# උත්පත්ති කථාව

## යයි සාමාන්‍යයෙන් කියනුලබන

## මෝසෙස්ගේ පළමුවෙනි පොත

### මැවීම

1 පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ
අහසත් පොළොවත් මැවූසේක.
2 පොළොව වනාහි පාළුව හිස්ව තිබුණාය;
ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්-
වහන්සේගේ ආත්මය ජල මතුයෙහි
3 හැසිරෙමින් සිටිසේක. දෙවියන්වහන්සේ:
එළිය වේවයි කීසේක; එවිට එළිය
4 විය. එළිය යහපත් බව දෙවියන්වහන්සේ
දුටුසේක. දෙවියන්වහන්සේ අන්ධ-
5 කාරයෙන් එළිය වෙන් කොට එළියට
දවාලය කියාද අන්ධකාරයට රාත්‍රිය
කියාද නම් තැබූසේක. සවස විය, උදය
විය, ඒ එක දවසක්ය.
6 දෙවියන්වහන්සේ: ජල මධ්‍යයෙහි
අවකාශයක් වේවා, එය කරණකොට-
ගෙන ජලය ජලයෙන් වෙන්වේවයි
7 කීසේක. දෙවියන්වහන්සේ අවකාශය
සාදා අවකාශයට උඩින් තිබුණු ජලයෙන්
අවකාශයට යටින් තිබුණු ජලය වෙන්-
8 කළසේක; ඒ එසේ විය. දෙවියන්වහන්සේ
අවකාශයට අහසය කියා නම් තැබූසේක.
සවස විය, උදය විය, ඒ දෙවෙනි
දවසක්ය.
9 දෙවියන්වහන්සේ: අහසට යටින්
තිබෙන ජලය එක් තැනකට රැස්
වේවා, වියළි බිම පෙනේවයි කීසේක.
10 ඒ එසේ විය. දෙවියන්වහන්සේ: වියළි
බිමට පොළොවය කියාද රැස්වූ ජලයට
මුහුදය කියාද නම් තැබූසේක. දෙවියන්-
වහන්සේ ඒ යහපත් බව දුටුසේක.
දෙවියන්වහන්සේ: පොළොව වනාහි 11
තෘණද බීජ උපදවන පලාද ඒ ඒ වර්ග
ලෙස ඵල දරන බීජ සහිත ඵල වෘක්ෂද
පොළොව පිට හටගන්වාවයි කීසේක.
ඒ එසේවිය. තෘණද ඒ ඒ වර්ග ලෙස 12
බීජ උපදවන පලාද ඒ ඒ වර්ග ලෙස
බීජ සහිත ඵලදරන වෘක්ෂද පොළො-
වෙන් හටගත්තේය. දෙවියන්වහන්සේ
ඒ යහපත් බව දුටුසේක. සවස විය, 13
උදය විය, ඒ තුන්වෙනි දවසක්ය.
දෙවියන්වහන්සේ: රාත්‍රියෙන් දවාල 14
වෙන් කිරීමට අහස්තලයෙහි ආලෝකයෝ
වෙත්වා, ඒවා ලකුණු පිණිසද සෘතු
පිණිසද දවස් පිණිසද අවුරුදු පිණිසද
වෙත්වා, පොළොවට එළිය දීමට ඒවා 15
අහස්තලයෙහි ආලෝකයන් පිණිස
වෙත්වයි කීසේක. ඒ එසේ විය. දෙවියන්- 16
වහන්සේ මහත් ආලෝක දෙක සෑදූසේක;
වඩා මහත් ආලෝකය දිවාභාගය
කෙරෙහි අධිපතිකම් කරන පිණිසය,
කුඩා ආලෝකය රාත්‍රිභාගය කෙරෙහි
අධිපතිකම් කරන පිණිසය. උන්වහන්සේ
තාරකාද සෑදූසේක. පොළොවට එළිය 17
දෙන පිණිසත් දවාල කෙරෙහිද රාත්‍රිය
කෙරෙහිද අධිපතිකම් කරන පිණිසත්
අන්ධකාරයෙන් එළිය වෙන්කරන 18
පිණිසත් දෙවියන්වහන්සේ ඒවා අහස්
තලයෙහි තැබූසේක. දෙවියන්වහන්සේ
ඒ යහපත් බව දුටුසේක. සවස විය, 19
උදය විය, ඒ සතරවෙනි දවසක්ය.

20 දෙවියන්වහන්සේ: ජලය වනාහි එහි
හැසිරෙන ජීවමාන සත්ත්වයන් බොහෝ
කොට හටගන්වාවා, පක්ෂීහු පොළොවට
උඩින් ආකාශ කුක්ෂියෙහි පියාසර
21 කෙරෙත්වයි කීසේක. තවද දෙවියන්-
වහන්සේ ඉතා මහත් ජලචර සත්ත්වයන්ද
ඒ ඒ වර්ගලෙස ජලයෙහි බොහෝ සෙයින්
හටගත්තාවූ එහි හැසිරෙන පණ ඇති
සියලු සත්ත්වයන්ද ඒ ඒ වර්ග ලෙස
පියාපත් ඇති සියලු පක්ෂීන්ද මැවූසේක.
දෙවියන්වහන්සේ ඒ යහපත් බව දුටුසේක.
22 දෙවියන්වහන්සේ උන්ට ආශීර්වාද-
කොට: තොපි සඵලව බෝවෙමින්
මුහුදු ජලය පුරා පැතිර සිටිව්, පක්ෂීහුද
පොළොවෙහි බෝවෙත්වයි කීසේක.
23 සවස විය, උදය විය, ඒ පස්වෙනි
දවසක්ය.
24 දෙවියන්වහන්සේ: පොළොව වනාහි
ඒ ඒ වර්ග ලෙස තිරිසනුන්ද බඩගා යන
ජාතීන්ද පොළොවේ මෘගයන්ද යන
ජීවමාන සත්ත්වයන් ඒ ඒ වර්ග ලෙස හට
ගන්වාවයි කීසේක. ඒ එසේ විය.
25 දෙවියන්වහන්සේ ඒ ඒ වර්ග ලෙස
පොළොවේ මෘගයන්ද ඒ ඒ වර්ග ලෙස
සිව්පාවුන්ද ඒ ඒ වර්ග ලෙස භූමියෙහි
බඩගා යන සියලු සතුන්ද සෑදූසේක.
දෙවියන්වහන්සේ ඒ යහපත් බව දුටු-
26 සේක. තවද දෙවියන්වහන්සේ: අපගේ
ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස
මනුෂ්‍යයා සාදම්හ; ඔව්හු මුහුදේ
මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂීන්
කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු
පොළොව කෙරෙහිද පොළොව පිට
බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩු-
27 කෙරෙත්වයි කීසේක. දෙවියන්වහන්සේ
තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූසේක,
දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු
මැවූසේක; පුරුෂයාද ස්ත්‍රියද කොට
28 ඔවුන් මැවූසේක. දෙවියන්වහන්සේ
ඔවුන්ට ආශීර්වාදකළසේක; දෙවියන්-
වහන්සේ ඔවුන්ට කියනසේක්: තුඹලා
බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණ-
කොට ඒක යටත්කරගනිව්; මුහුදේ
මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂීන්
කෙරෙහිද පොළොව පිට හැසිරෙන
සියලු සතුන් කෙරෙහිද අධිපතිකම් කරව්-
යයි කීසේක. තවද දෙවියන්වහන්සේ: 29
බලව, මුළු පොළෝතලයෙහි ඇති බීජ
දරන සියලු පලාද බීජ දරන ඵල ඇති
සියලු වෘක්ෂයන්ද තුඹලාට දුනිමි; එය
තුඹලාට ආහාර පිණිස වන්නේය.
පොළොවේ සියලු මෘගයන්ටත් 30
ආකාශයේ සියලු පක්ෂීන්ටත් පොළොව
පිට බඩගා යන පණ ඇති සියලු
සතුන්ටත් ආහාර පිණිස සියලු නිල්
පලා දුනිමියි කීසේක. ඒ එසේ විය.
දෙවියන්වහන්සේ තමන් සෑදූ සියල්ලම 31
දුටුසේක, බලව ඒ ඉතා යහපත්ව
තිබුණේය. සවස විය, උදය විය, ඒ
සවෙනි දවසක්ය.

2
මෙසේ අහසත් පොළොවත් එහි
මුළු සේනාවත් මවා නිමවනලද්දේය.
දෙවියන්වහන්සේ තමන් විසින් කළ 2
ස්වකීය කර්මාන්තය සත්වෙනි දවසේ
නිමකළසේක. උන්වහන්සේ තමන්
විසින් කරනලද සියලු වැඩවලින්
සත්වෙනි දවසේ නිවාඩු ගත්සේක.
දෙවියන්වහන්සේ තමන් මැවූවාවූ 3
සෑදූවාවූ ස්වකීය සියලු වැඩවලින්
සත්වෙනි දවසේ නිවාඩු ගත් හෙයින් ඒ
දවසට ආශීර්වාදකොට එය ශුද්ධයයි
නියමකළසේක.

## මැවීම, ඒදන් උයන

ස්වාමිවූ දෙවියන්වහන්සේ පොළොවත් 4
අහසත් සෑදූ දවසෙහි, ඒවා මවන ලද
කාලයෙහි, අහසෙත් පොළොවෙත් මුල්
ප්‍රවෘත්තිය මේය. ඒ තාක් කල් වනයේ 5
කිසි ගසක් පොළොවෙහි නොතිබුණේය,
වනයේ කිසි පලා ජාතියක්ද හටනො-
ගත්තේය. මක්නිසාද ස්වාමිවූ දෙවියන්-
වහන්සේ පොළොව පිට වර්ෂාව
නොවස්වා තිබුණු නිසාය. භූමිය වගා
කරන පිණිස මනුෂ්‍යයෙක්ද නොසිටි-
යේය. එහෙත් මීදුමක් පොළොවෙන් 6
නැගී මුළු භූමිතලය තෙමුවේය. ස්වාමිවූ 7

දෙවියන්වහන්සේ භූමියේ දූවිල්ලෙන්
මනුෂ්‍යයා සාද ඔහුගේ නාස්පුඩු
තුළට ජීවනයේ හුස්ම හෙළුසේක;
එවිට මනුෂ්‍යයා ජීවමාන *ප්‍රාණියක් විය.
8 ස්වාමිවූ දෙවියන්වහන්සේ නැගෙනහිර
දිශාවෙහි, ඒදන්හි, උයනක් වවා තමන්
9 සෑදූ මනුෂ්‍යයා එහි සිටෙවුසේක. දකීමට
ප්‍රියවූ කෑමට හොඳවූ සියලු ගස්ද උයන
මැද ජීවන වෘක්ෂයද යහපත හා නපුර
දනගැනීමේ ගහද ස්වාමිවූ දෙවියන්-
වහන්සේ භූමියෙන් හටගැන්වූසේක.
10 උයන තෙමන පිණිස ඒදනෙන් ගංගාවක්
නික්ම ගියාය; එය එතැනින් බෙදී ගංගා
11 සතරක් විය. පළමුවෙනි ගංගාවේ නම
පීශොන්ය; එය නම් රත්රන් ඇති මුළු
හවීලා දේශය වටේට ගලායන එකය;
12 ඒ දේශයේ රත්රන් හොඳය. බෙදෙලෑද
13 වෛදූර්‍ය්‍යයද එහි ඇත්තේය. දෙවෙනි
ගංගාවේ නම ගීහොන්ය; මුළු කූෂ් දේශය
14 වටේට වැටී තිබෙන්නේ ඒකය. තුන්වෙනි
ගංගාවේ නම †හිද්දෙකෙල්ය; අෂූර් දේශය
15 ‡ඉස්සරහින් ගලායන්නේ ඒකය. සතර-
වෙනි ගංගාව ප්‍රාත්ය. ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මනුෂ්‍යයා රැගෙන ඒදන්
උයන වවන්ටත් බලාගන්ටත් එහි පදිංචි-
16 කෙරෙවුසේක. ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මනුෂ්‍යයාට ආඥකරමින්:
තුඹට උයනේ සියලු ගස්වලින් කැමති
17 ලෙස කන්ට පුළුවන; එහෙත් යහපත
හා නපුර දනගැනීමේ ගහෙන් කන්ට
එපාය; මක්නිසාද එයින් කෑ දවසෙහි
ඒකාන්තයෙන් තුඹ නසින්නෙහියයි
කීසේක.
18 ස්වාමිවූ දෙවියන්වහන්සේ කථාකොට:
මනුෂ්‍යයා තනියම සිටීම හොඳ නැත;
ඔහුට සුදුසු සහකාරියක් සාද දෙන්නෙ-
19 මියි කීසේක. ස්වාමිවූ දෙවියන්වහන්සේ
වනයේ සියලු මෘගයන්ද ආකාශයේ
සියලු පක්ෂීන්ද භූමියෙන් සාද මනුෂ්‍යයා
උන්ට මොන මොන නම් තබන්නේදැයි
බලන පිණිස උන් ඔහු වෙතට පැමිණෙවු-
සේක. මනුෂ්‍යයා සියලු ජීවමාන
සත්ත්වයන්ට තැබූ නම් උන්ගේ නාමයෝ
වූහ. මනුෂ්‍යයා සියලු සිව්පාවුන්ටත් 20
ආකාශයේ පක්ෂීන්ටත් වනයේ සියලු
මෘගයන්ටත් නම් තැබීය; එහෙත්
*මනුෂ්‍යයාට සුදුසු සහකාරියක් සම්බ-
නොවීය. ස්වාමිවූ දෙවියන්වහන්සේ 21
මනුෂ්‍යයාට බරවූ 'නින්දක් පැමිණෙවු-
සේක, ඔහු නිදගත්තේය; උන්වහන්සේ
ඔහුගේ ඉළ ඇටවලින් එකක් ගෙන ඒ
ස්ථානය මාංසයෙන් පිරෙවූසේක.
ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගෙන් 22
ගත් ඉළඇටයෙන් ස්ත්‍රියක් සාද ඇය
මනුෂ්‍යයා වෙතට පැමිණෙවුසේක. එවිට 23
මනුෂ්‍යයා කථාකොට: මෑ මාගේ
ඇටවලින් ඇටය, මාගේ මාංසයෙන්
මාංසයය; මෑ මනුෂ්‍යයාගෙන් ගන්නාලද
හෙයින් මනුෂ්‍ය දූයයි කියනුලබන්නී යයි
කීය. එබැවින් පුරුෂ තෙමේ තමාගේ 24
පියාද මවුද අත්හැර තම භාර්යාවට
ඇලුම්වන්නේය; ඔව්හු එක මාංසයක්
වන්නෝය. තවද මනුෂ්‍යයාද ඔහුගේ 25
භාර්යාවද යන දෙදෙනා නග්නව සිටියෝය,
නුමුත් ඔව්හු ලජ්ජා නොවූහ.

## මනුෂ්‍යයා පරීක්ෂාකරනු ලැබීම සහ පාපයට වැටීම

3 සර්පයා වනාහි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ සෑදූ වනයේ කවර සත්ත්ව-
යෙකුටත් වඩා ප්‍රයෝග සහිත වූයේය.
ඌද: ඇත්තටම උයනේ කොයි ගසකින්-
වත් කන්ට එපාය කියා දෙවියන්-
වහන්සේ කීවාදැයි ස්ත්‍රියගෙන් ඇසීය.
ස්ත්‍රීද: උයනේ ගස්වල ගෙඩි කන්ට අපට 2
පුළුවන; එහෙත් දෙවියන්වහන්සේ- 3
තුඹලා නොනසින පිණිස උයන මැද
තිබෙන ගහේ ගෙඩි කන්ටවත් ඊට අත-
ගසන්ටවත් එපායයි කීසේකැයි
සර්පයාට කීවාය. සර්පයාද: තුඹලා 4

*එනම්, සත්ත්වයෙක්. †හෙවත් ටීග්‍රිස්.
‡නොහොත්, නැගෙනහිරින්.

*හෙවත්, ආදම්ට.

5 ඇත්තටම නසින්නේ නැත; මක්නිසාද
තුඹලා එයින් කන දවසෙහි තුඹලාගේ
ඇස් ඇරෙන බවත් තුඹලා යහපත හා
නපුර දැනගෙන දෙවියන්වහන්සේට
සමාන වන බවත් දෙවියන්වහන්සේ
6 දන්නාසේකැයි ස්ත්‍රීට කීය. ස්ත්‍රී වනාහි
ඒ ගහ කෑමට හොඳ බවද එය ඇස්වලට
ප්‍රිය බවද නුවණ ලැබීම සඳහා
ආශාවිය යුතු ගහක් බවද දැක එහි
ගෙඩි ගෙන කෑවාය; ඈ තමා සමග
සිටි තමාගේ පුරුෂයාටත් දුන්නාය, ඔහුද
7 කෑවේය. එවිට ඔවුන් දෙදෙනාගේම ඇස්
ඇරී තමන් නග්නව සිටින බව ඔව්හු
දැනගත්තෝය; ඔව්හු අත්තික්කා කොළ
මහා තමන්ට ඉණවැසුම් සාදගත්තෝය.
8 ඉක්බිති දිවාභාගයේ සිසිල් වේලේ
ස්වාමිවූ දෙවියන්වහන්සේ උයනෙහි
සක්මන්කරන ශබ්දය ඔවුන්ට ඇසුණේය.
එවිට මනුෂ්‍යයා සහ ඔහුගේ භාර්යාව
ස්වාමිවූ දෙවියන්වහන්සේ ඉදිරියෙන්
උයනේ ගස් අතරෙහි සැඟවුණෝය.
9 ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට
හඬගසමින්: තුඹ කොහේදැයි ඔහුට
10 කීසේක. ඔහු: මට ඔබවහන්සේගේ ශබ්දය
උයනෙහිදී ඇසී මම නග්න බැවින්
11 භයපත්ව සැඟවුණෙමියි කීය. උන්-
වහන්සේ: තුඹ නග්න බව තුඹට කීවේ
කවුද? නොකන්ට මා ආඥාකළ ගහෙන්
12 කෑවෙහිදැයි ඇසූසේක. මනුෂ්‍යයාද: මා
සමග සිටින්ට ඔබවහන්සේ දුන් ස්ත්‍රී
ගහෙන් මට දුන්නාය, මමද කෑවෙමියි
13 කීය. ස්වාමිවූ දෙවියන්වහන්සේ: තුඹ
කළ මේ දෙය මොකදැයි ස්ත්‍රියට කීසේක.
ස්ත්‍රීද: සර්පයා මා රැවටුවේය, මම
14 කෑවෙමියි කීවාය. එවිට ස්වාමිවූ
දෙවියන්වහන්සේ සර්පයාට කථාකොට:
තා මේක කළ බැවින් සියලු තිරිසනුන්ටත්
වනයේ සියලු සත්ත්වයන්ටත් වඩා තෝ
ශාප ලද්දෙක්ය; තෝ බඩගායමින්
තාගේ ජීවිතයේ සියලු දවස්වලම ධූලි
15 කන්නෙහිය. මම තා සහ ස්ත්‍රිය අතරෙහිද
තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද
සතුරුකම තබන්නෙමි; ඒ වංශය තාගේ
හිස පොඩිකරන්නේය, තෝ ඔහුගේ
විලුඹ පොඩිකරන්නෙහියයි කීසේක.
උන්වහන්සේ ස්ත්‍රියට කථාකොට: තුඹේ 16
*ශෝකය හා ගැබ්ගැනීම බොහෝ
සෙයින් වැඩිකරන්නෙමි; තුඹ වේදනා
සහිතව දරුවන් වදන්නීය; තුඹේ ආශාව
තුඹේ පුරුෂයා කෙරෙහි වන්නේය; ඔහු
තුඹ කෙරෙහි බලපවත්වන්නේයයි කී-
සේක. උන්වහන්සේ ආදම්ට කථාකොට: 17
තුඹේ භාර්යාවගේ හඬට ඇහුම්කන්දී
නොකන්ට මා අණ කළ ගහෙන් කෑ
බැවින් තුඹ නිසා භූමිය ශාපලද්දීය;
තුඹේ ජීවිතයේ සියලු දවස්වලම තුඹ
වෙහෙසින් යුක්තව එයින් කන්නෙහිය;
එය තුඹට කටුඳ ගොකටුඳ උපදවන්නේය; 18
තුඹ වනයේ පලා කන්නෙහිය; තුඹ 19
භූමියෙන් ගන්නාලද බැවින් එයට හැරී
යන තෙක් තුඹේ මුහුණේ ඩහදියෙන්
යුක්තව කෑම කන්නෙහිය; මක්නිසාද
තුඹ දූවිලිය, දූවිල්ලට හැරී යන්නෙහි-
යයි කීසේක. මනුෂ්‍යයා තමාගේ 20
භාර්යාව ජීවමාන සියල්ලන්ගේ මවූ
හෙයින් ඇට †ඒව යන නම තැබීය.
ස්වාමිවූ දෙවියන්වහන්සේ ආදම්ට සහ 21
ඔහුගේ භාර්යාවට සම්වලින් ඇඳුම් සාද
ඇන්දවූසේක.
තවද ස්වාමිවූ දෙවියන්වහන්සේ: බලව, 22
මනුෂ්‍යයා යහපත හා නපුර දැනගැනීමට
අපගෙන් කෙනෙකු මෙන් වුණේය. දැනුදු
ඔහු තමාගේ අත දිගුකොට ජීවන
වෘක්ෂයෙනුත් ගෙන කා සදාකාලයටම
ජීවත්නොවන පිණිසය කියා, යම් 23
භූමියකින් ඔහු ගන්නාලදද එය වවන
පිණිස ස්වාමිවූ දෙවියන්වහන්සේ
ඒදන් උයනෙන් ඔහු පිටකළසේක.
මෙසේ උන්වහන්සේ මනුෂ්‍යයා පිටතට 24
එළවා ජීවන වෘක්ෂයට යන මාර්ගය
රැකවල්කරන පිණිස ඒදන් උයනට

*නොහොත්, ගර්භදරීමේ වේදනාව.
†හෙබ්‍රෙව්: හව්වා, එනම් ජීවමාන,
නොහොත් ජීවනය.

නැගෙනහිරෙන් කෙරුබ්වරුන්ද හැම
අතටම කරකැවෙන්නාවූ ගිනිමයවූ
කඩුවක්ද පිහිටෙවුසේක.

## කායින් සහ ආබෙල්.

4 මනුෂ්‍යයා තමාගේ භාර්යාවවූ
ඒව හැඳින්නේය; ඈ ගර්භිණීව
කායින් වදා: ස්වාමීන්වහන්සේගෙන්
2 මනුෂ්‍යයෙකු ලබාගතිමියි කීවාය. නැවත
ඈ ඔහුගේ සහෝදරවූ ආබෙල් වැදුවාය.
ආබෙල් බැටළු පාලයෙක් වූයේය, නුමුත්
3 කායින් ගොවියෙක් වූයේය. කාලයකට
පසු කායින් භූමියේ ඵලයෙන් ස්වාමීන්-
4 වහන්සේට පඩුරක් ගෙනායේය. ආබෙල්ද
තමාගේ රැළේ කුලුඳුලන්ගෙන්ද උන්ගේ
තෙලින්ද ගෙනායේය. ස්වාමීන්වහන්සේ
ආබෙල් සහ ඔහුගේ පඩුර සැලකුසේක;
5 එහෙත් උන්වහන්සේ කායින් සහ ඔහුගේ
පඩුර නොසැලකුසේක. එවිට කායින්
අතිශයෙන් කෝපවිය, ඔහුගේ මුහුණද
6 වෙනස්විය. ස්වාමීන්වහන්සේ කායින්ට
කථාකොට: නුඹ කෝපව සිටින්නේ
මන්ද? නුඹේ මුහුණ වෙනස්ව තිබෙන්නේ
7 මක්නිසාද? නුඹ යහපත කෙරෙහිනම්
පිළිගනු නොලබන්නෙහිද? යහපත
නොකෙරෙහි නම් පාපය දොරකඩ ලැග
සිටියි; ඒකේ ආශාව නුඹ කෙරෙහි
වන්නේය, නුඹද එය කෙරෙහි ආණ්ඩු
8 කරන්නෙහියයි කීසේක. කායින් තමාගේ
සහෝදරවූ ආබෙල්ට කථාකෙළේය.
තවද ඔවුන් කෙතෙහි සිටි කල්හි
කායින් තමාගේ සහෝදරවූ ආබෙල්ට
විරුද්ධව නැගිට ඔහු මැරුවේය.
9 ස්වාමීන්වහන්සේ: නුඹේ සහෝදරවූ
ආබෙල් කොහේදැයි කායින්ට කීසේක.
ඔහුද: මම නොදනිමි; මම මාගේ
සහෝදරයාගේ රැකවලාදැයි කීය.
10 උන්වහන්සේ: නුඹ කුමක් කෙළෙහිද?
නුඹේ සහෝදරයාගේ ලෙයේ ශබ්දය
11 භූමියෙන් මට හඬගසයි. දැනුදු නුඹේ
අතින් නුඹේ සහෝදරයාගේ ලෙය
පිළිගන්නා පිණිස මුඛය ඇරියාවූ
භූමියෙන් නුඹ ශාපලද්දෙක්ය. නුඹ භූමිය 12
වගාකරන කල ඈ මෙතැන් පටන් ඇගේ
සාරවත්කම නුඹට නොදෙන්නීය. නුඹ
පොළොවෙහි පලායන්නෙක්ද තැනින්
තැන යන්නෙක්ද වන්නෙහියයි කීසේක.
එවිට කායින් ස්වාමීන්වහන්සේට කථා- 13
කොට: මාගේ දඬුවම දැරිය නොහැකි
තරම් මහත්ය. බැලුව මැනව, ඔබවහන්සේ 14
අද දවසෙහි භූමිතලයෙන් මා එළෙවූ-
සේක; මමද ඔබවහන්සේ ඉදිරියෙන්
සැඟවෙන්නෙමි; පොළොවෙහි පලා-
යන්නෙක්ද තැනින් තැන යන්නෙක්ද
වන්නෙමි; තවද මා සම්බවෙන කවරෙක්
නුමුත් මා මරන්නේයයි කීය. ස්වාමීන්- 15
වහන්සේ: ඉදින් යමෙක් කායින්
මරන්නේද ඔහුගෙන් සත්වරක් පළිගනු
ලබන්නේයයි ඔහුට කීසේක. කායින්
සම්බවෙන කිසිවෙක් ඔහුට පහර
නොදෙන පිණිස ස්වාමීන්වහන්සේ ඔහුට
ලකුණක් නියම කළසේක.

## කායින්ගේ සහ සෙත්ගේත් වංශ

කායින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් 16
පිටත්ව ගොස් ඒදනෙන් පෙරදිග නොද්
දේශයෙහි වාසය කෙළේය. කායින් 17
තමාගේ භාර්යාව හැඳින්නේය; ඈ
ගර්භිණීව ඒනොක් වැදුවාය. ඔහු නුවරක්
ගොඩනගා, තමාගේ පුත්‍රයාගේ නම
ලෙස ඊට ඒනොක් යන නම තැබීය.
ඒනොක්හට ඊරාද් උපන්නේය; ඊරාද්ට 18
දව මෙහුයායෙල් උපන්නේය; මෙහුයා-
යෙල්ට දව මෙතුෂායෙල් උපන්නේය;
මෙතුෂායෙල්ට දව ලාමෙක් උපන්නේය.
ලාමෙක් භාර්යාවන් දෙදෙනෙකු පාවා- 19
ගත්තේය; එක් තැනැත්තියකගේ නම
ආදය, අනික් තැනැත්තියගේ නම ශිල්ලාය.
ආදා යාබල් වැදුවාය; ඔහු කූඩාරම්වල 20
වාසය කරන්නාවූ ගෝපාලයන්ගේ
පියාය. ඔහුගේ සහෝදරයාගේ නම 21
යූබාල්ය; ඔහු වීණාවත් නළාවත්

පාවිච්චිකරන සියල්ලන්ගේ පියාය.
22 සිල්ලාද තුබල්-කායින් වැදුවාය, ඔහු
සියලු ආකාර පිත්තල සහ යකඩ ආයුධ
තනන ලෝකුරුවා වූයේය. තුබල්-
23 කායින්ගේ සහෝදරී නාමාය. ලාමෙක්
තමාගේ භාර්යාවන්ට කථාකොට:

ආදා සහ සිල්ලා, මාගේ හඬ අසව්;
ලාමෙක්ගේ භාර්යාවෙනි, මාගේ
බසට කන් දෙව්;
මට තුවාල කළ නිසා මිනිසෙක්ද
මට රිදවූ නිසා යෞවනයෙක්ද මැරීමි;
24 ඉදින් කායින් නිසා සත් වරක්
පළිගනු ලැබේ නම්
සැබවින් ලාමෙක් නිසා සැත්තෑසත්
වරක් පළිගනු ලැබේයයි කීවේය.

25 ආදම් නැවත තමාගේ භාර්යාව
හැඳින්නේය; ඈ පුත්‍රයෙකු වදා ඔහුට
සෙත් යන නම තැබුවාය. මක්නිසාද
කායින් ආබෙල් මැරූ හෙයින් ඔහු
වෙනුවට දෙවියන්වහන්සේ මට වෙන
වංශයක් නියමකර දුන්සේකැයි ඈ
26 කීවාය. සෙත්ටද පුත්‍රයෙක් උපන්නේය;
ඔහු ඒනොෂ් යන නම ඔහුට තැබීය.
එකල මනුෂ්‍යයෝ ස්වාමීන්වහන්සේගේ
නාමය කියා යාච්ඤාකරන්ට පටන්
ගත්තෝය.

## ආදම් පටන් නෝවා දක්වා පරම්පරා

5 ආදම්ගේ පරම්පරා පොත මේය.
දෙවියන්වහන්සේ මනුෂ්‍යයා මැවූ
දවසෙහි දෙවියන්වහන්සේගේ සමානත්-
2 වයෙන් ඔහු සෑදූසේක; පුරුෂයෙක්ද
ස්ත්‍රියෙක්ද කොට උන්වහන්සේ ඔවුන්
මැවූසේක; උන්වහන්සේ ඔවුන්ට ආශීර්-
වාදකර, ඔවුන් මවනු ලැබූ දවසෙහි
*ආදම් යන නාමය ඔවුන්ට තැබූසේක.
3 ආදම් එකසිය තිස් අවුරුද්දක් ජීවත්වූ
පසු තමාගේම සමානත්වයෙන් තමාගේ
ස්වරූපය මෙන් පුත්‍රයෙකු උපදවා
4 ඔහුට සෙත් යන නම තැබුවේය. සෙත්
උපන්නාට පසු ආදම්ගේ දවස් අවුරුදු
අටසියයක් විය. ඔහුට දුව පුත්‍රයෝද
දූවරුද උපන්නෝය. ආදම් ජීවත්වුණු 5
සියලු දවස් නවසිය තිස් අවුරුද්දක්ය;
ඔහු මළේය.
සෙත් එකසිය පස් අවුරුද්දක් ජීවත්වූ 6
පසු ඔහුට දුව ඒනොෂ් උපන්නේය.
සෙත් ඒනොෂ් ඉපදෙවූ පසු අටසිය සත් 7
අවුරුද්දක් ජීවත්වුණේය, ඔහුට දුව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය. සෙත්ගේ 8
සියලු දවස් නවසිය දොළොස් අවුරුද්දක්ය;
ඔහු මළේය.
ඒනොෂ් අනූ අවුරුද්දක් ජීවත්වූ පසු 9
ඔහුට දුව කේනාන් උපන්නේය. ඒනොෂ් 10
කේනාන් ඉපදෙවූ පසු අටසිය පසළොස්
අවුරුද්දක් ජීවත්වුණේය, ඔහුට දුව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය. ඒනොෂ්ගේ 11
සියලු දවස් නවසිය පස් අවුරුද්දක්ය;
ඔහු මළේය.
කේනාන් සැත්තෑ අවුරුද්දක් ජීවත්වූ 12
පසු ඔහුට දුව මහලලෙල් උපන්නේය.
කේනාන් මහලලෙල් ඉපදෙවූ පසු අටසිය 13
සතළිස් අවුරුද්දක් ජීවත් වුණේය, ඔහුට
දුව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
කේනාන්ගේ සියලු දවස් නවසිය දස 14
අවුරුද්දක්ය; ඔහු මළේය.
මහලලෙල් සැටපස් අවුරුද්දක් ජීවත්වූ 15
පසු ඔහුට දුව යරෙද් උපන්නේය.
මහලලෙල් යරෙද් ඉපදෙවූ පසු අටසිය 16
තිස් අවුරුද්දක් ජීවත්වුණේය, ඔහුට
දුව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
මහලලෙල්ගේ සියලු දවස් අටසිය අනූපස් 17
අවුරුද්දක්ය; ඔහු මළේය.
යරෙද් එකසිය සැට දෑවුරුද්දක් ජීවත්වූ 18
පසු ඔහුට දුව ඒනොක් උපන්නේය. යරෙද් 19
ඒනොක් ඉපදෙවූ පසු අටසිය අවුරුද්දක්
ජීවත්වුණේය, ඔහුට දුව පුත්‍රයෝද දූවරුද
උපන්නෝය. යරෙද්ගේ සියලු දවස් 20
නවසිය සැටදෑවුරුද්දක්ය; ඔහු මළේය.
ඒනොක් සැටපස් අවුරුද්දක් ජීවත්ව 21
මෙතුසෙලා ඉපදෙවුවේය. ඒනොක් 22
මෙතුසෙලා ඉපදෙවූ පසු අවුරුදු
තුන්සියයක් දෙවියන්වහන්සේ සමග

*හෙවත්, මනුෂ්‍යයා.

හැසුරුණේය. ඔහුට දව පුත්‍රයෝද දූවරුද
23 උපන්නෝය. ඒනොක්ගේ සියලු දවස්
24 තුන්සිය සැටපස් අවුරුද්දක්ය. තවද
ඒනොක් දෙවියන්වහන්සේ සමග හැසුරු-
ණේය: දෙවියන්වහන්සේ ඔහු ගත් බැවින්
ඔහු තවත් නොදක්නා ලද්දේය.
25 මෙතුසෙලා එකසිය අසූසත් අවුරුද්දක්
ජීවත්වූ පසු ඔහුට දව ලාමෙක් උපන්නේය.
26 මෙතුසෙලා ලාමෙක් ඉපදෙවූ පසු සත්සිය
අසූ දෑවුරුද්දක් ජීවත් වුණේය. ඔහුට
27 දව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. මෙතු-
සෙලාගේ සියලු දවස් නවසිය සැටනව
අවුරුද්දක්ය; ඔහු මෙළේය.
28 ලාමෙක් එකසිය අසූ දෑවුරුද්දක්
ජීවත්වූ පසු ඔහුට දව පුත්‍රයෙක්
29 උපන්නේය. ඔහු: **ස්වාමීන්වහන්සේ** ශාප
කළ භූමිය කරණකොටගෙනවූ අපගේ
වැඩද අත්වල වෙහෙසද ගැන මේ තෙමේ
අප සනසන්නේය කියා ඔහුට නෝවා
30 යන නම තැබීය. ලාමෙක් නෝවා
ඉපදෙවූ පසු පන්සිය අනූපස් අවුරුද්දක්
ජීවත්වුණේය, ඔහුට දව පුත්‍රයෝද දූවරුද
31 උපන්නෝය. ලාමෙක්ගේ සියලු දවස්
සත්සිය සැත්තෑසත් අවුරුද්දක්ය: ඔහු
මෙළේය.
32 නෝවාට අවුරුදු පන්සියයක් වයස්වූ
කල ඔහුට දව ෂෙම්ද හාම්ද යපෙත්ද
උපන්නෝය.

## මනුෂ්‍ය වර්ගයාගේ නපුරුකම

6 තවද භූමිය මතුපිට මනුෂ්‍යයන්
වැඩිවෙන්ට පටන්ගෙන ඔවුන්ට
2 දූවරුන් උපන් කල දෙවියන්වහන්සේගේ
පුත්‍රයෝ මනුෂ්‍යයන්ගේ දූවරුන් ශෝභන
බව දැක තමතමන් කැමති සියල්ලන්
භාර්යාවන් කොට පාවාගත්තෝය.
3 **ස්වාමීන්වහන්සේද**: මාගේ ආත්මය
මනුෂ්‍යයා හා සමග සදකල්ම විවාද
නොකරන්නේය: මක්නිසාද ඔහුත්
මාංසයය. එසේවී නුමුත් ඔහුගේ කාලය
එකසිය විසි අවුරුද්දක් වන්නේයයි
කීසේක. ඒ දවස්හි *යෝධයෝ 4
පොළොවෙහි සිටියෝය. ඉන්පසුත්
දෙවියන්වහන්සේගේ පුත්‍රයන් මනුෂ්‍ය-
යන්ගේ දූවරුන් වෙතට පැමිණි කල ඒ
ස්ත්‍රීන් ඔවුන් නිසා වැදූ දරුවෝ
පුරාණයෙහි සිටි කීර්තිමත්වූ බලසම්-
පන්න මනුෂ්‍යයෝ වූය. මනුෂ්‍යයාගේ 5
දුෂ්ටකම පොළොවෙහි මහත් බවද
ඔහුගේ සිතේ කල්පනාවල කවර
අරමුණත් නිරන්තරයෙන් නපුරුවම
තිබෙන බවද **ස්වාමීන්වහන්සේ**
දුටුසේක. තවද **ස්වාමීන්වහන්සේ** 6
පොළොවෙහි මනුෂ්‍යයා සෑදූ බැවින්
තැවී තමන් සිතෙන්ම ශෝකවූසේක.
**ස්වාමීන්වහන්සේ**: මා විසින් මවන- 7
ලද මනුෂ්‍යයා භූමිය මතුපිටින් නැතිකර
දමන්නෙමි; මනුෂ්‍යයන්ද මෘගයන්ද
බඩගා යන සත්ත්වයන්ද ආකාශයේ
පක්ෂීන්ද නැතිකර දමන්නෙමි; මක්නිසාද
මම ඔවුන් සෑදූ බැවින් තැවෙමියි
කීසේක. එහෙත් නෝවා **ස්වාමීන්-** 8
**වහන්සේගෙන්** කරුණාව ලැබුයේය.

## නෝවා නැව සෑදීම

නෝවාගේ පරම්පරා මේය. නෝවා 9
ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්ව තමාගේ පරම්-
පරාවන්හි †සම්පූර්ණව සිටියේය. නෝවා
දෙවියන්වහන්සේ සමග හැසුරුණේය.
නෝවාට දව ෂෙම්, හාම්, යපෙත් යන 10
පුත්‍රයන් තුන්දෙනෙක් උපන්නෝය.
පොළොව දෙවියන්වහන්සේ ඉදිරියෙහි 11
දූෂ්‍ය වූවාය. පොළොව බලාත්කාරයෙන්
පිරී තිබුණාය. දෙවියන්වහන්සේ 12
පොළොව දෙස බැලූසේක; බලව, එය
දූෂ්‍යව තිබුණාය: මක්නිසාද මාංසමයවූ
සියල්ලෝ පොළොවෙහි තමන්ගේ මාර්ග
දූෂ්‍යකරගෙන සිටියෝය.
දෙවියන්වහන්සේ නෝවාට කථා- 13
කොට: මාංසමයවූ සියල්ලන් කරණ-
කොටගෙන පොළොව බලාත්කාරයෙන්

*හෙබ්‍රෙව්: 'නෙෆිලිම්.'
†හෙවත්, නිර්මලව.

පිරී තිබෙන බැවින් ඔවුන්ගේ අන්තිමය
මා ඉදිරියට පැමිණ තිබේ; බලව, මම
ඔවුන් පොළොව හා සමග විනාශ-
14 කරන්නෙමි. නුඹ ගොෆෙර් ලීවලින්
නැවක් සාදගනින්න; නැවෙහි කාමර
සාද එහි ඇතුළත් පිටත් කීල් ගාපන්න.
15 නුඹ ඒක සෑදිය යුතු ආකාරය මේය.
නැවේ දිග රියන් තුන්සියයක්ය, පළල
රියන් පනසක්ය, උස රියන් තිහක්ය.
16 නැවට කවුළුවක් සාදවා ඉහළින් ඒක
රියනකින් නිම කරපන්න; නැවේ දෙර
පැත්තකින් සාදපන්න; පහළ තට්ටුවක්ද
දෙවෙනි තුන්වෙනි තට්ටුද ඇතුව ඒක
17 සාදපන්න. බලව, අහස යට ජීවන
හුස්ම ඇති මාංසමයවූ සියල්ලන් විනාශ
කරන පිණිස මම පොළොව පිටට ජල
ගැල්ම පමුණුවමි; පොළොවෙහි ඇත්තාවූ
18 සියල්ල නසින්නේය. එහෙත් නුඹ සමග
මාගේ ගිවිසුම පිහිටුවන්නෙමි; නුඹද
නුඹ සමග නුඹේ පුත්‍රයෝද නුඹේ
භාර්යාවද නුඹේ පුත්‍රයන්ගේ භාර්යාවෝද
19 නැවට ඇතුල්වන්නෝය. තවද මාංසමයවූ
පණ ඇති සියල්ලන්ගෙන් නුඹ සමග
පණ ඇතුව තබා ගන්න පිණිස එක
එක වර්ගයේ ගෑනු පිරිමි දෙදෙනෙකු
20 බැගින් නැවට ගෙනියාපන්න. ඒ ඒ
වර්ගයේ පක්ෂීන්ගෙන්ද ඒ ඒ වර්ගයේ
සිව්පාවුන්ගෙන්ද භූමියේ බඩගායන ඒ
ඒ වර්ගයේ සියල්ලන්ගෙන්ද පණ ඇතුව
තබාගන්න පිණිස සියලු වර්ගවලින්ම
දෙදෙනෙක් බැගින් නුඹ වෙතට
21 පැමිණෙන්නෝය. කන්නාවූ සියලු ආකාර
ආහාරයෙන් නුඹ වෙතට රැස්කරගනින්න;
ඒවා නුඹටද උන්ටද භෝජන පිණිස
22 වන්නේයයි කීසේක. නෝවා එසේ
කෙළේය; දෙවියන්වහන්සේ ඔහුට අණ-
කළ සියල්ල ලෙස ඔහු කෙළේය.

## ජලගැල්ම

7 ස්වාමීන්වහන්සේ නෝවාහට
කථාකොට: නුඹද නුඹේ මුළු පවුලද
නැවට ඇතුල්වෙයල්ලා; මක්නිසාද
නුඹ මේ පරම්පරාවෙහි මා ඉදිරියේ
ධර්මිෂ්ඨව සිටින බව දුටුවෙමි. මුළු 2
පොළෝතලයෙහි සත්ත්වයන් පවතින
පිණිස සියලු පවිත්‍ර මෘගයන්ගෙන්
පිරිමි සතුන් සහ උන්ගේ ගෑනු සතුන්
සත් සත් දෙනෙකු බැගින්ද අපවිත්‍ර
මෘගයන්ගෙන් පිරිමි සතුන් සහ උන්ගේ
ගෑනු සතුන් දෙදෙනෙකු බැගින්ද ආකාශ 3
පක්ෂීන්ගෙනුත් ගෑනු පිරිමි සතුන් සත්
සත් දෙනෙකු බැගින්ද නුඹ වෙතට
ගනින්න. මක්නිසාද තව සත් දවසකින් 4
දහවල් සතළිසක්ද රෑ සතළිසක්ද
පොළොව පිට වැසි වස්වන්නෙමි;
මා විසින් සාදනලද ජීවමාන සියල්ල
භූමිය මතුපිටින් නැතිකරදමන්නෙමියි
කීසේක. නෝවා ස්වාමීන්වහන්සේ තමාට 5
අණ කළ සියල්ල ලෙස කෙළේය.
පොළොවෙහි ජලගැල්මවූ කල්හි 6
නෝවා අවුරුදු හසියයක් වයස්ව
සිටියේය. ජලගැල්ම නිසා නෝවාද ඔහු 7
සමග ඔහුගේ පුත්‍රයෝද ඔහුගේ භාර්-
යාවද ඔහුගේ පුත්‍රයන්ගේ භාර්යාවෝද
නැවට ඇතුල්වූවෝය. පවිත්‍ර මෘගයන්- 8
ගෙන්ද අපවිත්‍ර මෘගයන්ගෙන්ද පක්ෂීන්-
ගෙන්ද භූමියෙහි බඩගා යන සියල්ලන්-
ගෙන්ද ගෑනු පිරිමි සතුන් දෙන්න දෙන්නා 9
බැගින් දෙවියන්වහන්සේ නෝවාට අණ
කළ ලෙස නෝවා වෙත නැවට ඇතුල්-
වූවෝය. ඒ සත් දවසට පසු ජලගැල්ම 10
පොළොවෙහි විය. නෝවාගේ ජීවිතයේ 11
හසියවෙනි අවුරුද්දේ දෙවෙනි මස දස
සත්වෙනි දිනයෙහිම මහත් ගැඹුරේ සියලු
උල්පත් බිඳී ගියේය, ආකාශයේ කවුළුද
ඇරුණේය. දහවල් සතළිසක්ද රෑ 12
සතළිසක්ද පොළොව පිට වැසි වැස්සේය.
එම දවසෙහිම නෝවාද නෝවාගේ 13
පුත්‍රයන්වූ ෂෙම්, හාම් සහ යාෆෙත්ද
නෝවාගේ භාර්යාවද ඔහුගේ පුත්‍රයන්
සමග ඔවුන්ගේ භාර්යාවන් තුන්දෙනාද
නැවට ඇතුල්වූවෝය; ඔව්හුද එක එක 14
වර්ගයේ සියලු මෘගයෝද එක එක
වර්ගයේ සියලු සිව්පාවෝද එක එක

වර්ගයේ පොළොවෙහි බඩගා යන
සියල්ලෝද එක එක වර්ගයේ සියලු
පක්ෂීහුද සියලු වර්ගවල සියලු කුරුල්ලෝද
15 ඇතුල්වූවෝය. මෙසේ ජීවන හුස්ම ඇති
මාංසමය සියල්ලන්ගෙන් දෙන්න දෙන්නා
බැගින් නෝවා වෙත නැවට ඇතුල්-
16 වූවෝය. ඇතුල්වූ සත්ත්වයෝ දෙවියන්-
වහන්සේ ඔහුට අණකළ ලෙස මාංසමය-
වූ සියල්ලන්ගෙන් ගැනු පිරිමි වශයෙන්
ඇතුල්වූවෝය; ස්වාමීන්වහන්සේ ඔහු
17 ඇතුල්කොට දොර වැසූසේක. ජලගැල්ම
සතලිස් දවසක් පොළොවෙහි විය; ජලය
වැඩිව නැව ඉල්පා විය, ඒක පොළොවෙන්
18 ඉවත්ව ගියාය. ජලය බලවත්ව පොළොව
පිට බොහෝසෙයින් වැඩිවිය; නැවද
19 ජල මතුයෙහි ගියාය. ජලය පොළොව
පිට අතිශයින් බලවත්විය; මුළු අහස
යට පිහිටි සියලු උස් කඳු වැසීගියේය.
20 කඳු වැසී ඊට ඉහළින් රියන් පසළොසක්
21 ජලය උස්ව ගියේය. පක්ෂීහුද සිව්පාවෝද
මෘගයෝද පොළොවෙහි බඩගා යන
සියල්ලෝද සියලු මනුෂ්‍යයෝද යන
පොළොව පිට හැසිරෙන මාංසමයවූ
22 සියල්ලෝ නැසුණෝය. තමන්ගේ නාස්-
පුඩුවල ජීවන හුස්ම ඇත්තාවූ එනම්
ගොඩබිම සිටි සියල්ලෝම මළෝය.
23 මෙසේ මනුෂ්‍යයා පටන් සිව්පාවාද
බඩගා යන සත්ත්වයාද ආකාශයේ
පක්ෂියාද දක්වා භූමිය මතුපිට සිටි
සියලු ප්‍රාණීහුම විනාශකරන ලද්දෝය;
ඔව්හු පොළොවෙන් විනාශ කරන-
ලද්දෝය. නෝවා සහ ඔහු සමග
නැවෙහි සිටියාහු පමණක් ඉතිරිවූවෝය.
24 ජලය එකසිය පනස් දවසක් පොළොව
පිට බලවත්ව පැවතුණේය.

## ජලගැල්ම නැවතීම

8 තවද දෙවියන්වහන්සේ නෝවාද
නැවෙහි ඔහු සමග සිටියාවූ පණ
ඇති සියල්ලන්ද සියලු සිව්පාවුන්ද
සිහිකළසේක. දෙවියන්වහන්සේ පොළොව
පිට හුළඟක් ගසන්ට සැලැස්වූසේක,
එවිට ජලය අඩුවිය; ගැඹුරේ උල්පත්ද 2
අහසේ කවුළුද පියනලද්දේය; අහසෙන්
වර්ෂාවද නවත්වනලද්දේය. ජලය නො- 3
කඩව පොළොවෙන් බැස ගියේය;
එකසිය පනස් දවසකට පසු ජලය
අඩුවිය. නැව සත්වෙනි මස දස 4
සත්වෙනි දින අරරත් කඳු පිට නැවතුණාය.
දසවෙනි මාසය දක්වා ජලය නොකඩව 5
බැස්සේය; දසවෙනි මස පළමුවෙනි දින
කඳු මුදුන් පෙනුණේය. සතලිස් දවසකට 6
පසු නෝවා තමා සෑදූ නැවේ කවුළුව
හැරියේය. ඔහු කපුටුවෙකු පිටතට යැවීය, 7
ඌ පිටතට ගොස් පොළොවෙන් ජලය
සිඳෙන තුරු ඔබ මොබ ගියේය. ඔහු 8
භූමිය මතුපිටින් ජලය බැසගියාදැයි
බලන පිණිස තමා වෙතින් පරෙවියෙකු
යැවීය; එහෙත් ජලය මුළු පොළොව 9
මතුපිට තිබුණු බැවින් පරෙවියා උගේ
පතුල තබන්ට තැනක් නොලැබ ඔහු
වෙත නැවට හැරී ආවේය. ඔහු තමාගේ
අත දිගුකොට ඌ අල්වා තමා වෙත
නැවට ගත්තේය. ඔහු තව සත් දවසක් 10
බලා සිට නැවතත් පරෙවියා නැවෙන්
පිටතට ඇරියේය; පරෙවියා සවස් 11
වේලෙහි ඔහු වෙතට ආවේය; බලව,
අමු ඔලීව කොළයක් උගේ තුඩෙහි
තිබුණේය. මෙසේ පොළොවෙන් ජලය
බැසගිය බව නෝවා දැන ගත්තේය.
ඔහු තව සත් දවසක් බලා සිට පරෙවියා 12
පිටතට ඇරියේය; ඌ නැවත ඔහු
වෙතට තවත් හැරී නාවේය. තවද හයසිය 13
එක්වෙනි අවුරුද්දේ පළමුවෙනි මස
පළමුවෙනි දින ජලය පොළොව
මතුපිටින් සිඳී ගොස් තිබුණේය. නෝවා
නැවේ වැස්ම හැර බැලුවේය. බලව,
භූමිතලය වියළී තිබුණාය. දෙවෙනි මස 14
විසිසත් වෙනි දින පොළොව වියළී
තිබුණාය.
එවිට දෙවියන්වහන්සේ නෝවාට කථා- 15
කොට: තුඹද තුඹ සමග තුඹේ භාර්යා- 16
වද තුඹේ පුත්‍රයෝද තුඹේ පුත්‍රයන්ගේ
භාර්යාවෝද නැවෙන් පිටතට වරෙල්ලා.

17 නුඹ සමග සිටින සියලු ආකාර
සත්ත්වයන්වූ පක්ෂීන්ද සිව්පාවුන්ද
පොළොව පිට බඩගා යන පණ ඇති
සියල්ලන්ද පොළොවෙහි අතිශයින්
වැඩිවී සඵලව පොළොව පිට බෝවෙන
පිණිස නුඹ සමග රැගෙන පිටතට
18 එවයි කීසේක. එවිට නෝවාද ඔහු
සමග ඔහුගේ පුත්‍රයෝද ඔහුගේ
භාර්යාවද ඔහුගේ පුත්‍රයන්ගේ භාර්යාවෝද
19 පිටතට ආවෝය. සියලු මෘගයෝද
සියලු බඩගා යන සත්ත්වයෝද සියලු
පක්ෂිහුද භූමියෙහි හැසිරෙන සියල්ලෝද
උන්ගේ ජාති ප්‍රකාරයට නැවෙත් පිටතට
ගියෝය.

## නෝවාට දෙවියන්වහන්සේ දුන් පොරොන්දුව

20 නෝවා ස්වාමීන්වහන්සේට පූජාසන-
යක් ගොඩනගා සියලු පවිත්‍ර සිව්පාවුන්-
ගෙන්ද සියලු පවිත්‍ර පක්ෂීන්ගෙන්ද
රැගෙන පූජාසනය පිට දවන පූජා පිදු-
21 වේය. ස්වාමීන්වහන්සේ මිහිරි සුවඳ සිඹ
තමන්වහන්සේගේ සිත තුළ කථා-
කරමින්: මනුෂ්‍යයා නිසා භූමියට තවත්
ශාප නොකරන්නෙමි; මක්නිසාද බාල
වයසේ පටන් ඔහුගේ සිතේ කල්පනා
නපුරුව තිබේ; තවද මා විසින් කළ
ලෙස නැවත ජීවමාන සියල්ලන්ට
22 තවත් පහර නොදෙන්නෙමි. පොළොව
පවතිනතුරු වපුරන කාලය සහ කපන
කාලයද ශීතය සහ උෂ්ණයද ග්‍රීෂ්ම
කාලය සහ ශීත කාලයද දවාල සහ
රාත්‍රියද නොනවතින්නේයයි කීසේක.

9 තවද දෙවියන්වහන්සේ නෝවාටත්
ඔහුගේ පුත්‍රයන්ටත් ආශීර්වාද-
කොට: නුඹලා සඵලවෙමින් බෝවී
2 පොළොව පූර්ණකරපල්ලා; නුඹලා
ගැන භයත් නුඹලා ගැන තැතිගැන්-
මත් පොළොවේ සියලු මෘගයන් කෙරෙහි
සහ ආකාශයේ සියලු පක්ෂීන් කෙරෙහි
වන්නේය; තවද භූමිය පිට බහුලව
හැසිරෙන සියල්ලෝද මුහුදේ සියලු
මත්ස්‍යයෝද නුඹලා අතට භාරදෙන-
ලද්දෝය. එහා මෙහා යන පණ ඇති 3
සියල්ල නුඹලාට ආහාර වන්නේය; නිල්
පලා ජාති මෙන් උන් සියල්ලන් මම
නුඹලාට දුනිමි. නුමුත් මාංසය එහි 4
ප්‍රාණය වන රුධිරය සමග නොකෑ
යුතුය. සැබවින් නුඹලාගේ ජීවිතය 5
වන නුඹලාගේ ලේ ගැන පළිගන්නෙමි;
සියලු මෘගයන් අතින්ද පළිගන්නෙමි.
මනුෂ්‍යයාගේ ජීවිතය ගැන මනුෂ්‍යයා
අතින් එනම් ඔහුගේ සහෝදරවූ එක්
එක්කෙනා අතින් පළිගන්නෙමි. දෙවියන්- 6
වහන්සේ තමන්ගේ ස්වරූපයෙන්
මනුෂ්‍යයා සෑදූ බැවින් යමෙක් මනුෂ්‍ය-
යාගේ ලේ වගුරුවන්නේද ඔහුගේ ලේ
මනුෂ්‍යයා විසින් වගුරුවනු ලබන්නේය.
නුඹලා වනාහි සඵලවෙමින් බෝ- 7
වෙයල්ලා; පොළොවෙහි අතිශයින්
බෝවී එහි වර්ධනවෙයල්ලායයි ඔවුන්ට
කීසේක.

දෙවියන්වහන්සේ නෝවාටද ඔහු 8
සමග ඔහුගේ පුත්‍රයන්ටද කථාකොට:
බලව, මම නුඹලා සමගත් නුඹලාට 9
පසුව නුඹලාගේ වංශය සමගත් නුඹලා
වෙත සිටින පණ ඇති සියලු සත්ත්වයන් වූ 10
පක්ෂීන්ද ගවයන්ද නුඹලා සමග සිටින
පොළොවේ සියලු මෘගයන්ද නැවෙත්
පිටව යන පොළොවේ සියලු මෘගයන්ද
සමගත් මාගේ ගිවිසුම පිහිටුවමි. නුඹලා 11
සමග මාගේ ගිවිසුම පිහිටුවන්නෙමි;
ජලගැලීමෙන් සියලු සත්ත්වයෝ තවත්
සිඳ දමනු නොලබන්නෝය; පොළොව
නාස්තිකරන පිණිස ජලගැලීමක්
තවත් නොවන්නේයයි කීසේක. තවද 12
දෙවියන්වහන්සේ: මා සහ නුඹලාද
නුඹලා සමග සිටින්නාවූ සියලු පණ
ඇති සත්ත්වයන්ද අතරෙහි සියලු පරම්-
පරාවලට මා විසින් කරන මාගේ
ගිවිසුමේ ලකුණනම් මේය: මාගේ දුන්න 13
වලාකුළෙහි තබමි, ඒක මා සහ
පොළොව අතරේ ගිවිසුමේ ලකුණක්
පිණිස වන්නේය. මා විසින් පොළොවට 14
ඉහලින් වලාකුළක් පමුණුවන කල්හි ඒ

15 දුන්න වලාකුළෙහි පෙනෙන්නේය, එවිට
මා සහ නුඹලාද සියලු ආකාර
මාංසමයවූ හැම පණ ඇති සත්ත්වයන්ද
අතරෙහි ඇත්තාවූ මාගේ ගිවිසුම
සිහිකරන්නෙමි; වතුර කරණකොටගෙන
සියලු සත්ත්වයන් විනාශනොවන පිණිස
16 තවත් ජලගැලීමක් නොවන්නේය. දුන්න
වලාකුලෙහි වන්නේය; දෙවියන්වහන්සේ
හා පොළොව පිට සියලු ආකාර
මාංසමයවූ හැම පණ ඇති සත්ත්වයන්
අතරෙහි ඇත්තාවූ සදකාල ගිවිසුම
සිහිවන පිණිස මම දුන්න දෙස
17 බලන්නෙමියි කීසේක. තවද දෙවියන්-
වහන්සේ: මාද පොළොවෙහි සිටින
මාංසමයවූ සියල්ලන්ද අතරෙහි මා
විසින් පිහිටුවනලද ගිවිසුමේ ලකුණ
මෙයයි නෝවාට කීසේක.

## නෝවා සහ ඔහුගේ පුත්‍රයන් තුන්දෙනා

18 තවද නැවෙන් පිටතට ගියාවූ
නෝවාගේ පුත්‍රයෝනම්: ෂෙම්, හාම් සහ
යපෙත්ය. හාම් කානාන්ගේ පියාය.
19 මේ තුන්දෙනා නෝවාගේ පුත්‍රයෝය.
මොවුන්ගෙන් මුළු පොළොව ගහනව
ගියේය.
20 නෝවා ගොවිකම් කරන්ට පටන් ගෙන
21 මිදි වත්තක් වැවුවේය. තවද ඔහු
මුද්‍රිකපානය බී මත්ව තමාගේ කූඩාරමෙහි
22 නග්නව උන්නේය. කානාන්ගේ පියවූ
හාම් තමාගේ පියාගේ නග්නභාවය
දැක පිටත සිටි තමාගේ සහෝදරයන්
23 දෙදෙනාට කීය. එවිට ෂෙම් සහ යපෙත්
වස්ත්‍රයක් ගෙන තමන්ගේ දෙවුර පිට
ඒක තබාගෙන පස්සෙන් පස්සට ගොස්
තමන් පියාගේ නග්නභාවය වැසුවෝය;
ඔවුන්ගේ මුහුණු අහකට හැරී තිබුණු
බැවින් ඔව්හු තමන් පියාගේ නග්නභාවය
24 නුදුටුවෝය. නෝවා තමාගේ මුද්‍රික-
පානයෙන් පිබිද තම බාල පුත්‍රයා තමාට
25 කළ දේ දැනගත්තේය. ඔහු:
කානාන්ට ශාප වේවා;
ඔහු තමාගේ සහෝදරයන්ට දසයන්ගේ
දසයෙක් වන්නේයයි කීය.
තවද ඔහු: 26
ෂෙම්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේට
ප්‍රශංසා වේවා;
කානාන් ඔහුට දසයෙක් වේවා.
දෙවියන්වහන්සේ යපෙත්ගේ සීමා 27
විශාලකරනසේක්වා,
ඔහු ෂෙම්ගේ කූඩාරම්වල වාසය
කෙරේවා;
කානාන් ඔහුගේ දසයා වේවයි
කීය.
නෝවා ජලගැලීමට පසු තුන්සිය 28
පනස් අවුරුද්දක් ජීවත්විය. නෝවාගේ 29
සියලු දවස් අවුරුදු නවසිය පනසක්ය;
ඔහු මෙළේය.

## නෝවාගෙන් පැවතාවුන් සහ ඔවුන්ගේ නිවාසස්ථාන

10 ෂෙම්ද හාම්ද යපෙත්ද යන
නෝවාගේ පුත්‍රයන්ගේ පරම්පරා
මේය. ජලගැලීමට පසු ඔවුන්ට පුත්‍රයෝ
උපන්නෝය.
යපෙත්ගේ පුත්‍රයෝනම්: ගොමෙර්, 2
මාගොග්, මාදයි, යාවාන්, තුබල්,
මෙෂෙක් සහ තීරාස්ය. ගොමෙර්ගේ 3
පුත්‍රයෝනම්: අෂ්කෙනස්, රීපත් සහ
තොගර්මාය. යාවාන්ගේ පුත්‍රයෝනම්: 4
එලීෂා, තර්ෂිෂ්, කිත්තිම්වරු සහ
දෝදනිම්වරුය. මොවුන්ගෙන්, ජාතීන්ගේ 5
ද්වීප වැසියෝ තම තමන්ගේ දේශයන්හි
ඔවුනොවුන්ගේ භාෂාවල ප්‍රකාරයටද
ඔවුන්ගේ ජාතිවල ඔවුන්ගේ පවුල්
ප්‍රකාරයටද බෙදුණෝය.
හාම්ගේ පුත්‍රයෝනම්: කූෂ්, මිශ්‍රයිම්, 6
පූට් සහ කානාන්ය. කූෂ්ගේ පුත්‍රයෝ- 7
නම්: සෙබා, හවීලා, සබ්තා, රාමා
සහ සබ්තෙකාය. රාමාගේ පුත්‍රයෝ-
නම්: ෂෙබා සහ දෙදාන්ය. කූෂ්ට දාව 8
නිම්රොද් උපන්නේය. ඔහු පොළොවෙහි
බලවන්තයෙක් වෙන්ට පටන් ගත්තේය.
ඔහු ස්වාමින්වහන්සේ ඉදිරියෙහි 9
බලවත් දඩයක්කාරයෙක් විය.

එබැවින්: **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
බලවත් දඩයක්කාරයෙක් වූ නිම්රොද්
10 වාගේයයි කීමක් විය. ඔහුගේ රාජ්‍යයේ
පටන්ගැන්ම නම්: ෂිනාර් දේශයෙහි පිහිටි
බාබෙල්, එරෙක්, අක්කද් සහ කල්නේය.
11 ඔහු ඒ දේශයෙන් අෂූර්ට පිටත්ව ගොස්
12 නිනිවයද රෙහොබොත්-ඊර්ද කලාද
නිනිවය සහ කලා අතරෙහි වූ රෙසෙන්ද
ගොඩනැගුවේය. (එය මහත් නුවරය.)
13 මිශ්‍රයිම්ට දාව ලූදිම්වරුද අනාමිම්වරුද
14 ලෙහාබිම්වරුද නප්තුහිම්වරුද පත්රු-
සිම්වරුද කස්ලුහිම්වරුද (පිලිස්තිවරුන්
නික්ම ආවේ මොවුන්ගෙන්ය) කප්තො-
රිම්වරුද උපන්නෝය.
15 කානාන්ට දාව තමාගේ කුලුඳුලාවූ
16 ශීදෝන්ද හෙත්ද යෙබූසිවරුද අමෝරි-
17 වරුද ගිර්ගාෂිවරුද හිවීවරුද අර්කිවරුද
18 සිනිවරුද අර්වාදිවරුද ශෙමාරිවරුද
හමාතිවරුද උපන්නෝය. ඉන්පසු
කානානිවරුන්ගේ ගෝත්‍රයෝ පැතිර
19 ගියෝය. කානාන්ගේ සීමාව ශීදෝන්
පටන් ගෙරාර් පිහිටි අතට ගාශා දක්වාද
සොදොම්, ගොමොරා, අද්මා සහ
ශෙබොයිම් යන මේවා පිහිටි අතට
20 ලාෂා දක්වාද් විය. තමන්ගේ දේශ-
වලද තමන්ගේ ජාතිවලද හැටියටත්
තමන්ගේ ගෝත්‍රවලද තමන්ගේ භාෂා-
වලද ප්‍රකාරයටත් හාම්ගේ පුත්‍රයෝ
නම් මොව්හුය.
21 ඒබෙර්ගේ සියලු පුත්‍රයන්ගේ පියාද
යෙපෙත්ගේ වැඩිමහල් සහෝදරයාද වූ
22 ෂෙම්ටත් පුත්‍රයෝ උපන්නෝය. ෂෙම්ගේ
පුත්‍රයෝනම්: ඒලාම්, අෂූර්, අර්පක්ෂද්,
23 ලූද් සහ අරාම්ය. අරාම්ගේ පුත්‍රයෝ-
නම්: ඌස්, හූල්, ගෙතෙර් සහ මෂ්ය.
24 අර්පක්ෂද්ට දාව ෂෙලා උපන්නේය.
25 ෂෙලාට දාව ඒබෙර් උපන්නේය. ඒබෙර්ට
පුත්‍රයෝ දෙදෙනෙක් උපන්නෝය. එක්-
කෙනෙකුගේ නම *පෙලෙග්ය, මක්නිසාද
ඔහුගේ දවස්වලදී පොළොව බෙදන්ට
යෙදුණේය. ඔහුගේ සහෝදරයාගේ නම

*එනම්, බෙදුම.

යොක්තාන්ය. යොක්තාන්ට දාව ආල්- 26
මෝදද්, ෂෙලෙප්, හශාර්මාවෙත්, යෙරා;
හදෝරාම්, ඌසාල්, දික්ලා; ඕබාල්, 27.28
අබිමායෙල්, ෂෙබා; ඕෆීර්, හවීලා සහ 29
යෝබාබ් උපන්නෝය. මේ සියල්ලෝ
යොක්තාන්ගේ පුත්‍රයෝය. ඔවුන්ගේ 30
වාසස්ථානය මේෂා පටන් නැගෙනහිර
කන්ද වූ ෂෙපාර් අතට වූයේය. තමන්ගේ 31
දේශවලද තමන්ගේ ජාතිවලද හැටියටත්
තමන්ගේ ගෝත්‍රවලද තමන්ගේ භාෂා-
වලද ප්‍රකාරයටත් ෂෙම්ගේ පුත්‍රයෝනම්
මොව්හුය.
තමන්ගේ ජාතිවල තමන්ගේ පරම්පරා- 32
වන් ප්‍රකාරයට නෝවාගේ පුත්‍රයන්ගේ
ගෝත්‍රවල නම් මේය. ජලගැලීමට පසු
පොළොවෙහි මනුෂ්‍ය ජාතීහු මොවුන්-
ගෙන් බෙදීගියෝය.

## බාබෙල් කොත

11 මුළු පොළොවෙහි එකම භාෂා-
වක්ද එකම කථා ක්‍රමයක්ද විය.
තවද ඔව්හු නැගෙනහිර දිසාවට ගමන් 2
කරන අතර ෂිනාර් නම් දේශයෙහි
සමභූමියක් සම්බවී එහි වාසය කළෝය.
ඔව්හු එකිනෙකාට කථාකොට: වරෙල්ලා, 3
අපි ගඩොල් සාදා හොඳට පුළුස්සමුයයි
කීවෝය. ගල් වෙනුවට ගඩොල්ද බදාම
වෙනුවට කීල්ද ඔවුන්ට තිබුණේය. ඔව්හු: 4
වරෙල්ලා, මුළු පොළෝතලයෙහි අප
විසිර නොයන පිණිස නුවරක්ද අහස
දක්වා මුදුනක් ඇති කොලුවක්ද
ගොඩනගා අපට නාමයක් සාදා ගනිමු-
යයි කීවෝය. එවිට මනුෂ්‍ය පුත්‍රයන් 5
ගොඩනගන නුවරද කොලුවද බලන
පිණිස **ස්වාමීන්වහන්සේ** බැස්සසේක.
**ස්වාමීන්වහන්සේද**: බලව, ඔව්හු එක 6
සෙනඟක්ය, ඔවුන් සියල්ලන්ට ඇත්තේ
එක භාෂාවක්ය; ඔවුන් කරන්ට පටන්-
ගන්නා දේ මේය; ඉදින් ඔවුන් කරන්ට
අදහස්කරන කිසිවක් ඔවුන්ට දුෂ්කර
නොවන්නේය. යමු, අපි බැස ඔවුන්ට 7

එකිනෙකාගේ කථාව නොතේරෙන ලෙස
එහි ඔවුන්ගේ භාෂාව අවුල්කරමුයයි
8 කීසේක. මෙසේ ස්වාමීන්වහන්සේ
එතැනින් මුළු පොළෝතලයෙහි ඔවුන්
9 විසිරෙවූසේක. ඔව්හුද නුවර ගොඩනැගීම
අත්හැරියෝය. එහිදී ස්වාමීන්වහන්සේ
මුළු පොළොවේ භාෂාව අවුල්කළ
බැවින් ඊට *බාබෙල් නම් විය. එතැනින්
ස්වාමීන්වහන්සේ මුළු පොළෝතලයෙහි
ඔවුන් විසිරෙවූසේක.

## තේරා දක්වා ෂෙම්ගෙන් පැවත ආ අය

10 ෂෙම්ගේ පරම්පරා මේය. ෂෙම් අවුරුදු
සියයක් වයස්වූ කල, ජලගැලීමට
දැවුරුද්දකට පසු ඔහුට දව අර්පක්ෂද්
11 උපන්නේය. අර්පක්ෂද් ඉපදෙවූ පසු
ෂෙම් පන්සිය අවුරුද්දක් ජීවත්වූණේය,
ඔහුට දව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
12 අර්පක්ෂද් තිස්පස් අවුරුද්දක් ජීවත්වූ
13 පසු ඔහුට දව ෂේලා උපන්නේය. ෂේලා
ඉපදෙවූ පසු අර්පක්ෂද් හාරසිය තුන්
අවුරුද්දක් ජීවත්වූණේය, ඔහුට දව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
14 ෂේලා තිස් අවුරුද්දක් ජීවත්වූ පසු
15 ඔහුට දව ඒබෙර් උපන්නේය. ඒබෙර්
ඉපදෙවූ පසු ෂේලා හාරසිය තුන්
අවුරුද්දක් ජීවත්වූණේය, ඔහුට දව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
16 ඒබෙර් තිස්හතර අවුරුද්දක් ජීවත්වූ
පසු ඔහුට දව පෙලෙග් උපන්නේය.
17 පෙලෙග් ඉපදෙවූ පසු ඒබෙර් හාරසිය
තිස් අවුරුද්දක් ජීවත්වූණේය, ඔහුට දව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
18 පෙලෙග් තිස් අවුරුද්දක් ජීවත්වූ
19 පසු ඔහුට දව රෙයූ උපන්නේය. රෙයූ
ඉපදෙවූ පසු පෙලෙග් දෙසිය නව
අවුරුද්දක් ජීවත්වූණේය, ඔහුට දව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
20 රෙයූ තිස් දැවුරුද්දක් ජීවත්වූ පසු
21 ඔහුට දව සෙරුග් උපන්නේය. සෙරුග්
ඉපදෙවූ පසු රෙයූ දෙසිය සත් අවුරුද්දක්

*එනම්, අවුල්කිරීම.

ජීවත්වූණේය, ඔහුට දව පුත්‍රයෝද දූවරුද
උපන්නෝය.
සෙරුග් තිස් අවුරුද්දක් ජීවත්වූ පසු 22
ඔහුට දව නාහෝර් උපන්නේය.
නාහෝර් ඉපදෙවූ පසු සෙරුග් දෙසිය 23
අවුරුද්දක් ජීවත්වූණේය, ඔහුට දව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
නාහෝර් විසිනව අවුරුද්දක් ජීවත්වූ 24
පසු ඔහුට දව තේරා උපන්නේය.
තේරා ඉපදෙවූ පසු නාහෝර් එකසිය 25
දසනව අවුරුද්දක් ජීවත්වූණේය, ඔහුට
දව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
තේරා හැත්තෑ අවුරුද්දක් ජීවත්වූ 26
පසු ඔහුට දව ආබ්‍රම්ද නාහෝර්ද
හාරාන්ද උපන්නෝය.
තේරාගේ පරම්පරාව මේය. තේරාට 27
දව ආබ්‍රම්ද නාහෝර්ද හාරාන්ද උපන්-
නෝය; හාරාන්ට දව ලොත් උපන්නේය.
හාරාන් තමා උපන් දේශයෙහි ඌර් 28
නම්වූ කල්දිවරුන්ගේ නුවරදී තමාගේ
පියවූ තේරා ඉදිරිපිට මෙළේය. ආබ්‍රම්ද 29
නාහෝර්ද භාර්යාවන් පාවාගත්තෝය;
ආබ්‍රම්ගේ භාර්යාවගේ නම සාරයිය;
නාහෝර්ගේ භාර්යාවගේ නම මිල්කාය,
ඈ මිල්කාගෙත් ඉස්කාගෙත් පියාවූ
හාරාන්ගේ දූවය. සාරයි වඳව දරුවෙක් 30
නැතුව සිටියාය. තේරා තමාගේ පුත්‍රවූ 31
ආබ්‍රම්ද තමාගේ පුත්‍රවූ හාරාන්ගේ පුත්‍රයා
වන ලොත්ද තමාගේ පුත්‍රවූ ආබ්‍රම්ගේ
භාර්යාව වන තමාගේ යෙහෙළිවූ සාරයිද
කැඳවාගෙන ඔවුන් සමග කානාන්
දේශයට යන පිණිස ඌර් නම්වූ
කල්දිවරුන්ගේ නුවරින් පිටත්ව ගොස්
හාරාන්ට පැමිණ එහි වාසයකෙළේය.
තේරාගේ දවස් දෙසිය පස් අවුරුද්දක්ය; 32
තේරා හාරාන්හිදී මෙළේය.

## ආබ්‍රහම් කානාන් දේශයට යාම

12 ස්වාමීන්වහන්සේ ආබ්‍රම්ට
කථාකොට: නුඹේ දේශයෙන්ද
නුඹේ නෑයන් කෙරෙන්ද නුඹේ පියාගේ
ගෙදරින්ද පිටත්ව මා විසින් නුඹට

2 පෙන්වන දේශයට පලයන්න. මම නුඹ
මහත් ජාතියක් කරන්නෙමි; නුඹට
ආශීර්වාද කොට නුඹේ නාමය කීර්ති-
මත් කරන්නෙමි; නුඹද ආශීර්වාදයක්
3 වෙයන්න. තවද නුඹට ආශීර්වාද
කරන්නන්ට මම ආශීර්වාදකරන්නෙමි,
නුඹට ශාපකරන්නාට මම ශාප-
කරන්නෙමි. පොළොවේ සියලු පවුල්
නුඹ කරණකොටගෙන ආශීර්වාද
4 ලබන්නෝයයි කීසේක. මෙසේ ආබ්‍රම්
ස්වාමීන්වහන්සේ තමාට කී ලෙස ගියේය;
ලොත් ඔහු සමග ගියේය. ආබ්‍රම්
හාරානෙන් පිටත්වූ කල ඔහුට සැත්තෑ
5 පස් අවුරුද්දක් වයස් විය. ආබ්‍රම් තමාගේ
භාර්යාවවූ සාරයිද තම සහෝදරයාගේ
පුත්‍රවූ ලොත්ද ඔවුන් රැස්කරගත තිබුණු
තමන්ගේ සියලු සම්පත්ද හාරාන්හිදී
ඔවුන් ලබාගෙන සිටි මිනිසුන්ද
රැගෙන කානාන් දේශයට යන පිණිස
පිටත්වුණෝය; ඔව්හු කානාන් දේශයට
6 පැමිණියෝය. ආබ්‍රම් ඒ දේශය මැදින්
ෂෙකෙම් නම් ස්ථානයෙහි මොරේගේ
ආලොන් වෘක්ෂය දක්වා ගියේය. ඒ
කාලයෙහි කානානිවරු දේශයෙහි
7 සිටියෝය. ස්වාමීන්වහන්සේ ආබ්‍රම්ට
පෙනී: මේ දේශය නුඹේ වංශයට
දෙන්නෙමියි කීසේක. එතැන්හි ඔහු තමාට
පෙනුණාවූ ස්වාමීන්වහන්සේට පූජා-
8 සනයක් ගොඩනැගුවේය. ඔහු ඒ
ස්ථානයෙන් ගොස් බෙතෙල්ට නැගෙන-
හිරින් පිහිටි කන්දට පැමිණ බස්නා-
හිරින් බෙතෙල්ද නැගෙනහිරින් ආයිද
ඇතුව තමාගේ කූඩාරම පිහිටුවාගත්තේය.
තවද ඔහු එතැන්හි ස්වාමීන්වහන්සේට
පූජාසනයක් ගොඩනගා ස්වාමීන්-
වහන්සේගේ නාමය කියා යාච්ඤා-
9 කෙළේය. ආබ්‍රම් ගමන්කරනුයේ, දකුණු
දෙසටම ගියේය.

## ආබ්‍රහම් මිසර දේශයෙහි වාසය කිරීම

10 දේශයෙහි සාගතයක් විය. දේශයෙහි
සාගතය මහත් බැවින් ආබ්‍රම් මිසරයෙහි
පොරොත්තුව සිටීම පිණිස එහි ගියේය.
තවද ඔහු මිසර දේශයට ඇතුල්වෙන්ට 11
ළංවූ කල තම භාර්යාව වූ සාරයිට
කථාකොට: බලව, නුඹ ශෝභන පෙනීම
ඇති ස්ත්‍රියක් බව දනිමි. මිසරවරුන් 12
නුඹ දුටු විට—මෑ ඔහුගේ භාර්යාවය
කියා මා මරා නුඹ ඉතුරු කරනවා
ඇත. ඉතින් නුඹ නිසා මට යහපත 13
සිද්ධවෙන පිණිසද නුඹ කරණ-
කොටගෙන මාගේ ප්‍රාණය ගැළවෙන
පිණිසද නුඹ මාගේ සහෝදරීයයි කියන
ලෙස ඉල්ලමියි කීය. තවද ආබ්‍රම් 14
මිසරයට පැමිණි කල ඒ ස්ත්‍රිය ඉතා
ශෝභන බව මිසරවරු දුටුවෝය.
ඵාරාවෝගේ ඇමතිවරු ඈ දැක ඵාරාවෝ 15
ඉදිරියෙහි ඈ වර්ණනාකළෝය. එවිට
ඒ ස්ත්‍රී ඵාරාවෝගේ ගෙට ගෙනයන-
ලද්දීය. ඔහු ඈ නිසා ආබ්‍රම්ට යහපත 16
කෙළේය. බැටළුවෝද ගවයෝද කොටළු-
වෝද දසයෝද දසියෝද කොටළුදෙන්නුද
ඔටුවෝද ඔහුට ලැබුණාහ. ස්වාමීන්- 17
වහන්සේ ආබ්‍රම්ගේ භාර්යාවවූ සාරයි
නිසා ඵාරාවෝටද ඔහුගේ ගෙයි
වැසියන්ටද මහත්වූ පීඩාවලින් පීඩාකළ-
සේක. එවිට ඵාරාවෝ ආබ්‍රම් කැඳවා: 18
නුඹ මට මේ කළේ මොකද? ඈ නුඹේ
භාර්යාව බව කුමක් නිසා මට
නොකීවෙහිද? ඈ නුඹේ සහෝදරීයයි 19
මට කීවේ මක්නිසාද? එබැවින් ඇය
මාගේ භාර්යා කොට ගතිමි. මෙන්න
නුඹේ භාර්යාව, ඇය රැගෙන පලයන්නැයි
ඔහුට කීය. ඵාරාවෝ ඔහු ගැන 20
මිනිසුන්ට අණදුන්නේය. ඔව්හු ඔහු
සහ ඔහුගේ භාර්යාවද ඔහු සන්තක
සියල්ලද මගට ගෙනැත් ඇරලුවෝය.

## ආබ්‍රහම් ලොත්ගෙන් වෙන්වීම

13 ආබ්‍රම් තම භාර්යාව සහ තමා
සන්තක සියල්ල රැගෙන ලොත්ද
කැටුව මිසරයෙන් නික්ම දකුණු
දෙසට ගියේය. ආබ්‍රම් සිව්පාවුන්ගෙන්ද 2
රන්රිදීයෙන්ද ඉතා පොහොසත්ව

3 සිටියේය. ඔහු දකුණු දිශාවේ සිට
බෙතෙල් දක්වා ගමන්කරමින් බෙතෙල්
සහ ආයි අතරෙහි පළමුවෙන් තමාගේ
4 කූඩාරමද තමා විසින් මුලදී
සෑදූ පූජාසනයද තිබුණාවූ ස්ථානයට
පැමුණුණේය. එහිදී ආබ්‍රම් **ස්වාමීන්-**
**වහන්සේගේ** නාමය කියා යාච්ඤා-
5 කෙළේය. ආබ්‍රම් සමග ගියාවූ ලොත්ටද
බැටළු රැළවල්ද ගවයෝද සිටියෝය,
6 කූඩාරම්ද තිබුණේය. ඔවුන්ට සම්පත්
බොහෝ නිසා එක්ව විසීමට දේශය
ඉඩ මදිවුණේය; එබැවින් එක්ව විසීම
7 ඔවුන්ට නුපුළුවන්විය. ආබ්‍රම්ගේ
ගවයන්ගේ එඬේරුන් සහ ලොත්ගේ
ගවයන්ගේ එඬේරුන් අතරේ ඩබරයක්
විය. එකල්හි කානානිවරුද පෙරිස්සි-
8 වරුද දේශයෙහි වාසය කළෝය. එවිට
ආබ්‍රම් ලොත්ට කථාකොට: මා සහ
නුඹ අතරෙහිද මාගේ එඬේරුන් සහ
නුඹේ එඬේරුන් අතරෙහිද ඩබරයක්
නොවේවා; මක්නිසාද අපි සහෝ-
9 දරයෝය. මුළු දේශය නුඹ ඉදිරියෙහි
තිබෙනවා නොවේද? මා කෙරෙන්
වෙන්ව යනලෙස නුඹෙන් ඉල්ලමි. නුඹ
වම් දෙසට යන්නෙහි නම් මම දකුණු
දෙසට යන්නෙමි; නුඹ දකුණු දෙසට
යන්නෙහි නම් මම වම් දෙසට යන්නෙමි-
10 යි කීවේය. ලොත් ඇස් ඔසවා බලා
යොර්දනේ මුළු සමභූමිය හැම තැනම
ජල සම්පන්නව තිබෙන බව දුටුවේය.
**ස්වාමීන්වහන්සේ** සොදෙම සහ
ගොමොරා විනාශ කරන්ට පළමුවෙන්
ඒක ශොවර් දෙසට **ස්වාමීන්වහන්සේගේ**
උයන මෙන්ද මිසර දේශය මෙන්ද වූයේය.
11 එවිට ලොත් යොර්දනේ මුළු සමභූමිය
තෝරාගෙන නැගෙනහිර දිසාවට ගමන්
කෙළේය. මෙසේ ඔව්හු තම තමන් කෙරෙන්
12 වෙන්වූවෝය. ආබ්‍රම් කානාන් දේශයෙහි
වාසයකෙළේය, ලොත් සමභූමියෙහි
නුවරවල වාසය කරමින් තමාගේ
කූඩාරම සොදෙම දක්වා ගෙනගියේය.
13 සොදෙමේ මනුෂ්‍යයෝ වනාහි දුෂ්ටව
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව අතිශයින්
පව්කාරව සිටියෝය. ආබ්‍රම් කෙරෙන් 14
ලොත් වෙන්වූ පසු **ස්වාමීන්වහන්සේ**
ආබ්‍රම්ට කථාකොට: නුඹේ ඇස් ඔසවා
නුඹ සිටින ස්ථානයේ සිට උතුරද
දකුණද නැගෙනහිරද බස්නාහිරද දෙස
බලාපන්න. මක්නිසාද නුඹ දක්නාවූ 15
මුළු දේශය නුඹටද නුඹේ වංශයටද
සදකාලයටම දෙන්නෙමි. නුඹේ වංශය 16
පොළොවේ ධූලි මෙන් වැඩිකරන්නෙමි.
එසේ හෙයින් මනුෂ්‍යයෙකුට පොළොවේ
ධූලි ගණන්කරන්ට පුළුවන්නම් නුඹේ
වංශයත් ගණන් කළ හැකි වන්නේය.
නැගිට දේශයෙහි දිගටත් හරහටත් 17
පලයන්න; මක්නිසාද ඒක නුඹට
දෙන්නෙමියි කීසේක. ආබ්‍රම් තමාගේ 18
කූඩාරම රැගෙන හෙබ්‍රොන්හි තිබෙන
මම්රේගේ ආලොන් ගස් ළඟට ඇවිත්
වාසයකොට එහි **ස්වාමීන්වහන්සේට**
පූජාසනයක් ගොඩනැගුවේය.

## ආබ්‍රහම් විසින් ලොත් ගළවාගැනීම

14 ෂිනාර්හි රජවූ අම්රාපෙල්ගේද
එල්ලාසාර්හි රජවූ අරියොක්ගේද
ඒලාම්හි රජවූ කෙදෙර්-ලායොමෙර්ගේද
ජාතීන්ගේ රජවූ තිදල්ගේද දවස්වලදී,
ඔව්හු සොදෙම්හි රජවූ බෙරාද ගො- 2
මොරාහි රජවූ බිර්ෂාද අද්මාහි රජවූ
ෂිනාබ්ද ශෙබොයිම්හි රජවූ ෂෙමේබෙර්ද
බෙලාහි (එනම් ශොවර්හි) රජද යන
මොවුන්ට විරුද්ධව යුද්ධකළෝය.
මොවුන් සියල්ලෝ ලුණු මුහුද වූ 3
සිද්දීම් මිටියාවතෙහි එකට රැස්වූ-
වෝය. ඔව්හු දෙළොස් අවුරුද්දක් 4
කෙදෙර්-ලායොමෙර්ට මෙහෙකොට
දහතුන්වෙනි අවුරුද්දේ කැරළිගැසුවෝය.
දසසතරවෙනි අවුරුද්දේදී කෙදෙර්- 5
ලායොමෙර්ද ඔහු සමග සිටි රජවරුද
ඇවිත් අෂ්තෙරොත්-කර්ණයිම්හි සිටිය
රෙඵාවරුන්ටත් හාම්හි සිටිය සූසි-
වරුන්ටත් කිරියාතායිම් සමබිමේ සිටි
ඒමිවරුන්ටත් කාන්තාරයට ළංවූ 6

ඒල්-පාරාන් දක්වා සේයිර් නම්වූ ස්වකීය
කඳුකරයෙහි සිටිය හෝරිවරුන්ටත්
7 පහරදුන්නෝය. තවද ඔව්හු හැරී
ඇවිත් ඒන්-මිෂ්පාත්ට (එනම් කාදෙෂ්ට)
පැමිණ අමලෙක්වරුන්ගේ මුළු රටටත්
හශශොන්-තාමාර්හි විසූ අමෝරි-
8 වරුන්ටත් පහරදුන්නෝය. එවිට
සොදෙම්හි රජද ගොමොරාහි රජද
අද්මාහි රජද ශෙබොයිම්හි රජද බෙලාහි
(එනම් ශොවර්හි) රජද යන රජවරු
9 පස්දෙනා පිටත්ව ගොස්, ඒලාම්හි රජවූ
කෙදෙර්-ලායොමෙර්ද ජාතීන්ගේ රජවූ
තිදල්ද ෂිනාර්හි රජවූ අම්රාපෙල්ද
එල්ලාසාර්හි රජවූ අරියොක්ද යන
රජවරුන් සතර දෙනාට විරුද්ධව සිද්දිම්
මිටියාවතෙහි යුද්ධයට සැරසී සිටියෝය.
10 සිද්දිම් මිටියාවත වනාහි කීල් වළවලින්
පිරී තිබුණේය; සොදෙම සහ ගොමොරාහි
රජවරු පලාගොස් එහි වැටුණෝය.
11 ඉතිරි අය කන්දට පලාගියෝය. එකල
ඔව්හු සොදෙම සහ ගොමොරාහි සියලු
සම්පත්ද ඔවුන්ගේ සියලු ආහාරද
12 රැගෙන ගියෝය. ඔව්හු සොදෙම්හි විසූ
ආබ්‍රම්ගේ සහෝදරයාගේ පුත්වූ ලොත්
සහ ඔහුගේ සම්පත්ද රැගෙන ගියෝය.
13 එවිට ගැළවී ගිය කෙනෙක් ඇවිත්
හෙබ්‍රෙව්වාවූ ආබ්‍රම්ට දන්විය. හෙතෙම
වනාහි එෂ්කොල්ගේ සහෝදරයාද
අනේර්ගේ සහෝදරයාද වූ අමෝරිය
මම්රේගේ ආලෝන් ගස් ළඟ වාසය
කෙළේය. මොව්හු ආබ්‍රම් සමග
14 ගිවිසුමක් කරගෙන සිටියෝය. ආබ්‍රම්
තමාගේ සහෝදරයා අල්වාගෙන ගිය
බව ඇසූ කල තමාගේ ගෙයි උපන්නාවූ
පුරුදුකරනු ලැබූ ස්වකීය මිනිසුන්
තුන්සිය දසඅට දෙනෙකු රැගෙන දන්
15 දක්වා ලුහුබැඳ ගියේය. තවද ඔහුත්
ඔහුගේ මෙහෙකරුවොත් රාත්‍රියෙහි
ඔවුන්ට විරුද්ධව බෙදී, ඔවුන්ට පහරදී,
දමස්කයට වම් පැත්තෙහිවූ හෝබා
දක්වා ලුහුබැඳ ගොස් සියලු සම්පත්
16 ආපසු ගෙනාවෝය. ඔහු තම සහෝදරවූ
ලොත් සහ ඔහුගේ සම්පත්ද ස්ත්‍රීන්ද
17 සෙනඟද ආපසු ගෙනායේය. ඔහු
කෙදෙර්-ලායොමෙර් සහ ඔහු සමග
සිටිය රජුන් මරා ආ කල්හි සොදෙම්හි
රජතෙම ඔහු සම්මුඛවන පිණිස ෂාවේ
මිටියාවතට (එනම් රජුගේ මිටියාවතට)
පිටත්ව ගියේය.

## මෙල්කිසදෙක්

සාලෙම්හි රජවූ මෙල්කිසදෙක් රොටි 18
හා මුද්‍රිකපානය ගෙනායේය. හෙතෙම
මහෝත්තම දෙවියන්වහන්සේගේ පූජ-
කයා විය. ඔහු ආබ්‍රම්ට ආශීර්වාද- 19
කොට: අහසත් පොළොවත් හිමිවූ
මහෝත්තම දෙවියන්වහන්සේගෙන්
ආබ්‍රම්ට ආශීර්වාද වේවා; තුඹේ සතුරන් 20
තුඹේ අතට පාවාදුන් මහෝත්තම
දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවයි කීය.
ආබ්‍රම්ද සියල්ලෙන් දසයෙන් කොටසක්
ඔහුට දුන්නේය. සොදෙම්හි රජද ආබ්‍රම්ට 21
කථාකොට: මිනිසුන් මට දියන්න.
සම්පත් තුඹටම ගනින්නැයි කීය. ආබ්‍රම්
සොදෙම්හි රජුට කථාකොට: මම ආබ්‍රම් 22
පොහොසත් කෙළෙම්යි තුඹ නොකියන
පිණිස යෞවනයන් කෑ දේ සහ මා
සමග ගියාවූ මිනිසුන්ගේ කොටස හැර
නූල්පටක්වත් මිරිවැඩි පටියක්වත් තුඹ 23
සන්තක කිසි දෙයක්වත් නොගන්-
නෙමියි අහසත් පොළොවත් හිමිවූ
මහෝත්තම දෙවිවූ ස්වාමීන්වහන්සේට
මාගේ අත ඔසවා දිවුළෙමි; අනේර්ද 24
එෂ්කොල්ද මම්රේද තමන්ගේ කොටස්
ගනිත්වයි කීය.

## ආබ්‍රහම්ගේ ගිවිසුම

15 මේ කාරණාවලට පසුව ස්වාමීන්-
වහන්සේගේ වචනය දර්ශනයකින්
ආබ්‍රම් වෙත පැමිණ: ආබ්‍රම්, භය
නොවෙන්න: තුඹේ පලිහද තුඹේ ඉතා
මහත් විපාකයද මමයයි කීසේක.
ආබ්‍රම් කථාකොට: ස්වාමිවූ දෙවියන්- 2
වහන්ස, මට දරුවෙක් නැත. දමස්කයේ
එලියේසර් මාගේ උරුමක්කාරයාවෙන්ට
සිටින්නේය. ඉතින් ඔබ මට කුමක් දෙන-
සේක්දැයි කීය. ආබ්‍රම්: බැලුව මැනව. ඔබ- 3
වහන්සේ මට කිසි දරුවෙකු නුදුන්සේක;

මාගේ ගෙදර උපන් කෙනෙක් මාගේ
4 උරුමක්කාරයායයි කීය. එවිට
**ස්වාමීන්වහන්සේගේ** වචනය ඔහු වෙතට
පැමිණ: මොහු නුඹේ උරුමක්කාරයා
නොවන්නේය; නුඹ තුළෙන් නික්මෙන
කෙනෙක්ම නුඹේ උරුමක්කාරයා වන්නේ-
5 යයි කීය. උන්වහන්සේ ඔහු පිටතට
කැඳවා: අහස දෙස බලා තාරකා
ගණන්කළ හැකි නම් ඒවා ගණන්-
කරපන්නැයි කීසේක; නුඹේ වංශයද
6 එසේම වන්නේයයි ඔහුට කීසේක. ඔහු
**ස්වාමීන්වහන්සේ** විශ්වාසකෙළේය;
උන්වහන්සේ ඒක ඔහු සඳහා ධර්මිෂ්ඨ-
7 කම කොට ගණන්ගත්සේක. උන්-
වහන්සේ ඔහුට කථාකොට: මම වනාහි
මේ දේශය උරුමකරගන්ට නුඹට දෙන
පිණිස ඌර් නම්වූ කල්දිවරුන්ගේ
නුවරින් නුඹ ගෙනාවාවූ **ස්වාමීන්-**
8 **වහන්සේයයි** ඔහුට කීසේක. ඔහුද:
ස්වාමිවූ දෙවියන්වහන්ස, ඒක මට උරුම
වෙන බව කුමකින් දැනගන්නෙම්දැයි කීය.
9 උන්වහන්සේ ඔහුට කථාකොට: තුන්
අවුරුදු ගොන්නැම්බියෙකුත් තුන් අවුරුදු
එළුදෙනකුත් තුන් අවුරුදු බැටළුවෙකුත්
කොබෙයියෙකුත් පරෙවි පැටවෙකුත් මට
10 ගෙනෙන්නැයි කීසේක. ඔහු ඒ සියල්ලන්
ගෙනැවිත් උන් දෙපළුකොට පළුවක්
ඉදිරිපිට අනික් පළුව බැගින් තැබීය.
එහෙත් ඔහු පක්ෂීන් දෙපළුකළේ නැත.
11 ගිජු පක්ෂීහු වනාහි මළකුණු පිටට
12 බැස්සෝය, ආබ්‍රම් උන් එළෙවුවේය. ඉර
බස්නා කල බරවූ නින්දක් ආබ්‍රම්
කෙරෙහි පැමුණුණේය; බලව, භයංකර-
කමක්ද මහත් අන්ධකාරයක්ද ඔහු
13 කරා පහළ විය. උන්වහන්සේ ආබ්‍රම්ට
කථාකොට: නුඹේ වංසය තමන්ට අයිති
නැති දේශයෙක්හි විදේශිවන බවද
ඔවුන්ට මෙහෙකරන බවද ඔවුන් අවුරුදු
හාර සියයක් ඔවුන්ට පීඩාකරන බවද
14 සැබවින් දැනගනින්න. තවද ඔවුන් මෙහෙ-
කරන්නාවූ ඒ ජාතිය මම විනිශ්චය-
කරන්නෙමි; ඉන්පසු ඔව්හු බොහෝ
15 සම්පත් ඇතුව පිටත්ව එන්නෝය. එහෙත්

නුඹ සමාදානයෙන් නුඹේ පියවරුන්
වෙතට යන්නෙහිය; හොඳ මහලු
වයසේදී තැන්පත්කරනු ලබන්නෙහිය.
සතරවෙනි පරම්පරාවේදී ඔව්හු නැවත 16
මෙහි එන්නෝය; මක්නිසාද ආමෝරි-
වරුන්ගේ අධර්මිෂ්ඨකම තවම සම්පූර්ණ
නැතැයි කීසේක. තවද ඉර බැස 17
අඳුරුවූ කල, බලව, දුම් නගින උදුනක්ද
ඒ පළු මැදින් යන්නාවූ දල්වෙන
ගිනි හුලක්ද පෙනුණේය. ඒ දවසේදී 18
**ස්වාමීන්වහන්සේ** ආබ්‍රම් සමග ගිවිසුමක්
කරමින්: මිසරයේ ගංගාව පටන්
මහත් ගංගාව, එනම්, ප්‍රාත් ගංගාව
දක්වා තිබෙන්නාවූ කේනිවරුන්ද 19
කෙනිස්සිවරුන්ද, කද්මොනිවරුන්ද 20
හිත්තීවරුන්ද පෙරිස්සිවරුන්ද රෙඵා-
වරුන්ද අමෝරිවරුන්ද කානානිවරුන්ද 21
ගිර්ගාෂිවරුන්ද යෙබූසිවරුන්ද සන්තක
මේ දේශය නුඹේ වංශයට දුනිමියි
කීසේක.

## හාගර්ගේ සැඟවීයාම. ඉෂ්මායෙල්ගේ උප්පැත්තිය

16 ආබ්‍රම්ගේ භාර්යාවවූ සාරයි
ඔහුට දරු දරුවන් නොවැදුවාය.
ඇට හාගර් නම් මිසරීය දාසියක්
සිටියාය. සාරයි ආබ්‍රම්ට කථාකොට: 2
**ස්වාමීන්වහන්සේ** මා දරුවන් වැදීමෙන්
වැළැක්වූසේක; මාගේ දාසිය වෙතට
පැමුණුණ මැනවි, සමහරවිට ඈ කරණ-
කොටගෙන මට දරුවෝ ලැබෙතැයි
කීවාය. ආබ්‍රම් සාරයිගේ හඬට කන්
දුන්නේය. ආබ්‍රම් කානාන් දේශයෙහි 3
දස අවුරුද්දක් වාසයකළ පසු ආබ්‍රම්ගේ
භාර්යාවවූ සාරයි තමාගේ දාසීවූ මිසරීය
හාගර් ගෙන තමාගේ පුරුෂයාවූ
ආබ්‍රම්ට භාර්යාවක් කොට පාවාදුන්-
නාය. ඔහු හාගර් වෙතට පැමිණියේය, 4
ඈ ගර්භිණීවූවාය. ඈ තමා ගර්භිණීවූ
බව දැනගත් කල ඇගේ ස්වාමිදුව සුළු
කොට සැලකුවාය. සාරයි ආබ්‍රම්ට 5
කථාකොට: මට වූ අයුත්ත නුඹ කෙරෙහි
වේවා. මාගේ දාසිය නුඹේ ළයට දුනිමි;

ඈ තමා ගර්භිණීවූ බව දැනගත් කල
මා සුළුකොට සැලකුවාය. **ස්වාමීන්-**
**වහන්සේ** මා සහ නුඹ අතරෙහි විනිශ්චය
6 කරනසේක්වයි කීවාය. ආබ්‍රම්ද: බලව,
නුඹේ දාසිය නුඹ යටතේය; නුඹට
යහපත්ව පෙනෙන ලෙස ඈට කරපන්නැයි
සාරයිට කීය. සාරයි ඈට හිරිහැර-
කළාය, ඈ සාරයි ඉදිරියෙන් පළාගියාය.
7 කාන්තාරයේ දිය උල්පතක් ළඟදී, එනම්,
ෂුර්ට යන පාරේ තිබෙන දිය උල්පත
ළඟදී, ඈ **ස්වාමීන්වහන්සේගේ** දූතයාට
8 සම්බ වුණාය. උන්වහන්සේ: සාරයිගේ
දාසීවූ හාගර්, නුඹ කොතැන්හි සිට
ආයෙහිද? කොතැනට යන්නෙහිදැයි
කීසේක. ඈ: මාගේ ස්වාමිදුවවූ සාරයි
9 ඉදිරියෙන් පලායමියි කීවාය. එවිට
**ස්වාමීන්වහන්සේගේ** දූතයා: නුඹේ
ස්වාමිදුව වෙතට හැරී ගොස් ඈට
10 යටත්ව සිටපන්නැයි කීසේක. තවද
**ස්වාමීන්වහන්සේගේ** දූතයා: නුඹේ වංශය
ගණන්කළ නොහැකි තරම් සමූහයක්
වන පිණිස බොහෝසෙයින් වැඩි-
11 කරන්නෙමියි ඈට කීසේක. **ස්වාමීන්-**
**වහන්සේගේ** දූතයා: බලව, නුඹ ගර්භිණීව
සිටියි, පුත්‍රයෙකු වදන්නීය; **ස්වාමීන්-**
**වහන්සේ** නුඹේ පීඩාව ඇසූ හෙයින්
ඔහුට *ඉෂ්මායෙල් යන නාමය
12 තබාපන්න. ඔහු වල් කොටළුවෙකු
වැනි මනුෂ්‍යයෙක් වන්නේය; ඔහුගේ
අත කාහටත් විරුද්ධවන්නේය, කාගේ
අතත් ඔහුට විරුද්ධවන්නේය; ඔහු
තමාගේ සියලු සහෝදරයන් ඉදිරියෙහි
13 වාසයකරන්නේයයි කීසේක. ඈ
තමාට කථාකළාවූ **ස්වාමීන්වහන්සේට**:
†එල් රොයි යන නාමය කීවාය. මක්-
නිසාද: මා දක්නාවූ උන්වහන්සේ දෙස
මෙහිදී බැලුවායින් පසු පවා ජීවත් වුණා
14 නොවේදැයි ඈ කීවාය. එබැවින් ඒ
ළිඳට ‡බෙයෙර්-ලහයි-රොයි යන නම

*එනම් දෙවියන්වහන්සේ අසනසේක.
†එනම්, ඔබ නම් දක්නාවූ
දෙවිකෙනෙක්ය.
‡එනම්, මා දක්නාවූ ජීවමාන
තැනන්වහන්සේගේ ළිඳය.

තබනලද්දේය. බලව, එය කාදෙෂ් සහ
බෙරෙද් අතරෙහි තිබේ. හාගර් ආබ්‍රම් 15
නිසා පුත්‍රයෙකු වැදුවාය. ආබ්‍රම් වනාහි
හාගර් වැදූ තමාගේ පුත්‍රයාට ඉෂ්මායෙල්
යන නම තැබීය. හාගර් ආබ්‍රම් නිසා 16
ඉෂ්මායෙල් වැදූ කල ආබ්‍රම්ගේ වයස
අසූ සාවුරුද්දක් විය.

## ගිවිසුම අලුත් කිරීම. චර්මඡේදනය පිහිටුවීම

17

ආබ්‍රම් අනූනව අවුරුදු වයසට
පැමිණි කල **ස්වාමීන්වහන්සේ**
ආබ්‍රම්ට පෙනී: මම සර්වපරාක්‍රමවූ
දෙවියන්වහන්සේය; මා ඉදිරියෙහි
හැසිරෙමින් සම්පූර්ණවෙයන්න. මා 2
සහ නුඹ අතරෙහි මාගේ ගිවිසුම පිහිටුවා
අතිශයින්ම නුඹ වැඩිකරන්නෙමියි ඔහුට
කීසේක. එවිට ආබ්‍රම් මුහුණින් 3
වැටුණේය. දෙවියන්වහන්සේ ඔහු සමග
කථාකරමින්: බලව, මාගේ ගිවිසුම නුඹ 4
සමගය; නුඹ බොහෝ ජාතීන්ගේ පියා
වන්නෙහිය. නුඹේ නාමය තවත් ආබ්‍රම්- 5
යයි කියනු නොලබන්නේය, නුඹේ
නාමය *ආබ්‍රහම් වන්නේය; මක්නිසාද
මම නුඹ බොහෝ ජාතීන්ගේ පියා
කෙළෙමි. මම නුඹ අතිශයින් බෝවෙන්ට 6
සලස්වා නුඹෙන් ජාතීන් උපදවන්නෙමි,
රජවරුද නුඹෙන් නික්මෙන්නෝය.
නුඹටද නුඹෙන් පසුව නුඹේ වංශයටද 7
දෙවියන්වහන්සේ වන පිණිස මාද නුඹ
සහ නුඹෙන් පසුව නුඹේ වංශයද
අතරෙහි ඔවුන්ගේ පරම්පාරාවන්හි
සදාකාල ගිවිසුමක් කොට මාගේ ගිවිසුම
පිහිටුවන්නෙමි. නුඹ විදේශීව වාසයකරන 8
දේශය වන මුළු කානාන් දේශය නුඹට
සහ නුඹෙන් පසුව නුඹේ වංශයටත්
සදාකාල උරුමයක් කොට දෙන්නෙමි;
මමද ඔවුන්ගේ දෙවියන්වහන්සේව
සිටින්නෙමියි කීසේක. තවද දෙවියන්- 9
වහන්සේ ආබ්‍රහම්ට කථාකොට: නුඹද

*එනම්, සමූහයක පියාණෝය.

තුඹෙන් පසුව සිටින තුඹේ වංශයද
තමන්ගේ පරම්පරාවන්හි මාගේ ගිවිසුම
10 රක්ෂා කළ යුතුය; මාද තුඹලා සහ
තුඹෙන් පසු තුඹේ වංශයද අතරෙහි
තුඹලා විසින් රක්ෂාකළයුතු මාගේ
ගිවිසුම නම් තුඹලා අතරෙහි සියලු
11 පිරිමින් චර්මඡේද්‍යය කිරීමය. තුඹලා
තුඹලාගේ චර්මාග්‍ර මාංසයෙහි ඡේද්‍යය-
කරනු ලබන්නහුය; ඒක මා සහ
තුඹලා අතරෙහි ඇති ගිවිසුමක ලකුණක්
12 වන්නේය. තුඹලාගේ පරම්පරාවන්හි
තුඹලා අතරෙහි ගෙයි උපන් තැනැත්තා
හෝ තුඹේ වංශයෙහි නොවන්නාවූ
විදේශියෙකුගෙන් මිලේට ගන්නාලද
තැනැත්තා හෝ අට දවසක් වයස්වූ
සියලු පිරිමි චර්මඡේද්‍යය කරනු
13 ලබන්නෝය. තුඹේ ගෙයි උපන්
තැනැත්තාද තුඹ විසින් මිලයට ගන්නා
ලද තැනැත්තාද චර්මඡේද්‍යය කරනු
ලබන්ටම ඕනෑය. මෙසේ මාගේ ගිවිසුම
සදකාල ගිවිසුමක් පිණිස තුඹලාගේ
14 මාංසයෙහි පවත්නේය. තමාගේ චර්මාග්‍ර
මාංසය ඡේද්‍යය නොකරනලද අචර්ම-
ඡේදිත පිරිමියෙක් ඇද්ද ඒ තැනැත්තා
තමාගේ සෙනඟ කෙරෙන් සිඳදමනු
ලබන්නේය; ඔහු මාගේ ගිවිසුම කඩ-
කෙළේයයි කීසේක.

## ඊසාක් ගැන පොරොන්දුව

15 තවද දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට
කථාකොට: තුඹේ භාර්යාවවූ සාරයිට
වනාහි සාරයි යන නාමය නොකියව,
16 ඇගේ නාමය *සාරා වන්නේය. මම
ඇට ආශීර්වාදකරන්නෙමි, තවද
ඇගෙන් තුඹට පුත්‍රයෙකු දෙන්නෙමි.
එසේය, මම ඇට ආශීර්වාදකරන්නෙමි,
ඇද ජාතීන්ගේ මවක් වන්නීය; ජනයන්ගේ
රජවරු ඇගෙන් නික්මෙන්නෝයයි
17 කීසේක. එවිට ආබ්‍රහම් මුහුණින්
වැටී සිනාසී: සියක් අවුරුදු වයස්වූ
තැනැත්තෙකුට දරුවෙක් උපදින්නේද?
අනූ අවුරුදු වයස්වූ සාරා වදන්නීදැයි
18 සිත තුළ කියාගත්තේය. ආබ්‍රහම්: අහෝ;

*එනම්, කුමාරී.

ඉෂ්මායෙල් ඔබවහන්සේ ඉදිරියෙහි
ජීවත්වේවයි දෙවියන්වහන්සේට කීය.
දෙවියන්වහන්සේද: සැබවින්ම තුඹේ 19
භාර්යාවවූ සාරා තුඹට පුත්‍රයෙකු
වදන්නීය; තුඹ ඔහුට *ඊසාක් යන නම
තබාපන්න. ඔහුගෙන් පසු ඔහුගේ
වංශයට සදකාල ගිවිසුමක් කොට මාගේ
ගිවිසුම ඔහු සමග පිහිටුවන්නෙමි. මම 20
ඉෂ්මායෙල් ගැනත් තුඹේ බස් ඇසීමි.
බලව, ඔහුට ආශීර්වාද කෙළෙමි, ඔහු
සඵලකරමින් අතිශයින් වැඩිකරන්නෙමි;
ඔහුට දව අධිපතීන් දෙළොස් දෙනෙක්
උපදින්නෝය, මම ඔහු මහත් ජාතියක්
කරන්නෙමි. එහෙත් මාගේ ගිවිසුම එන 21
අවුරුද්දේ නියම කාලයේදී සාරා තුඹට
වදන්නාවූ ඊසාක් සමග පිහිටුවන්නෙමියි
කීසේක. එවිට දෙවියන්වහන්සේ ආබ්‍රහම් 22
සමග කථාකිරීම නිමවා ඔහු වෙතින්
නැගී ගියසේක. එවිට ආබ්‍රහම් 23
දෙවියන්වහන්සේ ඔහුට කී ලෙස එම
දවසෙහිම තමාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්ද
තමාගේ ගෙයි උපන් සියල්ලන්ද තමා
මිල දී ගත් සියල්ලන්ද යන ආබ්‍රහම්ගේ
ගෙයි මිනිසුන් අතරෙන් සියලු පිරිමින්
රැගෙන ඔවුන්ගේ චර්මාග්‍ර මාංසය
ඡේද්‍යය කෙළේය. ආබ්‍රහම් චර්මාග්‍ර 24
මාංසය ඡේද්‍යය කරනු ලබන කල
අවුරුදු අනූනවයක් වයස්ව සිටියේය.
ඔහුගේ පුත්‍රවූ ඉෂ්මායෙල්ගේ චර්මාග්‍ර 25
මාංසය ඡේද්‍යය කරනු ලබන කල ඔහු
අවුරුදු දහතුනක් වයස්ව සිටියේය.
එම දවසෙහිම ආබ්‍රහම්ද ඔහුගේ 26
පුත්‍රවූ ඉෂ්මායෙල්ද චර්මඡේද්‍යය
කරනු ලැබුවෝය. ගෙයි උපන්නෝද 27
විදේශීන්ගෙන් මිලේට ගනු ලැබුවෝද
යන ඔහුගේ ගෙදර සියලු පිරිමි ඔහු
සමග චර්මඡේද්‍යය කරනු ලැබුවෝය.

## එම පොරොන්දුව අලුත්කිරීම

18
ඔහු දවාලේ ග්‍රීෂ්ම වේලාවේ
කූඩාරමේ දෙරකඩ හිඳින කල
ස්වාමීන්වහන්සේ මම්රේගේ ආලොන්
ගස් ළඟදී ඔහුට පෙනුණුසේක; ඔහු 2

*එනම්, සිනාසීම.

ඇස් ඔසවා බැලීය. බලව, මනුෂ්‍යයන්
තුන්දෙනෙක් ඔහු ඉදිරියෙහි සිටියෝය.
ඔහු ඔවුන් දුටු විට ඔවුන් සම්මුඛවන
පිණිස කූඩාරමේ දෙරකඩ සිට දිව
3 ගොස් බිමට නැමී: මාගේ ස්වාමීනි,
ඔබ ඉදිරියෙහි දැන් මම කරුණාව
ලැබුයෙම්නම් ඔබගේ මෙහෙකරුවා
කෙරෙන් අහක්ව නොයන ලෙස ඉල්ලමි.
4 පැන් ටිකක් ගෙනෙන්ට ඉඩ දී
ඔබවහන්සේලාගේ පාද සෝද, ගස
5 යට පහදුගත මැනව. ඔබවහන්සේලාගේ
සිත් ශක්තිමත් කරගන්න පිණිස මම
කෑම ටිකක් ගෙනෙන්නෙමි; පසුව ඔබ-
වහන්සේලාට යත හැකිය. මක්නිසාද
ඔබවහන්සේලා තමන් මෙහෙකරුවා
වෙතට ආවේ ඒ පිණිසයයි කීය. ඔව්හුද:
තුඹ කී ලෙස කරපන්නැයි කීවෝය.
6 එවිට ආබ්‍රහම් කූඩාරමේ සිටි සාරා
වෙතට යුහුව ගොස්: සිහින් පිටි නැළි
තුනක් ඉක්මනින් සූදනම්කොට අනා
7 රොටි සාදපන්නැයි කීය. ආබ්‍රහම් ගව
රැළට දිවගොස් ළපටි හොඳ වස්සෙකු
ගෙනවුත් මෙහෙකරුවාට දුන්නේය; ඔහු
8 ඌ ඉක්මනින් පිළියෙළකෙළේය. ඔහු
වෙඬරු හා කිරිද පිළියෙළකළ වස්සාද
ගෙනවුත් ඔවුන් ඉදිරියෙහි තබා ගස
යට ඔවුන් ළඟ සිටියේය; ඔව්හුද
9 කෑවෝය. තුඹේ භාර්යාවවූ සාරා
කොතැන්හිදැයි ඔව්හු ඔහුගෙන් ඇසු-
10 වෝය. කූඩාරමෙහියයි ඔහු කීය. එවිට
උන්වහන්සේ: සැබවින්ම එන අවුරුද්දේ
නියම කාලය පැමිණි විට මම තුඹ
වෙතට නැවත එන්නෙමි; බලව, තුඹේ
භාර්යාවවූ සාරා පුත්‍රයෙකු ලබන්නීයයි
කීසේක. උන්වහන්සේට පස්සෙන් තිබුණු
කූඩාරම් දෙරකඩදී සාරාට ඒ ඇසුණේය.
11 ආබ්‍රහම්ද සාරාද මහලුව වයෝවෘද්ධව
සිටියෝය; ස්ත්‍රීන්ට ඇති නියමය සාරා
12 පිළිබඳව නැවතී තිබුණේය. සාරා සිත
තුළ සිනාසී: මා වයෝවෘද්ධ වූවායින්
පසුත් මාගේ ස්වාමියා මහලුව සිටියදීත්
13 මම ප්‍රීතියක් ලබන්නෙම්දැයි කීවාය. එවිට
**ස්වාමීන්වහන්සේ** ආබ්‍රහම්ට කථාකොට:
මහලුවූ මම සැබවින් දරුවෙකු
වදන්නෙම්දැයි කියමින් සාරා සිනාසුණේ
මක්නිසාද? **ස්වාමීන්වහන්සේට** බැරි 14
දෙයක් ඇද්ද? එන අවුරුද්දේ නියම
කාලය පැමිණි විට තුඹ වෙතට නැවත
එන්නෙමි, සාරා පුත්‍රයෙකු ලබන්නී-
යයි කීසේක. සාරා භයවූ බැවින්: 15
මා සිනාසුණේ නැතැයි කීවාය. උන්-
වහන්සේද: නැත; තුඹ සිනාසුණායයි
කීසේක.

## සොදෙම උදෙසා ආබ්‍රහම් මැදහත්වීම

ඒ මනුෂ්‍යයෝ එතැනින් නැගිට 16
සොදෙම බලා ගියෝය. ආබ්‍රහම් ඔවුන්
ඇරලන පිණිස ඔවුන් සමග ගියේය.
**ස්වාමීන්වහන්සේ**: මා කරන්ට යන 17
දේ ආබ්‍රහම්ගෙන් සඟවම්ද? ආබ්‍රහම් 18
නම් සැබවින්ම මහත්වූ බලවත්
ජාතියක් වන්නේය; පොළොවේ සියලු
ජාතීහුද ඔහු කරණකොටගෙන
ආශීර්වාද ලබන්නෝය. මක්නිසාද 19
**ස්වාමීන්වහන්සේ** ආබ්‍රහම් ගැන කී
දේ ඔහු කෙරෙහි පමුණුවන ලෙස,
ධර්මිෂ්ඨකමද යුක්තියද කරමින් **ස්වාමීන්-
වහන්සේගේ** මාර්ගය රක්ෂා කරන්ට
ඔහු තමාට පසු තමාගේ දරුවන්ටද
තමාගේ ගෙයි වැසියන්ටද අණකරන
පිණිස ඔහු ඇඳිනගතිමියි කීසේක.
තවද **ස්වාමීන්වහන්සේ**: සොදෙමේද 20
ගොමොරාවේද මොරගැසීම මහත්
බැවින්ද ඔවුන්ගේ පාපය ඉතා බරපතළ
බැවින්ද, මම දැන් බැස ගොස් මා වෙතට 21
පැමිණි මොරගැසීම ලෙස ඔවුන්
සම්පූර්ණයෙන්ම කළාද කියා බලමි;
නැතහොත් දැනගන්නෙමියි කීසේක.
ඒ මනුෂ්‍යයෝ එතැනින් හැරී සොදෙම 22
දෙසට ගියෝය. තුමුත් ආබ්‍රහම් **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහිම නැවතී සිටියේය.
ආබ්‍රහම් ළංව: ඔබ දුෂ්ටයන් සමග 23
ධර්මිෂ්ඨයන් විනාශකරනසේක්ද? ඒ 24

නුවර ධර්මිෂ්ඨයන් පනස් දෙනෙක් සිටිත්
නම් එහි සිටින ධර්මිෂ්ඨයන් පනස් දෙනා
නිසා ඔබ ඒ ස්ථානය ඉතුරු නොකොට
25 විනාශකරනසේක්ද? එයාකාර කිරීම
ඔබගෙන් දුරුවේවා, ධර්මිෂ්ඨයා දුෂ්ටයා
හා සමානවන ලෙස දුෂ්ටයා සමග
ධර්මිෂ්ඨයා මැරීම ඔබ කෙරෙන්
දුරුවේවා. මුළු පොළොවේ විනිශ්චය-
කාරයාණන්වහන්සේ යුක්තිය නොකරන-
26 සේක්දැයි කීවේය. එවිට ස්වාමීන්වහන්සේ:
සොදෙම් නුවර තුළ ධර්මිෂ්ඨයන් පනස්
දෙනෙක් සම්බ වුණොත් ඔවුන් නිසා
මුළු ස්ථානය ඉතුරුකරන්නෙමියි කීසේක.
27 ආබ්‍රහම් උත්තරදෙමින්: බැලුව මැනව,
ධූලි හා අලු පමණක් වූ මම ස්වාමීන්-
වහන්සේට කථාකරන්ට ධෛර්ය
28 ගතිමි. ධර්මිෂ්ඨයන් පනස් දෙනාගෙන්
පස් දෙනෙක් අඩුවීනම්, පස් දෙනෙක්
අඩු නිසා ඔබ මුලු නුවර විනාශකරන-
සේක්දැයි කීය. උන්වහන්සේද: එහි
හතලිස්පස් දෙනෙක් මට සම්බවුණොත්
ඒක විනාශ නොකරන්නෙමියි කීසේක.
29 ඔහු නැවතත් උන්වහන්සේට කථාකොට:
සමහරවිට එහි හතලිස් දෙනෙක් සම්බ-
වන්නෝයයි කීවේය. උන්වහන්සේ:
හතලිස් දෙනා නිසා ඒක නොකර
30 සිටින්නෙමියි කීසේක. ඔහුද: අනේ
ස්වාමීන්වහන්සේ උදහස් නොවන-
සේක්වා, එවිට මම කථාකරන්නෙමි.
සමහරවිට තිස් දෙනෙක් එහි සම්බ-
වන්නෝයයි කීවේය. උන්වහන්සේද: තිස්
දෙනෙක් එහි මට සම්බවුණොත් ඒක
31 නොකර සිටින්නෙමියි කීසේක. එවිට
ඔහු: බැලුව මැනව, ස්වාමීන්වහන්සේට
කථාකරන්ට ධෛර්ය ගතිමි; සමහර-
විට විසි දෙනෙක් එහි සම්බවන්-
නෝයයි කීවේය. උන්වහන්සේද විසි
දෙනා නිසා ඒක විනාශනොකර
32 සිටින්නෙමියි කීසේක. ඔහුද: අනේ
ස්වාමීන්වහන්සේ උදහස් නොවන-
සේක්වා, එවිට මම මේ වර පමණක්
කථාකරන්නෙමි. සමහරවිට දස
දෙනෙක් එහි සම්බවන්නෝයයි කීය.
උන්වහන්සේද: දස දෙනා නිසා ඒක
විනාශ නොකර සිටින්නෙමියි කීසේක.
ස්වාමීන්වහන්සේ ආබ්‍රහම් සමග 33
කථාකොට නිමවූ වහාම යන්ට
ගියසේක. ආබ්‍රහම්ද තමාගේ ස්ථානයට
හැරී ගියේය.

## සොදෙම සහ ගොමෝරාවේ විනාශය. ලොත්ගේ මිදීම

19
දේවදූතයන් දෙදෙනා සවස්
වේලෙහි සොදෙමට පැමුණු-
ණෝය; ලොත් සොදෙමේ දෙරටුවේ
හුන්නේය. ලොත් ඔවුන් දැක ඔවුන්
සම්මුඛවන පිණිස නැගිට මුහුණින්
බිමට නැමුණේය; තවද ඔහු: බැලුව 2
මැනවි, මාගේ ස්වාමිවරුනි, නුඹ-
වහන්සේලාගේ මෙහෙකරුවාගේ ගෙදරට
ඇවිත් මුළු රෑ නැවතී සිට පාද සෝදගන
මැනවි, අලුයම් වේලෙහි නැගිට නුඹ-
වහන්සේලාගේ ගමන යන හැකියයි
කීවේය. ඔව්හුද: නැත; මුළු රෑ වීථියේ
නවතින්නෙමුයයි කීවෝය. නුමුත් ඔහු 3
ඔවුන්ට බොහෝසේ පෙරැත්තකළ
නිසා ඔව්හු ඔහු වෙතට හැරී ගොස්
ඔහුගේ ගෙට ඇතුල්වූවෝය; එවිට ඔහු
මුහුන් නුමුසු රොටි පුළුස්සා ඔවුන්ට
කෑමක් පිළියෙළ කෙළේය, ඔව්හුද
කෑවෝය. නුමුත් ඔවුන් නින්දට 4
පළමුවෙන් නුවර මනුෂ්‍යයෝ, එනම්
සොදෙමේ මනුෂ්‍යයෝ වූ සියලු දිගින්
ආවාවූ තරුණයෝද මහල්ලෝද යන
මුළු සෙනග ගෙය වටකරගත්තෝය;
ඉක්බිති ඔව්හු ලොත්ට හඬගසමින්: අද 5
රාත්‍රියේ නුඹ වෙතට ආවාවූ මනුෂ්‍යයෝ
කොහේද? අප විසින් ඔවුන් හැඳින-
ගන්නා පිණිස ඔවුන් අප ළඟට පිටතට
ගෙනෙන්නැයි කීවෝය. ලොත් දෙරකඩින් 6
නික්ම දෙර වසා ඔවුන් ළඟට ගොස්:
මාගේ සහෝදරයිනි, මෙබඳු දුෂ්ටකමක් 7
නොකරල්ලා. මෙන්න, පුරුෂයෙකු 8
නැඳින්න දූවරු දෙදෙනෙක් මට සිටිති;
ඔවුන් නුඹලා ළඟට පිටතට ගෙනෙන්ට
ඉඩදියල්ලා, නුඹලාට හොඳව පෙනෙන

ලෙස ඔවුන්ට කරපල්ලා; එහෙත් මේ
මනුෂ්‍යයන් මාගේ පියස්ස යටට ඇවිත්
සිටින නිසා ඔවුන්ට කිසිවක් නො-
9 කරල්ලායයි කීය. එවිට ඔව්හු: අහකට
පල, මේකා නැවතී සිටින්ට ඇවිත්
විනිශ්චයකාරයෙක් වෙන්ට හදයි. දැන්
ඔවුන්ට වඩා තදබලව තට ක්‍රියා-
කරන්නෙමුයයි කීවෝය. ඔව්හුද: ඒ
මනුෂ්‍යයා, එනම්, ලොත් තදින් තෙරපා
10 දෙර බිඳින පිණිස ළං වූවෝය. එහෙත්
ඒ මනුෂ්‍යයෝ තමන්ගේ අත් දිගුකොට
ලොත් තමත් වෙතට ගේ ඇතුළට
11 ඇදගෙන දෙර වැසුවෝය. තවද ඔව්හු
ගෙයි දෙර ළඟ සිටි ලොකු කුඩා
සියල්ලන් අන්ධ කළෝය. මෙසේ ඔව්හු
12 දෙර සොයමින් වෙහෙසුණෝය. ඒ
මනුෂ්‍යයෝ ලොත්ට කථාකොට: මෙහි
තුඹට සිටින්නෝ වෙන කවුද? බෑනා
හෝ තුඹේ පුත්‍රයන් හෝ තුඹේ දූවරුන්
හෝ වෙන මේ නුවර තුඹට සිටින කොයි
කෙනෙක් හෝ මේ ස්ථානයෙන් පිටතට
13 ගෙනෙන්න; මක්නිසාද ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි මේ මිනිසුන්ගේ මොරගැසීම
අධිකවූ බැවින් අපි මේ ස්ථානය විනාශ-
කරන්නෙමුව; එය විනාශකරන පිණිස
ස්වාමීන්වහන්සේ අප එවූසේකැයි
14 කීවෝය. ලොත් පිටතට ගොස් තමාගේ
දූවරුන් සරණ පාවාගත් බෑනාවරුන්ට
කථාකරමින්: නැගිට මේ ස්ථානයෙන්
පිටතට පලයල්ලා; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ මේ නුවර විනාශකරන්ට
යනසේකැයි කීවේය. එහෙත් ඔහු
සරදම්කරන්නෙකු මෙන් තම බෑනා-
15 වරුන්ට පෙනුණේය. පහන්වුණ කල
දේවදූතයෝ: මේ නුවර අයුතුකමෙහි
තුඹ නාස්තිනොවන පිණිස නැගිට
මෙහි සිටින තුඹේ භාර්යාවත් තුඹේ
දූවරුන් දෙදෙනාත් කැඳවාගෙන පල-
යන්නැයි කියා ලොත් ඉක්මන්
16 කෙරෙවුවෝය. එහෙත් ඔහු ප්‍රමාදවුණ
කල්හි ස්වාමීන්වහන්සේ ඔහු කෙරෙහි
ඇති දයාව නිසා ඒ මනුෂ්‍යයෝ ඔහුගේ
අතද ඔහුගේ භාර්යාවගේ අතද ඔහුගේ
දූවරුන් දෙදෙනාගේ අත්ද අල්වාගෙන
ඔහු ගෙනගොස් නුවරින් පිටත සිටෙවූ-
වෝය. ඔවුන් පිටතට ගෙනා කල්හි 17
උන්වහන්සේ කථාකොට: තුඹේ ප්‍රාණය
ගළවාගන්ට දුවපන්න; ආපසු නොබ-
ලන්න, සමභූමියෙහි කොතැනවත් නැවතී
නොසිටින්න; නාස්තිනොවන පිණිස
කන්දට දුවපන්නැයි කීසේක. එවිට ලොත්: 18
අනේ මාගේ ස්වාමීනි, එසේ නොවේවා.
මෙන්න බැලුව මැනවි, ඔබගේ මෙහෙ- 19
කරුවාට ඔබ ඉදිරියෙහි කරුණාව ලැබී
තිබේ; මාගේ ප්‍රාණය රක්ෂාකිරීමෙන්
ඔබ මට මහත් ලෙස කරුණාකළසේක;
මට කන්දට පලායන්ට නුපුළුවන,
සමහරවිට මට නපුර පැමිණීමෙන්
මරණය සිදු විය හැකිය. මෙන්න, 20
පලායන්ට අර නුවර ළඟය, ඒක කුඩා
එකක්ය. අහෝ එහි පලායන්ට අවසර
ලැබේවා; ඒක කුඩා එකක් නොවේද?
එවිට මාගේ ප්‍රාණය ජීවත්වන්නේයයි
ඔවුන්ට කීය. උන්වහන්සේද: බලව, තුඹ 21
සඳහන්කළ නුවර මා විසින් විනාශ
නොකරන හැටියට මේ කාරණය ගැනත්
තුඹ පිළිගතිමි. ඉක්මන්කරපන්න, 22
ගැළවෙන්ට එතැනට දුවපන්න;
මක්නිසාද තුඹ එතැනට පැමිණෙනතුරු
කිසිවක් කළ නොහැක්කෙමියි ඔහුට
කීසේක. එබැවින් ඒ නුවරට *ශොවර්
යන නම කියනලදී. ලොත් ශොවර් 23
නුවරට ළඟාවූ කල්හි පොළොව පිට
ඉර උදාවී තිබුණේය. එවිට ස්වාමීන්- 24
වහන්සේ සොදෙම පිට සහ ගොමොරා
පිට ස්වාමීන්වහන්සේ වෙතින් අහසෙන්
ගෙන්දගම් සහ ගිනිද වස්වා ඒ 25
නුවරවල්ද මුළු සමභූමියද ඒ නුවරවල
සියලු වැසියන්ද භූමියෙහි හටගත්
දේද විනාශකළසේක. එහෙත් ඔහුගේ 26
භාර්යාව ඔහුට පිටිපසින් යමින් ආපසු
බැලුවාය, ඈ වනාහි ලුණු කණුවක්
වූවාය. ආබ්‍රහම් අලුයම් වේලෙහි නැගිට 27
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තමා සිටි
ස්ථානයට ගොස් සොදෙම සහ 28

*එනම්, කුඩා.

ගොමොරාද සමභූමියෙහි මුළු දේශයද
දෙස බැලුවේය, බලව, ඒ දේශයේ
ධූමය උදුනක ධූමය ලෙස නගිනවා
ඔහු දුටුවේය.
29 තවද දෙවියන්වහන්සේ සමභූමි-
යෙහි නුවරවල් විනාශකරන කල්හි
දෙවියන්වහන්සේ ආබ්‍රහම් සිහිකොට,
ලොත් විසූ නුවරවල් විනාශකරද්දී ඒ
විනාශය මධ්‍යයෙන් ලොත් පිටතට
යැවූසේක.

## මෝවබ්වරුන් සහ අම්මොන්-වරුන්ගේත් උත්පත්තිය

30 ලොත් ඔහුගේ දූවරුන් දෙදෙනාත්
සමග ශොවර් කෙරෙන් ගොස් කන්දේ
වාසයකෙළේය; මක්නිසාද ඔහු ශොවර්හි
වාසයකරන්ට භයවිය. ඔහුත් ඔහුගේ
දූවරු දෙදෙනාත් ගුහාවක වාසය
31 කළෝය. එවිට වැඩිමහල් තැනැත්තී බාල
තැනැත්තියට කථාකොට: අපේ පියා
මහලුය, මුළු පොළොවේ ව්‍යවහාරය
ලෙස අප කරා පැමිණෙන්ට පොළොවෙහි
32 පුරුෂයෙක් නැත්තේය. වරෙන්න, අපේ
පියාගෙන් වංශය රක්ෂාකරගන්නා
පිණිස අපේ පියාණන්ට මුද්‍රිකපානය
පොවා ඔහු සමග සයනයකරමුයයි
33 කීවාය. ඔව්හු ඒ රාත්‍රියෙහි තමන්ගේ
පියාට මුද්‍රිකපානය පෙවුවෝය. වැඩිමහල්
තැනැත්තී ඇතුල්ව තමාගේ පියා
සමග සයනයකළාය; ඇගේ සයනය
කිරීමවත් නැගිටීමවත් ඔහු නොදත්තේය.
34 පසුවද වැඩිමහල් තැනැත්තී බාල
තැනැත්තියට කථාකොට: බලව, ඊයේ
රාත්‍රියේ මාගේ පියා සමග මම
සයනයකෙළෙමි. අද රාත්‍රියෙහිත් අප
විසින් ඔහුට මුද්‍රිකපානය පොවා අපේ
පියාගෙන් වංශය රක්ෂාකරගන්නා
පිණිස නුඹත් ඇතුල්ව ඔහු සමග සයනය-
35 කරපන්නැයි කීවාය. ඔව්හු ඒ රාත්‍රියෙහිත්
තමන් පියාණන්ට මුද්‍රිකපානය
පෙවුවෝය. බාල තැනැත්තීද නැගිට ඔහු
සමග සයනයකළාය; ඇගේ සයනය-
කිරීමවත් නැගිටීමවත් ඔහු නොදත්තේය.
මෙසේ ලොත්ගේ දූවරු දෙදෙනා 36
තමන්ගේ පියා කරණකොටගෙන
ගර්භිණීවූවෝය. වැඩිමහල් තැනැත්තී 37
පුත්‍රයෙකු වදා ඔහුට මෝවබ්යයි නම්
තැබුවාය. ඔහු අද දක්වා මෝවබ්-
වරුන්ගේ පියාණෝය. බාල තැනැත්තීද
පුත්‍රයෙකු වදා ඔහුට බෙන්අම්මියයි නම්
තැබුවාය. ඔහු අද දක්වා අම්මොන්
පුත්‍රයන්ගේ පියාණෝය.

## ආබ්‍රහම් සහ අබිමෙලෙක් ගෙරාර්හි සිටීම

20 ආබ්‍රහම් එතැනින් දකුණු
දේශයට ගමන්කර කාදේෂ්ද
ෂූර්ද අතරේ වාසය කෙළේය; ඔහු
ගෙරාර්හිද පොරොත්තුවුණේය. ආබ්‍රහම් 2
තම භාර්යාවවූ සාරා ගැන: ඈ මගේ
සහෝදරීයයි කීවේය. එවිට ගෙරාර්හි
රජවූ අබිමෙලෙක් මිනිසුන් යවා සාරා
ගෙන්වා ගත්තේය. නුමුත් දෙවියන්- 3
වහන්සේ රාත්‍රියේ හීනයකින් අබිමෙලෙක්
වෙතට පැමිණ: බලව, නුඹ ගෙන්වාගත්
ස්ත්‍රිය නිසා නුඹ මළ කෙනෙක්ය,
මක්නිසාද ඈ මනුෂ්‍යයෙකුගේ භාර්යාව-
යයි ඔහුට කීසේක. නුමුත් අබිමෙලෙක් 4
ඈ කරා නොපැමිණ සිටියේය. ඔහු
කියනුයේ: ස්වාමීන්වහන්ස, ඔබ
ධර්මිෂ්ඨ ජාතියක් පවා නසනසේක්ද?
ඈ මාගේ සහෝදරීයයි ඔහුම මට 5
නොකීයේද? ඈ පවා: ඔහු මාගේ
සහෝදරයායයි කීවාය; මාගේ සිතේ
අවංකකමින්ද මාගේ අත්වල නිදෙස්-
කමෙන්ද මේක කෙළෙමියි කීවේය.
දෙවියන්වහන්සේ ස්වප්නයෙන් ඔහුට 6
කථාකොට: එසේය, නුඹේ සිතේ අවංක-
කමින් මේක කළ බව දනිමි, මට
විරුද්ධව පව්කිරීමෙන් නුඹ වැළැක්කුවේ
මමය. එබැවින් ඈට ස්පර්ශකරන්ට
නුඹට ඉඩනැරියෙමි. එහෙයින් දැන් 7
ඒ මනුෂ්‍යයාගේ භාර්යාව ආපසු
දීපන්න; මක්නිසාද ඔහු අනාගතවක්තෘ
කෙනෙක්ය, ඔහු නුඹ ජීවත්වෙන පිණිස
නුඹ උදෙසා යාච්ඤා කරන්නේය. එහෙත්

අෑ ආපසු නොදෙන්නෙහි නම් නුඹද
නුඹ සන්තක සියල්ලන්ද ඒකාන්තයෙන්
නසින බව දනගනින්නැයි කීසේක.
8 අබිමෙලෙක් අලුයම් වේලෙහි නැගිට
තමාගේ සියලු මෙහෙකරුවන් කැඳවා
මේ සියල්ල ඔවුන් ඉදිරියෙහි කීවේය. ඒ
මනුෂ්‍යයෝ බොහෝසෙයින් භයවුණෝය.
9 එකල අබිමෙලෙක් ආබ්‍රහම් කැඳවා
ඔහුට කථාකොට: නුඹ අපට කළේ
මොකද? මා සහ මාගේ රාජ්‍යය
කෙරෙහි නුඹ මහත් පාපයක් පැමිණෙවූවේ
මා විසින් නුඹට විරුද්ධව කුමන පාපයක්
කළ නිසාද? නුඹ මට නොකටයුතු
10 ක්‍රියාවල් කෙළෙහියයි කීය. තවද අබි-
මෙලෙක්: නුඹ මේ දෙය කළේ කුමක්
11 දුටු නිසාදැයි ආබ්‍රහම්ට කීය. ආබ්‍රහම්:
සැබවින්ම මේ ස්ථානයෙහි දේව භය
නැත්තේය කියාත් ඔවුන් මාගේ භාර්යාව
නිසා මා මරනවා ඇත කියාත් මට
12 සිතුණු නිසාය. ඇරත් අෑ ඇත්තෙන්ම
මාගේ සහෝදරීය, මාගේ පියාගේ දුවය;
නුමුත් මාගේ මවුගේ දුව නොවේය; අෑ
13 මාගේ භාර්යාව වූවාය. තවද දෙවියන්-
වහන්සේ මාගේ පියාගේ ගෙයින් යන්ට
මට සැලැස්සූ කල මම අෑට කථාකර:
නුඹ මට පෙන්විය යුතු කරුණාව මේය,
අප පැමිණෙන්නාවූ සියලු තැන්හිදීම-ඔහු
මාගේ සහෝදරයායයි මා ගැන
14 කියාපන්නැයි කීමියි කීයේය. අබි-
මෙලෙක් බැටළුවන්ද ගවයන්ද දසයන්ද
දසීන්ද රැගෙන ආබ්‍රහම්ට දී ඔහුගේ
භාර්යාව වූ සාරාද ඔහුට ආපසු
15 දුන්නේය. අබිමෙලෙක්: බලව, මාගේ
දේශය නුඹ ඉදිරියෙහිය, කැමති තැනක
16 වාසයකරපන්නැයි කීවේය. ඔහු සාරාට
කථාකොට: බලව, මම නුඹේ සහෝ-
දරයාට රිදී දහසක් දුනිමි. එය නුඹ
සමග සිටින සියල්ලන් ඉදිරියෙහි නුඹට
ඇස් වැස්මක් පිණිසය; සියල්ලන්
ඉදිරියෙහි නුඹට යුක්තිය සිදුකරනලද්දේ-
17 යයි කීවේය. ආබ්‍රහම් දෙවියන්වහන්-
සේට යාච්ඤාකෙළේය. දෙවියන්වහන්සේ
අබිමෙලෙක් සහ ඔහුගේ භාර්යාවද
ඔහුගේ දසීන්ද සුවපත් කළසේක; එවිට
ඔව්හු දරුවන් වැදුවෝය. මක්නිසාද 18
ස්වාමීන්වහන්සේ විසින් ආබ්‍රහම්ගේ
භාර්යාවවූ සාරා නිසා අබිමෙලෙක්ගේ
ගෙයි සියල්ලන්ගේ ගර්භ තදින් පියා
තිබුණේය.

## ඊසාක්ගේ උප්පැන්නය

21 ස්වාමීන්වහන්සේ තමන් කියා
තිබුණු ලෙස සාරා දෙස
බැලූසේක, ස්වාමීන්වහන්සේ කථා-
කළ ලෙස සාරාට කළසේක. සාරා 2
ගර්භිණීව දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට
කීවාවූ නියම කාලයෙහිදී ඔහුගේ මහලු
වයසෙහි ඔහු නිසා පුත්‍රයෙකු වැදුවාය.
ආබ්‍රහම්ද තමාට උපන්නාවූ, සාරා 3
තමාට වැදුවාවූ තමාගේ පුත්‍රයාට ඊසාක්
යන නම තැබීය. දෙවියන්වහන්සේ 4
තමාට අණ දුන් ලෙස ආබ්‍රහම් තමාගේ
පුතුවූ ඊසාක්ට අට දවසක් වයස්වූ කල්හි
ඔහු චර්මඡේදනය කෙළේය. ආබ්‍රහම් 5
තමාගේ පුතුවූ ඊසාක් උපදින කල අවුරුදු
සියයක් වයස්ව සිටියේය. දෙවියන්- 6
වහන්සේ මා සිනාසෙන්ට සැලැස්වූ-
සේක; ඒ අසන සියල්ලන් මා සමග
සිනාසෙනවා ඇතැයි සාරා කීවාය.
තවද: සාරා දරුවන්ට කිරිදෙනවා ඇතැයි 7
ආබ්‍රහම්ට කියන්ට සිතුවේ කවුද?
මක්නිසාද මම ඔහුට ඔහුගේ මහලු
වයසෙහිදී පුත්‍රයෙකු වැදුවෙමියි අෑ
කීවාය.
ළදරුවා වැඩී කිරිවැරුවේය. ඊසාක් 8
කිරිවැරූ දවසෙහි ආබ්‍රහම් මහත් මංගල්‍ය
කෑමක් පිළියෙළ කෙළේය.

## හාගර් සහ ඇගේ ළමයාත් පිටත්කර හැරීම

මිසරීය හාගර් ආබ්‍රහම් නිසා වැදූ 9
පුත්‍රයා සරදම්කරනවා සාරා දුටුවාය.
එහෙයින් අෑ ආබ්‍රහම්ට කථාකොට: 10
මේ දසිය සහ ඇගේ පුත්‍රයා පිටත
දමාපන්න. මක්නිසාද මේ දසියගේ
පුත්‍රයා මාගේ පුත්‍රයාවූ ඊසාක් සමග

උරුමක්කාර නොවන්නේයයි කීවාය.
11 ආබ්‍රහම්ට මේ කාරණය තමාගේ පුත්‍රයා
12 නිසා තද කනගාටුවක් විය. එවිට
දෙවියන්වහන්සේ: ළමයා නිසාත් තුඹේ
දසිය නිසාත් කනගාටු නොවන්න;
සාරා තුඹට කියන සියල්ල ගැන ඇගේ
හඬට කන් දීපන්න; මක්නිසාද තුඹේ
වංශය කියවෙන්නේ ඊසාක්ගෙන්ය.
13 දසියගේ පුත්‍රයා තුඹේ බීජය බැවින්,
ඔහුගෙන්ද ජාතියක් කරන්නෙමියි
14 ආබ්‍රහම්ට කීසේක. ආබ්‍රහම් අලුයම
නැගිට රොටි සහ වතුර භාජනයකුත්
ගෙන හාගර්ගේ කරේ තබා දරුවාද
ඇට දී ඇය යන්ට හැරියේය. ඈ පිටත්ව
ගොස් බෙයර්-ෂෙබා නම් වනයෙහි
15 මංමුළාවූවාය. භාජනයෙහි වතුර ඉවර
විය, ඈ දරුවා පඳුරක් යට තබා ගොස්
16 ඔහු ඉදිරියෙන් ඈත්ව දුනුසැරයක් පමණ
දුරින් හිඳගත්තාය. මක්නිසාද: දරුවාගේ
මරණය මට නොපෙනේවයි ඈ කීවාය.
ඈ ඔහුට ඉදිරිපිටින් හිඳගෙන ශබ්ද
17 නගා හැඬුවාය. දෙවියන්වහන්සේ
ළමයාගේ හඬ ඇසූසේක; දෙවියන්-
වහන්සේගේ දූතයා ස්වර්ගයේ සිට
හාගර්ට හඬගසා: හාගර්, තුඹට මක්-
වෙලාද? භය නොවෙන්න; මක්නිසාද
දෙවියන්වහන්සේ ළමයා සිටින තැනින්
18 ඔහුගේ ශබ්දය ඇසූසේක. නැගිට ළමයා
ඔසවා තුඹේ අතින් අල්ලා ගනින්න.
මක්නිසාද මම ඔහු මහත් ජාතියක්
19 කරන්නෙමියි කීසේක. දෙවියන්වහන්සේ
ඇගේ ඇස් ඇරෙවුසේක, එවිට ඈ වතුර
ඇති ළිඳක් දැක එහි ගොස් භාජනයට
වතුර පුරවාගෙන ළමයාට බොන්නට
20 දුන්නාය. තවද දෙවියන්වහන්සේ
ළමයා සමග වූසේක, ඔහු වැඩී වනයෙහි
21 වාසය කොට දුනුකාරයෙක් විය. ඔහු
පාරාන් නම්වූ වනයෙහි වාසය කෙළේය.
ඔහුගේ මවු ඔහුට මිසරදේශයෙන්
භාර්යාවක් ගෙන දුන්නාය.

## අබිමෙලෙක් සහ ආබ්‍රහම් කරගත් ගිවිසුම

ඒ කාලයෙහි අබිමෙලෙක් සහ ඔහුගේ 22
සේනාපතිවූ පීකොල් ආබ්‍රහම්ට
කථාකොට: තුඹ කරන සියල්ලේදී
දෙවියන්වහන්සේ තුඹ හා සමගය.
එබැවින් තුඹ මටවත් මාගේ දරු 23
මුණුබුරන්ටවත් වංචාවක් නොකරන
හැටියටද, මා විසින් තුඹට කළ
කරුණාව ලෙස තුඹ මටත් තුඹ විදේශීව
සිටින මේ දේශයටත් කරන හැටියටද,
දෙවියන්වහන්සේගේ නාමයෙන් දැන්
මෙහිදී මට දිවුරාපන්නැයි කීවේය.
ආබ්‍රහම්ද: මම දිවුරන්නෙමියි කීය. 24
එහෙත් අබිමෙලෙක්ගේ මෙහෙකරුවන් 25
බලාත්කාරයෙන් උදුරාගත් වතුර
ඇති ළිඳක් ගැන ආබ්‍රහම් අබිමෙලෙක්ට
තරවටු කෙළේය. අබිමෙලෙක්ද: මේ දේ 26
කළේ කවුදැයි මම නොදනිමි. තුඹ
මට නොකීයෙහිය, අද වන තුරු ඒ ගැන
මා ඇසුවෙත් නැතැයි කීය. ආබ්‍රහම් 27
බැටළුවන් හා ගොනුන් ගෙන අබි-
මෙලෙක්ට දුන්නේය; ඔව්හු දෙදෙන
ගිවිසුමක් කරගත්තෝය. ආබ්‍රහම් 28
රැළෙන් බැටළු නැම්බියන් සත් දෙනකු
වෙන්කොට තැබුවේය. අබිමෙලෙක්ද: 29
තුඹ වෙන්කොට තැබූ මේ බැටළු නැම්-
බියන් සත්දෙනා කුමක් පිණිසදැයි
ආබ්‍රහම්ට කීය. ඔහු: මේ ළිඳ මා විසින් 30
හෑරෙවූ බවට මේ බැටළු නැම්බියන්
සත්දෙනා මට සාක්ෂියක් පිණිස මාගේ
අතින් පිළිගන්නැයි කීය. එහෙයින් ඔහු 31
ඒ ස්ථානයට *බෙයර්-ෂෙබායයි නම්
තැබීය. එසේ කළේ ඔවුන් දෙදෙනා
එතැන්හිදී දිවුළ බැවින්ය. මෙලෙස ඔව්හු 32
බෙයර්-ෂෙබාහිදී ගිවිසුමක් කරගත්-
තෝය. තවද අබිමෙලෙක් සහ ඔහුගේ
සේනාපතිවූ පීකොල් නැගිට පිලිස්ති-
වරුන්ගේ දේශයට හැරී ගියෝය. ආබ්‍රහම් 33
බෙයර්-ෂෙබාහි ඒෂෙල් ගසක් සිටුවා
එතැන්හි සදාකාල දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ නාමය කියා යාච්ඤාකෙළේය.
ආබ්‍රහම් පිලිස්තිවරුන්ගේ දේශයෙහි
බොහෝ දවස් පොරොත්තුව සිටියේය.

*එනම්, දිවුරුමේ ළිඳ.

## ඊසාක් පූජාකරනු ලැබීම

**22** මේ කාරණාවලින් පසු දෙවියන්-
වහන්සේ ආබ්‍රහම් පරීක්ෂා
කරමින්: ආබ්‍රහම් කියා ඔහුට කථාකළ-
සේක; ඔහුද: මම මෙහියයි කීය.
2 උන්වහන්සේ: නුඹේ පුත්‍රවූ නුඹ ප්‍රේම
කරන නුඹේ එකම පුත්‍රවූ ඊසාක්
රැගෙන මොරියා දේශයට ගොස්, මා
විසින් නුඹට කියන කන්දක් පිට දවන
පූජාවක් වශයෙන් ඔහු ඔප්පුකරවයි
3 කීසේක. ආබ්‍රහම් අලුයම නැගිට තමාගේ
කොටළුවා සූදානම්කොට, තමා කැටුව
තමාගේ තරුණයන්ගෙන් දෙදෙනෙකු හා
තමාගේ පුත්‍රවූ ඊසාක්ද රැගෙන, දවන
පූජාව පිණිස දර පළාගෙන, නැගිට
දෙවියන්වහන්සේ ඔහුට කී ස්ථානයට
4 ගියේය. තුන්වෙනි දින ආබ්‍රහම් ඇස්
එසවූයේ ඒ ස්ථානය දුර සිට දුටුවේය.
5 ආබ්‍රහම් තමාගේ තරුණයන්ට කථා-
කොට: කොටළුවා සමග නුඹලා මෙහි
සිටපල්ලා, ළමයාත් මමත් අතනට ගොස්
නමස්කාරකොට නුඹලා වෙතට නැවත
6 එන්නෙමුයයි කීය. එවිට ආබ්‍රහම් දවන
පූජාවට ගෙනා දර රැගෙන තමාගේ
පුත්‍රවූ ඊසාක් පිට තබා තමාගේ අතින්
ගිනිද පිහියද ගත්තේය; ඔව්හු දෙදෙනා
7 එක්ව ගියෝය. ඊසාක් තමාගේ පියවූ
ආබ්‍රහම්ට කථාකොට: මාගේ පියා-
ණෙනියි කීය. ඔහුද: මාගේ පුත්‍රය, මම
මෙහියයි කීය. ඔහු: බැලුව මැනවි,
ගින්දරත් දරත් තිබේ, එහෙත් දවන
පූජාවට බැටළුපැටවා කොයිදැයි කීවේය.
8 ආබ්‍රහම්: මාගේ පුත්‍රය, දෙවියන්-
වහන්සේම දවන පූජාවක් පිණිස බැටළු-
පැටවා සපයා ගන්නවා ඇතැයි කීවේය.
9 මෙසේ ඔව්හු දෙදෙනා එක්ව ගොස්
දෙවියන්වහන්සේ ඔහුට කී ස්ථානයට
පැමුණුණෝය; එවිට ආබ්‍රහම් එහි
පූජාසනය ගොඩනගා, දර පිළිවෙළින්
තබා, තම පුත්‍රවූ ඊසාක් බැඳ පූජාසනය
10 උඩ දර පිට තැබුවේය. තවද ආබ්‍රහම්
තමාගේ අත දිගුකොට තම පුත්‍රයා
මරන පිණිස පිහිය ගත්තේය. එවිට 11
**ස්වාමීන්වහන්සේගේ** දූතයා ස්වර්ගයෙහි
සිට ඔහුට අඬගසා: ආබ්‍රහම්, ආබ්‍රහම්-
යයි කීයේය. ඔහුද: මම මෙහියයි කීය.
දේවදූතයා: නුඹේ අත තරුණයා පිට 12
නොතබව, ඔහුට කිසිවක් නොකරව.
මක්නිසාද නුඹේ පුත්‍රයා, නුඹේ එකම
පුත්‍රයා මාගෙන් නොවැළැක්වූ බැවින්
නුඹ දෙවියන්වහන්සේට භයවෙන බව
දැන් දනිමියි කීයේය. ආබ්‍රහම් ඇස් 13
ඔසවා බැලූ විට, බලව, තමා පිටිපස
බැටළුවෙක් උගේ අංවලින් අකුලේ
පටලැවී සිටිනවා දුටුයේය. එවිට ආබ්‍රහම්
ගොස් ඒ බැටළුවා රැගෙන තමාගේ
පුත්‍රයා වෙනුවට දවන පූජාවක් කොට
ඔප්පුකෙළේය. ආබ්‍රහම් ඒ ස්ථානයට 14
*යෙහෝවා-යිරෙ යන නාමය තැබුවේය.
මෙසේ: **ස්වාමීන්වහන්සේගේ** කන්දේදී
සපයා දෙනුලබන්නේයයි අද දක්වා
කියති. **ස්වාමීන්වහන්සේගේ** දූතයා 15
දෙවෙනි වරත් ස්වර්ගයෙහි සිට
ආබ්‍රහම්ට හඬගසා: නුඹේ පුත්‍රයා, නුඹේ 16
එකම පුත්‍රයා වළක්වා නොගෙන මේ
දෙය කළ බැවින් මම ඒකාන්තයෙන්ම 17
නුඹට ආශීර්වාද කරන්නෙමි, අහසේ
තාරකා මෙන්ද මුහුදු වෙරළෙහි වැලි
මෙන්ද නුඹේ වංශය බොහෝසෙයින්
වැඩිකරන්නෙමි; නුඹේ වංශය තමන්
සතුරන්ගේ දොරටුව හිමිකරගන්නේය;
මාගේ ශබ්දයට නුඹ කීකරුවූ නිසා 18
නුඹේ වංශය කරණකොටගෙන
පොළොවේ සියලු ජාතීහු ආශීර්වාද
ලබන්නෝය කියා මා ගැනම දිවුළෙ-
මියි **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කීයේය. ආබ්‍රහම් තමාගේ තරුණයන් 19
වෙතට හැරී ආයේය, එවිට ඔව්හු
නැගිට බෙයර්-ෂෙබාට එක්ව ගියෝය;
ආබ්‍රහම් බෙයර්-ෂෙබාහි වාසය කෙළේය.

*එනම්–ස්වාමීන්වහන්සේ සපයාදෙනසේක, නොහොත් දක්නාසේක.

20 තවද මේ කාරණාවලට පසු: බලව,
මිල්කාත් තුඹේ සහෝදරවූ නාහෝර්
නිසා පුත්‍රයන් වැදුවායයි ආබ්‍රහම්ට
21 කියනලද්දේය; එනම්, ඔහුගේ කුලුඳුලාවූ
ඌශ්ද ඔහුගේ සහෝදරවූ බූශ්ද අරාම්ගේ
22 පියවූ කෙමුවෙල්ද, කෙසෙද්ද හශෝද
පිල්දෂ්ද ජීද්ලප්ද බෙතුයෙල්ද යන
23 මොව්හුය. බෙතුයෙල්ට දුව රෙබෙකා
උපන්නාය. මිල්කා මේ අට දෙන
ආබ්‍රහම්ගේ සහෝදරවූ නාහෝර් නිසා
24 වැදුවාය. රෙයුමා නම්වූ ඔහුගේ
උපභාර්යාවත් තෙබාද ගහම්ද තහෂ්ද
මාකාද වැදුවාය.

## සාරාගේ මරණය සහ භූමදානය

**23** සාරාගේ ජීවිත කාලය එකසිය
විසිහත් අවුරුද්දකි. මේවා
2 සාරාගේ ජීවිතයේ අවුරුදුය. සාරා
කානාන් දේශයෙහිවූ කිර්යත්-අර්භාහිදී
මළාය. ඒ වනාහි හෙබ්‍රොන් නම්
ස්ථානයය. එවිට ආබ්‍රහම් සාරා
නිසා වැලපෙන්ටත් හඬන්ටත් ආයේය.
3 ආබ්‍රහම් තමාගේ මළ තැනැත්තිය
ඉදිරියෙන් නැගිට හෙත්ගේ පුත්‍රයන්ට
4 කථාකරමින්: මම තුඹලා අතරෙහි
විදේශියෙක් හා ආගන්තුකයෙක් ව සිටිමි.
මාගේ මළ තැනැත්තිය මා ඉදිරියෙන්
වළලන පිණිස තුඹලා අතරෙහි මට
උරුමවන ලෙස සොහොන්පළක් දුන-
5 මැනවයි කීය. හෙත්ගේ පුත්‍රයෝ ආබ්‍රහම්ට
6 උත්තර දෙමින්: මාගේ ස්වාමීනි, අපේ
බස් ඇසුව මැනවි. ඔබ අප අතරෙහි
බලසම්පන්න අධිපතියෙක්ය. අපේ
සොහොන්පළවලින් ඉතා උතුම් එකක
ඔබගේ මළ තැනැත්තිය වැළලුව මැනවි;
ඔබ විසින් ඔබගේ මළ තැනැත්තිය
තැන්පත් කරන පිණිස අපගෙන් කිසිවෙක්
තමාගේ සොහොන්පළ නොවළක්වන්-
7 නේයයි කීවෝය. එවිට ආබ්‍රහම් නැගිට
ඒ රටේ සෙනඟට එනම් හෙත්ගේ පුත්‍රයන්ට
8 නැමී ආචාරකොට ඔවුන් සමග
කථාකරමින්: මා විසින් මාගේ මළ
තැනැත්තිය මා ඉදිරියෙන් වළලනවාට
තුඹලා කැමැත්තනුනම් මාගේ බස් අසා
ශොහර්ගේ පුත්‍රවූ එප්‍රොන්ගේ කෙතෙහි 9
කෙළවර තිබෙන තමා සන්තකවූ
මක්පේලායේ ගුහාව මට දෙන ලෙස
මා වෙනුවෙන් ඔහුගෙන් ඉල්ලුව මැනවි;
තුඹලා අතරෙහි මට හිමිවූ සොහොන්-
පළක් පිණිස එය වටින මිල ගණනට
ඔහු මට දේවයි කීවේය. එප්‍රොන් 10
හෙත්ගේ පුත්‍රයන් අතරෙහි හිඳගෙන
උන්නේය. එවිට හිත්තියවූ එප්‍රොන්
හෙත්ගේ පුත්‍රයන් එනම් තමන් නුවර
දොරටුවෙන් ඇතුල් වෙන්නාවූ සියල්ලන්
අසාගෙන සිටියදී ආබ්‍රහම්ට උත්තර
දෙමින්: මාගේ ස්වාමීනි, එසේ නො- 11
වේවා, මාගේ බස් ඇසුව මැනවි. ඒ
කෙත ඔබට දෙමි, එහි තිබෙන ගුහාවද
ඔබට දෙමි; මාගේ සෙනඟගේ
පුත්‍රයන් ඉදිරියෙහිදී මම ඒක ඔබට
දෙමි. ඔබගේ මළ තැනැත්තිය තැන්පත්-
කළ මැනවයි කීයේය. ආබ්‍රහම්ද 12
ඒ දේශයේ සෙනඟට නැමී ආචාර-
කොට, දේශයේ සෙනඟ අසාගෙන සිටියදී 13
එප්‍රොන්ට කථාකරමින්: ඔබ කරුණාකර
මාගේ බස් ඇසුව මැනවි. කෙතට මිල
දෙමි; එය මාගෙන් පිළිගත මැනවි, එවිට
එහි මාගේ මළ තැනැත්තිය වළලමියි
කීය. එප්‍රොන්ද ආබ්‍රහම්ට උත්තරදෙමින්: 14
මාගේ ස්වාමීනි, මාගේ බස් ඇසුව මැනවි. 15
රිදී ෂෙකෙල් හාරසියයක් වටින බිම්
කැබැල්ලක් මා සහ ඔබ අතරෙහි
මොකක්ද? එබැවින් ඔබගේ මළ අය
තැන්පත් කළ මැනවයි ඔහුට කීවේය.
ආබ්‍රහම් එප්‍රොන්ට ඇහුම්කන්දී, ඔහු 16
හෙත්ගේ පුත්‍රයන් අසාගෙන සිටියදී
ඔහු කී මිල එනම් වෙළඳුන් අතරෙහි වලංගුවූ
රිදී ෂෙකෙල් හාරසියයක් ඔහුට කිරා
දුන්නේය. මෙසේ මම්රේ ඉදිරිපිට 17
මක්පේලායෙහි තිබුණු එප්‍රොන්ගේ කෙතද
එහිවූ ගුහාවද කෙතෙහිත් වටකර සියලු
සීමාවලත් තිබුණු සියලු ගස්ද හෙත්ගේ
පුත්‍රයන් ඉදිරියෙහි, ඔහුගේ නුවර 18
දොරටුවෙන් ඇතුල්වුණාවූ සියල්ලන්
ඉදිරියෙහි, ආබ්‍රහම්ට අයිතියක් වශයෙන්

19 ස්ථිර කරන ලද්දේය. ඉන්පසු ආබ්‍රහම්
තම භාර්යාවවූ සාරා කානාන් දේශයෙහි
මම්රේ (එනම් හෙබ්‍රොන්) ඉදිරිපිට
මක්පේලායේ කෙතේ ගුහාවෙහි තැන්පත්-
20 කෙළේය. කෙත සහ එහි ඇති ගුහාවද
සොහොන්පළක් මෙන් අයිති වන පිණිස
හෙත්ගේ පුත්‍රයන් විසින් ආබ්‍රහම්ට
ස්ථිරකරනලද්දේය.

## ඊසාක්ට භාර්යාවක් සොයාගැනීම

24 ආබ්‍රහම් මහලුව වයෝවෘද්ධව
සිටියේය. **ස්වාමීන්වහන්සේ**
සියල්ලෙහි ආබ්‍රහම්ට ආශීර්වාදකර
2 තිබුණේය. ආබ්‍රහම්ද තමා සන්තක
සියල්ලට මූලිකකම් කළාවූ තමාගේ
ගෙදර වැඩිමහල් මෙහෙකරුවාට කථා-
3 කොට: මා වාසය කරන දේශයෙහි
කානානිවරුන්ගේ දූවරුන්ගෙන් නුඹ
මාගේ පුත්‍රයාට භාර්යාවක් නොගෙන
4 මාගේම දේශයටද මාගේම නෑයන්
වෙතටද ගොස් මාගේ පුත්‍රවූ ඊසාක්ට
භාර්යාවක් ගන්නා හැටියට ස්වර්ග-
යේ දෙවියන්වහන්සේද පොළොවේ
දෙවියන්වහන්සේද වූ **ස්වාමීන්වහන්සේ**
ගැන මා විසින් නුඹ දිවුරවන පිණිස
නුඹේ අත මාගේ කළවය යට තබාපන්-
5 නැයි කීයේය. එවිට මෙහෙකරුවා
ඔහුට කථාකර: සමහරවිට ඒ ස්ත්‍රී මා
කැටුව මේ දේශයට එන්ට අකැමති
වන්නීය. එසේවීනම් ඔබ පිටත්ව ආවාවූ
දේශයට මා විසින් ඔබගේ පුත්‍රයා නැවත
6 ගෙන යා යුතුදැයි ඔහුට කීය. ආබ්‍රහම්ද:
නුඹ මාගේ පුත්‍රයා නැවත එහි
7 ගෙන නොයන්ට බලාගනින්න. මාගේ
පියාණන්ගේ ගෙදරින්ද මා උපන්
දේශයෙන්ද මා ගෙනාවාවූ, මේ දේශය
නුඹේ වංශයට දෙන්නෙමියි කියා මට
කීවාවූ මට දිවුළාවූ ස්වර්ගයේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේම** තමන්වහන්සේගේ
දූතයා නුඹට පෙරටුව යවනසේක; නුඹ
එතැනින් මාගේ පුත්‍රයාට භාර්යාවක්
8 ගෙනෙන්නෙහිය. නුමුත් ස්ත්‍රී නුඹ කැටුව
එන්ට අකමැතිවී නම් නුඹ මාගේ
මේ දිවුරුමෙන් නිදහස් වන්නෙහිය;
එහෙත් මාගේ පුත්‍රයා එහි නැවත
ගෙනනොයන්නැයි කීවේය. මෙහෙකරුවා 9
තමාගේ ස්වාමිවූ ආබ්‍රහම්ගේ කළවය
යට අත තබා මේ කාරණය ගැන
ඔහුට දිවුරුම් දුන්නේය. එවිට මෙහෙ- 10
කරුතෙමේ ස්වාමියාගේ ඔටුවන්ගෙන්
දසදෙනෙකු රැගෙන පිටත්ව ගියේය;
ඔහුගේ ස්වාමියාගේ සියලු වස්තුව
ඔහුගේ අත යටතෙහි වූයේය. ඔහු
පිටත්වී මෙසොපොතාමියේ නාහෝර්ගේ
නුවරට ගියේය. සවස් වේලෙහි, 11
ස්ත්‍රීන් වතුර අදින පිණිස නික්ම යන
වේලෙහි, ඔහු නුවරින් පිටත වතුර ළිඳ
ළඟ තමාගේ ඔටුවන් දණගැස්සෙවුවේය.
ඔහු කථාකොට: මාගේ ස්වාමියාවූ 12
ආබ්‍රහම්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්ස**, මේ
දවසෙහි මාගේ ගමන සඵලකරමින්
මාගේ ස්වාමිවූ ආබ්‍රහම්ට කරුණාව
පෙන්නුව මැනව. බැලුව මැනව, මම දිය 13
උල්පත ළඟ සිටිමි; නුවර මනුෂ්‍යයන්ගේ
දූවරු වතුර අදින පිණිස නික්ම එති.
මට බොන පිණිස නුඹේ කළය පහත්කර- 14
පන්නැයි මම යම් තරුණියකට කීවාමෙ:
බීපන්න, නුඹේ ඔටුවන්ටත් බොන්ට
දෙමියි කියන්නාවූ ඕතොමෝ ඔබගේ
මෙහෙකරුවූ ඊසාක්ට ඔබවහන්සේ
නියම කළ තැනැත්තී වේවා; මාගේ
ස්වාමියා කෙරෙහි ඔබවහන්සේ
කරුණාව පෙන්වූ බව එයින් දැනගන්නෙමියි
කීය. තවද ඔහු කථාකොට නිමවන්ට 15
පළමුවෙන්, බලව, ආබ්‍රහම්ගේ සහෝදර
නාහෝර්ගේ භාර්යාවවූ මිල්කාගේ පුත්‍රවූ
බෙතුයෙල් නිසා උපන්නාවූ රෙබෙකා
ඇගේ කරේ කළය තබාගෙන පිටතට
ආවාය. ඒ තරුණී ඉතා ශෝභන 16
පෙනීමක් ඇත්තියක්ය, කන්‍යාවක්ය, ඈ
පුරුෂයෙකු නොහැඳින සිටියාය. ඈ
උල්පත ළඟට බැස කළය පුරවාගෙන
ගොඩට ආවාය. මෙහෙකරුවා ඈ 17
ඉදිරියට දිව ගොස්: නුඹේ කළයෙන්
වතුර ටිකක් බොන්නට දියන්නැයි කීය.

18 ඇද: මාගේ ස්වාමීනි, බිව මැනවියි කියා
ඇගේ කළය ඉක්මනින් අත පිටට ගෙන
19 ඔහුට බොන්ට දුන්නාය. ඈ ඔහුට
බොන්ට දුන් පසු: ඔබගේ ඔටුවන්ද
බී නිමවන තෙක් උන්ටත් ඇද දෙන්නෙමියි
20 කීවාය. ඈ ඉක්මන්කොට ඇගේ වතුර
කළය ඔරුවේ වත්කොට අදින පිණිස
නැවත ළිඳට දිව ගොස් ඔහුගේ සියලු
21 ඔටුවන්ටත් වතුර ඇද්දය. ඒ මනුෂ්‍යයා
ඈ දෙස ඕනෑකමින් බලා **ස්වාමීන්-**
**වහන්සේ** තමාගේ ගමන සඵලකළ-
සේක්ද නැද්දැයි දැනගන්නා පිණිස
22 නිශ්ශබ්දව සිටියේය. තවද ඔටුවන් වතුර
බී නිමවූ කල්හි ඒ මනුෂ්‍යයා ෂෙකෙල්
බාගයක් බර ඇති රන් නාසාභරණයක්ද
ඇගේ අත්වලට ෂෙකෙල් දසයක් බර
ඇති රන් වළලු දෙකක්ද රැගෙන දී:
23 නුඹ කාගේ දියණියෝදැයි මට කියන
ලෙස ඉල්ලමි. අපට නවාතැන් ගන්ට
නුඹේ පියාණන්ගේ ගෙදර ඉඩ ඇද්දැයි
24 කීය. ඇද: මම වනාහි නාහෝර් නිසා
මිල්කා වැදූ පුත්‍රයාවූ බෙතුයෙල්ගේ
25 දූවයයි ඔහුට කීවාය. තවද: අප ළඟ
සෑහෙන පමණ පිදුරුත් ගෝවරත්
නවාතැනට ඉඩත් තිබෙනවායයි ඈ
26 ඔහුට කීවාය. ඒ මනුෂ්‍යයා හිස නමා
**ස්වාමීන්වහන්සේට** නමස්කාරකොට:
27 මාගේ ස්වාමිවූ ආබ්‍රහම්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා වේවා,
මක්නිසාද උන්වහන්සේ තමන්ගේ
කරුණාවත් සැබෑකමත් මාගේ ස්වාමියා
වෙතින් අත්නොහළසේක. මා වනාහි
මාර්ගයේ සිටියදී **ස්වාමීන්වහන්සේ**
මාගේ ස්වාමියාගේ සහෝදරයන්ගේ
28 ගෙදරට මා පැමිණෙවූසේකැයි කීය. ඒ
තරුණී දිවගොස් ඇගේ මවුගේ ගෙදර
සිටියවුන්ට මේ කාරණා කීවාය.
29 රෙබෙකාට ලාබන් නම්වූ සහෝදරයෙක්
සිටියේය. ලාබන් වනාහි උල්පත ළඟ
පිටත සිටි මනුෂ්‍යයා වෙතට දිව ගියේය.
30 ඔහු නාසාභරණයද තමාගේ සහෝදරීගේ
අත්වල තිබෙන වළලුද දැක: ඒ මනුෂ්‍යයා
මට මෙලෙස කථාකෙළේය කියා තමාගේ
සහෝදරීවූ රෙබෙකා කී වචන ඇසූ
කල ඒ මනුෂ්‍යයා වෙතට ගියේය; බලව්,
ඔහු උල්පත ළඟ ඔටුවන් වෙත සිටියේය.
ඔහු: **ස්වාමීන්වහන්සේගෙන්** ආශීර්වාදලත් 31
තැනැත්ත, ඇතුළට එන්න; පිටත සිටින්නේ
මන්ද? මම ගෙයද ඔටුවන්ට ඉඩම්ද
සූදනම්කෙළෙමියි කීවේය. ඒ මනුෂ්‍යයා 32
ගෙට ඇතුල්ව ඔටුවන්ගේ පටි මිදුවේය;
ලාබන් ඔටුවන්ට පිදුරුත් ගෝවරත්
ඔහුගේ පාදද ඔහු සමග සිටිය
මනුෂ්‍යයන්ගේ පාදද සෝදන්ට වතුරත්
දුන්නේය. කන පිණිස ඔහු ඉදිරියෙහි 33
කෑමද තබනලද්දේය. එහෙත් ඔහු: මාගේ
කාරණය කියන තුරු නොකන්නෙමියි
කීය. ඔහුද: කියන්නැයි කීය. එවිට 34
ඔහු: මම ආබ්‍රහම්ගේ මෙහෙකරු වෙමි.
**ස්වාමීන්වහන්සේ** මාගේ ස්වාමියාට 35
බොහෝසෙයින් ආශීර්වාදකළසේක;
ඔහු උත්තමයෙක් වී සිටියි. උන්වහන්සේ
ඔහුට එළු බැටළු රැළවල් සහ ගව රැළවල්ද
රිදී සහ රත්රන්ද දසයන් සහ දාසීන්ද
ඔටුවන් සහ කොටළුවන්ද දී තිබේ.
මාගේ ස්වාමියාගේ භාර්යාවවූ සාරා 36
තමාගේ මහලු වයසෙහිදී මාගේ
ස්වාමියා නිසා පුත්‍රයෙකු වැදූවාය. ඔහු
තමන් සන්තක සියල්ල ඔහුට දී තිබේ.
තවද මාගේ ස්වාමියා—මා වසන රටෙහි 37
කානානිවරුන්ගේ දූවරුන්ගෙන් නුඹ
මාගේ පුත්‍රයාට භාර්යාවක් නොගෙන
මාගේ පියාණන්ගේ ගෙටද මාගේ 38
නෑයන් වෙතටද ගොස් මාගේ පුත්‍රයාට
භාර්යාවක් ගනින්න කියා මා දිවුරෙවූ-
වේය. මමද: ඒ ස්ත්‍රී සමහරවිට මා 39
කැටුව නොඑන්නීයයි මාගේ ස්වාමියාට
කීයෙමි. එවිට ඔහු මට කථාකොට: 40
මා සේවය කරන්නාවූ **ස්වාමීන්-**
**වහන්සේ** තමන්ගේ දූතයා නුඹ සමග
යවා නුඹේ ගමන සඵලකරනසේක;
නුඹ මාගේ පුත්‍රයාට මාගේ නෑයන්ගෙන්ද
මාගේ පියාණන්ගේ ගෙයින්ද භාර්-
යාවක් ගනින්න. මාගේ නෑයන් වෙතට 41
පැමිණි කල්හි නුඹ මාගේ දිවුරුමෙන්
නිදහස්වන්නෙහිය; ඔවුන් නුඹට ඇය

නොදෙනවා නම් නුඹ මාගේ දිවුරුමෙන්
42 නිදහස් වන්නෙහියයි කීවේය. ඒ හැටියට
අද මම උල්පත ළඟට අවුත්: මාගේ
ස්වාමියා වන ආබ්‍රහම්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබවහන්සේ මා යන
ගමන සඵලකරනසේක් නම් මෙසේ
43 වේවා: මෙන්න, මම උල්පත ළඟ සිටිමි;
වතුර අදින පිණිස පිටතට එන්නාවූ:
නුඹේ කළයෙන් වතුර ටිකක් බොන්ට
මට දියන්නැයි මා කියන විට—බීපන්න,
44 නුඹේ ඔටුවන්ටත් ඇදදෙන්නෙමියි
කියන්නාවූ කන්‍යාව **ස්වාමීන්වහන්සේ**
විසින් මාගේ ස්වාමියාගේ පුත්‍රයාට
45 නියමකළ ස්ත්‍රීම වේවයි කීමි. මා විසින්
මාගේ සිත තුළ කථාකර නිමවෙන්ට
පළමුවෙන් රෙබෙකා ඇගේ කරේ කළය
තබාගෙන ඇවිත් උල්පත ළඟට බැස
වතුර ඇද්දය. එවිට: මට බොන්ට
46 දෙන්නැයි ඇට කීමි. ඈද ඉක්මනින්
කළය ඇගේ කරෙන් පහත්කොට:
බොන්න, නුඹේ ඔටුවන්ටත් බොන්ට
දෙන්නෙමියි කීවාය. එවිට මම බීවෙමි,
47 ඈ ඔටුවන්ටත් පෙවුවාය. මමද: නුඹ
කාගේ දියණියෝද්දයි ඇගෙන් ඇසු-
වෙමි. ඈ: මිල්කා නාහෝර් නිසා වැදූ
පුත්‍රවූ බෙතුයෙල්ගේ දුවයයි කීවාය. එවිට
මම නාසාභරණය ඇගේ නාසයෙහිද
48 වළලු ඇගේ අත්වලද දැමුවෙමි. තවද
මම මාගේ හිස නමා **ස්වාමීන්වහන්සේට**
නමස්කාරකොට, මාගේ ස්වාමියාගේ
පුත්‍රයාට ඔහුගේ සහෝදරයාගේ
දියණිය ලබාගන්න පිණිස හරි
මාර්ගයෙහි මා ගෙනාවාවූ, මාගේ
ස්වාමියා වන ආබ්‍රහම්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා කෙළෙමි.
49 ඉදින් නුඹලා මාගේ ස්වාමියාට
කරුණාවෙන්ද අවංකකමෙන්ද ක්‍රියා-
කරන්නහු නම් මට කියාපල්ලා;
නැතහොත් මා විසින් දකුණට හෝ
වමට හෝ හැරෙන පිණිස මට
50 කියාපල්ලා යයි කීය. එවිට ලාබන්
සහ බෙතුයෙල් උත්තරදෙමින්: මේ වනාහි
**ස්වාමීන්වහන්සේ** කෙරෙන් පැමිණි
කාරණයකි. නරකක්වත් හොඳක්වත්
නුඹට කියන්ට අපට නුපුළුවන. මෙන්න, 51
රෙබෙකා නුඹ ඉදිරියෙහිය, ඈ කැඳවා-
ගෙන පලයන්න, **ස්වාමීන්වහන්සේ**
කී ලෙස ඈ නුඹේ ස්වාමියාගේ පුත්‍රයාගේ
භාර්යාව වේවයි කීවෝය. ආබ්‍රහම්ගේ 52
මෙහෙකරු තෙමේ ඔවුන්ගේ වචන
ඇසූ විට බිමට නැමී **ස්වාමීන්වහන්සේට**
නමස්කාර කෙළේය. මෙහෙකරුවා රිදී 53
ආභරණද රන් ආභරණද වස්ත්‍රද
ගෙනවුත් රෙබෙකාට දුන්නේය. තවද
ඔහු ඇගේ සහෝදරයාටත් මවුටත්
අනර්ඝ දේවල් දුන්නේය. ඔවුන්, එනම්, 54
ඔහු සහ ඔහු සමග සිටි මිනිසුන් කා බී
මුළු රාත්‍රියෙහි නැවතී උදය නැගුණු
විට: මාගේ ස්වාමියා වෙතට මා යන්ට
හැරපල්ලායයි ඔහු කීවේය. ඇගේ 55
සහෝදරයාද මවුද: තරුණී ටික දවසක්,
දස දවසක්වත්, අප සමග සිටීවා; ඉන්පසු
යන්ට පුළුවනැයි කීවෝය. **ස්වාමීන්-** 56
**වහන්සේ** මාගේ ගමන සඵලකළ බැවින්
මා ප්‍රමාද නොකර මාගේ ස්වාමියා
වෙතට යන පිණිස මා හැරපල්ලායයි
ඔහු ඔවුන්ට කීය. තරුණියට අඬගසා 57
ඇගෙන්ම විචාරන්නෙමුයයි ඔව්හු
කීවෝය. එලෙස ඔව්හු රෙබෙකාට 58
අඬගසා: නුඹ මේ මනුෂ්‍යයා කැටුව
යන්නෙහිදයි ඇසුවෝය. යන්නෙමියි
ඈ කීවාය. එවිට ඔව්හු තමන්ගේ 59
සහෝදරීවූ රෙබෙකාද ඇගේ කිරි
මවුද ආබ්‍රහම්ගේ මෙහෙකරුවාද ඔහුගේ
මිනිසුන්ද පිටත් කළෝය. ඔව්හු 60
රෙබෙකාට ආශීර්වාදකරමින්: අපගේ
සහෝදරිය, නුඹ දහස්වර - දසදහස්
ගණනකගේ මෑණියෝ වෙයන්න, නුඹේ
වංශය තමන්ට වෛරකරන්නවුන්ගේ
දොරටුව හිමිකර ගනීවයි කීවෝය.
රෙබෙකාද ඇගේ තරුණියෝද නැගිට 61
ඔටුවන් පිට නැගී ඒ මනුෂ්‍යයා කැටුව
ගියෝය. මෙහෙකරුවා රෙබෙකා
කැඳවාගෙන ගියේය. ඊසාක් බෙයර්- 62
ලහයි-රොයිට යන පාරෙන් ආයේය;
මක්නිසාද ඔහු දකුණු දේශයෙහි
විසුවේය. ඊසාක් සවස් වේලෙහි කෙතේ 63
මෙනෙහි කරන පිණිස ගියේය. තවද

ඔහු ඇස් ඔසවා බලා, ඔටුවන් එනවා
64 දුටුවේය. රෙබෙකාද ඇස් ඔසවා බලා
65 ඊසාක් දැක ඔටුවා පිටින් බැස්සාය. අර
කෙතේ අප ඉදිරියට එන්නාවූ මේ
මනුෂ්‍යයා කවුදැයි ඈ මෙහෙකරුවාගෙන්
ඇසුවාය. ඒ මාගේ ස්වාමියායයි
මෙහෙකරුවා කීය. එවිට ඈ තමාගේ
වැස්ම රැගෙන මුහුණ වසාගත්තාය.
66 මෙහෙකරුවා තමා කළාවූ සියල්ල
67 ඊසාක්ට කීවේය. ඊසාක් තමාගේ මවුවූ
සාරාගේ කූඩාරමට රෙබෙකා ගෙනවුත්
ඈ පාවාගත්තේය; ඈ ඔහුගේ භාර්යාව
වූවාය; ඔහු ඈට ප්‍රේමකෙළේය. ඊසාක්
තමාගේ මවුගේ මරණයෙන් පසු මෙසේ
සැනසුණේය.

## ආබ්‍රහම්ගේ තවත් පුත්‍රයෝ. ඔහුගේ මරණය

25 ආබ්‍රහම් නව භාර්යාවකු පාවා-
ගත්තේය, ඇගේ නාමය කෙතූරාය,
2 ඈ ඔහු නිසා ශිම්රාම්ද යොක්ෂාන්ද
මෙදන්ද මිදියාන්ද ඉෂ්බාක්ද ෂූවාද
3 වැදුවාය. යොක්ෂාන්ට දව ෂෙබාද
දෙදන්ද උපන්නෝය. දෙදන්ගේ පුත්‍රයෝ:
අෂූරිවරුත් ලෙතූසිවරුත් ලෙයුම්මිවරුත්ය.
4 මිදියාන්ගේ පුත්‍රයෝ: ඒඵාද ඒඵෙර්ද
හනොක්ද අබීදද එල්දයාද යන මොව්හුය.
මේ සියල්ලෝ කෙතූරාගේ දරුවෝය.
5 ආබ්‍රහම් තමා සන්තක සියල්ල ඊසාක්ට
6 දුන්නේය. නුමුත් ආබ්‍රහම්ට සිටිය උප
භාර්යාවන්ගේ පුත්‍රයන්ට ආබ්‍රහම් තෑගි
දී ඔහු ජීවත්ව සිටි කල්හිම තමාගේ
පුත්‍රවූ ඊසාක් කෙරෙන් ඔවුන් අහක්කර
නැගෙනහිර දෙසට එනම් පෙරදිග රටට
7 යන්ට හැරියේය. ආබ්‍රහම් ජීවත්ව සිටිය
ඔහුගේ ජීවිතයේ අවුරුදු ගණන නම්
8 එක්සිය සැත්තෑ පස් අවුරුද්දකි. ආබ්‍රහම්
හොඳ මහලු වයසේදී, වෘද්ධයෙක්ව,
වයසින් පූර්ණව, ප්‍රාණය හැර නැසී
9 තමාගේ සෙනඟට එකතුවුණේය. ඔහුගේ
පුත්‍රයෝවූ ඊසාක්ද ඉෂ්මායෙල්ද මම්රේ
ඉදිරියෙහි හිත්තීය සොහර්ගේ පුත්‍රවූ
එප්‍රොන්ගේ කෙතෙහි මක්පේලා ගුහාවෙහි
10 ඔහු තැන්පත්කළෝය; ඒක ආබ්‍රහම්
හෙත්ගේ පුත්‍රයන්ගෙන් මිලේට ගත්තාවූ
කෙතය. එහි ආබ්‍රහම්ද ඔහුගේ භාර්යාවවූ
සාරාද තැන්පත් කරනලද්දෝය. තවද 11
දෙවියන්වහන්සේ ආබ්‍රහම්ගේ මරණින්
පසු ඔහුගේ පුත්‍රවූ ඊසාක්ට ආශීර්වාද
කළසේක; ඊසාක් බෙයර්-ලහයි-රොයි
ළඟ වාසයකෙළේය.

## ඉෂ්මායෙල්ගේ වංශය

සාරාගේ දාසීවූ මිසරීය හාගර් ආබ්‍රහම් 12
නිසා වැදූ ආබ්‍රහම්ගේ පුත් ඉෂ්මායෙල්ගේ
පරම්පරා නම් මේය. තම තමන්ගේ 13
පරම්පරා ලෙස, නම් වශයෙන්
ඉෂ්මායෙල්ගේ පුත්‍රයින්ගේ නාම නම්:
ඉෂ්මායෙල්ගේ කුලුඳුලාවූ නෙබායොත්ය;
කේදාර්, අද්බෙයෙල්, මිබ්සාම්, මිෂ්මා, 14
දූමා සහ මස්සාය; හදද්, තේමා, යෙතූර්, 15
නාපීෂ් සහ කේදෙමාය. මොව්හු 16
ඉෂ්මායෙල්ගේ පුත්‍රයෝය, මොවුන්ගේ
ගම් සහ කඳවුරු ප්‍රකාරයට මොවුන්ගේ
නම් මේය; මොව්හු ස්වකීය ජාති
ප්‍රකාරයට අධිපතියෝ දොළොස් දෙනෙක්
වූහ. ඉෂ්මායෙල්ගේ ජීවිතයේ අවුරුදු 17
ගණන නම් එකසිය තිස් හත්
අවුරුද්දක්ය. ඔහු ප්‍රාණය හැර නැසී
තම සෙනඟට එකතු වුණේය. ඔව්හු 18
හවිලාවේ පටන් අෂූර්ට යන මාර්ගයෙහි
මිසරය ඉදිරියෙහි වූ ෂූර් දක්වා වාසය-
කළෝය. ඔහු තමාගේ සියලු සහෝ-
දරයන් ඉදිරියෙහි විසීය.

## ඊසාක්ගේ වංශය

ආබ්‍රහම්ගේ පුත්‍රවූ ඊසාක්ගේ පරම්පරාව 19
නම් මේය: ආබ්‍රහම්ට දාව ඊසාක්
උපන්නේය. ඊසාක් පදන්-ආරාමේ 20
සිරිය බෙතුයෙල්ගේ දූවූ සිරිය ලාබන්ගේ
සහෝදරීවූ රෙබෙකා තම භාර්යාව
කොට පාවාගත් කල්හි හතළිස් අවුරුදු
වයස් විය. ඊසාක් තමාගේ භාර්යාව 21
වඳ බැවින් ඈ උදෙසා **ස්වාමීන්-
වහන්සේට** කන්නලව් කෙළේය. **ස්වාමීන්-
වහන්සේ** ඔහුගේ කන්නලව්ව පිළිගත්-
සේක, ඔහුගේ භාර්යාවවූ රෙබෙකා

ගර්භිණී වූවාය. දරුවෝද ඇගේ කුසෙහි
22 එකට දඟලුවෝය. එවිට ඈ: මෙහෙම
නම් මම මක්නිසා ජීවත්වෙම්දැයි කීවාය.
ඈ **ස්වාමීන්වහන්සේගෙන්** විචාරන
23 පිණිස ගියාය. **ස්වාමීන්වහන්සේ**:
තුඹේ කුසේ ජාති දෙකක් සිටිති,
සෙනඟ දෙ වර්ගයක් තුඹේ උදරයෙන්
බෙදී යන්නෝය.
එක් සෙනඟක් අනික් සෙනඟට වඩා
බලවත් වන්නේය;
වැඩිමලා බාලයාට
මෙහෙකරන්නේයයි
24 ඈට කීසේක. ඇගේ වදන කාලය
සම්පූර්ණවූ කල, බලව, ඇගේ කුසෙහි
25 දරු දෙදෙනෙක් වූවෝය. ප්‍රථමයා රතුව
සහමුලින්ම රෝම වස්ත්‍රයක් මෙන්
රෝමවලින් වැසී බිහිවිය; ඔහුට ඒසව්
26 යන නාමය තැබුවෝය. ඊට පසුව
ඔහුගේ සහෝදරයා බිහිවිය, ඔහු
වනාහි තමාගේ අතින් ඒසව්ගේ විලුඹ
අල්වාගෙන සිටියේය; ඔහුට යාකොබ්
යන නම තබනලද්දේය. ඈ ඔවුන්
වැදූ කල ඊසාක් සැට අවුරුද්දක් වයස්ව
27 සිටියේය. දරුවෝ වැඩුණාහ. ඒසව්
හපන් දඩයක්කාරයෙක් ව වනයේ
මනුෂ්‍යයෙක් ව සිටියේය; යාකොබ්
කූඩාරම්වල වසන නිශ්චල මනුෂ්‍යයෙක්
28 විය. ඊසාක් ඒසව්ට ආදරේ වුණේය,
මක්නිසාද ඔහු ඒසව්ගේ මුව මස්
කෑයේය. එහෙත් රෙබෙකා යාකොබ්ට
29 ආදරේ වුණාය. යාකොබ් කෑමක්
පිසමින් සිටිය විට ඒසව් වනයේ සිට
30 ක්ලාන්තව අවුත්: මම ක්ලාන්තව සිටිමි,
එබැවින් ඔය රතුපාට කෑමෙන් ටිකක්
මට දියන්නැයි යාකොබ්ට කීය. එබැවින්
31 ඔහුගේ නම ඒදෙම් වූයේය. එවිට
යාකොබ්: තුඹේ කුලුඳුල්කම අද මට
32 විකුණාපන්නැයි කීය. ඒසව්ද: බලව,
මම මරණාසන්නව සිටිමි. මේ කුලුඳුල්-
කමෙන් මට කවර ප්‍රයෝජනයක්
33 වන්නේදැයි කීය. අද මට දිවුරුම්
දියන්නැයි යාකොබ් කීය; ඔහු යාකොබ්ට
දිවුරුම් දී ඔහුගේ කුලුඳුල්කම යාකොබ්ට
වික්කේය. එවිට යාකොබ් රොටිද 34
කොල්ලු ව්‍යංජනද ඒසව්ට දුන්නේය;
ඔහු කා බී නැගිට ගියේය. මෙසේ ඒසව්
තමාගේ කුලුඳුල්කම සුළු කෙළේය.

## ඊසාක් අබිමෙලෙක් වෙත ගෙරාර්හි විසීම

26 ආබ්‍රහම්ගේ දවස්වලදී වූ
පළමුවෙනි සාගතය හැර තවත්
සාගතයක් දේශයෙහි විය. ඊසාක්
පිලිස්තිවරුන්ගේ රජවූ අබිමෙලෙක්
වෙතට ගෙරාර්ට ගියේය. **ස්වාමීන්-** 2
**වහන්සේ** ඔහුට පෙනී: මිසරයට
නොගොස් මා විසින් තුඹට කියන
දේශයෙහි වාසයකරපන්න, මේ දේශයෙහි
විදේශීව සිටපන්න, මම තුඹ සමග සිට 3
තුඹට ආශීර්වාදකරන්නෙමි; මක්නිසාද
මම තුඹටද තුඹේ වංශයටද මේ සියලු
දේශයන් දෙන්නෙමි, මම තුඹේ පියවූ
ආබ්‍රහම්ට දිවුළ දිවිරීම ඉෂ්ටකරන්නෙමි;
ආබ්‍රහම් මාගේ හඬට කීකරුව මාගේ 4
නියමයද මාගේ ආඥද මාගේ පනත්ද
මාගේ ව්‍යවස්ථාද පැවැත්වූ හෙයින් තුඹේ 5
වංශය අහසේ තරු මෙන් වැඩිකර තුඹේ
වංශයට මේ සියලු දේශයන් දෙන්නෙමි.
තුඹේ වංශය කරණකොටගෙන
පොළොවේ සියලු ජාතීහු ආශීර්වාද
ලබන්නෝයයි කීසේක. ඊසාක් ගෙරාර්හි 6
වාසයකෙළේය. ඒ ස්ථානයේ මනුෂ්‍යයෝ 7
ඔහුගේ භාර්යාව ගැන ඔහුගෙන්
විචාළාහ; ඈ මාගේ සහෝදරීයයි ඔහු
කීය. රෙබෙකා දකීමට ශෝභන බැවින්:
ඇය නිසා ඒ ස්ථානයේ මනුෂ්‍යයන් මා
නොමරන පිණිසය කියා ඔහු—ඇය
මාගේ භාර්යාවයයි කියන්ට භයවුණේය.
ඔහු බොහෝ කලක් එහි වාසයකළ 8
පසු පිලිස්තිවරුන්ගේ රජවූ අබිමෙලෙක්
කවුළුවකින් බලා ඊසාක් තමාගේ
භාර්යාවවූ රෙබෙකාට ආදර කරනවා
දුටුවේය. අබිමෙලෙක් ඊසාක් කැඳවා: 9
සැබවින්ම ඈ තුඹේ භාර්යාවය. ඈ
මාගේ සහෝදරීයයි තුඹ කීවේ
කෙසේදැයි කීය. ඈ නිසා මා නොනසින

පිණිස කීයෙමියි ඊසාක් ඔහුට කීවේය.
10 අබිමෙලෙක්: නුඹ අපට කළ මේ දේ
කිමෙක්ද? සෙනඟගෙන් යමෙකුට
පහසුවෙන් නුඹේ භාර්යාව සමග
සයනයකළ හැකිව තිබුණේය, එවිට
නුඹ නිසා අප පිටට වරද පැමිණෙන්ට
11 තිබුණේයයි කීය. අබිමෙලෙක් තමාගේ
මුළු සෙනඟට අණකරමින්: මේ
මනුෂ්‍යයාටවත් ඔහුගේ භාර්යාවටවත්
අතගසන තැනැත්තේ ඒකාන්තයෙන්
12 මරනු ලබන්නේයයි කීයේය. ඊසාක් ඒ
දේශයෙහි බීජ වපුරා එම අවුරුද්දෙහිම
එකෙන් සියයක් අස්වැන්න ලැබුවේය.
**ස්වාමීන්වහන්සේ** ඔහුට ආශීර්වාදකළ-
13 සේක. ඒ මනුෂ්‍යයා පොහොසත් වී,
ඉතා පොහොසත් වන තුරු වඩ වඩාම
14 වර්ධනයවුණේය. ඔහුට එළු බැටළු
රැළවල්ද ගව රැළවල්ද බොහෝ ගෙයි
වැසියෝද සිටියෝය. පිලිස්තිවරු
15 ඔහුට ඊර්ෂ්‍යාකළෝය. ඔහුගේ පියවූ
ආබ්‍රහම්ගේ දවස්වලදී ඔහුගේ පියාගේ
වැඩකාරයන් විසින් හෑරූ සියලු ළිං
පිලිස්තිවරුන් විසින් පස් පුරවා වසාදමා
16 තිබුණේය. නුඹ අපට වඩා බොහෝ
බලවත් හෙයින් අප කෙරෙන් පලයන්නැයි
17 අබිමෙලෙක් ඊසාක්ට කීය. ඊසාක් එයින්
පිටත්ව ගොස් ගෙරාර් නම් මිටියාවතෙහි
කඳවුර පිහිටුවා එහි වාසයකෙළේය.
18 තවද තම පියවූ ආබ්‍රහම්ගේ දවස්වලදී
හාරනලද්දවූ, ආබ්‍රහම්ගේ මරණයෙන්
පසු පිලිස්තිවරුන් විසින් වසාදමා
තිබුණාවූ වතුර ඇති ළිං ඊසාක් නැවත
හාරා තමාගේ පියා තබා තිබුණාවූ
19 නාම ඒ ළිංවලට තැබුවේය. ඊසාක්ගේ
වැඩකාරයෝ මිටියාවතෙහි හාරා එහි
දිය උල්පත් ඇති ළිඳක් ලබාගත්තෝය.
20 එහෙත් ගෙරාර්හි එඬේරු: මේ වතුර
අපගේය කියමින් ඊසාක්ගේ එඬේරුන්
සමග විවාදකළෝය. ඔවුන් ඔහු හා
සමග විවාදකළ බැවින් ඔහු ඒ ළිඳට
21 *ඒසෙක් යන නම තැබීය. එවිට ඔව්හු
වෙන ළිඳක් හෑරුවෝය, ඔවුන් ඒ
ගැනත් විවාදකළ බැවින් ඔහු ඊට
†සිත්නායයි නම තැබීය. ඔහු එතනින් 22
ගොස් වෙන ළිඳක් හෑරුවේය; ඒ ගැන
ඔව්හු විවාදනොකළෝය. ඔහු ඊට
‡රෙහොබොත්යයි නම තැබීය; කුමක්-
හෙයින්ද: ඉතින් **ස්වාමීන්වහන්සේ** අපට
අවකාශ දුන් බැවින් අපි දේශයෙහි
සඵලවන්නෙමුයයි ඔහු කීවේය. ඔහු 23
එයින් බෙයර්-ෂෙබාට ගියේය. එම 24
රාත්‍රියෙහි **ස්වාමීන්වහන්සේ** ඔහුට පෙනී:
මම නුඹේ පියවූ ආබ්‍රහම්ගේ දෙවියන්-
වහන්සේය. භය නොවන්න, මක්නිසාද
නුඹ සමග සිටිමි, මම නුඹට ආශීර්-
වාදකර මාගේ මෙහෙකරුවූ ආබ්‍රහම්
නිසා නුඹේ වංශය වැඩිකරන්-
නෙමියි කීසේක. ඔහු එහි පූජාසනයක් 25
ගොඩනගා **ස්වාමීන්වහන්සේගේ** නාමය
කියා යාච්ඤාකෙළේය, ඔහු එහි තමාගේ
කූඩාරම පිහිටෙවුවේය. තවද ඊසාක්ගේ
වැඩකාරයෝ එහි ළිඳක් හෑරුවෝය.
එවිට අබිමෙලෙක්ද ඔහුගේ මිත්‍රයාවූ 26
අහුස්සත්ද ඔහුගේ සේනාපතිවූ පීකොල්ද
ගෙරාර්හි සිට ඔහු වෙතට ගියෝය.
ඊසාක්: නුඹලා මට වෛරකොට නුඹලා 27
වෙතින් මා යවාලාත් කුමක්හෙයින් මා
වෙතට ආවහුදැයි කීය. ඔව්හුද: **ස්වාමීන්-** 28
**වහන්සේ** නුඹ සමග සිටින බව අපි
පැහැදිලි ලෙස දුටිමු. එබැවින් අප
අතරෙහි එනම් අප සහ නුඹ අතරෙහි
දිවුරුමක් වේවා; අප නුඹට අත 29
නොගැසුවාක් මෙන්ද, නුඹට යහපතම
කර සමාදනයෙන් නුඹ යැවුවාක්
මෙන්ද, නුඹත් අපට කිසි හිංසාවක්
නොකරන ලෙස අපි නුඹ සමග
ගිවිසුමක් කරන්නෙමුයයි කීවෙමු; නුඹ
දැන් **ස්වාමීන්වහන්සේගෙන්** ආශීර්වාද
ලත් තැනැත්තේයයි කීවෝය. ඔහු ඔවුන්ට 30
මංගල්‍ය කෑමක් පිළියෙළ කෙළේය, ඔව්හුද
කෑවෝය, බීවෝය. අති උදය නැගිට 31
ඔව්හු එකිනෙකා සමග දිවුරාගත්තෝය.
ඊසාක් ඔවුන් පිටත්කෙළේය, ඔව්හු
සමාදනයෙන් ඔහු වෙතින් ගියෝය. තවද 32
එම දවසේ ඊසාක්ගේ වැඩකරුවෝ අවුත්
තමන් හෑරූ ළිඳ ගැන ඔහුට දන්වමින්:

*එනම්, තරඟය, විවාදය.

†එනම්, වෛරය. ‡එනම්, ඉඩ.

33 අපට වතුර සම්බවීයයි කීවෝය. ඔහු
ඊට ෂිබා යන නම තැබීය. එබැවින් ඒ
නුවර නම අද දක්වා බෙයර්-ෂෙබාය.
34 ඒසව් සතලිස් අවුරුදු වයස්වූ කල
හිත්තීය බෙයේරීගේ දූවූ යූදිත් හා හිත්තීය
ඒලොන්ගේ දූවූ බසෙමත්ද භාර්යාවන්
35 කොට පාවාගත්තේය. ඔව්හු ඊසාක්ටද
රෙබෙකාටද ශෝක හේතුවක් වූහ.

## ඒසව්ගේ ආශීර්වාදය යාකොබ් විසින් පැහැරගැනීම

27 තවද ඊසාක් මහලුව ඔහුගේ
ඇස් නොපෙනෙන ලෙස අඳුරුවූ
කල්හි තමාගේ වැඩිමල් පුත්‍රවූ ඒසව්
කැඳවා: මාගේ පුත්‍රයයි ඔහුට කීය.
2 ඔහුද: මම මෙහියයි කීවේය. එවිට
ඔහු කථාකොට: බලව, මම මහලුව
සිටිමි, මාගේ මරණයේ දවස නොදනිමි.
3 එබැවින් නුඹේ ආයුධ වන හීකොපුවත්
දුන්නත් රැගෙන වනයට ගොස් මට
4 මුව මස් ලබාගෙන, මට රුචිවූ රසවත්
කෑම සාදපන්න; මා එයින් කා, මැරෙන්ට
ප්‍රථමයෙන් මාගේ ආත්මය නුඹට
ආශීර්වාදකරන පිණිස ඒක මා ළඟට
5 ගෙනෙන්නැයි කීය. ඊසාක් තමාගේ පුත්‍රවූ
ඒසව්ට කථාකරන කල රෙබෙකාට
ඇසුණේය. ඒසව් දඩයම්කොට මුව මස්
6 ගෙනෙන පිණිස වනයට ගියේය. එවිට
රෙබෙකා ඇගේ පුත්‍රවූ යාකොබ්ට
කථාකරමින්: බලව, නුඹේ පියා—මා
විසින් කාලා මාගේ මරණයට ප්‍රථම-
යෙන් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි නුඹට
ආශීර්වාදකරන පිණිස මට මුව මස්
7 ගෙනවුත් රසවත් කෑම සාදපන්නැයි
නුඹේ සහෝදරවූ ඒසව්ට කියනවා
8 ඇසීමි. එබැවින් මාගේ පුත්‍රය, මා නුඹට
අණකරන කාරණය ගැන මාගේ හඬට
9 කීකරුවෙයන්න. දැන් එළු රැළට ගොස්
එතැනින් හොඳ එළුපැටියන් දෙදෙනකු
මට ගෙනෙන්න; මම උන්ගෙන් නුඹේ
පියාට ප්‍රියවූ රසවත් කෑම සාදන්නෙමි.
10 නුඹේ පියා කාලා තමාගේ මරණයට
ප්‍රථමයෙන් නුඹට ආශීර්වාදකරන පිණිස
ඒවා ඔහු වෙතට රැගෙන පලයන්නැයි
කීවාය. යාකොබ් තම මවුවූ රෙබෙකාට 11
කථාකොට: බලව, මාගේ සහෝදරවූ
ඒසව් ලෝම්ක කෙනෙක්ය, මම වනාහි
සිලුටු කෙනෙක්ය. සමහරවිට මාගේ 12
පියා මා අතගා බලයි, එවිට මා රැවටිලි-
කාරයෙක් මෙන් ඔහුට පෙනීයයි;
එකල්හි ආශීර්වාදයක් නොව ශාපයක්
මා පිටට වන්නේයයි කීය. ඔහුගේ 13
මවු: මාගේ පුත්‍රය, නුඹේ ශාපය මා
කෙරෙහි වේවා. නුඹ මා කියන දේ
පමණක් අසා, ගොස් උන් මා වෙතට
ගෙනෙන්නැයි ඔහුට කීවාය. ඔහු 14
ගොස් උන් රැගෙන තමාගේ මවු ළඟට
ආවේය. එවිට ඔහුගේ මවුතොමෝ
ඔහුගේ පියාට ප්‍රියවූ රසවත් භෝජනය
පිළියෙළකළාය. රෙබෙකා ඈ වෙත ගෙයි 15
තිබුණු ඇගේ වැඩිමල් පුත්‍රවූ ඒසව්ගේ
හොඳ වස්ත්‍ර රැගෙන ඇගේ බාල පුත්‍රවූ
යාකොබ්ට අන්දවා, එළු පැටියන්ගේ 16
සම් ඔහුගේ අත්වලද සිලුටු බෙල්ලෙහිද
ඇන්දෙවුවාය. තවද ඈ පිළියෙළකළ 17
රසවත් කෑමද රොටිද ඇගේ පුත්‍රවූ
යාකොබ් අතට දුන්නාය. ඔහු තමාගේ 18
පියා වෙතට අවුත්: මාගේ පියාණෙනියි
කීය. ඔහු: මම මෙහිය; මාගේ පුත්‍රය,
නුඹ කවුදැයි ඇසීය. යාකොබ්ද: මම 19
ඔබගේ කුලුඳුල් පුත්‍රවූ ඒසව්ය; ඔබ මට
අණකළ ලෙස කෙළෙමි. ඔබගේ
ආත්මය මට ආශීර්වාදකරන පිණිස
නැගිට හිඳ මාගේ මුව මස් කෑව මැනවියි
තමාගේ පියාට කීවේය. ඊසාක්: මාගේ 20
පුත්‍රය, මෙපමණ ඉක්මනට එය නුඹට
සම්බ වුණේ කොහොමදැයි තම පුත්‍රයා-
ගෙන් ඇසීය. ඔහු: ඔබගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ එය ඉක්මනින්
ඉෂ්ටවෙන්ට සැලැස්සූ හෙයිනැයි කීය.
තවද ඊසාක්: මාගේ පුත්‍රය, නුඹ මාගේ 21
පුත්‍රවූ ඒසව්මද නැද්ද කියා නුඹ අතගා
බලන්ට මා ළඟට වරෙන්නැයි යාකොබ්ට
කීවේය. එවිට යාකොබ් තමාගේ පියවූ 22
ඊසාක් ළඟට ගියේය; ඔහු අතගා
බලා: හඬ යාකොබ්ගේ හඬය, නමුත්
අත් ඒසව්ගේ අත්යයි කීය. ඔහුගේ අත් 23
ඔහුගේ සහෝදරවූ ඒසව්ගේ අත් මෙන්

ලෝමිකව තිබුණු බැවින් ඊසාක් ඔහු
නොහැඳින ඔහුට ආශීර්වාදකෙළේය.
24 තුඹ මාගේ පුත්‍රවූ ඒසව්මදැයි ඔහු ඇසීය.
25 එසේයයි ඔහු කීවේය. ඊසාක්ද: ඒවා
මා ළඟට ගෙනෙන්න, මාගේ ආත්මය
තුඹට ආශීර්වාදකරන පිණිස මාගේ
පුත්‍රයාගේ මුව මස් කන්නෙමියි කීවේය.
එසේ ඔහු ඒවා ඔහු ළඟට ගෙනගියේය,
ඊසාක් කෑයේය. මුද්‍රිකපානයත් ඔහු
26 ළඟට ගෙනගියේය, ඔහු බීවේය. එවිට
ඔහුගේ පියවූ ඊසාක්: ඉතින් මාගේ
පුත්‍රය, ළඟට අවුත් මා සිඹගනින්නැයි
27 ඔහුට කීය. එවිට ඔහු ළඟට අවුත්
ඔහු සිඹගත්තේය. ඊසාක් ඔහුගේ
වස්ත්‍රවල සුවඳ සිඹ ඔහුට ආශීර්වාද-
කරමින්:

බලව, මාගේ පුත්‍රයාගේ සුවඳ වනාහි
ස්වාමීන්වහන්සේ ආශීර්වාද කළ
කෙතක සුවඳ මෙනි.
28 එබැවින් දෙවියන්වහන්සේ අහසේ
පිනිද
පොළොවේ සාරත්වයද
බොහෝ ධාන්‍ය හා මිදියුසද තුඹට
දෙන සේක්වා.
29 මනුෂ්‍ය වර්ගයෝ තුඹට සේවය
කෙරෙත්වා,
ජාතීහු තුඹ බැහැදකිත්වා.
තුඹේ සහෝදරයන් කෙරෙහි ස්වාමියෙක්
වෙයන්න,
තුඹේ මෑණියන්ගේ පුත්‍රයෝ තුඹ
බැහැදකිත්වා.
තුඹට ශාපකරන සියල්ලෝ ශාප
කරනු ලබත්වා,
තුඹට ආශීර්වාදකරන සියල්ලෝ
ආශීර්වාද කරනු ලබත්වයි

30 කීය. ඊසාක් යාකොබ්ට ආශීර්වාද
කොට නිමවූ කෙණෙහිම, යාකොබ්
තමාගේ පියවූ ඊසාක් ඉදිරියෙන් පිටතට
යන කොටම, ඔහුගේ සහෝදරවූ ඒසව්
31 තමාගේ දඩයමින් හැරී ආයේය. ඔහුත්
රසවත් ආහාර සාද තමාගේ පියා
වෙතට ගෙනැවිත්: ඔබගේ ආත්මය මට
ආශීර්වාදකරන පිණිස මාගේ පියාණන්
නැගිට තමන් පුත්‍රයාගේ මුව මස් කැව
මැනවයි තම පියාට කීය. එවිට ඔහුගේ 32
පියවූ ඊසාක්: තුඹ කවරෙක්දැයි ඔහුට
කීය. මම ඔබගේ කුලුඳුල් පුත්‍රවූ ඒසව්-
යයි ඔහු කීය. එවිට ඊසාක් අතිශයින් 33
වෙවුලා කථාකොට: එසේ වීනම් දඩයම්
කර මුව මස් මා ළඟට ගෙනාවේ කවුද?
මම තුඹ එන්ට ප්‍රථමයෙන් සියල්ලෙන්ම
කා ඔහුට ආශීර්වාදකෙළෙමි; එසේය,
ඔහු ආශීර්වාද ලබන්නේයයි කීය. තම 34
පියාගේ බස් ඇසූ කල ඒසව් ඉතා
මහත්වූ දුක්බිතවූ මොරගැසීමකින්
කෑගසා: මාගේ පියාණෙනි, මටත්, අනේ
මටත් ආශීර්වාදකළ මැනවයි තම
පියාට කීය. ඔහු: තුඹේ සහෝදරයා 35
රැවටිල්ලෙන් අවුත් තුඹේ ආශීර්වාදය
හැරගත්තේයයි කීය. එවිට ඒසව්: 36
යාකොබ් යන නම ඔහුට තබා
තිබෙනවා සුදුසු නොවේද? මක්නිසාද
ඔහු මේ දෙවතාවක්ම මට ලැබෙන්ට
තිබුණු දේ පැහැරගත්තේය. ඔහු මාගේ
කුලුඳුල්කම ගත්තේය; මෙන්න, දැන්
මාගේ ආශීර්වාදයත් ගත්තේයයි කීය.
එවිට ඔහු: ඔබ මටත් ආශීර්වාදයක්
ඉතුරු නොකෙළෙහිදැයි ඇසීය. ඊසාක් 37
උත්තරදෙමින්: බලව, මම ඔහු තුඹේ
ස්වාමියා කෙළෙමි, ඔහුගේ සියලු
සහෝදරයන් මෙහෙකරුවන් කොට
ඔහුට දුනිමි; ධාන්‍යයෙන් සහ මිදියුසින්
ඔහු පෝෂණයකෙළෙමි. ඉතින් මාගේ
පුත්‍රය, තුඹට කුමක් කෙරෙම්දැයි ඒසව්ට
කීවේය. ඒසව්ද: මාගේ පියාණෙනි, ඔබට 38
ඇත්තේ එක ආශීර්වාදයක් පමණක්ද?
මාගේ පියාණෙනි, මටත්, අනේ මටත්
ආශීර්වාද කළ මැනවැයි තමාගේ පියාට
කියා ශබ්දනගා හැඬීය. එවිට ඔහුගේ 39
පියවූ ඊසාක් උත්තරදෙමින්:

බලව, තුඹේ වාසස්ථානය පොළොවේ
සාරත්වයෙන්ද
ඉහළින් පැමිණෙන අහස් පින්නෙන්ද
යුක්ත වන්නේය;
තුඹේ කඩුව කරණකොටගෙන ජීවත් 40
වන්නෙහිය, තුඹේ සහෝදරයාට

මෙහෙකරන්නෙහිය;
තවද නුඹ නිදහසට පැමුණුණාම
ඔහුගේ වියගහ නුඹේ බෙල්ලෙන්
ගසා දමන්නෙහියයි
41 ඔහුට කීවේය. ඒසව් තමාගේ පියා
යාකොබ්ට කළ ආශීර්වාදය නිසා
යාකොබ් කෙරේ වෛර බැන්දේය.
මාගේ පියාණන් ගැන වැලපෙන දවස්
ආසන්නය; එකල්හි මාගේ සහෝදරවූ
යාකොබ් මරන්නෙමියි ඒසව් තමාගේ
42 සිත තුළ කියාගත්තේය. තමාගේ
වැඩිමල් පුත්‍රවූ ඒසව්ගේ වචන
රෙබෙකාට දන්වනලද්දේය; ඈ තමාගේ
බාල පුත්‍රවූ යාකොබ් කැඳවා: බලව,
නුඹේ සහෝදරවූ ඒසව් නුඹ නසන්ට
සිතාගන නුඹ ගැන තමාම සනසා
43 ගනියි. එහෙයින් මාගේ පුත්‍රය, නුඹ
මාගේ හඬට ඇහුම්කන්දී පිටත්ව මාගේ
සහෝදරවූ ලාබන් වෙතට හාරාන්ට
44 පලායන්න; නුඹේ සහෝදරයාගේ
කෝපය පහවෙන තුරු, නුඹේ සහෝ-
දරයාගේ තරහ නුඹ කෙරෙන් පහවී
නුඹ ඔහුට කළ දේ සිහිනැති වෙනකල්,
45 ස්වල්ප දිනක් එහි සිටපන්න. එවිට
මම එතැනින් නුඹ ගෙන්වාගන්නෙමි.
එක දවසේ නුඹලා දෙදෙනාම මට
නැතිවෙන්නේ මක්නිසාදැයි කීවාය.

## යාකොබ් ගෙදර හැර යාම

46 රෙබෙකා ඊසාක්ට කථාකොට:
හෙත්ගේ දූවරුන් නිසා මාගේ ජීවිතය
මට එපාවී තිබේ. යාකොබ් මේ දේශයේ
දූවරුන් වූ හෙත්ගේ දූවරුන්ගෙන්
මෙබඳු භාර්යාවක් පාවාගන්නේ නම්
මාගේ ජීවිතය මට කුමටදැයි කීවාය.
28 ඊසාක් යාකොබ් කැඳවා ඔහුට
ආශීර්වාද කොට අණකරමින්:
නුඹ කානාන්හි දූවරුන්ගෙන් භාර්-
2 යාවකු පාවානොගනින්න. නුඹ පිටත්වී
පදන්-අරාමෙහි නුඹේ මවුගේ පියවූ
බෙතුයෙල්ගේ ගෙදරට ගොස් එතැනින්
නුඹේ මවුගේ සහෝදරවූ ලාබන්ගේ
දූවරුන්ගෙන් භාර්යාවක් පාවාගනින්න.
සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේ නුඹට 3
ආශීර්වාදකර නුඹ සෙනඟ රාශියක්
වන පිණිස නුඹ සඵලකොට නුඹ
වැඩිකරනසේක්වා; දෙවියන්වහන්සේ 4
ආබ්‍රහම්ට දුන්නාවූ නුඹ විදේශීව
සිටින්නාවූ දේශය නුඹට උරුම වෙන
පිණිස නුඹටත් නුඹේ වංශයටත්
ආබ්‍රහම්ගේ ආශීර්වාදය දෙනසේක්වයි
ඔහුට කීවේය. මෙසේ ඊසාක් යාකොබ් 5
පිටත්කර හැරියේය. ඔහු යාකොබ්ගේද
ඒසව්ගේද මවුවූ රෙබෙකාගේ සහෝදර-
වන අරාමිය බෙතුයෙල්ගේ පුත්‍රවූ ලාබන්
වෙතට පදන්-අරාමට ගියේය. ඊසාක් 6
යාකොබ්ට ආශීර්වාදකොට පදන්-
අරාමෙන් ඔහුට භාර්යාවකු පාවා-
ගන්නා පිණිස ඔහු එහි යැවූ බවද,
ඔහුට ආශීර්වාදකරද්දී: නුඹ කානාන්හි
දූවරුන්ගෙන් භාර්යාවකු පාවානො-
ගනින්නැයි අණකළ බවද, යාකොබ් 7
තමාගේ පියාටත් මවුටත් කීකරුව
පදන්-අරාමට ගිය බවද ඒසව් දුටුවේය.
තවද කානාන්හි දූවරුන්ට තමාගේ පියවූ 8
ඊසාක් අප්‍රිය වූ බව ඒසව් දැක ඉෂ්මායෙල් 9
වෙතට ගොස් තමාට සිටිය භාර්යාවන්
ඇතුළුව ආබ්‍රහම්ගේ පුත් ඉෂ්මායෙල්ගේ
දූවූ, නෙබායෝත්ගේ සහෝදරීවූ මහලත්
භාර්යාව වන පිණිස පාවාගත්තේය.

## බෙතෙල්හිදී යාකොබ් දුටු දර්ශනය

යාකොබ් බෙයර්-ෂෙබායෙන් පිටත්ව 10
හාරාන් දිසාවට ගියේය. ඔහු එක්තරා 11
ස්ථානයකට පැමිණ, ඉර බැසගිය බැවින්
මුළු රාත්‍රියේ එහි සිට, ඒ ස්ථානයේ ගල්-
වලින් එකක් අරන් තමාගේ හිසට
තබාගෙන, ඒ ස්ථානයෙහි නින්දට
වන්නේය. එවිට ඔහු ස්වප්නයක් දුටුවේය: 12
බලව, පොළොවෙහි තබනලද හිණිමගක්
විය, එහි මුදුන අහස දක්වා විය.
දෙවියන්වහන්සේගේ දූතයෝ එහි
නගිමින්ද බසිමින්ද සිටියෝය. බලව, 13
ස්වාමීන්වහන්සේ ඊට ඉහළින් සිට
කථාකොට: මම නුඹේ පියවූ ආබ්‍රහම්ගේ

දෙවිවූ, ඊසාක්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේය. තුඹ නිදා සිටින දේශය
තුඹටද තුඹේ වංශයටද දෙන්නෙමි;
14 තුඹේ වංශය පොළොවේ ධූලි මෙන්
වැඩිවන්නේය, තුඹ බස්නාහිර දෙසටද
නැගෙනහිර දෙසටද උතුර දෙසටද
දකුණ දෙසටද පැතිර යන්නෙහිය.
පොළොවේ සියලු ගෝත්‍රයෝ තුඹ
සහ තුඹේ වංශය කරණකොටගෙන
15 ආශීර්වාද ලබන්නෝය. බලව, මම
තුඹ සමග සිටිමි, තුඹ යන සියලු
තැන්හිදී තුඹ ආරක්ෂාකර නැවත මේ
දේශයට තුඹ පමුණුවන්නෙමි; මක්නිසාද
මා විසින් තුඹට කී දෙය සිදුකරන
තුරු තුඹ අත් නොහරින්නෙමියි කී-
16 සේක. යාකොබ් තමාගේ නින්දෙන්
පිබිද: ඒකාන්තයෙන්ම ස්වාමීන්වහන්සේ
මෙතැන සිටිනසේක; මම ඒ බව නො-
17 දත්තෙමියි කියා භයවී: මේක කොපමණ
භයානක ස්ථානයක්ද! ඒකාන්තයෙන්ම
මේක දෙවියන්වහන්සේගේ ගෘහයය,
මේක ස්වර්ගයේ දොරටුවයයි කීවේය.
18 යාකොබ් අලුයම නැගිට තමාගේ හිසට
තබනලද ගල රැගෙන කණුවක් කොට
සිටුවා එහි මුදුනේ තෙල් වත්කොට,
19 ඒ ස්ථානයට *බෙතෙල්යයි නම්
තැබීය. එහෙත් පළමුවෙන් ඒ නුවර
20 නම ලූස්ය. යාකොබ් භාරයක් වී:
මාගේ පියාණන්ගේ ගෙට නැවත
සමාදානයෙන් එන පිණිස දෙවියන්-
වහන්සේ මා සමග සිට මා යන මේ
21 මාර්ගයෙහි මා ආරක්ෂාකොට මට
කන්ට භෝජනද අඳින්ට වස්ත්‍රද
දෙනසේක් නම්, ස්වාමීන්වහන්සේ
මාගේ දෙවියන්වහන්සේ වනසේක,
22 කණුවක් කොට මා සිටෙවූ මේ ගල
දෙවියන්වහන්සේගේ ගෘහය වන්නේය.
ඔබවහන්සේ මට දෙන සියල්ලෙන්ම
දසයෙන් කොටසක් සැබවින්ම ඔබට
දෙන්නෙමියි කීවේය.

*එනම්—දෙවියන්වහන්සේගේ ගෘහය.

## යාකොබ් හාරාන්හි විසීම. ඔහුගේ විවාහ සහ දරුවෝ

29

එකල යාකොබ් ගමන්කොට
පෙරදිග ජනයන්ගේ දේශයට
පැමුණුණේය. ඔහු බලා, කෙතෙහි තිබෙන 2
ළිඳක් සහ ඒ ළඟ ඉන්න බැටළු
රැළවල් තුනක්ද දුටුවේය; මක්නිසාද
ඒ ළිඳෙන් බැටළු රැළවලට වතුර දෙන
ලදී. ළිං කට උඩ තිබුණු ගලද මහත්ය.
සියලු බැටළු රැළවල් එතැනට රැස් කර, 3
ළිං කටින් ගල අහකට පෙරළා,
බැටළුවන්ට වතුර පොවා ගල ළිං
කටෙහි තිබුණු තැන්හිම නැවත තබති.
එවිට යාකොබ්: මාගේ සහෝදරයිනි, 4
තුඹලා කොතැනින් ආවහුදැයි ඔවුන්-
ගෙන් ඇසුවේය. අපි හාරාන් සිට
ආවෙමුයයි ඔව්හු කීවෝය. නාහෝර්ගේ 5
පුත්‍රවූ ලාබන් අඳුනවුදැයි ඔහු ඔවුන්-
ගෙන් ඇසීය. අඳුනමුයයි ඔව්හු කීවෝය.
ඔහු සුවසේ සිටීදැයි ඔහු ඔවුන්- 6
ගෙන් ඇසීය. සුවසේ සිටියි. අන්න,
බැටළුවන් සමග අර එන්නී ඔහුගේ
දියණියවූ රාබෙල්යයි ඔව්හු කීවෝය.
ඔහුද: තවම දවහල්ය, ගවයන් රැස් 7
කිරීමට කල් නොවෙයි. බැටළුවන්ට
වතුර පොවාගෙන ගොස් උන්ට කවා-
පල්ලායයි කීය. සියලු රැළවල් එක්වෙන 8
තුරු අපට නුපුළුවන, එවිට ළිං කටින්
ගල අහකට පෙරළුවාම අපි බැටළුවන්ට
වතුර පොවමුයයි ඔව්හු කීවෝය. ඔහු 9
ඔවුන් සමග කථාකරද්දීම රාබෙල් තම
පියාගේ බැටළුවන් සමග ආවාය;
මක්නිසාද ඈ බැටළු පාළියක් වූවාය.
තවද යාකොබ් තම මෑණියන්ගේ 10
සහෝදරවූ ලාබන්ගේ දුව වන රාබෙල්ද
තම මෑණියන්ගේ සහෝදරවූ ලාබන්ගේ
බැටළුවන්ද දැක ළඟට ගොස් ළිං
කටින් ගල අහකට පෙරළා තමාගේ
මෑණියන්ගේ සහෝදරවූ ලාබන්ගේ
බැටළු රැළට වතුර පෙවුවේය. යාකොබ් 11
රාබෙල් සිඹ ශබ්ද නගා හැඬුවේය.
තවද යාකොබ් තමා ඇගේ පියාගේ 12
සහෝදරයා බවත් රෙබෙකාගේ පුත්‍රයා

බවත් රාබෙල්ට දන්නුවේය. ඈ දිවගොස්
13 ඇගේ පියාට දන්නුවාය. ලාබන් තමාගේ
සහෝදරීගේ පුත්‍රවූ යාකොබ් ගැන
ආරංචිය ඇසූ විට ඔහු සම්බවෙන්ට දිව-
ගොස් ඔහු වැලඳගෙන සිඹ, ඔහු තමාගේ
ගෙට කැඳවාගෙන ගියේය. ඔහු මේ
14 සියලු කරුණු ලාබන්ට කීයේය. සැබවින්
නුඹ මාගේ ඇට සහ මාංසයත්යයි
ලාබන් ඔහුට කීවේය. ඔහු මාසයක්
15 ඔහු සමග විසුවේය. නුඹ මාගේ
සහෝදරයා නිසා නිකම් මට වැඩ
කරන්ට යුතුද? නුඹේ කුලී කොපමණ
වන්නේදැයි මට කියාපන්නැයි ලාබන්
16 යාකොබ්ට කීය. ලාබන්ට දූවරු දෙදෙ-
නෙක් සිටියෝය. වැඩිමහල් තැනැත්තීගේ
නම ලෙයාය, බාල තැනැත්තීගේ නම
17 රාබෙල්ය. ලෙයාගේ ඇස් සිව්මැළිව
තිබුණෝය; නුමුත් රාබෙල් රූපත්ව
ප්‍රසන්න පෙනීමකින් යුක්ත වූවාය.
18 යාකොබ් රාබෙල්ට ආදරේවූයේය. ඔහු
කථාකොට: නුඹේ බාල දියණියවූ
රාබෙල් උදෙසා සත් අවුරුද්දක් නුඹට
19 වැඩකරන්නෙමියි කීය. මා විසින් ඇය
අන්‍ය පුරුෂයෙකුට දීමට වඩා නුඹට
දීම හොඳය, මා සමග සිටින්නැයි ලාබන්
20 කීය. යාකොබ් රාබෙල් උදෙසා සත්
අවුරුද්දක් වැඩකෙළේය; ඔහු ඈට ඇති
ආදරය නිසා ඒ සත් අවුරුද්ද ස්වල්ප
21 දවසක් මෙන් ඔහුට හැඟුණේය. තවද
යාකොබ්: මාගේ දවස් සම්පූර්ණවූ
බැවින් මාගේ භාර්යාව කරා එළඹෙන
පිණිස ඈ මට පාවාදෙන්නැයි ලාබන්ට
22 කීය. ලාබන් ඒ ස්ථානයේ සියලු
මිනිසුන් රැස්කොට මංගල්‍ය කෑමක්
23 පිළියෙළකර දුන්නේය. තවද සවස් වූ කල
ඔහු තමාගේ දියණියවූ ලෙයා කැඳවා
යාකොබ් ළඟට ගෙන ගියේය; ඔහු
24 ඈය කරා පැමිණියේය. ලාබන් තම දූවූ
ලෙයාට තමාගේ දාසීවූ සිල්පා දාසියක්
25 කොට දුන්නේය. තවද පහන්වූ කල ඒ
ලෙයා බව ඔහු දැන ගත්තේය. එවිට
ඔහු ලාබන්ට කථාකොට: නුඹ මට
කළ මේ දෙය කුමක්ද? මා නුඹට
මෙහෙකෙළේ රාබෙල් උදෙසා නොවේද?
කුමක්හෙයින් මට වංචා කෙළෙහිදැයි
ලාබන්ට කීය. එවිට ලාබන්: වැඩිමහල් 26
තැනැත්තියට පළමුවෙන් බාල තැනැත්තිය
සරණ පාවා දීම අපේ රටේ නොකෙ-
රෙයි. මැගේ සතිය සම්පූර්ණකරපන්න, 27
එවිට තව සත් අවුරුද්දක් මා ළඟ
කරන වැඩ නිසා අපි අනික් තැනැත්තියද
නුඹට දෙන්නෙමුයයි කීවේය. යාකොබ් 28
එසේ කොට ඇගේ සතිය සම්පූර්ණ-
කෙළේය. එවිට ඔහු තමාගේ දූවූ
රාබෙල්ද ඔහුට භාර්යාවක් කොට
දුන්නේය. තවද ලාබන් තම දියණියවූ 29
රාබෙල්ට තමාගේ දාසීවූ බිල්හා දාසියක්
කොට දුන්නේය. යාකොබ් රාබෙල් 30
කරා පැමුණුණේය, ඔහු ලෙයාට වඩා
රාබෙල්ට ආදරේව තව සත් අවුරුද්දක්
ලාබන් ළඟ වැඩකෙළේය.

ලෙයා අප්‍රියකරනු ලැබූ බව ස්වාමීන්- 31
වහන්සේ දැක ඈ ගර්භිණීවන්ට සැලැස්වූ-
සේක. නුමුත් රාබෙල් වඳව සිටියාය.
ලෙයා ගර්භිණීව පුත්‍රයෙකු වද: ස්වාමීන්- 32
වහන්සේ මාගේ දුක බැලූ බැවින් මාගේ
පුරුෂයා ඉතින් මට ආදරේවන්නේයයි
කියා ඔහුට රූබෙන් යන නම තැබුවාය.
නැවත ඈ ගර්භිණීව පුත්‍රයෙකු වද: මා 33
අප්‍රිය කරනු ලැබූ බව ස්වාමීන්වහන්සේ
ඇසූ බැවින් මේ පුත්‍රයාත් මට දුන්සේකැයි
කියා ඔහුට සිමියොන් යන නාමය
තැබුවාය. නැවත ඈ ගර්භිණීව පුත්‍රයෙකු 34
වද: ඉතින් මාගේ පුරුෂයා නිසා පුත්‍රයන්
තුන්දෙනෙකු වැදූ බැවින් ඔහු මේ වතාවේ
මට ඇලුම්වේයයි කීවාය. එබැවින්
ලෙවී යන නාමය ඔහුට තබනලද්දේය.
ඈ නැවතද ගර්භිණීව පුත්‍රයෙකු වද: 35
මේ වතාවේ ස්වාමීන්වහන්සේට ප්‍රශංසා
කරන්නෙමියි කීවාය. එබැවින් ඈ ඔහුට
යූද යන නාමය තැබුවාය; ඇගේ වැදීම
නැවතුණේය.

30
තමා යාකොබ්ට දරුවන් නො-
වැදූ බව රාබෙල් දුටු කල ඇගේ
සහෝදරීට ඊර්ෂ්‍යාකොට: මට දරුවන්
දෙන්න, නැතහොත් මම නසිමියි

2 යාකොබ්ට කීවාය. එවිට යාකොබ්
රාබෙල් කෙරෙහි තරහවිය. ඔහු කථා-
කොට: ගර්භයේ ඵල නුඹෙන් වැළැක්වූ
දෙවියන්වහන්සේ වෙනුවට මම සිටිම්-
3 දැයි කීය. එවිට රාබෙල්: මාගේ දාසිවූ
බිල්හා බලන්න. ඈ මාගේ උකුළට
දරුවන් වද දෙන පිණිසද ඈ කරණ-
කොටගෙන මටත් දරුවන් ලැබෙන
4 පිණිසද ඈ කරා එළඹෙන්න කියා
තමාගේ දාසිවූ බිල්හා භාර්යා කොට
ඔහුට පාවාදුන්නාය. යාකොබ් ඈ කරා
5 පැමිණියේය. බිල්හා ගර්භිණීව යාකොබ්
6 නිසා පුත්‍රයෙකු වැදුවාය. රාබෙල්
දෙවියන්වහන්සේ මා විනිශ්චයකොට
මාගේ හඬත් අසා පුත්‍රයෙකු මට දුන්-
සේකැයි කීවාය. එහෙයින් ඈ ඔහුට දාන්
7 යන නාමය තැබුවාය. රාබෙල්ගේ දාසිවූ
බිල්හා නැවත ගර්භිණීව යාකොබ්
8 නිසා දෙවෙනි පුත්‍රයෙකු වැදුවාය. එවිට
රාබෙල්: මහත් පොර ඇල්ලීම්වලින්
මාගේ සහෝදරී හා සමග පොර අල්ලා
ජයගතිමියි කියා ඔහුට නප්තලී යන
9 නාමය තැබුවාය. ලෙයාද තමාගේ
වැදීම නැවතුණු බව දුටු කල තමාගේ
දාසිවූ සිල්පා භාර්යා කොට යාකොබ්ට
10 පාවාදුන්නාය. ලෙයාගේ දාසිවූ සිල්පාද
යාකොබ් නිසා පුත්‍රයෙකු වැදුවාය.
11 ලෙයා: වාසනාවන්තයි! කියා ඔහුට
12 ගාද් යන නාමය තැබුවාය. ලෙයාගේ
දාසිවූ සිල්පා යාකොබ් නිසා දෙවෙනි
13 පුත්‍රයෙකු වැදුවාය. ලෙයා: මේ මාගේ
වාසනාවය, මක්නිසාද මම වාසනා-
වන්තියයි දූවරුන් කියනවා ඇතැයි කියා
ඔහුට ආෂේර් යන නාමය තැබුවාය.
14 තිරිඟු කපන කාලයේදී රූබෙන් කෙතට
ගිය කල එහි දූදයිම් ගෙඩි සම්බවී,
තමාගේ මවුවූ ලෙයාට ගෙනැවිත්
දුන්නේය. එවිට රාබෙල්: නුඹේ පුත්‍රයාගේ
දූදයිම් ගෙඩිවලින් ටිකක් මට දියන්නැයි
15 ලෙයාට කීවාය. ඈ: නුඹ මාගේ පුරුෂයා
පැහැරගත්තා මදිවාට මාගේ පුත්‍රයාගේ
දූදයිම් ගෙඩිත් ගන්ට හදනවාදැයි කීවාය.
එවිට: නුඹේ පුත්‍රයාගේ දූදයිම් දුන්නොත්
හෙතෙමේ අද රාත්‍රියෙහි නුඹ සමග
සයනය කරන්නේයයි රාබෙල් කීවාය.
යාකොබ් සවස් වේලෙහි කෙතෙන් එද්දී 16
ලෙයා ඔහු සම්බවෙන්ට ගොස්: ඔබ
මා කරා පැමිණෙන්ට ඕනැය; මක්නිසාද
මාගේ පුත්‍රයාගේ දූදයිම්වලින් ඔබ
සැබවින් කුලියට ගත්තෙමියි කීවාය.
ඔහු එද රාත්‍රියෙහි ඈ සමග සයනය
කෙළේය. දෙවියන්වහන්සේ ලෙයාට 17
කන්දුන්සේක, ඈ ගර්භිණීව යාකොබ්
නිසා පස්වෙනි පුත්‍රයෙකු වැදුවාය. මාගේ 18
දාසිය මාගේ පුරුෂයාට මා විසින් දුන්
හෙයින් දෙවියන්වහන්සේ මාගේ කුලී
මට දුන්සේක කියා ලෙයා ඔහුට
ඉස්සාබර් යන නාමය තැබුවාය. ලෙයා 19
නැවත ගර්භිණීව යාකොබ් නිසා හවෙනි
පුත්‍රයෙකු වැදුවාය. ඈ: දෙවියන්වහන්සේ 20
උතුම් දයාදයක් මට දී තිබේ; මාගේ
පුරුෂයා නිසා මා පුත්‍රයන් සදෙනෙකු
වැදූ බැවින් ඔහු මා සමග වසන්නේය
කියා ඔහුට සාබුලොන් යන නාමය
තැබුවාය. ඉන්පසු ඈ දුවෙකු වද ඈට 21
දීනා යන නාමය තැබුවාය. දෙවියන්- 22
වහන්සේ රාබෙල් සිහිකොට ඈට කන්දී
ඈ ගර්භිණී වෙන්ට සැලැස්වූසේක. ඈ 23
ගර්භිණීව පුත්‍රයෙකු වද: දෙවියන්වහන්සේ
මාගේ නින්දාව පහකළසේකැයි කීවාය.
තවද ඈ: **ස්වාමීන්වහන්සේ** තවත් පුත්‍ර- 24
යෙකු මට එකතුකරනසේක්වායි කියා
ඔහුට යෝසෙප් යන නාමය තැබුවාය.

## යාකොබ් ලාබන් වෙතදී දියුණුවීම

රාබෙල් යෝසෙප් වැදූ පසු යාකොබ් 25
ලාබන්ට කථාකොට: මාගේම ස්ථානයටද
මාගේ රටටද යන පිණිස මා හරින්න.
මා නුඹට වැඩකොට ලබාගත් මාගේ 26
භාර්යාවන්ද මාගේ දරුවන්ද මට දී
යන්ට හැරපන්න. මක්නිසාද මා විසින්
නුඹට කළ මෙහෙය නුඹ දන්නෙහි-
යයි කීය. එවිට ලාබන්: නුඹෙන් මට 27
කරුණාව ලැබී තිබේ නම් නැවතියන්න.
නුඹ නිසා **ස්වාමීන්වහන්සේ** මට ආශීර්-
වාදකළ බව නිමිත්තකින් මට පෙනී

28 ගොස් තිබේයයි ඔහුට කීවේය. තවද
ඔහු: නුඹේ කුලී නියමකරපන්න, එය
29 මම දෙන්නෙමියි කීවේය. එවිට යාකොබ්:
මා නුඹට වැඩකළ හැටිත් නුඹේ ගවයන්
මා ළඟ සිටිය හැටිත් නුඹ දන්නෙහිය.
30 මක්නිසාද මා එන්ට පළමුවෙන් නුඹට
තිබුණේ ස්වල්පයක්ය, දැන් එය බොහෝ
සෙයින් වර්ධනයවී තිබේ; මා කොයි
දෙසට හැරුණත් ස්වාමීන්වහන්සේ නුඹට
ආශීර්වාදකළසේක. ඉතින් මාගේම
පවුලටත් මා සපයන්නේ කවදාදැයි ඔහුට
31 කීය. මා විසින් නුඹට කුමක් දිය යුතු-
දැයි ඔහු ඇසුවේය. එවිට යාකොබ්:
නුඹ මට කිසිවක් දෙන්ට ඕනෑ නැත.
ඉදින් මේක මට කරනවානම් මම නැවත
නුඹේ රැළ පෝෂණය කොට බලා-
32 ගන්නෙමි. මම අද නුඹේ මුළු රැළ අතරට
ගොස් තිත් සහ ලප ඇති සියල්ලන්ද
බැටළුවන් අතරෙහි කළු පාට ඇති
සියල්ලන්ද එළුවන් අතරෙහි තිත් සහ
ලප ඇති සියල්ලන්ද වෙන්කරන්නෙමි.
එයාකාර එවුන් මාගේ කුලිය වන්නේය.
33 මෙසේ, නුඹ ඉදිරියෙහි තිබෙන මාගේ
කුලිය සඳහා නුඹ එන කල්හි, මාගේ
ධර්මිෂ්ඨකම මින් පසු මා වෙනුවට
උත්තර දෙනවා ඇත. එළුවන් අතරෙහි
තිත් සහ ලප නැත්තාවූද බැටළුවන්
අතරෙහි කළුපාට නොවූද එකෙක්වත්
මා වෙත සම්බවීනම් ඌ සොරකම්
කරනලදැයි ගණන්ගත යුතුයයි කීය.
34 බලව, නුඹේ වචන ලෙස වෙතොත්
35 කැමැත්තෙමියි කියා ලාබන් ඒ දවසේම
රේඛාද ලපද ඇති එළුවන් සහ තිත්ද
ලපද ඇති එළුදෙනුන්ද යන යම් තැනක
සුදු පාට ඇති සියල්ලන්ද බැටළුවන්
අතරෙහි කළුපාට ඇති සියල්ලන්ද
වෙන් කොට තමාගේ පුත්‍රයන් අතට
36 භාරදී, තමාද යාකොබ්ද අතරෙහි
තුන් දවසක ගමන් ප්‍රමාණ දුර තැබීය.
යාකොබ් ලාබන්ගේ ඉතිරි රැළවල්
37 පෝෂණය කෙළේය. යාකොබ් වනාහි
ලිබ්නෝ, ලූස්, ආර්මොන් යන ගස්-
වලින් අමු කෝටු රැගෙන සුදු රේඛා
වශයෙන් කොටුවල සුදු පෙනෙන හැටියට
ඒවායේ පොතු ඇර, සිව්පාවන් බොන්ට 38
ආ කල පොතු ඇරිය කෝටු වතුර වත්
කරන ඔරුවල උන් ඉදිරිපිට තැබුවේය;
සිව්පාවෝ බොන්ට ආ කල ගැබ්ගත්හ.
එසේ කෝටු ඉදිරියේදී ගැබ්ගෙන 39
රේඛා සහ තිත්ද ලපද ඇතිවුන් වැදුවෝය.
යාකොබ් බැටළුපැටවුන් වෙන් කොට 40
රැළවල සිව්පාවන්ගේ මුහුණු ලාබන්ගේ
රැළේ රේඛා ඇති සතුන්ද කළුපාට
ඇති සියල්ලන්ද දෙසට හැරෙවුවේය;
තමාගේම රංචු ලාබන්ගේ රැළ අතරෙහි
නොසිටුවා වෙන් කොට සිටෙවුවේය.
තවද රැළේ වඩා ශක්තිමත් එවුන් 41
ගැබ්ගන්න කල උන් කෝටු ඉදිරිපිටදී
ගැබ්ගන්නා පිණිස ඔහු ඒ කෝටු උන්ගේ
ඇස් ඉදිරිපිට වතුර ඔරුවල තැබුවේය.
එහෙත් රැළ දුර්වලව සිටිය කල ඔහු 42
ලී නොතැබුවේය. මෙසේ දුර්වල එවුන්
ලාබන්ගේද ශක්තිමත් එවුන් යාකොබ්-
ගේද වූහ. ඒ මනුෂ්‍යයා අතිශයින් 43
වර්ධනයවුණේය, ඔහුට රැළවල්ද දාසීහුද
දාසයෝද ඔටුවෝද කොටළුවෝද
වූවෝය.

## යාකොබ් කානාන් දේශයට හැරී ඊම

31 යාකොබ් අපේ පියා සන්තකවූ
සියල්ලම පැහැරගත්තේය; අපේ
පියාට තිබුණු දෙයින් මේ සියලු සම්පත
ඔහු ලබාගත්තේයයි ලාබන්ගේ පුත්‍ර-
යන් කී වචන යාකොබ්ට ඇසුණේය.
ලාබන්ගේ මුහුණ තමා කෙරෙහි ඉස්සර 2
වාගේ ප්‍රිය නැති බව යාකොබ් දුටුවේය.
නුඹේ පියවරුන්ගේ දේශයටද නුඹේ 3
නෑයන් වෙතටද හැරී පලයන්න; මම
නුඹ සමග සිටින්නෙමියි ස්වාමීන්වහන්සේ
යාකොබ්ට කීසේක. යාකොබ් රාහෙල් 4
සහ ලෙයා කෙතෙහි තමාගේ රැළ ළඟට
ගෙන්වාගෙන: නුඹලාගේ පියාගේ මුහුණ 5
මා කෙරෙහි පළමු ලෙස නොවන බව
මට පෙනේ; එහෙත් මාගේ පියාණන්ගේ
දෙවියන්වහන්සේ මා සමග සිටිසේක.

6 මා විසින් මාගේ මුළු ශක්තියෙන්
තුඹලාගේ පියාට මෙහෙකළ බව තුඹලා
7 දන්නහුය. තුඹලාගේ පියා මා රවටා
මාගේ කුලී දස වරක් වෙනස් කෙළේය;
එහෙත් මට හිංසාවක් කරන්ට දෙවියන්-
8 වහන්සේ ඔහුට ඉඩ් නුදුන්සේක. ලප
ඇතිවුන් තුඹේ කුලී වන්නේයයි ඔහු කී
කල, මුළු රැළ ලප ඇතිවුන් වැදුවෝය.
රේඛා ඇතිවුන් තුඹේ කුලී වන්නේයයි
කී කල, මුළු රැළ රේඛා ඇතිවුන් වැදූහ.
9 මෙසේ දෙවියන්වහන්සේ තුඹලාගේ
පියාගේ ගවයන් අරගෙන මට දුන්සේක.
10 තවද රැළ ගැබ්ගත් කාලයේදී හීනයකින්
මම මාගේ ඇස් ඔසවා බලා උන් පිට
නගින එළුවන් රේඛාද ලපද තිත්ද
11 ඇතිවුන් බව දුටිමි. එවිට දෙවියන්-
වහන්සේගේ දූතයා: යාකොබ් කියා
හීනයෙන් මට කීසේක. මම මෙහියයි
12 කීයෙමි. උන්වහන්සේ: දැන් තුඹේ ඇස්
ඔසවා බලව, සිව්පා රැළ පිට නගින
සියලු එළුවෝ රේඛාද ලපද තිත්ද ඇති
සත්තුය. මක්නිසාද ලාබන් තුඹට
13 කරන සියල්ල දුටුවෙමි. මම වනාහි
තුඹ කණුවක් ආලේපකර භාරයක්
වුණු ස්ථානය වූ බෙතෙල්හිදී ප්‍රකාශවූ
දෙවියන්වහන්සේය. ඉතින් නැගිට මේ
දේශයෙන් පිටත්ව තුඹ උපන් රටට
14 හැරී පලයන්නැයි කීසේකැයි කීය. එවිට
රාබෙල්ද ලෙයාද උත්තරදෙමින්: තවත්
අපගේ පියාගේ ගෙයි අපට කොටසක්-
15 වත් උරුමයක්වත් ඇද්ද? ඔහු අප
ආගන්තුකයන් මෙන් සලකනවා නො-
වේද? මක්නිසාද ඔහු අප විකුණා අපේ
මිලද සහමුලින් නැතිකර දැම්මේය.
16 දෙවියන්වහන්සේ අපගේ පියාගෙන්
පැහැරගත් සියලු වස්තුව අපටත් අපේ
දරුවන්ටත් අයිතිය. ඉතින් දෙවියන්-
වහන්සේ ඔබට කී සියල්ල කරන්නැයි
17 ඔහුට කීවෝය. එකල යාකොබ් නැගිට
තම පුත්‍රයන් සහ භාර්යාවන් ඔටුවන්
18 පිට නංවා, තමාගේ සියලු සිව්පා-
වන්ද පදන්-අරාමේදී තමා සම්බකරගත්
සියලු සම්පත්ද තමා ලබා ගත් සියලු
සිව්පාවන්ද රැගෙන, කානාන් දේශයට
තමාගේ පියවූ ඊසාක් වෙතට යන පිණිස
ගියේය. එකල ලාබන් බැටළුවන්ගේ 19
ලෝම කපන පිණිස ගොස් සිටියේය.
රාබෙල් ඇගේ පියාට අයිති දේවතා
රූප සොරකම් කරගත්තාය. යාකොබ් 20
තමා පලා යන බව අරාමීයවූ ලාබන්ට
නොකියා ඔහුට නොදන්වා සොරෙන්
ගියේය. මෙසේ ඔහු තමා සන්තක 21
සියල්ල රැගෙන පලාගියේය; ඔහු නැගිට
ගංගාවෙන් එතරවී ගිලියාද් කන්ද දෙස
බලා ගියේය.

යාකොබ් පලාගිය බව තුන්වෙනි දිනදී 22
ලාබන්ට දන්වනලද්දේය. එවිට ඔහු තම 23
සහෝදරයන් කැඳවාගෙන සත් දවසක
ගමන් ඔහු ලුහුබඳවා ගොස් ගිලියාද්
කන්දේදී ඔහු කිට්ටු කෙළේය. දෙවියන්- 24
වහන්සේ රාත්‍රියේ හීනයකින් අරාමීයවූ
ලාබන් වෙතට පැමිණ: තුඹ යාකොබ්ට
හොඳවත් නරකවත් නොකියන ලෙස
බලාගනින්නැයි කීසේක. ලාබන් 25
යාකොබ් ළඟට පැමුණුණේය. යාකොබ්
තමාගේ කූඩාරම කන්දේ පිහිටුවාගෙන
තිබුණේය. ලාබන්ද තම සහෝදරයන්
සමග ගිලියාද් කන්දේ කූඩාරම්
පිහිටුවාගත්තේය. ලාබන් යාකොබ්ට 26
කථාකොට: මා කෙරෙන් මාගේ දූවරුන්
කඩුවෙන් ගත් වාලුන් මෙන් ගෙන, මා
වෙතින් හොරෙන් පිටත්වී ගිය එක මොන
ක්‍රියාවක්ද? මාගේ පුත්‍රයන්ද දූවරුන්ද 27
සිඹගන්ට මට අවකාශ නොදී, ප්‍රීතියද
ගීතිකාද රබානද වීණාද ඇතුව තුඹ
පිටත් කරන පිණිස මට නොදන්වා,
සැඟවී රහසින් පලාගියේ මක්නිසාද? 28
තුඹ අනුවණ ලෙස ක්‍රියාකෙළෙහිය.
තුඹලාට හිංසා කරන්ට මාගේ අතේ 29
බලය තිබේ. එහෙත් ඊයේ රාත්‍රියේදී
තුඹේ පියාගේ දෙවියන්වහන්සේ
මට කථාකොට–යාකොබ්ට හොඳවත්
නරකවත් නොකියන ලෙස බලා-
ගනින්නැයි කීසේක. ඉතින් තුඹේ පියාගේ 30
ගෙදරට යන්ට තුඹ අතිශයින් ආශා
ඇති බැවින් තුඹ යන්ටම ඕනෑ නුමුත්,
මාගේ දේවතාවන් සොරකම්කරගත්තේ

31 මක්නිසාදයි කීවේය. යාකොබ් උත්තර-
දෙමින්: නුඹ බලාත්කාරයෙන් නුඹේ
දූවරුන් මා කෙරෙන් පැහැරගන්නෙහි
දෝහෝයි සිතා මා භයවූ නිසාය.
32 කවරෙකු ළඟ නුඹුත් නුඹේ දේවතාවෝ
සම්බවෙත්ද ඔහු ජීවත් නොවේවා.
නුඹේ යම් දෙයක් මා ළඟ තිබේද කියා
අපේ සහෝදරයන් ඉදිරියේදී බලා
එය ගනිත්නැයි කීවේය. මක්නිසාද
රාබෙල් ඒවා සොරාගත් බව යාකොබ්
33 නොදත්තේය. එවිට ලාබන් යාකොබ්ගේ
කූඩාරමටත් ලෙයාගේ කූඩාරමටත්
දාසීන් දෙදෙනාගේ කූඩාරමටත් ඇතුල්වී
සෙවූ නමුත් ඒවා සම්බනුණේය. ඔහු
ලෙයාගේ කූඩාරමෙන් ගොස් රාබෙල්ගේ
34 කූඩාරමට ඇතුල් විය. රාබෙල් ඒ දේවතා
රූප රැගෙන ඔටු ඇඳුම් යට තබා ඒවා
උඩ හිඳගෙන උන්නීය. ලාබන් මුළු
කූඩාරම අතගා බැලූ නුමුත් ඒවා
35 සම්බනොවීය. ඈ පියාට කථාකොට:
ඔබ ඉදිරියෙහි මට නැගිටින්ට බැරි නිසා
මාගේ ස්වාමියා කෝපනොවේවා;
මක්නිසාද ස්ත්‍රීන්ගේ නියමය මට සිදුවී
තිබේයයි කීවාය. මෙසේ ඔහු සෙවූ නුමුත්
36 ඒ රූප සම්බනොවීය. එවිට යාකොබ්
කිපී ලාබන් සමග විවාදකොට උත්තර-
දෙමින්: නුඹ වේගයෙන් මා පස්සේ
එළවාගන ආවේ මාගේ කුමන වරදක්
37 නිසාද? මාගේ පාපය කිමෙක්ද? නුඹ
මාගේ බඩු සියල්ල අතගා බැලුයෙහිය;
නුඹේ ගෙයි බඩු සියල්ලෙන් නුඹට
සම්බවුණේ කිමෙක්ද? එය මෙහි මාගේ
සහෝදරයන්ද නුඹේ සහෝදරයන්ද
ඉදිරියේ තබාපන්න, ඔව්හු අප දෙදෙනා
38 අතරෙහි විනිශ්චය කෙරෙත්වා. දැනට
විසි අවුරුද්දක් නුඹ සමග සිටියෙමි;
නුඹේ බැටළුදෙන්නුද නුඹේ එළුදෙන්නුද
ගැබ්සාතුවූවෝය, නුඹේ රැළවල බැටළුවන්
39 මම නොකෑයෙමි. වල් සතුන් විසින්
ඉරාදමන ලද්දවුන් නුඹ වෙතට නො-
ගෙනවුත් මම්ම ඒ අලාභය වින්දෙමි;
දවාලේ හෝ රාත්‍රියේ හෝ සොරකම්-
කරනලද්දවුන් නුඹ මා අතින් අය

කෙළෙහිය. දවාලේ රස්නයෙන්ද 40
රාත්‍රියේ ශීතලෙන්ද ක්ෂයවීමි; මාගේ
ඇස්වලින් මාගේ නින්ද පහව ගියේය.
මෙසේ පසුවුණෙමි. මේ විසි අවුරුද්ද 41
නුඹේ ගෙයි සිටියෙමි; නුඹේ දූවරුන්
දෙදෙනා උදෙසා දස සතර අවුරුද්දක්ද
නුඹේ රැළ උදෙසා සාවුරුද්දක්ද මෙහෙ-
කෙළෙමි. නුඹ මාගේ කුලිය දස වරක්
වෙනස්කෙළෙහිය. ආබ්‍රහම්ගේ දෙවියන්- 42
වහන්සේද ඊසාක්ගේ භය භූමියද වූ
තැනන්වහන්සේ, මාගේ පියාගේ
දෙවියන්වහන්සේ, මා සමග නොසිටි-
සේක්නම් සැබවින් නුඹ මා හිස් අතින්
යන්ට හරිනවා ඇත. දෙවියන්වහන්සේ
මාගේ පීඩාව සහ මාගේ අත්වල
වෙහෙසද දැක ඊයේ රාත්‍රියේ නුඹට
තරවටුකළසේකැයි ලාබන්ට කීය. ලාබන් 43
උත්තරදෙමින්: දූවරු මාගේ දූවරුය,
දරුවෝ මාගේ දරුවෝය, රැළවල් මාගේ
රැළවල්ය, නුඹට පෙනෙන මේ සියල්ල
මාගේය. මේ මාගේ දූවරුන්ට හෝ
ඔවුන්ට වැදූ දරුවන්ට හෝ අද කුමක්
කළහැකි වෙම්ද? ඉතින් දැන් වරෙන්න, 44
මමත් නුඹත් ගිවිසුමක් කරගනිමු; ඒක
මා සහ නුඹ අතරෙහි සාක්ෂියක්
පිණිස වේවයි යාකොබ්ට කීවේය.
යාකොබ් ගලක් රැගෙන කණුවක් 45
කොට සිටුවා: ගල් රැස්කරපල්ලායයි 46
තමන් සහෝදරයන්ට කීය; ඔව්හු ගල්
රැගෙන ගොඩක් සෑදුවෝය. තවද
ඔව්හු ඒ ගොඩ ළඟ හිඳ කෑවෝය.
ලාබන් ඊට *ඉගර්-සාහදූතා යන 47
නම තැබුවේය. එහෙත් යාකොබ් ඊට
†ගල්යේද් යන නම තැබුවේය. අද 48
මේ ගොඩ මා සහ නුඹ අතරේ
සාක්ෂියක්යයි ලාබන් කීවේය. එහෙ-
යින් ඊට ගල්යේද් යන නම තබන
ලද්දේය. තවද එයට ‡මිශ්පායයිද 49
කියනලදී. මක්නිසාද ඔහු කථාකර: අප
එකිනෙකාගෙන් වෙන්ව සිටින කල
ස්වාමීන්වහන්සේ මා සහ නුඹ අතරේ

*අරමේයික්–'සාක්ෂි ගොඩ'.
†හෙබ්‍රෙව්–'සාක්ෂි ගොඩ'.
‡එනම්, මුරකොටුව.

50 බලාඉන්නසේක්වා. ඉදින් තුඹ මාගේ
දූවරුන්ට පීඩා කළොත්, මාගේ දූවරුන්
ඇර තව භාර්යාවන් පාවාගත්තොත්,
කිසි මනුෂ්‍යයෙක් අප සමග නැතත්,
බලව, දෙවියන්වහන්සේ මා සහ තුඹ
අතරේ සාක්ෂි වනසේකැයි කීවේය.
51 තවද ලාබන්: මා සහ තුඹ අතරේ මා
සිටෙවූ මේ ගොඩත් මේ කණුවත් බලා-
52 පන්න. නපුරක් කරන පිණිස මා මේ
ගොඩ පසුකර තුඹ වෙතට නේන බවටත්
තුඹ මේ ගොඩ සහ මේ කණුව පසුකර
මා වෙතට නේන බවටත් මේ ගොඩ
සාක්ෂි වේවා, මේ කණුවද සාක්ෂි
53 වේවා. ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේද
නාහෝර්ගේ දෙවියන්වහන්සේද වන
ඔවුන්ගේ පියාණන්ගේ දෙවියන්වහන්සේ
අප අතරේ විනිශ්චයකරනසේක්වයි
යාකොබ්ට කීවේය. යාකොබ්ද තමාගේ
පියාවූ ඊසාක්ගේ භය භූමියවූ තැනන්-
54 වහන්සේ ගැන දිවුළේය. තවද යාකොබ්
කන්දේදී පූජාවක් ඔප්පු කොට කෑම
කන්ට තමාගේ සහෝදරයන් කැඳවිය.
ඔව්හුද කෑම කා මුළු රාත්‍රියෙහි
55 කන්දේ නැවතී සිටියෝය. ලාබන් අලුයම
නැගිට තම පුත්‍රයන්ද දූවරුන්ද සිඹ
ඔවුන්ට ආශීර්වාදකොට පිටත්ව
තමාගේ ස්ථානයට හැරී ගියේය.

1 **32** යාකොබ් තමාගේ ගමන යන්ට
ගියේය, දෙවියන්වහන්සේගේ
2 දූතයෝ ඔහුට සම්බවුණෝය. යාකොබ්
ඔවුන් දුටු විට: මේ දෙවියන්වහන්සේගේ
සේනාවය කියා ඒ ස්ථානයට *මහනායිම්
යන නම තැබීය.

## යාකොබ් ඒසව් සම්මුඛවෙන්ට සූදානම්වීම

3 තවද යාකොබ් ඒදෙම් රටවූ සේයීර්
දේශයෙහි සිටි තම සහෝදරවූ ඒසව්
වෙතට තමාට පෙරටුව පණිවුඩකාරයන්
4 යැවුවේය. ඔහු ඔවුන්ට අණකරමින්:
තුඹලා මාගේ ස්වාමිවූ ඒසව්ට කථා-
කොට: ඔබගේ මෙහෙකරුවූ යාකොබ්
මෙසේ කියන්නේය—මම ලාබන් වෙත
මේ දක්වා නැවතී සිටියෙමි. මට ගව- 5
යෝද කොටළුවෝද රැළවල්ද දස දාසීහුද
සිටිති. ඔබගෙන් කරුණාව ලැබෙන
පිණිස මාගේ ස්වාමියාට දන්වන්ට
එව්මියි කියාපල්ලායයි කීවේය. පණිවිඩ- 6
කාරයෝ යාකොබ් වෙතට හැරී අවුත්:
අපි ඔබගේ සහෝදරවූ ඒසව් වෙත
ගියෙමුව, තවද ඔහු මිනිසුන් හාරසියයක්
සමග ඔබ සම්බවෙන පිණිස එන්නේ-
යයි කීවෝය. එවිට යාකොබ් අති- 7
ශයින්ම භයපත්ව කැලඹුණේය. ඔහු
තමා කැටුව සිටි මිනිසුන්ද බැටළුවන්ද
ගවයින්ද ඔටුවන්ද කණ්ඩායම් දෙකකට
බෙදා: ඒසව් අවුත් එක් කණ්ඩායමකට 8
පහර දෙන්නේනම් ඉතිරි කණ්ඩායමට
ගැළවෙන්ට පුළුවනැයි කීවේය. තවද 9
යාකොබ්: මාගේ පියා වන ආබ්‍රහම්ගේ
දෙවියන්වහන්ස, මාගේ පියා වන
ඊසාක්ගේ දෙවියන්වහන්ස, තුඹේ රටටත්
තුඹේ නෑයන් වෙතටත් හැරී පලයන්න,
මම තුඹට යහපත කරන්නෙමියි මට
වදාළාවූ ස්වාමීන්වහන්ස, ඔබගේ මෙහෙ- 10
කරුවාට ඔබ දැක්වූ සියලු කරුණා-
වලින් ඉතා සුළු එකක්වත් ඔබගේ මුළු
විශ්වාසකමවත් ලැබීමට නොවටිමි;
මක්නිසාද මම මාගේ සැරයටිය පමණක්
රැගෙන මේ යොර්දානෙන් මෙතර වුණෙමි;
දැනුදු කණ්ඩායම් දෙකක්ව සිටිමි. මාගේ 11
සහෝදරයා අතින්, ඒසව් අතින්, මා
ගැළවුව මැනව. මක්නිසාද ඔහු ඇවිත්
මටත් මවුන් සහ දරුවන්ටත් පහර
දෙන්නේදෝහෝයි ඔහුට භයවෙමි. ඒකාන්- 12
තයෙන් මම තුඹට යහපත කර තුඹේ
වංශය ගණන් කළ නොහැකි තරමට
මුහුදේ වැලි මෙන් වැඩිකරන්නෙමියි
ඔබවහන්සේ කීසේකැයි කීවේය. ඔහු ඒ 13
රාත්‍රියේ එහි නැවතී සිට තමාගේ
සහෝදරවූ ඒසව්ට තෑග්ගක් පිණිස
තමාට තිබුණු දෙයින් එළුදෙනුන් 14
දෙසියයක් සහ එළුවන් විසිදෙනෙක්ද
බැටළුදෙනුන් දෙසියයක් සහ බැටළුවන්
විසිදෙනෙක්ද, කිරිදෙන ඔටුදෙනුන් 15
තිස්දෙනෙක් සහ උන්ගේ පැටියන්ද

*එනම්, සේනා දෙක.

එළදෙනුන් සතළිස් දෙනෙක් සහ
ගොන් දස දෙනෙක්ද කොටළුදෙනුන්
විසිදෙනෙක් සහ පැටවුන් දස දෙනෙක්ද
16 රැගෙන තමාගේ වැඩකාරයන් අතට ඒ
ඒ රංචු වෙන් වශයෙන් භාරදී: නුඹලා
රංචුවෙන් රංචුව ඈත්කර මට පෙරටුව
එතරට පලයල්ලායයි තමාගේ වැඩ-
17 කාරයන්ට කීවේය. තවද ඔහු ප්‍රථමයාට
අණකරමින්: මාගේ සහෝදරවූ ඒසව්
නුඹට සම්බව–නුඹ කාගේද? කොතැනට
යන්නෙහිද? නුඹට ඉස්සරින් යන මූන්
කාට අයිතිදැයි නුඹෙන් අසන කල:
18 උන් ඔබගේ මෙහෙකරුවූ යාකොබ්-
ගේය; උන් මාගේ ස්වාමිවූ ඒසව්ට එවන-
ලද තෑග්ගක්ය. ඔහුද අප පස්සෙන්
19 එන්නේයයි කියාපන්නැයි කීවේය. ඔහු
දෙවෙනියාටත් තුන්වෙනියාටත් රංචු
පස්සේ යන සියල්ලන්ටත් අණකරමින්:
ඒසව් සම්බවූ කල නුඹලා එයාකාරයෙන්
20 ඔහුට කථාකර–ඔබගේ මෙහෙකරුවූ
යාකොබ් අප පස්සෙන් එන්නේය කියා
කියාපල්ලායයි කීවේය. මක්නිසාද:
මට පෙරටුව යවන තෑග්ගෙන් ඔහු
සමගිකරගෙන පසුව ඔහුගේ මුහුණ
බලන්නෙමි; සමහරවිට ඔහු මා පිළි-
21 ගන්නවා ඇතැයි ඔහු කීවේය. මෙසේ
ඒ තෑග්ග ඔහුට පෙරටුව ගියේය. ඔහු
වනාහි ඒ රාත්‍රියේ අන්දයමෙහි
නැවතුණේය.

## යාකොබ්ගේ පොරබැදීම

22 ඔහු ඒ රාත්‍රියෙහි නැගිට තම
භාර්යාවන් දෙදෙනාද දාසීන් දෙදෙනාද
පුත්‍රයන් එකොළොසද රැගෙන යබ්බොක්
23 තොටුපළෙන් එගොඩ වුණේය. ඔහු
ඔවුන් කැඳවාගෙන ගොස් ඔයෙන්
එතර යැවුවේය, ඔහුට තිබුණු දේත්
24 එතර යැවුවේය. යාකොබ් හුදකලාව
සිටියේය; එවිට මනුෂ්‍යයෙක් පහන්-
වෙන තුරු ඔහු සමග පොරබැදුවේය.
25 ඒ තැනන්වහන්සේ ඔහුගෙන් ජය
නොලැබෙන බව දුටු විට ඔහුගේ කළවා
සන්ධියට ගැසුසේක; යාකොබ්ගේ කළවා
සන්ධියද උන්වහන්සේ සමග පොර
බැදද්දී ඈදීගියේය. උන්වහන්සේ කථා- 26
කොට: පහන්වෙන බැවින් මා යන්ට
හැරපන්නැයි කීසේක. ඔහුද: ඔබ මට
ආශීර්වාදකළොත් මිස නැත්නම් යන්ට
නොහරිමියි කීය. නුඹේ නම මොකදැයි 27
උන්වහන්සේ ඔහුගෙන් ඇසූසේක.
යාකොබ්යයි ඔහු කීය. නුඹ දෙවියන්- 28
වහන්සේ සමගත් මනුෂ්‍යයන් සමගත්
පොරබද ජයගත් නිසා නුඹේ නම
මින්මතු යාකොබ් නොව *ඉශ්‍රායෙල්
වන්නේයයි උන්වහන්සේ කීසේක.
යාකොබ්ද: ඔබගේ නාමය මට කිව 29
මැනවයි ඉල්ලුවේය. උන්වහන්සේ: නුඹ
කුමක්හෙයින් මාගේ නාමය විචා-
රනවාදැයි කියා එහිදී ඔහුට ආශීර්වාද
කළසේක. යාකොබ් ඒ ස්ථානයට 30
†පෙනීයේල්යයි නම් තැබුවේය. මක්-
නිසාද මම මුහුණට මුහුණ ලා දෙවියන්-
වහන්සේ දුටිමි, එහෙත් මාගේ ප්‍රාණය
ඉතුරුවියයි ඔහු කීවේය. ඔහු පෙනූයෙල් 31
පසුකර යන කල්හි ඉර උදාවිය, ඔහු
තමාගේ කළවයේ රිදුම නිසා කොර-
ගසමින් ගියේය. උන්වහන්සේ යාකොබ්- 32
ගේ කළවා සන්ධියේ නහරයට ගැසූ
බැවින් ඉශ්‍රායෙල් පුත්‍රයෝ අද දක්වා
කළවා සන්ධිය පිට තිබෙන නහරය
නොකති.

## යාකොබ් ඒසව් හා සමගිවීම

33
යාකොබ් තමාගේ ඇස් ඔසවා
බැලූ විට ඒසව්ද ඔහු සමග
මිනිසුන් හාරසියයක්ද එනවා දුටුවේය.
ඔහු ලෙයාටත් රාබෙල්ටත් දාසීන්
දෙදෙනාටත් දරුවන් වෙන්කොට දී, දාසීන් 2
සහ ඔවුන්ගේ දරුවන් පෙරටුකොටද,
ලෙයා සහ ඇගේ දරුවන් පස්සෙන්ද,
රාබෙල් සහ යෝසෙප් ඊටත් පස්සෙන්ද
සිටුවා, ඔවුන්ට ඉස්සරවී, තමාගේ 3
සහෝදරයා ළඟට එන තෙක් සත්වරක්
බිමට නැමී වැන්දේය. එවිට ඒසව් ඔහු 4

*එනම්, දෙවියන්වහන්සේ සමග පොර බදන්නා.

†එනම්, දෙවියන්වහන්සේගේ මුහුණ.

සම්මුඛ වෙන්ට දිවගොස් ඔහු වැළඳගෙන
බෙල්ල බදගෙන ඔහු සිඹගත්තේය.
5 තවද ඔව්හු ඇඬුවෝය. ඒසව් ඇස්
ඔසවා ස්ත්‍රීන් හා දරුවන් දැක: තුඹ
සමග සිටින මොව්හු කවුරුදැයි ඇසුවේය.
දෙවියන්වහන්සේ කරුණාවෙන් ඔබගේ
මෙහෙකරුවාට දුන් දරුවෝයයි ඔහු
6 කීවේය. එකල දාසීහුද ඔවුන්ගේ දරුවෝද
7 ළංවී වැන්දෝය. ලෙයාද ඇගේ දරුවෝද
ළංවී වැන්දෝය. ඉන්පසු යෝසෙප්ද
8 රාඛෙල්ද ළංවී වැන්දෝය. මට සම්බවුණු
තුඹේ ඔය පිරිස කුමක් පිණිසදැයි
ඒසව් ඇසුවේය. මාගේ ස්වාමිහුගෙන්
කරුණාව ලැබෙන පිණිසයයි ඔහු
9 කීවේය. ඒසව්: මට සෑහෙන පමණ තිබේ;
මාගේ සහෝදරය, තුඹට තිබෙන දේ
10 තුඹටම තිබේවයි කීය. එවිට යාකොබ්:
එසේ නොවේවා; ඔබගෙන් කරුණාව
ලදිම්නම් මා අතින් මාගේ තෑග්ග පිළි-
ගතමැනවි. කුමක්හෙයින්ද කෙනෙක්
දෙවියන්වහන්සේගේ මුහුණ දකින්නාක්
මෙන් මම ඔබගේ මුහුණ දුටුවෙමි, ඔබ
11 මා කෙරෙහි ප්‍රසන්නවූයෙහිය. දෙවියන්-
වහන්සේ මට කරුණා කළ හෙයින්ද
සෑහෙන පමණ මට තිබෙන හෙයින්ද
ඔබට ගෙනාවාවූ මාගේ තෑග්ග පිළිගත
මැනවියි කියා ඔහුට පෙරැත්ත කෙළේය.
12 එවිට ඔහු ඒක පිළිගත්තේය. තවද ඔහු:
අපි පිටත්ව යමු; මම තුඹට පෙරටුව
13 යන්නෙමියි කීවේය. එවිට යාකොබ්:
දරුවන් ළාබාල බවද කිරිදෙන එළු
බැටළු රැළවල් සහ ගව රැළවල් මා සමග
ඉන්න බවද මාගේ ස්වාමියා දන්නේය.
එක දවසක් උන් ඉක්මනට දක්කුවොත්
14 මුළු රැළ මියයන්නේය. මාගේ ස්වාමියා
ස්වකීය මෙහෙකරුවාට ඉස්සරව යේවා.
මම මාගේ ස්වාමියා වෙතට සේයිර්ට
පැමිණෙනතෙක් මට පෙරටුව යන
සිව්පාවුන්ටත් දරුවන්ටත් යන්ට පුළුවන්
ප්‍රමාණයට හෙමිහිට එන්නෙමියි ඔහුට
15 කීවේය. ඒසව්ද: එසේවීනම් මා සමග
සිටින මිනිසුන්ගෙන් සමහරෙකු තුඹ
සමග නවත්වා යන්නෙමියි කීවේය. ඔහුද:
ඒ කුමටද? මාගේ ස්වාමියාගෙන් මට
කරුණාව ලැබේවයි කීවේය. මෙසේ 16
ඒසව් ඒ දවසෙහි සේයිර්ට යන පිණිස
හැරීගියේය. යාකොබ් සුක්කොත්ට 17
ගමන්කොට තමාට ගෙයක් ගොඩ-
නැඟුවේය, තමාගේ සිව්පාවුන්ට මඩුද
සෑදීය. එබැවින් ඒ ස්ථානයට *සුක්කොත්
යන නම තබනලද්දේය.
යාකොබ් පදන්-අරාමෙන් ආ කල්හි 18
කානාන් දේශයෙහි තිබෙන ෂෙඛෙම්
නුවරට සමාදනයෙන් ඇවිත් නුවර
ඉදිරිපිට කූඩාරම් පිහිටුවා ගත්තේය.
ඔහු තමාගේ කූඩාරම පිහිටුවාගත් බිම් 19
කැබෙල්ල ෂෙඛෙම්ගේ පියවූ හාමොර්ගේ
පුත්‍රයන්ගෙන් රිදී කැලි සියයකට
ගෙන එහි පූජාසනයක් ගොඩනගා 20
†ඒල්-එලොහේ-ඉශ්‍රායෙල් යන නාමය
ඊට තැබුවේය.

## දීනා ගැන ප්‍රවෘත්තිය

34
ලෙයා යාකොබ්ට නිසා වැදූ
ඇගේ දුවවූ දීනා දේශයෙහි
දූවරුන් දකින්ට ගියාය. එවිට දේශයේ 2
අධිපතිවූ හිවීය හාමොර්ගේ පුත් ෂෙඛෙම්
ඇ දුටුවේය; ඔහු ඇ රැගෙන ඇ සමග
සයනය කොට ඇ අපවිත්‍ර කෙළේය.
ඔහුගේ සිත යාකොබ්ගේ දූවූ දීනා 3
කෙරෙහි ඇලුම්විය, ඔහු ඒ තරුණියට
ආදරව ඇට කරුණාවන්ත ලෙස
කථාකෙළේය. ෂෙඛෙම් තමාගේ පියවූ 4
හාමොර්ට කථාකොට: මේ තරුණිය
මට භාර්යාව කොට ලබාදුනමැනවැයි
කීය. ඔහු තමාගේ දූවූ දීනා අපවිත්‍ර- 5
කළ බව යාකොබ්ට සැලවිය; ඒ
වේලාවට ඔහුගේ පුත්‍රයෝ ඔහුගේ
සිව්පාවන් සමග කෙතෙහි සිටියෝය.
යාකොබ් ඔවුන් එනතුරු නිශ්ශබ්දව
සිටියේය. ෂෙඛෙම්ගේ පියවූ හාමොර් 6
යාකොබ් සමග කථාකරන පිණිස ඔහු
වෙතට පිටතට ගියේය. යාකොබ්ගේ 7

*එනම්, මඩු.
†එනම්, දෙවියන්වහන්සේ,
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ.

පුත්‍රයෝ ඒ අසා කෙතේ සිට ආවෝය.
ඔහු යාකොබ්ගේ දුව සමග සයනය-
කිරීමෙන් ඉශ්‍රායෙල් අතරේ නොකටයුතු
වූ නින්දිතකමක් කළ හෙයින් ඒ
මනුෂ්‍යයෝ ශෝකව ඉතා කෝපවූහ.
8 හාමෝර් ඔවුන් හා සමග කථාකරමින්:
මාගේ පුත්‍රවූ ෂෙඛෙම්ගේ සිත නුඹලාගේ
දියණිය කෙරෙහි ඇලුම්වෙයි. ඈ
භාර්යා කොට ඔහුට දුන මැනවි.
9 තවද අප හා සමග විවාහගනුදෙනු
කරමින් නුඹලාගේ දූවරුන් අපට දෙන
ලෙසත් අපේ දූවරුන් නුඹලාට ගන්න
10 ලෙසත් ඉල්ලමි. මෙසේ නුඹලා අප සමග
වාසය කරන්නහුය. දේශයද නුඹලා
ඉදිරියෙහි තිබේ; මෙහි වාසයකරමින්
වෙළඳම්කර උරුම වාසි ලබාගනිල්ලා-
11 යයි කීවේය. ෂෙඛෙම්ද දීනාගේ පියාට
හා සහෝදරයන්ටත් කථාකොට:
නුඹලාගෙන් මට කරුණාව ලැබේවා,
නුඹලා මට කියන දේ දෙන්නෙමි.
12 කොපමණ දයාද හා තෑගි මට
නියමකළත් නුඹලා මට කියන ප්‍රකාරයට
දෙන්නෙමි. කොහොම නුමුත් තරුණිය
මට භාර්යාකොට දුනමැනවැයි කීවේය.
13 එවිට යාකොබ්ගේ පුත්‍රයෝ වනාහි
ෂෙඛෙම් තමන්ගේ සහෝදරීවූ දීනාට
අවනම්බු කළ නිසා ඔහුටත් ඔහුගේ
පියවූ හාමෝර්ටත් වංචාවෙන් උත්තර-
14 දෙමින්: අචර්මඡේදිත කෙනෙකුට අපේ
සහෝදරිය දීම අපට නින්දවක් බැවින්
මේ කාරණය කරන්ට අපට නුපුළුවන.
15 අපට නුඹලා සමග එකඟවීමට ඇත්තේ
මේ විධිය පමණක්ය: එනම්, නුඹලාගේ
සියලු පිරිමි චර්මඡේදිතව අප මෙන්
16 විය යුතුය; එවිට අපගේ දූවරුන් නුඹලාට
දෙන්නෙමුව, නුඹලාගේ දූවරුන් අපි
ගන්නෙමුව, නුඹලා සමග වාසය
කරමින් එක සෙනඟක් වන්නෙමුව.
17 එහෙත් නුඹලා චර්මඡේදනය වන පිණිස
අපගේ වචන නොඅසන්නහුනම් අපගේ
දුව රැගෙන යන්නෙමුයයි ඔවුන්ට
18 කීවෝය. ඔවුන්ගේ වචන හාමෝර්ටත්
හාමෝර්ගේ පුත්‍රවූ ෂෙඛෙම්ටත් ප්‍රසන්න
19 විය. ඒ තරුණයා යාකොබ්ගේ දුවට
ප්‍රියව සිටිය බැවින් ඒක කරන්ට ප්‍රමාද
නොවීය. ඔහු තම පියාගේ ගෙදර
සියල්ලන්ට වඩා ගරුතර කෙනෙක්
විය. හාමෝර්ද ඔහුගේ පුත්‍රවූ ෂෙඛෙම්ද 20
තමුන්ගේ නුවර දොරටුව ළඟට අවුත්
තමුන්ගේ නුවර වාසීන් සමග කථා-
කරමින්: මේ මනුෂ්‍යයෝ අප හා 21
සමගිතාවෙන් සිටිති; එහෙයින් ඔව්හු
දේශයෙහි වැස වෙළඳම් කෙරෙත්වා;
මක්නිසාද දේශයෙහි ඔවුන්ට හොඳටම
ඉඩ තිබේ; අපි ඔවුන්ගේ දූවරුන්
භාර්යාවන් කොට ගනිමු, අපගේ දූවරුන්
ඔවුන්ට දෙමු. නුමුත් ඒ මනුෂ්‍යයන් 22
චර්මඡේදනය කරනු ලැබුවාක් මෙන් අප
අතරෙහි සියලු පිරිමි චර්මඡේදනය කරනු
ලැබුවොත් මිස නැත්නම් අප සමග
වාසයකර එක සෙනඟක් වෙන්ට ඔව්හු
අප හා එකඟ නොවන්නාහුය. ඔවුන්ගේ 23
ගවයෝද ඔවුන්ගේ වස්තුවද ඔවුන්ගේ
සියලු මෘගයෝද අපට අයිති
නොවන්නෝද? ඔවුන්ගේ අභිප්‍රායට
එකඟවමු, එවිට ඔව්හු අප සමග වාසය
කරන්නෝයයි කීවෝය. හාමෝර්ගේ 24
නුවර දොරටුවෙන් පිටතට ගිය සියල්ලෝ
ඔහුටත් ඔහුගේ පුත්‍රවූ ෂෙඛෙම්ටත්
කන්දුන්නෝය; ඔහුගේ නුවර දොරටුවෙන්
පිටතට ගිය සියලු පිරිමි චර්මඡේදනය
කරනු ලැබුවෝය. තවද තුන්වෙනි දින 25
ඔවුන් ගායව සිටි කල්හි යාකොබ්ගේ
පුත්‍රයන්ගෙන් දෙදෙනෙක් වූ දීනාගේ
සහෝදරයෝ වූ සිමියොන්ද ලෙවීද
තමුන්ගේ කඩු රැගෙන හදිසියෙන් නුවරට
වැද සියලු පිරිමින් මැරුවාහ. ඔව්හු 26
හාමෝර්ද ඔහුගේ පුත්‍රවූ ෂෙඛෙම්ද කඩු
මුවහතින් මරා ෂෙඛෙම්ගේ ගෙයින්
දීනා රැගෙන නික්ම ගියෝය. යාකොබ්ගේ 27
පුත්‍රයෝ මරනු ලැබූවන් කරා අවුත්
ඔවුන් තමුන්ගේ සහෝදරීට අවනම්බු
කළ බැවින් නුවර කොල්ලකෑවෝය.
ඔව්හු ඔවුන්ගේ එළු බැටළු රැළවල්ද 28
ගව රැළවල්ද කොටළුවන්ද නුවර
තිබුණු දේද කෙතෙහි තිබුණු දේද ඔවුන්-
ගේ සියලු වස්තුවද ගෙන, ඔවුන්ගේ 29

සියලු දරුවන්ද භාර්යාවන්ද අල්ලා-
ගෙන, ගෙවල තිබුණු සියලු දේද
30 කොල්ලකා ගත්තෝය. එවිට යාකොබ්
සිමියොන්ටත් ලෙවීටත් කථාකොට:
දේශයේ වැසියන්වූ කානානිවරුන් සහ
පෙරිස්සිවරුන් විසින් මා තුරුස්සනු
ලබන්ට සැලැස්වීමෙන් නුඹලා මා
හිරිහැරයට පත්කළහුය. ගණනින්
ස්වල්ප වූ මට විරුද්ධව ඔවුන් රැස්ව
මට පහර දෙනවා ඇත; මා හා
මාගේ පවුල විනාශවන්නේයයි කීය.
31 වේශ්‍යාවකුට මෙන් අපගේ සහෝදරීට
ක්‍රියාකරන්ට ඔහුට යුතුදැයි ඔව්හු
කීවෝය.

## බෙතෙල්හිදී යාකොබ්ට ගිවිසුම නැවත පිහිටුවීම

35 දෙවියන්වහන්සේ යාකොබ්ට
කථාකොට: නැගිට බෙතෙල්ට
ගොස් එහි වාසයකරපන්න. නුඹේ
සහෝදරවූ ඒසව් ඉදිරියෙන් නුඹ පලා
ගිය කල්හි නුඹට පෙනුණු දෙවියන්-
වහන්සේට එහි පූජාසනයක් සාදපන්නැයි
2 කීසේක. එවිට යාකොබ් තමාගේ
පවුලටත් තමා සමග සිටි සියල්ලන්ටත්
කථාකොට: නුඹලා අතරෙහි ඇත්තාවූ
*අන් දෙවිවරුන් පහකර දමා, පවිත්‍රවී,
3 නුඹලාගේ වස්ත්‍ර මාරුකරපල්ලා. නැගිට
බෙතෙල්ට යමු; මාගේ විපත්තියේ
දවසෙහි මට උත්තරදුන්නාවූ, මා ගිය
මාර්ගයෙහිදී මා සමග සිටියාවූ දෙවියන්-
වහන්සේට එහි පූජාසනයක් සාදන්-
4 නෙමියි කීය. එවිට ඔව්හු තමුන් අත
තුබූ සියලු *අන් දෙවිවරුන් සහ තමන්ගේ
කන්වල තිබුණු ආභරණද යාකොබ්ට
දුන්නෝය; යාකොබ් ෂෙකෙම් ළඟ තිබුණු
ආලොන් ගස යට ඒවා සඟවා
5 තැබුවේය. ඔව්හු ගමන්කළෝය. ඔවුන්
අවට තිබුණු නුවරවල් කෙරෙහි මහත්
භයක් පැමුණුණු බැවින් ඔව්හු
යාකොබ්ගේ පුත්‍රයන් ලුහු නොබැන්දෝය.

*එනම්, දේවතා රූප.

මෙසේ යාකොබ්ද ඔහු සමග සිටියාවූ 6
සියල්ලෝද කානාන් දේශයෙහි වූ ලූස්ට
පැමුණුණාහ. ඒ වනාහි බෙතෙල් නම්
ස්ථානයයි. ඔහු එහි පූජාසනයක් ගොඩ 7
නගා ඒ ස්ථානයට *ඒල්-බෙතෙල් යන
නම තැබුවේය. මක්නිසාද ඔහු තම
සහෝදරයා ඉදිරියෙන් පලා ගිය
කල්හි දෙවියන්වහන්සේ එතැන්හි ඔහුට
ප්‍රකාශවූසේක. රෙබෙකාගේ කිරි මවු වූ 8
දෙබොරා මළාය, ඈ බෙතෙල්ට පහළ
ආලොන් ගස යට තැන්පත්කරනු
ලැබුවාය. ඊට †අල්ලොන්-බාකුත් යන
නාමය කියනලදී.
යාකොබ් පදන්-අරාමෙන් ආ කල 9
දෙවියන්වහන්සේ නැවත ඔහුට පෙනී
ඔහුට ආශීර්වාදකළසේක. දෙවියන්- 10
වහන්සේ ඔහුට කථාකොට: නුඹේ නම
යාකොබ්ය. මින්මතු නුඹේ නාමය
යාකොබ් නොව ඉශ්‍රායෙල් වන්නේයයි
කීසේක. උන්වහන්සේ ඔහුට ඉශ්‍රායෙල්-
යයි නම්තැබූසේක. තවද දෙවියන්- 11
වහන්සේ ඔහුට කථාකොට: මම සර්ව-
පරාක්‍රමවූ දෙවියන්වහන්සේය. සඵල
වෙමින් වර්ධනයවෙයන්න; නුඹෙන්
ජාතියක්ද ජාති සමූහයක්ද ඇති-
වන්නෝය, නුඹේ කටියෙන් රජවරු නික්-
මෙන්නෝය; මම ආබ්‍රහම්ටද ඊසාක්ටද 12
දුන් දේශය නුඹට දෙන්නෙමි, නුඹට
පසුව නුඹේ වංශයට ඒ දේශය දෙන්-
නෙමියි කීසේක. තවද දෙවියන්වහන්සේ 13
ඔහු සමග කථාකළ ස්ථානයේ සිට
ඔහු වෙතින් නැගී ගියසේක. යාකොබ් 14
උන්වහන්සේ තමා සමග කථාකළ
ස්ථානයෙහි කණුවක් එනම් ගල්-
කණුවක් සිටුවා ඒ පිට බොන පූජාවක්
වත්කෙළේය, ඒ පිට තෙල්ද වත්කෙළේය.
යාකොබ් වනාහි දෙවියන්වහන්සේ 15
ඔහු සමග කථාකළ ස්ථානයට බෙතෙල්
යන නම තැබීය.

*එනම්, බෙතෙල්හි දෙවියන්වහන්සේ.
†එනම්, වැලපීමේ ආලොන් වෘක්ෂය.

## රාබෙල්ගේ සහ ඊසාක්ගේ මරණ

16 ඔව්හු බෙතෙල් සිට ගමන්කළෝය;
එප්‍රාත්ට පැමිණෙන්ට මඳක් දුර තිබියදී
රාබෙල් ප්‍රසව වේදනාවට පත්ව මහත්
17 අමාරු වින්දය. තවද ඇගේ වැදීමේ
අමාරුවේදී වින්නඹුව ඇට කථාකොට:
භයනොවෙන්න; නුඹ තව පුත්‍රයෙකු
18 ලබන්නෙහියයි කීවාය. ඈ මළාය,
ඇගේ ප්‍රාණය යන කල්හි ඈ ඔහුට
*බෙන්-ඕනි යන නම තැබුවාය. එහෙත්
ඔහුගේ පියා ඔහුට †බෙන්යමින් යන
19 නම තැබීය. මෙසේ රාබෙල් නැසී
එප්‍රාත්ට (එනම් බෙත්ලෙහෙමට) යන
මාර්ගයෙහි තැන්පත්කරනු ලැබුවාය.
20 යාකොබ්ද ඇගේ සොහොන පිට
කණුවක් සිටෙවුවේය. ඒක අද දක්වා
21 රාබෙල්ගේ සොහොන් කණුවය. ඉශ්‍රා-
යෙල් ගමන්කොට ඒදෙර් කොතට එහා
22 තමාගේ කූඩාරම ගසාගත්තේය. තවද
ඉශ්‍රායෙල් ඒ දේශයෙහි වසන කල්හි
රූබෙන් ගොස් තම පියාගේ උප-
භාර්යාවවූ බිල්හා සමග සයනය-
කෙළේය. ඉශ්‍රායෙල්ට එපවත් සැලවිය.
යාකොබ්ගේ පුත්‍රයෝ දෙළොස්
23 දෙනෙක්ය. ලෙයාගේ පුත්‍රයෝ:
යාකොබ්ගේ කුලුඳුලාවූ රූබෙන්,
සිමියොන්, ලෙවී, යූද, ඉස්සාබර් සහ
24 සාබුලොන්ය. රාබෙල්ගේ පුත්‍රයෝ
25 යෝසෙප් සහ බෙන්යමින්ය. රාබෙල්ගේ
දාසීවූ බිල්හාගේ පුත්‍රයෝ දාන් සහ
26 නප්තලීය. ලෙයාගේ දාසීවූ සිල්පාගේ
පුත්‍රයෝ ගාද් සහ ආෂේර්ය. පදන්-
අරාමේදී යාකොබ් නිසා උපන් පුත්‍රයෝ
27 මොව්හුය. යාකොබ් ආබ්‍රහම් සහ ඊසාක්
පොරොත්තුව සිටිය මම්රේට එනම්
කිර්යත්-අර්බාට තමාගේ පියවූ ඊසාක්
වෙතට ආයේය. ඒ වනාහි හෙබ්‍රොන්ය.
28 ඊසාක්ගේ වයස එකසිය අසූ අවුරුද්දක්ය.
29 ඊසාක්ද මහලුව දවස් සම්පූර්ණව
ප්‍රාණය හැර නැසී තමාගේ සෙනඟට
එකතුවුණේය. ඔහුගේ පුත්‍රයෝවූ ඒසව්ද
යාකොබ්ද ඔහු තැන්පත්කළෝය.

## ඒසව්ගේ පෙළපත්

36 ඒදෙම් නම්වූ ඒසව්ගේ පරම්-
පරාවල් මේය. ඒසව් කානාන්හි 2
දූවරුන්ගෙන් හිත්තීය ඒලොන්ගේ දූවූ
ආදද හිවීය සිබෙයොන්ගේ දූවූ අනාගේ
දූවූ ඔහොලිබාමාද නෙබායොත්ගේ 3
සහෝදරීවූ ඉෂ්මායෙල්ගේ දූවූ
බාසෙමත්ද භාර්යාවන් කොට
පාවාගත්තේය. ආද ඒසව් නිසා එලීඵස් 4
වැදුවාය; බාසෙමත්ද රෙවූයෙල්
වැදුවාය; ඔහොලිබාමා යෙවූෂ්ද 5
යලාම්ද කොරාද වැදුවාය. කානාන්
දේශයේදී ඒසව්ට උපන්නාවූ පුත්‍රයෝ
මොව්හුය. ඒසව් තමාගේ භාර්යාවන්ද 6
පුත්‍රයන්ද දූවරුන්ද තමාගේ ගෙයි සියලු
මනුෂ්‍යයන්ද තමාගේ ගවයන්ද තමාගේ
සියලු මෘගයන්ද කානාන් දේශයෙහිදී
තමා සපයාගත් සියලු සම්පත්ද රැගෙන
තමන් සහෝදරවූ යාකොබ්ගෙන් වෙන්ව
වෙන දේශයකට ගියේය. මක්නිසාද 7
ඔවුන්ට එක්ව වාසයකරන්ට නොහැකි
තරමට ඔවුන්ගේ සම්පත් අධිකව
තිබුණේය; ඔවුන් පොරොත්තුව සිටි
දේශය ඔවුන්ගේ සිව්පාවුන් නිසා ඔවුන්ට
ඉඩ මදි විය. ඒසව් වනාහි සේයීර් 8
කන්දෙහි විසුයේය. ඒසව් නම් ඒදෙම්ය. 9
සේයීර් කඳුකරයෙහි වූ ඒදෙම්වරුන්ගේ
පියවූ ඒසව්ගේ පරම්පරාවල් මේය.
ඒසව්ගේ භාර්යාව වූ ආදගේ පුත්‍ර 10
එලීඵස්ය, ඒසව්ගේ භාර්යාව වූ
බාසෙමත්ගේ පුත්‍ර රෙවූයෙල්ය. එලීඵස්ගේ 11
පුත්‍රයෝ තේමාන්, ඕමාර්, ශෙපෝ,
ගයිතාම් සහ කෙනස්ය. තිම්නා ඒසව්ගේ 12
පුත්‍රවූ එලීඵස්ගේ උපභාර්යාව වූවාය;
ඈ එලීඵස් නිසා අමලෙක් වැදුවාය.
ඒසව්ගේ භාර්යාවවූ ආදගේ පුත්‍රයෝ
මොව්හුය. රෙවූයෙල්ගේ පුත්‍රයෝ 13
නහත්, සෙරා, ෂම්මා සහ මිස්සාය.
ඒසව්ගේ භාර්යාව වූ බාසෙමත්ගේ පුත්‍ර-
යෝ මොව්හුය. සිබෙයොන්ගේ දුව වන 14

*එනම්, මාගේ දුකේ පුත්‍රයා.
†එනම්, දකුණතේ පුත්‍රයාය.

අනාගේ දූවූ ඒසව්ගේ භාර්යාව වූ
ඔහොලිබාමාගේ පුත්‍රයෝ මොව්හුය. ඈ
ඒසව් නිසා යෙවූෂ්ද යලාම්ද කොරාද
15 වැදුවාය. ඒසව්ගේ පුත්‍රයන්ගේ අධිපතියෝ
මොව්හුය. ඒසව්ගේ කුලුඳුල් පුත්‍රවූ
එලීඵස්ගේ පුත්‍රයෝ අධිපතිවූ තේමාන්,
අධිපතිවූ ඕමාර්, අධිපතිවූ ශෙපෝ,
16 අධිපතිවූ කෙනස්, අධිපතිවූ කෝරා,
අධිපතිවූ ගයිතාම් සහ අධිපතිවූ
අමලෙක්ය. මොව්හු ඒදෙම් දේශයෙහි
එලීඵස්ගෙන් පැවත ආ අධිපතියෝය;
17 මොව්හු ආදගේ පුත්‍රයෝය. ඒසව්ගේ
පුත්‍රවූ රෙවූයෙල්ගේ පුත්‍රයෝ: අධිපතිවූ
නහත්, අධිපතිවූ ශෙරා, අධිපතිවූ ෂම්මා
සහ අධිපතිවූ මිස්සාය. මොව්හු ඒදෙම්
දේශයෙහි රෙවූයෙල්ගෙන් පැවත ආ
අධිපතියෝය; මොව්හු ඒසව්ගේ භාර්යා-
18 වවූ බාසෙමත්ගේ පුත්‍රයෝය. ඒසව්ගේ
භාර්යාවවූ ඔහොලිබාමාගේ පුත්‍රයෝ
නම් අධිපතිවූ යෙවූෂ්, අධිපතිවූ යලාම්
සහ අධිපතිවූ කොරාය. මොව්හු අනාගේ
දූවූ ඒසව්ගේ භාර්යාවවූ ඔහොලිබාමා-
19 ගෙන් පැවත ආ අධිපතියෝය. ඒදෙම්
නම්වූ ඒසව්ගේ පුත්‍රයෝද ඔවුන්ගේ
අධිපතියෝද මොව්හුය.
20 ඒ දේශයෙහි වාසයකළ හෝරියවූ
සේයිර්ගේ පුත්‍රයෝ: ලෝතාන්, ෂෝබාල්,
21 ශිබෙයොන්, අනා, දීෂොන්, එශෙර් සහ
දීෂාන් යන මොව්හුය. මොව්හු ඒදෙම්
දේශයෙහිවූ සේයිර්ගේ දරුවන්වූ හෝරි-
22 වරුන්ගේ අධිපතියෝය. ලෝතාන්ගේ
දරුවෝ හෝරී සහ හේමාම්ය; ලෝ-
23 තාන්ගේ සහෝදරී තිම්නාය. ෂෝබාල්ගේ
දරුවෝ අල්වාන්, මානගත් සහ ඒබාල්ය,
24 ෂෙෆෝ සහ ඕනාම්ය. ශිබෙයොන්ගේ
දරුවෝ ආයා සහ අනාය. තමාගේ
පියවූ ශිබෙයොන්ගේ කොටළුවන් වන-
යෙහි ගොදුරු කවද්දී උණු දිය උල්පත්
25 සම්බවුණේ මේ අනාටය. අනාගේ
දරුවෝ දීෂොන් සහ අනාගේ දූවූ
26 ඔහොලිබාමාය. දීෂොන්ගේ දරුවෝ
හෙම්දන්, එෂ්බාන්, ඉත්රාන් සහ
27 කෙරාන්ය. ඒශෙර්ගේ දරුවෝ බිල්හන්,
28 සයවාන් සහ අකාන්ය. දීෂාන්ගේ
දරුවෝ ඌෂ් සහ අරාන්ය. හෝරි- 29
වරුන්ගෙන් පැමිණි අධිපතියෝ: අධිපතිවූ
ලෝතාන්, අධිපතිවූ ෂෝබාල්, අධිපතිවූ
ශිබෙයොන්, අධිපතිවූ අනා, අධිපතිවූ 30
දීෂොන්, අධිපතිවූ එශෙර් සහ අධිපතිවූ
දීෂාන්ය. මොව්හු සේයිර් දේශයෙහි
තමන් අධිපතීන්ගේ ක්‍රමයෙන් හෝරි-
වරුන්ගෙන් පැවත ආවාවූ අධිපතියෝය.
ඉශ්‍රායෙල්ගේ පුත්‍රයන් කෙරෙහි යම් 31
රජෙකු රජකම්කරන්ට පූර්වයෙන් ඒදෙම්
දේශයෙහි රජකම්කළ රජවරු මොව්හුය.
බෙයොර්ගේ පුත් බෙලා ඒදෙම්හි රජකම්- 32
කෙළේය; ඔහුගේ නුවර නම දින්හාබාය.
බෙලා මෙළේය, ඔහු වෙනුවට බොශ්- 33
රායේ ශෙරාගේ පුත්‍රවූ යෝබාබ් රජකම්-
කෙළේය. යෝබාබ් මෙළේය, ඔහු වෙනුවට 34
තේමානිවරුන්ගේ දේශයේ හූෂාම් රජකම්-
කෙළේය. හූෂාම් මෙළේය, ඔහු වෙනුවට 35
මෝවබ්ගේ කෙතේදී මිදියන්වරුන්ට
පහරදුන් බෙදද්ගේ පුත් හදද් රජකම්-
කෙළේය. ඔහුගේ නුවරේ නම අවිත්ය.
හදද් මෙළේය, ඔහු වෙනුවට මස්රේකාහි 36
ෂම්ලා රජකම්කෙළේය. ෂම්ලා මෙළේය, 37
ඔහු වෙනුවට ගංගාව ළඟ රෙහො-
බොත්හි ෂාවුල් රජකම්කෙළේය. ෂාවුල් 38
මෙළේය, ඔහු වෙනුවට අක්බෝර්ගේ
පුත් බාල්-හානන් රජකම්කෙළේය.
අක්බෝර්ගේ පුත්‍රවූ බාල්-හානන් මෙළේය, 39
ඔහු වෙනුවට හදර් රජකම්කෙළේය.
ඔහුගේ නුවරේ නම පායූය; ඔහුගේ
භාර්යාවගේ නාමය මෙහෙතාබෙල්ය, ඈ
මෙසාහබ්ගේ දූවූ මත්රෙද්ගේ දූය. තම 40
තමන්ගේ පෙළපත් සහ ඉඩම් ප්‍රකාරයට
නාම වශයෙන් ඒසව්ගෙන් පැවත ආ
අධිපතීන්ගේ නාමවල් නම්: අධිපතිවූ
තිම්නා, අධිපතිවූ අල්වා, අධිපතිවූ
යෙතේත්; අධිපතිවූ ඔහොලිබාමා, 41
අධිපතිවූ ඒලා, අධිපතිවූ පීනොන්;
අධිපතිවූ කෙනස්, අධිපතිවූ තේමාන්, 42
අධිපතිවූ මිබ්ශාර්; අධිපතිවූ මග්දීයෙල් 43
සහ අධිපතිවූ ඊරාම්ය. තම තමන් සන්තක
දේශයෙහි තමන්ගේ වාසස්ථාන
ප්‍රකාරයට ඒදෙම්හි අධිපතියෝ මොව්හුය.
මෙය ඒදෙම්වරුන්ගේ පියවූ ඒසව්ගේ
පෙළපතය.

## යෝසෙප් මිසරයට විකුණනු ලැබීම

37 යාකොබ් තමාගේ පියා පො-
රොත්තුව විසූ දේශය වූ කානාන්
2 දේශයෙහි වාසය කෙළේය. යාකොබ්ගේ
පරම්පරාවල් මේය. දහහත් අවුරුදු
වයස්වූ යෝසෙප් තමාගේ සහෝදරයන්
සමග බැටළු රැළ පෝෂණය කරමින්
සිටියේය; ඔහු වනාහි තම පියාගේ
භාර්යාවන්වූ බිල්හාගේද ශිල්පාගේද
පුත්‍රයන් සමග සිටි තරුණයෙකි.
යෝසෙප් ඇවිත් ඔවුන්ගේ නපුරු ක්‍රියා
ගැන ඔවුන්ගේ පියාට දන්නුවේය.
3 යෝසෙප් ඉශ්‍රායෙල්ගේ වෘද්ධ වයසේ
පුත්‍රයා බැවින් ඔහු තමාගේ සියලු
පුත්‍රයන්ට වඩා ඔහුට ආදරයවූයේ, අත්
ඇති දිග වස්ත්‍රයක් ඔහුට සාදදුන්නේය.
4 ඔහුගේ සියලු සහෝදරයන්ට වඩා
තමන්ගේ පියා ඔහුට ආදරය ඇති බව
ඔහුගේ සහෝදරයෝ දැක ඔහු කෙරෙහි
වෛරව ඔහු සමග සමාදානයෙන්
5 කථාකරන්ට නොහැකිවූවෝය. යෝසෙප්
ස්වප්නයක් දැක ඒක තමාගේ සහෝ-
දරයන්ට කීවේය. ඔව්හු ඔහු කෙරෙහි
6 වඩ වඩා වෛර වූවෝය. ඔහුද: මා
7 දුටු මේ ස්වප්නය අසාපල්ලා; අපි
කෙතෙහි ගොයම් මිටි බදිමින් සිටියෙමු,
බලව, මාගේ ගොයම් මිටිය නැගිට
කෙළින් සිටියේය; බලව, තුඹලාගේ
ගොයම් මිටි වටකොට ඇවිත් මාගේ
ගොයම් මිටියට වැන්දෝයයි කීය.
8 එවිට ඔහුගේ සහෝදරයෝ: සැබවින්
තුඹ අප කෙරෙහි රජකම්කරන්නෙහිද?
නොහොත් සැබවින් අප ආණ්ඩු-
කරන්නෙහිදැයි ඔහුට කියමින් ඔහුගේ
ස්වප්නද වචනද නිසා ඔහු කෙරෙහි වඩ
9 වඩා වෛරවූවෝය. ඔහු තව ස්වප්නයක්
දැක ඒක තමාගේ සහෝදරයන්ට
කියනුයේ: බලව, මම තවත් ස්වප්නයක්
දුටිමි. ඉරද සඳද තාරකා එකොළසක්ද
10 මට වැන්දෝයයි කීවේය. ඔහු ඒක
තමාගේ පියාටත් සහෝදරයන්ටත් කීවිට
ඔහුගේ පියා ඔහුට තරවටුකොට: තුඹ
දුටු මේ ස්වප්නය කිමෙක්ද? මමත් තුඹේ
මෑණියොත් සහෝදරයොත් සැබවින්ම
තුඹ ඉදිරියෙහි බිමට නැමී වදින්නෙමුදැයි
ඔහුට කීවේය. ඔහුගේ සහෝදරයෝ 11
ඔහුට ඊර්ෂ්‍යාකළෝය; නුමුත් ඔහුගේ
පියා ඒ කීම සිතේ තබාගත්තේය.
ඔහුගේ සහෝදරයෝ තමන් පියාගේ 12
රැළ පෝෂණයකරන පිණිස ෂෙකෙම්ට
ගියෝය. ඉශ්‍රායෙල් යෝසෙප්ට කථා- 13
කොට: තුඹේ සහෝදරයෝ ෂෙකෙම්හි
රැළ කවන්නාහු නොවෙද්ද? එරෙන්න,
තුඹ ඔවුන් ළඟට හරින්නෙමියි කීවේය.
ඔහු: යන්නෙමියි ඔහුට කීවේය. එවිට 14
ඔහු කථාකොට: තුඹ ගොස් තුඹේ
සහෝදරයොත් රැළත් සුවසේ සිටිද්ද
කියා බලා ඇවිත් මට දන්වාපන්නැයි
ඔහුට කීය. මෙසේ කියා හෙතෙම
හෙබ්‍රොන් මිටියාවතේ සිට ඔහු හැරියේය.
ඔහු ෂෙකෙම්ට පැමුණුණේය. බලව, ඔහු 15
කෙතෙහි එහා මෙහා යනවා එක්තරා
මනුෂ්‍යයෙක් දැක: තුමක් සොයන්නෙහිදැයි
ඔහුගෙන් ඇසීය. ඔහුද: මාගේ 16
සහෝදරයන් සොයමි. ඔවුන් රැළ කවන්-
නේ කොතනද කියා මට කියන්නැයි
කීවේය. ඒ මනුෂ්‍යයා: ඔව්හු මෙතැනින් 17
පිටත්ව ගියෝය. මක්නිසාද දෙතාන්ට
යමුයයි ඔවුන් කියනවා මට ඇසුණේයයි
කීය. යෝසෙප් තමාගේ සහෝදරයන්
සොයා ගියේය, ඔව්හු දෙතාන්හිදී ඔහුට
සම්බ වුණෝය. ඔව්හු දුරදීම ඔහු දැක 18
ඔහු මරණ පිණිස ඔහු ළඟට එන්ට
මත්තෙන් මන්ත්‍රණය කරගත්තෝය.
ඔව්හු ඔවුනොවුන්ට කථාකොට: අන්න 19
ස්වප්නකාරයා එන්නේය. දැන් එරෙල්ලා, 20
ඔහු මරා වළක දමා චණ්ඩ මෘගයෙක්
ඔහු කෑයේයයි කියමුව. එවිට ඔහුගේ
ස්වප්නවලට කුමක් වන්නේදැයි බලමු-
යයි කීවෝය. රූබෙන් ඒ අසා ඔවුන් 21
අතින් ඔහු මුදා: අපි ඔහුගේ ප්‍රාණය
හානි නොකරමුයයි කීය. රූබෙන් ඔහු 22
ඔවුන්ගේ අත්වලින් මුදා ඔහුගේ පියාට
නැවත භාරදෙන අදහසින් ඔවුන්ට
කථාකොට: ලේ නොවගුරුවා වනයෙහි

තිබෙන මේ වළේ ඔහු දමාපල්ලා;
එහෙත් ඔහු පිට අත් හෙළන්ට එපායයි
23 කීය. යෝසෙප් තමාගේ සහෝදරයන්
වෙතට ආකල ඔවුන් යෝසෙප්ගේ
සළුව, එනම් ඔහු ඇඳලා තිබුණු අත්
24 ඇති දිග වස්ත්‍රය ගලවාගෙන ඔහු අරන්
වළේ දැමුවෝය. ඒ වළ වතුර නැතුව
25 හිස්ව තිබුණේය. ඔව්හු කෑම කන
පිණිස හිඳ තමන් ඇස් ඔසවා බැලූ
විට, සුගන්ධ ද්‍රව්‍යද ගුගුල්ද සුවඳ
ලාටුද ඔටුවන් පිට පටවා, ඒවා මිසරයට
ගෙනයන පිණිස ගමන්කරන්නාවූ
ඉෂ්මායෙල්වරුන් කණ්ඩායමක් ගිලි-
26 යාද්හි සිට එනවා දුටුවෝය. එවිට යූද
තම සහෝදරයන්ට කථාකොට: අපගේ
සහෝදරයා මරා ඔහුගේ ලේ සැඟවීමෙන්
27 කවර ප්‍රයෝජනයක්ද? වරෙල්ලා, අර
ඉෂ්මායෙල්වරුන්ට ඔහු විකුණමු, අපගේ
අත ඔහු පිට නොපැමිණේවා; කුමක්-
හෙයින්ද ඔහු අපගේ සහෝදරයාත්
අපගේ මාංසයත්යයි කීවේය. ඔහුගේ
සහෝදරයෝ ඊට එකඟ වුණෝය.
28 මිදියන් වෙළෙන්දන් ඒ ළඟින් යන කල
ඔව්හු යෝසෙප් වළෙන් ඇද ගොඩට
ගෙන ඉෂ්මායෙල්වරුන්ට රිදී විස්සකට
වික්කෝය. ඔව්හු යෝසෙප් මිසරයට
29 ගෙනගියෝය. රූබෙන් වළ ළඟට හැරී
ආයේය; ඔහු යෝසෙප් වළේ නැති බව
30 දැක තමාගේ වස්ත්‍ර ඉරාගෙන තමාගේ
සහෝදරයන් ළඟට හැරීගොස්: ළමයා
නැත; අනේ මම කොතැනට යම්දැයි
31 කීය. ඔව්හු යෝසෙප්ගේ සළුව ගෙන,
එළුවෙකු මරා සළුව ලෙයෙහි ගල්වා,
32 අත් ඇති ඒ දිග වස්ත්‍රය තමන් පියා
ළඟට යවමින්: මේක අපට සම්බවුණේය;
මේක ඔබගේ පුත්‍රයාගේ සළුවද නැද්දැයි
33 බැලුව මැනවැයි කීවෝය. ඔහු ඒක
හැඳින: මේ මාගේ පුත්‍රයාගේ සළුවය;
චණ්ඩ මෘගයෙක් ඔහු කාදමා තිබේ;
යෝසෙප් ඉරාදමනු ලැබුවාට අනුමාන
34 නැතැයි කීවේය. තවද යාකොබ් තමාගේ
වස්ත්‍ර ඉරාගන, ගෝණි රෙදි තමාගේ
ඉණේ බැඳගන, තමාගේ පුත්‍රයා නිසා
බොහෝ දවස් වැලපුණේය. ඔහුගේ 35
සියලු පුත්‍රයෝද දූවරුද ඔහු සනසන්ට
ආවෝය; එහෙත් ඔහු සැනසෙන්ට
නොකැමති වී: මම වැලපෙමින් මාගේ
පුත්‍රයා වෙතට මිනීවළට යන්නෙමියි
කීවේය. මෙසේ ඔහුගේ පියා ඔහු නිසා
හැඬුවේය. මිදියන්වරු ඔහු මිසරයේදී 36
ඵාරාවෝගේ ඇමතියෙක්ද රැකවලුන්ගේ
නායකද වූ පෝතිඵර්ට වික්කෝය.

## තාමාර් ගැන ප්‍රවෘත්තිය

38 ඒ කාලයේ යූද තමාගේ
සහෝදරයන් වෙතින් අහක්ව
අදුල්ලමියයෙක්වූ හීරා නම් මනුෂ්‍යයෙකු
වෙතට ගියේය. යූද එහිදී ෂූවානම්වූ 2
කානානියයෙකුගේ දියණියක් දැක ඈ
පාවාගෙන ඈ වෙතට පැමිණුණේය.
ඈ ගර්භිණීව පුත්‍රයෙකු වැදුවාය; ඔහු 3
ඔහුට ඒර් යන නම තැබුවේය. ඈ 4
නැවත ගර්භිණීව පුත්‍රයෙකු වද ඔහුට
ඕනාන් යන නම තැබුවාය. ඈ නැවතත් 5
තව පුත්‍රයෙකු වද ඔහුට ෂේලා යන
නම තැබුවාය. ඈ ඔහු වදන කල්හි
යූද කෙසිබ්හි සිටියේය. යූද තමාගේ 6
කුලුදුලාවූ ඒර්ට තාමාර් නම්වූ භාර්-
යාවක් ගෙනදුන්නේය. යූදගේ කුලුදුලාවූ 7
ඒර් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි දුෂ්ටව
සිටිය බැවින් ස්වාමීන්වහන්සේ ඔහු
නැසූසේක. යූද ඕනාන්ට කථාකොට: 8
නුඹේ සහෝදරයාගේ භාර්යාව වෙත
පැමිණ මළ සහෝදරයා වෙනුවට ඈ
පාවාගැනීමෙන් නුඹේ යුතුකම ඉෂ්ටකර
නුඹේ සහෝදරයාට වංශයක් උපදවා-
පන්නැයි කීයේය. ඕනාන් ඒ වංශය 9
තමාට අයිති නොවන බව දැන තමාගේ
සහෝදරයාගේ භාර්යාව වෙතට
පැමිණි කල්හි තමාගේ සහෝදරයාට
වංශය නොදෙන පිණිස එය බිම
වැගිරෙවුවේය. ඔහු කළ දෙය 10
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි දුෂ්ටව
තිබුණු බැවින් උන්වහන්සේ ඔහුද
නැසූසේක. එවිට යූද තම යෙහෙළිවූ 11
තාමාර්ට කථාකොට: මාගේ පුත්‍රවූ

ෂේලා වැඩිවිය පැමිණෙන තෙක් නුඹේ
පියාගේ ගෙයි වැන්දඹුවක්ව සිටපන්-
නැයි කීවේය. කුමක් හෙයින්ද: ඔහුගේ
සහෝදරයන් මෙන් ඔහුද නොනස්නා
පිණිසයයි ඔහු කීය. තාමාර් ගොස්
12 ඇගේ පියාගේ ගෙයි විසුවාය. කල්යා-
මෙන් ෂූවාගේ දූවූ, යූදගේ භාර්යාව
මළාය; යූද සැනසුණායින් පසු තමාගේ
මිත්‍රවූ අදුල්ලම්යවූ හීරා සමග තමන්
බැටළුවන්ගේ ලොම් කපන්නන් වෙත
13 තිම්නාවට ගියේය. බලව, නුඹේ මාමා
තමාගේ බැටළුවන්ගේ ලොම් කපන
පිණිස තිම්නාට යන්නේයයි තාමාර්ට
14 කියනලද්දේය. ෂේලා වැඩිවිය පැමිණ
සිටි නුමුත් තමා ඔහුට භාර්යා කොට
පාවාදෙනු නොලැබූ බව දුටු බැවින් ඈ
තමාගේ කනවැන්දුම් වස්ත්‍ර පහ කොට
තමාගේ මුහුණු වැස්ම දමා පොරවා-
ගෙන තිම්නාවට යන මාර්ගයෙහිවූ
15 ඒනයිම් නම් දෙරටුවේ හිඳගත්තාය. යූද
ඈ දැක, මුහුණ වසාගෙන සිටි බැවින්
16 ඈ වේශ්‍යාවකැයි සිතුවේය. ඈ තමාගේ
යෙහෙළි බව ඔහු නොදැන මාර්ගයෙහිදී
හැරී ඈ ළඟට ගොස්: වරෙන්න, නුඹ
වෙත පැමිණෙන්ට මට ඉඩඇරපන්නැයි
කීවේය. ඈද: නුඹ මා කරා පැමිණෙන
පිණිස මට කුමක් දෙන්නෙහිදැයි
17 ඇසුවාය. රැළෙන් එළු පැටවෙකු නුඹට
එවන්නෙමියි ඔහු කීය. ඈ: නුඹ ඌ
එවනතුරු උකසක් මට දෙන්නෙහිදැයි
18 ඇසුවාය. කුමන උකසක් දෙම්දැයි ඔහු
ඇසීය. නුඹේ මුද්‍රාවත් නුඹේ මාලයත්
නුඹේ අතේ තිබෙන සැරයටියත්යයි ඈ
කීවාය. ඔහු ඒවා ඈට දී ඈ කරා
පැමිණියේය. ඈ ඔහු කරණකොටගෙන
19 ගර්භිණීවූවාය. ඈ නැගිට පිටත්ව ගොස්
මුහුණු වැස්ම අහක තබා ඇගේ
20 කනවැන්දුම් වස්ත්‍ර හැඳගත්තාය. යූද
ඒ ස්ත්‍රිය අතින් තමාගේ උකස ගන්න
පිණිස අදුල්ලම්යවූ තමාගේ මිත්‍රයා අත
21 එළු පැටවා යැවීය. එහෙත් ඈ ඔහුට
සම්බවුණේ නැත. එවිට ඔහු ඈ සිටි
ස්ථානයෙහි මනුෂ්‍යයන්ගෙන්: මාවත ළඟ
ඒනයිම්හි සිටියාවූ වේශ්‍යාව කොතනදැයි
ඇසුවේය. මෙහි වේශ්‍යාවක් සිටියේ
නැතැයි ඔව්හු කීවෝය. එවිට ඔහු යූද 22
වෙතට හැරී ගොස්: ඈ මට සම්බවුණේ
නැත; ඒ ස්ථානයේ මනුෂ්‍යයොත්
මෙහි වේශ්‍යාවක් සිටියේ නැත කියා
කීවෝයයි කීය. එවිට යූද: අපට නින්ද 23
නොපැමිණෙන පිණිස ඈ ඒක ගත්තාවේ.
මම මේ එළු පැටවා යැවීම්, එහෙත් නුඹට
ඈ සම්බවුණේ නැතැයි කීවේය. තුන් 24
මසක් පමණ ඉකුත්වූ පසු: නුඹේ
යෙහෙළිවූ තාමාර් වේශ්‍යාකම්කළාය;
තවද ඈ වේශ්‍යාකමෙන් ගර්භිණීව
සිටින්නීයයි යූදට දන්වනලද්දේය.
එවිට යූද: ඈ සිටතට ගෙනැවිත්
පුළුස්සාදමාපල්ලායයි කීවේය. ඈ 25
පිටතට ගෙනෙනු ලැබූ කල්හි ඈ කථා-
කොට: මේ දේ අයිති මනුෂ්‍යයා කරණ-
කොටගෙන මම ගර්භිණීව සිටිමි. මේ
මුද්‍රාවද මාලයද සැරයටියද කාගේදැයි
විමසා බලන ලෙස නුඹෙන් ඉල්ලමියි
ඇගේ මාමාට කියා ඇරියාය. යූද ඒවා 26
හැඳින: ඈ මට වඩා ධර්මිෂ්ඨය; කුමක්
හෙයින්ද මාගේ පුත්‍රවූ ෂේලාට ඈ
නුදුන්නෙමියි කීවේය. ඔහු තවත් ඈ
නොහැඳින්නේය. තවද ඈ වදන කාලය 27
පැමිණි කල්හි, බලව, නිඹුල් දරු
දෙදෙනෙක් ඇගේ කුසෙහි වූවෝය. ඈ 28
වදන කල එකෙක් අතක් පිට කෙළේය.
වින්නඹුව වනාහි: මොහු පළමුකොට
නික්ම ආයේය කියා රතු නූලක් ඔහුගේ
අතෙහි බැන්දය. ඔහු තමාගේ අත ඇදගත් 29
කල්හි ඔහුගේ සහෝදරයා බිහිවිය. ඈද:
නුඹ බිඳුමක් කරගත්තේ මක්නිසාදැයි
කීවාය. එබැවින් *පෙරෙශ් යන නම
ඔහුට තබනලද්දේය. පසුව අතේ 30
රතු නූල ඇති ඔහුගේ සහෝදරයා
බිහිවිය. ඔහුට සෙරා යන නම
තබනලද්දේය.

*එනම්, කැඞීම හෝ බිඳීම.

## යෝසෙප් පෝතිඵර්ගේ ගෙයි විසීම

39 යෝසෙප් මිසරයට ගෙනයන
ලද්දේය; ඵාරාවෝගේ ඇමතියෙක්ද
රැකවලුන්ගේ නායකයාද වූ මිසරයෙක්
වන පෝතිඵර් ඔහු එහි ගෙනගිය
ඉෂ්මායෙල්වරුන්ගෙන් ඔහු මිලේට
2 ගත්තේය. **ස්වාමීන්වහන්සේ** යෝසෙප්
සමග වූසේක, ඔහු සඵලවත්
මනුෂ්‍යයෙක්ව තම ස්වාමිවූ මිසරයාගේ
3 ගෙයි සිටියේය. ඔහුගේ ස්වාමියා
**ස්වාමීන්වහන්සේ** ඔහු සමග සිටින බවත්
ඔහු කළ සියල්ල ඔහුගේ අතේ දියුණු
වෙන්ට සලස්වන බවත් දුටුවේය.
4 යෝසෙප් ඔහුගෙන් කරුණාව ලැබ ඔහුට
මෙහෙකෙළේය. ඔහු තමාගේ ගෙට
ඔහු ප්‍රධානියා කොට තමා සන්තක
5 සියල්ල ඔහු අතට භාරදුන්නේය. ඔහු
තමාගේ ගෙට සහ තමා සන්තක
සියල්ලටත් ඔහු ප්‍රධානියා කළ තැන්
පටන් **ස්වාමීන්වහන්සේ** යෝසෙප් නිසා
මිසරයාගේ ගෙට ආශීර්වාද කළසේක;
ගෙයි සහ කෙතෙහි ඔහුට තිබුණාවූ
සියල්ල කෙරෙහි **ස්වාමීන්වහන්සේගේ**
6 ආශීර්වාදය වූයේය. එබැවින් ඔහු
තමාට තිබුණ සියල්ලම යෝසෙප් අතට
භාරදුන්නේය; තමා කන කෑම ගැන මිස
තමා ළඟ තිබුණු වෙන කිසිවක් ගැන
ඔහු සැලකුවේ නැත. යෝසෙප් වනාහි
රූපසම්පන්න ශෝභමාන කෙනෙක්
7 වූයේය. මින් පසු යෝසෙප්ගේ ස්වාමි-
හුගේ භාර්යාව ඔහු කෙරෙහි ඇස් හෙළා:
මා සමග සයනයකරපන්නැයි කීවාය.
8 එහෙත් ඔහු අකැමතිව තම ස්වාමියාගේ
භාර්යාවට කථාකොට: මාගේ ස්වාමියා
වනාහි ගෙයි මා ළඟ තිබෙන කිසිවක්
ගැන නොදනියි, ඔහු තමා සන්තක
9 සියල්ලම මා අතට භාරදී තිබේ; මට
වඩා උතුම් කෙනෙක් මේ ගෙයි නැත්තේය;
තුඹ ඔහුගේ භාර්යාව බැවින් තුඹ මිස
වෙන කිසිවක් මට තහනම් කරලා නැත.
එහෙයින් මම මේ මහත් දුෂ්ටකම කර
දෙවියන්වහන්සේට විරුද්ධව කෙසේ
පව්කරන්නෙම්දැයි ඇට කීවේය. ඈ දවසින් 10
දවස යෝසෙප්ට කථාකළ නුමුත් ඔහු
ඈ සමග සයනයකරන්ටවත් ඈ ළඟ
සිටින්ටවත් ඈට ඇහුම්කන් නුදුන්නේය.
තවද මේ කාලයෙහි එක් දවසක ඔහු 11
තමාගේ වැඩකරන පිණිස ගෙට ඇතුල්
විය; ගෙදර මිනිසුන්ගෙන් කිසිවෙක්
එහි ඇතුළෙහි නොසිටියේය. ඈ ඔහුගේ 12
සළුවෙන් ඔහු අල්වා: මා සමග සයනය-
කරන්නැයි කීවාය. එවිට ඔහු තමාගේ
සළුව ඈගේ අතට හැර පිටතට පලා
ගියේය. ඔහු තමාගේ සළුව ඈගේ අතට 13
හැර පිටතට පලාගිය බව ඈ දැක ඈගේ 14
ගෙයි මිනිසුන්ට හඬගසා: බලාපල්ලා,
හෙතෙම අපට නින්දකරන පිණිස
හෙබ්‍රෙව් මනුෂ්‍යයෙකු අප වෙතට
ගෙනායේය; ඔහු මා සමග සයනය-
කරන පිණිස මා වෙතට ආයේය, මම
මහත් හඬකින් මොරගැසීමි. තවද මා 15
හඬනගා මොරගසනවා ඇසී ඔහු තමා-
ගේ සළුව මා ළඟ දමා පිටතට පලා-
ගියේයයි කීවාය. ඔහුගේ ස්වාමියා ගෙදර 16
එන තුරු ඈ ඔහුගේ සළුව තමා ළඟ
තබාගත්තාය. මේ වචන ප්‍රකාරයටම 17
ඈ ඔහුට කථාකරමින්: තුඹ අප වෙතට
ගෙනාවාවූ හෙබ්‍රෙව් වැඩකාරයා මට
නින්දකරන්ට මා ළඟට ආයේය. එහෙත් 18
මා හඬනගා මොරගැසූ විට ඔහු තමා-
ගේ සළුව මා වෙත දමා පිටතට පලා-
ගියේයයි කීවාය. තුඹේ වැඩකාරයා මට 19
මෙලෙස කෙළේයයි තමාගේ භාර්යාව
කී වචන ඔහුගේ ස්වාමියා ඇසූකල
ඔහුගේ කෝපය ඇවිළුණේය. එවිට යෝ-
සෙප්ගේ ස්වාමියා ඔහු ගෙන රජහුගේ 20
හිරකාරයන් බඳිනලද ස්ථානය වූ හිර-
ගෙයි දැමීය. එහි ඔහු හිරගෙයි සිටියේය.
එහෙත් **ස්වාමීන්වහන්සේ** යෝසෙප් සමග 21
සිට ඔහුට දයාව පෙන්වා හිරගෙයි
නායකයාගේ ඇස් හමුයෙහි ඔහුට
කරුණාව ගෙනදුන්සේක. හිරගෙයි 22
නායකයාද හිරගෙයි සිටි සියලු
හිරකාරයන් යෝසෙප් අතට භාර-
දුන්නේය; ඔවුන් එහි කළාවූ සියල්ලද

23 ඔහු යටතේ කරනලද්දේය. හිරගෙයි
නායකයා ඔහු අත යටතේ තිබුණු
කිසිම දෙයක් බැලුවේ නැත, මක්නිසාද
ස්වාමීන්වහන්සේ ඔහු සමග සිටිසේක;
ඔහු කළ දේවල්ද ස්වාමීන්වහන්සේ
සඵලකළසේක.

## යෝසෙප් හිරගෙයි සිටීම

40 ඉක්බිති මිසරයේ රජ්ජුරුවන්ගේ
කුසලාන දරන්නාද පූප සාදන්නාද
තමන්ගේ ස්වාමිවූ මිසරයේ රජ්ජුරුවන්ට
2 විරුද්ධව වරද කළෝය. ඵාරාවෝ
තමන් ඇමතියන් දෙදෙනාවූ කුසලාන
දරන්නන්ගේ නායකයා කෙරෙහිද පූප
සාදන්නන්ගේ නායකයා කෙරෙහිද
3 උදහස්ව ඔවුන් යෝසෙප් හිර අඩස්-
සියේ සිටි ස්ථානය වූ රැකවලුන්-
ගේ නායකයාගේ ගෙය වන හිරගෙයි
4 දැම්මේය. රැකවලුන්ගේ නායකයා ඔවුන්
යෝසෙප්ට භාරකෙළේය, ඔහු ඔවුන්ට
සේවය කෙළේය. ඔව්හුද කාලයක් හිර-
5 ගෙයි සිටියෝය. හිරගෙයි බඳනා-
ලද්දවූ මිසරයේ රජ්ජුරුවන්ගේ කුසලාන
දරන්නාද පූප සාදන්නාද යන දෙ-
දෙනාම තම තමාට අදාළවූ අර්ථ ඇති
හීනයක් එක රාත්‍රියේම දුටුවෝය.
6 යෝසෙප් උදය ඔවුන් වෙතට ආ කල
ඔවුන් ශෝකයෙන් ඉන්න බව දුටුවේය.
7 තුඹලා අද මලානිකව සිටින්නේ මක්-
නිසාදැයි ස්වකීය ස්වාමියාගේ ගෙයි
තමා සමග හිරේ සිටි ඵාරාවෝගේ ඒ
8 ඇමතියන්ගෙන් ඔහු ඇසුවේය. ඔව්හුද:
අපි හීනයක් දුටිමුව, ඒකේ තේරුම කියා
දෙන්ට පුළුවන් කෙනෙක් නැත්තේයයි
ඔහුට කීවෝය. තේරුම කියාදීම
දෙවියන්වහන්සේට අයිති නොවේද? එය
මට කියාපල්ලායයි යෝසෙප් ඔවුන්ට
9 කීවේය. එවිට කුසලාන දරන්නන්ගේ
නායකයා තමාගේ හීනය යෝසෙප්ට
කියනුයේ: බලව, හීනෙන් මුද්‍රික වැලක්
10 මා ඉදිරියෙහි තිබුණේය. ඒ මුද්‍රික වැලේ
අතු තුනක් තිබුණේය. ඒක දළු දමා එහි
මල් අටගත්තාක් මෙන්ද විය; එහි වලුවල
ඉදුණු මිදි පල තිබුණේය. ඵාරාවෝගේ 11
කුසලාන මා අතෙහි තිබුණේය; මම
මුද්‍රික ඵල රැගෙන ඵාරාවෝගේ
කුසලානට මිරිකා ඒ කුසලාන ඵාරාවෝ
අතට දුනිමියි කීවේය. යෝසෙප් ඔහුට 12
කියනුයේ: එහි අර්ථය මේය. අතු තුන
නම් තුන් දවසක්ය; තව තුන් දවසක් 13
ඇතුළතදී ඵාරාවෝ තුඹේ හිස ඔසවා
තුඹේ තිලයට නැවත තුඹ පමුණුවන්නේය.
තුඹ ඵාරාවෝගේ කුසලාන දරන්නාව
සිටියදී පළමුවෙන් කළ ලෙස ඔහුගේ
කුසලාන ඔහු අතට දෙන්නෙහිය.
ඉතින් තුඹට ශුභසිද්ධවූ කල්හි මා සිහි 14
කොට, මට කරුණාව පෙන්වා, ඵාරාවෝට
මා ගැන සඳහන්කර, මේ ගෙයින් මා
නිදහස්කරවන ලෙස ඉල්ලමි. මක්නිසාද 15
සැබවින් මම හෙබ්‍රෙව්වරුන්ගේ දේශයෙන්
සොරකම් කරනු ලැබීමි. මෙහිදීත් මම
ඇඳිරිගෙයි දමනු ලැබීමට කිසිවක්
නොකෙළෙමියි කීය. පූප සාදන්නන්ගේ 16
නායකයා ඒ අර්ථ කීම යහපත් බව
දැක යෝසෙප්ට කියනුයේ: මමත් හීනයක්
දුටිමි, බලව, මාගේ හිස පිට සුදු රොටි
පෙට්ටි තුනක් තිබුණේය. ඉහළම 17
පෙට්ටියේ ඵාරාවෝට සාදන ලද සියලු
ආකාර පූප තිබුණේය; පක්ෂීහු මාගේ
හිස පිට තිබුණු පෙට්ටියෙන් ඒවා කෑවෝ-
යයි කීවේය. යෝසෙප් උත්තරදෙමින්: 18
ඒකේ අර්ථය මෙසේය. පෙට්ටි තුන නම් 19
තුන් දවසක්ය; තව තුන් දවසක් ඇතුළතදී
ඵාරාවෝ තුඹේ හිස තුඹ කෙරෙන් ඔසවා
තුඹ ගසක එල්ලවන්නේය; පක්ෂීහු තුඹේ
මාංස කඩා කන්නෝයයි කීය. තවද 20
තුන්වෙනි දිනවූ ඵාරාවෝ උපන් දවසේදී
ඔහු තමාගේ සියලු මෙහෙකරුවන්ට
මංගල්‍ය කෑමක් පිළියෙළකෙළේය.
යෝසෙප් ඔවුන්ට තේරුම කියාදුන් ලෙස
ඔහු කුසලාන දරන්නන්ගේ නායකයාගේ
හිසද පූප සාදන්නන්ගේ නායකයාගේ
හිසද තමාගේ සේවකයන් අතරෙහි
එසවූයේය. කුසලාන දරන්නන්ගේ 21
නායකයා ඔහුගේ තිලයට නැවත
පැමිණවිය; ඔහු ඵාරාවෝගේ අතට

22 කුසලාන දුන්නේය. එහෙත් ඔහු පූප
සාදන්නන්ගේ නායකයා එල්ලා දැමීය.
23 එසේවී නුමුත් කුසලාන දරන්නන්ගේ
නායකයා යෝසෙප් සිහිනොකොට ඔහු
මතක නැතිකෙළේය.

## ඵාරාවෝගේ ස්වප්නය යෝසෙප් විසින් තේරීම. යෝසෙප් උසස් කරනු ලැබීම

**41** සම්පූර්ණ දෑවුරුද්දක් ගතවූ
කල්හි ඵාරාවෝ ස්වප්නයක්
දුටීය. එනම්: ඔහු ගංගාව ළඟ සිටියේය.
2 බලව, පෙනීමට ලක්ෂණවූ මාංසයෙන්
තරවූ එළදෙනුන් සත්දෙනෙක් ගංගාවෙන්
නැගී අවුත් පන්ගස් අතරෙහි කමින්
3 සිටියෝය. බලව, උන්ට පසුව පෙනීමට
අවලක්ෂණවූ මාංසයෙන් කෙට්ටුවූ තවත්
එළදෙනුන් සත්දෙනෙක් ගංගාවෙන් නැගී
අවුත් ගං ඉවුරෙහි අනික් එළදෙනුන්
4 ළඟ සිටියෝය. පෙනීමෙන් අවලක්ෂණවූ
මාංසයෙන් කෙට්ටුවූ එළදෙන්නු
මාංසයෙන් තරවූ එළදෙනුන් සත්දෙනා
කාදැමුවෝය. එවිට ඵාරාවෝ පිබිදුණේය.
5 නැවත ඔහු නිදාගෙන දෙවෙනි වරද
ස්වප්නයක් දුටුවේය. බලව. තරවූ හොඳ
කරල් සතක් එක ගොයම් ගසක හට
6 ගත්තේය. බලව. ඒවාට පසුව හීන්වූ
පෙරදිග සුළඟින් වියළීගියාවූ කරල්
7 සතක් හැදුණේය. හීන්වූ කරල් තරවූ
සම්පූර්ණවූ කරල් සත ගිලගත්තේය.
එවිට ඵාරාවෝ පිබිදුණේය. ඒක
8 ස්වප්නයක් බව ඔහු දැනගත්තේය. උදෑසන
ඵාරාවෝගේ හිත කැලඹී තිබුණේය: ඔහු
පණිවිඩ යවා මිසරයේ සියලු මායා-
කාරයන්ද සියලු ශාස්ත්‍රකාරයන්ද කැඳවා
තමාගේ ස්වප්නය ඔවුන්ට කීවේය:
එහෙත් එහි අර්ථය ඵාරාවෝට කියා-
දීමට පොහොසත්වූ කිසිවෙක් නො-
9 සිටියේය. එවිට කුසලාන දරන්නන්ගේ
නායකයා ඵාරාවෝට කථාකරමින්:
10 මාගේ වරද අද සිහිකරමි. ඵාරාවෝ
තමන් සේවකයන් කෙරෙහි උදහස්වී
මා සහ පූප සාදන්නන්ගේ නායකයාද
රැකවලුන්ගේ අධිපතියාගේ ගෙයි හිරේ-
දැම්මේය. මමත් ඔහුත් එක රාත්‍රියෙහි 11
ස්වප්නයක් දුටිමුව; අපි එක් එක් කෙනා
තම තමාට අදාළවූ අර්ථ ඇති ස්වප්නයක්
දුටිමුව. රැකවලුන්ගේ අධිපතියාගේ 12
මෙහෙකරුවූ හෙබ්‍රෙව් තරුණයෙක් අප
සමග එහි සිටියේය; ඔහුට අපේ ස්වප්න
කීවෙමුව. ඔහු ඒවා අපට තෝරා-
දුන්නේය: එක් එක්කෙනාගේ ස්වප්නයේ
හැටියට තේරුම කියාදුන්නේය. ඔහු අපට 13
තේරුම කියාදුන් ලෙසම සිද්ධවිය:
රජතෙම මාගේ තනතුරට මා නැවත
පමුණුවා ඔහු එල්ලා දැමුවේයයි කීවේය.
එවිට ඵාරාවෝ පණිවිඩ යවා යෝසෙප් 14
කැඳවීය. ඔව්හු වහාම ඔහු ඇදිරිගෙයින්
ගෙනාවෝය. ඔහු රැවුල කපාගෙන
තමාගේ වස්ත්‍ර මාරුකර ඵාරාවෝ වෙතට
ආයේය. ඵාරාවෝ යෝසෙප්ට කථා- 15
කොට: මම ස්වප්නයක් දුටිමි. ඒකේ
තේරුම කියාදීමට පොහොසත්වූ කව-
රෙක්වත් නැත්තේය. නුඹ ස්වප්නයක්
ඇසූ කල්හි ඒකේ අර්ථය තෝරාදෙන්ට
නුඹට පුළුවනැයි නුඹ ගැන කියනවා
මම ඇසීමියි කීයේය. යෝසෙප් 16
ඵාරාවෝට උත්තරදෙමින්: මා නොව
දෙවියන්වහන්සේ ඵාරාවෝට සමාදාන
උත්තරයක් දෙනසේකැයි කීවේය. එවිට 17
ඵාරාවෝ යෝසෙප්ට කථාකොට:
මම ස්වප්නයෙන් ගංඉවුරෙහි සිටියෙමි.
බලව. මාංසයෙන් තරවූ. පෙනීමට 18
ලක්ෂණවූ එළදෙනුන් සත්දෙනෙක්
ගංගාවෙන් නැගී ඇවිත් පන්ගස් අතරේ
කමින් සිටියෝය. උන්ට පසුව හීන්වූ, 19
පෙනීමට ඉතා අවලක්ෂණවූ, කෙට්ටුවූ
වෙන එළදෙනුන් සත්දෙනෙක් නැගී
ආවෝය, එපමණ නරක එළදෙනුන්
මුළු මිසර දේශයෙහි නුදුටිමි. කෙට්ටුවූ 20
අවලක්ෂණවූ එළදෙන්නු තරවූ පළමු
එළදෙනුන් සත්දෙනා කාදැමුවෝය.
මෙසේ උන් කාදැමූ පසුත් කෑ බවක් 21
දැනගන්ට නොතිබුණේය: උන්ගේ පෙනීම
මුලදී මෙන්ම අවලක්ෂණව තිබුණේය.
එවිට මම පිබිදුණෙමි. නැවත මම 22

ස්වප්නයෙන් එක් ගොයම් ගසක
සම්පූර්ණවූ හොඳ කරල් සතක්
23 හටගන්නවා දුටිමි. බලව, ඒවාට පසු
බොල්වූ හීන්වූ පෙරදිග සුළඟින්
වියළීගියාවූ කරල් සතක් හැදුණේය.
24 හීන්වූ කරල් හොඳ කරල් සත ගිල-
ගත්තේය. මම එය මායාකාරයන්ට
කීමි; එහෙත් එය මට ප්‍රකාශකළ හැකිවූ
25 කිසිවෙක් නොවූයේයයි කීය. එවිට
යෝසෙප් ඵාරාවෝට කථාකොට:
ඵාරාවෝගේ ස්වප්නය එකක්මය.
දෙවියන්වහන්සේ තමන් කරන්ට යන
දෙය ඵාරාවෝට ප්‍රකාශ කළසේක.
26 හොඳ එළදෙනුන් සත්දෙනා නම් අවුරුදු
සතක්ය. හොඳ කරල් සත නම් අවුරුදු
27 සතක්ය; ස්වප්නය එකක්මය. උන්ට පසුව
නැගී ආවාවූ කෙට්ටුවූ අවලක්ෂණවූ
එළදෙනුන් සත්දෙනා නම් අවුරුදු
සතක්ය, පෙරදිග සුළඟින් වියළීගියාවූ
හීන්වූ කරල් සතත් එසේමය. ඒවා සාගත
28 අවුරුදු සත වන්නේය. මා විසින්
ඵාරාවෝට කී කාරණය මේය. දෙවියන්-
වහන්සේ තමන් කරන්ට යන දෙය
29 ඵාරාවෝට දක්වූසේක. මුළු මිසර
දේශයෙහි ඉතා සාරවූ අවුරුදු සතක්
30 පැමිණෙයි. ඉන් පසු සාගත අවුරුදු
සතක් පැමිණෙන්නේය; එවිට ඒ මුළු
සාරවත්කම මිසර දේශයෙහි මතක
නැතිවන්නේය; සාගතයෙන් දේශය
31 විනාශවන්නේය; පසුව පැමිණෙන ඒ
සාගතය ඉතා බලවත් නිසා සාරවත්කම
32 දේශයෙහි නොදැනී යන්නේය. ඵාරාවෝට
ස්වප්නය දෙවරක් පෙනුණේ ඒ කාරණය
දෙවියන්වහන්සේ විසින් ස්ථිරකර
තිබෙන නිසාය, දෙවියන්වහන්සේ ඉක්-
33 මනින් එය ඉෂ්ටකරනසේක. එහෙයින්
දැන් ඵාරාවෝ දැනුම් තේරුම් ඇති
ප්‍රඥාවන්ත මනුෂ්‍යයෙකු සොයා ඔහු
34 මිසර දේශය කෙරෙහි පත්කෙරේවා. එසේ
කොට, දේශය කෙරෙහි මූලාදෑනීන්
පත්කර, සාරවත්වූ අවුරුදු සතේදී මිසර
දේශයේ අස්වැන්නෙන් පහෙන් කොටස
35 ගනීවා. ඔව්හු පැමිණෙන මේ හොඳ
අවුරුදුවල ආහාර සියල්ල රැස්කොට
නුවරවල ආහාර පිණිස ඵාරාවෝගේ
අත යටතේ ධාන්‍ය රැස්කර තබාගනිත්වා.
දේශය සාගතයෙන් විනාශනොවෙන 36
පිණිස ඒ ආහාර මිසර දේශයෙහි
පැමිණෙන සාගත අවුරුදු සතේදී
දේශයට ගබඩාවක් වන්නේයයි කීවේය.
ඒ කාරණය ඵාරාවෝටද ඔහුගේ සියලු 37
මෙහෙකරුවන්ටද හොඳව පෙනුණේය.
එවිට ඵාරාවෝ තමාගේ සේවකයන්ට 38
කථාකොට: තමා තුළ දෙවියන්වහන්-
සේගේ ආත්මය ඇත්තාවූ මේ මනුෂ්‍යයා
වැනි කෙනෙක් අපට සොයාගන්ට
පුළුවන්දැයි කීවේය. ඵාරාවෝ යෝසෙප්ට 39
කථාකොට: දෙවියන්වහන්සේ මේ
සියල්ල තුඹට දක්වූ නිසා තුඹ පමණ
දැනුම් තේරුම් ඇති ප්‍රඥාවන්ත කෙනෙක්
නැත. තුඹ මාගේ ගෘහයට ප්‍රධානියා 40
විය යුතුය, මාගේ මුළු සෙනඟ තුඹේ
වචනයට යටත් වන්නේය. සිංහාසන-
යෙහිදී පමණක් මම තුඹට වඩා
උසස්වෙමියි කීවේය. තවද ඵාරාවෝ: 41
මුළු මිසර දේශයට මා විසින් තුඹ
අධිපති කොට පත්කළ බව දැන-
ගනින්නැයි යෝසෙප්ට කීවේය. ඵාරාවෝ 42
වනාහි තමාගේ අතේ තිබුණ පේරැස්
මුද්ද ගළවා යෝසෙප්ගේ අතේ දමා,
සිහින් වස්ත්‍රයෙන් ඔහු අඳවා, ඔහුගේ
කරෙහි රන් මාලාවක් ලා, ඔහුට තමාගේ 43
දෙවෙනි රථයෙන් යන්ට සැලැස්විය.
මිනිස්සුද: දණ නමව් කියා මොර
ගසමින් ඔහුට පෙරටුව ගියෝය.
ඵාරාවෝ මුළු මිසර දේශය කෙරෙහි
ඔහු අධිපති කොට තැබුවේය. ඔහු 44
යෝසෙප්ට කථාකරමින්: මම ඵාරා-
වෝය, තුඹ නැතුව මුළු මිසර දේශයෙහි
කිසිවෙක් තමාගේ අතවත් පයවත්
ඔසවන්නේ නැතැයි කීවේය. තවද 45
ඵාරාවෝ යෝසෙප්ට ශාෆෙනත්-පනේයා
යන නාමය තබා ඕන්හි පූජකවූ පෝති-
ෆෙරාගේ දියණියවූ ආසෙනත් ඔහුට
භාර්යාව කොට පාවාදුන්නේය. යෝසෙප්

පිටත්ව මිසර දේශය මුළුල්ලෙහි ගියේය.
46 යෝසෙප් මිසරයේ රජවූ ඵාරාවෝ
ඉදිරියට පැමිණෙන කල්හි තිස් අවුරුදු
වයස් විය. ඔහු ඵාරාවෝ ඉදිරියෙන්
නික්ම මිසර දේශය මුළුල්ලෙහි ගමන්-
47 කෙළේය. සාරවත්වූ සත් අවුරුද්දෙහි
පොළොවෙන් අතිශයින්ම එල හට-
48 ගත්තේය. ඔහු ඒ සත් අවුරුද්දේ මිසර
දේශයෙහි තිබුණාවූ ආහාර සියල්ල
රැස්කොට ඒවා නුවරවල තැබුවේය. එක
එක නුවර වටකර කෙත්වල තිබුණු
49 ආහාර ඔහු එහිම තැබුවේය. යෝසෙප්
ධාන්‍ය මුහුදේ වැලි මෙන් රාශි වශයෙන්,
ගණන් නොකර හරින තරමට රැස්-
කෙළේය; මක්නිසාද ඒවා ගණන්කළ
50 නොහැකි විය. සාගත අවුරුද්ද පැමි-
ණෙන්ට ප්‍රථම යෝසෙප්ට දව පුත්‍රයන්
දෙදෙනෙක් උපන්නෝය, ඕන්හි පූජ-
කයාවූ පෝති-ඵෙරාගේ දූවූ ආසෙනත්
51 ඔවුන් ඔහු නිසා වැදුවාය. යෝසෙප්ද:
දෙවියන්වහන්සේ මාගේ සියලු
වෙහෙසත් මාගේ පියාගේ මුළු පවුලත්
මතකනැතිකරන්ට මට සැලැස්වූසේකැයි
කියා තමාගේ කුලුඳුලාට *මනස්සේ
52 යන නාමය තැබීය. මාගේ පීඩාවේ
දේශයේදී දෙවියන්වහන්සේ මා සඵලකළ-
සේකැයි කියා දෙවෙනියාට †එප්‍රායිම්
53 යන නාමය තැබීය. මිසර දේශයෙහි
පැවතුණු සාරවූ අවුරුදු සත කෙළවර
54 විය. යෝසෙප් කී ලෙස සාගත අවුරුදු
සත පැමිණෙන්ට පටන්ගත්තේය. සියලු
දේශවල සාගතය විය; නුමුත් මිසර
55 දේශය මුළුල්ලෙහි ආහාර තිබුණේය. මුළු
මිසර දේශයෙහි සාගතය වූ කල
සෙනඟ ආහාර ගැන ඵාරාවෝට
මොරගැසුවෝය. ඵාරාවෝ සියලු
මිසරවරුන්ට කථාකොට: යෝසෙප්
වෙතට ගොස් ඔහු නුඹලාට කියන
56 දේ කරපල්ලායයි කීය. සාගතය මුළු
පොළෝතලයෙහි විය. යෝසෙප් සියලු
ගබඩා ඇර මිසරවරුන්ට වික්කේය;
තවද සාගතය මිසර දේශයෙහි බලවත්
විය. සාගතය මුළු පොළොවෙහි 57
බලවත්ව තිබුණු නිසා සියලු දේශ වාසීහු
ධාන්‍ය මිලේට ගන්නා පිණිස මිසරයට
යෝසෙප් වෙතට ආවෝය.

## යෝසෙප් සහ තම සහෝදරයන් පළමුවෙනි වර සම්මුඛවීම

42 මිසරයෙහි ධාන්‍ය තිබෙන බව
යාකොබ් දැක තම පුත්‍රයන්ට
කථාකොට: නුඹලා එකිනෙකා දෙස
බල බලා සිටින්නේ මක්නිසාද?
මිසරයෙහි ධාන්‍ය තිබෙන බව ඇසීමි. 2
අප නොනැසී ජීවත්වෙන පිණිස නුඹලා
එහි ගොස් එතැනින් අපට මිලේට
ගනිල්ලායයි කීවේය. එවිට යෝසෙප්ගේ 3
සහෝදරයන් දසදෙනෙක් මිසරයෙන්
ධාන්‍ය මිලේට ගන්නා පිණිස ගියෝය.
නමුත් යාකොබ් යෝසෙප්ගේ සහෝදරවූ 4
බෙන්යමින් ඔහුගේ සහෝදරයන් සමග
නොයැවීය; කුමක් හෙයින්ද: සමහරවිට
ඔහුට නපුරක් පැමිණෙන්ට පුළුවනැයි
ඔහු කීවේය. සාගතය කානාන් දේශයෙහි 5
වූ බැවින් මිලේට ගන්ට ආ තැනැත්තන්
අතරේ ඉශ්‍රායෙල්ගේ පුත්‍රයෝද ආවෝය.
යෝසෙප් දේශයෙහි ආණ්ඩුකාරයාව 6
සිටියේය; දේශයේ මුළු සෙනඟට වික්කේ
ඔහුය. යෝසෙප්ගේ සහෝදරයෝ අවුත්
මුහුණින් බිමට නැමී ඔහුට වැන්දෝය.
යෝසෙප් තමාගේ සහෝදරයන් දැක 7
ඔවුන් ඇඳිනගත්තේය, නුමුත් නාඳුනන්-
නාක් මෙන් පෙන්වා තද ලෙස ඔවුන්ට
කථාකොට: නුඹලා කොතැන සිට
ආවහුදැයි ඔවුන්ගෙන් ඇසීය. ආහාර
මිලේට ගන්නා පිණිස කානාන් දේශ-
යෙන් ආවෙමුයයි ඔව්හු කීවෝය.
යෝසෙප් තමාගේ සහෝදරයන් ඇඳින 8
ගත් නුමුත් ඔව්හු ඔහු ඇඳිනනො-
ගත්තෝය. එවිට යෝසෙප් තමා ඔවුන් 9
ගැන දුටු ස්වප්න සිහිකොට: නුඹලා
ඔත්තුකාරයෝය; දේශයේ බෙලහීනකම
බලන්ට ආවහුයයි ඔවුන්ට කීය. ඔව්හු: 10
නැත ස්වාමීනි, ආහාර මිලේට ගන්නා
පිණිස ඔබගේ මෙහෙකරුවෝ ආවෝය.

*එනම්, මතකනැතිකරවීම.
†එනම්, සඵලවීම.

11 අපි සියල්ලෝම එක මනුෂ්‍යයෙකුගේ
පුත්‍රයෝය; අපි අවංක මනුෂ්‍යයෝය,
ඔබගේ මෙහෙකරුවෝ ඔත්තුකාරයෝ
12 නොවෙතියි කීවෝය. නැත, දේශයේ
බෙලහීනකම බලන්ට ආවහුයයි ඔහු
13 ඔවුන්ට කීය. ඔව්හු: ඔබගේ මෙහෙකරුවූ
අපි සහෝදරයන් දොළොස් දෙනෙක්ය,
කානාන් දේශයෙහි එක මනුෂ්‍යයෙකුගේ
පුත්‍රයෝය; බාල තැනැත්තේ දැනට අපගේ
පියාණන් සමග සිටියි, එක්කෙනෙක්
14 නැත්තේයයි කීවෝය. එවිට යෝසෙප්:
මා නුඹලාට කීවේ ඒකමය, නුඹලා
15 ඔත්තුකාරයෝය. මෙයින් නුඹලා
පරීක්ෂාකරනු ලබන්නහුය. ඵාරාවෝගේ
ජීවිතය පා නුඹලාගේ බාල සහෝදරයා
මෙහි ආවොත් මිස නැත්නම් නුඹලා
මෙතැනින් නොයන්නහුයයි කියමි.
16 නුඹලා තුළ සැබෑකම තිබේද කියා
නුඹලාගේ වචනවලින් පරීක්ෂාකරනු
ලබන පිණිස අනික් අය හිරඅඩස්සියේ
සිටියදී නුඹලාගේ සහෝදරයා
ගෙනෙන්ට නුඹලාගෙන් එක්කෙනෙකු
යවාපල්ලා. නැතහොත් ඵාරාවෝගේ
ජීවිතය පා සැබවින්ම නුඹලා ඔත්තු-
17 කාරයෝයයි කියමියි කීය. මෙසේ
කියා ඔහු ඔවුන් සියල්ලන් තුන් දවසක්
18 එකට හිරගෙයි තැබුවේය. තුන්වෙනි දින
යෝසෙප් ඔවුන්ට කථාකොට: නුඹලා
ජීවත්වෙන පිණිස මෙසේ කරපල්ලා;
මක්නිසාද මම දෙවියන්වහන්සේ
19 කෙරෙහි භය ඇත්තෙමි. නුඹලා අවංක
මනුෂ්‍යයෝ නම් නුඹලාගේ සහෝදර-
යන්ගෙන් එක්කෙනෙක් නුඹලා සිටින
හිරගෙයි හිරඅඩස්සියේ සිටියදී නුඹලා
නුඹලාගේ ගෙවල්වල හිඟකම නිසා
20 ධාන්‍ය රැගෙන පලයල්ලා. නුඹලාගේ
බාල සහෝදරයා මා වෙතට ගෙනෙල්ලා;
මෙයින් නුඹලාගේ වචන සැබෑවන්නේය,
නුඹලාද නොනස්නහුයයි ඔවුන්ට කීය.
21 ඔව්හු එසේ කළෝය. ඔව්හු තම තමන්
අතරේ කථාකොට: අපේ සහෝදරයා
අපට කන්නලව්කරද්දී, ඔහුගේ හෘදය
වේදනාව දැකලාත්, අප ඔහුට කන් නුදුන්
හෙයින් සැබවින් අපි ඔහු ගැන වැරදි-
කාරයෝය; එබැවින් මේ විපත්තිය අපට
පැමිණ තිබේයයි කීවෝය. රූබෙන් 22
ඔවුන්ට උත්තරදෙමින්: ළමයාට විරුද්-
ධව පව් නොකරල්ලාය කියා මම
නුඹලාට නොකීයෙම්ද? එහෙත් නුඹලා
ඇහුවේ නැත. බලව, ඒ නිසාත්, ඔහුගේ
ලේ ගැන පළිගනු ලැබේයයි කීවේය.
යෝසෙප් සහ ඔවුන් අතරේ තෝල්ක- 23
කෙනෙක් සිටි නිසා ඔහුට තේරුණු
බවක් ඔව්හු දැනනොගත්තෝය. ඔහු 24
ඔවුන් වෙතින් අහක්ව ගොස් හැඬුවේය;
නැවතත් ඔහු ඔවුන් ළඟට ඇවිත් ඔවුන්
සමග කථාකර ඔවුන් කෙරෙන් සිමි-
යොන් රැගෙන ඔවුන්ගේ ඇස් හමුයෙහි
බැන්දේය. එවිට යෝසෙප් ඔවුන්ගේ 25
මලුවල ධාන්‍ය පුරවන ලෙසද ඔවුන්ගේ
මුදල් එකිනෙකාගේ ගෝණියෙහි නැවත
තබන ලෙසද මගට කෑම ඔවුන්ට
දෙන ලෙසද ආඥකෙළේය. එසේ 26
ඔවුන්ට කරනලද්දේය. ඔව්හු තමන්ගේ
කොටළුවන් පිට ධාන්‍ය පටවාගෙන
එතැනින් පිටත්ව ගියෝය. නවාතැන්- 27
පළේදී ඔවුන්ගෙන් එක්කෙනෙක් තමාගේ
කොටළුවාට ගොදුරු දෙන්ට තමාගේ
ගෝණිය ඇරිය කල තමාගේ මුදල්
තිබෙනවා දුටුවේය; ඒවා ඔහුගේ ගෝණි
කටෙහි තිබුණේය. ඔහු තම සහෝදර- 28
යන්ට කථාකොට: මාගේ මුදල් නැවත
ලැබී තිබේ; මෙන්න, ඒවා මාගේ
ගෝණියෙහි තිබේයයි කීය. එවිට
ඔවුන්ගේ සිත් කිඳා ගියේය, ඔව්හු
වෙවුලමින් එකිනෙකා දෙසට හැරී:
දෙවියන්වහන්සේ අපට කළාවූ මේ දේ
කිමෙක්දැයි කීවෝය. ඔව්හු කානාන් 29
දේශයට තමන්ගේ පියවූ යාකොබ්
වෙතට අවුත් තමන්ට සිදුවූ සියල්ල
ඔහුට දන්වමින්: දේශයේ අධිපතියාවූ 30
ඒ මනුෂ්‍යයා තද ලෙස අපට කථාකොට
අපි දේශයෙහි ඔත්තු බලන්නෝයයි
සිතුවේය. අපි ඔහුට කථාකොට: අපි 31
අවංක මනුෂ්‍යයෝය; ඔත්තුකාරයෝ
නොවමුව. අපි සහෝදරයන් දොළොස්- 32

දෙනෙක්ය, එක පියාගේ දරුවෝය;
එක්කෙනෙක් නැත්තේය, බාලයා දැනට
කානාන් දේශයෙහි අපේ පියා සමග
33 සිටීයයි කීමුව. එවිට දේශයේ අධිපතියාවූ
ඒ මනුෂ්‍යයා අපට කථාකොට:
තුඹලා අවංක මනුෂ්‍යයන් බව මෙයින්
දැනගන්නෙමි; තුඹලාගේ සහෝ-
දරයන්ගෙන් එක්කෙනෙක් මා ළඟ
නවත්වා, තුඹලාගේ ගෙවල්වල හිඟකම
නිසා ධාන්‍ය රැගෙන පලයල්ලා.
34 තුඹලාගේ බාල සහෝදරයා මා වෙතට
ගෙනෙල්ලා. එවිට තුඹලා ඔත්තු-
කාරයන් නොව අවංක මනුෂ්‍යයන් බව
දැනගන්නෙමි. එවිට තුඹලාගේ සහෝ-
දරයා තුඹලාට භාරදෙන්නෙමි, තුඹ-
ලාට දේශයෙහි වෙළඳම්කරන්ට පුළුවන
35 කියා කීයේයයි කීවෝය. තවද ඔවුන්
තමන්ගේ ගෝණි සිස්කළ කල්හි, බලව,
එක් එක්කෙනාගේ මුදල් මිටිය තම
තමාගේ ගෝණියෙහි තිබුණේය.
ඔව්හුද ඔවුන්ගේ පියාද ඔවුන්ගේ මුදල්
36 මිටි දැක භයවුණෝය. ඔවුන්ගේ පියවූ
යාකොබ්: තුඹලා මාගේ දරුවන්
මාගෙන් තුරන්කළහුය. යෝසෙප්
නැත, සිමියොන් නැත, තුඹලා බෙන්-
යමින්ද ගෙනයන්ට හදන්නාහුය. මේ
37 සියල්ල මට විරුද්ධයයි කීවේය. එවිට
රූබෙන් තමාගේ පියාට කථා-
කොට: මම ඔබ වෙතට ඔහු නැවත
නොගෙනායෙම්නම් මාගේ පුත්‍රයන්
දෙදෙනා මැරුව මැනවි. මා අතට ඔහු
භාරදුන මැනවි, මම ඔහු ඔබ ළඟට
38 නැවත ගෙනඑන්නෙමියි කීවේය. තුමුත්
ඔහු: මාගේ පුත්‍රයා තුඹලා සමග
නොයන්නේය; මක්නිසාද ඔහුගේ
සහෝදරයා මළේය, ඉතිරිව සිටින්නේ
මොහු පමණක්ය. ඉදින් තුඹලා යන
මාර්ගයේදී ඔහුට අනතුරක් වුණොත්
එයින් තුඹලා මාගේ පැසුණු කෙස්
ශෝකයෙන් මිනීවළට පමුණුවන්නාහු-
යයි කීය.

## බෙන්යමින් සමග සහෝදරයන් දෙවෙනි වර මිසරයට යාම

43 දේශයෙහි සාගතය බලවත්ව
පැවතුණේය. ඔවුන් මිසරයෙන් 2
ගෙනාවාවූ ධාන්‍ය කාලා ඉවර වූ කල
ඔවුන්ගේ පියා ඔවුන්ට කථාකොට:
නැවත ගොස් අපට ආහාර ටිකක්
මිලේට ගනිල්ලායයි කීවේය. යූදා ඔහුට 3
කථාකොට: තුඹලාගේ සහෝදරයා
තුඹලා සමග නැත්නම් මාගේ මුහුණ
දකින්නේ නැතැයි ඒ මනුෂ්‍යතෙමේ
අපට සත්තකකොට කීවේය. ඔබ අපගේ 4
සහෝදරයා අප සමග යවන්නෙහි නම්
අපි ගොස් ඔබට ආහාර මිලේට
ගන්නෙමුව. එහෙත් ඔබ ඔහු නො- 5
යවන්නෙහිනම් අපි නොයමුව. මක්නිසාද
ඒ මනුෂ්‍යතෙමේ—තුඹලාගේ සහෝදරයා
තුඹලා සමග නැත්නම් මාගේ මුහුණ
දකින්නේ නැතැයි අපට කීයේයයි කීය.
ඉශ්‍රායෙල්ද: තුඹලාට තව සහෝදරයෙක් 6
ඉන්න බව ඒ මනුෂ්‍යයාට කීමෙන් මට
එපමණ දුකක් පැමිණෙවුවේ මක්නිසා-
දැයි කීවේය. ඔව්හුද: තුඹලාගේ පියා 7
තවම ජීවත්ව සිටින්නේද? තුඹලාට තව
සහෝදරයෙක් ඉන්නේදැයි කියමින් ඒ
මනුෂ්‍යයා අප ගැනත් අපේ නෑයන්
ගැනත් විශේෂලෙස අපෙන් විචාළේය;
ඒ වචන ප්‍රකාරයට අපි ඔහුට දුන්නුවෙමු.
තුඹලාගේ සහෝදරයා මෙහි ගෙනෙල්-
ලායයි ඔහු කියන බව අපට යම්
හැටියකින් දැනගන්ට පුළුවන්වීදැයි
කීවෝය. යූදා තමාගේ පියවූ ඉශ්‍රායෙල්ට 8
කථාකොට: අප සහ ඔබත් අපේ
දරුවනුත් නොනැසී ජීවත්වන ලෙස අප
පිටත්වී යන පිණිස තරුණයා මා සමග
යැවුව මැනවි. මම ඔහු වෙනුවට 9
ඇපකාරයෙක් වන්නෙමි; ඔබ මා අතින්
ඔහු ඉල්ලනු මැනවි. ඉදින් මම ඔබ
වෙතට ඔහු ගෙනවුත් ඔබ ඉදිරියෙහි
නොසිටෙවුවෙම් නම්, ඒ දෝෂය හැම
කල්හි මා පිට වේවා. මක්නිසාද අපි 10
ප්‍රමාද නුණෙමුනම් සැබවින්ම දෙවෙනි
වරත් ගොස් මෙලහකට හැරී එන්ට

11 තිබුණේයයි කීය. ඔවුන්ගේ පියවූ
ඉශ්‍රායෙල්ද: එසේ විය යුතුම නම් මේක
කරපල්ලා; මේ දේශයේ අනර්ඝ දේ වන
ගුගුල් ටිකක්ද මීපැණි ටිකක්ද සුගන්ධ
ද්‍රව්‍යද සුවඳලාටුද පිස්ටැසියා ඇටද
කොට්ටම්බාද තුඹලාගේ භාජනවල
දමා ඒ මනුෂ්‍යයාට තෑග්ගක් පිණිස
12 ගෙනියාපල්ලා. මුදල් දෙගුණයක්
තුඹලාගේ අත්වල තබාගනිල්ලා;
තුඹලාගේ ගෝණි කටවල තිබී ගෙනා
මිල නැවත තුඹලාගේ අත්වල ගෙනියා-
පල්ලා; ඒක වැරදිල්ලක් වෙන්ට ඇත.
13 තුඹලාගේ සහෝදරයාද කැඳවාගෙන
පිටත්වී ඒ මනුෂ්‍යයා වෙතට නැවත
14 පලයල්ලා. ඒ මනුෂ්‍යයා තුඹලාගේ
අනික් සහෝදරයාද බෙන්යමින්ද
තුඹලාට නිදහස් කර දෙන පිණිස
සර්වපරාක්‍රම දෙවියන්වහන්සේ ඔහුගෙන්
තුඹලාට කරුණාව ලැබෙන්ට සලස්වන-
සේක්වා. මාගේ දරුවන් මා කෙරෙන්
තුරන් වුණොත් මම සැබවින්ම දරුවන්
නැති කෙනෙක් මෙන් වෙමියි ඔවුන්ට
කීවේය.
15 ඒ මනුෂ්‍යයෝ ඒ තෑග්ග රැගෙන,
මුදල් දෙගුණයක් අත්වල තබාගෙන,
බෙන්යමින්ද කැඳවාගෙන, පිටත්ව
මිසරයට ගොස් යෝසෙප් ඉදිරියෙහි
16 සිටියෝය. යෝසෙප් ඔවුන් සමග
බෙන්යමින් සිටිනවා දුටු කල්හි තමාගේ
ගෙයි ගබඩාකාරයාට කථාකොට:
මේ මනුෂ්‍යයන් ගෙට කැඳවාගන
ගොස් සතුන් මරා පිළියෙළ කරපන්න;
මක්නිසාද මේ මනුෂ්‍යයෝ දවාලට මා
17 සමග කන්නෝයයි කීවේය. ඒ මනුෂ්‍යයා
යෝසෙප් අණකළ ලෙස කෙළේය; ඔහු
ඒ මනුෂ්‍යයන් යෝසෙප්ගේ ගෙට කැඳවා-
18 ගෙන ගියේය. එසේ යෝසෙප්ගේ ගෙට
තමන් කැඳවාගෙන ගිය බැවින් ඒ
මනුෂ්‍යයෝ භයවූහ; ඔව්හු කථාකොට:
අප ඇතුළට ගෙනයන්නේ පළමු වර
අපේ ගෝණිවල තිබී නැවත ලැබුණු
මුදල් නිසා අප පිටට වරද පමුණුවා,
අප අල්ලා, අප දසයන් කරගෙන,
අපේ කොටළුවන්ද ගන්නා පිණිසයයි
කීවෝය. ඔව්හු යෝසෙප්ගේ ගෙයි 19
ගබඩාකාරයාට ළංවී ගෙයි දොරකඩදී
ඔහුට කථාකරමින්: අනේ ස්වාමීනි, 20
පළමු වර අපි ආහාර මිලේට ගන්නා
පිණිස ආවෙමු. තවද අපි නවාතැන්පළට 21
අවුත් අපේ ගෝණි ඇරිය කල්හි අපේ
මුදල් සම්පූර්ණ බරට එක්එක්කෙනාගේ
ගෝණි කටේ තිබුණේය. අපේ අත්වල
නැවත ඒවා ගෙනාවෙමු. ආහාර 22
මිලේට ගන්නා පිණිස වෙන මුදල්ද
අප අත්වල ගෙනාවෙමුව. අපේ මුදල්
අපේ ගෝණිවල දැමුවේ කවුදැයි නො-
දනිමුයයි කීවෝය. ඔහුද: තුඹලාට 23
සමාදනය වේවා, භයනොවෙල්ලා.
තුඹලාගේද තුඹලාගේ පියාණන්ගේද
දෙවියන්වහන්සේ තුඹලාගේ ගෝණිවල
තුඹලාට වස්තුවක් දුන්සේක. තුඹලාගේ
මුදල් මට ලැබුණේයයි කීවේය. තවද
ඔහු සිමියොන් ඔවුන් වෙතට පිටතට
ගෙනායේය. ඒ මනුෂ්‍යයා ඔවුන් 24
යෝසෙප්ගේ ගෙට කැඳවාගෙන ගොස්
ඔවුන්ට වතුර දුන්නේය, ඔව්හු පාද
සෝදගත්තෝය; ඔහු ඔවුන්ගේ කොටළු-
වන්ටත් ගොදුරු දුන්නේය. තමන් එහිදී 25
කෑම කන්ට යන බව ඔව්හු අසා
ඉරමුදුන් වේලාවේ යෝසෙප්ගේ ඊම වන
තුරු තමන්ගේ තෑග්ග සූදනම්කර
තැබුවෝය. යෝසෙප් ගෙදර ආ කල්හි 26
ඔව්හු තමන්ගේ අත්වල තිබුණු තෑග්ග
ඔහු වෙතට ගෙට ගෙනැවිත් බිමට නැමී
ඔහුට වැන්දෝය. ඔහු ඔවුන්ගේ සැප 27
සනීප අසා: තුඹලා කී මහලු මනුෂ්‍යයාවූ
තුඹලාගේ පියාණෝ සනීපෙන්ද? ඔහු
තවම ජීවත්ව සිටීදැයි ඇසුවේය. ඔබගේ 28
මෙහෙකරුවූ අපගේ පියා සනීපෙන්ය,
තවම ජීවත්ව සිටීයයි ඔව්හු කීවෝය.
තවද ඔව්හු හිස්නමා වැන්දෝය. ඔහු 29
තමාගේ ඇස් ඔසවා තමාගේ මවුගේ
පුත්‍රවූ තමාගේ සහෝදරවූ බෙන්යමින්
දැක: තුඹලා කී තුඹලාගේ බාල
සහෝදරයා මොහුදැයි අසා: මාගේ
පුත්‍රය, දෙවියන්වහන්සේ තුඹට

30 කරුණාකරනසේක්වයි කීවේය. යෝසෙප්-
ගේ සිත තමාගේ සහෝදරයා කෙරෙහි
උණුවුණු බැවින් ඔහු ඉක්මන්වී හඬන්ට
ස්ථානයක් සොයා ඇතුල් ගෙට ගොස්
31 එහිදී හැඬීය. ඔහු මුහුණ සෝද පිටතට
අවුත් තමාම හික්මවාගෙන: කෑම
32 ඇරපල්ලායයි කීය. ඔව්හු ඔහුට වෙනමද
ඔවුන්ට වෙනමද ඔහු සමග කන
මිසරවරුන්ට වෙනමද කෑම ඇරියෝය.
කුමක්හෙයින්ද මිසරවරුන්ට හෙබ්‍රෙව්-
වරුන් සමග කන්ට නුපුළුවන; මක්නිසාද
33 ඒක මිසරවරුන්ට පිළිකුලක්ය. ඔව්හු
ඔහු ඉදිරියෙහි වැඩිමලා තමාගේ
කුලුඳුල්කම ලෙසද බාලයා තමාගේ
බාලකම ලෙසද හිඳගන උන්නෝය.
ඊට ඒ මනුෂ්‍යයෝ පුදුමයෙන් ඔවුනොවුන්
34 දෙස බැලුවෝය. ඔහු තමන් ඉදිරියෙන්
කෑම කොටස් ඔවුන්ට යැවුවේය. ඔවුන්
සියල්ලන්ගේ කොටස්වලට වඩා
බෙන්යමින්ගේ කොටස පස් වරක්
වැඩිව තිබුණේය. ඔව්හු බී ඔහු සමග
ප්‍රීතිමත් වූහ.

## යෝසෙප් තම සහෝදරයන් පරීක්ෂාකිරීම

44 තවද ඔහු තමාගේ ගෙයි
ගබඩාකාරයාට අණකොට:
ගෙනගිය හැකි පමණ ආහාරයෙන් ඒ
මනුෂ්‍යයන්ගේ ගෝණි පුරවා එක් එක්
කෙනාගේ මුදල ඒ ඒ තැනැත්තාගේ
2 ගෝණි කටේ තබාපන්න. තවද
බාලයාගේ ගෝණි කටේ මගේ කුසලාන
එනම් රිදී කුසලානද ඔහුගේ ධාන්‍ය
මුදලද තබාපන්නැයි කීවේය. ඔහු
3 යෝසෙප් කී ලෙස කෙළේය. උදය එළිවූ
වහාම ඒ මනුෂ්‍යයෝද ඔවුන් සමග
ඔවුන්ගේ කොටළුවෝද පිටත් කරන-
4 ලද්දෝය. ඔවුන් නුවරින් පිටත වැඩිදුර
යන්ට ප්‍රථම යෝසෙප් තමන් ගබඩා-
කාරයාට කථාකොට: නැගිට ඒ
මනුෂ්‍යයන් පසුපස්සේ පලයන්න; නුඹ
ඔවුන් කිට්ටුකළාම: නුඹලා යහපතට
5 අයහපත කළේ මක්නිසාද? මාගේ
ස්වාමියා බොන්නෙත් ශාස්ත්‍ර කියන්නෙත්
මේකෙන් නොවේද? නුඹලා කළේ නපුරු
ක්‍රියාවකැයි කියාපන්නැයි කීවේය.
ඔහු ඔවුන් කිට්ටුකර මේ වචන ඔවුන්ට 6
කීවේය. ඔව්හුද: අපේ ස්වාමියා මෙයා- 7
කාර වචන කියන්නේ මක්නිසාද? එබඳු
දෙයක් කිරීම ඔබගේ මෙහෙකරුවන්ගෙන්
දුරුවේවා. බැලුව මැනවි, අපේ ගෝණි 8
කටවල තිබී අපට සම්බවූ මුදල් අපි
කානාන් දේශයේ සිට නැවත ඔබ වෙතට
ගෙනාවෙමු. එසේවී නම් අප විසින්
ඔබගේ ස්වාමියාගේ ගෙයින් රන්වත්
රිදීවත් සොරකම්කරන්නේ කොහොමද?
ඔබගේ මෙහෙකරුවන්ගෙන් යමෙකු වෙත 9
ඒක තිබී සම්බවුණොත් ඔහු නසීවා,
අපිද මාගේ ස්වාමියාට දසයෝ වන්නෙමු-
යයි කීවෝය. ඔහුද: දැනුදු නුඹලාගේ 10
වචන ලෙසම වේවා. ඒක යමෙකු වෙත
තිබී සම්බවන්නේද ඔහු මාගේ දසයා
වන්නේය; නුඹලා නිර්දෝෂවන්නහුයයි
කීවේය. එවිට ඔව්හු ඉක්මන් කොට 11
සියල්ලෝ තම තමාගේ ගෝණි බිමට
බා තම තමාගේ ගෝණි ලිහුවෝය.
ඔහු වැඩිමහල්ලාගෙන් පටන්ගෙන 12
බාලයා දක්වා සෙවූ කල කුසලාන
බෙන්යමින්ගේ ගෝණියෙහි තිබී
සම්බවිය. එවිට ඔව්හු තමන් වස්ත්‍ර 13
ඉරාගෙන තම තමන්ගේ කොටළුවන්
පිට බඩු පටවා නුවරට හැරීගියෝය.
යූදද ඔහුගේ සහෝදරයෝද යෝසෙප්ගේ 14
ගෙට පැමුණුණෝය; ඔහු ඒ වන
තෙක් එහි සිටියේය. ඔව්හු වනාහි
ඔහු ඉදිරියෙහි බිම වැටුණෝය.
යෝසෙප්: නුඹලා කළාවූ මේ ක්‍රියාව 15
කිමෙක්ද? මා වැනි මනුෂ්‍යයෙකුට
ශාස්ත්‍ර කියන්ට සැබවින්ම පුළුවන් බව
නොදනිවුදැයි ඔවුන්ට කීවේය. යූද 16
කියනුයේ: මාගේ ස්වාමියාට අපි කුමක්
කියමුද? කුමක් කථාකරමුද? අපි කෙසේ
අපම නිර්දෝෂකරගනිමුද? දෙවියන්-
වහන්සේ ඔබගේ මෙහෙකරුවන්ගේ
අපරාධය සොයාගත්සේක. බැලුව
මැනවි, කුසලාන යමෙකු අත තිබී

සම්බවීද ඔහුත් අපිත් මාගේ ස්වාමි-
17 යාගේ දසයෝ යයි කීය. ඔහු: එසේ
කිරීම මාගෙන් දුරුවේවා. කුසලාන
යමෙකු අතේ තිබී සම්බවීද ඔහු මාගේ
දසයා වන්නේය; තුඹලා තුඹලාගේ පියා
වෙතට සමාදනයෙන් පලයල්ලායයි
කීවේය.
18 එවිට යූද ඔහුට ළංවී: අහෝ, ස්වාමීනි,
ඔබගේ දසයාට මාගේ ස්වාමීන්
ඉදිරියෙහි වචනයක් කියන්ට අවසර
ලැබේවා, ඔබගේ උදහස ඔබගේ
මෙහෙකරුවාට විරුද්ධව නොඇවිළේවා.
මක්නිසාද ඔබ ඵාරාවෝ හා සමානය.
19 තුඹලාට පියෙක්වත් සහෝදරයෙක්වත්
ඇත්තේදැයි මාගේ ස්වාමියා ඔබගේ
20 මෙහෙකරුවන්ගෙන් ඇසුවේය. අපට
වයෝවෘද්ධයෙක්වූ පියෙක්ද ඔහුගේ මහලු
වයසේදී උපන් කුඩා දරුවෙක්ද සිටිති;
ඔහුගේ සහෝදරයා මළේය, ඔහුගේ
මවුගෙන් ඔහු පමණක් ඉතුරුව සිටියි,
ඔහුගේ පියාද ඔහුට ආදරේ ඇත්තේ-
21 යයි අපි මාගේ ස්වාමීන්ට කීවෙමු. ඔබද:
මාගේ ඇස්වලින් ඔහු දකින පිණිස ඔහු
මා වෙතට ගෙනෙල්ලායයි ඔබගේ
22 දසයන්ට කීවෙහිය. ළමයාට තමාගේ
පියා අත් අරින්ට බැරිය. ඔහු තමාගේ
පියා අත් ඇරියොත් ඔහුගේ පියා මැරේ-
යයි අපි මාගේ ස්වාමීන්ට කීවෙමුව.
23 ඔබද: තුඹලාගේ බාල සහෝදරයා
තුඹලා සමග ආවොත් මිස නැත්නම්
තුඹලා නවත් මාගේ මුහුණ දකින්නේ
නැතැයි ඔබගේ මෙහෙකරුවන්ට
24 කීයෙහිය. තවද අපි ඔබගේ දසවූ මාගේ
පියාණන් වෙතට පැමිණි කල්හි මාගේ
25 ස්වාමීන්ගේ වචන ඔහුට කීමුව. තුඹලා
නැවත ගොස් අපට කෑම ටිකක් මිලේට
26 ගනිල්ලායයි අපේ පියා කීවේය. එවිට
අපි—අපට යන්ට බැරිය. අපේ බාල
සහෝදරයා අප සමග යන්නේ නම්
යමුව. මක්නිසාද අපේ බාල සහෝදරයා
අප සමග නොගියොත් ඒ මනුෂ්‍යයාගේ
මුහුණ දකින්ට අපට අවසර
27 නොලැබෙන්නේයයි කීමුව. ඔබගේ
මෙහෙකරුවූ මාගේ පියාණෝ කථා-
කොට: මාගේ භාර්යාව මා නිසා
පුත්‍රයන් දෙදෙනෙකු වැදූ බව තුඹලා
දන්නහුය. එක් කෙනෙක් මා කෙරෙන් 28
ගියේය, සැබවින්ම ඔහු ඉරාදමනලද්දේයයි
කීමි; එද පටන් ඔහු නුදුටිමි. තුඹලා 29
මොහුත් මා කෙරෙන් ගෙන ගොස් ඔහුට
නපුරක් පැමුණුණොත්, තුඹලා මාගේ
පැසුණු හිසකේ ශෝකයෙන් සොහොනට
පමුණුවනවා ඇතැයි කීය. ඉතින් ළමයා 30
අප සමග නැතුව ඔබගේ මෙහෙකරුවූ
මාගේ පියා වෙතට මා පැමිණි කල
ඔහුගේ ප්‍රාණය ළමයාගේ ප්‍රාණයට
බැඳී තිබෙන බැවින්, ළමයා අප සමග 31
නැති බව දක්නා විට ඔහු මියයන්නේය.
මෙසේ ඔබගේ මෙහෙකරුවෝ ඔබගේ
මෙහෙකරුවූ අපේ පියාගේ පැසුණු
හිසකේ ශෝකයෙන් සොහොනට
පමුණුවන්නෝය. මක්නිසාද: මම ඔහු 32
ඔබ වෙතට නොගෙනායෙම් නම් මාගේ
පියාට සෑම කල්හිම දෝෂකාරයෙක්
වෙන්නෙමැයි කියා ඔබගේ මෙහෙකරුවා
ළමයා වෙනුවට මාගේ පියාට ඇප-
කාරයෙක් වූණේය. එබැවින් ළමයා 33
වෙනුවට ඔබගේ මෙහෙකරුවා මාගේ
ස්වාමීන්ට දසව සිටින්ටත් ළමයාට
තමාගේ සහෝදරයන් සමග යන්ටත්
අවසර දෙන ලෙස ඉල්ලමි. මක්නිසාද 34
ළමයා මා සමග නැතුව මාගේ පියා
වෙතට මා යන්නේ කෙසේද? එසේ
ගියොත් මාගේ පියාට සිද්ධවෙන විපත
මට දකින්ට වෙනවා ඇතැයි කීවේය.

## යෝසෙප් තම සහෝදරයන්ට ප්‍රකාශවීම. පියා කැඳවනුලැබීම

45 එකල්හි යෝසෙප් තමන්
සමග සිටි සියල්ලන් ඉදිරියෙහි
ඉවසාගන්ට නොහැකිව: සියලු මිනිසුන්
මා වෙතින් පිටතට ඇරපල්ලායයි
මොරගසා කීය. යෝසෙප් තමාගේ
සහෝදරයන්ට තමාම අඳුන්වාදෙන
අතර ඔහු සමග කිසිවෙක් නොසිටියේය.
ඔහු ශබ්ද නගා හැඬීය. එය මිසරවරුන්ට 2

ඇසුණේය, ඵාරාවෝගේ ගෙයි වැසි-
3 යන්ටත් ඇසුණේය. යෝසෙප් තමා-
ගේ සහෝදරයන්ට කථාකොට: මම
යෝසෙප්ය; මාගේ පියා තවම ජීවත්ව
සිටීදැයි ඇසුවේය. ඔහුගේ සහෝදරයෝ
ඔහුට උත්තරදෙන්ට නොහැකිවූවෝය;
මක්නිසාද ඔහු ඔවුන් ඉදිරියෙහි වූ
4 බැවින් ඔව්හු කැලඹී සිටියෝය. යෝසෙප්:
අනේ මා ළඟට වරෙල්ලායයි තමාගේ
සහෝදරයන්ට කීය. ඔව්හු ළංවුණෝය.
එවිට ඔහු: මම තුඹලා මිසරයට
වික්කාවූ තුඹලාගේ සහෝදරවූ
5 යෝසෙප්ය. තුඹලා මේ රටට මා වික්ක
නිසා ශෝකනොවෙල්ලා, තුඹලාටම
කෝපනොවෙල්ලා. මක්නිසාද දෙවියන්-
වහන්සේ ජීවිත ආරක්ෂාකරන පිණිස
6 තුඹලාට පෙරටුව මා එවූසේක. කුමක්-
හෙයින්ද මේ දෑවුරුද්දේ දේශයෙහි
සාගතය පැවතුණේය. සීසෑමක්වත්
කැපීමක්වත් නැත්තාවූ තවත් පස්
7 අවුරුද්දක් වන්නේය. දෙවියන්වහන්සේ
තුඹලා පොළොවෙහි ඉතිරිකරන
පිණිසද මහත්වූ ගැළවීමකින් තුඹලාගේ
ජීවිත ආරක්ෂාකරන පිණිසද තුඹලාට
8 පෙරටුව මා එවූසේක. එබැවින් මා
මෙහි එවූවේ තුඹලා නොව දෙවියන්-
වහන්සේය. උන්වහන්සේ මා ඵාරාවෝට
පියෙක්ද ඔහුගේ මුළු ගෙදරට ස්වාමියෙක්ද
මුළු මිසර දේශයට ආණ්ඩුකාරයෙක්ද
9 කළසේක. තුඹලා ඉක්මන්කොට මාගේ
පියා වෙතට ගොස්: ඔබගේ පුත්‍රවූ
යෝසෙප් මෙසේ කියයි—දෙවියන්-
වහන්සේ මා මුළු මිසර දේශයට
ස්වාමියා කළසේක. ප්‍රමාද නොව මා
10 වෙතට අව මැනවි. ඔබ ගෝෂෙන්
දේශයෙහි වාසයකරමින් ඔබද ඔබගේ
දරුවෝද ඔබගේ දරුවන්ගේ දරුවෝද
ඔබගේ එළු බැටළු රැළවල්ද ඔබගේ
ගව රැළවල්ද ඔබ සන්තක සියල්ලෝද
11 මා ළඟ සිටින්නහුය. ඔබද ඔබගේ ගෙයි
වැසියන්ද ඔබ සන්තක සියල්ලන්ද දිළිඳු
බවට නොපැමිණෙන පිණිස එහි ඔබ
රක්ෂා කරන්නෙමි; මක්නිසාද සාගතය
තව අවුරුදු පහක් පවතින්නේයයි
කියාපල්ලා. මෙන්න, තුඹලාට කථා- 12
කරන්නේ මාගේ මුඛය බව තුඹලාගේ
ඇස්වලටද මාගේ සහෝදරවූ බෙන්-
යමින්ගේ ඇස්වලටද පෙනෙයි. තුඹලා 13
මිසරයෙහි මාගේ සියලු ඓශ්වර්යය
ගැනද තුඹලා දුටු සියල්ල ගැනද මාගේ
පියාට දන්වා ඉක්මන්කොට මාගේ පියා
මෙහි කැඳවාගෙන වරෙල්ලායයි තමාගේ
සහෝදරයන්ට කීය. තවද ඔහු තම 14
සහෝදරවූ බෙන්යමින්ගේ බෙල්ල බැද-
ගෙන හැඬීය; බෙන්යමින්ද ඔහුගේ
බෙල්ල බැදගෙන හැඬීය. ඔහු තමාගේ 15
සියලු සහෝදරයන් සිඹ ඔවුන් වැලඳ-
ගෙන හැඬුවේය. ඉන්පසු ඔහුගේ
සහෝදරයෝ ඔහු සමග කථා කළෝය.
යෝසෙප්ගේ සහෝදරයෝ ආවෝය 16
කියා ඵාරාවෝගේ ගෙයි වැසියන්ට
ආරංචිවිය. ඵාරාවෝද ඔහුගේ සේවක-
යෝද ඊට බොහෝ ප්‍රසන්නවූවෝය.
ඵාරාවෝ යෝසෙප්ට කථාකොට: තුඹලා 17
මෙසේ කරපල්ලායයි තුඹේ සහෝදර-
යන්ට කියාපන්න—තුඹලාගේ මෘගයන්
පිට බඩු පැටවිලිකරගෙන ගොස්
කානාන් දේශයට පැමිණ, තුඹලාගේ 18
පියාණන් සහ තුඹලාගේ පවුල්ද රැගෙන
මා වෙතට වරෙල්ලා. මම මිසර දේශයේ
ඉතා හොඳ දේ තුඹලාට දෙන්නෙමි,
තුඹලා දේශයේ සාරය භුක්ති විඳින්නහුය.
දැනුදු තුඹට අණ ලැබුණු බැවින් මෙසේ 19
කරපල්ලායයි ඔවුන්ට කියාපන්න—තුඹලා
තුඹලාගේ දරුවන්ටද භාර්යාවන්ටද
මිසර දේශයෙන් ගැල් රැගෙන ගොස්,
තුඹලාගේ පියා කැඳවාගෙන වරෙල්ලා.
තුඹලාගේ බඩු ගැන කරදර- 20
නොවෙල්ලා; මක්නිසාද මුළු මිසර
දේශයේ ඉතා හොඳ දේ තුඹලාගේය
කියාපන්නැයි කීයේය. ඉශ්‍රායෙල්ගේ 21
පුත්‍රයෝ එලෙස කළෝය. ඵාරාවෝගේ
අණ ලෙස යෝසෙප් ගැල්ද මගට කෑමද
ඔවුන්ට දුන්නේය. ඔහු ඔවුන් එකිනෙකාට 22
ඇඳුම් කුට්ටමක් බැගින් දුන්නේය; නුමුත්
බෙන්යමින්ට රිදී තුන්සියයක් සහ ඇඳුම්

23 කුට්ටම් පහක් දුන්නේය. ඔහු තමාගේ
පියාට මෙයාකාරයෙන් යැවීය: එනම්.
මිසරයේ හොඳ දේවල් පටවනලද
කොටළුවන් දසදෙනෙකුත් තමාගේ
පියාට මගට ධාන්‍යද රොටිද
භෝජනද පටවන ලද කොටළුදෙනුන්
24 දසදෙනෙකුත් යැවුවේය. මෙසේ ඔහු
තමන් සහෝදරයන් හැරියේය. ඔව්හු
පිටත්ව ගියෝය. තවද: මගදී
ඩබරනොකරන්ට බලාගනිල්ලායයි ඔහු
25 ඔවුන්ට කීවේය. ඔව්හු මිසරයෙන් නික්ම
ගොස් කානාන් දේශයෙහි තමන්ගේ
පියවූ යාකොබ් වෙතට පැමිණියෝය.
26 තවද ඔව්හු: යෝසෙප් තවම ජීවත්ව
සිටියි, ඔහු මුළු මිසර දේශයට
ආණ්ඩුකාරයායයි ඔහුට කීවෝය.
ඔහුගේ සිත ක්ලාන්තවිය, මක්නිසාද
ඔහු ඔවුන් කී දේ විශ්වාස කළේ නැත.
27 ඔව්හුද යෝසෙප් තමන්ට කී සියලු වචන
ඔහුට කීවෝය. තමා ගෙනයන පිණිස
යෝසෙප් එවූ ගැල් ඔවුන්ගේ පියවූ
යාකොබ් දුටු කල ඔහුගේ සිත
28 ප්‍රාණවත්විය. ඉතින් ඇත; මාගේ පුත්‍රවූ
යෝසෙප් තවම ජීවත්ව සිටියි. නහින්ට
පළමුවෙන් ගොස් මම ඔහු දක්නෙමියි
ඉශ්‍රායෙල් කීවේය.

## යාකොබ් මිසරයට ගමන්කිරීම

46 ඉශ්‍රායෙල් තමා සන්තක
සියල්ල රැගෙන ගමන් ගෙන
බෙයර්-ෂෙබාවට පැමිණ තමාගේ පියවූ
ඊසාක්ගේ දෙවියන්වහන්සේට පූජා
2 ඔප්පුකෙළේය. දෙවියන්වහන්සේ රාත්‍රියේ
දර්ශනවලින් ඉශ්‍රායෙල්ට කථාකොට:
යාකොබ්, යාකොබ් යයි කීසේක.
3 මම මෙහි යයි ඔහු කීවේය. එවිට
උන්වහන්සේ: මම දෙවියන්වහන්සේය.
නුඹේ පියාගේ දෙවියන්වහන්සේය.
මිසරයට යන්ට භයනොවව; කුමක්-
හෙයින්ද මම එහිදී නුඹ මහත් ජාතියක්
4 කරන්නෙමි. මම නුඹ සමග මිසරයට
යන්නෙමි; සැබවින් මම නුඹ නැවත
ගෙනෙන්නෙමි. යෝසෙප්ද ඔහුගේ අත
නුඹේ ඇස් පිට තබන්නේයයි කීසේක.
පසුව යාකොබ් බෙයර්-ෂෙබාවෙන් 5
පිටත්වුණේය. ඉශ්‍රායෙල්ගේ පුත්‍රයෝ ඔහු
ගෙනයන පිණිස ඵාරාවෝ එවූ ගැල්වලින්
තමන්ගේ පියවූ යාකොබ්ද තමන්
දරුවන්ද භාර්යාවන්ද ගෙන ගියෝය.
ඔව්හු තමන්ගේ සිව්පාවුන්ද කානාන් 6
දේශයෙහිදී ලබා ගත් සම්පත්ද රැගෙන
මිසරයට පැමිණියෝය, මෙසේ යාකොබ්
සහ ඔහු සමග ඔහුගේ මුළු වංශයද
ගියෝය. ඔහු තමාගේ පුත්‍රයන්ද තමාගේ 7
පුත්‍රයන්ගේ පුත්‍රයන්ද තමාගේ දූවරුන්ද
තමාගේ පුත්‍රයන්ගේ දූවරුන්ද තමාගේ
මුළු වංශයද තමා සමග මිසරයට
ගෙනායේය.

මිසරයට පැමිණියාවූ ඉශ්‍රායෙල් 8
පුත්‍රයන්ගේ නම් මේය: යාකොබ් සහ
ඔහුගේ පුත්‍රයෝය. යාකොබ්ගේ කුලුඳුලාවූ
රූබෙන්ය. රූබෙන්ගේ පුත්‍රයෝ, හනොක්, 9
පල්ලු. හෙශ්රොන් සහ කර්මීය.
සිමියොන්ගේ පුත්‍රයෝ. යෙමුවෙල්. 10
යාමීන්. ඔහද්. යාකීන්, ශොහාර් සහ
කානානිය ස්ත්‍රියෙකුගේ පුත්‍රවූ ෂාවුල්ය.
ලෙවීගේ පුත්‍රයෝ. ගේර්ෂොන්, කොහාත් 11
සහ මෙරාරීය. යූදගේ පුත්‍රයෝ. එර්. 12
ඕනාන්. ෂෙලා, පෙරෙශ් සහ ශෙරාය.
එහෙත් එර් සහ ඕනාන් කානාන්
දේශයේදී නැසුණෝය. පෙරෙශ්ගේ
පුත්‍රයෝ. හෙශ්රොන් සහ හාමූල්ය.
ඉස්සාඛර්ගේ පුත්‍රයෝ. තෝලා, පූවා, 13
යෝබ් සහ ෂිම්රොන්ය. සාබුලොන්ගේ 14
පුත්‍රයෝ. සෙරෙද්. ඒලොන් සහ
යාලෙයෙල්ය. මොව්හු ලෙයාගේ 15
පුත්‍රයෝය. ඈ ඔවුන් සහ යාකොබ්ගේ
දුවවූ දීනාද පදන්-අරාමේදී ඔහු නිසා
වැදුවාය. ඔහුගේ සියලු පුත්‍රයොත් දූවරුත්
තිස් තුන් දෙනෙක්ය. ගාද්ගේ පුත්‍රයෝ, 16
ශිෆියොන්. හග්ගි. ෂූනී. එශ්බොන්, ඒරි.
අරෝදි සහ අරේලීය. ආෂේර්ගේ පුත්‍රයෝ. 17
ඉම්නා, ඉෂ්වා. ඉෂ්වී. බෙරියා සහ
ඔවුන්ගේ සහෝදරීවූ සෙරාය. බෙරියාගේ
පුත්‍රයෝ. හෙබෙර් සහ මල්කීයෙල්ය.
ඔව්හු ලාබන් තමාගේ දියණියවූ ලෙයාට 18

දූන් ශිල්පාගේ පුත්‍රයෝය, ඈ යාකොබ්
නිසා ඔවුන් වැදූවාය, ඔව්හු සොළොස්
19 දෙනෙක්ය. යාකොබ්ගේ භාර්යාවවූ
රාබෙල්ගේ පුත්‍රයෝ, යෝසෙප් සහ
20 බෙන්යමින්ය. යෝසෙප්ට මිසර දේශයේදී
මනස්සේ සහ එප්‍රායිම් උපන්නෝය,
ඕන්හි පූජකයාවූ පෝති-පෙරාගේ දූවූ
ආසෙනත් ඔවුන් ඔහු නිසා වැදූවාය.
21 බෙන්යමින්ගේ පුත්‍රයෝ, බෙලා, බෙකෙර්,
අෂ්බෙල්, ගේරා, නාමාන්, ඒහී, රොෂ්,
22 මුප්පීම්, හුප්පීම් සහ ආර්ද්ය. මොව්හු
යාකොබ්ට උපන් රාබෙල්ගේ පුත්‍රයෝය.
ඒ සියලු දෙනම දසසතර දෙනෙක්ය.
23,24 දන්ගේ පුත්‍රයෝ නම් හුෂිම්ය. නප්තලීගේ
පුත්‍රයෝ, යාශෙයෙල්, ගූනී, යේශෙර් සහ
25 ෂිල්ලෙම්ය. ඔවුන් ලාබන් තමාගේ
දියණියවූ රාබෙල්ට දූන් බිල්හාගේ
පුත්‍රයෝය, ඈ යාකොබ් නිසා ඔවුන්
වැදූවාය. ඒ සියල්ලෝ සත් දෙනෙක්ය.
26 යාකොබ්ගේ පුත්‍රයන්ගේ භාර්යාවන් හැර
යාකොබ්ගේ කටියෙන් නික්මුණාවූ,
ඔහු සමග මිසරයට පැමිණියාවූ
27 සියල්ලෝ සැට සදෙනෙක්ය. යෝසෙප්ට
මිසරයෙහිදී උපන් පුත්‍රයෝ දෙදෙනෙක්ය.
මිසරයට පැමිණියාවූ යාකොබ්ගේ ගෙයි
සියල්ලෝ සැත්තෑදෙනෙක්ය.

## ඉශ්‍රායෙල් ගෝෂෙන්හි විසීම

28 ගෝෂෙන්ට යන මාර්ගය පෙන්වන
පිණිස ඔහු තමාට පෙරටුව යූදා යෝසෙප්
වෙතට යැවීය; ඔව්හු ගෝෂෙන් දේශයට
29 පැමිණියෝය. යෝසෙප් තමාගේ රථය
සූදානම්කොට තමාගේ පියවූ ඉශ්‍රායෙල්
සම්මුඛවෙන පිණිස ගෝෂෙන්ට ගියේය;
ඔහු ඉදිරියට පැමිණ, ඔහුගේ බෙල්ල
වැලඳගෙන, ඔහුගේ බෙල්ලට හාන්සිවී,
30 බොහෝ වේලා හැඬුවේය. එවිට
ඉශ්‍රායෙල් යෝසෙප්ට කථාකොට: මා
ඔබගේ මුහුණ දැක ඔබ තවම ජීවත්ව
සිටින බව දැනගත් බැවින් ඉතින් මට
මරණය පැමුණුණාවේයයි යෝසෙප්ට
31 කීවේය. යෝසෙප් තමාගේ සහෝදර-
යන්ටද තම පියාගේ ගෙයි වැසියන්ටද
කථාකොට: මම ඵාරාවෝ වෙතට
ගොස්: කානාන් දේශයෙහි සිටියාවූ
මාගේ සහෝදරයෝත් මාගේ පියාගේ
ගෙයි වැසියෝත් මා වෙතට ඇවිත් සිටිති;
ඒ මනුෂ්‍යයෝ එඬේරුය, මක්නිසාද ඔව්හු 32
සිව්පාවුන් ඇතිකරන මනුෂ්‍යයෝය; ඔව්හු
තමන්ගේ එළු බැටළු රැළවල්ද තමන්ගේ
ගව රැළවල්ද තමන්ට ඇති සියල්ලද
ගෙනාවෝයයි ඔහුට කියන්නෙමි. තවද 33
ඵාරාවෝ තුඹලාට අඬගසා–තුඹලාගේ
රක්ෂාව මොකදැයි අසන කල, තුඹලාට
ගෝෂෙන් දේශයෙහි වාසය කරන්ට
ලැබෙන පිණිස–ඔබගේ මෙහෙකරුවූ
අපිද අපේ පියවරුද අපේ බාල වයසේ
පටන් මේ වන තුරු සිව්පාවුන් ඇති-
කරන්නෝයයි කියාපල්ලා; කුමක්-
හෙයින්ද සියලු එඬේරු මිසරවරුන්ට
පිළිකුලකැයි කීවේය.

47 එකල්හී යෝසෙප් ඇවිත්: මාගේ
පියා සහ මාගේ සහෝදරයෝද
ඔවුන්ගේ එළු බැටළු රැළවල් සහ ගව
රැළවල්ද ඔවුන් සන්තක සියල්ලද සමග
කානාන් දේශයෙන් ආවෝය; ඔව්හු
ගෝෂෙන් දේශයෙහි සිටිතියි ඵාරාවෝට
කීවේය. ඔහු තමාගේ සහෝදරයන්- 2
ගෙන් පස් දෙනෙකු කැඳවාගෙන ඇවිත්
ඵාරාවෝ ඉදිරියෙහි සිටෙවුවේය.
ඵාරාවෝ: තුඹලාගේ රක්ෂාව මොකදැයි 3
ඔහුගේ සහෝදරයන්ගෙන් ඇසුවේය.
ඔබගේ මෙහෙකරුවූ අපිත් අපේ පියවරුත්
එඬේරුයයි ඔව්හු ඵාරාවෝට කීවෝය.
තවද ඔව්හු: කානාන් දේශයෙහි සාගතය 4
බලවත් බැවින්, ඔබගේ මෙහෙකරුවන්ගේ
සිව්පා රැළවලට ගොදුරු නැති නිසා, මේ
දේශයෙහි පොරොත්තුවීමට ආවෙමුව;
එබැවින් දැන් ඔබගේ මෙහෙකරුවන්ට
ගෝෂෙන් දේශයෙහි වසන්ට අවසර
ලැබේවයි ඵාරාවෝට කීවෝය. ඵාරාවෝ 5
යෝසෙප්ට කථාකොට: තුඹේ පියාණෝද
සහෝදරයෝද තුඹ වෙතට ඇවිත්
සිටිති. මිසර දේශය තුඹ ඉදිරියෙහි 6
තිබේ; තුඹේ පියා සහ සහෝදරයන්
දේශයේ ඉතාම හොඳ පළාතෙහි වාසය

කරවන්න; ගෝෂෙන් දේශයෙහි ඔව්හු
වාසය කෙරෙත්වා. ඔවුන් අතරේ දක්ෂ
පුරුෂයන් දන්නෙහිනම් ඔවුන් මාගේ
සිව්පාවුන් කෙරෙහි ප්‍රධානීන් කොට
7 පත්කරන්නැයි කීය. යෝසෙප් තම
පියවූ යාකොබ් ඇතුළට කැඳවාගෙන
විත් ඵාරාවෝ ඉදිරියෙහි සිටෙවුවේය.
යාකොබ් ඵාරාවෝට ආශීර්වාදකෙළේය.
8 එවිට ඵාරාවෝ: නුඹේ ජීවිතයේ අවුරුදු
ගණන කීයක්දැයි යාකොබ්ගෙන් ඇසීය.
9 යාකොබ්ද: මාගේ ප්‍රවාස කාලයේ
අවුරුදු ගණන එකසිය තිහක්ය. මාගේ
ජීවිතයේ අවුරුදු ගණන ස්වල්පව
දුක්ඛිතව තිබුණේය, ඒවා මාගේ පිය-
වරුන්ගේ ජීවිතවල ඔවුන්ගේ ප්‍රවාස
කාලයේ අවුරුදු ගණනට නොපැමු-
10 ණුණේයයි ඵාරාවෝට කීයේය. තවද
යාකොබ් ඵාරාවෝට ආශීර්වාදකොට
ඵාරාවෝ ඉදිරියෙන් පිටතට ගියේය.
11 යෝසෙප් ඵාරාවෝ අණකළ ලෙස
තමාගේ පියා සහ සහෝදරයන් පදිංචි-
කරවමින් මිසර දේශයේ ඉතා හොඳ
පළාතවූ රමෙසෙස් නම් ප්‍රදේශයෙහි
12 ඔවුන්ට උරුමයක් දුන්නේය. යෝසෙප්
තමාගේ පියාට සහ සහෝදරයන්ටද
පියාගේ ගෙයි වැසි සියල්ලන්ටද ඔවුන්ගේ
පවුල්වල ප්‍රකාරයට ආහාර දී ඔවුන්
රක්ෂාකළේය.
13 දේශයෙහි කොතැනකවත් ආහාර
නොතිබුණේය; මක්නිසාද සාගතය
ඉතා බලවත් වූයේය, මිසර දේශයද
කානාන් දේශයද සාගතය නිසා පිරිහී
14 ගියාහ. යෝසෙප් මිනිසුන් මිලේට ගත්
ධාන්‍යවල මිලවූ මිසර දේශයෙහිද
කානාන් දේශයෙහිද තිබුණු මුදල් සියල්ල
එකතුකොට ඒ මුදල් ඵාරාවෝගේ ගෙට
15 ගෙනායේය. මිසර දේශයෙහිද කානාන්
දේශයෙහිද මුදල් සියල්ල වියදම්වූ
කල්හි, සියලු මිසරවරු යෝසෙප් වෙතට
අවුත්: අපට ආහාර දුනමැනවි. අපි
ඔබ ඉදිරියෙහි කුමක් හෙයින් නසිමෝද?
මක්නිසාද අපේ මුදල් ඉවරයයි කීවෝය.
16 යෝසෙප්ද: නුඹලාගේ සිව්පාවුන්
දියල්ලා; මුදල් ඉවරනම් සිව්පාවුන්
හිලව්වට ආහාර දෙන්නෙමියි කීය.
ඔව්හු තමන්ගේ සිව්පාවුන් යෝසෙප් 17
වෙතට ගෙනාවෝය. එවිට යෝසෙප්
අශ්වයන්ද එළු බැටළු රැළවල්ද ගව
රැළවල්ද කොටළුවන්ද හිලව්වට ඔවුන්ට
ආහාර දුන්නේය. ඔහු ඒ අවුරුද්දේ
ඔවුන්ගේ සියලු සිව්පාවුන් හිලව්වට
ආහාරයෙන් ඔවුන් රක්ෂාකෙළේය. ඒ 18
අවුරුද්ද කෙළවරවූ කල්හි ඔව්හු දෙවෙනි
අවුරුද්දේදී ඔහු වෙතට අවුත්: අපේ
මුදල් සියල්ල ඉවරවූ බව අපේ ස්වාමීන්
කෙරෙන් නොසඟවමුව; සිව්පා රැළවල්
අපේ ස්වාමීන්ගේය; අපේ ස්වාමීන්
ඉදිරියෙහි අපේ ශරීර සහ අපේ ගම් බිම්
හැර අන් කිසිවක් ඉතුරුව නැත්තේය.
අප සහ අපේ ගම්බිම් කුමක් නිසා 19
ඔබගේ ඇස් ඉදිරියෙහි නාස්තිවී
යන්නේද? අපද අපේ ගම්බිම්ද ගෙන
ආහාර දුන මැනවි; අපේ ගම්බිම් ඇතුළුව
අපි ඵාරාවෝට දාසයෝ වන්නෙමු. අප
නොනැසී ජීවත්වන පිණිසද භූමිය පාළු
නොවන පිණිසද අපට බීජ දුනමැනවයි
කීවෝය. මෙසේ යෝසෙප් මුළු මිසර 20
දේශය ඵාරාවෝට ගත්තේය; මක්නිසාද
සියලු මිසරවරුන් කෙරෙහි සාගතය
බලවත්වූ බැවින් ඔව්හු තම තමන්ගේ
කෙත් වික්කෝය. දේශයද ඵාරාවෝට
හිමි විය. ඔහු මිසරයේ එක් සීමා 21
කෙළවරක පටන් අනික් සීමා කෙළවර
දක්වා සෙනඟ නුවරවලට පැමිණෙවුවේය.
ඔහු නොගත්තේ පූජකයන්ගේ ගම්බිම් 22
පමණකි. මක්නිසාද පූජකයන්ට
ඵාරාවෝගෙන් කොටසක් ලැබුණේය,
ඵාරාවෝ ඔවුන්ට දුන් කොටස
ඔවුන් කෑ හෙයින් ඔව්හු තමන්ගේ ගම්
බිම් නොවික්කෝය. එකල යෝසෙප් 23
සෙනඟට කථාකොට: බලව, අද නුඹලා
සහ නුඹලාගේ ගම්බිම් ඵාරාවෝට
ගතිමි. මෙන්න, මෙහි නුඹලාට බීජ තිබේ,
වපුරාපල්ලා. අස්වැන්න රැස්කරන කල 24
පහෙන් කොටසක් ඵාරාවෝට දිය
යුතුය, කෙතේ බීජ පිණිසත් නුඹලාගේද

තුඹලාගේ ගෙයි වැසියන්ගේද ආහාර
පිණිසත් තුඹලාගේ දරුවන්ගේ ආහාර
පිණිසත් සතර කොටසක් තුඹලාට
25 වන්නේයයි කීවේය. ඔබ අපේ ජීවිත
රක්ෂා කෙළෙහිය. අපේ ස්වාමිහුගේ
ඇස් හමුයෙහි අපට කරුණාව ලැබේවා,
අපි ඵාරාවෝගේ දසයෝ වන්නෙමුයයි
26 ඔව්හු කීවෝය. පහෙන් කොටසක්
ඵාරාවෝට විය යුතුය යන මිසරයේ
බිම් ගැන අද දක්වා පවතින නියෝගයක්
යෝසෙප් විසින් නියමකරනලද්දේය;
පූජකයන්ගේ ගම්බිම් පමණක් ඵාරා-
27 වෝට අයිතිනොවීය. ඉශ්‍රායෙල්වරු
මිසර දේශයේ ගෝෂෙන් පළාතෙහි
වාසයකළෝය; ඔව්හු එහි ගම්බිම් ලබා-
ගෙන සඵලව අතිශයෙන් බෝවූවෝය.
28 යාකොබ් මිසර දේශයෙහි දහහත්
අවුරුද්දක් ජීවත්ව සිටියේය. මෙසේ
යාකොබ්ගේ ජීවිතයේ අවුරුදු ගණන
29 එකසිය සතළිස් සතක් විය. ඉශ්‍රායෙල්
නසින කාලය ආසන්නවූයේය. ඔහු
තමාගේ පුත්‍රවූ යෝසෙප් කැඳවා ඔහුට
කථාකොට: තුඹෙන් මට කරුණාව
ඇත්තේවීනම් තුඹේ අත මාගේ කළවය
යට තබා ගිවිස, මට කරුණාවෙන්
සහ සැබෑකමෙන් ක්‍රියාකරපන්න;
මිසරයෙහි මා තැන්පත්නොකරන්න.
30 මාගේ පියවරුන් සමග මා සැතපුණු
කල්හි මිසරයෙන් මා ගෙනගොස්
ඔවුන්ගේ සොහොන්පළෙහි මා තැන්පත්
කරපන්නැයි කීවේය. ඔබ කී ලෙස
31 මම කරන්නෙමියි ඔහු කීය. එවිට ඔහු:
මට දිවුරාපන්නැයි කීය. ඔහු දිවුළේය.
ඉශ්‍රායෙල් ඇඳ ඉද්දර දෙසට හැරී
නමස්කාරකෙළේය.

## යාකොබ් විසින් යෝසෙප්ගේ පුත්‍රයින්ට ආශීර්වාදකිරීම

48 මේ කාරණාවලට පසු: ඔබගේ
පියාණෝ ලෙඩින් ඉන්නාහයි
යෝසෙප්ට කියන ලද්දේය. ඔහු තමාගේ
පුත්‍රයන් දෙදෙනාවූ මනස්සේ සහ එප්‍රායිම්
2 තමා සමග ගෙනගියේය. තුඹේ පුත්‍රවූ
යෝසෙප් තුඹ වෙතට එන්නේයයි
යාකොබ්ට දන්වන්ට යෙදුණේය.
ඉශ්‍රායෙල් ශක්තිය උපදවාගෙන ඇඳේ
හිඳගත්තේය. යාකොබ් යෝසෙප්ට 3
කථාකොට: සර්වපරාක්‍රම දෙවියන්-
වහන්සේ කානාන් දේශයේ ලූශ්හිදී මට
පෙනී, මට ආශීර්වාදකර—බලව, මම 4
තුඹ සඵලකොට වැඩිකරන්නෙමි, තුඹෙන්
ජාති සමූහයක් ඇතිකරවා, මේ දේශය
තුඹෙන් පසු තුඹේ වංශයට සදාකාල
උරුමයක් පිණිස දෙන්නෙමියි මට
කීසේක. මා තුඹ වෙතට මිසරයට එන්ට 5
පළමුවෙන් මිසර දේශයෙහි තුඹට උපන්
පුත්‍රයන් දෙදෙනා මාගේය; එප්‍රායිම්ද
මනස්සේද රූබෙන් සහ සිමියොන් මෙන්
මාගේම වන්නෝය. මොවුන්ට පසු තුඹට 6
උපදින දරුවෝ තුඹට වන්නෝය; ඔව්හු
තමන් උරුම ගැන තමන් සහෝදරයන්ගේ
නාම ලබන්නෝය. මා පදන්හි සිට එද්දී, 7
කානාන් දේශයෙහි එප්‍රාත්ට පැමිණෙන්ට
ටිකක් දුර තිබියදී, රාබෙල් මගදී මා
ළඟ මළාය. මම ඇ එප්‍රාත්ට (එනම්
බෙත්-ලෙහෙමට) යන මාර්ගයෙහි
තැන්පත්කෙළෙමියි කීවේය. ඉශ්‍රායෙල් 8
යෝසෙප්ගේ පුත්‍රයන් දැක: මොව්හු
කවුරුදැයි ඇසුවේය. යෝසෙප්: මොව්හු 9
දෙවියන්වහන්සේ මට මෙහිදී දුන්
මාගේ පුත්‍රයෝයයි තමාගේ පියාට
කීවේය. ඔවුන් මා ළඟට ගෙනෙන්න,
මම ඔවුන්ට ආශීර්වාදකරන්නෙමියි
ඔහු කීය. වයස නිසා ඉශ්‍රායෙල්ගේ 10
ඇස් හොඳට නොපෙනී අඳුරුව
තිබුණේය. ඔහුද ඔවුන් ඔහු ළඟට
ගෙනායේය; ඔහු ඔවුන් සිඹ වැලඳ-
ගත්තේය. තවද ඉශ්‍රායෙල් යෝසෙප්ට 11
කථාකොට: තුඹේ මුහුණ දකින්ට
ලැබේයයි නොසිතුවෙමි. එහෙත්
දෙවියන්වහන්සේ තුඹේ දරුවනුත්
දකින්ට මට ඉඩ දුන්සේකැයි කීය.
යෝසෙප් ඔවුන් ඔහුගේ දණහිස් අතරෙන් 12
අහකට ගෙන තම මුහුණ බිමට නමා
වැන්දේය. යෝසෙප් ඒ දෙදෙනා රැගෙන 13
එප්‍රායිම් ඉශ්‍රායෙල්ගේ වම් පැත්තට

තමාගේ දකුණතින්ද මනස්සේ ඉශ්‍රා-
යෙල්ගේ දකුණතට තමාගේ වමතෙන්ද
අල්ලාගෙන ඔහු ළඟට පැමිණවිය.
14 ඉශ්‍රායෙල් තමාගේ දකුණත දිගුකොට
බාලයාවූ එප්‍රායිම්ගේ ඉස පිටද මනස්සේ
කුලුඳුලා නුමුත් තමාගේ වමත
මනස්සේගේ ඉස පිටද දැනගනම අත්
15 හරවමින් තැබුවේය. ඔහු යෝසෙප්ට
ආශීර්වාදකරමින්: මාගේ පියවරුන්වූ
ආබ්‍රහම් සහ ඊසාක් යම් දෙවි කෙනෙකුන්
ඉදිරියෙහි හැසුරුණෝද ඒ දෙවියන්-
වහන්සේ, මාගේ මුළු ජීවිතයෙහි මේ
දවස දක්වා මා පෝෂණය කළාවූ
16 දෙවියන්වහන්සේ, සියලු උවදුරෙන් මා
මිදූ දූතයා වන තැනන්වහන්සේ මේ
තරුණයන්ට ආශීර්වාදකරනසේක්වා;
මාගේ නාමයද මාගේ පියවරුන්වූ
ආබ්‍රහම්ගේ සහ ඊසාක්ගේ නම්ද ඔවුන්
කෙරෙහි කියනුලැබේවා; ඔව්හු පොළොව
මධ්‍යයෙහි සමූහයක් වෙන සේ
17 වර්ධනයවෙත්වයි කීවේය. යෝසෙප්
තමාගේ පියාණන් තම දකුණත
එප්‍රායිම්ගේ හිස පිට තබන බව දැක ඊට
අප්‍රසන්නවී තමාගේ පියාගේ අත
එප්‍රායිම්ගේ හිසින් අහක්කොට
මනස්සේගේ හිස පිට තබන පිණිස
18 ඒක ඉස්සුවේය. තවද යෝසෙප්:
මාගේ පියාණෙනි, එසේ නොවේවා.
මොහු කුලුඳුලාය; ඔබගේ දකුණත
මොහුගේ හිස පිට තැබුවමැනවැයි තම
19 පියාට කීවේය. ඔහුගේ පියා ඊට
කැමතිනොවී: මම දනිමි, මාගේ පුත්‍රය,
මම දනිමි. ඔහුද සෙනඟක් වන්නේය,
ඔහුද උත්තම වන්නේය. එසේ වුවත්
ඔහුගේ බාල සහෝදරයා ඔහුට වඩා
උතුම් වන්නේය, ඔහුගේ වංශයද ජාති
20 සමූහයක් වන්නේයයි කීය. ඔහු ඒ දවසෙහි
ඔවුන්ට ආශීර්වාදකොට: දෙවියන්-
වහන්සේ නුඹ එප්‍රායිම් මෙන්ද මනස්සේ
මෙන්ද කරනසේක්වයි කියමින්
ඉශ්‍රායෙල්වරු නුඹ ගැන ආශීර්වාද
කරන්නෝයයි කීවේය. ඔහු වනාහි
එප්‍රායිම් මනස්සේට වඩා උතුම් කොට
21 තැබුවේය. ඉශ්‍රායෙල් යෝසෙප්ට කථා-
කොට: බලව, මම නසිමි. එහෙත්
දෙවියන්වහන්සේ නුඹලා සමග සිට
නුඹලාගේ පියවරුන්ගේ දේශයට නැවත
නුඹලා පමුණුවනසේක. ඇරත් මම නුඹේ 22
සහෝදරයන්ට වඩා එක් කොටසක්
නුඹට දුනිමි, ඒක මාගේ දුන්නෙන්
සහ කඩුවෙන් අමෝරිවරුන්ගේ අතින්
ගතිමියි කීවේය.

## යාකොබ්ගේ මරණාසන්නයේදී පුත්‍රයන් දෙළොස්දෙනාට ආශීර්වාදකිරීම

49
එවිට යාකොබ් තමාගේ පුත්‍රයන්
කැඳවා: මතු කාලයේදී නුඹලාට
පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට
දන්වන පිණිස රැස්වෙයල්ලා.

යාකොබ්ගේ පුත්‍රයෙනි, රැස්ව 2
අසාපල්ලා;
නුඹලාගේ පියවූ ඉශ්‍රායෙල්ට
කන්දියල්ලා.
රූබෙන්, නුඹ මාගේ කුලුඳුලාය, 3
මාගේ බලයය, මාගේ ශක්තියේ
නාඹුල් ඵලයය;
ශ්‍රේෂ්ඨ භාවයේ උතුම්කමය, පරාක්‍රමයේ
උතුම්කමය.
ජලය මෙන් අස්ථිරවූ නුඹට ප්‍රධානකම 4
නොලැබෙන්නේය.
කුමක්හෙයින්ද නුඹ නුඹේ පියාගේ
ඇඳට නැගුණෙහිය,
එකල නුඹ එය කිලුටුකෙළෙහිය. ඔහු
මාගේ යහනට නැගුණේය.
සිමියොන් සහ ලෙවී සහෝදරයෝය; 5
ඔවුන්ගේ කඩු වනාහි බලාත්කාරකමේ
ආයුධය.
එම්බා මාගේ ආත්මය, ඔවුන්ගේ 6
මන්ත්‍රණයට ඇතුල්නොවන්න;
මාගේ මහිමය ඔවුන්ගේ සමාගමට
එකතුනොවන්න;
කුමක්හෙයින්ද ඔවුන්ගේ කෝපයෙන්
ඔව්හු මනුෂ්‍යයෙකු මැරුවෝය,
ඔවුන්ගේ හිතුවක්කාරකමෙන්
ගොනෙකුගේ කුදි කැපුවෝය.

7 ඔවුන්ගේ කෝපය රෞද්‍ර නිසාද
ඔවුන්ගේ උදහස කෲරතර නිසාද
ඊට ශාපවේවා.
මම ඔවුන් යාකොබ් අතරෙහි බෙද
ඉශ්‍රායෙල් අතරෙහි විසුරුවන්නෙමි.
8 එම්බා යූද, නුඹේ සහෝදරයෝ නුඹට
ප්‍රශංසාකරන්නෝය.
නුඹේ අත නුඹේ සතුරන්ගේ ගෙළෙහි
වන්නේය;
නුඹේ පියාගේ පුත්‍රයෝ නුඹ ඉදිරියෙහි
වැඳවැටෙන්නෝය.
9 යූද සිංහපැටවෙක;
මාගේ පුත්‍රය, නුඹ ගොදුර කා නැගී
ගියෙහිය.
ඔහු සිංහයෙකු මෙන්ද සිංහධේනුවක්
මෙන්ද නැමී ලැග්ගේය.
ඔහු නැගුටුවන්නේ කවුද?
10 ෂීලෝ එන තෙක්
යූද කෙරෙන් ජයකොන්තයවත්
ඔහුගේ පාද අතරෙන් ආණ්ඩුකාරයාගේ
සැරයටියවත් පහනොවන්නේය;
මනුෂ්‍ය වර්ගයන්ගේ කීකරුකම ඔහුට
වන්නේය.
11 ඔහු තමාගේ කොටළු පැටවා මුද්‍රික
වැලේද
තමාගේ කොටළු වස්සා සාරවූ මුද්‍රික
වැලේද බඳිමින්
තමාගේ වස්ත්‍ර මුද්‍රිකපානයෙන්ද
තමාගේ සළුව මුද්‍රික යුසයෙන්ද සේදුවේය.
12 ඔහුගේ ඇස් මුද්‍රිකපානයෙන් රතු
වන්නේය,
ඔහුගේ දත් කිරෙන් සුදුවන්නේය.
13 සාබුලොන් මුහුදු බඩ වසන්නේය.
ඔහු නැව් තොටක් පිණිස වන්නේය;
ඔහුගේ සීමාවද ශීදෙන් දක්වා වන්නේය.
14 ඉස්සාඛර් ගාල් අතුරෙහි ලැගහිඳින
ශක්තිමත් කොටළුවෙක.
15 ඔහු නවාතැනක් දක ඒ හොඳ බවද
දේශය ප්‍රසන්න බවද දක
බර ඉසිලීමට තමාගේ කර නමා
අමාරු වැඩට දසයෙක් වුණේය.
16 දාන් ඉශ්‍රායෙල්ගේ ගෝත්‍රවලින්
එකක් මෙන්
තමාගේ සෙනඟ විනිශ්චයකරන්නේය.
දාන් අශ්වයා පිට නැගී යන අය පස්සට 17
වැටෙන ලෙස
අශ්වයාගේ විලුඹුවලට දෂ්ටකරන්නාවූ
මාර්ගයෙහි සිටින සර්පයෙක් වන්නේය,
මාවත සිටින පොළඟෙක් වන්නේය.
ස්වාමීනි, ඔබගේ ගැළවීම ගැන 18
බලාසිටියෙමි.
ගාද්ට විරුද්ධව බලසමූදවක් ලුහුබැඳ 19
එන්නේය.
නුමුත් ඔහු හැරී ඔවුන් ලුහුබැඳ යන්නේය.
ආෂෙර් කෙරෙන් ඔහුගේ පෝෂ්‍ය 20
ආහාර හටගන්නේය,
ඔහු රාජකීය රසවත් භෝජන
උපදවන්නේය.
නප්තලී මුදහරිනලද මුවදෙනක්ය. 21
ඔහු ශෝභන වචන පවසයි.
යෝසෙප් එලදෙන අත්තක්ය, 22
උල්පතක් ළඟ තිබෙන එලදෙන
අත්තක්ය;
එහි ශාඛා හින්තිය පිට විහිද යති.
දුනුවායෝ ඔහුට අතිශයින් හිංසා 23
කොට
ඔහුට විද ඔහුට පීඩාකළෝය.
එහෙත් ඔහුගේ දුන්න ශක්තිමත්ව 24
පැවතුණේය,
යාකොබ්ගේ බලවන්තයාණන් -
වහන්සේගේ අත්වලින්ද
නුඹට පිහිටවන නුඹේ පියාගේ දෙවියන්-
වහන්සේගෙන්ද
ඉහළ අහසේ ආශීර්වාදවලිනුත්
පහළ වැතිර තිබෙන ගැඹුරේ ආශීර්වාද- 25
වලිනුත්
පායෝධරවල සහ ගර්භයේ ආශීර්වාද-
වලිනුත්
නුඹට ආශීර්වාදකරන සර්වපරාක්‍රමයාණන්
වහන්සේගෙන්ද
ඔහුගේ අත්වල ශක්තිය ස්ථිරකරන
ලද්දේය.
(ඉශ්‍රායෙල්ගේ පර්වතයවූ එඬේරා
මෙතැනින්ය.)
නුඹේ පියාගේ ආශීර්වාද 26
මාගේ පියවරුන්ගේ ආශීර්වාදවලට

වඩා අධිකවී
සදකාල කඳුවල ඉතා දුර සීමාව
දක්වා ගියේය.
ඒවා යෝසෙප්ගේ හිස පිටත්
තමන් සහෝදරයන්ගෙන් වෙන්ව
සිටි තැනැත්තාගේ හිස්මුදුන
පිටත් වන්නේය.
27 බෙන්යමින් ගසාකන වෘකයෙක.
ඔහු උදය ගොදුරු කාදමන්නේය,
සවස කොල්ලය බෙදගන්නේයයි
කීයේය.

28 මොවුන් සියල්ලෝ ඉශ්‍රායෙල්ගේ
ගෝත්‍ර දොළසය. ඔවුන්ගේ පියා ඔවුන්ට
ආශීර්වාදකරමින් ඔවුන්ට කීවේ
මෙලෙසය; ඒ ඒ අයගේ ආශීර්වාදය
ලෙස ඔහු ඔවුන්ට ආශීර්වාදකෙළේය.
29 ඔහු ඔවුන්ට අණකරමින්: මම මාගේ
සෙනහට එකතුවන්නෙමි. හිත්තීයවූ
එප්‍රොන්ගේ කෙතෙහි තිබෙන ගුහාවේ
එනම් කානාන් දේශයෙහි මම්රේ ඉදිරිපිට
30 මක්පේලායේ කෙතෙහි තිබෙන, ආබ්‍රහම්
විසින් උරුමවූ සොහොන් පළක් පිණිස
කෙතත් සමග හිත්තීයවූ එප්‍රොන්ගෙන්
මිලේට ගත්තාවූ ගුහාවෙහි මාගේ
පියවරුන් ළඟ මා තැන්පත්කරපල්ලා.
31 ඔව්හු එහි ආබ්‍රහම් සහ ඔහුගේ භාර්-
යාවවූ සාරා තැන්පත්කළෝය; ඔව්හු
එහි ඊසාක් සහ ඔහුගේ භාර්යාවවූ
රෙබෙකාද තැන්පත්කළෝය; එහි මමද
32 ලෙයා තැන්පත්කෙළෙමි. ඒ කෙත සහ
එහි තිබෙන ගුහාවත් හෙත්ගේ පුත්‍රයන්-
ගෙන් මිලේට ගන්නා ලදැයි කීවේය.
33 යාකොබ් තමාගේ පුත්‍රයන්ට අණකර
නිමකළ කල්හි තමාගේ පාද යහනට
ඔසවාගෙන ප්‍රාණය හැර තමාගේ
සෙනහට එකතුවුණේය.

## යාකොබ්ගේ භූමදානය

50 යෝසෙප් තමාගේ පියාගේ
මුහුණ මතුයෙහි හඬ හඬා ඔහු
2 සිඹගත්තේය. පසුව යෝසෙප් තමාගේ
පියාගේ මිනිය සුවඳ ද්‍රව්‍ය ගල්වා
ආරක්ෂාකරන්ට තමාගේ මෙහෙකරුවූ
වෙදුන්ට අණකෙළේය. ඒ හැටියට
වෙද්දු ඉශ්‍රායෙල්ගේ මිනියට සුවඳ ද්‍රව්‍ය
ගල්වා තැබූය. ඔව්හු ඔහු උදෙසා 3
සතලිස් දවසක් සම්පූර්ණ කළෝය;
මක්නිසාද සුවඳ ද්‍රව්‍ය ගැල්වීමට එපමණ
දවස් ගතකරත්. මිසරවරුද ඔහු ගැන
සැත්තෑ දවසක් වැලපුණෝය.
ඔහු ගැන වැලපීමේ දවස් ඉකුත්වූ 4
කල්හි යෝසෙප් ඵාරාවෝගේ ගෙයි
වැසියන්ට කථාකොට: නුඹලාගෙන්
මට කරුණාව ලැබී තිබේනම් නුඹලා
ඵාරාවෝට කථාකරමින් මෙසේ කියන
ලෙස ඉල්ලමි–මාගේ පියා මට කථා 5
කර: බලව, මම නසිමි. කානාන් දේශ-
යෙහි මා විසින් මට හාරා තිබෙන මාගේ
සොහොන්ගෙයි මා තැන්පත්කළ
යුතුය කියා මා දිවුරෙවුවේය. එබැවින්
දැන් ගොස් මාගේ පියා තැන්පත් කිරීමට
මට අවසර ලැබේවා, මම නැවත
එන්නෙමියි කියාපල්ලායයි කීවේය.
ඵාරාවෝද: නුඹේ පියා නුඹ දිවුරෙවූ 6
ලෙස ගොස් ඔහු තැන්පත් කරන්නැයි
කීවේය. එවිට යෝසෙප් තමන් පියා 7
තැන්පත්කරන පිණිස ගියේය. ඵාරා-
වෝගේ සියලු මෙහෙකරුවෝද ඔහුගේ
ගෙයි වැඩිමහල්ලෝද මිසර දේශයේ
සියලු වැඩිමහල්ලෝද යෝසෙප්ගේ ගෙයි 8
වැසි සියල්ලෝද ඔහුගේ සහෝදරයෝද
ඔහුගේ පියාගේ ගෙයි වැසියෝද ඔහු
සමග ගියෝය. ඔව්හු තමන්ගේ දරුවන්ද
තමන්ගේ එළුබැටළු රැළවල්ද තමන්ගේ
ගව රැළවල්ද පමණක් ගෝෂෙන්
දේශයෙහි නවත්වා ගියෝය. රථ සහ 9
අසරුවෝද ඔහු සමග ගියෝය. ඒ
වනාහි ඉතා මහත් පිරිසක් විය. ඔව්හු 10
යොර්දනෙන් එගොඩ පිහිටි ආතාද්ගේ
පාවරට පැමුණුණ කල එහිදී ඉතා
මහත්වූ තද වැලපීමකින් වැලපුණෝය.
ඔහු තම පියාණන් ගැන සත් දවසක්
ශෝකවුණේය. දේශවාසීවූ කානානිවරු 11
ආතාද්ගේ පාවරේ සිදුවූ වැලපීම
දැක: මේක මිසරවරුන්ට බරපතළ
වැලපීමකැයි කීවෝය. එබැවින්
යොර්දනෙන් එගොඩ තිබෙන ඒ

ස්ථානයට ආබෙල්-මිශ්‍රයිම් යන නාමය
12 තබන ලද්දේය. ඔහුගේ පුත්‍රයෝ තමන්ට
ඔහු අණ දුන් ලෙස ඔහුට කළෝය.
13 මක්නිසාද ඔහුගේ පුත්‍රයෝ ඔහු කානාන්
දේශයට ගෙන ගොස් ආබ්‍රහම් විසින්
හිත්තීයවූ එප්‍රොන්ගෙන් උරුමවූ සො-
හොන්පළක් පිණිස කෙතත් සමග
මිලේට ගත්තාවූ මම්රේ ඉදිරියෙහි වූ
මක්පේලායේ කෙතේ ගුහාවෙහි ඔහු
තැන්පත් කළෝය.

## යෝසෙප්ගේ අන්තිම දවස්

14 යෝසෙප් තමාගේ පියා තැන්පත්
කළ පසු ඔහුද ඔහුගේ සහෝදරයෝද
තම පියා තැන්පත්කරන පිණිස ඔහු
සමග ගිය සියල්ලෝද මිසරයට හැරී
15 ආවෝය. එවිට යෝසෙප්ගේ සහෝදරයෝ
තමන්ගේ පියා නැසීගිය බව දැක: සම-
හරවිට යෝසෙප් අපට වෛර කොට
අප විසින් ඔහුට කළ සියලු නපුරුකම්
ගැන සම්පූර්ණ ලෙස අපෙන් පළිගන්නේ-
16 යයි කීවෝය. ඔව්හු යෝසෙප් වෙතට
පණිවිඩයක් යවමින්: ඔබගේ පියා
තමාගේ මරණයට පළමුවෙන් අපට
17 අණකරමින්–තුඹලා යෝසෙප්ට මෙලෙස
කියාපල්ලා; ඔබගේ සහෝදරයන්ගේ
අපරාධයත් ඔබට නපුරුකම්කළ ඔවුන්ගේ
පාපයත් කමා කළ මැනවි. දැනුදු ඔබගේ
පියාගේ දෙවියන්වහන්සේගේ මෙහෙ-
කරුවන්ගේ වරද ක්ෂමාකරන ලෙස
ඉල්ලමුයයි කීවෝය. ඔවුන් යෝසෙප්ට
18 කථාකළ විට ඔහු හැඬුවේය. ඔහුගේ
සහෝදරයෝ ගොස් ඔහු ඉදිරියෙහි වැටී:
මෙන්න, අපි ඔබගේ මෙහෙකරුවෝයයි
19 කීවෝය. යෝසෙප්: භයනොවෙල්ලා. මම
දෙවියන්වහන්සේ වෙනුවට සිටිම්ද?
තුඹලා වනාහි මට නපුර කරන්ට 20
අදහස්කළහුය; එහෙත් බොහෝ සෙනඟ
දිවි සහිතව රක්ෂා කරන පිණිස අද
තිබෙන ප්‍රකාර ඉෂ්ට කිරීමට දෙවියන්-
වහන්සේ ඒක යහපතට අදහස්කළ-
සේක. එබැවින් භයනොවෙල්ලා. මම 21
තුඹලා සහ තුඹලාගේ දරුවන්ද
පෝෂ්‍යකරන්නෙමියි කීවේය. මෙසේ ඔහු
ඔවුන් සනසා කරුණාවෙන් ඔවුන්ට
කථාකෙළේය.

යෝසෙප්ද ඔහුගේ පියාගේ වංශයද 22
මිසරයෙහි වාසයකළෝය. යෝසෙප්
එකසිය දස අවුරුද්දක් ජීවත්ව එප්‍රායිම්ගේ 23
දරුවන් තුන්වෙනි පරම්පරාව දක්වා
දුටුවේය. මනස්සේගේ පුත්‍රවූ, මාඛිර්ගේ
දරුවෝද යෝසෙප්ගේ *උකුළ පිට
ඇතිවුණෝය. යෝසෙප් තමාගේ සහෝ- 24
දරයන්ට කථාකොට: මම නසිමි. එහෙත්
දෙවියන්වහන්සේ සැබවින් තුඹලා බලා
වදරා ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්-
ටද දෙන පිණිස දිවුළ දේශයට මේ
දේශයෙන් තුඹලා ගෙනයනවා ඇතැයි
කීවේය. තවද යෝසෙප් ඉශ්‍රායෙල් 25
පුත්‍රයන්ගෙන් දිවුරුමක් ගනිමින්:
දෙවියන්වහන්සේ සැබවින්ම තුඹලා
දෙස බලා වදරනවා ඇත, එවිට තුඹලා
මාගේ ඇට මෙතනින් ගෙනයන්ට ඕනෑ-
යයි කීවේය. යෝසෙප් එකසිය දස 26
අවුරුද්දක් වයස්ව මළේය. ඔව්හු ඔහුගේ
මිනිය සුවඳ ද්‍රව්‍ය ගල්වා ආරක්ෂා-
කළෝය, ඔහු මිසරයෙහි මිනී
පෙට්ටියක තබනලද්දේය.

*හෙවත්, උකුළට උපන්නෝය.

# නික්මයාම

## යයි සාමාන්‍යයෙන් කියනුලබන

## මෝසෙස්ගේ දෙවෙනි පොත

---

### ඉශ්‍රායෙල්වරුන් මිසරයේ වැඩිවීම

1 මිසරයට පැමිණි ඉශ්‍රායෙල්
2 පුත්‍රයන්ගේ නාමවල් නම්: රූබෙන්,
3 සිමියොන්, ලෙවී සහ යූද; ඉස්සාඛර්,
සාබුලොන් සහ බෙන්යමින්; දන් සහ
4 නප්තලී, ගාද් සහ ආෂේර්ය. යාකොබ්
කැටුව මේ එක එක මනුෂ්‍යයා සහ
ඔහුගේ ගෙයි වැසියෝද ආවෝය.
5 යාකොබ්ගේ කටියෙන් උපන් සියල්ලෝ
සැත්තෑ දෙනෙක්ය. යෝසෙප් මිසරයට
6 ගොස් සිටියේය. යෝසෙප්ද ඔහුගේ
සියලු සහෝදරයෝද ඒ මුළු පරම්-
7 පරාවද මළෝය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
සඵලව බොහෝසේ වැඩි වෙමින් බෝවී
අතිශයින් බලවත්වූවෝය; දේශය
ඔවුන්ගෙන් පිරුණේය.

### ඔවුන් වාල්ව සිටීම

8 තවද යෝසෙප් නාඳුනන අලුත් රජෙක්
9 මිසරය කෙරෙහි පත්වුණේය. ඔහු
තමාගේ සෙනඟට කථාකොට: බලව,
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සෙනඟ අපට වඩා
බොහෝව වඩා බලවත්ව සිටිති.
10 වරෙල්ලා, ඔවුන් බෝනොවන පිණිසත්
යම් යුද්ධයක් සිදුවන කල අපේ
සතුරන්ට එක්ව අපට විරුද්ධව සටන්
කොට දේශයෙන් පිටවී නොයන
පිණිසත් ඔවුන් සමග නුවණින්
11 ක්‍රියාකරමුයයි කීවේය. එසේ හෙයින්
ඔව්හු බර වැඩ පැවරීමෙන් ඔවුන්ට
පීඩාකරන පිණිස ඔවුන් කෙරෙහි
විධානවරුන් පත්කළෝය. ඔව්හු පිථොම්
සහ රාම්සෙස්නම් ගබඩා නුවරවල්
ඵාරාවෝ හට ගොඩනැගුවෝය. නුමුත් 12
ඔවුන්ට පීඩා කරන්ට කරන්ට ඔව්හු
වඩ වඩා බෝවී වඩ වඩා පැතිර-
ගියෝය. මිසරවරු ඉශ්‍රායෙල් පුත්‍රයන්
නිසා ඛේදයට පත්ව තද ලෙස 13
මෙහෙකරන්ට ඔවුන්ට සැලැස්සුවෝය.
ඔවුන් යෙදූ තද වැඩ වූ බදම සහ 14
ගඩොල් වැඩද කෙතෙහි සියලු ආකාර
වැඩද ඔවුන් ලවා කෙරෙවූ සියලු
තදබල වැඩද කරණකොටගෙන ඔව්හු
ඔවුන්ගේ ජීවිතය ඔවුන්ට තික්ත
කළෝය.
මිසරයේ රජතෙම ෂිප්රාද පූවාද නම්- 15
ලත් හෙබ්‍රෙව් වින්නඹුවන්ට කථාකොට:
නුඹලා හෙබ්‍රෙව් ස්ත්‍රීන්ට වින්නඹුකම් 16
කරන විට, ඔවුන් ප්‍රසූත යහනෙහි
ඉන්නවා දකින කල්හි, පුතෙක් නම්
ඔහු මරාපල්ලා; දුවක් නම් ඈ ජීවත්-
වුණාවේයයි කීවේය. එහෙත් වින්- 17
නඹුවෝ දෙවියන්වහන්සේට භයවෙමින්
මිසරයේ රජු අණදුන් ලෙස නො-
කොට පිරිමි දරුවන් නොමරා ඉතුරු
කළෝය. එවිට මිසරයේ රජ වින්- 18
නඹුවන් කැඳවා: කුමක්හෙයින් මේ
දේ කොට පිරිමි දරුවන් නොමරා
ඉතිරි කළහුදැයි ඔවුන්ගෙන් ඇසුවේය.
වින්නඹුවෝ: හෙබ්‍රෙව් ස්ත්‍රීහු මිසර 19

ස්ත්‍රීන්ට සමාන නොවෙති; ඔව්හු
ශක්තිමත් බැවින් වින්නඹුවන් ඔවුන්
වෙතට එන්ට පළමුවෙන් වදතියි
20 ඵාරාවොට කීවෝය. ඒ නිසා දෙවියන්-
වහන්සේ වින්නඹුවන්ට කරුණාව
පෙන්වූසේක. සෙනඟද බෝවී අතිශයින්
21 බලවත්වූවෝය. නවද වින්නඹුවන්
දෙවියන්වහන්සේට හයවූ බැවින්
උන්වහන්සේ ඔවුන්ට වංශයක් සාද
22 දුන්සේක. එවිට ඵාරාවෝ: උපදින්-
නාවූ සියලු පුත්‍රයන් ගඟේ දමා සියලු
දූවරුන් නොමරා ඉතුරුකරපල්ලායයි
තමාගේ මුළු සෙනඟට අණකෙළේය.

## මෝසෙස්ගේ උප්පැත්නය සහ යෞවන වයස

2 නවද ලෙවීගේ වංශයේ මනුෂ්‍යයෙක්
ගොස් ලෙවීගේ දූවක් පාවා-
2 ගත්තේය. ඒ ස්ත්‍රී ගර්භිණීව පුත්‍රයෙකු
වද ඔහු ශෝභමාන දරුවෙකු බව දැක
3 තුන් මසක් ඔහු සඟවා ගත්තාය. නවත්
ඔහු සඟවාගන්ට නොහැකිවූ කල්හි
ඈ පන් පෙට්ටියක් ගෙන ඒකේ කීල්
සහ ලාටු ගා දරුවා එහි තබා ගං-
4 ඉවුරේ පන්ගස් අතරේ තැබුවාය. ඔහුගේ
සහෝදරී ඔහුට කුමක් වන්නේදැයි
දැනගන්නා පිණිස දුරින් බලා සිටියාය.
5 ඵාරාවෝගේ දුව ගඟේ නාන්ට ආවාය;
ඈ සමග වූ තරුණියෝ ගංඉවුරේ
ඇවිද්දෝය; ඈ පන්ගස් අතරේ පෙට්ටිය
තිබෙනවා දැක ඒක ගෙනෙන්ට ඇගේ
6 දාසිය ඇරියාය. ඒක ඇරිය කල ඕ
තොමෝ දරුවා දුටුවාය. බලව, බිළිඳු
ඇඬුවේය. ඈ ඔහු කෙරෙහි අනුකම්පා
කොට: මොහු හෙබ්‍රෙව්වන්ගේ
7 දරුවෙකැයි කීවාය. එවිට ඔහුගේ
සහෝදරී ඵාරාවෝගේ දුවට කථා-
කරමින්: ඔබ උදෙසා දරුවාට කිරිදෙන
පිණිස මා ගොස් හෙබ්‍රෙව් ස්ත්‍රීන්-
ගෙන් කිරි මවක් කැඳවාගෙන එන්ටදැයි
8 ඇසුවාය. ඵාරාවෝගේ දුවද: පලයන්-
නැයි ඈට කීවාය. එවිට තරුණී ගොස්
දරුවාගේ මවු කැඳවාගෙන ආවාය.
ඵාරාවෝගේ දුව: මේ දරුවා ගෙන- 9
ගොස් මා උදෙසා කිරිදීපන්න, මම
තුඹට කුලී දෙන්නෙමියි කීවාය. ඒ ස්ත්‍රී
දරුවා ගෙන ගොස් කිරි දී හැදුවාය.
දරුවා වැඩුණු කල ඈ ඔහු ඵාරාවෝගේ 10
දියණිය වෙතට ගෙනාවාය, ඔහු ඇගේ
පුත්‍රයා වුණේය. ඈ වනාහි: මා ඔහු
වතුරෙන් ඇදගත් නිසාය කියා ඔහුට
*මෝසෙස් යයි නම් තැබුවාය.
මෝසෙස් වැඩි වයසට පැමුණුණු කල 11
තමාගේ සහෝදරයන් වෙතට ගොස්
ඔවුන්ගේ බර වැඩ බලා සිටියේය.
එවිට ඔහු තමාගේ සහෝදරවූ
හෙබ්‍රෙව්වෙකුට මිසරයෙක් ගහනවා
දුටීය. ඔහු ඔබ මොබ බලා කිසිවෙකු 12
ළඟ නොසිටි බව දැක මිසරයා මරා
වැල්ලෙහි සැඟෙවුවේය. ඔහු පසුවද 13
පිටතට ගිය කල, බලව, හෙබ්‍රෙව්
මිනිසුන් දෙදෙනෙක් ගහගනිමින්
සිටියෝය. තුඹ කුමක් හෙයින් තුඹේ
අසල්වාසියාට පහරදෙන්නෙහිදැයි
ඔහු වැරැද්ද කළ අයට කීය. එවිට 14
හෙතෙම අප කෙරෙහි අධිපතියෙක්ද
විනිශ්චයකාරයෙක්ද කොට තුඹ
පත්කළේ කවුද? තුඹ මිසරයා මැරුවාක්
මෙන් මාත් මරන්ට සිතන්නෙහිදැයි
කීය. එවිට මෝසෙස් හයව: සැබවින්ම
මේ කාරණය එළිදරව්වී තිබේයයි
කීවේය. ඵාරාවෝ ඒ දේ අසා මෝසෙස් 15
මරන්ට සෙවීය. නුමුත් මෝසෙස්
ඵාරවෝ කෙරෙන් පලාගොස් මිදියන්
දේශයෙහි වාසය කෙළේය. ඔහු ළිඳක්
ළඟ හිඳගත්තේය. මිදියන්හි පූජකයාට 16
දූවරු සත් දෙනෙක් වූහ. ඔව්හු අවුත්
තමන් පියාගේ එළු බැටළු රැළට පොවන
පිණිස වතුර ඇද ඔරුවල පිරෙවුවෝය.
එඬේරු අවුත් ඔවුන් එළෙවුවෝය. එහෙත් 17
මෝසෙස් නැගිට ඔවුන්ට උපකාර
කොට ඔවුන්ගේ සිව්පාවුන්ට වතුර
පෙවුවේය. ඔවුන් තමන් පියවූ රූවෙල් 18
වෙතට ආ කල: තුඹලා අද මෙපමණ

*එනම්, ඇදගැනීම.

වේලාසනින් ආවේ කොහොමදැයි ඔහු
19 ඇසුවේය. ඔව්හුද: මිසරයේ මනුෂ්‍ය-
යෙක් එඬේරුන්ගේ අතින් අප
ගැළෙව්වේය. ඒ ඇර අපට වතුරත් ඇද
දී සිව්පාවුන්ට පෙව්වේයයි කීවෝය.
20 ඒ මනුෂ්‍යයා කොහේද? ඔහු ඇරලා
ආවේ මක්නිසාද? කෑම කන පිණිස
ඔහුට අඬගසාපල්ලායයි ඔහු තමාගේ
21 දූවරුන්ට කීවේය. මෝසෙස් ඒ මනුෂ්‍යයා
සමග විසීමට සතුටුවිය. ඔහු තමාගේ
දූවූ ශිප්පොරා මෝසෙස්ට පාවා-
22 දුන්නේය. ඈ පුත්‍රයෙකු වැදුවාය.
මෝසෙස්: අන් දේශයක ආගන්තුක-
යෙක්ව සිටියෙමියි කියා ඔහුට
*ගේර්ෂොම් යන නම තැබීය.
23 ඉක්බිති කල් යාමේදී මිසරයේ රජ
මළේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ වහල්
වැඩ නිසා සුසුම්ලමින් මොරගැසුවෝය.
වහල් වැඩ නිසා ඔවුන්ගේ මොරගැසීම
දෙවියන්වහන්සේ වෙතට පැමුණුණේය.
24 දෙවියන්වහන්සේ ඔවුන්ගේ කෙඳිරිගෑම
අසා ආබ්‍රහම් සමගද ඊසාක් සමගද
යාකොබ් සමගද කළාවූ තමන්ගේ
25 ගිවිසුම සිහිකළසේක. දෙවියන්වහන්සේ
ඉශ්‍රායෙල් පුත්‍රයන් බලා ඔවුන්ගේ
තත්ත්වය සැලකුසේක.

## මෝසෙස් කැඳවනු ලැබීම

3 මෝසෙස් වනාහි තමාගේ මාමාවූ
මිදියන්හි පූජකවූ යෙත්‍රෝගේ එළු
බැටළු රැළ බලාගනිමින් සිටියේය. ඔහු
එළු බැටළු රැළ වනාන්තරයේ එහා
පැත්තට ගෙනගොස් දෙවියන්-
වහන්සේගේ කන්දට එනම් හොරේබ්ට
2 පැමිණියේය. ස්වාමීන්වහන්සේගේ දූතයා
පඳුරක් මැද ගිනිජාලාවක සිට ඔහුට
පෙනුණේය. ඔහු බලා සිටියේය, බලව,
පඳුර ගිනි ඇවිළ තිබුණු නුමුත් දලා-
3 නොගියේය. එවිට මෝසෙස්: මම
දැන් අහකට හැරී පඳුර දලානොගියේ
මක්නිසාද යන මේ මහත් දර්ශනය
4 බලන්නෙමියි කීය. ඔහු බලන පිණිස
හැරී යන බව ස්වාමීන්වහන්සේ දුටු
කල දෙවියන්වහන්සේ පඳුර මධ්‍යයෙන්:
මෝසෙස්, මෝසෙස් කියා ඔහුට
හඬගැසූසේක. මම මෙහියයි ඔහු
කීවේය. උන්වහන්සේ කථාකොට: 5
මෙතැනට ළංනොවව. නුඹේ පාදවලින්
නුඹේ වහන් ගළවව, මක්නිසාද නුඹ
සිටින ස්ථානය ශුද්ධභූමියකැයි කී-
සේක. උන්වහන්සේ තව දුරටත්: මම 6
නුඹේ පියාගේ දෙවියන්වහන්සේය,
ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේය, ඊසාක්-
ගේ දෙවියන්වහන්සේය, යාකොබ්ගේ
දෙවියන්වහන්සේයයි කීසේක. මෝසෙස්
තමාගේ මුහුණ වසා ගත්තේය; මක්-
නිසාද ඔහු දෙවියන්වහන්සේ දෙස
බලන්ට භයවිය. තවද ස්වාමීන්වහන්සේ 7
කථාකොට: මිසරයේ වසන මාගේ
සෙනඟගේ පීඩාව සැබවින්ම දුටිමි,
ඔවුන්ගේ විධානවරුන් නිසා ඇති
ඔවුන්ගේ මොරගැසීම ඇසීමි; මක්නිසාද 8
ඔවුන්ගේ දුක් දනිමි; එබැවින්
මිසරවරුන්ගේ අතින් ඔවුන් නිදහස්කර
ඒ රටින් පිටත්කොට යහපත්වූ විශාලවූ
දේශයකට, කිරි සහ මීපැණි ගලා
යන්නාවූ දේශයකට, එනම් කානානි-
වරුන්ගේද හිත්තීවරුන්ගේද අමෝරි-
වරුන්ගේද පෙරිස්සිවරුන්ගේද හිව්-
වරුන්ගේද යෙබුසිවරුන්ගේද ඉඩ-
මට පමුණුවන්ට බැස්සෙමි. දැන් බලව, 9
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මොරගැසීම
මා වෙතට පැමිණ තිබේ. මිසර-
වරුන් ඔවුන්ට කරන පීඩාවත් දුටිමි.
ඉතින් වරෙන්න, නුඹ මාගේ සෙනඟවූ 10
ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසරයෙන් පිටතට
ගෙනෙන පිණිස මම ඵාරාවෝ
වෙතට නුඹ යවන්නෙමියි කීසේක.
එවිට මෝසෙස්: ඵාරාවෝ වෙතට 11
යන්ටත් ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසරයෙන්
පිටතට ගෙනඑන්ටත් මම කවුදැයි
දෙවියන්වහන්සේට කීය. උන්වහන්සේද: 12
මම සැබවින් නුඹ සමග සිටින්නෙමි;
මා විසින් නුඹ යැවූ බවට මේක නුඹට
ලකුණක් වන්නේය; එනම් නුඹ සෙනඟ

*එනම්, විදේශියෙක්.

මිසරයෙන් පිටතට ගෙනා කල්හි නුඹලා
මේ කන්දේදී දෙවියන්වහන්සේට
නමස්කාර කරන්නහුයයි කීසේක.
13 මෝසෙස් කථාකොට: බැලුවමැනව,
මා ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙතට පැමිණ–
නුඹලාගේ පියවරුන්ගේ දෙවියන්-
වහන්සේ නුඹලා වෙතට මා එවූසේකැයි
ඔවුන්ට කී කල්හි: උන්වහන්සේගේ
නාමය කිමෙක්දැයි ඔවුන් මාගෙන්
අසන විට ඔවුන්ට කුමක් කියන්නෙම්-
14 දැයි දෙවියන්වහන්සේට කීවේය. එවිට
දෙවියන්වහන්සේ කථාකොට: මම
යම්සේ සිටිම්ද එසේම සිටිම්යි
මෝසෙස්ට කීසේක. තවද උන්වහන්සේ
කියනසේක්: නුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කථාකොට: ස්වයම්භූ නම් තැනැත්-
වහන්සේ නුඹලා වෙතට මා එවූ-
15 සේකැයි කියාපන්නැයි කීසේක. තව
දුරටත් දෙවියන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: ආබ්‍රහම්ගේ දෙවියන්-
වහන්සේද ඊසාක්ගේ දෙවියන්-
වහන්සේද යාකොබ්ගේ දෙවියන්-
වහන්සේද වන නුඹලාගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹලා වෙතට
මා එවූසේකැයි ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කියාපන්න. මෙය සදාකල්හිම මාගේ
නාමයය, මෙය සියලු පරම්පරාවන්ට
16 මාගේ සංඥා නාමයය. නුඹ ගොස්
ඉශ්‍රායෙල් වැඩිමහල්ලන් රැස්කොට:
නුඹලාගේ පියවරුන්ගේ දෙවියන්-
වහන්සේ වන ආබ්‍රහම්ගේද ඊසාක්ගේද
යාකොබ්ගේද දෙවිවූ ස්වාමීන්වහන්සේ
මට පෙනී: සැබවින් මම නුඹලා බලා
වදාරා මිසරයෙහිදී නුඹලාට කෙරෙන දේ
17 දුටිම්. මම නුඹලා මිසරයේ පීඩාවෙන්
මුදා කානානිවරුන්ගේද හිත්තිවරුන්ගේද
අමෝරිවරුන්ගේද පෙරිස්සිවරුන්ගේද
හිව්විවරුන්ගේද යෙබූසිවරුන්ගේද දේශය
වූ කිරි සහ මීපැණි ගලායන්නාවූ
දේශයකට පමුණුවන්නෙම්යි කීයෙම්යි
මට කීසේකැයි ඔවුන්ට කියාපන්න.
18 ඔවුන් නුඹේ හඬට ඇහුම්කන්දෙනවා
ඇත. නුඹද ඉශ්‍රායෙල් වැඩිමහල්ලෝද
මිසරයේ රජු වෙතට ගොස්: හෙබ්‍රෙව්-
වරුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
අපට සම්මුඛවූසේක: එබැවින් අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට පූජා ඔප්පු
කරන පිණිස තුන් දවසක ගමන්
වනාන්තරයට යන්ට අපට අවසරදෙන
ලෙස ඉල්ලමුයයි ඔහුට කියාපල්ලා.
නමුත් බලවත් අතකින් වුවත් මිසරයේ 19
රජු නුඹලාට යන්ට අවසර නො-
දෙන බව දනිමි. මමද මාගේ අත 20
දිගුකොට මිසරය මධ්‍යයෙහි කරන්නාවූ
මාගේ සියලු හාස්කම්වලින් ඊට පහර
දෙන්නෙමි. එයින් පසු ඔහු නුඹලා යන්ට
හරින්නේය. මම මිසරවරුන්ගේ ඇස් 21
හමුයෙහි මේ සෙනඟට කරුණාව
ලැබෙන්ට සලස්වන්නෙමි. තවද නුඹලා
යන කල්හි සිස් අතින් නොයන්නහුය.
එහෙත් එක එක ස්ත්‍රී තම තමාගේ 22
අසල්වාසී ස්ත්‍රියගෙන්ද තම තමාගේ
ගෙයි නැවතී සිටින්නියගෙන්ද රිදී
බඩුත් රන් බඩුත් වස්ත්‍රත් ඉල්වාගන්නීය.
නුඹලා ඒවා නුඹලාගේ පුත්‍රයන්ටද
දූවරුන්ටද පළඳවන්නහුය; මෙසේ
නුඹලා මිසරවරුන්ගේ වස්තුව ගන්නහු-
යයි කීසේක. එවිට මෝසෙස්

## 4

උත්තර දෙමින්: එහෙත් බැලුව
මැනව, ඔවුන් මා විශ්වාස නොකොට,
මාගේ හඬට ඇහුම්කන් නොදී, ස්වාමීන්-
වහන්සේ නුඹට නොපෙනුණුසේකැයි
කියනවා ඇතැයි කීය. එවිට ස්වාමීන්- 2
වහන්සේ: නුඹේ අතේ තිබෙන්නේ
මොකක්දැයි ඔහුගෙන් ඇසූසේක.
සැරයටියක්යයි ඔහු කීවේය. උන්- 3
වහන්සේ: ඒක බිම හෙළාපන්නැයි
කීසේක. ඔහු ඒක බිම හෙළූ විට ඒක
සර්පයෙක් විය; මෝසෙස් ඌ ඉදිරියෙන්
දිවුවේය. ස්වාමීන්වහන්සේ: නුඹේ අත 4
දිගුකොට ඌ වල්ගෙන් අල්වා
ගනින්නැයි මෝසෙස්ට කීසේක.
(ඔහු තමාගේ අත දිගුකොට ඌ
අල්වාගත්තේය, ඌ ඔහුගේ අතෙහි
සැරයටියක් වුණේය.) ආබ්‍රහම්ගේ 5
දෙවියන්වහන්සේද ඊසාක්ගේ දෙවියන්-

වහන්සේද යාකොබ්ගේ දෙවියන්-
වහන්සේද වන ඔවුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ තුඹට පෙනුණු
බව ඔවුන් විසින් විශ්වාස කරන පිණිස
6 එසේ කරපන්නැයි කීසේක. තවද
ස්වාමීන්වහන්සේ: තුඹේ අත තුඹේ
ළයෙහි තබවයි ඔහුට කීසේක. ඔහු
අත තමාගේ ළයෙහි තැබීය. ඔහු ඒක
අහකට ගත් විට, බලව, ඔහුගේ අත
හිම මෙන් කුෂ්ඨයෙන් සුදුවී තිබුණේය.
7 උන්වහන්සේ: තුඹේ අත නැවත ළයෙහි
තබවයි කීසේක. (ඔහු තමාගේ අත
නැවත ළයෙහි තැබීය; ඔහු ඒක තමාගේ
ළයෙන් පිටතට ගත් විට, බලව, එය
ඔහුගේ අනික් මාංසය මෙන් හරිගැහී
8 තිබුණේය.) ඔව්හු තුඹ විශ්වාස නො-
කරන්නෝ නම්, පළමුවෙනි ලකුණේ
හඬට කන්නොදෙන්නෝ නම්, ඔවුන්
අනික් ලකුණේ හඬ විශ්වාස කරනවා
9 ඇත. තවද ඔව්හු මේ ලකුණු දෙකම
විශ්වාසනොකර තුඹේ හඬට කන්නො-
දෙන්නෝ නම්, ගංගාවෙන් වතුර රැගෙන
වියළි බිමට වත්කරපන්න. එවිට තුඹ
ගංගාවෙන් ගත් වතුර භූමිය මතුයෙහි
10 ලේ වන්නේයයි කීසේක. මෝසෙස්:
අහෝ, ස්වාමීනි, මීට ප්‍රථමවත් ඔබ
තමන් මෙහෙකරුවාට කථාකළාට
පසුවවත් මම ව්‍යක්තයෙක් නොවෙමි.
මක්නිසාද කථාවට අදක්ෂවූ අදක්ෂ
දිවක් ඇත්තාවූ කෙනෙක්මියි ස්වාමීන්-
11 වහන්සේට කීයේය. එවිට ස්වාමීන්-
වහන්සේ කථාකොට: මනුෂ්‍යයාගේ
මුඛය සෑදුවේ කවුද? නොහොත්
ගොළුවෙක් හෝ බිහිරෙක් කොට
මනුෂ්‍යයෙකු මවන්නෙත් යමෙකුට
පෙනෙන්ට හෝ අන්ධවෙන්ට හෝ
සලස්වන්නෙත් කවුද? ස්වාමීන්වහන්සේ
12 වන මම නොවේද? එබැවින් දැන් යව,
මම තුඹේ මුඛය සමග සිට තුඹ විසින්
කිය යුතු දේ තුඹට උගන්වන්නෙමියි
13 ඔහුට කීසේක. ඔහු: අහෝ ස්වාමීනි,
ඔබවහන්සේ යවන්ට කැමැත්තෙකු
14 අත යැවුව මැනවයි කීය. එවිට
ස්වාමීන්වහන්සේගේ උදහස මෝසෙස්ට
විරුද්ධව ඇවුළුණේය. උන්වහන්සේ:
තුඹේ සහෝදරවූ ලෙවීයයා වූ ආරොන්
ඉන්නවා නොවේද? ඔහුට ව්‍යක්ත ලෙස
කථාකරන්ට පුළුවන් බව දනිමි. බලව,
ඔහු තුඹ සම්බවන්ට එන්නේය.
ඔහු තුඹ දුටුවාම තමන් සිතින් සන්-
තෝෂවන්නේය. තුඹ ඔහුට කථාකොට 15
ඔහුගේ කටට වචන දෙන්නෙහිය. මම
තුඹේ මුඛයත් ඔහුගේ මුඛයත් සමග
සිට තුඹලා විසින් කටයුතු දේ තුඹලාට
උගන්වන්නෙමි. ඔහු තුඹ වෙනුවට 16
සෙනඟට කථාකරන්නේය. මෙසේ
ඔහු තුඹට මුඛයක් වන්නේය, තුඹ
ඔහුට දෙවියන්වහන්සේ මෙන් වන්-
නෙහිය. තුඹ විසින් හාස්කම් දක්වන්ට 17
මේ සැරයටිය තුඹේ අතින් ගනුවයි
කීසේක.

## මෝසෙස් මිසරයට හැරීයාම

මෝසෙස් තමාගේ මාමා වූ යෙත්‍රෝ 18
වෙතට හැරීගොස්: මිසරයෙහි සිටින
මාගේ සහෝදරයෝ තවම ජීවත්ව
සිටින්නෝද්දයි බලන පිණිස ඔවුන්
වෙතට හැරීයන්ට මට අවසර දුන-
මැනවියි කීයේය. සමාදනයෙන්
පලයන්නැයි යෙත්‍රෝ මෝසෙස්ට කීවේය.
ස්වාමීන්වහන්සේ: තුඹේ ප්‍රාණය 19
නසන්ට සෙවූ සියල්ලෝ මළෝය.
එබැවින් මිසරයට නැවත යවයි
මිදියන්හිදී මෝසෙස්ට කීසේක. එවිට 20
මෝසෙස් තමාගේ භාර්යාවද පුත්‍රයන්ද
රැගෙන කොටළුවෙකු පිට හිඳුවා මිසර
දේශයට හැරී ගියේය. දෙවියන්-
වහන්සේගේ සැරයටියද අතින් රැගෙන
ගියේය. ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 21
කථාකොට: තුඹ මිසරයට නැවත
පැමිණි කල්හි මා විසින් තුඹේ අතෙහි
තැබූ සියලු ආශ්චර්යයන් ඵාරාවෝ
ඉදිරියේ කරන්ට බලාගනින්න. එහෙත්
සෙනඟ යන්ට නොහරින ලෙස මම
ඔහුගේ සිත දැඩි කරන්නෙමි. තුඹ 22
ඵාරාවෝට කථාකොට: ස්වාමීන්-

වහන්සේ මෙසේ කියනසේක–ඉශ්‍රායෙල්
23 මාගේ පුත්‍රයාය, මාගේ කුලුඳුලාය. මට
මෙහෙකරන පිණිස මාගේ පුත්‍රයා යන්ට
හරින්නැයි නුඹට කීමි; නුඹ ඔහුට යන්ට
නුදුන්නෙහිය. බලව, මම නුඹේ පුත්‍රයා
එනම් නුඹේ කුලුඳුලා නසන්නෙමියි
කියනසේකැයි කියාපන්නැයි කීසේක.
24 මාර්ගයෙහි නවාතැනේදී ස්වාමීන්-
වහන්සේ ඔහුට සම්බව ඔහු මරන්ට
25 සැදූසේක. එවිට ශිප්පොරා ගල්පිහියක්
රැගෙන ඇගේ පුත්‍රයාගේ චර්මාග්‍රය
කපා එයින් ඔහුගේ පාද ස්පර්ශ-
කොට: සැබවින් නුඹ මට ලෙයේ මන-
26 මාලයෙකැයි කීවාය. මෙසේ උන්වහන්සේ
ඔහු කෙරෙන් අහක්ව ගියසේක.
චර්මඡේද්‍යය නිසා නුඹ ලෙයේ මන-
මාලයෙක්යයි ඕතොම කීවාය.
27 මෝසෙස් සම්බවන පිණිස
වනාන්තරයට යවයි ස්වාමීන්වහන්සේ
ආරොන්ට කීසේක. ඔහු ගොස්
දෙවියන්වහන්සේගේ කන්දේදී ඔහු
28 සම්බව සිඹගත්තේය. ස්වාමීන්වහන්සේ
තමා අත කියා ඇරිය සියලු වචනද
උන්වහන්සේ තමාට අණකළාවූ සියලු
ලකුණුද මෝසෙස් ආරොන්ට දැන්නුවේය.
29 මෝසෙස්ද ආරොන්ද ගොස් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ සියලු වැඩිමහල්ලන්
30 රැස්කළෝය. ආරොන් ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට කථාකළ සියලු වචන කියා
සෙනඟ ඉදිරියෙහි ඒ ලකුණු දැක්විය.
31 සෙනඟද විශ්වාසකළෝය. ඔව්හු
ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්
දෙස බැලූ බවද තමන්ගේ පීඩාව දුටු
බවද ඇසූ කල හිස් නමා නමස්කාර-
කළෝය.

## මෝසෙස් පළමුවෙනි වරට ඵාරාවෝ ඉදිරිපිට සිටීම

5 ඉන්පසු මෝසෙස් සහ ආරොන්
ඵාරාවෝ වෙතට අවුත්: මට
වනාන්තරයෙහිදී මංගල්‍යයක් පවත්වන
පිණිස මාගේ සෙනඟ යන්ට හරින්නැයි
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
කියනසේකැයි කීවෝය. ඵාරාවෝ: 2
ඉශ්‍රායෙල්වරුන්ට යන්ට හරින ලෙස
මා විසින් ස්වාමීන්වහන්සේගේ බසට
ඇහුම්කන් දෙන්ට ඔහු කවුද? මම
ස්වාමීන්වහන්සේ නාඳුනමි. ඇරත්
ඉශ්‍රායෙල්වරුන්ට යන්ට නොහරින්නෙමියි
කීයේය. ඔව්හුද: හෙබ්‍රෙව්වරුන්ගේ 3
දෙවියන්වහන්සේ අපට සම්මුඛවූසේක.
උන්වහන්සේ වසංගතය හෝ කඩුව හෝ
ඇතුව අපට විරුද්ධව නොපැමිණෙන
පිණිස අප තුන් දවසක ගමන් වනාන්-
තරයට ගොස් අපගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට පූජා ඔප්පුකරන්ට අවසර
ලැබේවයි කීවෝය. මිසරයේ රජ්ජුරුවෝ: 4
එම්බා මෝසෙස් සහ ආරොන්,
නුඹලා සෙනඟ ඔවුන්ගේ වැඩවලින්
කුමට අහක්කරවුද? නුඹලාගේ බර
ඉසිලීමට පලයල්ලායයි කීහ. තවද 5
ඵාරාවෝ: බලව, දේශයේ සෙනඟ දැන්
බොහෝය, නුඹලා ඔවුන්ගේ බර වැඩ-
වලින් ඔවුන් නවත්වන්නහුයයි ඔවුන්ට
කීය. එම දවසෙහි ඵාරාවෝ සෙනඟ- 6
ගේ විධානවරුන්ටද ඔවුන්ගේ මූලා-
දෑනීන්ටද අණකොට: මේ දක්වා 7
කළාක් මෙන් ගඩොල් සෑදීමට සෙනඟට
පිදුරු තවත් නොදෙල්ලා. ඔව්හුම
ගොස් පිදුරු එකතුකරගනිත්වා. එහෙත් 8
ඔවුන් පළමු සෑදූ ගඩොල් ගණනම
සාදන්ට ඔවුන්ට නියමකරපල්ලා;
එයින් කිසිවක් අඩු නොකරල්ලා. මක්-
නිසාද ඔව්හු කම්මැළිය; එබැවින්:
අපේ දෙවියන්වහන්සේට පූජාකරන්ට
යන්ට අවසරදුනමැනවියි මොරගසති.
ඒ මනුෂ්‍යයන් බොරු වචන නො- 9
සලකා වැඩකිරීමෙහි යෙදී සිටින පිණිස
වඩා බර වැඩ ඔවුන් කෙරෙහි පවරා-
පල්ලායයි කීයේය. එවිට සෙනඟගේ 10
විධානවරුද ඔවුන්ගේ මූලාදෑනිහුද
පිටත ගොස් සෙනඟට කථාකොට:
ඵාරාවෝ මෙසේ කියන්නේය; මම
නුඹලාට පිදුරු නොදෙමි. නුඹලාම 11
ගොස් සොයාගන්ට පුළුවන් තැන්වලින්
පිදුරු ගෙනෙල්ලා. මක්නිසාද නුඹලාගේ

වැඩවලින් කිසිවක් අඩුකරන්ට බැරියයි
12 කියන්නේයයි කීවෝය. එබැවින් සෙනඟ
පිදුරු පිණිස ඉපනැලි එකතුකරන්ට
මුළු මිසර දේශයෙහි විසර ගියෝය.
13 විධානවරු: පිදුරු තිබුණු කල්හි මෙන්ම
තුඹලාගේ නියමවූ දවස්පතා වැඩ
සම්පූර්ණකරපල්ලාය කියා ඔවුන්ට
14 ඉක්මන්කළෝය. ඵාරාවෝගේ විධා-
නවරු තමන් විසින් ඉශ්‍රායෙල් පුත්‍රයන්
කෙරෙහි පත්කළ මූලාදෑනීන්ට කථා-
කොට: තුඹලා මීට ඉස්සර කළාක්-
මෙන් ඊයෙත් අදත් තුඹලාට නියම
ගඩොල් ගණන නොසෑදුවේ මක්නිසාදැයි
15 කියා ඔවුන්ට තැළුවෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ මූලාදෑනීහු අවුත්
ඵාරාවෝට කන්නලව්කරමින්: ඔබගේ
මෙහෙකරුවන්ට මෙසේ කරන්නේ
16 මක්නිසාද? ඔව්හු ඔබගේ මෙහෙකරු-
වන්ට පිදුරු නොදෙති, තුමුත් ගඩොල්
සාදපල්ලායයි අපට කියති. මෙසේ
වැරැද්ද ඔබගේම සෙනඟගේ අතේ
තිබියදී ඔබගේ මෙහෙකරුවෝ තැළුම්-
17 කතියි කීවෝය. එහෙත් ඔහු: තුඹලා
කම්මැළිය, තුඹලා කම්මැළිය. එබැවින්–
අපි ගොස් ස්වාමීන්වහන්සේට පූජා
18 ඔප්පුකරමුයයි කියන්නහුය. ඒ නිසා
දැන් ගොස් වැඩකරපල්ලා; පිදුරු
කොහෙන්ම තුඹලාට දෙනු නො-
ලැබේ, තුමුත් තුඹලාට නියම ගඩොල්
ගණන භාරදෙන්ට ඕනෑයයි කීයේය.
19 තුඹලාගේ ගඩොල් ගණනෙන් එනම්
තුඹලාගේ නියම දවස්පතා වැඩෙන්
කිසිවක් අඩුනොකළ යුතුයයි කී
කල, තමන්ට නපුර පැමිණ තිබෙන
බව ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මූලා-
20 දෑනීහු තේරුම්ගත්තෝය. ඔවුන්
ඵාරාවෝ වෙතින් එද්දී මග බලා
සිටියාවූ මෝසෙස් සහ ආරොන්
21 ඔවුන්ට සම්බවුණෝය. ඔව්හු ඔවුන්ට
කථාකොට: ස්වාමීන්වහන්සේ තුඹලා
දෙස බලා විනිශ්චයකරනසේක්වා;
මක්නිසාද තුඹලා ඵාරාවෝ ඉදිරියෙහිද
ඔහුගේ සේවකයන් ඉදිරියෙහිද අප
දුර්ගන්ධයක් වෙන්ට සලස්වා අප මරන
පිණිස ඔවුන්ගේ අතට කඩුවක් දුන්නහු-
යයි කීවෝය. එවිට මෝසෙස් ස්වාමීන්- 22
වහන්සේ වෙතට හැරී ගොස්: ස්වාමීනි,
ඔබ මක්නිසා මේ සෙනඟට නපුර
කළසේක්ද? ඔබ මා එවූවේ මන්ද?
මක්නිසාද මා ඔබගේ නාමයෙන් 23
කථාකරන පිණිස ඵාරාවෝ වෙතට
ආවායින් පසු ඔහු මේ සෙනඟට නපුර
කෙළේය; ඔබ තමන් සෙනඟ කිසිසේත්
නිදහස්නොකළසේකැයි කීවේය. එවිට
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
6
කථාකොට: මා විසින් ඵාරා-
වෝට කරන දේ දැන් තුඹ දක්නෙහිය.
මක්නිසාද ඔහු බලවත් අතක් කරණ-
කොටගෙන ඔවුන් යන්ට හරින්නේය,
ඔහු බලවත් අතක් කරණකොටගෙන
තමාගේ රටින් ඔවුන් පන්නාහරින්නේයයි
කීසේක.

## දෙවියන්වහන්සේ විසින් මෝසෙස්ට අණදීම

නවද දෙවියන්වහන්සේ මෝසෙස්ට 2
කථාකොට: මම යෙහෝවඃවහන්සේය.
මම ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද 3
සර්වපරාක්‍රම දෙවියන්වහන්සේ ලෙස
පෙනුණෙමි, තුමුත් යෙහෝවඃ යන මාගේ
නාමයෙන් ඔවුන්ට ප්‍රකාශනූණෙමි.
ඔවුන් විදේශීව සිටියාවූ ඔවුන්ගේ 4
පොරොන්දුව සිටීමේ රට වූ කානාන්
දේශය ඔවුන්ට දෙන පිණිස ඔවුන්
සමග මාගේ ගිවිසුමද පිහිටෙවූවෙමි.
ඇරත් මිසරවරුන් විසින් වහල්- 5
කමෙහි තබාගත සිටින ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ කෙඳිරිගෑම මම අසා මාගේ
ගිවිසුම සිහිකෙළෙමි. එබැවින් ඉශ්‍රායෙල් 6
පුත්‍රයන්ට කථාකොට: මම යෙහෝවඃ-
වහන්සේය, මිසරවරුන් තබන බරවලින්
මම තුඹලා පිටතට ගෙනෙන්නෙමි,
ඔවුන්ගේ වහල්කමෙන් තුඹලා නිදහස්-
කරන්නෙමි, දිගු කළ බාහුවකින්ද මහත්
විනිශ්චයවලින්ද තුඹලා මුදන්නෙමි.

7 තුඹලා මාගේ සෙනඟ කොට පිළිගෙන
තුඹලාට දෙවි කෙනෙක් වන්නෙමි.
මෙසේ මම මිසරවරුන්ගේ බරවලින්
තුඹලා පිටතට ගෙනෙන තුඹලාගේ
දෙවිවූ යෙහෝවඃවහන්සේ බව තුඹලා
8 දැනගන්නහුය. ආබ්‍රහම්ටත් ඊසාක්ටත්
යාකොබ්ටත් දෙන ලෙස යම් දේශයක්
ගැන මාගේ අත එසවීම්ද ඒ දේශයට
තුඹලා පමුණුවා උරුමයක් කොට ඒක
තුඹලාට දෙන්නෙමි. මම යෙහෝවඃ-
වහන්සේයයි කියාපන්නැයි කීසේක.
9 මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට එලෙස
කථාකෙළේය. එහෙත් ඔව්හු හෘදය
වේදනාව නිසාත් තද වහල්කම නිසාත්
මෝසෙස්ට ඇහුම්කන් නුදුන්නෝය.
10 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
11 කොට: තුඹ ඇතුල්වී, ඉශ්‍රායෙල් පුත්‍රයන්
තමන් දේශයෙන් යන්ට හරින ලෙස
මිසරයේ රජවූ ඵාරාවෝට කථාකරවයි
12 කීසේක. මෝසෙස් ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි කථාකොට: බැලුව මැනව,
ඉශ්‍රායෙල් පුත්‍රයෝ මට ඇහුම්කන්
නුදුන්නෝය; එසේවීනම් ඵාරාවෝ
අදක්ෂ තොල් ඇති මට කන්දෙන්නේ
13 කෙසේදැයි කීවේය. ස්වාමීන්වහන්සේ
මෝසෙස්ටද ආරොන්ටද කථාකොට,
ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර දේශයෙන්
පිටතට ගෙනෙන පිණිස ඉශ්‍රායෙල්
පුත්‍රයන් ගැනත් මිසරයේ රජවූ
ඵාරාවෝ ගැනත් ඔවුන්ට අණක්
දුන්සේක.

## පෙළපත්

14 තමන්ගේ පිය පෙළපත්වල ප්‍රධානියෝ
මොව්හුය: ඉශ්‍රායෙල්ගේ කුලුඳුලාවූ
රූබෙන්ගේ පුත්‍රයෝ, හනොක්, පල්ලු,
හෙශ්රොන් සහ කර්මීය. මොව්හු
15 රූබෙන්ගේ පෙළපත්ය. සිමියොන්ගේ
පුත්‍රයෝ: යෙමුවෙල්, යාමීන්, ඕහද්,
යාකීන්, ශොහර් සහ කානානිය
ස්ත්‍රියකගේ පුත්‍රවූ ෂාවුල්ය. මොව්හු
16 සිමියොන්ගේ පෙළපත්ය. තමන්ගේ
පරම්පරා වශයෙන් ලෙවී පුත්‍රයන්ගේ
නාම මෙසේය: ගේර්ෂොන්, කොහාත්
සහ මෙරාරීය. ලෙවීගේ ජීවිතයේ අවුරුදු
එකසිය තිස්හතක් විය. තමන්ගේ 17
පෙළපත් ලෙස ගේර්ෂොන්ගේ පුත්‍රයෝ,
ලිබ්නි සහ ෂිමෙයිය. කොහාත්ගේ 18
පුත්‍රයෝ: අම්රාම්, ඉශ්හාර්, හෙබ්‍රොන්
සහ උස්සීයෙල්ය. කොහාත්ගේ ජීවිතයේ
අවුරුදු එකසිය තිස්තුනක් විය.
මෙරාරීගේ පුත්‍රයෝ: මහ්ලි සහ මූෂිය. 19
තමන්ගේ පරම්පරා ලෙස ලෙවීගේ
පෙළපත් මේය. අම්රාම් තමාගේ පියාගේ 20
සහෝදරීවූ යොකෙබෙද් භාර්යාව
කොට පාවාගත්තේය; ඈ ඔහු නිසා
ආරොන් සහ මෝසෙස් වැදුවාය.
අම්රාම්ගේ ජීවිතයේ අවුරුදු එකසිය
තිස්හතක් විය. ඉශ්හාර්ගේ පුත්‍රයෝ: 21
කොරා, නෙපෙග් සහ සික්රීය.
උස්සීයෙල්ගේ පුත්‍රයෝ: මීෂායෙල්, එල්- 22
ෂාපාන් සහ සිත්රීය. ආරොන් අම්මි- 23
නාදබ්ගේ දූවූ, නාෂොන්ගේ සහෝ-
දරීවූ එලිෂෙබා භාර්යාව කොට
පාවාගත්තේය; ඈ ඔහු නිසා නාදබ්ද
අබිහූද එලෙයාසර්ද ඊතාමර්ද වැදුවාය.
කොරාගේ පුත්‍රයෝ: අස්සීර්, එල්කානා 24
සහ අබියාසාෆ්ය; මොවුන් කොරා-
වරුන්ගේ පෙළපත්ය. ආරොන්ගේ පුත්‍රවූ 25
එලෙයාසර් පූතියෙල්ගේ දූවක් භාර්යාව
කොට පාවාගත්තේය; ඈ ඔහු නිසා
පීනෙහාස් වැදුවාය. මොව්හු තමන්ගේ
පවුල් ලෙස ලෙවීවරුන්ගේ පිය
පෙළපත්වල ප්‍රධානියෝය. ඉශ්‍රායෙල් 26
පුත්‍රයන් තමන්ගේ සේනාවල හැටියට
මිසර දේශයෙන් පිටතට ගෙනෙව්යයි
ස්වාමීන්වහන්සේ කීවේ මේ ආරොන්ට
සහ මෝසෙස්ටත්ය. ඉශ්‍රායෙල් 27
පුත්‍රයන් මිසර දේශයෙන් පිටත ගෙ-
නෙන පිණිස මිසරයේ රජවූ ඵාරා-
වෝට කථාකළේ මෙම මෝසෙස් සහ
ආරොන්ය.

## මෝසෙස්ට දෙවනුව අණදීම

තවද මිසර දේශයේදී ස්වාමීන්- 28
වහන්සේ මෝසෙස්ට කථාකළ දවසේ

29 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කියන-
සේක්: මම ස්වාමීන්වහන්සේය. මා විසින්
තුඹට කියන සියල්ල මිසරයේ රජවූ
30 ඵාරාවෝට කියවයි කීසේක. මෝසෙස්
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි කථා-
කොට: මම අදක්ෂ තොල් ඇති
කෙනෙක් වෙමි, ඵාරාවෝ මට ඇහුම්-
කන්දෙන්නේ කොහොමදැයි කීවේය.

7 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: බලව, මම තුඹ
ඵාරාවෝට දෙවිකෙනෙකු කොට
තැබුවෙමි. තුඹේ සහෝදරවූ ආරොන්
2 තුඹේ ප්‍රොපේතවරයා වන්නේය. මා
තුඹට අණකරන සියල්ල තුඹ කිය
යුතුය. තුඹේ සහෝදරවූ ආරොන්
ඉශ්‍රායෙල් පුත්‍රයන් තමාගේ දේශයෙන්
යන්ට හරින ලෙස ඵාරාවෝට කිය
3 යුතුය. මම ඵාරාවෝගේ සිත දැඩිකොට
මාගේ ලකුණුද හාස්කම්ද මිසර
4 දේශයෙහි වැඩිකරන්නෙමි. නුමුත්
ඵාරාවෝ තුඹලාට ඇහුම්කන්
නොදෙන්නේය, මමද මාගේ හස්තය
මිසරය පිට හෙළා මහත් විනිශ්චයයන්
කරණකොටගෙන මාගේ සේනාවන්ද
මාගේ සෙනඟද වූ ඉශ්‍රායෙල් පුත්‍රයන්
මිසර දේශයෙන් පිටතට ගෙනෙන්නෙමි.
5 මම මිසරය පිටට මාගේ අත දිගුකොට
ඉශ්‍රායෙල් පුත්‍රයන් ඔවුන් අතරෙන්
පිටතට ගෙනෙන කල්හි මා ස්වාමීන්-
වහන්සේ බව මිසරවරු දැනගන්නෝ-
6 යයි කීසේක. මෝසෙස්ද ආරොන්ද
එසේ කළෝය; ඔව්හු ස්වාමීන්වහන්සේ
7 අණකළ ලෙස කළෝය. ඔවුන්
ඵාරාවෝට කථාකළ කල්හි මෝසෙස්
අවුරුදු අසූවක්ද ආරොන් අවුරුදු
අසූතුනක්ද වයස්ව සිටියෝය.

## සැරමිටිය සර්පයෙකු කරවීමෙන් පෙන්වූ ලකුණ

8 ස්වාමීන්වහන්සේ මෝසෙස් සහ
9 ආරොන්ට කථාකොට: තුඹලා උදෙ-
සා ආශ්චර්යයක් පෙන්වාපල්ලායයි
ඵාරාවෝ තුඹලාට කියන කල තුඹ
ආරොන්ට කථාකොට: තුඹේ සැරයටිය
රැගෙන එය සර්පයෙක් වන ලෙස
ඵාරාවෝ ඉදිරියෙහි හෙළාපන්නැයි
කියවයි කීසේක. මෝසෙස් සහ 10
ආරොන් ඵාරාවෝ වෙතට ගොස්
ස්වාමීන්වහන්සේ අණකළ ලෙස
කළෝය. ආරොන් තමාගේ සැරයටිය
ඵාරාවෝද ඔහුගේ සේවකයන්ද ඉදිරි-
යෙහි හෙළීය, එවිට ඒක සර්පයෙක්
වුණේය. ඵාරාවෝද ශාස්ත්‍රවන්තයන් 11
සහ මන්ත්‍රකාරයන් කැඳවීය. එවිට
මිසරයේ මායාකාරයෝවූ ඔව්හුද
තමන්ගේ ඇස්බැන්දුම්වලින් එලෙසම
කළෝය. මක්නිසාද ඔවුන් එක් එක් 12
කෙනා තම තමාගේ සැරයටිය හෙළූ
කල ඒවා සර්පයෝ වුණෝය. නුමුත්
ආරොන්ගේ සැරයටිය ඔවුන්ගේ සැර-
යටි ගිලගත්තේය. එහෙත් ස්වාමීන්- 13
වහන්සේ කී ලෙස ඵාරාවෝගේ සිත
දැඩිවිය, ඔහු ඔවුන්ට ඇහුම්කන් නුදුන්-
නේය.

## 1 වෙනි පීඩාව: වතුර ලේ වීම

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 14
කොට: ඵාරාවෝගේ සිත මුරණ්ඩුය,
ඔහු සෙනඟ යන්ට නොහරියි. තුඹ 15
උදය ඵාරාවෝ වෙතට පලයන්න; ඔහු
වතුර ළඟට පිටත්ව යන්නේය; තුඹද
සර්පයෙක් වුණ සැරයටිය තුඹේ අතින්
ගෙන ඔහුට සම්මුඛවන පිණිස
ගංඉවුරෙහි සිට ඔහුට කථාකරමින්–
වනාන්තරයෙහිදී මට මෙහෙකරන 16
පිණිස මාගේ සෙනඟ යන්ට හරින්නැයි
කියන පිණිස හෙබ්‍රෙව්වරුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ ඔබ වෙතට මා එවූ-
සේක. ඔබ මේ දක්වා ඇහුම්කන්
නුදුන්නෙහිය. මෙයින් මා ස්වාමීන්- 17
වහන්සේ බව ඔබ දැනගන්නෙහියයි
ස්වාමීන්වහන්සේ කියනසේක. මෙන්න,
මා අත තිබෙන සැරයටියෙන් ගංගාවේ
තිබෙන සියලුම වතුරවලට ගසන්නෙමි,
ඒවා ලේ වන්නේය. ගඟෙහි සිටින 18
මත්ස්‍යයෝද මියයන්නෝය, ගඟද

දුර්ගන්ධ වෙනවා ඇත; මිසරවරු ගඟේ
වතුර බොන්ට අතිශයින් අප්‍රියවන්නෝ-
19 යයි ඔහුට කියවයි කීසේක. තවද
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
කොට: නුඹ ආරොන්ට මෙසේ
කියාපන්න–නුඹේ සැරයටිය ගෙන
මිසරවරුන්ගේ ගංගාද ඔවුන්ගේ ඇළ
දෙළවල්ද ඔවුන්ගේ විල්ද ඔවුන්ගේ
සියලු දිය පොකුණුද ලේ වන පිණිස
මිසරයේ ජලය කෙරෙහි අත දිගුකරව;
මුළු මිසර දේශයෙහි ලී භාජනවලත්
ගල් භාජනවලත් ලේ ඇතිවන්නේයයි
20 කීසේක. මෝසෙස් සහ ආරොන්
ස්වාමීන්වහන්සේ අණකළ ලෙස
කළෝය; ඔහු සැරයටිය ඔසවා
ඵාරාවෝ සහ ඔහුගේ සේවකයන්
ඉදිරියෙහි ගඟේ ජලයට ගැසීය; එවිට
ගංගාවේ තිබුණ සියලුම වතුරු ලේ
21 වුණේය. ගඟේ සිටි මත්ස්‍යයෝ
මැරුණෝය; ගඟද දුර්ගන්ධවූවාය,
මිසරවරුන්ට ගඟෙන් වතුර බොන්ට
නොහැකිවිය; මිසර දේශය මුළුල්-
22 ලෙහිම ලේ තිබුණේය. මිසරයේ මායා-
කාරයෝද තමන්ගේ ඇස්බැන්දුම්-
වලින් එසේම කළෝය. ස්වාමීන්-
වහන්සේ කී ප්‍රකාර ඔවුන්ට කන්
නොදෙන ලෙස ඵාරාවෝගේ සිත
23 දැඩිව තිබුණේය. ඵාරාවෝ මේකවත්
හිතට නොගෙන තමන් ගෙට හැරී
24 ගියේය. සියලු මිසරවරු බොන පිණිස
වතුර ගන්ට ගඟ අසල හෑරුවෝය;
මක්නිසාද ඔවුන්ට ගඟේ වතුර
25 බොන්ට නොහැකිවිය. ස්වාමීන්වහන්සේ
ගංගාවට පහරදුන් පසු සත් දවසක්
ගතවිය.

## 2 වෙනි පීඩාව: මැඩියෝ

8 එවිට ස්වාමීන්වහන්සේ මෝසෙස්-
ට කථාකොට: ඵාරාවෝ වෙතට
ගොස්, ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේකැයි ඔහුට කියාපන්න–මට
මෙහෙකරන පිණිස මාගේ සෙනඟ
2 යන්ට හරින්න. ඉදින් ඔවුන් යන්ට
නොහරින්නෙහි නම් සීමා දක්වා
නුඹේ මුළු දේශයට මැඩියන් ලවා
පහරදෙන්නෙමි. එවිට මැඩියන්ගෙන් ගඟ 3
පිරෙනවා ඇත. උන් නුඹේ ගෙටත් නුඹේ
යහන් ගබඩාවටත් නුඹේ යහන පිටටත්
නුඹේ මෙහෙකරුවන්ගේ ගෙටත් නුඹේ
සෙනඟ පිටටත් නුඹේ උඳුන්වලටත්
නුඹේ පිටි අනන ඔරුවලටත් නැගී
එන්නෝය. මැඩියෝ නුඹ සහ නුඹේ 4
සෙනඟ පිටටත් නුඹේ සියලු මෙහෙ-
කරුවන් පිටටත් නගින්නෝයයි කියවයි
කීසේක. ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 5
කථාකොට: නුඹේ සැරයටිය ගෙන
මිසර දේශය පිට මැඩියන් පමුණුවන
පිණිස ගංගා කෙරෙහිද ඇළ දෙළවල්
කෙරෙහිද පොකුණු කෙරෙහිද නුඹේ
අත දිගුකරවයි ආරොන්ට කියාපන්නැයි
කීසේක. එසේ ආරොන් මිසරයේ 6
ජල කෙරෙහි තමාගේ අත දිගුකෙළේය;
එවිට මැඩියෝ නැගී ඇවිත් මිසර
දේශය වසාගත්තෝය. මායාකාරයෝද 7
තමන්ගේ ඇස්බැන්දුම්වලින් එලෙසම
කොට මැඩියන් මිසර දේශය පිටට
පැමිණෙවුවෝය. එවිට ඵාරාවෝ 8
මෝසෙස් සහ ආරොන් කැඳවා: මා
වෙතින්ද මාගේ සෙනඟ වෙතින්ද
මැඩියන් පහකරන පිණිස ස්වාමීන්-
වහන්සේට කන්නලව්කරපල්ලා; එවිට
ස්වාමීන්වහන්සේට පූජා ඔප්පුකරන
පිණිස සෙනඟ යන්ට හරින්නෙමියි
කීය. මෝසෙස් ඵාරාවෝට කියනුයේ: 9
මැඩියන් ඔබ වෙතින්ද ඔබගේ
මෙහෙකරුවන් වෙතින්ද ඔබගේ
ගෙවලින්ද සිඳදමනු ලැබ ගංගාවෙහි
පමණක් ඉතුරුවන පිණිස ඔබ සහ
ඔබගේ සේවකයන්ද ඔබගේ සෙනඟද
වෙනුවට මා කන්නලව්කරන්නේ කොයි
වේලේදැයි නියම කිරීමේ ගෞරවය
ඔබටම ගත මැනවියි කීවේය. ඔහුද: 10
හෙටයයි කීය. එවිට ඔහු: අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ හා සමාන කිසිවෙක්
නැති බව ඔබ දැනගන්නා පිණිස ඔබගේ
වචනය ලෙස වේවා. මැඩියෝ ඔබ 11

වෙතින්ද ඔබගේ ගෙවලින්ද ඔබගේ
සේවකයන් සහ සෙනඟ වෙතින්ද පහව
ගොස් ගංගාවේ පමණක් ඉතුරුවන්-
12 නෝයයි කීයේය. එවිට මෝසෙස් සහ
ආරොන් ඵාරාවෝ ඉදිරියෙන් පිටතට
ගියෝය. මෝසෙස් වනාහි ස්වාමීන්-
වහන්සේ ඵාරාවෝ පිටට පැමිණෙවූ
මැඩියන් ගැන උන්වහන්සේට යාච්ඤා-
13 කෙළේය. ස්වාමීන්වහන්සේ මෝසෙස්-
ගේ වචනය ලෙස කළසේක; ගෙවලද
මිදුල්වලද කෙත්වලද උන් මැඩියෝ
14 නැසුණෝය. ඔව්හු උන් එකතුකොට
ගොඩවල් ගැසුවෝය. දේශයද දුර්ගන්-
15 ධවිය. එහෙත් ඵාරාවෝ අවකාශයක්
ලැබුණු බව දැක ස්වාමීන්වහන්සේ
කියා තිබුණු ලෙස තමාගේ සිත
දැඩිකරගෙන ඔවුන්ට කන් නුදුන්නේය.

## 3 වෙනි පීඩාව: කිනිතුල්ලෝ

16 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
කොට: නුඹේ සැරයටිය දිඟුකොට
පොළොවේ දූවිල්ල මිසර දේශය
මුළුල්ලෙහි කිනිතුල්ලන් වෙන පිණිස
ඊට ගසවයි ආරොන්ට කියාපන්නැයි
17 කීසේක. ඔව්හු එසේ කළෝය; ආරොන්
තමාගේ සැරයටිය රැගෙන අත දිඟු-
කොට පොළොවේ දූවිල්ලට ගැසුවේය,
එවිට මනුෂ්‍යයන්ද මෘගයන්ද පිට
කිනිතුල්ලෝ වූවෝය; පොළොවේ
දූවිලි සියල්ල මිසර දේශය මුළුල්-
18 ලෙහි කිනිතුල්ලෝ විය. මායා-
කාරයෝද තමන්ගේ ඇස්බැන්දුම්වලින්
කිනිතුල්ලන් උපදවන්ට වෑයම් කළෝය,
නුමුත් නොහැකිවූවෝය. මනුෂ්‍යයන්
හා මෘගයන් පිට කිනිතුල්ලෝ වූවෝය.
19 එවිට මායාකාරයෝ: මේක දෙවියන්-
වහන්සේගේ ඇඟිල්ලයයි ඵාරාවෝට
කීවෝය. ස්වාමීන්වහන්සේ කියා තිබුණු
ලෙස ඵාරාවෝගේ සිත දැඩිවිය, ඔහු
ඔවුන්ට කන් නුදුන්නේය.

## 4 වෙනි පීඩාව: මැසි ජාති

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 20
කොට: අලුයම නැගිට ඵාරාවෝ
ඉදිරියෙහි සිටුව; බලව, ඔහු වතුර ළඟට
පිටත්ව එන්නේය; ඔහුට කථාකරමින්:
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක—මට
මෙහෙකරන පිණිස මාගේ සෙනඟ
යන්ට හරින්න. නැතහොත්, මාගේ 21
සෙනඟ නාරින්නෙහි නම්, මම නුඹ
පිටටත් නුඹේ සේවකයන් පිටටත් නුඹේ
සෙනඟ පිටටත් නුඹේ ගෙවලටත් මැසි
රංචු එවන්නෙමි. මිසරවරුන්ගේ ගෙවල්ද
ඔවුන් සිටින භූමියද මැසි රංචුවලින්
පිරීයන්නේය. පොළෝ මධ්‍යයෙහි මම 22
ස්වාමීන්වහන්සේව සිටින බව නුඹ
දැනගන්නා පිණිස ඒ දවසේදී මාගේ
සෙනඟ සිටින ගෝෂෙන් දේශයට මැසි
රංචු නොපැමිණෙන හැටියට මම ඒක
වෙන්කොට, මාගේ සෙනඟ හා නුඹේ 23
සෙනඟ අතරේ වෙනසක් කරන්නෙමි.
හෙට දවසේ මේ ලකුණ වන්නේය කියා
කියවයි කීසේක. ස්වාමීන්වහන්සේ 24
එසේ කළසේක; භයානක මැසි රංචු
ඵාරාවෝගේ ගෙටත් ඔහුගේ
සේවකයන්ගේ ගෙවලටත් ආවෝය. මුළු
මිසර දේශය මැසි රංචු නිසා නාස්තිවිය.
ඵාරාවෝ මෝසෙස් සහ ආරොන් 25
කැඳවා: නුඹලා ගොස් දේශයෙහිදී
නුඹලාගේ දෙවියන්වහන්සේට පූජා
ඔප්පුකරපල්ලායයි කීවේය. මෝසෙස්ද: 26
එසේ කරන්ට යුතු නැත; එසේ කළොත්
මිසරවරුන්ට පිළිකුලක් වන ලෙස අපි
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේට පූජා
ඔප්පුකරන්නෙමුව. මිසරවරුන්ගේ ඇස්
හමුයෙහි ඔවුන්ට පිළිකුලක් වන ලෙස
පූජා ඔප්පුකරන්නෙමුද? එවිට ඔව්හු
අපට ගල්නොගසන්නෝද? අපි තුන් 27
දිනක ගමන් වනාන්තරයට ගොස්
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අපට
අණකරන ලෙස උන්වහන්සේට පූජා
ඔප්පුකරන්නෙමුයයි කීවේය. එවිට 28
ඵාරාවෝ: නුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට වනාන්තරයේදී පූජා ඔප්පු-

කරන පිණිස තුඹලා යන්ට හරින්නෙමි;
එහෙත් බොහෝ දුර නොයල්ලා. මා
උදෙසා කන්නලව්කරපල්ලායයි කීවේය.
29 මෝසෙස්ද: බැලුව මැනවි, මම ඔබ
කෙරෙන් ගොස් මැසි රංචු පාරාවෝ
සහ ඔහුගේ සේවකයන් වෙතින්ද ඔහුගේ
සෙනඟ වෙතින්ද හෙට දවසේ පහවියන
ලෙස ස්වාමීන්වහන්සේට කන්නලව්-
කරන්නෙමි. තුමූන් ස්වාමීන්වහන්සේට
පූජා ඔප්පුකරන පිණිස සෙනඟ යන්ට
නොහරින ලෙස පාරාවෝ නවත්
වංචා ලෙස ක්‍රියානොකෙරේවයි කීය.
30 මෝසෙස් පාරාවෝ කෙරෙන් ගොස්
ස්වාමීන්වහන්සේට කන්නලව්කෙළේය.
31 ස්වාමීන්වහන්සේ මෝසෙස්ගේ වචන
ලෙස කොට මැසි රංචු පාරාවෝ සහ
ඔහුගේ සේවකයන් වෙතින්ද ඔහුගේ
සෙනඟ වෙතින්ද පහකළසේක;
32 එකෙක්වත් ඉතුරු නොවීය. එහෙත්
පාරාවෝ මේ වතාවෙන් තමාගේ සිත
දැඩිකරගත සෙනඟ යන්ට නො-
හැරියේය.

## 5 වෙනි පීඩාව: ගව වසංගතය

9 නවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: තුඹ පාරාවෝ වෙතට
ගොස් ඔහුට මෙසේ කියව—හෙබ්‍රෙව්-
වරුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක: මට මෙහෙකරන
පිණිස මාගේ සෙනඟ යන්ට හරින්න.
2 තුඹ ඔවුන්ට යන්ට නොදී නවදුරටත්
3 වලක්වන්නෙහිනම්, බලව, කෙතේ ඉන්න
තුඹේ සිව්පාවුන් පිට එනම් අශ්වයන්
පිටද කොටළුවන් පිටද ඔටුවන් පිටද
ගව රැළවල් සහ එළු බැටළු රැළවල්
පිටද ස්වාමීන්වහන්සේගේ හස්තය
පැමිණෙයි. ඉතා තද ගව වසංගතයක්
4 වන්නේය. ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්-
වරුන්ගේ සිව්පාවුන්ද මිසරයේ සිව්-
පාවුන්ද අතරේ වෙනසක් කරනසේක.
ඉශ්‍රායෙල් පුත්‍රයන් සන්තක සියල්ලන්-
ගෙන් කිසිවෙක් නොනසින්නේයයි
5 ඔහුට කියවයි කීසේක. ස්වාමීන්-
වහන්සේ වේලාවක් නියමකොට: හෙට
දවසේ ස්වාමීන්වහන්සේ මේ දෙය
දේශයෙහි කරනවා ඇතැයි කීසේක.
පසුවද ස්වාමීන්වහන්සේ ඒ දේ කළසේක, 6
මිසරයේ සියලු සිව්පාවෝ මළෝය.
එහෙත් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සිව්පාවුන්-
ගෙන් එකෙක්වත් නොමළේය. එවිට 7
පාරාවෝ මිනිසුන් යවා ඉශ්‍රායෙල්-
වරුන්ගේ සිව්පාවුන්ගෙන් එකෙක්වත්
නොමළ බව දැනගත්තේය. එහෙත්
පාරාවෝගේ සිත මුරණ්ඩුව තිබුණේය,
ඔහු සෙනඟ යන්ට නොහැරියේය.

## 6 වෙනි පීඩාව: ගඩු

නවද ස්වාමීන්වහන්සේ මෝසෙස් 8
සහ ආරොන්ට කථාකොට: උදුනේ
අලු අත් පුරා ගනිල්ලා, මෝසෙස් ඒවා
පාරාවෝගේ ඇස් හමුයෙහිදී අහස
දෙසට ඉසීවා. ඒවා මිසර දේශය 9
මුළුල්ලෙහි සිහින් ධූලිව, මිසර දේශය
මුළුල්ලෙහි මනුෂ්‍යයන් පිටද මෘගයන්
පිටද වණ අටගන්න ගඩුවන්නේයයි
කීසේක. ඔව්හු උදුනේ අලු රැගෙන 10
පාරාවෝ ඉදිරිපිට සිටියෝය; මෝසෙස්
ඒවා අහස දෙසට ඉස්සේය; ඒවා
මනුෂ්‍යයන් පිටත් මෘගයන් පිටත්
වණ අටගන්න ගඩු විය. ගඩු නිසා 11
මායාකාරයන්ට මෝසෙස් ඉදිරිපිට
සිටින්ට නුපුළුවන් වූයේය; මක්නිසාද
මායාකාරයන් සහ සියලු මිසර-
වරුන්ට ගඩු හැදුණේය. ස්වාමීන්- 12
වහන්සේ පාරාවෝගේ සිත දැඩිකළ-
සේක, ඔහු වනාහි ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට කී ලෙස ඔවුන්ට ඇහුම්කන්-
නුදුන්නේය.

## 7 වෙනි පීඩාව: ගල් වර්ෂාව

නවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 13
කථාකොට: අලුයම නැගිට පාරාවෝ
ඉදිරිපිට සිට හෙබ්‍රෙව්වරුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේකැයි
කියව: මට මෙහෙකරන පිණිස මාගේ
සෙනඟ යන්ට හරින්න. මක්නිසාද මුළු 14
පොළොවෙහි මා සමාන කෙනෙක් නැති
බව තුඹ දැනගන්නා පිණිස මේ වතාවේ

තුඹේ සිතටත් තුඹේ සේවකයන් පිටටත්
තුඹේ සෙනඟ පිටටත් මාගේ සියලු
15 පීඩාවන් පමුණුවන්නෙමි. මක්නිසාද
දැනට මා විසින් මාගේ අත දිගුකොට
තුඹට සහ තුඹේ සෙනඟට වසංගත-
යෙන් පහර දෙන්ටත් එසේ තුඹ
පොළොවෙන් සිඳිනු ලබන්ටත්
16 තිබුණේය. සැබවින් මා විසින් තුඹ
ආරක්ෂාකළේ තුඹට මාගේ බලය
පෙන්වන පිණිසත් මාගේ නාමය මුළු
පොළොවෙහි ප්‍රකාශවෙන පිණිසත්ය.
17 තවමත් මාගේ සෙනඟ යන්ට නොහරින
ලෙස ඔවුන්ට විරුද්ධව උසස්වන්නෙහිද?
18 බලව, හෙට මේ වේලාව පමණේදී
මිසරය පිහිටෙවු ද පටන් මේ දක්වා
නුවූ ආකාර භයානක ගල් වර්ෂාවක්
19 වස්වන්නෙමි. එබැවින් දැන් මිනිසුන් යවා
කෙතෙහි සිටින තුඹේ සිව්පාවුන්ද
තුඹ සන්තක සියල්ලද ඉක්මනින්
ගෙන්වාගනින්න; මක්නිසාද ගෙට
ගෙන්වා නොගෙන කෙතෙහි සිටින්-
නාවූ සියලු මිනිසුන් සහ මෘගයන්
පිට ගල් වර්ෂාව වසින්නේය, ඔව්හු
මියන්නෝයයි ඔහුට කියවයි කීසේක.
20 ඵාරාවෝගේ සේවකයන් අතරෙන්
ස්වාමීන්වහන්සේගේ වචනයට භයවූ
තැනැත්තේ තමාගේ මෙහෙකරුවන්ද
සිව්පාවුන්ද ගෙවලට පලායන්ට
21 සැලැස්වීය. ස්වාමීන්වහන්සේගේ වචනය
නොසැලකූ තැනැත්තේ තමාගේ වැඩ-
කාරයන්ද සිව්පාවුන්ද කෙතෙහි සිටින්ට
හැරියේය.
22 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
කොට: මිසර දේශය මුළුල්ලෙහි
මනුෂ්‍යයන් පිටටත් මෘගයන් පිටටත්
මුළු මිසර දේශයෙහි කෙතේ සියලු පලා
ජාති පිටටත් ගල් වර්ෂාව වසින පිණිස
අහස දෙසට තුඹේ අත දිගුකරපන්නැයි
23 කීසේක. මෝසෙස් තමාගේ සැරයටිය
අහස දෙසට දිගුකෙළේය. එවිට ස්වාමීන්-
වහන්සේ අකුණු ගර්ජනා සහ ගල්
වර්ෂාව එවූසේක, ගින්න පොළොව
පිට වැටුණේය; ස්වාමීන්වහන්සේ මිසර
දේශය පිටට ගල් වර්ෂාව වැස්සෙවූ-
සේක. මෙසේ මිසර දේශය ජනපදයක්වූ 24
පසු එහි කොතැනකවත් නුවූලෙස ඉතා
තද ගල් වර්ෂාවද ගල් වර්ෂාව හා
මිශ්‍රව ගින්ද වැස්සේය. ගල් වර්ෂාව 25
වනාහි මුළු මිසර දේශයෙහි කෙත්වල
සිටි සියලු මනුෂ්‍යයන්ද මෘගයන්ද
හෙළා දැම්මේය; තවද ගල් වර්ෂාවෙන්
කෙතේ සියලු පලා ජාති නාස්තිවිය,
සියලු ගස්ද බිඳීගියේය. ඉශ්‍රායෙල් පුත්‍රයන් 26
සිටි ගෝෂෙන් නම් දේශයෙහි පමණක්
කිසි ගල් වර්ෂාවක් නොවීය. එවිට 27
ඵාරාවෝ පණිවුඩ යවා මෝසෙස් සහ
ආරොන් හඬගස්වා: මම මේ වතාවේ
පව්කෙළෙමි. ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨ-
සේක, මමද මාගේ සෙනඟද දුෂ්ටයෝය.
ස්වාමීන්වහන්සේට කන්නලව්කරපල්ලා; 28
මක්නිසාද මේ මහත් අකුණු ගර්ජනා
සහ ගල් වර්ෂාව ඉතින් ඇත; මම
තුඹලා තවත් නවත්වා නොගෙන යන්ට
හරින්නෙමියි ඔවුන්ට කීය. මෝසෙස්ද: 29
මම නුවරින් පිට ගිය කෙණෙහිම
ස්වාමීන්වහන්සේ දෙසට මාගේ අත්
දිගුකරන්නෙමි; පොළොව ස්වාමීන්-
වහන්සේගේයයි ඔබ දැනගන්නා පිණිස
අකුණු ගර්ජනා නවතින්නේය, ගල් වර්-
ෂාවද නවත් නොවන්නේය. එහෙත් ඔබද 30
ඔබගේ සේවකයෝද ස්වාමිවූ දෙවියන්-
වහන්සේට තවම භයනොවන්නහුයයි
දනිමියි ඔහුට කීවේය. හණ සහ යවද 31
නාස්තිවුණේය. මක්නිසාද යව කරල්
හටගෙන තිබුණේය, හණද පීදී
තිබුණේය. තුමූත් තිරිඟු සහ තණහාල් 32
නොවැඩී තිබුණු බැවින් ඒවා නාස්ති
නොවීය. මෝසෙස් ඵාරාවෝ කෙරෙන් 33
නුවරින් පිටතට ගොස් ස්වාමීන්වහන්සේ
දෙසට තමාගේ අත් දිගුකෙළේය. එවිට
අකුණු ගර්ජනා සහ ගල් වර්ෂාවද
නැවතුණේය, වර්ෂාවද පොළෝ මතු-
පිට නොවැස්සේය. ඵාරාවෝ වනාහි 34
වර්ෂාවද ගල් වර්ෂාවද අකුණු ගර්-
ජනාද නැවතුණු බව දුටු කල ඔහුත්
ඔහුගේ සේවකයොත් වඩ වඩා පව්-
කරමින් තමන්ගේ සිත් දැඩිකරගත්තෝය.

35 ස්වාමීන්වහන්සේ මෝසෙස් ලවා කී
ලෙස ඵාරාවෝගේ සිත දැඩිවිය, ඔහු
ඉශ්‍රායෙල් පුත්‍රයන් යන්ට නොහැරියේය.

## 8 වෙනි පීඩාව: පළඟැටියෝ

10 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: ඵාරාවෝ වෙතට
යව. මක්නිසාද මා විසින් ඵාරාවෝගේ
සිතද ඔහුගේ සේවකයන්ගේ සිත්ද
දැඩිකළේ ඔවුන් මධ්‍යයෙහි මාගේ
2 ලකුණු දක්වන පිණිසත් මිසරයට මා
කළ දේ සහ ඔවුන් අතරේ දැක්වූ මාගේ
ලකුණු කුමක්දැයි නුඹේ පුත්‍රයාටත්
නුඹේ පුත්‍රයාගේ පුත්‍රයාටත් ඇසෙන
පරිද්දෙන් නුඹ විසින් කියාදෙන
පිණිසත් මම ස්වාමීන්වහන්සේ බව
නුඹලා දැනගන්න පිණිසත්යයි කීසේක.
3 මෝසෙස් සහ ආරොන් ඵාරාවෝ
වෙතට ගොස්: හෙබ්‍රෙව්වරුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
නුඹ කොතෙක් කල් මා ඉදිරියෙහි
යටත්නොවී සිටින්නෙහිද? මට මෙහෙ-
කරන පිණිස මාගේ සෙනඟ යන්ට
4 හැරපන්න. එසේ හරින්ට අකැමති
වන්නෙහිනම්, බලව, මම හෙට නුඹේ
සීමාව ඇතුළට පැළහැටියන් පමුණු-
5 වන්නෙමි. පොළොව නොපෙනෙන
තරම් උන් පොළෝතලය වසාගෙන,
ගල් වර්ෂාවෙන් ගැළවී ඉතුරුව තිබෙන
කොටසත් කෙතෙහි නුඹලාට වැඩෙන
6 සියලු ගසුත් කන්නෝය. නුඹේ
පියවරුන්වත් නුඹේ පියවරුන්ගේ
පියවරුන්වත් පොළොවේ විසූ තැන්
පටන් අද දක්වා නුදුටු ලෙස නුඹේ
ගෙවල්ද නුඹේ සියලු සේවකයන්ගේ
ගෙවල්ද සියලු මිසරවරුන්ගේ ගෙවල්ද
උන්ගෙන් පිරෙන්නේයයි ඔහුට කීය.
ඔහු හැරී ඵාරාවෝ කෙරෙන් පිටතට
7 ගියේය. ඵාරාවෝගේ මෙහෙකරුවෝ:
මේ මනුෂ්‍යයා කොතෙක් කල් අපට
මලපතක් වන්නේද? ඒ මනුෂ්‍යයන්
තමන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
මෙහෙකරන පිණිස යන්ට හැරිය
මැනවි. මිසරය විනාශවී තිබෙන බව
ඔබ තවම නොදන්නෙහිදැයි කීවෝය.
මෝසෙස් සහ ආරොන් ඵාරාවෝ 8
වෙතට නැවත ගෙන්වනලද්දෝය. ඔහු:
නුඹලා ගොස් නුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට මෙහෙකරපල්ලා.
එහෙත් යන්නෝ කවුරුදැයි ඔවුන්ගෙන්
ඇසුවේය. මෝසෙස්ද: අපි අපේ 9
බාලයන් සහ මහල්ලන්ද අපේ පුත්‍රයන්
සහ දූවරුන්ද සමග යන්නෙමුව,
අපි අපේ එළු බැටළු රැළවල් සහ ගව
රැළවල්ද සමග යන්නෙමුව; මක්-
නිසාද ස්වාමීන්වහන්සේට අප විසින්
මංගල්‍යයක් පවත්වන්ට තිබේයයි
කීවේය. ඔහුද: මම නුඹලා සහ 10
නුඹලාගේ බාලයන්ද යන්ට හරින්නාක්
මෙන් ස්වාමීන්වහන්සේ නුඹලා සමග
වනසේක්වා; බලාගනිල්ලා, මක්නිසාද
නුඹලා ඉස්සරහ නපුරක් තිබේ. එසේ 11
නොවේ. නුඹලාගේ පිරිමි පක්ෂය ගොස්
ස්වාමීන්වහන්සේට මෙහෙකරපල්ලා;
මක්නිසාද නුඹලාගේ ඉල්ලීම ඒකයයි
ඔවුන්ට කීවේය. තවද ඔව්හු ඵාරාවෝ
ඉදිරියෙන් පන්නලද්දෝය.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 12
කොට: පළඟැටියන් මිසර දේශය
පිටට අවුත් දේශයේ සියලු පලා ජාතීන්
එනම් ගල් වර්ෂාවෙන් ඉතුරුව තිබෙන
සියල්ල කා දමන පිණිස නුඹේ අත
මිසර දේශය කෙරෙහි දිගුකරපන්නැයි
කීසේක. මෝසෙස් තමාගේ සැරයටිය 13
මිසර දේශය කෙරෙහි දිගුකෙළේය,
ස්වාමීන්වහන්සේද ඒ දවසේ දවාල
හා රාත්‍රිය මුළුල්ලෙහි ඒ දේශය පිටට
පෙරදිග සුළඟක් පැමිණෙවූසේක;
පහන්වුණු කල පෙරදිග සුළඟින් පළ-
හැටියෝ ගෙනෙන ලද්දෝය. පළ- 14
හැටියෝ මිසර දේශය මුළුල්ලෙහි
ගොස් මිසරයේ සියලු සීමාවල නැවතී
සිටියෝය; උන් ඉතා භයානක වූය; ඊට
පළමුවෙන් එබඳු පළඟැටියෝ නොවූහ,
ඊට පසුවත් නොවන්නාහ. මක්නිසාද 15
දේශය අඳුරුවෙන තරම් උන් මුළු

පොළෝතලය වසාගෙන දේශයේ සියලු
පලා ජාතිද ගල් වර්ෂාවෙන් ඉතිරි වූ
ගස්වල සියලු ගෙඩිද කෑවෝය. මිසර
දේශය මුළුල්ලෙහි කෙතේ ගසක්වත්
පලා ජාතියක්වත් කිසි අමු දෙයක්වත්
16 ඉතිරි නොවීය. එවිට ඵාරාවෝ
මෝසෙස් සහ ආරොන් හණික කැඳවා:
මම තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේටත් තුඹලාටත් විරුද්ධව
17 පව්කෙළෙමි. එබැවින් මේ වර පමණක්
මාගේ පාපයට කමාවී මේ මරණය
පමණක් මාගෙන් පහකරන්ට තුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට කන්නලව්-
18 කරපල්ලායයි කීවේය. ඔහු ඵාරාවෝ
වෙතින් ගොස් ස්වාමීන්වහන්සේට
19 කන්නලව් කෙළේය. ස්වාමීන්වහන්සේ
ඉතා බලවත් හුළඟක් බස්නාහිරින්
හැමවූසේක, පළඟැටියෝ ගහගත ගොස්,
රතු මුහුදේ හෙළන ලද්දෝය; මිසරයේ
මුළු සීමාව තුළ එක පළඟැටියෙක්-
20 වත් ඉතුරුනොවීය. එහෙත් ස්වාමීන්-
වහන්සේ ඵාරාවෝගේ සිත දැඩිකළසේක,
ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන් යන්ට නො-
හැරියේය.

## 9 වෙනි පීඩාව: ඝනාන්ධකාරය

21 එකල්හි ස්වාමීන්වහන්සේ: අන්ධ-
කාරය එනම් අතගා බලන්ට හැකි තරම්
අන්ධකාරය මිසර දේශය පිටට පැමිණෙන
පිණිස තුඹේ අත අහස දෙසට
දිගුකරපන්නැයි මෝසෙස්ට කීසේක.
22 මෝසෙස් තමාගේ අත අහස දෙසට
දිගුකෙළේය; එවිට මිසර දේශය මුළුල්-
ලෙහි තුන් දවසක් ඝනාන්ධකාරයක්
23 වූයේය; ඔවුන් තුන් දවසක් එකිනෙකා
දුටුවේවත් කිසිවෙක් තමාගේ ස්ථාන-
යෙන් නැගිට්ටේවත් නැත. නුමුත් සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ වාසස්ථානවල
24 එළිය තිබුණේය. එවිට ඵාරාවෝ
මෝසෙස්ට හඬගසා: තුඹලා ගොස්
ස්වාමීන්වහන්සේට මෙහෙකරපල්ලා;
තුඹලාගේ එළු බැටළු රැළවල්ද ගව
රැළවල්ද පමණක් නවතීවා. තුඹලාගේ
බාලයෝද තුඹලා සමග යෙත්වයි
කීවේය. මෝසෙස්: අප විසින් අපේ 25
දෙවිවූ ස්වාමීන්වහන්සේට ඔප්පුකරන
පිණිස ඔබ අපේ අත්වලට පූජාද දවන
පූජාද දිය යුතුය. අපේ ගවයන් අප 26
සමග යා යුතුය; එක කුරයක්වත්
ඉතුරුකර යන්ට නුපුළුවන; මක්නිසාද
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
මෙහෙකිරීමට ගවයන්ගෙන් ගත යුතුය;
කුමකින් ස්වාමීන්වහන්සේට මෙහෙ-
කටයුතුදැයි එහි යන තෙක් නොදනිමු-
යයි කීය. එහෙත් ස්වාමීන්වහන්සේ 27
ඵාරාවෝගේ හිත දැඩිකළසේක, ඔහු
ඔවුන් යන්ට හරින්ට නොකැමතිවිය.
ඵාරාවෝ: මා කෙරෙන් පලයන්න; 28
නවත් මාගේ මුහුණ නොදක්නට බලා-
ගනින්න; මක්නිසාද මාගේ මුහුණ
දක්නාවූ දවසේදී තුඹ නසින්නෙහියයි
කීයේය. මෝසෙස්ද: ඔබ කීවා හොඳය; 29
මම නවත් ඔබගේ මුහුණ නොදක්-
නෙමියි කීය.

## 10 වෙනි පීඩාව (කුලුඳුලන් මැරීම) ගැන දන්වීම

11

නවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: ඵාරාවෝ සහ මිසරය
පිටට නව එක පීඩාවක් පමුණුවන්නෙමි;
ඉන්පසු ඔහු තුඹලා මෙතැනින් යන්ට
හරින්නේය. ඔහු තුඹලා හරින කල
සැබවින් සහමුලින්ම තුඹලා මෙතැනින්
නෙරපන්නේය. දැන් සෙනඟ ඉදිරියෙහි 2
කථාකරව, එක එක පුරුෂයා තම
තමාගේ අසල්වාසියාගෙන්ද එක එක
ස්ත්‍රී තම තමාගේ අසල්වාසී ස්ත්‍රියගෙන්ද
රිදී බඩුත් රන්රන් බඩුත් ඉල්ලාගනිත්වයි
කීසේක. ස්වාමීන්වහන්සේ මිසරයන් 3
ඉදිරියෙහි සෙනඟට කරුණාව ලැබෙන්ට
සැලැස්සූසේක. එපමණක් නොව
මෝසෙස් නම් මනුෂ්‍යයා මිසර
දේශයෙහිද ඵාරාවෝගේ සේවකයන්
ඉදිරියෙහිද සෙනඟ ඉදිරියෙහිද ඉතා
උතුම් කොට සලකන ලද්දේය.

4 මෝසෙස් කථාකොට: ස්වාමීන්-
වහන්සේ මෙසේ කියනසේක: මධ්‍යම
රාත්‍රිය පමණේදී මම මිසරය මැදට
5 යන්නෙමි. එවිට සිංහාසනයේ හිඳින
ඵාරාවෝගේ කුලුඳුලා පටන් ඇඹරුම්
ගල පිටිපස්සේ සිටින දසියගේ කුලුඳුලා
දක්වා මිසර දේශයෙහි සියලු කුලුඳුලෝ-
ද සිව්පාවුන්ගේ සියලු කුලුඳුලෝද
6 නසින්නෝය. කිසි කලෙකත් නො-
තිබුණාවූද මතුත් නොවන්නාවූද ආකාර
මහත් හැඬීමක් මුළු මිසර දේශයෙහි
7 වන්නේය. එහෙත් මිසරවරුන් සහ
ඉශ්‍රායෙල් අතරෙහි ස්වාමීන්වහන්සේ
වෙනසක් කරන බව නුඹලා දනගන්නා
පිණිස ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ කිසි
මනුෂ්‍යයෙකුටවත් මෘගයෙකුටවත්
විරුද්ධව බල්ලෙක් පවා උගේ දිව
8 නොසොල්වන්නේයයි කීසේක. ඔබගේ
මේ සියලු සේවකයෝද මා වෙතට
අවුත් මට වැඳ වැටී: නුඹත් නුඹ අනුව
යන මුළු සෙනඟත් ගිය මැනවැයි
කියන්නෝය. ඉන්පසු යන්නෙමියි කීවේය.
මෙසේ කියා ඔහු තද කෝපයෙන්
ඵාරාවෝ ඉදිරියෙන් පිටතට ගියේය.
9 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
කොට: මිසර දේශයෙහි මාගේ ආශ්-
චර්යයන් බොහෝවන පිණිස ඵාරාවෝ
නුඹලාට ඇහුම්කන් නොදෙන්නේයයි
10 කීසේක. මෝසෙස් සහ ආරොන්
ඵාරාවෝ ඉදිරියෙහි මේ සියලු ආශ්-
චර්යයන් කළෝය. ස්වාමීන්වහන්සේ
ඵාරාවෝගේ සිත දැඩිකළසේක, ඔහු
ඉශ්‍රායෙල් පුත්‍රයන් තමාගේ දේශයෙන්
යන්ට නොහැරියේය.

## පාස්කු මංගල්‍යය නියෝගකිරීම

12 ස්වාමීන්වහන්සේ මිසර දේශයේදී
මෝසෙස් සහ ආරොන්ට
2 කථාකොට: මේ මාසය නුඹලාට
මාසවල පටන්ගැන්ම වන්නේය. ඒක
නුඹලාට අවුරුද්දේ පළමුවෙනි මාසය
3 වන්නේය. නුඹලා ඉශ්‍රායෙල්ගේ මුළු
සමූදුවට කථාකොට: මේ මාසේ
දසවෙනි දිනදී ඔවුන්ගේ පියවරුන්ගේ
පවුල් වශයෙන් පවුලකට බැටළු
පැටවෙකු බැගින් එක එක අය බැටළු
පැටවෙකු ගන්නේය. ඉඳින් බැටළු 4
පැටවෙකු කන්ට ගෙයි වැසියෝ මදිනම්
ඔහුද ඔහුගේ ගේ ළඟ සිටින ඔහුගේ
අසල්වාසියාද මිනිසුන්ගේ ගණන
හැටියට එකෙකු ගන්නෝය; එක එක
මනුෂ්‍යයා කන ප්‍රමාණයේ හැටියට
බැටළු පැටවා සම්බන්ධව ගණන්කර
ගනිත්වා. ඒ බැටළු පැටවා කැලලක් 5
නැති අවුරුද්දක් වූ පිරිමි සතෙක් විය
යුතුය. බැටළුවන්ගෙන් හෝ එළුවන්ගෙන්
හෝ ඌ රැගෙන, එම මාසේ දස 6
සතරවෙනි දවස දක්වා තබාගනිල්ලා.
එවිට ඉශ්‍රායෙල් සමූහයා වන මුළු
සභාව සවස ඌ මරා, ලෙයින් රැගෙන 7
ඌ කන්නට යෙදෙන ගෙවල්වල
උළුවහු කණු දෙකේද උඩ පඩිකදේද
ගාන්නෝය. ඔව්හු ගින්නෙන් පුළුස්- 8
සතලද ඒ මාංසයද මුහුන් නුමුසු
රොටිද ඒ රාත්‍රියේදී කන්නෝය; තිත්ත
පලා සමග ඒවා කන්නෝය. එයින් 9
අමුවෙන්වත් කිසිසේත් වතුරෙන්
තම්බාවත් නොකා උගේ හිසද කකුල්ද
අභ්‍යන්තර කොටියාස සමග ගින්නෙන්
පුළුස්සා කාපල්ලා. උදය දක්වා එයින් 10
කිසිවක් ඉතුරු නොකරල්ලා; උදය
දක්වා එයින් ඉතුරුවන ඒවා ගින්නෙන්
දවාපල්ලා. නුඹලා ඒවා කෑ යුතු 11
මෙසේය: නුඹලාගේ ඉහටි බැඳ වහන්
පය ලා සැරයටි අතින් ගෙන ඉක්මනින්
කෑ යුතුය. ඒක ස්වාමීන්වහන්සේගේ
*පාස්කුවය. මක්නිසාද ඒ රාත්‍රියේදී 12
මිසර දේශය මැදින් යන්නෙමි, මිසර
දේශයෙහි මනුෂ්‍යයන්ගේද සිව්පා-
වුන්ගේද සියලු කුලුඳුලන්ට පහර-
දෙන්නෙමි; මිසරයේ සියලු දෙවිවරුන්ට
විරුද්ධව විනිශ්චයයන් ඉෂ්ටකරන්නෙමි.
මම ස්වාමීන්වහන්සේය. ඒ ලේ නුඹලා 13
සිටින ගෙවල්වල නුඹලා උදෙසා
ලකුණක් පිණිස වන්නේය. මම ඒ ලේ

*හෙවත්, පසුකර යාමේ මංගල්‍යය

දැක තුඹලා පසුකර යන්නෙමි, මා විසින්
මිසර දේශයට පහරදෙන කල තුඹලා
විනාශකිරීමට පීඩාවක් තුඹලා පිට
14 නොවන්නේය. මේ දවස තුඹලාට
සිහිවීම් උත්සවයක් පිණිස වන්නේය,
තුඹලා එය ස්වාමීන්වහන්සේට මංගල්‍ය
දවසක් කොට පවත්වාපල්ලා. එය
තුඹලාගේ සියලු පරම්පරාවල
නියෝගයකින් මංගල්‍යයක් කොට
15 සැම කල්හිම පවත්වාපල්ලා. සත්
දවසක් තුඹලා මුහුන් තුමුසු රොටි කෑ
යුතුය; ප්‍රථම දවසෙහිම තුඹලාගේ
ගෙවලින් මුහුන් බැහැරකළ යුතුය.
මක්නිසාද ප්‍රථම දවස පටන් සත්වෙනි
දවස දක්වා මුහුන් මුසු රොටි කන
කවරෙක් තුමුත් ඉශ්‍රායෙල් කෙරෙන්
16 සිඳදමනු ලබන්නේය. පළමුවෙනි දවසේ
තුඹලාට ශුද්ධවූ රැස්වීමක්ද සත්වෙනි
දවසෙහිත් ශුද්ධවූ රැස්වීමක්ද වන්නේය;
ඒ දවස්වල කිසි වැඩක් නොකළ යුතුය,
එකිනෙකාගේ කෑම පිණිස උවමනා
17 වැඩක් පමණක්ම කළ යුතුය. එසේ
තුඹලා මුහුන් තුමුසු රොටි මංගල්‍යය
පවත්වන්නහුය; මක්නිසාද ඒ දවසේ-
දීම මම තුඹලාගේ සේනාවන් මිසර
දේශයෙන් පිටතට ගෙනාවෙමි. එබැවින්
තුඹලා මේ දවස තුඹලාගේ සියලු
පරම්පරාවල නියෝගයකින් සැම
18 කල්හිම පවත්වන්නහුය. පළමුවෙනි
මාසයේ දස සතරවෙනිද සවස පටන්
විසි එක්වෙනිද සවස දක්වා මුහුන්
19 තුමුසු රොටි කන්නහුය. සත් දවසක්
තුඹලාගේ ගෙවල මුහුන් නොතිබිය
යුතුය. මක්නිසාද විදේශියෙක් වේවා,
දේශයෙහි උපන් කෙනෙක් වේවා, මුහුන්
මුසු දේ කන කවරෙක් තුමුත් ඉශ්‍රායෙල්
20 සභාවෙන් සිඳිනු ලබන්නේය. මුහුන් මුසු
කිසිවක් නොකෑ යුතුය; තුඹලාගේ සියලු
වාසස්ථානවල මුහුන් තුමුසු රොටි කෑ
යුතුයයි කියවයි කීසේක.
21 එවිට මෝසෙස් ඉශ්‍රායෙල්ගේ සියලු
වැඩිමහල්ලන් කැඳවා: තුඹලාගේ පවුල්වල
හැටියට බැටළු වස්සන් තෝරාගෙන
පාස්කු මංගල්‍යය පිණිස මරාපල්ලා.
හිසොප් මිටියක් ගෙන ඒක තැටියේ 22
තිබෙන ලෙයෙහි ගල්වා තැටියෙහි
තිබෙන ලෙයින් උළුවස්සේ උඩ පඩි-
කඩේද කණු දෙකේද ඉහපල්ලා; තුඹලා
අතරෙන් කිසිවෙක් උදය වන තුරු
තමන් ගෙයි දෙරකඩින් පිට නොයා
යුතුය. මක්නිසාද ස්වාමීන්වහන්සේ 23
මිසරවරුන්ට පහරදෙන පිණිස දේශය
මැදින් යනසේක; උන්වහන්සේ උළුවස්සේ
උඩ පඩිකඩේද කණු දෙකේද ලේ දුටු
කල්හි දෙරකඩ පසුකර යනසේක,
තුඹලාට පහරදෙන පිණිස තුඹලාගේ
ගෙවලට ඇතුල්වෙන්ට විනාශකයාට
ඉඩ නොදෙනසේක. මේ දෙය තුඹටත් 24
තුඹේ පුත්‍රයන්ටත් සදකාලේටම
නියෝගයක් කොට පවත්වාපල්ලා.
නවද ස්වාමීන්වහන්සේ පොරොන්දුවූ 25
ලෙස තුඹලාට දෙන්නාවූ දේශයට
තුඹලා පැමිණි කල්හි මේ මෙහෙය
පවත්වාපල්ලා. නවද මේ මෙහෙයේ 26
අදහස කිමෙක්දැයි තුඹලාගේ දරුවන්
තුඹලාගෙන් අසන කල: ඒක නම් 27
ස්වාමීන්වහන්සේගේ පාස්කුවය, උන්-
වහන්සේ මිසරවරුන්ට පහර දුන් කල
මිසරයෙහිවූ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ගෙවල් පසුකර ගොස් අපේ ගෙවල්
ගළවාගත්සේකැයි කියයුතුයයි කීයේය.
එවිට සෙනඟ හිස් නමා වැන්දෝය.
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගොස් එසේ කළෝය; 28
ඔව්හු ස්වාමීන්වහන්සේ මෝසෙස් සහ
ආරොන්ට අණ කළ ලෙසම කළෝය.

## 10 වෙනි පීඩාව පැමිණවීම ඉශ්‍රායෙල්වරුන්ට යන්ට ඇරීම

නවද මධ්‍යම රාත්‍රියේදී ස්වාමීන්- 29
වහන්සේ, සිංහාසනය පිට හුන්
ඵාරාවෝගේ කුලුඳුලා පටන් හිරගෙයි
සිටි වහලාගේ කුලුඳුලා දක්වා
මිසරයෙහි සියලු කුලුඳුලන්ටත්
සිව්පාවුන්ගේ සියලු කුලුඳුලන්ටත් පහර
දුන්සේක. ඵාරාවෝද ඔහුගේ සියලු 30
මෙහෙකරුවෝද සියලු මිසරවරුද
රාත්‍රියේ නැඟිටුණෝය; මිසරයෙහි මහත්

වැලපීමක් විය; මක්නිසාද මළ කෙනෙක්
31 නැති ගෙයක් නොවීය. ඔහු රාත්‍රියේදී
මෝසෙස්ද ආරොන්ද කැඳවා: නැගිට
මාගේ සෙනඟ කෙරෙන් තුඹලාත්
ඉශ්‍රායෙල් පුත්‍රයොත් නික්ම ගොස්
තුඹලා කී ලෙස ස්වාමීන්වහන්සේට
32 මෙහෙකරපල්ලා. තුඹලා කී ලෙස
තුඹලාගේ එළු බැටළු රැළවල්ද ගව
රැළවල්ද රැගෙන පලයල්ලා; මටත්
ආශීර්වාද කරපල්ලායයි කීවේය.
33 මිසරවරු: අපි සියල්ලෝම මළ නැනැ-
ත්තෝ වමුව කියා සෙනඟ දේශයෙන්
ඉක්මනින් යවන පිණිස ඔවුන්ට බල-
34 කළෝය. එබැවින් සෙනඟ තමන්ගේ
අනාපු පිටි පිපෙන්ට පළමුවෙන් ඒවා
අනන ඔරු තමන්ගේ ඇඳුම්වලින් ඔතා
35 කරේ තබාගත්තෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ මෝසෙස්ගේ වචනය ලෙස
කරමින් මිසරවරුන්ගෙන් රිදී බඩුත්
රත්රන් බඩුත් වස්ත්‍රත් ඉල්ලා ගත්තෝය.
36 ස්වාමීන්වහන්සේ මිසරවරුන්ගෙන්
සෙනඟට කරුණාව ලබාදුන් බැවින්
ඔව්හු ඔවුන් ඉල්ලූ දේ දුන්නෝය.
මෙසේ ඔව්හු මිසරවරුන්ගේ වස්තුව
ගත්තෝය.

## ගමන පිටත්වීම

37 ඉශ්‍රායෙල් පුත්‍රයෝ රාමෙසෙස්හි සිට
සුකොත්ට ගමන්කළෝය, බාලයන්
හැර පයින් ගියාවූ පුරුෂයෝ සලක්ෂයක්
38 පමණ වූවෝය. ඔවුන් සමග මිශ්‍ර
සමූහයක්ද එළු බැටළු රැළවල් හා ගව
රැළවල් යන සිව්පාවුන් රාශියක්ද
39 ගියෝය. ඔවුන් මිසරයෙන් පන්නාදමනු
ලැබ ප්‍රමාදවෙන්ට නොහැකිව සිටි
නිසාත් තමන්ට කිසි ආහාරයක්
පිළියෙළකරගන නොතිබුණු නිසාත්
ඔව්හු මිසරයෙන් ගෙනාවාවූ නොපිපුණු
අනාපු පිටිවලින් මුහුන් තුමුසු රොටි
40 පිළිස්සුවෝය. මිසරයෙහි ඉශ්‍රායෙල්
පුත්‍රයන් විසූ කාලය හාරසිය තිස්
අවුරුද්දක්ය. නවද හාරසිය තිස් 41
අවුරුද්ද කෙළවරවූ දවසේදීම ස්වාමීන්-
වහන්සේගේ සියලු සේනාවෝ මිසර
දේශයෙන් පිටත්ව ගියෝය. ඒ රාත්‍රියෙහි 42
ඔවුන් මිසර දේශයෙන් පිටතට ගෙනා
බැවින් එය ස්වාමීන්වහන්සේ උදෙසා
ඉතා සැලකිය යුතු රාත්‍රියක්ය. සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් තමන්ගේ
පරම්පරාවල ඉතා සැලකිය යුතු වූ
ස්වාමීන්වහන්සේගේ රාත්‍රිය මේය.
ස්වාමීන්වහන්සේ මෝසෙස් සහ 43
ආරොන්ට කථාකොට: පාස්කු
නියෝගය මේය. කිසි විදේශියෙක් එයින්
නොකෑ යුතුය. එහෙත් ඒ ඒ මනුෂ්‍යයා 44
විසින් මිලේට ගත් මෙහෙකරුවා තුඹ
විසින් චර්මඡේදනය කරනු ලැබූ
පසු එයින් කන්නට ඔහුට පුළුවන.
විදේශියෙක්ද කුලී වැඩ කරන 45
කෙනෙක්ද එයින් නොකෑ යුතුය. එක 46
ගෙදරකදීම එය කෑ යුතුය; තුඹ එහි
මාංසයෙන් කිසිවක් ගෙයින් පිටත
නොගෙනා යුතුය; තුඹලා එයින් කිසි
ඇටයක්ද නොකැඩිය යුතුය. මුළු 47
ඉශ්‍රායෙල් සභාව ඒක පවත්වනවා ඇත.
විදේශියෙක් තුඹ සමග සිට ස්වාමීන්- 48
වහන්සේට පාස්කු මංගල්‍යය පවත්වන්ට
කැමතිවීනම් ඔහුගේ සියලු පිරිමි
චර්මඡේදනයකරනු ලබත්වා, එවිට ඔහු
ළංව ඒක පවත්වාවා; ඔහුද දේශයෙහි
උපන් කෙනෙකු මෙන් වන්නේය.
එහෙත් අචර්මඡේදිත කිසිවෙක් එයින්
නොකන්නේය. දේශයෙහි උපන් තැනැත්- 49
තාටත් තුඹලා අතරෙහි විදේශීව
සිටින්නාටත් එක ව්‍යවස්ථාවක් වන්නේ-
යයි කීසේක. සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ 50
මෙසේ කළෝය; ඔව්හු ස්වාමීන්වහන්සේ
මෝසෙස් සහ ආරොන්ට අණකළ
ලෙසම කළෝය. ඒ දවසේම ස්වාමීන්- 51
වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන් ඔවුන්ගේ
සේනාවල ප්‍රකාරයට මිසර දේශයෙන්
පිටතට ගෙනාසේක.

## කුලුඳුලන් ස්වාමීන්වහන්සේට කැපකිරීම

13 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
2 කොට: ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි
මනුෂ්‍යයන්ගෙන්ද මෘගයන්ගෙන්ද ගර්-
භයේ ප්‍රථම එලවූ සියලු කුලුඳුලන් මට
කැපකරව. එය මට අයිතියයි කීසේක.
3 මෝසෙස් සෙනඟට කථාකොට:
නුඹලා මිසරයෙන් එනම් වහල්කමේ
ගෙයින් පිටතට ආවාවූ මේ දින
සිහිකරපල්ලා; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ ස්වකීය හස්ත බලයෙන්
එතැනින් නුඹලා ගෙනාසේක. එහෙයින්
මුහුන් මුසු කිසිවක් නොකෑ යුතුය.
4 ආබීබ්නම් මාසයේ මේ දවසේ නුඹලා
5 නික්ම යන්නහුය. තවද ස්වාමීන්-
වහන්සේ නුඹට දෙන පිණිස නුඹේ
පියවරුන්ට දිවුළාවූ, කානානිවරුන්ගේත්
හිත්තීවරුන්ගේත් අමෝරිවරුන්ගේත්
හිවීවරුන්ගේත් යෙබූසිවරුන්ගේත් දේශය
වන කිරි සහ මීපැණි ගලායන දේශයට
නුඹ ගෙනා කල මේ මාසයේ මේ
6 මෙහෙය පැවැත්විය යුතුය. සත් දවසක්
මුහුන් නුමුසු රොටි කෑ යුතුය, සත්වෙනි
දවසේදී ස්වාමීන්වහන්සේට මංගල්‍යයක්
7 වන්නේය. ඒ සත් දවස මුළුල්ලෙහි මුහුන්
නුමුසු රොටි කෑ යුතුය; මුහුන් මුසු
රොටි නුඹ වෙත නොතිබිය යුතුය, නුඹේ
සියලු සීමාවල නුඹ වෙත මුහුන්
8 නොතිබිය යුතුය. මෙසේ කරන්නේ මා
මිසරයෙන් ඊමේදී ස්වාමීන්වහන්සේ
මට කළ දේ නිසාය කියා ඒ දවසේ
9 නුඹේ පුත්‍රයාට දන්වාපන්න. ස්වාමීන්-
වහන්සේගේ ව්‍යවස්ථාව නුඹේ මුඛයෙහි
තිබෙන පිණිස එය නුඹේ අතේ නුඹට
ලකුණක් ලෙසද නුඹේ ඇස් අතරේ
සිහිවීමක් ලෙසද වන්නේය. මක්නිසාද
ස්වාමීන්වහන්සේ බලවත් හස්තයකින්
නුඹ මිසරයෙන් පිටතට ගෙනාසේක.
10 එබැවින් අවුරුද්දෙන් අවුරුද්ද නියම
කාලයෙහි මේ නියෝගය පවත්වාපන්න.
ස්වාමීන්වහන්සේ නුඹටත් නුඹේ 11
පියවරුන්ටත් දිවුළ ලෙස කානානි-
වරුන්ගේ දේශයට නුඹ ගෙනවුත් එය
නුඹට දුන් කල්හි, ගර්භයෙහි ප්‍රථම 12
එලවූ සියල්ලන්ද නුඹ සන්තක
මෘගයන්ගෙන් සියලු කුලුඳුලන්ද
ස්වාමීන්වහන්සේට වෙන්කරන්නෙහිය;
පිරිමි ස්වාමීන්වහන්සේට වන්නෝය.
නුමුත් නුඹ කොටළුවන්ගේ සියලු 13
කුලුඳුලන් බැටළු පැටවෙකු බැගින් දී
මුදගත යුතුය; ඌ මුදන්ට නො-
කැමැත්තෙහි නම් උගේ බෙල්ල කැඩිය
යුතුය. එහෙත් නුඹේ පුත්‍රයන් අතරෙන්
සියලු මනුෂ්‍ය කුලුඳුලන් මුදගත යුතුය.
තවද මතු පැමිණෙන කාලයෙහි නුඹේ 14
පුත්‍රයා: මේ කිමෙක්දැයි අසන කල
ස්වකීය හස්ත බලයෙන් ස්වාමීන්-
වහන්සේ මිසරයෙන් එනම් වහල්කමේ
ගෙයින් අප පිටතට ගෙනාසේක. තවද 15
ඵාරාවෝ අප නාරින ලෙස සිත
දැඩිකරගත සිටි කල්හි ස්වාමීන්-
වහන්සේ මිසර දේශයේ සියලු කුලුඳුලන්
එනම් මනුෂ්‍යයන්ගේද මෘගයන්ගේද
සියලු කුලුඳුලන් මැරූසේක. එබැවින්
ගර්භයෙහි ප්‍රථම එලවූ සියලු පිරිමින්
මම ස්වාමීන්වහන්සේට පූජාකරමි;
එහෙත් මාගේ පුත්‍රයන් අතරේ සියලු
කුලුඳුලන් මුදගනිමි. ඒක නුඹේ අතෙහි 16
ලකුණක් පිණිසද ඇස් අතරෙහි නළල්
පටි පිණිසද වන්නේය. මක්නිසාද
ස්වකීය හස්ත බලයෙන් ස්වාමීන්-
වහන්සේ මිසරයෙන් අප පිටතට
ගෙනාසේකැයි ඔහුට කියාපන්නැයි
කීවේය.

## රතු මුහුද පසුකර යාම

තවද ඵාරාවෝ සෙනඟ යන්ට හැරිය 17
කල්හි පිලිස්තිවරුන්ගේ දේශය මැදින්
යාම කිට්ටු නුමුත් දෙවියන්වහන්සේ ඒ
මාර්ගයෙන් ඔවුන් ගෙන නොගියසේක;
මක්නිසාද: සෙනඟ යුද්ධය දැක සමහර-
විට පසුතැවිලිව මිසරයට හැරී නොයන
පිණිසයයි දෙවියන්වහන්සේ කීසේක.
එහෙත් දෙවියන්වහන්සේ සෙනඟ රතු 18

මුහුද ළඟ වනාන්තරය පාරේ වටකර
යන්ට සැලැස්වූසේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
මිසර දේශයෙන් සන්නාහ සන්නද්ධව
19 ගියෝය. මෝසෙස්ද යෝසෙප්ගේ ඇට
තමා සමග ගෙනගියේය. මක්නිසාද
යෝසෙප්: සැබවින් දෙවියන්වහන්සේ
තුඹලා දෙස බලනසේක; තුඹලා සමග
මාගේ ඇට මෙතැනින් ගෙනයන්ට
ඕනෑයයි ඉශ්‍රායෙල් පුත්‍රයන් තදින්
20 දිවුරවා තිබුණේය. ඔව්හු සුකොත් නම්
ස්ථානයෙන් ගමන්කර වනාන්තරය
අද්දර ඒතාම්හි කඳවුරු බැඳගත්තෝය.
21 තවද ඔවුන් දවාලෙත් රාත්‍රියෙත් ගමන්-
කරන පිණිස ස්වාමීන්වහන්සේ ඔවුන්ට
මගපෙන්වීමට දවල් වලා ටැඹකින්ද
රාත්‍රියේ ඔවුන්ට එළිය දීමට ගිනි
ටැඹකින්ද ඔවුන්ට පෙරටුව ගියසේක.
22 දවල් වලා ටැඹද රාත්‍රියේ ගිනි ටැඹද
සෙනඟ ඉදිරියෙන් පහව නොගියේය.

14 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
2 කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කථාකොට–හැරී මිග්දෝල් සහ මුහුද
අතරෙහි බාල්-ශෙඵොන් ඉදිරිපිට
තිබෙන පී-හහීරොත් ඉදිරිපිට කූඩාරම්
ගහගන්ට ඔවුන්ට කියාපන්න. එය
ඉදිරිපිට මුහුද ළඟ කූඩාරම් ගහගනිල්ලා.
3 ඵාරාවෝද: ඔව්හු දේශයෙහි මංමුළාවී
සිටිති, ඔව්හු කාන්තාරයට අසුවී සිටිතියි
ඉශ්‍රායෙල් පුත්‍රයන් ගැන කියනවා ඇත.
4 මම ඵාරාවෝගේ සිත දැඩිකරන්නෙමි,
ඔහු ඔවුන් ලුහුබැඳ එන්නේය; මම
ඵාරාවෝ සහ ඔහුගේ මුළු සේනාව
කරණකොටගෙන ගෞරව ලබන්නෙමි;
මිසරවරු මා ස්වාමීන්වහන්සේ බව
දැනගන්නෝයයි කීසේක. ඔව්හු එසේ
5 කළෝය. සෙනඟ පලාගිය බව මිසරයේ
රජුට දන්වනලද්දේය. එවිට ඵාරාවෝ
සහ ඔහුගේ මෙහෙකරුවන්ගේ සිත්
සෙනඟට විරුද්ධව වෙනස්වී ඉශ්‍රායෙලි-
තයන් අපට මෙහෙකිරීමෙන් යන්ට හැර
අප විසින් කළේ මොන ක්‍රියාවක්දැයි
6 ඔව්හු කීවෝය. ඔහු තමාගේ රථය
සූදානම්කරගෙන තමාගේ සෙනඟ තමා
සමග රැගෙන, තෝරාගත් රථ 7
හයසියයක්ද මිසරයේ සියලු රථද
ගත්තේය, ඒවා සියල්ල කෙරෙහි සේනා
නායකයන්ද පත්කෙළේය. ස්වාමීන්- 8
වහන්සේ මිසරයේ රජවූ ඵාරාවෝගේ
සිත දැඩි කළසේක, ඔහු ඉශ්‍රායෙල්
පුත්‍රයන් ලුහුබැඳ ආයේය. මක්නිසාද
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ධෛර්යවත් ලෙස
නික්ම ගියෝය. මිසරවරු එනම් 9
ඵාරාවෝගේ සියලු අසුන් සහ රථද
ඔහුගේ අසරුවෝද ඔහුගේ සේනාවද
ඔවුන් ලුහුබැඳවිත් බාල්-ශෙඵොන්
ඉදිරිපිට පී-හහීරොත්හි මුහුදුබඩ
කූඩාරම් ගහගන සිටි ඔවුන්ට ළංවූය.
ඵාරාවෝ ළංවූ කල්හි ඉශ්‍රායෙල් පුත්‍රයෝ 10
තමන්ගේ ඇස් ඔසවා මිසරවරුන්
තමන් පස්සේ එනවා දැක අතිශයින්
භයවූවෝය. එබැවින් ඉශ්‍රායෙල් පුත්‍රයෝ
ස්වාමීන්වහන්සේට මොරගැසුවෝය.
ඔව්හු මෝසෙස්ට කථාකොට: කාන්- 11
තාරයෙහි මැරෙන්ට තුඹ අප ගෙනාවේ
මිසරයෙහි මිනීවළවල් නැති නිසාද?
මිසරයෙන් අප ගෙනවුත් අපට
මෙලෙස ක්‍රියා කෙළේ මක්නිසාද?
මිසරවරුන්ට මෙහෙකරන්ට අප 12
අත්හරින්ටය කියා මිසරයෙහිදී අප
කීවේ මේක නොවේද? වනාන්තරයෙහි
මැරෙනවාට වඩා මිසරවරුන්ට මෙහෙ-
කිරීම අපට යහපතැයි මෝසෙස්ට
කීවෝය. මෝසෙස්ද: භයනොවෙල්ලා, 13
නිශ්චලව සිට ස්වාමීන්වහන්සේ අද
තුඹලාට සිදුකර දෙන ගැළවීම
බලාපල්ලා. මක්නිසාද තුඹලා අද දුටු
මිසරවරුන් නැවත තවත් කවදාවත්
නොදක්නහුය. ස්වාමීන්වහන්සේ තුඹලා 14
උදෙසා සටන්කරනසේක, තුඹලා
නිශ්ශබ්දව සිටිය යුතුයයි සෙනඟට
කීවේය.

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 15
කොට: තුඹ කුමක්හෙයින් මට
මොරගසන්නෙහිද? ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
ඉදිරියට යන්ට කියාපන්න. තුඹේ 16
සැරයටිය ඔසවා තුඹේ අත මුහුද

කෙරෙහි දිගු කොට ඒක බෙදපන්න.
ඉශ්‍රායෙල් පුත්‍රයෝ මුහුද මැදට වියළි
17 භූමිය පිට යන්නෝය. බලව, මම වනාහි
මිසරවරුන්ගේ සිත් දැඩිකරන්නෙමි,
18 ඔව්හු මොවුන් පස්සේ යන්නෝය. මා
ඵාරාවෝද ඔහුගේ මුළු සේනාවද
ඔහුගේ රථ සහ අසුරුවන්ද කරණ-
කොටගෙන ගෞරව ලබන්නෙමි. මා
ඵාරාවෝද ඔහුගේ රථද ඔහුගේ
අසුරුවන්ද කරණකොටගෙන ගෞරව
ලැබූ කල්හි මම ස්වාමීන්වහන්සේ බව
මිසරවරු දැනගන්නෝයයි කීසේක.
19 ඉශ්‍රායෙල්වරුන්ගේ සමූදවට පෙරටුව
ගිය දෙවියන්වහන්සේගේ දූතයා අහක්ව
ඔවුන්ට පස්සෙන් ගියේය; වලා ටැඹද
ඔවුන් ඉදිරිපිටින් අහක්ව ඔවුන්ට
20 පස්සෙන් සිටියේය. ඒක මිසරවරුන්ගේ
සමූදවත් ඉශ්‍රායෙල්ගේ සමූදවත් අතරට
පැමුණුණේය; මෙසේ වලාකුළද අන්ධ-
කාරයද විය, එහෙත් එය රාත්‍රියෙහි
එළිය දුන්නේය. මෙසේ මුළු රාත්‍රියෙහි
එක් පක්ෂය අනික් පක්ෂයට ළං
21 නොවීය. මෝසෙස් තමාගේ අත මුහුදට
උඩින් දිගුකෙළේය; ස්වාමීන්වහන්සේද
ඒ මුළු රාත්‍රියෙහි බලවත්වූ නැගෙනහිර
සුළඟක් කරණකොටගෙන මුහුද ආපසු
යන්ට සලස්වා මුහුද ගොඩබිමක් කළ-
22 සේක, ජලද බෙදීගියේය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ වියළි භූමිය පිට මුහුද මැදට
ගියෝය. ජලය ඔවුන්ගේ දකුණු
පැත්තෙන්ද වම් පැත්තෙන්ද ඔවුන්ට
23 තාප්පයක් මෙන් විය. මිසරවරු එනම්
ඵාරාවෝගේ සියලු අශ්වයෝද ඔහුගේ
රථද ඔහුගේ අසරුවෝද ලුහුබඳවා
ඔවුන් පස්සේ මුහුද මැදට ගියෝය.
24 තවද ස්වාමීන්වහන්සේ උදය යාමෙහි
ගිනි සහ වලා ටැඹ මැදින් මිසර සේනාව
දෙස බලා මිසර සේනාව වියවුල්කළ-
25 සේක. උන්වහන්සේ ඔවුන්ගේ චක්‍ර-
රෝද ගැළෙවූසේක, ඔව්හු ඒවා
අමාරුවෙන් දක්කුවෝය. එබැවින්
මිසරවරු කථාකොට: අපි ඉශ්‍රායෙල්
කෙරෙන් පලායමු; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ ඔවුන් උදෙසා මිසරවරුන්ට
විරුද්ධව සටන්කරනසේකැයි කීවෝය.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 26
කොට: ජලය මිසරවරුන් පිටද ඔවුන්ගේ
රථ සහ අසරුවන් පිටද හැරී එන
පිණිස තුඹේ අත මුහුද කෙරෙහි
දිගුකරන්නැයි කීසේක. මෝසෙස් තමාගේ 27
අත මුහුද කෙරෙහි දිගුකෙළේය, පහන්වූ
කල මුහුද එහි නියම ස්වභාවයට
හැරුණේය; මිසරවරු ඒ ඉදිරියට
දිවගියෝය; ස්වාමීන්වහන්සේ මිසර-
වරුන් මුහුද මැද හෙළාදැමූසේක. ජලය 28
හැරීඇවිත් රථද අසුරුවන්ද එසේය,
ඔවුන් පස්සේ මුහුදට ගියාවූ ඵාරාවෝගේ
මුළු සේනාව වසාගත්තාය; ඔවුන්ගෙන්
එක්කෙනෙක්වත් ඉතුරුනොවීය. එහෙත් 29
ඉශ්‍රායෙල් පුත්‍රයෝ මුහුද මැද වියළි
භූමිය පිට ගියෝය; ජලය දකුණෙන්ද
වමෙන්ද ඔවුන්ට තාප්පයක් වූයේය.
මෙසේ ස්වාමීන්වහන්සේ ඒ දවසෙහි 30
මිසරවරුන් අතින් ඉශ්‍රායෙල්වරුන්
ගැළවූසේක; මිසරවරුන් මුහුදු වෙරළේ
මැරී සිටිනවා ඉශ්‍රායෙල්වරු දුටුවෝය.
මෙසේ ස්වාමීන්වහන්සේ මිසරවරුන්ට 31
කළ මහත් ක්‍රියාව ඉශ්‍රායෙල්වරු
දුටුවාහුය, එබැවින් සෙනඟ ස්වාමීන්-
වහන්සේට භයව ස්වාමීන්වහන්සේද
උන්වහන්සේගේ මෙහෙකරුවූ මෝසෙස්ද
විශ්වාසකළෝය.

## මෝසෙස්ගේ ගීතිකාව

15 එවිට මෝසෙස් සහ ඉශ්‍රායෙල්
පුත්‍රයෝ ස්වාමීන්වහන්සේට මේ
ගීතිකාව ගායනාකරමින් මෙසේ
කීවෝය:

මම ස්වාමීන්වහන්සේට ගී කියන්නෙමි,
මක්නිසාද උන්වහන්සේ
තේජාන්විත ලෙස ජයගත්සේක.
උන්වහන්සේ අශ්වයා සහ අසරුවා
මුහුදට හෙළූසේක.
මාගේ ශක්තියද ගීතිකාවද 2
ස්වාමීන්වහන්සේය,
උන්වහන්සේ මාගේ ගැළවීම
වූසේක.

මේ මාගේ දෙවියන්වහන්සේය,
උන්වහන්සේ වර්ණනාකරන්නෙමි;
මාගේ පියාණන්ගේ
දෙවියන්වහන්සේය,
උන්වහන්සේ උසස්කරන්නෙමි.
3 **ස්වාමීන්වහන්සේ** යුද්ධ දක්ෂයෙක.
උන්වහන්සේගේ නාමය
**ස්වාමීන්වහන්සේය.**
4 ඵාරාවෝගේ රථ සහ ඔහුගේ සේනාව
උන්වහන්සේ මුහුදට හෙළූසේක.
ඔහුගේ තෝරාගත් සේනාපතියෝ
රතු මුහුදෙහි කිඳගියෝය.
5 ගැඹුරු ජලයෝ ඔවුන් වසාගනිති.
ඔව්හු ගලක් මෙන් පතුලට කිඳුණෝය.
6 **ස්වාමීන්වහන්ස**, ඔබගේ දකුණත
පරාක්‍රමයෙන් මහිමවත්ය,
**ස්වාමීන්වහන්ස**, ඔබගේ දකුණත
සතුරා කැබලිකරදමයි.
7 ඔබගේ මහත්තත්ත්වයේ උතුම්කමෙන්
ඔබ ඔබට විරුද්ධව නැගිටින්නන්
පරාජයකරනසේක.
ඔබ ස්වකීය උදහස යවනසේක,
එයින් ඉපනැල්ල
මෙන් ඔව්හු දැවෙන්නෝය.
8 ඔබගේ නාසිකා වාතයෙන් ජලය
ගොඩක් මෙන් සිටියේය,
ජලධාරාවෝ ගොඩක් මෙන් කෙලින්
සිටියෝය;
මුහුද මැද ජලස්කන්ධයෝ මිදුණෝය.
9 සතුරා කියනුයේ:
මම ලුහුබඳින්නෙමි, අල්වාගන්නෙමි,
කොල්ලය බෙදන්නෙමි.
මාගේ ආශාව ඔවුන් කෙරෙහි තෘප්තියට
පමුණුවනු ලැබේ;
මාගේ කඩුව අදින්නෙමි, මාගේ අත
ඔවුන් විනාශකරන්නේයයි කීය.
10 ඔබ ස්වකීය හුස්ම පිඹලූසේක, එවිට
මුහුද ඔවුන් වසාගත්තේය.
ඔව්හු මහත් ජලයෙහි ඊයම් මෙන්
කිඳුණෝය.
11 **ස්වාමීන්වහන්ස**, දෙවිවරුන් අතරේ
ඔබට සමාන කවුද?
ශුද්ධකමින් මහිමවත්වූ,
ප්‍රශංසාවලින් භයංකරවූ, පුදුම දේ
කරන්නාවූ ඔබ සමාන කවුද?
ඔබ ස්වකීය දකුණත දිගුකළසේක, 12
පොළොව ඔවුන් ගිලගත්තාය.
ඔබවහන්සේ මුදගත් සෙනඟ ස්වකීය 13
කරුණාවෙන් යුක්තව
ගෙනගියසේක.
ඔබගේ ශුද්ධ වාසස්ථානයට ස්වකීය
ශක්තියෙන් ඔවුන්ට මග
පෙන්වූසේක.
ජනයන්ට ඇසුණේය, ඔව්හු වෙව්ලති, 14
වේදනාව වනාහි පිලිස්තියාවේ
වැසියන් අල්වා ගත්තේය.
එවිට ඒදොම්හි අධිපතියෝ විස්මයට 15
පත්වූවෝය;
වෙව්ලුම මෝවබ්හි බලවන්තයන්
අල්වාගනී.
කානාන්හි සියලු වැසියෝ දියව ගියෝය.
භීතිය හා භයංකරය ඔවුන් පිට 16
වැටෙයි;
**ස්වාමීනි**, ඔබගේ සෙනඟ එතරව
යන තෙක්ද
ඔබ මිලේට ගත් සෙනඟ එතරව යන
තෙක්ද
ඔබගේ බාහු බලය නිසා ඔව්හු ගලක්
මෙන් නිශ්චලව සිටිති.
**ස්වාමීනි**, ඔබ වසන පිණිස සාදනලද 17
ස්ථානයද
ස්වාමීනි, ඔබගේ අත්වලින් පිහිටුවන
ලද ශුද්ධස්ථානයද වන
ඔබගේ උරුමයවූ කන්දට ඔවුන්
ගෙන්වා එහි ඔවුන් සිටුවනසේක.
**ස්වාමීන්වහන්සේ** සදකල්ම රජකම් 18
කරනසේක.
මක්නිසාද ඵාරාවෝගේ අශ්වයෝ 19
ඔහුගේ රථ සහ අසුරුවන් සමග මුහුද
තුළට ගියෝය, **ස්වාමීන්වහන්සේ** සමුද්‍ර
ජලධාරාවන් ඔවුන් පිටට හැරෙවූසේක;
එහෙත් ඉශ්‍රායෙල් පුත්‍රයෝ වියළි
භූමිය පිට මුහුද මැදින් ගියෝය. එවිට 20
ආරොන්ගේ සහෝදරීවූ මිරියාම් ප්‍රො-
ජේත දූ තොමෝ රබානක් අතින්
ගත්තීය; සියලු ස්ත්‍රීහු රබන්ද නැටුම්ද
ඇතුව ඈ පස්සේ ගියෝය. මිරියාම් 21
ඔවුන්ට උත්තරදෙමින්:

ස්වාමීන්වහන්සේට ගායනාකරව්,
මක්නිසාද උන්වහන්සේ තේජාන්-
විත ලෙස ජයගත්සේක;
උන්වහන්සේ අශ්වයා සහ අසරුවා
මුහුදට හෙළූසේකැයි
කීවාය.

## මාරා සහ ඒලිම්

22 තවද මෝසෙස් ඉශ්‍රායෙල් මිනිසුන්
රතු මුහුදේ සිට ගෙනගියේය, ඔව්හු
ෂූර් නම් වනාන්තරයට පිටත්ව ගියෝය;
ඔව්හු තුන් දවසක් වනාන්තරයෙහි ගොස්
23 වතුර නොලැබුවෝය. ඔවුන් මාරාට
පැමුණුණු කල එහි වතුර තික්ත නිසා
බොන්ට නොහැකි විය. එබැවින්
ඒ ස්ථානයට *මාරා යන නම තබන-
24 ලද්දේය. සෙනඟ: අපි කුමක් බොමු-
දැයි කියමින් මෝසෙස්ට විරුද්ධව
25 කොඳුලෝය. ඔහු ස්වාමීන්වහන්සේට
හඬගැසීය; ස්වාමීන්වහන්සේ ඔහුට
ගහක් පෙන්වූසේක, ඔහු ඒක ජලයට
හෙළූ කල ජලය මිහිරි විය. එහිදී
උන්වහන්සේ ඔවුන්ට නියෝගයක්ද
පනතක්ද දුන්සේක, එහිදී උන්වහන්සේ
26 ඔවුන් පරීක්ෂාකොට: නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ හඬට නුඹ ඕනෑ-
කමින් ඇහුම්කන්දී උන්වහන්සේගේ ඇස්
හමුයෙහි හරිව තිබෙන දේ කොට
උන්වහන්සේගේ ආඥාවලට කන්දෙමින්
උන්වහන්සේගේ සියලු නියෝග රක්ෂා-
කරන්නෙහිනම් මිසරවරුන් පිට මා
පැමිණෙවූ රෝගවලින් එකක්වත් නුඹ
පිටට නොපමුණුවන්නෙමි. මක්නිසාද
මම වනාහි නුඹ සුවකරන්නාවූ
ස්වාමීන්වහන්සේයයි කීසේක.
27 ඔව්හු දිය උල්පත් දොළසක් හා ඉඳි
ගස් සැත්තෑවක් ඇති ඒලිම්ට අවුත්
එහි දිය අසල කූඩාරම් ගසාගත්තෝය.

## මන්නා සහ වටුවෝ

16 පසුව ඔව්හු ඒලිම්හි සිට ගමන්
ගත්තෝය, තවද ඔවුන් මිසර
දේශයෙන් නික්ම ගියායින් පසු දෙවෙනි
මාසයේ පසළොස්වෙනි දිනදී ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ මුළු සභාව ඒලිම් සහ සීනයි
අතරෙහිවූ සීන් නම් වනාන්තරයට
පැමුණුණෝහ. ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු 2
සභාව වනාන්තරයෙහිදී මෝසෙස්
සහ ආරොන්ට විරුද්ධව කොඳුලෝය.
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඔවුන්ට කථාකොට: 3
මිසර දේශයෙහිදී මස් භාජන ළඟ හිඳ
සෑහෙන පමණ කෑම කෑ විට ස්වාමීන්-
වහන්සේගේ අතින් අපි නැසුණෙමුනම්
යහපත; මක්නිසාද මේ මුළු සමූහයා
ක්ෂුධාවෙන් මරවන පිණිස නුඹලා
අප මේ වනාන්තරයට ගෙනාවෝයයි
කීවෝය. එවිට ස්වාමීන්වහන්සේ 4
මෝසෙස්ට කියනසේක්: බලව, ඔව්හු
මාගේ ව්‍යවස්ථාව ලෙස හැසිරෙන්නෝද
නැද්දැයි පරීක්ෂාකරන පිණිස ස්වර්ග-
යෙන් නුඹලා උදෙසා ආහාර වස්-
වන්නෙමි; සෙනඟ පිටත ගොස් දවසකට
සෑහෙන ප්‍රමාණය දවස්පතා රැස්-
කරගනිත්වා. තවද සවෙනි දවසේදී 5
ඔවුන් ගෙනෙන දේ සූදනම්කරත්වා,
එය ඔවුන් දවස්පතා රැස්කරගන්නා
ප්‍රමාණය ලෙස දෙගුණයක් වන්නේයයි
කීසේක. මෝසෙස්ද ආරොන්ද සියලු 6
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට: නුඹලා
මිසර දේශයෙන් ගෙනාවේ ස්වාමීන්-
වහන්සේ බව සවස දනගන්නහුය.
උදය ස්වාමීන්වහන්සේගේ තේජස 7
දකින්නහුය; මක්නිසාද ස්වාමීන්-
වහන්සේට විරුද්ධව නුඹලාගේ කෙඳිරීම්
උන්වහන්සේට ඇසෙයි. නුඹලා අපට
විරුද්ධව කොඳුරන්ට අපි කවුරුදැයි
කීවෝය. මෝසෙස්: මෙසේ වන්නේ 8
ස්වාමීන්වහන්සේ සවස නුඹලාට කන
පිණිස මාංසද උදය සෑහෙන තරම්
ආහාරද දෙන විටය; මක්නිසාද නුඹලා
ස්වාමීන්වහන්සේට විරුද්ධව කොඳුරන
නුඹලාගේ කෙඳිරීම් උන්වහන්සේට
ඇසේ. අපි කවුරුද? නුඹලාගේ කෙඳිරීම්
අපට විරුද්ධව නොව ස්වාමීන්-
වහන්සේට විරුද්ධවයයි කීවේය. තවද 9
මෝසෙස් ආරොන්ට කථාකොට:

*එනම්, තික්තකම.

ස්වාමීන්වහන්සේ නුඹලාගේ කෙඳිරීම්
ඇසූ හෙයින් උන්වහන්සේ ඉදිරියට
ළංවෙයල්ලායයි ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
මුළු සභාවට කියාපන්නැයි කීය.
10 ආරොන් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු
සභාවට කථාකළ කල්හි ඔව්හු
වනාන්තරය දෙස බැලුවෝය, බලව,
ස්වාමීන්වහන්සේගේ තේජස වලා-
11 කුළෙහි පෙනුණේය. ස්වාමීන්වහන්සේ
12 මෝසෙස්ට කථාකොට: මම ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ කෙඳිරීම් ඇසීමි. නුඹලා
සවස මාංස කන්නහුය, උදය රොටි-
වලින් තෘප්තියට පැමිණෙන්නහුය; මම
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ බව
නුඹලා දැනගන්නහුයයි ඔවුන්ට කියවයි
13 කීසේක. ඒ හැටියට සවස වටුවෝ
අවුත් අන්දයම් වසාගත්තෝය. උදය
14 කඳවුර හාත්පස පිනි තිබුණේය. වැටී
තිබුණු ඒ පිනි හිඳුණු කල, බලව, හිම
වැනි සීන් කුඩා වටවූ දෙයක්
වනාන්තරයේ බිම පිට තිබුණේය.
15 ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඒ දැක කිමෙක්දැයි
නොදැන: මේ මොනවාදැයි එකිනෙකාට
කීවෝය. එවිට මෝසෙස්: මේ වනාහි
කෑම පිණිස ස්වාමීන්වහන්සේ නුඹලාට
16 දුන් රොටිය. ස්වාමීන්වහන්සේ අණකර
තිබෙන දේ මේය—නුඹලා එකිනෙකා
තම තමා කන ප්‍රකාරයට එයින් රැස්-
කරගනිල්ලා; නුඹලාගේ ගණනේ
හැටියට එකිනෙකා තම තමාගේ
කූඩාරමේ සිටින්නන්ට එක්කෙනාට
*ඕමෙරයක් බැගින් ගනිල්ලායයි කීය.
17 ඉශ්‍රායෙල් පුත්‍රයෝ එසේ කොට
සමහරෙක් වැඩියෙන්ද සමහරෙක්
18 අඩුවෙන්ද රැස්කරගත්තෝය. ඔවුන්
ඕමෙර යන මිම්මකින් ඒ මැන්න
කල බොහෝ රැස්කළ තැනැත්තාට
වැඩිව නොතිබුණේය, ටික රැස්කළ
තැනැත්තාට අඩුව නොතිබුණේය;
එකිනෙකා තම තමා කන ප්‍රමාණයට
19 එකතුකෙළේය. මෝසෙස්: කිසිකෙනෙක්
පසුවදා උදය දක්වා එයින් ඉතුරු

නොකෙරේවයි කීය. එසේවීනුමුත් ඔව්හු 20
මෝසෙස්ට ඇහුම්කන්නොදී සමහරෙක්
පසුවදා උදය වනතුරු එයින්
ඉතුරුකළෝය, එය පණුවන් හැදී
දුර්ගන්ධවිය. මෝසෙස් ඔවුන් කෙරෙහි
කෝප විය. ඔවුන් එකිනෙකා තම 21
තමා කන ප්‍රකාරයට උදයෙන් උදය එය
රැස්කරගත්තේය. අව්ව තදවූ විට එය
දියවීගියේය. නවද හවෙනි දවසේදී 22
ඔව්හු එකිනෙකාට ඕමෙර දෙකක්
බැගින් දෙගුණයක් රැස්කරගත්තෝය.
සභාවේ සියලු අධිපතීහු අවුත්
මෝසෙස්ට ඒ බව කීවෝය. ඔහුද: 23
ස්වාමීන්වහන්සේ කී කාරණය මේය,
සෙට දවස ගරුමයවූ නිවාඩුවක්ය,
ස්වාමීන්වහන්සේට ශුද්ධ සබතක්ය.
පුළුස්සන දේ පුළුස්සා ගනිල්ලා, තම්බන
දේ තම්බාගනිල්ලා; ඉතුරුව තිබෙන
සියල්ල පසුවදා උදය දක්වා තිබෙන්ට
නුඹලා ළඟ තබාගනිල්ලායයි ඔවුන්ට
කීවේය. ඔව්හු මෝසෙස් කී ලෙස පසු- 24
වදා උදය වනතුරු ඒවා තබාගත්තෝය.
ඒවා දුර්ගන්ධනොවීය, එහි කිසි
පණුවෙක්ද නොවීය. මෝසෙස්: අද ඒවා 25
කාපල්ලා; මක්නිසාද අද ස්වාමීන්-
වහන්සේට පවත්වන සබතය. අද ඒවා
කෙතෙහි සම්බනොවන්නේය. සදවසක් 26
ඒවා රැස්කරගනිල්ලා; එහෙත් සත්වෙනි
දවස සබතය, ඒ දවසෙහි එයින් කිසිවක්
නොතිබේයයි කීය. නවද සෙනග 27
අතරෙන් සමහරෙක් සත්වෙනි දවසෙහි
රැස්කරගන්ට පිටතට ගිය නුමුත් කිසිවක්
නොලැබුණේය. ස්වාමීන්වහන්සේ 28
මෝසෙස්ට කථාකොට: නුඹලා මාගේ
ආඥාද ව්‍යවස්ථාද පවත්වන්ට කො-
පමණ කල් අකමැතිව සිටිනවාද?
බලාපල්ලා, ස්වාමීන්වහන්සේ නුඹලාට 29
සබත් දවස දුන්සේක, එබැවින් උන්-
වහන්සේ සවෙනි දවසේදී දෙදවසක
ආහාර නුඹලාට දෙනසේක; එකිනෙකා
තමතමාගේ ස්ථානයේ නැවතී සිටිනු
මිස සත්වෙනි දවසෙහි තමාගේ ඉඩ-
මෙන් කිසිවෙක් නොයේවයි කීසේක.

*ඕමෙරයක් නැළි තුනහමාරයි.

30 මෙසේ සෙනඟ සත්වෙනි දවසෙහි
31 නිවාඩුගත්තෝය. ඉශ්‍රායෙල් වංශය
ඒවාට *මන්නා යන නාමය තැබූහ.
ඒවා කොත්තමල්ලි ඇට සමානය, සුදුය;
එහි රස මීපැණි මිශ්‍රවූ පූප මෙනි.
32 මෝසෙස් කියනුයේ: ස්වාමීන්වහන්සේ
අණකළ දේ මේය, මා විසින් මිසර
දේශයෙන් නුඹලා ගෙනා කල්හි
වනාන්තරයේදී නුඹලා පෝෂණයකළ
ආහාර නුඹලාගේ පරම්පරාවල අය
දකින පිණිස ඔවුන් නිසා ඕමෙරයක්
33 පුරවා තබාගනිල්ලායයි කීය. මෝසෙස්
ආරොන්ට කථාකොට: භාජනයක්
රැගෙන මන්නාවලින් ඕමෙරයක් පුරවා
නුඹලාගේ පරම්පරාවන් උදෙසා
ප්‍රවේසම්ව තිබෙන පිණිස ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි ඒවා තබාපන්නැයි
34 කීවේය. ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
අණකළ ලෙස ආරොන් ඒවා ප්‍රවේසම්වී
තිබෙන පිණිස †සාක්ෂිය ඉදිරියෙහි
35 තැබීය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ මනුෂ්‍ය
පථයකට එන තෙක් සතලිස් අවුරුද්දක්
මන්නා කෑවෝය; ඔව්හු කානාන්
දේශයේ සීමාවලට පැමිණෙන තෙක්
36 මන්නා කෑවෝය. ඕමෙරයක් නම්
‡ඒඵාවෙන් දසයෙන් කොටසක්ය.

## පර්වතයෙන් වතුර දීම

17 ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු
සභාව ස්වාමීන්වහන්සේගේ
ආඥාව ලෙස සීන් වනාන්තරයේ
සිට ක්‍රමයෙන් ගමන්කොට රෙෆිදීම්හි
කඳවුරු බැඳගත්තාය. එහි සෙනඟට
2 බොන්ට වතුර නොතිබුණේය. එබැවින්
සෙනඟ මෝසෙස් සමග විවාද-
කරමින්: අපට බොන්ට වතුර දෙන්-
නැයි කීවෝය. මෝසෙස්: නුඹලා මා
සමග විවාද කරන්නේ මන්ද? කුමට
ස්වාමීන්වහන්සේ පරීක්ෂාකරන්නහුදැයි
ඔවුන්ට කීවේය. එහිදී සෙනඟට 3
වතුර පිපාසා විය; එහෙයින් සෙනඟ
කථාකොට: අපද අපේ දරුවන්ද අපේ
සිව්පාවුන්ද පිපාසායෙන් මරවන්ට
මිසරයෙන් අප කුමට ගෙනායෙහිද කියා
මෝසෙස්ට විරුද්ධව කොඳුළෝය.
මෝසෙස් ස්වාමීන්වහන්සේට මොර- 4
ගසා: මේ සෙනඟ ගැන කුමක් කෙරෙම්ද?
ඔව්හු මට ගල් ගසන්ට මෙන් සෑදී
සිටිතියි කීය. එවිට ස්වාමීන්වහන්සේ 5
මෝසෙස්ට කථාකොට: ඉශ්‍රායෙල්
ප්‍රධානීන්ගෙන් සමහරුන් කැඳවාගෙන
ගංගාවට පහර දුන් සැරයටියත් අතින්
ගෙන සෙනඟට පෙරටුව යව. බලව, 6
මම හොරේබ්හි පර්වතය පිට එහි නුඹ
ඉදිරියෙහි සිටිමි; නුඹ පර්වතයට
ගසාපන්න, සෙනඟට බොන්ට වතුර
එයින් නික්මෙන්නේයයි කීසේක.
මෝසෙස් ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ගේ
ඇස් හමුයෙහි එසේ කෙළේය. ඉශ්‍රායෙල් 7
පුත්‍රයන්ගේ විවාදය නිසාත් ස්වාමීන්-
වහන්සේ අප අතරෙහි ඇද්ද නැද්දැයි
කියමින් ඔවුන් ස්වාමීන්වහන්සේ
පරීක්ෂාකළ නිසාත් ඔහු ඒ ස්ථානයට
*මස්සා සහ †මෙරිබා කියා නම්
තැබුවේය.

## අමලෙක්වරුන් පරාජය කිරීම

එකල අමලෙක්වරු අවුත් රෙෆිදීම්- 8
හිදී ඉශ්‍රායෙල් සමග සටන්කළෝය.
මෝසෙස් යෝෂුවාට කථාකොට: නුඹ 9
අපට මිනිසුන් තෝරාගෙන පිටත්ව
ගොස් අමලෙක්වරුන් සමග සටන්-
කරපන්න. හෙට මම දෙවියන්-
වහන්සේගේ සැරයටිය අතින් ගෙන හෙළ
මුදුනේ සිටින්නෙමියි කීවේය. යෝෂුවා 10
මෝසෙස් තමාට කී ලෙස කොට,
අමලෙක්වරුන් සමග සටන්කෙළේය.
මෝසෙස්ද ආරොන්ද හූර්ද හෙළ
මුදුනට ගියෝය. මෝසෙස් තමාගේ 11

*එනම්, මොනවාද? නොහොත් ප්‍රසාදයක්.
†එනම්, සාක්ෂිපෙට්ටිය නොහොත් සාක්ෂි ලෑල්ල.
‡ඒඵාවක් තැළි තිස්පහයි.

*එනම්, පරීක්ෂාකිරීම.
†එනම්, විවාදකිරීම.

අත ඔසවා සිටි විට ඉශ්‍රායෙල්වරු
ජයගත්තෝය. ඔහුගේ අත පහත
හෙළූවිට අමලෙක්වරු ජයගත්තෝය.
12 එහෙත් මෝසෙස්ගේ අත් බරවුණේය;
එවිට ඔව්හු ගලක් රැගෙන ඔහුට යටින්
තැබුවෝය, ඔහු ඒ පිට හිඳගත්තේය;
ආරොන් සහ හූර් දෙපැත්තෙන් සිට
ඔහුගේ අත් උසුලා සිටියෝය; එවිට
ඔහුගේ අත් ඉර බස්නා තෙක් ස්ථිරව
13 තිබුණේය. මෙසේ යෝෂුවා අමලෙක්
හා ඔහුගේ සෙනඟ කඩු මුවහතින්
14 පරාජයකෙළේය. ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට කථාකොට: මම අමලෙක්-
වරුන් ගැන සිහිවීම අහස යටින්
සහමුලින් මකාදමන්නෙමැයි යන
මෙය සිහිවීම පිණිස පොතක ලියා,
යෝෂුවාට ඇසෙන්ට කියාදෙවයි
15 කීසේක. මෝසෙස් පූජාසනයක් ගොඩ-
නගා ඊට *යෙහෝවඃ-නිස්සී යන නම
16 තැබීය. ඔහු කථාකොට: ස්වාමීන්-
වහන්සේට පරම්පරාවෙන් පරම්පරාවට
අමලෙක්ට විරුද්ධව යුද්ධ ඇතිවන්නේය
කියා ස්වාමීන්වහන්සේ දිවුළසේකැයි
කීවේය.

## යෙත්‍රෝගේ පැමිණීම

18 මිදියන්හි පූජකවූ මෝසෙස්ගේ
මාමා වන යෙත්‍රෝ වනාහි
දෙවියන්වහන්සේ මෝසෙස් උදෙසාත්
ස්වකීය සෙනඟවූ ඉශ්‍රායෙල් උදෙසාත්
කරනලද සියල්ල එනම් ස්වාමීන්-
වහන්සේ ඉශ්‍රායෙල් මිසරයෙන් පිටතට
2 ගෙනා වග ඇසුවේය. එවිට මෝසෙස්-
ගේ මාමාවූ යෙත්‍රෝ මෝසෙස් ඇරලා
සිටියාවූ ඔහුගේ භාර්යාවවූ ශිප්-
පොරාද ඇගේ පුත්‍රයන් දෙදෙනාද
3 රැගෙන පිටත්වුණේය; ඔවුන්ගෙන් එක්-
කෙනෙකුගේ නම ගේර්ෂොම්ය; මක්-
නිසාද: මම අන් රටක ආගන්තුකයෙක්ව
4 සිටියෙමියි මෝසෙස් කීවේය. අනික්
පුත්‍රයාගේ නම එලියේසර්ය; මක්නිසාද:
මාගේ පියාණන්ගේ දෙවියන්වහන්සේ
මට පිහිටවී ඵාරාවෝගේ කඩුවෙන්
මා ගළවාගත්සේකැයි ඔහු කීවේය.
මෝසෙස්ගේ මාමාවූ යෙත්‍රෝ මෝ- 5
සෙස්ගේ පුත්‍රයන් සහ භාර්යාව සමග
දෙවියන්වහන්සේගේ කන්දළඟ වනාන්-
තරයෙහි කඳවුර බැඳ සිටි මෝසෙස්
වෙතට අවුත්: නුඹේ මාමාවූ යෙත්‍රෝ 6
නම් මමද නුඹේ භාර්යාවද ඈ සමග
ඇගේ පුත්‍රයෝ දෙදෙනාද නුඹ වෙතට
ඇවිත් සිටිමුයයි මෝසෙස්ට කියා
ඇරියේය. මෝසෙස් තමාගේ මාමාගේ 7
පෙරමගට ගොස් වැඳ ඔහු සිඹගත්තේය;
ඔව්හු එකිනෙකාගේ සුව දුක් විචාරා
කූඩාරමට ඇතුල්වූවෝය. මෝසෙස් 8
ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් උදෙසා
ඵාරාවෝටද මිසරවරුන්ටද කළ
සියල්ල සහ මාර්ගයෙහිදී ඔවුන්ට
පැමිණි සියලු අමාරුකම්ද ස්වාමීන්-
වහන්සේ ඔවුන් ගැළෙවූ ප්‍රකාරයද
ඔහුගේ මාමාට කීවේය. ස්වාමීන්- 9
වහන්සේ ඉශ්‍රායෙල් මිසරවරුන් අතින්
ගළවාගෙන ඔවුන්ට කළාවූ සියලු
යහපත්කම් ගැන යෙත්‍රෝ ප්‍රීතිවිය. ඔහු 10
කියනුයේ: මිසරවරුන් අතින්ද ඵාරාවෝ
අතින්ද නුඹලා මුදා මිසරවරුන් යටතින්
සෙනඟ ගළවාගත්තාවූ ස්වාමීන්-
වහන්සේට ප්‍රශංසා වේවා. ස්වාමීන්- 11
වහන්සේ සියලු දෙවිවරුන්ට වඩා
උතුම් බව දත් දනිමි. එසේය, ඔවුන්
උඩඟු ලෙස මොවුන්ට විරුද්ධව
හැසුරුණු කාරණයේදී උන්වහන්සේ
එසේම වූසේකැයි කීයේය. මෝසෙස්ගේ 12
මාමාවූ යෙත්‍රෝ දෙවියන්වහන්සේට
දවන පූජාවක්ද යාගද ගෙනායේය.
ආරොන්ද ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු
වැඩිමහල්ලෝද මෝසෙස්ගේ මාමා
සමග දෙවියන්වහන්සේ ඉදිරියෙහි
කෑම කන පිණිස ආවෝය. තවද 13
පසුවදා මෝසෙස් සෙනඟ විනිශ්චය
කරන පිණිස හිඳගත්තේය. සෙනඟද
උදය පටන් සවස දක්වා ඔහු අවට
සිටියාහ. මෝසෙස් සෙනඟ සම්- 14
බන්ධව කරන සියල්ල ඔහුගේ මාමා

*එනම්, ස්වාමීන්වහන්සේ මාගේ ධජයය.

දැක: නුඹ සෙනඟ ගැන කරන මේ දෙය
කිමෙක්ද? නුඹ පමණක් වාඩිවී ඉන්-
නෙත් මුළු සෙනඟ උදේ පටන් සවස
දක්වා නුඹ අවට නැගිට සිටින්නෙත්
15 මක්නිසාදැයි කීය. මෝසෙස්ද: සෙනඟ
දෙවියන්වහන්සේගෙන් විභාගකරන
16 පිණිස මා වෙතට එන නිසාය. ඔවුන්ට
කාරණයක් ඇති කල ඔව්හු මා වෙතට
එති; මමද මනුෂ්‍යයෙකු සහ ඔහුගේ
අසල්වාසියා අතරේ විනිශ්චයකොට
දෙවියන්වහන්සේගේ නියෝගයද
ව්‍යවස්ථාද ඔවුන්ට දන්වමියි තමාගේ
17 මාමාට කීවේය. මෝසෙස්ගේ මාමා
ඔහුට කථාකොට: නුඹ කරන දේ හොඳ
18 නැත. නුඹද නුඹ සමග සිටින මේ
සෙනඟද ඒකාන්තයෙන් වැරීයන්නාහුය.
මක්නිසාද මේ කාරණය නුඹට බර
වැඩිය; නුඹට පමණක්ම එය ඉෂ්ට-
19 කිරීම නොහැකිය. ඉතින් මාගේ හඬට
ඇහුම්කන්දියන්න, මම නුඹට දැන-
මුතුකම් දෙමි, දෙවියන්වහන්සේ නුඹ
සමග සිටිනසේක්වා. නුඹ සෙනඟ
උදෙසා දෙවියන්වහන්සේ ඉදිරියේ සිට
උන්වහන්සේ ඉදිරියට කාරණා පමුණු-
20 වාපන්න. නුඹ ඔවුන්ට නියෝග සහ
ව්‍යවස්ථා උගන්වා ඔවුන් විසින්
හැසිරිය යුතු මාර්ගයත් කළ යුතු වැඩත්
21 ඔවුන්ට පෙන්වාදීපන්න. ඇරත් නුඹ
මුළු සෙනඟ අතරෙන් දෙවියන්වහන්සේ
කෙරෙහි භය ඇත්තාවූ සත්‍යවාදිවූ අයුතු
ලාභයට ද්වේෂකරන්නාවූ සමර්ථ මනු-
ෂ්‍යයන් තෝරාගෙන ඔවුන් සහස්‍රාධි-
පතීන්ද ශතාධිපතීන්ද පනසාධිපතීන්ද
දශාධිපතීන්ද කොට සෙනඟ කෙරෙහි
22 පත්කරපන්න. ඔව්හු සියලු ප්‍රස්තාවයන්-
හිදී සෙනඟ විනිශ්චය කෙරෙත්වා. ඔව්හු
සියලු මහත් කාරණා නුඹ වෙතට
පමුණුවා සියලු සුළු කාරණා තුමූම
විනිශ්චය කෙරෙත්වා. මෙසේ නුඹට
ලුහක් පහසු වන්නේය, ඔව්හු නුඹ
23 සමග බර උසුලන්නෝය. නුඹ මෙසේ
කරන්නෙහි නම්, දෙවියන්වහන්සේත්
එසේ නුඹට අණකරනසේක්නම්, නුඹට
දැරියහැකි වන්නේය, මේ මුළු සෙනඟද
තමුන්ගේ ස්ථානයට සමාදානයෙන්
යන්නෝයයි කීවේය. මෝසෙස් තම 24
මාමාගේ බසට කන්දී ඔහු කී සියල්ල
කෙළේය. මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ගෙන් 25
සමර්ථ මනුෂ්‍යයන් තෝරාගෙන ඔවුන්
සහස්‍රාධිපතීන්ද ශතාධිපතීන්ද පනසාධි-
පතීන්ද දශාධිපතීන්ද වශයෙන් සෙනඟ
කෙරෙහි ප්‍රධානීන් කොට ඔවුන් පත්-
කෙළේය. ඔව්හු සියලු ප්‍රස්තාවයන්හිදී 26
සෙනඟ විනිශ්චයකළෝය. අමාරු
කාරණා මෝසෙස් වෙතට ගෙනාවෝය,
එහෙත් සියලු සුළු කාරණා ඔව්හුම
විනිශ්චයකළෝය. මෝසෙස් තමාගේ 27
මාමා යන්ට හැරියේය; ඔහු සිය රටට
ගියේය.

## සීනයි කන්දේදී ව්‍යවස්ථාව ලැබීමට සූදනම්වීම

19 ඉශ්‍රායෙල් පුත්‍රයෝ මිසර
දේශයෙන් ඇවිත් තුන් මාසයක්-
වූ එම දවසෙහි සීනයි වනාන්තරයට
පැමිණියෝය. ඔව්හු රෙපීඩිම්හි 2
සිට පිටත්ව සීනයි වනාන්තරයට
ඇවිත් වනාන්තරයෙහි කූඩාරම්
ගසාගත්තෝය; එහි කන්ද ඉදිරිපිට
ඉශ්‍රායෙල්වරු කූඩාරම් ගසාගත්තෝය.
මෝසෙස් වනාහි දෙවියන්වහන්සේ 3
වෙතට නැගී ගියේය, ස්වාමීන්වහන්සේ
කන්දේ සිට ඔහුට හඬගසා: නුඹ මෙසේ
යාකොබ්ගේ වංශයට කියා ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට දන්වාපන්න: මා විසින් 4
මිසරවරුන්ට කළ දෙයද නුඹලා
රාජාලීන්ගේ පියාපත් පිට උසුලා මා
වෙතට ගෙනා බවද නුඹලා දුටුවහුය.
දැනුදු නුඹලා සැබවින් මාගේ හඬට 5
කීකරුව මාගේ ගිවිසුම රක්ෂා කරන්න-
හුනම් සියලු සෙනඟ අතරෙන් නුඹලා
මට අසහාය වස්තුවක් වන්නාහුය.
මක්නිසාද මුළු පොළොව මාගේය.
නුඹලා මට පූජක රාජ්‍යයක් සහ ශුද්ධ 6
ජාතියක් වන්නාහුය. නුඹ විසින් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කිය යුතු වචන මේයයි
කීසේක. මෝසෙස් අවුත් සෙනඟගේ 7

ප්‍රධානීන් කැඳවා ස්වාමීන්වහන්සේ
තමාට අණකළ මේ සියලු වචන
8 ඔවුන් ඉදිරියෙහි තැබුවේය. එවිට මුළු
සෙනඟ එක්ව උත්තරදෙමින්: ස්වාමීන්-
වහන්සේ කී සියල්ලම කරන්නෙමුයයි
කීවෝය. මෝසෙස් සෙනඟගේ වචන
ස්වාමීන්වහන්සේට සැලකෙළේය.
9 ස්වාමීන්වහන්සේද: බලව, මා නුඹ
සමග කථාකරන කල සෙනඟ අසන
පිණිසත් සැම කල්හිම නුඹ කෙරෙහිද
විශ්වාසකරන පිණිසත් ඝන වලාකුළකින්
නුඹ වෙතට එමියි මෝසෙස්ට කීසේක.
මෝසෙස් සෙනඟගේ වචන ස්වාමීන්-
10 වහන්සේට දැන්නුවේය. ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට කථාකොට: නුඹ සෙනඟ
ළඟට ගොස් අදත් හෙටත් ඔවුන්
පවිත්‍රකරව, ඔව්හු තමුන්ගේ ඇඳුම්
අපුල්ලා තුන්වෙනි දවසට සැදී සිටින්වා,
11 මක්නිසාද තුන්වෙනි දවසේදී ස්වාමීන්-
වහන්සේ මුළු සෙනඟගේ ඇස් හමු-
යෙහි සීනයි කන්ද පිටට බසිනසේක.
12 නුඹ සෙනඟට හාත්පසින් සීමා තබා:
නුඹලා කන්දට නොනගින හැටියටත්
එහි අද්දර ස්පර්ශනොවන හැටියටත්
බලාගනිල්ලායයි කියාපන්න. කන්දේ
හැපෙන කවරෙක් නුමුත් සැබවින් මරනු
13 ලබන්නේය. කිසි අතක් ඔහුට ස්පර්ශ
නොවන්නේය, ඔහු සැබවින් ගල්-
ගසනු ලබන්නේය, නොහොත් විදදමනු
ලබන්නේය; මෘගයෙක් වුවත් මනුෂ්‍යයෙක්
වුවත් ජීවත් නොවන්නේය. හොරණෑව
බොහෝ වේලා ශබ්දකරන කල්හි ඔව්හු
14 කන්දට පැමිණෙන්වයි කීසේක. මෝසෙස්
කන්දෙන් සෙනඟ ළඟට බැස අවුත්
ඔවුන් පවිත්‍රකෙළේය; ඔව්හු තමුන්ගේ
15 වස්ත්‍ර අපුල්ලාගත්තෝය. ඔහුද: තුන්වෙනි
දවසට සැදී සිටපල්ලා. ස්ත්‍රියෙකු කරා
නොපැමිණෙල්ලායයි සෙනඟට කීය.
16 තුන්වෙනි දින උදය වූ කල ගිගිරුම්ද
විදුලිද කන්ද පිට ඝන වලාකුළක්ද
ඉතා තද හොරණෑ ශබ්දයක්ද විය;
එවිට කඳවුරෙහි සිටිය මුළු සෙනඟ
17 වෙවුලුවෝය. දෙවියන්වහන්සේට අභිමුඛ-
වන පිණිස මෝසෙස් සෙනඟ කඳවුරෙන්
පිටතට ගෙනායේය; ඔව්හුද කන්ද පහළ
සිටියෝය. ස්වාමීන්වහන්සේ සීනයි 18
කන්ද පිටට ගින්නෙන් බැස්ස බැවින්
ඒක මුළුල්ල ධූමයෙන් වැසී තිබුණේය.
එහි ධූමය උදුනක ධූමය මෙන්
නැගුණේය, මුළු කන්ද බොහෝසෙයින්
කම්පාවිය. හොරණෑ ශබ්දය වැඩි වැඩිව 19
පැවතුණු විට මෝසෙස් කථාකෙළේය,
දෙවියන්වහන්සේ ශබ්දයකින් ඔහුට
උත්තරදුන්සේක. ස්වාමීන්වහන්සේ 20
සීනයි කඳු මුදුනට බැස අවුත් කඳු
මුදුනට මෝසෙස් කැඳවූසේක; මෝ-
සෙස්ද නැගී ගියේය. ස්වාමීන්වහන්සේ 21
මෝසෙස්ට කථාකොට: බැස යව,
බලන පිණිස සෙනඟ ස්වාමීන්වහන්සේ
වෙතට සීමා බිඳගන අවුත් ඔවුන්ගෙන්
බොහෝදෙනෙක් නොනස්නා පිණිස
සීමාව ඉක්මවා නොයනලෙස ඔවුන්ට
අණකරව. ස්වාමීන්වහන්සේ ළඟට එන 22
පූජකයෝද ස්වාමීන්වහන්සේ ඔවුන්ට
පහර නොදෙන පිණිස තමන්ම පවිත්‍ර-
කරගනිත්වයි කීසේක. මෝසෙස්ද: 23
සෙනඟ සීනයි කන්දට නැගෙන්ට
නොහැකි වෙති. මක්නිසාද: කන්ද
වටකර සීමා තබා ඒක කැපකරවයි
කියා ඔබ අපට අණකළසේකැයි
ස්වාමීන්වහන්සේට කීවේය. ස්වාමීන්- 24
වහන්සේද: පලයන්න, පහළ බැසපන්න;
නුඹද නුඹ සමග ආරොන්ද නැගී
වරෙල්ලා. නුමුත් ස්වාමීන්වහන්සේ
ඇවිත් පහරනොදෙන පිණිස පූජකයෝද
සෙනඟද උන්වහන්සේ වෙතට නැග එන්ට
සීමාව බිඳගන නොයෙත්වයි ඔහුට කී-
සේක. එවිට මෝසෙස් සෙනඟ ළඟට 25
බැස ඔවුන්ට එසේ කීවේය.

## ආඥා දශය

20 දෙවියන්වහන්සේ කථාකොට
මේ සියලු වචන වදරනසේක්:
මම වනාහි වහල්කමේ ගෙයින් එනම් 2
මිසර දේශයෙන් නා පිටතට
ගෙනාවාවූ නාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේය.

3 මා ඇර අන් දෙවිවරුන් තට ඇතුව
නොසිටුව.
4 කැපූ රූපයක් හෝ උඩ අහසෙහිවත්
පාත පොළොවෙහිවත් පොළොවෙන්
යට ජලයෙහිවත් තිබෙන කිසිම දෙයක
සමානත්වයක් හෝ තට සාදනොගනුව.
5 ඊට නමස්කාර නොකරව, සේවය නො-
කරව. මක්නිසාද තාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** වන මම *අන්‍ය භක්ති
නොඉවසන්නාවූ, මට වෛරවෙන්-
නන්ගේ තුන්වෙනි සතරවෙනි පරම්පරාව
කෙරෙහි පියවරුන්ගේ අධර්ෂ්ඨකම
6 ගැන දරුවන්ට ප්‍රතිඵල දෙන්නාවූ, මට
ප්‍රේමකරමින් මාගේ ආඥා පවත්-
වන්නවුන්ගෙන් පැවතෙන දහස් ගණන්
පරම්පරා දක්වා දයාව පෙන්වන්නාවූ
දෙවිකෙනෙක්ය.
7 තාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
නාමය †නිකරුණේ ව්‍යවහාරනොකරව;
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** තමන්
නාමය නිකරුණේ ව්‍යවහාර කරන
තැනැත්තා නිවැරදිකාරයෙකුකොට
ගණන් නොගන්නාසේක.
8 සබත් දවස ශුද්ධකොට පවත්වන්ට
9 සිහිකරගනුව. සදවසක් වැඩකරමින්
තාගේ සියලු වැඩ කර්මාන්ත කරගනුව.
10 එහෙත් සත්වෙනි දවස තාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** පවත්වන සබතක්ය.
ඒ දවසේ තෝවත් තාගේ පුත්‍රයාවත්
තාගේ දුවවත් තාගේ වැඩකාරයාවත්
තාගේ වැඩකාරීවත් තාගේ සිව්පාවෝවත්
තාගේ දොරටු ඇතුළත සිටින ආගන්තු-
11 කයාවත් කිසි වැඩක් නොකරව. කුමක්
හෙයින්ද **ස්වාමීන්වහන්සේ** අහසත්
පොළොවත් මුහුදත් එහි ඇත්තාවූ
සියල්ලත් සදවසින් සාද සත්වෙනි
දවසෙහි නිවාඩුගත්සේක. එහෙයින්
**ස්වාමීන්වහන්සේ** සබත් දවසට
ආශීර්වාදකොට එය විශුද්ධකළසේක.

*හෙවත්, ස්වකීය ගෞරවය රක්ෂා කරන්නාවූ.
†හෙවත්, බොරුවට.

තාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තට 12
දෙන දේශයෙහි තාගේ දවස් බොහෝ
වන පිණිස තාගේ පියාටත් තාගේ
මවුටත් ගෞරවකරව.
මිනීනොමරව. 13
කාමමිථ්‍යාචාරය නොකරව. 14
සොරකම් නොකරව. 15
තාගේ අසල්වාසියාට විරුද්ධව බොරු 16
සාක්ෂි නොකියව.
තාගේ අසල්වාසියාගේ ගෙට ආශා 17
නොවව, තාගේ අසල්වාසියාගේ
භාර්යාවටවත් ඔහුගේ වැඩකරුවා-
ටවත් ඔහුගේ වැඩකාරීටවත් ඔහුගේ
ගවයාටවත් ඔහුගේ කොටළුවාටවත්
තාගේ අසල්වාසියාගේ කිසි දෙයකටවත්
ආශා නොවවයි කීසේක.
මුළු සෙනඟ ගිගුරුම්ද විදුලිද හොරණෑ 18
ශබ්දයද කන්දෙන් දුම් නැඟීමද දුටුවෝය.
සෙනඟ ඒ දැක වෙව්ලමින් දුරින් සිට,
මෝසෙස්ට කථාකොට: ඔබ අප සමග 19
කථාකළ මැනවි, අපි අසන්නෙමුව.
දෙවියන්වහන්සේ අප සමග කථා-
නොකරනසේක්වා, කථාකළොත් අප
නසිනවා ඇතැයි කීවෝය. මෝසෙස්ද: 20
භය නොවෙල්ලා. තුඹලා සෝදිසිකරන
පිණිසද තුඹලා උන්වහන්සේ කෙරෙහි
භය ඇතුව සිට පව්නොකරන පිණිසද
දෙවියන්වහන්සේ ආසේකැයි සෙනඟට
කීය. සෙනඟ එසේ දුරින් සිටියෝය, 21
මෝසෙස්ද දෙවියන්වහන්සේ සිටි
ඝනාන්ධකාරය ළඟට පැමුණුණේය.

## ගිවිසුමේ පොත*

## ප්‍රසිද්ධ නමස්කාරය

**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 22
කොට: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෙසේ
කියාපන්න: අහසේ සිට මා තුඹලා
සමග කථාකළ බව තුඹලාම දුටුවහුය.
මා ඇර අන් දෙවිවරුන් සාදනොගනිව්; 23
රිදීයෙන් දෙවිවරුන්වත් රනින් දෙවි-
වරුන්වත් සාදනොගනිව්. පස්වලින් 24
පූජාසනයක් මට සාද තුඹේ දවන පූජාද

*පරිච්: 24. 7 බලනු.

තුඹේ ශාන්ති පූජාද තුඹේ බැටළුවන්ද
තුඹේ ගවයින්ද එහි පූජාකරව. මා
විසින් මාගේ නාමය සඳහන් කරන
සියලු තැන්වලදී තුඹ වෙතට අවුත්
25 තුඹට ආශීර්වාදකරන්නෙමි. ගල්වලින්
මට පූජාසනයක් සාදන්නෙහි නම්
කැපූ ගල්වලින් ඒක ගොඩනොනගව.
මක්නිසාද තුඹේ ආවුදය ඒ පිට
එසෙවුවෙහි නම් ඒක අපවිත්‍ර කෙළෙහිය.
26 තුඹේ නග්නභාවය නොපෙනෙන පිණිස
මාගේ පූජාසනයට පඩිවලින් නො-
නැගෙවයි කීසේක.

## හෙබ්‍රෙව් වහල්ලු

21 තුඹ විසින් ඔවුන් ඉදිරියෙහි
තැබිය යුතු නියමවල් මේවාය.
2 තුඹ හෙබ්‍රෙව් වැඩකාරයෙකු මිලේට
ගන්නෙහි නම් ඔහු අවුරුදු හයක්
වැඩකොට සත්වෙනි අවුරුද්දේ නිකමට
3 නිදහස්ව යන්නේය. ඔහු පමණක් ආයේ
නම් ඔහු පමණක් නිදහස්ව යන්නේය.
විවාහවූ අයෙක්නම් ඔහුගේ භාර්යාව
4 ඔහු සමග යන්නීය. ඔහුගේ ස්වාමියා
ඔහුට භාර්යාවක් දුන්නේනම්, ඈ ඔහු
නිසා පුත්‍රයන් හෝ දූවරුන් හෝ
වැදුවානම්, ඒ ස්ත්‍රියද ඇගේ දරුවෝද
ස්වාමියා සන්තකය, ඔහු පමණක්
5 නිදහස්ව යන්නේය. එහෙත් ඒ වැඩ-
කාරයා: මාගේ ස්වාමියාටද මාගේ
භාර්යාවටද මාගේ දරුවන්ටද ආදරේ
ඇත්තෙමි; නිදහස්ව නොයන්නෙමියි
6 ඇත්තටම කියාසිටියොත්, ඔහුගේ
ස්වාමියා ඔහු දෙවියන්වහන්සේ
ඉදිරියට කැඳවා දෙර ළඟට නොහොත්
උළුවහු කණුව ළඟට ගෙන ගොස් විදින
කටුවකින් ඔහුගේ කන සිදුරු කළ
යුතුය; ඔහුද සැමකල්හිම ඔහුට
වැඩකරන්නේය.
7 මනුෂ්‍යයෙක් තමාගේ දුව දසියෙකු-
කොට වික්කොත් වැඩකාරයන්
නිදහස්ව යන්නාක්මෙන් ඈ නො-
8 යන්නීය. ඈට විවාහ බස් දුන් ඇගේ
ස්වාමියා ඈ කෙරෙහි ප්‍රසන්න නැත්නම්
ඔහු ඈ මුදන්ට ඉඩදේවා, ඔහු ඈට
රැවටිල්ලෙන් ක්‍රියා කළ බැවින් අන්
සෙනඟකට ඈ විකුණන්ට ඔහුට කිසි
බලයක් නැත. ඔහු තමාගේ පුත්‍රයාට 9
ඈ ගැන විවාහ බස් දුන්නොත්
දූවරුන්ගේ නියමයේ හැටියට ඈට
ක්‍රියාකරන්නේය. ඔහු වෙන තැනැත්- 10
තියක් සරණපාවා ගත්තොත් ඔහු ඇගේ
කෑමද ඇඳීමද විවාහයේ යුතුකමද
අඩුනොකරන්නේය. ඈට මේ කාරණා 11
තුන ඉෂ්ට නොකළොත් මිල නොදී
නිකම් අහක්වයන්ට ඈට පුළුවන.

## ශරීරයට කරන අනතුරු

මනුෂ්‍යයෙකුට මැරෙන ලෙස පහර 12
දෙන තැනැත්තේ ඒකාන්තයෙන්
මරනු ලබන්නේය. නුමුත් මනුෂ්‍යයෙක් 13
රැක නොසිටිද්දී ඔහු අතට අසුවෙන්ට
දෙවියන්වහන්සේ ඉඩ ඇරියොත් ඔහු
විසින් පලායන පිණිස තැනක් තුඹට
නියම කරන්නෙමි. නුමුත් මනුෂ්‍යයෙක් 14
අදහස්කරලාම තම අසල්වාසියා කරා
අවුත් ඔහු ප්‍රයෝගයෙන් මැරුවොත්
ඔහු මරනු ලබන පිණිස මාගේ
පූජාසනය වෙතින් වුවත් ඔහු අහක්කර
ගනින්න.
තමාගේ පියාටවත් මවුටවත් පහර 15
දෙන තැනැත්තා සැබවින් මරනු ලැබිය
යුතුය.
මනුෂ්‍යයෙකු සොරකම්කොට විකු- 16
ණන්නාවූ නොහොත් තමා සමග තබා
ගන්නාවූ තැනැත්තා සැබවින් මරනු
ලැබිය යුතුය.
තමාගේ පියාට හෝ මවුට හෝ ශාප 17
කරන තැනැත්තා සැබවින් මරනු
ලැබිය යුතුය.
මනුෂ්‍යයන් ඩබරකොට එක්කෙනෙක් 18
අනික් අයට ගලකින් හෝ මිටින් හෝ
පහරදුන් විට ඔහු නොනැසී ඔත්පළම
සිට දෙවනු නැගිට ඔහුගේ සැරයටි 19
වාරුවෙන් පිටත ඇවිද්දෙත් ඔහුට
පහරදුන් තැනැත්තේ නිදහස් වන්නේය.
නුමුත් ඔහු විසින් ඒ මනුෂ්‍යයා නිකම්
සිටි කාලයට පමණක් ගෙවා ඔහු

සම්පූර්ණයෙන් සුවකරනු ලබන්ට
සැලැස්විය යුතුය.
20 මනුෂ්‍යයෙක් තමාගේ වැඩකාරයාට
හෝ වැඩකාරීට හෝ සැරයටියකින්
ගසා එයින් ඒ අය මෙළේ නම්, ගැසූ අය
21 සැබවින් දඬුවම් ලැබිය යුතුය. එසේවී
නුමුත් ඔහු දවසක් හෝ දෙදවසක්
හෝ නොමැරී සිටියොත් ඔහු දඬුවම්
නොලබන්නේය. මක්නිසාද ඒ තැනැත්තා
ඔහුගේ වස්තුවය.
22 මනුෂ්‍යයන් ඩබරකරන කොට
ගර්භිණියක් ගස්සාවන ලෙස යමෙක්
ඈට ගැසුවොත්, අනතුරක් සිදුනූණත්,
ඇගේ පුරුෂයා නියමකරන හැටියට
සැබවින් ඔහු දඩගසනු ලැබ විනිශ්චය-
කාරයන් විසින් නියමකරන ලෙස
23 ගෙවිය යුතුය. නුමුත් යම් අනතුරක්
24 සිදුවුණොත්, ප්‍රාණයට ප්‍රාණයත් ඇසට
ඇසත් දතට දතත් අතට අතත් පයට
25 පයත් දැවීමට දැවීමත් තුවාලයට
තුවාලයත් පහරට පහරත් දිය යුතුය.
26 මනුෂ්‍යයෙක් තමාගේ වැඩකාරයාගේ
ඇසට හෝ වැඩකාරීගේ ඇසට හෝ
පහරදී එය නැතිකළොත් ඔහුගේ ඇස
නිසා ඔහු නිදහස්කර හැරිය යුතුය.
27 ඔහු තමාගේ වැඩකාරයාගේ දත හෝ
වැඩකාරීගේ දත හෝ ඉගිලෙන්ට
ගැසුවොත් ඒ අයගේ දත නිසා ඔහු
නිදහස් කර හැරිය යුතුය.
28 ගවයෙක් පුරුෂයෙකුට හෝ ස්ත්‍රියකට
හෝ මැරෙන ලෙස ඇන්නොත් ගවයා
සැබවින් ගල්ගසා මැරිය යුතුය, උගේ
මස් නොකෑ යුතුය; එහෙත් ගව හිමියා
29 නිදෙස්ය. නුමුත් ගවයා ඉස්සර සිට
අනින බව ඌ අයිතිකාරයාට දන්වනු
ලැබ තිබියදීත් ඌ ප්‍රවේසම්කර නො-
තැබීම නිසා ඌ පුරුෂයෙකු හෝ
ස්ත්‍රියෙකු හෝ මැරුවොත් ගවයා ගල්
ගසා මැරිය යුතුය, උගේ අයිතිකාරයාද
30 මරනු ලැබිය යුතුය. ඔහුට දඩයක්
නියමකරන ලද්දේ වීනම් ඔහුට නියම
කරන සියල්ලේ හැටියට ඔහු තමාගේ
ප්‍රාණය මුදා ගැනීම පිණිස දිය යුතුය.
31 ඌ පුත්‍රයෙකුට ඇන්නත් දුවකට ඇන්නත්
මේ විනිශ්චය ලෙස ඔහුට කළ
යුතුය. ගවයා වැඩකාරයෙකුට හෝ 32
වැඩකාරියකට හෝ ඇන්නොත් ඔවුන්ගේ
ස්වාමියාට ඔහු රිදී ෂෙකෙල් තිහක්
දිය යුතුය, ගවයාද ගල් ගසා මැරිය
යුතුය.

## දේපළ

මනුෂ්‍යයෙක් වළක වැස්ම හැර තැබූ 33
කල නොහොත් වළක් හාරා ඒක
නොවසා තැබූ කල ගවයෙක් හෝ
කොටළුවෙක් හෝ එහි වැටුණොත්, වළ 34
අයිතිකාරයා උගේ අලාභය ගෙවා
උන්ගේ අයිතිකාරයාට මිල දිය යුතුය,
මළ සතා ඔහුට වන්නේය.
යම් මනුෂ්‍යයෙකුගේ ගොනෙක් වෙන 35
කෙනෙකුගේ ගොනෙකුට මැරෙන තරම්
තුවාල කළොත් ඔව්හු ජීවත්ව සිටින
ගවයා විකුණා ඒ මිල බෙදාගනිත්වා,
මළ ගොනාද බෙදාගනිත්වා. නොහොත් 36
ඒ ගවයා ඉස්සර සිට අනින බව උගේ
අයිතිකාරයා දැනගන ඌ ප්‍රවේසම්කර
නොතැබුවේ නම් ඔහු විසින් ගවයා
වෙනුවට ගවයෙක් දිය යුතුය, මළ සතාද
ඔහුට වන්නේය.
22 මනුෂ්‍යයෙක් ගොනෙකු හෝ
බැටළුවෙකු හෝ සොරකම්
කොට මැරුවොත් නොහොත්
වික්කොත් ගවයෙකුට ගවයන්
පස්දෙනෙක්ද බැටළුවෙකුට බැටළුවන්
සතර දෙනෙක්ද දිය යුතුය. උමං කණින 2
අතර සොරා අසුවී පහර ලැබීමෙන්
මළොත් ඔහු ගැන මිනීමැරීමේ වරදක්
නොවන්නේය. නුමුත් ඉර උදාවී තිබේ 3
නම් ඔහු ගැන මිනීමැරීමේ වරද වන්නේය.
සොරා විසින් අලාභය ගෙවිය යුතුය;
ඔහුට කිසිවක් නැත්නම් සොරකම්කළ
දේවල් ගැන ඔහු විකුණනු ලැබිය
යුතුය. සොරාගත් දේ ගවයෙකු හෝ 4
කොටළුවෙකු හෝ බැටළුවෙකු හෝ
පණපිටින් ඔහු අත සම්බවුණොත් ඔහු
දෙගුණයක් ගෙවිය යුතුය.
මනුෂ්‍යයෙක් තමාගේ මෑගයා වෙන 5
කෙනෙකුගේ කෙතෙහි කැවුවොත්, ඌ

ලිහාඅරිනු ලැබ කෙතක හෝ මිදි
වත්තක හෝ කෑවොත්, තමාගේම
කෙතේද මිදිවත්තේද හොඳ කොටසෙන්
ඔහු විසින් අලාභය ගෙවිය යුතුය.
6 ගිනි ඇවිළ කටුගස්වලට අල්ලා එයින්
ගොයම් කොළ හෝ නොකැපූ ගොයම්
හෝ කෙත හෝ ද ගියොත් ගිනි ඇවුළු
තැනැත්තා විසින් සැබවින්ම අලාභය
ගෙවිය යුතුය.
7 මනුෂ්‍යයෙක් මුදල් හෝ බඩු හෝ
ප්‍රවේසම් කරන පිණිස තමාගේ අසල්-
වාසියාට භාරදුන් කල්හි ඒ මනුෂ්‍යයා-
ගේ ගෙයින් ඒවා සොරකම් කරනු
ලැබුවොත් සොරාද අසුවුණොත් ඔහු
8 දෙගුණයක් ගෙවිය යුතුය. සොරා
අසුනුණොත් ගෙයි ස්වාමියා තම
අසල්වාසියාගේ බඩුවලට අත නො-
පෙවුවාදැයි බලන පිණිස ඔහු දෙවියන්-
9 වහන්සේ වෙතට පැමිණේවා. සියලු
අපරාධ කාරණා ගැන එනම් ගොනෙකු
ගැන හෝ කොටළුවෙකු ගැන හෝ
බැටළුවෙකු ගැන හෝ වස්ත්‍රයක් ගැන
හෝ නැතිවූ කොයි ප්‍රකාර දෙයක් ගැන
හෝ මේ ඒකයයි යමෙක් කීවොත්
දෙපක්ෂයේ කාරණය දෙවියන්වහන්සේ
වෙතට පැමිණේවා; දෙවියන්වහන්සේ
විසින් වරදට පත්කරන තැනැත්තා
තමාගේ අසල්වාසියාට දෙගුණයක් දිය
යුතුය.
10 මනුෂ්‍යයෙක් තමාගේ අසල්වාසියාට
කොටළුවෙකු හෝ ගොනෙකු හෝ
බැටළුවෙකු හෝ වෙන යම් මෘගයෙකු
හෝ ප්‍රවේසම්කිරීමට භාරදුන් කල්හි
කිසිවෙකුට නොපෙනී ඌ මළොත්
නොහොත් තුවාලකරනු ලැබුවොත්
නොහොත් පන්නා අල්ලාගනු
11 ලැබුවොත්, ඔහු තමාගේ අසල්-
වාසියාගේ දෙයට අත නොතැබූ බවට
ඔවුන් දෙදෙනා අතරේ ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි දිවිරීමක් වේවා;
උගේ අයිතිකාරයා එය පිළිගන්නේය,
අනික් අය ඊට අලාභය ගෙවන්ට
12 ඕනෑ නැත. එහෙත් ඌ ඔහු කෙරෙන්
සොරකම් කරනු ලැබුවොත් ඌ වෙනුවට
අයිතිකාරයාට අලාභය ගෙවිය යුතුය.
ඌ ඉරාදමනු ලැබීනම් සාක්ෂි පිණිස 13
ඒකා ගෙනේවා; ඉරනු ලැබුවාට
අලාභය ගෙවන්ට ඕනෑ නැත.
මනුෂ්‍යයෙක් තමාගේ අසල්- 14
වාසියාගෙන් සතෙකු ඉල්ලාගෙන,
අයිතිකාරයා ළඟ නැති කල ඒකාට
තුවාල වුණොත්, නොහොත් ඌ මළොත්,
ඔහු සැබවින්ම අලාභය ගෙවිය යුතුය.
උගේ අයිතිකාරයා ළඟ සිටියොත් 15
එලෙස ගෙවන්ට ඕනෑ නැත. ඌ කුලියට
ගත් එකෙක් නම් ඌ උගේ කුලියට
ආයේය.

## සිරිත් වාරිත්‍ර සහ චරිතය සම්බන්ධ වරද

මනුෂ්‍යයෙක් විවාහ බස් නුදුන්නාවූ 16
කන්‍යාවක් පොළඹවාගෙන ඈ සමග
සයනයකළොත් ඈ තමාගේ භාර්යාව
වන පිණිස ඔහු සැබවින්ම දයාදයක්
දිය යුතුය. ඈගේ පියා ඈ ඔහුට 17
දෙන්ට කොහෙත්ම කැමතිනූණොත්
ඔහු කන්‍යාවන්ගේ දයාද ලෙස මුදල්
ගෙවිය යුතුය.
මායාකාරියෙකුට ජීවත්වන්ට ඉඩ 18
නොහරින්න.
මෘගයෙකු සමග සංවාසයකරන 19
කවරෙක් නමුත් සැබවින් මරනු ලැබිය
යුතුය,
ස්වාමීන්වහන්සේ ඇර වෙන 20
දෙවියෙකුට පූජාකරන තැනැත්තා සිඳ
දමනු ලැබිය යුතුය. විදේශියෙකුට 21
අයුත්තක් හෝ පීඩාවක් නොකරන්න.
මක්නිසාද නුඹලා මිසර දේශයෙහි
විදේශියෝව සිටියහුය. කිසි කණවැන්- 22
දුම්යෙකුටවත් පියා නැති දරුවෙකුටවත්
හිංසා නොකරන්න. නුඹ යම් ආකාරයකින් 23
ඔවුන්ට හිංසාකළොත් ඔවුන් මට හඬ-
ගැසුවාම මම සැබවින්ම ඔවුන්ගේ
හඬ අසන්නෙමි; එවිට මාගේ උදහස 24
ඇවිළෙනවා ඇත, මමද කඩුවෙන්
නුඹලා මරාදමන්නෙමි; මෙසේ

නුඹලාගේ භාර්යාවෝ කණවැන්-
දුම්යෝද නුඹලාගේ දරුවෝ පියා
නැත්තෝද වන්නෝය.
25 නුඹ ළඟ සිටින මාගේ සෙනඟ
අතරෙන් දුප්පත් කිසිවෙකුට නුඹ මුදල්
ණයට දුන්නොත් නුඹ ඔහුට ණය
හිමියෙක් මෙන් වෙන්ටවත් නුඹලා
ඔහුගෙන් පොළී ගන්ටවත් යුතු නැත.
26 නුඹේ අසල්වාසියාගේ වස්ත්‍රය කො-
හෙත්ම උකස්කොට ගත්තෙහිනම් ඉර
බහින විට නුඹ ඒක නැවත ඔහුට
27 දියයුතුය. මක්නිසාද ඒක ඔහුගේ එකම
වැස්මය, ඒක ඔහුගේ ඇඟේ වස්ත්‍රයය.
ඔහු නිදන විට පෙරවාගන්නේ කුමක්ද?
තවද ඔහු මට හඬගසන විට ඇහුම්-
කන්දෙන්නෙමි; මක්නිසාද මම කරුණා-
හරිතය.
28 දෙවියන්වහන්සේට දෙස් නොකියව,
නුඹේ සෙනඟගේ අධිපතියෙකුට ශාප
29 නොකරව. නුඹේ භෝගවලින්ද පාන
වර්ගවලින්ද පූජාකිරීමට ප්‍රමාද නොවව.
නුඹේ පුත්‍රයන්ගේ කුලුඳුලා මට දිය
30 යුතුය. නුඹේ ගවයින් සහ බැටළුවන්
ගැනද එසේම කළ යුතුය. උං සත්
දවසක් මවු ළඟ සිටීවා; අටවෙනි දින
31 උං මට දිය යුතුය. නුඹලා මට ශුද්ධ
මනුෂ්‍යයෝ වන්නෝය. එබැවින්
කෙතෙහි මෘගයන් විසින් ඉරූ සතෙකුගේ
මාංස නොකෑ යුතුය; ඒවා බල්ලන්ට
දැමිය යුතුය.

**23** බොරු ප්‍රවෘත්තියක් පතළ
නොකරන්න. අධර්මිෂ්ඨ සාක්ෂි-
කාරයෙකු වීමට දුෂ්ටයෙකුට නුඹේ
2 අත නොදෙන්න. නපුරක් කිරීමට
සමූහයක් අනුව නොයන්න; විනිශ්චය
පෙරළන පිණිස කාරණයකදී
සමූහයකට පක්ෂව සාක්ෂි නොදෙන්න.
3 දිළිඳෙකුටත් ඔහුගේ නඩුවේදී පක්ෂ-
නොවන්න.
4 නුඹේ සතුරාගේ ගොනා හෝ ඔහුගේ
කොටළුවා හෝ මුළාව යනවා
සම්බවුණොත් නුඹ ඒකා ඔහු කරා
5 නැවත ගෙනයා යුතුමය. නුඹට වෛර
කරන්නාගේ කොටළුවා බර සමග වැටී
ඉන්නවා දුටුවොත් ඔහුට උපකාර
කිරීමෙන් වැලකෙන්ට සිතුණත් උං
මුදන්ට නුඹ ඔහුට උදව්විය යුතුමය.
නුඹේ දිළිඳු අයෙකුගේ නඩුවේදී ඔහුගේ 6
විනිශ්චය නොපෙරළන්න. බොරු 7
කාරණයකින් දුරුව සිටින්න; නිදොස්වූ
ධර්මිෂ්ඨවූ තැනැත්තා නොමරන්න.
මක්නිසාද මම දුෂ්ටයා ධර්මිෂ්ඨ
නොකරන්නෙමි. අල්ලස් නොගනින්න. 8
මක්නිසාද අල්ලස ඇස් පෙනීම ඇත්තන්
අන්ධකරයි, ධර්මිෂ්ඨයාගේ වචන
පෙරළයි. විදේශියෙකුට පීඩානො- 9
කරන්න. මක්නිසාද නුඹලා මීසර
දේශයෙහි විදේශීව සිටි බැවින්
විදේශියාගේ සිත දන්නහුය.
නුඹේ බිම් සාවුරුද්දක් වපුරා 10
එහි අස්වැන්න රැස්කරගනින්න. එහෙත් 11
සත්වෙනි අවුරුද්දේ නුඹේ සෙනඟගේ
දිළිඳුන් එයින් කන පිණිස ඒක
නොවපුරා නිකම් තිබෙන්ට හැරපන්න.
ඔවුන් ඉතිරිකරන දෙය කෙතේ මෘගයෝ
කත්වා. නුඹේ මිදිවත්ත සහ ඔලීව
වත්ත ගැනත් එසේම කරපන්න.
සදවසක් නුඹේ වැඩ කරගනින්න, එහෙත් 12
නුඹේ ගවයාට සහ නුඹේ කොටළුවාට
නිවාඩු ලැබෙන පිණිසද නුඹේ
වැඩකාරීගේ පුත්‍රයා සහ විදේශියාත්
පහදු ලබන පිණිසද සත්වෙනි දවසේ
නිවාඩු ගනින්න. මා විසින් නුඹලාට 13
කී සියලු කාරණා ගැන සිතටගනිල්ලා.
අන් දෙවිවරුන්ගේ නාම සඳහන්
නොකරල්ලා, ඒක නුඹලාගේ මුඛයෙන්
පිටවෙනවා අසන්ට නොලැබේවා.
අවුරුද්දට තුන් වරක් මට මංගල්‍යයක් 14
පවත්වාපන්න. මුහුන් නුමුසු රොටි 15
මංගල්‍යය පවත්වාපන්න. නුඹලා ආබීබ්
මාසයේදී මිසරයෙන් පිටතට ආ බැවින්
මා විසින් අණකළ ලෙස ඒ මාසයේ
නියම කාලයේදී සත් දවසක් මුහුන්
නුමුසු රොටි කාපන්න; කිසිවෙක් හිස්
අතින් මා ඉදිරියට නොපැමිණේවා.
නුඹ කෙතෙහි වපුරන බීජවල ප්‍රථම 16
ඵල ඔප්පුකිරීමට කපන කාලයේ

මංගල්‍යයද අවුරුද්ද අන්තිමේදී කෙතෙන්
තුඹේ අස්වැන්න රැස්කළ කල්හි රැස්
17 කිරීමේ මංගල්‍යයද පවත්වාපන්න. තුඹේ
සියලු පිරිමි අවුරුද්දකට තුන් වරක්
ස්වාමිවූ දෙවියන්වහන්සේ ඉදිරිපිට පෙනී
සිටිය යුතුය.
18 මාගේ පූජාවේ ලේ මුහුන් දමූ රොටි
සමග පූජා නොකරන්න; මාගේ
මංගල්‍යයේ තෙලද පසුවද උදය වන
තුරු රෑ මුළුල්ලේ නොතිබිය යුතුය.
19 තුඹේ භූමියේ ප්‍රථම ඵලවලින් පළමු
ඒවා තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ
ගෙට ගෙනෙන්න. එළුපැටවෙකු උගේ
මවුගේ කිරෙන් නොපිහන්න.

## අන්තිම අවවාද

20 බලව, මාර්ගයෙහි තුඹ ආරක්ෂා-
කරන පිණිසද මා විසින් පිළියෙළකළ
ස්ථානයට තුඹ පමුණුවන පිණිසද තුඹට
21 පෙරටුව දූතයෙකු යවමි. උන්වහන්සේ
ඉදිරියෙහි ප්‍රවේසම්වෙමින් උන්-
වහන්සේගේ හඬට කන්දීපල්ලා;
උන්වහන්සේ කෝප නොකරල්ලා.
මක්නිසාද උන්වහන්සේ තුඹලාගේ
අපරාධවලට කමා නොවනසේක;
මක්නිසාද මාගේ නාමය උන්වහන්සේ
22 තුළ ඇත්තේය. එහෙත් තුඹ සැබවින්
උන්වහන්සේගේ හඬට ඇහුම්කන්දී මා
කියන සියල්ල කළොත් මම තුඹේ
සතුරන්ට සතුරෙක්ද තුඹේ විරුද්ධ-
කාරයන්ට විරුද්ධකාරයෙක්ද වන්නෙමි.
23 මක්නිසාද මාගේ දූතයා තුඹට පෙරටුව
ගොස් අමෝරීවරුන්ද හිත්තීවරුන්ද
පෙරිස්සිවරුන්ද කානානිවරුන්ද හිවී-
වරුන්ද යෙබූසිවරුන්ද වෙතට තුඹ
පමුණුවනසේක. මමද ඔවුන් සිඳ-
24 දමන්නෙමි. තුඹ ඔවුන්ගේ දෙවිවරුන්ට
නමස්කාර නොකරන්න, ඔවුන්ට
මෙහෙනොකරන්න, ඔවුන්ගේ ක්‍රියාවල
හැටියට නොකරන්න. එසේ නොව ඔවුන්
මුළුමනින්ම පෙරළාදමා ඔවුන්ගේ
රූපස්තම්භ කැබලිකොට බිඳදමාපන්න.
25 තුඹලා තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට මෙහෙකරපල්ලා, උන්-
වහන්සේ තුඹේ භෝජනයටත් තුඹේ
වතුරටත් ආශීර්වාද කරනසේක; මම
තුඹ මධ්‍යයෙන් රෝග ඉවත්කරන්නෙමි.
තුඹේ දේශයෙහි කිසි ගස්සාවීමක්වත් 26
වඳව සිටීමක්වත් නොවන්නේය. මම
තුඹේ දවස් ගණනද සම්පූර්ණ-
කරන්නෙමි. මාගේ භයංකරකම 27
තුඹට පෙරටුව යවා තුඹ පැමිණෙන
තැන්වල මුළු සෙනඟ වියවුල්කොට
තුඹේ සියලු සතුරන් තුඹට පිටපාන්ට
සලස්වන්නෙමි. තුඹ ඉදිරියෙන් හිවී- 28
වරුන්ද කානානිවරුන්ද හිත්තී-
වරුන්ද පන්නන පිණිස තුඹට පෙරටුව
දෙබරුන් යවන්නෙමි. මම එක 29
අවුරුද්දකින් ඔවුන් තුඹ ඉදිරියෙන්
පන්නා නොදමන්නෙමි; එසේ කළොත්
දේශය පාළුවී වන මෘගයන් තුඹට
විරුද්ධව බෝවෙනවා ඇත. තුඹලා 30
වැඩිවී දේශය උරුමකරගන්න තෙක්
ඔවුන් ටිකෙන් ටික තුඹ ඉදිරියෙන්
පන්නාදමන්නෙමි. මම තුඹේ සීමාව 31
රතු මුහුද පටන් පිලිස්තිවරුන්ගේ මුහුද
දක්වාද වනාන්තරය පටන් ගංගාව
දක්වාද තබන්නෙමි. මක්නිසාද තුඹ
විසින් දේශයේ වැසියන් තුඹ ඉදිරියෙන්
පන්නාදමන පිණිස ඔවුන් තුඹේ අතට
පාවාදෙන්නෙමි. ඔවුන් සමගවත් 32
ඔවුන්ගේ දෙවිවරුන් සමගවත් ගිවිසුමක්
නොකරන්න. මට විරුද්ධව පව්කරන්ට 33
ඔවුන් තුඹ නොසලස්වන පිණිස ඔවුන්
තුඹේ දේශයෙහි වාසය කරන්ට ඔවුන්ට
ඉඩ නොදෙන්න. මක්නිසාද තුඹ
ඔවුන්ගේ දෙවිවරුන්ට මෙහෙකරන්නෙහි-
නම් සැබවින්ම ඒක තුඹට මලපතක්
වන්නේයයි කීසේක.

## ගිවිසුම ස්ථිරකිරීම

24 උන්වහන්සේ මෝසෙස්ට කියන-
සේක්: තුඹ සහ ආරොන්ද
නාදාබ්ද අබීහූද ඉශ්‍රායෙල්වරුන්ගේ
වැඩිමහල්ලන්ගෙන් හැත්තෑ දෙනෙක්ද
ස්වාමීන්වහන්සේ වෙතට කන්දට ඇවිත්

2 දුරින් සිට නමස්කාරකරපල්ලා. මෝ-
සෙස් පමණක් ස්වාමීන්වහන්සේ ළඟට
එන්නේය; තුමුන් ඔවුන් ළංනොවිය
යුතුය; සෙනඟ ඔහු සමග නොනැග්ග
3 යුතුයයි කීසේක. මෝසෙස් අවුත්
ස්වාමීන්වහන්සේගේ සියලු වචනද
විනිශ්චයයන්ද සෙනඟට කියා දුන්නේය.
මුළු සෙනඟ එක හඬින් උත්තරදෙමින්:
ස්වාමීන්වහන්සේ කී සියල්ල කරන්-
4 නෙමුයයි කීවෝය. මෝසෙස්ද
ස්වාමීන්වහන්සේගේ සියලු වචන
ලියා අලුයම නැඟිට කන්ද මුල පූජා-
සනයක් හා ඉශ්‍රායෙල්ගේ ගෝත්‍ර දොළසේ
ගණන ලෙස කණු දොළසක්ද ගොඩ-
5 නැගුවේය. ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන්
යෞවනයන් යැවීය, ඔව්හු ස්වාමීන්-
වහන්සේට දවන යාග සහ ශාන්ති
යාග කොට ගවයින් පූජාකළෝය.
6 මෝසෙස් ලෙයින් දෙකෙන් කොටසක්
ගෙන භාජනවල දමා ඉතිරි කොටස
7 පූජාසනය පිට ඉස්සේය. තවද ඔහු
ගිවිසුමේ පොත රැගෙන සෙනඟ
ඉදිරියෙහි කියෙවුවේය. ඔව්හුද:
ස්වාමීන්වහන්සේ කී සියල්ල කරමින්
8 කීකරුවන්නෙමුයයි කීවෝය. එවිට
මෝසෙස් ඒ ලේ රැගෙන සෙනඟට
ඉසිමින්: මේ සියලු වචන ගැන ස්වාමීන්-
වහන්සේ තුඹලා සමග කළාවූ ගිවිසුමේ
9 ලේ මේ යයි කීවේය. එකල මෝසෙස්ද
ආරොන්ද නාදබ්ද අබීහුද ඉශ්‍රායෙල්-
වරුන්ගේ වැඩිමහල්ලන්ගෙන් හැත්තෑ
10 දෙනෙක්ද නැගී ගොස්, ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේ දුටුවෝය; උන්-
වහන්සේගේ පාද යට නීලමාණික්‍ය
ආස්තරණයක් වැන්නක්ද දීප්තිමත්-
කමින් අහස්තලයම වැන්නක්ද වූයේය.
11 උන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
උත්තමයන් පිට අත නොහෙළූසේක,
ඔව්හු දෙවියන්වහන්සේ දැකලාත් කා
බී සිටියෝය.

## මෝසෙස් සීනයි කන්දට දෙවෙනි වර නැගීයාම

12 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කියන-
සේක්: මා ළඟට කන්දට නැගී ඇවිත්
මෙහි සිටපන්න. තුඹ ඔවුන්ට උගන්වන
පිණිස මා ලියූ ගල්ලෑලිද ව්‍යවස්ථාවද
ආඥාවද තුඹට දෙන්නෙමියි කීසේක.
මෝසෙස්ද ඔහුගේ සේවකවූ යෝෂුවාද 13
නැගිට ගියෝය. මෝසෙස් දෙවියන්-
වහන්සේගේ කන්දට නැගුණේය. ඔහු 14
වැඩිමහල්ලන්ට කථාකොට: අප තුඹලා
වෙතට නැවත එන තෙක් මෙහි
සිටපල්ලා. මෙන්න, ආරොන් සහ
හූර් තුඹලා සමග සිටිති. යමෙකුට
කාරණයක් ඇත්නම් ඔහු ඔවුන් වෙතට
පැමිණේවයි කීවේය. මෝසෙස් කන්දට 15
නැගී ගියේය, වලාකුළ කන්ද වසා-
ගත්තේය. ස්වාමීන්වහන්සේගේ තේජස 16
සීනයි කන්දේ පැවතුණේය, වලාකුළ
සදවසක් ඒක වසා සිටියාය. සත්වෙනි
දින උන්වහන්සේ වලාකුළ මැදින්
මෝසෙස්ට හඬගෑසූසේක. ස්වාමීන්- 17
වහන්සේගේ තේජසේ පෙනීම කන්ද
මුදුනේ ඇවිළී යන ගිනි මෙන් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ ඇස්වලට පෙනුණේය.
මෝසෙස් වලාකුළ මැදට ඇතුල්වී 18
කන්දට නැගුණේය. මෝසෙස් දවල්
සතළිසක්ද රෑ සතළිසක්ද කන්දේ
සිටියේය.

## මණ්ඩපය පිළිබඳ ආඥා පඬුරු දීම

25 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්: මට 2
පඬුරක් ගෙනෙන්ට ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කියාපන්න. තමාගේ සිත එළඹවන එක
එක අයගෙන් මාගේ පඬුර ගනිල්ලා.
ඔවුන්ගෙන් තුඹලා විසින් ගත යුතු 3
පඬුර නම්–රන්, රිදී, සහ පිත්තලද; නිල්, 4
රත්නිල්, රතු නූල්ද සිහින් හණ රෙදි
සහ එළු ලොම්ද; රතු සායම් පෙවූ බැටළු 5
හම්, තහෂ් හම් සහ ෂිටිම් ලීද; එළිය 6
පිණිස තෙල්, ආලේප තෛල සහ සුවඳ-
දුම් පූජාවට සුගන්ධ ද්‍රව්‍ය, ඒෆොද් 7
සහ ළයවැස්ම උදෙසා තඹමාණික්‍යද

8 බැඳීමට ගල්ද යන මේවාය. මා
ඔවුන් අතරේ වාසයකරන පිණිස ඔව්හු
9 මට ශුද්ධ ස්ථානයක් සාදන්වා. මා විසින්
තුඹට පෙන්වන සියල්ල ලෙස එනම්
මණ්ඩපයේ ආදර්ශයද එහි සියලු
බඩුවල ආදර්ශයද ලෙස එය සාදපල්ලා.

## ගිවිසුම් පෙට්ටිය

10 ඔව්හු ෂිටිම් ලීවලින් පෙට්ටියක්
සාදන්වා. ඒකේ දිග දෙරියන් හමාරක්ද
ඒකේ පළල එක්රියන් හමාරක්ද ඒකේ
උස එක්රියන් හමාරක්ද විය යුතුය.
11 තුඹ එය පවිත්‍ර රනින් වැසිය යුතුය,
ඇතුළත් පිටත් එසේ වසා වටකරින්
12 ඊට රන් ලීස්තරයක් සෑදිය යුතුය. තුඹ
ඒකට රන් වළලු සතරක් වාත්තුකොට
ඒකේ පාද සතරේ තැබිය යුතුය; එක
පැත්තකට වළලු දෙකක්ද අනික්
පැත්තට වළලු දෙකක්ද විය යුතුය.
13 ෂිටිම් ලීයෙන් පොලු සාද ඒවා රනින්
14 වසාපන්න. පෙට්ටිය ඔසවන පිණිස
පෙට්ටියේ පැතිවල තිබෙන වළලුවල ඒ
15 පොලු දමාපන්න. පොලු පෙට්ටියේ
වළලුවල වන්නේය. ඒවා එයින්
16 අහක්කරනු නොලබන්නේය. මා විසින්
තුඹට දෙන සාක්ෂිය පෙට්ටියෙහි
17 තබාපන්න. පවිත්‍ර රනින් කරුණා-
සනයක් සාදපන්න; ඒකේ දිග දෙරියන්
හමාරක්ද ඒකේ පළල එක්රියන්
18 හමාරක්ද විය යුතුය. රන් තළා
කෙරුබ්වරුන් දෙදෙනෙක් සාද
කරුණාසනයේ දෙකෙළවරෙහි පිහිටු-
19 වාපන්න. එක් කෙළවරක කෙරුබ-
යෙක්ද අනික් කෙළවර කෙරුබයෙක්ද
බැගින් සාදපන්න. තුඹලා කරුණාසනය
හා සම්බන්ධකොට දෙකෙළවර පිට
20 කෙරුබ්වරුන් සෑදිය යුතුය. කෙරුබ්-
වරුන්ගේ පියාපත්වලින් කරුණාසනය
වැසෙන හැටියට ඊට උඩින් පියාපත්
විහිදී ඔවුන්ගේ මුහුණු එකිනෙකා
දෙසට තිබේවා; කෙරුබ්වරුන්ගේ මුහුණු
කරුණාසනය දෙසට තිබේවා.
21 කරුණාසනය පෙට්ටිය පිට ඉහළින්
තබාපන්න; මා විසින් තුඹට දෙන
සාක්ෂිය පෙට්ටියෙහි තබාපන්න. මම 22
එහිදී තුඹට සම්මුඛව සාක්ෂි පෙට්ටිය
මතුයෙහි සිටින කෙරුබිම් දෙදෙනා
අතරේ කරුණාසනය උඩ සිට මා විසින්
තුඹ ලවා ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා
අණකරවන සියල්ල ගැන තුඹ සමග
කථාකරන්නෙමි.

## පිදීමේ රොටි තබන මේසය

ෂිටිම් ලීවලින් මේසයක්ද සාදපන්න. 23
ඒකේ දිග දෙරියනක්ද ඒකේ පළල
එක් රියනක්ද ඒකේ උස එක් රියන්
හමාරක්ද විය යුතුය. ඒක පවිත්‍ර රනින් 24
වසා වටකරින් ඊට රන් ලීස්තරයක්
සාදපන්න. වටකරින් ඊට අල්ලක 25
පළල ඇති පටියක්ද සාද ඒ පටිය
වටේ රන් ලීස්තරයක් සාදපන්න. ඊට 26
රන් වළලු සතරක් සාද එහි කකුල්
සතරේ කොන් සතරෙහි ඒ වළලු
දමාපන්න මේසය ගෙනයන පිණිස 27
පොලු තැබීමට ඒ වළලු පටිය ළඟම
තිබිය යුතුය. මේසය ගෙනයන පිණිස 28
ෂිටිම් ලීවලින් පොලු සාද ඒවා රනින්
වසාපන්න. ඒකේ තැටිද ඒකේ හැඳිද 29
ඒකේ කෙණ්ඩිද ඒකේ පාත්‍රාද ඒවායින්
වත්කරන පිණිස පවිත්‍ර රනින් සාදපන්න.
පිදීමේ රොටි මේසය පිට මා ඉදිරියෙහි 30
නිතරම තබාපන්න.

## රන් පහන් රුක

පවිත්‍ර රනින් පහන් රුකක් සාදපන්න. 31
අඩියද කඳද ඇතුළුව පහන් රුක තළා
සාදනු ලැබිය යුතුය: ඒකේ කුසලාන්ද
මොට්ටුද මල්ද එක වැඩක් විය යුතුය.
එහි පැතිවලින් නික්මෙන අතු සයක් 32
විය යුතුය; පහන් රුකේ එක පැත්තක
අතු තුනක්ද අනික් පැත්තේ අතු
තුනක්ද විය යුතුය. කොට්ටම්බා මල් 33
හා සමානව සාදනලද පෙති කුසලාන්
තුනක් මොට්ටුවකුත් මලකුත් ඇතුව
එක අත්තකද කොට්ටම්බා මල් හා
සමානව සාදනලද පෙති කුසලාන්
තුනක් මොට්ටුවකුත් මලකුත් ඇතුව

අනික් අත්තේද විය යුතුය. පහන්
රුකෙන් නික්මෙන අතු සයේම එසේ
34 විය යුතුය. පහන්රුකේ කොට්ටම්බා මල්
සමානව සාදනලද පෙති කුසලාන්
සතරක් ඒවායේ මොට්ටු සහ මල්ද
35 සහිතව ඇතිවිය යුතුය. පහන් රුකෙන්
නික්මෙන අතු සයට ඒකේ අතු දෙකක්
යට ඊට සම්බන්ධව මොට්ටුවක්ද
අනික් අතු දෙක යට ඊට සම්බන්ධව
මොට්ටුවක්ද අනික් අතු දෙක යට
ඊට සම්බන්ධවූ මොට්ටුවක්ද වන්නේය.
36 ඒවායේ මොට්ටු සහ අතු ඊට සම්බන්ධ
වන්නේය. ඒ සියල්ල තළනලද පවිත්‍ර
37 රනින් කළ වැඩක් විය යුතුය. ඒකේ
පහන් සතක් සාදපන්න. ඔව්හු ඒක
ඉදිරිපිටින් එළිය වැටෙන පිණිස ඒවා
38 දල්වන්නෝය. ඒකේ කතුරුද කතුරු
39 තැටිද පවිත්‍ර රනින් විය යුතුය. එයද
මේ සියලු භාජනද පවිත්‍රවූ රන්
40 තලෙන්තයකින් සෑදිය යුතුය. කන්දේදී
තුඹට පෙන්වනලද ආදර්ශය ලෙස ඒවා
සාදන්ට බලාගනින්න.

## මණ්ඩපය

26 නවද මණ්ඩපය තිර දසයකින්
සාදපන්න; නිල්වන්වූ රත්නිල්වූ
රත්වන්වූ කටිනලද සිහින් හණවලින්
දක්ෂ කම්කරුවෙකු විසින් කළ කෙරුබ්
2 රූප ඇතුව ඒවා සාදපන්න. එක එක
තිරයේ දිග විසිඅට රියනක්ද එක එක
තිරයේ පළල සතර රියනක්ද විය
යුතුය. සියලුම තිර එක ප්‍රමාණ විය
3 යුතුය. තිර පහක් එකකට එකක්
සන්ධිකරනු ලබන්නේය; අනික් තිර
පහද එකකට එකක් සන්ධිකරනු
4 ලබන්නේය. සන්ධිකරන තිරවල එක
කෙළවරක තිරයේ වාටියෙහි නිල් පුඩු
සාදපන්න; සන්ධිකරන අනික් තිරවල
කෙළවරක තිරයේ වාටියෙහිත් එසේම
5 සාදපන්න. එක තිරයක පුඩු පනසක්ද
සන්ධිකරන අනික් තිරවල කෙළවරෙහි
පුඩු පනසක්ද එකිනෙකට ඉදිරිපිට
6 සාදපන්න. රන් කොකු පනසකුත්
සාද මණ්ඩපය එකක්ව තිබෙන පිණිස
කොකුවලින් තිර එකිනෙකට සන්ධි-
කරපන්න. මණ්ඩපය මතුපිටින් කූඩා- 7
රමක් කොට එළු ලොමින් තිර සාද-
පන්න. ඒ ආකාර තිර එකොළොසකුත්
සාදපන්න. එක එක තිරයේ දිග රියන් 8
තිහක්ය, එක එක තිරයේ පළල රියන්
සතරක්ය. තිර එකොළොසම එක
මිම්මට තිබිය යුතුය. තිර පහක් වෙනමද 9
තිර හයක් වෙනමද සන්ධිකර හවෙනි
තිරය කූඩාරමේ ඉස්සරහ පැත්තෙහි
දෙකට නමා තබාපන්න. සන්ධිකරන 10
තිරවල එක කෙළවරක තිරයේ
වාටියෙහි පුඩු පනසක්ද සන්ධිකරන
අනික් තිරවල කෙළවරක තිරයේ
වාටියෙහි පුඩු පනසක්ද සාදපන්න.
පිත්තල කොකු පනසක් සාද කොකු 11
පුඩුවල දමා එක කූඩාරමක් වන පිණිස
සන්ධි කරපන්න. කූඩාරමේ තිරවලින් 12
වැඩිපුරව තිබෙන කැල්ල වන ඉතිරි
තිර භාගය මණ්ඩපය පිටිපස එල්ලී
තිබේවා. කූඩාරමේ තිරවල දිගින් 13
ඉතිරිවන සෙස්සෙන් එක පැත්තකින්
රියනක්ද අනික් පැත්තෙන් රියනක්ද
මණ්ඩපය වසන පිණිස ඒකේ පැතිවල
මතුපිටින් ඒ පැත්තෙන්ද මේ පැත්තෙන්ද
එල්ලී තිබේවා. රතු සායම් පෙවූ බැටළු 14
සම්වලින් කූඩාරමට වැස්මක්ද තාහෂ්
සම්වලින් උඩ වැස්මක්ද සාදපන්න.
මණ්ඩපයේ ලෑලි ෂිටිම් ලීවලින් සාද 15
කෙළින් සිටුවාපන්න. ලෑල්ලක දිග 16
දස රියනක්ද එක එක ලෑල්ලේ පළල
එක් රියන් හමාරක්ද විය යුතුය.
එකිනෙකට සම්බන්ධවූ එක එක 17
ලෑල්ලට කුඩිම්බි දෙකක් තිබිය යුතුය.
මණ්ඩපයේ සියලු ලෑලිවලට එසේ
සාදපන්න. මණ්ඩපයේ දකුණු දිසාවෙහි 18
දකුණු පැත්තට ලෑලි විස්සක් සාදපන්න.
එක ලෑල්ලක කුඩිම්බි දෙකකට අඩි 19
දෙකක්ද අනික් ලෑල්ලේ කුඩිම්බි
දෙකකට අඩි දෙකක්ද බැගින් ලෑලි
විස්ස යට රිදීයෙන් අඩි සතළිසක් සාද-
පන්න. උතුරු දෙසට තිබෙන මණ්ඩපයේ 20
දෙවෙනි පැත්තටත් ලෑලි විස්සක්ද එක 21

එක ලැල්ල යට අඩි දෙකක් බැගින්
ඒවායේ රිදී අඩි සතළිසක්ද සාදපන්න.
22 අපරදිග මණ්ඩපයේ පසු පැත්තට
23 ලැලි සයක් සාදපන්න. මණ්ඩපයේ පසු
පැත්තෙහි කොන්වලට ලැලි දෙකක්
24 සාදපන්න. යටින් ඒවා දෙගුණ කළ
යුතුය, එලෙස ඒවා මුදුනේ පළමුවෙනි
වළල්ල දක්වා ඒකාබද්ධ විය යුතුය.
දෙකම එසේ විය යුතුය; ඒවා දෙකොනට
25 වන්නේය. ලැලි අටක්ද එක ලැල්ලක්
යට අඩි දෙකක් සහ තවත් ලැල්ලක්
යට අඩි දෙකක්ද බැගින් රිදීයෙන් අඩි
26 සොළොසක් වන්නේය. ෂිටිම් ලීවලින්
මණ්ඩපයේ එක් පැත්තක ලැලිවලට
27 පොලු පහක්ද මණ්ඩපයේ අනික් පැත්තේ
ලැලිවලට පොලු පහක්ද මණ්ඩපයේ
අපරදිග පසු පැත්තේ ලැලිවලට පොලු
28 පහක්ද සාදපන්න. ලැලි මධ්‍යයෙහි
තිබෙන මැද පොල්ල එක් කෙළවරක
පටන් අනික් කෙළවර දක්වා දිගටම
29 තිබිය යුතුය. ලැලි රනින් වසා පොලු
දමන පිණිස ඒවායේ වළලු රනින් සාද
30 පොලුද රනින් වසාපන්න. කන්දේදී තුඹට
පෙන්වූ ප්‍රකාරය ලෙස මණ්ඩපය
පිහිටුවාපන්න.
31 නිල්, රත්නිල්, රතු කටිනලද සිහින්
හණ නූලින් තිරයක් සාදපන්න. ඒක
දක්ෂ කම්කරුවෙකු විසින් කළ කෙරුබ්
32 රූප සහිතව සෑදිය යුතුය. ඒක රනින්
වැසුවාවූ රන් කොකු ඇත්තාවූ රිදී අඩි
සතරක් පිට පිහිටුවා තිබෙන්නාවූ ෂිටිම්
ලී කුළුනු සතරක් පිට එල්ලාපන්න.
33 තිරයෙන් ශුද්ධ ස්ථානය අති
ශුද්ධ ස්ථානයෙන් තුඹලාට වෙන්ව
තිබෙන හැටියට තිරය කොකුවල යටින්
එල්ලා එහි තිරයට ඇතුළතින් සාක්ෂි
34 පෙට්ටිය තබාපන්න. අති ශුද්ධ
ස්ථානයෙහි සාක්ෂි පෙට්ටිය පිට
35 කරුණාසනය තබාපන්න. තිරයට
පිටතින් මේසයද මේසය ඉදිරිපිටින්
මණ්ඩපයේ දකුණු දිග පැත්තේ පහන්
රුකද තබාපන්න. මේසයද උතුරු
36 පැත්තේ තබාපන්න. කූඩාරමේ දෙරටුවට
නිල්, රත්නිල්, රතු කටිනලද සිහින් හණ
නූලින් මල් වැඩ කළ කඩතුරාවක්
සාදපන්න. කඩතුරාවට ෂිටිම් ලීවලින් 37
කණු පහක් සාද ඒවා රනින් වසාපන්න;
ඒවායේ කොකුද රනින් විය යුතුය.
ඒවාට පිත්තල අඩි පහක්ද වාත්තු-
කරපන්න.

## පූජාසනය

27 පූජාසනය පස් රියනක් දිගටද
පස් රියනක් පළලටද ෂිටිම්
ලීවලින් සාදපන්න; පූජාසනය හතරැස්
විය යුතුය. එහි උස තුන්රියනක් විය
යුතුය. එහි අං එහි කොන් සතර පිට 2
සාදපන්න. අංද ඊට සම්බන්ධවී තිබිය
යුතුය. ඒක පිත්තලින් වසාපන්න.
එහි අලු ඉවත ගෙනයෑමට ඒකේ හැළිද 3
ඒකේ හැඳිද ඒකේ තලිද ඒකේ මස්
කොකුද ඒකේ ගිනි කබල්ද සාදපන්න.
ඒකේ සියලු භාජන පිත්තලෙන් සෑදිය
යුතුය. ඊට පිත්තලෙන් දැල්කම් කළ 4
මැස්සක්ද දැල පිට ඒකේ සතර කොනේ
පිත්තල වළලු සතරක්ද සාදපන්න.
දැල පහළ සිට පූජාසනය මැද 5
දක්වා යන පිණිස එය පූජාසනය
වටකර තිබෙන ගැටිය යට තබාපන්න.
පූජාසනයට පොලු ෂිටිම් ලීවලින් සාද 6
පිත්තලින් වසාපන්න. පූජාසනය 7
ගෙනයන විට පොලු ඒකේ දෙපැත්තේ
තිබෙන පිණිස පොලු වළලුවල දමාපන්න.
ඒක ලැලිවලින් කුහර ඇතුව සාදපන්න. 8
කන්දේදී තුඹට පෙන්වූ ලෙස ඔව්හු
එය සාදත්වා.

## මණ්ඩප මළුව

මණ්ඩපයේ මළුවද සාදපන්න. දකුණු 9
පැත්තේ දකුණු දෙසට කටිනලද සිහින්
හණ නූලින් කළ එක පැත්තට රියන්
සියයක් දික්වූ තිර මළුවට විය යුතුය.
ඒකේ කුළුනු විස්සක්ද ඒ කුළුනුවල අඩි 10
විස්සක්ද පිත්තලෙන් විය යුතුය;
කුළුනුවල කොකුද ඒවායේ පටිද
රිදීයෙන් විය යුතුය. උතුරු පැත්ත දිගේ 11
රියන් සියයක් දික්වූ තිරද ඒවායේ

කුළුනු විස්සක්ද ඒ කුළුනුවල පිත්තල
අඩි විස්සක්ද විය යුතුය; කුළුනුවල
කොකු සහ ඒවායේ පටිත් රිදීයෙන්
12 විය යුතුය. බස්නාහිර පැත්තෙහි
මිදුලේ පළලට පනස් රියනක් දිග තිරද
ඒවායේ කුළුනු දසයක්ද ඒවායේ අඩි
13 දසයක්ද විය යුතුය. නැගෙනහිර
දෙසටත් මිදුලේ පළල පනස් රියනක්ය.
14 එක පැත්තක පහළොස් රියනක් පළල
තිරද ඒවායේ කුළුනු තුනක්ද ඒවායේ
15 අඩි තුනක්ද තිබිය යුතුය. අනික්
පැත්තෙහිද පහළොස් රියන් තිර විය
යුතුය. ඒවායේ කුළුනු තුනක්ද කුළුනුවල
16 අඩි තුනක්ද විය යුතුය. මළුවේ දොරටුවට
නිල්, රත්නිල්, රතු කටිනලද සිහින් හණ
නූලින් මල් වැඩ කළ විසි රියන්
කඩතුරාවක් විය යුතුය. ඒකේ කුළුනු
සතරක්ද කුළුනුවල අඩි සතරක්ද විය
17 යුතුය. මළුව වටකර සියලු කුළුනු රිදී
පටිවලින් බඳිනු ලැබිය යුතුය; ඒවායේ
කොකු රිදීයෙන්ද ඒවායේ අඩි
18 පිත්තලින්ද විය යුතුය. මළුවේ දිග රියන්
සියයක්ය, පළල හැම තැනම පනස්
රියනක්ය, උස පස් රියනක්ය, තිර
කටිනලද සිහින් හණ නූල්වලින්ද අඩි
19 පිත්තලින්ද විය යුතුය. මණ්ඩපයේ
සියලු වැඩවලට ගන්නාවූ සියලු ආවුදද
ඒකේ සියලු ඇණද මළුවේ සියලු ඇණද
පිත්තලෙන් විය යුතුය.
20 එළිය දීමට පහනක් නිතර දල්වී
තිබෙන පිණිස, කොටා සිඳගත් පිරිසිදු
ඔලීව තෙල් තුඹ ළඟට ගෙනෙන්ට
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අණකරපන්න.
21 සාක්ෂි පෙට්ටිය ඉදිරියෙහි තිබෙන
තිරයට පිටතින් සම්මුඛවීමේ කූඩා-
රමෙහි ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සවස
පටන් උදය දක්වා ඒක පිළියෙළකර
තබන්නෝය. ඒක ඉශ්‍රායෙල් පුත්‍රයන්
උදෙසා ඔවුන්ගේ පරම්පරාවල
පැවැත්විය යුතු නිරන්තර පනතක්
වන්නේය.

## පූජක ඇඳුම්

28 තුඹේ සහෝදරවූ ආරොන්ද
ඔහු සමග ඔහුගේ පුත්‍රයන්ද
මට පූජකකම් කරන පිණිස, ආරොන්ද
ඔහුගේ පුත්‍රයන්වූ නාදබ්ද අබීහූද
එලෙයාසර්ද ඊතාමර්ද ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙන් තුඹ ළඟට කැඳවා
ගනින්න. තුඹේ සහෝදරවූ ආරොන්ට 2
මහිමය සහ අලංකාරය පිණිස ශුද්ධවූ
වස්ත්‍ර සාදපන්න. ආරොන් පූජක 3
තනතුරෙහි මට සේවය කරන පිණිස
ඔහු ශුද්ධකිරීමට ඔහුගේ වස්ත්‍ර සාදන්ට
මා විසින් ප්‍රඥ ආත්මයෙන් පූර්ණ-
කරනලද ප්‍රඥ සිතක් ඇති සියල්ලන්ට
කියාපන්න. ඔවුන් විසින් සෑදිය යුතු 4
වස්ත්‍ර නම්: ළය වැස්මක්ද ඒඵොද්
සැට්ටයක්ද සළුවක්ද විසිතුරු උතුරු
සළුවක්ද මකුටයක්ද ඉහ පටියක්ද යන
මේවාය. තුඹේ සහෝදරවූ ආරොන්
පූජක තනතුරෙහි මට සේවය කරන
පිණිස ඔහුටත් ඔහුගේ පුත්‍රයන්ටත් ශුද්ධ
වස්ත්‍ර සාදන්වා. ඔව්හු රන්ද, නිල්, 5
රත්නිල්, රතු නූල්ද සිහින් හණ රෙදිද
ගනින්වා.
ඒඵොද් සැට්ටය රනින්ද, නිල්, රත්- 6
නිල්, රතු නූල්වලින්ද කටිනලද සිහින්
හණ නූලින්ද දක්ෂ කම්කරුවාගේ
කර්මාන්තය ලෙස සාදන්වා. එය එකට 7
සම්බන්ධකරන පිණිස උරපටි දෙක ඒකේ
දෙකෙළවරේ බඳිනු ලැබිය යුතුය.
බඳින පිණිස එය පිට තිබෙන්නාවූ 8
රනින්ද, නිල්, රත්නිල්, රතු නූල්වලින්ද
කටිනලද සිහින් හණ නූලින්ද යුක්තවූ
විසිතුරු ආකාරයෙන් වියනලද්දවූ පටිය
එහි කර්මාන්තය ලෙස එය හා
සම්බන්ධවී තිබිය යුතුය. තබමාණික්‍ය 9
දෙකක් ගෙන ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
නම් ඒවායේ කැටයම්කරපන්න. ඔවුන්ගේ 10
උත්පත්තිය ලෙස නම්වලින් සයක් එක
ගලක් පිටත් ඉතිරි සය අනික් ගල
පිටත් විය යුතුය. ගල්වල කැටයම් කරන 11
විධියට මුද්‍රාකෙටීම මෙන් ඒ මැණික්

දෙකෙහි ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ නම්
කොටා, ඒවා රන් කෙවෙනිවල
12 බැඳපන්න. ඒ මැණික් දෙක ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට සිහිවීමේ ගල් පිණිස ඒපෝද්
සැට්ටයේ උර පටි පිට පිහිටුවාපන්න.
මෙසේ ආරොන් ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි සිහිකරවීමක් පිණිස ඔවුන්ගේ
නම් තමාගේ දෙඋර පිට දරන්නේය.
13,14 රනින් කෙවෙනි සාදපන්න. පවිත්‍ර
රනින් මාල දෙකක්ද සාදපන්න; ඒවා
ගෙතූ කර්මාන්තයෙන් ලනු මෙන් සාද
ගෙතූ මාල කෙවෙනිවලට බැඳපන්න.
15 දක්ෂ කම්කරුවාගේ කර්මාන්තය වූ
විනිශ්චයේ ළය වැස්මක් ඒපෝද්
සැට්ටයේ වැඩ වාගේ සාදපන්න;
රනින්ද, නිල්, රත්නිල්, රතු නූල්වලින්ද
කටිනලද සිහින් හණ නූලින්ද ඒක
16 සාදපන්න. ඒක හතරැස්ව දෙපටක්ව
තිබිය යුතුය; ඒකේ දිග වියතක්ද
17 පළල වියතක්ද විය යුතුය. ඒ පිට
මැණික් පේළි සතරක් බැඳපන්න.
පළමුවෙනි පේළිය ලෝහිතංකයක්ද
පුෂ්පරාගයක්ද මරකතයක්ද ඇති
18 පේළියක් වන්නේය; දෙවෙනි පේළිය
රතු කැටයක්ද නීල මාණික්‍යයක්ද
19 වජ්‍රයක්ද වන්නේය; තුන්වෙනි පේළිය
පද්මරාගයක්ද වර්ණකාන්තියක්ද අඹ-
20 තෙස් ගලක්ද වන්නේය; සතරවෙනි
පේළිය රන්කාන්තියක්ද තබමාණි-
ක්‍යයක්ද සූර්යකාන්තියක්ද වන්නේය.
21 ඒවා රන් කෙවෙනිවල බැන්ද යුතුය. ඒ
මැණික් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ නම්
ගණන ලෙස දොළසක්ව, ගෝත්‍ර දොළසේ
හැටියට එකිනෙකාගේ නාමය මුද්‍රාවක
කැටයම් ලෙස එහි කැටයම්කර තිබිය
22 යුතුය. ළය වැස්ම පිට පවිත්‍ර රනින්
ලනු මෙන් ගොතනලද මාල සාදපන්න.
23 ළය වැස්ම පිට රනින් වළලු දෙකක්
සාද ඒ වළලු දෙක ළය වැස්මේ
24 දෙකෙළවර පිට තබාපන්න. රනින්
ගොතනලද මාල දෙක ළය වැස්මේ
දෙකෙළවර තිබෙන වළලු දෙක පිට
25 තබාපන්න. ගොතනලද මාල දෙකේ
ඉතිරි දෙකෙළවර කෙවෙනි දෙක පිට
බැඳ ඒපෝද් සැට්ටයේ උර පටි පිට
ඉදිරිකොට තබාපන්න. තවත් රන් වළලු 26
දෙකක් සාද ළය වැස්මේ කෙළවර දෙකේ
ඒකේ වාටිය පිට ඒපෝද් සැට්ටය දෙසට
ඇතුල් පැත්තේ ඒවා අල්ලාපන්න. තවත් 27
රන් වළලු දෙකක් සාද ඒපෝද් සැට්ටයේ
උර පටි දෙක පිට ඉස්සරහ දෙපැත්තේ
පහතින් ඒකේ සන්ධිය ළඟ ඒපෝද්
සැට්ටයේ විසිතුරු පටියට උඩින්
අල්ලාපන්න. ළය වැස්ම ඒපෝද් 28
සැට්ටයේ විසිතුරු පටිය පිට තිබෙන
පිණිසද ඒක ඒපෝද් සැට්ටයෙන්
වෙන්නොවී තිබෙන පිණිසද ඒකේ
වළලුවලින් ඒපෝද් සැට්ටයේ වළලු
නිල්වන් පටියකින් බඳින්වා. මෙසේ 29
ආරොන් ශුද්ධ ස්ථානයට ඇතුල්වන
කල්හි ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
නිරන්තර සිහිකරවීමක් පිණිස ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ නාම විනිශ්චයේ ළය
වැස්මෙහි තමාගේ හෘදය පිට දරාවා.
විනිශ්චයේ ළය වැස්මෙහි *ඌරීම් සහ 30
තුම්මීම් තබාපන්න; ආරොන් ස්වාමීන්-
වහන්සේ ඉදිරියට ඇතුල්වන කල්හි ඒවා
ඔහුගේ හෘදය පිට තිබේවා. ආරොන්
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ විනිශ්චය
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තමන්
හෘදය පිට නිතර දරන්නේය.
ඒපෝද් සැට්ටයට අයිති සළුව 31
මුළුල්ලම නිල් පැහැයෙන් සාදපන්න.
ඒකේ මැද ඉස දැමීමට සිදුරක් තිබිය 32
යුතුය. ඒක නොඉරෙන පිණිස
සන්නාහයක සිදුර මෙන් ඒ සිදුර වට
වියනලද වාටියක් විය යුතුය. ඒකේ 33
පහළ වාටිය දිගේ නිල්, රත්නිල්, රතු
දෙළුම් ගෙඩිද වටකර ඒවා අතරතුරේ
රන් මිණිගෙඩිද සාදපන්න. රන් මිණි- 34
ගෙඩියක්ද දෙළුම් ගෙඩියක්ද බැගින්
වටකර සළුවේ පහළ වාටිය විය
යුතුය. සේවයකිරීමට ආරොන් එය 35

*එනම්, ආලෝක සහ සම්පූර්ණකම් ප්‍රකාශ
කරන පස ඇට විශේෂයක්.

පළඳින්නේය. ඔහු ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි ශුද්ධ ස්ථානයට ඇතුල් වන
විටද පිටතට එන විටද නොනසින
ලෙස එහි ශබ්දය ඇසෙන්නේය.
36 පිරිසිදු රන් තහඩුවක් සාද: ස්වාමීන්-
වහන්සේට ශුද්ධය කියා මුද්‍රයක
කැටයම් මෙන් එහි කැටයම් කරපන්න.
37 තවද ඒක නිල් පටියකට අල්ලා මකුටය
පිට බැඳපන්න; ඒක මකුටයේ ඉස්සරහ
38 පැත්තෙහි විය යුතුය. එය ආරොන්ගේ
නළල පිට වන්නේය, මෙසේ ආරොන්
ඉශ්‍රායෙල් පුත්‍රයන් තමන්ගේ සියලු ශුද්ධ
දීමනාවලදී කැපකරන ශුද්ධ දේවල
අපරාධය දරන්නේය; ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි ඔවුන් පිළිගනු ලබන පිණිස
ඒක ඔහුගේ නළල පිට නිතරම
39 වන්නේය. සිහින් හණ නූලින් උතුරු
සළුව විසිතුරු කොට වියා සිහින්
හණ නූලින් මකුටයක්ද සාදපන්න,
විසිතුරුකර වියා ඉහ පටියකුත්
40 සාදපන්න. ආරොන්ගේ පුත්‍රයන්ටත් යට
ඇඳුම්ද ඉහපටිද සාදපන්න, මහිමය සහ
අලංකාරය පිණිස ඔවුන්ට මකුටත්
41 සාදපන්න. ඒවා නුඹේ සහෝදරවූ
ආරොන්ටද ඔහු හා සමග ඔහුගේ
පුත්‍රයන්ටද පළඳවාපන්න; ඔවුන් පූජක
තනතුරෙහි මට සේවයකරන පිණිස
ආලේපකර කැපකර විශුද්ධකරපන්න.
42 ඔවුන්ගේ නග්නකම වසන පිණිස
ඔවුන්ට හණ රෙදි කලිසම් සාදපන්න;
ඒවා ඉහටිය පටන් කළවය දක්වා විය
43 යුතුය. ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්
සම්මුඛවීමේ කූඩාරමට ඇතුල්වන විට
හෝ ශුද්ධ ස්ථානයෙහි සේවය කරන
පිණිස පූජාසනයට ළංවන විට හෝ
ඔවුන් අපරාධය දරා නොනසින පිණිස
ඔවුන් ඒවා ඇඳගන සිටිය යුතුය. මේක
ඔහුටද ඔහුට පසුව ඔහුගේ වංශයටද
නිරන්තර පනතක් වන්නේය.

### ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් කැපකිරීම

29 පූජක තනතුරෙහි මට මෙහෙ
කරන පිණිස ඔවුන් විශුද්ධ-
කරන්ට නුඹ විසින් ඔවුන්ට කළ යුතු
දේ මේය. පළුදුවක් නැති එක නාඹ
ගොනෙක්ද බැටළුවන් දෙදෙනෙක්ද, මුහුන් 2
නොදැමූ රොටිද තෙලින් මිශ්‍රවූ මුහුන්
නොදැමූ පූපයන්ද තෙල් ගැල්වූ මුහුන්
නොදැමූ පූපපෙතිද ගනින්න. ඒවා
සිහින් තිරිඟු පිටියෙන් සෑදිය යුතුය.
ඒවා එක පැසක තබා පෙට්ටිය සමග 3
ඒවා සහ ගොනාත් බැටළුවන්
දෙදෙනාත් ගෙනෙන්න. ආරොන් සහ 4
ඔහුගේ පුත්‍රයන්ද සම්මුඛවීමේ කූඩාරමේ
දොරකඩට කැඳවාගෙන ඔවුන් වතුරෙන්
නාවාපන්න. ඒ වස්ත්‍ර ගෙන යට ඇඳුමද 5
ඒඵොද් සැට්ටයේ සළුවද ඒඵොද්
සැට්ටයද ළය වැස්මද ආරොන්ට අඳවා
ඒඵොද් සැට්ටයේ විසිතුරු පටියෙන්
ඔහුගේ ඉහ බැඳපන්න. ඔහුගේ හිසේ 6
මකුටයද මකුටය පිට ශුද්ධ ඔටුන්නද
තබාපන්න. එවිට නුඹ ආලේප තෛලය 7
ගෙන ඔහුගේ හිස පිට වත්කරමින් ඔහු
ආලේපකරපන්න. ඔහුගේ පුත්‍රයන් 8
කැඳවා ඔවුන්ට යට ඇඳුම් අඳවාපන්න.
ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ට ඉහපටිද 9
දමා ඔවුන්ට හිස වැසුම් බැඳපන්න.
නිරන්තර පනතකින් පූජක තනතුර
ඔවුන්ට වන්නේය. මෙසේ නුඹ ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන් පත්කරපන්න.
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ 10
ඉදිරිපිටට ගොනා ගෙනෙන්න. ආරොන්
සහ ඔහුගේ පුත්‍රයෝද ගොනාගේ හිස
පිට තමන්ගේ අත් තබත්වා. එවිට 11
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩදී ඒ ගොනා
මරාපන්න. තවද උගේ ලෙයින් 12
ස්වල්පයක් ගෙන නුඹේ ඇඟිල්ලෙන්
පූජාසනයේ අංවල ගා ලේ සියල්ල
පූජාසනය මුල වත්කරපන්න. අතුණු 13
වසා තිබෙන තෙල් සියල්ලද අක්මාව
පිට තිබෙන දලද වකුගඩු දෙකද එහි
තිබෙන තෙල්ද රැගෙන පූජාසනය පිට
දවාපන්න. එහෙත් ගොනාගේ මාංසද 14
හමද ගොමද කඳවුරෙන් පිට ගින්නෙන්
දවාපන්න. ඒක පාප පූජාවක්ය. එක 15

බැටළුවෙකුත් අරගනින්න; ආරොන් සහ
ඔහුගේ පුත්‍රයෝ තමන්ගේ අත්
16 බැටළුවාගේ හිස පිට තබන්වා. එවිට
නුඹ බැටළුවා මරා උගේ ලේ රැගෙන
පූජාසනය පිට වටකරින් ඉසපන්න.
17 බැටළුවා උගේ කොටස්වලට කපා උගේ
අතුණුද කකුල්ද සෝද ඒවා උගේ
කොටස්ද උගේ ඉසද සමග තබාපන්න.
18 තවද මුළු බැටළුවා පූජාසනය පිට
දවාපන්න. ඒක ස්වාමින්වහන්සේට දවන
පූජාවක්ය, මිහිරි සුවඳක්ය, ස්වාමින්-
වහන්සේට ගින්නෙන් කළ පූජාවක්ය.
19 අනික් බැටළුවාද හැරගනින්න; ආරොන්ද
ඔහුගේ පුත්‍රයෝද බැටළුවාගේ හිස පිට
20 තමුන්ගේ අත් තබන්වා. එවිට නුඹ
බැටළුවා මරා උගේ ලෙයින් ස්වල්පයක්
ගෙන ආරොන්ගේ දකුණු කනේ
කෙළවරද ඔහුගේ පුත්‍රයන්ගේ දකුණු
කන් කෙළවරද ඔවුන්ගේ දකුණු අත්වල
මාපට ඇඟිලිවලද දකුණු පාදවල
මාපට ඇඟිලිවලද ගා ලේ පූජාසනය
21 පිට වටකරින් ඉසපන්න. පූජාසනය පිට
තිබෙන ලෙයින්ද ආලේප තෙල්වලින්ද
ස්වල්පයක් රැගෙන ආරොන් පිටත්
ඔහුගේ වස්ත්‍ර පිටත් ඔහු සමග ඔහුගේ
පුත්‍රයන් පිටත් ඔවුන්ගේ වස්ත්‍ර පිටත්
ඉසපන්න. මෙසේ ඔහු සහ ඔහුගේ
වස්ත්‍රද ඔහු සමග ඔහුගේ පුත්‍රයෝද
ඔවුන්ගේ වස්ත්‍රද ශුද්ධවන්නෝය.
22 තවද බැටළුවාගෙන් තෙල්ද තෙල ඇති
වල්ගයද අතුණු වැසී තිබෙන තෙල්ද
අක්මාව පිට දලද වකුගඩු දෙකද ඒවා
පිට තිබෙන තෙලද දකුණු කළවයද
ගනින්න; මක්නිසාද ඌ කැපකිරීමේ
23 බැටළුවෙක්ය. තවද ස්වාමින්වහන්සේ
ඉදිරියෙහි තිබෙන මුහුන් නොදමූ රොටි
පැසෙන් රොටියක්ද තෙල් ගැල්වූ
24 රොටියක්ද පූප පෙත්තක්ද ගනින්න. ඒ
සියල්ල ආරොන්ගේ අත්වලද ඔහුගේ
පුත්‍රයන්ගේ අත්වලද තබා ඒවා ස්වාමින්-
වහන්සේ ඉදිරියෙහි තේව පූජාවක්
25 වශයෙන් වනා තේවකරපන්න. නුඹ
ඒවා ඔවුන් අතින් ගෙන පූජාසනය පිට
ස්වාමින්වහන්සේ ඉදිරියෙහි මිහිරි
සුවඳක් පිණිස දවන පූජාව පිට
දවාපන්න. ඒක ස්වාමින්වහන්සේට
ගින්නෙන් කළ පූජාවක්ය. ආරොන්ගේ 26
පත්වීමේ බැටළුවාගේ ළැපැත්ත ගෙන
තේව පූජාවක් පිණිස වනා ස්වාමින්-
වහන්සේ ඉදිරියෙහි තේවකරපන්න. එය
නුඹේ කොටස වන්නේය. පත්කිරීමේ 27
බැටළුවාගෙන් එනම් ආරොන්ටත්
ඔහුගේ පුත්‍රයන්ටත් ලැබිය යුතුවූ
කොටසෙන් තේවකරනලද මැනීමේ
පූජාවෙන් ළැපැත්තද තේවකරනලද
එසවීමේ පූජාවෙන් කළවයද විශුද්ධ-
කරපන්න. එය නිරන්තරයෙන් ඉශ්‍රායෙල් 28
පුත්‍රයන් විසින් දිය යුත්තක් කොට
ආරොන්ටද ඔහුගේ පුත්‍රයන්ටද
වන්නේය. මක්නිසාද එය එසවීමේ
පූජාවක්ය. එය ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ශාන්ති පූජාවල යාගවලින් එනම් ඔවුන්
විසින් ස්වාමින්වහන්සේට ඔසවන
පූජාවලින් එසවීමේ පූජාවක් වන්නේය.
ආරොන්ගේ ශුද්ධ වස්ත්‍ර ඔහුගේ පුත්‍රයන් 29
ඇඳගෙන ආලේප කරනුලැබීමටත්
පත්කරනුලැබීමටත් ඔහුගෙන් පසු
ඔවුන්ට වන්නේය. ඔහු වෙනුවට පූජකයා 30
වෙන්නාවූ ඔහුගේ පුත්‍රයා ශුද්ධ
ස්ථානයෙහි සේවය කරන පිණිස
සම්මුඛවීමේ කූඩාරමට ඇතුල් වන
කල්හි සත් දවසක් ඒවා ඇන්ද යුතුය.
නුඹ කැපකිරීමේ බැටළුවා රැගෙන ශුද්ධවූ 31
තැනක උගේ මාංසය පිසින්න. ආරොන් 32
හා ඔහුගේ පුත්‍රයෝ සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩ සිට ඒ බැටළුවාගේ
මාංසද පැසේ තිබෙන රොටිද කෑ යුතුය.
ඔවුන් පත්කිරීමටත් විශුද්ධකිරීමටත් 33
ඒවායින් සමගිකම්කළ බැවින් ඔවුන්
විසින් ඒවා කන්නට යෙදේවා. නුමුත්
ඒවා ශුද්ධ බැවින් විදේශියෙක් එයින්
නොකෑ යුතුය. කැපකිරීමේ මාංසයෙන් 34
හෝ රොටියෙන් හෝ පසුවද උදය
දක්වා කිසිවක් ඉතිරි වී නම් ඒ ඉතිරි
ඒවා ගින්නෙන් දවාපන්න. ඒවා ශුද්ධ
බැවින් නොකෑයුතුය. මා විසින් නුඹට 35

අණකළ සියල්ල ලෙස ආරොන්ටද
ඔහුගේ පුත්‍රයන්ටද කරපන්න. සත්
දවසක් එසේ කරමින් තුඹ ඔවුන්
36 කැපකළ යුතුය. තුඹ සමගිකිරීම පිණිස
පාප පූජාවේ ගොනා හැමදම පූජාකළ
යුතුය. පූජාසනය උදෙසා සමගිකමක්
කරන විට ඒක පවිත්‍ර කරපන්න; ඒක
විශුද්ධකරන පිණිස ඒක ආලේප
37 කරපන්න. සත් දවසක් පූජාසනය
උදෙසා සමගිකිරීමේ පූජාව ඔප්පුකොට
ඒක විශුද්ධකරපන්න. මෙසේ පූජාසනය
අති ශුද්ධ වන්නේය; පූජාසනයට
ස්පර්ශවන කොයි දෙයක් තුමුත් ශුද්ධ
වන්නේය.

## දිනපතා පූජා. දෙවියන්වහන්සේගේ වැඩ සිටීම

38 තුඹ පූජාසනය පිට ඔප්පුකළ යුතු
දේ නම් මේය; නොකඩව දවස්පතා
එක් අවුරුදු බැටළු වස්සෝ දෙදෙනෙක.
39 එක බැටළු වස්සෙකු උදය පූජාකර-
පන්න; අනික් බැටළු වස්සා සවස
40 පූජාකරපන්න. සිහින් පිටි ඒඵාවකින්
දසයෙන් කොටසක් කොටා සිඳගත්
තෙල් හිනකින් සතරෙන් කොටසක්
සමග මිශ්‍රකර, ඒවා සහ පාන පූජාවක්
කොට මුද්‍රික පානය හිනකින් සතරෙන්
කොටසක්ද එක බැටළු වස්සෙකු සමග
41 ඔප්පුකරපන්න. අනික් බැටළු පැටවා
සවස ඔප්පුකර ඒ සමග උදය ආහාර
පූජාවේ හැටියටත් ඒකේ පාන පූජාවේ
හැටියටත් මිහිරි සුවඳක් පිණිස එය
ස්වාමීන්වහන්සේට ගින්නෙන් කරනලද
42 පූජාවක් කොට ඔප්පුකරපන්න. ඒක
සම්මුඛවීමේ කූඩාරමේ දෙරකඩ
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තුඹලාගේ
පරම්පරාවල ඔප්පුකළ යුතු නිරන්තර
දවන පූජාවක්ය. ඒ කූඩාරම වනාහි
තුඹලා සමග කථාකරන පිණිස මා
43 තුඹලාට සම්මුඛවන ස්ථානයය. එහිදී
මම ඉශ්‍රායෙල් පුත්‍රයන්ට සම්මුඛ
වන්නෙමි; මාගේ මහිමයෙන් කූඩාරම
44 විශුද්ධ කරනු ලබන්නේය. මම
සම්මුඛවීමේ කූඩාරමද පූජාසනයද
විශුද්ධකරන්නෙමි. පූජක තනතුරෙහි
මට මෙහෙ කරන පිණිස ආරොන් සහ
ඔහුගේ පුත්‍රයන්ද විශුද්ධකරන්නෙමි.
මම ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ 45
වාසයකරමින් ඔවුන්ගේ දෙවියන්-
වහන්සේ වන්නෙමි. මම වනාහි ඔවුන් 46
අතරේ වාසයකරන පිණිස ඔවුන්
මිසර දේශයෙන් ගෙනාවාවූ ඔවුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ බව ඔව්හු
දැනගන්නෝය. මම ඔවුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේය.

## දූම් පූජාසනය

30
සුවඳ දූම් ඔප්පුකිරීමට පූජා-
සනයක් සාදපන්න. ෂිටිම් ලී-
වලින් එය සාදපන්න. එහි දිග රියනක්ද 2
එහි පළල රියනක්ද විය යුතුය; ඒක
සතරැස් විය යුතුය. එහි උස දෙරියනක්
විය යුතුය. එහි අං ඒ එක්කම තිබිය
යුතුය. ඒකේ මුදුනද වටකරින් ඒකේ 3
පැතිද ඒකේ අංද පවිත්‍ර රනින්
වසාපන්න; ඒක වටේට රන්
ලීස්තරයකුත් සාදපන්න. ඒකේ ලීස්- 4
තරයට යටින් ඒකේ රිටි දෙක පිට රන්
වළලු දෙකක්ද සාදපන්න, දෙපැත්තෙහි
ඒවා සාදපන්න; ඒවා ඒක ඉසිලීමට
පොලු දැමීම පිණිස වන්නේය. පොලුද 5
ෂිටිම් ලීවලින් සාද ඒවා රනින්
වසාපන්න. සාක්ෂි පෙට්ටිය ළඟ තිබෙන 6
තිරය ඉදිරිපිට එනම් සාක්ෂිය පිට
තිබෙන කරුණාසනය ඉස්සරහින් ඒක
තබාපන්න, එහිදී මම තුඹට සම්මුඛ
වන්නෙමි. ආරොන් එය පිට මිහිරි 7
සුගන්ධ ද්‍රව්‍ය දවන්නේය. ඔහු හැම
උදයම පහන් සූදනම් කරන කල්හි ඒවා
දැවිය යුතුය. ආරොන් සවස පහන් 8
දල්වන කල්හි ඒවා දැවිය යුතුය, ඒක
තුඹලාගේ පරම්පරාවල ස්වාමීන්-
වහන්සේ ඉදිරියේ නිතර පැවැත්විය
යුතුවූ සුවඳ පූජාවක්ය. තුඹලා අන්‍ය 9
සුවඳ ද්‍රව්‍යයක්වත් දවන පූජාවක්වත්
ආහාර පූජාවක්වත් ඒක පිට ඔප්පු
නොකරල්ලා; පාන පූජාවක්ද ඒක පිට
වත්නොකරල්ලා. ආරොන් අවුරුද්දට 10

වරක් එහි අං පිට සමගිකමක් කරන්-
නේය. ඔහු තුඹලාගේ පරම්පරාවල
අවුරුද්දට වරක් සමගිකමේ පාප පූජාවේ
ලෙයින් ඒක උදෙසා සමගිකමක් කරන්-
නේය. ඒක ස්වාමීන්වහන්සේට අති
ශුද්ධයයි කීසේක.

## සමගිකම්කිරීමේ මිලය

11 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
12 කොට: ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් ගණන්
කරනු ලබන තැනැත්තන්ගේ ගණන
තුඹ ගන්නා කල්හි එනම් ඔවුන් ගණන්
කිරීමේදී ඔවුන් අතරෙහි වසංගතයක්
නොපැමිණෙන පිණිස ඔවුන් ගණන්
කිරීමේදී එක එක මනුෂ්‍යයා තම
තමාගේ ප්‍රාණය උදෙසා මිදීමේ මිලයක්
13 ස්වාමීන්වහන්සේට දේවා. ඔවුන් විසින්
දිය යුතු මෙසේය, ගණන්ගනුලබන
එක් එක්කෙනා ශුද්ධ ස්ථානයේ
ෂෙකෙල් මිලයේ හැටියට ස්වාමීන්-
වහන්සේට පඩුරක් පිණිස ෂෙකෙල්
බාගයක් දිය යුතුය. (ෂෙකෙලයක් නම්
14 ගේරා විස්සක්ය.) විසි අවුරුදුවූද ඉන්
වැඩිවූද වයස් ඇති ගණන්ගනුලබන
එක් එක්කෙනා ස්වාමීන්වහන්සේගේ
15 පඩුර දේවා. තුඹලාගේ ප්‍රාණය ගැන
සමගිකමක් කරන පිණිස ස්වාමීන්-
වහන්සේගේ පූජාව දෙන කල ධනවන්-
තයා ෂෙකෙල් බාගයට වැඩියෙන්වත්
16 දිළිඳා ඊට අඩුවෙන්වත් නොදේවා. තුඹද
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් සමගිකරන
මුදල ගෙන තුඹලාගේ ප්‍රාණ ගැන සමගි-
කිරීමට ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා සිහිකරවීමක්
පිණිස එය සම්මුඛවීමේ කූඩාරමේ
මෙහෙයට නියමකරපන්නැයි කීසේක.

## පිත්තල භාජනය

17 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
18 කොට: සේදීම පිණිස පිත්තලෙන්
භාජනයක්ද පිත්තලෙන් එහි අඩියද
සාදපන්න. එය සම්මුඛවීමේ කූඩාරමටත්
පූජාසනයටත් අතරෙහි තබා එහි වතුර
වත්කරපන්න. එතැනදී ආරොන් සහ 19
ඔහුගේ පුත්‍රයෝ තමන්ගේ අත්ද තමන්ගේ
පාදද සෝදන්වා. ඔවුන් සම්මුඛවීමේ 20
කූඩාරමට යන කල හෝ ස්වාමීන්-
වහන්සේට ගින්නෙන් කරනලද පූජාවක්
දවන පිණිස සේවයකරන්ට පූජාසනය
ළඟට එන කල හෝ නොනසින පිණිස
වතුරෙන් සෝදගත යුතුය. මෙසේ ඔව්හු 21
නොනස්නා පිණිස තමන්ගේ අත්ද
තමන්ගේ පාදද සෝද ගනිත්වා. ඒක
ඔවුන්ට එනම් ඔහුටද ඔහුගේ වංශයටද
ඔවුන්ගේ පරම්පරාවල නිරන්තර
පනතක් වන්නේයයි කීසේක.

## ආලේප තෙල් සහ සුවඳ තෙල්

නවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 22
කථාකොට: ශුද්ධ ස්ථානයේ ෂෙකෙල් 23
මිලයේ හැටියට ෂෙකෙල් පන්සියයක
වැස්සෙන ගන්ධ රසද එයින් ගණනින්
භාගයක් වන දෙසියපනසක සුවඳති
කුරුඳුද දෙසියපනසක සුවඳ දඬුද,
පන්සියයක තලිස් පතුරුද යන ප්‍රධාන 24
සුගන්ධ ද්‍රව්‍ය සහ ඔලීව තෙල් හිනක්ද
ගනින්න. එයින් ශුද්ධවූ ආලේපය පිණිස 25
තෛල මිශ්‍රකරන විධියට ඒවා මිශ්‍රකර
ශුද්ධ තෛලයක් සාදපන්න. ඒ ශුද්ධ
ආලේප තෛලයක් වන්නේය. එයින් 26
සම්මුඛවීමේ කූඩාරමද සාක්ෂි
පෙට්ටියද, මේසය සහ එහි සියලු 27
භාජනද පහන් රුක සහ එහි සියලු
භාජනද දුම් පූජාසනයද, දවන පූජා- 28
සනය සහ එහි සියලු භාජනද සෝදන
භාජනය සහ එහි අඩියද ආලේප-
කරපන්න. ඒවා අති ශුද්ධව තිබෙන 29
පිණිස එසේ විශුද්ධ කරපන්න. ඒවාට
නැවරෙන කොයි දෙයක් නමුත් කැපව
තිබේවා. ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් 30
පූජක තනතුරෙහි මට මෙහෙකරන
පිණිස ආලේප කොට විශුද්ධකරපන්න.
තුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට: 31
මේවා තුඹලාගේ පරම්පරාවල මට
ශුද්ධ ආලේප තෛලයක් වන්නේය.
මනුෂ්‍ය ශරීරය පිට ඒවා වත්කරනු 32
නොලැබිය යුතුය, තුඹලා ඒවායේ ද්‍රව්‍ය

ප්‍රමාණයේ හැටියට ඒ හා සමාන
කිසිවක් නොසෑදිය යුතුය. එය ශුද්ධය,
33 එය නුඹලාට ශුද්ධ වන්නේය. ඊට
සමානව ඒවා මිශ්‍රකරන්නා හෝ එයින්
විදේශියෙකුට ගාන්නා හෝ තමන්ගේ
සෙනඟ කෙරෙන් සිඳදමනු ලබන්නේ-
යයි කියවයි කීසේක.
34 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කියන-
සේක්: සුගන්ධ ද්‍රව්‍ය එනම් නාතාප්
සහ ෂෙධෙලෙත්ද බෙල්බෙනාද යන
සුගන්ධ ද්‍රව්‍ය සහ පවිත්‍ර තුවරලාද
35 එකිනෙක සමබරට ගෙන, තෛල
මිශ්‍රකරන විධියට ඒවා මිශ්‍රකර ලුණු
දමා පවිත්‍රවූ ශුද්ධවූ සුගන්ධයක්
36 සාදපන්න. ඉන් කොටසක් සුණුකොට
එයින් මා නුඹට සම්මුඛවෙන තැනවූ
සම්මුඛවීමේ කූඩාරමෙහි සාක්ෂිය
ඉදිරියෙහි තබාපන්න. එය නුඹලාට ඉතා
37 ශුද්ධ වන්නේය. නුඹ සාදන සුගන්ධය
ඒ ද්‍රව්‍ය ප්‍රමාණයේ හැටියට නුඹලාට
සාදනොගනිල්ලා. ඒවා නුඹලාට
ස්වාමීන්වහන්සේ උදෙසා ශුද්ධ
38 වන්නේය. සුවඳ පිණිස ඊට සමාන
සුගන්ධයක් සාදන කවරෙක් නුමුත්
තමාගේ සෙනඟ කෙරෙන් සිඳදමනු
ලබන්නේයයි කීසේක.

## කර්මාන්තකාරයින් පත්කිරීම

31 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
2 කථාකොට: බලව, මම යූදගේ
ගෝත්‍රයේ හූර්ගේ පුත්‍රයා වන උරීගේ
පුත්‍රවූ බෙශලෙල්ගේ නම කියා
3 ඔහු කැඳවා, දක්ෂ කර්මාන්ත යෝජනා
කර රනින්ද රිදීයෙන්ද පිත්තලෙන්ද
4 වැඩ කිරීමටත්, බැඳීමට මැණික්
කැපීමටත් ලීවලින් කැටයම් වැඩ
කිරීමටත් සියලු ආකාර වැඩවලට
5 ප්‍රඥාවද බුද්ධියද දැනගැන්මද සියලු
ආකාර කර්මාන්තවලට තේරුමද
ලැබෙන ලෙස ඔහු දෙවියන්වහන්සේගේ
6 ආත්මයෙන් පූර්ණ කෙළෙමි. තවද බලව,
මම ඔහු සමග දාන්ගේ ගෝත්‍රයේ
අහිසාමක්ගේ පුත්‍රවූ ඔහොලියාබ්
පත්කෙළෙමි; මා විසින් නුඹට අණකළ
සියල්ල සාදන පිණිස ප්‍රඥාව ඇති
සියල්ලන්ගේ හෘදයන්හි ප්‍රඥාව තැබීමි.
සම්මුඛවීමේ කූඩාරමද සාක්ෂි පෙට්ටියද 7
ඒක පිට තබන කරුණාසනයද
කූඩාරමේ සියලු බඩුද, මේසය සහ 8
එහි භාජනද පවිත්‍ර පහන් රුක සහ
එහි සියලු භාජනද දුම් පූජාසනයද,
දවන පූජාවල පූජාසනය සහ එහි සියලු 9
භාජනද සෝදන භාජනය සහ එහි
අඩියද, විසිතුරුකළ වස්ත්‍රද පූජක 10
තනතුරෙහි මෙහෙකිරීමට පූජකවූ
ආරොන්ට ශුද්ධ වස්ත්‍ර සහ ඔහුගේ
පුත්‍රයන්ගේ වස්ත්‍රද, ආලේප තෛලයද 11
ශුද්ධ ස්ථානයට සුගන්ධ ධූප ද්‍රව්‍යද
මා විසින් නුඹට අණකළ සියල්ල ලෙස
ඔව්හු කරත්වායයි කීසේක.

## සබත් දවස

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 12
කොට: නුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 13
කථාකරමින්: සැබවින් නුඹලා මාගේ
සබත් රක්ෂාකළ යුතුය. මක්නිසාද
නුඹලා විශුද්ධකරන්නාවූ ස්වාමීන්-
වහන්සේ මමයයි නුඹලා දැනගන්නා
පිණිස ඒක නුඹලාගේ පරම්පරාවල
නුඹලා සහ මා අතරෙහි ලකුණක්ය.
එබැවින් නුඹලා සබත් දවස රක්ෂා- 14
කරපල්ලා; මක්නිසාද එය නුඹලාට
ශුද්ධය. එය අශුද්ධකරන කවරෙක්
නුමුත් සැබවින්ම මරනු ලබන්නේය.
මක්නිසාද ඒ දවසෙහි යමෙක් යම්
වැඩක් කෙරේද ඒ තැනැත්තේ තමාගේ
සෙනඟ අතරෙන් සිඳදමනු ලබන්නේය.
සදවසක් වැඩ කළ යුතුය; එහෙත් 15
සත්වෙනි දවස ස්වාමීන්වහන්සේට
ශුද්ධවූ ගරුමයවූ නිවාඩුව වන සබතක්ය.
සබත් දවසේදී යම් වැඩක් කරන
කවරෙක් නුමුත් සැබවින්ම මරනු
ලබන්නේය. එබැවින් ඉශ්‍රායෙල් පුත්‍රයන් 16
තමුන්ගේ පරම්පරාවල නිරන්තර
ගිවිසුමක් කොට සබත් පවත්වමින්
සබත් දවස රක්ෂාකළ යුතුය. එය 17
සදාකාලයටම මා සහ ඉශ්‍රායෙල්

පුත්‍රයන් අතරේ ලකුණක්ය. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** අහසත් පොළොවත්
සදවසකින් සාදා සත්වෙනි දින
නැවතී නිවාඩුගත්සේකැයි කියාපන්නැයි
කීසේක.
18 උන්වහන්සේ සීනයි කන්ද පිටදී
මෝසෙස් සමග කථාකර කෙළවරවූ
කල දෙවියන්වහන්සේගේ ඇඟිල්ලෙන්
ලියනලද ගල්ලෑලිවූ සාක්ෂියේ ලෑලි
දෙක ඔහුට දුන්සේක.

## රන් වහු රූපය

32 මෝසෙස් කන්දෙන් බසින්ට
ප්‍රමාදවන බව සෙනඟ දැක
ආරොන් ළඟට රැස්ව: නැගිටින්න, අපට
පෙරටුව යන පිණිස අපට දෙවිකෙනෙක්
සාදපන්න; මක්නිසාද මිසර දේශයෙන්
අප ගෙනා මනුෂ්‍යයා වූ මේ මෝසෙස්ට
කුමක් වීදැයි නොදනිමුයයි කීවෝය.
2 ආරොන්ද: තුඹලාගේ භාර්යාවන්ගේද
පුත්‍රයන්ගේද දූවරුන්ගේද කන්වල
තිබෙන රන් කුණ්ඩලාභරණ ගළවා
3 මා ළඟට ගෙනෙල්ලායයි කීය. එවිට
මුළු සෙනඟ තමුන්ගේ කන්වල තිබුණු
රන් කුණ්ඩලාභරණ ගළවා ආරොන්
4 ළඟට ගෙනාවෝය. ඔහු ඒවා ඔවුන්
අතින් ගෙන කැටයම්කරන ආවුදයකින්
හැඩ කොට වාත්තු වස්සෙකු සෑදුවේය.
ඔව්හුද: එම්බා ඉශ්‍රායෙල්, තුඹ මිසර
දේශයෙන් ගෙනාවාවූ තුඹේ දෙවියෝ
5 මේයයි කීවෝය. ආරොන් ඒ
දැක ඒක ඉදිරියෙහි පූජාසනයක්
ගොඩනගා: හෙට **ස්වාමීන්වහන්සේට**
මංගල්‍යයක් වන්නේය කියා ප්‍රසිද්ධියක්
6 කෙළේය. ඔව්හු පසුවද වේලාසනින්
නැගිට, දවන පූජා ඔප්පුකළෝය,
ශාන්ති පූජාද ගෙනාවෝය; එවිට
සෙනඟ කන්ටත් බොන්ටත් ඉඳ පසුව
සෙල්ලම් කරන්ට නැගුටුණෝය.
7 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
කොට: පලයන්න, බැස පලයන්න;
මක්නිසාද තුඹ මිසර දේශයෙන්
ගෙනාවාවූ තුඹේ සෙනඟ තමන්ම
දූෂ්‍යකරගෙන, මා අණකළ මාර්ගයෙන් 8
ඉක්මනින් අහක්ව ගියෝය. ඔව්හු වාත්තු
වස්සෙකු සාදාගෙන ඊට නමස්කාරකර,
පූජාකර—එම්බා ඉශ්‍රායෙල්, තුඹ
මිසර දේශයෙන් ගෙනාවාවූ තුඹේ
දෙවියෝ මේයයි කීවෝයයි කීසේක.
තවද **ස්වාමීන්වහන්සේ**: මම මේ සෙනඟ 9
විමසීමි, බලව, ඔව්හු තද කුළල් ඇති
සෙනඟක්ය. එබැවින් මාගේ උදහස 10
ඔවුන්ට විරුද්ධව ඇවිළී ඔවුන් විනාශ-
කරන පිණිස මට ඉඩහැරපන්න; මම
තුඹෙන් මහත් ජාතියක් උපදවන්නෙමියි
මෝසෙස්ට කීසේක. මෝසෙස් තමන් 11
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** කන්නලව්
කරනුයේ: **ස්වාමීන්වහන්ස**, ඔබ මහත්
බලයෙන් හා බලසම්පන්න හස්තයකින්
මිසර දේශයෙන් ගෙනාවාවූ ඔබගේ
සෙනඟට විරුද්ධව ඔබගේ උදහස
ඇවිළෙන්නේ මන්ද? උන්වහන්සේ ඔවුන් 12
පිටතට ගෙනගියේ නපුර පිණිසය, එනම්
කඳුවලදී ඔවුන් මරා පොළෝතලය මතු-
පිටින් ඔවුන් නාස්තිකරන පිණිසයයි
කියන්ට මිසරවරුන්ට ඉඩදෙන්නේ
මක්නිසාද? ඔබගේ තද උදහසෙන් හැරී
ඔබගේ සෙනඟට පමුණුවන්ට යන මේ
විපත ගැන තැවුණ මැනව. ඔබගේ 13
මෙහෙකරුවන්වූ ආබ්‍රහම්ද ඊසාක්ද
ඉශ්‍රායෙල්ද සිහිකළ මැනව, ඔබ ඔබ-
වහන්සේ ගැනම ඔවුන්ට දිවුරමින්:
තුඹලාගේ වංශය අහසේ තාරකා මෙන්
බෝකොට මා කීවාවූ මේ මුළු දේශය
තුඹලාගේ වංශයට දෙන්නෙමි, ඔව්හු
එය සදාකාලේටම උරුමකරගන්නෝයයි
ඔබ කීසේකැයි කීවේය. **ස්වාමීන්**- 14
**වහන්සේ** තමන් සෙනඟට කරන්නේයයි
කී විපත ගැන තැවුණසේක.
එවිට මෝසෙස් හැරී තමන් අතින් 15
සාක්ෂියේ ලෑලි දෙක රැගෙන කන්දෙන්
බැස්සේය; ඒ ලෑලිවල දෙපැත්තේ ලියා
තිබුණේය; ඒවායේ එක පැත්තකද අනික්
පැත්තේද ලියා තිබුණේය. ඒ ලෑලි 16

දෙවියන්වහන්සේගේ කර්මාන්තයද ලෑලි
පිට කොටනලද ලියවිල්ල දෙවියන්-
17 වහන්සේගේ ලියවිල්ලද විය. සෙනඟ
ඝෝෂාකරන හඬ යෝෂුවාට ඇසී:
කඳවුරෙහි යුද්ධ ඝෝෂාවක් තිබේයයි
18 මෝසෙස්ට කීය. ඔහු: මට ඇසෙන්නේ
ජය නිසා ඝෝෂාකරන්නන්ගේ
ශබ්දයවත් පරාජය නිසා හඬනගන්-
නන්ගේ ශබ්දයවත් නොව ගීතිකා-
19 කරන්නන්ගේ හඬයයි කීය. තවද ඔහු
කඳවුරට ළංවූ වහාම වස්සාද නැටීමද
දුටුවේය. මෝසෙස්ගේ උදහස ඇවිළු-
ණේය, ඔහු තමාගේ අතින් ලෑලි හෙළා
20 කන්ද මුලදී ඒවා බින්දේය. ඔහු ඔවුන්
විසින් සෑදූ වස්සා ගෙන ගින්නෙන්
දවා දූවිලි වෙන තුරු කුඩුකර ඒවා
වතුර පිට ඉස ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
21 බොන්ට සැලැස්සුවේය. මෝසෙස්ද
ආරොන්ට කථාකොට: මේ සෙනඟ
කෙරෙහි මහත්වූ පාපයක් පමුණුවන්ට
ඔවුන් නුඹට කළේ කුමක්දැයි ඇසුවේය.
22 ආරොන්ද: මාගේ ස්වාමිහුගේ උදහස
නොඇවිළේවා. සෙනඟ නපුරට සෑදී
23 සිටින බව ඔබ දන්නෙහිය. කුමක්
හෙයින්ද: අපට පෙරටුව යන පිණිස
දෙවිවරුන් සාදපන්න. මිසර දේශයෙන්
අප ගෙනා මනුෂ්‍යයා වන මේ
මෝසෙස්ට කුමක් සිදුවූණේදැයි නො-
24 දනිමුයයි ඔව්හු මට කීවෝය. මමද:
රන් ඇති කවුරු නුඹුත් එය ගළවා
දෙත්වයි ඔවුන්ට කීවෙමි; ඔව්හු එය
මට දුන්නෝය. මම එය ගින්නෙහි දැමු-
වෙමි, එවිට මේ වස්සා නික්ම ආයේ-
25 යයි කීවේය. සෙනඟ තෘෂ්ණාවට හැරී
සිටින බව මෝසෙස් දුටුවේය; මක්නිසාද
ඔවුන්ගේ සතුරන් අතරේ ඔවුන් හෙළා
දක්නා ලබන පිණිස ආරොන් ඔවුන්ගේ
26 තෘෂ්ණාවට ඉඩ හැරියේය. එවිට
මෝසෙස් කඳවුරේ දොරකඩ සිට:
**ස්වාමීන්වහන්සේගේ** පක්ෂයට සිටින්නේ
කවරෙක්ද, ඔහු මා වෙතට ඒවයි කීය.
එවිට ලෙවීගේ සියලු පුත්‍රයෝ ඔහු
27 ළඟට රැස්වූවෝය. ඔහුද: එක් එක්කෙනා
තම තමාගේ කඩුව කළවයෙහි
බැඳගෙන කඳවුර මුළුල්ලෙහි දොරටු-
වෙන් දොරටුවට ඔබ මොබ ගොස් එක්
එක්කෙනා තම තමාගේ සහෝදරයාද
එක් එක්කෙනා තම තමාගේ මිත්‍රයාද
එක් එක්කෙනා තම තමාගේ අසල්-
වාසියාද මරාපල්ලායයි ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
ඔවුන්ට කීවේය. ලෙවීගේ පුත්‍රයෝ 28
මෝසෙස්ගේ වචනය ලෙස කළෝය.
එසේ ඒ දවසේදී සෙනඟ අතරෙන් තුන්-
දහසක් පමණ මනුෂ්‍යයෝ වැටුණෝය.
මෝසෙස්ද: මෙදින නුඹලා කෙරෙහි 29
**ස්වාමීන්වහන්සේ** ආශිර්වාදයක් එවන
පිණිස එක් එක්කෙනා තම තමාගේ
පුත්‍රයාට විරුද්ධවද තම තමාගේ
සහෝදරයාට විරුද්ධවද අද උන්-
වහන්සේට කැපවෙයල්ලායයි කීය.
පසුවද මෝසෙස් සෙනඟට කථාකොට: 30
නුඹලා මහත් පාපයක් කළහුය, මම දැන්
**ස්වාමීන්වහන්සේ** වෙතට නගින්නෙමි;
සමහර විට නුඹලාගේ පාපය ගැන
සමගිකමක් කරන්ට මට පුළුවන්
වන්නේයයි සෙනඟට කීවේය. මෝසෙස් 31
**ස්වාමීන්වහන්සේ** වෙතට හැරී ගොස්:
අහෝ, මේ සෙනඟ මහත් පාපයක්
කර තමුන්ට රනින් දෙවිවරුන් සාද-
ගත්තෝය. එහෙත් දැන් ඔබ ඔවුන්ගේ 32
පාපය ක්ෂමාකරන්ට කැමතිවනසේක්
නම් [යහපත]; නැතහොත් ඔබවහන්සේ
ලියා තිබෙන පොතෙන් මා මකාදමුව
මැනවයි කීවේය. එවිට **ස්වාමීන්-** 33
**වහන්සේ**: මට විරුද්ධව පව්කළ කවරෙකු
නුඹුත් මාගේ පොතෙන් මකා දමන්-
නෙමි. දැන් නුඹ ගොස් මා විසින් නුඹට 34
කී ස්ථානයට සෙනඟ ගෙනයාපන්න.
බලව, මාගේ දූතයා නුඹට පෙරටුව
යන්නේය, එහෙත් මා විසින් ප්‍රතිඵල
දෙන දවසේදී ඔවුන්ගේ පාපය
ගැන ඔවුන්ට දඬුවම් කරන්නෙමියි
මෝසෙස්ට කීසේක. ආරොන් සෑදූ 35
වස්සා සෙනඟ විසින් සාදවා ගත් බැවින්
**ස්වාමීන්වහන්සේ** ඔවුන්ට පහරදුන්-
සේක.

## ගමන නැවත යාම

33 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: නුඹ සහ නුඹ විසින්
මිසර දේශයෙන් ගෙනා සෙනඟද
මෙතැනින් පිටත්ව: නුඹේ වංශයට
දෙන්නෙමියි මම ආබ්‍රහම්ටත් ඊසාක්ටත්
යාකොබ්ටත් දිවුළ දේශයට පලයල්ලා.
2 මම නුඹට පෙරටුව දූතයෙකු යවා
කානානිවරුන්ද අමෝරිවරුන්ද හිත්තී-
වරුන්ද පෙරිස්සිවරුන්ද හිවීවරුන්ද
3 යෙබූසිවරුන්ද පන්නාදමන්නෙමි. ඒක
කිරිද මීපැණිද ගලා යන දේශයක්ය.
නුඹ තද කුළල් ඇති සෙනඟක් බැවින්
මාර්ගයේදී මා විසින් නුඹලා විනාශ-
නොකරන පිණිස නුඹලා අතරේ නො-
4 යන්නෙමියි කීසේක. සෙනඟ මේ
නපුරු ප්‍රවෘත්ති අසා වැලපුණෝය.
කිසි මනුෂ්‍යයෙක්වත් තමාගේ ආභරණ
5 පැළඳ නොගත්තේය. ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට කියනසේක්: ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකොට—නුඹලා තද
කුළල් ඇති සෙනඟක්ය. මම එක
මොහොතකට නුඹලා අතරට පැමිණි-
යෙම් නම් නුඹලා නැතිකරදමන්-
නෙමි. එබැවින් නුඹලාට කළ යුතු දේ
කිමෙක්දැයි දැනගන්නා පිණිස දැන්
නුඹලාගේ ආභරණ නුඹලා වෙතින්
පහකරපල්ලායයි කියවයි කීසේක.
6 ඉශ්‍රායෙල් පුත්‍රයෝද හොරේබ් කන්දේ
පටන් ඉන් ඉදිරියට තමුන්ගේ ආභරණ
ගළවාගන ගියෝය.
7 මෝසෙස් කූඩාරම ගෙන කඳවුරෙන්
පිටත කඳවුරට ඈතින් පිහිටුවන්ට
පුරුදුව සිටියේය; ඔහු ඊට සම්මුඛවීමේ
කූඩාරමයයි නම් තැබුවේය. තවද
ස්වාමීන්වහන්සේ සොයන හැමදෙනාම
කඳවුරෙන් පිට තිබුණු සම්මුඛවීමේ
8 කූඩාරම ළඟට ගියෝය. මෝසෙස්
කූඩාරම ළඟට පිටතට ගිය කල මුළු
සෙනඟ නැඟිට එක එක මනුෂ්‍යයා තම
තමාගේ කූඩාරමේ දෙරකඩ සිට
මෝසෙස් කූඩාරමට ඇතුල්වන තෙක්
9 ඔහු දෙස බලා සිටියෝය. මෝසෙස්
කූඩාරමට ඇතුල්වූ කල්හි වලාටැඹ
බැස කූඩාරමේ දෙරකඩ ළඟ සිටියේය.
ස්වාමීන්වහන්සේද මෝසෙස් සමග
කථාකළසේක. වලාටැඹ කූඩාරමේ 10
දෙරකඩ ළඟ සිටිනවා දුටුවිට මුළු
සෙනඟ නැඟිට එක එක අය තම
තමන්ගේ කූඩාරම් දෙරකඩ සිට
නමස්කාර කළෝය. මනුෂ්‍යයෙකු තමාගේ 11
මිත්‍රයාට මුහුණට මුහුණ ලා කථා-
කරන්නාක්මෙන් ස්වාමීන්වහන්සේ
මෝසෙස් සමග කථාකළසේක. ඔහු
නැවත කඳවුරට හැරී ආයේය. නුමුත්
නූන්ගේ පුත්‍රවූ තරුණයෙක් වන ඔහුගේ
සේවකයාවූ යෝෂුවා කූඩාරමෙන්
අහක්ව නොගියේය.

## මෝසෙස්ගේ කන්නලව්කිරීම. ස්වාමීන්වහන්සේගේ උත්තර දීම

මෝසෙස් ස්වාමීන්වහන්සේට කථා- 12
කොට: බැලුව මැනව, ඔබවහන්සේ—
මේ සෙනඟ ගෙන යවයි මට කී නුමුත්
මා සමග යවන්නේ කවරෙක්දැයි
මට නොදන්වූසේක. එසේවීනුමුත්:
නාමයෙන් නුඹ අඳුනමියි කියාත් මා
ඉදිරියෙහි නුඹට කරුණාව ලැබුණේය
කියාත් ඔබ මට කීසේක. එබැවින් මට 13
ඔබ ඉදිරියෙහි කරුණාව ලැබී තිබේ
නම් ඔබ ඉදිරියෙහි මට කරුණාව
ලැබෙන හැටියට මා විසින් ඔබ
හැඳිනගන්නා පිණිස ඔබගේ මාර්ගයන්
දැන් මට පෙන්නුව මැනව. මේ ජාතිය
ඔබගේ සෙනඟ බවත් සැලකුව මැනවයි
කීවේය. උන්වහන්සේද: මම්ම නුඹ සමග 14
ගොස් නුඹට නිවාඩු දෙන්නෙමියි
කීසේක. ඔහු: ඔබවහන්සේම නොයන- 15
සේක් නම් මෙතැනින් අප ගෙන නොගිය
මැනව. මක්නිසාද මටත් ඔබගේ 16
සෙනඟටත් ඔබ ඉදිරියෙහි කරුණාව
ලැබී තිබෙන බව දැනගන්නේ කුමකින්ද?
අප එනම් මාද ඔබගේ සෙනඟද භූමිය
මතුපිට සිටින මුළු සෙනඟ කෙරෙන්

වෙන්කරනුලබන ලෙස අප සමග
ඔබගේ යාමෙන් නොවේදැයි උන්-
වහන්සේට කීසේක.
17 ස්වාමීන්වහන්සේද: තුඹ කී මේ දේත්
කරන්නෙමි. මක්නිසාද තුඹට මා
ඉදිරියෙහි කරුණාව ලැබී තිබේ,
නාමයෙන්ද තුඹ අඳුනමියි මෝසෙස්ට
18 කීසේක. ඔහුද: අනේ ඔබගේ තේජස
මට පෙන්නුව මැනවයි කීවේය.
19 උන්වහන්සේද: මම මාගේ සියලු
ගුණවත්කම තුඹ ඉදිරිපිටින් යන්ට
සලස්වා ස්වාමීන්වහන්සේගේ නාමය
තුඹ ඉදිරිපිට ප්‍රකාශකරන්නෙමි;
මම කරුණා කරන්ට කැමති
තැනැත්තාට කරුණා කරන්නෙමි, මම
දයාව පෙන්වන්ට කැමති තැනැත්තාට
20 දයාව පෙන්වන්නෙමියි කීසේක. තවද
උන්වහන්සේ: මාගේ මුහුණ දකින්ට
තුඹට නුපුළුවන. මක්නිසාද මනුෂ්‍යයා
මා දැක ජීවත් නොවන්නේයයි කීසේක.
21 ස්වාමීන්වහන්සේද: බලව, මා ළඟ
ස්ථානයක් තිබේ, තුඹ පර්වතය පිට
22 සිටපන්න. එවිට මාගේ තේජස තුඹ
පසුකර යන කල මම තුඹ පර්වතයේ
විවරයෙක්හි තබා මා තුඹ පසුකර
යනතුරු මාගේ අතින් තුඹ වසන්-
23 නෙමි. මමද මාගේ අත අහකට-
ගන්නෙමි, එවිට තුඹ මාගේ *පශ්චිම
ප්‍රභාව දකින්නෙහිය. එහෙත් මාගේ
මුහුණ දකිනු නොලබන්නේයයි
කීසේක.

## ව්‍යවස්ථාවේ දෙවෙනි ගල්ලැලි

34 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කියනසේක්: පළමු ඒවා වැනි
ගල්ලැලි දෙකක් කපාගනින්න. තුඹ
විසින් බින්ද පළමු ලැලිවල තිබුණු
2 වචන ඒ ලැලිවල ලියන්නෙමි. අලුයම්
වේලෙහි සැදී සිට උදයම සීනයි
කන්දට නැගී ඇවිත් එහි කන්ද මුදුනේ
3 මා ඉදිරියෙහි පෙනීසිටපන්න. කිසි
මනුෂ්‍යයෙක් තුඹ සමග උඩට

*හෙවත්, පිට

නොපැමිණිය යුතුය, කන්ද මුළුල්ලෙහිම
කිසි මනුෂ්‍යයෙක් දක්නා නොලැබිය
යුතුය; ඒ කන්ද ඉදිරියෙහි එළු බැටළු
රැළවල්වත් ගව රැළවල්වත් ගොදුරු
කන්ට නොහැරිය යුතුයයි කීසේක.
මෝසෙස් පළමු ඒවා වැනි ගල්ලැලි 4
දෙකක් කපා ගත්තේය; ඔහු උදෑසන
නැගිට තමන් අතින් ගල්ලැලි දෙක
රැගෙන ස්වාමීන්වහන්සේ අණ දුන් ලෙස
සීනයි කන්දට නැගුණේය.

## ස්වාමීන්වහන්සේ අලුතෙන් ප්‍රකාශවීම

එවිට ස්වාමීන්වහන්සේ වලාකුළ 5
ඇතුව බැස එහි ඔහු සමග සිට
ස්වාමීන්වහන්සේගේ නාමය ප්‍රකාශකළ-
සේක. ස්වාමීන්වහන්සේ ඔහු ඉදිරිපිටින් 6
වඩිමින්: ස්වාමීන්වහන්සේය, ස්වාමීන්-
වහන්සේය, උන්වහන්සේ අනුකම්පාවෙන්
පූර්ණවූ දයාවන්තවූ උදහස්වීමට
ප්‍රමාදවන්නාවූ අධිකතර කරුණාව සහ
සැබෑකමද ඇත්තාවූ දෙවි කෙනෙක්ය.
උන්වහන්සේ දහස් ගණනකට කරුණාව 7
පවත්වනසේක, අයුතුකමත් අපරාධයත්
පාපයත් ක්ෂමාකරනසේක. වරද-
කරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස්
නොකරනසේක; තුන්වෙනි සතර-
වෙනි පරම්පරාව දක්වා දරුවන්ටත්
දරුවන්ගේ දරුවන්ටත් පියවරුන්ගේ
අධර්මිෂ්ඨකම ගැන ප්‍රතිඵල දෙන-
සේකැයි ප්‍රකාශකළසේක. මෝසෙස්ද 8
ඉක්මන්කොට තමන් හිස බිමට නමා
වැන්දේය. එවිට ඔහු: අහෝ ස්වාමීන්- 9
වහන්ස, ඔබ ඉදිරියෙහි මට කරුණාව
ලැබී තිබේ නම් ස්වාමීන්වහන්සේ
අප අතරෙහි යනසේක්වා; මක්නිසාද
මොව්හු තද කුළල් ඇති සෙනඟක්ය;
නුමුත් අපේ අයුතුකමද පාපයද
ක්ෂමාකර අප ඔබගේ උරුමය කොට
පිළිගතමැනවයි කීයේය.

## ගිවිසුම නැවත පිහිටුවීම

උන්වහන්සේද: බලව, මම ගිවිසුමක් 10
කරන්නෙමි. මුළු පොළොවෙහි හෝ

කිසි ජාතියක් අතරෙහි හෝ කරනු
නොලැබූ පුදුම දේ නුඹේ මුළු සෙනඟ
ඉදිරියෙහි කරන්නෙමි. නුඹ යම්
සෙනඟක් අතරෙහි සිටිනෙහිද ඒ මුළු
සෙනඟ **ස්වාමීන්වහන්සේගේ** ක්‍රියාව
දකින්නෝය; මක්නිසාද මා නුඹ සමග
11 කරන දේ භයානක දෙයක්ය. අද මා
විසින් නුඹට අණකරන දෙය සිතට
ගනින්න. බලව, අමෝරිවරුන්ද
කානානිවරුන්ද හිත්තීවරුන්ද පෙරිස්සි-
වරුන්ද හිවීවරුන්ද යෙබූසිවරුන්ද නුඹ
12 ඉදිරියෙන් පන්නාදමන්නෙමි. නුඹ යන
දේශයේ වැසියන් නුඹලා අතරේ
මළපතක් නොවන පිණිස ඔවුන් සමග
ගිවිසුමක් නොකරන්ට බලාගනින්න.
13 නුඹලා ඔවුන්ගේ පූජාසන කඩාදමා,
ඔවුන්ගේ රූපස්තම්භ බිඳදමා, ඔවුන්ගේ
14 අෂේරා කණු කපාදමාපල්ලා. මක්-
නිසාද ස්වයම් ගෞරව රක්ෂක නම්වූ
**ස්වාමීන්වහන්සේ** ස්වකීය ගෞරවය
රක්ෂාකරන්නාවූ දෙවිකෙනෙක් බැවින්
නුඹ අන් දෙවි කෙනෙකුට නමස්කාර
15 නොකළ යුතුය. නැතහොත් නුඹ දේශයේ
වැසියන් සමග යම් ගිවිසුමක් කරනවා
ඇත. එවිට ඔවුන් තමුන්ගේ දෙවිවරුන්
සමග වේශ්‍යාකම් කරමින් තමුන්ගේ
දෙවිවරුන්ට යාග පුදන කල්හි ඔවුන්-
ගෙන් කෙනෙක් නුඹට අඬ ගසන කල
16 නුඹ ඔහුගේ යාගයෙන් කැමටද, නුඹ
විසින් ඔවුන්ගේ දූවරුන්ගෙන් නුඹේ
පුත්‍රයන්ට පාවාගන්ටද ඔවුන්ගේ දූවරුන්
තමන්ගේ දෙවිවරුන් සමග වේශ්‍යාකම්
කොට නුඹේ පුත්‍රයන්ද ඔවුන්ගේ
දෙවිවරුන් සමග වේශ්‍යාකම් කිරීමටද
17 සලස්වනු ලබනවා ඇත. වාත්තු දෙවි-
වරුන් සාදනොගනින්න.

## මංගල්‍ය හා සබත් නැවත නියමකිරීම

18 මුහුන් නොදැමූ රොටි මංගල්‍යය
පවත්වාපන්න. මා නුඹට අණදුන් ලෙස
ආබීබ් මාසයේ නියම කාලයෙහි සත්
දවසක් මුහුන් නොදැමූ රොටි කාපන්න.
මක්නිසාද ආබීබ් මාසයේදී නුඹ
මිසරයෙන් පිටතට ආවෙහිය. ගර්භයේ 19
ප්‍රථම ඵලවූ සියල්ලෝද ගවයන්ගෙන්ද
බැටළුවන්ගෙන්ද උපදින සියලුම
කුලුඳුල් පිරිමි සත්තුද මාගේය. කුලුඳුල් 20
කොටළුවා වෙනුවට බැටළු වස්සෙකු
දී ඌ මුදගනින්න. මුදගන්ට නො-
කැමැත්තෙහිනම් නුඹ උගේ බෙල්ල
කඩන්ට ඕනෑය. නුඹේ පුත්‍රයන්ගෙන්
සියලු කුලුඳුලන් මුදගනින්න. සිස් අතින්
කිසිවෙක් මා ඉදිරියෙහි නොපෙනේවා.
නුඹ සදවසක් වැඩකොට සත්වෙනි 21
දින නිවාඩු ගත යුතුය. හාන කාලයෙත්
ගොයම් කපන කාලයෙත් ඒ දින
නිවාඩු ගත යුතුය. තිරිඟු කපන කාලයේ 22
ප්‍රථම ඵල ඔප්පුකිරීමේ සති මංගල්‍යයද
අවුරුද්දේ කෙළවරදී රැස්කිරීමේ මංගල්‍ය-
යද නුඹ විසින් පැවැත්විය යුතුය. නුඹේ 23
සියලු පිරිමි අවුරුද්දකට තුන්වරක්
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** ඉදිරියෙහි පෙනී සිටින්ට
ඕනෑය. මක්නිසාද මම නුඹ ඉදිරියෙන් 24
ජාතීන් දුරුකොට නුඹේ සීමාව
විශාල කරන්නෙමි. නුඹ අවුරුද්දකට
තුන් වරක් නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි පෙනෙන්ට යන
කල්හි කිසිවෙක් නුඹේ දේශයට
ආශා නොකරන්නේය. නුඹ මාගේ 25
යාගයේ ලේ මුහුන් දැමූ රොටි සමග
පූජා නොකළ යුතුය; පාස්කු මංගල්‍යයේ
යාගයද පසුවද උදය දක්වා ඉතිරිකර
නොතැබිය යුතුය. නුඹේ බිමේ ප්‍රථම 26
ඵලයෙන් ප්‍රථම කොටස නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ගෙනෙන්න. නුඹ එළුපැටවෙකු උගේ
මවුගේ කිරෙන් නොපිසිය යුතුයයි
කීසේක. තවද **ස්වාමීන්වහන්සේ** 27
මෝසෙස්ට කථාකොට: මේ වචන
ලියාගනින්න. මක්නිසාද මේ වචන
ලෙස මම නුඹ සමගද ඉශ්‍රායෙල් සමගද
ගිවිසුමක් කෙළෙමියි කීසේක. ඔහු දවල් 28
සතළිසක්ද රෑ සතළිසක්ද කෑම නොකා
වතුර නොබී එහි **ස්වාමීන්වහන්සේ**
සමග සිටියේය. උන්වහන්සේ ගිවිසුමේ
වචන වන ආඥා දසය ලෑලිවල ලියා
දුන්සේක.

## මෝසෙස්ගේ මුහුණු වැස්ම

29 තවද මෝසෙස් සාක්ෂියේ ලැලි දෙක
තමාගේ අතින් ගෙන සීනයි කන්දෙන්
බැස්සේය, තුමුත් උන්වහන්සේ මෝසෙස්
සමග කථාකිරීම කරණකොටගෙන
ඔහුගේ මුහුණේ සමෙන් රශ්මි විහිදෙන
බව කන්දෙන් බැස්ස කල ඔහු නොදන
30 සිටියේය. ආරොන් සහ සියලු ඉශ්‍රායෙල්
පුත්‍රයන් මෝසෙස් දුටු කල, බලව, ඔහුගේ
මුහුණේ සමෙන් රශ්මි විහිදෙමින්
තිබුණේය; එබැවින් ඔව්හු ඔහු ළඟට
31 එන්ට භයවූය. තුමුත් මෝසෙස් ඔවුන්ට
අඬගැසුවේය; එවිට ආරොන්ද සභාවේ
සියලු අධිපතිවරුද ඔහු ළඟට හැරී
ආවෝය. මෝසෙස් ඔවුන්ට කථා-
32 කෙළේය. ඉන්පසු සියලු ඉශ්‍රායෙල්
පුත්‍රයෝ ළඟට ආවෝය. ඔහුද සීනයි
කන්දේදී **ස්වාමීන්වහන්සේ** ඔහු සමග
කථාකළ සියල්ල ගැන ඔවුන්ට අණ-
33 දුන්නේය. මෝසෙස් ඔවුන් සමග
කථාකොට කෙළවරවූ කල වැස්මක්
34 තමාගේ මුහුණේ තබාගත්තේය. එහෙත්
මෝසෙස් **ස්වාමීන්වහන්සේ** සමග
කථාකරන පිණිස උන්වහන්සේ ඉදිරියට
ඇතුල්ව පිටතට එනතෙක් වැස්ම අහකින්
තැබුවේය; ඔහු පිටතට අවුත් තමාට
අණකරන්ට යෙදුණු කාරණා ඉශ්‍රායෙල්
35 පුත්‍රයන්ට කීයේය; ඉශ්‍රායෙල් පුත්‍රයෝද
මෝසෙස්ගේ මුහුණ බැලූ විට
මෝසෙස්ගේ මුහුණේ සමෙන් රශ්මි
විහිදෙන බව දුටුවෝය. මෝසෙස්ද
උන්වහන්සේ සමග කථාකරන්ට ඇතුල්-
වන තෙක් නැවත තමාගේ මුහුණේ
වැස්ම තබාගත්තේය.

## සබත

35 මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
මුළු සමූහය රැස්කොට කියනුයේ:
තුඹලා විසින් කරන පිණිස **ස්වාමීන්-
වහන්සේ** අණ කළාවූ කාරණා මේවාය:
2 සදවසක් වැඩකළ යුතුය, එහෙත් සත්වෙනි
දින තුඹලාට **ස්වාමීන්වහන්සේ** උදෙසා
ගරුමයවූ නිවාඩුවේ සබතක් වන ශුද්ධවූ
දවසක්ව තිබෙන්ට ඕනෑය. එදින කිසි
වැඩක් කරන කවරෙක් තුමුත් මරනු-
ලබන්නේය. සබත් දවසේදී තුඹලාගේ 3
සියලු වාසස්ථානවල ගින්දර පත්තු
නොකළයුතුයයි කීයේය.

## මණ්ඩපය සහ පූජක ඇඳුම්

### උවමනා ද්‍රව්‍ය

මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු 4
සමූහයට මෙසේ කීය. **ස්වාමීන්වහන්සේ**
අණකර කීවාවූ දේ මේය—තුඹලා 5
අතරෙන් **ස්වාමීන්වහන්සේට** පඬුරක්
ගෙනෙල්ලා. කැමති සිතක් ඇති කවරෙක්
තුමුත් **ස්වාමීන්වහන්සේට** පඬුරක් කොට
රන්ද රිදීද පිත්තලද, නිල්, රත්නිල්, රතු 6
නූල්ද සිහින් හණ රෙදිද එළු ලොම්ද,
රතු සායම් පෙවූ බැටළු සම්ද තහඡ සම්ද 7
ෂිටිම් ලීද, එළිය දීමට තෙල්ද ආලේප 8
තෙල්වලටත් සුවඳ දුම්වලටත් සුගන්ධ
ද්‍රව්‍යයන්ද, ඒෆොද් සහ ළය වැස්ම 9
උදෙසා තබමාණික්‍යද බැඳීමට මැණික්ද
යන මේවා ගෙනේවා. තුඹලා අතරෙහි 10
ප්‍රඥ සිත් ඇති සියල්ලෝ අවුත්
**ස්වාමීන්වහන්සේ** අණකළ සියලු දේ
සාදත්වා; එනම් මණ්ඩපයද ඒකේ 11
කූඩාරමද ඒකේ වැස්මද ඒකේ කොකුද
ඒකේ ලෑලිද ඒකේ පොලුද ඒකේ කණුද
ඒකේ අඩිද; ගිවිසුම් පෙට්ටිය සහ ඒකේ 12
පොලුද කරුණාසනයද කඩතුරාවේ
වැස්මද; මේසය සහ ඒකේ පොලුද ඒකේ 13
සියලු භාජනද පිදීමේ රොටිද; එළිය 14
දීමට පහන්රුකද ඒකේ භාජනද ඒකේ
පහන් සහ එළිය දීමට තෙල්ද; දුම් 15
පූජාසනය සහ ඒකේ පොලුද ආලේප
තෛලයද සුගන්ධ ධූප ද්‍රව්‍යයද
මණ්ඩපයට ඇතුල්වීමේ දොරකඩට
දොරකඩ කඩතුරාවද; දවන පූජාසනය 16
හා ඒකේ පිත්තල ගරාදි මැස්සද
එකේ පොලුද ඒකේ සියලු භාජනද
සෝදන භාජනය සහ ඒකේ අඩියද;
මළුවේ කඩතිර හා ඒවායේ කුළුනුද 17
ඒවායේ අඩිද මළුවේ දොරකඩට
කඩතුරාවද; මණ්ඩපයේ ඇණද මළුවේ 18

19 ඇණද ඒවායේ ලනුද; ශුද්ධ ස්ථානයෙහි
සේවය පිණිස පූජකයාවූ ආරොන්ට
ශුද්ධ වස්ත්‍රද ඔහුගේ පුත්‍රයන්ගේ වස්ත්‍රද
වන පූජකකම් කිරීමට අදින සියුම්ව
සාදනලද වස්ත්‍රද යන මේවායයි කීවේය.
20 එවිට ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු
සමූහය මෝසෙස් ඉදිරියෙන් අහක්ව
21 ගියේය. තවද තමුන්ගේ සිත් පොලඹවන
ලද්දවූ තමුන්ගේ ආත්මයෙන් කැමති
කරනලද්දවූ සියල්ලෝ අවුත් සම්මුඛවී-
මේ කූඩාරමේ කර්මාන්ත පිණිසද ඒකේ
සියලු මෙහෙය හා ශුද්ධ වස්ත්‍ර පිණිසද
ස්වාමීන්වහන්සේට පඩුරු ගෙනාවෝය.
22 කැමති සිත් ඇති සියලු පුරුෂයෝද
ස්ත්‍රීහුද අවුත් මේබලාද කුණ්ඩලා-
භරණද පේරැස් මුදුද වළලුද යන
සියලු ආකාර රන් බඩු ගෙනාවෝය;
ස්වාමීන්වහන්සේට රන් පඩුරක් ඔප්පු
කරන හැම දෙනා එසේ ගෙනාවෝය.
23 තවද නිල්, රත්නිල්, රතු නූල්ද සිහින්
හණ රෙදිද එළු ලොම්ද රතු සායම්
පෙවූ බැටළු සම්ද තහෂ් සම්ද ඇතුව
24 සිටි සියල්ලෝ ඒවා ගෙනාවෝය. රිදී
හා පිත්තල පඩුරක් ඔප්පුකරන සියල්-
ලෝ ස්වාමීන්වහන්සේගේ පඩුර ගෙනා-
වෝය. මෙහෙයේ යම් කර්මාන්තය-
කට ෂිටිම් ලී ඇති හැම දෙනා ඒවා
25 ගෙනාවෝය. ප්‍රඥ සිත් ඇති සියලු
ස්ත්‍රීහුද තමන් අත්වලින් නූල් කැට,
ඔවුන් විසින් කටිනලද දේ වන නිල්,
රත්නිල්, රතු නූල්ද සිහින් හණ රෙදිද
26 ගෙනාවෝය. ප්‍රඥ ඇතුව සිතින් පො-
ලඹවනලද සියලු ස්ත්‍රීහු එළු ලොම්
27 කැට්ටෝය. අධිපතීහු ඒඵෝද් සැට්ටය
උදෙසාත් ළයවැස්ම උදෙසාත් තබ-
28 මාණික්‍යද බැඳීමට මැණික්ද; එළිය
දීමටත් ආලේප තෛලය පිණිසත්
සුවඳ දුම් පිණිසත් සුගන්ධ ද්‍රව්‍යයන්
29 හා තෙල්ද ගෙනාවෝය. කරන්ට
කියා ස්වාමීන්වහන්සේ මෝසෙස් ලවා
අණකෙරෙවූ සියලුම වැඩවලට යමක්
ගෙනෙන්ට සිත් කැමතිකරවනලද්දවූ
සියලු ස්ත්‍රී පුරුෂයෝ ස්වාමීන්-
වහන්සේ වෙතට ස්වේච්ඡා පඩුරක්
ගෙනාවෝය.

## බෙශලෙල් සහ ඔහොලියාබ්

මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 30
කියනුයේ: බලාපල්ලා, ස්වාමීන්වහන්සේ
යූදගේ ගෝත්‍රයේ හූර්ගේ පුත්‍රයා වන
ඌරිගේ පුත්‍රවූ බෙශලෙල්ගේ නම
කියා ඔහු කැඳවා දක්ෂ කර්මාන්ත 31
යෝජනා කර රනින්ද රිදීයෙන්ද
පිත්තලෙන්ද වැඩ කිරීමටත් බැඳීමට 32
මැණික් කැපීමටත් ලීවලින් කැටයම්
වැඩ කිරීමටත් සියලු ආකාර වැඩ- 33
වලට ප්‍රඥවද බුද්ධියද දනගැන්මද
සියලු ආකාර කර්මාන්තවලට තේ-
රුමද ලැබෙන ලෙස ඔහු දෙවියන්-
වහන්සේගේ ආත්මයෙන් පූර්ණ කළ-
සේක. තවද උන්වහන්සේ ඔහුටද 34
දාන්ගේ ගෝත්‍රයේ අහිසාමක්ගේ පුත්‍රවූ
ඔහොලියාබ්ටද උගන්වන්ටත් සිත් දුන්-
සේක. කැටයම්කරන්නාගේද දක්ෂ 35
කම්කරුවාගේද නිල්, රත්නිල්, රතු නූලින්
සහ සිහින් හණවලින් ගොතන්නාගේද
වියන්නාගේද කොයි කර්මාන්තයක්
තුමුන් කරන්නාගේද දක්ෂ කර්මාන්ත
යොදන්නන්ගේද සියලු ආකාර කර්-
මාන්ත කරන්ට ඔවුන්ගේ සිත්
ප්‍රඥවෙන් පූර්ණ කළසේක.

## 36

බෙශලෙල් සහ ඔහොලියාබ්ද ස්වාමීන්-
වහන්සේ අණකළ සියල්ල ලෙස ශුද්ධ
ස්ථානයේ මෙහෙයේ සියලු ආකාර
කර්මාන්ත කරන හැටි දන ගන්නා
පිණිස ස්වාමීන්වහන්සේ විසින් ප්‍රඥවත්
බුද්ධියත් දෙනලද්දවූ නැණවත් සිත් ඇති
සියල්ලන්ද වැඩකරනවා ඇතැයි කීවේය.
මෝසෙස් විනාහි බෙශලෙල් හා 2
ඔහොලියාබ්ද ස්වාමීන්වහන්සේ විසින්
සිතෙහි ප්‍රඥව තබනලද නැණවත් සිත්
ඇති සියලු මනුෂ්‍යයන්ද එනම් ඒ වැඩේ
කරන පිණිස පොලඹවනලද සිත් ඇති
සියල්ලන්ද කැඳවිය. ඔව්හු ඉශ්‍රායෙල් 3
පුත්‍රයන් ශුද්ධස්ථානයේ මෙහෙයේ
කර්මාන්ත කිරීමට ගෙනාවාවූ මුළු
පඩුර මෝසෙස්ගෙන් බාරගත්තෝය.
සෙනඟ උදයක් පාසා තවත් ස්වේච්ඡා
පඩුරු ඔහු වෙතට ගෙනාවෝය.

4 ශුද්ධ ස්ථානයේ සියලු කර්මාන්ත
කළාවූ සියලු ශිල්පීහු තම තමන් කළ
5 කර්මාන්තය හැර ඇවිත් මෝසෙස්ට
කථාකොට: කරන්ට කියා ස්වාමීන්-
වහන්සේ අණ කළ කර්මාන්ත
මෙහෙවරය සඳහා සෑහෙන පමණට
හුඟක් වැඩියෙන් සෙනඟ ගෙනෙතියි
6 කීවෝය. එවිට මෝසෙස්ගේ අණ පිට:
කිසි පුරුෂයෙක්වත් ස්ත්‍රියක්වත් ශුද්ධ
ස්ථානයට පූජාකරන පිණිස තවත්
කිසි කර්මාන්තයක් නොකෙරේවයි මුළු
කඳවුරෙහි ප්‍රකාශයක් කරන ලෙස
නියමයක් කළෝය. මෙසේ සෙනඟ
පූජා ගෙනඊමෙන් වලක්වනු ලැබුවෝය.
7 මක්නිසාද ඔවුන්ට තිබුණු ද්‍රව්‍ය වැඩ
සියල්ල කිරීමට ඔවුන්ට සෑහී ඉතුරුත්
විය.

## මණ්ඩපය සෑදීම

8 එවිට කර්මාන්තය කරන්නන් අතරේ
නැණවත් සිත් ඇති සියල්ලෝ මණ්ඩපය
තිර දසයකින් සෑදුවෝය; කටිනලද
සිහින් හණ නූල්වලින්ද නිල්, රත්නිල්,
රතු නූල්වලින්ද දක්ෂ කම්කරුවාගේ
වැඩෙන් යුක්තවූ කෙරුබ් රූප සහිතව
9 ඒ තිර සෑදුවෝය. එක එක තිරයේ දිග
විසිඅට රියනක්ය, එක එක තිරයේ
පළල සතර රියනක්ය. තිර සියල්ල
10 එක ප්‍රමාණ විය. ඔහු තිර පහක් එකට
එක මූට්ටුකෙළේය. අනික් තිර පහත්
11 එකට එක මූට්ටුකෙළේය. මූට්ටුකළ
තිරවල එක කෙළවරක තිරයේ
වාටියෙහි නිල් පුඩු සෑදුවේය. මූට්ටුකළ
අනික් තිරවල කෙළවරක තිරයේ
12 වාටියෙහිත් එසේම සෑදුවේය. ඔහු
එක තිරයක පුඩු පනසක්ද මූට්ටුකළ
අනික් තිරවල කෙළවරෙහි පුඩු පනසක්ද
13 එකිනෙකට ඉදිරියෙහි සෑදුවේය. රන්
කොකු පනසක්ද සාද මණ්ඩපය
එකක්ව තිබෙන පිණිස කොකුවලින්
තිර එකිනෙකට සම්බන්ධකෙළේය.
14 මණ්ඩපයට උඩින් කූඩාරමක් පිණිස
එළු ලොමින් තිර සෑදුවේය. එයාකාර
15 තිර එකොළොසක් සෑදුවේය. එක එක
තිරයේ දිග තිස් රියනක්ය, එක එක
තිරයේ පළල හතර රියනක්ය. තිර
එකොළොසම එක ප්‍රමාණ වූයේය.
ඔහු තිර පහක් වෙනමද තිර හයක් 16
වෙනමද මූට්ටුකෙළේය. මූට්ටුකළ 17
තිරවල එක කෙළවරක තිරයේ වාටි-
යෙහි පුඩු පනසක්ද මූට්ටුකළ අනික්
තිරවල කෙළවරක තිරයේ වාටියෙහි
පුඩු පනසක්ද සෑදුවේය. කූඩාරම 18
එකක්ව තිබෙන පිණිස සන්ධිකිරීමට
ඔහු පිත්තල කොකු පනසකුත් සෑදුවේය.
රතු සායම් පෙවූ බැටළු සමින් කූඩාරමට 19
වැස්මක්ද ඊ පිට තහඟු සම්වලින්
වැස්මක්ද සෑදුවේය.
ඔහු මණ්ඩපයට ලෑලි ෂිටිම් ලීවලින් 20
සාද ඒවා කෙළින් පිහිටෙවුවේය.
ලෑල්ලක දිග දස රියනක්ය, එක එක 21
ලෑල්ලේ පළල එක් රියන් හමාරක්ය.
එක එක ලෑල්ලට එකිනෙකට සම්බන්ධවූ 22
කුඩිම්බි දෙකක් විය. මණ්ඩපයේ
සියලු ලෑලිවලට ඔහු එසේ සෑදුවේය.
මණ්ඩපයට සෑදූ ලෑලි මෙසේය: දකුණු 23
දිසාවේ දකුණු පැත්තට ලෑලි විස්සක්ය.
ලෑල්ලක කුඩිම්බි දෙකකට අඩි දෙකක් 24
සහ අනික් ලෑල්ලෙහි කුඩිම්බි දෙකකට
අඩි දෙකක් බැගින් ලෑලි විස්ස යට රිදී
අඩි සතළිසක් සෑදුවේය. උතුරු දිසාවේ 25
මණ්ඩපයේ දෙවෙනි පැත්තට ලෑලි
විස්සක්ද එක එක ලෑල්ල යට අඩි 26
දෙකක් බැගින් ඒවායේ රිදී අඩි
සතළිසක්ද සෑදුවේය. අපරදිග 27
මණ්ඩපයේ පසු පැත්තට ලෑලි සයක්
සෑදුවේය. මණ්ඩපයේ පසු පැත්තෙහි 28
මුලුවලට ලෑලි දෙකක්ද සෑදුවේය. යටින් 29
ඒවා ද්විගුණ විය, එසේම මුදුනේ
පළමුවෙනි වළල්ල දක්වාත් ද්විගුණ
විය. ඔහු එසේ මුලු දෙකේ ඒ දෙකටම
සෑදුවේය. එසේ ලෑලි අටක්ද සියලු 30
ලෑලි යට අඩි දෙකක් බැගින් රිදී අඩි
සොළොසක්ද විය. ඔහු මණ්ඩපයේ 31
එක පැත්තක ලෑලිවලට පොලු පහක්ද
මණ්ඩපයේ අනික් පැත්තේ ලෑලිවලට 32
පොලු පහක්ද මණ්ඩපයේ අපරදිග පසු
පැත්තේ ලෑලිවලට පොලු පහක්ද බැගින් 33
ෂිටිම් ලීවලින් පොලු සෑදුවේය. ඔහු

මැද පොල්ල ලෑලි මධ්‍යයෙහි එක්
කෙළවරක පටන් අනික් කෙළවර
දක්වා දිගටම තිබෙන හැටියට සෑදුවේය.
34 ඔහු ලෑලි රනින් වසා පොලු දමීමට
වළලු රනින් සාද පොලුත් රනින්
වැසුවේය.
35 ඔහු නිල්, රත්නිල්, රතු කටිනලද
සිහින් හණ නූලින් තිරය සෑදුවේය.
කෙරුබිම් රූප සහිතව දක්ෂ කර්මාන්ත-
කරුවෙකුගේ කර්මාන්තයෙන් එය
36 සෑදුවේය. ඔහු ඒකට ෂිටිම් ලීවලින්
කුළුනු සතරක් සාද ඒවා රනින් වැසුවේය.
ඒවායේ කොකු රනින් සාද ඒවාට
රිදී අඩි සතරකුත් වාත්තුකෙළේය.
37 ඔහු කූඩාරමේ දොරකඩට නිල්, රත්නිල්,
රතු කටිනලද සිහින් හණ නූල්වලින්
38 කඩතුරාවක් විසිතුරුකර වියා ඒකේ
කුළුනු පහද ඒවායේ කොකුද සෑදුවේය.
ඒවායේ පේකඩද ඒවායේ පටිද
රනින් වැසුවේය. ඒවායේ අඩි පහ
පිත්තලෙන් විය.

## ගිවිසුම් පෙට්ටිය යනාදිය

37 බෙශලෙල් ෂිටිම් ලීවලින්
පෙට්ටිය සෑදුවේය. ඒකේ දිග
දෙරියන් හමාරක්ද ඒකේ පළල
එක්රියන් හමාරක්ද ඒකේ උස එක්රියන්
2 හමාරක්ද විය. ඔහු ඒකේ ඇතුළත්
පිටත් පවිත්‍ර රනින් වසා වටකරින්
3 ඊට රන් ලීස්තරයක්ද සෑදුවේය. ඔහු
ඊට රන් වළලු සතරක් වාත්තුකර ඒකේ
එක පැත්තක වළලු දෙකක්ද අනික්
පැත්තේ වළලු දෙකක්ද බැගින් ඒකේ
4 අඩි සතරෙහි තැබුවේය. ෂිටිම් ලීවලින්
5 පොලු සාද ඒවා රනින් වසා, පෙට්ටිය
ඔසවන පිණිස පෙට්ටියේ පැතිවල
6 වළලුවලට ඒ පොලු දැම්මේය. ඔහු
පවිත්‍ර රනින් කරුණාසනයක්ද සෑදුවේය.
ඒකේ දිග දෙරියන් හමාරක්ද ඒකේ
7 පළල එක්රියන් හමාරක්ද විය. තලාපු
රනින් කෙරුබ්වරුන් දෙදෙනෙකු සාද
8 එක් කෙරුබයෙක් එක් කෙළවරකද
අනික් කෙරුබයා අනික් කෙළවරේද
කරුණාසනය දෙකෙළවර පිහිටෙවුවේය.
කරුණාසනය හා සම්බන්ධකොට ඒකේ
දෙකෙළවර ඔහු කෙරුබ්වරුන් සෑදුවේය.
කෙරුබ්වරු ඉහළට පියාපත් විදහා 9
ඔවුන්ගේ පියාපත්වලින් කරුණාසනය
වසාගනිමින් ඔවුනොවුන්ට මුහුණට
මුහුණ ලා සිටියෝය; කෙරුබ්වරුන්ගේ
මුහුණු කරුණාසනය දෙසට විය.
ඔහු ෂිටිම් ලීවලින් මේසය සෑදුවේය. 10
ඒකේ දිග දෙරියනක්ද ඒකේ පළල
එක්රියනක්ද ඒකේ උස එක් රියන්
හමාරක්ද වූයේය. ඔහු ඒක පවිත්‍ර 11
රනින් වසා වටකරින් රන් ලීස්තරයක්
සෑදුවේය. ඔහු එහි වටකරින් අල්ලක 12
පළල ඇති පටියක්ද ඒ පටිය වටේ රන්
ලීස්තරයක්ද සෑදුවේය. ඊට රන් වළලු 13
සතරක් වාත්තුකර ඒකේ කකුල් සතරේ
කොන් සතරෙහි ඒ වළලු දැමීය. මේසය 14
ගෙන යන පිණිස පොලු දමීමට වළලු,
පටිය ළඟම තිබුණේය. මේසය ගෙනයන 15
පිණිස ෂිටිම් ලීවලින් පොලු සාද ඒවා
රනින් වැසුවේය. ඔහු මේසය පිට තබන 16
භාජන වන ඒකේ තැටිද ඒකේ හැඳිද
ඒකේ පාත්‍රාද පාන පූජා වත්කරන
පිණිස ඒකේ කෙණ්ඩිද පවිත්‍ර රනින්
සෑදුවේය.
ඔහු පවිත්‍ර රනින් පහන් රුකත් 17
සෑදුවේය. තලාපු කර්මාන්තයෙන් පහන්
රුක සෑදුවේය, ඒකේ අඩිය හා කඳද
ඒකේ පෙති කුසලානද මොට්ටුද මල්ද
ඊටම සම්බන්ධකොට සාද තිබුණේය.
ඒකේ පැතිවලින් නික්මෙන අතු සයක් 18
විය; පහන් රුකේ එක් පැත්තක අතු
තුනක්ය, පහන් රුකේ අනික් පැත්තේ
අතු තුනක්ය. කොට්ටම්බා මල් මෙන් 19
සාදනලද පෙති කුසලාන් තුනක්ද
ගෙඩියක්ද මලක්ද එක් අත්තක විය;
කොට්ටම්බා මල් මෙන් සාදනලද පෙති
කුසලාන් තුනක්ද ගෙඩියක්ද මලක්ද
අනික් පැත්තේ විය. පහන් රුකේ අතු
හයේම එසේ තිබුණේය. පහන් රුකේ 20
මොට්ටු සහ මල් සහිතව කොට්ටම්බා
මල් මෙන් සාදනලද පෙති කුසලන්
සතරක් වූයේය. පහන් රුකින් නික්මෙන 21

අතු හයට එහි අතු දෙකක් යට ඊට
සම්බන්ධව මොට්ටුවක්ද එහි අනික්
අතු දෙක යට ඊට සම්බන්ධව
මොට්ටුවක්ද අනික් අතු දෙක යට ඊට
22 සම්බන්ධව මොට්ටුවක්ද විය. ඒවායේ
මොට්ටුද අතුද ඊටම සම්බන්ධවූයේය.
මුළු වැඩය තළනලද පවිත්‍ර රනින් කළ
23 එකම කර්මාන්තයක් වූයේය. ඔහු ඒකේ
පහන් සතද ඒකේ කතුරුද ඒකේ කතුරු
24 තැටිද පවිත්‍ර රනින් සෑදුවේය. එයද ඊට
ඇතුළත් සියලු භාජනද ඔහු පවිත්‍ර රන්
තලෙන්තයකින් සෑදුවේය.
25 ඔහු ෂිටිම් ලීවලින් දුම් පූජාසනය
සෑදුවේය. ඒකේ දිග රියනක්ය; ඒකේ
පළල රියනක්ය, එය සතරැස් විය;
ඒකේ උස දෙරියනක් විය. ඒකේ අං
26 ඊටම සම්බන්ධවිය; ඔහු ඒකේ මුදුනද
හාත්පසින් ඒකේ පැතිද ඒකේ අංද
පවිත්‍ර රනින් වසා ඒකේ වටේට රන්
27 ලීස්තරයක් සෑදුවේය. ඒක ගෙන යන
පිණිස පොලු තැබීමට ඒකේ දෙපැත්තේ
ලීස්තරයට යටින් ඒකේ අංශ දෙකේ
28 රන් වළලු දෙකක් සෑදුවේය. පොලුද
ෂිටිම් ලීවලින් සාද ඒවා රනින්
29 වැසුවේය. ඔහු ශුද්ධ ආලේප තෛලයද
පිරිසිදු සුවඳ ධූප ද්‍රව්‍යද තෛල
මිශ්‍රකරන්නන්ගේ විධියට සෑදුවේය.

## දවන පූජාසනය යනාදිය

38 දවන පූජාවල පූජාසනයද
ඔහු ෂිටිම් ලීවලින් සෑදුවේය.
ඒක පස් රියනක් දිගද පස් රියනක්
පළලද ඇතුව සතරැස්ව තුන් රියනක්
2 උස්ව තිබුණේය. ඒකේ අං ඒකේ සතර
කොනේ සෑදුවේය. ඒකේ අං ඊටම
සම්බන්ධවිය. ඔහු ඒක පිත්තලෙන්
3 වැසුවේය. පූජාසනයේ සියලු භාජන
එනම් හැළිද හැඳිද තලිද මස් කොකුද
ගිනි කබල්ද සෑදුවේය. ඒකේ සියලු
4 භාජන ඔහු පිත්තලෙන් සෑදුවේය. ඔහු
පූජාසනයට ඒකේ වැටියට යටින් ඒකේ
මැද දක්වා යන දැල්කම් කළ මැස්සක්ද
5 පිත්තලෙන් සෑදුවේය. ඒ පිත්තල මැස්සේ
සතර කොනෙහි පොලු දැමීමට වළලු
6 සතරක් වාත්තුකෙළේය. පොලුද ෂිටිම්
ලීවලින් සාද ඒවා පිත්තලෙන් වැසුවේය.
පූජාසනය ගෙනයන පිණිස ඒකේ 7
පැතිවල වූ වළලුවල පොලු දැමුවේය;
ඔහු ඒක කුහර ඇතුව ලෑලිවලින්
සෑදුවේය.
සම්මුඛවීමේ කූඩාරමේ දෙරකඩ ළඟ 8
මෙහෙකිරීමට රැස්වන ස්ත්‍රීන්ගේ
කැඩපත්වල පිත්තලෙන් සෝදන
භාජනයද ඒකේ අඩියද සෑදුවේය.
ඔහු මළුවද සෑදුවේය. කටිනලද 9
සිහින් හණ නූලින් ඒකේ දකුණු පැත්තේ
දකුණු දෙසට මළුවේ තිර රියන් සියයක්
විය. ඒවායේ කුළුනු විස්සක්ය, ඒ 10
කුළුනුවල පිත්තල අඩි විස්සක්ය;
කුළුනුවල කොකුද පටිද රිදීයෙන් විය.
උතුරු පැත්තට රියන් සියයක් විය, 11
ඒවායේ කුළුනු විස්සක්ය, ඒවායේ
පිත්තල අඩි විස්සක්ය; කුළුනුවල
කොකු සහ ඒවායේ පටි රිදීයෙන් විය.
බස්නාහිර පැත්තට පනස් රියන් තිරද 12
විය, ඒවායේ කුළුනු දසයක්ද ඒවායේ
අඩි දසයක්ද විය; කුළුනුවල කොකු
සහ ඒවායේ පටි රිදීයෙන් විය.
නැගෙනහිර පැත්තේ නැගෙනහිර දෙසට 13
පනස් රියනක් විය. දෙරටුවේ එක 14
පැත්තක තිර පසළොස් රියනක් විය;
ඒවායේ කුළුනු තුනක්ය, ඒවායේ අඩි
තුනක්ය; අනික් පැත්තටත් එසේ විය. 15
මළුවේ දෙරටුවට ඒ අතින්ද මේ අතින්ද
පසළොස් රියන් තිර විය; ඒවායේ කුළුනු
තුනක්ය, ඒවායේ අඩි තුනක්ය. වටකරින් 16
මළුවේ සියලු තිර කටිනලද සිහින් හණ
නූලින් විය. කුළුනුවල අඩිද පිත්තලෙන් 17
විය; කුළුනුවල කොකුද ඒවායේ පටිද
රිදීයෙන් විය; ඒවායේ පේකඩ වැස්මද
රිදීයෙන් විය; මළුවේ සියලු කුළුනුද
රිදීයෙන් බඳිනලද්දේය. මළුවේ දෙරටුවේ 18
කඩතුරාව නිල්, රත්නිල්, රතු නූල්වලින්ද
කටිනලද සිහින් හණ නූල්වලින්ද විසිතුරු
කළ වැඩක්ව තිබුණේය. මළුවේ තිරවල
ප්‍රමාණයට සමාන වන ලෙස ඒකේ
දිග විසි රියනක්ද පළලෙන් ඒකේ උස
පස් රියනක්ද විය. ඒවායේ කුළුනු 19
සතරක්ය, ඒවායේ අඩි සතරක්ය, ඒවා

පිත්තලෙන් විය; ඒවායේ කොකුද පේකඩ
වැස්මද ඒවායේ පටිද රිදීයෙන් විය.
20 මණ්ඩපයේද හාත්පස මළුවේද සියලු
ඇණ පිත්තලෙන් විය.
21 පූජකවූ ආරොන්ගේ පුත්‍ර වන ඊතාමාර්
අතින් ලෙවීවරුන්ගේ මෙහෙය පිණිස
මෝසෙස්ගේ ආඥාව ලෙස මණ්ඩපය
එනම් සාක්ෂියේ මණ්ඩපය සඳහා
22 ගණන්ගත් දේවල ගණන මේය. යූද
ගෝත්‍රයෙන් හූර්ගේ පුත්‍රයා වන ඌරීගේ
පුත්‍රවූ බෙශලෙල් ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට අණකළ සියල්ල සෑදුවේය.
23 කැටයම්කරන්නෙක්ද දක්ෂ කම්කරු-
වෙක්ද නිල්, රත්නිල්, රතු සිහින් හණ
නූලින් විසිතුරු වැඩ කරන්නෙක්ද වූ
දාන්ගේ ගෝත්‍රයේ අහිසාමක්ගේ පුත්‍රවූ
ඔහොලියාබ්ද ඔහු සමග වූයේය.
24 ඔප්පුකළ රන් වන ශුද්ධස්ථානයේ
සියලු කර්මාන්තයෙහි වැඩට වියදම්වූ
රන් සියල්ල තලෙන්ත එකුන් තිසක්
හා ශුද්ධස්ථානයේ ෂෙකෙල් ලෙස
25 ෂෙකෙල් හත්සිය තිහක්ද විය. සෙනඟ
අතරෙන් ගණන්කරනු ලැබූවන්ගෙන්
ලත් රිදීද තලෙන්ත සියයක් හා ශුද්ධ-
ස්ථානයේ ෂෙකෙල් ලෙස ෂෙකෙල්
එක්දහස් සත්සිය සැත්තෑපහක් විය.
26 ගණන්කරනු ලැබූවන්ට ඇතුළත් විසි
අවුරුදු හා ඉන් ඉහළ වයස්වූ සලක්ෂ
තුන්දහස් පන්සිය පනස් දෙනෙක් වූ
සියලු පුරුෂයන්ගෙන් එකිනෙකාට
බෙකක් එනම් ශුද්ධස්ථානයේ ෂෙකෙල්
ලෙස ෂෙකෙල් බාගයක් බැගින්
27 ලැබීමෙන් මෙසේ විය. රිදී තලෙන්ත
සියය ශුද්ධස්ථානයේ අඩි සහ
තිරයේ අඩිත් වාත්තුකිරීමටය; අඩියකට
තලෙන්තයක් බැගින් තලෙන්ත සියයකින්
28 අඩි සියයක් විය. ඔහු ෂෙකෙල් එක්දහස්
සත්සිය සැත්තෑ පහකින් කුළුනුවලට
කොකු සාද ඒවායේ පේකඩ වසා ඒවාට
29 පටිද සෑදුවේය. ඔප්පුකළ පිත්තලද
තලෙන්ත සැත්තෑවක් සහ ෂෙකෙල් දෙදස්
30 හාරසියයක් විය. ඔහු එයින් සම්මුඛ-
වීමේ කූඩාරමේ දොරටුවට අඩිද පිත්තල
පූජාසනයද ඊට පිත්තල මැස්සද
31 පූජාසනයේ සියලු භාජනද, වටකරින්
මළුවේ අඩිද මළු දොරටුවේ අඩිද
මණ්ඩපයේ සියලු ඇණද හාත්පසින්
මළුවේ සියලු ඇණද සෑදුවේය.

## පූජක ඇඳුම් පැළඳුම්

39 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
අණකළ ලෙස ඔව්හු ශුද්ධස්ථා-
නයෙහි මෙහෙකරන පිණිස නිල්, රත්-
නිල්, රතු සිහින් වස්ත්‍ර සාද ආරොන්ට
ශුද්ධ වස්ත්‍රද සෑදුවෝය.
ඔහු රනින්ද නිල්, රත්නිල්, රතු 2
කටිනලද සිහින් හණ නූලින්ද ඒපොද්
සැට්ටය සෑදුවේය. ඔව්හු දක්ෂ 3
කම්කරුවාගේ කර්මාන්තයෙන් නිල්,
රත්නිල්, රතු සිහින් හණ නූලින් කළ
කර්මාන්තයක් වන පිණිස තුනී රන්
තහඩු තළා කෙඳි කොට කැපුවෝය.
ඔව්හු උරපටි ඊට සන්ධිකොට 4
සෑදුවෝය. එය දෙකෙළවරින් එක්කරන-
ලද්දේය. ඒ පිට තිබුණාවූ ඒක බඳින 5
විසිතුරු පටිය ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට අණ කළ ලෙස ඒකේ වැඩ
වාගේ රනින්ද නිල්, රත්නිල්, රතු
කටිනලද සිහින් හණ නූලින්ද යුක්තව
ඊට සම්බන්ධ කොට සෑදුවේය.
ඔව්හු මුද්‍රයක කැටයම් වාගේ 6
තබමාණික්‍ය ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
නාම ප්‍රකාරයට කැටයම් කොට ඒවා
රන් කෙවෙනිවල බැන්දෝය. ස්වාමීන්- 7
වහන්සේ මෝසෙස්ට අණකළ ලෙස
ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා සිහිවීමේ
ගල් පිණිස ඒවා ඒපොද් සැට්ටයේ
උරපටි පිට සවිකෙළේය.
ඔහු ඒපොද්හි කර්මාන්තය මෙන් 8
රනින්ද නිල්, රත්නිල්, රතු කටිනලද
සිහින් හණ නූලින්ද කළ දක්ෂ
කම්කරුවාගේ කර්මාන්තයෙන් යුක්තවූ
ළය වැස්ම සෑදුවේය. ඒක සතරැස් 9
විය; ඔව්හු ළය වැස්ම ද්විගුණකොට
සෑදුවෝය. ඒකේ දිග වියතක්ය, ඒකේ
පළල වියතක්ය, ඒක දෙපට වූයේය.
එහි මැණික් පේළි සතරක් බැන්දෝය. 10
පළමුවෙනි පේළියට ලෝහිතාංකයක්ද
පුෂ්පරාගයක්ද මරකතයක්ද විය.

11 දෙවෙනි පේළියට රතු කැටයක්ද නීල-
12 කාන්තයක්ද වජ්‍රයක්ද විය. තුන්වෙනි
පේළියට පද්මරාගයක්ද වර්ණකාන්-
13 තියක්ද අඹතෙස්ගලක්ද විය. සතරවෙනි
පේළියට රන් කාන්තියක්ද නබමාණි-
ක්‍යයක්ද සූර්යකාන්තියක්ද විය. ඒවා
14 රන් කෙවෙනිවල බඳිනලද්දේය. ඒ
මැණික් ගල් පිට ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
නාම ගණනේ හැටියට නාම දෙළසක්
වූහ; ගෝත්‍ර දෙළසේ ගණනට එකි-
නෙකාගේ නාමය මුද්‍රාවක කැටයම්
15 ලෙස විය. ඔව්හු ළය වැස්ම පිට පවිත්‍ර
රතින් ලනු මෙන් ගොතනලද මාල
16 සෑදූවෝය. ඔව්හු රන් කෙවෙනි දෙකක්
සහ රන් වළලු දෙකක්ද සාද ඒ රන්
වළලු දෙක ළය වැස්මේ දෙකෙළවර
17 පිට සවිකළෝය. ඔව්හු රතින් ගොතන
ලද මාල දෙක ළය වැස්මේ දෙකෙළවර
තිබෙන වළලු දෙකෙහි තබා,
18 ගොතනලද මාල දෙකේ අනික්
දෙකෙළවර කෙවෙනි දෙකෙහි බැඳ ඒවා
ඒපොද්හි උරපටි පිට ඉස්සරහින්
19 සවිකළෝය. ඔව්හු වළලු දෙකක් රතින්
සාද ඒපොද් සැට්ටයේ ඇතුල් පැත්තේ
තිබෙන ළය වැස්මේ දෙකෙළවර
20 වාටියෙහි සවිකළෝය. ඔව්හු තවත්
වළලු දෙකක් රතින් සාද උරපටි දෙකේ
යට පැත්තේ ඒකේ මූට්ටුව ළඟ
ඉදිරියෙහිද ඒපොද්හි විසිතුරු කොට
වියනලද ඒකේ පටිය පිටද ඒවා සවි-
21 කළෝය. ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
අණකළ ලෙස ඔව්හු ළය වැස්ම ඒපොද්
සැට්ටයේ විසිතුරු කොට වියනලද
පටිය පිට තිබෙන පිණිසද ළය වැස්ම
ඒපොද් සැට්ටයෙන් ගැළවී නොයන
පිණිසද ඒකේ වළලු ඒපොද් සැට්ටයේ
වළලුවලට නිල් පටියකින් බැන්දෝය.
22 ඔහු වියනලද ඒපොද් සැට්ටයේ සළුව
23 මුළුල්ල නිල් නූලින් වියා සෑදුවේය. ඒ
සළුවේ මැද සන්නාහයක සිදුරක් මෙන්
සිදුරක් විය. එය නොඉරෙන පිණිස
ඒක වටේට වියනලද වාටියක් විය.
24 ඔව්හු සළුවේ පහළ වාටිය දිගේ නිල්,
රත්නිල්, රතු සිහින් හණ නූලින් දෙළුම්
25 ගෙඩිද සෑදුවෝය. ඔව්හු පවිත්‍ර රතින්
මිණිගෙඩිද සාද ඒවා දෙළුම් ගෙඩි
අතරෙහි සළුවේ පහළ වාටිය දිගේ
වටේ දෙළුම් ගෙඩි අතරේ තැබුවෝය;
සේවය කිරීම පිණිස සළුවේ පහළ වාටිය 26
දිගේ මිණිගෙඩියක්ද දෙළුම් ගෙඩියක්-
ද මිණිගෙඩියක්ද දෙළුම් ගෙඩියක්ද
වශයෙන් ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
අණකළ ලෙස සෑදූවෝය.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට අණ- 27
කළ ලෙස ඔව්හු ආරොන් හා ඔහුගේ
පුත්‍රයන්ට කටිනලද සිහින් හණ නූලින්
උතුරු සළුද, සිහින් හණ නූලින් මකුටයද 28
සිහින් හණ නූලින් අලංකාර හිස් වැසුම්ද
කටිනලද සිහින් හණ නූලින් හණ
කලිසම්ද, නිල්, රත්නිල්, රතු කටිනලද 29
සිහින් හණ නූලින් ඉහපටියද විසිතුරුකර
වියා සෑදූවෝය.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට අණ- 30
කළ ලෙස ඔව්හු පවිත්‍ර රතින් ශුද්ධ
කිරීටයේ තහඩුව සාද ඊ පිට ස්වාමීන්-
වහන්සේට ශුද්ධය යන ලියවිල්ල
මුද්‍රාවක කැටයම් මෙන් ලියූවෝය. ඒක 31
මකුටය මුදුනෙහි සවිකිරීමට ඊට නිල්
පටියකුත් බැන්දෝය.

## වැඩ නිමකොට මෝසෙස්ට භාරදීම

සම්මුඛවීමේ කූඩාරමේ මණ්ඩපයේ 32
සියලු කර්මාන්ත මෙසේ නිමවන
ලද්දේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝද ස්වාමීන්-
වහන්සේ මෝසෙස්ට අණකළ සියල්ල
ලෙස කළෝය.
ඔව්හු මණ්ඩපය එනම් කූඩාරම සහ 33
ඒකේ සියලු බඩුද ඒකේ කොකුද
ඒකේ ලෑලිද ඒකේ පොලුද ඒකේ කුළුනු
සහ අඩිද; රතු සායම් පෙවූ බැටළු 34
සම් වැස්ම සහ තහෂ් සම් වැස්මද
කඩතුරාවේ තිරයද; සාක්ෂිපෙට්ටිය සහ 35
ඒකේ පොලුද කරුණාසනයද; මේසය 36
සහ ඒකේ සියලු භාජනද පිදීමේ රොටිද;
පවිත්‍ර පහන් රුකද ඒකේ පහන් 37
එනම් පිළිවෙළට තබන්ට පහන්ද ඒකේ
සියලු භාජනද එළිය දීමට තෙල්ද;
රන්මය පූජාසනයද ආලේප තෙලයද 38
සුගන්ධ ධූප ද්‍රව්‍යයන්ද කූඩාරමේ

39 දෙරකඩට කඩතුරාවද; පිත්තල පූජා-
සනයද ඒකේ පිත්තල මැස්සද ඒකේ
පොලු සහ ඒකේ සියලු භාජනද
සෝදන භාජනය සහ ඒකේ අඩියද,
40 මළුවේ තිර සහ ඒකේ කුළුනුද ඒකේ
අඩිද මළුවේ දෙරටුවට කඩතුරාව සහ
ඒකේ ලනුද ඒකේ ඇණද සම්මුඛවීමේ
කූඩාරමට මණ්ඩපයේ මෙහෙයේ සියලු
41 භාණ්ඩද, ශුද්ධස්ථානයෙහි මෙහෙ
කිරීමට සියුම්කොට සාදනලද ඇඳුම්ද
පූජකවූ ආරොන්ට ශුද්ධ වස්ත්‍රද
පූජක තනතුරෙහි මෙහෙකිරීමට
ඔහුගේ පුත්‍රයන්ගේ වස්ත්‍රද මෝසෙස්
42 ළඟට ගෙනාවෝය. **ස්වාමීන්වහන්සේ**
මෝසෙස්ට අණකළ සියල්ල ලෙස
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඒ සියලු කර්මාන්ත
43 කළෝය. මෝසෙස් ඒ සියලු කර්මාන්ත
බලා **ස්වාමීන්වහන්සේ** අණකළ ලෙසම
ඔවුන් ඒවා සාද තිබෙන බව දැක ඔවුන්ට
ආශීර්වාද කෙළේය.

## මණ්ඩපය පිහිටුවීම

40 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට: පළමුවෙනි මාසේ
පළමුවෙනි දින සම්මුඛවීමේ කූඩාරමේ
3 මණ්ඩපය පිහිටුවාපන්න. සාක්ෂිපෙට්ටිය
එහි තබා පෙට්ටිය තිරයෙන් බෙද
4 වෙන්කරපන්න. මේසය ඇතුළට ගෙන
එහි බඩු පිළිවෙළින් තබාපන්න; පහන්
රුකද ඇතුළට ගෙන ඒකේ පහන්
5 දල්වාපන්න. දුම් පූජාව පිණිස රන්
පූජාසනය සාක්ෂිපෙට්ටිය ඉදිරියෙහි
තබා මණ්ඩපයේ දෙරකඩ කඩතුරාව
6 එල්ලා තබාපන්න. දවන පූජාසනය
සම්මුඛවීමේ කූඩාරම වන මණ්ඩපයේ
7 දෙරකඩ ඉදිරියෙහි තබාපන්න. සෝදන
භාජනය සම්මුඛවීමේ කූඩාරමටත්
පූජාසනයටත් අතරෙහි තබා එහි වතුර
8 වත්කරපන්න. වටේට මළුව පිහිටුවා
මළුවේ දෙරකඩ කඩතුරාව එල්ලාපන්න.
9 ආලේප තෛලය ගෙන මණ්ඩපයද එහි
ඇති සියල්ලද ආලේපකොට ඒකද
ඒකේ සියලු බඩුද විශුද්ධකරපන්න. එවිට
10 එය ශුද්ධ වන්නේය. දවන පූජාසනයද
ඒකේ සියලු භාජනද ආලේපකොට
පූජාසනයද විශුද්ධකරපන්න. පූජාසනයද
ඉතා ශුද්ධවන්නේය. සෝදන භාජනයද 11
ඒකේ අඩියද ආලේපකොට විශුද්ධ-
කරපන්න. ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් 12
සම්මුඛවීමේ කූඩාරම් දෙරකඩ ළඟට
ගෙනවුත් වතුරෙන් නාවා, ආරොන්ට 13
ශුද්ධ වස්ත්‍ර හඳවා පූජක තනතුරෙහි මට
මෙහෙකරන පිණිස ඔහු ආලේපකොට
ශුද්ධකරපන්න. ඔහුගේ පුත්‍රයන්ද 14
ගෙනවුත් ඔවුන්ට ඇඳුම් හඳවා, පූජක 15
තනතුරෙහි මට මෙහෙකරන පිණිස
ඔවුන්ගේ පියාණන් ආලේප කළාක්
මෙන් ඔවුන්ද ආලේපකරපන්න. ඔවුන්
ආලේපකිරීම ඔවුන්ගේ සියලු පරම්පරා-
වලට ඔවුන්ට සදාකාල පූජකකමක්
පිණිස වන්නේයයි කීසේක. මෝසෙස් 16
මෙසේ කෙළේය. ඔහු **ස්වාමීන්-
වහන්සේ** තමාට අණකළ සියල්ල ලෙස
කෙළේය.

දෙවෙනි අවුරුද්දේ පළමුවෙනි මාසයේ 17
පළමුවෙනි දවසේදී මණ්ඩපය පිහිටුවන-
ලද්දේය. මෝසෙස් මණ්ඩපය පිහිටුවා 18
ඒකේ අඩි සවිකොට ඒකේ ලෑලි
පිහිටුවා ඒකේ පොලු දමා ඒකේ කුළුනු
හිටවිය. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට 19
අණකළ ලෙස ඔහු මණ්ඩපය මතුපිටින්
කූඩාරම අතුරා ඊට උඩින් කූඩාරමේ
වැස්ම තැබීය. **ස්වාමීන්වහන්සේ** 20
මෝසෙස්ට අණකළ ලෙස ඔහු සාක්ෂිය
පෙට්ටියෙහි තබා, පෙට්ටියට පොලුද
පෙට්ටිය උඩ කරුණාසනයද තබා,
පෙට්ටිය මණ්ඩපය ඇතුළට ගෙනවුත් 21
වැසීමේ තිරය එල්වා, සාක්ෂිපෙට්ටිය
වෙන්කෙළේය. **ස්වාමීන්වහන්සේ** මෝ- 22
සෙස්ට අණදුන් ලෙස ඔහු මේසය
සම්මුඛවීමේ කූඩාරම තුළ මණ්ඩපයේ
උතුරු පැත්තෙහි තිරයට පිටතින් තබා,
ඒක උඩ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි 23
පිළිවෙළින් රොටි තැබීය. **ස්වාමීන්-** 24
**වහන්සේ** මෝසෙස්ට අණකළ ලෙස
ඔහු පහන් රුක සම්මුඛවීමේ කූඩාර-
මෙහි මේසය ඉදිරිපිට මණ්ඩපයේ
දකුණු පැත්තේ තබා, **ස්වාමීන්වහන්සේ** 25
ඉදිරියෙහි පහන් දල්විය. **ස්වාමීන්-** 26
**වහන්සේ** මෝසෙස්ට අණකළ ලෙස
ඔහු රන් පූජාසනය සම්මුඛවීමේ

27 කූඩාරමෙහි තිරය ඉදිරිපිට තබා, ඊ
28 පිට සුගන්ධ ධූප ද්‍රව්‍ය දැවීය. **ස්වාමීන්-
වහන්සේ** මෝසෙස්ට අණකළ ලෙස
මණ්ඩප දොරකඩ කඩතුරාව එල්ලා,
29 දවන පූජාසනය සම්මුඛවීමේ කූඩාරමේ
මණ්ඩප දොරකඩ ළඟ තබා, ඊ පිට
දවන පූජාවද ආහාර පූජාවද ඔප්පු-
30 කෙළේය. ඔහු සෝදන භාජනය
සම්මුඛවීමේ කූඩාරමද පූජාසනයද
අතරෙහි තබා සේදීමට වතුර එහි
31 වත්කෙළේය. මෝසෙස්ද ආරොන් සහ
ඔහුගේ පුත්‍රයෝද ඔවුන්ගේ අත් පා
32 එහි සේදුවෝය. ඔව්හු සම්මුඛවීමේ
කූඩාරම ඇතුළට ගිය කල්හිද
පූජාසනයට ළංවූ කල්හිද **ස්වාමීන්-
වහන්සේ** මෝසෙස්ට අණකළ ලෙස
33 සෝදගත්තෝය. ඔහු මණ්ඩපය හා
පූජාසනය වටේට මළුව පිහිටුවා මළුවේ
දොරකඩ කඩතුරාව නැඟීය. මෙසේ
මෝසෙස් වැඩ නිමකෙළේය.

එවිට වලාකුළ සම්මුඛවීමේ කූඩාරම 34
වසා ගත්තේය, **ස්වාමීන්වහන්සේගේ**
තේජසෙන් මණ්ඩපය පිරීගියේය. වලාකුළ 35
ඊ පිට රැඳුණු බැවින්ද **ස්වාමීන්වහන්සේගේ**
තේජසෙන් මණ්ඩපය පිරීගිය බැවින්ද
මෝසෙස්ට සම්මුඛවීමේ කූඩාරමට
ඇතුල්වෙන්ට නොහැකිවිය. වලාකුළ 36
මණ්ඩපය මතුයෙන් ඔසවනු ලැබූ
හැමවිටම ඉශ්‍රායෙල් පුත්‍රයෝ තමුන්ගේ
ගමන් යන්ට පිටත්වුණෝය. එහෙත් 37
වලාකුළ ඔසවනු නොලැබුවහොත්
ඒක ඔසවනුලබන දින දක්වා ඔව්හු
ගමන් නොකර සිටියෝය. මක්නිසාද 38
මණ්ඩපය උඩ දවාලේ **ස්වාමීන්-
වහන්සේගේ** වලාකුළද රාත්‍රියේ
ගින්නද මුළු ඉශ්‍රායෙල් වංශයේ ඇස්
ඉදිරියෙහි ඔවුන්ගේ සියලු ගමන්වලදී
වූයේය.

# ලෙවී කථාව

## යයි සාමාන්‍යයෙන් කියනුලබන

## මෝසෙස්ගේ තුන්වෙනි පොත

---

### පූජා ගැන අණපනත්
### දවන පූජා

1 ස්වාමින්වහන්සේ මෝසෙස්ට
හඬගසා සම්මුඛවීමේ කූඩාරමේ සිට
2 ඔහුට කථාකොට: නුඹ ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකරමින් මෙසේ
කියාපන්නැයි කීසේක–නුඹලාගෙන් යම්
මනුෂ්‍යයෙක් ස්වාමීන්වහන්සේට පූජාවක්
ඔප්පුකරන කල සිව්පාවුන්ගෙන් එනම්
ගව රැළෙන්ද එළු බැටළු රැළෙන්ද
නුඹලාගේ පූජාව ඔප්පුකරපල්ලා.
3 ඉදින් ඔහුගේ පූජාව ගව රැළෙන් වූ
දවන පූජාවක් නම්, ඔහු කැලල් නැති
පිරිමි සතෙකු ඔප්පුකළ යුතුය. ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි පිළිගනු ලබන පිණිස
ඔහු ඌ සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩදී
4 ඔප්පුකළ යුතුය. ඔහු තමාගේ අත දවන
පූජා සතාගේ ඉස පිට තබාවා. එය
ඔහු උදෙසා සමගිකම් කිරීමට ඔහු නිසා
5 පිළිගනු ලබන්නේය. ඔහු ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි ගොනා මැරිය යුතුය.
ආරොන්ගේ පුත්‍රයන්වූ පූජකයන්ද ලේ
ඔප්පුකොට සම්මුඛවීමේ කූඩාරමේ
දොරකඩ ළඟ තිබෙන පූජාසනය පිට
6 හාත්පසින් ඒ ලේ ඉසිය යුතුය. ඔහු
දවන පූජා සතා හමගසා උගේ
7 කොට්ඨාසවලට කැපිය යුතුය. පූජකවූ
ආරොන්ගේ පුත්‍රයෝ පූජාසනය පිට
ගිනි දල්වා ගිනි පිට දර පිළිවෙළින්
8 තබත්වා. ආරොන්ගේ පුත්‍රයන්වූ පූජකයන්
හිසද තෙලද යන කොට්ඨාස පූජාසනය
මතුයෙහි ගින්න පිට තිබෙන දර උඩ
පිළිවෙළින් තැබිය යුතුය. එහෙත් ඔහු 9
උගේ අතුණුද උගේ කකුල්ද වතුරෙන්
සේදිය යුතුය. එය ස්වාමින්වහන්සේට
ගින්නෙන් කළ මිහිරි සුවඳක් ඇති ගිනි
පූජාවක් වන දවන පූජාවක් කොට
පූජකයා විසින් ඒ සියල්ල පූජාසනය
පිට දැවිය යුතුය.
ඉදින් දවන පූජාවක් පිණිස ඔහුගේ 10
පූජාව බැටළු රැළෙන්වත් එළු රැළෙන්වත්
වන්නේනම්, ඔහු නොකැලල් පිරිමි සතෙකු
පූජාකළ යුතුය. ඔහු පූජාසනයට උතුරු 11
පැත්තේ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි ඌ
මැරිය යුතුය. ආරොන්ගේ පුත්‍රයන්වූ
පූජකයෝ උගේ ලේ පූජාසනය පිට
හාත්පසින් ඉසිත්වා. ඔහු උගේ හිසද 12
තෙලද සමග ඌ කොට්ඨාසවලට
කපාවා. පූජකයාද පූජාසනය මතුයෙහි
ගින්න පිට තිබෙන දර උඩ ඒවා
පිළිවෙළින් තැබිය යුතුය; එහෙත් ඔහු 13
අතුණුද කකුල්ද වතුරෙන් සේදිය යුතුය.
පූජකයා ඒ සියල්ල ඔප්පුකොට
පූජාසනය පිට දැවිය යුතුය. ඒක
ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳක් ඇති,
ගින්නෙන් කළ දවන පූජාවක්ය.
ඉදින් ස්වාමීන්වහන්සේට ඔහුගේ පූජාව 14
පක්ෂීන්ගෙන් වූ දවන පූජාවක් නම්,
කොබෙයියන්ගෙන් හෝ පරෙවි පැටවුන්-
ගෙන් හෝ ඔහු තමාගේ පූජාව ඔප්පු-
කළ යුතුය. පූජකයාද ඌ පූජාසනයට 15
ගෙනවුත් උගේ හිස කඩාදමා පූජාසනය

පිට දැවිය යුතුය; උගේ ලේ පූජාසනයේ
16 පැත්තේ වැගිරෙන්ට හැරිය යුතුය. ඔහු
උගේ ගොදුරු බොක්කද උගේ පිහාටුද
පහකර ඒවා පූජාසනය ළඟ නැගෙන-
හිරින් අළු දමන තැන දැමිය යුතුය.
17 උෟ වෙන් නොකොට අත්හැදි ළඟින්
ඉරා පූජකයා පූජාසනය පිට ගින්නෙහි
තිබෙන දර පිට උෟ දැවිය යුතුය. ඒක
**ස්වාමීන්වහන්සේට** ගින්නෙන් කළ මිහිරි
සුවඳක් ඇති දවන පූජාවක්ය.

## ආහාර පූජා

**2** යමෙක් ආහාර පූජාවක් **ස්වාමීන්-
වහන්සේට** ඔප්පුකරන කල ඔහුගේ
පූජාව සිහින් පිටිවලින් විය යුතුය; ඔහු
ඊ පිට තෙල් වත්කොට, ඊ පිට තුවරලා
2 දමා, ආරොන්ගේ පුත්‍රයන්වූ පූජකයන්
වෙතට එය ගෙනවුත්, එහි සිහින් පිටියෙන්
සහ තෙලින් අතළොස්සක් එහි සියලු
තුවරලා සමග ගත යුතුය. පූජකයා
**ස්වාමීන්වහන්සේට** මිහිරි සුවඳක් වූ
ගින්නෙන් කළ පූජාවක් මෙන් ඒ සිහිවීමේ
කොටස පූජාසනය පිට දැවිය යුතුය.
3 ආහාර පූජාවෙන් ඉතිරි කොටස
ආරොන්ටත් ඔහුගේ පුත්‍රයන්ටත්
වන්නේය. එය **ස්වාමීන්වහන්සේට**
ගින්නෙන් කළ පූජාවලින් අති ශුද්ධ
එකක්ය.
4 උදුනෙහි පුලුස්සනලද ආහාර පූජාවක්
තුඹ විසින් ඔප්පුකරන කල එය තෙල්
මිශ්‍රකොට සිහින් පිටියෙන් සෑදූ මුහුන්
නැති සිහින් රොටි හෝ තෙල ගල්වනලද
මුහුන් නුමුසු පෙති කැවුම් හෝ විය
5 යුතුය. තුඹේ පූජාව ඇතිලියේ පුලුස්සන
ආහාර පූජාවක් නම් එය තෙල්
මිශ්‍රකරනලද මුහුන් නුමුසු සිහින් පිටියෙන්
6 විය යුතුය. එය කැබලි කොට කඩා ඒ
පිට තෙල් වත්කරපන්න. එය ආහාර
7 පූජාවක්ය. තුඹේ පූජාව සැළියේ බදින
ආහාර පූජාවක් නම් එය තෙල්
මිශ්‍රකොට සිහින් පිටියෙන් සෑදිය යුතුය.
8 තුඹ මේ දේවලින් සාදනලද ආහාර
පූජාව **ස්වාමීන්වහන්සේ** වෙතට
ගෙනෙන්න. එය පූජකයාට ඔප්පුකරනු
ලැබිය යුතුය, පූජකයාද එය පූජාසනය
ළඟට ගෙනෙන්ට ඕනෑය. තවද පූජකයා 9
ආහාර පූජාවෙන් සිහිවීමේ කොටස
ගෙන පූජාසනය පිට දැවිය යුතුය. එය
**ස්වාමීන්වහන්සේට** මිහිරි සුවඳක් ඇති,
ගින්නෙන් කළ පූජාවක්ය. ආහාර 10
පූජාවෙන් ඉතිරි කොටස ආරොන්ටත්
ඔහුගේ පුත්‍රයන්ටත් වන්නේය. එය
**ස්වාමීන්වහන්සේට** ගින්නෙන් කළ
පූජාවලින් අති ශුද්ධ එකක්ය. තුඹලා 11
**ස්වාමීන්වහන්සේට** ඔප්පු කරන කිසි
ආහාර පූජාවක් මුහුන් මිශ්‍ර කොට
නොසෑදිය යුතුය. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේට** ගින්නෙන් කළ පූජාවක්
වශයෙන් මුහුන්වත් මීපැණිවත් නොදැවිය
යුතුය. ප්‍රථම ඵල පූජාවක් කොට ඒවා 12
**ස්වාමීන්වහන්සේට** ඔප්පුකරන්ට තුඹලාට
පුළුවන. එහෙත් ඒවා මිහිරි සුවඳක් පිණිස
පූජාසනය පිටට නොපැමිණවිය යුතුය.
තුඹේ සියලු ආහාර පූජා ලුණෙන් 13
රසකරපන්න; තුඹේ දෙවියන්වහන්සේගේ
ගිවිසුමේ ලුණු තුඹේ ආහාර පූජාවට
නොදමා නොහැරිය යුතුය. තුඹේ සියලු
පූජාවල් සමග ලුණු ඔප්පුකළ යුතුය.
ඉදින් ප්‍රථම ඵලවලින් තුඹ **ස්වාමීන්-** 14
**වහන්සේට** ආහාර පූජාවක් ඔප්පු-
කරන්නෙහිනම් ගින්නෙන් බැදපු ශස්‍ය
කරල්වලින් පොඩිකරගත් අලුත් ධාන්‍ය
තුඹේ ආහාර පූජාව කොට ඔප්පු-
කරපන්න. ඊ පිට තෙල් වත්කර ඊ පිට 15
තුවරලා තබාපන්න. එය ආහාර
පූජාවක්ය. එවිට පූජකයා මඩිනලද එහි 16
ධාන්‍ය කොටසකින්ද එහි තෙල්
කොටසකින්ද යුත් ඒ සිහිවීමේ කොටස
එහි තුවරලා සියල්ල සමග දවන්ට
ඕනෑය. ඒක **ස්වාමීන්වහන්සේට** ගින්නෙන්
කළ පූජාවක්ය.

## ශාන්ති පූජා

**3** ඔහුගේ පූජාව ශාන්ති පූජාවක්
නම්, ඔහු ගවරැළෙන් පිරිමි සතෙකු
හෝ ගැනු සතෙකු හෝ පුදන්නේනම්,
කැලල් නැති එකෙකු **ස්වාමීන්වහන්සේ**

2 ඉදිරියේ පූජාකළ යුතුය. ඔහු තමාගේ
අත තමාගේ පූජා සතාගේ ඉස පිට
තබා සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩදී
ඌ මරාවා. ආරොන්ගේ පුත්‍රයන්වූ
පූජකයෝ පූජාසනය පිට හාත්පසින් ඒ
3 ලේ ඉසිත්වා. ඔහු අතුණු වැසී තිබෙන
තෙලද අතුණු පිට තිබෙන තෙල්
4 සියල්ලද, වකුගඩු දෙක සහ ඒ පිට
තුනටිය ළඟින් තිබෙන තෙලද වකුගඩු
සමග අක්මාව පිට තිබෙන දලද
වෙන්කොට ස්වාමීන්වහන්සේට ශාන්ති
පූජා යාගයෙන් ගින්නෙන් කළ පූජාවක්
5 ඔප්පු කෙරේවා. ආරොන්ගේ පුත්‍රයෝ
පූජාසනයෙහි ගින්නේ දර පිට තිබෙන
දවන පූජාව මත්තෙහි එය දවත්වා. එය
ස්වාමීන්වහන්සේට ගින්නෙන් කළ
මිහිරි සුවඳ පූජාවක්ය.
6 ස්වාමීන්වහන්සේට ශාන්ති පූජාවක්
පිණිස ඔහුගේ පූජාව එළු රැළෙන් හෝ
බැටළු රැළෙන් නම් ඔහු කැලල් නැති
පිරිමි සතෙකු හෝ ගැනු සතෙකු හෝ
7 පූජාකළ යුතුය. තමාගේ පූජාව කොට
ඔහු බැටළු පැටවෙකු ඔප්පුකරන්නේනම්
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි ඌ ඔප්පු
8 කෙරේවා. ඔහු තමාගේ අත තමාගේ
පූජා සතාගේ හිස පිට තබා සම්මුඛවීමේ
කූඩාරම ඉදිරිපිට ඌ මරාවා. ආරොන්ගේ
පුත්‍රයෝද ඌගේ ලේ පූජාසනය පිට
9 හාත්පසින් ඉසිත්වා. ඔහු ඌගේ තෙල
සහ පිටිකොන්ද ළඟින් කපාගන්න මුළු
තර වල්ගයද අතුණු වැසී තිබෙන තෙලද
අතුණු පිට තිබෙන තෙල සියල්ලද,
10 වකුගඩු දෙක සහ ඒ පිට තුනටිය ළඟ
තිබෙන තෙලද වකුගඩු සමග අක්මාව
පිට තිබෙන දලද අහක්කොට ශාන්ති
පූජාවෙන් ස්වාමීන්වහන්සේට ගින්නෙන්
11 කළ පූජාවක් ඔප්පුකෙරේවා. පූජකයාද
ඒවා පූජාසනය පිට දවිය යුතුය. ඒවා
ස්වාමීන්වහන්සේට ගින්නෙන් කළ පූජාවේ
ආහාරය වේ.
12 ඔහුගේ පූජාව එළුවෙක් නම්, ඔහු
ස්වාමීන්වහන්සේ ඉදිරියේ ඌ පූජා
කළ යුතුය. ඔහු තමාගේ අත ඌගේ හිස 13
පිට තබා සම්මුඛවීමේ කූඩාරම ඉදිරිපිට
ඌ මැරිය යුතුය. ආරොන්ගේ පුත්‍රයෝද
ඌගේ ලේ පූජාසනය පිට හාත්පසින්
ඉසිත්වා. ඔහු අතුණු වැසී තිබෙන තෙලද 14
අතුණු පිට තිබෙන තෙල් සියල්ලද
වකුගඩු දෙක සහ ඒ පිට තුනටිය ළඟ
තිබෙන තෙලද, වකුගඩු සමග අක්මාව 15
පිට දලද අහක්කොට ඒවායින් තමාගේ
පූජාව එනම් ස්වාමීන්වහන්සේට ගින්නෙන්
කළ පූජාවක් ඔප්පු කළ යුතුය. පූජකයාද 16
ඒවා පූජාසනය පිට දවිය යුතුය. ඒවා
මිහිරි සුවඳක් පිණිස ගින්නෙන් කළ
පූජාවේ ආහාරය වේ. තෙල සියල්ලම
ස්වාමීන්වහන්සේට අයිතිය. තුඹලා විසින් 17
තෙලවත් ලේවත් නොකෑ යුතුය යනු
තුඹලාගේ පරම්පරාවල තුඹලාගේ සියලු
වාසස්ථානවල නිරන්තර පනතක්
වන්නේය.

## පාප පූජා

4
තවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල් 2
පුත්‍රයන්ට මෙසේ කියාපන්න–නොකට-
යුතුයයි ස්වාමීන්වහන්සේ විසින් අණකළ
කිසිවකට විරුද්ධව යමෙක් නොදැනුවත්ව
පව්කොට එයින් එකක් කළොත්, [ඔහු
මෙසේ කළ යුතුය]. සෙනඟ පිට වරද 3
පැමිණෙන ලෙස ආලේප ලත් පූජකයා
පව්කළොත්, ඔහු කළාවූ ඒ පාපය
ගැන ස්වාමීන්වහන්සේට පාප පූජාවක්
පිණිස කැලල් නැති ගොන් නාම්බෙකු
ඔප්පුකෙරේවා. ඔහු සම්මුඛවීමේ 4
කූඩාරමේ දොරකඩ ළඟට ස්වාමීන්-
වහන්සේ ඉදිරියට ගොනා ගෙනවුත්
තමාගේ අත ගොනාගේ හිස පිට තබා,
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි ගොනා
මරන්ට ඕනෑය. එවිට ආලේපලත් 5
පූජකයා ගොනාගේ ලෙයින් මඳක්
රැගෙන එය සම්මුඛවීමේ කූඩාරම ළඟට
ගෙනා යුතුය. පූජකයාද තමාගේ ඇඟිල්ල 6
ලෙයෙහි ගල්වා ශුද්ධස්ථානයේ

තිරය ඉදිරිපිට **ස්වාමින්වහන්සේ** ඉදිරි-
යෙහි ඒ ලෙයින් සත් වරක් ඉසිය
7 යුතුය. තවද පූජකයා ලෙයින් මඳක්
**ස්වාමින්වහන්සේ** ඉදිරියෙහි සම්මුඛවීමේ
කූඩාරමෙහි තිබෙන සුවඳ දුම් පූජාසනයේ
අං පිට ගා සම්මුඛවීමේ කූඩාරමේ
දෙරකඩ ළඟ තිබෙන දවන පූජාසනය
මුල ගොනාගේ ලේ සියල්ල වත්කළ
8 යුතුය. ඔහු ශාන්ති පූජාවේ ගොනාගෙන්
තෙල වෙන්කොට ගත්තාක් මෙන් පාප
පූජා ගොනාගේ තෙල සියල්ලද අතුණු
වැසී තිබෙන තෙලද අතුණු පිට තිබෙන
9 මුළු තෙලද, වකුගඩු දෙක සහ ඊ පිට
තුනටිය ළඟ තිබෙන තෙලද වකුගඩු
සමග අක්මාව පිට දලද අහක්කළ
10 යුතුය. පූජකයා දවන පූජාසනය පිට
11 ඒවා දවා ගොනාගේ හමද උගේ මාංස
12 සියල්ලද හිසද කකුල්ද අතුණු සහ
ගොමද යන මුළු ගොනා කඳවුරෙන්
පිටත අළු දමන පවිත්‍ර ස්ථානයකට
ගෙනගොස් දර පිට ගින්නෙන්
දවන්නේය. අළු දමන ස්ථානයෙහි ඌ
පුලුස්සා දැමිය යුතුය.
13 මුළු ඉශ්‍රායෙල් සභාව වැරදි දෙයක්
කළොත්, ඒ දෙය සමූහයාගේ ඇස්
ඉදිරියෙන් සැඟවී තිබේ නම්, නොකටයුතු-
යයි **ස්වාමින්වහන්සේ** අණකළ දේවලින්
යමක් කොට ඔව්හු වැරදිකාරයෝ
14 වූවෝනම්, ඔවුන් කළ පාපය දැනගත්
කල සමූහයා පාප පූජාවක් පිණිස ගොන්
නාම්බෙකු ඔප්පුකර ඌ සම්මුඛවීමේ
15 කූඩාරම ඉදිරියට ගෙනා යුතුය. සභාවේ
වැඩිමහල්ලෝ **ස්වාමින්වහන්සේ** ඉදිරි-
යෙහි තමන්ගේ අත් ගොනාගේ හිස
පිට තැබිය යුතුය. තවද ගොනා
**ස්වාමින්වහන්සේ** ඉදිරියෙහි මරනු
16 ලබන්නේය. ආලේපලත් පූජකයා
ගොනාගේ ලෙයෙන් මඳක් සම්මුඛවීමේ
17 කූඩාරම ළඟට ගෙනවුත්, තමාගේ
ඇඟිල්ල ලෙයෙහි ගල්වා **ස්වාමින්-
වහන්සේ** ඉදිරියෙහි තිරය ඉදිරිපිට සත්
18 වරක් එය ඉසිය යුතුය. තවද ඔහු ලෙයින්
මඳක් **ස්වාමින්වහන්සේ** ඉදිරියෙහි
සම්මුඛවීමේ කූඩාරමේ තිබෙන පූජා-
සනයේ අං පිට ගා සම්මුඛවීමේ කූඩාරමේ
දෙරකඩ ළඟ තිබෙන දවන පූජාසනය
මුල ඉතිරි ලේ සියල්ල වත්කළ යුතුය.
ඔහු උගේ තෙල සියල්ලම අහක්කොට 19
ඒවා පූජාසනය පිට දැවිය යුතුය.
ඔහු ගොනාට මෙලෙස කළ යුතුය; 20
පාප පූජාවේ ගොනාට කළාක් මෙන්
මේ ගොනාටත් කළ යුතුය. මෙසේ
පූජකයා ඔවුන් උදෙසා සමගිකමක්
කරන්නේය, එවිට ඔව්හු ක්ෂමාකරනු
ලබන්නෝය. ඔහු ඒ ගොනා කඳවුරෙන් 21
පිටතට ගෙනගොස් ප්‍රථම ගොනා
දැවූවාක් මෙන් ඌ දැවිය යුතුය. එය
සමූහයා උදෙසා පාප පූජාවය.
අධිපතියෙක් තමාගේ දෙවිවූ **ස්වාමින්-** 22
**වහන්සේ** නොකටයුතුයයි අණකළ
දේවලින් යමක් නොදැනුවත්ව කොට
වැරදිකාරයෙක්ව සිටින කල, තමා 23
කළාවූ පාපය ඔහු දැනගත්තොත්, පූජාව
පිණිස එළුවන්ගෙන් කැලල් නැති පිරිමි
සතෙකු ගෙනවුත්, තමාගේ අත එළුවාගේ 24
හිස පිට තබා **ස්වාමින්වහන්සේ**
ඉදිරියෙහි දවන පූජාව මරන තැන්හිදී
ඌ මරාවා. එය පාප පූජාවක්ය.
පූජකයාද තමාගේ ඇඟිල්ලෙන් පාප 25
පූජාවේ ලේ ගෙන දවන පූජාසනයේ අං
පිට ගා උගේ ලේ දවන පූජාසනය මුල
වත්කෙරේවා. උගේ තෙල සියල්ලම 26
ශාන්ති පූජාවේ තෙල මෙන් පූජාසනය
පිට දවන්ට ඕනෑය. මෙසේ පූජකයා
ඔහුගේ පාපය ගැන ඔහු උදෙසා
සමගිකම් කරන්නේය, එවිට ඔහු ක්ෂමා
කරනු ලබන්නේය.
පොදු සෙනඟගෙන් කිසිවෙක් 27
නොකටයුතුයයි **ස්වාමින්වහන්සේ** අණ-
කළ දේවලින් යමක් නොදැනුවත්ව
කිරීමෙන් වැරදිකාරයෙක් වී නම්, ඔහු 28
තමා කළ පාපය ඔහු දැනගත්තොත්
තමා කළාවූ පාපය නිසා එළුවන්ගෙන්
කැලල් නැති ගැනු සතෙකු ඔහුගේ පූජාව
පිණිස ගෙනා යුතුය. ඔහු තමාගේ අත 29

පාප පූජාවේ හිස පිට තබා දවන පූජාවේ
ස්ථානයෙහි පාප පූජාවේ සතා මරාවා.
30 පූජකයාද උගේ ලෙයින් මඳක් තමාගේ
ඇඟිල්ලට ගෙන දවන පූජාසනයේ අං
පිට ගා උගේ ලේ සියල්ල පූජාසනය
31 මුල වත්කෙරේවා. ශාන්ති පූජාවලින්
තෙල ගත්තාක් මෙන් උගේ තෙල සියල්ල
ගෙනවුත් එය **ස්වාමීන්වහන්සේට** මිහිරි
සුවඳක් කොට පූජාසනය පිට දැවිය
යුතුය. මෙසේ පූජකයා ඔහු උදෙසා
සමගිකම් කරන්නේය, ඔහුද ක්ෂමාකරනු
ලබන්නේය.
32 ඉදින් ඔහු පාප පූජාවක් පිණිස බැටළු
පැටවෙකු ගෙනෙන්නේනම් කැලල් නැති
33 ගැනු සතෙකු ගෙනේවා. ඔහු තමාගේ
අත පාප පූජාවේ හිස පිට තබා දවන
පූජාව මරන තැන්හිදී ඌ පාප පූජාවක්
34 පිණිස මැරිය යුතුය. පූජකයා පාප
පූජාවේ ලෙයින් මඳක් ඇඟිල්ලට ගෙන
දවන පූජාසනයේ අං පිට ගා උගේ ලේ
සියල්ල පූජාසනය මුල වත්කෙරේවා.
35 ශාන්ති පූජාවල බැටළුපැටවාගෙන් තෙල්
ගත්තාක් මෙන් පූජකයා උගේ තෙල
සියල්ල වෙන්කොට **ස්වාමීන්වහන්සේට**
ගින්නෙන් කළ පූජා මතුයෙහි පූජාසනය
පිට දැවිය යුතුය. මෙසේ පූජකයා ඔහු
කළාවූ පාපය උදෙසා සමගිකමක්
කරන්නේය, ඔහුද ක්ෂමාකරනු ලබන්-
නේය.

5 යමෙක් කාරණාවක් දැක නොහොත්
දැනගෙන සාක්ෂිකාරයෙක්ව සිටිද්දී,
දිවුරවීමේ හඬ අසා නොදන්වා සිටීමෙන්
පව්කළොත්, ඔහු තමාගේ අයුතුකම දැරිය
2 යුතුය. නොහොත් යම් කෙනෙක් අපවිත්‍රවූ
යමක එනම් අපවිත්‍ර මෘගයෙකුගේ
මළකඳක හෝ අපවිත්‍ර සිව්පාවන්ගේ
මළකඳක හෝ බඩගායන අපවිත්‍ර
සතුන්ගේ මළකඳක හෝ ස්පර්ශ-
වුණොත් ඔහු එය නොදැන සිටිය
නුමුත් ඔහු අපවිත්‍රව වරදකාරයෙක්
3 වන්නේය. නොහොත් ඔහු මනුෂ්‍යයාගේ
අපවිත්‍රකමක එනම් මනුෂ්‍යයෙකු
අපවිත්‍රවෙන කවර අපවිත්‍රකමකවත්
ස්පර්ශවුණොත්, ඔහු එය නොදැන සිටිය
නුමුත් දැනගත්කල වරදකාරයෙක්
වන්නේය. නොහොත් යමෙක් නපුරු 4
කිරීමට හෝ යහපත කිරීමට හෝ
ඉක්මන්ව කථාකරමින් දිවුරුවොත්,
මනුෂ්‍යයෙක් දිවිරීමකින් ඉක්මන්ව
කථාකරන කොයි දෙයක් වුවත් ඔහු
නොදැන සිටිය නුමුත්, ඔහු එය දැනගත්-
කල මේ දේවලින් එකක් ගැන ඔහු
වරදකාරයෙක් වන්නේය. එසේ ඔහු මේ 5
දේවලින් එකක් ගැන වරදකාරයෙක් වූ
කල ඒ දේ ගැන පව්කළ බව කියාදී,
තමා විසින් කළ පාපය උදෙසා අපරාධ 6
පූජාව පිණිස රැළෙන් බැටළුවන්ගෙන්
හෝ එළුවන්ගෙන් හෝ ගැනු සතෙකු
පාප පූජාවක් පිණිස **ස්වාමීන්වහන්සේ**
වෙතට ගෙනෙන්ට ඕනෑය; පූජකයාද
ඔහුගේ පාපය ගැන ඔහු උදෙසා
සමගිකමක් කරන්නේය. එළු පැටවෙකු 7
හෝ බැටළු පැටවෙකු හෝ ගෙනෙන්ට
ඔහුට වත්කම නැත්නම් ඔහු තමා කළ
පාපය ගැන කොබෙයියන් දෙදෙනෙකු
හෝ පරෙවි පැටවුන් දෙදෙනෙකු හෝ
**ස්වාමීන්වහන්සේ** වෙතට ගෙනෙන්ට
ඕනෑය; එකෙක් පාප පූජාවක් පිණිසය,
අනිකා දවන පූජාවක් පිණිසය. ඔහු 8
උන් පූජකයා වෙතට ගෙනා යුතුය,
පූජකයා පළමුකොට පාප පූජා සතාගේ
බොටුව ළඟින් හිස කඩා දමා වෙන්
නොකොට, පාප පූජාවේ ලෙයින් 9
ස්වල්පයක් පූජාසනයේ පැත්තේ ඉසිය
යුතුය; ඉතිරි ලේ පූජාසනය මුල
වැගිරෙන්ට හැරිය යුතුය. එය පාප
පූජාවක්ය. නියමය ලෙස ඔහු අනිකා 10
දවන පූජාවක් කොට ඔප්පුකළ යුතුය.
එසේ පූජකයා ඔහු කළ පාපය ගැන
ඔහු උදෙසා සමගිකමක් කරන්නේය,
ඔහුද ක්ෂමාකරනු ලබන්නේය.
කොබෙයියන් දෙදෙනෙක්වත් පරෙවි 11
පැටවුන් දෙදෙනෙක්වත් ගෙනෙන්ට ඔහුට
වත්කම නැත්නම්, ඔහු කළ පාපය ගැන
පාප පූජාවක් පිණිස සිහින් පිටි
ඒඵාවකින් දසයෙන් කොටසක්

ගෙනෙන්ට ඕනෑය; ඒවා පාප පූජාවක්
බැවින් ඒ පිට තෙල්වත් තුවරලාවත්
12 නොදැමිය යුතුය. ඔහු ඒවා පූජකයා
වෙතට ගෙනා යුතුය, පූජකයාද එයින්
අහුරක් වන එහි සිහිවීමේ කොටස ගෙන
පූජාසනය පිට ස්වාමීන්වහන්සේට
ගින්නෙන් කළ පූජා මතුයෙහි දැවිය
13 යුතුය. එය පාප පූජාවක්ය. මෙසේ
පූජකයා ඔහු මේ දේවලින් එකක් ගැන
කළාවූ ඔහුගේ පාපය ගැන සමගි-
කමක් කරන්නේය, ඔහුද ක්ෂමාකරනු
ලබන්නේය. ඉතිරි කොටස ආහාර පූජාව
මෙන් පූජකයාට වන්නේයයි කීසේක.

## අපරාධ පූජා

14 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
15 කොට: යමෙක් ස්වාමීන්වහන්සේගේ
ශුද්ධවූ දේවල් ගැන වරදක් කොට
නොදැනුවත්ව පව්කළොත් ඔහු තමාගේ
අපරාධය උදෙසා අපරාධ පූජාවක්
පිණිස ශුද්ධ ස්ථානයේ ෂෙකෙලේ
හැටියට තුඹ නියමකරන රිදී ෂෙකෙල්
ගණනට රැළෙන් කැලල් නැති
බැටළුවෙකු ස්වාමීන්වහන්සේ වෙතට
16 ගෙනවුත්, ශුද්ධවූ දේ ගැන කළාවූ
දෝෂයට වන්දි ගෙවීමක් කොට ඊට
පහෙන් කොටසක් එකතුකර ඒක
පූජකයාට දිය යුතුය. පූජකයාද අපරාධ
පූජාවේ බැටළුවාගෙන් ඔහු උදෙසා
සමගිකමක් කරන්නේය, ඔහුද ක්ෂමා-
කරනු ලබන්නේය.
17 යමෙක් පව්කොට ස්වාමීන්වහන්සේ
නොකරන්ට අණකළ දේවලින් යමක්
කළොත් ඔහු එය නොදැන සිටිය තුමුත්
වැරදිකාරයෙක්ව, තමාගේ අයුතුකම දැරිය
18 යුතුය. ඔහු තුඹ නියම කරන ගණනට
අපරාධ පූජාවක් පිණිස රැළෙන් කැලල්
නැති බැටළුවෙකු පූජකයා වෙතට ගෙනා
යුතුය. පූජකයාද ඔහු වැරදිල්ලකින්
නොදැන කළ වරද ගැන ඔහු උදෙසා
සමගිකමක් කරන්නේය, ඔහුද ක්ෂමා-
කරනු ලබන්නේය. එය අපරාධ
19 පූජාවක්ය. සැබවින් ඔහු ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි වරදකාරයෙක්යයි කීසේක.

6
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්: යමෙක් 2
පව්කොට ස්වාමීන්වහන්සේට විරුද්ධව
වරදක් කරමින් ප්‍රවේසමට භාරගත්
දෙයක් ගැන හෝ ගනුදෙනුවක් ගැන
හෝ සොරකමක් ගැන හෝ තම
අසල්වාසියාට අවිශ්වාස ලෙස
ක්‍රියාකළොත්, නොහොත් තම
අසල්වාසියාට බලාත්කාරයක් කළොත්,
නැතිවූ දෙය සම්බවූ කල ඔහු ඒ ගැන 3
අවිශ්වාස ලෙස ක්‍රියාකොට බොරුවට
දිවුළොත්, මෙසේ මනුෂ්‍යයෙක් පව්-
කරමින් මේ දේවලින් යම් කිසිවක්
කිරීමෙන්, පව්කොට වරදකාරයෙක් 4
වුණොත්, තමා විසින් සොරකමින් ගත්
දෙය හෝ බලාත්කාරකමින් ගත් දෙය
හෝ ප්‍රවේසමට තමාට භාරදුන් දෙය
හෝ නැතිවී තමාට සම්බවුණාවූ දෙය
හෝ, තමා යමක් ගැන බොරුවට 5
දිවුළේද ඒ දෙය හෝ ඔහු නැවත දිය
යුතුය. එසේය, ඔහු සම්පූර්ණ වශයෙන්
එය දෙමින් ඊට තව පහෙන් කොටසක්ද
එකතුකර දිය යුතුය. ඔහු තමා
වරදකාරයා වූ දවසෙහි ඒක
අයිතිකාරයාට දේවා. ඔහු තුඹ විසින් 6
නියම කරන ගණනේ හැටියට බැටළු
රැළෙන් කැලල් නැති බැටළුවෙකු
ස්වාමීන්වහන්සේට අපරාධ පූජාවක්
පිණිස පූජකයා වෙතට ගෙනෙන්ට
ඕනෑය. පූජකයාද ස්වාමීන්වහන්සේ 7
ඉදිරියෙහි ඔහු උදෙසා සමගිකමක්
කරන්නේය, ඔහු යමක් කිරීමෙන්
වරදකාරයෙක් වූයේද ඒ ගැන ක්ෂමා-
කරනු ලබන්නේයයි කීසේක.

## පූජා සම්බන්ධව පූජකයන්ගේ යුතුකම්

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 8
කොට: ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ට 9
අණකරමින් මෙසේ කියාපන්න: දවන
පූජාව පිළිබඳ ව්‍යවස්ථාව මේය–දවන
පූජාව මුළු රාත්‍රියෙහි උදය දක්වා

පූජාසනයේ මැස්ස පිට තිබිය යුතුය;
පූජාසනයේ ගින්නද එහි දල්වෙමින් තිබිය
10 යුතුය. එවිට පූජකයා තමාගේ හණ
වස්ත්‍රය හැඳ තමාගේ මාංසය පිට හණ
කලිසම ලාගෙන පූජාසනය පිට දවන
පූජාව දැවූ ගින්නේ අළු රැගෙන පූජාසනය
11 ළඟ දමන්නේය. ඔහු තමාගේ ඇඳුම්
ගළවා වෙන ඇඳුම් ඇඳගෙන කඳවුරෙන්
පිට පවිත්‍ර තැනකට අළු ගෙනේවා.
12 පූජාසනය පිට ගින්න නොනිවී එහි
දල්වෙමින් තිබිය යුතුය; පූජකයාද හැම
උදයම ඒ මතුයෙහි දර දවන්නේය. ඔහු
ඊ පිට දවන පූජාව පිළිවෙළට තබා
එහි ශාන්ති පූජාවල තෙල දවන්නේය.
13 ගින්න පූජාසනය පිට නිතර දල්වෙමින්
නොනිවී තිබිය යුතුය.
14 ආහාර පූජාව පිළිබඳ ව්‍යවස්ථාව
මේය: ආරොන්ගේ පුත්‍රයන් ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි පූජාසනය ඉදිරිපිට
15 ඒක ඔප්පුකළ යුතුය. ඔහු ආහාර පූජාවේ
සිහින් පිටියෙන්ද ඒකේ තෙලින්ද අහුරක්
සහ ආහාර පූජාව පිට තිබෙන තුවරලා
සියල්ලත් රැගෙන ඒ සිහිවීමේ කොටස
ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳක් කොට
16 පූජාසනය පිට දැවිය යුතුය. එයින් ඉතිරි
හරිය ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ
කත්වා. එය ශුද්ධවූ තැනකදී මුහුන් නැතුව
කෑ යුතුය; ඔව්හු ඒක සම්මුඛවීමේ
17 කූඩාරමේ මළුවේදී කත්වා. ඒක මුහුන්
දමා බදිනු නොලැබිය යුතුය. ගින්නෙන්
කළ මාගේ පූජාවලින් ඔවුන්ගේ කොටස
මෙන් ඒක දුනිමි; පාප පූජාව මෙන්ද
අපරාධ පූජාව මෙන්ද ඒක අති ශුද්ධය.
18 ස්වාමීන්වහන්සේට ගින්නෙන් කළ
පූජාවලින් නුඹලාගේ පරම්පරාවල
නිරන්තරයෙන්ම අයිති කොටසක් මෙන්
ආරොන්ගේ දරුවන් අතරේ සියලු
පිරිමින්ට එයින් කන්නට පුළුවන. ඊට
තැවරෙන කවරෙක් නුමුත් ශුද්ධවන්නේ-
යයි කීසේක.
19 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
20 කොට කියනසේක්: ආරොන් ආලේප
ලබන දවසෙහි ඔහු සහ ඔහුගේ පුත්‍රයන්
විසින් ස්වාමීන්වහන්සේට ඔප්පු
කරන්නාවූ ඔවුන්ගේ පූජාව මේය—
නිරන්තර ආහාර පූජාවක් පිණිස සිහින්
පිටි ඒඵාවකින් දසයෙන් කොටසකින්
උදයේ එයින් භාගයක්ද සවස එයින්
භාගයක්ද වේ. ඒවා තෙල් ඇතුව 21
ඇතිලියක පිළියෙළකරනු ලැබිය යුතුය;
ඒවා පෙඟුණු කල ඇතුළට ගෙනැවිත්
පිලිස්සූ ආහාර පූජාවක් කොට කැබලි
වශයෙන් ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳක්
පිණිස ඔප්පුකරපන්න. ඔහුගේ පුත්‍රයන්- 22
ගෙන් ඔහු වෙනුවට ආලේපලත් පූජකයා
ඒක පූජාකළ යුතුය. නිරන්තර පනතකින්
ඒක ස්වාමීන්වහන්සේට සහමුලින්ම දවනු
ලැබිය යුතුය. පූජකයෙකුගේ සියලු 23
ආහාර පූජා සහමුලින්ම දවනු ලබන්ට
ඕනෑය. ඒවා නොකෑ යුතුයයි කීසේක.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 24
කොට කියනසේක්: ආරොන් සහ 25
ඔහුගේ පුත්‍රයන්ට කථාකරමින් මෙසේ
කියාපන්න—පාප පූජාව පිළිබඳ
ව්‍යවස්ථාව මේය: දවන පූජාවේ සතා
මරන තැනදී පාප පූජාවේ සතාද
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි මැරිය යුතුය.
එය අති ශුද්ධය. පාප පූජාවක් කොට 26
එය ඔප්පුකරන පූජකයා එය කන්ට
ඕනෑය. සම්මුඛවීමේ කූඩාරමේ මළුවෙහිදී,
ශුද්ධවූ තැනක එය කනු ලැබේවා. ඒකේ 27
මාංසයෙහි ස්පර්ශවන කොයි දෙයක්
නුමුත් ශුද්ධවන්නේය. ඒකේ ලේ කිසි
වස්ත්‍රයක ඉසුණොත් ඒ ඉසුණු වස්ත්‍රය
ශුද්ධවූ ඉඩමක සෝදපන්න. එහෙත් ඒක 28
තැම්බූ මැටි භාජනය බිඳ දැමිය යුතුය.
එය පිත්තල භාජනයක තම්බන ලද්දේ
වීනම් භාජනය මැදලා වතුරෙන් සේදිය
යුතුය. පූජකයන් අතරෙහි සියලු පිරිමි 29
එයින් කන්නෝය. එය අති ශුද්ධය. ශුද්ධ 30
ස්ථානයෙහි සමගි කිරීම පිණිස යම්
පාප පූජාවක ලේවලින් සම්මුඛවීමේ
කූඩාරමට ගෙනෙනු ලැබේද ඒ පූජාව
නොකෑ යුතුය. එය ගින්නෙන් දවනු
ලබන්නේය.

7 අපරාධ පූජාව පිළිබඳ ව්‍යවස්ථාව
2 මේය: එය අති ශුද්ධය. ඔව්හු දවන
පූජාවේ සතා මරන තැනදී අපරාධ
පූජාවේ සතාද මරත්වා. ඔහු උගේ ලේ
3 පූජාසනය පිට හාත්පසින් ඉසීවා. ඔහු
උගේ තෙල සියල්ල පුදන්නේය; තර
වල්ගේද අතුණු වැසී තිබෙන තෙලද,
4 වකුගඩු දෙකද ඒ පිට තුනටිය ළඟින්
තිබෙන තෙලද අක්මාව පිට දලද
5 වකුගඩු සමග වෙන්කෙරේවා. පූජකයා
ඒවා **ස්වාමීන්වහන්සේට** ගිනි පූජාවක්
පිණිස පූජාසනය පිට දැවිය යුතුය. එය
6 අපරාධ පූජාවක්ය. පූජකයන් අතරෙහි
සියලු පිරිමින්ට එයින් කන්ට පුළුවන.
ශුද්ධවූ තැනකදී එය කෑ යුතුය. එය අති
7 ශුද්ධය. පාප පූජාව යම්සේද අපරාධ
පූජාවත් එසේමය. ඒවාට එක පනතක්
ඇත්තේය. එයින් සමගිකම් කරන පූජකයා
8 ඒවා ලැබිය යුතුය. යම් පූජකයෙක් යම්
කෙනෙකුගේ දවන පූජාව ඔප්පුකරන්නේද
ඒ පූජකයා ඔහු පිදූ දවන පූජා සතාගේ
9 හම ලැබිය යුතුය. උදුනේ බදින්නාවූ
ආහාර පූජා සියල්ලද වළඳෙත් ඇතිලි-
යෙත් පිළියෙළකරන සියල්ලද ඒවා
ඔප්පුකරන පූජකයාට හිමිවන්නේය.
10 තෙලින් මිශ්‍රවූද අමිශ්‍රවූද සියලු ආහාර
පූජා ආරොන්ගේ පුත්‍රයන් හැමදෙනාටම
එකාකාරයෙන් හිමිවන්නේය.
11 යම් කෙනෙක් **ස්වාමීන්වහන්සේට**
ඔප්පුකරන ශාන්ති පූජා යාගය පිළිබඳ
12 ව්‍යවස්ථාව මේය. ඒක ස්තුති වශයෙන්
ඔප්පුකරන්නේනම්, ස්තුති පූජාව සමග
තෙල් මිශ්‍රවූ මුහුන් නොදමූ පූපද තෙල්
ගැවාවූ මුහුන් නොදමූ පෙතිද පෙහුණු
සිහින් පිටිවලින් බදිනලද තෙල් මිශ්‍රවූ
13 පූපද ඔප්පුකළ යුතුය. පූප ඇතුළුව මුහුන්
මුසු රොටිත් ඔහු තමාගේ පූජාව කොට
තමාගේ ශාන්ති පූජාව සමග ස්තුති
14 වශයෙන් ඔප්පුකළ යුතුය. එක එක
පූජාවෙන් එකක් බැගින් **ස්වාමීන්-**
**වහන්සේට** එසවීමේ පූජාවක් පිණිස ඔහු
එයින් ඔප්පු කෙරේවා; එය ශාන්ති
පූජාවල ලේ ඉසින පූජකයාට හිමි
වන්නේය. ස්තුති දීම පිණිස වූ ඔහුගේ 15
ශාන්ති පූජා යාගයේ මාංසය පිදූ
දවසෙහිම කෑ යුතුය; උදය දක්වා එයින්
කිසිවක් ඉතුරුනොකළ යුතුය. එහෙත් 16
ඔහු ඔප්පුකරන තමාගේ පූජාව භාරයක්
හෝ ස්වේච්ඡා පූජාවක් නම්, ඔහුගේ
පූජාව ඔප්පුකරන දවසෙහි එය කෑ
යුතුය. එයින් ඉතුරුවෙන දෙය පසුවද
කන්ට පුළුවන. එහෙත් තුන්වෙනි දවස 17
දක්වා පූජාවේ මාංසයෙන් ඉතුරුවෙන
ඒවා ගින්නෙන් පුලුස්සා දැමිය යුතුය.
ඔහුගේ ශාන්ති පූජාවල යාගයේ 18
මාංසයෙන් කිසිවක් තුන්වෙනි දවසෙහි
කෑවොත් එය පිළිගනු ලැබීමවත් එය
පූජාකරන තැනැත්තාගේ ගණනට තබනු
ලැබීමවත් නොවිය යුතුය. එය පිළිකුලක්
වන්නේය, එයින් කන තැනැත්තේද
තමාගේ අයුතුකම දරන්නේය. අපවිත්‍ර 19
යම් දෙයක ස්පර්ශවන මාංසය නොකා
ගින්නෙන් දැවිය යුතුය. ඉතිරි මාංසය
පවිත්‍රව සිටින සියල්ලන් විසින් කන්නට
පුළුවන. එහෙත් අපවිත්‍රකමක් ඇතුව 20
**ස්වාමීන්වහන්සේට** අයිති ශාන්ති පූජාවේ
මාංසය කන තැනැත්තේ තමාගේ
සෙනඟ කෙරෙන් සිඳිනු ලබන්නේය.
මනුෂ්‍යයෙකුගේ අපවිත්‍රකමක් වේවා 21
අපවිත්‍ර මෘගයෙක් වේවා අපවිත්‍ර
පිළිකුල්කමක් වේවා කිසියම් අපවිත්‍රකමක
ස්පර්ශවී **ස්වාමීන්වහන්සේට** අයිති
ශාන්ති පූජාවල මාංසය කන තැනැත්තේ
තමාගේ සෙනඟ අතරෙන් සිඳදමනු
ලබන්නේයයි කීසේක.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 22
කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 23
මෙසේ කියාපන්න—තුඹලා ගොනෙකු-
ගේවත් බැටළුවෙකුගේවත් එළුවෙකු-
ගේවත් තෙල නොකෑ යුතුය.
ඉබේ මළාවූ සතාගේ තෙලද මෘගයන් 24
විසින් ඉරාදමූ සතාගේ තෙලද අන්
කිසියම් වැඩකට ගත හැකිය. නුමුත්
තුඹලා කිසිසේත් ඒවායින් නොකෑ

25 යුතුය. කුමක්හෙයින්ද මනුෂ්‍යයන් විසින්
ස්වාමීන්වහන්සේට ගින්නෙන් පූජා
කිරීමට ඔප්පුකරන්නාවූ මෘගයෙකුගේ
තෙල කන කවරෙක් නුමුත් තමාගේ
සෙනඟ කෙරෙන් සිඳදමනු ලබන්නේය.
26 පක්ෂියෙකුගේ වේවා මෘගයෙකුගේ වේවා
කිසි ලෙයක් නුඹලාගේ කොයි
27 වාසස්ථානයකදීවත් නොකෑ යුතුය. ලේ
කන්නා වූ කවරෙක් නුමුත් තමාගේ
සෙනඟ කෙරෙන් සිඳදමනු ලබන්නේ-
යයි කීසේක.
28 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
29 කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකරමින් මෙසේ
කියාපන්න–ස්වාමීන්වහන්සේට ශාන්ති
පූජා යාගය ඔප්පුකරන තැනැත්තේ
තමාගේ ශාන්ති පූජාවල යාගයෙන්
තමාගේ පූජාව ස්වාමීන්වහන්සේ වෙතට
30 ගෙනේවා. ස්වාමීන්වහන්සේට ගින්නෙන්
කළ පූජාව ඔහු තමාගේම අතින්
ගෙනේවා; ළැපැත්ත ස්වාමීන්වහන්සේ
ඉදිරියේ තේව පූජාවක් කොට තේවකරන
පිණිස ළැපැත්ත සමග තෙල ගෙනේවා.
31 පූජකයාද තෙල පූජාසනය පිට
දවන්නේය. එහෙත් ළැපැත්ත ආරොන්ටත්
ඔහුගේ පුත්‍රයන්ටත් හිමිවන්නේය.
32 නුඹලාගේ ශාන්ති පූජා යාගවලින්
එසවීමේ පූජාවක් පිණිස දකුණු කලවය
33 පූජකයාට දීපල්ලා. ආරොන්ගේ පුත්‍රයන්
අතරෙන් ශාන්ති පූජාවල ලේද තෙලද
ඔප්පු කරන්නාට ඔහුගේ කොටස
වශයෙන් දකුණු කලවය දෙනු ලැබේවා.
34 මක්නිසාද මම ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ශාන්ති පූජා යාගවලින් තේව ළැපැත්තද
එසවීමේ කලවයද ගෙන ඉශ්‍රායෙල්
පුත්‍රයන් කෙරෙන් පූජකයාවූ ආරොන්ටත්
ඔහුගේ පුත්‍රයන්ටත් සදාකාලයටම
අයිතියක් කොට දුනිමියි කීසේක.
35 ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්
පූජක තනතුරෙහි ස්වාමීන්වහන්සේට
මෙහෙකරන පිණිස මෝසෙස් ඔවුන්
ගෙනා දවසෙහි ගින්නෙන් කළ පූජාවලින්
ඔවුන්ට ලැබෙන හැටියට නියම වූ
කොටස මේකය; සදාකාලේටම තමන්ගේ 36
පරම්පරාවල නියම කොටසක් කොට
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් එය ඔවුන්ට දෙනු
ලබන ලෙස, ඔවුන් ආලේපකළ දවසේදී
ස්වාමීන්වහන්සේ අණකළ සේක.
ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් තමන්ගේ පූජා 37
ස්වාමීන්වහන්සේට ඔප්පුකරන ලෙස
සීනයි වනයෙහිදී මෝසෙස් ඔවුන්ට
අණකළ දවසේදී, ස්වාමීන්වහන්සේ 38
සීනයි කන්දේදී මෝසෙස්ට අණකළාවූ
දවන පූජාවේද ආහාර පූජාවේද පාප
පූජාවේද අපරාධ පූජාවේද කැප කිරීමේදී
ශාන්ති පූජා යාගයේද නියමය ඒකය.

## පූජකයන් කැපකිරීම

8 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: ආරොන්ද ඔහුගේ 2
පුත්‍රයන්ද වස්ත්‍රද ආලේප තෙල්ද පාප
පූජාවට ගොනාද බැටළුවන් දෙදෙනාද
මුහුන් නොදැමූ රොටි පැසද රැගෙන,
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟට 3
මුළු සභාව රැස්කරවාපන්නැයි කීසේක.
මෝසෙස් ස්වාමීන්වහන්සේ තමාට 4
අණකළ ලෙස කෙළේය; සභාවද
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟට
රැස්වූවාය. ස්වාමීන්වහන්සේ කරන්ට 5
අණකළ දේ මේයයි මෝසෙස් සභාවට
කීවේය. මෝසෙස් ආරොන් සහ ඔහුගේ 6
පුත්‍රයන් ගෙන්වා ඔවුන් වතුරෙන්
නෑවුවේය. ඔහු දික් යට ඇඳුම ඔහුට හඳවා, 7
ඉණපටිය ඔහුගේ ඉඟටියේ බැඳ, සළුව
ඔහුට පළඳවා, ඒපොද් සැට්ටයද ඔහුට
හඳවා, ඒපොද්හි විසිතුරු ලෙස වියන
ලද පටිය දමා, එය ඔහුගේ ඉඟටියේ
බැන්දේය. ඔහු ළය වැස්ම ඔහු පිට 8
පිහිටුවා ඒ ළය වැස්මෙහි *ඌරීම් සහ
තුම්මීම් තැබුවේය. තවද ඔහුගේ හිස 9
පිට මකුටය ලා, මකුටය පිට ඉදිරියෙන්
රන් තහඩුව වන ශුද්ධ ඔටුන්න ස්වාමීන්-
වහන්සේ මෝසෙස්ට අණකළ ලෙස
තැබුවේය. මෝසෙස් ආලේප තෙලය 10

*නික්මයාම 28.30 බලනු.

රැගෙන මණ්ඩපය හා එහි තිබුණු
සියල්ල ආලේපකරමින් ඒවා පවිත්‍ර
11 කෙළේය. ඔහු එයින් පූජාසනය පිට සත්
වරක් ඉස පූජාසනය සහ ඒකේ සියලු
භාජනද සෝදන භාජනය හා ඒකේ
අඩියද පවිත්‍රකරන පිණිස ඒවා ආලේප-
12 කෙළේය. ඔහු ආරොන් පවිත්‍රකරන පිණිස
ඔහුගේ හිස පිට ආලේප තෛලය
13 වත්කොට ඔහු ආලේපකෙළේය. තවද
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට අණකළ
ලෙස ඔහු ආරොන්ගේ පුත්‍රයන් ගෙන්වා,
ඔවුන්ට දික් යට ඇඳුම් හඳවා, ඉණපටි
ඔවුන්ගේ ඉගටිවල බැඳ, ඔවුන්ගේ හිස්වල
14 මකුට බැන්දේය. එවිට ඔහු පාප පූජාවේ
ගොනා ගෙනායේය. ආරොන්ද ඔහුගේ
පුත්‍රයෝද පාප පූජාවේ ගොනාගේ හිස
15 පිට තමුන්ගේ අත් තැබුවෝය. ඔහු ඌ
මැරීය; මෝසෙස් ලේ රැගෙන පූජාසනයේ
අං වටේ තමාගේ ඇඟිල්ලෙන් ගා
පූජාසනයේ දෝෂය පහකොට පූජාසනය
මුල ලේ වත්කර එය උදෙසා සමගිකමක්
16 කරන පිණිස එය විශුද්ධ කෙළේය. ඔහු
අතුණු පිට තිබෙන තෙල සියල්ලද
අක්මාවේ දලද වකුගඩු දෙකද ඒවායේ
තෙලද ගත්තේය, මෝසෙස් ඒවා
17 පූජාසනය පිට දැවුවේය. එහෙත් ගොනා
සහ උගේ සමද මාංසයද ගොමද
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට අණකළ
ලෙස ඔහු කඳවුරෙන් පිටත ගින්නෙන්
18 පුලුස්සාදැමුවේය. ඔහු දවන පූජාවේ
බැටළුවා ගෙනායේය. ආරොන් සහ
ඔහුගේ පුත්‍රයෝ බැටළුවාගේ හිස පිට
19 තමුන්ගේ අත් තැබූහ. ඔහු ඌ මැරීය.
මෝසෙස් උගේ ලේ පූජාසනය පිට
20 හාත්පස ඉස්සේය. ඔහු බැටළුවා උගේ
කොටස්වලට කැපීය; මෝසෙස් උගේ
21 හිස සහ කැබලිත් තෙලත් දැවුවේය. ඔහු
අතුණුද කකුල්ද වතුරෙන් සේදුවේය;
මෝසෙස් මුළු බැටළුවා පූජාසනය පිට
දැවීය. ඒක **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
අණකළ ලෙස මිහිරි සුවඳක් පිණිස
දවන පූජාවක්ද **ස්වාමීන්වහන්සේට**
ගින්නෙන් කළ පූජාවක්ද වූයේය. ඔහු 22
කැපකිරීමේ බැටළුවා වන අනික් බැටළුවා
ගෙනායේය. ආරොන් සහ ඔහුගේ
පුත්‍රයෝ බැටළුවාගේ හිස පිට තමුන්ගේ
අත් තැබුවෝය. ඔහු ඌ මැරීය; මෝසෙස් 23
උගේ ලෙයින් මදක් රැගෙන ආරොන්ගේ
දකුණු කනේ කෙළවරෙහිද ඔහුගේ
දකුණතේ මාපට ඇඟිල්ලෙහිද ඔහුගේ
දකුණු පයේ මාපට ඇඟිල්ලෙහිද ගෑයේය.
ඔහු ආරොන්ගේ පුත්‍රයන්ද ගෙනායේය, 24
මෝසෙස් ලෙයින් මදක් ඔවුන්ගේ දකුණු
කන් කෙළවරෙහිද ඔවුන්ගේ දකුණත
මාපට ඇඟිල්ලෙහිද ඔවුන්ගේ දකුණු
පයේ මාපට ඇඟිල්ලෙහිද ගෑයේය.
මෝසෙස් උගේ ලේ පූජාසනය පිට
හාත්පස ඉස්සේය. ඔහු තෙලද තර 25
වල්ගයද අතුණු පිට තෙල සියල්ලද
අක්මාවේ දලද වකුගඩු දෙකද ඒවායේ
තෙලද දකුණු කළවයද රැගෙන,
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි වූ මුහුන් 26
නොදැමූ රොටි පැසින් මුහුන් නැති එක
රොටියක්ද තෙල් මිශ්‍රවූ එක රොටි
කැවුමක්ද එක පූප පෙත්තක්ද ගෙන
ඒවා තෙල පිටත් දකුණු කළවය පිටත්
තබා, ඒ සියල්ල ආරොන්ගේ අත්වල 27
සහ ඔහුගේ පුත්‍රයන්ගේ අත්වලත් තබා,
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි තේව
පූජාවක් පිණිස ඒවා තේව කෙළේය.
මෝසෙස් ඒවා ඔවුන්ගේ අත්වලින් ගෙන 28
පූජාසනයෙහි දවන පූජාව පිට දැවුවේය.
ඒවා මිහිරි සුවඳක් වන පිණිස
කැපකිරීමක් විය. එය **ස්වාමීන්වහන්සේට**
ගින්නෙන් කළ පූජාවක්ය. මෝසෙසේ 29
ළපැත්ත රැගෙන තේව පූජාවක් පිණිස
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි තේව-
කෙළේය. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
අණකළ ලෙස ඒක කැපකිරීමේ
බැටළුවාගෙන් මෝසෙස්ගේ කොටස විය.
මෝසෙස් ආලේප තෙලින් හා පූජාසනය 30
පිට තිබුණු ලෙයින් රැගෙන ඒවා ආරොන්
පිටද ඔහුගේ වස්ත්‍ර පිටද ඔහුගේ පුත්‍රයන්
පිටද ඔහුගේ පුත්‍රයන්ගේ වස්ත්‍ර පිටද
ඉස ආරොන් සහ ඔහුගේ වස්ත්‍රද ඔහුගේ
පුත්‍රයන් සහ ඔහුගේ පුත්‍රයන්ගේ වස්ත්‍රද

31 විශුද්ධ කෙළේය. මෝසෙස්ද ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන්ට කියනුයේ:
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟ ඒ
මාංසය තම්බාපල්ලා. ආරොන් සහ
ඔහුගේ පුත්‍රයන් විසින් එය කෑ යුතුයයි
මා විසින් අණකළ ලෙස එහිදී
කැපකිරීමේ පැසෙහි තිබෙන රොටිත්
32 සමග එය කාපල්ලා. මාංසය හා
රොටිවලින් ඉතුරු ඒවා ගින්නෙන්
33 දවාපල්ලා. තුඹලා සත් දවසක්
සම්පූර්ණවන තෙක් එනම් තුඹලාගේ
කැපකිරීමේ දවස් සම්පූර්ණවන තෙක්
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩින්
පිටතට නොයල්ලා. මක්නිසාද සත්
දවසක් තුඹලා කැපකරනු ලබන්නහුය.
34 තුඹලා වෙනුවට සමගිකමක් කරන
පිණිස, අද දවසේදී කළාක් මෙන් කරන්ට
35 ස්වාමීන්වහන්සේ අණකර තිබේ. තුඹලා
නොනස්නා පිණිස සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩ ළඟ රෑ දවල් සත්
දවසක් සිටිමින් ස්වාමීන්වහන්සේගේ
නියමය පවත්වාපල්ලා. මක්නිසාද එසේ
36 මට අණකර තිබේයයි කීවේය. මෙසේ
ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ ස්වාමීන්-
වහන්සේ මෝසෙස් ලවා අණකළ
සියල්ල කළෝය.

## පූජකයන්ගේ සේවය පටන්ගැන්ම

9 තවද අටවෙනි දින මෝසෙස්
ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ද
ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ද කැඳවා
2 ආරොන්ට කථාකොට: පාප පූජාවක්
පිණිස කැලලක් නැති එළවස්සෙක්ද
දවන පූජාවක් පිණිස කැලලක් නැති
බැටළුවෙක්ද රැගෙන ස්වාමීන්වහන්සේ
3 ඉදිරියෙහි උන් ඔප්පුකරපන්න. තුඹ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකරමින්:
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි පූජා කරන්ට
පාප පූජාවක් පිණිස එළුවෙක්ද දවන
පූජාවක් පිණිස අවුරුද්දක් පිරුණු
කැලලක් නැති එළවස්සෙක් හා
4 බැටළු පැටවෙක්ද, ශාන්ති පූජාව පිණිස
ගොනෙක්ද බැටළුවෙක්ද තෙල් මිශ්‍රවූ
ආහාර පූජාවක්ද ගෙනෙල්ලා.
මක්නිසාද අද ස්වාමීන්වහන්සේ
තුඹලාට පෙනෙනසේකැයි කියාපන්නැයි
කීවේය. ඔව්හු මෝසෙස් අණකළ දේ 5
සම්මුඛවීමේ කූඩාරම ඉදිරිපිටට
ගෙනාවෝය. මුළු සභාවද ළඟට අවුත්
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සිටියාය.
මෝසෙස්ද: තුඹලා විසින් කළ යුතුයයි 6
ස්වාමීන්වහන්සේ අණකළ දේ මේය.
එවිට ස්වාමීන්වහන්සේගේ තේජස
තුඹලාට පෙනෙන්නේයයි කීය. මෝසෙස් 7
ආරොන්ට කථාකොට: තුඹ පූජාසනයට
ළඟාවී ස්වාමීන්වහන්සේ අණකළ ලෙස
තුඹේ පාප පූජාවද තුඹේ දවන පූජාවද
පූජාකොට තුඹ උදෙසාත් සෙනඟ
උදෙසාත් සමගිකමක් කරපන්න.
සෙනඟගේ පූජාව පූජාකොට ඔවුන්
උදෙසා සමගිකමක් කරපන්නැයි කීවේය.
එවිට ආරොන් පූජාසනයට ළඟාවී තමා 8
උදෙසා වූ පාප පූජාවේ එළවස්සා
මැරුවේය. ආරොන්ගේ පුත්‍රයෝද ලේ 9
ඔහු ළඟට ගෙනාවෝය. ඔහු තමාගේ
ඇඟිල්ල ලෙයෙහි ගල්වා පූජාසනයේ
අංවල ගා පූජාසනය මුල ලේ
වත්කෙළේය. එහෙත් ස්වාමීන්වහන්සේ 10
මෝසෙස්ට අණකළ හැටියට තෙලද
වකුගඩුද පාප පූජාවේ අක්මාවේ දැලද
පූජාසනය පිට දැවීය. මාංසයද හමද 11
ඔහු කඳවුරෙන් පිටදී ගින්නෙන් පුලුස්සා
දැමුවේය. තවද ඔහු දවන පූජාවේ සතා 12
මැරුවේය; ආරොන්ගේ පුත්‍රයෝද ඔහුට
ලේ අරන් දුන්නෝය, ඔහු ඒවා
පූජාසනය පිට වටේට ඉස්සේය. ඔව්හු 13
දවන පූජාව කොට්ඨාස වශයෙන් හිසත්
ඇතුළුව ඔහුට රැගෙන දුන්නෝය. ඔහු
ඒවා පූජාසනය පිට දැවුවේය. ඔහු 14
අතුණුද කකුල්ද සෝද පූජාසන මතුයෙහි
දවන පූජාව පිට දැවුවේය. ඔහු සෙනඟගේ 15
පූජාව ගෙනැවිත් සෙනඟ උදෙසා වූ
පාප පූජාවේ එළුවා රැගෙන මරා පළමු
එකා මෙන් පාපය නිසා ඔප්පුකෙළේය.
ඔහු දවන පූජාවද ගෙනැවිත් නියමය 16

17 ලෙස එය ඔප්පුකෙළේය. ඔහු ආහාර
පූජාව ගෙනැවිත් එයින් අතපුරා රැගෙන
උදයේ දවන පූජාව හැර ඒවාත් පූජාසනය
18 පිට දැවූවේය. ඔහු සෙනඟ උදෙසා වූ
ශාන්ති පූජාව වන ගොනාත් බැටළුවාත්
මැරුවේය. ආරොන්ගේ පුත්‍රයෝද
ඔහුට ලේ අරන් දුන්නෝය, ඔහු ඒවා
පූජාසනය පිට හාත්පසින් ඉස්සේය.
19 ඔව්හු ගොනාගේ තෙලද බැටළුවාගේ
තර වල්ගයද අතුණු වැසී තිබෙන තෙලද
වකුගඩුද අක්මාවේ දලද ගෙනවුත්, තෙල
20 ළැපැත්ත පිට තැබුවෝය, ඔහු තෙල
21 පූජාසනය පිට දැවූවේය. මෝසෙස්
අණකළ ලෙස ආරොන් තේව පූජාවක්
පිණිස ළැපැත්ත හා දකුණු කළවයද
රැගෙන **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි තේව
22 කෙළේය. ආරොන් සෙනඟ දෙසට තමාගේ
අත් ඔසවා ඔවුන්ට ආශීර්වාදකොට
පාප පූජාවද දවන පූජාවද ශාන්ති
පූජාද ඔප්පුකළ ස්ථානයෙන් බැස්සේය.
23 මෝසෙස් සහ ආරොන් සම්මුඛවීමේ
කූඩාරමට ඇතුල්ව පිටට අවුත් සෙනඟට
ආශීර්වාද කළෝය. එවිට **ස්වාමීන්-
වහන්සේගේ** මහිමය මුළු සෙනඟට
24 පෙනුණේය. **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙන්
ගිනි නික්ම අවුත් පූජාසනය පිට දවන
පූජාවද තෙල්ද දවා දැමුවේය. මුළු සෙනඟ
ඒ දැක ශබ්ද පවත්වා මුහුණින්
වැටුණෝය.

## නාදබ් සහ අබිහුගේ පාපය

10 ආරොන්ගේ පුත්‍රයෝවූ නාදබ්
සහ අබිහු තම තමාගේ ධූම
භාජනය රැගෙන එහි ගිනි බහා ඒ පිට
සුවඳ ද්‍රව්‍ය දමා **ස්වාමීන්වහන්සේ**
ඔවුන්ට අණනොකළාවූ අන්‍ය ගින්නක්
උන්වහන්සේ ඉදිරියෙහි ඔප්පුකළෝය.
2 තවද **ස්වාමීන්වහන්සේ** කෙරෙන් ගිනි
නික්ම අවුත් ඔවුන් දවා දැම්මේය, එසේ
ඔව්හු **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
3 මළෝය. එකල්හි මෝසෙස් ආරොන්ට
කථාකොට: මා ළඟට පැමිණෙන්නන්
කරණකොටගෙන මා විශුද්ධ බව
දක්වා මුළු සෙනඟ ඉදිරියෙහි ගෞරවය
ලබන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කී
කාරණය මේයයි කීවේය. ආරොන්
නිශ්ශබ්දව සිටියේය. එවිට මෝසෙස් 4
ආරොන්ගේ බාල පියා වන උසියෙල්ගේ
පුත්‍රයන්වූ මීෂායෙල් හා එල්ශාඵාන්
කැඳවා: තුඹලා ළඟාවී තුඹලාගේ
සහෝදරයන් ශුද්ධ ස්ථානය ඉදිරියෙන්
කඳවුරෙන් පිටතට උස්සාගන පලයල්ලා-
යයි ඔවුන්ට කීවේය. ඔව්හු මෝසෙස් 5
කී හැටියට ළඟාවී ඒ අය ඔවුන්ගේ දික්
යට ඇඳුම් පිටින් කඳවුරෙන් පිටතට
උස්සාගෙන ගියෝය. මෝසෙස් 6
ආරොන්ටත් ඔහුගේ පුත්‍රවූ එලෙයාසර්ට
හා ඊතාමාර්ටත් කථාකොට: තුඹලා
නොනස්නා පිණිසද උන්වහන්සේ මුළු
සභාව කෙරෙහි උදහස් නොවන පිණිසද
තුඹලාගේ හිසකේ විදහා නොගනිල්ලා,
තුඹලාගේ වස්ත්‍ර ඉරානොගනිල්ලා.
එහෙත් තුඹලාගේ සහෝදරයෝ වන
මුළු ඉශ්‍රායෙල් වංශය **ස්වාමීන්වහන්සේ**
ඇවිලෙවූ දැවීම ගැන වැලපෙත්වා.
**ස්වාමීන්වහන්සේගේ** ආලේප තෛලය 7
තුඹලා පිට තිබෙන නිසා, තුඹලා
නොනස්නා පිණිස, සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩින් පිටතට නොගොස්
සිටපල්ලායයි කීවේය. ඔව්හු
මෝසෙස්ගේ වචනය ලෙස කළෝය.

## පූජකයන්ට තවත් ආඥා

**ස්වාමීන්වහන්සේ** ආරොන්ට කථා- 8
කොට: සම්මුඛවීමේ කූඩාරමට ඇතුල් 9
වෙන කල තුඹවත් තුඹේ පුත්‍රයෝවත්
නොනසින පිණිස මුද්‍රිකපානයවත්
මද්‍යපානයවත් පානයනොකරල්ලා.
තුඹලා විසින් ශුද්ධ දේ සහ අකැප දේ 10
අතරෙහිත් අපවිත්‍ර දේ සහ පවිත්‍ර
දේ අතරෙහිත් වෙනසක් කරන පිණිසද,
**ස්වාමීන්වහන්සේ** මෝසෙස් ලවා 11
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කියෙවූ සියලු පනත්
තුඹලා ඔවුන්ට උගන්වන පිණිසද
ඒක තුඹලාගේ පරම්පරාවල සදකාල
නියෝගයක් වන්නේයයි කීසේක.

12 මෝසෙස් ආරොන්ටත් ඔහුගේ ඉතිරිව
සිටි පුත්‍රයන් වූ එලෙයාසාර් සහ
ඊතාමාර්ටත් කථාකොට: **ස්වාමීන්-
වහන්සේට** ගින්නෙන් කළ පූජාවලින්
ඉතුරුව තිබෙන ආහාර පූජාව රැගෙන
පූජාසනය ළඟදී මුහුන් නැතුව කාපල්ලා.
13 මක්නිසාද එය අති ශුද්ධය. **ස්වාමීන්-
වහන්සේට** ගින්නෙන් කළ පූජාවලින්
එය නුඹේද නුඹේ පුත්‍රයන්ගේද නියම
කොටස වන නිසා එය ශුද්ධවූ තැනකදී
කාපල්ලා. මක්නිසාද එසේ මට
14 අණකරනලද්දේය. නුඹද නුඹ සමග
නුඹේ පුත්‍රයෝද නුඹේ දූවරුද තේව
ළැපැත්ත සහ එසවීමේ කළවය පවිත්‍ර
තැනකදී කෑ යුතුය. මක්නිසාද ඒවා
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ ශාන්ති පූජාවල
යාගවලින් නුඹේද නුඹේ පුත්‍රයන්ගේද
නියම කොටස කොට දෙන ලද්දේය.
15 ඔව්හු **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි තේව
පූජාවකට තේවකරන පිණිස ඔසවන
කළවයද තේව ළැපැත්තද ගින්නෙන් කළ
පූජාව වන තෙල සමග ගෙනෙත්වා.
ඒක **ස්වාමීන්වහන්සේ** අණකළ ලෙස
නුඹටද නුඹ සමග නුඹේ පුත්‍රයන්ටද
සදාකාලේටම අයිතිවන්නාවූ කොටසක්-
යයි කීවේය.
16 මෝසෙස් පාප පූජාවේ එළුවා
ඕනෑකමින් සෙවීය, බලව, ඒකා
පුලුස්සාදමා තිබුණේය. ඔහු ඉතිරිව සිටිය
ආරොන්ගේ පුත්‍රයන් වූ එලෙයාසර්ද
17 ඊතාමාර්ද කෙරෙහි උදහස්ව: නුඹලා
පාප පූජාව ශුද්ධ ස්ථානයෙහිදී නොකෑවේ
මක්නිසාද? එය අති ශුද්ධය. ඇරත්
නුඹලා සභාවේ අයුතුකම පහකරන
පිණිසද **ස්වාමීන්වහන්සේ** ඉදිරිපිට ඔවුන්
උදෙසා සමගිකමක් කරන පිණිසද
උන්වහන්සේ එය නුඹලාට දී තිබේ.
18 බලව, ඒකේ ලේ ශුද්ධස්ථානය ඇතුළට
නොගෙනෙන ලද්දේය. මා අණකළ ලෙස
ඒක සැබවින් ශුද්ධ ස්ථානයෙහිදී නුඹලා
විසින් කෑ යුතුව තිබුණේයයි කීය.
19 ආරොන් මෝසෙස්ට කථාකොට: ඔව්හු
මේ දවසෙහි තමුන්ගේ පාප පූජාව සහ
දවන පූජාව **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
පූජාකළෝය; නුමුත් මෙයාකාර දේ මට
සිද්ධවී තිබේ. ඉදින් මම පාප පූජාව
අද කෑවෙම් නම් ඒක **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි යහපත්ව පෙනේදැයි කීවේය.
මෝසෙස් ඒ ඇසූ කල එය යහපත් බව 20
ඔහුට පෙනුණේය.

## පිරිසිදු අපිරිසිදු සතුන් පිළිබඳ නියෝග

11 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ටත්
ආරොන්ටත් කථාකොට කියන-
සේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෙසේ 2
කියාපල්ලා—පොළොවෙහි සියලු මෘග-
යන් අතරෙන් නුඹලා විසින් කෑ යුතු
වන්නේ මේ ජීවමාන සත්ත්වයෝය.
මෘගයන් අතරෙන් කුරය දෙකට බෙදී 3
වෙන්ව තිබෙන්නාවූ වමාරාකන්නාවූ
සියල්ලන් නුඹලාට කන්ට පුළුවන. එසේ වී 4
නුමුත් වමාරාකන මෘගයන්ගෙන්ද කුරය
බෙදුණවුන්ගෙන්ද මොවුන් නුඹලා විසින්
නොකෑ යුතුය: එනම් ඔටුවා, වමාරාකන
නුමුත් කුරය බෙදී නැති නිසා නුඹලාට
අපවිත්‍රය. බෙන් හාවා, වමාරාකන නුමුත් 5
කුරය බෙදී නැති නිසා ඌ නුඹලාට
අපවිත්‍රය. හාවා, වමාරාකන නුමුත් 6
කුරය බෙදී නැති නිසා ඌ නුඹලාට
අපවිත්‍රය. ඌරා, කුරය බෙදී වෙන්ව 7
තිබෙන නුමුත් වමාරානොකන නිසා
ඌ නුඹලාට අපවිත්‍රය. උන්ගේ මාංස 8
නොකල්ලා, උන්ගේ මළකුණු ස්පර්ශ-
නොකරල්ලා; උන් නුඹලාට අපවිත්‍රය.
ජලයෙහි ඉන්න සියල්ලන්ගෙන් 9
නුඹලාට කන්ට පුළුවන්වන්නේ මේ
සත්ත්වයෝය: එනම් මුහුදුවලත් ගංගාවලත්
ජලයෙහි ඉන්නාවූ වරල් සහ කොරපොතු
ඇති සියල්ලන් කන්ට පුළුවන. එහෙත් 10
ජලයෙහි හැසිරෙන සියල්ලන්ගෙන්ද
ජලයෙහි ඉන්නාවූ පණ ඇති සියලු
සතුන්ගෙන්ද මුහුදුවලත් ගංගාවලත්

ඉන්නාවූ වරල්ද කොරපොතුද නැති
11 සියල්ලෝ තුඹලාට පිළිකුලක්ය, උන්
තුඹලාට පිළිකුලක් වන්නෝය; උන්ගේ
මාංසය නොකල්ලා, උන්ගේ මළකුණු
12 පිළිකුල් කොට සලකාපල්ලා. ජලයෙහි
ඉන්නාවූ වරල්ද කොරපොතුද නැති
කොයි සතෙක් නුමුත් තුඹලාට පිළිකුලක්ය.
13 පක්ෂීන් අතරෙන් තුඹලා විසින්
පිළිකුල්කළ යුතු වන්නේ මේ සත්තුය;
උන් නොකෑ යුතුය, උන් පිළිකුලක්ය—
එනම් රාජාලියාද මහ ගිජුලිහිණියාද
14 මුහුදු උකුස්සාද; උකුස්සාද ඒ ඒ වර්ගයේ
15 කුරුළුගොයිද; ඒ ඒ වර්ගයේ සියලු
16 කපුටුවෝද; පැස්බරාද රෑ උකුස්සාද මුහුදු
ලිහිණියාද ඒ ඒ වර්ගයේ උකුස්සෝද;
17 බස්සාද දියකාවාද බකමූණාද;
18 උලමාද කරවැල් කොකාද ගිජුලිහිණියාද;
19 මානකොකාද ඒ ඒ වර්ගයේ කොක්කුද
හුපුවාද වවුලාද යන උන්ය.
20 පියාපත් ඇති බඩගායන සතර පයින්
ඇවිදින සියලු සත්තු තුඹලාට
21 පිළිකුලක්ය. එහෙත් පියාපත් ඇති බඩගා
යන සතර පයින් ඇවිදින භූමිය පිට
පැනයන පිණිස පාදවලට ඉහළින්
කකුල් ඇති සියලු සතුන් අතරෙන් මුන්
22 තුඹලාට කන්ට පුළුවන: එනම් ඒ ඒ
වර්ගයේ පළඟැටියෝද ඒ ඒ වර්ගයේ
තට්ට පළඟැටියෝද ඒ ඒ වර්ගයේ
ගොඩවෙලුවෝද ඒ ඒ වර්ගයේ
තනගිරව්ද තුඹලාට කන්ට පුළුවන.
23 එහෙත් පියාපත් ඇති බඩගායන සතර
පයින් ඇවිදින සියලු සත්තු තුඹලාට
පිළිකුලක්ය.
24 තුඹලා මුන්ගෙන් අපවිත්‍රවන්නහුය.
උන්ගේ මළකුණු ස්පර්ශකරන කවරෙක්
25 නුමුත් සවස දක්වා අපවිත්‍රව සිටී. උන්ගේ
මළකුණුවලින් කිසිවක් උසුලාගෙනයන
කවරෙක් නුමුත් තමාගේ වස්ත්‍ර
සෝදගනීවා, ඔහු සවස දක්වා අපවිත්‍රව
26 සිටී. බෙදුණු නුමුත් වෙන්නූණු
කුර ඇති වමාරානොකන සියලු
මෘගයෝ තුඹලාට අපවිත්‍රය. උන්ට
ස්පර්ශවන සියල්ලෝද අපවිත්‍ර
වන්නෝය. පාද සතරෙන් යන සියලු 27
ආකාර මෘගයන් අතරෙන් පතුල් තබා
යන සියල්ලෝ තුඹලාට අපවිත්‍රය.
උන්ගේ මළකුණු ස්පර්ශකරන කවරෙක්
නුමුත් සවස දක්වා අපවිත්‍රවන්නේය.
උන්ගේ මළකුණු උසුලාගනයන්නා 28
තමාගේ වස්ත්‍ර සෝදගනීවා, ඔහු සවස
දක්වා අපවිත්‍රව සිටී. ඒ සත්තු තුඹලාට
අපවිත්‍රය.
පොළොව පිට බඩගායන සතුන් 29
අතරෙන් තුඹලාට අපවිත්‍රවන්නේ මේ
සත්තුය: එනම් ඒ ඒ වර්ගයේ මුගටියාද
බඩුමීයාද ඒ ඒ වර්ගයේ කබරගොයි
හා තලගොයිද හූනාද ගොඩ කිඹුලාද 30
හිකනැලාද වැලි හූනාද කටුස්සාද යන
උන්ය. බඩගායන සියලු සතුන් අතරෙන් 31
තුඹලාට අපවිත්‍රවන්නේ මේ සත්තුය.
උන් මළ පසු උන්ට ස්පර්ශවන කවරෙක්
නුමුත් සවස දක්වා අපවිත්‍රව සිටී. උන් 32
මළ පසු යම් බඩුවක් පිටට වැටුණොත්
ලී භාජනයක් නුමුත් ඇඳුමක් නුමුත්
හමක් නුමුත් මල්ලක් නුමුත් යම් වැඩකට
පාවිච්චිකරන වෙන යම් භාජනයක්
නුමුත් ඒක අපවිත්‍රවන්නේය, එය වතුරෙහි
දැමිය යුතුය, එය සවස දක්වා අපවිත්‍රව
තිබේ; ඉන්පසු එය පවිත්‍රවන්නේය.
උන්ගෙන් යම් එකෙක් මැටි භාජනයක 33
වැටුණොත් එහි තිබෙන සියල්ල
අපවිත්‍රවන්නේය, ඒකද බිඳ දැමිය යුතුය;
එහි තිබෙන කන්නාවූ කොයි කෑමක් 34
පිටට නුමුත් [උන්ගේ] වතුර වැටේද
ඒ කෑම අපවිත්‍රවන්නේය; එබඳු හැම
භාජනවලින් බොන සියලු බීම
අපවිත්‍රවන්නේය. උන්ගේ මළකුණෙන් 35
කිසිවක් යම් දෙයක් පිටට එනම් උදුනක
හෝ වලන් මැස්සක හෝ වැටුණොත් එය
බිඳදැමිය යුතුය. ඒවා අපවිත්‍රය, ඒවා
තුඹලාට අපවිත්‍රවන්නේය. එසේවී නුමුත් 36
උල්පතක් හෝ වතුර එකතුවෙන වළක්
හෝ පවිත්‍රය. නුමුත් උන්ගේ මළකුණු

ස්පර්ශවන සියල්ල අපවිත්‍රවන්නේය.
37 උන්ගේ මළකුණුවලින් කිසිවක් වපුරන්ට
තිබෙන මොන බිත්තර පිට තුමුත්
38 වැටුණත් ඒවා පවිත්‍රය. එහෙත් ඒ බිත්තර
පිට වතුර වත්කළ පසු උන්ගේ මළකුණු-
වලින් කිසිවක් ඒ පිට වැටුණොත් ඒවා
තුඹලාට අපවිත්‍රය.
39 තුඹලා කෑමට ගන්න මෘගයින්ගෙන්
එකෙක් මැරුණොත් උගේ මළකුණේ
ස්පර්ශවන තැනැත්තේ සවස දක්වා
40 අපවිත්‍රව සිටී. ඒ මළකුණෙන් කන
තැනැත්තේ වස්ත්‍ර සෝදගත යුතුය, ඔහු
සවස දක්වා අපවිත්‍රව සිටී. ඒ මළකුණ
උසුලාගන යන තැනැත්තේද තමාගේ
වස්ත්‍ර සෝදගත යුතුය, ඔහු සවස දක්වා
අපවිත්‍රව සිටී.
41 බිම බඩගායන සියලු සත්තුද පිළිකුල්ය;
42 උන් නොකෑ යුතුය. බඩගා යන්නාවූද
සතර පයින් යන්නාවූද නොහොත්
බොහෝ පා ඇත්තාවූ එනම් පොළොව
පිට බඩගායන්නාවූද සියලු සතුන්
නොකෑ යුතුය; මක්නිසාද උන් පිළිකුල්ය.
43 බඩගායන කොයි සතෙකුගෙන්වත්
පිළිකුල් නොවෙල්ලා, උන්ගෙන් පිළිකුල්-
වන ලෙස උන් කරණකොටගෙන
44 අපවිත්‍රනොවෙල්ලා. මක්නිසාද මම
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය.**
මා ශුද්ධ බැවින් තුඹලාත් පවිත්‍රවී ශුද්ධව
සිටපල්ලා. පොළොව පිට බඩගා යන
කොයි සතෙකුගෙන්වත් තුඹලාම අපවිත්‍ර-
45 කරනොගනිල්ලා. මක්නිසාද මම වනාහි
තුඹලාගේ දෙවියන්වහන්සේ වන පිණිස
මිසර දේශයෙන් තුඹලා ගෙනාවාවූ
**ස්වාමීන්වහන්සේය.** මම ශුද්ධ බැවින්
තුඹලාත් ශුද්ධව සිටපල්ලා.
46 අපවිත්‍රයන්ද පවිත්‍රයන්ද අතරෙත්
කෑමට සුදුසු සතුන්ද කෑමට නුසුදුසු
සතුන්ද අතරෙත් වෙනස දක්වීමට,
47 මෘගයන්ද පක්ෂීන්ද ජලයෙහි හැසිරෙන
පණ ඇති සතුන්ද බිම බඩගායන
සියලු සතුන්ද ගැන ව්‍යවස්ථාව මෙයයි
කීසේක.

## මව්වරුන්ගේ පිරිසිදුවීම

12

**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
කථාකොට කියනසේක්: ඉශ්‍රා- 2
යෙල් පුත්‍රයන්ට කථාකර මෙසේ
කියාපන්න–ස්ත්‍රියෙක් ගර්භිණීව පිරිමි
ළමයෙකු වැදුවොත් ඈ සත් දවසක්
අපවිත්‍රව සිටින්නීය; ඈ ඔසප්වී වෙන්ව
සිටින දවස් ලෙස ඈ අපවිත්‍රව සිටින්නීය.
අටවෙනි දවසේදී ඔහුගේ චර්මාග්‍ර මාංසය 3
ඡේදනය කරනු ලැබිය යුතුය. තවද ඇගේ 4
ලෙයින් පවිත්‍රවීම පිණිස ඈ තිස්තුන්
දවසක් සිටින්නීය; ඇගේ පවිත්‍රවීමේ දවස්
සම්පූර්ණවන තෙක් කිසි ශුද්ධ දෙයක
ස්පර්ශ නොවිය යුතුය, ශුද්ධ ස්ථානයට
ඇතුල් නොවිය යුතුය. එහෙත් ඈ ගැනු 5
ළමයෙකු වැදුවොත් ඇගේ වෙන්ව සිටීම
ලෙස ඈ දෙසතියක් අපවිත්‍රව සිටින්නීය;
ඇගේ ලෙයින් පවිත්‍රවීම පිණිස ඈ
හැටහදවසක් සිටිය යුතුය. පුත්‍රයෙකු 6
සඳහා හෝ දුවෙකු සඳහා හෝ ඇගේ
පවිත්‍රවීමේ දවස් සම්පූර්ණවූ කල්හි දවන
පූජාවකට අවුරුද්දක්වූ බැටළුවෙක්ද
පාප පූජාවකට පරෙවි පැටියෙක් හෝ
කොබෙයියෙක්ද සම්මුඛවීමේ කූඩාරමේ
දොරකඩ ළඟට පූජකයා වෙතට ගෙනා
යුතුය. ඔහු ඌ **ස්වාමීන්වහන්සේ** 7
ඉදිරියෙහි ඔප්පුකර ඈ වෙනුවට සමගි-
කමක් කරන්නේය; මෙසේ ඈ ලේ
ධාරාව කෙරෙන් පවිත්‍රවන්නීය. පිරිමි
දරුවෙකු හෝ ගැහැනු දරුවෙකු හෝ
වදන තැනැත්තිය ගැන ව්‍යවස්ථාව ඒකය.
බැටළුපැටවෙකු ගෙනෙන්ට ඇට වත්කම 8
නැත්නම් ඈ කොබෙයියන් දෙදෙනෙක්
හෝ පරෙවිපැටවුන් දෙදෙනෙක් හෝ
ගෙනේවා; එයින් එකෙක් දවන
පූජාවටය, අනිකා පාප පූජාවටය.
පූජකයාද ඈ උදෙසා සමගිකමක්
කරන්නේය, ඈ පවිත්‍රවන්නීයයි කීසේක.

## කුෂ්ඨ රෝගය පිළිබඳ අණ පනත්

13 ස්වාමීන්වහන්සේ මෝසෙස්
සහ ආරොන්ට කථාකොට:
2 මනුෂ්‍යයෙකුගේ ශරීරයේ හමෙහි
බිබිලක්වත් කබොල්ලක්වත් රතුපල්ලක්-
වත් හටගැනී ඒක ඔහුගේ ශරීරයේ
හමෙහි කුෂ්ඨ ලකුණක් වන්නේ නම්
ඔහු පූජකයාවූ ආරොන් වෙතට හෝ
ඔහුගේ පුත්‍රයන්වූ පූජකයන්ගෙන්
එක්කෙනෙකු වෙතට හෝ පමුණුවනු
3 ලබාවා. පූජකයාද ශරීරයේ හමෙහි
රෝගය බලාවා. රෝගය තිබෙන තැන
මයිල් සුදුවූ බවද ඒ රෝගය සෑදී තිබෙන
ස්ථානය ඔහුගේ ශරීරයේ හමට වඩා
පහත්ව තිබෙන බවද පෙනේනම් ඒක
කුෂ්ඨයේ ලකුණක්ය. පූජකයා ඔහු බලා
4 ඔහු අපවිත්‍රයයි කිය යුතුය. නුමුත් ඔහුගේ
ශරීරයේ හමෙහි තිබෙන පැල්ලම සුදු
බවද හමට වඩා පහත්ව නැති බවද
එහි මයිල් සුදු නොවී තිබෙන බවද
පෙනේනම් පූජකයා රෝගකාරයා සත්
5 දිනක් වෙන්කර සිටුවා, සත්වෙනි දින
ඔහු බලන්නේය; එවිට ඒ ලකුණ හමෙහි
පැතිර නොගොස් නැවතී තිබෙන බව
ඔහුට පෙනේනම් තවත් සත් දිනක්
පූජකයා ඔහු වෙන්කොට සිටුවා,
6 සත්වෙනි දිනදී නැවත ඔහු බලාවා,
එවිට ඒ කුෂ්ඨ ලකුණු හමෙහි
පැතිර නොගොස් මැලවී තිබේ නම්
පූජකයා ඔහු පවිත්‍රයයි කිය යුතුය. ඒ
කාබොල්ලක්ය. ඔහු තමාගේ වස්ත්‍ර සෝද
7 පවිත්‍රවන්නේය. එහෙත් ඔහුගේ පවිත්‍රවීම
පිණිස ඔහු පූජකයාට පෙනුණු පසු
කබොල්ල හමෙහි පැතිර ගියොත් ඔහු
8 නැවත පූජකයාට පෙනේවා. එවිට
පූජකතැන බලා කබොල්ල හමෙහි පැතිර
තිබෙන බව පෙනේනම් ඔහු අපවිත්‍රයයි
කිය යුතුය. ඒක කුෂ්ඨ රෝගයය.
9 මනුෂ්‍යයෙකුට කුෂ්ඨ ලකුණක් හටගත්
කල්හි ඔහු පූජකයා ළඟට පමුණුවනු
10 ලැබිය යුතුය; පූජකයා ඔහු බලාවා,
එවිට හමෙහි සුදු බිබිලක් තිබී එයින්
මයිල් සුදුවී බිබිලෙහි අමු මාංස පෙනේ-
නම්, ඒක ඔහුගේ ශරීරයේ හමෙහි 11
කල්ගිය කුෂ්ඨ රෝගයක්ය, පූජකයා
ඔහු අපවිත්‍රයයි ප්‍රකාශකොට ඔහු අපවිත්‍ර
බැවින් සිරකර නොසිටුවන්නේය. කුෂ්ඨය 12
හමෙහි පැතිර ගොස් රෝගාතුරයාගේ
මුළු හම ඔහුගේ හිස පටන් ඔහුගේ
පාද දක්වාම පූජකයාට පෙනෙන සෑම
තැනම කුෂ්ඨයෙන් වැසී තිබේනම්,
පූජකයා බලාවා, එවිට ඔහුගේ මුළු 13
ශරීරය කුෂ්ඨයෙන් වැසී තිබේනම්
රෝගාතුරයා පවිත්‍රයයි ඔහු විසින් කිය
යුතුය. සියල්ල සුදුවී තිබෙන බැවින්
ඔහු පවිත්‍රය. එහෙත් කිසිවිටක අමු මාංස 14
පෙනේනම් ඔහු අපවිත්‍රය. පූජකයාද අමු 15
මාංස බලා ඔහු අපවිත්‍රයයි කිය යුතුය.
අමු මාංස අපවිත්‍රය. ඒ කුෂ්ඨයය. අමු 16
මාංස නැවත වෙනස්වී සුදුවුණොත් ඔහු
පූජකයා වෙතට පැමිණේවා, පූජකයා 17
ඔහු බැලුවාම කුෂ්ඨ ලකුණ සුදුවී
තිබෙන බව දුටුවොත් රෝගාතුරයා
පවිත්‍රය කියා පූජකයා කිය යුතුය. ඔහු
පවිත්‍රය.
ශරීරයේ හමේ ගඩගෙඩියක් තිබී සුව 18
වුණාට පසු, ගඩගෙඩිය තිබුණු තැන 19
සුදු බිබිලක්වත් රතට හුරු සුදු පල්ලක්වත්
හටගත්තොත් එය පූජකයාට පෙන්විය
යුතුය; පූජකයා බැලූ කල එය හමට 20
වඩා පහත්වී එහි මයිල් සුදුවී තිබෙන
බව දුටුවොත් ඔහු අපවිත්‍රයයි පූජකයා
කිය යුතුය. එය කුෂ්ඨ ලකුණය, ඒක
ගඩගෙඩියෙන් හටගත්තේය. එහෙත් 21
පූජකයා එය බැලූ කල එහි තුළ සුදු
මයිල් නැතුව හමට වඩා පහත් නොවී
මැලවී තිබුණොත් පූජකයා ඔහු සත්-
දිනක් වෙන්කර සිටුවිය යුතුය. ඉදින් 22
ඒක හමේ පැතුරුණොත් ඔහු අපවිත්‍ර-
යයි පූජකයා කිය යුතුය. ඒක කුෂ්ඨ
ලකුණක්ය. එහෙත් පල්ල පැතිර නො- 23
ගොස් තිබුණු තැනම නැවතුණොත් ඒක
ගඩගෙඩියේ කැලලය; පූජකයා ඔහු
පවිත්‍රයයි කියාවා.

24 නොහොත් ශරීරයේ හමෙහි ගින්නෙන්
දවීමක් වූ කල දැවාවූ තුවාලයේ මාංසය
රතට හුරුව සුදු පල්ලක් වන්නේ නම්,
25 පූජකයා ඒක බලාවා. එවිට පැල්ලමේ
මයිල් සුදුවී ඒක හමට වඩා පහත් බව
පෙනේ නම් ඒක කුෂ්ඨරෝගයය, ඒක
දැවාවූ තුවාලයෙන් හටගත්තේය. ඔහු
26 අපවිත්‍රයයි පූජකයා කියයුතුය. ඒක
කුෂ්ඨරෝගයය. එහෙත් පූජකයා බැලූ
කල පැල්ලමේ සුදු මයිල් නැතුව හමට
වඩා පහත්නොවී මැලවී තිබුණොත්
පූජකයා ඔහු සත් දවසක් වෙන්කර
27 සිටුවිය යුතුය. සත්වෙනි දින පූජකයා
ඔහු බලාවා. ඒක හමේ පැතිර තිබේනම්
ඔහු අපවිත්‍රයයි පූජකයා ප්‍රකාශකෙරේවා.
28 ඒක කුෂ්ඨරෝගයය. එහෙත් පල්ල පැතිර
නොගොස්, තිබුණු තැනම නැවතී මැලවී
තිබුණොත්, ඒක දැවාවූ තුවාලයෙන්
හටගත් ඉදිමුමය, පූජකයා ඔහු පවිත්‍ර-
යයි ප්‍රකාශකළ යුතුය. ඒක තුවාලයේ
කැලලය.

29 පුරුෂයෙකුට හෝ ස්ත්‍රියෙකුට හෝ
හිසේ නොහොත් රැවුලේ ලපයක් තිබෙන
30 විට, පූජකයා ලපය බැලිය යුතුය. එවිට
ඒක හමට වඩා පහත් බවද ඒකේ
කහවත් සිහින් මයිල් තිබෙන බවද
පෙනුණොත් පූජකයා ඔහු අපවිත්‍රයයි
ප්‍රකාශකළ යුතුය. ඒක කබොල්ලක්ය,
හිසේ නොහොත් රැවුලේ කුෂ්ඨයක්ය.
31 නුමුත් පූජකයා කබලු ලකුණ
බැලුවාම ඒක හමට වඩා පහත් බව
නොපෙනුණොත්, ඒකේ කළු මයිල් නැතුව
තිබුණොත්, පූජකයා කබලු ලපය ඇත්තා
32 සත් දවසක් හිරකර සිටුවාවා. සත්වෙනි
දින ඔහු ලපය බලාවා. එවිට කබොල්ල
පැතිර නොගොස් එහි කහවත් මයිල්
නැතුව කබොල්ල හමට වඩා පහත්
33 නැති බව පෙනේ නම්, ඔහුගේ හිස
මුඩුකරනු ලැබිය යුතුය, එහෙත් ලපය
මුඩු නොකළ යුතුය; පූජකයා
කබොල්ල ඇත්තා තවත් සත් දිනක්
34 වෙන්කර සිටුවා තබාවා. තවද සත්වෙනි
දින පූජකයා ලපය බලාවා. එවිට
කබොල්ල හමෙහි පැතිර නොගොස්
හමට වඩා පහත්ව නැති බව පෙනුණොත්
ඔහු පවිත්‍රයයි පූජකයා ප්‍රකාශ කෙරේවා.
ඔහු තමාගේ වස්ත්‍ර සෝදගෙන
පවිත්‍රවන්නේය. එහෙත් ඔහුගේ පවිත්‍ර- 35
වීමෙන් පසු කබොල්ල හමේ පැතුරුණොත්
පූජකයා ඔහු බලාවා. එවිට කබොල්ල 36
හමේ පැතිර තිබුණොත් පූජකයා කහපාට
මයිල් ඇද්දයි සොයන්ට ඕනෑ නැත;
ඔහු අපවිත්‍රය. එහෙත් කබොල්ල නැවතී 37
එහි තුළ කළු මයිල් හටගැනී තිබෙන
බව ඔහුට පෙනේනම් කබලුව සුවවී
ඔහු පවිත්‍රව සිටී. පූජකයා ඔහු පවිත්‍ර-
යයි ප්‍රකාශකෙරේවා.

පුරුෂයෙකුට හෝ ස්ත්‍රියෙකුට හෝ 38
ඔවුන්ගේ ශරීරයේ හමේ පල්ල එනම්
සුදු පල්ල හටගත් කල්හි, පූජකතෙමේ 39
බලාවා; එවිට ඔවුන්ගේ ශරීරයේ හමේ
සුදුමැලි පලු තිබෙන බව දුටුවොත් ඒවා
හමේ හටගත් ගෝමරය; ඒ අය පවිත්‍රය.

යමෙකුගේ හිසකේ වැටී ඔහු හිස 40
මුඩුකෙනෙක් වුණත් ඔහු පවිත්‍රය.
යමෙකුගේ ඉස්සරහ පැත්තේ හිසකේ 41
වැටී නළල මුඩු කෙනෙක් වුණත් ඔහු
පවිත්‍රය. නුමුත් මුඩු හිසේවත් මුඩු 42
නළලේවත් රතට හුරු සුදු ලපයක්
හටගත්තොත් එය ඔහුගේ මුඩු හිසෙහි
හෝ මුඩු නළලෙහි හෝ හටගන්න
කුෂ්ඨයක්ය. එවිට පූජකයා ඔහු බලාවා. 43
තවද ශරීරයේ හමේ කුෂ්ඨරෝගයේ
පෙනීම වාගේ රතට හුරු සුදු කුෂ්ඨ
ඉදිමුමක් ඔහුගේ මුඩු හිසේවත් මුඩු
නළලේවත් තිබුණොත්, ඔහු කුෂ්ඨ- 44
රෝගකාරයෙක්ය, ඔහු අපවිත්‍රය; ඔහු
අපවිත්‍රයයි පූජකයා සැබවින් ප්‍රකාශ
කළ යුතුය; ඔහුගේ රෝගය ඔහුගේ
හිසෙහිය.

කුෂ්ඨරෝගය ඇති අය තමාගේ 45
වස්ත්‍ර ඉරාගන හිසකේ විදහාගන උඩු
තොල වසාගන: අපවිත්‍රය අපවිත්‍රය කියා
මොරගැසිය යුතුය. රෝගය ඔහුට තිබෙන 46
මුළු කාලයෙහි ඔහු අපවිත්‍රව සිටින්නේය;

අපවිත්‍ර බැවින් ඔහු තනියම වාසය කළ
යුතුය; ඔහුගේ වාසස්ථානය කඳවුරෙන්
පිටත වන්නේය.
47 ලොම් වස්ත්‍රයකවත් හණ වස්ත්‍රයකවත්
48 හණ තුමුත් ලොම් තුමුත්, දිග නූල්-
වලවත් හරස් නූල්වලවත් හමකවත්
හමෙන් සෑදූ යම් දෙයකවත් කුෂ්ඨයක්
49 හටගැනී, ඒ කුෂ්ඨය වස්ත්‍රයේ හෝ
හම්වල හෝ දිග නූල්වලවත් හරස්
නූල්වලවත් හමින් සෑදූ යම් දෙයකවත්
කොළපාට ඇතුව නොහොත් රතුව
පෙනුණොත්, ඒක කුෂ්ඨයක් බැවින්
50 පූජකයාට පෙන්විය යුතුය. පූජකයා ඒ
කුෂ්ඨය බලා කුෂ්ඨය ඇති දෙය සත්
51 දිනක් වසා තබාවා. ඔහු සත්වෙනි දින
කුෂ්ඨය බලාවා. ඉදින් වස්ත්‍රයේ දිග
නූල්වලවත් හරස් නූල්වලවත් හමේවත්
හමෙන් සෑදූ කොයියම් දෙයකවත් කුෂ්ඨය
පැතිර තිබෙන බව පෙනේනම් එය වස
52 කුෂ්ඨයක්ය; ඒක අපවිත්‍රය. ඒ වස්ත්‍රයත්
ලොම් වුවත් හණ වුවත් දිග නූල් හෝ
හරස් නූල් හෝ කුෂ්ඨය ඇති සියලුම
හම් බඩුත් ඔහු පුලුස්සා දැමිය යුතුය;
මක්නිසාද එය වස කුෂ්ඨයක්ය; ඒක
53 ගින්නෙන් පුලුස්සා දැමිය යුතුය. නුමුත්
පූජකයා බැලූ කල වස්ත්‍රයේවත් දිග
නූල්වලවත් හරස් නූල්වලවත් හමෙන්
සෑදූ යම් දෙයකවත් කුෂ්ඨය පැතිර නැති
54 බව දුටුවොත්, කුෂ්ඨය ඇති දෙය
සෝදන්ට ඔවුන්ට අණකර, තවත් සත්
55 දිනක් ඒක වසා තැබිය යුතුය. එසේ
සේදුවාට පසු පූජකයා කුෂ්ඨය නැවත
බැලූ කල කුෂ්ඨයේ පෙනීම වෙනස්නොවී
තිබේ නම්, කුෂ්ඨය පැතිරී නැත්නම්,
ඒක අපවිත්‍රය; එය ගින්නෙන් පුලුස්සා
දමාපන්න. ඒක ඇතුල් පැත්තේවත් පිට
56 පැත්තේවත් තිබෙන දිරුමක්ය. නුමුත්
ඒක සේදුවාට පසු කුෂ්ඨය මැලවී තිබෙන
බව පූජකයා දුටුවොත් වස්ත්‍රයෙන්වත්
හමෙන්වත් දිග නූල්වලින්වත් හරස්
නූල්වලින්වත් ඒක ඉරා දැමිය යුතුය.
57 නුමුත් එය වස්ත්‍රයේවත් දිග නූල්වලවත්
හරස් නූල්වලවත් හමෙන් සෑදූ යම්
දෙයකවත් තවත් පෙනුණොත් එය
පැතිරෙන බැවින් කුෂ්ඨය ඇති දෙය
ගින්නෙන් පුලුස්සා දමාපන්න. නුඹ 58
සෝදන වස්ත්‍රයෙන්වත් දිග නූල්වලින්-
වත් හරස් නූල්වලින්වත් හමෙන් සෑදූ
දෙයකින්වත් කුෂ්ඨය පහවුණොත් ඒක
දෙවෙනි වරත් සෝදනු ලැබිය යුතුය,
එවිට ඒක පවිත්‍රවන්නේය. ලොම් 59
නොහොත් හණ වස්ත්‍රයක්වත් දිග නූල්-
වත් හරස් නූල්වත් හමෙන් සෑදූ යම්
දෙයක්වත් පවිත්‍රය නොහොත් අපවිත්‍ර-
යයි කියන පිණිස ඒවායේ කුෂ්ඨය පිළිබඳ
ව්‍යවස්ථාව මේකයයි කීසේක.

## 14

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්: කුෂ්ඨ- 2
රෝගියා පවිත්‍රවීමේ දවසෙහි ඔහු පිළිබඳ
ව්‍යවස්ථාව මේය—ඔහු පූජකයා වෙතට
පමුණුවනු ලැබිය යුතුය. පූජකයාද 3
කඳවුරෙන් පිටතට ගොස් ඔහු බැලිය
යුතුය, කුෂ්ඨරෝගය සුවවී කුෂ්ඨ-
රෝගියාගෙන් පහවී තිබෙන බව
දුටුවොත්, පවිත්‍ර වෙන්ට සිටින්නා උදෙසා 4
පණ ඇති පවිත්‍රවූ පක්ෂීන් දෙදෙනෙක්ද
කිහිරි දඬුද රතු ලොම්ද හිසොප්ද
ගෙනෙන්ට පූජකයා අණකරාවා.
පක්ෂීන්ගෙන් එකෙකු මැටි භාජනයක 5
බැසයන ජලය පිට මරන්ට අණකළ
යුතුය. එවිට පූජකයා පණ ඇති පක්ෂියා 6
සහ කිහිරි දඬුද රතු ලොම්ද හිසොප්ද
රැගෙන ඒවාද පණ ඇති පක්ෂියාද බැස
යන ජලය පිට මරනලද පක්ෂියාගේ
ලෙයෙහි ගිල්වා, කුෂ්ඨයෙන් පවිත්‍රවෙන්ට 7
සිටින්නාට සත් වරක් ඉස ඔහු පවිත්‍ර-
යයි කියා පණපිටින් සිටින පක්ෂියා
එළිමහනෙහි නිදහස්කර හරීවා. පවිත්‍ර 8
වෙන්ට සිටින්නාද තමාගේ වස්ත්‍ර
සෝදගෙන තමාගේ කේස සියල්ල
බූගා වතුර නාගනීවා, එවිට ඔහු
පවිත්‍රවන්නේය. පසුව ඔහු කඳවුර
තුළට අවුත් තමාගේ කූඩාරමෙන්
පිටත සත් දවසක් නැවතී සිටින්නේය.

9 සත්වෙනි දවසේදී තමාගේ සියලු කේස
එනම් තමාගේ ඉසකෙස්ද තමාගේ
රැවුලද තමාගේ ඇස්බැමිද බූගාගන
තමාගේ වස්ත්‍ර සෝදගන තමාගේ ශරීරය
වතුරෙන් නාවාගනීවා, එවිට ඔහු පවිත්‍ර-
10 වන්නේය. අටවෙනි දවසේදී ඔහු කැලලක්
නැති බැටළු වස්සන් දෙදෙනෙක්ද
කැලලක් නැති අවුරුද්දක බැටළු
වැස්සියෙක්ද තෙල් මිශ්‍රවූ සිහින් පිටි
ඒඵාවකින් දසයෙන් තුන් කොටසක්ද
11 තෙල් හුණ්ඩුවක්ද ගෙනේවා. ඔහු
පවිත්‍රකරන පූජකයාද පවිත්‍රවෙන්ට සිටින
මනුෂ්‍යයා සහ ඒ දේවල් ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි සම්මුඛවීමේ
12 කූඩාරමේ දොරකඩ ඉදිරිපිට තබා, එක
බැටළු වස්සෙක්ද තෙල් හුණ්ඩුවක්ද
රැගෙන අපරාධ පූජාවක් පිණිස
ඔප්පුකරමින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
තේව පූජාවක් කොට ඒවා තේවකෙරේවා.
13 ශුද්ධ ස්ථානයෙහි පාප පූජාවේද දවන
පූජාවේද සතුන් මරන ස්ථානයෙහි ඔහු
බැටළු පැටවා මැරිය යුතුය. මක්නිසාද
පාප පූජාව පූජකයාට අයිතිවාක් මෙන්
අපරාධ පූජාවත් අයිතිය. ඒක අතිශුද්ධය.
14 පූජකයාද අපරාධ පූජාවේ ලෙයින්
ස්වල්පයක් ගෙන පවිත්‍රවෙන්ට
සිටින්නාගේ දකුණු කන් කෙළවරෙහිද
ඔහුගේ දකුණු අත මාපට ඇඟිල්ලේද
ඔහුගේ දකුණු පය මාපට ඇඟිල්ලේද
15 ගා, තෙල් හුණ්ඩුවෙන් ස්වල්පයක්
16 තමාගේ වම් අල්ලේ වත්කරගන, තමාගේ
වම් අල්ලේ තිබෙන තෙලෙහි තමාගේ
දකුණු ඇඟිල්ල ගිල්වා, තමාගේ
ඇඟිල්ලෙන් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
17 සත් වරක් තෙල් ඉස, තමාගේ
අතේ ඉතිරිවෙන තෙලින් පවිත්‍රවෙන්ට
සිටින්නාගේ දකුණු කන් කෙළවරෙහිද
දකුණු අත මාපට ඇඟිල්ලේද දකුණු
පය මාපට ඇඟිල්ලේද අපරාධ පූජාවේ
18 ලේ පිට ගා, පූජකයාගේ අතේ ඉතිරිව
තිබෙන තෙල් පවිත්‍රවෙන්ට සිටින්නාගේ
හිසේ ගා, ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
19 ඔහු උදෙසා සමගිකමක් කෙරේවා. තවද
පූජකයා පාප පූජාව ඔප්පුකර තමාගේ
අපවිත්‍රකම නිසා පවිත්‍රවෙන්ට සිටින්නා
උදෙසා සමගිකමක් කෙරේවා; පසුව
ඔහු දවන පූජාවේ සතා මරාවා. පූජකයා 20
ඒ දවන පූජාවද ආහාර පූජාවද
පූජාසනය පිට ඔප්පුකොට ඔහු උදෙසා
සමගිකමක් කරන්නේය, එවිට ඔහු
පවිත්‍රවන්නේය.

නුමුත් ඔහු එපමණ වත්කම නැති 21
දිළින්දෙක් නම්, තමා උදෙසා සමගිකමක්
කරන්ට තේව කරන අපරාධ පූජාවක්
පිණිස එක බැටළුවස්සෙක්ද ආහාර
පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ සිහින් පිටි
ඒඵාවකින් දසයෙන් පංගුවක්ද තෙල්
හුණ්ඩුවක්ද ගෙනේවා; තවද තමාගේ 22
වත්කමේ හැටියට කොබෙයියන්
දෙන්නෙක්ද නොහොත් පරෙවි පැටවුන්
දෙන්නෙක්ද එකෙක් පාප පූජාවක්
පිණිසත් අනිකා දවන පූජාවක් පිණිසත්
ගනීවා. ඔහු තමාගේ පවිත්‍රවීම පිණිස 23
අටවෙනි දවසේදී ස්වාමීන්වහන්සේ
ඉදිරියට සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ
ළඟට ඒවා පූජකයා වෙතට ගෙනේවා.
පූජකයාද අපරාධ පූජාවේ බැටළු පැටවා 24
සහ තෙල් හුණ්ඩුවද රැගෙන ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි ඒවා තේව පූජාවක්
කොට තේවකෙරේවා. අපරාධ පූජාවේ 25
බැටළු පැටවාද මරා අපරාධ පූජාවේ
ලේවලින් මදක් ගෙන පවිත්‍ර වෙන්ට
සිටින්නාගේ දකුණු කන් කෙළවරෙහිද
දකුණු අතේ මාපට ඇඟිල්ලේද දකුණු
පයේ මාපට ඇඟිල්ලේද ගා, තෙලින් 26
මදක් තමාගේ වම් අල්ලේ වත්කොට,
තමාගේ වම් අල්ලේ තිබෙන තෙල්වලින් 27
තමාගේ දකුණු ඇඟිල්ලෙන් ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි සත් වරක් ඉස,
තමාගේ අතේ තිබෙන තෙල්වලින් 28
පවිත්‍රවෙන්ට සිටින්නාගේ දකුණු කන්
කෙළවරෙහිද ඔහුගේ දකුණු අතේ මාපට
ඇඟිල්ලේද දකුණු පයේ මාපට
ඇඟිල්ලේද අපරාධ පූජාවේ ලේ තිබෙන
තැන ගා, පූජකයාගේ අල්ලේ ඉතුරුවෙන 29

තෙල් පවිත්‍රවෙන්ට සිටින්නා උදෙසා
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි සමගිකමක්
කිරීමට ඔහුගේ හිසේ ගෑ යුතුය.
30 එවිට ඔහු තමාගේ වත්කමේ හැටියට
කොබෙයියන්ගෙන්වත් පරෙවි පැටවුන්-
31 ගෙන්වත්, තමාගේ වත්කමේ හැටියට
එකෙක් පාප පූජාවක් කොටද අනිකා
දවන පූජාවක් කොටද ආහාර පූජාව
ඇතුළුව ඔප්පුකෙරේවා. එසේ පූජකයා
පවිත්‍රවෙන්ට සිටින්නා උදෙසා **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි සමගිකමක්
32 කරන්නේය. තමාගේ පවිත්‍රවීමට නිසි
දෙය සපයාගන්ට වත්කම මදිවූ
කුෂ්ඨරෝගියා ගැන ව්‍යවස්ථාව ඒක-
යයි කීසේක.
33 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට සහ
ආරොන්ට කථාකොට කියනසේක්:
34 නුඹලාට භුක්තියක් පිණිස මා විසින්
දෙන කානාන් දේශයට නුඹලා
පැමුණුණු කල්හි නුඹලා භුක්තිවිඳින
දේශයේ ගෙයකට මම කුෂ්ඨරෝගය
35 පැමිණෙවුවෙමිනම්, ගේ අයිතිකාරයා
ඇවිත්: ගෙයි කුෂ්ඨයක් තිබෙනවා වාගේ
මට පෙනේයයි පූජකයාට කියන්නේය.
36 එවිට ගෙයි තිබෙන සියල්ල අපවිත්‍ර
නොවන පිණිස පූජකයා කුෂ්ඨය
බැලීමට ඇතුල් වෙන්ට මත්තෙන් ගේ
හිස්කරන්ට ඔවුන්ට අණකළ යුතුය.
ඉන්පසු පූජකයා ගෙය බලන්ට ඇතුල්විය
37 යුතුය. ඔහු කුෂ්ඨය බැලූ කල කුෂ්ඨය
ගෙයි හිත්තිවල පලාවන් හෝ රත්වන්
හෝ පැළුණු රේඛා සහිතව හිත්තියට
වඩා පහත් පෙනීමක් ඇතුව තිබුණොත්,
38 පූජකයා ගෙයින් පිටතට දොරකඩ
ළඟට ඇවිත් සත් දවසක් ගෙය වසා
39 තබා, සත්වෙනි දවසෙහි නැවත
අවුත් බලාවා. එවිට කුෂ්ඨය ගෙයි
40 හිත්තිවල පැතිර තිබුණොත්, කුෂ්ඨය
ඇති ගල් ගළවා නුවරින් පිට අපවිත්‍ර
ස්ථානයක ඒවා දමන්ට පූජකයා
41 අණකළ යුතුය. තවද ඔහු ගෙයි
ඇතුළත වටකරින් සූරන්ට සැලැස්විය
යුතුය, ඔව්හු සූරාදමන බදම නුවරින්
පිටත අපවිත්‍ර ස්ථානයක දමා, වෙන 42
ගල් ගෙන අනික් ගල් තිබුණු තැන්වල
තබත්වා; ඔහු වෙන බදම රැගෙන ගෙයි
බදම ගෑ යුතුය. ගල් අහක් කොට 43
ගෙනගොස් ගේ සූරාදමා එහි බදම ගෑ
පසු කුෂ්ඨය නැවත පැමිණ ගෙයි
පැතිරෙන්නේනම්, පූජකයා ඇවිත් බලාවා. 44
එවිට කුෂ්ඨය ගෙයි පැතිර තිබේනම් එය
ගෙයි තිබෙන වස කුෂ්ඨයක්ය. ඒක
අපවිත්‍රය. ඔහු ගෙය ඒකේ ගල්ද ඒකේ 45
දඬුද ගෙයි බදම සියල්ලද ඇතුළුව කඩාදමා
නුවරින් පිටත අපවිත්‍ර ස්ථානයකට ගෙන
ගිය යුතුය. තවද ගෙය වසා තිබෙන 46
කාලය තුළ එහි ඇතුල්වන තැනැත්තේ
සවස දක්වා අපවිත්‍රව සිටින්නේය. ඒ 47
ගෙයි නිදන තැනැත්තේ තමාගේ වස්ත්‍ර
සෝදගත යුතුය; ඒ ගෙයිදී කෑම කන්නාද
තමාගේ වස්ත්‍ර සෝද ගත යුතුය. පූජකයා 48
අවුත් බැලූ විට ගෙය බදම ගෑ පසු
කුෂ්ඨය ගෙයි පැතිර ගොස් නැත්නම්
කුෂ්ඨය සුවවූ බැවින් ගෙය පවිත්‍රයයි
පූජකයා ප්‍රකාශ කරාවා. ඔහු ගෙය 49
පවිත්‍රකරන පිණිස පක්ෂීන් දෙදෙනෙක්ද
කිහිරි දඬුද රතු ලොම්ද හිසොප්ද රැගෙන,
පක්ෂීන්ගෙන් එකෙකු මැටි භාජනයක 50
බැස යන ජලය පිට මරා, කිහිරි 51
දඬුද හිසොප්ද රතුලොම්ද පණ ඇති
පක්ෂියාද රැගෙන, මැරූ පක්ෂියාගේ
ලෙයෙහිත් බැස යන ජලයෙහිත් ගිල්වා
සත් වරක් ගෙට ඉස, එසේ පක්ෂියාගේ 52
ලෙයින්ද බැස යන ජලයෙන්ද පණ
ඇති පක්ෂියාගෙන්ද කිහිරි දඬුවලින්ද
හිසොප්වලින්ද රතු ලොම්වලින්ද ගෙය
පවිත්‍ර කොට, පණ ඇති පක්ෂියා නුවරින් 53
පිටත එළිමහනෙහි නිදහස්කර හරීවා.
මෙලෙස ඔහු ගෙය උදෙසා සමගිකමක්
කරන්නේය; ඒක පවිත්‍රවන්නේය.
සියලු ආකාර කුෂ්ඨරෝගද කබලුද, 54
වස්ත්‍රයක හා ගෙයක කුෂ්ඨයද, ඉදිමුමද, 55,56
කබුලද පල්ලද සම්බන්ධව, ඒවා පවිත්‍ර 57
කොයි විටද අපවිත්‍ර කොයි විටදැයි
ඉගැන්වීමට ව්‍යවස්ථාව මේය. කුෂ්ඨය
පිළිබඳ ව්‍යවස්ථාව මේයයි කීසේක.

## නොයෙක් අපවිත්‍රකම් ගැන අණපනත්

15 ස්වාමීන්වහන්සේ මෝසෙස් සහ
ආරොන්ට කථාකොට කියන-
2 සේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට
මෙසේ කියාපල්ලා—යම් මනුෂ්‍යයෙකුට
තමාගේ මාංසයෙන් ප්‍රමේහයක් ඇති
කල ඔහුගේ ප්‍රමේහය නිසා ඔහු අපවිත්‍රය.
3 ප්‍රමේහය සම්බන්ධව ඔහුගේ අපවිත්‍රකම
මේය: ඔහුගේ ප්‍රමේහය ඔහුගේ
මාංසයෙන් නික්මෙන නුමුත් මාංසය
තුළ නවතින නුමුත් ඒක ඔහුගේ
4 අපවිත්‍රකමය. ප්‍රමේහය ඇති අය සයනය
කරන සියලු යහන් අපවිත්‍රවන්නේය.
ඔහු හිඳින සියලු බඩුද අපවිත්‍රවන්නේය.
5 ඔහුගේ යහනේ ස්පර්ශවන තැනැත්තේ
තමාගේ වස්ත්‍ර සෝද වතුර නාගත යුතුය,
සවස දක්වාද ඔහු අපවිත්‍රව සිටින්නේය.
6 ප්‍රමේහය ඇති අය හිඳගන්න කිසිවක්
පිට හිඳින තැනැත්තේ තමාගේ වස්ත්‍ර සෝද
වතුර නාගත යුතුය, සවස දක්වාද ඔහු
7 අපවිත්‍රව සිටින්නේය. ප්‍රමේහය ඇත්තාගේ
ශරීරයෙහි ස්පර්ශවන තැනැත්තේ තමාගේ
වස්ත්‍ර සෝද වතුර නාගත යුතුය, සවස
දක්වාද ඔහු අපවිත්‍රව සිටින්නේය.
8 ප්‍රමේහය ඇති අය පවිත්‍ර කෙනෙකු පිටට
කෙළගැසුවොත් ඔහු තමාගේ වස්ත්‍ර සෝද
වතුර නාගත යුතුය, සවස දක්වාද ඔහු
9 අපවිත්‍රවන්නේය. ප්‍රමේහය ඇති අය නැගී
යන සියලු රථවාහනද අපවිත්‍රවන්නේය.
10 ඔහුගේ ඇහට යටව තිබුණු කිසිදෙයක
ස්පර්ශවන කවුරු නුමුත් සවස දක්වා
අපවිත්‍රව සිටින්නේය. ඒවා ගෙනයන්නාද
තමාගේ වස්ත්‍ර සෝදගෙන වතුර නාගත
යුතුය, සවස දක්වාද ඔහු අපවිත්‍රව
11 සිටින්නේය. ප්‍රමේහය ඇති අය තමාගේ
අත් වතුරෙන් සෝද නොගෙන අතගසන
කවුරු නුමුත් තමාගේ වස්ත්‍ර සෝදගෙන
වතුර නාගත යුතුය, ඔහු සවස දක්වාද
12 අපවිත්‍රව සිටින්නේය. ප්‍රමේහය ඇති අය
අත ගසන මැටි භාජනය බිඳදැමිය යුතුය.
සියලු ලී භාජනද වතුරෙන් සේදිය යුතුය.
ප්‍රමේහය ඇති අය ප්‍රමේහයෙන් පවිත්‍රවූ 13
කල ඔහු තමාගේ පවිත්‍රවීමට සත් දවසක්
පසුකොට තමාගේ වස්ත්‍ර සෝදගෙන
තමාගේ ශරීරය බැස යන වතුරෙන්
නාවා ගනීවා, එවිට ඔහු පවිත්‍රවන්නේය.
අටවෙනි දවසෙහි ඔහු කොබෙයියන් 14
දෙන්නෙකු හෝ පරෙවිපැටවුන් දෙන්නෙකු
හෝ රැගෙන **ස්වාමීන්වහන්සේ** ඉදිරියට
සම්මුඛවීමේ කූඩාරමේ දෙරකඩ ළඟට
අවුත් උන් පූජකයාට දේවා. පූජකයාද 15
උන්ගෙන් එකෙකු පාප පූජාවක් පිණිසද
අනිකා දවන පූජාවක් පිණිසද ඔප්පුකර,
ඔහුගේ ප්‍රමේහය ගැන **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි ඔහු උදෙසා සමගිකමක්
කරන්නේය.
යම් පුරුෂයෙකුගේ ශුක්‍රධාතුව ඔහු 16
කෙරෙන් පිටවුණොත් ඔහු තමාගේ මුළු
ශරීරය වතුරෙන් සෝද ගත යුතුය, ඔහු
සවස දක්වාද අපවිත්‍රව සිටින්නේය.
ශුක්‍රධාතුව තැවරෙන සියලු වස්ත්‍රද හම්ද 17
සෝදනු ලැබිය යුතුය, ඒවා සවස
දක්වාද අපවිත්‍රවන්නේය. ශුක්‍රධාතුව 18
වැගිරීම ඇති පුරුෂයෙක් ස්ත්‍රියෙක් සමග
සයනයකළොත් ඔවුන් දෙදෙනම වතුර
නාගත යුතුය, ඔව්හු සවස දක්වාද
අපවිත්‍රව සිටින්නෝය.
යම් ස්ත්‍රියෙකුට ප්‍රමේහයක් ඇතිවී ඇගේ 19
ශරීරයේ ප්‍රමේහය ලේවීනම් ඈ සත්
දවසක් ඇගේ කිලුටුකමෙහි වන්නීය. ඈ
ස්පර්ශවන කවරෙක් නුමුත් සවස දක්වා
අපවිත්‍රව සිටින්නේය. ඇගේ කිලුටුකමේදී 20
ඈ සැතපෙන සියල්ලද අපවිත්‍රවන්නේය.
ඈ හිඳගන්න සියල්ලද අපවිත්‍රවන්නේය.
ඇගේ යහනෙහි ස්පර්ශවන තැනැත්තේ 21
තමාගේ වස්ත්‍ර සෝදගෙන වතුර නාගත
යුතුය, සවස දක්වාද ඔහු අපවිත්‍රව
සිටින්නේය. ඈ හිඳගන්න කිසිවක 22
ස්පර්ශවන කවුරු නුමුත් තමාගේ
වස්ත්‍ර සෝදගෙන වතුර නාගත යුතුය,
සවස දක්වාද ඔහු අපවිත්‍රව සිටින්නේය.
යහන පිටවත් ඈ හිඳගන්න දෙයක් 23

පිටවත් තිබෙන දෙයෙහි ස්පර්ශවන
තැනැත්තේ සවස දක්වා අපවිත්‍රව
24 සිටින්නේය. යම් පුරුෂයෙක් ඈ සමග
සයනය කොට ඇගේ කිලුට ඔහු පිට
වන්නේනම්, ඔහු සත් දවසක් අපවිත්‍රව
සිටින්නේය; ඔහු සැතපෙන සියලු යහන්ද
අපවිත්‍රව තිබෙන්නේය.
25 යම් ස්ත්‍රියෙකුට ඇගේ කිලුටුකමේ
කාලයට ඇතුළත් නැති බොහෝ දවසක්
ලේ වැගිරීමක් වන්නේනම් නොහොත්
ඇගේ කිලුටුකමේ කාලයට වැඩි කාලයක්
ලේ වැගිරීමක් වන්නේනම් ඇගේ
අපවිත්‍රකමේ සියලු දවස්වල ඇගේ
කිලුටුකමේ දවස්වලදී මෙන් සිටින්නීය.
26 ඈ අපවිත්‍රය. ඇගේ වැගිරීමේ සියලු
දවස්වලදී ඈ සැතපෙන සියලු යහන්
ඇගේ කිලුටුකමේ යහන මෙන් වන්නේය.
ඈ හිඳින සියල්ලද ඇගේ කිලුටුකමේ
අපවිත්‍රකම මෙන්ම අපවිත්‍රවන්නේය.
27 එහි ස්පර්ශවන තැනැත්තේ අපවිත්‍රව
සිටින්නේය, ඔහු තමාගේ වස්ත්‍ර සෝද-
ගෙන වතුර නාගත යුතුය, සවස දක්වාද
28 ඔහු අපවිත්‍රව සිටින්නේය. නුමුත් ඇගේ
වැගිරීමෙන් ඈ පවිත්‍රවූවානම් සත් දවසක්
ගත කළාට පසු ඈ පවිත්‍රවන්නීය.
29 අටවෙනි දවසෙහි කොබෙයියන්
දෙන්නෙක් හෝ පරෙවි පැටවුන්
දෙන්නෙක් හෝ රැගෙන සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩ ළඟට පූජකයා
30 වෙතට උන් ගෙනා යුතුය. පූජකයාද
එකෙක් පාප පූජාවක් පිණිසද අනිකා
දවන පූජාවක් පිණිසද ඔප්පුකොට ඇගේ
අපවිත්‍රකමේ වැගිරීම සඳහා ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි ඈ උදෙසා සමගි-
කමක් කරන්නේය.
31 එසේ ඉශ්‍රායෙල් පුත්‍රයන් තමන්
මධ්‍යයෙහි තිබෙන මාගේ මණ්ඩපය
කිලුටු කොට තමුන්ගේ අපවිත්‍රකමෙන්
නොනස්නා පිණිස නුඹලා ඔවුන්ගේ
අපවිත්‍රකමෙන් ඔවුන් වෙන්කරපල්ලා.
32 වැගිරීමක් ඇත්තාද ශුක්‍ර වැගිරීමෙන්
අපවිත්‍ර වෙන්නාද ඔසප් ඇතිවීමෙන්
33 අසනීපව සිටින්නීද, පුරුෂයෙක් නුමුත්
ස්ත්‍රියෙක් නුමුත් වැගිරීමක් ඇති අයද
අපවිත්‍ර ස්ත්‍රියෙක් සමග සයනය-
කරන්නාද ගැන ව්‍යවස්ථාව මෙයයි
කීසේක.

## සමගිකම්කිරීමේ දවස

16 ස්වාමීන්වහන්සේ ඉදිරියට
ළඟාවී සිටිද්දී මැරුණු, ආරොන්-
ගේ පුත්‍රයන් දෙදෙනාගේ මරණයෙන්
පසු, ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 2
කථාකොට කියනසේක්: නුඹේ
සහෝදරවූ ආරොන් නොනස්නා පිණිස
තිරය ඇතුළතින් ශුද්ධස්ථානයෙහි
පෙට්ටිය පිට තිබෙන කරුණාසනය
ඉදිරියට නිතරම ඇතුල් නොවන ලෙස
ඔහුට කියාපන්න. මක්නිසාද මම
කරුණාසනය මතුයේ වලාකුළෙහි
පෙනෙන්නෙමි. ආරොන් ශුද්ධස්ථානයට 3
ඇතුල්විය යුතු මෙසේය: පාප පූජාවකට
ගොන් නාම්බෙක්ද දවන පූජාවකට
බැටළුවෙක්ද රැගෙන ඔප්පුකිරීමෙන්ය.
ඔහු ශුද්ධ හණ යට ඇඳුම ඇඳ, තමාගේ 4
ඇඟේ හණ කලිසම දමාගෙන, හණ
පටිය ඉඟටියේ බැඳගන, මකුටය පැලඳ
ගන්නේය. ඒවා ශුද්ධ වස්ත්‍ර බැවින් ඔහු
තමාගේ ශරීරය වතුරෙන් සෝදගෙන
ඒවා පැලඳගත යුතුය. ඔහු ඉශ්‍රායෙල් 5
පුත්‍රයන්ගේ සභාවෙන් පාප පූජාවකට
එළුවන් දෙන්නෙක්ද දවන පූජාවකට
එක බැටළුවෙක්ද ගන්නේය. එවිට 6
ආරොන් තමා උදෙසා වූ පාප පූජාවේ
ගොනා ඔප්පුකර තමා උදෙසාද තමාගේ
පවුල උදෙසාද සමගිකමක් කරන්නේය.
ඔහු එළුවන් දෙදෙනා රැගෙන ස්වාමීන්- 7
වහන්සේ ඉදිරියෙහි සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩ ළඟ සිටවන්නේය.
එවිට ආරොන් එළුවන් ගැන පස ඇට 8
දැමිය යුතුය: ස්වාමීන්වහන්සේට එක
පස ඇටයක්ය, *අශාශෙල්ට එක පස
ඇටයක්ය. පසඇට දැමීමෙන් ස්වාමීන්- 9
වහන්සේට වූ එළුවා ගෙනැවිත් ආරොන්
පාප පූජාවක් කොට ඔප්පුකරන්නේය.

*හෙවත්, නිදහස්කර හැරීමට දඩුව
වැටුණු.

10 එහෙත් පසඅැට දැමීමෙන් *අශාශෙල්ට
වූ එළුවා අශාශෙල් උදෙසා වනාන්තර-
යෙහි නිදහසට ඇරීමට උගෙන්
සමගිකමක් කරන පිණිස උෟ පණපිටින්
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සිටවනු
11 ලැබේවා. ආරොන් තමා උදෙසා වූ
පාප පූජාවේ ගොනා ඔප්පු කොට,
තමා උදෙසාද තමාගේ පවුල උදෙසාද
සමගිකමක් කරමින්, තමා උදෙසා වූ
12 පාප පූජාවේ ගොනා මරන්නේය. එවිට
ඔහු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තිබෙන
පූජාසනයේ ගිනි අඟුරුවලින් ධූප
භාජනයක් පුරවා, කුඩුකළාවූ සුගන්ධ
ද්‍රව්‍යයෙන් තමාගේ අත් පුරවාගෙන,
13 තිරයෙන් ඇතුළට ඇවිත්, ඔහු නොනසින
පිණිස ධූප පටලය සාක්ෂිය මතුයෙහි
තිබෙන කරුණාසනය වසාගන්නා ලෙස
ඒ සුවඳ ද්‍රව්‍ය ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
14 ගින්න පිට දමන්නේය. තවද ඔහු
ගොනාගේ ලෙයින් ස්වල්පයක් ගෙන
තමාගේ ඇඟිල්ලෙන් කරුණාසනයෙහි
නැගෙන ඉර පැත්තේ ඉසින්නේය; ඔහු
කරුණාසනය ඉදිරියෙහි තමාගේ
ඇඟිල්ලෙන් ඒ ලේ සත් වරක් ඉසිය
15 යුතුය. එවිට ඔහු සෙනඟ උදෙසා
වූ පාප පූජාවේ එළුවා මරා උගේ
ලේ තිරයෙන් ඇතුළට ගෙනගොස්
ගොනාගේ ලෙයින් කළ ලෙසම උගේ
ලෙයිනුත් කරමින් කරුණාසනය පිටද
කරුණාසනය ඉදිරියෙහිද ඉසින්නේය.
16 එසේ ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
අපවිත්‍රකම් නිසාද ඔවුන්ගේ සියලු
අපරාධයන් එනම් ඔවුන්ගේ සියලු පව්
නිසාද ශුද්ධස්ථානය උදෙසා සමගි-
කමක් කරන්නේය. ඔවුන් අතරේ
ඔවුන්ගේ අපවිත්‍රකම් මැද පිහිටා
තිබෙන සම්මුඛවීමේ කූඩාරමටත් එසේම
17 කළ යුතුය. ඔහු ශුද්ධස්ථානයෙහි

*හෙවත්, නිදහස්කර හැරීමට දඩුව වැටුණු.

සමගිකමක් කරන්ට ඇතුල්වන කල තමා
උදෙසාද තමාගේ පවුල උදෙසාද මුළු
ඉශ්‍රායෙල් සභාව උදෙසාද සමගිකමක්
කොට පිටතට එනතුරු කිසිවෙක්
සම්මුඛවීමේ කූඩාරමෙහි නොසිටිය
යුතුය. ඔහු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි 18
තිබෙන පූජාසනය ළඟට පිටතට ගොස්
ඒක උදෙසා සමගිකමක් කරමින්
ගොනාගේ ලෙයින්ද එළුවාගේ ලෙයින්ද
මඳ මඳ රැගෙන පූජාසනයේ අංවල වටේට
ගාන්නේය. ඔහු ඒ පිට සත්වරක් තමාගේ 19
ඇඟිල්ලෙන් ලේ ඉස ඒක පවිත්‍රකොට
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ අපවිත්‍රකමෙන් ඒක
විශුද්ධකෙරේවා. ඔහු ශුද්ධස්ථානයද 20
සම්මුඛවීමේ කූඩාරමද පූජාසනයද
උදෙසා සමගිකමක් කොට නිමවූ කල
පණ පිටින් සිටින එළුවා ඉදිරියට
ගෙනේවා. ආරොන්ද තමාගේ අත් දෙක 21
පණ පිටින් සිටින එළුවාගේ හිස පිට
තබා ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු
අයුතුකම්ද ඔවුන්ගේ සියලු අපරාධයන්ද
එනම් ඔවුන්ගේ සියලු පව් කියා දෙමින්
ඒවා එළුවාගේ හිස පිට තබා සූදානම්ව
සිටින මනුෂ්‍යයෙකු අත උෟ
වනාන්තරයට යැවිය යුතුය. එළුවාද 22
ඔවුන්ගේ සියලු අයුතුකම් දරාගෙන
පාළු දේශයකට යන්නේය. ඔහු එළුවා
වනාන්තරයෙහි යන්ට හරින්නේය. එවිට 23
ආරොන් සම්මුඛවීමේ කූඩාරමට ඇතුල්ව
තමා ශුද්ධස්ථානයට ඇතුල්වෙන විට
හැඳගත සිටි හණ වස්ත්‍ර ගළවා
එහි තබා, ශුද්ධ ඉඩමකදී වතුර 24
නාවාගන, තමාගේ වස්ත්‍ර හැඳගන
පිටතට අවුත්, තමාගේ දවන පූජාවද
සෙනඟගේ දවන පූජාවද ඔප්පුකර, තමා
උදෙසාද සෙනඟ උදෙසාද සමගිකමක්
කරන්නේය. පාප පූජාවේ තෙල පූජාසනය 25
පිට දැවිය යුතුය. අශාශෙල් උදෙසා වූ 26
එළුවා යන්ට හරින තැනැත්තේ තමාගේ
වස්ත්‍ර සෝදගෙන වතුර නාගෙන
පසුව කඳවුරට ආ යුතුය. තවද 27
ශුද්ධස්ථානයෙහි සමගිකමක් කරන
පිණිස ලේ ගන්ට යෙදුණු පාප පූජාවේ
ගොනාද පාප පූජාවේ එළුවාද කඳවුරෙන්

පිටතට ගෙන ගොස් උන්ගේ හම්ද මාංසද
ගොමද ගින්නෙන් පුලුස්සා දැමිය යුතුය.
28 ඒවා පුලුස්සාදමන තැනැත්තේ තමාගේ
වස්ත්‍ර සෝදගෙන, වතුර නාගන, පසුව
කඳවුරට එන්නේය.
29 එය නුඹලාට නිරන්තර පනතක්
වන්නේය. සත්වෙනි මාසේ දසවෙනි දිනදී
නුඹලාගේ ප්‍රාණවලට පීඩාකරගත යුතුය,
ස්වදේශියාවත් නුඹලා අතරේ වසන
විදේශියාවත් කිසිම වැඩක් නොකළ
30 යුතුය. මක්නිසාද නුඹලාගේ සියලු
පාපවලින් නුඹලා **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි පවිත්‍රවෙන පිණිස නුඹලා
පවිත්‍රකරනු ලැබීමට ඒ දවසේ නුඹලා
උදෙසා සමගිකමක් කරනු ලබන්නේය.
31 ඒක නුඹලාට ශුද්ධවූ නිවාඩුවක් වන
සබතක්ය, නුඹලා නුඹලාගේ ආත්මවලට
දුක් දිය යුතුය. එය සදාකාල
32 නියෝගයක්ය. ආලේපය ලබා තමාගේ
පියා වෙනුවට පූජකකම් කිරීමට පත්-
වෙන්නාවූ පූජකයා එසේ සමගිකම කළ
යුතුය. ඔහු හණ වස්ත්‍ර එනම් ශුද්ධ
33 වස්ත්‍ර හැඳගන, අති ශුද්ධස්ථානය උදෙසා
සමගිකමක් කළ යුතුය, සම්මුඛවීමේ
කූඩාරමද පූජාසනයද පූජකයින්ද
සභාවේ සියලු සෙනඟද උදෙසාත්
34 සමගිකමක් කළ යුතුය. ඉශ්‍රායෙල්
පුත්‍රයන් උදෙසා ඔවුන්ගේ සියලු පව්
ගැන අවුරුද්දකට වරක් සමගිකමක්
කරන පිණිස මේක නුඹලාට නිරන්තර
පනතක් වන්නේයයි කීසේක. ඔහු
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට අණකළ
ලෙස කෙළේය.

## මණ්ඩපයට පමණක් පූජා රැගෙන ආ යුතු බව

17 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
කථාකොට කියනසේක්:
2 ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ටද
සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන්ටද මෙසේ
කියාපන්න—**ස්වාමීන්වහන්සේ** අණකළ
3 දේ නම් මේය: ඉශ්‍රායෙල් වංශයේ
කොයි මනුෂ්‍යයෙක් නුමුත් ගවයෙක්වත්
බැටළුපැටවෙක්වත් එළුවෙක්වත් **ස්වාමීන්-**
**වහන්සේගේ** මණ්ඩපය ඉදිරියෙහි
**ස්වාමීන්වහන්සේට** පූජාවක් කොට ඔප්පු-
කරන්ට සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ
ළඟට නොගෙනැවිත්, කඳවුරේදී හෝ 4
පිටතදී හෝ ඌ මැරුවොත් ඒ මනුෂ්‍යයාට
ලේ අපරාධය තබනු ලැබේ; ඒ මනුෂ්‍යයා
ලේ වැගිරෙවූ බැවින් ඔහු තමාගේ සෙනඟ
අතරෙන් සිඳදමනු ලබන්නේය. මෙසේ 5
අණ කරන්නේ ඉශ්‍රායෙල් පුත්‍රයන්
එළිමහතේ පූජාකරන තමන්ගේ පූජාවල්
**ස්වාමීන්වහන්සේ** වෙතට සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩ ළඟට පූජකයා
වෙතට ගෙනවුත් ශාන්ති පූජාවල් කොට
**ස්වාමීන්වහන්සේට** පූජාකරන පිණිසය.
පූජකයාද ඒ ලේ සම්මුඛවීමේ කූඩාරමේ 6
දොරකඩ ඉදිරිපිට තිබෙන **ස්වාමීන්-**
**වහන්සේගේ** පූජාසනය පිට ඉස
**ස්වාමීන්වහන්සේට** මිහිරි සුවඳක් පිණිස
තෙල දැවිය යුතුය. ඔවුන් *යක්ෂයන් 7
පස්සේ වේශ්‍යාකමින් ගොස් තමුන්ගේ
පූජා ඔවුන්ට තවත් පූජා නොකළ යුතුය.
මෙය ඔවුන්ට ස්වකීය පරම්පරාවල
නිරන්තර පනතක් වන්නේය.
තවද ඔවුන්ට මෙසේ කියාපන්න: 8
ඉශ්‍රායෙල් වංශයෙන්වත් ඔවුන් අතරෙහි
වසන විදේශීන්ගෙන්වත් දවන පූජාවක්
හෝ යාගයක් හෝ පූජාකරන කවරෙක්
නුමුත්, **ස්වාමීන්වහන්සේට** ඔප්පුකරන 9
පිණිස එය සම්මුඛවීමේ කූඩාරමේ
දොරකඩ ළඟට නොගෙනාවොත් ඒ
මනුෂ්‍යයා තමාගේ සෙනඟ අතරෙන්
සිඳදමනු ලබන්නේය.

## ලෙය නොකෑ යුතු බව

ඉශ්‍රායෙල් වංශයෙන් හෝ ඔවුන් අතරේ 10
වසන විදේශීන්ගෙන් හෝ කවරෙක්
නුමුත් කොයියාකාර ලෙයක්වත්
කැවොත් මම එසේ ලේ කන තැනැත්තාට
විරුද්ධව මාගේ මුහුණ යොමු-
කරමින් ඔහු තමාගේ සෙනඟ අතරෙන්

*හෙවත්, වන එළුවන්.

11 සිද්දමන්නෙමි. මක්නිසාද මාංසයේ පණ
තිබෙන්නේ ලෙයෙහිය. මම එය
නුඹලාගේ ප්‍රාණ උදෙසා පූජාසනය පිට
සමගිකමක් කරන පිණිස නුඹලාට
නියම කෙළෙමි. මක්නිසාද සමගිකමක්
සිදුකරන්නේ ලේය, එසේ වන්නේ
12 එහි ප්‍රාණය තිබෙන නිසාය. එබැවින්:
නුඹලාගෙන් කිසිවෙක් ලේ නොකෑ යුතුය,
නුඹලා අතරෙහි වසන විදේශියාද ලේ
නොකෑ යුතුයයි මම ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කීයෙමි.
13 ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන්වත් ඔවුන්
අතරේ වසන විදේශීන්ගෙන්වත් කිසිවෙක්
කෑමට ගන්නාවූ මෘගයෙක් හෝ
පක්ෂියෙක් හෝ දඩයම් කරගත්තොත්
ඔහු උගේ ලේ වගුරුවා එය පස්වලින්
14 වසා දැමිය යුතුය. මක්නිසාද සියලුම
මාංසවල පණ තිබෙන්නේ ඒවායේ
ලෙයෙහිය, එය පණ හා සමානය.
එබැවින් කිසි මාංසයක ලේ නොකෑ
යුතුයයි ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කීයෙමි.
මක්නිසාද සියලු මාංසවල පණ
තිබෙන්නේ ඒවායේ ලෙයෙහිය; එය කන
කවරෙක් නුමුත් සිද්දමනු ලබන්නේය.
15 ස්වදේශීවූ හෝ විදේශීවූ හෝ කවරෙක්
නුමුත් ඉබේ නැසුණු නොහොත් මෘගයන්
විසින් ඉරාදමනලද සතෙකුගේ මාංස
කෑවොත් ඔහු තමාගේ වස්ත්‍ර සෝදගෙන
වතුර නාගත යුතුය, ඔහු සවස
දක්වාද අපවිත්‍රව සිටින්නේය, ඊට
16 පසු ඔහු පවිත්‍රවන්නේය. එහෙත් ඔහු
ඒවා සෝදගන්නේවත් තමාම වතුර
නාගන්නේවත් නැත්නම් ඔහු තමාගේ
අයුතුකම දරනවා ඇතැයි කීසේක.

## නීති විරෝධ විවාහය සහ කාම තෘෂ්ණාවන් තහනම්කිරීම

18 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්:
2 ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෙසේ කියාපන්න–
මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
3 **වහන්සේය**. නුඹලා විසූ මිසර දේශයේ
ක්‍රියා ලෙස නොකරල්ලා. මා විසින් නුඹලා
පමුණුවනු ලබන කානාන් දේශයේ ක්‍රියා
ලෙස නොකරල්ලා. ඔවුන්ගේ පනත්
ලෙස නොහැසිරෙල්ලා. නුඹලා මාගේ 4
විනිශ්චයයන් ඉෂ්ටකර මාගේ පනත්
පවත්වා ඒවායේ හැටියට හැසිරියල්ලා.
මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේය**. එබැවින් නුඹලා මාගේ පනත් 5
සහ විනිශ්චයයන් පවත්වාපල්ලා.
මනුෂ්‍යයෙක් ඒවා පවත්වන්නේ නම් ඔහු
එයින් ජීවත්වන්නේය. මම **ස්වාමීන්-**
**වහන්සේය**.
නුඹලාගෙන් කිසිවෙක් තමාගේ කිට්ටු 6
නෑයෙකු කරා නග්නභාවය හරින පිණිස
ළංනොවිය යුතුය. මම **ස්වාමීන්-**
**වහන්සේය**. නුඹේ පියාගේ නග්නභාවය 7
එනම් නුඹේ මවුගේ නග්නභාවය
නොහරින්න. ඈ නුඹේ මෑණියෝය; ඈගේ
නග්නභාවය නොහරින්න. නුඹේ පියාගේ 8
භාර්යාවගේ නග්නභාවය නොහරින්න.
එය නුඹේ පියාගේ නග්නභාවයය. ගෙදර 9
උපන් හෝ පිටත උපන් හෝ නුඹේ
පියාගේ දූවවත් නුඹේ මවුගේ දූවවත්
වන නුඹේ සහෝදරීගේ නග්නභාවය
නොහරින්න. නුඹේ පුත්‍රයාගේ දූවගේ 10
හෝ නුඹේ දියණියන්ගේ දූවගේ හෝ
නග්නභාවය නොහරින්න. මක්නිසාද
ඔවුන්ගේ නග්නභාවය නුඹේම නග්න-
භාවයය. නුඹේ පියාට දාව උපන්නාවූ 11
නුඹේ පියාගේ භාර්යාවගේ දූව වන
නුඹේ සහෝදරීගේ නග්නභාවය
නොහරින්න. නුඹේ පියාගේ සහෝදරීගේ 12
නග්නභාවය නොහරින්න. ඈ නුඹේ
පියාට කිට්ටු නෑයෙක්ය. නුඹේ මවුගේ 13
සහෝදරීගේ නග්නභාවය නොහරින්න.
මක්නිසාද ඈ නුඹේ මවුගේ කිට්ටු
නෑයෙක්ය. නුඹේ පියාගේ සහෝදරයාගේ 14
නග්නභාවය නොහරින්න, එනම් ඔහුගේ
භාර්යාවට ළංනොවන්න. ඈ නුඹේ
කුඩම්මාය. නුඹේ ලේලිගේ නග්න- 15
භාවය නොහරින්න. ඈ නුඹේ පුත්‍රයාගේ
භාර්යාවය; නුඹ ඈගේ නග්නභාවය
නැරිය යුතුය. නුඹේ සහෝදරයාගේ 16

භාර්යාවගේ නග්නභාවය නොහරින්න.
එය නුඹේ සහෝදරයාගේ නග්නභාවය.
17 ස්ත්‍රියෙකුගේ සහ ඇගේ දුවගේත්
නග්නභාවය නොහරින්න; ඇගේ
පුත්‍රයාගේ දුවවත් ඇගේ දියණියන්ගේ
දුවවත් නග්නභාවය හරින පිණිස
නොගනින්න; ඔව්හු ළඟ නෑකම්
18 ඇත්තියෝය. ඒක දූෂ්‍යකමක්ය. නුඹේ
භාර්යාව ජීවත්ව සිටියදී විරුද්ධකම්
හටගන්න හැටියට, ඈ හැර ඇගේ
සහෝදරීත් නග්නභාවය හරින පිණිස
19 පාවානොගනින්න. ස්ත්‍රියෙක් මාසේ
මාරුවී අපවිත්‍රව සිටින තුරු ඇගේ
නග්නභාවය හැරීමට ඈ කරා
20 නොපැමිණෙන්න. නුඹේ අසල්වාසියාගේ
භාර්යාව සමග නුඹ කිලුටු වන පිණිස
ඈ සමග සංවාසය නොකළ යුතුය.
21 නුඹේ වංශයෙන් කිසිවෙකු මොලෙක්ට
ගිනි මැදින් යවා පූජාකොට නුඹේ
දෙවියන්වහන්සේගේ නාමයට අපහාස-
නොකරන්න. මම **ස්වාමීන්වහන්සේ**ය.
22 ගැහැනුන් සමග මෙන් පිරිමින් සමග
සංවාසය නොකරන්න. ඒක පිළිකුලක්ය.
23 කිසි මෘගයෙකු සමග සංවාසයකොට
අපවිත්‍ර නොවන්න. කිසි ස්ත්‍රියෙක්ද
සංවාසය පිණිස මෘගයෙකු ඉදිරියට
නොපැමිණිය යුතුය. ඒක ව්‍යාකූල
දෙයක්ය.
24 මේ කිසිවකින් තමුන්ම කිලුටුකර
නොගනිල්ලා. මක්නිසාද මා විසින්
නුඹලා ඉදිරියෙන් පහකරන ජාතීහු මේ
25 සියලු දේවලින් අපවිත්‍රව සිටිති. දේශයද
කිලුටුවී තිබේ. ඒ නිසා එහි අයුතුකම
ඒ පිටට පමුණුවන්නෙමි, දේශයද එහි
26 වැසියන් වමාරා දමන්නීය. නුඹලා
මේ පිළිකුල්වලින් කිසිවක් නොකොට,
මාගේ පනත් හා මාගේ විනිශ්චයයන්
පවත්වාපල්ලා; ස්වදේශියෙක් වුවත්
නුඹලා අතරේ සිටින විදේශියෙක් වුවත්
27 එසේ පවත්වන්ට ඕනෑය. (මක්නිසාද
නුඹලාට පළමුවෙන් දේශයෙහි විසූ
මනුෂ්‍යයෝ මේ සියලු පිළිකුල්කම්-
28 කොට දේශය කිලුටුකළෝය.) එසේ
නුඹලාත් දේශය අපවිත්‍රකළොත් දේශය
නුඹලාට පළමුවෙන් සිටිය ජාතීන්
වමාරාදැමුවාක්මෙන් නුඹලාත් වමාරා
දමනවා ඇත. මක්නිසාද කවුරු නුමුත් 29
මේ පිළිකුල්කම්වලින් කිසිවක් කළොත්
එසේ කරන අය තමුන්ගේ සෙනඟ
අතරෙන් සිඳදමනු ලබන්නෝය. එබැවින් 30
නුඹලාට පළමුවෙන් කරනලද මේ
පිළිකුල් සිරිත්වලින් කිසිවක් පවත්වා
නුඹලා ඒවායින් අපවිත්‍ර නොවෙන
පිණිස, මාගේ නියමය රක්ෂාකරපල්ලා.
මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
යයි කීසේක.

## සුචරිතය සහ සත්පුරුෂ ගුණය ගැන අණපනත්

19 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල් 2
පුත්‍රයන්ගේ මුළු සභාවට මෙසේ
කියාපන්න—නුඹලා ශුද්ධව සිටිය යුතුය.
මක්නිසාද නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** වන මම ශුද්ධය. නුඹලා 3
එකිනෙකා තමතමාගේ මවුටද පියාටද
භයවිය යුතුය, මාගේ සබත් රක්ෂාකළ
යුතුය. මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ**ය. රූප වෙතට නොහැරෙල්ලා, 4
වාත්තු දේවතාවුන් සාදනොගනිල්ලා.
මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ**ය. නුඹලා ශාන්ති පූජාවක් 5
**ස්වාමීන්වහන්සේ**ට පූජාකරන කල
නුඹලා පිළිගනු ලබන ලෙස එය පූජාකළ
යුතුය. එය නුඹලා විසින් පූජාකරන 6
දවසේදීද පසු දවසේදීද කෑ යුතුය.
තුන්වෙනි දවස දක්වා කිසිවක් ඉතුරුව
තිබුණොත් ඒවා ගින්නෙන් දවනු ලැබිය
යුතුය. එයින් කිසිවක් තුන්වෙනි දවසේදී 7
කෑවොත් එය පිළිකුල්ය; එය පිළිගනු
නොලබන්නේය. එය කන තැනැත්තේ 8
තමාගේ අපරාධය දරන්නේය, මක්නිසාද
ඔහු **ස්වාමීන්වහන්සේ**ගේ ශුද්ධවූ දේ
අපවිත්‍රකෙළේය. ඒ තැනැත්තා තමාගේ
සෙනඟ අතරෙන් සිඳදමනු ලබන්නේය.

9 නුඹලාගේ දේශයේ ගොයම් කපන කල
නුඹේ කෙතේ මුලු තීන්දුවට කපා
නොගනින්න, කපන විට වැටෙන කරල්
10 එකතුකර නොගනින්න. නුඹේ මිදිවත්තේ
දෙවරක් වලු කපානොගනින්න, නුඹේ
මිදිවත්තේ වැටී තිබෙන ඵල එකතු
නොකරන්න. දිළිඳුට විදේශියාටද
ඒවා අත්හැරපන්න. මම නුඹලාගේ
11 දෙවිවූ **ස්වාමීන්වහන්සේය**. සොරකම්
නොකරල්ලා; වංචා නොකරල්ලා,
ඔවුනොවුන්ට බොරු නොකියල්ලා.
12 නුඹේ දෙවියන්වහන්සේගේ නාමයට
අපහාස නොපැමිණෙන පිණිස මාගේ
නාමයෙන් බොරුවට නොදිවුරල්ලා. මම
13 **ස්වාමීන්වහන්සේය**. නුඹේ අසල්වාසියාට
හිංසා නොකරන්න, ඔහුගෙන් කොල්ල
නොකන්න. කුලීකාරයාගේ කුලී පසුව
ද උදය වනතුරු රෑ මුළුල්ලේ නුඹ
14 වෙත නොතිබිය යුතුය. බිහිරාට දෙස්
නොකියන්න, අන්ධයාට ඉස්සරහ
පැකිළවන දෙයක් නොතබා, නුඹේ
දෙවියන්වහන්සේට භයව සිටපන්න.
15 මම **ස්වාමීන්වහන්සේය**. විනිශ්චයේදී
අධර්මිෂ්ඨකමක් නොකරල්ලා. දිළිඳාගේ
තරම සැලකීමෙන්වත් බලවතාගේ
තත්ත්වයට ගරුකිරීමෙන්වත් නොව
ධර්මිෂ්ඨකමින් නුඹේ අසල්වාසියා
16 විනිශ්චයකරපන්න. නුඹේ සෙනඟ
අතරෙහි කේලාම් කියමින් ඔබ මොබ
නොයන්න. නුඹේ අසල්වාසියාගේ
ප්‍රාණයට විරුද්ධව නොනැගිටින්න.
17 මම **ස්වාමීන්වහන්සේය**. නුඹේ සිතින්
සහෝදරයාට වෛරනොවෙන්න. නුඹේ
අසල්වාසියාගේ හේතුවෙන් නුඹ පාපය
නොදරන පිණිස සැබවින් ඔහුට
18 තරවටු කරපන්න. පළිගන්නේවත් නුඹේ
සෙනඟගේ පුත්‍රයන්ට විරුද්ධව කිසි
වෛරයක් පවත්වන්නේවත් නැතුව නුඹට
මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේම-
කරපන්න. මම **ස්වාමීන්වහන්සේය**.
19 මාගේ පනත් රක්ෂාකරපල්ලා. නුඹේ
ගවයන්ට වෙනස් වර්ගයක සතුන් සමග
සංවාසය කරන්ට ඉඩ නොදිය යුතුය.
දෙවර්ගයක බීජ නුඹේ කෙතේ නොවපුළ
යුතුය. දෙවර්ගයක නූල් මිශ්‍රකර
වියාපු වස්ත්‍රයක් හැඳ නොගත යුතුය.
පුරුෂයෙකුට විවාහබස් දී කිසිසේත් මුදනු 20
නොලැබ, නිදහස ලබා නොගෙන, සිටින
දාසියක් සමග යමෙක් සංවාසය කළොත්
ඔවුන්ට දඬුවම්කළ යුතුය; ඈ නිදහස්ව
නොසිටි නිසා ඔව්හු මරනු
නොලබන්නෝය. ඔහු තමාගේ අපරාධ 21
පූජාවට බැටළුවෙකු සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩ ළඟට අපරාධ
පූජාවක් පිණිස **ස්වාමීන්වහන්සේ** වෙතට
ගෙනා යුතුය. පූජකයාද ඔහු කළ පාපය 22
ගැන **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
අපරාධ පූජාවේ බැටළුවාගෙන් ඔහු
උදෙසා සමගිකමක් කෙරේවා. එවිට
ඔහු කළ පාපය ගැන ඔහුට ක්ෂමාව
ලැබේ. නුඹලා දේශයට අවුත් ආහාර 23
පිණිස සියලු ආකාර ගස් සිටෙවූ කල
එහි ඵල ඒවායේ අචර්මඡේද්‍යය මෙන්
සලකාපල්ලා. ඒවා තුන් අවුරුද්දක්
නුඹලාට අචර්මඡේද්‍යය මෙන් තිබිය
යුතුය; ඒවා නොකෑ යුතුය. එහෙත් 24
සතරවෙනි අවුරුද්දේ එහි සියලු
ඵල **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසාවේ
මංගල්‍යයක් පිණිස ශුද්ධ වන්නේය.
ඒවායේ ඵල ප්‍රයෝජන නුඹලාට වැඩිවන 25
ලෙස පස්වෙනි අවුරුද්දේ ඒවායේ
ඵල කාපල්ලා. මම නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේය**. නුඹලා ලේ සමග 26
කිසිවක් නොකෑ යුතුය. ශාස්ත්‍ර
නොබලල්ලා, මායම් භාවිතා නො-
කරල්ලා. නුඹලාගේ නළල් කෙළවරවල් 27
වටනොකළ යුතුය, නුඹලාගේ රැවුලේ
කොන් නොකැපිය යුතුය. මළවුන් නිසා 28
නුඹලාගේ ශරීරවල කැපුමක් කර
නොගනිල්ලා, නුඹලාගේ ශරීරයෙහි කිසි
සායම් ලකුණක්ද කොටා නොගනිල්ලා.
මම **ස්වාමීන්වහන්සේය**. දේශය වේශ්‍යා- 29
කමට වැටී දූෂ්‍යකමින් නොපිරෙන
පිණිස නුඹේ දුව වේශ්‍යාකමට දී
අපවිත්‍රනොකරන්න. මාගේ සබත් 30
රක්ෂාකරපල්ලා, මාගේ ශුද්ධස්ථානයට

ගෞරව කරපල්ලා. මම **ස්වාමීන්-**
31 **වහන්සේය.** ආත්ම බන්ධනකාරයන්
දෙසටවත් ශාස්ත්‍රකාරයන් දෙසටවත්
නොහැරෙල්ලා; ඔවුන්ගෙන් අපවිත්‍ර
නොවන පිණිස ඔවුන් සොයා
නොයල්ලා. මම තුඹලාගේ දෙවිවූ
32 **ස්වාමීන්වහන්සේය.** පැසුණු හිසකේ
ඇත්තා ඉදිරියෙහි නැගිට සිටපන්න,
මහල්ලාගේ මුහුණට ගෞරවකරපන්න.
තුඹේ දෙවියන්වහන්සේට භයවෙයන්න;
33 මම **ස්වාමීන්වහන්සේය.** විදේශියෙක්
තුඹලාගේ දේශයෙහි තුඹ ළඟ වසන්නේ-
නම් ඔහුට අයුත්තක් නොකරල්ලා.
34 තුඹලා ළඟ වාසයකරන විදේශියා
තුඹලා අතරෙහිම උපන්නෙකු මෙන්
වේවා, තුඹට මෙන් ඔහුට ප්‍රේම-
කරපන්න; මක්නිසාද තුඹලා මිසර
දේශයෙහි විදේශියෝව සිටියහුය. මම
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය.**
35 විනිශ්චයයෙන්වත් මනින දණ්ඩෙන්වත්
කිරුමෙන්වත් මැනීමෙන්වත් අධර්මිෂ්ඨකම්
36 නොකරල්ලා. හරි තරාදිද හරි බරද
හරි ඒඵාවක්ද හරි හිනක්ද තුඹලාට
තබාගනිල්ලා. මම මිසර දේශයෙන්
තුඹලා ගෙනාවාවූ තුඹලාගේ දෙවිවූ
37 **ස්වාමීන්වහන්සේය.** එබැවින් තුඹලා
මාගේ සියලු පනත්ද මාගේ සියලු
විනිශ්චයයන්ද පවත්වා ඒවා ඉෂ්ට-
කරපල්ලා. මම **ස්වාමීන්වහන්සේයයි**
කීසේක.

## ඉහත කී වරදවලට නිසි දඬුවම්

20 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට කියනසේක්: නැවත
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෙසේ කියා-
පන්න–ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් හෝ
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි සිටින
විදේශීන්ගෙන් හෝ තමාගේ දරුවන්ගෙන්
කෙනෙක් මොලෙක්ට දෙන කවරෙකු
තුමුත් සැබවින් මරනු ලැබිය යුතුය;
දේශයේ වැසියෝ ඔහුට ගල්ගසත්වා.
3 ඒ මනුෂ්‍යයා මාගේ ශුද්ධස්ථානය
අපවිත්‍රකරන්ටත් මාගේ ශුද්ධ නාමයට
නින්දකරන්ටත් තමාගේ දරුවන්ගෙන්
කෙනෙක් මොලෙක්ට දුන් බැවින් මම
ඔහුට විරුද්ධව මාගේ මුහුණ යොමු-
කොට ඔහුගේ සෙනඟ කෙරෙන් ඔහු
සිඳදමන්නෙමි. ඒ මනුෂ්‍යයා තමාගේ 4
දරුවන්ගෙන් කෙනෙක් මොලෙක්ට දෙන
කල දේශයේ වැසියෝ යම් ආකාරයකින්
ඔහු කෙරෙන් තමුන්ගේ ඇස් වසා-
ගෙන ඔහු නොමරන්නෝ නම්, මම ඒ 5
මනුෂ්‍යයාටද ඔහුගේ පවුලටද විරුද්ධව
මාගේ මුහුණ යොමුකොට, ඔහුද
මොලෙක් සමග වේශ්‍යාකම් කරන්ට
ඔහු සමග වේශ්‍යාකමට ගිය සියල්ලන්ද
ඔවුන්ගේ සෙනඟ අතරෙන් සිඳදමන්නෙමි.
ආත්ම බන්ධනකාරයන් දෙසටත් ශාස්ත්‍ර- 6
කාරයන් දෙසටත් හැරී ඔවුන් පස්සේ
වේශ්‍යාකමට යන තැනැත්තාට විරුද්ධව
මාගේ මුහුණ යොමුකොට ඔහුගේ
සෙනඟ අතරෙන් ඔහු සිඳදමන්නෙමි.
එබැවින් තුඹලා තුඹලාම පවිත්‍රකරගෙන 7
ශුද්ධව සිටපල්ලා. මක්නිසාද මම
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය.**
මාගේ පනත් රක්ෂාකරමින් ඒවා 8
ඉෂ්ටකරපල්ලා. මම තුඹලා පවිත්‍ර-
කරන **ස්වාමීන්වහන්සේය.** පියාට හෝ 9
මෑණියන්ට හෝ දෙස් කියන කවරෙක්
තුමුත් සැබවින් මරනු ලැබිය යුතුය.
ඔහු තමාගේ පියාට හෝ මෑණියන්ට
දෙස් කීවේය; ඔහුගේ ලේ ඔහු පිට
වන්නේය. අන් මනුෂ්‍යයෙකුගේ භාර්යාව 10
සමග කාමමිථ්‍යාචාරය කරන්නෙක්
එනම් තමාගේ අසල්වාසියාගේ භාර්යාව
සමග කාමමිථ්‍යාචාරය කරන්නෙක්
ඇද්ද එසේ කරන්නාද කරන්නීද සැබවින්
මරනු ලැබිය යුතුය. තමාගේ පියාගේ 11
භාර්යාව සමග සයනයකරන මනුෂ්‍යයා
තම පියාගේ නග්නභාවය හැරිය බැවින්
ඔවුන් දෙදෙනාම සැබවින් මරනු ලැබිය
යුතුය; ඔවුන්ගේ ලේ ඔවුන් පිට වන්නේය. 12
මනුෂ්‍යයෙක් තම පුත්‍රයාගේ භාර්යාව
සමග සයනය කළොත් ඔවුන් දෙදෙනාම
සැබවින් මරනු ලැබිය යුතුය. ඔව්හු

ව්‍යාකුලයක් කළෝය; ඔවුන්ගේ ලේ ඔවුන්
13 පිට වන්නේය. මනුෂ්‍යයෙක් ගැහැනියකු
සමග සයනයකරන්නාක් මෙන්
පිරිමියෙකු සමග සයනයකළොත් ඔවුන්
දෙදෙනාම පිළිකුලක් කළෝය. ඔව්හු
සැබවින් මරනු ලැබිය යුතුය; ඔවුන්ගේ
14 ලේ ඔවුන් පිට වන්නේය. මනුෂ්‍යයෙක්
භාර්යාවක් සහ ඇගේ මෑණියන් පාවා
ගත්තොත් ඒක දූෂ්‍යකමක්ය. තුඹලා
අතරේ දුෂ්ටකමක් නොවන පිණිස ඔහුද
ඔව්හුද ගින්නෙන් දවනු ලබත්වා.
15 මනුෂ්‍යයෙක් මෘගයෙකු සමග සංවාසය
කළොත් ඔහු සැබවින් මරනු ලැබිය
16 යුතුය. ඒ මෘගයාද මරාදමාපල්ලා. තවද
ස්ත්‍රියෙක් මෘගයෙකු සමග සංවාසය
කරන්ට ළංවුණොත් ඒ ස්ත්‍රිය හා
මෘගයාද මරා දමාපන්න. ඔව්හු සැබවින්
මරනු ලැබිය යුතුය; ඔවුන්ගේ ලේ ඔවුන්
17 පිට වන්නේය. මනුෂ්‍යයෙක් තමාගේ
පියාගේ දුව නොහොත් තමාගේ මවගේ
දුව වන තමාගේ සහෝදරිය පාවාගෙන
ඇගේ නග්නභාවය දුටුවොත්, ඇද ඔහුගේ
නග්නභාවය දුටුවොත්, එය නින්දිත-
කමක්ය; ඔවුන් තමන් සෙනඟගේ
පුත්‍රයන්ගේ ඇස් හමුයෙහි සිඳදැමිය යුතුය.
ඔහු තමාගේ සහෝදරියගේ නග්නභාවය
හැරියේය; ඔහු තමාගේ අපරාධය දැරිය
18 යුතුය. මනුෂ්‍යයෙක් ඔසප්වී සිටින
ස්ත්‍රියෙකු සමග සයනයකර ඇගේ
නග්නභාවය හැරියොත් ඔහු ඇගේ
උල්පත නග්නකෙළේය, ඇද තමාගේ
ලේ උල්පත හැරියාය. ඔවුන් දෙදෙනාම
ඔවුන්ගේ සෙනඟ අතරෙන් සිඳදැමිය
19 යුතුය. තුඹේ මෑණියන්ගේ සහෝ-
දරීගේවත් පියාගේ සහෝදරීගේවත්
නග්නභාවය නොහරින්න. මක්නිසාද
ඔහු තමාගේ කිට්ටු නෑයා නග්නකෙළේය.
ඔව්හු තමුන්ගේ අපරාධය දරන්නෝය.
20 මනුෂ්‍යයෙක් තමාගේ මහම්මා නොහොත්
කුඩම්මා සමග සයනයකළොත් ඔහු
තමාගේ මවුගේ සහෝදරයාගේ හෝ
පියාගේ සහෝදරයාගේ හෝ නග්න-
භාවය හැරියේය; ඔවුන් තමුන්ගේ පාපය
දරා දරුවන් නොලැබ මැරෙනවා ඇත.
මනුෂ්‍යයෙක් තමාගේ සහෝදරයාගේ 21
භාර්යාව පාවාගත්තේනම් එය
කිලුටුකමක්ය. ඔහු තමාගේ සහෝදර-
යාගේ නග්නභාවය හැරියේය; ඔවුන්
දරුවන් නොලැබ සිටිනවා ඇත.

එබැවින් තුඹලා වාසය කරන පිණිස 22
මා විසින් තුඹලා පමුණුවන දේශය
තුඹලා වමාරානොදමන පිණිස මාගේ
සියලු පනත්ද මාගේ සියලු විනිශ්ච-
යයන්ද රක්ෂාකරමින් පවත්වාපල්ලා.
තුඹලා ඉදිරියෙන් මා විසින් පහකරනු 23
ලබන සෙනඟගේ සිරිත් ප්‍රකාරයට
නොහැසිරෙල්ලා. මක්නිසාද ඔවුන් මේ
සියලු දේවල් කළ නිසා මම ඔවුන්
පිළිකුල්කෙළෙමි. එහෙත්: තුඹලා 24
ඔවුන්ගේ දේශය හිමිකරගන්නහුය, කිරිද
මීපැණිද ගලා යන දේශයක් වන
ඒක හිමිකරගන්නා පිණිස තුඹලාට
දෙන්නෙමියි තුඹලාට කීයෙමි. මම
වනාහි ජාතීන් කෙරෙන් තුඹලා වෙන්කර
ගත්තාවූ තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේය. එබැවින් තුඹලා පවිත්‍ර අපවිත්‍ර 25
මෘගයන් අතරේද අපවිත්‍ර පවිත්‍ර පක්ෂීන්
අතරේද වෙනස සලකාපල්ලා. තුඹලාට
අපවිත්‍රකොට මා විසින් වෙන්කරන-
ලද්දවූ මෘගයන්ගෙන්වත් පක්ෂීන්-
ගෙන්වත් බඩගා යන කිසි සතෙකුගෙන්-
වත් තුඹලාගේ ආත්ම පිළිකුල්කර
නොගනිල්ලා. තුඹලා මට ශුද්ධව 26
සිටපල්ලා. මක්නිසාද ස්වාමීන්වහන්සේ
වන මම ශුද්ධය, මාගේ සෙනඟ වන
පිණිස මනුෂ්‍ය ජාතීන් අතරෙන් තුඹලා
වෙන්කරගතිමි.

ආත්ම බන්ධනකරුවූ නොහොත් 27
ශාස්ත්‍රකාරවූ පුරුෂයෙක් හෝ ස්ත්‍රියෙක්
හෝ සැබවින් මරනු ලැබිය යුතුය. ඔවුන්
ගල්ගසනු ලැබිය යුතුය. ඔවුන්ගේ ලේ
ඔවුන් පිට වන්නේයයි කීසේක.

## පූජකයන්ගේ චරිතානුකූලවූද ශාරීරිකවූද සුදුසුකම්

21 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්:
ආරොන්ගේ පුත්‍රවූ පූජකයන්ට
කථාකරමින් මෙසේ කියාපන්න–
කිසිවෙක් තමාගේ සෙනඟ අතරේ
මළවුන් උදෙසා අපවිත්‍ර නොවිය යුතුය;
2 එහෙත් ඔහුට කිට්ටුවූ ඔහුගේ නෑයා
උදෙසා එනම් තමාගේ මවු උදෙසාද
තමාගේ පියා උදෙසාද තමාගේ පුත්‍රයා
උදෙසාද තමාගේ දූව උදෙසාද තමාගේ
3 සහෝදරයා උදෙසාද, පුරුෂයෙකු
නොගත් තමා ළඟ ඉන්න කන්‍යාවක්වූ
තමාගේ සහෝදරී උදෙසාද අපවිත්‍ර-
4 වෙන්ට ඔහුට පුළුවන. තමාගේ සෙනඟ
අතරේ නායකයෙක්වූ ඔහු තමා දූෂණය
5 වන ලෙස අපවිත්‍ර නොවිය යුතුය. ඔව්හු
තමුන්ගේ හිස් මුඩු නොකරත්වා,
රැවුලේ කොන් බූනොගාත්වා, ඔවුන්ගේ
ශරීරයෙහි කිසි කැපීමක් නොකරත්වා.
6 ඔව්හු තමුන්ගේ දෙවියන්වහන්සේට
ශුද්ධව සිටිත්වා, තමුන්ගේ දෙවියන්-
වහන්සේගේ නාමය දූෂණයනොකරත්වා.
මක්නිසාද ඔව්හු තමුන්ගේ දෙවියන්-
වහන්සේගේ භෝජනය වන ස්වාමීන්-
වහන්සේගේ ගිනි පූජා ඔප්පු කරති.
එබැවින් ඔවුන් ශුද්ධව සිටිය යුතුය.
7 ඔව්හු වේශ්‍යාවක්වත් කිලුටුකරනු ලැබූ
තැනැත්තියෙක්වත් පුරුෂයාගෙන් පහ-
කරනු ලැබූ ස්ත්‍රියෙක්වත් පාවා
නොගනිත්වා. මක්නිසාද ඔහු තමාගේ
දෙවියන්වහන්සේට ශුද්ධ කෙනෙක්ය.
8 එබැවින් නුඹ ඔහු විශුද්ධකරපන්න;
මක්නිසාද ඔහු නුඹේ දෙවියන්-
වහන්සේගේ භෝජනය පූජාකරයි.
ඔහු නුඹට ශුද්ධ කෙනෙක් වන්නේය.
මක්නිසාද නුඹලා විශුද්ධකරන ස්වාමීන්-
9 වහන්සේ වන මම ශුද්ධය. තවද යම්කිසි
පූජකයෙකුගේ දූවක් වේශ්‍යාකමෙන්
තොමෝම දූෂණයවන්නීනම් ඈ තමාගේ
පියාට අපහාසකරන්නීය. ඈ ගින්නෙන්
පුලුස්සා දමනු ලැබිය යුතුය.

තමාගේ හිස පිට ආලේප තෛලය 10
වත්කරන ලද්දවූ, ශුද්ධ වස්ත්‍ර හැඳීමට
කැපකරන ලද්දවූ, තමාගේ සහෝදරයන්
අතරේ නායක පූජකයාවූ තැනැත්තේ
තමාගේ හිසකේ ලිහානොගත යුතුය,
තමාගේ වස්ත්‍රද ඉරා නොගත යුතුය;
ඔහු කිසි මළකඳක් ළඟට නොයා යුතුය, 11
තමාගේ පියා උදෙසාවත් තමාගේ මවු
උදෙසාවත් අපවිත්‍ර නොවිය යුතුය; ඔහු 12
ශුද්ධස්ථානයෙන් පිටතට නොයා
යුතුය, තමාගේ දෙවියන්වහන්සේගේ
ශුද්ධස්ථානය කිලුටු නොකළ යුතුය;
මක්නිසාද ඔහුගේ දෙවියන්වහන්සේගේ
ආලේප තෛලය නමැති ඔටුන්න ඔහු
පිට තිබේ. මම ස්වාමීන්වහන්සේය. ඔහු 13
භාර්යාවක් ඇගේ කන්‍යා භාවයෙහිදී
පාවාගනීවා. ඔහු වැන්දඹුවක්වත් 14
අත්හරිනලද ස්ත්‍රියෙක්වත් දූෂණයවූ
තැනැත්තියෙක්වත් වේශ්‍යාවක්වත්
පාවානොගෙන තමාගේම සෙනඟ
අතරෙන් කන්‍යාවක් භාර්යාව කොට
පාවාගත යුතුය. ඔහු තමාගේම සෙනඟ 15
අතරෙහි තමාගේ වංශය දූෂණය-
නොකොට සිටිය යුතුය. මක්නිසාද මම
ඔහු විශුද්ධකරන ස්වාමීන්වහන්සේ යයි
කීසේක.

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 16
කොට කියනසේක්: ආරොන්ට මෙසේ 17
කියාපන්න–නුඹේ වංශයේ පරම්පරාවලදී
ශරීරයේ කැලලක් ඇති කිසිවෙක් ඇද්ද,
හෙතෙම තමාගේ දෙවියන්වහන්සේගේ
භෝජනය පූජාකරන්ට ළංනොවේවා.
කැලලක් ඇති කොයි මනුෂ්‍යයෙක් නුමුත් 18
ළංනොවිය යුතුය. අන්ධයෙක්වත්
කොරෙක්වත් මුක්කමෙක්වත් විකල්
අංග ඇත්තෙක්වත්, අතපය කැඩුණු 19
කෙනෙක්වත්, කුදෙක්වත් මිට්ටෙක්වත් 20
ඇසේ පුදක් ඇති කෙනෙක්වත්
කබොල්ලක් ඇත්තෙක්වත් දද ඇත්තෙක්-
වත් තැළුණු අණ්ඩ ඇත්තෙක්වත් ළං-
නොවිය යුතුය; පූජකවූ ආරොන්ගේ 21
වංශයෙහි ශරීරයේ කැලලක් ඇති
කිසි මනුෂ්‍යයෙක් ස්වාමීන්වහන්සේගේ

දවන පූජා ඔප්පුකරන්ට ළංනොවිය
යුතුය; ඔහුට පලුදුවක් ඇති බැවින්
තමාගේ දෙවියන්වහන්සේගේ භෝජනය
ඔප්පුකරන පිණිස ළංනොවිය යුතුය.
22 අති ශුද්ධවූද ශුද්ධවූද දේවලින් තමාගේ
දෙවියන්වහන්සේගේ භෝජනය ඔහුට
23 කන්ට පුළුවන. නුමුත් ඔහුට කැලලක්
තිබෙන බැවින් මාගේ ශුද්ධස්ථානය
දූෂණයනොකරන පිණිස ඔහු තිරයෙන්
ඇතුළට පැමිණෙන්ටවත් පූජාසනයට
ළංවෙන්ටවත් යුතු නැත. මක්නිසාද මම
ඒවා විශුද්ධ කරන **ස්වාමීන්වහන්සේ-**
24 යයි කීසේක. මෝසෙස් ආරොන්ට සහ
ඔහුගේ පුත්‍රයන්ටද සියලු ඉශ්‍රායෙල්
පුත්‍රයන්ටද එසේ කීයේය.

## ශුද්ධ මෙහෙයේදී ක්‍රියාකළයුතු අන්දම

22 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල්
පුත්‍රයන් විසින් මට කැපකරන ශුද්ධ
දේවලින් වෙන්ව සිටින්ටත් මාගේ
ශුද්ධ නාමය දූෂණයනොකරන්ටත්
ආරොන්ටද ඔහුගේ පුත්‍රයන්ටද
කියාපන්න. මම **ස්වාමීන්වහන්සේය.**
3 ඔවුන්ට මෙසේ කියාපන්න: නුඹලාගේ
පරම්පරාවලදී නුඹලාගේ මුළු වංශයෙන්
කවරෙක් නුමුත් තමාගේ අපවිත්‍රකම
තිබෙද්දී ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින්
**ස්වාමීන්වහන්සේට** කැපකරන ශුද්ධවූ
දේවලට ළංවුණොත්, ඒ තැනැත්තා
මා ඉදිරියෙන් සිඳදමනු ලබන්නේය.
4 මම **ස්වාමීන්වහන්සේය.** ආරොන්ගේ
වංශයෙන් කොයි පුරුෂයෙක් නුමුත්
කුෂ්ඨ රෝගියෙක් හෝ යම් ප්‍රමේහයක්
ඇත්තෙක් හෝ වන්නේද ඔහු පවිත්‍රවන-
තෙක් ශුද්ධවූ දෙයින් නොකෑ යුතුය.
මළවුන් කරණකොටගෙන අපවිත්‍රවී
තිබෙන කිසි දෙයකට ස්පර්ශවන
කෙනෙක්වත් ශුක්‍ර වැගිරීමක් ඇති
5 කෙනෙක්වත්, තමා අපවිත්‍රකළ හැකි
බඩගායන කිසි සතෙකුට හෝ තමා කොයි
අන්දමින් නුමුත් අපවිත්‍රකළ හැකි
අපවිත්‍රකමක් ඇති කිසි පුරුෂයෙකුට හෝ,
ස්පර්ශවන තැනැත්තෙක්වත් සවස දක්වා 6
අපවිත්‍රවන්නේය, තමා වතුර නාගත්තොත්
මිස නැත්නම් ඔහු ශුද්ධ දේවලින් නොකෑ
යුතුය. නුමුත් ඉර බැස්ස කල ඔහු 7
පවිත්‍රවන්නේය; පසුව ශුද්ධවූ දේ කන්ට
ඔහුට පුළුවන, මක්නිසාද ඔහුගේ
භෝජන ඒවාය. ඔහු ඉබේ මැරුණු 8
නොහොත් මෘගයන් විසින් මරාදමූ
සතෙකුගේ මස් කා අපවිත්‍ර නොවිය
යුතුය. මම **ස්වාමීන්වහන්සේය.** එබැවින් 9
ඔව්හු මාගේ නියමය දූෂණයකොට, ඒ
නිසා පාපය දරා, එහි නොනසින පිණිස
එය රක්ෂා කරත්වා. මම ඔවුන්
විශුද්ධකරන **ස්වාමීන්වහන්සේය.** අන්‍යවූ 10
කිසිවෙක් ශුද්ධවූ දෙයින් නොකෑ යුතුය.
පූජකයා ළඟ සිටින ආගන්තුකයෙක්වත්
කුලියට ගත් වැඩකාරයෙක්වත් ශුද්ධවූ
දෙයින් නොකෑ යුතුය. එහෙත් පූජකයෙකු 11
විසින් තමාගේ මිලයෙන් මිලේට ගත්
කෙනෙකුට එයින් කන්ට පුළුවන; ඔහුගේ
ගෙදර උපන් අයටත් ඔහුගේ භෝජන-
වලින් කන්ට පුළුවන. පූජකයෙකුගේ දුවක් 12
අන්‍ය ගෝත්‍රයක පුරුෂයෙකුගේ භාර්යාව
වුණොත් ඈ ශුද්ධ දේවල එසවීමේ
පූජාවෙන් නොකෑ යුතුය. එහෙත් පූජක- 13
යෙකුගේ දුව වැන්දඹුවක්ව නොහොත්
අත්හරිනු ලැබ දරුවන් නැතුව ඇගේ
පියාගේ ගෙට හැරී ඇවිත් සිටී නම්, ඇගේ
තරුණ වයසේදී මෙන් ඇගේ පියාගේ
භෝජනවලින් ඈට කන්ට පුළුවන. නුමුත්
අන්‍යවූ කිසිවෙක් එයින් නොකෑ යුතුය.
තවද යම් මනුෂ්‍යයෙක් නොදැනුවත්ව 14
ශුද්ධ දෙයක් කෑවොත් ඔහු ඒ තරමෙන්
පහෙන් කොටසක් ඊට එකතුකොට ශුද්ධ
දෙය පූජකයාට දිය යුතුය. ඉශ්‍රායෙල් 15
පුත්‍රයන් විසින් **ස්වාමීන්වහන්සේට** පූජා-
කරන්නාවූ ඔවුන්ගේ ශුද්ධ දේවල්
කෑමෙන් දෝෂ පමුණුවන අයුතුකම 16
දරන්ට නොසලස්වන පිණිස ඔව්හු ඒවා

දූෂණයනොකෙරෙත්වා. මක්නිසාද මම
ඒවා විශුද්ධකරන **ස්වාමීන්වහන්සේයයි**
කීසේක.
17 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
18 කොට කියනසේක්: ආරොන්ටද ඔහුගේ
පුත්‍රයන්ටද සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන්ටද
කථාකොට මෙසේ කියාපන්න-
ඉශ්‍රායෙල් වංශයෙන් හෝ ඉශ්‍රායෙල්හි
වසන විදේශීන්ගෙන් හෝ තමුන් පූජාව
ඔප්පුකරන කවරෙක් නුමුත් ඔහුගේ
භාරවලින් එකක්වත් ඔහුගේ සතුටු
පඬුරුවලින් එකක්වත් **ස්වාමීන්වහන්සේට**
දවන පූජාවක් කොට ඔප්පුකරන්නේනම්;
19 නුඹලා පිළිගනු ලබන පිණිස ගවයන්-
ගෙන් හෝ බැටළුවන්ගෙන් හෝ
එළුවන්ගෙන් හෝ කැලලක් නැති පිරිමි
20 සතෙකු ඔප්පුකරපල්ලා. කැලලක් ඇති
එකෙකු ඔප්පුනොකරල්ලා. මක්නිසාද
එය නුඹලා උදෙසා පිළිගනු
21 නොලබන්නේය. යමෙක් භාරයක්
ඉෂ්ටකිරීමට නොහොත් සතුටු පඬුරක්
පිණිස ගවයන්ගෙන්වත් එළු බැටළු
රැළෙන්වත් ශාන්ති පූජාවක් ඔප්පුකරන
විට එය පිළිගනු ලබන පිණිස එහි
අංගසම්පූර්ණව තිබිය යුතුය; උගේ කිසි
22 කැලලක් නොතිබිය යුතුය. අන්ධවූද
අවයව කැඩුණාවූද අබ්බාගාතවූද
වණවත් පිළිකාවත් දදවත් ඇත්තාවූද
සතුන් **ස්වාමීන්වහන්සේට** ඔප්පු-
නොකරල්ලා, උන්ගෙන් පූජාසනය
පිට **ස්වාමීන්වහන්සේට** ගිනි
23 පූජාවක් ඔප්පුනොකරල්ලා. අංග විකල්වූ
නොහොත් අඩුපාඩුවූ ගවයෙකු හෝ
බැටළුවෙකු හෝ ස්වෙච්ඡා පූජාවක්
පිණිස පූජාකළ හැකිය; නුමුත් භාරයක්
පිණිස ඌ පිළිගනු නොලබන්නේය.
24 අණ්ඩ මඩිනලද හෝ පොඩිකරනලද
හෝ කඩාදමනලද හෝ කපාදමනලද
හෝ සතෙක් **ස්වාමීන්වහන්සේට** පූජා
නොකරල්ලා: නුඹලාගේ දේශයෙහි එසේ
25 නොකරල්ලා. නුඹලාගේ දෙවියන්-
වහන්සේගේ භෝජනය පිණිස මුන්ගෙන්
කිසිවෙකු විදේශියෙකුගේ අතින් ගෙන
ඔප්පුනොකරල්ලා; මක්නිසාද උන්ට
අන්සීනයක් වී තිබේ, උන්ට කැලලක්
ඇත්තේය. උන් නුඹලා උදෙසා පිළිගනු
නොලබන්නේයයි කීසේක.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 26
කොට කියනසේක්: ගවයෙක් හෝ 27
බැටළුවෙක් හෝ එළුවෙක් හෝ බිහිවූ
කල්හි ඌ සත් දවසක් මවු ළඟ සිටිවා;
අටවෙනි දවස පටන් ඉන් මත්තට ඌ
**ස්වාමීන්වහන්සේට** ගිනි පූජාවක් කොට
ඔප්පුකිරීමට සුදුසු එකෙක්ව සිටියි. තවද 28
එළදෙනෙක් වුවත් බැටළුදෙනෙක් වුවත්
ඌ සහ උගේ පැටවා එක දවසෙහි
නොමරල්ලා. නුඹලා ස්තුති පූජාවක් 29
**ස්වාමීන්වහන්සේට** පූජාකරන කල්හි
නුඹලා පිළිගනු ලබන ලෙස පූජා-
කරපල්ලා. එම දවසෙහිම එය කෑ යුතුය; 30
පසුවදා වන තුරු එයින් කිසිවක්
ඉතුරුනොකළ යුතුය. මම **ස්වාමීන්-
වහන්සේය**. එබැවින් මාගේ ආඥා 31
රක්ෂාකොට ඒවා පවත්වාපල්ලා. මම
**ස්වාමීන්වහන්සේය**. නුඹලා මාගේ 32
ශුද්ධවූ නාමයට අපහාස නොකළ යුතුය;
මම ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි
විශුද්ධකරනු ලබන්නෙමි. මම නුඹලා
විශුද්ධකරන **ස්වාමීන්වහන්සේය**, නුඹ- 33
ලාගේ දෙවියන්වහන්සේ වන පිණිස
නුඹලා මිසර දේශයෙන් ගෙනාවෙමි.
මම **ස්වාමීන්වහන්සේයයි** කීසේක.

## ශුද්ධ මංගල්‍ය

23 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල් 2
පුත්‍රයන්ට කථාකොට මෙසේ
කියාපන්න-ශුද්ධ සහා රැස්වීම් කොට
නුඹලා විසින් ප්‍රසිද්ධකළ යුතු **ස්වාමීන්-
වහන්සේගේ** මංගල්‍යයන් එනම් මාගේ
නියම මංගල්‍යයන් මේවාය: සදවසක් 3
වැඩකරන්ට පුළුවන. එහෙත් සත්වෙනි
දවසේ ගරුමය නිවාඩුවේ සබත්ය,
ශුද්ධ සභා රැස්වීමක්ය; නුඹලා කිසිම

වැඩක් නොකරල්ලා. එය නුඹලාගේ
සියලු වාසස්ථානවල **ස්වාමීන්වහන්සේට**
පැවැත්විය යුතු සබතක්ය.
4 ඒ ඒ නියම කාලවල නුඹලා විසින්
ප්‍රසිද්ධකළ යුතු ශුද්ධ සභා රැස්වීම් වන
**ස්වාමීන්වහන්සේගේ** නියම මංගල්‍යයන්
5 මේවාය. පළමුවෙනි මස දස සතරවෙනි
දින සවස **ස්වාමීන්වහන්සේගේ** පාස්කුව
6 වේ. එම මස පසළොස්වෙනි දින
**ස්වාමීන්වහන්සේට** මුහුන් නොදමූ රොටි
මංගල්‍යය වන්නේය. සත් දවසක් මුහුන්
7 නැති රොටි කාපල්ලා. පළමුවෙනි දින
ශුද්ධ සභා රැස්වීමක් පවත්වාපල්ලා.
8 කිසි බර වැඩක් නොකරල්ලා. එහෙත්
ගින්නෙන් කරන පූජාවක් සත් දවසක්
**ස්වාමීන්වහන්සේට** ඔප්පුකළ යුතුය.
සත්වෙනි දින ශුද්ධ සභා රැස්වීමක්
පැවැත්විය යුතුය; කිසිම බර වැඩක්
නොකළ යුතුයයි කීසේක.
9 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට තවත්
10 කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකොට මෙසේ
කියාපන්න–මා විසින් නුඹලාට දෙන
දේශයට නුඹලා අවුත් එහි ගොයම්
කපන කල නුඹලාගේ ශස්‍යයෙන් නාඹුල්
එල මිටිය පූජකයා වෙතට ගෙනෙල්ලා.
11 ඒ මිටිය නුඹලා උදෙසා පිළිගනු ලබන
පිණිස ඔහු **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
එය තේවකරන්නේය. සබත් දවසට පසුවද
12 පූජකයා එය තේවකෙරේවා. නුඹලා ඒ
මිටිය තේවකරන දවසේදී **ස්වාමීන්-**
**වහන්සේට** දවන පූජාවක් කොට
කැලලක් නැති අවුරුද්දක බැටළු-
13 වස්සෙක්ද, ඊට ආහාර පූජාවක් පිණිස
**ස්වාමීන්වහන්සේට** මිහිරි සුවඳක් ඇති
ගිනි පූජාවක් කොට තෙල් මිශ්‍රවූ සිහින්
පිටි ඒඵාවකින් දසයෙන් දෙපංගුවක්ද
ඊට පාන පූජාවක් කොට මුද්‍රික-
පාන හිනකින් සතරෙන් පංගුවක්ද
14 ඔප්පුකරපල්ලා. එසේ ඒ දවස දක්වා
නුඹලාගේ දෙවියන්වහන්සේගේ පඬුරක්
නුඹලා ගෙනෙන තුරුම රොටිවත්
විලඳවත් අමුකරල්වත් නුඹලා විසින්
නොකෑ යුතුය. එය නුඹලාගේ සියලු
පරම්පරාවලදී නුඹලාගේ සියලු
වාසස්ථානවල සදාකාල පනතක්ය.
සබතට පසුව ද වන නුඹලාගේ තේව 15
මිටිය ගෙනෙන දවසේ පටන් ගැණලා
සබත් දවස් සතක්ම පසුවෙන්ට ඇර,
සත්වෙනි සබත් දවසට පසුව ද දක්වා 16
පනස් දවසක් ගණින්කරගෙන, අලුත්
ආහාර පූජාවක් **ස්වාමීන්වහන්සේට**
ඔප්පුකරපල්ලා. නුඹලාගේ වාසස්ථාන- 17
වලින් සිහින් පිටි ඒඵාවකින් දසයෙන්
දෙපංගුවකින් සෑදුවාවූ මුහුන් දමා
පිලිස්සුවාවූ තේව රොටි දෙකක්
**ස්වාමීන්වහන්සේට** නාඹුල් එල කොට
ගෙනෙල්ලා. නුඹලා ඒ රොටි සමග 18
**ස්වාමීන්වහන්සේට** දවන පූජාවක් පිණිස
කැලලක් නැති බැටළුවස්සන් සත්-
දෙනෙක්ද එක ගොන් නාම්බෙක්ද
බැටළුවන් දෙන්නෙක්ද **ස්වාමීන්-**
**වහන්සේට** මිහිරි සුවඳක් ඇති ගින්නෙන්
කළ දවන පූජාවක් කොට උන්ගේ
ආහාර පූජාද පාන පූජාද සමග
ඔප්පුකළ යුතුය. තවද පාප පූජාවක් 19
පිණිස එක එළුවෙක්ද ශාන්ති පූජාවක්
පිණිස එක් අවුරුදු බැටළුපැටවුන්
දෙන්නෙක්ද ඔප්පුකළ යුතුය. පූජකයාද 20
නාඹුල් එලවලින් සෑදූ රොටි සහ බැටළු
පැටවුන් දෙදෙනා සමග උන් **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි තේව පූජාවක් කොට
තේවකෙරේවා. එය පූජකයාට ලැබෙන
පිණිස **ස්වාමීන්වහන්සේට** ශුද්ධවන්නේය.
එම දවසේම ශුද්ධ සභා රැස්වීමක් 21
ප්‍රසිද්ධකර පවත්වාපල්ලා. කිසි බර වැඩක්
නොකරල්ලා. එය නුඹලාගේ සියලු
වාසස්ථානවල නුඹලාගේ පරම්පරා-
වලට නිරන්තර පනතක්ය.
නුඹලාගේ දේශයේ ගොයම් කපන කල 22
නුඹේ කෙතේ මුලුවලින් සහමුලින් කපා
නොගනින්න, වැටී තිබෙන කරල්
එකතුකර නොගනින්න. ඒවා දිළිඳුන්ට

හා විදේශීන්ට ඇරපන්න. මම නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේයයි** කීසේක.
23 තවද **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
24 කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකරමින් මෙසේ
කියාපන්න–සත්වෙනි මස පළමුවෙනි දින
නුඹලාට ගරුමය නිවාඩුවක්ද හොරණෑ
පිඹීමේ සිහිවීමක්ද ශුද්ධ සහා රැස්වීමක්ද
25 වන්නේය. නුඹ කිසිම බර වැඩක් නොකළ
යුතුය. **ස්වාමීන්වහන්සේට** ගිනි පූජාවක්
ඔප්පුකළ යුතුයයි කීසේක.
26 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට තවත්
27 කථාකොට කියනසේක්: ඒ කෙසේ වුවත්
මේ සත්වෙනි මස දසවෙනි දින
සමගිකමක් කිරීමේ දවසය. නුඹලා
ශුද්ධ සහා රැස්වීමක් පැවැත්විය යුතුය,
නුඹලාගේ ආත්මවලට දුක්දී **ස්වාමීන්-**
**වහන්සේට** ගිනි පූජාවක් ඔප්පුකළ යුතුය.
28 නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි නුඹලා උදෙසා සමගිකමක්
කරන පිණිස එය සමගි කිරීමේ දවසක්
නිසා ඒ දවසේදී කිසිම වැඩක් නොකළ
29 යුතුය. ඒ දවසේ තමාට දුක්නොදෙන්නාවූ
කවරෙක් නුමුත් තමාගේ සෙනඟ අතරෙන්
30 සිඳදමනු ලබන්නේය. ඒ දවසේදී කිසියම්
වැඩක් කරන කවරෙකු නුමුත් ඔහුගේ
සෙනඟ අතරෙන් විනාශ කරන්නෙමි.
31 කිසිම වැඩක් නොකරල්ලා. ඒක
නුඹලාගේ සියලු පරම්පරාවලට
නුඹලාගේ සියලු වාසස්ථානවල
32 නිරන්තර පනතක්ය. ඒක නුඹලාට
ගරුමය නිවාඩුවක් වන සබතක්ය,
නුඹලාගේ ආත්මවලට දුක්දීපල්ලා.
මාසේ නවවෙනි දින සවස
එනම් සවස පටන් සවස දක්වා
නුඹලාගේ සබත් පවත්වාපල්ලායයි
කීසේක.
33 තවද **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
34 කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකරමින් මෙසේ
කියාපන්න–මේ සත්වෙනි මස
පසළොස්වෙනි දින පටන් සත් දවසක්
**ස්වාමීන්වහන්සේට** කුඩාරම් මංගල්‍යය
වන්නේය. පළමුවෙනි දින ශුද්ධ සහා 35
රැස්වීමක් පවත්වාපල්ලා. කිසිම බර
වැඩක් නොකරල්ලා. සත් දවසක් ගිනි 36
පූජාවක් **ස්වාමීන්වහන්සේට** ඔප්පු-
කරපල්ලා. අටවෙනි දින ශුද්ධ රැස්වීමක්
පවත්වා ගිනි පූජාවක් **ස්වාමීන්වහන්සේට**
ඔප්පුකරපල්ලා. එය මංගල්‍ය රැස්වීමක්
බැවින් නුඹලා කිසිම බර වැඩක් නොකළ
යුතුය.
**ස්වාමීන්වහන්සේගේ** සබත්ද නුඹලාගේ 37
දනද නුඹලාගේ සියලු භාරවල්ද
**ස්වාමීන්වහන්සේට** දෙන නුඹලාගේ
සියලු සතුටු පඬුරුද ඇර, ඒ ඒ දවසට 38
නියම ලෙස **ස්වාමීන්වහන්සේට** ගින්නෙන්
කරන පූජාවක් වන දවන පූජාවක්ද
ආහාර පූජාවක්ද යාගයක්ද පාන පූජා
ඔප්පුකරන පිණිස ශුද්ධ සහා රැස්වීම්
කොට නුඹලා විසින් ප්‍රසිද්ධකළ යුතු
**ස්වාමීන්වහන්සේගේ** නියම මංගල්‍යයන්
මේවාය.
ඒ කෙසේ වුවත් දේශයේ අස්වැන්න 39
රැස්කරගත් කල්හි සත්වෙනි මස
පසළොස්වෙනි දින පටන් සත් දවසක්
**ස්වාමීන්වහන්සේගේ** මංගල්‍ය පවත්වා-
පල්ලා. පළමුවෙනි දින ගරුමය
නිවාඩුවක්ද අටවෙනි දිනත් ගරුමය
නිවාඩුවක්ද වන්නේය. පළමුවෙනි දින 40
ලක්ෂණ ගස්වල ඵලද තල් අතුද
බොහෝ කොළ ඇති ගස්වල අතුද
ගංනළා ගස්ද රැගෙන සත් දවසක්
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි ප්‍රීතිවෙයල්ලා. අවුරුද්දකට 41
සත් දවසක් එය **ස්වාමීන්වහන්සේට**
මංගල්‍යයක් කොට පවත්වාපල්ලා.
එය නුඹලාගේ පරම්පරාවල නිරන්තර
පනතක්ය. සත්වෙනි මාසයේ ඒක
පවත්වාපල්ලා. මා ඉශ්‍රායෙල් පුත්‍රයන් 42
මිසර දේශයෙන් ගෙනා කල ඔවුන්
පැල්වල වාසය කෙරෙවූ බව නුඹලාගේ
පරම්පරාවල අය දනගන්නා පිණිස
සත් දවසක් පැල්වල වාසයකරපල්ලා.
ඉශ්‍රායෙල්හි ස්වදේශිකවූ සියල්ලෝ 43
පැල්වල වාසය කෙරෙත්වා. මම

නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ-
44 යයි කීසේක. මෝසෙස්ද ස්වාමීන්-
වහන්සේගේ නියම මංගල්‍යයන් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට දන්වා දුන්නේය.

## තෙල් සහ පිදීමේ රොටි

24 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
2 කථාකොට: එළිය පිණිස
පහනක් නිතරම දල්වීම සඳහා කොටා
හිඳගත් පවිත්‍ර ඔලිව තෙල් නුඹ ළඟට
ගෙනෙන්ට ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අණ-
3 කරපන්න. සම්මුඛවීමේ කූඩාරමෙහි
සාක්ෂියේ තිරයට පිටතින් සවස පටන්
උදය දක්වා ආරොන් ඒක ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි නිතරම පිළියෙළකර
තබන්නේය. ඒක නුඹලාගේ පරම්පරා-
4 වලට නිරන්තර පනතක්ය. ඔහු
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි පවිත්‍ර
පහන්රුක මත්තෙහි පහන් නිතරම
පිළියෙළකර තැබිය යුතුය.

5 සිහින් පිටි ගෙන එයින් රොටි
දෙළොසක් පුලුස්සාපන්න. එක එක
රොටිය ඒඵාවකින් දසයෙන් දෙ-
6 පංගුවකින් සාදපන්න. ඒවා ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි පවිත්‍ර මේසය උඩ
පෙළකට සයක් බැගින් දෙපෙළකට
7 තබාපන්න. ස්වාමීන්වහන්සේට ගිනි
පූජාවක් මෙන් රොටිවල සිහිවීමක් පිණිස
ඒ දෙපෙළ පිට පවිත්‍ර තුවරලා තබාපන්න.
8 ඔහු ඒවා ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා
නිරන්තර ගිවිසුමක් වන පිණිස
හැම සබත් දවසේම ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි නිතරම පිළිවෙළට තබන්නේය.
9 ඒවා ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ට
වන්නේය; ඔව්හු ශුද්ධ තැනකදී ඒවා
කත්වා. මක්නිසාද ඒවා ස්වාමීන්-
වහන්සේට ගින්නෙන් කළ පූජාවලින්
ඔහුට නිරන්තර පනතකින් අතිශුද්ධ යයි
කීසේක.

## දෙස් තැබීමට නියම අච්චුව

10 ඉශ්‍රායෙල් ස්ත්‍රියෙකුගේද මිසරිය
පුරුෂයෙකුගේද පුත්‍රයෙක් ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරේ මිසරයෙන් ආවේය.
ඉශ්‍රායෙල් ස්ත්‍රියගේ පුත්‍රයාද ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෙක්ද කඳවුරෙහිදී ඩබරකර-
ගත්තෝය; ඉශ්‍රායෙල් ස්ත්‍රියගේ පුත්‍රයා 11
ස්වාමීන්වහන්සේගේ නාමයට අපහාස-
කොට දෙස් කීවේය. ඔව්හු ඔහු මෝසෙස්
ළඟට ගෙනාවෝය. ඔහුගේ මවුගේ නම
ෂෙලොමීත්ය, ඈ දන්ගේ ගෝත්‍රයේ
දිබ්රීගේ දුවය. ස්වාමීන්වහන්සේගේ 12
මුඛයෙන් ඔවුන්ට දන්වන තුරු ඔව්හු
ඔහු හිර අඩස්සි කළෝය.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 13
කොට කියනසේක්: දෙස්කීවාවූ 14
තැනැත්තා කඳවුරෙන් පිටතට ගෙනියා-
පන්න; ඔහුගේ වචන ඇසූ සියල්ලෝ
තමුන්ගේ අත් ඔහුගේ හිස පිට තබත්වා,
මුළු සභාවද ඔහුට ගල්ගසාවා. නුඹ 15
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට:
තමාගේ දෙවියන්වහන්සේට දෙස්කියන
කවරෙක් නුමුත් තමාගේ පාපය දරන්ට
ඕනැයයි කියාපන්න. ස්වාමීන්වහන්සේගේ 16
නාමයට අපහාසකරන තැනැත්තා
සැබවින් මරනු ලැබිය යුතුය; මුළු සභාව
සැබවින් ඔහු ගල්ගසා මැරිය යුතුය.
විදේශියා වුවත් ස්වදේශියා වුවත්
ස්වාමීන්වහන්සේගේ නාමයට අපහාස-
කළොත් මරනු ලැබිය යුතුය.
මනුෂ්‍යයෙකුට මැරෙන්ට පහර දෙන 17
තැනැත්තා සැබවින් මරනු ලැබිය
යුතුය; මෘගයෙකුට මැරෙන්ට පහර දෙන 18
තැනැත්තා මෘගයා වෙනුවට මෘගයෙකු
දී පළි ගෙවිය යුතුය. මනුෂ්‍යයෙක් 19
තමාගේ අසල්වාසියාට පලුදුවක් කළොත්
ඔහු කළ ලෙසම ඔහුටත් කරනු ලැබේවා;
බිඳුමට බිඳුමක්ද ඇසට ඇසක්ද දතට 20
දතක්ද වශයෙන් මනුෂ්‍යයෙකුට ඔහු කළ
පලුදුවේ හැටියට ඔහුටත් කරනු ලැබේවා.
මෘගයෙකු මරන්නා ඊට පළි ගෙවිය 21
යුතුය. නුමුත් මනුෂ්‍යයෙකු මරන්නා මරනු
ලැබිය යුතුය. ස්වදේශියාට මෙන් 22
විදේශියාටද එක විනිශ්චය ක්‍රමයක්
නුඹලාට තිබෙන්ට ඕනැය. මක්නිසාද

මම නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ-
23 යයි කීසේක. මෝසෙස් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකෙළේය, ඔහු කී ලෙස
ඔව්හු දෙස් කීවාවූ තැනැත්තා කඳවුරෙන්
පිටතට ගෙනවුත් ගල්ගසා මැරුවෝය.
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට අණකළ ලෙස කළෝය.

## සබත් වර්ෂය සහ ජුබිලි වර්ෂය

25 ස්වාමීන්වහන්සේ සීනයි කන්දේදී
මෝසෙස්ට කථාකොට කියන-
2 සේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකරමින්
මෙසේ කියාපන්න–මා විසින් නුඹලාට
දෙන දේශයට නුඹලා පැමිණි කල දේශය
ස්වාමීන්වහන්සේට සබතක් පවත්වන්නීය.
3 සාවුරුද්දක් නුඹේ කෙත වපුරාපන්න,
සාවුරුද්දක් නුඹේ මිදිවැල් කප්පාදු-
4 කොට එහි එල එක්කරගනින්න; එහෙත්
සත්වෙනි අවුරුද්ද ස්වාමීන්වහන්සේට
පවත්වන සබතක් වන දේශයට ගරුමය
නිවාඩුවේ සබත් කාලයක් වන්නේය.
නුඹේ කෙත නොවපුරන්න, නුඹේ
5 මිදිවැල් කප්පාදු නොකරන්න. නුඹේ
ගොයමින් ඉබේම හටගන්න ඒවා කපා
නොගනින්න, කප්පාදු නොකළ නුඹේ
මිදිවැළේ වලු රැස්කර නොගනින්න. එය
දේශයට ගරුමය නිවාඩුවේ අවුරුද්දක්
6 වන්නේය. දේශයේ සබත් නුඹලාට එනම්
නුඹටත් නුඹේ මෙහෙකරුවාටත් නුඹේ
මෙහෙකාරීටත් නුඹේ කුලීකාරයාටත්
නුඹ සමග වසන ආගන්තුකයාටත්
7 ආහාර පිණිස වන්නේය; එහි මුළු
වර්ධනය නුඹේ ගවයන්ටත් නුඹේ
දේශයෙහි සිටින මෘගයන්ටත් ගොදුරු
පිණිස වන්නේය.
8 අවුරුදුවල සත් සබතක් නුඹට
ගණන්කර ගනින්න, එනම් සත් වරක්
සත් අවුරුද්දක්ය; එවිට අවුරුදුවල සත්
සබතක දවස් එනම් හතළිස් නව
9 අවුරුද්දක් නුඹට වන්නේය. පසුව
සත්වෙනි මාසයේ දසවෙනි දින හොරණෑ
ශබ්දය සෑම තැනම පවත්වාපන්න;
සමගිකමක් කිරීමේ දවසේදී නුඹලාගේ
දේශය මුළුල්ලේ හොරණෑව පිඹපල්ලා.
එසේ පනස්වෙනි වර්ෂය ශුද්ධ ලෙස 10
පවත්වා දේශයෙහි සියලු වැසියන්ට
නිදහස ප්‍රකාශකරපල්ලා. එය නුඹලාට
ජුබිලියක් වන්නේය; එකල නුඹලා
එකිනෙකා තම තමාගේ උරුමයටත්
තම තමාගේ පෙළපතටත් නැවත
පැමිණිය යුතුය. ඒ පනස්වෙනි වර්ෂය 11
නුඹලාට ජුබිලියක් වන්නේය. ඒ
කාලයෙහි වපුරන්ටවත් ඉබේම හටගන්න
ඒවා කපාගන්ටවත් කප්පාදු නොකළ
මිදි වැළෙන් එල නෙලාගන්ටවත් යුතු
නැත. මක්නිසාද එය ජුබිලියක්ය; ඒක 12
නුඹලාට ශුද්ධවන්නේය. ඒකේ අස්වැන්න
කෙතෙන්ම ගෙන කාපල්ලා. ඒ ජුබිලි 13
වර්ෂයෙහිදී නුඹලා එකිනෙකා තම
තමාගේ උරුමයට නැවත පැමිණිය
යුතුය. නුඹේ අසල්වාසියාට කිසිවක් 14
වික්කොත් නොහොත් නුඹේ අසල්වාසියා
අතින් මිලේට ගත්තොත් ඔවුනොවුන්ට
අයුතුකම් නොකරල්ලා. ජුබිලි වර්ෂයට 15
පසුව තිබෙන අවුරුදු ගණන හැටියට
නුඹේ අසල්වාසියාගෙන් මිලේට ගනින්න,
අස්වනු ලැබෙන අවුරුදු ගණන හැටියට
ඔහු නුඹට විකිණිය යුතුය. අස්වැන්න 16
ලැබෙන ප්‍රමාණයට ඔහු නුඹට ඒවා
විකුණන නිසා, අවුරුදුවල වැඩිකමේ
ප්‍රකාරයට එහි මිල ගණන වැඩිකළ
යුතුය, අවුරුදුවල අඩුකමේ ප්‍රකාරයට එහි
මිල ගණන අඩුකළ යුතුය. එබැවින් 17
ඔවුනොවුන්ට අයුතුකම් නොකොට,
නුඹේ දෙවියන්වහන්සේට භය ඇතුව
සිටපන්න. මක්නිසාද මම නුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේය. එබැවින් මාගේ 18
පනත් ඉෂ්ටකොට, මාගේ විනිශ්චයයන්
පවත්වා, ඒවා රක්ෂාකරපල්ලා; එවිට
නුඹලා දේශයෙහි සුවසේ වාසයකරනවා
ඇත. දේශය තමාගේ එලය දෙන්නීය, 19
නුඹලා තෘප්තියට පැමිණෙන තෙක් කා
එහි සුවසේ වාසයකරන්නහුය. ඉදින් 20
අප විසින් වපුරන්නේවත් අපේ අස්වැන්න
රැස්කරගන්නේවත් නැත්නම් සත්වෙනි
අවුරුද්දේ කුමක් කමුද්දැයි නුඹලා

21 අසනවානම් මෙසේ කියමි. හවෙනි
අවුරුද්දේ තුන් අවුරුද්දකට අස්වැන්න
ලැබෙන හැටියට මාගේ ආශීර්වාදය
තුඹලා කෙරෙහි පැමිණෙන්ට අණ-
22 කරන්නෙමි. එසේ තුඹලා අටවෙනි
අවුරුද්දේ වපුරා පරණ එලයෙන්
කන්නහුය; නවවෙනි අවුරුද්දේ එල
ලැබෙන තුරුම පරණ එල කන්නහුය.
23 දේශය හැමදටම විකුණනු නොලැබිය
යුතුය; මක්නිසාද දේශය මාගේය.
තුඹලා වනාහි මා වෙත වසන විදේශීන්
24 හා ආගන්තුකයෝය. තුඹලාට උරුම-
වෙන මුළු දේශයෙහි බිම් මුදගන්ට තුඹලා
ඉඩඇරිය යුතුය.
25 තුඹේ සහෝදරයෙක් දුප්පත්ව තමාගේ
උරුමයෙන් කොටසක් විකුණන්නේ-
නම් ඔහුගේ කිට්ටු නෑයා ඇවිත් තම
සහෝදරයා විසින් විකුණනලද ඉඩම
26 මුදගත යුතුය. එසේ යමෙකුට
මිදුම්කාරයෙක් නැති තුමුත් ඔහු
පොහොසත්ව එය මුදගැනීමට සෑහෙන
27 පමණ වත්කම ලබාගත්තොත්, ඔහු වික්ක
ද පටන් අවුරුදු ගණන්කොට වැඩිව
තිබෙන මුදල් ඒක මිලේට ගත්
තැනැත්තාට නැවත දී තමාගේ උරුමයට
28 දෙවනු පැමිණේවා. එහෙත් එය නැවත
ලබාගන්ට ඔහුට නොහැකිවී නම්
විකුණනලද ඉඩම මිලේටගත්
තැනැත්තාගේ අතේ ජුබිලි වර්ෂය
දක්වා තිබේවා. ජුබිලි වර්ෂයෙහි ඒක
මිදෙන්නේය, ඔහුද තමාගේ උරුමයට
නැවත පැමිණෙන්නේය.
29 මනුෂ්‍යයෙක් පවුරු ඇති නුවරක තිබෙන
ගෙයක් වික්කොත් එය වික්ක තැන්
පටන් සම්පූර්ණ අවුරුද්දක් ඇතුළතදී
ඒක මුදගත හැකි වන්නේය; අවුරුද්දක්
තුළේම එය මුදගන්ට ඔහුට බලය තිබේ.
30 සම්පූර්ණ අවුරුද්දක් ඇතුළතදී එය මුදනු
නොලැබුවොත් පවුරු ඇති නුවර තිබෙන
ගේ මිලේට ගත් තැනැත්තාට එය
ඔහුගේ පරම්පරාවල නිරන්තර උරුමයක්
වන්නේය. එය ජුබිලි වර්ෂයෙහිදී ආපසු
නොයන්නේය. එහෙත් වටකරින් පවුරු 31
නැති ගම්වල ගෙවල් දේශයේ කෙත්
සමග ගණන්ගනු ලබන්නේය. ඒවා
මුදගත හැකි වන්නේය, ජුබිලි වර්ෂයෙහිදී
ඒවා ආපසු යන්නෝය. එසේවී තුමුත් 32
ලෙවීවරුන්ගේ නුවරවල් එනම් ඔවුන්ගේ
උරුම නුවරවල ගෙවල් කොයි කලෙක
වුවත් ලෙවීවරුන්ට මුදගත හැකිය.
ලෙවීවරුන්ගෙන් කවරෙක්වත් මිදුවොත් 33
විකුණනලද ගෙයද ඔහුගේ උරුම නුවරද
ජුබිලි වර්ෂයේදී ආපසු යන්නේය.
මක්නිසාද ලෙවීවරුන්ගේ නුවරවල
ගෙවල් ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි
ඔවුන්ගේ උරුමයය. එහෙත් ඔවුන්ගේ 34
නගරබද ප්‍රදේශයේ කෙත් විකුණනු
නොලැබිය යුතුය; මක්නිසාද ඒවා
ඔවුන්ගේ නිරන්තර උරුමයක්ය.
තුඹ වෙත තුඹේ සහෝදරයෙක් දිළිඳු 35
වී ඔහුගේ අතමිට හිඟවුණොත් ඔහුට
උපකාරකරපන්න. විදේශියෙකු හා
ආගන්තුකයෙකු මෙන් ඔහු තුඹ වෙත
වාසයකෙරේවා. තුඹේ සහෝදරයා තුඹ 36
වෙත රක්ෂාවෙන පිණිස පොළීවත්
ලාභයක්වත් ඔහුගෙන් නොගෙන තුඹේ
දෙවියන්වහන්සේට භයව සිටපන්න.
තුඹේ මිල පොළියටවත් තුඹේ ආහාර 37
ලාභ ලබන පිණිසවත් ඔහුට නොදිය
යුතුය. මම වනාහි කානාන් දේශය 38
තුඹලාට දී තුඹලාගේ දෙවියන්-
වහන්සේ වන පිණිස තුඹලා මිසර
දේශයෙන් ගෙනාවාවූ තුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේය.
තුඹ වෙත තුඹේ සහෝදරයා දිළිඳු 39
බවට පැමිණ තුඹට තමාම වික්කොත්
ඔහුගෙන් දසයෙකුගේ වැඩ නොගත
යුතුය. කුලීකාරයෙකු මෙන්ද විදේශියෙකු 40
මෙන්ද ඔහු තුඹ වෙත සිටිමින් ජුබිලි
වර්ෂය දක්වා තුඹට මෙහෙකෙරේවා.
එකල ඔහුද ඔහු හා සමග ඔහුගේ 41
දරුවෝද තුඹ වෙතින් ගොස් තමාගේ
පෙළපතටත් තමාගේ පියවරුන්ගේ
උරුමයටත් නැවත පැමිණෙත්වා.

42 මක්නිසාද ඔව්හු මිසර දේශයෙන් මා
විසින් ගෙනෙනලද මාගේ මෙහෙකරුවෝය.
දසයන් මෙන් ඔවුන් විකුණනු නොලැබිය
43 යුතුය. තදකමින් ඔහු කෙරෙහි අධිපතිකම්
නොකොට නුඹේ දෙවියන්වහන්සේට
44 භය වෙයන්න. නුඹට ඇතිවන්නාවූ දස
දසීන් ගැන නම්, නුඹලා වටකරින් සිටින
ජාතීන්ගෙන්ම දස දසීන් මිලේට ගත
45 යුතුය. ඇරත් නුඹලා අතරෙහි විදේශීව
සිටින්නාවූ අන් රට වැසියන්ගේ
දරුවන්ගෙන්ද ඔවුන්ට නුඹලාගේ දේශ-
යෙහිදී උපදින්නාවූ නුඹලා ළඟ සිටින
ඔවුන්ගේ පවුල්වලින්ද මිලේට ගනිල්ලා.
ඔවුන් නුඹලාගේ උරුමයක් කොට
46 තබාගන්ට පුළුවන. නුඹලාට පසුව
නුඹලාගේ දරුවන්ටද උරුමයක් කොට
ඔවුන් හිමිකර දෙන්ට පුළුවන; ඔවුන්
අතරෙන් සදාකාලේටම නුඹලාගේ දසයන්
ලබාගත හැකිය. එහෙත් නුඹලාගේ
සහෝදරයන්වූ ඉශ්‍රායෙල් පුත්‍රයන්
කෙරෙහි එනම් එක එකා තමතමාගේ
සහෝදරයා කෙරෙහි තදකමින්
අධිපතිකම් නොකළ යුතුය.
47 නුඹ වෙත සිටින විදේශීවූ ආගන්තුකවූ
කෙනෙක් පොහොසත්වෙන්ටත් ඔහු වෙත
සිටින නුඹේ සහෝදරයෙක් දිළිඳුව නුඹ
වෙත සිටින විදේශීවූ ආගන්තුකවූ අයට
හෝ විදේශියාගේ පවුලේ කෙනෙකුට
හෝ විකුණනු ලබන්ටත් යෙදුණොත්,
48 ඔහු විකුණූ පසු නැවත මුදනු ලැබිය
හැකිය; ඔහුගේ සහෝදරයන්ගෙන් එක්
49 කෙනෙකුට ඔහු මුදගත හැකිය. ඔහුගේ
මවුගේවත් පියාගේවත් සහෝදරයාට
හෝ මවුගේවත් පියාගේවත්
සහෝදරයාගේ පුත්‍රයාට හෝ ඔහුගේ
පවුලට ළඟ නෑයින්ගෙන් කෙනෙකුට
හෝ ඔහු මුදගන්ට පුළුවන; නොහොත්
ඔහු ධනවත් වන්නේනම් තමාම මුදගන්ට
50 හැකිවන්නේය. ඔහු මිලේට ගත්
තැනැත්තා සමග විකුණනු ලබන අවුරුද්ද
පටන් ජුබිලි අවුරුද්ද දක්වා ගණන්
බලාවා. ඔහුගේ විකිණීමේ මිල ඒ අවුරුදු
ගණන හැටියට වන්නේය; ඔහු පඩියට
වැඩකරන්නෙකුගේ කාලය ලෙස ඔහු
සමග සිටීවා. බොහෝ අවුරුදු ඉතුරුව 51
තිබේනම් ඒවායේ හැටියට තමාගේ
මිදීමේ මිලය තමා විකුණනු ලැබූ
මිලයෙන් නැවත ගෙවිය යුතුය. ජුබිලි 52
අවුරුද්ද දක්වා ඉතුරුව තිබෙන්නේ
අවුරුදු ස්වල්පයක් නම් ඔහු සමග ගණන
බලා තමාගේ අවුරුදුවල හැටියට
තමාගේ මිදීමේ මිල නැවත දේවා.
අවුරුද්දෙන් අවුරුද්ද පඩියට වැඩ 53
කරන්නෙකු මෙන් ඔහු ඒ අය වෙත
සිටීවා. ඒ අය නුඹ ඉදිරිපිට ඔහු කෙරෙහි
තද ලෙස අධිපතිකම් නොකෙරේවා. මේ 54
අන්දම්වලින් ඔහු මුදනු නොලබන්නේනම්,
ඔහු සහ ඔහු සමග ඔහුගේ දරුවෝද
ජුබිලි අවුරුද්දේ නිදහස්ව යන්නෝය.
මක්නිසාද ඉශ්‍රායෙල් පුත්‍රයෝ මාගේ 55
මෙහෙකරුවෝය; ඔව්හු මා විසින්
මිසර දේශයෙන් ගෙනාවාවූ මාගේ
මෙහෙකරුවෝය. මම නුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේය.

## අවවාද සහ පොරොන්දු

# 26

රූප සාදනොගනිල්ලා, කැපූ
පිළිමයක්වත් රූපස්තම්භයක්වත්
සිටුවා නොගනිල්ලා, නමස්කාර කරන
පිණිස නුඹලාගේ දේශයෙහි කැටයම්කළ
කිසි ගලක් නොතබල්ලා. මක්නිසාද
මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේය**. නුඹලා මාගේ සබත් රක්ෂා- 2
කළ යුතුය, මාගේ ශුද්ධස්ථානයට
ගෞරව කළ යුතුය. මම **ස්වාමීන්-**
**වහන්සේය**.
නුඹලා මාගේ පනත් ලෙස හැසිර 3
මාගේ ආඥාවන් රක්ෂාකරමින් ඒවා
පවත්වන්නහු නම්, මම නියම සෘතුවෙහි 4
නුඹලාගේ වර්ෂාවල් දෙන්නෙමි, දේශය
එහි වර්ධනයන් දෙන්නීය, කෙතේ ගස්ද
ඒවායේ ඵල දෙන්නේය. නුඹලාගේ 5
ගොයම් මඩින කාලය මුද්‍රිකඵල
නෙළන කාලය දක්වා පවත්නේය,
මුද්‍රිකඵල නෙළන කාලය වපුරන කාලය

දක්වා පවත්නේය. තුඹලා සෑහෙන්ට
කෑම කා තුඹලාගේ දේශයෙහි
6 සුරක්ෂිතව සිටින්නහුය. තුඹලා නිදාගන්න
කල කිසිවෙක් තුඹලා භය නොගන්වන
ලෙස දේශයෙහි සමාදානය දෙන්නෙමි.
දේශයෙන් චණ්ඩ මෘගයන් පහකරන්නෙමි,
කඩුවද තුඹලාගේ දේශය මැදින්
7 නොයන්නේය. තුඹලා තුඹලාගේ සතුරන්
එළවන්නහුය, ඔව්හු තුඹලා ඉදිරියෙහි
8 කඩුවෙන් වැටෙන්නෝය. තුඹලාගෙන්
පස්දෙනෙක් සියදෙනෙක්ද තුඹලාගෙන්
සියදෙනෙක් දසදහසක්ද එළවනවා
ඇත. එසේ තුඹලාගේ සතුරෝ තුඹලා
හමුයෙහි කඩුවෙන් වැටෙන්නෝය.
9 මම තුඹලා සලකා බෝකොට වැඩි-
කරන්නෙමි; මාගේ ගිවිසුම තුඹලා
10 සමග පිහිටුවන්නෙමි. තුඹලා බොහෝ
කල් රැස්කර තිබුණු පරණ දේ කන්නහුය,
අලුත් දේ කන පිණිස පරණ දේ පහ-
11 කරන්නහුය. මමද මාගේ මණ්ඩපය
තුඹලා අතරෙහි පිහිටුවන්නෙමි. මාගේ
ආත්මයද තුඹලා පිළිකුල් නොකරන්නේය.
12 මම තුඹලා අතරෙහි හැසිර තුඹලාගේ
දෙවියන්වහන්සේ වන්නෙමි, තුඹලා
13 මාගේ සෙනඟ වන්නහුය. මම වනාහි
තුඹලා මිසරවරුන්ගේ වහලුන්ව
නොසිටින පිණිස මිසර දේශයෙන් තුඹලා
පිටතට ගෙනාවාවූ තුඹලාගේ දෙවිවූ
ස්වාමින්වහන්සේය; මම තුඹලාගේ
වියගහේ බැඳුම් බිඳ තුඹලාට කෙළින්ව
යන්ට සැලැස්වීමි.
14 එහෙත් තුඹලා මට ඇහුම්කන් නොදී
15 මේ සියලු ආඥා නොපවත්වා, මාගේ
පනත් ප්‍රතික්ෂේප කරන්නහුනම්, තුඹලා-
ගේ ප්‍රාණය මාගේ විනිශ්චයයන්
පිළිකුල්කරන්නේනම්, එසේ මාගේ
සියලු ආඥා නොපවත්වා මාගේ ගිවිසුම්
16 කඩකරන්නහුනම්, මමද තුඹලාට මෙසේ
කරන්නෙමි: මම තුඹලා කෙරෙහි භය
එනම් ඇස් ක්ෂය කරන්නාවූ, ප්‍රාණය
හීනකරන්නාවූ, ක්ෂයරෝගයද උණද
පමුණුවන්නෙමි. තුඹලා නිෂ්ඵලයේ බීජ
වපුරන්නහුය, මක්නිසාද තුඹලාගේ
සතුරෝ ඒවා කන්නෝය. මම මාගේ 17
මුහුණ තුඹලාට විරුද්ධව යොමු
කරන්නෙමි, තුඹලා තුඹලාගේ සතුරන්
ඉදිරියෙහි පරාජය වන්නහුය. තුඹලාට
වෛරකරන අය තුඹලා කෙරෙහි
අධිපතිකම් කරන්නහුය; කිසිවෙක්
නොඑළවන කල තුඹලා පලායන්නහුය.
තවද මේ සියල්ල නිසාවත් තුඹලා මට 18
ඇහුම්කන් නුදුන්නොත් තව සත් ගුණයක්
තුඹලාගේ පව් නිසා තුඹලාට දඬුවම්
කරන්නෙමි. මම තුඹලාගේ බලයේ 19
උඩඟුකම බිඳින්නෙමි; තුඹලාගේ අහස
යකඩ මෙන්ද තුඹලාගේ භූමිය පිත්තල
මෙන්ද කරන්නෙමි. එසේ තුඹලාගේ 20
ශක්තිය නිකරුණේ වියදම්වන්නේය.
මක්නිසාද තුඹලාගේ දේශය එහි
වර්ධනය නොදෙන්නීය, දේශයේ ගස්ද
එල නොදෙන්නේය. තුඹලා මට විරුද්ධව 21
හැසිර මට ඇහුම්කන් නොදෙන්නහුනම්
මම තුඹලාගේ පාපවල හැටියට තව
සත් ගුණයක් තුඹලාට පීඩා පමුණු-
වන්නෙමි. මම තුඹලා අතරට වන 22
මෘගයන් එවන්නෙමි, උන් තුඹලාගේ
දරුවන් තුඹලාගෙන් කොල්ලකන්නෝය,
තුඹලාගේ ගවයන් විනාශ කරන්නෝය,
තුඹලා ගණනින් අඩු කරන්නෝය; එසේ
තුඹලාගේ මාර්ග පාළුවන්නේය. මේ 23
දේවලින්වත් තුඹලා මා කෙරෙහි හරි-
නොගැසී මට විරුද්ධව හැසුරුණොත්,
මමත් තුඹලාට විරුද්ධව හැසිර 24
තුඹලාගේ පාපවල් නිසා සත් ගුණයක්
පහරදෙන්නෙමි. මම ගිවිසුම ගැන 25
පළිගන්නාවූ කඩුවක් තුඹලා පිටට
පමුණුවන්නෙමි; තුඹලා තුඹලාගේ
නුවරවල රැස්ව සිටින කල්හි තුඹලා
අතරට වසංගතය පමුණුවන්නෙමි;
තුඹලාද තුඹලාගේ සතුරාගේ අතට
පාවාදෙනු ලබන්නහුය. මා විසින් 26
තුඹලාගේ කෑම නැමති රුකුල බින්ද
විට ස්ත්‍රීහු දසදෙනෙක් එක් උදුනෙක්හි
තුඹලාගේ රොටි පුලුස්සා කිරමින්

නැවත හාරදෙන්නෝය. නුඹලා කා
සෑහීමට නොපැමිණෙන්නහුය.
27 ඉදින් නුඹලා මේ සියල්ල නිසාවත්
මට ඇහුම්කන් නොදී මට විරුද්ධව
28 හැසිරෙන්නහුනම්, මම නුඹලාට
විරුද්ධව උදහසින් හැසිර නුඹලාගේ
පාපවල් නිසා සත් ගුණයක් නුඹලාට
29 දඬුවම් කරන්නෙමි. නුඹලාද නුඹලාගේ
පුත්‍රයන්ගේ මාංස කනවා ඇත, නුඹලාගේ
30 දූවරුන්ගේ මාංසද කනවා ඇත. මම
නුඹලාගේ උස් තැන් විනාශකොට,
නුඹලාගේ සූර්ය රූප සිඳදමා, නුඹලාගේ
දේවරූප කැබලි පිට නුඹලාගේ මළ
කඳන් හෙළන්නෙමි; මාගේ ආත්මයද
31 නුඹලා පිළිකුල් කරන්නේය. මම
නුඹලාගේ නුවරවල් පාළුවක් කොට
නුඹලාගේ ශුද්ධස්ථාන නටබුන් බවට
පමුණුවන්නෙමි, නුඹලාගේ මිහිරි සුවඳ
32 ආඝ්‍රාණය නොකරන්නෙමි. මම දේශය
නාස්තිකරන්නෙමි. එහි වාසය කරන
නුඹලාගේ සතුරෝද ඒ ගැන විස්මයට
33 පත්වන්නෝය. මම ජාතීන් අතරෙහි
නුඹලා විසුරුවා නුඹලා පස්සෙන් කඩුව
ඇදගත එන්නෙමි. නුඹලාගේ දේශය
නාස්තියක්ද නුඹලාගේ නුවරවල්
34 පාළුවක්ද වන්නේය. එකල නුඹලාගේ
සතුරන්ගේ දේශයෙහි නුඹලා සිටින අතර
නාස්තිවීමේ කාලය මුළුල්ලෙහි දේශය
ඒකේ සබත් කාලවල් භුක්තිවිඳිනවා ඇත;
එකල දේශය නිවාඩු ලැබ ඒකේ සබත්
35 කාලවල් භුක්තිවිඳිනවා ඇත. නුඹලා
එහි වාසයකරද්දී නුඹලාගේ සබත්
කාලවල ඊට නොලැබුණු නිවාඩුව
නටබුන් භාවයේ කාලයෙහිදී ලබනවා
36 ඇත. නුඹලාගෙන් ඉතුරුවෙන්නන් ගැන
නම්, මම ඔවුන්ගේ සතුරන්ගේ දේශවලදී
ඔවුන්ගේ සිත්වලට ක්ලාන්තභාවයක්
පමුණුවන්නෙමි. සැලෙන කොළයක
ශබ්දයට ඔව්හු දුවන්නෝය; කඩුව
ඉදිරියෙන් යමෙක් පලායන්නාක් මෙන්
ඔව්හු පලා ගොස් කිසිවෙකු ඔවුන්
37 නොඑළවන කල වැටෙන්නෝය. කඩුව
ඉදිරියෙන් දුවන්නාක් මෙන් කිසිවෙකු
ලුහුනොබඳින කල ඔව්හු එකිනෙකා පිට
හැපී වැටෙන්නෝය. නුඹලාගේ සතුරන්
ඉදිරිපිට සිටින්ට නුඹලාට කිසි බලයක්
නැතිවන්නේය. නුඹලා ජාතීන් අතරෙහි 38
නැතිවන්නහුය, නුඹලාගේ සතුරන්ගේ
දේශය තොම නුඹලා කා දමන්නීය.
නුඹලාගෙන් ඉතිරිවන අය තමුන්ගේ 39
අපරාධ නිසාත් තමුන්ගේ පියවරුන්ගේ
අපරාධ නිසාත් නුඹලාගේ සතුරන්ගේ
දේශවලදී ක්ෂයවී යනවා ඇත. එවිට 40
ඔවුන් මට විරුද්ධව කළ ද්‍රෝහිකමෙන්
වුණාවූ තමුන්ගේ අයුතුකමද, තමුන්ගේ
පියවරුන්ගේ අයුතුකමද, ඔවුන් මට
විරුද්ධව හැසුරුණු නිසා, මාත් ඔවුන්ට 41
විරුද්ධව හැසිර ඔවුන්ගේ සතුරන්ගේ
දේශයට ඔවුන් පැමිණෙවූ බවද කියා
දෙනවා ඇත. එකල්හිවත් ඔවුන්ගේ
අචර්මඡේදිත සිත් යටහත්වී ඔව්හු
තමුන්ගේ අයුතුකමේ දඬුවම පිළිගන්නෝ
නම්, මම යාකොබ් සමග කළ මාගේ 42
ගිවිසුම සිහිකරන්නෙමි; ඊසාක් සමග
කළ මාගේ ගිවිසුමත් ආබ්‍රහම් සමග
කළ මාගේ ගිවිසුමත් සිහිකරන්නෙමි;
දේශයද සිහිකරන්නෙමි. දේශයද ඔවුන් 43
නිසා පාළුව තිබෙන තෙක් ඔවුන් විසින්
අත්හරිනු ලැබ එහි සබත් කාලවල්
භුක්තිවිඳින්නීය; ඔව්හුද තමුන්ගේ
අයුතුකමේ දඬුවම පිළිගන්නෝය.
මක්නිසාදයත් ඔව්හු මාගේ විනිශ්චයයත්
ප්‍රතික්ෂේපකොට තමුන්ගේ සිතින් මාගේ
පනත් පිළිකුල්කළෝය. එසේවී නුමුත් 44
ඔවුන් තමුන් සතුරන්ගේ දේශයෙහි සිටින
කල ඔවුන් මුළුමනින් විනාශවන ලෙසද
ඔවුන් සමග මාගේ ගිවිසුම කඩවන
ලෙසද මම ඔවුන් එපා නොකරන්නෙමි,
ඔවුන් පිළිකුල් නොකරන්නෙමි. මක්නිසාද
මම ඔවුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය.**
ඔවුන්ගේ මුතුන් මුත්තන්ගේ දෙවියන්- 45
වහන්සේ වන පිණිස ජාතීන්ගේ ඇස්
හමුයෙහි මිසර දේශයෙන් මා විසින්
ගෙනෙන ලද්දවූ ඒ තැනැත්තන් සමග

කළ ගිවිසුම මම ඔවුන් උදෙසා සිහි-
කරන්නෙමි. මම **ස්වාමීන්වහන්සේයයි**
**කීසේක.**
46 **ස්වාමීන්වහන්සේ** තමන්වහන්සේද
ඉශ්‍රායෙල් පුත්‍රයන්ද අතරේ සීනයි
කන්දේදී මෝසෙස් ලවා පිහිටුවනලද
පනත්ද විනිශ්චයයන්ද ව්‍යවස්ථාද
මේවාය.

## කැපකරනලද තැනැත්තන් හා දේවල් ගැන

27 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට කියනසේක්:
2 ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට මෙසේ
කියාපන්න–මනුෂ්‍යයෙක් භාරයක් ඉෂ්ට-
කරන කල භාරයට ඇතුළත් අයවල්
තුඹ නියමකරන ගණනේ හැටියට
3 **ස්වාමීන්වහන්සේට** අයිති වන්නෝය. විසි
අවුරුද්ද පටන් සැට අවුරුද්ද දක්වා
වයස් ඇති පුරුෂයෙක් ගැන තුඹේ
නියමකිරීම ශුද්ධස්ථානයේ ෂෙකෙලේ
හැටියට රිදී ෂෙකෙල් පනහක් වන්නේය.
4 ස්ත්‍රියෙක් නම් තුඹේ නියමකිරීම ෂෙකෙල්
5 තිසක් වන්නේය. පස් අවුරුද්ද පටන්
විසි අවුරුද්ද දක්වා වයස් ඇති කෙනෙක්
නම් පිරිමියෙක් ගැන තුඹේ නියමකිරීම
ෂෙකෙල් විස්සක්ද ගෑනු කෙනෙක් ගැන
6 ෂෙකෙල් දසයක්ද වන්නේය. මසක් පටන්
පස් අවුරුද්ද දක්වා වයස් ඇති කෙනෙක්
නම් පිරිමියෙක් ගැන තුඹේ නියමකිරීම
රිදී ෂෙකෙල් පහක්ද ගෑනු කෙනෙක්
ගැන තුඹේ නියමකිරීම රිදී ෂෙකෙල්
7 තුනක්ද වන්නේය. සැට අවුරුද්ද පටන්
වැඩි වයස් ඇති කෙනෙක් නම්
පිරිමියෙක් ගැන තුඹේ නියමකිරීම
ෂෙකෙල් පසළොසක්ද ගෑනු කෙනෙක්
8 ගැන ෂෙකෙල් දසයක්ද වන්නේය. නුමුත්
ඔහු තුඹ නියමකරන ගණනේ තරම
ගෙවන්ට බැරි දිළින්දෙක් නම් පූජකයා
ඉදිරිපිට සිටවනු ලැබිය යුතුය, පූජකයා
ඔහුට ගණනක් නියම කරාවා;
භාරයක්වූ තැනැත්තාගේ වත්කමේ
ප්‍රකාරයට පූජකයා ඔහුට නියමකරාවා.

මනුෂ්‍යයන් විසින් **ස්වාමීන්වහන්සේට** 9
පූජාවක් ඔප්පුකිරීමට ගන්නාවූ මෘගයෙක්
නම්, මනුෂ්‍යයෙකු **ස්වාමීන්වහන්සේට**
දෙන්නාවූ එබඳු සියල්ලම ශුද්ධවන්නේය.
ඔහු හොඳ එකෙකු නරක එකෙකුට 10
හෝ නරක එකෙකු හොඳ එකෙකුට
හෝ වෙනස් නොකළ යුතුය,
මාරුනොකළ යුතුය. කොයි ආකාර-
යකින්වත් මෘගයෙකුට මෘගයෙකු
මාරුකරන්නේනම් ඒකාද ඌට මාරුකළ
එකාද ශුද්ධවන්නෝය. නුමුත් **ස්වාමීන්-** 11
**වහන්සේට** පූජාවක් ඔප්පුකිරීමට
නොගන්නාවූ යම් අපවිත්‍ර මෘගයෙක්
නම්, ඔහු ඒ මෘගයා පූජකයා ඉදිරිපිට
සිටවිය යුතුය. පූජකයා ඌගේ හොඳ 12
නරක හැටියට ඌගේ ගණන
නියමකරාවා. පූජකයාවූ තුඹේ
නියමකිරීමේ හැටියටම වේවා. නුමුත් 13
ඌ මුදගන්ට ඔහු කැමති නම් තුඹ
නියමකරන ගණනට ඔහු පහෙන්
පංගුවක් එකතුකර දිය යුතුය.
මනුෂ්‍යයෙක් තමාගේ ගෙය **ස්වාමීන්-** 14
**වහන්සේට** ශුද්ධකොට කැපකරන කල
පූජකයා ඒකේ හොඳ නරක හැටියට ගණන
නියමකරාවා. පූජකයා නියම කරන
ගණනේ හැටියටම එය ස්ථිර වේවා.
කැපකළ තැනැත්තේ තමාගේ ගෙය 15
මුදගන්ට කැමතිනම් තුඹ නියම කරන
මුදලට එයින් පහෙන් පංගුවක් එකතුකර
දේවා, එවිට ඒක ඔහුගේ වන්නේය.
මනුෂ්‍යයෙක් තමාගේ ප්‍රවේණි බිමෙන් 16
කොටසක් **ස්වාමීන්වහන්සේට** කැප-
කරන්නේනම් තුඹේ නියමකිරීම ඒකේ
වැපිරීමේ හැටියට වන්නේය. යව බීජ
හෝමරයක වපසරිය රිදී ෂෙකෙල්
පනහක් බැගින් වේවා. ඔහු තමාගේ 17
කෙත ජුබිලි වර්ෂය පටන් කැප-
කරන්නේනම් තුඹේ නියමකිරීමේ හැටියට
එය ස්ථිරවන්නේය. එහෙත් ඔහුගේ කෙත 18
ජුබිලි වර්ෂයට පසුව කැපකරන්නේනම්
පූජකයා ජුබිලි වර්ෂය දක්වා ඉතිරිව
තිබෙන අවුරුදු ලෙස ඔහුට මිල ගණන්
බලා කියාවා, ඒ හැටියට තුඹේ

19 නියමකිරීම අඩුවන්නේය. බිම කැපකරන
තැනැත්තා ඒක මුදගන්ට කැමතිනම් නුඹ
නියමකරන මුදලට එයින් පහෙන්
පංගුවක් එකතුකර දිය යුතුය. එවිට
20 ඒක ඔහුට ස්ථිරවන්නේය. නුමුත් ඔහු
කෙත මුදනොගන්නේනම් නොහොත් ඔහු
කෙත වෙන කෙනෙකුට විකුණා තිබේනම්
21 ඒක තවත් මුදනු නොලබන්නේය. ඒ
බිම ජුබිලි වර්ෂයේදී නිදහස් වෙන විට
තීන්දුවටම කැපවූ බිමක් මෙන්
**ස්වාමීන්වහන්සේට** ශුද්ධවන්නේය; ඒකේ
22 අයිතිය පූජකයාට වන්නේය. යමෙක්
තමාගේ උරුම බිමක් නොවන්නාවූ තමා
මිලේට ගත් කෙතක් **ස්වාමීන්වහන්සේට**
23 කැපකරන්නේනම්, පූජකයා ජුබිලි වර්ෂය
දක්වා නුඹ නියමකරන මිලයේ හැටියට
ඔහුට ගණන බලා කියාවා. ඔහු ඒ
දවසේදී නුඹ නියමකරන ගණන
**ස්වාමීන්වහන්සේට** ශුද්ධ දෙයක් කොට
24 දේවා. ජුබිලි වර්ෂයේදී ඒ කෙත
එය වික්කාවූ එහි උරුමය අයිතිවූ
25 තැනැත්තාට නැවත ලැබෙන්නේය. නුඹේ
සියලු නියමකිරීම් ශුද්ධස්ථානයේ
ෂෙකෙලේ හැටියට ෂෙකෙලට ගේරා
විස්සක් බැගින් විය යුතුය.
26 නුමුත් කුලුඳුල්ව ඉපිද **ස්වාමීන්-
වහන්සේට** අයිතිවෙන කුලුඳුල් මෘගයෙක්
කිසිවෙකු විසින් කැපනොකළ යුතුය;
ගවයෙක් වුවත් එළුවෙක් හෝ බැටළුවෙක්
වුවත් ඌ **ස්වාමීන්වහන්සේටම** අයිතිය.
27 ඌ අපවිත්‍ර මෘගයෙක්නම් ඔහු නුඹ
නියමකරන ගණනට එයින් පහෙන්
පංගුවක් එකතුකර ඌ මුදගත යුතුය.
මුද නොගත්තොත් ඌ නුඹ නියමකරන
ගණනට විකුණනු ලැබිය යුතුය.
ඒ අතරම කිසිවෙක් තමා සන්තක 28
සියල්ලෙන් එනම් මිනිසුන්ගෙන් හෝ
මෘගයන්ගෙන් හෝ තමාගේ උරුම
කෙතෙන් හෝ **ස්වාමීන්වහන්සේට**
තීන්දුවටම කැපකරන කිසිවක් විකුණන්-
ටවත් මුදගන්ටවත් නුපුළුවන. තීන්දුවටම
කැපකරන සියල්ල **ස්වාමීන්වහන්සේට**
අති ශුද්ධය. මනුෂ්‍යයන්ගෙන් තීන්දුවටම 29
කැපකරනු ලැබූ කෙනෙක් මුදනු
නොලබන්නේය, ඔහු මරනු ලබන්ටම
ඕනෑය.
භූමියේ මුළු අස්වැන්නෙන් එනම් භූමියේ 30
ධාන්‍යයෙන්ද ගස්වල ඵලයෙන්ද
සියල්ලෙන් දසයෙන් කොටසක්
**ස්වාමීන්වහන්සේට** අයිතිය. එය
**ස්වාමීන්වහන්සේට** ශුද්ධය. යමෙකු 31
තමාගේ දසයෙන් කොටසෙන් යමක්
මුදගන්ටම කැමති නම් ඔහු ඒ ගණනට
එයින් පහෙන් පංගුවක් එකතුකර දිය
යුතුය. කෙවිට යටින් යන්නාවූ සියලුම 32
මෘගයන් වන ගව එළු බැටළු රැළවලින්
දසයෙන් කොටසක් **ස්වාමීන්වහන්සේට**
ශුද්ධය. ඔහු විසින් ඌ හොඳද නරකද 33
කියා සොයන්ට හෝ ඌ මාරුකරන්ට
හෝ යුතු නැත. මාරුකළොත් ඌ සහ
ඌට මාරුකරන එකාත් ශුද්ධය; ඌ
මුදනු නොලබන්නේයයි කීසේක.
ඉශ්‍රායෙල් පුත්‍රයන් සඳහා **ස්වාමීන්-** 34
**වහන්සේ** සීනයි කන්දේදී මෝසෙස්ට
දුන් ආඥා මේවාය.

# ගණන් කථාව

## යයි සාමාන්‍යයෙන් කියනු ලබන

## මෝසෙස්ගේ හතරවෙනි පොත

### ගෝත්‍ර ගණන්කිරීම

1 ඔවුන් මිසර දේශයෙන් නික්ම
ආවායින් පසු දෙවෙනි අවුරුද්දේ
දෙවෙනි මාසයේ පළමුවෙනි දින සීනයි
කාන්තාරයෙහි සම්මුඛවීමේ කූඩාරමේදී
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
2 කොට මෙසේ කීසේක: ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ මුළු සභාවේ සියලු පුරුෂ-
යන්ගේ මුළු ගණන ඔවුන්ගේ පවුල් ප්‍රකාර
ඔවුන්ගේ පිය පෙළපත්වල හැටියට වෙන්
වෙන් වශයෙන් ඔවුන්ගේ නාම ගණන
3 ඇතුව ගනිල්ලා; එනම් ඉශ්‍රායෙල්වරුන්
අතරෙන් යුද්ධයට යන හැකිවූ, අවුරුදු
විස්ස පටන් වයස් ඇති සියල්ලන් ඔවුන්
ඔවුන්ගේ සේනාවල ප්‍රකාරයට තුඹ සහ
4 ආරොන්ද ගණන් කරපල්ලා. එක එක
ගෝත්‍රයට එක්කෙනෙකු බැගින් තමන්
පිය පෙළපත්වල ප්‍රධානියෝවූ තැනැත්-
5 තෝද තුඹලා සමග වන්නෝය. තුඹලා
සමග සිටිය යුතු මනුෂ්‍යයන්ගේ නාම
මේය: රූබෙන් ගෝත්‍රයෙන් ෂෙදෙවුර්ගේ
6 පුත්‍රවූ එලිශූර්ය. සිමියොන් ගෝත්‍රයෙන්
7 ශූරිෂද්දයිගේ පුත්‍රවූ ෂෙලුමියෙල්ය. යූද
ගෝත්‍රයෙන් අම්මිනාදබ්ගේ පුත්‍රවූ
8 නාෂොන්ය. ඉස්සාඛර් ගෝත්‍රයෙන්
9 ශූවර්ගේ පුත්‍රවූ නෙතනේල්ය. සාබුලොන්
ගෝත්‍රයෙන් හේලොන්ගේ පුත්‍රවූ එලියාබ්ය.
10 යෝසෙප්ගේ පුත්‍රයන් අතරෙන් එප්‍රායිම්-
ගෙන් අම්මිහුද්ගේ පුත්‍රවූ එලිෂාමා
සහ මනස්සේගෙන් පෙදශූර්ගේ පුත්‍රවූ
11 ගමාලියෙල්ය. බෙන්යමින් ගෝත්‍රයෙන්
ගිදෙයොනිගේ පුත්‍රවූ අබිදන්ය. දන් 12
ගෝත්‍රයෙන් අම්මිෂද්දයිගේ පුත්‍රවූ
අහියේසෙර්ය. ආෂෙර් ගෝත්‍රයෙන් 13
ඔක්‍රාන්ගේ පුත්‍රවූ පගියෙල්ය. ගාද් 14
ගෝත්‍රයෙන් දෙවුයෙල්ගේ පුත්‍රවූ
එලියාසාප්ය. නප්තලී ගෝත්‍රයෙන් 15
ඒනාන්ගේ පුත්‍රවූ අහිරාය. සභාවෙන් 16
කැඳවාගන්නාලද්දෝ මොව්හුය, මොව්හු
තමුන්ගේ පියවරුන්ගේ ගෝත්‍රවල
අධිපතියෝව ඉශ්‍රායෙල් දහස්
ගණන්වලට මූලාදෑනියෝව සිටියෝය.
මෝසෙස් සහ ආරොන් නාම වශයෙන් 17
සඳහන් කරනලද ඒ මනුෂ්‍යයන්
කැඳවාගෙන, දෙවෙනි මාසයේ පළවෙනි 18
දිනදී මුළු සභාව රැස්කෙරෙවූවෝය,
තවද විසිඅවුරුද්ද පටන් ඉන් ඉහළ
වයස් ඇත්තාවූ අය වෙන් වශයෙන්
තමුන්ගේ පවුල් ප්‍රකාර තමුන්ගේ
පිය පෙළපත්වල හැටියට නාම
ගණන ලෙස ලියවුණෝය. **ස්වාමීන්-** 19
**වහන්සේ** මෝසෙස්ට අණ කළ ලෙස
ඔහු සීනයි කාන්තාරයේදී ඔවුන් ගණන්
කෙළේය.

ඉශ්‍රායෙල්ගේ කුලුඳුලාවූ රූබෙන්ගේ 20
පුත්‍රයන්ගෙන් තමුන්ගේ පවුල් ප්‍රකාරයට
තමුන්ගේ පිය පෙළපත්වල හැටියට වෙන්
වශයෙන් නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
රූබෙන්ගේ ගෝත්‍රයෙන් ගණන් කරනු 21
ලැබූ සියලු පිරිමි සතළිස් හදස්
පන්සියයක්ය.

22 සිමියොන්ගේ පුත්‍රයින්ගෙන් තමුන්ගේ
පවුල් ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට ලියවුණාවූ, වෙන් වශයෙන් නාම
ගණන ලෙස ගණන්කරනු ලැබුවාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
23 සිමියොන්ගේ ගෝත්‍රයෙන් ගණන්
කරනු ලැබූ සියලු පිරිමි පනස් නවදස්
තුන්සියයක්ය.
24 ගාද්ගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ පවුල්
ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
25 ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ, ගාද්ගේ
ගෝත්‍රයෙන් ගණන් කරනු ලැබූ සියල්ලෝ
සතළිස් පන්දස් හසිය පනසක්ය.
26 යූදගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ පවුල්
ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
27 ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ, යූදගේ
ගෝත්‍රයෙන් ගණන්කරනු ලැබූ සියල්ලෝ
හැත්තෑ හාරදස් හසියයක්ය.
28 ඉස්සාඛර්ගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ
පවුල් ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
29 ඉස්සාඛර්ගේ ගෝත්‍රයෙන් ගණන්කරනු
ලැබූ සියල්ලෝ පනස් හාරදස්
හාරසියයක්ය.
30 සාබුලොන්ගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ
පවුල් ප්‍රකාර තමුන්ගේ පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ
වයස් ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
31 සාබුලොන්ගේ ගෝත්‍රයෙන් ගණන්කරනු
ලැබූ සියල්ලෝ පනස් හත්දෙස්
හාරසියයක්ය.
32 යෝසෙප්ගේ පුත්‍රයන්ගෙන් එනම්
එප්‍රායිම්ගේ පුත්‍රයන් අතරෙන් තමුන්ගේ
පවුල් ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ, එප්‍රායිම්ගේ 33
ගෝත්‍රයෙන් ගණන්කරනු ලැබූ සියල්ලෝ
සතළිස්දස් පන්සියයක්ය.
මනස්සේගේ පුත්‍රයන් අතරෙන් තමුන්ගේ 34
පවුල් ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
මනස්සේගේ ගෝත්‍රයෙන් ගණන් කරනු 35
ලැබූ සියල්ලෝ තිස් දෙදස් දෙසියයක්ය.
බෙන්යමින්ගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ 36
පවුල් ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ
වයස් ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
බෙන්යමින්ගේ ගෝත්‍රයෙන් ගණන් කරනු 37
ලැබූ සියල්ලෝ තිස් පන්දස් හාරසියයක්ය.
දන්ගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ පවුල් 38
ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ, දන්ගේ 39
ගෝත්‍රයෙන් ගණන්කරනු ලැබූ සියල්ලෝ
හැටදෙදස් හත්සියයක්ය.
ආෂෙර්ගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ පවුල් 40
ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
ආෂෙර්ගේ ගෝත්‍රයෙන් ගණන්කරනු 41
ලැබූ සියල්ලෝ සතළිස් එක්දස්
පන්සියයක්ය.
නප්තලීගේ පුත්‍රයන්ගෙන් තමුන්ගේ පවුල් 42
ප්‍රකාර තමුන්ගේ පිය පෙළපත්වල
හැටියට නාම ගණන ලෙස ලියවුණාවූ,
අවුරුදු විස්ස පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, යුද්ධයට යන හැකිවූ,
නප්තලීගේ ගෝත්‍රයෙන් ගණන්කරනු ලැබූ 43
සියල්ලෝ පනස් තුන්දස් හාරසියයක්ය.

44 මෝසෙස් සහ ආරොන් විසින්ද තම
තමාගේ පිය පෙළපත වෙනුවට සිටිය
මනුෂ්‍යයන් දෙළොස්දෙනා වන ඉශ්‍රායෙල්
අධිපතීන් විසින්ද ගණන්කරනු ලැබුවෝ
45 මොව්හුය. මෙසේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන්
තමුන්ගේ පිය පෙළපත්වල හැටියට
ගණන්කරනු ලැබූ සියල්ලෝ වන අවුරුදු
විස්ස පටන් ඉන් ඉහළ වයස් ඇත්තාවූ,
46 යුද්ධයට යන හැකිවූ, ගණන්කරනු ලැබූ
සියලුම ඉශ්‍රායෙල්වරු සලක්ෂ තුන්දස්
පන්සිය පනස්දෙනෙක්ය.
47 එහෙත් ලෙවීවරු තමුන්ගේ පිය
ගෝත්‍රයේ හැටියට ඔවුන් අතරේ
48 ගණන්කරනු නොලැබුවෝය. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
49 කොට: ලෙවීගේ ගෝත්‍රය පමණක් ගණන්
නොකරන්න, ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ
50 ඔවුන්ගේ ගණන නොගනින්න. එහෙත්
ලෙවීවරුන් සාක්ෂි මණ්ඩපය කෙරෙහිද
එහි සියලුම භාණ්ඩ කෙරෙහිද ඊට
අඩංගු සියල්ල කෙරෙහිද පත්කරපන්න.
ඔව්හු මණ්ඩපයද එහි සියලු භාණ්ඩද
උස්සා ගෙන යන්නෝය; ඔව්හු එහි
මෙහෙය කරමින් මණ්ඩපය හාත්පස
කූඩාරම් ගසාගෙන සිටින්නෝය.
51 මණ්ඩපය ගෙනයන්ට ඕනෑවූ කල
ලෙවීවරු ඒක බාගන්නෝය. මණ්ඩපය
පිහිටුවන්ට ඕනෑවූ කල ලෙවීවරු ඒක
පිහිටුවන්නෝය. අන්‍යයෙක් ළංවුණොත්
52 ඔහු මරනු ලැබිය යුතුය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ තම තමුන්ගේ කඳවුර ළඟද
තම තමුන්ගේ ධජය ළඟද තමුන්ගේ
සේනා ප්‍රකාරයට කූඩාරම් ගසා-
53 ගන්නෝය. එහෙත් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
සභාව කෙරෙහි උදහස නොපැමිණෙන
පිණිස ලෙවීවරු සාක්ෂි මණ්ඩපය
වටකරින් කූඩාරම් ගසා ගන්නෝය.
ලෙවීවරුන්ම සාක්ෂි මණ්ඩපයේ සේවය
54 භාරගත යුතුයයි කීසේක. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ එසේ කළෝය; **ස්වාමීන්වහන්සේ**
මෝසෙස්ට අණකළ සියල්ල ලෙස ඔව්හු
කළෝය.

## කූඩාරම් පිහිටුවාගැනීම සහ ගමන් පිළිවෙළ

2 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
හා ආරොන්ට කථාකොට කියන-
සේක්: ඉශ්‍රායෙල් පුත්‍රයෝ තම තමුන්ගේ 2
පිය පෙළපත්වල විශේෂ ලකුණු ඇති
තම තමුන්ගේ ධජය ළඟ සම්මුඛවීමේ
කූඩාරම ඉදිරිපිට වටකරින් තමුන්ගේ
කූඩාරම් ගසා ගනිත්වා. නැගෙන ඉර 3
පැත්තෙහි කූඩාරම් ගසාගන්නෝනම්
තමුන්ගේ සේනා ප්‍රකාරයට යූදගේ
අන්දයමේ ධජයට අයිති අයය. යූද
පුත්‍රයන්ගේ අධිපතියා අම්මීනාදබ්ගේ
පුත්‍රවූ නාෂොන් වන්නේය. ඔහුගේ 4
සේනාව වන ඔවුන්ගෙන් ගණන් කරන
ලද්දෝ සැත්තෑ හාරදස් හසියයක්ය.
ඊළඟ කූඩාරම් ගසාගන්නෝනම් 5
ඉස්සාබර්ගේ ගෝත්‍රයය. ඉස්සාබර්ගේ
පුත්‍රයන්ට අධිපතියා ශුවර්ගේ පුත්‍රවූ
නෙතනේල් වන්නේය. ඔහුගේ සේනාව 6
වන ඔවුන්ගෙන් ගණන්කරන ලද්දෝ
පනස් හාරදස් හාරසියයක්ය. ඊළඟ
සාබුලොන්ගේ ගෝත්‍රයය. සාබුලොන්ගේ 7
පුත්‍රයන්ගේ අධිපතියා හේලොන්ගේ පුත්‍රවූ
එලියාබ් වන්නේය. ඔහුගේ සේනාව 8
වන ඔවුන්ගෙන් ගණන්කරන ලද්දෝ
පනස් හත්දස් හාරසියයක්ය. යූදගේ 9
කඳවුරෙහි ඔවුන්ගේ සේනාවල හැටියට
ගණන්කරනලද සියල්ලෝ එක්ලක්ෂ
අසූහදස් හාරසියයක්ය. ඔවුන් ප්‍රථම-
කොට පිටත්ව යා යුතුය.
දකුණු පැත්තෙහි තමුන්ගේ සේනාවල 10
හැටියට රූබෙන්ගේ අන්දයමේ ධජයට
අයිති අය සිටිත්වා. රූබෙන්ගේ පුත්‍රයන්ට
අධිපතියා ෂෙදෙයූර්ගේ පුත්‍රවූ එලිශූර්
වන්නේය. ඔහුගේ සේනාව වන ඔවුන්ගෙන් 11
ගණන්කරන ලද්දෝ සතළිස් හදස්
පන්සියයක්ය. ඔහු ළඟ කූඩාරම් ගසා- 12
ගන්නෝනම් සිමියොන්ගේ ගෝත්‍රයය.
සිමියොන්ගේ පුත්‍රයන්ට අධිපතියා ශූරි-
ෂද්දයිගේ පුත්‍රවූ ෂෙලුමියෙල් වන්නේය.
ඔහුගේ සේනාව වන ඔවුන්ගෙන් 13

ගණන්කරනලද්දෝ පනස් නවදස්
14 තුන්සියයක්ය. ඊළඟ ගාද්ගේ ගෝත්‍රයය.
ගාද්ගේ පුත්‍රයන්ට අධිපතියා රෙවුයෙල්ගේ
15 පුත්‍රවූ එලියාසාප් වන්නේය. ඔහුගේ
සේනාව වන ඔවුන්ගෙන් ගණන්-
කරනලද්දෝ සතළිස් පන්දස් හයසිය
16 පනසක්ය. රූබෙන්ගේ අන්දයමෙහි
ඔවුන්ගේ සේනාවල හැටියට ගණන්-
කරනලද සියල්ලෝ එක්ලක්ෂ පනස්
එක්දස් හාරසිය පනසක්ය. ඔවුන්
දෙවනුව පිටත්ව යා යුතුය.
17 එවිට සම්මුඛවීමේ කූඩාරම කඳවුරු
වලට මැදිව ලෙවීවරුන්ගේ අන්දයම
සමග පිටත්ව යන්නේය. ඔව්හු කූඩාරම්
ගසාගන්න පිළිවෙළටම තම තමුන්ගේ
ස්ථානවල සිට තමුන්ගේ ධජවල හැටියට
පිටත්ව යා යුතුය.
18 බස්නාහිර පැත්තෙහි තමුන්ගේ
සේනාවල හැටියට එප්‍රායිම්ගේ අන්දයමේ
ධජයට අයිති අය සිටින්නෝය. එප්‍රායිම්ගේ
පුත්‍රයන්ට අධිපතියා අම්මිහුද්ගේ පුත්‍රවූ
19 එලිෂාමා වන්නේය. ඔහුගේ සේනාව
වන ඔවුන්ගෙන් ගණන්කරනලද්දෝ
20 සතළිස්දස් පන්සියයක්ය. ඊළඟ
මනස්සේගේ ගෝත්‍රයය. මනස්සේගේ
පුත්‍රයන්ට අධිපතියා පෙදශූර්ගේ පුත්‍රවූ
21 ගමාලියෙල්ය. ඔහුගේ සේනාව වන
ඔවුන්ගෙන් ගණන්කරනලද්දෝ තිස්
22 දෙදස් දෙසියයක්ය. ඊළඟ බෙන්යමින්ගේ
ගෝත්‍රයය. බෙන්යමින්ගේ පුත්‍රයන්ට
අධිපතියා ගිදෙයෝනිගේ පුත්‍රවූ අබිදන්
23 වන්නේය. ඔහුගේ සේනාව වන ඔවුන්-
ගෙන් ගණන්කරනලද්දෝ තිස් පන්දස්
24 හාරසියයක්ය. එප්‍රායිම්ගේ කඳවුරෙහි
ඔවුන්ගේ සේනාවල හැටියට ගණන්-
කරනලද සියල්ලෝ එක්ලක්ෂ අටදස්
එකසියයක්ය. ඔවුන් තුන්වෙනුව පිටත්ව
යා යුතුය.
25 උතුරු පැත්තෙහි තමුන්ගේ සේනාවල
හැටියට දන්ගේ අන්දයමේ ධජයට
අයිති අය සිටින්නෝය. දන්ගේ
පුත්‍රයන්ට අධිපතියා අම්මිෂද්දයිගේ පුත්‍රවූ
අහියේසෙර් වන්නේය. ඔහුගේ සේනාව 26
වන ඔවුන්ගෙන් ගණන්කරනලද්දෝ හැට
දෙදස් හත්සියයක්ය. ඊළඟ කූඩාරම් 27
ගසාගන්නෝනම් ආෂෙර්ගේ ගෝත්‍රයය.
ආෂෙර් පුත්‍රයන්ගේ අධිපතියා ඔක්‍රාන්ගේ
පුත්‍රවූ පගීයෙල් වන්නේය. ඔහුගේ සේනාව 28
වන ඔවුන්ගෙන් ගණන්කරනලද්දෝ
සතළිස් එක්දස් පන්සියයක්ය. ඊළඟ 29
නප්තලීගේ ගෝත්‍රයය. නප්තලී පුත්‍රයන්ගේ
අධිපතියා ඒනාන්ගේ පුත්‍රවූ අහිරා
වන්නේය. ඔහුගේ සේනාව වන ඔවුන්ගෙන් 30
ගණන්කරනලද්දෝ පනස් තුන්දස්
හාරසියයක්ය. දන්ගේ අන්දයමෙහි 31
ගණන්කරනලද සියල්ලෝ එක්ලක්ෂ
පනස් හත්දස් හයසියයක්ය. ඔවුන්
තමුන්ගේ ධජවල හැටියට අන්තිමට
පිටත්ව යා යුතුයයි කීසේක.
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් තමුන්ගේ පිය 32
පෙළපත්වල හැටියට ගණන්කරන-
ලද්දෝ මොව්හුය. කඳවුරුවල තමුන්ගේ
සේනාවල හැටියට ගණන්කරනලද
සියල්ලෝ හලක්ෂ තුන්දස් පන්සිය
පනසක්ය. එහෙත් ස්වාමීන්වහන්සේ 33
මෝසෙස්ට අණකළ ලෙස ලෙවීවරු
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ ගණන්-
කරනු නොලැබුවෝය. ස්වාමීන්වහන්සේ 34
මෝසෙස්ට අණකළ සියල්ල ලෙස
ඉශ්‍රායෙල් පුත්‍රයෝ කළෝය. එසේ ඔව්හු
තමුන්ගේ වංශවල ප්‍රකාරයට තමුන්ගේ
පිය පෙළපත් ලෙස තමුන්ගේ ධජවල
හැටියට කූඩාරම් ගසාගත්තෝය, එසේම
නික්ම ගියෝය.

## ආරෝන්ගේ පූජක පෙළපත

3 ස්වාමීන්වහන්සේ සීනයි කන්දේදී
මෝසෙස් සමග කථාකළ දවසෙහි
ආරෝන්ගේ සහ මෝසෙස්ගේ පෙළපත්
මේ ආකාරය. ආරෝන්ගේ පුත්‍රයන්ගේ 2
නාම නම් කුලුඳුලාවූ නාදබ්, අබීහු,
එලෙයාසර්, ඊතාමාර් යන මොව්හුය.
පූජක තනතුරෙහි මෙහෙකරන 3

පිණිස ආරොන් විසින් කැපකරනලද්දවූ
ආලේපලත් පූජකයන් වූ ආරොන්ගේ
4 පුත්‍රයන්ගේ නාම මේය. එහෙත් නාදබ්
සහ අබීහු සීනයි කාන්තාරයේදී
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි අන්‍ය
ගින්නක් ඔප්පුකළ කල්හි **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි මළෝය, ඔවුන්ට
දරුවෝ නොසිටියෝය. එලෙයාසර් සහ
ඊතාමාර් තමුන්ගේ පියවූ ආරොන්
ඉදිරියෙහි පූජක තනතුරේ සේවය කළෝය.

## ලෙවීවරුන් ගණන් කිරීම සහ වෙන් කිරීම

5 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
6 කොට කියනසේක්: ලෙවී ගෝත්‍රය
පූජකයාවූ ආරොන්ට සේවයකරන
පිණිස ඔවුන් ගෙන්වාගෙන ඔහු ඉදිරිපිට
7 සිටවාපන්න. ඔව්හු සම්මුඛවීමේ කූඩාරම
ඉදිරියෙහි ඔහුට සහ මුළු සභාවටත්
සේවය කරමින් මණ්ඩපයේ වැඩ
8 කරත්වා. ඔව්හු සම්මුඛවීමේ කූඩාරමේ
සියලු බඩු රක්ෂාකොට ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ සේවය ඉෂ්ටකරමින්
9 මණ්ඩපයේ වැඩය කරත්වා. ලෙවීවරුන්
ආරොන්ටද ඔහුගේ පුත්‍රයන්ටද දීපන්න.
ඔව්හු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් මුළුමනින්ම
10 ඔහුට දෙනලද්දෝය. ආරොන් සහ
ඔහුගේ පුත්‍රයන් තමුන්ගේ පූජක තනතුර
පවත්වන පිණිස ඔවුන් පත්කරපන්න.
ළංවෙන අන්‍යයා මරනු ලැබිය යුතුයයි
කීසේක.
11 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
12 කොට: බලව, මමම ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙන් ගර්භයේ පළමුවෙනියන් වන
සියලු කුලුඳුලන් වෙනුවට ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙන් ලෙවීවරුන් ගතිමි;
13 ලෙවීවරු මට අයිති වන්නෝය. මක්නිසාද
සියලු කුලුඳුලෝ මාගේය; මා විසින්
මිසර දේශයේ සියලුම කුලුඳුලන්ට
පහරදුන් දවසේදී ඉශ්‍රායෙල්වරුන්
අතරෙහි මනුෂ්‍යයන්ගෙන්ද මෘගයන්-
ගෙන්ද සියලුම කුලුඳුලන් මට
විශුද්ධකර ගතිමි. ඔව්හු මාගේ වන්නෝය;
මම **ස්වාමීන්වහන්සේයයි** කීසේක.
තවද **ස්වාමීන්වහන්සේ** සීනයි 14
කාන්තාරයේදී මෝසෙස්ට කථාකොට:
ලෙවීගේ පුත්‍රයන් ඔවුන්ගේ පිය 15
පෙළපත්වල හැටියට ඔවුන්ගේ වංශවල
ප්‍රකාරයට ගණන්කරපන්න. මසක් පටන්
ඉන් ඉහළ වයස්වූ සියලු පිරිමින් තුඹ
විසින් ගණන්කළ යුතුයයි කීසේක.
මෝසෙස්ද **ස්වාමීන්වහන්සේ** තමාට 16
අණකළ ප්‍රකාර ඔවුන් ගණන්කෙළේය.
නාම වශයෙන් ලෙවීගේ පුත්‍රයෝනම් 17
ගේර්ෂෝන්, කොහාත් සහ මෙරාරීය.
පවුල් වශයෙන් ගේර්ෂෝන්ගේ පුත්‍රයන්ගේ 18
නාම නම් ලිබ්නි සහ ෂිමෙයිය. පවුල් 19
වශයෙන් කොහාත්ගේ පුත්‍රයෝනම්
අම්රාම්, ඉශ්හාර්, හෙබ්‍රොන් සහ
උස්සීයෙල්ය. පවුල් වශයෙන් මෙරාරීගේ 20
පුත්‍රයෝනම් මාළී සහ මූෂිය. තමුන්ගේ
පිය පෙළපත්වල හැටියට ලෙවීවරුන්ගේ
පවුල් මේවාය.
ගේර්ෂෝන්ට ලිබ්නි පවුලද ෂිමෙයි 21
පවුලද අයිතිය. ගේර්ෂෝන්වරුන්ගේ පවුල්
නම් මේවාය. ඔවුන්ගෙන් ගණන්කරනු 22
ලැබූ මසක් පටන් ඉන් ඉහළ වයස්වූ
සියලුම පිරිමින්ගේ ගණනේ හැටියට
හත්දස් පන්සියයක්ය. ගේර්ෂෝන්- 23
වරුන්ගේ පවුල් මණ්ඩපය පිටිපස
අපරදිගින් කූඩාරම් පිහිටුවාගන්නෝය.
ගේර්ෂෝන්වරුන්ගේ පිය පෙළපතේ 24
අධිපතියා නම් ලායෙල්ගේ පුත්‍රවූ
එලියාසාෆ්ය. සම්මුඛවීමේ කූඩාරමෙහි 25
ගේර්ෂෝන් පුත්‍රයන්ගේ භාරයනම්
මණ්ඩපය සහ කූඩාරමද ඒකේ වැස්ම
සහ සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ
කඩතුරාවද, මණ්ඩපය සහ පූජාසනය 26
ළඟ වටකරින් මළුවේ තිරද මළුවේ
දොරකඩ කඩතුරාවද ඒකේ සියලුම
වැඩවලට ඕනෑකරන ලනුද ලබාගැනීමය.
අම්රාම් පවුලද ඉශ්හාර් පවුලද හෙ- 27
බ්‍රොන් පවුලද උස්සීයෙල් පවුලද කො-
හාත්ගෙන් වූවෝය. කොහාත්වරුන්ගේ
පවුල් මේවාය. මසක් පටන් ඉන් ඉහළ 28
වයස්වූ සියලුම පිරිමින්ගේ ගණන අටදස්

හසියයක්ය. ඔව්හු ශුද්ධස්ථානයේ සේවය
29 භාරගත්තෝය. කොහාත් පුත්‍රයන්ගේ
පවුල් මණ්ඩපයට දකුණු පැත්තෙහි
30 කූඩාරම් පිහිටුවාගත්තෝය. කොහාත්-
වරුන්ගේ පවුල්වල පිය පෙළපතේ
අධිපතියානම් උස්සීයෙල්ගේ පුත්‍රවූ
31 එලිශාඵාන්ය. ඔවුන්ගේ භාරය නම්
පෙට්ටියද මේසයද පහන්රුකද පූජාසනද
ශුද්ධස්ථානයෙහි සේවයට ගන්නා
භාජනද කඩතුරාවද ඊට අයිති සියලු
32 වැඩද බලාගැනීමය. පූජකවූ ආරොන්ගේ
පුත්‍රවූ එලෙයාසර් ලෙවීවරුන්ගේ
අධිපතීන්ගේ අධිපතියාව ශුද්ධස්ථානයේ
සේවය භාරගන්නන්ගේ මූලාදෑනියා
වන්නේය.
33 මාලී පවුල සහ මූෂි පවුල මෙරාරීගෙන්
වූවෝය. මෙරාරීවරුන්ගේ පවුල් මේවාය.
34 මොවුන්ගෙන් ගණන්ගනු ලැබූ අය මසක්
පටන් ඉන් ඉහළ වයස් ඇති සියලුම
පිරිමින්ගේ ගණනේ හැටියට හදස්
35 දෙසියයක්ය. මෙරාරීවරුන්ගේ පවුල්වල
පිය පෙළපතේ අධිපතියා නම්
අබිහයිල්ගේ පුත්‍රවූ ශුරියෙල්ය. ඔව්හු
මණ්ඩපයට උතුරු පැත්තෙහි කූඩාරම්
36 පිහිටුවාගත්තෝය. මෙරාරීගේ පුත්‍රයන්ට
නියම භාරයනම් මණ්ඩපයේ ලෑලිද ඒකේ
පොලුද කුළුනුද අඩිද ඒකේ සියලු
උපකරණද ඒකේ මෙහෙයට ගන්නා
37 සියල්ලද; වටකරින් මළුවේ කුළුනුද
ඒවායේ අඩිද ඒවායේ ඇණද ලනුද
38 බලාගැනීමය. නැගෙනහිර පැත්තෙහි
මණ්ඩපයට ඉස්සරහපිටින් නැගෙනහිරට
සම්මුඛවීමේ කූඩාරම ඉදිරිපිට කඳවුරු
බැඳගන්නෝනම් මෝසෙස් හා ආරොන්ද
ඔහුගේ පුත්‍රයෝද වෙත්. ඔව්හු ඉශ්‍රායෙල්
පුත්‍රයන් වෙනුවට ශුද්ධස්ථානයේ සේවය
භාරගන්නෝය; ළංවන්නාවූ අන්‍යයා
39 මරනු ලබන්නේය. මෝසෙස් සහ
ආරොන් විසින් **ස්වාමීන්වහන්සේගේ**
ආඥාව පිට ලෙවීවරුන්ගෙන් ඔවුන්ගේ
පවුල්වල හැටියට ගණන්කරනලද මසක්
පටන් ඉන් ඉහළ වයස් ඇති සියලු
පිරිමි විසිදෙදහසක්ය.

## කුලුඳුලන් මුදගැනීම

**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 40
කොට: මසක් පටන් ඉන් ඉහළ වයස්
ඇති ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු කුලුඳුල්
පිරිමින් ගණන්කොට ඔවුන්ගේ නාම
ගණන ගනින්න. ඉශ්‍රායෙල් පුත්‍රයන් 41
අතරෙහි සියලු කුලුඳුලන් වෙනුවට
ලෙවීවරුන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ගවයන් අතරෙහි සියලු කුලුඳුල් ගවයන්
වෙනුවට ලෙවීවරුන්ගේ ගවයන්ද මට
ගනින්න; මම **ස්වාමීන්වහන්සේයයි**
කීසේක. මෝසෙස්ද **ස්වාමීන්වහන්සේ** 42
තමාට අණකළ ලෙස ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි සියලු කුලුඳුලන් ගණන් කෙළේය.
එසේ ගණන් කරනු ලැබුවාවූ මසක් 43
පටන් ඉන් ඉහළ වයස් ඇති සියලු
කුලුඳුල් පිරිමි නාම ගණනේ හැටියට
විසි දෙදස් දෙසිය සැත්තෑ තුන්දෙනෙක්ය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 44
කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන් 45
අතරෙහි සියලු කුලුඳුලන් වෙනුවට
ලෙවීවරුන්ද ඔවුන්ගේ ගවයන් වෙනුවට
ලෙවීවරුන්ගේ ගවයන්ද ගනින්න.
ලෙවීවරු මාගේ වන්නෝය; මම
**ස්වාමීන්වහන්සේය.** ලෙවීවරුන්ගේ 46
ගණනට වැඩිව සිටින්නාවූ ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ කුලුඳුලන් දෙසිය සැත්තෑ
තුන්දෙනාගේ මිදීම පිණිස, එක් එක්- 47
කෙනා වෙනුවට ෂෙකෙල් පහක් බැගින්
ගනින්න; ශුද්ධස්ථානයේ ෂෙකෙලේ
හැටියට ෂෙකෙලට ගේරා විස්සක් බැගින්
ගනින්න. මුදනු ලබන්ට සිටින්නන්ගේ 48
වැඩිපුර ගණනින් ලත් මුදල ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන්ට දීපන්නැයි
කීසේක. මෝසෙස්ද ලෙවීවරුන් විසින් 49
මුදනු ලැබූවන්ට වඩා වැඩිව සිටියන්ගේ
මිදීමේ මිල ගත්තේය. ඔහු ඉශ්‍රායෙල් 50
පුත්‍රයන්ගේ කුලුඳුලන්ගෙන් ශුද්ධස්ථානයේ
ෂෙකෙල් ගණනට ෂෙකෙල් එක්දස්
තුන්සිය හැටපහක් මුදල ගෙන, ඒ මුදනු 51
ලැබූවන්ගේ මුදල **ස්වාමීන්වහන්සේගේ**
වචනය ප්‍රකාරයට **ස්වාමීන්වහන්සේ**

මෝසෙස්ට අණකළ ලෙස ආරොන්ටද
ඔහුගේ පුත්‍රයන්ටද දුන්නේය.

## ලෙවීගේ තුන්වංශයේ මෙහෙය

4 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට සහ
2 ආරොන්ට කථාකොට: ලෙවීගේ
පුත්‍රයන් අතරෙන් ඔවුන්ගේ පවුල් ප්‍රකාර
3 ඔවුන්ගේ පිය පෙළපත් ලෙස, තිස්
අවුරුද්ද පටන් පනස් අවුරුද්ද දක්වා
වයස් ඇති, සම්මුඛවීමේ කූඩාරමෙහි
වැඩ කරන පිණිස සේවයට ඇතුල්වන
කොහාත්ගේ සියලුම පුත්‍රයන්ගේ ගණන
4 ගනිල්ලා. අති ශුද්ධ දේ ගැන සම්මුඛවීමේ
කූඩාරමෙහි කොහාත් පුත්‍රයන්ගේ
5 මෙහෙය නම් මේය: කඳවුර නික්මෙන
කල ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ
අවුත් වහන තිරය බාගෙන එයින් සාක්ෂි
6 පෙට්ටිය වසා, ඒක පිට තහෂ් හම්
වැස්මක් දමා, ඒ පිට මුළුල්ලම නිල්වත්
රෙද්දක් අතුරා ඒකේ පොලු තබත්වා.
7 පිදීමේ රොටි මේසය පිටත් නිල් රෙද්දක්
අතුරා ඒ මතුයෙහි තැටිද පාත්‍රද
කෙණ්ඩිද වත්කරන කුසලාන්ද තබත්වා.
නිරන්තර රොටිත් එය පිට තිබේවා.
8 ඔව්හු ඒවා පිට රතු රෙද්දක් අතුරා
ඒක තහෂ් හම් වැස්මකින් වසා ඒකේ
9 පොලු තබත්වා. ඔව්හු නිල් රෙද්දක්
ගෙන පහන්රුකද ඒකේ පහන්ද ඒකේ
කතුරුද කතුරු තැටිද ඊට ගන්න සියලු
10 තෙල් භාජනද වසා, ඒකද ඒකේ
සියලු භාජනද තහෂ් හම් වැස්මක
11 දමා මැස්ස පිට තබත්වා. රන් පූජාසනය
පිට නිල් රෙද්දක් අතුරා තහෂ්
හම් වැස්මකින් ඒක වසා ඒකේ
12 පොලු තබත්වා. ඔව්හු ශුද්ධස්ථානයෙහි
සේවයට ගන්න සියලු භාජන ගෙන
නිල් රෙද්දක තබා තහෂ් හම් වැස්මකින්
13 ඒවා වසා මැස්ස පිට තබත්වා. ඔව්හු
පූජාසනයෙන් අළු පහකොට ඒක පිට
14 රත්නිල් රෙද්දක් අතුරා, ඒක පිට සේවය
කිරීමට ගන්න ඒකේ සියලු භාජන
එනම් ගිනි භාජනද මස් කොකුද
පාත්‍රද තලිද යන පූජාසනයේ සියලුම
බඩු ඒක පිට තබා තහෂ් හම් වැස්මක්
ඒක පිට අතුරා ඒකේ පොලු තබත්වා.
කඳවුර පිටත්වන කල, ආරොන් සහ 15
ඔහුගේ පුත්‍රයන් ශුද්ධස්ථානය සහ
ශුද්ධස්ථානයේ සියලු බඩුද වසා
නිමකළ පසු, කොහාත්ගේ පුත්‍රයෝ ඒක
ගෙනයන පිණිස එත්වා. එහෙත් ඔව්හු
නොනස්නා පිණිස ශුද්ධස්ථානයට අත-
නොගසත්වා. සම්මුඛවීමේ කූඩාරමෙහි
කොහාත්ගේ පුත්‍රයන්ට ගෙනයන්ට
තිබෙන්නේ මේවාය. පූජක ආරොන්ගේ 16
පුත්‍රවූ එලෙයාසර්ගේ භාරය නම්, එළිය
පිණිස තෙල්ද සුගන්ධ ධූප ද්‍රව්‍යද
නිරන්තර ආහාර පූජාවද ආලේප
තෛලයද ශුද්ධස්ථානය හා ඒකේ
සියලුම බඩු ඇතුළුව මුළු මණ්ඩපයද
එහි ඇති සියල්ලද බලාගැනීමයයි
කීසේක.
තවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 17
සහ ආරොන්ට කථාකොට: කොහාත්- 18
වරුන්ගේ පවුල්වල ගෝත්‍රය ලෙවීවරුන්
අතරෙන් නාස්තිවෙන්ට ඉඩ නැර, ඔවුන් 19
අති ශුද්ධ දේවලට ළඟාවන කල්හි
නොනැසී ජීවත්ව සිටින පිණිස ඔවුන්
ගැන මෙසේ කරපල්ලා—ආරොන් සහ
ඔහුගේ පුත්‍රයෝ ඇතුල්ව ඔවුන් ඒක
එකා තම තමාගේ මෙහෙයටත් ගෙන-
යන බරටත් පත්කරත්වා. එහෙත් 20
ඔව්හු නොනස්නා පිණිස මොහොත-
කටවත් ශුද්ධස්ථානය බලන්ට ඇතුල්
නොවෙත්වයි කීසේක.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 21
කොට කියනසේක්: ගේර්ෂොන් 22
පුත්‍රයන්ගේ ගණනත් ඔවුන්ගේ පිය
පෙළපත්වල හැටියට ඔවුන්ගේ පවුල්වල
ප්‍රකාර ගනින්න; තිස් අවුරුද්ද පටන් 23
පනස් අවුරුද්ද දක්වා වයස් ඇති,
සම්මුඛවීමේ කූඩාරමෙහි වැඩකරන
පිණිස සේවයට ඇතුල්වන්නාවූ සියල්ලන්
ගණන්කරපන්න. මෙහෙකිරීමෙනුත් බර 24
ගෙනයාමෙනුත් ගේර්ෂොන්වරුන්ගේ
පවුල්වලට කරන්ට තිබෙන සේවය
මෙසේය—ඔව්හු මණ්ඩපයේ තිරද 25

සම්මුඛවීමේ කූඩාරමද ඒකේ වැස්මද
එය පිට උඩින් තිබෙන තහෂ් හම් වැස්මද
සම්මුඛවීමේ කූඩාරමේ දෙරකඩ
26 කඩතුරාවද, මළුවේ තිරද මණ්ඩපයටත්
පූජාසනයටත් හාත්පසින් මළුවේ දොරටුවේ
කඩතුරාවද ඒවායේ ලනුද ඒවායේ වැඩට
ගන්නා සියලු බඩුද ගෙනයත්වා, ඒවායින්
කිරීමට තිබෙන සියල්ලද ඔව්හු කරත්වා.
27 ගේර්ෂෝන්වරුන්ගේ පුත්‍රයන්ට ගෙන-
යන්ටත් කරන්ටත් තිබෙන සියල්ල වන
ඔවුන්ගේ මුළු මෙහෙය ආරොන්ගේද
ඔහුගේ පුත්‍රයන්ගේද ආඥාවේ හැටියට
ඔව්හු කරත්වා. ඔවුන්ට ගෙනයන්ට
තිබෙන සියල්ලම ඔවුන්ට නියම-
28 කරදීපල්ලා. සම්මුඛවීමේ කූඩාරම
පිළිබඳව ගේර්ෂෝන් පුත්‍රයන්ගේ පවුල්වල
මෙහෙය මේය; ඔවුන්ගේ භාරය පූජක
ආරොන්ගේ පුත්‍රවූ ඊතාමාර් යටතේය.
29 මෙරාරීගේ පුත්‍රයන් ඔවුන්ගේ පවුල්වල
ප්‍රකාරයට ඔවුන්ගේ පිය පෙළපත්වල
30 හැටියට ගණන්කරපන්න; තිස් අවුරුද්ද
පටන් පනස් අවුරුද්ද දක්වා වයස් ඇති
සම්මුඛවීමේ කූඩාරමෙහි වැඩකරන
පිණිස සේවයට ඇතුල්වන්නාවූ සියල්ලන්
31 ගණන්කරපන්න. සම්මුඛවීමේ කූඩාරමෙහි
ඔවුන්ගේ මුළු මෙහෙයේ හැටියට ඔවුන්ට
ගෙනයන්ට තිබෙන දේවල භාරය මේය:
මණ්ඩපයේ ලෑලිද ඒකේ පොලුද ඒකේ
32 කුළුනුද ඒවායේ අඩිද, වටකරින් තිබෙන
මළුවේ කුළුනුද ඒවායේ අඩිද ඒවායේ
ඇණද ලනුද ඒවායේ සියලුම බඩුද
ඒවාට අයිති සියල්ලද යන මේවාය.
ඔවුන් විසින් ගෙන යා යුතු උපකරණ
33 නම් වශයෙන් ගණන්කරදීපල්ලා. පූජක
ආරොන්ගේ පුත්‍රවූ ඊතාමාර්ගේ අත
යටතේ සම්මුඛවීමේ කූඩාරම ගැන
තිබෙන මෙරාරීගේ පුත්‍රයන්ගේ පවුල්වල
මුළු වැඩේ හැටියට ඔවුන්ගේ මෙහෙය
මේයයි කීසේක.
34 මෙසේ මෝසෙස් හා ආරොන්ද
සභාවේ අධිපතියෝද තිස් අවුරුද්ද
පටන් පනස් අවුරුද්ද දක්වා වයස්
ඇත්තාවූ, සම්මුඛවීමේ කූඩාරමෙහි
වැඩකරන පිණිස සේවයට ඇතුල්-
වෙන්නාවූ, කොහාත්වරුන්ගේ සියලුම 35
පුත්‍රයන් ඔවුන්ගේ පවුල්වල ප්‍රකාරයට
ඔවුන්ගේ පිය පෙළපත්වල හැටියට
ගණන්කළෝය. තමුන්ගේ පවුල් ප්‍රකාර 36
ඔවුන්ගෙන් ගණන්කරනලද්දෝ දෙදස්
හත්සිය පනසක්ය. **ස්වාමීන්වහන්සේ** 37
මෝසෙස් ලවා අණකෙරෙවූ ලෙස
කොහාත්වරුන්ගේ පවුල්වලින් සම්මුඛ-
වීමේ කූඩාරමෙහි මෙහෙකළාවූ,
මෝසෙස් හා ආරොන් විසින් ගණන්-
කරන ලද්දවූ සියල්ලෝ මොව්හුය.
ගේර්ෂොන් පුත්‍රයන්ගේද තිස් අවුරුද්ද 38
පටන් පනස් අවුරුද්ද දක්වා වයස්
ඇති, සම්මුඛවීමේ කූඩාරමෙහි වැඩ 39
කරන පිණිස සේවයට ඇතුල්වෙන්නාවූ
සියල්ලෝ තමුන්ගේ පවුල් ප්‍රකාරයට
තමුන්ගේ පිය පෙළපත්වල හැටියට
ගණන්කරනු ලැබුවෝය. එසේ තමුන්ගේ 40
පවුල්වල ප්‍රකාරයට තමුන්ගේ පිය
පෙළපත්වල හැටියට ගණන්කරනලද්දෝ
දෙදස් හයසිය තිහක්ය. **ස්වාමීන්-** 41
**වහන්සේගේ** අණ ලෙස මෝසෙස් සහ
ආරොන් විසින් ගණන්කරනු ලැබුවාවූ,
සම්මුඛවීමේ කූඩාරමෙහි මෙහෙකළාවූ,
ගේර්ෂොන්ගේ පුත්‍රයන්ගේ පවුල්වලින්
ගණන්කරනලද සියල්ලෝ මොව්හුය.
මෙරාරීගේ පුත්‍රයන්ගේ පවුල්වලින්ද තිස් 42
අවුරුද්ද පටන් පනස් අවුරුද්ද දක්වා
වයස් ඇත්තාවූ, සම්මුඛවීමේ කූඩාරමෙහි 43
වැඩකරන පිණිස ඇතුල්වෙන්නාවූ
සියල්ලෝ තමුන්ගේ පවුල්වල ප්‍රකාරයට
තමුන්ගේ පිය පෙළපත්වල හැටියට
ගණන්කරනු ලැබුවෝය. එසේ තමුන්ගේ 44
පවුල්වල ප්‍රකාරයට ගණන්කරනලද
ඔවුන් තුන්දස් දෙසියයක්ය. **ස්වාමීන්-** 45
**වහන්සේ** මෝසෙස් ලවා දුන් අණ ලෙස
මෝසෙස් සහ ආරොන් විසින් ගණන්-
කළාවූ, මෙරාරීගේ පුත්‍රයන්ගේ පවුල්වලින්
ගණන්කරනලද්දෝ මොව්හුය.

46 තිස් අවුරුද්ද පටන් පනස් අවුරුද්ද
දක්වා වයස් ඇත්තාවූ, තමුන්ගේ පවුල්වල
ප්‍රකාරයට තමුන්ගේ පිය පෙළපත්වල
47 හැටියට ගණන්කරනු ලැබුවාවූ, මෝසෙස්
සහ ආරොන්ද ඉශ්‍රායෙල් අධිපතීන්ද
විසින් ගණන්කළාවූ සියලුම ලෙවීවරු
48 වන, සම්මුඛවීමේ කූඩාරමෙහි මෙහෙයේ
වැඩද බර ගෙනයාමේ වැඩද කිරීමට
ඇතුල්වුණාවූ ගණන්කරනු ලැබුවෝ
49 අටදහස් පන්සිය අසූවක්ය. **ස්වාමීන්-**
**වහන්සේගේ** අණ ලෙස ඔවුන් සියල්ලෝ
එකිනෙකාගේ මෙහෙයත් ගෙනයන බරත්
ලෙස මෝසෙස් විසින් ගණන්කරනු
ලැබුවෝය. මෙසේ **ස්වාමීන්වහන්සේ**
මෝසෙස්ට අණකළ ලෙස ඔව්හු
ගණන්කරන ලද්දෝය.

## අන්දයම අපවිත්‍රවීම පිළිබඳ අණපනත්

**5** තවද **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට කියනසේක්: සියලු
කුෂ්ඨරෝගීන්ද ප්‍රමේහයක් ඇති
සියල්ලන්ද මෘත ශරීරයකින් අපවිත්‍රව
සිටින සියල්ලන්ද කඳවුරෙන් පිටතට
යවන්ට ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අණ-
3 කරපන්න. එසේ ගැනු පිරිමි දෙගොල්ල
යවාපල්ලා; මා ඔවුන්ගේ කඳවුරු මැද
වාසයකරන බැවින් ඔවුන් ඒවා අපවිත්‍ර
නොකරන පිණිස ඔවුන් කඳවුරෙන්
පිටතට යවාපල්ලායයි කීසේක.
4 ඉශ්‍රායෙල් පුත්‍රයෝ එසේ කොට ඔවුන්
කඳවුරෙන් පිටතට ඇරියෝය. **ස්වාමීන්-**
**වහන්සේ** මෝසෙස්ට කී ලෙසම ඉශ්‍රායෙල්
පුත්‍රයෝ කළෝය.
5 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
6 කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
මෙසේ කියාපන්න—පුරුෂයෙක් හෝ
ස්ත්‍රියෙක් හෝ මනුෂ්‍යයන් විසින් කරන
කොයියම් පාපයක් තුමූත් කර **ස්වාමීන්-**
**වහන්සේට** විරුද්ධව අපරාධයක්
කළොත් එසේ ඒ අය වරදකාරයන්
7 වුණාම, ඔවුන් කළාවූ තමුන්ගේ පාපය
කියාදිය යුතුය. තවද ඔහු තමා
කළ අලාභයේ මුළු ගණනම ගෙවා
එයින් පහෙන් කොටසක් ඊට එකතු
කර ඔහුගෙන් අලාභ වින්ද තැනැත්තාට
දේවා. තුමූත් වන්දියේ ගණන ලබන්ට 8
ඒ මනුෂ්‍යයාට නෑයෙක් නැත්නම් වරද
ගැන තමා උදෙසා සමගිකමක් කිරීමට
වරදකාරයා දෙන බැටළුවා හැර
**ස්වාමීන්වහන්සේට** දෙන වන්දියේ
ගණනත් පූජකයාට වන්නේය. ඉශ්‍රායෙල් 9
පුත්‍රයන්ගේ සියලු ශුද්ධ දේවලින්
පූජකයා වෙතට ගෙනෙන එසවීමේ පූජා
සියල්ලත් ඔහුට වන්නේය. එක එක 10
මනුෂ්‍යයාගේ විශුද්ධ දේ ඔහුට වන්නේය.
යම් මනුෂ්‍යයෙක් පූජකයාට දෙන කොයි
දේත් ඔහුට වන්නේයයි කියාපන්නැයි
කීසේක.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 11
කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 12
කථාකර ඔවුන්ට මෙසේ කියාපන්න—
යම් මනුෂ්‍යයෙකුගේ භාර්යාව අහක්ව
ඇගේ පුරුෂයාට විරුද්ධව වැරද්දක්
කර, පුරුෂයෙක් ඈ සමග සයනය 13
කරන්නේ නම්, එය ඇගේ පුරුෂයාගෙන්
සැඟවී රහස්ව තිබේ නම්, ඈ අපවිත්‍රව
සිටින නමුත් ඈට විරුද්ධ සාක්ෂියක්
නැත්තේවී නම්, ඈ වරද කරද්දී
අසුනොවීනම්, ඈ අපවිත්‍රව සිටිද්දී ඔහු 14
කාමක්‍රෝධ ගතියට පැමිණ තමාගේ
භාර්යාව ගැන ශංකා සිතන්ටත් එසේ
නැත්නම් ඈ අපවිත්‍ර නොවී සිටිද්දී ඔහු
කාමක්‍රෝධ ගතියකට පැමිණ තමාගේ
භාර්යාව ගැන ශංකා සිතන්ටත්
යෙදුණේවීනම්, ඒ මනුෂ්‍යයා තමාගේ 15
භාර්යාව පූජකයා වෙතට කැඳවාගෙන
ඒවා, ඈ උදෙසා ඇගේ පූජාව පිණිස
යව පිටි ඒඵාවකින් දසයෙන් කොටසක්
ගෙනේවා; ඒක ශංකා ආහාර
පූජාවක් වන වරද සිහිකරවන සිහිවීමේ
ආහාර පූජාවක් නිසා ඔහු ඒවා
පිට කිසි තෙලක් වත්නොකෙරේවා, ඒවා
පිට තුවරලාද නොදමාවා. එවිට 16
පූජකයා ඈ කැඳවාගෙන ඇවිත්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඈ සිටුවා,

17 මැටි භාජනයකට ශුද්ධ වතුර ගෙන,
මණ්ඩප භූමියෙහි තිබෙන ධූලියෙන්
18 ටිකක් අරන් වතුරේ දමා, **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි ඒ ස්ත්‍රිය සිටුවා,
ඇගේ හිසකේ ලිහවා, ඒ ශංකා ආහාර
පූජාව වන සිහිවීමේ පූජාව ඇගේ අත්වල
තබා, ශාපය උපදවන තික්ත වතුර
19 තමාගේ අතේ තබාගෙන, ඈ දිවුරවමින්
ඈට කථාකොට: නුඹේ පුරුෂයා යටතේ
සිටිනාතර කිසි පුරුෂයෙකු නුඹ සමග
සයනය නොකළානම්, නුඹ අපවිත්‍රකමට
අහක්ව නොගියානම්, ශාපය උපදවන
මේ තික්ත වතුරෙන් නුඹට අන්තරා
20 නොවේවා. එහෙත් නුඹේ පුරුෂයා
යටතේ සිටියදී නුඹ අහක්ව ගොස්
කිලුටුවීනම්, නුඹේ පුරුෂයා හැර
වෙන යම් මනුෂ්‍යයෙකු නුඹ සමග
21 සයනයකෙළේනම්, **ස්වාමීන්වහන්සේ**
නුඹේ කළවය ක්ෂයවීයන්ටත් නුඹේ බඩ
ඉදිමෙන්ටත් සැලැස්වීමෙන් **ස්වාමීන්-
වහන්සේ** නුඹේ සෙනඟ අතරෙහි නුඹ
ශාපයක්ද දෙස් කීමක්ද කරනසේක්වා.
22 බඩ ඉදිමෙන ලෙසද කළවය ක්ෂයවී
යන ලෙසද ශාපය උපදවන මේ වතුර
නුඹේ බඩවැල තුළට යන්නේයයි ශාප
දිවුරුමෙන් ස්ත්‍රිය දිවුරවාවා. ස්ත්‍රීද
23 *ආමෙන්, ආමෙන්යයි කියාවා. එවිට
පූජකයා මේ ශාප පොතක ලියා එය
24 තික්ත වතුරට සෝද දමා, ශාපය
උපදවන තික්ත වතුර ඒ ස්ත්‍රියට බොන්ට
දේවා. ශාපය උපදවන වතුර ඈ
25 තුළට පැමිණ තික්තවන්නේය. පූජකයාද
ඒ ශංකා ආහාර පූජාව ස්ත්‍රියගේ
අතින් ගෙන **ස්වාමීන්වහන්සේ** ඉදිරිපිට
තේව්කොට පූජාසනය ළඟට ගෙනවුත්,
26 ආහාර පූජාවේ සිහිවීමේ කොටසක්
කොට එයින් අහුරක් ගෙන පූජාසනය
පිට දවාවා, පසුව ඔහු ඒ වතුර
27 ස්ත්‍රියට බොන්ට සලස්වාවා. එවිට ඈ
කිලුටුව සිටීනම්, ඇගේ පුරුෂයාට
විරුද්ධව වැරැද්දක් කර තිබේනම්,
ඔහු ඒ වතුර ඈට බොන්ට සැලැස්සු-
වායින් පසු ශාපය උපදවන ඒ වතුර
තික්තවන පිණිස ඈ තුළට පැමිණ ඇගේ
බඩ ඉදිමෙන්ටත් ඇගේ කළවය
ක්ෂයවීයන්ටත් යෙදී ඒ ස්ත්‍රී ඇගේ
සෙනඟ අතරෙහි ශාපයක් වන්නීය.
තුමුත් ඒ ස්ත්‍රී කිලුටු නොව පවිත්‍රව 28
සිටීනම්, ඈ උපද්‍රවයෙන් බේරී ගර්භිණී
වන්නීය. කාමශංකාව පිළිබඳ ව්‍යවස්ථාව 29
මේය: ස්ත්‍රියෙක් තමාගේ පුරුෂයා යටතේ
සිටිනාතර අහක්ව ගොස් කිලුටුවූ කල
හෝ, මනුෂ්‍යයෙක් කාමක්‍රෝධ ගතියකට 30
පැමිණ තමාගේ භාර්යාව ගැන ශංකා
සිතන්ට යෙදුණු කල හෝ, ඈ ඔහු
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි සිටවන්නේය,
පූජකයාද මේ මුළු ව්‍යවස්ථාව ඈ
කෙරෙහි ඉෂ්ටකරන්නේය. එවිට ඒ 31
මනුෂ්‍යයා අයුතුකමෙන් නිදහස්
වන්නේය, ඒ ස්ත්‍රීද ඇගේ අයුතුකම
දරන්නීයයි කීසේක.

## නසරීයයන් සම්බන්ධ අණපනත්

**6** **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
කථාකොට කියනසේක්: ඉශ්‍රායෙල් 2
පුත්‍රයන්ට කථාකරමින් ඔවුන්ට
මෙසේ කියාපන්න–පුරුෂයෙක් හෝ
ස්ත්‍රියෙක් හෝ **ස්වාමීන්වහන්සේට**
කැපවී සිටීම පිණිස භාරයක් එනම්
නසරීයයෙකුගේ භාරයක් වෙන කල,
ඔහු මුද්‍රිකපානයෙන්ද මද්‍යපානයෙන්ද 3
වැලකී සිටිය යුතුය; ඔහු මුද්‍රික කාඩිවත්
මද්‍යපාන කාඩිවත් නොබිව යුතුය, මුද්‍රික
ඵලවලින් සාදන කිසි බීමක්ද නොබිව
යුතුය, අමු මුද්‍රික ඵල හෝ වේළුණ
මුද්‍රික ඵල හෝ නොකෑ යුතුය. ඔහු 4
තමාගේ කැපවී සිටීමේ සියලු දවස්වල
මදේ පටන් ලෙල්ල දක්වා මුද්‍රික
වැළෙන් සාදන කිසි දෙයක් නොකා සිටිය
යුතුය. ඔහු තමාගේ කැපව සිටීමේ 5
භාරයේ සියලු දවස්වල ඔහුගේ හිසෙහි
කිසි දැළිපිහියක් නොතිබිය යුතුය. ඔහු
**ස්වාමීන්වහන්සේට** වෙන්ව සිටින දවස්
සම්පූර්ණවන තෙක් ශුද්ධව සිටින්නේය,

*එනම්, එසේමය.

තමාගේ හිසකේ වැඬෙන්ට හරින්නේය.
6 ඔහු **ස්වාමීන්වහන්සේට** කැපවී සිටින
සියලු දවස්වල මෘත ශරීරයක් ළඟට
7 නොයා යුතුය. ඔහු තමාගේ පියා තුමුත්
මවු තුමුත් සහෝදරයා තුමුත් සහෝදරී
තුමුත් මැරුණු කල ඔවුන් නිසා අපවිත්‍ර
නොවිය යුතුය. මක්නිසාද ඔහුගේ
දෙවියන්වහන්සේට කැපව සිටීමේ හාරය
8 ඔහුගේ හිස පිට තිබේ. ඔහු කැපව
සිටින සියලු දවස්වල ඔහු **ස්වාමීන්-**
9 **වහන්සේට** ශුද්ධය. තුමුත් ඔහුගේ කැපවූ
හිස අපවිත්‍රවෙන පරිද්දෙන් යමෙක් ඔහු
ළඟ ඉතා හදිසියෙන් මළොත්, ඔහු
පිරිසිදුවෙන දවසේ එනම් සත්වෙනි දවසේ
10 තමාගේ හිස බූගා ගනීවා. අටවෙනි
දවසෙහි ඔහු කොබෙයියන් දෙන්නෙක්
හෝ පරෙවි පැටවුන් දෙන්නෙක් හෝ
සම්මුඛවීමේ කූඩාරමේ දෙරකඩට
11 පූජකයා වෙතට ගෙනේවා. පූජකයාද
එකෙකු පාප පූජාවක් පිණිසද අනිකා
දවන පූජාවක් පිණිසද ඔප්පුකර, මෘත
ශරීරය නිසා ඔහු වරදකළ බැවින්, ඔහු
උදෙසා සමගිකම් කරාවා, ඔහු එමදම
12 කැපව හිස පිරිසිදුකරගනීවා. ඔහු
තමාගේ වෙන්ව සිටීමේ දවස් **ස්වාමීන්-**
**වහන්සේට** වෙන්කොට වරද පූජාවක්
වශයෙන් එක් අවුරුදු බැටළු පැටවෙකු
ගෙනේවා. එහෙත් ඔහුගේ කැපව සිටීම
කිලුටුවූ නිසා පළමු දවස් අවලංගු
වන්නේය.

13 නසරීයයාගේ කැපව සිටීමේ දවස්
සම්පූර්ණවූ කල ඔහු ගැන ව්‍යවස්ථාව
මේය: ඔහු සම්මුඛවීමේ කූඩාරමේ
14 දෙරකඩට පමුණුවනු ලැබ, තමාගේ
පූජාව වන දවන පූජාවක් පිණිස කැලල්
නැති එක් අවුරුදු බැටළුපැටවෙකුද පාප
පූජාවක් පිණිස කැලල් නැති එක් අවුරුදු
බැටළුවැස්සියෙකුද ශාන්ති පූජා පිණිස
15 කැලල් නැති බැටළුවෙකුද, මුහුන් නැති
රොටි පෙට්ටියක් වන තෙල් මුසු
සිහින් පිටියෙන් සෑදූ රොටිද තෙල්
ගැවාවූ මුහුන් නැති පූපද උන්ගේ
ආහාර පූජාවද උන්ගේ බොන පූජාද
**ස්වාමීන්වහන්සේට** ඔප්පුකරාවා. පූජ- 16
කයාද ඒවා **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
ඔප්පුකරමින් ඔහුගේ පාප පූජාව සහ
දවන පූජාව පූජාකොට, **ස්වාමීන්-** 17
**වහන්සේට** ශාන්ති පූජා යාගයක් වෙන
පිණිස මුහුන් නැති රොටි පැස සමග
බැටළුවාද පූජාකෙරේවා. තවද පූජකයා
උගේ ආහාර පූජාවත් පාන පූජාවත්
ඔප්පුකෙරේවා. නසරීයයාද සම්මුඛවීමේ 18
කූඩාරමේ දෙරකඩදී තමාගේ කැපවීමේ
හිස බූගා ඒ ඔහුගේ කැපවූ හිසකේ
ගෙන ශාන්ති පූජා යාගය යට තිබෙන
ගින්නෙහි දමාවා. පූජකයා බැටළුවාගේ 19
පිසනලද ඉස්සරහ ගාතය සහ පැසෙන්
මුහුන් නැති එක රොටියක්ද මුහුන් නැති
සිහින් පූපයක්ද ගෙන ඒවා නසරීයයා
තමාගේ කැපවීමේ හිස බූගැවායින් පසු
ඔහුගේ අත් පිට තබා, ඒවා **ස්වාමීන්-** 20
**වහන්සේ** ඉදිරියෙහි තේව පූජාවක් පිණිස
තේව කෙරේවා; තේව ළැපැත්ත සහ
එසවීමේ කළවයද සමග මේකත්
පූජකයාට ශුද්ධය. එයින් පසු නසරීයයාට
මුද්‍රිකපානය බොන්ට පුළුවන. තමා විසින් 21
සපයා දිය හැකි දෙය හැර තමාගේ
කැපවීම ගැන **ස්වාමීන්වහන්සේට**
පූජාවක් කරන හැටියට හාරයක්
වෙන්නාවූ නසරීයයා ගැන තිබෙන
ව්‍යවස්ථාව මේය. ඔහු වෙන්නාවූ හාරය
ලෙස තමාගේ කැපවීමේ ව්‍යවස්ථාව
ප්‍රකාර ඔහු විසින් කළ යුතුමයයි
කීසේක.

## ඉශ්‍රායෙල් කෙරෙහි පූජක ආශීර්වාදය

තවද **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට 22
කථාකොට කියනසේක්: ආරොන්ට සහ 23
ඔහුගේ පුත්‍රයන්ට කථාකරමින්-තුඹලා
මේ ආකාරයෙන් කියා ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට ආශීර්වාදකරපල්ලායයි ඔවුන්ට
කියාපන්න:

**ස්වාමීන්වහන්සේ** තුඹට ආශීර්වාද 24
කොට තුඹ ආරක්ෂාකරනසේක්වා.

25 ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ
කෙරෙහි බබළවා නුඹට කරුණා කරන-
සේක්වා.
26 ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ
කෙරෙහි ඔසවා නුඹට සමාදනය දෙන-
සේක්වා.
27 මෙසේ ඔව්හු මාගේ නාමය ඉශ්‍රායෙල්
පුත්‍රයන් පිට තබත්වා; මමද ඔවුන්ට
ආශීර්වාදකරන්නෙමියි කීසේක.

## අධිපතීන් දෙළොස්දෙනාගේ පඩුරු

7 තවද මෝසෙස් මණ්ඩපය පිහිටුවීම
නිමවා ඒක ආලේපකොට ඒක
විශුද්ධකොට ඒකේ සියලු බඩුත්
පූජාසනය හා ඒකේ සියලු භාජනත්
ආලේපකොට ඒවා විශුද්ධකළ දවසේදී,
2 තම තමුන්ගේ පිය පෙළපත්වලට
ප්‍රධානියෝ වන ඉශ්‍රායෙල්හි අධිපතියෝ
පඩුරු ඔප්පුකළෝය; මොව්හු ගෝත්‍රයන්
කෙරෙහි අධිපතිවූවෝය, මොව්හු
ගණන්කරනලද්දවුන් කෙරෙහි මුලා-
3 දැනියෝව සිටියෝය. මොව්හු තමුන්ගේ
පඩුර ස්වාමීන්වහන්සේ ඉදිරියට
ගෙනැවිත් අධිපතීන් දෙදෙනෙකු විසින්
ගැළක්ද එක්කෙනෙකු විසින් ගවයෙක්ද
බැගින් අඹරාව ඇති ගැල් හයක් සහ
ගවයන් දොළොස් දෙනෙකුත් මණ්ඩපය
4 ඉදිරියෙහි ඔප්පුකළෝය. ස්වාමීන්-
වහන්සේ මෝසෙස්ට කථාකොට:
5 සම්මුඛවීමේ කූඩාරමේ මෙහෙය කිරීම
පිණිස ඒවා ඔවුන්ගෙන් පිළිගෙන
ලෙවීවරුන්ට එකිනෙකාගේ සේවයේ
6 ප්‍රකාරයට දීපන්නැයි කීසේක. එවිට
මෝසෙස් ගැල් හා ගවයන් ගෙන
7 ලෙවීවරුන්ට දුන්නේය. ගේර්ෂොන්ගේ
පුත්‍රයන්ට ඔවුන්ගේ සේවයේ හැටියට
ඔහු ගැල් දෙකක්ද ගවයන් සතර
8 දෙනෙක්ද දුන්නේය. පූජක ආරොන්ගේ
පුත්‍රවූ ඊතාමාර් යටතේ සිටි මෙරාරීගේ
පුත්‍රයන්ට ඔවුන්ගේ සේවයේ හැටියට
ගැල් සතරක්ද ගවයන් අටදෙනෙක්ද
9 දුන්නේය. එහෙත් කොහාත්ගේ පුත්‍රයන්ට
ඔහු කිසිවක් දුන්නේ නැත. මක්නිසාද
ඔවුන්ට තිබුණේ ශුද්ධස්ථානයේ වැඩය;
ඔවුන් බර ගෙනයන්නේ කරෙන්ය.
පූජාසනය ආලේපකළ දවසෙහි 10
අධිපතිවරු එය කැපකිරීම පිණිස
තමුන්ගේ පඩුරු පූජාසනය ඉදිරියෙහි
ඔප්පුකළෝය. ස්වාමීන්වහන්සේ 11
මෝසෙස්ට කථාකොට: පූජාසනය
කැපකිරීම පිණිස අධිපතියෝ තමුන්ගේ
පඩුරු ඔප්පුකෙරෙත්වා, එක එක
අධිපතියා තම තමාගේ දවසෙහි එසේ
කෙරේවායි කීසේක.
පළමුවෙනි දවසේදී තමාගේ පඩුර 12
ඔප්පුකළේ යූද ගෝත්‍රයේ අම්මීනාදබ්ගේ
පුත්‍රවූ නාෂොන්ය. ඔහුගේ පඩුර නම් 13
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් එකසිය තිහක් බර ඇති එක
රිදී තැටියක් සහ ෂෙකෙල් සැත්තෑවක්
බර ඇති එක රිදී තාලියකුත්ය; ඒ දෙකම
ආහාර පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ
සිහින් පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ 14
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ, ෂෙකෙල්
දසයක් බර ඇති එක රන් පාත්‍රයක්ද;
දවන පූජාවක් පිණිස එක තරුණ 15
ගොනෙක්ද එක බැටළුවෙක්ද එක් අවුරුදු
එක බැටළු පැටවෙක්ද; පාප පූජාවක් 16
පිණිස එක එළුවෙක්ද; ශාන්ති පූජා 17
යාගය පිණිස ගොන් දෙන්නෙක්ද
බැටළුවන් පස් දෙනෙක්ද එළුවන් පස්
දෙනෙක්ද එක් අවුරුදු බැටළු පැටවුන්
පස් දෙනෙක්ද යන මේය. අම්මීනාදබ්ගේ
පුත්‍රවූ නාෂොන්ගේ පඩුර මේය.
දෙවෙනි දවසේදී ශුවර්ගේ පුත්‍රවූ 18
ඉස්සාඛර්වරුන්ගේ අධිපතියාවූ නෙත-
නේල් ඔප්පුකෙළේය. ඔහු ඔප්පුකළේ 19
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් එකසිය තිහක් බර ඇති එක
රිදී තැටියක් සහ ෂෙකෙල් සැත්තෑවක්
බර ඇති එක රිදී තාලියකුත්ය; ඒ දෙකම
ආහාර පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ
සිහින් පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ 20
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන 21
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද

එක බැටළුවෙක්ද එක් අවුරුදු එක බැටළු
22 පැටවෙක්ද; පාප පූජාවක් පිණිස එක
23 එළුවෙක්ද; ශාන්ති පූජා යාගය
පිණිස ගවයන් දෙන්නෙක්ද බැටළුවන්
පස්දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. ශුවර්ගේ පුත්‍රවූ නෙතනේල්ගේ පඬුර
මේය.

24 තුන්වෙනි දවසේදී හේලොන්ගේ
පුත්‍රවූ සාබුලොන්වරුන්ගේ අධිපතියාවූ
25 එලියාබ්ය. ඔහුගේ පඬුරනම්
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් එකසිය තිහක් බර ඇති එක
රිදී තැටියක් සහ ෂෙකෙල් සැත්තෑවක්
බර ඇති එක රිදී තාලියකුත්ය; ඒ දෙකම
ආහාර පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ
26 සිහින් පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
27 බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
28 පැටවෙක්ද; පාප පූජාවක් පිණිස එක
29 එළුවෙක්ද; ශාන්ති පූජා යාගය පිණිස
ගවයන් දෙන්නෙක්ද බැටළුවන් පස්-
දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. හේලොන්ගේ පුත්‍රවූ එලියාබ්ගේ
පඬුර මේය.

30 සතරවෙනි දවසේදී ෂෙදෙවූර්ගේ පුත්‍රවූ
රූබෙන් පුත්‍රයන්ගේ අධිපතියාවූ එලිශූර්ය.
31 ඔහුගේ පඬුරනම් ශුද්ධස්ථානයේ
ෂෙකෙලේ හැටියට ෂෙකෙල් එකසිය
තිහක් බර ඇති එක රිදී තැටියක් සහ
ෂෙකෙල් සැත්තෑවක් බර ඇති එක රිදී
තාලියකුත්ය; ඒ දෙකම ආහාර පූජාවක්
පිණිස තෙල් මිශ්‍රවූ සිහින් පිටිවලින් පිරී
32 තිබුණේය; සුගන්ධ ද්‍රව්‍යවලින් පිරී
තිබුණාවූ ෂෙකෙල් දසයක් බර ඇති
33 එක රන් පාත්‍රයක්ද; දවන පූජාවක් පිණිස
එක තරුණ ගොනෙක්ද එක බැටළුවෙක්ද
34 එක් අවුරුදු බැටළුපැටවෙක්ද; පාප
35 පූජාවක් පිණිස එක එළුවෙක්ද; ශාන්ති
පූජා යාගය පිණිස ගවයන් දෙන්නෙක්ද
බැටළුවන් පස්දෙනෙක්ද එළුවන්
පස්දෙනෙක්ද එක් අවුරුදු බැටළුපැටවුන්
පස්දෙනෙක්ද යන මේය. ෂෙදෙවූර්ගේ
පුත්‍රවූ එලිශූර්ගේ පඬුර මේය.

පස්වෙනි දවසේදී ශූරිෂද්දයිගේ පුත්‍රවූ 36
සිමියොන් පුත්‍රයන්ගේ අධිපතියාවූ
ෂෙලුමියෙල්ය. ඔහුගේ පඬුරනම් ශුද්ධස්- 37
ථානයේ ෂෙකෙලේ හැටියට ෂෙකෙල්
එකසිය තිහක් බර ඇති එක රිදී තැටියක්
සහ ෂෙකෙල් සැත්තෑවක් බර ඇති එක
රිදී තාලියකුත්ය; ඒ දෙකම ආහාර
පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ සිහින්
පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ 38
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන 39
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
පැටවෙක්ද; පාප පූජාවක් පිණිස 40
එක එළුවෙක්ද; ශාන්ති පූජා යාගය 41
පිණිස ගවයන් දෙන්නෙක්ද බැටළුවන්
පස්දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. ශූරිෂද්දයිගේ පුත්‍රවූ ෂෙලුමියෙල්-
ගේ පඬුර මේය.

හයවෙනි දවසේදී දෙවුයෙල්ගේ පුත්‍රවූ 42
ගාද් පුත්‍රයන්ගේ අධිපතියාවූ
එලියාසාප්ය. ඔහුගේ පඬුර නම් 43
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් එකසිය තිහක් බර ඇති එක
රිදී තැටියක් සහ ෂෙකෙල් සැත්තෑවක්
බර ඇති එක රිදී තාලියකුත්ය; ඒ දෙකම
ආහාර පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ
සිහින් පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ 44
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන 45
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු
බැටළුපැටවෙක්ද; පාප පූජාවක් පිණිස 46
එක එළුවෙක්ද; ශාන්ති පූජා යාගය 47
පිණිස ගවයන් දෙන්නෙක්ද බැටළුවන්
පස්දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද

යන මේය. දෙවුයෙල්ගේ පුත්‍රවූ එලියා-
සාප්ගේ පඩුර මේය.
48 සත්වෙනි දවසේදී අම්මිහුද්ගේ පුත්‍රවූ
එප්‍රායිම් පුත්‍රයන්ගේ අධිපතියාවූ
49 එලිෂාමාය. ඔහුගේ පඩුරනම් ශුද්ධ-
ස්ථානයේ ෂෙකෙලේ හැටියට ෂෙකෙල්
එකසිය තිහක් බර ඇති එක රිදී තැටියක්
සහ ෂෙකෙල් සැත්තෑවක් බර ඇති එක
රිදී තාලියකුත්ය; ඒ දෙකම ආහාර
පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ සිහින්
50 පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
51 බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු
52 බැටළුපැටවෙක්ද; පාප පූජාවක් පිණිස
53 එක එළුවෙක්ද; ශාන්ති පූජා යාගය
පිණිස ගවයන් දෙන්නෙක්ද බැටළුවන්
පස්දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. අම්මිහුද්ගේ පුත්‍රවූ එලිෂාමාගේ
පඩුර මේය.
54 අටවෙනි දවසේදී පෙදශුර්ගේ පුත්‍රවූ
මනස්සේ පුත්‍රයන්ගේ අධිපතියාවූ
55 ගමාලියෙල්ය. ඔහුගේ පඩුරනම්
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් එකසිය තිහක් බර ඇති එක
රිදී තැටියක් සහ ෂෙකෙල් සැත්තෑවක්
බර ඇති එක රිදී තාලියකුත්ය; ඒ දෙකම
ආහාර පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ
56 සිහින් පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
57 බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
58 පැටවෙක්ද; පාප පූජාවක් පිණිස එක
59 එළුවෙක්ද; ශාන්ති පූජා යාගය පිණිස
ගවයන් දෙන්නෙක්ද බැටළුවන් පස්-
දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. පෙදශුර්ගේ පුත්‍රවූ ගමාලියෙල්ගේ
පඩුර මේය.
60 නවවෙනි දවසේදී ගිදෙයොනිගේ පුත්‍රවූ
බෙන්යමින් පුත්‍රයන්ගේ අධිපතියාවූ
අබිදන්ය. ඔහුගේ පඩුරනම් ශුද්ධ- 61
ස්ථානයේ ෂෙකෙලේ හැටියට ෂෙකෙල්
එකසිය තිහක් බර ඇති එක රිදී තැටියක්
සහ ෂෙකෙල් සැත්තෑවක් බර ඇති එක
රිදී තාලියකුත්ය; ඒ දෙකම ආහාර
පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ පිටිවලින්
පිරී තිබුණේය; සුගන්ධ ද්‍රව්‍යවලින් පිරී 62
තිබුණාවූ ෂෙකෙල් දසයක් බර ඇති
එක රන් පාත්‍රයක්ද; දවන පූජාවක් පිණිස 63
එක තරුණ ගොනෙක්ද එක බැටළුවෙක්ද
එක් අවුරුදු බැටළුපැටවෙක්ද; පාප 64
පූජාවක් පිණිස එක එළුවෙක්ද; ශාන්ති 65
පූජා යාගය පිණිස ගවයන් දෙන්නෙක්ද
බැටළුවන් පස්දෙනෙක්ද එළුවන් පස්-
දෙනෙක්ද එක් අවුරුදු බැටළුපැටවුන්
පස්දෙනෙක්ද යන මේය. ගිදෙයොනිගේ
පුත්‍රවූ අබිදන්ගේ පඩුර මේය.
දසවෙනි දවසේදී අම්මිෂද්දයිගේ 66
පුත්‍රවූ දාන් පුත්‍රයන්ගේ අධිපතියාවූ
අහියෙසෙර්ය. ඔහුගේ පඩුරනම් 67
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් එකසිය තිහක් බර ඇති එක
රිදී තැටියක් සහ ෂෙකෙල් සැත්තෑවක්
බර ඇති එක රිදී තාලියකුත්ය; ඒ දෙකම
ආහාර පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ
සිහින් පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ 68
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන 69
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
පැටවෙක්ද; පාප පූජාවක් පිණිස 70
එළුවෙක්ද; ශාන්ති පූජා යාගය පිණිස 71
ගවයන් දෙන්නෙක්ද බැටළුවන් පස්-
දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. අම්මිෂද්දයිගේ පුත්‍රවූ අහියෙ-
සෙර්ගේ පඩුර මේය.
එකළොස්වෙනි දවසේදී ඔක්‍රාන්ගේ 72
පුත්‍රවූ ආෂේර් පුත්‍රයන්ගේ අධිපතියාවූ
පගීයෙල්ය. ඔහුගේ පඩුරනම් ශුද්ධ- 73
ස්ථානයේ ෂෙකෙලේ හැටියට ෂෙකෙල්
එකසිය තිහක් බර ඇති එක රිදී තැටියක්

සහ ෂෙකෙල් සැත්තෑවක් බර ඇති එක
රිදී තාලියකුත්ය; ඒ දෙකම ආහාර
පූජාවක් පිණිස තෙල් මිශ්‍රවූ සිහින්
74 පිටිවලින් පිරී තිබුණේය; සුගන්ධ ද්‍රව්‍ය-
වලින් පිරී තිබුණාවූ ෂෙකෙල් දසයක්
75 බර ඇති එක රන් පාත්‍රයක්ද; දවන
පූජාවක් පිණිස එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
76 පැටවෙක්ද; පාප පූජාවක් පිණිස එක
77 එළුවෙක්ද; ශාන්ති පූජා යාගය පිණිස
ගවයන් දෙන්නෙක්ද බැටළුවන් පස්-
දෙනෙක්ද එළුවන් පස්දෙනෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් පස්දෙනෙක්ද යන
මේය. ඔක්‍රාන්ගේ පුත්‍රවූ පගීයෙල්ගේ පඬුර
මේය.

78 දෙළොස්වෙනි දවසේදී ඒනාන්ගේ පුත්‍රවූ
නප්තලී පුත්‍රයන්ගේ අධිපතියාවූ අහිරාය.
79 ඔහුගේ පඬුරනම් ශුද්ධස්ථානයේ
ෂෙකෙලේ හැටියට ෂෙකෙල් එකසිය
තිහක් බර ඇති එක රිදී තැටියක් සහ
ෂෙකෙල් සැත්තෑවක් බර ඇති එක රිදී
තාලියකුත්ය; ඒ දෙකම ආහාර පූජාවක්
පිණිස තෙල් මිශ්‍රවූ සිහින් පිටිවලින් පිරී
80 තිබුණේය; සුගන්ධ ද්‍රව්‍යවලින් පිරී
තිබුණාවූ ෂෙකෙල් දසයක් බර ඇති
81 එක රන් පාත්‍රයක්ද; දවන පූජාවක් පිණිස
එක තරුණ ගොනෙක්ද එක බැටළුවෙක්ද
82 එක් අවුරුදු බැටළුපැටවෙක්ද; පාප
83 පූජාවක් පිණිස එක එළුවෙක්ද; ශාන්ති
පූජා යාගය පිණිස ගවයන් දෙන්නෙක්ද
බැටළුවන් පස්දෙනෙක්ද එළුවන් පස්-
දෙනෙක්ද එක් අවුරුදු බැටළුපැටවුන්
පස්දෙනෙක්ද යන මේය. ඒනාන්ගේ පුත්‍රවූ
අහිරාගේ පඬුර මේය.

84 පූජාසනය ආලේපකළ දවසේදී ඒක
කැපකිරීමට ඉශ්‍රායෙල් අධිපතිවරුන්ගෙන්
ලැබුණු දේවල් මේවාය. රිදී තැටි
දෙළොසක්ය, රිදී තාලි දෙළොසක්ය,
85 රන් පාත්‍රා දෙළොසක්ය. එක එක රිදී
තැටියේ බර ෂෙකෙල් එකසිය තිහක්ය,
එක එක තාලියේ බර ෂෙකෙල්
සැත්තෑවක්ය. ඒ සියලු රිදී බඩු
ශුද්ධස්ථානයේ ෂෙකෙලේ හැටියට
ෂෙකෙල් දෙදස් හාරසියයක් විය; සුගන්ධ 86
ද්‍රව්‍යවලින් පිරී තිබුණාවූ රන් පාත්‍රා
දෙළොසක්ය; ශුද්ධස්ථානයේ ෂෙකෙලේ
හැටියට එක එක පාත්‍රය ෂෙකෙල්
දසයක්ය. පාත්‍රාවල මුළු රන් බර
ෂෙකෙල් එකසිය විස්සක්ය. දවන පූජාව 87
පිණිස සියලුම ගවයෝ ගොනුන්
දෙළොස් දෙනෙක්ය, බැටළුවන් දෙළොස්
දෙනෙක්ය, එක් අවුරුදු බැටළුපැටවුන්
දෙළොස් දෙනෙක්ය, උන් සමග ඔප්පු
කළ ආහාර පූජාවය. පාප පූජාවක්
පිණිස එළුවන් දෙළොස් දෙනෙක්ය.
ශාන්ති පූජා යාගය පිණිස සියලුම 88
ගවයෝ ගොන් විසිහතරදෙනෙක්ය,
බැටළුවන් සැටදෙනෙක්ය, එළුවන්
සැටදෙනෙක්ය, එක් අවුරුදු බැටළුපැටවුන්
සැටදෙනෙක්ය. පූජාසනය ආලේප කළ
පසු එය කැපකිරීමේ පූජා මේවාය.
මෝසෙස් උන්වහන්සේ සමග කථා- 89
කරන පිණිස සම්මුඛවීමේ කූඩාරමට
ඇතුල් වන කල, සාක්ෂි පෙට්ටිය පිට
තිබුණු කරුණාසනය උඩ සිට
කෙරුබ්වරුන් දෙදෙනාට අතරෙන්
තමාට කථාකරන හඬ ඔහුට ඇසුණේය.
ඔහුද උන්වහන්සේට කථාකෙළේය.

## මණ්ඩපයේ පහන්

8 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
කථාකොට **කියනසේක්:** තුඹ 2
පහන් දල්වන කල පහන් සතේ එළිය
පහන් රුක ඉස්සරහට වැටෙන්ට ඕනෑය
**කියා** ආරොන්ට **කියාපන්නැයි කීසේක.**
ආරොන්ද එසේ කරමින් **ස්වාමීන්-** 3
**වහන්සේ** මෝසෙස්ට අණකළ ලෙස
පහන් රුක ඉස්සරහට එළිය වැටෙන
ලෙස පහන් දල්වූයේය. පහන් රුකේ 4
කර්මාන්තය වනාහි තළාපු රනින් විය;
ඒකේ අඩිය හා ඒකේ මල් දක්වා එය
තළාපු කර්මාන්තය විය. **ස්වාමීන්-**
**වහන්සේ** මෝසෙස්ට පෙන්වූ ආදර්ශය
ලෙස ඔහු පහන් රුක සෑදුවේය.

## ලෙවීවරුන්ගේ යුතුකම් සඳහා ඔවුන් පවිත්‍රකිරීම

5 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
6 කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙන් ලෙවීවරුන් කැඳවාගන ඔවුන්
7 පවිත්‍රකරපන්න. ඔවුන් පවිත්‍ර කරන පිණිස
මෙසේ කරපන්න—දෝෂ පහකිරීමේ වතුර
ඔවුන් පිට ඉසපන්න, ඔව්හු දැළිපිහියකින්
තමුන්ගේ මුළු ශරීරය බූගා, තමුන්ගේ
වස්ත්‍ර සෝදගෙන තමුන්ම පවිත්‍ර-
8 කරගනිත්වා. එවිට ඔව්හු තරුණ
ගොනෙක්ද ඊට අයිති ආහාර පූජාවට
තෙල් මිශ්‍ර සිහින් පිටිද ගනිත්වා, නුඹ
පාප පූජාවක් පිණිස තවත් තරුණ
9 ගොනෙක් ගෙන, සම්මුඛවීමේ කූඩාරම
ඉදිරිපිටට ලෙවීවරුන් කැඳවාගෙන
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාවත්
10 රැස්කරවාපන්න. නුඹ ලෙවීවරුන්
**ස්වාමීන්වහන්සේ** ඉදිරිපිටට කැඳවාගත
යුතුය. ඉශ්‍රායෙල් පුත්‍රයෝද තමුන්ගේ
11 අත් ලෙවීවරුන් පිට තබත්වා. ආරොන්ද
ලෙවීවරුන් **ස්වාමීන්වහන්සේගේ** මෙහෙය
කිරීමට සිටින පිණිස ඉශ්‍රායෙල් පුත්‍රයන්
උදෙසා තේව පූජාවක් වශයෙන්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඔවුන්
12 ඔප්පුකරන්නේය. ලෙවීවරු තමුන්ගේ අත්
ගොනුන්ගේ හිස් පිට තබත්වා. එවිට
නුඹ ලෙවීවරුන් උදෙසා සමගිකමක්
කරන පිණිස එකෙක් පාප පූජාවක්
කොටද එකෙක් දවන පූජාවක් කොටද
13 **ස්වාමීන්වහන්සේට** පූජාකරපන්න. නුඹ
ආරොන්ද ඔහුගේ පුත්‍රයන්ද ඉදිරිපිට
ලෙවීවරුන් සිටුවා ඔවුන් තේව පූජාවක්
කොට **ස්වාමීන්වහන්සේට** ඔප්පු-
14 කරපන්න. මෙසේ ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙන් ලෙවීවරුන් වෙන්කරපන්න.
15 ලෙවීවරු මාගේ වන්නෝය. ඉන්පසු
ලෙවීවරු සම්මුඛවීමේ කූඩාරමෙහි
මෙහෙකරන පිණිස ඇතුල්වෙත්වා. එසේ
ඔවුන් පවිත්‍රකර තේව පූජාවක් කොට
16 ඔවුන් ඔප්පුකරපන්න. මක්නිසාද ඔව්හු
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙන් මුළුමනින්ම
මට දෙනලද්දෝය; ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි ගර්භයේ ප්‍රථම එලවූ සියල්ලන්
එනම් සියලු කුලුඳුලන් වෙනුවට ඔවුන්
මට ගත්තෙමි. මක්නිසාද මනුෂ්‍යයන්- 17
ගෙනුත් මෘගයන්ගෙනුත් ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙහි සියලු කුලුඳුලෝ
මාගේය. මා විසින් මිසර දේශයෙහි
සියලු කුලුඳුලන්ට පහරදුන් දවසේදී
ඔවුන් මට ශුද්ධය කියා නියමකෙළෙමි.
එසේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු 18
කුලුඳුලන් වෙනුවට මම ලෙවීවරුන්
ගෙන, ඉශ්‍රායෙල් පුත්‍රයන් ශුද්ධස්ථානයට 19
ළංවෙන කල ඔවුන් අතරට වසංගතයක්
නොපැමිණෙන පිණිස, සම්මුඛවීමේ
කූඩාරමෙහි ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
මෙහෙය කිරීමටත් ඉශ්‍රායෙල් පුත්‍රයන්
උදෙසා සමගිකමක් කිරීමටත් ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙන් ලෙවීවරුන් ත්‍යාගයක්
කොට ආරොන්ටද ඔහුගේ පුත්‍රයන්ටද
දුනිමියි කීසේක. මෝසෙස් සහ 20
ආරොන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු
සභාවද ලෙවීවරුන්ට එසේ කළෝය.
**ස්වාමීන්වහන්සේ** ලෙවීවරුන් ගැන
මෝසෙස්ට අණකළ සියල්ල ලෙස
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ලෙවීවරුන්ට
කළෝය. ලෙවීවරුද තමුන්ගෙන් දෝෂ 21
පහකරගෙන තමුන්ගේ වස්ත්‍ර සෝද-
ගත්තෝය; එවිට ආරොන් ඔවුන් තේව
පූජාවක් කොට **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි ඔප්පුකර ඔවුන් පවිත්‍රකරන
පිණිස ඔවුන් උදෙසා සමගිකමක්
කෙළේය. ඉන්පසු ලෙවීවරු ආරොන්ද 22
ඔහුගේ පුත්‍රයන්ද ඉදිරියෙහි සම්මුඛවීමේ
කූඩාරමෙහි තමුන්ගේ වැඩකරන පිණිස
සේවයට ඇතුල්වූවෝය. **ස්වාමීන්වහන්සේ**
ලෙවීවරුන් ගැන මෝසෙස්ට අණකළ
ලෙස ඔව්හු ලෙවීවරුන්ට කළෝය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 23
කොට කියනසේක්: ලෙවීවරුන් සම්- 24
බන්ධ කාරණය මෙසේය—විසිපස්
අවුරුද්ද පටන් ඉන් ඉහළ වයස් ඇත්තෝ
සම්මුඛවීමේ කූඩාරමේ වැඩකරන
පිණිස සේවයට ඇතුල්වෙත්වා. පනස් 25

අවුරුදු වයස්වූ පසු ඔව්හු මෙහෙකිරීමෙන්
අහක්ව, තවත් සේවය නොකර සිටිත්වා;
26 කටයුතු බලාගැනීමට සම්මුඛවීමේ
කූඩාරම තුළ ඔවුන්ගේ සහෝදරයන්
සමග මෙහෙකරනවා මිස ඔව්හු වැඩ
නොකරන්නෝය. ලෙවීවරුන්ගේ භාර
සම්බන්ධව ඔවුන්ට එසේ කරපන්නැයි
කීසේක.

## පාස්කුව පැවැත්වීම

9 ඔවුන් මිසර දේශයෙන් පිටත්ව
ආවායින් පසු දෙවෙනි අවුරුද්දේ
පළමුවෙනි මාසයේ සීනයි කාන්තාර-
යේදී **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට: තවද ඉශ්‍රායෙල් පුත්‍රයෝ
නියම කාලයෙහි පාස්කුව පවත්-
3 වත්වා. ඊට නියම කාලය වන මේ මස
දසසතරවෙනි දින සවස් වරුවේ
ඒක පවත්වාපල්ලා. ඒකේ සියලු පනත්ද
ඒකේ සියලු නියෝගද ප්‍රකාර ඒක
4 පවත්වාපල්ලායයි කීසේක. මෝසෙස්ද
පාස්කුව පවත්වන්ට ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
5 කීවේය. එසේ ඔව්හු පළමුවෙනි මස
දසසතරවෙනි දින සවස සීනයි
කාන්තාරයේදී පාස්කුව පැවැත්වූහ.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට අණකළ
සියල්ල ලෙස ඉශ්‍රායෙල් පුත්‍රයෝ
6 කළෝය. මෘත ශරීරයකින් අපවිත්‍රවී ඒ
දවසේ පාස්කුව පවත්වන්ට නොහැකිවූ
සමහර මනුෂ්‍යයෝ එහි සිටියෝය. ඒ
මනුෂ්‍යයෝ ඒ දවසේදී මෝසෙස් සහ
ආරොන් ඉදිරියට අවුත් කථාකොට:
7 අපි මෘත ශරීරයකින් අපවිත්‍රවී සිටිමුව.
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි **ස්වාමීන්-**
**වහන්සේගේ** පූජාව ඊට නියම කාලයෙහි
ඔප්පු කිරීමෙන් අප වලක්වනු ලබන්නේ
මක්නිසාදැයි ඔහුගෙන් ඇසුවෝය.
8 මෝසෙස්ද: **ස්වාමීන්වහන්සේ** නුඹලා
ගැන අණකරන්නේ කුමක්දැයි දැනගන්න
තෙක් සිටපල්ලායයි ඔවුන්ට කීවේය.
9 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
10 කොට: නුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
මෙසේ කියාපන්න–නුඹලාගෙන්වත්
නුඹලාගේ පරම්පරාවලින්වත් කිසිවෙකු
මළ කඳකින් අපවිත්‍රව සිටින නුමුත්
දුර ගමනක යෙදී සිටින නුමුත් ඔහු
**ස්වාමීන්වහන්සේට** පාස්කුව පවත්වාවා.
දෙවෙනි මස දසසතරවෙනි දින සවස 11
ඔව්හු ඒක පවත්වා මුහුන් නැති රොටි
සහ තික්ත පලා සමග එය කත්වා.
ඔව්හු එයින් කිසිවක් උදය දක්වා ඉතුරු 12
කරන්නේවත් උගේ ඇටයක් බිඳින්නේවත්
නැතුව පාස්කුවේ මුළු පනත ලෙස එය
පවත්වන්නෝය. නුමුත් පවිත්‍රවූ, ගමනක 13
යෙදී නොසිටින මනුෂ්‍යයෙක් පාස්කුව
නොපවත්වා සිටින්නේනම්, ඒ තැනැත්තේ
තමාගේ සෙනඟ අතරෙන් සිඳදමනු
ලබන්නේය. **ස්වාමීන්වහන්සේගේ** පූජාව
ඊට නියමකළ කාලයෙහි ඔප්පුනොකළ
බැවින් ඒ මනුෂ්‍යයා තමාගේ පාපය
දරනවා ඇත. විදේශියෙක් නුඹලා 14
අතරෙහි පදිංචිව සිට **ස්වාමීන්වහන්සේට**
පාස්කුව පවත්වන්ට කැමතිනම් ඔහු
පාස්කුවේ පනතද ඒකේ නියෝගයද
ප්‍රකාර එය පැවැත්විය යුතුය. විදේශියෙක්
වේවා ස්වදේශියෙක් වේවා නුඹලාට
එකම පනතක් තිබිය යුතුයයි කීසේක.

## මගපෙන්වීමේ වලාකුළ

තවද මණ්ඩපය පිහිටෙවූ දවසේදී 15
වලාකුළකින් මණ්ඩපය එනම් සාක්ෂි
කූඩාරම වැසුණේය. සවස්වූ කල
මණ්ඩපය මත්තෙහි ගින්නක් වැනි
පෙනීමක් පහන්වෙන තුරු තිබුණේය.
නිරතුරුම එසේ විය. එය වලාකුළෙන්ද 16
රාත්‍රියෙහි ගින්නක පෙනීමෙන්ද
වැසුණේය. වලාකුළ යම් විටක කූඩාරම 17
මත්තෙන් ඔසවනලද්දේද ඉන්පසු
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගමන්කළෝය.
වලාකුළ යම් තැනක නැවතුණේද
එතැන්හි ඉශ්‍රායෙල් පුත්‍රයෝ කූඩාරම්
ගසාගත්තෝය. **ස්වාමීන්වහන්සේගේ** 18
ආඥාව පිට ඉශ්‍රායෙල් පුත්‍රයෝ
ගමන්කළෝය, **ස්වාමීන්වහන්සේගේ**
ආඥාව පිට ඔව්හු කූඩාරම්

ගසාගත්තෝය. වලාකුළ මණ්ඩපය පිට
නැවතී තිබුණු මුළු කාලයෙහි ඔව්හු
තමුන්ගේ කූඩාරම්වල සිටියෝය.
19 වලාකුළ මණ්ඩපය පිට බොහෝ දවස්
නැවතුණු කල ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගමන්
නොකොට **ස්වාමීන්වහන්සේගේ** සේවය
20 බලාගත්තෝය. සමහරවිට වලාකුළ
මණ්ඩපය පිට ස්වල්ප දවසක්
නැවතුණේය; එකල ඔව්හු **ස්වාමීන්-**
**වහන්සේගේ** අණ ලෙස කූඩාරම්වල
නැවතී සිටියෝය, ඔව්හු **ස්වාමීන්-**
**වහන්සේගේ** අණ ලෙස ගමන්කළෝය.
21 සමහරවිට වලාකුළ සවස පටන් උදය
දක්වා නැවතී තිබුණේය; උදය වලාකුළ
ඔසවනු ලැබූ විට ඔව්හු ගමන්කළෝය.
දවාලේ හෝ රාත්‍රියේ හෝ වලාකුළ
ඔසවනු ලැබුයේනම් ඔව්හු ගමන්කළෝය.
22 වලාකුළ දෙදවසක් හෝ මසක් හෝ
අවුරුද්දක් හෝ මණ්ඩපය පිට නැවතී
තිබුණු කල ඉශ්‍රායෙල් පුත්‍රයෝ
ගමන්නොකර තමුන්ගේ කූඩාරම්වල
නැවතී සිටියෝය. නුමුත් එය ඔසවනු
ලැබූ කල ඔව්හු ගමන්කළෝය.
23 **ස්වාමීන්වහන්සේගේ** ආඥාව පිට ඔව්හු
කූඩාරම් ගසාගත්තෝය, **ස්වාමීන්-**
**වහන්සේගේ** ආඥාව පිට ඔව්හු ගමන්-
කළෝය. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්
ලවා අණකෙරෙවූ හැටියට ඔව්හු
**ස්වාමීන්වහන්සේගේ** සේවය බලා
ගත්තෝය.

## රිදී හොරණෑ

10 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට කියනසේක්: සභාව
කැඳවීමටත් සේනාව පිටත්කරවීමටත්
පිඹින පිණිස රිදී හොරණෑ දෙකක්
සාදගනින්න; ඒවා තළාපු කර්මාන්ත-
3 යෙන් සාදපන්න. ඒවා පිඹින කල මුළු
සභාව සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ
4 ළඟට තුඹ වෙතට රැස්වෙත්වා. එක
හොරණෑවක් පමණක් පිම්බ කල
ඉශ්‍රායෙල් දහස් ගණන්වල ප්‍රධානියෝ
වන අධිපතීහු තුඹ වෙතට රැස්වෙත්වා.
තුඹලා මහත් හඬකින් පිම්බ කල 5
නැගෙනහිර පැත්තෙහි කූඩාරම් ගසාගත
සිටින සේනාවෝ පිටත්වෙත්වා. දෙවෙනි 6
වර මහත් හඬකින් පිම්බ කල දකුණු
පැත්තෙහි කූඩාරම් ගසාගත සිටින
සේනාවෝ පිටත්වෙත්වා. එසේ ඔවුන්ගේ
ගමන් පිණිස මහත් හඬකින් පිඹින්නෝය.
නුමුත් සභාව රැස්කරවන්ට ඕනෑවූ විට 7
මහත් ශබ්දයක් නොකොට පිඹපල්ලා.
පූජකයෝවූ ආරොන්ගේ පුත්‍රයෝ 8
හොරණෑ පිඹිත්වා; ඒවා තුඹලාගේ
පරම්පරාවල තුඹලාට නිරන්තර පනතක්
පිණිස වන්නේය. තුඹලාගේ දේශයෙහි 9
තුඹලාට සතුරුකම් කරන සතුරාට
විරුද්ධව තුඹලා යුද්ධයට යන විටද
මහත් හඬකින් හොරණෑ පිඹපල්ලා;
එවිට තුඹලා තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි සිහිකරනු
ලැබ තුඹලාගේ සතුරන්ගෙන් ගළවනු
ලබන්නහුය. තුඹලාගේ ප්‍රීති දවසෙහිත් 10
තුඹලාගේ නියම මංගල්‍යවලදීත්
තුඹලාගේ මාස් ආරම්භයෙහිදීත්
තුඹලාගේ දවන පූජාද ශාන්ති පූජාද
ඔප්පුකරන කල හොරණෑ පිඹපල්ලා;
ඒවා තුඹලාගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි තුඹලාට සිහිවීමක් පිණිස
වන්නේය. මම තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේයයි** කීසේක.

## සීනයි කන්දෙන් පිටත්වයාම

### හොබාබ් කැඳවනු ලැබීම

දෙවෙනි වර්ෂයෙහි දෙවෙනි මස 11
විසිවෙනි දින වලාකුළ සාක්ෂි මණ්ඩපය
කෙරෙන් ඔසවාගන්නා ලද්දේය. එවිට 12
ඉශ්‍රායෙල් පුත්‍රයෝ තමුන්ගේ ගමන්
ප්‍රකාර සීනයි කාන්තාරයෙන් පිටත්ව
ගියෝය; වලාකුළ පාරාන් කාන්තාර-
යෙහි නැවතුණේය. එවිට ඔව්හු 13
**ස්වාමීන්වහන්සේ** මෝසෙස් ලවා අණ
කෙරෙවූ ලෙස පළමු වරට ගමන්කළෝය.
පළමුකොට යූද පුත්‍රයන්ගේ කඳවුරේ 14

ධජය ඔවුන්ගේ සේනාවල හැටියට
පිටත්විය. ඔහුගේ සේනාවට අධිපතියා
අම්මිනාදබ්ගේ පුත්‍රවූ නාෂොන්ය.
15 ඉස්සාකර් පුත්‍රයන්ගේ ගෝත්‍රයේ
සේනාවට අධිපතියා ශුවර්ගේ පුත්‍රවූ
16 නෙතනේල්ය. සාබුලොන් පුත්‍රයන්ගේ
ගෝත්‍රයේ සේනාවට අධිපතියා
හේලොන්ගේ පුත්‍රවූ එලියාබ්ය.
17 මණ්ඩපයද බානලද්දේය; එවිට
මණ්ඩපය උසුලා ගෙනයන්නෝ වන
ගේර්ෂොන්ගේ පුත්‍රයෝද මෙරාරීගේ
18 පුත්‍රයෝද පිටත්ව ගියෝය. රූබෙන්ගේ
කඳවුරේ ධජය ඔවුන්ගේ සේනාවල
හැටියට පිටත්ව ගියේය. ඔහුගේ සේනාවට
අධිපතියා ෂෙදෙවුර්ගේ පුත්‍රවූ එලිශූර්ය.
19 සිමියොන් පුත්‍රයන්ගේ ගෝත්‍රයේ
සේනාවට අධිපතියා ශූරිෂද්දයිගේ පුත්‍රවූ
20 ෂෙලුමියෙල්ය. ගාද් පුත්‍රයන්ගේ ගෝත්‍රයේ
සේනාවට අධිපතියා දෙවුයෙල්ගේ පුත්‍රවූ
21 එලියාසාෆ්ය. එවිට කොහාත්වරු පිටත්වී
ශුද්ධස්ථානය උසුලාගෙන ගියෝය. ඔවුන්
එනතුරු අනික් අය මණ්ඩපය
22 පිහිටෙවුවෝය. එෆ්‍රායිම් පුත්‍රයන්ගේ
කඳවුරේ ධජය ඔවුන්ගේ සේනාවල
හැටියට පිටත්ව ගියේය. ඔහුගේ සේනාවට
අධිපතියා අම්මිහුද්ගේ පුත්‍රවූ එලිෂාමාය.
23 මනස්සේ පුත්‍රයන්ගේ ගෝත්‍රයේ සේනා-
වට අධිපතියා පෙදශූර්ගේ පුත්‍රවූ
24 ගමාලියෙල්ය. බෙන්යමින් පුත්‍රයන්ගේ
ගෝත්‍රයේ සේනාවට අධිපතියා ගිදෙ-
25 යොනිගේ පුත්‍රවූ අබිදන්ය. සියලු
කඳවුරුවලින් අන්තිම එකවූ දන්
පුත්‍රයන්ගේ කඳවුරේ ධජය ඔවුන්ගේ
සේනාවල හැටියට පිටත්ව ගියේය.
ඔහුගේ සේනාවට අධිපතියා අම්මි-
26 ෂද්දයිගේ පුත්‍රවූ අහියෙසෙර්ය. ආෂේර්
පුත්‍රයන්ගේ ගෝත්‍රයේ සේනාවට
අධිපතියා ඔක්‍රාන්ගේ පුත්‍රවූ පගීයෙල්ය.
27 නප්තලී පුත්‍රයන්ගේ ගෝත්‍රයේ සේනාවට
අධිපතියා ඒනාන්ගේ පුත්‍රවූ අහිරාය.
28 තමුන්ගේ සේනාවල හැටියට ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ ගමන්කිරීම් මෙයාකාරය;
ඔව්හුද පිටත්ව ගියෝය.

මෝසෙස් තමාගේ මාමා වන මිදියන්හි 29
රෙවූයෙල්ගේ පුත්‍රවූ හොබාබ්ට කියනුයේ:
මම තුඹලාට දෙන්නෙමියි කියා
**ස්වාමීන්වහන්සේ** කී ස්ථානයට අපි
ගමන්කරමුව. අප සමග වරෙන්න, අපි
තුඹට යහපත කරන්නෙමුව. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් ගැන යහපත
කථාකර තිබේයයි කීවේය. ඔහුද: මම 30
නොඑන්නෙමි; මාගේ දේශයටත් මාගේ
නෑයන් වෙතටත් යන්නෙමියි ඔහුට
කීවේය. මෝසෙස්ද: අප අත්හැර නොයන 31
මෙන් ඉල්ලමි; මක්නිසාද අප විසින්
කාන්තාරයෙහි කඳවුරු බැඳගන්ට ඕනෑ
කෙසේදැයි තුඹ දන්න බැවින් තුඹ අපට
ඇස් මෙන් වෙනවා ඇත. ඉදින් තුඹ අප 32
සමග යන්නෙහි නම් **ස්වාමීන්වහන්සේ**
අපට කරන යහපතම අපි සැබවින්
තුඹට කරන්නෙමුයයි කීවේය.

ඔව්හු **ස්වාමීන්වහන්සේගේ** කන්දෙන් 33
පිටත්ව තුන් දවසක ගමන් ගියෝය;
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටියද
ඔවුන්ට නවතින තැනක් සොයන පිණිස
ඔවුන්ට පෙරටුවෙන් තුන් දිනක් ගමන්
කෙළේය. ඔවුන් කඳවුරෙන් පිටත්වූ කල 34
**ස්වාමීන්වහන්සේගේ** වලාකුළ දවාලේදී
ඔවුන්ට උඩින් තිබුණේය.

තවද ගිවිසුම් පෙට්ටිය පිටත්වෙන කල 35
මෝසෙස් කියනුයේ: **ස්වාමීන්වහන්ස**,
නැගිටුණු මැනව, ඔබගේ සතුරෝ විසිර
යෙත්වා; ඔබට වෛරවෙන්නෝද ඔබ
ඉදිරියෙන් පලා යෙත්වයි කීවේය. ගිවිසුම් 36
පෙට්ටිය නැවතුණු කල ඔහු: **ස්වාමීන්-
වහන්ස**, ඉශ්‍රායෙල්වරුන්ගේ දහස්
ගණන්වලින් දසදහස් දෙනා වෙතට හැරී
අව මැනවයි කීවේය.

## සෙනඟගේ දෙස්කීම

11 සෙනඟ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි කොඳුරන්නන් මෙන්
දෙස්කියමින් සිටියෝය. **ස්වාමීන්-**

වහන්සේට එය ඇසුණු කල උන්-
වහන්සේගේ උදහස ඇවුළුණේය;
ස්වාමීන්වහන්සේගේ ගින්න ඔවුන් අතරේ
පත්තුවී කඳවුරු සීමාවෙහි දවෙමින්
2 ගියේය. එවිට සෙනඟ මෝසෙස්ට
මොරගැසුවෝය; මෝසෙස් ස්වාමීන්-
වහන්සේට යාච්ඤා කෙළේය, ගින්න
3 නිවීගියේය. ස්වාමීන්වහන්සේගේ ගින්න
ඔවුන් අතරේ ඇවුළුණු බැවින් ඒ
ස්ථානයට *තබේරා යන නාමය
තබනලද්දේය.
4 තවද ඔවුන් අතරේ සිටිය මිශ්‍ර සමූහයා
තෘෂ්ණාවට වැටුණේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
නැවත හඬා: අපට කන්ට මස් දෙන්නේ
5 කවුද? මිසරයෙහිදී අප නොමිලයේ
කෑවාවූ මාලුද පිපිඤ්ඤාද කොමඩුද
කුඩා ලූනුද සුදුලූනුද අපට මතක්වෙයි.
6 නුමුත් දැන් අපේ ශරීර වේළී ගොස්
තිබේ; කිසිම දෙයක් නැත. මේ මන්නා
මිස වෙන කිසි දෙයක් අපේ ඇස්
7 හමුයෙහි නැතැයි කීවෝය. මන්නා
වනාහි කොත්තමල්ලි ඇට වාගේය. එහි
8 පැහැය මුතුවල පැහැය මෙන්ය. සෙනඟ
එහා මෙහා ගොස් ඒවා රැස්කරගන
ඇඹරුම් ගලෙන් අඹරා නොහොත් වනේ
ලා කොටා සැළියක උයා කැවිලි
සෑදුවෝය. එහි රස අලුත් තෙල් රස
9 හා සමානය. රාත්‍රියෙහි කඳවුර පිට
පිනි වැටුණු කල මන්නා ඒ පිට
10 වැටුණේය. සෙනඟ පවුල් වශයෙන්
තම තමුන්ගේ කූඩාරම් දෙරකඩවල
සිට අඬනවා මෝසෙස්ට ඇසුණේය.
ස්වාමීන්වහන්සේගේ උදහසද බොහෝ-
සෙයින් ඇවුළුණේය; මෝසෙස් අප්‍රසන්-
11 නවිය. මෝසෙස් ස්වාමීන්වහන්සේට
කියනුයේ: ඔබ මේ මුළු සෙනඟගේ
බර මා පිට තැබීමෙන් ඔබගේ
මෙහෙකරුවාට කුමක් නිසා අයහපත
කළසේක්ද? ඔබගේ ඇස් හමුයෙහි මට
කරුණාව නොපෙන්නුවේ මක්නිසාද?
12 මේ සියලු සෙනඟ කුසේ දරුවේ මමද?
ඇතිකරන පියෙක් කිරි බොන දරුවා
උසුලාගෙන යන්නාක්මෙන් ඔවුන්ගේ

*එනම්, ඇවිළීම.

පියවරුන්ට ඔබ දිවුළ දේශයට ඔවුන්
නුඹේ ළයේ උසුලාගෙන පලයන්නැයි
ඔබ මට කියන්ට ඔවුන් ඉපදෙවූවේ
මමද? මේ මුළු සෙනඟට කන්ට මස් 13
මට කොයින්ද? මක්නිසාද: අපට මස්
කන්ට දෙන්නැයි කියා ඔව්හු අඬමින්
මට කියති. තනියම මේ මුළු සෙනඟ 14
දරන්ට මට බැරිය, මක්නිසාද එය මට
බර වැඩිය. ඔබ මට මෙසේ කරන- 15
සේක්නම්, ඔබගෙන් මට කරුණාව ලැබී
තිබේනම්, වහාම මා මරන ලෙස
ඔබගෙන් ඉල්ලමි; අහෝ මාගේ කාල-
කණ්ණිකම මට දකින්ට නුදුන මැනවයි
කීවේය.

## වැඩිමහල්ලන් සැත්තෑදෙනා

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 16
කොට: සෙනඟගේ වැඩිමහල්ලන් ව ඔවුන්
කෙරේ මුලාදෑනීන්ව සිටින බව නුඹ
දන්නාවූ ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ගෙන්
සැත්තෑදෙනෙකු මට රැස් කර ඔවුන්
නුඹ සමග සිටින පිණිස සම්මුඛවීමේ
කූඩාරම ළඟට කැඳවාගන වරෙන්න.
මම බැස එහිදී නුඹ සමග කථා- 17
කරන්නෙමි. නුඹ තනියම සෙනඟගේ
බර නුසුලා, ඔවුන් නුඹ සමග එය
උසුලන පිණිස නුඹ කෙරෙහි තිබෙන
ආත්මයෙන් ගෙන මම ඔවුන් කෙරෙහි
තබන්නෙමි. නුඹ සෙනඟට කථාකොට: 18
හෙට දවසට පවිත්‍ර වෙයල්ලා, එවිට
නුඹලා මාංස කන්නහුය. මක්නිසාද
නුඹලා: අපට මස් කන්ට දෙන්නේ කවුද?
මිසරයෙහිදී අපි සැප වින්දෙමුයයි
කියමින් ස්වාමීන්වහන්සේගේ කන්වලට
ඇසෙන්ට වැලපුණාහුය. එබැවින්
ස්වාමීන්වහන්සේ නුඹලාට මාංස
දෙනවා ඇත, නුඹලාද කන්නහුය.
නුඹලා අතරේ සිටින ස්වාමීන්වහන්සේ 19
ප්‍රතික්ෂේපකොට: අපි කුමක් නිසා
මිසරයෙන් ආවෙමුදැයි කියමින් උන්-
වහන්සේ ඉදිරියෙහි වැලපුණු බැවින්,
එක දවසක් නොව දෙදවසක් නොව 20
පස් දවසක් නොව දස දවසක්

නොව විසි දවසක් නොව මාසයක්
මුළුල්ලේම මාංස තුඹලාගේ නාස්පුඩු-
වලින් නික්ම තුඹලාට පිළිකුල් වන
තුරු තුඹලා ඒවා කනවා ඇතැයි
සෙනඟට කියාපන්නැයි කීසේක.
21 මෝසෙස් කියනුයේ: මා වෙත සිටින
පයින් යන සෙනඟ සලක්ෂයක; එහෙත්
මාසයක් මුළුල්ලෙහි ඔවුන්ට මස් කන්ට
22 දෙන්නෙමියි ඔබ කීසේක. ඔවුන්
තෘප්තියට පමුණුවන පිණිස එළු බැටළු
රැළවල්ද ගව රැළවල්ද ඔවුන් නිසා මැරිය
හැක්කේද? නොහොත් ඔවුන් සෑහීමට
පමුණුවන පිණිස මුහුදේ සියලු මත්-
ස්‍යයන් ඔවුන් උදෙසා රැස්කළ හැක්කේ-
දැයි කීයේය.
23 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
කොට: **ස්වාමීන්වහන්සේගේ** හස්තය
ලුහුඬුව තිබේද? මගේ වචනය ඉෂ්ට
වේද නැද්ද කියා දැන් තුඹට පෙනේ-
24 යයි කීසේක. එවිට මෝසෙස් පිටතට
ගොස් **ස්වාමීන්වහන්සේගේ** වචන
සෙනඟට කියා, සෙනඟ අතරෙන් වැඩි-
මහල්ලන් සැත්තෑදෙනෙකු රැස්කොට
ඔවුන් කූඩාරම වටකර සිටෙව්වේය.
25 **ස්වාමීන්වහන්සේ** වලාකුළ පිරිවරා
බැස්සසේක්, ඔහුට කථාකොට: ඔහු
කෙරෙහි තිබුණු ආත්මයෙන් ගෙන
වැඩිමහල්ලන් සැත්තෑදෙනා කෙරෙහි
තැබූසේක. එසේ ආත්මය ඔවුන් කෙරෙහි
පිහිටි කල ඔව්හු ප්‍රොපේත වාක්‍ය
කීවෝය, නුමුත් පසුව එසේ නොකීවෝය.
26 එහෙත් මනුෂ්‍යයෝ දෙදෙනෙක් කඳවුරෙහි
නැවතී සිටියෝය, එක්කෙනෙකුගේ නම
එල්දද්ය, අනික් අයගේ නම මේදද්ය.
ආත්මය ඔවුන් කෙරෙහිද පිහිටියේය;
ඔව්හු ලියනලද්දවුන්ට ඇතුළත්ව සිටිය
නුමුත් කූඩාරම ළඟට නොගියෝය.
ඔව්හුද කඳවුරෙහිදී දිව්‍ය වාක්‍ය කීවෝය.
27 තරුණයෙක් දිවගොස් මෝසෙස්ට
කථාකොට: එල්දද් සහ මේදද්
කඳවුරෙහි සිට දිව්‍ය වාක්‍ය කියතියි
28 කීය. මෝසෙස්ගේ මෙහෙකරුවූ
ඔහුගේ තෝරාගත් මනුෂ්‍යයන්ගෙන්
කෙනෙක්වූ නූන්ගේ පුත්‍රවූ යෝෂුවා
උත්තරදෙමින්: මෝසෙස් ස්වාමීනි, ඔවුන්
තහනම්කළ මැනවයි කීය. මෝසෙස්ද: 29
තුඹ මා නිසා ඊර්ෂ්‍යාවෙනවාද?
**ස්වාමීන්වහන්සේගේ** සියලු සෙනඟ
ප්‍රොපේතවරුන් වෙන ලෙස **ස්වාමීන්-
වහන්සේ** තමන්ගේ ආත්මය ඔවුන්
කෙරෙහි තැබුවොත් යෙහෙකැයි කීවේය.
පසුව මෝසෙස්ද ඉශ්‍රායෙල් වැඩිමහල්- 30
ලෝද කඳවුර ඇතුළට ගියෝය.

## වටුවන් සහ පීඩාව

එවිට **ස්වාමීන්වහන්සේ** කෙරෙන් 31
සුළඟක් නික්ම ගොස් වටුවන් මුහුදෙන්
පමුණුවා කඳවුර ළඟ මෙහායින් දවසක
ගමන් පමණද එහායින් දවසක ගමන්
පමණද දුරටත් පොළොව මතුපිට
දෙරියනක් පමණ උසටත් කඳවුර
හාත්පසින් උන් වැටෙන්ට සැලැස්විය.
සෙනඟ ඒ දවස මුළුල්ලෙහිත් රෑ 32
මුළුල්ලෙහිත් පසුව ද මුළුල්ලෙහිත් නැගිට
සිට වටුවන් එකතුකළෝය. ඉතාම ස්වල්ප
වශයෙන් එකතුකළ තැනැත්තේ හෝමෙර
දසයක් එකතුකරගත්තේය. ඔව්හු කඳවුර
හාත්පස උන් තමුන්ටම අතුරා තබා-
ගත්තෝය. නුමුත් මාංස ඔවුන්ගේ 33
දත් අතරේ තිබෙද්දීම, ඒවා විකන්ට
පළමුවෙන්, **ස්වාමීන්වහන්සේගේ** උදහස
සෙනඟට විරුද්ධව ඇවිළුණේය, **ස්වාමීන්-
වහන්සේ** ඉතා මහත් වසංගතයකින්
සෙනඟට පහරදුන්සේක. තෘෂ්ණාධික 34
සෙනඟ එහි තැන්පත් කරනු ලැබූ බැවින්
ඒ ස්ථානයට *කිබ්‍රොත්-හත්තාවා යන
නම තබන ලද්දේය. සෙනඟ කිබ්‍රොත්- 35
හත්තාවායෙන් නික්ම හශේරොත්ට
පිටත්ව ගොස් හශේරොත්හි නැවතී
සිටියෝය.

## මිරියාම් සහ ආරොන්ගේ කෙඳිරිම

12 මෝසෙස් පාවාගත් කුෂ් ස්ත්‍රිය
නිසා මිරියාම් සහ ආරොන් ඔහුට
විරුද්ධව කථාකළෝය. මක්නිසාද ඔහු

*එනම්, තෘෂ්ණා සොහොන්පළ

කුෂ් ස්ත්‍රියෙක් සරණපාවාගෙන සිටියේය.
2 ඔව්හුද: ස්වාමීන්වහන්සේ කථා-
කෙරෙවුවේ මෝසෙස් ලවා පමණක්ද?
උන්වහන්සේ අප ලවාත් කථානො-
කෙරෙවුසේක්දැයි කීවෝය. ස්වාමීන්-
3 වහන්සේ ඒක ඇසූසේක. මෝසෙස්
නම් මනුෂ්‍යා තෙමේ පොළෝ මතුයෙහි
සිටි සියලු මනුෂ්‍යයන්ට වඩා අධික
වශයෙන් මෘදු ගුණාන්විත කෙනෙක්
4 වූයේය. ස්වාමීන්වහන්සේ එකෙණෙහිම
මෝසෙස් හා ආරොන්ටත් මිරියාම්ටත්
කථාකොට: නුඹලා තුන්දෙනා සම්-
මුඛවීමේ කූඩාරම ළඟට පිටතට
වරෙල්ලායයි කීසේක. ඔවුන් තුන්දෙනා
5 පිටතට ආවෝය. ස්වාමීන්වහන්සේ
වලාටැඹකින් ඇවිත් කූඩාරමේ දොරකඩ
සිට ආරොන්ට සහ මිරියාම්ට අඬගැසූ-
සේක. ඒ දෙදෙනා ඉදිරියට ආවෝය.
6 උන්වහන්සේද: මාගේ වචන අසාපල්ලා.
නුඹලා අතරෙහි ප්‍රොපේත කෙනෙක්
සිටිනම් ස්වාමිවූ මම ඔහුට දර්ශනයකින්
ප්‍රකාශවෙන්නෙමි, හීනයකින් මම ඔහුට
7 කථාකරන්නෙමි. මාගේ මෙහෙකරුවූ
මෝසෙස් එසේ නොවේ; ඔහු මාගේ
8 මුළු ගෘහයෙහි ඉතා විශ්වාසිකය. මම
ඔහු සමග අඳුරු කථාවලින් නොව
මුවෙන් මුව ප්‍රකාශ ලෙස කථාකරමි;
ස්වාමීන්වහන්සේගේ ස්වරූපයද ඔහු
බලන්නේය. එබැවින් නුඹලා මාගේ
මෙහෙකරුවූ මෝසෙස්ට විරුද්ධව
කථාකරන්ට භයනූණේ කෙසේදැයි
9 කීසේක. ස්වාමීන්වහන්සේගේ උදහස
ඔවුන්ට විරුද්ධව ඇවිළී, උන්වහන්සේ
10 අහක්ව ගියසේක. වලාකුළද කූඩාරම
මතුයෙන් පහව ගියේය; බලව,
මිරියාම් කුෂ්ඨ රෝගීව හිම මෙන්
සුදුවූවාය. ආරොන් මිරියාම් දෙස
11 බැලූවිට ඈ කුෂ්ඨ සහිත වූවාය. ආරොන්
මෝසෙස්ට කථාකොට: අහෝ මාගේ
ස්වාමිනි, අප විසින් මෝඩ ලෙස හැසිර
කළාවූ පාපය අප කෙරෙහි නොතැබුව-
12 මැනවි. ඈ තමාගේ මාංසයෙන් භාගයක්
දිරා ගොස්, මවු කුසෙන් බිහිවෙන මළ
දරුවෙකු මෙන් වෙන්ට නොහරින මෙන්
අයදිමියි කීවේය. මෝසෙස්ද: අනේ 13
දෙවියන්වහන්ස, ඈ සුවකළමැනවයි
ස්වාමීන්වහන්සේට හඬගැසීය. ස්වාමීන්- 14
වහන්සේද: ඇගේ පියා ඇගේ මුහුණට
කෙළගැසුවේනම් ඒකට පවා ඈ
සත් දවසක් ලජ්ජාවෙන් නොසිටින්නීද?
ඈ සත් දවසක් කඳවුරෙන් පිටත වසා
තබනු ලැබ පසුව ඇතුළට ගනුලබාවයි
ඔහුට කීසේක. එසේ මිරියාම් කඳවුරෙන් 15
පිටත සත් දවසක් වසා තබනලද්දීය.
සෙනඟ වනාහි මිරියාම් ඇතුළට
ගෙනෙන තෙක් ගමන් නොකළෝය. පසුව 16
සෙනඟ හශේරොත්හි සිට පිටත්ව
ගොස් පාරාන් කාන්තාරයෙහි කූඩාරම්
ගසාගත්තෝය.

## 13

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කියනසේක්: මා විසින් ඉශ්‍රායෙල් 2
පුත්‍රයන්ට දෙන කානාන් දේශය
සෝදිසිකරන පිණිස මනුෂ්‍යයන්
යවාපන්න. තම තමාගේ පිය ගෝත්‍රයෙන්
එක්කෙනෙකු බැගින් ඔවුන් අතරේ
අධිපතිව සිටින තැනැත්තන්ම යවා-
පන්නැයි කීසේක. මෝසෙස් ස්වාමීන්- 3
වහන්සේගේ ආඥාව ලෙස පාරාන්
කාන්තාරයේ සිට ඔවුන් යැවුවේය. ඔවුන්
සියල්ලෝම ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ප්‍රධානියෝව සිටි මනුෂ්‍යයෝය. ඔවුන්ගේ 4
නාමවල් මේය: රූබෙන් ගෝත්‍රයෙන්
සක්කූර්ගේ පුත්‍රවූ ෂම්මුවාය. සිමියොන් 5
ගෝත්‍රයෙන් හොරීගේ පුත්‍රවූ ෂාඵාත්ය.
යූදා ගෝත්‍රයෙන් යෙෆුන්නෙගේ පුත්‍රවූ 6
කාලෙබ්ය. ඉස්සාඛර් ගෝත්‍රයෙන් 7
යෝසෙප්ගේ පුත්‍රවූ ඉගාල්ය. එප්‍රායිම් 8
ගෝත්‍රයෙන් නූන්ගේ පුත්‍රවූ හෝෂෙයාය.
බෙන්යමින් ගෝත්‍රයෙන් රාෆුගේ පුත්‍රවූ 9
පල්තීය. සාබුලොන් ගෝත්‍රයෙන් සෝදීගේ 10
පුත්‍රවූ ගද්දීයෙල්ය. යෝසෙප් ගෝත්‍රයෙන් 11
එනම් මනස්සේ ගෝත්‍රයෙන් සූසිගේ
පුත්‍රවූ ගද්දීය. දාන් ගෝත්‍රයෙන් 12
ගෙමල්ලීගේ පුත්‍රවූ අම්මීයෙල්ය. ආෂේර් 13
ගෝත්‍රයෙන් මිකායෙල්ගේ පුත්‍රවූ
සෙතූර්ය. නප්තලී ගෝත්‍රයෙන් වොප්සීගේ 14
පුත්‍රවූ නාබීය. ගාද් ගෝත්‍රයෙන් 15
මාකීගේ පුත්‍රවූ ගෙවුයෙල්ය. දේශය 16

සෝදිසි කරන පිණිස මෝසෙස් යැවූ
මනුෂ්‍යයන්ගේ නාමවල් මේය. මෝසෙස්
නූන්ගේ පුත්‍රවූ හෝෂෙයාට යෝෂුවා-
17 යයි නම්තැබුවේය. එසේ කානාන් දේශය
සෝදිසිකරන පිණිස මෝසෙස් ඔවුන්
යවමින්: තුඹලා මේ දකුණු දිශාවෙන්
18 ගොස් කඳුකරයට නැගී දේශය කොයි
ආකාරද කියාත්, එහි වසන සෙනඟ
බලවත්ද දුර්වලද ස්වල්පද බොහෝද
19 කියාත්, ඔවුන් වාසයකරන දේශය
හොඳද නරකද කියාත්, ඔවුන් සිටින
නුවරවල් කොයි ආකාරද, ඔවුන්
වසන්නේ කූඩාරම්වලද බලකොටුවලද
20 කියාත්, දේශය සශ්‍රීකද නිශ්‍රීකද, එහි
මූකළාන් ඇද්ද නැද්ද කියාත් බලාපල්ලා.
තුඹලා ධෛර්යවත්ව සිට දේශයේ
ඵලවලින් ගෙනෙල්ලායයි කීවේය. ඒ
කාලය ප්‍රථම මුද්‍රික ඵල වාරයව
21 තිබුණේය. එසේ ඔව්හු ගොස් ශීන්
කාන්තාරයේ පටන් හමාත්ට යන
තැන තිබෙන රෙහොබ් දක්වා දේශය
22 සෝදිසිකළෝය. ඔව්හු දකුණු දිශාවේ
නැගී ගොස් හෙබ්‍රොන්ට පැමුණුණෝය;
එහි අනාක්ගේ පුත්‍රයන් වන අහීමන්ද
ෂේෂයිද තල්මයිද සිටියෝය. (හෙබ්‍රොන්
නුවර මීසරයේ ශෝවන් නුවරට සත්
අවුරුද්දකට ප්‍රථමයෙන් ගොඩනගනලදී.)
23 ඔව්හු එෂ්කොල් මිටියාවතට අවුත්
එතැනින් එක මුද්‍රික පොකුරක් ඇති
අත්තක් කපාගත්තෝය, දෙදෙනෙක් ඒක
දණ්ඩක තබාලාගන ආවෝය; ඔව්හු
දෙළුම් හා අත්තික්කාත් ගෙනාවෝය.
24 ඉශ්‍රායෙල් පුත්‍රයන් එහිදී කපාගත්
මුද්‍රික පොකුර නිසා ඒ ස්ථානයට
එෂ්කොල් මිටියාවතයයි නම් තබන
25 ලද්දේය. ඔව්හු දේශය සෝදිසිකර
සතළිස් දවසකට පසු හැරී ඇවිත්,
26 මෝසෙස් සහ ආරොන්ද ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ මුළු සභාවද වෙතට
පාරාන් කාන්තාරයෙහිවූ කාදෙෂ්ට
පැමිණ ඔවුන්ටත් මුළු සභාවටත්
තොරතුරු දන්වා දේශයේ ඵල ඔවුන්ට
27 පෙන්නුවෝය. ඔව්හු ඔහුට කථාකොට:
ඔබ අප යැවූ දේශයට ගියෙමුව, සැබවින්
එහි කිරි සහ මීපැණි ගලායයි; එහි ඵල
මේය. එසේවීනමුත් දේශයෙහි සිටින 28
සෙනඟ බලවත්ය, නුවරවල්ද ප්‍රාකාර
සහිතව ඉතා මහත්ය. ඒ ඇරත් අනාක්ගේ
පුත්‍රයන් එහි දුටිමුව. අමලෙක්වරු දකුණු 29
දිසාවේ රටෙහි වාසය කරති. හිත්තීවරුත්
යෙබූසිවරුත් අමෝරිවරුත් කඳුකරයෙහි
වාසයකරති. කානානිවරු මුහුදු බඩද
යොර්දන් අසබඩද වාසයකරතියි
කීවෝය. කාලෙබ් මෝසෙස් ඉදිරියෙහි 30
සෙනඟ නිශ්ශබ්ද කරවා: අපි වහාම
නැගී ගොස් ඒක හිමිකර ගනිමු;
මක්නිසාද අපට ඒක යටත්කරගන්ට
හොඳටම පුළුවනැයි කීය. එහෙත් ඔහු 31
සමග ගිය මනුෂ්‍යයෝ කථාකොට: ඒ
සෙනඟට විරුද්ධව යන්ට අපට නො-
හැකිය; මක්නිසාද ඔවුන් අපට වඩා
බලවත්යයි කීවෝය. ඔව්හු තමුන් 32
සෝදිසිකළ දේශය ගැන ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙහි නරක ප්‍රවෘත්තියක්
පතළකරමින්: අප සෝදිසිකරන්ට ගිය
දේශයනම් වැසියන් නාස්තිකරදමන
දේශයක්ය; එහි අප විසින් දක්නාලද
සෙනඟ සියල්ලෝම බොහෝ උස මහත
ඇති මනුෂ්‍යයෝය. එහි යෝධයන්ගෙන් 33
පැවත එන අනාක්ගේ පුත්‍රයන් වන
යෝධයන් දුටිමුව. අප පළඟැටියන් මෙන්
අපටම පෙනුණේය, එසේම ඔවුන්ටත්
අප පෙනුණේයයි කීවෝය.

## සෙනඟ මැසිවිලි කීම හා සතළිස් අවුරුද්දක් මාර්ගයෙහි මංමුළාවීම

14 එවිට මුළු සභාව ශබ්දනගා
හැඬුවාය; සෙනඟ ඒ රාත්‍රියේ
වැලපුණෝය. සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ 2
මෝසෙස්ටත් ආරොන්ටත් විරුද්ධව
කොඳුළෝය. මුළු සභාව ඔවුන්ට
කථාකර: අහෝ අපි මීසර දේශයෙහි
මෙළෙමු නම් යහපත; නොහොත් මේ
කාන්තාරයෙහි මෙළෙමුනම් යහපත.

3 අප කඩුවෙන් වැටෙන පිණිස ස්වාමීන්-
වහන්සේ මේ දේශයට අප ගෙනෙන්නේ
මක්නිසාද? අපේ භාර්යාවන්ද බාලයන්ද
කොල්ලයක් වෙනවා ඇත. මිසරයට
හැරීයාම අපට හොඳ නොවේදැයි
4 කීවෝය. තවද ඔව්හු එකිනෙකාට
කථාකොට: අපි ප්‍රධානියෙකු පත්කරගෙන
5 මිසරයට හැරීයමුයයි කීවෝය. එවිට
මෝසෙස් හා ආරොන් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ සභාවේ මුළු සමූහයා
6 ඉදිරියෙහි මුහුණින් වැටුණෝය. දේශය
සෝදිසිකළවුන්ගෙන් නූන්ගේ පුත්‍රවූ
යෝෂුවාද යෙපුන්නෙගේ පුත්‍රවූ කාලෙබ්ද
7 තමුන්ගේ වස්ත්‍ර ඉරාගෙන, ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ මුළු සභාවට කථාකොට:
අප සෝදිසි කරන්ට ගිය දේශය ඉතාම
8 හොඳ දේශයක්ය. **ස්වාමීන්වහන්සේ** අප
කෙරෙහි ප්‍රසන්නවනසේක්නම් කිරි සහ
මීපැණි ගලායන ඒ දේශයට අප
පමුණුවා ඒක අපට දෙනවා ඇත.
9 **ස්වාමීන්වහන්සේට** විරුද්ධව කැරළි-
ගැසීමක් නම් නොකරල්ලා, ඒ දේශයේ
සෙනඟට භයනොවෙල්ලා; මක්නිසාද
ඔව්හු අපට ගොදුරු වැනිය. ඔවුන්ගේ
ආරක්ෂාව ඔවුන් කෙරෙන් පහව ගියාය,
**ස්වාමීන්වහන්සේ** අප සමග සිටිනසේක.
ඔවුන්ට භය නොවෙල්ලායයි කීවෝය.
10 එහෙත් මුළු සභාව ගල්ගසා ඔවුන්
මරන්ට කීහ. **ස්වාමීන්වහන්සේගේ**
මහිමයද සම්මුඛවීමේ කූඩාරමේදී සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට පෙනුණේය.
11 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
කොට: මේ සෙනඟ කොපමණ කල් මා
හෙළාදකින්නෝද? ඔවුන් අතරෙහි මා
විසින් කළ සියලු ලකුණු දැකලාවත්
කොපමණ කල් ඔව්හු මා අදහා
12 නොගෙන සිටින්නෝද? මම වසංගතයෙන්
ඔවුන්ට පහරදී, ඔවුන් අහිමිකොට,
ඔවුන්ට වඩා මහත්වූ බලවත්වූ සෙනඟක්
නුඹෙන් හටගන්වන්නෙමියි කීසේක.
13 මෝසෙස් **ස්වාමීන්වහන්සේට** කථා-
කොට: එවිට මිසරවරුන්ට එය
සැලවෙනවා ඇත; මක්නිසාද ඔබ ඔවුන්
අතරෙන් මේ සෙනඟ ඔබගේ
පරාක්‍රමයෙන් ගෙනාසේක; ඔව්හු මේ 14
දේශයෙහි වැසියන්ටද ඒක කියන්නාහුය.
**ස්වාමීන්වහන්ස**, ඔබ මේ සෙනඟ මැද
සිටිනසේකැයි ඔවුන් විසින් අසන-
ලද්දේය; මක්නිසාද **ස්වාමීන්වහන්ස**, ඔබ
මුහුණට මුහුණ ලා දක්නාලබනසේක,
ඔබගේ වලාකුළ මොවුන් මතුයෙහි තිබේ.
ඔබ දවාලෙහි වලා ටැඹකින්ද රාත්‍රියෙහි
ගිනි ටැඹකින්ද මොවුන්ට පෙරටුව
යනසේක. ඉදින් ඔබ දැන් මේ සෙනඟ 15
එක්කෙනෙකු මෙන් මරනසේක් නම්
ඔබගේ කීර්තිය ඇසූ ජාතීන් කථා-
කරමින්: **ස්වාමීන්වහන්සේ** මේ සෙනඟට 16
දිවුළ දේශයට ඔවුන් පමුණුවන්ට නො-
හැකිවූ බැවින් උන්වහන්සේ ඔවුන්
කාන්තාරයෙහි මරා දැමූසේකැයි
කියනවා ඇත. එබැවින් ඔබ කථා- 17
කොට: **ස්වාමීන්වහන්සේ** උදහස් වීමට
ප්‍රමාදවනසේක. බොහෝ දයාවෙන්
යුක්තය, උන්වහන්සේ අයුතුකම හා වරද 18
ක්ෂමාකරනසේක, එහෙත් අපරාධීන්
කොයි ආකාරයකින්වත් නිර්දෝෂ
නොකරනසේක; තුන්වෙනි සතරවෙනි
පරම්පරාව දක්වා පියවරුන්ගේ අයුතුකම
ගැන දරුවන්ට ප්‍රතිඵල දෙනසේකැයි
කීලෙසම **ස්වාමීන්වහන්සේගේ** බලය
මහත් වේවා. ඔබවහන්සේගේ දයාවේ 19
මහත්කම ලෙසද මේ සෙනඟ මිසරයෙහි
සිටින කාලයේ පටන් මේ දක්වා ඔබ
මේ සෙනඟට කමාවුණාක් මෙන්ද මේ
සෙනඟගේ අයුතුකමට කමාවුණ-
මැනවයි කීවේය. **ස්වාමීන්වහන්සේද**: 20
නුඹේ වචනය ප්‍රකාරයට කමාවුණෙමි.
එහෙත් මා ජීවත්ව සිටිනවාත් මුළු 21
පොළොව **ස්වාමීන්වහන්සේගේ** තේජසෙන්
පූර්ණකරනු ලබනවාත් සැබෑවාසේම,
මාගේ තේජසත් මිසරයෙහිදී හා 22
කාන්තාරයෙහිදී මා විසින් දැක්වූ ලකුණුත්
දුටුවාවූ මේ සියලු මනුෂ්‍යයන් මාගේ
හඬට කීකරුනොවී දැන් දසවරක් මා
පරීක්ෂාකළ බැවින්, සැබවින් මා විසින් 23
ඔවුන්ගේ පියවරුන්ට දෙන ලෙස දිවුළ
දේශය ඔව්හු නොදක්නෝය, මා

හෙළාදක්වූ කිසිවෙක්වත් ඒක නො-
24 දක්නේය. එහෙත් මාගේ මෙහෙකරුවූ
කාලෙබ්ට වෙන ආකාර සිතක් තිබුණු
බැවින්ද ඔහු සම්පූර්ණ ලෙස මා අනුව
ආ බැවින්ද ඔහු ගිය දේශයට මම ඔහු
පමුණුවන්නෙමි; ඔහුගේ වංශයද එය
25 හිමිකරගන්නේය. දැන් අමලෙක්වරුන්ද
කානානිවරුන්ද මිටියාවතෙහි වාසය-
කරන බැවින් හෙට නුඹලා හැරී රතු
මුහුදට යන මාර්ගයෙන් කාන්තාරයට
පිටත්ව පලයල්ලායයි කීසේක.
26 **ස්වාමීන්වහන්සේ** මෝසෙස් සහ
27 ආරොන්ටද කථාකොට: මට විරුද්ධව
කොඳුරන මේ දුෂ්ට සභාව ගැන
කොපමණ කල් ඉවසම්ද? ඉශ්‍රායෙල්
පුත්‍රයන් මට විරුද්ධව කොඳුරන
28 ඔවුන්ගේ කෙඳිරීම් ඇසීමි. ඔවුන්ට මෙසේ
කියාපන්න—මා ජීවත්ව සිටිනවා සැබෑවා
සේම මෙසේ කියමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක: නුඹලා මා ඉදිරියෙහි
29 කී ලෙසම නුඹලාට කරන්නෙමි. විසි
අවුරුද්ද පටන් ඉන් ඉහළ වයස්
ඇත්තාවූ, නුඹලාගේ මුළු ගණන වන
නුඹලා අතරෙන් ගණන් කරනලද්දවූ,
මට විරුද්ධව කොඳුළාවූ නුඹලා
සියල්ලන්ගේ මළකඳන් මේ කාන්තාර-
30 යෙහි වැටෙනවා ඇත. නුඹලා යම්
දේශයක වාසයකරවමියි කියා මාගේ
අත එසවීම්ද, එහි යෙපුන්නෙගේ පුත්‍රවූ
කාලෙබ්ද නූන්ගේ පුත්‍රවූ යෝෂුවාද මිස
නුඹලා නම් කිසිසේත් ඇතුල්නො-
31 වන්නහුය. එහෙත් කොල්ලයක් වේයයි
නුඹලා කීවාවූ නුඹලාගේ බාලයන් එහි
පමුණුවන්නෙමි, ඔව්හු නුඹලා ප්‍රතික්-
32 ෂේපකළාවූ දේශය දැනගන්නෝය. එහෙත්
නුඹලාගේ මළකඳන් මේ කාන්තාරයෙහි
33 වැටෙනවා ඇත. නුඹලාගේ පුත්‍රයෝද
සතළිස් අවුරුද්දක් කාන්තාරයෙහි
එඬේරුන් මෙන් තැනින් තැන යමින්,
නුඹලාගේ මළකඳන් කාන්තාරයෙහි
ක්ෂයවී යන තෙක් නුඹලාගේ අනාචාර-
34 කම් දරන්නෝය. නුඹලා දේශය
සෝදිසිකළ දවස් ගණනවූ සතළිස්
දවසේ හැටියට දවසකට අවුරුද්දක්
බැගින් සතළිස් අවුරුද්දක් නුඹලාගේ
අයුතුකම් දරමින්, මාගේ විරෝධවීම
නුඹලා දැනගන්නහුය. ස්වාමිවූ 35
මම කථාකොට: සැබවින්ම මට
විරුද්ධව රැස්ව සිටින මේ මුළු දුෂ්ට
සභාවට මම මේක කරන්නෙමි.
මේ කාන්තාරයෙහි ඔව්හු නාස්තිවන්-
නෝය, මෙහි ඔව්හු නසින්නෝයයි
කීමියි කීසේක. දේශය සෝදිසිකරන 36
පිණිස මෝසෙස් විසින් යවන ලදුව
හැරී ඇවිත් දේශය ගැන විරුද්ධවූ නරක
ප්‍රවෘත්තියක් පළකිරීමෙන් මුළු සභාව
ඔහුට විරුද්ධව කොඳුරන්ට සැලැස්සුවාවූ
මනුෂ්‍යයෝ, එනම් දේශය ගැන නරක 37
ප්‍රවෘත්තියක් ගෙනාවාවූ මනුෂ්‍යයෝ
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි වසංගතයෙන්
මරුණාහ. එහෙත් දේශය සෝදිසිකරන්ට 38
ගිය ඒ මනුෂ්‍යයන්ගෙන් නූන්ගේ පුත්‍රවූ
යෝෂුවාද යෙපුන්නෙගේ පුත්‍රවූ කාලෙබ්ද
ජීවත්ව ඉතිරිව සිටියෝය. මෝසෙස් 39
ඒ වචන සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කීවේය. එවිට සෙනඟ බොහෝසෙයින්
වැලපුණෝය. පසුවදා ඔව්හු අලුයම 40
නැගිට කථාකර: මෙන්න, අපි මෙහිය,
**ස්වාමීන්වහන්සේ** පොරොන්දුවූ ස්ථා-
නයට නැගී යමුව, මක්නිසාද අපි
පව්කෙළෙමුයයි කියා කන්ද මුදුනට නැගී
ගියෝය. නුමුත් මෝසෙස් කථාකර: 41
සඵලයක් නොවන බව දැනගනත් නුඹලා
මෙසේ **ස්වාමීන්වහන්සේගේ** අණ කඩ
කරන්නේ මක්නිසාද? නුඹලාගේ සතුරන් 42
ඉදිරියෙහි පහර නොලබන පිණිස නැගී
නොයල්ලා. මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
නුඹලා අතරෙහි නොවන සේක.
අමලෙක්වරුන්ද කානානිවරුන්ද එහි 43
නුඹලා ඉදිරිපිට සිටින බැවින් නුඹලා
කඩුවෙන් වැටෙනවා ඇත. නුඹලා
**ස්වාමීන්වහන්සේ** අනුව යාමෙන් හැරී
ගොස් සිටින බැවින් **ස්වාමීන්වහන්සේ**
නුඹලා සමග නොසිටිනසේකැයි කීවේය.
එහෙත් ඔව්හු හිතුවක්කාරකමින් 44
කන්ද මුදුනට ගියෝය. එසේ වී නුමුත්
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටියද

මෝසෙස්ද කඳවුරෙන් පිටත්ව නො-
45 ගියෝය. එවිට ඒ කන්දේ වාසයකළ
අමලෙක්වරුද කානානිවරුද බැස ඇවිත්
ඔවුන්ට පහරදී හෝර්මා දක්වා ඔවුන්
විසුරුවාදැමූහ.

## නොයෙක් පුද පූජාවන් පිළිබඳ අණපනත්

15 තවද ස්වාමීන්වහන්සේ මෝ-
සෙස්ට කථාකොට කියනසේක්:
2 තුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකර
ඔවුන්ට මෙසේ කියාපන්න—මා විසින්
තුඹලාට දෙන තුඹලාගේ වාස භූමිය
වන්නාවූ දේශයට තුඹලා පැමිණි කල්හි,
3 භාරයක් ඉෂ්ටකිරීම පිණිස හෝ සතුටු
පඬුරක් පිණිස හෝ තුඹලාගේ නියම
මංගල්‍යවලදී හෝ ගවරැළෙන්වත් එළු
බැටළු රැළෙන්වත් ස්වාමීන්වහන්සේට
මිහිරි සුවඳක් කොට තුඹලා ගිනි
පූජාවක් ඔප්පුකරනවිට, ඒක දවන
පූජාවක් තුමුත් යාග පූජාවක් තුමුත්,
4 එසේ තමාගේ පූජාව ස්වාමීන්වහන්සේට
ඔප්පුකරන්නා ආහාර පූජාවක් පිණිස
තෙල් හිනකින් සතරෙන් කොටසක්
සමග සිහින් පිටි ඒඵාවකින් දසයෙන්
5 කොටසක් මිශ්‍රකර ඔප්පුකෙරේවා. පාන
පූජාවක් පිණිස මුද්‍රිකපාන හිනකින්
සතරෙන් කොටසක් දවන පූජාවට තුමුත්
යාග පූජාවට තුමුත් ඒක ඒක බැටළු-
6 පැටවා සමග ඔප්පුකරපන්න. බැටළුවෙකු
සමග නම් ආහාර පූජාවක් පිණිස තෙල්
හිනකින් තුනෙන් කොටසක් සමග සිහින්
පිටි ඒඵාවකින් දසයෙන් දෙකොටසක්
7 මිශ්‍රකර ඔප්පුකරපන්න. පාන පූජාවක්
පිණිස මුද්‍රිකපාන හිනකින් තුනෙන්
කොටසක්ද ස්වාමීන්වහන්සේට මිහිරි
8 සුවඳක් පිණිස ඔප්පුකරපන්න. තුඹ
භාරයක් ඉෂ්ට කිරීමටවත් ශාන්ති පූජා
පිණිසවත් ගොනෙක් දවන පූජාවක්
පිණිස නොහොත් යාග පූජාවක් පිණිස
ස්වාමීන්වහන්සේට ඔප්පුකරන විට,
9 ගොනා සමග ආහාර පූජාවක් පිණිස
තෙල් හිනකින් භාගයක් සමග සිහින්
පිටි ඒඵාවකින් දසයෙන් තුන් කොටසක්
මිශ්‍රකර ඔප්පු කෙරේවා. පාන පූජාවක් 10
පිණිස ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳ
ඇති ගිනි පූජාවක් පිණිස මුද්‍රිකපාන
හිනකින් භාගයක්ද ඔප්පුකරපන්න. ඒක 11
ඒක ගවයාට වුණත් ඒක ඒක බැටළුවාට
වුණත් ඒක ඒක බැටළුපැටවාට වුණත්
ඒක ඒක එළුපැටවාට වුණත් එලෙස
කළ යුතුය. තුඹලා පිළියෙළ කරන 12
ගණනේ හැටියට උන්ගේ ගණනෙන් ඒක
ඒකා ගැන එසේ කරපන්න. ස්වාමීන්- 13
වහන්සේට මිහිරි සුවඳක් ඇති ගිනි
පූජාවක් ඔප්පුකිරීමට ස්වදේශීවූ
සියල්ලෝ මේ දේ මේ ප්‍රකාරයට
කරත්වා. තුඹලා සමග සිටින විදේශියෙක් 14
තුමුත් තුඹලාගේ පරම්පරාවල තුඹලා
අතරෙහි සිටින වෙන කවුරු තුමුත්
ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳක් ඇති
ගිනි පූජාවක් ඔප්පුකරන විට තුඹලා
කරන්නාක්මෙන් ඔහුද කළ යුතුය. මුළු 15
සභාවට එනම් තුඹලාටත් තුඹලා සමග
සිටින විදේශියාටත් ඒක පනතක්
වන්නේය, එය තුඹලාගේ පරම්පරාවලට
සදාකාල පනතක්ය. ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි තුඹලා යම් ආකාරද
විදේශියාත් එයාකාරව සිටීවා.
තුඹලාටත් තුඹලා සමග සිටින 16
විදේශියාටත් ඒක ව්‍යවස්ථාවක් හා ඒක
නියෝගයක් තිබිය යුතුයයි කීසේක.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 17
කොට කියනසේක්: තුඹ ඉශ්‍රායෙල් 18
පුත්‍රයන්ට කථාකර ඔවුන්ට මෙසේ කියා-
පන්න—මා විසින් තුඹලා පමුණුවන
දේශයට තුඹලා ඇතුල්ව, දේශයේ රොටි 19
කන කල්හි ස්වාමීන්වහන්සේට එසවීමේ
පූජාවක් ඔප්පුකරපල්ලා. ප්‍රථමකොට 20
අනාපු පිටියෙන් තුඹලා රොටියක් සාද
එසවීමේ පූජාවක් පිණිස ඔප්පුකරපල්ලා.
පාවරේ එසවීමේ පූජාව මෙන් ඒකත්
ඔසවාපල්ලා. තුඹලාගේ ප්‍රථමකොට 21
අනාපු පිටියෙන් තුඹලාගේ පරම්පරා-
වන්හි ස්වාමීන්වහන්සේට එසවීමේ
පූජාවක් ඔප්පුකරපල්ලා.

22 තුඹලාට වැරදිලා, තුඹලා **ස්වාමීන්-
වහන්සේ** මෝසෙස්ට කීවාවූ මේ
23 සියලු ආඥා, එනම් **ස්වාමීන්වහන්සේ**
ආඥා පැණෙවූ දවස පටන් තුඹලාගේ
පරම්පරාවන්හි පවත්වාගනයන්ට
**ස්වාමීන්වහන්සේ** මෝසෙස් ලවා
තුඹලාට අණකෙරෙවූ සියල්ලෙන් යමක්
24 නොකර ඇරියොත්, එය සභාවේ
දැනගැන්ම නැතුව වැරදිල්ලකින් කරන
ලද්දේ නම්, මුළු සභාව **ස්වාමීන්-
වහන්සේට** මිහිරි සුවඳක් පිණිස, දවන
පූජාවක් පිණිස, එක තරුණ ගොනෙක්ද
නියමයේ හැටියට උගේ ආහාර පූජාවද
පාන පූජාවද පාප පූජාවක් කොට
25 එක එළුවෙක්ද ඔප්පුකරාවා. පූජකයාද
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාව උදෙසා
සමගිකමක් කෙරේවා, එවිට ඔවුන්ට
කමාව ලැබේ; මක්නිසාද ඒක
වැරදිල්ලක්ය, ඔව්හුද **ස්වාමීන්වහන්සේට**
ගිනි පූජාවක් කොට තමුන්ගේ පූජාව
සහ තමුන්ගේ පාප පූජාවත් තමුන්ගේ
වැරදිල්ල ගැන **ස්වාමීන්වහන්සේ** ඉදිරියට
26 ගෙනාවාහුය. එසේ වැරදිල්ලකින් මුළු
සෙනඟ එය කළ බැවින් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ මුළු සභාවටත් ඔවුන්
අතරෙහි සිටින විදේශියාටත් කමාව
27 ලැබේ. එක්කෙනෙක් වැරදිල්ලකින් පව්-
කරන්නේනම් ඔහු පාප පූජාවක් පිණිස
එක් අවුරුදු එළුදෙනකු පූජාකරාවා.
28 පූජකයාද එසේ වැරදිල්ලකින් නොදැන
පව්කරන අය උදෙසා සමගිකමක්
කිරීමෙන් ඔහුට කමාව ලැබෙන පිණිස
ඔහු උදෙසා **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
29 සමගිකමක් කරාවා. වැරදිල්ලකින් යමක්
කරන අය ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි
ස්වදේශියෙක් වුණත් ඔවුන් අතරෙහි
වසන විදේශියෙක් වුණත් ඔවුන් ගැන
එක ව්‍යවස්ථාවක් තුඹලාට වන්නේය.
30 එහෙත් ස්වදේශියාවත් විදේශියාවත්
එඩි සිතින් යමක් කරන්නේනම්, ඒ අය
**ස්වාමීන්වහන්සේට** අපහාස කරන
බැවින්, ඔහු තමාගේ සෙනඟ අතරෙන්
සිඳදමනු ලබන්නේය. මක්නිසාද ඔහු 31
**ස්වාමීන්වහන්සේගේ** වචනය සුළුකොට
සිතා උන්වහන්සේගේ ආඥාව කඩ-
කෙළේය; ඔහු සහමුලින්ම සිඳදමනු
ලබන්නේය, ඔහුගේ අයුතුකම ඔහුට
වන්නේයයි කීසේක.

ඉශ්‍රායෙල් පුත්‍රයන් කාන්තාරයෙහි 32
සිටියදී මනුෂ්‍යයෙක් සබත් දවසේ දර
එකතුකරනවා ඔව්හු දුටුවෝය. එසේ 33
ඔහු දර එකතුකරනවා දුටු අය මෝසෙස්
හා ආරොන්ද මුළු සභාවද වෙතට
ඔහු ගෙනාවෝය. එවිට, ඔහුට කළ 34
යුතු දේ දන්වා නොතිබුණු බැවින් ඔහු
හිරඅඩස්සි කළෝය. **ස්වාමීන්වහන්සේද**: 35
ඒ මනුෂ්‍යයා සැබැවින් මරනු ලැබිය
යුතුය. මුළු සභාව කඳවුරෙන් පිටතදී
ගල්ගසා ඔහු මරත්වයි මෝසෙස්ට
කීසේක. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට 36
අණකළ ලෙස මුළු සභාව කඳවුරෙන්
පිටතට ඔහු ගෙනගොස් ඔහුට ගල්
ගැසුවාය, ඔහු මෙළේය.

**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 37
කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 38
කථාකරමින්, ඔවුන්ගේ පරම්පරාවලදී
තමුන්ගේ වස්ත්‍ර වාටිවල දවලු සාදගන
එක එක වාටියේ දවල්ල පිට නිල් පටියක්
අල්ලන හැටියට ඔවුන්ට කියාපන්න.
තුඹලා දවල්ල බලා **ස්වාමීන්වහන්සේගේ** 39
සියලු ආඥා සිහිකොට ඒවා කරන
පිණිසත්, තුඹලා පුරුදු ලෙස
අනාචාරකම් කරමින් තුඹලාගේ
සිත්ද ඇස්ද අනුව නොයන පිණිසත්,
තුඹලා මාගේ සියලු ආඥා සිහිකොට 40
ඒවා පවත්වමින් තුඹලාගේ දෙවියන්-
වහන්සේට ශුද්ධව සිටින පිණිසත්, එබඳු
දවල්ලක් තුඹලාට තිබේවා. තුඹලාගේ 41
දෙවියන්වහන්සේ වන පිණිස මම
මිසරදේශයෙන් තුඹලා ගෙනාවාවූ
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය**.
මම තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ-
යයි** කීසේක.

## කෝරා යනාදීන්ගේ කැරළිගැසීම

16 ලෙවීගේ පුත්‍රවූ කොහාත්ගේ
පුත්‍රයා වන ඉශ්හාර්ගේ පුත්‍රයාවූ
කෝරාද රූබෙන් පුත්‍රයෝ වන
එලියාබ්ගේ පුත්‍රයෝවූ දාතාන් හා
අබීරාම්ද පෙලෙත්ගේ පුත්‍රවූ ඕන්ද,
2 ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් සභාවේ
අධිපතීන් වන සභාවෙන් කැඳවාගනු
ලැබුවාවූ කීර්තිමත්වූ මනුෂ්‍යයන් දෙසිය
පනස්දෙනෙකු සමග මෝසෙස්ට එදිරිව
3 නැගිට, මෝසෙස්ට සහ ආරොන්ට
විරුද්ධව රැස්ව ඔවුන්ට කථාකොට:
*නුඹලාගේ ලොකුකම් ඉතා වැඩිය.
මක්නිසාද මුළු සභාවේ සියල්ලන්
ශුද්ධව සිටිද්දීත්, ස්වාමීන්වහන්සේද
ඔවුන් අතරෙහි සිටිද්දීත්, නුඹලා
ස්වාමීන්වහන්සේගේ සභාවට ඉහළින්
ලොකුකම් ගන්නේ මක්නිසාදැයි කීවෝය.
4 මෝසෙස් ඒ අසා මුහුණින් වැටුණේය.
5 ඔහු කෝරාට සහ ඔහුගේ මුළු
සමාගමට කථාකොට: ස්වාමීන්වහන්සේ
තමන්ට අයිතිවූ අය කවුද කියාත් ශුද්ධවූ
තැනැත්තා කවුද කියාත් හෙට උදය
දන්වාදී ඒ අය තමන් ළඟට පමුණුවනවා
ඇත. උන්වහන්සේ තෝරාගන්න
අයම තමන් ළඟට පමුණුවනවා ඇත.
6 මේක කරපල්ලා; කෝරා සහ ඔහුගේ
සමාගමේ සියල්ලෙනි, හෙට ධූප
7 භාජන ගෙන, ඒවායේ ගින්දර බහා,
ස්වාමීන්වහන්සේ ඉදිරියේ එහි සුවඳ
ද්‍රව්‍ය දමාපල්ලා. එවිට ස්වාමීන්-
වහන්සේ විසින් තෝරාගන්න මනුෂ්‍යයාම
ශුද්ධ තැනැත්තා වන්නේය. ලෙවීගේ
පුත්‍රයෙනි, නුඹලාගේ ලොකුකම්
8 ඉතා වැඩියයි කීවේය. තවද මෝසෙස්
කෝරාට කථාකොට: ලෙවීගේ
9 පුත්‍රයෙනි, අසාපල්ලා. ස්වාමීන්-
වහන්සේගේ මණ්ඩපයේ මෙහෙය
කිරීමටත් සභාවට සේවයකරන
පිණිස ඔවුන් ඉදිරියෙහි සිටීමටත්
නුඹලා තමන්වහන්සේ ළඟට

*නොහොත්, නුඹලා කළ දේ ඇත.

පමුණුවන ලෙස ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සභාවෙන්
නුඹලා වෙන්කරගත් එකත්, උන්වහන්සේ 10
නුඹ සහ නුඹ සමග ලෙවීගේ පුත්‍රයන්
වන නුඹේ සියලු සහෝදරයන්ද ළංකර
ගත් එකත් නුඹලාට මදිද? නුඹලා පූජක
තනතුරත් ගන්ට හදනවාද? එබැවින් 11
නුඹත් නුඹේ මුළු සමාගමත් ස්වාමීන්-
වහන්සේට විරුද්ධව රැස්ව සිටිති. නුඹලා
විසින් ආරොන්ට විරුද්ධව කොඳුරන්ට
ඔහු කවුද්දැයි කීවේය. මෝසෙස් 12
එලියාබ්ගේ පුත්‍රවූ දාතාන්ට සහ අබීරාම්ට
අඬගසා ඇරියේය. නුමුත් ඔව්හු: අපි
නොඑමුව. කාන්තාරයෙහි අප මරන 13
පිණිස කිරිද මීපැණිද ගලා යන
දේශයකින් නුඹ අප ගෙනාවා මදිවාට
නුඹම අප කෙරෙහි අධිපතියෙක්
වෙන්ටත් හදනවාද? ඒ ඇර කිරිද 14
මීපැණිද ගලායන දේශයකට නුඹ අප
ගෙනාවේවත් කෙත් හා මිදිවතු අපට
උරුමකොට දුන්නේවත් නැත. මේ
මිනිසුන්ගේ ඇස් උගුලා දමන්ට
සිතන්නෙහිද? අපි නොඑමුයයි කීවෝය.
මෝසෙස් ඉතා උදහස්ව ස්වාමීන්- 15
වහන්සේට කථාකොට: ඔබවහන්සේ
ඔවුන්ගේ පූජාව නොසැලකුව මැනව.
මම ඔවුන්ගෙන් එක කොටළුවෙක්වත්
නොගතිමි, ඔවුන්ගෙන් එක්කෙනෙකුටවත්
පාඩුවක් නොකෙළෙමියි කීවේය. තවද 16
මෝසෙස් කෝරාට කියනුයේ: නුඹ සහ
නුඹේ මුළු සභාවද ආරොන්ද හෙට
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සිට,
එකිනෙකා තම තමාගේ ධූප භාජන 17
රැගෙන එහි සුවඳ ද්‍රව්‍ය ලා එකිනෙකා
ධූප භාජනයක් බැගින් ධූප භාජන දෙසිය
පනසක්ද නුඹ හා ආරොන් තම තමාගේ
ධූප භාජනයද ස්වාමීන්වහන්සේ ඉදිරියට
ගෙනෙල්ලායයි කීවේය. එසේ ඔව්හු 18
එකිනෙකා තම තමාගේ ධූප භාජනය
ගෙන, ඒවායේ ගිනිබහා, එහි සුවඳ ද්‍රව්‍ය
ලා, මෝසෙස් හා ආරොන් සමග
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟ
සිටගත්හ. කෝරාද ඔවුන්ට විරුද්ධව 19

මුළු සභාව සම්මුඛවීමේ කූඩාරමේ
දෙරකඩ ළඟට රැස් කෙළේය. එවිට
**ස්වාමීන්වහන්සේගේ** තේජස මුළු සභාවට
පෙනුණේය.
20 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට සහ
21 ආරොන්ට කථාකොට: මා විසින් මේ
සභාව ක්ෂණයකින් විනාශ කරන
පිණිස තුඹලා මොවුන් අතරෙන්
22 වෙන්වෙයල්ලායයි කීසේක. එවිට
ඔව්හු මුහුණින් වැටී: අහෝ, දෙවියන්-
වහන්ස, මාංසයවූ සියල්ලන්ගේ ආත්ම-
වල දෙවියන්වහන්ස, එක මනුෂ්‍ය-
යෙක් පව්කරන විට ඔබ මුළු සභාව
කෙරෙහි උදහස්වනසේක්දැයි කීවෝය.
23 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
24 කොට: කෝරා හා දාතාන්ගේද
අබීරාම්ගේද වාසස්ථානය ළඟින් අහක්ව
පලයල්ලාය කියා සභාවට කියාපන්නැයි
25 කීසේක. එවිට මෝසෙස් නැගිට දාතාන්
හා අබීරාම් ළඟට ගියේය; ඉශ්‍රායෙල්-
වරුන්ගේ වැඩිමහල්ලෝද ඔහු පස්සේ
26 ගියෝය. එවිට ඔහු සභාවට කථාකර:
මේ දුෂ්ට මනුෂ්‍යයන්ගේ සියලු පාපවලින්
විනාශ නොවෙන පිණිස ඔවුන්ගේ
කිසිදෙයකට අතනොගසා ඔවුන්ගේ
කූඩාරම් වෙතින් අහක්වෙයල්ලායයි
27 කීවේය. එසේ ඔව්හු හැම අතින්ම
කෝරාගේද දාතාන්ගේද අබීරාම්ගේද
වාසස්ථානය ළඟින් අහක්ව ගියෝය.
දාතාන්ද අබීරාම්ද ඔවුන්ගේ භාර්යාවෝද
ඔවුන්ගේ පුත්‍රයෝද ඔවුන්ගේ ළාබාල-
යෝද පිටතට අවුත් තමුන්ගේ කූඩාරම්
28 දෙරකඩ ළඟ සිටියෝය. මෝසෙස්ද:
මේ සියලු ක්‍රියා කරන පිණිස **ස්වාමීන්-
වහන්සේ** මා එවූ බව මෙයින් තුඹලා
දැනගන්නහුය; මක්නිසාද ඒවා මාගේම
29 කල්පනාවෙන් නොකෙළෙමි. සියලු
මිනිසුන්ට පොදුවූ මරණයකින් මේ
මනුෂ්‍යයන් මැරුණොත් නොහොත්
සියලු මිනිසුන්ට සිද්ධවන දේ මොවුන්ට
සිද්ධවුණොත් **ස්වාමීන්වහන්සේ** මා
30 නොඑවූසේක. තුමුත් **ස්වාමීන්වහන්සේ**
අමුතු දෙයක් කළොත්, භූමිය ඈගේ
මුඛය ඇර ඔවුන් සන්තක සියල්ල සමඟ
ඔවුන් ගිලගත්තොත්, ඔවුන් පණපිටින්
පාතාලයට ගියොත්, මේ මනුෂ්‍යයන්
විසින් **ස්වාමීන්වහන්සේ** හෙළාදක්ක බව
තුඹලා දැනගන්නවා ඇතැයි කීවේය.
තවද ඔහු මේ සියලු වචන කියා නිමවූ 31
විට ඔවුන් යට තිබුණු භූමිය දෙකට
පැළුණාය. පොළොව ඈගේ මුඛය ඇර 32
ඔවුන්ද ඔවුන්ගේ පවුල්ද කෝරාට අයිති
සියලු මනුෂ්‍යයන්ද ඔවුන්ගේ සියලු
සම්පත්ද ගිලගත්තාය. මෙසේ ඔව්හුද 33
ඔවුන්ට අයිති සියල්ලෝද පණපිටින්
පාතාලයට කිඳ ගියෝය. පොළොව
ඔවුන් වසාගත්තාය, එසේ ඔව්හු සභාව
අතරෙන් විනාශ වූවෝය. ඔවුන් අවට 34
සිටි සියලු ඉශ්‍රායෙල්වරු ඔවුන්ගේ හැඬීම
අසා: මෙහි සිටියොත් පොළොව අපත්
ගිලගන්නවා ඇතැයි කියමින් පලා-
ගියෝය. තවද **ස්වාමීන්වහන්සේ** 35
කෙරෙන් ගිනි නික්ම අවුත් සුවඳ දුම්
ඔප්පුකළ දෙසිය පනස්දෙනා දවාදැමීය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 36
කොට: ධූප භාජන ශුද්ධ නිසා ඒවා 37
ගිනි මැදින් ගෙනෙන්ට පූජකවූ
ආරොන්ගේ පුත්‍රයා වන එලෙයාසර්ට
කියාපන්න; එහි ගින්න අහකට විසුරුවා
දමාපන්න; තමුන්ගේම ප්‍රාණවලට 38
විරුද්ධවුණ මේ පව්කාරයන්ගේ ධූප
භාජනවලින් පූජාසනය වැසීමට තළාපු
තහඩු සාදනු ලැබේවා. ඔවුන් ඒවා
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඔප්පු කළ
බැවින් ඒවා ශුද්ධය. ඒවා ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට ලකුණක් පිණිස වන්නේයයි
කීසේක. එසේ පූජකවූ එලෙයාසර් 39
දැගියවුන් ඔප්පුකළ පිත්තල ධූප භාජන
අරගත්තේය. **ස්වාමීන්වහන්සේ** මෝසෙස් 40
ලවා කියෙවූ ලෙස ආරොන්ගේ වංශයෙහි
නොවූ අන්‍ය කෙනෙක් **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පුකරන්ට ළංවී
කෝරා හා ඔහුගේ සමාගම මෙන්
නොවන පිණිස ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
සිහිවීමක් කොට පූජාසනයට වැස්මක්
සඳහා ඒවා තළා තහඩු සෑදූහ.

## සෙනඟ කෙඳිරීම: වසංගතය

41 එහෙත් පසුවද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
මුළු සභාව මෝසෙස්ට සහ ආරොන්ට
විරුද්ධව කොඳුරමින්: නුඹලා **ස්වාමීන්-
වහන්සේගේ** සෙනඟ මැරුවහුයයි කීවාය.
42 තවද සභාව මෝසෙස් සහ ආරොන්ට
විරුද්ධව රැස්ව සිටිද්දී ඔව්හු සම්මුඛවීමේ
කූඩාරම දෙස බැලූ කල වලාකුළක්
ඒක වසාගෙන තිබුණේය, **ස්වාමීන්-
වහන්සේගේ** තේජසද දෘශ්‍යමාන විය.
43 එවිට මෝසෙස් සහ ආරොන් සම්මුඛ-
වීමේ කූඩාරම ඉදිරියට ආවෝය.
44 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
45 කොට: මා විසින් මේ සභාව
ක්ෂණයකින් විනාශකරන පිණිස
මොවුන් අතරෙන් අහක්වෙයල්ලායයි
කීසේක. එවිට ඔව්හු මුහුණින්
46 වැටුණෝය. එවිට මෝසෙස් ආරොන්ට
කථාකොට: නුඹේ ධූප භාජනය
රැගෙන පූජාසනයෙන් ගිනි අරන් එහි
බහා, සුවඳ ද්‍රව්‍ය ලා, වහාම සභාව
ළඟට ගෙන ගොස් ඔවුන් උදෙසා
සමගිකමක් කරපන්න. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** කෙරෙන් උදහස නික්ම
ගියේය; වසංගතය පටන්ගත්තේයයි
47 කීවේය. ආරොන් මෝසෙස් කී ලෙස
රැගෙන සභාව මැදට දිවීය; බලව,
සෙනඟ අතරෙහි වසංගතය පටන්ගෙන
තිබුණේය. ඔහු සුවඳ ද්‍රව්‍ය ලා සෙනඟ
48 උදෙසා සමගිකමක් කෙළේය. එසේ ඔහු
මළවුන්ටත් ජීවතුන්ටත් අතරේ සිටියේය;
49 එවිට වසංගතය නැවතුණේය. කෝරාගේ
කාරණය නිසා මැරුණවුන් ඇර වසංග-
තයෙන් මැරුණු අය දසසතරදස් හත්-
50 සියයක් වූහ. ආරොන් සම්මුඛවීමේ
කූඩාරමේ දොරකඩට මෝසෙස් වෙතට
හැරී ආවේය. වසංගතය නැවතී තිබුණේය.

## ආරොන්ගේ පූජක බලය ස්ථිරකිරීම

17 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට කියනසේක්: නුඹ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකර, එක එක
පිය වංශයට සැරයටියක් බැගින් ඔවුන්ගේ
සියලු අධිපතීන්ගෙන් ඔවුන්ගේ පිය
වංශවලට සැරයටි දොළොසක් රැගෙන,
එක එක මනුෂ්‍යයාගේ නම ඔහුගේ
සැරයටිය පිට ලියාපන්න. ආරොන්ගේ 3
නම ලෙවීගේ සැරයටිය පිට ලියාපන්න.
මක්නිසාද ඔවුන්ගේ පිය වංශවල එක
එක ප්‍රධානියාට එක සැරයටියක් බැගින්
තිබිය යුතුය. නුඹ ඒවා සම්මුඛවීමේ 4
කූඩාරමෙහි මා නුඹලාට සම්බවෙන
ස්ථානයෙහි සාක්ෂි පෙට්ටිය ඉදිරිපිට
තබාපන්න. තවද මා විසින් තෝරාගන්න 5
මනුෂ්‍යයාගේ සැරයටිය ලියලනවා ඇත.
එසේ ඉශ්‍රායෙල් පුත්‍රයන් නුඹලාට
විරුද්ධව කොඳුරන ඔවුන්ගේ කෙඳිරීම්
මා වෙතට පැමිණීම නවතින්ට සලස්-
වන්නෙමියි කීසේක. මෝසෙස් ඉශ්‍රායෙල් 6
පුත්‍රයන්ට කථාකෙළේය, ඔවුන්ගේ සියලු
අධිපතියෝ තමුන්ගේ පිය වංශවල එක
එක අධිපතියාට එක සැරයටියක් බැගින්
සැරයටි දොළොසක් ඔහුට දුන්නෝය.
ආරොන්ගේ සැරයටියද ඔවුන්ගේ
සැරයටි අතරේ තිබුණේය. මෝසෙස් ඒ 7
සැරයටි සාක්ෂි මණ්ඩපයෙහි **ස්වාමීන්-
වහන්සේ** ඉදිරිපිට තැබුවේය. පසුවද 8
මෝසෙස් සාක්ෂි මණ්ඩපයට ඇතුල්වූ
කල, බලව, ලෙවීගේ වංශය වෙනුවට
තිබුණු ආරොන්ගේ සැරයටිය දළුලා
මොට්ටු හටගැනී මල් පිපී පැසුණු
කොට්ටම්බා ඇතුව තිබුණේය. මෝසෙස් 9
සියලු සැරයටි **ස්වාමීන්වහන්සේ** ඉදිරි-
යෙන් සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන් ළඟට
පිටතට ගෙනායේය. ඔවුන්ද බලා, එක්
එක්කෙනා තම තමාගේ සැරයටිය
ගත්තේය. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට 10
කථාකොට: ඔවුන් නොනසින පිණිස
නුඹ විසින් ඔවුන්ගේ කෙඳිරීම නිමකිරීම
සඳහා ආරොන්ගේ සැරයටිය කැරළිකාර
පුත්‍රයන්ට ලකුණක් කොට තිබෙන්ට
නැවත සාක්ෂි පෙට්ටිය ඉදිරියෙහි
තබාපන්නැයි කීසේක. මෝසෙස් 11
එසේ කෙළේය. **ස්වාමීන්වහන්සේ** තමාට
අණකළ ලෙස ඔහු කෙළේය.

12 ඉශ්‍රායෙල් පුත්‍රයෝ මෝසෙස්ට කථා-
කොට: මෙන්න, අපි විනාශවෙමුව, අපි
නැතිවී සිටිමුව, අපි සියල්ලෝ නැතිවී
13 සිටිමුව. ළංවන්නාවූ, **ස්වාමීන්වහන්සේගේ**
මණ්ඩපයට ළංවන්නාවූ කවුරු නුමුත්
නසින්නේය. තීන්දුවට අපි සියල්ලෝම
විනාශවන්නෙමුදැයි කීවෝය.

## පූජකයින් හා ලෙවීවරුන්ගේ යුතුකම් හා තඩත්තුව

18 ස්වාමීන්වහන්සේ ආරොන්ට
කථාකොට: නුඹද නුඹ සමග
නුඹේ පුත්‍රයෝද නුඹේ පිය වංශයද ශුද්ධ
ස්ථානය සම්බන්ධ අයුතුකම ගැන
වගකියනවා ඇත. නුඹද නුඹ සමග
නුඹේ පුත්‍රයෝද නුඹලාගේ පූජකකම
සම්බන්ධ අයුතුකම ගැන වගකියනවා
2 ඇත. නුඹේ පිය ගෝත්‍රයවූ ලෙවීගේ
ගෝත්‍රය වන නුඹේ සහෝදරයන්ද නුඹට
එකතුවී නුඹට සේවයකරන පිණිස ඔවුන්
නුඹ සමග ළඟට පමුණුවාගනින්න.
එහෙත් නුඹද නුඹ සමග නුඹේ පුත්‍රයෝද
සාක්ෂි මණ්ඩපය ඉදිරියෙහි සිටපල්ලා.
3 ඔව්හු නුඹටත් මුළු කූඩාරමටත් සේවය-
කරත්වා. ඔවුන්වත් නුඹලාවත් නොනසින
පිණිස ඔව්හු ශුද්ධස්ථානයේ භාජන-
වලටවත් පූජාසනයටවත් ළංනොවෙත්වා.
4 කූඩාරමේ සියලුම සේවය පිණිස ඔව්හු
නුඹට එකතුවී සම්මුඛවීමේ කූඩාරම
සම්බන්ධව සේවය කරත්වා. අන්‍යයෙක්
5 නුඹලා ළඟට නොපැමිණේවා. ඉශ්‍රායෙල්
පුත්‍රයන් පිට උදහස නවත් නො-
පැමිණෙන පිණිස ශුද්ධස්ථානයේ
භාරයද පූජාසනයේ සේවයද නුඹලා
6 විසින් බලාගත යුතුය. බලව, මම
ලෙවීවරුන්වූ නුඹලාගේ සහෝදරයන්
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙන් ගතිමි.
සම්මුඛවීමේ කූඩාරමේ මෙහෙය කරන
පිණිස නුඹලාට ත්‍යාගයක් කොට
ඔව්හු **ස්වාමීන්වහන්සේට** දෙනලද්දෝය.
7 නුඹද නුඹ සමග නුඹේ පුත්‍රයෝද
පූජාසනයේ සියලු දේ ගැනත් තිරයට
ඇතුළත තිබෙන දේ ගැනත් නුඹලාගේ
පූජකකම පවත්වමින් මෙහෙ කරපල්ලා.
මම පූජකකම ත්‍යාග සේවයක් කොට
නුඹලාට දෙමි. නුමුත් ළංවන අන්‍යයා
මරනු ලබන්නේයයි කීසේක.

**ස්වාමීන්වහන්සේ** ආරොන්ට කථා- 8
කොට: බලව, මාගේ එසවීමේ පූජාවල
භාරය එනම් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
කැපකරනලද සියලුම දේවල් නුඹට
සහ නුඹේ පුත්‍රයන්ටද ආලේපකිරීම
හේතුකොටගෙන සදකාලයටම නියම
කොටසක් කොට මා විසින් දී තිබේ.
ගින්නෙහි නොදවන්නාවූ අති ශුද්ධ දේ- 9
වලින් නුඹට අයිති වන්නේ ඔවුන්ගේ
සියලු පූජා එනම් ඔවුන්ගේ සියලු ආහාර
පූජාද ඔවුන්ගේ සියලු පාප පූජාද
ඔවුන්ගේ සියලු වරද පූජාද යන මේවාය;
ඔවුන් මට දෙන දේවල් නුඹටත් නුඹේ
පුත්‍රයන්ටත් අති ශුද්ධ වන්නේය. අති 10
ශුද්ධ දේවල් ලෙස එයින් කාපන්න.
සියලු පිරිමින්ට එයින් කන්ට පුළුවන:
ඒක නුඹට ශුද්ධ වන්නේය. මේවාත් 11
නුඹට අයිතිය, එනම්, ඔවුන්ගේ දීමනාවේ
එසවීමේ පූජාවවූ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
සියලුම තේව පූජාය. ඒවා නුඹටත්
නුඹ සමග නුඹේ පුත්‍රයන්ටත් නුඹේ
දූවරුන්ටත් සදකාලයටම නියම
කොටසක් කොට මා විසින් දී තිබේ.
නුඹේ ගෙයි පවිත්‍රව සිටින සියල්ලන්ට
එයින් කන්ට පුළුවන. තෙල්වලින් 12
උතුම්වූ කොටසද මුද්‍රික යුසයෙන් හා
ධාන්‍යවලින් උතුම්වූ කොටසද වන
ඔවුන් **ස්වාමීන්වහන්සේට** දෙන්නාවූ
දේවල ප්‍රථම ඒවා මම නුඹට දුනිමි.
ඔවුන් **ස්වාමීන්වහන්සේට** ගෙනෙන්නාවූ 13
ඔවුන්ගේ දේශයෙහි තිබෙන සියලු
දේවල ප්‍රථම ඵල නුඹට වේ; නුඹේ
ගෙයි පවිත්‍රව සිටින සියල්ලන්ට එයින්
කන්ට පුළුවන. ඉශ්‍රායෙල්වරුන් අතරෙහි 14
කැපකරනලද සියල්ල නුඹට වන්නේය.
**ස්වාමීන්වහන්සේට** ඔප්පුකරනු ලබන 15
සියලු සත්ත්වයන්ගෙන් මනුෂ්‍යයන්ගේ

වේවා මෘගයන්ගේ වේවා ගර්භයේ
සියලුම ප්‍රථම ඵල තුඹට අයිතිය. එසේවී
තුමුත් මනුෂ්‍යයන්ගේ කුලුඳුලන් තුඹ
සැබවින් මිදිය යුතුය, අපවිත්‍ර මෘගයන්ගේ
කුලුඳුලන්ද තුඹ විසින් මිදිය යුතුය.
16 මසක දරුවා පටන් ඔවුන්ගෙන් මුදනු
ලබන්ට සිටින්නන්, තුඹේ නියමයේ
හැටියට, ගේරා විස්සක්වූ ශුද්ධස්ථානයේ
ෂෙකෙලේ ප්‍රකාරයට, ෂෙකෙල් පහකට
17 මුදපන්න. එහෙත් එළදෙනෙකුගේ හෝ
බැටළුදෙනෙකුගේ හෝ එළුදෙනෙකුගේ
හෝ කුලුඳුලා නොමිදිය යුතුය, උන්
ශුද්ධය. උන්ගේ ලේ පූජාසනය පිට ඉස,
**ස්වාමීන්වහන්සේට** මිහිරි සුවඳක් පිණිස
ගිනි පූජාවක් කොට උන්ගේ තෙල
18 දවාපන්න. එහෙත් උන්ගේ මාංස තුඹට
වන්නේය, තේව් ළැපැත්ත හා දකුණු
කළවය තුඹට වන්නාක්මෙන් ඒවාත්
19 තුඹට වන්නේය. ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින්
**ස්වාමීන්වහන්සේට** පූජාකරන ශුද්ධ
දේවලින් සියලු එසවීමේ පූජා තුඹටත්
තුඹ සමග තුඹේ පුත්‍රයන්ටත් තුඹේ
දූවරුන්ටත් සදකාලේට නියම කොටසක්
කොට මා විසින් දී තිබේ. ඒක තුඹටත්
තුඹ සමග තුඹේ වංශයටත් **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි නිරන්තරවූ ලවණ
20 ගිවිසුමක්යයි කීසේක. **ස්වාමීන්වහන්සේ**
ආරොන්ට කථාකොට: ඔවුන්ගේ
දේශයෙහි කිසි උරුමයක්වත් ඔවුන්
අතරෙහි කිසි කොටසක්වත් තුඹට
නොවන්නේය. ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි තුඹේ කොටසද තුඹේ උරුමයද
මමය.
21 බලව, ලෙවීගේ පුත්‍රයන්ට ඔවුන්
කරන මෙහෙය එනම් සම්මුඛවීමේ
කූඩාරමේ මෙහෙය නිසා උරුමයක් කොට
ඉශ්‍රායෙල්වරුන්ගේ සියල්ලෙන් දසයෙන්
22 කොටසක් මා විසින් දී තිබේ. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ පාපය දරා නොනසින පිණිස
මෙතැන් පටන් රැස්වීමේ කූඩාරම ළඟට
23 නොපැමිණෙත්වා. එහෙත් ලෙවීවරුම
සම්මුඛවීමේ කූඩාරමේ මෙහෙය කර
තමුන්ගේ අපරාධ ගැන වග කියන්නෝය.
ඒක තුඹලාගේ පරම්පරාවල සදකාල
පනතක් වන්නේය, ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි ඔවුන්ට කිසි උරුමයක් නො-
වන්නේය. මක්නිසාද එසවීමේ පූජාවක් 24
කොට ඉශ්‍රායෙල් පුත්‍රයන් **ස්වාමීන්-
වහන්සේට** ඔප්පු කරන දසයෙන්
කොටස ලෙවීවරුන්ට උරුමයක් කොට
මා විසින් දී තිබේ. එබැවින් ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙහි කිසි උරුමයක් ඔවුන්ට
නොලැබෙන්නේය කියා මම ඔවුන්ට
කීයෙමියි කීසේක.

**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 25
කොට කියනසේක්: තවද තුඹ ලෙවී- 26
වරුන්ට මෙසේ කියාපන්න—තුඹලාගේ
උරුමය කොට මා විසින් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට දී තිබෙන දසයෙන් කොටස
තුඹලා ඔවුන්ගෙන් ගන්න කල එයින්
දසයෙන් කොටසක් **ස්වාමීන්වහන්සේට**
එසවීමේ පූජාවක් කොට ඔප්පු කර-
පල්ලා. තුඹලාගේ එසවීමේ පූජාව 27
පාවරේ ධාන්‍ය මෙන්ද මිදිපැසේ පූර්ණ-
කම මෙන්ද තුඹලාට ගණන්ගනු ලබන්-
නේය. මෙලෙස තුඹලා ඉශ්‍රායෙල් පුත්‍ර- 28
යන්ගෙන් ලබන තුඹලාගේ ඒ සියලුම
දසයෙන් කොටස්වලින් තුඹලාත්
**ස්වාමීන්වහන්සේට** එසවීමේ පූජාවක්
ඔප්පුකර **ස්වාමීන්වහන්සේගේ** එසවීමේ
පූජාව පූජකවූ ආරොන්ට දීපල්ලා.
තුඹලාට ලැබෙන සියලු දීමනාවලින් 29
**ස්වාමීන්වහන්සේගේ** සියලු එසවීමේ පූජා
තුඹලා ඔප්පුකළයුතු වන්නේ සියලු
උතුම් කොට්ඨාසවලින්ය, එනම් එයින්
ශුද්ධවූ කොටසය. එබැවින් තුඹලා එයින් 30
උතුම් කොට්ඨාසය ඔප්පුකරන විට එය
පාවරේ අස්වැන්න මෙන්ද මිදිපැසේ
පූර්ණකම මෙන්ද ලෙවීවරුන්ට ගණන්ගනු
ලබන්නේය. එය සම්මුඛවීමේ කූඩාරමෙහි 31
තුඹලාගේ මෙහෙයට විපාකය වන
බැවින් තුඹලාටත් තුඹලාගේ ගෙයි
වැසියන්ටත් සියලු තැන්හිදී එය කන්ට
පුළුවන. එසේ තුඹලා එයින් උතුම් 32

කොට්ඨාසය එසේවූ කල ඒ ගැන කිසි
පාපයක් දරන්නේවත් ඉශ්‍රායෙල් පුත්‍ර-
යන්ගේ ශුද්ධවූ දේවල් දූෂණය කොට
තුඹලා නසින්නේවත් නැත කියා ඔවුන්ට
කියාපන්නැයි කීසේක.

## පවිත්‍රවීම සඳහා රතු එළදෙනෙකු පූජාකිරීම

19 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට සහ
ආරොන්ට කථාකොට කියන-
2 සේක්: ස්වාමීන්වහන්සේ අණකළ
ව්‍යවස්ථාවේ පනත මේය: කැලලක් නැති,
සම්පූර්ණවූ, වියගහ නොදරුවාවූ රතු
ගොන් නැම්බියක් තුඹ ළඟට ගෙනෙන්ට
3 ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කියාපන්න. තුඹලා
ඌ පූජකවූ එලෙයාසර්ට දීපල්ලා, ඔහු
ඌ කඳවුරෙන් පිටතට ගෙනයේවා, ඌ
ඔහු ඉදිරියෙහි යම් කෙනෙකු විසින්
4 මරනු ලැබේවා. පූජකවූ එලෙයාසර්ද
තමාගේ ඇඟිල්ලට උගේ ලෙයින් ගෙන
සම්මුඛවීමේ කූඩාරමේ ඉස්සරහ පැත්ත
දෙසට උගේ ලෙයින් සත්වරක් ඉසීවා.
5 ඔහු ඉදිරියෙහි යම් කෙනෙක් ඒ ගොන්
නැම්බිය පුලුස්සා දමාවා; උගේ හමද
මාංසද ලේද ගොම සමග පුලුස්සා
6 දමාවා. පූජකයා කිහිරි දඬුද හිසොප්ද
රතු ලොම්ද රැගෙන ගොන් නැම්බිය
7 දැවෙන ගින්න මැදට දමාවා. එවිට
පූජකයා තමාගේ වස්ත්‍ර සෝද වතුර
නාගත යුතුය, පසුව කඳවුරට ඇතුල්-
වෙන්ට ඔහුට පුළුවන, ඔහු සවස් වන
8 තෙක් අපවිත්‍රව සිටින්නේය. ඌ දැවූ
තැනැත්තේ තමාගේ වස්ත්‍ර දියෙන් සෝද,
වතුර නාගන, සවස් වන තෙක් අපවිත්‍රව
9 සිටින්නේය. පවිත්‍ර මනුෂ්‍යයෙක් ගොන්
නැම්බියගේ අළු එකතුකර කඳවුරෙන්
පිටත පවිත්‍ර තැනක තබාවා, එය
අපවිත්‍රකම පහකිරීමේ වතුරක් පිණිස
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සභාව උදෙසා
තබාගනු ලබන්නේය. එය පාප පූජාවක්ය.
10 ගොන් නැම්බියගේ අළු එකතුකරන්නා
තමාගේ වස්ත්‍ර සෝදගත යුතුය.
ඔහු සවස් වන තෙක් අපවිත්‍රව
සිටින්නේය. එය ඉශ්‍රායෙල් පුත්‍රයන්ටද
ඔවුන් අතරෙහි සිටින විදේශියාටද
සදාකාල පනතක් පිණිස වන්නේය. යම් 11
මනුෂ්‍යයෙකුගේ මළකඳක ස්පර්ශවන
තැනැත්තේ සත් දවසක් අපවිත්‍රව
සිටින්නේය. ඔහු තුන්වෙනි ද එයින් දෝෂ 12
පහකර ගනීවා, එවිට සත්වෙනි දින
ඔහු පවිත්‍රවන්නේය. නුමුත් ඔහු තුන්වෙනි
ද දෝෂ පහකරනොගත්තොත් සත්වෙනි
දින පවිත්‍රනොවන්නේය. යමෙක් මැරුණු 13
මිනිසෙකුගේ මළකඳට ස්පර්ශවූ කල්හි,
ඔහු දෝෂ පහකර නොගත්තොත්,
ස්වාමීන්වහන්සේගේ මණ්ඩපය දූෂණය
කරන්නේය; ඒ තැනැත්තේ ඉශ්‍රායෙල්වරුන්
අතරෙන් සිඳදමනු ලබන්නේය. අපවි-
ත්‍රකම පහකිරීමේ වතුර ඔහු කෙරෙහි
නොඉස්ස බැවින් ඔහු අපවිත්‍රවන්නේය;
ඔහුගේ අපවිත්‍රකම ඒ වන තුරු ඔහු
කෙරෙහි තිබේ. මනුෂ්‍යයෙක් කූඩාරමක 14
මැරුණු කල්හි ව්‍යවස්ථාව මේය: ඒ
කූඩාරමට ඇතුල්වන සියල්ලෝද
කූඩාරමේ සිටින සියල්ලෝද සත් දවසක්
අපවිත්‍රව සිටින්නෝය. කඩවැස්මක් 15
නොබැඳ ඇරලා තිබෙන සියලු භාජන
අපවිත්‍රය. කඩුවෙන් මැරුම්කෑ කෙනෙකුට- 16
වත් මළකඳකවත් මිනී ඇටයකවත් මිනී
වළකවත් එළිමහනේදී ස්පර්ශවන
තැනැත්තේ සත් දවසක් අපවිත්‍ර වන්නේය.
පුලුස්සා දැමූ පාප පූජාවේ අලුවලින් 17
ස්වල්පයක් අපවිත්‍ර තැනැත්තා උදෙසා
රැගෙන භාජනයක දමා ගලායන වතුර
ඒවා පිට වත්කරත්වා. එවිට පවිත්‍ර 18
කෙනෙක් හිසොප් රැගෙන ඒ වතුරේ
ගල්වා කූඩාරමේද එහි සියලු භාජන-
වලද එහි සිටිය සියලු තැනැත්තන් පිටද
ඇටයක්වත් මැරුම්කෑ කෙනෙක්වත්
මළකෙනෙක්වත් මිනීවළක්වත් ස්පර්ශවූ
තැනැත්තා පිටද ඉසීවා. එසේ පවිත්‍ර 19
තැනැත්තේ තුන්වෙනි දත් සත්වෙනි
දත් අපවිත්‍ර තැනැත්තාට වතුර ඉසීවා.
එසේ සත්වෙනි දින හෙතෙම ඔහුගේ

දෝෂ පහකරාවා; ඔහු තමාගේ වස්ත්‍ර
සෝද් වතුර නාගන සවස පවිත්‍ර
20 වන්නේය. එහෙත් යමෙක් අපවිත්‍රවී
තමාගේ දෝෂ පහකරනොගත්තොත්,
ඒ තැනැත්තා **ස්වාමීන්වහන්සේගේ**
ශුද්ධස්ථානය දූෂණයකළ බැවින්, සභා
මධ්‍යයෙන් සිඳිනු ලබන්නේය. අපවිත්‍රකම
පහකිරීමේ වතුර ඔහු පිට නොඉසින-
21 ලද්දේය; ඔහු අපවිත්‍රය. එය ඔවුන්ට
නිරන්තර පනතක් වන්නේය. අපවිත්‍රකම
පහකිරීමේ වතුර ඉසින්නාද තමාගේ
වස්ත්‍ර සෝද්ගනීවා; අපවිත්‍රකම පහකිරීමේ
වතුර ස්පර්ශවන තැනැත්තේද සවස් වන
22 තෙක් අපවිත්‍රවන්නේය. අපවිත්‍ර අය
ස්පර්ශවන සියල්ල අපවිත්‍රවන්නේය; එහි
ස්පර්ශවන තැනැත්තේද සවස් වන තෙක්
අපවිත්‍රවන්නේයයි කීසේක.

## මිරියාම්ගේ මරණය

20 ඉශ්‍රායෙල් පුත්‍රයෝ එනම් මුළු
සභාව පළමුවෙනි මාසයේදී ශීන්
කාන්තාරයට ආවෝය. සෙනඟ කාදෙෂ්හි
නවාතැන් ගත්තෝය; මිරියාම් එහිදී නැසී
2 එහි තැන්පත්කරන ලද්දීය. සභාවට වතුර
නොතිබුණු බැවින් ඔව්හු මෝසෙස්ටද
ආරොන්ටද විරුද්ධව රැස්වුණෝය.

## මෙරිබායේදී විවාදකිරීම

3 සෙනඟ මෝසෙස් සමග විවාදකරමින්:
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි අපේ
සහෝදරයන් මැරුණ කල්හි අපිත්
4 මැරුණෙමුනම් යහපත! අපද අපේ
සිව්පාවුන්ද මෙහි මැරෙන පිණිස
තුඹලා **ස්වාමීන්වහන්සේගේ** සභාව මේ
කාන්තාරයට ගෙනාවේ මක්නිසාද?
5 මේ නරක ස්ථානයට අප පමුණුවන්ට
මිසරයේ සිට අප ගෙනාවේ මන්ද?
මේක බීජවත් අත්තික්කාවත් මිදිවැල්වත්
දෙළුම්වත් ඇති ස්ථානයක් නොවේ;
බොන්නට වතුරත් නැතැයි කීවෝය.
6 මෝසෙස් හා ආරොන් සභාව ඉදිරියෙන්
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟට
ගොස් මුහුණින් වැටුණෝය. **ස්වාමීන්-**
**වහන්සේගේ** තේජස ඔවුන්ට පෙනුණේය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 7
කොට: තුඹද තුඹේ සහෝදරවූ 8
ආරොන්ද සැරයටිය රැගෙන, සභාව
රැස්කර, පර්වතය විසින් ඒකේ වතුර
දෙන ලෙස ඔවුන්ගේ ඇස් ඉදිරිපිට
ඊට කථාකරපල්ලා; එසේ ඔවුන්ට
පර්වතයෙන් වතුර ගෙන්වා සභාවටත්
ඔවුන්ගේ සිව්පාවුන්ටත් බොන්ට
දීපන්නැයි කීසේක. මෝසෙස් **ස්වාමීන්-** 9
**වහන්සේ** ඔහුට අණකළ ලෙස උන්-
වහන්සේ ඉදිරියෙන් සැරයටිය ගත්තේය.
මෝසෙස් සහ ආරොන් සභාව පර්වතය 10
ඉදිරියට රැස්කළෝය. ඔහු: කැරළි-
කාරයිනි, අසාපල්ලා; අප විසින් මේ
පර්වතයෙන් තුඹලාට වතුර ගෙන්වා
දෙන්ටදැයි ඔවුන්ට කියා, තමාගේ අත 11
ඔසවා සැරයටියෙන් දෙවරක් පර්වතයට
ගැසීය. එවිට වතුර බොහෝසෙයින්
ගලාආයේය, සභාවද ඔවුන්ගේ
සිව්පාවෝද එයින් බීවෝය. **ස්වාමීන්-** 12
**වහන්සේ** මෝසෙස් සහ ආරොන්ට
කථාකොට: තුඹලා ඉශ්‍රායෙල් පුත්‍රයන්
ඉදිරියෙහි මට ගෞරව පැමිණෙන ලෙස
මා කෙරෙහි විශ්වාස නොකළ බැවින්
මේ සභාවට මා විසින් දුන් දේශයට
තුඹලා ඔවුන් නොපමුණුවන්නහුයයි
කීසේක. ඒ වනාහි *මෙරිබා වතුරය; 13
එහිදී ඉශ්‍රායෙල් පුත්‍රයෝ **ස්වාමීන්-**
**වහන්සේ** සමග විවාදකළෝය, එහෙත්
උන්වහන්සේ ඔවුන් අතරෙහි ගෞරව-
කරනු ලැබූසේක.

## ඒදෝම්ගේ සතුරුකම

එවිට මෝසෙස් කාදෙෂ්හි සිට ඒදෝම් 14
රජ වෙතට පණිවිඩකාරයන් යවා: තුඹේ
සහෝදරවූ ඉශ්‍රායෙල් මෙසේ කියයි—
අපට පැමිණි සියලු අමාරුකම් තුඹ
දන්නෙහිය. අපේ පියවරු මිසරයට 15
ගියෝය, අපි බොහෝ කල් මිසරයෙහි
සිටියෙමුව; මිසරවරු අපටත් අපේ

*එනම්, විවාදයේ.

16 පියවරුන්ටත් නපුරුකම් කළෝය. අපි
**ස්වාමීන්වහන්සේට** මොරගැසුවෙමුව,
එවිට උන්වහන්සේ අපේ හඬ අසා
දූතයෙකු එවා අප මිසරයෙන් පිටතට
ගෙනාසේක. ඉතින් අපි නුඹේ සීමාන්ත-
17 යෙහි නුවරක් වූ කාදෙෂ්හි සිටිමුව. නුඹේ
දේශය මැදින් යන්ට අපට අවසර
ලැබේවා. අපි කෙත් මැදින්වත් මිදි වතු
මැදින්වත් නොයන්නෙමුව, ළිංවලින්
වතුර නොබොන්නෙමුව. රජ මාවත
යන්නෙමුව, නුඹේ සීමාව පසුකරන
තෙක් අපි දකුණටවත් වමටවත්
නොහැරෙන්නෙමුයයි කියන්ට කීවේය.
18 ඒදෙම්ද: නුඹ මාගේ රට මැදින් නොගිය
යුතුය, ගියොත් මම නුඹට විරුද්ධව
කඩුව ගෙන එන්නෙමියි ඔහුට කීවේය.
19 ඉශ්‍රායෙල් පුත්‍රයෝද: අපි මහ මාවත
යන්නෙමුව. අපි එනම් මාද මාගේ
සිව්පාවුන්ද නුඹේ වතුර බීවොත් ඒවාට
මිල ගෙවන්නෙමු. වෙන කිසි දෙයක්
නොකොට මට පයින් යන්ට පමණක්
20 ඉඩ දුනමැනවියි කීවෝය. ඔහු: නුඹ
නොඑවයි කීවේය. තවද ඒදෙම්වරු මහත්
සෙනඟක්ද බලවත් අතක්ද ඇතුව ඔවුන්ට
21 විරුද්ධව ආවෝය. මෙසේ ඒදෙම්වරු
තමුන්ගේ සීමාව මැදින් ඉශ්‍රායෙල්ට
යන්ට දෙන්ට අකැමති වූහ. එබැවින්
ඉශ්‍රායෙල්වරු ඔවුන් කෙරෙන් අහක්ව
ගියෝය.

## ආරෝන්ගේ මරණය

22 ඉශ්‍රායෙල් පුත්‍රයෝ එනම් මුළු සභාව
කාදෙෂ්හි සිට ගමන්කොට හෝර්
23 කන්දට පැමුණුණෝය. **ස්වාමීන්වහන්සේ**
ඒදෙම් දේශයේ සීමාව ළඟ හෝර් කන්දේදී
මෝසෙස්ට හා ආරොන්ට කථාකොට:
24 ආරොන් තමාගේ සෙනඟට එකතු-
වන්නේය. මක්නිසාද නුඹලා මෙරිබාහි
වතුර ළඟදී මාගේ වචනයට විරුද්ධව
කැරළිකාරව සිටිය බැවින් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට මා විසින් දුන් දේශයට ඔහු
25 ඇතුල්නොවන්නේය. ආරොන් සහ
ඔහුගේ පුත්‍රවූ එලෙයාසර් කැඳවාගන
හෝර් කන්දට අවුත්, ආරොන්ගේ වස්ත්‍ර 26
ඔහුගෙන් ගළවා ඔහුගේ පුත්‍රවූ
එලෙයාසර්ට අන්දවාපන්න. ආරොන්
එහිදී මැරී තමාගේ සෙනඟට එකතු-
වන්නේයයි කීසේක. මෝසෙස් **ස්වාමීන්-** 27
**වහන්සේ** අණකළ ලෙස කෙළේය. ඔව්හු
මුළු සභාව ඉදිරියෙහි හෝර් කන්දට
නැංගෝය. එවිට මෝසෙස් ආරොන්ගේ 28
වස්ත්‍ර ඔහුගෙන් ගළවා ඔහුගේ පුත්‍රවූ
එලෙයාසර්ට ඒවා ඇන්දෙවුවේය;
ආරොන් එහි කන්ද මුදුනේදී මෙළේය.
එවිට මෝසෙස් සහ එලෙයාසර්
කන්දෙන් බැස්සෝය. මුළු සභාව එනම් 29
මුළු ඉශ්‍රායෙල් වංශය ආරොන් මළ
බව දුටු කල ආරොන් ගැන තිස් දවසක්
වැලපුණාහ.

## පිත්තල සර්පයා.

### බාෂාන අත්පත්කරගැනීම

21 දකුණු දිසාවෙහි වාසයකළ
කානානියවූ අරද්හි රජ අතාරීම්
මාර්ගයෙන් ඉශ්‍රායෙල්වරුන් එන බව
අසා ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව යුද්ධ-
කොට ඔවුන්ගෙන් සමහරෙක් අල්ලා-
ගත්තේය. ඉශ්‍රායෙල්වරුද **ස්වාමීන්-** 2
**වහන්සේට** භාරයක් වෙමින්: ඉදින්
ඔබවහන්සේ මේ සෙනඟ මා අතට
පාවාදෙනසේක්නම් මම ඔවුන්ගේ නුවර-
වල් මුළුමනින්ම විනාශකරන්නෙමියි කීය.
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්වරුන්ගේ 3
හඬට ඇහුම්කන්දී කානානිවරුන් ඔවුන්ට
පාවාදුන්සේක; එවිට ඔව්හු ඔවුන්
සහ ඔවුන්ගේ නුවරවල් සහමුලින්ම
විනාශකළෝය. ඒ ස්ථානයට හෝර්මා
යන නම තබනලදී.
ඔව්හු ඒදෙම් දේශය වටකර යන 4
පිණිස රතු මුහුදට යන පාරෙන් හෝර්
කන්දේ සිට ගමන්කළෝය. එවිට ගමන්
මාර්ගයේදී සෙනඟගේ සිත බොහෝසේ
අධෛර්ය විය. සෙනඟ දෙවියන්- 5
වහන්සේටත් මෝසෙස්ටත් විරුද්ධව
කථාකොට: මේ කාන්තාරයෙහි
මැරෙන්ට නුඹලා මිසරයෙන් අප

ගෙනාවේ මක්නිසාද? රොටි නැත, වතුරත්
නැත; අපේ ප්‍රාණය මේ සැහැල්ලු කෑමට
6 අප්‍රිය කෙරේයයි කීවෝය. **ස්වාමීන්-**
**වහන්සේ** සෙනඟ අතරට ගිනි සර්පයන්
යැවූසේක, උන් සෙනඟට දෂ්ටකළෝය;
එසේ ඉශ්‍රායෙල්වරුන්ගෙන් බොහෝ
7 දෙනෙක් මළෝය. එබැවින් සෙනඟ
මෝසෙස් ළඟට අවුත්: අපි **ස්වාමීන්-**
**වහන්සේටත්** තුඹටත් විරුද්ධව කථා-
කිරීමෙන් පව්කෙළෙමුව; **ස්වාමීන්-**
**වහන්සේ** අප වෙතින් සර්පයන් පහකරන
ලෙස උන්වහන්සේට යාච්ඤාකළමැනවියි
කීවෝය. මෝසෙස් සෙනඟ උදෙසා
8 යාච්ඤාකෙළේය. එවිට **ස්වාමීන්වහන්සේ:**
තුඹ ගිනි සර්පයෙකු සාදා ඒක කුඹයක්
පිට තබාපන්න. දෂ්ටකරනු ලැබූ කවරෙක්
නුමුත් ඒ දෙස බැලීමෙන් ජීවත්වන්නේ-
9 යයි මෝසෙස්ට කීසේක. මෝසෙස්
පිත්තල සර්පයෙකු සාදා ඒක කුඹයක්
පිට තැබීය. තවද යමෙක් සර්පයෙකු
විසින් දෂ්ටකරනු ලද්දේනම් ඔහු පිත්තල
සර්පයා දෙස බැලූ කල්හි ජීවත්වූණේය.
10 පසුව ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගමන්කොට
11 ඔබොත්හි කූඩාරම් ගසාගත්තෝය. ඔව්හු
ඔබොත් සිට පිටත්ව ගොස් මෝවබ්
රට ඉදිරිපිට නැගෙනහිරට තිබෙන
කාන්තාරයේ ඉයේ-අබාරීම්හි කූඩාරම්
12 ගසාගත්තෝය. එතැනින් ඔව්හු පිටත්ව
ගොස් සෙරෙද් මිටියාවතේ කූඩාරම්
13 ගසා ගත්තෝය. එතැනින් ඔව්හු පිටත්ව
ගොස් අමෝරිවරුන්ගේ සීමාවෙන්
ගලායන්නාවූ, කාන්තාරයෙහි තිබෙන
අර්ණොන් ගඟ එගොඩ කූඩාරම්
ගසාගත්තෝය. අර්ණොන් වනාහි
මෝවබ්වරුන් හා අමෝරිවරුන් අතරේ
14 තිබෙන මෝවබ් රටේ සීමාවය. එබැවින්
**ස්වාමීන්වහන්සේගේ** යුද්ධ පොතෙහි:
සූපාශයේ වහෙබ්ද
අර්ණොන් මිටියාවත්ද
15 ආර් නිවෙස දෙසට හැරීයන්නාවූ,
මෝවබ් සීමාවට යාවූ,
මිටියාවත්වල බෑවුමයයි
කියා තිබේ. එතැනින් ඔව්හු බෙයේර්ට 16
ගමන්කළෝය. ඒ වනාහි: මා සෙනඟට
වතුර දෙන පිණිස ඔවුන් රැස්කරපන්නැයි
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කී
ස්ථානයෙහි තිබෙන ළිඳය.
එවිට ඉශ්‍රායෙල්වරු මේ ගීතිකාව 17
කියමින්:
එම්බා ළිඳ, වතුර නගව; ඊට ගී
කියව්.
අධිපතීන් ජයකොන්තයෙන් හා තමුන් 18
සැරයටිවලින් කැණුවාවූ,
සෙනඟගේ උත්තමයන් හෑරුවාවූ
ළිඳ මේයයි ගීතිකාකළෝය. ඔව්හු
කාන්තාරයෙන් මත්තානායටද, මත්තා- 19
නායෙන් නහලීයෙලටද නහලීයෙලෙන්
බාමොත්ටද, බාමොතෙන් මෝවබ් රටේ 20
තිබෙන මිටියාවත සහ කාන්තාරය
ඉදිරිපිට තිබෙන පිස්ගා මුදුන දෙසටද
ගමන්කළෝය.
ඉශ්‍රායෙල්වරු අමෝරිවරුන්ගේ රජවූ 21
සීහොන් වෙතට පණිවිඩකාරයන්
යවමින්: තුඹේ දේශය මැදින් යන්ට 22
මට අවසර ලැබේවා. අපි කෙත්වලටවත්
මිදිවතුවලටවත් නොහැරෙන්නෙමුව.
ළිංවලින් වතුර නොබොන්නෙමුව. තුඹේ
සීමාව පසුකරන තෙක් රජ මාවත
යන්නෙමුයයි කියන්ට කීවෝය. එහෙත් 23
සීහොන් තමාගේ සීමාව මැදින් යන්ට
ඉශ්‍රායෙල්වරුන්ට ඉඩනොදී, තමාගේ
සියලු සෙනඟ රැස්කොට, ඉශ්‍රායෙල්-
වරුන්ට විරුද්ධව කාන්තාරයට අවුත්
යහශ්ට පැමිණ, ඉශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව යුද්ධ කෙළේය. එවිට ඉශ්‍රායෙල්- 24
වරු ඔහුට කඩුමුවහතින් පහරදී
අර්ණොන් පටන් යබ්බොක්ට පැමිණෙන
තුරු අම්මොන් පුත්‍රයන්ගේ සීමාව
දක්වා ඔහුගේ දේශය හිමිකරගත්තෝය.
මක්නිසාද අම්මොන් පුත්‍රයන්ගේ සීමාව
බලවත්ව තිබුණේය. ඉශ්‍රායෙල්වරු ඒ 25
සියලු නුවරවල් අල්ලාගෙන අමෝරි-
වරුන්ගේ සියලු නුවරවල් වන හෙෂ්-
බොන්හිද ඊට අයිති සියලු නියම්ගම්-
වලද වාසයකළෝය. හෙෂ්බොන් නම් 26

අමෝරිවරුන්ගේ රජවූ සීහොන්ගේ
නුවරය, ඔහු මෝවබ්හි ප්‍රථම රජුට
විරුද්ධව යුද්ධකොට අර්ණොන් දක්වා
ඔහුගේ මුළු දේශය ඔහුගේ අතින්
27 ගත්තේය. එබැවින් කිවිහු කියන්නෝ:
හෙෂ්බොන්ට එව්,
සීහොන් නුවර ගොඩනගනුලැබ සවි
වේවා.
28 මක්නිසාද හෙෂ්බොන් සිට ගින්නක්ද
සීහොන් නුවරින් ගිනිදලක්ද නික්ම
ගියේය.
එය මෝවබ්හි ආර්ද
අර්ණොන් උස්තැන්වල ස්වාමිවරුන්ද
දවා දැමීය.
29 මෝවබ් තට දුක් විය!
අහෝ කෙමොෂ් වැසියෙනි, තොපි
නාස්ති වූහුය.
ඔහු තමාගේ පුත්‍රයන් පලායාමටත්
තමාගේ දූවරුන් අමෝරිවරුන්ගේ
රජවූ සීහොන්ට වාලටත් දුන්නේය.
30 අපි ඔවුන්ට විද්දෙමුව; හෙෂ්බොන්
දීබොන් දක්වාම නාස්තිවිය,
නොඵා දක්වා පාළු කෙළෙමුව,
මෙදීබා දක්වා ගිනි ඇවුළුණේයයි
31 කියති. මෙසේ ඉශ්‍රායෙල්වරු අමෝරි-
වරුන්ගේ දේශයෙහි වාසයකළෝය.
32 මෝසෙස් යාසේර් රට සෝදිසිකරන
පිණිස හැරියේය, ඔව්හු එහි නියම්ගම්
අල්ලාගෙන එහි සිටි අමෝරිවරුන්
33 පන්නාදැමූහ. තවද ඔව්හු හැරී බාෂාන්ට
යන මාර්ගයෙන් ගියෝය. එවිට බාෂාන්හි
රජවූ ඕග්ද ඔහුගේ මුළු සෙනඟද ඔවුන්-
ට විරුද්ධව යුද්ධ කරන්ට එද්රෙයිට
34 ආවෝය. ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
කථාකොට: ඔහුට භය නොවන්න. මක්-
නිසාද ඔහු හා ඔහුගේ සියලු සෙනඟද
ඔහුගේ දේශයද නුඹ අතට පාවාදුනිමි;
හෙෂ්බොන්හි සිටි අමෝරිවරුන්ගේ රජවූ
සීහොන්ට කළාක්මෙන් නුඹ ඔහුටත්
35 කරන්නෙහියයි කීසේක. එසේ ඔව්හු
ඔහුගෙන් කිසිවෙක් ගැළවී ඉතුරු නොවන
තුරු ඔහුට හා ඔහුගේ පුත්‍රයන්ටද
ඔහුගේ සියලු සෙනඟටද පහරදී ඔහුගේ
දේශය හිමිකරගත්තෝය.

22
ඉශ්‍රායෙල් පුත්‍රයෝ පිටත්ව
ගොස් යෙරිකෝව ළඟ
යොර්දනෙන් එතර මෝවබ් සමභූමිවල
කූඩාරම් ගසාගත්තෝය.

## ඉශ්‍රායෙල්ට ශාපකරන්ට කැඳවනු ලැබූ බාලාම්ගේ යාම

තවද සිප්පෝර්ගේ පුත්‍රවූ බාලාක් 2
ඉශ්‍රායෙල් විසින් අමෝරිවරුන්ට කළ
සියල්ල දුටුවේය. සෙනඟ බොහෝවූ 3
බැවින් මෝවබ්වරු ඔවුන් ගැන
අතිශයෙන් භයපත්වුණෝය. එසේ
මෝවබ් ඉශ්‍රායෙල් පුත්‍රයන් නිසා කැලඹී,
මිදියන්හි වැඩිමහල්ලන්ට කථාකොට: 4
ගවයා කෙතේ තෘණ කා දමන්නාක්
මෙන් ඒ සමූහයා අප වටකර තිබෙන
සියල්ල කාදමනවා ඇතැයි කීවේය.
සිප්පෝර්ගේ පුත්‍රවූ බාලාක් ඒ කාලයේ
මෝවබ්හි රජව සිටියේය. ඔහු 5
බෙයොර්ගේ පුත්‍රවූ බාලාම් කැඳවාගන
එන්ට ඔහුගේ සෙනඟගේ පුත්‍රයන්ගේ
දේශයවූ *ගංගාව ළඟ තිබෙන
පෙතෝර්ට පණිවිඩකාරයන් යවමින්:
මිසරයෙන් සෙනඟක් ඇවිත් සිටිති. බලව,
ඔව්හු පොළෝතලය වසාගෙන මට
ඉදිරිපිටින් සිටිති. එබැවින් දැන් ඇවිත් 6
මා වෙනුවෙන් මේ සෙනඟට ශාපකළ
මැනවි; මක්නිසාද ඔව්හු මට වඩා
බලවත්ය. සමහරවිට ඔවුන්ට පහරදී
ඔවුන් දේශයෙන් පන්නාදමන්ට මට
පුළුවන්වන්නේය. මක්නිසාද නුඹ
ආශීර්වාදකරන තැනැත්තා ආශීර්වාද
ලබන බවත් නුඹ ශාපකරන තැනැත්තා
ශාප ලබන බවත් දනිමියි කියන්ට
කීවේය. මෝවබ්හි වැඩිමහල්ලෝද 7
මිදියන්හි වැඩිමහල්ලෝද පේන කීමට
දෙන තෑගි අතේ ඇතුව පිටත්ව බාලාම්
වෙතට පැමිණ බාලාක්ගේ වචන ඔහුට
කීවෝය. ඔහු ඔවුන්ට කථාකොට: 8
අද රාත්‍රියේ මෙහි නැවතියල්ලා.
ස්වාමීන්වහන්සේ මට කියන හැටියට
නුඹලාට උත්තරදෙන්නෙමියි ඔවුන්ට

*එනම්, ප්‍රාත් ගංගාව.

කීවේය. එසේ මෝවබ්හි අධිපතියෝ
9 බාලාම් වෙත නැවතුණෝය. දෙවියන්-
වහන්සේ බාලාම් වෙතට අවුත්: නුඹ
සමග සිටින මේ මනුෂ්‍යයෝ කවුරුදැයි
10 ඇසූසේක. බාලාම්ද: මෝවබ්හි රජවූ
සිප්පෝර්ගේ පුත්‍රවූ බාලාක් ඔවුන් මා
11 වෙතට එවා: බලව, මිසරයෙන් ආ
සෙනඟ පොළෝතලය වසාගෙන සිටිති.
දැන් ඇවිත් මා උදෙසා ඔවුන්ට ශාප-
කරපන්න; සමහරවිට ඔවුන්ට විරුද්ධව
යුද්ධ කොට ඔවුන් පන්නාහරින්ට
හැකිවන්නෙමියි කියා එවා තිබේයයි
12 දෙවියන්වහන්සේට කීවේය. දෙවියන්-
වහන්සේ: ඔවුන් සමග නොයන්න; ඒ
සෙනඟට ශාපනොකරන්න. මක්නිසාද
ඔව්හු ආශීර්වාදලත් සෙනඟක් යයි
13 බාලාම්ට කීසේක. බාලාම් උදය නැගිට
බාලාක්ගේ අධිපතීන්ට කථාකොට:
නුඹලාගේ දේශයට පලයල්ලා. මක්-
නිසාද නුඹලා සමග යන්ට ස්වාමීන්-
වහන්සේ මට ඉඩ නොදෙනසේකැයි
14 කීවේය. මෝවබ්හි අධිපතියෝ නැගිට
බාලාක් වෙතට ගොස්: බාලාම් අප
සමග එන්ට බැරිය කියන්නේයයි
15 කීවෝය. බාලාක් ගණනින් ඔවුන්ට
වැඩිවූ ඔවුන්ට වඩා ගරුතරවූ අධිපතීන්
16 නැවත යැවීය. ඔව්හු බාලාම් වෙතට
අවුත් කියන්නෝ: සිප්පෝර්ගේ පුත්‍රවූ
බාලාක් මෙසේ කියයි: නුඹ මා වෙතට
ඒමට කිසිවකින් නුඹට බාධාවක්
17 නොවේවා. මක්නිසාද මම නුඹ ඉතා
මහත් ගෞරවයට පමුණුවන්නෙමි, නුඹ
මට කියන කොයි දෙයක් නුමුත්
කරන්නෙමි. එබැවින් අවුත් මේ සෙනඟට
මා උදෙසා ශාපකරන ලෙස නුඹෙන්
ඉල්ලමියි කියන්නේයයි ඔහුට කීවෝය.
18 බාලාම් බාලාක්ගේ සේවකයන්ට උත්තර-
දෙමින්: බාලාක් තමාගේ ගෙය පුරවා
රන් රිදී මට දෙතත් අඩුව හෝ වැඩිව
හෝ කරන්ට මාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ වචනය ඉක්මවා යා
19 නොහැක්කෙමි. එබැවින් ස්වාමීන්-
වහන්සේ තවත් මට කියන්නේ කිමෙක්දැයි
මා දැනගන්නා පිණිස නුඹලාත් අද
රාත්‍රියේ මෙහි සිටපල්ලායයි කීවේය.
දෙවියන්වහන්සේ රාත්‍රියෙහි බාලාම් 20
වෙතට අවුත් ඔහුට කථාකොට: ඒ
මනුෂ්‍යයෝ නුඹ කැඳවන පිණිස අවුත්
සිටිත්නම් නැගිට ඔවුන් සමග පලයන්න;
එසේවී නුමුත් මා නුඹට කියන වචනය
පමණක්ම කරපන්නැයි කීසේක. බාලාම් 21
උදය නැගිට තමාගේ කොටළුදෙන
සූදානම්කොට මෝවබ්හි අධිපතීන් සමග
ගියේය. ඔහු ගිය නිසා දෙවියන්- 22
වහන්සේගේ උදහස ඇවිළුණේය.
ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට
විරුද්ධකාරයෙක්ව මාර්ගයෙහි සිට-
ගත්තේය. ඔහු තමාගේ කොටළුදෙන
පිට නැගී උන්නේය, ඔහුගේ මෙහෙ-
කරුවෝ දෙදෙනා ඔහු සමග සිටියෝය.
කොටළුදෙන ස්වාමීන්වහන්සේගේ දූතයා 23
කඩුව ඇදගෙන මාර්ගයෙහි සිටින බව
දැක මඟින් ඉවත්ව කෙතට ගියාය.
බාලාම් කොටළුදෙන මඟට හරවන
පිණිස ඈට ගැසීය. එවිට ස්වාමීන්- 24
වහන්සේගේ දූතයා දෙපැත්තේ තාප්ප
ඇති මිදිවතු අතරේ පටු පාරක සිට-
ගත්තේය. කොටළුදෙන ස්වාමීන්- 25
වහන්සේගේ දූතයා දැක තාප්පයට හැපී
බාලාම්ගේ පය තාප්පයට වැද්දෙවුවාය.
ඔහු නැවතත් ඈට ගැසුවේය. ස්වාමීන්- 26
වහන්සේගේ දූතයා තව දුරටත් ගොස්,
දකුණටවත් වමටවත් හැරෙන්ට ඉඩ නැති
නුපුළුල් ස්ථානයක සිටගත්තේය.
කොටළුදෙන ස්වාමීන්වහන්සේගේ දූතයා 27
දැක බාලාම් ඈ පිට ඉන්දදීම බිම
වැදහොත්තාය. බාලාම්ගේ කෝපය
ඇවිළුණේය, ඔහු තමාගේ කෙවිටෙන්
කොටළුදෙනට ගැසීය. එවිට ස්වාමීන්- 28
වහන්සේ කොටළුදෙනගේ මුඛය ඇරෙවු-
සේක, ඈද: මේ තුන් වරක්ම මට ගැසීමට
මම ඔබට කුමක් කෙළෙම්දැයි බාලාම්ට
කීවාය. බාලාම්ද: තී මට සරදම්කළ 29
නිසාය. මාගේ අතේ කඩුවක් තිබුණේවී-
නම් මා විසින් මෙලහට තී මැරුවා
නොවේදැයි කොටළුදෙනට කීවේය.

30 කොටළුදෙන: මම ඔබගේ මුළු ජීවිතයේ
අද දක්වා ඔබ නැගීගිය ඔබගේ
කොටළුදෙන නොවෙම්ද? ඔබට මෙසේ
කරන්ට කවදාවත් පුරුදුව සිටියෙම්දැයි
බාලාම්ට කීවාය. ඔහු: නැතැයි කීවේය.
31 එවිට **ස්වාමීන්වහන්සේ** බාලාම්ගේ
ඇස් ඇරෙවුසේක, ඔහු **ස්වාමීන්-
වහන්සේගේ** දූතයා කඩුව ඇදගෙන
මාර්ගයෙහි සිටිනවා දැක හිස නමා
32 මුහුණින් වැටුණේය. **ස්වාමීන්වහන්සේගේ**
දූතයා ඔහුට කථාකොට: තුඹේ
කොටළුදෙනට තුඹ මේ තුන් වරක්ම
ගැසුවේ මක්නිසාද? තුඹේ මාර්ගය
මා ඉදිරියෙහි ඇදව තිබෙන නිසා
විරුද්ධකාරයෙක් මෙන් මෙහි ඇවිත්
33 සිටිමි. කොටළුදෙනද මා දැක මේ තුන්
වරක්ම මා ඉදිරියෙන් ඉවත හැරුණාය.
ඈ මා කෙරෙන් ඉවත නොහැරුණා
නම් සැබවින් මා විසින් තුඹ මරා ඈ
ඉතුරුකරනලද්දේ නොවේදැයි කීවේය.
34 බාලාම්ද: ඔබ මට විරුද්ධව මාර්ගයෙහි
සිටි බව මා නොදත් බැවින් පව්කෙළෙමි.
ඉදින් ඔබ අසතුටුනම් හැරීයන්නෙමියි
**ස්වාමීන්වහන්සේගේ** දූතයාට කීවේය.
35 **ස්වාමීන්වහන්සේගේ** දූතයා: ඒ
මනුෂ්‍යයන් සමග පලයන්න. එහෙත් මා
විසින් තුඹට කියන වචනය පමණක්
තුඹ විසින් කිය යුතුයයි බාලාම්ට
කීවේය. මෙසේ බාලාම් බාලාක්ගේ
36 අධිපතීන් සමග ගියේය. බාලාක්තෙමේ
බාලාම් ආ බව අසා ඔහු සම්බවන
පිණිස අර්ණොන් සීමාවට ළංවූ
සීමාන්තයෙහි තිබෙන මෝවබ් නුවරට
37 ගියේය. ඔහු බාලාම්ට කථාකොට:
මම ඕනෑකමින් තුඹට එන්ට කියා
නැරියෙම්ද? තුඹ මා වෙතට නාවේ
මක්නිසාද? සැබවින් තුඹ ගෞරවයට
පමුණුවන්ට මට බැරිදැයි ඔහුට කීවේය.
38 බාලාම් කථාකොට: මෙන්න, මම තුඹ
වෙතට ඇවිත් සිටිමි. මොකවත් කියන්ට
දැන් මට කිසි බලයක් ඇද්ද? දෙවියන්-
වහන්සේ මාගේ මුඛයෙහි තබන
වචනයම කියන්නෙමියි බාලාක්ට කීවේය.

බාලාම් බාලාක් සමග ගියේය. 39
ඔව්හු කිර්යත්-හුශෝත්ට පැමුණුණෝය.
බාලාක් ගවයන් හා බැටළුවන් පූජා- 40
කොට බාලාම්ටද ඔහු සමග සිටි
අධිපතීන්ටද කොටස් යැවීය. තවද පසුව 41
දා උදේ බාලාක් බාලාම් කැඳවාගෙන
බාල්ගේ උස් තැන්වලට ගියේය, එහි
සිට ඔහු කෙළවර දක්වාම සෙනඟ දිටීය.

## බාලාම්ගේ අනාගතවාක්‍ය

23

බාලාම් තෙමේ බාලාක්ට කථා-
කොට: මෙහි මට පූජාසන
සතක් ගොඩනගා ගොන් සත්දෙනෙක්ද
බැටළුවන් සත්දෙනෙක්ද පිළියෙළ
කරන්නැයි කීවේය. බාලාක් තෙමේ 2
බාලාම් කී ලෙස කෙළේය; බාලාක්
සහ බාලාම් එක එක පූජාසනය පිට
ගොනෙකු සහ බැටළුවෙකු බැගින් ඔප්පු-
කළෝය. බාලාම් බාලාක්ට කථාකොට: 3
තුඹ තුඹේ දවන පූජාව ළඟ සිටින්න,
මම යන්නෙමි; සමහරවිට **ස්වාමීන්-
වහන්සේ** මා සම්මුඛවෙන්ට එනසේක.
උන්වහන්සේ මට පෙන්වන කොයි දෙයක්
නමුත් තුඹට දන්වන්නෙමියි කියා මුඩු
හෙලකට ගියේය. දෙවියන්වහන්සේ 4
බාලාම්ට සම්මුඛවූසේක. ඔහුද: මම
පූජාසන සත පිළියෙළකොට එක එක
පූජාසනය පිට ගොනෙකු හා බැටළුවෙකු
බැගින් ඔප්පුකෙළෙමියි උන්වහන්සේට
කීවේය. **ස්වාමීන්වහන්සේ** බාලාම්ගේ 5
මුඛයෙහි වචනයක් තබා: බාලාක්
වෙතට හැරී ගොස් එසේ කියාපන්නැයි
කීසේක. බාලාම් ඔහු වෙතට හැරී 6
ගියේය, බලව, ඔහුද මෝවබ්හි සියලු
අධිපතීහුද ඔහුගේ දවන පූජාව ළඟ
සිටියෝය. ඔහු උපමා කථා පවසමින් 7
කියනුයේ:

ඇවිත් මා වෙනුවෙන් යාකොබ්ට
ශාපකරපන්න,
ඇවිත් ඉශ්‍රායෙල්ට දෙස් කියාපන්නැයි
කියා
මෝවබ්හි රජවූ බාලාක් අරාමෙන්ද

පෙරදිග්හි කඳුවලින්ද මා ගෙන්වූවේය.
8 දෙවියන්වහන්සේ ශාපනොකළ
අයට මම කෙලෙස ශාපකරම්ද?
**ස්වාමීන්වහන්සේ** දෙස් නොකිවූ
අයට කෙලෙස දෙස් කියම්ද?
9 මක්නිසාද පර්වත මුදුනේ සිට ඔහු
දකිමි,
හෙල්වල සිට ඔහු බලමි.
බලව, ඔව්හු හුදකලාව වසන
සෙනඟකි,
ඔව්හු ජාතීන් අතරේ තමුන්ම
ගණන්කර නොගත්තෝය.
10 යාකොබ්ගේ ධූලි ගණන්කරන්ටවත්
ඉශ්‍රායෙල්ගෙන් සතරෙන් කොටසක්
ගණන්කරන්ටවත් කාට හැකිද?
මාගේ මරණය ධර්මිෂ්ඨයන්ගේ
මරණය මෙන් වේවා.
මාගේ අන්තිමය ඔවුන්ගේ අන්තිමය
මෙන් වේවයි
11 කීවේය. බාලාක්: තුඹ මට කළේ
මොකද? මාගේ සතුරන්ට ශාපකරන්ට
තුඹ ගෙන්වා ගත්තෙමි, එහෙත්, තුඹ
ඔවුන්ට ආශීර්වාදම කෙළෙහියයි
12 බාලාම්ට කීවේය. ඔහු උත්තරදෙමින්:
**ස්වාමීන්වහන්සේ** මාගේ මුඛයෙහි තබන
දේම කියන්ට මා විසින් බලාගත යුතු
13 නොවේදැයි කීවේය. බාලාක් ඔහුට
කථාකොට: ඔවුන් දකින්ට පුළුවන් අන්
තැනකට මා සමග වරෙන්න; තුඹ ඔවුන්
සියල්ලන් නොදක ඔවුන්ගේ ඉතා ඈත
කොටස පමණක් දක්නෙහිය. එහි සිට
මා උදෙසා ඔවුන්ට ශාප කරපන්නැයි
14 කියා, සොෆීම් කෙතෙහි පිස්ගා මුදුනට
ඔහු ගෙනගොස් පූජාසන සතක්
ගොඩනගා එක එක පූජාසනය පිට
ගොනෙකු හා බැටළුවෙකු බැගින්
15 පූජාකෙළේය. ඔහු බාලාක්ට කථාකොට:
මෙහි තුඹේ දවන පූජාව ළඟ සිටින්න,
මම අරෙහේ **ස්වාමීන්වහන්සේ** සම්මුඛ-
16 වන්නෙමියි කීවේය. **ස්වාමීන්වහන්සේ**
බාලාම්ට සම්මුඛවී ඔහුගේ මුඛයෙහි
වචනයක් තබා: තුඹ බාලාක් වෙතට
හැරී ගොස් එසේ කියාපන්නැයි
කීසේක. හෙතෙම ඔහු ළඟට ආවේය, 17
බලව, ඔහුද ඔහු සමග මෝවබ්හි
අධිපතීහුද ඔහුගේ දවන පූජාව ළඟ
සිටියෝය. බාලාක්: **ස්වාමීන්වහන්සේ**
කුමක් කීසේක්දැයි ඔහුගෙන් ඇසුවේය.
ඔහු උපමා කථා පවසමින් කියනුයේ: 18
බාලාක්, නැගිට අසාපන්න;
ශිප්පෝර්ගේ පුත්‍රය, කන්
යොමුකරපන්න.
බොරු කියන්ට දෙවියන්වහන්සේ 19
මනුෂ්‍යයෙක්වත්
තැවෙන්ට මනුෂ්‍ය පුත්‍රයෙක්වත්
නොවනසේක.
උන්වහන්සේ කී දේ
නොකරනසේක්ද?
උන්වහන්සේ කථාකළ දේ
ඉෂ්ට නොකරනසේක්ද?
බලව, ආශීර්වාදකරන්ට අණ ලැබීමි. 20
උන්වහන්සේ ආශීර්වාදකළසේක, මට
එය වෙනස්කරන්ට නොහැක්කේය.
උන්වහන්සේ යාකොබ් කෙරෙහි 21
අයුතුකමවත්
ඉශ්‍රායෙල් කෙරෙහි දූෂ්‍යකමවත්
නුදුටුසේක.
ඔහුගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඔහු සමග සිටිනසේක,
ඔවුන් අතරේ රජෙකුගේ ජය ඝෝෂාව
ඇත්තේය.
දෙවියන්වහන්සේ ඔවුන් මිසරයෙන් 22
ගෙන එනසේක;
ඔහුට කුළුහරකා මෙන් ශක්තිය
ඇත්තේය.
සැබවින් යාකොබ්ට විරුද්ධව 23
ශාස්ත්‍රකීමක්වත්
ඉශ්‍රායෙල්ට විරුද්ධව පේනකීමක්වත්
නැත.
දැනුදු යාකොබ් සහ ඉශ්‍රායෙල් ගැන:
දෙවියන්වහන්සේ කොපමණ දේ
ඉෂ්ටකර තිබේද! කියා කියනු
ලැබේ.

24 බලව, ඒ සෙනඟ සිංහධේනුවක් මෙන් නැගිටියි,
සිංහයෙකු මෙන් තමාම උසස්වෙයි.
ඔහු ගොදුරු කන තෙක්ද
මැරුම්කන්නන්ගේ ලේ බොන තෙක්ද නොලගින්නේයයි
25 කීවේය. බාලාක් බාලාම්ට කථාකොට:
ඔවුන්ට කොහෙත්ම ශාපවත් ආශීර්වාද-
26 වත් නොකරන්නැයි කීවේය. එහෙත්
බාලාම් බාලාක්ට උත්තරදෙමින්:
**ස්වාමීන්වහන්සේ** මට කියන සියල්ල
මා විසින් කළ යුතුයයි තුඹට නො-
27 කීයෙම්දැයි කීවේය. බාලාක්ද: වරෙන්න,
වෙන තැනකට තුඹ ගෙනයන්නෙමි;
එතැන සිට මා උදෙසා ඔවුන්ට ශාප
කරනවාට දෙවියන්වහන්සේ සමහරවිට
ප්‍රසන්නවනසේකැයි බාලාම්ට කියා,
28 කාන්තාරය ඉදිරිපිට පෙනෙන පෙයෝර්
29 මුදුනට බාලාම් ගෙනගියේය. බාලාම්ද:
මෙහි පූජාසන සතක් මට ගොඩනගා
ගොන් සත්දෙනෙක් සහ බැටළුවන්
සත්දෙනෙක් මෙහි මට පිළියෙළ-
30 කරපන්නැයි බාලාක්ට කීවේය. බාලාක්
බාලාම් කී ලෙස කොට එක එක
පූජාසනය පිට ගොනෙකු හා බැටළුවෙකු

24 බැගින් පූජාකෙළේය. එවිට ඉශ්‍රා-
යෙල්ට ආශීර්වාදකිරීමට **ස්වාමීන්-
වහන්සේ** ප්‍රසන්න බව බාලාම් දුටු කල
වෙන වතාවල මෙන් මායම් කරන්ට
නොගොස් තමාගේ මුහුණ කාන්තාරය
2 දෙසට හරවා ගත්තේය. බාලාම් තමාගේ
ඇස් ඔසවා ඉශ්‍රායෙල්වරුන් තමුන්ගේ
ගෝත්‍ර ප්‍රකාරයට වාසයකරන බව
දුටුවේය; දෙවියන්වහන්සේගේ ආත්මයද
3 ඔහු කෙරෙහි පැමිණියේය. ඔහු උපමා
කථා පවසමින් කියනුයේ:
බෙයෝර්ගේ පුත් බාලාම්ගේ කීම,
ඇස් පියවුණු මනුෂ්‍යයාගේ කීම,
4 දෙවියන්වහන්සේගේ වචන අසන්නාවූ,
වැටී ඉඳ පැහැදුණු ඇස් ඇතුව
සර්වපරාක්‍රමයාණන්ගේ දර්ශනය දකින්නාවූ තැනැත්තාගේ කීම
මෙසේය:

එම්බා යාකොබ්, තුඹේ කූඩාරම්, 5
එම්බා ඉශ්‍රායෙල්, තුඹේ මණ්ඩප කොපමණ ශෝභනද!
ඒවා මිටියාවත් මෙන්ද 6
ගඟබඩ උයන් මෙන්ද
**ස්වාමීන්වහන්සේ** සිටෙවූ අගරු ගස් මෙන්ද
දිය අසල කිහිරි ගස් මෙන්ද විහිදී තිබේ.
ඔහුගේ භාජනවලින් වතුර ගලායන්නේය, 7
ඔහුගේ බීජද බොහෝ ජල මතුයෙහි වන්නේය,
ඔහුගේ රජ ආගග්ට වඩා උසස්වන්නේය,
ඔහුගේ රාජ්‍යය උතුම් වන්නේය.
දෙවියන්වහන්සේ මිසරයෙන් ඔහු ගෙනෙන සේක; 8
ඔහුට කුළුහරකාට මෙන් ශක්තිය ඇත්තේය.
ඔහු තමාගේ සතුරන්වූ ජාතීන් කා දමා,
ඔවුන්ගේ ඇට පොඩිකරන්නේය,
තමාගේ ඊගස්වලින් ඔවුන් විද දමන්නේය.
ඔහු නැමී හුන්නේය, සිංහයෙකු මෙන්ද 9
සිංහධේනුවකු මෙන්ද වැදහොත්තේය;
ඔහු නැඟුටුවන්නේ කවුද?
තුඹට ආශීර්වාදකරන සියල්ලෝ ආශීර්වාදකරනු ලබත්වා,
තුඹට ශාපකරන සියල්ලෝ ශාපකරනු ලබත්වයි
කීවේය. එවිට බාලාක්ගේ කෝපය 10
බාලාම්ට විරුද්ධව ඇවුළුණේය, ඔහු
තමාගේ අත් එකට ගසා: මාගේ සතුරන්ට
ශාපකරන පිණිස තුඹ කැඳවාගතිමි,
එහෙත් තුඹ දන් තුන් වරක් ඔවුන්ට
ආශීර්වාද කෙළෙහිය. එබැවින් තුඹේ 11
ස්ථානයට දුවපන්න. මම තුඹ
මහත් ගෞරවයට පමුණුවන්ට සිතීමි;
එහෙත් **ස්වාමීන්වහන්සේ** ගෞරවයට
පැමිණීමෙන් තුඹ වැළැක්වූසේකැයි

12 බාලාම්ට කීවේය. බාලාම්ද: බාලාක්
තමුන් ගෙය පුරවා රන් රිදී මට දෙතත්
මාගේම සිතින් යහපතවත් අයහපතවත්
කිරීම පිණිස **ස්වාමීන්වහන්සේගේ**
වචනය ඉක්මවා යන්ට නොහැක්-
කෙමියි කියාද, **ස්වාමීන්වහන්සේ** කියන
13 දේම කියන්නෙමියි කියාද, තුඹ මා
වෙත එවූ තුඹේ දූතයන්ට නොකීයෙම්ද?
14 බලව, දැන් මාගේ සෙනඟ ළඟට යමි.
වරෙන්න, මතු දවස්වලදී මේ සෙනඟ
තුඹේ සෙනඟට කරන දේ තුඹට
15 දන්වන්නෙමියි බාලාක්ට කීවේය. ඔහු
උපමා කථා පවසමින් කියනුයේ:
බෙයෝර්ගේ පුත් බාලාම්ගේ කීම,
ඇස් පියවුණු මනුෂ්‍යයාගේ කීම,
16 දෙවියන්වහන්සේගේ වචන අසන්නාවූ,
මහෝත්තමයාණන් ගැන දැනගැන්ම
ඇත්තාවූ,
වැටී ඉඳ පැහැදුණු ඇස් ඇතුව
සර්වපරාක්‍රමයාණන්ගේ දර්ශනය
දකින්නාවූ තැනැත්තාගේ කීම
මෙසේය:
17 මම උන්වහන්සේ දකිමි, එහෙත්
දැන් නොවේ.
මම උන්වහන්සේ බලමි, එහෙත්
ළඟදීම නොවේ.
යාකොබ්ගෙන් තාරකාවක්
නික්මෙන්නේය,
ඉශ්‍රායෙල්ගෙන් ජයකොන්තයක්
නැගී එන්නේය,
එය මෝවබ් දෙකෙළවර නටබුන්කර
සියලු කලහකාර පුත්‍රයන් බිඳ
හෙළන්නේය.
18 ඒදෙම් උරුමයක් වන්නේය,
සේයිර්ද තමාගේ සතුරන්ට උරුමයක්
වන්නේය;
ඉශ්‍රායෙල්ද බලවත්තකම් කරන්නේය.
19 යාකොබ්ගෙන් කෙනෙක් රාජ්‍යය
ලැබ
නුවරින් ඉතුරුවෙන්නන් විනාශ
කරන්නේයයි
කීවේය. තවද ඔහු අමලෙක් දෙස 20
බලා උපමා කථා පවසමින් කියනුයේ:
අමලෙක් ජාතීන්ගෙන් පළමුවෙනි
ජාතිය විය;
එහෙත් ඔහුගේ අන්තිමය විනාශය
වන්නේයයි කීවේය.
ඔහු කේනිවරුන් දෙස බලා උපමා 21
කථා පවසමින් කියනුයේ:
තුඹේ වාසස්ථානය ස්ථිරය,
තුඹේ කැදැල්ල පර්වතයෙහි පිහිටා
තිබේ.
එසේ වුවත් අෂූර් තුඹ වහල්කමට 22
ගෙන යන තෙක්
*කායින් නාස්තිකරනු ලබන්නේයයි
කීවේය. තවද ඔහු උපමා කථා පවසමින් 23
කියනුයේ:
අහෝ, දෙවියන්වහන්සේ මෙය
කරන විට කවුරු ජීවත්වන්නේද?
එහෙත් කිත්තීම් දිසාවෙන් නැව් 24
එන්නේය,
ඔව්හු අෂූර් යටහත්කරන්නෝය,
ඒබෙර්ද යටහත්කරන්නෝය,
ඔහුද විනාශයට පැමිණෙන්නේයයි
කීවේය. බාලාම් නැගිට තමාගේ 25
ස්ථානයට හැරී ගියේය. බාලාක්ද යන්ට
ගියේය.

## ඉශ්‍රායෙල්ගේ අනාචාරය සහ රූපවන්දනාවත් ඊට දඬුවමත්

# 25

ඉශ්‍රායෙල්වරු ෂිට්ටීම්හි සිටි-
යෝය, එවිට සෙනඟ මෝවබ්
දූවරුන් සමග වේශ්‍යාකම් කරන්ට පටන්-
ගත්තෝය. ඒ තැනැත්තියෝ තමුන්ගේ 2
දෙවිවරුන්ගේ යාගවලට සෙනඟ
කැඳෙවුවෝය. සෙනඟ කා ඔවුන්ගේ
දෙවිවරුන් ඉදිරියේ වැඳ වැටුණෝය.
තවද ඉශ්‍රායෙල් බාල්පෙයෝර්ට බැඳුණේ 3
විය. **ස්වාමීන්වහන්සේගේ** උදහසද
ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව ඇවිළුණේය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 4
කොට: සෙනඟගේ සියලු නායකයන්
රැගෙන **ස්වාමීන්වහන්සේගේ** තද උදහස
ඉශ්‍රායෙල්වරුන් කෙරෙන් පහවෙන පිණිස

*එනම්, කේනිවරු.

ඔවුන් **ස්වාමීන්වහන්සේ** උදෙසා සූර්යයා
ඉදිරිපිට එල්ලා තබාපන්නැයි කීසේක.
5 මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ගේ විනිශ්චය-
කාරයන්ට කථාකොට: නුඹලා එකි-
නෙකා බාල්පෙයෝර්ට එක්වූ තම
තමාගේ මිනිසුන් මරාපල්ලායයි කීය.
6 එකල ඔවුන් සම්මුඛවීමේ කූඩාරමේ
දෙරකඩ ළඟ හඬමින් සිටියදී ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගෙන් එක් කෙනෙක් මෝසෙස්
ඉදිරියෙහිද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු
සභාව ඉදිරියෙහිද මිදියන් ස්ත්‍රියෙකු
කැඳවාගෙන තමාගේ සහෝදරයන් ළඟට
7 ආයේය. එවිට පූජකවූ ආරොන්ගේ පුත්‍රවූ
එලෙයාසර්ගේ පුත්‍ර වන පීනෙහාස් ඒ
දැක සභා මධ්‍යයෙන් නැගිට හෙල්ලයක්
8 අතින් ගෙන, ඉශ්‍රායෙල් මනුෂ්‍යයා පස්සේ
කූඩාරමට ඇතුල්වී ඉශ්‍රායෙල් මනුෂ්‍යයාද
ඒ ස්ත්‍රීගේ බඩද සිදුරුවන ලෙස ඒ
දෙදෙනාටම ඇන්නේය. එවිට ඉශ්‍රායෙල්
පුත්‍රයන් කෙරෙන් වසංගතය නැවතුණේය.
9 වසංගතයෙන් මැරුණු අය විසිහතර
දහසක්ය.
10 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
11 කොට: පූජක ආරොන්ගේ පුත්‍රවූ
එලෙයාසර්ගේ පුත්‍රයා වන පීනෙහාස්
මා විසින් මාගේ ජ්වලිතයෙන් ඉශ්‍රායෙල්
පුත්‍රයන් විනාශ නොකරන පිණිස ඔවුන්
අතරෙහි මාගේ ජ්වලිතයෙන් ජ්වලිතව
සිටීමෙන් ඉශ්‍රායෙල් පුත්‍රයන් කෙරෙන්
12 මාගේ උදහස පහකෙළේය. එබැවින් මාගේ
13 ශාන්තියේ ගිවිසුම ඔහුට දෙමි. ඔහු
තමාගේ දෙවියන්වහන්සේ ගැන ජ්වලිතව
සිට ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා
සමගිකමක් කළ බැවින් එය ඔහුටත්
ඔහුගෙන් පසු ඔහුගේ වංශයටත් සදාකාල
පූජකකමක ගිවිසුමක් වන්නේය කියා
14 කියාපන්නැයි කීසේක. මරනු ලැබූ
එනම් මිදියන් ස්ත්‍රිය සමග මරනු ලැබූ
ඉශ්‍රායෙල් මනුෂ්‍යයාගේ නම සිම්රීය,
ඔහු වනාහි සාලුගේ පුත්‍රවූ, සිමියොන්-
වරුන්ගේ පිය වංශයක අධිපතියෙක්ය.
මරනු ලැබූ මිදියන් ස්ත්‍රියගේ නම 15
කොස්බීය, ඇ වනාහි මිදියන්වරුන්ගේ
පිය වංශයක සෙනඟගේ ප්‍රධානියා වූ
ශූර්ගේ දුවය.
තවද **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට 16
කථාකොට: මිදියන්වරුන් පෙයෝර්ගේ 17
කාරණයේදීද පෙයෝර්ගේ කාරණය
නිසා වසංගතය පැමිණි දවසේදී මරනු
ලැබූ ඔවුන්ගේ සහෝදරී වන මිදියන්
අධිපතියෙකුගේ දුවවූ කොස්බීගේ
කාරණයේදීද ඔවුන් නුඹලාට කළාවූ
ඔවුන්ගේ ප්‍රයෝගවලින් ඔවුන් නුඹලාට
සතුරුකම් කරන බැවින්, ඔවුන්ට 18
සතුරුකම්කොට පහරදීපල්ලායයි
කීසේක.

## ඉශ්‍රායෙල් දෙවෙනි වර ගණන්කරනු ලැබීම

26
තවද වසංගතයට පසු **ස්වාමීන්-
වහන්සේ** මෝසෙස්ටද පූජක
ආරොන්ගේ පුත්‍රවූ එලෙයාසර්ටද
කථාකොට: ඉශ්‍රායෙල් පුත්‍රයන් වන මුළු 2
සභාවෙන් විසි අවුරුද්ද පටන් ඉන් ඉහළ
වයස් ඇත්තාවූ, ඉශ්‍රායෙල්වරුන් අතරෙන්
යුද්ධයට යන හැකි සියල්ලන්ගේ ගණන
ඔවුන්ගේ පිය පෙළපත්වල හැටියට
ගනිල්ලායයි කීසේක. මෝසෙස්ද 3
පූජකවූ එලෙයාසර්ද යොර්දන අසබඩ
යෙරිකෝව ළඟ මෝවබ් සමභූමිවලදී
ඔවුන්ට කථාකරමින්–**ස්වාමීන්වහන්සේ** 4
මෝසෙස්ටද මිසරදේශයෙන් ආවාවූ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ටද අණකළ ලෙස
විසි අවුරුද්ද පටන් ඉන් ඉහළ වයස්
ඇති සෙනඟගේ ගණන ගනිල්ලායයි
කීවෝය.

ඉශ්‍රායෙල්ගේ කුලුඳුලාවූ රූබෙන්ය. 5
රූබෙන්ගේ පුත්‍රයෝ නම්: හනොක්-
ගෙන් පැවත ආ හනොක් පවුලය.
පල්ලූගෙන් පැවත ආ පල්ලූ පවුලය.
හෙශ්රොන්ගෙන් පැවත ආ හෙශ්- 6
රොන් පවුලය. කර්මීගෙන් පැවත ආ
කර්මී පවුලය. රූබෙන්වරුන්ගේ පවුල් 7
ඒවාය. ඔවුන්ගෙන් ගණන්කරනලද්දෝ
සතළිස් තුන්දස් හත්සිය තිස්දෙනෙක්ය.

8 පල්ලූගේ පුත්‍රයෝනම්: එලියාබ්ය.
9 එලියාබ්ගේ පුත්‍රයෝනම්: නෙමුවෙල්, දතාන් සහ අබීරාම්ය. මේ දතාන් සහ අබීරාම් නම් කෝරාගේ සමාගම ස්වාමීන්වහන්සේට විරුද්ධව විවාදකළ කල්හි සභාවෙන් කැඳවනු ලැබ ඔවුන් සමග මෝසෙස්ටත් ආරොන්ටත්
10 විරුද්ධව විවාදකළාවූ අයවල්ය. ඒ සමාගම නැසුණු කල්හි එනම් ගින්නෙන් දෙසිය පනස් දෙනෙක් විනාශවූ කල්හි භූමිය ඇගේ මුඛය ඇර කෝරා සමග ඔවුන් ගිලගත්තාය. එසේ ඔව්හු අවවාද
11 ලකුණක් වූහ. එසේවී නුමුත් කෝරාගේ පුත්‍රයෝ නොනැසුණෝය.
12 තමුන්ගේ පවුල්වල හැටියට සිමියොන්ගේ පුත්‍රයෝ මොව්හුය: නෙමුවෙල්ගෙන් පැවත ආ නෙමුවෙල් පවුලය. යාමීන්ගෙන් පැවත ආ යාමීන් පවුලය. යාකීන්ගෙන්
13 පැවත ආ යාකීන් පවුලය. ශෙරාගෙන් පැවත ආ ශෙරා පවුලය. ෂාවුල්ගෙන්
14 පැවත ආ ෂාවුල් පවුලය. සිමියොන්වරුන්ගේ පවුල් ඒවාය, විසිදෙදස් දෙසියයක්ය.
15 තමුන්ගේ පවුල්වල හැටියට ගාද්ගේ පුත්‍රයෝ නම් ශෙඵොන්ගෙන් පැවත ආ ශෙඵොන් පවුලය. හග්ගීගෙන් පැවත ආ හග්ගී පවුලය. ෂූනීගෙන් පැවත ආ
16 ෂූනී පවුලය. ඔශ්නීගෙන් පැවත ආ ඔශ්නී පවුලය. ඒරීගෙන් පැවත ආ ඒරී පවුලය.
17 අරොද්ගෙන් පැවත ආ අරොද් පවුලය. අර්යේලිගෙන් පැවත ආ අර්යේලි පවුලය.
18 ගාද්ගේ පුත්‍රයන්ගේ පවුල් ඒවාය, ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය සතළිස්දස් පන්සියයක්ය.
19 යූදාගේ පුත්‍රයෝනම් ඒර් සහ ඕනාන්ය. ඒර් සහ ඕනාන් කානාන් දේශයේදී
20 නැසුණෝය. තමුන්ගේ පවුල්වල හැටියට යූදාගේ පුත්‍රයෝනම්: ෂේලාගෙන් පැවත ආ ෂේලා පවුලය. පෙරෙශ්ගෙන් පැවත ආ පෙරෙශ් පවුලය. ශෙරාගෙන් පැවත
21 ආ ශෙරා පවුලය. පෙරෙශ්ගේ පුත්‍රයෝනම්: හෙශ්රොන්ගෙන් පැවත ආ හෙශ්රොන් පවුලය. හාමුල්ගෙන් පැවත
ආ හාමුල් පවුලය. යූදාගේ පවුල් ඒවාය, 22
ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය සැත්තෑහදස් පන්සියයක්ය.

තමුන්ගේ පවුල්වල හැටියට ඉස්සාකර්- 23
ගේ පුත්‍රයෝ නම්: තෝලාගෙන් පැවත ආ තෝලා පවුලය. පූවාගෙන් පැවත
ආ පූනී පවුලය. යාෂුබ්ගෙන් පැවත ආ 24
යාෂුබ් පවුලය. ෂිම්රොන්ගෙන් පැවත
ආ ෂිම්රොන් පවුලය. ඉස්සාකර්ගේ පවුල් 25
ඒවාය, ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය හැටහතරදස් තුන්සියයක්ය.

තමුන්ගේ පවුල්වල හැටියට සාබුලොන්- 26
ගේ පුත්‍රයෝ නම්: සෙරෙද්ගෙන් පැවත ආ සෙරෙද් පවුලය. ඒලොන්ගෙන් පැවත ආ ඒලොන් පවුලය. යාලෙයෙල්ගෙන්
පැවත ආ යාලෙයෙල් පවුලය. සාබු- 27
ලොන්වරුන්ගේ පවුල් ඒවාය, ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය හැටදස් පන්සියයක්ය.

තමුන්ගේ පවුල්වල හැටියට යෝසෙප්- 28
ගේ පුත්‍රයෝ නම්: මනස්සේ සහ
එප්‍රායිම්ය. මනස්සේගේ පුත්‍රයෝ නම්: 29
මාකීර්ගෙන් පැවත ආ මාකීර් පවුලය. මාකීර්ට දුව ගිලියද් උපන්නේය. ගිලියද්ගෙන් පැවත ආ ගිලියද් පවුලය.
ගිලියද්ගේ පුත්‍රයෝ නම්: ඊයෙසෙර්ගෙන් 30
පැවත ආ ඊයෙසෙර් පවුලය. හේලෙක්ගෙන් පැවත ආ හේලෙක් පවුලය.
අශ්‍රියෙල්ගෙන් පැවත ආ අශ්‍රියෙල් පවුලය. 31
ෂෙකෙම්ගෙන් පැවත ආ ෂෙකෙම් පවුලය.
ෂෙමීදගෙන් පැවත ආ ෂෙමීද පවුලය. 32
හේඵෙර්ගෙන් පැවත ආ හේඵෙර් පවුලය.
හේඵෙර්ගේ පුත්‍රවූ ශෙලෝඵෙහාද්ට 33
දූවරු මිස පුත්‍රයෝ නොසිටියෝය. ශෙලෝඵෙහාද්ගේ දූවරුන්ගේ නාම මාලා, නෝවා, හොග්ලා, මිල්කා සහ තිර්ශාය. මනස්සේගේ පවුල් ඒවාය.
ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය පනස් 34
දෙදස් හත්සියයක්ය.

35 තමුන්ගේ පවුල්වල හැටියට එප්‍රායිම්ගේ
පුත්‍රයෝ මොව්හුය: ශුතෙලාගෙන් පැවත
ආ ශුතෙලා පවුලය. බෙකෙර්ගෙන් පැවත
ආ බෙකෙර් පවුලය. තහන්ගෙන් පැවත
36 ආ තහන් පවුලය. ශුතෙලාගේ පුත්‍රයෝ
මොව්හුය: එරාන්ගෙන් පැවත ආ එරාන්
37 පවුලය. එප්‍රායිම්ගේ පුත්‍රයන්ගේ පවුල්
ඒවාය, ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ
අය තිස් දෙදස් පන්සියයක්ය. තමුන්ගේ
පවුල්වල හැටියට යෝසෙප්ගේ පුත්‍රයෝ
ඔව්හුය.
38 තමුන්ගේ පවුල්වල හැටියට බෙන්යමීන්-
ගේ පුත්‍රයෝ නම්: බෙලාගෙන් පැවත
ආ බෙලා පවුලය. අෂ්බෙල්ගෙන් පැවත
ආ අෂ්බෙල් පවුලය. අහිරාම්ගෙන් පැවත
39 ආ අහිරාම් පවුලය. ෂෙෆූපාම්ගෙන් පැවත
ආ ෂූපාම් පවුලය. හූපාම්ගෙන් පැවත
40 ආ හූපාම් පවුලය. බෙලාගේ පුත්‍රයෝ
නම්: අර්ද් සහ නාමාන්ය. අර්ද්ගෙන්
පැවත ආ අර්ද් පවුලය. නාමාන්ගෙන්
41 පැවත ආ නාමාන් පවුලය. තමුන්ගේ
පවුල්වල හැටියට බෙන්යමීන්ගේ පුත්‍රයෝ
ඔව්හුය. ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ
අය සතළිස් පන්දස් හසියයක්ය.
42 තමුන්ගේ පවුල්වල හැටියට දන්ගේ
පුත්‍රයෝ මොව්හුය: ෂුහාම්ගෙන් පැවත
ආ ෂුහාම් පවුලය. තමුන්ගේ පවුල්-
වල හැටියට දන්ගේ පවුල් ඔව්හුය.
43 ෂුහාම්වරුන්ගේ සියලු පවුල්වලින්
ගණන්කරනු ලැබූ අය සැට සතරදස්
හාරසියයක්ය.
44 තමුන්ගේ පවුල්වල හැටියට ආෂෙර්ගේ
පුත්‍රයෝ නම්: ඉම්නාගෙන් පැවත ආ
ඉම්නා පවුලය. ඉෂ්වීගෙන් පැවත ආ
ඉෂ්වී පවුලය. බෙරියාගෙන් පැවත ආ
45 බෙරියා පවුලය. බෙරියාගේ පුත්‍රයන්ගෙන්
හේබෙර්ගෙන් පැවත ආ හේබෙර් පවුලය.
මල්කීයෙල්ගෙන් පැවත ආ මල්කීයෙල්
46 පවුලය. ආෂෙර්ගේ දුවගේ නම සෙරාය.
47 ආෂෙර් පුත්‍රයන්ගේ පවුල් ඒවාය,
ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය
පනස්තුන්දස් හාරසියයක්ය.

තමුන්ගේ පවුල්වල හැටියට නප්තලීගේ 48
පුත්‍රයෝ නම්: යාශීල්ගෙන් පැවත ආ
යාශීල් පවුලය. ගූනීගෙන් පැවත ආ
ගූනී පවුලය. යේශෙර්ගෙන් පැවත ආ 49
යේශෙර් පවුලය. ෂිල්ලෙම්ගෙන් පැවත
ආ ෂිල්ලෙම් පවුලය. තමුන්ගේ පවුල්වල 50
හැටියට නප්තලීගේ පවුල් ඒවාය.
ඔවුන්ගෙන් ගණන්කරනු ලැබූ අය
සතළිස් පන්දස් හාරසියයක්ය.
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් ගණන්කරනු 51
ලැබූ ඔව්හු සලක්ෂ එක්දස් හත්සිය
තිස්දෙනෙක්ය.
තවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට 52
කථාකෙට: නාම ගණන හැටියට දේශය 53
මොවුන්ට උරුමයක් වෙන පිණිස බෙදනු
ලැබිය යුතුය. වැඩිව සිටින්නන්ට 54
වැඩියෙන්ද අඩුව සිටින්නන්ට අඩුවෙන්ද
ඔවුන්ගේ උරුමය දීපන්න. ගණන්කරනු
ලැබූවන්ගේ ගණනේ ප්‍රකාරයට එක එක
ගෝත්‍රයට උරුමය දෙනු ලැබේවා.
එසේවීනුමුත් පස ඇට දැමීමෙන් දේශය 55
බෙදනු ලබාවා. ඔවුන්ගේ පිය ගෝත්‍රවල
නාමවල හැටියට ඔවුන්ට උරුමය
ලැබේවා. පස ඇට වැටීමේ හැටියටම 56
වැඩි නුමුත් ස්වල්ප නුමුත් ඔවුන්ගේ
උරුමය බෙද දෙනු ලැබේවයි කීසේක.
තමුන්ගේ පවුල්වල හැටියට ලෙවී- 57
වරුන්ගෙන් ගණන්කරනලද්දෝ මො-
ව්හුය: ගේර්ෂොන්ගෙන් පැවත ආ
ගේර්ෂොන් පවුලය. කොහාත්ගෙන් පැවත
ආ කොහාත් පවුලය. මෙරාරීගෙන් පැවත
ආ මෙරාරී පවුලය. ලෙවීවරුන්ගේ පවුල් 58
මේවාය: ලිබ්නී පවුලය, හෙබ්‍රොන් පවුලය,
මාලී පවුලය, මූෂි පවුලය, කෝරා
පවුලය. කොහාත්ට දව අම්රාම්
උපන්නේය. අම්රාම්ගේ භාර්යාවගේ නම 59
යොකෙබෙද්ය, ඈ මිසරයේදී ලෙවීට
දව උපන්නාවූ ඔහුගේ දුවක්ය. ඈ
අම්රාම් නිසා ආරොන්ද මෝසෙස්ද
ඔවුන්ගේ සහෝදරීවූ මිරියාම්ද
වැදුවාය. ආරොන්ට දව නාදබ් සහ 60
අබීහුද එලෙයාසර් සහ ඊතාමාර්ද

61 උපන්නෝය. නාදබ් සහ අබීහු ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි අන්‍ය ගින්නක්
62 ඔප්පුකළ කල්හි නැසුණෝය. ඔවුන්ගෙන්
ගණන්කරනලද්දෝ මසක් පටන් ඉන්
ඉහළ වයස් ඇති සියලුම පිරිමි වන
විසි තුන්දහසක්ය. ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරේ කිසි උරුමයක් ඔවුන්ට නුදුන්
බැවින් ඔව්හු ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ
ගණන්කරනු නොලැබූහ.
63 යොර්දන අසබඩ යෙරිකෝව ළඟ
මෝවබ් සමභූමිවලදී ඉශ්‍රායෙල් පුත්‍රයන්
ගණන්කළාවූ මෝසෙස් හා පූජකවූ
එලෙයාසර්ද විසින් ගණන්කරනු
64 ලැබුවෝ මොව්හුය. එහෙත් සීනයි
කාන්තාරයෙහිදී ඉශ්‍රායෙල් පුත්‍රයන්
ගණන්කළාවූ මෝසෙස් හා පූජකවූ
ආරොන්ද විසින් ගණන්කළවුන්ගෙන්
කිසිවෙක් මොවුන් අතරේ නොසිටියෝය.
65 මක්නිසාද: ඔව්හු කාන්තාරයෙහි
සැබවින්ම මියන්නෝයයි ස්වාමීන්-
වහන්සේ ඔවුන් ගැන කීසේක. එහෙත්
යෙපුන්නෙගේ පුත්‍රවූ කාලෙබ්ද නූන්ගේ
පුත්‍රවූ යෝෂුවාද හැර ඔවුන්ගෙන්
කිසිවෙක්වත් ඉතුරු නොවීය.

## උරුම ගැන නීතිය

27 එකල යෝසෙප්ගේ පුත්‍රයා වන
මනස්සේගේ වංශවලින් මනස්-
සේගේ පුත්‍රවූ මාකීර්ගේ පුත්‍රයා වන
ගිලියද්ගේ පුත්‍රවූ හේපෙර්ගේ පුත්‍රයා වන
ශෙලෝපෙහාද්ගේ දූවරු ළංවුණෝය.
ඔහුගේ දූවරුන්ගේ නාම මාලා, නෝවා,
2 හොග්ලා, මිල්කා, සහ තිර්ශාය. ඔව්හු
මෝසෙස්ද පූජකවූ එලෙයාසර්ද
අධිපතීන්ද මුළු සභාවද ඉදිරියෙහි
සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟ
3 සිට කථාකොට: අපේ පියා
කාන්තාරයෙහි මෙළේය, ඔහු කෝරාගේ
සමාගම වන ස්වාමීන්වහන්සේට
විරුද්ධව රැස්වුණ සභාව අතරේ
නොසිටියේය. ඔහු තමාගේ පාපය නිසාම
මෙළේය; ඔහුට පුත්‍රයෝ නොසිටියෝය.
4 අපේ පියාණන්ට පුත්‍රයෙකු නැති
බැවින් ඔහුගේ නාමය ඔහුගේ වංශය
අතරෙන් පහවෙන්ට ඕනෑ මක්නිසාද?
අපේ පියාගේ සහෝදරයන් අතරේ අපට
උරුමයක් දුනමැනවියි කීවෝය.
මෝසෙස් ඔවුන්ගේ කාරණය ස්වාමීන්- 5
වහන්සේ ඉදිරිපිටට ගෙනායේය. එවිට 6
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
කොට: ශෙලෝපෙහාද්ගේ දූවරුන් කියන 7
දේ හරිය. තුඹ සැබවින් ඔවුන්ගේ පියාගේ
සහෝදරයන් අතරේ ඔවුන්ට උරුමයක්
දිය යුතුය; ඔවුන්ගේ පියාගේ උරුමය
ඔවුන්ට හිමිවෙන්ට සලසාපන්න. තුඹ 8
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකර: මනුෂ්‍ය-
යෙක් පුත්‍රයෙකු නොලැබ නැසුණොත්
ඔහුගේ උරුමය ඔහුගේ දූවට හිමිවෙන්ට
සලසාපල්ලා. ඔහුට දූවක් නැත්නම් 9
ඔහුගේ සහෝදරයන්ට ඔහුගේ උරුමය
දීපල්ලා. ඔහුට සහෝදරයනුත් නැත්නම් 10
ඔහුගේ පියාගේ සහෝදරයන්ට ඔහුගේ
උරුමය දීපල්ලා. ඔහුගේ පියාගේ සහෝ- 11
දරයනුත් නැත්නම් ඔහුගේ වංශයෙන්
ඔහුට ළඟ නෑයාට ඔහුගේ උරුමය
දීපල්ලා. ඔහුට ඒක හිමිවිය යුතුය.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට අණකළ
ලෙස ඒක ඉශ්‍රායෙල් පුත්‍රයන්ට විනිශ්චය
පිළිබඳ පනතක් වන්නේයයි කීසේක.

## මෝසෙස්ගේ තනතුරට යෝෂුවා නියමකරනු ලැබීම

ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 12
කොට: මේ අබාරීම්නම් කන්දට නැඟී
මා විසින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට දී තිබෙන
දේශය බලාපන්න. තුඹ ඒක දුටු පසු 13
තුඹේ සහෝදරවූ ආරොන් තමාගේ
සෙනඟට එකතුවුණාක්මෙන් තුඹත් තුඹේ
සෙනඟට එකතුවන්නෙහිය. මක්නිසාද 14
ශීන් කාන්තාරයෙහිදී සභාව කළ
විවාදයේදී ඔවුන්ගේ ඇස් හමුයෙහි වතුර
ළඟදී මා ගෞරවයට නොපමුණුවන
ලෙස, තුඹලා මාගේ අණට විරුද්ධව
කැරළි ගැසූ නිසායයි කීසේක. ඒ
වනාහි ශීන් කාන්තාරයේ කාදෙෂ්හි
තිබෙන මෙරීබා වතුරය. එවිට මෝසෙස් 15

16 ස්වාමීන්වහන්සේට කථාකොට: මාංස-
මයවූ සියල්ලන්ගේ ආත්මවල
දෙවිවූ ස්වාමීන්වහන්සේ තමන්-
වහන්සේගේ සභාව එඬේරෙක් නැති
17 බැටළුවන්මෙන් නොවන පිණිස, ඔවුන්ට
පෙරටුව පිටතට යන්ටත් ඔවුන්ට පෙර-
ටුව ඇතුළට එන්ටත් ඔවුන් පිටතට
ගෙනයන්ටත් ඇතුළට ගෙන එන්ටත්
සභාව කෙරෙහි මනුෂ්‍යයෙකු පත්කරන-
18 සේක්වයි කීවේය. ස්වාමීන්වහන්සේ
මෝසෙස්ට කථාකොට: *ආත්මය ඇති
මනුෂ්‍යයෙක් වන නූන්ගේ පුත්‍රවූ යෝෂුවා
කැඳවා නුඹේ අත ඔහු පිට තබාපන්න;
19 පූජකවූ එලෙයාසර් සහ මුළු සභාව
ඉදිරියෙහි ඔහු සිටුවා ඔවුන්ගේ ඇස්
ඉදිරියෙහි ඔහුට අණක් දීපන්න.
20 ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාව
ඔහුට කීකරුවන පිණිස නුඹට ඇති
ගරුතරකමෙන් කොටසක් ඔහු කෙරෙහි
21 තබාපන්න. පූජකවූ එලෙයාසර් ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි †ඌරීම් විනිශ්චයෙන්
ඔහු උදෙසා විභාගකරන පිණිස ඔහු
එලෙයාසර් ඉදිරියට පැමිණේවා.
එලෙයාසර්ගේ අණ පිට ඔහුද ඔහු සමග
සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝද එනම් මුළු
සභාවද පිටතට යෙත්වා, ඔහුගේ අණ
22 පිට ඇතුළටද එත්වයි කීසේක. මෝසෙස්
ස්වාමීන්වහන්සේ තමාට අණකළ ලෙස
කොට යෝෂුවා කැඳවාගෙන පූජකවූ
එලෙයාසර් සහ මුළු සභාව ඉදිරියෙහි
23 සිටුවා, තමාගේ අත් ඔහු පිට තබා,
ස්වාමීන්වහන්සේ මෝසෙස් ලවා කියෙවූ
ලෙස අණක් ඔහුට දුන්නේය.

## පූජා සහ මංගල්‍ය සම්බන්ධ අණපනත්

28 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
2 කථාකොට කියනසේක: නුඹ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අණකරමින්, මාගේ
පූජාව එනම් මිහිරි සුවඳක් ඇති ගින්නෙන්
කළ යුතු මාගේ පූජා පිණිස මාගේ
භෝජන ඒවායේ නියම කාලවලදී මට
ඔප්පුකරන්ට බලාගනිල්ලායයි ඔවුන්ට
කියාපන්න. නුඹ ඔවුන්ට මෙසේ 3
කියාපන්න–නුඹලා ස්වාමීන්වහන්සේට
ඔප්පුකරන්නාවූ ගිනි පූජාව නම්
නිරන්තර දවන පූජාවක් පිණිස
දවස්පතාම කැලල් නැති එක් අවුරුදු
බැටළුපැටවුන් දෙදෙනෙක්ය. එක 4
බැටළුපැටවෙකු උදය පූජාකරපන්න,
අනික් බැටළුපැටවා සවස පූජාකරපන්න;
ආහාර පූජාවකට කොටා සිඳගත් තෙල් 5
හිනකින් සතරෙන් කොටසක් සමග
මිශ්‍රකළ සිහින් පිටි ඒඵාවකින් දසයෙන්
කොටසක් ඔප්පුකරපන්න. එය 6
ස්වාමීන්වහන්සේට ගිනි පූජාවක් කොට
මිහිරි සුවඳක් පිණිස සීනයි කන්දේදී
නියමකළාවූ නිරන්තර දවන පූජාවක්ය.
ඒකේ පාන පූජාව එක එක 7
බැටළුපැටවාට හිනකින් සතරෙන්
කොටසක්ය. ස්වාමීන්වහන්සේට පාන
පූජාවක් පිණිස ශුද්ධස්ථානයෙහි මද්‍ය-
පානය වත්කරපන්න. අනික් බැටළු- 8
පැටවා සවස පූජාකරපන්න. උදය
ආහාර පූජාව මෙන්ද ඒකේ පාන පූජාව
මෙන්ද ඒක ස්වාමීන්වහන්සේට මිහිරි
සුවඳක් ඇති ගිනි පූජාවක් කොට ඔප්පු-
කරපන්න.

සබත් දවසේදී කැලල් නැති එක් අවුරුදු 9
බැටළුපැටවුන් දෙදෙනෙකුද ආහාර
පූජාවකට තෙල් මිශ්‍ර සිහින් පිටි ඒඵාවකින්
දසයෙන් දෙකොටසක්ද ඒකේ පාන
පූජාවද ඔප්පුකරපන්න. මෙය වනාහි 10
නිරන්තර දවන පූජාව සහ ඒකේ පාන
පූජාවද ඇර එක එක සබත් දවසේදී
ඔප්පුකරන දවන පූජාවය.

නුඹලාගේ මාසාරම්භවලදී ස්වාමීන්- 11
වහන්සේට දවන පූජාවක් ඔප්පු-
කරපල්ලා; එනම් ස්වාමීන්වහන්සේට
ගින්නෙන් කරන පූජාවක් වන මිහිරි
සුවඳ ඇති දවන පූජාවක් පිණිස කැලල්
නැති තරුණ ගොන් දෙදෙනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-

*හෙවත්, බුහුටිකම.
†නික්ම. 28.30 බලනු.

12 පැටවුන් සත් දෙනෙක්ද, එක එක
ගොනාට ආහාර පූජාවක් පිණිස තෙල්
මිශ්‍ර සිහින් පිටි ඒඵාවකින් දසයෙන්
තුන් කොටසක්ද එක එක බැටළුවාට
ආහාර පූජාවක් කොට තෙල් මිශ්‍ර සිහින්
13 පිටියෙන් දසයෙන් දෙකොටසක්ද, එක
එක බැටළුපැටවාට ආහාර පූජාවක්
කොට තෙල් මිශ්‍ර සිහින් පිටියෙන්
දසයෙන් කොටසක්ද ඔප්පුකරපල්ලා.
14 උන්ගේ පාන පූජා නම් ගොනෙකුට
මුද්‍රිකපාන හිනකින් දෙකෙන් කොටසක්ද
එක එක බැටළුවාට හිනකින් තුනෙන්
කොටසක්ද එක එක බැටළුපැටවාට
හිනකින් සතරෙන් කොටසක්ද වන්නේය.
මෙය අවුරුද්දේ මාසවලින් එක එක
15 මාසයේ දවන පූජාවය. නිරන්තර දවන
පූජාව ඇර ස්වාමීන්වහන්සේට පාප
පූජාවක් පිණිස එළුවෙක්ද උගේ පාන
පූජාවද ඔප්පුකරනු ලබන්නේය.
16 පළමුවෙනි මස දසසතරවෙනි දින
17 ස්වාමීන්වහන්සේගේ පාස්කුවය. ඒ
මාසයේ පසළොස්වෙනි දින මංගල්‍ය
දවසක්ය. සත් දවසක් මුහුන් නොදැමූ
18 රොටි කෑ යුතුය. පළමුවෙනි දවසේ
ශුද්ධ රැස්වීමක් වන්නේය; කිසි බර
19 වැඩක් නොකරල්ලා. තවද ස්වාමීන්-
වහන්සේට දවන පූජාවක් වන ගිනි
පූජාවක් කොට කැළල් නැති තරුණ
ගොන් දෙදෙනෙක්ද එක බැටළුවෙක්ද
එක් අවුරුදු බැටළුපැටවුන් සත් දෙනෙක්ද
20 රැගෙන ඔප්පුකරපල්ලා. උන්ගේ ආහාර
පූජාව වන තෙල් මිශ්‍ර සිහින් පිටියෙන්
එක එක ගොනාට දසයෙන් තුන්
කොටසක්ද එක එක බැටළුවාට
21 දසයෙන් දෙකොටසක්ද, බැටළුපැටවුන්
සත් දෙනාගෙන් එක එක බැටළුපැටවාට
දසයෙන් කොටසක්ද බැගින් ඔප්පු-
22 කරපල්ලා; නුඹලා උදෙසා සමගිකමක්
කරන පිණිස පාප පූජාවකට එක
23 එළුවෙකුත් පූජාකරපල්ලා. නිරන්තර
දවන පූජාවක් වන උදයේ දවන
පූජාව ඇර මේවාත් ඔප්පුකරපල්ලා.

එලෙස සත් දවසක් එක එක දවසට 24
ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳක් ඇති
ගිනි පූජාවේ ආහාරය ඔප්පුකරපල්ලා.
නිරන්තර දවන පූජාව ඇර ඒකත් ඒකේ
පාන පූජාවත් ඔප්පුකරනු ලබන්නේය.
සත්වෙනි දින ශුද්ධ රැස්වීමක් පවත්වා- 25
පල්ලා; බර වැඩක් නොකරල්ලා.
තවද නුඹලාගේ සති මංගල්‍යයේදී 26
නුඹලා ස්වාමීන්වහන්සේට අලුත් ආහාර
පූජාවක් ඔප්පුකරන ප්‍රථම ඵල දවසේදීත්
ශුද්ධ රැස්වීමක් පවත්වාපල්ලා; කිසි බර
වැඩක් නොකරල්ලා. එහෙත් ස්වාමීන්- 27
වහන්සේට මිහිරි සුවඳක් පිණිස දවන
පූජාවකට තරුණ ගොන් දෙදෙනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
පැටවුන් සත්දෙනෙක්ද, උන්ගේ ආහාර 28
පූජාව වන තෙල් මිශ්‍ර සිහින් පිටියෙන්
එක එක ගොනාට දසයෙන් තුන්
කොටසක්ද එක එක බැටළුවාට
දසයෙන් දෙකොටසක්ද, බැටළුපැටවුන් 29
සත් දෙනාගෙන් එක එක බැටළුපැටවාට
දසයෙන් කොටසක්ද, නුඹලා උදෙසා 30
සමගිකමක් කරන පිණිස එක එළුවෙක්ද
ඔප්පුකරපල්ලා. නිරන්තර දවනපූජාව 31
සහ ඒකේ පාන පූජාවද ඇර උන්ද
උන්ගේ පාන පූජාවල්ද ඔප්පුකරපල්ලා.
උන් කැළල් නැති සත්තු විය යුතුය.

## 29

සත්වෙනි මාසයේ පළමුවෙනි
දින ශුද්ධ රැස්වීමක් පවත්වා-
පල්ලා; කිසි බර වැඩක් නොකරල්ලා.
ඒක නුඹලාට හොරණෑ පිඹීමේ දවසක්ය.
ස්වාමීන්වහන්සේට ගිනි පූජාවක් කොට 2
මිහිරි සුවඳක් පිණිස ඔවුන්ගේ නියෝගය
ලෙස අමාවක දවසේ දවන පූජාව සහ
ඒකේ ආහාර පූජාවද, නිරන්තර දවන 3
පූජාව සහ ආහාර පූජාවද ඒවායේ
පාන පූජාද ඇර ස්වාමීන්වහන්සේට
මිහිරි සුවඳක් පිණිස දවන පූජාවක්
කොට කැළල් නැති තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
පැටවුන් සත් දෙනෙක්ද, උන්ගේ ආහාර 4
පූජාව වන තෙල් මිශ්‍ර සිහින් පිටියෙන්
එක එක ගොනාට දසයෙන් තුන්

කොටසක්ද එක එක බැටළුවාට
5 දසයෙන් දෙකොටසක්ද, බැටළුපැටවුන්
සත් දෙනාගෙන් එක එක බැටළුපැටවාට
6 දසයෙන් කොටසක්ද, තුඹලා උදෙසා
සමගිකමක් කරන පිණිස පාප පූජාවක්
කොට එක එළුවෙක්ද ඔප්පුකරපල්ලා.

7 මේ සත්වෙනි මස දසවෙනි දවසේ
ශුද්ධ රැස්වීමක් පවත්වා කිසි ආකාර
වැඩක් නොකර දුක් විලාසයෙන්
8 සිටපල්ලා. එහෙත් සමගිකමක් කිරීමේ
පාප පූජාව සහ නිරන්තර දවන පූජාවත්
ඒකේ ආහාර පූජාවත් ඒවායේ පාන
9 පූජාවලුත් ඇර, ස්වාමීන්වහන්සේට
මිහිරි සුවඳක් ඇති දවන පූජාවක් කොට
කැලල් නැති එක තරුණ ගොනෙක්ද
එක බැටළුවෙක්ද එක් අවුරුදු බැටළු-
10 පැටවුන් සත් දෙනෙක්ද රැගෙන, උන්
සහ උන්ගේ ආහාර පූජාව වන තෙල්
මිශ්‍ර සිහින් පිටියෙන් එක එක ගොනාට
දසයෙන් තුන් කොටසක්ද එක එක
බැටළුවාට දසයෙන් දෙකොටසක්ද,
11 බැටළුපැටවුන් සත් දෙනාගෙන් එක එක
බැටළුපැටවාට දසයෙන් කොටසක්ද
පාප පූජාවක් පිණිස එක එළුවෙක්ද
ඔප්පුකරපල්ලා.

12 සත්වෙනි මස පසළොස්වෙනි දවසේ
ශුද්ධ රැස්වීමක් පවත්වාපල්ලා; කිසි
බර වැඩක් නොකරල්ලා, සත් දවසක්
ස්වාමීන්වහන්සේට මංගල්‍යයක් පවත්වා-
13 පල්ලා. නිරන්තර දවන පූජාව සහ ඒකේ
ආහාර පූජාවද ඒකේ පාන පූජාවද
ඇර ස්වාමීන්වහන්සේට මිහිරි සුවඳක්
14 ඇති ගිනි පූජාවක් පිණිස, කැලල් නැති
තරුණ ගොන් දහතුන් දෙනෙක්ද
බැටළුවන් දෙදෙනෙක්ද එක් අවුරුදු
15 බැටළුපැටවුන් දසසතර දෙනෙක්ද, උන්ගේ
ආහාර පූජාව වන තෙල් මිශ්‍ර
සිහින් පිටියෙන් ගොන් දහතුන්
දෙනාගෙන් එක එක ගොනාට
දසයෙන් තුන් කොටසක්ද බැටළුවන්
දෙන්නාගෙන් එක එක බැටළුවාට
16 දසයෙන් දෙකොටසක්ද, බැටළුපැටවුන්
දසසතර දෙනාගෙන් එක එක බැටළු-
පැටවාට දසයෙන් කොටසක්ද පාප
පූජාවක් පිණිස එක එළුවෙක්ද ඔප්පු-
කරපල්ලා.

දෙවෙනි දවසේ නිරන්තරවූ දවන පූජාව 17
සහ ඒකේ ආහාර පූජාවද ඒකේ පාන
පූජාද ඇර, කැලල් නැති තරුණ ගොන් 18
දෙළොස් දෙනෙක්ද බැටළුවන් දෙන්-
නෙක්ද එක් අවුරුදු බැටළුපැටවුන්
දසසතර දෙනෙක්ද, ගොනුන්ටත් බැටළු- 19
වන්ටත් බැටළුපැටවුන්ටත් නියෝගයේ
ප්‍රකාරයට උන්ගේ ගණනේ හැටියට
උන්ගේ ආහාර පූජාව සහ පාන පූජාද
පාප පූජාවක් පිණිස එක එළුවෙක්ද
ඔප්පුකරපල්ලා.

තුන්වෙනි දවසේ නිරන්තරවූ දවන 20
පූජාව සහ ඒකේ ආහාර පූජාවද ඒකේ
පාන පූජාවද ඇර, කැලල් නැති ගොන් 21
එකොළොස් දෙනෙක්ද බැටළුවන්
දෙන්නෙක්ද එක් අවුරුදු බැටළුපැටවුන්
දසසතර දෙනෙක්ද, ගොනුන්ටත් 22
බැටළුවන්ටත් බැටළුපැටවුන්ටත් නියෝ-
ගයේ ප්‍රකාරයට උන්ගේ ගණනේ හැටියට
උන්ගේ ආහාර පූජාව සහ පාන පූජාද
පාප පූජාවක් පිණිස එළුවෙක්ද
ඔප්පුකරපල්ලා.

සතරවෙනි දවසේ නිරන්තර දවන 23
පූජාව සහ ඒකේ ආහාර පූජාවද ඒකේ
පාන පූජාවද ඇර, කැලල් නැති ගොන් 24
දස දෙනෙක්ද බැටළුවන් දෙන්නෙක්ද
එක් අවුරුදු බැටළුපැටවුන් දසසතර
දෙනෙක්ද, ගොනුන්ටත් බැටළුවන්ටත් 25
බැටළුපැටවුන්ටත් නියෝගයේ ප්‍රකාරයට
උන්ගේ ගණනේ හැටියට උන්ගේ ආහාර
පූජාව සහ පාන පූජාවද පාප පූජාවක්
පිණිස එළුවෙක්ද ඔප්පුකරපල්ලා.

පස්වෙනි දවසේ නිරන්තර දවන පූජාව 26
සහ ඒකේ ආහාර පූජාවද ඒකේ පාන
පූජාවද ඇර, කැලල් නැති ගොන් 27
නවදෙනෙක්ද බැටළුවන් දෙන්නෙක්ද
එක් අවුරුදු බැටළුපැටවුන් දසසතර
දෙනෙක්ද, ගොනුන්ටත් බැටළුවන්ටත් 28
බැටළුපැටවුන්ටත් නියෝගයේ ප්‍රකාරයට

උන්ගේ ගණනේ හැටියට උන්ගේ ආහාර
පූජාව සහ පාන පූජාද පාප පූජාවක්
පිණිස එළුවෙක්ද ඔප්පුකරපල්ලා.
29 සවෙනි දවසේ නිරන්තර දවන පූජාව
සහ ඒකේ ආහාර පූජාවද ඒකේ පාන
30 පූජාවද ඇර, කැලල් නැති ගොන් අට
දෙනෙක්ද බැටළුවන් දෙන්නෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් දසසතර දෙනෙ-
31 ක්ද, ගොනුන්ටත් බැටළුවන්ටත් බැටළු-
පැටවුන්ටත් නියෝගයේ ප්‍රකාරයට උන්-
ගේ ගණනේ හැටියට ආහාර පූජාව
සහ පාන පූජාද පාප පූජාවක් පිණිස
එක එළුවෙක්ද ඔප්පුකරපල්ලා.
32 සත්වෙනි දවසේ නිරන්තර දවන පූජාව
සහ ඒකේ ආහාර පූජාවද ඒකේ පාන
33 පූජාවද ඇර, කැලල් නැති ගොන් සත්
දෙනෙක්ද බැටළුවන් දෙන්නෙක්ද එක්
අවුරුදු බැටළුපැටවුන් දසසතර දෙනෙක්-
34 ද, ගොනුන්ටත් බැටළුවන්ටත් බැටළු-
පැටවුන්ටත් නියෝගයේ ප්‍රකාරයට
උන්ගේ ගණනේ හැටියට ආහාර පූජාව
සහ පාන පූජාද පාප පූජාවක් පිණිස
එක එළුවෙක්ද ඔප්පුකරපල්ලා.
35 අටවෙනි දවසේ ගරුමය රැස්වීමක්
පවත්වාපල්ලා. කිසි බර වැඩක්
36 නොකරල්ලා. එහෙත් නිරන්තර දවන
පූජාව සහ ඒකේ ආහාර පූජාවද පාන
37 පූජාවද ඇර, **ස්වාමීන්වහන්සේට** මිහිරි
සුවඳක් ඇති ගිනි පූජාවක් කොට දවන
පූජාවක් පිණිස කැලල් නැති එක
ගොනෙක්ද එක බැටළුවෙක්ද එක් අවුරුදු
38 බැටළුපැටවුන් සත් දෙනෙක්ද, ගොනාටත්
බැටළුවාටත් බැටළුපැටවුන්ටත් නියෝ-
ගයේ ප්‍රකාරයට උන්ගේ ගණනේ හැටියට
උන්ගේ ආහාර පූජාවද පාන පූජාද
පාප පූජාවක් පිණිස එක එළුවෙක්ද
ඔප්පුකරපල්ලා.
39 තුඹලාගේ බාරවලටත් තුඹලාගේ
ස්වේච්ඡා පූජාවලටත් අඩංගුවන්නාවූ
තුඹලාගේ දවන පූජාද ආහාර පූජාද
පාන පූජාද ශාන්ති පූජාද ඇර මේවා
තුඹලාගේ නියම මංගල්‍යවලදී **ස්වාමීන්-
වහන්සේට** ඔප්පුකරපල්ලාය කියා
ඔවුන්ට කියාපන්නැයි කීසේක. මෝසෙස්ද 40
**ස්වාමීන්වහන්සේ** තමාට අණකළ
සියල්ල ලෙස ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කීවේය.

## බාරවල් ගැන නීතිය

30 මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ගෝත්‍රවල ප්‍රධානීන්ට කථාකොට:
**ස්වාමීන්වහන්සේ** අණකර තිබෙන දේ
මේය–මනුෂ්‍යයෙක් **ස්වාමීන්වහන්සේට** 2
බාරයක් වුණොත් නොහොත් යමකින්
වැලකීමට බැඳෙන හැටියට දිවුරුමක්
දිවුළොත් ඔහු තමාගේ වචනය කඩ-
නොකර තමාගේ මුඛයෙන් නික්මෙන
සියල්ල ලෙස කෙරේවා. ස්ත්‍රියෙක් ඇගේ 3
තරුණ වයසේදී ඇගේ පියාගේ ගෙයි
සිටින අතර **ස්වාමීන්වහන්සේට** බාරයක්
වී යමකින් වැලකීමට බැඳෙන කල,
ඇගේ පියා ඇගේ බාරය හා ඈ බැඳුණු 4
බැඳීමේ වචනද අසා ඒ ගැන කිසිවක්
නොකියා සිටියොත්, ඇගේ සියලු බාරද
ඈ විසින් ඉෂ්ට කරන්ට බැඳුණු හැම
බැඳීම්ද ස්ථිර වන්නේය. එහෙත් ඇගේ 5
පියා එය ඇසූ දවසේදී ඈට තහනම්-
කළොත්, ඇගේ බාරද ඈ බැඳුණ බැඳීම්ද
ස්ථිර නොවන්නේය. ඇගේ පියා ඈට
තහනම් කළ බැවින් **ස්වාමීන්වහන්සේ**
ඈට ක්ෂමාකරනසේක. ඇගේ බාර ඈ 6
පිට තිබියදී නොහොත් ඈ බැඳෙන
හැටියට අපරීක්ෂාවෙන් ඇගේ තොල්-
වලින් කියාවුණාවූ දේ තිබියදී ඈ
පුරුෂයෙකු සමග විවාහවූවානම්, ඇගේ 7
පුරුෂයා ඒ ඇසූ දවසේදී කිසිවක්
නොකීවොත්, ඇගේ බාරද ඈ බැඳුණු
ඇගේ බැඳීම්ද ස්ථිර වන්නේය. එහෙත් 8
ඇගේ පුරුෂයා ඒ ඇසූ දවසේදී ඈට
තහනම් කළොත්, ඈ කෙරෙහි තිබෙන
ඇගේ බාරයද ඈ බැඳෙන හැටියට
අපරීක්ෂාවෙන් ඇගේ තොල් වලින්
කියවුණාවූ වචනද ඔහු අවලංගු-
කරන්නේය. **ස්වාමීන්වහන්සේද** ඈට
ක්ෂමාකරනසේක. එහෙත් වැන්දඹුවකු 9
විසින් හෝ අත්හරිනලද භාර්යාවකු

විසින් හෝ බාරයක් වූ කල්හි ඈ බැඳුණු
සියල්ලම ඈ කෙරෙහි ස්ථිරවන්නේය.
10 තවද ඇගේ පුරුෂයාගේ ගෙයිදී ඈ
බාරයක් වුණොත් නොහොත් යමකින්
වැලකීමට ඈ දිවුරුමකින් බැඳුණොත්,
11 ඇගේ පුරුෂයාද ඒ අසා
කිසිවක් නොකීයේනම්, ඈට තහනම්
නොකෙළේ නම්, ඇගේ සියලු බාරද
ඈ කරන්ට බැඳුණාවූ සියල්ලද
12 ස්ථිරවන්නේය. එහෙත් ඇගේ පුරුෂයා
ඒ ඇසූ දවසේදී ඒවා මුළුමනින්ම අවලංගු
කෙළේනම්, ඇගේ බාරවල් ගැනද ඇගේ
බැඳීම ගැනද ඇගේ තොල් වලින්
නික්මුණාවූ කිසිවක් ස්ථිර නොවන්නේය.
ඇගේ පුරුෂයා ඒවා අවලංගුකෙළේය;
**ස්වාමීන්වහන්සේද** එය ඈට ක්ෂමා-
13 කරනසේක. සියලු බාරවල්ද ප්‍රාණයට
දුක් විලාසයෙන් සිටීමට කරන සියලු
දිවුරුම්ද ඇගේ පුරුෂයාට ස්ථිර කරන්ට
හෝ අවලංගුකරන්ට හෝ පුළුවන.
14 එහෙත් ඇගේ පුරුෂයා දවසින් දවස
ඒ ගැන නිශ්ශබ්දව සිටියොත් ඈ
කෙරෙහි තිබෙන ඇගේ සියලු බාරවල්
හෝ ඇගේ සියලු බැඳීම් ඔහු විසින්
ස්ථිරකරනු ලැබේ. ඔහු ඒ ඇසූ
දවසේදී ඈට කිසිවක් නොකී බැවින්
15 ඔහු ඒවා ස්ථිරකෙළේය. එහෙත් ඔහු
ඒවා ඇසුවායින් පසු යම් අන්දමකින්
ඒවා අවලංගුකළොත්, ඔහු ඇගේ අයුතු-
16 කම දරන්නේයයි කීවේය. පුරුෂයෙකු
සහ ඔහුගේ භාර්යාව අතරේද පියෙකු
සහ ඔහුගේ දුව ඇගේ තරුණ වයසේදී
ඇගේ පියාගේ ගෙයි සිටින කල ඈ
අතරේද පවත්වන ලෙස **ස්වාමීන්වහන්සේ**
මෝසෙස්ට අණකළ පනත් මේවාය.

## ඉශ්‍රායෙල්වරු මිදියන්-වරුන්ගෙන් පළිගැනීම

31 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
2 කථාකොට: ඉශ්‍රායෙල් පුත්‍රයන්
උදෙසා මිදියන්වරුන්ගෙන් පළිගනින්න.
ඉන්පසු තුඹ තුඹේ සෙනහට එක්කරනු
3 ලබන්නෙහියයි කීසේක. මෝසෙස්
සෙනහට කථාකොට: මිදියන්වරුන්ට
විරුද්ධව ගොස් **ස්වාමීන්වහන්සේ**
උදෙසා මිදියන්වරුන්ගෙන් පළිගන්නා
පිණිස තුඹලා අතරෙන් මිනිසුන්
යුද්ධයට සන්නද්ධකරපල්ලා. සියලු 4
ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් එක එක
ගෝත්‍රයෙන් දහක් බැගින් යුද්ධයට
යවාපල්ලායයි කීවේය. එලෙස 5
ඉශ්‍රායෙල්වරුන්ගේ දහස් ගණන්
අතරෙන් එක එක ගෝත්‍රයෙන් දහක්
බැගින් යුද්ධය පිණිස සන්නද්ධවූ
පුරුෂයෝ දෙළොස් දහක් භාරදෙනු
ලැබූහ. මෝසෙස්ද ගෝත්‍රයකින් දහක් 6
බැගින් වූ ඔවුන් සහ පූජක එලෙයාසර්ගේ
පුත්‍රවූ ඵීනෙහාස්ද ඔහු අතට ශුද්ධ
ස්ථානයෙහි භාජනත් පිඹීමට නළාත්
දී යුද්ධයට ඇරියේය. **ස්වාමීන්වහන්සේ** 7
මෝසෙස්ට අණකළ ලෙස ඔව්හු
මිදියන්වරුන්ට විරුද්ධව යුද්ධකොට
සියලු පිරිමින් මැරුවෝය. මරනලද්දවුන් 8
අතරේ එවීද රෙකෙම්ද ශූර්ද හූර්ද
රෙබාද යන මිදියන් රජුන් පස්දෙනාද
මැරුවෝය. ඔව්හු බෙයෝර්ගේ පුත්‍රවූ
බාලාම්ද කඩුවෙන් මැරුවෝය.
ඉශ්‍රායෙල් පුත්‍රයෝ මිදියන් ස්ත්‍රීන්ද 9
ඔවුන්ගේ බාලයන්ද වහල්කමට ගෙන
ඔවුන්ගේ සියලු ගවයන්ද ඔවුන්ගේ සියලු
සිව්පා රැළවල්ද ඔවුන්ගේ සියලු සම්පත්ද
කොල්ලයක් කොට ගත්තෝය. ඔවුන් 10
විසූ ස්ථානවල සියලු නුවරවල්ද
ඔවුන්ගේ සියලු කොටුද ගින්නෙන් දවා
දැමූහ. එහෙත් මුළු කොල්ලයද මනුෂ්‍ය- 11
යන්ගෙන් සහ මෘගයන්ගෙන් අල්ලාගත්
සියල්ලද අරගත්තෝය. ඔව්හු යොර්දන් 12
අසබඩ යෙරිකෝව සමීපයෙහි වූ මෝවබ්
සමභූමිවල කඳවුරේ සිටි මෝසෙස් සහ
පූජකවූ එලෙයාසර්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්-
ගේ සභාවද වෙතට අල්ලාගත්තවුන්
හා මෘගයන්ද කොල්ලයද ගෙනාවෝය.
මෝසෙස්ද පූජකවූ එලෙයාසර්ද 13
සභාවේ සියලු අධිපතිහුද ඔවුන්
සම්බවෙන්ට කඳවුරෙන් පිටතට
ගියෝය. එවිට මෝසෙස් යුද්ධයෙන් 14
හැරී ආවාවූ සහස්‍රාධිපතීන් වන සේනාවේ
මුලාදෑනීන් කෙරෙහි උදහස්ව: තුඹලා 15
සියලු ස්ත්‍රීන් ඉතුරු කළහුද? බලව, 16

මොව්හු බාලාම්ගේ මන්ත්‍රණය කරණ-
කොටගෙන පෙයොර්ගේ කාරණයේදී
ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් ස්වාමීන්-
වහන්සේට විරුද්ධව අපරාධ කරන්ට
සැලැස්සුවෝය, ඒ නිසා ස්වාමීන්-
වහන්සේගේ සභාව අතරෙහි වසංගතය
17 විය. එබැවින් බාලයන් අතරෙහි සියලු
පිරිමින්ද පුරුෂයන් සමග සයනය-
කිරීමෙන් පුරුෂයන් දනගත් සියලු ස්ත්‍රීන්ද
18 මරා, පුරුෂයන් සමග සයනයකිරීමෙන්
පුරුෂයෙකු දනනොගත් සියලුම ගැනු
19 දරුවන් ඉතුරුකර ගනිල්ලා. තුඹලාද
සත් දවසක් කඳවුරෙන් පිට සිටපල්ලා.
යමෙකු මැරූ සියල්ලෝද මැරුම් කෑ
කිසිවෙකුට ස්පර්ශවූ සියල්ලෝද තුඹලා
තුමුත් තුඹලා විසින් අල්වාගනු ලැබුවෝ
තුමුත් තුන්වෙනි දවසේදීත් සත්වෙනි
20 දවසේදීත් දෝෂ පහකරගනිල්ලා. සියලු
වස්ත්‍රද සියලු හම් බඩුද එළු ලොම්වලින්
සෑදූ සියලු දේද සියලු ලී බඩුද තුඹලාම
21 පවිත්‍රකරපල්ලායයි කීවේය. පූජකවූ
එලෙයාසර්ද සටනට ගිය යුද්ධ-
කාරයන්ට කථාකොට: ස්වාමීන්-
වහන්සේ මෝසෙස්ට අණකළ ව්‍යවස්-
22 ථාවේ පනත මේය—රන් රිදී පිත්තල
23 යකඩ බෙලෙක් ඊයම් සහ ගිනි ඉසිලිය
හැකි සියලු දේ ගින්නෙහි දමා
අරගනිල්ලා, එවිට ඒවා පවිත්‍රවන්නේය;
එසේවී තුමුත් අපවිත්‍රකම පහකිරීමේ
වතුරෙන් ඒවායේ දෝෂ පහකළ යුතුය.
එහෙත් ගිනි ඉසිලිය නොහැකි සියල්ල
24 වතුරෙහි දමාගත යුතුය. සත්වෙනි
දවසේ තුඹලාගේ වස්ත්‍ර සෝදගනිල්ලා,
එවිට තුඹලා පවිත්‍රවන්නහුය, ඉන් පසු
කඳවුරට ඇතුල්වෙන්ට පුළුවනැයි කීවේය.
25 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා-
26 කොට කියනසේක්: තුඹද පූජකවූ
එලෙයාසර්ද සභාවේ පිය පෙළපත්වල
ප්‍රධානීහුද අල්ලාගනු ලැබූ මනුෂ්‍යයන්
හා මෘගයන් යන කොල්ලය ගණන්කර-
27 පල්ලා. ඒ කොල්ලය සටනට ගිය යුද්ධ
දක්ෂයන් සහ මුළු සභාව අතරේ
දෙකොටසකට බෙදපල්ලා. සටනට ගිය 28
යුද්ධකාරයන්ගෙන් ස්වාමීන්වහන්සේට
ආදයමක් කොට මිනිසුන්ගෙන්ද
ගවයන්ගෙන්ද කොටළුවන්ගෙන්ද එළු
බැටළුවන්ගෙන්ද පන්සියයකින් එකෙකු
බැගින් අයකරපන්න. ඔවුන්ගේ කොට- 29
සෙන් එය ගෙන ස්වාමීන්වහන්සේට
එසවීමේ පූජාවක් පිණිස පූජකවූ
එලෙයාසර්ට දීපන්න. ඉශ්‍රායෙල් 30
පුත්‍රයන්ගේ කොටසෙන් මිනිසුන්ගෙන්ද
ගවයන්ගෙන්ද කොටළුවන්ගෙන්ද එළු
බැටළුවන්ගෙන්ද සියලු ආකාර
මෘගයන්ගෙන්ද පනසකින් එකෙකු
බැගින් වෙන්කොට රැගෙන ස්වාමීන්-
වහන්සේගේ මණ්ඩපය භාරකාරවූ
ලෙවීවරුන්ට දීපන්නැයි කීසේක. එවිට 31
මෝසෙස්ද පූජකවූ එලෙයාසර්ද ස්වාමීන්-
වහන්සේ මෝසෙස්ට අණකළ ලෙස
කළෝය. යුද්ධකාරයන් විසින් අල්වාගත් 32
දේ හැර අනික් කොල්ලය බැටළුවන්
සලක්ෂ හැත්තෑපන්දහක්ද, ගවයන් 33
සැත්තෑ දෙදහක්ද, කොටළුවන් හැට 34
එක්දහක්ද, පුරුෂයෙකු සමග සයනය- 35
කිරීම දනනොගත් ස්ත්‍රීන් තිස් දෙදහක්ද
විය. යුද්ධයට නික්ම ගිය තැනැත්තන්ගේ 36
කොටස නම් ගණිනින් තුන්ලක්ෂ
තිස් හත්දස් පන්සියයක් බැටළුවෝය.
බැටළුවන්ගෙන් ස්වාමීන්වහන්සේට අයවූ 37
කොටස හසිය හැත්තෑපස් දෙනෙක්ය.
ගවයෝ තිස්හය දහසක්ය; උන්ගෙන් 38
ස්වාමීන්වහන්සේට අයවූ කොටස
සැත්තෑ දෙන්නෙක්ය. කොටළුවෝ 39
තිස්දහස් පන්සියයක්ය; උන්ගෙන්
ස්වාමීන්වහන්සේට අයවූ කොටස
හැට එකදෙනෙක්ය. මනුෂ්‍ය ප්‍රාණීන්- 40
ගෙන් සොළොස් දහසක්ය; ඔවුන්ගෙන්
ස්වාමීන්වහන්සේට අයවූ කොටස දෙතිස්
දෙනෙක්ය. මෝසෙස් ස්වාමීන්වහන්සේ 41
ඔහුට අණකළ ලෙස ස්වාමීන්-
වහන්සේගේ එසවීමේ පූජාව පූජකවූ

42 එලෙයාසර්ට දුන්නේය. යුද්ධකාරයන්-
ගෙන් මෝසෙස් විසින් ඉශ්‍රායෙල්
43 පුත්‍රයන්ට අරගන දුන්නාවූ, සභාවේ
කොටසටත් බැටළුවන් තුන් ලක්ෂ
44 තිස්හත්දස් පන්සියයක්ද, ගවයන් තිස්හය
45 දහසක්ද, කොටළුවන් තිස්දස්
46 පන්සියයක්ද, මනුෂ්‍ය ප්‍රාණීන්ගෙන්
47 දහසය දහසක්ද විය. මෝසෙස්
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ කොටසෙන්
මනුෂ්‍යයන්ගෙන් හා මෘගයන්ගෙනුත්
පනසකින් එකෙකු බැගින් වෙන්කර
රැගෙන උන් **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට
අණකළ ලෙස **ස්වාමීන්වහන්සේගේ**
මණ්ඩප භාරය රක්ෂා කරන ලෙවී-
48 වරුන්ට දුන්නෝය. එවිට සේනාවේ දහස්
ගණන්වල මුලාදෑනි වන සහස්‍රාධිපතීහුද
ශතාධිපතීහුද මෝසෙස් ළඟට අවුත්:
49 තුඹේ මෙහෙකරුවෝ වන අපි අප
යටතේ සිටින යුද්ධකාරයන්ගේ ගණන්
බලා අපෙන් එක මනුෂ්‍යයෙක්වත්
50 අඩු නැති බව දැනගතිමුව. එබැවින්
**ස්වාමීන්වහන්සේට** පඬුරක් කොට
එකිනෙකාට සම්බවී තිබෙන හැටියට
ස්වර්ණාභරණ වන පාද මාලාද අත්
වළලුද පේරුස් මුදුද කුණ්ඩලාභරණද
මාලද **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
අපේ ප්‍රාණ උදෙසා සමගිකමක් කරන
පිණිස ගෙනාවෙමුයයි මෝසෙස්ට
51 කීවෝය. මෝසෙස් සහ පූජකවූ එලෙ-
යාසර් ඒ රන් එනම් සාදපු සියලු
52 ආභරණ ඔවුන්ගෙන් පිළිගත්තෝය. එසේ
සහස්‍රාධිපතීන්ගෙන්ද ශතාධිපතීන්-
ගෙන්ද ලැබී **ස්වාමීන්වහන්සේට** ඔප්පු-
කළ එසවීමේ පූජාවේ රන් සියල්ල
ෂෙකෙල් සොළොස් දහස් සත්සිය
53 පනසක්ය. මක්නිසාද යුද්ධකාරයෝ තම
තමුන්ට කොල්ලය ලබාගන සිටියෝය.
54 මෝසෙස් සහ පූජකවූ එලෙයාසර්
සහස්‍රාධිපතීන්ගේද ශතාධිපතීන්ගේද රන්
පිළිගෙන ඒවා **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා
සිහිකරවීමක් පිණිස සම්මුඛවීමේ
කූඩාරමට ගෙනාවෝය.

## රූබෙන් ගාද් සහ මනස්සේ අතර දේශය බෙදීම

**32**
රූබෙන් පුත්‍රයන්ටද ගාද්
පුත්‍රයන්ටද ගවයෝ ඉතා මහත්
සමූහයක් වූහ. ඔව්හු යාසේර් දේශයද
ගිලියද් දේශයද සිව්පාවුන්ට සුදුසු
ස්ථානයක් බව දුටුවෝය. එවිට ගාද් 2
පුත්‍රයෝද රූබෙන් පුත්‍රයෝද ඇවිත්
මෝසෙස්ටත් පූජකවූ එලෙයාසර්ටත්
සභාවේ අධිපතීන්ටත් කථාකොට:
ඉශ්‍රායෙල් සභාව ඉදිරිපිට **ස්වාමීන්-** 3
**වහන්සේ** පහර දුන් දේශය වන,
අතාරොත්ද දීබොන්ද යාසේර්ද නිම්රාද 4
හෙෂ්බොන්ද එලෙයාලේද සෙබාම්ද
නෙබෝද බෙයොන්ද සිව්පාවුන්ට
සෑහෙන දේශයක්ය, තුඹේ මෙහෙ-
කරුවන්ට සිව්පාවෝ සිටිති. එබැවින් 5
අපි තුඹ ඉදිරියෙහි කරුණාව ලදිමුනම්
මේ දේශය තුඹේ මෙහෙකරුවන්ට
උරුමයක් පිණිස දෙනු ලබාවා;
යොර්දනෙන් එතරට අප නොපැමිණෙවුව
මැනවියි කීවෝය. එවිට මෝසෙස් ගාද් 6
පුත්‍රයන් හා රූබෙන් පුත්‍රයන්ට කියනුයේ:
තුඹලාගේ සහෝදරයන් යුද්ධයට යන
අතර තුඹලා මෙහි නවතින්ට හදනවාද?
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 7
දී තිබෙන දේශයට නොයන ලෙස
ඔවුන්ගේ සිත් කුමට කලකිරවවුද?
දේශය බලන පිණිස මා විසින් තුඹලාගේ 8
පියවරුන් කාදෙෂ්-බර්නේයේ සිට යැවූ
කල ඔව්හුද එසේ කළෝය. ඔව්හු 9
එෂ්කොල් මිටියාවතට ගොස් දේශය
දැක **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
දුන් දේශයට ඔවුන් නොපැමිණෙන ලෙස
ඔවුන්ගේ සිත් කලකිරෙවූවෝය. ඒ 10
දවසේදී **ස්වාමීන්වහන්සේගේ** උදහස
ඇවිළුණේය. උන්වහන්සේ කථාකොට:
සම්පූර්ණ ලෙස **ස්වාමීන්වහන්සේ** අනුව 11
ගියාවූ කෙනෙස්සියවූ යෙපුන්නෙගේ පුත්‍රවූ
කාලෙබ් සහ නූන්ගේ පුත්‍රවූ යෝෂුවාද
හැර, මිසරයෙන් ආවාවූ විසි අවුරුද්ද 12
පටන් ඉන් ඉහළ වයස් ඇත්තාවූ

මනුෂ්‍යයන්ගෙන් කිසිවෙක් මා විසින්
ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද
දෙන්ට දිවුළ දේශය සැබවින්ම නො-
දක්නෝය; මක්නිසාද ඔවුන් සම්පූර්ණ
ලෙස මා පස්සේ ආවේ නැතැයි
13 කීසේක. ස්වාමීන්වහන්සේගේ උදහස
ඉශ්‍රායෙල්ට විරුද්ධව ඇවුළුණේය.
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි නපුරුකම්
කළ මුළු පරම්පරාව විනාශවන තෙක්
උන්වහන්සේ ඔවුන්ට සතළිස් අවුරුද්දක්
කාන්තාරයෙහි ඔබමොබ යන්ට
14 සැලැස්වූසේක. දන් නුඹලාත් පව්කාර
වර්ගයක්ව ස්වාමීන්වහන්සේගේ තද
උදහස ඉශ්‍රායෙල්වරුන්ට තවත් වැඩි-
කරන පිණිස නුඹලාගේ පියවරුන්
15 වෙනුවට නැගුටුණුහුය. නුඹලා උන්-
වහන්සේ අනුව නොගොස් හැරීගියොත්
නැවතත් උන්වහන්සේ ඔවුන් කාන්තාර-
යෙහි තවත් නවත්වනවා ඇත; එසේ
නුඹලා මේ මුළු සෙනඟ නාස්ති-
16 කරන්නහුයයි කීවේය. එවිට ඔව්හු
ළංවී කථාකොට: අපි මෙහි අපේ
සිව්පාවුන්ට ගාල්ද අපේ බාලයන්ට
17 නුවරවල්ද ගොඩනගන්නෙමුය. නුමුත්
අපි වනාහි ඉශ්‍රායෙල් පුත්‍රයන් ඔවුන්ගේ
ස්ථානයට පමුණුවන තුරු ඔවුන්ට
පෙරටුව යන්ට සන්නද්ධව සිටින්නෙමුව.
අපේ බාලයෝ දේශවාසීන් නිසා
බලකොටු සහිත නුවරවල වසන්නෝය.
18 ඉශ්‍රායෙල් පුත්‍රයන් එකිනෙකා තම
තමාගේ උරුමය හිමිකරගන්න තුරු අපි
අපේ ගෙවලට හැරී නොඑන්නෙමුව.
19 මක්නිසාද යොර්දනෙන් මෙගොඩ
නැගෙනඉර පැත්තෙහි අපේ උරුමය අපට
ලැබී තිබෙද්දී අපි ඔවුන් සමග
යොර්දනෙන් එගොඩත් එයින් එහාත්
උරුමය නොගන්නෙමුයයි කීවෝය.
20 එවිට මෝසෙස් ඔවුන්ට කථාකොට:
නුඹලා මේ දේ කරමින්, ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි යුද්ධයට යාමට සැරසී,
21 උන්වහන්සේ තමන්ගේ සතුරන් තමන්
ඉදිරියෙන් පන්නාදමන තෙක්ද දේශය
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි යටත්-
කරන තෙක්ද නුඹලා අතරෙන් යුද්ධයට
සැරසුණු සියල්ලන් ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි යොර්දනෙන් එතරට ගියොත්,
පසුව නුඹලාට ආපසු එන්ට පුළුවන, 22
එසේ නුඹලා ස්වාමීන්වහන්සේද
ඉශ්‍රායෙල්ද ඉදිරියෙහි නිදෙස්ව
සිටින්නහුය; මේ දේශයද ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි නුඹලාට උරුමයක්
පිණිස වන්නේය. එහෙත් නුඹලා එසේ 23
නොකළොත්, බලව, නුඹලා ස්වාමීන්-
වහන්සේට විරුද්ධව පව්කළා වේ.
නුඹලාගේ පාපයද නුඹලා පිටට
පැමිණෙන බව සහතිකලෙස දන-
ගනිල්ලා. නුඹලාගේ බාලයන්ට නුවර- 24
වල්ද නුඹලාගේ බැටළුවන්ට ගාල්ද
ගොඩනගා නුඹලාගේ මුඛයෙන් නික්මුණු
දේ කරපල්ලායයි කීවේය. ගාද් පුත්‍රයෝද 25
රූබෙන් පුත්‍රයෝද මෝසෙස්ට කථා-
කොට: අපේ ස්වාමිතුමා අණකරන
ලෙස නුඹවහන්සේගේ දසයෝ වන අපි
කරන්නෙමුව. අපේ බාලයෝද අපේ 26
භාර්යාවෝද අපේ සිව්පාවෝද අපේ
සියලු ගවයෝද මෙහි ගිලියද් නුවරවල
සිටින්නෝය. එහෙත් අපේ ස්වාමිතුමා 27
කියන ලෙස නුඹවහන්සේගේ දසයෝ
සියල්ලෝම යුද්ධයට සැරසී ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි සටනට එතර
යන්නෝයයි කීවෝය.
මෝසෙස්ද ඔවුන් ගැන පූජකවූ 28
එලෙයාසර්ටද නූන්ගේ පුත්‍රවූ යෝෂුවාටද
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ ගෝත්‍රවල පිය
පෙළපත්වල ප්‍රධානීන්ටද අණකරමින්,
ගාද් පුත්‍රයන් සහ රූබෙන් පුත්‍රයන් 29
සියල්ලන්ම යුද්ධයට සැරසී ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි නුඹලා සමග
යොර්දනෙන් එතරට ගියොත්, දේශය
නුඹලා ඉදිරියෙහි යටත්කරනු ලැබූ කල්හි,
ගිලියද් දේශය උරුමයක් කොට ඔවුන්ට
දීපල්ලා. එහෙත් ඔවුන් යුද්ධයට සැරසී 30
නුඹලා සමග එතරට යන්නේ නැත්නම්
ඔව්හු කානාන් දේශයෙහි නුඹලා
අතරෙහි උරුම ලබත්වයි කීවේය. ගාද් 31
පුත්‍රයෝද රූබෙන් පුත්‍රයෝද උත්තර
දෙමින්: ඔබේ දසයන්ට ස්වාමීන්වහන්සේ

32 කී ලෙසම අපි කරන්නෙමුව. අපි
සන්නද්ධව ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
කානාන් දේශයට එතරව යන්නෙමුව,
අපේ උරුම කොටස යොර්දනෙන්
මෙගොඩ අපට වේවයි කීවෝය.
33 මෝසෙස් ඔවුන්ට එනම් ගාද් පුත්‍රයන්ටත්
රූබෙන් පුත්‍රයන්ටත් යෝසෙප්ගේ
පුත්‍රවූ මනස්සේගේ අර්ධ ගෝත්‍රයටත්
අමෝරිවරුන්ගේ රජවූ සීහොන්ගේ
රාජ්‍යයද බාෂාන්හි රජවූ ඕග්ගේ
රාජ්‍යයද යන දේශය සහ එහි සීමාවල
නුවරවල් වන දේශයෙහි වටකර තිබුණු
34 නුවරවල්ද දුන්නේය. ගාද් පුත්‍රයෝ
දීබොන් සහ අතාරොත්ද අරෝයේර්ද;
35 අත්රොත්-ෂොඵාන්ද යාසේර්ද යොග්-
36 බෙහාද; බෙත්-නිම්රා සහ බෙත්-හාරන්ද
යන බලකොටු සහිත නුවරවල් සහ
බැටළුවන්ට ගාල්ද ගොඩනැගුවෝය.
37 රූබෙන් පුත්‍රයෝ හෙෂ්බොන් හා
38 එලෙයාලේද කිරියතායිම්ද; නම්
වෙනස්වුණාවූ නෙබෝ හා බාල්-
මෙයොන්ද සිබ්මාද ගොඩනැගුවෝය.
ඔව්හු තමුන් විසින් ගොඩනැගූ නුවරවලට
39 වෙන නම් තැබුවෝය. මනස්සේගේ පුත්‍රයා
වන මාකීර්ගේ පුත්‍රයෝ ගිලියද් දේශයට
ගොස් ඒක අල්ලාගෙන එහි සිටි
40 අමෝරිවරුන් පන්නාදැමුවෝය. මෝසෙස්
මනස්සේගේ පුත්‍රවූ මාකීර්ට ගිලියද්
දේශය දුන්නේය; ඔහු එහි විසුවේය.
41 මනස්සේගේ පුත්‍රවූ යායීර් ගොස් එහි
නුවරවල් අල්වාගෙන ඒවාට හවොත්-
42 යායීර්යයි නම් තැබීය. නොබාද ගොස්
කෙනත් සහ එහි ගම් අල්ලාගෙන
තමාගේ නාමය හැටියට ඊට නොබායයි
නම් තැබුවේය.

## මිසරයේ සිට යොර්දනට ගමන් පිළිවෙළ

33 මෝසෙස් සහ ආරොන් යටතේ
තමුන්ගේ සේනාවල හැටියට
මිසර දේශයෙන් ආවාවූ ඉශ්‍රායෙල්
2 පුත්‍රයන්ගේ ගමන් මේය. මෝසෙස්ද
ස්වාමීන්වහන්සේගේ ආඥාව පිට ඔවුන්ගේ
ගමන්වල හැටියට ඔවුන්ගේ නික්මීම්
ලියුවේය. ඔවුන්ගේ නික්මීම් ප්‍රකාර
ඔවුන්ගේ ගමන් මේවාය. ඔව්හු පළමු 3
වෙනි මස පසළොස් වෙනි දින
රාමෙසෙස්හි සිට පිටත්වුණෝය; එසේ
ඉශ්‍රායෙල් පුත්‍රයෝ පාස්කුවට පසුවද
සියලු මිසරවරුන්ගේ ඇස් ඉදිරියෙහි
එසෙවුවාවූ අතක් කරණකොටගෙන
පිටතට ආවෝය. එසේ ආවේ මිසරවරුන් 4
ස්වාමීන්වහන්සේ විසින් ඔවුන් අතරෙහි
පහරදෙනලද්දවුන් වන සියලුම කුලුඳුලන්
ඔවුන් විසින් තැන්පත්කරද්දීය. ස්වාමීන්-
වහන්සේ ඔවුන්ගේ දෙවිවරුන් කෙරෙහිත්
විනිශ්චයන් ඉෂ්ටකළසේක. ඉශ්‍රායෙල් 5
පුත්‍රයෝ රාමෙසෙස් කෙරෙන් පිටත්ව
සුකොත්හි කූඩාරම් ගසාගත්තෝය. ඔව්හු 6
සුකොත් කෙරෙන් පිටත්ව ගොස්
කාන්තාරයේ අද්දර තිබෙන ඒතාම්හි
කූඩාරම් ගසාගත්තෝය. ඒතාමෙන් 7
පිටත්ව ගොස් බාල්-ශෙඵොන් ඉදිරිපිට
තිබෙන පීහාහිරොත්ට හැරී ගොස්
මිග්දෙල් ඉදිරියෙහි කූඩාරම් ගසා-
ගත්තෝය. ඔව්හු හාහිරොත් ඉදිරියෙන් 8
පිටත්ව ගොස් මුහුද මැදින් කාන්තාරයට
අවුත් ඒතාම් කාන්තාරයෙහි තුන් දවසක
ගමන්ගෙන මාරාහි කූඩාරම් ගසා-
ගත්තෝය. මාරා කෙරෙන් පිටත්ව ගොස් 9
ඒලිම්ට ආවෝය. ඒලිම්හි දිය උල්පත්
දොළොසක් හා තල්ගස් සැත්තෑවක්ද
තිබුණේය; ඔව්හු එහි කූඩාරම් ගසා-
ගත්තෝය. ඔව්හු ඒලිම් කෙරෙන් පිටත්ව 10
ගොස් රතු මුහුද ළඟ කූඩාරම් ගසා-
ගත්තෝය. රතු මුහුද ළඟින් පිටත්ව 11
ගොස් සීන් කාන්තාරයෙහි කූඩාරම්
ගසාගත්තෝය. සීන් කාන්තාරයෙන් 12
පිටත්ව ගොස් දෙප්කාහි කූඩාරම් ගසා-
ගත්තෝය. දෙප්කායෙන් පිටත්ව ගොස් 13
අලූෂ්හි කූඩාරම් ගසාගත්තෝය. අලූෂ් 14
කෙරෙන් පිටත්ව ගොස් රෙෆිඩීම්හි
කූඩාරම් ගසාගත්තෝය. එහි සෙනඟට
බොන්ට වතුර නොතිබුණේය. ඔව්හු 15
රෙෆිඩීමෙන් පිටත්ව ගොස් සීනයි
කාන්තාරයෙහි කූඩාරම් ගසාගත්තෝය.

16 සීනයි කාන්තාරයෙන් පිටත්ව ගොස්
කිබ්රොත්-හත්තාවාහි කූඩාරම් ගසා-
17 ගත්තෝය. කිබ්රොත්-හත්තාවායෙන්
පිටත්ව ගොස් හශේරොත්හි කූඩාරම්
18 ගසාගත්තෝය. හශේරොතින් පිටත්ව
ගොස් රිත්මාහි කූඩාරම් ගසාගත්තෝය.
19 රිත්මාවෙන් පිටත්ව ගොස් රිම්මොන්-
පෙරෙශ්හි කූඩාරම් ගසාගත්තෝය.
20 රිම්මොන්-පෙරෙශෙන් පිටත්ව ගොස්
ලිබ්නාහි කූඩාරම් ගසාගත්තෝය.
21 ලිබ්නාවෙන් පිටත්ව ගොස් රිස්සාහි
22 කූඩාරම් ගසාගත්තෝය. රිස්සාවෙන්
පිටත්ව ගොස් කෙහේලාතාහි කූඩාරම්
23 ගසාගත්තෝය. කෙහේලාතාවෙන් පිටත්ව
ගොස් ෂෙෆෙර් කන්දෙහි කූඩාරම්
24 ගසාගත්තෝය. ෂෙෆෙර් කන්දෙන් පිටත්ව
ගොස් හරාදහි කූඩාරම් ගසාගත්තෝය.
25 හරාදවෙන් පිටත්ව ගොස් මක්හේලොත්හි
26 කූඩාරම් ගසාගත්තෝය. මක්හේලොතෙන්
පිටත්ව ගොස් තාහත්හි කූඩාරම්
27 ගසාගත්තෝය. තාහතෙන් පිටත්ව ගොස්
තෙරාහි කූඩාරම් ගසාගත්තෝය.
28 තෙරාවෙන් පිටත්ව ගොස් මිත්කාහි
29 කූඩාරම් ගසාගත්තෝය. මිත්කාවෙන්
පිටත්ව ගොස් හෂ්මොනාහි කූඩාරම්
30 ගසාගත්තෝය. හෂ්මොනාවෙන් පිටත්ව
ගොස් මොසේරොත්හි කූඩාරම් ගසා-
31 ගත්තෝය. මොසේරොතෙන් පිටත්ව
ගොස් බෙනෙ-යාකාන්හි කූඩාරම්
32 ගසාගත්තෝය. බෙනෙ-යාකානෙන්
පිටත්ව ගොස් හෝර්-හග්ගිද්ගාද්හි
33 කූඩාරම් ගසාගත්තෝය. හෝර්-හග්ගිද්-
ගාදෙන් පිටත්ව ගොස් යොට්බාතාහි
34 කූඩාරම් ගසාගත්තෝය. යොට්-
බාතාවෙන් පිටත්ව ගොස් අබ්රොනාහි
35 කූඩාරම් ගසාගත්තෝය. අබ්රොනාවෙන්
පිටත්ව ගොස් එශියොන්-ගෙබෙර්හි
36 කූඩාරම් ගසාගත්තෝය. එශියොන්-
ගෙබෙර් කෙරෙන් පිටත්ව ගොස් සීන්
කාන්තාරයෙහි එනම් කාදෙෂ්හි කූඩාරම්
37 ගසාගත්තෝය. ඔව්හු කාදෙෂ් කෙරෙන්
පිටත්ව ගොස් ඒදෙම් දේශයේ
සීමාව ළඟ හෝර් කන්දේ කූඩාරම්
ගසාගත්තෝය. පූජකවූ ආරොන් 38
ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර දේශයෙන්
පිටත්ව ආවායින් පසු සතළිස්වෙනි
අවුරුද්දේ පස්වෙනි මස පළමුවෙනි දින
ස්වාමීන්වහන්සේගේ අණ පිට හෝර්
කන්දට නැගී ගොස් එහි මැරුණේය.
ආරොන් හෝර් කන්දේ මැරෙන කල 39
අවුරුදු එකසිය විසිතුනක් වයස්ව
සිටියේය. කානාන් දේශයේ දකුණු දිග 40
විසූ කානානීය අරාද්හි රජ ඉශ්‍රායෙල්
පුත්‍රයන් එන බව ඇසුවේය. ඔව්හු හෝර් 41
කන්දෙන් පිටත්ව ගොස් සල්මොනාහි
කූඩාරම් ගසාගත්තෝය. සල්මොනාවෙන් 42
පිටත්ව ගොස් පූනොන්හි කූඩාරම්
ගසාගත්තෝය. පූනොනෙන් පිටත්ව 43
ගොස් ඕබොතෙහි කූඩාරම් ගසා-
ගත්තෝය. ඕබොතෙන් පිටත්ව ගොස් 44
මෝවබ් සීමාවෙහි වූ ඉයේ-ආබාරිම්හි
කූඩාරම් ගසාගත්තෝය. ඉයිම් කෙරෙන් 45
පිටත්ව ගොස් දීබොන්-ගාද්හි කූඩාරම්
ගසාගත්තෝය. දීබොන්-ගාදෙන් පිටත්ව 46
ගොස් අල්මොන්-දිබ්ලාතයිම්හි කූඩාරම්
ගසාගත්තෝය. අල්මොන්-දිබ්ලාතයි- 47
මෙන් පිටත්ව ගොස් නෙබෝ ඉදිරිපිට
අබාරීම් කඳුවල කූඩාරම් ගසාගත්තෝය.
අබාරීම් කඳුවලින් පිටත්ව ගොස් 48
යොර්දන අසබඩ යෙරිකෝව ළඟ
මෝවබ් සමභූමිවල කූඩාරම් ගසා-
ගත්තෝය. ඔව්හු යොර්දන අසබඩ 49
බෙත්-යෙෂිමොත් පටන් ආබෙල්-ෂිත්තිම්
දක්වා මෝවබ් සමභූමිවල කූඩාරම්
ගසාගත්තෝය.

ස්වාමීන්වහන්සේ යොර්දන අසබඩ 50
යෙරිකෝව ළඟ මෝවබ් සමභූමිවලදී
මෝසෙස්ට කථාකොට කියනසේක්:
නුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට 51
ඔවුන්ට මෙසේ කියාපන්න—නුඹලා
යොර්දනෙන් එතර කානාන් දේශයට
පැමිණි කල, දේශයේ සියලු වැසියන් 52
නුඹලා ඉදිරියෙන් පන්නා දමා ඔවුන්ගේ
සියලු රූප සහිතවූ කැටයම් ගල්ද
ඔවුන්ගේ සියලු වාත්තු පිළිමද නැතිකර

දමා ඔවුන්ගේ සියලු උස් තැන්
53 නටබුන්කරපල්ලා. දේශය හිමිකරගෙන
එහි වාසයකරපල්ලා. මක්නිසාද හිමි-
කරගැනීමට දේශය මා විසින් නුඹලාට
54 දී තිබේ. පසඇට දැමීමෙන් නුඹලාගේ
වංශවල හැටියට දේශය උරුමකර-
ගනිල්ලා; වැඩිව සිටින්නන්ට ඔවුන්ගේ
උරුමය වැඩිකර, ස්වල්පව සිටින්නන්ට
ඔවුන්ගේ උරුමය ස්වල්ප කර දීපල්ලා.
දඬුවෙන් යමෙකුට වැටෙන ස්ථානයම
ඔහුට වේවා; නුඹලාගේ පිය ගෝත්‍රවල
55 හැටියට උරුමකරගනිල්ලා. එහෙත්
නුඹලා දේශයේ වැසියන් නුඹලා
ඉදිරියෙන් පන්නා නොදැමුවොත්, නුඹලා
විසින් ඔවුන්ගෙන් ඉතුරුකරන අය
නුඹලාගේ ඇස්වලට උල්ද නුඹලාගේ
ඇලපත්වලට කටුද වී, නුඹලා වසන
දේශයෙහි නුඹලාට සතුරුකම් කරනවා
56 ඇත. තවද මම ඔවුන්ට කරන්ට සිතූ
ලෙස නුඹලාට කරන්නෙමියි කීසේක.

## පොරොන්දුවූ දේශයේ සීමා

34 ස්වාමීන්වහන්සේ මෝසෙස්ට
2 කථාකොට කියනසේක්: නුඹ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අණකොට
ඔවුන්ට මෙසේ කියාපන්න–නුඹලා
කානාන් දේශයට පැමිණි කල්හි
නුඹලාට උරුමයක් කොට වැටෙන
දේශය නම් ඒකේ සීමාවල ප්‍රකාරයට
3 කානාන් දේශයය. එසේ නුඹලාගේ
දකුණු පැත්ත ශීන් කාන්තාරයේ පටන්
ඒදෝම් දිශාව ළඟින් වන්නේය, නුඹලාගේ
දකුණු සීමාව නැගෙනහිර දිග ලුණු
මුහුදේ කෙළවර සිට පටන්ගෙන,
4 නුඹලාගේ සීමාව අක්‍රබ්බීම්හි නැගුමට
දකුණෙන් හැරී ශීනට පැමිණ, කාදේෂ්-
බර්නේයට දකුණෙන් වැටී, එතැනින්
හශර්-අද්දර්ටත් එයින් අශ්මොන්ටත්
5 වන්නේය. අශ්මොන් පටන් සීමාව
මිසර ඔය දෙසට හැරී ගොස් මුහුද ළඟ
6 කෙළවර වන්නේය. බස්නාහිර සීමාවට
වනාහි මහ මුහුද නුඹලාගේ සීමාව වන්-
නේය. ඒක නුඹලාගේ බස්නාහිර සීමාව
වන්නේය. නුඹලාගේ උතුරු සීමාව මෙසේ 7
වන්නේය: මහ මුහුද පටන් හෝර් කන්ද
දක්වා ලකුණුකරගන, හෝර් කන්දෙන් 8
හමාත්ට ඇතුල්වන තැන දක්වා
ලකුණුකරපල්ලා; සීමාව ශෙදද්ට
පැමිණ, ශිප්‍රොන්ට ගොස් හශර්-ඒනාන් 9
ළඟ කෙළෙවර වන්නේය. ඒක නුඹලාගේ
උතුරු සීමාව වන්නේය. නුඹලාගේ 10
නැගෙනහිර සීමාව හශර්-ඒනානෙන්
ෂෙපාම් දක්වා ලකුණුකරපල්ලා. සීමාවද 11
ෂෙපාම් පටන් අයින්ට නැගෙනහිරෙන්
රිබ්ලාට බැස, කින්නෙරෙත් මුහුදේ
නැගෙනහිර අද්දරින්ම බැස ඇවිත්,
එතනින් සීමාව යොර්දන අද්දරින් බැස 12
ලුණු මුහුද ළඟදී කෙළවර වන්නේය.
වටකර සීමාවල ප්‍රකාරයට මේක
නුඹලාගේ දේශය වන්නේයයි කීසේක.
මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අණ- 13
කරමින්: නුඹලා විසින් පස ඇට දැමීමෙන්
උරුමකරගත යුතු වන්නාවූ, ගෝත්‍ර
නවයටත් අර්ධ ගෝත්‍රයටත් දෙන්ට
**ස්වාමීන්වහන්සේ** අණකළාවූ දේශය
නම් මේය. මක්නිසාද තමුන්ගේ පිය 14
පෙළපත් ලෙස රූබෙන් පුත්‍රයන්ගේ
ගෝත්‍රයටද ගාද් පුත්‍රයන්ගේ ගෝත්‍රයටද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයටද තමුන්ගේ
උරුමය ලැබී තිබේ. එසේ ඒ ගෝත්‍ර 15
දෙකටද අර්ධ ගෝත්‍රයටද යොර්දනෙන්
මෙගොඩ යෙරිකෝව ළඟ නැගෙනහිර
දිශාවෙහි තමුන්ගේ උරුමය ලැබී
තිබේයයි කීවේය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා- 16
කොට කියනසේක්: නුඹලාට දේශය 17
උරුමයක් කොට බෙද දෙන්නන් වූ
මනුෂ්‍යයන්ගේ නාම නම්: පූජකවූ
එලෙයාසර් සහ නූන්ගේ පුත්‍රවූ යෝෂු-
වාය. දේශය උරුම වශයෙන් බෙදන 18
පිණිස සියලු ගෝත්‍රවලින් එක අධිපති-
යෙකු බැගින් ගනිල්ලා. ඒ මනුෂ්‍යයන්ගේ 19
නාම මේවාය: යූද ගෝත්‍රයෙන් යෙපුන්-
නෙගේ පුත්‍රවූ කාලෙබ්ය. සිමියොන් 20
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් අම්මීහූද්ගේ පුත්‍රවූ
ෂෙමුවෙල්ය. බෙන්යමින්ගේ ගෝත්‍රයෙන් 21
කිස්ලොන්ගේ පුත්‍රවූ එලිදද්ය. දන් 22

පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් යොග්ලීගේ පුත්‍රවූ
23 අධිපතියෙක්වූ බුක්කීය. යෝසෙප්ගේ
පුත්‍රයන්ගෙන් මනස්සේ පුත්‍රයන්ගේ
ගෝත්‍රයෙන් ඒෆෝද්ගේ පුත්‍රවූ අධිපති-
24 යෙක්වූ හන්නීයෙල්ය. එප්‍රායිම් පුත්‍රයන්-
ගේ ගෝත්‍රයෙන් ෂිප්තාන්ගේ පුත්‍රවූ
25 අධිපතියෙක්වූ කෙමුවේල්ය. සාබුලොන්
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් පර්නාක්ගේ පුත්‍රවූ
26 අධිපතියෙක්වූ එලිශාඵාන්ය. ඉස්සාකර්
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් අස්සාන්ගේ පුත්‍රවූ
27 අධිපතියෙක්වූ පල්තියෙල්ය. ආෂෙර්
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් ෂෙලොමීගේ
28 පුත්‍රවූ අධිපතියෙක්වූ ආහිහුද්ය. නප්තලී
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් අම්මීහුද්ගේ පුත්‍රවූ
අධිපතියෙක්වූ පෙදහෙල්යයි කීසේක.
29 ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කානාන් දේශයෙහි
උරුමය බෙදදෙන පිණිස ස්වාමීන්-
වහන්සේ අණකළේ මොවුන්ටය.

## ලෙවීවරුන්ගේ නුවරවල් සහ ආරක්ෂා නගර

35 තවද ස්වාමීන්වහන්සේ යෝර්දන්
අසබඩ යෙරිකෝව ළඟ මෝවබ්
සමභූමිවලදී මෝසෙස්ට කථාකොට
2 කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින්
තමුන්ට හිමිවූ උරුමයෙන් ලෙවීවරුන්ගේ
වාසය පිණිස නුවරවල් දෙන්ට
අණකරපන්න; නුවරවලට වටකරින්
ඒවාට පිට-බිම් ලෙවීවරුන්ට දීපල්ලා.
3 නුවරවල් ඔවුන්ගේ වාසය පිණිස
වන්නේය; ඒවායේ පිට-බිම් ඔවුන්ගේ
සිව්පාවුන්ටත් ඔවුන්ගේ දේපළවලටත්
ඔවුන්ගේ සියලු මෘගයන්ටත් වන්නේය.
4 තුඹලා විසින් ලෙවීවරුන්ට දෙන
නුවරවල පිට-බිම් නුවර පවුර පටන්
රියන් දහසක් දුරට වටකරින් තිබේවා.
5 නුවර මැදිකර නුවරට පිටතින්
නැගෙනහිර දෙසට රියන් දෙදහසක්ද
දකුණු දෙසට රියන් දෙදහසක්ද
බස්නාහිර දෙසට රියන් දෙදහසක්ද
උතුරු දෙසට රියන් දෙදහසක්ද මැන-
පල්ලා. ඔවුන්ගේ නුවරවල පිට-
බිම් එයාකාර වේවා. තුඹලා ලෙවී- 6
වරුන්ට දිය යුතුවූ නුවරවල් නම් මිනී-
මරන්නාට පලායාම පිණිස දෙන්නාවූ
ආරක්ෂා නුවරවල් හයය. ඒවා ඈර
තව නුවරවල් සතළිස් දෙකක් දීපල්ලා.
තුඹලා ලෙවීවරුන්ට දිය යුතු සියලු 7
නුවරවල් වනාහි නුවරවල් සතළිස්
අටක්ය. ඒවාත් ඒවායේ පිට-බිමුත්
දීපල්ලා. තුඹලා ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ 8
උරුමයෙන් නුවරවල් දිය යුතු වන්නේ
වැඩියේ ඇති අයගෙන් වැඩියේත්
ස්වල්පයක් ඇති අයගෙන් ස්වල්පයකුත්ය.
එකිනෙකාට ලැබෙන තමාගේ උරුමය
ලෙස තම තමාගේ නුවරවලින් ලෙවී-
වරුන්ට දිය යුතුයයි කීසේක.
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා- 9
කොට කියනසේක්: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 10
කථාකර ඔවුන්ට මෙසේ කියාපන්න—
තුඹලා යෝර්දනෙන් එතර කානාන්
දේශයට පැමිණි කල, අත්වැරැද්දෙන් 11
යමෙකු මරන තැනැත්තා පලායන පිණිස
තුඹලාට ආරක්ෂා නුවරවල් වශයෙන්
නුවරවල් නියමකරගනිල්ලා. මිනීමරන්නා 12
විනිශ්චය පිණිස සභාව ඉදිරිපිට සිටින්ට
පළමුවෙන් නොනස්නා පිණිස ඒ
නුවරවල් පළිගන්නාගෙන් තුඹලාට
ආරක්ෂාව පිණිස වන්නේය. තුඹලා 13
දෙන නුවරවල් වනාහි තුඹලා උදෙසා
ආරක්ෂා නුවරවල් හයක් වන්නේය.
යෝර්දනෙන් මෙගොඩ නුවරවල් තුනක්ද 14
කානාන් දේශයේ නුවරවල් තුනක්ද
ආරක්ෂා නුවරවල් කොට දීපල්ලා. අත් 15
වැරැද්දෙන් යමෙකු මරන තැනැත්තාට
පලායාමට ඒ නුවරවල් හය ඉශ්‍රායෙල්
පුත්‍රයන්ටත් විදේශියාටත් ඔවුන් අතරේ
සිටින ආගන්තුකයාටත් ආරක්ෂාව
පිණිස වේවා. එහෙත් යමෙක් මැරෙන 16
ලෙස හෙතෙම යකඩ ආවුදයකින්
ඔහුට පහර දුන්නේනම් ඔහු මිනී-
මරන්නෙක්ය. මිනීමරන්නා සැබවින්ම
මරනු ලැබිය යුතුය. යමෙකු මරන්ට 17
පුළුවන් ගලක් අරගෙන මැරෙන ලෙස

ඔහුට පහරදුන්නේනම්, හෙතෙම
මිනීමරන්නෙක්ය. මිනීමරන්නා සැබවින්
18 මරනු ලැබිය යුතුය. නොහොත් යමෙකු
මරන්ට පුළුවන් ලී ආවුදයක් රැගෙන
ඔහු මැරෙන ලෙස පහර දුන්නේ නම්,
හෙතෙම මිනීමරන්නෙක්ය. මිනීමරන්නා
19 සැබවින් මරනු ලැබිය යුතුය. ලේවල
පළිය ගන්න තැනැත්තේම මිනීමරන්නා
මරාවා. ඔහු සම්බවූවිට ඔහු මරාවා.
20 වෛරයක් නිසා මැරෙන ලෙස
ඇන්නේනම්, නොහොත් රැක සිට ඔහු
21 පිටට යමක් හෙළුවේනම්, නොහොත්
මැරෙන ලෙස සතුරුකමක් නිසා තමාගේ
අතින් ඔහුට ගැසුවේනම්, ඔහුට පහරදුන්
තැනැත්තේ සැබවින් මරනු ලැබිය යුතුය;
හෙතෙම මිනීමරන්නෙක්ය. ලේවල පළිය
ගන්න තැනැත්තේ මිනීමරන්නා සම්බවූ
22 විට ඔහු මරාවා. එහෙත් සතුරුකමක්
නිසා නොව අහම්බෙන් ඔහුට
ඇන්නේනම්, නොහොත් රැක නොසිට
23 ඔහු පිටට යමක් හෙළුවේනම්, නොහොත්
ඔහු නොදක, ඔහු ඒ අයගේ සතුරෙක්
නොවී, අන්තරායක් කරන්ට නොසිතා
මනුෂ්‍යයෙකු මරන්ට පුළුවන්වූ යම් ගලක්
මැරෙන ලෙස ඔහු පිටට වැටීමට
24 ඇරියේනම්, පහරදෙන්නා සහ ලේවල
පළිය ගන්නා අතරේ මේ විනිශ්චයවල
හැටියට සභාව විසින් විනිශ්චය කළ
25 යුතුය. ඔව්හු ලේවල පළිය ගන්නා අතින්
මිනීමරන්නා මුදා ඔහු පලාගිය තමාගේ
ආරක්ෂා නුවරට ඔහු නැවත පමුණු-
වන්නෝය. ශුද්ධ තෙලින් ආලේප ලත්
උත්තම පූජකයා නසිනතෙක් ඔහු එහි
26 වාසය කෙරේවා. එහෙත් මිනීමරන්නා
යම් විටක තමා පලාගිය ආරක්ෂා
නුවර සීමාවෙන් පිටතට ආවොත්,
27 ලේවල පළිය ගන්නාට ඔහුගේ ආරක්ෂා
නුවර සීමාවෙන් පිටතදී ඔහු සම්බවී
ඔහු මරන්නේවී නුමුත්, ඔහු ලේ ගැන
28 වරදකාරයෙක් නොවන්නේය. මක්නිසාද
උත්තම පූජකයා නසින තුරු ඔහු
ආරක්ෂා නුවර සිටිය යුතු වූයේය. එහෙත්
උත්තම පූජකයාගේ මරණින් පසු
මිනීමරන්නාට තමාගේ උරුමය තිබෙන
රටට හැරී එන්ට පුළුවන. මේවා 29
නුඹලාගේ පරම්පරාවලදී නුඹලාගේ
සියලු වාසස්ථානවල නුඹලාට විනිශ්-
චයේ පනතක් වන්නේය. කා විසින් නුමුත් 30
යමෙකු මැරුවොත් මිනීමරන තැනැත්තේ
සාක්ෂිකාරයන්ගේ කීම පරිද්දෙන් මරනු
ලැබිය යුතුය. එහෙත් යමෙකු මරන
පිණිස එක සාක්ෂිකාරයෙක් පමණක්
ඔහුට විරුද්ධව සාක්ෂි නොදිය යුතුය.
මරනු ලබන්ට සුදුසු වරදකාරයෙක් ව 31
සිටින මිනීමරන්නාගේ ප්‍රාණය උදෙසා
මිදීමේ මුදලක් භාරනොගනිල්ලා.
මක්නිසාද ඔහු සැබවින් මරනු ලැබිය
යුතුය. තමාගේ ආරක්ෂා නුවරට පලා- 32
ගොස් සිටින තැනැත්තා උත්තම පූජකයා
නසින්ට පළමුවෙන් දේශයෙහි වාසය-
කිරීමට හැරී එන පිණිස ඔහු උදෙසාත්
මිදීමේ මුදලක් භාරනොගනිල්ලා. එසේ 33
නුඹලා වසන දේශය දූෂ්‍ය නොකරල්ලා.
මක්නිසාද ලේ වැගිරීමෙන් දේශය
පිළිකුල්වෙයි. තවද ලේ වැගිරෙවූ තැනැත්-
තාගේ ලෙයින් මිස එහි වගුරුවනලද
ලෙයේ දෝෂයෙන් දේශය මිදිය නො-
හැකිය. නුඹලා පදිංචිවෙන දේශය තුළ 34
මා වාසයකරන බැවින් ඒක අපවිත්‍ර
නොකර සිටපල්ලා. මක්නිසාද ස්වාමීන්-
වහන්සේ වන මම ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි වාසයකරමියි කීසේක.

## උරුමක්කාරියන් සම්බන්ධ නීතිය

36 යෝසෙප් පුත්‍රයන්ගේ වංශ-
වලින් මනස්සේගේ පුත්‍රයා වන
මාකීර්ගේ පුත්‍රවූ ගිලියද් පුත්‍රයන්ගේ
වංශයේ පිය පෙළපත්වල ප්‍රධානියෝ
අවුත් මෝසෙස් ඉදිරියෙහිද ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ පිය පෙළපත්වල ප්‍රධානීන්ව
සිටි අධිපතීන් ඉදිරියෙහිද කථාකොට:
දේශය උරුමයක් කොට පසඇට දැමීමෙන් 2
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට දෙන ලෙස
ස්වාමීන්වහන්සේ අපේ ස්වාමිතුමාට
අණකළසේක. අපේ ස්වාමිතුමා අපේ

සහෝදරවූ ශෙලෝෆෙහාද්ගේ උරුමය
ඔහුගේ දූවරුන්ට දෙන ලෙස ස්වාමීන්-
3 වහන්සේගෙන් අණ ලැබීය. ඉදින් ඔවුන්
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ වෙන ගෝත්‍රවල
පුත්‍රයන්ගෙන් කිසිවෙකුට විවාහවූවොත්
ඔවුන්ගේ උරුමය අපේ පියවරුන්ගේ
උරුමයෙන් පහවී ඔවුන් අයිතිවන
ගෝත්‍රයේ උරුමයට එක් කරනු ලබනවා
ඇත. මෙසේ ඒක අපේ උරුම කොටසින්
4 පහවන්නේය. මෙසේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ජුබිලිය පැමිණි කල්හි ඔවුන්ගේ උරුමය
ඔවුන් අයිතිවන ගෝත්‍රයේ උරුමයට
එක් කරනු ලැබ අපේ පියවරුන්ගේ
ගෝත්‍රයේ උරුමයෙන් පහවේයයි
5 කීවෝය. මෝසෙස් ස්වාමීන්වහන්සේගේ
වචනය හැටියට ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
අණකොට: යෝසෙප් පුත්‍රයන්ගේ
6 ගෝත්‍රයේ අය කියනවා හරිය. ස්වාමීන්-
වහන්සේ ශෙලෝෆෙහාද්ගේ දූවරුන් ගැන
අණකර තිබෙන කාරණාව මේය–ඔව්හු
තමුන් කැමති තැනැත්තන් සමග
විවාහ වෙත්වා; එහෙත් ඔවුන් විවාහ
විය යුතු තමුන්ගේ පියාගේ ගෝත්‍රයේ
වංශයක තැනැත්තන් සමග පමණක්ය.
7 මෙසේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ උරුමයක්
ගෝත්‍රයෙන් ගෝත්‍රයට නොයන්නේය.
මක්නිසාද සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ
තම තමුන්ගේ පියවරුන්ගේ ගෝත්‍රයේ
උරුමයට බැඳී සිටිත්වා. ඉශ්‍රායෙල් 8
පුත්‍රයන්ට තම තමුන්ගේ පියවරුන්ගේ
උරුමය හිමිවෙන පිණිස ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ කිසි ගෝත්‍රයක උරුමයක්
ලබන එක එක දූව ඇගේ පිය ගෝත්‍රයේ
වංශයක කෙනෙකුගේ භාර්යාව වේවා.
මෙසේ උරුමයක් එක ගෝත්‍රයකින් වෙන 9
ගෝත්‍රයකට මාරු නොවන්නේය;
මක්නිසාද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු
ගෝත්‍රයන් තම තමුන්ගේ උරුමයටම
බැඳී සිටිනවා ඇතැයි කීවේය.
ශෙලෝෆෙහාද්ගේ දූවරු ස්වාමීන්- 10
වහන්සේ මෝසෙස්ට අණකළ ලෙසම
කළෝය. මෙසේ ශෙලෝෆෙහාද්ගේ 11
දූවරුන්වූ මාලාද තිර්ශාද හොග්ලාද
මිල්කාද නෝවාද යන මොව්හු තමුන්ගේ
පියාගේ සහෝදරයන්ගේ පුත්‍රයන් සමග
විවාහ වූහ. ඔව්හු යෝසෙප්ගේ පුත්‍රවූ 12
මනස්සේගේ පුත්‍රයන්ගේ වංශවල අය
සමග විවාහ වූවෝය, ඔවුන්ගේ උරුමයද
ඔවුන්ගේ පිය වංශයේ ගෝත්‍රයෙහිම
පැවතුණේය.

ස්වාමීන්වහන්සේ යෝර්දන අසබඩ 13
යෙරිකෝව ළඟ මෝවබ් සමභූමිවලදී
මෝසෙස් ලවා ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
අණකෙරෙවූ ආඥාද විනිශ්චයවල්ද
මේවාය.

# ද්විතීය කථාව

## යයි සාමාන්‍යයෙන් කියනු ලබන

## මෝසෙස්ගේ පස්වෙනි පොත

---

### කාදෙෂ්හි සිට සීනයි දක්වා ගමන නැවත දක්වීම

1 යොර්දනෙන් එගොඩ කාන්තාරයෙහි
පාරාන්ද තොපෙල්ද ලාබාන්ද
හශේරොත්ද දී-සාහාබ්ද අතරේ *සූෆ්
ඉදිරිපිට අරබා සමභූමියේදී මෝසෙස්
විසින් සියලු ඉශ්‍රායෙල්වරුන්ට කියන-
2 ලද වචන මේවාය. හොරේබ් සිට
කාදෙෂ්-බර්නේයට සෙයිර් කඳුකර
මාර්ගයෙන් එකොළොස් දවසක ගමන්
3 දුරය. ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කියන්ට
ස්වාමීන්වහන්සේ මෝසෙස්ට අණ
කළ සියල්ල ලෙස ඔහු සතළිස්වෙනි
අවුරුද්දේ එකොළොස්වෙනි මාසයේ
4 පළමුවෙනි දින ඔවුන්ට කීවේය. හෙෂ්-
බොන්හි වාසය කළ අමෝරිවරුන්ගේ
රජවූ සීහොන්ටද එද්රෙය අසල
අෂ්තාරොත්හි වාසයකළ බාෂාන්හි
5 රජවූ ඕග්ටද පහරදුන් පසු, යොර්දනෙන්
එගොඩ මෝවබ් දේශයේදී මෝසෙස්
මේ ව්‍යවස්ථාව ප්‍රකාශකරන්ට පටන්ගෙන
6 මෙසේ කීවේය. අපේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ හොරේබ්හිදී අපට කථා-
කොට: නුඹලා මේ කන්දේ විසූ කාලය
7 ඇත. හැරී ගමන්කොට අමෝරිවරුන්ගේ
කඳුකරයටද ඊට ළංවූ අරබා සමභූමියෙත්
කඳුකරයෙහිත් පාතරටෙහිත් දකුණු
දිසාවෙත් කානානිවරුන්ගේ දේශය
වන මුහුදුබඩත් සියලු තැන්වලටද
ලෙබනොන්ටද මහත් ගංගාව වන
8 ප්‍රාත් ගංගාව දක්වාද පලයල්ලා. බලව,
මම දේශය නුඹලා ඉදිරිපිට තැබීමි. එහි
ඇතුල්ව නුඹලාගේ පියවරුන් වන
ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද
ඔවුන්ට පසු ඔවුන්ගේ වංශයටද දෙන
ලෙස ස්වාමීන්වහන්සේ ඔවුන්ට දිවුළ
දේශය හිමිකරගනිල්ලා යයි කීසේක. මම 9
ඒ කාලයේදී නුඹලාට කථාකොට:
තනියම නුඹලා දරන්ට නොහැක්කෙමි.
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ 10
නුඹලා වැඩිකළසේක, නුඹලා දැන්
ගණනින් අහසේ තාරකා මෙන්ය.
නුඹලාගේ පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්- 11
වහන්සේ නුඹලා දැන් සිටිනවාටත් වඩා
දහස් ගුණයක් වැඩිකොට උන්වහන්සේ
පොරොන්දුවුණු ලෙස නුඹලාට ආශිර්වාද-
කරනසේක්වා! මම වනාහි තනියම 12
නුඹලාගෙන් පැමිණෙන වෙහෙසත් බරත්
නුඹලාගේ විවාදත් කෙසේ දරම්ද?
ප්‍රඥාවන්තවූ බුද්ධිමත්වූ අඳුනන මනුෂ්‍යයන් 13
නුඹලාගේ ගෝත්‍ර ප්‍රකාරයට තෝරා-
ගනිල්ලා. මම ඔවුන් නුඹලා කෙරෙහි
ප්‍රධානීන් කොට පත්කරන්නෙමියි
කීයෙමි. නුඹලා මට උත්තරදෙමින්: නුඹ 14
කී දේ කිරීම අපට යහපතැයි කීවහුය.
එහෙයින් මම ප්‍රඥාවන්තවූ අඳුනන්නාවූ 15
මනුෂ්‍යයන් වන නුඹලාගේ ගෝත්‍රවල
ප්‍රධානීන් ගෙන සහස්‍රාධිපතීන්ද ශතාධි-
පතීන්ද පනසාධිපතීන්ද දශාධිපතීන්ද
නුඹලාගේ ගෝත්‍රවලට මූලාදෑනීන්ද
වශයෙන් ඔවුන් නුඹලා කෙරෙහි
ප්‍රධානීන් කොට පත්කෙළෙමි. මම ඒ 16
කාලයේදී නුඹලාගේ විනිශ්චයකාරයන්ට

---

*හෙවත්-රතු මුහුද

අණකරමින්: තුඹලාගේ සහෝදරයන්
අතරේ නඩු අසා මනුෂ්‍යයෙකු හා ඔහුගේ
සහෝදරයාද ඔහු සමග සිටින විදේශියාද
අතරේ දැහැමින් විනිශ්චයකරපල්ලා.
17 විනිශ්චයේදී මිනිසුන්ගේ තරාතිරම්
නොබලා ලොකු කුඩා අයට එක ලෙස
කන්දීපල්ලා; මනුෂ්‍යයන්ට භයනො-
වෙල්ලා; මක්නිසාද විනිශ්චයකිරීම
දෙවියන්වහන්සේගේය. තුඹලාට අමාරු
වැඩිවූ කාරණයක් ඇත්නම් මා ළඟට
ගෙනෙල්ලා, මම ඒක විචාරන්නෙමියි
18 කීයෙමි. ඒ කාලයේදී තුඹලා විසින්
කළ යුතු සියලු දේ ගැනත් තුඹලාට
අණකෙළෙමි.
19 අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අපට
අණකළ ලෙස අපි හොරේබ්හි සිට
ගමන් ගෙන අමෝරිවරුන්ගේ කඳුකරයට
යන මාර්ගයෙන් තුඹලා දුටු ඒ මහත්වූ
භයංකරවූ මුළු කාන්තාරය මැදින් ගොස්
20 කාදෙෂ්-බර්නේයට පැමිණියෙමු. මමද
තුඹලාට කථාකොට: අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අපට දෙන අමෝරි-
වරුන්ගේ කඳුකරයට තුඹලා අවුත්
21 සිටින්නහුය. බලව, තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** දේශය තුඹ ඉදිරිපිට
තබා තිබේ. තුඹේ පියවරුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** තුඹට කීලෙස
නැගීගොස් හිමිකරගනින්න; භය-
නොවන්න, නොකැලඹෙන්නැයි කීයෙමි.
22 තුඹලා සියල්ලෝද මා ළඟට අවුත්:
අප උදෙසා දේශය සෝදිසි කරන
පිණිසත් අප විසින් යා යුතු මාර්ගයද
පැමිණිය යුතු නුවරවල්ද ගැන හැරී ඇවිත්
අපට දන්වන පිණිසත් අපට පෙරටුව
23 මනුෂ්‍යයන් යවමුයයි කීවහුය. ඒ
කාරණය මටත් හොඳව පෙනුණේය.
මම ගෝත්‍රයකට එක්කෙනෙකු බැගින්
තුඹලාගෙන් මිනිසුන් දොළොස්දෙනෙකු
24 ගතිමි. ඔව්හු පිටත්වී කන්දට නැගී
එෂ්කොල් මිටියාවත දක්වා ගොස් ඒක
25 සෝදිසිකළෝය. ඔව්හු දේශයේ එලවලින්
ස්වල්පයක් තමුන්ගේ අත්වල රැගෙන
අප ළඟට බැස අවුත්: අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අපට දෙන දේශය
හොඳය කියා අපට දැන්වූහ. එසේවීනමුත් 26
තුඹලා යන්ට නොකැමැතිව තුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ආඥාවට
විරුද්ධව කැරළිගසා, තුඹලාගේ 27
කූඩාරම්වල සිට කොඳුරමින්: **ස්වාමීන්-
වහන්සේ** අපට වෛරවූ බැවින් අප
විනාශකරන පිණිස අමෝරිවරුන් අතට
අප පාවා දීමට මිසර දේශයෙන් අප
ගෙනාසේක. අපි කොතැනට නැගී
යමුද? අපේ සහෝදරයෝ කථාකොට—ඒ 28
සෙනඟ අපට වඩා මහත්ව උස්ව සිටිති;
නුවරවල්ද මහත්ව අහස දක්වා පවුරු
සහිතව තිබේ; ඒ හැර අනාක්වරුන්ගේ
පුත්‍රයන්ද එහි දුටිමුව කියා අපේ සිත්
මලානික වෙන්ට සැලැස්සුවෝයයි
කීවහුය. එකල්හි මම තුඹලාට 29
කථාකොට: තැති නොගනිල්ලා, ඔවුන්
ගැන භයනොවෙල්ලා. තුඹලාට පෙරටුව 30
යන්නාවූ තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** මිසරයෙහිද කාන්තාරයෙහිද
තුඹලාගේ ඇස් හමුයෙහි තුඹලා උදෙසා
කළ සියල්ල හැටියට උන්වහන්සේම
තුඹලා උදෙසා යුද්ධකරනවා ඇත.
මනුෂ්‍යයෙකු තමාගේ පුත්‍රයා උසුලා 31
ගෙනයන්නාක් මෙන් තුඹලා මේ
ස්ථානයට පැමිණෙන තෙක් ආවාවූ
මුළු මාර්ගයෙහිම තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** තුඹ උසුලා ගෙනා බව තුඹ
දැකලා තිබේ. එහෙත් තුඹලා යා යුතු 32
මාර්ගය රාත්‍රියෙහි ගින්නෙන්ද දවාලේ
වලාකුළෙන්ද තුඹලාට පෙන්වමින්,
තුඹලාට කූඩාරම් ගසාගන්ට ස්ථානයක්
සොයා දෙන පිණිස මාර්ගයෙහි
තුඹලාට පෙරටුව ගියාවූ, තුඹලාගේ 33
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹලා මේ
කාරණයේදී විශ්වාසකළේ නැත. **ස්වාමීන්-** 34
**වහන්සේ** තුඹලාගේ වචනවල හඬ අසා
උදහස්ව: සැබවින් යෙපුන්නෙගේ පුත්‍රවූ 35
කාලෙබ් හැර මේ නපුරු පරම්පරාවේ
මේ මනුෂ්‍යයන්ගෙන් එක්කෙනෙක්වත් මා
විසින් තුඹලාගේ පියවරුන්ට දෙන ලෙස

දිවුළ ඒ යහපත් දේශය නොදක්නේය;
36 කාලෙබ් වනාහි ඒක දකින්නේය; ඔහු
සම්පූර්ණ ලෙස ස්වාමීන්වහන්සේ අනුව
ගිය බැවින් ඔහු පය ගැසූ දේශය ඔහුටත්
ඔහුගේ දරුවන්ටත් දෙන්නෙමියි කියා
37 දිවුළසේක. තවද ස්වාමීන්වහන්සේ
තුඹලා නිසා මටත් උදහස්ව කථාකොට:
38 තුඹත් එහි ඇතුල්නොවන්නෙහිය. තුඹ
ඉදිරිපිට සිටින නූන්ගේ පුත්‍රවූ
යෝෂුවා එහි ඇතුල්වන්නේය. ඔහු
ශක්තිමත්කරපන්න; මක්නිසාද ඒක
ඉශ්‍රායෙල්වරුන්ට උරුමකර දෙන්ට
39 සිටින්නේ ඔහුය. තවද කොල්ලයක්
වන්නෝයයි තුඹලා විසින් කීවාවූ
තුඹලාගේ බාලයෝද අද යහපතවත්
අයහපතවත් නොදන සිටින තුඹලාගේ
දරුවෝද එහි ඇතුල්වන්නෝය, ඔවුන්ට
මම ඒක දෙන්නෙමි, ඔව්හු ඒක හිමිකර
40 ගන්නෝය. තුඹලා වනාහි හැරී රතු
මුහුදට යන මාර්ගයෙන් කාන්තාරයට
41 ගමන්කරපල්ලා යයි කීසේක. එවිට
තුඹලා උත්තරදෙමින්: අපි ස්වාමීන්-
වහන්සේට විරුද්ධව පව්කෙළෙමුව, අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ අපට අණකළ
සියල්ල ලෙස අපි ගොස් සටන්-
කරන්නෙමුයයි මට කියා තුඹලා
එකිනෙකා තමතමාගේ යුද්ධායුධ
බැඳගෙන අහංකාරයෙන් කන්දට නැඟී
42 යන්ට සැදී සිටියහුය. නුමුත් ස්වාමීන්-
වහන්සේ මට කථාකොට: තුඹලාගේ
සතුරන් ඉදිරියෙහි පහර නොලබන
පිණිස නැඟී නොයල්ලා, සටන්
නොකරල්ලා; මක්නිසාද මම තුඹලා
අතරෙහි නොසිටිමියි කියා ඔවුන්ට
43 කියාපන්නැයි කීසේක. මම තුඹලාට
එසේ කීමි, එහෙත් තුඹලා නොඅසා
ස්වාමීන්වහන්සේගේ අණට විරුද්ධව
කැරළිගසා හිතුවක්කාරකමින් කන්දට
44 නැඟී ගියහුය. එවිට ඒ කන්දේ විසූ
අමෝරිවරු තුඹලාට විරුද්ධව පිටත්ව
අවුත් මීමැස්සන් කරන්නාක් මෙන්
තුඹලා එළවා දමා සේයිර්හිදී හොර්මා
45 දක්වාම තුඹලාට පහරදුන්නෝය. තුඹලා
හැරී ඇවිත් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
ඇඬුවහුය; එහෙත් ස්වාමීන්වහන්සේ
තුඹලාගේ හඬ ඇසුවේවත් තුඹලාගේ
බසට ඇහුම්කන්දුන්නේවත් නැත. මෙසේ 46
තුඹලා කාදෙෂ්හි නැවතුණු දවස් ලෙස
බොහෝ දවස් එහි වාසය කළහුය.

## 2

එවිට ස්වාමීන්වහන්සේ මට කී
ලෙස අපි හැරී රතු මුහුදට යන
මාර්ගයෙන් කාන්තාරයට ගමන්කොට
බොහෝ දවස් සේයිර් කඳුකරය වටේ
ගියෙමුව. ස්වාමීන්වහන්සේ මට කථා- 2
කොට: තුඹලා මේ කඳුකරය වටකර 3
ගිය කාලය ඇත. උතුරු දෙසට
හැරී පලයල්ලා. තුඹ සෙනඟට 4
අණකරමින්–සේයිර්හි වසන ඒසව්ගේ
පුත්‍රයන් වන තුඹලාගේ සහෝදරයන්ගේ
සීමාව මැදින් තුඹලා යන්නහුය; ඔව්හු
තුඹලාට භයවන්නෝය. එබැවින් තුඹලා
හොඳකාර ප්‍රවේසම්වෙයල්ලා. ඔවුන්ට 5
විරුද්ධව සටන් නොකරල්ලා; මක්නිසාද
සේයිර් කඳුකරය උරුමයක් කොට
ඒසව්ට මා විසින් දී තිබෙන බැවින්
ඔවුන්ගේ දේශයෙන් පියවරක් පමණවත්
තුඹලාට නොදෙන්නෙමි. කන පිණිස 6
ආහාර ඔවුන්ගෙන් මිලදී ගනිල්ලා; බොන
පිණිස වතුරත් ඔවුන්ගෙන් මිලදී
ගනිල්ලා. මක්නිසාද තුඹේ දෙවිවූ 7
ස්වාමීන්වහන්සේ තුඹේ අත්වැඩ
සියල්ලෙහිදී තුඹට ආශීර්වාදකළසේක.
තුඹ මේ මහත් කාන්තාරය මැදින් ගමන්
කළ හැටි උන්වහන්සේ දන්නාසේක.
මේ සතළිස් අවුරුද්දක්ම තුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ තුඹ සමග වූසේක;
තුඹට කිසි හිඟයක් නොවීයයි
කියාපන්නැයි කීසේක. මෙසේ අප 8
සේයිර්හි සිටින ඒසව්ගේ පුත්‍රයන් වන
අපේ සහෝදරයන් ළඟින් ඒලත්
කෙරෙන්ද එශියොන්-ගෙබෙර් කෙරෙන්ද
අරබා සමභූමි මාර්ගයෙන් ගියෙමුව.
අපි හැරී මෝවබ් කාන්තාර මාර්ගයෙන්
ගියෙමු. ස්වාමීන්වහන්සේ මට කථාකොට: 9

මෝවබ්ට සතුරුකමක්වත් ඔහුට
විරුද්ධව සටනක්වත් නොකරන්න.
ඔවුන්ගේ දේශයෙන් නුඹට කිසි උරුමයක්
නොදෙන්නෙමි; මක්නිසාද ආර් මා
විසින් ලොත්ගේ පුත්‍රයන්ට උරුමයක්
10 කොට දී තිබේයයි කීසේක. (අනාක්-
වරුන් මෙන් මහත්ව බොහෝව උස්ව
සිටි සෙනඟක් වන ඒමිවරු ඉහතදී එහි
11 විසුවෝය. ඔව්හුද අනාක්වරුන් මෙන්
රෙඵායිම් යෝධයෝයයි කල්පනා කරනු
ලැබේ. එහෙත් මෝවබ්වරු ඔවුන්ට
12 ඒමිවරුයයි කියති. සේයිර්හිද ඉහතදී
හෝරිවරු වාසය කළෝය. එහෙත්
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්වරුන්ට දුන්
උරුම දේශයට ඔවුන් කළාක් මෙන්
ඒසව්ගේ පුත්‍රයෝද ඔවුන් පන්නා දමා
තමුන් ඉදිරියෙන් ඔවුන් විනාශකොට
ඔවුන්ගේ ස්ථානයෙහි වාසයකළෝය.)
13 දැන් නැගිට ශෙරෙද් ඔයෙන් එතර-
වෙයල්ලායයි කීසේක. අපි ශෙරෙද්
14 ඔයෙන් එතරවීමු. අප කාදෙෂ්-බර්නේය
කෙරෙන් පිටත්වී ශෙරෙද් ඔයෙන් එතරව
යුද්ධකාරයන්ගේ මුළු පරම්පරාව
**ස්වාමීන්වහන්සේ** ඔවුන්ට දිවුළ ලෙස
සෙනඟ අතරෙන් නැතිවී යන තුරු
ගතවුණු කාලය තිස්අට අවුරුද්දක්ය.
15 ඔවුන් නැතිවන තුරුම සෙනඟ අතරෙන්
ඔවුන් විනාශ කරන පිණිස **ස්වාමීන්-
වහන්සේගේ** හස්තය ඔවුන්ට විරුද්ධව
තිබුණේය.
16 මෙසේ සියලු යුද්ධකාරයන් සෙනඟ
අතරෙන් මැරී නැතිවී ගියාට පසු,
17,18 **ස්වාමීන්වහන්සේ** මට කථාකොට: නුඹ
අද මෝවබ් සීමාව වන ආර් පසුකර
19 යන්ට සිටිනෙහිය. අම්මොන් පුත්‍රයන්
ඉදිරියට ළංවූ කල ඔවුන්ට සතුරු-
කමක්වත් ඔවුන්ට විරුද්ධකමක්වත්
නොකරන්න. අම්මොන් පුත්‍රයන්ගේ
දේශයෙන් නුඹට කිසි උරුමයක්
නොදෙන්නෙමි. මක්නිසාද මා විසින්
එය ලොත්ගේ පුත්‍රයන්ට උරුමයක්
20 කොට දී තිබේ. (එයද රෙඵායිම්
යෝධයන්ගේ දේශයක්යයි කල්පනා
කරනු ලැබේ. රෙඵායිම් යෝධයෝ

ඉහතදී එහි විසුවෝය; එහෙත්
අම්මොන්වරු ඔවුන්ට සම්සුම්මිවරුයයි
කියති; මොව්හු අනාක්වරුන් මෙන් 21
මහත්වූ බොහෝවූ උස්වූ සෙනඟක්ය;
එහෙත් **ස්වාමීන්වහන්සේ** ඔවුන් මොවුන්
ඉදිරියෙන් විනාශ කළසේක; මොව්හු
ඔවුන් පන්නාදමා ඔවුන්ගේ ස්ථානයෙහි
විසුවෝය. උන්වහන්සේ සේයිර්හි 22
වාසයකළ ඒසව් පුත්‍රයන් ඉදිරියෙන්
හෝරිවරුන් විනාශ කිරීමෙන් ඔවුන්
උදෙසා කළාක් මෙන්ම මොවුන්ටත්
කළසේක; ඔව්හු ඔවුන් පන්නාදමා
ඔවුන්ගේ ස්ථානයෙහි අද දක්වා
වාසයකරති. කප්තෝර්හි සිට ආ 23
කප්තෝර්වරු ගාශා දක්වා ගම්වල විසූ
අව්විවරුනුත් විනාශකොට ඔවුන්ගේ
ස්ථානයෙහි විසුවෝය.) නුඹලා නැගිට 24
ගමන් ගෙන අර්ණොන් ඔයෙන් එතරට
පලයල්ලා. බලව, මම හෙෂ්බොන්හි
රජවූ අමෝරියවූ සීහොන්ද ඔහුගේ
දේශයද නුඹ අතට දුනිමි. ඒක හිමි-
කරගන්ට පටන්ගෙන ඔහුට විරුද්ධව
යුද්ධ කරපන්න. මුළු අහසින් යට සිටින 25
සෙනඟවල් පිටට නුඹ නිසා තැතිගැන්ම
හා භය පමුණුවන්ට අද දවසේ
පටන්ගනිමි, ඔව්හු නුඹේ ප්‍රවෘත්තිය අසා
නුඹ නිසා වෙව්ලමින් අතිශයින්
කැලඹෙන්නෝයයි කීසේක.
එවිට මම කෙදෙමොත් කාන්තාරයේ 26
සිට හෙෂ්බොන්හි රජවූ සීහොන් වෙතට
සමාදාන වචන ඇතුව පණිවිඩකාරයන්
යවා: නුඹේ දේශය මැදින් යන්ට මට 27
අවසර ලැබේවා. දකුණටවත් වමටවත්
නොහැරී මහමාවත යන්නෙමි. සේයිර්හි 28
වාසයකරන ඒසව් පුත්‍රයන්ද ආර්හි
වාසය කරන මෝවබ්වරුන්ද මට
කළාක් මෙන් නුඹත් අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අපට දෙන දේශයට
අප යොර්දනෙන් එතරව යන තුරු, කන්ට 29
මට ආහාර මිලේට විකුණා, බොන්ට
මට වතුර මිලේට දුන මැනවි. පයින්
යන්ට පමණක් මට අවසර ලැබේවයි
කියා ඇරියෙමි. නුමුත් හෙෂ්බොන්හි 30

රජවූ සීහොන් තමා ළඟින් යන්ට අපට
ඉඩ දෙන්ට කැමති නූණේය. මක්නිසාද
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මේ දවසේ
තිබෙන්නාක් මෙන් ඔහු නුඹ අතට
පාවාදෙන පිණිස ඔහුගේ ආත්මය
දැඩිකොට ඔහුගේ සිත මුරණ්ඩු කළසේක.
31 **ස්වාමීන්වහන්සේ** මට කථාකොට: බලව,
සීහොන්ද ඔහුගේ දේශයද නුඹට පාවා
දෙන්ට පටන්ගතිමි. ඔහුගේ දේශය හිමි
කරගන්නා පිණිස එය අල්ලාගන්ට පටන්
32 ගනින්නැයි කීසේක. එවිට සීහොන්ද
ඔහුගේ මුළු සෙනඟද අපට විරුද්ධව
සටන්කරන පිණිස යහශ්ට ආවෝය.
33 අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඔහු අපට
පාවාදුන්සේක; අපි ඔහුටත් ඔහුගේ
පුත්‍රයන්ටත් ඔහුගේ මුළු සෙනඟටත්
34 පහරදුනිමු. එකල අපි ඔහුගේ සියලු
නුවරවල් අල්ලාගෙන සියලුම නුවර-
වල පුරුෂයන්ද ස්ත්‍රීන්ද බාලයන්ද
එක්කෙනෙක්වත් ඉතුරු නොකර
35 සහමුලින්ම විනාශකෙළෙමු. සිව්පාවුන්ද
අප අල්ලාගත් නුවරවල සම්පත්ද
පමණක් අපට කොල්ලයක් පිණිස ගතිමු.
36 අර්ණෝන් ඔය අසබඩ තිබෙන
අරෝයෙර් පටන්ද මිටියාවතේ තිබෙන
නුවර පටන්ද ගිලියද් දක්වා අපට
අල්වාගන්ට බැරිතරම් උස්වූ නුවරක්
නොතිබුණේය. අපේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** සියල්ලම අපට දුන්සේක.
37 එහෙත් අම්මොන් පුත්‍රයන්ගේ දේශය
වන මුළු යබ්බොක් ඔය අසබඩටවත්
කඳුකරයේ නුවරවලටවත් අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අපට තහනම්කළ කිසි
තැනකටවත් නුඹ ළං නූණෙහිය.

**3** එකල අපි හැරී බාෂාන්ට යන
මාර්ගයෙන් නැගී ගියෙමුව. බාෂාන්හි
රජවූ ඕග් සහ ඔහුගේ මුළු සෙනඟද
සටන්කරන්ට අපට විරුද්ධව එද්රෙයිට
2 ආවෝය. **ස්වාමීන්වහන්සේ** මට කථා-
කොට: ඔහුට භයනොවන්න. මක්නිසාද
මම ඔහු සහ ඔහුගේ මුළු සෙනඟද
ඔහුගේ දේශයද නුඹ අතට පාවා
දුනිමි; හෙෂ්බොන්හි වාසයකළ අමෝරි-
වරුන්ගේ රජවූ සීහොන්ට කළාක්මෙන්
ඔහුටත් කරපන්නැයි කීසේක. එසේ අපේ 3
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** බාෂාන්හි රජවූ
ඕග් සහ ඔහුගේ මුළු සෙනඟද අප
අතට පාවාදුන්සේක. අපිද ඔහුට
එක්කෙනෙක්වත් ඉතුරු නොවන තුරු
පහරදුනිමු. එකල අපි ඔහුගේ සියලු 4
නුවරවල් අල්ලාගතිමු; ඔවුන්ගෙන් අල්ලා
නොගත් එක නුවරක්වත් නොවීය; එනම්
නුවරවල් හැටක් ඇත්තාවූ බාෂාන්හි වූ
ඕග්ගේ රාජ්‍යය වන මුළු අර්ගොබ් පළාත
අල්ලා ගතිමු. මේ සියලු නුවරවල් උස්වූ 5
පවුරුවලින්ද ද්වාරවලින්ද අගුල්වලින්ද
සුරක්ෂිතකර තිබුණේය; ඒවා ඇර පවුරු
නැති නුවරවල් මහත් ගණනක්ද අල්ලා
ගතිමු. අප විසින් හෙෂ්බොන්හි රජවූ 6
සීහොන්ට කළාක්මෙන් ඔවුනුත් සහ-
මුලින් විනාශකෙළෙමු, සියලුම නුවර-
වල පුරුෂයන්ද ස්ත්‍රීන්ද බාලයන්ද
සම්පූර්ණයෙන් විනාශකෙළෙමු. එහෙත් 7
සියලු සිව්පාවුන්ද නුවරවල සම්පත්ද
අපට කොල්ලයක් කොට ගතිමු. එකල 8
අපි යොර්දනෙන් මෙගොඩ අර්ණෝන්
ඔයේ පටන් හෙර්මොන් කන්ද දක්වා
තිබෙන දේශය අමෝරිවරුන්ගේ
රජවරුන් දෙදෙනා අතින් ගතිමු.
(සීදෝන්වරු හෙර්මොන්ට සිරියොන්යයි 9
කියත්, අමෝරිවරු ඊට සෙනීර්යයි
කියත්;) තලාවේ සියලු නුවරවල්ද මුළු 10
ගිලියද්ද බාෂාන්හි ඕග්ගේ රාජ්‍යයේ
නුවරවල් වූ සලෙකා සහ එද්රෙයි දක්වා
මුළු බාෂාන් රටද අල්ලා ගතිමු. (ඉතුරුවූ 11
රෙඵායිම් යෝධයන්ගෙන් ඒ වන තුරු
ඉතුරුව සිටියේ බාෂාන්හි රජවූ ඕග්
පමණක්ය; ඔහුගේ ඇඳ යකඩ ඇඳකි;
එය අම්මොන් පුත්‍රයන්ට අයිති රබ්බාහි
තිබෙනවා නොවේද? මනුෂ්‍යයෙකුගේ
රියන ලෙස එහි දිග නව රියනක්ය, එහි
පළල සතර රියනක්ය.) අපි එකල්හි ඒ 12
දේශය හිමිකරගතිමු. අර්ණෝන් ඔය
අසබඩ තිබෙන අරෝයෙර් පටන් ගිලියද්

කඳුකරයෙන් දෙකෙන් කොටසක් හා
එහි නුවරවල්ද රූබෙන්වරුන්ටත්
13 ගාද්වරුන්ටත් දුනිමි. ගිලියද්හි ඉතුරු
කොටසද ඕග්ගේ රාජ්‍යයවූ මුළු බාෂාන්
රටද මනස්සේගේ අර්ධ ගෝත්‍රයට දුනිමි.
(ඒක රෙඵායිම් යෝධයන්ගේ දේශයයයි
කියන මුළු බාෂාන් වන මුළු අර්ගොබ්
14 පළාතය. මනස්සේගේ පුත්‍රවූ යායිර් තෙම
ගෙෂූර්වරුන්ගේද මාකාත්වරුන්ගේද
සීමාව දක්වා මුළු අර්ගොබ් පළාත
අල්ලාගෙන ඒවාට එනම් බාෂාන්ට අද
දක්වා තිබෙන්නාක්මෙන් තමාගේ නාමය
ප්‍රකාර හව්වොත්-යායිර්යයි නම
15,16 තැබුවේය.) ගිලියද් මාකීර්ට දුනිමි. තවද
ගිලියද් පටන් අර්ණෝන් ඔය ඇතුළත
දක්වාම තිබෙන පළාතත් අම්මොන්
පුත්‍රයන්ගේ සීමාව වන යබ්බොක් ඔය
17 දක්වා තිබෙන පළාතත්, කින්නෙරෙත්
පටන් පිස්ගායේ පාමුළට පහළින්
තිබෙන ලුණු මුහුද වන අරබා සමභූමියේ
මුහුද දක්වා නැගෙනහිරට පිහිටි අරබා
සමභූමියත් යොර්දනත් ඒ පළාතත්
රූබෙන්වරුන්ට සහ ගාද්වරුන්ට දුනිමි.
18 මම එකල්හි නුඹලාට අණකොට: මේ
දේශය හිමිකරගන්නා පිණිස නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** එය නුඹලාට
දී තිබේ. සන්නාහ සන්නද්ධව
නුඹලාගෙන් බලවන්තයන් ව සිටින
සියල්ලන් නුඹලාගේ සහෝදරවූ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට පෙරටුව යන්ට
19 ඕනෑය. එහෙත් නුඹලාගේ භාර්යාවෝද
බාලයෝද සිව්පාවෝද මා නුඹලාට දී
තිබෙන නුවරවල සිටිත්වා; (නුඹලාට
බොහෝ සිව්පාවන් ඉන්න බව දනිමි.)
20 **ස්වාමීන්වහන්සේ** නුඹලා මෙන් නුඹලාගේ
සහෝදරයන්ද එහි පදිංචිකරවන තුරුද
යොර්දනෙන් එගොඩ නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඔවුන්ට දෙන දේශය
ඔවුන් හිමිකරගන්නා තුරුද නුඹලා
ගොස් පසුව එකිනෙකා මා නුඹලාට දී
තිබෙන දේශයට හැරී වරෙල්ලාය කියා
21 නුඹලාට කීමි. එකල මම යෝෂුවාට
අණ දෙමින්: නුඹලාගේ **ස්වාමීන්වහන්සේ**
මේ රජුන් දෙදෙනාට කළ සියල්ල නුඹේ
ඇසින් දුටුවෙහිය. නුඹ පැමිණෙන සියලු
රාජ්‍යවලට **ස්වාමීන්වහන්සේ** එසේම
කරනසේක. ඔවුන්ට භය නොවෙල්ලා. 22
මක්නිසාද නුඹලා උදෙසා සටන්-
කරන්නේ නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ**යයි කීමි.
මම එකල්හි **ස්වාමීන්වහන්සේ**ට 23
කන්නලව් කොට: අහෝ, ස්වාමිවූ 24
දෙවියන්වහන්ස, ඔබගේ උතුම්කමද
බලවත් හස්තයද ඔබගේ මෙහෙකරුවාට
පෙන්වන්ට ඔබ පටන්ගත්සේක.
මක්නිසාද ඔබගේ ක්‍රියාවලද ඔබගේ
බලසරාක්‍රමයේද හැටියට කරන්ට
පුළුවන් වෙන මොන දෙවිකෙනෙක්
ස්වර්ගයෙහිවත් පොළොවෙහිවත්
ඇත්තේද? එගොඩට ගොස් යොර්දනෙන් 25
එතර තිබෙන ඒ යහපත් දේශයද ඒ
ශෝභන කඳු රටද ලෙබනොන්ද දකින
පිණිස මට යන්ට ඉඩදුන මැනවයි
කීයෙමි. එහෙත් **ස්වාමීන්වහන්සේ** නුඹලා 26
නිසා මා කෙරෙහි උදහස්ව මට
ඇහුම්කන්නොදී මට කථාකොට: ඔය
ඇත, මේ කාරණය ගැන තවත් මට
කථානොකරන්න. නුඹ පිස්ගා මුදුනට 27
නැගී ඇස් ඔසවා බස්නාහිර දෙසද
උතුරු දෙසද දකුණු දෙසද නැගෙනහිර
දෙසද නුඹේ ඇස් යොමා බලාපන්න.
මක්නිසාද නුඹ මේ යොර්දනෙන් එතරට
නොයන්නෙහිය. එහෙත් යෝෂුවාට 28
අණදී ඔහු ධෛර්යමත්කර ඔහු
ශක්තිමත්කරපන්න. මක්නිසාද ඔහු මේ
සෙනඟට පෙරටුව ගොස් නුඹ දක්නා
දේශය තෙමේම ඔවුන්ට උරුම්
කරදෙන්නේයයි මට කීසේක. මෙසේ 29
අපි බෙත්-පෙයෝර් ඉදිරිපිට මිටියාවතේ
නැවතී සිටියෙමුව.

## කීකරුවීමට අවවාදනුශාසනා

4 ඉතින් ඉශ්‍රායෙල්වරුනි, නුඹලා
ජීවත්ව සිට නුඹලාගේ පියවරුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹලාට දෙන
දේශයට ඇතුල්වී ඒක හිමිකර ගන්නා
පිණිස පවත්වන්ට මා විසින් නුඹලාට

උගන්වන පනත්වලටද විනිශ්චයවලටද
2 ඇහුම්කන්දියල්ලා. මා තුඹලාට
අණකරන තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ ආඥා පවත්වන පිණිස මා
තුඹලාට අණකරන වචනයට කිසිවක්
එකතුකිරීමවත් එයින් කිසිවක් අඩු-
3 කිරීමවත් නොකරල්ලා. බාල්-පෙයෝර්
නිසා ස්වාමීන්වහන්සේ කළ දෙය
තුඹලාගේ ඇස්වලින් දුටුවහුය.
මක්නිසාද බාල්-පෙයෝර් පස්සේ ගිය
සියලු මනුෂ්‍යයන් තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ තුඹලා අතරෙන් විනාශකළ-
4 සේක. එහෙත් තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ඇලුම්ව සිටි තුඹලා
සියල්ලෝම අද දවසේ ජීවත්ව සිටිති.
5 බලව, තුඹලා හිමිකරගන්ට ඇතුල්වන
දේශයේදී තුඹලා විසින් පවත්වන පිණිස
මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මට
අණකළ ලෙසම පනත්ද විනිශ්චයන්ද
6 තුඹලාට ඉගැන්වීමි. එබැවින් ඒවා
පවත්වමින් කරපල්ලා; මක්නිසාද මෙය
මනුෂ්‍ය වර්ගයන් ඉදිරියෙහි තුඹලාගේ
ප්‍රඥාවත් තුඹලාගේ නැණවත්කමත්ය,
ඔවුන් මේ සියලු පනත් අසා: සැබවින්ම
මේ මහත් ජාතිය ප්‍රඥාවන්තවූ නුවණ
ඇත්තාවූ සෙනඟක්යයි කියනවා ඇත.
7 මක්නිසාද අපේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට අප යාච්ඤාකරන සියලු
ප්‍රස්ථාවයන්හිදීම උන්වහන්සේ අපට ළංව
සිටින්නාක් මෙන් වෙන කොයි මහත්
ජාතියකට දෙවිකෙනෙක් ළංව සිටින්නේද?
8 අද මා විසින් තුඹලා ඉදිරිපිට තබන
මේ මුළු ව්‍යවස්ථාව මෙන් ධර්මිෂ්ඨවූ
පනත් හා විනිශ්චයන් ඇත්තේ වෙන
9 කොයි මහත් ජාතියකටද? තුඹේ ඇස්-
වලින් දුටු දේවල් තුඹට මතකනැති
නොවන පිණිසත් තුඹේ ජීවිතයේ සියලු
දවස්වල ඒවා තුඹේ සිතෙන් පහනොවන
පිණිසත් බලාගෙන, තුඹේ ආත්මය
ප්‍රවේසමෙන් ආරක්ෂාකරගනින්න; ඒවා
තුඹේ පුත්‍රයන්ටද තුඹේ පුත්‍රයන්ගේ
10 පුත්‍රයන්ටද දන්වාපන්න. ඒවා නම්,
ස්වාමීන්වහන්සේ මට කථාකොට:
සෙනඟ මා ළඟට රැස්කරපන්න, ඔවුන්
භූමිය මතුපිට ජීවත්වෙන සියලු දවස්වල
මට භය වෙන්ට ඉගෙන ගන්නා පිණිසත්
තමුන්ගේ දරුවන්ට උගන්වන පිණිසත්
මාගේ වචන ඔවුන්ට ඇසෙන්ට
සලස්වන්නෙමියි මට කී කල තුඹ
හොරෙබ්හිදී තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි සිටි දවසේදී වූණ
දේවල්ය. තුඹලා වනාහි ළංවී කන්ද 11
මුල සිටියහුය; කන්දද අඳුරත්
වලාපටලත් ඝනාන්ධකාරයත් ඇතුව
අහස මැද දක්වා ගින්නෙන් ඇවිළී
ගියේය. ස්වාමීන්වහන්සේද ගිනි මැද 12
සිට තුඹලාට කථාකළසේක. තුඹලා
වචන හඬ ඇසූ නුමුත් කිසි රූපාකාරයක්
දුටුවේ නැත; හඬ පමණක් තුඹලාට
ඇසුණේය. උන්වහන්සේ තුඹලාට 13
පවත්වන්ට අණකළ තමන්වහන්සේගේ
ගිවිසුම වන ආඥා දසය තුඹලාට
දන්වාදී ඒවා ගල්ලෑලි දෙකක ලියූසේක.
තුඹලා හිමිකරගන්ට යන දේශයේදී 14
තුඹලා විසින් පැවැත්විය යුතු පනත් හා
විනිශ්චයන්ද තුඹලාට උගන්වන්ට
ස්වාමීන්වහන්සේ ඒ කාලයේදී මට
අණකළසේක. ස්වාමීන්වහන්සේ 15
හොරේබ්හි ගින්න මැද සිට තුඹලාට
කථාකළ දවසේදී තුඹලා කිසි
රූපාකාරයක් දුටුවේ නැත. එබැවින් 16
තුඹලාම දූෂ්‍යකරගන, පුරුෂයෙකුගේ
හෝ ස්ත්‍රියෙකුගේ ආකාරයවත්, පොළොවේ 17
කිසි මෘගයෙකුගේ ආකාරයවත්,
ආකාශයෙහි පියාසරකරන පියාපත් ඇති
කිසි පක්ෂියෙකුගේ ආකාරයවත්, භූමිය 18
පිට බඩගා යන කිසි සතෙකුගේ
ආකාරයවත්, පොළොව යට ජලයෙහි
ඉන්න කිසි මත්ස්‍යයෙකුගේ ආකාරයවත්
යන මේ කොයි රූපාකාරයකට නුමුත්
සමානවූ කැපූ රූපයක් සාද නොගන්න
හැටියටද, තුඹේ ඇස් අහස දෙසට 19
ඔසවා ඉර සඳ තාරකා යන සියලු
අහස් සේනාව දකින කල මුළු අහසින්
යට සිටින සියලු ජාතීන්ට තුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ කොටස්කර දී තිබෙන
ඒ දේවලට නමස්කාරකිරීමටත් සේවය

කිරීමටත් ඇදී නොයන හැටියටද හොඳට
20 ප්‍රවේසම් වෙයල්ලා. එහෙත් අද තිබෙන්නාක්
මෙන් තුඹලා තමන්වහන්සේට උරුම
සෙනඟක් වන පිණිස **ස්වාමීන්වහන්සේ**
තුඹලා රැගෙන යකඩ උඳුනක් වැනිවූ
මිසරයෙන් තුඹලා පිටතට ගෙනාසේක.
21 තවද **ස්වාමීන්වහන්සේ** තුඹලා නිසා
මා කෙරෙහි උදහස්ව, මට යොර්දනෙන්
එතරට යන්ටත් තුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** උරුමයක් පිණිස තුඹට දෙන
ඒ යහපත් දේශයට ඇතුල්වෙන්ටත්
නොලැබෙන්නේය කියා දිවුළසේක.
22 මෙසේ මා මේ දේශයෙහි මැරෙන්ට
ඕනෑය, මා යොර්දනෙන් එගොඩට
නොයා යුතුය. එහෙත් තුඹලා එගොඩට
ගොස් ඒ යහපත් දේශය හිමිකරගන්නවා
23 ඇත. තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
තුඹලා සමග කළාවූ උන්වහන්සේගේ
ගිවිසුම මතක නැතිකොට තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** තුඹට තහනම්කර
තිබෙන කිසිවකට සමානවූ රූපයක් සාද
24 නොගන්ට බලාගනිල්ලා. මක්නිසාද
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** විනාශ-
කරන ගින්නක් වන, ස්වකීය ගෞරවය
රක්ෂා කරන්නාවූ දෙවිකෙනෙක්ය.
25 තුඹට දරුවන්ද දරුවන්ගේ දරුවන්ද
ඉපද, තුඹලා දේශයෙහි බොහෝ කලක්
සිටි කල්හි, තුඹලා දූෂ්‍යකම්කරමින්,
කොයි දෙයකට තුමූත් සමානවූ රූපයක්
සාදගන, තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
උදහස්වන හැටියට උන්වහන්සේ ඉදිරියේ
නපුරුව තිබෙන දෙය කළොත්,
26 තුඹලා හිමිකරගන්ට යොර්දනෙන්
එතරට යන දේශය මතුපිටින්
තුඹලා ඉක්මනට සහමුලින් විනාශවෙන
බවට අද දවසේ තුඹලාට විරුද්ධව
සාක්ෂි පිණිස අහසටද පොළොවටද
හඬගසමි; එහි තුඹලාගේ දවස්
වැඩිනොවී, තුඹලා සහමුලින්ම විනාශ
27 වන්නහුය. **ස්වාමීන්වහන්සේ** මනුෂ්‍ය
වර්ගයන් අතරෙහි තුඹලා විසුරුවනවා

ඇත, **ස්වාමීන්වහන්සේ** විසින් තුඹලා
පමුණුවන ජාතීන් අතරෙහි තුඹලා
ගණනින් ස්වල්පව සිටින්නහුය. එහිදී 28
තුඹලා ඇස් පෙනෙන්නේවත් කන්
ඇසෙන්නේවත් කෑම කන්නේවත් ගඳ
සුවඳ දැනෙන්නේවත් නැත්තාවූ ලී සහ
ගල්වලින් මනුෂ්‍යයන්ගේ අතින් සෑදුවාවූ
දෙවිවරුන්ට මෙහෙකරනවා ඇත. එහෙත් 29
එතන සිට තුඹලා තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** සොයමින් තුඹේ මුළු
සිතෙන්ද තුඹේ මුළු ආත්මයෙන්ද
සොයන්නහු නම් උන්වහන්සේ තුඹට
සම්බවනසේක. තුඹ පීඩා විඳින කලද 30
මේ සියලු දේ තුඹට පැමිණි කලද
අන්තිම දවස්වලදී තුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** දෙසට හැරී උන්වහන්සේගේ
හඬට ඇහුම්කන්දුන්නොත්, තුඹේ දෙවිවූ 31
**ස්වාමීන්වහන්සේ** දයාවන්ත දෙවි-
කෙනෙක් බැවින් උන්වහන්සේ තුඹ
අත්නොහරිනසේක, තුඹ විනාශ-
නොකරනසේක, උන්වහන්සේ තුඹේ
පියවරුන් සමග දිවුළාවූ ගිවිසුම
මතකනැතිනොකරනසේක. මක්නිසාද 32
දෙවියන්වහන්සේ පොළොව පිට
මනුෂ්‍යයා මැවූ දවසේ පටන් අහසේ
එක් කෙළවරක සිට අනික් කෙළවර
දක්වා මෙයාකාර මහත් දෙයක්
සිද්ධවුණාද නොහොත් මෙයාකාර
දෙයක් අසන්ට යෙදුණාද කියා තුඹට
ප්‍රථම තිබුණු පසුගිය දවස්වලින්
විභාගකරපන්න. ගින්න මැද සිට 33
කථාකරන දෙවියන්වහන්සේගේ හඬ
තුඹ විසින් ඇසුවාක් මෙන් වෙන යම්
සෙනඟක් අසා ජීවත් වුණාද? නොහොත් 34
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
මිසරයේදී තුඹලාගේ ඇස් ඉදිරියෙහි
තුඹලා උදෙසා කළ සියල්ල ලෙස වෙන
යම් දෙවිකෙනෙක් ඇවිත් පරීක්ෂණ-
වලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද
යුද්ධයෙන්ද බලවත් හස්තයකින්ද දිගුකළ
බාහුවකින්ද මහත් භයංකරකම්වලින්ද
එක ජාතියක් වෙන ජාතියක් මධ්‍යයෙන්
තමන්ට ගන්ට හැදුයේද? එසේ තුඹට 35

පෙන්වනලද්දේ ස්වාමීන්වහන්සේම
දෙවියන්වහන්සේ බවත් උන්වහන්සේ
මිස වෙන දෙවිකෙනෙක් නැති බවත්
36 තුඹ දැනගන්න පිණිසය. උන්වහන්සේ
තුඹට උගන්වන පිණිස තමන්-
වහන්සේගේ හඬ අහසෙන් තුඹට
ඇසෙන්ට සලස්වා, පොළොව පිට
තමන්වහන්සේගේ මහත් ගින්න තුඹට
දැක්වූසේක; උන්වහන්සේගේ වචනද ගින්න
37 මැදින් තුඹට ඇසුණේය. උන්වහන්සේ
තුඹේ පියවරුන්ට ප්‍රේමකළ බැවින්
ඔවුන්ට පසුව ඔවුන්ගේ වංශය
තෝරාගෙන, තුඹට වඩා මහත්වූ
බලවත්වූ ජාතීන් තුඹ ඉදිරිපිටින්
38 පන්නාදමා තුඹ ඇතුළට පමුණුවා, අද
දවසේ තිබෙන්නාක් මෙන් ඔවුන්ගේ දේශය
තුඹට උරුමයක් කොට දෙන පිණිස
තෙමේම ප්‍රකාශවී, ස්වකීය මහත් බලය
කරණකොටගෙන තුඹ මිසරයෙන්
39 පිටතට ගෙනාසේක. එබැවින් ස්වාමීන්-
වහන්සේම ඉහළ ස්වර්ගයෙහිත් පහත
පොළොවෙහිත් දෙවියන්වහන්සේ බවද
වෙන දෙවිකෙනෙක් නැති බවද අද
දවසේ දැනගෙන ඒ බව තුඹේ සිතේ
40 තබාගනින්න. තුඹටත් තුඹෙන් පසු තුඹේ
දරුවන්ටත් ශුභසිද්ධවන පිණිසද තුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ සදාකාලයටම
තුඹට දෙන දේශයෙහි තුඹේ දවස්
වැඩිකරගන්නා පිණිසද අද මා විසින්
තුඹට අණකරන උන්වහන්සේගේ පනත්
සහ ආඥා පවත්වාපන්නැයි කීවේය.

### ආරක්ෂා නගර තුනක් නියමකිරීම

41 එකල මෝසෙස් පෙර වෛරයක්
නොතිබී අත් වැරැද්දෙන් තමාගේ
අසල්වාසියා මරන කෙනෙකුට පලා-
42 යාමට, යෝර්දනෙන් එගොඩ නැගෙනහිර
දෙස නුවරවල් තුනක් වෙන්කෙළේය;
එසේ කෙළේ ඔහු එයින් එකකට පලා
43 ගොස් ජීවත්වන පිණිසය. ඒ නුවරවල්
නම් රූබෙන්වරුන්ට තැනිකලා රටේ
කාන්තාරයෙහි තිබෙන බෙශෙර්ද
ගාද්වරුන්ට ගිලියද්හි තිබෙන රාමොත්ද
මනස්සේවරුන්ට බාෂාන්හි තිබෙන
ගෝලන්ද යන මේවාය.

මෝසෙස් ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙහි 44
තැබූ ව්‍යවස්ථාව මේය. ඉශ්‍රායෙල් පුත්‍රයන් 45
මිසරයෙන් ආ කල මෝසෙස්
යෝර්දනෙන් එගොඩදී හෙෂ්බොන්හි
වාසයකළාවූ අමෝරිවරුන්ගේ රජවූ
සීහොන්ගේ දේශයෙහි බෙත්-පෙයෝර් 46
ඉදිරිපිට තිබෙන මිටියාවතේදී ඔවුන්ට
කියාදුන් ශික්ෂාද පනත්ද විනිශ්චයවල්ද
මේවාය. මෝසෙස් සහ ඉශ්‍රායෙල්
පුත්‍රයෝ මිසරයෙන් ආ කල සීහොන්
රජුට පහරදී, අර්ණොන් ඔයබඩ තිබෙන 47
අරෝයෙර් පටන් හෙර්මොන් හෙවත්
සිරියොන් කන්ද දක්වා යෝර්දනෙන්
එගොඩ නැගෙනහිරට තිබෙන අමෝරි- 48
වරුන්ගේ රජුන් දෙදෙනා වන සීහොන්ගේ
දේශයද බාෂාන්හි රජවූ ඕග්ගේ දේශයද,
පිස්ගායේ පාමුලට පහළින් තිබෙන 49
අරබා සමභූමියේ මුහුද දක්වා
යෝර්දනෙන් එගොඩ නැගෙනහිරට
තිබෙන මුළු අරබා සමභූමියද හිමි-
කරගත්තෝය.

### ආඥා දශය දෙවනු විස්තරකිරීම

5 මෝසෙස් සියලු ඉශ්‍රායෙල්වරුන්
කැඳවා ඔවුන්ට කථාකොට: එම්බා
ඉශ්‍රායෙල්වරුනි, අද තුඹලා අසාගෙන
සිටියදී මා කියන පනත්ද විනිශ්චයවල්ද
අසාපල්ලා; තුඹලා ඒවා ඉගෙන-
ගෙන ඒවා කරන්ට බලාගනිල්ලා. අපේ 2
දෙවිවූ ස්වාමීන්වහන්සේ අප සමග
හොරේබ්හිදී ගිවිසුමක් කළසේක.
ස්වාමීන්වහන්සේ මේ ගිවිසුම කළේ අපේ 3
පියවරුන් සමග නොව අප සමගය,
එසේය, අද මෙහි ජීවත්ව සිටින සියල්ලන්
වන අප සමගය. ස්වාමීන්වහන්සේ 4
කන්දේදී ගින්න මැද සිට තුඹලා
සමග මුහුණට මුහුණ ලා කථාකළ-
සේක. (ස්වාමීන්වහන්සේගේ වචන 5
තුඹලාට දන්වන පිණිස එකල්හි මම

**ස්වාමීන්වහන්සේටත්** තුඹලාටත් අතරේ
සිටියෙමි; මක්නිසාද තුඹලා ගින්න නිසා
භයවී කන්දට නොනැගී සිටියහුය.)
උන්වහන්සේ කථාකොට මෙසේ කීසේක:
6 මම මිසර දේශය වන වහල්කමේ
ගෙදරින් තුඹ පිටතට ගෙනාවාවූ තුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේය.**
7 මා ඇර අන් දෙවිවරුන් ඇතුව
නොසිටුව.
8 කැපූ රූපයක්වත් උඩ අහසෙහි හෝ
පහත පොළොවෙහි හෝ පොළොවෙන්
යට ජලයෙහි හෝ තිබෙන කිසිම දෙයක
සමානත්වයක්වත් තුඹට සාදා නොගනුව.
9 ඊට නමස්කාර නොකරව, සේවය
නොකරව. මක්නිසාද තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** වන මම *අන්‍ය භක්ති
නොඉවසන්නාවූ, මට වෛරවන්නන්ගේ
තුන්වෙනි හතරවෙනි පරම්පරා කෙරෙහි
පියවරුන්ගේ අධර්මිෂ්ඨකම ගැන
10 දරුවන්ට ප්‍රතිඵල දෙන්නාවූ, මට ප්‍රේම-
කරමින් මාගේ ආඥා පවත්වන්නන්ගෙන්
පැවතෙන දහස් ගණන් පරම්පරා දක්වා
දයාව පෙන්වන්නාවූ දෙවිකෙනෙක්ය.
11 තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
නාමය †නිකරුණේ ව්‍යවහාර නොකරව.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
නාමය †නිකරුණේ ව්‍යවහාර කරන
තැනැත්තා නිවැරදිකාරයෙකු කොට
ගණන් නොගන්නාසේක.
12 තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
තුඹට අණකළ ලෙස සබත් දවස ශුද්ධ
13 කොට පවත්වන්ට බලාගනුව. සදවසක්
වැඩකරමින් තුඹේ සියලු වැඩකර්මාන්ත
14 කරගනුව. නමුත් සත්වෙනි දවස
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
පවත්වන සබතක්ය. ඒ දවසේ තුඹ
මෙන් තුඹේ වැඩකාරයාත් තුඹේ
වැඩකාරීත් නිවාඩු ගන්න පිණිස තුඹවත්
තුඹේ පුතාවත් තුඹේ දූවවත් තුඹේ

*හෙවත්, ස්වගෞරවය රක්ෂාකරන්නාවූ.
†හෙවත්, බොරුවට.

වැඩකාරයාවත් තුඹේ වැඩකාරීවත් තුඹේ
ගවයාවත් තුඹේ කොටළුවාවත් තුඹේ
කිසි සිව්පාවෙක්වත් තුඹේ දොරටු ඇතුළත
සිටින ආගන්තුකයාවත් කිසි වැඩක්
නොකරව්. තුඹත් මිසර දේශයෙහි 15
වැඩකාරයෙක් ව සිටි බවත් තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** බලවත් හස්තයකින්ද
දිගුකළ බාහුවකින්ද තුඹ එතැනින් පිටතට
ගෙනා බවත් සිහිකරපන්න. එබැවින්
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** සබත්
දවස පවත්වන්ට තුඹට අණකළසේක.
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹට 16
දෙන දේශයෙහි තුඹේ දවස් බොහෝ
වන පිණිසද තුඹට ශුභසිද්ධ වන පිණිසද
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹට
අණකළ ලෙස තුඹේ පියාටද තුඹේ
මවුටද ගෞරව කරව්.
මිනී නොමරව්. 17
කාමමිථ්‍යාචාරය නොකරව්. 18
සොරකම් නොකරව්. 19
තුඹේ අසල්වාසියාට විරුද්ධව බොරු 20
සාක්ෂි නොකියව්.
තුඹේ අසල්වාසියාගේ භාර්යාවට 21
ආසා නොවව්; තුඹේ අසල්වාසියාගේ
ගෙටවත් ඔහුගේ කෙතටවත් ඔහුගේ
වැඩකරුවාටවත් ඔහුගේ වැඩකාරීටවත්
ඔහුගේ ගොනාටවත් ඔහුගේ
කොටළුවාටවත් තුඹේ අසල්වාසියාගේ
කිසිම දෙයකටවත් තණ්හා නොවව්.
මේ වචන **ස්වාමීන්වහන්සේ** කන්දේදී 22
ගින්නද වලාකුළද කළුවරද මැද සිට
තුඹලාගේ මුළු සභාවට මහත් හඬකින්
කීසේක. උන්වහන්සේ තවත් නොකියා
ඒවා ගල්ලැලි දෙකක ලියා මට දුන්සේක.
කන්ද ගින්නෙන් ඇවිළෙද්දී අන්ධකාරය 23
මැදින් පැමිණි හඬ තුඹලාට ඇසුණු
කල්හි තුඹලා එනම් තුඹලාගේ ගෝත්‍ර-
වල සියලු ප්‍රධානියෝද තුඹලාගේ
වැඩිමහල්ලෝද මා ළඟට අවුත්
කථාකොට: බලව. අපේ දෙවිවූ **ස්වාමීන්-** 24
**වහන්සේ** තමන්ගේ තේජසද මහත්-
තත්ත්වයද දක්වූසේක, උන්වහන්සේගේ

හඬද ගින්න මැදින් අපට ඇසුණේය.
දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමග
කථාකරලාත් ඔහු ජීවත්ව සිටින බව
25 අද දවසේ අපි දුටිමුව. ඉතින් අපි
මක්නිසා නස්නෙමුද? මේ මහත් ගින්න
අප දවා දමනවා ඇත. අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** හඬ අප විසින් තවත්
26 ඇසුවොත් අප නසිනවා ඇත. මක්නිසාද
මාංසමයවූ සියල්ලන්ගෙන්, අප ඇසුවාක්
මෙන් ගින්න මැද සිට කථාකරන
ජීවමාන දෙවියන්වහන්සේගේ හඬ අසා
27 ජීවත්ව සිටියේ වෙන කවරෙක්ද? නුඹ
ළංවී අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කියන සියල්ල අසා අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට කථාකරන
සියල්ල අපට කියන්න; අපි ඒ අසා ඒ
28 හැටියට කරන්නෙමුයයි කීවෝය. නුඹලා
මා සමග කථාකළ විට **ස්වාමීන්වහන්සේ**
නුඹලාගේ වචනවල හඬ අසා මට
කථාකොට: මේ සෙනඟ නුඹට කථාකළ
වචනවල හඬ ඇසීමි. ඔවුන් කී සියල්ල
29 මනා ලෙස කීවෝය. අහෝ ඔවුන්ටද
ඔවුන් සමග ඔවුන්ගේ දරුවන්ටද
සදාකාලේටම ශුභ සිද්ධවන පිණිස
නිතරම මට භයවීමටත් මාගේ සියලු
ආඥා රක්ෂාකිරීමටත් මෙයාකාර සිතක්
30 තිබුණොත් යහපත! නුඹ ගොස්:
නුඹලාගේ කූඩාරම්වලට හැරී
31 පලයල්ලායයි ඔවුන්ට කියාපන්න. එහෙත්
නුඹ වනාහි මෙහි මා වෙත සිටපන්න,
මමද හිමිකරගැනීම පිණිස මා ඔවුන්ට
දෙන දේශයෙහි ඔවුන් පවත්වන පිණිස
නුඹ ඔවුන්ට ඉගැන්විය යුතුවූ ආඥා
පන්තියද පනත්ද විනිශ්චයන්ද
32 නුඹට කියන්නෙමියි කීසේක. එබැවින්
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹලාට අණකළ ලෙස කරන්ට
බලාගනිල්ලා. දකුණටවත් වමටවත්
33 නොහැරෙල්ලා. නුඹලා හිමිකරගන්ට
යන දේශයෙහි නුඹලා ජීවත්ව සිටින
පිණිසත් නුඹලාට ශුභ සිද්ධවන පිණිසත්
නුඹලාගේ දවස් වැඩිකරගන්න පිණිසත්
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹලාට අණකර තිබෙන මුළු
මාර්ගයෙහි හැසිරියල්ලා.

## අවවාද සහ ආඥා

6 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
භයව නුඹේ ජීවිතයේ සියලු
දවස්වල නුඹද නුඹේ පුත්‍රයාද නුඹේ
පුත්‍රයාගේ පුත්‍රයාද මා විසින් නුඹට
අණකරන උන්වහන්සේගේ සියලු පනත්
සහ ආඥා පවත්වන පිණිසත් නුඹේ දවස්
වැඩිවෙන පිණිසත්, නුඹලා හිමිකරගන්ට 2
එතරව යන්නාවූ දේශයේදී පැවැත්වීමට
නුඹලාට උගන්වන හැටියට මට අණකළ
ආඥාවද පනත්ද විනිශ්චයවල්ද මේවාය.
එබැවින් ඉශ්‍රායෙල්, නුඹට ශුභ සිද්ධවන 3
පිණිසත් නුඹේ පියවරුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට පොරොන්දුවුණු
ලෙස කිරි හා මීපැණි ගලායන
දේශයකදී නුඹලා අතිශයින් වැඩිවෙන
පිණිසත් එය අසා ඉෂ්ටකරන්ට
බලාගනින්න.
එම්බා, ඉශ්‍රායෙල්, අසාපන්න. අපේ 4
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** එකම **ස්වාමීන්-**
**වහන්සේය**. නුඹේ දෙවිවූ **ස්වාමීන්-** 5
**වහන්සේට** නුඹේ මුළු සිතෙන්ද නුඹේ
මුළු ආත්මයෙන්ද නුඹේ මුළු ශක්තියෙන්ද
ප්‍රේමකරපන්න. මා විසින් අද නුඹට 6
අණකරන මේ වචන නුඹේ සිතේ තිබේවා.
ඒවා නුඹේ දරුවන්ට හොඳකාරයෙන් 7
උගන්වා, නුඹ ගෙයි හිඳින කලද මග
යන කලද නුඹ සයනයකරන කලද
නැගිටින කලද ඒවා ගැන කථාකරපන්න.
ඒවා නුඹේ අතෙහි ලකුණක් පිණිස 8
බැඳගනින්න, ඒවා නුඹේ ඇස් අතරෙහි
නළල් පටි පිණිස තිබේවා. ඒවා නුඹේ 9
ගෙයි උළුවහු පිටද නුඹේ දොරවල් පිටද
ලියාපන්න.
නුඹට දෙන හැටියට නුඹේ දෙවිවූ 10
**ස්වාමීන්වහන්සේ** නුඹේ පියවරුන් වන
ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද
දිවුළාවූ දේශයට නුඹ පැමිණෙවූ කල්හිත්,
නුඹ ගොඩ නොනැගුවාවූ විශාලවූ

11 හොඳවූ නුවරවල්ද, නුඹ නොපිරෙවූවාවූ,
සියලු යහපත් දේවලින් පිරී තිබෙන
ගෙවල්ද නුඹ නොකැපුවාවූ කපා තිබෙන
තටාකද නුඹ නොහිටෙවූ මිදි වතුද
ඔලීව ගස්ද නුඹ විසින් ලබාගන කාලා
12 තෘප්තියට පැමුණුණ කල්හිත්, මිසර
දේශය වන වහල්කමේ ගෙයින් නුඹ
පිටතට ගෙනාවාවූ **ස්වාමීන්වහන්සේ**
සිහිනැති නොකරන්ට බලාගනින්න.
13 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට** නුඹ
විසින් හයවෙන්ටත් උන්වහන්සේටම
සේවයකරන්ටත් *උන්වහන්සේගේ
14 නාමයෙන් දිවුරන්ටත් ඕනෑය. අන්
දෙවිවරුන් වන නුඹලා වටකර සිටින
ජාතීන්ගේ දෙවිවරුන් අනුව නොයල්ලා;
15 එසේ කළොත් නුඹලා මධ්‍යයෙහි වැඩ
සිටින නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
†අන්‍ය භක්ති නොඉවසන්නාවූ
දෙවිකෙනෙක් බැවින්, උන්වහන්සේගේ
උදහස නුඹට විරුද්ධව ඇවිළ නුඹ
පොළොව මතුපිටින් විනාශකරනවා
ඇත.
16 මස්සාහිදී කළාක් මෙන් නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** පරීක්ෂා-
17 නොකරල්ලා. නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹලාට අණකළ
උන්වහන්සේගේ ආඥාද ශික්ෂාද පනත්ද
18 හොඳකාරයෙන් රක්ෂාකරපල්ලා. නුඹට
ශුභ සිද්ධවන පිණිසද **ස්වාමීන්වහන්සේ**
නුඹේ පියවරුන්ට දෙන්ට දිවුළ යහපත්
දේශයට ඇතුල්ව එය හිමිකරගන්නා
පිණිසද **ස්වාමීන්වහන්සේ** කී ලෙස නුඹේ
සියලු සතුරන් නුඹ ඉදිරියෙන් එළවා
19 දමන පිණිසද, **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි හරිව යහපත්ව පෙනෙන දේ
කරපල්ලා.
20 අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹලාට
අණකළ මේ ශික්ෂාද පනත්ද විනිශ්ච-
යන්ද මොනවාදැයි මතු කාලයෙහිදී
නුඹේ පුත්‍රයා නුඹෙන් අසන විට,
නුඹේ පුත්‍රයාට උත්තරදෙමින්: අපි 21
මිසරයෙහි ඵාරාවෝගේ දාසයෝ ව
සිටියෙමුව; **ස්වාමීන්වහන්සේද** බලවත්
හස්තයකින් අප මිසරයෙන් පිටතට
ගෙනාසේක; මිසරයද ඵාරාවෝද ඔහුගේ 22
ගෙදර වාසී සියල්ලන්ද කෙරෙහි
**ස්වාමීන්වහන්සේ** අපේ ඇස් හමුයෙහි
මහත්වූ භයානකවූ ලකුණුද ආශ්චර්යද
කොට, අපේ පියවරුන්ට දෙන්ට දිවුළ 23
දේශයට අප පමුණුවා, ඒක අපට දෙන
පිණිස එතැනින් පිටතට අප ගෙනාසේක.
අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට** අප 24
විසින් හයවෙන පිණිසත් සැම කල්ම
අපට ශුභ සිද්ධවෙන පිණිසත් අද දවසේ
මෙන් අප ජීවමානව රක්ෂාකරන
පිණිසත් මේ සියලු පනත් ඉෂ්ටකරන්ට
**ස්වාමීන්වහන්සේ** අපට අණකළසේක.
අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අපට අණ 25
කර තිබෙන ලෙස මේ මුළු ආඥාව
පවත්වන්ට බලාගනිමුනම් ඒ අපට
ධර්මිෂ්ඨකම වන්නේයයි කියාපන්න.

## වෙන්වීමට අණකිරීම

7 නුඹ හිමිකරගන්ට යන්නාවූ දේශයට
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹ
පමුණුවා නොයෙක් ජාතීන් වන
හිත්තීවරුන්ද ගිර්ගාෂිවරුන්ද අමෝරි-
වරුන්ද කානානිවරුන්ද පෙරිස්සිවරුන්ද
හිවීවරුන්ද යෙබූසිවරුන්ද යන නුඹට
වඩා මහත්වූ බලසම්පන්නවූ ජාතීන් සත
නුඹ ඉදිරියෙන් පහකර දමන කල්හිද,
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඔවුන් 2
නුඹ අතට පාවාදෙන්ටත් නුඹ ඔවුන්ට
පහරදෙන්ටත් යෙදෙන කල්හිද නුඹ ඔවුන්
සමග කිසි ගිවිසුමක් නොකොට, ඔවුන්ට
කරුණා නොකොට, ඔවුන් සහමුලින්ම
විනාශ කර දමාපන්න. ඔවුන් සමග 3
ආවාහවිවාහ නොකරන්න; නුඹේ දුව
ඔහුගේ පුත්‍රයාට පාවා නොදෙන්න,
ඔහුගේ දුව නුඹේ පුත්‍රයාට පාවා
නොගනින්න. මක්නිසාද ඔවුන් අන් 4
දෙවිවරුන්ට සේවයකරන පිණිස නුඹේ
පුත්‍රයා මා අනුව යාමෙන් අහකට

*එනම්, උන්වහන්සේගේ නාමය
සහතිකයක් කොට කියා සිටින්ටත්.
†හෙවත්, ස්වගෞරවය රක්ෂාකරන්නාවූ.

හරවාගන්නවා ඇත. එවිට **ස්වාමීන්-**
**වහන්සේගේ** උදහස නුඹට විරුද්ධව
ඇවිළ උන්වහන්සේ වහාම නුඹ
5 විනාශකරනවා ඇත. එහෙත් ඔවුන්ට
මෙසේ කරපල්ලා: ඔවුන්ගේ පූජාසන
කඩාදමා, ඔවුන්ගේ රූපස්තම්භ බිඳදමා,
ඔවුන්ගේ අෂේරා කණු කපාදමා,
ඔවුන්ගේ රූප ගින්නෙන් දවාදමාපල්ලා.
6 මක්නිසාද නුඹ නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේට** ශුද්ධ සෙනඟක්ය.
පොළෝතලයෙහි සිටින සියලු මනුෂ්‍ය
වර්ගයන් අතරෙන් **ස්වාමීන්වහන්සේ**
තමන් සන්තක සෙනඟක් වන පිණිස
7 නුඹ තෝරාගත්සේක. **ස්වාමීන්වහන්සේ**
නුඹලා කෙරෙහි ඇලුම්වී නුඹලා
තෝරාගත්තේ අන් සියලු ජනයන්ට වඩා
නුඹලා ගණනින් වැඩි නිසා නොවේ;
මක්නිසාද නුඹලා අන් සියලු ජනයන්ට
8 වඩා ස්වල්ප වූහුය. නුමූත් **ස්වාමීන්-**
**වහන්සේ** නුඹලා බලවත් හස්තයකින්
පිටතට ගෙනැවිත්, වහල්කමේ ගෙදර
වන මිසරයේ රජවූ ඵාරාවෝ අතින්
නුඹලා මිදුවේ උන්වහන්සේ නුඹලාට
ප්‍රේමකළ නිසාත් නුඹලාගේ පියවරුන්ට
දිවුළ දිවිරීම ඉෂ්ටකරන්ට කැමතිවූ
9 නිසාත්ය. එබැවින් නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** දෙවියන්වහන්සේ බවද
උන්වහන්සේට ප්‍රේමකරමින් උන්-
වහන්සේගේ ආඥා පවත්වන්නන් සමග
පරම්පරා දහසක් දක්වා ගිවිසුම සහ
කරුණාව පවත්වන්නාවූ විශ්වාසවූ
10 දෙවියන්වහන්සේ බවද, උන්වහන්සේට
වෛරවන්නන් විනාශ කරන පිණිස
උන්වහන්සේ ඔවුන්ගේ මුහුණු ඉදිරිපිට
ඔවුන්ට ප්‍රතිඵල දෙන බවද දනගනින්න.
උන්වහන්සේ තමන්ට වෛරවන්නා ගැන
ප්‍රමාද නොවී ඔහුගේ මුහුණ ඉදිරිපිට
11 ඔහුට ප්‍රතිඵල දෙනසේක. එබැවින්
පවත්වන්ට මා විසින් අද නුඹට
අණකරන ආඥාවද පනත්ද විනිශ්චයන්ද
රක්ෂා කරපන්න.

## ජය ලැබෙන බවට පොරොන්දුව

තවද නුඹලා මේ විනිශ්චයන් අසා 12
ඒවා පවත්වා ඉෂ්ටකරන බැවින් නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹේ
පියවරුන්ට දිවුළ ගිවිසුම හා කරුණාව
නුඹ සමග පවත්වා, නුඹට ප්‍රේමවී, නුඹට 13
ආශීර්වාදකොට, නුඹ වැඩිකර, නුඹට
දෙන ලෙස නුඹේ පියවරුන්ට දිවුළ
දේශයෙහිදී නුඹේ ගර්භයෙහි ඵලයට
සහ නුඹේ භූමියේ ඵලය වන නුඹේ
ධාන්‍යවලටද මුද්‍රික රසයටද තෙල්-
වලටද නුඹේ ගවයන්ගේ බෝවීමටද
නුඹේ එළු බැටළු පැටවුන්ටද
ආශීර්වාදකරනවා ඇත. නුඹ සියලු 14
මනුෂ්‍ය වර්ගයන්ට වඩා ආශීර්වාද
ලබනවා ඇත. නුඹලා අතරෙහිද
නුඹලාගේ සිව්පාවුන් අතරෙහිද පිරිමි-
යෙක්වත් ගැහැනියෙක්වත් ගැනු
සනෙක්වත් වඳ නොවෙයි. **ස්වාමීන්-** 15
**වහන්සේ** සියලු රෝග නුඹ කෙරෙන්
පහකොට, නුඹ දන්නාවූ මිසරයේ අරිෂ්ට
රෝගවලින් එකක්වත් නුඹ පිටට
නොපමුණුවා, නුඹට වෛරවන සියල්ලන්
පිට ඒවා තබනවා ඇත. නුඹේ දෙවිවූ 16
**ස්වාමීන්වහන්සේ** නුඹට පාවාදෙන සියලු
මනුෂ්‍ය වර්ගයන් නැතිකරදමාපන්න;
නුඹේ ඇස ඔවුන්ට අනුකම්පා
නොකෙරේවා. ඔවුන්ගේ දෙවිවරුන්ට
සේවය නොකරන්න; මක්නිසාද ඒක
නුඹට මලපතක් වන්නේය. මේ ජාතීහු 17
මට වඩා වැඩිව සිටිති; ඔවුන් පන්නා
දමන්ට මට පුළුවන් කෙසේදැයි නුඹට
සිතෙන විට ඔවුන්ට භයනොවන්න. නුඹේ 18
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඵාරාවෝ සහ
මුළු මිසරයට කළ දේද නුඹේ ඇස්වලින් 19
දුටු මහත් පරීක්ෂණද ලකුණුද
ආශ්චර්යයන්ද නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** නුඹ පිටතට ගෙනාවාවූ ඒ
බලසම්පන්න හස්තය හා දිගුකළ
බාහුවද මනාකොට සිහිකරගනින්න.
නුඹ භයවෙන්නාවූ සියලුම ජනයන්ට
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** එසේම
කරනවා ඇත. තවද ඉතුරුවී සැඟ- 20
වෙන්නාවූ අය නුඹ ඉදිරියෙන් නැතිවී

යනතුරු නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඔවුන් අතරට දෙබරුන් යවනවා ඇත.
21 මහත්වූ භයානකවූ දෙවිකෙනෙක් ව සිටින
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹලා
අතරෙහි සිටින බැවින් ඔවුන් නිසා තැති
22 නොගනිත්ත. නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** ඒ ජාතීන් නුඹ ඉදිරියෙන්
ටිකෙන් ටික පහකර දමනවා ඇත. නුඹ
ඉක්මනින් ඔවුන් නැතිකර නොදැමිය
යුතුය, එසේ කළොත් වන මෘගයෝ
23 නුඹට විරුද්ධව වැඩිවන්නෝය. නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඔවුන් නුඹ අතට
පාවාදී, ඔවුන් නැතිවී යන තුරු මහත්වූ
පරාජයකින් ඔවුන් පරාජය කරනවා
24 ඇත. ඔවුන්ගේ රජවරුන්ද උන්වහන්සේ
නුඹ අතට පාවා දෙනවා ඇත, නුඹ
අහස යටින් ඔවුන්ගේ නාමය නැතිකර
දමන්නෙහිය. නුඹ ඔවුන් විනාශකර
දමන තුරු කිසි මනුෂ්‍යයෙකුට නුඹට
විරුද්ධව සිටින්ට නොහැකිවන්නේය.
25 ඔවුන්ගේ දෙවිවරුන්ගේ රූප ගින්නෙන්
දවාදමාපල්ලා. ඒවායේ තිබෙන රන්
රිදීවලට ආශාවී ඒවා නොගනිත්ත, එසේ
කළොත් නුඹ මලපතකට අසුවන්නේය.
මක්නිසාද ඒවා නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
26 **වහන්සේට** පිළිකුලක්ය. පිළිකුල් දෙයක්
නුඹේ ගෙට ගෙනගොස් නුඹ ඊට
සමානවී නාස්තියට කැපනොවත්ත. නුඹ
ඊට ද්වේෂකොට එය සහමුලින්ම
පිළිකුල්කොට සිතාපත්ත. මක්නිසාද එය
නාස්තියට කැපය.

## කාන්තාර ගමනෙන් පාඩම්

**8** නුඹලා ජීවත්ව බෝවෙන පිණිසද
ස්වාමීන්වහන්සේ නුඹලාගේ
පියවරුන්ට දිවුළ දේශයට ඇතුල්ව ඒක
හිමිකරගන්නා පිණිසද අද මා විසින්
නුඹට අණකරන මුළු ආඥාව
2 රක්ෂාකරන්ට බලාගනිල්ලා. නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹ යටහත්කර,
නුඹ සෝදිසිකර, උන්වහන්සේගේ
ආඥා නුඹ රක්ෂාකරනවාද නැද්දැයි නුඹේ
සිතේ තිබෙන දෙය දැනගන්නා පිණිස
මේ සතළිස් අවුරුද්දේ කාන්තාරයෙහි
නුඹ ගෙනගිය මුළු මාර්ගය
සිහිකරපත්ත. උන්වහන්සේ නුඹ 3
යටත්කොට, නුඹ බඩගින්නට පැමිණෙන්ට
ඉඩඇර, මනුෂ්‍යයා ජීවත්වෙන්නේ
රොටිවලින් පමණක් නොවන බවත්
**ස්වාමීන්වහන්සේගේ** මුඛයෙන් නික්මෙන
සියල්ලෙන් මනුෂ්‍යයා ජීවත්වන බවත්
නුඹට දන්වාදෙන පිණිස, නුඹ
දැනනොගෙන සිටියාවූ, නුඹේ පියවරුන්ද
දැනනොගෙන සිටියාවූ මන්නාවලින් නුඹ
පෝෂණයකළසේක. මේ සතළිස් 4
අවුරුද්දේ නුඹේ වස්ත්‍ර නුඹ පිට පරණ
නොවීය, නුඹේ පාද ඉදිමුණේ නැත.
මනුෂ්‍යයෙකු තමාගේ පුත්‍රයාට දඬුවම් 5
කරන්නාක් මෙන් නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** නුඹට දඬුවම්කරන බව නුඹේ
සිතින් කල්පනාකරපත්ත. නුඹේ 6
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** මාර්ගවල
හැසිරෙමින් උන්වහන්සේට භයව
උන්වහන්සේගේ ආඥා රක්ෂාකරපත්ත.
මක්නිසාද නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** 7
නුඹ හොඳ දේශයකට පමුණුවනසේක.
එය මිටියාවත්වලිනුත් හෙල්වලිනුත්
නික්මෙන දිය ඔයවල්ද උල්පත්ද වැව්ද
ඇති දේශයක්ය; එය තිරිඟුද යවද මුද්‍රික 8
වැල්ද අත්තික්කා ගස්ද දෙළුම් ගස්ද
ඇති දේශයක්ය; තෙල් ඔළීවද මීපැණිද
ඇති දේශයක්ය; ඒ දේශයේ නුඹට හිඟ 9
නැතුව කෑම කන්ට පුළුවන, එහිදී නුඹට
කිසි දෙයකින් අඩු පාඩුවක් නොවන්නේය;
ඒ දේශයේ ගල් යකඩය, එහි හෙල්වලින්
නුඹට පිත්තල හාරාගන්ට පුළුවන. නුඹ 10
කා තෘප්තියට පැමිණ නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට දුන් යහපත්
දේශය ගැන උන්වහන්සේට ප්‍රශංසා-
කරපත්ත. මා විසින් අද නුඹට 11
අණකරන නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** ආඥාද විනිශ්චයන්ද පනත්ද
නොපැවැත්වීමෙන් උන්වහන්සේ
මතකනැති නොකරන්ට බලාගනිත්ත.
නුඹ කා තෘප්තියට පැමිණ හොඳ ගෙවල් 12

ගොඩනගා එහි වාසය කරන කල්හිත්,
13 නුඹේ ගව රැළවල් හා එළු බැටළු
රැලවල් වැඩිවී, නුඹේ රන් රිදීද වැඩිවී,
නුඹට ඇති සියල්ලම වර්ධනයවූ
14 කල්හිත්, නුඹේ සිත උඩඟු නොවන
හැටියටද, මිසර දේශය වන වහල්කමේ
ගෙයින් නුඹ පිටතට ගෙනාවාවූ, නුඹේ
මතු කාලයේදී නුඹට යහපත කිරීමට
නුඹ යටහත්කර නුඹ සෝදිසිකරන
15 පිණිස, ගිනි සර්පයන් සහ ගෝනුස්සන්
ඇත්තාවූ, වතුර නැති, නියංසායෙන්
යුක්තවූ ඒ මහත් භයංකර කාන්තාරය
මැදින් නුඹ ගෙනාවාවූ, ගිනිගල්
පර්වතයෙන් නුඹට වතුර නික්මවා දී,
16 නුඹේ පියවරුන් නොදත්තාවූ, මන්නා-
වලින් කාන්තාරයේදී නුඹ පෝෂණය-
කළාවූ නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
17 මතක නැතිකොට: මාගේ බල
පුළුවන්කමෙනුත් මාගේ බාහු
ශක්තියෙනුත් මේ වස්තුව ලද්දෙමියි නුඹේ
සිතින් නොකියන හැටියටද බලාගනින්න.
18 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
සිහිකරපන්න, මක්නිසාද නුඹේ
පියවරුන්ට දිවුළ තමන්ගේ ගිවිසුම අද
තිබෙන්නාක් මෙන් ඉෂ්ටකරන පිණිස
නුඹට සම්පත් ලබාගැනීමට පුළුවන්කම
19 දෙන්නේ උන්වහන්සේය. තවද නුඹ නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** සිහිනැති කොට
අන් දෙවිවරුන් පස්සේ ගොස්, ඔවුන්ට
සේවය කොට නමස්කාරකරන්නෙහිනම්,
නුඹලා සැබවින් විනාශ වෙන බවට
අද මම නුඹලාට විරුද්ධව සාක්ෂිදෙමි.
20 නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
හඬට ඇහුම්කන්දෙන්ට නුඹලා
නොකැමතිවූ බැවින් උන්වහන්සේ නුඹලා
ඉදිරියෙන් විනාශවෙන්ට සලස්වන ජාතීන්
මෙන් නුඹලාත් විනාශවෙනවා ඇත.

## කාන්තාර ගමනෙන් පාඩම්

(ඉහත හා සම්බන්ධයි.)

9 එම්බා, ඉශ්‍රායෙල්, අසාපන්න.
දැන් නුඹ යොර්දනෙන් එතරවී, නුඹට
වඩා මහත්වූ බලවත්වූ ජාතීන් පන්නා
දමන්ටත්, අහස දක්වා පවුරු ඇති
2 මහත් නුවරවල් අල්ලාගන්ටත්, නුඹ
දන්නාවූ අනාක්වරුන්ගේ පුත්‍රයන් වන
මහත්වූ උස ඇත්තාවූ සෙනඟක් පන්නා
දමන්ටත් යන්නෙහිය. අනාක්ගේ පුත්‍රයන්
ඉදිරියෙහි සිටින්ට පුළුවන් කාටදැයි යන
කීම නුඹ අසා තිබේ. එබැවින් නුඹේ 3
දෙවිවූ **ස්වාමීන්වහන්සේම** විනාශකරන
ගින්නක් ව නුඹට පෙරටුව යන බව අද
දැනගනින්න; උන්වහන්සේම ඔවුන්
විනාශකරනවා ඇත, උන්වහන්සේම
ඔවුන් නුඹ ඉදිරියෙහි යටත්කරදෙනවා
ඇත. මෙසේ **ස්වාමීන්වහන්සේ** නුඹට
කී ලෙස නුඹ ඔවුන් පන්නා ඉක්මනින්
නැතිකර දමනවා ඇත. නුඹේ දෙවිවූ 4
**ස්වාමීන්වහන්සේ** නුඹ ඉදිරියෙන් ඔවුන්
පහකළ පසු: මේ දේශය හිමිකරගැනීමට
**ස්වාමීන්වහන්සේ** මා ගෙනාවේ මාගේ
ධර්මිෂ්ඨකම නිසායයි නුඹේ සිතින්
නොකියන්න. නුමුත් **ස්වාමීන්වහන්සේ**
ඒ ජාතීන් නුඹ ඉදිරියෙන් පන්නාදමන්නේ
ඔවුන්ගේ දුෂ්ටකම නිසාය. ඔවුන්ගේ 5
දේශය හිමිකරගැනීමට නුඹ ඇතුල්
වෙන්නේ නුඹේ ධර්මිෂ්ඨකම නිසාවත්
නුඹේ සිතේ අවංකකම නිසාවත් නොවේ.
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඒ ජාතීන්
නුඹ ඉදිරියෙන් පන්නාදමන්නේ ඔවුන්ගේ
දුෂ්ටකම නිසාත් නුඹේ පියවරුන් වන
ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද
**ස්වාමීන්වහන්සේ** දිවුළ වචනය
ඉෂ්ටකරන පිණිසත්ය. එබැවින් ඒ හොඳ 6
දේශය හිමිකරගැනීමට **ස්වාමීන්වහන්සේ**
එය නුඹට දෙන්නේ නුඹේ ධර්මිෂ්ඨකම
නිසා නොවන බව දැනගනින්න;
මක්නිසාද නුඹ තද කුළල් ඇති
සෙනඟක්ය. නුඹ කාන්තාරයේදී නුඹේ 7
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** උදහස් කළ
හැටි සිහිකරපන්න, මතක නැති
නොකරන්න. නුඹ මිසර දේශයෙන් පිටත්-
වුණු ද පටන් මේ ස්ථානයට පැමිණෙන
තෙක් නුඹලා **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව කැරළිකාරව සිටියහුය.
හොරේබ්හිදීත් නුඹලා **ස්වාමීන්වහන්සේ** 8
උදහස් කළහුය, **ස්වාමීන්වහන්සේද**

තුඹලා විනාශකරන තරමට තුඹලාට
9 කෝප්පවූසේක. එසේ වුණේ ස්වාමීන්-
වහන්සේ තුඹලා සමග කළ ගිවිසුමේ ලෑලි
වන ගල්ලෑලි ලබාගන්ට මා කන්දට නැගී,
කෑම නොකා වතුර නොබී දවල් සතළිසක්
හා රෑ සතළිසක් කන්දේ සිටියාවූද,
10 දෙවියන්වහන්සේගේ ඇඟිල්ලෙන් ලියන-
ලද ගල්ලෑලි දෙක ස්වාමීන්වහන්සේ
මට භාරදුන්නාවූද ප්‍රස්තාවේදීය;
රැස්වීමේ දවසේ ස්වාමීන්වහන්සේ
කන්දෙහිදී ගිනි මැද සිට තුඹලාට
කථාකළ සියලු වචනවල ප්‍රකාරයට
11 ඒවායේ ලියා තිබුණේය. දවල් සතළිසක්ද
රෑ සතළිසක්ද ගතවූ කල ස්වාමීන්-
වහන්සේ ගිවිසුමේ ලෑලි වන ගල්ලෑලි
12 දෙක මට දී කථාකොට: තුඹ නැගිට
මෙතනින් ඉක්මනට බැස පලයන්න;
මක්නිසාද තුඹ මිසරයෙන් ගෙනාවාවූ
තුඹේ සෙනඟ දුෂ්ටකම් කළෝය; මා
ඔවුන්ට අණ කළ මාර්ගයෙන් ඔව්හු
අහක්වී තමුන්ට පිළිමයක් වාත්තුකරගන
13 සිටිතියි කීසේක. ස්වාමීන්වහන්සේ තව
දුරටත් මට කථාකොට: මේ සෙනඟ
බැලුවෙමි, ඔව්හු තද කුළල් ඇති
14 සෙනඟක්ය. මා විසින් ඔවුන් විනාශ
කොට ඔවුන්ගේ නාමය අහස යටින්
මකාදමන පිණිස මට ඉඩ ඇරපන්න.
මම තුඹ ඔවුන්ට වඩා බලවත්වූ මහත්වූ
සෙනඟක් වෙන්ට සලස්වන්නෙමියි
15 කීසේක. එවිට මම හැරී කන්දෙන්
බැස්සෙමි, කන්ද ගින්නෙන් ඇවිළුණේය.
ගිවිසුමේ ලෑලි දෙක මාගේ දෑතෙහි
16 තිබුණේය. මම බැලීමි, තුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට විරුද්ධව තුඹලා
පව්කොට, වහු රූපයක් තුඹලාට
වාත්තුකරගෙන, ස්වාමීන්වහන්සේ
තුඹලාට අණකළ මාර්ගයෙන් තුඹලා
17 ඉක්මනින් අහක්ව ගිය බව දැක, මම
ලෑලි දෙක ගෙන මාගේ දෑතින් වීසිකොට
තුඹලාගේ ඇස් හමුයෙහි ඒවා බින්දෙමි.
18 ස්වාමීන්වහන්සේ කෝපකරන හැටියට
උන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුවූ
දේ කරමින් තුඹලා කළාවූ තුඹලාගේ
සියලුම පාපවල් නිසා මම පළමු වතාවේ
මෙන් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි වැටී
දවල් සතළිසක්ද රෑ සතළිසක්ද කෑම
නොකා වතුර නොබී සිටියෙමි. මක්නිසාද 19
තුඹලා විනාශකිරීමට ස්වාමීන්වහන්සේ
තුඹලාට විරුද්ධව උදහස්වී සිටිය
උදහසද කෝපයද නිසා භයවීමි. නුමුත්
ස්වාමීන්වහන්සේ ඒ වතාවේදීත් මට
ඇහුම්කන්දුන්සේක. ස්වාමීන්වහන්සේ 20
ආරොන්ද විනාශකරන පිණිස ඔහුට
විරුද්ධව ඉතා උදහස්ව සිටිසේක. මම
ඒ ප්‍රස්තාවේදී ආරොන් උදෙසාත් යාච්ඤා
කෙළෙමි. තුඹලාගේ පාපය වන තුඹලා 21
සෑදූ වස්සා මම අරගෙන ගින්නෙන්
පුළුස්සා දමා, කොටා, ධූලි මෙන්
පොඩිවෙන තුරු අඹරා, ඒකේ කුඩු
කන්දෙන් ගලාගෙන ආ ඔයේ හෙළීමි.
තවද තාබෙරාහිදීත් මස්සාහිදීත් 22
කිබ්රොත්-හත්තාවාහිදීත් තුඹලා ස්වාමීන්-
වහන්සේ උදහස් කළහුය. තුඹලා නැගී 23
ගොස් මා තුඹලාට දුන් දේශය හිමි-
කර ගනිල්ලාය කියා ස්වාමීන්වහන්සේ
කාදෙෂ්-බර්නේයේ සිට තුඹලා යැවූ
විටත් තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ අණට විරුද්ධව තුඹලා
කැරළිගැසුවහුය, තුඹලා උන්වහන්සේ
විශ්වාස කළේවත් උන්වහන්සේගේ හඬ
ඇසුවේවත් නැත. මා තුඹලා දැනගත් 24
දවස පටන් තුඹලා ස්වාමීන්වහන්සේට
විරුද්ධව කැරළිකාරව සිටියහුය. ස්වාමීන්- 25
වහන්සේ තුඹලා විනාශකරනසේකැයි
කී බැවින් මා වැටී සිටිය දවස් ලෙස
දවල් සතළිසකුත් රෑ සතළිසකුත්
ස්වාමීන්වහන්සේ ඉදිරියේ වැටී,
උන්වහන්සේට යාච්ඤා කරමින්: ස්වාමිවූ 26
දෙවියන්වහන්ස, ඔබගේ මහත්-
කත්ත්වයෙන් ඔබ මුදාගත්තාවූ, බලවත්
හස්තයකින් මිසරයෙන් පිටතට
ගෙනාවාවූ ඔබගේ සෙනඟද උරුමයද
විනාශනොකළ මැනව. ඔබගේ 27
මෙහෙකරුවන්වූ ආබ්‍රහම්ද ඊසාක්ද
යාකොබ්ද සිහිකළ මැනව; මේ
සෙනඟගේ මුරණ්ඩුකමවත් දුෂ්ටකමවත්

පාපයවත් නොබලා වදළ මැනව.
28 බැලුවොත් ඔබ යම් දේශයකින් අප
පිටතට ගෙනාසේක්ද එහි වැසියන්
කථාකොට: ස්වාමීන්වහන්සේ ඔවුන්ට
පොරොන්දු වූණ දේශයට ඔවුන්
පමුණුවන්ට උන්වහන්සේට නොහැකිවූ
බැවින්ද උන්වහන්සේ ඔවුන්ට වෛරවූණ
බැවින්ද කාන්තාරයේදී ඔවුන් මරණ
පිණිස පිටතට ගෙනාසේකැයි කියනවා
29 ඇත. නුමුත් මොවුන් ඔබගේ මහත්
බලයෙන්ද දිගුකළ ඔබගේ බාහුවෙන්ද
ඔබ විසින් පිටතට ගෙනාවාවූ ඔබගේ
සෙනඟත් ඔබගේ උරුමයත්යයි කීවෙමි.

## කාන්තාර ගමනෙන් පාඩම්

(ඉහත හා සම්බන්ධයි.)

10 ඒ කාලයේදී ස්වාමීන්වහන්සේ මට
කථාකොට: නුඹ පළමු ඒවාට
සමානවූ ගල්ලෑලි දෙකක් කපාගන මා
වෙතට කන්දට නැඟී වරෙන්න. ලීයෙන්
2 පෙට්ටියක්ද සාද ගනින්න. එවිට නුඹ
බිඳ දැමූ පළමු ලෑලිවල තිබුණ වචන ඒ
ලෑලිවල ලියන්නෙමි. නුඹ ඒවා
3 පෙට්ටියෙහි තබාපන්නැයි කීසේක. මමද
ෂිට්ටිම් ලීවලින් පෙට්ටියක් සාද, පළමු
ඒවාට සමානවූ ගල්ලෑලි දෙකක් කපා,
ලෑලි දෙක මාගේ අතින් රැගෙන, කන්දට
4 නැඟුණෙමි. රැස්වීමේ දවසෙහි ස්වාමීන්-
වහන්සේ කන්දේදී ගින්න මැද සිට
නුඹලාට වදළ දශවාක්‍යය පළමු
ලියවිල්ල ලෙස උන්වහන්සේ ඒ ලෑලිවල
5 ලියා ඒවා මට දුන්සේක. මමද හැරී
කන්දෙන් බැස, මා සෑදූ පෙට්ටියෙහි ඒ
ලෑලි තැබීමි: ස්වාමීන්වහන්සේ මට අණ
6 කළ ලෙස ඒවා එහි තිබේ. (ඉශ්‍රායෙල්
පුත්‍රයෝ බීරොත් බෙනෙ-යාකන්හි සිට
මොසේරාට පිටත්ව ගියෝය. එහිදී
ආරොන් මැරී එහි තැන්පත් කරනු
ලැබුවේය: ඔහුගේ පුත්‍රවූ එලෙයාසර් ඔහු
වෙනුවට පූජක තනතුරේ මෙහෙය ඉෂ්ට
7 කෙළේය. එතැනින් ගුද්ගොදටත් ගුද්ගොදහි
සිට දිය ඔයවල් ඇති රටක් වන
යොත්බාතාටත් ඔව්හු පිටත්ව ගියෝය.
ඒ කාලයේදී ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් 8
පෙට්ටිය ගෙන යන පිණිසද අද දක්වා
කරන ලෙස ස්වාමීන්වහන්සේට සේවය
කිරීමට උන්වහන්සේ ඉදිරියෙහි සිටින
පිණිසද උන්වහන්සේගේ නාමයෙන්
ආශීර්වාද කරන පිණිසද ස්වාමීන්-
වහන්සේ ලෙවීගේ ගෝත්‍රය වෙන්කළ-
සේක. එබැවින් ලෙවීට තමාගේ 9
සහෝදරයන් සමග කොටසක්වත්
උරුමයක්වත් නැත: නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඔහුට කී ලෙස ස්වාමීන්-
වහන්සේම ඔහුගේ උරුමයය.) මම පළමු 10
වතාවේ මෙන් දවල් සතළිසක්ද රෑ
සතළිසක්ද කන්දේ නැවතුණෙමි. ස්වාමීන්-
වහන්සේ ඒ වතාවේදීත් මට ඇහුම්කන්දී,
නුඹ විනාශකරන්ට නොකැමැතිවූසේක.
ස්වාමීන්වහන්සේ මට කථාකොට: 11
නැගිට සෙනඟට පෙරටුව ගමන්කරපන්න:
ඔවුන්ට දෙන හැටියට මා විසින් ඔවුන්ගේ
පියවරුන්ට දිවුළ දේශයට ඔව්හු ඇතුල්ව
එය හිමිකරගනිත්වයි කීසේක.
ඉතින් ඉශ්‍රායෙල්, නුඹේ දෙවිවූ ස්වාමීන්- 12
වහන්සේට භයවීමත් උන්වහන්සේගේ
සියලු මාර්ගවල හැසිරීමත් උන්-
වහන්සේට ප්‍රේමකිරීමත් නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට නුඹේ මුළු සිතින්ද
නුඹේ මුළු ආත්මයෙන්ද සේවය කිරීමත්
නුඹේ යහපත පිණිස අද මා විසින් 13
නුඹට අණකරන ස්වාමීන්වහන්සේගේ
ආඥාද පනත්ද පැවැත්වීමත් මිස නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹෙන්
ඉල්ලන්නේ වෙන කුමක්ද? බලව. 14
ස්වර්ගය සහ ස්වර්ගවල ස්වර්ගයද
පොළොව සහ එහි ඇති සියල්ලද අයිති
නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේටය.
එතකුදුවුවත් ස්වාමීන්වහන්සේ නුඹේ 15
පියවරුන්ට ප්‍රේමකරන ලෙස ඔවුන්
කෙරෙහි ඇලුම්වී, අද තිබෙන්නාක් මෙන්
ඔවුන්ගෙන් පසු ඔවුන්ගේ වංශයවූ නුඹලා
සියලු මනුෂ්‍ය වර්ගයන්ට ඉහල්කොට

16 තෝරාගත්සේක. එබැවින් නුඹලාගේ
කුළල් තවත් තදකර නොගෙන, නුඹලාගේ
හෘදයවල චර්මාග්‍රය ඡේදනයකරගනිල්ලා.
17 මක්නිසාද නුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ දෙවිවරුන්ගේ දෙවියන්-
වහන්සේය, ස්වාමිවරුන්ගේ ස්වාමීන්-
වහන්සේය, මහත්වූ බලසම්පන්නවූ
භයංකරවූ දෙවියන්වහන්සේය, උන්-
වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම්
බලන්නේවත් අල්ලසක් ගන්නේවත් නැත.
18 උන්වහන්සේ පියා නැත්තාටද වැන්දඹුවටද
යුක්තිය ඉෂ්ට කරදෙනසේක, විදේශියාට
කෑම ඇඳීම දෙමින් ඔහුට ප්‍රේමකරන-
19 සේක. එබැවින් විදේශියාට ප්‍රේම
කරපල්ලා. මක්නිසාද නුඹලා මිසර
දේශයෙහි විදේශියෝව සිටියහුය. නුඹේ
20 දෙවිවූ ස්වාමීන්වහන්සේට භයව,
උන්වහන්සේටම සේවය කොට, උන්-
වහන්සේටම ඇලුම්ව සිට, *උන්-
වහන්සේගේ නාමයෙන් දිවුරාපන්න.
21 උන්වහන්සේම නුඹේ ප්‍රශංසා භූමියය,
උන්වහන්සේම නුඹේ ඇස්වලින් දුටු මේ
මහත්වූ භයානකවූ දේ නුඹ උදෙසා
22 කළාවූ නුඹේ දෙවියන්වහන්සේය. සැත්තෑ-
දෙනෙක්වූ නුඹේ පියවරු මිසර දේශයට
බැස ගියෝය; දැනුදු නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ අහසේ තාරකා මෙන්
ගණනින් නුඹ වැඩිකළසේක.

## කාන්තාර ගමනෙන් පාඩම්

(ඉහත හා සම්බන්ධයි.)

11 එබැවින් නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ප්‍රේමකරමින් උන්-
වහන්සේගේ නියමයන්ද පනත්ද
විනිශ්චයන්ද ආඥාද නිතර පවත්වා-
2 පන්න. මා අද දවසේ කථාකරන්නේ
නුඹලාගේ දරුවන් සමග නොවන බව
දැනගනිල්ලා. ඔවුන් වනාහි නුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ දඬුවමද
උන්වහන්සේගේ මහත්තත්ත්වයද බලවත්
3 හස්තයද දිගුකළ බාහුවද, උන්වහන්සේ
මිසරය මැදදී මිසරයේ රජවූ
ඵාරාවෝටත් ඔහුගේ මුළු දේශයටත්
දක්වූ ලකුණුද ක්‍රියාවන්ද, උන්වහන්සේ 4
මිසරයේ යුද්ධ සේනාව සහ ඔවුන්ගේ
අශ්වයන්ටත් රථවලටත් කළ දෙය එනම්
ඔවුන් නුඹලා ලුහුබැඳ එද්දී උන්වහන්සේ
රතු මුහුදේ වතුර ඔවුන් පිටට පමුණුවා
අද දවස දක්වා ස්වාමීන්වහන්සේ ඔවුන්
විනාශ කළ හැටිද, නුඹලා මෙතැනට 5
එන තෙක් උන්වහන්සේ කාන්තාරයේදී
නුඹලාට කළ දෙයද, උන්වහන්සේ 6
රූබෙන්ගේ පුත්‍රයා වන එලියාබ්ගේ
පුත්‍රයන්වූ දාතාන් සහ අබිරාම්ට කළ
දෙය එනම් පොළොව ඇගේ මුඛය ඇර
ඔවුන් සහ ඔවුන්ගේ පවුල්ද කූඩාරම්ද
ඔවුන් අනුව ගිය පණ ඇති සියල්ලන්ද
මුළු ඉශ්‍රායෙල් මධ්‍යයෙහි ගිලගත් හැටිද
දන්නේවත් දුටුවේවත් නැත. නුමුත් නුඹලා 7
ස්වාමීන්වහන්සේ කළාවූ සියලු මහත්
ක්‍රියා නුඹලාගේ ඇස්වලින් දුටුවහුය.
එබැවින් නුඹලා ශක්තිමත්ව සිට නුඹලා 8
විසින් හිමිකර ගැනීමට එතරව යන
දේශයට ඇතුල්වී ඒක හිමිකරගන්නා
පිණිසද, නුඹලාගේ පියවරුන්ටත් 9
ඔවුන්ගේ වංශයටත් දෙන ලෙස ස්වාමීන්-
වහන්සේ ඔවුන්ට දිවුළාවූ කිරි හා
මීපැණි ගලායන්නාවූ දේශය මතුපිට
නුඹලාගේ දවස් වැඩිකර ගන්නා පිණිසද
මා විසින් අද නුඹලාට අණකරන මුළු
ආඥාව පවත්වාපල්ලා. මක්නිසාද නුඹලා 10
හිමිකරගැනීමට ඇතුල්වෙන දේශය
නුඹලා පිටත්ව ආවාවූ, බීජ වැපුරූ කල
එළවළු වත්තකට මෙන් පයින් වතුර
ඉසින්ට ඕනෑකරන්නාවූ මිසර දේශය
මෙන් නොවේ. නුමුත් නුඹලා විසින් 11
හිමිකරගැනීමට එතරව යන දේශය
හෙල්වලින් හා මිටියාවත්වලින් යුක්තවූ,
අහසෙන් වැස්සෙන වතුර උරාගන්නාවූ
දේශයක්ය; නුඹේ දෙවිවූ ස්වාමීන්- 12
වහන්සේ බලා සලකන්නාවූ දේශයක්ය.
අවුරුද්ද පටන්ගැන්මේ සිට අවුරුද්ද
අන්තිමය දක්වා නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ ඇස් නිරන්තරයෙන් එය
කෙරෙහි යොමුවී තිබේ.

*244 වෙනි පිටේ සංලක්ෂණය බලනු.

13 ඉදින් නුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට නුඹලා ප්‍රේමකොට නුඹලාගේ
මුළු සිතෙනුත් මුළු ආත්මයෙනුත්
උන්වහන්සේට සේවයකරන ලෙස, මා
අද නුඹලාට අණකරන මාගේ අණට
14 නුඹලා ඇත්තටම කීකරුවුණොත්, නුඹේ
ධාන්‍ය හා මුද්‍රික එලද තෙල්ද රැස්-
කරගන්නා පිණිස මම නිසි කාලයට
නුඹලාගේ දේශයෙහි වර්ෂාව එනම් ප්‍රථම
වර්ෂාවද අන්තිම වර්ෂාවද දෙන්නෙමි.
15 නුඹ කා තෘප්තියට පැමිණෙන පිණිස
සිව්පාවුන්ට නුඹේ පිට්ටනිවල තණකොළ
16 හටගන්වා දෙන්නෙමි. නුඹලාගේ සිත්
රැවටී, නුඹලා අහක්ව ගොස්, අන්
දෙවිවරුන්ට සේවයකරමින් නමස්කාර
17 නොකරන හැටියට බලාගනිල්ලා. එසේ
කළොත් ස්වාමීන්වහන්සේගේ උදහස
නුඹලාට විරුද්ධව ඇවිළ, වැසි
නොවසින ලෙසද භූමියේ අස්වැන්න
හටනොගන්නා ලෙසද උන්වහන්සේ
අහස පියවා ඇත; නුඹලාද ස්වාමීන්-
වහන්සේ නුඹලාට දෙන්නාවූ ඒ හොඳ
දේශය මතුපිටින් ඉක්මනින් නැතිවී
18 යනවා ඇත. එබැවින් ස්වාමීන්වහන්සේ
නුඹලාගේ පියවරුන්ට දිවුළ දේශයෙහි
නුඹලාගේ දවස්ද නුඹලාගේ දරුවන්ගේ
දවස්ද පොළොවට ඉහළින්වූ අහස
පවත්නා දවස් මෙන් වැඩිවෙන පිණිස,
19 නුඹලා මාගේ මේ වචන නුඹලාගේ
සිතෙහිද ආත්මයෙහිද තබාගෙන, ඒවා
නුඹලාගේ අත්වල ලකුණක් පිණිස බැඳ,
නුඹලාගේ ඇස් අතරේ නළල් පටි
20 පිණිසද බැඳ ගනිල්ලා. නුඹ ගෙදර ඉන්න
විටත් මාර්ගයෙහි යන විටත් නුඹ
නිදගන්න විටත් නැගිටින විටත් ඒවා
ගැන කථාකරමින්, ඒවා නුඹලාගේ
21 දරුවන්ට උගන්වාපල්ලා. ඒවා නුඹේ
ගෙයි උළුවහුද නුඹේ දොරවල්ද පිට
22 ලියාපන්න. මක්නිසාද මා නුඹලාට
අණකරන මේ මුළු ආඥාව රක්ෂා
කරන ලෙස නුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට නුඹලා ප්‍රේමකොට
උන්වහන්සේගේ සියලු මාර්ගවල
හැසිරෙමින් උන්වහන්සේට ඇලුම්ව සිටින
ලෙස නුඹලා ඇත්තටම එය පවත්වනවා
නම්, ස්වාමීන්වහන්සේ මේ සියලු ජාතීන් 23
නුඹලා ඉදිරියෙන් පන්නාදමනවා ඇත,
නුඹලාද නුඹලාට වඩා මහත්වූ බලවත්වූ
ජාතීන් අත්පත්කරගන්නවා ඇත.
නුඹලාගේ පා තබන සියලු තැන් 24
නුඹලාට වන්නේය. නුඹලාගේ සීමාව
කාන්තාරය හා ලෙබනොන් සිට ප්‍රාත්
ගඟ පටන් පශ්චිම මුහුද දක්වාම
වන්නේය. නුඹලාට විරුද්ධව සිටින්ට 25
කිසිවෙකුට නොහැකි වන්නේය.
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
නුඹලාට කී හැටියට නුඹලා නිසා
ඇතිවන්නාවූ භයද තැතිගැන්මද
උන්වහන්සේ නුඹලා පය තබන මුළු
දේශය පිට තබනවා ඇත.

මම අද නුඹලා ඉදිරියෙහි ආශීර්වා- 26
දයක්ද ශාපයක්ද තබමි; ආශීර්වාදය 27
වන්නේ මා අද නුඹලාට අණකරන
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ
ආඥාවලට නුඹලා කීකරුවුණොත්ය.
ශාපය වන්නේ නුඹලාගේ දෙවිවූ 28
ස්වාමීන්වහන්සේගේ ආඥාවලට කීකරු
නොවී, නුඹලා නාඳුනන අන් දෙවිවරුන්
අනුව යමින්, මා විසින් අද නුඹලාට
අණකරන මාර්ගයෙන් අහක්ව
ගියොත්ය.

තවද නුඹ හිමිකරගන්ට ඇතුල්වෙන 29
දේශයට නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
නුඹ පැමිණෙවූ කල්හි ගෙරිසීම් කන්ද
පිට ආශීර්වාදයද ඒබාල් කන්ද පිට
ශාපයද *තබාපන්න. ඒවා යොර්දනෙන් 30
එතර බස්නාහිර පාරට එහායින් අරබා
සමභූමියෙහි වාසය කරන කානානි-
වරුන්ගේ රටෙහි ගිල්ගාල් ඉදිරිපිටවූ
මොරේගේ ආලොන් ගස් ළඟ තිබෙනවා
නොවේද? නුඹලාගේ දෙවිවූ ස්වාමීන්- 31
වහන්සේ නුඹලාට දෙන දේශයට
ඇතුල්වී එය හිමිකරගන්න පිණිස නුඹලා
යොර්දනෙන් එතරට යන්ට සිටිනහුය,
නුඹලා ඒක හිමිකරගෙන එහි වාසය
කරන්නහුය. මා විසින් අද නුඹලා 32
ඉදිරියෙහි තබන සියලු පනත්ද
විනිශ්චයන්ද රක්ෂාකරන්ට බලාගනිල්ලා.

*නොහොත්, ප්‍රකාශකරපන්න.

## දේශයේදී ආශීර්වාද ලැබීමට ඇති කාරණා

12 නුඹේ පියවරුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට හිමි-
කරගැනීමට දෙන දේශයේදී නුඹලා
භූමිය මතුපිට ජීවත්වෙන සියලුම
දවස්වල නුඹලා විසින් රක්ෂාකරන
පිණිස බලාගන්ට ඕනෑවූ පනත්ද
2 විනිශ්චයවල්ද මේවාය. නුඹලා පන්නා
දමන ජාතීන් විසින් උස් කඳු පිටද
හෙල් පිටද සියලු අමු ගස් යටද
තමුන්ගේ දෙවිවරුන්ට සේවය කළාවූ
3 සියලු ස්ථාන විනාශකොට, ඔවුන්ගේ
පූජාසන කඩාදමා, ඔවුන්ගේ රූපස්තම්භ
බිඳහෙළා, ඔවුන්ගේ අෂේරා කණු
ගින්නෙන් දවා, ඔවුන්ගේ දෙවිවරුන්ගේ
රූප කපාදමා, ඒවායේ නාම ඒ ඒ
ස්ථානවලින් නැතිකර දමාපල්ලා.
4 නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ගැන
5 නුඹලා එයාකාර නොකර, නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තමන් නාමය
තබන පිණිස නුඹලාගේ සියලු ගෝත්‍ර
අතරෙන් තෝරාගන්න ස්ථානය වන
උන්වහන්සේගේ වාසස්ථානයටම ළඟාවී
6 එහි පැමිණියල්ලා. නුඹලාගේ දවන
පූජාද යාග පූජාද දසයෙන් කොටස්ද
නුඹලාගේ අතෙහි එසවීම් පූජාවද
නුඹලාගේ බාරද නුඹලාගේ ස්වේච්ඡා
පූජාද නුඹලාගේ ගවයන්ගෙත් එළු
බැටළුවන්ගෙත් කුලුඳුලන්ද එහි ගෙනවුත්,
7 නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි කා, නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** නුඹට ආශීර්වාදකළ නිසා,
නුඹලා අත තබන සියල්ල ගැන නුඹලාද
නුඹලාගේ ගෙයි වැසියෝද ප්‍රීතිවෙයල්ලා.
8 මෙහි අප විසින් මේ දවසේ එකිනෙකා
තම තමාට හරිව පෙනෙන කොයි දේත්
කරන්නාක් මෙන් නුඹලා එහිදී නොකළ
9 යුතුය. මක්නිසාද නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට දෙන නියම
වාසස්ථානයටත් උරුමයටත් නුඹලා
10 තවම පැමුණුණේ නැත. එහෙත් නුඹලා

යොර්දනෙන් එතරට ගොස් නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹලාට උරුම
කරදෙන දේශයෙහි වසන කල්හිද,
නුඹලා සුරක්ෂිතව වාසයකරන ලෙස
වටකර සිටින නුඹලාගේ සියලු
සතුරන්ගෙන් උන්වහන්සේ නුඹලාට
විශ්‍රාමය දුන් කල්හිද, නුඹලාගේ දෙවිවූ 11
**ස්වාමීන්වහන්සේ** තමන්ගේ නාමය
පිහිටුවන්ට තෝරාගන්නාවූ ස්ථානයට
මා විසින් නුඹලාට අණකරන නුඹලාගේ
දවන පූජාද යාග පූජාද දසයෙන්
කොටස්ද නුඹලාගේ අතෙහි එසවීම්
පූජාවද නුඹලා කැමැත්තෙන්ම වෙන්නාවූ
නුඹලාගේ සියලු විශිෂ්ට බාරද ගෙනවුත්,
නුඹලාද නුඹලාගේ පුත්‍රයෝද දූවරුද 12
වැඩකාරයෝද වැඩකාරියෝද නුඹලාගේ
දොරටු ඇතුළත සිටින්නාවූ, නුඹලා
සමග කොටසක්වත් උරුමයක්වත්
නොලැබූවාවූ ලෙවීයයාද නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
ප්‍රීතිවෙයල්ලා. නුඹ දකින සියලු තැන්හිම 13
නුඹේ දවන පූජා නොපුදන්ට බලා
ගනින්න. නුමුත් නුඹේ ගෝත්‍රයන්ගෙන් 14
එකක් තුළවූ **ස්වාමීන්වහන්සේ** තෝරා-
ගන්නාවූ ස්ථානයෙහිම නුඹේ දවන පූජා
පුද මා විසින් නුඹට අණ කරන
සියල්ලත් එහිම කරපන්න. එසේවී 15
නුමුත් නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹට දෙන ආශීර්වාදයේ හැටියට
නුඹේ සියලු දොරටු ඇතුළේ නුඹේ
සිතේ මුළු ආශාවේ හැටියට නුඹට
සතුන් මරා මස් කන්ට පුළුවන. මුව-
මස්ද ගෝනමස්ද මෙන් අපවිත්‍ර අයටත්
පවිත්‍ර අයටත් ඒවා කන්ට පුළුවන. නුමුත් 16
ලේ නොකා එය වතුර මෙන් භූමිය පිට
වත්කරපන්න. නුඹේ ධාන්‍යයෙන්ද මුද්‍රික 17
රසයෙන්ද, තෙලින්ද දෙන දසයෙන්
කොටසවත් නුඹේ ගවයන්ගේද එළු
බැටළුවන්ගේද කුලුඳුලන්වත් නුඹ
වෙන්නාවූ නුඹේ කිසි බාර පූජාවක්වත්
නුඹේ ස්වේච්ඡා පූජාවල්වත් නුඹේ අතේ
එසවීම් පූජාවවත් නුඹේ දොරටු ඇතුළතදී
නොකෑ යුතුය. නුමුත් නුඹේ දෙවිවූ 18

**ස්වාමීන්වහන්සේ** තෝරාගන්නාවූ
ස්ථානයේදී, නුඹද නුඹේ පුත්‍රයාද නුඹේ
දූවද නුඹේ දාසයාද නුඹේ දාසීද නුඹේ
දොරටු ඇතුළත වසන ලෙවීයයාද නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඒවා
කා, නුඹේ අත තබන සියල්ල ගැන
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
19 ප්‍රීතිවෙයල්ලා. නුඹේ දේශය මතුපිට නුඹ
ජීවත්වෙන සියලුම දවස්වල ලෙවීයයා
අත්නොහරින්ට බලාගනින්න.
20 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට
පොරොන්දුවුණු ලෙස නුඹේ සීමාව
විශාලකළ කල්හි මස් කන්ට නුඹේ සිත
ආශාවෙන නිසා: මම මස් කන්නෙමියි
නුඹ කියන විට නුඹේ සිතේ මුළු ආශාව
21 ලෙස මස් කන්ට පුළුවන. නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** තමන්ගේ නාමය
තබන පිණිස තෝරාගන්න ස්ථානය
නුඹට දුර වැඩිනම් **ස්වාමීන්වහන්සේ**
නුඹට දුන් ගවයන්ගෙන්ද එළු
බැටළුවන්ගෙන්ද කොයි එකෙක් නුමුත්
මා නුඹට අණකළ ලෙස මරා, නුඹේ
සිතේ මුළු ආශාව ලෙස නුඹේ දොරටු
22 ඇතුළතදී කාපන්න. මුව මස්ද ගෝන
මස්ද මෙන් නුඹ ඒවා කාපන්න. අපවිත්‍ර
අයටද පවිත්‍ර අයටද එක සමානව ඒවා
23 කන්ට පුළුවන. එහෙත් ලේ නොකන්ට
ප්‍රවේසම් වෙයන්න. මක්නිසාද ලේ
ප්‍රාණයය; එබැවින් නුඹ මාංසය සමග
24 ප්‍රාණය නොකෑ යුතුය. නුඹ එය නොකා
වතුර මෙන් එය භූමිය පිට වත්කළ
25 යුතුය. **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
හරිවූ දේ කරන කල්හි නුඹටත් නුඹට
පසු නුඹේ දරුවන්ටත් ශුභ සිද්ධවන
පිණිස නුඹ එය නොකා සිටපන්න.
26 නුඹට තිබෙන නුඹේ ශුද්ධ දේවල්ද නුඹේ
බාරවල්ද රැගෙන **ස්වාමීන්වහන්සේ**
27 තෝරාගන්නාවූ ස්ථානයට පැමිණ, නුඹේ
දවන පූජා එනම් මාංසයත් රුධිරයත්
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
පූජාසනය පිට ඔප්පුකරපන්න. නුඹේ
යාග පූජාවල ලේ නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** පූජාසනය පිට
වත්කරනු ලැබේ, මාංසය නුඹට කන්නට
පුළුවන. නුඹේ දෙවිවූ **ස්වාමීන්-** 28
**වහන්සේගේ** ඇස් හමුයෙහි යහපත්වූ
හරිවූ දේ කරන කල්හි නුඹටත් නුඹට
පසු නුඹේ දරුවන්ටත් සදාකාලේටම ශුභ
සිද්ධවන පිණිස මා නුඹට අණකරන
මේ සියලු වචන අසන්ට බලාගනින්න.
නුඹ විසින් අත්පත්කරගන්ට යන ජාතීන් 29
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹ
ඉදිරියෙන් සිඳදමූ කල්හි, නුඹ ඔවුන්
පන්නාදමා ඔවුන්ගේ දේශයෙහි වාසය
කරන විට, ඔවුන් නුඹ ඉදිරියෙන් 30
විනාශකරනු ලැබූ පසු, නුඹ ඔවුන් අනුව
යාමට අසුනොවෙන හැටියටත්: මේ
ජාතීන් තමුන්ගේ දෙවිවරුන්ට සේවය
කරන්නේ කෙලෙසද, මමත් එලෙස
කරන්නෙමියි කියමින් ඔවුන්ගේ
දෙවිවරුන් ගැන විභාග නොකරන
හැටියටත් බලාගනින්න. නුඹේ දෙවිවූ 31
**ස්වාමීන්වහන්සේට** නුඹ විසින් එයාකාර
නොකළ යුතුය. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** ද්වේෂකරන්නාවූ පිළිකුල්-
කරන්නාවූ සියලු දේවල් ඔව්හු තමුන්ගේ
දෙවිවරුන් සඳහා කළෝය; ඔවුන්ගේ
පුත්‍රයන්ද ඔවුන්ගේ දූවරුන්ද පවා
ඔවුන්ගේ දෙවිවරුන්ට ගින්නේ දවා
පූජාකරති.
මා විසින් නුඹලාට අණකරන සියලුම 32
දේ කරන්නට බලාගනිල්ලා. නුඹ ඊට
කිසිවක් එකතු නොකළ යුතුය, එයින්
කිසිවක් අඩු නොකළ යුතුය.

## රූප වන්දනාවට වැටීම ගැන අවවාද

13 නුඹලා අතරෙහි අනාගත-
වක්තෘ කෙනෙක්වත් ස්වප්න-
කාරයෙක්වත් නැඟිට, නුඹ දැනනොගත්: 2
අන් දෙවිවරුන් අනුව අපි ගොස් ඔවුන්ට
සේවය කරමුයයි කියමින්, ලකුණක් හෝ

ආශ්චර්යයක් තුඹට නියම කළ කල්හි,
ඔහු තුඹට කී ලකුණත් ආශ්චර්යයත්
3 සිද්ධවුණත්, ඒ අනාගතවක්තෘගේ
වචනවලටවත් ඒ ස්වප්නකාරයාටවත්
ඇහුම්කන්නොදෙන්න. මක්නිසාද
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
තුඹලාගේ මුළු සිතෙන්ද මුළු
ආත්මයෙන්ද තුඹලා ප්‍රේමකරනවාදැයි
දැනගන්ට තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** තුඹලා සෝදිසිකරනසේක.
4 තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
අනුව ගොස්, උන්වහන්සේට භයව,
උන්වහන්සේගේ ආඥා රක්ෂාකොට,
උන්වහන්සේගේ හඬට කීකරුව,
උන්වහන්සේට සේවයකර, උන්වහන්සේට
5 ඇලුම්ව සිටපල්ලා. ඒ අනාගතවක්තෘ
හෝ ස්වප්නකාරයා මරනු ලැබිය යුතුය;
මක්නිසාද යන ලෙස තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** තුඹට අණකළ
මාර්ගයෙන් තුඹ අහක් කිරීමට, තුඹලා
මිසර දේශයෙන් පිටතට ගෙනාවාවූ,
වාල්කමේ ගෙයින් තුඹලා මුදාගත්තාවූ
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගෙන්**
වෙන් වෙන්ටය කියා ඔහු කථාකළ
නිසාය. මෙසේ තුඹලා අතරෙන් ඒ නපුර
පහකරපල්ලා.
6 තුඹලා අවට තුඹට කිට්ටුව හෝ
තුඹෙන් ඈත්ව හෝ පොළොවේ එක්
කොනක සිට අනික් කොන දක්වා සිටින
7 මනුෂ්‍ය වර්ගයන්ගේ දෙවිවරුන්වූ, තුඹවත්
තුඹේ පියවරුන්වත් දැන නොගත්: අන්
දෙවිවරුන්ට අපි ගොස් සේවය කරමු-
යයි තුඹේ මවුගේ පුත්‍රවූ තුඹේ
සහෝදරයාවත් තුඹේ පුත්‍රයාවත් තුඹේ
දුවවත් තුඹේ ළයෙහි හොත් භාර්යාවවත්
තුඹේම ප්‍රාණය වැනිවූ මිත්‍රයාවත් තුඹට
රහසින් කියා තුඹ පොළඹවන්ට
8 උත්සාහකරන්නේවීනම්, තුඹ ඔහුට
එකඟනොවෙන්න, ඔහුට ඇහුම්කන්
නොදෙන්න; තුඹේ ඇස ඔහුට දයා
නොකෙරේවා, ඔහු ඉතුරු කරන්නේවත්
9 සඟවන්නේවත් නැතුව, තුඹ විසින් ඔහු
මැරිය යුතුමය; ඔහු මරන පිණිස
පළමුකොට තුඹේ අතද පසුව මුළු
සෙනඟගේ අත්ද ඔහු පිට තබනු ලැබේවා.
වහල්කමේ ගෙයවූ මිසර දේශයෙන් තුඹ 10
පිටතට ගෙනාවාවූ තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** කෙරෙන් තුඹ
අහක්කරන්ට සෙවූ බැවින්, ඔහු මැරෙන
පිණිස ඔහුට ගල්ගසන්ට ඕනෑය. සියලු 11
ඉශ්‍රායෙල්වරු ඒ අසා භයවී එබඳු
දුෂ්ටකමක් තුඹලා අතරෙහි තවත්
නොකර සිටින්නාහුය.
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹ 12
වාසය කරන්ට දෙන නුවරකදී සමහර
අධමයන් තුඹලා අතරෙන් නික්ම ගොස්:
තුඹලා දැන නොගත්තාවූ අන් දෙවි- 13
වරුන්ට සේවයකරන්ට යමුයයි කියමින්
තමුන්ගේ නුවරවාසීන් අහක්කර
ගන්නාලදැයි කියනවා තුඹ ඇසුවොත්,
තුඹ හොඳකාර සොයා විභාගකර අසා- 14
පන්න; එවිට එබඳු පිළිකුල් දෙයක් තුඹලා
අතරෙහි කරනලද බව සැබෑවක්නම්,
කාරණය සත්තකනම්, ඒ නුවරවාසීන්ට 15
කඩුමුවහතින් පහරදී එයද එහි ඇති
සියල්ලද ගවයන්ද කඩුමුවහතින්
සහමුලින් විනාශකරපන්න. එහි තිබෙන 16
සම්පත් සියල්ලම වීථිය මැදට රැස්කර,
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** උදෙසා
නුවරද එහි තිබෙන සම්පත් සියල්ලද
ගින්නෙන් පුලුස්සාදමාපන්න. ඒක නැවත
ගොඩනගනු නොලැබ සදාකල්ම ගොඩක්
ව තිබේවා. විනාශයට කැපකරනලද 17
දේවලින් කිසිවක් තුඹේ අතෙහි
නොඇලේවා. මෙසේ මා විසින් අද
තුඹට අණකරන තුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේගේ** සියලු ආඥා තුඹ පවත්-
වමින් උන්වහන්සේට හරිව පෙනෙන
දේ කරන පිණිස, තුඹේ දෙවිවූ 18
**ස්වාමීන්වහන්සේගේ** හඬට ඇහුම්-
කන්දෙන කල්හි, **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ තද උදහසෙන් හැරී තුඹට
කරුණාව පෙන්වා, තුඹට අනුකම්පාකර
තුඹේ පියවරුන්ට දිවුළ ලෙස තුඹ
වැඩිකරනවා ඇත.

## ආහාර සම්බන්ධ නීති

14 තුඹලා තුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ දරුවෝය.
මළ කෙනෙකු නිසා ශරීරය කපා-
ගැනීමවත් තුඹලාගේ ඇස්බැම අතරේ
2 බූගෑමවත් නොකරල්ලා. මක්නිසාද තුඹ
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ශුද්ධ
සෙනඟක්ය, ස්වාමීන්වහන්සේද
පොළෝතලයෙහි වසන සියලු මනුෂ්‍ය
වර්ගයන් අතරෙන් තමන් සන්තක
සෙනඟක් වන පිණිස තුඹ තෝරා-
ගත්සේක.
3 කිසි පිළිකුල් දෙයක් නොකන්න.
4 තුඹලාට කන්ට පුළුවන්වූ මෘගයෝනම්:
5 ගවයාද බැටළුවාද එළුවාද, ගෝනාද
තිත්මුවාද වැලිමුවාද වල්එළුවාද
ඕලුමුවාද කුරංගයාද වාතමෘගයාද යන
6 මේ සත්තුය. මෘගයන් අතරෙන් කුරය
දෙකට බෙදී වෙන්ව තිබෙන්නාවූ,
වමාරා කන්නාවූ සියලු මෘගයන්
7 තුඹලාට කන්ට පුළුවන. එසේ වී නුමුත්
වමාරා කනවුන්ගෙන්ද කුරය බෙදී
වෙන්ව තිබෙනවුන්ගෙන්ද තුඹලා නොකෑ
යුතු සත්තු නම්: ඔටුවාත් හාවාත්
බෙන්හාවාත්ය; උන් වමාරා කන නුමුත්
උන්ගේ කුරය බෙදී නැති නිසා තුඹලාට
8 අපවිත්‍රය. ඌරාගේ කුරය බෙදී තිබෙන
නුමුත් ඌ වමාරා නොකන නිසා
තුඹලාට අපවිත්‍රය. තුඹලා උන්ගේ මස්
නොකෑ යුතුය, උන්ගේ මළකුණු ස්පර්ශ
නොකළ යුතුය.
9 ජලයෙහි ඉන්න සියල්ලන් අතරෙන්
තුඹලාට කන්ට පුළුවන් මේ සත්තුය,
එනම් වරල් සහ කොරපොතු ඇති
10 සියල්ලන් කන්ට පුළුවන. වරල් සහ
කොරපොතු නැති කිසි සතෙකු තුඹලා
විසින් නොකෑ යුතුය; ඌ තුඹලාට
අපවිත්‍රය.
11 සියලු පවිත්‍ර පක්ෂීන් තුඹලාට කන්ට
12 පුළුවන. එහෙත් තුඹලා කන්ට යුතු
නැති පක්ෂීහු නම්: රාජාලියාත් මහගිජු-
13 ලිහිණියාත් මුහුදු උකුස්සාත්ය; ගුරු-
ළාත් කුරුළුගොයාත් ඒ ඒ වර්ගයේ
14 උකුස්සෝත්ය; ඒ ඒ වර්ගයේ සියලු
කපුටුවෝය; පැස්බරාත් රෑ උකුස්සාත් 15
මුහුදු ලිහිණියාත් ඒ ඒ වර්ගයේ
උකුස්සෝත්ය; බස්සාත් බකමූණාත් 16
උලමාත්; කරවැල් කොකාත් ගිජු- 17
ලිහිණියාත් දියකාවාත්ය; මානකොකාත් 18
ඒ ඒ වර්ගයේ කොක්කුත් හූපූවාත්
වවුලාත්ය. පියාපත් ඇත්තාවූ බඩගායන 19
සියලු සත්තු තුඹලාට අපවිත්‍රය. උන්
නොකෑයුතුය. පවිත්‍රවූ සියලු පක්ෂීන් 20
තුඹලාට කන්ට පුළුවන.
ඉබේ මැරුණු කිසි සතෙකුගේ මාංස 21
නොකෑ යුතුය. ඒවා තුඹේ දොරටු ඇතුළත
සිටින්නාවූ විදේශියාට කන්ට දෙන්ට
හෝ පරදේශියෙකුට විකුණන්ට හෝ
තුඹට පුළුවන. මක්නිසාද තුඹ තුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට ශුද්ධවූ
සෙනඟක්ය. එළුපැටවෙකු උගේ මවුගේ
කිරෙන් නොතැම්බිය යුතුය.
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට 22
නිතරම භයවෙන්ට ඉගෙනගන්න පිණිස
අවුරුද්දෙන් අවුරුද්ද කෙතේ තුඹේ
බීජවලින් අටගන්න සියලු අස්වැන්නෙන්
දසයෙන් කොටසක් වෙන්කර, තුඹේ 23
ධාන්‍යවලිනුත් මුද්‍රික රසයෙනුත්
තෙල්වලිනුත් දසයෙන් කොටසද තුඹේ
ගවයන්ගෙන් එළු බැටළුවන්ගෙන්
කුලුඳුලන්ද තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ස්වකීය නාමය වාසයකරවන්ට
තෝරාගන්න ස්ථානයේදී උන්වහන්සේ
ඉදිරියෙහි කාපන්න. තුඹේ දෙවිවූ 24
ස්වාමීන්වහන්සේ තුඹට ආශීර්වාදකරන
කල්හි උන්වහන්සේ ස්වකීය නාමය
තබන්ට තෝරාගන්න ස්ථානය තුඹට
දුර නිසා ඒවා ගෙනයන්ට බැරි ලෙස ඒ
ගමන තුඹට දුර වැඩි නම්, ඒවා මිලේට 25
දී, ඒ මුදල තුඹේ අතේ බැඳ තබාගෙන,
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තෝරා-
ගන්නා තැනට ගොස් තුඹේ හිතට 26
රුචිවන කොයි දෙයකට නුමුත් එනම්
ගවයන්ට හෝ බැටළුවන්ට හෝ
මුද්‍රිකපානයට හෝ මද්‍යපානයට හෝ
තුඹේ සිත තුඹට කියන කොයි දෙයකට
නුමුත් ඒ මුදල දී ඒවා රැගෙන,

නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
නුඹද නුඹේ ගෙයි වැසියෝද කා
27 ප්‍රීතිවෙයල්ලා. නුඹේ දොරටු ඇතුළත සිටින
ලෙවීයයාත් අත්නොහරින්න; මක්නිසාද
ඔහුට නුඹ සමග කොටසක්වත්
උරුමයක්වත් නැත.
28 හැම තුන් අවුරුදු කෙළවරදී ඒ
අවුරුද්දේ නුඹේ අස්වැන්නෙන් දසයෙන්
කොටස් සියල්ලම පිටතට ගෙනවුත්
29 නුඹේ දොරටු ඇතුළෙහි තබාපන්න. එවිට
ලෙවීයයාට නුඹ සමග කොටසක්වත්
උරුමයක්වත් නැති බැවින් ඔහුත් නුඹේ
දොරටු ඇතුළත සිටින විදේශියාත් පියා
නැත්තාත් වැන්දඹුවත් අවුත් කා
තෘප්තියට පැමිණෙත්වා; මෙසේ නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹ කරන
නුඹේ අතේ ඇති සියලු වැඩපලවලදී
නුඹට ආශීර්වාදකරනවා ඇත.

## නිදහස් අවුරුද්ද

15 හැම අවුරුදු සතක කෙළවරදී
නුඹ විසින් මුදලීමක් කළ යුතුය.
2 මුදලීමේ පිළිවෙළ මෙසේය: තමාගේ
අසල්වාසියාට ණයට දුන් කවුරු
නුමුත් ණයට දෙනලද්ද තමාගේ
අසල්වාසියාගෙන්වත් සහෝදරයා-
ගෙන්වත් අය නොකර මිදීමක් දෙන්ට
ඕනෑය; මක්නිසාද ස්වාමීන්වහන්සේ
දෙන මිදීම ප්‍රකාශකරනලද්දේය.
3 පරදේශියෙකුගෙන් නම් ඒක අයකරන්ට
නුඹට පුළුවන. එහෙත් නුඹට අයිති යමක්
නුඹේ සහෝදරයා ළඟ ඇද්ද, නුඹ එය
4 නිදහස්කර දීපන්න. කොයි හැටි වුවත්
නුඹ වෙත දිළින්දෙක් නොසිටිය යුතුය;
මක්නිසාද මා විසින් අද නුඹට
අණකරන මේ මුළු ආඥාව රක්ෂාකරන්ට
බලාගන්න හැටියට නුඹ නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ හඬට මනාකොට
5 ඇහුම්කන්දෙන්නෙහිනම්, නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ නුඹට හිමිකර ගැනීමට
උරුමයක් කොට දෙන දේශයේදී
ස්වාමීන්වහන්සේ නුඹට සැබවින්
6 ආශීර්වාද කරනවා ඇත; එසේය, නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹට
පොරොන්දුවූ ලෙස නුඹට ආශීර්වාද
කරන නිසා, නුඹ බොහෝ ජාතීන්ට
ණය දෙන්නෙහිය, නුමුත් ණය නො-
ගන්නෙහිය; නුඹ බොහෝ ජාතීන්
කෙරෙහි අධිපතිකම් කරන්නෙහිය, නුමුත්
ඔව්හු නුඹ කෙරෙහි අධිපතිකම් නො-
කරන්නෝය.
නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹට 7
දෙන දේශයෙහි නුඹේ යම් නුවරක් තුළ
නුඹේ සහෝදරයන්ගෙන් යම් දිළින්දෙක්
නුඹ වෙත සිටින්නේ නම්, නුඹ නුඹේ
හෘදය දැඩිකරගන්නේවත් නුඹේ දිළිඳු
සහෝදරයා වෙතින් නුඹේ අත
පියාගන්නේවත් නැතුව, නුඹේ අත ඔහුට 8
විදහා, ඔහුගේ හිඟකමට සෑහෙන පමණ
ඇත්තෙන්ම ඔහුට ණයට දෙන්ට ඕනෑය.
නුඹ මිදීමේ අවුරුද්දවූ සත්වෙනි අවුරුද්ද 9
ළඟයයි කියමින් නුඹේ සිතේ දුෂ්ට
කල්පනාවක් හටගෙන, නුඹේ දිළිඳු
සහෝදරයාට නොදෙන ලෙස නුඹේ
බැල්ම ඔහු කෙරෙහි අප්‍රසන්න වන බැවින්
ඔහු නුඹට විරුද්ධව ස්වාමීන්වහන්සේට
මොරනොගසන හැටියටත්, එසේ නුඹ
පිටට පාපය නොපැමිණෙන හැටියටත්
බලාගනින්න. නුඹ ඔහුට දෙන්ටම 10
ඕනෑය, නුඹ ඔහුට දෙන විට නුඹේ
සිතේ කනගාටුවක් නොවේවා. මක්නිසාද
මේ කාරණය නිසා නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ නුඹේ සියලු වැඩවලදීත්
නුඹේ අත තබන සියල්ලේදීත් නුඹට
ආශීර්වාදකරනවා ඇත. දිළින්දෝ 11
කවදත් දේශයෙහි ඉන්නෝමය. එබැවින්
නුඹේ දේශයෙහිදී නුඹේ සහෝදරයාවූ
නුඹේ දුප්පතාටත් නුඹේ දිළින්දාටත් නුඹේ
අත සැබවින් විදහාපන්නැයි නුඹට
අණකරමි.
නුඹේ සහෝදරවූ හෙබ්‍රෙව් 12
පුරුෂයෙක්වත් හෙබ්‍රෙව් ස්ත්‍රියෙක්වත්
නුඹට විකුණනලදුව සාවුරුද්දක් නුඹට
මෙහෙකළොත්, සත්වෙනි වර්ෂයෙහි ඔහු
නුඹ වෙතින් නිදහස්කර හැරපන්න.
ඔහු නුඹ වෙතින් නිදහස්කර හරින 13
කල්හි ඔහු සිස් අතින් නැර, නුඹේ එළු 14

බැටළු රැළෙන්ද තුඹේ පාවරෙන්ද තුඹේ
මිදි පැසෙන්ද තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ තුඹට ආශීර්වාදකළ හැටියට
15 ඔහුට නොමසුරු ලෙස දිය යුතුය. තුඹ
මිසර දේශයෙහි වහලෙක්ව සිටි බවද
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තුඹ
මිදූ බවද සිහිකරපන්න. එබැවින් මම
16 අද මේ දෙය තුඹට අණකරමි. එහෙත්
ඔහු තුඹ සමග හොඳින් සිට තුඹටත්
තුඹේ පවුලටත් ප්‍රේමකරන බැවින්: මම
තුඹෙන් අහක්වී නොයන්නෙමියි
17 කියන්නේ නම්, විදින කටුවක් අරගන
ඔහුගේ කන දොරට තදකර තබා
විදපන්න, මෙසේ ඔහු හැම කල්හිම
තුඹේ දසයා වන්නේය. තුඹේ දාසීටත්
18 එසේම කරපන්න. තුඹ කෙරෙන් ඔහු
නිදහස් කර හැරීම තුඹට අමාරු
කාරණාවක් ව නොපෙනේවා; මක්නිසාද
ඔහු සාවුරුද්දක් කුලීකාරයෙකුගේ
වැඩෙන් දෙපංගුවකට වඩා තුඹට
වැඩකෙළේය. තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේද තුඹ කරන සියල්ලේදී තුඹට
ආශීර්වාදකරනවා ඇත.
19 තුඹේ ගවයන්ගෙන්ද එළු බැටළුවන්-
ගෙන්ද උපදින සියලු කුලුඳුල් පිරිමි සතුන්
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
කැපකරපන්න. තුඹේ ගවයන්ගේ
කුලුඳුලාගෙන් වැඩනොගනින්න, තුඹේ
බැටළුවන්ගේ කුලුඳුලාගෙන් ලෝමද
20 නොකපන්න. ස්වාමීන්වහන්සේ තෝරා-
ගන්න ස්ථානයේදී අවුරුද්දෙන් අවුරුද්ද
තුඹ සහ තුඹේ ගෙයි වැසියෝ තුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි උගේ
21 මස් කාපල්ලා. එහෙත් උගේ යම් කැලලක්
ඇත්නම්, කොරකමක් හෝ අන්ධකමක්
හෝ වෙන යම් නරක කැලලක් ඇත්තේවී
නම්, ඌ තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
22 පූජා නොකරන්න. ඌද තුඹේ දොරටු
ඇතුළතදී කාපන්න. මුව මස්ද ගෝන
මස්ද මෙන් අපවිත්‍ර අයටත් පවිත්‍ර
අයටත් එකාකාරයෙන් එය කන්ට
23 පුළුවන. එහෙත් උගේ ලේ නොකා එය
වතුර මෙන් පොළොව පිට වත්කරපන්න.

## අවුරුදු මංගල්‍ය තුන

16 ආබීබ් මාසය සිහිකර තුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට පාස්කුව
පවත්වාපන්න. මක්නිසාද ආබීබ්
මාසයේදී තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
රාත්‍රියෙහි තුඹ මිසරයෙන් පිටතට
ගෙනාසේක. එබැවින් ස්වාමීන්වහන්සේ 2
ස්වකීය නාමය වාසයකරවන්ට
තෝරාගන්න ස්ථානයේදී එළු බැටළුවන්
හා ගවයන්ගෙන් තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට පාස්කුව පූජාකරපන්න.
තුඹ මිසර දේශයෙන් පිටතට ආ දවස 3
තුඹේ ජීවිතයේ සියලු දවස්හි සිහිකරන
පිණිස, ඒ සමග මුහුන් දමූ රොටි නොකා,
දුක් රොටි වන මුහුන් නොදමූ ඒවා
සත් දවසක් ඒ සමග කාපන්න; මක්-
නිසාද තුඹ ඉක්මනින් මිසර දේශයෙන්
ආවෙහිය. සත් දවසක් තුඹේ සියලු 4
සීමා ඇතුළත තුඹ ළඟ මුහුන් නො-
තිබේවා; තුඹ පළමුවෙනිද සවස
පූජාකරන මාංසවලින් කිසිවක් උදය
දක්වා ඉතිරිව නොතිබේවා. තුඹේ දෙවිවූ 5
ස්වාමීන්වහන්සේ තුඹට දෙන්නාවූ තුඹේ
කොයි නුවරකදී නුමුත් පාස්කුව
පූජානොකොට, තුඹේ දෙවිවූ ස්වාමීන්- 6
වහන්සේ තමන්ගේ නාමය වාසය-
කරවන්ට තෝරාගන්න ස්ථානයේදී,
සවස ඉර බසින විට, එනම් මිසරයෙන්
තුඹ පිටතට ආ කාලයේ, තුඹ පාස්කුව
පූජාකරපන්න. තවද තුඹේ දෙවිවූ 7
ස්වාමීන්වහන්සේ තෝරාගන්න ස්ථාන-
යේදී ඒක පුලුස්සා කා, උදය තුඹේ
කූඩාරම්වලට හැරී පලයන්න. සදවසක් 8
මුහුන් නොදමූ රොටි කාපන්න.
සත්වෙනිද තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ගරුමය රැස්වීමක් වන්නේය;
ඒ දවසේදී කිසි වැඩක් නොකරන්න.
සති සතක් තුඹට ගණන්කරගනින්න. 9
දැකැත්ත ගොයමට යොදන තැන් පටන්
ඒ සති සත ගණන්කරන්ට පටන්ගනින්න.
එවිට තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ 10
තුඹට ආශීර්වාදකරන හැටියට තුඹේ

අතින් සිය කැමැත්තෙන් දෙන්නාවූ පූජා
පඬුරකින් සති මංගල්‍යය තුඹේ දෙවිවූ
11 **ස්වාමීන්වහන්සේට** පවත්වාපන්න. තුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ස්වකීය නාමය
වාසයකරවන්ට තෝරාගන්න ස්ථානයේදී
තුඹද තුඹේ පුත්‍රයාද තුඹේ දූවද තුඹේ
වැඩකරුවාද තුඹේ වැඩකාරීද තුඹේ
දෙරටු ඇතුළත සිටින ලෙවීයයාද තුඹලා
අතරෙහි සිටින විදේශියාද පියා
නැත්තාද වැන්දඹුවද තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ප්‍රීති-
12 වෙයල්ලා. තුඹ මිසරයෙහි වහලෙක්ව
සිටි බව සිහිකරමින්, මේ පනත්
රක්ෂාකරන්ට බලාගනින්න.
13 තුඹේ පාවරෙන්ද මිදිපැසෙන්ද රැස්
කරගත් පසු සත් දවසක් කූඩාරම්
14 මංගල්‍යය පවත්වාපන්න. තුඹද තුඹේ
පුත්‍රයාද තුඹේ දූවද තුඹේ වැඩකරුවාද
තුඹේ වැඩකාරීද තුඹේ දෙරටු ඇතුළත
සිටින ලෙවීයයාද විදේශියාද පියා
නැත්තාද වැන්දඹුවද තුඹේ මංගල්‍යයෙහිදී
15 ප්‍රීතිවෙයල්ලා. තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** තෝරාගන්න ස්ථානයේදී
සත් දවසක් තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** මංගල්‍යයක් පවත්වාපන්න.
මක්නිසාද තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
තුඹේ මුළු අස්වැන්නෙන්ද තුඹේ අත්වල
සියලු වැඩවලදීද තුඹට ආශීර්වාද
කරනවා ඇත, තුඹද මුළුමනින් ප්‍රීතිමත්
16 වෙයන්න. අවුරුද්දට තුන් වරක් එනම්
මුහුන් නොදැමූ රොටි මංගල්‍යයේදීද සති
මංගල්‍යයේදීද කූඩාරම් මංගල්‍යයේදීද
තුඹේ සියලු පිරිමි තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** තෝරාගන්න ස්ථානයට පැමිණ
උන්වහන්සේ ඉදිරියෙහි පෙනෙන්ට
ඕනෑය. ඔවුන් **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි හිස් අතින් නොපෙනී,
17 තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹට
දී තිබෙන ආශීර්වාදයේ හැටියට,
එකිනෙකා තම තමාගේ පුළුවන්කම
ප්‍රකාර දීමනාවක් ඇතුව පෙනී සිටීවා.

## විනිශ්චයකාරයෝ

තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹට 18
දෙන සියලු දෙරටුවල තුඹේ ගෝත්‍රවල
හැටියට විනිශ්චයකාරයන්ද මූලාදැනීන්ද
පත්කරගනින්න. ඔව්හු ධර්මිෂ්ඨකමින්
සෙනඟ විනිශ්චය කෙරෙත්වා. තුඹ 19
විනිශ්චය නොපෙරළන්න; මනුෂ්‍යයන්ගේ
තරාතිරම් නොබලන්න. අල්ලසක්
නොගනින්න; මක්නිසාද අල්ලස ප්‍රඥා-
වන්තයන්ගේ ඇස් අන්ධකොට ධර්මිෂ්ඨ-
යන්ගේ වචන පෙරළන්නේය. තුඹ ජීවත්ව 20
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹට
දෙන දේශය උරුමකරගන්න පිණිස
ධර්මිෂ්ඨකමම අනුව පලයන්න.

## නොනිසි නමස්කාරයට විරුද්ධව අණදීම

තුඹ සාදන්නාවූ තුඹේ දෙවිවූ **ස්වාමීන්-** 21
**වහන්සේගේ** පූජාසනය ළඟ කිසියම්
වෘක්ෂයකින් කළ අෂේරා කණුවක් සිටුවා
නොගනින්න. තුඹට රූපස්තම්භයක්ද 22
පිහිටුවා නොගනින්න; තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඊට ද්වේෂකරනසේක.

**17**

යම් කැලලක් නොහොත් යම්
විරූපකමක් ඇති ගොනෙක්වත්
බැටළුවෙක්වත් තුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** පූජා නොකරන්න.
මක්නිසාද එය තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** පිළිකුලක්ය.

තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹට 2
දෙන්නාවූ තුඹේ යම් නුවරක් තුළ
තුඹලා අතරෙහි සිටින යම් පුරුෂයෙක්
හෝ ස්ත්‍රියෙක් ගොස්, මා විසින් 3
අණනොකළ අන් දෙවිවරුන්ටවත් ඉරට
හෝ සඳටවත් අහස් සේනාවෙන්
කිසිවකුටවත් සේවය කරමින්, ඔවුන්ට
නමස්කාර කොට, තුඹේ දෙවිවූ 4
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම කඩකරන
හැටියට උන්වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරුව තිබෙන දේ කරන්නේය කියා
තුඹට දන්වන්ටත් තුඹ ඒක අසන්ටත්
යෙදුණොත්, තුඹ හොඳකාර විභාග
කරපන්න. එවිට ඒ පිළිකුල ඉශ්‍රායෙල්

තුළ කෙරුණු බව සැබෑ නම්, කාරණයද
5 සත්තක නම්, ඒ නපුරු දේ කළාවූ ඒ
පුරුෂයා හෝ ඒ ස්ත්‍රිය හෝ නුඹේ
දොරටු ළඟට ගෙනවුත්, ඒ පුරුෂයා හෝ
ස්ත්‍රිය මැරෙන පිණිස ඔවුන්ට ගල්
6 ගසාපන්න. මරණයට පත්වෙන තැනැත්තා
සාක්ෂිකාරයන් දෙදෙනෙකුගේ හෝ
තුන්දෙනෙකුගේ හෝ මුඛයෙන් කී
සාක්ෂිය පිට මරනු ලබන්නේය; එක
සාක්ෂිකාරයෙකුගේ මුඛයේ කීම පිට
7 ඔහු මරනු නොලබන්නේය. ඔහු මරන
පිණිස පළමුකොට සාක්ෂිකාරයන්ගේ
අත්ද පසුව මුළු සෙනඟගේ අත්ද ඔහු
පිට තබනු ලැබේවා. මෙසේ නුඹලා
අතරෙන් ඒ නපුර පහකරන්නෙහිය.

## අමාරු කාරණා බේරීම

8 නුඹේ දොරටු ඇතුළෙහි හටගන්න
නඩුවලින් ලේ සහ ලේ අතරේද
පැමිණිල්ල සහ පැමිණිල්ල අතරේද
පහර සහ පහර අතරේද විනිශ්චය-
කරන්ට යම් කාරණයක් නුඹට අමාරු
වැඩි නම්, නුඹ නැගිට නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** තෝරාගන්නාවූ
9 ස්ථානයට ගොස්, ලෙවීවරු වන
පූජකයන්ද ඒ දවස්වල සිටින විනිශ්චය-
කාරයාද ළඟට ගොස් විභාග කරපන්න;
ඔවුන් නුඹට නඩුවේ තීන්දුව දන්වනවා
10 ඇත. **ස්වාමීන්වහන්සේ** තෝරාගන්නාවූ
ඒ ස්ථානයේ සිට ඔවුන් නුඹට දන්වන
තීන්දුව ප්‍රකාර කරපන්න; ඔවුන් නුඹට
දන්වාදෙන සියල්ලේ හැටියට කරන්ට
11 බලාගනින්න. ඔවුන් නුඹට දන්වා දෙන
ව්‍යවස්ථාවේද නුඹට කියන විනිශ්චයේද
හැටියට කරපන්න. ඔවුන් නුඹට දන්වන
තීන්දුවෙන් දකුණටවත් වමටවත්
12 නොහැරෙන්න. නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි සේවය කිරීමට එහි
සිටින පූජකයාටවත් විනිශ්චයකාරයාටවත්
ඇහුම්කන් නොදී අහංකාරකමින් හැසි-
රෙන මනුෂ්‍යයා මරනු ලැබේවා. මෙසේ
ඉශ්‍රායෙල්වරුන් අතරෙන් නපුර
පහකරපන්න. මුළු සෙනඟ අසා භයවී 13
තවත් හිතුවක්කාරකම් නොකර සිටිනවා
ඇත.

## රජෙක් සම්බන්ධ කටයුතු

නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට 14
දෙන දේශයට නුඹ පැමිණ ඒක හිමිකරගෙන
එහි වාසයකරන විට, මා වටකර සිටින
සියලු ජාතීන් මෙන් මා කෙරෙහි රජෙකු
පත්කරගන්නෙමියි කීවොත්, නුඹේ දෙවිවූ 15
**ස්වාමීන්වහන්සේ** තෝරාගන්න තැනැත්තා
නුඹ කෙරෙහි රජකමට කොහොමහරි
පත්කර ගනින්න. නුඹේ සහෝදරයන්
අතරෙන් එක්කෙනෙකු නුඹ රජකමට
පත්කර ගනින්න; නුඹේ සහෝදරයෙක්
නොවන පරදේශියෙකු නුඹ කෙරෙහි
රජකර නොගත යුතුය. බොහෝ 16
අශ්වයන් ඔහු විසින් සපයා නොගත
යුතුය, බොහෝ අශ්වයන් සපයාගන්න
පිණිස සෙනඟ මිසරයට හැරී යන්ට
නොසැලැස්විය යුතුය. මක්නිසාද: නැවත
මේ මාර්ගයෙන් තවත් හැරී නොයල්ලා-
යයි **ස්වාමීන්වහන්සේ** නුඹලාට කීසේක.
තමාගේ සිත ඉවත නොහැරෙන පිණිස 17
ඔහු විසින් භාර්යාවන් වැඩිකර නොගත
යුතුය. රන් රිදීද බොහෝසෙයින් සපයා
නොගත යුතුය. ඔහු තමාගේ රාජ්‍යයෙහි 18
සිංහාසනය පිට හිඳින කල, ලෙවීවරුන්
වන පූජකයන් ඉදිරියෙහි තිබෙන පොතේ
හැටියට ඔහු මේ ව්‍යවස්ථාවෙන් පිටපතක්
ලියා, තමා ළඟ තබා ගත යුතුය. ඔහුගේ 19
හෘදය තමාගේ සහෝදරයන් කෙරේ
උඩඟුනොවී, ඔහු ආඥාවෙන් දකුණට
හෝ වමට හැරී නොගොස්, මේ
ව්‍යවස්ථාවේ සියලු වචනද මේ නියෝගද
පවත්වා රක්ෂාකරන හැටියට, තමාගේ 20
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** භයවෙන්ට
ඉගෙන ගන්න පිණිසද මෙසේ තමාගේ
රාජ්‍යය කෙරෙහි තමාගේ සහ
තමාගේ පුත්‍රයන්ගේත් දවස් ඉශ්‍රායෙල්
මැද වැඩිකරගන්න පිණිසද තමාගේ
ජීවිතයේ සියලු දවස්වලදී ඒ පිටපත
කියවන්නේය.

## පූජකයන්ට දිය යුතු දේ

18 ලෙවීවරුන්වූ පූජකයන්ටද
ලෙවීගේ මුළු ගෝත්‍රයටද
ඉශ්‍රායෙල් සමග කොටසක්වත් උරුමයක්වත්
නොලැබේ. ඔව්හු **ස්වාමීන්වහන්සේගේ**
ගිනි-පූජාද උන්වහන්සේගේ උරුමයද
2 කන්නෝය. ඔවුන්ට තමුන්ගේ
සහෝදරයන් අතරෙහි උරුමයක්
නොලැබේ. **ස්වාමීන්වහන්සේ** ඔවුන්ට
කී ලෙස ඔවුන්ගේ උරුමය නම්
3 උන්වහන්සේමය. සෙනඟගෙන් එනම්
ගොනෙකු හෝ බැටළුවෙකු හෝ යාගයක්
පිණිස ඔප්පුකරන තැනැත්තන්ගෙන්
පූජකයන්ට ලැබිය යුතු කොටස
මේය: ඉස්සරහ ගාතයක්ද දෙකන්සද
4 ආමාශයද පූජකයාට දිය යුතුය. නුඹේ
ධාන්‍යයෙන්ද මුද්‍රික රසයෙන්ද තෙලින්ද
ප්‍රථම ඵ්වාත් නුඹේ බැටළුවන්ගේ ප්‍රථම
5 ලෝමත් ඔහුට දීපන්න. මක්නිසාද නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඔහු සහ ඔහුගේ
පුත්‍රයන්ද **ස්වාමීන්වහන්සේගේ** නාමයෙන්
සැම කල්හිම සේවයකිරීමට සිටින පිණිස
නුඹේ සියලු ගෝත්‍රවලින් ඔහු තෝරාගත්-
සේක.
6 මුළු ඉශ්‍රායෙල්හි කොතන නමුත්
තිබෙන නුඹේ යම් නුවරක පොරොත්තුව
සිටින ලෙවීයයෙක් එතනින් පිටත්වී
**ස්වාමීන්වහන්සේ** තෝරාගන්න
ස්ථානයට තමාගේ සිතේ මුළු ආශාව
7 ඇතුව ආවොත්, එහි **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි සිටින ලෙවීවරුන් වන තමාගේ
සියලු සහෝදරයන් කරන්නාක් මෙන්
ඔහු තමාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
8 නාමයෙන් සේවය කෙරේවා. තමාගේ
පිය උරුමය විකිණීමෙන් ලැබෙන දෙය
හැර කන පිණිස ඵකාකාර කොටස්
ඔවුන් සමග ඔහුට ලැබිය යුතුය.

## ප්‍රොපේත තැනගේ චරිතය හා වැඩය

9 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට
දෙන දේශයට නුඹ පැමිණි කල්හි ඒ
ජාතීන්ගේ පිළිකුල් ක්‍රියාවල හැටියට
කරන්ට ඉගෙන නොගනින්න. තමාගේ 10
පුත්‍රයා හෝ දූව හෝ ගිනි මැදින්
යවා පූජාකරන කෙනෙක්වත් පේන
කියන්නෙක්වත් නිමිති බලන්නෙක්වත්
ශාස්ත්‍ර කියන්නෙක්වත් මායාකාරයෙක්-
වත්, මතුරන්නෙක්වත් ආත්ම බන්ධන- 11
කාරයෙක්වත් අනවිනකාරයෙක්වත්
මළවුන්ගෙන් විචාරන්නෙක්වත් නුඹ
අතරෙහි නොසිටීවා. මක්නිසාද මේ දේ 12
කරන කවරෙක් නුමුත් **ස්වාමීන්-**
**වහන්සේට** පිළිකුලක්ය. මේ පිළිකුල් නිසා
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹ
ඉදිරියෙන් ඔවුන් පන්නා දමනසේක. නුඹ 13
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
සම්පූර්ණව සිටපන්න. මක්නිසාද නුඹ 14
පන්නාදමන්ට යන්නාවූ මේ ජාතීහු නිමිති-
බලන්නන්ටත් පේන කියන්නන්ටත්
ඇහුම්කන්දෙති. නුමුත් නුඹට නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** එසේ කරන්ට ඉඩදීලා
නැත. මා සමාන අනාගතවක්තෘ 15
කෙනෙකු නුඹලා අතරෙන් නුඹේ
සහෝදරයන්ගෙන් නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** නුඹට නැගුටුවා දෙනවා ඇත;
නුඹලා එතුමාට ඇහුම්කන් දෙන්නහුය.
ඒ හැටියට හොරේබ්හි රැස්වීමේ දවසේදී 16
නුඹ කථාකොට: මා නොනස්නා පිණිස
මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** හඬ
නැවත මට නොඇසේවා, මේ මහත්
ගින්නත් නවත් මට නොපෙනේවයි කියා
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගෙන්** නුඹ
ඉල්ලුවෙහිය. **ස්වාමීන්වහන්සේ** මට 17
කථාකොට: ඔවුන් කී දේ මනා ලෙස
කීවෝය. මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් 18
නුඹ සමාන අනාගතවක්තෘ කෙනෙකු
ඔවුන්ට නැගුටුවා දී මාගේ වචන ඔහුගේ
මුඛයෙහි තබන්නෙමි, මා ඔහුට අණකරන
සියල්ල ඔහු ඔවුන්ට කියන්නේය. මාගේ 19
නාමයෙන් ඔහු කථාකරන මාගේ
වචනවලට ඇහුම්කන් නොදෙන කිසිවෙක්
ඇද්ද මම ඔහුගෙන් පළිගන්නෙමි. එහෙත් 20
කියන්ට මා විසින් අණ නොකළ
වචනයක් මාගේ නමින් හිතුවක්කාරකමින්

කථාකරන්නාවූ නොහොත් අන් දෙවි-
වරුන්ගේ නාමයෙන් කථාකරන්නාවූ
අනාගතවක්තෘ කෙනෙක් වේ නම් ඒ
21 තෙමේ මරනු ලබන්නේය. ඉදින් **ස්වාමීන්-
වහන්සේ** නොකී වචනය අපි කෙසේ
දනිමුදැයි නුඹේ සිතින් කියන්නෙහි නම්,-
22 අනාගතවක්තෘ **ස්වාමීන්වහන්සේගේ**
නාමයෙන් කථාකරන දේ ඉෂ්ට
නොවන්නේ නම්, නොපැමිණෙන්නේ නම්,
ඒ වනාහි **ස්වාමීන්වහන්සේ** නොකී
කාරණයය. ඒ අනාගතවක්තෘතෙම ඒක
හිතුවක්කාරකමින් කීවේය, ඔහුට
භයනොවන්නැයි මට කීසේක.

## ආරක්ෂක නුවරවල් සහ බොරු සාක්ෂි ගැන

19 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹට දෙන දේශයෙහි සිටින
ජාතීන් නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
විසින් සිඳ දමන කල්හි. නුඹ ඔවුන්ගේ
දේශය හිමිකරගෙන ඔවුන්ගේ නුවරවල
2 සහ ගෙවල්වල වාසයකරන විට: නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට හිමි-
කරගැනීමට දෙන නුඹේ දේශය
මධ්‍යයෙහි නුවරවල් තුනක් වෙන්කර
3 ගනින්න. මිනීමරන සියල්ලන් එහි
පලායන පිණිස මගහරිගස්සා නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට හිමි-
කරගැනීමට දෙන නුඹේ දේශයේ සීමාව
4 තුන් කොටසකට බෙදපන්න. එහි
පලාගොස් ජීවත්වෙන්ට සුදුසු වූ
මිනීමරන්නා නම් පළමු තමාගේ
අසල්වාසියා කෙරේ වෛරයක් නොතිබී
අත් වැරැද්දෙන් ඔහු මරන තැනැත්තාය.
5 යම් මනුෂ්‍යයෙක් ලී කපන්ට තමාගේ
අසල්වාසියා සමග වනයට ගොස් ගස
කපා හෙළන්ට පොරොව ගෙන තමාගේ
අත එසෙවූ කල්හි පොරෝ තලය
මිටෙන් ගැළවී ඔහුගේ අසල්වාසියා පිට
වැටීමෙන් ඔහු මළොත්, එසේ මිනීමරන
තැනැත්තේ ජීවත්වන පිණිස ඒ නුවරවලින්
6 එකකට පලායේවා. නැත්නම් සමහරවිට
පළමු ඔහු තමාගේ අසල්වාසියාට වෛර
නොකළ බැවින්, ඔහු මරනු ලබන්ට
නුසුදුසු නමුත්, ලෙයෙහි පළිය ගන්නාගේ
සිත කෝපව තිබෙන කල්හි ඔහු පස්සේ
එලවාගෙන ගොස්, ගමන දුර නිසා
ඔහු කරා පැමිණ ඔහු මරනවා ඇත.
එබැවින් නුවරවල් තුනක් නුඹට වෙන්කර 7
ගනින්නැයි කියා නුඹට අණකරමි.
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට** නුඹ 8
ප්‍රේමකරමින් උන්වහන්සේගේ මාර්ගවල
නිතරම හැසිරෙන හැටියට මා අද නුඹට
අණ කරන මේ මුළු ආඥාව නුඹ
පවත්වන්ට බලාගන්න විට, නුඹේ දෙවිවූ 9
**ස්වාමීන්වහන්සේ** නුඹේ පියවරුන්ට දිවුළ
ලෙස නුඹේ සීමාව විශාලකරමින්
උන්වහන්සේ නුඹේ පියවරුන්ට දෙන
පිණිස පොරොන්දුවූ මුළු දේශය නුඹට
දෙනසේක් නම්, නුඹේ දෙවිවූ **ස්වාමීන්-** 10
**වහන්සේ** නුඹට උරුමයක් කොට දෙන
ඒ දේශය මධ්‍යයෙහි නිදෙස් ලේ
වැගිරවීමෙන් නුඹ පිටට ලෙයේ දෝෂය
නොපැමිණෙන පිණිස, මේ නුවරවල්
තුන හැර තවත් තුනක් වෙන්කර ගනින්න.
එහෙත් යමෙක් තමාගේ අසල්වාසියා 11
කෙරෙහි වෛරයක් ඇතුව ඔහු ගැන
රැකසිට ඔහුට විරුද්ධව නැගිට ඔහුට
මැරෙන්ට පහරදී මේ නුවරවලින්
එකකට පලායන්නේනම්, ඔහුගේ නුවර 12
වැඩිමහල්ලෝ එතැනින් ඔහු ගෙන්වා-
ගෙන ඔහු මැරෙණ පිණිස ලෙයෙහි
පළිය ගන්නාගේ අතට ඔහු පාවාදෙත්වා.
නුඹේ ඇස ඔහු කෙරෙහි දයා නො- 13
කෙරේවා, නුඹට ශුභ සිද්ධවන පිණිස
ඉශ්‍රායෙල් කෙරෙන් නිදෙස් ලේ වැගිරීමේ
දෝෂය පහකරපන්න.

නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට 14
හිමිකරගැනීමට දෙන දේශයෙහි නුඹට
උරුමවෙන්නාවූ නුඹේ උරුමයෙහි
පුරාතනයන් විසින් නියමකළාවූ නුඹේ
අසල්වාසියාගේ මායිම් ඉවත් නොකරන්න.

කොයි අපරාධයකට නුමුත්, මනුෂ්‍යයෙක් 15
කරන පාපවල් අතරෙන් කොයි පාපයකට
නුමුත්, එක සාක්ෂිකාරයෙක් කිසිවෙකුට

විරුද්ධව නොනැගිටීවා. සාක්ෂිකාරයන්
දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ
මුඛයෙන් කාරණයක් ස්ථිර වන්නේය.
16 අධර්මිෂ්ඨ සාක්ෂිකාරයෙක් යමෙකු පිට
වරද තබන පිණිස ඔහුට විරුද්ධව
17 නැගුටුණොත්. ඒ නඩුව ඇති මනුෂ්‍යයෝ
දෙන්නාම ස්වාමීන්වහන්සේ ඉදිරියට
එනම් ඒ දවස්වල සිටින පූජකයන්ද
විනිශ්චයකාරයන්ද ඉදිරියට පැමිණෙත්වා;
18 විනිශ්චයකාරයෝද හොඳකාරයෙන්
විභාගකරත්වා. එවිට ඔහු බොරු
සාක්ෂිකාරයෙක් බවත් තමාගේ
සහෝදරයාට විරුද්ධව බොරු සාක්ෂි
19 කී බවත් පෙනුණොත්, ඔහු තමාගේ
සහෝදරයාට කරන්ට සිතූ හැටියටම
ඔහුට කරපල්ලා. මෙසේ තුඹලා අතරෙන්
20 නපුර පහකරපල්ලා. සෙස්සෝ ඒ අසා
භයව එයාකාර නපුරු දෙයක් තුඹලා
අතරෙහි තවත් නොකර සිටින්නාහුය.
21 තුඹේ ඇස දයා නොකෙරේවා; ප්‍රාණය
හිලව්වට ප්‍රාණයක් ගනු ලැබේ, ඇස
හිලව්වට ඇසක්ය, දත හිලව්වට දතක්ය,
අත හිලව්වට අතක්ය, පය හිලව්වට
පයක්ය.

## යුද්ධ නීති

20 තුඹේ සතුරන්ට විරුද්ධව තුඹ
සටනට ගොස් අශ්වයන් හා රථද
තුඹට වඩා ගණනින් වැඩිවූ සෙනඟක්ද
දක්නා කල ඔවුන්ට භයනොවෙන්න.
මක්නිසාද තුඹ මිසර දේශයෙන් පිටතට
ගෙනාවාවූ තුඹේ දෙවිවූ ස්වාමීන්-
2 වහන්සේ තුඹ සමග වනසේක. තවද
තුඹලා සටනට ළංවෙන කල්හි පූජකයා
සෙනඟ ළඟට අවුත් කථාකරමින්:
3 ඉශ්‍රායෙල්වරුනි, අසාපල්ලා, තුඹලා අද
තුඹලාගේ සතුරන්ට විරුද්ධව සටනට
ළංවෙනවාය. තුඹලාගේ සිත් ක්ලාන්ත
නොවේවා; ඔවුන් නිසා භය නොවෙල්ලා,
4 වෙවුලමින් තැති නොගනිල්ලා. මක්නිසාද
තුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
තුඹලාගේ සතුරන්ට විරුද්ධව තුඹලා
වෙනුවට සටන්කොට තුඹලා ගළවන
පිණිස තුඹලා සමග යනසේකැයි
ඔවුන්ට කියාවා. මුලාදෑනියෝද 5
සෙනඟට කථාකරමින්: අලුත් ගෙයක්
ගොඩනැගුවේවී නුමුත් එහි ගෙවදීම
නොකළ මනුෂ්‍යයෙක් ඇද්ද ඔහු තමාගේ
ගෙදරට හැරීයේවා, නැත්නම් ඔහු සටනේදී
මළොත් අනිකෙක් ගෙවදීම කරනවා
ඇත. මිදි වත්තක් වවා එහි ඵල භුක්ති 6
නොවින්ද මනුෂ්‍යයෙක් ඇද්ද ඔහු
තමාගේ ගෙදරට හැරී යේවා, නැත්නම්
ඔහු සටනේදී මළොත් අනිකෙක් එය
භුක්ති විඳිනවා ඇත. ස්ත්‍රියෙකුට විවාහ 7
බස් දී ඈ පාවා නොගත් මනුෂ්‍යයෙක්
ඇද්ද ඔහු තමාගේ ගෙදරට හැරී යේවා,
නැත්නම් ඔහු සටනේදී මළොත් අනිකෙක්
ඈ පාවා ගන්නවා ඇතැයි කියන්ට
ඕනෑය. මුලාදෑනීහු සෙනඟට තවත් 8
කථාකර: භයවෙන්නාවූ ක්ලාන්ත සිතක්
ඇත්තාවූ මනුෂ්‍යයෙක් ඇද්ද ඔහු තමාගේ
ගෙට හැරී යේවා, නැත්නම් ඔහුගේ සිත
මෙන් ඔහුගේ සහෝදරයන්ගේ සිත්ද
දියවෙනවා ඇතැයි කියන්ට ඕනෑය.
මුලාදෑනීන් සෙනඟට කථාකර තීන්දුවූ 9
කල්හි ඔව්හු සෙනඟ කෙරෙහි
සේනාපතියන් පත්කෙරෙත්වා.

තුඹ නුවරකට විරුද්ධව සටන්කරන්ට 10
ළංවන කල්හි ඊට සමාදානය ප්‍රකාශ-
කරපන්න. තුඹට සමාදාන උත්තරයක් දී 11
දොරටුව ඇර දුන්නොත් එහි සිටින මුළු
සෙනඟ තුඹට කප්පම් දෙමින් තුඹට
සේවය කළ යුතුය. ඒ නුවර වනාහි තුඹ 12
සමග සමාදාන වෙන්ට අකැමතිව තුඹට
විරුද්ධව යුද්ධකරන්නේ නම් තුඹ ඒක
වටලාපන්න. තුඹේ දෙවිවූ ස්වාමීන්- 13
වහන්සේ ඒක තුඹ අතට පාවා දුන්
කල්හි එහි සිටින සියලු පිරිමින්ට
කඩු මුවහතින් පහර දීපන්න. නුමුත් 14
ස්ත්‍රීන්ද බාලයන්ද සිව්පාවුන්ද නුවර
තිබෙන සියල්ල එනම් එහි මුළු
කොල්ලයද තුඹලාටම කොල්ලයක්
පිණිස අරගනින්න; තුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ තුඹට දුන්නාවූ තුඹේ
සතුරන්ගෙන් ගන්න කොල්ලය තුඹට
කන්නට පුළුවන. මෙහි සිටින මේ 15
ජාතීන්ගේ නුවරවල් නොවන්නාවූ තුඹෙන්

ඉතා ඈත්ව තිබෙන සියලු නුවරවලට
16 එසේ කරපන්න. එහෙත් නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** උරුමයක් කොට
නුඹට දෙන්නාවූ මේ සෙනඟගේ නුවරවල
හුස්ම ඇති කිසිවෙක්වත් ඉතුරු
17 නොකරන්න. තමුන්ගේ දෙවිවරුන් සඳහා
ඔවුන් කළ සියලු පිළිකුල් ක්‍රියා ලෙස
කරන්ට ඔවුන් නුඹලාට නුගන්වන
පිණිසද, එසේ නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේට** විරුද්ධව නුඹලා පව්
18 නොකරන පිණිසද, හිත්තීවරුද
අමෝරිවරුද කානානිවරුද පෙරිස්සිවරුද
හිව්වරුද යෙබූසිවරුද වන ඔවුන් නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට අණකළ
ලෙස නුඹ විසින් සහමුලින්ම විනාශකර
දැමිය යුතුය.
19 නුඹ යම් නුවරක් අල්ලාගන්ට ඊට
විරුද්ධව යුද්ධකරමින් බොහෝ දවස්
ඒක වටලාගෙන ඉන්න අතර එහි
තිබෙන ගස් පොරොවෙන් කපා නාස්ති
නොකරන්න; මක්නිසාද නුඹට ඒවායෙන්
කන්ට පුළුවන, ඒවා කපා නොදමන්න;
කුමක්හෙයින්ද නුඹ විසින් වටලනු ලබන
පිණිස කෙතේ වෘක්ෂය මනුෂ්‍යයෙක්ද?
20 කෑමට නුසුදුසු බව නුඹ දන්නා ගස්
පමණක් කපා නාස්තිකර, නුඹට විරුද්ධව
යුද්ධ කරන නුවර පරාජය වනතුරු ඊට
විරුද්ධව පවුරු ගොඩනගාපන්න.

## මරනලද අයෙක් ගැන විභාගය

21 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹට හිමිකරගැනීමට දෙන
දේශයෙහි යමෙකු කෙතේ මරාදමා
තිබෙනවා සම්බවුණොත්, ඔහු කා විසින්
2 මැරුවාද කියා නොදන්නවා නම්, නුඹේ
වැඩිමහල්ලෝද විනිශ්චයකාරයෝද
පිටතට අවුත් ඒ මළකඳ වටේට තිබෙන
3 නුවරවල් දක්වා මැන බලත්වා. එවිට
මළකඳට කිට්ටුව තිබෙන නුවර
වැඩිමහල්ලෝ වැඩ නොකළාවූ වියගහ
නොඇදුරුවාවූ එළනැම්බියක් රැළෙන්
4 ගෙන, හාන්ටවත් වපුරන්ටවත් නොයෙ-
දෙන්නාවූ වතුර නිතරම ගලායන්නාවූ
මිටියාවතකට ගෙනැවිත්, නැම්බියගේ
බොටුව මිටියාවතේදී කඩත්වා. ලෙවීගේ 5
පුත්‍රයෝවූ පූජකයෝද එහි පැමිණෙත්වා;
මක්නිසාද නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
විසින් තමන්ට සේවයකරන පිණිසද
**ස්වාමීන්වහන්සේගේ** නාමයෙන් ආශීර්වා-
දකරන පිණිසද ඔවුන් තෝරාගත්සේක;
ඔවුන්ගේ කීමේ හැටියට සියලු විවාදද
සියලු දඬුවම්ද වේවා. මළකඳට කිට්ටුව 6
තිබෙන නුවර සියලු වැඩිමහල්ලෝ
මිටියාවතේදී බොටුව කඩනු ලැබූ නැම්බී
මත්තේ තමුන්ගේ අත් සෝදා උත්තරදෙමින්:
අපේ අත් මේ ලේ වැගිරෙවූවේවත් අපේ 7
ඇස් මෙය දුටුවේවත් නැත. **ස්වාමීන්-** 8
**වහන්ස,** ඔබ මුදාගත් ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් කෙරෙහි නිදෙස් ලේවල
වරදනොතබා ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්ට කමා වුණ මැනවයි කියත්වා.
එවිට ඒ ලේ ගැන ඔවුන්ට කමාව ලැබේ.
මෙසේ නුඹ **ස්වාමීන්වහන්සේගේ** ඇස් 9
හමුයෙහි හරිව තිබෙන දේ කිරීමෙන්
නිදෙස් ලේ වැගිරීමේ දෝෂය නුඹලා
අතරෙන් පහකළ යුතුය.

## ගෘහ වාස නීති

නුඹේ සතුරන්ට විරුද්ධව නුඹ සටනට 10
ගොස් නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඔවුන් නුඹ අතට පාවා දෙන විට නුඹ
ඔවුන් වහල්කමට අල්වාගෙන, ඔවුන් 11
අතරේ රුව ඇති ස්ත්‍රියෙකු දැක ඇට
ඇලුම්වී ඈ භාර්යාව කොට ගත්තොත්,
ඈ නුඹේ ගෙදරට ගෙනියාපන්න; ඈ 12
තමාගේ හිස මුඩුකොට, ඇගේ නියපොතු
කපා, ඇගේ වහල්කමේ වස්ත්‍රය තමා 13
කෙරෙන් පහකොට, නුඹේ ගෙයි හිඳ
පුරා මාසයක් ඇගේ මවුපියන් ගැන
වැලපේවා. ඉන් පසු නුඹ ඈ කරා එළඹ
ඇගේ පුරුෂයා වන්නෙහිය, ඈද නුඹේ
භාර්යාව වන්නීය. ඉදින් නුඹ ඈ කෙරෙහි 14
ප්‍රසන්න නැත්නම් ඈ මිලේට නොවිකුණා
ඈ කැමති තැනකට යන්ට ඇරපන්න.
නුඹ ඈට අගෞරව කළ බැවින් ඈ
කෙරෙහි වහලියකු කෙරෙහි මෙන්
නොහැසිරිය යුතුය.

15 මනුෂ්‍යයෙකුට ප්‍රියවූ තැනැත්තියක්ද
අප්‍රියවූ තැනැත්තියක්ද වන භාර්යාවන්
දෙදෙනෙක් ඇත්නම්, ප්‍රියවූ තැනැත්තීත්
අප්‍රියවූ තැනැත්තීත් දෙන්නාම ඔහු නිසා
දරුවන් වැදුවෝ නම්, අප්‍රියවූ තැනැත්තීගේ
16 පුත්‍රයා කුලුඳුලා වන්නේ නම්, ඔහු තමා
සන්තක දේපල තමාගේ පුත්‍රයන්ට
උරුම කර දෙන කල්හි කුලුඳුලාව සිටින
අප්‍රියවූ භාර්යාවගේ පුත්‍රයා වෙනුවට
ප්‍රියවූ භාර්යාවගේ පුත්‍රයා කුලුඳුලා
17 මෙන් නියම නොකළ යුතුය. අප්‍රියවූ
තැනැත්තීගේ පුත්‍රයාට තමා සන්තක
සියල්ලෙන් දෙකොටසක් දීමෙන් ඔහු
කුලුඳුලා කොට පිළිගත යුතුය.
මක්නිසාද ඔහුගේ ශක්තියේ පටන්ගැන්ම
ඔහුය; කුලුඳුලාගේ වාසි කොටස ඔහුට
අයිතිය.
18 තමාගේ පියාගේ හඬටත් මවගේ
හඬටත් කීකරු නොවෙන්නාවූ, ඔවුන්
ඔහුට දඬුවම්කරන නුමුත් ඔවුන්ට
ඇහුම්කන් නොදෙන්නාවූ, මුරණ්ඩුවූ,
කැරළිකාර පුත්‍රයෙක් යමෙකුට ඇත්නම්,
19 ඔහුගේ මවුපියෝ ඔහු අල්ලා ඔහුගේ
නුවර වැඩිමහල්ලන් වෙතටත් ඔහුගේ
ස්ථානයේ දොරටුවටත් ගෙන ගොස්:
20 මේ අපේ පුත්‍රයා මුරණ්ඩුය, කැරළිකාරය,
ඔහු අපට කීකරු නොවී නාස්ති-
කාරයෙක් ව බේබද්දෙක් ව සිටීයයි
ඔහුගේ නුවර වැඩිමහල්ලන්ට කියත්වා.
21 එවිට ඔහුගේ නුවර සියලු මනුෂ්‍යයෝ
ඔහු මැරෙන පිණිස ඔහුට ගල්ගසත්වා.
මෙසේ නුඹලා අතරෙන් දුෂ්ටකම
පහකරපල්ලා; මුළු ඉශ්‍රායෙල්ද අසා
භයවෙනවා ඇත.
22 මරණය ලැබීමට සුදුසු පාපයක් කර
මරනු ලැබුවාවූ යමෙක් නුඹ විසින් ගසක
23 එල්ලනු ලැබුවේනම්, නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ උරුමයක් කොට
නුඹට දෙන දේශය නුඹ විසින් අපවිත්‍ර
කරනු නොලබන පිණිස ඔහුගේ මළකඳ
රාත්‍රියෙහි ගසේ තිබෙන්ට නැර, එය
එම මුළු දවසේදීම තැන්පත්කරපන්න;
මක්නිසාද එල්ලනු ලබන තැනැත්තේ
දෙවියන්වහන්සේගෙන් ශාප ලද්දෙක්ය.

## නොයෙක් අතුරු ආඥා

22
නුඹේ සහෝදරයාගේ ගොනා
හෝ ඔහුගේ බැටළුවා හෝ
මුළාව යනවා නුඹ දුටු විට උන්ගෙන්
මගහැර උන් නැවත නුඹේ සහෝදරයා
ළඟට නුඹ විසින් ගෙනයා යුතුමය.
නුඹේ සහෝදරයා නුඹට ළංව නැත්නම්, 2
නොහොත් නුඹ ඔහු නාඳුනනවානම්,
ඌ නුඹේ ගෙදරට ගෙනියාපන්න, නුඹේ
සහෝදරයා ඌ සොයා එන තුරු ඌ
නුඹ ළඟ සිටීවා, ඌ නැවත ඔහුට
භාරදීපන්න. ඔහුගේ කොටළුවා ගැනත් 3
එසේම කරපන්න; ඔහුගේ වස්ත්‍රය ගැනත්
එසේම කරපන්න; නුඹේ සහෝදරයාගෙන්
නැතිවුණාවූ නුඹට සම්බවුණාවූ කොයි
දෙයක් ගැනත් එසේම කරපන්න. නුඹ
එයින් මගහැරිය යුතුය.
නුඹේ සහෝදරයාගේ කොටළුවා හෝ 4
ගොනා මග වැටී ඉන්නවා දුටු විට ඌ
කෙරෙන් මග හැර, නැවත උන් නැගුටුවන
පිණිස ඔහුට නුඹ විසින් උදව්විය යුතුමය.
ස්ත්‍රියෙකු විසින් පුරුෂයෙකුගේ 5
ඇඳුමක්වත් පුරුෂයෙකු විසින් ස්ත්‍රියෙකු-
ගේ වස්ත්‍රයක්වත් නොහැඳිය යුතුය.
මක්නිසාද මෙසේ කරන කවරෙක් නුමුත්
නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
පිළිකුලක්ය.
පැටවුන් හෝ බිත්තර ඇති පක්ෂි 6
කූඩුවක් ගසකවත් බිමවත් තිබී නුඹට
මගදී සම්බවුණොත්, මව පැටවුන් පිට
නොහොත් බිත්තර පිට සිටින්නීනම්,
පැටවුන් සමග මව අල්වා නොගනින්න.
නුඹට ශුභ සිද්ධවන පිණිසද නුඹේ දවස් 7
වැඩිවන පිණිසද කෙසේ නමුත් මවට
යන්ට හැර පැටවුන් පමණක් ගනින්න.
නුඹ අලුත් ගෙයක් ගොඩනගන විට 8
යමෙක් පියස්සෙන් වැටීමෙන් ලේවල
දෝෂය නුඹේ ගේ පිටට නුඹ විසින්
පමුණුවානොගන්න පිණිස පියස්ස වටේ
පවුරක් සාදපන්න. නුඹේ මිදි වත්තේ 9
දෙවර්ගයක බීජ නොවපුරන්න. වැපුරු-
වොත් එහි පලදාව වන නුඹ වපුරන බීජ
සහ මිදි වත්තේ අස්වැන්නද ශුද්ධ
ස්ථානයට අයිතිවන්නේය.

10 ගොනෙකු සහ කොටළුවෙකු එකට
11 බැඳ නොහාන්න. ලෝම සහ පුළුන්
ආදී දෙවර්ගයක ද්‍රව්‍ය මිශ්‍රවූ වස්ත්‍රයක්
ඇඳනොගනින්න.
12 තුඹේ පොරවන සළුවේ සතර කොනේ
දවලු සාදගනින්න.

## නිර්දෝෂවූ හෝ දෝෂ සහිතවූ භාර්යාව

13 මනුෂ්‍යයෙක් භාර්යාවක් පාවාගෙන
ඈ කරා එළඹ ඈට වෛරවී කථාකොට:
14 මම මේ ස්ත්‍රිය පාවාගතිමි; ඈ කරා
එළඹුණු කල්හි කන්‍යාභාවයෙහි ලකුණු
ඈ කෙරෙහි සම්බනොවීයයි නින්දිත
වැරදි ඈ කෙරෙහි තබා ඈට විරුද්ධව
15 නරක නාමයක් පතළකළොත්, ඒ
යෞවනීගේ පියා සහ මව යෞවනීගේ
කන්‍යාකමේ ලකුණ දෙරටුවෙහි සිටින
නුවර වැඩිමහල්ලන් වෙත ගෙන යෙත්වා.
16 එවිට යෞවනීගේ පියා කථාකොට:
මම මාගේ දුව මේ මනුෂ්‍යයාට
භාර්යාව කොට පාවාදුනිමි, නුමුත් ඔහු
17 ඈට වෛරවී–තුඹේ දුවගේ කන්‍යාකමේ
ලකුණු නුදුටිමියි කියමින් නින්දිත වැරදි
තබයි; එහෙත් මාගේ දුවගේ කන්‍යාකමේ
ලකුණු මේයයි වැඩිමහල්ලන්ට කියාවා.
එවිට ඔව්හු නුවර වැඩිමහල්ලන්
18 ඉදිරියෙහි වස්ත්‍රය දිගඅරිත්වා. ඒ නුවර
වැඩිමහල්ලෝද ඒ මනුෂ්‍යයා අල්ලා
19 ඔහුට දඬුවම්කර, ඔහු ඉශ්‍රායෙල්
කන්‍යාවකට විරුද්ධව නරක නාමයක්
පතළකළ බැවින් රිදී ෂෙකෙල් සියයක්
ඔහුට දඩගසා ඒවා යෞවනියගේ පියාට
දෙත්වා, ඈ ඔහුගේ භාර්යාව වන්නීය;
ඔහු තමාගේ සියලු දවස්හිම ඈ
20 අත්නොහැර සිටිය යුතුය. එහෙත් ඒ
කාරණය වන යෞවනියගේ කන්‍යාකමේ
21 ලකුණු සම්බනූණ බව සැබෑනම්, ඔව්හු
ඈ ඇගේ පියාගේ දෙරකඩ ළඟ පිටතට
ගෙනවුත්, ඈ තම පියාගේ ගෙදරදී
වේශ්‍යාකම් කොට ඉශ්‍රායෙල් අතරේ
නින්දිතකම් කළ බැවින්, ඈ මැරෙන පිණිස
නුවර මනුෂ්‍යයෝ ඈට ගල්ගසත්වා.
මෙසේ නුඹලා අතරෙන් දුෂ්ටකම
පහකරපල්ලා.
පුරුෂයෙකුට සරණපාවාදී සිටින 22
ස්ත්‍රියෙක් සමග මනුෂ්‍යයෙක්
සයනයකරනවා සම්බවුණොත් ස්ත්‍රිය
සමග සයනය කළ මනුෂ්‍යයාත් ස්ත්‍රීත්
දෙදෙනාම මරනු ලබන්නෝය. මෙසේ
නුඹ ඉශ්‍රායෙල් කෙරෙන් දුෂ්ටකම
පහකරපන්න.
පුරුෂයෙකුට විවාහබස් දී සිටින කන්‍යා 23
යෞවනියක් යම් මනුෂ්‍යයෙකුට නුවරදී
සම්බවී ඔහු ඈ සමග සයනයකළොත්,
ඒ යෞවනී නුවර සිටලාත් මොර 24
නොගැසූ බැවින්ද ඒ මනුෂ්‍යයා තමාගේ
අසල්වාසියාගේ භාර්යාවට අවමාන්න
කළ බැවින්ද ඔවුන් දෙන්නාම ඒ නුවර
දෙරටුව ළඟට ගෙනගොස් ඔවුන් මැරෙන
පිණිස ඔවුන්ට ගල්ගසාපල්ලා. මෙසේ
නුඹලා අතරෙන් දුෂ්ටකම පහකරපල්ලා.
එහෙත් විවාහබස්දී සිටින යෞවනිය 25
ඒ මනුෂ්‍යයාට කෙතේදී සම්බවී ඔහු
ඈට බලාත්කාරකොට ඈ සමග
සයනයකරන්නේ නම්, ඈ සමග සයනය
කළ මනුෂ්‍යයා පමණක් මරනු
ලබන්නේය. නුමුත් යෞවනියට කිසිවක් 26
නොකරන්න; මරනු ලැබීමට සුදුසු
පාපයක් යෞවනී කළේ නැත. මේ
කාරණය වනාහි මනුෂ්‍යයෙක් තමාගේ
අසල්වාසියාට විරුද්ධව නැගිට ඔහු
මරා දැමීම හා සමානය. මක්නිසාද ඈ 27
කෙතේදී ඔහුට සම්බවිය; විවාහ බස් දී
සිටි ඒ යෞවනිය මොරගැසූ නුමුත්
ඈ ගළවන්ට කිසිවෙක් නොසිටියේය.
විවාහ බස් නොදී සිටින කන්‍යා 28
යෞවනියක් මනුෂ්‍යයෙකුට සම්බවී ඔහු
ඈ අල්ලා ඈ සමග සයනයකරනවා
සම්බ වුණොත්, ඈ සමග සයනයකළ 29
මනුෂ්‍යයා යෞවනියගේ පියාට රිදී
ෂෙකෙල් පනසක් දෙන්ට ඕනෑය, ඔහු
ඈට අවමාන්නකළ බැවින් ඈ ඔහුගේ
භාර්යාව වන්නීය; ඔහු තමාගේ සියලු
දවස්හිම ඈ අත්නොහැර සිටින්ට ඕනෑය.
මනුෂ්‍යයෙක් තම පියාගේ භාර්යාව 30
පාවා නොගත යුතුය, තම පියාගේ
යහන් වස්ත්‍රයද ඉවත් නොකළ යුතුය.

## නානා ප්‍රකාර ආඥා

**23** කෝෂය පොඩි කරනලද
නොහොත් රහසඟ කපනලද
කෙනෙක් ස්වාමීන්වහන්සේගේ සභාවට
ඇතුල් නොවිය යුතුය.
2 අවජාතකයෙක් ස්වාමීන්වහන්සේගේ
සභාවට ඇතුල්නොවිය යුතුය; ඔහුගෙන්
පැවතඑන කිසිවෙක් දසවෙනි පරම්පරාව
දක්වාම ස්වාමීන්වහන්සේගේ සභාවට
ඇතුල් නොවිය යුතුය.
3 අම්මොනියයෙක්වත් මෝවබියයෙක්-
වත් ස්වාමීන්වහන්සේගේ සභාවට ඇතුල්
නොවිය යුතුය; ඔවුන්ගෙන් පැවතඑන
කිසිවෙක් දසවෙනි පරම්පරාව දක්වාත්
කවදාවත් ස්වාමීන්වහන්සේගේ සභාවට
4 ඇතුල් නොවිය යුතුය. මක්නිසාද තුඹලා
මිසරයෙන් ආ කල්හි ඔවුන් මාර්ගයේදී
කෑමත් වතුරත් රැගෙන තුඹලාගේ
පෙරමගට නා නිසාත් තුඹට ශාපකරන
පිණිස මෙසොපොතාමියේ පෙතෝර්හි
සිට බෙයෝර්ගේ පුත්‍රවූ බාලාම් තුඹලාට
5 විරුද්ධව කුලියට ගත් නිසාත්ය. එසේ
වුවත් තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
තුඹට ප්‍රේමකළ බැවින් තුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ බාලාම්ට ඇහුම්කන්
නොදී ඒ ශාපය ආශීර්වාදයකට හැරෙවූ-
6 සේක. තුඹේ සියලු දවස්වල සදාකාලයටම
ඔවුන්ගේ සමාදානයවත් ඔවුන්ගේ ශුභ
සිද්ධියවත් නොසොයන්න.
7 ඒදෝමියයෙකුට ද්වේෂ නොකරන්න;
මක්නිසාද ඔහු තුඹේ සහෝදරයාය.
මිසරයෙකුට ද්වේෂ නොකරන්න;
මක්නිසාද තුඹ ඔහුගේ දේශයෙහි
8 ආගන්තුකයෙක්ව සිටියෙහිය. තුන්වෙනි
පරම්පරාවේදී ඔවුන්ට උපදින දරුවන්ට
ස්වාමීන්වහන්සේගේ සභාවට ඇතුල්
වෙන්ට පුළුවන.
9 තුඹේ සතුරන්ට විරුද්ධව තුඹ කඳවුරට
යන කල සියලු නපුරු දේවලින් වැලකී
10 සිටපන්න. රාත්‍රියේ ධාතුපහවීමක් නිසා
අපිරිසිදුවන මනුෂ්‍යයෙක් තුඹලා අතරෙහි
වේනම්, ඔහු කඳවුරෙන් පිටතට ගොස්
11 කඳවුරට ඇතුල්නොවී සිට, සවස්වන
කල වතුර නාගන ඉර බැස්ස විට
කඳවුරට ඇතුල්වේවා. එළියට යන 12
පිණිස තුඹට කඳවුරෙන් පිට ස්ථානයක්
තිබේවා. තුඹේ ආයුධ අතරේ හාරන 13
හැන්දක් තුඹ ළඟ තිබිය යුතුය; තුඹ
එළියට ගියාම ඒකෙන් හාරා තුඹ
පහරන දේ පස්සට හැරී වසාපන්න.
මක්නිසාද තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ 14
තුඹ ගළවා තුඹේ සතුරන් තුඹට
පාවාදෙන පිණිස තුඹේ කඳවුර
මධ්‍යයෙහි හැසිරෙනසේක; එබැවින්
උන්වහන්සේ තුඹ කෙරෙහි යම්
අපිරිසිදුකමක් දැක තුඹෙන් අහක්ව
නොයන පිණිස තුඹේ කඳවුර පවිත්‍රව
තිබිය යුතුය.
තමාගේ ස්වාමියා කෙරෙන් ගැළවී 15
තුඹ ළඟට එන වාලෙක් තමාගේ
ස්වාමියාට භාරනොදෙන්න. ඔහු තමාට 16
හොඳව පෙනෙනලෙස තුඹේ නුවරවලින්
එකක් තුළ තමා තෝරාගන්න
ස්ථානයෙහි තුඹලා අතරෙහි වාසය
කරාවා. ඔහුට පීඩා නොකරන්න.
ඉශ්‍රායෙල් දූවරුන්ගෙන්වත් ඉශ්‍රායෙල් 17
පුත්‍රයින්ගෙන්වත් කිසිවෙක් වේශ්‍යාකමට
කැප නොවේවා. වේශ්‍යාවකුගේ පඩි- 18
යම්වත් *බල්ලෙකුගේ කුලීවත් කිසියම්
බාරයක් පිණිස තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ ගෘහයට නොගෙනෙන්න.
මක්නිසාද මේ දෙකම තුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය.
පොලීගන්න පිණිස තුඹේ සහෝදර- 19
යාට මුදල්වත් ආහාරවත් මිනිසුන් විසින්
පොලියට දෙන කිසි දෙයක්වත් ණයට
නොදෙන්න. විදේශියෙකුට පොලියට 20
දෙන්ට තුඹට පුළුවන; නුමුත් තුඹ හිමි
කරගන්ට යන දේශයෙහි තුඹ අත තබන
සියල්ලේදී තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
තුඹට ආශීර්වාදකරන පිණිස තුඹේ
සහෝදරයාට පොලියට නොදෙන්න.
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට තුඹ 21
බාරයක් වුණ කල්හි ඒක ගෙවන්ට
ප්‍රමාදනොවෙන්න. මක්නිසාද තුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ඒක තුඹෙන්
අයකරනවාම ඇත; ඒක තුඹට පාපයක්

*එනම්, බලුකම් කරන්නෙකුගේ.

22 වේ. එහෙත් නුඹ බාරයක් නොවී
සිටියොත් එයින් නුඹට පාපයක් නැත.
23 නුඹේ තොල්වලින් පිටත්වුණු දෙය
පවත්වමින් නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේට** නුඹ විසින් ගිවිසුම් කළාවූ
නුඹේ කටින් පොරොන්දුවුණාවූ ස්වේච්ඡා
පූජාව ඉෂ්ටකරපන්න.
24 නුඹේ අසල්වාසියාගේ මිදිවත්තට ආ
කල්හි නුඹ කැමති පරිද්දෙන් තෘප්තියට
පැමිණෙන තුරු මුදිරික ඵල නුඹට කන්ට
පුළුවන; නුමුත් නුඹේ භාජනයෙහි කිසිවක්
දමානොගනින්න.
25 නුඹේ අසල්වාසියාගේ ගොයමට ආ
කල්හි නුඹේ අතින් කරල් කඩාගන්ට
පුළුවන; නුමුත් නුඹේ අසල්වාසියාගේ
ගොයමට දෑකැත්තක් නොපොවන්න.

**24** මනුෂ්‍යයෙක් ස්ත්‍රියෙක් ගෙන ඈ
සරණපාවාගත් පසු, ඈගේ යම්කිසි
නොහොබිනාකමක් ඇති බව ඔහුට
දැනගන්ට ලැබීම නිසා ඔහු ඈට
අප්‍රසන්නවී නම්, ඔහු ඈට අත් ඇරීම්
පත්‍රයක් ලියා ඈගේ අතට දී තමාගේ
2 ගෙයින් ඈ පිටත්කර හරීවා. ඈ ඔහුගේ
ගෙයින් අහක්වුණාම ඈට ගොස්
වෙන කෙනෙකුගේ භාර්යාව වෙන්ට
3 පුළුවන. දෙවෙනි පුරුෂයාත් ඈට ද්වේෂ
කර ඈට අත්හැරීම් පත්‍රයක් ලියා ඈගේ
අතට දී තමාගේ ගෙයින් ඈ පිටකරන්නේ
නම්, නොහොත් ඈ භාර්යාකොට ගත්
4 දෙවෙනි පුරුෂයා නසින්නේ නම්, ඈ
එසේ කිලුටුවූ පසු ඈ අත්ඇරියාවූ ඈගේ
ප්‍රථම පුරුෂයාට නැවත ඈ භාර්යාව
කොට ගන්ට නුපුළුවන; මක්නිසාද ඒක
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි පිළිකුලක්ය.
නුඹ නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
උරුමයක් පිණිස නුඹට දෙන දේශයට
වරද නොපමුණුවන්න.
5 භාර්යාවකු අලුත පාවාගත් මනුෂ්‍ය-
යෙක් යුද්ධ සේනාව සමග පිටත්ව
නොයේවා, කිසි වැඩක්ද ඔහුට භාරදෙනු
නොලැබේවා. ඔහු අවුරුද්දක් ගෙදර
නිදහස්ව සිට තමා පාවාගත් භාර්යාව
6 සන්තෝෂ කෙරේවා. කිසිවෙක් ඇඹරුම්
යන්ත්‍රයවත් උඩ ගලවත් උකසට නො-
ගනීවා. මක්නිසාද එය ප්‍රාණය උකසට
ගැනීම වේ.

යමෙකු විසින් ඉශ්‍රායෙල් පුත්‍රයන් වූ 7
තමාගේ සහෝදරයන්ගෙන් කිසිවෙකු
සොරකම්කොට ඔහු වාලට ගත් බව
හෝ වික්ක බව හෝ දැනගන්ට
ලැබුණොත්, ඒ සොරා මරනු ලබන්නේය.
මෙසේ නුඹලා අතරෙන් දුෂ්ටකම
පහකරපල්ලා.
කුෂ්ඨරෝගය ගැන ලෙවීවරුන් වන 8
පූජකයන් නුඹලාට උගන්වන සියල්ලේ
ප්‍රකාරයට හොඳකාර ඉෂ්ටකරන ලෙස
බලාගනිල්ලා. මා විසින් ඔවුන්ට අණ
කළ ලෙස කරන්ට බලාගනිල්ලා. නුඹලා 9
මිසරයෙන් ආ කල නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** මගදී මිරියාම්ට කළ දේ
සිහිකරපල්ලා.
නුඹේ අසල්වාසියාට නුඹ කිසිවක් 10
ණයට දෙන කල ඔහුගේ උකස ගැනීමට
ඔහුගේ ගෙට ඇතුල්නොවී, පිටත 11
සිටපන්න, නුඹෙන් ණයට ගන්න
තැනැත්තා උකස නුඹ ළඟට පිටතට
ගෙනේවා. ඔහු දිළිඳෙක් නම් ඔහුගේ 12
උකස නුඹ ළඟ තිබෙද්දී නිදනොගනින්න.
ඔහු තමාගේ වස්ත්‍රය පෙරවාගන 13
නිදගන්න පිණිසද නුඹට ආශීර්වාද
කරන පිණිසද ඉරබස්නා කල්හි ඔහුගේ
උකස නුඹ විසින් ඔහුට දිය යුතුමය.
ඒක නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි නුඹට ධර්මිෂ්ඨකම වන්නේය.
නුඹේ සහෝදරයන්ගෙන් හෝ නුඹේ 14
දේශයෙහි නුඹේ නුවර දොරටු තුළෙහි
සිටින විදේශීන්ගෙන් හෝ යම් දිළිඳුවූ
අසරණවූ කුලීකාරයෙකුට පීඩා-
නොකරන්න. ඔහු නුඹට විරුද්ධව 15
**ස්වාමීන්වහන්සේට** මොර නොගසන
පිණිසද එය නුඹට පාපය නොවන
පිණිසද ඉර බසින්ට පළමුවෙන් ඔහුගේ
දවසේ කුලී ඔහුට දීපන්න; මක්නිසාද
ඔහු දිළිඳුය, ඔහුගේ ආශාවද ඒ කෙරෙහි
තබා තිබේ.
දරුවන් වෙනුවට පියවරුවත් පියවරුන් 16
වෙනුවට දරුවෝවත් මරනු නොලැබෙත්වා.
එක් එක්කෙනා තම තමාගේ පාපය
නිසා මරනු ලැබේවා.

17 විදේශියාගේද පියා නැත්තාගේද
විනිශ්චය නොපෙරළන්න; වැන්දඹුවගේ
18 වස්ත්‍රය උකසට නොගනින්න. නුඹ
මිසරයෙහි වහලෙක්ව සිටි බවද නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** එතැනින් නුඹ
මුදගත් බවද සිහිකරපන්න. එබැවින් මේ
දේ කරන්ට නුඹට අණකරමි.
19 නුඹේ කෙතෙහි ගොයම් කපන කල්හි
කෙතේ ගොයම් මිටියක් මතකනැති
වුණොත් ඒක ගෙනෙන්ට ආපසු
නොයන්න. නුඹේ අතේ ඇති සියලු
වැඩපලවලදී නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** නුඹට ආශීර්වාදකරන පිණිස
ඒක විදේශියාටද පියා නැත්තාටද
වැන්දඹුවටද වන්නේය.
20 නුඹේ ඔලීව ගහට ගසා එල නෙළා
ගැනීමේදී අතුවල ඉතුරු වෙන ගෙඩි
නැවත සොයා නොයන්න. ඒවා
විදේශියාටද පියා නැත්තාටද වැන්දඹුවටද
21 වන්නේය. නුඹේ මිද්‍රික වලු කපාගැනීමේදී
ඉතිරි ඒවා නැවත නෙළානොගනින්න.
ඒවා විදේශියාටද පියා නැත්තාටද
22 වැන්දඹුවටද වන්නේය. නුඹ මිසර දේශයෙහි
වහලෙක් ව සිටි බව සිහිකරපන්න. එබැවින්
මේ දේ කරන්ට නුඹට අණකරමි.

**25** මනුෂ්‍යයන් අතරේ අරෝවක්
හටගැනී ඔවුන් විනිශ්චය පිණිස
ආවොත්, විනිශ්චයකාරයෝ ඔවුන්
විනිශ්චයකරමින් ධර්මිෂ්ඨයා නිදොස්කර
2 දුෂ්ටයා වරදට පත්කරත්වා; ඉදින්
දුෂ්ටයා තළනු ලැබීමට සුදුස්සෙක් නම්,
විනිශ්චයකාරයා ඔහු බිම බාවා ඔහුගේ
දුෂ්ටකමේ හැටියට තමා ඉදිරියේදී
ගණන්කර ඔහුට පහර තළවන්නේය.
3 ඔහුට පහර සතළිසක් තළන්ට පුළුවන,
ඊට වඩා නොතැළිය යුතුය. මක්නිසාද
ඊට වඩා බොහෝ පහර ඔහුට තැළුවොත්
නුඹේ සහෝදරයා නුඹට නීචව
පෙනෙනවා ඇත.
4 ගවයෙක් ගොයම් පාගන විට උගේ
කට නොබඳින්න.
5 සහෝදරයන් එකට වාසයකරන අතර
ඔවුන්ගෙන් එක්කෙනෙක් පුත්‍රයෙකු නැතුව
මළොත් මළ අයගේ භාර්යාව අන්‍යවූ
පිට කෙනෙකුට සරණ නොවිය යුතුය.
ඇගේ පුරුෂයාගේ සහෝදරයා ඈ වෙතට
පැමිණ ඈ තමාට භාර්යාව කොට
පාවාගෙන පුරුෂයාගේ සහෝදරයෙකුගේ
යුතුකම ඈට කෙරේවා. තවද මළාවූ 6
සහෝදරයාගේ නාමය ඉශ්‍රායෙල්
කෙරෙන් නොමැකෙන පිණිස ඈ වදන
කුලුඳුලා මළ සහෝදරයාගේ නාමය
දරන්නේය. ඒ මනුෂ්‍යයා තමාගේ 7
සහෝදරයාගේ භාර්යාව පාවාගන්ට
අකැමති නම් ඔහුගේ සහෝදරයාගේ
භාර්යාව දොරටුවෙහි සිටින වැඩිමහල්ලන්
වෙතට ගොස්: මාගේ පුරුෂයාගේ
සහෝදරයා තමාගේ සහෝදරයාට
ඉශ්‍රායෙල්හි නාමයක් උපදවන්ට කැමති
නැත, ඔහු පුරුෂයෙකුගේ සහෝදරයාගේ
යුතුකම මට කරන්ට නොකැමැත්තේ-
යයි කියාවා. එවිට ඔහුගේ නුවර 8
වැඩිමහල්ලෝ ඔහු අඬගස්වා ඔහු සමග
කථාකරත්වා. ඔහු ස්ථිරව සිට ඈ
පාවාගන්ට නොකැමැත්තෙමියි කියන්නේ
නම්, ඔහුගේ සහෝදරයාගේ භාර්යාව 9
වැඩිමහල්ලන් ඉදිරියෙහි ඔහු ළඟට
ගොස්, ඔහුගේ මිරිවැඩියක් ඔහුගේ පයින්
ගළවා, ඔහුගේ මුහුණට කෙළගසා:
තමාගේ සහෝදරයාගේ පවුල ගොඩ
නොනගන මනුෂ්‍යයාට මෙසේ කළ යුතු-
යයි උත්තර දෙමින් කියාවා. මිරිවැඩිය 10
මුදනු ලැබූ තැනැත්තාගේ ගෙය යන
නම ඉශ්‍රායෙල්වරුන් අතරේ ඔහුට කියනු
ලබන්නේය.
මනුෂ්‍යයන් එකිනෙකා සමග ඩබර 11
කරන කල එක්කෙනෙකුගේ භාර්යාව
ඇගේ පුරුෂයාට ගහන තැනැත්තාගේ
අතින් ඔහු ගළවාගන්ට ළංව ඇගේ අත
දිගුකර අනික් අයගේ රහසඟ
ඇල්ලුවොත්, ඇගේ අත කපාදමාපන්න, 12
නුඹේ ඇස ඈ කෙරෙහි දයා නො-
කෙරේවා.
නුඹේ මල්ලේ වෙනස් කිරුම් පඩි එනම් 13
ලොකු එකක් සහ කුඩා එකක්
තබානොගනින්න. නුඹේ ගෙයි වෙනස් 14
මිමි එනම් ලොකු එකක් සහ කුඩා
එකක් තබානොගනින්න. නුඹේ දෙවිවූ 15
**ස්වාමීන්වහන්සේ** නුඹට දෙන දේශයෙහි
නුඹේ දවස් වැඩිවන පිණිස සම්පූර්ණවූ

හරිවූ කිරුම් පඩියක් සහ සම්පූර්ණවූ
හරිවූ මිම්මක් නුඹ ළඟ තබාගනින්න.
16 මක්නිසාද එබඳු දේ කරන සියල්ලෝ
එනම් අධර්මිෂ්ඨ ලෙස ක්‍රියාකරන
සියල්ලෝ නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** පිළිකුලක්ය.
17 නුඹලා මිසරයෙන් ආ කල්හි අමලෙක්
18 විසින් මගදී කළ දේ, එනම් ඔහු
දෙවියන්වහන්සේට භයනොවී, නුඹ
ක්ලාන්තව වෙහෙසව සිටි කල මගදී
නුඹට සම්මුඛව, නුඹලාට පස්සෙන්
ආවාවූ සියලු දුර්වලයන්ට පහරදුන්
19 හැටි සිහිකරපන්න. එබැවින් නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** හිමිකරගැනීමට
උරුමයක් කොට නුඹට දෙන දේශයේදී
වටකර සිටින නුඹේ සියලු සතුරන්ගෙන්
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට
විශ්‍රාමය දුන් විට, අමලෙක් ගැන සිහිවීම
අහස යටින් මකාදමාපන්න; එය
මතකනැති නොකරන්න.

## ප්‍රථම එල පුදකිරීම

26 නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
උරුමයක් පිණිස නුඹට දෙන
දේශයට නුඹ පැමිණ ඒක හිමිකරගෙන
2 එහි වසන කල්හි, නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට දෙන නුඹේ
දේශයෙන් රැස්කරගන්නාවූ භූමියේ සියලු
එලවලින් ප්‍රථම ඒවායෙන් ස්වල්පයක්
රැගෙන පෙට්ටියක දමාගෙන, නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ස්වකීය නාමය
වාසයකරවන්ට තෝරාගන්න ස්ථානයට
3 පලයන්න. නුඹ ඒ දවස්වල සිටින
පූජකයා ළඟට පැමිණ: **ස්වාමීන්වහන්සේ**
අපට දෙන ලෙස අපේ පියවරුන්ට දිවුළ
දේශයට මා ඇවිත් සිටිනවාය කියා
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට** අද
ප්‍රකාශකර සිටිමියි ඔහුට කියාපන්න.
4 පූජකයා නුඹේ අතින් පෙට්ටිය ගෙන
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
5 පූජාසනය ඉදිරිපිට ඒක තබාවා. එවිට
නුඹ නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි කථාකර: මාගේ පියාණෝ
නැතිවෙන්ට ගිය අරාමියයෙක්ය, ඔහු
ස්වල්පදෙනෙකුත් සමග මිසරයට ගොස්
එහි වාසය කොට මහත්වූ බලවත්වූ
ගණනින් බොහෝවූ ජාතියක් විය.
මිසරවරුද අපට නපුරුකම් කරමින් අපට 6
පීඩාකොට අප තද වහල්කමට පත්කළෝය.
අපි අපේ පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්-** 7
**වහන්සේට** මොරගැසීමුව, **ස්වාමීන්-
වහන්සේ** අපේ හඬ අසා, අපේ පීඩාවත්
වෙහෙසත් හිරිහැරයත් බලා, බලවත් 8
හස්තයකින්ද දිගුකළ බාහුවකින්ද මහත්
භයංකරකම්න්ද ලකුණුවලින්ද හාස්කම්-
වලින්ද අප මිසරයෙන් පිටතට පමුණුවා,
මේ ස්ථානයට අප ගෙනවුත්, කිරිද 9
මීපැණිද ගලා යන දේශයක් වන මේ
දේශය අපට දුන්සේක. දැන් **ස්වාමීන්-** 10
**වහන්ස**, මෙන්න, ඔබ මට දී තිබෙන
භූමියේ එලවලින් ප්‍රථම ඒවා ගෙනා-
යෙමියි කියා නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි ඒවා තබා, නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
නමස්කාර කොට, නුඹේ දෙවිවූ 11
**ස්වාමීන්වහන්සේ** නුඹටද නුඹේ පවුලටද
දුන් සියලු යහපත් දේ ගැන නුඹද
ලෙවීයයාද නුඹලා අතරෙහි වසන
විදේශියාද ප්‍රීති වෙයල්ලා.
දසයෙන් කොටස දෙන අවුරුද්ද වන 12
තුන්වෙනි අවුරුද්දේදී නුඹේ අස්වැන්නෙන්
දසයෙන් කොටස් සියල්ලම නුඹ
වෙන්කර තීන්දුකළ කල්හි, ලෙවීයයාද
විදේශියාද පියා නැත්තාද වැන්දඹුවද
නුඹේ නුවර දොරටු තුළදී කා තෘප්තියට
පැමිණෙන පිණිස ඒවා ඔවුන්ට දී, නුඹේ 13
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
කථාකොට: ඔබ විසින් මට අණ කළ
ඔබගේ මුළු ආඥාව ලෙස පිරිනැමූ දේවල්
මම මාගේ ගෙයින් වෙන්කොට ඒවා
ලෙවීයයාටද විදේශියාටද පියා නැත්තාටද
වැන්දඹුවටද දුනිමි. ඔබගේ ආඥාවලින්
කිසිවක් කඩනොකෙළෙමි, ඒවා සිහි-
නැතිනොකෙළෙමි. මාගේ දුකේදී එයින් 14
කැවේවත්, අපවිත්‍රකමේදී එයින් අහක්-
කළේවත්, මළකෙනෙකු උදෙසා එයින්
දුන්නේවත් නැත. මාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** හඬට කන්දී, ඔබ

මට අණකළ සියල්ල ලෙස කෙළෙමි.
15 ඔබගේ ශුද්ධවාසස්ථානය වන ස්වර්ගයේ
සිට බලා, ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ටද
ඔබ අපේ පියවරුන්ට දිවුළ ලෙස අපට
දුන්නාවූ කිරි හා මීපැණි ගලා යන
දේශයක්ව තිබෙන භූමියටද ආශීර්වාද
කළ මැනවයි කියාපන්න.
16 මේ පනත් හා විනිශ්චයවල් පවත්වන්ට
අද දවසේදී තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ තුඹට අණකරනසේක. එබැවින්
ඒවා තුඹේ මුළු සිතින්ද තුඹේ මුළු
ආත්මයෙන්ද පවත්වන්ට බලාගනින්න.
17 තුඹ ස්වාමීන්වහන්සේ තුඹේ දෙවියන්-
වහන්සේ කොට පිළිගෙන උන්-
වහන්සේගේ මාර්ගවල හැසිරෙමින්
උන්වහන්සේගේ පනත්ද ආඥද
විනිශ්චයන්ද පවත්වා උන්වහන්සේගේ
හඬට කන්දෙන හැටියට අද පොරොන්දු-
18 වුණෙහිය. ස්වාමීන්වහන්සේද තමන්ගේ
සියලු ආඥ තුඹ විසින් පවත්වන පිණිස
තමන් සන්තක සෙනඟක් කොට තුඹට
19 කී ලෙස තුඹ පිළිගන්ටත්, තමන් මැවූ
සියලු ජාතීන්ට වඩා කීර්තියෙන්ද
නාමයෙන්ද ගෞරවයෙන්ද තුඹ උසස්
කරන්ටත්, තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
කී ලෙස තුඹ තමන්වහන්සේට ශුද්ධවූ
සෙනඟක් කරගන්ටත් අද තුඹට
පොරොන්දුවූසේකැයි කීවේය.

## ගල්කණුවල ව්‍යවස්ථාව ලිවීම

27 මෝසෙස්ද ඉශ්‍රායෙල් වැඩි-
මහල්ලෝද සෙනඟට අණ-
කරමින්: මා විසින් අද තුඹලාට
අණකරන මුළු ආඥව පවත්වාපල්ලා.
2 තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තුඹට
දෙන දේශයට යොර්දනෙන් එතරව තුඹ
යන දවසේ මහත් ගල් සිටුවාගන.
3 ඒවායේ හුනු ගා. තුඹේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ තුඹට
පොරොන්දු වුණ හැටියට තුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ තුඹට දෙන්නාවූ, කිරි
හා මීපැණි ගලා යන දේශයක් ව තිබෙන
දේශයට ඇතුල්වෙන පිණිස තුඹ එතරව
ගිය කල්හි, මේ ව්‍යවස්ථාවේ සියලු වචන
ඒවා පිට ලියාපන්න. එබැවින් තුඹලා 4
යොර්දනෙන් එතරව ගිය විට මා අද
තුඹලාට අණකරන මේ ගල් ඒබාල්
කන්දේ හිටවා හුනු ගාපන්න. එහිද 5
තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
පූජාසනයක් එනම් ගල්වලින් පූජාසනයක්
ගොඩනගාපන්න. ඊට යකඩ ආවුදයක්
නොපොවන්න. තුඹේ දෙවිවූ ස්වාමීන්- 6
වහන්සේගේ පූජාසනය *පියවි ගල්වලින්
ගොඩනගා, තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ඒක පිට දවන පූජාවන්
පූජාකොට. ශාන්ති පූජාවල්ද ඔප්පුකර. 7
එහිදී කමින් තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි ප්‍රීතිවෙයන්න. ඒ ගල් 8
පිට මේ ව්‍යවස්ථාවේ සියලු වචන ඉතා
පැහැදිලි ලෙස කොටා ලියාපන්නැයි
කීවෝය.

## ඒබාල් සහ ගෙරිසීම් කඳු පිට සිට කළ ආශීර්වාද හා ශාප

මෝසෙස්ද ලෙවීවරුවූ පූජකයෝද 9
සියලු ඉශ්‍රායෙල්වරුන්ට කථාකොට:
ඉශ්‍රායෙල්, තුඹ නිශ්ශබ්දව සිට
අසාපන්න; තුඹ අද දවසේදී තුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ සෙනඟ
වූයෙහිය. එබැවින් තුඹේ දෙවිවූ 10
ස්වාමීන්වහන්සේගේ හඬට තුඹ
කීකරුව මා විසින් අද තුඹට අණ-
කරන උන්වහන්සේගේ ආඥද පනත්ද
පවත්වාපන්නැයි කීවෝය.
මෝසෙස් එම දවසේදී සෙනඟට අණ 11
කරමින්: තුඹලා යොර්දනෙන් එතරට 12
පැමිණි කල්හි සෙනඟට ආශීර්වාදකරන
පිණිස සිමියොන්ද ලෙවීද යූදද
ඉස්සාකර්ද යෝසෙප්ද බෙන්යමීන්ද යන
මොව්හු ගෙරිසීම් කන්ද පිට සිටින්වා.
ශාපකියන පිණිස රූබෙන්ද ගාද්ද 13
ආෂේර්ද සාබුලොන්ද දන්ද නප්තලීද
යන මොව්හු ඒබාල් කන්ද පිට සිටින්වා.
ලෙවීවරුද උත්තරදෙමින් සියලු 14
ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ට ශබ්දනගා
මෙසේ කියන්වා–

*හෙවත්, නොකැඩූ හෝ නොකැපූ

15 **ස්වාමීන්වහන්සේට** පිළිකුලක්ද
කම්කරුවාගේ හස්තකර්මාන්තයද වන
කැපූ රූපයක් හෝ වාත්තු පිළිමයක්
හෝ සාදා එය රහසින් තබාගන්න
මනුෂ්‍යයාට ශාප වේවා. එවිට මුළු
සෙනඟ: ආමෙන් කියා උත්තරදෙත්වා.
16 තමාගේ පියාට හෝ මවට හෝ
අගෞරව කරන්නාට ශාප වේවා. එවිට
මුළු සෙනඟ: ආමෙන් කියත්වා.
17 තමාගේ අසල්වාසියාගේ බිමේ ඉම
පහකරන්නාට ශාප වේවා. එවිට මුළු
සෙනඟ: ආමෙන් කියත්වා.
18 අන්ධයා මංමුළාකරන්නාට ශාප වේවා.
එවිට මුළු සෙනඟ: ආමෙන් කියත්වා.
19 විදේශියාගේද පියා නැත්තාගේද
වැන්දඹුවගේද විනිශ්චය පෙරළන්නාට
ශාප වේවා. එවිට මුළු සෙනඟ: ආමෙන්
කියත්වා.
20 තමාගේ පියාගේ භාර්යාව සමග
සයනයකරන්නාට ශාප වේවා; මක්නිසාද
ඔහු තම පියාගේ යහන් වස්ත්‍රය ඉවත්
කෙළේය. එවිට මුළු සෙනඟ: ආමෙන්
කියත්වා.
21 කිසියම් මෘගයෙකු සමග සයනය-
කරන්නාට ශාප වේවා. එවිට මුළු
සෙනඟ: ආමෙන් කියත්වා.
22 තමාගේ සහෝදරීවූ තමාගේ පියාගේ
දුව හෝ මවගේ දුව සමග සයනය-
කරන්නාට ශාප වේවා. එවිට මුළු
සෙනඟ: ආමෙන් කියත්වා.
23 තමාගේ භාර්යාවගේ මව සමග
සයනයකරන්නාට ශාප වේවා. එවිට
මුළු සෙනඟ: ආමෙන් කියත්වා.
24 තමාගේ අසල්වාසියා රහසින්
මරන්නාට ශාප වේවා. එවිට මුළු
සෙනඟ: ආමෙන් කියත්වා.
25 නිදෙස් කෙනෙකු මරන්ට අල්ලස්
ගන්නාට ශාප වේවා. එවිට මුළු සෙනඟ:
ආමෙන් කියත්වා.
26 මේ ව්‍යවස්ථාවේ වචන ඉෂ්ටකරන
පිණිස ඒවා ස්ථිර නොකරන්නාට ශාප
වේවා. එවිට මුළු සෙනඟ: ආමෙන්
කියත්වා.

## කීකරුකමේ ආශීර්වාද

28 තවද මා විසින් අද නුඹට අණ
කරන නුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේගේ** සියලු ආඥා රක්ෂාකරන්ට
බලාගන්න ලෙස උන්වහන්සේගේ හඬට
ඕනෑකමින් කන්දෙන්නෙහි නම් නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** පොළොවේ
සියලු ජාතීන්ට වඩා නුඹ උසස්
කොට තබනසේක. නුඹේ දෙවිවූ 2
**ස්වාමීන්වහන්සේගේ** හඬට නුඹ
කන්දෙන්නෙහි නම් මේ සියලු ආශීර්වාද
නුඹ කරා පැමිණ නුඹ සමග වන්නේය.
නුඹ නුවරෙහි ආශීර්වාදලද්දෙක් 3
වන්නෙහිය, කෙතෙහිත් ආශීර්වාදලද්දෙක්
වන්නෙහිය. නුඹේ ගර්භයේ ඵලයටද 4
නුඹේ භූමියේ ඵලයටද නුඹේ
සිවුපාවුන්ගේ ඵලයටද නුඹේ ගවයන්ගේ
බෝවීමටද නුඹේ එළු බැටළු පැටවුන්ටද
ආශීර්වාද ලැබෙන්නේය. නුඹේ පැසටද 5
පිටි අනන ඔරුවටද ආශීර්වාද
ලැබෙන්නේය. නුඹ ඇතුළට එන කල්හිද 6
පිටතට යන කල්හිද ආශීර්වාද ලද්දෙක්
වන්නෙහිය. නුඹට විරුද්ධව නැගිටින්නාවූ 7
නුඹේ සතුරන් **ස්වාමීන්වහන්සේ** නුඹ
ඉදිරියෙහි පරාජය වෙන්ට සලස්වන-
සේක. ඔව්හු නුඹට විරුද්ධව එක මගකින්
අවුත් සත් මගකින් නුඹ ඉදිරියෙන්
පලායන්නෝය. නුඹේ ගබඩා කෙරෙහිද 8
නුඹ අත තබන සියල්ලෙහිද **ස්වාමීන්-**
**වහන්සේ** නුඹට ආශීර්වාදය එවා, නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට දෙන
දේශයේදී නුඹට ආශීර්වාදකරනසේක.
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ආඥා 9
පවත්වා උන්වහන්සේගේ මාර්ගවල
හැසිරෙන්නෙහි නම්, **ස්වාමීන්වහන්සේ**
නුඹට දිවුළලෙස උන්වහන්සේටම ශුද්ධ
සෙනඟක් කොට නුඹ ස්ථිර කරනසේක.
**ස්වාමීන්වහන්සේගේ** නාමය නුඹ කෙරෙහි 10
තබා තිබෙන බව පොළොවේ සියලු
මනුෂ්‍ය වර්ගයෝ දැක නුඹට භය-
වන්නෝය. **ස්වාමීන්වහන්සේ** නුඹට දෙන 11
ලෙස නුඹේ පියවරුන්ට දිවුළ භූමිය
මතුපිට නුඹේ ගර්භයේ ඵලයද නුඹේ
සිවුපාවුන්ගේ ඵලයද භූමියේ ඵලයද

යහපත පිණිස නුඹට වැඩිකර දෙන-
12 සේක. **ස්වාමීන්වහන්සේ** නිසි කාලයට
නුඹේ දේශයට වර්ෂාව දෙන්ටද නුඹේ
අත්වල සියලු වැඩට ආශීර්වාද කරන්ටද
අහස නමැති තමන්ගේ උතුම් ගබඩාව
නුඹට විවෘත කරනසේක. නුඹ බොහෝ
ජාතීන්ට ණයට දෙන නුමුත් නුඹ ණයට
13 නොගන්නෙහිය. මා අද නුඹලාට
අණකරන සියලු වචනවලින් නුඹ
දකුණටවත් වමටවත් හැරී අන්
දෙවිවරුන්ට සේවය කරන්ට ඔවුන්
14 පස්සේ නොගොස්, මා අද නුඹට
අණකරන නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** ආඥා පවත්වමින් ඉෂ්ටකරන
ලෙස නුඹ ඒවාට කීකරුවන්නෙහි නම්,
**ස්වාමීන්වහන්සේ** නුඹ වල්ගය නොව
හිස වෙන්ට සලස්වනවා ඇත; නුඹද
යටින් නොව ඉහළින්ම සිටිනවා ඇත.

## අකීකරුවීමේ ශාපලත්කම

15 නුමුත් මා විසින් අද නුඹට අණකරන
නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
සියලු ආඥාද පනත්ද පවත්වන්ට බලා
ගන්න හැටියට නුඹ උන්වහන්සේගේ
හඬට කන්නොදෙන්නෙහිනම්, මේ සියලු
ශාප නුඹ පිටට පැමිණ නුඹ අසුකර
16 ගන්නේය. නුඹ නුවරෙහි ශාපලද්දෙක්ද
කෙතෙහි ශාපලද්දෙක්ද වන්නෙහිය.
17 නුඹේ පැසටද පිටි අනන ඔරුවටද ශාප
18 පැමිණෙන්නේය. නුඹේ ගර්භයේ ඵලයටද
නුඹේ භූමියේ ඵලයටද නුඹේ ගවයන්ගේ
බෝවීමටද නුඹේ එළු බැටළු පැටවුන්ටද
19 ශාප පැමිණෙන්නේය. නුඹ ඇතුළට එන
විටද පිටතට යන විටද ශාප ලබන්-
20 නෙහිය. නුඹ විසින් මා අත්හැරීමෙන්
කළාවූ නුඹේ නපුරු ක්‍රියා නිසා නුඹ
විනාශව ඉක්මනින් නැතිව යන තෙක්,
නුඹ කරන්ට අත තබන සියල්ලේදී
**ස්වාමීන්වහන්සේ** ශාපයද පරාජයද
තරවටුවද නුඹ පිටට එවනසේක.
21 **ස්වාමීන්වහන්සේ** නුඹ හිමිකරගන්ට යන
භූමිය මතුපිටින් නුඹ නැතිකර දමන
තුරුම වසංගතය නුඹට ඇලී තිබෙන්ට
22 සලස්වනසේක. **ස්වාමීන්වහන්සේ**
ක්ෂයරෝගයෙන්ද උණෙන්ද උෂ්ණයෙන්ද
දැවිල්ලෙන්ද කඩුවෙන්ද ගොයම්
වියළීමෙන්ද ගොයම් රෝගයෙන්ද නුඹට
පහරදෙනසේක; නුඹ නැතිවීයන තුරු
ඒවා නුඹ එළවාගන එනවා ඇත. නුඹේ 23
හිසට උඩින් තිබෙන අහස පිත්තල
වන්නේය, නුඹට යටින් තිබෙන භූමිය
යකඩ වන්නේය. **ස්වාමීන්වහන්සේ** නුඹේ 24
දේශයෙහි වර්ෂාව සුනුද ධූලිද වෙන්ට
සලස්වනසේක. නුඹ විනාශවෙන තුරු
අහසෙන් ඒවා නුඹ පිටට බසින්නේය.
**ස්වාමීන්වහන්සේ** නුඹේ සතුරන් ඉදිරියෙහි 25
නුඹ පරාජයවෙන්ට සලස්වනසේක. නුඹ
ඔවුන්ට විරුද්ධව එක මගකින් ගොස්
සත් මගකින් ඔවුන් ඉදිරියෙන්
පලායන්නෙහිය. නුඹ පොළොවේ සියලු
රාජ්‍යවල ඔබ මොබ ගෙනයනු
ලබන්නෙහිය. නුඹේ මළකඳ ආකාශයේ 26
සියලු පක්ෂීන්ටද භූමියේ සියලු
මෘගයන්ටද ගොදුරු වන්නේය, කිසිවෙක්
උන් භයගන්වා නොඑළවන්නේය. සුව 27
විය නොහැකි ලෙස **ස්වාමීන්වහන්සේ**
මිසරයේ ගඩුවලින්ද අර්ශස්වලින්ද
පිළිකාවලින්ද හොරිවලින්ද නුඹට
පහරදෙනසේක. **ස්වාමීන්වහන්සේ** 28
උමතුකමද අන්ධකමද විස්මිතභාවයද
යන මේවායින් නුඹට පහරදෙනසේක.
අන්ධයා අඳුරෙහි අතගගා යන්නාක් 29
මෙන් නුඹ ඉරමුදුන් වේලාවෙහි අතගගා
යන්නෙහිය, නුඹේ මාර්ගවලදී නුඹ සඵල
නොවන්නෙහිය. නුඹ ගළවන්ට කිසිවෙකු
නැතුව නුඹ නිරන්තරයෙන් පීඩාවට හා
කොල්ලයටම ගොදුරු වන්නෙහිය. නුඹ 30
භාර්යාවකට විවාහ බස් දෙන නුමුත්
අනිකෙක් ඈ සමග සයනයකරන්නේය.
නුඹ ගෙයක් ගොඩනගන නුමුත් එහි
නොවසන්නෙහිය. නුඹ මිදිවත්තක් වවන
නුමුත් ඒකේ ඵල භුක්තිනොවිඳින්නෙහිය.
නුඹේ ගොනා නුඹේ ඇස් ඉදිරියෙහි මරනු 31
ලබන නුමුත් නුඹ එයින් නොකන්නෙහිය.
නුඹේ කොටළුවා නුඹ ඉදිරියෙන්
බලාත්කාරයෙන් ගනු ලබන්නේය, නැවත
ඌ නුඹට නොලැබෙන්නේය. නුඹේ
බැටළුවෝ නුඹේ සතුරන්ට දෙනු

ලබන්නෝය, නුඹ ගළවන්ට කිසිවෙක්
32 නොවන්නේය. නුඹේ පුත්‍රයෝද දූවරුද
අන් සෙනඟකට දෙනු ලබන්නෝය, ඔවුන්
ගැන දවස මුළුල්ලේම බලා සිටීමෙන්
නුඹේ ඇස් ක්ෂයවන්නේය. නුඹේ අතේ
බලයෙන් කිසිවක් කළනොහැකි වන්නේය.
33 නුඹේ භූමියේ පලදාවද නුඹේ මුළු උත්සාහ
ලාභයද නුඹ නොදන්න සෙනඟක්
භුක්තිවිඳිනවා ඇත, නුඹ නිරන්තරයෙන්
පීඩාවට හා බලාත්කාරයටම ගොදුරු-
34 වන්නෙහිය. නුඹේ ඇස්වලින් දකින කාරණා
නිසා නුඹ උමතුකමට පැමිණෙන්නෙහිය.
35 නුඹේ පතුළ පටන් හිස්මුදුන දක්වා
සුවයක් නොහැකිවන ලෙස **ස්වාමීන්-
වහන්සේ** නුඹේ දණහිස්වලටද කකුල්-
වලටද නපුරු ගඩු හටගැන්වීමෙන් නුඹට
36 පහරදෙනසේක. **ස්වාමීන්වහන්සේ** නුඹද
නුඹ කෙරෙහි නුඹ පත්කරගන්න රජුද
නුඹවත් නුඹේ පියවරුන්වත් දන නොගත්
ජාතියක් වෙතට පමුණුවනසේක; එහිදී
නුඹ ලීද ගල්ද වූ අන් දෙවිවරුන්ට සේවය-
37 කරන්නෙහිය. **ස්වාමීන්වහන්සේ** නුඹ
පමුණුවන්නාවූ සියලු ජනයන් අතුරෙහි
නුඹ මවිතයට හේතුවක්ද උපමාවක්ද
38 නින්දා කීමක්ද වන්නෙහිය. නුඹ බොහෝ
බීජ කෙතට ගෙනයන නුමුත් ස්වල්පයක්ම
රැස්කරගන්නෙහිය; මක්නිසාද පළඟැටියෝ
39 ඒවා කාදමන්නෝය. නුඹ මිදිවතු වවා
ඒවා සශ්‍රීකකරන නුමුත් පණුවන් ඒවා
කාදමන බැවින් නුඹ මුද්‍රිකපානය
නොබොන්නෙහිය, එල නෙළා
40 නොගන්නෙහිය. නුඹේ සියලු සීමාවල
ඔලීව ගස් නුඹට තිබෙන නුමුත් ඔලීව
තෙල් ගාගන්ට නුඹට නොලැබේ;
මක්නිසාද නුඹේ ඔලීව එල වැටීයන්නේය.
41 නුඹ පුත්‍රයන්ද දූවරුන්ද ජාතකකරන
නුමුත් ඔව්හු නුඹට නොවන්නෝය;
මක්නිසාද ඔව්හු වහල්කමට යන්නෝය.
42 නුඹේ සියලු ගස්ද නුඹේ භූමියේ එලද
43 පළඟැටියෝ භුක්තිවිඳින්නෝය. නුඹ අතරේ
සිටින විදේශියා වැඩි වැඩිව නුඹට වඩා
උසස් වන්නේය; නුඹ වැඩි වැඩිව පහත්
44 වන්නෙහිය. ඔහු නුඹට ණයට දෙනවා
මිස නුඹ ඔහුට ණයට දෙන්නේ නැත.
ඔහු හිස වන්නේය, නුඹ වල්ගය වන්නෙහිය.

නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට 45
අණකළ තමන්ගේ ආඥාද තමන්ගේ
පනත්ද පවත්වන පිණිස උන්වහන්සේගේ
හඬට කන්නුදුන් බැවින් මේ සියලු ශාප
නුඹ පිටට පැමිණ, නුඹ නාස්තිවෙන
තුරු නුඹ පස්සේ එළවාගෙන ඇවිත්
නුඹ අසුකරගන්නේය. ඒවා ලකුණක් 46
හා පුදුමයක් පිණිස නුඹ පිටත් නුඹේ
වංශය පිටත් සදාකාලයටම වන්නේය.
සියලු දේ පුරාම තිබෙද්දී නුඹ ප්‍රීතියෙන්ද 47
සිත් සන්තෝෂයෙන්ද නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** සේවය නොකළ
නිසා, **ස්වාමීන්වහන්සේ** නුඹට විරුද්ධව 48
එවන්නාවූ නුඹේ සතුරන්ට නුඹ විසින්
බඩගින්නද පිපාසයද නිර්වස්ත්‍රකමද
සියල්ල ගැන හිඟකමද ඇතුව
සේවයකරනවා ඇත. ඔවුන් නුඹ
විනාශකර දමන තුරු යකඩ වියගහක්
නුඹේ කරේ තබනවා ඇත. මහල්ලාට 49
ගෞරව නොකරන්නාවූ, බාලයාට
අනුකම්පා නොකරන්නාවූ, රෞද්‍ර මුහුණු
ඇත්තාවූ, නුඹට නොතේරෙන භාෂාවක් 50
කථාකරන්නාවූ ජාතියක් රාජාලියා
වේගයෙන් එන්නාක් මෙන් දුර සිට
පොළොවේ කෙළවරෙන් **ස්වාමීන්-
වහන්සේ** නුඹට විරුද්ධව පමුණුවනසේක.
නුඹ විනාශවී යන තුරු ඔව්හු නුඹේ 51
සිව්පාවුන්ගේ එලයද නුඹේ භූමියේ
එලයද කාදමන්නෝය. ඔව්හු නුඹ
නැතිකර දමන තුරු නුඹට ධාන්‍යවත්
මුද්‍රික රසයවත් තෙල්වත් නුඹේ ගව
වස්සන්වත් එළු බැටළු පැටවුන්වත්
ඉතුරු නොකරන්නෝය. නුඹේ මුළු 52
දේශයෙහි තිබෙන්නාවූ නුඹ විශ්වාසය
තැබූ නුඹේ උස්වූ බලවත් පවුරු වැටෙන
තුරු, ඔව්හු නුඹේ සියලු නුවර දොරටුවලදී
නුඹ වටලාගන්නෝය. නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට දුන් නුඹේ මුළු
දේශයෙහි තිබෙන නුඹේ සියලු නුවර
දොරටුවලදී ඔව්හු නුඹ වටලාගන්නෝය.
නුඹේ සතුරන් විසින් නුඹ වටලා අවහිර 53
කිරීමෙන් වන තද පීඩාවේදී නුඹේ
ශරීරයේ එලය වන නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹට දුන් පුත්‍රයන්ගෙන්

54 දූවරුන්ගෙත් මාංස කන්නෙහිය. නුඹලා
අතරේ බොහෝ සැපෙන් සිටි සුමුදු
මනුෂ්‍යයා වනාහි, නුඹේ සතුරන් විසින්
නුඹේ සියලු නුවර දෙරටුවලදී නුඹ වටලා
අවහිර කිරීමෙන් වන තද පීඩාවේදී,
55 තමාට කිසිවක් ඉතුරුව නැති බැවින්
කන්නාවූ තමාගේ දරුවන්ගේ මාංසයෙන්
කොටසක් තමාගේ සහෝදරයාටවත්
තමාගේ ළයේ භාර්යාවටවත් ඔහු ඉතුරු
කරන තමාගේ අනික් දරුවන්ගෙන්
කිසිවෙකුටවත් නොදෙන හැටියට ඔවුන්
කෙරෙහි ඔහුගේ බැල්ම අප්‍රසන්න
56 වන්නේය. මෘදුකම සහ සිව්මැළිකම
නිසා පතුල බිම තබන්ට අකමැතිවූ
නුඹලා අතරේ සිටින මෘදුවූ සිව්මැළිවූ
ස්ත්‍රියගේ බැල්ම ඇගේ කකුල් අතරෙන්
පිටත එන්නාවූ ඇගේ වැදෑමහ
57 පිළිබඳයෙන්ද, ඈ වදන්නාවූ ළදරුවන්
පිළිබඳයෙන්ද, ඇගේ ළයෙහි පුරුෂයා
කෙරෙහිත් ඇගේ පුත්‍රයා කෙරෙහිත් ඇගේ
දූව කෙරෙහිත් අප්‍රසන්න වන්නේය.
මක්නිසාද නුඹේ සතුරා නුඹේ නුවර
දෙරටුවලදී නුඹ වටලා අවහිර කිරීමෙන්
වන තද පීඩාවේදී, ඈට කිසිවක් නැති
58 බැවින් ඈ ඔවුන් රහසින් කන්නීය. නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** යන මේ
මහිමවත් භයානක නාමයට භයවෙන
හැටියට මේ පොතෙහි ලියා තිබෙන මේ
ව්‍යවස්ථාවේ සියලු වචන රක්ෂාකරන්ට
59 බලානොගන්නෙහි නම්, **ස්වාමීන්-
වහන්සේ** නුඹ සහ නුඹේ වංශය කෙරෙහි
පුදුමවූ පීඩාවල් එනම් මහත්වූ
පවතින්නාවූ පීඩාද නපුරුවූ පවතින්නාවූ
60 රෝගද පමුණුවනසේක. නුඹට භය
ඉපදෙවූවාවූ මිසරයේ සියලු රෝගත්
නුඹ පිටට නැවත පමුණුවනසේක; ඒවාද
61 නුඹට ඇලී තිබෙන්නේය. ඇරත් මේ
ව්‍යවස්ථා පොතෙහි නොලියනලද සියලු
රෝග පීඩාද නුඹ විනාශවෙන තුරු
**ස්වාමීන්වහන්සේ** නුඹ පිටට පමුණුවන-
62 සේක. නුඹලා අහසේ තාරකා මෙන්
වැඩිවී සිටිය නුමුත්, නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** හඬට කන්නුදුන්
බැවින් නුඹලා ස්වල්ප ගණනක්ව ඉතිරි
වන්නාහුය. තවද නුඹලාට යහපත 63
කරන්ටත් නුඹලා වැඩිකරන්ටත්
**ස්වාමීන්වහන්සේ** නුඹලා කෙරෙහි
ප්‍රසන්නව සිටියාක් මෙන්, නුඹලා
විනාශකොට නැතිකරන්ට **ස්වාමීන්-
වහන්සේ** ප්‍රසන්නවනසේක; නුඹ විසින්
හිමිකරගැනීමට ඇතුල්වෙන දේශයෙන්ද
නුඹලා උදුරාදමනු ලබන්නහුය.
පොළොවේ එක් කෙළවරක පටන් අනික් 64
කෙළවර දක්වා සියලු මනුෂ්‍ය වර්ගයන්
අතරෙහි **ස්වාමීන්වහන්සේ** නුඹ විසුරුවා-
දමනසේක; එහිදී නුඹවත් නුඹේ
පියවරුන්වත් දනනොගත් ලීද ගල්ද වූ
අන් දෙවිවරුන්ට නුඹ සේවය
කරන්නෙහිය. ඒ ජාතීන් අතරෙහි නුඹට 65
කිසි පහසුවක්වත් නුඹේ පතුලට කිසි
සහනයක්වත් නොලැබෙන්නේය. එහි
**ස්වාමීන්වහන්සේ** මවිතවන සිතක්ද ඇස්
වැහැරයාමද ආත්මයේ ක්ලාන්තකමද
නුඹට දෙනසේක. නුඹේ ජීවිතය ගැන 66
නුඹට අනුමාන ඇතිවන්නේය; නුඹ රෑ
දවල් භය ඇතුව, නුඹේ ජීවිතය ගැන
විශ්වාසයක් නැතුව සිටින්නෙහිය. නුඹේ 67
සිතට පැමිණෙන භීතියද නුඹේ ඇස්වලින්
දකින කාරණාද නිසා නුඹ උදය-
කාලයෙහි: අහෝ, දැන් සවස නම්
හොඳය කියාද, සවස්කාලයෙහි: අහෝ,
දැන් උදය නම් හොඳය කියාද
කියන්නෙහිය. නුඹ තවත් ඒක 68
නොදකින්නෙහියයි මා විසින් නුඹ කී
මාර්ගයෙන් නැව්වලින් **ස්වාමීන්වහන්සේ**
නුඹ මිසරයට නැවත ගෙනයනසේක.
එහිදී නුඹලාගේ සතුරන්ට දසයන්ද
දසීන්ද කොට නුඹලාම විකුණනු
ලබන්ට සැදී සිටින නුමුත් කිසිවෙක්
නුඹලා මිලේට නොගන්නේයයි කීවේය.

## අවවාද හා තරවටු

29 **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්
පුත්‍රයන් සමග හොරේබ්හිදී කළ
ගිවිසුම හැර උන්වහන්සේ මෝවබ්
දේශයෙහිදී ඔවුන් සමග කරනලෙස
මෝසෙස්ට අණකළ ගිවිසුමේ වචන
මේය.

2 මෝසෙස් සියලු ඉශ්‍රායෙල්වරුන් කැඳවා
ඔවුන්ට මෙසේ කීය: ස්වාමීන්වහන්සේ
මීසර දේශයෙහි නුඹලාගේ ඇස් ඉදිරියේදී
ඵාරාවෝට්ද ඔහුගේ සියලු මෙහෙ-
කරුවන්ටද ඔහුගේ මුළු දේශයටද
3 කළාවූ සියල්ල වන නුඹේ ඇස්වලින්
දුටුවාවූ මහත් පරීක්ෂණද ලකුණුද ඒ
4 මහත්වූ පුදුමද නුඹලා දුටුවහුය. එසේ
නුමුත් දැනගැනීමට සිතක්ද දැකීමට
ඇස්ද ඇසීමට කන්ද අද දවස දක්වා
ස්වාමීන්වහන්සේ නුඹලාට නුදුන්සේක.
5 උන්වහන්සේද: මම සතළිස් අවුරුද්දක්
නුඹලා කාන්තාරයෙහි ගෙනායෙමි.
නුඹලාගේ වස්ත්‍ර නුඹලා පිට පරණ
නොවීය, නුඹේ පයෙහි නුඹේ වහන්
6 පරණ නොවීය. නුඹලා රොටි කෑවේවත්
මුද්‍රික රස හෝ මද්‍යපානය බීවේවත්
නැත. මෙසේ වූයේ මම නුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ බව නුඹලා විසින්
දැනගන්නා පිණිසයයි කියනසේක.
7 නුඹලා මේ ස්ථානයට පැමුණුණකල
හෙෂ්බොන්හි රජවූ සීහොන්ද බාෂාන්හි
රජවූ ඕග්ද අපට විරුද්ධව යුද්ධයට
8 ආවෝය. අපි ඔවුන්ට පහරදී, ඔවුන්ගේ
දේශය අල්ලාගෙන, රූබෙන්වරුන්ටද
ගාද්වරුන්ටද මනස්සේගේ අර්ධගෝත්‍රයටද
9 එය උරුමයක් කොට දුනිමුව. එබැවින්
නුඹලා කරන සියල්ලෙහි නුඹලා
සඵලවන පිණිස මේ ගිවිසුමේ වචන
පවත්වා රක්ෂාකරපල්ලා.
10 නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹට
කී හැටියටද, නුඹේ පියවරුන් වන
ආබ්‍රහම්ටත් ඊසාක්ටත් යාකොබ්ටත්
දිවුළ හැටියටද, අද උන්වහන්සේ නුඹ
තමන්ට සෙනඟක් කොට ස්ථිරකරන
පිණිසත් නුඹේ දෙවියන්වහන්සේ වන
11 පිණිසත්, නුඹ නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුමටද උන්වහන්සේ අද
නුඹ සමග කරන දිවුරුමටද ඇතුල්
12 වීමට, නුඹලාගේ ප්‍රධානියෝද නුඹලාගේ
ගෝත්‍රද නුඹලාගේ වැඩිමහල්ලෝද
නුඹලාගේ මූලාදෑනීහුද වන සියලු
13 ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ සහ නුඹලාගේ
බාලයන්ද භාර්යාවන්ද නුඹේ දර කපන්නා
සහ වතුර අදින්නාත් ඇතුළුව නුඹේ
අන්දයම්වල සිටින විදේශියාද යන
නුඹලා සියල්ලෝම අද නුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
සිටිනහුය. නුමුත් මේ ගිවිසුමත් මේ 14
දිවුරුමත් මා කරන්නේ නුඹලා සමග
පමණක් නොව මෙහි අද අපේ දෙවිවූ 15
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි අප වෙත
සිටින්නා සමගත් අද මෙහි අප වෙත නැති
තැනැත්තා සමගත්ය. (මක්නිසාද මීසර 16
දේශයෙහි අපි කෙසේ විසීමුද කියාත්
නුඹලා පසුකර ආ ජාතීන් මැදින් අපි
කෙසේ පසුකර ආවෙමුද කියාත් නුඹලා
දන්නහුය; ඔවුන් අතරේ තිබුණ ඔවුන්ගේ 17
පිළිකුල්කම්ද ඔවුන්ගේ ලී ගල් රන් රිදී
දේව රූපද නුඹලා දුටුවහුය.) එබැවින් ඒ 18
ජාතීන්ගේ දෙවිවරුන්ට සේවයකරන්ට
යන පිණිස අද අපේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ වෙතින් අහක්ව යන සිතක්
ඇති පුරුෂයෙක්වත් ස්ත්‍රියෙක්වත්
පවුලක්වත් ගෝත්‍රයක්වත් නුඹලා
අතරෙහි නොසිටින හැටියටත් වසද
තික්තකමද හටගන්වන මූලක් නුඹලා
අතරෙහි නොතිබෙන හැටියටත්
බලාගනිල්ලා. තවද එබඳු කෙනෙක් මේ 19
දිවුරුමේ වචන අසන විට: මම මාගේ
සිතේ මුරණ්ඩුකමින් හැසිරෙම් නුමුත්
මට සමාදනය ලැබේයයි කියමින්
පිපාසයට බේබදුකම එකතුකරන පිණිස
තමාගේ සිතතුළ තමාට ආශීර්වාද
කරගත්තොත්, ස්වාමීන්වහන්සේ ඔහුට 20
කමානොවනසේක, ස්වාමීන්වහන්සේගේ
උදහස සහ කෝපය ඒ මනුෂ්‍යයාට
විරුද්ධව ඇවිළෙන්නේය. මේ පොතෙහි
ලියා තිබෙන මුළු ශාපයද ඔහු පිට
පිහිටන්නේය, ස්වාමීන්වහන්සේ ඔහුගේ
නාමය අහස යටින් මකාදමා, මේ 21
ව්‍යවස්ථා පොතෙහි ලියා තිබෙන ගිවිසුමේ
සියලු ශාපවල ප්‍රකාරයට නපුර පිණිස
සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් ඔහු
වෙන්කරනසේක. එවිට නුඹලාට පසුව 22
නැගිටින පරම්පරාව වන නුඹලාගේ
දරුවන්ද දුර රටකින් එන විදේශියාද
එසේය, සියලු ජාතීන්ද ඒ දේශයේ
පීඩාවල් සහ ස්වාමීන්වහන්සේ ඒක පිටට
පැමිණෙවූ රෝගද, ස්වාමීන්වහන්සේ 23

තමන්ගේ උදහසිනුත් කෝපයෙනුත්
විනාශකළාවූ සොදෙම් සහ ගො-
මොරාහිද අද්මා සහ ශෙබොයිම්හිද
විනාශය මෙන් ඒ මුළු දේශයෙහි
වැපිරීමක්වත් කිසි පලා ජාතියක්
වැවීමක්වත් හටගැනීමක්වත් නොවන
ලෙස ඒක ගෙන්දගමෙනුත් ලුණුවලිනුත්
24 දලා තිබෙන බවද දුටු කල්හි: මේ දේශයට
ස්වාමීන්වහන්සේ මෙසේ කළේ
මක්නිසාද? මේ මහත්වූ උදහසේ
බලවත්කමට කාරණය කිමෙක්දැයි
25 කියනවා ඇත. එවිට මනුෂ්‍යයෝ
කථාකොට: ඔවුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ඔවුන් මිසර
දේශයෙන් පිටතට ගෙනා විට ඔවුන්
සමග කළාවූ උන්වහන්සේගේ ගිවිසුම
26 ඔවුන් අත්හැර ගොස්, ඔවුන් දන-
නොගත්තාවූ, උන්වහන්සේ ඔවුන්ට නියම
නොකළාවූ අන් දෙවිවරුන්ට සේවය-
කරන්ටත් නමස්කාරකරන්ටත් යෙදුණු
27 බැවින්, මේ පොතෙහි ලියා තිබෙන මුළු
ශාපය මේ දේශය පිටට පමුණුවන
හැටියට ස්වාමීන්වහන්සේගේ උදහස ඊට
28 විරුද්ධව ඇවිළුණේය; ස්වාමීන්වහන්සේ
උදහසෙන්ද කෝපයෙන්ද මහත් අමනාප-
යෙන්ද ඔවුන් ස්වකීය භූමිය මතුපිටින්
අහක්කර, අද දවසේ තිබෙන්නාක් මෙන්
ඔවුන් අන් දේශයකට හෙළාදමූසේකැයි
29 කියන්නෝය. රහස්වූ දේ අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට අයිතිය. එහෙත් මේ
ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින්
පවත්වන පිණිස එළිදරව්කර තිබෙන
දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම
අයිතිය.

## මිදීමේ පොරොන්දු සහ ජීවනයට ආරාධනා

30 තවද මා විසින් නුඹ ඉදිරියෙහි
තැබූ ආශීර්වාදයද ශාපයද යන
මේ සියලු දේ නුඹ පිටට පැමිණි කල්හි
නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ විසින්
නුඹ පන්නාදමූ සියලු ජාතීන් අතරේදී
2 ඒවා සිතට ගෙන, නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ දෙසට හැරී, අද මා විසින්
නුඹට අණකරන සියල්ල ලෙස නුඹද
නුඹේ පුත්‍රයෝද මුළු සිතෙනුත් මුළු
ආත්මයෙනුත් උන්වහන්සේගේ හඬට
කීකරුවන්නෝ නම්, නුඹේ දෙවිවූ 3
ස්වාමීන්වහන්සේ නුඹේ වහල්කම
පහකර, නුඹට අනුකම්පාකොට, නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹ විසිරෙවූ
සියලු ජනයන් අතරෙන් නුඹ නැවත
රැස්කරගන්නසේක. නුඹෙන් පිටිවහල් 4
කරනු ලැබූ කිසිවෙක් අහසේ කෙළවර
දක්වා දුරව සිටියත් නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ එතැනින් පවා නුඹ
රැස්කොට එතැනින් නුඹ ගෙනෙනසේක.
නුඹේ පියවරුන් භුක්තිවින්දවූ දේශය 5
නුඹ විසින් භුක්තිවිඳින පිණිස නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹ එහි
පමුණුවා, උන්වහන්සේ නුඹට යහපත
කොට, නුඹේ පියවරුන්ට වඩා නුඹ
වැඩි කරනසේක. නුඹ ජීවත් වෙන පිණිස 6
නුඹේ මුළු සිතෙන්ද නුඹේ මුළු
ආත්මයෙන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ප්‍රේමකරන හැටියට නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹේ සිතද
නුඹේ දරුමුණුබුරන්ගේ සිත්ද චර්මඡේදනය
කරනසේක. නුඹේ දෙවිවූ ස්වාමීන්- 7
වහන්සේද මේ සියලු ශාප නුඹට පීඩා
කළාවූ නුඹේ සතුරන් පිටද නුඹට වෛර-
වෙන්නන් පිටද තබනවා ඇත. නුඹ හැරී 8
ඇවිත්, ස්වාමීන්වහන්සේගේ හඬට
කීකරුව, අද මා විසින් නුඹට අණ-
කරන උන්වහන්සේගේ සියලු ආඥා
පවත්වන්නෙහිය. එවිට නුඹේ දෙවිවූ 9
ස්වාමීන්වහන්සේ නුඹේ අත්වල සියලු
වැඩවල ඵලයද නුඹේ ගර්භයේ ඵලයද
නුඹේ සිව්පාවුන්ගේ ඵලයද නුඹේ
භූමියේ ඵලයද යහපත පිණිස නුඹට
වැඩිකර දෙනසේක. මක්නිසාද මේ 10
ව්‍යවස්ථා පොතෙහි ලියා තිබෙන නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ ආඥාද
පනත්ද පවත්වන හැටියට නුඹ උන්-
වහන්සේගේ හඬට කීකරුවන්නෙහි නම්,
නුඹේ මුළු සිතෙන්ද නුඹේ මුළු
ආත්මයෙන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ දෙසට හැරෙන්නෙහි නම්,
ස්වාමීන්වහන්සේ නුඹේ පියවරුන්

කෙරෙහි ප්‍රසන්නව සිටියාක් මෙන් නැවත
නුඹට යහපත පිණිස නුඹ කෙරෙහිත්
ප්‍රසන්නවනසේක.
11 අද මා විසින් නුඹට අණකරන මේ
ආඥාව නුඹට අමාරු වැඩිවූ එකක්වත්
12 දුරව තිබෙන එකක්වත් නොවේ. අප
විසින් එය පවත්වන පිණිස අප උදෙසා
ස්වර්ගයට නැගී, එය අපට ගෙනත් අපට
ප්‍රකාශකරන්නේ කවරෙක්දැයි නුඹ
විසින් අසන්ට ඕනෑවෙන හැටියට එය
13 ස්වර්ගයෙහි තිබෙනවා නොවේ. අප
විසින් එය පවත්වන පිණිස අප උදෙසා
මුහුදෙන් එතරට ගොස් එය අපට ගෙනත්
අපට ප්‍රකාශකරන්නේ කවරෙක්දැයි නුඹ
විසින් අසන්ට ඕනෑවෙන හැටියට එය
මුහුදෙන් එතර තිබෙනවාත් නොවේ.
14 නුමුත් ඒ වචනය ලෙස නුඹ කරන
පිණිස එය නුඹට ඉතා ළංව නුඹේ
මුඛයේද නුඹේ සිතේද තිබේ.
15 මෙන්න, මම අද ජීවනය හා යහපතද
මරණය හා විපතද නුඹ ඉදිරියෙහි
16 තැබීමි. එසේය, නුඹ ජීවත්ව සිට වැඩිවෙන
පිණිසද නුඹ හිමිකරගන්ට ඇතුල්වෙන
දේශයේදී නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹට ආශීර්වාද කරන පිණිසද නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** ප්‍රේමකොට,
උන්වහන්සේගේ මාර්ගවල හැසිරෙමින්,
උන්වහන්සේගේ ආඥාද පනත්ද
විනිශ්චයන්ද පවත්වන්ට මම අද නුඹට
17 අණකරමි. නුමුත් නුඹ කීකරුනොවෙන
හැටියට නුඹේ සිත හැරීගොස්, අන්
දෙවිවරුන්ට නමස්කාරකිරීමටත් සේවය-
18 කිරීමටත් නුඹ ඇදී ගියොත්, සැබවින්
නුඹලා විනාශවෙන බව අද නුඹලාට
දන්වමි; හිමිකරගන්න පිණිස ඇතුල්වීමට
නුඹ යොර්දනෙන් එතරව යන භූමිය
මතුපිට නුඹලාගේ දවස් වැඩිනොවන්නේය.
19 මා විසින් ජීවනය හා මරණයද ආශීර්වාදය
හා ශාපයද නුඹලා ඉදිරියෙහි තැබූ බවට
අද නුඹලාට විරුද්ධව සාක්ෂි පිණිස
අහසටත් පොළොවටත් හඬගසමි.
එබැවින් නුඹත් නුඹේ වංශයත් ජීවත්ව
සිටින පිණිස ජීවනය තෝරාගෙන,
20 **ස්වාමීන්වහන්සේ** නුඹේ පියවරුන් වන
ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද දෙන
හැටියට ඔවුන්ට දිවුළ භූමිය මතුපිට
නුඹ වාසයකරන පිණිස, නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** ප්‍රේමකොට, උන්-
වහන්සේගේ හඬට කීකරුවී, උන්-
වහන්සේට ඇලුම්ව සිටපන්න. මක්නිසාද
නුඹේ ජීවනයත් නුඹේ දවස්වල වැඩිවීමත්
එයයයි කීවේය.

## සෙනඟට හා පූජකයන්ට මෝසෙස්ගේ අවසාන කියමන්

31 තවද මෝසෙස් ගොස් සියලු
ඉශ්‍රායෙල්වරුන්ට මේ වචන
කීවේය. ඔහු ඔවුන්ට කථාකොට: මම 2
අද අවුරුදු එකසිය විස්සක් වයස්ව
සිටිමි; තවත් පිටතට යන්ටත් ඇතුළට
එන්ටත් නොහැක්කෙමි. නුඹ මේ
යොර්දනෙන් එතරට නොයන්නෙහියයි
**ස්වාමීන්වහන්සේ** මට කීසේක. නුඹේ 3
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹට පෙරටුව
එතරට යනසේක; උන්වහන්සේම නුඹ
ඉදිරියෙන් මේ ජාතීන් විනාශකරනසේක,
නුඹ ඔවුන්ගේ දේශය හිමිකරගන්නෙහිය.
**ස්වාමීන්වහන්සේ** කී ලෙස යෝෂුවා
නුඹට පෙරටුව යන්නේය. **ස්වාමීන්-** 4
**වහන්සේ** විනාශකළ අමෝරිවරුන්ගේ
රජුන්වූ සීහොන්ට සහ ඕග්ටද ඔවුන්ගේ
දේශයටද කළ ලෙස උන්වහන්සේ
මොවුන්ටත් කරනසේක. **ස්වාමීන්-** 5
**වහන්සේ** මොවුන් නුඹලාට පාවාදුන්
කල්හි මා විසින් නුඹලාට අණකළ මුළු
ආඥාවේ හැටියට ඔවුන්ට කරපල්ලා.
ශක්තිමත්ව ධෛර්යවත්ව සිටපල්ලා, 6
ඔවුන් ගැන භයනොවෙල්ලා, තැති-
නොගනිල්ලා. මක්නිසාද නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේම** නුඹ සමඟ යනසේක;
උන්වහන්සේ නුඹෙන් අහක්ව යන්නේවත්
නුඹ අත්හරින්නේවත් නැතැයි කීවේය.
මෝසෙස් යෝෂුවා කැඳවා සියලු 7
ඉශ්‍රායෙල්වරුන් ඉදිරියෙහි ඔහුට කථා-
කොට: නුඹ ශක්තිමත්ව ධෛර්යවත්ව
සිටපන්න. මක්නිසාද මේ සෙනඟට දෙන
හැටියට **ස්වාමීන්වහන්සේ** ඔවුන්ගේ

පියවරුන්ට දිවුළ දේශයට තුඹ ඔවුන්
සමග ගොස් ඒක ඔවුන්ට උරුමකර-
8 දෙනවා ඇත. **ස්වාමීන්වහන්සේම** තුඹට
පෙරටුව යනසේක; උන්වහන්සේ තුඹ
සමග වනසේක, උන්වහන්සේ තුඹෙන්
අහක්ව යන්නේවත් තුඹ අත්හරින්නේවත්
නැත. භයනොවන්න, නොකැලඹෙන්නැයි
කීවේය.
9 මෝසෙස් මේ ව්‍යවස්ථාව ලියා,
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය
ගෙනයන ලෙවීගේ පුත්‍රයන්වූ පූජකයන්ටද
සියලු ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ටද එය
10 භාරදී, ඔවුන්ට අණකරමින් කියනුයේ:
සෑම අවුරුදු සතක කෙළවරදී, මිදීමේ
අවුරුද්දේදී, නියම කාලය වන කූඩාරම්
11 මංගල්‍යයේදී, තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** තෝරාගන්න ස්ථානයේ
උන්වහන්සේ ඉදිරියෙහි පෙනෙන පිණිස
සියලු ඉශ්‍රායෙල්වරුන් ආ විට, මේ
ව්‍යවස්ථාව සියලු ඉශ්‍රායෙල්වරුන්
අසාගන සිටිද්දී ඔවුන් ඉදිරිපිට කියවා-
12 පන්න. පුරුෂයන්ද ස්ත්‍රීන්ද බාලයන්ද
තුඹේ දොරටු ඇතුළෙහි සිටින විදේශියාද
අසා ඉගෙනගන තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** භයවී මේ ව්‍යවස්-
ථාවේ සියලුම වචනවල හැටියට කරන්ට
13 බලාගන්න පිණිසද, එය දැනනොගත්
ඔවුන්ගේ දරුවන්ද අසා තුඹලා හිමි-
කරගන්ට යොර්දනෙන් එතරව යන
භූමිය මතුපිට තුඹලා ජීවත්වෙන
සියලු දවස්වල තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** භයවෙන්ට ඉගෙනගන්න
පිණිසද සෙනඟ රැස්කරපල්ලායයි
කීවේය.

## ඉශ්‍රායෙල්ගේ පසුබටවීම ගැන දැන්වීම

14 **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කථා-
කොට: බලව, තුඹ මැරෙන කාලය
ආසන්නය. තුඹ යෝෂුවා කැඳවාගන
විත් මා විසින් ඔහුට අණකරන පිණිස
සම්මුඛවීමේ කූඩාරමෙහි සිටපල්ලායයි
කීසේක. එවිට මෝසෙස් හා යෝෂුවා
ගොස් සම්මුඛවීමේ කූඩාරමෙහි
15 සිටියෝය. **ස්වාමීන්වහන්සේද** වලා-
ටැඹකින් කූඩාරමෙහි පෙනුණුසේක.
වලාටැඹ කූඩාරමේ දොරකඩට ඉහළින්
පිහිටා සිටියේය. **ස්වාමීන්වහන්සේ** 16
මෝසෙස්ට කථාකොට: බලව, තුඹ
තුඹේ පියවරුන් සමග සැතපෙන්නෙහිය;
මේ සෙනඟද නැගිට ඔවුන් යන දේශයෙහි
වූ අන්‍ය දෙවිවරුන් සමග වේශ්‍යාකම්කර,
මා අත්හැර, මා ඔවුන් සමග කළ මාගේ
ගිවිසුම කඩකරනවා ඇත. ඒ දවසේ 17
මාගේ උදහස ඔවුන්ට විරුද්ධව
ඇවිළෙන්නේය, මම ඔවුන් අත්හැර මාගේ
මුහුණ ඔවුන්ගෙන් සඟවාගන්නෙමි, එවිට
ඔව්හු කොල්ලයක් වන්නෝය, ඔවුන්
පිටට බොහෝ විපත්තිද දුක්ද
පැමිණෙන්නේය; ඔව්හු ඒ දවසේ
කථාකොට: මේ විපත්ති අප පිටට
පැමිණ තිබෙන්නේ අපේ දෙවියන්-
වහන්සේ අප අතරේ නැති නිසා නොවේදැයි
කියන්නෝය. ඔවුන් අන් දෙවිවරුන් 18
වෙතට හැරීයාමෙන් කළාවූ සියලු
දුෂ්ටකම් නිසා ඒ දවසේදී මාගේ මුහුණ
සැබවින් සඟවාගන්නෙමි. එබැවින් මේ 19
ගීතිකාව ලියාගෙන ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
උගන්වාපල්ලා. මේ ගීතිකාව ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට විරුද්ධව මා උදෙසා සාක්ෂියක්
වන පිණිස ඒක ඔවුන්ගේ මුඛයෙහි
තබාපල්ලා. මක්නිසාද මා විසින් ඔවුන්ගේ 20
පියවරුන්ට දිවුළාවූ, කිරි හා මීපැණි
ගලායන්නාවූ දේශයට මා විසින් ඔවුන්
පැමිණෙවූ කල්හි, ඔවුන් කා තෘප්තියට
පැමිණ තරවූ කල්හි, ඔවුන් අන් දෙවිවරුන්
වෙතට හැරී ඔවුන්ට සේවයකරමින්, මා
එපාකර මාගේ ගිවිසුම කඩකරනවා
ඇත. එසේ ඔවුන් පිටට බොහෝ විපත්තිද 21
දුක්ද පැමිණි කල්හි, මේ ගීතිකාව
ඔවුන්ගේ දරුමුණුබුරන්ගේ මුඛවලින්
පහවී නොයන බැවින් මෙය
ඔවුන්ට උත්තර දෙන සාක්ෂිකාරයෙකු
මෙන් සාක්ෂිදරනවා ඇත. මක්නිසාද
මා විසින් දිවුළ දේශයට ඔවුන්
පමුණුවන්ට මත්තෙන් දැන් පවා ඔවුන්
කරන ඔවුන්ගේ යෝජනාව දනිමියි
කීසේක. එබැවින් මෝසෙස් එම දවසෙහි 22
මේ ගීතිකාව ලියා ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
ඉගැන්නුවේය. උන්වහන්සේ නූන්ගේ පුත්‍රවූ 23
යෝෂුවාට අණකරමින්: තුඹ ශක්තිමත්ව

ධෛර්යවත්ව සිටපන්න. මක්නිසාද මා
විසින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට දිවුළ දේශයට
නුඹ ඔවුන් ගෙනයන්නෙහිය. මමද නුඹ
සමග සිටින්නෙමියි කීසේක.
24 තවද මෝසෙස් මේ ව්‍යවස්ථාවේ වචන
නීන්දුවටම පොතක ලියා නිමකළ කල්හි,
25 **ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය
ගෙනයන ලෙවීවරුන්ට මෝසෙස් අණ-
26 කරමින්: මේ ව්‍යවස්ථාපොත රැගෙන
මෙය එහි නුඹලාට විරුද්ධව
සාක්ෂියක්ව තිබෙන පිණිස නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම්
27 පෙට්ටිය ළඟ තබාපල්ලා. මක්නිසාද
මම නුඹේ කැරළිකාරකමද නුඹේ කුළලේ
තදකමද දනිමි. නුඹලා සමග දැන් මා
ජීවත්ව සිටියදීම නුඹලා **ස්වාමීන්-
වහන්සේට** විරුද්ධව කැරළිකාරව
සිටියහුය; මාගේ මරණයෙන් පසු
කොපමණ වැඩියෙන් එසේ නො-
28 කරන්නහුද? නුඹලාගේ ගෝත්‍රවල
වැඩිමහල්ලන්ද නුඹලාගේ මුලාදෑනීන්ද
අසාගන සිටිද්දී මා විසින් මේ වචන
කියමින් ඔවුන්ට විරුද්ධව අහසටද
පොළොවටද සාක්ෂි පිණිස හඬගසන්ට
ඔවුන් මා වෙතට රැස්කරපල්ලා.
29 මක්නිසාද මාගේ මරණයෙන් පසු
නුඹලා සහමුලින් නුඹලාම දූෂ්‍ය
කරගෙන මා නුඹලාට අණකළ
මාර්ගයෙන් අහක්ව යන බව දනිමි;
එබැවින් මතු දවස්වලදී විපත්තිය
නුඹලාට පැමිණෙන්නේය; මක්නිසාද
නුඹලාගේ අත්වල වැඩෙන් **ස්වාමීන්-
වහන්සේ** කෝපකරන හැටියට නුඹලා
උන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව
තිබෙන දේ කරනවා ඇතැයි කීවේය.
30 මෝසෙස් වනාහි මුළු ඉශ්‍රායෙල් සභාව
අසාගන සිටිද්දී මේ ගීතිකාවේ වචන
නිමවන තෙක් පැවසුවේය.

## මෝසෙස්ගේ ගීතිකාව

**32** ස්වර්ගයෙනි, කන්දෙව්, මම
කථාකරන්නෙමි;
පොළොවද මාගේ මුඛයේ වචන
අසාවා.
මාගේ ශික්ෂාව වර්ෂාව මෙන් 2
බසින්නේය,
මාගේ කථාව පිනිමෙන්ද,
ළා තණකොළ පිට වැසිපොද මෙන්ද,
තණකොළ පිට වැස්ස මෙන්ද
පහළවන්නේය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේගේ** 3
නාමය ප්‍රකාශ කරන්නෙමි.
අපගේ දෙවියන්වහන්සේගේ උතුම්කම
වර්ණනාකරව්.
උන්වහන්සේ පර්වතයය, 4
උන්වහන්සේගේ ක්‍රියාව සම්පූර්ණය;
මක්නිසාද උන්වහන්සේගේ සියලු
මාර්ග ධර්මිෂ්ඨය.
උන්වහන්සේ විශ්වාසවූ අයුතුකමෙන්
තොරවූ දෙවිකෙනෙක,
උන්වහන්සේ වනාහි ධර්මිෂ්ඨය,
අවංකය.
ඔව්හු උන්වහන්සේට විරුද්ධව 5
දුෂ්ටකම් කළෝය, ඔව්හු
උන්වහන්සේගේ දරුවෝ නොවෙති,
ඔව්හු කැලල් ඇත්තෝය;
වංකවූ වංචාකාරවූ වංශයක
අහෝ මෝඩවූ නුවණ නැති ජනයෙනි, 6
නුඹලා **ස්වාමීන්වහන්සේට** මෙසේ
ප්‍රතිඵල දෙන්නහුද?
නුඹ මිදූ තැනන්වහන්සේම නුඹේ
පියාණෝ නොවනසේක්ද?
උන්වහන්සේම නුඹ සාද නුඹ
පිහිටෙවූසේක.
පුරාණ දවස් සිහිකරව්, 7
පරම්පරාවෙන් පරම්පරාවට පසුවූණ
වර්ෂ කල්පනාකරව්.
නුඹේ පියාගෙන් අසව, ඔහු නුඹට
පෙන්වන්නේය;
නුඹේ වැඩිමහල්ලන්ගෙන් අසව,
ඔව්හු නුඹට කියන්නෝය.
මහෝත්තමයාණන් ජාතීන්ට උරුමය 8
බෙදා දුන් කල්හිද,
මනුෂ්‍ය පුත්‍රයන් වෙන්කළ කල්හිද
උන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ගණන හැටියට
ජනයන්ගේ සීමාවන්
නියමකළසේක.
මක්නිසාද **ස්වාමීන්වහන්සේගේ** 9

කොටස නම් ස්වකීය සෙනඟය;
යාකොබ් උන්වහන්සේගේ උරුම
කොටසය.
10 කාන්තාර දේශයකදීද
පාළුවූ භයංකරවූ වනයේදීද ඔහු
උන්වහන්සේට සම්බවිය;
උන්වහන්සේ ඔහු වටකරගෙන, ඔහු
රැක බලාගෙන,
තමන් ඇසේ කළුරුවාව මෙන් ඔහු
රක්ෂාකළ සේක.
11 රාජාලියා උගේ කැදැල්ල අවුස්සා,
උගේ පැටවුන් පිට තටු ගසමින්
උගේ පියාපත් විහිදුවා, උන් අරන්
උගේ පියාපත් පිට උසුලන්නාක්
මෙන්,
12 ස්වාමීන්වහන්සේ පමණක්ම ඔහු
ගෙනගිය සේක,
අන් දෙවිකෙනෙක් උන්වහන්සේ
සමග නොසිටියේය.
13 උන්වහන්සේ ඔහු පොළොවේ උස්
තැන් පිට නැගීයන්ට සැලැස්වූසේක,
ඔහුද කෙතේ අස්වැන්න කෑයේය;
පර්වතයෙන් මීපැණිද
ගිනිගල් පර්වතයෙන් තෙල්ද
උන්වහන්සේ ඔහුට පෙවූසේක;
14 දීකිරිවලින් සහ බැටළු කිරිවලින්ද
බැටළුපැටවුන්ගෙන්
බාෂන්හි බැටළුවන්ගෙන් එළුවන්ගෙන්
තෙලින්ද
තිරිඟු ඇටවල තරකමින්ද ඔහු
පෝෂණය කළසේක;
මුද්‍රික ඵලවල ලේ වන පානයද නුඹ
බීවෙහිය.
15 එහෙත් යෙෂුරුන් තරවී පයින් ගැසීය.
නුඹ තරවී ස්ථූලවී තරබාරු වූයෙහිය.
එවිට ඔහු තමා සෑදූ දෙවියන්වහන්සේ
අත්හැර,
තමාගේ ගැළවීමේ පර්වතය සුළු
කොට සිතුවේය.
16 ඔව්හු අන් දෙවිවරුන්
කරණකොටගෙන උන්වහන්සේ
කෝප කළෝය,
පිළිකුල් ක්‍රියාවලින් උන්වහන්සේ
උදහස් කළෝය.

දෙවියන්වහන්සේ නොවන දේවතාවන්ට, 17
එනම් ඔවුන් නොදන සිටියාවූ
දෙවිවරුන්ට,
අලුතෙන් පැමිණි අමුතු දෙවිවරුන්ට
ඔව්හු පූජාකළෝය.
නුඹලාගේ පියවරු ඒ දෙවිවරුන්ට
භය නූණෝය.
නුඹ ජාතකකළ පර්වතය 18
නොසලකන්නෙහිය,
නුඹ ඉපදෙවූ දෙවියන්වහන්සේ සිහිනැති
කෙළෙහිය.
ස්වාමීන්වහන්සේ ඒ දැක, 19
තමන් පුත්‍රයන්ගේද දූවරුන්ගේද
කෝප ඉපදවීම නිසා ඔවුන් එපා
කළසේක.
උන්වහන්සේ කථාකොට: මාගේ 20
මුහුණ ඔවුන්ගෙන් සඟවා ගන්නෙමි,
ඔවුන්ගේ කෙළවර කුමක්
වන්නේදැයි බලන්නෙමි.
මක්නිසාද ඔව්හු හිතුවක්කාර වංශයක,
අවිශ්වාස දරුවෝය.
දෙවි නොවන්නන් කරණකොටගෙන 21
ඔව්හු මා කෝපකළෝය;
තමුන්ගේ නිෂ්ඵලකම්වලින් මා උදහස්
කළෝය.
මමද සෙනඟක් නොවන්නන්
කරණකොටගෙන ඔවුන්
කෝපකරවන්නෙමි;
අඥාන ජාතියක් ලවා ඔවුන් උදහස්
කරවන්නෙමි.
මක්නිසාද මාගේ උදහසින් ගින්නක් 22
ඇවිළී,
ගැඹුරු පාතාලය දක්වාම දැවී
යන්නේය,
එයින් පොළොවද ඒකේ අස්වැන්නද
විනාශ වන්නේය,
කඳුවල අත්තිවාරම්ද දැවී යන්නේය.
මම ඔවුන් පිට විපත්ති 23
ගොඩකරන්නෙමි;
මාගේ ඊගස් සියල්ලම ඔවුන්ට
විදින්නෙමි.
ඔව්හු සාගතයෙන් ක්ෂයවෙමින්, 24
දවන උෂ්ණයෙන්ද
සැර විසංගතයෙන්ද නැතිවී යන්නෝය;

මෘගයන්ගේ දත්ද දූවිල්ලේ බඩගා
යන සතුන්ගේ විෂද
ඔවුන්ට විරුද්ධව යවන්නෙමි.
පිටතදී කඩුවද
25 ගෙයිදී භීතියද වන්නේය;
එය තරුණයා සහ කන්‍යාවද
කිරි දරුවා සහ පැසුණු හිසකේ
ඇත්තාද විනාශකරන්නේය.
26 ඔවුන්ගේ විරුද්ධකාරයන් වරද්ද
සිතමින්,
අපේ අතම උසස් වී තිබේ,
මේ දේවල් කළේ **ස්වාමීන්වහන්සේ**
නොවේයයි කියමින්
සතුරා කෝපකරවීමට මම
භයනොවීම් නම්,
27 මම ඔවුන් විසුරුවා දමා,
ඔවුන් ගැන සිහිවීම මනුෂ්‍යයන්
අතරෙන් නැතිකරදමන්නෙමියි කීමි.
28 මක්නිසාද ඔව්හු දැනුම් නැති ජාතියක,
ඔවුන් තුළ තේරුමක් නැත.
29 අහෝ, ඔවුන් ඥානවත්ව, මේක
තේරුම්ගෙන,
තමුන්ගේ මතු කාලය ගැන මෙනෙහි
කළොත් යහපත!
30 ඔවුන්ගේ පර්වතයාණෝ ඔවුන්
නොවික්ක සේක් නම්,
**ස්වාමීන්වහන්සේ** ඔවුන්
පාවාතුදුන්සේක් නම්,
එක්කෙනෙකු විසින් දහසක් පන්නා
දමන්නෙත්,
දෙදෙනෙකුන් විසින් දසදහසක්
එළවන්නෙත් කෙසේද?
31 අපේ සතුරන්ගේ විනිශ්චයේ හැටියට
පවා,
ඔවුන්ගේ පර්වතය අපේ පර්වතයමෙන්
නොවේ.
32 මක්නිසාද ඔවුන්ගේ මුද්‍රික වැල
සොදෝම්හි මුද්‍රිකවැලෙන්ද
ගොමොරාහි කෙත්වලින්ද වේ.
ඒවායේ වලු විෂ සහිතය,
ඒවායේ ඵල තික්තය.
33 ඔවුන්ගේ මුද්‍රිකපානය සර්පයන්ගේ
විෂය,
පොළඟුන්ගේ සැර විෂය.

මෙය මා ළඟ සඟවා, 34
මාගේ ගබඩාවල මුද්‍රකර තබා
තිබෙනවා නොවේද?
ඔවුන්ගේ පය ලිස්සන කල්හි, 35
පළිගැනීමද ප්‍රතිඵල දීමද මට අයිතිය.
මක්නිසාද ඔවුන්ගේ විපත්ති දවස
ළඟය,
ඔවුන්ට සූදනම්කර තිබෙන දේද
ඉක්මන් වන්නේය.
එසේය, **ස්වාමීන්වහන්සේ** තමන් 36
සෙනඟගේ බලය පහවී තිබෙන
බවද
දසයාත් නිර්දසයාත් නැතිවී ගිය බවද
දුටුවාම,
ස්වකීය සෙනඟට යුක්තිය ඉෂ්ටකොට,
තමන් මෙහෙකරුවන් ගැන අනුකම්පා
කරන සේක.
උන්වහන්සේ කථාකොට: ඔවුන්ගේ 37
පූජාවල තෙල කැවාවූ,
ඔවුන්ගේ පාන පූජාවේ මුද්‍රිකපානය
බීවාවූ,
ඔවුන් විශ්වාසකළ පර්වතය වන 38
ඔවුන්ගේ දෙවිවරු කොතැනද?
ඔව්හු නැගිට තුඹලාට උපකාරකොට
තුඹලාගේ ආවරණය වෙත්වා.
ඉතින් මා පමණක්ම උන්වහන්සේ 39
බවත්,
මා මිස අන් දෙවිකෙනෙක් නැති
බවත් බලා පල්ලා.
නසන්නෙත් ජීවත්කරන්නෙත් මමය;
මම තුවාලකෙළෙමි, මම සුවකරමි.
මාගේ අතින් ගළවන්ට පුළුවන්
කිසිවෙක් නැත්තේය.
මක්නිසාද මා සදාකාලේටම ජීවත් 40
වන්නාක්මෙන්,
මම මාගේ දිලිසෙන කඩුව මුවහත්
කර,
යුක්තිය අතට ගනිම් නම්, 41
මාගේ එදිරිකාරයන්ගෙන් පළිගන්නෙමි,
මට වෛරවෙන්නන්ටද ප්‍රතිඵල
දෙන්නෙමි.
මාගේ ඊගස් මැරුම්කෑවුන්ගේද 42
වාලට ගත්තවුන්ගේද ලෙයින් මත්
කරන්නෙමි;
මාගේ කඩුවද සතුරාගේ කේශ සහිත

මුදුනෙන් මාංස කන්නේයයි
මාගේ අත ස්වර්ගය දෙසට ඔසවා
කියමියි කියනසේක.
43 එම්බා ජාතීනි, උන්වහන්සේගේ
සෙනඟ සමග ප්‍රීතිවෙයල්ලා.
මක්නිසාද උන්වහන්සේ ස්වකීය
මෙහෙකරුවන්ගේ ලේවලට
පළිගනිමින්,
තමන් එදිරිකාරයන්ට ප්‍රතිඵල දී,
ස්වකීය දේශයටත් සෙනඟටත් ක්ෂමා
වනසේක.
44 මෝසෙස්ද නූන්ගේ පුත්‍රවූ යෝෂුවාද
අවුත් මේ ගීතිකාවේ සියලු වචන සෙනඟ
45 අසාගන සිටිද්දී කීවෝය. මෝසෙස් මුළු
ඉශ්‍රායෙල්ට මේ සියලු වචන කියා නිමවා
46 ඔවුන්ට කථාකොට: මේ ව්‍යවස්ථාවේ
සියලු වචනවල ප්‍රකාරයට කරන්ට
බලාගන්න හැටියට තුඹලාගේ දරුවන්ට
තුඹලා අණකරන පිණිස මා අද
තුඹලාට ස්ථිරකර කියන්නාවූ සියලු
වචනවලට තුඹලාගේ සිත් යොමු-
47 කරපල්ලා. මක්නිසාද මේක තුඹලාට
නිෂ්ඵල දෙයක් නොව තුඹලාගේ
ජීවනයව තිබේ, තුඹලා හිමිකරගන්ට
යොර්දනෙන් එතරව යන භූමිය මතුපිට
මේ දෙය කරණකොටගෙන තුඹලාගේ
දවස් තුඹලා වැඩිකරගන්නවා ඇතැයි
කීවේය.
48 එම දවසේදීම ස්වාමීන්වහන්සේ
49 මෝසෙස්ට කථාකොට: යෙරිකෝව
ඉදිරියේ මෝවබ් දේශයෙහි අබාරීම් කඳු
අතරේ තිබෙන නෙබෝ කන්දට තුඹ
නැගී, උරුමයක් පිණිස ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට මා විසින් දෙන කානාන්
50 දේශය බලා, තුඹේ සහෝදරවූ ආරොන්
හෝර් කන්දේදී මැරී තමාගේ සෙනඟට
එකතුවුණාක් මෙන්, තුඹත් මැරී තුඹේ
51 සෙනඟට එකතුවෙයන්න. එසේ වන්නේ
ශීන් කාන්තාරයේ කාදෙෂ්හි මෙරීබා
ජලය ළඟදී තුඹලා ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි මට විරුද්ධව වරදකොට
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි මට ගෞරව
52 නොකළ නිසාය. තුඹ දුර සිට දේශය
දක්නෙහිය; එහෙත් මා විසින් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට දෙන දේශයට ඇතුල්
නොවන්නෙහියයි කීසේක.

## ගෝත්‍රවලට ආශීර්වාද කිරීම

33 දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ
මෝසෙස් තමාගේ මරණයට
පළමුවෙන් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කළාවූ
ආශීර්වාදය මේය. ඔහු මෙසේ කීවේය: 2
ස්වාමීන්වහන්සේ සීනයිහි සිට
ආසේක,
සේයිර්හි සිට ඔවුන් කෙරෙහි උදවූසේක;
උන්වහන්සේ පාරාන් කන්දෙන්
බැබළුණුසේක,
දසදහසක් ශුද්ධවන්තයන් අතරේ සිට
ආසේක.
ඔවුන් උදෙසා ගිනිමය වූ ව්‍යවස්ථාවක්
උන්වහන්සේගේ දකුණතෙහි
තිබුණේය.
එසේය, උන්වහන්සේ ජනයන්ට 3
ප්‍රේම කරනසේක;
ඔවුන්ගේ සියලු ශුද්ධවන්තයෝ ඔබ
අතෙහිය.
ඔව්හු ඔබ පාමුල හිඳ,
ඔබගේ වචන පිළිගන්නෝය.
යාකොබ්ගේ සභාවේ උරුමයක් 4
කොට
මෝසෙස් අපට ව්‍යවස්ථාවක් පනවා
දුන්නේය.
ඉශ්‍රායෙල්හි සියලු ගෝත්‍ර වන 5
සෙනඟගේ ප්‍රධානීන් රැස්වූ කල,
උන්වහන්සේ යෙෂුරූන්හි රජව
සිටිසේක.
රූබෙන් නොනැසී ජීවත්වේවා; 6
එහෙත් ඔහුගේ මනුෂ්‍යයෝ ස්වල්ප
දෙනෙක් වෙත්වා.
යූදාගේ ආශීර්වාදය මේය: ඔහු 7
කියනුයේ-
ස්වාමීන්වහන්ස, යූදාගේ හඬ අසා,
ඔහුගේ සෙනඟ වෙතට ඔහු ගෙන
ආවමැනව.
ඔහු සියතින් තමා උදෙසා පොර බැඳුවේය;
ඔහුගේ එදිරිකාරයන්ට විරුද්ධව ඔබ
ඔහුට පිහිටක් වනසේකැයි කීය.
ඔහු ලෙවී ගැන කියනුයේ- 8
තුඹ විසින් මස්සාහිදී පරීක්ෂාකර,
මෙරීබාහි වතුර ළඟදී විවාදකළාවූ,
තමාගේ පියා ගැනත් මවු ගැනත් 9
මම ඔවුන් නුදුටුවෙමියි කීවාවූ,

තමාගේ සහෝදරයන් නැඳින
තමාගේ දරුවන්ද නොදන සිටියාවූ,
තුඹේ පියා තැනැත්තා ළඟ
තුඹේ *තුම්මීම්ද තුඹේ ඌරීම්ද ඇත්තේය.
මක්නිසාද ඔව්හු ඔබගේ වචනය
පැවැත්තුවෝය,
ඔබගේ ගිවිසුමද රක්ෂාකෙරෙති.
10 ඔව්හු යාකොබ්ට ඔබගේ විනිශ්චයන්ද
ඉශ්‍රායෙල්ට ඔබගේ ව්‍යවස්ථාවද
උගන්වන්නෝය.
ඔබ ඉදිරියෙහි සුවඳ දුම්ද
ඔබගේ පූජාසන මතුයෙහි මුළු දවන
පූජාවද තබන්නෝය.
11 **ස්වාමීන්වහන්ස**, ඔහුගේ ශක්තියට
ආශීර්වාද කොට,
ඔහුගේ අත්වල වැඩය පිළිගත
මැනව.
ඔහුට විරුද්ධව නැගිටින්නන්ද ඔහුට
වෛර වෙන්නන්ද
නවත් නොනැගිටින ලෙස, ඔවුන්ගේ
තුනටියට ගැසුව මැනවයි කීවේය.
12 ඔහු බෙන්යමින් ගැන කියනුයේ–
**ස්වාමීන්වහන්සේගේ** ප්‍රේමවන්තයා
උන්වහන්සේ වෙත සුරක්ෂිතව
වසන්නේය;
උන්වහන්සේ දවස මුළුල්ලේ ඔහු
ආවරණ කරනසේක,
ඔහු උන්වහන්සේගේ උරහිස් අතරේ
වාසය කරන්නේයයි කීය.
13 ඔහු යෝසෙප් ගැන කියනුයේ–
අහසේ අනර්ඝ දේවලින්ද පිනිවලින්ද
යට තිබෙන ගැඹුරෙන්ද
14 සූර්යයාගේ අනර්ඝ අස්වැන්නෙන්ද
චන්ද්‍ර මාසවල අනර්ඝ වැවිලිවලින්ද
15 පුරාණ කඳුවල උතුම් දේවලින්ද
සදාකාල හෙල්වල අනර්ඝ දේවලින්ද
16 භූමිය සහ එහි පූර්ණකමේ අනර්ඝ
දේවලින්ද
**ස්වාමීන්වහන්සේ** ඔහුගේ දේශයට
ආශීර්වාද කරන සේක්වා;
පඳුරෙහි විසූ තැනන්වහන්සේගේ
කරුණාවද
යෝසෙප්ගේ හිස පිටටත්,
තමාගේ සහෝදරයන් අතරෙහි
ශ්‍රේෂ්ඨව සිටි තැනැත්තාගේ හිස්
මුදුන පිටටත් පැමිණේවා.
ඔහුගේ ගව කුලුඳුලා එනාහි මහිමය 17
දරයි;
ඔහුගේ අං කුළු හරකාගේ අං මෙන්ය.
එයින් ඔහු ජනයන් පොළොවේ
කෙළවර දක්වා එකට තල්ලුකර
දමන්නේය.
ඒවා නම් එප්‍රායිම්ගේ දසදහස්
ගණන්ය,
ඒවා මනස්සේගේ දසදහස් ගණන්
යයි කීය.
ඔහු සාබුලොන් ගැන කියනුයේ– 18
එම්බා සාබුලොන්, තුඹේ නික්ම යාම්
ගැනද
එම්බා ඉස්සාකර්, තුඹේ කූඩාරම්
ගැනද ප්‍රීති වෙයල්ලා.
ඔව්හු කන්දට ජනයන් කැඳවාගෙන, 19
එහි ධර්මිෂ්ඨකමේ පූජා
ඔප්පුකරන්නෝය.
මක්නිසාද ඔව්හු මුහුදුවල
සම්පූර්ණකමද
වැල්ලෙහි සැඟවී තිබෙන වස්තුවද
උරාගන්නෝයයි කීය.
ඔහු ගාද් ගැන කියනුයේ– 20
ගාද් විශාලකරන තැනන්වහන්සේට
ප්‍රශංසා වේවා.
ඔහු සිංහ ධේනුවක් මෙන් හිඳ
බාහුව සහ හිස්මුදුනත් ඉරාදමන්නේය.
ඔහු ප්‍රථම කොටස තමාටම සපයා 21
ගත්තේය,
මක්නිසාද නීති දායකයා විසින් කොටසක්
එහි ඉතුරුකර තිබුණේය;
ඔහු සෙනඟගේ ප්‍රධානීන් කැඳුව විත්
**ස්වාමීන්වහන්සේගේ** ධර්මිෂ්ඨකමද
ඉශ්‍රායෙල් සමග උන්වහන්සේගේ
විනිශ්චයන්ද ඉෂ්ට කළේයයි කීය.
ඔහු දාන් ගැන කියනුයේ– 22
දාන් සිංහ පැටවෙක,
ඔහු බාෂාන්හි සිට පනින්නේයයි කීය.
ඔහු නප්තලී ගැන කියනුයේ– 23
එම්බා නප්තලී, කරුණාවෙන් තෘප්තියට
පැමිණ,
**ස්වාමීන්වහන්සේගේ** ආශීර්වාදයෙන්
පූර්ණව සිටින තුඹ,

*එනම්, ආලෝක සහ සම්පූර්ණකම්
ප්‍රකාශ කරන පස ඇට විශේෂයක්.

බස්නාහිර දිශාවද දකුණු දිශාවද
හිමිකර ගන්නැයි කීය.
24 ඔහු ආෂේර් ගැන කියනුයේ–
ආෂේර්ට දරුසම්පත ලැබේවා;
ඔහු තමාගේ සහෝදරයන්ට ප්‍රීතියක්ව
සිටීවා,
තමාගේ පාදය තෙලෙහි ගල්වා
ගනීවා.
25 නුඹේ අගුල් පොලු යකඩ සහ පිත්තලය;
නුඹේ ශක්තියද නුඹේ දවස් මෙන්
වන්නේය.
26 අහෝ යෙෂුරූන්, නුඹට උපකාර
කරන්ට අහස පිටද
ස්වකීය මහිමයෙන් වලාකුල් පිටද
නැගී එන්නාවූ
දෙවියන්වහන්සේට සමාන කෙනෙක්
නැත.
27 සදාකාල දෙවියන්වහන්සේ නුඹේ
වාසස්ථානයය,
යටින් සදාකාල හස්තයෝ නුඹ දරා
සිටින්නෝය.
නුඹ ඉදිරියෙන් උන්වහන්සේ සතුරන්
පන්නා දමා,
ඔවුන් විසින් විනාශ කරවයි කීසේක.
28 ඉශ්‍රායෙල් සුරක්ෂිතවද,
යාකොබ්ගේ උල්පත හුදකලාවද,
ධාන්‍ය හා මුද්‍රික රස ඇති දේශයක
වාසය කරයි;
එසේය, ආකාශයෙන් ඔහුට පිනි
බින්දු වැටෙයි.
29 එම්බා ඉශ්‍රායෙල්, නුඹ වාසනාවන්තය.
ස්වාමීන්වහන්සේ විසින් මුදන ලද
සෙනඟක්වූ නුඹට සමාන කවුද?
උන්වහන්සේ නුඹට උපකාර කරන
පලිහත්
නුඹේ මහිමයේ කඩුවත්ය.
නුඹේ සතුරෝ නුඹට යටත් වන්නෝය;
නුඹද ඔවුන්ගේ උසස්ථාන
පාගන්නෙහියයි කීය.

## මෝසෙස් දේශය දැකීම සහ ඔහුගේ මරණය

34 ඉක්බිති මෝසෙස් මෝවබ්
සමභූමිවල සිට යෙරිකෝව
ඉදිරිපිට නෙබෝ කන්දේ තිබෙන පිස්ගා
මුදුනට නැගුණේය. **ස්වාමීන්වහන්සේ**
ඔහුට දන් දක්වා තිබෙන මුළු ගිලියද්
දේශයද, මුළු නප්තලීයද එප්‍රායිම් සහ 2
මනස්සේ දේශයද අපර දිගවූ මුහුද
දක්වා තිබෙන මුළු යූද රටද, දකුණු 3
දිශාවද සෝවර් දක්වා තිබෙන ඉඳිගස්
නුවරවූ යෙරිකෝ මිටියාවතේ සමභූමියද
දැක්වූ සේක. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට 4
කියන සේක්: නුඹේ වංශයට දෙන්නෙමියි
කියා ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද
දිවුළ දේශය මේය. ඒක නුඹේ ඇස්වලින්
දකින්ට සැලැස්වීමි, එහෙත් නුඹ එහි
නොයන්නෙහියයි කීසේක. මෙසේ 5
**ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවූ
මෝසෙස් **ස්වාමීන්වහන්සේගේ** වචනය
ලෙස මෝවබ් දේශයේ ඒ ස්ථානයේදී
නැසුණේය. උන්වහන්සේ ඔහු මෝවබ් 6
දේශයේ බෙත්-පෙයෝර් ඉදිරිපිට තිබෙන
මිටියාවතේ තැන්පත්කළසේක; නුමුත්
කිසි මනුෂ්‍යයෙක් අද දක්වා ඔහුගේ
සොහොන්පළ නොදනියි. මෝසෙස් 7
මැරෙන කල අවුරුදු එකසිය විස්සක්
වයස්ව සිටියේය. ඔහුගේ ඇස් අඳුරු
නොවීය, ඔහුගේ ස්වාභාවික ශක්තියද
අඩු නොවීය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ මෝවබ් 8
සමභූමිවලදී මෝසෙස් ගැන තිස්දවසක්
වැලපුණෝය. මෙසේ මෝසෙස් ගැන
අඬා වැලපීමේ දවස් ඉකුත්විය. මෝසෙස් 9
තමාගේ අත් නූන්ගේ පුත්‍රවූ යෝෂුවා
පිට තැබූ බැවින් ඔහු ප්‍රඥාවේ
ආත්මයෙන් පූර්ණ වුණේය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝද ඔහුට කීකරුවී **ස්වාමීන්-** 10
**වහන්සේ** මෝසෙස්ට අණ කළ ලෙස
කළෝය. **ස්වාමීන්වහන්සේ** මෝසෙස්
යවා මිසර දේශයෙහි ඵාරාවෝට්ත්
ඔහුගේ සියලු මෙහෙකරුවන්ටත් ඔහුගේ
මුළු දේශයටත් කෙරෙවුවාවූ ඒ සියලු
ලකුණුද ආශ්චර්යද, සියලු ඉශ්‍රායෙල්- 11
වරුන්ගේ ඇස් ඉදිරියේදී ඔහු පෑවාවූ ඒ
මුළු පරාක්‍රමවත් හස්තයද ඒ සෑම මහත්
භයානකකමද සම්බන්ධයෙන්, **ස්වාමීන්-** 12
**වහන්සේ** මුහුණට මුහුණ ලා ඇඳින්නාවූ
මෝසෙස් හා සමාන ප්‍රොපේත කෙනෙක්
ඉන් පසු ඉශ්‍රායෙල්හි නොනැගිට්ටේය.

# යෝෂුවාගේ පොත

## යෝෂුවා පත් කරනු ලැබීම

1 **ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවූ
මෝසෙස් මැරුණු පසු **ස්වාමීන්-**
**වහන්සේ** මෝසෙස්ගේ සේවකයා වූ
නූන්ගේ පුත්‍රවූ යෝෂුවාට කථාකොට
2 කියනසේක්: මාගේ මෙහෙකරුවූ
මෝසෙස් මෙළේය; එබැවින් දැන් තුඹත්
මේ මුළු සෙනඟත් නැගිට මා විසින්
ඔවුන්ට එනම් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට දෙන
දේශයට මේ යොර්දනෙන් එතරව
3 පලයල්ලා. තුඹලා අඩිය තබන සියලුම
ස්ථාන මා විසින් මෝසෙස්ට කී ලෙස
4 තුඹලාට දුනිමි. කාන්තාරය හා මේ
ලෙබනොන් පටන් මහත් ගංගාව වන
ප්‍රාත් ගංගාව දක්වා හිත්තීවරුන්ගේ මුළු
දේශය සහ බස්නාහිර මහමුහුද දක්වාද
5 තුඹලාගේ සීමාව වන්නේය. තුඹේ
ජීවිතයේ සියලු දවස්වල කිසිවෙකුට
තුඹට විරුද්ධව සිටින්ට නොහැකි
වන්නේය. මම මෝසෙස් සමග සිටියාක්
මෙන්ම තුඹ සමගත් සිටින්නෙමි.
තුඹෙන් අහක්ව නොයන්නෙමි, තුඹ
6 අත්නාරින්නෙමි. ශක්තිමත්ව ධෛර්ය-
වත්ව සිටපන්න. මක්නිසාද මේ සෙනඟට
දෙන හැටියට මා විසින් ඔවුන්ගේ
පියවරුන්ට දිවුළ දේශය තුඹ
7 ඔවුන්ට උරුමකර දෙන්නෙහිය. මාගේ
මෙහෙකරුවූ මෝසෙස් තුඹට අණකළ
මුළු ව්‍යවස්ථාවේ ප්‍රකාර කරන්ට
බලාගන්න පිණිස ශක්තිමත්ව ඉතා
ධෛර්යවත්ව සිටපන්න. තුඹ යන
සෑම තැනදීම තුඹට ශුභ සිද්ධවන
පිණිස එයින් දකුණටවත් වමටවත්
8 නොහැරෙන්න. මේ *ව්‍යවස්ථා පොත
තුඹේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා
තිබෙන සියල්ල කරන්ට බලාගන්න
පිණිස රෑ දවල් ඒ ගැන මෙනෙහි
කරපන්න. එවිට තුඹේ මාර්ගය සඵලවී
තුඹට ශුභ සිද්ධවන්නේය. මා විසින් 9
තුඹට අණකර තිබෙනවා නොවේද?
ශක්තිමත්ව ධෛර්යවත්ව සිටපන්න; තැති
නොගනින්න, නොකැලඹෙන්න. මක්-
නිසාද තුඹ යන සෑම තැන්හිම තුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹ සමග
සිටිනසේකැයි කීසේක.

එවිට යෝෂුවා සෙනඟගේ මුලා- 10
දැනීන්ට අණකරමින් කියනුයේ: තුඹලා 11
අන්දයම මුළුල්ලෙහි ගොස් සෙනඟට
කථාකර–හිමිකරගැනීමට තුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹලාට දෙන
දේශය හිමිකරගන්න පිණිස ඇතුල්වීමට
තුඹලා තව තුන් දවසකින් මේ
යොර්දනෙන් එතරට යන නිසා
කෑම සූදනම් කරගනිල්ලාය කියා
අණකරපල්ලායයි කීවේය.

යෝෂුවා රූබෙන්වරුන්ටද ගාද්- 12
වරුන්ටද මනස්සේගේ අර්ධ ගෝත්‍ර-
යටද කථාකොට: **ස්වාමීන්වහන්සේගේ** 13
මෙහෙකරුවූ මෝසෙස් තුඹලාට අණකර
කීදෙය සිහිකරපල්ලා; තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** තුඹලාට විශ්‍රාම දී මේ
දේශය තුඹලාට දෙනසේක. තුඹලාගේ 14
භාර්යාවෝද බාලයෝද සිව්පාවෝද
මෝසෙස් යොර්දනෙන් මෙගොඩ
තුඹලාට දී තිබෙන දේශයෙහි සිටින්වා;
තුමූත් **ස්වාමීන්වහන්සේ** තුඹලාට මෙන්
තුඹලාගේ සහෝදරයන්ට විශ්‍රාම
දෙනතෙක්ද තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** ඔවුන්ට දෙන දේශය ඔවුන්
විසිනුත් හිමිකර ගන්නා තෙක්ද,
තුඹලාගෙන් බලසම්පන්න පුරුෂයෝව 15
සිටින සියල්ලෝ සන්නද්ධව තුඹලාගේ
සහෝදරයන්ට පෙරටුව ගොස් ඔවුන්ට
උපකාරකරපල්ලා. ඉන්පසු **ස්වාමීන්-**
**වහන්සේගේ** මෙහෙකරුවූ මෝසෙස්

*හෙවත්, ව්‍යවස්ථා පොත කියවීම.

යෝර්දානෙන් මෙගොඩ නැගෙනහිර
දිශාවෙහි තුඹලාට දුන් තුඹලාගේ උරුම
කොටසවූ දේශයට හැරී ඇවිත් ඒක
16 භුක්තිවිඳපල්ලායයි කීවේය. ඔව්හු
යෝෂුවාට උත්තරදෙමින්: තුඹ අපට
අණකළ සියල්ල කරන්නෙමුව, තුඹ අප
යවන කොතැනට නුමුත් යන්නෙමුව.
17 අප විසින් සියලු කාරණාවලදී
මෝසෙස්ට කීකරුවුණාක් මෙන් තුඹටත්
කීකරුවන්නෙමුව. තුඹේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** මෝසෙස් සමග සිටි ලෙසම
18 තුඹ සමගත් සිටිනසේක්වා. තුඹ අපට
අණකරන සියල්ල ගැන තුඹේ වචන
නාසා තුඹේ අණට විරුද්ධව කැරළිගසන
කවරෙක් වුවත් මරණයට පත් කරනු
ලබන්නේය. තුඹ වනාහි ශක්තිමත්ව
ධෛර්යවත්ව සිටින්නැයි කීවෝය.

## රාහාබ් සහ මත්තුකාරයෝ

**2** නුන්ගේ පුත්‍රවූ යෝෂුවා ෂිට්ටීම්හි
සිට මනුෂ්‍යයන් දෙදෙනෙක් ඔත්තු-
කාරයන් කොට රහසින් පිටත්කර:
තුඹලා ගොස් දේශයද යෙරිකෝවද
බලා වරෙල්ලායයි කීවේය. ඔව්හු ගොස්
රාහාබ් නම් වේශ්‍යා ස්ත්‍රියෙකුගේ ගෙට
2 ඇතුල්ව එහි නැවතී සිටියෝය. එවිට
දේශය සොයා බලන පිණිස ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගෙන් මිනිස්සු අද රෑ මෙහි
ආවෝයයි යෙරිකෝවේ රජුට කියන-
3 ලද්දේය. යෙරිකෝවේ රජ රාහාබ් වෙත
පණිවිඩයක් යවා: තුඹ වෙතට ඇවිත්
තුඹේ ගෙට ඇතුල්වී සිටින මිනිසුන්
පිටතට ගෙනෙන්න. මක්නිසාද ඔව්හු
මුළු දේශය සොයාබලන්ට ආවෝයයි
4 රාහාබ්ට කියා ඇරියේය. ඒ ස්ත්‍රී ඒ
මිනිසුන් දෙදෙනා අඩගහගන ගොස්
සැඟෙවුවාය; තවද ඈ කථාකොට: එසේය,
ඒ මනුෂ්‍යයෝ මා වෙතට ආවෝය,
නුමුත් ඔවුන් කොතැනින් ආවාද කියා
5 නොදන සිටියෙමි. තවද කළුවර වී දොර
වසන වේලාව පමණේදී ඒ මනුෂ්‍යයෝ
පිටතට ගියෝය. කොතැනට ගියෝදැයි
නොදනිමි. ඉක්මනින් ඔවුන් පස්සේ
එළවාගන පලයල්ලා; තුඹලා ඔවුන් කරා
පැමිණෙනවා ඇතැයි කීවාය. නුමුත් ඈ 6
ඔවුන් ගෙයි පියස්ස උඩට ගෙනගොස්,
එහි අහුරා තිබුණු හණ දඬු යට ඔවුන්
සැඟෙවුවාය. ඒ මනුෂ්‍යයෝ යෝර්දානට 7
යන මාර්ගයෙන් තොටුපළවල් දක්වා
ඔවුන් පස්සේ එළවාගන ගියෝය. ඔවුන්
පස්සේ එළවාගන ගිය අය පිටතට ගිය
හැටියේම දොර වසනලද්දේය. ඔවුන් 8
නිදාගන්ට පළමුවෙන් ඈ පියස්ස උඩ
ඔවුන් වෙතට ඇවිත්, ඒ මනුෂ්‍යයන්ට 9
කථාකොට: **ස්වාමීන්වහන්සේ** දේශය
තුඹලාට දී තිබෙන බවද තුඹලා නිසා
භීතිය අප පිට පැමිණ තිබෙන බවද
දේශයේ සියලු වැසියන්ගේ සිත් තුඹලා
නිසා දියවී තිබෙන බවද දනිමි.
මක්නිසාද තුඹලා මිසරයෙන් පිටතට 10
එන කල **ස්වාමීන්වහන්සේ** තුඹලා
ඉදිරියෙහි රතු මුහුදේ වතුර සිඳෙවූ හැටිද
තුඹලා විසින් සිඳදමන ලද යෝර්දානෙන්
එතර සිටිය අමෝරිවරුන්ගේ රජවරුන්
දෙදෙනාවූ සීහොන්ටත් ඕග්ටත් තුඹලා
කළ දේද ඇසීමුව. ඒ ඇසූ කෙණෙහිම 11
අපේ සිත් දියවගියේය, තුඹලා නිසා
කිසිවෙකු තුළ ධෛර්යයක් තවත් නොවීය.
මක්නිසාද තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේම** ඉහළ ස්වර්ගයෙහිද පහත
පොළොවෙහිද දෙවියන්වහන්සේය. ඉතින් 12
මා තුඹලාට කරුණා කළ බැවින්
තුඹලාත් මාගේ පියාගේ පවුලට
කරුණාකරමින් මාගේ පියාද මවුද
සහෝදරයන්ද සහෝදරියන්ද ඔවුන්ට 13
ඇති සියල්ලන්ද ආරක්ෂාකොට අපේ
ප්‍රාණ මරණයෙන් ගළවන හැටියට
**ස්වාමීන්වහන්සේ** ගැන මට දිවුරා
සත්‍යවූ ලකුණක් මට දුනමැනවියි ඒ
මනුෂ්‍යයන්ට කීවාය. ඒ මනුෂ්‍යයෝ ඈට 14
කථාකොට: අපේ මේ කාරණය තුඹලා
එළිදරව් නොකරතොත් **ස්වාමීන්වහන්සේ**
දේශය අපට දෙන කල අපි තුඹට
කරුණාවෙන්ද සැබෑකමින්ද ක්‍රියා-
කරන්නෙමුව. එසේ ක්‍රියානොකළොත්
අපේ ප්‍රාණ තුඹලා වෙනුවට මරණයට

15 පැමිණෝවයි කීවෝය. එවිට ඈ
ලනුවකින් ඔවුන් කවුළුවෙන් බැස්-
සෙවුවාය. මක්නිසාද ඇගේ ගෙය නුවර
පවුර පිට තිබුණේය, ඈද පවුර පිට
16 වාසයකළාය. ඈ ඔවුන්ට කථාකොට:
එළවාගන ගිය අයට නුඹලා අසු
නොවන පිණිස කඳුකරයට පලයල්ලා;
ඔවුන් හැරී එන තුරු එහි තුන් දවසක්
සැඟවී සිටපල්ලා. ඉන්පසු නුඹලාගේ
17 ගමන පලයල්ලායයි ඔවුන්ට කීවාය. ඒ
මනුෂ්‍යයෝ: නුඹ අප දිවුරවාගත් මේ
දිවුරුම ගැන අපි නිදෙස් වන්නෙමුව.
18 අප දේශයට ආ කල මේ රතු නූල්
පටිය නුඹ අප බැස්සෙවූ කවුළුවෙහි
බැඳ තබා නුඹේ පියාද මවුද සහෝ-
දරයන්ද නුඹේ පියාගේ ගෙයි වැසි
සියල්ලන්ද නුඹ වෙතට ගෙයි එකතු-
19 කරගනින්න. එවිට කවරෙක්වත් නුඹේ
ගෙයි දොරටුවලින් පිටවී වීථියට ගියොත්
ඔහුගේ ලේ තමාගේම හිස පිට වන්නේය,
අපි නිදෙස්ය. නුඹ සමග ගෙයි සිටින
යමෙකු පිට අතක් හෙළුවොත් ඔහුගේ
20 ලේ අපේ හිස පිට වන්නේය. නුමුත් නුඹ
අපේ මේ කාරණය එළිදරව්කළොත්
නුඹ අප දිවුරවාගත් දිවුරුම ගැන අපි
21 නිදහස්වන්නෙමුයයි කීවෝය. ඈ:
නුඹලාගේ වචනවල හැටියට වේවයි
කියා ඔවුන් පිටත්කළාය, ඔව්හු ගියෝය.
22 ඈ රතු ලනුව කවුළුවේ බැන්දය. ඔව්හු
ගොස් කඳුකරයට පැමිණ එළවාගන ගිය
අය හැරී යන තුරු තුන් දවසක් එහි
නැවතුණෝය. එළවාගන ගිය අය
මාර්ගයේ සෑම තැනම ඔවුන් සෙවූ නුමුත්
23 සම්බවුණේ නැත. එවිට ඒ මනුෂ්‍යයෝ
දෙදෙනා හැරී කඳුකරයෙන් බැස, එතරවී,
නූන්ගේ පුත්‍රවූ යෝෂුවා වෙතට අවුත්
තමුන්ට සිද්ධවුණු සියල්ල ඔහුට
24 කීවෝය. ඔව්හුද: සැබවින් ස්වාමීන්-
වහන්සේ මුළු දේශය අපේ අත්වලට දී
තිබේ; දේශයේ සියලු වැසියන්ගේ සිත්
අප ඉදිරියෙහි දියවී යතියි යෝෂුවාට
කීවෝය.

## යොර්දනෙන් එගොඩවීම

3 යෝෂුවා අලුයම නැගිට සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයන් සමග ෂිට්ටීම්හි
සිට පිටත්ව යොර්දනට පැමිණ, එතරව
යන්ට පළමුවෙන් එහි නැවතුණේය. තවද 2
තුන් දවසකට පසු මුලාදෑනීහු අන්දයම
මුළුල්ලෙහි ගොස්, සෙනඟට කථාකොට: 3
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ
ගිවිසුම් පෙට්ටියත් ලෙවීවරුන්වූ පූජකයන්
එය ගෙනයනවාත් නුඹලා දකින විට
නුඹලාගේ ස්ථානවලින් පිටත්ව ඒ පස්සේ
පලයල්ලා. එහෙත් මිම්මෙන් රියන් 4
දෙදහසක් පමණවූ ඉඩක් නුඹලාටත්
ඊටත් අතරේ තිබිය යුතුය. මීට පළමුවෙන්
නුඹලා මේ මාර්ගයෙහි නොගිය බැවින්
නුඹලා යන්ට ඕනෑ මාර්ගය දැනගන්න
පිණිස ඊට ළංනොවී සිටපල්ලායයි
අණකළෝය. යෝෂුවාද: හෙට ස්වාමීන්- 5
වහන්සේ නුඹලා අතරේ පුදුම දේ
කරන්ට යන නිසා පවිත්‍රවෙයල්ලායයි
සෙනඟට කීවේය. යෝෂුවා පූජකයන්ටද 6
කථාකොට: නුඹලා ගිවිසුම් පෙට්ටිය
රැගෙන සෙනඟට පෙරටුව පලයල්ලා-
යයි කීවේය. ඔව්හු ගිවිසුම් පෙට්ටිය
රැගෙන සෙනඟට පෙරටුව ගියෝය.
ස්වාමීන්වහන්සේ යෝෂුවාට කථාකොට: 7
මා මෝසෙස් සමග සිටියාක් මෙන්
නුඹ සමගත් සිටින බව සියලු
ඉශ්‍රායෙල්වරුන් දැනගන්නා පිණිස
ඔවුන්ගේ ඇස් හමුයෙහි නුඹ උසස්
කරන්ට අද දවසේ පටන්ගන්නෙමි. නුඹ 8
ගිවිසුම් පෙට්ටිය ගෙනයන පූජකයන්ට
අණකොට: නුඹලා යොර්දන් ජලය
අද්දරට පැමුණුණාම යොර්දනේ නැවතී
සිටපල්ලාය කියා ඔවුන්ට කියාපන්නැයි
කීසේක.

යෝෂුවාද: නුඹලා මෙහි ළංවී 9
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ
වචන අසාපල්ලායයි ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කීවේය. යෝෂුවා කථාකොට: 10
ජීවමාන දෙවියන්වහන්සේ නුඹලා
අතරෙහි සිටින බවත් උන්වහන්සේ
නොවරදවාම නුඹලා ඉදිරියෙන්

කානානිවරුන්ද හිත්තීවරුන්ද හිව්-
වරුන්ද පෙරිස්සිවරුන්ද ගිර්ගාෂිවරුන්ද
අමෝරිවරුන්ද යෙබූසිවරුන්ද පන්නා-
දමන බවත් තුඹලා මෙයින් දැනගන්-
11 නහුය. බලව, මුළු පොළොවේ ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය තුඹලාට
12 පෙරටුව යොර්දනට යන්නේය. එබැවින්
එක එක ගෝත්‍රයෙන් එක්කෙනෙකු බැගින්
ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් මනුෂ්‍යයන්
13 දෙළොස්දෙනෙකු තෝරාගනිල්ලා. මුළු
පොළොවට ස්වාමිවූ ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනයන
පූජකයන්ගේ පතුල් යොර්දන් ජලයේ
තබන විට යොර්දන් ජලය එනම් ඉහළින්
එන ජලය නැවතී එක ගොඩක් වී හිටිනවා
14 ඇතැයි කීවේය. සෙනඟ යොර්දනෙන්
එතරට යන්ට තමුන්ගේ කූඩාරම්වලින්
නික්මගිය විට ගිවිසුම් පෙට්ටිය ගෙනයන
පූජකයෝ සෙනඟට පෙරටුවෙන්
15 සිටියෝය. පෙට්ටිය ගෙනයන්නන්
යොර්දනට පැමිණි විටද පෙට්ටිය ගෙන-
යන පූජකයන්ගේ පාද ජලයේ අද්දර
ගැලුණු විටද (ගොයම් කපන කාලය
මුළුල්ලෙහි යොර්දනේ ජලය එහි සියලු
16 ඉවුරු ඉක්මවා උතුරායයි) ඉහළින්
බැස එන ජලය නැවතී ඉතා දුරට,
ශාරෙතාන් ඉදිරිපිට තිබෙන නුවරවූ
ආදම් දක්වා, එක ගොඩක් වී නැංගේය.
අරබා සමභූමියෙහි මුහුද එනම් ලුණු
මුහුද දෙසට බැස යන ජලය තීන්දුවටම
වෙන්වී ගියේය. සෙනඟද යෙරිකෝව
17 ඉදිරියෙහි එතරට ගියෝය. ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙන යන
පූජකයෝ යොර්දන් මැද වියළි භූමිය
පිට ස්ථිරව සිටියෝය, මුළු සෙනඟ
යොර්දනෙන් සම්පූර්ණයෙන් එතර වන
තෙක් සියලු ඉශ්‍රායෙල්වරු වියළි බිම
පිට ගියෝය.

## යොර්දනෙන් එගොඩවීම

(ඉහත හා සම්බන්ධයි.)

4 තවද මුළු සෙනඟ සම්පූර්ණයෙන්
යොර්දනෙන් එතරවූ කල ස්වාමීන්-
2 වහන්සේ යෝෂුවාට කථාකොට: තුඹලා
එක එක ගෝත්‍රයෙන් එක්කෙනෙකු
බැගින් මනුෂ්‍යයන් දෙළොස්දෙනෙකු
තෝරාගෙන, ඔවුන්ට අණකරමින්– 3
තුඹලා මෙහි යොර්දන් මැද පූජකයන්ගේ
පාද ස්ථිරව පිහිටි තැනින් ගල් දෙළසක්
රැගෙන තුඹලා සමඟ එතරට ගෙන
ගොස්, ඒවා තුඹලා අද රෑ නවාතැන්
ගන්න ස්ථානයෙහි තබන්ට කියාපල්ලා-
යයි කීසේක. එවිට යෝෂුවා එක එක 4
ගෝත්‍රයෙන් එක්කෙනෙකු බැගින් තමා
විසින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් නියමකළ
මිනිසුන් දෙළොස්දෙන කැඳවා, ඔවුන්ට 5
කථාකොට: තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ පෙට්ටිය ඉදිරියෙහි තුඹලා
යොර්දන මැදට ගොස් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ ගෝත්‍රවල ගණන ලෙස
එකිනෙකා ගලක් බැගින් රැගෙන කරේ
තබාගන පලයල්ලා. මෙසේ කරන්නේ 6
ඒවා තුඹලා අතරේ සිහිවීම් ලකුණක්
වන පිණිසය. මේ ගල් තිබෙන්නේ
කුමටදැයි තුඹලාගේ දරුවන් මතු
කාලයේ අසනවිට, තුඹලා ඔවුන්ට 7
කථාකර: ස්වාමීන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය ඉදිරියෙහි යොර්දනේ ජලය
බෙදී ගිය නිසාය; පෙට්ටිය යොර්දනෙන්
මෙතරට එන විට යොර්දන් ජලය බෙදී
ගියේය. මේ ගල්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
සදාකාල සිහිවීමක් පිණිස වන්නේයයි
කියාපල්ලායයි කීවේය. ඉශ්‍රායෙල් 8
පුත්‍රයෝ යෝෂුවා අණකළ ප්‍රකාරයට
කරමින් ස්වාමීන්වහන්සේ යෝෂුවාට
කී ලෙස ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ ගෝත්‍රවල
ගණන හැටියට යොර්දන මැදින් ගල්
දෙළසක් රැගෙන, ඒවා තමුන් සමඟ
මෙතරට ගෙනැවිත් ඔවුන් නැවතුණ
ස්ථානයෙහි තැබුවෝය. යොර්දන් මැද 9
ගිවිසුම් පෙට්ටිය ගෙනගිය පූජකයන්ගේ
පාද තිබුණු තැනද යෝෂුවා ගල් දෙළසක්
තැබුවේය. ඒවා අද දක්වා එහි තිබේ.
මෝසෙස් විසින් යෝෂුවාට අණකළ 10
සියල්ල ලෙස සෙනඟට කියන්ට
ස්වාමීන්වහන්සේ යෝෂුවාට අණකළ
සියලු දෙය කෙළවර වන තෙක්

ගිවිසුම් පෙට්ටිය ගෙනගිය පූජකයෝ
යොර්දන මැද නැවතී සිටියෝය. සෙනඟද
11 ඉක්මන් කර මෙතරට ආවෝය. මුළු
සෙනඟ මෙතරවී නිමවූ කල **ස්වාමීන්-**
**වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය හා
පූජකයෝ සෙනඟ ඉදිරියෙහි මෙතර
12 වූවෝය. රූබෙන් පුත්‍රයෝද ගාද්
පුත්‍රයෝද මනස්සේගේ අර්ධ ගෝත්‍රයද
සන්නද්ධව මෝසෙස් ඔවුන්ට කී ලෙස
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට පෙරටුව මෙතරට
13 ආවෝය. යුද්ධයට සැරසුණු අය සතළිස්
දහසක් පමණ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි යෙරිකෝවේ සමභූමිවලට
යුද්ධය පිණිස මෙතරට ආවෝය.
14 ඒ දවසේදී **ස්වාමීන්වහන්සේ** සියලු
ඉශ්‍රායෙල්වරුන්ගේ ඇස් හමුයෙහි
යෝෂුවා උසස් කළසේක; ඔව්හු
මෝසෙස්ට හයව සිටියාක්මෙන්
යෝෂුවාගේ ජීවිතයේ සියලු දවස්වලදී
ඔහුටත් හයව සිටියෝය.
15 **ස්වාමීන්වහන්සේ** යෝෂුවාට කථා-
16 කොට: සාක්ෂි පෙට්ටිය ගෙනයන
පූජකයන්ට යොර්දනෙන් ගොඩට නැගී
17 එන්ට අණකරපන්නැයි කීසේක. එබැවින්
යෝෂුවා: යොර්දනෙන් ගොඩට නැගී
වරෙල්ලායයි පූජකයන්ට අණ කෙළේය.
18 තවද **ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම්
පෙට්ටිය ගෙනගිය පූජකයන් යොර්දන
මැදින් ගොඩට අවුත් තමුන්ගේ පාද
වියලි භූමිය පිට තැබූ කල, යොර්දනේ
ජලය ස්වකීය ස්ථානයට හැරී ඇවිත්,
පළමු ලෙස එහි සියලු ඉවුරු ඉක්මවා
19 උතුරා ගියේය. මෙසේ සෙනඟ පළමුවෙනි
මස දසවෙනිද යොර්දනෙන් නැගී අවුත්
යෙරිකෝවට නැගෙනහිර දිශාවෙන්
20 ගිල්ගාල්හි කඳවුරු බැඳගත්තෝය. ඔවුන්
යොර්දනෙන් ගත්තාවූ ඒ ගල්දොළොස
21 යෝෂුවා ගිල්ගාල්හි සිටුවා, ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකොට: මේ ගල් තිබෙන්නේ
කුමකටදැයි මතු කාලයේ තුඹලාගේ
දරුවන් තමුන්ගේ පියවරුන්ගෙන්
22 අසනවිට, තුඹලා ඔවුන්ට කථාකර:
ඉශ්‍රායෙල්වරු මේ යොර්දනෙන් මෙතර
වියලි බිම පිට ආවෝය. මක්නිසාද 23
පොළොවේ සියලු මනුෂ්‍ය වර්ගයන්
**ස්වාමීන්වහන්සේගේ** හස්තය බලවත් බව
දැනගන්න පිණිසත්, ඔවුන් තුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** සෑම කල්හිම
හයවෙන පිණිසත්, තුඹලාගේ දෙවිවූ 24
**ස්වාමීන්වහන්සේ** අප රතු මුහුදෙන්
මෙතරවෙන තුරු එහි ජලය අප
ඉදිරියෙන් හින්දවා දැමුවාක් මෙන් තුඹලා
මෙතර වෙන තුරු තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** යොර්දනේ ජලය
තුඹලා ඉදිරියෙනුත් හින්දවා දැමූසේක
කියා දන්වාපල්ලායයි කීවේය.

5 ඉශ්‍රායෙල් පුත්‍රයන් මෙතර වෙන
තුරු **ස්වාමීන්වහන්සේ** ඔවුන්
ඉදිරියෙන් යොර්දනේ ජලය හින්දවා
දැමූ බව යොර්දනට මෙතර බස්නාහිරදිග
සිටි අමෝරිවරුන්ගේ සියලු රජවරුන්ද
මුහුද ළඟ සිටි කානානිවරුන්ගේ සියලු
රජවරුන්ද ඇසූ කල ඔවුන්ගේ සිත් දියව
ගියේය, ඉශ්‍රායෙල් පුත්‍රයන් නිසා තවත්
ඔවුන් තුළ ධෛර්යයක් නොවීය.

## දෙවෙනි චර්මඡේදනය

ඒ කාලයේ **ස්වාමීන්වහන්සේ**: ගල්- 2
පිහියා සාදගෙන දෙවෙනි වර ඉශ්‍රා-
යෙල් පුත්‍රයන් චර්මඡේද්‍යකරපන්නැයි
යෝෂුවාට කීසේක. යෝෂුවා ගල්පිහියා 3
සාද චර්මාග්‍ර-කන්දේදී ඉශ්‍රායෙල් පුත්‍රයන්
චර්මඡේද්‍යකළේය. යෝෂුවා විසින් 4
චර්මඡේද්‍යයකළ කාරණය මේය:
මිසරයෙන් ආවාවූ සියලු පිරිමි එනම්
සියලු යුද්ධ සෙනඟ මිසරයෙන් ආවාට
පසු මගදී කාන්තාරයෙහි මිය ගියෝය.
නික්ම ආ සියලු සෙනඟ චර්මඡේද්‍යය 5
ලබා සිටියෝය. නුමුත් මිසරයෙන්
එන කල මගදී කාන්තාරයෙහි උපන්
සියලු සෙනඟ චර්මඡේද්‍යය නොලබා
සිටියෝය. මක්නිසාද ඉශ්‍රායෙල් 6
පුත්‍රයන් **ස්වාමීන්වහන්සේගේ** හඬට
ඇහුම්කන් නුදුන් නිසා මුළු ජාතිය එනම්
මිසරයෙන් ආවාවූ යුද්ධකාර සෙනඟ
විනාශවන තෙක් සතළිස් අවුරුද්දක්
ඔව්හු කාන්තාරයෙහි හැසුරුණෝය.

මෙසේ වුණේ, අපට දෙන හැටියට
**ස්වාමීන්වහන්සේ** ඔවුන්ගේ පියවරුන්ට
දිවුළාවූ, කිරි හා මීපැණි ගලා යන
දේශයක්ව තිබෙන දේශය දකින්ට ඔවුන්ට
ඉඩනාරින ලෙස **ස්වාමීන්වහන්සේ**
7 ඔවුන්ට දිවුළ නිසාය. උන්වහන්සේ ඔවුන්
වෙනුවට නැගිටවූ ඔවුන්ගේ දරුවන්
මගදී චර්මඡේද්‍යනොකළ බැවින් ඔව්හු
අචර්මඡේදිතව සිටියෝය. යෝෂුවා ඔවුන්
8 චර්මඡේද්‍ය කෙළේය. තවද මුළු සෙනඟ
චර්මඡේද්‍යකොට නිමවූ කල ඔවුන්ට
සුවවෙන තුරු අන්දයමේ ඔව්හු තමුන්ගේ
9 ස්ථානවල නැවතුණෝය. **ස්වාමීන්-
වහන්සේ** යෝෂුවාට කථාකොට: මම
අද නුඹලා කෙරෙන් මිසරයේ නින්දව
අහකට පෙරළුවෙමියි කීසේක. ඒ නිසා
ඒ ස්ථානයට ගිල්ගාල්යයි අද දවස
දක්වා කියනු ලැබේ.

## පාස්කුව: මන්නා නැවතීම

10 ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගිල්ගාල්හි කඳවුරු
බැඳගෙන මාසේ දසසතරවෙනි ද සවස
යෙරිකෝවේ සමභූමිවලදී පාස්කුව
11 පැවැත්තුවෝය. පාස්කුවට පසු දවසේදීම
ඔව්හු දේශයේ ධාන්‍යවලින් සෑදූ මුහුන්
නොදමූ රොටි හා විලඳ කෑවෝය.
12 දේශයේ ධාන්‍යයෙන් ඔවුන් කෑවාට
පසුව ද මන්නා නැවතුණේය; ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට තවත් මන්නා නොලැබුණේය;
එහෙත් ඔව්හු කානාන් දේශයේ භෝග
ඵල ඒ අවුරුද්දේ කෑවෝය.

## දිව්‍ය අධිපතියා

13 තවද යෝෂුවා යෙරිකෝව ළඟ සිටියදී
තමාගේ ඇස් ඔසවා බැලූ කල, තමා
ඉදිරිපිට මනුෂ්‍යයෙක් ඇදගත් කඩුවක්
අතේ ඇතුව සිටිනවා දුටුවේය. යෝෂුවා
ඔහු ළඟට ගොස්: නුඹ අපේ පැත්තටද
නොහොත් අපේ විරුද්ධකාරයන්ගේ
14 පැත්තටදැයි ඔහුගෙන් ඇසුවේය. ඒ
තෙමේද: එසේ නොවෙයි; මම
දැන් **ස්වාමීන්වහන්සේගේ** සේනාවේ
අධිපතියාව ආවෙමියි කීවේය. එවිට
යෝෂුවා මුහුණින් බිම වැටී නමස්කාර
කොට: මාගේ **ස්වාමීන්වහන්සේ** ඔබගේ
මෙහෙකරුවාට කුමක් කියනසේක්දැයි
ඇසීය. **ස්වාමීන්වහන්සේගේ** සේනා- 15
පතියාද: නුඹ සිටින තැන ශුද්ධ
ස්ථානයක් නිසා නුඹේ පාදවලින් වහන්
ගළවාපන්නැයි යෝෂුවාට කීවේය.
යෝෂුවාද එසේ කෙළේය.

## යෙරිකෝව අත්පත්කරගැනීම

**6** යෙරිකෝව ඉශ්‍රායෙල් පුත්‍රයන්
නිසා තරයේ වසා තිබුණේය.
කිසිවෙක් පිටතට නොගියේය, ඇතුළටද
නාවේය. **ස්වාමීන්වහන්සේ** යෝෂුවාට 2
කථාකොට: බලාපන්න, යෙරිකෝවද
එහි රජද බලවත් යුද්ධකාරයන්ද නුඹ
අතට පාවාදුනිමි. යුද්ධකාරයෝවූ නුඹලා 3
සියල්ලෝ නුවර වටකරින් එක වරක්
නුවර වටේට පලයල්ලා. සදවසක් නුඹ
විසින් එසේ කළ යුතුය. පූජකයෝ සත් 4
දෙනෙක් බැටළු අං හොරණෑ සතක්
රැගෙන ගිවිසුම් පෙට්ටියට පෙරටුව
යෙත්වා. සත්වෙනි දවසේදී සත් වරක්
නුවර වටේට පලයල්ලා, පූජකයෝද
හොරණෑ පිඹිත්වා. තවද ඔවුන් බැටළු 5
අං හොරණෑවෙන් බොහෝ වේලාවක්
ශබ්ද පවත්වන විට, හොරණෑ ශබ්දය
නුඹලාට ඇසුණාම, මුළු සෙනඟ මහත්
ඔල්වර හඬක් පවත්වත්වා; එවිට නුවර
පවුර ඇද වැටෙන්නේය, සෙනඟද
එකිනෙකා තම තමා ඉදිරිපිට
නැගීයත්වයි කීසේක. එවිට නූන්ගේ පුත්‍රවූ 6
යෝෂුවා පූජකයන් කැඳවා ඔවුන්ට
කථාකොට: ගිවිසුම් පෙට්ටිය උසුලා
ගනිල්ලා, පූජකයෝ සත් දෙනෙක්
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටිය ඉදිරිපිට
බැටළු අං හොරණෑ සතක් රැගෙන
යෙත්වයි කීවේය. ඔහු සෙනඟටත් කථා- 7
කොට: ඉදිරියට ගොස් නුවර වටේ
පලයල්ලා, ආයුධ ගත් පුරුෂයෝ
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටියට පෙරටුව
යෙත්වයි කීවේය. යෝෂුවා සෙනඟට 8
කථාකොට නිමවූ කල, පූජකයෝ
සත්දෙනා බැටළු අං හොරණෑ සත

රැගෙන ස්වාමීන්වහන්සේ ඉදිරිපිට
යමින් හොරණෑ පිම්බෝය. ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටියද ඔවුන්ට
9 පස්සෙන් ගියේය. සන්නද්ධවූ අය
හොරණෑ පිඹින පූජකයන්ට පෙරටුව
ගියෝය, හොරණෑ පිඹිමින් යද්දී අනික්
අය පෙට්ටියට පස්සෙන් ගියෝය.
10 යෝෂුවා සෙනඟට අණකොට කියනුයේ:
ඔල්වර හඬ ගසන්ට මා විසින් තුඹලාට
කියන දවස දක්වා තුඹලා ඔල්වර හඬ
නොපැවැත්විය යුතුය, තුඹලාගේ කටහඬ
ඇසෙන්ටවත් තුඹලාගේ කටින් කිසි
වචනයක් නික්මෙන්ටවත් නොදිය යුතුය.
මා කී විට ඔල්වර හඬ පවත්වාපල්ලායි
11 කීවේය. මෙසේ ඔහු ස්වාමීන්වහන්සේගේ
ගිවිසුම් පෙට්ටිය එක වරක් නුවර වටකර
යන්ට සැලැස්විය. ඔව්හු කඳවුරට අවුත්
එහි නැවතුණෝය.
12 යෝෂුවා අලුයම නැඟුටුණේය,
පූජකයෝද ස්වාමීන්වහන්සේගේ ගිවිසුම්
13 පෙට්ටිය උසුලා ගත්තෝය. පූජකයෝ
සත්දෙනා බැටළු අං හොරණෑ සත ගෙන
ස්වාමීන්වහන්සේගේ පෙට්ටියට පෙරටුව
නොනැවතී යමින් හොරණෑ පිම්බෝය.
සන්නද්ධවූ අය ඔවුන්ට පෙරටුව ගියෝය;
හොරණෑ පිඹිමින් යද්දී අනික් අය
ස්වාමීන්වහන්සේගේ පෙට්ටියට පස්සෙන්
14 ගියෝය. මෙසේ දෙවෙනි දවසේදී එක
වරක් නුවර වටේට ගොස් කඳවුරට
හැරී ආවෝය. සදවසක් ඔව්හු එසේ
15 කළෝය. සත්වෙනි දින පහන්වන වේලේ
ඔව්හු නැගිට එම ආකාරයෙන්ම සත්
වරක් නුවර වටේට ගියෝය. එද පමණක්
ඔව්හු සත්වරක් නුවර වටේට ගියෝය.
16 සත්වෙනි වර පූජකයන් හොරණෑ පිම්බ
කල යෝෂුවා සෙනඟට කථාකොට:
ඔල්වර හඬගසාපල්ලා; මක්නිසාද
ස්වාමීන්වහන්සේ තුඹලාට නුවර දී
17 තිබේ. නුවර හා එහි ඇති සියල්ල
ස්වාමීන්වහන්සේ උදෙසා මුළුමනින්ම
විනාශයට කැප වන්නේය. රාහාබ් නම්
වේශ්‍යා ස්ත්‍රිය අප යැවූ පණිවිඩකාරයන්
සැඟෙවූ බැවින් ඇද ඈ සමග ගෙයි
සිටින සියල්ලෝද පමණක් ජීවත්-
වන්නෝය. විනාශයට කැපවූ දෙයින් 18
කොහොමහරි වැලකියල්ලා, නැකහොත්
තුඹලා කැපකළ පසු කැපවූ දෙයින්
යමක් ගත්තොත්, තුඹලා ඉශ්‍රායෙල්
අන්දයමට ශාප ලැබෙන්ට සලස්වා එය
කලඹනවා ඇත. රන් රිදී සියල්ලද 19
පිත්තල සහ යකඩ බඩුද ස්වාමීන්-
වහන්සේට කැපය. ඒවා ස්වාමීන්-
වහන්සේගේ ගබඩාවෙහි තැබිය යුතු-
යයි කීවේය. එසේ සෙනඟ ඔල්වර හඬ 20
ගැසූහ, පූජකයෝ හොරණෑ පිම්බෝය.
සෙනඟ හොරණෑ ශබ්දය අසා මහත්
හඬකින් ඔල්වර හඬ පැවැත්තූ විට පවුර
ඇදවැටුණේය, සෙනඟද එකිනෙකා තම
තමා ඉදිරිපිට නැඟී ගොස් නුවර අල්ලා
ගෙන, පුරුෂයන් හා ස්ත්‍රීන්ද බාලයන් 21
හා මහල්ලන්ද ගවයන්ද බැටළුවන්ද
කොටළුවන්ද යන නුවර සිටි සියල්ලන්ම
කඩුමුවහතින් මුළුමනින්ම විනාශකර
දැමුවෝය. දේශය සොයාබැලූ දෙදෙනාට 22
යෝෂුවා කථාකොට: වේශ්‍යා ස්ත්‍රියගේ
ගෙට ගොස් තුඹලා ඈට දිවුළ ලෙස ඒ
ස්ත්‍රිය සහ ඈට අයිති සියල්ලන් පිටතට
ගෙනෙල්ලායයි කීවේය. ඔත්තුකාරයෝ 23
වූ ඒ තරුණයෝ ඇතුළට ගොස් රාහාබ්ද
ඇගේ පියාද මවුද සහෝදරයන්ද ඈට
අයිති සියල්ලන්ද ඇගේ සියලු නෑයන්ද
පිටතට ගෙනවුත් ඉශ්‍රායෙල්වරුන්ගේ
කඳවුරෙන් පිටත ඔවුන් සිටෙවුවෝය.
නුවර හා එහි තිබුණු සියල්ල ගින්නෙන් 24
පුලුස්සා දැමුවෝය. රන් රිදීද පිත්තල
හා යකඩ බඩුද පමණක් ඔව්හු
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ ගබඩාවෙහි
තැබුවෝය. යෙරිකෝව සෝදිසිකරන්ට 25
යෝෂුවා යැවූ පණිවිඩකාරයන් වේශ්‍යාව-
වූ රාහාබ් විසින් සැඟවූ බැවින් යෝෂුවා
ඈට සහ ඇගේ පියාගේ පවුලටද ඈට
අයිති සියල්ලන්ටද ජීවත්වෙන්ට ඉඩ
හැරියේය; ඈ ඉශ්‍රායෙල්වරුන් අතරෙහි
අද දක්වා වාසයකරන්නීය. ඒ කාලයෙහි 26
යෝෂුවා දිවුරමින්: යමෙක් නැගිට මේ

යෙරිකෝ නුවර ගොඩනගන්නේ නම්,
ඔහු **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ශාප
ලත්තෙක් වේවා. ඔහු එහි අත්තිවාරම
තබන විට ඔහුගේ කුලුදුලාද එහි දොරටු
තබන විට ඔහුගේ බාල පුත්‍රයාද
නැතිවෙනවා ඇතැයි ඔවුන්ට කීවේය.
27 මෙසේ **ස්වාමීන්වහන්සේ** යෝෂුවා සමග
සිටිසේක; ඔහුගේ කීර්තිය දේශය
මුළුල්ලෙහි පතළවිය.

## ආකාන්ගේ පාපය

7 එහෙත් ඉශ්‍රායෙල් පුත්‍රයෝ කැප
කළ දේ සම්බන්ධව අපරාධයක්
කළෝය. මක්නිසාද යූද ගෝත්‍රයට අයිති
සෙරාගේ පුත්‍රවූ ශබ්දීගේ පුත්‍රයා වන
කර්මීගේ පුත්‍රවූ ආකාන් කැපවූ දෙයින්
ගත්තේය. **ස්වාමීන්වහන්සේගේ** උදහස
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට විරුද්ධව ඇවිළුණේය.
2 තවද යෝෂුවා යෙරිකෝවේ සිට
බෙතෙල්ට නැගෙනහිරින් බෙතාවන් ළඟවූ
හායිට යෙරිකෝවේ සිට මනුෂ්‍යයන්
යවමින්: නුඹලා නැගී ගොස් දේශය
සෝදිසිකරගන වරෙල්ලායයි ඔවුන්ට
කීවේය. ඒ මනුෂ්‍යයෝ නැගී ගොස් හායි
3 සෝදිසිකරගන, යෝෂුවා වෙතට හැරී
ඇවිත් ඔහුට කථාකොට: මුළු සෙනඟ
යන්ට ඕනෑ නැත; දෙතුන් දහසක්
පමණ මනුෂ්‍යයෝ ගොස් හායිට පහර
දෙත්වා; එහි සිටින අය ස්වල්ප නිසා
මුළු සෙනඟ එහි යැවීමෙන් වෙහෙස
4 කරවන්ට ඕනෑ නැතැයි කීවෝය. ඒ
හැටියට සෙනඟගෙන් තුන්දහසක් පමණ
මනුෂ්‍යයෝ එහි ගියෝය. නුමුත් ඔව්හු
හායි මනුෂ්‍යයන් ඉදිරියෙන් පලා ගියෝය.
5 හායි නුවර මනුෂ්‍යයෝ ඔවුන්ගෙන්
තිස් හදෙනෙක් පමණ මැරුවෝය.
ඔව්හු නුවර දොරටුවේ සිට ෂෙබාරිම්
දක්වා ඔවුන් පස්සේ එළවාගන ගොස්,
පල්ලමේදී ඔවුන්ට පහරදුන්නෝය. එවිට
සෙනඟගේ සිත් දියවී ගොස් වතුර මෙන්
6 වුණේය. යෝෂුවා තමාගේ වස්ත්‍ර
ඉරාගෙන ඉශ්‍රායෙල් වැඩිමහල්ලන් සමග
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය
ඉදිරියෙහි සවස් වන තෙක් මුහුණින්
බිම වැටී උන්නේය; ඔව්හු තමුන්ගේ හිස්
පිට ධූලිද දමාගත්තෝය. යෝෂුවා: අහෝ, 7
**ස්වාමිවූ දෙවියන්වහන්ස**, අප නැතිකරන
පිණිස අමෝරිවරුන් අතට අප පාවා-
දීමට ඔබ මේ සෙනඟ යොර්දනෙන්
මෙගොඩට පැමිණෙවුවේ මක්නිසාද?
අනේ අපි යොර්දනෙන් එගොඩ
වාසයකරන්ට සතුටුවුණෙමුනම් හොඳය.
අහෝ, ස්වාමීන්වහන්ස, ඉශ්‍රායෙල්වරුන් 8
තමුන්ගේ සතුරන්ට පිටිපෑවාට පසු මම
මක්කියම්ද? කානානිවරුන්ද දේශයේ 9
සියලු වැසියන්ද ඒ අසා අප වටලා
අපේ නාමය පොළොවෙන් සිඳදමනවා
ඇත. එවිට ඔබගේ මහත් නාමය ගැන
ඔබ කරන්නේ කුමක්දැයි කීය. එවිට 10
**ස්වාමීන්වහන්සේ** යෝෂුවාට කථාකොට:
නැගිටියන්න; මක්නිසා මෙසේ මුහුණින්
වැතිර ඉන්නෙහිද? ඉශ්‍රායෙල්වරු 11
පව්කළෝය; එසේය, මා ඔවුන්ට අණකළ
මාගේ ගිවිසුම ඔවුන් කඩකර තිබේ.
එසේය, ඔවුන් කැපකළ දේවලින් අරගන
සොරකම්කර, ඒවා සඟවා, ඒවා
තමුන්ගේම බඩු අතරේ තබා තිබේ.
එබැවින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට තමුන්ගේ 12
සතුරන් ඉදිරියෙහි සිටින්ට බැරිය, ඔව්හු
ශාපයට අසුවුණ බැවින් තමුන්ගේ
සතුරන්ට පිටපාති. ඒ කැපවූ දේ නුඹලා
අතරෙන් නාස්තිකර නොදැමුවොත් මම
තවත් නුඹලා සමග නොසිටින්නෙමි.
නුඹ නැගිට සෙනඟ පවිත්‍ර කරපන්න, 13
ඔවුන්ට කථාකොට: නුඹලා හෙට දවසට
පවිත්‍රවෙයල්ලා. මක්නිසාද ඉශ්‍රායෙල්-
වරුනි, නුඹලා අතරේ කැපවූ දෙයක්
තිබේ, කැපවූ දෙය නුඹලා අතරෙන්
පහකරන තුරු නුඹලාගේ සතුරන්
ඉදිරියෙහි සිටින්ට නුඹලාට බැරිවේයයි
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කියනසේක. හෙට නුඹලාගේ ගෝත්‍රවල 14
හැටියට ළංවෙයල්ලා.

ස්වාමීන්වහන්සේ *ගන්නාවූ ගෝත්‍රය
පවුල් වශයෙන් ළංවන්නේය. ස්වාමීන්-
වහන්සේ *ගන්නාවූ පවුලද පෙළපත්
වශයෙන් ළංවන්නේය. ස්වාමීන්වහන්සේ
*ගන්නාවූ පෙළපත එකිනෙකා වශයෙන්
15 ළංවන්නේය. කැපවූ දෙය ගත් තැනැත්තා
අසුවූ කල්හි ඔහු ස්වාමීන්වහන්සේගේ
ගිවිසුම කඩකළ නිසාත්, ඉශ්‍රායෙල්හි
දුෂ්ටකමක් කළ නිසාත්, ඔහු හා ඔහු
සන්තක සියල්ල ගින්නෙන් පුලුස්සා දමනු
ලැබේයයි කියාපන්නැයි කීසේක.
16 යෝෂුවා අලුයම නැගිට ඉශ්‍රායෙල්-
වරුන් ඔවුන්ගේ ගෝත්‍රවල හැටියට
ළංකෙරෙවුවේය; යූද ගෝත්‍රය අසුවිය.
17 ඔහු යූදගේ ගෝත්‍රය ළංකෙරෙවූවිට
ශෙරහිවරුන්ගේ පවුල අසු විය.
ශෙරහිවරුන්ගේ පවුල එක එක පෙළපත
වශයෙන් ළංකෙරෙවූ විට ශබ්දීගේ
18 පෙළපත අසුවිය. ඔහුගේ පෙළපත
එකිනෙකා වශයෙන් ළංකෙරෙවූ විට
යූද ගෝත්‍රයට අයිති ශෙරාගේ පුත්‍රවූ
ශබ්දීගේ පුත්‍රයා වන කර්මීගේ පුත්‍රවූ
19 ආකාන් අසුවිය. යෝෂුවා ආකාන්ට
කථාකොට: මාගේ පුත්‍රය, ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට ගෞරව දී,
උන්වහන්සේට ඇත්ත කියා, නුඹ කළ
දේ මාගෙන් නොසඟවා මට දන්වා-
20 පන්නැයි කීවේය. ආකාන් යෝෂුවාට
උත්තරදෙමින්: සැබවින් මම ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට විරුද්ධව
පව්කෙළෙමි, මම මේ මේ ආකාර
21 කෙළෙමි: කොල්ලය අතරේ ශෝභන
බබිලෝනිය සළුවක්ද රිදී ෂෙකෙල්
දෙසියයක්ද ෂෙකෙල් පනසක් බර
ඇති රන් †පේනුවක්ද මම දැක, ඒවාට
ආශාවී, ඒවා ගත්තෙමි; ඒවා මාගේ
කූඩාරම මැද පොළොව යට සඟවා
තිබේ, ඊට යටින් රිදී තිබේ යයි
22 කීවේය. යෝෂුවා පණිවිඩකාරයන්

*එනම්, පස ඇටයෙන් අසුකරගන්නාවූ.
†හෙවත්, කුඤ්ඤ හැඩයාකාර කැබෙල්ලක්.

හැරියේය, ඔව්හු කූඩාරමට දිවගියෝය;
බලව, එයත් එය යට රිදීත් ඔහුගේ
කූඩාරමෙහි සඟවා තිබෙනවා
සම්බවුණේය. ඔව්හු කූඩාරම මැද සිට 23
ඒවා යෝෂුවා ළඟටද සියලු ඉශ්‍රායෙල්
පුත්‍රයන් ළඟටද ගෙනවුත් ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි තැබූහ. එවිට 24
යෝෂුවා සහ ඔහු සමග සියලු
ඉශ්‍රායෙල්වරු ශෙරාගේ පුත්‍රවූ ආකාන්ද
රිදීද සළුවද රන් *පේනුවද ඔහුගේ
පුත්‍රයන් හා දූවරුන්ද ඔහුගේ ගවයන්ද
කොටළුවන්ද බැටළුවන්ද ඔහුගේ
කූඩාරමද ඔහු සන්තක සියල්ලද අරගෙන
ආකෝර් මිටියාවතට ගෙන ගියෝය.
යෝෂුවා: නුඹ අප කැලඹුවේ 25
මක්නිසාද? ස්වාමීන්වහන්සේ අද නුඹ
කලඹවනසේකැයි කීවේය. එවිට සියලු
ඉශ්‍රායෙල්වරු ඔහුට ගල් ගැසුවෝය;
ඔව්හු ඔවුන්ට ගල්ගසා, ඔවුන් ගින්නෙන්
පුලුස්සා දැමුවෝය. මහත් ගල් ගොඩක්ද 26
ඔහු පිට ගොඩගැසූහ, එය අද දවස
දක්වා තිබේ; ස්වාමීන්වහන්සේ තමන්ගේ
බලවත් උදහසෙන් හැරුණුසේක, එබැවින්
ඒ ස්ථානයට අද දවස දක්වා †ආකෝර්
මිටියාවතයයි කියනලද්දේය.

## හායි අල්ලාගැනීම

8 ස්වාමීන්වහන්සේ යෝෂුවාට
කථාකොට: භය නොවෙන්න,
නොකැලඹෙන්න. මුළු යුද්ධ සේනාව
නුඹ සමග ගෙන නැගිට හායිට පලයන්න.
මා විසින් හායි රජු හා ඔහුගේ සෙනඟත්
ඔහුගේ නුවරත් ඔහුගේ රටත් නුඹ අතට
පාවාදී තිබේ. නුඹ යෙරිකෝවටත් එහි 2
රජුටත් කළ ලෙස හායිටත් එහි රජුටත්
කරපන්න. නුමුත් එහි කොල්ලය හා
සිව්පාවුන් නුඹලාට කොල්ලයක් කොට
ගනිල්ලා. නුවරට එහායින් සේනාවක්
රහසේ සිටුවාපන්නැයි කීසේක. මෙසේ 3

*හෙවත්, කුඤ්ඤ හැඩයාකාර කැබෙල්ලක්.
†එනම්, කැලඹවීම.

යෝෂුවා හා මුළු යුද්ධ සේනාව හායිට
යන පිණිස නැගිට්ටෝය. යෝෂුවා
බලසම්පන්න යුද්ධකාරයන් තිස් දහසක්
තෝරාගෙන රාත්‍රියේ ඔවුන් යවමින්,
4 ඔවුන්ට අණ කොට: තුඹලා නුවරට
එහායින් සැඟවී සිටිල්ලා, නුවරින් වැඩිදුර
නොගොස් සියල්ලෝම සූදානම්ව
5 සිටිල්ලා. මාද මා සමග සිටින සියලු
සෙනඟද නුවරට ළංවී ඔවුන් පළමු
වතාවේ මෙන් අපට විරුද්ධව පිටතට
ආ කල්හි අපි ඔවුන් ඉදිරියෙන්
6 පලායන්නෙමුව; මක්නිසාද: පළමු
වතාවේ මෙන් ඔව්හු අප ඉදිරියෙන්
පලායන්නෝයයි කියමින්, ඔවුන් නුවරින්
ඈත්කරගන්න තුරු ඔවුන් අප පස්සේ
එනවා ඇත; එබැවින් අපි ඔවුන්
7 ඉදිරියෙන් පලායන්නෙමුව. එවිට තුඹලා
සැඟවී සිටින තැනින් නැගිට ඇවිත් නුවර
අල්ලාගනිල්ලා. මක්නිසාද තුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ඒක තුඹලා
8 අතට පාවාදෙනසේක. තුඹලා නුවර
අල්ලාගත්තාම ඒක ගිනිලාපල්ලා;
ස්වාමීන්වහන්සේගේ වචනය ලෙස
කරපල්ලා. මා තුඹලාට අණකළ බව
9 බලාගනිල්ලායයි කීවේය. මෙසේ යෝෂුවා
විසින් යවන ලදුව ඔව්හු ගොස් හායිට
බස්නාහිරින් බෙතෙල්ටත් හායිටත්
අතරේ සැඟවී සිටියෝය. නුමුත් යෝෂුවා
ඒ රාත්‍රියෙහි සෙනඟ අතරේ නැවතී
සිටියේය.
10 යෝෂුවා අලුයම නැගිට සෙනඟ රැස්
කොට ගණන්කොට ඉශ්‍රායෙල් වැඩි-
මහල්ලන් සමග සෙනඟට පෙරටුව
11 හායිට ගියේය. මුළු සෙනඟ එනම් ඔහු
සමග සිටි සියලු යුද්ධකාරයෝ නැගී
ළංවී නුවර ඉදිරිපිටට පැමිණ හායිට
උතුරෙන් කඳවුරු බැඳගත්තෝය. ඔහුටත්
12 හායිටත් අතරේ මිටියාවතක් විය. ඔහු
පන්දහසක් පමණ මනුෂ්‍යයන් රැගෙන
ඔවුන් හායිට බස්නාහිරින් බෙතෙල්ටත්
හායිටත් අතරේ රහසේ සිටෙවුවේය.
13 එසේ නුවරට උතුරෙන් සිටිය මුළු
සමූදුවද නුවරට බස්නාහිරින් රහසේ
සිටිය අයද යන සෙනඟ සිටෙවුවායින්
පසු යෝෂුවා ඒ රාත්‍රියේ මිටියාවත
මැදට ගියේය. තවද හායි රජු එය දුටු 14
කල ඔහු සහ නුවර මනුෂ්‍යයෝ වන
ඔහුගේ මුළු සෙනඟත් ඉක්මන්කර අලුයම
නැගිට, ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
යුද්ධකරන්ට අරබා සමභූමිය ඉදිරිපිට
නියම ස්ථානයට පිටත්ව ගියෝය;
එහෙත් නුවරට එහායින් තමාට විරුද්ධව
සමූහයක් සැඟවී ඉන්න බව ඔහු
නොදැන සිටියේය. යෝෂුවාද සියලු 15
ඉශ්‍රායෙල්වරුද ඔවුන් ඉදිරියෙහි
පැරදුණාක් මෙන් කාන්තාරයට යන
මාර්ගයෙහි පලාගියෝය. එවිට ඔවුන් 16
පස්සේ එළවාගන යන පිණිස හායි
නුවර සිටි මුළු සෙනඟ අඬගස්වා
ගන්නාලද්දහ. ඔව්හු යෝෂුවා පස්සේ
එළවාගන ගොස් නුවරින් ඈත්වූවෝය.
ඉශ්‍රායෙල්වරුන් පස්සේ යන්ට පිටතට 17
නොගිය එක මනුෂ්‍යයෙක්වත් හායිහි
හෝ බෙතෙල්හි හෝ ඉතුරුනොවීය.
නුවර නොවසා අත්හැර, ඔව්හු
ඉශ්‍රායෙල්වරුන් එළවාගෙන ගියෝය.
ස්වාමීන්වහන්සේ යෝෂුවාට කථාකොට: 18
තුඹේ අතේ තිබෙන හෙල්ලය හායි
දෙසට දිගුකරපන්න; මක්නිසාද මම
ඒක තුඹ අතට දෙන්නෙමියි කීසේක.
යෝෂුවා තමාගේ අතේ තිබුණු හෙල්ලය
නුවර දෙසට දිගුකෙළේය. එවිට සැඟවී 19
සිටිය සමූදුව තමුන් සිටි තැනින් වහාම
නැගිට, ඔහු අත දිගුකළ කෙණෙහිම
දිව ඇවිත් නුවරට වැද ඒක අල්ලා,
ඉක්මන්කර ගිනිලෑවෝය. හායි 20
මනුෂ්‍යයන් පස්සට හැරී බැලූ කල නුවර
ධූමය අහසට නගින බව ඔව්හු දුටුවෝය,
එවිට එහෙන්වත් මෙහෙන්වත් පලායන්ට
ඔවුන්ට බලයක් නොතිබුණේය. කාන්-
තාරය දෙසට පලාගිය සෙනඟ තමුන්
ලුහුබැඳ ආවුන් දෙසට හැරුණෝය.
යෝෂුවා සහ සියලු ඉශ්‍රායෙල්වරු සැඟවී 21
සිටිය සමූදුව නුවර අල්ලා ගත් බවත්
නුවර ධූමය නැගෙන බවත් දැක, හැරී
ඇවිත් හායි නුවර මිනිසුන් මැරුවෝය.
සෙස්සෝද ඔවුන්ට විරුද්ධව නුවරින් 22

නික්ම ආවෝය; මෙසේ ඔවුන් ඒ
පැත්තෙනුත් මේ පැත්තෙනුත් ඉශ්‍රායෙල්-
වරුන්ට මැදිවුණු කල, ඔවුන්ගෙන් එක්
කෙනෙක්වත් ගැළවී ඉතුරු වෙන්ට
23 නොහැර ඔවුන්ට පහරදුන්නෝය. හායි
රජ පණපිටින් අල්වා යෝෂුවා ළඟට
24 ගෙනාවෝය. ඉශ්‍රායෙල්වරුන් තමුන්
පස්සේ කාන්තාරයෙහි එළවාගත ආවාවූ
හායිහි සියලු වැසියන් පිටතදී මරා
තීන්දුකළ පසුද මෙසේ ඔවුන් සියල්ලන්ම
නාස්තිවෙනතුරු කඩු මුවහතින් වැටීගිය
පසුද සියලු ඉශ්‍රායෙල්වරු හායිට
හැරීගොස් ඊට කඩු මුවහතින් පහර-
25 දුන්නෝය. ඒ දවසේදී වැටුණු ස්ත්‍රී
පුරුෂයෝ වූ හායිහි සියලු මනුෂ්‍යයෝ
26 දෙළොස් දහසක්ය. මක්නිසාද යෝෂුවා
හෙල්ලය දිගුකළ තමාගේ අත හායිහි
සියලු වැසියන් මුළුමනින්ම විනාශකර
දමන තුරු පස්සට නොගත්තේය.
27 නුමුත් සිව්පාවුන්ද ඒ නුවර කොල්ලයද
ස්වාමීන්වහන්සේ යෝෂුවාට අණකළ
වචනය ප්‍රකාර ඉශ්‍රායෙල්වරු තමුන්ට
28 කොල්ලයක් කොට ගත්තෝය. මෙසේ
යෝෂුවා හායි ගිනිලා, එය සදකල්
පවතින ගොඩක් එනම් අද දක්වා
29 පවතින පාළු ස්ථානයක් කෙළේය. ඔහු
හායිහි රජ සවස දක්වා ගසක එල්ලා
තැබුවේය. ඉර බසින වේලාවේ ඔහුගේ
මළකඳ යෝෂුවාගේ අණ පිට ගසින්
බා, නුවර දොරකඩ හෙළා, මහත් ගල්
ගොඩක් ඒ පිට ගොඩගැසුවෝය. එය
අද දවස දක්වා තිබේ.

## ව්‍යවස්ථාවේ ආශීර්වාද සහ ශාප

30 එවිට යෝෂුවා ස්වාමීන්වහන්සේගේ
මෙහෙකරුවූ මෝසෙස් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට අණකළ පරිදි මෝසෙස්ගේ
ව්‍යවස්ථා පොතෙහි ලියා තිබෙන ලෙස,
31 කිසිවෙකු විසින් යකඩයක් නොපෙවුවාවූ
*පියවි ගල්වලින් ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට ඒබාල්
කන්දෙහි පූජාසනයක් ගොඩනැගුවේය.
ඔව්හු ඒක පිට ස්වාමීන්වහන්සේට දවන
පූජා පුද, ශාන්ති පූජාද ඔප්පුකළෝය.
ඔහු එහිදී ඒ ගල් පිට මෝසෙස්ගේ 32
ව්‍යවස්ථාවෙන් පිටපතක් ලියුවේය. ඔහු
එය ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙහි
ලියුවේය. සියලු ඉශ්‍රායෙල්වරුද ඔවුන්ගේ 33
වැඩිමහල්ලෝද මුලාදෑනීහුද විනිශ්චය-
කාරයෝද ස්වදේශියා සේම විදේශියාද
ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
ඉසුලූ ලෙවීවරුන් වූ පූජකයන් ඉදිරියෙහි
ගිවිසුම් පෙට්ටිය දෙපැත්තේ සිටියෝය;
දෙකෙන් කොටසක් ගෙරිසීම් කන්ද
ඉදිරිපිටය, දෙකෙන් කොටසක් ඒබාල්
කන්ද ඉදිරිපිටය. මෙසේ කළේ පළමු-
කොටම ඉශ්‍රායෙල් සෙනඟට ආශීර්වාද
කළ යුතුය කියා ස්වාමීන්වහන්සේගේ
මෙහෙකරුවූ මෝසෙස් අණකළ හැටියටය.
ඉන්පසු ව්‍යවස්ථා පොතෙහි ලියා තිබෙන 34
සියල්ලේ හැටියට ආශීර්වාදයත් ශාපයත්
යන ව්‍යවස්ථාවේ සියලු වචන ඔහු
කියෙවුවේය. මෝසෙස් අණකළ සියල්- 35
ලෙන් යෝෂුවා මුළු ඉශ්‍රායෙල් සභාවද
ස්ත්‍රීන්ද බාලයන්ද ඔවුන් අතරෙහි
හැසුරුණු විදේශීන්ද ඉදිරියේදී නො-
කියෙවූ එකද වචනයක් නොවීය.

## ගිබියෝන්වරුන් සමග කළ ගිවිසුම

9

යෝර්දනෙන් මෙගොඩ කඳු
රටෙහිත් පාත රටෙහිත්
ලෙබනොන් ඉදිරිපිට තිබෙන මහ මුහුද
අසබඩ මුළුල්ලෙහිත් සිටිය හිත්තී-
වරුන්ගේද අමෝරීවරුන්ගේද කානානි-
වරුන්ගේද පෙරිස්සිවරුන්ගේද හිවී-
වරුන්ගේද යෙබුසිවරුන්ගේද සියලු
රජවරුන් ඒ ඇසූ කල, ඔව්හු එක් 2
සිත්ව යෝෂුවාට සහ ඉශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව යුද්ධකරන්ට එකට රැස්වූවෝය.
නුමුත් ගිබියෝන් වැසියන් යෝෂුවා 3
විසින් යෙරිකෝවටත් හායිටත් කළ දේ
ඇසූ විට, ඔව්හු ප්‍රයෝගයෙන් හැසිරෙමින්, 4

*ද්විතීය කථා 27.6 බලනු.

තානාපතීන් මෙන් පිටත්ව, පරණ
ගෝණිද පැළී පිළියම්කළ පරණ
සම් මුද්‍රිකපාන භාජනද තමුන්ගේ
5 කොටළුවන් පිට පටවාගෙන, අණ්ඩ දමූ
පරණ වහන් පයලාගෙන, පරණ වස්ත්‍ර
හැඳගන ගියෝය; ඔවුන්ගේ කෑමට ගත්
රොටි සියල්ලද වේළී පුස්බැඳී තිබුණේය.
6 ඔව්හු ගිල්ගාල්හි අන්දයමේ සිටි යෝෂුවා
වෙතට ගොස් ඔහුටත් ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන්ටත් කථාකොට: අපි දුර
රටකින් ආවෙමුව, එබැවින් අප සමග
7 ගිවිසුමක් කළමැනවියි කීවෝය. ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝද: තුඹලා අප අතරේ
වසනවා වෙන්ට පුළුවන; කෙසේ අපි
තුඹලා සමග ගිවිසුමක් කරමුදැයි
8 හිව්වරුන්ට කීවෝය. ඔව්හු: අපි
තුඹවහන්සේගේ දසයෝයයි යෝෂුවාට
කීවෝය. යෝෂුවාද: තුඹලා කවුරුද?
කොතැනින් ආවහුදැයි ඔවුන්ගෙන්
9 ඇසුවේය. ඔව්හු උත්තරදෙමින්: තුඹ-
වහන්සේගේ දසයෝවූ අපි තුඹ-
වහන්සේගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
නාමය නිසා බොහෝ දුරු රටකින්
ආවෙමුව. මක්නිසාද උන්වහන්සේගේ
කීර්තියද උන්වහන්සේ විසින් මිසරයෙහි
10 කළ සියල්ලද, යොර්දනෙන් එගොඩ
සිටිය අමෝරිවරුන්ගේ රජවරුන්
දෙන්නා වන හෙෂ්බොන්හි රජවූ
සීහොන්ටත් අෂ්ටාරොත්හි සිටි බාෂන්හි
රජවූ ඕග්ටත් කළ සියල්ලද ඇසීමුව.
11 එබැවින් අපේ වැඩිහිටි මහල්ලෝද අපේ
රට වැසි සියල්ලෝද අපට කථාකොට:
තුඹලාගේ ගමනට ආහාර රැගෙන
ඔවුන් සම්මුඛවෙන්ට ගොස්-අපි තුඹ-
වහන්සේලාගේ දසයෝය කියාද අප
සමග ගිවිසුමක් කළ මැනවියි කියාද
ඔවුන්ට කියාපල්ලායයි අපට කීවෝය.
12 තුඹවහන්සේලා ළඟට එන්ට අප
පිටත්වුණ දවසේදී අපේ ආහාර පිණිස
මේ රොටි උණුහුම්ව තිබෙද්දීම අපේ
ගෙවලින් ගතිමුව; තුමුත් දන් මේවා
13 වේළී පුස්බැඳී තිබේ. අප විසින් පිරෙවූ
මේ මුද්‍රිකපාන සම්භාජන අලුත්ව
තිබුණේය; දැන් මේවා ඉරී තිබේ.
මේ අපේ වස්ත්‍රද වහන්ද ගමන ඉතා දුර
නිසා පරණ වී තිබෙනවායයි කීවෝය.
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ **ස්වාමීන්-** 14
**වහන්සේගෙන්** දැනුමැතිකම් නොවිචාරා
ඔවුන්ගේ ආහාරවලින් පිළිගත්තෝය.
යෝෂුවා ඔවුන් සමග සමාදනවී, 15
ඔවුන්ගේ ප්‍රාණ ඉතුරුකරන හැටියට
ඔවුන් සමග ගිවිසුමක් කෙළේය. සභාවේ
අධිපතිහුද ඔවුන්ට දිවුරුම් දුන්නෝය.
එහෙත් ඔවුන් සමග ගිවිසුමක් කර තුන් 16
දවසකට පසු ඔවුන් තමුන්ගේ අසල්වාසීන්
බවත් තමුන් අතරෙහි වාසය කරන
බවත් ඔවුන්ට ආරංචිවුණේය. ඉශ්‍රායෙල් 17
පුත්‍රයෝ ගමන්කොට තුන්වෙනි දින
ඔවුන්ගේ නුවරවලට පැමිණියෝය.
ඔවුන්ගේ නුවරවල් නම් ගිබියොන්,
කෙපීරා, බෙයේරොත්, කිර්යත්-යෙයාරීම්
යන මේවාය. සභාවේ අධිපතීන් 18
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ගැන ඔවුන්ට දිවුරුම්දී තිබුණු නිසා
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඔවුන්ට පහර
නුදුන්නෝය. මුළු සභාව අධිපතීන්ට
විරුද්ධව කොඳුළෝය. තුමුත් සියලු 19
අධිපතීහු කථාකොට: අපි ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ගැන ඔවුන්ට
දිවුළෙමුව. එබැවින් ඔවුන්ට අත ගසන්ට
නොහැකිවමුව. අප විසින් ඔවුන්ට 20
දුන් දිවුරුම නිසා උදහස අප
පිටට නොපැමිණෙන පිණිස, ඔවුන්ට
ජීවත්වෙන්ට ඉඩ හැර, ඔවුන්ට මෙසේ
කරමුයයි මුළු සභාවට කීවෝය. තවද 21
අධිපතීහු ඔවුන්ට කථාකොට: ඔව්හු
ජීවත්වෙත්වයි කීවෝය. අධිපතීන් විසින්
ඔවුන්ට කී හැටියට ඔව්හු වනාහි මුළු
සභාවට දර කපන්නෝද දිය අදින්නෝද
වූහ. යෝෂුවා ඔවුන් කැඳවා: තුඹලා 22
අප අතරේ වාසය කරද්දී-අපි තුඹ-
වහන්සේලාට බොහෝ දුරින් සිටිමුව
කියා අප රැවටුවේ මක්නිසාද? ඉතින් 23
තුඹලා ශාපලද්දෝය, තුඹලාගෙන් මාගේ
දෙවියන්වහන්සේගේ ගෘහයට දර
කපන්නෝද දිය අදින්නෝද යන දසයෝ
කිසි කලක තොර නොවන්නාහයි
ඔවුන්ට කීවේය. ඔව්හු යෝෂුවාට 24

උත්තරදෙමින්: මුළු දේශය තුඹ-
වහන්සේලාට දෙන්ටත් තුඹවහන්සේලා
ඉදිරියෙන් දේශයේ සියලු වැසියන්
විනාශකරදමන්ටත් තුඹවහන්සේලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
මෙහෙකරුවූ මෝසෙස්ට අණකළ බව
ඔබගේ දසයන්ට සැබවින් දන්වන්ට
යෙදුණේය: එබැවින් අපි තුඹවහන්සේලා
නිසා අපේ ප්‍රාණ ගැන ඉතා භයව මේ
25 දේ කෙළෙමුව. ඉතින් අපි ඔබ අතේය;
ඔබට යහපත්ව හරිව පෙනෙන ලෙස
26 අපට කළ මැනවියි කීවෝය. ඔහු ඔවුන්ට
එලෙසම කොට, ඉශ්‍රායෙල් පුත්‍රයන්
විසින් ඔවුන් මරානොදමන ලෙස ඔවුන්
27 අතින් ගළවාගත්තේය. අද දක්වා තිබෙන
හැටියට යෝෂුවා ඒ දවසේ ඔවුන්
සභාවටත් **ස්වාමීන්වහන්සේ** තෝරා-
ගන්න ස්ථානයෙහි උන්වහන්සේගේ
පූජාසනයටත් දර කපන්නන්ද දිය
අදින්නන්ද කෙළේය.

## ගිබියොන්හිදී ලත් ජය

**10** යෝෂුවා හායි නුවර අල්වා
ඒක සිඳදමා, ඔහු යෙරිකෝවටත්
එහි රජුටත් කළ හැටියට හායිටත් එහි
රජුටත් කළ බවත්, ගිබියොන් වැසියන්
ඉශ්‍රායෙල්වරුන් සමග සමාදනවී ඔවුන්
අතරේ සිටින බවත් යෙරුසලමේ රජවූ
2 අදෝනි-ශෙදෙක් ඇසූ කල, ඔව්හු ඉතා
භයවූවෝය, මක්නිසාද ගිබියොන්
රාජකීය නුවරක් මෙන් මහත් නුවරක් ව
තිබුණේය; ඒක හායිට වඩා මහත් විය.
එහි සියලු මනුෂ්‍යයෝද බලවන්තයෝ
3 වූහ. එබැවින් යෙරුසලමේ රජවූ අදෝනි-
ශෙදෙක්: ගිබියොන්වරුන් යෝෂුවාද
ඉශ්‍රායෙල් පුත්‍රයන්ද සමග සමාදන වූ
නිසා අප ඊට පහරදෙන පිණිස මා
වෙතට අවුත් මට උපකාර කරපල්ලා-
4 යයි හෙබ්‍රොන්හි රජවූ හෝහාම්ටද
යර්මූත්හි රජවූ පීරාම්ටද ලාකීෂ්හි රජවූ
යපියාටද එග්ලොන්හි රජවූ දෙබීර්ටද
5 කියා යැවීය. එබැවින් අමෝරිවරුන්ගේ
රජවරු පස්දෙන එනම් යෙරුසලමේ රජද
හෙබ්‍රොන්හි රජද යර්මූත්හි රජද ලාකීෂ්හි
රජද එග්ලොන්හි රජද එකතුව ඔව්හුද
ඔවුන්ගේ සියලු සේනාවෝද ගොස්
ගිබියොන් ඉදිරියේ කඳවුරු බැඳ ඊට
විරුද්ධව යුද්ධ කළෝය. එවිට ගිබි- 6
යොන්හි මනුෂ්‍යයෝ: ඔබගේ දසයන්
අත්නැර අප වෙතට ඉක්මනින් අවුත්
අප ගළවා අපට උපකාරකළ මැනවි.
මක්නිසාද කඳු රටේ වසන අමෝරි-
වරුන්ගේ සියලු රජවරු අපට විරුද්ධව
එකතුවී සිටිතියි ගිල්ගාල්හි අන්දයමේ
සිටි යෝෂුවාට කියා යැවූහ. එවිට 7
යෝෂුවා මුළු යුද්ධ හමුදවද සියලු
බලවන්ත යුද්ධකාරයන්ද සමග ගිල්ගාල්
කෙරෙන් නැගී ගියේය. **ස්වාමීන්වහන්සේ** 8
යෝෂුවාට කථාකොට: ඔවුන්ට භය-
නොවෙන්න. මක්නිසාද මා විසින් ඔවුන්
තුඹ අතට පාවාදී තිබේ: ඔවුන්ගෙන්
කිසිවෙක්වත් තුඹ ඉදිරියේ නොසිටින්-
නේයයි කීසේක. යෝෂුවා ගිල්ගාල්හි සිට 9
රාත්‍රිය මුළුල්ලේ නැගී ගොස් හදිසියෙන්
ඔවුන් ළඟට පැමිණියේය. **ස්වාමීන්-** 10
**වහන්සේ** ඉශ්‍රායෙල්වරුන් ඉදිරියෙහි
ඔවුන් කලඹා විසුරුවා දමූසේක. එබැවින්
ඔව්හු මහත් මැරීමකින් ගිබියොන් ළඟදී
ඔවුන් නසා, බෙත්-හෝරොන්ට නැගීයන
මාර්ගයෙහි ඔවුන් ලුහුබඳවා ගොස්,
අසේකා සහ මක්කේද දක්වා ඔවුන්ට
පහරදුන්නෝය. තවද ඔවුන් ඉශ්‍රායෙල් 11
ඉදිරියෙන් පලායද්දී, බෙත්-හෝරොන්
පල්ලමේදී, අසේකා දක්වා **ස්වාමීන්-**
**වහන්සේ** අහසෙන් මහත් ගල් ඔවුන්
පිටට හෙළුසේක. එයින් ඔව්හු
මැරුණෝය. ගල් වැස්සෙන් නැසුණු අය
වනාහි ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් කඩුවෙන්
මැරූ අයට වඩා බොහෝ වූහ.
**ස්වාමීන්වහන්සේ** අමෝරිවරුන් 12
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට පාවාදුන් ඒ
දවසේදී යෝෂුවා **ස්වාමීන්වහන්සේට**
කථා කොට මුළු ඉශ්‍රායෙල්වරුන්ගේ
ඇස් හමුයෙහිදී කියනුයේ:
එම්බා සූර්යය, තෝ ගිබියොන් පිටද,

චන්ද්‍රය, තෝ ආයාලොන් මිටියාවත
පිටද නැවතී සිටිව්යයි කීවේය.
13 එවිට සෙනඟ තමුන්ගේ සතුරන්ගෙන්
පළිගන්නතුරු,
සූර්යයා නැවතී සිටියේය, චන්ද්‍රයාද
නැවතුණේය.
මෙපවත් *යාෂාර්ගේ පොතේ ලියා
තිබෙනවා නොවේද? සූර්යයා සම්පූර්ණ
දවසක් පමණ බැසීමට ඉක්මන් නොවී
14 අහස මැද සිටියේය. ස්වාමීන්වහන්සේ
මනුෂ්‍යයෙකුගේ හඬ ඇසූ එබඳු දවසක්
ඊට ප්‍රථමවත් පසුවවත් නොවීය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්
උදෙසා සටන්කළසේක.
15 ඉක්බිති යෝෂුවාද ඔහු සමග සියලු
ඉශ්‍රායෙල්වරුද ගිල්ගාල්හි අන්දයමට
හැරී ගියෝය.
16 ඒ රජවරුන් පස්දෙනා පලාගොස්
17 මක්කේදහි ගුහාවේ සැඟවුණෝහ. රජවරුන්
පස්දෙනා මක්කේදහි ගුහාවේ සැඟවී
ඉන්නවා සම්බවීයයි යෝෂුවාට දන්වන-
18 ලද්දේය. යෝෂුවාද: නුඹලා ගුහාවේ
කටට ලොකු ගල් පෙරළා තබා, ඔවුන්
19 මුරකරන්ට මිනිසුන් සිටුවාපල්ලා. එහෙත්
නුඹලා වනාහි නැවතී නොසිටිල්ලා;
නුඹලාගේ සතුරන් පස්සේ එළවාගෙන
ගොස් ඔවුන්ගෙන් පස්සේ සිටින්නන්ට
පහර දීපල්ලා; තමුන්ගේ නුවරවලට
ඇතුල්වෙන්ට ඉඩනාරිල්ලා. මක්නිසාද
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
ඔවුන් නුඹලා අතට දී තිබේයයි කීවේය.
20 යෝෂුවා සහ ඉශ්‍රායෙල් පුත්‍රයන් ඔවුන්
විනාශවනතෙක් ඉතා මහත් මැරීමකින්
ඔවුන් මරා නිමකළ පසුද, ඔවුන්ගෙන්
ඉතිරී අය පවුරු ඇති නුවරවලට
21 ඇතුල්වූ පසුද, මුළු සෙනඟ මක්කේදහි
කඳවුරට යෝෂුවා වෙතට සුවසේ
හැරී ආවෝය. ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන්
කිසිවෙකුට විරුද්ධව කවරෙක්වත්
22 තමාගේ දිව නොසෙල්විය. එවිට
යෝෂුවා කථාකොට: ගුහාවේ කට ඇර
ඒ රජුන් පස්දෙනා ගුහාවෙන් මා ළඟට
ගෙනෙල්ලායයි කීය. ඔව්හු එසේ කොට 23
ඒ රජවරුන් පස්දෙනා එනම් යෙරුසලමේ
රජද හෙබ්‍රොන්හි රජද යර්මූත්හි රජද
ලාකීෂ්හි රජද එග්ලොන්හි රජද
ගුහාවෙන් ඔහු ළඟට ගෙනාවෝය.
තවද ඔවුන් ඒ රජුන් යෝෂුවා වෙතට 24
ගෙනා කල, යෝෂුවා සියලු ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන් කැඳවා තමා සමග ගිය
යුද්ධකාරයන්ගේ අධිපතීන්ට කථාකර:
ළංවී නුඹලාගේ පාද මේ රජුන්ගේ කුළල්
මත්තෙහි තබාපල්ලායයි කීවේය. ඔව්හු
ළංව තමුන්ගේ පාද ඔවුන්ගේ කුළල්
මත්තෙහි තැබුවෝය. යෝෂුවා ඔවුන්ට 25
කථාකොට: භයනොවී නොකැලඹී
සිටිල්ලා, ශක්තිමත්ව ධෛර්යවත්ව
සිටපල්ලා. මක්නිසාද නුඹලාට විරුද්ධව
යුද්ධ කරන නුඹලාගේ සියලු සතුරන්ට
ස්වාමීන්වහන්සේ මෙසේ කරනසේකැයි
කීවේය. ඉන්පසු යෝෂුවා ඔවුන්ට පහරදී 26
මරා, ගස් පහක එල්ලුවේය. ඔවුන් සවස
දක්වා ගස්වල එල්ලා තබා තිබුණේය.
ඉර බසින වේලාවේ යෝෂුවාගේ අණ 27
පිට ඔව්හු ඔවුන් ගස්වලින් බා ඔවුන්
සැඟවී සිටිය ගුහාවේ දමා, අද දක්වාම
තිබෙන මහත් ගල් ඒ ගුහා කටෙහි
තැබුවෝය.

## මක්කේද යනාදී තැන් අල්ලාගැනීම

ඒ දවසේ යෝෂුවා මක්කේද අල්වා 28
ඊටත් එහි රජුටත් කඩු මුවහතින් පහරදී,
එකද කෙනෙක්වත් ඉතුරු නොකර,
ඔවුන්ද එහි සිටිය සියලු ප්‍රාණීන්ද
මුළුමනින්ම විනාශකරදමා, යෙරිකෝවේ
රජුට කළාක් මෙන් මක්කේදහි රජුටත්
කෙළේය.
මක්කේදහි සිට යෝෂුවා සියලු 29
ඉශ්‍රායෙල්වරුන් සමග ලිබ්නාට ගොස්
ලිබ්නාට විරුද්ධව යුද්ධකෙළේය.
ස්වාමීන්වහන්සේ ඒකත් එහි රජුත් 30
ඉශ්‍රායෙල්වරුන් අතට පාවාදුන්සේක;
ඔව්හු එහි සිටිය එක්කෙනෙක්වත් ඉතුරු
නොකොට එයටත් එහි සිටිය සියලු

*හෙවත්–ධර්මිෂ්ඨයාගේ.

ප්‍රාණීන්ටත් කඩු මුවහතින් පහරදී,
යෙරිකෝවේ රජුට කළාක් මෙන් එහි
රජුටත් කළෝය.
31 ලිබ්නාහි සිට යෝෂුවා සියලු
ඉශ්‍රායෙල්වරුන් සමග ලාකීෂ්ට ගොස්,
එය ඉදිරිපිට කඳවුරු බැඳ, ඊට විරුද්ධව
32 යුද්ධකෙළේය. **ස්වාමීන්වහන්සේ** ලාකීෂ්ද
ඉශ්‍රායෙල්වරුන් අතට පාවාදුන්සේක,
ඕහු දෙවෙනි දවසේදී එය අල්ලාගෙන
ලිබ්නාට කළ සියල්ල ලෙස ඊටත් එහි
සිටිය සියලු ප්‍රාණීන්ටත් කඩු මුවහතින්
පහරදුන්නේය.
33 එවිට ගෙශෙර්හි රජවූ හොරාම්
ලාකීෂ්ට උපකාර කරන පිණිස ආයේය;
යෝෂුවා ඕහුට එක්කෙනෙක්වත් ඉතුරු-
නොවෙන තුරු ඕහුටත් ඕහුගේ
සෙනඟටත් පහරදුන්නේය.
34 ලාකීෂ්හි සිට යෝෂුවා ඉශ්‍රායෙල්වරුන්
සමග එග්ලෝන්ට ගොස් එය ඉදිරිපිට
කඳවුරු බැඳ ඊට විරුද්ධව යුද්ධකෙළේය;
35 ඔව්හු ඒ දවසේදී එය අල්ලාගෙන, ඊට
කඩු මුවහතින් පහරදී, ලාකීෂ්ට කළ
සියල්ල ලෙස එහි සිටි සියලු ප්‍රාණීන්ද
ඒ දවසේදී මුළුමනින්ම විනාශකර
දැමුවෝය.
36 එග්ලෝන්හි සිට යෝෂුවා සියලු
ඉශ්‍රායෙල්වරුන් සමග හෙබ්‍රෝන්ට ගොස්
ඊට විරුද්ධව යුද්ධකොට එය අල්ලාගෙන,
37 ඊටත් එහි රජුටත් ඊට අයිති සියලු
නුවරවලටත් එහි සිටි සියලු ප්‍රාණීන්ටත්
කඩු මුවහතින් පහරදී, එග්ලෝන්ට කළ
සියල්ල ලෙස එක්කෙනෙකුවත් ඉතුරු
නොකොට එයද එහි සිටි සියලු ප්‍රාණීන්ද
මුළුමනින්ම විනාශකර දැමුවේය.
38 යෝෂුවා සියලු ඉශ්‍රායෙල්වරුන් සමග
දෙබීර්ට හැරී ඇවිත් ඊට විරුද්ධව යුද්ධ
39 කොට, එය සහ එහි රජුද ඊට අයිති
සියලු නුවරවල්ද අල්ලාගෙන, කඩු
මුවහතින් පහරදී, එක්කෙනෙකුවත් ඉතුරු
නොකර එහි සිටිය සියලු ප්‍රාණීන්
මුළුමනින්ම විනාශකර දැමුවේය; ඕහු
හෙබ්‍රෝන්ට කළාක් මෙන්ද ලිබ්නාටත්
එහි රජුටත් කළාක් මෙන්ද දෙබීර්ටත්
එහි රජුටත් කෙළේය.

මෙසේ යෝෂුවා මුළු දේශයට එනම් 40
කඳු රටට හා දකුණු දේශයටද පාත
රටට හා කඳු බෑවුම්වලටද එහි සියලු
රජුන්ටද පහරදී එක්කෙනෙක්වත්
ඉතුරුනොකොට ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අණකළ ලෙස හුස්ම
ඇති සියල්ලන් මුළුමනින්ම සිඳදැමුවේය.
කාදේෂ්-බර්නේය පටන් ගාසා දක්වාද 41
මුළු ගෝෂෙන් රටෙහි ගිබියොන් දක්වාද
යෝෂුවා ඔවුන්ට පහර දුන්නේය.
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** 42
ඉශ්‍රායෙල් උදෙසා සටන් කළ බැවින්
යෝෂුවා ඒ සියලු රජුන්ද ඔවුන්ගේ
දේශයද එකවිටම අල්ලාගත්තේය.
ඉක්බිති යෝෂුවාද ඕහු සමග සියලු 43
ඉශ්‍රායෙල්වරුද ගිල්ගාල්හි අන්දයමට
හැරී ආවෝය.

## මුළු දේශය අල්ලාගැනීම

11 තවද හාශෝර්හි රජවූ යාබීන්
මේ දේ ඇසූ කල, මාදෝන්හි
රජවූ යෝබාබ්ටද ෂිම්රෝන්හි රජුටද
ආක්ෂාප්හි රජුටද, උතුරු දිශාවේ කඳු 2
රටේ සහ කින්නෙරොත්ට දකුණෙන්
තිබෙන අරබා සමභූමියෙහිත් පාත
රටෙත් බස්නාහිරෙන් තිබෙන දෝර්
කඳුකරයෙහිත් සිටිය රජවරුන්ටද,
නැගෙනහිරෙන් සහ බස්නාහිර දිගෙනුත් 3
සිටිය කානානිවරුන්ටද අමෝරිවරුන්ටද
හිත්තීවරුන්ටද පෙරිස්සිවරුන්ටද කඳු
රටේ සිටි යෙබූසිවරුන්ටද මිශ්පා
දේශයෙහි හෙර්මොන්ට පහළින් සිටිය
හෙවීවරුන්ටද කියා යැවීය. ඔව්හු 4
මුහුදු වෙරළේ වැලි මෙන් ගණනින්
බොහෝවූ සෙනඟක් වන තමුන්ගේ
සියලු සේනාවල්ද අශ්වයන් හා රථ ඉතා
මහත් ගණනක්ද ඇතුව පිටත්ව
ආවෝය. මේ සියලු රජවරු රැස්වී 5
ඇවිත්, ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව යුද්ධ
කරන්ට මෙරොම්හි ජල ළඟ එක්ව
කඳවුරු බැඳගත්තෝය. **ස්වාමීන්වහන්සේ** 6
යෝෂුවාට කථාකොට: ඔවුන් ගැන

හයනොවන්න. මක්නිසාද ඔවුන්
මැරුම්කන පිණිස හෙට මේ වේලාවට
ඔවුන් සියල්ලන් ඉශ්‍රායෙල්වරුන් අතට
පාවා දෙන්නෙමි. ඔවුන්ගේ අශ්වයන්ගේ
කුදි කපා ඔවුන්ගේ රථ ගින්නෙන්
7 පුලුස්සාදමාපන්නැයි කීසේක. මෙසේ
යෝෂුවා මුළු යුද්ධ සේනාව සමග
මෙරොම්හි ජල ළඟ සිටි ඔවුන්ට
විරුද්ධව හදිසියෙන් අවුත් ඔවුන් මැදට
8 වන්නේය. **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්-
වරුන්ගේ අතට ඔවුන් පාවා දුන්සේක,
ඔව්හු ඔවුන්ට පහරදී මහ ශීදෙන් දක්වාද
මිස්රෙපොත්-මයිම් දක්වාද නැගෙනහිර
තිබෙන මිශ්පාහි මිටියාවත දක්වාද
ඔවුන් එළවාගන ගොස් ඔවුන්ගෙන්
එක්කෙනෙක්වත් ඉතුරු නොවන තුරු
9 ඔවුන්ට පහරදුන්නෝය. යෝෂුවා
**ස්වාමීන්වහන්සේ** තමාට කී ලෙස ඔවුන්ට
කරමින් ඔවුන්ගේ අශ්වයන්ගේ කුදි
කපා ඔවුන්ගේ රථ ගින්නෙන් පුලුස්සා
දැමුවේය.
10 ඒ ප්‍රස්තාවේ යෝෂුවා හැරී ඇවිත්
හාශෝර් අල්වාගෙන එහි රජුට කඩුවෙන්
පහරදුන්නේය. මක්නිසාද හාශෝර්
ඉහතදී ඒ සියලු රාජ්‍යවල ප්‍රධාන නුවරව
11 තිබුණේය. ඔව්හු එහි සිටිය සියලු
ප්‍රාණීන්ට කඩු මුවහතින් පහරදී ඔවුන්
මුළුමනින්ම විනාශකර දැමුවෝය. හුස්ම
ඇති කිසිවෙක් ඉතුරු නොවීය. ඔහු
හාශෝර් ගින්නෙන් පුලුස්සා දැමුවේය.
12 යෝෂුවා මේ සියලු රජුන්ගේ නුවරවල්ද
එහි සියලු රජුන්ද අල්වාගෙන, **ස්වාමීන්-
වහන්සේගේ** මෙහෙකරුවූ මෝසෙස්
අණකළ ලෙස කඩු මුවහතින් ඔවුන්ට
13 පහරදී ඔවුන් සිඳදැමුවේය. එහෙත් හෙල්
පිට පිහිටා තිබුණ සියලු නුවරවලින්
හාශෝර් මිස එකක්වත් ඉශ්‍රායෙල්වරු
14 පුලුස්සා නොදැමුවෝය. යෝෂුවා
හාශෝර් පමණක් පුලුස්සා දැමුවේය. ඒ
නුවරවල මුළු කොල්ලයද සිව්පාවුන්ද
ඉශ්‍රායෙල් පුත්‍රයෝ තමුන්ට කොල්ලයක්
කොට ගත්තෝය; නුමුත් තමුන් විසින්
සියලු මනුෂ්‍යයන් විනාශකරනු ලබන
තුරු ඔවුන්ට කඩු මුවහතින් පහර-
දුන්නෝය, හුස්ම හෙළන කිසිවෙකු ඔව්හු
ඉතුරුනොකළෝය. **ස්වාමීන්වහන්සේ** 15
තමන්ගේ මෙහෙකරුවූ මෝසෙස්ට
අණකළ ලෙස මෝසෙස් යෝෂුවාට
අණකෙළේය. යෝෂුවාද එසේ කෙළේය;
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට අණකළ
සියල්ලෙන් ඔහු කිසිවක් නොකොට
නොසිටියේය.
මෙසේ සේයිර්ට නගින මාර්ගයෙහි 16
හලක් කන්ද පටන් හෙර්මොන් කන්දට
පහළ ලෙබනොන් මිටියාවතේ තිබෙන
බාල්-ගාද් දක්වා, කඳු රටද මුළු දකුණු 17
දිශාවද මුළු ගෝෂෙන් රටද පාත රටද
අරබා සමභූමියද ඉශ්‍රායෙල් කඳු රටද
එහි පාත රටද යන මුළු දේශය යෝෂුවා
අත්කරගන, එහි සියලු රජුන්ද අල්වා,
ඔවුන්ට පහරදී ඔවුන් මැරුවේය. ඒ සියලු 18
රජුන් සමග යෝෂුවා බොහෝ කල්
යුද්ධ කෙළේය. ගිබියොන්හි වැසියන්වූ 19
හිවීවරුන් මිස වෙන කිසි නුවරක්
ඉශ්‍රායෙල් පුත්‍රයන් සමග සමාදන
නොවීය. ඔව්හු යුද්ධයෙන් අවශේෂ
සියල්ලම අල්වාගත්තෝය. මක්නිසාද 20
ඉශ්‍රායෙල්වරුන් සමග යුද්ධ කරන්ට
පැමිණීමට ඔවුන්ගේ සිත් දැඩිකර
ගැනීම **ස්වාමීන්වහන්සේගෙන්** පැමුණුණු
කාරණයක්ය. මෙසේ වූණේ ඔවුන්ට
කරුණා නොකර, ඔවුන් මුළුමනින්ම
විනාශකර දමා, **ස්වාමීන්වහන්සේ**
මෝසෙස්ට අණකළ පරිදි ඔහු විසින්
ඔවුන් සිඳ දමන පිණිසය.
ඒ කාලයෙහි යෝෂුවා අවුත් කඳු 21
රටින්ද හෙබ්‍රොන් කෙරෙන්ද දෙබීර්
කෙරෙන්ද අනාබ් කෙරෙන්ද මුළු යූද
කඳු රටෙන්ද මුළු ඉශ්‍රායෙල් කඳු රටෙන්ද
අනාක්වරුන් නැතිකර දැමුවේය. යෝෂුවා
ඔවුන්ගේ නුවරවල් සමග ඔවුන්
මුළුමනින්ම විනාශකර දැමුවේය. ඉශ්‍රායෙල් 22
පුත්‍රයන්ගේ දේශයෙහි අනාක්වරුන්
එක්කෙනෙක්වත් ඉතුරු නොවීය.
ගාසාහිද ගාත්හිද අෂ්දෝද්හිද පමණක්
ඔව්හු ඉතුරුව සිටියෝය. මෙසේ 23
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට කී සියල්ල

ලෙස යෝෂුවා මුළු දේශය අල්ලාගෙන,
ඉශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍ර බෙදීම්වල
හැටියට ඒක ඔවුන්ට උරුමයක් කොට
දුන්නේය. එවිට යුද්ධය නැවතී දේශය
නිශ්චලවිය.

## යටත්කරගත් රජවරුන්ගේ නාම ලේඛනය

**12** නැගෙනහිරට යෝර්දනෙන්
එගොඩ අර්ණෝන් ඔය පටන්
හෙර්මෝන් කන්ද දක්වාද මුළු
නැගෙනහිර අරබා සමභූමියටද
ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් පහරදී හිමි-
කරගත්තාවූ ඒ දේශයේ රජවරු මොව්හුය.
2 හෙෂ්බොන්හි විසූ අමෝරිවරුන්ගේ රජවූ
සීහොන්ය. ඔහු අර්ණෝන් ඔය අද්දර
තිබෙන අරොයෙර් පටන්ද, මිටියාවත
මැද තිබෙන නුවර පටන්ද, අම්මොන්
පුත්‍රයන්ගේ සීමාව වන යබ්බොක් ඔය
දක්වා ගිලියද් අර්ධයක් කෙරෙහිද,
3 නැගෙනහිරට කින්නෙරොත් මුහුද
දක්වාත් බෙත්-යෙෂිමොත්ට යන
මාර්ගයෙහි පිස්ගා පාමුලට පහළින්
දකුණු දිශාවට තිබෙන ලුණු මුහුද
වන අරබා සමභූමියේ මුහුද දක්වාත්
නැගෙනහිරට තිබෙන අරබා සමභූමිය
4 කෙරෙහිද ආණ්ඩුකෙළේය. රෙපායිම්-
වරුන්ගෙන් ඉතුරුව සිටිය බාෂාන්හි
රජවූ ඕග්ගේ පළාතටත් පහරදී
ඔව්හු එය හිමිකරගත්තෝය. ඔහු
අෂ්තාරොත්හිත් එද්‍රෙයෙහිත් වාසය
5 කොට, හෙර්මෝන් කන්දද සලෙකාද
ගෙෂූර්වරුන්ගේ සහ මයකාත්වරුන්ගේ
සීමාව දක්වා මුළු බාෂාන්ද හෙෂ්-
බොන්හි රජවූ සීහොන්ගේ සීමාව දක්වා
ගිලියද් අර්ධයක්ද කෙරෙහි ආණ්ඩු-
6 කෙළේය. ස්වාමීන්වහන්සේගේ මෙහෙ-
කරුවූ මෝසෙස්ද ඉශ්‍රායෙල් පුත්‍රයෝද
ඔවුන්ට පහර දුන්නෝය. ස්වාමීන්-
වහන්සේගේ මෙහෙකරුවූ මෝසෙස් ඒ
රට රූබෙන්වරුන්ටත් ගාද්වරුන්ටත්
මනස්සේගේ අර්ධ ගෝත්‍රයටත් උරුමයක්
කොට දුන්නේය.

බස්නාහිරට යෝර්දනෙන් මෙගොඩ 7
ලෙබනොන් මිටියාවතෙහි තිබෙන බාල්-
ගාද් පටන් සේයිර්ට නගින මාර්ගයෙහි
හලක් කන්ද දක්වා යෝෂුවා සහ
ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් පහර දුන්නාවූ,
යෝෂුවා ඉශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍රවලට
ඔවුන්ගේ බෙදීම්වල හැටියට උරුමයක්
කොට දුන්නාවූ දේශයේ රජවරු
මොව්හුය: එනම් කඳු රටෙහිද පාත 8
රටෙහිද අරබා සමභූමියෙහිද කඳු බෑවුම්
ළඟද කාන්තාරයෙහිද දකුණු දිශාවෙහිද
සිටිය හිත්තීවරුත් අමෝරිවරුත්
කානානිවරුත් පෙරිස්සිවරුත් හිවීවරුත්
යෙබූසිවරුත්ය. යෙරිකෝවේ රජ එක්- 9
කෙනෙක්ය; බෙතෙල් අසල හායිහි රජ
එක්කෙනෙක්ය; යෙරුසලමේ රජ 10
එක්කෙනෙක්ය; හෙබ්‍රොන්හි රජ එක්-
කෙනෙක්ය; යර්මූත්හි රජ එක්කෙනෙක්ය; 11
ලාකීෂ්හි රජ එක්කෙනෙක්ය; එග්ලොන්හි 12
රජ එක්කෙනෙක්ය; ගෙසෙර්හි රජ එක්-
කෙනෙක්ය; දෙබීර්හි රජ එක්කෙනෙක්ය; 13
ගෙදෙර්හි රජ එක්කෙනෙක්ය; හොර්මාහි 14
රජ එක්කෙනෙක්ය; අරාද්හි රජ එක්-
කෙනෙක්ය; ලිබ්නාහි රජ එක්කෙනෙක්ය; 15
අදුල්ලාම්හි රජ එක්කෙනෙක්ය; මක්- 16
කේදහි රජ එක්කෙනෙක්ය; බෙතෙල්හි
රජ එක්කෙනෙක්ය; තප්පුවාහි රජ 17
එක්කෙනෙක්ය; හේපෙර්හි රජ එක්-
කෙනෙක්ය; අපෙක්හි රජ එක්කෙනෙක්ය; 18
ලෂ්ෂාරොන්හි රජ එක්කෙනෙක්ය;
මාදෙන්හි රජ එක්කෙනෙක්ය; හාශෝර්හි 19
රජ එක්කෙනෙක්ය; ෂිම්රොන්-මෙරොන්හි 20
රජ එක්කෙනෙක්ය; අක්ෂාප්හි රජ
එක්කෙනෙක්ය; තයනාක්හි රජ එක්- 21
කෙනෙක්ය; මෙගිද්දෝහි රජ එක්-
කෙනෙක්ය; කෙදෙෂ්හි රජ එක්කෙනෙක්ය; 22
කර්මෙල්ට අයිති යොක්නෙයාම්හි රජ
එක්කෙනෙක්ය; දෝර් කඳුකරේ වූ 23
දෝර්හි රජ එක්කෙනෙක්ය; ගිල්ගාල්හි
සිටිය ජාතීන්ගේ රජ එක්කෙනෙක්ය;
තිර්ශාහි රජ එක්කෙනෙක්ය. සියලු 24
රජවරු තිස්එක්දෙනෙක්ය.

## දේශය බෙදීමට නියමකිරීම

13 යෝෂුවා මහලුව වයෝවෘද්ධව
සිටි කල ස්වාමීන්වහන්සේ ඔහුට
කථාකොට: නුඹ මහලුව වයෝවෘද්ධව
සිටින්නෙහිය, හිමිකරගැනීමට දේශයෙන්
විශාල කොටසක් තවම ඉතුරුව තිබේ.
2 තවත් ඉතුරුව තිබෙන දේශය මේය:
මිසරය ඉදිරිපිට තිබෙන ෂීහෝර් පටන්
කානානිවරුන්ට අයිතිව උතුරේ තිබෙන
එක්‍රොන් සීමාව දක්වා පිලිස්තිවරුන්ගේ
3 සියලු පළාත් වන ගාසාවරුද අෂ්දෝද්-
වරුද අෂ්කෙලොන්වරුද ගිත්තීවරුද
එක්‍රොන්වරුද යන පිලිස්තිවරුන්ගේ
අධිපතීන් පස්දෙනාගේ පළාත් සහ මුළු
ගෙෂූරත් අව්විවරුන්ගේ පළාතත්ය.
4 දකුණු දිශාවේද ශීදෙන්වරුන්ට අයිතිවූ
මෙයාරාහිද පටන් අපෙක්ට පැමිණෙන
තුරු අමෝරිවරුන්ගේ සීමාව දක්වා
5 කානානිවරුන්ගේ මුළු දේශයත්, ගෙබල්-
වරුන්ගේ දේශයත්, නැගෙනහිරට
හෙර්මොන් කන්ද පහළින් තිබෙන
බාල්-ගාද් පටන් හමාත්ට ඇතුල්වෙන
තැන දක්වා මුළු ලෙබනොනුත්ය.
6 ලෙබනොන් පටන් මිස්රෙපොත්-මයිම්
දක්වා කඳු රටේ සියලු වැසියන් වන
සියලු ශීදෙන්වරුන් මම ඉශ්‍රායෙල්
පුත්‍රයන් ඉදිරියෙන් පන්නා දමන්නෙමි.
මා විසින් නුඹට අණකළ හැටියට
පසඇට දමා එය ඉශ්‍රායෙල්වරුන්ට
7 උරුමයක් කොට බෙදපන්න. එබැවින්
දැන් මේ දේශය ගෝත්‍ර නවයටත්
මනස්සේගේ අර්ධ ගෝත්‍රයටත් බෙද
8 දීපන්නැයි කීසේක. අනික් අර්ධ
ගෝත්‍රයටත් රූබෙන්වරුන්ටත් ගාද්-
වරුන්ටත් ස්වාමීන්වහන්සේගේ
මෙහෙකරුවූ මෝසෙස් දුන්නාවූ ඔවුන්ගේ
උරුමය නැගෙනහිරට යොර්දනෙන්
9 එගොඩ ඔවුන්ට ලැබී තිබුණේය. එනම්
අර්නොන් ඔය අද්දර තිබෙන අරෝයෙර්
පටන්ද මිටියාවත මැද තිබෙන නුවර
පටන්ද දීබොන් දක්වා තිබෙන
මේදෙබාහි මුළු තලාවද, හෙෂ්බොන්හි 10
රජකම්කළ අමෝරිවරුන්ගේ රජවූ
සීහොන්ට අම්මොන් පුත්‍රයන්ගේ සීමාව
දක්වා තිබුණු සියලු නුවරවල්ද, ගිලියද්ද 11
ගෙෂූර්වරුන්ගෙත් මයකාත්වරුන්ගෙත්
පළාතද මුළු හෙර්මොන් කඳුකරයද
අෂ්ටාරොත්හිත් එද්‍රෙයෙහිත් රජකම්
කළාවූ ඕග් රජුගේ මුළු රාජ්‍යය වන
සලෙකා දක්වා තිබෙන මුළු බාෂාන්ද
යන මේවාය. (ඔහු රෙපායිම් යෝධයන්- 12
ගෙන් ඉතුරුව සිටිය කෙනෙකි.)
මෝසෙස් ඔවුන්ට පහරදී ඔවුන් පන්නා
දැමුවේය. එසේවී නුමුත් ඉශ්‍රායෙල් පුත්‍රයෝ 13
ගෙෂූර්වරුන්ද මයකාත්වරුන්ද පන්නා
නොදැමුවෝය. ගෙෂූර්වරුද මයකාත්-
වරුද අද දක්වා ඉශ්‍රායෙල්වරුන්
අතරෙහි වාසයකරති. ලෙවී ගෝත්‍රයට 14
පමණක් ඔහු කිසි උරුමයක් නුදුන්නේය;
ඔහු ඔවුන්ට කී ලෙස ඔවුන්ගේ උරුමය
නම් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ගින්නෙන් ඔප්පුකරන
පූජාවල්ය.
මෝසෙස් රූබෙන් පුත්‍රයන්ගේ 15
ගෝත්‍රයට ඔවුන්ගේ පවුල්වල හැටියට
දුන්නේය. ඔවුන්ගේ පළාත නම් 16
අර්නොන් ඔය අද්දර තිබෙන
අරෝයෙර් පටන්ද මිටියාවත මැද
තිබෙන නුවර පටන්ද මේදෙබා ළඟ
තිබෙන මුළු තලාවද, හෙෂ්බොන් සහ 17
ඊට අයිතිවූ තලාවේ තිබෙන සියලු
නුවරවල් වන දීබොන්ද බාමොත්-බාල්ද
බෙත්-බාල්-මෙයොන්ද, යාහශ්ද 18
කෙදේමොත්ද මෙපාත්ද, කිරියාතයිම්ද 19
සිබ්මාද මිටියාවතේ කන්දෙහි තිබෙන
ශෙරෙත්-ෂහර්ද, බෙත්-පෙයෝර්ද පිස්ගාහි 20
පාවුලද බෙත්-යෙෂිමොත්ද, තලාවේ 21
සියලු නුවරවල්ද හෙෂ්බොන්හි රජකම්
කළ අමෝරිවරුන්ගේ රජවූ සීහොන්ගේ
මුළු රාජ්‍යයද යන මේවාය. ඔහුට සහ
දේශයෙහි වාසය කළාවූ සීහොන්ගේ
අමාත්‍යයන්ව සිටියා වූ මිදියන්හි
අධිපතීන් වන එවීටත් රෙකෙම්ටත්

ශූර්ටත් හූර්ටත් රෙබාටත් මෝසෙස්
22 පහරදුන්නේය. ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින්
මරනලද්දවුන් අතරේ ඔව්හු බෙයෝර්ගේ
පුත්‍රවූ බාලාම් නම් පේනකියන්නාද
23 කඩුවෙන් මැරූහ. යොර්දනද එහි
අසබඩද රූබෙන් පුත්‍රයන්ගේ සීමාව
විය. එය වනාහි නුවරවල්ද ඒවායේ
ගම්ද ඇතුළුව රූබෙන් පුත්‍රයන්ගේ
පවුල්වල හැටියට ඔවුන්ට ලැබුණු
උරුමයය.
24 මෝසෙස් ගාද් පුත්‍රයන්ගේ ගෝත්‍රයට
ඔවුන්ගේ පවුල්වල හැටියට දුන්නේය.
25 ඔවුන්ගේ පළාත නම් යාශෙර්ද ගිලියද්හි
සියලු නුවරවල්ද රබ්බා ඉදිරිපිට තිබෙන
අරෝයෙර් දක්වා අම්මොන් පුත්‍රයන්ගේ
26 රටෙන් දෙකෙන් කොටසද, හෙෂ්බොන්
පටන් රාමත්-මිශ්පේ සහ බෙතොනීම්
දක්වාත් මහනයිම් පටන් දෙබීර් සීමාව
27 දක්වාත් තිබෙන පළාතද, හෙෂ්බොන්හි
රජවූ සීහොන්ගේ රාජ්‍යයෙන් ඉතුරු
කොට්ඨාසය වන මිටියාවතේ තිබෙන
බෙත්-හාරාම්ද බෙත්-නිම්රාද සුක්-
කොත්ද ශාපොන්ද නැගෙනහිරට
යොර්දනෙන් එගොඩ කින්නෙරෙත් මුහුදේ
කෙළවර දක්වා යොර්දන සහ සීමාවද
28 යන මේය. ඒ වනාහි නුවරවල්ද ඒවායේ
ගම්ද ඇතුළුව පවුල්වල හැටියට ගාද්
පුත්‍රයන්ට ලැබුණු උරුමයය.
29 මෝසෙස් මනස්සේගේ අර්ධ
ගෝත්‍රයටත් උරුමයක් දුන්නේය. එය
මනස්සේ පුත්‍රයන්ගේ අර්ධ ගෝත්‍රයට
තමුන්ගේ පවුල්වල හැටියට ලැබුණේය.
30 ඔවුන්ගේ පළාත නම් මහනයිම් පටන්
මුළු බාෂාන් වන බාෂාන්හි රජවූ ඕග්
රජුගේ මුළු රාජ්‍යයත් බාෂාන්හි තිබෙන
යායීර්ගේ සියලු නිවාස වන නුවරවල්
31 හැටකුත්ය. ගිලියද් දේශයෙන් අර්ධයක්ද
බාෂාන්හි තිබුණ ඕග් රජුගේ රාජ්‍යයේ
නුවරවල් වන අෂ්ටාරොත්ද එද්‍රෙයිද
මනස්සේගේ පුත්‍රවූ මාකීර්ගේ පුත්‍රයන්ට
එනම් මාකීර්ගේ පුත්‍රයන්ගෙන් දෙකෙන්
කොටසකට තමුන්ගේ පවුල්වල හැටියට
ලැබුණේය.

මෝසෙස් විසින් නැගෙනහිරට 32
යොර්දනෙන් එගොඩ මෝවබ්
සමභූමිවල යෙරිකෝව ළඟදී බෙදදුන්
උරුම කොටස් මේවාය. නුමුත් ලෙවී 33
ගෝත්‍රයට මෝසෙස් කිසි උරුමයක්
නුදුන්නේය. ඔවුන්ට කී හැටියට ඔවුන්ගේ
උරුමයනම් ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේමය.**

## කාලෙබ්ගේ කොටස

14

පූජකයාවූ එලෙයාසර්ද නූන්ගේ
පුත්‍රවූ යෝෂුවාද ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ ගෝත්‍රවල පිය පෙළපත්වල
ප්‍රධානීන්ද විසින් ඔවුන්ට බෙද දුන්නාවූ,
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කානාන් දේශයෙහි
ලැබුණාවූ උරුම කොටස් මේවාය.
**ස්වාමීන්වහන්සේ** මෝසෙස් ලවා 2
අණකෙරෙවූ හැටියට ගෝත්‍ර නවයටත්
අර්ධ ගෝත්‍රයටත් පස ඇට දමීමෙන්
ඔවුන්ගේ උරුම ලැබුණේය. මක්නිසාද 3
ගෝත්‍ර දෙකටත් අර්ධ ගෝත්‍රයටත්
මෝසෙස් යොර්දනෙන් එගොඩ ඔවුන්ගේ
උරුම දුන්නේය. නුමුත් ලෙවීවරුන්ට
ඔහු ඔවුන් අතරේ උරුමයක් නුදුන්නේය.
මක්නිසාද යෝසෙප්ගේ පුත්‍රයෝ වනාහි 4
මනස්සේ සහ එප්‍රායිම් යන ගෝත්‍ර
දෙකක් වූහ. ලෙවීවරුන්ට විසීම පිණිස
නුවරවල්ද ඔවුන්ගේ සිව්පාවුන් හා
දේපළ උදෙසා ඒ නුවරවල පිට-බිම්ද
මිස දේශයේ කිසි කොටසක් ඔව්හු
නුදුන්නෝය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ 5
**ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට අණකළ
ලෙස කරමින් දේශය බෙදුවෝය.
එවිට යූදගේ පුත්‍රයෝ ගිල්ගාල්හි සිටි 6
යෝෂුවා වෙතට ආවෝය. කෙනිස්සියවූ
යෙපුන්නේගේ පුත්‍රවූ කාලෙබ් ඔහුට කථා-
කොට: දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ
මෝසෙස්ට **ස්වාමීන්වහන්සේ** කාදෙෂ්-
බර්නේයේදී මා ගැනත් නුඹ ගැනත්
කී කාරණය නුඹ දන්නෙහිය. දේශය 7
සෝදිසිකරන පිණිස **ස්වාමීන්වහන්සේගේ**
මෙහෙකරුවූ මෝසෙස් කාදෙෂ්-බර්නේයේ

සිට මා එවූ කල සතළිස් අවුරුද්දක්
වයස්ව සිටියෙමි; මමද හැරී ඇවිත් මාගේ
සිතේ කල්පනාව ලෙස ඔහුට ප්‍රවෘත්තිය
8 කීවෙමි. එහෙත් මා සමග ගිය මාගේ
සහෝදරයෝ සෙනඟගේ සිත් දියව යන්ට
සැලැස්සුවෝය. නුමුත් මම සම්පූර්ණ
ලෙස මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
9 අනුව ගියෙමි. මෝසෙස් ඒ දවසේ
දිවුරමින්: තුඹ සම්පූර්ණ ලෙස මාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අනුව ගිය නිසා
සැබවින්ම තුඹ පය තැබූ දේශය තුඹටත්
තුඹේ පුත්‍රයන්ටත් සදකාල උරුමයක්
10 පිණිස වන්නේයයි කීවේය. බලව,
ඉශ්‍රායෙල්වරුන් කාන්තාරයෙහි හැසුරුණු
කල්හි **ස්වාමීන්වහන්සේ** මෝසෙස්ට මේ
වචනය කී කාලයේ සිට මේ සතළිස්
පස් අවුරුද්ද තුළ **ස්වාමීන්වහන්සේ** කී
හැටියට මා ජීවත්කොට රක්ෂාකළ-
සේක. අද මම අසූපස් අවුරුද්දක් වයස්ව
11 සිටිමි. මෝසෙස් මා යැවූ දවසේදී මෙන්ම
අදත් මම ශක්තිමත්ව සිටිමි. යුද්ධ
කරන්ටත් පිටතට යන්ටත් ඇතුළට
එන්ටත් මාගේ ශක්තිය ඒ කාලයේ
12 තිබුණාක් මෙන්ම දැනුත් තිබේ. එබැවින්
**ස්වාමීන්වහන්සේ** ඒ දවසේදී සඳහන්
කළ මේ කන්ද මට දුනමැනවි; එහි
අනාක්වරුන් සිටින බවද පවුරු ඇති
මහත් නුවරවල් තිබෙන බවද තුඹ ඒ
දවසේදී ඇසුවෙහිය. **ස්වාමීන්වහන්සේ**
කී ලෙස සමහරවිට උන්වහන්සේ මා
සමග සිට ඔවුන් එළවන්ට මට පුළුවන්
13 කරනසේකැයි කීවේය. යෝෂුවා ඔහුට
ආශීර්වාදකොට, යෙපුන්නේගේ පුත්‍රවූ
කාලෙබ්ට උරුමයක් කොට හෙබ්‍රොන්
14 නුවර දුන්නේය. එබැවින් කෙනිස්සිය
යෙපුන්නේගේ පුත්‍රවූ කාලෙබ් සම්පූර්ණ
ලෙස ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අනුව ගිය නිසා
හෙබ්‍රොන් අද දවස දක්වා ඔහුගේ
15 උරුමයව තිබේ. මීට පළමුවෙන්
හෙබ්‍රොන් නුවරේ නම කිරියත්-අර්බාය;
අර්බා වනාහි අනාක්වරුන් අතරෙන්
ඉතා මහත් තැනැත්තාය. යුද්ධ නැවතී
දේශය නිශ්චලවූවාය.

## යූදගේ කොටස

15 යූද පුත්‍රයන්ගේ ගෝත්‍රයට
ඔවුන්ගේ පවුල්වල හැටියට
වැටුණු කොටස දකුණට ඒදෙම්හි සීමාව
වන ශීන් කාන්තාරය දක්වා දකුණු
සීමාව තෙක්ම පිහිටා තිබුණේය.
ඔවුන්ගේ දකුණු සීමාව ලුණු මුහුදේ 2
කෙළවර වන දකුණට හැරී තිබෙන
වරායේ පටන්, අක්‍රාබ්බීම්හි නැගුමට 3
දකුණෙන් වැටී, ශීන් දක්වා ගොස්,
කාදෙෂ්-බර්නේයට දකුණෙන් නැගී
හෙෂ්රෝන්ට ගොස්, අද්දර්ට නැගී කර්කා
දෙසට හැරී ගොස්, අශ්මොන්ට පැමිණ, 4
මිසරයේ ඔය දක්වාත් ගියේය; ඒ සීමාව
මුහුද ළඟ කෙළවරවිය. මෙය තුඹලාගේ
දකුණු සීමාව වන්නේය. නැගෙනහිර 5
සීමාව යොර්දන් කෙළවර දක්වා ලුණු
මුහුදය. උතුරු පැත්තේ සීමාව නම්
යොර්දන් කෙළවරෙහිවූ මුහුදේ වරාය
පටන්ය. එම සීමාව බෙත්-හොග්ලාට 6
නැගී, බෙත්-අරබාට උතුරෙන් ගොස්,
රූබෙන්ගේ පුත්‍රවූ බොහන්ගේ ගල ළඟට
නැගී, ආකොර් මිටියාවතෙන් දෙබීර්ට 7
නැගී, ඔයට දකුණෙන් තිබෙන අදුම්මීම්හි
නැගුම ඉදිරිපිට තිබෙන ගිල්ගාල්
දෙසට උතුරට හැරීගොස්, එතනින්
ඒන්-ෂෙමෙෂ්හි ජල ළඟට ගොස්,
ඒන්-රොගෙල් ළඟ කෙළවරවුණේය.
එතනින් සීමාව යෙබූසිවරුන් වාසය 8
කළ යෙරුසලමට දකුණු පැත්තෙන්
හින්නොම්ගේ පුත්‍රයාගේ මිටියාවත
මැදින් නැගී ගොස්, හින්නොම්ගේ
මිටියාවත ඉදිරිපිට බස්නාහිරෙන්ද
රෙෆාවරුන්ගේ මිටියාවතේ කෙළවරට
උතුරෙන්ද තිබෙන කන්ද මුදුනට ගියේය.
සීමාව කන්ද මුදුනේ සිට නෙප්තෝවාහි 9
දිය උල්පත ළඟට වැටී, එතනින් එප්‍රොන්
කන්දේ නුවරවල් දක්වා ගියේය; එතනින්
සීමාව කිරියත්-යෙයාරීම් වන බාලාට
ගොස්, බාලා සිට බස්නාහිරට හැරී 10
සේයිර් කන්දටද, එතනින් කෙසාලොන්
වන යෙයාරීම් කන්දට උතුරු පැත්තෙන්ද

ගොස් බෙත්-ෂෙමෙෂ්ට බැස, තිම්නාට
11 ගියේය. එතනින් සීමාව එක්‍රොන්ට උතුරු
පැත්තෙන් ගොස් ෂික්කෙරොන්ට වැටී,
එතනින් බාලා කන්දට ගොස්
යබ්නෙයෙල්ට වැටී. මුහුද ළඟ
12 කෙළවරවුණේය. බස්නාහිර සීමාව නම්
මහ මුහුදත් එහි අසබඩත්ය. යූද
පුත්‍රයන්ගේ පවුල්වල හැටියට වටේට
තිබුණ ඔවුන්ගේ සීමාව මේය.
13 යෝෂුවා **ස්වාමීන්වහන්සේ** තමාට
අණකළ ලෙස යෙපුන්නේගේ පුත්‍රවූ
කාලෙබ්ට යූදගේ පුත්‍රයන් අතරෙහි
කොටසක් දුන්නේය. එය හෙබ්‍රොන් නම්වූ
කිරියත්-අර්බාය. අර්බා අනාක්වරුන්ගේ
14 පියාය. කාලෙබ් වනාහි අනාක්ගෙන්
පැවත ආ ෂේෂයිද අහිමාන්ද තල්මයිද
යන අනාක්ගේ පුත්‍රයන් තුන්දෙනා
15 එතනින් පන්නා දැමුවේය. එතනින් ඔහු
දෙබීර් වැසියන්ට විරුද්ධව
ගියේය. දෙබීර්ට පළමු තිබුණු නම
16 කිරියත්-සේපෙර්ය. කාලෙබ් කථාකොට:
කිරියත්-සේපෙර්ට පහරදී ඒක අල්වා-
ගන්න තැනැත්තාට මාගේ දුවවූ අක්සා
භාර්යාව කොට පාවාදෙන්නෙමියි
17 කීවේය. කාලෙබ්ගේ සහෝදරයා වන
කෙනස්ගේ පුත්‍රවූ ඔත්නියෙල් ඒක
අල්ලාගත්තේය. කාලෙබ් තමාගේ දුවවූ
අක්සා ඔහුට භාර්යාව කොට පාවා
18 දුන්නේය. ඈ ඔහු වෙත පැමිණි කල
ඇගේ පියාගෙන් කෙතක් ඉල්ලන්ට ඔහු
ඈට සැලැස්විය; ඈ කොටළුවා පිටින්
බැස්සාය; කාලෙබ් ඈට කථාකොට:
19 නුඹට ඕනෑ මොකදැයි ඇසීය. ඈද:
මට වරයක් දුන මැනවි; මක්නිසාද
ඔබ දකුණු රටක් මට දී තිබේ, දිය
උල්පත්ද මට ලැබේවයි කීවාය. එවිට
ඔහු ඉහළ උල්පත්ද පහළ උල්පත්ද ඈට
දුන්නේය.
20 යූද පුත්‍රයන්ගේ ගෝත්‍රයට ඔවුන්ගේ
පවුල්වල හැටියට ලැබුණ උරුමය මේය.
21 දකුණු දිශාවෙහි ඒදෝමිහි සීමාව
දක්වා යූද පුත්‍රයන්ගේ ගෝත්‍රයට
තිබුණු ඉතා දුරවූ නුවරවල් නම්:
කබ්ශෙයෙල්ද ඒදෙර්ද යාගුර්ද, කීනාද 22
දිමෝනාද අදාදද, කෙදෙෂ්ද හාශෝර්ද 23
ඉත්නාන්ද, ශීප්ද තෙලෙම්ද බෙයාලොත්ද, 24
හාශෝර්-හදත්තාද කෙරීයොත්- 25
හෙෂ්රෝන් වන හාශෝර්ද, ආමාම්ද 26
ෂෙමාද මෝලාදද, හශර්-හද්දද 27
හෙෂ්මොන්ද බෙත්-පෙලෙත්ද, හශර්- 28
ෂූවාල්ද බෙයෙර්-ෂෙබාද බිස්යෝතියාද,
බාලාද ඉයිම්ද එශෙම්ද, එල්තෝලද්ද 29,30
කෙසීල්ද හෝර්මාද, ශික්ලග්ද 31
මද්මන්නාද සන්සන්නාද, ලෙබායොත්ද 32
ෂිල්හිම්ද ආයින්ද රිම්මොන්ද යන
මේවාය. ගම් සහිතව සියලු නුවරවල්
විසිනවයක්ය.
තැනිතලා රටෙහි තිබුණු ඒවා නම්: 33
එෂ්තායොල්ද ශොරාද අෂ්නාද, 34
ශානොවාද ඒන්-ගන්නීම්ද තප්පුවාද
ඒනාම්ද, යර්මූත්ද අදුල්ලාම්ද 35
සෝකෝද අසේකාද, ෂයරයීම්ද 36
අදීතයිම්ද ගෙදේරාද ගෙදේරෝතයීම්ද
යන නුවරවල් දහතර සහ ඒවායේ
ගම්ද යන මේවාය.
ශෙනාන්ද හදාෂාද මිග්දල්-ගාද්ද, 37
දිල්යාන්ද මිශ්පේද යොක්තෙයෙල්ද, 38
ලාකීෂ්ද බෝශ්කත්ද එග්ලොන්ද, 39
කබ්බොන්ද ලාමාම්ද කිත්ලීෂ්ද, 40
ගෙදේරොත්ද බෙත්-දාගොන්ද නයමාද 41
මක්කේදද යන නුවරවල් දහසය සහ
ඒවායේ ගම්ද යන මේවාය.
ලිබ්නාද එතෙර්ද ආෂාන්ද, ඉප්තාද 42,43
අෂ්නාද නේශීබ්ද, කෙයිලාද අක්ශීබ්ද 44
මරේෂාද යන නුවරවල් නවය සහ
ඒවායේ ගම්ද යන මේවාය.
එක්‍රොන්ද ඊට අයිති නුවරවල් සහ 45
ගම්ද යන මේවාය. එක්‍රොන් පටන් 46
බස්නාහිරට මුහුද දක්වා අෂ්දෝද් ළඟ
තිබෙන සියලු නුවරවල් සහ ඒවායේ
ගම්ය.
අෂ්දෝද්ද ඊට අයිති නුවරවල් සහ ගම්ද 47
යන මේවාය; මිසරයේ ඔය සහ මහ
මුහුදත් එහි අසබඩත් දක්වා ගාසාද
ඊට අයිති නුවරවල් සහ ගම්ද යන
මේවාය.

48 කඳු රටේ තිබුණ ඒවානම්: ෂාමීර්ද
49 යත්තීර්ද සෝකෝද, දන්නාද දෙබීර්
50 වන කිරියත්-සන්නාද, අනාබ්ද
51 එෂ්තෙමෝද ආනීම්ද, ගෝෂෙන්ද
හෝලොන්ද ගිලෝද යන නුවරවල්
එකොළොස සහ ඒවායේ ගම්ද යන
මේවාය.
52,53 අරාබ්ද දූමාද එෂාන්ද, යානීම්ද බෙත්-
54 තප්පුවාද අපේකාද, හුම්තාද
හෙබ්‍රොන් නම්වූ කිරියත්-අර්බාද
ශීයෝර්ද යන නුවරවල් නවයද ඒවායේ
ගම්ද යන මේවාය.
55 මායෝන්ද කර්මෙල්ද ශීප්ද යූතාද,
56 යෙශ්‍රයෙල්ද යොක්දෙයාම්ද සානොවාද,
57 කායින්ද ගිබෙයාද තිම්නාද යන
නුවරවල් දසය සහ ඒවායේ ගම්ද යන
මේවාය.
58 හල්හුල්ද බෙත්-ශූර්ද ගෙදෝර්ද,
59 මාරාත්ද බෙත්-අනොත්ද එල්තෙකොන්ද
යන නුවරවල් හය සහ ඒවායේ ගම්ද
යන මේවාය.
60 කිරියත්-යෙයාරීම් වන කිරියත්-බාල්ද
රබ්බාද යන දෙනුවර සහ ඒවායේ ගම්ය.
61 කාන්තාරයෙහි තිබුණ ඒවානම්:
62 බෙත්-අරබාද මිද්දීන්ද සෙකාකාද,
නිබ්ෂාන්ද ලුණු නුවරද ඒන්-ගෙදීද යන
නුවරවල් හය සහ ඒවායේ ගම්ය.
63 නුමුත් යෙරුසලමේ වාසයකළ
යෙබූසිවරුන් පන්නාදමන්ට යූද පුත්‍රයන්ට
නොහැකි විය. අද දවස දක්වා
යෙබූසිවරු යූද පුත්‍රයන් සමග
යෙරුසලමෙහි වාසයකරති.

## එප්‍රායිම්ගේ කොටස

16 යෝසෙප්ගේ පුත්‍රයන්ට වැටුණු
කොටසේ සීමාව නැගෙනහිර
කාන්තාරය ළඟ තිබෙන යෙරිකෝවේ
ජල ළඟ සිට යෙරිකෝව ඉදිරිපිට තිබෙන
යොර්දනේ පටන් යෙරිකෝවෙන් කඳුරට
2 මැදින් බෙතෙල්ට නැගීගොස්, බෙතෙල්
සිට ලූස්ට ගොස්, අර්කිවරුන්ගේ
3 සීමාවේ අටාරෝත්ට පැමිණ, එතනින්
බස්නාහිරට යප්ලේතිවරුන්ගේ සීමාවටත්
පහළ බෙත්-හෝරොන් සීමාවටත්
ගෙසෙර්ටත් බැස ගොස්, මුහුද ළඟ
කෙළවරවුණේය. මනස්සේ සහ එප්‍රායිම් 4
යන යෝසෙප් පුත්‍රයෝ මෙසේ තමුන්ගේ
උරුමය ලැබූහ. එප්‍රායිම් පුත්‍රයන්ගේ 5
සීමාව ඔවුන්ගේ පවුල්වල හැටියට මෙසේ
විය. නැගෙනහිරට ඔවුන්ගේ උරුමයේ
සීමාව අටාරොත්-අද්දර් පටන් ඉහළ
බෙත්-හෝරොන් දක්වාය; උතුරු සීමාව 6
මික්මෙතාත් සිට බස්නාහිරට ගියේය;
එතනින් සීමාව නැගෙනහිරට හැරී
තානත්-ශීලෝ ළඟට ගොස්, යනෝවාට
නැගෙනහිරින් එය පසුකර ගියේය;
යනෝවෙන් අටාරෝත්ටත් නාරාටත් 7
බැස යෙරිකෝවට පැමිණ යොර්දන
දක්වා ගියේය. තප්පුවා සිට සීමාව 8
බස්නාහිර දෙස කානා ඔයට ගොස්
මුහුද ළඟ කෙළවරවුණේය. එප්‍රායිම්
පුත්‍රයන්ට ඔවුන්ගේ පවුල්වල හැටියට
ලැබුණු උරුමය වනාහි, එය සහ මනස්සේ 9
පුත්‍රයන්ගේ උරුමය තුළ එප්‍රායිම්
පුත්‍රයන්ට වෙන්කරන්ට යෙදුණු සියලු
නුවරවල්ද ඒවායේ ගම්ද වේ. ඔව්හු 10
ගෙසෙර්හි වාසයකළ කානානිවරුන්
පන්නා නොදැමුවෝය. නුමුත්
කානානිවරු අද දවස දක්වා එප්‍රායිම්-
වරුන් අතරේ වාසයකරමින් බර වැඩට
යටත්ව සිටිති.

## මනස්සේගේ කොටස

17 යෝසෙප්ගේ කුලුඳුලාවූ
මනස්සේගේ ගෝත්‍රයට ලැබුණු
කොටස මේය. මනස්සේගේ කුලුඳුලාවූ,
ගිලියද්ගේ පියවූ මාකීර් යුද්ධකාර
මනුෂ්‍යයෙක් බැවින් ඔහුට ගිලියද්ද
බාෂාන්ද ලැබුණේය. මනස්සේගේ අනික් 2
පුත්‍රයන් වන අබියෙසෙර්ගේ පුත්‍රයන්ටද
හේලෙක්ගේ පුත්‍රයන්ටද අශ්‍රියෙල්ගේ
පුත්‍රයන්ටද ෂෙකෙම්ගේ පුත්‍රයන්ටද
හේපෙර්ගේ පුත්‍රයන්ටද ෂෙමීදගේ
පුත්‍රයන්ටද ඔවුන්ගේ පවුල්වල හැටියට
කොටස් ලැබුණේය. තමුන්ගේ පවුල්වල
හැටියට යෝසෙප්ගේ පුත්‍රවූ මනස්සේගේ

3 පිරිමි දරුවෝ මොව්හුය. නුමුත්
මනස්සේගේ පුත්‍රයා වන මාකීර්ගේ පුත්‍රවූ
ගිලියද්ගේ පුත්‍රයා වන හෙපෙර්ගේ පුත්‍රවූ
ශෙලොප්වෙහාද්ට දූවරුන් මිස පුත්‍රයෝ
නුවූහ. ඔහුගේ දූවරුන්ගේ නාම මාලා,
නෝවා, හොග්ලා, මිල්කා සහ තිර්ශාය.
4 ඔව්හු පූජකයාවූ එලෙයාසර්ද නූන්ගේ
පුත්‍රවූ යෝෂුවාද අධිපතීන්ද ඉදිරියට
අවුත්: **ස්වාමීන්වහන්සේ** අපේ
සහෝදරයන් අතරේ අපට උරුමයක්
දෙන්ට මෝසෙස්ට අණ කළසේකැයි
කීවෝය. එබැවින් ඔහු **ස්වාමීන්-
වහන්සේගේ** ආඥාව ලෙස ඔවුන්ගේ
පියාගේ සහෝදරයන් අතරෙහි ඔවුන්ට
5 උරුමයක් දුන්නේය. යොර්දනෙන්
එගොඩ තිබෙන ගිලියද්ද බාෂාන්ද හැර
මනස්සේට කොටස් දසයක් වැටුණේය.
6 මක්නිසාද මනස්සේගේ දූවරුන්ට ඔහුගේ
පුත්‍රයන් අතරෙහි උරුමයක් ලැබුණේය.
මනස්සේගේ අනික් පුත්‍රයන්ට ගිලියද්
7 දේශය හිමිවුණේය. මනස්සේගේ සීමාව
ආෂෙර් පටන් ෂෙකෙම් ඉදිරියෙහි තිබෙන
මික්මෙතාත් දක්වා විය; එතනින් සීමාව
දකුණට ඒන්-තප්පුවාහි වාසීන් කරා
8 ගියේය. තප්පුවා රට මනස්සේට අයිති
විය. එහෙත් මනස්සේගේ සීමාවේ තිබුණු
තප්පුවා එප්‍රායිම් පුත්‍රයන්ට වුණේය.
9 එතනින් සීමාව කානා ඔයට දකුණෙන්
ඔය ළඟට බැස්සේය. මේ නුවරවල්
මනස්සේගේ නුවරවල් අතරේ එප්‍රායිම්ට
හිමිවිය. මනස්සේගේ සීමාව ඔයට
උතුරෙන් වැටී මුහුද ළඟ කෙළවර
10 වුණේය. දකුණු පැත්ත එප්‍රායිම්ටද උතුරු
පැත්ත මනස්සේටද අයිතිය, තවත්
ඔහුගේ සීමාවක් මුහුදය; ඒවා උතුරෙන්
ආෂෙර්ටත් නැගෙනහිරෙන් ඉස්සාකර්ටත්
11 යාව තිබේ. තවද ඉස්සාකර්හි සහ
ආෂෙර්හි බෙත්-ෂෙයාන් සහ ඊට අයිති
නුවරවල්ද ඉබ්ලෙයාම් සහ ඊට අයිති
නුවරවල්ද දෝර් වැසියන් සහ ඊට අයිති
නුවරවල්ද ඒන්-දෝර් වැසියන් සහ ඊට
අයිති නුවරවල්ද තයනාක් වැසියන් සහ
ඊට අයිති නුවරවල්ද මෙගිද්දෝ වැසියන්
සහ ඊට අයිති නුවරවල්ද යන උස්
ප්‍රදේශ තුන මනස්සේට ලැබුණේය. එහෙත් 12
මනස්සේ පුත්‍රයන්ට ඒ නුවරවල වැසියන්
එළවන්ට නොහැකි විය; කානානිවරු
ඒ රටේ වාසයකරන්ටම කැමතිව
සිටියෝය. ඉශ්‍රායෙල් පුත්‍රයන් ශක්තිමත්වූ 13
කල ඔව්හු කානානිවරුන් බර වැඩට
පත්කළෝය, එහෙත් ඔවුන් සහමුලින්
පන්නා නොදැමූහ.
යෝසෙප්ගේ පුත්‍රයෝ යෝෂුවාට 14
කථාකොට: **ස්වාමීන්වහන්සේ** මේ දක්වා
අපට ආශීර්වාදකළ බැවින් අප මහත්
සෙනඟක්ව සිටියදී ඔබ එක කොටසක්ද
එක පංගුවක්ද පමණක් අපට උරුමයක්
කොට දුන්නේ මක්නිසාදැයි කීවෝය.
යෝෂුවා උත්තරදෙමින්: නුඹලා මහත් 15
සෙනඟක් නම්, එප්‍රායිම් කඳු රට
නුඹලාට මදි බැවින් වනාන්තරයට ගොස්
එහි පෙරිස්සිවරුන්ගේද රෙඵාවරුන්ගේද
රටෙන් කොටසක් එළිකර ගනිල්ලායයි
ඔවුන්ට කීවේය. යෝසෙප්ගේ පුත්‍රයෝ 16
කථාකොට: කඳු රට අපට මදිය.
මිටියාවත් රටෙහි එනම් බෙත්-
ෂෙයාන්හිද ඊට අයිති නුවරවලද
යෙශ්‍රෙයෙල් මිටියාවතෙහිද වාසය කරන
සියලු කානානිවරුන්ට යකඩ රථ
තිබේයයි කීවෝය. යෝෂුවා එප්‍රායිම්ද 17
මනස්සේද යන යෝසෙප්ගේ වංශයට
කථාකොට: නුඹලා මහත් සෙනඟක්ය,
නුඹලාට බොහෝ බලය ඇත්තේය.
නුඹලාට ලැබෙන්නේ එක කොටසක්
පමණක් නොවේය. කඳු රටත් නුඹලාට 18
අයිතිවන්නේය; එය වනාන්තරයක් නුමුත්
නුඹලා එය කපා එළිකරගනිල්ලා, එවිට
සීමා දක්වාම එය නුඹලාට වන්නේය.
කානානිවරුන්ට යකඩ රථ තිබෙන
නුමුත්, ඔවුන් ශක්තිමත්ව සිටින නුමුත්,
නුඹලා ඔවුන් පන්නා දමනවා ඇතැයි
කීවේය.

## ඉතුරු කොටස බෙදීම

**18** තවද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු
සභාව ෂීලෝහි රැස්ව සම්මුඛවීමේ
කූඩාරම එහි පිහිටෙවූවාය. දේශයද
ඔවුන් ඉදිරියෙහි යටත්ව තිබුණේය.
2 තමුන්ගේ උරුමය නොලැබූ ගෝත්‍ර සතක්
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ ඉතුරුව
3 සිටියෝය. යෝෂුවා ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
කථාකොට: තුඹලාගේ පියවරුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹලාට දී
තිබෙන දේශය හිමිකරගැනීමට යන්ට
තුඹලා කොපමණ කල් ප්‍රමාදවන්නහුද?
4 තුඹලා උදෙසා එක එක ගෝත්‍රයට
මනුෂ්‍යයන් තුන්දෙනෙකු බැගින්
පත්කරපල්ලා. මම ඔවුන් යවන්නෙමි,
ඔව්හු පිටත්ව දේශයෙහි ගමන්කොට
තමුන්ගේ උරුමවලට සුදුසු ලෙස ඒක
සටහන් කරගන මා වෙතට එන්නෝය.
5 ඔව්හු ඒක සත් කොටසකට බෙදන්-
නෝය. යූදා දකුණු දිග තමාගේ සීමාව
තුළ සිටීවා, යෝසෙප්ගේ වංශය උතුරු
දිග තිබෙන තමුන්ගේ සීමාව තුළ සිටීවා.
6 තුඹලා දේශය සත් කොටසකට බෙදා
සටහන්කරගන, මෙහි මා ළඟට
වරෙල්ලා. මම අපේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි තුඹලා වෙනුවට
7 මෙහිදී පසඇට දමන්නෙමි. මක්නිසාද
ලෙවීවරුන්ට තුඹලා අතරෙහි කොටසක්
නැත; ඔවුන්ගේ උරුමය වනාහි
**ස්වාමීන්වහන්සේගේ** පූජක තනතුරය.
ගාද්ටත් රූබෙන්ටත් මනස්සේගේ
අර්ධ ගෝත්‍රයටත් **ස්වාමීන්වහන්සේගේ**
මෙහෙකරුවූ මෝසෙස් විසින් ඔවුන්ට
දුන්නාවූ ඔවුන්ගේ උරුමය නැගෙනහිරට
යොර්දනෙන් එගොඩ ලැබී තිබේයයි
8 කීවේය. ඒ මනුෂ්‍යයෝ පිටත්ව ගියෝය.
යෝෂුවා දේශයේ සටහනක් ගැනීමට
පිටත්ව යන අයට අණකරමින්: තුඹලා
ගොස් ඒ දේශයෙහි ඇවිද ඒක සටහන්
කරගන මා ළඟට හැරී වරෙල්ලා, මම
මෙහි ෂීලෝහිදී **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි තුඹලා උදෙසා පසඇට
දමන්නෙමියි කීවේය. ඒ මනුෂ්‍යයෝ 9
දේශයෙහි ඇවිද, එය කොටස් සතකට
බෙදා, නුවරවල ප්‍රකාරයට පොතක
සටහන්කරගන, ෂීලෝහි කඳවුරේ
යෝෂුවා ළගට ආවෝය. යෝෂුවා ඔවුන් 10
උදෙසා ෂීලෝහිදී **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි පස ඇට දමා එහිදී ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ කොට්ඨාසවල හැටියට
ඔවුන්ට දේශය බෙදුන්නේය.

## බෙන්යමින්ගේ කොටස

බෙන්යමින් පුත්‍රයන්ගේ ගෝත්‍රයේ 11
කොටස ඔවුන්ගේ පවුල්වල හැටියට
වැටුණේය. ඔවුන්ගේ කොටසේ පළාත
යූදා පුත්‍රයන්ට හා යෝසෙප් පුත්‍රයන්ටත්
අතරේ නියමවුණේය. උතුරු පැත්තෙහි 12
ඔවුන්ගේ සීමාව යොර්දනේ සිට ගොස්,
යෙරිකෝවට උතුරු පැත්තෙන් නැගී,
කඳු රටෙහි බස්නාහිරට ගොස්,
බෙත්-ආවන්හි කාන්තාරය ළඟ
කෙළවරවුණේය. එතනින් සීමාව බෙතෙල් 13
නම්වූ ලූස්ට ගොස්, දකුණු පැත්තෙන්
ලූස් පසුකර පහළ බෙත්-හෝරොන්ට
දකුණෙන් තිබෙන කන්දෙන් අටාරොත්-
අද්දර්ට බැස්සේය. එතනින් සීමාව බෙත්- 14
හෝරොන් ඉදිරිපිට ඊට දකුණෙන්
තිබෙන කන්දෙන් දකුණට බස්නාහිර
පැත්තෙහි හැරීගොස්, යූදා පුත්‍රයන්ගේ
නුවරක්වූ කිරියත්-යෙයාරීම් වන
කිරියත්-බාල්හි කෙළවරවුණේය. බස්-
නාහිර පැත්ත මේය. දකුණු පැත්ත 15
කිරියත්-යෙයාරීම්හි කෙළවර සිට පිහිටා
තිබුණේය, සීමාවද බස්නාහිර දෙස
නෙප්තෝවාහි දිය උල්පත ළඟට ගියේය.
එතනින් සීමාව හින්නොම්ගේ පුත්‍රයා- 16
ගේ මිටියාවත ඉදිරිපිට රෙඵාවරුන්ගේ
මිටියාවතෙහි උතුරට තිබෙන කන්දේ
කෙළවරට බැස, එතනින් යෙබූසිවරුන්ට
දකුණු පැත්තෙන් තිබෙන හින්නොම්ගේ
මිටියාවතට බැස, එතනින් ඒන්-රොගෙල්ට
බැස්සේය. එය උතුරෙන් ගොස් ඒන්- 17
ෂෙමෙෂ්ටත්, එතනින් අදුම්මීම්හි නැගුම
ඉදිරිපිට තිබෙන ගෙලීලොත්ටත් පැමිණ,

එතනින් රූබෙන්ගේ පුත්‍රවූ බොහන්ගේ
18 ගල ළඟට බැස්සේය; එතනින් අරබා
සමභූමිය ඉදිරිපිට උතුරු පැත්තෙන්
19 ගොස් අරබා සමභූමියට බැස, එතනින්
සීමාව උතුරු පැත්තෙන් බෙත්-හොග්ලාට
ගොස්, යොර්දනේ දකුණු කෙළවරේ
තිබෙන ලුණු මුහුදේ උතුරු වරායෙහි
කෙළවරවුණේය. දකුණු සීමාව මේය.
20 එහි නැගෙනහිර පැත්තේ සීමාව නම්
යොර්දනය. බෙන්යමින් පුත්‍රයන්ගේ
පවුල්වල හැටියට, වටකර සීමාවල
හැටියට, ඔවුන්ගේ උරුමය මේය.
21 බෙන්යමින් පුත්‍රයන්ගේ ගෝත්‍රයට
ඔවුන්ගේ පවුල්වල හැටියට ලැබුණු
නුවරවල් නම්: යෙරිකෝවද බෙත්-
22 හොග්ලාද ඒමෙක්-කෙශිශ්ද, බෙත්-
23 අරබාද ශෙමාරයිම්ද බෙතෙල්ද, අව්වීම්ද
24 පාරාද ඔෆ්‍රාද, කෙපර්-අම්මෝනිද ඔෆ්නීද
ගෙබාද යන නුවරවල් දොළොස සහ
25 ඒවායේ ගම්ය. ගිබියෝන්ද රාමාද
26 බෙයේරොත්ද, මිශ්පේද කෙපිරාද
27 මොශාද, රෙකෙම්ද ඉර්පෙයෙල්ද
28 තරලාද, ශේලාද එලෙෆ්ද යෙරුසලම
වන යෙබූසියද ගිබෙයත්ද කිරියත්ද යන
නුවරවල් දස සතර සහ ඒවායේ ගම්ය.
බෙන්යමින් පුත්‍රයන්ගේ පවුල්වල හැටියට
ඔවුන්ගේ උරුමය මේය.

## සිමියොන් ආදීන්ගේ කොටස්

19 දෙවෙනි කොටස සිමියොන්ට
එනම් සිමියොන් පුත්‍රයන්ගේ
ගෝත්‍රයට ඔවුන්ගේ පවුල්වල හැටියට
වැටුණේය. ඔවුන්ගේ උරුමය යූද
පුත්‍රයන්ගේ උරුමය ඇතුළත තිබුණේය.
2 ඔවුන්ගේ උරුමය නම්: බෙයර්-ෂෙබා
3 හෙවත් ෂෙබාද මෝලාදද, හශර්-ෂූවාල්ද
4 බාලාද එශෙම්ද, එල්තොලද්ද බෙතුල්ද
5 හොර්මාද, ශික්ලග්ද බෙත්-
6 මර්කාබොත්ද හශර්-සුසාද, බෙත්-
ලෙබායොත්ද ෂාරුහෙන්ද යන නුවරවල්
7 දහතුන සහ ඒවායේ ගම්ය. ආයින්ද
රිම්මොන්ද එතෙර්ද ආෂාන්ද යන මේ
නුවරවල් සතර සහ ඒවායේ ගම්ය.
දකුණු රාමා වන බාලත්-බෙයේර් දක්වා 8
ඒ නුවරවල් වටකර තිබෙන ගම්
සියල්ලත්ය. සිමියොන් පුත්‍රයන්ගේ
පවුල්වල හැටියට ඔවුන්ගේ ගෝත්‍රයේ
උරුමය මේය. සිමියොන් පුත්‍රයන්ගේ 9
උරුමය යූද පුත්‍රයන්ගේ කොට්ඨාසයෙන්
ගන්ට යෙදුණේය. මක්නිසාද යූද
පුත්‍රයන්ගේ කොටස ඔවුන්ට වැඩිව
තිබුණේය. එබැවින් ඔවුන්ගේ උරුමය
ඇතුළත සිමියොන් පුත්‍රයන්ට උරුමයක්
තිබුණේය.
තුන්වෙනි කොටස සාබුලොන් 10
පුත්‍රයන්ට ඔවුන්ගේ පවුල්වල හැටියට
වැටුණේය. ඔවුන්ගේ උරුමයේ සීමාව
සාරීද් දක්වා විය. ඔවුන්ගේ සීමාව 11
බස්නාහිර දෙස මරලාට නැගී,
දබ්බෙෂෙත්ටද යොක්නෙයාම් ඉදිරියෙහි
තිබෙන ඔය ළඟටද පැමුණුණේය;
සාරීද්හි සිට සීමාව නැගෙනහිරට හැරී 12
කිස්ලොත්-තාබෝර් දක්වා ගොස්,
එතනින් දබෙරත්ටද යාපියාටද නැගී
ගියේය; එතනින් නැගෙනහිර දෙස ගත්- 13
හේපෙර්ටද එත්-කාශීන්ටද පැමිණ,
නෙයා දෙසට පිහිටා තිබෙන රිම්මොන්ට
ගියේය. සීමාව ඊට වටකරින් උතුරට 14
හැරී හන්නාතොන්ට ගොස්, ඉෆ්තා-
යෙල් මිටියාවත ළඟ කෙළවර වුණේය;
කට්ටාත්ද නහලාල්ද ෂිම්රොන්ද ඉදලාද 15
බෙත්-ලෙහෙම්ද යනාදි නුවරවල්
දොළොසක්ද ඒවායේ ගම්ද තිබුණේය.
සාබුලොන් පුත්‍රයන්ගේ පවුල්වල හැටියට 16
ඔවුන්ගේ උරුමය මෙකී නුවරවල් සහ
ඒවායේ ගම්ය.
සතරවෙනි කොටස ඉස්සාකර්ට එනම් 17
ඉස්සාකර් පුත්‍රයන්ට ඔවුන්ගේ පවුල්වල
හැටියට වැටුණේය. ඔවුන්ගේ පළාතට 18
යෙශ්‍රෙයෙල්ද කෙසුල්ලොත්ද ෂූනෙම්ද,
හපාරයිම්ද ෂියෝන්ද අනාහරාත්ද, 19
රබ්බිත්ද කිෂියෝන්ද එබෙශ්ද, රෙමෙත්ද 20,21
ඒන්-ගන්නීම්ද ඒන්-හද්දද බෙත්-පශේශ්ද
දක්වා විය; සීමාව තාබෝර්ද ෂහශූමාද 22
බෙත්-ෂෙමෙෂ්ද දක්වා ගියේය; ඔවුන්ගේ

සීමාව යොර්දන ළඟ කෙළවර වුණේය.
නුවරවල් දහසයක්ද ඒවායේ ගම්ද
23 තිබුණේය. ඉස්සාකර් පුත්‍රයන්ගේ
පවුල්වල හැටියට ඔවුන්ගේ ගෝත්‍රයේ
උරුමය මෙකී නුවරවල් සහ ඒවායේ
ගම්ය.
24 පස්වෙනි කොටස ආෂෙර් පුත්‍රයන්ගේ
ගෝත්‍රයට ඔවුන්ගේ පවුල්වල හැටියට
25 වැටුණේය. ඔවුන්ගේ සීමාව හෙල්කත්ද
26 හලීද බෙටෙන්ද අක්ෂාෆ්ද, අල්ලම්-
මෙලෙක්ද අමාද්ද මිෂාල්ද යන මේවාය;
බස්නාහිරට සීමාව කර්මෙල්ටත්
ෂිහොර්-ලිබ්නාත්ටත් පැමුණුණේය;
27 එතනින් නැගෙනහිරට හැරී බෙත්-
දගොන්ට ගොස්, සාබුලොන්ටත් බෙත්-
ඒමෙක්ට සහ නෙයියෙල්ට උතුරෙන්
තිබෙන ඉප්තා-යෙල් මිටියාවතටත්
28 පැමිණ, වමට තිබෙන කාබුල්ද, එබ්‍රොන්ද
රෙහොබ්ද හම්මොන්ද කානාද මහ
29 සීදොන්ද දක්වා ගියේය; එතනින් සීමාව
රාමාට හැරී, පවුරු ඇති නුවරවූ තීර්ට
පැමිණ, හෝසාට හැරී අක්සීබ් පළාතේ
පටන් ගොස් මුහුද ළඟ කෙළවර වුණේය.
30 උම්මාද අපෙක්ද රෙහොබ්ද අඬංගුය.
නුවරවල් විසිදෙකක් සහ ඒවායේ ගම්ද
31 තිබුණේය. ආෂෙර් පුත්‍රයන්ගේ පවුල්වල
හැටියට ඔවුන්ගේ ගෝත්‍රයේ උරුමය
මෙකී නුවරවල් සහ ඒවායේ ගම්ය.
32 සවෙනි කොටස නප්තලී පුත්‍රයන්ට
එසේය, නප්තලීගේ පුත්‍රයන්ට ඔවුන්ගේ
33 පවුල්වල හැටියට වැටුණේය. ඔවුන්ගේ
සීමාව හේලෙප්හි සිට ශානන් තිම්හි
තිබුණ අලෝන වෘක්ෂය පටන් අදමී-
නෙකෙබ්ද යබ්නෙයෙල්ද ලක්කුම්ද දක්වා
ගොස්, යොර්දන ළඟ කෙළවර වුණේය.
34 එතනින් සීමාව බස්නාහිරට හැරී
අස්නොත්-තාබොර්ට ගොස්, එතනින්
හුකොක්ට පැමිණ, දකුණෙන්
සාබුලොන්ද බස්නාහිරෙන් ආෂෙර්ද
නැගෙනහිරෙන් යොර්දනේ යුදයද දක්වා
35 ගියේය. පවුරු ඇති නුවරවල් නම්: සිද්දීම්ද
ශේර්ද හම්මත්ද රක්කත්ද කින්නෙරෙත්ද,
අදමාද රාමාද හාශෝර්ද, කෙදෙෂ්ද 36,37
එද්‍රෙයිද ඒන්-හාශෝර්ද, ඉරොන්ද 38
මිග්දල්-යෙල්ද හොරෙම්ද බෙත්-අනාත්ද
බෙත්-ෂෙමෙෂ්ද යන මේවාය; නුවරවල්
දහනවයක් සහ ඒවායේ ගම්ද තිබුණේය.
නප්තලීගේ පවුල්වල හැටියට ඔවුන්ගේ 39
ගෝත්‍රයේ උරුමය මෙකී නුවරවල් සහ
ඒවායේ ගම්ය.
සත්වෙනි කොටස දන් පුත්‍රයන්ගේ 40
ගෝත්‍රයට ඔවුන්ගේ පවුල්වල හැටියට
වැටුණේය. ඔවුන්ගේ උරුමයේ පළාත 41
නම් ශොරාද එෂ්තායොල්ද ඊර්-
ෂෙමෙෂ්ද, ෂාලබ්බීන්ද අායාලොන්ද 42
ඉත්ලාද, ඒලොන්ද තිම්නාද එක්‍රොන්ද, 43
එල්තෙකේද ගිබ්බෙතොන්ද බාලාත්ද, 44
යෙහුද්ද බෙනේ-බෙරක්ද ගත්- 45
රිම්මොන්ද, මේ-යර්කොන්ද යොප්පාව 46
ඉදිරිපිට තිබෙන පළාත ඇතුළුව
රක්කොන්ද යන මේවාය. දන් පුත්‍රයන්ගේ 47
පළාත ඔවුන්ට මදිව තිබුණ නිසා ඔව්හු
ගොස් ලෙෂෙම්ට විරුද්ධව යුද්ධකොට
එය අල්වාගෙන, ඊට කඩු මුවහතින්
පහරදී එය හිමිකරගෙන, එහි වාසය
කොට, ඔවුන්ගේ පියවූ දන්ගේ නම ප්‍රකාර
ලෙෂෙම්ට දන් යන නම තැබුවෝය. දන් 48
පුත්‍රයන්ගේ පවුල්වල හැටියට ඔවුන්ගේ
ගෝත්‍රයේ උරුමය මෙකී නුවරවල් සහ
ඒවායේ ගම්ය.
මෙසේ උරුම පිණිස සීමා වශයෙන් 49
දේශය බෙදදී නිමකොට ඉශ්‍රායෙල්
පුත්‍රයෝ නූන්ගේ පුත්‍රවූ යෝෂුවාට තමුන්
අතරෙහි උරුමයක් දුන්නෝය. ඔහු ඉල්ලූ 50
නුවර වන එප්‍රායිම් කඳු රටෙහි
තිබෙන තිම්නත්-සෙරා ඔව්හු **ස්වාමීන්-
වහන්සේගේ** ආඥාව ප්‍රකාර ඔහුට
දුන්නෝය. ඔහු ඒ නුවර ගොඩනගා
එහි වාසය කෙළේය.
පූජකයාවූ එලෙයාසර්ද නූන්ගේ පුත්‍රවූ 51
යෝෂුවාද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
ගෝත්‍රවල පිය පෙළපත්වල ප්‍රධානීන්ද
ෂීලෝහිදී සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි පසඇට
දමා බෙදදුන් උරුමවල් මේවාය. මෙසේ
ඔව්හු දේශය බෙද නිම කළෝය.

## ආරක්ෂා නුවරවල්

20 ස්වාමීන්වහන්සේ යෝෂුවාට
2 කථාකොට: ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
මෙසේ කියාපන්න–නොදැනුවත්ව
වැරදිල්ලකින් යමෙකු මරන අයට
3 පලාගොස් සිටීම පිණිස, මා විසින්
මෝසෙස් ලවා නුඹලාට කියෙවූ
හැටියට ආරක්ෂා නුවරවල් නියමකර-
ගනිල්ලා. ඒවා ලේ ගැන පළිගන්නාගෙන්
ආරක්ෂාවක් වන පිණිස නුඹලාට
4 තිබේවා. ඔහු ඒ නුවරවලින් එකකට
පලාගොස් නුවර දොරකඩ සිට ඒ නුවර
වැඩිමහල්ලන් ඉදිරියෙහි තමාගේ
කාරණය කියාසිටින්නේය; ඔවුන් ඔහු
නුවරට පිළිගෙන ඔහු තමුන් සමග
වාසයකරන පිණිස ඔහුට තැනක් දිය
5 යුතුය. ලේ ගැන පළිගන්න අය ඔහු
ලුහුබැඳ ආවොත් මිනීමැරූ තැනැත්තා
ඔහු අතට පාවා නොදිය යුතුය;
මක්නිසාද පළමු ඔහු තමාගේ
අසල්වාසියාට වෛරයක් නොතිබී,
6 අත්වැරැද්දෙන් ඔහු මැරූ නිසාය. ඔහු
විනිශ්චය පිණිස සභාව ඉදිරියෙහි සිටින
තුරුද ඒ දවස්වල සිටින උත්තම පූජකයා
නසින තුරුද ඒ නුවර වසන්නේය. ඉන්පසු
මිනී මැරූ තැනැත්තා තමා හැරගිය
තමාගේම නුවරටත් තමාගේම ගෙදරටත්
7 හැරී යන්නේයයි කීසේක. මෙසේ ඔව්හු
නප්තලී කඳු රටේ තිබෙන ගලීලයෙහි
කෙදෙෂ්ද එප්‍රායිම් කඳු රටේ ෂෙකෙම්ද
යූද කඳු රටේ හෙබ්‍රොන් වන කිරියත්-
අර්බාද වෙන්කොට තැබුවෝය.
8 යෙරිකෝවට නැගෙනහිරෙන් යොර්දනෙන්
එගොඩ රූබෙන් ගෝත්‍රයෙන් තලාවේ
කාන්තාරයෙහි තිබෙන බෙශෙර්ද ගාද්
ගෝත්‍රයෙන් ගිලියද්හි තිබෙන රාමොත්ද
මනස්සේ ගෝත්‍රයෙන් බාෂාන්හි තිබෙන
ගෝලාන්ද ඔව්හු නියමකළෝය.
9 වැරදිල්ලකින් මිනීමරන කවුරු නුමුත්
සභාව ඉදිරියෙහි සිටින්ට පළමුවෙන්
ලේ ගැන පළිගන්නාගේ අතින් මැරුම්
නොකන පිණිස පලාගොස් සිටීමට සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයන්ද ඔවුන් අතරෙහි සිටින
විදේශීන්ද උදෙසා නියමකරනලද
නුවරවල් මේවාය.

## ලෙවීය නුවරවල්

එවිට ලෙවීවරුන්ගේ පිය 21
පෙළපත්වල ප්‍රධානීහු පූජකයාවූ
එලෙයාසර්ද නූන්ගේ පුත්‍රවූ යෝෂුවාද
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ පිය පෙළපත්වල
ප්‍රධානීන්ද වෙතට පැමිණ, කානාන් 2
දේශයේ ශීලෝහිදී ඔවුන්ට කථාකොට:
වාසයකිරීමට නුවරවල්ද අපේ සිව්-
පාවුන්ට ඒවායේ පිට-බිම්ද දෙන්ට කියා
ස්වාමීන්වහන්සේ මෝසෙස් ලවා
ආඥකෙරෙවූසේකැයි කීවෝය. ඉශ්‍රායෙල් 3
පුත්‍රයෝ ස්වාමීන්වහන්සේගේ ආඥව
ලෙස තමුන්ගේ උරුමයෙන් මෙකී
නුවරවල්ද ඒවායේ පිට-බිම්ද ලෙවීවරුන්ට
දුන්නෝය.
කොහාත්වරුන්ගේ පවුල්වලට පස 4
ඇටය වැටුණේය. ලෙවීවරුන්ගෙන්වූ
ආරොන් පූජකයාගේ පුත්‍රයන්ට යූද
ගෝත්‍රයෙන්ද සිමියොන් ගෝත්‍රයෙන්ද
බෙන්යමින් ගෝත්‍රයෙන්ද නුවරවල්
දහතුනක් පස ඇට දැමීමෙන් ලැබුණේය.
කොහාත්ගේ අනික් පුත්‍රයන්ට එප්‍රායිම් 5
ගෝත්‍රයේ පවුල්වලින්ද දාන් ගෝත්‍රයෙන්ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන්ද නුවරවල්
දසයක් පස ඇට දැමීමෙන් ලැබුණේය.
ගේර්ෂොන්ගේ පුත්‍රයන්ට ඉස්සාකර් 6
ගෝත්‍රයේ පවුල්වලින්ද ආෂෙර්
ගෝත්‍රයෙන්ද නප්තලී ගෝත්‍රයෙන්ද
බාෂාන්හි සිටිය මනස්සේගේ අර්ධ-
ගෝත්‍රයෙන්ද නුවරවල් දහතුනක් පස
ඇට දැමීමෙන් ලැබුණේය.
මෙරාරීගේ පුත්‍රයන්ට ඔවුන්ගේ පවුල්වල 7
හැටියට රූබෙන් ගෝත්‍රයෙන්ද ගාද්
ගෝත්‍රයෙන්ද සාබුලොන් ගෝත්‍රයෙන්ද
නුවරවල් දොළොසක් ලැබුණේය.
ඒ නුවරවල් සහ ඒවායේ පිට-බිම් 8
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමීන්වහන්සේ

මෝසෙස් ලවා අණකෙරෙවූ ලෙස පස
ඇට දමීමෙන් ලෙවීවරුන්ට දුන්නෝය.
9 යූදා පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන්ද සිමියොන්
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන්ද මෙහි නම්
10 සඳහන්කරනු ලබන නුවරවල් ඔව්හු
ලෙවීගේ පුත්‍රයන්වූ කොහාත්වරුන්ගේ
පවුල්වලට අයිති ආරොන්ගේ පුත්‍රයන්ට
දුන්නෝය. මක්නිසාද පළමුවෙනි පස
11 ඇටය වැටුණේ ඔවුන්ටය. ඔව්හු යූදා
කඳු රටේ තිබෙන හෙබ්‍රොන් නම්
කිරියත්-අර්බාද ඒ අවට තිබෙන එහි
පිට-බිම්ද ඔවුන්ට දුන්නෝය. අර්බාද
ඒ අවට තිබෙන එහි පිට-බිම්ද ඔවුන්ට
දුන්නෝය. අර්බා වනාහි අනාක්ගේ
12 පියාය. එහෙත් නුවර කෙත්ද එහි ගම්ද
ඔව්හු යෙපුන්නේගේ පුත්‍රවූ කාලෙබ්ට
උරුමයක් කොට දුන්නෝය.
13 ඔව්හු පූජක ආරොන්ගේ පුත්‍රයන්ට,
මිනීමරන අයට ආරක්ෂා නුවරක්වූ
හෙබ්‍රොන් සහ එහි පිට-බිම්ද ලිබ්නා
14 සහ එහි පිට-බිම්ද, යත්තීර් සහ එහි
පිට බිම්ද එෂ්තෙමෝවා සහ එහි පිට-
15 බිම්ද, හෝලොන් සහ එහි පිට-බිම්ද
16 දෙබීර් සහ එහි පිට-බිම්ද, ආයින් සහ
එහි පිට-බිම්ද යුත්තා සහ එහි පිට-
බිම්ද බෙත්-ෂෙමෙෂ් සහ එහි පිට-බිම්ද
යන මේ නුවරවල් නවය ඒ ගෝත්‍ර
17 දෙකෙන් දුන්නෝය. බෙන්යමීන්
ගෝත්‍රයෙන් ගිබියොන් සහ එහි පිට-
බිම්ද ගෙබා සහ එහි පිට-බිම්ද,
18 අනාතොත් සහ එහි පිට-බිම්ද අල්මොන්
සහ එහි පිට-බිම්ද යන නුවරවල්
19 සතරත් දුන්නෝය. පූජකයන්වූ ආරොන්
පුත්‍රයන්ගේ සියලු නුවරවල් වනාහි
ඒවායේ පිට-බිම් ඇතුළුව නුවරවල්
දහතුනක්ය.
20 ලෙවීවරුන් වන කොහාත්ගේ අනික්
පුත්‍රයන්ගේ පවුල්වලට ඔවුන්ගේ කොටසේ
නුවරවල් එප්‍රායිම් ගෝත්‍රයෙන් ලැබු-
21 ණේය. මිනීමරන අය උදෙසා නියමකළ
ආරක්ෂා නුවරක්වූ ෂෙකෙම් සහ එහි
පිට-බිම්ද ගෙසෙර් සහ එහි පිට-බිම්ද,
22 කිබ්ශයිම් සහ එහි පිට-බිම්ද බෙත්-
හෝරොන් සහ එහි පිට-බිම්ද යන
නුවරවල් සතර ඔවුන්ට දුන්නෝය. දාන් 23
ගෝත්‍රයෙන් එල්තෙකේ සහ එහි පිට-
බිම්ද ගිබ්බෙතොන් සහ එහි පිට-බිම්ද,
අයාලොන් සහ එහි පිට-බිම්ද ගැත්- 24
රිම්මොන් සහ එහි පිට-බිම්ද යන මේ
නුවරවල් සතරත් දුන්නෝය. මනස්සේගේ 25
අර්ධ ගෝත්‍රයෙන් තයනාක් සහ එහි
පිට-බිම්ද ගැත්-රිම්මොන් සහ එහි පිට-
බිම්ද යන නුවරවල් දෙකත් දුන්නෝය.
කොහාත්ගේ අනික් පුත්‍රයන්ගේ පවුල්වලට 26
ලැබුණ සියලු නුවරවල් වනාහි ඒවායේ
පිට-බිම් ඇතුළුව නුවරවල් දසයක්ය.
ඔවුන් ලෙවීවරුන්ගේ පවුල්වලට අයිතිවූ 27
ගේර්ෂොන්ගේ පුත්‍රයන්ට මනස්සේගේ
අර්ධ ගෝත්‍රයෙන් දුන්නේ මිනීමරන අය
උදෙසා නියමකළ ආරක්ෂා නුවරක්වූ
බාෂාන්හි තිබෙන ගෝලාන් සහ එහි
පිට-බිම්ද බෙ-යෙෂ්තෙරා සහ එහි පිට-
බිම්ද යන නුවරවල් දෙකය. ඉස්සා- 28
කර්ගේ ගෝත්‍රයෙන් කිෂියොන් සහ එහි
පිට-බිම්ද දබෙරත් සහ එහි පිට-බිම්ද,
යර්මුත් සහ එහි පිට-බිම්ද ඒන්-ගන්නීම් 29
සහ එහි පිට-බිම්ද යන නුවරවල් සතරත්
දුන්නෝය. ආෂේර් ගෝත්‍රයෙන් මිෂාල් 30
සහ එහි පිට-බිම්ද අබ්දෝන් සහ එහි
පිට-බිම්ද, හෙල්කාත් සහ එහි පිට- 31
බිම්ද රෙහොබ් සහ එහි පිට-බිම්ද යන
නුවරවල් සතරත් දුන්නෝය. නප්තලී 32
ගෝත්‍රයෙන් මිනීමරන අය උදෙසා නියම
කළ ආරක්ෂා නුවරක්වූ, ගලීලයෙහි
තිබෙන කෙදෙෂ් සහ එහි පිට-බිම්ද
හම්මොත්-දෝර් සහ එහි පිට-බිම්ද
කර්තාන් සහ එහි පිට-බිම්ද යන නුවර-
වල් තුනත් දුන්නෝය. ගේර්ෂොන්වරුන්ට 33
ඔවුන්ගේ පවුල්වල හැටියට ලැබුණ සියලු
නුවරවල් වනාහි ඒවායේ පිට-බිම්
ඇතුළුව නුවරවල් දහතුනක්ය.
අනික් ලෙවීවරුන් වන මෙරාරීගේ 34
පුත්‍රයන්ගේ පවුල්වලට සාබුලොන්
ගෝත්‍රයෙන් යොක්නෙයාම් සහ එහි පිට-
බිම්ද කර්තා සහ එහි පිට-බිම්ද, දිම්නා 35

සහ එහි පිට-බිම්ද නහලාල් සහ එහි
පිට-බිම්ද යන නුවරවල් සතර දුන්නෝය.
36 රූබෙන් ගෝත්‍රයෙන් බෙශෙර් සහ එහි
පිට-බිම්ද යාහශ් සහ එහි පිට-බිම්ද,
37 කෙදේමොත් සහ එහි පිට-බිම්ද මේපාත්
සහ එහි පිට-බිම්ද යන නුවරවල් සතරත්
38 දුන්නෝය. ගාද් ගෝත්‍රයෙන්, මිනීමරන
අය උදෙසා නියමකළ ආරක්ෂා
නුවරක්වූ ගිලියද්හි තිබෙන රාමොත්
සහ එහි පිට-බිම්ද මහනයිම් සහ එහි
39 පිට-බිම්ද, හෙෂ්බොන් සහ එහි පිට-
බිම්ද යාශෙර් සහ එහි පිට-බිම්ද යන
40 නුවරවල් සතරත් දුන්නෝය. මේ සියල්ල
ලෙවීවරුන්ගේ අනික් පවුල් වන
මෙරාරීගේ පුත්‍රයන්ට ඔවුන්ගේ පවුල්වල
හැටියට ලැබුණු නුවරවල්ය; ඔවුන්ගේ
කොටස නුවරවල් දෙළොසක්ය.
41 ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ උරුමය තුළ
තිබුණු ලෙවීවරුන්ගේ සියලු නුවරවල්
වනාහි ඒවායේ පිට-බිම් ඇතුළුව
42 නුවරවල් සතළිස් අටක්ය. මේ
නුවරවලින් එක එක නුවර වටකර පිට-
බිම් තිබුණේය. ඒ සියලු නුවරවල් ඒ
ආකාරව තිබුණේය.
43 මෙසේ ඉශ්‍රායෙල්වරුන්ගේ පියවරුන්ට
දෙන ලෙස **ස්වාමීන්වහන්සේ** දිවුළාවූ
මුළු දේශය උන්වහන්සේ ඔවුන්ට
දුන්සේක; ඔව්හු ඒක හිමිකරගෙන එහි
44 විසුවෝය. **ස්වාමීන්වහන්සේ** ඔවුන්ගේ
පියවරුන්ට දිවුළ සියල්ල ලෙස
හාත්පසින් උන්වහන්සේ ඔවුන්ට විශ්‍රාම
දුන්සේක. ඔවුන්ගේ සියලු සතුරන්ගෙන්
කිසිවෙකුට ඔවුන්ට විරුද්ධව සිටින්ට
නොහැකිවිය; **ස්වාමීන්වහන්සේ** ඔවුන්ගේ
සියලු සතුරන් ඔවුන් අතට පාවාදුන්-
45 සේක. **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්
වංශයට කී යහපත් දෙයින් කිසිවක්
අත්නැරී සියල්ලම සිදු වුණේය.

## රූබෙන් සහ ගාද් අහක්වී සාක්ෂි පූජාසනයක් ගොඩනැඟීම

**22** එවිට යෝෂුවා රූබෙන්වරුන්ද
ගාද්වරුන්ද මනස්සේගේ අර්ධ
2 ගෝත්‍රයද කැඳවා, ඔවුන්ට කථාකොට:
**ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවූ
මෝසෙස් තුඹලාට අණකළ සියල්ල
තුඹලා පැවැත්තුවහුය, මා තුඹලාට
අණකළ සියල්ල ගැන මාගේ හඬටත්
කීකරුවූහුය. තුඹලා අද දවස දක්වා 3
මෙපමණ දීර්ඝ කාලයක් තුඹලාගේ
සහෝදරයන් අත්නැර සිට තුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ආඥාවේ
භාරය රක්ෂාකළහුය. දැන් තුඹලාගේ 4
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුඹලාගේ
සහෝදරයන්ට කී ප්‍රකාරයට ඔවුන්ට
විශ්‍රාම දුන්සේක. තුඹලා ඉතින් හැරී
**ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවූ
මෝසෙස් විසින් යොර්දනෙන් එගොඩ
තුඹලාට දුන් උරුම දේශයෙහි තුඹලාගේ
කූඩාරම්වලට පලයල්ලා. එහෙත් 5
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
තුඹලා ප්‍රේමකොට, උන්වහන්සේගේ
සියලු මාර්ගවල හැසිරෙමින්,
උන්වහන්සේගේ ආඥා පවත්වා,
උන්වහන්සේට ඇලුම්ව සිට, තුඹලාගේ
මුළු සිතෙන්ද මුළු ආත්මයෙන්ද
උන්වහන්සේට සේවයකරන හැටියට
**ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවූ
මෝසෙස් තුඹලාට අණකළ ආඥාවද
ව්‍යවස්ථාවද රක්ෂාකරන්ට හොඳ-
කාරයෙන් බලාගනිල්ලායයි කීවේය.
මෙසේ යෝෂුවා ඔවුන්ට ආශීර්වාදකොට 6
ඔවුන් යන්ට හැරියේය. ඔව්හු තමුන්ගේ
කූඩාරම්වලට යන්ට ගියෝය.
මනස්සේගේ ගෝත්‍රයෙන් අර්ධයකට 7
මෝසෙස් බාෂාන්හි උරුමයක් දී
තිබුණේය. අනික් අර්ධයට යෝෂුවා
ඔවුන්ගේ සහෝදරයන් අතරෙහි
බස්නාහිරට යොර්දන් මෙගොඩ
උරුමයක් දුන්නේය. තවද යෝෂුවා
ඔවුන්ගේ කූඩාරම්වලට ඔවුන් හරින
කල ඔවුන්ට ආශීර්වාදකරමින්: තුඹලා 8
බොහෝ ධනයද සිව්පාවුන් ඉතා මහත්
ගණනක්ද රිදීද රන්ද පිත්තලද යකඩද
බොහෝ වස්ත්‍රද ඇතුව තුඹලාගේ
කූඩාරම්වලට ගොස්, තුඹලාගේ
සතුරන්ගෙන් ගත් කොල්ලය තුඹලාගේ

සහෝදරයන් සමග බෙදාගනිල්ලායයි
ඔවුන්ට කීවේය.
9 එවිට රූබෙන් පුත්‍රයෝද ගාද් පුත්‍රයෝද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයද ස්වාමීන්-
වහන්සේ මෝසෙස් ලවා අණකෙරෙවූ
ලෙස තමුන් ලබාගත සිටිය තමුන්ගේ
උරුම දේශය වන ගිලියද් දේශයට
යන්ට කානාන් දේශයේ තිබෙන ෂීලෝහි
සිට ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙතින් පිටත්ව
10 ගියෝය. කානාන් දේශයෙහි තිබෙන
යොර්දනේ අසබඩ පළාතට ඔවුන්
පැමුණුණු කල රූබෙන් පුත්‍රයෝද ගාද්
පුත්‍රයෝද මනස්සේගේ අර්ධ ගෝත්‍රයද
එහි යොර්දන ළඟ පූජාසනයක් එනම්
දකිමට මහත් පූජාසනයක් ගොඩ-
11 නැගුවෝය. එවිට රූබෙන් පුත්‍රයන්ද ගාද්
පුත්‍රයන්ද මනස්සේගේ අර්ධ ගෝත්‍රයද
කානාන් දේශය ඉදිරිපිට ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ පැත්තෙහි යොර්දන අසබඩ
පළාතේ පූජාසනයක් ගොඩනගා
තිබේයයි ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ආරංචිවිය.
12 ඉශ්‍රායෙල් පුත්‍රයන් ඒ බව ඇසූ කල
ඔවුන්ට විරුද්ධව යුද්ධයට යන පිණිස
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාව ෂීලෝහි
රැස්වුණාය.
13 ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගිලියද් දේශයේ
සිටි රූබෙන් පුත්‍රයන්ද ගාද් පුත්‍රයන්ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයද වෙතට
පූජකවූ එලෙයාසර්ගේ පුත්‍රයා වන
14 පීනෙහාස්ද, ඔහු සමග සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රවලින් එක එක පිය පෙළපතට
අධිපතිව සිටි අධිපතිවරුන් දසදෙනෙක්ද
යැවුවෝය. ඔව්හු එකිනෙකා ඉශ්‍රායෙල්
දහස් ගණන් අතරෙහි තම තමුන්ගේ
පිය පෙළපත්වලට ප්‍රධානියෝව
15 සිටියෝය. ඔව්හු ගිලියද් දේශයෙහි
රූබෙන් පුත්‍රයන්ද ගාද් පුත්‍රයන්ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයද ළඟට
16 අවුත් කථාකරමින්: තුඹලා අද දවසේ
ස්වාමීන්වහන්සේට විරුද්ධව කැරළි-
ගසන පිණිස පූජාසනයක් ගොඩනගා
ගැනීමෙන් තුඹලා අද ස්වාමීන්වහන්සේ
වෙතින් අහක්ව ගොස් ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවියන්වහන්සේට විරුද්ධව කළාවූ මේ
අපරාධය කිමෙක්ද? පෙයෝර් පිළිබඳ 17
අපරාධය මදිද? ස්වාමීන්වහන්සේගේ
සභාව පිටට වසංගතයක් පැමිණි නුමුත්
අද දක්වා අපි ඒ අපරාධයෙන් පවිත්‍ර
නොවීමුව. එහෙත් තුඹලා අද ස්වාමීන්- 18
වහන්සේ වෙතින් අහක්ව යන්නහුය.
මෙසේ තුඹලා අද ස්වාමීන්වහන්සේට
විරුද්ධව කැරළිගසන හෙයින් හෙට
උන්වහන්සේ මුළු ඉශ්‍රායෙල් සභාව
කෙරෙහි උදහස්වෙනවා ඇත. තුඹලාගේ 19
උරුම දේශය අපවිත්‍ර නම් ස්වාමීන්-
වහන්සේගේ මණ්ඩපය පිහිටුවා තිබෙන
උන්වහන්සේගේ උරුම දේශයට එතරව
අප අතරේ උරුමය ගනිල්ලා. නුමුත්
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ
පූජාසනය හැර තුඹලාට වෙන
පූජාසනයක් ගොඩනැගීමෙන් ස්වාමීන්-
වහන්සේටත් අපටත් විරුද්ධව
කැරළිනොගසල්ලා. ශෙරාගේ පුත්‍රවූ 20
ආකාන් කැපවූ දෙය සම්බන්ධ අපරාධය
කළ නිසා මුළු ඉශ්‍රායෙල් සභාව පිටට
උදහස නොපැමිණියේද? ඒ මනුෂ්‍යයා
තමාගේ අපරාධය කරණකොටගෙන
තනියම විනාශනුණේය කියා ස්වාමීන්-
වහන්සේගේ මුළු සභාව කියනවායයි
ඔවුන්ට කීවෝය.
රූබෙන් පුත්‍රයෝද ගාද් පුත්‍රයෝද 21
මනස්සේගේ අර්ධ ගෝත්‍රයද ඉශ්‍රායෙල්හි
දහස්ගණන්වූ ජනයන්ගේ ප්‍රධානීන්ට
උත්තරදෙමින්: දෙවිවරුන්ගේ දෙවිවූ 22
ස්වාමීන්වහන්සේ, දෙවිවරුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ, උන්වහන්සේම
දන්නාසේක, ඉශ්‍රායෙල්ද දැනගන්නවා
ඇත; අප විසින් කැරළිකාරකමින්වත්
ස්වාමීන්වහන්සේට විරුද්ධව ද්‍රෝහි-
කමින්වත්, ස්වාමීන්වහන්සේ වෙතින්
අහක්ව යන පිණිස අපට පූජාසනයක්
ගොඩනගා තිබේ නම්, අද දවසේ අප
නොගැළවුව මැනව. ඒක පිට දවන පූජා 23
නොහොත් ආහාර පූජා පුදන්ටවත්
ශාන්ති පූජා ඔප්පුකරන්ටවත් ඒක

ගොඩනැගුවා නම්, ස්වාමීන්වහන්සේම
24 ඒ ගැන පළිගන්නසේක්වා; අප මේක
කළේ ප්‍රවේසම පිණිස අදහසක් ඇතුවය,
එනම් මතු කාලයේදී තුඹලාගේ පුත්‍රයෝ
අපේ පුත්‍රයන්ට කථාකොට: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගෙන් තුඹලාට
25 කම්කිම්ද? රූබෙන් පුත්‍රයෙනි, ගාද්
පුත්‍රයෙනි, අපටත් තුඹලාටත් අතරේ
ස්වාමීන්වහන්සේ යොර්දන සීමාව
කොට තබා තිබෙන නිසා ස්වාමීන්-
වහන්සේ තුළ තුඹලාට කොටසක්
නැතැයි කියා මෙසේ තුඹලාගේ පුත්‍රයෝ
අපේ පුත්‍රයන් ස්වාමීන්වහන්සේට
භයවීමෙන් වෙන්කරන්නෝයයි අපි
26 සිතීමුව. එබැවින් අපට පූජාසනයක්
ගොඩනගා ගැනීමට අපි සූදානම්වෙමු-
යයි අප විසින් කියාගත්තේ දවන
පූජාවල්වත් යාගවල්වත් ඔප්පුකිරීමට
27 නොව, අපේ දවන පූජාවලිනුත් අපේ
යාගවලිනුත් අපේ ශාන්ති පූජාවලිනුත්
ස්වාමීන්වහන්සේගේ සේවය උන්වහන්සේ
ඉදිරියෙහි ඉෂ්ටකිරීම යුතු බවට අප
සහ තුඹලාද අපට පසුව අපේ පරම්පරාද
අතරේ එහි සාක්ෂියක් වන පිණිසත්,
ස්වාමීන්වහන්සේ තුළ තුඹලාට
කොටසක් නැත කියා මතු කාලයේ
තුඹලාගේ පුත්‍රයන් විසින් අපේ පුත්‍රයන්ට
28 නොකියන පිණිසත්ය. එසේ හෙයින්
ඔවුන් අපටවත් අපේ පරම්පරාවලටවත්
මතු කාලයේ එසේ කීවොත්: දවන පූජා
හෝ යාග පූජා හෝ ඔප්පුකිරීමට
නොව අප සහ තුඹලා අතරේ
සාක්ෂියක් පිණිස අපේ පියවරුන්
සෑදුවාවූ ස්වාමීන්වහන්සේගේ පූජා-
සනයේ ආදර්ශය බලාපල්ලාය කියා
අපට කියන්ට පුළුවනැයි අපි කියා-
29 ගත්තෙමුව. අපේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ මණ්ඩපය ඉදිරියෙහි තිබෙන
උන්වහන්සේගේ පූජාසනය හැර දවන
පූජා හෝ ආහාර පූජා හෝ යාග පූජා
හෝ ඔප්පුකිරීමට වෙන පූජාසනයක්
ගොඩනැගීමෙන් ස්වාමීන්වහන්සේට
විරුද්ධව කැරළිගසා අද ස්වාමීන්-
වහන්සේ වෙතින් අහක්ව යාම අපෙන්
දුරුවේවයි කීවෝය.
එවිට රූබෙන් පුත්‍රයන්ද ගාද් පුත්‍රයන්ද 30
මනස්සේ පුත්‍රයන්ද විසින් කී වචන පූජකවූ
පීනෙහාස්ද ඔහු සමග සිටිය සභාවේ
අධිපතීන් වන ඉශ්‍රායෙල් දහස්ගණන්වූ
ජනයන්ගේ ප්‍රධානීන්ද ඇසූ කල ඊට
ඔව්හු බොහෝසේ සතුටු වූහ. පූජක 31
එලෙයාසර්ගේ පුත්‍රවූ පීනෙහාස් රූබෙන්
පුත්‍රයන්ටත් ගාද් පුත්‍රයන්ටත් මනස්සේ
පුත්‍රයන්ටත් කථාකොට: ස්වාමීන්-
වහන්සේ අප අතරේ වසන බව තුඹලා
මේ ද්‍රෝහිකම ස්වාමීන්වහන්සේට
විරුද්ධව නොකළ නිසා අපි අද
දැනගතිමුව. මෙසේ තුඹලා ඉශ්‍රායෙල්
පුත්‍රයන් ස්වාමීන්වහන්සේගේ අතින්
ගැළවූවහුයයි කීවේය. එවිට පූජක 32
එලෙයාසර්ගේ පුත්‍රවූ පීනෙහාස්ද
අධිපතීහුද රූබෙන් පුත්‍රයන් හා ගාද්
පුත්‍රයන් කෙරෙන් ගිලියද් දේශයේ සිට
කානාන් දේශයෙහි ඉශ්‍රායෙල් පුත්‍රයන්
වෙත හැරී ඇවිත් ඔවුන්ට එපවත් කීවෝය.
ඒ කාරණය ඉශ්‍රායෙල් පුත්‍රයන්ට හොඳව 33
පෙනුණේය; එබැවින් රූබෙන් පුත්‍රයන්ද
ගාද් පුත්‍රයන්ද වාසයකළ දේශය
විනාශකරන පිණිස ඔවුන්ට විරුද්ධව
යුද්ධයට යාම ගැන ඉශ්‍රායෙල් පුත්‍රයෝ
තවත් කථානොකොට දෙවියන්-
වහන්සේට ප්‍රශංසාකළෝය. රූබෙන් 34
පුත්‍රයෝද ගාද් පුත්‍රයෝද: ස්වාමීන්-
වහන්සේ දෙවියන්වහන්සේ බවට එය
අප අතරේ සාක්ෂියක් වන නිසාය කියා
ඒ පූජාසනයට ඒද්* යන නාමය
තැබුවෝය.

## යෝෂුවාගේ ප්‍රථම අවසාන කථාව

23 ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්-
වරුන් වටකර සිටිය ඔවුන්ගේ
සියලු සතුරන්ගෙන් ඔවුන්ට විශ්‍රාමය දී
බොහෝ කලකට පසු, යෝෂුවා මහලුව

*එනම්, සාක්ෂියක්.

2 වයෝවෘද්ධව සිටියදී, යෝෂුවා සියලු
ඉශ්‍රායෙල්වරුන් වන ඔවුන්ගේ
වැඩිමහල්ලන්ද ප්‍රධානීන්ද විනිශ්චය-
කාරයන්ද මුලාදෑනීන්ද කැඳවා ඔවුන්ට
කථාකොට: මම මහලුව වයෝවෘද්ධව
3 සිටිමි. නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** නුඹලා උදෙසා මේ සියලු
ජාතීන්ට කළ සියල්ල නුඹලා දුටුවහුය;
මක්නිසාද නුඹලා උදෙසා යුද්ධ කෙළේ
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**මය.
4 ඉතුරුව සිටින මේ ජාතීන්ගේද මා විසින්
සිඳදැමූ සියලු ජාතීන්ගේද දේශය යොර්දන්
පටන් බස්නාහිර මහ මුහුද දක්වා
නුඹලාගේ ගෝත්‍රවලට උරුමයක් කොට
පස ඇට දමා නුඹලාට බෙදුදුනිමි.
5 නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**,
උන්වහන්සේම, නුඹලා ඉදිරියෙන් ඔවුන්
එළවා නුඹලා ඉදිරිපිටින් ඔවුන් පන්නා
දමනවා ඇත; නුඹලාද නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹලාට කී හැටියට
ඔවුන්ගේ දේශය හිමිකර ගන්නවා ඇත.
6 එබැවින් නුඹලා අතරේ ඉතිරිව සිටින
මේ ජාතීන් අතරෙහි නොගැවසී, ඔවුන්ගේ
දෙවිවරුන්ගේ නාම සඳහන් නොකොට,
ඔවුන් ගැන නොදිවුරවා, ඔවුන්ට සේවය
නොකර නමස්කාර නොකර සිටින
7 පිණිස, මෝසෙස්ගේ ව්‍යවස්ථා පොතෙහි
ලියා තිබෙන සියල්ලෙන් දකුණටවත්
වමටවත් නොහැරී ඒවා පවත්වන්ටත්
රක්ෂාකරන්ටත් ඉතා ධෛර්යවන්-
8 වෙයල්ලා. නුඹලා අද දවස දක්වා කළ
හැටියට නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ**ටම ඇලුම්ව සිටපල්ලා.
9 මක්නිසාද **ස්වාමීන්වහන්සේ** ඉතා
මහත්වූ බලවත්වූ ජාතීන් නුඹලා
ඉදිරියෙන් පන්නා දැමූසේක. එහෙත්
නුඹලාට විරුද්ධව සිටින්ට අද දවස
දක්වා කිසිවෙකුට පුළුවන්වුණේ නැත.
10 නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹලාට කී හැටියට නුඹලා උදෙසා
යුද්ධ කරන්නේ උන්වහන්සේය, එබැවින්
නුඹලාගෙන් එක්කෙනෙක් දහසක්
11 එළවන්නේය. එහෙයින් නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ**ට ප්‍රේමකරන ලෙස
හොඳකාරයෙන් බලාගනිල්ලා. මක්- 12
නිසාද නුඹලා යම් හෙයකින් හැරී ගොස්,
නුඹලා ළඟ ඉතුරුව සිටින මේ ජාතීන්ට
ඇලුම්වී, ඔවුන් සමග විවාහ කර-
ගනිමින්, නුඹලා ඔවුන් අතරෙහිද ඔවුන්
නුඹලා අතරෙහිද ගැවසුණොත්, නුඹලාගේ 13
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹලා
ඉදිරියෙන් මේ ජාතීන් තවත් පන්නා
නොදමන බවත්, නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹලාට දී තිබෙන
මේ යහපත් දේශය මතුපිටින් නුඹලා
විනාශවී යන තුරු, ඔවුන් නුඹලාට
මලපතකද උගුලක්ද නුඹලාගේ
ඇලපත්වලට කසයක්ද නුඹලාගේ
ඇස්වලට කටුද වන බවත් හොඳට
දැනගනිල්ලා. බලව, අද මම මුළු 14
පොළොවේ සියල්ලන් යන මාර්ගයේ
යමි. නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹලා ගැන කී සියලු යහපත් දේවලින්
එක දෙයක්වත් අත්නෑරුණ බව
නුඹලාගේ මුළු සිතෙනුත් මුළු
ආත්මයෙනුත් නුඹලා දන්නහුය; එයින්
එක දෙයක්වත් අත්නෑරී සියල්ලම
නුඹලාට පැමුණුණේය. තවද නුඹලාගේ 15
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** කී සියලු යහපත්
දේ නුඹලා කෙරෙහි පැමුණුණාක් මෙන්ම,
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹලාට අණකළ තමන්ගේ ගිවිසුම
නුඹලා කඩකර ගොස් අන් දෙවිවරුන්ට
සේවයකර ඔවුන්ට නමස්කාරකරන කල,
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** 16
නුඹලාට දී තිබෙන මේ යහපත් දේශය
මතුපිටින් නුඹලා විනාශවීයන තුරු,
සියලු නරක දේවල් නුඹලා පිටට
පමුණුවනවා ඇත. මෙසේ **ස්වාමීන්-**
**වහන්සේ**ගේ උදහස නුඹලාට විරුද්ධව
ඇවිළෙන්නේය, උන්වහන්සේ නුඹලාට
දී තිබෙන යහපත් දේශය මතුපිටින්
ඉක්මනින් නුඹලා නැතිකර දමනවා
ඇතැයි කීවේය.

## යෝෂුවාගේ දෙවෙනි අවසාන කථාව සහ මරණය

24 පසුව යෝෂුවා සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රයන් ෂෙකෙම්ට රැස්කරවා,
ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ද ඔවුන්ගේ
ප්‍රධානීන්ද ඔවුන්ගේ විනිශ්චයකාරයන්ද
ඔවුන්ගේ මුලාදෑනීන්ද කැඳවිය; ඔව්හු
දෙවියන්වහන්සේ ඉදිරිපිට පෙනී සිටියෝය.
2 යෝෂුවා මුළු සෙනඟට කථාකොට:
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක–පූර්ව කාලයෙහි
තුඹලාගේ පියවරුන් වන ආබ්‍රහම්ගේද
නාහෝර්ගේද පියවූ තෙරා ප්‍රාත්
ගංගාවෙන් එතර වාසය කෙළේය. ඔව්හු
3 අන් දෙවිවරුන්ට සේවයකළෝය. මම
වනාහි ඒ ගංගාව එතරින් තුඹලාගේ
පියවූ ආබ්‍රහම් කැඳවාගෙන කානාන්
දේශය මුළුල්ලෙහි ඔහු ගෙන ගොස්,
ඔහුගේ වංශය වැඩි කෙළෙමි. මම ඔහුට
4 ඊසාක් දුනිමි. ඊසාක්ට යාකොබ්ද ඒසව්ද
දුනිමි. ඒසව්ට සේයීර් කඳුකරයද
උරුමයක් කොට දුනිමි; යාකොබ්ද
ඔහුගේ පුත්‍රයෝද මිසරයට ගියෝය.
5 මම මෝසෙස් සහ ආරොන් යවා මා
විසින් මිසරය මධ්‍යයෙහි කළ ප්‍රකාරයටම
ඊට පීඩාකෙළෙමි. පසුව තුඹලා පිටතට
6 ගෙනායෙමි. මා විසින් තුඹලාගේ
පියවරුන් මිසරයෙන් පිටතට ගෙනා
කල තුඹලා මුහුද ළඟට ආවහුය;
මිසරවරු රථ සහ අසරුවන් ඇතුව
තුඹලාගේ පියවරුන් පස්සේ එළවාගෙන
7 රතු මුහුද දක්වා ආවෝය. ඔවුන්
**ස්වාමීන්වහන්සේට** මොරගැසූ කල
උන්වහන්සේ තුඹලාටත් මිසරවරුන්ටත්
අතරේ අන්ධකාරය තබා, මුහුද ඔවුන්
පිටට පමුණුවා. ඔවුන් වසාදැමූසේක;
මා විසින් මිසරයේදී කළ දේ තුඹලාගේ
ඇස්වලින් දුටුවහුය. ඇරත් කාන්තාරයෙහි
තුඹලා බොහෝ දවස් වාසයකළහුය.
8 තවද යෝර්දානෙන් එතර වාසය කළ
අමෝරිවරුන්ගේ දේශයට තුඹලා
ගෙනායෙමි; ඔව්හු තුඹලාට විරුද්ධව
යුද්ධකළෝය. මම ඔවුන් තුඹලා අතට
පාවාදුනිමි, තුඹලා ඔවුන්ගේ දේශය
හිමිකරගත්තහුය; මම තුඹලා ඉදිරියෙන්
ඔවුන් විනාශකෙළෙමි. එකල සිප්පෝර්ගේ 9
පුත්‍රවූ මෝවබ්හි රජවූ බාලාක් නැගිට
ඉශ්‍රායෙල්ට විරුද්ධව යුද්ධකර, තුඹලාට
ශාපකරන පිණිස බෙයෝර්ගේ පුත්‍රවූ
බාලාම්ට අඬගසා හැරියේය. එහෙත් 10
මා බාලාම්ට ඇහුම්කන්දෙන්ට
නොකැමැතිවූ හෙයින් ඔහු තුඹලාට
ආශීර්වාදම කෙළේය. මෙසේ මම
ඔහුගේ අතින් තුඹලා ගැළවීමි. තුඹලා 11
යෝර්දානෙන් මෙගොඩ වී යෙරිකෝවට
පැමුණුණහුය. යෙරිකෝවේ වැසියෝද
අමෝරිවරුද පෙරිස්සිවරුද කානානිවරුද
හිත්තීවරුද ගිර්ගාෂිවරුද හිවීවරුද
යෙබූසිවරුද තුඹලාට විරුද්ධව
සටන්කළෝය: මම ඔවුන් තුඹලා අතට
පාවාදුනිමි. මම තුඹලාට පෙරටුව 12
දෙබරුන් යැවීමි, උන් අමෝරිවරුන්ගේ
රජුන් දෙදෙනා තුඹලා ඉදිරියෙන්
එළෙවුවෝය; ඒක වුණේ තුඹේ
කඩුවෙන්වත් තුඹේ දුන්නෙන්වත් නොවේ.
මෙසේ තුඹලා වැඩ නොකර ලබාගත් 13
දේශයක්ද තුඹලා ගොඩනොනැගූ
නුවරවල්ද තුඹලාට දුනිමි, තුඹලා එහි
වසන්නහුය: තුඹලා නොවැවූ මිදි
වතුවලින්ද ඔලීව වතුවලින්ද තුඹලා
එල කන්නහුයයි කීසේක. එබැවින් තුඹලා 14
**ස්වාමීන්වහන්සේට** භයව අවංක-
කම්නුත් සැබෑකම්නුත් උන්වහන්සේට
සේවයකරපල්ලා. තුඹලාගේ පියවරුන්
ගංගාවෙන් එතරදීත් මිසරයේදීත්
සේවයකළ දෙවිවරුන් පහකරදමා,
**ස්වාමීන්වහන්සේට** සේවයකරපල්ලා.
**ස්වාමීන්වහන්සේට** සේවයකිරීම තුඹලාට 15
නරකව පෙනේනම්, ගඟ එගොඩ සිටිය
තුඹලාගේ පියවරුන් සේවයකළ
දෙවිවරුන් හෝ තුඹලා වාසයකරන
දේශයෙහි සිටිය අමෝරිවරුන්ගේ
දෙවිවරුන් හෝ තුඹලා සේවයකරන්ට
කැමති කාටද කියා අදම
තෝරාගනිල්ලා. එහෙත් අපි නම්–මමද
මාගේ පවුලද–**ස්වාමීන්වහන්සේට**
සේවයකරමුයයි කීවේය. සෙනඟ 16

උත්තරදෙමින්: අන් දෙවිවරුන්ට
සේවයකරන පිණිස **ස්වාමීන්වහන්සේ**
17 අත්හැරීම අපෙන් දුරුවේවා; මක්නිසාද
අප සහ අපේ පියවරුන්ද මිසර දේශය
වන වාල්කමේ ගෙදරින් පිටතට
ගෙනාවෙත්, අපේ ඇස් ඉදිරියේදී ඒ මහත්
හාස්කම් කළෙත්, අප ගිය මුළු
මාර්ගයේදීද අප පසුකර ආවාවූ සියලු
සෙනඟ අතරේදීද අප ආරක්ෂාකළෙත්
අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය**,
18 උන්වහන්සේමය. **ස්වාමීන්වහන්සේ** සියලු
මනුෂ්‍ය වර්ගයන්ද දේශයෙහි විසූ
අමෝරිවරුන්ද අප ඉදිරියෙන් එළවාදැමූ-
සේක. එබැවින් අපිත් **ස්වාමීන්වහන්සේට**
සේවයකරන්නෙමුව; මක්නිසාද උන්-
වහන්සේ අපේ දෙවියන්වහන්සේයයි
19 කීවෝය. යෝෂුවා සෙනඟට කථාකොට:
**ස්වාමීන්වහන්සේට** සේවයකරන්ට
නුඹලාට බැරිය; මක්නිසාද උන්වහන්සේ
ශුද්ධවූ දෙවිකෙනෙක්ය; ස්වකීය
ගෞරවය රක්ෂාකරන දෙවිකෙනෙක්ය;
උන්වහන්සේ නුඹලාගේ අපරාධද පාපද
20 කමානොකරනසේක. ඉදින් නුඹලා
**ස්වාමීන්වහන්සේ** අත්හැර අන්
දෙවිවරුන්ට සේවයකරන්නහුනම්
උන්වහන්සේ නුඹලාට යහපත කළ නුමුත්
හැරී නුඹලාට විපත්ති පමුණුවා නුඹලා
21 විනාශකරනසේකැයි කීවේය. සෙනඟද:
නැත, අපි **ස්වාමීන්වහන්සේට** සේවය-
කරන්නෙමුයයි යෝෂුවාට කීවෝය.
22 යෝෂුවාද: **ස්වාමීන්වහන්සේට** සේවය-
කිරීමට නුඹලා විසින් උන්වහන්සේ
තෝරාගත් බවට නුඹලා නුඹලාටම
විපක්ෂ සාක්ෂිකාරයෝයයි සෙනඟට
කීවේය. ඔව්හු: අපි සාක්ෂියයි කීවෝය.
23 එසේ වී නම් නුඹලා අතරෙහි ඇත්තාවූ
අන්‍ය දෙවිවරුන් පහකර දමා,
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
නුඹලාගේ සිත් යොමුකරපල්ලායයි
24 ඔහු කීවේය. සෙනඟද: අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** අපි සේවයකර,
උන්වහන්සේගේ හඬට අපි ඇහුම්කන්
දෙන්නෙමුයයි යෝෂුවාට කීවෝය.
මෙසේ යෝෂුවා ඒ දවසේ ෂෙකෙම්හිදී 25
සෙනඟ සමග ගිවිසුමක් කොට, ඔවුන්ට
පනතක්ද නියෝගයක්ද නියමකෙළේය.
යෝෂුවා මේ වචන දෙවියන්- 26
වහන්සේගේ ව්‍යවස්ථා පොතෙහි ලියා,
මහත් ගලක් රැගෙන එය **ස්වාමීන්-
වහන්සේගේ** ශුද්ධස්ථානය ළඟ තිබුණු
අලෝන ගස යට පිහිටුවා, මුළු සෙනඟට 27
කථාකොට: මෙන්න, මේ ගල අපට
විරුද්ධව සාක්ෂියක් පිණිස තිබේ;
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** අපට කී
උන්වහන්සේගේ සියලු වචන ඊට
ඇසුණේය. එබැවින් නුඹලා විසින්
නුඹලාගේ දෙවියන්වහන්සේ එපා-
නොකරන පිණිස ඒක නුඹලාට විරුද්ධව
සාක්ෂියක් පිණිස වන්නේයයි කීවේය.
පසුව යෝෂුවා මුළු සෙනඟ තම තමුන්ගේ 28
උරුම ප්‍රදේශවලට පිටත්කර හැරියේය.
මේ කාරණාවලට පසු **ස්වාමීන්-** 29
**වහන්සේගේ** මෙහෙකරුවූ නූන්ගේ පුත්‍රවූ
යෝෂුවා එකසිය දස අවුරුදු වයස්ව
මෙළේය. ඔව්හු එප්‍රායිම් කඳු රටේ ගායෂ් 30
කන්දට උතුරෙන් තිබෙන තිම්නාත්-සෙරා
නම්වූ ඔහුගේ උරුම පළාතෙහි ඔහු
තැන්පත්කළාහ. ඉශ්‍රායෙල්වරු වනාහි 31
යෝෂුවාගේ සියලු දවස්වලදීද යෝෂුවාට
පසුවත් ජීවත්ව සිටියාවූ, **ස්වාමීන්වහන්සේ**
ඉශ්‍රායෙල් උදෙසා කළ උන්වහන්සේගේ
සියලු ක්‍රියා දැනගෙන සිටියාවූ
වැඩිමහල්ලන්ගේ සියලු දවස්වලදීද
**ස්වාමීන්වහන්සේට** සේවය කළෝය.
තවද ඉශ්‍රායෙල් පුත්‍රයෝ මිසරයෙන් 32
ගෙනාවාවූ යෝසෙප්ගේ ඇට ෂෙකෙම්හි,
යාකොබ් විසින් ෂෙකෙම්ගේ පියවූ
හමෝර්ගේ පුත්‍රයන්ගෙන් රිදී සියයකට
මිලේටගත් බිම් කොටසෙහි තැන්පත්-
කළෝය. ඒවා යෝසෙප් පුත්‍රයන්ට
උරුමයක් වූයේය. ආරොන්ගේ පුත්‍රවූ 33
එලෙයාසර්ද මෙළේය; ඔව්හු ඔහුගේ
පුත්‍රවූ ෆීනෙහාස්ට එප්‍රායිම් කඳු රටෙහි
දෙනලද හෙලේ ඔහු තැන්පත්කළෝය.

# විනිශ්චයකාරයන්ගේ පොත

## දේශය අත්කරගැනීම අසම්පූර්ණ බව

1 යෝෂුවාගේ මරණයෙන් පසු
ඉශ්‍රායෙල් පුත්‍රයෝ: අපගේ කවුරු
කානානිවරුන්ට විරුද්ධව යුද්ධකරන්ට
පළමුකොට යා යුතුදැයි **ස්වාමීන්-**
2 **වහන්සේගෙන්** ඇසුවෝය. **ස්වාමීන්-**
**වහන්සේද:** යූද යා යුතුය. මම ඔහු
3 අතට දේශය දුනිමියි කීසේක. යූද තම
සහෝදරවූ සිමියෝන්ට කථාකොට: අප
කානානිවරුන්ට විරුද්ධව යුද්ධකරන
පිණිස මාගේ උරුම කොටසට මා
සමග නැගී වරෙන්න; මමත් නුඹේ
උරුම කොටසට නුඹ සමග එන්නෙමියි
කීවේය. මෙසේ සිමියෝන් ඔහු සමග
4 ගියේය. යූද එසේ නැගී ගිය කල
**ස්වාමීන්වහන්සේ** කානානිවරුන්ද
පෙරිස්සිවරුන්ද ඔවුන්ගේ අතට පාවාදුන්-
සේක. ඔව්හු බෙශෙක්හිදී මනුෂ්‍යයන්
දසදහසකට පහර දුන්නෝය.
5 බෙශෙක්හිදී අදෝනි-බෙශෙක් ඔවුන්ට
සම්බවුණෝය. ඔව්හු ඔහුට විරුද්ධව
යුද්ධකොට කානානිවරුන්ටත්
6 පෙරිස්සිවරුන්ටත් පහරදුන්නෝය. නුමුත්
අදෝනි-බෙශෙක් පලාගියේය; ඔව්හු ඔහු
පස්සේ එළවාගන ගොස් ඔහු අල්ලා,
ඔහුගේ අත්පාවල මාපට ඇඟිලි
7 කපාදැමුවෝය. අදෝනි-බෙශෙක් කථා-
කොට: අත්පාවල මාපට ඇඟිලි කපා-
දමනලද රජවරු සැත්තෑ දෙනෙක් මාගේ
මේසය යට කෑම ඇහිඳගත්තෝය.
මා කළ ලෙස දෙවියන්වහන්සේ මට
ප්‍රතිඵල දුන්සේකැයි කීවේය. ඔව්හු
ඔහු යෙරුසලමට ගෙනගියෝය, ඔහු
එහිදී මළේය.
8 යූද පුත්‍රයෝ යෙරුසලමට විරුද්ධව
යුද්ධකොට, ඒක අල්ලාගෙන, ඊට කඩු
මුවහතින් පහරදී, නුවර ගිනිලෑවෝය.
ඉන්පසු යූද පුත්‍රයෝ කඳු රටේද දකුණු 9
දිශාවේද පාත රටේද විසූ කානානි-
වරුන්ට විරුද්ධව යුද්ධකරන්ට බැස
ගියෝය. එසේ යූද ඉහතදී කිරියත්- 10
අර්බා යන නම ඇති හෙබ්‍රොන්හි
වාසයකළ කානානිවරුන්ට විරුද්ධව
ගොස්, ෂේෂයිටද අහිමාන්ටද තල්මයිටද
පහර දුන්නේය. එතැනින් ඔහු දෙබීර්හි 11
වැසියන්ට විරුද්ධව ගියේය. ඉහතදී
දෙබීර්ට තිබුණු නම කිරියත්-සේපෙර්ය.
කාලෙබ් කථාකොට: කිරියත්-සේපෙර්ට 12
පහරදී ඒක අල්ලාගන්න තැනැත්තාට
මාගේ දුවවූ අක්සා භාර්යාව කොට
පාවා දෙන්නෙමියි කීවේය. කාලෙබ්ගේ 13
බාල සහෝදරයා වන කෙනස්ගේ පුත්‍රවූ
ඔත්නියෙල් ඒක අල්ලාගත්තේය. කාලෙබ්
තමාගේ දූවූ අක්සා ඔහුට භාර්යාව
කොට පාවාදුන්නේය. තවද ඈ ඔහු 14
වෙත පැමිණි කල ඇගේ පියාගෙන්
කෙතක් ඉල්ලන්ට ඔහු ඈට සැලැස්විය,
ඈ කොටළුවා පිටින් බැස්සාය. කාලෙබ්
ඈට කථාකොට: නුඹට ඕනෑ මොකදැයි
ඇගෙන් ඇසීය. ඈද: මට වරයක් 15
දුනමැනවි; මක්නිසාද ඔබ දකුණු රටක්
මට දී තිබේ, දිය උල්පත්ද මට ලැබේවයි
කීවාය. එවිට කාලෙබ් ඉහළ උල්පත්ද
පහළ උල්පත්ද ඈට දුන්නේය.
තවද මෝසෙස්ගේ මාමා වන කේනිය- 16
යාගේ පුත්‍රයෝ යූද පුත්‍රයන් සමග ඉඳිගස්
නුවර සිට ඇවිත්, අරාද්ට දකුණෙන්
තිබෙන යූද කාන්තාරයට ගොස්, සෙනඟ
සමග වාසයකළෝය. යූදද තමන් 17
සහෝදරයාවූ සිමියෝන් සමග ගියේය,
ඔව්හු ශෙපත්හි විසූ කානානිවරුන්ට
පහරදී එය සහමුලින්ම විනාශකරදැමුවෝය.

ඒ නුවරට හොර්මා යන නම තැබූහ.
18 යූද වනාහි ගාසා හා එහි පළාතද
අෂ්කෙලොන් හා එහි පළාතද එක්‍රොන්
හා එහි පළාතද අල්ලාගත්තේය.
19 ස්වාමීන්වහන්සේ යූද සමග වූසේක;
ඔහු කඳු රටේ වැසියන් පන්නාදැමුවේය.
නුමුත් මිටියාවතේ වැසියන්ට යකඩ රථ
තිබුණු නිසා ඔවුන් පන්නාදමන්ට
20 නොහැකිවිය. මෝසෙස් කී ලෙස ඔව්හු
කාලෙබ්ට හෙබ්‍රොන් නුවර දුන්නෝය.
එතැනින් ඔහු අනාක්ගේ පුත්‍රයන්
21 තුන්දෙනා පන්නාදැමීය. බෙන්යමින්
පුත්‍රයෝ යෙරුසලමේ විසූ යෙබූසිවරුන්
පන්නානොදැමූහ. යෙබූසිවරු අද දවස
දක්වා බෙන්යමින් පුත්‍රයන් සමග
යෙරුසලමෙහි වාසයකරති.
22 යෝසෙප්ගේ වංශයද බෙතෙල්ට
විරුද්ධව ගියේය. ස්වාමීන්වහන්සේ ඔවුන්
23 සමග වූසේක. යෝසෙප්ගේ වංශය
බෙතෙල් සෝදිසිකරන්ට මිනිසුන්
යැවුවේය. පළමුවෙන් ඒ නුවර නම ලූස්ය.
24 රැක සිටියෝද මනුෂ්‍යයෙක් නුවරින්
එනවා දැක: නුවරට ඇතුල්වෙන මාර්ගය
අපට පෙන්වාපන්න, එවිට අපි නුඹට
25 කරුණාකරන්නෙමුයයි කීවෝය. නුවරට
ඇතුල්වෙන මාර්ගය ඔහු ඔවුන්ට
පෙන්නුවේය, ඔව්හු කඩු මුවහතින්
නුවරට පහරදුන්නෝය; නුමුත් ඔව්හු
ඒ මනුෂ්‍යයාත් ඔහුගේ මුළු පවුලත්
26 යන්ටහැරියෝය. ඒ මනුෂ්‍යයා හිත්තී-
වරුන්ගේ දේශයට ගොස් නුවරක්
ගොඩනගා ඊට ලූස් යන නම තැබුවේය.
අද දවස දක්වා එහි නම ඒකය.
27 මනස්සේ බෙත්-ෂෙයාන් හා ඊට අයිති
නුවරවල වැසියන්වත් තානාක් හා
ඊට අයිති නුවරවල වැසියන්වත් දෝර්
හා ඊට අයිති නුවරවල වැසියන්වත්
ඉබ්ලෙයාම් හා ඊට අයිති නුවරවල
වැසියන්වත් මෙගිද්දෝ හා ඊට අයිති
නුවරවල වැසියන්වත් පන්නා නො-
දැමුවේය. කානානිවරු ඒ රටේ
වාසයකරන්ටම කැමතිව සිටියෝය.
28 ඉශ්‍රායෙල්වරුන් බලවත් වූ කල ඔව්හු
කානානිවරුන් බර වැඩට යටත්කළෝය,
නුමුත් ඔවුන් සහමුලින් පන්නානො-
දැමුවෝය.
එප්‍රායිම් ගෙසෙර්හි විසූ කානානිවරුන් 29
පන්නා නොදැමුවේය; කානානිවරු
ගෙසෙර්හි ඔවුන් අතරේ වාසය කළෝය.
සාබුලොන් කිත්‍රොන් වැසියන්ද 30
නහලොල් වැසියන්ද පන්නා නො-
දැමුවේය; කානානිවරු ඔවුන් අතරේ
වාසයකරමින් බර වැඩට යටත් වූහ.
ආෂෙර්ද අක්කෝහි වැසියන්වත්, 31
ශීදෙන්හිත් අහ්ලාබ්හිත් අක්ශීබ්හිත්
හෙල්බාහිත් අපික්හිත් රෙහොබ්හිත්
වැසියන්වත් පන්නා නොදැමුවේය.
ආෂෙර්වරු ඒ දේශ වාසීවූ කානානි- 32
වරුන් අතරේ වාසය කළෝය, මක්නිසාද
ඔව්හු ඔවුන් පන්නා නොදැමුවෝය.
නප්තලී බෙත්-ෂෙමෙෂ්හි වැසියන්වත් 33
බෙත්-අනාත්හි වැසියන්වත් පන්නා
නොදමා රටේ වැසියන් වූ කානානි-
වරුන් අතරේ වාසය කළේය. එසේ
වුවත් බෙත්-ෂෙමෙෂ්හිද බෙත්-අනාත්හිද
වැසියෝ බර වැඩ පිණිස ඔවුන්ට
යටත්වුණෝය.
අමෝරිවරු දාන් පුත්‍රයන්ට මිටියාවතට 34
බසින්ට නොදී කඳු රටට ඔවුන් නෙරපා
හැරියෝය. අමෝරිවරු හෙරෙස් කන්දේද 35
අයාලොන්හිද ෂාල්බීම්හිද වාසය-
කරන්ටම කැමතිව සිටියෝය. එසේ වුවත්
යෝසෙප්ගේ වංශයේ අත බලවත්ව
තිබුණු බැවින් ඔව්හු බර වැඩට යටත්-
වුණෝය. අමෝරිවරුන්ගේ සීමාව 36
අක්‍රබ්බීම් නැගුම වූ පර්වතයේ සිට ඉහළට
පිහිටියේය.

## යෝෂුවාගේ කාලයට අනතුරුව පසුබට වීම

2 ස්වාමීන්වහන්සේගේ දූතයා
ගිල්ගාල්හි සිට බෝකීම්ට ඇවිත්
කථාකොට: මම නුඹලා මිසරයෙන්
පිටතට පමුණුවා, නුඹලාගේ පියවරුන්ට
දිවූළ දේශයටද නුඹලා ගෙනායෙමි;

නුඹලා සමග මාගේ ගිවිසුම කිසිකලකත්
2 කඩනොකරන්නෙමියි කියාද, මේ
දේශයේ වැසියන් සමග කිසි ගිවිසුමක්
නොකොට ඔවුන්ගේ පූජාසන කඩා-
දමාපල්ලාය කියාද කීවෙමි. නුමුත්
නුඹලා මාගේ හඬට ඇහුම්කන්
නුදුන්නහුය. නුඹලා මෙසේ කළේ
3 මක්නිසාද? එබැවින්: මම නුඹලා
ඉදිරියෙන් ඔවුන් පන්නා නොදමන්නෙමි;
ඔව්හු නුඹලාගේ ඇළපත්වලට කටු මෙන්
වන්නෝය, ඔවුන්ගේ දෙවිවරු නුඹලාට
මලපතක්ව සිටින්නෝයයි කීමියි කීසේක.
4 තවද ස්වාමීන්වහන්සේගේ දූතයා සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මේ වචන කී විට
5 සෙනඟ ශබ්දනගා හැඬුවෝය. ඔව්හු ඒ
ස්ථානයට *බෝකීම් යයි නම් තබා
එහිදී ස්වාමීන්වහන්සේට පූජා ඔප්පු
කළෝය.
6 යෝෂුවා සෙනඟ යන්ට හැරිය කල
ඉශ්‍රායෙල් පුත්‍රයෝ දේශය හිමිකරගන්න
පිණිස තම තමුන්ගේ උරුමවලට
7 ගියෝය. සෙනඟ යෝෂුවාගේ සියලු
දවස්වලද යෝෂුවාට පසුවත් ජීවත්ව
සිටියාවූ, ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්
උදෙසා කළ උන්වහන්සේගේ සියලුම
මහත් ක්‍රියා දුටුවාවූ වැඩිමහල්ලන්ගේ
සියලු දවස්වලද ස්වාමීන්වහන්සේට
8 සේවය කළෝය. ස්වාමීන්වහන්සේගේ
මෙහෙකරුවූ නූන්ගේ පුත්‍රවූ යෝෂුවා
එකසිය දස අවුරුද්දක් වයස්ව මළේය.
9 ඔව්හු එප්‍රායිම් කඳු රටේ ගයෂ් කන්දට
උතුරෙන් තිබෙන තිම්නාත්-හෙරෙස් නම්
ඔහුගේ උරුම පළාතෙහි ඔහු තැන්පත්-
10 කළෝය. ඒ මුළු පරම්පරාවද තමුන්ගේ
පියවරුන්ට එකතුවුණේය. ඔවුන්ට පසුව
ස්වාමීන්වහන්සේවත් ඉශ්‍රායෙල් උදෙසා
උන්වහන්සේ කළ ක්‍රියාවල්වත්
නොදන්නාවූ වෙන පරම්පරාවක්
නැගුටුණේය.
11 ඉශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි නපුරුව තිබෙන දේ කොට
12 බාල් දේවතාවුන්ට සේවයකළෝය. ඔව්හු

*එනම් අඬන්නෝ.

තමුන්ගේ පියවරුන් මිසර දේශයෙන්
ගෙනාවාවූ තමුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ අත්හැර, අන් දෙවිවරුන්වූ
තමුන් වටකර සිටිය මනුෂ්‍ය ජාතීන්ගේ
දෙවිවරුන් පස්සේ ගොස්, ඔවුන්ට
නමස්කාරකොට, ස්වාමීන්වහන්සේ
කෝපකළෝය. ඔව්හු ස්වාමීන්වහන්සේ 13
අත්හැර බාල්ටත් අෂ්ටාරොත්ටත්
සේවයකළෝය. ස්වාමීන්වහන්සේගේ 14
උදහසද ඉශ්‍රායෙල්ට විරුද්ධව ඇවිළ
උන්වහන්සේ ඔවුන් කොල්ලකාරයන්
අතට පාවාදුන්සේක, ඔව්හු ඔවුන්ගෙන්
කොල්ලකෑවෝය. තමුන්ගේ සතුරන්ට
විරුද්ධව සිටින්ට තවත් ඔවුන්ට බැරිවෙන
හැටියට උන්වහන්සේ ඔවුන් වටකර සිටිය
සතුරන්ගේ අතට ඔවුන් පාවාදුන්සේක.
ස්වාමීන්වහන්සේ කී ප්‍රකාරයටත් 15
උන්වහන්සේ ඔවුන්ට දිවුරා තිබුණු
හැටියටත් ස්වාමීන්වහන්සේගේ හස්තය
ඔවුන් ගිය හැම තැනම නපුර පිණිස
ඔවුන්ට විරුද්ධව තිබුණේය. ඔව්හු තද
අමාරුවට පත්වුණෝය.

## විනිශ්චයකාරයන් නියමකිරීම

එවිට ඔවුන්ගෙන් කොල්ලකෑ අයගෙන් 16
ඔවුන් ගළවාගන්න පිණිස ස්වාමීන්-
වහන්සේ විනිශ්චයකාරයන් නැගුටුවාදුන්-
සේක. එහෙත් ඔව්හු ඒ විනිශ්චය- 17
කාරයන්ටත් ඇහුම්කන්නොදී, අන්
දෙවිවරුන් අනුව අනාචාරයෙන්
හැසිරෙමින්, ඔවුන්ට නමස්කාර කළෝය.
ස්වාමීන්වහන්සේගේ ආඥාවලට කීකරුව
සිටි තමුන්ගේ පියවරුන් මෙන් ඔව්හු
නොකොට, ඔවුන්ගේ මාර්ගයෙන් වහාම
ඉවත්ව ගියෝය. ස්වාමීන්වහන්සේ 18
ඔවුන්ට විනිශ්චයකාරයන් නැගුටුවා දුන්
කල උන්වහන්සේ විනිශ්චයකාරයා සමග
සිට, ඔහුගේ සියලු දවස්වල ඔවුන්ගේ
සතුරන්ගේ අතින් ඔවුන් ගැළවූසේක.
මක්නිසාද ඔවුන්ට පීඩාකළාවූ ඔවුන්
පොඩිකළාවූ අය කරණකොටගෙන
හටගත් ඔවුන්ගේ කෙඳිරිගෑම නිසා

ස්වාමීන්වහන්සේ අනුකම්පාවූසේක.
19 නුමුත් විනිශ්චයකාරයා මැරුණු කල,
ඔව්හු හැරී අන් දෙවිවරුන් පස්සේ ගොස්,
ඔවුන්ට සේවයකොට නමස්කාරකරමින්,
තමුන්ගේ පියවරුන්ටත් වඩා දුෂ්‍යකම්
කළෝය; ඔව්හු තමුන්ගේ ක්‍රියාවලින්වත්
තමුන්ගේ මුරණ්ඩු මාර්ගයෙන්වත්
20 කිසිවක් අත්නැරියෝය. ස්වාමීන්-
වහන්සේගේ උදහස ඉශ්‍රායෙල්ට
විරුද්ධව ඇවිළ: මේ ජාතිය මාගේ
හඬට ඇහුම්කන්නොදී මා විසින්
ඔවුන්ගේ පියවරුන්ට අණකළ මාගේ
21 ගිවිසුම කඩකළ බැවින්, මමත් යෝෂුවා
නසින විට ඉතුරුව සිටි ජාතීන්ගෙන්
එක්කෙනෙක්වත් ඔවුන් ඉදිරියෙන් තවත්
22 පන්නා නොදමන්නෙමි. මෙසේ කරන්නේ
ඔවුන්ගේ පියවරුන් ස්වාමීන්වහන්සේගේ
මාර්ගය රක්ෂාකළාක් මෙන් ඔව්හු ඒ
මාර්ගයෙහි හැසිරෙන ලෙස ඒක
රක්ෂාකරන්නෝද නැද්දැයි ඒ ජාතීන්
කරණකොටගෙන ඉශ්‍රායෙල් සෝදිසි-
23 කරන පිණිසයයි කීසේක. එබැවින්
ස්වාමීන්වහන්සේ ඒ ජාතීන් යෝෂුවා
අතට පාවා නොදී, ඔවුන් ඉක්මනින්
පන්නා නොදමා, ඉතිරිකළසේක.

## පරාජය නුවූ ජාතීහු

**3** කානාන්හි සියලු යුද්ධ
දැනනොගත්තාවූ සියලු ඉශ්‍රායෙල්-
2 වරුන් සෝදිසිකරන පිණිසද, ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ පරම්පරාවලින් පළමු යුද්ධ
කරන්ට දැනනොගත් අයට එය උගන්වන
පිණිසද ස්වාමීන්වහන්සේ ඉතිරිකළ
3 ජාතීහු මොව්හුය: පිලිස්තිවරුන්ගේ
අධිපතිවරු පස්දෙනාත් සියලු කානානි-
වරුත් ශීදොන්වරුත් බාල්-හෙර්මොන්
කන්දේ පටන් හමාත්ට ඇතුල්වෙන තැන
දක්වා ලෙබනොන් කඳුකරයේ වාසයකළ
4 හිව්විවරුත්ය. ඔවුන් ඉතිරි කළේ ස්වාමීන්-
වහන්සේ මෝසෙස් ලවා ඉශ්‍රායෙල්-
වරුන්ගේ පියවරුන්ට අණ කෙරෙවූ
උන්වහන්සේගේ ආඥාවලට ඔව්හු
ඇහුම්කන් දෙන්නෝද නැද්දැයි දැනගැනීමට
ඔවුන් කරණකොටගෙන ඉශ්‍රායෙල්වරුන්
සෝදිසිකරන පිණිසය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ 5
කානානිවරුන්ද හිත්තීවරුන්ද අමෝරි-
වරුන්ද පෙරිස්සිවරුන්ද හිව්විවරුන්ද
යෙබූසිවරුන්ද අතරෙහි වාසයකොට,
ඔවුන්ගේ දූවරුන් පාවාගෙන, තමුන්ගේ 6
දූවරුන් ඔවුන්ගේ පුත්‍රයන්ට දී, ඔවුන්ගේ
දෙවිවරුන්ට සේවයකළෝය.

ඉශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමීන්වහන්සේගේ 7
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ
කළෝය, ඔව්හු තමුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ සිහිනැතිකොට බාල්
දේවතාවුන්ටත් *අෂේරීන්ටත් සේවය-
කළෝය. එබැවින් ස්වාමීන්වහන්සේගේ 8
උදහස ඉශ්‍රායෙල්ට විරුද්ධව ඇවිළ,
මෙසොපොතාමියේ රජවූ කුෂන්-
රිෂාතයිම් අතට උන්වහන්සේ ඔවුන්
පාවාදුන්සේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
කුෂන්-රිෂාතයිම්ට අට අවුරුද්දක්
මෙහෙකළෝය.

## 1 වෙනි විනිශ්චයකාරවූ ඔත්නියෙල්

ඉශ්‍රායෙල් පුත්‍රයන් ස්වාමීන්වහන්සේට 9
මොරගැසූකල ස්වාමීන්වහන්සේ
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ගැළවුම්කාරයෙකු
නැගුටුවා දී ඔවුන් ගැළවූසේක, ඒ
වනාහි කාලෙබ්ගේ බාල සහෝදරයා
වන කෙනස්ගේ පුත්‍රවූ ඔත්නියෙල්ය.
ස්වාමීන්වහන්සේගේ ආත්මය ඔහු 10
කෙරෙහි පැමිණියෙන්, ඔහු ඉශ්‍රායෙල්-
වරුන් විනිශ්චයකරමින් යුද්ධයට පිටත්ව
ගියේය. ස්වාමීන්වහන්සේ මෙසො-
පොතාමියේ රජවූ කුෂන්-රිෂාතයිම්
ඔහු අතට පාවාදුන්සේක. ඔහුගේ අත
කුෂන්-රිෂාතයිම්ට විරුද්ධව ජයගත්තේය.
එවිට ඒ සතළිස් අවුරුද්දක් දේශය 11
නිශ්චලව තිබුණාය. කෙනස්ගේ පුත්‍රවූ
ඔත්නියෙල්ද මළේය.

*එනම්, අෂේරා ස්තම්භ.

## ඒහුද්

12 නැවත ඉශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමීන්-
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ කළෝය. ඔවුන් ස්වාමීන්-
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ කළ නිසා උන්වහන්සේ ඔවුන්ට
විරුද්ධව මෝවබ්හි රජවූ එග්ලොන්
13 බලවත් කළසේක. ඔහු අම්මොන් සහ
අමලෙක් පුත්‍රයන් රැස්කරවාගන ගොස්
ඉශ්‍රායෙල්ට පහර දුන්නේය, ඔව්හු ඉඳිගස්
14 නුවරද හිමිකරගත්තෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ මෝවබ්හි රජවූ එග්ලොන්ට
15 දසඅට අවුරුද්දක් සේවයකළෝය. එහෙත්
ඉශ්‍රායෙල් පුත්‍රයන් ස්වාමීන්වහන්සේට
මොරගැසූ කල ස්වාමීන්වහන්සේ
ගැළවුම්කාරයෙකු ඔවුන්ට නැගුටුවාදුන්-
සේක. ඔහු වනාහි බෙන්යමින් ගෝත්‍රයට
අයිති ගේරාගේ පුත්‍රවූ වමත හුරු
මනුෂ්‍යයෙක්වූ ඒහුද්ය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
මෝවබ්හි රජවූ එග්ලොන්ට ඔහු අත
16 තෑග්ගක් යැවූවෝය. ඒහුද් තෙමේ රියනක්
දිග ඇති දෙමුවහත් කඩුවක් සාදගෙන
එය තමාගේ දකුණු කළවේ තමාගේ
17 ඇඳුම් යට බැඳගන ගොස්, මෝවබ්හි
රජවූ එග්ලොන්ට ඒ තෑග්ග ඔප්පු-
කෙළේය. එග්ලොන් වනාහි ඉතා තර
18 මනුෂ්‍යයෙකි. ඒහුද් තෑග්ග ඔප්පුකර නිමවූ
විට තෑග්ග ගෙන ගිය මිනිසුන් පිටත්කර
19 හැරියේය. නුමුත් ඔහු ගිල්ගාල් ළඟ
තිබෙන ගල් කපන තැන සිට හැරීගොස්:
රජ්ජුරුවෙනි, ඔබට කියන්ට රහස්වූ
පණිවිඩයක් මට තිබේයයි කීවේය.
රජතෙමේ: නිශ්ශබ්ද වෙයව්යයි කීය.
එවිට ඔහු වෙත සිටි සියල්ලෝ ඔහු
20 කෙරෙන් පිටතට ගියෝය. ඒහුද් ඔහු
ළඟට පැමිණියේය; ඔහු තමාගේ සිසිල්
උඩුමහල්තලයෙහි තනියම ඉඳගන
උන්නේය. ඒහුද් තෙමේ: ඔබට දෙවියන්-
වහන්සේගේ පණිවිඩයක් දන්වන්ට මට
ඇතැයි කීය. ඔහු හුනස්නෙන් නැගිට්ටේය.
21 ඒහුද් තමාගේ වමත දිගුකොට දකුණු
කළවයෙන් කඩුව හැරගෙන ඔහුගේ බඩට
22 ඇන්නේය. තලය සමග මිටත් ඇතුළට
ගියේය. ඔහුගේ බඩෙන් ඔහු කඩුව ඇද
නොගත් බැවින් තලය මාංසයෙන් වැසී
ගොස් පිටිපස්සෙන් එළියට ආයේය.
ඒහුද් පිටත ශාලාවට ගොස් උඩුමහල් 23
දෙරවල් වසා තබා අගුල් දමා ගියේය.
ඔහු පිටත්ව ගිය කල රජුගේ මෙහෙ- 24
කරුවෝ ඇවිත් බැලූහ; තවද ඔව්හු
උඩුමහලේ දෙරවල් අගුල්දමා තිබෙනවා
දැක: සැබවින් රජු සිසිල් උඩුමහල්-
තලයෙහි තමාගේ පාද වසාගන ඉන්නවා
වෙන්ට ඕනෑයයි කීවෝය. ඔව්හු 25
තුෂ්ණීම්භූතව බලා සිටියෝය. ඔහු
උඩුමහලෙහි දෙරවල් නොඇරිය බැවින්
ඔව්හු යතුර ගෙන ඒවා ඇරිය කල
ඔවුන්ගේ ස්වාමියා බිම වැටී මැරී
ඉන්නවා දුටුවෝය. ඔවුන් ප්‍රමාදවෙද්දී 26
ඒහුද් ගැළවී ගල් කපන තැන පසුකර
සෙයිරාට ගැළවී ගියේය. ඔහු ඇවිත් 27
එප්‍රායිම් කඳු රටේදී හොරණෑවක්
පිම්බේය, එවිට ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඔහු
සමග කඳුරටෙන් බැස ගියෝය, ඔහු
ඔවුන්ට පෙරටුවෙන් ගොස්, ඔවුන්ට 28
කථාකොට: මා පස්සේ වරෙල්ලා.
මක්නිසාද ස්වාමීන්වහන්සේ තුඹලාගේ
සතුරන් වන මෝවබ්වරුන් තුඹලා අතට
පාවා දී තිබේයයි කීවේය. ඔව්හු ඔහු
පස්සේ ගොස් මෝවබ් ළඟ තිබෙන
යොර්දන්හි තොටුපළවල් අල්ලාගෙන,
කිසිවෙකුට එයින් එගොඩවෙන්ට ඉඩ
නුදුන්නෝය. ඔව්හු ඒ ප්‍රස්තාවේදී 29
මෝවබ්වරුන් දස දහසක් පමණ
මැරුවෝය. ඔවුන් සියල්ලෝම ශක්තිමත්ව
සියල්ලෝම බලවත්තයෝ ව සිටියෝය;
එක්කෙනෙක්වත් ගැළවුණේ නැත. ඒ 30
දවසේදී මෝවබ්වරු ඉශ්‍රායෙල්වරුන්ට
යටත්කරනු ලැබුවෝය. ඉක්බිති අසූ
අවුරුද්දක් දේශය නිශ්චලව තිබුණාය.

## ෂම්ගර්

ඔහුට පසුව පැමිණියේ අනාත්ගේ පුත්‍රවූ 31
ෂම්ගර්ය. හෙතෙම පිලිස්තිවරුන්ගෙන්
මනුෂ්‍යයන් හසියයක් හරක් අංකුසයකින්
මැරීය. ඔහුද ඉශ්‍රායෙල් ගැළවූවේය.

## දෙබොරා සහ බාරක්

4 ඒහුද් මැරුණායින් පසු ඉශ්‍රායෙල්
පුත්‍රයෝ නැවත **ස්වාමීන්වහන්සේගේ**
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ
2 කළෝය. **ස්වාමීන්වහන්සේද** හාශෝර්හි
රජකම්කළ කානාන්හි රජවූ යාබින් අතට
ඔවුන් පාවාදුන්සේක; ඔහුගේ සේනාවේ
අධිපතියා ජාතීන්ට අයත් හරොෂෙත්හි
3 විසූ සිසෙරාය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
**ස්වාමීන්වහන්සේට** මොරගැසුවෝය.
මක්නිසාද ඔහුට යකඩ රථ නවසියයක්
තිබුණේය; ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන්ට විසි
අවුරුද්දක් බලවත් ලෙස පීඩා කෙළේය.
4 ඒ කාලයෙහි ඉශ්‍රායෙල්වරුන්
විනිශ්චයකෙළේ ලප්පිදෙත්ගේ භාර්යාව
වූ අනාගතවක්ත්‍රියක් වූ දෙබොරා
5 තොමෝය. ඈ එප්‍රායිම් කඳු රටේ
රාමාටත් බෙතෙල්ටත් අතරේ තිබෙන
දෙබොරාගේ ඉඳි ගස යට වාසයකළාය.
ඉශ්‍රායෙල් පුත්‍රයෝ විනිශ්චය පිණිස
6 ඈ ළඟට ආවෝය. ඈ කෙදෙෂ්-
නප්තලීයෙන් අබිනොවම්ගේ පුත්‍රවූ
බාරාක් අඬගස්වාගෙන ඔහුට
කථාකොට: තුඹ ගොස් නප්තලී
පුත්‍රයන්ගෙනුත් සාබුලොන් පුත්‍රයන්ගෙනුත්
මනුෂ්‍යයන් දසදහසක් රැස්කරගෙන
7 තාබෝර් කන්දට පලයන්න කියාත්, මම
යාබින්ගේ සේනාවේ අධිපතියාවූ
සිසෙරාද ඔහුගේ රථද සමුදුවද කීෂොන්
ඔය ළඟ තුඹ වෙතට රැස්කර ඔහු තුඹ
අතට පාවා දෙන්නෙමියි කියාත්
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
8 අණකළා නොවේදැයි කීවාය. එවිට
බාරාක් ඈට කථාකොට: තුඹ මා
සමග යනවා නම් මම යන්නෙමි. තුඹ
මා සමග නොයනවා නම් මමත්
9 නොයන්නෙමියි කීය. ඈද: සැබවින් මම
තුඹ සමග යන්නෙමි. එසේවීනුමුත් තුඹ
යන ගමන තුඹේ ගෞරවය පිණිස
නොවන්නේය; මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** ස්ත්‍රියක් අතට සිසෙරා
පාවාදෙනවා ඇතැයි කීවාය. දෙබොරා
තොමෝ පිටත්වී බාරාක් සමග
කෙදෙෂ්ට ගියාය. බාරාක් සාබුලොන්- 10
වරුන්ද නප්තලීවරුන්ද කෙදෙෂ්ට
අඬගස්වාගත්තේය; මනුෂ්‍යයන්
දසදහසක් ඔහු කැටුව ගියෝය.
දෙබොරාත් ඔහු සමග ගියාය. එකල 11
කේනියවූ හෙබෙර් මෝසෙස්ගේ මාමා
වන හොබාබ්ගේ පුත්‍රයන්වූ
කේනිවරුන්ගෙන් වෙන්වී, කෙදෙෂ් ළඟ
තිබෙන ශයනන්නීම්හි අලෝන වෘක්ෂය
ළඟ තමාගේ කූඩාරම පිහිටුවාගෙන
සිටියේය. එවිට අබිනොවම්ගේ පුත්‍රවූ 12
බාරාක් තාබෝර් කන්දට ගිය බව
සිසෙරාට දන්වනලද්දේය. සිසෙරා 13
තමාගේ සියලු රථ එනම් යකඩ රථ
නවසියයක්ද තමා සමග සිටි මුළු
සෙනඟද ජාතීන්ට අයත් හරොෂෙත්හි
සිට කීෂොන් ඔය ළඟට අඬගස්වා-
ගත්තේය. එවිට දෙබොරා බාරාක්ට 14
කථාකොට: නැගිටින්න; මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** සිසෙරා තුඹ අතට
පාවා දෙන දවස මේය. **ස්වාමීන්වහන්සේ**
තුඹට පෙරටුව යනවා නොවේදැයි
කීවාය. එහෙයින් බාරාක්ද ඔහු පස්සේ
මනුෂ්‍යයන් දසදහසක්ද තාබෝර්
කන්දෙන් බැස ගියෝය. එවිට **ස්වාමීන්-** 15
**වහන්සේ** සිසෙරා හා ඔහුගේ සියලු
රථද ඔහුගේ මුළු සේනාවද බාරාක්
ඉදිරියෙහි කඩුමුවහතින් කලඹා විසුරුවා
දැමූසේක; සිසෙරා තමාගේ රථයෙන්
බැස පයින් පලා ගියේය. නුමුත් බාරාක් 16
රථ හා සේනාව පස්සේ ජාතීන්ට අයත්
හරොෂෙත් දක්වා එළවාගෙන ගියේය.
සිසෙරාගේ මුළු සේනාව කඩුමුවහතින්
වැටුණාය; එක්කෙනෙක්වත් ඉතුරුවුණේ
නැත.
නුමුත් හාශෝර්හි රජවූ යාබින් හා 17
කේනියවූ හෙබෙර්ගේ වංශය අතරේ
සමාදානය තිබුණු බැවින් සිසෙරා කේනිය
හෙබෙර්ගේ භාර්යාවවූ යායෙල්ගේ
කූඩාරමට පයින් පලා ගියේය. යායෙල් 18
සිසෙරාගේ පෙරමගට ගොස්: මාගේ
ස්වාමිනි, ඇතුළට අව මැනවි; භයනොවී
මා ළඟට ඇතුළට අවමැනවියි ඔහුට

කීවාය. ඔහු ඈ සමග කූඩාරමට ගියේය,
19 ඈ පලස් රෙද්දකින් ඔහු වැසුවාය. ඔහුද:
කරුණාකර වතුර ටිකක් බොන්ට
දියන්න, මට පිපාසායයි කීවේය. ඈ
කිරි භාජනයක් ඇර ඔහුට බොන්ට දී
20 ඔහු වැසුවාය. ඔහු ඈට කථාකොට:
නුඹ කූඩාරමේ දෙරකඩ සිට, යම් කෙනෙක්
ඇවිත්–මෙහි කවුරුවත් ඉන්නවාදැයි
නුඹෙන් ඇසුවොත්, නැත කියාපන්නැයි
21 ඈට කීවේය. එවිට හෙබෙර්ගේ
භාර්යාවවූ යායෙල් කූඩාරම් ඇණයක්
හැරගෙන මිටියකුත් අතේ ඇතුව
හීන්සැරේ ඔහු ළඟට ගොස්, නිදගන
තෙහෙට්ටුවී සිටියාවූ ඔහුගේ නළල්
කෙළවරට ඇණය පොළොවට යනතෙක්
ගසා එය සිදුරුකළාය; මෙසේ ඔහු
22 විසංඥව මළේය. බාරාක් සිසෙරා
පස්සේ එළවාගන ආ කල යායෙල්
ඔහුගේ පෙරමගට ගොස්: වරෙන්න, නුඹ
සොයන මනුෂ්‍යයා නුඹට පෙන්වමියි
ඔහුට කීවාය. ඔහු ඈ වෙතට ආකල
සිසෙරා වැටී මැරී ඉන්නවාත් ඇණය
ඔහුගේ නළල් කෙළවරේ ඇනී
23 තිබෙනවාත් දුටුවේය. මෙසේ දෙවියන්-
වහන්සේ ඒ දවසේදී කානාන්හි රජවූ
යාබීන් ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියේ යටත්
24 කළසේක. කානාන්හි රජවූ යාබීන්
විනාශ කරදමන තුරු ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ අත කානාන්හි රජවූ යාබීන්ට
විරුද්ධව වඩ වඩා බලවත්වුණේය.

## දෙබොරා සහ බාරාක්ගේ ගීතිකාව

**5** ඉක්බිති ඒ දවසේදී දෙබොරාද
අබිනොවම්ගේ පුත්‍රවූ බාරාක්ද
මෙසේ ගීතිකාකළෝය:

2 අධිපතීන් ඉශ්‍රායෙල්හි මූලිකව ගිය
බැවින්ද,
සෙනඟ කැමැත්තෙන්ම ඉදිරියට ආ
බැවින්ද,
ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකරපල්ලා.
3 රජදරුවෙනි, අසාපල්ලා; අධිපතියෙනි,
කන්දියල්ලා;
මම, එසේය, මම, ස්වාමීන්වහන්සේට
ගී කියන්නෙමි;
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
ප්‍රශංසා ගී කියන්නෙමි.
ස්වාමීන්වහන්ස, ඔබ සේයිර් සිට 4
නික්මගිය කලද
ඒදෙම් පළාතේ සිට නැගී ආකලද
පොළොව වෙවුලුවාය, අහසෙන් වැසි
වැස්සේය,
එසේය, වළාකුල්වලින් වතුර වැස්සුණේය.
කඳු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහිද 5
අර සීනයි කන්ද ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහිද
දියව ගියේය.
අනාත්ගේ පුත්‍රවූ ෂම්ගර්ගේ දවස්වලද 6
යායෙල්ගේ දවස්වලද මාවත් හිස්ව
තිබුණේය,
මඟීහුද අතුරු පාරවලින් ගියෝය.
දෙබොරානම් මා නැගිටින තෙක්, 7
මා ඉශ්‍රායෙල්හි මවක් ව නැගිටින තෙක්,
ඉශ්‍රායෙල්හි ප්‍රධානියෝ නැතුව
සිටියෝය, නැතුවම සිටියෝය.
ඔව්හු අමුතු දෙවිවරුන් 8
තෝරාගත්තෝය;
එවිට යුද්ධය දෙරටුවලට පැමුණුණේය.
ඉශ්‍රායෙල්හි සතළිස් දහසක් අතරේ
පලිහක්වත් හෙල්ලයක්වත් දකිනු
ලැබුයේද?
සෙනඟ අතරෙන් කැමැත්තෙන්ම 9
ඉදිරියට ආ
ඉශ්‍රායෙල් ආණ්ඩුකාරයන් කෙරේ
මාගේ සිත ඇලුම් වේ;
ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකරපල්ලා.
සුදු කොටළුවන් පිට නැගී යන නුඹලාත්, 10
අනගි පලස් පිට හිඳින නුඹලාත්,
මාර්ගයෙහි යන නුඹලාත් එය ප්‍රකාශ
කරපල්ලා.
දුනුවායන්ගේ ඝෝෂාවෙන් ඈත දිය 11
අදින තැන්වලදී,

ඔව්හු ස්වාමීන්වහන්සේගේ ධර්මිෂ්ඨ ක්‍රියා
එනම් ඉශ්‍රායෙල්හි උන්වහන්සේගේ ආණ්ඩුවේ ධර්මිෂ්ඨ ක්‍රියා පවසන්නෝය.
එකල ස්වාමීන්වහන්සේගේ සෙනඟ දොරටුවලට බැස්සෝය.
12 පිබිදෙව, දෙබොරා පිබිදෙව;
පිබිදෙව, පිබිදෙව, ගීතිකාවක් පවසව.
බාරාක් නැගුටුව, එම්බා අබිනොවම්ගේ පුත්‍රය, නුඹ වාලට ගත් අය වාලට ගෙනයව.
13 එකල උත්තමයන්ගෙන් හා සෙනඟගෙන් ඉතුරු කොටසක් බැස ආයේය;
ස්වාමීන්වහන්සේ මා උදෙසා බලවතුන්ට විරුද්ධව බැස ආසේක.
14 අමලෙක්හි මුල ඇත්තෝ එප්‍රායිම් කෙරෙන් ආවෝය;
එම්බා බෙන්යමින්, නුඹ පස්සේ, නුඹේ සෙනඟ අතරේ ආවෝය.
මාඛීර් කෙරෙන් ආණ්ඩුකාරයෝද සාබුලොන් කෙරෙන් සේනාපතියාගේ ලේකම් සැරයටිය දරන්නෝද ආහ.
15 ඉස්සාකර්ගේ අධිපතීහුද දෙබොරා සමග වූහ;
ඉස්සාකර් යම්සේද බාරාක්ද එසේම විය;
ඔව්හු ඔහු පස්සේ මිටියාවතට වේගයෙන් දිවූහ.
රූබෙන්ගේ කඳුරැලි ළඟදී
සිතේ මහත් සනිටුහන් තිබුණේය.
16 නුඹ බැටළුපාලයන්ගේ නළා හඬ අසන පිණිස
බැටළු පට්ටි අතරේ කුමට ඉඳගත්තෙහිද?
රූබෙන්ගේ කඳුරැලි ළඟදී
මහත් සිත් විමසීම් විය.
17 ගිලියද් යොර්දනෙන් එතර විසීය.
දන් තෙමේ නැව්වල කුමට නැවතී සිටියේද?
ආෂෙර් මුහුදු වෙරළේ නිශ්චලව ඉඳගෙන
තමාගේ කලපු ළඟ විසීය.
සාබුලොන් වනාහි මරණය දක්වා 18
තම ජීවිත උපද්‍රව නොසැලකූ සෙනඟක,
නප්තලීද යුද්ධ භූමියේ උස්තැන් පිට එසේමය.
රජවරු ඇවිත් යුද්ධකළාහුය; 19
එවිට තයනාක්හිදී මෙගිද්දෝ ජලය ළඟ
කානාන් රජවරු යුද්ධකළෝය.
මුදලෙන් ඔවුන්ට කොල්ලයක් නොලැබුණේය.
තාරකාවෝ අහසේ සිට යුද්ධ කළෝය, 20
ස්වකීය ගසරවලදී සිසෙරාට විරුද්ධව සටන් කළෝය.
කීෂොන් ගංගාව, ඒ පැරණි ගඟවූ 21
කීෂොන් ගංගාව,
ඔවුන් ගසාගෙන ගියාය.
එම්බා මාගේ ආත්මය! ශක්තියෙන් ගමනය කරව.
එවිට පැනීම් නිසා එනම් ඔවුන්ගේ 22
බලවතුන්ගේ පැනීම් නිසා
අශ්වයෝ තදින් අඩි හැපුවෝය.
ස්වාමීන්වහන්සේගේ උදව්වටද 23
බලවතුන්ට විරුද්ධව ස්වාමීන්-
වහන්සේගේ උදව්වටද නා බැවින්
මෙරෝස්ට ශාපකරව්,
එහි වැසියන්ට තදලෙස ශාපකරව්යයි
ස්වාමීන්වහන්සේගේ දූතයා කීය.
කේනිය හෙබෙර්ගේ භාර්යා වන 24
යායෙල් තොමෝ වෙන ස්ත්‍රීන්ට වඩා
ආශීර්වාද ලත්තියක් වන්නීය.
කූඩාරම්හි ස්ත්‍රීන්ට වඩා ඈ ආශීර්වාද ලත්තියක් වන්නීය.
ඔහු වතුර ඉල්ලිය, ඈ කිරි දුන්නාය; 25
ඈ උත්කෘෂ්ට තැටියක ඔහු වෙත වෙඬරු ගෙනාවාය.
ස්වකීය අතින් ඇණයත් 26
ස්වකීය දකුණතින් කම්කරු මිටියත් ගෙන,
මිටියෙන් සිසෙරාට ගැසුවාය, ඔහුගේ හිස සිදුරුවෙන්ට ගැසුවාය,

එසේය, ඈ ඔහුගේ තළල් කෙළවර
සිදුරුකොට එය පොඩිවෙන්ට
ගැසුවාය.
27 ඈ පාමුල ඔහු නැමුණේය, ඔහු
වැටුණේය, ඔහු දිගාවුණේය.
ඈ පාමුල ඔහු නැමුණේය, ඔහු
වැටුණේය.
නැමුණු තැනම ඔහු වැටී නැසුණේය.
28 සිසෙරාගේ මවු කවුළු තුළින් බලා,
ගරාදි අතරෙන් මොරගසා:
ඔහුගේ රථය මෙතෙක් කල් පමාවන්නේ
මක්නිසාද?
ඔහුගේ රථරෝද මක්නිසා සුනංගු
වන්නේදැයි කීවාය.
29 ඇගේ නැණවත් කුලඟනෝ ඈට
උත්තර දුන්නුය.
එසේය, ඕ තමාටම ප්‍රතිඋත්තර කීවාය:
30 ඔව්හු කොල්ලය බෙදාගෙන,
එකිනෙකාට තරුණියක් එසේය,
තරුණියන් දෙන්නෙක්ද
සිසෙරාට නානා වර්ණ වස්ත්‍රයක් එසේය,
නානා වර්ණ ගෙත්තම් වස්ත්‍රයක්,
කොල්ලය ගත් අයගේ කරවල් පිට
දෙපැත්තේම නානා වර්ණ ගෙත්තම්
කළ වස්ත්‍රයක් නොලැබුද්දැයි කීවෝය.
31 **ස්වාමීන්වහන්ස**, මෙසේ ඔබගේ සියලු
සතුරෝ විනාශවෙත්වා.
නුමුත් උන්වහන්සේට ප්‍රේමකරන්නෝ
සූර්යයා ස්වකීය වික්‍රමයෙන් නික්ම
එන්නාක් මෙන් වෙත්වයි කීවෝය.
දේශයද සතළිස් අවුරුද්දක් නිශ්චලව
තිබුණාය.

## මිදියන්වරුන් විසින් පීඩාකිරීම

6 ඉශ්‍රායෙල් පුත්‍රයෝ වනාහි ස්වාමීන්-
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ කළෝය. **ස්වාමීන්වහන්සේ**
ඔවුන් මිදියන්වරුන් අතට සත්
2 අවුරුද්දකට පාවාදුන්සේක. මිදියන්-
වරුන්ගේ අත ඉශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව ජයගත්තේය. මිදියන්වරුන්
නිසා ඉශ්‍රායෙල් පුත්‍රයෝ කඳුවල තිබෙන
බිම්ගෙවල්ද ගුහාවල්ද කොටුද සාද
ගත්තෝය. ඉශ්‍රායෙල්වරුන් වැපුරුවාට 3
පසු මිදියන්වරුද අමෙලෙක්වරුද පූර්ව
දිශාවේ වැසියෝද ඔවුන්ට විරුද්ධව
ඇවිත්, ඔවුන්ට විරුද්ධව කඳවුරු බැඳ, 4
ගාසා දෙරටු දක්වා පොළොවේ භෝග
ඵල නාස්තිකළෝය, ඔව්හු ආහාරවත්
එළුබැටළුවන්වත් ගවයන්වත් කොටළු-
වන්වත් ඉශ්‍රායෙල්වරුන්ට ඉතිරිනො-
කළෝය. මක්නිසාද ඔව්හු තමුන්ගේ 5
ගවයන්ද කූඩාරම්ද ඇතුව නැගී ආවෝය,
ඔව්හුද ඔවුන්ගේ ඔටුවෝද ගණනින්
පළඟැටියන් මෙන් ගණනාවක් නැතුව
ඇවිත්, දේශය විනාශකරන පිණිස එහි
ඇතුල්වුණෝය. මිදියන්වරුන් නිසා 6
ඉශ්‍රායෙල්වරු ඉතා පහත්භාවයට
පැමිණියාහ; එවිට ඉශ්‍රායෙල් පුත්‍රයෝ
**ස්වාමීන්වහන්සේට** මොරගැසුවෝය.
තවද ඉශ්‍රායෙල් පුත්‍රයන් මිදියන්වරුන් 7
නිසා **ස්වාමීන්වහන්සේට** මොරගැසූ කල,
**ස්වාමීන්වහන්සේ** ප්‍රොපේත කෙනෙකු 8
ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙතට එවූසේක.
ඔහු ඔවුන්ට කථාකොට: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක—මම තුඹලා මිසරයෙන් ගෙනැවිත්,
තුඹලා වාල්කමේ ගෙයින් පිටතට
පැමිණෙවුවෙමි; මිසරවරුන්ගේ අතින්ද 9
තුඹලාට පීඩා කළ සියල්ලන්ගේ
අතින්ද තුඹලා නිදහස්කර, තුඹලා
ඉදිරියෙන් ඔවුන් පන්නාදමා, ඔවුන්ගේ
දේශය තුඹලාට දුනිමි; මම තුඹලාගේ 10
දෙවිවූ **ස්වාමීන්වහන්සේය** කියාද
තුඹලා වාසයකරන දේශයේ සිටි
අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට භයනො-
වෙල්ලාය කියාද තුඹලාට කීයෙමි.
එහෙත් තුඹලා මාගේ හඬට ඇහුම්-
කන් දුන්නේ නැතැයි කියනසේකැයි
කීවේය.

## ගිඩියොන් කැඳවනු ලැබීම

11 **ස්වාමීන්වහන්සේගේ** දූතයා ඇවිත්
අබියෙශ්‍රිය යෝවාෂ්ට අයිතිවූ ඔප්‍රාහි
තිබෙන අලෝන ගස යට හිඳගත්තේය.
යෝවාෂ්ගේ පුත්‍රවූ ගිඩියොන් මිදියන්-
වරුන්ගෙන් තිරිඟු සඟවාගන්න පිණිස
ඒවා මුද්‍රික යන්ත්‍රයෙහි මඩිමින් සිටියේය.
12 **ස්වාමීන්වහන්සේගේ** දූතයා ඔහුට පෙනී:
ධෛර්යමත් බලවත් මනුෂ්‍යය, **ස්වාමීන්-
වහන්සේ** තුඹ සමග සිටිනසේකැයි කීය.
13 ගිඩියොන් ඔහුට කථාකොට: අහෝ
මාගේ ස්වාමිනි, **ස්වාමීන්වහන්සේ** අප
සමග සිටිනසේක් නම් මේ සියල්ල
අපට සිද්ධවී තිබෙන්නේ මක්නිසාද?
**ස්වාමීන්වහන්සේ** අප මිසරයෙන්
ගෙනාවා නොවේද කියා අපේ පියවරුන්
අපට කියාදුන් උන්වහන්සේගේ සියලු
පුදුම ක්‍රියා කොයිද? දැන් නම් **ස්වාමීන්-
වහන්සේ** අප අත්හැරදමා මිදියන්වරුන්
අතට අප පාවා දුන්සේකැයි කීවේය.
14 **ස්වාමීන්වහන්සේ** ඔහු දෙස බලා: තුඹේ
මේ බලවත්කමින් ගොස් මිදියන්වරුන්
අතින් ඉශ්‍රායෙල් ගළවාපන්න. මා තුඹ
15 යැවුවා නොවේදැයි කීසේක. ඔහු
උන්වහන්සේට කථාකොට: අහෝ,
ස්වාමිනි, කුමකින් මම ඉශ්‍රායෙල්
ගළවාගනිම්ද? බැලුව මැනව, මාගේ
පවුල මනස්සේහි ඉතා දිළිඳු පවුලය,
මමද මාගේ පියාගේ ගෙයි ඉතාම කුඩා
16 තැනැත්තා වෙමියි කීවේය. **ස්වාමීන්-
වහන්සේද**: සැබවින් මම තුඹ සමග
සිටින්නෙමි, තුඹ එක්කෙනෙකුට මෙන්
මිදියන්වරුන්ට පහරදෙන්නෙහියයි ඔහුට
17 කීසේක. ඔහු උන්වහන්සේට කථාකොට:
දැන් ඔබ ඉදිරියෙහි මට කරුණාව ලැබී
තිබේනම්, ඔබ මා සමග කථාකරන
බවට ලකුණක් මට පෙන්නුව මැනව.
18 ඔබ වෙත මාගේ පූජාව ගෙනවුත් ඔබ
ඉදිරියෙහි තබන තෙක් මෙතැනින්
නොගිය මැනවයි කීවේය. උන්වහන්සේද:
තුඹ හැරී එන තුරු මම නවතින්නෙමියි
19 කීසේක. ගිඩියොන් ඇතුළට ගොස්
එළු පැටියෙක්ද ඒෆාවක පිටිවලින් මුහුන්
නොදැමූ රොටිද සූදානම්කොට, මස්
පෙට්ටියක තබා, සොදි භාජනයක
වත්කොට, අලෝන ගස යටට ගෙනවුත්
උන්වහන්සේට ඔප්පුකෙළේය. දෙවියන්- 20
වහන්සේගේ දූතයා: මස් සහ මුහුන්
නොදැමූ රොටි අරන් මේ ගල පිට තබා,
සොදි වත්කරපන්නැයි ඔහුට කීය. ඔහු
එසේ කෙළේය. එවිට **ස්වාමීන්වහන්සේගේ** 21
දූතයා තමාගේ අතේ තිබුණු සැරයටියේ
අග දිගුකොට මස්වලටත් මුහුන් නොදැමූ
රොටිවලටත් තට්ටු කෙළේය; එවිට
පර්වතයෙන් ගිනි මතුවී මස්ද මුහුන්
නොදැමූ රොටිද දවාදැමුවේය; **ස්වාමීන්-
වහන්සේගේ** දූතයා ඔහු ඉදිරියෙන්
නොපෙනී ගියේය. ඒ **ස්වාමීන්වහන්සේගේ** 22
දූතයා බව ගිඩියොන් දැක: අහෝ,
ස්වාමිවූ **දෙවියන්වහන්ස!** මක්නිසාද මම
**ස්වාමීන්වහන්සේගේ** දූතයා මුහුණට
මුහුණ ලා දුටිමියි කීය. **ස්වාමීන්වහන්සේ**: 23
තුඹට සමාදානය වේවා; භයනොවන්න.
තුඹ නසින්නේ නැතැයි ඔහුට කීසේක.
එවිට ගිඩියොන් එහි **ස්වාමීන්වහන්සේට** 24
පූජාසනයක් ගොඩනගා, *යෙහෝවා-
ෂාලොම් යන නාමය ඊට තැබුවේය.
එය අද දවස දක්වා අබියෙශ්‍රිවරුන්ට
අයිති ඔප්‍රාහි තිබේ.
තවද එදම රෑ **ස්වාමීන්වහන්සේ** ඔහුට 25
කථාකොට: තුඹේ පියාට අයිති ගොනා
එනම් සත් අවුරුදු වයස් ඇති දෙවෙනි
ගොනා ගෙන ගොස්, තුඹේ පියාට
තිබෙන බාල්ගේ පූජාසනය කඩාදමා,
ඒ ළඟ තිබෙන අෂේරා කණුව කපාදමා,
මේ බලකොටුව මුදුනේ තුඹේ දෙවිවූ 26
**ස්වාමීන්වහන්සේට** පූජාසනයක් නිසි
පිළිවෙළට සාද, දෙවෙනි ගොනා ගෙන
තුඹ කපන්නාවූ අෂේරා කණුවේ
ලීවලින් ඌ දවන පූජාවක් කොට
ඔප්පුකරපන්නැයි කීසේක. එවිට 27
ගිඩියොන් තමාගේ වැඩකාරයන්ගෙන්
දසදෙනෙකුන් කැඳවාගෙන **ස්වාමීන්-
වහන්සේ** ඔහුට කී ලෙස කෙළේය.

*එනම්, **ස්වාමීන්වහන්සේ** සමාදානයය.

ඔහු තමාගේ පියාගේ ගෙයි වැසියන්
නිසාත් නුවර වැසියන් නිසාත් එය
දවාලේදී කරන්ට භයව රාත්‍රියේදී
28 කෙළේය. නුවර මනුෂ්‍යයන් අලුයම
නැගුටුණු විට, බලව, බාල්ගේ පූජාසනය
කඩාදමා තිබුණේය. ඒ ළඟ තිබුණු
අෂේරා කණුව කපන ලදුව, ගොඩනැගූ
පූජාසනය පිට දෙවෙනි ගොනා පූජාකර
29 තිබුණේය. මේක කෙළේ කවුදැයි ඔවුන්
එකිනෙකාගෙන් අසා සෙවූ කල,
යෝවාෂ්ගේ පුත්‍රවූ ගිඩියොන් මේක කෙළේ-
30 යයි ඔවුන්ට කියන ලද්දේය. එවිට නුවර
මනුෂ්‍යයෝ යෝවාෂ්ට කථාකොට:
නුඹේ පුතා බාල්ගේ පූජාසනය කඩාදැමූ
නිසාද ඒ ළඟ තිබුණු අෂේරා කණුව
කැපූ නිසාද ඔහු මරන පිණිස පිටතට
31 ගෙනෙන්නැයි කීවෝය. යෝවාෂ්ද තමාට
විරුද්ධව සිටි සියල්ලන්ට කථාකොට:
නුඹලා බාල් උදෙසා කාරණා
කියනවාද? නොහොත් නුඹලා ඔහු
ගළවන්ට හදනවාද? ඔහු උදෙසා
කාරණා කියන්ට කැමති තැනැත්තේ
උදයව තිබෙද්දීම මරනු ලැබේවා. ඔහු
දෙවිකෙනෙක් නම් යමෙක් ඔහුගේ
පූජාසනය කඩාදැමුවාට ඔහුම තමා
32 උදෙසා කාරණා කියාවයි කීවේය. ඔහු
බාල්ගේ පූජාසනය කඩාදැමූ නිසා බාල්ම
ඔහුට විරුද්ධව කාරණා කියාවයි කියා
ඒ දවසේදී ඔහුට *යෙරුබ්බාල් යන
නම තැබුවේය.
33 එවිට සියලු මිදියන්වරුද අමලෙක්-
වරුද පූර්ව දිශාවේ වැසියෝද එකට
රැස්ව මෙගොඩට ඇවිත් යෙශ්‍රෙයෙල්
මිටියාවතේ කඳවුරු බැඳගත්තෝය.
34 ස්වාමීන්වහන්සේගේ ආත්මය ගිඩියොන්
කෙරෙහි පහළවූයේය: ඔහු හොරණෑවක්
පිම්බේය; එවිට අබියෙසෙර්වරු ඔහු
35 ළඟට රැස්වූහ. ඔහු මනස්සේ මුළුල්ලෙහි
පණිවිඩකාරයන් යැවීය: ඔව්හුද ඔහු
ළඟට රැස්වූහ. ඔහු ආෂේර්වරුන්ද
සාබුලොන්වරුන්ද නප්තලීවරුන්ද
වෙතටත් පණිවිඩකාරයන් ඇරියේය:
ඔව්හු ඔවුන් සම්මුඛවන පිණිස
ආවෝය. ගිඩියොන් දෙවියන්වහන්සේට 36
කථාකොට: ඔබවහන්සේ කී ලෙස මා
ලවා ඉශ්‍රායෙල් ගළවනසේක් නම්,
බැලුව මැනව, මම බැටළු ලොම් 37
මිටියක් පාවරේ තබන්නෙමි: ලොම්
මිටිය පිට පමණක් පිනි ඇතුව මුළු බිම
වියළී තිබුණොත් ඔබවහන්සේ කී ලෙස
මා ලවා ඉශ්‍රායෙල් ගළවන බව එයින්
මම දැනගන්නෙමියි කීවේය. ඒ එසේ 38
සිද්ධවිය. ඔහු පසුවදා අලුයම නැගිට
ලොම් මිටියෙන් පිනි මිරිකා තැටියක් පුරා
වතුර මිරිකා හැරියේය. තවද ගිඩියොන් 39
දෙවියන්වහන්සේට කථාකොට: ඔබ-
වහන්සේගේ උදහස මට විරුද්ධව නො-
ඇවිළේවා. මේ වර පමණක් කථා-
කරන්නෙමි. මේ වර පමණක් ලොම්
මිටියෙන් විමසන්ට මට අවසර ලැබේවා;
මුළු බිම පිට පිනි තිබෙද්දී ලොම් මිටිය
පමණක් වියළී තිබේවයි කීවේය.
දෙවියන්වහන්සේ ඒ රාත්‍රියේ එසේ කළ- 40
සේක. මුළු බිම පිට පිනි තිබෙද්දී ලොම්
මිටිය පමණක් වියළී තිබුණේය.

## ගිඩියොන් සහ තුන්සිය දෙනා ලත් ජය

7 එවිට යෙරුබ්බාල් නම්වූ ගිඩි-
යොන්ද ඔහු සමග සිටි මුළු
සෙනඟද අලුයම නැගිට හාරොද්හි
උල්පත ළඟ කඳවුරු බැඳගත්තෝය.
මිදියන් කඳවුරු ඔවුන්ට උතුරෙන්
මෝරේගේ කන්ද ළඟ මිටියාවතෙහි
තිබුණේය.
එවිට ස්වාමීන්වහන්සේ ගිඩියොන්ට 2
කථාකොට: නුඹ සමග සිටින සෙනඟ
වැඩිය. මා විසින් ඔවුන් අතට මිදියන්-
වරුන් පාවාදුන්නොත් ඉශ්‍රායෙල් මට
විරුද්ධව අහංකාරවී—අපේ අත අප
ගැළෙවුවේයයි කියනවා ඇත. එබැවින්: 3
භයද තැතිගැන්මද ඇති කවුරු නුමුත්
ගිලියද් කන්දේ සිට හැරීයේවයි සෙනඟට
ඇසෙන්ට ප්‍රසිද්ධකරපන්නැයි කීසේක.
එවිට සෙනඟගෙන් විසිදෙදහසක් හැරී-
ගියෝය: දසදහසක් ඉතිරිව සිටියෝය.

*එනම්, බාල් තෙමේ පැමිණිලිකෙරේවා.

4 **ස්වාමීන්වහන්සේ** ගිඩියොන්ට කථා-
කොට: සෙනඟ තවම වැඩිය; ඔවුන්
වතුර සමීපයට ගෙනෙන්න, මම එහිදී
ඔවුන් නුඹ උදෙසා විමසන්නෙමි. මොහු
නුඹ සමග යේවයි මම යමෙකු ගැන
නුඹට කියන්නෙම්ද ඔහු යන්නේය; මොහු
නුඹ සමග නොයේවයි මම යමෙකු
ගැන නුඹට කියන්නෙම්ද ඔහු නො-
5 යන්නේයයි කීසේක. ඔහු වතුර ළඟට
සෙනඟ ගෙනායේය. **ස්වාමීන්වහන්සේ**
ගිඩියොන්ට කථාකොට කියනසේක්:
බල්ලා ලෙවකා බොන්නාක් මෙන්
තමුන්ගේ දිවෙන් ලෙවකා වතුර බොන
හැමදෙනා වෙනමද බොන්නට දණ-
ගසන හැමදෙනා වෙනමද සිටවා-
6 පන්නැයි ගිඩියොන්ට කීසේක. තමුන්ගේ
අත කටට තබා ලෙවකා බීවාවූ
මිනිසුන්ගේ ගණන තුන්සියයක්ය.
සෙනඟගෙන් අනික් සියල්ලෝ වතුර
7 බොන පිණිස දණගැසුවෝය. **ස්වාමීන්-
වහන්සේද**: ලෙවකා බීවාවූ මිනිසුන්
තුන්සියය ලවා නුඹලා ගළවා මිදියන්-
වරුන් නුඹ අතට පාවාදෙන්නෙමි. අනික්
සියල්ලෝ තම තමුන්ගේ ස්ථානවලට
8 යෙත්වයි ගිඩියොන්ට කීසේක. මෙසේ
සෙනඟ කෑමත් තමුන්ගේ හොරණෑත්
අතින් ගෙන ගියෝය. ඔහු ඒ මිනිසුන්
තුන්සියය නවත්වාගෙන අනික් සියලු
ඉශ්‍රායෙල්වරුන් තම තමුන්ගේ
කූඩාරම්වලට යන්ට හැරියේය. මිදියන්
කඳවුර ඔහුට පහළින් මිටියාවතේ
තිබුණේය.

9 එදා රෑ **ස්වාමීන්වහන්සේ** ඔහුට
කථාකොට: නැගිට කඳවුරට බැස
පලයන්න; මක්නිසාද මම එය නුඹ
10 අතට පාවාදුනිමි. නුමුත් නුඹ බැස යන්ට
භය නම් නුඹේ මෙහෙකරුවාවූ පූරා
11 සමග කඳවුරට බැස පලයන්න. එවිට
ඔවුන් කියන දේ නුඹට ඇසුණාම කඳවුරට
බැසයන්ට නුඹේ අත් බලවත්වන්නේයයි
කීසේක. එවිට ඔහු තම මෙහෙකරුවාවූ
පූරා සමග කඳවුරේ අයිනේ ආයුධ ගත්
12 මනුෂ්‍යයන් වෙතට බැස්සේය. මිදියන්වරුද
අමලෙක්වරුද පූර්ව දිශාවේ සියලු
වැසියෝද ගණනින් පළඟැටියන් මෙන්
මිටියාවතේ පැතිර සිටියෝය; ඔවුන්ගේ
ඔටුවෝද ගණනාවක් නැතුව මුහුදු
වෙරළේ වැලි මෙන් බොහෝව සිටියෝය.
ගිඩියොන් ආ විට, බලව, මනුෂ්‍යයෙක් 13
තවත් කෙනෙකුට ස්වප්නයක් කියමින්:
මම ස්වප්නයක් දුටිමි, යව රොටියක්
මිදියන් කඳවුරට පෙරළීගෙන ඇවිත්
කූඩාරම දක්වා පැමිණ ඊට හැපී ඒක
වැටෙන්ට පහරදී ඒක පෙරළා දමා
තිබෙනු දුටිමියි කීවේය. අනික් තැනැත්තා 14
උත්තරදෙමින්: මේක ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෙක් වූ, යෝවාෂ්ගේ පුත්‍රවූ
ගිඩියොන්ගේ කඩුව මිස වෙන දෙයක්
නොවේ. ඔහු අතට දෙවියන්වහන්සේ
මිදියන්වරුන්ද මුළු සේනාවද පාවා දී
තිබේයයි කීවේය.

ස්වප්නය කීමත් ඒකේ තේරුමත් 15
ගිඩියොන් ඇසූ විට ඔහු නමස්කාර
කොට ඉශ්‍රායෙල් කඳවුරට හැරීගොස්:
නැගිටිල්ලා; මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
මිදියන් සේනාව නුඹලා අතට පාවාදුන්-
සේකැයි කීය. ඔහු ඒ මනුෂ්‍යයන් තුන්සියය 16
කණ්ඩායම් තුනකට බෙදා, ඔවුන්
සියල්ලන් අතට හොරණෑද ඇතුළේ
පන්දම් ඇති හිස් කළද දී ඔවුන්ට
කථාකොට: මා කරන හැටි බලා ඒ 17
ආකාරයෙන් කරපල්ලා. මා කඳවුර
අද්දරට පැමින්නාම මා කරන හැටියට
නුඹලාත් කරපල්ලා. මාත් මා සමග 18
සිටින සියලු දෙනාත් හොරණෑ පිඹින
විට නුඹලාත් මුළු කඳවුර වටකරින්ම
හොරණෑ පිඹ—**ස්වාමීන්වහන්සේ** හා
ගිඩියොන් උදෙසාය කියා කියාපල්ලා-
යයි කීවේය.

මෙසේ මධ්‍යම යාමයේ මුලදී මුර 19
මාරුකළ හැටියේම ගිඩියොන්ද ඔහු
සමග සිටි මිනිසුන් සියයද කඳවුර
අද්දරට පැමිණ හොරණෑ පිඹ තමුන්ගේ
අත්වල තුබූ කළගෙඩි බින්දෝය.
කණ්ඩායම් තුනම හොරණෑ පිඹ, 20
කළගෙඩි බිඳ දමා, වමතින් පන්දම්ද
පිඹින පිණිස දකුණතින් හොරණෑද

අල්ලාගෙන: **ස්වාමීන්වහන්සේගේද**
ගිඩියොන්ගේද කඩුවයයි මොර-
21 ගැසුවෝය. ඔවුන් සියල්ලෝම කඳවුරු
වටේට එකිනෙකා තම තමාගේ
ස්ථානයෙහි සිටියෝය. මුළු සේනාවද
22 දිව කෑගසමින් පලාගියෝය. ඔව්හු
හොරණෑ තුන්සියය පිම්බෝය, **ස්වාමීන්-
වහන්සේ** එක එක මනුෂ්‍යයාගේ කඩුව
එකිනෙකාටත් මුළු සේනාවටත් විරුද්ධව
හැරෙවුසේක. සේනාවද ශෙරේරා දෙසට
බෙත්-ෂිට්ටා දක්වාද ටබ්බාත් ළඟ
තිබෙන ආබෙල්-මෙහෝලාහි සීමාව
23 දක්වාද පලාගියෝය. ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝ නප්තලීයෙන්ද ආෂෙරෙන්ද
මුළු මනස්සෙන්ද රැස්ව මිදියන්වරුන්
24 පස්සේ එළවාගන ගියෝය. ගිඩියොන්
එප්‍රායිම් කඳු රට මුළුදම පණිවිඩ-
කාරයන් යවා: මිදියන්වරුන්ට විරුද්ධව
බැස ඇවිත් බෙත්-බාරා දක්වා
තොටුපල්ද යොර්දනද ඔවුන්ට පළමුවෙන්
අල්ලාගනිල්ලායයි කියා යැවීය. එවිට
එප්‍රායිම්හි සියලු මිනිස්සු රැස්ව බෙත්-
බාරා දක්වා තොටුපල්ද යොර්දනද
25 අල්ලාගත්තෝය. ඔව්හු මිදියන්ගේ
අධිපතීන් දෙදෙනා වන ඔරෙබ්ද ශීබ්ද
අල්ලාගෙන ඔරෙබ් පර්වතය ළඟදී
ඔරෙබ් මරා, ශීබ්හි මිදි යන්ත්‍රය ළඟදී
ශීබ්ද මරා, මිදියන්වරුන් පස්සේ
එළවාගන ගියෝය. තවද ඔරෙබ්ගේද
ශීබ්ගේද හිස් යොර්දනෙන් එගොඩ
ගිඩියොන් වෙතට ගෙනාවෝය.

## ගිඩියොන්ගේ මරණය දක්වා කරුණු

8 එප්‍රායිම් මනුෂ්‍යයෝ ඔහුට කථා-
කොට: තුඹ මිදියන්වරුන්ට
විරුද්ධව යුද්ධකරන්ට යන කල අපට
අඬනොගසා මෙසේ කළේ මක්නිසාදැයි
කියා ඔහු සමග තද ලෙස විවාද-
2 කළෝය. ඔහු ඔවුන්ට කථාකොට:
තුඹලා කළ දේ බැලුවාම මා කළේ
කුමක්ද? අබියෙශෙර්ගේ මුළු මුද්‍රික
එලදවට වඩා එප්‍රායිම්ගේ ඉතුරු එල
3 හොඳ නොවේද? තුඹලා අතට දෙවියන්-
වහන්සේ මිදියන්හි අධිපතීන්වූ ඔරෙබ්ද
ශීබ්ද පාවා දුන්සේක. තුඹලා කළ
දේට සමවෙන්ට මට කරන්ට පුළුවන්-
වුණේ කිමෙක්දැයි ඔවුන්ට කීවේය. ඔහු
එසේ කී කල ඔහු කෙරෙහි තිබුණු
ඔවුන්ගේ කෝපය සන්සිඳුණේය.
ගිඩියොන්ද ඔහු සමග සිටි මිනිසුන් 4
තුන්සියයද ක්ලාන්තව සිටි නුමුත්
එළවාගනම ගොස් යොර්දනට පැමිණ
එගොඩට ගියෝය. ඔහු සුක්කොත්හි 5
මනුෂ්‍යයන්ට කථාකොට: මා කැටුව
යන මිනිසුන් ක්ලාන්තව සිටින බැවින්
ඔවුන්ට රොටි දුනමැනවි; මම මිදියන්හි
රජවරුන්වූ සෙබාද ශල්මුන්නාද
එළවාගෙන යමියි කීවේය. සුක්කොත්හි 6
අධිපතීහු: අප විසින් තුඹේ සේනාවට
කෑම දෙන්ට සෙබාද ශල්මුන්නාද දැන්
තුඹ අතට අසුවී සිටිනවාදැයි කීවෝය.
ගිඩියොන්ද: **ස්වාමීන්වහන්සේ** සෙබාද 7
ශල්මුන්නාද මා අතට පාවාදුන් විට
මම තුඹලාගේ මාංසය වනයේ
කටුවලින්ද වේරැන්වලින්ද ඉරා-
දමන්නෙමියි කීවේය. ඔහු එතැනින් 8
පෙනුයෙල්ට ගොස් ඔවුන්ටත් එයාකාර
කීවේය. එවිට පෙනුයෙල්හි මනුෂ්‍යයෝද
සුක්කොත්හි මනුෂ්‍යයන් උත්තරදුන්
හැටියට ඔහුට උත්තර දුන්නෝය. ඔහු 9
පෙනුයෙල්හි මනුෂ්‍යයන්ටත් කථාකොට:
මම සමාදානයෙන් හැරී ආ කල්හි මේ
කොටුව බිඳදමන්නෙමියි කීවේය.
සෙබාද ශල්මුන්නාද ඔවුන් සමග පූර්ව 10
දිශාවේ වැසියෝ වූ මුළු සේනාවෙන්
ඉතුරුවුණ සියල්ලෝ එනම් පහළොස්
දහසක් පමණවූ ඔවුන්ගේ සේනාවද
කර්කෝර්හි සිටියෝය. මක්නිසාද
කඩුගත්ත මනුෂ්‍යයන් එකසිය විසි දහසක්
නැසුණෝය. ගිඩියොන් නොබාටද 11
යොග්බෙහාටද පෙරදිගින් කූඩාරම්වල
වසන්නන්ගේ පාරෙන් ගොස් සේනාව
පරීක්ෂා රහිතව සිටිද්දී ඔවුන්ට පහර
දුන්නේය. සෙබාද ශල්මුන්නාද පලා 12
ගියෝය; ඔහු ඔවුන් පස්සේ එළවාගන

ගොස් මිදියන් රජුන් දෙදෙනා වන
සෙබාද ශල්මුන්නාද අල්ලාගත්තේය,
මුළු සේනාවද භයගන්වා විසුරුවා
13 හැරියේය. එවිට යෝවාෂ්ගේ පුත්‍රවූ
ගිඩියොන් හෙරෙස් නැගුමේ සිට
14 යුද්ධයෙන් හැරී ඇවිත්, සුක්කොත්හි
යෞවනයෙකු අල්ලාගෙන ඔහුගෙන්
තොරතුරු විචාළේය. ඔහු සැත්තෑ සත්
දෙනෙක් වන සුක්කොත්හි අධිපතීන්ද
වැඩිමහල්ලන්ද ගැන විස්තර ඔහුට ලියා
15 දුන්නේය. ඔහු සුක්කොත්හි මනුෂ්‍යයන්
ළඟට ඇවිත් ඔවුන්ට කථාකොට: නුඹේ
වෙහෙසවූ මිනිසුන්ට අප විසින් කෑම
දෙන්ට සෙබාද ශල්මුන්නාද දැන් නුඹ
අතට අසුවී සිටිනවාද කියා නුඹලා
විසින් යමෙකු ගැන මට සරදම්කර
කීවාද ඒ සෙබාද ශල්මුන්නාද මෙන්න
16 බලාපල්ලායයි කීය. ඔහු නුවර
වැඩිමහල්ලන් අල්ලා වනයේ කටුගස්ද
වේරැන්ද අරන් එයින් සුක්කොත්හි
17 මිනිසුන් මට්ටුකෙළේය. ඔහු පෙනුයෙල්හි
කොටුවත් බිඳදමා නුවර මිනිසුන්
18 මැරුවේය. එවිට ඔහු සෙබා හා
ශල්මුන්නාට කථාකොට: නුඹලා
තාබෝර්හිදී මැරූ අය කොයි ආකාර
මිනිස්සුදැයි ඇසුවේය. ඔව්හු උත්තර-
දෙමින්: ඒ අයද නුඹ වාගේය, එකිනෙකා
පෙනීමෙන් රාජ කුමාරයන්ට සමාන-
19 යයි කීවෝය. ඔහුද: ඔව්හු මාගේ
සහෝදරයෝය, මාගේ මෑණියන්ගේ
පුත්‍රයෝය. නුඹලා ඔවුන් ඉතුරුකළානම්
*ස්වාමීන්වහන්සේ ජීවමාන බව සැබෑවා
සේම මමත් නුඹලා නොමරමියි කීය.
20 ඔහු තමාගේ කුලුඳුලාවූ යෙතෙර්ට:
නැගිට ඔවුන් මරාපන්නැයි කීය. නුමුත්
ඒ තරුණයා භයව කඩුව නොඇද
සිටියේය, මක්නිසාද ඔහු ඒතාක්
21 තරුණයෙක්ව සිටියේය. එවිට සෙබාද
ශල්මුන්නාද කථාකොට: නුඹම නැගිට
අප මරාපන්න, මක්නිසාද මනුෂ්‍යයාගේ
ප්‍රමාණය යම්සේද ඔහුගේ ශක්තියත්
එසේමයයි කීවෝය. ගිඩියොන් නැගිට
සෙබාද ශල්මුන්නාද මරා ඔවුන්ගේ
ඔටුවන්ගේ කරේ තිබුණු නව සඳකාර
ආභරණ ගත්තේය.
එකල ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ 22
ගිඩියොන්ට කථාකොට: නුඹද නුඹේ
පුත්‍රයාද නුඹේ පුත්‍රයාගේ පුත්‍රයාද
අප කෙරෙහි ආණ්ඩුකරන්ට ඕනෑය.
මක්නිසාද නුඹ මිදියන්වරුන්ගේ අතින්
අප ගළවාගත්තෙහියයි කීවෝය.
ගිඩියොන් ඔවුන්ට කථාකොට: මම 23
නුඹලා කෙරෙහි ආණ්ඩු නොකරන්නෙමි,
මාගේ පුත්‍රයාවත් නුඹලා කෙරෙහි
ආණ්ඩුනොකරන්නේය; ස්වාමීන්වහන්සේ
නුඹලා කෙරෙහි ආණ්ඩුකරනසේකැයි
කීවේය. ගිඩියොන් ඔවුන්ට කථාකොට: 24
මම නුඹලාගෙන් ඉල්ලීමක් කරමි, නුඹලා
එකිනෙකා කොල්ලගත් කුණ්ඩලාභරණ
මට දියල්ලායයි කීවේය. මක්නිසාද
ඔවුන් ඉෂ්මායෙල්වරුන් බැවින් ඔවුන්ට
රන් කුණ්ඩලාභරණ තිබුණේය. ඔව්හු: 25
අපි ඒවා කැමැත්තෙන්ම දෙමුයයි
උත්තරදී, වස්ත්‍රයක් අතුරා එක් එක්-
කෙනා තම තමා කොල්ලගත්
කුණ්ඩලාභරණ එහි දැමූහ. මිදියන්හි 26
රජුන් පැළඳ සිටිය නව සඳකාර
ආභරණද කර්ණාභරණද රත්තිල්
වස්ත්‍රද ඔවුන්ගේ ඔටුවන්ගේ කර වට
තිබුණු මාලද ඇර ඔහු ඉල්ලා ගත් රන්
කුණ්ඩලාභරණවල බර රන් ෂෙකෙල්
එක්දස් හත්සියයක්ය. ගිඩියොන් එයින් 27
ඒඵොද් සැට්ටයක් සාදා ඒක තමාගේ
නුවරවූ ඔප්‍රාහි පිහිටෙවුවේය. සියලු
ඉශ්‍රායෙල්වරු ඒක අනුව අනාචාරකමින්
ගියෝය. ඒක ගිඩියොන්ටත් ඔහුගේ
පවුලටත් මලපතක් විය. මෙසේ 28
මිදියන්වරු ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙහි
යටත්කරනු ලැබුවාහු තමුන්ගේ ඉස් තවත්
නොඔසෙවුවෝය. දේශයද ගිඩියොන්ගේ
දවස්වලදී සතළිස් අවුරුද්දක් නිශ්චලව
තිබුණේය.
යෝවාෂ්ගේ පුත්‍රවූ යෙරුබ්බාල් ගොස් 29
තමාගේම ගෙදර වාසයකෙළේය.
ගිඩියොන්ට දව උපන් පුත්‍රයෝ සැත්තෑ- 30
දෙනෙක් වූහ. මක්නිසාද ඔහුට බොහෝ

*හෙවත් ස්වාමීන්වහන්සේගේ ජීවිතය පා.

31 භාර්යාවෝ සිටියෝය. ෂෙකෙම්හි සිටි
ඔහුගේ උපභාර්යාවද ඔහු නිසා පුත්‍රයෙකු
වැදුවාය, ඔහු ඔහුට අබිමෙලෙක්යයි
32 නම් තැබීය. යෝවාෂ්ගේ පුත්‍රවූ ගිඩියොන්
බොහෝ ආයු වළඳ මැරී අබියෙශ්‍රීවරුන්ට
අයිති ඔප්‍රාහි තමාගේ පියවූ යෝවාෂ්ගේ
සොහොන් ගෙයි තැන්පත්කරනු ලැබුවේය.

## නැවතත් පසුබටවීම

33 තවද ගිඩියොන් මැරුණු වහාම
ඉශ්‍රායෙල් පුත්‍රයෝ නැවතත් බාල්
දේවතාවන් අනුව අනාචාරයෙන්
හැසිරෙමින් බාල්-බෙරීත් තමුන්ට දෙවි-
34 කොට තබාගත්තෝය. වටකර සිටි
තමුන්ගේ සියලු සතුරන්ගේ අත්වලින්
තමුන් ගැළෙවූ තමුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්
35 විසින් සිහිකෙළේවත්, යෙරුබ්බාල් එනම්
ගිඩියොන් ඉශ්‍රායෙල්ට කළ සියලු
යහපත්කම්වල හැටියට ඔහුගේ පවුලට
කරුණාව පෙන්නුවේවත් නැත.

## අබිමෙලෙක් කැරලිගැසීම සහ පරාජයවීම

9 යෙරුබ්බාල්ගේ පුත්‍රවූ අබිමෙලෙක්
ෂෙකෙම්හි සිටි තමාගේ මවුගේ
සහෝදරයන් ළඟට ගොස් ඔවුන්ටත්
තමාගේ මවුගේ පිය වංශයේ මුළු
2 පවුලටත් කථාකොට: තුඹලාට කොයි
එක වඩා හොඳද-යෙරුබ්බාල්ගේ සියලු
පුත්‍රයන් එනම් සැත්තෑදෙනෙක් තුඹලා
කෙරෙහි අධිපතිකම්කිරීමද නොහොත්
එක්කෙනෙක් තුඹලා කෙරෙහි අධිපති-
කම්කිරීමද කියා ෂෙකෙම්හි සියලු
වැසියන් ඉදිරියෙහි කථාකරන ලෙස
තුඹලාගෙන් ඉල්ලමි: මා වනාහි
තුඹලාගේ ඇට හා මාංසය බවත්
3 සිහිකරපල්ලායයි කීවේය. ඔහුගේ මවුගේ
සහෝදරයෝ ෂෙකෙම්හි සියලු වැසියන්
ඉදිරියෙහි මේ සියලු වචන ඔහු ගැන
කීවෝය. ඔවුන්ගේ සිත්ද අබිමෙලෙක්
දෙසට ඇදීගියේය; මක්නිසාද: ඔහු අපේ
4 සහෝදරයායයි ඔව්හු කීවෝය. තවද
ඔව්හු බාල්-බෙරීත්ගේ ගෘහයෙන් රිදී
මිල සැත්තෑවක් ඔහුට දුන්නෝය. එයින්
අබිමෙලෙක් තමා කැටුව යන පිණිස
කමකට නැති චණ්ඩි මිනිසුන් කුලියට
ගත්තෝය. ඔහු ඔප්‍රාහි තමාගේ පියාගේ 5
ගෙදරට ගොස් යෙරුබ්බාල්ගේ පුත්‍රවූ
තමාගේ සහෝදරයන් වන මිනිසුන්
සැත්තෑදෙනෙක් එක ගලක් පිට
මැරුවේය. නුමුත් යෙරුබ්බාල්ගේ බාල
පුත්‍රයාවූ යෝතාම් ඉතුරු විය: මක්නිසාද
ඔහු සැඟවුණේය.
ෂෙකෙම්හි සියලු වැසියෝද මිල්ලෝහි 6
සියලු වැසියෝද එක්ව ගොස් ෂෙකෙම්හි
තිබුණු කණුව අසල අලෝන වෘක්ෂය
ළඟදී අබිමෙලෙක් රජකමට පත් කළෝය.
ඔවුන් එය යෝතාම්ට දන්වූ විට ඔහු 7
ගොස් ගෙරිසීම් කන්ද මුදුනේ සිට
ශබ්දනගා මොරගසමින්: ෂෙකෙම්හි
වැසියෙනි, දෙවියන්වහන්සේ තුඹලාට
ඇහුම්කන්දෙන පිණිස තුඹලා මට
ඇහුම්කන්දියල්ලා. එක් කලෙක ගස් 8
තමුන් කෙරෙහි රජෙකු පත්කරගන්ට
ගොස්-තුඹ අප කෙරෙහි රජ වුණමැනවියි
ඔලීව වෘක්ෂයට කීවෝය. නුමුත් ඔලීව 9
වෘක්ෂය ඒවාට කථාකොට-දෙවියන්-
වහන්සේද මනුෂ්‍යයන්ද මා කරණකොට-
ගෙන ගෞරව ලබන්ට හේතුවූ මාගේ
සාරකම් අත්හැර ගස් කෙරෙහි එහා
මෙහා වැනෙන්ට යාම මට යුතුදැයි
කීවේය. එවිට ගස් තුමූ: තුඹ ඇවිත් අප 10
කෙරෙහි රජවුණ මැනවියි අත්තික්කා
ගසට කීවෝය. අත්තික්කා වෘක්ෂය 11
ඒවාට කථාකොට: මාගේ මිහිරිකමද
හොඳ පලදාවද අත්හැර ගස් කෙරෙහි
එහා මෙහා වැනෙන්ට යාම මට යුතුදැයි
කීවේය. එවිට ගස් තුමූ: තුඹ ඇවිත් අප 12
කෙරෙහි රජවුණ මැනවියි මිදිවැලට
කීවෝය. මිදිවැලද: දෙවියන්වහන්සේ සහ 13
මනුෂ්‍යයා ප්‍රීති කරවන මාගේ රසය
අතහැර ගස් කෙරෙහි එහා මෙහා
වැනෙන්ට යාම මට යුතුදැයි ඒවාට
කීවේය. එවිට සියලු ගස්: තුඹ ඇවිත් 14

අප කෙරෙහි රජවුණ මැනවයි කටුඇඹිල්ල
15 ගහට කීවෝය. කටුඇඹිල්ල ගහද:
තුඹලා සැබෑවටම තුඹලා කෙරෙහි
රජෙකු කොට මා පත්කර ගන්නවා
නම් ඇවිත් මාගේ සෙවණෙහි මුවාවී
සිටපල්ලා. නැතහොත් කටුඇඹිල්ල
ගහෙන් ගින්නක් නික්ම ලෙබනොන්හි
කිහිරි ගස් දවා දමාවයි ගස්වලට
16 කීවේය. ඉතින් අබිමෙලෙක් රජකමට
පත්කරගැනීමෙන් තුඹලා සැබෑකමින්ද
අවංකකමින්ද ක්‍රියාකොට, යෙරුබ්බාල්ට
සහ ඔහුගේ වංශයට යහපත්කම් කර,
ඔහුගේ අත්වල ක්‍රියාවල හැටියට ඔහුට
17 කළහුද? මක්නිසාද මාගේ පියා තමාගේ
ජීවිතය නොසලකා තුඹලා උදෙසා
යුද්ධකර මිදියන්වරුන්ගේ අත්වලින්
18 තුඹලා ගැළෙවුවේය. තුමුත් තුඹලා අද
මාගේ පිය වංශයට විරුද්ධව නැගිට
ඔහුගේ පුත්‍රයන් සැත්තෑදෙනෙක් එක
ගලක් පිට මරා ඔහුගේ දාසියගේ පුත්‍රවූ
අබිමෙලෙක් තුඹලාගේ සහෝදරයා
බැවින් ඔහු ෂෙකෙම්හි වැසියන් කෙරෙහි
19 රජකමට පත්කළහුය. තුඹලා මෙසේ
අද දවසේ යෙරුබ්බාල්ටත් ඔහුගේ
වංශයටත් සැබෑකමින්ද අවංකකමින්ද
ක්‍රියාකළානම් අබිමෙලෙක් ගැන
ප්‍රීතිවෙයල්ලා, ඔහුත් තුඹලා ගැන
20 ප්‍රීතිවේවා. එසේ නැත්නම් අබිමෙලෙක්-
ගෙන් ගිනි නික්ම ෂෙකෙම් වැසියන්ද
මිල්ලෝ වංශයද දවාදමාවා; ෂෙකෙම්
වැසියන්ගෙන්ද මිල්ලෝ වංශයෙන්ද
ගිනි නික්ම අබිමෙලෙක් දවාදමාවයි
21 කීවේය. යෝතාම් තමාගේ සහෝදරවූ
අබිමෙලෙක්ට හයින් බෙයේර්ට පලා
ගොස් එහි විසුවේය.
22 අබිමෙලෙක් ඉශ්‍රායෙල් කෙරෙහි තුන්
අවුරුද්දක් අධිපතිකම්කළායින් පසු,
23 දෙවියන්වහන්සේ අබිමෙලෙක් සහ
ෂෙකෙම් වැසියන් අතරට එදිරිකාර
ආත්මයක් පැමිණෙවූසේක; ෂෙකෙම්
වැසියෝ අබිමෙලෙක්ට ද්‍රෝහිකම්කළෝය.
24 මෙසේ වුණේ යෙරුබ්බාල්ගේ පුත්‍රයන්
සැත්තෑදෙනාට කළාවූ අයුක්තියේ එලද
ඔවුන්ගේ ලේද ඔවුන් මැරූ ඔවුන්ගේ
සහෝදරවූ අබිමෙලෙක් පිටටත් ඔහුගේ
සහෝදරයන් මැරීමට ඔහුගේ අත්
බලවත්කළාවූ ෂෙකෙම් වැසියන් පිටටත්
පැමිණෙන පිණිසය. ෂෙකෙම් වැසියෝ 25
ඔහුට විරුද්ධව කඳු මුදුන්වල රහසින්
මනුෂ්‍යයන් සිටෙවුවෝය, ඔව්හු ඒ
මාර්ගයෙහි තමුන් ළඟින් යන
සියල්ලන්ගෙන් කොල්ලකෑවෝය. එපවත්
අබිමෙලෙක්ට දන්වනලද්දේය.
තවද එබෙද්ගේ පුත්‍රවූ ගයල් 26
තමාගේ සහෝදරයන් සමග ෂෙකෙම්ට
පැමිණියේය. ෂෙකෙම් වැසියෝ ඔහු
කෙරෙහි විශ්වාසය තැබූහ. තවද ඔව්හු 27
කෙත්වලට ගොස් තමුන්ගේ මිදි වතු-
වලින් එල නෙළා මැඩගෙන මංගල්‍ය
පවත්වමින්, තමුන්ගේ දෙවියන්ගේ
ගෘහයට ඇතුල්වී කා බී අබිමෙලෙක්ට
දෙස් කීවෝය. එබෙද්ගේ පුත්‍රවූ ගයල් 28
කථාකොට: අප විසින් සේවයකිරීමට
අබිමෙලෙක් කවුද? ෂෙකෙම් කවුද? ඔහු
යෙරුබ්බාල්ගේ පුතා නොවේද? ඔහුගේ
අධිපතියා ශෙබුල් නොවේද? තුඹලා
ෂෙකෙම්ගේ පියවූ හාමෝර්ගේ මිනිසුන්ට
මෙහෙකරපල්ලා. තුමුත් අපි කුමක් පිණිස
ඔහුට මෙහෙකරමුද? අහෝ මේ මිනිස්සු 29
මා යටතේ නම්! එවිට මම අබිමෙලෙක්
පහකරදමන්නෙමියි කියා: තුඹේ සේනාව
වැඩිකරගෙන පිටතට වරෙන්නැයි
අබිමෙලෙක් ගැන කීවේය. නුවර 30
ආණ්ඩුකාරයාවූ ශෙබුල් එබෙද්ගේ
පුත්‍රවූ ගයල්ගේ වචන ඇසූ කල ඔහුගේ
කෝපය ඇවිළුණේය. ඔහු හොරෙන් 31
පණිවිඩකාරයන් අබිමෙලෙක් වෙත යවා:
මෙන්න, එබෙද්ගේ පුත්‍රවූ ගයල්ද ඔහුගේ
සහෝදරයෝද ෂෙකෙම්ට ඇවිත් සිටිති;
මෙන්න, තුඹට විරුද්ධව නුවර වැසියන්
පොළඹවති. එබැවින් තුඹ සහ තුඹ 32
වෙත සිටින සෙනඟ රාත්‍රියේ පිටත්වී
කෙතේ සැඟවී සිට උදය ඉර උදාවූ වහාම
නැගිට නුවරට විරුද්ධව පැමිණියල්ලා.
එවිට ඔහුද ඔහු සමග සිටින සෙනඟද 33

තුඹට විරුද්ධව පිටතට ආ කල්හි
ප්‍රස්ථාවේ හැටියට ඔවුන්ට කරන්නැයි
කියන්ට කීවේය.
34 අබිමෙලෙක්ද ඔහු සමග සිටි මුළු
සෙනඟද රාත්‍රියේ පිටත්ව ඇවිත්
කණ්ඩායම් සතරකට බෙදී ෂෙකෙම්ට
35 විරුද්ධව සැඟවී සිටියෝය. එබෙද්ගේ
පුත්‍රවූ ගයල්ද පිටතට ගොස් නුවරට
ඇතුල්වෙන දොරකඩ සිටියේය.
අබිමෙලෙක්ද ඔහු සමග සිටි මිනිස්සුද
සැඟවී සිටි තැනින් නැගිට ආවෝය.
36 ගයල් සෙනඟ දැක: අන්න, සෙනඟක්
කඳු මුදුන්වලින් බැස එනවායයි ශෙබුල්ට
කීවේය. ශෙබුල්ද: කඳුවල සෙවණැල්ල
මිනිසුන් වාගේ තුඹට පෙනේයයි ඔහුට
37 කීය. ගයල් නැවත කථාකොට: අන්න,
සෙනඟක් රටේ උස් පළාතෙන්
බැස එනවාය, තවත් කණ්ඩායමක්
මෙයොනෙනීම්හි අලෝන ගසට යන
38 මාර්ගයෙන් එනවායයි කීය. එවිට
ශෙබුල් ඔහුට කථාකොට: අප විසින්
මෙහෙකිරීමට අබිමෙලෙක් කවුදැයි තුඹ
කීවාවූ තුඹේ කට දැන් කොහේද? මේ
තුඹ විසින් හෙළාදක්නාලද මිනිස්සු
නොවෙද්ද? ඉතින් දැන් තුඹ ගොස්
ඔවුන්ට විරුද්ධව සටන් කරපන්නැයි
39 කීවේය. එවිට ගයල් ෂෙකෙම් වැසියන්ට
පෙරටුව ගොස් අබිමෙලෙක්ට විරුද්ධව
40 සටන්කෙළේය. අබිමෙලෙක් ඔහු පස්සේ
එළවාගන ගියේය, ඔහුද ඔහු ඉදිරියෙන්
පළාගියේය, නුවර දොරකඩට පැමිණෙන
තුරු බොහෝ දෙනෙක් මැරුම්කා
41 වැටුණෝය. අබිමෙලෙක් අරුමාහි
වාසයකෙළේය. ශෙබුල් වනාහි ගයල්ටද
ඔහුගේ සහෝදරයන්ටද ෂෙකෙම්හි
වාසයකරන්ට ඉඩනොදී ඔවුන් නෙරපා
42 දැමුවේය. පසුවදා සෙනඟ පිටතට ගියෝය;
ඒ බව අබිමෙලෙක්ට දන්වන ලද්දේය.
43 ඔහු සෙනඟ කැඳවා කණ්ඩායම් තුනකට
බෙදා පිටත සැඟවී සිටියේය; සෙනඟ
නුවරින් පිටතට එනවා ඔහු දුටු කල
ඔවුන්ට විරුද්ධව නැගිට ඔවුන්ට
44 පහරදුන්නේය. අබිමෙලෙක්ද ඔහු සමග
සිටි කණ්ඩායම්ද ඉදිරියට දුවගොස්
නුවරට ඇතුල්වෙන දොරකඩ සිටියෝය.
කණ්ඩායම් දෙකක්ද පිටත සිටි සියල්ලන්
ළඟට දුවගොස් ඔවුන්ට පහරදුන්නෝය.
අබිමෙලෙක් ඒ දවස මුළුල්ලෙහි නුවරට 45
විරුද්ධව සටන්කොට නුවර අල්ලාගෙන
එහි සිටි සෙනඟ මරා, නුවර බිඳහෙළා,
එහි ලුණු වැපුරුවේය.
ෂෙකෙම් කොටුවේ සිටි සියලු 46
මනුෂ්‍යයෝ ඒ අසා එල්-බෙරීත්
දෙවියාගේ ගෘහයේ කොතට ඇතුල්-
වුණෝය. ෂෙකෙම් කොටුවේ සියලු 47
මනුෂ්‍යයන් එකට රැස්ව සිටින බව
අබිමෙලෙක්ට දන්වන ලද්දේය. අබි- 48
මෙලෙක්ද ඔහු සමග සිටි සියලු
මිනිස්සුද ශල්මොන් කන්දට නැගී
ගියෝය; අබිමෙලෙක් අතින් පොරවක්
ගෙන ගසකින් අත්තක් කපා ඒක උස්සා
කර පිට තබාගෙන තමා සමග සිටි
සෙනඟට කථාකොට: මා කරනවා
තුඹලා දුටු දේම තුඹලාත් ඉක්මනින්
කරපල්ලායයි කීවේය. එවිට මුළු 49
සෙනඟත් එකිනෙකා අත්තක් බැගින්
කපාගෙන අබිමෙලෙක් පස්සේ ගොස්
ඒවා කොත ළඟ තබා මිනිසුන් ඇතුළේ
සිටිද්දී කොත ගිනිලෑවෝය. මෙසේ
ෂෙකෙම් කොටුවේ සියල්ලන්වූ ස්ත්‍රීන්
හා පුරුෂයන් දහසක් පමණ මළෝය.
ඉක්බිති අබිමෙලෙක් තේබේෂ්ට ගොස්, 50
තේබේෂ්ට විරුද්ධව කඳවුරු බැඳ ඒක
අල්වාගත්තේය. ඒ නුවර තුළ සවි ඇති 51
බලකොටුවක් විය, සියලු ස්ත්‍රීන් හා
පුරුෂයෝද නුවර වැසි සියල්ලෝද
එහි පලාගොස් දොරවල් වසාගෙන
කොටුවේ පියස්ස මුදුනට නැගුණෝය.
අබිමෙලෙක් කොටුව ළඟට ඇවිත් ඊට 52
විරුද්ධව සටන්කොට කොටු දොර
පුලුස්සා දමන්ට ඒ ළඟට ගියේය. එවිට 53
එක්තරා ස්ත්‍රියෙක් ඇඹරුම් ගලක උඩ
පළුව අබිමෙලෙක්ගේ හිස පිට හෙළා
ඔහුගේ ඉස්කබල බින්දය. ඔහු තමාගේ 54
ආයුධ ගෙනයන තරුණයා ඉක්මනට
කැඳවා: ස්ත්‍රියෙක් ඔහු මැරුවායයි
මිනිසුන් මා ගැන නොකියන පිණිස

නුඹේ කඩුව ඇද මා මරාපන්නැයි කීය.
තරුණයා ඔහුට ඇන්නේය, ඔහු මෙළේය.
55 ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ අබිමෙලෙක් මළ
බව දැක සියල්ලෝ තමුන්ගේ ස්ථානයට
56 ගියෝය. මෙසේ දෙවියන්වහන්සේ
අබිමෙලෙක් තමාගේ සහෝදරයන්
සැත්තෑදෙන මැරීමෙන් තමාගේ පියාට
කළ ඔහුගේ දුෂ්ටකමට විපාක දුන්-
57 සේක. ෂෙකෙම්හි මිනිසුන්ගේ මුළු
දුෂ්ටකමේ ප්‍රතිඵලත් දෙවියන්වහන්සේ
ඔවුන්ගේ හිස් පිටට පැමිණෙවූසේක.
මෙසේ යෙරුබ්බාල්ගේ පුත්‍රවූ යෝතාම්
කළ ශාපය ඔවුන් පිටට පැමුණුණේය.

## තෝලා සහ යායීර්

10 අබිමෙලෙක්ට පසුව ඉස්සාකර්හි
මනුෂ්‍යයෙක්වූ දෝදෝගේ පුත්‍රයා
වන පූවාගේ පුත්‍රවූ තෝලා ඉශ්‍රායෙල්
ගළවන්ට නැගුටුණේය; ඔහු එප්‍රායිම්
කඳුරටෙහි වූ ෂාමීර්හි වාසය කෙළේය.
2 ඔහු විසිතුන් අවුරුද්දක් ඉශ්‍රායෙල්
විනිශ්චයකොට නැසී ෂාමීර්හි තැන්පත්-
කරනු ලැබුවේය.
3 ඔහුට පසුව ගිලියද්හි මනුෂ්‍යයෙක්වූ
යායීර් නැගිට විසි දෑවුරුද්දක් ඉශ්‍රායෙල්
4 විනිශ්චයකෙළේය. පුත්‍රයෝ තිස්දෙනෙක්
ඔහුට සිටියෝය, නැගීයාම පිණිස
කොටළුවෝ තිස්දෙනෙක් ඔවුන්ට
වූවෝය, නුවරවල් තිහක්ද ඔවුන්ට ගිලියද්
දේශයෙහි තිබුණේය, ඒවාට හවෝත්-
යායීර්යයි අද දවස දක්වා කියනු ලැබේ.
5 යායීර්ද නැසී කාමොන්හි තැන්පත්කරනු
ලැබුවේය.

## නැවත පසුබටවීම හා පීඩාවිඳීම

6 ඉශ්‍රායෙල් පුත්‍රයෝ නැවතත් **ස්වාමීන්-
වහන්සේගේ** ඇස් හමුයෙහි නපුරුව
තිබුණ දේ කොට බාල්දේවතාවුන්ටත්
අෂ්ටාරොත්ටත් සිරියේ දෙවිවරුන්ටත්
ශීදෝන්හි දෙවිවරුන්ටත් මෝවබ්හි දෙවි-
වරුන්ටත් අම්මොන් පුත්‍රයන්ගේ
දෙවිවරුන්ටත් පිලිස්තිවරුන්ගේ දෙවි-
වරුන්ටත් සේවයකළෝය; **ස්වාමීන්-
වහන්සේට** සේවය නොකොට උන්-
වහන්සේ අත්හැරියෝය. **ස්වාමීන්-** 7
**වහන්සේගේ** උදහස ඉශ්‍රායෙල්ට විරුද්ධව
ඇවිළී, උන්වහන්සේ ඔවුන් පිලිස්තිවරුන්
අතටද අම්මොන් පුත්‍රයන් අතටද
පාවාදුන්සේක. ඔව්හු ඒ අවුරුද්ද පටන් 8
දසඅට අවුරුද්දක් යොර්දනෙන් එගොඩ
ගිලියද්හි තිබෙන අමෝරිවරුන්ගේ
දේශයෙහි සිටි සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
පීඩාකොට ඔවුන් මැඩලූවෝය. තවද 9
අම්මොන් පුත්‍රයෝ යූදටත් බෙන්යමින්ටත්
එප්‍රායිම් වංශයටත් විරුද්ධව යුද්ධකරන
පිණිස යොර්දනෙන් මෙගොඩට ආවෝය;
මෙසේ ඉශ්‍රායෙල් තද අමාරුවට
පැමිණියේය. එවිට ඉශ්‍රායෙල් පුත්‍රයෝ 10
**ස්වාමීන්වහන්සේට** මොරගසා: අපි අපේ
දෙවියන්වහන්සේ අත්හැර බාල්දේවතා-
වුන්ට සේවය කිරීමෙන් ඔබවහන්සේට
විරුද්ධව පව්කෙළෙමුයයි කීවෝය.
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන්ට 11
කථාකොට: මිසරවරුන්ගෙන්ද අමෝරි-
වරුන්ගෙන්ද අම්මොන් පුත්‍රයන්ගෙන්ද
පිලිස්තිවරුන්ගෙන්ද මම නුඹලා ගළවා-
නොගතිම්ද? ශීදෝන්වරුන් සහ 12
අමලෙක්වරුද මායොන්වරුද නුඹලාට
පීඩා කළෝය; නුඹලා මට මොරගැසූ-
කල ඔවුන්ගේ අතිනුත් නුඹලා
ගැළෙවුවෙමි. නුමුත් නුඹලා මා අත්හැර 13
අන් දෙවිවරුන්ට සේවය කළහුය.
එබැවින් මම තවත් නුඹලා නො-
ගළවන්නෙමි. නුඹලා විසින් තෝරාගත් 14
දෙවිවරුන් කරා ගොස් ඔවුන්ට
මොරගසාපල්ලා; ඔව්හු නුඹලාගේ
විපත්ති කාලයේදී නුඹලා ගළවත්වයි
කීසේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ **ස්වාමීන්-** 15
**වහන්සේට** කථාකොට: අපි පව්කෙළෙමුව.
ඔබවහන්සේට යහපත්ව පෙනෙන
දෙයක් අපට කළමැනව; එහෙත් මේ
වතාවේ අප ගැළවුවමැනවයි කීවෝය.
එවිට ඔව්හු තමුන් අතරෙන් අන් 16
දෙවිවරුන් පහකරදමා **ස්වාමීන්-
වහන්සේට** සේවයකළෝය. උන්-
වහන්සේගේ ආත්මය ඉශ්‍රායෙල්ගේ
කාලකණ්ණිකම ගැන ශෝකවූයේය.

17 එකල අම්මොන් පුත්‍රයෝ රැස්ව
ගිලියද්හි කඳවුරු බැන්දෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝද එකතුවී මිශ්පාහි කඳවුරු
18 බැන්දෝය. එවිට සෙනඟ එනම් ගිලියද්හි
අධිපතියෝ එකිනෙකාට කථාකොට:
අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව
සටන්කරන්ට පටන්ගන්න මනුෂ්‍යයා
කවරෙක්ද? ඔහු ගිලියද්හි සියලු වැසියන්
කෙරෙහි ප්‍රධානියා වන්නේයයි කීවෝය.

## යෙප්තා සහ අමෝනිවරු

11 ගිලියදීය යෙප්තා බලසම්පන්න
වික්‍රමාන්විත මනුෂ්‍යයෙක්ව
සිටියේය, ඔහු වේශ්‍යා ස්ත්‍රියෙකුගේ
පුත්‍රයෙක. ගිලියද් තෙමේ යෙප්තා ඉපද-
2 විය. ගිලියද්ගේ භාර්යාව ඔහු නිසා
පුත්‍රයන් වැදුවාය; ඔහුගේ භාර්යාවගේ
පුත්‍රයන් වැඩිවයසට පැමිණි කල ඔව්හු
යෙප්තාට කථාකොට: නුඹ අන්‍ය
ස්ත්‍රියෙකුගේ පුතෙක් බැවින් අපේ
පියාණන්ගේ ගෙදර උරුමක්කාරයෙක්
නොවන්නෙහිය කියා ඔහු එළවා
3 දැම්මෝය. එවිට යෙප්තා තමාගේ
සහෝදරයන් ඉදිරියෙන් පලාගොස්
ටෝබ් දේශයෙහි වාසය කෙළේය.
කමකට නැති මනුෂ්‍යයෝ යෙප්තාට
එකතුවී ඔහු කැටුව ගියෝය.
4 කලකට පසු අම්මොන් පුත්‍රයෝ
ඉශ්‍රායෙල්ට විරුද්ධව යුද්ධකළෝය.
5 අම්මොන් පුත්‍රයන් ඉශ්‍රායෙල්ට විරුද්ධව
යුද්ධකරන විට ගිලියද් වැඩිමහල්ලෝ
ටෝබ් දේශයෙන් යෙප්තා කැඳවාගන
6 එන්ට ගොස් ඔහුට කථාකොට: අප
අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව යුද්ධකරන
පිණිස අපේ අධිපතියා වෙන්ට වරෙන්නැයි
7 කීවෝය. යෙප්තා: නුඹලා මා කෙරේ
වෛර බැඳ මාගේ පියාගේ ගෙයින් මා
පන්නා දැමුවා නොවේද? දැන් නුඹලාගේ
විපතේදී මක්නිසා මා ළඟට ආවහුදැයි
8 ගිලියද් වැඩිමහල්ලන්ට කීවේය. එවිට
ගිලියද් වැඩිමහල්ලෝ: අප දැන් නැවත
නුඹ ළඟට ආවේ නුඹ අප සමග ගොස්
අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව යුද්ධකර
ගිලියද් වැසියන්වූ අප සියල්ලන්ට
ප්‍රධානියා වෙන පිණිසයයි යෙප්තාට
කීවෝය. යෙප්තා ගිලියද් වැඩිමහල්ලන්ට 9
කථාකොට: අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව
යුද්ධකරන පිණිස නුඹලා මා නැවත
කැඳවාගන ගියාම **ස්වාමීන්වහන්සේ**
ඔවුන් මට පාවාදුන්නොත් මම නුඹලාගේ
ප්‍රධානියා වන්නෙම්දැයි කීවේය. ගිලියද් 10
වැඩිමහල්ලෝ: **ස්වාමීන්වහන්සේ** අප
අතරේ සාක්ෂි වනසේක; සැබවින් නුඹේ
වචනය ලෙස අපි කරන්නෙමුයයි
යෙප්තාට කීවෝය. එවිට යෙප්තා ගිලියද් 11
වැඩිමහල්ලන් සමග ගියේය, සෙනඟ
වනාහි ඔහු තමුන්ගේ ප්‍රධානියාද
අධිපතියාද කරගත්තෝය. යෙප්තා
මිශ්පායේදී තමාගේ සියලු වචන
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි කීවේය.
එවිට යෙප්තා අම්මොන් පුත්‍රයන්ගේ 12
රජ වෙත පණිවිඩකාරයන් යවා: නුඹ
මාගේ දේශයට විරුද්ධව යුද්ධකරන
පිණිස මා ළඟට ආවේ මා සහ
නුඹ අතරේ තිබෙන මොන කාරණයක්
නිසාදැයි අසා ඇරියේය. අම්මොන් 13
පුත්‍රයන්ගේ රජ යෙප්තාගේ පණිවිඩ-
කාරයන්ට උත්තරදෙමින්: ඉශ්‍රායෙල්
මිසරයෙන් ආ කල අර්ණොන් පටන්
යබ්බොක් හා යොර්දන දක්වා මාගේ
දේශය පැහැරගත් නිසාය. එහෙයින් දැන්
ඒ රටවල් සමාදනයෙන් ආපසු දෙන්නැයි
කීවේය. යෙප්තා අම්මොන් පුත්‍රයන්ගේ 14
රජ වෙතට නැවත පණිවිඩකාරයන් යවා:
යෙප්තා මෙසේ කියන්නේය—ඉශ්‍රායෙල් 15
මෝවබ් දේශයවත් අම්මොන් පුත්‍රයන්ගේ
දේශයවත් පැහැරගත්තේ නැත. නුමුත් 16
ඉශ්‍රායෙල්වරුන් මිසරයෙන් ආ කල
ඔව්හු රතු මුහුද දක්වා කාන්තාරයෙහි
ගමන්කර කාදෙෂ්ට පැමුණුණෝය; එවිට 17
ඉශ්‍රායෙල්වරු ඒදෙම් රජු වෙත
පණිවිඩකාරයන් යවා: ඔබගේ දේශය
මැදින් යන්ට අවසර ලැබේවයි කියා
ඇරියෝය. නුමුත් ඒදෙම් රජ ඇහුම්කන්
නුදුන්නේය. මෝවබ් රජු වෙතටත් එසේම

පණිවිඩකාරයන් ඇරියෝය. ඔහුද කැමති-
වූණේ නැත. ඉශ්‍රායෙල්වරුද කාදෙෂ්හි
18 නැවතී සිටියෝය. පසුව ඔව්හු
කාන්තාරය මැදින් ගමන්කොට ඒදෝම්
දේශයත් මෝවබ් දේශයත් වටකරින්
ගොස්, මෝවබ් දේශයට නැගෙනහිරින්
අවුත්, මෝවබ් සීමාව ඇතුළට නොපැමිණ,
අර්නෝන් ඔයෙන් එගොඩ කූඩාරම්
පිහිටුවාගත්තෝය, මක්නිසාද අර්නෝන්
19 ඔය වනාහි මෝවබ් සීමාවය. එවිට
ඉශ්‍රායෙල්වරු හෙෂ්බොන්හි රජ වන
අමෝරිවරුන්ගේ රජවූ සීහොන් වෙතට
පණිවිඩකාරයන් යවා: ඔබගේ දේශය
මැදින් අපේ ස්ථානයට යන්ට අපට
20 අවසර ලැබේවයි කියා ඇරියෝය. නුමුත්
සීහොන් තමාගේ දේශය මැදින් යාම
ගැන ඉශ්‍රායෙල්වරුන් විශ්වාස නොකර,
තමාගේ මුළු සෙනඟ රැස්කොට, යහශ්හි
කඳවුරු බැඳ, ඉශ්‍රායෙල්ට විරුද්ධව
21 යුද්ධකෙළේය. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** සීහොන් සහ ඔහුගේ
මුළු සෙනඟ ඉශ්‍රායෙල් අතට පාවා දුන්-
සේක. ඔව්හු ඔවුන්ට පහර දුන්නෝය.
මෙසේ ඉශ්‍රායෙල්වරු ඒ දේශවාසීවූ
අමෝරිවරුන්ගේ මුළු රට හිමිකර-
22 ගත්තෝය. ඔව්හු අර්නෝන් පටන්
යබ්බොක් දක්වාද කාන්තාරයේ පටන්
යොර්දන් දක්වාද අමෝරිවරුන්ගේ
23 මුළු දේශය හිමිකරගත්තෝය. මෙසේ
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ සෙනඟවූ ඉශ්‍රායෙල් ඉදිරියෙන්
අමෝරිවරුන් පන්නාදමා තිබෙද්දී නුඹ
ඔවුන්ගේ රට හිමිකරගන්ට යනවාද?
24 නුඹේ දෙවිවූ කෙමොෂ් නුඹට හිමි-
කරගැනීමට දෙන දේ නුඹ හිමි-
කරගන්නවා නොවේද? එලෙසම අපේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අප ඉදිරියෙන්
පන්නාදැමූ සියල්ලන්ගේ රට අපිත් හිමි-
25 කරගනිමුව. ඉතින් ශිප්පෝර්ගේ පුත්‍රවූ
මෝවබ්හි රජවූ බාලාක්ට වඩා නුඹ
කොයි ආකාරයකින්වත් උතුම්ද? ඔහු
ඉශ්‍රායෙල් සමග කවදවත් විවාද කෙළේද?
නොහොත් ඔවුන්ට විරුද්ධව කවදවත්
26 යුද්ධකෙළේද? ඉශ්‍රායෙල් වනාහි හෙෂ්බොන්
හා ඊට අයිති නුවරවලද අරොයෙර්
හා ඊට අයිති නුවරවලද අර්නෝන්
අසබඩ තිබෙන සියලු නුවරවලද අවුරුදු
තුන්සියයක් වාසයකරද්දී නුඹලා ඒ
කාලය අතරතුරේ ඒවා ගළවා නොගත්තේ
මක්නිසාද? එබැවින් මම නුඹලාට 27
විරුද්ධව වරදක් නොකෙළෙමි. නුමුත්
මට විරුද්ධව යුද්ධකිරීමෙන් නුඹ මට
අයුත්තක් කරන්නෙහිය. විනිශ්චයකාරවූ
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන් හා
අම්මොන් පුත්‍රයන් අතරේ අද විනිශ්චය-
කරනසේක්වයි කීවේය. එසේ වුවත් 28
අම්මොන් පුත්‍රයන්ගේ රජ යෙප්තා
තමාට කියා එවූ වචනවලට ඇහුම්කන්
නුදුන්නේය.

## යෙප්තාගේ බාරය

එවිට **ස්වාමීන්වහන්සේගේ** ආත්මය 29
යෙප්තා කෙරෙහි පැමුණුණේය. ඔහු
ගිලියද් සහ මනස්සේ මැදින් ගොස්
ගිලියද්හි මිශ්පේට පැමිණ, ගිලියද්හි
මිශ්පේ සිට අම්මොන් පුත්‍රයන් වෙතට
ගියේය. යෙප්තා **ස්වාමීන්වහන්සේට** 30
*බාරයක් වෙමින්: ඔබවහන්සේ සැබවින්
අම්මොන් පුත්‍රයන් මා අතට පාවා දෙන-
සේක් නම්, මා සමාදනයෙන් අම්මොන් 31
පුත්‍රයන් වෙතින් හැරී එන කල මා
සම්මුඛවෙන්ට මාගේ ගෙයි දෙරකඩින්
පිටත්ව එන †කුමක් වුවත් ඒ **ස්වාමීන්-
වහන්සේට** අයිති වන්නේය, මම එය
දවන පූජාවක් කොට ඔප්පුකරන්නෙමියි
කීවේය. මෙසේ යෙප්තා අම්මොන් 32
පුත්‍රයන්ට විරුද්ධව යුද්ධකරන්ට ඔවුන්
වෙතට ගියේය; **ස්වාමීන්වහන්සේද** ඔහු
අතට ඔවුන් පාවාදුන්සේක. ඔහු 33
අරොයෙර් පටන් මින්නිත්ට පැමිණෙන
තැන දක්වාද ආබෙල්-කෙරාමීම් දක්වාද
ඔවුන්ට, එනම් නුවරවල් විස්සකට පහරදී.
ඉතා මහත් මැරීමක් කෙළේය. මෙසේ
අම්මොන් පුත්‍රයෝ ඉශ්‍රායෙල් පුත්‍රයන්
ඉදිරියෙහි යටත්කරනු ලැබූහ.

---

*ලෙවී කථාවේ 27 වෙනි පරිච්ඡේදය බලනු.

†නොහොත්, කවරෙක් වුවත්,

34 යෙප්තා මිශ්පාහි තමාගේ ගෙදරට
එන කොට ඔහුගේ දුව රබන්ද නැටුම්ද
ඇතුව ඔහුගේ පෙරමගට ආවාය. ඈ
වනාහි ඔහුගේ එකම දරුවාය. ඈ හැර
ඔහුට පුතෙක්වත් දුවෙක්වත් නොවීය.
35 ඔහු ඈ දුටු විට තමාගේ වස්ත්‍ර ඉරාගෙන:
අහෝ මාගේ දියණියෙනි, තුඹ මා ඉතා
කණගාටු කෙළෙහිය, තුඹ මා කළඹන
තැනැත්තියක්ය. මක්නිසාද මම **ස්වාමීන්-
වහන්සේට** මාගේ මුඛය හැර පොරොන්දුවක්
කෙළෙමි, එය වෙනස්කළ නොහැක්කෙමියි
36 කීය. ඈද: මාගේ පියාණෙනි, තුඹේ
මුඛය හැර තුඹ **ස්වාමීන්වහන්සේට**
පොරොන්දුවුණෙහිය; **ස්වාමීන්වහන්සේ**
තුඹේ සතුරන්වූ අම්මොන් පුත්‍රයන්ගෙන්
තුඹ උදෙසා පළිගත් බැවින් තුඹේ
මුඛයෙන් නික්මුණු හැටියටම මට
37 කරන්නැයි ඔහුට කීවාය. තවද ඈ
තමාගේ පියාට කථාකොට: මෙසේ
මට අවසර ලැබේවා—මාද මාගේ
යෙහෙළීන්ද ගොස් කඳුවල ඇවිද මාගේ
කන්‍යාකම ගැන වැලපෙන්ට දෙමසක්
38 මට කල් දුන මැනවියි කීවාය. ඔහුද:
පලයන්නැයි කියා ඈ දෙමසකට
ඇරියේය. ඈ ඇගේ යෙහෙළීන් සමග
ගොස් ඇගේ කන්‍යාකම ගැන කඳුවල
39 වැලපුණාය. දෙමස තීන්දුවූ කල ඈ
ඇගේ පියා වෙතට හැරී ආවාය, එවිට
ඔහු තමා වුණාවූ බාරය ඈ කෙරෙහි
ඉෂ්ටකෙළේය. ඈ කිසි පුරුෂයෙකු ඇඳින
40 නොගත්තාය. ගිලියද්හි යෙප්තාගේ දුව
සිහිකිරීම පිණිස අවුරුද්දකට සතර
දවසක් බැගින් ඉශ්‍රායෙල් දූවරුන් අවුරුදු
පතා යන සිරිතක් ඉශ්‍රායෙල්වරුන් අතරේ
ඇතිවිය.

## එප්‍රායිම්වරුන් සමග සටන්කිරීම

**12** එප්‍රායිම් මනුෂ්‍යයෝ රැස්වී උතුරු
දිශාවට ගොස් යෙප්තාට කථා-
කොට: තුඹ සමග යන්ට අපට අඬනොගසා
තුඹ අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව
යුද්ධකරන්ට එගොඩට ගියේ මක්නිසාද?
අපි තුඹේ ගෙය තුඹත් ඇතුළුව ගින්නෙන්
පුළුස්සාදමමුයයි කීවෝය. යෙප්තා 2
ඔවුන්ට කථාකොට: මමත් මාගේ
සෙනඟත් අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව
මහත් පොරයක යෙදී සිටියෙමුව; මා
තුඹලාට අඬගැසූ නුමුත් ඔවුන්ගේ අතින්
තුඹලා මා ගැළෙවුවේ නැත. තුඹලා 3
මා ගැළෙවුවේ නැති බව මම දුටු විට
මාගේ ජීවිතය නොසලකා අම්මොන්
පුත්‍රයන්ට විරුද්ධව එගොඩට ගියෙමි,
**ස්වාමීන්වහන්සේද** ඔවුන් මා අතට
පාවාදුන්සේක. ඉතින් තුඹලා මට
විරුද්ධව සටන්කරන්ට අද දවසේ මා
ළඟට ආවේ මක්නිසාදැයි ඔවුන්ට
කීවේය. එවිට යෙප්තා ගිලියද්හි සියලු 4
මනුෂ්‍යයන් රැස්කරවාගෙන එප්‍රායිම්ට
විරුද්ධව යුද්ධකෙළේය. තුඹලා එප්‍රායිම්-
වරුන්ගෙන් පලාගිය අයවල්ය, ගිලියද්වරු
එප්‍රායිම්වරුන්ද මනස්සේවරුන්ද අතරේ
සිටියෝයයි එප්‍රායිම්වරුන් කී බැවින්
ගිලියද් මනුෂ්‍යයෝ ඔවුන්ට පහර-
දුන්නෝය. ගිලියද්වරු එප්‍රායිම්ට යන 5
යොර්දන් තොටුපල් අල්ලාගත්තෝය.
තවද පලාගිය එප්‍රායිම්වරුන්ගෙන්
යමෙක් ඇවිත්: මට එගොඩවෙන්ට
ඇරපල්ලායයි කී කල ගිලියද්
මනුෂ්‍යයෝ: තුඹ එප්‍රායිමියයෙක්දැයි
ඔහුගෙන් අසති; ඔහු: නැතැයි කීවොත්, 6
ෂිබ්බොලෙත්ය කියාපන්නැයි ඔව්හු ඔහුට
කියති; ඔහුට ඒක හරියට ශබ්දකරන්ට
නොහැකිව, සිබ්බොලෙත්ය කීවොත්
ඔව්හු ඔහු අල්ලා යොර්දන් තොටුපල්
ළඟදී මරති. ඒ ප්‍රස්තාවේදී එප්‍රායිම්-
වරුන්ගෙන් සතළිස් දෙදහක් මැරුම්-
කෑවෝය.
යෙප්තා සාවුරුද්දක් ඉශ්‍රායෙල් විනිශ්වය 7
කෙළේය. ගිලියදීය යෙප්තා නැසී ගිලියද්හි
නුවරක තැන්පත්කරන ලද්දේය.

## ඉබ්ශාන්, ඒලොන්, අබ්දොන්

ඔහුට පසුව බෙත්-ලෙහෙම්හි ඉබ්ශාන් 8
ඉශ්‍රායෙල් විනිශ්වයකෙළේය. ඔහුට 9
පුත්‍රයෝ තිස්දෙනෙක් සිටියෝය, තවද

ඔහු දූවරුන් තිස්දෙනෙක් පිටට හැර
පිටතින් තමාගේ පුත්‍රයන්ට දූවරුන්
තිස්දෙනෙක් ගෙනායේය. ඔහු සත්
අවුරුද්දක් ඉශ්‍රායෙල් විනිශ්චයකෙළේය.
10 ඉබ්ශාන් මැරී බෙත්-ලෙහෙමෙහි තැන්පත්-
කරන ලද්දේය.
11 ඔහුට පසුව සාබුලොනිය ඒලොන්
ඉශ්‍රායෙල් විනිශ්චයකෙළේය; ඔහු දස
අවුරුද්දක් ඉශ්‍රායෙල් විනිශ්චයකෙළේය.
12 සාබුලොනිය ඒලොන්ද මැරී සාබුලොන්
රටේ තිබෙන අයාලොන්හි තැන්පත්කරන
ලද්දේය.
13 ඔහුට පසුව පිරාතෝනිය හිල්ලෙල්ගේ
පුත්‍රවූ අබ්දෙන් ඉශ්‍රායෙල් විනිශ්චය-
14 කෙළේය. පුත්‍රයෝ සතළිස් දෙනෙක්ද
මුණුබුරෝ තිස්දෙනෙක්ද ඔහුට සිටියෝය,
ඔව්හු කොටළුවන් සැත්තෑදෙනෙක් පිට
නැගී ගියාහුය. ඔහු අට අවුරුද්දක්
15 ඉශ්‍රායෙල් විනිශ්චය කෙළේය. පිරාතෝනිය
හිල්ලෙල්ගේ පුත්‍රවූ අබ්දෙන්ද මැරී
එප්‍රායිම් රටේ අමලෙක්වරුන්ගේ කඳුකරයේ
පිරාතෝන්හි තැන්පත්කරන ලද්දේය.

## සම්සොන්ගේ මවුපියන් හා උප්පැන්නය

**13** ඉශ්‍රායෙල් පුත්‍රයෝ නැවතත්
ස්වාමීන්වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කළෝය;
ස්වාමීන්වහන්සේද ඔවුන් පිලිස්ති-
වරුන්ගේ අතට සතළිස් අවුරුද්දකට
පාවාදුන්සේක.
2 දන්ගේ වංශයට අයිතිවූ ශොරාහි
එක්තරා මනුෂ්‍යයෙක් විය, ඔහුගේ නම
මානෝවාය; ඔහුගේ භාර්යාව වඳව
3 දරුවන් නොලැබ සිටියාය. ස්වාමීන්-
වහන්සේගේ දූතයා ඒ ස්ත්‍රීට පෙනී: බලව,
නුඹ වඳව දරුවන් නොලැබ සිටිනෙහිය.
නුමුත් නුඹ ගර්භිණීව පුත්‍රයෙකු
4 වදන්නෙහිය. ඒ නිසා දැන් ඉතින් නුඹ
මුද්‍රික පානයවත් සැර බීමවත් නොබී
අපවිත්‍ර දෙයක් නොකා සිටින හැටියට
බලාගනිත්ත. මක්නිසාද නුඹ ගර්භිණීව 5
පුත්‍රයෙකු වදන්නෙහිය; ඔහුගේ හිසට
කිසි දැළිපිහියක් නොපැමිණිය යුතුය.
මක්නිසාද දරුවා ගර්භයේ පටන්
දෙවියන්වහන්සේට *නාශරීයයෙකු විය
යුතුය. ඔහු පිලිස්තිවරුන්ගේ අතින්
ඉශ්‍රායෙල් ගළවන්ට පටන්ගන්නවා
ඇතැයි ඇට කීවේය. එවිට ඒ ස්ත්‍රී 6
අවුත් ඇගේ පුරුෂයාට කථාකොට:
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් මා
ළඟට ආයේය, ඔහුගේ පෙනීම දේව
දූතයෙකුගේ පෙනීම හා සමානව ඉතා
භයානකව තිබුණේය; ඔහු කොතැනින්
ආවාද කියා මම නොඇසීමි, ඔහු
තමාගේ නම මට දන්නුවේත් නැත. නුමුත් 7
ඔහු මට කථාකොට: බලව, නුඹ
ගර්භිණීව පුත්‍රයෙකු වදන්නෙහිය; ඒ නිසා
දැන් ඉතින් නුඹ මුද්‍රිකපානයවත් සැර
බීමවත් නොබී අපවිත්‍ර කිසිදෙයක්
නොකා සිටපන්න. මක්නිසාද ඒ දරුවා
ගර්භයේ පටන් මැරෙන දවස දක්වා
දෙවියන්වහන්සේට නාශරීයයෙකු
විය යුතුය කියා කීයේයයි කීවාය.
එවිට මානෝවා ස්වාමීන්වහන්සේට 8
කන්නලව්කරමින්: අහෝ ස්වාමීන්-
වහන්ස, ඔබ විසින් එවනලද දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයා නැවත අප ළඟට
ඇවිත්, උපදින්නාවූ දරුවාට අප විසින්
කළයුතු දේ අපට උගන්වාවයි කීවේය.
දෙවියන්වහන්සේ මානෝවාගේ හඬට 9
ඇහුම්කන්දුන්සේක; දේව දූතයා ඒ
ස්ත්‍රිය කෙතේ ඉන්දද්දී නැවත ඈ ළඟට
ආයේය. නුමුත් ඇගේ පුරුෂයාවූ
මානෝවා ඈළඟ නොසිටියේය. ස්ත්‍රීද 10
ඉක්මනින් දුව ගොස්: මෙන්න එද මා
ළඟට ආ මනුෂ්‍යයා මට දැන් පෙනුණේය
කියා ඇගේ පුරුෂයාට දන්නුවාය.
මානෝවා නැගිට තමාගේ භාර්යාව 11
කැටුව ගොස් ඒ මනුෂ්‍යයා ළඟට
පැමිණ: මේ ස්ත්‍රීට කථාකළ මනුෂ්‍යයා
ඔබදැයි ඔහුගෙන් ඇසීය. ඔහුද: මම-
යයි කීවේය. එවිට මානෝවා: ඔබගේ 12

*හෙවත්, කැපවූ කෙනෙක්

වචන ලෙස සිදුවේවා. දරුවා කෙබඳු
කෙනෙක් වන්නේද? ඔහුට ක්‍රියාකළ යුතු
13 කෙසේදැයි කියා ඇසුවේය. **ස්වාමීන්-**
**වහන්සේගේ** දූතයා මානෝවාට
කථාකොට: මා විසින් ස්ත්‍රියට කී
14 සියල්ල ඈ බලාගනීවා. මුද්‍රිකවැලෙන්
උපදින කිසිවක් ඈ නොකා, මුද්‍රික-
පානයවත් සුර බීමවත් නොබී, අපවිත්‍ර
කිසි දෙයක් නොකා සිටීවා; මා විසින්
ඈට අණ කළ සියල්ල ඈ පවත්වාවයි
15 කීය. මානෝවා **ස්වාමීන්වහන්සේගේ**
දූතයාට කථාකොට: අප විසින් ඔබට
එළුපැටවෙකු පිළියෙළකරන තුරු ඔබ
ප්‍රමාදකරගන්ට අපට අවසර ලැබේවයි
16 කීවේය. **ස්වාමීන්වහන්සේගේ** දූතයා: නුඹ
මා ප්‍රමාදකරගන්න නුමුත් නුඹේ කෑමෙන්
නොකන්නෙමි, නුඹ දවන පූජාවක්
පිළියෙළකරන්ට කැමති නම් එය නුඹ
විසින් **ස්වාමීන්වහන්සේට** ඔප්පුකළ යුතු-
යයි මානෝවාට කීවේය. මක්නිසාද
ඔහු **ස්වාමීන්වහන්සේගේ** දූතයා
බව මානෝවා නොදැන සිටියේය.
17 මානෝවාද: ඔබගේ වචන ලෙස සිද්ධවූ
කල අප විසින් ඔබට ගෞරව කරන
පිණිස ඔබගේ නාමය කිමෙක්දැයි
**ස්වාමීන්වහන්සේගේ** දූතයාගෙන්
18 ඇසුවේය. **ස්වාමීන්වහන්සේගේ** දූතයාද:
නුඹ මාගේ නාමය ගැන විචාරන්නේ
මක්නිසාද? ඒක *පුදුමයයි කීවේය.
19 එවිට මානෝවා එළුපැටවාත් ආහාර
පූජාවත් ගෙනැවිත් **ස්වාමීන්වහන්සේට**
පර්වතය පිට පූජා කෙළේය. එවිට
දේවදූතයා පුදුම ලෙස කෙළේය,
මානෝවා සහ ඔහුගේ භාර්යාව
20 බලාගන සිටියෝය. මක්නිසාද ගිනිදැල
පූජාසනයෙන් අහස දෙසට නැගී ගියේය,
**ස්වාමීන්වහන්සේගේ** දූතයා පූජාසනයේ
ගිනි දැලෙහි නැගී ගියේය. මානෝවාද
ඔහුගේ භාර්යාවද බලාගන සිටියෝය.
ඔව්හු මුහුණින් බිම වැටුණෝය.
21 **ස්වාමීන්වහන්සේගේ** දූතයා තවත්
මානෝවාටවත් ඔහුගේ භාර්යාවටවත්
නොපෙනුණේය. එවිට මානෝවා ඔහු

*නොහොත්, රහසයයි.

**ස්වාමීන්වහන්සේගේ** දූතයා බව දැන-
ගත්තේය. මානෝවා: අප දෙවියන්- 22
වහන්සේ දුටු නිසා ඒකාන්තයෙන්
නසිනවා ඇතැයි තමාගේ භාර්යාවට
කීවේය. නුමුත් ඔහුගේ භාර්යාව: 23
**ස්වාමීන්වහන්සේ** අප නසන්ට කැමති-
සේක්නම් උන්වහන්සේ අප අතින්
දවන පූජාවක් හා ආහාර පූජාවක්
පිළිගන්නේවත් උන්වහන්සේ මේ සියල්ල
අපට පෙන්වන්නේවත් මේ කාලයේදී
අපට මෙබඳු දේවල් දන්වන්නේවත්
නැතැයි ඔහුට කීවාය. ඒ ස්ත්‍රී තොමෝ 24
පුත්‍රයෙකු වදා ඔහුට සම්සොන් යන
නම තැබුවාය. දරුවා වැඩුණේය,
**ස්වාමීන්වහන්සේ** ඔහුට ආශීර්වාදකළ-
සේක. **ස්වාමීන්වහන්සේගේ** ආත්මයද 25
ශොරාටත් ඒෂ්තායොල්ටත් අතරෙහි වූ
මහනේ-දන්හිදී ඔහු ක්‍රියාවෙහි
පොළඹවන්ට පටන්ගත්තේය.

## සම්සොන් පිලිස්තිය ස්ත්‍රියෙකුට ආසාවීම

14 සම්සොන් තිම්නාහි තිම්නාට
ගොස් පිලිස්තිවරුන්ගේ දූවරුන්-
ගෙන් එක් ස්ත්‍රියක් තිම්නාහිදී දිටීය.
ඔහු අවුත් තමාගේ පියාටත් මවුටත් 2
කථාකොට: පිලිස්තිවරුන්ගේ දූවරුන්-
ගෙන් එක් ස්ත්‍රියක් තිම්නාහිදී දුටිමි.
ඈ මට භාර්යාකොට ලබාදියල්ලායයි
කීවේය. එවිට ඔහුගේ මව්පියෝ 3
කථාකොට: නුඹ අචර්මඡේදිත පිලිස්ති-
වරුන්ගෙන් භාර්යාවකු ගන්ට යන්නේ
නුඹේ සහෝදරයන්ගේ දූවරුන්
අතරේවත් මාගේ මුළු සෙනඟ අතරේවත්
ස්ත්‍රියක් නැති නිසාදැයි ඔහුට කීවෝය.
නුමුත් සම්සොන්: ඒ තැනැත්තිය මට
ලබාදියල්ලා, මක්නිසාද මම ඈට
කැමතියයි තමාගේ පියාට කීවේය.
ඒ කාරණය **ස්වාමීන්වහන්සේගෙන්** 4
පැමුණුණු බව ඔහුගේ මව්පියෝ නොදැන
සිටියෝය; මක්නිසාද ඔහු පිලිස්ති-
වරුන්ට විරුද්ධව ප්‍රස්තාවක් සෙවුවේය.
ඒ කාලයේදී පිලිස්තිවරු ඉශ්‍රායෙල්
කෙරෙහි ආණ්ඩුකළෝය.

5 පසුව සම්සොන්ද ඔහුගේ මව්පියෝද
තිම්නාට යන්ට ගියෝය. තිම්නාහි
මිදිවතුවලට පැමිණි කල බලව, තරුණ
6 සිංහයෙක් ඔහුට ගෙරෙවුවේය. එවිට
ස්වාමීන්වහන්සේගේ ආත්මය බලවත්
ලෙස ඔහු කෙරෙහි පැමිණියේය, ඔහු
තමාගේ අතේ කිසිවක් නැතුව එළු-
පැටවෙකු ඉරාදමන්නාක්මෙන් ඌ
ඉරාදැමීය. නුමුත් ඔහු කළ දේ තමාගේ
7 පියාටවත් මවුටවත් දැන්නුවේ නැත. ඔහු
ගොස් ඒ ස්ත්‍රිය හා සමග කථාකෙළේය;
ඈ ඔහුට බොහෝ ප්‍රසන්න වූවාය.

## සම්සොන්ගේ ප්‍රහේලිකාව සහ එහි ඵල

8 ස්වල්ප දවසකට පසු ඔහු ඈ
පාවාගන්ට නැවත යද්දී සිංහයාගේ
මළකුණ බලන්ට අහකට හැරී ගියේය.
බලව, සිංහයාගේ ශරීරයෙහි මීමැසි
9 රැළක්ද මීපැණිද තිබුණේය. ඔහු එය
ගෙන අතේ තබාගෙන කකා ගොස්
තමාගේ මව්පියන් ළඟට අවුත් ඔවුන්ටත්
දුන්නේය, ඔව්හුද කෑවෝය. නුමුත් ඒ
මීපැණි සිංහයාගේ ශරීරයෙන් ගත් බව
10 ඔහු ඔවුන්ට දැන්නුවේ නැත. ඔහුගේ
පියා ඒ ස්ත්‍රිය සිටි තැනට ආවේය.
සම්සොන් එහිදී මංගල්‍යයක් පිළියෙළ
කෙළේය; මක්නිසාද යෞවනයන් විසින්
11 එසේ කිරීම සිරිතක් විය. තවද ඔව්හු
ඔහු දුටු විට ඔහු සමග සිටින පිණිස
යහළුවන් තිස්දෙනෙකු ගෙනාවෝය.
12 සම්සොන් වනාහි: මම දැන් නුඹලාට
තේරවිල්ලක් කියමි. මංගල්‍ය දවස් සත
ඇතුළතදී ඒක විසඳ මට කීවොත් මම
නුඹලාට සිහින් සළු තිහක්ද ඇඳුම්
13 කුට්ටම් තිහක්ද දෙන්නෙමි. ඒක මට
විසඳ කියන්ට නුඹලාට බැරි වුණොත්
නුඹලා සිහින් සළු තිහක්ද ඇඳුම් කුට්ටම්
තිහක්ද මට දෙන්ට ඕනෑයයි කීවේය.
ඔව්හු අපට අසන්ට නුඹේ තේරවිල්ල
14 කියාපන්නෑයි ඔහුට කීවෝය. ඔහුද:

බුදින්නා කෙරෙන් භෝජන
නික්මුණේය.
බලවතා කෙරෙන් මිහිර
නික්මුණේයයි

ඔවුන්ට කීවේය. ඒ තේරවිල්ල තුන්
දවසකින් විසඳ කියන්ට ඔවුන්ට
නුපුළුවන් විය. තවද *සත් වෙනි දවසේදී 15
ඔව්හු සම්සොන්ගේ භාර්යාවට කථා-
කොට: තේරවිල්ල අපට කියාදෙන්ට
නුඹේ පුරුෂයා පොළඹවාපන්න, නැත්නම්
අපි නුඹත් නුඹේ පියාගේ ගෙයත්
ගින්නෙන් දවන්නෙමුව. නුඹලා අප
කැඳෙවුවේ අප දිළිඳුකරන්ට නොවේදැයි
කීවෝය. සම්සොන්ගේ භාර්යාව ඔහු 16
ඉදිරියේ අඬා: නුඹ මට වෛරවෙනවාම
මිස ආදරේ නැත. මාගේ සෙනඟගේ
පුත්‍රයන්ට නුඹ තේරවිල්ලක් කී නුමුත්
මට ඒක තෝරාදුන්නේ නැතැයි කීවාය.
ඔහුද: බලව, මම මාගේ පියාටවත්
මවුටවත් ඒක නොකීයෙමි, නුඹට
කෙලෙස කියම්දැයි ඈට කීවේය.
ඔවුන්ගේ මංගල්‍යය පැවතුණ සත් දවස 17
තිස්සේම ඈ ඔහු ඉදිරියෙහි ඇඬුවාය.
ඈ ඔහුට කරච්චල්කළ බැවින් ඔහු සත්-
වෙනි දවසේදී ඒක ඈට කීය. ඈද ඈගේ
සෙනඟගේ පුත්‍රයන්ට තේරුම කීවාය.
සත්වෙනි දවසේදී ඉරබසින්ට පළමුවෙන් 18
නුවර මනුෂ්‍යයෝ ඔහුට කථාකොට:
මීපැණිවලට වඩා මිහිරි කුමක්ද?
සිංහයෙකුට වඩා බලවතා මොකෙක්දැයි
ඔහුට කීවෝය. ඔහුද:

නුඹලා මාගේ නැම්බීගෙන්
නොසෑහුනම්
මාගේ තේරවිල්ල දැනගන්ට
නොයෙදේයයි

ඔවුන්ට කීවේය. එවිට ස්වාමීන්වහන්සේගේ 19
ආත්මය බලවත් ලෙස ඔහු කෙරෙහි
පැමිණියේය, ඔහු අෂ්කෙලොන්ට ගොස්
එහි මිනිසුන් තිස්දෙනෙකු මරා
ඔවුන්ගෙන් කොල්ලකාගෙන තේරවිල්ල
තෝරා දුන් අයට ඇඳුම් කුට්ටම්
දුන්නේය. ඔහුගේ කෝපය ඇවිළී ඔහු

*සමහර පිටපත්හි: සතරවෙනි.

තමාගේ පියාගේ ගෙදරට ගියේය.
20 සම්සොන්ගේ භාර්යාවද ඔහු යහළුවා
කොට ගත් ඔහුගේ සමාගම්කාරයාට
දෙන ලද්දීය.

## හිවලුන් සහ පන්දම්

**15** ස්වල්ප දවසකට පසු තිරිඟු කපන
කාලයේදී සම්සොන් එළු පැටවකු
රැගෙන තමාගේ භාර්යාව බලන්ට
ගොස්: මාගේ භාර්යාව වෙතට ඇතුල්
ගෙට යම්යි කීය. එහෙත් ඇගේ පියා
2 ඔහුට යන්ට නොදී: සැබවින් තුඹ ඈට
මුළුමනින්ම වෛරවුණායයි සිතා මම
ඈ තුඹේ යහළුවාට දුනිමි. ඇගේ බාල
සහෝදරී ඈට වඩා ලක්ෂණ නොවේද?
ඈ වෙනුවට මෑ පාවාගනින්නැයි ඔහුට
3 කීවේය. සම්සොන්ද: මා පිලිස්තිවරුන්ට
අනදරයක් කරන විට මේ වතාවේ ඔවුන්
අරබයා මම නිදෙස්යයි ඔවුන්ට කීවේය.
4 සම්සොන් ගොස් හිවලුන් තුන්සියයක්
අල්ලාගන හුළුඅතු අරන් උන්ගේ වල්ගා
දෙකක් බැගින් එකට බැඳ, ඒ වල්ගා
දෙක මැද හුලු අත්තක් බැගින් තබා,
5 එහි ගිනි අවුළා, පිලිස්තිවරුන්ගේ ගොයම්
අතරට යන්ට හැරියේය, කැපූ ගොයම්
මිටිද නොකැපූ ගොයම්ද ඔලීව වතුද
6 එයින් දලා ගියේය. එවිට පිලිස්ති-
වරු: මේක කළේ කවුදැයි ඇසුවෝය.
තිම්නීයයාගේ බෑනාවූ සම්සොන්ය, ඔහු
සම්සොන්ගේ භාර්යාව අරගෙන ඔහුගේ
යහළුවාට දුන් නිසා මෙසේ කෙළේයයි
මිනිස්සු කීවෝය. පිලිස්තිවරු අවුත් ඈත්
ඇගේ පියාත් ගින්නෙන් දවා දැමුවෝය.
7 සම්සොන් ඔවුන්ට කථාකොට: ඉදින්
තුඹලා මෙයාකාර කරනවානම් සැබවින්
තුඹලාගෙන් පළිගන්නෙමි, ඉන්පසු
8 නවතින්නෙමියි ඔවුන්ට කීය. ඔහු ඔවුන්ට
ගිය ගිය අතේ පහරදී මහත් මැරීමක්
කෙළේය. පසුව ඔහු ගොස් ඒතාම්
පර්වතයේ විවරයෙහි නැවතී සිටියේය.

## පිලිස්තිවරුන් මරාදැමීම

එකල පිලිස්තිවරු පිටත්ව ගොස් යූදාහි 9
කඳවුරු බැඳ ලෙහියේ පැතිර සිටියෝය.
යූදා මනුෂ්‍යයෝ: කුමක් හෙයින් තුඹලා 10
අපට විරුද්ධව ආවහුදැයි ඇසුවෝය.
ඔව්හුද: සම්සොන් බැඳ ඔහු අපට කළ
හැටියට ඔහුට කරන පිණිස ආවෙමු-
යයි කීවෝය. එවිට යූදා මනුෂ්‍යයන්ගෙන් 11
තුන් දහසක් ඒතාම් පර්වත විවරය ළඟට
බැස සම්සොන්ට කථාකොට: පිලිස්ති-
වරුන් අප කෙරෙහි ආණ්ඩුකරන බව
තුඹ දන්නේ නැද්ද? එහෙනම් තුඹ මේ
අපට කරලා තිබෙන්නේ මොකදැයි
කීවෝය. ඔවුන් මට කළ ලෙසම මමත්
ඔවුන්ට කෙළෙමියි ඔහු කීය. ඔව්හුද: 12
තුඹ බැඳ පිලිස්තිවරුන් අතට පාවාදෙන
පිණිස අපි ආවෙමුයයි ඔහුට කීවෝය.
සම්සොන්ද: තුඹලාම මට පහර
නොදෙන හැටියට දිවුරුම් දියල්ලායයි
ඔවුන්ට කීවේය. ඔව්හුද: තුඹ බැඳ ඔවුන් 13
අතට පාවා දෙනවා මිස සැබවින් අපි
තුඹ නොමරන්නෙමුයයි ඔහුට කියා,
අලුත් ලනු දෙකකින් ඔහු බැඳ,
පර්වතයෙන් ගෙනාවෝය. ඔහු ලෙහියට 14
පැමිණි කල පිලිස්තිවරු ඔහු දැක ඔල්වර
හඬ නැගුවෝය. ස්වාමීන්වහන්සේගේ
ආත්මය බලවත් ලෙස ඔහු කෙරෙහි
පැමින්නේය, ඔහුගේ අත් බැඳ තිබුණු
ලනු ගින්නෙන් දලාගිය හණ මෙන් විය,
තවද ඔහුගේ අත්වලින් බැඳුම් ලිහී
වැටුණේය. ඔහු කොටළුවෙකුගේ අලුත් 15
හකු ඇටයක් දැක අත දිගුකොට ඒක
ගෙන එයින් මිනිසුන් දහසක් මැරීය.
එවිට සම්සොන්: 16

කොටළු හකු ඇටයකින් ගොඩවල්
පිට ගොඩවල් ගසා,
එසේය, කොටළු හකු ඇටයකින්
මනුෂ්‍යයන් දහසක් මැරුවෙමියි

කීවේය. ඔහු කථාකර තීන්දුවූ විට 17
තමාගේ අතෙන් හකු ඇටය වීසිකොට,
එතැනට *රාමත්-ලෙහිය යන නම

*එනම්, හකු ඇට හෙල.

18 තැබුවේය. එවිට ඔහු ඉතා පිපාසිතව
ස්වාමීන්වහන්සේට යාච්ඤාකොට: ඔබගේ
මෙහෙකරුවා ලවා ඔබම මේ මහත්
ගැළවීම දුන්සේක. දැන් මම පිපාසායෙන්
නැසී අචර්මඡේදිතයන්ගේ අතට
19 අසුවන්නෙම්දැයි කීවේය. දෙවියන්-
වහන්සේද ලෙහියෙහි තිබෙන කුහර
තැනක් විවරකළසේක, එයින් වතුර
නික්මුණේය; ඔහු බිවූ කල ශක්තිය ලැබ
ප්‍රාණවත් වුණේය. එබැවින් ඒ ස්ථානයට
*එන්-හක්කෝරේ යන නම තබනලදි,
එය අද දවස දක්වා ලෙහියේ තිබේ.
20 ඔහු පිලිස්තිවරුන්ගේ දවස්වල විසි
අවුරුද්දක් ඉශ්‍රායෙල්වරුන් විනිශ්චය-
කෙළේය.

## සම්සොන් ගාසාහි කළ දේ

16 සම්සොන් ගාසාට ගොස් එහි
වේශ්‍යා ස්ත්‍රියක් දැක ඈ වෙත
2 ගියේය. සම්සොන් මෙහි ඇවිත් ඉන්නේය
කියා ගාසා වැසියන්ට දන්වන ලද්දේය.
එවිට ඔව්හු ඔහු වටකොට ඔහු අල්ලන්ට
නුවර දොරටුව ළඟ රාත්‍රිය මුළුල්ලෙහි
රැක සිටියෝය. ඔව්හු කථාකොට:
පහන්වනතුරු සිටියාවේ, එවිට ඔහු
මරන්නෙමුව කියා රාත්‍රිය මුළුල්ලෙහි
3 නිශ්චලව සිටියෝය. සම්සොන් මධ්‍යම
රාත්‍රිය දක්වා නිදහිඳ, මධ්‍යම රාත්‍රියේ
නැගිට, නුවර දොරටුවේ දොරවලුත් උළුවහු
කණු දෙකත් අගුල් ආදියත් සමග උගුලා
කරපිට තබාගෙන, හෙබ්‍රොන් ඉදිරිපිට
තිබෙන කන්ද මුදුනට ගියේය.

## සම්සොන් සහ දෙලීලා

4 ඉන්පසු ඔහු සොරෙක් මිටියාවතෙහි
සිටියාවූ දෙලීලානම් ස්ත්‍රියෙකුට ආදරේ
5 විය. පිලිස්තිවරුන්ගේ අධිපතිවරු ඈ
ළඟට අවුත් ඈට කථාකොට: නුඹ ඔහු
පොළඹවාගන ඔහුගේ මහත් ශක්තිය
තිබෙන්නේ කොතැන්හිද කියාත් අප
විසින් ඔහුට පීඩාකිරීමට ඔහු බඳින
පිණිස ඔහු දමනයකරන්ට පුළුවන්
කොහොමද කියාත් දැන ගනින්න. එවිට
අපි එක් එක්කෙනා රිදී එකොළොස්
සියයක් බැගින් නුඹට දෙන්නෙමුයයි
කීවෝය. දෙලීලා: නුඹේ මහත් ශක්තිය 6
තිබෙන්නේ කොතනද කියාත් පීඩා කරන
පිණිස නුඹ බඳින්ට පුළුවන් මොකකින්ද
කියාත් මට කියාපන්නැයි සම්සොන්ට
කීවාය. සම්සොන්ද: නොවේලාපු අලුත් 7
රැන් සතකින් මා බැන්දොත් මා බෙලහීනව
වෙන මනුෂ්‍යයෙකු මෙන් වෙනවා ඇතැයි
ඈට කීවේය. එවිට පිලිස්තිවරුන්ගේ 8
අධිපතීහු නොවේලාපු අලුත් රැන් සතක්
ඈට ගෙනත් දුන්නෝය, ඈ එයින් ඔහු
බැන්දාය. මනුෂ්‍යයෝ ඈ වෙත ඇතුල් 9
ගෙයි සැඟවී බලාගන සිටියෝය. ඈ
වනාහි: සම්සොන්, පිලිස්තිවරු නුඹ
අල්ලන්ට එත්යයි ඔහුට කීවාය. එවිට
ඔහු හණ නූලක් ගින්නේ තැවරෙන විටම
කැඩෙන්නාක් මෙන් ඒ රැන් කඩාදැමීය.
මෙසේ ඔහුගේ ශක්තිය දැනනොගන්නා
ලද්දේය. නුඹ මා රවටා බොරු කීවෙහිය, 10
දැන්වත් නුඹ බඳින්ට පුළුවන් මොකකින්ද
කියා මට කියාපන්නැයි දෙලීලා
සම්සොන්ට කීවාය. ඔහුද: කිසි වැඩකට 11
පාවිච්චි නොකළ අලුත් කඹවලින් මා
බැන්දොත් මා බෙලහීනව වෙන
මනුෂ්‍යයෙකු මෙන් වෙනවා ඇතැයි ඈට
කීවේය. එබැවින් දෙලීලා අලුත් කඹ 12
ගෙන එයින් ඔහු බැඳ: සම්සොන්,
පිලිස්තිවරු නුඹ අල්ලන්ට එත්යයි
ඔහුට කීවාය. මනුෂ්‍යයෝද ඇතුල් ගෙයි
සැඟවී බලා සිටියෝය. ඔහු ඒවා
නූල් පටක් මෙන් තමාගේ අත්වලින්
කඩාදැමුවේය. දෙලීලා සම්සොන්ට 13
කථාකොට: නුඹ මේ වන තෙක් මා
රවටා මට බොරු කීවෙහිය. ඉතින්
නුඹ බඳින්ට පුළුවන් මොකකින්ද කියා
මට කියාපන්නැයි කීවාය. ඔහුද: නුඹ
මාගේ හිසේ සැඩපළු සත නූල් වියමනත්
සමග ගෙතුවොත් පුළුවනැයි ඈට කීවේය.

*එනම්, අඬගැසූ අයගේ උල්පත.

14 ඇද ඇණයෙන් ඒවා තදකොට:
සම්සොන්, පිලිස්තිවරු නුඹ අල්ලන්ට
එත්යයි කීවාය. ඔහු නින්දෙන් පිබිද
යොත් දණ්ඩේ ඇණය නූල් වියමනත්
15 සමග ගළවා දැමුවේය. එවිට ඈ: නුඹේ
සිත මා වෙත නැතිකොට නුඹ මට
ආදරේය කියා කියන්නේ කොහොමද?
නුඹ දැන් තුන්වරක්ම මා රැවටුවෙහිය,
නුඹේ මහත් ශක්තිය තිබෙන තැන මට
16 නොකීවෙහියයි ඔහුට කීවාය. ඉන්පසු
ඈ සැමදම ඇගේ වචනවලින් ඔහුට
බලකරමින් ඔහු මැරෙන තරම් ඔහුට
17 කරච්චල්කළ කල්හි, ඔහු තමාගේ සිතේ
තිබුණු සියල්ල ඈට දැන්වූවාය: මා
මව්කුස පටන් දෙවියන්වහන්සේට කැපවූ
නාශරියයෙක් බැවින් දැළිපිහියක් මාගේ
හිසට ළංනොකරන ලද්දේය. මාගේ හිස
බූගෑවොත් මාගේ ශක්තිය මාගෙන්
නැතිවී යන්නේය, මාද බෙලහීනව
වෙන මනුෂ්‍යයෙකු මෙන් වෙනවා ඇතැයි
18 ඈට කීවාය. ඔහු තමාගේ සිතේ තිබුණු
සියල්ල තමාට කී බව දෙලීලා දැන
පිලිස්තිවරුන්ගේ අධිපතිවරුන් අඬ-
ගස්වමින්: මේ වතාවේ වරෙල්ලා,
මක්නිසාද ඔහු තමාගේ සිතේ තිබෙන
සියල්ල මට කියා තිබේයයි දන්වා
ඇරියාය. එවිට පිලිස්තිවරුන්ගේ අධිපතීහු
තමුන්ගේ අත්වල මුදල් ඇතුව ඈ ළඟට
19 ආවෝය. ඈ තමාගේ උකුළ පිට ඔහු
නිදන්ට සලස්වා, මිනිහෙකු කැඳවා,
ඔහුගේ හිසේ සැඩපළු සත කපාදමා,
ඔහුට පීඩා කරන්ට පටන්ගත්තාය,
ඔහුගේ ශක්තියද ඔහුගෙන් පහව ගියේය.
20 ඈද: සම්සොන්, පිලිස්තිවරු නුඹ
අල්ලන්ට එත්යයි කීවාය. එවිට ඔහු
නින්දෙන් පිබිද, ස්වාමීන්වහන්සේ තමා
කෙරෙන් අහක්ව ගිය බව නොදැන,
වෙන වතාවලදී මෙන් පිටතට ගොස්
බැඳුම්වලින් නිදහස්වන්නෙමියි කීවේය.
21 නුමුත් පිලිස්තිවරු ඔහු අල්ලාගෙන ඔහුගේ
ඇස් උගුලාදමා, ගාසාට ගෙනගොස්
ඔහු පිත්තල දම්වැල්වලින් බැන්දෝය;
ඔහු හිරගෙයි ඇඹරුවේය. එසේ වුවත් 22
ඔහුගේ හිසකේ කපාදැමුවායින් පසු ඒවා
නැවත වැඩෙන්ට පටන්ගත්තේය.

## සම්සොන්ගේ පළිගැනීම සහ මරණය

පිලිස්තිවරුන්ගේ අධිපතීහු තමුන්ගේ 23
දෙවිවූ දාගොන්ට මහත් පූජාවක්
ඔප්පුකරන්ටත් ප්‍රීති වෙන්ටත් රැස්වූහ.
මක්නිසාද: අපේ දෙවියෝ අපේ සතුරාවූ
සම්සොන් අප අතට පාවාදුන්නාහයි
ඔව්හු කීවෝය. සෙනඟ ඔහු දුටු කල 24
තමුන්ගේ දෙවියන්ට ප්‍රශංසා කළෝය.
මක්නිසාද: අපේ දෙවියෝ අපේ දේශය
නාස්ති කළාවූ, අපෙන් බොහෝ දෙනෙකු
මැරුවාවූ අපේ සතුරා අප අතට
පාවාදුන්නාහයි ඔව්හු කීවෝය. ඔවුන්ගේ 25
සිත් ප්‍රීතිමත්වූ කල: අපට ක්‍රීඩා
පෙන්වන්ට සම්සොන්ට අඬගසාපල්ලා-
යයි කියා ඔව්හු හිරගෙයින් ඔහු
අඬගස්වාගත්තෝය; ඔහු ඔවුන් ඉදිරියේ
ක්‍රීඩා කෙළේය. ඔව්හු කුළුනු කණු අතරේ
ඔහු සිටෙවුවෝය. සම්සොන් තමාගේ 26
අත අල්වා සිටි යෞවනයාට කථා-
කොට: මේ ගෘහය පිහිටා තිබෙන
කුළුනුවලට මා හාන්සිවෙන පිණිස
ඒවායේ මාගේ අත තබා බලන්ට
ඉඩහැරපන්නැයි කීවේය. ඒ ගෘහය 27
පුරුෂයන්ගෙන්ද ස්ත්‍රීන්ගෙන්ද පිරී
තිබුණේය. පිලිස්තිවරුන්ගේ සියලු
අධිපතිවරුත් එහි සිටියෝය; පියස්ස
උඩ ස්ත්‍රී පුරුෂයෝ තුන් දහසක් පමණ
සම්සොන් ක්‍රීඩා පෙන්වනවා බලා
සිටියෝය. සම්සොන් ස්වාමීන්වහන්සේට 28
යාච්ඤා කොට: අනේ ස්වාමිවූ දෙවියන්-
වහන්ස, මා සිහිකළමැනව, අනේ
දෙවියන්වහන්ස, මාගේ ඇස් දෙක ගැන
මා විසින් පිලිස්තිවරුන්ගෙන් එකවරටම
පළිගන්න පිණිස මේ වතාවේ පමණක්
මා බලවත් කළ මැනවයි කීවේය. එවිට 29
සම්සොන් ගෘහය ඉසුලුවාවූ මැද කුළුනු
දෙක එකක් දකුණතින්ද එකක් වමතින්ද
නමමින්: පිලිස්තිවරුන් සමග මමත් 30

නසිම්වායි කියා තමාගේ මුළු ශක්ති-
යෙන් නැඹුරුවුණේය; එවිට ගෘහය
අධිපතිවරුන් සහ එහි සිටි මුළු සෙනඟ
පිට වැටුණේය. මෙසේ ඔහු ජීවත්ව සිටියදී
මැරූ අයට වඩා ඔහුගේ මරණයේදී
31 මැරූ අය වැඩි වූහ. එවිට ඔහුගේ
සහෝදරයෝද ඔහුගේ පියාගේ මුළු
පවුලද ගොස් ඔහු ගෙනැවිත් ශොරාද
එෂ්තායොල්ද අතරේ තිබෙන ඔහුගේ
පියවූ මානෝවාගේ සොහොන්පළේ
තැන්පත් කළෝය. ඔහු විසි අවුරුද්දක්
ඉශ්‍රායෙල්වරුන් විනිශ්චය කෙළේය.

## මීකාගේ රූපය සහ පූජකයා

17 එප්‍රායිම් කඳු රටේ මීකානම්
2 මනුෂ්‍යයෙක් සිටියේය. ඔහු
තමාගේ මවුට කථාකොට: තුඹෙන්
ගන්නා ලද්දවූ, තුඹ ශාපකර මා
ඉදිරියෙහි මතක්කළාවූ රිදී එකොළොස්
සියය මා ළඟ තිබේ; ඒවා ගත්තේ
මමයයි කීවේය. ඔහුගේ මවුද:
මාගේ පුත්‍රයාට **ස්වාමීන්වහන්සේගෙන්**
3 ආශීර්වාද වේවයි කීවාය. ඔහු තමාගේ
මවුට රිදී එකොළොස් සියය නැවත
දුන්නේය, එවිට ඔහුගේ මවු කථාකොට:
කැපූ රූපයක්ද වාත්තු පිළිමයක්ද සෑදීමට
මම මේ රිදී මාගේ අතින් මාගේ පුත්‍රයා
වෙනුවෙන් **ස්වාමීන්වහන්සේට** සැබවින්ම
කැපකෙළෙමි. දැන් ඒවා නැවත තුඹට
4 දෙමියි කීවාය. ඔහු ඒ මුදල නැවත
තමාගේ මවුට දුන් කල ඔහුගේ මවු
රිදී දෙසියයක් රැගෙන කම්කරුවාට
දුන්නාය, ඔහු එයින් කැපූ රූපයක්ද
වාත්තු පිළිමයක්ද සෑදුවේය. ඒවා
5 මීකාගේ ගෙයි තිබුණේය. මීකා නම්වූ
මනුෂ්‍යයාට දේවාලයක් තිබුණේය, ඔහු
ඒඵෝද් සැට්ටයක්ද තෙරපීම් රූපද සාදා,
තමාට පූජකයෙකුව සිටින පිණිස
6 තමාගේ පුත්‍රයෙකු පත්කෙළේය. ඒ දවස්වල
ඉශ්‍රායෙල්හි රජෙක් නොසිටියේය. එක්
එක්කෙනා තම තමාගේ ඇස් හමුයෙහි
හරිව තිබුණු දේ කෙළේය.

යුදා පෙළපතට අයිතිවූ, යුදයේ 7
බෙත්-ලෙහෙමේ සිට ආවාවූ එක්තරා
ලෙවීය තරුණයෙක් සිටියේය, ඔහු එහි
වාසයකෙළේය. ඒ මනුෂ්‍යයා තමාට 8
සිටීමට තැනක් සොයන පිණිස යුදයේ
බෙත්-ලෙහෙම් නුවරින් පිටත්ව ගොස්
ගමන්කරනුයේ, එප්‍රායිම් කඳු රටේ
මීකාගේ ගෙදරට පැමුණුණේය. තුඹ 9
කොතැනින් ආවාදැයි මීකා ඔහුගෙන්
ඇසීය. ඔහුද: මම යුදයේ බෙත්-ලෙහෙමේ
ලෙවීයයෙක්ය, මට සිටීමට තැනක්
සොයා යමියි කීවේය. එවිට මීකා: මා 10
සමග වැස මට පිය කෙනෙක්ද
පූජකයෙක්ද වෙයන්න, මම තුඹට අවුරුදු
පතා රිදී දසයක් හා ඇඳුම් කුට්ටමකුත්
කෑමත් දෙන්නෙමියි ඔහුට කීවේය. එවිට 11
ලෙවීයයා ඇතුල්වී, ඒ මනුෂ්‍යයා සමග
වසන්ට සතුටු විය; ඒ තරුණයා ඔහුට
ඔහුගේ පුත්‍රයන්ගෙන් එක්කෙනෙකු
මෙන් වූයේය. මීකා වනාහි ඒ ලෙවීයයා 12
පත්කෙළේය, තරුණයා මීකාට පූජක-
යෙක්වී ඔහුගේ ගෙයි විසීය. එවිට 13
මීකා: ලෙවීයයෙකු මට පූජකකමට
සිටින නිසා **ස්වාමීන්වහන්සේ** මට
යහපත කරනසේකැයි දැන් දනිමියි
කීවේය.

## දාන්වරු ලායිෂ්ට විරුද්ධව ගොස් ජයගැනීම

18 ඒ දවස්වල ඉශ්‍රායෙල්හි
රජෙක් නොසිටියේය. තවද ඒ
දවස්වලදී දාන් ගෝත්‍රය තමුන්ට වාසය
කිරීම පිණිස උරුමයක් සෙවීය;
මක්නිසාද ඒ දවස දක්වා ඉශ්‍රායෙල්
ගෝත්‍ර අතරේ ඔවුන්ට උරුමයක් ලැබී
තිබුණේ නැත. දාන් පුත්‍රයෝ දේශය 2
සෝදිසි කර බලා විභාගකරන පිණිස
තමුන්ගේ මුළු ගණනෙන් තමුන්ගේ
පෙළපතේ වික්‍රමාන්විත මනුෂ්‍යයන් පස්
දෙනෙක් ශොරාද එෂ්තායොල්ද සිට
යවමින්: තුඹලා ගොස් දේශය
විභාගකරපල්ලායයි ඔවුන්ට කීවෝය.
ඔව්හු එප්‍රායිම් කඳු රටේ මීකාගේ ගෙට

3 අවුත් එහි නවාතැන් ගත්තෝය. ඔව්හු
මීකාගේ ගේ ළඟ සිටිද්දී ලෙවීයයාවූ
තරුණයාගේ කටහඬ ඇඳින එහි ගොස්
ඔහුට කථාකොට: නුඹ මෙහි ගෙනාවේ
කවුද? මෙතන නුඹ කරන්නේ මොකද?
මෙහි නුඹට ඇත්තේ කිමෙක්දැයි
4 ඇසුවෝය. ඔහුද: මීකා මට මේ මේ
ආකාර කර, මා ඔහුගේ පූජකයාව
සිටින පිණිස මා කුලියට ගත්තේයයි
5 ඔවුන්ට කීවේය. ඔව්හු ඔහුට කථාකොට:
අප යන්නාවූ අපේ මේ ගමන
සඵලවේද කියා අප විසින් දැනගන්නා
පිණිස දෙවියන්වහන්සේගෙන් විභාග-
6 කරපන්නැයි කීවෝය. පූජක තෙමේද:
සමාදානයෙන් පලයල්ලා; නුඹලා යන
ගමන ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තිබේ-
යයි ඔවුන්ට කීවේය.
7 එවිට ඒ පස්දෙන පිටත්ව ගොස්
ලායිෂ්ට පැමිණ, එහි සිටින සෙනඟ
අපරීක්ෂාකාරීව, ශීදෙන් වැසියන් හා
සමානව නිශ්චලකමින්ද අප්‍රවේසමෙන්ද
වාසයකරන බව දුටුවෝය; මක්නිසාද
යමක් ගැන ඔවුන් ලජ්ජාකරන්ට
පුළුවන්වූ, බලය ලත් කෙනෙක් දේශයෙහි
නැති බවත් ඔවුන් ශීදෙන්වරුන්ගෙන්
දුරව සිටින බවත් කිසිවෙකු සමඟ
8 ගනුදෙනුකිරීමක් නැති බවත් දැක, ඔව්හු
සොරාහිද එෂ්තායොල්හිද සිටි තමුන්ගේ
සහෝදරයන් වෙතට ආවෝය. ඔවුන්ගේ
සහෝදරයෝ ඔවුන්ට කථාකොට:
නුඹලා කියන්නේ මොකදැයි ඔවුන්ගෙන්
9 ඇසුවෝය. ඔව්හුද: අපි පිටත්වී ඔවුන්ට
විරුද්ධව යමුව. මක්නිසාද ඒ රට
ඉතා යහපත් බව අපි දුටිමුව. නුඹලා
නිකම් සිටිනවාද? ඒ රටට ඇතුල්ව
ඒක හිමිකරගන්නා පිණිස යන්ට
10 මැලිනොවෙල්ලා. නුඹලා ගියාම
අප්‍රවේසමෙන් සිටින සෙනඟක් කරා
පැමිණෙනවා ඇත, ඒ රට විශාලය.
දෙවියන්වහන්සේ නුඹලා අතට ඒක
දී තිබේ; එය පොළොවේ තිබෙන
කිසිදෙයකින් හිඟයක් නැති ස්ථානයක්-
යයි කීවෝය.
11 එවිට එතැනින් දාන්ගේ පෙළපතේ
මනුෂ්‍යයෝ හසියයක් යුද්ධායුධ පැළඳ-
ගෙන, සොරාද එෂ්තායොල්ද සිට
පිටත්ව ගොස්, යුදයේ තිබෙන 12
කිරියත්-යෙයාරීම්හි කඳවුරු බැන්දෝය.
ඒ නිසා ඒ ස්ථානයට අද දක්වා
මහනේ-දාන්යයි කියති. බලව, ඒක
කිරියත්-යෙයාරීම්ට එහායින් තිබේ.
ඔව්හු එතැනින් එප්‍රායිම් කඳු රටට ගොස් 13
මීකාගේ ගේ ළඟට පැමුණුණෝය. එවිට 14
ලායිෂ් රට සෝදිසිකරන්ට ගිය පස්දෙන
තමුන්ගේ සහෝදරයන්ට කථාකොට:
මේ ගෙවල්හි ඒඵොද් සැට්ටයක්ද තෙරපීම්
රූපද කැපූ රූපයක්ද වාත්තු පිළිමයක්ද
තිබෙන බව නුඹලා දන්නවාද? ඉතින්
දැන් නුඹලා විසින් කළ යුතු දේ
කල්පනාකරපල්ලායයි කීවෝය. ඔව්හු 15
එහි හැරීගොස් තරුණ ලෙවීයයාගේ
ගේ වන මීකාගේ ගෙට පැමිණ ඔහුගේ
සැප පහසු විචාළෝය. තමුන්ගේ 16
යුද්ධායුධ පැළඳගත්තාවූ, දාන් පුත්‍රයෝ
වූ ඒ මනුෂ්‍යයන් හසියය දොරකඩ ළඟ
සිටියෝය. රට සෝදිසිකරන්ට ගිය 17
පස්දෙන නැගී ගොස් එහි ඇතුල්ව කැපූ
රූපයද ඒඵොද් සැට්ටයද තෙරපීම් රූපද
වාත්තු පිළිමයද ගත්තෝය. පූජකයා
සහ යුද්ධායුධ පැළඳගත් මනුෂ්‍යයන්
හසියය දොරකඩ ළඟ සිටියෝය. මොවුන් 18
මීකාගේ ගෙට ඇතුල්ව කැපූ රූපයද
ඒඵොද් සැට්ටයද තෙරපීම් රූපද වාත්තු
පිළිමයද පිටත ගෙනා විට පූජකයා:
නුඹලා මක්කරනවාදැයි ඔවුන්ට කීය.
ඔව්හුද: නිශ්ශබ්දව අතින් කට වසා ගෙන 19
අප සමඟ ගොස් අපට පියෙක්ද
පූජකයෙක්ද වෙයන්න. නුඹට වඩා හොඳ
කෝකද-එක මනුෂ්‍යයෙකුගේ පවුලට
පූජකයෙක් වීමද නොහොත් ඉශ්‍රායෙල්
ගෝත්‍රයකටත් පෙළපතකටත් පූජකව
සිටීමදැයි ඔහුට කීවෝය. එවිට 20
පූජකයාගේ සිත සතුටුව ඔහු ඒඵොද්
සැට්ටයද තෙරපීම් රූපද කැපූ රූපද
රැගෙන සෙනඟ අතරට ගියේය. මෙසේ 21
ඔව්හු හැරී බාලයන්ද සිව්පාවුන්ද බඩුද
ඉස්සරකරගන ගියෝය. ඔවුන් මීකාගේ 22
ගෙයින් දුර ගිය කල මීකාගේ ගේ අසල

ගෙවල මිනිස්සු එකතුව දන් පුත්‍රයන්
පස්සේ ගොස් ඔවුන්ට ළංව මොර-
23 ගැසුවෝය. ඔව්හු හැරී බලා:
මිනිසුන් රැස්කරගන එන්ට තුඹට වෙලා
තිබෙන්නේ මොකදැයි මීකාගෙන්
24 ඇසුවෝය. ඔහු උත්තරදෙමින්: මා සෑදූ
මාගේ දේවතාවන් සහ පූජකයාද තුඹලා
ගෙනගියහුය, තවත් මට ඇත්තේ
කිමෙක්ද? තුඹට වෙලා තිබෙන්නේ
මොකද කියා තුඹලා මාගෙන් අසන්නේ
25 කොහොමදැයි කීවේය. දන් පුත්‍රයෝ
ඔහුට කථාකොට: තුඹ කථානොකර
සිටපන්න, කථාකළොත් රෞද්‍ර මිනිසුන්
තුඹලාට විරුද්ධව එන්ට පුළුවන, එවිට
තුඹේ ජීවිතයද තුඹේ ගෙයි වැසියන්ගේ
ජීවිතද හානිවේයයි ඔහුට කියා යන්ට
26 ගියෝය. ඔවුන් තමාට වඩා බලවත්
බව මීකා දැක හැරී නැවත තමාගේ
27 ගෙදරට ගියේය. ඔව්හු මීකා සාදගත
තිබුණු දේද ඔහු වෙත සිටිය පූජකයාද
රැගෙන ගොස් නිශ්චලකමින්ද
අප්‍රවේසමෙන්ද සිටි ලායිෂ්හි සෙනඟ
කරා පැමිණ, කඩුමුවහතින් ඔවුන්ට
28 පහරදී, නුවර ගිනිලෑවෝය. එය සීදොන්
නුවරින් දුර නිසාද කිසිවෙකු සමග
ඔවුන්ගේ ගනුදෙනු කිරීමක් නැති නිසාද
ගළවන්ට කිසිවෙක් නොවීය; එය
බෙත්-රෙහොබ් ළඟ පිහිටි මිටියාවතේ
තිබුණේය. ඔව්හු නුවර ගොඩනගා එහි
29 වාසයකළෝය. ඉශ්‍රායෙල්ට දාව උපන්
තමුන්ගේ පියවූ දන්ගේ නාමය අනුව
ඔව්හු ඒ නුවරට දන් යන නම තැබුවෝය.
නුමුත් පළමුවෙන් ඒ නුවර නම ලායිෂ්ය.
30 දන් පුත්‍රයෝ කැපූ රූපය පිහිටුවා-
ගත්තෝය. *මෝසෙස්ගේ පුත්‍රයා වන
ගේර්ෂොම්ගේ පුත්‍රවූ යොනාතාන්ද
ඔහුගේ පුත්‍රයෝද රටවැසියන් වාලට
ගිය දවස දක්වා දන් ගෝත්‍රයට පූජකයෝ
31 වූවෝය. මෙලෙස ඔව්හු දෙවියන්-
වහන්සේගේ මණ්ඩපය ෂීලෝහි තිබුණු
මුළු කාලයෙහි මීකාගේ කැපූ රූපය
පිහිටුවාගෙන සිටියෝය.

*නොහොත්, මනස්සේගේ.

## ගිබියා වැසියන්ගේ දුෂ්ටකම

19

තවද ඉශ්‍රායෙල්හි රජෙක්
නොසිටිය ඒ දවස්වලදී එප්‍රායිම්
කඳු රටේ එහා පැත්තේ එක්තරා
ලෙවීයයෙක් වාසයකළේය. ඔහු වනාහි
යුදයේ බෙත්-ලෙහෙමෙන් උප භාර්යාවක්
පාවාගත්තේය, ඔහුගේ උප භාර්යාව 2
ඔහුට විරුද්ධව වේශ්‍යාකම්කොට
ඔහු අත්හැර යුදයේ බෙත්-ලෙහෙමේ
ඇගේ පියාගේ ගෙදරට ගොස් එහි
හාරමාසයක් සිටියාය. එවිට ඇගේ 3
පුරුෂයා කරුණාවෙන් කථාකොට
නැවත ඈ ගෙනෙන පිණිස තමාගේ
වැඩකාරයාද කොටළුවන් දෙන්නෙක්ද
සමග ඈ කරා ගියේය. ඈ තමාගේ
පියාගේ ගෙට ඔහු කැඳවා ගෙනාවාය.
යෞවනියගේ පියා ඔහු දැක ඔහු
සම්බවුණාට ප්‍රීතිවිය. ඔහුගේ මාමා වන 4
යෞවනියගේ පියා ඔහු නවත්වාගත්තේය;
ඔහු තුන් දවසක් ඔහු සමග විසීය.
එසේ ඔව්හු කමින් බොමින් එහි නැවතී
සිටියෝය. සතරවෙනි ද ඔවුන් අලුයම 5
නැගුණු විට ඔහු යන්ට හැදුවේය.
යෞවනියගේ පියාද: කෑම ටිකකින් තුඹේ
සිත සනසාගන පසුව යන්ට පුළුවනැයි
ඔහුගේ බෑනාට කීවේය. මෙසේ ඔවුන් 6
දෙදෙනා හිඳගෙන එක්ව කෑවෝය,
බීවෝය. තවද යෞවනියගේ පියා ඒ
මනුෂ්‍යයාට කථාකොට: අනේ අද
රාත්‍රියේ නවතින්ට සතුටු වෙයන්න, තුඹේ
සිත සන්තෝෂවේවයි ඒ මනුෂ්‍යයාට
කීවේය. ඒ මනුෂ්‍යයා යන්ට නැගුණු 7
විට ඔහුගේ මාමා පෙරැත්ත කළ නිසා
ඔහු නැවත එහි සිටියේය. පස්වෙනිද 8
අලුයම ඔහු යන්ට නැගුණු විට
යෞවනියගේ පියා ඔහුට කථාකොට:
අනේ තුඹේ සිත සනසා ගනින්න,
සවස්වන තෙක් සිටපල්ලායයි කීවේය.
ඔවුන් දෙදෙනද කෑම කෑවෝය. ඒ 9
මනුෂ්‍යයා සහ ඔහුගේ උප භාර්යාවද
වැඩකාරයාද යන්ට නැගුණු විට ඔහුගේ
මාමා වන යෞවනියගේ පියා ඔහුට
කථාකොට: දැන් සවස්වේගන එයි,

අනේ මුළු රාත්‍රියේ සිටපල්ලා. ඉර
බහින්ට ළඟය, රාත්‍රියේ මෙහි සිට නුඹේ
සිත සන්තෝෂකරගෙන හෙට නුඹලාගේ
ගමනට වේලාසනින් නැගිට ගෙදර යන්ට
10 පිටත්වෙයල්ලායයි කීවේය. එහෙත්
ඒ මනුෂ්‍යයා ඒ රාත්‍රියේ නවතින්ට
නොකැමතිව නැගිට ඇඳුම් දමූ
කොටළුවන් දෙදෙනෙකුත් තමාගේ
උපභාර්යාවත් රැගෙන ගොස් යෙබූස්
(එනම් යෙරුසලම) ඉදිරිපිටට
11 පැමුණුණේය. ඔවුන් යෙබූස්ට ළංවෙන
විට දවාල බොහෝසෙයින් ගතවී
තිබුණේය; වැඩකාරයාද: අපි ගොස්
යෙබූසිවරුන්ගේ මේ නුවරට ඇතුල්වී
එහි නවාතැන් ගනිමුයයි තමාගේ
12 ස්වාමියාට කීය. ඔහුගේ ස්වාමියාද:
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට අයිති නැති
අන්‍යයන්ගේ නුවරට අපි නොගොස්
13 ගිබියාට යමුයයි ඔහුට කීවේය. තවද
ඔහු: ගිබියාහිවත් රාමාහිවත් නවතින
පිණිස ඒ ස්ථානවලින් එකකට ළඟාවෙමු-
යයි තමාගේ වැඩකාරයාට කීවේය.
14 මෙසේ ඔවුන් තව දුරටත් ගමන් කොට
බෙන්යමින්ට අයිති ගිබියාට ළඟාවෙන
15 විට ඉර බැස්සේය. ඔව්හු ගිබියාහි
නවාතැන් ගන්න පිණිස ඇතුල්වෙන්ට
එහි හැරී ගියෝය. ඔහු ඇතුල්වී නුවර
වීථියේ හිඳගත්තේය. මක්නිසාද කිසිවෙක්
නවාතැන් දීමට ඔවුන් ගෙදරට කැඳවා
16 නොගත්තේය. නුමුත් මහලු මනුෂ්‍යයෙක්
කෙතේ වැඩකර සවස ආවේය; ඒ
මනුෂ්‍යයා එප්‍රායිම් කඳු රටේ කෙනෙක්ය,
හෙතෙම ගිබියාහි වාසයකෙළේය. එහෙත්
ඒ ස්ථානයේ මනුෂ්‍යයෝ බෙන්යමින්-
17 වරුය. මහලු මනුෂ්‍යයා තමාගේ ඇස්
ඔසවා ඒ මගියා නුවර වීථියේ ඉඳිනු
දැක: නුඹ කොතැනට යනවාද? කොතැන
18 සිට එනවාදැයි ඇසීය. ඔහුද: අපි යූදයේ
බෙත්-ලෙහෙමේ සිට කඳු රටේ එහා
පැත්තට යමුව; මම එහි කෙනෙක්ය,
යූදයේ බෙත්-ලෙහෙමට ගියෙමි. දැන්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට යමි; එහෙත්
තමාගේ ගෙදරට මා කැඳවාගන්න
කෙනෙක් නැත. අපේ කොටළුවන්ට 19
පිදුරුත් ගෝචරත් තිබේ; මට සහ
නුඹේ වැඩකාරිටද නුඹේ මෙහෙකරුවන්
සමග සිටින තරුණයාටද රොටිත්
මුද්‍රිකපානයත් තිබේ. කිසි දෙයකින්
අඩුවක් නැතැයි ඔහුට කීවේය. මහලු 20
මනුෂ්‍යයාද: නුඹට සමාදනයවේවා;
නුඹේ සියලු ඕනෑකම් මා පිට වේවා;
වීථියේ නම් රෑ නොසිටින්නැයි ඔහුට
කීවේය. එවිට ඔහු තමාගේ ගෙදරට 21
ඔවුන් කැඳවාගෙන ගොස් කොටළුවන්ට
ගෝචර දුන්නේය. ඔව්හු තමුන්ගේ පාද
සෝදාගෙන කෑවෝය, බීවෝය. ඔවුන් 22
තමුන්ගේ සිත් සන්තෝෂකරගන්න අතර,
*දුර්ජනයෝව සිටි ඒ නුවර සමහර
මනුෂ්‍යයෝ ගේ වටකර සිට, දොරට
ගසමින්, ගෙදර ස්වාමියාවූ මහලු
මනුෂ්‍යයාට කථාකොට: නුඹේ ගෙදරට
ඇවිත් සිටින මනුෂ්‍යයා අප විසින්
ඇඳිනගන්නා පිණිස ඔහු පිටතට
ගෙනෙන්නැයි කීවෝය. එවිට ගෙදර 23
ස්වාමියාවූ ඒ මනුෂ්‍යයා පිටතට ඔවුන්
වෙතට ගොස් ඔවුන්ට කථාකොට: අනේ
මාගේ සහෝදරයෙනි, එසේ නොවේවා,
එපමණ දුෂ්‍යකම් නොකරල්ලා; මේ
මනුෂ්‍යයා මාගේ ගෙට ඇවිත් සිටිද්දී
ඔය නින්දිතකම නොකරල්ලා. මෙන්න, 24
මෙහි මාගේ කන්‍යා දුවත් ඔහුගේ
උපභාර්යාවත් සිටිති; මම දැන් ඔවුන්
පිටතට ගෙනෙන්නෙමි, ඔවුන් වශහකොට
නුඹලාට හොඳව පෙනෙන දෙයක්
ඔවුන්ට කරපල්ලා. නුමුත් මේ මනුෂ්‍යයාට
ඔය නින්දිතකම් නොකරල්ලායයි ඔවුන්ට
කීවේය. එහෙත් ඒ මනුෂ්‍යයෝ ඔහුට 25
ඇහුම්කන් නුදුන්නෝය. එබැවින් ඒ
මනුෂ්‍යයා තමාගේ උප භාර්යාව
අල්වාගෙන ඔවුන් ළඟට පිටතට
ගෙනාවේය; ඔව්හු ඈ හැඳින, අලුයම
දක්වා මුළු රාත්‍රියෙහි ඈට දූෂ්‍යකම්
කොට, පහන්වෙන වේලේ ඈ යන්ට
හැරියෝය. එවිට ඒ ස්ත්‍රී අලුයම් 26
වේලේ ඇවිත් ඈගේ ස්වාමියා සිටි ඒ

*හෙවත්–බෙලියල් පුත්‍රයෝ.

මනුෂ්‍යයාගේ ගෙයි දෙරකඩ ළඟ වැටී
27 එළිවෙන තෙක් උන්නාය. ඇගේ
ස්වාමියා උදය නැගිට ගෙයි දොරවල්
හැර තමාගේ ගමන යන්ට එළියට
ගියේය. බලව, තමාගේ උපභාර්යාව
වන ඒ ස්ත්‍රී ගෙයි දෙරකඩ ළඟ වැටී
උන්නාය, ඇගේ අත් එළිපත්ත උඩ
28 තිබුණේය. ඔහු ඈට කථාකොට:
නැගිටපන්න, අපි යමුයයි කීය; නුමුත්
උත්තරයක් ලැබුණේ නැත. එවිට ඔහු
ඈ ඔසවා කොටළුවා පිට තබාගෙන
29 තමාගේ ස්ථානයට ගියේය. ඔහු තමාගේ
ගෙදරට පැමිණි කල පිහියක් ගෙන,
තමාගේ උපභාර්යාව අල්ලා, ඇගේ
ඇටවල ප්‍රකාරයට ඈ කොට්ඨාස
දොළහකට කපා, ඉශ්‍රායෙල්වරුන්ගේ
30 සියලු පළාත්වලට හැරියේය. ඒ දුටු
සියල්ලෝ: ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර
දේශයෙන් පිටත්ව ආ දවස පටන් අද
දක්වා මෙබඳු දෙයක් සිද්ධවුණේවත්
දකින්ට යෙදුණේවත් නැත. මේ ගැන
හිතට ගෙන මන්ත්‍රණය කොට කථා-
කරපල්ලායයි කීවෝය.

## දඬුවමක් වශයෙන් බෙන්යමින් ගෝත්‍රය නැතිකර දැමීම

20 එවිට දාන් පටන් බෙයෙර්-ෂෙබා
දක්වාත් ගිලියද් දේශයෙත් සිටි
සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන් පිටත්ව ඇවිත්
සභාව එක්කෙනෙකු මෙන් මිශ්පාහි
ස්වාමීන්වහන්සේ වෙතට රැස්වුණාය.
2 එවිට මුළු සෙනඟ වන සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රවල ප්‍රධානීහු කඩුව පාවිච්චිකරන
පාබළ මනුෂ්‍යයන් හාර ලක්ෂයක්වූ,
දෙවියන්වහන්සේගේ සෙනඟවූ සභාව
3 මැද නැගිට සිටියෝය. (ඉශ්‍රායෙල්
පුත්‍රයන් මිශ්පාට ගිය බව බෙන්යමින්
පුත්‍රයන්ට සැලවිය.) මේ දුෂ්ටකම
සිදුවුණේ කොහොමදැයි කියාපල්ලා-
4 යයි ඉශ්‍රායෙල් පුත්‍රයෝ කීවෝය. එවිට
මරනු ලැබූ ස්ත්‍රියගේ ස්වාමිපුරුෂයාවූ
ලෙවීයයා උත්තරදෙමින්: මමත්
මාගේ උපභාර්යාවත් නවාතැන් ගන්ට
බෙන්යමින්වරුන්ට අයිති ගිබියාට
පැමිණියෙමුව. එවිට ගිබියා වැසියෝ 5
මට විරුද්ධව නැගිට මා සිටි ගේ රාත්‍රියේ
වටලාගත්තෝය; ඔව්හු මා මරන්ට
සිතුවෝය, මාගේ උපභාර්යාව මැරෙන
ලෙස ඈට බලාත්කාරකම් කළෝය.
එවිට මම මාගේ උපභාර්යාව අරන් 6
ඈ කොට්ඨාසවලට කපා, ඉශ්‍රායෙල්-
වරුන්ගේ උරුමයේ සියලු පළාත්වලට
හැරියෙමි. මක්නිසාද ඔව්හු ඉශ්‍රායෙල්හි
දූෂ්‍යකමක්ද නින්දිතකමක්ද කළෝය.
ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, නුඹලා සියල්ලෝ 7
මෙහි නුඹලාගේ කල්පනාවත් දැන-
මුතුකමත් කියාදියල්ලායයි කීවේය.
එවිට මුළු සෙනඟ එක්කෙනෙකු මෙන් 8
නැගිට කථාකොට: අපෙන් කිසිවෙක්
තමාගේ කූඩාරමට නොයන්නේය,
කිසිවෙක් තමාගේ ගෙදරට නො-
පැමිණෙන්නේය. අපි දැන් ගිබියාට මෙසේ 9
කරන්නෙමුව; පස ඇට වැටෙන හැටියට
ඊට විරුද්ධව යන්නෙමුව; සියලු ඉශ්‍රායෙල් 10
ගෝත්‍රවලින් මනුෂ්‍යයන් සියයට දස-
දෙනෙක්ද දහසකට සියයක්ද දස
දහසකට දහසක්ද බැගින් සෙනඟට
ආහාර ගෙනෙන පිණිස අපි නියම-
කරගන, ඔවුන් ආවාම බෙන්යමින්ට
අයිති ගිබියාහි මනුෂ්‍යයන් විසින්
ඉශ්‍රායෙල්හි කළ මුළු නින්දිතකම
ප්‍රකාරයට ඔවුන්ට කරන්නෙමුයයි
කීවෝය. ඒ හැටියට සියලු ඉශ්‍රායෙල් 11
මනුෂ්‍යයෝ එක්කෙනෙකු මෙන් එකට
බැඳී ඒ නුවරට විරුද්ධව රැස්වූවෝය.
ඉශ්‍රායෙල් ගෝත්‍රවල අය බෙන්යමින් 12
ගෝත්‍රයේ සෑම තැන්වලට මනුෂ්‍යයන්
යවමින්: නුඹලා අතරේ කළ මේ දුෂ්ටකම
මොකද? ඉතින් අප විසින් ගිබියාහි 13
සිටින දුර්ජන මනුෂ්‍යයන් මරා
ඉශ්‍රායෙල්වරුන් අතරෙන් නපුර පහකර
දමන පිණිස ඔවුන් අපට පාවාදියල්ලා-
යයි කීවෝය. නුමුත් බෙන්යමින් පුත්‍රයෝ
තමුන්ගේ සහෝදරවූ ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ හඬට ඇහුම්කන් දෙන්ට
නොකැමතිවූහ. තවද බෙන්යමින් 14
පුත්‍රයෝ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට විරුද්ධව

යුද්ධකරන්ට යන පිණිස නුවරවලින්
පිටත්ව ගිබියාට ඇවිත් රැස්වූවෝය.
15 ගිබියාහි වැසියන්ගෙන් තෝරාගත්
මිනිසුන් සත් සියයක් හැර නුවරවලින්
රැස්වුණාවූ, කඩුව පාවිච්චිකරන්නන්වූ
බෙන්යමින් පුත්‍රයන් විසිහය දහසක් ඒ
16 දවසෙහි ගණන් කරනු ලැබූහ. මේ මුළු
සෙනග අතරේ වමත හුරුවූ තෝරාගත්
මනුෂ්‍යයෝ සත්සියයක් වූවෝය: ඔවුන්
සියල්ලෝම හිසකේ ගහක් පමණවත්
නොවරද්ද ගල් පටියකින් ගල් විදින්ට
පුළුවන් අයය.
17 බෙන්යමින්වරුන් හැර කඩුව පාවිච්චි-
කරන ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ සාර
ලක්ෂයක් ගණන්කරනු ලැබුවෝය. මේ
18 සියල්ලෝම යුද්ධකාරයෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ පිටත්ව බෙතෙල්ට ගොස්:
බෙන්යමින් පුත්‍රයන්ට විරුද්ධව යුද්ධ-
කරන්ට අපෙන් පළමුව යායුතු කවුදැයි
දෙවියන්වහන්සේගෙන් විචාළෝය. යූද-
වරු පළමුව යෙත්වයි **ස්වාමීන්වහන්සේ**
19 කීසේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ උදය නැගිට
ගිබියා ඉදිරිපිට කඳවුරු බැඳගත්තෝය.
20 ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ බෙන්යමින්ට
විරුද්ධව යුද්ධයට ගොස් ගිබියා ළඟ
ඔවුන්ට විරුද්ධව සටනට පිළිවෙළින්
21 සිටියෝය. එවිට බෙන්යමින් පුත්‍රයෝ
ගිබියායෙන් පිටත්ව අවුත් ඒ දවසේ
ඉශ්‍රායෙල්වරුන්ගෙන් මිනිසුන් විසි
දෙදහක් විනාශකර බිම හෙළුවෝය.
22 සෙනග එනම් ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ
ධෛර්ය වඩා තමුන් පළමුවෙනි දවසේදී
පිළිවෙළින් සිටි ස්ථානයෙහි නැවත
23 යුද්ධයට පිළිවෙළින් සිටියෝය. තවද
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගොස් **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි සවස් වන තෙක්
හඬා: අපේ සහෝදරයන්වූ බෙන්යමින්
පුත්‍රයන්ට විරුද්ධව අප නැවත සටනට
යා යුතුදැයි **ස්වාමීන්වහන්සේගෙන්**
ඇසුවෝය. ඔවුන්ට විරුද්ධව පලයල්ලා-
යයි **ස්වාමීන්වහන්සේ** කීසේක.
24 ඉශ්‍රායෙල් පුත්‍රයෝ දෙවෙනිද බෙන්යමින්
25 පුත්‍රයන්ට විරුද්ධව ළංවුණෝය. එවිට
බෙන්යමින්වරු දෙවෙනිද ඔවුන්ට විරුද්ධව
ගිබියායෙන් පිටතට ඇවිත් නැවත
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් මිනිසුන්
දහඅටදහසක් විනාශකර බිම හෙළුවෝය:
මේ සියල්ලෝ කඩුව පාවිච්චි කරන
මනුෂ්‍යයෝය. එකල සියලු ඉශ්‍රායෙල් 26
පුත්‍රයෝද මුළු සෙනගද ගොස් බෙතෙල්ට
පැමිණ, එහිදී **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
අඬමින් හිඳ, එදා සවස් වන තෙක්
නිරාහාරව සිට, **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි දවන පූජාද ශාන්ති පූජාද
ඔප්පුකළෝය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ: අපේ 27
සහෝදරයන්වූ බෙන්යමින් පුත්‍රයන්ට
විරුද්ධව අප නැවතත් යුද්ධයට යා
යුතුද නැතහොත් නවතින්ටදැයි **ස්වාමීන්-
වහන්සේගෙන්** ඇසුවෝය. (ඒ දවස්වලදී 28
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
එහි තිබුණේය. ආරොන්ගේ පුත්‍රයා
වන එලෙයාසර්ගේ පුත්‍රවූ පීනෙහාස්
ඒ දවස්වල එය ඉදිරිපිට සිටියේය.)
**ස්වාමීන්වහන්සේද**: පලයල්ලා, මක්-
නිසාද හෙට ඔවුන් තුඹලා අතට පාවා-
දෙන්නෙමියි කීසේක. ඉශ්‍රායෙල්වරුද 29
ගිබියා වටකර මිනිසුන් සඟවා
සිටෙවුවෝය.
තුන්වෙනිද ඉශ්‍රායෙල් පුත්‍රයෝ 30
බෙන්යමින් පුත්‍රයන්ට විරුද්ධව ගොස්
වෙනවතාවලදී මෙන් ගිබියා ළඟ
පිළිවෙළින් සිටගත්හ. බෙන්යමින් පුත්‍රයෝ 31
සෙනගට විරුද්ධව පිටතට අවුත් නුවරින්
ඈත්වී, වෙන වතාවලදී මෙන් සෙනගට
පහරදෙන්ට පටන්ගෙන, කෙතෙහි
බෙතෙල්ටත් ගිබියාටත් යන මාවත්
දෙකේදී ඉශ්‍රායෙල් මිනිසුන් තිස්දෙනෙක්
පමණ මැරුවෝය. පළමු ලෙස ඔවුන් 32
අප ඉදිරියෙහි පරාජයවෙනවායයි
බෙන්යමින් පුත්‍රයෝ කීවෝය. එහෙත්
ඉශ්‍රායෙල් පුත්‍රයෝ: අපි පලාගොස්
ඔවුන් නුවරින් ඈත්කොට මාවත්වලට
පමුණුවාගනිමුයයි කීවෝය. එවිට සියලු 33
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ තමුන් සිටි තැනින්
නැගිට ගොස් බාල්-තාමාර්හි පිළිවෙළින්
සිටගත්තෝය. සැඟවී බලා සිටි
ඉශ්‍රායෙල්වරුද තමුන්ගේ ස්ථානයවූ
ගිබියාහි පිට්ටනියෙන් නික්ම ආවෝය.

34 සියලු ඉශ්‍රායෙල්වරුන්ගෙන් තෝරාගත්
මනුෂ්‍යයන් දසදහක් ගිබියා ඉදිරිපිටට
ආවෝය, සටනද බලතර විය. නුමුත්
විපත තමුන්ට ළංවූ බව ඔව්හු නොදත
35 සිටියාහ. ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්
ඉදිරියෙහි බෙන්යමින් පරාජයකෙරෙවූ-
සේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඒ දවසේදී
බෙන්යමින්වරුන්ගෙන් මිනිසුන් විසි-
පන්දස් එකසියයක් විනාශකළෝය. මේ
සියල්ලෝ කඩුව පාවිච්චිකරන අයය.
36 තමුන් පරාජය වෙන බව බෙන්යමින්
පුත්‍රයෝ දුටුවෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ
වනාහි තමුන් විසින් ගිබියා ළඟ සඟවා
සිටෙවූ මනුෂ්‍යයන් විශ්වාසකළ නිසා
බෙන්යමින්වරුන් ඉදිරියෙන් ගියෝය.
37 සැඟවී සිටි මිනිස්සුද ඉක්මන් කොට
ගිබියාට විරුද්ධව වේගයෙන් පැතිර
ගොස් මුළු නුවරට කඩුමුවහතින් පහර
38 දුන්නෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ද සැඟවී
උන් අයද අතරේ නියමකරගත් ලකුණ
නම් නුවරින් මහත් දුම් කඳක් නැග්ග-
39 වීමය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ සටනේදී
හැරුණෝය, බෙන්යමින්වරු ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන්ට පහරදෙන්ට පටන්ගෙන,
ඔවුන්ගෙන් තිස්දෙනෙක් පමණ මරා:
පළමුවෙනි සටනේදී මෙන්ම ඔවුන්
සත්තකින් අපට පරාජයවෙනවායයි
40 කීවෝය. එහෙත් දුම් කණුවක්වී ධූමය
නුවරින් නගින්ට පටන්ගත්තේය, බෙන්-
යමින්වරු පස්සට හැරී බැලූ කල නුවර
හැමතැනින්ම දුම් අහසට නගිනවා
41 දුටුවෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝද
හැරුණෝය, එවිට බෙන්යමින්
මනුෂ්‍යයෝ විපත තමුන් පිටට පැමිණ
42 තිබෙන බව දැක කැලඹී, ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන් ඉදිරියෙන් කාන්තාරයට යන
මාර්ගයේ හැරී ගියෝය; එහෙත් සටන
ඔවුන් පසු පස්සෙහි බලවත්ව පැවතුණේය;
නුවරවලින් පිටතට ආ තැනැත්තෝ
43 මැදිවුණාවූ අයින් විනාශකළෝය. ඔව්හු
බෙන්යමින්වරුන් හැම අතින් වටකරගන,
නැගෙනහිරින් ගිබියාට පැමිණෙන තුරු
ඔවුන් පස්සේ එළවාගන ගොස්, ඔවුන්
නැවතුණ තැනදී ඔවුන් පාගාදැමූවෝය.
44 මෙසේ බෙන්යමින්වරුන්ගෙන් මනුෂ්‍යයන්
දහඅට දහක් වැටුණෝය; ඔවුන්
සියල්ලෝ වික්‍රමාන්විත මනුෂ්‍යයෝය.
ඔව්හු හැරී කාන්තාරයෙහි තිබෙන 45
රිම්මොන් පර්වතයට පලා ගියෝය.
ඔවුන්ගෙන් වෙන් වශයෙන් පන්දහසක්
මාවත්වලදී මරා, ඉතිරි අය පස්සේ
ගිදෙම් දක්වා එළවාගන ගොස්,
ඔවුන්ගෙන් දෙදහසක් මැරුවෝය. මෙසේ 46
බෙන්යමින්වරුන්ගෙන් ඒ දවසේදී වැටුණු,
කඩුව පාවිච්චි කරන මනුෂ්‍යයෝ
විසි පන්දහසක්ය; ඔවුන් සියල්ලෝ
වික්‍රමාන්විත මනුෂ්‍යයෝය. නුමුත් 47
මනුෂ්‍යයන් හසියයක් හැරී කාන්-
තාරයෙහි තිබෙන රිම්මොන් පර්වතයට
පලාගොස් රිම්මොන් පර්වතයෙහි
හාර මාසයක් සිටියෝය. ඉශ්‍රායෙල් 48
මනුෂ්‍යයෝ නැවත බෙන්යමින් පුත්‍රයන්
ළඟට හැරී ඇවිත්, නුවර මිනිසුන්ටද
ගවයන්ටද තමුන්ට සම්බවූ සියල්ලන්ටද
කඩුමුවහතින් පහරදී, ඔවුන්ට සම්බවුණු
සියලු නුවරවල්ද ගිනිලෑවෝය.

## ඉතිරිවූ බෙන්යමින්වරුන්ට භාර්යාවන් සපයාදීම

21
අපෙන් කිසිවෙක් තමාගේ
දුවෙකු බෙන්යමින් මනුෂ්‍යයෙකුට
භාර්යා කොට නොදෙන්නෙමුයයි
ඉශ්‍රායෙල් මනුෂ්‍යයන් විසින් මිශ්පාහිදී
දිවුරා තිබුණේය. සෙනඟ බෙතෙල්ට 2
පැමිණ එහි සවස්වන තෙක් දෙවියන්-
වහන්සේ ඉදිරියෙහි හිඳ ශබ්දනගා මහත්
හැඬීමකින් හැඬුවෝය. ඉශ්‍රායෙල්ගේ 3
දෙවිවූ ස්වාමීන්වහන්ස, අද ඉශ්‍රායෙල්-
වරුන්ගෙන් එක ගෝත්‍රයක් අඩුවෙන
හැටියට මේ කාරණය ඉශ්‍රායෙල්හි
සිද්ධවුණේ මක්නිසාදැයි ඔව්හු කීවෝය.
පසුවද සෙනඟ අලුයම නැගිට 4
පූජාසනයක් ගොඩනගා දවන පූජාද
ශාන්ති පූජාද ඔප්පුකළෝය. ඉශ්‍රායෙල් 5
පුත්‍රයෝ: සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින්
සභාව සමග ස්වාමීන්වහන්සේ වෙතට
නාවේ කවුරුදැයි ඇසුවෝය; මක්නිසාද
මිශ්පාහි ස්වාමීන්වහන්සේ වෙතට නෝන
අය මැරිය යුතුමය කියා මහත් දිවුරුමක්

6 කර තිබුණේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
තමුන්ගේ සහෝදරවූ බෙන්යමින් ගැන
ශෝකවී: මේ දවසේ ඉශ්‍රායෙල්වරුන්ගෙන්
7 එක ගෝත්‍රයක් සිඳින ලද්දේය. ඔවුන්ගෙන්
ඉතුරුව සිටින්නන්ට භාර්යාවන් ලැබෙන
පිණිස අපි කුමක් කරමුද? අපේ දූවරුන්
ඔවුන්ට භාර්යාවන් කොට නොදෙන
හැටියට ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
8 දිවුළෙමුයයි කීවෝය. තවද ඔව්හු:
ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් ස්වාමීන්වහන්සේ
වෙත මිශ්පාට නාවේ කොයි එකදැයි
අසා යාබෙෂ්-ගිලියද්හි සිට කිසිවෙක්
සභාව සමග කඳවුරට නා බව
9 දැනගත්තෝය. මක්නිසාද සෙනඟ
ගණන්කළ විට යාබෙෂ්-ගිලියද්
වැසියන්ගෙන් කවුරුවත් එහි නැති බව
10 පෙනුණේය. සභාව ඉතා වික්‍රමාන්විත
මනුෂ්‍යයන්ගෙන් දෙළොස් දහසක්
එතැනට යවමින් ඔවුන්ට අණකොට:
නුඹලා ගොස් ස්ත්‍රීන්ද බාලයන්ද ඇතුළුව
යාබෙෂ්-ගිලියද්හි වැසියන්ට කඩු-
11 මුවහතින් පහරදීපල්ලා. නුඹලා විසින්
කළ යුතු දේ නම් සියලු පුරුෂයන්ද
පුරුෂයන් සමග සයනය කළ සියලු
ස්ත්‍රීන්ද මුළුමනින්ම විනාශකරදැමීම-
12 යයි කීවෝය. පුරුෂයෙකු සමග සයනය
කිරීමෙන් ඔහු හැඳින නොගත් කන්‍යා
යෞවනියන් හාර සියයක් යාබෙෂ්-ගිලියද්
වැසියන් අතරේ ඔවුන්ට සම්බවී, කානාන්
දේශයේ ෂීලෝහි තිබුණ අන්දයමට ඔවුන්
ගෙනාවෝය.
13 එවිට රිම්මොන් පර්වතයේ සිටි
බෙන්යමින් පුත්‍රයන් සමග කථාකොට
ඔවුන්ට සමාදනය ප්‍රකාශකරන්ට මුළු
14 සභාව මිනිසුන් හැරියාය. එකල
බෙන්යමින්වරු හැරී ආවෝය; ඔව්හු
යාබෙෂ්-ගිලියද්හි ස්ත්‍රීන්ගෙන් ඉතුරුකළ
ස්ත්‍රීන් ඔවුන්ට දුන්නෝය. ඒත් ඔවුන්ට
15 මදි විය. ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්
ගෝත්‍ර අතරෙහි බිඳීමක් කළ නිසා
සෙනඟ බෙන්යමින් ගැන ශෝකවූහ.
16 එවිට සභාවේ වැඩිමහල්ලෝ කථා-
කොට: ඉතිරි අයට භාර්යාවන් ලැබෙන
පිණිස කුමක් කරමුද? මක්නිසාද
බෙන්යමින්වරුන් අතරෙන් ස්ත්‍රියෝ
නැතිවූහයි කීවෝය. තවද ඔව්හු 17
කථාකොට: ඉශ්‍රායෙල්වරුන් අතරෙන්
ගෝත්‍රයක් නොමැකෙන ලෙස
බෙන්යමින්හි ගැළවී සිටින්නන්ට
උරුමයක් තිබිය යුතුය. එහෙත් අපට 18
අපේ දූවරුන්ගෙන් ඔවුන්ට භාර්යාවන්
දෙන්ට බැරිය. මක්නිසාද බෙන්යමින්
මනුෂ්‍යයෙකුට භාර්යාවක් දෙන
තැනැත්තාට ශාපවේවයි කියා ඉශ්‍රායෙල්
පුත්‍රයෝ දිවුළෝයයි කීවෝය.
තවද ඔව්හු කථාකොට: බෙතෙල්ට 19
උතුරෙන්ද බෙතෙල් සිට ෂෙකෙම්ට යන
මාවතට නැගෙනහිරෙන්ද ලෙබොනාට
දකුණෙන්ද තිබෙන ෂීලෝහිදී අවුරුදු-
පතා ස්වාමීන්වහන්සේට මංගල්‍යයක්
පවත්වන්නෝයයි කියා, ඔව්හු 20
බෙන්යමින් පුත්‍රයන්ට අණකරමින්:
නුඹලා ගොස් මිදිවතුවල සැඟවී සිට,
ෂීලෝහි දූවරුන් නටන්ට පිටතට 21
ආවොත් නුඹලා මිදිවතුවලින් නික්ම
ඇවිත් එකිනෙකා ෂීලෝහි දූවරුන්ගෙන්
තම තමාට භාර්යාවක් අල්ලාගෙන
බෙන්යමින් රටට පලයල්ලා. ඉතින් 22
ඔවුන්ගේ පියවරුන් හෝ සහෝදරයන්
හෝ අප ඉදිරියෙහි පැමිණිලිකරන්ට
ආවාම අපි ඔවුන්ට කථාකොට:
කරුණාවෙන් ඔවුන් අපට දුනමැනවි;
මක්නිසාද අපි යුද්ධයේදී එක එකාට
භාර්යාවක් ඉතුරු නොකෙළෙමුව,
නුඹලාත් ඔවුන් ඔවුන්ට දුන්නේ නැත;
දුන්නා නම් නුඹලා වරදකාරයෝ
වන්නහුයයි කියන්නෙමුයයි ඔවුන්ට
කීවෝය. බෙන්යමින් පුත්‍රයෝ එසේ 23
කොට නැටූ තැනැත්තියන්ගෙන් තමුන්ගේ
ගණන ලෙස තමුන්ට භාර්යාවන්
අදුකරගෙන, තමුන්ගේ උරුමයට
හැරීගොස්, නුවරවල් ගොඩනගා එහි
විසුවෝය. එකල ඉශ්‍රායෙල් පුත්‍රවූ සියලු 24
මනුෂ්‍යයෝ තමතමුන්ගේ ගෝත්‍රයද
පෙළපතද කරා ගියෝය, එතනින්
එකිනෙකා තමතමාගේ උරුමයට පිටත්ව
ගියේය. ඒ දවස්වල ඉශ්‍රායෙල්හි රජෙක් 25
නොසිටියේය. එක් එක් මනුෂ්‍ය තෙමේ
තම තමාගේ ඇස් හමුයෙහි හරිව තිබුණු
දේ කෙළේය.

# රූත්ගේ කථාව

## නායෝමි මෝවබ්හි විසීම සහ රූත් සමග හැරී ඒම

1 තවද විනිශ්චයකාරයන් විනිශ්චය
කරන දවස්වලදී දේශයෙහි
සාගතයක් විය. එවිට යූදයේ බෙත්-
ලෙහෙමේ එක්තරා මනුෂ්‍යයෙක් තමාගේ
භාර්යාවද පුත්‍රයන් දෙදෙනාද සමග
මෝවබ් දේශයෙහි වසන පිණිස ගියේය.
2 ඒ මනුෂ්‍යයාගේ නම එලීමෙලෙක්ය,
ඔහුගේ භාර්යාවගේ නම නායෝමිය,
පුත්‍රයන් දෙදෙනාගේ නම් මාලොන් සහ
කිලියොන්ය, ඔව්හු යූදයේ බෙත්-ලෙහෙමේ
එප්‍රාත්වරුය. ඔව්හු මෝවබ් රටට පැමිණ
3 එහි සිටියෝය. නායෝමිගේ පුරුෂයාවූ
එලීමෙලෙක් මළේය; ඈද ඇගේ පුත්‍රයෝ
4 දෙදෙනාද ඉතිරිව සිටියෝය. ඔව්හු
මෝවබ් ස්ත්‍රීන්ගෙන් භාර්යාවන් පාවා-
ගත්තෝය; එක තැනැත්තියෙකුගේ නම
ඔර්පාය, අනික් තැනැත්තියගේ නම
රූත්ය. ඔව්හු දස අවුරුද්දක් පමණ
5 එහි විසුවෝය. මාලොන්ද කිලියොන්ද
යන දෙදෙනාම මළෝය; මෙසේ ඒ ස්ත්‍රී
ඇගේ දරුවන් දෙදෙනාද ඇගේ පුරුෂයාද
6 නැතිව තනිවූවාය. එවිට මෝවබ් රටින්
හැරීඑන පිණිස ඈ තමාගේ යෙහෙළින්
සමග නැගුට්ණාය. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේ** තමන් සෙනඟට භෝජනය
දීමෙන් ඔවුන්ට කරුණාව පෙන්වූ බව
7 මෝවබ් රටේදී ඈට සැලවිය. ඈද ඈ
සමග ඇගේ යෙහෙළින් දෙදෙනාද තමුන්
සිටි තැනින් පිටත්ව ගොස් යූද දේශයට
හැරී එන පිණිස ගමන්ගත්තෝය.
8 නායෝමි ඇගේ යෙහෙළින් දෙදෙනාට
කථාකොට: තුඹලා හැරී තුඹලාගේ
මවුවරුන්ගේ ගෙවලට පලයල්ලා. තුඹලා
මැරුණ අයටත් මටත් කරුණාවෙන්
ක්‍රියා කළ ලෙස **ස්වාමීන්වහන්සේ**
තුඹලාටත් කරුණාවෙන් යුක්තව
ක්‍රියාකරනසේක්වා. තුඹලා එකිනෙකා 9
තම තමාගේ පුරුෂයා ඇතුව ඔහුගේ
ගෙදර විශ්‍රාමය ලබන ලෙස **ස්වාමීන්-
වහන්සේ** තුඹලාට වර දෙනසේක්වයි
කීවාය. ඉක්බිති ඕතොමෝ ඔවුන්
සිඹගත්තාය. ඔව්හුද ශබ්දනගා අඬා: 10
නැත, අපි තුඹ සමග තුඹේ සෙනඟ
වෙතට යන්නෙමුයයි ඈට කීවෝය.
නායෝමිද: මාගේ දූවරුනි, හැරී 11
පලයල්ලා. මා සමග යන්නේ මොකටද?
තුඹලාට පුරුෂයෝ වෙන්ට මාගේ
කුසෙහි තවත් පුත්‍රයෝ ඇද්ද? මාගේ 12
දූවරුනි, හැරී පලයල්ලා; මක්නිසාද
පුරුෂයෙකු පාවාගන්ට මට වයස වැඩිය.
ඉදින් මට බලාපොරොත්තුව තිබේය
කියා, අද රාත්‍රියේම පුරුෂයෙකු ලැබ
පුත්‍රයන් වැදුවත්, ඔවුන් වැඩෙන තෙක් 13
තුඹලා පුරුෂයන් සරණපාවානො-
ගෙන ඔවුන් ගැන බලාපොරොත්තුව
සිටින්නහුද? මාගේ දූවරුනි, එසේ
නොවේය; **ස්වාමීන්වහන්සේගේ** අත
මට විරුද්ධව තිබෙන නිසා තුඹලාගේ
දුකට වඩා මාගේ දුක මහත්ව තිබේ-
යයි කීවාය. ඔව්හු ශබ්දනගා නැවත 14
ඇඬුවෝය. ඔර්පා ඇගේ නැන්ද සිඹ
යන්ට ගියාය; නුමුත් රූත් ඈට
ඇලුම්කමින් බැඳී සිටියාය. ඈ 15
කථාකොට: බලව, තුඹේ නෑනා ඇගේ
සෙනඟද දෙවියන්ද වෙතට හැරී ගියාය.
තුඹේ නෑනා පස්සේ හැරී පලයන්නැයි
කීවාය. රූත් කියන්නී: තුඹ අත්හැර 16
හැරීයන ලෙස මට පෙරැත්ත නොකරන්න.
මක්නිසාද තුඹ යන තැනට මමත්
යමී; තුඹ නවතින තැන මමත් නවතිමි.
තුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය,
තුඹේ දෙවියන්වහන්සේ මාගේ

17 දෙවියන්වහන්සේ වනසේක. තුඹ නසින
තැන මමත් නැසී, එතැනම තැන්පත්
කරනු ලබන්නෙමි. මරණය මිස වෙන
කිසිවක් තුඹත් මාත් වෙන්කළොත්,
**ස්වාමීන්වහන්සේ** එසේද ඊට වැඩියෙන්ද
18 මට කරනසේක්වයි කීවාය. එවිට රූත්
ඈ සමග යන්ටම නියමකරගන සිටින
බව ඈ දක ඈට කථාකිරීමෙන්
19 නැවතුණාය. මෙසේ ඔවුන් දෙදෙනා
බෙත්-ලෙහෙමට පැමිණෙන තුරු
ගමන්කළෝය. තවද ඔවුන් බෙත්-
ලෙහෙමට පැමුණුණු කල මුළු නුවර
ඔවුන් ගැන කැලඹී, ස්ත්‍රීහු කථා-
කොට: මේ නායොමිදැයි කීවෝය.
20 ඈද: මට *නායොමියයි නොකියා
†මාරායයි කියාපල්ලා. මක්නිසාද
සර්වපරාක්‍රමයාණන්වහන්සේ මා අති
21 තික්තකමට පැමිණෙවූසේක. මම
සම්පූර්ණව පිටත්ව ගියෙමි, **ස්වාමීන්-**
**වහන්සේ** මා සිස්කොට නැවත ගෙනා-
සේක. **ස්වාමීන්වහන්සේ** මට විරුද්ධව
සාක්ෂිදී සර්වපරාක්‍රමයාණන්වහන්සේ
මට පීඩා පමුණුවා තිබෙද්දී, තුඹලා
මට නායොමිය කියන්නේ මක්නිසාදැයි
22 කීවාය. මෙසේ නායොමිද ඈ සමග
මෝවබ් රටෙන් ආවාවූ ඈගේ යෙහෙළී
වූ මෝවබිය රූත්ද හැරී ආවෝය. යව
කපන කාලය පටන්ගැන්මේදී ඔව්හු
බෙත්-ලෙහෙමට පැමුණුණෝය.

## රූත් බෝවස්ගේ කෙත්වල කරල් ඇහිදීම

**2** නායොමිගේ පුරුෂයා වන
එලීමෙලෙක්ගේ පෙළපතට අයිතිවූ,
මහත් වස්තුකාරයෙක්වූ බෝවස් නම්
2 නෑයෙක් ඈට සිටියේය. මෝවබිය රූත්
නායොමිට කථාකොට: මම කෙතට ගොස්
මට කරුණාව පෙන්වන කෙනෙකු පස්සේ
යමින් කරල් ඇහිදගන එන්නෙමියි
කීවාය. ඈද: මාගේ දියණියෙනි,
3 පලයන්නැයි කීවාය. ඈ ගොස් කෙතට
පැමිණ ගොයම් කපන්නන් පස්සේ
කරල් ඇහින්දය. වාසනාවට මෙන් ඈ
එලීමෙලෙක්ගේ පෙළපතට අයිති
බෝවස්ගේ කෙත් කොටසට පැමින්නාය.
බලව, බෝවස් බෙත්-ලෙහෙමේ සිට අවුත්: 4
**ස්වාමීන්වහන්සේ** තුඹලා සමග වේවයි
ගොයම් කපන්නන්ට කීවේය. ඔව්හු
උත්තරදෙමින්: **ස්වාමීන්වහන්සේ** තුඹට
ආශීර්වාදකරනසේක්වයි ඔහුට කීවෝය.
එවිට බෝවස්: මේ යෞවනිය කාගේදැයි 5
ගොයම් කපන්නන්ගේ ප්‍රධානියාවූ
තමාගේ මෙහෙකරුවාගෙන් ඇසීය.
ගොයම් කපන්නන්ගේ ප්‍රධානියාවූ 6
මෙහෙකරුවා උත්තර දෙමින්: මැ
නායොමි සමග මෝවබ් රටෙන් හැරී
ආවාවූ මෝවබිය යෞවනීය. මැ: ගොයම් 7
කපන්නන් පස්සේ ගොයම් මිටි අතරේ
කරල් ඇහිද එකතු කරන්ට මට අවසර
ලැබේවයි කියා ඇවිත් ගෙයි ටිකක්
ප්‍රමාදවුණා මිසක් උදය පටන් මේ වන
තුරු කරල් ඇහිදිමින් සිටිනීයයි කීවේය.
එවිට බෝවස්: මාගේ දියණියෙනි, 8
අහපන්න; වෙන කෙතකට ඇහිදින්ට
නොයන්න, මෙතැනින් නොගොස් මෙහි
මාගේ තරුණියන් එක්කම සිටපන්න.
ඔවුන් කපන කෙත බලාගන ඔවුන් පස්සේ 9
පලයන්න. තුඹට අත නොගසන ලෙස
මා විසින් තරුණ පුරුෂයන්ට අණකර
තිබෙනවා නොවේද? තුඹට පිපාසාවූ
කල භාජන ළඟට ගොස් තරුණයන්
ඇද තිබෙන වතුරෙන් බීපන්නැයි රූත්ට
කීවේය. එවිට ඈ බිම වැතිර මුහුණින් 10
වැටී වැඳ: විදේශීවූ මා සලකන ලෙස
ඔබ ඉදිරියෙහි මට කරුණාව ලැබී
තිබෙන්නේ මක්නිසාදැයි ඔහුට කීවාය.
බෝවස් උත්තරදෙමින්: තුඹේ පුරුෂයා 11
නැසුණු පසු තුඹේ නැන්දට තුඹ කළ
සියල්ලත් තුඹේ පියා හා මවුද ජන්ම
භූමියද අත්හැර මීට ප්‍රථම තුඹ නැදින්න
සෙනඟක් වෙතට ආ බවත් මට
සම්පූර්ණයෙන් දන්වා තිබේ. **ස්වාමීන්-** 12
**වහන්සේ** තුඹේ ක්‍රියාවට විපාක දෙන-
සේක්වා, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේගේ** පියාපත් යටතේ ආරක්ෂාවී

*එනම්, ප්‍රසන්න, මිහිරි.
†එනම්, තික්ත.

සිටින්ට ආවාවූ නුඹට උන්වහන්සේගෙන්
සම්පූර්ණ විපාකයක් ලැබේවයි ඈට
13 කීවේය. එවිට ඈ: මාගේ ස්වාමිනි,
ඔබ ඉදිරියෙහි මට කරුණාව
ලැබේවා; මක්නිසාද මා ඔබගේ
මෙහෙකාරියන්ගෙන් කෙනෙකු මෙන්
නොවන නුමුත්, ඔබ මා සනසා ඔබගේ
මෙහෙකාරිය සමග කරුණාවෙන්
14 කථාකෙළෙහියයි කීවාය. කෑම කන
වේලාවේ බෝවස් ඈට කථාකොට:
මෙහාට ඇවිත් මේ රොටිවලින් අරන්
නුඹේ කැබෙල්ල කාඩි හොද්දේ පොවා
කාපන්නැයි ඈට කීවේය. ඈද ගොයම්
කපන්නන් ළඟ ඉඳගත්තාය. ඔහු විලඳත්
ඈට ළංකරදුන්නේය, ඈ කා තෘප්තියට
15 පැමිණ ඉතුරු කරගත්තාය. ඈ කරල්
ඇහිඳින්ට නැගිට ගිය විට බෝවස්
තමාගේ වැඩකාරයන්ට අණකරමින්:
ඈට මිටි අතරෙන් ඇහිඳින්ට ඉඩදීපල්ලා,
16 ඈට සැර නොකරල්ලා. අහුරුවලිනුත්
සමහරක් ඈද දමා ඈට ඇහිඳ ගැනීමට
අත්හැරපල්ලා, ඈට තරවටු නොකරල්ලා-
17 යයි කීවේය. මෙසේ ඈ සවස් වනතෙක්
කෙතෙහි ඇහිඳ ඈ ඇහිඳපු ඒවා
මැඩගත්තාය, යව ඒඵාවක් පමණ
18 තිබුණේය. ඈ ඒවා රැගෙන නුවරට
ගියාය. ඈ ඇහිඳපු ඒවා ඇගේ නැන්දා
දුටුවාය. ඈ තෘප්තියට පැමිණි පසු
ඉතුරුකරගත් ඒවාත් එළියට අරන් ඈට
19 දුන්නාය. ඇගේ නැන්දා: නුඹ අද ඇහින්දේ
කොහේද? වැඩකළේ කොතනදැයි
ඇගෙන් අසා, නුඹ ගැන සැලකූ අයට
ආශීර්වාදවේවයි කීවාය. කා වෙත
වැඩකළාද කියා ඈ තම නැන්දාට
දන්වමින්: මා අද වැඩකළේ බෝවස්
නම්වූ මනුෂ්‍යයෙකු වෙතයයි කීවාය.
20 එවිට නායොමි ඇගේ යෙහෙළිට
කථාකොට: ඔහු ජීවතුන්ටත් මළවුන්ටත්
ඇති තමාගේ කරුණාව අත්නොහැරියේය,
ඔහුට ස්වාමීන්වහන්සේගෙන් ආශීර්වාද
ලැබේවයි කීවාය. තවද නායොමි: ඒ
මනුෂ්‍යයා අපට ළඟ නෑයෙක්ය, *අපේ
ළඟම නෑයෙක්යයි ඈට කීවාය.

*හෙබ්‍රෙව්: 'ගෝයෙල්'-එනම්, මිදීම
සිද්ධකරන්ට නිස්සා.

මෝවබිය රූත්ද: එසේය, ඔහු මට 21
කථාකර-මාගේ ගොයම් සියල්ල කපා
නිමාකරන තුරු නුඹ මාගේ
වැඩකාරයන් ළඟම සිටපන්න කියාත්
කීවේයයි කීවාය. නායොමිද: මාගේ 22
දියණියෙනි, වෙන කෙතකදී මිනිසුන්
නුඹට අන්තරා නොකරන පිණිස
ඔහුගේ යෞවනියන් සමග යාම හොඳ-
යයි ඇගේ යෙහෙළිවූ රූත්ට කීවාය.
මෙසේ යව කපන කාලයත් තිරිඟු කපන 23
කාලයත් නිමවනතෙක් ඈ ඇහිඳින
පිණිස බෝවස්ගේ යෞවනියන් එක්කම
සිටියාය; ඈ වනාහි ඇගේ නැන්දා සමග
විසුවාය.

## රූත් බෝවස්ගෙන් කළ ඉල්ලීම

3 එවිට ඇගේ නැන්දාවූ නායොමි
ඈට කථාකොට: මාගේ දියණියෙනි,
නුඹට ශුභසිද්ධියක් වෙන පිණිස මා
විසින් නුඹට නිවාසයක් සොයන්ට ඕනෑ
නොවේද? ඉතින් නුඹ සමග සිටිය 2
යෞවනියන්ගේ ස්වාමියාවූ බෝවස්
අපේ නෑයෙක් නොවේද? ඔහු අද රෑ
පාවරේ යව පොළන්නේය. එබැවින් නුඹ 3
නා, තෙල්ගාගෙන, නුඹේ වස්ත්‍ර ඇඳගෙන,
පාවරට පලයන්න. ඒ මනුෂ්‍යයා කා බී
නිමවන තුරු නුඹ දකින්ට ඔහුට
ඉඩනොදියන්න. ඔහු නිදාගන්න විට, ඔහු 4
නිදාගන්න තැන බලාගෙන ඇතුළට ගොස්
ඔහුගේ පාවැසුම් ඇර නිදාගනින්න; එවිට
නුඹ විසින් කළ යුතු දේ ඔහු නුඹට
දන්වනවා ඇතැයි කීවාය. නුඹ මට 5
කියන සියල්ල කරන්නෙමියි ඈ ඈට
කීවාය. ඈ පාවරට ගොස් ඇගේ නැන්දා 6
ඈට අණකළ සියල්ල ලෙස කළාය.
බෝවස් කා බී ඔහුගේ සිත ප්‍රීතිවූ කල, 7
ඔහු ධාන්‍ය ගොඩේ කෙළවරෙහි
නිදාගන්ට ගියේය. ඈද හෙමින් අවුත්
ඔහුගේ පාදවලින් වැස්ම ඇර නිදාගත්තාය.
මධ්‍යම රාත්‍රියේ ඒ මනුෂ්‍යයා භයපත්ව 8
හැරී බලා, ස්ත්‍රියක් තමාගේ පාද ළඟ
නිදාඉන්නවා දැක: නුඹ කවුදැයි ඇසීය.
ඈද: මම ඔබගේ මෙහෙකාරීවූ රූත්ය; 9

එබැවින් ඔබගේ වස්ත්‍රය ඔබගේ
මෙහෙකාරී පිට අතුරනු මැනවි;
මක්නිසාද ඔබ ළඟනෑයෙකැයි කීවාය.
10 ඔහු: මාගේ දියණියෙනි, **ස්වාමීන්-**
**වහන්සේගෙන්** නුඹට ආශීර්වාද
ලැබේවා. නුඹ දිළිඳු හෝ පොහොසත්
හෝ තරුණයන් පස්සේ නොගිය
කාරණයෙන් නුඹ පටන්ගැන්මට වඩා
අන්තිමේදී වැඩි කරුණාව පෙන්වූයෙහිය.
11 දැන් මාගේ දියණියෙනි, භයනොවෙන්න;
නුඹ කියන සියල්ල නුඹට ඉෂ්ට-
කරන්නෙමි. මක්නිසාද මාගේ නුවර
සියලු මනුෂ්‍යයෝ නුඹ සුශීලවත් ස්ත්‍රියක්
12 බව දනිති. ඉතින් මා නුඹට ළඟනෑයෙක්
බව සැබෑය. නුමුත් මට වඩා ළඟනෑයෙක්
13 ඇත්තේය. අද රෑට පමාවෙයන්න, හෙට
උදය ඔහු නෑයෙකුගේ යුතුකම නුඹට
කළොත් යහපති. ඔහු නෑයෙකුගේ යුතුකම
ඉෂ්ටකෙරේවා. නුමුත් නෑයෙකුගේ
යුතුකම නුඹට ඉෂ්ටකරන්ට ඔහු
අකැමතිනම් **ස්වාමීන්වහන්සේ** ජීවමාන
බව සැබෑවා සේම මම එය ඉෂ්ට-
කරන්නෙමි. පහන්වන තෙක් නිද-
14 ගනින්නැයි කීවේය. ඈ පහන්වන තෙක්
ඔහුගේ පාමුල නිද හිඳ, එකිනෙකා
ඇඳිනගන්ට පුළුවන්වෙන්ට මත්තෙන්
නැගුටුණාය. ඔහුද: ඒ ස්ත්‍රිය පාවරට
ආ බව කිසිවෙකුට නොදැනේවයි කීවේය.
15 තවද ඔහු: නුඹ පොරවා සිටින සළුව
මෙහි ගෙනත් අල්ලාපන්නැයි කීවේය;
ඈ ඒක ඇල්ලූ කල යව නැළි හයක්
16 මැන ඈ පිට තබා නුවරට ගියේය. ඈ
තම නැන්දා ළඟට ආ කල: මාගේ
17 දියණියෙනි, නුඹ කවුදැයි ඇසුවාය. එවිට
ඈ ඒ මනුෂ්‍යයා තමාට කළ සියල්ල
නැන්දාට දන්වා—නුඹේ නැන්දා ළඟට හිස්
අතින් නොයන්නැයි ඔහු මට කියා මේ
යව නැළි හය මට දුන්නේයයි කීවාය.
18 එවිට ඈ: මාගේ දියණියෙනි, කාරණය
කෙසේ සිදුවන්නේද කියා දැනගන්නා
තුරු ඉඳින්න; මක්නිසාද ඒ මනුෂ්‍යයා
අද මේ දේ තීන්දුකරනතුර නිවාඩු
නොගන්නේයයි කීවාය.

## රූත් හා බෝවස් විවාහවීම සහ දවිත් දක්වා ඔවුන්ගේ පෙළපත

4 බෝවස් නුවර දොරටුව ළඟට
ගොස් එහි හිඳගත්තේය. බලව,
බෝවස් කී ළඟනෑයා එහි පැමිණියේය.
බෝවස් තම කියා: ඕයි! නුඹද? මෙහි
ඇවිත් වාඩිවෙයන්නැයි කීය. ඔහු
ගොස් වාඩිවුණේය. එවිට ඔහු නුවර 2
වැඩිමහල්ලන්ගෙන් දසදෙනෙක් කැඳවා-
ගෙන: නුඹලාත් මෙහි වාඩිවෙයල්ලා-
යයි කීවේය. ඔව්හුද වාඩිවුණෝය. ඔහු 3
ඒ ළඟනෑයාට කථාකොට: මෝවබ්
රටින් හැරී ඇවිත් සිටින නායෝමි
අපගේ සහෝදරවූ එලීමෙලෙක්ට තිබුණු
බිම් කොටස විකුණන්නීය. මෙහි 4
හිඳින්නන් සහ මාගේ සෙනඟගේ
වැඩිමහල්ලන් ඉදිරියෙහි ඒක මිලේට
ගනින්න කියා කාරණය නුඹට දන්වන්ට
සිතුවෙමි. ඉතින් ඒක ගළවාගන්ට
කැමතිනම් ගළවාගනින්න. ගළවාගන්ට
අකැමතිනම් ඒ බව දැනගන්නා පිණිස
මට කියාපන්න. මක්නිසාද ඒක
ගළවාගන්ට නුඹ සහ නුඹට පසුව මාත්
ඇර වෙන කිසිවෙක් නැතැයි කීවේය.
ඒක මම ගළවාගන්නෙමියි ඔහු කීය.
එවිට බෝවස්: නායෝමි අතින් ඒ බිම 5
මිලේට ගන්නා දවසේදී, මැරුණු අයගේ
නම උරුමය කෙරෙහි පවතින පිණිස
මැරුණු අයගේ භාර්යාවවූ මෝවබිය
රූත්ගෙනුත් ඒක මිලේට ගන්ට ඕනෑ-
යයි කීවාය. ඒ ළඟනෑයා කථාකොට: 6
මට ඒක ගළවාගන්ට බැරිය; එසේ
කළොත් මාගේ උරුමයට අලාභවෙයි.
මට ගළවාගන්ට බැරි නිසා මට තිබෙන
මිදීමේ බලය නුඹම භාරගනින්නැයි
කීවාය. පෙර කාලයේ මුදාගැනීමද 7
හුවමාරු කරගැනීමද ගැන සියලු
කාරණා ඉශ්‍රායෙල්වරුන් අතරේ ස්ථිර-
කිරීමේ සිරිත මෙසේය: එක්කෙනෙක්
තමාගේ මිරිවැඩිය ගළවා අනික් අයට
දෙන්නේය. ඒක ඉශ්‍රායෙල්වරුන් අතරේ
සහතික කිරීමේ විධියව තිබුණේය. ඒ 8
නිසා ළඟනෑයා: නුඹ ඒක මිලේට
ගනින්නැයි බෝවස්ට කියා තමාගේ

9 මිරිවැඩිය ගැළෙව්වේය. බෝවස්
වැඩිමහල්ලන්ටත් මුළු සෙනඟටත්
කථාකොට: එලීමෙලෙක්ට තිබුණු
සියල්ලත් කිලියොන්ට සහ මාලොන්ට
තිබුණු සියල්ලත් මා විසින් නායොමි
අතින් මිලදීගත් බවට තුඹලා අද
10 සාක්ෂිකාරයෝය. ඇරත් මැරුණු
අයගේ නාමය ඔහුගේ සහෝදරයන්
අතරෙන්ද ඔහුගේ ස්ථානයේ දොරටුවෙන්ද
මැකීනොයන පිණිස මැරුණු අයගේ
උරුමය කෙරෙහි ඔහුගේ නාමය
ගෙනයන පිණිස මාලොන්ගේ භාර්යාවවූ
මෝවබිය රූත් මාගේ භාර්යාව
කොට මිලදී ගතිමි. ඊට තුඹලා අද
11 සාක්ෂිකාරයෝයයි කීවේය. දොරටුවේ
සිටි මුළු සෙනඟද වැඩිමහල්ලෝද
කථාකොට: අපි සාක්ෂිකාරයෝය.
ස්වාමීන්වහන්සේ තුඹේ ගෙට එන මේ
ස්ත්‍රිය ඉශ්‍රායෙල් වංශය ගොඩනැගූ
රාකෙල්ද ලෙයාද යන ස්ත්‍රීන් දෙදෙනා
මෙන් කරනසේක්වා. තුඹ එප්‍රාතාහි
සම්පත් උපදවා ගනින්න, බෙත්-
12 ලෙහෙමෙහි කීර්තිමත් වෙයන්න. ස්වාමීන්-
වහන්සේ මේ යෞවනීගෙන් තුඹට දෙන
බීජය කරණකොටගෙන තුඹේ වංශය
යූද නිසා තාමාර් වැදූ පෙරෙශ්ගේ වංශය
13 හා සමානවේවයි කීවෝය. මෙසේ
බෝවස් රූත් පාවාගත්තේය, ඇ ඔහුගේ
භාර්යාව වූවාය. ඔහු ඇ වෙතට
පැමිණි කල ස්වාමීන්වහන්සේ ඇට
ගර්භෝත්පත්තිය දුන්සේක, ඇ පුත්‍රයෙකු
වැදුවාය. ස්ත්‍රියෝ නායොමිට කථා- 14
කොට: අද තුඹට ළඟනෑයෙක් නැතුව
සිටින්ට නැරියාවූ ස්වාමීන්වහන්සේට
ප්‍රශංසා වේවා, ඔහුගේ නාමය
ඉශ්‍රායෙල්හි කීර්තිමත් වේවා. ඔහු වනාහි 15
තුඹේ ජීවිතය ප්‍රාණවත් කරන්නෙක්ද
තුඹේ මහලු වයසේදී තුඹ පෝෂ්‍ය-
කරන්නෙක්ද වන්නේය. මක්නිසාද තුඹට
ආදරය ඇත්තාවූද පුත්‍රයන් සත්දෙනෙකුට
වඩා තුඹට යහපත්වූද තුඹේ යෙහෙළිය
ඔහු වැදුවායයි කීවෝය. නායොමි 16
ළදරුවා ගෙන තමාගේ ළයෙහි හොවා
ඇතිකළාය. අසල්වාසි ස්ත්‍රියෝ: 17
නායොමිට පුත්‍රයෙක් උපන්නේය කියා
ඕබෙද් යන නම ඔහුට තැබුවෝය. ඔහු
දාවිත්ගේ පියවූ යෙස්සේගේ පියාය.
පෙරෙශ්ගේ පෙළපත මේය: පෙරෙශ් 18
හෙශ්රොන් ඉපදවිය; හෙශ්රොන් රාම් 19
ඉපදවිය, රාම් අම්මිනාදබ් ඉපදවිය;
අම්මිනාදබ් නාෂොන් ඉපදවිය, නාෂොන් 20
සල්මොන් ඉපදවිය; සල්මොන් බෝවස් 21
ඉපදවිය, බෝවස් ඕබෙද් ඉපදවිය; ඕබෙද් 22
යෙස්සේ ඉපදවිය, යෙස්සේ දාවිත්
ඉපදවිය.

# සාමුවෙල්ගේ පළමුවෙනි පොත

## සාමුවෙල්ගේ උත්පත්තිය සහ කැපකරනුලැබීම

1 එප්‍රායිම්යයෙක්වූ ශුප්ගේ පුත්‍රවූ
තොහුගේ පුත්‍රයා වන එලීහුගේ පුත්‍රවූ
යෙරොහාම්ගේ පුත්‍රයා වන එල්කානා
නම් මනුෂ්‍යයෙක් එප්‍රායිම් කඳු රටේ
2 රාමාතයිම්-ශෝපීම්හි සිටියේය. ඔහුට
භාර්යාවන් දෙදෙනෙක් වූවෝය; එක්
තැනැත්තියකගේ නම හන්නාය, අනික්
තැනැත්තියගේ නම පෙනින්නාය.
පෙනින්නාට දරුවෝ සිටියෝය, නුමුත්
3 හන්නාට දරුවෝ නොසිටියෝය. ඒ
මනුෂ්‍යයා ෂීලෝහිදී සේනාවල ස්වාමීන්-
වහන්සේට නමස්කාරකරන්ටත් පූජා-
කරන්ටත් අවුරුද්දෙන් අවුරුද්ද තමාගේ
නුවර සිට නික්ම ගියේය. එහි ස්වාමීන්-
වහන්සේගේ පූජකයෝවූ හොප්නී සහ
පීනෙහාස් යන ඒලීගේ පුත්‍රයෝ දෙදෙනා
4 සිටියෝය. එල්කානා පූජාකරන දවස
පැමිණි කල තමාගේ භාර්යාවවූ
පෙනින්නාටත් ඇගේ සියලු පුත්‍රයන්ටත්
5 දූවරුන්ටත් කොටස් දුන්නේය. නුමුත්
හන්නාට ඔහු *දෙකොටසක් දුන්නේය.
මක්නිසාද ඔහු හන්නාට ආදරේව
සිටියේය, නුමුත් ස්වාමීන්වහන්සේ
විසින් ඇගේ ගර්භය පියවා තිබුණේය.
6 ස්වාමීන්වහන්සේ විසින් ඇගේ ගර්භය
පියවනලද බැවින් ඇගේ සැතිරී ඈ
කෝපකරන පිණිස ඇට බොහෝසෙයින්
7 තරහ ඉපදෙවුවාය. ඔහු අවුරුද්දෙන්
අවුරුද්ද එසේ කළේය. ඈ ස්වාමීන්-
වහන්සේගේ ගෘහයට ගිය ප්‍රස්තාවලදී
ඒ තැනැත්තී එසේ ඇට තරහ ඉප-
දෙවුවාය; ඒ නිසා ඈ කෑම නොකා
8 අඬමින් සිටියාය. එවිට ඇගේ පුරුෂයාවූ
එල්කානා ඇට කථාකොට: හන්නා,
නුඹ අඬන්නේ මන්ද? නොකා සිටින්නේ
මන්ද? නුඹේ සිත ශෝකව තිබෙන්නෙත්
මක්නිසාද? මා පුත්‍රයන් දසදෙනෙකුට
වඩා නුඹට හොඳ නැද්දැයි කීවේය.
ෂීලෝහිදී ඔවුන් කා බී පසුව හන්නා 9
නැගිට ගියාය. ඒලී පූජකයා ස්වාමීන්-
වහන්සේගේ මාලිගාවේ උළුවහුකණුව
ළඟ තිබුණ තමාගේ ආසනයේ ඉඳගෙන
උන්නේය. ඇගේ ආත්මය ශෝකයෙන් 10
පීඩිතවූයේය, ඈ ස්වාමීන්වහන්සේට
යාච්ඤාකරමින් අඬ අඬා සිටියාය. ඈ 11
භාරයක්වෙමින්: සේනාවල ස්වාමීන්-
වහන්ස, ඔබගේ මෙහෙකාරීගේ දුක
සැබවින් බලා මා සිහි කර, ඔබගේ
මෙහෙකාරී මතකනැති නොකර, ඔබගේ
මෙහෙකාරීට පිරිමි දරුවෙක් දෙන-
සේක් නම්, ඔහුගේ ජීවිතයේ සෑමදටම
ඔහු ස්වාමීන්වහන්සේට දෙන්නෙමි,
දැළිපිහියක්ද ඔහුගේ හිස පිටට
නොපැමිණෙන්නේයයි කීවාය. ඈ 12
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි බොහෝ
වේලා යාච්ඤාකරන අතර ඒලී ඇගේ
මුඛය දෙස බලා සිටියේය. මක්නිසාද 13
හන්නා තමාගේ සිත තුළේම කථාකළාය.
ඇගේ තොල් පමණක් සෙලවුණේය,
ඇගේ කටහඬ ඇසුණේ නැත. ඉන්නිසා
ඈ බී මත්වෙලායයි ඒලී සිතුවේය. ඒලී 14
ඇට කථාකොට: නුඹ කොපමණ කල්
මත්ව සිටිනවාද? නුඹේ මුද්‍රිකපානය
නුඹෙන් පහකරපන්නැයි කීවේය. හන්නා 15
උත්තරදෙමින්: මාගේ ස්වාමිනි, එසේ
නොවේ, මම ශෝක සිතක් ඇති
ස්ත්‍රියක්ය. මුද්‍රිකපානයවත් සුරා බීමවත්
නොබීවෙමි, ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
මාගේ ආත්මය වැගිරෙවුවෙමි. ඔබගේ 16

*ඇතැම් පිටපත්හි: තනි කොටසක්.

මෙහෙකාරී *බෙලියල්ගේ දුවකැයි
කල්පනානොකළ මැනවි. මක්නිසාද
මාගේ දුක සහ සන්තාපයේ අධිකතාව
නිසා මේ වන තුරු කථාකෙළෙමියි
17 කීවාය. එවිට ඒලී උත්තරදෙමින්:
සමාදානයෙන් පලයන්න; ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේගෙන් නුඹ කළ ඉල්ලීම
උන්වහන්සේ නුඹට ඉෂ්ටකරදෙන-
18 සේක්වයි කීවේය. ඈද: ඔබගේ
මෙහෙකාරීට ඔබ ඉදිරියෙහි කරුණාව
ලැබේවයි කීවාය. එවිට ඒ ස්ත්‍රී පිටත්ව
ගොස් කෑම කෑවාය, ඇගේ මුහුණද
19 තවත් මලානිකව නොතිබුණේය. ඔව්හු
අලුයම නැගිට **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි නමස්කාර කොට හැරී ගොස්
රාමාහි තමුන්ගේ ගෙදරට පැමුණුණෝය.
එල්කානා තමාගේ භාර්යාවවූ හන්නා
ඇඳින්නේය; **ස්වාමීන්වහන්සේද** ඈ
20 සිහිකළසේක. තවද අවුරුද්දක් යන
තැනදී හන්නා ගර්භිණීව පුත්‍රයෙකු
වැදුවාය; ඈ: මා **ස්වාමීන්වහන්සේගෙන්**
ඔහු ඉල්ලාගත් බැවිනැයි කියා ඔහුට
21 සාමුවෙල් යන නම තැබුවාය. එල්කානා
නම් මනුෂ්‍යයාද ඔහුගේ මුළු පවුලද
අවුරුදු පතා කරන පූජාවත් තමාගේ
බාරයත් **ස්වාමීන්වහන්සේට** ඔප්පුකරන
22 පිණිස නික්ම ගියෝය. නුමුත් හන්නා
ගියේ නැත; මක්නිසාද: ළමයා **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි පෙනී එහි හැම
කල්හිම නැවතී සිටින පිණිස,
කිරිවැරුවාම ඔහු ගෙන යන තුරු මම
නොයමියි ඈ තමාගේ පුරුෂයාට කීවාය.
23 ඇගේ පුරුෂයාවූ එල්කානා: නුඹට
යහපත්ව පෙනෙන දේ කරපන්න; ඔහු
කිරිවරන තුරු නැවතියන්න; නුමුත්
**ස්වාමීන්වහන්සේ** තමන්ගේ වචනය
ඉෂ්ටකරනසේක්වයි ඈට කීවේය. මෙසේ
ඒ ස්ත්‍රී නැවතී තමාගේ පුත්‍රයා කිරිවරන
24 තුරු ඔහුට කිරි දුන්නාය. ඔහු කිරිවැරූ
කල ඈ ගොන් තුන්දෙනෙක්ද පිටි
ඒඵාවක්ද මුද්‍රිකපාන භාජනයක්ද ඇතුව
ඔහු ගෙනගොස් ෂීලෝහි තිබුණු
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට පැමුණුණාය.
ළමයා බාලව සිටියේය. ඔව්හු ගොනා 25
මරා ළමයා ඒලී ළඟට ගෙනාවෝය.
ඈද: අනේ මාගේ ස්වාමීනි, *ඔබ ජීවත් 26
වන බව සැබෑවා සේම, මාගේ ස්වාමීනි,
මෙහි ඔබ ළඟ **ස්වාමීන්වහන්සේට**
යාච්ඤාකරමින් සිටි ස්ත්‍රී මමය. මේ දරුවා 27
ලබාගන්ට යාච්ඤාකෙළෙමි; **ස්වාමීන්-**
**වහන්සේද** මා උන්වහන්සේගෙන් ඉල්ලූ
මාගේ ඉල්ලීම මට දුන්සේක. එබැවින් 28
මමත් ඔහු **ස්වාමීන්වහන්සේට** දුනිමි;
ඔහු ජීවත්ව සිටින තෙක් ඔහු **ස්වාමීන්-**
**වහන්සේට** කැපයයි කීවාය. ඔව්හු එහිදී
**ස්වාමීන්වහන්සේට** නමස්කාර කළෝය.

## හන්නාගේ ස්තුති ගීය

2
හන්නා යාච්ඤාකරමින් කියන්නී-
මාගේ සිත **ස්වාමීන්වහන්සේ**
කෙරෙහි ප්‍රීතිමත් වේ,
මාගේ අඟ **ස්වාමීන්වහන්සේ** කෙරෙහි
උසස්වී තිබේ.
මාගේ මුඛය මාගේ සතුරන්ට විරුද්ධව
ඇරී තිබේ;
මක්නිසාද මම ඔබගේ ගැළවීම ගැන
ප්‍රීතිවෙමි.
**ස්වාමීන්වහන්සේ** මෙන් ශුද්ධවූ එකද 2
කෙනෙක් නැත;
මක්නිසාද ඔබ ඇර වෙන දෙවිකෙනෙක්
නැත.
අපේ දෙවියන්වහන්සේට සමානවූ
පර්වතයක් නැත.
ඔපමණ උඩඟු ලෙස තවත් කථා 3
නොකරල්ලා;
අහංකාරය නුඹලාගේ මුඛවලින්
නොනික්මේවා.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** සියල්ල
දන්න දෙවිකෙනෙක්ය,
උන්වහන්සේ ක්‍රියාවල් කිරා
බලනසේක.
බලවන්තයන්ගේ දුනු බිඳී තිබේ, 4
පැකුළුණු අයද බලය නමැති ඉඟපටිය

*එනම්, දුර්ජන හෙවත් කමකට නැති ස්ත්‍රියක්.

*හෙවත්, ඔබගේ ජීවිතය පා.

බැඳගන සිටිති.
5 තෘප්තිමත්ව සිටියෝ ආහාර ලබන
පිණිස කුලීවැඩ කරති.
බඩගිනිව සිටි අය එයින් මිදුණෝය.
එසේය, වඳ ස්ත්‍රී සත්දෙනෙකු වැදුවාය:
බොහෝ දරුවන් ඇත්තී පිරිහෙන්නීය.
6 **ස්වාමීන්වහන්සේ** නසනසේක,
ජීවත්කරනසේක.
*මිනීවළට පමුණුවනසේක, එයින්
නැගුටුවනසේක.
7 **ස්වාමීන්වහන්සේ** දිළිඳුකරනසේක,
පොහොසත්කරනසේක.
පහත්කරනසේක, උසස්කරනසේක.
8 අධිපතීන් සමග හිඳුවන පිණිසත්,
මහිමයේ සිංහාසනය උරුමකරවන
පිණිසත්,
උන්වහන්සේ දුප්පතා ධූලියෙන්
නැගුටුවනසේක.
දිළින්ද කසළ ගොඩින් ඔසවනසේක.
මක්නිසාද පොළොවේ කණු
**ස්වාමීන්වහන්සේගේය**,
උන්වහන්සේ ලෝකය ඒවා පිට
පිහිටෙවූසේක.
9 උන්වහන්සේ තමන් ශුද්ධවන්තයන්ගේ
පාද ආරක්ෂාකරනසේක,
නුමුත් දුෂ්ටයෝ අන්ධකාරයෙහි විනාශ
වන්නෝය.
මක්නිසාද ශක්තිය කරණකොටගෙන
කිසිවෙක් ජයනොගන්නේය.
10 **ස්වාමීන්වහන්සේ** සමග විවාදකරන්නෝ
කැබෙලිකරනු ලබන්නෝය;
උන්වහන්සේ අහසෙහි සිට ඔවුන්ට
විරුද්ධව ගර්ජනාකරනසේක.
**ස්වාමීන්වහන්සේ** පොළොවේ අන්තයන්
විනිශ්චයකරනසේක;
උන්වහන්සේ තමන් රජුට බලය
දෙනසේක,
ස්වකීය අභිෂේකලත් තැනැත්තාගේ
අඟ උසස්කරනසේකැයි කීවාය.

*හෙබ්‍රෙව්: ෂෙයෝල්.

## ඒලීගේ පුත්‍රයන්ගේ දුෂ්ටකම සහ ඒ ගැන තර්ජනකිරීම

එල්කානා රාමාහි තමාගේ ගෙදරට 11
ගියේය. ළමයාද ඒලී පූජකයා ඉදිරියෙහි
**ස්වාමීන්වහන්සේට** සේවයකෙළේය.
ඒලීගේ පුත්‍රයෝ වනාහි *දුර්ජනයෝ 12
වූවෝය; ඔව්හු **ස්වාමීන්වහන්සේ**
හැඳිනගත නොසිටියෝය. ඒ පූජකයන් 13
සෙනඟ සමග හැසුරුණු අන්දම
මෙසේය: කවුරු නුමුත් පූජාවක්
ඔප්පුකරන කල, මස් උයන අතර,
පූජකයාගේ වැඩකාරයා දති තුනක් ඇති
මස්කොක්කක් අතේ ඇතුව ඇවිත්,
හට්ටියේ හෝ සැළියේ හෝ කටාරමේ 14
හෝ ඇතිළියේ හෝ දමන්නේය; එවිට
කොක්කට අසුවූ සියල්ල පූජකයා
තමාටම ගන්නේය. ෂීලෝට පැමිණි
සියලු ඉශ්‍රායෙල්වරුන්ට ඔව්හු මෙසේ
කළෝය. එසේය, තෙල දවන්ටත් 15
පළමුවෙන් පූජකයාගේ වැඩකාරයා
ඇවිත් පූජා කරන මනුෂ්‍යයාට
කථාකොට: පූජකයාට පුලුස්සන්ට මස්
දියන්න; මක්නිසාද ඔහු අමු මස් මිස
උයාපු මස් නුඹෙන් පිළිනොගන්නේයයි
කීය. ඉදින් ඒ මනුෂ්‍යයා ඔහුට 16
කථාකොට: දැන්ම තෙල දවනවා ඇත,
එවිට සිතේ ආශාවේ පමණටම
ගනින්නැයි ඔහුට කීවේ නම්, ඔහු: එසේ
නොව නුඹ දැන්ම දෙන්ට ඕනෑය.
නැත්නම් බලාත්කාරයෙන් ගන්නෙමියි
කියන්නේය. මෙසේ ඒ තරුණයන්ගේ 17
පාපය **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඉතා
මහත්ව තිබුණේය. මක්නිසාද මනුෂ්‍යයෝ
**ස්වාමීන්වහන්සේගේ** පූජාව පුළුකොට
සිතුවෝය.
එහෙත් ළමයෙක්ව සිටි සාමුවෙල් හණ 18
ඒඵොද් සැට්ටයක් ඇඳගන **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි සේවයකෙළේය. තවද 19
ඔහුගේ මෑණියෝ ඇගේ පුරුෂයා සමග
අවුරුදු පූජාව ඔප්පුකරන පිණිස එන
කල අවුරුද්දෙන් අවුරුද්ද ඔහුට කුඩා

*බෙලියල් පුත්‍රයෝ.

20 යට ඇඳුමක් සාදගන ආවාය. ඒලී
එල්කානාටත් ඔහුගේ භාර්යාවටත්
ආශීර්වාදකරමින්: නුඹලා **ස්වාමීන්-**
**වහන්සේට** දුන්නාවූ දීම වෙනුවට
**ස්වාමීන්වහන්සේ** නුඹට මේ ස්ත්‍රියගෙන්
වංශයක් දෙනසේක්වයි කීවේය.
ඔව්හු තමුන්ගේ ගෙදරට ගියෝය.
21 **ස්වාමීන්වහන්සේ** හන්නාට කරුණා-
කළසේක, ඈ ගර්භිණීව පුත්‍රයන්
තුන්දෙනෙකුත් දූවරුන් දෙදෙනෙකුත්
වැදුවාය. සාමුවෙල් නම් ළමයා
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි වැඩුණේය.
22 ඒලී ඉතා මහලුව සිටියේය; තමාගේ
පුත්‍රයන් විසින් සියලු ඉශ්‍රායෙල්වරුන්ට
කළ සියල්ලත් සම්මුඛවීමේ කූඩාරම්
දෙරකඩ සේවයකළාවූ ස්ත්‍රීන් සමග
ඔවුන් සයනයකරන බවත් ඔහුට ආරංචි
23 විය. ඔහු ඔවුන්ට කථාකොට: නුඹලා
මෙයාකාර දේවල් කරන්නේ මක්නිසාද?
නුඹලාගේ නපුරු ක්‍රියා ගැන මේ
හැමදෙනාගෙන්ම මට අසන්ට ලැබේ.
24 මාගේ පුත්‍රයෙනි, එසේ නොකරල්ලා;
මක්නිසාද මට ලැබෙන ආරංචි හොඳ
නැත. නුඹලා **ස්වාමීන්වහන්සේගේ**
සෙනඟ වරද කරන්ට සලස්වති.
25 මනුෂ්‍යයෙකුට විරුද්ධව මනුෂ්‍යයෙක් පව්
කළොත් දෙවියන්වහන්සේ ඔහුට යුක්තිය
කරනවා ඇත. නුමුත් **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව මනුෂ්‍යයෙක් පව් කළොත් ඔහු
වෙනුවට මැදහත්වන්නේ කවුද්දයි ඔවුන්ට
කීවේය. නුමුත් ඔව්හු තමුන්ගේ පියාගේ
හඬට ඇහුම්කන් නුදුන්නෝය, මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** ඔවුන් නසන්ට අභිප්‍රා-
26 කළසේක. සාමුවෙල් නම් ළමයා
වැඩෙමින් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහිත්
මනුෂ්‍යයන් ඉදිරියෙහිත් ප්‍රසන්නව
සිටියේය.
27 දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ඒලී
ළඟට ඇවිත් කථාකොට: **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක—නුඹේ
පියාගේ වංශය මිසරයෙහි ඵාරාවෝගේ
ගෙදර සිටිද්දී මම ඔවුන්ට ප්‍රකාශ
28 නූණෙම්ද? ඔහු මාගේ පූජාසනය පිට
පූජා ඔප්පුකරන පිණිසද සුවඳ දුම් ඔප්පු-
කරන පිණිසද මා ඉදිරියෙහි ඒඵෝද්
සැට්ටය අඳින පිණිසද මාගේ පූජකයා
කොට සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින්
මම ඔහු තෝරා නොගතිම්ද? ඉශ්‍රායෙල්
පුත්‍රයන් විසින් ඔප්පුකරන සියලු
ගිනි පූජා මම නුඹේ පියාගේ වංශයට
නුදුනිම්ද? මාගේ වාසස්ථානයෙහි ඔප්පු 29
කරන්ට මා අණකර තිබෙන මාගේ
යාගයටත් මාගේ පූජාවටත් නුඹලා
පයින් ගසන්නෙත්, මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු පූජාවල ඉතා
හොඳ කොට්ඨාසවලින් නුඹලාම තරකර
ගන්න පිණිස නුඹ මට වඩා නුඹේ
පුත්‍රයන්ට ගෞරවකරන්නෙත් මක්නිසාද?
එබැවින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-** 30
**වහන්සේ** මෙසේ කියනසේක: නුඹේ
වංශයත් නුඹේ පියාගේ වංශයත් සෑම
කල්හිම මා ඉදිරියෙහි හැසිරෙනවා
ඇතැයි සැබවින්ම කීවෙමි. නුමුත් දැන්
**ස්වාමීන්වහන්සේ** කියන්නේ නම්: එය
මාගෙන් දුරුවේවා කියාය; මක්නිසාද
මට ගෞරවකරන්නන්ට මමත් ගෞරව
කරමි, මා සුළුකොට සිතන්නෝ නීච-
කොට සලකනු ලබති. බලව, නුඹේ 31
වංශයේ මහලු මිනිහෙක් නොසිටින
ලෙස නුඹේ බාහුවද නුඹේ පියාගේ
වංශයේ බාහුවද මා විසින් සිඳදමන
කාලයක් පැමිණෙන්නේය. දෙවියන්- 32
වහන්සේ ඉශ්‍රායෙල්ට යහපත කරන
කාලය මුළුල්ලේ, මාගේ වාසස්ථානයෙහි
විපත ඇති බව නුඹ දකිනවා ඇත.
නුඹේ වංශයේ මහලු මිනිහෙක් කවදාවත්
නොසිටින්නේය. මාගේ පූජාසනය ළඟින් 33
මා විසින් සිඳිනු නොලබන නුඹට අයිති
මනුෂ්‍යයා ඉතුරුවෙන්නේ නුඹේ ඇස්
ක්ෂයවී යන්ටත් නුඹේ හෘදය ශෝකාතුර
වෙන්ටත් සලස්වන පිණිසය. නුඹේ
වංශයෙන් පැවත එන සියල්ලන් මධ්‍යම
වයසේදීම මැරෙනවා ඇත. නුඹේ පුත්‍රයන් 34
දෙදෙනා වන හොප්නී සහ ඵීනෙහාස්
කෙරෙහි පැමිණෙන දෙය නුඹට ලකුණක්
වන්නේය; එනම් ඔවුන් දෙදෙනාම එක

35 දවසේදී මැරෙන්නෝය. මාගේ සිතේද
මාගේ කල්පනාවේද හැටියට කරන්නාවූ
විශ්වාසවූ පූජකයෙකු මම නැගුටුවාගෙන,
ඔහුට ස්ථිරවූ වංශයක් උපදවා දෙන්නෙමි;
ඔහු මාගේ අභිෂේකලත් තැනැත්තා
ඉදිරියෙහි සැමකල්ම හැසිරෙන්නේය.
36 තවද නුඹේ වංශයෙහි ඉතුරුවෙන
හැමදෙනා රිදී මිලයක්ද රොටියක්ද
ලබාගන්න පිණිස ඇවිත් ඔහු ඉදිරියේ
වැඳ වැටී: අනේ රොටී කැල්ලක් කන
පිණිස පූජක තනතුරකට මා පත්කළ
මැනවැයි කියනවා ඇත කියා කියන-
සේකැයි කීවේය.

## සාමුවෙල් කැඳවනු ලැබීම

3 සාමුවෙල් නම් ළමයා ඒලී ඉදිරියෙහි
**ස්වාමීන්වහන්සේට** සේවය කෙළේය.
ඒ දවස්වලදී **ස්වාමීන්වහන්සේගේ** වචනය
දුර්ලභවීය; දර්ශන බොහොමයක්ද
2 නොවීය. ඒ කාලයේ ඒලීගේ ඇස්
හරියාකාර නොපෙනෙන ලෙස අඳුරු-
3 වෙන්ට පටන්ගෙන තිබුණේය. එකල
ඒලී තමාගේ ස්ථානයෙහි සැතපෙද්දීත්,
දෙවියන්වහන්සේගේ පෙට්ටිය තිබුණාවූ
**ස්වාමීන්වහන්සේගේ** මාලිගාවෙහි
සාමුවෙල් නිදා ඉදිද්දීත්, දෙවියන්-
වහන්සේගේ පහන නිවෙන්ට පළමුවෙන්,
4 **ස්වාමීන්වහන්සේ** සාමුවෙල්ට හඬගැසූ-
5 සේක. ඔහු: මම මෙහියයි කියා, ඒලී
ළඟට දිවගොස්: මම මෙහිය; ඔබ මට
හඬගැසුවායයි කීය. ඔහුද: මම හඬ-
නොගැසීමි; නැවත නිදාගනින්නැයි
කීවේය. ඔහු ගොස් නිදාගත්තේය.
6 **ස්වාමීන්වහන්සේ** නැවතත්: සාමුවෙල්
කියා හඬගැසූසේක. සාමුවෙල් නැගිට
ඒලී ළඟට ගොස්: මම මෙහිය; ඔබ
මට හඬගැසුවායයි කීය. මාගේ
පුත්‍රය, මම හඬනොගැසීමි; නැවතත්
7 නිදාගනින්නැයි ඔහු කීවේය. සාමුවෙල්
ඒ වෙන තුරු **ස්වාමීන්වහන්සේ** නො-
හැඳින්නේය, ඒ වෙන තුරු **ස්වාමීන්-
වහන්සේගේ** වචනයද ඔහුට එළිදරව්
නොවීය. **ස්වාමීන්වහන්සේ** තුන්වෙනි 8
වරත් නැවත සාමුවෙල්ට හඬගැසූසේක.
ඔහු නැගිට ඒලී ළඟට ගොස්: මම
මෙහිය; ඔබ මට හඬගැසුවායයි
කීය. එවිට **ස්වාමීන්වහන්සේ** ළමයාට
හඬගසන බව ඒලී දැනගත්තේය. එබැවින් 9
ඒලී සාමුවෙල්ට කථාකොට: නුඹ ගොස්
නිදාගනින්න. නුඹට හඬගැසුවොත්—
**ස්වාමීන්වහන්ස**, කථාකළමැනව; ඔබ-
වහන්සේගේ මෙහෙකරුවා අසාගන
ඉන්නවාය කියා කියාපන්නැයි කීවේය.
සාමුවෙල් ගොස් තමාගේ ස්ථානයෙහි
නිදාගත්තේය. **ස්වාමීන්වහන්සේ** ඇවිත් 10
සිට වෙන වතාවලදී මෙන්: සාමුවෙල්,
සාමුවෙල් කියා හඬගැසූසේක. එවිට
සාමුවෙල්: කථාකළ මැනව; ඔබ-
වහන්සේගේ මෙහෙකරුවා අසාගන
ඉන්නවායයි කීවේය. **ස්වාමීන්වහන්සේ** 11
සාමුවෙල්ට කථාකොට: මෙන්න, මම
ඉශ්‍රායෙල්හි කාරණයක් කරන්නෙමි, ඒක
අසන සියල්ලන්ගේ කන් දෙක
ලෙළදෙන්නේය. මා විසින් ඒලීගේ වංශය 12
ගැන කී සියල්ලම මුල පටන් අග
දක්වා ඒ දවසේදී ඒලීට විරුද්ධව
ඉෂ්ටකරන්නෙමි. ඔහුගේ පුත්‍රයන් තමුන් 13
පිටට ශාපයක් පමුණුවාගන්න බව ඔහු
දැනගනත් ඔවුන් නොවැලැක්වූ අපරාධය
නිසා මම ඔහුගේ වංශය සැමකල්ම
විනිශ්චයකරන්නෙමියි ඔහුට දන්වමි.
එබැවින් ඒලීගේ වංශයේ අපරාධය 14
පූජාවෙන්වත් පඬුරෙන්වත් කිසිකලක
පහකරනු නොලබන්නේය කියා ඒලීගේ
වංශයට මා දිවුරා තිබේයයි කීසේක.
සාමුවෙල් පහන්වෙන තුරු නිදාහිඳ, 15
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි දොරවල්
ඇරියේය. නුමුත් සාමුවෙල් දර්ශනය
ඒලීට දන්වන්ට භයව සිටියේය. එවිට 16
ඒලී: මාගේ පුත්‍රය, සාමුවෙල්යයි කියා
සාමුවෙල්ට හඬගැසුවේය. ඔහුද: මම
මෙහියයි කීවේය. එවිට ඔහු: **ස්වාමීන්-** 17
**වහන්සේ** නුඹට කී කාරණය මොකද?
ඒක මාගෙන් නොසඟවන්න. උන්වහන්සේ
නුඹට කී සියලු දෙයින් නුඹ යමක්

මාගෙන් සඟවන්නෙහිනම් දෙවියන්-
**වහන්සේ** තුඹට එසේමත් ඊට වැඩියෙනුත්
18 කරනසේක්වයි කීවේය. සාමුවෙල්
කිසිවක් නොසඟවා ඒ සියල්ලම
ඔහුට කීවේය. එවිට ඔහු: උන්වහන්සේ
**ස්වාමීන්වහන්සේය;** උන්වහන්සේට
යහපත්ව පෙනෙන හැටියට කරන-
19 සේක්වයි කීවේය. සාමුවෙල් වැඩුණේය,
**ස්වාමීන්වහන්සේ** ඔහු සමග සිට, ඔහුගේ
වචනවලින් එකක්වත් සිස්වෙන්ට
20 ඉඩ නුදුන්සේක. සාමුවෙල් **ස්වාමීන්-
වහන්සේගේ** අනාගතවක්තෘ කෙනෙකු
හැටියට ස්ථිරකරනලද බව දන් පටන්
බෙයෙර්-ෂෙබා දක්වා සිටි සියලු
21 ඉශ්‍රායෙල්වරු දැනගත්තෝය. **ස්වාමීන්-
වහන්සේ** ෂීලෝහිදී නැවතත් පෙනුණු-
සේක. මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ වචනයෙන් ෂීලෝහි සාමුවෙල්ට
එළිදරව්වුණුසේක.

4 සාමුවෙල්ගේ වචනයද සියලු
ඉශ්‍රායෙල්වරුන් වෙතට පැමුණුණේය.

## පිලිස්තිවරුන් විසින් ගිවිසුම් පෙට්ටිය ගැනීම. ඒලීගේ මරණය

ඉශ්‍රායෙල්වරු පිලිස්තිවරුන්ට විරුද්ධව
යුද්ධකරන්ට පිටත්ව ගොස් එබෙන්-
එසෙර් ළඟ කඳවුරු බැඳගත්තෝය.
පිලිස්තිවරු අපෙක්හි කඳවුරු බැඳ-
2 ගත්තෝය. පිලිස්තිවරුන් ඉශ්‍රායෙල්-
වරුන්ට විරුද්ධව සටනට සැරසී
යුද්ධය පැතිර ගිය විට, ඉශ්‍රායෙල්වරු
පිලිස්තිවරුන් ඉදිරියෙහි පරාජය වූහ.
ඔව්හු යුද්ධ භූමියෙහි සේනාවෙන්
මනුෂ්‍යයන් හාරදහක් පමණ මැරුවෝය.
3 සෙනඟ කඳවුරට ආ කල ඉශ්‍රායෙල්
වැඩිමහල්ලෝ කථාකොට: **ස්වාමීන්-
වහන්සේ** අද පිලිස්තිවරුන් ඉදිරියෙහි
අප විසුරුවාදැමුවේ මක්නිසාද? **ස්වාමීන්-
වහන්සේගේ** ගිවිසුම්පෙට්ටිය අප අතරට
පැමිණ අපේ සතුරන්ගේ අතින් අප
ගළවන පිණිස අපි ඒක ෂීලෝවෙන්
4 ගෙන්වාගනිමුයයි කීවෝය. ඒ හැටියට
සෙනඟ ෂීලෝට මිනිසුන් යවා කෙරුබ්
පිට වැඩහිඳින, සේනාවල **ස්වාමීන්-
වහන්සේගේ** ගිවිසුම්පෙට්ටිය ගෙන්වා-
ගත්තෝය. හොප්නී සහ ෆීනෙහාස්
යන ඒලීගේ පුත්‍රයෝ දෙදෙනා එහි
දෙවියන්වහන්සේගේ ගිවිසුම්පෙට්ටියත්
සමග සිටියෝය. **ස්වාමීන්වහන්සේගේ** 5
ගිවිසුම්පෙට්ටිය කඳවුරට පැමිණි
කල සියලු ඉශ්‍රායෙල්වරු පොළොව
දෝංකාර දෙන මහත් ඝෝෂාවකින්
ඝෝෂාකළෝය. පිලිස්තිවරු ඒ ඝෝෂාවේ 6
ශබ්දය අසා: හෙබ්‍රෙව්වරුන්ගේ කඳවුරේ
තිබෙන මේ මහත් ඝෝෂා ශබ්දය
කිමෙක්දැයි කීවෝය. **ස්වාමීන්වහන්සේගේ**
පෙට්ටිය කඳවුරට පැමිණි බව ඔව්හු
දැනගත්තෝය. එවිට පිලිස්තිවරු 7
භයවුණෝය, මක්නිසාද: දෙවියන්-
වහන්සේ කඳවුරට වැඩියසේකැයි ඔව්හු
කීවෝය. ඔව්හු කථාකොට: අපට දුක්වේ!
මක්නිසාද මෙබඳු දෙයක් මීට ප්‍රථම
නොවීය. අපට දුක්වේ! මේ බලවන්ත 8
දෙවිවරුන්ගේ අතින් අප ගළවන්නේ
කවුද? මේ වනාහි කාන්තාරයේදී
මිසරවරුන්ට සියලු ආකාර වසංගත-
වලින් පහරදුන් දෙවිවරුය. පිලිස්තිවරුනි, 9
ශක්තිමත්ව පුරුෂයන් මෙන් සිටපල්ලා,
හෙබ්‍රෙව්වරුන් තුඹලාට මෙහෙ-
කරුවන්වූ ලෙස තුඹලා ඔවුන්ට
මෙහෙකරුවන් නොවන පිණිස පුරුෂයන්
මෙන් සිට සටන්කරපල්ලායයි කීවෝය.
පිලිස්තිවරු සටන්කළෝය, එවිට 10
ඉශ්‍රායෙල්වරු පැරදී එක එකා
තම තමාගේ කූඩාරමට පලාගියෝය.
ඉතා මහත් නාස්තියක් සිද්ධවිය;
ඉශ්‍රායෙල්වරුන්ගෙන් පාබළ සෙනඟ
තිස්දහක් වැටුණෝය. දෙවියන්- 11
වහන්සේගේ පෙට්ටියත් අල්ලාගනුලැබුණේය;
ඒලීගේ පුත්‍රයන් දෙදෙනා වන හොප්නීද
ෆීනෙහාස්ද මැරුම්කෑවෝය. බෙන්යමින් 12
මනුෂ්‍යයෙක් සේනාවෙන් දුවගොස්,
තමාගේ ඇඳුම් ඉරාගෙන, හිසේ පස්
දමාගෙන, ඒ දවසේ ෂීලෝට ආයේය.
ඔහු එනකොට ඒලී පාර අද්දර තිබුණ 13

තමාගේ ආසනයේ හිඳගන බලා-
උන්නේය. මක්නිසාද දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය ගැන ඔහුගේ හිත
ගැහි ගැහී තිබුණේය. ඒ මනුෂ්‍යයා
නුවරට ඇවිත් එපවත් කී කල නුවර
14 වැසි සියල්ලෝ මොරගැසුවෝය. ඒලී
ඒ මොරගැසීමේ ශබ්දය අසා: අර
කෝලාහල ශබ්දය කිමෙක්දැයි ඇසීය.
ඒ මනුෂ්‍යයා ඉක්මනින් ඇවිත් ඒලීට
15 දැන්නුවේය. ඒලී වනාහි අනූ අට
අවුරුද්දක් වයස්ව සිටියේය; ඔහුගේ ඇස්
නොපෙනෙන ලෙස අඳුරුව තිබුණේය.
16 ඒ මනුෂ්‍යයා කථාකොට: සේනාවේ සිට
ආ තැනැත්තා මමය, අද සේනාවේ සිට
පලා ආමියි ඒලීට කීවේය. ඔහුද: මාගේ
පුත්‍රය, එහි සිද්ධවුණේ කිමෙක්දැයි
17 ඇසුවේය. පණිවිඩකාරයා උත්තරදෙමින්:
ඉශ්‍රායෙල්වරු පිලිස්තිවරුන් ඉදිරියෙන්
පලාගියෝය, සෙනඟ අතරේ මහත්
නාස්තියක්ද වුණේය, ඔබගේ පුත්‍රයන්
දෙදෙනා වන හොප්නීද පීනෙහාස්ද
මළෝය, දෙවියන්වහන්සේගේ පෙට්ටියත්
18 අසුවුණායයි කීවේය. ඔහු දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය ගැන සඳහන් කළ
විට, ඒලී හුනස්නෙන් දොරටුව සමීපයෙහි
පස්සට වැටී බෙල්ල කැඩී මළේය.
මක්නිසාද ඔහු මහලු මනුෂ්‍යයෙක්ව
බරව සිටියේය. ඔහු සැතළිස් අවුරුද්දක්
19 ඉශ්‍රායෙල් විනිශ්චයකෙළේය. ඔහුගේ
යෙහෙළී වන පීනෙහාස්ගේ භාර්යාව
ගර්භිණීව වදන්ට ළංව සිටියාය. දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය අසුවූ බවත් ඇගේ
මාමාද පුරුෂයාද මැරුණු බවත් ඈ
ඇසූ කල, ප්‍රසව වේදනා හටගෙන
20 නැඹුරුවී වැදුවාය. ඈ මැරෙන වේලාවේ
ඈ ළඟ සිටි ස්ත්‍රීහු කථාකොට:
භයනොවන්න; තුඹ පුත්‍රයෙකු වැදුවා-
යයි ඈට කීවෝය. නුමුත් ඈ උත්තර
දුන්නේවත් සැලකුවේවත් නැත.
21 දෙවියන්වහන්සේගේ පෙට්ටිය අසුවූ
නිසාද ඇගේ මාමාත් පුරුෂයාත් නිසාද
ඈ: ඉශ්‍රායෙල් කෙරෙන් තේජස පහව
ගියේය කියා දරුවාට *ඊකාබොද් යන නම
තැබුවාය. ඕතොමෝ: දෙවියන්වහන්සේ- 22
ගේ පෙට්ටිය අසුවූ හෙයින් තේජස ඉශ්‍රා-
යෙල් කෙරෙන් පහව ගියේයයි කීවාය.

## ගිවිසුම් පෙට්ටිය පිලිස්තිවරුන් අතරේ තිබී එයින් වූ පීඩාව

5 පිලිස්තිවරු දෙවියන්වහන්සේගේ
පෙට්ටිය රැගෙන එබෙන්-එසෙර්හි
සිට අෂ්දොද්ට ගෙනාවෝය. පිලිස්තිවරු 2
දෙවියන්වහන්සේගේ පෙට්ටිය රැගෙන
ඒක දගොන්ගේ ගෘහයට ගෙන ගොස්
දගොන් ළඟ තැබූහ. අෂ්දොද්හි මනුෂ්‍යයන් 3
පසුවද අලුයම නැගුට්ණු කල දගොන්
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටිය ඉදිරිපිට
මුහුණින් බිම වැටී තිබෙනවා දුටුවෝය.
ඔව්හු දගොන් රැගෙන නැවත ඔහුගේ
ස්ථානයෙහි සිටෙවුවෝය. ඔවුන් පසුවද 4
උදය අලුයම නැගුට්ණු කල දගොන්
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටිය ඉදිරිපිට
මුහුණින් බිම වැටී, දගොන්ගේ හිසද
අත් දෙකද කපාදමා එළිපත්ත උඩ
තිබෙනවා දුටුවෝය; දගොන්ට ඉතුරුව
තිබුණේ කඳ පමණක්ය. ඒ නිසා අද 5
දවස දක්වා දගොන්ගේ පූජකයෝවත්
දගොන්ගේ ගෘහයට ඇතුල්වෙන්නාවූ
වෙන කිසිවෙක්වත් අෂ්දොද්හි තිබෙන
දගොන්ගේ එළිපත්ත නොපාගති.
එවිට **ස්වාමීන්වහන්සේගේ** හස්තය 6
අෂ්දොද් වැසියන් කෙරෙහි බරව තිබුණේය,
උන්වහන්සේ ඔවුන්ට එනම් අෂ්දොද්හි
සහ එහි දිශාවල වැසියන්ට කලල්
ගඩු කරණකොටගෙන පහරදී ඔවුන්
නාස්තිකළසේක. අෂ්දොද් මනුෂ්‍යයෝ ඒ 7
බව දැක: ඉශ්‍රායෙල් දෙවියන්වහන්සේගේ
පෙට්ටිය අප ළඟ නොතිබිය යුතුය.
මක්නිසාද උන්වහන්සේගේ හස්තය අප
පිටත් අපේ දෙවිවූ දගොන් පිටත් තදව
තිබේයයි කීවෝය. එබැවින් ඔව්හු 8
පණිවිඩ යවා, පිලිස්තිවරුන්ගේ සියලු
අධිපතීන් තමුන් ළඟට රැස්කර: ඉශ්‍රායෙල්
දෙවියන්වහන්සේගේ පෙට්ටිය ගැන අප

*එනම්, තේජස පහව ගියේය.

විසින් කුමක් කටයුතුදැයි කීවෝය.
ඔව්හුද: ඉශ්‍රායෙල් දෙවියන්වහන්සේගේ
පෙට්ටිය ගාත්ට ගෙනයනු ලැබේවයි
කීවෝය. එසේ ඔව්හු ඉශ්‍රායෙල්
දෙවියන්වහන්සේගේ පෙට්ටිය ගෙන-
9 ගියෝය. තවද ඔවුන් ඒක ගෙනගිය පසු
ස්වාමීන්වහන්සේගේ හස්තය ඒ නුවර
පිටට ඉතා මහත් කැලඹීමක් ඇතුව
පැමුණුණේය. උන්වහන්සේ නුවර වැසි
ලොකු කුඩා සියල්ලන්ට පහරදුන්සේක,
10 ගඩුද ඔවුන් පිට හටගත්තේය. එවිට
ඔව්හු දෙවියන්වහන්සේගේ පෙට්ටිය
එක්‍රොන්ට හැරියෝය. දෙවියන්වහන්සේගේ
පෙට්ටිය එක්‍රොන්ට පැමිණි කල
එක්‍රොන්වරු මොරගසමින්: අපද අපේ
සෙනඟද නසන්ට ඉශ්‍රායෙල් දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය අප ළඟට
11 ගෙනාවෝයයි කීවෝය. එබැවින් ඔව්හු
පණිවිඩ යවා පිලිස්තිවරුන්ගේ සියලු
අධිපතීන් රැස්කර: ඉශ්‍රායෙල් දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය අප හා අපේ
සෙනඟ නාස්තිනොකරන පිණිස එය
ස්වකීය ස්ථානයට හැරී යන්ට
යවාපල්ලායයි කීවෝය. මක්නිසාද
නුවර මුළුල්ලෙහි මරණීය කැලඹීමක්
හටගත්තේය; දෙවියන්වහන්සේගේ හස්තය
12 එහි ඉතා බරව තිබුණේය. නොමැරුණු
මනුෂ්‍යයෝ ගඩුවලින් පීඩා වින්දෝය.
නුවරුන්ගේ විලාපයද අහස දක්වා
නැගුණේය.

## ගිවිසුම්පෙට්ටිය ඉශ්‍රායෙල්වරුන්ට ආපසු දීම

6 ස්වාමීන්වහන්සේගේ පෙට්ටිය
පිලිස්තිවරුන්ගේ රටෙහි හත්
2 මාසයක් තිබුණේය. පිලිස්තිවරු
පූජකයන්ද පේනකියන්නන්ද කැඳවා:
අප විසින් ස්වාමීන්වහන්සේගේ පෙට්ටිය
ගැන කරන්ට ඕනෑ මොකද? එය ස්වකීය
ස්ථානයට මොන දෙයක් සමග ඇරිය
යුතුද කියා අපට දන්වාපල්ලායයි
3 කීවෝය. ඔව්හු: නුඹලා ඉශ්‍රායෙල්
දෙවියන්වහන්සේගේ පෙට්ටිය හරින්-
නහුනම්, එය සිස්ව නැර උන්වහන්සේට
අපරාධ පූජාවක් දී ඇරපල්ලා. එවිට
නුඹලාට සුවවන්නේය, උන්වහන්සේගේ
හස්තය නුඹලා කෙරෙන් පහනොවන්නේ
මක්නිසාද කියා නුඹලාට දැනගන්ට
ලැබේයයි කීවෝය. එවිට ඔව්හු: 4
උන්වහන්සේට මොන අපරාධ පූජාවක්
දී හරින්නෙමුදැයි ඇසුවෝය. ඔව්හු
කථාකොට: පිලිස්තිවරුන්ගේ අධිපතීන්-
ගේ ගණන ලෙස රන් ගඩු පසකුත් රන්
මීයන් පසකුත්ය. මක්නිසාද නුඹලා
සියල්ලන්ද නුඹලාගේ අධිපතීන්ද
කෙරෙහි පැමුණුණේ එක පීඩාවක්ය.
එබැවින් නුඹලාගේ ගඩුවල රූපද රට 5
නාස්තිකරන නුඹලාගේ මීයන් සමාන
රූපද සාද ඉශ්‍රායෙල් දෙවියන්වහන්සේට
ගෞරව දීපල්ලා. සමහරවිට උන්වහන්සේ
ස්වකීය හස්තය නුඹලා කෙරෙන්ද
නුඹලාගේ දෙවිවරුන් කෙරෙන්ද
නුඹලාගේ දේශය කෙරෙන්ද අහක්කර-
ගන්නවා ඇත. මිසරවරුන් හා ඵාරාවෝ 6
තමුන්ගේ සිත් දැඩිකරගත් ලෙස නුඹලාත්
සිත් දැඩිකරගන්නේ මක්නිසාද?
උන්වහන්සේ ඔවුන් අතරේ පුදුම ලෙස
ක්‍රියාකළ විට ඔවුන් සෙනඟට යන්ට
අවකාශ දුන්නා නොවේද? ඔවුන් පිටත්ව
ගියා නොවේද? ඉතින් දැන් අලුත් 7
ගැළක් සාදගෙන, වියගහ නොදැරූ කිරි
එළදෙනුන් දෙදෙනෙකු රැගෙන ගැළට
බැඳ, උන්ගේ වස්සන් උන් වෙතින් අරන්
ගෙයි නවත්වා, ස්වාමීන්වහන්සේගේ 8
පෙට්ටිය රැගෙන ගැළ පිට තබා, අපරාධ
පූජාවක් පිණිස උන්වහන්සේට දෙන
රන් බඩු එහි පැත්තක කුඩා කරඬුවක
තබා ඒක යන්ට හැර, බලාසිටපල්ලා. 9
ඉදින් ඒකේ සීමාවට යන මාර්ගයෙන්
බෙත්-ෂෙමෙෂ්ට ගියොත්, මේ මහත්
විපත්තිය අපට සිදුකළේ උන්වහන්සේ
බව එයින් පෙනෙයි, නැත්නම් අපට පහර
දුන්නේ උන්වහන්සේගේ හස්තය නොව
ඒක ඉබේම අපට පැමුණුණ බව අපට
පෙනෙනවා ඇතැයි කීවෝය. ඒ මනුෂ්‍යයෝ 10

එසේ කරමින් කිරි එළදෙනුන් දෙන්නෙක්
අරන් ගැළට බැඳ, උන්ගේ වස්සන් ගෙයි
11 වසා තබා, **ස්වාමීන්වහන්සේගේ**
පෙට්ටියද රන් මීයන් සහ ඔවුන්ගේ
ගඬුවල රූප දමූ කුඩා කරඬුවද ගැළේ
12 තැබුවෝය. එළදෙන්නු බෙත්-ෂෙමෙෂ්ට
කෙළින් යන පාරේ ගියෝය; දකුණටවත්
වමටවත් නොහැරී කෑගසගසා ඒ මාවත
දිගේම ගියෝය; පිලිස්තිවරුන්ගේ
අධිපතියෝද බෙත්-ෂෙමෙෂ්හි සීමාව
13 දක්වා උන් පස්සේ ගියෝය. බෙත්-
ෂෙමෙෂ්හි මිනිස්සු මිටියාවතේ තිරිඟු
කපමින් සිටියෝය. ඔව්හු ඇස් ඔසවා
බලා පෙට්ටිය දැක, ඒක දුටු නිසා ප්‍රීතිවූහ.
14 ගැළද බෙත්-ෂෙමියවූ යෝෂුවාගේ කෙතට
පැමිණ එහි නැවතුණේය, එහි ලොකු
ගලක් තිබුණේය. ඔව්හු ගැළේ ලී පළා,
එළදෙනුන් **ස්වාමීන්වහන්සේට** දවන
15 පූජාවක් කොට ඔප්පු කළෝය. ලෙවීවරු
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටියද රන් බඩු
දමා තිබුණු කරඬුවද බා මහ ගල පිට
තැබුවෝය. බෙත්-ෂෙමෙෂ්හි මනුෂ්‍යයෝ
ඒ දවසේදී **ස්වාමීන්වහන්සේට** දවන
පූජා ඔප්පුකොට යාගද පිදුවෝය.
16 පිලිස්තිවරුන්ගේ අධිපතිවරු පස්දෙන
ඒ දැක එදම එක්‍රොන්ට හැරී ගියෝය.
17 පිලිස්තිවරුන් විසින් අපරාධ පූජාවක්
පිණිස **ස්වාමීන්වහන්සේට** දුන්නාවූ රන්
ගඬු මේවාය: අෂ්දෝද් උදෙසා එකක්ය,
ගාසා උදෙසා එකක්ය, අෂ්කෙලොන්
උදෙසා එකක්ය, ගාත් උදෙසා එකක්ය,
18 එක්‍රොන් උදෙසා එකක්ය. තවද ඔවුන්
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටිය තැබුවාවූ
බෙත්-ෂෙමිය යෝෂුවාගේ කෙතෙහි අද
වන තෙක් පවත්නාවූ මහ ගල දක්වා
තිබෙන පවුරු සහිත නුවරවල්ද පිටිසර
ගම්ද ඇතුළුව අධිපතීන් පස්දෙනාට
අයිතිවූ පිලිස්තිවරුන්ගේ සියලු නුවරවල
ගණනේ හැටියට දුන් රන් මීයෝ මේය.
19 බෙත්-ෂෙමෙෂ්හි මනුෂ්‍යයන් **ස්වාමීන්-**
**වහන්සේගේ** පෙට්ටිය ඇර බැලූ නිසා
උන්වහන්සේ සෙනඟගෙන් සැත්තෑ
දෙනෙකුටත් පනස් දහසකටත් පහර
දුන්සේක. **ස්වාමීන්වහන්සේ** සෙනඟ
අතරෙහි මහත් නාස්තියක් කළ බැවින්
සෙනඟ වැලපුණාහ. බෙත්-ෂෙමෙෂ්හි 20
මනුෂ්‍යයෝ කථාකොට: **ස්වාමීන්-**
**වහන්සේ** එනම් මේ ශුද්ධ දෙවියන්-
වහන්සේ ඉදිරියෙහි සිටින්ට කාට
පුළුවන්ද? උන්වහන්සේ අප වෙතින්
කා වෙතට යවමුදැයි කීවෝය. ඔව්හු: 21
පිලිස්තිවරුන් විසින් **ස්වාමීන්වහන්සේගේ**
පෙට්ටිය නැවත ගෙනැවිත් තිබේ; නුඹලා
ඇවිත් ඒක අරගන්න පලයල්ලායයි
කිරියත්-යෙයාරීම් වැසියන්ට පණිවිඩ-
කාරයන් අත කියා යැවුවෝය.
7 කිරියත්-යෙයාරීම් මනුෂ්‍යයෝ
ඇවිත් **ස්වාමීන්වහන්සේගේ** පෙට්ටිය
රැගෙන හෙල පිට තිබුණු අබිනාදබ්ගේ
ගෙට ගෙනගොස්, **ස්වාමීන්වහන්සේගේ**
පෙට්ටිය රක්ෂාකරන පිණිස ඔහුගේ
පුත්‍රවූ එලෙයාසර් පත්කළෝය.

## සාමුවෙල් ඉශ්‍රායෙල්ගේ විනිශ්චය-කාරයා සහ මිදුම්කාරයා වීම

තවද පෙට්ටිය කිරියත්-යෙයාරීම්හි තැබූ 2
දවස පටන් දීර්ඝ කාලයක් එනම් විසි
අවුරුද්දක් ගතවිය. මුළු ඉශ්‍රායෙල් වංශය
**ස්වාමීන්වහන්සේ** සොයා වැලපුණෝය.
සාමුවෙල් මුළු ඉශ්‍රායෙල් වංශයට 3
කථාකොට: නුඹලාගේ මුළු සිතින්
නුඹලා **ස්වාමීන්වහන්සේ** වෙතට හැරී
එන්නහු නම්, නුඹලා අතරෙන් අන්‍ය
දෙවිවරුන්ද අෂ්ටාරොත්ද පහකර
දමා නුඹලාගේ සිත් **ස්වාමීන්වහන්සේ**
දෙසටම යොමුකොට උන්වහන්සේට
පමණක් සේවයකරපල්ලා. උන්වහන්සේද
පිලිස්තිවරුන්ගේ අතින් නුඹලා
ගළවාගන්නවා ඇතැයි කීවේය. එවිට 4
ඉශ්‍රායෙල් පුත්‍රයෝ බාල් දේවතාවන්ද
අෂ්ටාරොත්ද පහකරදමා **ස්වාමීන්-**
**වහන්සේට** පමණක් සේවයකළෝය.
සාමුවෙල්ද: මා නුඹලා උදෙසා 5
**ස්වාමීන්වහන්සේට** යාච්ඤා කරන පිණිස

සියලු ඉශ්‍රායෙල්වරුන් මිශ්පාට රැස්-
6 කරපල්ලායයි කීවේය. ඔව්හු මිශ්පාට
රැස්වී වතුර ඇද **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි වත්කොට, ඒ දවසේ නිරාහාරව
සිට: අපි **ස්වාමීන්වහන්සේට** විරුද්ධව
පව්කෙළෙමුයයි එහිදී කීවෝය. සාමුවෙල්
මිශ්පාහිදී ඉශ්‍රායෙල් පුත්‍රයන් විනිශ්චය-
7 කෙළේය. ඉශ්‍රායෙල් පුත්‍රයන් මිශ්පාට
රැස්ව සිටින බව පිලිස්තිවරුන්
ඇසූකල පිලිස්තිවරුන්ගේ අධිපතියෝ
ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව නැගී
ආවෝය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඒ අසා
8 පිලිස්තිවරුන්ට භය වූවෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ: අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
පිලිස්තිවරුන්ගේ අතින් අප ගළවන
පිණිස අප උදෙසා උන්වහන්සේට නො-
නැවතී යාච්ඤාකළමැනවැයි සාමුවෙල්ට
9 කීවෝය. සාමුවෙල් කිරිබොන බැටළු
පැටවෙකු රැගෙන **ස්වාමීන්වහන්සේට**
මුළු දවන පූජාවක් කොට ඔප්පුකර,
ඉශ්‍රායෙල්වරුන් උදෙසා **ස්වාමීන්-**
**වහන්සේට** යාච්ඤාකෙළේය; **ස්වාමීන්-**
**වහන්සේ** ඔහුට උත්තර දුන්සේක.
10 සාමුවෙල් දවන පූජාව ඔප්පු කරන
කල්හිම පිලිස්තිවරු ඉශ්‍රායෙල්ට විරුද්ධව
සටනට ළංවූහ. නුමුත් **ස්වාමීන්වහන්සේ**
ඒ දවසේ මහත් ශබ්දයකින් පිලිස්තිවරුන්
මත්තෙහි ගර්ජනා කොට ඔවුන් විසුරුවා
දැමූසේක; ඔව්හු ඉශ්‍රායෙල් ඉදිරියෙහි
11 පැරදුණෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ
මිශ්පායෙන් නික්ම පිලිස්තිවරුන් පස්සේ
එළවාගන ගොස් බෙත්-කාර්හි පාවුලට
පැමිණෙන තුරු ඔවුන්ට පහරදුන්නෝය.
12 එවිට සාමුවෙල් ගලක් ගෙන මිශ්පාටත්
ෂේන්ටත් අතරේ තබා: මෙතැන් දක්වා
**ස්වාමීන්වහන්සේ** අපට පිහිටවූසේකැයි
කියමින්, ඊට *එබෙන්-එසෙර් යන නම
13 තැබුවේය. මෙසේ පිලිස්තිවරු යටත්-
කරනු ලැබ, තවත් ඉශ්‍රායෙල්ගේ සීමාවට
ඇතුල්නුවූහ. **ස්වාමීන්වහන්සේගේ**
හස්තයද සාමුවෙල්ගේ සියලු දවස්වල

*එනම්, පිහිටවීමේ ගල.

පිලිස්තිවරුන්ට විරුද්ධව තිබුණේය.
පිලිස්තිවරුන් විසින් එක්‍රොන් පටන් ගාත් 14
දක්වා ඉශ්‍රායෙල්වරුන්ගෙන් ගත්තාවූ
නුවරවල් ඉශ්‍රායෙල්වරුන්ට නැවත
ලැබුණේය; ඉශ්‍රායෙල්වරු ඒවායේ
සීමාවලුත් පිලිස්තිවරුන්ගේ අතින්
ගළවාගත්තෝය. ඉශ්‍රායෙල්වරුන් හා
අමෝරීවරුන් අතරේ සමාදනය
පැවතුණේය. සාමුවෙල් තමාගේ ජීවිතයේ 15
සියලු දවස්වල ඉශ්‍රායෙල් විනිශ්චය-
කෙළේය. ඔහු අවුරුද්දෙන් අවුරුද්ද පිටත්වී 16
බෙතෙල්ටත් ගිල්ගාල්ටත් මිශ්පාටත්
පිළිවෙළින් ගොස්, ඒ සියලු ස්ථාන-
වලදී ඉශ්‍රායෙල්වරුන් විනිශ්චයකර,
රාමාට හැරී ආවේය, මක්නිසාද 17
ඔහුගේ ගෙය තිබුණේ එහිය; එහිදී ඔහු
ඉශ්‍රායෙල් විනිශ්චයකෙළේය. ඔහු එහි
**ස්වාමීන්වහන්සේට** පූජාසනයක් ගොඩ-
නැගුවේය.

## සෙනඟ විසින් රජෙකු ඉල්ලීම. රජුගේ තත්ත්වය

8 සාමුවෙල් මහලුවූ කල ඔහු
තමාගේ පුත්‍රයන් ඉශ්‍රායෙල්වරුන්ට
විනිශ්චයකාරයන් කොට පත්කෙළේය.
ඔහුගේ කුලුඳුල් පුත්‍රයාගේ නම 2
යෝවෙල්ය; ඔහුගේ දෙවෙනියාගේ නම
අබියාය. ඔව්හු බෙයෙර්-ෂෙබාහි
විනිශ්චයකාරයෝ වූවෝය. නුමුත් ඔහුගේ 3
පුත්‍රයෝ ඔහුගේ මාර්ගවල නොහැසිර,
අයුතු ලාභය පිණිස ඉවතට හැරී, අල්ලස්
ගෙන විනිශ්චය පෙරළුවෝය.
එවිට ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු 4
වැඩිමහල්ලෝ රැස්වී රාමාහි සිටි
සාමුවෙල් ළඟට ඇවිත් කථාකොට:
ඔබ මහලුව සිටිනෙහිය, ඔබගේ පුත්‍රයෝ 5
ඔබගේ මාර්ගවල නොහැසිරෙති. ඉතින්
සියලු ජාතීන්ට මෙන් අප විනිශ්චයකරන
පිණිස අපටත් රජෙකු පත්කළ මැනවැයි
කීවෝය. එහෙත්: අප විනිශ්චයකරන්ට 6
අපට රජෙකු දුන මැනවැයි කී කීම
ගැන සාමුවෙල් අසතුටු විය. තවද
සාමුවෙල් **ස්වාමීන්වහන්සේට** යාච්ඤා-
කෙළේය. **ස්වාමීන්වහන්සේද**: සෙනඟ නුඹට 7

කියන සියල්ල ගැන ඔවුන්ගේ හඬට
ඇහුම්කන්දීපන්න. මක්නිසාද ඔව්හු නුඹ
එපාකළා නොව, මා ඔවුන් කෙරෙහි
රජකම් නොකරන පිණිස මා එපා-
8 කළෝය. මා විසින් ඔවුන් මිසරයෙන්
ගෙනා දවසේ පටන් අද දවස දක්වා
මා අත්හැර වෙන දෙවිවරුන්ට සේවය-
කරමින් ඔවුන් කළාවූ සියලු ක්‍රියාවල
9 හැටියට ඔව්හු නුඹටත් කරති. දැන් ඉතින්
ඔවුන්ගේ හඬට ඇහුම්කන්දීපන්න.
එසේවී නුමුත් ඔවුන් කෙරෙහි රජකම්
කරන රජුගේ අන්දම ඔවුන්ට දන්වමින්
ඔවුන්ට විරුද්ධව සාක්ෂි දීපන්නැයි
කීසේක.
10 එවිට සාමුවෙල් තමාගෙන් රජෙකු
ඉල්ලා සිටි සෙනඟට **ස්වාමීන්වහන්සේගේ**
11 සියලු වචන කීවේය. ඔහු කථාකොට:
නුඹලා කෙරෙහි රජකම්කරන්නාවූ රජුගේ
අන්දම මෙසේ වන්නේය. ඔහු නුඹලාගේ
පුත්‍රයන් ගෙන තමාගේ රථාචාර්යයන්
හා අසරුවන් කොටද තමාගේ රථවලට
පෙරටුව දුවන පිණිසද පත්කරගන්නේය.
12 ඔහු ඔවුන් සහස්‍රාධිපතීන් කොටද
පනසාධිපතීන් කොටද පත්කරගන්නේය.
ඔහු සමහරුන් තමාගේ බිම් හාන්ටද
තමාගේ ගොයම් කපන්ටද තමාගේ
යුද්ධායුධත් රථායුධත් සාදන්ටද
13 පත්කරගන්නේය. ඔහු නුඹලාගේ දූවරුන්
සුවඳ ද්‍රව්‍ය සාදන පිණිසද කෑම
උයන පිණිසද රොටි පුලුස්සන පිණිසද
14 ගන්නේය. ඔහු නුඹලාගේ කෙත්ද මිදි
වතුද ඔලීව වතුද අතරෙන් ඉතා හොඳ
ඒවා අරන් තමාගේ සේවකයන්ට
15 දෙන්නේය. නුඹලාගේ ධාන්‍යවලින්ද
මුද්‍රිකඵලයෙන්ද දසයෙන් කොටසක්
ගෙන තමාගේ ඇමතියන්ටත් සේවක-
16 යන්ටත් දෙන්නේය. නුඹලාගේ වැඩ-
කාරයන්ද වැඩකාරියන්ද නුඹලාගේ
ශෝභනවූ තරුණයන්ද නුඹලාගේ
කොටළුවන්ද ගෙන තමාගේ වැඩට
17 පත්කරගන්නේය. ඔහු නුඹලාගේ
බැටළුවන්ගෙන් දසයෙන් කොටසක්
ගන්නේය. නුඹලා ඔහුගේ සේවකයෝ
වන්නාහුය. ඒ දවසෙහි නුඹලා තෝරාගත් 18
නුඹලාගේ රජු නිසා නුඹලා කෑගසනවා
ඇත; නුමුත් **ස්වාමීන්වහන්සේ** ඒ දවසේදී
නුඹලාට උත්තර දෙන්නේ නැතැයි කීවේය.
එහෙත් සෙනඟ සාමුවෙල්ගේ හඬට 19
කීකරුවෙන්ට කැමති නොවී කථාකොට:
නැත; අපත් සෑම ජාතීන්ට සමාන 20
වන පිණිසද අපේ රජ විසින් අප
විනිශ්චයකරන පිණිසද අපට පෙරටුව
ගොස් අපේ යුද්ධවල් කරන පිණිසද
අප කෙරෙහි රජෙක් සිටින්ටම ඕනෑ-
යයි කීවෝය. සාමුවෙල් සෙනඟගේ 21
සියලු වචන අසා ඒවා **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි කීවේය. ඔවුන්ගේ 22
හඬට ඇහුම්කන්දී ඔවුන්ට රජෙකු
පත්කරපන්නැයි **ස්වාමීන්වහන්සේ**
සාමුවෙල්ට කීසේක. සාමුවෙල්ද: නුඹලා
එකිනෙකා තමතමාගේ නුවරට පලයල්ලා-
යයි ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ට කීවේය.

## සාමුවෙල් සහ සාවුල් සම්මුඛවීම

9
බෙන්යමීය මනුෂ්‍යයෙකුගේ පුත්‍රවූ,
අපියාගේ පුත්‍රයා වන බෙඛෝරත්ගේ
පුත්‍රවූ ශෙරොර්ගේ පුත්‍රයා වන අබියෙල්ගේ
පුත්‍රවූ කීෂ් නම්වූ බෙන්යමීය මනුෂ්‍යයෙක්
සිටියේය, ඔහු මහත් ධනවතෙක්ය. ඔහුට 2
සාවුල් නම්වූ තරුණ ශෝභන පුත්‍රයෙක්
සිටියේය. ඔහුට වඩා ශෝභන කෙනෙක්
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ සිටියේ නැත.
ඔහු සෙනඟ අතරේ සියලුදෙනාටම වඩා
උරහිස පටන් ඉහළට උස්ව සිටියේය.
සාවුල්ගේ පියවූ කීෂ්ගේ කොටළුවෝ 3
නැතිවුණෝය. කීෂ් තමාගේ පුත්‍රවූ සාවුල්ට
කථාකොට: නුඹ වැඩකාරයන්ගෙන්
එක්කෙනෙකු අඬගහගෙන පිටත්ව ගොස්
කොටළුවන් සොයාපන්නැයි කීවේය. ඔහු 4
එප්‍රායිම් කඳු රටෙහිද ෂාලිෂා රටෙහිද
ඇවිද්ද නුමුත් උන් සම්බවුණේ නැත.
ඔව්හු ෂාලීම් රටෙහිත් ඇවිද්දෝය,
උන් එහිත් නැති බැවින් ඔහු බෙන්යමින්
රටෙහිද ඇවිද්දේය. නුමුත් ඔවුන්ට

5 උන් සම්බවුණේ නැත. ඔවුන් ශුප් රටට
පැමිණි කල, සාවුල් තමා සමග සිටි
තමාගේ වැඩකාරයාට කථාකොට: අපි
හැරී යමු; නැත්නම් මාගේ පියා
කොටළුවන් ගැන කල්පනාව අත්හැර
අප ගැන ශෝක වෙනවා ඇතැයි කීවේය.
6 ඔහුද: මේ නුවර දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයෙක් සිටී, ඒ මනුෂ්‍යයා
ගෞරවණීය කෙනෙක්ය; ඔහු කියන
සියල්ල සැබවින් සිද්ධවෙයි. අපි එහි යමු;
සමහරවිට අප යන ගමන ගැන ඔහු
අපට දන්වනවා ඇතැයි ඔහුට කීවේය.
7 එවිට සාවුල් තමාගේ වැඩකාරයාට
කථාකොට: යනවානම් අපි ඒ
මනුෂ්‍යයාට කුමක් ගෙනයමුද?
මක්නිසාද අපේ භාජනවල තිබුණ
කෑම කම්මුතුවිය, දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයාට ගෙනයන්ට කිසි තෑග්ගක්
නැත්තේය. අප ළඟ කුමක් තිබේදැයි
8 කීවේය. වැඩකාරයා නැවත සාවුල්ට
උත්තරදෙමින්: මා අතේ රිදී ෂෙකෙලකින්
සතරෙන් පංගුවක් තිබේ. අපේ මාර්ගය
අපට දන්වන පිණිස ඒක දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාට දෙන්නෙමියි
9 කීවේය. (පෙර කාලයේදී ඉශ්‍රායෙල්හි
මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේගෙන්
විචාරන්ට යන විට: දිවස් ඇත්තා ළඟට
යමුයයි කියන්නේය. මක්නිසාද දැන්
අනාගතවක්තෘය කියන තැනැත්තාට
පෙර කාලයේදී දිවස් ඇත්තායයි
10 කීවෝය.) එවිට සාවුල්: නුඹ කීවා
හොඳයි; වරෙන්, අපි යමුයයි තමාගේ
වැඩකාරයාට කීවේය. මෙසේ ඔව්හු
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සිටි
11 නුවරට ගියෝය. ඔව්හු නුවර නැඟුමේ
යන කල, යෞවනියන් වතුර අදින පිණිස
පිටතට එනවා ඔවුන්ට සම්බව: දිවස්
ඇත්තා මෙහි ඉන්නවාදැයි ඔවුන්ගෙන්
12 ඇසුවෝය. ඔව්හු උත්තරදෙමින්:
ඉන්නවාය; ඔහු නුඹ ඉදිරියෙහිය.
ඉක්මන්කරපන්න, මක්නිසාද උස් තැනදී
අද සෙනඟ පූජාවක් පවත්වන බැවින්
ඔහු අද නුවරට ඇවිත් සිටියි. නුඹලා 13
නුවරට ඇතුල්වූ වහාම කෑම කන පිණිස
උස් තැනට නගින්ට මත්තෙන් ඔහු
සම්බවෙයි. මක්නිසාද ඔහු පූජාවට
ආශීර්වාදකරන බැවින් ඔහු එන තුරු
සෙනඟ කන්නේ නැත; කැඳවනලද්දෝ
ඉන් පසුව කති. ඉන් නිසා පලයල්ලා;
මක්නිසාද මේ වේලාවට ඔහු නුඹලාට
සම්බවේයයි කීවෝය. ඔවුන් නුවරට 14
ගොස් නුවර ඇතුළට පැමිණෙද්දී
සාමුවෙල් උස් තැනට යන පිණිස ඔවුන්
ඉස්සරහට පිටතට ආවේය.
සාවුල් එන්ට දවසකට ප්‍රථම ස්වාමින්- 15
වහන්සේ සාමුවෙල්ට කථාකොට: මම 16
හෙට මේ වේලාවට පමණ බෙන්යමින්
රටෙන් මනුෂ්‍යයෙකු නුඹ ළඟට
එවන්නෙමි, ඔහු මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා කොට
ආලේප කරපන්න, ඔහු පිලිස්තිවරුන්ගේ
අතින් මාගේ සෙනඟ ගළවන්නේය.
මක්නිසාද මාගේ සෙනඟගේ
මොරගැසීම මා වෙත පැමිණි හෙයින්
මම ඔවුන් දෙස බැලීමියි දන්වා
තිබුණේය. සාමුවෙල් සාවුල් දුටු විට 17
ස්වාමින්වහන්සේ ඔහුට කථාකොට:
මෙන්න, මා නුඹට කී මනුෂ්‍යයා!
මොහු මාගේ සෙනඟ කෙරෙහි බලය
පවත්වන්නේයයි කීසේක. එවිට සාවුල් 18
දොරටුවේදී සාමුවෙල් ළඟට ඇවිත්: දිවස්
ඇත්තාගේ ගෙය තිබෙන්නේ කොතනද
කියා මට දන්නුවමැනවැයි කීවේය.
සාමුවෙල්ද සාවුල්ට උත්තර දෙමින්: 19
දිවස් ඇත්තා මමය; මට පෙරටුව උස්
තැනට පලයන්න, මක්නිසාද නුඹලා
අද මා සමග කෑම කන්ට ඕනෑය.
හෙට උදේ නුඹ යන්ට හරින්නෙමි,
නුඹේ සිතේ තිබෙන සියල්ලද නුඹට
දන්වන්නෙමි. තුන් දවසකට පළමුවෙන් 20
නැතිවූ නුඹේ කොටළුවන්ගේ කාරණය
සිතට නොගනින්න; උන් සම්බවුණාය.
ඉශ්‍රායෙල්හි ආශාවිය යුතු සියල්ල කා
උදෙසාද? නුඹ උදෙසාත් නුඹේ පියාගේ
මුළු පවුල උදෙසාත් නොවේදැයි කීවේය.
සාවුල් උත්තර දෙමින්: මම ඉශ්‍රායෙල් 21

ගෝත්‍රවලින් ඉතා කුඩා එකක්ව තිබෙන
බෙන්යමින් ගෝත්‍රයේ කෙනෙක් නොවම්ද?
මාගේ පවුල වනාහි බෙන්යමින් ගෝත්‍රයේ
සියලු පවුල්වලින් සුළු එක නොවේද?
එසේ නම් ඔබ මෙයාකාර මට
කථාකරන්නේ මක්නිසාදැයි ඇසුවේය.
22 තවද සාමුවෙල් සාවුල් හා ඔහුගේ
වැඩකාරයාත් කැඳවාගෙන ආගන්තුක
ශාලාවට ඇතුල්වී, ගණනින් තිහක්
පමණ වූ කැඳවනලද මනුෂ්‍යයින් අතරේ
ප්‍රධාන ස්ථානයෙහි ඔවුන් හින්දෙවුවේය.
23 සාමුවෙල් අරක්කැමියාට කථාකොට:
තුඹ ළඟ තබාගන්ට කියා මා තුඹට
දුන්නාවූ කොටස මෙහි ගෙනෙන්නැයි
24 කීවේය. අරක්කැමියා ගාතයද ඊ පිට
තිබුණු දේද ගෙනැවිත් සාවුල් ඉදිරිපිට
තැබුවේය. සාමුවෙල්ද: මෙන්න තුඹ
උදෙසා තැබූ ඒවා! මේවා තුඹ ඉදිරිපිට
තබාගෙන කාපන්න; මක්නිසාද මා
විසින් සෙනඟ කැඳෙවුවායයි කී වේලාවට
මේවා තුඹ උදෙසා වෙන්කොට
තබන ලද්දේයයි කීවේය. මෙසේ සාවුල්
25 එද සාමුවෙල් සමග කෑයේය. ඔවුන්
උස්තැනින් නුවරට බැස ආ කල
සාමුවෙල් සාවුල් සමග පියස්ස උඩදී
26 කථාකෙළේය. ඔව්හු අලුයම නැගුටුණෝය.
තවද පහන්වෙන වේලාව පමණේදී
සාමුවෙල් සාවුල්ට පියස්ස උඩට
අඬගසා: මා විසින් තුඹ පිටත්කරන
පිණිස නැගිටින්නැයි කීවේය. සාවුල්
නැගිට්ටේය, ඔවුන් දෙදෙනා එනම් ඔහු
27 සහ සාමුවෙල් පිටතට ගියෝය. ඔවුන්
බැස යන කල නුවර කෙළවරදී
සාමුවෙල් සාවුල්ට කථාකොට: අපට
පෙරටුව යන්ට තුඹේ වැඩකාරයාට කියා,
මා විසින් තුඹට දෙවියන්වහන්සේගේ
වචනය දන්වන පිණිස තුඹ දැන්
නැවතියන්නැයි කීවේය. වැඩකාරයා
ඉස්සරව ගියේය.

## සාවුල් රජකමට පත්කිරීම

10 එවිට සාමුවෙල් තෙල් කුලාව
රැගෙන සාවුල්ගේ හිසේ වත්කොට
ඔහු සිඹ: ස්වාමීන්වහන්සේ තමන්ගේ
උරුමය කෙරෙහි අධිපතියා කොට
තුඹ ආලේපකළසේක් නොවේදැයි කීය.
තුඹ අද මා ළඟින් පිටත්ව යන විට 2
බෙන්යමින් සීමාවේ ශෙල්ශාහි තිබෙන
රාබෙල්ගේ සොහොන්පළ ළඟදී
මනුෂ්‍යයන් දෙදෙනෙක් තුඹට සම්බ-
වන්නෝය; ඔවුන් තුඹට කථාකොට—තුඹ
සොයන්ට ගිය කොටළුවෝ සම්බ-
වුණෝය. තුඹේ පියාණෝ කොටළු-
වන්ගේ කාරණය අත්හැර: මාගේ පුත්‍රයා
ගැන මක්කරම්දැයි කියමින් තුඹලා
ගැන ශෝකවන්නේයයි කියනවා
ඇත. එවිට තුඹ එතැනින් තවත් දුර 3
ගොස් තාබෝර්හි අලෝන වෘක්ෂය
ළඟට පැමිණ්නාම, එක්කෙනෙක්
එළුපැටියන් තුන්දෙනෙක්ද එක්කෙනෙක්
රොටි තුනක්ද එක්කෙනෙක් මුද්‍රිකපාන
භාජනයක්ද රැගෙන දෙවියන්වහන්සේ
ළඟට බෙතෙල්ට යන මනුෂ්‍යයන්
තුන්දෙනෙක් තුඹට සම්බවන්නෝය. ඔවුන් 4
තුඹට ආචාර කොට රොටි දෙකක්
තුඹට දෙනවා ඇත; ඒවා ඔවුන් අතින්
පිළිගන්න. ඊට පසුව තුඹ පිලිස්තිවරුන්ගේ 5
මුර සමුදව සිටින දෙවියන්වහන්සේගේ
කන්දට පැමිණෙන්නෙහිය. තුඹ එහි
නුවරට ඇතුල්වෙන විට ප්‍රොපේත
කණ්ඩායමක් තමුන්ට පෙරටුව
වීණාවක්ද රබානක්ද නළාවක්ද කුඩා
වීණාවක්ද ඇතුව ධර්මවාක්‍ය පවසමින්
උස් තැනින් බැස එනවා තුඹට
සම්බවන්නේය. එවිට ස්වාමීන්වහන්සේගේ 6
ආත්මය ආනුභාසම්පන්නව තුඹ
කෙරෙහි බලවත් ලෙස පැමිණෙන්නේය,
තුඹ ඔවුන් සමග ධර්මවාක්‍ය පවසමින්
අන්‍යාකාර මනුෂ්‍යයෙක් වන්නෙහිය. මේ 7
ලකුණු තුඹට පැමිණි කල තුඹ ප්‍රස්තාවේ
හැටියට ක්‍රියාකරපන්න; මක්නිසාද
දෙවියන්වහන්සේ තුඹ සමග සිටිනසේක.
තුඹ මට පෙරටුව ගිල්ගාල්ට පලයන්න; 8
මම වනාහි දවන පූජා ඔප්පු කරන
පිණිසත් ශාන්ති පූජාවල යාගයන්
පූජාකරන පිණිසත් තුඹ ළඟට එන්නෙමි.

මා නුඹ ළඟට ඇවිත් නුඹ කළයුතු දේ
නුඹට දන්වන තුරු සත් දවසක්
9 බලාසිටපන්නැයි කීවේය. තවද ඔහු
සාමුවෙල් වෙතින් යන්ට පිටිපෑකල
දෙවියන්වහන්සේ ඔහුට අමුතු සිතක්
දුන්සේක. ඒ සියලු ලකුණු ඒ දවසේදී
සිද්ධවුණේය.
10 ඔවුන් ඒ හෙල ළඟට පැමිණි කල,
බලව, ප්‍රොපේත කණ්ඩායමක් ඔහුට
සම්බවිය; දෙවියන්වහන්සේගේ ආත්මයද
ඔහු කෙරෙහි ආනුභාසම්පන්නව
පැමිණියේය, එවිට ඔහු ඔවුන් අතරේ
11 ධර්මවාක්‍ය පැවසුවේය. පළමු ඔහු ඇඳින
සිටි හැමදෙනාම ඔහු ප්‍රොපේතවරුන්
සමග ධර්මවාක්‍ය පවසනවා දුටු කල
ඔවුනොවුන්ට කථාකොට: කීෂ්ගේ
පුත්‍රයාට මේ මක්වෙලාද? සාවුලුත්
ප්‍රොපේතවරුන් සමග සිටිනවාදැයි
12 කීවෝය. ඒ ස්ථානයේ එක්කෙනෙක්
උත්තර දෙමින්: ඔවුන්ගේ පියා කවුදැයි
කීවේය. එබැවින්: සාවුලුත් ප්‍රොපේතවරුන්
අතරේ සිටින්නේද යන කීමක් හට-
13 ගත්තේය. ඔහු ධර්මවාක්‍ය පවසා නිමවූ
කල උස් තැනට ආයේය.
14 සාවුල්ගේ බාප්පා: නුඹලා කො-
තැනට ගියාදැයි ඔහුගෙන්ද ඔහුගේ
වැඩකාරයන්ගෙන්ද ඇසුවේය. අපි
කොටළුවන් සොයන්ට ගියෙමුව. උන්
නැති බව දුටු විට අපි සාමුවෙල් ළඟට
15 පැමුණුණෙමුයයි ඔහු කීවේය. සාමුවෙල්
නුඹලාට කීවේ මොකද කියා මට
කියාපන්නැයි සාවුල්ගේ බාප්පා කීය.
16 සාවුල්ද: කොටළුවන් සම්බවුණ බව
ඔහු අපට පැහැදිලි ලෙස දන්නුවේයයි
තමාගේ බාප්පාට කීවේය. නුමුත් රජකම
ගැන සාමුවෙල් කී කාරණය ඔහුට
දන්නුවේ නැත.
17 සාමුවෙල් **ස්වාමීන්වහන්සේ** වෙතට
18 මිශ්පාට සෙනඟ රැස්කරවා, ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කථාකොට: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක—මම ඉශ්‍රායෙල් මිසරයෙන්
ගෙනැවිත් මිසරවරුන්ගේ අතින්ද
නුඹලාට පීඩාකළ සියලු රාජ්‍යයන්ගේ
බලයෙන්ද නුඹලා ගළවාගතිමි. එහෙත් 19
නුඹලාගේ සියලු විපත්තිවලින්ද
පීඩාවලින්ද නුඹලා ගැළෙවූ නුඹලාගේ
දෙවියන්වහන්සේ නුඹලා අද එපාකර:
රජකෙනෙකු අප කෙරෙහි පත්කරන්ට
ඕනෑයයි උන්වහන්සේට කීවහුය.
එබැවින් දැන් නුඹලාගේ ගෝත්‍ර හා දහස්
ගණන් ප්‍රකාරයට **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි සිටපල්ලායයි කියනසේකැයි
කීවේය. මෙසේ සාමුවෙල් සියලු 20
ඉශ්‍රායෙල් ගෝත්‍රයන් ළංකෙරෙවූ විට
බෙන්යමින් ගෝත්‍රය ගන්නාලද්දේය.
බෙන්යමින් ගෝත්‍රය පවුල් වශයෙන් 21
ළංකෙරෙවූ විට මට්රීගේ පවුල ගන්නා
ලද්දේය. කීෂ්ගේ පුත්‍රවූ සාවුල්ද
ගන්නාලද්දේය; නුමුත් ඔවුන් ඔහු
සෙවූ විට ඔහු සම්බවුණේ නැත.
එබැවින් ඔව්හු: ඒ මනුෂ්‍යයා දැන් මෙහි 22
ඇවිත් සිටීදැයි වැඩිදුරටත් **ස්වාමීන්-
වහන්සේගෙන්** ඇසුවෝය. **ස්වාමීන්-
වහන්සේ** උත්තර දෙමින්: ඔහු බඩු අතරේ
සැඟවී ඉන්නවායයි කීසේක. ඔව්හු 23
දුවගොස් ඔහු එතැනින් ගෙනාවෝය;
ඔහු සෙනඟ අතරේ සිටි කල උරඉස්
පටන් ඉහළට හැමදෙනාටම වඩා
උස්ව සිටියේය. සාමුවෙල් මුළු 24
සෙනඟට කථාකොට: **ස්වාමීන්වහන්සේ**
තෝරාගත් තැනැත්තාට සමාන
කෙනෙක් මුළු සෙනඟ අතරේ නැති
බව නුඹලාට පෙනෙනවාදැයි කීවේය.
මුළු සෙනඟද රජු සැරදේවා කියා
මොරගැසූහ.
එවිට සාමුවෙල් රජකමේ විධිය 25
සෙනඟට කියාදී, ඒක පොතෙහි ලියා,
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි තැබුවේය.
සාමුවෙල් මුළු සෙනඟ හරිනුයේ,
එකිනෙකා තම තමාගේ ගෙදරට යන්ට
හැරියේය. සාවුල් වනාහි ගිබියාහි තිබුණ 26
තමාගේ ගෙදරට ගියේය; දෙවියන්-
වහන්සේ විසින් සිත පොළොඹවනලද
සේනාවද ඔහු සමග ගියාය. නුමුත් 27
සමහර *දුර්ජනයෝ කථාකොට: මේ

*බෙලියල්ගේ පුත්‍රයෝ.

මනුෂ්‍යයා අප ගළවන්නේ කොහොමදැයි
කියා ඔහු සුළුකොට සිතා ඔහුට කිසි
තෑග්ගක් නොගෙනාවෝය. නුමුත් ඔහු
නිශ්ශබ්දව සිටියේය.

## සාවුල් රජ අම්මොනිවරුන් පරාජයකිරීම

11 එවිට අම්මොනිය නාහාෂ් ඇවිත්
යාබෙෂ්-ගිලියද්ට විරුද්ධව කඳවුරු
බැන්දේය. යාබෙෂ්හි සියලු මනුෂ්‍යයෝ:
අප සමග ගිවිසුමක් කළ මැනවි,
එවිට අපි ඔබට මෙහෙකරන්නෙමු-
2 යයි නාහාෂ්ට කීවෝය. අම්මොනිය
නාහාෂ්ද: නුඹලා සියල්ලන්ගේ දකුණු
ඇස් උගුලාදමා, එයින් සියලු
ඉශ්‍රායෙල්වරුන් පිටට නින්දවක්
පමුණුවන්ට මට ඉඩදුන්නොත්, නුඹලා
සමග ගිවිසුමක් කරන්නෙමියි ඔවුන්ට
3 කීවේය. යාබෙෂ්හි වැඩිමහල්ලෝද: අප
විසින් සියලු ඉශ්‍රායෙල් පළාත්වලට
පණිවිඩකාරයන් යවන පිණිස අපට
සත් දවසක් කල් දුනමැනවි. එවිට අප
ගළවන්ට කිසිවෙක් නැත්නම් ඔබ වෙතට
පිටතට එන්නෙමුයයි ඔහුට කීවෝය.
4 එකල පණිවිඩකාරයෝ සාවුල් සිටි
ගිබියාට ඇවිත් ඒ කාරණා සෙනඟ
ඉදිරියෙහි කීවෝය. මුළු සෙනඟ
5 ශබ්දනගා ඇඬූහ. ඒ වේලාවට සාවුල්
කෙතේ සිට හරකුන් පස්සෙන් ආවේය.
තවද: සෙනඟ අඬන්නේ කුමන
කාරණයක් නිසාදැයි සාවුල් ඇසුවේය.
ඔව්හු යාබෙෂ්හි මනුෂ්‍යයන්ගේ වචන
6 ඔහුට දැන්නුවෝය. සාවුල් මේ වචන
ඇසූ විට දෙවියන්වහන්සේගේ ආත්මය
ආනුභාසම්පන්නව ඔහු කෙරෙහි
පැමිණියේය, ඔහුගේ කෝපයද අතිශයින්
7 ඇවිළුණේය. ඔහු ගොන් බානක්
ගෙන උන් කැලිවලට කපා: සාවුල්ද
සාමුවෙල්ද පස්සේ පිටත්ව නොඑන
යමෙක් ඇද්ද ඔහුගේ හරකුන්ට මෙසේම
කරනු ලැබේය කියා ඒවා පණිවිඩ-
කාරයන් අත ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු
පළාත්වලට හැරියේය. සෙනඟ පිටට
ස්වාමීන්වහන්සේගෙන් භීතියක් පහළවී
ඔව්හු එක්කෙනෙකු මෙන් පිටත්ව
ආවෝය. ඔහු බෙශෙක්හිදී ඔවුන් 8
ගණන්කෙළේය; ඉශ්‍රායෙල් පුත්‍රයන් තුන්
ලක්ෂයක්ද යූද මනුෂ්‍යයන් තිස්දහක්ද
සිටියෝය. එවිට ආවාවූ පණිවිඩ- 9
කාරයන්ට ඔව්හු කථාකොට: හෙට අව්ව
තදවෙන වේලාවට නුඹලාට ගැළවීම
ලැබේය කියා යාබෙෂ්-ගිලියද්
මනුෂ්‍යයන්ට කියාපල්ලායයි කීවෝය.
පණිවිඩකාරයෝ ගොස් යාබෙෂ්හි
මනුෂ්‍යයන්ට දැන්නුවෝය; ඔව්හුද
ප්‍රීතිවුණෝය, එබැවින් යාබෙෂ්හි 10
මනුෂ්‍යයෝ: හෙට අපි නුඹලා ළඟට
එන්නෙමුව, එවිට නුඹලාට හොඳව
පෙනෙන සියල්ලේ හැටියට අපට කරන්ට
නුඹලාට පුළුවනැයි කීවෝය. පසුවද 11
සාවුල් සෙනඟ කණ්ඩායම් තුනකට
බෙදුවේය; ඔව්හු එළිවන යාමයෙහි
අම්මොනිවරුන්ගේ කඳවුර මැදට පැමිණ
ඉර මුදුන් වේලාව දක්වා අම්මොනි-
වරුන්ට පහර දුන්නෝය. තවද
දෙදෙනෙක් එක තැනක නොසිටින
හැටියට ඉතිරිවුණ අය විසුරුවනු ලැබූහ.
සෙනඟ සාමුවෙල්ට කථාකොට: සාවුල් 12
අප කෙරෙහි රජකම්කරන්ටදැයි කීවේ
කවුද? ඒ මනුෂ්‍යයන් මරණ පිණිස ඔවුන්
ගෙනෙල්ලායයි කීවෝය. සාවුල්ද: අද 13
දවසේ කිසිවෙක් මරණයට පත් කරනු
නොලැබේ. මක්නිසාද ස්වාමීන්වහන්සේ
අද ඉශ්‍රායෙල්හි ගැළවීමක් ඉෂ්ටකළ-
සේකැයි කීවේය.
එවිට සාමුවෙල් සෙනඟට කථාකොට: 14
වරෙල්ලා, අපි ගිල්ගාල්ට ගොස් එහිදී
රජකම නැවත ස්ථිරකරගනිමුයයි කීවේය.
මුළු සෙනඟද ගිල්ගාල්ට ගොස් එහි 15
ස්වාමීන්වහන්සේ ඉදිරියේදී සාවුල්
රජකමට පත්කොට ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි ශාන්ති පූජා ඔප්පු කළෝය;
එහි සාවුල්ද සියලු ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝද බොහෝසෙයින් ප්‍රීතිවූවෝය.

## සාමුවෙල්ගේ අවසාන කථාව

සාමුවෙල් සියලු ඉශ්‍රායෙල්- 12
වරුන්ට කථාකොට: මෙන්න,
නුඹලා මට කී සියල්ල ගැන මම නුඹලාගේ

හඬට ඇහුම්කන්දී තුඹලා කෙරෙහි
2 රජෙකු පත්කෙළෙමි. දැන් රජ්ජුරුවෝ
තුඹලා ඉදිරියෙහි හැසිරෙන්නෝය. මම
නම් මහලුය, මාගේ හිසකෙස් පැහී තිබේ;
මාගේ පුත්‍රයෝත් තුඹලා සමග සිටිති.
මම බාල වයසේ පටන් අද දක්වා
3 තුඹලා ඉදිරියෙහි හැසුරුණෙමි. මම
මෙහිය. මම කාගේ හරකා ගතිම්ද?
කාගේ කොටළුවා ගතිම්ද? කාට
අයුක්තියක් කෙළෙම්ද? කාට බලාත්-
කාරකමක් කෙළෙම්ද? මාගේ ඇස්
වසාගන්න පිණිස කාගෙන් අල්ලසක්
ගතිම්දැයි **ස්වාමීන්වහන්සේද** උන්-
වහන්සේගේ අභිෂේකලත් තැනැත්තාද
ඉදිරියෙහි මට විරුද්ධව සාක්ෂි දීපල්ලා,
එවිට මම එය නැවත තුඹලාට
4 දෙන්නෙමියි කීවේය. ඔව්හුද: ඔබ අපට
අයුක්තියක් කළේවත් බලාත්කාරකමක්
කළේවත් කිසිවෙකුගේ අතින් මොකවත්
5 ගත්තේවත් නැතැයි කීවෝය. ඔහුද:
තුඹලාට මා අත වරදක් සම්බනූණු
බවට **ස්වාමීන්වහන්සේද** උන්වහන්සේගේ
අභිෂේකලත් තැනැත්තේද අද දවසේ
තුඹලාට විරුද්ධව සාක්ෂිකාරයෝව
සිටිතියි ඔවුන්ට කීවේය. ඔව්හුද:
උන්වහන්සේ සාක්ෂියයි කීවෝය.
6 සාමුවෙල් සෙනඟට කථාකොට:
මෝසෙස් සහ ආරොන් පත්කළෙක්
මිසරයෙන් තුඹලාගේ පියවරුන්
7 ගෙනාවෙත් **ස්වාමීන්වහන්සේය**. එබැවින්
තුඹලාටත් තුඹලාගේ පියවරුන්ටත්
**ස්වාමීන්වහන්සේ** කළාවූ සියලු
ධර්මිෂ්ඨ ක්‍රියා ගැන මා විසින්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි තුඹලාට
මතක්කර දෙන පිණිස නිශ්චලව
8 සිටපල්ලා. යාකොබ් මිසරයට පැමිණියාට
පසු තුඹලාගේ පියවරුන් **ස්වාමීන්-
වහන්සේට** මොරගැසූ විට **ස්වාමීන්-
වහන්සේ** මෝසෙස්ද ආරොන්ද යවා
තුඹලාගේ පියවරුන් මිසරයෙන් ගෙන්වා
මේ ස්ථානයෙහි වාසයකෙරෙවූසේක.
9 එහෙත් ඔව්හු තමුන්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** මතකනැතිකළෝය, එවිට
උන්වහන්සේ හාසෝර්හි සේනාපතියාවූ
සීසෙරා අතටත් පිලිස්තිවරුන් අතටත්
මෝවබ්හි රජු අතටත් ඔවුන් පාවා-
දුන්සේක, ඔව්හුද ඔවුන්ට විරුද්ධව
යුද්ධකළෝය. එවිට ඔව්හු **ස්වාමීන්-** 10
**වහන්සේට** මොරගසමින්: අපි **ස්වාමීන්-
වහන්සේ** අත්හැර බාල් දේවතාවන්ටත්
අෂ්ටාරොත්ටත් සේවයකිරීමෙන් පව්-
කෙළෙමුව. එහෙත් දැන් අපේ
සතුරන්ගේ අතින් අප ගැළවුව මැනව,
අපි ඔබවහන්සේට සේවයකරන්නෙමු-
යයි කීවෝය. **ස්වාමීන්වහන්සේ** 11
යෙරුබ්බාල්ද බෙදන්ද යෙප්තාද
සාමුවෙල්ද එවා වටකර සිටි තුඹලාගේ
සතුරන්ගේ අතින් ගැළවූසේක, එවිට
තුඹලා සුරක්ෂිතව වාසයකළහුය. තුමුත් 12
අම්මොන් පුත්‍රයන්ගේ රජවූ නාහාෂ්
තුඹලාට විරුද්ධව එන බව තුඹලා
දුටු කල, තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** තුඹලාගේ රජව සිටි තුමූත්
තුඹලා—එසේ නොවේ, රජකෙනෙක් අප
කෙරෙහි රජකම් කරන්ට ඕනෑයයි
කීවහුය. ඉතින් තුඹලා තෝරා- 13
ගත්තාවූ තුඹලා ඉල්ලූවාවූ රජ්ජුරුවන්
බලාපල්ලා. **ස්වාමීන්වහන්සේ** තුඹලා
කෙරෙහි රජ කෙනෙකු පත්කළසේක.
තුඹලා **ස්වාමීන්වහන්සේගේ** අණට 14
විරුද්ධව කැරළි නොගසා උන්වහන්සේට
භයව උන්වහන්සේට සේවයකොට
උන්වහන්සේගේ හඬට කීකරුව
සිටිනවානම්, තුඹලාත් තුඹලා කෙරෙහි
රජකම් කරන රජුත් තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** පස්සේ යනවානම්,
යෙහෙකි. තුමුත් තුඹලා **ස්වාමීන්-** 15
**වහන්සේගේ** හඬට ඇහුම්කන් නොදී
උන්වහන්සේගේ අණට විරුද්ධව කැරළි
ගසන්නහුනම්, උන්වහන්සේගේ හස්තය
තුඹලාගේ පියවරුන්ට විරුද්ධව
තිබුණාක් මෙන් තුඹලාටත් විරුද්ධ
වන්නේය. එබැවින් දැන් නිශ්චලව 16
සිට **ස්වාමීන්වහන්සේ** තුඹලාගේ ඇස්
හමුයෙහි කරන්ට යන මේ මහත් දෙය
බලාපල්ලා. දැන් තිරිඟු කපන කාලය 17
නොවේද? අහස් ගර්ජනාවද වර්ෂාවද

එවන ලෙස මම ස්වාමීන්වහන්සේට
යාච්ඤා කරන්නෙමි; රජෙකු ඉල්ලීමෙන්
තුඹලා ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි කළ
දුෂ්ටකම මහත් බව එයින් තුඹලා දැන
තේරුම් ගන්නවා ඇතැයි කීවේය.
18 සාමුවෙල් ස්වාමීන්වහන්සේට යාච්ඤා
කෙළේය; ස්වාමීන්වහන්සේ එද අහස්
ගර්ජනාවද වර්ෂාවද එවූසේක. එවිට
මුළු සෙනඟ ස්වාමීන්වහන්සේටත්
සාමුවෙල්ටත් බොහෝ භයයින් භයවූහ.
19 එවිට මුළු සෙනඟද: අප නොනසින
පිණිස ඔබගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
ඔබගේ මෙහෙකරුවන් උදෙසා
යාච්ඤාකළමැනවි. මක්නිසාද රජෙකු
ඉල්ලීමේ වැරැද්ද අපේ අනික් සියලු
පාපවලට එකතුකෙළෙමුයයි සාමුවෙල්ට
20 කීවෝය. සාමුවෙල් සෙනඟට කථාකොට:
භයනොවෙල්ලා. තුඹලා ඇත්තෙන්ම මේ
මුළු වැරැද්ද කළහුය. එහෙත් ස්වාමීන්-
වහන්සේ අනුව යාම අත්නොහැර
තුඹලාගේ මුළු සිතින් ස්වාමීන්වහන්සේට
සේවයකරපල්ලා; අහක්වනොයල්ලා.
21 එසේ ගියොත් පිහිටවෙන්ටවත්
ගළවන්ටවත් නොහැකිවූ නිරර්ථක දේ
අනුව යන්නෝ වන්නහුය. මක්නිසාද
22 ඒවා නිරර්ථක දේවල්මය. ස්වාමීන්-
වහන්සේ තුඹලා ස්වකීය සෙනඟ
කරගන්ට ප්‍රසන්නවූ බැවින් තමන්ගේ
මහත් නාමය නිසා තමන් සෙනඟ
23 අත් නොහරිනසේක. ඇරත් මා විසින්
තුඹලා උදෙසා යාච්ඤා නොකර
සිටීමෙන් ස්වාමීන්වහන්සේට විරුද්ධව
පව්කිරීම මාගෙන් දුරුවේවා. මම
යහපත්වූ හරිවූ මාර්ගය තුඹලාට
24 උගන්වන්නෙමි. ස්වාමීන්වහන්සේට භයව
තුඹලාගේ මුළු සිතින් උන්වහන්සේට
සැබෑලෙස සේවයකරපල්ලා. මක්නිසාද
උන්වහන්සේ තුඹලා උදෙසා කොපමණ
මහත් දේ කළසේක්ද කියා බලාපල්ලා.
25 නුමුත් තුඹලා තවත් නපුරම කරනවා
නම් තුඹලාද තුඹලාගේ රජුද නාස්ති
වෙනවා ඇතැයි කීවේය.

## පිලිස්තිවරුන් සමග යුද්ධකිරීම

13
සාවුල් රජකමට පැමිණෙන විට
ඔහු අවුරුදු *[තිහක්] වයස්ව
සිටියේය. ඔහු ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
දැවුරුද්දක් රජකම්කෙළේය. තවද සාවුල් 2
ඉශ්‍රායෙල්වරුන්ගෙන් තුන්දහක් මනුෂ්‍යයන්
තෝරාගත්තේය; ඔවුන්ගෙන් දෙදහක්
සාවුල් සමග මික්මාෂ්හිද බෙතෙල්
කන්දේද සිටියෝය, දහක් යොනාතාන්
සමග බෙන්යමින් ගිබියාහි සිටියෝය.
ඔහු සෙනඟගෙන් ඉතිරි අය එකිනෙකා
තම තමාගේ කූඩාරමට හැරියේය.
යොනාතාන් ගෙබාහි සිටි පිලිස්ති- 3
වරුන්ගේ මුර සමූදවට පහරදුන්නේය.
එපවත් පිලිස්තිවරුන්ට ආරංචිවිය.
සාවුල්ද හෙබ්‍රෙව්වරු අසත්වයි කියා
දේශය මුළුල්ලෙහි හොරණෑව
පිම්බෙවුවේය. සාවුල් විසින් පිලිස්ති- 4
වරුන්ගේ මුර සමූදවට පහරදුන් බවත්
පිලිස්තිවරුන් ඉශ්‍රායෙල්ට පිළිකුල්කළ
බවත් සියලු ඉශ්‍රායෙල්වරුන්ට සැලවිය.
සෙනඟද ගිල්ගාල්හි සිටිය සාවුල් වෙතට
රැස්වූවෝය.
පිලිස්තිවරු ඉශ්‍රායෙල් සමග යුද්ධ 5
කරන පිණිස රථ තිස්දහක්ද අසරුවන්
හදහක්ද ගණනින් මුහුදු වෙරළේ වැලි
මෙන් වූ සෙනඟක්ද ඇතුව රැස්වී ඇවිත්
බෙතාවෙන්ට නැගෙනහිරෙන් මික්මාෂ්හි
කඳවුරු බැඳගත්තෝය. නුමුත් අන්- 6
තරායට අසුවී ඉන්න බව ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝ දුටුවෝය. (මක්නිසාද සෙනඟ
පීඩිතව සිටියෝය.) එවිට සෙනඟ
ගුහාවලද කැලෑවලද පර්වතවලද කොන්-
වලද වළවල්වලද සැඟවුණෝය. සමහර 7
හෙබ්‍රෙව්වරු ගාද් දේශයටත් ගිලියද්
දේශයටත් යොර්දානෙන් එගොඩව
ගියෝය; නුමුත් සාවුල් ඒ වන තුරු
ගිල්ගාල්හි සිටියේය, මුළු සෙනඟ
වෙවුලමින් ඔහු පස්සේ ගියෝය.

*මුල් පිටපත්වල ගණනක්
නොපෙනෙන නුමුත් ඇතැම්හු මෙසේ
තිහක් යයි කියති.

## සාවුල් එපාකරනු ලැබීම

8 ඔහු සාමුවෙල් විසින් නියමකර තිබුණු
කාලයේ හැටියට සත් දවසක් නැවතී
සිටියේය. නුමුත් සාමුවෙල් ගිල්ගාල්ට
නාවේය; සෙනඟද ඔහු වෙතින් විසිර
9 ගියෝය. එවිට සාවුල්: දවන පූජාව හා
ශාන්ති පූජා මා ළඟට ගෙනෙල්ලායයි
කීවේය. ඔහු දවන පූජාව ඔප්පුකෙළේය.
10 ඔහු දවන පූජාව ඔප්පුකර තීන්දුවුණු
හැටියේම සාමුවෙල් ආයේය; සාවුල්ද
ඔහුට ආචාර කරන පිණිස ඔහුගේ
11 පෙරමගට ගියේය. සාමුවෙල්: නුඹ
කුමක් කෙළෙහිදැයි ඇසීය. සාවුල්
කථාකොට: සෙනඟ මා වෙතින් විසිර
යන බවත් නියමකළ දවස් ඇතුළතදී
ඔබ නා බවත් පිලිස්තිවරුන් මික්මාෂ්හි
12 රැස්වී සිටින බවත් දුටු බැවින්, මම
කථාකොට: මා ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි කන්නලව්කරාට මත්තෙන්
පිලිස්තිවරු මට විරුද්ධව ගිල්ගාල්ට
එන්නෝය කියා, අකැමැත්තෙන් දවන
13 පූජාව පූජාකෙළෙමියි කීවේය. සාමුවෙල්ද
සාවුල්ට කථාකොට: නුඹ අඥවන ලෙස
ක්‍රියාකෙළෙහිය. නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ නුඹට අණකළ උන්වහන්සේගේ
ආඥාව රක්ෂාකළේ නැත. රක්ෂා කළා
නම් ස්වාමීන්වහන්සේ නුඹේ රජකම
ඉශ්‍රායෙල් කෙරෙහි සදාකාලේටම
14 ස්ථිරකරනවා ඇත. නුමුත් දැන් නුඹේ
රජකම පවතින්නේ නැත. ස්වාමීන්-
වහන්සේ නුඹට අණකළ දේ නුඹ
රක්ෂානොකළ බැවින් උන්වහන්සේ
තමන්ගේ සිතට එකඟවූ මනුෂ්‍යයෙකු
සොයාගෙන තමන්ගේ සෙනඟ කෙරෙහි
අධිපතියා වෙන්ට ඔහු නියමකර තිබේ-
යයි කීවේය.
15 සාමුවෙල් පිටත්වී ගිල්ගාලෙන්
බෙන්යමින් ගිබියාට ගියේය. සාවුල්
තමා සමග සිටි මිනිසුන් ගණන්කෙළේය,
16 ඔව්හු හසියයක් පමණ වූහ. සාවුල්ද
තමාගේ පුත්‍රවූ යොනාතාන්ද ඔවුන්
සමග සිටි සෙනඟද බෙන්යමීය ගෙබාහි
නැවතී සිටියෝය. නුමුත් පිලිස්තිවරු
මික්මාෂ්හි කඳවුරු බැන්දෝය.
පිලිස්තිවරුන්ගේ කඳවුරෙන් කොල්ල- 17
කාරයෝ කණ්ඩායම් තුනක්ව නික්ම
ආවෝය. එක කණ්ඩායමක් ඕප්‍රාට යන
මාර්ගයෙන් ෂූවාල් රටට ගියේය. එක 18
කණ්ඩායමක් බෙත්-හොරොන්ට යන
මාර්ගයෙන් ගියේය. එක කණ්ඩායමක්
කාන්තාරයට යන්නාවූ ශෙබොයිම්
මිටියාවතට ඉහළින් තිබෙන සීමාවේ
මාර්ගයෙන් ගියේය.
මුළු ඉශ්‍රායෙල් දේශයෙහි ආචාරියෙක් 19
නොසිටියේය. මක්නිසාද: හෙබ්‍රෙව්වන්
කඩුද හෙල්ලද සාදනොගන්න පිණිස-
යයි පිලිස්තිවරු කීවෝය. සියලු 20
ඉශ්‍රායෙල්වරු තම තමුන්ගේ හීවැලද
දැකැත්තද පොරොවද උදැල්ලද මුවහත්
කරන්ට පිලිස්තිවරුන් ළඟට ගියෝය;
එහෙත් උදලුද දැකැතිද යකඩ කොකුද 21
පොරෝද මුවහත් කරන්ටත් කෙවිට
හරිගස්සන්ටත් ඔවුන්ට පීරක් තිබුණේය.
මෙසේ යුද්ධ දවසේදී සාවුල්ටත් ඔහුගේ 22
පුත්‍රවූ යොනාතාන්ටත් මිස සාවුල් සහ
යොනාතාන් සමග සිටි සෙනඟගෙන්
කිසිවෙකු අතේ කඩුවක්වත් හෙල්ලයක්වත්
තිබුණේ නැත. පිලිස්තිවරුන්ගේ මුර 23
සමූදව මික්මාෂ්හි කඳු පාරට ගියේය.

## යොනාතාන්ගේ ජයගැන්ම සහ ඒ සම්බන්ධ කරුණු

14 එක් දවසක් සාවුල්ගේ පුත්‍රවූ
යොනාතාන් තමාගේ ආයුධ
ගෙනයන තරුණයාට කථාකොට:
වරෙන්, අර පැත්තේ සිටින පිලිස්ති-
වරුන්ගේ මුර සමූදව ළඟට යමුයයි
කීවේය. නුමුත් ඔහු තමාගේ පියාට
දැන්නුවේ නැත. සාවුල් ගිබියාහි කෙළවර 2
මිග්‍රොන්හි තිබෙන දෙළුම් ගස යට
සිටියේය. ඔහු සමග සිටි සෙනඟ
හසියයක් පමණ මනුෂ්‍යයෝය. ෂීලෝහි 3
ස්වාමීන්වහන්සේගේ පූජකයාව සිටි
ඒලීගේ පුත්‍රවූ පීනෙහාස්ගේ පුත්‍රයා වන

ඊකාබොද්ගේ සහෝදරවූ අහිතූබ්ගේ
පුත්‍රයා වන අහියා එහි ඒෆොද් සැට්ටයක්
ඇඳගෙන සිටියේය. යොනාතාන් ගිය
බව සෙනඟ නොදැන සිටියෝය.
4 පිලිස්තිවරුන්ගේ මුර සමූදව ළඟට
යොනාතාන් යන්ට උත්සාහකළ කඳු
පාරවල් අතරේ එක පැත්තක ගිරිකුළක්ද
අනික් පැත්තේ ගිරිකුළක්ද තිබුණේය.
එකක නම බෝශෙශ්ය, අනිකේ නම
5 සෙනේය. එක ගිරිකුළක් උතුරට මික්මාෂ්
ඉදිරිපිටද අනික් එක දකුණට ගෙබා
6 ඉදිරිපිටද උස්ව තිබුණේය. යොනාතාන්
තමාගේ ආයුධ ගෙනයන තරුණයාට
කථාකොට: වරෙන්, අපි අර
අචර්මඡේදිතයන්ගේ මුර සමූදව ළඟට
යමු. සමහරවිට ස්වාමීන්වහන්සේ අප
උදෙසා ක්‍රියාකරනවා ඇත. මක්නිසාද
බොහෝ දෙනෙකු කරණකොටගෙන
හෝ ස්වල්ප දෙනෙකු කරණකොටගෙන
හෝ ගළවන්ට ස්වාමීන්වහන්සේට
7 අවහිරකමක් නැතැයි කීවේය. ඔහුගේ
ආයුධ ගෙනයන්නාද: නුඹේ සිතේ
තිබෙන සියල්ල කරන්න. එහි යමු, නුඹේ
සිතේ හැටියටම මම නුඹ සමග සිටිමියි
8 ඔහුට කීවේය. එවිට යොනාතාන්: අපි
මේ මනුෂ්‍යයන් ළඟට ගොස් ඔවුන්ට
9 පෙනෙමුව. එවිට ඔවුන්–නුඹලා ළඟට
අප එන කල් නැවතියල්ලායයි අපට
කීවොත් අපි ඔවුන් ළඟට නැගී
නොගොස් අපේ ස්ථානයෙහිම සිටිමුව.
10 එහෙත් ඔවුන්–අප ළඟට නැගී වරෙල්ලා-
යයි කීවොත්, අපි නැගී යමුව. මක්නිසාද
ස්වාමීන්වහන්සේ ඔවුන් අප අතට පාවා
දී තිබේ. ඒක අපට ලකුණ වන්නේයයි
11 කීය. ඔවුන් දෙදෙනා ගොස් පිලිස්ති-
වරුන්ගේ මුර සමූදවට පෙනුණාහ.
පිලිස්තිවරු: අන්න, හෙබ්‍රෙව්වෝ සැඟවී
සිටින ගුහාවලින් පිටතට එතියි කීවෝය.
12 මුර සමූදවේ මිනිස්සු යොනාතාන්-
ටත් ඔහුගේ ආයුධ ගෙනයන්නාටත්
කථාකොට: අප ළඟට නැගී වරෙල්ලා,
අපි නුඹලාට කාරණයක් පෙන්වන්නෙමු-
යයි කීවෝය. යොනාතාන් තමාගේ
ආයුධ ගෙනයන්නාට කථාකොට: මා
පස්සේ වරෙන්, ස්වාමීන්වහන්සේ ඔවුන්
ඉශ්‍රායෙල් අතට පාවාදී තිබේයයි
කීවේය. යොනාතාන්ද ඔහු පස්සේ 13
ඔහුගේ ආයුධ ගෙනයන්නාද අත් පා
ගගහා නැගී ගියෝය. ඔව්හු යොනාතාන්
ඉදිරියෙහි පැරදී වැටුණෝය; ආයුධ
ගෙනයන්නාද ඔහු පස්සේ ගොස් ඔවුන්
මැරුවේය. යොනාතාන්ද ඔහුගේ ආයුධ 14
ගෙනයන්නාද මුලදී මෙසේ මැරුවේ
අක්කරයක බිමේ හීවිටි බාගයක දිග
ප්‍රමාණය හරියේ විසි දෙනෙකු පමණය.
කඳවුරේද එළිමහනේද මුළු සෙනඟ 15
අතරේද වෙවුලුමක් හටගත්තේය; මුර
සමූදවත් කොල්ලකාරයොත් වෙවුලුවෝය.
පොළොව කම්පාවිය; මෙසේ ඉතා මහත්
වෙවුලුමක් වූයේය. බෙන්යමින් ගිබියාහි 16
සාවුල්ගේ රැකවල්ලු බැලූ විට ඒ සමූහයා
අඩුවෙවී ඔබ මොබ විසිර යනවා
දුටුවෝය.
එවිට සාවුල් තමා සමග සිටි සෙනඟට 17
කථාකොට: අප කෙරෙන් ගියේ කවුද
කියා ගණන්කර බලාපල්ලායයි කීවේය.
ඔවුන් ගණන්කළ විට යොනාතාන්ද
ඔහුගේ ආයුධ ගෙනයන්නාද එහි නැති
බව පෙනී ගියේය. සාවුල් අහියාට 18
කථාකොට: දෙවියන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය මෙහි ගෙනෙන්නැයි කීවේය.
මක්නිසාද එකල්හි දෙවියන්වහන්සේගේ
ගිවිසුම් පෙට්ටිය ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙත
තිබුණේය. සාවුල් පූජකයාට කථාකරන 19
අතර පිලිස්තිවරුන්ගේ කඳවුරේ තිබුණ
කෝලාහලය වැඩි වැඩිව පැවැත්තේය.
නුඹේ අත අහකට ගනින්නැයි සාවුල්
පූජකයාට කීය. එවිට සාවුල්ද ඔහු 20
සමග සිටි මුළු සෙනඟද එකට රැස්ව
යුද්ධයට පැමිණියෝය. එවිට එක එක
මනුෂ්‍යයාගේ කඩුව තම තමා ළඟ සිටි
තැනැත්තාට විරුද්ධව තිබී, ඉතා මහත්
විසිරීමක් හටගෙන තිබෙන බව ඔව්හු

21 දුටුවෝය. අවට ප්‍රදේශවලින් පිලිස්ති-
වරුන් සමග කඳවුරට ඇවිත් පෙර ලෙස
ඔවුන් සමග සිටියාවූ හෙබ්‍රෙව්වරුත්
සාවුල් හා යොනාතාන් සමග සිටි
22 ඉශ්‍රායෙල්වරුන්ට එකතුවුණෝය. එසේම
එප්‍රායිම් කඳු රටේ සැඟවී සිටි සියලු
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝත් පිලිස්තිවරුන්
පලායන බව අසා සටන්කරමින් ඔවුන්
පස්සේ හයියෙන් එළවාගන ගියෝය.
23 මෙසේ ස්වාමීන්වහන්සේ ඒ දවසේදී
ඉශ්‍රායෙල්වරුන් ගැළවූසේක. යුද්ධයද
24 බෙත්-ආවෙන් ඉක්මවා පැවතුණේය. ඒ
දවසේදී ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ පෙළෙමින්
සිටියෝය. එහෙත් සාවුල් කථාකොට:
මා විසින් මාගේ සතුරන්ගෙන්
පළිගන්නතුරු, සවස්වන තෙක්, කිසි
කෑමක් කන මනුෂ්‍යයාට ශාපවේවයි
කියා සෙනඟ දිවුරෙවුවේය. එබැවින්
සෙනඟගෙන් කිසි කෙනෙක් කෑම කෑවේ
25 නැත. මුළු සෙනඟ වනයට පැමිණියෝය;
26 එහි බිම පිට මීපැණි තිබුණේය. සෙනඟ
වනයට පැමිණි විට මීපැණි වැගිරෙනවා
දුටුවෝය. නුමුත් සෙනඟ දිවුරුම ගැන
භයවූ බැවින් කවරෙක්වත් තමාගේ අත
27 කටට ගත්තේ නැත. නුමුත් තමාගේ
පියා සෙනඟ දිවුරවනවා යොනාතාන්ට
ඇසුණේ නැත. ඔහු තමාගේ අතේ තිබුණු
සැරයටිය දිඟුකොට එහි අග මීවදයක
ගල්වා ඒවා අරගන කටට ගත්තේය;
28 එයින් ඔහුගේ ඇස් පැහැදුණේය. එවිට
සෙනඟගෙන් එක්කෙනෙක් කථාකරමින්:
නුඹේ පියාණෝ අද කෑම කන
මනුෂ්‍යයාට ශාපවේවයි කියා සෙනඟ
තදින් දිවුරෙවුවාහ. මෙසේ සෙනඟද
29 විඩාවී සිටිතියි කීවේය. එවිට
යොනාතාන් කථාකොට: මාගේ
පියාණන් දේශය කලඹා තිබේ. මේ
මීපැණි ටික කෑමෙන් මාගේ ඇස්
30 පැහැදුණ හැටි බලාපල්ලා. ඉදින් සෙනඟ
තමුන්ගේ සතුරන්ගෙන් ලබාගත්
කොල්ලයෙන් රිසිසේ අද කෑවානම් තව
කොපමණ හොඳද? මක්නිසාද දැනට
පිලිස්තිවරුන් අතරෙහි මහත් නාස්තියක්
31 වී නැතැයි කීවේය. ඔව්හු ඒ දවසේදී
මික්මාෂ් පටන් අයලොන් දක්වා
පිලිස්තිවරුන්ට පහරදුන්නෝය. සෙනඟ
ඉතා විඩාවී සිටියෝය. සෙනඟ 32
කොල්ලය පිටට පැන, බැටළුවන්ද
හරකුන්ද වස්සන්ද අරගන බිමදමා මරා,
ලේ පිටින් කෑවෝය. එවිට: සෙනඟ ලේ 33
පිටින් කෑමෙන් ස්වාමීන්වහන්සේට
විරුද්ධව පව්කරතියි කියා සාවුල්ට
දන්වනලද්දේය. ඔහුද: නුඹලා ද්‍රෝහි
ලෙස ක්‍රියාකළහුය. අද මා ළඟට මහත්
ගලක් පෙරළා ගෙන වරෙල්ලායයි
කීවේය. තවද සාවුල්: නුඹලා සෙනඟ 34
අතරට ගොස්-ලේ සමග කෑමෙන්
ස්වාමීන්වහන්සේට විරුද්ධව පව්නොකර,
නුඹලා එකිනෙකා තම තමාගේ හරකාද
තම තමාගේ බැටළුවාද මා ළඟට
ගෙනැවිත් මෙහි මරා කාපල්ලායයි
කියන්ට කීවේය. මුළු සෙනඟ එකිනෙකා
තම තමාගේ හරකා රාත්‍රියෙහි ගෙනවුත්
එහි මැරුවෝය. සාවුල් ස්වාමීන්වහන්සේට 35
පූජාසනයක් ගොඩනැඟුවේය. එය ඔහු
විසින් ස්වාමීන්වහන්සේට ගොඩ නැඟූ
පළමුවෙනි පූජාසනයය.

තවද සාවුල් කථාකොට: අපි අද 36
රාත්‍රියේ පිලිස්තිවරුන් පස්සේ ගොස්
ඔවුන්ගෙන් එක් කෙනෙක්වත් ඉතුරු-
නොකර පහන්වෙන තෙක් ඔවුන්ගෙන්
කොල්ලගනිමුයයි කීවේය. ඔව්හුද:
ඔබට හොඳව පෙනෙන කොයි දේ වුවත්
එය කළ මැනවැයි කීවෝය. එවිට
පූජකයා: අපි මෙහි දෙවියන්වහන්සේ
වෙතට ළංවමුයයි කීවේය. සාවුල්ද: 37
මා පිලිස්තිවරුන්ට විරුද්ධව යන්ට
ඕනෑද? ඔබවහන්සේ ඔවුන් ඉශ්‍රායෙල්
අතට පාවාදෙනසේක්දැයි දෙවියන්-
වහන්සේගෙන් විචාළේය. නුමුත්
උන්වහන්සේ එද ඔහුට උත්තර
නුදුන්සේක. එවිට සාවුල් කථාකොට: 38
සෙනඟගේ සියලු ප්‍රධානියෙනි, මෙහි
ඇවිත්, අද මේ පාපය සිද්ධවුණේ
කුමක් කරණකොටගෙනද කියා බලා
දැනගනිල්ලා. මක්නිසාද එය තිබෙන්නේ 39
මාගේ පුත්‍රවූ යොනාතාන් කෙරෙහි වුණත්,

ඉශ්‍රායෙල් ගළවන **ස්වාමීන්වහන්සේ**
ජීවමාන බව සැබෑවා සේම ඔහු
නසින්නටම ඕනෑයයි කීවේය. නුමුත්
මුළු සෙනඟ අතරෙන් කිසිවෙක් ඔහුට
40 උත්තර දුන්නේ නැත. එවිට ඔහු: නුඹලා
එක පක්ෂයක සිටපල්ලා, මමද මාගේ
පුත්‍රවූ යොනාතාන්ද අනික් පක්ෂයේ
සිටිමුයයි සියලු ඉශ්‍රායෙල්වරුන්ට
කීවේය. ඔබට යහපත්ව පෙනෙන දෙයක්
කළමැනවැයි සෙනඟ සාවුල්ට කීවෝය.
41 සාවුල්ද: ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්ස,
හරි දේ පෙන්වාදුනමැනවයි **ස්වාමීන්-**
**වහන්සේට** කීවේය. පසඇට දැමූ විට
සාවුල් සහ යොනාතාන් අසුවුණෝය,
42 සෙනඟ ගැළවුණෝය. මා සහ මාගේ
පුත්‍රවූ යොනාතාන් අතරේ පසඇට
දමාපල්ලායයි සාවුල් කීය. එවිට
43 යොනාතාන් අසුවිය. නුඹ කළේ
මොකද කියා මට කියාපන්නැයි සාවුල්
යොනාතාන්ට කීවේය. යොනාතාන්
ඔහුට කියනුයේ: මාගේ අතේ තිබුණු
සැරයටියේ අගින් මීපැණි ටිකක් ගෙන
කෑවා සැබෑය; ඔන්න, මා නසින්ට ඕනෑ-
44 යයි කීවේය. සාවුල්ද: යොනාතාන්,
නුඹ නසින්ටම ඕනෑය, නැත්නම්
දෙවියන්වහන්සේ එසේත් ඊට වැඩියෙනුත්
45 මට කරනසේක්වයි කීයේය. එවිට සෙනඟ
සාවුල්ට කථාකොට: ඉශ්‍රායෙල්හි මේ
මහත් ගැළවීම සිද්ධකළ යොනාතාන්
නසින්ට ඕනෑද? එසේ නොවේවා.
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව සැබෑවා
සේම ඔහුගේ හිසෙන් කේශයක්වත් බිම
නොවැටෙන්නේය; මක්නිසාද ඔහු
දෙවියන්වහන්සේ සමග අද දවසේ
ක්‍රියාකෙළේයයි කීවෝය. මෙසේ
යොනාතාන් නොනසින ලෙස සෙනඟ
46 ඔහු මුදගත්තෝය. එවිට සාවුල්
පිලිස්තිවරුන් පස්සේ නොගොස් හැරී
ආවේය. පිලිස්තිවරු තමුන්ගේ ස්ථානයට
ගියෝය.
47 මෙසේ සාවුල් ඉශ්‍රායෙල් කෙරෙහි
රජකම ලැබුවායින් පසු වටකර සිටි
තමාගේ සියලු සතුරන් වන මෝවබ්-
වරුන්ටත් අම්මොන් පුත්‍රයන්ටත්
ඒදෝම්වරුන්ටත් සෝබාහි රජුන්ටත්
පිලිස්තිවරුන්ටත් විරුද්ධව යුද්ධකෙළේය.
ඔහු ගිය ගිය තැන ජයගත්තේය.
ඔහු වික්‍රමාන්විතව ක්‍රියාකරනුයේ, 48
අමලෙක්වරුන්ට පහරදී, ඉශ්‍රායෙල්
කොල්ලකන අයින්ගේ අත්වලින් ඔවුන්
ගළවා ගත්තේය.
සාවුල්ගේ පුත්‍රයෝනම් යොනාතාන්ද 49
ඉෂ්වීද මල්කීෂුවාද යන මොව්හුය.
ඔහුගේ දූවරුන් දෙදෙනාගේ නාම
මේය: වැඩිමහල් දුවගේ නම මේරබ්ය,
බාල දුවගේ නම මීකල්ය. සාවුල්ගේ 50
භාර්යාවගේ නම අහීනොවම්ය, ඈ
අහීමයස්ගේ දූවය. ඔහුගේ සේනා-
පතියාගේ නම අබ්නේර්ය, ඔහු සාවුල්ගේ
බාප්පා වන නේර්ගේ පුත්‍රයාය. සාවුල්ගේ 51
පියා කීෂ්ය. අබ්නේර්ගේ පියවූ නේර්
අබියෙල්ගේ පුත්‍රයාය.
සාවුල්ගේ සියලු දවස්වල පිලිස්ති- 52
වරුන්ට විරුද්ධව දරුණුවූ යුද්ධ
පැවතුණේය. සාවුල් වනාහි යම් බල-
සම්පන්න මනුෂ්‍යයෙකු හෝ වික්‍රමාන්විත
මනුෂ්‍යයෙකු හෝ දුටු විට ඔහු තමා
යටතට පත්කරගත්තේය.

## අමලෙක්වරුන්ට විරුද්ධව සාවුල්ගේ සටන්කිරීම. ඔහු දෙවෙනි වර එපාකරනු ලැබීම

15 සාමුවෙල් සාවුල්ට කථාකොට:
**ස්වාමීන්වහන්සේ** තමන්ගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි නුඹ රජ
කොට ආලේපකරන පිණිස මා එවූ-
සේක. එබැවින් දැන් **ස්වාමීන්වහන්සේගේ**
වචනවල හඬට ඇහුම්කන් දෙන්න.
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ 2
කියනසේක: ඉශ්‍රායෙල් මිසරයෙන් එන
කල අමලෙක්වරුන් ඔවුන්ට කළ දේ
එනම් ඔවුන්ට විරුද්ධව මාර්ගයෙහි
සිටි හැටි සිහිකරමි. දැන් නුඹ ගොස් 3
අමලෙක්ට පහරදී, ඔවුන් ඉතිරි නොකොට,

ඔවුන් සතු සියල්ල සහමුලින්ම
විනාශකරදමා, පුරුෂයන් හා ස්ත්‍රීන්ද
බාලයින් හා කිරිදරුවන්ද ගවයන් හා
බැටළුවන්ද ඔටුවන් හා කොටළුවන්ද
මරාදමාපන්නැයි කියනසේකැයි කීවේය.
4 සාවුල් සෙනඟ එකතුකරවා තෙලායිම්-
හිදී ඔවුන් ගණන්කෙළේය, පාබළ
සෙනඟ දෙලක්ෂයක්ද යූදා මනුෂ්‍යයෝ
5 දස දහසක්ද සිටියෝය. සාවුල්
අමලෙක්වරුන්ගේ නුවර ළඟට පැමිණ
6 මිටියාවතේ සැඟවී රැක සිටියේය. තවද
සාවුල් කේනිවරුන්ට කථාකොට: මා
විසින් අමලෙක්වරුන් සමග නුඹලා
විනාශ නොකරන පිණිස ඔවුන් අතරෙන්
අහක්ව පලයල්ලා. මක්නිසාද ඉශ්‍රායෙල්
පුත්‍රයන් මිසරයෙන් එද්දී නුඹලා ඔවුන්
සියල්ලන්ට කරුණාකළහුයයි කීවේය.
එබැවින් කේනිවරු අමලෙක්වරුන්
7 අතරෙන් අහක්ව ගියෝය. සාවුල්ද
හවිලා පටන් මිසරය ඉදිරිපිට තිබෙන
ෂූර් දක්වා අමලෙක්වරුන්ට පහර
8 දුන්නේය. ඔහු අමලෙක්වරුන්ගේ රජවූ
ආගග් පණපිටින් අල්ලාගෙන මුළු සෙනඟ
කඩුමුවහතින් සහමුලින්ම විනාශකර
9 දැමුවේය. එහෙත් සාවුල් සහ සෙනඟ
ආගග්ද බැටළුවන් හා ගවයින්ගෙනුත්
තර සතුන්ගෙනුත් ඉතා හොඳ එවුන්ද
බැටළු පැටවුන්ද සියලු හොඳ දේවල්ද
සහමුලින්ම විනාශකර දමන්ට අකැමැතිව
ඉතිරි කරගත්තෝය. නුමුත් නුසුදුසුවූ
නොවටිනාවූ සියල්ලම ඔව්හු
විනාශකර දැමුවෝය.
10 එවිට ස්වාමීන්වහන්සේගේ වචනය
11 සාමුවෙල් වෙතට පැමිණ: මම සාවුල්
රජකමට පත්කළ බැවින් තැවෙමි.
මක්නිසාද ඔහු මාගේ ආඥා නොපවත්වා,
මාගේ වචනය ඉෂ්ටනොකර, මා අනුව
යාමෙන් අහක්ව ගියේයයි කීසේක.
සාමුවෙල් උදහස්වී රාත්‍රිය මුළුල්ලේ
ස්වාමීන්වහන්සේට යාච්ඤාකෙළේය.
12 සාමුවෙල් උදය සාවුල් සම්බවෙන්ට යන
පිණිස වේලාසනින් නැගිට්ටේය; එවිට:
සාවුල් කර්මෙල්ට පැමිණ, එහි ජයස්-
තම්භයක් පිහිටුවා, හැරී ගිල්ගාල්ට
බැස යන්ට ගියේයයි සාමුවෙල්ට
දන්වනලද්දේය. සාමුවෙල් සාවුල් 13
ළඟට පැමුණුණු කල සාවුල් ඔහුට
කථාකොට: ස්වාමීන්වහන්සේගෙන් ඔබට
ආශීර්වාද ලැබේවා. මම ස්වාමීන්-
වහන්සේගේ වචනය ඉෂ්ටකෙළෙමියි කීය.
සාමුවෙල්ද: එසේ නම් මාගේ කන්වල 14
වැටෙන මේ බැටළු හඬත් මට ඇසෙන
ගවයින්ගේ හඬත් කිමෙක්දැයි ඇසුවේය.
සාවුල් කථාකොට: සෙනඟ අමලෙක්- 15
වරුන්ගෙන් උන් ගෙනාවෝය. මක්නිසාද
ඔබගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
පූජාකරන පිණිස සෙනඟ බැටළුවන්-
ගෙන්ද ගොනුන්ගෙන්ද ඉතා හොඳවුන්
ඉතුරුකරගත්තෝය; අනික් එවුන්
සහමුලින් විනාශකර දැමුවෙමුයයි
කීවේය. එවිට සාමුවෙල්: නවතින්න, මේ 16
රාත්‍රියේ ස්වාමීන්වහන්සේ මට කී
කාරණය නුඹට දන්වමියි සාවුල්ට
කීවේය. කිව මැනවැයි ඔහු කීය. සාමුවෙල් 17
කථාකොට: නුඹ සුළු කෙනෙකැයි නුඹම
සිතූ නුමුත්, නුඹ ඉශ්‍රායෙල් ගෝත්‍රයන්
කෙරෙහි අධිපතිකරනු ලැබුවා නොවේද?
ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් කෙරෙහි
රජකමට නුඹ ආලේප කළසේක;
ස්වාමීන්වහන්සේද නුඹ ගමනක් යවමින්: 18
අමලෙක්වරුන් වන පව්කාරයන්
විනාශකරදමා, ඔවුන් නැතිවී යන තුරු
ඔවුන්ට විරුද්ධව යුද්ධකරපන්නැයි කී-
සේක. ඉතින් නුඹ ස්වාමීන්වහන්සේගේ 19
හඬට කීකරුනොවී, කොල්ලය පිටට
පැන, ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරුව තිබෙන දේ කළේ මක්නිසාදැයි
කීවේය. සාවුල්ද: නැත, මම ස්වාමීන්- 20
වහන්සේගේ හඬට කීකරුව, ස්වාමීන්-
වහන්සේ මා යැවූ ගමන ගොස්, අමලෙක්-
වරුන්ගේ රජවූ ආගග් ගෙනාවෙමි,
අමලෙක්වරුන්ද සහමුලින්ම විනාශකර-
දැමීමි. නුමුත් සෙනඟ වනාහි විනාශයට 21
කැපවූ දේවලින් ප්‍රධාන කොට්ඨාසය වන

බැටළුවන්ද ගවයන්ද කොල්ලය අතරෙන්
රැගෙන ගිල්ගාල්හිදී ඔබගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** පූජාකරන පිණිස
ආවෝයයි සාමුවෙල්ට කීවේය.
22 සාමුවෙල්ද: **ස්වාමීන්වහන්සේගේ** හඬට
කීකරුවීම පමණ දවන පූජාවලටත් යාග
පූජාවලටත් **ස්වාමීන්වහන්සේ** ප්‍රසන්න-
වනසේක්ද? පූජාවට වඩා කීකරු-
වීමත් බැටළුවන්ගේ තෙලට වඩා
23 ඇහුම්කන්දීමත් හොඳය. මක්නිසාද
කැරළිකාරකම පේනකීමේ පාපයටත්
මුරණ්ඩුකම දේවතාවන් හා රූප
ඇදහීමටත් සමානය. තුඹ **ස්වාමීන්-
වහන්සේගේ** වචනය පහකළ නිසා
උන්වහන්සේත් තුඹ රජකමෙන් පහකළ-
24 සේකැයි කීවේය. සාවුල් සාමුවෙල්ට
කථාකොට: මම පව්කෙළෙමි. මක්නිසාද
මම සෙනඟට භයවී ඔවුන්ගේ හඬට
කීකරුවූ බැවින් **ස්වාමීන්වහන්සේගේ**
ආඥාවද ඔබගේ වචනද කඩකෙළෙමි.
25 එහෙත් ඔබ දැන් මගේ පාපයට කමාවී,
මා විසින් **ස්වාමීන්වහන්සේට** නමස්කාර-
කරන පිණිස මා සමග හැරී අව මැනවැයි
26 සාමුවෙල්ට කීවේය. මම තුඹ සමග
හැරී නොඑමි. මක්නිසාද තුඹ **ස්වාමීන්-
වහන්සේගේ** වචනය පහකෙළෙහිය,
**ස්වාමීන්වහන්සේද** ඉශ්‍රායෙල් කෙරෙහි
රජව සිටීමෙන් තුඹ පහකළසේකැයි
27 සාමුවෙල් සාවුල්ට කීවේය. සාමුවෙල්
යන්ට හැරෙන විට සාවුල් ඔහුගේ සළුවේ
කෙළවර අල්ලාගත්තේය, එවිට ඒක
28 ඉරුණේය. සාමුවෙල් ඔහුට කථාකොට:
**ස්වාමීන්වහන්සේ** අද ඉශ්‍රායෙල් රජකම
තුඹෙන් පැහැරගෙන තුඹට වඩා යහපත්
29 වූ තුඹේ අසල්වාසියෙකුට දී තිබේ. ඇරත්
ඉශ්‍රායෙල්ගේ පරාක්‍රමයාණෝ බොරු
නොකියනසේක, නොතැවෙනසේක.
මක්නිසාද තැවෙන්ට උන්වහන්සේ
30 මනුෂ්‍යයෙක් නොවේයයි කීවේය. එවිට
ඔහු: මම පව්කෙළෙමි. එහෙත් දැනට
මාගේ සෙනඟගේ වැඩිමහල්ලන්ද
ඉශ්‍රායෙල්වරුන්ද ඉදිරියේදී මට ගෞරවය
දී, මා විසින් ඔබගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** නමස්කාරකරන පිණිස මා
සමග හැරී අවමැනවැයි කීවේය. එවිට 31
සාමුවෙල් හැරී සාවුල් සමග ගියේය;
සාවුල්ද **ස්වාමීන්වහන්සේට** නමස්කාර-
කෙළේය.
එවිට සාමුවෙල්: අමලෙක්වරුන්ගේ 32
රජවූ ආගග් මා ළඟට ගෙනෙල්ලායයි
කීවේය. ආගග්ද: වෙවුල වෙවුලා ඔහු
ළඟට ඇවිත්–සැබවින්ම මරණයේ
තික්තකම පහව ගියේයයි කීය.
සාමුවෙල්ද: තුඹේ කඩුව ස්ත්‍රීන් දරුවන් 33
නැති අය කළාක්මෙන් තුඹේ මෑණියෝත්
ස්ත්‍රීන් අතරෙහි දරුවන් නැත්තියක්
වන්නීයයි කීය. සාමුවෙල් ගිල්ගාල්හිදී
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ආගග්
කැබලිකොට කපාදැමුවේය.
ඉක්බිති සාමුවෙල් රාමාට ගියේය; 34
සාවුල් වනාහි ගිබියාහි තිබුණ තමාගේ
ගෙදරට ගියේය. ඉන්පසු සාමුවෙල් තමා 35
මැරෙන දවස දක්වා තවත් සාවුල් දකින්ට
නායේය. නුමුත් සාමුවෙල් සාවුල් ගැන
ශෝකවිය. **ස්වාමීන්වහන්සේද** සාවුල්
ඉශ්‍රායෙල් කෙරෙහි රජකමට පත්කළ
බැවින් තැවුණුසේක.

## දවිත් රජකොට ආලේපකරනු ලැබීම

16 **ස්වාමීන්වහන්සේ** සාමුවෙල්ට
කථාකොට: මා විසින් සාවුල්
ඉශ්‍රායෙල් කෙරෙහි රජකම්කිරීමෙන්
පහකර තිබෙද්දී තුඹ ඔහු ගැන
කොපමණ කල් ශෝකවන්නෙහිද? තුඹේ
තෙල් කුලාව පුරවාගෙන පලයන්න, මම
බෙත්-ලෙහෙමිය යෙස්සේ ළඟට තුඹ
යවමි. මක්නිසාද ඔහුගේ පුත්‍රයන්
අතරෙන් රජෙකු මට සපයාගත්තෙමියි
කීසේක. සාමුවෙල්ද: මා යන්නේ 2
කොහොමද? එය සාවුල්ට සැලවුණොත්
ඔහු මා මරනවා ඇතැයි කීවේය.
**ස්වාමීන්වහන්සේද** තුඹ වැස්සියක්
ගෙනගොස්: මම **ස්වාමීන්වහන්සේට** පූජා

3 කරන්ට ආවෙමියි කියාපන්න. යෙස්සේද
පූජාවට කැඳවාගනින්න, එවිට තුඹ විසින්
කටයුතු දේ මම තුඹට පෙන්වන්නෙමි.
මා තුඹට කියන තැනැත්තා මට
4 ආලේපකරපන්නැයි කීසේක. සාමුවෙල්
**ස්වාමීන්වහන්සේ** කී දේ කොට බෙත්-
ලෙහෙමට ආයේය. එවිට නුවර වැඩි-
මහල්ලෝ වෙවුලමින් ඔහු සම්මුඛවෙන්ට
අවුත්: ඔබ එන්නේ සමාදනයෙන්දැයි
5 ඇසූහ. සමාදනයෙන්ය. **ස්වාමීන්වහන්සේට**
පූජාකරන්ට ආවෙමි. තුඹලා පවිත්‍රවී
මා සමග පූජාවට වරෙල්ලායයි ඔහු
කීවේය. ඔහු යෙස්සේද ඔහුගේ පුත්‍රයන්ද
පවිත්‍රකොට පූජාවට කැඳෙවුවේය.
6 ඔවුන් ආ කල ඔහු එලියාබ් දෙස
බලා: සැබෑවටම **ස්වාමීන්වහන්සේගේ**
අභිෂේකලත් තැනැත්තේ උන්වහන්සේ
7 ඉදිරියෙහි සිටීයයි කියාගත්තේය. නුමුත්
**ස්වාමීන්වහන්සේ** සාමුවෙල්ට කථා-
කොට: ඔහුගේ පෙනීම දෙසවත් ශරීරයේ
උස දෙසවත් නොබලන්න; මක්නිසාද
මම ඔහු එපාකෙළෙමි. **ස්වාමීන්වහන්සේ**
මනුෂ්‍යයා බලන්නාක්මෙන් නොබලන-
සේක; මනුෂ්‍ය තෙමේ පිටාතර පෙනීම
බලන්නේය, නුමුත් **ස්වාමීන්වහන්සේ** සිත
8 බලනසේකැයි කීසේක. එවිට යෙස්සේ
අබිනාදබ්ට හඬගසා සාමුවෙල් ඉදිරි-
පිටින් යන්ට සැලැස්විය. මොහුවත්
**ස්වාමීන්වහන්සේ** තෝරානොගත්සේකැයි
9 ඔහු කීය. එවිට යෙස්සේ ෂම්මා ඔහු
ළඟින් යන්ට සැලැස්විය. මොහුවත්
**ස්වාමීන්වහන්සේ** තෝරානොගත්සේකැයි
10 ඔහු කීවේය. මෙසේ යෙස්සේ තමාගේ
පුත්‍රයන්ගෙන් සත්දෙනෙක් සාමුවෙල්
ඉදිරිපිටින් යන්ට සැලැස්සුවේය.
සාමුවෙල්ද: මොවුන් **ස්වාමීන්වහන්සේ**
තෝරානොගත්සේකැයි යෙස්සේට කියා,
11 තුඹේ පුත්‍රයන් හැමදෙනාම මෙහි
ඉන්නවාදැයි යෙස්සේගෙන් ඇසුවේය.
ඔහු කථාකොට: තව ඉතිරිව ඉන්නේ
බාලයාය, ඔහු බැටළුවන් බලාගන
සිටිනවායයි කීවේය. සාමුවෙල්ද:
කෙනෙක් යවා ඔහු ගෙන්වාපන්න. ඔහු
මෙහි එන තුරු අපි කෑමට ඉඳ
නොගන්නෙමුයයි යෙස්සේට කීය. එවිට 12
හෙතෙම කෙනෙකු යවා ඔහු ගෙන්විය.
ඔහු රතුපාටව, ශෝභමාන පෙනීමක්
ඇතුව, රූප සම්පන්නව සිටියේය.
**ස්වාමීන්වහන්සේ:** නැගිට මොහු
ආලේපකරපන්න, මොහු ඒ තැනැත්තා-
යයි කීසේක. එවිට සාමුවෙල් තෙල් 13
කුලාව රැගෙන ඔහුගේ සහෝදරයන්
මැද්දේ ඔහු ආලේපකෙළේය. එදින
පටන් **ස්වාමීන්වහන්සේගේ** ආත්මය
ආනුභාසම්පන්නව දාවිත් කෙරෙහි
පැමිණියේය. සාමුවෙල් නැගිට රාමාට
ගියේය.
නුමුත් **ස්වාමීන්වහන්සේගේ** ආත්මය 14
සාවුල්ගෙන් පහව ගොස් **ස්වාමීන්-
වහන්සේගෙන්** නපුරු ආත්මයක් ඔහු
කැලඹුවේය. සාවුල්ගේ සේවකයෝ ඔහුට 15
කථාකොට: දැන් දෙවියන්වහන්සේගෙන්
නපුරු ආත්මයක් ඔබ කලඹයි. දක්ෂ 16
වීණාකාරයෙකු සොයන්ට අපේ
ස්වාමිතුමා ඔබ ඉදිරිපිට සිටින ඔබගේ
සේවකයන්ට අණකෙරේවා. එවිට
දෙවියන්වහන්සේගෙන් නපුරු ආත්මය
ඔබ කෙරෙහි තිබෙන කල, ඔබට
සුවවෙන පිණිස ඔහු තමාගේ අතින්
ගායනාකරන්නේයයි කීවෝය. සාවුල් 17
කථාකොට: හොඳට ගායනාකරන
මනුෂ්‍යයෙකු සොයා ඔහු මා ළඟට
ගෙනෙල්ලායයි තමාගේ සේවකයන්ට
කීවේය. එවිට වැඩකාරයන්ගෙන් එක්- 18
කෙනෙක් උත්තර දෙමින්: ගායනා-
කරන්ට දන්නාවූ, බෙත්-ලෙහෙමිය
යෙස්සේගේ පුත්‍රයෙකු දුටිමි, ඔහු
බලවත් වික්‍රමාන්විත පුරුෂයෙක් ව,
යුද්ධකාරයෙක් ව, කථාවෙහි දක්ෂවූ
රූපසම්පන්නවූ කෙනෙක් ව සිටියි,
**ස්වාමීන්වහන්සේත්** ඔහු සමගයයි
කීවේය. එබැවින් සාවුල් යෙස්සේ වෙත 19
පණිවිඩකාරයන් යවා: බැටළුවන් සමග
සිටින තුඹේ පුත්‍රවූ දාවිත් මා ළඟට
එවාපන්නැයි කියා යැවීය. එවිට 20
යෙස්සේ රොටිද මුද්‍රිකපාන භාජනයක්ද

එළුපැටවෙක්ද කොටළුවෙකු පිට පටවා
ඒවා තමාගේ පුත්‍රවූ දාවිත් අත සාවුල්ට
21 ඇරියේය. දාවිත් සාවුල් ළඟට ඇවිත්
ඔහු ඉදිරියෙහි සිටියේය. ඔහුද ඔහුට
ඉතා ආදරේවිය; ඔහු සාවුල්ගේ ආයුධ
22 ගෙනයන්නා වුණේය. දාවිත් මාගේ ඇසට
ප්‍රිය නිසා ඔහු මා ඉදිරියෙහි සිටීවයි
23 සාවුල් යෙස්සේට කියා යැවීය. තවද
දෙවියන්වහන්සේගෙන් නපුරු ආත්මය
සාවුල්ට පැමිණි කල දාවිත් තෙමේ වීණාව
ගෙන අතින් ගායනාකෙළේය. එයින්
සාවුල්ට පහසුවද සුවයද ලැබී, නපුරු
ආත්මය ඔහුගෙන් පහව ගියේය.

## දාවිත් ගොලියත්ගෙන් ජයගැනීම

17 පිලිස්තිවරු තමුන්ගේ සේනාවන්
යුද්ධයට රැස්කළෝය, ඔව්හු යුදට
අයිතිවූ සොකෝහි එකතුව සොකෝටත්
අසේකාටත් අතරේ එපෙස්-දම්මීම්හි
2 කඳවුරු බැඳගත්තෝය. සාවුල්ද ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝද රැස්ව ඒලා මිටියාවතේ
කඳවුරු බැඳ පිලිස්තිවරුන්ට විරුද්ධව
3 යුද්ධ පිළිවෙළින් සිටියෝය. පිලිස්තිවරු
එක පැත්තක තිබුණු කන්දේද
ඉශ්‍රායෙල්වරු අනික් පැත්තේ තිබුණු
කන්දේද සිටියෝය. ඔවුන්ට අතරේ
4 මිටියාවතක් තිබුණේය. ගාත්හි
වැසියෙක්වූ ගොලියත් නම්වූ හරියන්
හමාරක් උස ඇති මල්ලවයෙක්
පිලිස්තිවරුන්ගේ කඳවුරෙන් පිටතට
5 ආවේය. ඔහුගේ හිසෙහි පිත්තල
තොප්පියක් තිබුණේය, ඔහු ලෝහ
හැට්ටයක් පැළඳගෙන සිටියේය; සැට්ටයේ
පිත්තලවල බර ෂෙකෙල් පන්දහසක්ය.
6 ඔහුගේ පාදවල පිත්තල වැසුම් තිබුණේය,
ඔහුගේ පිටිකරෙහි පිත්තලමය කුඩා
7 හෙල්ලයක් තිබුණේය. ඔහුගේ මහ
හෙල්ලයේ මිට වියන දණ්ඩට සමානය;
ඔහුගේ හෙල්ලයේ තලය යකඩ ෂෙකෙල්
හසියයක බරය. ඔහුගේ පලිහ
ගෙනයන්නා ඔහුට පෙරටුවෙන් ගියේය.
ඔහු සිට ඉශ්‍රායෙල් සේනාවන්ට 8
මොරගසා: තුඹලා යුද්ධ පිළිවෙළින්
සිටින්ට පිටතට එන්නේ මක්නිසාද? මම
පිලිස්තියයෙක් නොවම්ද? තුඹලා
සාවුල්ගේ සේවකයෝ නොවෙත්ද? මා
ළඟට එන පිණිස තුඹලා වෙනුවට
මනුෂ්‍යයෙකු තෝරාගනිල්ලා. මා 9
සමග සටන්කොට මා මරන්ට ඔහුට
පුළුවන්වුණොත්, අපි තුඹලාගේ
මෙහෙකරුවෝ වන්නෙමුව. නුමුත් මා
ඔහුගෙන් ජයගෙන ඔහු මැරුවොත්,
තුඹලා අපේ මෙහෙකරුවන්ව අපට
සේවයකරන්ට ඕනෑයයි කීවේය. තවද 10
ඒ පිලිස්තියයා: මම ඉශ්‍රායෙල්
සේනාවන්ට අද දවසේ මිගකියම්; මා
සමග සටන්කරන්ට මනුෂ්‍යයෙක්
දියල්ලායයි කීවේය. සාවුල්ද සියලු 11
ඉශ්‍රායෙල්වරුද පිලිස්තියයාගේ ඒ වචන
අසා තැතිගෙන බොහෝසෙයින්
භයපත්වූහ.
දාවිත් යුදයේ බෙත්-ලෙහෙම්හි යෙස්සේ 12
නම්වූ ඒප්‍රාතියයාගේ පුත්‍රයාය; යෙස්සේට
පුත්‍රයන් අට දෙනෙක් වූවෝය. ඒ
මනුෂ්‍යයා සාවුල්ගේ දවස්වල මහලුව
මනුෂ්‍යයන් අතරේ වයස්ගතව සිටියේය.
යෙස්සේගේ වැඩිමහල් පුත්‍රයන් තුන්දෙනා 13
සාවුල් අනුව යුද්ධයට ගියෝය. යුද්ධයට
ගිය ඔහුගේ පුත්‍රයන් තුන්දෙනාගේ නාම
මෙසේය: කුළුඳුලා එලියාබ්ය, දෙවෙනියා
අබිනාදබ්ය, තුන්වෙනියා ෂම්මාය. දාවිත් 14
සියල්ලන්ට බාලයාය. වැඩිමහල්
තුන්දෙන සාවුල් අනුව ගියෝය. දාවිත් 15
වනාහි බෙත්-ලෙහෙම්හි තමාගේ පියාගේ
බැටළුවන් බලාගන්ට සාවුල් වෙතින්
ඔබ මොබ ගියේය. ඒ පිලිස්තියයා 16
සතළිස් දවසක් උදයත් සවසත්
ඉස්සරහට ඇවිත් පෙනී සිටියේය.
යෙස්සේ තමාගේ පුත්‍රවූ දාවිත්ට 17
කථාකොට: මේ විලඳවලින් ඒඵාවක්ද
මේ රොටි දසයද රැගෙන කඳවුරට තුඹේ
සහෝදරයන් ළඟට ඉක්මනින් ගොස්
ඔවුන්ට දීපන්න; ඔවුන්ගේ සහස්‍රාධි- 18
පතියාට මේ කේජුගෙඩි දහයද ගෙනගොස්,

තුඹේ සහෝදරයන්ගේ සැප සනීප
කොහොමදැයි බලා, ඔවුන්ගේ තොරතුරු
19 දැනගෙන වරෙන්නැයි කීවේය. සාවුල්ද
ඔව්හුද ඉශ්‍රායෙල් මනුෂ්‍යයන් සියලුදෙනාද
ඒලානම් මිටියාවතේ පිලිස්තිවරුන් සමග
20 සටන්කරමින් සිටියෝය. දාවිත් අලුයම
නැගිට, බැටළු පාලයෙකුට බැටළුවන්
භාරදී, යෙස්සේ තමාට අණකළ ලෙස
අරගෙන ගොස්, ගැල් තිබුණු ස්ථානයට
පැමුණුණේය. එවිට සේනාව යුද්ධ-
භූමියට යමින් ඔල්වර හඬ පැවැත්තුවෝය.
21 ඉශ්‍රායෙල්වරුද පිලිස්තිවරුද සේනාවට
විරුද්ධව සේනාවක් වශයෙන් යුද්ධ
22 පිළිවෙළින් සිටියාහ. දාවිත් තමා ගෙනා
දේවල් බඩු ප්‍රවේසම් කරන්නා අතට
භාරදී, සේනාව ළඟට දිවගොස් තමාගේ
23 සහෝදරයන්ට ආචාරකෙළේය. ඔහු ඔවුන්
සමග කථාකරන කල, බලව, ගාත්හි
ගොලියත් නම් පිලිස්තිය මල්ලවයා
පිලිස්තිවරුන්ගේ සමූදවලින් පිටත්ව
අවුත් ඒ වචනවල හැටියට කථාකෙළේය.
24 දාවිත්ට ඒවා ඇසුණේය. සියලු ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝ ඒ මනුෂ්‍යයා දුටු විට
බොහෝසෙයින් භයවී ඔහු ඉදිරියෙන්
25 දිවුවෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ
කථාකොට: ඉස්සරහට එන්නාවූ අර
මනුෂ්‍යයා තුඹලා දක්කහුද? ඉශ්‍රායෙල්-
වරුන්ට මිගකියන්ටම ඔහු ඇවිත්
සිටියි. රජ්ජුරුවෝ ඔහු මරන මනුෂ්‍යයා
බොහෝ වස්තුවෙන් පොහොසත්කොට,
තමාගේ දුව ඔහුට සරණ පාවාදී,
ඉශ්‍රායෙල්හි ඔහුගේ පියාගේ පවුලට
26 නිදහසද දෙන්නාහයි කීවෝය. දාවිත්
තමා ළඟ සිටි මනුෂ්‍යයන්ට කථාකොට:
මේ පිලිස්තියයා මරා ඉශ්‍රායෙල්වරුන්
කෙරෙන් නින්දාව පහකරන මනුෂ්‍යයාට
කුමක් කරන්නේද? ජීවමාන දෙවියන්-
වහන්සේගේ සේනාවලට මිගකියන
මේ අචර්මඡේදිත පිලිස්තියයා කවුදැයි
27 කීවේය. සෙනඟ ඒ වචනවල හැටියට
ඔහුට කථාකොට: ඔහු මරන තැනැත්තාට
28 මෙසේ කරනු ලැබේයයි කීවෝය. ඔහු
මිනිසුන්ට කථා කරන කල ඔහුගේ
වැඩිමහල් සහෝදරවූ එලියාබ් අසාගෙන
සිටියේය; එවිට එලියාබ් දාවිත් කෙරෙහි
කෝපවී: තුඹ ආවේ මොකටද? කාන්-
තාරයෙහි ඉන්න ඒ බැටළුවන් ස්වල්ප-
දෙනා තුඹ කාට භාරදී ආවාද? තුඹේ
උඩඟුකමත් සිතේ මුරණ්ඩුකමත් මම
දනිමි; තුඹ ආවේ යුද්ධය බලන පිණිස-
යයි කීවේය. දාවිත්ද: මම දැන් මක්- 29
කෙළෙම්ද? වචනයක් කීවා පමණක්
නොවේදැයි කියා, ඔහු වෙතින් අනිකෙකු 30
දෙසට හැරීගොස් ඒ හැටියටම කථා-
කෙළේය. මිනිස්සු පළමු හැටියටම ඔහුට
නැවතත් උත්තරදුන්නෝය. දාවිත් කී වචන 31
සැලවූ කල මනුෂ්‍යයෝ සාවුල්ට එපවත්
දැන්නුවෝය; සාවුල්ද ඔහු අඬගස්වා
හැරියේය. දාවිත් සාවුල්ට කථාකොට: 32
කිසිවෙකුගේ සිත ඔහු නිසා ක්ලාන්ත
නොවේවා; ඔබගේ මෙහෙකරුවාවූ
මම ගොස් මේ පිලිස්තියයා සමග
සටන්කරමියි කීය. සාවුල්ද: මේ 33
පිලිස්තියයාට විරුද්ධව ගොස් ඔහු සමග
සටන්කරන්ට තුඹට බැරිය. මක්නිසාද
තුඹ තරුණයෙක්ය, ඔහු වනාහි
තරුණ වයස පටන් යුද්ධකාරයෙක්ව
සිටින්නෙකැයි දාවිත්ට කීවේය. දාවිත්ද: 34
ඔබගේ මෙහෙකරුවා තමාගේ
පියාගේ බැටළුවන් බලාගන සිටිද්දී
සිංහයෙකුත් වලසෙකුත් ඇවිත් රැළෙන්
බැටළුවෙකු ගත්තෝය. මම ඌ පස්සේ 35
ගොස් ඌට ගසා ඌගේ කටින් බැටළුවා
ගළවාගත්තෙමි. ඌ මට විරුද්ධව
නැගිට්ට විට මම ඌ රැවුලෙන්
අල්ලා ඌට ගසා මැරුවෙමි. ඔබගේ 36
මෙහෙකරුවාවූ මම සිංහයාත් වලසාත්
දෙන්නාම මැරුවෙමි. ජීවමාන දෙවියන්-
වහන්සේගේ සේනාවලට නින්දකළ මේ
අචර්මඡේදිත පිලිස්තියයාත් උන්ගෙන්
එකෙකු මෙන් වන්නේයයි සාවුල්ට
කීවේය. තවද දාවිත්: සිංහයාගේ 37
නියපහරින්ද වලසාගේ නියපහරින්ද
මා ගැළවූ **ස්වාමීන්වහන්සේ** මේ
පිලිස්තියයාගේ අතිනුත් මා ගළවන-
සේකැයි කීවේය. සාවුල් කථාකොට:
පලයන්න, **ස්වාමීන්වහන්සේ** තුඹ සමග
සිටිනසේක්වයි දාවිත්ට කීවේය. තවද 38

සාවුල් තමාගේ ඇඳුම් දාවිත්ට හඳවා,
ඔහුගේ හිසේ පිත්තල තොප්පියක් දමා,
යුද්ධ හැට්ටයක් ඔහුට පැළඳෙවුවේය.
39 දාවිත් තමාගේ ඇඳුම පිට කඩුව බැඳගන
ඇවිදින්ට උත්සාහ කෙළේය; මක්නිසාද
ඔහු ඒවා ඇඳලා පුරුදු නැත. එවිට
දාවිත් සාවුල්ට කථාකොට: මා මේවා
ඇඳලා පුරුදු නැති බැවින් මේවා ඇඳගන
40 යන්ට බැරියයි කියා, ඒවා ගළවා
දමා, තමාගේ සැරයටිය අතින් ගෙන,
දෙළෙන් සිලුට්ටු ගල් පහක් තෝරාගෙන
තමා ළඟ තිබුණු එඬේර මල්ලේ එනම්
පසුම්බියේ දමාගෙන, අතින් ගල්පටිය
අරන් පිලිස්තියයා දෙසට යන්ට ගියේය.
41 පිලිස්තියයාද පිටත්ව ඇවිත් දාවිත්ට
ළංවේගන ආවේය; පලිහ ගෙනයන
මනුෂ්‍යයාත් ඔහුට පෙරටුවෙන් ආවේය.
42 පිලිස්තියයා බලා දාවිත් දුටු විට ඔහුට
ගර්හාකෙළේය. මක්නිසාද ඔහු රතු
පාටවූ, ශෝභමාන පෙනීමක් ඇත්තාවූ
43 තරුණයෙක් පමණක් විය. පිලිස්තියයා
දාවිත්ට කථාකොට: තෝ සැරයටි රැගෙන
මා ළඟට එන්නේ මම බල්ලෙක්දැයි
කියා, තමාගේ දෙවියන්ගේ නාමයෙන්
44 දාවිත්ට දෙස්කීවේය. තවද පිලිස්තියයා:
මා ළඟට වර, මම තාගේ මස්
ආකාශයේ පක්ෂීන්ටත් වනයේ
මෘගයන්ටත් දෙන්නෙමියි දාවිත්ට කීවේය.
45 එවිට දාවිත්: තෝ කඩුවක්ද හෙල්ලයක්ද
කුඩා හෙල්ලයක්ද රැගෙන මා ළඟට
එන්නෙහිය. මම වනාහි තා නින්දකළ
ඉශ්‍රායෙල් සමූහවල දෙවිවූ සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** නාමයෙන් තා
46 ළඟට එමි. අද දවසේ **ස්වාමීන්වහන්සේ**
තා මා අතට පාවාදෙනසේක; මම තට
ගසා, තාගේ හිස කපාදමා, පිලිස්ති-
වරුන්ගේ සේනාවේ මළකඳන් අද දවසේ
ආකාශයේ පක්ෂීන්ටද පොළොවේ වන
මෘගයන්ටද දෙන්නෙමි; මෙසේ ඉශ්‍රායෙල්
කෙරෙහි දෙවිකෙනෙක් ඉන්න බව
පොළොවේ සියල්ලන්ම දැනගන්නවා
47 ඇත. **ස්වාමීන්වහන්සේ** කඩුවෙන් හා
හෙල්ලයෙන් නොගළවන බව මේ
මුළු සමූහයාත් දැනගන්නවා ඇත.
මක්නිසාද යුද්ධය **ස්වාමීන්වහන්සේගේය**,
උන්වහන්සේද නුඹලා අප අතට
පාවාදෙනසේකැයි පිලිස්තියයාට කීවේය.
තවද පිලිස්තියයා නැගිට දාවිත්ට විරුද්ධව 48
ළංවෙද්දී දාවිත් ඉක්මන්කොට පිලිස්තියයාට
විරුද්ධව සේනාව දෙසට දුවගොස්,
මල්ලේ අතදමා එයින් ගලක් අරන්, 49
ඒක ගල්පටියෙන් විද්දේය; ඒ ගල
පිලිස්තියයාගේ නළලට වැදී ඔහුගේ
නළලේ ගිලී ඔහු මුහුණින් බිම වැටුණේය.
මෙසේ දාවිත් ගල්පටියෙන්ද ගලෙන්ද 50
පිලිස්තියයාගෙන් ජයගෙන, ඔහුට
පහරදී, ඔහු මැරුවේය; නුමුත් දාවිත්ගේ
අතේ කඩුවක් තිබුණේ නැත. එවිට දාවිත් 51
දුවගොස් පිලිස්තියයා ළඟ සිට, ඔහුගේ
කඩුව අල්ලා කොපුවෙන් ඇද ඔහු මරා,
එයින් ඔහුගේ හිස කපා දැමුවේය.
පිලිස්තිවරු තමුන්ගේ බලවතා මැරුණු
බව දැක පලාගියෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍ය- 52
යෝද යූද මනුෂ්‍යයෝද නැගිට, ඔල්වර
හඬ පවත්වා, පිලිස්තිවරුන් පස්සේ
ගායිට පැමිණෙන තැන දක්වාත්
එක්‍රොන්හි දොරටු දක්වාත් එළවාගන
ගියෝය. මැරුම් කෑ පිලිස්තිවරු
ෂාරයිම්ට යන මාර්ගයෙහි ගාත් දක්වාද
එක්‍රොන් දක්වාද වැටුණෝය. ඉශ්‍රායෙල් 53
පුත්‍රයෝ පිලිස්තිවරුන් පස්සේ එළවා
යාමෙන් හැරීඇවිත් ඔවුන්ගේ කඳවුර
කොල්ලකා ගත්තෝය. දාවිත් පිලිස්තිය- 54
යාගේ හිස අරගන යෙරුසලමට
ගෙනාවේය; නුමුත් ඔහුගේ ආයුධ
තමාගේ කූඩාරමේ තැබුවේය.
දාවිත් පිලිස්තියයාට විරුද්ධව පිටත්ව 55
යනවා සාවුල් දැක සේනාවේ අධිපතියාවූ
අබ්නේර්ට කථාකොට: අබ්නේර්, මේ
තරුණයා කාගේ පුත්‍රයාදැයි ඇසුවේය.
අබ්නේර්: රජ්ජුරුවනි, ඔබගේ ප්‍රාණය
ජීවත්වන බව සැබෑවා සේම මම
නොදනිමියි කීවේය. රජ තෙමේද: මේ 56
තරුණයා කාගේ පුත්‍රයාද කියා
අසාපන්නැයි කීවේය. දාවිත් පිලිස්තියයා 57

මරා හැරී එනකල අබ්නේර් ඔහු
කැඳවාගෙන සාවුල් ඉදිරියට ගියේය,
පිලිස්තියයාගේ හිසද ඔහුගේ අතේ
58 තිබුණේය. තරුණය, නුඹ කාගේ
පුත්‍රයාදැයි සාවුල් ඔහුගෙන් ඇසීය.
මම ඔබගේ මෙහෙකරුවූ බෙත්ලෙහෙමීය
යෙස්සේගේ පුත්‍රයෙක්මියි දවිත් උත්තර-
දුන්නේය.

## දවිත් සහ යොනාතාන්ගේ මිත්‍රකම. සාවුල්ගේ ඊර්ෂ්‍යාව. එසේවී නුමුත් දුවණිය දීම

18 තවද ඔහු සාවුල්ට කථාකොට
නිමවූ කල යොනාතාන්ගේ
ප්‍රාණය දවිත්ගේ ප්‍රාණයට බැඳී,
යොනාතාන් තමාගේම ප්‍රාණයට මෙන්
2 ඔහුට ආදරේවිය. ඒ දවසේ සාවුල් ඔහු
නවත්වාගෙන, ඔහුගේ පියාගේ ගෙදරට
හැරියන්ට තවත් ඔහුට ඉඩ නුදුන්නේය.
3 යොනාතාන් තමාගේම ප්‍රාණයට මෙන්
දවිත්ට ආදරේවූ බැවින් ඔහු සහ දවිත්
4 ගිවිසුමක් කරගත්තෝය. යොනාතාන්
තමාගේ සළුව ගළවා ඒකද කඩුවත්
දුන්නත් ඉහපටියත් ඇතුළුව තමාගේ
5 ඇඳුමද දවිත්ට දුන්නේය. දවිත් වනාහි
සාවුල් තමා යැවූ හැම තැනටම ගොස්
*නුවණින් හැසුරුණේය. සාවුල් ඔහු
යුද්ධකාරයන් කෙරෙහි ප්‍රධානියා
කෙළේය, මුළු සෙනඟද සාවුල්ගේ
සේවකයෝද ඊට ප්‍රසන්නවූහ.
6 තවද දවිත් පිලිස්තියයා මරා හැරී
එන මාර්ගයේදී කාන්තාවෝ සියලු
ඉශ්‍රායෙල් නුවරවලින් නික්ම
ගායනාකරමින්ද නටමින්ද රබානුත් ප්‍රීති
හඬත් අත්තාලමුත් ඇතුව සාවුල්
රජ්ජුරුවන්ගේ පෙරමගට ආවෝය.
7 කාන්තාවෝ නට නටා එකිනෙකාට ගී
කියමින්:

සාවුල් තෙමේ දහස් ගණන්ද
දවිත් දසදහස් ගණන්ද මැරීයයි

8 කීවෝය. සාවුල් ඉතා කෝපවී, ඒ කීමට
අප්‍රසන්නව කථාකොට: ඔව්හු දවිත්ට
දසදහස් ගණන්ද මට දහස් ගණන්
පමණක්ද පිරිනැමූහ. රජකම හැර තව
ඔහුට ලැබෙන්ට තිබෙන්නේ කුමක්දැයි
කීවේය. එද පටන් සාවුල් දවිත් දෙස 9
ඇස් හෙළා සිටියේය.
තවද පසුවද දෙවියන්වහන්සේගෙන් 10
නපුරු ආත්මයක් සාවුල්ට ආවේශ විය,
ඔහු ගේ ඇතුළේදී ධර්මවාග් ලීලාවෙන්
දෙඩෙව්වේය. එවිට දවිත් වෙන දවස්වල
මෙන් අතින් වීණාව ගැවේය. සාවුල්ගේ
අතේ හෙල්ලය තිබුණේය. මම 11
භිත්තියටම වදින්ට දවිත්ට අනිමියි සිතා
ඔහු හෙල්ලය වීසිකෙළේය. දවිත් ඔහු
ඉදිරියෙන් දෙවරක් ගැළවී ගියේය.
ස්වාමීන්වහන්සේ දවිත් සමග සිටි නිසාත් 12
සාවුල්ගෙන් පහව ගිය නිසාත් සාවුල්
ඔහුට භයවුණේය. ඒ නිසා සාවුල් තමා 13
වෙතින් ඔහු අහක්කොට සහස්‍රාධිපතියෙකු
කෙළේය; මෙසේ ඔහු සෙනඟට පෙරටුවෙන්
යන්ට එන්ට වන්නේය. දවිත් තමාගේ 14
සියලු මාර්ගවලදී නුවණින් හැසුරුණේය;
ස්වාමීන්වහන්සේද ඔහු සමග සිටිසේක.
ඔහු බොහෝ නුවණින් හැසිරෙන බව 15
සාවුල් දැක ඔහුට භයවිය. නුමුත් සියලු 16
ඉශ්‍රායෙල්වරුද යූදවරුද දවිත්ට ප්‍රේම-
කළෝය; මක්නිසාද ඔහු ඔවුන්ට
පෙරටුවෙන් යන්ට එන්ට වන්නේය.
සාවුල් දවිත්ට කථාකොට: මෙන්න, 17
මාගේ වැඩිමහල් දුවවූ මේරබ් නුඹට
භාර්යාව කොට දෙන්නෙමි. නුඹ වූකලී
මා උදෙසා වික්‍රමාන්විතව ස්වාමීන්-
වහන්සේගේ යුද්ධයන් කරපන්නැයි
කීවේය. මක්නිසාද සාවුල්: මාගේ අත
නොව පිලිස්තිවරුන්ගේ අත ඔහු පිටට
වැටේවයි සිතුවේය. දවිත් සාවුල්ට 18
කථාකොට: රජ්ජුරුවන්ට බෑනා වෙන්ට
මම කවුද? මාගේ ජීවිතයවත් ඉශ්‍රායෙල්හි
මාගේ පිය වංශයවත් මොකක්දැයි
කීවේය. නුමුත් සාවුල්ගේ දුවවූ මේරබ් 19
දවිත්ට දෙන්ට තිබූ කාලයේදී ඹිතොමෝ
මෙහොලාතිය අද්‍රියෙල්ට භාර්යාව
කොට දෙනලද්දීය. තවද සාවුල්ගේ 20

*හෙවත්, සඵලවත් විය,

දුවවූ මීඛල් දාවිත්ට ආදරේවූවාය. ඒ
21 බව සාවුල්ට දන්වන ලද්දේය. සාවුල්
ඊට ප්‍රසන්නවී කථාකොට: පිලිස්ති-
වරුන්ගේ අත ඔහු පිටට වැටෙන
පරිද්දෙන් ඔහුට ඈ මලපතක් වෙන
පිණිස ඈ ඔහුට දෙන්නෙමියි කීවේය.
එබැවින් සාවුල් දෙවෙනි වතාවට
දාවිත්ට කථාකොට: නුඹ අද මාගේ
22 බෑනාවෙන්ට ඕනෑයයි කීවේය. සාවුල්
තමාගේ සේවකයන්ට අණකරමින්:
නුඹලා දාවිත් සමග රහස් ලෙස
කථාකොට–රජ්ජුරුවෝ නුඹ කෙරෙහි
ප්‍රසන්නය, ඔහුගේ සියලු සේවකයෝද
නුඹට ප්‍රේම කරති. එබැවින් රජ්ජුරුවන්ගේ
බෑනා වෙන්න කියා කියාපල්ලායයි
23 කීවේය. සාවුල්ගේ සේවකයෝ දාවිත්ට
ඒ වචන කීවෝය. දාවිත් කථාකොට:
මම නම් දිළිඳුවූ සුළුවූ කෙනෙක්මි. ඉතින්
රජ්ජුරුවන්ගේ බෑනා වීම සුළු දෙයක්මෙන්
24 නුඹලාට පෙනේදැයි කීවේය. සාවුල්ගේ
සේවකයෝ: දාවිත් මෙලෙස කීවේය
25 කියා ඔහුට දැන්වූවෝය. එවිට සාවුල්
කථාකොට: රජුගේ සතුරන්ගෙන්
පළිගන්න පිණිස පිලිස්තිවරුන් සිය-
දෙනෙකුගේ චර්මාග්‍ර මිස රජ්ජුරුවන්ට
කිසි දායාදයක් ඕනෑ නැත කියා දාවිත්ට
කියාපල්ලායයි කීය. නුමුත් සාවුල්
පිලිස්තිවරුන්ගේ අතින් දාවිත් මරවන්ට
26 කල්පනාකෙළේය. ඔහුගේ සේවකයන්
මේ වචන දාවිත්ට දැන්වූ කල දාවිත්
රජුගේ බෑනා වෙන්ට සතුටුවිය. ඒ දවස්
27 සම්පූර්ණ වෙන්ට පළමුවෙන්, දාවිත්
සහ ඔහුගේ මිනිස්සු පිටත්ව ගොස්
පිලිස්තිවරුන්ගෙන් මිනිසුන් දෙසියයක්
මැරුවෝය; දාවිත් ඔවුන්ගේ චර්මාග්‍ර
ගෙනායේය, ඔහු රජුගේ බෑනා වෙන
පිණිස මිනිස්සු ඒවා සම්පූර්ණ ගණන
ලෙස රජු ඉදිරියෙහි තැබුවෝය. සාවුල්
තමාගේ දූවූ මීඛල් ඔහුට භාර්යාව කොට
28 පාවාදුන්නේය. ස්වාමීන්වහන්සේ දාවිත්
සමග සිටින බව සාවුල් දැක
තේරුම්ගත්තේය; සාවුල්ගේ දුවවූ මීඛල්
29 දාවිත්ට ආදරේවූවාය. ඉන්නිසා සාවුල්
තව වඩාත් දාවිත්ට භයවුණේය; සාවුල්
නිරන්තරයෙන්ම දාවිත්ට සතුරුව
සිටියේය.
පිලිස්තිවරුන්ගේ අධිපතීහු පිටත්ව 30
ආවෝය. තවද ඔව්හු යම් පමණ වර
පිටත්ව ආවෝද එපමණ වර දාවිත්
සාවුල්ගේ සියලු සේවකයන්ට වඩා
නුවණින් හැසුරුණේය; ඒ නිසා ඔහුගේ
නාමය ඉතා අනර්ඝ කොට සලකන
ලද්දේය.

## සාවුල් දාවිත්ට වෛරවීම. දාවිත් පලායාම

19 තවද සාවුල් දාවිත් මරන්ට කියා
තම පුත්‍රවූ යොනාතාන්ටත් තමාගේ
සියලු සේවකයන්ටත් කීවේය. නුමුත් 2
සාවුල්ගේ පුත්‍රවූ යොනාතාන් දාවිත්
කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටියේය.
යොනාතාන් එය දාවිත්ට දන්වමින්:
මාගේ පියවූ සාවුල් නුඹ මරන්ට
සොයන්නේය. ඒ නිසා නුඹ හෙට උදේ
ප්‍රවේසම්වී රහස් තැනක සැඟවී සිටින්න.
මම ඇවිත් නුඹ සිටින කෙතෙහි මාගේ 3
පියාණන් ළඟ සිට නුඹ ගැන මාගේ
පියාණන් සමග කථාකොට, කාරණා
දැනගෙන නුඹට දන්වන්නෙමියි දාවිත්ට
කීවේය. යොනාතාන් තමාගේ පියවූ 4
සාවුල්ට දාවිත්ගේ ගුණ කියමින්:
රජ්ජුරුවෝ තමාගේ සේවකයාවූ දාවිත්ට
විරුද්ධව පව් නොකෙරෙත්වා; මක්නිසාද
ඔහු ඔබට විරුද්ධව පව් නොකෙළේය,
ඔබ පිළිබඳවූ ඔහුගේ ක්‍රියාවලුත් ඔබට
ඉතා ප්‍රයෝජනවත්ය. කුමක් හෙයින්ද 5
ඔහු තමාගේ ප්‍රාණය නොසලකා ගොස්
පිලිස්තියයා මැරුවේය, එයින් ස්වාමීන්-
වහන්සේ සියලු ඉශ්‍රායෙල්වරුන්ට මහත්
ගැළවීමක් ඉෂ්ටකර දුන්සේක. ඔබ ඒ
දැක ප්‍රීතිවූයෙහිය. එබැවින් නිෂ්කාරණයේ
දාවිත් මරා නිදෙස් ලේ වැගිරීමෙන් ඔබ
පවිකරන්ට හදන්නේ මක්නිසාදැයි
කීවේය. සාවුල් යොනාතාන්ගේ හඬට 6
ඇහුම්කන්දී: ස්වාමීන්වහන්සේ ජීවමාන

බව සැබෑවා සේම ඔහු මරනු නොලබන්-
7 නේයයි දිවුරුවේය. යොනාතාන් දවිත්ට
අඬගසා ඒ සියල්ල ඔහුට දන්වා, සාවුල්
ළඟට ඔහු කැඳවාගන ගියේය, හෙතෙම
පෙර ලෙස ඔහු ඉදිරියෙහි සිටියේය.
8 නැවතත් යුද්ධයක් විය. දවිත් පිටත්ව
ගොස් පිලිස්තිවරුන්ට විරුද්ධව යුද්ධ-
කොට ඔවුන් අතරේ මහත් නාස්තියක්
කෙළේය; ඔව්හු ඔහු ඉදිරියෙන් පලා-
9 ගියෝය. තවද සාවුල් තමාගේ හෙල්ලය
අතේ තබාගන ගෙයි හිඳින අතර
**ස්වාමීන්වහන්සේගෙන්** නපුරු ආත්මයක්
ඔහුට ආවේශවිය; දවිත් තමාගේ අතින්
10 වීණාව ගැසුවේය. සාවුල්ද භිත්තියටම
වදින පිණිස හෙල්ලයෙන් දවිත්ට
අනින්ට උත්සාහ කෙළේය; නුමුත් ඔහු
සාවුල් ඉදිරියෙන් අහකට පැන්නේය,
හෙල්ලය භිත්තියට වැදුණේය. නුමුත්
දවිත් පලාගොස් ඒ රාත්‍රියේ ගැළවුණේය.
11 දවිත් ගැන රැකසිට පසුවද උදය ඔහු
මරන පිණිස සාවුල් ඔහුගේ ගේ ළඟට
පණිවිඩකාරයන් යැවීය. එය දවිත්ගේ
භාර්යාවවූ මීකල් ඔහුට දන්වා: අද
රාත්‍රියේ නුඹේ ප්‍රාණය ගළවා නො-
ගත්තොත් හෙට නුඹ මරනු ලබනවා
12 ඇතැයි ඔහුට කීවාය. මීකල්ද කවුළුවෙන්
දවිත් බැස්සෙවුවාය. ඔහු පලා ගොස්
13 ගැළවුණේය. මීකල් තෙරපීම් රූපය
රැගෙන ඇඳේ තබා, ඒකේ ඉසයට එළු
ලොම් කොට්ටයක් තබා, ඒක රෙදි-
14 වලින් වැසුවාය. දවිත් ගෙනෙන්ට සාවුල්
පණිවිඩකාරයන් යැවූ කල: ඔහු ලෙඩින්යයි
15 ඈ කීවාය. දවිත් බලන්ට සාවුල් නැවත
පණිවිඩකාරයන් යවා ඔහු මරන පිණිස
ඇඳත් පිටින් මා ළඟට ගෙනෙල්ලායයි
16 කීවේය. පණිවිඩකාරයන් ඇතුල්වූ කල
හිසට තිබූ එළු ලොම් කොට්ටය සමග
17 තෙරපීම් රූපය ඇඳේ තිබුණේය. නුඹ
මෙසේ මා රවටා මාගේ සතුරාට ගැළවී
යන්ට ඉඩ ඇරියේ මක්නිසාදැයි සාවුල්
මීකල්ගෙන් ඇසීය. මීකල් උත්තරදෙමින්:
මා විසින් නුඹ නොමරන පිණිස මා
යන්ට ඇරපන්න කියා ඔහු මට කීවේ-
යයි සාවුල්ට කීවාය.

මෙසේ දවිත් පලාගොස් ගැළවී රාමාහි 18
සිටි සාමුවෙල් ළඟට පැමිණ, සාවුල්
තමාට කළ සියල්ල ඔහුට දැන්නුවේය.
එවිට ඔහු සහ සාමුවෙල් ගොස්
නායොත්හි විසුවෝය. දවිත් රාමායේ 19
නායොත්හි සිටින්නේයයි සාවුල්ට
දන්වනලද්දේය. සාවුල් දවිත් ගෙනෙන්ට 20
පණිවිඩකාරයන් යැවීය. ඔවුන් ධර්ම-
වාක්‍ය පවසමින් සිට ප්‍රොපේත මණ්ඩ-
ලයද සාමුවෙල් ඔවුන්ගේ මූලිකයාව
සිටින බවද දුටු විට දෙවියන්වහන්සේගේ
ආත්මය සාවුල්ගේ පණිවිඩකාරයන්
කෙරෙහි පැමුණුණේය, ඔව්හුද ධර්ම-
වාක්‍ය පැවසුවෝය. ඒ බව සාවුල්ට 21
දැන්වූ කල ඔහු වෙන පණිවිඩකාරයන්
යැවීය, ඔව්හුද ධර්මවාක්‍ය පැවසුවෝය.
සාවුල් නැවතත් තුන්වෙනි වර පණිවිඩ-
කාරයන් යැවීය, ඔව්හුද ධර්මවාක්‍ය
පැවසුවෝය. එවිට ඔහුත් රාමාට ගොස් 22
සේඛූහි තිබෙන මහත් ළිඳ ළඟට
පැමිණ: සාමුවෙල් සහ දවිත් කොතන
සිටිනවාදැයි ඇසුවේය. අන්න, ඔවුන්
රාමායේ නායොත්හි සිටිනවායයි
කෙනෙක් ඔහුට කීවේය. ඔහු රාමායේ 23
නායොත්ට ගියේය. එවිට ඔහු කෙරෙහිත්
දෙවියන්වහන්සේගේ ආත්මය පහළ-
වූයෙන් ඔහු රාමාහි නායොත්ට
පැමිණෙන තුරු ධර්මවාක්‍ය පවස පවසා
ගියේය. ඔහු තමාගේ වස්ත්‍ර ගළවා දමා, 24
සාමුවෙල් ඉදිරියෙහි ධර්මවාක්‍ය පවසා,
ඒ මුළු දවාලෙත් ඒ මුළු රාත්‍රියෙත්
නග්නව වැටී උන්නේය. එබැවින්: සාවුලුත්
ප්‍රොපේතවරුන් අතරේදැයි මනුෂ්‍යයෝ
කියති.

## යොනාතාන් විසින් දවිත් ආරක්ෂා කිරීම

20 දවිත් රාමායේ තිබෙන නායො-
ත්හි සිට පලාගොස් යොනාතාන්
ළඟට පැමිණ කථාකොට: නුඹේ පියා-
ණන් මා මරන්ට සොයන්නේ මම කුමක්
කෙළෙම්ද? මාගේ අපරාධය කිමෙක්ද?
ඔහු ඉදිරියෙහි මා කළ පාපය මොකදැයි

2 ඇසුවේය. ඔහුද: එසේ නොවේවා; නුඹ
නොනස්නෙහිය. බලව, මාගේ පියා මට
නොදන්වා ලොකු හෝ සුළු හෝ කිසි
දෙයක් නොකරන්නේය. මාගේ පියා
මේ කාරණය මාගෙන් සඟවන්නේ
මක්නිසාද? ඒක එසේ නොවේයයි
3 කීවේය. දාවිත්ද තවත් දිවුරමින්: නුඹ
මට කරුණාව ඇති බව නුඹේ පියා
හොඳකාරයෙන් දන්නේය; ඉන්නිසා:
යොනාතාන් කනගාටු නොවෙන පිණිස
ඔහු මේක දැනනොගනීවයි ඔහු කියයි.
නුමුත් **ස්වාමීන්වහන්සේ** ජීවමාන බව
සැබෑවාසේම, නුඹේ ප්‍රාණයද ජීවත්වන
සේම, සැබවින් මටත් මරණයටත් අතරේ
ඇත්තේ එක අඩියක් පමණයයි කීවේය.
4 යොනාතාන්ද: නුඹ කැමති කොයි දෙයක්
නුමුත් නුඹ නිසා කරන්නෙමියි කීය.
5 දාවිත් යොනාතාන්ට කථාකොට: හෙට
අමාවක බැවින් මා නොවරදවාම
රජ්ජුරුවන් සමග කෑමට ඉඳගත යුතුය.
නුමුත් තුන්වෙනිද සවස වෙන තුරු මා
කෙතේ සැඟවී සිටින පිණිස මට යන්ට
6 ඉඩ ඇරපන්න. ඉදින් මා කොතනද
කියා නුඹේ පියා ඇසුවොත්: ස්වකීය
නුවරවූ බෙත්-ලෙහෙම්හි මුළු පවුල උදෙසා
අවුරුදු පතා පූජාවක් ඔප්පුකරන බැවින්
එහි ගොහින් එන්ට ඔහු උදක්ම මාගෙන්
අවසර ඉල්ලා සිටියේයයි කියාපන්න.
7 ඉදින් ඔහු: හොඳයයි කීවොත්, නුඹේ
මෙහෙකරුවාවූ මට සමාදානය ලැබෙයි.
ඔහු කිපුණොත්, ඔහු විසින් මට නපුරක්
නියමකරගන තිබෙන බව දැනගන්න.
8 එවිට නුඹේ මෙහෙකරුවාවූ මට නුඹ
කරුණාව පෙන්වන්ට ඕනෑය; මක්නිසාද
නුඹේ මෙහෙකරුවා සමග නුඹ **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි ගිවිසුමක් කර-
ගත්තෙහිය. නුමුත් මා කෙරෙහි වරදක්
ඇත්නම් නුඹම මා මරාපන්න; නුඹේ
පියාණන් වෙතට මා ගෙනයන්නේ
9 මක්නිසාදැයි කීවේය. යොනාතාන්ද:
නුඹට එසේ නොවේවා. නුඹ පිටට
නපුරක් පමුණුවන්ට මාගේ පියා
නියමකරගන සිටින බව මම ඇත්තටම
දැනගතිම්නම් මා ඒක නුඹට දන්වන්නේ
නැද්දැයි කීවේය. එවිට දාවිත්: නුඹේ 10
පියාණන් නුඹට තදලෙස උත්තර
දුන්නොත් මට දන්වන්නේ කවුදැයි
යොනාතාන්ගෙන් ඇසුවේය. යොනාතාන්ද: 11
වරෙන්න, කෙතට යමුයයි දාවිත්ට කීය.
ඔවුන් දෙදෙනා කෙතට ගියෝය.

යොනාතාන් දාවිත්ට කථාකොට: 12
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
සාක්ෂි වනසේක්වා; හෙටවත් අනිද්දවත්
මේ වේලාවට පමණ මා විසින් මාගේ
පියාගේ අදහස සොයාබැලුවාම දාවිත්ට
හොඳක් වෙන්ට තිබේනම් නුඹට දන්වන
පිණිස මා නුඹට පණිවිඩ එවන්නේ
නැද්ද? මාගේ පියා නුඹට නපුරක් කරන්ට 13
කැමැත්තේ නම්, නුඹ සමාදානයෙන් යන
පිණිස මා ඒක නුඹට දන්වා නුඹ
පිටත්කර නොහැරියොත්, **ස්වාමීන්-
වහන්සේ** යොනාතාන්ට එසේමත් ඊට
වැඩියෙනුත් කරනසේක්වා. **ස්වාමීන්-
වහන්සේ** මාගේ පියාණන් සමග
සිටියාක් මෙන් නුඹ සමගත්
සිටිනසේක්වා. ඇරත් මා නොනස්නා 14
ලෙස නුඹ **ස්වාමීන්වහන්සේගේ** කරුණාව
මා ජීවත්ව සිටින තුරුම මට පෙන්වනවා
පමණක් නොව, මාගේ වංශයෙන්ද 15
නුඹේ කරුණාව කවදාවත් පහනොකරන්න.
එසේය, **ස්වාමීන්වහන්සේ** දාවිත්ගේ
සතුරන් එකිනෙකා භූමිය මතුපිටින්
සිඳදැමූ කල්හිත් එසේ නොකරන්නැයි
කීවේය. මෙසේ යොනාතාන් දාවිත්ගේ 16
වංශය සමග ගිවිසුමක් කොට: **ස්වාමීන්-
වහන්සේ** දාවිත්ගේ සතුරන් අතින් ඒක
අය කරනසේක්වයි කීවේය. යොනාතාන් 17
දාවිත් කෙරෙහි පැවති ආදරය නිසා
නැවත ඔහු දිවුරෙවුවේය. මක්නිසාද ඔහු
තමාගේ ප්‍රාණයටමෙන් ඔහුට ආදරේ-
වුණේය. එවිට යොනාතාන් ඔහුට 18
කථාකොට: හෙට අමාවකය, නුඹේ
ආසනය සිස්වන බැවින් නුඹ එහි නැති
බව පෙනෙන්නේය. නුඹ තුන් දවසක් 19
නැවතී සිට ඉක්මනින් බැස ඇවිත්, මේ

කාරණාව කෙරෙද්දී නුඹ සැඟවී සිටි
තැනට පැමිණ, එසෙල් ගල ළඟ සිටපන්න.
20 එවිට මම ඉලක්කයකට විදින්නාක්මෙන්
21 එහි පැත්තකට ඊගස් තුනක් විද, ඊගස්
සොයාගන එන්ට ළමයා හරින්නෙමි.
ඊගස් නුඹට මෙහායින්ය, ඒවා ගෙනෙන්-
නැයි මම ළමයාට කියම්නම් නුඹ
වරෙන්න; මක්නිසාද ස්වාමීන්වහන්සේ
ජීවමාන බව සැබෑවා සේම නුඹට
සමාදානය මිස වෙන කිසිවක් නැත්-
22 තේය. නුමුත් මම ළමයාට: ඊගස් නුඹට
එහායින්ය කියම්නම්, නුඹ පලයන්න;
මක්නිසාද ස්වාමීන්වහන්සේ නුඹ යන්ට
23 අරිනසේක. තවද නුඹත් මාත් කථාකළ
කාරණය ගැන වනාහි ස්වාමීන්වහන්සේ
සෑම කල්හිම නුඹත් මාත් අතරේ
වනසේකැයි කීවේය.
24 ඒ හැටියට දාවිත් කෙතේ සැඟවුණේය.
අමාවක පැමිණි විට රජ්ජුරුවෝ කෑම
25 කන්ට හිඳගත්තාහ. වෙනද මෙන්
රජ්ජුරුවෝ හිත්තිය ළඟ තමාගේ
ආසනයෙහි හිඳගත්තාහ; යොනාතාන්
නැගිට සිටියේය, අබ්නේර්ද සාවුල්ගේ
පැත්තක හිඳගත්තේය. නුමුත් දාවිත්ගේ
26 ඉඳුම හිස්ව තිබුණේය. එහෙත් සාවුල්
ඒ දවසේ කිසිවක් කීවේ නැත. මක්නිසාද:
ඔහුට මොකක් නුමුත් වෙලාය, ඔහු
පවිත්‍ර නැත; ඇත්තටම පවිත්‍ර නැතැයි
27 ඔහු කල්පනා කෙළේය. අමාවකට පසුවද
වන දෙවෙනි දිනත් දාවිත්ගේ ඉඳුම හිස්ව
තිබුණේය. සාවුල් තමාගේ පුත්‍රවූ
යොනාතාන්ට කථාකොට: යෙස්සේගේ
පුත්‍රයා ඊයෙත් අදත් කෑමට නාවේ
28 මක්නිසාදැයි කීවේය. යොනාතාන්
සාවුල්ට උත්තරදෙමින්: දාවිත් බෙත්-
ලෙහෙමට යන පිණිස ඕනෑකමින්
29 මාගෙන් ඉල්ලා—මට යන්ට අවසර දුන
මැනවි; මක්නිසාද ඒ නුවර අපේ පවුලේ
පූජාවක් ඇත්තේය; මාගේ සහෝදරයාද
එහි එන්ට මට අණ කෙළේය. එබැවින්
නුඹේ ඇස් හමුයෙහි මට කරුණාව ලැබී
තිබේනම් මාගේ සහෝදරයන් දකින
පිණිස යන්ට මට අවසර ලැබේවයි
කියා සිටියේය. ඔහු රජ්ජුරුවන්ගේ
මේසයට නාවේ ඒ නිසා යයි කීවේය.
එවිට සාවුල්ගේ කෝපය යොනාතාන්ට 30
විරුද්ධව ඇවිළ, ඔහු කථාකොට:
හිතුවක්කාර කැරළිකාර ස්ත්‍රියකුගේ
පුත්‍රය, නුඹට ලජ්ජාවත් නුඹේ මෑණියන්ට
ලජ්ජාවත් හා අගෞරවයත් පැමිණෙන
ලෙස නුඹ යෙස්සේගේ පුත්‍රයා කෙරෙහි
ඇලුම්ව සිටින බව මම නොදනිම්ද?
මක්නිසාද යෙස්සේගේ පුත්‍රයා භූමිය 31
මතුපිට ජීවත්ව සිටින තුරුම නුඹවත්
නුඹේ රජකමවත් ස්ථිරවෙන්නේ නැත.
එබැවින් දැන් මිනිසුන් යවා ඔහු මා
ළඟට ගෙන්වාපන්න, සැබවින් ඔහු මරනු
ලබන්නේයයි කීය. යොනාතාන් තමාගේ 32
පියවූ සාවුල්ට උත්තරදෙමින්: ඔහු මරන්ට
ඕනෑ මක්නිසාද? ඔහු කෙළේ මොකදැයි
කීවේය. එවිට සාවුල් ඔහුට අනින පිණිස 33
ඔහු දෙසට හෙල්ලය වීසිකෙළේය. දාවිත්
මරන්ට තමාගේ පියා නියමකරගන
සිටින බව එයින් යොනාතාන් දැනගත්තේය.
යොනාතාන් තද කෝපයෙන් මේසයෙන් 34
නැගිටගොස් මාසයේ දෙවෙනි ද කෑම
නොකා සිටියේය. මක්නිසාද තමාගේ
පියා දාවිත්ට අගෞරව කළ බැවින් ඔහු
දාවිත් ගැන ශෝකවුණේය.
පසුවද උදය යොනාතාන් දාවිත් සමග 35
නියම කරගත් වේලාවේදී කුඩා ළමයෙකු
සමග කෙතට ගියේය. ඔහු ළමයාට 36
කථාකොට: නුඹ දුවගොස්, මා විසින්
විදින ඊගස් සොයාගන වරෙන්නැයි
කියා, ළමයා දුවද්දී ඔහුට එහායින්
යන්ට ඊගහක් විද්දේය. යොනාතාන් 37
විද්ද ඊගහ තිබෙන තැනට ළමයා
පැමුණුණු කල යොනාතාන් ළමයාට
මොරගසා: ඊගහ නුඹට එහායින් තිබෙනවා
නොවේදැයි කීවේය. යොනාතාන් ළමයාට 38
මොරගසා: කඩිසරවී ඉක්මන්වෙයන්න,
ප්‍රමාදවෙන්ට එපායයි කීය. යොනාතාන්ගේ

ළමයාද ඊගස් එකතු සරගන තමාගේ
39 ස්වාමියා ළඟට ආවේය. නුමුත් ළමයා
කිසිවක් දැනනොගත්තේය. යොනාතාන්
සහ දවිත් පමණක් ඒ කාරණය දැනගන
40 සිටියෝය. යොනාතාන් තමාගේ ආයුධ
ළමයාට දී: මේවා නුවරට අරගන
41 පලයන්නැයි ඔහුට කීවේය. ළමයා
ගියපසු දවිත් දකුණු පැත්තෙන් නැගිට
ඇවිත් මුහුණින් බිමවැටී තුන් විටක්
වැන්දේය. ඔව්හු එකිනෙකා සිඹගන
දෙදෙනා එක්ව ඇඬුවෝය. දවිත් වඩාම
42 ඇඬුවේය. යොනාතාන් දවිත්ට කථාකොට:
**ස්වාමීන්වහන්සේ** මා සහ නුඹ අතරේද
මාගේ වංශය සහ නුඹේ වංශය අතරේද
සැම කල්හිම වනසේක්වයි කියා අප
දෙදෙනා **ස්වාමීන්වහන්සේගේ** නාමයෙන්
දිවුරා තිබේ, ඒ නිසා සමාදනයෙන්
පලයන්නැයි කීවේය. එවිට ඔහු නැගිට
පිටත්ව ගියේය. යොනාතාන් නුවරට
ගියේය.

## දවිත් අහිමෙලෙක් සහ ආකීෂ් වෙතට පලායාම

21 එවිට දවිත් නොබ්හි අහිමෙලෙක්
පූජකයා වෙතට පැමුණුණේය.
අහිමෙලෙක් දවිත් සම්බවෙන්ට වෙවුලමින්
ඇවිත්: කිසිවෙකු නුඹ සමග නැතුව
තනියම ආවේ මක්නිසාදැයි ඔහුගෙන්
2 ඇසුවේය. දවිත්ද: රජ්ජුරුවෝ වැඩක්
මට නියමකොට—මා විසින් නුඹ
යවන්නාවූ නුඹට අණ කළාවූ කාරණය
ගැන කිසිවෙක් මොකවත් දැනනොගනීවයි
මට කීවාහ. අසවල් ස්ථානයට යන්ට
කියා මා විසින් සේවකයන්ට දන්වා
3 තිබේ. දැන් නුඹේ අත යට තිබෙන්නේ
මොනවාද? මා අතට රොටි පහක්
හෝ වෙන තිබෙන දෙයක් හෝ
දුනමැනවැයි පූජකවූ අහිමෙලෙක්ට
4 කීවේය. පූජකයා දවිත්ට උත්තරදෙමින්:
ශුද්ධ රොටි මිස වෙන රොටි මා ළඟ
නැත; සේවකයෝ ස්ත්‍රීන්ගෙන් වැලකී
සිටියෝනම් දෙන්ට පුළුවනැයි කීවේය.
දවිත් පූජකයාට උත්තරදෙමින්: සැබැව- 5
වම දැන් තුන්දවසක් පමණ ස්ත්‍රියෝ
අපෙන් වෙන්ව සිටියාහුය; මේක
සාමාන්‍ය ගමනක් වුණේවී නුමුත් මා
පිටත්වෙන කොට සේවකයන්ගේ භාජන
ශුද්ධව තිබුණේය; කොපමණ වැඩියෙන්
අද ඒවා ශුද්ධව නොතිබේදැයි ඔහුට
කීවේය. එවිට **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙන් 6
අහකට ගත් පිදීමේ රොටි මිස වෙන
රොටි එහි නොතිබුණු බැවින් පූජකයා
ශුද්ධ රොටි ඔහුට දුන්නේය. ඒවා අහකට
ගත්තේ එම දවසේදී උණු රොටි තබන
පිණිසය. තවද ඒ දවසේදී සාවුල්ගේ 7
වැඩකාරයන්ගෙන් එක්කෙනෙක්වූ
සාවුල්ගේ එඬේරුන්ගේ ප්‍රධානියා වන
දෙවෙග් නම්වූ ඒදෝමිය මනුෂ්‍යයෙක්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි එහි නැවතී
සිටියේය. දවිත් අහිමෙලෙක්ට කථාකොට: 8
මෙහි නුඹ ළඟ හෙල්ලයක් හෝ කඩුවක්
නැද්ද? රජ්ජුරුවන්ගේ කටයුත්ත ඉක්මන්
බැවින් මාගේ කඩුවවත් ආයුධවත්
නොගෙනායෙමියි කීවේය. පූජකතෙමේ: 9
නුඹ විසින් ඒලා මිටියාවතේදී මැරූ
පිලිස්තියයාවූ ගොලියත්ගේ කඩුව
රෙද්දකින් ඔතා ඒෆොද් සැට්ටයට
එහායින් තබා තිබේ. ඒක ගන්ට
කැමතිනම් අරගනින්න. ඒක මිස වෙන
එකක් මෙහි නැතැයි කීවේය. ඒ වාගේ
වෙන එකක් නැත, ඒක මට දෙන්නැයි
දවිත් කීවේය.
දවිත් පිටත්වී සාවුල්ට භයින් ඒ දවසේ 10
පලා ගොස් ගාත්හි රජවූ ආඛීෂ් වෙතට
පැමුණුණේය. ආඛීෂ්ගේ සේවකයෝ ඔහුට 11
කථාකොට: මොහු දේශයෙහි රජවූ
දවිත් නොවේද?
සාවුල් තෙමේ දහස් ගණන්ද
දවිත් දසදහස් ගණන්ද මැරීයයි
කියමින් ඔවුන් නැටුම් ඇතුව එකිනෙකාට
ගීතිකා කළේ මොහු ගැන නොවේදැයි
කීවෝය. දවිත් ඒ වචන සිතට ගෙන 12
ගාත්හි රජවූ ආඛීෂ්ට බොහෝසෙයින්
භයවුණේය. ඔවුන් ඉදිරියේදී ඔහු තමාගේ 13
හැසිරීම වෙනස්කොට, පිස්සු වැටුණාක්

මෙන් ඔවුන් ළඟදී හඟවමින්, වාසල්දෙර
පහුරුගෑවේය, තමාගේ කෙළ රැවුල
14 පිට වැටෙන්ටත් ඇරියේය. එවිට ආකීෂ්
තමාගේ සේවකයන්ට කථාකොට:
මෙන්න, මේ මනුෂ්‍යයා පිස්සෙක් බව
නුඹලාට පෙනේ. නුඹලා ඔහු මා ළඟට
15 ගෙනාවේ මක්නිසාද? මා ඉදිරියෙහි
පිස්සු විකාරකරන්ට මොහු ගෙනාවේ
පිස්සන් මට හිඟ නිසාද? මොහු මගේ
ගෙට එන්ට යුතුදැයි කීවේය.

## දාවිත් ඔබ මොබ යෑම

22 එවිට දාවිත් එතනින් ගැළවී ගොස්
අදුල්ලාම්හි ගුහාවට පැමුණුණේය.
ඔහුගේ සහෝදරයෝද ඔහුගේ පියාගේ
පවුලේ සියල්ලෝද ඒ අසා එහි ඔහු
2 ළඟට ගියෝය. විපතට පත්වූ සියල්ලෝද
ණයතුරුස් ඇති සියල්ලෝද නොසතුටු
සිත් ඇති සියල්ලෝද ඔහු වෙතට
රැස්වූහ; ඔහු ඔවුන්ගේ අධිපතියා විය.
මෙසේ ඔහු සමග හාරසියයක් පමණ
මනුෂ්‍යයෝ ඇති වූහ.
3 දාවිත් එතැනින් මෝවබ්හි මිශ්පාට
ගොස් මෝවබ් රජුට කථාකොට:
දෙවියන්වහන්සේ මට කරන්ට යන්නේ
කුමක්දැයි මා විසින් දැනගන්නතුරු
මාගේ මවුපියන් අවුත් නුඹලා වෙත
4 සිටින්ට අවසර ලැබේවයි කීවේය. ඔහු
මෝවබ් රජු ඉදිරියට ඔවුන් කැඳවාගෙන
ගියේය. ඔව්හුද දාවිත් කොටුවෙහි සිටි
කාලය මුළුල්ලේම රජු වෙත වාසය-
5 කළෝය. ගාද් නම් අනාගතවක්තෘ තෙම
දාවිත්ට කථාකොට: කොටුවෙහි නොසිට
යූදා රටට පිටත්ව වරෙන්නැයි දාවිත්ට
කීවේය. එවිට දාවිත් පිටත්ව හෙරෙත්
වනයට පැමුණුණේය.

## නොබ්හි පූජකයන් මැරීම

6 දාවිත් සහ ඔහු සමග වූ මනුෂ්‍යයන්
සිටින ස්ථානය එළිදරව් වූ බව සාවුල්ට
සැලවිය. සාවුල් ඒ වේලාවේ තමාගේ
හෙල්ලය අතේ ඇතුව ගිබියාවේ රාමාහි
තිබුණු ඒෂෙල් ගස යට ඉඳගෙන උන්නේය,
ඔහුගේ සියලු සේවකයෝ ඔහු පිරිවරා
සිටියෝය. සාවුල් තමා වෙත සිටි 7
තමාගේ සේවකයන්ට කථාකොට:
බෙන්යමින්වරුනි, අසාපල්ලා; යෙස්සේගේ
පුත්‍රයා නුඹලා හැමදෙනාට කෙත්ද
මිදිවතුද දෙනවා ඇද්ද? නුඹලා සියල්ලන්
සහස්‍රාධිපතීන්ද ශතාධිපතීන්ද කරනවා
ඇද්ද? නැත්නම් නුඹලා සියල්ලන් මට 8
විරුද්ධව කුමන්ත්‍රණය කරගෙන සිටින්නේ
මක්නිසාද? මාගේ පුත්‍රයා යෙස්සේගේ
පුත්‍රයා සමග ගිවිසුමක් කරගන්න කල
කිසිවෙක් මට නොදන්නුවෙත්, මා ගැන
දුක්වෙන කිසිවෙක් නුඹලා අතරේ
නැත්තෙත්, අද දවසේ සිද්ධවී තිබෙන
හැටියට මාගේ පුත්‍රයා විසින් මාගේ
මෙහෙකරුවා මට විරුද්ධව රැකසිටීමට
පෙළඹවූ බව මට නොදන්වන්නෙත්
මන්දැයි කීවේය. එවිට සාවුල්ගේ 9
මෙහෙකරුවන්ගේ ප්‍රධානියාව සිටිය
ඒදෝමිය දොවේග් උත්තරදෙමින්:
යෙස්සේගේ පුත්‍රයා නොබ්හි සිටින
අහිතුබ්ගේ පුත්‍රවූ අහිමෙලෙක් ළඟට
එනවා දුටිමි. හෙතෙම ස්වාමින්- 10
වහන්සේගෙන් ඔහු උදෙසා විචාරා,
ඔහුට ආහාර දී, පිලිස්තියයාවූ
ගොලියත්ගේ කඩුවත් ඔහුට දුන්නේයයි
කීවේය. එවිට රජතෙමේ අහිතුබ්ගේ පුත්‍රවූ 11
අහිමෙලෙක් නම් පූජකයාටද නොබ්හි
සිටි පූජකයන් වන ඔහුගේ පිය වංශයේ
සියල්ලන්ටද අඬගස්වා ඇරියේය. ඔවුන්
සියල්ලෝ රජු ළඟට ආවෝය. එවිට 12
සාවුල්: අහිතුබ්ගේ පුත්‍රය, අසාපන්නැයි
කීය. ඔහු: මාගේ ස්වාමිනි, මම මෙහි-
යයි උත්තරදුන්නේය. සාවුල්ද: නුඹත් 13
යෙස්සේගේ පුත්‍රයාත් මට විරුද්ධව
කුමන්ත්‍රණය කළේ මක්නිසාද? නුඹ
ඔහුට ආහාරද කඩුවක්ද දුන්නෙහිය,
අද දවසේ පෙනෙන හැටියට, ඔහු මට
විරුද්ධව රැකසිටීමට නැගිටින පිණිස
ඔහු උදෙසා දෙවියන්වහන්සේගෙන්
විචාළෙහියයි ඔහුට කීවේය. එවිට 14

අහිමෙලෙක් රජුට උත්තරදෙමින්:
රජ්ජුරුවන්ගේ බෑනාවූ, ඔබගේ මන්ත්‍රණ
සභාවට ඇතුළත්වූ, ඔබගේ ගෘහයේ
ගරුතරව සිටින්නාවූ දවිත් මෙන් ඔබගේ
සියලු මෙහෙකරුවන් අතරෙන් විශ්වාසව
15 සිටින්නේ කවුද? මා ඔහු උදෙසා
දෙවියන්වහන්සේගෙන් විචාරන්ට පටන්
ගත්තේ මේ දවසේදීද? එය මාගෙන්
දුරුවේවා. රජ්ජුරුවෝ තමාගේ මෙහෙ-
කරුවාවූ මා කෙරෙහිවත් මාගේ පිය
වංශයේ කිසිවෙකු කෙරෙහිවත් වරද
නොතබත්වා. මක්නිසාද ඔබගේ
මෙහෙකරුවා මේ මුළු කාරණය ගැන
අඩු වශයෙන්වත් වැඩි වශයෙන්වත්
කිසිවක්ම නොදන්නේයයි කීවේය.
16 රජ්ජුරුවෝ: අහිමෙලෙක්, තුඹත් තුඹේ
මුළු පිය වංශයේ සියලු දෙනාත් සැබවින්
17 මරනු ලබන්ට ඕනෑයයි කීය. රජතෙම
තමා වෙත සිටි මුරකාරයන්ට කථාකොට:
තුඹලා ළංවී ස්වාමීන්වහන්සේගේ
පූජකයන් මරාපල්ලා; මක්නිසාද ඔව්හුද
දවිත්ට එකතුව සිටිති, ඔහු පලායන බව
දැනගනත් ඔවුන් මට එය එළිදරව්-
කළේ නැතැයි කීවේය. එහෙත් රජුගේ
සේවකයෝ ස්වාමීන්වහන්සේගේ පූජකයන්ට
පහරදෙන්ට තමුන්ගේ අත් දිගුකරන්ට
18 නොකැමැතිවූවෝය. එවිට රජ: තුඹ ළංවී
පූජකයන්ට පහරදීපන්නැයි දෙවෙග්ට
කීවේය. ඒදෙමීය දෙවෙග් ළංවී පූජකයන්ට
පහරදී, සිහින් හණරෙදි ඒඵොද්
සැට්ටයක් ඇඳ සිටියාවූ අසූපස්දෙනෙකු
19 ඒ දවසේදී මැරුවේය. ඔහු පූජකයන්ගේ
නුවර වන නොබ්ට එනම් එහි සිටි
පුරුෂයන්ට හා ස්ත්‍රීන්ටත් බාලයන්ට
හා කිරිදරුවන්ටත් ගවයන්ට හා
කොටළුවන්ටත් බැටළුවන්ටත් කඩු
20 මුවහතින් පහරදුන්නේය. නුමුත් අහිතුබ්ගේ
පුත්‍රයා වන අහිමෙලෙක්ගේ පුත්‍රයන්-
ගෙන් එක්කෙනෙක්වූ අබියාතර් ගැළවී
21 දවිත් වෙතට පලාගියේය. සාවුල්
ස්වාමීන්වහන්සේගේ පූජකයන් මැරූ බව
22 අබියාතර් දවිත්ට දන්නුවේය. දවිත්ද:
ඒදෙමීය දෙවෙග් එහි සිටිය බැවින් ඔහු
සාවුල්ට නිසැකින්ම දන්වන බව මම ඒ
දවසේදී දැනගතිමි. තුඹේ පිය වංශයේ
සියල්ලන්ගේ මරණයට හේතුවූයේ මමය.
තුඹ මා ළඟ සිටපන්න, භයනොවන්න; 23
මා මරන්ට සොයන්නා තුඹත් මරන්ට
සොයන්නේය. නුමුත් තුඹ මා වෙත
සුරක්ෂිතව සිටින්නෙහියයි අබියාතර්ට
කීවේය.

## දවිත් කෙයිලාය ගළවා ශීඝ්‍රව යාම

23 එකල පිලිස්තිවරු කෙයිලාට
විරුද්ධව යුද්ධකරමින් පාවර-
වලින් කොල්ලකතියි දවිත්ට දන්වන
ලද්දේය. එබැවින්: මා ගොස් මේ 2
පිලිස්තිවරුන්ට පහරදෙන්ටදැයි දවිත්
ස්වාමීන්වහන්සේගෙන් විචාළේය. තුඹ
ගොස් පිලිස්තිවරුන්ට පහරදී කෙයිලා
ගළවාපන්නැයි ස්වාමීන්වහන්සේ දවිත්ට
කීසේක. නුමුත් දවිත්ගේ මනුෂ්‍යයෝ 3
ඔහුට කථාකොට: අපි මෙහි යූදාහිදී
භයෙන් සිටිමුව. පිලිස්තිවරුන්ගේ
සමූහවලට විරුද්ධව අපි කෙයිලාට
ගියොත් කොපමණ වැඩියෙන් භය-
නොවන්නෙමුද්දැයි කීවෝය. එවිට දවිත් 4
නැවත ස්වාමීන්වහන්සේගෙන් විචාළේය.
ස්වාමීන්වහන්සේ ඔහුට උත්තරදෙමින්:
නැගිට කෙයිලාට පලයන්න; මම තුඹ
අතට පිලිස්තිවරුන් පාවාදෙන්නෙමියි
කීසේක. එවිට දවිත්ද ඔහුගේ මිනිස්සුද 5
කෙයිලාට ගොස් පිලිස්තිවරුන් සමග
යුද්ධකොට, ඔවුන්ගේ සිව්පාවුන්
අල්ලාගෙන, මහත් නාස්තියකින් ඔවුන්
නාස්තිකළෝය. මෙසේ දවිත් කෙයිලාහි
වැසියන් ගැළෙවුවේය.
අහිමෙලෙක්ගේ පුත්‍රවූ අබියාතර් 6
කෙයිලාහි දවිත් ළඟට පලා ආ කල
ඔහු තමාගේ අතේ ඒඵොද් සැට්ටයක්
ඇතුව ආයේය. දවිත් කෙයිලාට ආ 7
බව සාවුල්ට දන්වන ලද්දේය. සාවුල්ද:
දෙවියන්වහන්සේ ඔහු මා අතට පාවා

දුන්සේක; මක්නිසාද ඔහු වාසල්දොරවල්ද
අගුල්ද ඇති නුවරකට ඇතුල්වීමෙන්
8 අසුවුණේයයි කීවේය. සාවුල් දාවිත්
සහ ඔහුගේ මිනිසුන් වටලන පිණිස
කෙයිලාට යන්ට මුළු සෙනඟ යුද්ධයට
9 අඬගස්වාගත්තේය. තමාට අන්තරා-
කරන්ට සාවුල් උපා යොදන බව දාවිත්
දැනගත් විට: ඒපොද් සැට්ටය මෙහි
ගෙනෙන්නැයි ඔහු පූජකවූ අබියාතර්ට
10 කීවේය. එවිට දාවිත්: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්ස**, සාවුල් මා
නිසා කෙයිලා නුවර විනාශ කරන
පිණිස එන්ට සොයන බව ඔබගේ
මෙහෙකරුවාවූ මට සැබවින් සැලවී
11 තිබේ. කෙයිලාහි මනුෂ්‍යයන් ඔහු
අතට මා පාවාදෙනවා ඇද්ද? ඔබගේ
මෙහෙකරුවාට සැලවුණු ලෙස සාවුල්
එනවා ඇද්ද? ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබගේ මෙහෙකරුවාට
දන්නුව මැනවයි කීවේය. ඔහු එන්නේ-
12 යයි **ස්වාමීන්වහන්සේ** කීසේක. එවිට
දාවිත්: කෙයිලාහි මනුෂ්‍යයන් මා සහ
මාගේ මිනිසුන් සාවුල් අතට පාවාදෙනවා
ඇද්දැයි ඇසුවේය. **ස්වාමීන්වහන්සේ**:
13 ඔවුන් පාවාදෙනවා ඇතැයි කීසේක. එවිට
දාවිත්ද හයසියයක් පමණවූ ඔහුගේ
මිනිස්සුද නැගිට කෙයිලායෙන් පිටත්වී
තමුන්ට යන්ට පුළුපුළුවන් තැන්වලට
ගියෝය. දාවිත් කෙයිලායෙන් ගැළවී ගිය
බව සාවුල්ට දන්වනලද්දේය; එවිට ඔහු
තමාගේ ගමන නැවැත්තුවේය.
14 දාවිත් කාන්තාරයේ බලකොටුවල
වාසයකරමින් ශීප් කාන්තාරයේ තිබෙන
කඳු රටේ සිටියේය. සාවුල් හැමදම ඔහු
සෙවුවේය, නුමුත් දෙවියන්වහන්සේ සාවුල්
15 අතට ඔහු පාවා නුදුන්සේක. දාවිත්ද
තමා මරන්ට සාවුල් පිටත්ව ආ බව
දුටුවේය. එකල දාවිත් ශීප් කාන්තාරයේ
16 තිබුණ කැලෑවක සිටියේය. එවිට
සාවුල්ගේ පුත්‍රවූ යොනාතාන් නැගිට
අවුත් කැලෑවේ සිටි දාවිත් ළඟට ගොස්,
දෙවියන්වහන්සේ කෙරෙහි ඔහුගේ අත
බලවත්කරමින්, ඔහුට කථාකොට: 17
භයනොවන්න. මක්නිසාද මාගේ පියවූ
සාවුල්ගේ අතට නුඹ අසුනොවන්නෙහිය;
නුඹ ඉශ්‍රායෙල් කෙරෙහි රජවන්නෙහිය,
මමද නුඹට දෙවෙනියා වන්නෙමි; මාගේ
පියවූ සාවුල්ද ඒ බව දන්නේයයි ඔහුට
කීය. ඔවුන් දෙදෙනා **ස්වාමීන්වහන්සේ** 18
ඉදිරියෙහි ගිවිසුමක් කරගත්තෝය. දාවිත්
කැලෑවෙහි සිටියේය, යොනාතාන්
තමාගේ ගෙදරට ගියේය. එවිට ශීප් 19
වැසියෝ ගිබියාහි සිටි සාවුල් ළඟට
අවුත්: දාවිත් අප අතරේ මරුකතරට
දකුණෙන් තිබෙන හකීලා හෙලේ
කැලෑවේ බලකොටුවල සැඟවී සිටිනවා
නොවේද? එබැවින් රජ්ජුරුවෙනි, එන්ට 20
ඔබගේ සිතේ ඇති මුළු ආශාව ලෙස
අවමැනවි; රජ්ජුරුවන් අතට ඔහු
අල්වාදීම අපේ වැඩක්යයි කීවෝය.
සාවුල්: නුඹලා මට අනුකම්පාකළ 21
නිසා **ස්වාමීන්වහන්සේගෙන්** නුඹලාට
ආශීර්වාදවේවා. ඉතින් නුඹලා ගොස් 22
තව සෝදිසිකර, ඔහු ගැවසෙන ඔහුගේ
ස්ථානයත් එහි ඔහු දුටුවේ කව්ද කියාත්
බලා දැනගනිල්ලා. මක්නිසාද ඔහු බොහෝ
උපාය දක්ෂව හැසිරෙන බව මට දැනගන්ට
ලැබී තිබේ. ඒ නිසා ඔහු සැඟවී සිටින 23
සියලු රහස් ස්ථාන බලා, සත්තකලෙස
දැනගෙන, මා ළඟට නැවත වරෙල්ලා,
එවිට මම නුඹලා සමග ගොස්, ඔහු රටේ
ඉන්නවා නම්, යූදාහි සියලු දහස්ගණන්
අතරෙහි ඔහු සොයාගන්නෙමියි කීවේය.
ඔව්හු පිටත්ව සාවුල්ට පළමුවෙන් ශීප්ට 24
ගියෝය. එහෙත් දාවිත් සහ ඔහුගේ
මිනිස්සු මරුකතරට දකුණු දිගින්
අරබා සමභූමියෙහි තිබෙන මායොන්
කාන්තාරයේ සිටියෝය. සාවුල්ද ඔහුගේ 25
මිනිස්සුද ඔහු සොයන්ට ගියෝය. ඒ
බව දාවිත්ට දන්වනලද බැවින් ඔහු
පර්වතයට බැස ඇවිත් මායොන්
කාන්තාරයෙහි සිටියේය. සාවුල් ඒ අසා
මායොන් කාන්තාරයෙහි දාවිත් පස්සේ

26 එළවාගන ගියේය. සාවුල් කන්දේ එක
පැත්තකින්ද දාවිත් හා ඔහුගේ මිනිස්සු
කන්දේ අනික් පැත්තෙන්ද ගියෝය.
සාවුල් සහ ඔහුගේ මිනිසුන් දාවිත් සහ
ඔහුගේ මිනිසුන් අල්ලාගන්න පිණිස
වටකළ නිසා දාවිත් සාවුල්ට භයෙන්
27 ගැළවීයන්ට ඉක්මන්කෙළේය. එහෙත්
සාවුල් ළඟට පණිවිඩකාරයෙක් ඇවිත්:
කොල්ලකෑමට පිලිස්තිවරුන් රටට
ඇවිත් සිටින නිසා ඉක්මනින් අවමැනවැයි
28 කීවේය. එබැවින් සාවුල් දාවිත් පස්සේ
එළවාගනයාමෙන් හැරී ඇවිත් පිලිස්ති-
වරුන්ට විරුද්ධව ගියේය. ඒ නිසා ඔව්හු
ඒ ස්ථානයට *සෙල-හම්මාලෙකොත්
29 යන නම තැබුවෝය. දාවිත් එතනින්
ගොස් ඒන්-ගෙදියේ බලකොටුවල
සිටියේය.

## දාවිත් ඒන්-ගෙදියේදී සාවුල්ගේ ජීවිතය ගැළවීම

24 තවද සාවුල් පිලිස්තිවරුන්
ලුහුබැඳ යාමෙන් හැරී ආ කල:
දාවිත් ඒන්-ගෙදියේ කාන්තාරයෙහි
සිටිනවාය කියා ඔහුට දන්වනලද්දේය.
2 එවිට සාවුල් සියලු ඉශ්‍රායෙල්වරුන්ගෙන්
තෝරාගත් මනුෂ්‍යයන් තුන්දහසක්
රැගෙන වල් එළුවන් ගැවසෙන පර්වත
පිට දාවිත් හා ඔහුගේ මිනිසුන් සොයන්ට
3 ගියේය. ඔහු මාර්ගයෙහි තිබුණු බැටළු
ගාල්වලට පැමුණුණේය. සාවුල් ශරීර-
කෘත්‍යය සඳහා එහි තිබුණ ගුහාවකට
ඇතුල්වුණේය. දාවිත්ද ඔහුගේ මිනිස්සුද
4 ගුහාවේ ඇතුල් භාගවල සිටියෝය. එවිට
දාවිත්ගේ මිනිස්සු කථාකොට: මෙන්න,
තුඹට හොඳව පෙනෙන ලෙස තුඹේ
සතුරාට කරන පිණිස මම තුඹ අතට
ඔහු පාවාදෙන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කීවේ අද දවස ගැනයයි කීවෝය.
එවිට දාවිත් නැගිට සාවුල්ගේ සළුවේ
5 කොන රහසින් කපාගත්තේය. නුමුත්
පසුව දාවිත්ගේ සිත සාවුල්ගේ සළුවේ
කොන කපාගත් බැවින් ඔහුට
දෙස්තැබුවේය. ඔහු තමාගේ මිනිසුන්ට 6
කථාකොට: **ස්වාමීන්වහන්සේගේ** අභි-
ෂේකලත් තැනැත්තා වන මාගේ
ස්වාමියාට විරුද්ධව මේ දේ කිරීමෙන්
එනම් මාගේ අත දිගුකිරීමෙන් **ස්වාමීන්-**
**වහන්සේ** මා වලක්වනසේක්වා,
මක්නිසාද ඔහු **ස්වාමීන්වහන්සේගේ**
අභිෂේකලත් තැනැත්තායයි කීවේය.
මෙසේ සාවුල්ට විරුද්ධව නැගිටින්ට 7
දාවිත් තමාගේ මිනිසුන්ට ඉඩනැර මේ
වචනවලින් ඔවුන් නවත්වා ගත්තේය.
සාවුල් ගුහාවෙන් පිටත්ව යන්ට ගියේය.
ඉන්පසු දාවිත් නැගිට ගුහාවෙන් 8
පිටතට ගොස්: මාගේ ස්වාමිවූ රජ්ජුරු-
වන්වහන්සැයි කියා සාවුල්ට මොර-
ගැසීය. සාවුල් පස්සට හැරී බැලූ කල
දාවිත් මුහුණින් බිමට නැමී වැඳ,
සාවුල්ට කථාකොට: දාවිත් ඔබට 9
අනතුරු කරන්ට සොයන්නේයයි කියන
මනුෂ්‍යයන්ගේ වචනවලට ඔබ ඇහුම්-
කන්දෙන්නේ මක්නිසාද? **ස්වාමීන්-** 10
**වහන්සේ** අද ගුහාවේදී ඔබ මා අතට
පාවාදුන් බව ඔබගේ ඇස්වලටම මේ
දවසේදී පෙනුණේය. සමහරු ඔබ
මරන්ටය කියා මට කීවෝය. නුමුත්
මම ඔබට කරුණාකෙළෙමි; මක්නිසාද–
මාගේ ස්වාමියා **ස්වාමීන්වහන්සේගේ**
අභිෂේකලත් තැනැත්තා බැවින් ඔහුට
විරුද්ධව මාගේ අත දිගුනොකරමියි
කීමි. තවද මාගේ පියාණෙනි, බැලුව 11
මැනවි, ඔබගේ සළුවේ කොන මාගේ
අතේ තිබෙන බව බැලුවමැනවි. මා ඔබ
නොමරා ඔබගේ සළුවේ කොන කපා-
ගත් බව බලා, මා අත නපුරක්වත්
අපරාධයක්වත් නැති බවද මා ඔබට
විරුද්ධව පව් නොකළ බවද බලා
දැනගතමැනවි, එහෙත් මාගේ ප්‍රාණය
නසන්ට ඔබ මා පස්සේ එළවාගන
එන්නෙහිය. **ස්වාමීන්වහන්සේ** මා සහ 12
ඔබ අතරේ විනිශ්චයකොට මා නිසා
ඔබගෙන් පළිගන්නාසේක්වා. මාගේ
අත නම් ඔබ පිටට නොපැමිණෙන්නේය.
පුරාතනයන්ගේ උපදේශ කීම ලෙසෙ: 13
දුෂ්ටයාගෙන් දුෂ්ටකම නික්මෙන්නේය.

*එනම්, මිදීයාමේ පර්වතය.

තුමුත් මාගේ අත ඔබ පිටට නො-
14 පැමිණෙන්නේය. ඉශ්‍රායෙල්වරුන්ගේ
රජතුමා කා පස්සේ පිටත්ව ආවේද?
ඔබ කා පස්සේ එළවාගෙන එනවාද?
මළ බල්ලෙක් පස්සේය. බලුමැක්කෙක්
15 පස්සේය. එබැවින් **ස්වාමීන්වහන්සේ**
විනිශ්චයකාරයා වී මාත් ඔබත් අතරේ
විනිශ්චයකොට, මාගේ විත්තිය කියා,
ඔබගේ අතින් මා ගළවනසේක්වයි
16 කීවේය. දවිත් මේ වචන සාවුල්ට කියා
තීන්දුකළ විට සාවුල් කථාකොට: මාගේ
පුත්‍රවූ දවිත්, ඔය තුඹේ හඬද කියා
17 ශබ්දනගා ඇඬුවේය. ඔහු දවිත්ට
කථාකොට: තුඹ මට වඩා ධර්මිෂ්ඨය.
මක්නිසාද මා තුඹට නපුර කළ නුමුත්
18 තුඹ මට යහපත කෙළෙහිය. **ස්වාමීන්-
වහන්සේ** තුඹ අතට මා පාවාදුන් විට
තුඹ මා නොමැරූ බැවින් තුඹ මට
යහපත කළ බව අද පෙන්වා දුන්නෙහිය.
19 මනුෂ්‍යයෙකුට තමාගේ සතුරා අසුවු-
ණොත් ඔහු සුවසේ යන්ට හරීද? එබැවින්
තුඹ අද දවසේ මට කළ කාරණය
ගැන **ස්වාමීන්වහන්සේ** තුඹට යහපත්
20 විපාකයක් දෙනසේක්වා. ඉතින් සැබෑ-
වටම තුඹ රජවෙන බවත් ඉශ්‍රායෙල්
රජකම තුඹේ අතේ ස්ථිරවෙන බවත්
21 දනිමි. ඒ නිසා මට පසුව මාගේ වංශය
තුඹ විසින් සිඳ නොදමන ලෙසත් මාගේ
පිය වංශයෙන් මාගේ නම නැතිකර-
නොදමන ලෙසත් **ස්වාමීන්වහන්සේගේ**
22 නාමයෙන් මට දිවුරන්නැයි කීවේය. දවිත්
සාවුල්ට දිවුරුම් දුන්නේය. ඉක්බිති සාවුල්
ගෙදර ගියේය; තුමුත් දවිත්ද ඔහුගේ
මිනිස්සුද බලකොටුවට නැගී ගියාහ.

## දවිත්, නාබල් සහ අබීගායිල්

**25** තවද සාමුවෙල් මළේය; සියලු
ඉශ්‍රායෙල්වරු රැස්ව ඔහු ගැන
වැලපී, රාමාහි තිබුණ ඔහුගේ
නිවාසයෙහි ඔහු තැන්පත්කළෝය. දවිත්ද
පිටත්ව පාරාන් කාන්තාරයට බැස
ගියේය.

කර්මෙල්හි සම්පත් ඇති මනුෂ්‍යයෙක්
මායොන්හි සිටියේය. ඒ මනුෂ්‍යයා මහත් 2
ධනවතෙක්ය, ඔහුට බැටළුවන් තුන්-
දහසක්ද එළුවන් දහසක්ද සිටියෝය.
ඔහු වනාහි කර්මෙල්හි තමාගේ බැටළු-
වන්ගේ ලොම් කප්පවමින් සිටියේය.
ඒ මනුෂ්‍යයාගේ නම නාබල්ය; ඔහුගේ 3
භාර්යාවගේ නම අබීගායිල්ය. ඒ ස්ත්‍රී
වනාහි බුද්ධිමත්, රූප ශෝභාව ඇති
තැනැත්තියක් වූවාය. එහෙත් ඒ මනුෂ්‍යයා
ක්‍රියාවලින් කර්කශවූ නපුරු වූ කෙනෙකි.
ඔහු කාලෙබ්ගේ වංශයේ කෙනෙකි.
නාබල් තමාගේ බැටළුවන්ගේ ලොම් 4
කප්පවන බව කාන්තාරයේදී දවිත්ට
සැලවිය. දවිත් යෞවනයන් දස දෙනෙකු 5
යවමින්: තුඹලා කර්මෙල්ට ගොස්,
නාබල් ළඟට පැමිණ, මාගේ නාමයෙන්
ඔහුගේ සැප සනීප අසා, සම්පත් ඇති 6
ඔහුට කථාකොට—තුඹට සමාදානය
වේවා, තුඹේ පවුලටත් සමාදානය වේවා,
තුඹට ඇති සියල්ලටත් සමාදානය වේවා.
තුඹට බැටළු ලොම් කපන්නන් සිටින 7
බව ඇසීමි. තුඹේ බැටළු එඬේරු අප
සමග සිටියෝය, අප ඔවුන්ට හිංසා-
කළේවත් ඔවුන් කර්මෙල්හි සිටි මුළු
කාලයෙහි ඔවුන්ගෙන් කිසිවක් නැති-
වුණේවත් නැත. තුඹේ වැඩකාරයන්- 8
ගෙන් ඇසුවොත් ඔවුන් තුඹට කියනවා
ඇත. ඒ නිසා යෞවනයන්ට තුඹේ ඇස්
හමුයෙහි කරුණාව ලැබේවා; මක්නිසාද
අපි හොඳ දවසකදී ආවෙමුව. තුඹේ
මෙහෙකරුවන්ටත් තුඹේ පුත්‍රවූ දවිත්ටත්
තුඹට පුළුවන් දෙයක් දෙන ලෙස
ඉල්ලමියි කියාපල්ලායයි කීවේය.
දවිත්ගේ යෞවනයෝ ගොස් ඒ සියලු 9
වචනවල ප්‍රකාරයට දවිත්ගේ නාමයෙන්
කථාකර නැවැත්තෝය. නාබල් දවිත්ගේ 10
මෙහෙකරුවන්ට උත්තරදෙමින්: දවිත්
කවුද? යෙස්සේගේ පුත්‍රයා කවුද? මේ
කාලයේ තම තමුන්ගේ ස්වාමිවරුන්
වෙතින් පලායන මෙහෙකරුවෝ
බොහෝය. එසේවීනම් මා විසින් මාගේ 11
රොටිද මාගේ වතුරද මාගේ බැටළු

ලොම් කපන්නන්ට මා විසින් මැරූ
සතුන්ගේ මස්ද අරන් කොතැනින් ආවාද
කියා මා නොදන්න මිනිසුන්ට දෙන්ටදැයි
12 කීවේය. එවිට දාවිත්ගේ යෞවනයෝ හැරී
ගොස් දාවිත් ළඟට පැමිණ ඒ සියලු
වචනවල ප්‍රකාරයට ඔහුට දැන්නුවෝය.
13 දාවිත්ද: නුඹලා එකිනෙකා තම තමාගේ
කඩුව බැඳගනිල්ලායයි තමාගේ
මිනිසුන්ට කීය. ඔව්හු හැමදෙනම තම
තමුන්ගේ කඩු බැඳගත්තෝය; දාවිත්ද
තමාගේ කඩුව බැඳගත්තේය. මිනිසුන්
හාරසියයක් පමණ දාවිත් අනුව ගියෝය;
දෙසියයක් බඩු ළඟ නැවතී සිටියෝය.
14 නුමුත් වැඩකාරයන්ගෙන් එක්කෙනෙක්
නාබාල්ගේ භාර්යාවවූ අබීගායිල්ට
කථාකොට: අපේ ස්වාමියාට ආචාර-
කරන පිණිස දාවිත් කාන්තාරයේ සිට
පණිවිඩකාරයන් එව්වේය; ඔහු ඔවුන්ට
15 බැණවැදුණේය. ඒ මනුෂ්‍යයෝ නම් අපට
ඉතා යහපත්ව සිටියෝය, අප කෙත්වල
සිටියදී ඔවුන් සමග ගැවසුණු මුළු
කාලයේදී අපට අන්තරායක් වුණේවත්
16 අපෙන් කිසිවක් නැතිවුණේවත් නැත. අප
බැටළුවන් බලාගනිමින් ඔවුන් සමග
සිටි මුළු කාලයේ ඔව්හු රෑ දවල් අපට
17 ප්‍රාකාරයක්ව සිටියෝය. ඒ නිසා දැන්
ඔබ ඒ දැනගෙන කුමක් කටයුතුදැයි
කල්පනාකළ මැනවි; මක්නිසාද අපේ
ස්වාමියාටත් ඔහුගේ මුළු පවුලටත්
විරුද්ධව අනතුරක් නියමකර තිබේ. ඔහු
වනාහි යමෙකුට ඔහු සමග කථාකරන්ට
18 බැරි තරම් *දුර්ජනයෙක්යයි කීය. එවිට
අබීගායිල් ඉක්මන්කර, රොටි දෙසියයක්ද
මුද්‍රිකපාන භාජන දෙකක්ද පුලුස්සාපු
බැටළුවන් පස්දෙනෙක්ද විලඳ නැළි
පහක්ද වියළි මුද්‍රිකඵල පොකුරු
සියයක්ද අත්තික්කා කැටි දෙසියයක්ද
රැගෙන, ඒවා කොටළුවන් පිට පටවා,
19 ඇගේ වැඩකාරයන්ට කථාකොට: නුඹලා
මට පෙරටුව පලයල්ලා; මම නුඹලාට
පස්සෙන් එන්නෙමියි කීවාය. එහෙත්
ඇගේ පුරුෂයාවූ නාබාල්ට ඈ ඒ බව

*හෙවත්, බෙලියල්ගේ පුත්‍රයෙක්

කීවේ නැත. ඈ කොටළුවා පිට නැගී 20
කන්දේ මුවාව තිබුණ ස්ථානයකින්
බැසයද්දී දාවිත්ද ඔහුගේ මිනිස්සුද ඈ
ඉදිරිපිට බැස ආවෝය; ඈද ඔවුන්ට
මුණගැසුණාය. තවද: සැබවින් කාන්- 21
තාරයෙහි මොහුට ඇති සියල්ලෙන්
කිසිවක් නැතිනොවන ලෙස මොහු
සන්තක සියල්ල මා විසින් ආරක්ෂාකළ
එක නිෂ්ඵලය. මොහු මට යහපතට
අයහපතෙන් ප්‍රතිදානය කෙළේය. මා 22
විසින් මොහුගේ සියලු පිරිමින්ගෙන්
එක්කෙනෙක්වත් හෙට එළිවෙනතුරු
ඉතිරිකළොත් දෙවියන්වහන්සේ දාවිත්ගේ
සතුරන්ටත් එසේත් ඊට වැඩියත් කරන-
සේක්වයි දාවිත් කියා තිබුණේය.
අබීගායිල් දාවිත් දැක, ඉක්මනින් 23
කොටළුවා පිටින් බැස, දාවිත් ඉදිරියෙහි
මුහුණින් බිමට වැටී වැඳ, ඔහුගේ පාමුල 24
වැටී කථාකොට: ඒ අපරාධය මා පිට,
මාගේ ස්වාමීනි, මා පිටම වේවා. ඔබට
කථාකරන්ට ඔබගේ මෙහෙකාරීට
අවසර ලැබේවා, ඔබගේ මෙහෙකාරීගේ
වචන ඇසුව මැනවි. මාගේ ස්වාමීනි, ඒ 25
*දුර්ජන මනුෂ්‍යයාවූ නාබාල් ගැන
නොසැලකුව මැනවි. ඔහුගේ නාමය
යම්සේද ඔහුගේ ගතියත් එසේමය; ඔහුගේ
නම †නාබාල්ය, මෝඩකම ඔහු තුළ
තිබේ. එහෙත් ඔබගේ මෙහෙකාරීවූ
මම මාගේ ස්වාමිවූ ඔබ විසින් එවූ
යෞවනයන් නුදුටිමි. දැන් මාගේ 26
ස්වාමීනි, ස්වාමීන්වහන්සේ ජීවමාන බව
සැබෑවා සේම, ඔබගේ ප්‍රාණයත් ජීවත්
වන බව සැබෑවා සේම, ලේ වැගිරීමේ
අපරාධයෙන්ද ඔබගේම අතින් පළි-
ගැනීමෙන්ද ස්වාමීන්වහන්සේ ඔබ
වැලැක්වූසේක්මය, එබැවින් ඔබගේ
සතුරෝද මාගේ ස්වාමියාට අන්තරා-
කරන්ට සොයන්නෝද නාබාල් මෙන්
වෙත්වා. ඉතින් ඔබගේ වැඩකාරීවූ මා 27
විසින් මාගේ ස්වාමියාට ගෙනාවාවූ
මේ තෑග්ග මාගේ ස්වාමියා අනුව
යන යෞවනයන්ට දෙනු ලැබේවා.

*එනම්, බෙලියල්ගේ පුත්‍රයා.
†එනම්, මෝඩයා.

28 ඔබගේ මෙහෙකාරීගේ වරදට කමාවුණ-
මැනවි. මක්නිසාද මාගේ ස්වාමියා
**ස්වාමීන්වහන්සේගේ** යුද්ධ කරන බැවින්
**ස්වාමීන්වහන්සේ** මාගේ ස්වාමියාට
ස්ථිරවූ වංශයක් සාදා දෙනසේක්මය,
ඔබගේ සියලු දවස්වලදී ඔබ තුළ නපුර
29 දකිනු නොලබන්නේය. ඔබ පස්සේ
එළවාගෙන ඇවිත් ඔබගේ ප්‍රාණය හානි-
කරන්ට මනුෂ්‍යයෙක් නැගුටුණත්, මාගේ
ස්වාමියාගේ ප්‍රාණය ඔබගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** වෙත ජීවතුන්ගේ
මිටියෙහි බඳිනුලැබ, ඔබගේ සතුරන්ගේ
ප්‍රාණ උන්වහන්සේ ගල් පටියෙන් මෙන්
30 වීසිකරදමනසේක. තවද **ස්වාමීන්-
වහන්සේ** මාගේ ස්වාමියා ගැන කී සියලු
යහපත්කම් ප්‍රකාර ඔබට කර ඔබ
ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා කොට
31 පත්කළ කල්හි, මාගේ ස්වාමියා
නිකරුණේ ලේ වැගිරෙවූවාය කියාවත්
තමාගේම අතින් පළිගත්තාය කියාවත්
මේක ඔබට චිත්ත ඛේදයක් හෝ
ශෝකයක් නොවන්නේය. තවද **ස්වාමීන්-
වහන්සේ** මාගේ ස්වාමියාට යහපත
කළ කල්හි ඔබගේ මෙහෙකාරී සිහිකළ
32 මැනවැයි කීවාය. දවිත් අබීගායිල්ට
කථාකොට: මා සම්බවෙන්ට අද දවසේ
තුඹ එවූවාවූ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
33 **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා වේවා. තුඹේ
නුවණටද ප්‍රශංසා වේවා, ලේ වගුරුවා
මාගේම අතින් පළිගැනීමෙන් අද දවසේ
මා වැළැක්වූ තුඹට ආශීර්වාද වේවා.
34 මක්නිසාද තුඹට හිංසා කිරීමෙන් මා
වැළැක්වූවාවූ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව සැබැවා
සේම, තුඹ ඉක්මනින් මා සම්බවෙන්ට
නාවා නම්, නාබල්ට අයිති එක පිරිමි-
යෙක්වත් හෙට එළිවෙනකොට ඉතුරු
35 නොවන්නේයයි කීවේය. මෙසේ දවිත්
ඈ තමාට ගෙනා දේවල් ඇගේ අතින්
පිළිගෙන: තුඹේ ගෙදරට සමාදානයෙන්
පලයන්න; මම තුඹේ හඬට ඇහුම්කන්දී
36 තුඹ පිළිගතිමියි කීවේය. අබීගායිල්
නාබල් ළඟට පැමිණිවිට, රාජ මංගල්‍යයක්
මෙන් ඔහු තමාගේ ගෙදර මංගල්‍යයක්
පවත්වමින් සිටියේය; තවද නාබල්ගේ
සිත ප්‍රීතිමත්ව තිබුණේය, මක්නිසාද ඔහු
හොඳටම මත්වී සිටියේය. එබැවින්
පසුවදා එළිවෙන තුරු ඈ කිසිවක් ඔහුට
දැන්නුවේ නැත. පසුවදා නාබල්ගේ වෙරි 37
සිඳුණු කල ඔහුගේ භාර්යාව ඔහුට මේ
කාරණා දැන්නුවාය, එවිට ඔහුගේ සිත
ඔහු තුළ කිඳාගොස් ඔහු ගලක් මෙන්
විය. ඊට දස දවසකට පමණ පසු 38
**ස්වාමීන්වහන්සේ** නාබල්ට පහරදුන්-
සේක, ඔහු මළේය. නාබල් මැරුණු 39
බව දවිත් අසා: නාබල් අතින් මට වුණ
නින්දාව ගැන යුක්තිය කළාවූ, තමන්ගේ
මෙහෙකරුවා නපුරෙන් වැළැක්වූවාවූ
**ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා වේවා.
**ස්වාමීන්වහන්සේ** නාබල්ගේ නපුරුකම්
ඔහුගේ හිස පිටටම හැරවූසේකැයි කීය.
දවිත් අබීගායිල් තමාට භාර්යාව කොට
පාවාගන්නා පිණිස ඈ සමග කථාකරන්ට
පණිවිඩකාරයන් හැරියේය. දවිත්ගේ 40
සේවකයෝ කර්මෙල්හි අබීගායිල් ළඟට
පැමිණ ඈට කථාකරමින්: දවිත් තමාට
භාර්යාව වීමට තුඹ කැඳවාගෙන යන
පිණිස තුඹ වෙතට අප එවූවේයයි
කීවෝය. ඈද නැගිට මුහුණින් බිමට 41
නැමී: ඔබගේ දාසී මාගේ ස්වාමියාගේ
සේවකයන්ගේ පාද සෝදන්ට දාසියකැයි
කීවාය. එවිට අබීගායිල් ඉක්මන්කර 42
කොටළුවෙකු පිට නැගී පිටත්වුණාය,
ඇගේ තරුණියෝ පස්දෙනෙක්ද ඈ
අනුව ගියෝය; එසේ ඈ දවිත්ගේ
පණිවිඩකාරයන් කැටුව ගොස් ඔහුගේ
භාර්යාව වූවාය. දවිත් යෙස්‍රෙයෙල්හි 43
අහිනොවම්ද පාවාගත්තේය; ඔවුන්
දෙදෙනාම ඔහුට භාර්යාවවෝය. සාවුල් 44
විසින් දවිත්ගේ භාර්යාවවූ තමාගේ දුවවූ
මීකල් ගල්ලීම්හි විසූ ලායිෂ්ගේ පුත්‍රවූ
පල්තීට දෙනලද්දීය.

## දවිත් විසින් දෙවෙනි වර සාවුල් ගැළවීම

26 සීප්වරු ගිබියාහි සිටි සාවුල්
ළඟට ඇවිත්: දවිත් මරුකතර
ඉදිරියේ තිබෙන හකීලා හෙලේ සැඟවී
ඉන්නවා නොවේදැයි කීවෝය. එවිට 2

සාවුල් පිටත්වී, ඉශ්‍රායෙල්ගෙන් තෝරා-
ගත් මනුෂ්‍යයන් තුන්දහසක් ඇතුව ශීප්
කාන්තාරයෙහි දාවිත් සොයන පිණිස
3 ශීප් කාන්තාරයට ගියේය. සාවුල්
මරුකතර ඉදිරිපිට මාර්ගය ළඟ තිබෙන
හකීලා හෙලේ කූඩාරම් ගසාගත්තේය.
එහෙත් දාවිත් කාන්තාරයෙහි සිටියේය,
සාවුල් තමා පස්සේ කාන්තාරයට ඇවිත්
4 සිටින බව ඔහු දුටුවේය. ඒ නිසා
දාවිත් ඔත්තුකාරයන් යවා සාවුල් ඇවිත්
5 සිටිනවා සැබෑ බව දැනගත්තේය. එවිට
දාවිත් පිටත්වී සාවුල් කූඩාරම් ගසාගත
සිටි ස්ථානයට ඇවිත් සාවුල්ද ඔහුගේ
සේනාපතිවූ නේර්ගේ පුත්‍රවූ අබ්නේර්ද
නිදා උන් ස්ථානය දුටුවේය. සාවුල්
ගැල් තිබුණු ස්ථානයේ වැදහොත්තේය,
සෙනඟ ඔහු වටකර කූඩාරම් ගසා-
6 ගන සිටියෝය. එවිට දාවිත් හිත්තීය
අහිමෙලෙක්ටත් ශෙරුයාගේ පුත්‍රවූ,
යෝවාබ්ගේ සහෝදරවූ අබිෂයිටත්
කථාකොට: සාවුල් ළඟට මා සමඟ
අන්දයමට යන්නේ කවුදැයි ඇසුවේය.
මම ඔබ සමඟ යමියි අබිෂයි කීවේය.
7 මෙසේ දාවිත්ද අබිෂයිද රාත්‍රියෙහි සෙනඟ
ළඟට පැමිණි විට, සාවුල් තමාගේ
හෙල්ලය තමාගේ හිස ළඟ බිම සිටුවා,
ගැල් තිබුණු ස්ථානයේ නිදාඉන්නවා
දුටුවෝය. අබ්නේර් සහ සෙනඟ ඔහු
8 වටකර නිදාඋන්නෝය. එවිට අබිෂයි
දාවිත්ට කථාකොට: දෙවියන්වහන්සේ
අද ඔබගේ සතුරා ඔබ අතට
පාවාදුන්සේක. එබැවින් දැන් එක
පහරකින් හෙල්ලයෙන් ඔහු බිමටම
ඇනදමන්ට මට අවසර දුනමැනවි,
ඔහුට පහර දෙකක් නොගසන්නෙමියි
9 දාවිත්ට කීය. දාවිත් කථාකොට: ඔහු
විනාශනොකරන්න. **ස්වාමීන්වහන්සේගේ**
අභිෂේකලත් තැනැත්තාට විරුද්ධව
තමාගේ අත දිගුකර නිර්දෝෂව සිටින්ට
පුළුවන් කාටදැයි අබිෂයිට කීවේය.
10 තවද දාවිත් කියනුයේ: **ස්වාමීන්වහන්සේ**
ජීවමාන බව සැබෑවා සේම **ස්වාමීන්-
වහන්සේ** ඔහුට පහර දෙනසේක;
නැතහොත් ඔහු මැරෙන දවස
පැමිණෙන්නේය; නොහොත් ඔහු යුද්ධයට
ගොස් නාස්තිවන්නේය. මාගේ අත 11
**ස්වාමීන්වහන්සේගේ** අභිෂේකලත්
තැනැත්තාට විරුද්ධව දිගුකිරීමෙන්
**ස්වාමීන්වහන්සේ** මා වලක්වනසේක්වා.
එහෙත් ඔහුගේ හිස ළඟ තිබෙන
හෙල්ලයත් වතුර භාජනයත් අරගනින්න,
අපි යමුයයි කීවේය. මෙසේ දාවිත් 12
සාවුල්ගේ හිස ළඟ තිබුණු හෙල්ලයත්
වතුර භාජනයත් ගෙන අහක්ව ගියේය;
ඒක කවුරුවත් දුටුවේ නැත, දැනගත්-
තෙත් නැත, කිසිවෙක් පිබිදුණෙත් නැත.
සියල්ලෝම නිදාඋන්නෝය; මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** කෙරෙන් බර නින්දක්
ඔවුන්ට පැමිණ තිබුණේය. එවිට දාවිත් 13
අනික් පැත්තට ගොස්, දෙගොල්ල අතරේ
මහත් ඉඩ ප්‍රමාණයක් ඇති වන ලෙස
කන්ද මුදුනේ දුරින් සිටියේය. තවද දාවිත් 14
සෙනඟටත් නේර්ගේ පුත්‍රවූ අබ්නේර්ටත්
හඬගසා: අබ්නේර්, නුඹ උත්තර නො-
දෙන්නෙහිදැයි කීය. එවිට අබ්නේර්
උත්තරදෙමින්: රජ්ජුරුවන්ට හඬගසන
නුඹ කවුදැයි ඇසුවේය. දාවිත්ද: නුඹ 15
වික්‍රමාන්විත මනුෂ්‍යයෙක් නොවේද?
ඉශ්‍රායෙල්හි නුඹ හා සමාන කෙනෙක්
කවුද? නුඹේ ස්වාමිවූ රජ්ජුරුවන් නුඹ
විසින් රැකවල් නොකළේ මක්නිසාද?
නුඹේ ස්වාමිවූ රජ්ජුරුවන් නසන පිණිස
සෙනඟගෙන් කෙනෙක් ඇතුල්වූයේය.
නුඹ කළ මේ දෙය හොඳ නැත. 16
නුඹලා **ස්වාමීන්වහන්සේගේ** අභිෂේකලත්
තැනැත්තා වන නුඹලාගේ ස්වාමියා
රැකවල් නොකළ නිසා **ස්වාමීන්වහන්සේ**
ජීවමාන බව සැබෑවා සේම නුඹලා
මරණයට සුදුස්සෝය. රජ්ජුරුවන්ගේ
හිස ළඟ තිබුණු හෙල්ලයත් වතුර
භාජනයත් දැන් කොහේද කියා
බලාපන්නැයි කීවේය. සාවුල් දාවිත්ගේ 17
හඬ ඇඳින: මාගේ පුත්‍රවූ දාවිත්, ඔය
නුඹේ හඬදැයි ඇසීය. දාවිත්ද: මාගේ
ස්වාමිවූ රජ්ජුරුවනි, ඒ මාගේ හඬය.
මාගේ ස්වාමියා තමාගේ මෙහෙකරුවා 18
පස්සේ එළවාගන එන්නේ මක්නිසාද?

මා කළේ මොකද? මා අත තිබෙන
19 දෝෂය මොකද? එබැවින් දැන් මාගේ
ස්වාමිවූ රජ්ජුරුවෝ තමාගේ මෙහෙ-
කරුවාගේ වචන අසත්වා. ඉදින් ඔබව
මට විරුද්ධව පෙළෙඹවූවේ **ස්වාමීන්-**
**වහන්සේ** නම්, උන්වහන්සේ පූජාවක්
පිළිගන්නාසේක්වා. නුමුත් මනුෂ්‍ය පුත්‍ර-
යෝ නම්, ඔව්හු **ස්වාමීන්වහන්සේ** ඉදිරි-
යෙහි ශාප ලත්තෝ වෙත්වා; මක්නිසාද:
තුඹ ගොස් අන් දෙවිවරුන්ට සේවය-
කරපන්න කියා, මා දැන් **ස්වාමීන්-**
**වහන්සේගේ** උරුමයට බැඳී නොසිටින
හැටියට ඔව්හු මා පන්නා දැමුවෝය.
20 නුමුත් **ස්වාමීන්වහන්සේගේ** මුහුණ
ඉදිරිපිටින් දුරුව මාගේ ලේ බිම නො-
වැටේවා. මක්නිසාද යමෙක් කඳුවල
වටුවෙකු පස්සේ එළවාගන යන්නාක්
මෙන් ඉශ්‍රායෙල් රජ්ජුරුවෝ බලූ
මැක්කෙක් සොයන්ට පිටතට ආවෝ-
21 යයි කීවේය. එවිට සාවුල්: මම
පව්කෙළෙමි. මාගේ පුත්‍රවූ දාවිත්, හැරී
වරෙන්න. මාගේ ප්‍රාණය අද දවසේ
තුඹට අනර්ඝව පෙනුණු නිසා තුඹට
තවත් හිංසා නොකරන්නෙමි. මම
මෝඩයෙක් මෙන් හැසිර බොහෝසේ
22 මුළාවීමියි කීවේය. දාවිත් උත්තර-
දෙමින්: රජ්ජුරුවන්ගේ හෙල්ලය මෙන්න!
යෞවනයන්ගෙන් එක්කෙනෙක් මෙහි
23 ඇවිත් ඒක ගෙන ගියාවේ. **ස්වාමීන්-**
**වහන්සේ** එක එක තැනැත්තාට තම
තමාගේ ධර්මිෂ්ඨකමද විශ්වාසකමද
ලෙස විපාක දෙනසේක්වා. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** අද ඔබ මා අතට
පාවාදුන් නුමුත් මම **ස්වාමීන්වහන්සේගේ**
අභිෂේකලත් තැනැත්තාට විරුද්ධව
මාගේ අත දිගුකරන්ට නොකැමැතිවීමි.
24 ඉතින් අද දවසේ ඔබගේ ප්‍රාණය මට
උතුම්ව පෙනුණාක් මෙන් මාගේ ප්‍රාණයද
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
උතුම්ව පෙනේවා, උන්වහන්සේ සියලු
විපත්තිවලින් මා ගළවනසේක්වයි කීවේය.
25 එවිට සාවුල් කථාකොට: මාගේ පුත්‍රවූ
දාවිත්, තුඹට ආශීර්වාදවේවා. තුඹ මහත්
දේ ඉෂ්ටකරන්නෙහිය, ඒකාන්තයෙන්
ජයගන්නෙහියයි දාවිත්ට කීවේය. පසුව
දාවිත් යන්ට ගියේය, සාවුල්ද තමාගේ
ස්ථානයට හැරී ගියේය.

## දාවිත් පිලිස්තියවූ ආකීෂ් රජුගේ පළාතේ විසීම

27 දාවිත් තමාගේ සිතින් කල්පනා
කොට: යම් දවසක සාවුල් අතින්
මට මරණය පැමිණෙන්නේය. පිලිස්ති-
වරුන්ගේ දේශයට ගැළවීයාම මිස වෙන
හොඳ විධියක් මට නැත; සාවුල්ද මුළු
ඉශ්‍රායෙල් සීමාව තුළේ තවත් මා
සෙවීමෙන් මත්තට වලකිනවා ඇත.
මෙසේ ඔහුගේ අතින් ගැළවෙන්ට මට
පුළුවන්වේයයි කීවේය. එවිට දාවිත්ද 2
ඔහු සමග සිටි මනුෂ්‍යයන් හයසියයද
පිටත්වී මායොක්ගේ පුත්‍රවූ ගාත්හි
රජවූ ආකීෂ් වෙතට ගියෝය. දාවිත් 3
සහ ඔහුගේ මිනිස්සුද ඔවුනොවුන්ගේ
පවුල්ද දාවිත් සමග ඔහුගේ භාර්යාවන්
දෙදෙනා වන යෙස්‍රෙයෙලිය අහිනොවම්
සහ නාබල්ගේ භාර්යාව ව සිටියාවූ
කර්මෙලිය අබීගායිල්ද ආකීෂ් වෙත
ගාත්හි විසුවෝය. දාවිත් ගාත්ට පලාගිය 4
බව සාවුල්ට දන්වනලද්දේය. ඔහු තවත්
ඔහු නොසෙවූවේය.
තවද දාවිත් ආකීෂ්ට කථාකොට: 5
ඔබගේ ඇස් හමුයෙහි මට කරුණාව
ලැබී තිබේනම් මට වාසයකිරීමට පිටිසර
නුවරක යම් ස්ථානයක් ලැබේවා. ඔබගේ
මෙහෙකරුවා ඔබ සමග රජ නුවර
වාසයකරන්නේ මක්නිසාදැයි කීවේය.
ආකීෂ්ද ඒ දවසේදී ශික්ලග් නුවර ඔහුට 6
දුන්නේය. ඒ නිසා ශික්ලග් අද දක්වා
යූදාහි රජවරුන්ට අයිතිය.
දාවිත් පිලිස්තිවරුන්ගේ රටේ විසූ 7
කාලය පුරා එක් අවුරුදු සාරමාසයක්ය.
දාවිත්ද ඔහුගේ මිනිස්සුද පිටත්ව 8
ගෙෂූර්වරුන්ටද ගිර්ශිවරුන්ටද අමලෙක්-
වරුන්ටද විරුද්ධව ගියෝය. ඒ ජාතීහු
ෂූර්ට යන මාවත දක්වාද මිසරදේශය
දක්වාද පුරාණයේ සිට දේශයේ වැසියෝ
වූහ. දාවිත් පුරුෂයෙක්වත් ස්ත්‍රියෙක්වත් 9

ඉතුරු නොකර දේශයේ සියල්ලන්
මරාදමා, බැටළුවන්ද ගවයින්ද කොටළු-
වන්ද ඔටුවන්ද වස්ත්‍රද අරගන හැරී
10 ආකීෂ් ළඟට ආවේය. අද නුඹලා කොයි
පළාතට විරුද්ධව ගියහුදැයි ආකීෂ්
ඇසුවේය. දාවිත්ද: යූදාහි දකුණු දිශාවටද
යෙරාමෙයෙල්වරුන්ගේ දකුණු දිශාවටද
කේනිවරුන්ගේ දකුණු දිශාවටද විරුද්ධව
11 ගියෙමුයයි කීවේය. ගාත්ට ගෙන එන
පිණිස දාවිත් පුරුෂයෙක්වත් ස්ත්‍රියෙක්වත්
ඉතුරුකළේ නැත; මක්නිසාද: දාවිත් මේ
මේ ආකාර කළේය කියා ඔවුන් අපට
විරුද්ධව කාරණා දන්වන්ට පුළුවනැයි
ඔහු සිතුවේය. ඔහු පිලිස්තිවරුන්ගේ රටේ
සිටි කාලය මුළුල්ලෙහි ඔහුගේ හැසිරීම
12 එයාකාරව තිබුණේය. ආකීෂ් දාවිත්
විශ්වාසකොට: ඔහු තමාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්වරුන් තමාට මුළුමනින්
පිළිකුල්කරන්ට සලස්වාගත් බැවින් ඔහු
සැම කල්හිම මාගේ මෙහෙකරුවා
වන්නේයයි කීවේය.

## සාවුල් සහ ඒන්-දෝර්හි ආත්ම බන්ධනකාරී

28 තවද ඒ දවස්වලදී පිලිස්තිවරු
ඉශ්‍රායෙල්ට විරුද්ධව සටන්
කරන පිණිස තමුන්ගේ සේනා යුද්ධයට
රැස්කළෝය. ආකීෂ් දාවිත්ට කථාකොට:
නුඹ හා නුඹේ මිනිසුන් මා සමග සමුදුව
අතරේ යන්ට ඕනෑ බව දැනගනින්-
2 නැයි කීවේය. දාවිත්ද: එබැවින් ඔබගේ
මෙහෙකරුවා කරන දෙය ඔබ දැන-
ගන්නවා ඇතැයි ආකීෂ්ට කීය. ආකීෂ්ද:
එබැවින් නුඹ සැම කල්හිම මාගේ
හිස රක්ෂාකරන්නා කොට පත්කරමියි
දාවිත්ට කීවේය.
3 මේ කාලයට ප්‍රථම සාමුවෙල් මළේය.
සියලු ඉශ්‍රායෙල්වරු ඔහු ගැන වැලපී
ඔහුගේම නුවරවූ රාමාහි ඔහු තැන්පත්
කළෝය. සාවුල් ආත්ම බන්ධනකාරයන්ද
අනාවිනකාරයන්ද දේශයෙන් පහකරදමා
තිබුණේය. පිලිස්තිවරු රැස්වී ඇවිත් 4
ෂූනෙම්හි කඳවුරු බැඳගත්තෝය. සාවුල්ද
සියලු ඉශ්‍රායෙල්වරුන් රැස්කෙළේය, ඔව්හු
ගිල්බෝවාහි කඳවුරු බැඳගත්තෝය.
සාවුල් පිලිස්තිවරුන්ගේ සේනාව දැක 5
භයවිය, ඔහුගේ සිතද බොහෝසෙයින්
වෙවුලුවේය. සාවුල් **ස්වාමීන්වහන්සේගෙන්** 6
විචාළ කල **ස්වාමීන්වහන්සේ** ස්වප්න-
වලින්වත් ඌරිම්වලින්වත් අනාගත-
වක්තෘන් ලවාවත් ඔහුට උත්තර නුදුන්-
සේක. එවිට සාවුල් තමාගේ සේවක- 7
යන්ට කථාකොට: ආත්ම බන්ධනකාර
ස්ත්‍රියෙක් මට සොයාපල්ලා, මම ඈ
ළඟට ගොස් ඈගෙන් විචාරන්නෙමියි
කීවේය. ඔහුගේ සේවකයෝද: ආත්ම
බන්ධනකාර ස්ත්‍රියෙක් ඒන්-දෝර්හි
සිටිනවායයි ඔහුට කීවෝය. සාවුල් 8
අමුතු වස්ත්‍ර ඇඳ, වෙස්වළාගෙන, මිනිසුන්
දෙදෙනෙකු සමග ගොස්, රාත්‍රියේ ඒ
ස්ත්‍රී වෙතට පැමිණ ඈට කථාකොට:
ආත්ම බන්ධනයෙන් මට පේන කියාපන්න,
මා නුඹට කියන තැනැත්තා මට නැගුප්පවා
දියන්නැයි කීවේය. ස්ත්‍රීද: සාවුල් කළ 9
දෙය එනම් ඔහු ආත්ම බන්ධනකාරයන්
සහ අනාවිනකාරයන් දේශයෙන් සිඳදැමූ
හැටි නුඹ දන්නෙහිය. එසේ නම් මා
නසන පිණිස නුඹ මාගේ ප්‍රාණයට
මලපතක් තබන්නේ මක්නිසාදැයි ඔහුට
කීවාය. **ස්වාමීන්වහන්සේ** ජීවමාන බව 10
සැබෑවාසේම මේ කාරණය නිසා නුඹට
කිසි දඬුවමක් නොවන්නේයයි සාවුල්
ඈට කියා **ස්වාමීන්වහන්සේ** ගැන ඈට
දිවුළේය. එවිට ඒ ස්ත්‍රී: මම නුඹට 11
කවුරු නැගුප්පවා ගෙනෙම්දැයි කීවාය.
ඔහු: සාමුවෙල් මට නැගුප්පවා
ගෙනෙන්නැයි කීය. ඒ ස්ත්‍රී සාමුවෙල් 12
දුටු කල මහත් හඬින් කෑගැසුවාය. ඈ
සාවුල්ට කථාකොට: ඔබ මා රැවටුවේ
මක්නිසාද? ඔබ නම් සාවුල්යයි ඔහුට
කීවාය. රජද: භයනොවෙන්නැයි කියා- 13
නුඹට පෙනෙන්නේ කුමක්දැයි ඈගෙන්

ඇසුවේය. දෙවිකෙනෙක් පොළොවෙන් නැගී
එනවා මට පෙනේයයි ස්ත්‍රී සාවුල්ට
14 කීවාය. ඔහුගේ හැටි කොහොමදැයි ඔහු
ඇගෙන් ඇසුවේය. ඈ: මහලු මනුෂ්‍යයෙක්
නැගීඑන්නේය; ඔහු සළුවක් පෙරවාගෙන
ඉන්නේයයි කීවාය. ඒ සාමුවෙල් බව
සාවුල්ට දැනී ඔහු මුහුණින් බිමට
15 නැමී වැන්දේය. එවිට සාමුවෙල්: මා
නැගිටවීමෙන් තුඹ මා කැලඹුවේ
මක්නිසාදැයි සාවුල්ගෙන් ඇසුවේය.
සාවුල්ද: මම තද අමාරුවට පත්ව
සිටිමි; පිලිස්තිවරු මට විරුද්ධව
යුද්ධකෙරෙති, දෙවියන්වහන්සේ මා
කෙරෙන් අහක්ව ගියසේක, උන්වහන්සේ
දැන් අනාගතවක්තෘන් කරණකොට-
ගෙනවත් ස්වප්නවලින්වත් මට උත්තර
දෙන්නේ නැත. එබැවින් මා විසින් කළ
යුතු දේ ඔබ මට දන්වන පිණිස ඔබට
16 අඬගැස්වීමියි කීවේය. එවිට සාමුවෙල්:
**ස්වාමීන්වහන්සේ** තුඹ කෙරෙන් අහක්වී
තුඹට විරුද්ධව සිටිද්දී තුඹ මාගෙන්
17 අසන්නේ මක්නිසාද? **ස්වාමීන්වහන්සේ**
මා ලවා කියෙවූහැටියට ඉෂ්ටකළසේක.
**ස්වාමීන්වහන්සේ** තුඹ අතින් රජකම
පැහැරගෙන තුඹේ අසල්වාසීවූ දවිත්ට
18 දුන්සේක. තුඹ **ස්වාමීන්වහන්සේගේ**
බලවත් උදහස අමලෙක්වරුන් කෙරේ
ඉෂ්ට නොකර උන්වහන්සේගේ හඬට
අකීකරුවූ බැවින් උන්වහන්සේ අද දවසේ
19 තුඹට මේ දෙය කළසේක. ඇරත්
**ස්වාමීන්වහන්සේ** පිලිස්තිවරුන් අතට
තුඹ සමග ඉශ්‍රායෙල්වරුන් පාවාදෙන-
සේක. හෙට තුඹ සහ තුඹේ පුත්‍රයන් මා
සමග සිටිනවා ඇත. **ස්වාමීන්වහන්සේ**
ඉශ්‍රායෙල් සමූදුවත් පිලිස්තිවරුන් අතට
20 පාවාදෙනසේකැයි කීවේය. එවිට සාවුල්
එකෙණෙහිම බිම වැතිර සාමුවෙල්ගේ
වචන නිසා අතිශයින් භයවූයේය. ඔහු
එද මුළු දවාලෙහිවත් රාත්‍රියෙහිවත් කෑම
නොකෑ නිසා ඔහු තුළ කිසි ශක්තියක්
21 නොතිබුණේය. ඒ ස්ත්‍රී සාවුල් ළඟට
ඇවිත්, ඔහු ඉතා කැළඹී සිටි බව දැක
ඔහුට කථාකොට: ඔබගේ දසීවූ මම
ඔබගේ හඬට කීකරුව මාගේ ජීවිතය
නොසලකා ඔබ මට කී වචන ඇසීමි.
ඒ නිසා ඔබත් දැන් ඔබගේ දසීගේ වචන 22
අසා, ඔබ ඉදිරියෙහි රොටි කෑල්ලක්
තබන්ට මට අවසර දී, ඔබ මාර්ගයෙහි
යන කල ඔබට ශක්තිය ඇතිවෙන පිණිස
කෑව මැනවැයි කීවාය. නුමුත් ඔහු 23
අකැමැතිව: මම නොකමියි කීය. නුමුත්
ඔහුගේ සේවකයෝද ඒ ස්ත්‍රීද ඔහුට
පෙරැත්තකළ නිසා ඔහු ඔවුන්ගේ හඬට
ඇහුම්කන්දී බිමින් නැගිට ඇඳේ
හිඳගත්තේය. ඒ ස්ත්‍රීට තරකරපු වස්සෙක් 24
ගෙදර උන්නේය; ඈ ඉක්මනින් ඌ
මරා, පිටි අරන් අනා, මුහුන් නොදැමූ
රොටි පුලුස්සා, ඒවා සාවුල්ද ඔහුගේ 25
සේවකයන්ද ඉදිරියෙහි තැබුවාය; ඔව්හුද
කා නැගිට ඒ රාත්‍රියේම පිටත්ව ගියෝය.

## පිලිස්තිවරුන් විසින් දවිත් නෙරපා හැරීම

29 පිලිස්තිවරු තමුන්ගේ සියලු
සමූදවල් අපේක්ට රැස්කළෝය.
ඉශ්‍රායෙල්වරුද යෙස්‍රෙයෙල්හි තිබෙන
උල්පත ළඟ කඳවුරු බැඳගත්තෝය.
පිලිස්තිවරුන්ගේ අධිපතීහු සිය ගණන්ද 2
දහස් ගණන්ද වශයෙන් ආවෝය. දවිත්ද
ඔහුගේ මිනිස්සුද ආකීෂ් සමග ඔවුන්ට
පස්සෙන් ආවෝය. එවිට පිලිස්තිවරුන්ගේ 3
අධිපතීහු: මේ හෙබ්‍රෙව්වෝ මෙහි
මක්කෙරෙද්දැයි ඇසුවෝය. ආකීෂ්
පිලිස්තිවරුන්ගේ අධිපතිවරුන්ට කථා-
කොට: මොහු ඉශ්‍රායෙල්වරුන්ගේ
රජවූ සාවුල්ගේ සේවකයෙක්ව සිටිය
දවිත් නොවේද? මොහු දැන් කලක
නොහොත් අවුරුදු ගණනක සිට මා
සමග සිටියි, ඔහු මට එකතුවුණ ද
පටන් අද දක්වා ඔහු අත කිසි
වරදක් මට සම්බවුණේ නැතැයි කීවේය.
එහෙත් පිලිස්තිවරුන්ගේ අධිපතීහු ඔහු 4
කෙරෙහි කෝපවී ඔහුට කථාකොට: ඒ
මනුෂ්‍යයාට තුඹ නියමකළ ස්ථානයට

හැරී යන පිණිස ඔහු යන්ට හරින්න,
ඔහු යුද්ධයේදී අපට විරුද්ධකාරයෙකු
නොවෙන පිණිස ඔහු අප සමග යුද්ධයට
නොයේවා. මේ මිනිහා නැවත තමාගේ
ස්වාමියා හා සමගි වෙන්නේ මොකකින්ද?
මේ මිනිසුන්ගේ හිස් කරණකොටගෙන
නොවේද?
5 සාවුල් තෙමේ දහස් ගණන්ද
දවිත් දසදහස් ගණන්ද මැරීයයි
කියමින් ඔවුන් නැටුම් ඇතුව එකිනෙකාට
ගීතිකාකළේ මේ දවිත් ගැන නොවේදැයි
6 කීවෝය. එවිට ආකීෂ් දවිත් කැඳවා
ඔහුට කථාකොට: **ස්වාමීන්වහන්සේ**
ජීවමාන බව සැබෑවාසේම නුඹ අවංකව
හැසුරුණෙහිය, නුඹ සමුදව අතරෙහි
මා සමග ආ ගිය හැටි මට හොඳව
පෙනුණේය. නුඹ මා ළඟට ආ ද
පටන් අද දක්වා නුඹ අත කිසි නපුරක්
මට සම්බවුණේ නැත. එසේ වුවත්
7 අධිපතීන් නුඹට කැමති නැත. එබැවින්
පිලිස්තිවරුන්ගේ අධිපතීන් අප්‍රසන්න-
නොවෙන පිණිස දැන් සමාදානයෙන් හැරී
8 පලයන්නැයි කීවේය. දවිත්ද: මම කුමක්
කෙළෙම්ද? මා ඇවිත් මාගේ ස්වාමිවූ
රජ්ජුරුවන්ගේ සතුරන්ට විරුද්ධව
සටන්කරන්ට බැරි හැටියට මා ඔබ
ඉදිරියට පැමුණුණ ද පටන් අද දවසෙ
දක්වා ඔබගේ මෙහෙකරුවා අත
සම්බවුණ වරද මොකදැයි ආකීෂ්ගෙන්
9 ඇසුවේය. ආකීෂ් උත්තරදෙමින්: ඒක
දනිමි, දෙවියන්වහන්සේගේ දූතයෙකු
මෙන් නුඹ මාගේ ඇස් හමුයෙහි යහපත්
බව දනිමි. නුමුත් පිලිස්තිවරුන්ගේ
අධිපතීහු—ඔහු අප සමග යුද්ධයට
10 නොයන්නේයයි කීවෝය. එබැවින් නුඹ
සමග ආ නුඹේ ස්වාමියාගේ සේවකයන්
සමග අලුයම නැගිට එළිවන කොටම
11 පිටත්වෙයන්නැයි දවිත්ට කීවේය, මෙසේ
දවිත්ද ඔහුගේ මිනිස්සුද පිලිස්තිවරුන්-
ගේ දේශයට හැරී යන පිණිස උදයම
පිටත්වෙන්ට නැගුටුණෝය. පිලිස්තිවරු
යෙස්‍රෙයෙල්ට ගියෝය.

## අමලෙක්වරු ශික්ලග් අල්ලා ගැනීම. දවිත් ඔවුන් විනාශකිරීම

30
තවද දවිත් හා ඔහුගේ මිනිස්සු
තුන්වෙනි ද ශික්ලග්ට පැමුණුණෝය,
ඊට ප්‍රථම අමලෙක්වරු දකුණු දිශාවටත්
ශික්ලග්ටත් විරුද්ධව ඇවිත්, ශික්ලග්ට
පහරදී, ඒක ගින්නෙන් පුලුස්සා දමා,
එහි සිටි ස්ත්‍රීන්ද ලොකු කුඩා සියල්ලන්ද 2
වාලට ගෙන, කිසිවෙකු නොමරා ඔවුන්
අල්ලාගන යන්ට ගියෝය. දවිත්ද ඔහුගේ 3
මිනිස්සුද නුවරට පැමිණි කල, ඒක
ගිනිලා තිබෙන බවත් ඔවුන්ගේ
භාර්යාවන්ද පුත්‍රයන්ද දූවරුන්ද වාලට
අසුවී ගිය බවත් දුටුවෝය. එවිට 4
දවිත්ද ඔහු සමග සිටි සෙනඟද ඔවුන්ට
තවත් අඬන්ට පුළුවන්කම නැතිවෙන
තුරුම ශබ්දනගා ඇඬුවෝය. දවිත්ගේ 5
භාර්යාවන් දෙදෙනා වන යෙස්‍රෙයෙලිය
අහිනොවම් සහ කර්මෙලිය නාබල්ගේ
භාර්යාව ව සිටි අබීගායිල්ද වාලට
අසුවී ගියෝය. දවිත් තද අමාරුවට 6
පත්විය; මක්නිසාද මුළු සෙනඟගේ සිත්
තම තමුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද ගැන
ශෝකවුණ බැවින් ඔහුට ගල්ගසන්ට
සෙනඟ කථාකළෝය. නුමුත් දවිත්
තමාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තුළ
ශක්තිය උපදවාගත්තේය.
ඒඵෝද් සැට්ටය මා ළඟට ගෙනෙන්නැයි 7
දවිත් අහිමෙලෙක්ගේ පුත්‍රවූ අබියාතර්
පූජකයාට කීවේය. අබියාතර් ඒඵෝද්
සැට්ටය දවිත් ළඟට ගෙනාවේය. මම 8
මේ සමුදව ලුහුබැඳයෙම් නම් ඔවුන්
කරා පැමිණෙන්ට මට පුළුවන් වේදැයි
දවිත් **ස්වාමීන්වහන්සේගෙන්** විචාළේය.
උන්වහන්සේ ඔහුට උත්තරදෙමින්:
ලුහුබැඳ පලයන්න. මක්නිසාද නුඹ
සැබවින් ඔවුන් කරා පැමිණ නොවරදවාම
සියල්ල නැවත ලබාගන්නවා ඇතැයි
කීසේක. එවිට දවිත්ද ඔහු සමග 9
සිටි මිනිසුන් හසියයද ගියෝය. ඔවුන්
බෙසෝර් ඔය ළඟට පැමුණුණු විට
නවත්වායන්ට සිදුවූ අය එහි නැවතුණෝය.

10 එහෙත් දවිත් සහ මිනිසුන් හාරසියයක්
එළවාගෙන ගියෝය. බෙසෝර් ඔයෙන්
එගොඩට යන්ට බැරිතරම් වෙහෙසව
සිටියාවූ මිනිසුන් දෙසියයක්
11 නැවතුණෝය. මිසර මනුෂ්‍යයෙක් පිටතදී
ඔවුන්ට සම්බවී, ඔහු දවිත් ළඟට
ගෙනවුත් කන්ට රොටිද බොන්ට වතුරද
12 ඔහුට දුන්නෝය. තවද ඔව්හු අත්තික්කා
කැටියකින් කැබෙල්ලක්ද මුද්‍රිකඵල
පොකුරු දෙකක්ද ඔහුට දුන්නෝය;
ඔහු කෑ පසු ප්‍රාණවත්විය. මක්නිසාද
ඔහු දවල් තුනකුත් රෑ තුනකුත් කෑම
13 කෑවේවත් වතුර බීවේත් නැත. නුඹ කාට
අයිතිද? කොතැනින් ආයෙහිදැයි දවිත්
ඔහුගෙන් ඇසුවේය. ඔහුද: මම අමලෙක්
මනුෂ්‍යයෙකුගේ වැඩකාරයෙක්ව සිටින
මිසරිය යෞවනයෙක්ය; තුන් දවසකට
ඉස්සර මට අසනීපවූ බැවින් මාගේ
14 ස්වාමියා මා අත්හැරදමා ගියේය. අපි
කෙරෙතිවරුන්ගේ දකුණු දිශාවටත් යූදට
අයිති පළාතටත් කාලෙබ්ගේ දකුණු
දිශාවටත් විරුද්ධව යුද්ධකෙළෙමුව;
ශික්ලග් ගින්නෙන් පුලුස්සා දැමීමුයයි
15 කීවේය. ඒ සමූහය ළඟට යන්ට නුඹ
මට මඟ පෙන්වනවාදැයි දවිත් ඔහුගෙන්
ඇසුවේය. ඔහුද: මා නොමරන හැටියටත්
මාගේ ස්වාමියාගේ අතට පාවානොදෙන
හැටියටත් දෙවියන්වහන්සේගේ නාමයෙන්
ඔබ මට දිවිරුම්දෙතොත් මම ඒ සමූහය
ළඟට පැමිණෙන්ට ඔබට මඟ පෙන්වමියි
16 කීවේය. තවද ඔහු විසින් ඒ ස්ථානයට
ඔහු පැමිණෙවූ විට ඔවුන් පිලිස්ති-
වරුන්ගේ දේශයෙනුත් යූද දේශයෙනුත්
ගත්තාවූ මහත්වූ මුළු කොල්ලය නිසා
කමින් බොමින් නටමින් බිම මුළුල්ලෙහිම
17 විසිර සිටියෝය. දවිත් ඇදිරි වේලාවේ
පටන් පසුවද සවස දක්වා ඔවුන්ට
පහරදුන්නේය. ඔටුවන් පිට නැගී
පලාගියාවූ යෞවනයන් හාරසියයක්
හැර ඔවුන්ගෙන් වෙන කිසිවෙක්
18 ගැළවුණේ නැත. මෙසේ දවිත් අමලෙක්-
වරුන් විසින් ගෙන ගිය සියල්ලත් තමාගේ
භාර්යාවන් දෙදෙනාත් ගළවාගත්තේය.
ලොකු කුඩා සියල්ලන්ගෙන්ද පුත්‍රයන්- 19
ගෙන්ද දූවරුන්ගෙන්ද කිසිවෙක්වත්
කොල්ලයවත් ඔවුන් ගත්තාවූ කිසිවක්වත්
අඩු නැතුව දවිත් සියල්ලම නැවත
ගෙනාවේය. සියලු එළු බැටළුවන්ද 20
ගවයින්ද දවිත් ගත්තේය, උන් අනික්
සිව්පාවුන්ට පෙරටුවෙන් දක්කමින්: මෙය
දවිත්ගේ කොල්ලයයයි කීවෝය. දවිත් 21
අනුව යන්ට බැරි ලෙස වෙහෙසව
සිටියාවූ, බෙසෝර් ඔය ළඟ සිටින්ට
ඇරියාවූ මිනිසුන් දෙසියය ළඟට දවිත්
පැමිණි විට ඔව්හු දවිත් සහ ඔහු සමඟ
සිටි සෙනඟගේ පෙරමගට ආවෝය.
දවිත් සෙනඟ ළඟට ආ කල ඔවුන්ට
ආචාර කෙළේය. එවිට දවිත් සමඟ ගිය 22
මිනිසුන් අතරෙන් නපුරුවූ *දුර්ජනවූ
මිනිසුන් සියල්ලෝ කථාකොට: අප
සමඟ නොගිය සියලු මිනිසුන්ට එක
එකා තම තමාගේ භාර්යාවද දරුවන්ද
අරගෙන යන පිණිස ඔවුන් දෙනවා මිස
අප විසින් ගළවාගත් කොල්ලයෙන්
කිසිවක් නොදෙමුයයි කීවෝය. එකල 23
දවිත්: මාගේ සහෝදරයෙනි, ස්වාමීන්-
වහන්සේ අපට දුන් දේවල් ගැන එසේ
නොකරල්ලා, උන්වහන්සේ අප ආරක්ෂා-
කර අපට විරුද්ධව ආවාවූ සමූහය අප
අතට පාවාදුන්සේක. මේ කාරණය 24
ගැන නුඹලාට ඇහුම්කන්දෙන්නේ කවුද?
යුද්ධයට යන අයගේ කොටස යම්සේද
බඩු ළඟ නවතින අයගේ කොටසත්
එසේම වන්නේය. ඔවුන් විසින් එක
සමානව බෙදගත යුතුයයි කීවේය.
තවද ඔහු මේ කාරණය එද පටන් අද 25
දක්වා ඉශ්‍රායෙල් කෙරෙහි පනතක් හා
නියෝගයක් කොට නියමකෙළේය.

දවිත් ශික්ලග්ට පැමුණුණු විට තමාගේ 26
මිත්‍රයන් වන යුදහි වැඩිමහල්ලන්ට
කොල්ලයෙන් කොටස් යවමින්: මෙන්න,
ස්වාමීන්වහන්සේගේ සතුරන්ගෙන් ගත්
කොල්ලයෙන් නුඹලාට තෑගියයි කියා

*බෙලියල් මිනිසුන්.

27 ඇරියේය; එසේ ඇරියේ බෙතෙල්හිද
දකුණු රාමොත්හිද යත්තිර්හිද;
28 අරෝයෙර්හිද සිප්මෝත්හිද එෂ්තෙ-
29 මොවාහිද; රාකාල්හිද යෙරමෙයෙල්-
වරුන්ගේ නුවරවලද කේනිවරුන්ගේ
30 නුවරවලද; හොර්මාහිද කෝර්-ආෂාන්හිද
31 අතාබ්හිද; හෙබ්‍රොන්හිද දවිත් සහ
ඔහුගේ මිනිසුන් ගැවසුණු සියලු තැන්වලද
සිටි වැඩිමහල්ලන්ටය.

## ගිල්බෝවාහිදී ඉශ්‍රායෙල් පරාජයවීම. සාවුල්ගේ මරණය

31 පිලිස්තිවරු වනාහි ඉශ්‍රායෙල්-
වරුන්ට විරුද්ධව යුද්ධ කළෝය.
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ පිලිස්තිවරුන්
ඉදිරියෙන් පලාගොස්, ගිල්බෝවා
කන්දේදී මැරුම්කා වැටුණෝය.
2 පිලිස්තිවරු සාවුල්ද ඔහුගේ පුත්‍රයන්ද
පස්සේ එළවාගන ගොස් සාවුල්ගේ
පුත්‍රයන්වූ යොනාතාන්ද අබිනාදබ්ද
3 මල්කී-ෂුවාද මැරුවෝය. සටන සාවුල්ට
විරුද්ධව බලවත් විය, දුනුවායෝ ඔහුට
ළංවූය; ඔහු දුනුවායන් නිසා තද
4 අමාරුවට පත්විය. එවිට සාවුල් තමාගේ
ආයුධ ගෙනයන්නාට කථාකොට: අර
අචර්මඡේදිතයන් ඇවිත් මට ඇන
අවනම්බු නොකරන පිණිස තුඹේ කඩුව
ඇද මට ඇනපන්නැයි කීය. නුමුත් ඔහුගේ
ආයුධ ගෙනයන්නා එසේ කරන්ට
කැමතිවුණේ නැත; මක්නිසාද ඔහු ඉතා
භයව සිටියේය. එවිට සාවුල් තමාගේ
5 කඩුව රැගෙන එය පිට වැටුණේය. සාවුල්
මැරුණු බව ඔහුගේ ආයුධ ගෙනයන්නා
දුටු විට ඔහුද තමාගේ කඩුව පිට වැටී
ඔහු සමග මෙළේය. මෙසේ සාවුල්ද 6
ඔහුගේ පුත්‍රයන් තුන්දෙනාද ඔහුගේ
ආයුධ ගෙනයන්නාද ඔහුගේ සියලු
මිනිස්සුද ඒ දවසේදී එකවිටම
මැරුණෝය. ඉශ්‍රායෙල් මනුෂ්‍යයන් පලා 7
ගිය බවත් සාවුල්ද ඔහුගේ පුත්‍රයන්ද
මැරුණ බවත් මිටියාවතට මෙහායින්ද
යොර්දනෙන් මෙගොඩද සිටි ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝ දැක නුවරවල් අත්හැර
පලාගියෝය; පිලිස්තිවරු ඇවිත් එහි
වාසයකළෝය.
තවද පසුවද මැරුම්කෑ අයගෙන් 8
කොල්ලය ගන්ට පිලිස්තිවරුන් ආ කල
සාවුල්ද ඔහුගේ පුත්‍රයන් තුන්දෙනාද
ගිල්බෝවා කන්දේ වැටී ඉන්නවා ඔවුන්ට
සම්බවුණේය. ඔව්හු ඔහුගේ හිස කපා 9
දමා, ඔහුගේ ආයුධ ගළවා, එපවත්
තමුන්ගේ දේවාලයෙහිත් සෙනඟ අතරෙහිත්
ප්‍රකාශකරන පිණිස පිලිස්තිවරුන්ගේ
දේශය මුළුල්ලෙහි හැරියෝය. ඔහුගේ 10
ආයුධ ඔව්හු අෂ්ටාරොත්ගේ ගෘහයේ
තැබුවෝය. ඔහුගේ ශරීරය බෙත්-ෂාන්හි
පවුරට සවිකර එල්ලා තැබුවෝය.
පිලිස්තිවරුන් සාවුල්ට කළ දේ ගැන 11
යාබෙෂ්-ගිලියද් වැසියන් ඇසූ කල, සියලු 12
වික්‍රමාන්විත මනුෂ්‍යයෝ නැගිට, මුළු
රාත්‍රියේ ගොස්, බෙත්-ෂාන්හි පවුරෙන්
සාවුල්ගේ මළකඳද ඔහුගේ පුත්‍රයන්ගේ
මළකඳන්ද රැගෙන යාබෙෂ්ට ඇවිත්,
එහිදී ඒවා දවා, ඔවුන්ගේ ඇට රැගෙන 13
යාබෙෂ්හි ඒෂෙල් ගසයට වළලා, සත්
දවසක් නිරාහාරව සිටියෝය.

# සාමුවෙල්ගේ දෙවෙනි පොත

## සාවුල් සහ යොනාතාන්ගේ මරණය ගැන දාවිත් ඇසීම

1 තවද සාවුල් මැරුණු පසු, දාවිත්
අමලෙක්වරුන් නසා හැරී ඇවිත්
ශික්ලග්හි දෙදවසක් සිටියායින් පසු,
2 තුන්වෙනිදා මනුෂ්‍යයෙක් තමාගේ ඇඳුම්
ඉරාගත හිසේ පස් දමාගෙන සාවුල්
වෙතින් කඳවුරෙන් නික්ම ආයේය. ඔහු
දාවිත් ළඟට පැමිණි විට බිම වැටී
3 වැන්දේය. තුඹ කොතැනින් ආයෙහිදැයි
දාවිත් ඔහුගෙන් ඇසුවේය. ඔහුද: මම
ඉශ්‍රායෙල් කඳවුරෙන් ගැළවී ආයෙමියි
4 ඔහුට කීය. එවිට දාවිත්: එහි සිදුවූණේ
කිමෙක්දැයි මට කියාපන්නැයි ඔහුට
කීවේය. ඔහු උත්තරදෙමින්: සෙනඟ
යුද්ධයෙන් පලාගියෝය, සෙනඟගෙන්
බොහෝ දෙනෙක්ද වැටී මළෝය; සාවුල්ද
ඔහුගේ පුත්‍රවූ යොනාතාන්ද මැරුණෝ-
5 යයි කීවේය. එකල දාවිත්: සාවුල් සහ
ඔහුගේ පුත්‍රවූ යොනාතාන් මළ බව
තුඹ දන්නේ කොහොමදැයි තමාට කී
6 යෞවනයාගෙන් ඇසීය. ඔහුට දැන්වූ
යෞවනයා කථාකොට: මම ගිල්බෝවා
කන්දට අහම්බෙන් පැමුණුණෙමි. ඒ
වේලාවේ සාවුල් තමාගේ හෙල්ලයට
හේත්තුවී උන්නේය; රථ හා අසරුවෝ
ඔහු පස්සේ සැරෙන් එළවාගෙන ආවෝය.
7 ඔහු පස්සට හැරී මා දැක මට අඬගැසීය.
8 මම මෙහියයි උත්තරදුනිමි. තුඹ කවුදැයි
ඔහු මාගෙන් ඇසුවේය. මම අමලෙක්
9 මනුෂ්‍යයෙක්මියි ඔහුට උත්තරදුනිමි. ඔහු
මට කථාකොට: මා ළඟ සිට මා
මරාපන්න, මක්නිසාද මම ගාවිනාවෙන්
සිටිමි; මාගේ පණද සම්පූර්ණයෙන් තවම
10 මා තුළ තිබේයයි කීවේය. එවිට මම
ඔහු ළඟ සිට ඔහු මැරුවෙමි, මක්නිසාද
ඔහු වැටුණායින් පසු ජීවත්වෙන්නේ නැති
බව සත්තක ලෙස මට දැනුණේය. මම
ඔහුගේ හිසේ තිබුණු කිරීටයද අතේ
දමා තිබුණු වළල්ලද රැගෙන මෙහි
මාගේ ස්වාමියා ළඟට ගෙනායෙමියි
කීවේය. එවිට දාවිත්ද ඔහු සමග සිටි 11
සියලු මිනිස්සුද තමුන්ගේ වස්ත්‍ර
අල්වා ඉරාගෙන, සාවුල්ද ඔහුගේ පුත්‍රවූ 12
යොනාතාන්ද **ස්වාමීන්වහන්සේගේ**
සෙනඟද ඉශ්‍රායෙල් වංශයද කඩුවෙන්
වැටුණු නිසා ඔවුන් ගැන වැලපෙමින්
හඬමින් සවස දක්වා නිරාහාරයෙන්
සිටියෝය. දාවිත් තමාට එපවත් කී 13
තරුණයාට කථාකොට: තුඹ කොහේ
කෙනෙක්දැයි ඇසීය. මම විදේශියෙක්වූ
අමලෙක් මනුෂ්‍යයෙකුගේ පුතෙක් වෙමියි
ඔහු කීවේය. දාවිත්ද: **ස්වාමීන්වහන්සේගේ** 14
අභිෂේකලත් තැනැත්තා විනාශකිරීමට
භය නැතුව තුඹේ අත දිගුකළේ කෙසේදැයි
ඔහුට කියා, තරුණයන්ගෙන් එක්- 15
කෙනෙකුට හඬගසා: තුඹ ගොස් ඔහුට
පහරදීපන්නැයි කීය. ඔහුද පහරදී ඔහු
මැරුවේය. දාවිත් ඔහුට කථාකොට: 16
තුඹේ ලේ තුඹේම හිස පිට වේවා;
මක්නිසාද—මම **ස්වාමීන්වහන්සේගේ**
අභිෂේකලත් තැනැත්තා මැරුවෙමියි
කියා තුඹේම මුඛය තුඹට විරුද්ධව
සාක්ෂිදුන්නේයයි කීවේය.

## දාවිත්ගේ විලාපය

දාවිත්, සාවුල් සහ ඔහුගේ පුත්‍රවූ 17
යොනාතාන් ගැන මේ විලාප ගීය
කියමින් වැලපුණේය. *ධනුර් ගීය නම්වූ 18
ගීය යූදා පුත්‍රයන්ට උගන්වන්ටත් ඔහු

*නොහොත්, දුනු ශිල්පය පුහුණුකරන්ට.

නියමකෙළේය. ඒක *යාෂාර්ගේ පොතේ
ලියා තිබේ.
19 එම්බා ඉශ්‍රායෙල්, නුඹේ අලංකාරය
උස් තැන්හිදී නාස්තිවුණේය!
අහෝ! බලවතුන් වැටුණු හැටි!
20 පිලිස්තිවරුන්ගේ දූවරුන් ප්‍රීතිනොවන
පිණිසද
අචර්මඡේදිතයන්ගේ දූවරුන් ජයඝෝෂා
නොකරන පිණිසද
එය ගාත්හි නොදන්වව්,
අෂ්කෙලොන් වීදිවල ප්‍රකාශනොකරව්.
21 එම්බා ගිල්බෝවා කඳුනි,
†තොප පිට පිනිවත් වර්ෂාවවත්
නොවැටේවා, ප්‍රථම ඵල පූජා
පිට්ටනිද නොතිබේවා.
මක්නිසාද බලවතුන්ගේ පලිහ වන
සාවුල්ගේ පලිහ
තෙලින් ආලේපකරනු නොලැබුවාක්
මෙන් අගෞරව ලෙස අහක දමන
ලද්දේය.
22 මරනලද්දවුන්ගේ ලෙයින්ද
බලවතුන්ගේ තෙලින්ද
යොනාතාන්ගේ දුන්න පස්සට
නොපැන්නේය,
සාවුල්ගේ කඩුවද සිස්ව හැරීනායේය.
23 සාවුල් හා යොනාතාන් ජීවත්ව සිටියදී
ප්‍රේමවත්ව ප්‍රසන්නව සිටියෝය,
තමුන්ගේ මරණයේදී ඔව්හු වෙන්නුණෝය,
ඔව්හු රාජාලීන්ට වඩා වේගවත් වූය,
සිංහයන්ට වඩා බලවත් වූය.
24 ඉශ්‍රායෙල් දූවරුනි, ප්‍රියකරු රතු වස්ත්‍ර
නුඹලාට පැලඳෙවුවාවූ,
නුඹලාගේ වස්ත්‍ර රන් ආභරණවලින්
සැරසුවාවූ
සාවුල් ගැන අඬව්.

*හෙවත්, ධර්මිෂ්ඨයන්ගේ.
†නොහොත්, මරණයේ කෙත්නි, තොප
පිට පිනිවත් වර්ෂාවවත් නොවැටේවා.

අහෝ බලවතුන් සටන මැදදී වැටුණු 25
හැටි!
අහෝ යොනාතාන්, නුඹේ උස් තැන්
පිට නුඹ මැරුම්කෑවෙහිය.
මාගේ සහෝදරවූ යොනාතාන්, නුඹ 26
ගැන මට ශෝකය ඇත්තේය.
නුඹ මට ඉතා ප්‍රියකරුව සිටියෙහිය.
මා කෙරෙහි වූ නුඹේ ආදරය පුදුමය,
ස්ත්‍රීන්ගේ ආදරයට වඩා මහත්ය.
අහෝ බලවතුන් වැටුණු හැටි! 27
යුද්ධායුධත් නාස්තිවුණ හැටි!

## දාවිත් යූද කෙරෙහිත් ඊෂ්-බොෂෙත් ඉශ්‍රායෙල් කෙරෙහිත් රජකමට පත්වීම

2 ඉන්පසු දාවිත් **ස්වාමීන්වහන්සේගෙන්**
විචාරමින්: මා යූදහි යම් නුවරකට
යන්ටදැයි ඇසුවේය. **ස්වාමීන්වහන්සේ:**
පලයන්නැයි ඔහුට කීසේක. මා
කොතැනට යන්ටදැයි දාවිත් ඇසුවේය.
හෙබ්‍රොන්ටයයි උන්වහන්සේ කීසේක.
එවිට දාවිත්ද ඔහුගේ භාර්යාවන් දෙදෙනා 2
වන යෙස්‍රෙයෙලිය අහිනොවම්ද
කර්මෙලිය නාබල්ගේ භාර්යාවව
සිටියාවූ අබිගායිල්ද එහි ගියෝය. දාවිත් 3
තමා සමග සිටි තමාගේ මිනිසුන් ඔවුන්
එකිනෙකාගේ ගෙයි වැසියන් සමග
කැඳවාගෙන ආයේය. ඔව්හු හෙබ්‍රොන්
නුවරවල වාසය කළෝය. තවද යූදහි 4
මනුෂ්‍යයෝ ඇවිත් එහිදී දාවිත් යූද වංශය
කෙරෙහි රජ කොට ආලේපකළෝය.
සාවුල් තැන්පත්කෙළේ යාබෙෂ්-
ගිලියද්හි මනුෂ්‍යයන් විසින්යයි දාවිත්ට
දන්වනලද්දේය. දාවිත් යාබෙෂ්-ගිලියද් 5
මනුෂ්‍යයන් වෙතට පණිවිඩකාරයන්
යවමින්: නුඹලාගේ ස්වාමියාවූ සාවුල්ට
නුඹලා මේ කරුණාව පෙන්වා
ඔහු තැන්පත්කළ බැවින් **ස්වාමීන්-
වහන්සේගෙන්** නුඹලාට ආශීර්වාද
වේවා. දැන් **ස්වාමීන්වහන්සේ** නුඹලාට 6
කරුණාවත් සැබෑකමත් පෙන්වනසේක්වා.

නුඹලා මේ දේ කළ නිසා මමත් එසේම
7 නුඹලාට යහපත කරන්නෙමි. එබැවින්
නුඹලාගේ අත් බලවත් වේවා. නුඹලා
වික්‍රමාන්විතව සිටපල්ලා. මක්නිසාද
නුඹලාගේ ස්වාමිවූ සාවුල් මෙළේය, ඇරත්
යූද වංශය තමුන් කෙරෙහි රජ කොට
මා ආලේපකෙළේයයි කියන්ට කීවේය.
8 තවද නේර්ගේ පුත්‍රවූ, සාවුල්ගේ
සේනාපතිවූ අබ්නේර් සාවුල්ගේ පුත්‍රවූ
ඊෂ්-බොෂෙත් කැඳවාගන මහනායිම්ට
9 ගොස්, ගිලියද්ද අෂූර්වරුන්ද යෙස්‍රෙයෙල්ද
එප්‍රායිම්වරුන්ද බෙන්යමින්වරුන්ද මුළු
ඉශ්‍රායෙල්ද කෙරෙහි ඔහු රජකමට
10 පත්කෙළේය. (සාවුල්ගේ පුත්‍රවූ ඊෂ්-
බොෂෙත් ඉශ්‍රායෙල්හි රජකම්කරන්ට
පටන්ගන්න කල ඔහු අවුරුදු සතළිසක්
වයස්ව සිටියේය, ඔහු දෑවුරුද්දක් රජකම්
කෙළේය.) නුමුත් යූද වංශය පමණක්
11 දවිත්ට ඇලුම් වුණේය. දවිත් හෙබ්‍රොන්හි
යූද වංශයට රජව සිටි කාලය සත්අවුරුදු
හමාසයක්ය.

## අබ්නේර් විසින් අසාහෙල් මැරීම

12 නේර්ගේ පුත්‍රවූ අබ්නේර්ද සාවුල්ගේ
පුත්‍රවූ ඊෂ්-බොෂෙත්ගේ සේවකයෝද
මහනායිම් සිට පිටත්ව ගිබියොන්ට
13 ගියෝය. ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ්ද
දවිත්ගේ සේවකයෝද පිටත්ව ගොස්
ගිබියොන් පොකුණ ළඟදී මුණගැසී එක
පක්ෂයක් පොකුණේ එක පැත්තකද අනික්
පක්ෂය පොකුණේ අනික් පැත්තේද
14 හිඳගත්තෝය. අබ්නේර්: තරුණයෝ
නැගිට අප ඉදිරියෙහි ක්‍රීඩාකෙරෙත්වයි
යෝවාබ්ට කීය. යෝවාබ්ද: ඔව්හු එසේ
15 කෙරෙත්වයි කීය. එවිට සාවුල්ගේ පුත්‍රවූ
ඊෂ්-බොෂෙත්ට අයිති බෙන්යමින්-
වරුන්ගෙන් ගණන් වශයෙන් දොළොස්
දෙනෙක්ද දවිත්ගේ සේවකයන්ගෙන්
දොළොස් දෙනෙක්ද නැගිට ගියෝය.
16 එවිට ඔව්හු එකිනෙකා තමතමාගේ
විරුද්ධකාරයාගේ හිස අල්ලා කඩුවෙන්
ළැපැත්තට ඇන එක්ව වැටුණෝය.
එබැවින් ගිබියොන් ළඟ තිබෙන ඒ
ස්ථානයට *හෙල්කත්-හශ්ශූරිම් යන නම
තබනලද්දේය. ඒ දවසේ සටන ඉතා 17
බලවත්විය; අබ්නේර්ද ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝද දවිත්ගේ සේවකයන්ට
පැරදුණෝය. ශෙරුයාගේ පුත්‍රයන් 18
තුන්දෙනා වන යෝවාබ්ද අබිෂයිද
අසාහෙල්ද එහි සිටියෝය. අසාහෙල්ට
වනයේ මුවෙකුට මෙන් පාදවල ශීඝ්‍රකම
තිබුණේය. අසාහෙල් අබ්නේර් පස්සේ 19
එළවාගන යනුයේ, දකුණටවත් වමටවත්
නොහැරී අබ්නේර් පස්සේම ගියේය. එවිට 20
අබ්නේර් පස්සට හැරී: නුඹ අසාහෙල්දැයි
ඇසීය. එසේයයි ඔහු කීය. අබ්නේර්: 21
නුඹ දකුණට හෝ වමට හෝ හැරී,
යෞවනයන්ගෙන් එක්කෙනෙකු අල්ලා,
ඔහුගේ ආයුධ හැරගනින්නැයි ඔහුට
කීවේය. නුමුත් අසාහෙල් ඔහු වෙතින්
අහක්ව යන්ට කැමති නොවීය. නැවතත් 22
අබ්නේර්: මා වෙතින් අහක්ව පලයන්න,
මක්නිසාද මම නුඹ බිමට ගසා-
හෙළන්නෙම්ද? එසේ කළොත් මා නුඹේ
සහෝදරවූ යෝවාබ්ට මාගේ මුහුණ
ඔසවන්නේ කොහොමදැයි අසාහෙල්ට
කීවේය. එහෙත් ඔහු අහක්ව යන්ට 23
අකැමැතිවිය. එබැවින් අබ්නේර් හෙල්ල
මිටේ අගින් ඔහුගේ බඩට ඇන්නේය,
හෙල්ලය ඔහුගේ පිටෙන් නික්මුණේය;
ඔහු එතැනම මෙළේය. තවද අසාහෙල්
වැටී මැරුණු තැනට ආ සියල්ලෝම
නැවතුණෝය. නුමුත් යෝවාබ්ද අබිෂයිද 24
අබ්නේර් ලුහුබඳවා ගොස් ඉරබැස්ස
විට ගිබියොන් කාන්තාරයට යන
මාර්ගයෙහි ගීයා ඉදිරිපිට තිබෙන අම්මා
හෙලට පැමුණුණෝය. බෙන්යමින් 25
පුත්‍රයෝ අබ්නේර් වෙතට රැස්වී එක
කණ්ඩායමක්ව හෙලක් මුදුනේ නැවතී
සිටියෝය. එවිට අබ්නේර් යෝවාබ්ට 26

*එනම්, මුවහත් පිහියා කෙත.

අඬගසා: කඩුව නිතරම විනාශකරන්ටද?
එයින් අන්තිමේදී තික්තකම හටගන්න
බව නුඹ නොදන්නෙහිද? එසේවී නම්
තමුන්ගේ සහෝදරයන් ලුහුබැඳ යාමෙන්
හැරී එන්ට කියා නුඹ කොපමණ කල්
සෙනඟට අණ නොකර සිටිනෙහිදැයි
27 කීවේය. යෝවාබ්ද: දෙවියන්වහන්සේ
ජීවමාන බව සැබෑවා සේම නුඹ
කථානොකෙළෙහිනම් සැබවින් සෙනඟ
උදයේම තමුන්ගේ සහෝදරයන් ලුහුබැඳ
නොගොස් හැරී යන්ට තිබුණේයයි
28 කීවේය. එවිට යෝවාබ් හොරණෑව
පිඹබේය, මුළු සෙනඟද නැවතුණේය,
ඔවුන් තවත් ඉශ්‍රායෙල්වරුන් පස්සේ
එළවාගන ගියේවත් තවත් යුද්ධකළේවත්
29 නැත. අබ්නේර් සහ ඔහුගේ මිනිස්සු ඒ
රාත්‍රිය මුළුල්ලෙහි අරබා සමභූමිය
මැදින් ගොස්, යොර්දනෙන් එගොඩව,
මුළු බිත්රොන් මැදින් ගොස්, මහනායිම්ට
30 පැමුණුණෝය. යෝවාබ් තෙමේ අබ්නේර්
ලුහුබැඳ යාමෙන් හැරී ඇවිත් මුළු සෙනඟ
රැස්කළේය, එවිට දවිත්ගේ සේවකයන්-
ගෙන් මිනිසුන් දහනවදෙනෙක්ද
31 අසාහෙල්ද නැති බව පෙනුණේය. නුමුත්
දවිත්ගේ සේවකයෝ බෙන්යමින්-
වරුන්ගෙන්ද අබ්නේර්ගේ මිනිසුන්ගෙන්ද
තුන්සිය හැටකට පහරදී මැරුවෝය.
32 ඔව්හු අසාහෙල් රැගෙන බෙත්-ලෙහෙම්හි
තිබුණ ඔහුගේ පියාගේ සොහොන් ගෙයි
ඔහු තැන්පත් කළෝය. යෝවාබ්ද ඔහුගේ
මිනිස්සුද මුළු රාත්‍රියේ ගොස් එළිවෙන-
කොට හෙබ්‍රොන්ට පැමුණුණෝය.

## හෙබ්‍රොන්හි දවිත් රජුගේ පවුල

3 තවද සාවුල්ගේ වංශයත් දවිත්ගේ
වංශයත් අතරේ බොහෝ කල්
යුද්ධය පැවතුණේය. දවිත් වනාහි වඩ
වඩා බලවත්වේගන ගියේය, නුමුත්
සාවුල්ගේ වංශය වඩ වඩා බෙලහීන
වේගන ගියේය.
හෙබ්‍රොන්හිදී දවිත්ට පුත්‍රයෝ උපන්නෝය. 2
ඔහුගේ කුලුඳුලා නම් යෙස්‍රෙයෙලිය
අහිනොවම්ගෙන් උපන් අම්නොන්ය;
ඔහුගේ දෙවෙනියා කර්මෙලිය නාබල්ගේ 3
භාර්යාව ව සිටියාවූ අබිගායිල්ගෙන්
උපන් කිලෙයාබ්ය; තුන්වෙනියා ගෙෂූර්හි
රජ වන තල්මයිගේ දූව වූ මයකාගේ
පුත්‍රවූ අබ්සලොම්ය; සතරවෙනියා 4
හග්ගිත්ගේ පුත්‍රවූ අදොනියාය; පස්වෙනියා
අබිටල්ගේ පුත්‍රවූ ෂෙපටියාය; සවෙනියා 5
දවිත්ගේ භාර්යාව වූ එග්ලාගෙන් උපන්
ඉත්රෙයාම්ය. මොව්හු හෙබ්‍රොන්හිදී
දවිත්ට උපන්නෝය.

## අබ්නේර් ඊෂ්-බොෂෙත් හැර ගොස් දවිත්ට එකතුවීම

සාවුල්ගේ වංශයද දවිත්ගේ වංශයද 6
අතරේ යුද්ධය පැවතෙද්දී අබ්නේර්
සාවුල්ගේ වංශය උදෙසා බලවත් විය.
අයාගේ දූවූ රිශ්පානම් උප භාර්යාවක් 7
සාවුල්ට සිටියාය. ඊෂ්-බොෂෙත්ද: නුඹ
මාගේ පියාණන්ගේ උප භාර්යාව වෙතට
පැමුණුණේ මන්දැයි අබ්නේර්ට කීවේය.
එවිට අබ්නේර් ඊෂ්-බොෂෙත්ගේ වචන 8
ගැන ඉතා කෝපවී: මම යූදට අයිති
බලු හිසක්ද? මම දවිත් අතට
නුඹ අසුකරනොදී, අද දක්වා නුඹේ
පියවූ සාවුල්ගේ වංශයටත් ඔහුගේ
සහෝදරයන්ටත් ඔහුගේ මිත්‍රයන්ටත්
කරුණාව පෙන්වමි, එහෙත් අද නුඹ
මේ ස්ත්‍රිය ගැන මා කෙරෙහි වරද
පමුණුවයි. රජකම සාවුල්ගේ වංශයෙන් 9
අහක්කර, දවිත්ගේ සිංහාසනය දන් පටන්
බෙයෙර්-ෂෙබා දක්වා ඉශ්‍රායෙල්වරුන්ද
යූදවරුන්ද කෙරෙහි පිහිටුවන පිණිස,
ස්වාමීන්වහන්සේ දවිත්ට දිවුළ ලෙස 10
මම ඔහුට නොකෙළෙම්නම් දෙවියන්-
වහන්සේ අබ්නේර්ට එසේමත් ඊට
වැඩියත් කරනසේක්වයි කීවේය. ඔහු 11
අබ්නේර්ට භයවුණ බැවින් තවත් එක
වචනයක්වත් කියා උත්තරදෙන්ට
නොහැකිවිය.

12 එවිට අබ්නේර් තමා වෙනුවෙන් දාවිත්
වෙතට පණිවිඩකාරයන් යවා: දේශය
කාට අයිතිදැයි කියාත් ඔබ මා සමග
ගිවිසුමක් කළොත් සියලු ඉශ්‍රායෙල්වරුන්
ඔබ වෙත හරවාගන්නා පිණිස මාගේ
අත ඔබ සමග වන්නේය කියාත් කියන්ට
13 කීවේය. දාවිත්ද කථාකොට: යහපත;
මම තුඹ සමග ගිවිසුමක් කරන්නෙමි.
නුමුත් තුඹ විසින් එක දෙයක් කළ
යුතුය, එනම් තුඹ මා දකින්ට එන
විට පළමුකොට සාවුල්ගේ දූවූ මීකල්
කැඳවාගන එන්ට ඕනෑය; නැත්නම් තුඹ
මාගේ මුහුණ නොදක්නෙහියයි කීවේය.
14 තවද දාවිත් සාවුල්ගේ පුත්‍රවූ ඊෂ්-බොෂෙත්
වෙතට පණිවිඩකාරයන් යවා:
පිලිස්තිවරුන් සියදෙනෙකුගේ චර්මාග්‍රදී
ලබාගත් මාගේ භාර්යාවවූ මීකල් මට
15 දියන්නැයි කියන්ට කීවේය. ඊෂ්-
බොෂෙත් මිනිසුන් යවා, ඇගේ පුරුෂයා
වන ලායිෂ්ගේ පුත්‍රවූ පල්ටියෙල් වෙතින්
16 ඈ ගෙන්නෙවුවේය. ඇගේ පුරුෂයා ඈ
සමග ගොස් බහුරීම් දක්වා ඈ පස්සේ
අඬ අඬා ගියේය. එවිට අබ්නේර්: හැරී
පලයන්නැයි ඔහුට කීය. ඔහු හැරී ගියේය.
17 අබ්නේර් ඉශ්‍රායෙල් වැඩිමහල්ලන් සමග
කථාකොට: දාවිත් තුඹලා කෙරෙහි
රජකර ගන්න පිණිස තුඹලා පසුගිය
18 කාලයෙහි සෙවුහුය. දැන් එසේ කරපල්ලා.
මක්නිසාද මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්
පිලිස්තිවරුන්ගේ අතින්ද ඔවුන්ගේ සියලු
සතුරන්ගේ අතින්ද මාගේ මෙහෙකරුවූ
දාවිත් ලවා මම ගළවන්නෙමියි ස්වාමීන්-
වහන්සේ දාවිත් ගැන කියා තිබේයයි
19 කීවේය. අබ්නේර් බෙන්යමින්වරුන්
සමගත් කථාකෙළේය. ඉන්පසු අබ්නේර්
ඉශ්‍රායෙල්වරුන්ටද මුළු බෙන්යමින්
වංශයටද හොඳව පෙනුණු සියල්ල
හෙබ්‍රොන්හි සිටි දාවිත්ටත් කියන්ට
20 ගියේය. මෙසේ අබ්නේර්ද ඔහු සමග
මනුෂ්‍යයන් විසිදෙනෙක්ද හෙබ්‍රොන්හි
සිටි දාවිත් ළඟට පැමුණුණෝය. දාවිත්
අබ්නේර්ටත් ඔහු සමග සිටි මනුෂ්‍යයන්ටත්
මංගල්‍යකෑමක් පිළියෙළ කෙළේය.
අබ්නේර් දාවිත්ට කථාකොට: මම 21
පිටත්ව ගොස් සියලු ඉශ්‍රායෙල්වරුන්
මාගේ ස්වාමිවූ රජ්ජුරුවන් සමග
ගිවිසුමක් කරන පිණිස ඔවුන් ඔබ
වෙතට රැස්කරගන එන්නෙමි, මෙසේ
ඔබගේ සිතට ආසා ඇති සියල්ලන්
කෙරෙහි ඔබ රජකම්කරනවා ඇතැයි
කීවේය. දාවිත් අබ්නේර් යන්ට ඇරියේය;
ඔහු සමාදානයෙන් ගියේය. ඉන් පසු 22
දාවිත්ගේ සේවකයෝද යෝවාබ්ද
කොල්ලකෑම පිණිස පිටත්ව ගොස්
බොහෝ වස්තු ලබාගන හැරී ආවෝය.
ඒ වේලාවේ අබ්නේර් හෙබ්‍රොන්හි දාවිත්
සමග නොසිටියේය; මක්නිසාද දාවිත්
ඔහු යන්ට හැරියේය. ඔහු සමාදානයෙන්
ගියේය. නුමුත් යෝවාබ් සහ ඔහු සමග 23
සිටි මුළු සේනාවද ආ විට: නේර්ගේ
පුත්‍රවූ අබ්නේර් රජු ළඟට ආයේය, රජු
ඔහු යන්ට හැරියේය, ඔහු සමාදානයෙන්
ගියේය කියා යෝවාබ්ට කියනලද්දේය.
එවිට යෝවාබ් රජ්ජුරුවන් ළඟට ඇවිත්: 24
ඔබ කළේ කුමක්ද? අබ්නේර් ඔබ වෙතට
ආයේය; ඔහු ගොහින් ඉවරය. ඔබ එසේ
ඔහුට යන්ට හැරියේ මක්නිසාද? නේර්ගේ 25
පුත්‍රවූ අබ්නේර් ඔබ රවටා, ඔබගේ යාම
ඊමත් ඔබ කරන සියල්ලත් දැනගන්ට
ආ බව ඔබ දන්නෙහියයි කීවේය.
යෝවාබ් දාවිත් වෙතින් පිටතට ඇවිත් 26
අබ්නේර් පස්සේ පණිවිඩකාරයන් යැවීය,
ඔව්හු සිරා ළිඳ ළඟ සිට ඔහු නැවත
කැඳවාගන ආවෝය. නුමුත් දාවිත් ඒ
බව නොදන්නේය.

## යෝවාබ් විසින් අබ්නේර් මැරීම

අබ්නේර් හෙබ්‍රොන්ට හැරී ආකල යෝවාබ් 27
ඔහු සමග රහසින් කථාකරන්ට
දොරටුවේ පැත්තකට කැඳවාගෙන ගොස්
ඔහුගේ බඩට ඇන්නේය. එසේ කළේ
තමාගේ සහෝදරවූ අසාහෙල්ගේ ලේ
සඳහාය. ඔහු මළේය. ඉන්පසු දාවිත් 28
ඒ අසා: මමත් මාගේ රාජ්‍යයත්

**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි නේර්ගේ
පුත්‍රවූ අබ්නේර්ගේ ලේ ගැන සදාකාලේටම
29 නිදෙස්ය. ඒ වරද යෝවාබ්ගේ හිස පිටත්
ඔහුගේ පියාගේ මුළු වංශය පිටත්
පැමිණේවා; යෝවාබ්ගේ වංශයෙහි
ප්‍රමේහයක් ඇති කෙනෙක් හෝ
කුෂ්ඨරෝගකාරයෙක් හෝ හැරමිටි
වාරුවෙන් යන කෙනෙක් හෝ කඩුවෙන්
වැටෙන කෙනෙක් හෝ කෑම හිඟවූ
කෙනෙක් හෝ නැතුව නොසිටීවයි
30 කීවේය. අබ්නේර් ගිබියොන්හි සටනේදී
තමුන්ගේ සහෝදරවූ අසාහෙල් මැරූ
නිසා යෝවාබ්ද ඔහුගේ සහෝදරවූ
අබිෂයිද මෙසේ ඔහු මරාදැමුවෝය.
31 දාවිත් යෝවාබ්ටත් ඔහු සමග සිටි
මුළු සෙනඟටත් කථාකොට: තුඹලාගේ
ඇඳුම් ඉරා, ගෝණි රෙදි ඇඳගෙන,
අබ්නේර්ට පෙරටුවෙන් වැලපෙමින්
පලයල්ලායයි කීවේය. දාවිත් රජද
32 දෙනය පස්සෙන් ගියේය. ඔව්හු අබ්නේර්
හෙබ්‍රොන්හි තැන්පත්කළෝය. රජ ශබ්ද
නගා අබ්නේර්ගේ සොහොන්පළ ළඟදී
ඇඬීය. මුළු සෙනඟද ඇඬුවෝය.
33 රජ්ජුරුවෝ අබ්නේර් ගැන විලාප ගීයක්
කියමින්:

මෝඩයෙක් මැරෙන්නාක් මෙන්
අබ්නේර් මැරෙන්ට යුතුද?
34 තුඹේ අත් නොබඳිනලද්දේය, තුඹේ
පාදවල විලංගු නොදමනලදදේය.
දුෂ්ටයන් ඉදිරිපිට මනුෂ්‍යයෙක්
වැටෙන්නාක්මෙන් තුඹ වැටුණෙහි-

යයි කීවේය. නැවතද මුළු සෙනඟ ඔහු
35 ගැන ඇඬුවෝය. දවහල්ව තිබියදීම
දාවිත්ට කෑම කන්ට සලස්වන පිණිස
මුළු සෙනඟ ආවෝය; නුමුත් දාවිත්: මා
විසින් රොටිවත් වෙන කිසි දෙයක්වත්
ඉර බහින තෙක් කටට ගත්තොත්
දෙවියන්වහන්සේ එසේමත් ඊට වැඩියත්
36 මට කරනසේක්වයි කියා දිවුළේය. මුළු
සෙනඟද ඒක දැනගත්තෝය, ඒක ඔවුන්ට
යහපත්ව පෙනුණේය. එසේම රජ්ජුරුවන්
කළ සියල්ලත් මුළු සෙනඟට යහපත්ව
පෙනුණේය. මෙසේ නේර්ගේ පුත්‍රවූ 37
අබ්නේර් මැරීම රජ්ජුරුවන් කෙරෙන්
නොවූ බව මුළු සෙනඟද සියලු
ඉශ්‍රායෙල්වරුද ඒ දවසේ දැනගත්තෝය.
රජ්ජුරුවෝ තමාගේ සේවකයන්ට 38
කථාකොට: අද දවසේ ඉශ්‍රායෙල්හි
අධිපතියෙක්ද උත්තමයෙක්ද වැටුණු බව
තුඹලා දන්නේ නැද්ද? මම රජමෙන් 39
ආලේප ලත්තෙම් නුමුත් අද දුර්වලව
සිටිමි; ශෙරුයාගේ පුත්‍රයෝ වූ මේ
මනුෂ්‍යයෝ මට සැර වැඩිය. නපුර
කරන්නාට ඔහුගේ නපුරුකම ලෙස
**ස්වාමීන්වහන්සේ** විපාක දෙනසේක්වයි
කීවේය.

## ඊෂ්-බොෂෙත් මරා දැමීම

4 අබ්නේර් හෙබ්‍රොන්හිදී මැරුණු
බව සාවුල්ගේ පුත්‍රවූ ඊෂ්-බොෂෙත්ට
සැලවූ විට ඔහුගේ අත් බෙලහීන විය,
සියලු ඉශ්‍රායෙල්වරුද කැලඹුණෝය.
සාවුල්ගේ පුත්‍රයාට කණ්ඩායම් කෙරෙහි 2
අධිපතියෝවූ මනුෂ්‍යයන් දෙදෙනෙක්
සිටියෝය. එක්කෙනෙකුගේ නම බානාය,
අනික් අයගේ නම රේකාබ්ය. ඔව්හු
බෙන්යමින් ගෝත්‍රයට අයිති බෙයේරොතිය
රිම්මොන්ගේ පුත්‍රයෝය. (මක්නිසාද
බෙයේරොත්ද බෙන්යමින් ගණනට
ඇතුළත් කර තිබේ. බෙයේරොත්වරු 3
ගිත්තායිම්ට පලාගොස් අද දක්වා එහි
විදේශියෝ ව සිටිති.)
සාවුල්ගේ පුත්‍රවූ යොනාතාන්ට පාද 4
කොරවූ පුත්‍රයෙක් සිටියේය. යෙස්‍රෙයෙල්හි
සිටි සාවුල් සහ යොනාතාන් ගැන
ආරංචි ලැබුණු කල ඔහු පස් හැවිරිදි
ළමයෙක්ව සිටියේය, ඔහුගේ කිරි මව්
ඔහු වඩාගෙන පලාගියාය. ඈ ඉක්මන්කර
පලා යන අතර ඔහු වැටී කොරවුණේය.
ඔහුගේ නම මෙපිබොෂෙත්ය.
තවද බෙයේරොතිය රිම්මොන්ගේ 5
පුත්‍රයෝවූ රේකාබ්ද බානාද ගොස් දවල්
ග්‍රීෂ්ම වේලාව පමණේදී ඊෂ්-බොෂෙත්ගේ
ගෙට ඇතුල්වුණෝය, ඉරමුදුන් වේලාව
නිසා ඔහු සැතපී උන්නේය. ඔව්හු තිරිඟු 6

ගෙනයන්ට එන්නාක් මෙන් ගේ ඇතුළට
පැමිණ ඔහුගේ බඩට ඇන්නෝය.
රේකාබ්ද ඔහුගේ සහෝදරවූ බානාද
7 පැනලා ගියෝය. එසේ ඔහු තමාගේ
සැතපෙන ගෙයි ඇඳේ නිදා ඉන්දදී ඔව්හු
ගෙට ඇතුල්වී ඔහුට ඇන, ඔහු මරා,
ඔහුගේ හිස කපාදමා, එය රැගෙන මුළු
රාත්‍රියේ අරබා සමභූමියේ පාරෙන්
8 ගියෝය. ඔව්හු හෙබ්‍රොන්හි සිට දාවිත්
ළඟට ඊෂ්-බොෂෙත්ගේ හිස ගෙනැවිත්
රජුට කථාකොට: ඔබ මරන්ට සෙවුවාවූ
ඔබට සතුරුවූ සාවුල්ගේ පුත්‍රයා වන
ඊෂ්-බොෂෙත්ගේ හිස මෙන්න; මෙසේ
**ස්වාමීන්වහන්සේ** මාගේ ස්වාමිවූ
රජ්ජුරුවන් උදෙසා අද දවසේ සාවුල්-
ගෙන්ද ඔහුගේ වංශයෙන්ද පළිගත්-
9 සේකැයි කීවෝය. දාවිත්ද බෙයේරොතිය
රිම්මොන්ගේ පුත්‍රයන් වන රේකාබ්ටත්
ඔහුගේ සහෝදරවූ බානාටත් උත්තර
දෙමින්: සියලු විපත්තිවලින් මාගේ
ප්‍රාණය ගළවාගත් **ස්වාමීන්වහන්සේ**
10 ජීවමාන බව සැබෑවාසේම, යහපත්
ආරංචියක් ගෙනෙමියි සිතාගන එක්
කෙනෙක් සාවුල් මැරුණේය කියා මට
දැන්වූ විට මම ඔහු අල්වා සික්ලග්හිදී
මරා දැමුවෙමි, ඔහු ගෙනා ආරංචිය
ගැන මා විසින් දුන් විපාකය ඒකය.
11 තමාගේ ගෙයි තමාගේ යහනේ ඉන්දදී
ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු මරාදැමූ දුෂ්ට
මිනිසුන්ට ඊට කොපමණ වැඩියෙන්
එසේ කරන්ට ඕනෑ නොවේද? එබැවින්
මම ඔහුගේ ලේ නුඹලාගේ අතින්
අයකර නුඹලා දත් පොළොවෙන්
12 පහනොකරන්නෙම්දැයි කීවේය. දාවිත්
තමාගේ යෞවනයන්ට අණ දුන්නේය,
ඔව්හු ඔවුන් මරා, ඔවුන්ගේ අත් පා
කපාදමා, හෙබ්‍රොන්හි පොකුණ ළඟ
එල්ලා තැබුවෝය. නුමුත් ඔව්හු ඊෂ්-
බොෂෙත්ගේ හිස රැගෙන හෙබ්‍රොන්හි
තිබුණු අබ්නේර්ගේ සොහොනේ තැන්පත්
කළෝය.

## දාවිත් මුළු ඉශ්‍රායෙල්හි රජ වී යෙරුසලම අගනුවර කරගැනීම

5

එකල සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රයෝ
හෙබ්‍රොන්හි සිටි දාවිත් වෙතට
ඇවිත්: අපි ඔබගේ ඇට හා මාංසයත්ය.
පසුගිය කාලයේ සාවුල් අප කෙරෙහි 2
රජ ව සිටි කල්හි ඉශ්‍රායෙල්වරුන් පිටතට
ගෙනගියෙත් ඇතුළට ගෙනාවෙත් ඔබමය.
**ස්වාමීන්වහන්සේ** ඔබට කථාකොට—
නුඹ මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල් පාලනය
කරමින් ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා
වන්නෙහියයි කීසේකැයි කීවෝය.
මෙසේ ඉශ්‍රායෙල්හි සියලු වැඩිමහල්ලෝ 3
හෙබ්‍රොන්හි සිටි රජ්ජුරුවන් වෙතට
පැමිණියෝය; දාවිත් රජද හෙබ්‍රොන්හිදී
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඔවුන් සමග
ගිවිසුමක් කෙළේය. ඔව්හු දාවිත් ඉශ්‍රායෙල්
කෙරෙහි රජ කොට ආලේපකළෝය.
දාවිත් රජවෙන කල තිස් අවුරුදු වයස් 4
වූයේය, ඔහු සතළිස් අවුරුද්දක්
රජකම්කළේය. ඔහු හෙබ්‍රොන්හි යූදවරුන් 5
කෙරෙහි රජකම් කළේ සත් අවුරුදු
හමාසයක්ය, යෙරුසලමේ ඔහු සියලු
ඉශ්‍රායෙල්වරුන්ද යූදවරුන්ද කෙරෙහි
රජකම්කළේ තිස්තුන් අවුරුද්දක්ය.
රජුද ඔහුගේ මිනිස්සුද රටේ වැසියන්වූ 6
යෙබූසිවරුන්ට විරුද්ධව යෙරුසලමට
ගියෝය. ඔව්හුද: දාවිත්ට මෙහි ඇතුල්-
වෙන්ට බැරියයි කියා දාවිත්ට
කථාකොට—නුඹ මෙහි ඇතුල් නො-
වන්නෙහිය, අන්ධයන් හා කොරුන්
නුඹ පහකරදමනවා ඇතැයි කීවෝය.
නුමුත් දාවිත් සියොන් බලකොටුව අල්ලා 7
ගත්තේය; එය දාවිත්ගේ නුවර විය. ඒ 8
දවසේදී දාවිත් කථාකොට: යෙබූසිවරුන්ට
පහර දෙන සියල්ලෝම වතුර පාරට
වැද, දාවිත්ගේ ආත්මය ද්වේෂකරන ඒ
කොරුන්ටත් අන්ධයන්ටත් පහරදෙත්වයි
කීවේය. එබැවින් අන්ධයාටත් කොරාටත්
ගෙට ඇතුල්වෙන්ට නොලැබේයයි
මනුෂ්‍යයෝ කියත්. දාවිත් බලකොටුවෙහි 9

වාසයකළේය, ඊට දවිත්ගේ නුවරයයි
නම්කෙළේය. දවිත් මිල්ලෝ පටන් වට-
කරින්ද ඇතුළතින්ද ගොඩනැගුවේය.
10 දවිත් වඩ වඩා උතුම්වෙගෙන ගියේය;
මක්නිසාද සේනාවල දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** ඔහු සමග සිටිසේක.
11 තවද තීර්හි රජවූ හීරාම් පණිවිඩ-
කාරයන්ද කිහිරි ලීද වඩුවන්ද ගල්
වඩුවන්ද දවිත් වෙතට එවුවේය. ඔව්හු
12 දවිත්ට ගෙයක් ගොඩනැගුවෝය. තමා
ඉශ්‍රායෙල් කෙරෙහි රජකොට **ස්වාමීන්-**
**වහන්සේ** විසින් පිහිටෙවූ බවත් උන්-
වහන්සේගේ සෙනඟවූ ඉශ්‍රායෙල් උදෙසා
තමාගේ රාජ්‍යය උසස්කළ බවත් දවිත්
දැනගත්තේය.
13 දවිත් හෙබ්‍රොන්හි සිට ආවාට පසු
තවත් උප භාර්යාවන්ද භාර්යාවන්ද
යෙරුසලමෙන් පාවාගත්තේය. තව
පුත්‍රයෝද දූවරුද දවිත් නිසා උපන්නෝය.
14 යෙරුසලමේදී ඔහු නිසා උපන්නවුන්ගේ
නම් මේය: ෂම්මුවාද ෂෝබාබ්ද නාතාන්ද
15 සාලමොන්ද, ඉබ්හාර්ද එලීෂුවාද;
16 නෙපෙග්ද යපියාද; එලීෂාමාද එලියාද
සහ එලිපෙලෙත්ද යනුයි.

## දවිත් පිලිස්තිවරුන්ට පහරදීම

17 දවිත් ඉශ්‍රායෙල් කෙරෙහි රජකොට
ආලේපකරනලද බව පිලිස්තිවරුන් ඇසූ
කල ඔවුන් සියල්ලෝම දවිත් සොයා
ආවෝය; දවිත් ඒ අසා බලකොටුවට
18 බැස ගියේය. පිලිස්තිවරු ඇවිත්
රෙඵාවරුන්ගේ මිටියාවතේ පැතිර
19 සිටියෝය. දවිත් **ස්වාමීන්වහන්සේගෙන්**
විචාරමින්: මා පිලිස්තිවරුන්ට විරුද්ධව
යන්ටද? ඔබවහන්සේ ඔවුන් මා අතට
පාවාදෙනසේක්දැයි ඇසුවේය. **ස්වාමීන්-**
**වහන්සේ**: පලයන්න. මක්නිසාද මම
සැබවින් පිලිස්තිවරුන් නුඹ අතට
20 පාවාදෙන්නෙමියි දවිත්ට කීසේක. දවිත්
බාල්-පෙරාශීම්ට ඇවිත් එහිදී ඔවුන්ට
පහරදී: **ස්වාමීන්වහන්සේ** ජල බිඳීමක්
මෙන් මා ඉදිරියේ මාගේ සතුරන්
බින්දසේකැයි කීවේය. එබැවින් ඔහු ඒ
ස්ථානයට *බාල්-පෙරාශීම්යයි නම්
තැබීය. ඔව්හු තමුන්ගේ රූප එහි දමා 21
ගියෝය. දවිත්ද ඔහුගේ මිනිස්සුද ඒවා
රැගෙන ගියෝය.
පිලිස්තිවරු නැවතත් ඇවිත් රෙඵා- 22
වරුන්ගේ මිටියාවතේ පැතිර සිටියෝය.
දවිත් **ස්වාමීන්වහන්සේගෙන්** විචාළ 23
කල්හි උන්වහන්සේ: නුඹ ඉස්සරහට
නොයන්න. වටකරින් ඔවුන්ට පිටිපස්සෙන්
ගොස් ඇඹිල්ල ගස්වලට ඉස්සරහපිටින්
ඔවුන් ළඟට පැමිණියන්න. තවද ඇඹිල්ල 24
ගස් මුදුන්වල අඩි තබා යන ශබ්දයක්
නුඹට ඇසෙනකල කඩිසර වෙයන්න.
මක්නිසාද ඒ වේලාවට **ස්වාමීන්වහන්සේ**
පිලිස්තිවරුන්ගේ සේනාවට පහර දෙන
පිණිස නුඹට පෙරටුව පිටත්ව යන-
සේකැයි කීසේක. දවිත් **ස්වාමීන්වහන්සේ** 25
අණකළ හැටියට කොට ගෙබාහි සිට
ගෙසේර්ට පැමිණෙන තෙක් පිලිස්ති-
වරුන්ට පහර දුන්නේය.

## දවිත් ගිවිසුම් පෙට්ටිය යෙරුසලමට ගෙනඊම

6 ඉශ්‍රායෙල්වරුන්ගෙන් තෝරාගත්
සියල්ලන් වන තිස්දහසක් මනුෂ්‍යයන්
දවිත් නැවත රැස්කෙළේය. දවිත් නැගිට 2
තමා සමග සිටි මුළු සෙනඟ සමග
පිටත්ව යනුයේ, නාමය එනම් කෙරුබ්වරුන්
පිට වැඩඉන්න සේනාවල **ස්වාමීන්-**
**වහන්සේගේ** නාමය තබා තිබෙන
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
ගෙනෙන පිණිස යූදහි බායාලෙට ගියේය.
ඔව්හු දෙවියන්වහන්සේගේ ගිවිසුම් 3
පෙට්ටිය හෙලෙහි තිබුණ අබීනාදබ්ගේ
ගෙයින් අලුත් ගැළක තබා ගෙනාවෝය.
අබීනාදබ්ගේ පුත්‍රයෝවූ උස්සාද අහියෝද
අලුත් ගැළ දක්කුවෝය. ඔව්හු හෙලෙහි 4
තිබුණු අබීනාදබ්ගේ ගෙයින් දෙවියන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙන
ගැළේ තබා ගෙනාවෝය. අහියෝ ගිවිසුම්

*එනම්, භංග ස්ථානය.

5 පෙට්ටියට පෙරටුව ගියේය. දවිත් සහ
මුළු ඉශ්‍රායෙල් වංශය සියලු ආකාර
දේවදර තූර්යභාණ්ඩවලින්ද කුඩා වීණා-
වලින්ද වීණාවලින්ද රබන්වලින්ද කයි-
තාලම්වලින්ද අත්තල්වලින්ද **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි ගායනාකළෝය.
6 ඔවුන් නාබොන්ගේ පාවරට පැමිණි විට
හරක් දඟලූ බැවින්, උස්සා දෙවියන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටියට අත
7 දිගුකොට එය ඇල්ලුවේය. එවිට
**ස්වාමීන්වහන්සේගේ** උදහස උස්සාට
විරුද්ධව ඇවුළුණේය; ඒ වරද නිසා
දෙවියන්වහන්සේ එහිදී ඔහුට පහර දුන්-
සේක; ඔහු දෙවියන්වහන්සේගේ ගිවිසුම්
8 පෙට්ටිය ළඟ මළේය. **ස්වාමීන්වහන්සේ**
උස්සාට පහරදුන් බැවින් දවිත් ඛේදයට
පත්වී ඒ ස්ථානයට *පෙරෙශ්-උස්සා
යන නම තැබුවේය. ඒ නාමය අද දක්වා
9 පවතී. ඒ දවසේදී දවිත් **ස්වාමීන්වහන්සේට**
භයව: **ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම්
පෙට්ටිය මා ළඟට එන්නේ කෙසේදැයි
10 කීවේය. මෙසේ දවිත් **ස්වාමීන්වහන්සේගේ**
ගිවිසුම් පෙට්ටිය දවිත්ගේ නුවරට තමා
වෙතට ගෙනෙන්ට අකැමැතිව අහකට
හරවා ගිත්තිය ඕබෙද්-ඒදොම්ගේ ගෙට
11 ගෙන ගියේය. **ස්වාමීන්වහන්සේගේ**
ගිවිසුම් පෙට්ටිය ගිත්තිය ඕබෙද්-
ඒදොම්ගේ ගෙයි තුන් මාසයක් තිබුණේය.
**ස්වාමීන්වහන්සේ** ඕබෙද්-ඒදොම්ටත්
ඔහුගේ මුළු පවුලටත් ආශීර්වාද කළ-
12 සේක. තවද දෙවියන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය නිසා **ස්වාමීන්වහන්සේ** ඕබෙද්-
ඒදොම්ටත් ඔහුට අයිති සියල්ලටත්
ආශීර්වාදකළසේකැයි දවිත් රජුට
දන්වන ලද්දේය. එවිට දවිත් ගොස්
දෙවියන්වහන්සේගේ පෙට්ටිය ඕබෙද්-
ඒදොම්ගේ ගෙයින් දවිත්ගේ නුවරට ප්‍රීති
13 සහිතව ගෙනායේය. තවද **ස්වාමීන්-
වහන්සේගේ** පෙට්ටිය උසුලන්නන් අඩි
හයක් ගිය කල ඔහු ගොනෙක්ද තර
වස්සෙක්ද පූජාකෙළේය. දවිත් හණ 14
ඒඵොද් සැට්ටයක් හැඳගෙන **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි මුළු ශක්තියෙන්
නැටුවේය. මෙසේ දවිත් හා මුළු 15
ඉශ්‍රායෙල් වංශය මල්වරහඬත් හොරණෑ
ශබ්දයත් ඇතුව **ස්වාමීන්වහන්සේගේ**
ගිවිසුම් පෙට්ටිය ගෙනාවෝය. තවද 16
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය
දවිත්ගේ නුවරට පැමිණෙන කල
සාවුල්ගේ දූවූ මීකල් කවුළුවෙන් බලා,
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි දවිත් රජ
උඩ පනිමින් නටනවා දැක, ඇගේ
සිතින් ඔහු හෙළාදැක්කාය. තවද ඔව්හු 17
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටිය ඇතුළට
ගෙනවුත් දවිත් ඊට පිහිටුවා තිබුණ
කූඩාරම මධ්‍යයෙහි ඊට නියම
ස්ථානයෙහි එය තැබුවෝය. දවිත්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි දවන පූජා
හා ශාන්ති පූජා ඔප්පුකෙළේය. දවිත් 18
දවන පූජාද ශාන්ති පූජාද ඔප්පුකර
තීන්දුකළ පසු සේනාවල **ස්වාමීන්-
වහන්සේගේ** නාමයෙන් සෙනඟට
ආශීර්වාදකෙළේය. තවද ඔහු මුළු 19
සෙනඟට එනම් ඉශ්‍රායෙල් සමූහයාගෙන්
එක එක පුරුෂයාටත් ස්ත්‍රීටත් රොටියකුත්
මස් කැබෙල්ලකුත් වියළි මුද්‍රිකඵල
කැටියකුත් දුන්නේය. එවිට මුළු සෙනඟ
තම තමුන්ගේ ගෙවලට ගියෝය. දවිත්ද 20
තමාගේ ගෙයි වැසියන්ට ආශීර්වාද
කරන පිණිස හැරීගියේය. සාවුල්ගේ
දූවූ මීකල් දවිත්ගේ පෙරමගට අවුත්
කථාකොට: කමකට නැති කෙනෙක්
ලජ්ජා නැතිව තමාගේ ඇඳුම් ගළවා
දමන්නාක් මෙන් අද තමාගේ
මෙහෙකරුවන්ගේ දාසීන් ඉදිරියෙහි
තමාගේ ඇඳුම් ගළවාදැමූ ඉශ්‍රායෙල්
රජතුමා අද කොපමණ තේජවත් නොවීද-
යි කීවාය. දවිත් මීකල්ට කථාකොට: 21
ඒ සිද්ධවුණේ ස්වකීය සෙනඟ වන
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි අධිපතියා
කොට පත්කරන පිණිස තුඹේ පියාත්
ඔහුගේ මුළු වංශයත් පහකොට මා

*එනම්, උස්සා ප්‍රහාරය.

තෝරාගත් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහිය.
ඒ නිසා මම **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
22 ක්‍රීඩාකරන්නෙමි, මම ඊටත් වඩා නීචව
මාගේම ඇස් ඉදිරිපිට පහත්වන්නෙමි.
නුමුත් නුඹ කී දසීන්ගෙන් නම් ගෞරව
23 ලබන්නෙමියි කීවේය. එබැවින් සාවුල්ගේ
දුවවූ මීකල්ට ඈ මැරෙන දවස දක්වා
දරුවෙක් නොලැබුණේය.

## ස්වාමීන්වහන්සේට ගෘහයක් ගොඩනැඟීමට දවිත්ගේ ආශාව සහ ඔහුගේ යාච්ඤාව

7 රජුගේ සියලු සතුරන්ගෙන් **ස්වාමීන්-**
**වහන්සේ** ඔහුට හාත්පසින්ම නිදහස
දුන්නායින් පසු ඔහු තමාගේ ගෘහයේ
2 වාසයකරන අතර, රජ ප්‍රොපේතවූ
නාතාන්ට කථාකොට: මෙන්න, මම
දන් කිහිරි ලී ගෙයක වසමි, එහෙත්
දෙවියන්වහන්සේගේ පෙට්ටිය තිර ඇතුළේ
3 වාසයකරනවායයි කීවේය. එවිට
නාතාන්: නුඹ ගොස් නුඹේ සිතේ තිබෙන
සියල්ල කරන්න; මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** නුඹ සමග සිටිනසේකැයි රජුට
4 කීවේය. තවද එම රාත්‍රියේදී **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනය නාතාන්ට පැමිණ
5 කියනුයේ: නුඹ ගොස්, **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේකැයි මාගේ මෙහෙකරුවූ
දවිත්ට කියාපන්න–මාගේ වාසස්ථානය
කොට නුඹ මට ගෘහයක් ගොඩනගන්නෙහිද?
6 මම ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසරයෙන් ගෙනා
දවස පටන් අද දක්වා ගෙයක නොවැස
කූඩාරමකද මණ්ඩපයකද හැසුරුණෙමි.
7 මාගේ සෙනහවූ ඉශ්‍රායෙල් පාලනයකරන්ට
මාගෙන් අණ ලැබූ යම් ඉශ්‍රායෙල්
ගෝත්‍රයකට: නුඹලා මට කිහිරි ලීවලින්
ගෘහයක් ගොඩනොනැගුවේ මක්නිසාද
යන වචනයක් මා සියලු ඉශ්‍රායෙල්
පුත්‍රයන් අතරෙහි හැසුරුණ කොයි
8 ස්ථානයකදීවත් කීවෙම්ද? එබැවින් දන්
මාගේ මෙහෙකරුවූ දවිත්ට මෙසේ
කියාපන්න, සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක–මාගේ සෙනහවූ
ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා වන පිණිස
බැටළු ගාලෙන්ද බැටළුවන් පස්සේ
යාමෙන්ද නුඹ ගත්තෙමි. නුඹ ගිය හැම 9
තැන්හිම මම නුඹ සමග සිට නුඹේ
සතුරන් නුඹ ඉදිරියෙන් සිඳ දැමුවෙමි;
පොළොවේ සිටින උත්තමයන්ගේ නාමය
මෙන් මහත් නාමයක් නුඹට සාද
දෙන්නෙමි. මාගේ සෙනහවූ ඉශ්‍රායෙල් 10
තමුන්ගේම ස්ථානයෙහි වාසයකරමින්
තවත් අහක් නොවෙන ලෙස මම ඔවුන්ට
ස්ථානයක් නියම කොට ඔවුන්
පිහිටුවන්නෙමි; මුලදී කළ ලෙසද මාගේ 11
සෙනහවූ ඉශ්‍රායෙල් කෙරෙහි විනිශ්චය-
කාරයන් පත්කළ කාලයේ සිට කළ
ලෙසද දුෂ්ටකමේ දරුවෝ තවත් ඔවුන්ට
පීඩා නොකරන්නෝය. නුඹේ සියලු
සතුරන්ගෙන් නුඹට නිදහස ලැබෙන්ට
සලස්වන්නෙමි. ඇරත් **ස්වාමීන්වහන්සේ**
නුඹට වංශයක් සාදදෙන බව **ස්වාමීන්-**
**වහන්සේ** නුඹට දන්වනසේක. නුඹේ 12
දවස් සම්පූර්ණවී නුඹේ පියවරුන් සමග
නුඹ සැතපුණු කල්හි, මම නුඹෙන් පැවත
එන නුඹේ බීජය නුඹට පසුව පිහිටුවා
ඔහුගේ රජකම ස්ථිරකරන්නෙමි. ඔහුම 13
මාගේ නාමයට ගෘහයක් ගොඩනගන්නේය,
ඔහුගේ රජකමේ සිංහාසනයද සදාකාලේ-
ටම ස්ථිරකරන්නෙමි. මම ඔහුට පියා 14
වන්නෙමි, ඔහු මට පුත්‍රයා වන්නේය.
ඔහු අයුතුකම් කළොත් මම මනුෂ්‍ය-
යන්ගේ ඉපලෙන්ද මනුෂ්‍ය පුත්‍රයන්ගේ
පහරවලින්ද ඔහුට දඬුවම් කරන්නෙමි;
එහෙත් නුඹ ඉදිරියෙන් මා විසින් 15
අහක්කළ සාවුල්ගෙන් මාගේ කරුණාව
පහකළාක් මෙන් ඔහුගෙන් එය පහ-
නොවන්නේය. නුඹේ වංශයද රජකමද 16
නුඹ ඉදිරියෙහි සදාකාලේටම ස්ථිරකරනු
ලබන්නේය. නුඹේ සිංහාසනයද සදටම
පිහිටුවනු ලබන්නේය කියා කියනසේකැයි
කීවේය. මේ සියලු වචනවල හැටියටත් 17
මේ මුළු දර්ශනය ලෙසත් නාතාන් දවිත්ට
කීවේය.

18 එවිට දාවිත් රජ ඇතුළට ගොස්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි හිඳ
කථාකොට: ස්වාමිවූ **දෙවියන්වහන්ස**,
ඔබවහන්සේ මෙපමණ දුරට මා
ගෙනඒමට මම කවුද? මාගේ වංශය
19 මොකක්ද? එහෙත් ස්වාමිවූ **දෙවියන්-
වහන්ස**, මේකත් ඔබ ඉදිරියෙහි මදිව
මතු බොහෝ කලකට ඔබගේ
මෙහෙකරුවාගේ වංශය ගැනත් ඔබ
කථාකළසේක; ඒත් ස්වාමිවූ **දෙවියන්-
20 වහන්ස**, මනුෂ්‍ය ප්‍රකාරයටය. දාවිත් ඔබට
තවත් මක්කියන්ටද? ස්වාමිවූ **දෙවියන්-
වහන්ස**, ඔබනම් ඔබගේ මෙහෙකරුවා
21 දන්නාසේක. ඔබ මේ මුළු මහත් දේ
කොට ඔබගේ මෙහෙකරුවාට දන්නුවේ
ඔබගේ වචනය නිසාත් ඔබගේ
22 සිතේ හැටියටත්ය. එබැවින් ස්වාමිවූ
දෙවියන්වහන්ස, ඔබවහන්සේ උතුම්ව
සිටිනසේක. අපේ කන්වලින් ඇසූ සියල්ල
ලෙස ඔබට සමාන කෙනෙක් නැත, ඔබ
ඇර වෙන කිසි දෙවිකෙනෙක්ද නැත.
23 පොළොවේ මොන ජාතියක් ඔබගේ
සෙනඟවූ ඉශ්‍රායෙල්ට සමානද?
මක්නිසාද දෙවියන්වහන්සේ තමන්ට
සෙනඟක් කොට ඔවුන් මුදාගන්න පිණිස
ඒමටත් තමන්ට නාමයක් උපදවා-
ගැනීමටත් ඔබ මිසරයෙන්ද ජාතීන්ගෙන්ද
ඔවුන්ගේ දෙවිවරුන්ගෙන්ද ඔබට
මුදාගත්තාවූ ඔබගේ සෙනඟ ඉදිරියේදී
ඔබගේ දේශය උදෙසා ඔබ මහත්වූ
24 භයානකවූ දේ කළසේක. මෙසේ ඔබගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් ඔබ සදාකාලේටම
ඔබට සෙනඟක් කොට ස්ථිරකරගත
ඔබම, **ස්වාමීන්වහන්ස**, ඔවුන්ගේ
25 දෙවියන්වහන්සේ වී සිටිනසේක. ඉතින්
ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ මෙහෙ-
කරුවාද ඔහුගේ වංශයද ගැන ඔබ කී
වචනය සදාකාලේටම ස්ථිරකොට ඔබ
26 කී ලෙස කළමැනව. ඉශ්‍රායෙල් කෙරෙහි
දෙවියන්වහන්සේව සිටින්නේ සේනාවල
**ස්වාමීන්වහන්සේයයි** කියනු ලැබීමෙන්
ඔබගේ නාමය සදකල් වර්ණනාකරනු
ලැබේවා. ඔබගේ මෙහෙකරුවූ දාවිත්ගේ
වංශයද ඔබ ඉදිරියෙහි ස්ථිරව තිබේ.
මක්නිසාද ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල 27
**ස්වාමීන්වහන්ස**,—මම තුඹට වංශයක්
සාදන්නෙමියි කියා ඔබගේ මෙහෙ-
කරුවාට ඔබ එළිදරව් කළසේක.
එබැවින් මේ යාච්ඤාව ඔබට ඔප්පුකරන්ට
ඔබගේ මෙහෙකරුවා ධෛර්ය ගත්තේය.
ඉතින් ස්වාමිවූ **දෙවියන්වහන්ස**, ඔබම 28
දෙවියන්වහන්සේය, ඔබගේ වචන
සැබෑමය, ඔබද ඔබගේ මෙහෙකරුවාට
මේ යහපත් දෙය පොරොන්දුවූසේක.
එබැවින් ඔබගේ මෙහෙකරුවාගේ වංශය 29
ඔබ ඉදිරියෙහි සදාකාලේටම පවතින
පිණිස ඊට ආශීර්වාදකරන්ට ඔබ
කැමතිවනසේක්වා. මක්නිසාද ස්වාමිවූ
**දෙවියන්වහන්ස**, ඔබ ඒක කීසේක. ඔබගේ
ආශීර්වාදයෙන් ඔබගේ මෙහෙකරුවාගේ
වංශය සදාකාලේටම ආශීර්වාදකරනු
ලබාවයි කීවේය.

## දාවිත්ගේ යුද්ධ සහ ඔහුගේ මන්ත්‍රීවරු

8 ඉන්පසු දාවිත් පිලිස්තිවරුන්ට පහරදී
ඔවුන් යටත්කරගෙන, අගනුවර
ප්‍රධානකම පිලිස්තිවරුන් අතින්
පැහැරගත්තේය. ඔහු මෝවබ්වරුන්ටත් 2
පහරදී, ඔවුන් බිම දිගාවෙන්ට සලස්වා,
ලනුවකින් මැන්නේය; මරණ පිණිස පේළි
දෙකක්ද ඉතුරුකරන පිණිස එක
සම්පූර්ණ පේළියක්ද මැන්නේය. මෙසේ
මෝවබ්වරු දාවිත්ට මෙහෙකරුවෝව
කප්පන් ගෙනාවෝය. තවද රෙහෝබ්ගේ 3
පුත්‍රයාවූ සෝබාහි රජවූ හදද්එසෙර් ප්‍රාත්
ගංගාව ළඟ තමාගේ බලය නැවත
පිහිටුවන්ට යද්දී දාවිත් ඔහුටත් පහර දී,
අසරුවන් එක්දස් සත්සියයක්ද පාබළ 4
සෙනඟ විසිදහක්ද ඔහුගෙන් අල්ලාගෙන,
එයින් රථ සියයකට අසුන් ඉතුරුකරගන,
අනික් සියලු අශ්වයන්ගේ කුදි කැපුවේය.
දමස්කයෙහි සිරියවරු සෝබාහි රජවූ 5
හදද්එසෙර්ට උපකාරකරන්ට ආවෝය,

එවිට දාවිත් සිරියවරුන්ගෙන් මනුෂ්‍යයන්
6 විසිදෙදහකට පහර දී, දමස්කයේ
සිරියාවෙහි මුරකාර සමූදවල් තැබුවේය.
සිරියවරුද දාවිත්ට මෙහෙකරුවෝ ව
කප්පන් ගෙනාවෝය. දාවිත් ගිය ගිය
තැනදී **ස්වාමීන්වහන්සේ** ඔහුට ජය දුන්-
7 සේක. දාවිත් හදද්එසෙර්ගේ සේවකයන්ට
තිබුණු රන් පලිස් රැගෙන යෙරුසලමට
8 ගෙනාවේය. බෙටාද බෙරෝතයිද යන
හදද්එසෙර්ගේ නුවරවලින් දාවිත් රජ
9 පිත්තල බොහෝසෙයින්ම ගත්තේය. දාවිත්
හදද්එසෙර්ගේ මුළු සේනාවට පහරදුන්
10 බව හමාත්හි රජවූ තොයි අසා, දාවිත්
එසේ හදද්එසෙර්ට විරුද්ධව සටන්
කොට ඔහුට පහරදුන් නිසා දාවිත්ට
ආචාරකරන්ටත් ඔහුට ආශීර්වාද-
කරන්ටත් ඔහු වෙතට තමාගේ පුත්‍රවූ
යෝරාම් එවූවේය. මක්නිසාද හදද්එසෙර්
සහ තොයි අතරේ යුද්ධ පැවතුණේය.
යෝරාම් රිදී බඩුද රන් බඩුද පිත්තල
11 බඩුද ගෙනාවේය. දාවිත් රජ යටත්-
කරගත් සියලු ජාතීන් වන සිරිය-
වරුන්ගෙන්ද මෝවබ්වරුන්ගෙන්ද
අම්මොන් පුත්‍රයන්ගෙන්ද පිලිස්ති-
12 වරුන්ගෙන්ද අමලෙක්වරුන්ගෙන්ද
රෙහෝබ්ගේ පුත්‍රයාවූ ශෝබාහි රජවූ
හදද්එසෙර්ගෙන් ගත් කොල්ලයෙන්ද
කැපකළාවූ රන් රිදී සමග ඒවාත්
13 **ස්වාමීන්වහන්සේට** කැපකළේය. දාවිත්
ලුණු මිටියාවතේදී සිරියවරුන්ගෙන්
දහඅටදහකට පහර දී හැරී ආ කල
14 ඔහු කීර්තිමත්වුණේය. ඔහු ඒදොම්හි හැම
තැනම මුරකාර සමූදවල් තැබුවේය,
සියලු ඒදොම්වරු දාවිත්ට මෙහෙකරුවෝ
වූවෝය. දාවිත් ගිය ගිය තැනදී **ස්වාමීන්-
වහන්සේ** ඔහුට ජයදුන්සේක.
15 දාවිත් මුළු ඉශ්‍රායෙල් කෙරෙහි
රජකම්කරමින් තමාගේ මුළු සෙනඟට
විනිශ්චය හා යුක්තිය ඉෂ්ටකෙළේය.
16 සෙරුයාගේ පුත්‍රවූ යෝවාබ් සේනාපතියාව
සිටියේය; අහිලුද්ගේ පුත්‍රවූ යෙහෝෂාපාත්
17 වාර්තාකරුවාව සිටියේය. අහිතුබ්ගේ
පුත්‍රවූ සාදොක් හා අබියාතර්ගේ පුත්‍රවූ
අහිමෙලෙක් පූජකයෝ ව සිටියෝය; සෙරායා
ලේකම්ව සිටියේය, යෙහෝයාදාගේ පුත්‍රවූ 18
බෙනායා කෙරෙතිවරුන්ද පෙලෙතිවරුන්ද
කෙරෙහි අධිපතියාව සිටියේය; දාවිත්ගේ
පුත්‍රයෝද මන්ත්‍රීවරු ව සිටියෝය.

## මෙපිබොෂෙත්ට දාවිත් කරුණාකිරිම

9
දාවිත් කථාකොට: සාවුල්ගේ
වංශයෙන් යමෙක් තව ඉතුරුව
සිටිනවාද? සිටිනවා නම් මම යොනාතාන්
නිසා ඔහුට කරුණාව පෙන්වන්නෙමියි
කීවේය. සාවුල්ගේ වංශයට අයිති ශීබා 2
නම් මෙහෙකරුවෙක් විය, ඔවුන් ඔහු
දාවිත් ළඟට කැඳවාගන ආ කල; නුඹ
ශීබාදැයි රජ ඔහුගෙන් ඇසීය. ඔහුද:
ඔබගේ මෙහෙකරුවා ඒයයි කීවේය.
රජද: සාවුල්ගේ වංශයේ කිසිවෙක් තව 3
ඉතුරුව නැද්ද? ඉතුරුව ඇත්නම් මම
ඔහුට දෙවියන්වහන්සේගේ කරුණාව
පෙන්වන්නෙමියි කීවේය. ශීබාද: යො-
නාතාන්ගේ පුත්‍රයෙක් තවම සිටියි, ඔහු
පාදකොරවූ කෙනෙක්යයි රජුට කීවේය.
එවිට: ඔහු කොතැනදැයි රජ ඔහුගෙන් 4
ඇසුවේය. ශීබාද: ඔහු ලෝ-දෙබාර්හි
අම්මීයෙල්ගේ පුත්‍රවූ මාකීර්ගේ ගෙදර
සිටීයයි රජුට කීය. එවිට දාවිත් 5
රජ පණිවිඩ යවා ලෝ-දෙබාර්හි
අම්මීයෙල්ගේ පුත්‍රවූ මාකීර්ගේ ගෙදරින්
ඔහු ගෙන්වූයේය. සාවුල්ගේ පුත්‍රයා වන 6
යොනාතාන්ගේ පුත්‍රවූ මෙපිබොෂෙත්
දාවිත් වෙතට ඇවිත් මුහුණින් වැටී
වැන්දේය. දාවිත්ද: මෙපිබොෂෙත්යයි කීය.
ඔබගේ මෙහෙකරුවා මෙහියයි ඔහු
උත්තරදුන්නේය. දාවිත් කථාකොට: 7
භයනොවෙන්න. සැබෑවටම නුඹේ පියවූ
යොනාතාන් නිසා මම නුඹට කරුණාව
පෙන්වා නුඹේ පියවූ සාවුල්ගේ සියලු
ගම්බිම් නුඹට නැවත දෙන්නෙමි; නුඹ
වනාහි මාගේ මේසයේ නිතර කෑම
කන්නෙහියයි ඔහුට කීය. ඔහු වැඳ 8
කථාකොට: ඔබ විසින් මා වැනි මළ
බල්ලෙකු සැලකීමට ඔබගේ මෙහෙකරුවා

9 කවුද්දයි කීවේය. එවිට රජ සාවුල්ගේ
වැඩකාරයාවූ ශීබාට අඩගසා:
සාවුල්ටත් ඔහුගේ මුළු වංශයටත් අයිතිව
තිබුණු සියල්ල තුඹේ ස්වාමිහුගේ
10 පුත්‍රයාට දුනිමි. එබැවින් තුඹේ ස්වාමිහුගේ
පුත්‍රයාට ආහාර කන්නට ලැබෙන පිණිස
තුඹ සහ තුඹේ පුත්‍රයෝද තුඹේ වැඩ-
කාරයෝද ඔහු උදෙසා ඒ බිම්
වගාකොට එහි අස්වැන්න ගෙනෙල්ලා.
තුඹුත් තුඹේ ස්වාමිහුගේ පුත්‍රවූ
මෙපිබොෂෙත් මාගේ මේසයේ නිතරම
කෑම කනවා ඇතැයි කීවේය. ශීබාට
පුත්‍රයන් පසළොස්දෙනෙක් හා
වැඩකාරයන් විසිදෙනෙක් සිටියෝය.
11 එවිට ශීබා: මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්
තමන්ගේ මෙහෙකරුවාට අණකරන
සියල්ල ලෙස ඔබගේ මෙහෙකරුවා
කරන්නේයයි රජුට කීවේය. මෙපි-
බොෂෙත් වනාහි රාජ පුත්‍රයන්ගෙන්
එක්කෙනෙකු මෙන් රජුගේ මේසයේ කෑම
12 කැවේය. මෙපිබොෂෙත්ට මීකා නම් බාල
පුත්‍රයෙක් විය. ශීබාගේ ගෙයි වැසි
සියල්ලෝ මෙපිබොෂෙත්ගේ වැඩකාරයෝව
13 සිටියෝය. මෙලෙස මෙපිබොෂෙත්
යෙරුසලමේ විසීය. මක්නිසාද ඔහු
රජුගේ මේසයේ නිතරම කෑම කැවේය;
ඔහුගේ දෙපයම කොරව තිබුණේය.

## අම්මොන් සහ සිරියාව සමග යුද්ධකිරීම

10 ඉන්පසු අම්මොන් පුත්‍රයන්ගේ රජ
මැරුණේය, ඔහුගේ පුත්‍රවූ හානූන්
2 ඔහු වෙනුවට රජවුණේය. දාවිත්ද:
හානූන්ගේ පියවූ නාහෂ් මට කරුණාව
පෙන්වූ ලෙස මම හානූන්ට කරුණාව
පෙන්වන්නෙමියි කියා, ඔහුගේ පියා ගැන
ඔහු සනසන පිණිස තමාගේ සේවකයන්
අත කියා ඇරියේය. දාවිත්ගේ සේවකයෝ
අම්මොන් පුත්‍රයන්ගේ දේශයට පැමු-
3 ණුණෝය. එහෙත් අම්මොන් පුත්‍රයන්ගේ
අධිපතීහු තමුන්ගේ ස්වාමිවූ හානූන්ට
කථාකොට: දාවිත් ඔබ ළඟට සැන-
සිලිකාරයන් එවූ නිසා ඔහු ඔබගේ
පියාණන්ට ගෞරවකරන්නේයයි ඔබ
සිතනවාද? දාවිත් තමාගේ සේවකයන්
ඔබ වෙතට එව්වේ නුවර සෝදිසිකර
ඔත්තු බලා ඒක විනාශකරන අදහසින්
නොවේද්දයි කීවෝය. එබැවින් හානූන් 4
දාවිත්ගේ සේවකයන් අල්ලා ඔවුන්ගේ
රැවුලෙන් බාගයක් බූගා දමා, තට්ටම්
දක්වා ඔවුන්ගේ ඇඳුම් මැදින් කපා දමා,
ඔවුන් යන්ට ඇරියේය. ඒ බව දාවිත්ට 5
දන්වූ කල ඔහු ඔවුන් සම්බවෙන්ට
මිනිසුන් ඇරියේය; මක්නිසාද ඒ
මනුෂ්‍යයෝ බොහෝසෙයින් ලජ්ජාවට
පැමිණ සිටියෝය. තුඹලාගේ රැවුල්
වැඩෙන කල් යෙරිකෝවෙහි නැවතී සිට
පසුව හැරී වරෙල්ලායයි රජ කියා
ඇරියේය. තවද අම්මොන් පුත්‍රයෝ දාවිත් 6
ඉදිරියෙහි තමුන් පිළිකුල්වූ බව දැක
පණිවිඩකාරයන් යවා බෙත්-රෙහෝබ්හි
සිරියවරුන්ගෙනුත් ශෝබාහි සිරිය-
වරුන්ගෙනුත් පාබළ සෙනඟ විසිදහසක්ද
මිනිසුන් දහසක් සමග මයකාහි රජුද
ටොබ්හි මිනිසුන් දෙළොස්දහසක්ද
කුලියට ගත්තෝය. දාවිත් ඒ අසා 7
යෝවාබ් හා බලවන්තයන් වන මුළු
සේනාව යැවුවේය. අම්මොන් පුත්‍රයෝ 8
පිටතට ඇවිත් දොරටුව ළඟ යුද්ධයට
පිළිවෙළින් සිටියෝය; ශෝබාහිද
රෙහෝබ්හිද ටෝබ්හිද මයකාහිද
මනුෂ්‍යයොත් භූමියෙහි වෙනම සිටියෝය.
ඉස්සරින්ද පස්සෙන්ද යුද්ධය තමාට 9
විරුද්ධව යොදා තිබෙන බව යෝවාබ්
දැක සියලු බලවන්ත ඉශ්‍රායෙල්වරුන්ගෙන්
පංගුවක් තෝරාගෙන සිරියවරුන්ට
විරුද්ධව සිටුවා, අනික් සෙනඟ 10
අම්මොන් පුත්‍රයන්ට විරුද්ධව සිටුවන
පිණිස ඔවුන් තමාගේ සහෝදරවූ අබීෂයි
අතට භාරදී කථාකොට: සිරියවරුන් 11
මට වඩා බලවත්වුණොත් තුඹ මට
උපකාරකරපන්න. අම්මොන් පුත්‍රයන්
තුඹට වඩා බලවත්වුණොත් මම ඇවිත්
තුඹට උපකාරකරන්නෙමි. ධෛර්යවත්ව 12
සිටපන්න, අපේ සෙනඟ උදෙසාත් අපේ
දෙවියන්වහන්සේගේ නුවරවල් උදෙසාත්

බලවත්ව සිටිමු. **ස්වාමීන්වහන්සේ**
තමන්ට යහපත්ව පෙනෙන ලෙස කරන-
13 සේක්වයි කීය. මෙසේ යෝවාබ්ද ඔහු
සමග සිටි සෙනඟද සිරියවරුන්ට
විරුද්ධව සටනට ළංවූහ. එවිට ඔව්හු
14 ඔහු ඉදිරියෙන් පලාගියෝය. සිරියවරුන්
පලාගිය බව අම්මොන් පුත්‍රයෝ දැක
ඔව්හු අබිෂයි ඉදිරියෙන් පලාගොස්
නුවරට ඇතුල්වූහ. එවිට යෝවාබ්
අම්මොන් පුත්‍රයන් වෙතින් යෙරුසලමට
15 හැරී ආයේය. සිරියවරු තමුන් ඉශ්‍රායෙල්
ඉදිරියෙහි පරාජයවූ බව දැක එකට
16 රැස්වූවෝය. හදර්එසෙර්ද ප්‍රාත් ගංගාවට
එගොඩින් සිටිය සිරියවරුන් ගෙන්වා-
ගත්තේය. ඔව්හුද ඔවුන්ට පෙරටුව
හදර්එසෙර්ගේ සේනාපතියාවූ ෂෝබාද
17 හේලාම්ට ආවෝය. එපවත් දාවිත්ට දැන්වූ
කල ඔහු සියලු ඉශ්‍රායෙල්වරුන් රැස්-
කරගන යොර්දනෙන් එගොඩවී
18 හේලාම්ට ගියේය. සිරියවරුද දාවිත්ට
විරුද්ධව යුද්ධයට සැරසී ඔහු සමග
සටන්කළවිට ඔව්හු ඉශ්‍රායෙල් ඉදිරියෙන්
පලාගියෝය; දාවිත් සිරියවරුන්ගෙන්
රථ සත්සියයක මිනිසුන්ද අසරුවන්
සතළිස් දහසක්ද මරා ඔවුන්ගේ
සේනාපතිවූ ෂෝබාටත් පහරදුන්නේය,
19 ඔහුද එහිදී මළේය. එවිට හදර්එසෙර්ට
සේවකයෝවූ සියලු රජවරු තමුන්
ඉශ්‍රායෙල් ඉදිරියෙහි පරාජයවූ බව දැක
ඉශ්‍රායෙල්වරුන් සමග සමාදනවී ඔවුන්ට
සේවයකළෝය. මෙසේ සිරියවරු
අම්මොන් පුත්‍රයන්ට තවත් උපකාර-
කරන්ට භයවූහ.

## බැත්-ෂෙබා සම්බන්ධව දාවිත්ගේ මහත් පාපය

11 තවද ඊළඟ අවුරුද්දේ රජුන්
යුද්ධයට පිටත්ව යන කාලයේ
දාවිත් යෝවාබ්ද ඔහු සමග තමාගේ
සේවකයන්ද සියලු ඉශ්‍රායෙල්වරුන්ද
හැරියේය; ඔව්හු අම්මොන් පුත්‍රයන්
විනාශකොට රබ්බා වටලූහ. තුමුන් දාවිත්
යෙරුසලමේ නැවතී සිටියේය.

දිනක් සවස් වේලාවේ දාවිත් තමාගේ 2
යහනෙන් නැගිට රජගෙදර පියස්ස උඩ
සක්මන්කෙළේය. එවිට ඔහු ස්ත්‍රියෙක්
නානවා පියස්සේ සිට දුටුවේය. ඒ ස්ත්‍රී
පෙනීමෙන් ඉතා ශෝභමාන වූවාය. දාවිත් 3
පණිවිඩ යවා ස්ත්‍රිය ගැන විභාග
කෙරෙව්වේය. එක්කෙනෙක් කථාකොට:
ඈ එලියාම්ගේ දුවවූ, හිත්තීය උරියාගේ
භාර්යාවවූ බැත්-ෂෙබා නොවේදැයි
කීය. දාවිත් පණිවිඩකාරයන් යවා ඈ 4
ගෙන්වාගත්තේය: ඈ ඔහු ළඟට ආවාය,
ඔහු ඈ සමග සයනය කෙළේය. (ඈ
තමාගේ අපවිත්‍රකමින් පිරිසිදුවී සිටියාය.)
ඈ තමාගේ ගෙදරට හැරී ගියාය. ඒ 5
ස්ත්‍රී ගැබ්ගෙන: මම ගර්භිණීව සිටිමියි
දාවිත්ට දන්වා යැවුවාය. එවිට දාවිත්: 6
හිත්තීය උරියා මා වෙතට එවාපන්නැයි
යෝවාබ්ට කියා යැවීය. යෝවාබ් දාවිත්
ළඟට උරියා හැරියේය. උරියා ඔහු ළඟට 7
ආ කල දාවිත් යෝවාබ්ගේද සෙනඟගේද
සැප සනීපත් යුද්ධය කෙරීගනයන හැටිත්
ඔහුගෙන් විචාළේය. පසුව දාවිත්: නුඹ 8
ගෙදර ගොස් නුඹේ පාද සෝදගනින්නැයි
උරියාට කීවේය. උරියා රජ ගෙදරින්
පිටතට ගියේය, රජුගෙන් ආහාර
කොටසක් ඔහු පස්සෙන් හරින ලද්දේය.
එහෙත් උරියා තමාගේ ගෙදරට 9
නොගොස් තමාගේ ස්වාමිහුගේ සියලු
මෙහෙකරුවන් සමග රජ ගෙයි දොරකඩ
නිදගත්තේය. උරියා තමාගේ ගෙදරට 10
නොගියේයයි දාවිත්ට දැන්වූ කල දාවිත්
උරියාට කථාකොට: නුඹ ගමනක්
ගොස් ආවා නොවේද? නුඹ ගෙදර
නොගියේ මක්නිසාදැයි ඇසුවේය. උරියා 11
දාවිත්ට කථාකොට: ගිවිසුම් පෙට්ටියද
ඉශ්‍රායෙල්වරුද යූදවරුද පැල්වල සිටිති;
මාගේ ස්වාමිවූ යෝවාබ්ද මාගේ
ස්වාමිහුගේ සේවකයෝද එලිමහනේ
කඳවුරු බැඳගෙන සිටිති: එසේ නම් මම
කන්ටත් බොන්ටත් මාගේ භාර්යාව
සමග සයනයකරන්ටත් මාගේ ගෙදරට
යම්ද? ඔබ ජීවත්වන බවද ඔබගේ

ආත්මය ජීවත්වන බවද සැබෑවා සේම
12 මම එසේ නොකරමියි කීය. දාවිත්ද:
අදත් මෙහි සිටපන්න, හෙට තුඹ යන්ට
හරින්නෙමියි උරියාට කීවේය. එසේ උරියා
එදත් පසුවදත් යෙරුසලමෙහි සිටියේය.
13 පසුව දාවිත් ඔහු කැඳවූ කල්හි ඔහු ඇවිත්
රජ ඉදිරියෙහි කෑවේය, බීවේය; රජතෙමේ
ඔහු වෙරිකෙළේය. ඔහු සවස තමාගේ
ස්වාමිහුගේ මෙහෙකරුවන් සමග
තමාගේ ඇඳේ නිදගන්ට පිටතට ගියේය.
එහෙත් තමාගේම ගෙදරට ගියේ නැත.
14 පසුවද දාවිත් යෝවාබ්ට ලියුමක් ලියා
15 ඒක උරියා අත ඇරියේය. ඒ ලියුමේ
ලිව්වේ: සටන ඉතා බලවත්ව තිබෙන
තැන පෙරමුණේම උරියා සිටුවා, පහර
ලැබ නසින පිණිස ඔහු අත්හැර අහක්
16 වෙයල්ලාය කියාය. යෝවාබ් නුවර
රැක සිටියදී, වික්‍රමාන්විත මනුෂ්‍යයන්
සිටින බව ඔහු දන්න ස්ථානයෙහි උරියා
17 සිටෙව්වේය. නුවර මනුෂ්‍යයෝ පිටතට
ඇවිත් යෝවාබ් සමග යුද්ධකළෝය.
එවිට සෙනඟගෙන් එනම් දාවිත්ගේ
සේවකයන්ගෙන් සමහරෙක් වැටුණෝය;
18 හිත්තීය උරියාද මැරුම්කෑවේය. එවිට
යෝවාබ් යුද්ධය ගැන සියලු කාරණා
19 දාවිත්ට දන්වා ඇරියේය; ඔහු පණිවිඩ-
කාරයාට කථාකොට: තුඹ යුද්ධය ගැන
සියලු කාරණා රජ්ජුරුවන්ට කියා නිමවූ
20 කල, රජු කෝපවී: තුඹලා සටන්කරන
පිණිස නුවරට එපමණ ළංවූණේ
මක්නිසාද? ඔවුන් පවුරේ සිට විදින
21 බව දන්නේ නැද්ද? යෙරුබ්බෙෂෙත්ගේ
පුත්‍රවූ අබිමෙලෙක් මරනලද්දේ කා
විසින්ද? තේබේශ්හිදී ස්ත්‍රියෙක් පවුරේ
සිට ඔහු පිටට ඇඹරුම් ගලක උඩ
පළුව හෙළා ඔහු මැරුවා නොවේද?
තුඹලා එපමණ පවුරට ළංවූණේ
මක්නිසාදැයි තුඹට කීවොත්—ඔබගේ
සේවකයාවූ හිත්තීය උරියාද මෙළේයයි
22 කියාපන්නැයි ඔහුට අණකෙළේය. මෙසේ
පණිවිඩකාරයා ගොස් යෝවාබ් තමා
අත කියා හැරිය සියල්ල දාවිත්ට
23 දන්නුවේය. පණිවිඩකාරයා දාවිත්ට
කථාකොට: ඒ මනුෂ්‍යයන් අපට විරුද්ධව
බලවත්වී අපට විරුද්ධව පිටතට ආ
විට අපිත් දොරටුව දක්වා ඔවුන්ට
විරුද්ධව ගියෙමුව. එවිට දුනුවායෝ 24
පවුරේ සිට ඔබගේ සේවකයන්ට විද්දෝය;
රජ්ජුරුවන්ගේ සේවකයන්ගෙන් සමහරෙක්
මළෝය, හිත්තීය උරියා නම්වූ ඔබගේ
සේවකයාත් මෙළේයයි කීවේය. එවිට 25
දාවිත් පණිවිඩකාරයාට කථාකොට:
තුඹ යෝවාබ්ට මෙසේ කියාපන්න—මේ
කාරණය ගැන කනගාටු නොසිතන්න;
මක්නිසාද කඩුව එකෙකු නසන්නාක්
මෙන් අනිකෙකුද නසන්නේය. නුවරට
විරුද්ධව සටන තව බලතරකොට ඒක
බිඳ හෙළාපන්න කියා ඔහුට ධෛර්ය
දීපන්නැයි කීවේය. උරියාගේ භාර්යාව 26
තමාගේ පුරුෂයාවූ උරියා මැරුණු බව
අසා තමාගේ පුරුෂයා ගැන වැලපුණාය.
වැලපීමේ කාලය නිමවූ කල දාවිත් 27
තමාගේ ගෙට ඈ ගෙන්වාගත්තේය, ඈ
ඔහුගේ භාර්යාව වී ඔහුට පුත්‍රයෙකු
වැදුවාය. නුමුත් දාවිත් කළ ක්‍රියාව
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි දුෂ්ටව
තිබුණේය.

## දාවිත්ගේ පශ්චාත්තාපය. සාලමොන්ගේ උප්පැත්තිය. රබ්බා ගැනීම

12 තවද ස්වාමීන්වහන්සේ දාවිත්
වෙතට නාතාන් යැවූසේක. ඔහු
දාවිත් ළඟට ඇවිත් කථාකොට: එක්
නුවරක මනුෂ්‍යයෝ දෙදෙනෙක්
සිටියෝය; එක්කෙනෙක් ධනවතෙක්ය,
අනික් අය දිළින්දෙක්ය. ධනවතාට බැටළු 2
රැළවල්ද ගව රැළවල්ද ඉතා මහත්
ගණනක් වූහ. නුමුත් දිළින්දාට තමා 3
මිලේට ගෙන ඇතිකළාවූ එක කුඩා
බැටළු වැස්සියෙකු හැර වෙන කිසිවක්
නොවීය. ඈ ඔහු වෙතම ඔහුගේ දරුවන්
සමග වැඩෙමින්ද ඔහුගේ කෑම ටිකෙන්
කමින්ද ඔහුගේ කුසලානෙන් බොමින්ද
ඔහුගේ ළයෙහි හොවමින්ද ඔහුට දුවෙකු
මෙන් සිටියාය. ධනවතා ළඟට ගමන් 4
යන්නෙක් ආයේය, ඔහු තමා ළඟට ආ

මගියාට කෑම පිළියෙළ කරන පිණිස
තමාගේම බැටළුවන්ගෙන්වත් ගවයින්-
ගෙන්වත් ගන්ට අකමැතිවී දිළින්දාගේ
බැටළු වැස්සිය රැගෙන තමා ළඟට
ආ මනුෂ්‍යයාට කෑම පිළියෙළකෙළේයයි
5 ඔහුට කීය. එවිට දාවිත්ගේ කෝපය ඒ
මනුෂ්‍යයාට විරුද්ධව බොහෝසෙයින්
ඇවිළ, ඔහු නාතාන්ට කථාකොට:
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව
සැබෑවාසේම මේක කළ මිනිහා
6 මැරුම්කෑ යුතුය. ඔහු මේ ක්‍රියාව කළ
බැවින්ද අනුකම්පා නොකළ බැවින්ද ඒ
බැටළු වැස්සී වෙනුවට සතරදෙනෙක්
දෙන්ට ඕනෑයයි කීවේය.
7 එවිට නාතාන් දාවිත්ට කථාකොට: ඒ
මනුෂ්‍යයා තුඹය. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක–
මම තුඹ ඉශ්‍රායෙල් කෙරෙහි රජකොට
ආලේපකර මමම තුඹ සාවුල් අතින්
8 ගළවාගතිමි. මම තුඹේ ස්වාමිහුගේ
වංශයද තුඹේ ළයට තුඹේ ස්වාමිහුගේ
භාර්යාවන්ද දුනිමි; ඉශ්‍රායෙල් සහ යූද
වංශයත් තුඹට දුනිමි; ඒ මදිනම් මම
තවත් මේ මේ ආකාර දේ තුඹට දෙන්-
9 නෙමි. තුඹ **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කිරීමෙන්
උන්වහන්සේගේ වචනය සුළුකොට
සිතුවේ මක්නිසාද? තුඹ හිත්තීය උරියා
කඩුවෙන් නසා ඔහුගේ භාර්යාව තුඹට
භාර්යාව කොට ගත්තෙහිය, තුඹ වනාහි
අම්මොන් පුත්‍රයන්ගේ කඩුවෙන් ඔහු
10 මැරෙවූවෙහිය. ඉතින් තුඹ මා සුළුකොට
සිතා හිත්තීය උරියාගේ භාර්යාව තුඹට
භාර්යා කොට ගත් බැවින් කඩුව කිසි
කලක තුඹේ වංශයෙන් පහනොවන්නේය.
11 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක–
මම තුඹට විරුද්ධව තුඹේම පවුලෙන්
විපත්ති උපදවා, තුඹේ ඇස් ඉදිරියේදී
තුඹේ භාර්යාවන් රැගෙන තුඹේ අසල්-
වාසියෙකුට දෙන්නෙමි; හෙතෙම මේ
සූර්යයා ඉදිරියෙහි තුඹේ භාර්යාවන්
12 සමග සයනයකරන්නේය. මක්නිසාද තුඹ
ඒක රහසින් කෙළෙහිය. නුමුත් මම සියලු
ඉශ්‍රායෙල්වරුන්ද සූර්යයාද ඉදිරියෙහි
මේ දේ කරවන්නෙමියි කියනසේකැයි
කීවේය. එවිට දාවිත්: මම **ස්වාමීන්-** 13
**වහන්සේට** විරුද්ධව පව්කෙළෙමියි
නාතාන්ට කීය. නාතාන්ද: **ස්වාමීන්-**
**වහන්සේ** තුඹේ පාපය පහකළසේක,
තුඹ නොනස්නෙහිය. නුමුත් තුඹ මේ 14
ක්‍රියාව කරණකොටගෙන අපහාසකරන්ට
**ස්වාමීන්වහන්සේගේ** සතුරන්ට අවකාශ
දුන් බැවින් තුඹ නිසා උපන් ළදරුවා
සැබවින්ම මැරෙන්නේයයි දාවිත්ට
කීයේය. නාතාන් තමාගේ ගෙදරට 15
ගියේය.
උරියාගේ භාර්යාව දාවිත් නිසා වැදූ
ළදරුවාට **ස්වාමීන්වහන්සේ** පහරදුන්-
සේක, ළදරුවා ඉතා රෝගාතුරවිය.
එබැවින් දාවිත් ළදරුවා ගැන දෙවියන්- 16
වහන්සේට කන්නලව්කෙළේය; දාවිත්
නිරාහාරව සිට ගෙට ඇතුල්වී රාත්‍රිය
මුළුල්ලෙහි බිම වැතිර උන්නේය. ඔහු 17
බිමෙන් නැගුටුවන්ට ඔහුගේ ගෙදර
වැඩිමහල්ලෝ නැගිට ඔහු ළඟ
සිටියෝය. එහෙත් ඔහු කැමතිවුණේ
නැත, ඔවුන් සමග කෑම කෑවේත් නැත.
සත්වෙනිදා ළදරුවා මැරුණේය. දාවිත්ගේ 18
සේවකයෝ ළදරුවා මැරුණු බව ඔහුට
දන්වන්ට භයවූහ. මක්නිසාද: ළදරුවා
ජීවත්ව සිටියදී අප ඔහුට කථා කළ
විට ඔහු අපේ හඬට ඇහුම්කන් දුන්නේ
නැත. ඉදින් දැන් ළදරුවා මැරුණ බව
ඔහුට කීවොත් තමාටම යම් අනතුරක්
කරනොගන්නේදැයි ඔව්හු කීවෝය.
නුමුත් දාවිත් තමාගේ මෙහෙකරුවන් 19
කොඳුරනවා දැක ළදරුවා මැරුණු බව
ඔහුට දැනී: ළදරුවා මැරුණාදැයි
මෙහෙකරුවන්ගෙන් ඇසීය. මැරුණායයි
ඔව්හු කීවෝය. එවිට දාවිත් බිමින් 20
නැගිට නා තෙල්ගාගෙන, තමාගේ වස්ත්‍ර
මාරුකර, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ඇතුල්වී නමස්කාර කොට, පසුව
තමාගේ ගෙට ආයේය; තවද ඔහු තමා
ඉදිරියෙහි කෑම තබන්ට කියා ඉල්ලා
කෑම අනුභවකෙළේය. එවිට ඔහුගේ 21
සේවකයෝ ඔහුට කථාකොට: ඔබ කළ
මේ දේ මොකද? ළදරුවා ජීවත්ව සිටියදී

ඔබ ඔහු ගැන නිරාහාරව ඇඬුවෙහිය;
නුමුත් ළදරුවා මැරුණු විට ඔබ නැගිට
22 කෑම කෑයෙහියයි කීවෝය. ඔහුද:
ළදරුවා ජීවත්ව සිටියදී මම නිරාහාරව
සිට ඇඬුවෙමි. මක්නිසාද—ළදරුවා
ජීවත්වෙන ලෙස **ස්වාමීන්වහන්සේ** මට
කරුණාකරනසේක්ද නැද්දැයි දන්නේ
23 කවුද්දැයි සිතුවෙමි. නුමුත් දැන් ඔහු
මැරුණායින් පසු කුමට නිරාහාරව
සිටිම්ද? ඔහු නැවත ගෙන්වාගන්ට මට
පුළුවන්ද? මා ඔහු ළඟට යනවා මිස
ඔහු මා ළඟට හැරී එන්නේ නැතැයි
24 කීය. පසුව දවිත් තමාගේ භාර්යාවවූ
බැත්-ෂෙබා සනසා ඈ ළඟට පැමිණ
ඈ සමග සයනයකෙළේය. ඈ පුත්‍රයෙකු
වැදූවාය, ඔහු සාලමොන් යන නාමය
ඔහුට තැබුවේය. **ස්වාමීන්වහන්සේ**
25 ඔහුට ප්‍රේමකළසේක; උන්වහන්සේ
අනාගතවක්තෘවූ නාතාන් අත කියා
හැරියසේක, **ස්වාමීන්වහන්සේ** නිසා
ඔහුට *යෙදීදියා යන නම තබන ලද්දේය.
26 යෝවාබ් අම්මොන් පුත්‍රයන්ට
අයිති රබ්බාට විරුද්ධව යුද්ධකොට
27 රාජධානිය අල්ලාගත්තේය. යෝවාබ්
දවිත් වෙතට පණිවිඩකාරයන් යවමින්:
රබ්බාට විරුද්ධව යුද්ධකෙළෙමි, ජල
28 නුවරද අල්වාගතිමි. එබැවින් මා විසින්
ඒ නුවර අල්ලා ගැනීමෙන් ඊට මාගේ
නාමය නොලැබෙන පිණිස ඔබ ඉතිරි
සෙනඟ රැස්කරගෙන නුවරට විරුද්ධව
කඳවුරු බැඳ ඒක අල්වාගත මැනවියි
29 කියන්ට කීවේය. දවිත් වනාහි මුළු සෙනඟ
රැස්කරගෙන රබ්බාට ගොස් ඊට විරුද්ධව
30 සටන්කොට එය අල්වාගත්තේය. ඔහු
ඔවුන්ගේ රජුගේ ඔටුන්න ඔහුගේ හිසෙන්
ගත්තේය; ඒකේ බර රන් තලෙන්තයක්ය,
එහි අනර්ඝ මැණික් ගල් අල්ලා
තිබුණේය; ඒක දවිත්ගේ හිසේ තබන
ලද්දේය. ඔහු නුවරින් කොල්ලය බොහෝ
31 සෙයින්ම ගෙනායේය. ඔහු එහි සිටි

*එනම්, ස්වාමීන්වහන්සේ ප්‍රේමකළ තැනැත්තා.

සෙනඟ පිටතට ගෙන්වා *කියත්වලින්ද
මඩින යකඩ යන්ත්‍රවලින්ද යකඩ
පොරෝවලින්ද කපා දැමුවේය, ගඩොල්
උදුන මැදින් යන්ටද සැලැස්සුවේය. ඔහු
අම්මොන් පුත්‍රයන්ගේ සියලු නුවරවලට
මෙසේ කෙළේය. එවිට දවිත් සහ මුළු
සෙනඟ යෙරුසලමට හැරී ආවෝය.

## අම්නොන්ගේ අපරාධය. අබ්සලොම්ගේ පළිගැනීම

13 ඉන්පසු මෙසේ සිදුවිය. දවිත්ගේ
පුත්‍රවූ අබ්සලොම්ට තාමර් නම්වූ
රූපවත් සහෝදරියක් සිටියාය; දවිත්ගේ
පුත්‍රවූ අම්නොන් ඈට පෙම් බැන්දේය.
අම්නොන් තමාගේ සහෝදරීවූ තාමර් 2
නිසා අසනීපවෙන තරම් කනස්සලුව
සිටියේය; මක්නිසාද ඈ කන්‍යාවක්ය;
ඈට යමක් කරන්ට තමාට උගහට
බවත් අම්නොන්ට පෙණුණේය. නුමුත් 3
දවිත්ගේ සහෝදරයා වන ෂිමෙයාගේ
පුත්‍රවූ යොනාදබ් නම්වූ මිත්‍රයෙක්
අම්නොන්ට සිටියේය. යොනාදබ් ඉතා
උපා දක්ෂ මනුෂ්‍යයෙකි. ඔහු: රාජ පුත්‍රය, 4
නුඹ දවසින් දවස මෙසේ කෘශවෙන්නේ
මක්නිසාද? මට කියන්නේ නැද්දැයි
ඔහුට කීය. එවිට අම්නොන්: මාගේ
සහෝදරයා වන අබ්සලොම්ගේ සහෝදරීවූ
තාමර්ට ආලය ඇත්තෙමියි ඔහුට කීය.
යොනාදබ්ද: නුඹ ලෙඩින් ඉන්නාක්මෙන් 5
නුඹේ යහනේ වැතිර හිඳ නුඹේ පියාණන්
නුඹ බලන්ට ආකල ඔහුට කථාකොට—
මාගේ සහෝදරීවූ තාමර් ඇවිත් මට
කෑම දෙන්ටත් මට පෙනෙන ලෙස මා
ඉදිරියෙහි කෑම පිළියෙළ කරන්ටත් ඇගේ
අතින් මට එය කන්ටත් අවසර
දුනමැනවියි ඔහුට කියාපන්නැයි කීවේය.
මෙසේ අම්නොන් ලෙඩින් ඉන්නාක්මෙන් 6
වැතිර උන්නේය. රජු අම්නොන් බලන්ට
ආ කල ඔහු රජුට කථාකොට: මා

*ඇතමෙක් මෙය: කියත් යනාදියෙන්ද ගඩොල් උදුනේද වැඩ කරන්ට සැලැස්සුවේය කියාත් කිව හැකි බැව් කල්පනාකරත්.

විසින් මාගේ සහෝදරීවූ තාමර්ගේ අතින්
කන පිණිස ඈ මාගේ ඇස් ඉදිරියේදී
7 රොටි දෙකක් සාදවයි කීවේය. එවිට
දාවිත්: නුඹේ සහෝදරවූ අම්නොන්ගේ
ගෙට ගොස් ඔහුට කෑම සාද දීපන්නැයි
8 ගෙදර උන් තාමර්ට කියා යැවීය. එවිට
තාමර් ඇගේ සහෝදරවූ අම්නොන්ගේ
ගෙට ගියාය; ඔහු නිදා සිටියේය. ඈ පිටි
රැගෙන අනා ඔහුගේ ඇස් ඉදිරියේදී
9 රොටි සාද පුලුස්සා ඇතිලිය ගෙනැවිත්
ඔහු ඉදිරියෙහි ඒවා හෙළුවාය; එහෙත්
ඔහු කන්ට කැමතිවුණේ නැත. අම්නොන්:
හැමදෙනාම මා වෙතින් පිටතට
පලයල්ලායයි කීය. සියලු දෙනාම
10 ඔහු වෙතින් පිටතට ගියෝය. අම්නොන්:
මා නුඹේ අතින් කන පිණිස කෑම
ඇතුල්ගෙට ගෙනෙන්නැයි තාමර්ට
කීවේය. තාමර්ද ඈ සෑදූ රොටි රැගෙන
ඇතුල් ගෙයි උන් ඇගේ සහෝදරවූ
11 අම්නොන් ළඟට ගෙනගියාය. ඒවා
ඔහුට කන්ට ළඟට ගෙනගිය විට ඔහු
ඈ අල්වා: මාගේ සහෝදරිය, ඇවිත්
මා සමග සයනයකරපන්නැයි ඈට
12 කීවේය. එවිට ඈ: මාගේ සහෝදරය,
එසේ නොවේවා, මට අවනම්බු
නොකරන්න; ඉශ්‍රායෙල්හි එබඳු දෙයක්
කරන්ට යුතු නැත; මේ නින්දිතකම
13 නොකරන්න. එසේ කළොත් මම
මාගේ නින්දාව කොතැනට ගෙනයම්ද?
නුඹත් ඉශ්‍රායෙල්හි නින්දිතයන්ගෙන්
එක්කෙනෙකු මෙන් වන්නෙහිය. ඉත්නිසා
රජ්ජුරුවන්ට කථාකරපන්න; ඔහු මා
නුඹට නොදී සිටින්නේ නැතැයි කීවාය.
14 නුමුත් ඔහු ඇගේ හඬට කන්නොදී ඈට
වඩා ශක්තිමත් බැවින් ඈට බලාත්කාර-
15 කොට ඈ සමග සයනයකෙළේය. එවිට
අම්නොන් ඉතා මහත් වෛරයකින් ඈට
වෛරවුණේය; මක්නිසාද ඔහු ඈට
වුණාවූ වෛරය පළමු ඈට බැන්දවූ
ආලයට වඩා මහත්ව තිබුණේය. නැගිට
16 පලයන්නැයි අම්නොන් ඈට කීය. එසේ
නොකරන්න, මා යන්ට හැරීම නුඹ මට
කළ අනික් නපුරට වඩා මහත්යයි ඈ
17 ඔහුට කීවාය. නුමුත් ඔහු ඈට ඇහුම්කන්
නොදී තමාට සේවයකළ වැඩකාරයාට
අඬගසා: මේ ස්ත්‍රිය මා ළඟින් පිටත
ඇර දොර අගුල්ලාපන්නැයි කීවේය. ඈ 18
නානා වර්ණ වස්ත්‍රයක් ඇඳගෙන
සිටියාය. මක්නිසාද රජ්ජුගේ කන්‍යා දූවරු
එබඳු සළු ඇන්දෝය. ඔහුගේ වැඩකාරයා
ඈ පිටතට ඇර දොරේ අගුළුදැමුවේය.
එවිට තාමර් තමාගේ හිසේ අලු 19
දමාගන, ඇඳගන සිටිය *නානා වර්ණ
වස්ත්‍රය ඉරාගන, හිසේ අත තබාගන,
කෑගසමින් ගියාය. ඇගේ සහෝදරවූ 20
අබ්සලොම් ඈට කථාකොට: නුඹේ
සහෝදරවූ අම්නොන් නුඹ සමග
උන්නාද? ඉතින් මාගේ සහෝදරිය,
නිශ්ශබ්දව හිඳින්න. ඔහු නුඹේ
සහෝදරයාය; මේ කාරණය සිතට
නොගනින්නැයි ඈට කීවේය. තාමර්
ඇගේ සහෝදර අබ්සලොම්ගේ ගෙයි
අසරණභාවයෙන් විසුවාය. දාවිත් රජ 21
මේ සියලු දේ අසා ඉතා උදහස් විය.
නුමුත් අබ්සලොම් අම්නොන්ට 22
හොඳක්වත් නරකක්වත් කථා
නොකෙළේය. මක්නිසාද තමාගේ
සහෝදරීවූ තාමර්ට අම්නොන් අවනම්බු
කළ බැවින් අබ්සලොම් ඔහුට වෛර
බැන්දේය.

මීට පුරා දෑවුරුද්දකට පසු එප්‍රායිම්ට 23
නුදුරුවූ බාල්-හාසොර්හි අබ්සලොම්ට
බැටළු ලොම් කපන්නෝ වූවෝය. අබ්සලොම්
සියලු රාජ පුත්‍රයන් කැඳෙවුවේය. ඔහු 24
රජු වෙතට ඇවිත් කථාකොට: ඔබගේ
මෙහෙකරුවාට බැටළුලොම් කපන්නෝ
සිටිති; ඉතින් රජුද තමන්ගේ සේවකයන්ද
ඔබගේ මෙහෙකරුවා සමග අවමැනවියි
කීවේය. රජද: නෑ, මාගේ පුත්‍රය, අපි 25
සියල්ලෝම නොඑන්නෙමුව, ආවොත්
නුඹට බරක් වේයයි අබ්සලොම්ට
කීවේය. ඔහු පෙරැත්තකළ නුමුත් ඔහු
යන්ට කැමති නොවීය, නුමුත් ඔහුට
ආශීර්වාදකෙළේය. එකල අබ්සලොම්: 26
එසේ නම් මාගේ සහෝදරවූ අම්නොන්ට
අප සමග යන්ට අවසර ලැබේවයි

*නොහොත්, අත් ඇති දිග.

කීවේය. ඔහු තුඹ සමග යන්නේ කුමටදැයි
27 රජ ඇසුවේය. නුමුත් අබ්සලෝම් ඔහුට
පෙරැත්ත කෙළේය, එවිට ඔහු අම්නොන්ද
රජුගේ සියලු පුත්‍රයන්ද ඔහු සමග
28 යන්ට ඉඩදුන්නේය. අබ්සලෝම් තමාගේ
වැඩකාරයන්ට අණකරමින්: මෙන්න,
බලාපල්ලා, අම්නොන්ගේ සිත මුද්‍රික
පානයෙන් ප්‍රීතිවී තිබෙන විට–
අම්නොන්ට පහරදීපල්ලායයි මා
තුඹලාට කීවාම ඔහු මරාපල්ලා,
භයනොවෙල්ලා. තුඹලාට අණකළේ මම
නොවෙම්ද? ධෛර්යවත්ව වික්‍රමාන්විතව
29 සිටපල්ලායයි කීවේය. අබ්සලෝම්ගේ
වැඩකාරයෝ අබ්සලෝම් අණකළ ලෙස
අම්නොන්ට කළෝය. එවිට රජුගේ
සියලු පුත්‍රයෝ නැගිට තම තමුන්ගේ
අශ්වතරයන් පිට නැගී පලාගියෝය.
30 ඔවුන් මාර්ගයෙහි යද්දී: අබ්සලෝම්
රජුගේ සියලු පුත්‍රයන් මැරුවේය, එක්-
කෙනෙක්වත් ඉතුරුව නැත කියා දාවිත්ට
31 සැලවිය. එවිට රජ නැගිට තමාගේ
වස්ත්‍ර ඉරාගෙන බිම වැතිරුණේය; ඔහුගේ
සියලු සේවකයෝද තමුන්ගේ වස්ත්‍ර
32 ඉරාගෙන ළඟ සිටියෝය. තවද දාවිත්ගේ
සහෝදරයා වන ෂිමෙයාගේ පුත්‍රවූ
යොනාදබ් කථාකොට: රජුගේ පුත්‍රයන්
වන ඒ යෞවනයන් සියල්ලන්ම ඔව්හු
මැරුවෝයයි මාගේ ස්වාමියා නො-
සිතාවා; අම්නොන් පමණක් මෙළේය.
මක්නිසාද අබ්සලෝම්ගේ සහෝදරීවූ
තාමර්ට අම්නොන් අවනම්බුකළද පටන්
අබ්සලෝම් විසින් එය නියමකර
33 තිබුණේය. ඒ නිසා සියලු රාජ පුත්‍රයෝ
මළෝයයි සිතන හැටියට මාගේ
ස්වාමිවූ රජ්ජුරුවෝ කාරණය සිතට
නොගතමැනවි. අම්නොන් පමණක්
34 මෙළේයයි කීවේය. එහෙත් අබ්සලෝම්
පලාගියේය. රැකවලෙහි සිටි යෞවනයා
තමාගේ ඇස් ඔසවා බැලූවිට මහත්
සෙනඟක් කන්දේ පැත්තකින් තමා
පිටිපස්සේ තිබුණ මාර්ගයෙහි එනවා
35 දුටුවේය. යොනාදබ් රජුට කථාකොට:
අන්න රාජ පුත්‍රයෝ එන්නාහ. ඔබගේ
මෙහෙකරුවා කී ලෙසම සිද්ධවී තිබේ-
යයි කීවේය. තවද ඔහු කථාකොට නිමවූ 36
විට රාජ පුත්‍රයෝ ඇවිත් ශබ්දනගා
ඇඬුවෝය. රජද ඔහුගේ සියලු සේවකයෝද
අතිශයින් ඇඬුවෝය. අබ්සලෝම් ගෙෂූර්හි 37
රජවූ අම්මිහුද්ගේ පුත්‍රවූ තල්මයි වෙතට
පලාගියේය. දාවිත් තමාගේ පුත්‍රයා ගැන
හැමදම වැලපුණේය.
මෙසේ අබ්සලෝම් ගෙෂූර්ට පලාගොස් 38
එහි තුන් අවුරුද්දක් සිටියේය.
අම්නොන්ගේ මරණයෙන් පසු දාවිත් රජ 39
සැනසී සිටි බැවින් ඔහු අබ්සලෝම්
ළඟට යන්ට ඉතා ආශාවිය.

## යෝවාබ් කරණකොටගෙන අබ්සලෝම් දාවිත් සමග සමාදනවීම

14 රජුගේ සිත අබ්සලෝම් කෙරෙහි
ඇලුම්ව තිබෙන බව ශෙරුයාගේ
පුත්‍රවූ යෝවාබ්ට දැනුණේය. එවිට 2
යෝවාබ් තෙකෝවායෙන් නුවණක්කාර
ස්ත්‍රියෙක් ගෙන්වාගෙන ඈට කථාකොට:
තුඹ වැලපෙන්නාක් මෙන් වැලපීමේ වස්ත්‍ර
හැඳ, තෙල් නොගා, මැරුණ කෙනෙකු
ගැන බොහෝ කල් වැලපුණු ස්ත්‍රියෙක්
මෙන් වී, රජු ළඟට ගොස් මේ මේ 3
වචනවල හැටියට ඔහුට කියාපන්නැයි
කියා ඒ වචන ඈගේ කටට දුන්නේය.
තෙකෝවාහි ස්ත්‍රී රජු ළඟට ගොස් 4
මුහුණින් බිම වැටී වැඳ: අනේ
රජ්ජුරුවෙනි, පිහිටවුවමැනවැයි කීවාය.
රජ: තුඹට මක්වෙලාදැයි ඈගෙන් ඇසුවේය. 5
ඈද: සැබවින් මම වැන්දඹුවක්මි, මාගේ
පුරුෂයා මැරුණේය. ඔබගේ දාසීට 6
පුත්‍රයන් දෙදෙනෙක් සිටියෝය, ඒ
දෙදෙනා පිටතදී දබර කරගත්තෝය,
ඔවුන් නවත්වන්ට කිසිවෙක් නොසිටිය
නිසා එක්කෙනෙක් අනිකාට ගසා ඔහු
මැරුවේය. ඉතින් දැන් පවුලේ සියල්ලෝ 7
ඔබගේ දාසීට විරුද්ධව නැගිට: තමාගේ
සහෝදරයා මැරූ තැනැත්තා ඔහු විසින්
මරනලද සහෝදරයාගේ ප්‍රාණය උදෙසා
අප විසින් මරන පිණිස අපට දියන්න,
මෙසේ අපි උරුමක්කාරයාත් විනාශ

කරන්නෙමුයයි කියති. මේ ආකාරයෙන්
මාගේ පුරුෂයාට පොළෝ මතුපිට
නාමයක්වත් දරුවෙක්වත් නොපවතින
ලෙස ඔවුන් මට ඉතුරුව තිබෙන අඟුර
8 නිවනවා ඇතැයි කීවාය. රජද: තුඹ
ගෙදර පලයන්න, මම තුඹ ගැන
9 අණදෙමියි ස්ත්‍රියට කීවේය. තෙකෝවාහි
ස්ත්‍රී: මාගේ ස්වාමිවූ රජ්ජුරුවෙනි ඒ
දෝෂය මා පිටත් මාගේ පිය වංශය
පිටත් වේවා. රජද රජුගේ සිංහාසනයද
10 නිර්දෝෂවේවයි රජුට කීවාය. රජද:
තුඹට විරුද්ධව කථාකරන අය මා
ළඟට ගෙනෙන්න, එවිට ඔහු තවත් තුඹට
11 අත නොගසන්නේයයි කීවේය. එවිට
ඈ: ලේවලට පළිගන්න අය විසින් තවත්
විනාශනොකරන පිණිසද ඔවුන් මාගේ
පුත්‍රයා නැතිනොකරන පිණිසද රජ්ජුරුවෝ
ඔබගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** සිහි-
කෙරෙත්වයි කීවාය. ඔහුද: **ස්වාමීන්-**
**වහන්සේ** ජීවමාන බව සැබෑවා සේම
තුඹේ පුත්‍රයාගේ ඉසකෙසක්වත් බිම
12 නොවැටෙන්නේයයි කීවේය. එවිට ඒ
ස්ත්‍රී: මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට
වචනයක් කියන්ට ඔබගේ දාසීට අවසර
ලැබේවයි කීවාය. කියාපන්නැයි ඔහු
13 කීවේය. ස්ත්‍රීද: එසේවීනම් ඔබ දෙවියන්-
වහන්සේගේ සෙනඟට විරුද්ධව එබඳු
දෙයක් කල්පනාකළේ මක්නිසාද?
පන්නාදමනු ලැබූ තමන්ගේම තැනැත්තා
නැවත ගෙන්වා නොගන්න බැවින්
රජ්ජුරුවෝ දන් කී කාරණය නිසා
වරදකාරයෙක් මෙන් සිටින්නාහ.
14 කුමක්හෙයින්ද බිම වැගුරුණ වතුර
එකතුකරගන්ට බැරුවාක්මෙන් අප
මැරෙන්ටම ඕනෑය; දෙවියන්වහන්සේ
වනාහි ප්‍රාණය හානි නොකොට,
පන්නාදමනු ලැබූ අය තමන් වෙතින්
තවත් පිටවහලෙකු නොවනලෙස
15 යෝජනාකරගන්නාසේක. එබැවින් මා
දන් මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට මේ
කාරණාව කියන්ට ඇවිත් සිටින්නේ
සෙනඟ මා භයගැන්වූ නිසාය. එබැවින්:
මම රජ්ජුරුවන්ට කථාකරමි; සමහර
විට රජ්ජුරුවන් තමන් දාසියගේ ඉල්ලීම
ඉෂ්ටකරනවා වෙන්ට පුළුවන. මක්නිසාද 16
දෙවියන්වහන්සේගේ උරුමයෙන් මාත්
මාගේ පුත්‍රයාත් එක වරම නැතිකර
දමන්ට හදන මනුෂ්‍යයාගේ අතින්
තමන්ගේ දාසිය ගළවන්ට රජ්ජුරුවන්
ඇහුම්කන්දෙනවා ඇතැයි මම සිතුවෙමි.
එබැවින් මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ගේ 17
වචනයෙන් සැනසීම ලැබේවයි ඔබගේ
දාසී කීවාය. මක්නිසාද යහපත අයහපත
විමසීමට මාගේ ස්වාමිවූ රජ්ජුරුවෝ
දෙවියන්වහන්සේගේ දූතයෙකු හා
සමානය. එබැවින් ඔබගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඔබ සමග සිටින-
සේක්වයි කීවාය. එවිට රජ උත්තරදෙමින්: 18
මා තුඹෙන් අසන දෙය මාගෙන්
සඟවන්ට එපායයි ස්ත්‍රියට කීවේය.
ස්ත්‍රීද: මාගේ ස්වාමිවූ රජ්ජුරුවෝ
කථාකෙරෙත්වයි කීවාය. රජද: මේ 19
සියල්ල සම්බන්ධව යෝවාබ්ගේ අත
තුඹ සමගදැයි ඇසුවේය. ස්ත්‍රී උත්තර-
දෙමින්: මාගේ ස්වාමිවූ රජ්ජුරුවෙනි,
ඔබගේ ආත්මය ජීවත්වන බව
සැබෑවා සේම මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්
කී සියල්ලෙන් දකුණටවත් වමටවත්
හැරෙන්ට කිසිවෙකුට නුපුළුවන. එසේය,
ඔබගේ සේවකවූ යෝවාබ්ම මට
අණකර ඔහුම මේ සියලු වචන ඔබගේ
දාසීගේ කටට දුන්නේය. ඔබගේ 20
සේවකයාවූ යෝවාබ් මෙසේ කළේ
කාරණයේ අන්දම හරවා පෙන්වන
පිණිසය. තුමූත් පොළොවේ සියල්ල
දැනගැනීමට මාගේ ස්වාමියාගේ ප්‍රඥාව
දෙවියන්වහන්සේගේ දූතයෙකුගේ ප්‍රඥාව
හා සමානයයි කීවාය. එවිට රජ 21
යෝවාබ්ට කථාකොට: මෙන්න, මම
ඒ කාරණය ඉෂ්ටකෙළෙමි. තුඹ ගොස්
අබ්සලොම් යෞවනයා කැඳවාගෙන
වරෙන්නැයි කීවේය. යෝවාබ් මුහුණින් 22
බිම වැටී වැඳ රජුට ස්තුතිකොට:
රජ්ජුරුවන් විසින් තමන් මෙහෙකරුවාගේ
ඉල්ලීම ඉෂ්ටකළ නිසා මාගේ ස්වාමිවූ
රජ්ජුරුවෙනි, ඔබ ඉදිරියෙහි මට
කරුණාව ලැබී තිබෙන බව ඔබගේ

මෙහෙකරුවා දන් දන්නේයයි කීවේය.
23 මෙසේ යෝවාබ් පිටත්ව ගෙෂූර්ට ගොස්
අබ්සලොම් යෙරුසලමට කැඳවාගන
24 ආවේය. රජද: ඔහු තමාගේ ගෙදරට
යේවා, ඔහු මාගේ මුහුණ නොදක්නේ-
යයි කීවේය. එබැවින් අබ්සලොම් තමාගේ
ගෙදරට හැරී ගියේය, ඔහු රජුගේ මුහුණ
දුටුවේ නැත.
25 අබ්සලොම් මෙන් රූප ශෝභාව ගැන
ප්‍රශංසා කටයුතු කෙනෙක් මුළු
ඉශ්‍රායෙල්හි සිටියේ නැත. පතුළ පටන්
හිස්මුදුන දක්වා ඔහුට කිසි කැලලක්
26 නොවීය. ඔහු තමාගේ හිසකේ
අවුරුද්දෙන් අවුරුද්ද කැපුවේය; ඒවා
කැපුවේ ඔහුට බරව තිබුණ නිසාය.
ඔහු හිසකේ කැපූ විට එය කිරා
බැලුවේය, ඒවායේ බර රාජ පඩියෙන්
27 ෂෙකෙල් දෙසියයක් විය. අබ්සලොම්ට
පුත්‍රයන් තුන්දෙනෙක්ද එක දූවක්ද
උපන්නෝය, ඇගේ නම තාමර්ය. ඈ
ශෝභන පෙනීමක් ඇති ස්ත්‍රියෙක් වූවාය.
28 අබ්සලොම් රජුගේ මුහුණ නොදැක
දෑවුරුද්දක්ම යෙරුසලමෙහි වාසය-
29 කෙළේය. එවිට අබ්සලොම් යෝවාබ් රජු
ළඟට යවන පිණිස ඔහුට හඬගසා,
ඇරියේය; නුමුත් ඔහු එන්ට කැමති
නොවීය. ඔහු නැවත දෙවෙනි වර
ඇරියේය, එහෙත් ඔහු එන්ට කැමතිවුණේ
30 නැත. එබැවින් ඔහු තමාගේ වැඩ-
කාරයන්ට කථාකොට: බලාපල්ලා,
යෝවාබ්ගේ කෙත මගේ කෙත ළඟය,
එහි ඔහුට යව ගොයම් තිබේ; නුඹලා
ගොස් එය ගිනිලාපල්ලායයි කීවේය.
අබ්සලොම්ගේ මෙහෙකරුවෝ ඒ කෙතට
31 ගිනි තිබුවෝය. එවිට යෝවාබ් නැගිට
අබ්සලොම් ළඟට ඔහුගේ ගෙදරට
ඇවිත්: නුඹේ වැඩකාරයන් මාගේ
කෙතට ගිනිතැබුවේ මක්නිසාදැයි
32 ඔහුගෙන් ඇසුවේය. අබ්සලොම්ද
යෝවාබ්ට කථාකොට: මම ගෙෂූර් සිට
කුමට ආයෙම්ද? මේ වනතුරුත් එහි
සිටියෙම් නම් මට හොඳය කියා කියන්ට
නුඹ රජු වෙතට යවන පිණිස, මෙහි
වරෙන්න කියා නුඹට කියා එවූවෙමි.
ඉතින් මට රජුගේ මුහුණ දකින්ට
ලැබේවා; මා තුළ අපරාධයක් ඇත්නම්
ඔහු මා මැරුවාවේයයි කීවේය. යෝවාබ් 33
රජු ළඟට ඇවිත් එපවත් ඔහුට
දැන්නුවේය. ඔහු අබ්සලොම් කැඳවූ කල
හෙතෙම රජු ළඟට ඇවිත් රජු ඉදිරියෙහි
මුහුණින් බිමට නැමී වැන්දේය. රජද
අබ්සලොම් සිඹගත්තේය.

## අබ්සලොම්ගේ කැරළිගැසීම. දාවිත්ගේ පලායාම

15 ඉන්පසු අබ්සලොම් රථයක්ද
අශ්වයන්ද තමාට පෙරටුවෙන්
දුවන්ට මනුෂ්‍යයන් පනස්දෙනෙක්ද
පිළියෙළකරගත්තේය. තවද අබ්සලොම් 2
අලුයම නැගිට දොරටුවට යන මාර්ගයේ
අයිනේ සිට, විනිශ්චය පිණිස රජු වෙතට
පැමිණීමට නඩුවක් ඇති එකිනෙකාට
අඬගසා: නුඹ මොන නුවරට අයිතිදැයි
ඇසීය. ඔහුද: ඔබගේ මෙහෙකරුවා
ඉශ්‍රායෙල් ගෝත්‍රයකට අයිතියයි කීවේය.
අබ්සලොම්: ඔන්න නුඹේ කාරණා 3
හොඳය, හරිය; නුමුත් නුඹේ කාරණා
අසන පිණිස රජු විසින් පත්කරනලද
කෙනෙක් නැතැයි ඔහුට කීවේය. ඇරත් 4
අබ්සලොම් කථාකොට: දේශයේ
විනිශ්චයකාරයා කොට මා පත්කළොත්
යහපත! එවිට නඩුවක් හෝ පැමිණිල්ලක්
ඇති කවුරු නුමුත් මා වෙතට ආ කල්හි
මම ඔහුට යුක්තිය කරන්නෙමියි කීවේය.
යමෙක් ඔහුට වඳින්ට ළංවූ කල ඔහු 5
තමාගේ අත දිගුකොට ඔහු අල්වා
සිඹ ගත්තේය. විනිශ්චය පිණිස රජු 6
ළඟට ආ සියලු ඉශ්‍රායෙල්වරුන්ට
අබ්සලොම් මෙයාකාර කොට, හොරෙන්
ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ගේ සිත් දිනා
ගත්තේය.
තවද *සතර අවුරුද්දකට පසු අබ්සලොම් 7
රජුට කථාකොට: **ස්වාමීන්වහන්සේට**
වූණාවූ මාගේ බාරය හෙබ්‍රොන්හිදී
ඉෂ්ටකරන පිණිස යන්ට මට අවසර
ලැබේවා. මක්නිසාද ඔබගේ මෙහෙකරුවා 8
සිරියේ ගෙෂූර්හි සිටියදී: **ස්වාමීන්වහන්සේ**

*ඇතැම් පිටපත්වල: සතළිසයයි පෙනේ.

සැබවින් මා නැවත යෙරුසලමට
පමුණුවන්ට යෙදුණොත් මම **ස්වාමීන්-**
**වහන්සේට** සේවයකරන්නෙමියි කියා
9 බාරයක් වුණේයයි කීවේය. සමාදානයෙන්
පලයන්නැයි රජ ඔහුට කීවේය. ඔහු
10 නැගිට හෙබ්‍රොන්ට ගියේය. නුමුත්
අබ්සලොම් ඉශ්‍රායෙල් ගෝත්‍ර සියල්ල
අතරෙහි ඔත්තුකාරයන් යවා: නුඹලාට
හොරණෑ ශබ්දය ඇසුණු කෙණෙහිම–
අබ්සලොම් හෙබ්‍රොන්හි රජවී සිටියයි
11 කියාපල්ලායයි කියන්ට කීවේය. තවද
කැඳවනලද මනුෂ්‍යයන් දෙසියයක්
අබ්සලොම් සමග යෙරුසලමෙන්
ගියෝය; ඔව්හු කිසිවක් නොදන නමුත්ගේ
12 අවංකකමින් ගියෝය. අබ්සලොම් පූජා
ඔප්පු කරන අතර දාවිත්ගේ මන්ත්‍රියෙක්වූ
ගීලොනිය අහිතොපෙල් ඔහුගේ නුවර
වූ ගීලොයෙන් ගෙන්වාගත්තේය. මෙසේ
කුමන්ත්‍රණය බලවත් වී සෙනඟ වඩ
වඩා අබ්සලොම්ට එකතුවුණෝය.
13 පණිවිඩකාරයෙක් දාවිත් කරා ඇවිත්:
ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ගේ සිත් අබ්සලොම්
14 දෙසට හැරීගියේයයි කීවේය. එවිට
දාවිත් යෙරුසලමේ තමා සමග සිටි
තමාගේ සියලු සේවකයන්ට කථාකොට:
අපි පිටත්ව පලායමු; නැතහොත් අපෙන්
කිසිවෙක් අබ්සලොම්ගෙන් ගැළවෙන්නේ
නැත. ඔහු වහාම අප කරා පැමිණ අප
පිටට අනතුරු පමුණුවා, කඩුමුවහතින්
නුවරට පහර නොදෙන පිණිස, යන්ට
15 ඉක්මන්කරපල්ලායයි කීවේය. රජුගේ
සේවකයෝ රජුට කථාකොට: අපගේ
ස්වාමිවූ රජ්ජුරුවන් නියමකරන කොයි
දෙයක් නුමුත් කරන්ට ඔබගේ සේවකයෝ
16 සැදී සිටිතියි කීවෝය. එවිට රජුද ඔහු
අනුව ඔහුගේ ගෙයි වැසි සියල්ලෝද
පිටත්ව ගියෝය. උප භාර්යාවන්වූ
ස්ත්‍රීන් දසදෙනෙක් රජ තෙමේ ගෙදර
17 බලාගැනීමට නවත්වා ගියේය. මෙසේ
රජද ඔහු අනුව සියලු සෙනඟද පිටත්ව
ගොස් බෙත්-මෙර්හාක්හි නැවතුණෝය.
18 ඔහුගේ සියලු සේවකයෝ ඔහු ළඟින්
පැත්තෙන් ගියෝය. සියලු කෙරෙතිවරුද
සියලු පෙලෙතිවරුද ගාත්හි සිට ඔහු
අනුව ආ ගිත්තියයන්වූ මනුෂ්‍යයන්
හසියයක්ද ඔහුට පෙරටුවෙන් ගියෝය.
එවිට රජ ගිත්තීය ඉත්තයිට කථාකොට: 19
නුඹත් අප සමග එන්නේ මක්නිසාද?
හැරී ගොස් රජු සමග සිටපන්න.
මක්නිසාද නුඹ විදේශියෙක්ය, නුඹේ
රටින් පිටවුණ කෙනෙක්ය; නුඹේ
ස්ථානයට හැරී පලයන්න. ඊයේ ආවාවූ 20
නුඹට අද එහා මෙහා අප සමග යන්ට
සැලැස්වීම යුතුද? මම වනාහි යන්ට
පුළුවන් කොතනට නුමුත් යමි. නුඹ හැරී
නුඹේ සහෝදරයන් කැඳවාගන
පලයන්න; කරුණාවත් සැබෑකමත් නුඹ
සමග වේවයි කීවේය. ඉත්තයි රජුට 21
උත්තර දෙමින්: **ස්වාමීන්වහන්සේ** ජීවමාන
බවද රජු ජීවත්වන බවද සැබෑවා සේම,
මාගේ ස්වාමිවූ රජ්ජුරුවන් සිටින්නේ
යම් තැනෙක්හිද එතැන්හිම මැරෙන්ට
හෝ ජීවත්වෙන්ට හෝ ඔබගේ මෙහෙකරුවා
සිටින්නේයයි කීවේය. දාවිත්ද: ගොස් 22
එගොඩවෙයන්නැයි ඉත්තයිට කීය. එවිට
ගිත්තීය ඉත්තයිද ඔහුගේ සියලු මිනිස්සුද
ඔහු සමග සිටි සියලු බාලයෝද
එගොඩවූවෝය. මුළු සෙනඟ යද්දී 23
දේශයේ සෑම තැනම මිනිස්සු මහත්
හඩින් ඇඩුවෝය. රජ තෙමේ කිද්‍රොන්
නම් ඔයෙන් එගොඩව ගියේය, මුළු
සෙනඟද කාන්තාරයට යන මාර්ගය
දෙසට එගොඩව ගියෝය. ශාදොක්ද 24
ඔහු සමග සියලු ලෙවීවරුද
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
රැගෙන ආවෝය; මුළු සෙනඟ නුවරින්
ඇවිත් නිමවෙන තුරු ඔව්හු දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය බිම තැබුවෝය.
අබියාතර්ද ඇවිත් සිටියේය. රජ 25
ශාදොක්ට කථාකොට: දෙවියන්-
වහන්සේගේ පෙට්ටිය නැවත නුවරට
ගෙනියාපන්න. **ස්වාමීන්වහන්සේගේ**
ඇස් හමුයෙහි මට කරුණාව ලැබුණොත්
උන්වහන්සේ නැවත මා ගෙනැවිත් ඒකත්
එහි වාසස්ථානයත් මට පෙන්වනවා
ඇත. නුමුත්–මම නුඹ කෙරෙහි 26
ප්‍රසන්න නොවෙමියි උන්වහන්සේ
කියනසේක් නම්, මම මෙහිය,

උන්වහන්සේට යහපත්ව පෙනෙන ලෙස
27 මට කරනසේක්වයි කීවේය. රජ
පූජකවූ ශාදෙක්ට තවදුරටත් කතාකොට:
තුඹට තේරෙනවාද? තුඹේ පුත්‍රවූ
අහිමයාශ්ද අබියාතර්ගේ පුත්‍රවූ
යොනාතාන්ද යන තුඹලාගේ පුත්‍රයන්
දෙදෙනා සමග සමාදනයෙන් නුවරට
28 හැරී පලයන්න. මෙන්න, මට දන්වන්ට
තුඹලාගෙන් ආරංචි ලැබෙන තුරු
කාන්තාරයේ සමභූමිවල නවතින්නෙමියි
29 කීවේය. එබැවින් ශාදෙක්ද අබියාතර්ද
දෙවියන්වහන්සේගේ පෙට්ටිය නැවත
යෙරුසලමට ගෙනගොස් එහි සිටියෝය.
30 දවිත් අඬ අඬා හිස වසාගත වහන් නැතුව
ඔලීව කන්දට නගින පාරේ ගියේය.
ඔහු සමග සිටි මුළු සෙනඟද තම
තමුන්ගේ හිස් වසාගන අඬමින් නැගී
31 ගියෝය. අහිතොපෙල් කුමන්ත්‍රණකාරයන්
අතරේ අබ්සලොම් සමග සිටින බව
දවිත්ට දන්වනලද්දේය. එවිට දවිත්:
අහෝ, ස්වාමීන්වහන්ස, අහිතොපෙල්ගේ
මන්ත්‍රණය මෝඩකමට හැරවුව මැනවයි
32 කීවේය. තවද දෙවියන්වහන්සේට
නමස්කාරකරන ස්ථානයවූ කන්ද
මුදුනට දවිත් පැමුණුණු විට අර්කීය
හූෂයි තමාගේ උතුරුසළුව ඉරාගන, හිස
පිට පස් දමාගන, ඔහුගේ පෙරමගට
33 ආයේය. දවිත්ද: තුඹ මා සමග ගියොත්
34 තුඹ මට බරක් වන්නේය. නුමුත් තුඹ
නුවරට හැරී ගොස් අබ්සලොම්ට
කථාකර—රජ්ජුරුවෙනි, මම ඔබගේ
සේවකයා වෙමි; පළමු මම ඔබගේ
පියාගේ සේවකයෙක්ව සිටියාක්මෙන්
දැන් ඔබගේ සේවකයෙක් වෙමියි
කියන්නෙහි නම්, මා උදෙසා අහි-
තොපෙල්ගේ මන්ත්‍රණය නිෂ්ඵලකරන්ට
35 තුඹට පුළුවන්වන්නේය. පූජකවූ ශාදෙක්
සහ අබියාතර් තුඹ සමග එහි සිටිනවා
නොවේද? එබැවින් රජ ගෙදරින් අසන්ට
ලැබෙන කොයි දෙයක් නුමුත් තුඹ
පූජකයන්වූ ශාදෙක්ටත් අබියාතර්ටත්
36 දන්වාපන්න. ඔවුන්ගේ පුත්‍රයන් දෙදෙනා
වන ශාදෙක්ගේ පුත්‍රවූ අහිමයාශ් හා
අබියාතර්ගේ පුත්‍රවූ යොනාතාන්ද එහි
ඔවුන් සමග සිටිති; තුඹලා දැනගන්න
සියලු දේ ඔවුන් අත මට කියා එවා-
පල්ලායයි කීවේය. මෙසේ දවිත්ගේ 37
මිත්‍රවූ හූෂයි නුවරට ආයේය; අබ්ස-
ලොම්ද යෙරුසලමට ආයේය.

## ශීබා, ෂිමෙයි, අහිතොපෙල්

16
දවිත් කඳු මුදුනෙන් ටිකක්
ඔබ්බට ගිය විට මෙපිබොෂෙත්ගේ
වැඩකාරයාවූ ශීබා ඇඳුම් දමූ
කොටළුවන් දෙදෙනෙක්ද උන් පිට
පැටවූ රොටි දෙසියයක්ද වියළි
මුද්‍රිකඵල පොකුරු සියයක්ද ඉදිඵල තට්ටු
සියයක්ද මුද්‍රිකපාන භාජනයක්ද ඇතුව
ඔහුගේ පෙරමගට ආයේය. මේවා මොකට- 2
දැයි රජ ශීබාගෙන් ඇසුවේය. ශීබාද:
කොටළුවන් රජ්ජුරුවන්ගේ පවුලට නැගී-
යන්ටත් රොටි හා ඉදිඵල යෞවනයන්ට
කන්ටත් මුද්‍රිකපානය කාන්තාරයේදී
වෙහෙසෙන්නන්ට බොන්ටත්යයි කීවේය.
එවිට රජ: තුඹේ ස්වාමියාගේ පුත්‍රයා 3
කොතනදැයි ඇසුවේය. ශීබාද: ඔහු
යෙරුසලමෙහි නැවතී සිටියි. මක්නිසාද—
ඉශ්‍රායෙල් වංශය අද මාගේ පියාගේ
රාජ්‍යය නැවත මට දෙනවා ඇත කියා
ඔහු කීවායයි රජුට කීවේය. එවිට රජ: 4
බලව, මෙපිබොෂෙත්ට අයිති සියල්ල
තුඹට වේවයි ශීබාට කීය. ශීබාද: මාගේ
ස්වාමිවූ රජ්ජුරුවෙනි, මම ඔබ
බැහැදකිමි; ඔබ ඉදිරියෙහි මට කරුණාව
ලැබේවයි කීවේය.
දවිත් රජ බහුරීම්ට ආ කල, සාවුල්ගේ 5
වංශ-පෙළපතට අයිතිවූ, ගේරාගේ පුත්‍රවූ
ෂිමෙයි නම් මනුෂ්‍යයෙක් එතැනින් පිටත්වී
දෙස් කිය කියා යමින්, දවිත්ටත් දවිත් 6
රජුගේ සියලු සේවකයන්ටත් ගල්ගැසීය.
මුළු සෙනඟද සියලු බලවන්තයෝද
දවිත්ගේ දකුණු පසෙහිද වම් පසෙහිද
සිටියෝය. ෂිමෙයි දෙස් තබමින් කියනුයේ: 7
මිනීමරු මනුෂ්‍යය, *දුර්ජන මනුෂ්‍යය,
පලයන්, පලයන්. සාවුල් වෙනුවට 8

*බෙලියල්ගේ මනුෂ්‍යය.

රජවුණාවූ නුඹ පිටට **ස්වාමීන්වහන්සේ**
සාවුල්ගේ පවුලේ සියල්ලන්ගේ ලේ
පමුණුවා, නුඹේ පුත්‍රවූ අබ්සලොම් අතට
රජකම භාරදුන්සේක. ඔන්න, නුඹ
විපත්තියට අසුවී ඉන්නෙහිය, මක්නිසාද
9 නුඹ මිනීමරුවෙක්යයි කීවේය. එවිට
ශෙරුයාගේ පුත්‍රවූ අබිෂයි රජුට කථා-
කොට: අර මළ බල්ලා මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන්ට දෙස් කියන්නේ
මක්නිසාද? ගොස් ඔහුගේ හිස කපාදමන්ට
10 මට අවසර ලැබේවයි කීවේය. රජද:
ශෙරුයාගේ පුත්‍රයෙනි, නුඹලාගෙන් මට
කම් කිම්ද? ඔහු දෙස් කීවේ මක්නිසාද?
දවිත්ට දෙස් කියාපන්නැයි **ස්වාමීන්-
වහන්සේ** ඔහුට කියා තිබේ නම්—නුඹ
මෙසේ කළේ මක්නිසාදැයි කියන්ට
11 පුළුවන් කවරෙකුටදැයි කීවේය. තවද
දවිත් අබිෂයිටත් තමාගේ සියලු
සේවකයන්ටත් කථාකොට: මා තුළෙන්
නික්මුණාවූ මාගේ පුත්‍රයා මා නසන්ට
සොයන්නේය. ඊට කොපමණ වැඩියෙන්
මේ බෙන්යමියයාට දැන් එසේ කරන්ට
බැරිද? ඔහු නිකම් උන්නාවේ, දෙස්
කීවාවේ; මක්නිසාද එසේ කරන්ට
**ස්වාමීන්වහන්සේ** ඔහුට කීසේක.
12 සමහරවිට මට කරනලද අයුක්තිය
දෙස **ස්වාමීන්වහන්සේ** බලා, අද දවසේ
ඔහුගේ දෙස් කීම වෙනුවට මට යහපත
13 කරනවා ඇතැයි කීවේය. මෙසේ දවිත්
හා ඔහුගේ මිනිසුන් මාර්ගයෙහි යද්දී
ෂිමෙයි ඔහුට ඉදිරිපිටින් කන්දේ
පැත්තකින් යනුයේ දෙස් කියමින්ද ඔහු
දෙසට ගල්ගසමින් දූලි දම දමාද
14 ගියේය. රජද තමා වෙත සිටි මුළු සෙනඟ
සමග වෙහෙසව ඇවිත් එහි විඩා
සන්සිඳුවාගත්තේය.
15 තුමුත් අබ්සලොම්ද ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන් වන මුළු සෙනඟද ඔහු සමග
අහිතොපෙල්ද යෙරුසලමට ආවෝය.
16 තවද දවිත්ගේ මිත්‍රයාවූ අර්කීය හූෂයි
අබ්සලොම් ළඟට පැමිණුණු විට: රජු
සැරදේවා, රජු සැරදේවයි කීවේය.
17 අබ්සලොම්ද: නුඹේ මිත්‍රයා කෙරෙහි
ඇති නුඹේ කරුණාව මේකද? නුඹේ
මිත්‍රයා සමග නොගියේ මක්නිසාදැයි
හූෂයිට කීවේය. හූෂයිද: එසේ නොවෙයි; 18
**ස්වාමීන්වහන්සේද** මේ සෙනඟද සියලු
ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ද විසින් තෝරාගත්
තැනැත්තාට මම එකතුව ඔහු සමග
සිටින්නෙමි. ඇරත් මා විසින් සේවයකළ 19
යුතු කාටද? ඔහුගේ පුත්‍රයා ඉදිරියෙහි
නොවේද? මම ඔබගේ පියාණන්
ඉදිරියෙහි සේවය කළාක් මෙන් ඔබ
ඉදිරියෙහිත් සේවය කරන්නෙමියි
අබ්සලොම්ට කීවේය. එවිට අබ්සලොම් 20
අහිතොපෙල්ට කථාකොට: අප විසින්
කුමක් කටයුතුදැයි මන්ත්‍රණය කොට
කියාපල්ලායයි කීවේය. අහිතොපෙල්ද: 21
ඔබගේ පියාණන් ගෙදර ප්‍රවේසම්
කිරීමට සිටවා ගිය ඔහුගේ උපභාර්යාවන්
කරා එළඹෙන්න; එවිට සියලු
ඉශ්‍රායෙල්වරු ඔබගේ පියාණන්ට ඔබ
පිළිකුලක්ව සිටින බව අසන්නෝය.
එකල්හි ඔබ සමග සිටින සියල්ලන්ගේ
අත් සවිවන්නේයයි අබ්සලොම්ට
කීවෝය. මෙසේ ඔව්හු ගෙය උඩ 22
අබ්සලොම්ට කූඩාරමක් ගැසුවෝය;
අබ්සලොම්ද සියලු ඉශ්‍රායෙල්වරුන්
ඉදිරියේදී තමාගේ පියාගේ උපභාර්යාවන්
කරා එළඹුණේය. ඒ දවස්වලදී 23
අහිතොපෙල් දුන් මන්ත්‍රණය මනුෂ්‍යයෙකු
විසින් දෙවියන්වහන්සේගේ මුඛයෙන්
විචාරීමක් මෙන් විය. දවිත්ටත්
අබ්සලොම්ටත් අහිතොපෙල්ගේ සියලු
මන්ත්‍රණ එයාකාරව තිබුණේය.

## හූෂයිගේත් අහිතොපෙල්ගේත් මන්ත්‍රණ

17 තවද අහිතොපෙල් අබ්සලොම්ට
කථාකොට: මනුෂ්‍යයන් දොළොස්
දහසක් තෝරාගෙන අද රාත්‍රියේ පිටත්ව
දවිත් පස්සේ එළවාගන යන්ට මට
අවසර ලැබේවා. ඔහු වෙහෙසව 2
අත්හෙළා සිටියදී මම ඔහුට විරුද්ධව
පැමිණ ඔහු භයගන්වන්නෙමි. එවිට ඔහු
සමග සිටින මුළු සෙනඟ පලායනවා
ඇත; මම රජුට පමණක් පහරදී, මුළු 3

සෙනඟ ඔබ වෙතට හරවාගන්නෙමි.
ඔබ විසින් සොයන මනුෂ්‍යයා වනාහි
සියල්ලන්ගේ හැරී ඒම හා සමානය.
මෙසේ මුළු සෙනඟ සමාදනයෙන් සිටිනවා
4 ඇතැයි කීවේය. ඒ කීමට අබ්සලොම්ද
සියලු ඉශ්‍රායෙල් වැඩිමහල්ලෝද ප්‍රසන්න
වූහ.
5 එවිට අබ්සලොම්: දැන් අර්කීය හූෂයිටත්
අඬගසාපල්ලා, ඔහු කියන දේත් අසමු-
6 යයි කීවේය. හූෂයි අබ්සලොම් ළඟට
ආ කල්හි අබ්සලොම් ඔහුට කථාකොට:
අහිතොපෙල් මේ ආකාරයෙන් කථා-
කෙළේය. ඔහුගේ කීම ලෙස කරමුද?
නැත්නම් නුඹ කථාකරපන්නැයි
7 කීය. හූෂයි අබ්සලොම්ට කථාකොට:
අහිතොපෙල් මේ වතාවේ කළ මන්ත්‍රණය
8 හොඳ නැතැයි කීවේය. හූෂයි වැඩි
දුරටත් කියනුයේ: ඔබගේ පියාණන් හා
ඔහුගේ මිනිසුන් බලවන්තයන් බවත්
වනයෙහි පැටියන් නැතිවුණ වැල-
හින්නියක් මෙන් කෝපව සිටින බවත්
ඔබ දන්නෙහිය. ඔබගේ පියාණෝ
යුද්ධකාරයෙක්ය, ඔහු රාත්‍රියෙහි සෙනඟ
9 සමග නවතින්නේ නැත. දැන් ඔහු වළක
හෝ වෙන තැනක හෝ සැඟවී ඇත.
තවද පටන්ගැන්මේදීම ඔවුන්ගෙන්
සමහර දෙනෙක් වැටුණාම ඒ අසන
කවුරු නුමුත්—අබ්සලොම් අනුව යන
සෙනඟ අතරෙහි මැරීමක් සිදුවීයයි
10 කියනවා ඇත. එවිට සිංහයෙකුගේ සිත
මෙන් සිතක් ඇති බලවන්තයා පවා
මුළුමනින්ම මලානික වෙනවා ඇත.
මක්නිසාද ඔබගේ පියාණන් බලවන්තයෙක්
බවත් ඔහු සමග සිටින අය වික්‍රමාන්විත
මනුෂ්‍යයන් බවත් සියලු ඉශ්‍රායෙල්වරු
11 දනිති. මා කියන මන්ත්‍රණය නම්: දාන්
පටන් බෙයෙර්-ෂෙබා දක්වා සිටින
සියලු ඉශ්‍රායෙල්වරුන් ගණනින් මුහුදු
වෙරළේ වැලි මෙන් ඔබ වෙතට
රැස්කරගන ඔබම සටනට යන ලෙසය.
12 එසේ ඔහු සිටින යම් ස්ථානයකට
අපි ඔහු වෙතට පැමිණ, භූමි මතුයෙහි
පිනි වැටෙන්නාක් මෙන් ඔහු පිටට
බැස එන්නෙමුව. එවිට ඔහුවත් ඔහු
සමග සිටින සියලු මනුෂ්‍යයන්ගෙන්
එක්කෙනෙක්වත් ඉතුරුනොවන්නේය.
ඇරත් ඔහු නුවරකට ඇතුල්වී සිටියොත් 13
සියලු ඉශ්‍රායෙල්වරුන් ඒ නුවරට ලනු
දමා, එහි කුඩා ගලක්වත් සම්බ නොවෙන
තුරු අපි ගඟටම ඒක ඇදදමන්නෙමු-
යයි කීවේය. අබ්සලොම්ද සියලු 14
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝද: අහිතොපෙල්ගේ
මන්ත්‍රණයට වඩා අර්කීය හූෂයිගේ
මන්ත්‍රණය හොඳයයි කීවෝය. මක්නිසාද
ස්වාමීන්වහන්සේ අබ්සලොම් පිටට
නාස්තිය පමුණුවන පිණිස අහිතොපෙල්ගේ
හොඳ මන්ත්‍රණය නිෂ්ඵල කරන්ට
නියමකර තිබුණේය.
එකල හූෂයි පූජකයන්වූ ශාදෝක්ටත් 15
අබියාතර්ටත් කථාකොට: අහිතොපෙල්
මේ මේ ආකාරයෙන් අබ්සලොම්ටත්
ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ටත් මන්ත්‍රණය
දුන්නේය; මම මේ මේ ආකාරයෙන්
මන්ත්‍රණය දුනිමි. එබැවින් දැන් ඉක්මනින් 16
පණිවිඩයක් යවා: රජුද ඔහු සමග මුළු
සෙනඟද නැතිනොවන පිණිස අද රෑ
කාන්තාරයේ සමභූමිවල නොනැවතී
කොහොම නුමුත් එගොඩවෙන්ට ඕනෑ-
යයි දාවිත්ට දන්වාපල්ලායයි කීවේය.
යොනාතාන්ද අහිමයාශ්ද තමුන්ගේ 17
නුවර ඇතුළට එනවා දක්නා නොලබන
පිණිස ඒන්-රොගෙල් ළඟ සිටියෝය;
වැඩකාරියක් ගොස් ඔවුන්ට දන්නුවාය;
ඔව්හු ගොස් දාවිත් රජුට දන්නුවෝය.
නුමුත් තරුණයෙක් ඔවුන් දැක 18
අබ්සලොම්ට දන්නුවේය. ඔවුන්
දෙදෙනාම ඉක්මනින් ගොස් බහුරිම්හි
මනුෂ්‍යයෙකුගේ ගෙදරට පැමුණුණෝය;
ඔහුගේ මිදුලෙහි ළිඳක් තිබුණේය; ඔව්හු
ඒකට බැස්සෝය. ස්ත්‍රීද වැස්ම රැගෙන 19
ළිං කටේ එළා, කිසිවක් දැනනොගන්නා
හැටියට ඒ පිට ඇඹරූ ධාන්‍ය වනා
තැබුවාය. අබ්සලොම්ගේ සේවකයෝ 20
ස්ත්‍රී ළඟට ඒ ගෙදරට ඇවිත්: අහිමයාශ්ද
යොනාතාන්ද කොතැනදැයි ඇසුවෝය.
ඒ ස්ත්‍රී: ඔව්හු වතුර ඇළෙන් එගොඩවූවෝ-
යයි කීවාය. ඒ මනුෂ්‍යයෝ ඔවුන් සොයා
සම්බනුණ බැවින් යෙරුසලමට හැරී

21 ගියෝය. තවද ඔවුන් ගිය පසු, ඔව්හු
ළිඳෙන් ගොඩ නැගී ගොස් දාවිත් රජුට
දන්වමින්: ඔබට විරුද්ධව අහිතොපෙල්
මෙසේ මන්ත්‍රණය කළ නිසා පිටත්වී
ඉක්මනින් ඇළෙන් එගොඩවුවමැනවැයි
22 දාවිත් රජුට කීවෝය. එවිට දාවිත්ද ඔහු
සමග සිටි මුළු සෙනඟද පිටත්ව යෝර්-
දනෙන් එගොඩවූවෝය. එළිවෙනකොට
ඔවුන්ගෙන් එක්කෙනෙක්වත් යෝර්දනෙන්
එගොඩ නොගොස් ඉතුරුව සිටියේ නැත.
23 තමාගේ මන්ත්‍රණය ලෙස නොකළ බව
අහිතොපෙල් දැක, තමාගේ කොටළුවා
සූදානම්කොට පිටත්ව ස්වකීය නුවරෙහි
තිබුණ ඔහුගේ ගෙදරට ගොස්, *තමාගේ
ගෙදර කාරණා සකස් කොට තබා,
එල්ලී මැරුණේය; ඔහු තම පියාගේ
සොහොන්ගෙයි තැන්පත් කරනු ලැබීය.
24 දාවිත් මහනායිම්ට ආයේය. අබ්සලොම්ද
ඔහු සමග සියලු ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝද
25 යෝර්දනෙන් එගොඩට ගියෝය. තවද
අබ්සලොම්ද යෝවාබ් වෙනුවට අමාසා
සේනාපතියා කෙළේය. අමාසා වූකලී
නාහාෂ්ගේ දුවක්වද යෝවාබ්ගේ මවුවූ
ශෙරුයාගේ සහෝදරියක්වද සිටි
අබීගායිල් කරා පැමුණුණු ඉත්රානම්
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙකුගේ පුත්‍රයාය.
26 ඉශ්‍රායෙල්වරුද අබ්සලොම්ද ගිලියද්
රටෙහි අන්දයම් බැඳගත්තෝය.
27 දාවිත් මහනායිම්ට පැමුණුණු විට
අම්මොන් පුත්‍රයන්ට අයිති රබ්බාහි
නාහාෂ්ගේ පුත්‍රවූ ෂෝබිද ලෝ-දෙබාර්හි
අම්මීයෙල්ගේ පුත්‍රවූ මාකීර්ද රොගේලීම්හි
28 ගිලියදිය බර්සිල්ලයිද, යහන්, තළි, මැටි
භාජන, කෑමට තිරිඟු, යව, පිටි, විලඳ,
29 මෑ, කොල්ලු, බැදපු මුං, මීපැණි, වෙඬරු,
බැටළුවන්, එළ දීකිරි යන මේවා දාවිත්ටත්
ඔහු සමග සිටි සෙනඟටත් ගෙනාවෝය.
මක්නිසාද: සෙනඟ කාන්තාරයෙහි
බඩගිනිව වෙහෙසව පිපාසාව සිටිත්යයි
ඔව්හු කීවෝය.

*නොහොත්, තමාගේ පවුල ගැන
අණකොට.

## අබ්සලොම්ගේ මරණය සහ දාවිත්ගේ ශෝකය

18 දාවිත් තමා සමග සිටි සෙනඟ
ගණන්කොට ඔවුන් කෙරෙහි
සහස්‍රාධිපතීන්ද ශතාධිපතීන්ද පත්-
කෙළේය. තවද දාවිත් සෙනඟගෙන් තුනෙන් 2
කොටසක් යෝවාබ් යටතේද තුනෙන්
කොටසක් ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ්ගේ
සහෝදරවූ අබීෂයි යටතේද තුනෙන්
කොටසක් ගිත්තිය ඉත්තයි යටතේද
පිටත්කර හැරියේය. මමත් නුඹලා සමග 3
යමියි සෙනඟට රජ කීය. නුමුත් සෙනඟ:
ඔබ නොගිය යුතුය. මක්නිසාද අප
පලාගියත් ඔවුන් අප ගැන සලකන්නේ
නැත; අපෙන් දෙකෙන් කොටසක්
මැරුණත් අප ගැන සලකන්නේ නැත.
නුමුත් ඔබ අපෙන් දස දහසක් මෙන්ය.
එබැවින් අපට උපකාරකරන්ට සූදානම්ව
ඔබ නුවර සිටියොත් මැනවැයි කීවෝය.
නුඹලාට ඉතා හොඳව පෙනෙන හැටියක් 4
කරමියි රජ ඔවුන්ට කීය. රජ දොරටුවේ
පැත්තකින් සිටිද්දී සියලු සෙනඟ සියය
සියය බැගින්ද දහස දහස බැගින්ද
පිටත්ව ගියෝය. රජ යෝවාබ්ටද 5
අබීෂයිටද ඉත්තයිටද කථාකොට: මා
නිසා ඒ යෞවනයාට, අබ්සලොම්ට
මෘදුකමින් ක්‍රියාකරපල්ලායයි අණ-
කෙළේය. රජ අබ්සලොම් ගැන සියලු
අධිපතීන්ට අණකරනවා මුළු සෙනඟට
ඇසුණේය. මෙසේ සෙනඟ ඉශ්‍රායෙල්- 6
වරුන්ට විරුද්ධව පිටතට ගියෝය.
සටන එප්‍රායිම් වනයෙහිදී සිදුවිය.
එතැනදී ඉශ්‍රායෙල් සෙනඟ දාවිත්ගේ 7
සේවකයන්ට පරාජය වූවෝය, එදා මහත්
මැරීමක් සිදුවී මනුෂ්‍යයන් විසිදහසක්
මැරුණෝය. යුද්ධය රට මුළුල්ලේ පැතිර 8
ගොස්, එදා කඩුවෙන් විනාශවුණාට වැඩි
සෙනඟක් වනයෙන් විනාශවුණෝය.
අබ්සලොම් තම අශ්වතරයා පිට 9
නැගී යද්දී දාවිත්ගේ සේවකයන්ට
මුණගැසුණේය. අශ්වතරයා මහත්
අලෝන ගසක ඝන ශාඛා යටින් යද්දී
ඔහුගේ හිස අලෝන ගසට අසුවී ඔහු

අහසටත් පොළොවටත් අතරේ එල්ලී
උන්නේය; ඔහු නැගී සිටි අශ්වතරයා
10 යන්ට ගියේය. එක්තරා මනුෂ්‍යයෙක්
ඒ දැක යෝවාබ්ට දන්වමින්, අබ්සලොම්
අලෝන ගසක එල්ලී ඉන්නවා දුටිමියි
11 කීවේය. යෝවාබ් තමාට එපවත් කී
මනුෂ්‍යයාට කථාකොට: එසේ දුටු
නුඹ එහිදී ඔහු ගසා නොහෙළුවේ
මක්නිසාද? එසේ කෙළෙහිනම් රිදී
දසයක්ද ඉඟපටියක්ද මම නුඹට
12 දෙන්නෙමියි කීවේය. ඒ මනුෂ්‍යයාද: මට
අත්පිට රිදී දහසක් ලැබුණත් රජුගේ
පුත්‍රයාට විරුද්ධව මාගේ අත දිගුනො-
කරමි. මක්නිසාද කවුරුවත් අබ්සලොම්
යෞවනයාට අත නොගසන ලෙස
බලාගනිල්ලාය කියා අප අසාගන
සිටියදී රජ්ජුරුවෝ ඔබටත් අබිෂයිටත්
13 ඉත්තයිටත් අණකළහ. එසේ මම ඔහුගේ
ජීවිතයට විරුද්ධව ද්‍රෝහිකම් කෙළෙමිනම්
ඔබම මට විරුද්ධව සිටිනවා ඇත,
මක්නිසාද කිසිදෙයක් රජුගෙන් සැඟවී
14 නැතැයි කීවේය. එවිට යෝවාබ්: මට
මෙසේ නුඹ සමග ප්‍රමාදවෙවී ඉන්ට
බැරිය කියා හෙල්ල තුනක් අතින් ගෙන
අබ්සලොම් අලෝන ගස මැද පණ
ඇතුව සිටිද්දීම එයින් ඔහුගේ හෘදයට
15 ඇන්නේය. යෝවාබ්ගේ ආයුධ ගෙනයන
මෙහෙකරුවෝ දස දෙනෙක් වටකරින්
සිට අබ්සලොම්ට පහරදී ඔහු මැරුවෝය.
16 යෝවාබ් හොරණෑව පිම්බේය, එවිට
සෙනඟ ඉශ්‍රායෙල්වරුන් ලුහුබැඳ යාමෙන්
හැරී ආවෝය. මක්නිසාද යෝවාබ්
17 සෙනඟ නැවැත්තුවේය. ඔව්හු අබ්සලොම්
රැගෙන වනයෙහි තිබුණ මහත් වළේ
හෙළා ඔහු පිට ඉතා මහත් ගල්ගොඩක්
නැගුවෝය. සියලු ඉශ්‍රායෙල්වරුද තම
තමුන්ගේ කූඩාරම්වලට පලා ගියෝය.
18 අබ්සලොම් ජීවත්ව සිටියදී: මාගේ
නාමය සිහිපත් කරවන්ට පුත්‍රයෙක් නැත
කියා රජුගේ මිටියාවතේ තිබෙන කණුව
තමා උදෙසා පිහිටුවා, ඊට තමාගේ
නාමයේ හැටියට නම් කෙළේය. අද
දක්වා ඊට අබ්සලොම් ටැඹයයි කියති.

එකල ශාදෙක්ගේ පුත්‍රවූ අහිමයාශ් 19
කථාකොට: ස්වාමීන්වහන්සේ රජ්ජුරුවන්
උදෙසා ඔහුගේ සතුරන්ගෙන් පළිගත්
බව රජුට දන්වන පිණිස දුවන්ට මට
අවසර ලැබේවයි කීවේය. යෝවාබ්ද: 20
අද නුඹ ආරංචි ගෙන නොයන්න, වෙන
දවසක ආරංචි ගෙනයන්ට පුළුවන.
නුමුත් රජුගේ පුත්‍රයා මැරුණු නිසා අද
ආරංචි ගෙනයන්ට එපායයි ඔහුට
කීවේය. එවිට යෝවාබ්: ගොස් නුඹ 21
දුටු කාරණා රජුට දන්වාපන්නැයි
කූෂියයාට කීවේය. කූෂියයා යෝවාබ්ට
වැඳ දිවුවේය. එවිට ශාදෙක්ගේ පුත්‍රවූ 22
අහිමයාශ් නැවතත් යෝවාබ්ට
කථාකොට: කොහොම නුමුත් මටත්
කූෂියයා පස්සේ දුවන්ට අවසර
දුනමැනවැයි කීවේය. යෝවාබ්ද: මාගේ
පුත්‍රය, නුඹට සෑහෙන ආරංචි නැති
කොට දුවන්නේ මක්නිසාදැයි ඇසුවේය.
එහෙත් ඔහු: මක්වෙතත් දුවමියි කීවේය. 23
ඔහුද: දුවපන්නැයි ඔහුට කීය. එවිට
අහිමයාශ් සමභූමියේ මාවතින් දුවගොස්
කූෂියයා පසුකර ගියේය.

දාවිත් දොරටු දෙකට අතරේ ඉඳගන 24
උන්නේය. මුරකාරයා පවුරේ දොරටුව
උඩ තිබුණ පියස්සට ගියේය, ඔහු ඇස්
ඔසවා බැලූ විට මනුෂ්‍යයෙක් තනියම
දුවගන එනවා දුටුවේය. මුරකාරයා 25
මොරගසා එපවත් රජුට කීය. ඔහු
තනියම එන්නේ නම් ආරංචි ගෙනෙන්නේ-
යයි රජ කීවේය. ඔහු ඉක්මනට ඇවිත්
ළංවුණේය. මුරකාරයා තවත් මනුෂ්‍යයෙකු 26
දුව එනවා දැක දොරටුපාලයාට අඬගසා:
තව මනුෂ්‍යයෙක් තනියම දුවඑන්නේ-
යයි කීවේය. එවිට රජ: ඔහුත් ආරංචි
ගෙනෙන්නේයයි කීය. මුරකාරයාද: 27
පළමුවෙනි අයගේ දිවීම ශාදෙක්ගේ පුත්‍රවූ
අහිමයාශ්ගේ දිවීම වාගේ මට පෙනේ-
යයි කීවේය. රජද: ඔහු යහපත්
මනුෂ්‍යයෙක්ය, හොඳ ආරංචි ඇතුව
එන්නේයයි කීය. අහිමයාශ් මොරගසා: 28
*සියල්ල යහපතැයි රජුට කියා මුහුණින්

*හෙබ්‍රෙව්: සමාදානයයි.

බිමට නැමී රජුට වැඳ කථාකොට: මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන්ට විරුද්ධව තමුන්ගේ
අත් එසෙවූ මනුෂ්‍යයන් පාවාදුන් ඔබගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා වේවයි
29 කීවේය. අබ්සලොම් යෞවනයා සුවසේ
සිටිනේදැයි රජ ඇසුවේය. එවිට අහිමයාශ්:
යෝවාබ් විසින් රජ්ජුරුවන්ගේ මෙහෙ-
කරුවාත් ඔබගේ මෙහෙකරුවූ මාත් එවන
කොට මහත් කෝලාහලයක් දුටිමි,
නුමුත් එය කිමෙක්දැයි නොදත්තෙමියි
30 උත්තරදුන්නේය. පැත්තකට වී මෙහි
සිටපන්නැයි රජ ඔහුට කීය. ඔහු
31 පැත්තකට වී සිටියේය. එවිට කූෂියයා
ආවේය. කූෂියයා කථාකොට: මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන්ට ආරංචි තිබේ.
මක්නිසාද ඔබට විරුද්ධව නැගුණු
සියල්ලන්ගෙන් **ස්වාමීන්වහන්සේ** අද ඔබ
32 උදෙසා පළිගත්සේකැයි කීවේය. එවිට
රජ: අබ්සලොම් යෞවනයා සුවසේ
සිටිනේදැයි කූෂියයාගෙන් ඇසුවේය.
කූෂියයාද: මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ගේ
සතුරෝද ඔබට අන්තරාකරන්ට ඔබට
විරුද්ධව නැගිටින සියල්ලෝද ඒ
යෞවනයා මෙන් වේත්වයි උත්තර-
33 දුන්නේය. එවිට රජ බොහෝසෙයින්
කම්පාවී, දොරටුවේ උඩුමහලට නැගී
ගොස් ඇඩුවේය. ඔහු යමින්ම: අහෝ,
මාගේ පුත්‍රවූ අබ්සලොම්, මාගේ පුත්‍රය,
මාගේ පුත්‍රවූ අබ්සලොම්! තුඹ වෙනුවට
මා මැරුණා නම් යහපත, අහෝ,
අබ්සලොම්, මාගේ පුත්‍රය, මාගේ පුත්‍රයයි
කීවේය.

19 තවද රජ අබ්සලොම් ගැන අඬා
වැලපෙන්නේය කියා යෝවාබ්ට
2 දන්වන ලද්දේය. රජ තමාගේ පුත්‍රයා
ගැන ශෝකවන්නේයයි ඒ දවසේ
සෙනඟට සැලවුණු බැවින් ඒ දවසේ
ඇතිවූ ජය මුළු සෙනඟට වැලපීමක්
3 වුණේය. මක්නිසාද යුද්ධයේදී පලායන
සෙනඟ ලජ්ජා සහිතව හොරෙන්
එන්නාක් මෙන්, ඒ දවසේදී සෙනඟ
4 හොරෙන් නුවරට ඇතුල්වුණෝය. රජ
තමාගේ මුහුණ වසාගෙන: අනේ, මාගේ
පුත්‍රවූ අබ්සලොම්, අනේ, අබ්සලොම්,
මාගේ පුත්‍රය, මාගේ පුත්‍රය කියා මහත්
හඬින් ඇඬුවේය. යෝවාබ්ද රජු ළඟට 5
ගෙට ඇතුල්වී කථාකොට: ඔබට
වෛරවෙන්නන්ට ප්‍රේමකිරීමෙන්ද ඔබට
ප්‍රේමකරන්නන්ට වෛරවීමෙන්ද ඔබගේ
ජීවිතයත් ඔබගේ පුත්‍රයන්ගෙත් දූවරුන්ගෙත්
ජීවිතත් ඔබගේ භාර්යාවන්ගේ ජීවිතත්
ඔබගේ උපභාර්යාවන්ගේ ජීවිතත් අද
ගැළවුවාවූ ඔබගේ සියලු සේවකයන්ගේ
මුහුණු ඔබ අද ලජ්ජා කෙළෙහිය.
මක්නිසාද අධිපතීන්ගෙන්වත් සේවක- 6
යන්ගෙන්වත් ඔබට කමක් නැති බව
ඔබ අද පෙන්නුවෙහිය. අප සියල්ලන්ම
අද මැරුණත් අබ්සලොම් ඉතුරුවුණා
නම් ඔබ ඉතා ප්‍රසන්නවන බව අද
මට පෙනෙයි. එබැවින් දැන් නැගිට 7
පිටතට ගොස් ඔබගේ සේවකයන්ට
කරුණාවෙන් කථාකළ මැනවි. ඔබ
පිටත නොගියොත් ඔබ සමඟ අද රෑ
කිසිවෙක් නොසිටින බවට **ස්වාමීන්-
වහන්සේගේ** නාම කියා දිවුරමි. එයින්
ඔබගේ බාල වයසේ පටන් දැන් දක්වා
ඔබට සිදුවුණු සියලු අන්තරාවලට වඩා
ඔබට අන්තරාවේයයි කීවේය. එවිට 8
රජ නැගිට දොරටුවේ හිඳගත්තේය. රජ
දොරටුවේ හිඳිනේයයි මුළු සෙනඟට
දන්වනලද්දේය. මුළු සෙනඟද රජු
ඉදිරියට ආවෝය.

## දාවිත් යෙරුසලමට හැරීඒම

ඉශ්‍රායෙල්වරු තම තමුන්ගේ කූඩාරම්-
වලට පලාගොස් සිටියෝය. සියලු 9
ඉශ්‍රායෙල් ගෝත්‍ර අතරෙහි සෙනඟ
විවාදකරමින්: රජ්ජුරුවෝ අපේ සතුරන්
අතින් අප මුදා පිලිස්තිවරුන්ගේ අතින්ද
ඔහුම අප ගළවාගත්තාහ; එහෙත්
දැන් ඔහු අබ්සලොම් වෙතින් රටින්
පලාගියේය. අප කෙරෙහි අප විසින් 10
පත්කරගත් අබ්සලොම්ද යුද්ධයේදී
මැරුණේය. ඒ නිසා රජ්ජුරුවන් නැවත
ගෙන්වීම ගැන තුඹලා නිශ්ශබ්දව
සිටින්නේ මක්නිසාදැයි කීවෝය.
එවිට දාවිත් රජ පූජකයන් වන 11
ශාදෝක්ටත් අබියාතර්ටත් මෙසේ කියා

ඇරියේය: නුඹලා යුදහි වැඩිමහල්ලන්ට
කථාකොට–රජ්ජුරුවන් තමාගේ ගෙට
ගෙන්වන්ට මුළු ඉශ්‍රායෙල් කරන කථාව
ඔහුට සැලවී තිබෙද්දී රජ්ජුරුවන්
තමාගේ ගෙට නැවත ගෙනෙන්ට නුඹලා
12 අන්තිමයන් වන්නේ මක්නිසාද? නුඹලා
මාගේ සහෝදරයෝය, මාගේ ඇට සහ
මාංසයත්ය. එබැවින් රජ්ජුරුවන් නැවත
ගෙනෙන්ට නුඹලා අන්තිමයන් වෙන්-
13 නේ මක්නිසාදැයි කියාපල්ලා. තවද
අමාසාට කථාකොට: නුඹ මාගේ ඇට
සහ මාංශයත් නොවේද? නුඹ යෝවාබ්
වෙනුවට සෑම කල්හිම මා ඉදිරියෙහි
සේනාපතියා ව සිටින්ට නොයෙදුණොත්
දෙවියන්වහන්සේ එසේත් ඊට වැඩියෙනුත්
මට කරනසේක්වයි කියාපල්ලායයි
14 කියා ඇරියේය. මෙසේ ඔහු සියලු යුද
මනුෂ්‍යයන්ගේ සිත් එක්කෙනෙකුගේ සිත
මෙන් නමා ගත්තේය; ඔව්හුද: ඔබගේ
සියලු සේවකයන් සමග හැරී අව-
15 මැනවැයි රජුට කියා ඇරියෝය. එවිට
රජ හැරී යොර්දන් ළඟට ආයේය.
යුදවරුද යොර්දනෙන් මෙගොඩට රජු
කැඳවාගන එන පිණිස රජුගේ පෙරමගට
යන්ට ගිල්ගාල්ට ආවෝය.
16 තවද බහුරීම්හි බෙන්යමීය ගේරාගේ
පුත්‍රවූ ෂිමෙයි ඉක්මන්කර යුද මනුෂ්‍යයන්
සමග දවිත් රජුගේ පෙරමගට බැස
17 ආවේය. ඔහු සමග බෙන්යමීන්
මනුෂ්‍යයන් දහසක්ද සාවුල්ගේ වංශයේ
සේවකයෙක්වූ ශීබාද ඔහු සමග තමාගේ
පුත්‍රයෝ පහළොස්දෙනාද තමාගේ
වැඩකාරයන් විසිදෙනාද සිටියෝය;
ඔව්හු රජු ඉදිරියෙහි යොර්දන මැදින්
18 ගියෝය. රජ ගෙදර වැසියන් මෙගොඩ
කරන්ටත් ඔහුගේ කැමැත්තක් කරන්ටත්
පාරුවක් එගොඩට ගියේය. ගේරාගේ
පුත්‍රවූ ෂිමෙයි යොර්දනෙන් එගොඩවුණ
19 කල රජු ඉදිරියෙහි වැටී, කථාකොට:
මාගේ ස්වාමියා මා ගණනට කිසි
අපරාධයක් නොතැබුව මැනවි, මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන් යෙරුසලමෙන්
පිටත්ව ගිය දවසේදී ඔබගේ දසයා
හිතුවක්කාරකමින් කළ දේ රජතුමා
සිහිනොකළ මැනවි, එය සිතට නොගත
මැනවි. මක්නිසාද ඔබගේ දසයාවූ මා 20
පව්කළ බව මම දනිමි. එබැවින්
යෝසෙප්ගේ මුළු වංශය අතරෙන් මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන්ගේ පෙරමගට බැස
එන්ට මම පළමු කොටම ආවෙමියි
කීය. එහෙත් ශෙරුයාගේ පුත්‍රවූ අබිෂයි 21
උත්තරදෙමින්: ෂිමෙයි **ස්වාමීන්වහන්සේ-**
ගේ අභිෂේකලත් තැනැත්තාට දෙස් කී
බැවින් ඔහු මරනු ලැබිය යුතු නොවේදැයි
කීය. දවිත්ද: ශෙරුයාගේ පුත්‍රයෙනි, 22
නුඹලා අද මට එදිරිවීමට නුඹලාත්
මාත් අතරේ තිබෙන සම්බන්ධකම
මොකද? අද ඉශ්‍රායෙල්වරුන්ගෙන්
කිසිවෙකු මරණයට පත් කරන්ට යුතුද?
මක්නිසාද අද මා ඉශ්‍රායෙල් කෙරෙහි
රජව සිටින බව මම නොදනිම්දැයි
කීවේය. තවද: නුඹ නොනස්නෙහියයි 23
රජ ෂිමෙයිට කියා දිවුළේය.
සාවුල්ගේ පුත්‍රවූ මෙපිබොෂෙත් රජුගේ 24
පෙරමගට ආයේය; ඔහු රජු ගිය ද පටන්
සමාදනයෙන් ආ දවස දක්වා තමාගේ
පාදත් රැවුලත් හරිගස්සා ගත්තේවත්
තමාගේ ඇඳුම් සේදුවේවත් නැත. තවද 25
ඔහු රජු සම්මුඛවෙන්ට යෙරුසලමට
ආ කල රජ කථාකොට: මෙපිබොෂෙත්,
නුඹ මා සමග නොගියේ මක්නිසාදැයි
ඔහුගෙන් ඇසුවේය. ඔහු උත්තරදෙමින්: 26
මාගේ ස්වාමිවූ රජ්ජුරුවෙනි, මාගේ
වැඩකාරයා මා රැවටුවේය. මක්නිසාද
ඔබගේ මෙහෙකරුවා කොර බැවින්–
කොටළුවෙකු සූදනම්කරගන ඌ පිට
නැගී රජ්ජුරුවන් සමග යමියි ඔබගේ
මෙහෙකරුවා කීවේය. ඔහු මාගේ 27
ස්වාමිවූ රජුට ඔබගේ මෙහෙකරුවා
ගැන කේලාම් කීවේය. එහෙත් මාගේ
ස්වාමිවූ රජ්ජුරුවෝ දෙවියන්වහන්සේගේ
දූතයෙකු මෙන්ය. ඔබගේ ඇස් හමුයෙහි
හොඳව තිබෙන දේ කළමැනවි.
මක්නිසාද මාගේ පියාගේ මුළු වංශය 28
මාගේ ස්වාමිවූ රජු ඉදිරියෙහි මරණයට
සුදුස්සෝ වූහ. එසේවීනමුත් ඔබගේම
මේසයෙන් කන තැනැත්තන් අතරේ
ඔබ ඔබගේ මෙහෙකරුවා සිටෙවුවෙහිය.

ඒ නිසා රජ්ජුරුවන්ට තවත් කන්නලව්
කරන්ට මට ඇති යුතුකම මොකදැයි
29 කීය. රජද: තුඹේ කාරණා ගැන තවත්
කථාකරන්නේ මන්ද? තුඹත් ශීබාත් බිම
බෙදාගන්න ලෙස මම කියමියි ඔහුට
30 කීවේය. මෙපිබොෂෙත්ද: එසේය, මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන් තමාගේ ගෙදරට
සමාදානයෙන් ආ බැවින් සියල්ලම වුණත්
ඔහු ගත්තාවේයයි රජුට කීවේය.
31 තවද ගිලියදිය බර්සිල්ලයි රොගේලීම්
සිට ඇවිත් යොර්දානෙන් මෙගොඩට
රජු ගෙනෙන පිණිස ඔහු සමග
යොර්දානෙන් මෙගොඩට ආයේය.
32 බර්සිල්ලයි ඉතා මහලුව අසූ අවුරුද්දක්
වයස්ව සිටියේය. ඔහු රජු මහනායිම්හි
සිටි කල ඔහුට කන බොන දේ
සපයාදුන්නේය; ඔහු ඉතා පොහොසත්
33 මනුෂ්‍යයෙකි. රජද: මා සමග යන්ට
වරෙන්න, යෙරුසලමේ මා වෙත
තුඹ පෝෂ්‍යකරන්නෙමියි බර්සිල්ලයිට
34 කීවේය. බර්සිල්ලයිද: රජ්ජුරුවන් සමග
යෙරුසලමට යන්ට මාගේ ජීවිතයේ
තවත් ඉතිරිව තිබෙන අවුරුදුවල දවස්
35 කොපමණද? මම දැනට අසූ අවුරුද්දක්
වයස් ව සිටිමි. හොඳ නරක මට
දැනෙනවාද? ඔබගේ මෙහෙකරුවූ මට
කන බොන දේවල රස දැනේද? ගී
කියන පුරුෂයන්ගෙත් ගී කියන
ස්ත්‍රීන්ගෙත් හඬ මට තවත් අසන්ට
පුළුවන්ද? එබැවින් ඔබගේ මෙහෙකරුවා
මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට තවත් බරක්
36 වෙන්නේ කුමටද? ඔබගේ මෙහෙකරුවා
රජ්ජුරුවන් සමග යොර්දානෙන් එගොඩට
යෑම සුළු දෙයක්ය. එබැවින් රජ්ජුරුවන්
එබඳු විපාකයක් මට දෙන්නේ
37 මක්නිසාද? මාගේම නුවර මාගේ
පියාණන්ගෙත් මාගේ මෑණියන්ගෙත්
සොහොන්පළ ළඟ මා මැරෙන පිණිස
ඔබගේ මෙහෙකරුවාට හැරී යන්ට
අවසර ලැබේවා. නුමුත් ඔබගේ
මෙහෙකරුවූ කිම්හාම්, මාගේ ස්වාමිවූ
රජ්ජුරුවන් සමග එගොඩ ගියාවේ; ඔබට
හොඳව පෙනෙන හැටියක් ඔහුට කළ
38 මැනවැයි කීවේය. රජද: කිම්හාම් එගොඩ
මා සමග යේවා, තුඹට හොඳව පෙනෙන
හැටියක් ඔහුට කරන්නෙමි. තුඹ මාගෙන්
ඉල්ලන සියල්ලත් තුඹට කරදෙන්නෙමියි
කීවේය. මුළු සෙනඟ යොර්දානෙන් 39
මෙගොඩවුණෝය, රජද මෙගොඩවුණේය.
රජතෙමේ බර්සිල්ලයි සිඹ ඔහුට
ආශීර්වාදකෙළේය; ඔහු තමාගේ
ස්ථානයට හැරීගියේය.
මෙසේ රජ මෙගොඩවී ගිල්ගාල්ට 40
ආවේය, කිම්හාම්ද ඔහු සමග ආවේය.
මුළු යූද සෙනඟද ඉශ්‍රායෙල් සෙනඟගෙන්
දෙකෙන් කොටසක්ද රජු මෙගොඩට
කැඳවාගත ආවෝය. එවිට සියලු 41
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ රජු ළඟට අවුත්
රජුට කථාකොට: අපේ සහෝදරවූ යූද
මනුෂ්‍යයන් ඔබ හොරෙන් අඬගසාගන
රජුද ඔහුගේ ගෙයි වැසියන්ද ඔහු සමග
දාවිත්ගේ සියලු මනුෂ්‍යයන්ද යොර්දානෙන්
මෙගොඩට ගෙනාවේ මක්නිසාදැයි
ඇසුවෝය. සියලු යූද මනුෂ්‍යයෝ 42
ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්ට උත්තර දෙමින්:
රජ්ජුරුවන් අපේ නෑයෙක් නිසාය. තුඹලා
මේ කාරණය ගැන කෝපවෙන්නේ
මක්නිසාද? රජුගේ වියදමෙන් අපි
කොහෙත්ම කෑවෙමුද? නොහොත් ඔහු
අපට කිසි තෑග්ගක් දුන්නේදැයි කීවෝය.
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ යූද මනුෂ්‍යයන්ට 43
උත්තරදෙමින්: රජුගෙන් දස කොටසක්
අපට තිබේ, දාවිත්ගෙනුත් තුඹලාට වඩා
අයිතිකම අපට ඇත්තේය. තුඹලා අප
සුළුකොට සිතුවේ මක්නිසාද? රජු නැවත
ගෙනෙන්ට පළමුකොට කථාකළේ අප
නොවේදැයි කීවෝය. නුමුත් ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන්ගේ වචනවලට වඩා යූද
මනුෂ්‍යයන්ගේ වචන සැරව තිබුණේය.

## ෂෙබාගේ කැරළිගැසීම

20 බෙන්යමීයයෙක්වූ බික්‍රිගේ පුත්‍රවූ
ෂෙබා නම්වූ *දුර්ජන මනුෂ්‍යයෙක්
එහි සිටියේය. ඔහු හොරණෑව පිඹ: දාවිත්
තුළ කොටසක්වත් යෙස්සේගේ පුත්‍රයා

*බෙලියල්ගේ මනුෂ්‍යයෙක්.

තුළ කිසි උරුමයක්වත් අපට නැත.
ඉශ්‍රායෙල්වරුනි, ඒ ඒ මනුෂ්‍යයා තම
2 තමාගේ කූඩාරම්වලට යේවයි කීය. එවිට
සියලු ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ දාවිත්
අත්හැර බික්‍රිගේ පුත්‍රවූ ෂෙබා පස්සේ
ගියෝය. නුමුත් යොර්දන් පටන්
යෙරුසලම දක්වාම යූද මනුෂ්‍යයෝ
තමුන්ගේ රජුට ඇලුම්ව සිටියෝය.
3 දාවිත් යෙරුසලමෙහිවූ තමාගේ ගෙදරට
පැමුණුණු විට ගෙය ප්‍රවේසම්කිරීමට
රජු විසින් සිටුවාගිය උපභාර්යාවන්
දසදෙනා රැගෙන හිරකර තබා ඔවුන්
පෝෂ්‍යකෙළේය, නුමුත් ඔවුන් කරා
නොඑළඹුණේය. මෙසේ ඔව්හු මැරෙන
දවස දක්වා හිරෙහිම වැන්දඹු භාවයෙහි
සිටියෝය.
4 තවද රජ අමාසාට කථාකොට: තුන්
දවසකින් යූද මනුෂ්‍යයන් මා වෙතට
අඬගස්වාපන්න, නුඹත් මෙහි සිටපන්නැයි
5 කීය. මෙසේ අමාසා යූද මනුෂ්‍යයන්
අඬගස්වාගන එන්ට ගොස් ඔහුට
6 නියමකළ කාලයට වඩා ප්‍රමාදවිය. දාවිත්
අබිෂයිට කථාකොට: දැන් අබ්සලොම්ට
වඩා, බික්‍රිගේ පුත්‍රවූ ෂෙබා අපට
අනතුරුකරනවා ඇත. ඔහු පවුරු ඇති
නුවරවල් අත්කරගෙන අපෙන් ගැළවී
නොයන පිණිස, නුඹේ ස්වාමියාගේ
සේවකයන් කැඳවාගන ඔහු ලුහුබැඳ
7 පලයන්නැයි කීවේය. එවිට යෝවාබ්ගේ
මිනිස්සුද කෙරෙතිවරුද පෙලෙතිවරුද
සියලු බලවන්තයෝද ඔහු පස්සේ පිටත්ව
ගියෝය. බික්‍රිගේ පුත්‍රවූ ෂෙබා ලුහුබැඳ
යන පිණිස ඔව්හු යෙරුසලමෙන් නික්ම
8 ගියෝය. ඔවුන් ගිබියොන්හි තිබෙන මහ
ගල ළඟ සිටියදී අමාසා ඔවුන් ඉදිරියට
ආයේය. යෝවාබ් තමාගේ යුද්ධ ඇඳුම්
ඇඳ ඒ උඩ ඉඟ පටියක් බැඳගන
උන්නේය, කඩුවක්ද කොපුවේ දමා
ඔහුගේ ඉඟටියේ එයින් බැඳ තිබුණේය;
ඔහු පිටතට යද්දී ඒක වැටුණේය.
9 යෝවාබ් අමාසාට කථාකොට: මාගේ
සහෝදරය, නුඹ සුවසේ සිටිනෙහිදැයි
අමාසාට කියා ඔහු සිඹින්ට ඔහුගේ
10 රැවුල දකුණතින් අල්ලාගත්තේය. නුමුත්
අමාසා යෝවාබ් අතේ තිබුණු කඩුව
ගැන නොසැලකුවේය. යෝවාබ් එයින්
ඔහුගේ බඩට ඇන එක පහරකින්ම
ඔහුගේ අතුණු බිම වැගිරෙවුවේය, මෙසේ
ඔහු මෙළේය. යෝවාබ්ද ඔහුගේ
සහෝදරවූ අබිෂයිද බික්‍රිගේ පුත්‍රවූ
ෂෙබා ලුහුබැඳ ගියෝය. යෝවාබ්ගේ 11
සේවකයන්ගෙන් එක්කෙනෙක් අමාසා
ළඟ සිට: යෝවාබ්ට හිතවත්වූ දාවිත්ගේ
පක්ෂයට සිටින්නාවූ කවුරු නුමුත්
යෝවාබ් පස්සේ යේවයි කීවේය. අමාසා 12
වනාහි මහමාවත මැද ලෙයෙහි පෙරළී
උන්නේය. ඉන්නිසා මුළු සෙනඟ නවතින
බව ඒ මනුෂ්‍යයා දැක, අමාසා ළඟින්
එන සියල්ලන් මෙසේ නවතින බව ඔහු
දුටු කල්හි, ඔහු අමාසා මාවතෙන් කෙතට
ගෙනගොස් ඔහු පිට රෙද්දක් හෙළුවේය.
ඔහු මාවතින් අහක්කළායින් පසු මුළු 13
සෙනඟ බික්‍රිගේ පුත්‍රවූ ෂෙබා ලුහුබඳින
පිණිස යෝවාබ් පස්සේ ගියෝය. ෂෙබා 14
සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රද සියලු
බේරීවරුන්ද අතරේ ගොස් ආබෙල්ටත්
බෙත්-මයකාටත් පැමුණුණේය. මිනිස්සු
රැස්වී ඔහු පස්සේ ගියෝය. ඔව්හු ඇවිත් 15
බෙත්-මයකාහි ආබෙල් වටලාගන නුවර
ඉදිරිපිට ගොඩැල්ලක් ඉදිකළෝය; එය
පවුර ඉදිරිපිට තිබුණේය. යෝවාබ් සමග
සිටි මුළු සෙනඟද පවුර හෙළාදමන්ට
ඊට පහරදුන්නෝය. එවිට ප්‍රඥවන්ත 16
ස්ත්‍රියෙක් නුවර සිට මොරගසා: මෙන්න
අහපල්ලා, අහපල්ලා; මා යෝවාබ්
සමග කථාකරන පිණිස මෙහි ළඟා-
වෙන්ට කියා ඔහුට කිවමැනවියි
කීවාය. ඔහු ඈ ළඟට ආ කල ඒ ස්ත්‍රී: 17
ඔබ යෝවාබ්දැයි ඇසුවාය. ඔහුද: එසේ-
යයි උත්තර දුන්නේය. එවිට ඈ: ඔබගේ
මෙහෙකාරීගේ වචන ඇසුවමැනවියි
ඔහුට කීවාය. ඔහුද: මම අසමියි කීවේය.
එවිට ඈ කථාකොට: ඔව්හු සැබවින්ම 18
ආබෙල්හිදී විචාරන්නෝය කියා කථා-
කරන්ට පුරාණ කාලයේදී මනුෂ්‍යයෝ
පුරුදුව සිටියෝය. එසේ ඔව්හු කාරණය
තීන්දුකළෝය. මම වනාහි සමාදනය 19
හා විශ්වාසයෙන් යුක්තවූ ඉශ්‍රායෙල්-

වරුන්ගෙන් එක්කෙනෙකි. ඔබ ඉශ්‍රායෙල්හි
නුවරක්ද මවුකෙනෙක්ද නැතිකරන්ට
හදන්නෙහිය. **ස්වාමීන්වහන්සේගේ** උරුමය
නාස්තිකරන්නේ මක්නිසාදැයි කීවාය.
20 යෝවාබ් උත්තරදෙමින්: නැති නාස්ති
කිරීම මාගෙන් දුරුවේවා, දුරුවේවා.
21 මේ කාරණය එසේ නොවේ. බික්‍රිගේ
පුත්‍රවූ ෂෙබා නම්වූ එප්‍රයිම් කඳු රටේ
මනුෂ්‍යයෙක් දවිත් රජ්ජුරුවන්ට විරුද්ධව
තමාගේ අත එසෙවුවේය. ඔහු පමණක්
පාවාදියන්න, එවිට මම නුවරින් අහක්ව
යන්නෙමියි කීවේය. ඒ ස්ත්‍රීද: ඔහුගේ
හිස පවුර උඩින් ඔබ වෙතට වීසිකරනු
22 ලබන්නේයයි යෝවාබ්ට කීවාය. එවිට
ඒ ස්ත්‍රී ඇගේ ප්‍රඥාවෙන් යුක්තව මුළු
සෙනඟ ළඟට ගියාය. ඔව්හු බික්‍රිගේ
පුත්‍රවූ ෂෙබාගේ හිස කපා යෝවාබ්
වෙතට වීසිකළෝය. යෝවාබ් හොර-
ණෑව පිම්බේය, එවිට ඔව්හු නුවරින්
තම තමුන්ගේ කූඩාරම්වලට විසිර
ගියෝය. යෝවාබ්ද යෙරුසලමට රජු
වෙතට හැරී ආවේය.
23 යෝවාබ් මුළු ඉශ්‍රායෙල් සේනාවට
අධිපතියාය. යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායා
කෙරෙතිවරුන්ටත් පෙලෙතිවරුන්ටත්
24 අධිපතියාය. අදෝරාම් රාජකාරියේ
මුලාදෑනියාය. අහිලූද්ගේ පුත්‍රවූ
25 යෙහෝෂාපාත් වාර්තාකරුවාය. ෂෙවා
වනාහි ලේකම්ය. ශාදොක්ද අබියාතර්ද
26 පූජකයෝය. යායිර්හි ඊරාත් දවිත්ගේ
මන්ත්‍රීවරයෙක්ය.

## තුන් අවුරුදු සාගතය. පිලිස්තියයන් හා සමඟ සටන්

21 දවිත්ගේ දවස්වලදී අවුරුද්දෙන්
අවුරුද්ද තුන් අවුරුද්දක්ම
සාගතයක් විය; දවිත් **ස්වාමීන්-
වහන්සේගෙන්** විභාගකළ විට **ස්වාමීන්-
වහන්සේ**: සාවුල් විසින් ගිබියොන්වරුන්
මැරූ බැවින් ඔහු නිසාත් ඔහුගේ කුරිරු
2 වංශය නිසාත්යයි කීසේක. (ගිබියොන්වරු
ඉශ්‍රායෙල් පුත්‍රයෝ නොව අමෝරි-
වරුන්ගෙන් ඉතිරිව සිටිය කොට්ඨාසයක්ය;
ඉශ්‍රායෙල් පුත්‍රයන් ඔවුන්ට දිවුරුම් දී
තිබුණ නුමුත් සාවුල් ඉශ්‍රායෙල් පුත්‍ර-
යන්ටත් යූදාටත් ඇති තමාගේ ජ්වලිතකම
නිසා ඔවුන් මරන්ට සෙවුවේය.) දවිත් 3
රජ ගිබියොන්වරුන් කැඳවා ඔවුන්ට
කථාකොට: නුඹලා උදෙසා කුමක්
කරම්ද? නුඹලා **ස්වාමීන්වහන්සේගේ**
උරුමයට ආශීර්වාදකරන පිණිස මා
මොන දෙයකින් සමගිකමක් කළ යුතුදැයි
ඔවුන්ගෙන් ඇසුවේය. ගිබියොන්වරුද: 4
සාවුල්ට සහ ඔහුගේ වංශයට විරුද්ධව
අපට ඇත්තේ රිදී රත්රන් ගැන
කාරණයක් නොවේ; ඉශ්‍රායෙල්හි යමෙකු
මැරීම අපේ වැඩක් නොවේයයි ඔහුට
කීවෝය. ඔහුද: නුඹලා කියන දෙයක්
නුඹලාට කරදෙමියි කීවේය. ඔව්හු රජුට 5
කථාකොට: අප නැතිකළාවූ, අප
ඉශ්‍රායෙල්වරුන්ගේ කොයි සීමාවකවත්
නොසිට නැතිවීයන ලෙස අපට විරුද්ධව 6
උපා යෙදූ මනුෂ්‍යයාගේ පුත්‍රයන්ගෙන්
පුරුෂයන් සත්දෙනෙකුන් අපට පාවා-
දුන මැනවි, අපිද **ස්වාමීන්වහන්සේ**
විසින් තෝරාගත් සාවුල් සිටි ගිබියාහි
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඔවුන් එල්ලා
තබන්නෙමුයයි කීවෝය. එවිට රජ:
ඔවුන් දෙන්නෙමියි කීවේය. නුමුත් ඔවුන් 7
අතරේ එනම් දවිත් සහ සාවුල්ගේ පුත්
යොනාතාන් අතරේ **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි කරන්ට යෙදුණු දිවුරුම නිසා
රජ සාවුල්ගේ පුත්‍ර වන යොනාතාන්ගේ
පුත්‍රවූ මෙපිබොෂෙත් ඉතුරු කෙළේය.
නුමුත් ඔහු අයාගේ දූවවූ රිශ්පා සාවුල් 8
නිසා වැදූ අර්මොනිද මෙපිබොෂෙත්ද
යන පුත්‍රයන් දෙදෙනාද සාවුල්ගේ දූවවූ
මීකල් මෙහොලාතිය බර්සිල්ලයිගේ
පුත්‍රවූ අද්‍රියෙල් නිසා වැදූ පුත්‍රයන්
පස්දෙනාද ගෙන, ගිබියොන්වරුන් 9
අතට පාවාදුන්නේය, ඔව්හු **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි කන්දේ ඔවුන් එල්ලා
දැමුවෝය, මෙසේ ඒ සත්දෙනා එකවිටම
වැටුණෝය. ඔවුන් මරනු ලැබුවේ යව
කපන්ට පටන්ගන්න කාලයේ පළමුවෙනි
දවස්වලදීය. එවිට අයාගේ දූවවූ රිශ්පා 10
ගෝනි රෙදි අරගෙන ගොස් පර්වතය

පිට අතුරා ඉඳ, ගොයම් කපන කාලයේ
පටන්ගැන්මේ සිට ඔවුන් පිට අහසින්
වැසි වසින තුරු දවල් ආකාශයේ
පක්ෂීන්ටවත් රෑ වනයේ මෘගයන්ටවත්
ඔවුන් ළඟට පැමිණෙන්ට ඉඩ නොදී
11 සිටියාය. අයාගේ දූවූ සාවුල්ගේ
උපභාර්යාවවූ රිශ්පා කළ දෙය දාවිත්ට
12 දන්වනලද්දේය. පිලිස්තිවරුන් විසින්
ගිල්බෝවාහි සාවුල් මැරූ දවසේදී
පිලිස්තිවරු සාවුල් සහ ඔහුගේ පුත්‍රවූ
යොනාතාන් බෙත්-ෂාන්හි වීථියේ
එල්ලාදැමුවෝය. එතැනින් ඔවුන්ගේ ඇට
යාබෙෂ්-ගිලියද් මනුෂ්‍යයන් විසින්
13 හොරෙන් ගෙන ගොස් තිබුණේය. දාවිත්
ගොස් සාවුල්ගේ ඇට සහ ඔහුගේ පුත්‍රවූ
යොනාතාන්ගේ ඇට එතැනින් ගෙනායේය.
එල්ලා දමනලද තැනැත්තන්ගේ ඇටත්
14 ඔව්හු එකතුකළෝය. සාවුල්ගේද ඔහුගේ
පුත්‍රවූ යොනාතාන්ගේද ඇට බෙන්යමින්
රටේ ශේලාහි තිබෙන ඔහුගේ පියවූ
කීෂ්ගේ සොහොන්ගෙයි තැන්පත්කොට
රජු විසින් අණකළ සියල්ල කළෝය.
ඉන්පසු දේශය ගැන කළ කන්නලව්ව
දෙවියන්වහන්සේ පිළිගත්සේක.
15 නැවත ඉශ්‍රායෙල් සමඟ පිලිස්ති-
වරුන්ගේ යුද්ධයක් විය; දාවිත්ද තමාගේ
සේවකයන් සමඟ ගොස් පිලිස්තිවරුන්ට
විරුද්ධව සටන්කෙළේය. දාවිත් විඩාවට
16 පැමිණියේය. එවිට යෝධයාගේ පුත්‍රයන්-
ගෙන් එක්කෙනෙක්වූ ඉෂ්බි-බෙනොබ්
දාවිත් මරන්ට සිතීය. ඔහුගේ හෙල්ලයේ
බර පිත්තල ෂෙකෙල් තුන්සියයක්ය, ඔහු
අලුත් කඩුවක්ද ඉණේ බැඳගෙන උන්නේය.
17 නුමුත් ශෙරුයාගේ පුත්‍රවූ අබිෂයි රජුට
උපකාරකොට පිලිස්තියයාට පහරදී
ඔහු මැරුවේය. එවිට දාවිත්ගේ මිනිස්සු:
ඉශ්‍රායෙල්ගේ පහන නොනිවන පිණිස
ඔබ තවත් අප සමඟ යුද්ධයට
නොයායුතුයයි දිවුරා දාවිත්ට කියා
සිටියෝය.
18 ඉන්පසු නැවතත් පිලිස්තිවරුන් සමඟ
ගෝබ්හි යුද්ධයක් විය. එවිට හුෂාතිය
සිබ්බෙකයි යෝධයාගේ පුත්‍රයන්ගෙන්
19 එක්කෙනෙක්වූ සප් මැරුවේය. නැවතත්
පිලිස්තිවරුන් සමඟ ගෝබ්හි යුද්ධයක්
විය; බෙත්-ලෙහෙමිය යාරේ-ඔරෙගීම්ගේ
පුත්‍රවූ එල්හානාන් ගිත්තිය ගොලියත්ගේ
සහෝදරයා මැරුවේය. ඔහුගේ හෙල්ලයේ
මිට වියන දණ්ඩක් හා සමානය.
නැවතත් ගාත්හි යුද්ධයක් විය, එහි 20
බොහෝ උස මහත ඇති මනුෂ්‍යයෙක්
සිටියේය, ඔහුගේ අත්වලත් පාදවලත්
හය හය බැගින් ගණනින් ඇඟිලි
විසිහතරක් ඔහුට තිබුණේය; ඔහුත්
යෝධයා නිසා උපන් කෙනෙක්ය. ඔහු 21
ඉශ්‍රායෙල්වරුන්ට මිග කී කල දාවිත්ගේ
සහෝදරයා වන ෂිමෙයිගේ පුත්‍රවූ
යොනාතාන් ඔහු මැරීය. ඒ සතරදෙනා 22
ගාත්හිදී යෝධයා නිසා උපන්නෝය;
ඔව්හු දාවිත් අතින්ද ඔහුගේ සේවකයන්
අතින්ද පැරදී වැටුණෝය.

## දාවිත් රජුගේ මිදීමේ ගීය

22 ස්වාමීන්වහන්සේ දාවිත්ගේ සියලු
සතුරන් අතින්ද සාවුල්ගේ අතින්ද
ඔහු ගැළවූ කල ඔහු මේ ගීතිකාවේ
වචන ස්වාමීන්වහන්සේට කියනුයේ:
ස්වාමීන්වහන්සේ මාගේ පර්වතයය 2
මාගේ බලකොටුවය. මාගේ, මාගේම
මිදුම්කාරයාණෝය;
මාගේ පර්වතයවූ දෙවියන්වහන්සේය, 3
උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරමි;
උන්වහන්සේ මාගේ පලිහය, මාගේ
ගැළවීමේ අඟය, මාගේ උස් කොටුවය,
මාගේ රක්ෂාස්ථානයය;
මාගේ ගැළවුම්කාරයාණෝය,
බලාත්කාරකමෙන් ඔබ මා
ගළවනසේක.
ප්‍රශංසනීයවූ ස්වාමීන්ට අයැද සිටිමි. 4
මෙසේ මාගේ සතුරන්ගෙන්
ගැළවෙන්නෙමි.
කුමක්හෙයින්ද මරණය නැමති 5
තරංගයෝ මා වටකළෝය,
අධර්මය නැමති ජලධාරාවෝ මා
භයගැන්වූය.
ෂෙයොලේ බැමි මා අවටින් විය, 6
මරණයේ මලපත් මා පිටට ආයේය.
මාගේ විපතේදී ස්වාමීන්ට අයැදීම්, 7

එසේය, මාගේ දෙවියන්වහන්සේට
මොරගැසීමි.
උන්වහන්සේ තමන් මාලිගාවේ සිට
මාගේ හඬ ඇසූසේක,
මාගේ හඬ උන්වහන්සේගේ කණෙහි
වැටුණේය.
8 එවිට පොළොව සෙලවී කම්පා විය,
අහසේ අත්තිවාරම්ද වෙවුලා
සෙලවුණේය, මක්නිසාද උන්වහන්සේ
උදහස් වූසේක.
9 උන්වහන්සේගේ නාස්පුටවලින් දුමක්
නැංගේය.
උන්වහන්සේගේ මුඛයෙන් ගිනි නික්ම
විනාශකෙළේය.
එයින් අඟුරු ඇවුළුණේය.
10 උන්වහන්සේ අහස නමාගෙන
බැස්සසේක;
උන්වහන්සේගේ පාද යට
ඝනාන්ධකාරය විය.
11 උන්වහන්සේ කෙරුබයෙකු පිට නැඟී
පියාසරකළසේක.
එසේය, උන්වහන්සේ හුළඟ නැමැති
පියාපත් පිට පෙනුණුසේක.
12 උන්වහන්සේ අන්ධකාරයද ජලරාශිය
වන අහසේ ඝන වලාකුළුද
තමන් වටකොට මණ්ඩපයන්
කරගත්සේක.
13 උන්වහන්සේ ඉදිරියෙහිවූ දීප්තිය
නිසා අඟුරු දැල්වී ගියේය.
14 ස්වාමීන්වහන්සේ අහසේ සිට
ගර්ජනාකළසේක,
මහෝත්තමයාණෝද තමන් හඬ
නිකුත්කළසේක.
15 උන්වහන්සේ තමන් ඊගස් විද ඔවුන්
විසිරවූසේක;
විදුලිය එවා ඔවුන් පරාජයකළසේක.
16 එකල ස්වාමීන්ගේ තරවටුවෙන්ද
උන්වහන්සේගේ නාසා වාතය නිසාද
සමුද්‍ර පතුල් ප්‍රකාශවුණේය,
පොළොවේ අත්තිවාරම්ද ප්‍රකාශ විය.
17 උන්වහන්සේ උඩින් අත පොවා මා
අල්වාගත්සේක;
බොහෝ ජලධාරාවලින් මා
ඇදගත්සේක;
මාගේ බලවත් සතුරාගෙන්ද 18
මට වෛරවූවන්ගෙන්ද උන්වහන්සේ
මා මුදගත්සේක; මක්නිසාද
ඔව්හු මට වඩා බලවත් වූය.
මාගේ විපත්ති දවසේදී ඔව්හු මට 19
විරුද්ධව ආවෝය.
නුමුත් ස්වාමීන්වහන්සේ මාගේ
ආධාරය වූසේක.
උන්වහන්සේ විශාල ස්ථානයකට 20
මා ගෙනාසේක.
උන්වහන්සේ මා කෙරෙහි ප්‍රසන්නවූ
බැවින් මා මිදූසේක.
ස්වාමීන්වහන්සේ මාගේ ධර්මිෂ්ඨකම 21
ලෙස මට විපාක දුන්සේක.
මාගේ අත්වල පිරිසිදුකම ලෙස මට
ප්‍රතිඵල දුන්සේක.
මක්නිසාද මම ස්වාමීන්ගේ 22
මාර්ග රක්ෂාකෙළෙමි,
මාගේ දෙවියන්වහන්සේ කෙරෙන්
දුෂ්ට ලෙස අහක්ව නොගියෙමි.
උන්වහන්සේගේ සියලු විනිශ්චයයෝ 23
මා ඉදිරියෙහි වූය.
උන්වහන්සේගේ පනත්වලින් අහක්ව
නොගියෙමි.
මම උන්වහන්සේ වෙත *නිර්දෝෂව 24
සිටියෙමි,
මාගේ අයුතුකමින් වැලකුණෙමි.
එබැවින් ස්වාමීන්වහන්සේ මාගේ 25
ධර්මිෂ්ඨකම ලෙසත්
උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහිවූ
මාගේ පිරිසිදුකම ලෙසත් මට ප්‍රතිඵල
දුන්සේක.
කරුණාවන්තයා සමග ඔබද 26
කරුණාවන්ත බව දක්වනසේක,
නිර්දෝෂ තැනැත්තා සමග †නිර්දෝෂ
බව දක්වනසේක;
පිරිසිදු අය සමග ඔබ පිරිසිදු බව 27
දක්වනසේක;
හිතුවක්කාර අය සමග විරුද්ධව බව
දක්වනසේක.
ඔබ පීඩිත සෙනඟ ගළවනසේක. 28
එහෙත් උඩඟුවූවන් පහත්කරන පිණිස
ඔබගේ ඇස් ඔවුන් දෙසට යොමා
තිබේ.

*හෙවත්, සම්පූර්ණව.
†හෙවත්, සම්පූර්ණ බව.

29 මක්නිසාද ස්වාමීන්වහන්ස, ඔබ මාගේ පහනය.
ස්වාමීන්වහන්සේ මාගේ අන්ධකාරය ආලෝකකරනසේක.
30 මක්නිසාද ඔබ කරණකොටගෙන සමූදවකට විරුද්ධව දුවමි.
මාගේ දෙවියන්වහන්සේ කරණකොටගෙන පවුරක් උඩින් පනිමි.
31 දෙවියන්වහන්සේගේ මාර්ගය වනාහි සම්පූර්ණය.
ස්වාමීන්ගේ වචනය නිර්මලය;
උන්වහන්සේ තමන් කෙරෙහි විශ්වාස-කරන සියල්ලන්ට පලිහක් වනසේක.
32 මක්නිසාද ස්වාමීන්වහන්සේ මිස දෙවියන්වහන්සේ වෙන කවුද?
අපේ දෙවියන්වහන්සේ මිස පර්වතයක් වෙන කවුද?
33 දෙවියන්වහන්සේ මාගේ බලකොටුවය.
උන්වහන්සේ *නිර්දෝෂ අයට මාර්ගය පෙන්වනසේක.
34 උන්වහන්සේ මාගේ පාද මුවදෙනුන්ගේ පාද මෙන් කරනසේක.
මාගේ උස් තැන්වල මා පිහිටුවනසේක.
35 උන්වහන්සේ යුද්ධයට මාගේ අත් පුහුණුකරනසේක;
එහෙයින් මාගේ බාහු පිත්තල දුන්නක් නමන්නේය.
36 ඔබගේ ගැළවීම නමැති පලිහ ඔබ මට දුන්සේක.
ඔබගේ මෘදුකම මා උසස්කෙළේය.
37 ඔබ මා යට මාගේ අඩිපාර පළල්කළසේක,
මාගේ පාදයෝද නොලිස්සුවෝය.
38 මම මාගේ සතුරන් ලුහුබැඳ ගොස් විනාශකෙළෙමි;
මම ඔවුන් වනසන තුරු හැරී නායෙමි.
39 නැගිටින්ට බැරිවන ලෙස මම ඔවුන්ට පහරදී ඔවුන් සුන්කෙළෙමි.
එසේය, ඔව්හු මාගේ පාද යට වැටුණෝය.

*හෙවත්, සම්පූර්ණ.

මක්නිසාද ඔබ සටන් පිණිස බලයෙන් මාගේ ඉඟටිය සැරසූසේක. 40
මට විරුද්ධව නැඟුටුණු අය ඔබ මා යටතේ අවනතකරවූසේක.
මට ද්වේෂකරන්නන් මා විසින් සිඳ දමන පිණිස 41
ඔබ මාගේ සතුරන් මට පිටිපාන්ට සැලැස්වූසේක.
ඔව්හු බැලුවෝය, තුමුත් ගළවන්ට කිසිවෙක් නොවීය; 42
ස්වාමීන් දෙස බැලුවෝය, තුමුත් උන්වහන්සේ ඔවුන්ට උත්තර නුදුන්සේක.
එකල මම පොළොවෙහි ධූලි මෙන් ඔවුන් සුණුකෙළෙමි, 43
වීථිවල මඩ මෙන් ඔවුන් පාගා විසුරුවාදැමීමි.
ඔබ මාගේ සෙනඟගේ ඩබරවලින් මා මුදගත්සේක; 44
ජාතීන්ට ප්‍රධානියා වීමට මා රක්ෂාකළසේක.
මා විසින් නොහැඳින්න සෙනඟක් මට මෙහෙකරන්නෝය.
විදේශීහු මට යටත්කම පාන්නෝය. 45
මා ගැන ඇසූ කෙණෙහිම ඔව්හු මට කීකරු වන්නෝය.
විදේශීහු මලානිකවී 46
තමුන් සැඟවී හුන් තැන්වලින් වෙවුලමින් පිටත එන්නෝය.
ස්වාමීන්වහන්සේ ජීවත්ව සිටිනසේක; 47
මාගේ පර්වතයාණන්ට ප්‍රශංසා වේවා;
මාගේ ගැළවීමේ පර්වතය වන දෙවියන්වහන්සේ උසස්වනසේක්වා.
උන්වහන්සේ මා උදෙසා පළිගන්නාවූ; 48
ජාතීන් මට යටත්කර දෙන්නාවූ,
මාගේ සතුරන්ගෙන් මා මුදගන්නාවූ 49
දෙවියන්වහන්සේය.
එසේය, මට විරුද්ධව නැගිටින්නන්ට වඩා ඔබ මා උසස්කරනසේක.
බලාත්කාර මනුෂ්‍යයාගෙන් මා ගළවනසේක.
එබැවින් ස්වාමීන්වහන්ස, ජාතීන් 50

අතරේ ඔබට ස්තුතිකරන්නෙමි,
ඔබගේ නාමයට ප්‍රශංසා ගී
කියන්නෙමි.
51 උන්වහන්සේ තමන් රජහට මහත්
ගැළවීම දෙනසේක.
තමන්ගේ අභිෂේකලත් තැනැත්තා වන
දාවිත්ටත් ඔහුගේ වංශයටත් සදාකල්
කරුණාව පෙන්වනසේකැයි කීවේය.

## දාවිත් රජුගේ අන්තිම වචන

23 තවද දාවිත්ගේ අන්තිම
වචන මේවාය.
යෙස්සේගේ පුත්‍රයාද
උසස්කරනු ලැබූ මනුෂ්‍යයාද
යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ
අභිෂේකලත් තැනැත්තාද
ඉශ්‍රායෙල්ගේ මිහිරි ගීතිකාකාරයාද
වූ දාවිත් මෙසේ කියන්නේය:
2 ස්වාමීන්වහන්සේගේ ආත්මය මා
ලවා කථාකෙරෙවූසේක,
උන්වහන්සේගේ වාක්‍යයද මාගේ
දිවේ තිබුණේය.
3 ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ කීවේත්
ඉශ්‍රායෙල්ගේ පර්වතයාණන් මට
කථාකළේත් මෙසේය–
දෙවියන්වහන්සේ කෙරෙහි භය
ඇතුව
මනුෂ්‍යයන් කෙරෙහි ආණ්ඩුකරන
ධර්මිෂ්ඨ ආණ්ඩුකාරයෙක් එන්නේය.
4 ඒ තෙමේ වලාකුල් නැතුව
ඉර උදාවන කල්හි තිබෙන උදය
ආලෝකයද
වැස්සෙන් පසුව බබළන දීප්තිය
කරණකොටගෙන
පොළොවෙන් හටගන්න ළපටි තෘණද
මෙන් වන්නේය.
5 සැබවින් මාගේ වංශය
දෙවියන්වහන්සේ ඉදිරියෙහි එසේම
පවතිනු නොවේද?
මක්නිසාද සියල්ල ගැන නියම ලෙස
ස්ථිරකර තිබෙන
සදාකාල ගිවිසුමක් උන්වහන්සේ මා
සමග කළසේක.
ඒ මාගේ මුළු ගැළවීමත් මාගේ මුළු
ප්‍රසන්නයත් වේ.
උන්වහන්සේ එය වැඩෙන්ට
නොසලස්වනසේක්ද?
6 නුමුත් සියලු *දුර්ජනයෝ අතින්
නාල්ලන්නාවූ
අහක දමන්නාවූ කටු ගස්වලට
සමානය.
7 ඒවා අල්ලන මනුෂ්‍යයා
යකඩ සහ හෙල්ල මිටක්ද රැගෙන
සිටිය යුතුය;
ඒවා තිබෙන තැනම මුළුමනින්
ගින්නෙන් දවා දමනු ලබන්නේය.

*හෙවත්, බෙලියල් පුත්‍රයෝ.

## දාවිත් රජුගේ බලවන්තයෝ

දාවිත්ට සිටි බලවන්තයන්ගේ නාම 8
මේවාය: අධිපතීන්ට ප්‍රධානවූ තාකෙමොනිය
යොෂෙබ්-බෂ්ෂෙබෙත්ය; ඔහු එක්
වතාවකදී අටසිය දෙනෙකුට විරුද්ධව
තමාගේ හෙල්ලය ඔසවා ඔවුන්
මැරුවේය. ඊළඟට අහෝහිය දෝදෝගේ 9
පුත්‍රවූ එලෙයාසර්ය; ඔහු පිලිස්තිවරුන්
යුද්ධයට රැස්ව සිටිද්දී ඒ ස්ථානයෙහි
දාවිත් සමග සිට ඔවුන්ට මිගකී බලවන්ත-
යන් තුන්දෙනාගෙන් එක්කෙනෙක්ය,
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝද ගොස් සිටියෝය.
ඔහු නැගිට තමාගේ අතට වෙහෙසවී 10
තමාගේ අත කඩුවට ඇලෙන තුරු
පිලිස්තිවරුන්ට පහර දුන්නේය. ස්වාමීන්-
වහන්සේ එදා මහත් ජයක් සාදා දුන්-
සේක; සෙනඟද කොල්ලය ගන්ට
පමණක් ඔහු පස්සේ ගියෝය. ඊළඟට 11
හාරාරිය අගීගේ පුත්‍රවූ ෂම්මාය.
පිලිස්තිවරු හමුදාවක්ව කොල්ලූ පුරාම
තිබුණු බිම් කොටසක රැස්ව සිටියෝය;
සෙනඟද පිලිස්තිවරුන් ඉදිරියෙන්
පලාගියෝය. නුමුත් ඔහු බිම් කොටස 12
මැද සිට ඒක බේරාගන පිලිස්තිවරුන්
මැරුවේය. ස්වාමීන්වහන්සේ මහත් *ජයක්
සාදා දුන්සේක. ප්‍රධාන තිස්දෙනාගෙන් 13
තුන්දෙනෙක් ගොයම් කපන කාලයේදී
ගොස් දාවිත් සිටි අදුල්ලම් ගුහාවට
බැස ගියෝය; පිලිස්තිවරුන්ගේ හමුදාව
රෙපායිම් මිටියාවතෙහි කඳවුරු
බැඳගෙන උන්නාහ. දාවිත් එවකට 14
බලකොටුවෙහි සිටියේය. පිලිස්තිවරුන්ගේ
හමුදාව එවකට බෙත්-ලෙහෙම්හි සිටියාහ.

*හෙබ්‍රෙව්: ගැළවීමක්.

15 දාවිත් තද ආශාවක් ඇත්තේ: අනේ බෙත්-
ලෙහෙම් දොරටුව ළඟ තිබෙන ළිඳේ වතුර
කවුරුවත් මට බොන්ට ගෙනත් දෙනවා
16 නම් හොඳයයි කීවේය. එවිට ඒ
බලවන්තයන් තුන්දෙනා පිලිස්තිවරුන්ගේ
සේනාව මැදින් බිඳගත ගොස් බෙත්-
ලෙහෙම් දොරටුව ළඟ තිබෙන ළිඳෙන්
වතුර ඇද දාවිත් වෙතට ගෙනාවෝය.
නුමුත් ඔහු ඒවා බොන්ට අකමැතිව
ඒවා **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
17 වත්කොට: **ස්වාමීන්වහන්ස**, මෙසේ කිරීම
මාගෙන් දුරුවේවා. තමුන්ගේ ප්‍රාණය
නොසලකා ගිය මේ මනුෂ්‍යයන්ගේ
රුධිරය බොන්ට යුතුදැයි කියා ඒවා
බොන්ට අකමැතිවුණේය. ඒ බලවන්තයෝ
18 තුන්දෙනා මේ දේවල් කළෝය. ශෙරුයාගේ
පුත්‍රවූ යෝවාබ්ගේ සහෝදරවූ අබිෂයි
තුන්දෙනාගේ ප්‍රධානියාව සිටියේය. ඔහු
තමාගේ හෙල්ලය තුන්සිය දෙනෙකුට
විරුද්ධව ඔසවා ඔවුන් මරා තුන්දෙනා
19 අතරේ නාමයක් ලැබීය. තුන්දෙනා
අතරෙන් ඔහු ඉතා ගරුතර තැනැත්තා
නොවේද? එබැවින් ඔහු ඔවුන්ගේ
අධිපතියා කරනලද්දේය. එසේ වුවත්
ඔහු පළමුවෙනි තුන්දෙනාගේ ප්‍රමාණයට
20 නොපැමිණියේය. මහත් ක්‍රියාවල්
කළාවූ, කබ්සෙයෙල්හි වික්‍රමාන්විත
මනුෂ්‍යයෙකුගේ පුත්‍රවූ යෙහෝයාදගේ
පුත්‍රයා වන බෙනායා මෝවබ්හි අරියෙල්ගේ
පුත්‍රයන් දෙන්නා මැරුවේය. හිමවැටෙන
දවසකදී ඔහු බැස ගොස් වළක්
21 ඇතුළෙහිදී සිංහයෙකු මැරුවේය. ඔහු
එඩිතර පෙනීමක් ඇති මිසර මනුෂ්‍යයෙකුත්
මැරුවේය. මිසරයාගේ අතේ හෙල්ලයක්
තිබුණේය; එහෙත් ඔහු පොල්ලක් ඇතුව
මිසරයා ළඟට ගොස් ඔහුගේ අතින්
හෙල්ලය උදුරාගෙන ඔහුගේම හෙල්ලයෙන්
22 ඔහු මැරුවේය. යෙහෝයාදගේ පුත්‍රවූ
බෙනායා මේ දේවල් කොට බලවන්තයන්
තුන්දෙනා අතරේ නාමයක් ලැබුවේය.
23 ඔහු තිස්දෙනාට වඩා ගරුතර කෙනෙක්ය,
එහෙත් පළමුවෙනි තුන්දෙනාගේ
ප්‍රමාණයට නොපැමිණියේය. දාවිත්
තමාගේ මුරකාරයන් කෙරෙහි ඔහු
අධිපතියා කෙළේය.

යෝවාබ්ගේ සහෝදරවූ අසාහෙල් 24
වනාහි තිස් දෙනාගෙන් එක්කෙනෙක්ය;
තවත් අය නම් බෙත්-ලෙහෙමෙහි
දෝදෝගේ පුත්‍රවූ එල්හානාන්ය; හරෝදිය 25
ෂම්මාය, හරෝදිය එලිකාය; පල්තිය 26
හෙලෙශ්ය, තෙකෝයිය ඉක්කෙෂ්ගේ
පුත්‍රවූ ඊරාය; අනාතෝතිය අබියෙසේර්ය, 27
හුෂාතිය මෙබුන්නයිය; අහොහිය 28
ශල්මොන්ය, නෙටොපාතිය මහරයිය;
නෙටොපාතිය බානාගේ පුත්‍රවූ හෙලෙබ්ය, 29
බෙන්යමින් පුත්‍රයන්ගේ ගිබියාහි රීබයිගේ
පුත්‍රවූ ඉත්තයිය; පිරාතොනිය බෙනායාය, 30
ගාෂ්හි දෙළවල හිද්දයිය; අර්බාතිය 31
අබී-යල්බොන්ය, බර්හුමිය අස්මාවෙත්ය;
ෂාල්බොනිය එලියාබාය, යාෂෙන්ගේ 32
පුත්‍රයන්ගෙන් යොනාතාන්ය; හරාරිය 33
ෂම්මාය, අරාරිය ෂාරාර්ගේ පුත්‍රවූ
අහියාම්ය; මයකාතියයාගේ පුත්‍රයා 34
වන අහස්බයිගේ පුත්‍රවූ එලිපෙලෙත්ය,
ගීලොනිය අහිතොපෙල්ගේ පුත්‍රවූ
එලියාම්ය; කර්මෙලිය හෙශ්රයිය, අර්බිය 35
පයරයිය; ශෝබාහි නාතාන්ගේ පුත්‍රවූ 36
ඉගාල්ය, ගාදිය බානීය; අම්මොනිය 37
ශෙලෙක්ය, ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ්ගේ
ආයුධ ගෙනයන්නා වන බෙයේරොතිය
නහරයිය; ඉත්රිය ඊරාය, ඉත්රිය 38
ගාරෙබ්ය; හිත්තීය උරියාය. ඒ සියල්ලෝ 39
තිස් සත්දෙනෙක්ය.

## සෙනඟ ගණන් කිරීම සහ එහි විපාකය

24 නැවත **ස්වාමීන්වහන්සේගේ** උදහස
ඉශ්‍රායෙල්ට විරුද්ධව ඇවුළුණේය.
උන්වහන්සේද: ගොස් ඉශ්‍රායෙල්වරුන්ද
යූදවරුන්ද ගණන් කරපන්නැයි කියමින්
දාවිත් ඔවුන්ට විරුද්ධව පෙළඹවූසේක.
රජතෙමේ තමා සමග සිටි සේනාපතියාවූ 2
යෝවාබ්ට කථාකොට: මා විසින් සෙනඟ-
ගේ ගණන දැනගන්නා පිණිස තුඹලා
දාන් පටන් බෙයෙර්-ෂෙබා දක්වා සියලු
ඉශ්‍රායෙල් ගෝත්‍ර අතරේ ඇවිද සෙනඟ
ගණන්කරපල්ලායයි කීවේය. යෝවාබ් 3
රජුට කථාකොට: දැන් සිටින ගණන

කොපමණ වුවත් ඊට වඩා ඔබගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** සෙනඟ සිය ගුණයක්
වැඩිකරනසේක්වා, මාගේ ස්වාමිවූ
රජ්ජුරුවන්ට සියැසින් දකින්ටත් ලැබේවා.
නුමුත් මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්
මේ කාරණයට ප්‍රියවන්නේ මක්නිසා-
4 දැයි කීවේය. එහෙත් යෝවාබ්ගේද
සේනාපතීන්ගේද වචනය යටපත් වී
රජුගේ වචනය ස්ථිරවිය. යෝවාබ්ද
සේනාපතීහුද ඉශ්‍රායෙල් සෙනඟ ගණන්
කරන පිණිස රජු ඉදිරියෙන් පිටත්ව
5 ගියෝය. ඔව්හු යොර්දනෙන් එගොඩට
ගොස් අරෝයෙර්හි ගාද් මිටියාවත මැද
තිබෙන නුවරට දකුණෙන් යාසේර්
දෙසට කූඩාරම් පිහිටුවාගත්තෝය.
6 එතනින් ඔව්හු ගිලියද්ටත් තාතීම්-හොද්ෂි
රටටත් පැමුණුණෝය; එතනින්
දන්-යාන්ටත් සීදෙන් වටකර ස්ථානවලටත්
7 පැමිණියාහ. එතනින් පවුරු ඇති තීර්ටත්
හිව්වරුන්ගේද කානානිවරුන්ගේද සියලු
නුවරවලටත් පැමිණියාහ. යූදහි දකුණු
දිශාවේ බෙයෙර්-ෂෙබා දක්වාද ගියෝය.
8 මෙලෙස ඔව්හු මුළු දේශයෙහි ඇවිද
නව මස් විසි දවසකට පසු යෙරුසලමට
9 ආවෝය. යෝවාබ් ගණන්කොට
සෙනඟගේ මුළු ගණන රජුට දුන්නේය.
කඩුගත් යුද්ධකාර ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්
අට ලක්ෂයක්ද යූද මනුෂ්‍යයන් පන්-
ලක්ෂයක්ද සිටියෝය.
10 දාවිත් සෙනඟ ගණන්කළ පසු ඔහුගේ
සිත ඔහුට දෙස් තැබුවේය. දාවිත්
**ස්වාමීන්වහන්සේට** කථාකොට: මම මේ
දේ කිරීමෙන් බොහෝසෙයින් පව්
කෙළෙමි. දැන් **ස්වාමීන්වහන්ස**, ඔබගේ
මෙහෙකරුවාගේ අපරාධය පහකළ
මැනව; මක්නිසාද බොහෝ අනුවණ ලෙස
11 ක්‍රියාකෙළෙමියි කීවේය. දාවිත් උදයේ
නැගුටුණු කල දාවිත්ගේ දර්ශකයා වන
ගාද් ප්‍රොපේතවරයා වෙතට **ස්වාමීන්-**
12 **වහන්සේගේ** වචනය පැමිණ: නුඹ ගොස්
දාවිත්ට මෙසේ කියාපන්න—මම කාරණා
තුනක් නුඹ ඉදිරියෙහි තබමි; මා විසින්
නුඹට කරන පිණිස එයින් එකක්
තෝරාගනින්නැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කීය. ගාද් දාවිත් ළඟට 13
ඇවිත් ඔහුට දන්වමින්: නුඹ කැමති
කොයි එකටද? නුඹේ දේශයේ සත්
අවුරුද්දක් සාගතය නුඹට පැමිණෙන-
වාටද? නොහොත් තුන් මාසයක් නුඹේ
සතුරන් නුඹ පස්සේ එළවාගෙන එද්දී
නුඹ ඔවුන් ඉදිරියෙන් පලායනවාටද?
නොහොත් නුඹේ දේශයෙහි තුන්දවසකට
වසංගතයක් පැමිණෙනවාටද? දැන් ඉතින්
කල්පනා කර මා එවූ තැනන්වහන්සේට
කෙබඳු උත්තරයක් මා විසින් දිය යුතුදැයි
කල්පනාකර බලන්නැයි කීවේය. දාවිත්ද: 14
මම මහත් අමාරුවකට පැමිණ සිටිමි.
ඉතින් **ස්වාමීන්වහන්සේගේ** අතට භාර-
වන්නෙමු; මක්නිසාද උන්වහන්සේගේ
අනුකම්පාව මහත්ය. මනුෂ්‍යයින්ගේ අතට
අසුනොවෙම්වායි ගාද්ට කීවේය. මෙසේ 15
**ස්වාමීන්වහන්සේ** උදය පටන් නියමි
වේලාව දක්වා ඉශ්‍රායෙල් අතරට වසං-
ගතයක් එවූසේක. එයින් දාන් පටන්
බෙයෙර්-ෂෙබා දක්වා සෙනඟගෙන්
මනුෂ්‍යයන් සැත්තෑදහසක් මැරුණෝය.
දේවදූතයා යෙරුසලම විනාශකරන්ට 16
තමාගේ අත ඒ දෙසට දිගුකළ විට
**ස්වාමීන්වහන්සේ** විපත ගැන තැවී
සෙනඟ විනාශකරන දූතයාට කථාකොට:
ඉතින් ඇත, නුඹේ අත නවතාගනින්නැයි
කීසේක. **ස්වාමීන්වහන්සේගේ** දූතයා
යෙබූසිය අරව්නාගේ පාවර ළඟ සිටියේය.
දාවිත්ද සෙනඟට පහර දෙන දූතයා දැක 17
**ස්වාමීන්වහන්සේට** කථාකොට: මම
පව්කෙළෙමි, මම අපරාධකෙළෙමි. නුමුත්
මේ බැටළුවෝ කුමක් කළෝද? අනේ
ඔබගේ අත මා පිටටත් මාගේ පිය වංශය
පිටටත් පැමිණේවයි කීවේය.
එදින ගාද් දාවිත් ළඟට අවුත්: නුඹ 18
ගොස් යෙබූසිය අරව්නාගේ පාවරේ
**ස්වාමීන්වහන්සේට** පූජාසනයක් ගොඩ-
නගන්නැයි ඔහුට කීවේය. දාවිත් 19
**ස්වාමීන්වහන්සේ** අණකළ ලෙස ගාද්ගේ
කීමේ හැටියට නැගී ගියේය. අරව්නා 20
බැලූ විට රජුද ඔහුගේ සේවකයන්ද
තමා වෙතට එනවා දැක පිටතට ඇවිත්
මුහුණින් බිමට නැමී රජුට වැඳ: මාගේ 21

ස්වාමිවූ රජ්ජුරුවන් තමාගේ මෙහෙ-
කරුවා ළඟට ආවේ කුමක් පිණිසදැයි
ඇසුවේය. වසංගතය සෙනඟගෙන්
පහවෙන පිණිස **ස්වාමීන්වහන්සේට** පූජා-
සනයක් ගොඩනැඟීමට පාවර නුඹෙන්
මිලේට ගැනීමටයයි දාවිත් කීවේය.
22 අරව්නාද: මාගේ ස්වාමිවූ රජ්ජුරුවෝ
තමන්ට හොඳව පෙනෙන දෙයක්
රැගෙන පූජාකෙරෙත්වා. මෙන්න, දවන
පූජාවට ගවයෝ සිටිති, දර පිණිස මඩින
යන්ත්‍රද ගවයන්ගේ වියගස්ද තිබේ.
23 රජ්ජුරුවෙනි, අරව්නා මේ සියල්ල රජ්ජුරු-
වන්ට දෙන්නේයයි දාවිත්ට කීවේය. තවද
අරව්නා කථාකොට: ඔබගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඔබ පිළිගන්නා-
සේක්වයි රජුට කීවේය. රජද: එසේ 24
නොව මිල ගණනකට එය නුඹෙන්
ගනිමි. මට වියදමක් නැතුව මාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** දවන පූජා ඔප්පු
නොකරමියි අරව්නාට කීවේය. එසේ
දාවිත් පාවරද ගවයන්ද රිදී ෂෙකෙල්
පනසකට ගත්තේය. එහි දාවිත් **ස්වාමීන්-** 25
**වහන්සේට** පූජාසනයක් ගොඩනගා
දවන පූජාද ශාන්ති පූජාද ඔප්පුකෙළේය.
එවිට **ස්වාමීන්වහන්සේ** දේශය ගැන
කන්නලව්ව පිළිගත්සේක, වසංගතයද
ඉශ්‍රායෙල් අතරෙන් නැවතුණේය.

---

# රාජාවලියේ පළමුවෙනි පොත

## දාවිත් රජුගේ මහලු කාලය. සාලමොන් රජවීම

1 දාවිත් රජ මහලුව වයස්ගතව සිටිය
කල වස්ත්‍රවලින් වසනු ලැබූ නුමුත්
2 ඔහුට උණුහුම ලැබුණේ නැත. එබැවින්
ඔහුගේ සේවකයෝ ඔහුට කථාකොට:
රජ්ජුරුවන් ඉදිරියෙහි සිටීමටත් ඔබට
සාත්තුකාරියක් වී අපේ ස්වාමිවූ
රජ්ජුරුවන්ට උණුහුම ලැබෙන පිණිස
ඔබගේ ළයෙහි සැතපීමටත් සුදුසුවූ
තරුණ කන්‍යාවක් අපේ ස්වාමිවූ
රජ්ජුරුවන්ට සොයාදෙන්ට අපට අවසර
3 ලැබේවයි කීවෝය. ඔව්හු ශෝභන
තරුණියෙකු සියලු ඉශ්‍රායෙල් සීමා තුළ
සොයා ෂූනම්මිය අබිෂග් සම්බවී ඈ
4 රජු ළඟට ගෙනාවෝය. තරුණියද
ඉතා ශෝභනව සිටියාය; ඈ රජුට
සාත්තුකාරියක් වී ඔහුට මෙහෙවර
කළාය. එහෙත් රජ ඈ නොහැඳින්නේය.
5 එකල හග්ගීත්ගේ පුත්‍රවූ අදෝනියා: මම
රජවෙමියි කියා තමාම උසස්කරගෙන
රථද අසරුවන්ද තමාට පෙරටුව දුවන
පිණිස මනුෂ්‍යයන් පනස්දෙනෙක්ද
6 සපයාගත්තේය. නුඹ මෙසේ කළේ මන්දැයි
කියා ඔහුගේ පියා කවදාවත් ඔහුට
සැරකළේ නැත. තවද ඔහු ඉතා
ශෝභමාන මනුෂ්‍යයෙක් විය; ඔහු
7 අබ්සලොම්ට පසුව උපන්නේය. ඔහු
ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ් සහ
අබියාතර් පූජකයා සමග මන්ත්‍රණය-
කෙළේය. ඔව්හු අදෝනියාට පක්ෂව ඔහුට
8 උපකාරකළෝය. නුමුත් ශාදෝක් පූජකයාද
යෙහෝයාදාගේ පුත්‍රවූ බෙනායාද අනාගත-
වක්තෘවූ නාතාන්ද ෂිමෙයිද රේයිද දාවිත්ට
අයිති බලවන්තයෝද අදෝනියා සමග
9 නොවූහ. අදෝනියා ඒන්-රොගෙල් ළඟ
තිබෙන සොහෙලෙත් ගල ළඟදී
බැටළුවන්ද හරකුන්ද තර වස්සන්ද මරා
රජුගේ පුත්‍රයන්වූ තමාගේ සියලු
සහෝදරයන්ද රජුගේ සේවකයන්වූ සියලු
යූදා මනුෂ්‍යයන්ද කැඳෙවූවේය. නුමුත් 10
ඔහු අනාගතවක්තෘවූ නාතාන්ද
බෙනායාද බලවන්තයන්ද තමාගේ
සහෝදරවූ සාලමොන්ද කැඳෙව්වේ
නැත. එවිට නාතාන් සාලමොන්ගේ 11
මව්වූ බැත්-ෂෙබාට කථාකොට: අපේ
ස්වාමිවූ දාවිත් නොදැනුවත්ව හග්ගීත්ගේ
පුත්‍රවූ අදෝනියා රජවී සිටින බව නුඹට
සැලනොවීද? එබැවින් නුඹේ ජීවිතයත් 12
නුඹේ පුත්‍රවූ සාලමොන්ගේ ජීවිතයත්
නුඹ විසින් ආරක්ෂා කරගන්න පිණිස
නුඹට දැනමුතුකමක් දෙන්ට මට අවසර
ලැබේවා. නුඹ ගොස් දාවිත් රජු ළඟට 13
පැමිණ ඔහුට කථාකොට: මගේ ස්වාමිවූ
රජ්ජුරුවෙනි—සැබවින් නුඹේ පුත්‍රවූ
සාලමොන් මට පසුව රජවී ඔහු මාගේ
සිංහාසනය පිට හිඳගන්නේය කියා
ඔබගේ මෙහෙකාරීට ඔබ දිවුරුම් දුන්නා
නොවේද? එසේවීනම් අදෝනියා රජ වී
සිටින්නේ මන්දැයි ඔහුට කියාපන්න.
නුඹ එහි රජ්ජුරුවන් සමග කථාකරද්දීම 14
මමත් නුඹට පසුව ඇවිත් නුඹේ වචන
ස්ථිර කරන්නෙමියි කීවේය. බැත්-ෂෙබා 15
ඇතුල්ගෙයි සිටි රජු ළඟට ගියාය.
රජ ඉතා මහලුව සිටියේය; ෂූනම්මිය
අබිෂග් රජුට මෙහෙකරමින් සිටියාය.
බැත්-ෂෙබා නැමී රජුට වැන්දාය. නුඹට 16
ඕනෑ මොකදැයි රජ ඇසුවේය. එවිට ඈ: 17
මාගේ ස්වාමිනි, ඔබගේ දෙවිවූ **ස්වාමින්-
වහන්සේ** ගැන ඔබගේ මෙහෙකාරීට
ඔබ දිවුරමින්—සැබවින් නුඹේ පුත්‍රවූ
සාලමොන් මට පසුව රජ වී මාගේ
සිංහාසනය පිට හිඳගන්නේයයි කීවෙහිය.
එහෙත් දැන් අදෝනියා රජව සිටියි. මාගේ 18

ස්වාමිවූ රජ්ජුරුවෙනි, ඔබ එය නො-
19 දන්නෙහිය. ඔහු හරකුන්ද තර වස්සන්ද
බැටළුවන්ද බොහෝ ගණනක් මරා
රජුගේ සියලු පුත්‍රයන්ද පූජකවූ
අබියාතර්ද සේනාපතිවූ යෝවාබ්ද
කැඳෙව්වේය. නුමුත් ඔහු ඔබගේ
සේවකයාවූ සාලමොන් කැඳෙව්වේ නැත.
20 ඉතින් මාගේ ස්වාමිවූ රජ්ජුරුවෙනි, ඔබට
පසුව මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ගේ
සිංහාසනය පිට හිඳගත යුත්තේ කවුද
කියා ඔබ විසින් ඉශ්‍රායෙල්වරුන්ට
දන්වනවා ඇත කියා ඔවුන් සියල්ලෝ
21 බලා සිටිති. එසේ නොකළොත් මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන් තමන්ගේ පියවරුන්
සමග සැතපුණාම මාද මාගේ පුත්‍රවූ
සාලමොන්ද වරදකාරයන් වෙනවා
22 ඇතැයි ඔහුට කීවාය. ඈ රජු සමග
කථාකරද්දීම අනාගතවක්තෘවූ නාතාන්
23 ඇතුළට ආයේය. අනාගතවක්තෘවූ
නාතාන් ඇවිත් ඉන්නේය කියා රජුට
දන්වූ කල ඔහු රජු ඉදිරියට ඇවිත්
මුහුණින් බිමට නැමී රජුට වැන්දේය.
24 නාතාන් කථාකොට: මාගේ ස්වාමිවූ
රජ්ජුරුවෙනි, අදෙනියා මට පසුව රජ
වී මාගේ සිංහාසනය පිට හිඳගත යුතුය
25 කියා ඔබ කීයෙහිද? මක්නිසාද ඔහු
අද බැස ගොස් හරකුන්ද තර වස්සන්ද
බැටළුවන්ද බොහෝ ගණනක් මරා
රජුගේ සියලු පුත්‍රයන්ද සේනාපතීන්ද
පූජකවූ අබියාතර්ද කැඳෙව්වේය; ඔව්හු
ඔහු ඉදිරියෙහි කා බී—අදෙනියා රජු
26 සැරදේවයි කියති. නුමුත් ඔහු මා, එසේය,
ඔබගේ මෙහෙකරුවූ මාද පූජකවූ ශාදෙක්ද
යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායාද ඔබගේ
මෙහෙකරුවූ සාලමොන්ද කැඳෙව්වේ
27 නැත. මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට පසු
ස්වකීය සිංහාසනයෙහි හිඳගත යුත්තේ
කවුද කියා ඔබගේ මෙහෙකරුවන්ට
නොදන්වා මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්
විසින් මේ දේ කරනලද්දේදැයි ඇසුවේය.
28 එවිට දවිත් රජ උත්තරදෙමින්: බැත්-
ෂෙබා මා ළඟට කැඳවාගෙන වරෙල්ලායයි

කීවේය. ඈ රජු වෙතට ඇවිත් රජු
ඉදිරියෙහි සිටියාය. එවිට රජ කථාකොට: 29
සියලු විපත්තිවලින් මාගේ ප්‍රාණය
මිදුවාවූ **ස්වාමීන්වහන්සේ** ජීවමාන බව
සැබෑවාසේම, සැබවින් නුඹේ පුත්‍රවූ 30
සාලමොන් මට පසුව රජ වී මා වෙනුවට
මාගේ සිංහාසනයෙහි හිඳින්නේය කියා
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
නාමයෙන් මා විසින් නුඹට දිවුරුම්
දුන් ලෙසම සැබවින් අද දවසේ කරමියි
කියා දිවුළේය. එවිට බැත්-ෂෙබා 31
මුහුණින් බිමට නැමී රජුට වැඳ:
මාගේ ස්වාමිවූ දවිත් රජ්ජුරුවෝ
සදහටම ජීවත්වේවයි කීවාය. තවද දවිත් 32
රජ: ශාදෙක් පූජකයාත් නාතාන්
අනාගතවක්තෘත් යෙහෝයාදගේ පුත්‍රවූ
බෙනායාත් මා ළඟට කැඳවාගෙන
වරෙල්ලායයි කීවේය. ඔව්හු රජු
ඉදිරියට ආවෝය. රජද: නුඹලාගේ 33
ස්වාමිහුගේ සේවකයන් කැඳවාගන මාගේ
පුත්‍රවූ සාලමොන් මාගේම අශ්වතරයා
පිට නංවාගන ගීහොන්ට පලයල්ලා.
එහිදී ශාදෙක් පූජකයා සහ නාතාන් 34
අනාගතවක්තෘ ඔහු ඉශ්‍රායෙල් කෙරෙහි
රජකොට ආලේප කෙරෙත්වා. නුඹලාත්
හොරණෑව පිඹ—සාලමොන් රජු
සැරදේවයි කියාපල්ලා. එවිට නුඹලා 35
ඔහු අනුව නැඟී වරෙල්ලා, ඔහුද ඇවිත්
මාගේ සිංහාසනය පිට හිඳ ගනීවා;
ඔහුම මා වෙනුවට රජ වන්නේය. ඔහු
ඉශ්‍රායෙල්වරුන්ද යූදවරුන්ද කෙරෙහි
අධිපතියා කොට පත්කෙළෙමියි ඔවුන්ට
කීවේය. එවිට යෙහෝයාදගේ පුත්‍රවූ 36
බෙනායා රජුට උත්තරදෙමින්: ආමෙන්.
මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේත්** එසේ කියනසේක්වා.
**ස්වාමීන්වහන්සේ** මාගේ ස්වාමිවූ 37
රජ්ජුරුවන් සමග සිටියාක් මෙන්ම
සාලමොන් සමගත් සිට ඔහුගේ
සිංහාසනය මාගේ ස්වාමිවූ දවිත්
රජ්ජුරුවන්ගේ සිංහාසනයටත් වඩා උතුම්
කරනසේක්වයි කීවේය. මෙසේ ශාදෙක් 38
පූජකයාද නාතාන් අනාගතවක්තෘද
යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායාද

කෙරෙතිවරුද පෙලෙතිවරුද බැසගොස්
දවිත් රජුගේ අශ්වතරයා පිට සාලමොන්
39 නංවාගන ගීහොන්ට ගියෝය. ශාදෙක්
පූජකයා කූඩාරමෙන් තෙල් කුලාව
රැගෙන ගොස් සාලමොන් ආලේපකෙළේය.
එවිට ඔව්හු හොරණෑව පිම්බෝය; මුළු
සෙනඟද: සාලමොන් රජු සැරදේවයි
40 කීවෝය. මුළු සෙනඟ ඔහු අනුව ගොස්
නළා පිඹ, පොළොව පැළෙන තරම්වූ
ඔවුන්ගේ ශබ්දයෙන් මහත් ප්‍රීතියකින්
41 ප්‍රීතිවුණෝය. එවිට ඔවුන් කා තීන්දුවෙන-
කොටම අදෙනියාටද ඔහු සමග කෑමට
ඇවිත් සිටි සියල්ලන්ටද ඒ ඇසුණේය.
යෝවාබ් හොරණෑ ශබ්දය අසා: නුවර
කලඹන මේ ඝෝෂාව මොකක් නිසාදැයි
42 ඇසීය. ඔහු කථාකරද්දීම අබියාතර්
පූජකයාගේ පුත්‍රවූ යොනාතාන් ආයේය.
එවිට අදෙනියා කථාකොට: ඇතුළට
වරෙන්න; නුඹ විශ්වාස මනුෂ්‍යයෙක්ය,
නුඹ හොඳ ආරංචි ගෙනෙනවා ඇතැයි
43 ඔහුට කීවේය. යොනාතාන් උත්තර-
දෙමින්: නැත, අපේ ස්වාමිවූ දවිත්
රජ්ජුරුවෝ සැබවින් සාලමොන් රජකමට
44 පත් කළාහ. රජ ඔහු සමග ශාදෙක්
පූජකයාද නාතාන් අනාගතවක්තෘද
යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායාද
කෙරෙතිවරුන්ද පෙලෙතිවරුන්ද යැවුවේය,
ඔව්හු රජුගේ අශ්වතරයා පිට ඔහු
45 නැංගෙවුවෝය. ශාදෙක් පූජකයා හා
නාතාන් අනාගතවක්තෘ ගීහොන්හිදී ඔහු
රජකොට ආලේපකළෝය. නුවර පිළි-
රැව්දෙන තරම් ඔව්හු ප්‍රීතිවෙවී එතැනින්
නැගී ආවෝය. නුඹලාට ඇසුණු ඝෝෂාව
46 ඒකය. තවද සාලමොන් රාජ සිංහාසනය
47 පිට හිඳින්නේය. ඇරත් රජුගේ සේවකයෝ
අපේ ස්වාමිවූ දවිත් රජුට ආශීර්වාද-
කරන්ට ඇවිත්–දෙවියන්වහන්සේ
සාලමොන්ගේ නාමය ඔබගේ නාමයට
වඩා උසස්කර ඔහුගේ සිංහාසනය
ඔබගේ සිංහාසනයට වඩා උතුම්කරන-
සේක්වයි කීවෝය. රජද යහන පිටදී
48 නමස්කාර කෙළේය. තවද රජ කථාකොට:
මාගේ ඇස්වලින් දකින හැටියට අද
මාගේ සිංහාසනයෙහි හිඳගැනීමට
කෙනෙකු දුන්නාවූ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා වේවයි කීයේ-
යයි අදෙනියාට කීවේය. එවිට අදෙනියා 49
සමග කෑමට ඇවිත් සිටි සියල්ලෝම
භයපත්වී නැගිට එකිනෙකා තම තමාගේ
ස්ථානයට ගියෝය. අදෙනියා සාලමොන්ට 50
භයින් නැගිට ගොස් පූජාසනයේ අං
අල්ලාගත්තේය. අදෙනියා සාලමොන් 51
රජුට භයවී–සාලමොන් රජු තමාගේ
මෙහෙකරුවා කඩුවෙන් නොමරන ලෙස
අද මට දිවුරාවයි කියමින් පූජාසනයේ
අං අල්ලාගෙන සිටීයයි සාලමොන්ට
දන්වනලද්දේය. සාලමොන්ද: ඔහු විශ්වාස 52
මනුෂ්‍යයෙක් බව පෙනුණොත් ඔහුගේ
හිසකෙසක්වත් බිම නොවැටෙන්නේය.
නුමුත් ඔහු අත නපුරුකම සම්බවුණොත්
ඔහු නසින්නේයයි කීවේය. එවිට 53
සාලමොන් රජ මිනිසුන් යවා ඔහු
පූජාසනය ළඟින් ගෙන්විය. ඔහු ඇවිත්
සාලමොන් රජුට වැන්දේය. සාලමොන්ද:
නුඹේ ගෙට පලයන්නැයි ඔහුට කීවේය.

## දවිත් රජුගේ අන්තිම අවවාදය සහ මරණය

2 දවිත් නසින කාලය ආසන්නවිය.
ඔහු තමාගේ පුත්‍රවූ සාලමොන්ට
අණකරමින්: මම පොළොවේ සියල්ලන් 2
යන ගමන යමි. එබැවින් නුඹ බලවත්ව
පුරුෂයෙකු මෙන් සිටපන්න; නුඹ කරන 3
සියල්ලේදීද නුඹ යන සෑම තැන්වලදීද
නුඹට ශුභසිද්ධවෙන පිණිසත්, **ස්වාමීන්-
වහන්සේ** මට කථාකොට–නුඹේ පුත්‍රයෝ
තමුන්ගේ මුළු සිතින්ද මුළු ආත්මයෙන්ද
මා ඉදිරියෙහි සැබෑකමින් හැසිරෙන
හැටියට තමුන්ගේ මාර්ගය බලාගත්තෝ
නම් ඉශ්‍රායෙල් සිංහාසනය පිට හිඳීමට
නුඹට කෙනෙක් නැතුව නොයන්නේයයි
කියා උන්වහන්සේ කීවාවූ තමන්ගේ
වචනය උන්වහන්සේ ඉෂ්ටකරන පිණිසත්,
මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ලියා තිබෙන 4
හැටියට නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
මාර්ගවල හැසිරෙමින් උන්වහන්සේගේ
පනත්ද ආඥද විනිශ්චයයන්ද ශික්ෂාද

රක්ෂාකරමින් උන්වහන්සේගේ නියමය
5 පවත්වාපන්න. තවද ශෙරුයාගේ පුත්‍රවූ
යෝවාබ් විසින් මට කළ දේ, එසේය,
ඉශ්‍රායෙල් සේනාවල අධිපතීන් දෙදෙනාවූ
නේර්ගේ පුත්‍රවූ අබ්නේර්ටත් යෙතෙර්ගේ
පුත්‍රවූ අමාසාටත් කළ දේ නුඹ
දන්නෙහිය; ඔහු ඔවුන් මරා සමාදාන
කාලයේදී යුද්ධ ලේ වගුරුවා තමාගේ
ඉහටියෙහි තිබුණු පටිය පිටත් තමාගේ
පාදවල තිබුණු වහන් පිටත් යුද්ධ ලේ
6 දමාගත්තේය. එබැවින් ඔහුගේ පැසුණු
හිසකේ සමාදානයෙන් මිනීවලට බසින්ට
නොදී ප්‍රස්තාවට සුදුසු ලෙස නුවණින්
7 ක්‍රියාකරපන්න. නුමුත් ගිලියදිය
බර්සිල්ලයිගේ පුත්‍රයන්ට කරුණාව
පෙන්වාපන්න, ඔව්හු නුඹේ මේසයෙන්
කන තැනැත්තන් අතරේ සිටිත්වා.
මක්නිසාද නුඹේ සහෝදරවූ අබ්සලොම්
ඉදිරියෙන් මා පලාගිය විට ඔව්හු එලෙස
8 මා ළඟට ආවෝය. තවද බහුරීම්හි
බෙන්යමිය ගේරාගේ පුත්‍රවූ ෂිමෙයි නුඹ
ළඟ සිටියි. මා මහනායිම්ට ගිය දවසේදී
ඔහු තදබල ලෙස මට දෙස් කීවේය.
එහෙත් ඔහු යොර්දන් ළඟදී මාගේ පෙර-
මගට ආවේය, මමද—නුඹ කඩුවෙන්
නොමරන්නෙමියි ස්වාමීන්වහන්සේගේ
9 නම කියා දිවුළෙමි. එහෙත් ඔහුට
අව්වුනොකර නාරින්න, මක්නිසාද නුඹ
ප්‍රඥාවත් මනුෂ්‍යයෙකු බැවින් ඔහුගේ
පැසුණු හිසකේ ලෙයින් යුක්තව මිනීවළට
පමුණුවන පිණිස නුඹ විසින් කටයුතු
කිමෙක්දැයි නුඹ දන්නෙහියයි කීවේය.
10 පසුව දවිත් තමාගේ පියවරුන් සමග
සැතපී දවිත්ගේ නුවර තැන්පත්කරනු
11 ලැබීය. දවිත් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
රජකම්කළ කාලය සතළිස් අවුරුද්දක්ය.
ඔහු හෙබ්‍රොන්හි සත් අවුරුද්දක්ද
යෙරුසලමේ තිස්තුන් අවුරුද්දක්ද රජකම්
කෙළේය.

## සාලමොන්ගේ රජකම ස්ථිරවීම. සමහර සතුරන් නසාදැමීම

12 සාලමොන් තමාගේ පියවූ දවිත්ගේ
සිංහාසනය පිට වැඩඋන්නේය; ඔහුගේ
රජකමද බොහෝ සෙයින් ස්ථිරවුණේය.
එකල හග්ගීත්ගේ පුත්‍රවූ අදෙනියා 13
සාලමොන්ගේ මැණියන්වූ බැත්-ෂෙබා
ළඟට ආයේය. නුඹ එන්නේ සමාදාන-
යෙන්දැයි ඈ ඇසුවාය. සමාදානයෙන්-
යයි ඔහු කීය. තවද ඔහු: නුඹට 14
කාරණයක් කියන්ට මට තිබේයයි
කීවේය. කියාපන්නැයි ඈ කීවාය. එවිට 15
ඔහු: රාජ්‍යය මට ලැබෙන්ට තිබුණු
බවත් මා රජකම්කරනවා ඇත කියා
සියලු ඉශ්‍රායෙල්වරුන් මා ගැන බලා
සිටිය බවත් නුඹ දන්නෙහිය. නුමුත්
රජකම වෙනස්වී මාගේ සහෝදරයාට
ගියේය. මක්නිසාද ඒක ඔහුට ස්වාමීන්-
වහන්සේගෙන් ලැබුණේය. ඉතින් මම 16
එක ඉල්ලීමක් නුඹෙන් ඉල්ලා සිටිමි,
ඒක ඉෂ්ට නොකර නොසිටින්නැයි
කීවේය. ඈද: කියාපන්නැයි ඔහුට කීවාය.
ඔහු: ෂූනම්මීය අබිෂග් මට භාර්යාකොට 17
දෙන ලෙස සාලමොන් රජුට කථාකළ
මැනවි, මක්නිසාද ඔහු නුඹේ ඉල්ලීම
ඉෂ්ට නොකර නොසිටින්නේයයි කීවේය.
බැත්-ෂෙබාද: හොඳයි නුඹ උදෙසා 18
රජුට කථාකරන්නෙමියි කීවාය. එබැවින් 19
බැත්-ෂෙබා අදෙනියා උදෙසා සාලමොන්
රජුට කථාකරන්ට ඔහු ළඟට ගියාය.
රජ ඈ ඉදිරියෙහි නැගිට, ඈට වැඳ,
තමාගේ සිංහාසනය පිට හිඳගත්තේය,
රජුගේ මැණියන්ටත් සිංහාසනයක්
තබන්ට යෙදුණේය; ඈ ඔහුගේ දකුණෙන්
හිඳගත්තාය. එවිට ඈ: මම එක සුළු 20
ඉල්ලීමක් නුඹෙන් ඉල්ලමි; එය නොදී
නොසිටිය මැනවැයි කීවාය. රජද: මාගේ
මැණියනි, ඉල්ලුමැනවි; මම එය නුඹට
නොදී නොසිටින්නෙමියි ඈට කීවේය.
ඈද: ෂූනම්මීය අබිෂග් නුඹේ සහෝදරවූ 21
අදෙනියාට භාර්යාකොට දෙනු ලැබේවයි
කීවාය. සාලමොන් රජ උත්තරදෙමින්: 22
නුඹ අදෙනියා උදෙසා ෂූනම්මීය අබිෂග්
ඉල්ලන්නේ මන්ද? රජකමත් ඔහු උදෙසා
ඉල්ලුව මැනවි; මක්නිසාද ඔහු මාගේ
වැඩිමල් සහෝදරයාය; ඔහු උදෙසාත්
පූජකවූ අබියාතර් සහ ශෙරුයාගේ පුත්‍රවූ
යෝවාබ් උදෙසාත් ඉල්ලුව මැනවියි
තමාගේ මැණියන්ට කීවේය. එවිට 23
සාලමොන් රජ ස්වාමීන්වහන්සේගේ

තම කියා දිවුරමින්: අදොනියා ඒ වචනය
තමාගේම ප්‍රාණයට විරුද්ධව නොකීයේ
නම් දෙවියන්වහන්සේ මට එසේමත් ඊට
24 වැඩියෙනුත් කරනසේක්වා. එබැවින් මා
පිහිටෙවුවාවූ, මාගේ පියවූ දාවිත්ගේ
සිංහාසනය පිට මා හිඳෙවුවාවූ, තමන්-
වහන්සේ පොරොන්දුවූ ලෙස මට
වංශයක් උපදවා දුන්නාවූ **ස්වාමීන්-**
**වහන්සේ** ජීවමාන බව සැබෑවා සේම
සැබවින් අදොනියා අද දවසෙහි මරනු
25 ලබන්නේයයි කීය. සාලමොන් රජ
යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායා යැවීය;
26 ඔහු ඔහුට ගසා මැරුවේය. තවද රජ
අබියාතර් පූජකයාට කථාකොට:
අනාතොත්හි තිබෙන තුඹේම ඉඩමට
පලයන්න; තුඹ මරණයට සුදුස්සෙක්ය.
එහෙත් තුඹ මාගේ පියවූ දාවිත් ඉදිරියෙහි
**ස්වාමිවූ දෙවියන්වහන්සේගේ** පෙට්ටිය
ඉසුලූ බැවින්ද මාගේ පියාණන් දරූ
සියලු දුක්වලදී තුඹත් දුක් වින්ද බැවින්ද
මේ වතාවේ තුඹ නොමරමියි කීවේය.
27 මෙසේ ෂීලෝහිදී ඒලීගේ වංශය ගැන
**ස්වාමීන්වහන්සේ** කී වචනය සම්පූර්ණ-
වෙන ලෙස **ස්වාමීන්වහන්සේගේ**
පූජකකමෙන් සාලමොන් අබියාතර්
28 පහකෙළේය. ඒ කාරණය යෝවාබ්ට
සැලවිය. මක්නිසාද යෝවාබ් අහක්ව
අබ්සලොම් අනුව නොගිය නුමුත්
අදොනියා අනුව ගියේය. එවිට යෝවාබ්
**ස්වාමීන්වහන්සේගේ** මණ්ඩපයට පලා-
ගොස් පූජාසනයේ අං අල්ලාගත්තේය.
29 යෝවාබ් **ස්වාමීන්වහන්සේගේ** කූඩාරමට
පලාගිය බවද ඔහු පූජාසනය ළඟ
සිටින්නේය කියාද සාලමොන් රජුට
දන්වනලද්දේය. එවිට සාලමොන්:
තුඹ ගොස් ඔහු මරාපන්නැයි කියා
යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායා යැවීය.
30 බෙනායා **ස්වාමීන්වහන්සේගේ** මණ්ඩපයට
ඇතුල්වී: පිටත වරෙන්න කියා රජ
කියන්නේයයි ඔහුට කීය. නැත; මම
මෙතන නසින්නෙමියි ඔහු කීවේය. එවිට
බෙනායා ගොස්: යෝවාබ් මෙසේ
කියමින් මට මෙසේ උත්තරදුන්නේයයි

රජුට කීවේය. රජ ඔහුට කියනුයේ: ඔහු 31
කී ලෙස කොට ඔහු මරා තැන්පත්-
කරපන්න; එසේ කිරීමෙන් යෝවාබ්
නිකරුණේ වගුළ ලේ මා කෙරෙන්ද
මාගේ පියාගේ වංශයෙන්ද පහකරපන්න.
ඔහු තමාට වඩා ධර්මිෂ්ඨයවූ වඩා 32
යහපත්වූ මනුෂ්‍යයන් දෙදෙනෙකු එනම්
නේර්ගේ පුත්‍රවූ ඉශ්‍රායෙල් සේනාවට
අධිපතියා වූ අබ්නේර්ටද යෙතෙර්ගේ
පුත්‍රවූ යූද සේනාවට අධිපතියා වූ
අමාසාටද ගසා මාගේ පියවූ දාවිත්
නොදැනුවත්ව ඔවුන් කඩුවෙන් මරාදැමූ
බැවින් **ස්වාමීන්වහන්සේ** ඔහුගේ ලේ
ඔහුගේම හිස පිටට මෙසේ පමුණුවනවා
ඇත. ඔවුන්ගේ ලේ යෝවාබ්ගේ 33
හිස පිටද ඔහුගේ වංශයේ හිස පිටද
සදාකල්හිම පැමිණෙන්නේය. නුමුත්
දාවිත්ටද ඔහුගේ වංශයටද ඔහුගේ
පවුලටද ඔහුගේ සිංහාසනයටද සමාදානය
**ස්වාමීන්වහන්සේගෙන්** සදාකල්හිම වන්නේ-
යයි ඔහුට කීවේය. එවිට යෙහෝයාදගේ 34
පුත්‍රවූ බෙනායා ගොස් ඔහුට ගසා ඔහු
මැරුවේය; ඔහු කාන්තාරයෙහි තිබුණ
තමාගේම ගෙයි තැන්පත්කරනු ලැබීය.
රජ ඔහු වෙනුවට සේනාව කෙරෙහි 35
යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායාද අබියාතර්
වෙනුවට පූජකවූ ශාදොක්ද පත්කළේය.
තවද රජ ෂිමෙයි අඬගස්වා: තුඹ 36
යෙරුසලමෙහි ගෙයක් සාදාගන එහි
වාසයකරපන්න, එතැනින් කොහාටවත්
නොයන්න. තුඹ පිටතට ගොස් කිද්‍රොන් 37
ඔයෙන් එගොඩව ගිය දවසේදී නසිනවාම
ඇතැයි දැනගනින්න. තුඹේ ලේ තුඹේම
හිස පිට වන්නේයයි ඔහුට කීවේය.
ෂිමෙයිද: ඒ කීම යහපත; මාගේ ස්වාමිවූ 38
රජ්ජුරුවන් කී ලෙසම ඔබගේ
මෙහෙකරුවා කරන්නේයයි රජුට
කීවේය. එසේ ෂිමෙයි යෙරුසලමෙහි
බොහෝ දවස් විසුවේය. නුමුත් තුන් 39
අවුරුද්දකට පසු ෂිමෙයිගේ වැඩකාරයන්
දෙදෙනෙක් පලාගොස් මයකාගේ පුත්‍රවූ
ගාත්හි රජවූ ආකීෂ් වෙතට පලා
ගියෝය. එවිට: තුඹේ වැඩකාරයෝ

ගාත්හි සිටිතියි ෂිමෙයිට දන්වන්ට
40 යෙදුණේය. ෂිමෙයි නැගිට තමාගේ
කොටළුවා සූදනම්කොට, තමාගේ
වැඩකාරයන් සොයන්ට ගාත්හි ආකීෂ්
වෙතට ගියේය. මෙසේ ෂිමෙයි ගොස්
ගාත්හි සිට තමාගේ වැඩකාරයන්
41 ගෙනායේය. ෂිමෙයි යෙරුසලමෙන්
ගාත්ට ගොස් දෙවනු ආ බව සාලමොන්ට
42 දන්වනලද්දේය. රජතෙමේ ෂිමෙයිට
අඬගස්වා ඔහුට කථාකොට: නුඹ
කොහේ නුමුත් පිටතට ගිය දවසේදී
නසිනවාම ඇතැයි දනගනින්න කියා
මා නුඹට සහතික කොට නුඹ
**ස්වාමීන්වහන්සේගේ** නම කියා දිවුරෙවුවා
නොවේද? නුඹද–මා ඇසූ කීම යහපතැයි
43 මට කීයෙහිය. ඉතින් නුඹ **ස්වාමීන්-
වහන්සේගේ** නම කියා කළ දිවුරුමත්
මා නුඹට අණකළ ආඥවත් රක්ෂා-
නොකළේ මක්නිසාදැයි ඔහුට කීවේය.
44 තවද රජ ෂිමෙයිට කථාකොට: නුඹ
මාගේ පියවූ දාවිත්ට කළාවූ නුඹේ සිතට
දැනෙන මුළු දුෂ්ටකම නුඹ දන්නෙහිය.
එබැවින් **ස්වාමීන්වහන්සේ** නුඹේ හිස
පිටට නුඹේ දුෂ්ටකම හරවනසේක.
45 නුමුත් සාලමොන් රජ ආශීර්වාද ලබන්-
නේය, දාවිත්ගේ සිංහාසනයද **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි සදකාලේටම
46 පිහිටුවනු ලබන්නේයයි කීවේය. මෙසේ
රජ යෙහෝයාදගේ පුත්‍රවූ බෙනායාට
අණකෙළේය; ඔහු පිටතට ගොස් ඔහුට
ගසා මැරුවේය. මෙසේ රජකම
සාලමොන් අතේ ස්ථිර විය.

## ඵාරාවෝ රජුගේ දුව පාවා ගැනීම. ප්‍රඥව තෝරාගැනීම

3 තවද සාලමොන් මිසරයේ රජවූ
ඵාරාවෝ හා නෑකම් බැඳ ඵාරාවෝගේ
දුව පාවාගෙන, තමාගේ ගෙයත්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයත් යෙරුසලම
වටකර පවුරත් ගොඩනගා නිම කරන
තුරු ඈ දාවිත්ගේ නුවරට ගෙනාවේය.
2 ඒ දවස් වන තුරු **ස්වාමීන්වහන්සේගේ**
නාමයට කිසි ගෘහයක් ගොඩනගා
නොතිබුණු බැවින් සෙනඟ උස් තැන්වල
පූජා ඔප්පුකළෝය. සාලමොන් තමාගේ 3
පියවූ දාවිත්ගේ නියෝග ලෙස හැසිර
**ස්වාමීන්වහන්සේට** ප්‍රේම කෙළේය. නුමුත්
ඔහු උස් තැන් පිට පූජා හා සුවඳ දුම්
ඔප්පුකෙළේය.
ගිබියොන් ප්‍රධාන උස් තැනවූ බැවින් 4
පූජා ඔප්පුකරන පිණිස රජ එතැනට
ගියේය. දවන පූජා දහසක් සාලමොන්
ඒ පූජාසනය පිට පුදකෙළේය. ගිබි- 5
යොන්හිදී **ස්වාමීන්වහන්සේ** රාත්‍රියේ
ස්වප්නයකින් සාලමොන්ට පෙනුණු-
සේක. තවද දෙවියන්වහන්සේ කථා-
කොට: මා විසින් නුඹට දිය යුතු දෙය
ඉල්ලාපන්නැයි කීසේක. සාලමොන් 6
කථාකොට: ඔබගේ මෙහෙකරුවූ මාගේ
පියවූ දාවිත් ඔබ ඉදිරියෙහි සැබෑකමෙන්ද
ධර්මිෂ්ඨකමෙන්ද ඔබ සමග සිතේ
අවංකකමින්ද හැසුරුණු පරිද්දෙන් ඔබ
ඔහුට මහත්වූ කරුණාව පෙන්වූසේක;
තවද අද තිබෙන හැටියට ඔහුගේ
සිංහාසනය පිට හිඳින්ට ඔහුට පුත්‍රයෙකු
දීමෙන් මේ මහත් කරුණාවත් ඔබ ඔහුට
දෙන්ට ඉතුරුකරගන සිටිසේක. දැනුදු 7
මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්ස**, ඔබ මාගේ
පියවූ දාවිත් වෙනුවට ඔබගේ මෙහෙකරුවා
රජකොට පත්කළසේක. මම වනාහි
කුඩා ළමයෙක්මි; පිටතට යන්ටත්
ඇතුළට එන්ටත් නොදනිමි. ඔබගේ 8
මෙහෙකරුවා වනාහි ගණන්කරන්ටවත්
ගණන කියන්ටවත් බැරි තරම් මහත්
සමූහයක්වූ ඔබ විසින් තෝරාගත් ඔබගේ
සෙනඟ මැද සිටියි. එබැවින් ඔබගේ මේ 9
සෙනඟ විනිශ්චය කරන පිණිස යහපත
හා නපුර දැනගන්ට පුළුවන්වන ලෙස
නුවණැති සිතක් ඔබගේ මෙහෙකරුවාට
දුන මැනව; මක්නිසාද ඔබගේ මේ මහත්
සෙනඟ විනිශ්චයකරන්ට කවරෙකුට
පුළුවන්දැයි කීවේය. සාලමොන් මේ 10
දේ ඉල්ලූ නිසා ස්වාමීන්වහන්සේ ඊට
ප්‍රසන්නවූසේක. දෙවියන්වහන්සේ 11
කථාකොට: නුඹ දීර්ඝායුස ඉල්ලන්නේවත්
ධනය ඉල්ලන්නේවත් නුඹේ සතුරන්ගේ

ජීවිතය ඉල්ලන්නේවත් නැතුව විනිශ්චය
තේරුම් ගැනීමට නුවණ ඉල්ලූ බැවින්,
12 මම නුඹේ වචනය ලෙස කෙළෙමි. නුඹට
සමාන කෙනෙක් නුඹට පළමුවෙන්
සිටියේවත් නුඹට පසුව නැගිටින්නේවත්
නැති ලෙස ප්‍රඥාවන්ත නුවණැති සිතක්
13 නුඹට දුනිමි. ඇරත් නුඹේ සියලු දවස්වලදී
රජවරුන් අතරේ නුඹට සමාන කෙනෙක්
නොවන ලෙස ධනයද ගෞරවයද යන
14 නුඹ නොඉල්ලූ දේත් නුඹට දුනිමි. ඉදින්
නුඹේ පියවූ දාවිත් හැසුරුණාක්මෙන් නුඹ
මාගේ පනත්ද ආඥාද රක්ෂාකරමින්
මාගේ මාර්ගවල හැසිරෙන්නෙහිනම්
නුඹේ දවස්ද වැඩිකරන්නෙමියි ඔහුට
15 කීසේක. සාලමොන් පිබිද ඒක ස්වප්නයක්
බව දැනගත්තේය. ඔහු යෙරුසලමට
ඇවිත් ස්වාමීන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය ඉදිරියෙහි සිට දවන පූජාද
ශාන්ති පූජාද ඔප්පුකෙළේය; තමාගේ
සියලු සේවකයන්ට මංගල්‍යයක්ද
පිළියෙළකොට දුන්නේය.
16 එකල වේශ්‍යා ස්ත්‍රීන් දෙදෙනෙක් රජු
ළඟට ඇවිත් ඔහු ඉදිරියෙහි සිටියෝය.
17 එක ස්ත්‍රියක් කියන්නී: අනේ, මාගේ
ස්වාමිනි, මමත් මේ ස්ත්‍රීත් එක ගෙයක
වසමුව; ඒ ගෙයි ඈ සමග සිටියදී මම
18 දරුවෙකු වැදුවෙමි. තවද මා වදා තුන්
දිනකට පසු මේ ස්ත්‍රීද වැදුවාය. අපි
එකට සිටියෙමුව; ගෙයි උන් අප දෙදෙනා
ඇර අන් කිසිවෙක් අප සමග එහි සිටියේ
19 නැත. මේ ස්ත්‍රියගේ දරුවා රාත්‍රියේදී
20 ඇගේ ඇඟට යටවීමෙන් මෙළේය. ඈ
මධ්‍යම රාත්‍රියෙහි නැගිට ඔබගේ
මෙහෙකාරී නිදාගත ඉන්දැද්දී මාගේ
පුත්‍රයා මා ළඟින් රැගෙන ඇගේ ළයෙහි
තබාගෙන, මළාවූ ඇගේ දරුවා මාගේ
21 ළයෙහි තැබුවාය. උදය මාගේ දරුවාට
කිරිදෙන්ට නැගුටුණු විට ඔහු මැරී
උන්නේය. නුමුත් මා උදය ඔහු විමසා
බැලූ විට ඔහු මා වැදූ මාගේ පුත්‍රයා
22 නොවන බව දැනගතිමියි කීවාය. අනික්
ස්ත්‍රීද: නැත; ජීවමාන පුත්‍රයා මාගේය,
මළ පුත්‍රයා නුඹේයයි කීවාය. මැද:
නැත; මළ පුත්‍රයා නුඹේය, ජීවත්ව ඉන්න
පුත්‍රයා මාගේයයි කීවාය. මෙසේ ඔව්හූ
රජු ඉදිරියෙහි විවාදකළෝය. එවිට රජ 23
කථාකොට: එක් තැනැත්තියක්—මේ
ජීවත්ව ඉන්න පුත්‍රයා මාගේය, මළ පුත්‍රයා
නුඹේය කියාත්, අනික් තැනැත්තී—නැත,
මළ දරුවා නුඹේය, ජීවත්ව ඉන්න පුත්‍රයා
මාගේය කියාත් කියනවාය. මට කඩුවක් 24
ගෙනෙල්ලායයි කීවේය. රජු ඉදිරියට
කඩුවක් ගෙනෙන ලද්දේය. එවිට රජ 25
කථාකොට—ජීවත්ව ඉන්න දරුවා දෙකට
කපා භාගයක් එක් තැනැත්තියකටත්
භාගයක් අනික් තැනැත්තියටත් දෙව්-
යයි කීවේය. එවිට ජීවත්ව ඉන්න 26
දරුවාගේ මවගේ හෘදය ඇගේ පුත්‍රයා
කෙරෙහි උණුවූ බැවින් ඈ රජුට
කථාකොට: අනේ, මාගේ ස්වාමිනි,
ජීවත්ව ඉන්න දරුවා ඇට දුනමැනවි,
මරන්ට නම් එපායයි කීවාය. නුමුත්
අනික් තැනැත්තී: ඔහු මටවත් නුඹටවත්
නොවේවා, කපත්වයි කීවාය. එවිට රජ 27
උත්තරදෙමින්: ජීවත්ව ඉන්න දරුවා
මරන්ට එපා, අර තැනැත්තීට දීපල්ලා,
ඈ ඔහුගේ මවුයයි කීවේය. රජු විසින් 28
කළ විනිශ්චය සියලු ඉශ්‍රායෙල්වරු අසා,
යුක්තිය සිදුකිරීමට දෙවියන්වහන්සේගේ
ප්‍රඥාව ඔහු තුළ තිබෙන බව දැක, රජු
කෙරෙහි භයවූවෝය.

## රජුගේ අධිපතියෝ

4 සාලමොන් රජු මුළු ඉශ්‍රායෙල්
කෙරෙහි රජව සිටියේය. ඔහුට සිටි 2
අධිපතීහු මොව්හුය: ශාදෙක්ගේ පුත්‍රවූ
අශරියා පූජකයාය; ෂීෂාගේ පුත්‍රයෝවූ 3
එලීහොරෙප්ද අහියාද ලේකම්වරුය;
අහිලූද්ගේ පුත්‍රවූ යෙහෝෂාපාට්
වාර්තාකරුවාය; යෙහෝයාදගේ පුත්‍රවූ 4
බෙනායා සේනාපතියාය; ශාදෙක්ද
අබියාතර්ද පූජකයෝය; නාතාන්ගේ පුත්‍රවූ 5
අශරියා මුලාදෑනීන්ගේ නායකයාය;
නාතාන්ගේ පුත්‍රවූ සාබුද් ඇමතියෙක් ව
රජුගේ මිත්‍රයා ව සිටියේය; අහිෂාර් වනාහි 6
රජගෙදර ප්‍රධානියාය. අබ්දගේ පුත්‍රවූ
අදෝනිරම් රාජකාරියේ මුලාදෑනියාය.

7 රජුටත් ඔහුගේ ගෘහවාසීන්ටත් ආහාර
සපයන පිණිස සාලමොන්ගේ මූලා-
දෑනීන් දෙළොස්දෙනෙක් මුළු ඉශ්‍රායෙල්
කෙරෙහි පත්ව සිටියෝය. එසේ සපයාදීම
එකිනෙකාට වැටුණේ අවුරුද්දට මාසයක්
8 බැගින්ය. ඔවුන්ගේ නාම මේය: එප්‍රායිම්
9 කඳු රටේ සිටිය බෙන්-හූර්ය. මාකශ්හිද
ෂයාල් බිම්හිද බෙත්-ෂෙමෙෂ්හිද
ඒලොන්-බෙත්-හානාන්හිද සිටිය
10 බෙන්-දෙකෙර්ය. අරුබ්බෝත්හි බෙන්-
හෙසෙද්ය; ඔහුට සෝකොව සහ මුළු
11 හේපෙර් රටද වැටුණේය. දෝර් නම්
කඳුකරය මුළුල්ලෙහි සිටිය බෙන්-
අබිනාදබ්ය; ඔහුගේ භාර්යාව සාල-
12 මොන්ගේ දුවවූ තාපත්ය. අහිලූද්ගේ
පුත්‍රවූ බානාට තයනාක්ද මෙගිද්දෝද
ශාරෙතාන්ට කිට්ටුව යෙස්‍රෙයෙල්ට
පහළින් තිබෙන මුළු බෙත්-ෂෙයාන්ද
වැටුණේය. ඒ පළාත බෙත්-ෂෙයාන්
පටන් ආබෙල්-මෙහෝලා දක්වාද
යොක්මෙයාම්ට එහා සීමා දක්වාද
13 පිහිටා තිබේ. රාමොත්-ගිලියද්හි සිටිය
බෙන්-ගෙබර්ය. ගිලියද්හි තිබෙන්නාවූ,
මනස්සේගේ පුත්‍රවූ යායීර්ගේ නුවරවලුත්
පවුරුද පිත්තල අගුල්ද ඇති මහා නුවරවල්
හැටක් සහිත බාෂාන්හි අර්ගොබ්
14 පළාතත් ඔහුට වැටුණේය. මහනායිම්හි
සිටිය ඉද්දෝගේ පුත්‍රවූ අහිනාදබ්ය.
15 නප්තලීහි සිටිය අහිමාශ්ය; ඔහුද
සාලමොන්ගේ දූවූ බාසෙමත් භාර්යා
16 කොට පාවාගත්තේය. ආෂේර්හිද
බෙයාලොත්හිද සිටිය හූෂයිගේ පුත්‍රවූ
17 බානාය. ඉස්සාකර්හි සිටිය පරුවාගේ
18 පුත්‍රවූ යෙහෝෂාපාට්ය. බෙන්යමින්හි
19 සිටිය ඒලාගේ පුත්‍රවූ ෂිමෙයිය. අමෝරි-
වරුන්ගේ රජවූ සීහොන්ගේද බාෂාන්හි
රජවූ ඕග්ගේද දේශය වූ ගිලියද්
දේශයෙහි සිටිය උරීගේ පුත්‍රවූ ගෙබෙර්ය;
ඒ දේශයෙහි සිටියේ එක මූලාදෑනි-
යෙක්ය.

## සාලමොන්ගේ රාජෛශ්වර්යය

20 යූදවරුද ඉශ්‍රායෙල්වරුද මුහුදු වෙරළේ
වැලි මෙන් ගණනින් අධිකව සිටියෝය,
ඔව්හු කමින් බොමින් ප්‍රීතිවෙමින් පසුවූහ.
සාලමොන් වනාහි ප්‍රාත් ගංගාවේ 21
පටන් පිලිස්තිවරුන්ගේ දේශය සහ
මිසරයේ සීමාව දක්වා සියලු රාජ්‍යවල්
කෙරෙහි ආණ්ඩුකෙළේය. ඔව්හු කප්පන්
ගෙනැත්දී සාලමොන්ගේ ජීවිතයේ සියලු
දවස්වල ඔහුට සේවයකළෝය. දවසකට 22
සාලමොන්ගේ ආහාර මෙසේය: සිහින්
පිටි *කෝර තිහක්ය, වෙන පිටි කෝර
සැටක්ය. මුවන්ද තිත්මුවන්ද රතුමුවන්ද 23
තරකළ පක්ෂීන්ද හැර තර හරක්
දසදෙනෙකුත් කෙතේ හරක් විසි
දෙනෙකුත් බැටළුවන් සියයකුත්ය.
මක්නිසාද ඔහු තිප්සා පටන් ගාශා 24
දක්වාම ගංගාවෙන් මෙගොඩ තිබෙන
මුළු දේශයද ගංගාවෙන් මෙගොඩ සියලු
රජුන්ද කෙරෙහි ආණ්ඩුකෙළේය. ඔහු
අවට සෑම දිශාවලද ඔහුට සමාදනය
තිබුණේය. සාලමොන්ගේ සියලු දවස්වල 25
දාන් පටන් බෙයර්-ෂෙබා දක්වා යූදවරුද
ඉශ්‍රායෙල්වරුද එකිනෙකා තම තමාගේ
මුද්‍රිකවැල යටද අත්තික්කා ගස යටද
සුවසේ වාසය කළෝය. සාලමොන්ට 26
ඔහුගේ රථවලට ගාල් †සතළිස් දහසක
අශ්වයෝ සිටියෝය, අසුරුවන් දෙළොස්
දහසක්ද සිටියෝය. ඒ මූලාදෑනීන් 27
එකිනෙකා තම තමාට නියම මාසයේදී
සාලමොන් රජුටද සාලමොන් රජුගේ
මේසයට ආවාවූ සියල්ලන්ටද කිසිවක්
අඩුවෙන්ට ඉඩ නැර ආහාර සපයා-
දුන්නේය. ඔවුන් එකිනෙකා තම තමාට 28
නියමවී තිබුණු හැටියට අශ්වයන්ටත්
සෙන්ධවයන්ටත් යව සහ පිදුරුත් නියම
ස්ථානයට ගෙනාවේය.
දෙවියන්වහන්සේ ඉතා මහත් ප්‍රඥවකුත් 29
ඥනයකුත් මුහුදු වෙරළේ වැල්ල මෙන්
විශාලවූ සිහියකුත් සාලමොන්ට දුන්-
සේක. සාලමොන්ගේ ප්‍රඥව පූර්වදිග 30
රටවල සියලු ජනයාගේ ප්‍රඥවටත්
මිසරවරුන්ගේ මුළු ප්‍රඥවටත් වඩා
මහත්ව තිබුණේය. මක්නිසාද ඔහු සියලු 31

---

*කෝරය බුසල් $5^1/_2$ක්ය.

†2 ලේකම් 9.25: භාරදහසක.

මනුෂ්‍යයන්ටද එශ්‍රාහිය ඒතාන්ටද
මාහොල්ගේ පුත්‍රයන්වූ හේමන්ටද
කල්කොල්ටද දර්දටද වඩා ප්‍රඥාවන්තව
සිටියේය. ඔහුගේ කීර්තියද අවට සිටි
සියලු ජාතීන් අතරේ පතළවී ගියේය.
32 ඔහු උපදේශවාක්‍ය තුන්දහසක් කීවේය.
33 ඔහුගේ ගීතිකාද එක්දස් පහක්ය. ඔහු
ලෙබනොන්හි තිබෙන කිහිරි ගස පටන්
හිත්තියෙන් හටගන්න හිසොප් ගහ දක්වා
ගස් ගැන කථාකෙළේය. ඔහු මෘගයන්ද
පක්ෂීන්ද බඩගා යන සතුන්ද මත්ස්‍යයන්ද
34 ගැනත් කථාකෙළේය. ඔහුගේ ප්‍රඥාව ගැන
ඇසුවාවූ පොළොවේ සියලු රජුන් වෙතින්
සියලු වර්ගයන් කෙරෙන් මනුෂ්‍යයෝ
සාලමොන්ගේ ප්‍රඥාව අසන්ට ආවෝය.

## දේවමාලිගාව සාදන්ට සූදනම් කිරීම

5 සාලමොන් ඔහුගේ පියාණන්
වෙනුවට රජකොට ආලේපකරනු
ලැබූ බව තීර්හි රජවූ හීරාම් අසා
තමාගේ සේවකයන් ඔහු වෙතට එවූවේය.
මක්නිසාද හීරාම් සැම කල්හිම දාවිත්ට
2 ස්නේහ ඇත්තෙක් විය. සාලමොන්
හීරාම් වෙත පණිවිඩයක් යවමින්:
3 ස්වාමීන්වහන්සේ මාගේ පියවූ දාවිත්ගේ
සතුරන් ඔහුගේ පතුල යට දමන තෙක්
ඔහු හාත්පසින් තිබුණු යුද්ධ නිසා ඔහුගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ නාමයට
ගෘහයක් ගොඩනගන්ට ඔහුට බැරිවුණු
4 බව ඔබ දන්නෙහිය. නුමුත් දැන් මාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ හැම අතින්ම
මට නිශ්චලතාව දී තිබේ; එදිරිකාරයෙක්වත්
5 අශුභ සිද්ධියක්වත් නැත්තේය. ස්වාමීන්-
වහන්සේ මාගේ පියවූ දාවිත්ට කථාකොට—
තුඹ වෙනුවට තුඹේ සිංහාසනය පිට
මා විසින් තබන තුඹේ පුත්‍රයා මාගේ
නාමයට ගෘහයක් ගොඩනගනවා
ඇතැයි කී හැටියට මාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ නාමයට ගෘහයක්
6 ගොඩනගන්ට මම අදහස්කරමි. එබැවින්
ලෙබනොන්හි කිහිරි ගස් මට කපා දෙන්ට
අණකළ මැනවි; මාගේ වැඩකාරයෝ
ඔබගේ වැඩකාරයින් හා සමග වන්නෝය;
ඔබගේ වැඩකාරයන්ගේ කුලී ඔබ කියන
ප්‍රකාරයටම ඔබට දෙන්නෙමි. මක්නිසාද
සීදොන්වරුන් මෙන් ලී කපන්ට දන්න
කෙනෙක් අප අතරේ නැති බව ඔබ
දන්නෙහියයි කියා ඇරියේය. හීරාම් 7
සාලමොන්ගේ වචනය අසා ඉතා ප්‍රීතිවී:
ඒ මහත්වූ සෙනඟ ආණ්ඩුකරන පිණිස
ප්‍රඥාවන්ත පුත්‍රයෙකු දාවිත්ට දුන්නාවූ
ස්වාමීන්වහන්සේට අද ප්‍රශංසා වේවයි
කීවේය. හීරාම් සාලමොන් වෙත 8
පණිවිඩයක් එවමින්: ඔබ මට කියා
එවූ කාරණා ඇසීමි. කිහිරි ලී ගැනද
දේවදර ලී ගැනද ඔබගේ මුළු කැමැත්ත
ඉෂ්ටකරන්නෙමි. මාගේ වැඩකාරයෝ 9
ලෙබනොන්හි සිට මුහුද ළඟට ඒවා
ගෙනෙන්නෝය. මම ඒවා පහුරු බඳවා
ඔබ මට කියා එවන තැනකට මුහුදෙන්
එවන්නෙමි, තවද ඔබ විසින් බාරගන්න
පිණිස ඒවා එහිදී ලිහන්ට සලස්වන්-
නෙමි. ඔබ වනාහි මාගේ ගෙයි වැසියන්ට
ආහාර දීමෙන් මාගේ කැමැත්ත
ඉෂ්ටකරන්නෙහියයි කියා එවූවේය.
මෙසේ හීරාම් සාලමොන්ගේ මුළු 10
කැමැත්ත ලෙස කිහිරි ලීද දේවදර ලීද
ඔහුට දුන්නේය. සාලමොන්ද හීරාම්ගේ 11
ගෙයි වැසියන්ට ආහාර පිණිස ගෝධුම
කෝර විසිදහසක්ද හිඳපු තෙල් කෝර
විස්සක්ද ඔහුට දුන්නේය. සාලමොන්
අවුරුද්දෙන් අවුරුද්ද මෙසේ හීරාම්ට
දුන්නේය. ස්වාමීන්වහන්සේ සාලමොන්ට 12
පොරොන්දුවූ ලෙස උන්වහන්සේ ඔහුට
ප්‍රඥාව දුන්සේක; හීරාම් සහ සාලමොන්
අතරේ සමාදානය පැවතුණේය; තවද ඔවුන්
දෙදෙනා එක්ව ගිවිසුමක් කරගත්තෝය.
සාලමොන් රජ සියලු ඉශ්‍රායෙල්වරුන් 13
අතරෙන් රාජකාරියට මිනිසුන් ගත්තේය;
ඊට තෝරාගනු ලැබූ මනුෂ්‍යයෝ තිස්-
දහසක්ය. ඔහු මාසයකට දසදහසක් 14
බැගින් වාර පිළිවෙළින් ඔවුන් ලෙබනොන්ට
යැව්ය. ඔව්හු එක මසක් ලෙබනොන්හිද
දෙමසක් ගෙදරද සිටියෝය. අදෝනිරාම්

වනාහි රාජකාරියේ මුලාදෑනියා විය.
15 බර උසුලන්නෝ හැත්තෑ දහසක්ද කඳුවල
ලී හා ගල් කපන්නෝ අසූදහසක්ද
16 සාලමොන්ට සිටියෝය. ඒ හැර වැඩබලා-
ගත්තාවූ, වැඩකළ සෙනඟ ආණ්ඩුකළාවූ,
සාලමොන්ගේ ප්‍රධාන මුලාදෑනීන්
17 තුන්දහස් තුන්සියයක් වූහ. කැපූ ගල්වලින්
ගෘහයේ අත්තිවාරම තබන පිණිස රජුගේ
ආඥාව පිට මහත්වූද අනර්ඝවූද ගල්
18 ගෙනාවෝය. සාලමොන්ගේ වඩුවෝද
හීරාම්ගේ වඩුවෝද ගෙබලිවරුද ඒවා
කැපුවෝය, මෙසේ ගෘහය තැනීමට ඔව්හු
ලී දඬුද ගල්ද සූදානම්කළෝය.

## දේවමාලිගාව සෑදීම

6 තවද ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර
දේශයෙන් පිටත්ව ආවාට පසු
හාරසිය අසූවෙනි අවුරුද්දේ එනම්
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි සාලමොන්ගේ
රජකම් කිරීමේ සතරවෙනි අවුරුද්දේ
දෙවෙනි මාසයවූ ශීව් මාසයේදී ඔහු
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය ගොඩනගන්ට
2 පටන්ගත්තේය. සාලමොන් රජ **ස්වාමීන්-
වහන්සේට** ගොඩනැගූ ගෘහයේ දිග රියන්
සැටක්ය, පළල රියන් විස්සක්ය, උස
3 රියන් තිහක්ය. ගෘහයේ මාලිගාව
ඉස්සරහ තිබුණු ශාලාවේ දිග ගෘහයේ
පළල හැටියටම රියන් විස්සක්ව, එහි
පළල ගෘහය ඉස්සරහ රියන් දසයක්ව
4 තිබුණේය. ගරාදි සවිකරනලද කවුළු
5 ඔහු ගෘහයට සෑදුවේය. ඔහු මාලිගාවත්
දිව්‍ය-වාක්‍යස්ථානයත් වටකරින් ගෘහයේ
හිත්ති වටේට ගෘහයේ හිත්තියට යාකර
මහල් ගොඩනගා වටේට කාමර සෑදුවේය.
6 පහතම මහලේ පළල පස්රියනක්ය, මැද
එකේ පළල සරියනක්ය, තුන්වෙනි එකේ
පළල සත්රියනක්ය. මක්නිසාද ගෘහයේ
හිත්තිවලට බාල්ක ඇතුල් නොකරන
පිණිස පිටින් වටේටම ගෘහයේ හිත්තිවල
7 තැනින් තැන පඩුකර සෑදුවේය. ගල්වළේදී
තීන්දුවට සූදානම්කළ ගල්වලින් ගෘහය
ගොඩනැගූ බැවින් ගෘහය ගොඩනැගීමේදී
මිටියකවත් පොරවකවත් වෙන කිසි
යකඩ ආවුදයකවත් ශබ්දයක් නො-
ඇසුණේය. මැද කාමරවලට දෙර ගෘහයේ 8
දකුණු පැත්තෙහි විය. වටවූ පඩිපෙළකින්
මැද මහලටත් මැද මහලෙන් තුන්වෙනි
මහලටත් නගින්ට සාද තිබුණේය. මෙසේ 9
ඔහු ගෘහය තනා නිමකෙළේය; ඔහු
ගෘහය කිහිරි දූවවලින්ද ලෑලිවලින්ද
වැසුවේය. ඔහු මුළු ගෘහයට යාකර 10
පස්රියනක් බැගින් උස ඇති මහල්
ගොඩනැගුවේය. ඒවා කිහිරි ලීවලින්
ගෘහයට සවිකරනලද්දේය.
**ස්වාමීන්වහන්සේගේ** වචනය 11
සාලමොන්ට පැමිණ කියනුයේ: තුඹ 12
ගොඩනගන මේ ගෘහය ගැන වනාහි,
තුඹ මාගේ පනත්වල හැසිර මාගේ
විනිශ්චයවල් ඉෂ්ටකර මාගේ සියලු
ආඥා පවත්වමින් ඒ ප්‍රකාර
හැසිරෙන්නෙහිනම්, තුඹේ පියවූ දාවිත්ට
මා විසින් කී මාගේ වචනය තුඹට
ඉෂ්ටකරන්නෙමි. තවද මාගේ සෙනඟවූ 13
ඉශ්‍රායෙල් අත්නෑර, ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි වාසයකරන්නෙමියි කීසේක.
මෙසේ සාලමොන් ගෘහය ගොඩනගා 14
නිමකෙළේය. ඇතුළතින් ඔහු ගෘහයේ 15
හිත්තිවල කිහිරි ලෑලි ඇල්ලුවේය; ගෘහයේ
බිම පටන් පියස්සේ පැති දක්වා
ඇතුළතින් ලීවලින් වැසුවේය. ගෘහයේ
බිම දේවදර ලෑලිවලින් වැසුවේය. ඔහු 16
ගෘහයේ ඉතා ඇතුල් කොට්ඨාසයෙන්
රියන් විස්සක් දිගට බිමෙහි සහ
හිත්තිවලත් කිහිරි ලෑලි ඇල්ලුවේය.
ඇතුළතින් ඔහු ඒක දිව්‍ය-වාක්‍යස්ථානයක්
වන අති ශුද්ධස්ථානය කොට සෑදුවේය.
ඊට ඉදිරිපිටවූ ගෘහය එනම් මාලිගාව 17
සතළිස් රියනක් දිගය. ගෘහයේ ඇතුළත 18
කැකිරි වැල්ද පිපුණු මල්ද කැටයම්කළ
කිහිරි ලීවලින් වසා තිබුණේය. මුළුල්ලම
කිහිරි ලීය; කිසි ගලක් පෙනෙන්ට
නොතිබුණේය. ඔහු **ස්වාමීන්වහන්සේගේ** 19
ගිවිසුම් පෙට්ටිය තැබීමට ඇතුළතින් ගෘහය
තුළ දිව්‍ය-වාක්‍යස්ථානයක් පිළියෙළ-
කෙළේය. ඇතුළතින් දිව්‍ය-වාක්‍යස්ථානයේ 20

දිග විසි රියනක්ය, පළල විසි රියනක්ය,
එහි උසත් විසි රියනක්ය; ඔහු එය
අනර්ඝ රනින් වැසුවේය. පූජාසනය
21 ඔහු කිහිරි ලීවලින් වැසුවේය. මෙසේ
සාලමොන් ගෘහයේ ඇතුළත අනර්ඝ
රනින් වසා, රන් දම්වැල් දිව්‍ය-
වාක්‍යස්ථානයේ ඉස්සරහ පැත්තෙහි ඇද,
22 ඒක රනින් වැසුවේය. මුළු ගෘහය වසා
තීන්දුවන තෙක් ඔහු ඒක මුළුල්ලම රනින්
වැසුවේය. දිව්‍ය-වාක්‍යස්ථානයට අයිති
පූජාසනය මුළුල්ලත් රනින් වැසුවේය.
23 ඔහු දිව්‍ය-වාක්‍යස්ථානයෙහි ඇතුළේ වල්
ඔලීව ලීවලින් දස රියන බැගින් උස
ඇති කෙරුබ් රූප දෙකක් සාද තැබුවේය.
24 එක කෙරුබ් රූපයක එක පියාපතක්
පස් රියනක්ය, කෙරුබ් රූපයේ අනික්
පියාපත පස් රියනක්ය. එක පියාපතක
කෙළවර පටන් අනික් පියාපතේ කෙළවර
25 දක්වා දස රියනක්ය. අනික් කෙරුබ්
රූපයත් දස රියනක්ය. කෙරුබ් රූප
දෙකම එක මිම්මටද එක හැඩේටද
26 වූහ. එක කෙරුබ් රූපයක උස දස
රියනක්ය, අනික් කෙරුබ් රූපයත්
27 එසේමය. ඔහු ඒ කෙරුබ් රූප ඇතුල්
ගෘහය තුළ පිහිටෙවුවේය. එක කෙරුබ්
රූපයක පියාපතක් එක හිත්තියට වදින
හැටියටත් අනික් කෙරුබ් රූපයේ
පියාපතක් අනික් හිත්තියට වදින
හැටියටත් ඒවායේ පියාපත් ගෘහය
මධ්‍යයෙහි එකිනෙකට වදින හැටියටත්
ඒවායේ පියාපත් විහිදුවා තබන ලද්දේය.
28 ඔහු කෙරුබ් රූප රනින් වැසුවේය.
29 වටකර ඇතුළෙනුත් පිටිනුත් ගෘහයේ
සියලු හිත්තිවල ඔහු කෙරුබ්ද තල් ගස්ද
පිපුණු මල්ද කොටා කැටයම් වැඩ
30 කෙළේය. ඔහු ගෘහයේ බිම ඇතුළෙනුත්
31 පිටිනුත් රනින් වැසුවේය. දිව්‍ය-
වාක්‍යස්ථානයේ දෙරකඩට වල් ඔලීව
ලීවලින් දෙරවල් සෑදුවේය. උඩ පඩිකදද
උළුවහු කණුද හිත්තියෙන් පහෙන්
32 කොටසක් විය. වල් ඔලීව ලීවලින් සෑදූ
ඒ දෙර දෙකේ ඔහු කෙරුබ්ද තල් ගස්ද
පිපුණු මල්ද කැටයම්කර, රනින් වසා,
කෙරුබ් හා තල් ගස් පිටත් රත්රන්
ගැවේය. එසේම මාලිගාවේ දෙරකඩටත් 33
වල් ඔලීව ලීවලින් උළුවහු කණුද
දේවදර ලීවලින් දෙරවල් දෙකක්ද
සෑදුවේය; ඒට හිත්තියෙන් සතරෙන් 34
කොටසක් ගියේය. එක දෙරකට අකුළන
පියන් දෙකක්ද අනික් දෙරට අකුළන
පියන් දෙකක්ද විය. ඔහු ඒවායේ 35
කෙරුබ්ද තල් ගස්ද පිපුණු මල්ද කපා
ඒ කැටයම් පිට සම ලෙස රත්රන් ගැවේය.
ඇතුළු මිදුල කැපූ ගල්පේළි තුනකින්ද 36
කිහිරි දව පේළියකින්ද සෑදුවේය.
සතරවෙනි අවුරුද්දේ ශීව් මාසයේදී 37
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ අත්තිවාරම
තබනලද්දේය. එකොළොස්වෙනි අවුරුද්දේ 38
අටවෙනි මාසය වන බූල් මාසයේ දී
ගෘහය එහි සියලු කොට්ඨාස ඇතුළුව
එහි නියම මුළු විධියට නිම කරන-
ලද්දේය. මෙසේ ඔහු සත් අවුරුද්දක්
එය ගොඩනැගීමේ යෙදී සිටියේය.

## දේවමාලිගාව ඇතුළුව රාජ මන්දිරයක් සෑදීම

7 සාලමොන් තමාගේම ගෘහය
දහතුන් අවුරුද්දකින් ගොඩ-
නැගුවේය, තමාගේ මුළු ගෘහයද අවසාන
කෙළේය. ඔහු ලෙබනොන් වනය නම් 2
ගෘහය ගොඩනැගීය; කිහිරි කණු පේළි
සතරක්ද ඒ කණු පිට කිහිරි දවද ඇතුව
එය සාදනලද්දේය. එහි දිග රියන්
සියයක්ය, පළල රියන් පනහක්ය, උස
රියන් තිහක්ය. කණු පිට පේළියට 3
පසළොසක් බැගින් පිහිටුවා තිබුණ
කාමර සතළිස් පහ කිහිරි ලීවලින් උඩින්
වසා තිබුණේය, ජනේල තට්ටු තුනක් 4
තිබුණේය. කවුළුවක් ඉදිරිපිට කවුළුවක්
වශයෙන් තට්ටු තුනක ඒවා තිබුණේය.
සියලු දෙරකඩවල්ද උළුවහුද ජනේල- 5
වලට කෙළින් සතරැස්ව තිබුණේය.
කවුළුවක් ඉදිරිපිට කවුළුවක් වශයෙන්
තට්ටු තුනක ඒවා තිබුණේය. ඔහු රියන් 6
පනහක් දිගද රියන් තිහක් පළලද ඇති

කුළුනු ශාලාවත් සෑදුවේය; ඒවා ඉදිරිපිට
කුළුනුද පඩි පෙළක්ද ඇති තවත්
7 ශාලාවකුත් ඒවා ඉදිරිපිට සෑදුවේය. ඔහු
විනිශ්චයකරන පිණිස සිංහාසනයේ
ශාලාව වන අධිකරණ ශාලාවත්
සෑදුවේය. එය බිම පටන් උඩ තට්ටුව
දක්වා කිහිරි ලීවලින් වසන ලද්දේය.
8 ඔහුට වාසයකිරීමට ශාලාවට එහා
පැත්තෙන් අනික් මිදුලේ තිබුණ ඔහුගේ
ගෘහය ඊට සමානව සාදන ලද්දේය. ඒ
ශාලාවට සමානවූ ගෙයක් සාලමොන්
තමා භාර්යා කොට පාවාගත් ඵාරාවෝගේ
9 දූවටත් සෑදුවේය. මේ සියල්ලම කියතෙන්
ඉරා කැපූ ගල්වල මිම්වල හැටියට
ඇතුළෙනුත් පිටිනුත් අත්තිවාරමේ පටන්
පේකඩය දක්වාද පිටත සිට මහ
මිදුල දක්වාද අනර්ඝ ගල්වලින් විය.
10 අත්තිවාරමද මහත්වූ අනර්ඝවූ ගල්වලින්
එනම් දස රියන්වූ ගල්වලින්ද අට
11 රියන්වූ ගල්වලින්ද දමා තිබුණේය. ඊ
පිට කැපූ ගල්වල මිම්වල හැටියට අනර්ඝවූ
12 ගල්ද කිහිරි ලීද තිබුණේය. වටකර තිබුණ
මහ මිදුල කැපූ ගල් පේළි තුනකින්ද
කිහිරි දව පේළියකින්ද සාදන ලද්දේය;
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ ඇතුළු
මිදුලත් ගෘහයේ ශාලාවත් එසේමය.
13 සාලමොන් රජ තීර්හි සිට හීරාම්
14 ගෙන්වා ගත්තේය. ඔහු නප්තලී ගෝත්‍රයේ
වැන්දඹු ස්ත්‍රියෙකුගේ පුත්‍රයෙක්ය, ඔහුගේ
පියා තීර්හි මනුෂ්‍යයෙක්වූ ලෝකුරුවෙක්ය;
ඔහු සියලු ආකාර පිත්තල වැඩකිරීමට
ප්‍රඥාවෙන්ද තේරුමෙන්ද දැනගැන්මෙන්ද
පූර්ණව සිටියේය. ඔහු සාලමොන් රජු
ළඟට ඇවිත් ඔහුගේ සියලු වැඩ කෙළේය.
15 ඔහු පිත්තල කුළුනු දෙක සෑදුවේය. එක
එක කුළුනේ උස දහ අට රියනක්ය,
එක එක කුළුනේ වට ප්‍රමාණය දොළොස්
16 රියනක්ය. කුළුනු මුදුන් පිට තබන්ට
ඔහු පිත්තල පේකඩ දෙකක් වාත්තුකර
සෑදුවේය. එක පේකඩයක උස රියන්
පහක්ය, අනික් පේකඩයේ උස රියන්
17 පහක්ය. කුළුනු මුදුන්පිට තිබුණු
පේකඩවලට දැල් වැඩද දම්වැල් මාලා
වැඩද තිබුණේය; එක පේකඩයට සතක්ද
අනික් පේකඩයට සතක්ද තිබුණේය.
කුළුනු මුදුන් පිට තිබුණ පේකඩ වසන 18
පිණිස එක එක පේකඩයේ දැල් වැඩ
පිට වටකරින්ම ඔහු දෙළුම් ගෙඩි පේළි
දෙකක් සෑදුවේය. ශාලාවේ කුළුනු මුදුන් 19
පිට තිබුණ පේකඩවල මානෙල් වැඩ
සතර රියනක් සාද තිබුණේය. කුළුනු 20
දෙකේ පේකඩවල දැල් කර්මාන්තයට
උඩින් බන්ධිය ළඟ එක එක පේකඩය
වටකර දෙළුම් දෙසියයක් පේළිවල
තිබුණේය. ඔහු මාලිගාවේ ශාලාව 21
ඉදිරිපිට ඒ කුළුනු පිහිටෙව්වේය. දකුණු
කුළුන පිහිටුවා ඊට යාකීන් යන නමද
වම් කුළුන පිහිටුවා ඊට බොවස් යන
නමද තැබුවේය. කුළුනු මුදුන්වල මානෙල් 22
වැඩ තිබුණේය. මෙසේ කුළුනුවල වැඩ
නිමකරනලද්දේය. ඔහු ජලාධාරයත් 23
වාත්තුකර සෑදුවේය. ඒක ගැටියේ එක
පැත්තක සිට අනික් පැත්ත දක්වා රියන්
දසයක්ය; ඒක වටකුරුව තිබුණේය. ඒකේ
උස පස්රියනක් විය; ඒකේ වට ප්‍රමාණය
තිස්රියනක් විය. ඒකේ ගැටියට යටින් 24
ඒක වටකර රියනකට කැකිරි දසයක්
බැගින්, ඒක වාත්තුකරනවිට වාත්තුකළ
දෙපේළියක කැකිරි ගෙඩි ජලාධාරය
වටකරින්ම තිබුණේය. එය ගව රූප 25
දොළොසක් පිට තබා තිබුණේය, තුනක්
උතුරු දෙසටද තුනක් බස්නාහිර දෙසටද
තුනක් දකුණු දෙසටද තුනක් නැගෙනහිර
දෙසටද හැරී තිබුණේය. ජලාධාරය
ඒවාට උඩින් ඒවා පිට තබා තිබුණේය,
ඒවායේ පස්සා කොට්ඨාස සියල්ලම
ඇතුළට තිබුණේය. ඒකේ ඝනකම අල්ලක 26
පළලය; ඒකේ ගැටිය පාත්‍රයක ගැටිය
මෙන් මානෙල් මලක් ලෙස සාදන
ලද්දේය. එහි *බාත් දෙදහක් ඇල්ලුවේය.
ඔහු අඩි දසයක් පිත්තලෙන් සෑදුවේය; 27
එක එක අඩියේ දිග සතර රියනක්ය,
පළල සතර රියනක්ය, උස තුන් රියනක්ය.

*බාත් එකක් ගැලොම් $8^1/_2$ කි.

28 අඩිවල වැඩ මෙසේය: ඒවා පතේල
ආකාරව තිබුණේය; පතේල සන්ධිවලට
29 අතරේ තිබුණේය. එසේ සන්ධිවලට
අතරේ පතේල පිට සිංහ රූපද ගව
රූපද කෙරුබ් රූපද වූහ; සන්ධි පිටත්
ඉහළ පැත්ත එසේම තිබුණේය.
සිංහයන්ටත් ගවයන්ටත් යටින් එල්ලෙන
30 මාලා කර්ම තිබුණේය. එක එක අඩියට
පිත්තල රෝද සතරක්ද පිත්තල අලවංගුද
තිබුණේය. ඒකේ අඩි සතරට ආධාරවල්
තිබුණේය. සෝදන භාජනය යට එක
එක පැත්තේ මාලා ඇත්තාවූ වාත්තු
31 කළ ආධාරවල්ද විය. පේකඩය ඇතුළෙත්
ඉහලත් ඒකේ කට හරහා රියනක් විය.
කුළුනු අඩියක වැඩ ඇතුව ඒකේ කට
වටකුරුව රියන් එකහමාරක් උසව
තිබුණේය. ඒකේ කට පිට කැටයම් වැඩ
තිබුණේය, නුමුත් ඒවායේ පතේල
වටකුරුව නොව සතරැස්ව තිබුණේය.
32 රෝද සතර පතේලවලට යටින් තිබුණේය;
රෝදවල අලවංගු අඩිවලට අල්ලා
තිබුණේය. එක එක රෝදයේ උස
33 රියන් එකහමාරක්ය. රෝදවල වැඩ රථ
රෝදයක වැඩයට සමානය. ඒවායේ
අලවංගුද වක්අතුද දත්ද බොස්ගෙඩිද
34 සියල්ලම වාත්තුකරන ලද්දේය. එක
එක අඩියේ කොන් සතරට අඩිය එක්කම
35 සාදපු ආධාර සතරක් විය. අඩියේ
මුදුන රියන් භාගයක් උසට වටකුරුකර
තිබුණේය. අඩියේ මුදුනෙහි තිබුණ ඒකේ
අත්ද පතේලද එය එක්කම සාද
36 තිබුණේය. ඔහු ඒකේ අත්වල ලෑලිවලද
ඒකේ පතේලවලද ඒ ඒ ඉඩ ප්‍රමාණයට
කෙරුබ් රූපද සිංහ රූපද තල් ගස්ද
කැටයම් කළේය; වටේට මාලාද
37 තිබුණේය. මේ අන්දමට ඔහු අඩි දසය
සෑදුවේය. ඒ සියල්ලට තිබුණේ එක
වාත්තුවත් එක මිම්මත් එක හැඩයත්ය.
38 තවද සේදීම පිණිස පිත්තල භාජන
දශයක් ඔහු සෑදුවේය. එක එක භාජනයේ
බාත් සතළිසක් ඇල්ලුවේය. එක එක
භාජනය රියන් හතරක් පළලය. අඩි
දසයෙන් එක එක අඩිය පිට භාජනයක්
තිබුණේය. ඔහු අඩි පහක් ගෘහයට 39
දකුණු පැත්තෙන්ද පහක් ගෘහයට වම්
පැත්තෙන්ද තැබුවේය. ජලාධාරය වනාහි
ඔහු ගෘහයට දකුණු පැත්තෙන් පූර්ව
දිශාවටත් දකුණු දිශාවටත් අතරේ
තැබුවේය. තවද හීරාම් සෝදන භාජනද 40
හැඳිද තාලිද සෑදීය. මෙසේ හීරාම්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය උදෙසා
සාලමොන් රජුට කළ සියලු වැඩ
නිමකෙළේය. එනම් කුළුනු දෙකක්ද කුළුනු 41
මුදුන් පිට තිබුණු පේකඩවල ගෝල
දෙකද කුළුනු මුදුන් පිට තිබුණු
පේකඩවල ගෝල දෙක වැසීමට දැල්
වැඩ දෙකද, කුළුනු පිට තිබුණ පේකඩවල 42
ගෝල දෙක වැසීමට එක එක දැල්
වැඩේට දෙළුම් දෙපේළියක් බැගින් දැල්
වැඩ දෙකට දෙළුම් හාරසියයද; අඩි 43
දසයද අඩි පිට තිබුණ භාජන දසයද;
ඒ එක ජලාධාරයද ජලාධාරය යට 44
තිබුණ ගවයන් දොළසද; හැළිද හැඳිද 45
තාලිද යන මේවාය. හීරාම් **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහය උදෙසා සාලමොන්
රජුට සෑදූ මේ සියලු බඩු ඔපදැමූ පිත්තලෙන්
විය. රජ යොර්දන් සමභූමියෙහි 46
සුක්කොත් හා ශාරෙතන් අතරේ
තිබෙන මැටි භූමියෙහි ඒවා වාත්තු-
කෙරෙව්වේය. ඒ සියලු බඩු ඉතා මහත් 47
ගණනක්ව තිබුණ බැවින් සාලමොන්
ඒවා නොකිරා හැරියේය. පිත්තලවල
බරද දැනගත්තේ නැත. සාලමොන් 48
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි සියලු
බඩු එනම් රන් පූජාසනයද පිදීමේ
රොටි තැබීමට රන් මේසයද, දිව්‍ය- 49
වාක්‍යස්ථානය ඉදිරිපිට දකුණු
පැත්තෙන් වම් පැත්තෙන් පහක් බැගින්
තැබීමට අනර්ඝ රනින් පහන්රුක්ද
මල්ද පහන්ද අඬුද, අනර්ඝ රනින් 50
තලිද පහන් කතුරුද තාලිද පාත්‍රාද
ගිනි භාජනද රනින් ඇතුල් ගෘහය වන
අති ශුද්ධස්ථානයේ දොරවලටත් ගෘහය
වන මාලිගාවේ දොරවලටත් රන්
අසව්-විලිද සෑදෙව්වේය. මෙලෙස 51

සාලමොන් රජ **ස්වාමීන්වහන්සේගේ**
ගෘහය උදෙසා කෙරෙවූ සියලු වැඩ
නිමවිය. සාලමොන් තමාගේ පියවූ දවිත්
විසින් කැපකළ දේ එනම් රිදීද රන්ද
බඩුද ඇතුළට ගෙනවුත් **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ ගබඩාවල
තැබුවේය.

## දේවමාලිගාව කැපකිරීම. රජුගේ යාච්ඤාව

8 එවිට සාලමොන් දවිත්ගේ නුවරවූ
සියොනේ සිට **ස්වාමීන්වහන්සේගේ**
ගිවිසුම් පෙට්ටිය ගෙනෙන පිණිස
ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ද ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ පිය වංශවල අධිපතීන්වූ
ගෝත්‍රවල සියලු ප්‍රධානීන්ද සාලමොන්
රජු වෙතට යෙරුසලමට රැස්කෙරෙවුවේය.
2 සියලු ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ සත්වෙනි
මාසය වන ඒතානිම් මාසයේ
මංගල්‍යයේදී සාලමොන් රජු වෙතට
3 රැස්වූවෝය. ඉශ්‍රායෙල්ගේ සියලු
වැඩිමහල්ලන් ආ කල පූජකයෝ ගිවිසුම්
4 පෙට්ටිය උසුලාගත්තෝය. තවද ඔව්හු
**ස්වාමීන්වහන්සේගේ** පෙට්ටියද රැස්වීමේ
කූඩාරමද කූඩාරමෙහි තිබුණු සියලු
ශුද්ධ බඩුද ගෙනාවෝය; පූජකයෝ සහ
5 ලෙවීවරු ඒවා ගෙනාවෝය. සාලමොන්
රජද ඔහු වෙත රැස්ව සිටි මුළු ඉශ්‍රායෙල්
සභාවද ගණින්ටවත් ගණන්කරන්ටවත්
බැරි තරම් බැටළුවන් සහ ගවයින්
පූජාකරමින් ගිවිසුම් පෙට්ටිය ඉදිරියෙහි
6 සිටියෝය. පූජකයෝ **ස්වාමීන්වහන්සේගේ**
ගිවිසුම් පෙට්ටිය අති ශුද්ධස්ථානය වන
ගෘහයේ දිව්‍ය-වාක්‍යස්ථානයට ගෙනැවිත්
කෙරුබ්වරුන්ගේ පියාපත් යට ඒකේ
7 ඉඩමෙහි තැබුවෝය. මක්නිසාද
පෙට්ටියේ ඉඩමට උඩින් විහිදී
තිබුණු කෙරුබ්වරුන්ගේ පියාපත්වලට
පෙට්ටියත් ඒකේ පොලුත් උඩින් වැසී
8 තිබුණේය. ඒ පොලු ඒවායේ අග්ගිස්
දිව්‍ය-වාක්‍යස්ථානයට ඉදිරියෙහි වූ
ශුද්ධස්ථානයට පෙනෙන තරම් දිගව
තිබුණේය; නුමුත් ඒවා පිටතට පෙනුණේ
නැත. ඒවා අද දක්වාම එහි තිබේ.

ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර දේශයෙන් 9
ආවායින් පසු **ස්වාමීන්වහන්සේ** ඔවුන්
සමග ගිවිසුමක් කළ විට මෝසෙස්
විසින් හොරෙබ්හිදී තිබූ ගල්ලෑලි දෙක
මිස ගිවිසුම් පෙට්ටියේ වෙන කිසිවක්
නොතිබුණේය. පූජකයන් ශුද්ධස්ථානයේ 10
සිට පිටතට ආ කල **ස්වාමීන්වහන්සේගේ**
ගෘහය වලාපටලයෙන් පිරුණේය.
වලාපටලය නිසා පූජකයන්ට සේවය 11
කිරීම පිණිස සිටින්ට නොහැකි විය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේගේ** තේජසින්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය පිරුණේය.
එවිට සාලමොන් කථාකොට: තමන්- 12
වහන්සේ ඝනාන්ධකාරයෙහි වසනසේකැයි
**ස්වාමීන්වහන්සේ** කීසේක. මම ඔබට 13
නිවාස ගෘහයක්ද සදාකාලේටම ඔබට
වැඩ සිටීමට ස්ථානයක්ද සැබවින්ම
ගොඩනැගීමියි කීවේය. රජ තෙමේ 14
මුහුණ හරවා මුළු ඉශ්‍රායෙල් සභාව
නැගිට සිටිද්දී මුළු ඉශ්‍රායෙල් සභාවට
ආශීර්වාදකරමින් කියනුයේ: ඉශ්‍රායෙල්ගේ 15
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා වේවා.
මක්නිසාද උන්වහන්සේ ස්වකීය මුඛයෙන්
මාගේ පියවූ දවිත්ට කථාකරමින්—මා 16
විසින් මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්
මිසරයෙන් ගෙනා දවසේ පටන් මාගේ
නාමය තැබීමට ගෘහයක් ගොඩනගන
පිණිස සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින්
කිසි නුවරක් තෝරානොගෙන, මාගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි ප්‍රධානව
සිටීමට දවිත් තෝරාගතිමියි කියා ස්වකීය
හස්තයෙන් ඒක ඉෂ්ට කළසේක.
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** 17
නාමයට ගෘහයක් ගොඩනගන්ට මාගේ
පියවූ දවිත්ගේ සිතේ තිබුණේය. එහෙත් 18
**ස්වාමීන්වහන්සේ** මාගේ පියවූ දවිත්ට
කථාකොට: මාගේ නාමයට ගෘහයක්
ගොඩනගන්ට නුඹේ සිතේ තිබුණ
කල්පනාව හොඳ කාරණයක්මය.
එසේවීනුමුත් නුඹ ඒ ගෘහය ගොඩ 19
නොනගන්නෙහිය; නුඹේ කටියෙන්
නික්මෙන නුඹේ පුත්‍රයාම මාගේ නාමයට
ගෘහය ගොඩනගන්නේයයි කීසේක.

20 ස්වාමීන්වහන්සේ තමන් කී වචනය
ඉෂ්ටකර තිබේ; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ කී හැටියට මම මාගේ පියවූ
දාවිත් වෙනුවෙන් නැගිට ඉශ්‍රායෙල්
සිංහාසනයේ හිඳ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ නාමයට ගෘහය
21 ගොඩනැගුවෙමි. තවද ස්වාමීන්වහන්සේ
අපේ පියවරුන් මිසර දේශයෙන් ගෙනා
කල ඔවුන් සමග කළ ගිවිසුම තබා
තිබෙන පෙට්ටියට එහි ස්ථානයක් නියම
කෙළෙමියි කීවේය.
22 එවිට සාලමොන් මුළු ඉශ්‍රායෙල් සභාව
ඉදිරියෙහි ස්වාමීන්වහන්සේගේ පූජාසනය
ඉදිරිපිට සිට ස්වර්ගය දෙසට තමාගේ
23 අත් විදහාගන මෙසේ කීවේය: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්ස, ඉහළ ස්වර්ගයෙහි-
වත් පහත පොළොවෙහිවත් ඔබට
සමානවූ දෙවිකෙනෙක් ඇත්තේ නැත.
ඔබ වනාහි ඔබ ඉදිරියෙහි තමුන්ගේ
මුළු සිතින් හැසිරෙන්නාවූ ඔබගේ
මෙහෙකරුවන් සමග ගිවිසුමත්
24 කරුණාවත් පවත්වනසේක. ඔබගේ
මෙහෙකරුවූ මාගේ පියවූ දාවිත්ට ඔබ
පොරොන්දුවූ දේ ඔහුට ඉෂ්ටකර දුන්සේක.
එසේය, ඔබ ස්වකීය මුඛයෙන් ඒක කියා
අද දවසේ තිබෙන ප්‍රකාරයට ස්වකීය
25 හස්තයෙන් එය ඉෂ්ට කළසේක. එබැවින්
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්ස,
ස්වකීය මෙහෙකරුවූ මාගේ පියවූ දාවිත්ට
ඔබ කථාකොට: නුඹ මා ඉදිරියෙහි
හැසුරුණාක් මෙන් නුඹේ දරුවෝ මා
ඉදිරියෙහි හැසිරෙන පිණිස තමුන්ගේ
මාර්ගය ගැන ප්‍රවේසම්වන්නෝ නම්,
ඉශ්‍රායෙල් සිංහාසනයෙහි හිඳීමට මා
ඉදිරියෙහි නුඹට කෙනෙක් නැතුව
නොයන්නේය කියා ඔබ කී කාරණය
26 ඔහුට ඉෂ්ටකරදුන මැනව. එබැවින්
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්ස, ඔබගේ
මෙහෙකරුවූ මාගේ පියවූ දාවිත්ට කී
27 ඔබගේ වචනය මෙසේ ස්ථිරවේවා. නුමුත්
දෙවියන්වහන්සේ සැබවින්ම පොළොවෙහි
වසන්ට සතුටුවූ වනසේක්ද? ස්වර්ගයද
ස්වර්ගවල ස්වර්ගයද ඔබවහන්සේට ඉඩ
මදිය; එසේ නම් මා විසින් ගොඩනැගු
මේ ගෘහය ඊට වඩා කොපමණ මදිද?

එහෙත් මාගේ දෙවිවූ ස්වාමීන්වහන්ස, 28
ඔබගේ මෙහෙකරුවාගේ යාච්ඤාවද
කන්නලව්වද සලකා අද ඔබ ඉදිරියෙහි
ඔබගේ මෙහෙකරුවා ඔප්පුකරන
ඉල්ලීමද යාච්ඤාවද ඇසුවමැනව. මාගේ 29
නාමය එහි වන්නේයයි ඔබ යම්
ස්ථානයක් ගැන කීසේක්ද ඒ ස්ථානය
වන මේ ගෘහය දෙස ඔබගේ ඇස් රෑ
දවල් ඇරී තිබේවා. මේ ස්ථානය දෙසට
ඔබගේ මෙහෙකරුවා ඔප්පුකරන යාච්ඤාවද
ඇසුව මැනව. ඔබගේ මෙහෙකරුවාද 30
ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ද මේ ස්ථානය
දෙසට ඔප්පුකරන ඔවුන්ගේ කන්නලව්ව
ඇසුව මැනව. එසේය, ස්වකීය වාසස්ථානය
වන ස්වර්ගයෙහි සිට ඇසුව මැනව;
අසා කමාවුණමැනව. යමෙක් තමාගේ 31
අසල්වාසියාට විරුද්ධව වරද කොට
ඔහු දිවුරවන පිණිස දිවුරුමක් ඔහු පිට
තබන ලදුව, ඔහු ඇවිත් මේ ගෘහයේ
ඔබගේ පූජාසනය ඉදිරිපිට දිවුළොත්,
ඔබ ස්වර්ගයෙහි සිට අසා ක්‍රියාකරමින්, 32
දුෂ්ටයා වරදට පත්කර, ඔහුගේ
මාර්ගය ඔහුගේ හිස පිටට පමුණුවා,
ධර්මිෂ්ඨයා නිදොස්කර, ඔහුගේ ධර්මිෂ්ඨ-
කමේ හැටියට ඔහුට විපාක දෙමින්,
ඔබගේ මෙහෙකරුවන් විනිශ්චය කළ
මැනව. ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල්වරුන් 33
ඔබට විරුද්ධව පව්කළ බැවින් සතුරා
ඉදිරියෙහි පරාජයවූ කල ඔවුන් දෙවනු
ඔබ වෙතට හැරී ඔබගේ නාමය
ප්‍රකාශකර, මේ ගෘහයේදී ඔබට යාච්ඤා
කර කන්නලව් කළොත්, ඔබ ස්වර්ගයේ 34
සිට අසා වදරා, ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්වරුන්ගේ පාපයට කමාවී,
ඔවුන්ගේ පියවරුන්ට ඔබ දුන් දේශයට
ඔවුන් නැවත පැමිණෙවුව මැනව. ඔවුන් 35
ඔබට විරුද්ධව පව්කළ බැවින් අහස
පියවී වර්ෂාව නැතුව යන විට, ඔබ
මෙසේ ඔවුන්ට දඬුවම්කරන බැවින් ඔවුන්
මේ ස්ථානය දෙසට හැරී යාච්ඤාකොට
ඔබගේ නාමය ප්‍රකාශකර තමුන්ගේ
පාපය අත්ඇරියොත්, ඔබ ස්වර්ගයේ 36
සිට අසා ඔවුන් විසින් යා යුතු යහපත්
මාර්ගය ඔවුන්ට පෙන්නාදුන් කල, ඔබගේ
මෙහෙකරුවන්ගේත් ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්ගේත් පාපයට කමාවී, උරුමයක්

කොට ඔබගේ සෙනඟට ඔබ දී තිබෙන
ඔබගේ දේශයට වර්ෂාව දුන මැනව.
37 දේශයෙහි සාගතයක් පැමිණෙන්ටවත්
වංසගතය පැමිණෙන්ටවත් ගොයම්
වියළීයාම හෝ ගොයම් රෝගය හෝ
පළඟැටියන් හෝ දළඹුවන් හෝ
පැමිණෙන්ටවත්; ඔවුන්ගේ දේශයේ
නුවරවල ඔවුන් සිටිද්දී ඔවුන්ගේ සතුරන්
විසින් ඔවුන් වටලාගන්ටවත්; මොන
පීඩාවක් තුමුත් මොන රෝගයක් තුමුත්
38 පැමිණෙන්ටවත් යෙදුණු කල්හි; කොයි
යම් මනුෂ්‍යයෙකු විසින් හෝ ඔබගේ
මුළු සෙනඟවූ ඉශ්‍රායෙල් විසින් හෝ
තම තමුන්ගේ සිත්වල පීඩාව දැනගෙන
මේ ගෘහය දෙසට තමුන්ගේ අත්
විදහාගෙන යම් යාච්ඤාවක් හෝ
39 කන්නලව්වක් හෝ ඔප්පු කළොත්, ඔබගේ
වාසස්ථානය වන ස්වර්ගයෙහි සිට අසා
කමාවී, ඔබ අපේ පියවරුන්ට දුන් දේශය
මතුපිට ඔවුන් ජීවත්වෙන සියලු දවස්වල
ඔබ කෙරෙහි භය ඇතුව සිටින පිණිස,
සිත දන්නාවූ ඔබ එකිනෙකාට තම
තමාගේ සියලු මාර්ගවල හැටියට
40 ඉෂ්ටකර දුන මැනව. මක්නිසාද ඔබ
පමණක්ම සියලු මනුෂ්‍ය පුත්‍රයන්ගේ සිත්
41 දන්නාසේක. තවද ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් කෙනෙක් නොවන විදේශීන්
ඔබගේ උතුම් නාමය සහ බලවත් අතද
දිගුකළ හස්තයද ගැන අසනවා ඇත.
42 එසේ ඔබගේ නාමය නිසා දුර දේශයකින්
ආවාවූ විදේශියෙක් මේ ගෘහය දෙසට
43 හැරී යාච්ඤාකළොත්, ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් මෙන් පොළොවේ සියලු
සෙනඟ විසිනුත් ඔබගේ නාමය
ඇඳිනගන ඔබ කෙරෙහි භයවන පිණිසද,
මා විසින් ගොඩනැගුවාවූ මේ ගෘහයට
ඔබගේ නම තබා තිබෙන බව දැනගන්න
පිණිසද, ඔබගේ වාසස්ථානය වන
ස්වර්ගයෙහි සිට අසා, විදේශියා ඔබට
කරන මුළු කන්නලව්ව ලෙස ඔහුට
44 කළ මැනව. ඔබගේ සෙනඟ තමුන්ගේ
සතුරන්ට විරුද්ධව යුද්ධකරන්ට ඔබ
ඔවුන් යවන කොයි මාර්ගයෙන් වුවත්
ගොස්, ඔබ තෝරාගත් නුවරද ඔබගේ
නාමයට මා විසින් ගොඩනගනලද
ගෘහයද දෙසට හැරී ස්වාමීන්වහන්සේට
යාච්ඤාකළොත්, ඔබ ස්වර්ගයේ සිට 45
ඔවුන්ගේ යාච්ඤාවද කන්නලව්වද අසා
ඔවුන්ට යුක්තිය කළමැනව. පව් 46
නොකරන මනුෂ්‍යයෙක් නැත. එබැවින්
ඔවුන් ඔබට විරුද්ධව පව්කරන්ටත් ඔබ
ඔවුන් කෙරෙහි උදහස්වී ඔවුන්ගේ
සතුරන්ට ඔවුන් පාවාදෙන්ටත් ඔවුන්
වාලට ගන්න අය විසින් දුර හෝ ළඟ
හෝ තිබෙන සතුරන්ගේ දේශයට ඔවුන්
ගෙනයන්ටත් යෙදුණොත්, ඔවුන් වාලුන් 47
කොට ගෙනයනු ලැබූ දේශයේදී ඔවුන්
ඒ කාරණා සිතට ගෙන හැරී ඔවුන්
වාලට ගත් අයගේ දේශයේදී ඔබට
කන්නලව් කොට: අපි පව් කෙළෙමුව,
හිතුවක්කාරකම් කෙළෙමුව, දුෂ්ටලෙස
ක්‍රියා කෙළෙමුයයි කියමින්, ඔවුන් 48
වාලට ගත් ඔවුන්ගේ සතුරන්ගේ
දේශයේදී තමුන්ගේ මුළු සිතින්ද මුළු
ආත්මයෙන්ද ඔබ දෙසට හැරී ඔබ
ඔවුන්ගේ පියවරුන්ට දුන් ඔවුන්ගේ
දේශයද ඔබ තෝරාගත් නුවරද ඔබගේ
නාමයට මා විසින් ගොඩනැගූ ගෘහයද
දෙස බලා ඔබට යාච්ඤා කළොත්,
ඔබගේ වාසස්ථානය වන ස්වර්ගයේ 49
සිට ඔබ ඔවුන්ගේ යාච්ඤාවද
කන්නලව්වද අසා, ඔවුන්ට යුක්තිය
කරමින්, ඔබට විරුද්ධව පව්කළ ඔබගේ 50
සෙනඟ ඔබට විරුද්ධව කළාවූ ඔවුන්ගේ
සියලු අපරාධවලට ඔවුන්ට කමාවී,
ඔවුන් වාලට ගත් අය විසින් ඔවුන්ට
අනුකම්පාකරන හැටියට ඔවුන්ට ඒ
අයගෙන් අනුකම්පාව ලබාදුනමැනව.
මක්නිසාද ඔව්හු ඔබ විසින් මිසරයෙන් 51
එනම් යකඩ උදුනෙන් පිටතට ගෙනාවාවූ
ඔබගේ සෙනඟත් ඔබගේ උරුමයත්ය.
ඔබගේ මෙහෙකරුවාගේ කන්නලව්වද 52
දෙස ඔබගේ ඇස් ඇරී තිබේවා; ඔවුන්
ඔබගෙන් ඉල්ලන සියල්ල ගැන ඔවුන්ට
ඇහුම්කන් දුනමැනව. මක්නිසාද ස්වාමිවූ 53
දෙවියන්වහන්ස, ඔබ අපේ පියවරුන්
මිසරයෙන් ගෙනාවිට ඔබගේ මෙහෙකරුවූ
මෝසෙස් ලවා කථාකෙරෙවූ ප්‍රකාරයට,
ඔබට උරුමයක් කොට ඔබම පොළොවේ
සියලු මනුෂ්‍ය වර්ගයන් අතරෙන් ඔවුන්
වෙන්කරගත්සේකැයි කීවේය.

54 සාලමොන් ස්වාමීන්වහන්සේට මේ මුලු
යාච්ඤාවද කන්නලව්වද ඔප්පු කර
නිමකළ විට ඔහු ස්වාමීන්වහන්සේගේ
පූජාසනය ඉදිරිපිට ස්වර්ගය දෙසට
තමාගේ අත් විදහාගන දණගසා
55 හිඳීමෙන් නැගිට්ටේය. තවද ඔහු නැගිට
සිට මහත් හඬින් මුළු ඉශ්‍රායෙල් සභාවට
56 ආශීර්වාදකරමින් කියනුයේ: තමන්-
වහන්සේ පොරොන්දුවූ සියල්ලේ
හැටියට තමන්ගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට
නිශ්චලතාව දුන් ස්වාමීන්වහන්සේට
ප්‍රශංසාවේවා. උන්වහන්සේ තමන්ගේ
මෙහෙකරුවූ මෝසෙස් ලවා ගිවිස්සාවූ
සියලු යහපත් වචනවලින් එක
57 වචනයක්වත් හිස්නොවීය. අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ අපේ පියවරුන් සමග
සිටියාක් මෙන් අප සමගත් සිටිනසේක්වා.
උන්වහන්සේ අප අත්නොහරිනසේක්වා,
58 අප බැහැර නොදමනසේක්වා. එසේ
උන්වහන්සේගේ සියලු මාර්ගවල හැසිරෙන්-
ටත් උන්වහන්සේ අපේ පියවරුන්ට අණ-
කළ උන්වහන්සේගේ ආඥාද පනත්ද
විනිශ්චයවල්ද පවත්වන්ටත් උන්වහන්සේ
අපේ සිත් තමන් වෙතට නමාගන්නසේක්වා.
59 ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ බවත්
වෙන දෙවිකෙනෙක් නැති බවත්
පොළොවේ සියලු ජාතීන් දැනගන්නා
60 පිණිස, තමන්ගේ මෙහෙකරුවන්ටත්
තමන්ගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ටත් දවසින්
දවස වුවමනා වන ලෙස යුක්තිය
ඉෂ්ටකිරීමට ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
මා විසින් ඔප්පුකළ මේ කන්නලව්
වචන රෑ දවල් අපේ දෙවිවූ ස්වාමීන්-
61 වහන්සේ සමීපයෙහි පවතීවා. එබැවින්
උන්වහන්සේගේ පනත්වල හැසිර
උන්වහන්සේගේ ආඥා පවත්වන හැටියට
නුඹලාගේ සිත් අද දවසේ මෙන් අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ වෙත සම්පූර්ණව
62 තිබේවයි කීවේය. රජද ඔහු සමග සියලු
ඉශ්‍රායෙල්වරුද ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
63 පූජා ඔප්පුකළෝය. සාලමොන් ස්වාමීන්-
වහන්සේට ඔප්පුකළ ශාන්ති පූජා සඳහා
ඔහු ගොනුන් විසිදෙදහක්ද බැටළුවන්
එක් ලක්ෂ විසිදහසක්ද පූදකෙළේය. මෙසේ
රජද සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝද ස්වාමීන්-
64 වහන්සේගේ ගෘහය කැපකළෝය. එම
දවසේ රජ ස්වාමීන්වහන්සේගේ ගෘහය
ඉදිරිපිට තිබෙන මළුවේ ඇතුල් භාගය
විශුද්ධකෙළේය; මක්නිසාද ඔහු දවන
පූජාවද ආහාර පූජාවද ශාන්ති පූජාවල
තෙල්ද එතන ඔප්පුකෙළේය. එසේ කළේ
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තිබෙන
පිත්තල පූජාසනය දවන පූජාවද ආහාර
පූජාවද ශාන්ති පූජාවල තෙල්ද දරන්ට
ඉඩ මදි නිසාය. මෙසේ ඒ කාලයෙහි 65
සාලමොන්ද ඔහු සමග සියලු ඉශ්‍රායෙල්
වන හාමත්ට ඇතුල් වෙන තැන පටන්
මිසරයේ ඔය දක්වා පළාත්වලින් ආවාවූ
මහත් සමූහයක්ද අපේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි සත් දවසක්ද තවත්
සත්දවසක්ද එනම් දහහතර දවසක්
මංගල්‍යය පැවැත්තූහ. අටවෙනිද ඔහු 66
සෙනඟ යන්ට හැරියේය, ඔව්හු රජුට
ආශීර්වාද ඉල්ලා, ස්වාමීන්වහන්සේ
තමන්ගේ මෙහෙකරුවූ දාවිත්ටත් තමන්ගේ
සෙනඟවූ ඉශ්‍රායෙල්ටත් කළ සියලු
යහපත්කම් ගැන ප්‍රීතිමත්ව, සන්තෝෂ
සිත් ඇතුව, තමුන්ගේ කූඩාරම්වලට
ගියෝය.

## දෙවියන්වහන්සේ සාලමොන්ට උත්තර දීම

9 තවද සාලමොන් ස්වාමීන්වහන්සේගේ
ගෘහයද රජ ගෙයද ගොඩනගා,
සාලමොන් තමාගේ මුළු ආශාවේ
හැටියට සාදන්ට කැමතිවූ සියල්ලත්
නිමකළ විට, ස්වාමීන්වහන්සේ ගිබි- 2
යොන්හිදී සාලමොන්ට පෙනුණාක්
මෙන් දෙවෙනි වර ඔහුට පෙනුණුසේක.
ස්වාමීන්වහන්සේ කථාකොට: නුඹ මා 3
ඉදිරියෙහි ඔප්පුකළ නුඹේ යාච්ඤාවත්
කන්නලව්වත් ඇසුවෙමි. නුඹ ගොඩනැගූ
මේ ගෘහයෙහි මාගේ නාමය සදා-
කාලේටම තබන පිණිස ඒක විශුද්ධ
කෙළෙමි; මාගේ ඇස්ද මාගේ සිතද
නිරන්තරයෙන් මෙහි වන්නේය. ඉතින් 4
නුඹේ පියවූ දාවිත් හැසුරුණාක් මෙන්
නුඹ මා ඉදිරියෙහි සිතේ ඇද
නැතිකමින්ද අවංකකමින්ද හැසිරෙමින්,
මා විසින් නුඹට අණකළ සියල්ලේ
ප්‍රකාරයට කර, මාගේ පනත්ද

විනිශ්චයවල්ද පවත්වන්නෙහි නම්,
5 ඉශ්‍රායෙල් සිංහාසනයෙහි හිඳින්ට නුඹට
කෙනෙක් නැතුව යන්නේ නැත කියා
මා විසින් නුඹේ පියවූ දාවිත්ට
පොරොන්දුවූ හැටියට, ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි නුඹේ රාජ්‍යයේ සිංහාසනය
6 සදාකාලේටම ස්ථිර කරන්නෙමි. නුමුත්
නුඹලාත් නුඹලාගේ දරුවොත් මා
වෙතින් ඉවත්ව ගොස්, මා විසින් නුඹලා
ඉදිරියෙහි තබා තිබෙන මාගේ
ආඥාද පනත්ද නොපවත්වා, ගොස්
අන් දෙවිවරුන්ට සේවයකර ඔවුන්ට
7 නමස්කාරකළොත්, මා විසින් ඉශ්‍රායෙල්ට
දී තිබෙන දේශය මතුපිටින් ඔවුන්
සිඳදමන්නෙමි; මාගේ නාමයට මා විසින්
විශුද්ධකළ මේ ගෘහයත් මාගේ ඇස්
හමුයෙන් පහකරදමන්නෙමි; ඉශ්‍රායෙල්ද
සියලු ජනයන් අතරෙහි උපමාවක්ද
8 පරිහාසයක්ද වන්නේය. මෙපමණ උස්ව
තිබෙන මේ ගෘහය ළඟින් යන සියල්ලන්
විස්මයට පත්ව කවටකම්කර: **ස්වාමීන්-
වහන්සේ** මේ දේශයටත් මේ ගෘහයටත්
මෙසේ කළේ මක්නිසාදැයි අසනවා
9 ඇත. එවිට: ඔවුන් තමුන්ගේ පියවරුන්
මිසරදේශයෙන් ගෙනාවාවූ තමුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අත්හැර, අන්
දෙවිවරුන්ට ඇලුම්වී, ඔවුන්ට නමස්කාර-
කොට සේවයකළ නිසා, **ස්වාමීන්-
වහන්සේ** මේ සියලු විපත්ති ඔවුන්
පිටට පැමිණෙවුසේකැයි මිනිසුන්
උත්තරදෙනවා ඇතැයි ඔහුට කීසේක.

## සාලමොන් රජ සහ හීරාම් රජ

10 තවද සාලමොන් විසින් ගෘහ දෙක
එනම් **ස්වාමීන්වහන්සේගේ** ගෘහය සහ
රජ ගෙය ගොඩනැගීමට ගත කළ විසි
11 අවුරුද්දට පසු, සාලමොන්ගේ මුළු
කැමැත්තේ හැටියට ඔහුට කිහිරි ලීද
දේවදාර ලීද රන්ද සපයා දුන් තීර්හි
රජවූ හීරාම්ට සාලමොන් රජ ගලීල
දේශයෙහි නුවරවල් විස්සක් දුන්නේය.
12 හීරාම්ද සාලමොන් තමාට දුන් නුවරවල්
බලන්ට තීර්හි සිට ඇවිත් ඒවා ගැන
සතුටු නොවී: මාගේ සහෝදරය, නුඹ 13
මට දුන් මේ නුවරවල් මොනවාදැයි
කියා ඒවාට කාබුල් රටයයි නම්
තැබුවේය. ඒ නම අද දක්වාත් පවතී.
හීරාම් රන් තලෙන්ත එකසිය විස්සක් 14
රජුට එව්වේය.

## රාජකාරී වැඩ ගැනීම යනාදිය

සාලමොන් රජු රාජකාරියට මනුෂ්‍යයන් 15
ගත් අභිප්‍රාය නම්, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයද තමාගේම ගෙයද මිල්ලෝද
යෙරුසලමේ පවුරද හාශෝර්ද මෙගිද්දෝද
ගෙසෙර්ද ගොඩනැගීම පිණිසය.
මිසරයේ රජ වූ ඵාරාවෝ ඇවිත් ගෙසෙර් 16
අල්වාගෙන ඒක ගින්නෙන් පුලුස්සාදමා,
ඒ නුවර වාසයකළ කානානිවරුන් මරා,
ඒක සාලමොන්ගේ භාර්යාවවූ තමාගේ
දුවට දායාදයක් කොට දී තිබුණේය.
සාලමොන් ගෙසෙර්ද පහළ බෙත්- 17
හොරොන්ද, බාලාත්ද දේශයෙහි තිබෙන 18
කාන්තාරයෙහි *තාමර්ද, සාලමොන් 19
සන්තකවූ සියලු ගබඩා නුවරවල්ද
රථවලට නුවරවල්ද අසරුවන්ට නුවරවල්ද
සාලමොන් යෙරුසලමෙහිත් ලෙබනොන්-
හිත් තමාගේ ආණ්ඩුවට අඩංගුවූ
මුළු දේශයෙහිත් තමා සතුටුවූ ප්‍රකාර
ගොඩනගන්ට කැමතිවූ සියල්ලද ගොඩ-
නැගුවේය. ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් 20
නුවූ, ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මුළුමනින්ම
විනාශකර දමන්ට බැරිවුණාවූ අමෝරි-
වරුන්ගෙන්ද හිත්තීවරුන්ගෙන්ද පෙරිස්සි-
වරුන්ගෙන්ද හිව්වරුන්ගෙන්ද යෙබූසි-
වරුන්ගෙන්ද ඉතිරිවුණ සියලු ජාතීන්ට
පසුව, දේශයෙහි ඉතිරිව සිටියාවූ 21
ඔවුන්ගේ පුත්‍රයන්ගෙන් සාලමොන්
අද දවස දක්වා රාජකාරියට දාසයන්
ගණනක් ගත්තේය. නුමුත් ඉශ්‍රායෙල් 22
පුත්‍රයන්ගෙන් සාලමොන් කිසිවෙක්
වහලුන් කොට නොගත්තේය. ඔව්හු
වනාහි යුද්ධකාරයෝව ඔහුගේ
සේවකයෝව ඔහුගේ අධිපතියෝව ඔහුගේ
සේනාපතියෝව ඔහුගේ රථ කෙරෙහිද
අසරුවන් කෙරෙහිද ප්‍රධානියෝව
සිටියෝය. සාලමොන්ගේ වැඩ බලාගත්තාවූ, 23

*2 ලේකම් 8. 4: තදේමෝර්.

වැඩකළ සෙනඟ ආණ්ඩුකළාවූ ප්‍රධාන
මුලාදෑනීහු පන්සිය පනස් දෙනෙක් වූහ.
24 ඵාරාවෝන්ගේ දියණිය වනාහි දාවිත්ගේ
නුවර සිට සාලමොන් විසින් ඈ උදෙසා
ගොඩනැගූ ඇගේ ගෙට ආවාය. එවිට
25 ඔහු මිල්ලෝ ගොඩනැගීය. සාලමොන්
තමා **ස්වාමීන්වහන්සේට** ගොඩනැගූ
පූජාසනය පිට අවුරුද්දට තුන් වරක්
දවන පූජාද ශාන්ති පූජාද **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි තිබුණු පූජාසනය
පිට සුවඳ දුම්ද ඔප්පුකළේය. මෙසේ
ඔහු ගෘහය සාද නිමකෙළේය.
26 සාලමොන් රජ ඒදෙම් දේශයෙහි රතු
මුහුද අද්දර ඒලෝත් ළඟ පිහිටි
එශියොන්-ගෙබෙර්හි නැව් සෑදෙවුවේය.
27 හීරාම්ද මුහුදේ කාරණා දන්නාවූ
නැව්කාරයින් වන තමාගේ සේවකයන්
සාලමොන්ගේ සේවකයන් සමග ඒ
28 නැව්වල යැවුවේය. ඔව්හු ඕපිර්ට ගොස්
එතැනින් රන් තලෙන්ත හාරසිය විස්සක්
සාලමොන් රජු ළඟට ගෙනාවෝය.

## ෂෙබායේ බිසවගේ පැමිණීම

10 ෂෙබායේ බිසව **ස්වාමීන්-
වහන්සේගේ** නාමයේ හේතුවෙන්
සාලමොන්ට තිබෙන කීර්තිය අසා ගූඪ
ප්‍රශ්නවලින් ඔහු පරීක්ෂාකරන පිණිස
2 ආවාය. ඕතොමෝ ඉතා මහත් පිරිවරක්ද
සුවඳ ද්‍රව්‍ය සහ රත්රන් රාශියකුත් අනර්ඝ
ගලුත් පටවනලද ඔටුවන්ද ඇතුව
යෙරුසලමට ආවාය. ඈ සාලමොන්
වෙතට පැමිණ ඇගේ සිතේ තිබුණු
සියල්ල ගැන ඔහු සමග කථාකළාය.
3 සාලමොන්ද ඇගේ සියලු ප්‍රශ්න ඈට
විසඳ කීය. රජ විසින් ඈට තෝරාදෙන්ට
නොහැකිවූ යම් ප්‍රශ්නයක් නොවීය;
කිසිවක් ඔහුගෙන් සැඟවී තිබුණේ නැත.
4 ෂෙබාහි බිසව සාලමොන්ගේ මුළු ප්‍රඥාවද
5 ඔහු ගොඩනැගූ ගෘහයද, ඔහුගේ මේසයේ
කෑමද ඔහුගේ සේවකයන් හිඳගන්න
අන්දමද ඔහුගේ මෙහෙකරුවන් සිටින
හැටිද ඔවුන්ගේ ඇඳුම්ද ඔහුගේ කුසලාන
දරන්නන්ද ඔහු විසින් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට නැගී යන පඩිපෙළද දුටු කල
ඈ අතිශයින් මවිතවී, රජුට කථාකොට: 6
මාගේ දේශයේදී ඔබගේ ක්‍රියාද ඔබගේ
ප්‍රඥාවද ගැන මා විසින් ඇසූ පවත්
සැබෑය. එහෙත් මම ඇවිත් මාගේ ඇසින් 7
දකින තෙක් ඒ වචන විශ්වාස-
නොකෙළෙමි. සැබවින් අර්ධයක්වත් මට
නොකියන ලද්දේය. ඔබගේ ප්‍රඥාවත්
යසසත් අභිවෘද්ධියත් මා ඇසූ කීර්තියට
වඩා මහත්ව තිබේ. ඔබගේ මිනිස්සු 8
වාසනාවන්තයෝය, නිතරම ඔබ ඉදිරියෙහි
සිට ඔබගේ ප්‍රඥාව අසන මේ ඔබගේ
සේවකයෝ වාසනාවන්තයෝය. ඉශ්‍රායෙල් 9
සිංහාසනය පිට ඔබ හිඳුවන පිණිස
ඔබ කෙරෙහි ප්‍රසන්නවූණාවූ ඔබගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා
වේවා. **ස්වාමීන්වහන්සේ** සැමකල්හිම
ඉශ්‍රායෙල්ට ප්‍රේම කළ බැවින් විනිශ්චයත්
යුක්තියත් ඉෂ්ට කරන්ට උන්වහන්සේ
ඔබ රජකොට පත්කළසේකැයි රජුට
කීවාය. තවද ඈ රන් තලෙන්ත එකසිය 10
විස්සක්ද සුවඳ ද්‍රව්‍ය මහත් රාශියක්ද
අනර්ඝ ගල්ද රජුට දුන්නාය. ෂෙබාහි
බිසව සාලමොන් රජුට දුන් ඒ සුවඳ
ද්‍රව්‍ය තරම් සුවඳ ද්‍රව්‍ය තවත් නොලැබුණේය.
ඕපිර් සිට රන් ගෙනාවාවූ හීරාම්ගේ 11
නැව්වලින් හඳුන් ලී බොහොමයක්ද
අනර්ඝ ගල්ද ඕපීරෙන් ගෙනෙන ලද්දේය.
රජ ඒ හඳුන් ලීවලින් **ස්වාමීන්වහන්සේගේ** 12
ගෘහයටත් රජුගේ ගෙටත් කණු සහ
ගායනාකාරයන්ට වීණාද කුඩා වීණාද
සෑදෙවුවේය. ඒ ආකාර හඳුන් ලී අද
දවස දක්වා තවත් ගෙනාවේවත් දකින්ට
ලැබුණේවත් නැත. සාලමොන් රජ 13
තමාගේ රාජකීය ත්‍යාගවත්කමෙන්
ෂෙබාහි බිසවට දුන් දේවල් හැර ඇගේ
කැමැත්තේ හැටියට ඈ ඉල්ලූ සියල්ලත්
ඈට දුන්නේය. ඉක්බිති ඈත් ඇගේ
පිරිවරත් සිය රටට හැරී ගියෝය.

## රජුගේ ආදයම් හා උතුම්කම

සාලමොන්ට බඩු හුවමාරු කරගන්- 14
නන්ගෙන්ද වෙළඳුන්ගේ වෙළඳාමෙන්ද
මිශ්‍ර ජාතීන්ගේ සියලු රජවරුන්ගෙන්ද

දේශයේ ආණ්ඩුකාරයන්ගෙන්ද ලැබුණු
15 රන් හැර, අවුරුද්දකට ලැබුණු රන්වල
බර තලෙන්ත හසිය හැටහයක්ය.
16 සාලමොන් රජතෙමේ තළාපු රනින් පලිස්
දෙසියයක් සෑදුවේය. එක එක පලිහට
17 රන් ෂෙකෙල් හසියයක් ගියේය. ඔහු
කුඩා පලිස් තුන්සියයකුත් තළාපු රනින්
සෑදුවේය; එක එක කුඩා පලිහට රන්
රාත්තල් තුනක් ගියේය. රජ ලෙබනොන්
වනය නම් ගෘහයෙහි ඒවා තැබුවේය.
18 තවද රජ ඇත් දත්වලින් මහත් සිංහාසනයක්
සාද ඉතා පවිත්‍ර රනින් ඒක වැසුවේය.
19 සිංහාසනයට පඩි හයක් තිබුණේය,
සිංහාසනයේ මුදුන පස්සෙන් වටකුරුව
තිබුණේය. වාඩිවෙන ආසනය දෙපැත්තේ
අත්ඇඳි සහ අත්ඇඳි ළඟ සිටගත් සිංහ
20 රූප දෙකක්ද වූහ. පඩි හය පිට
දෙපැත්තේ සිටගත් සිංහ රූප දොළොසක්ද
වූහ. එයාකාර එකක් කොයි රාජ්‍යයකවත්
21 සාද නොතිබුණේය. සාලමොන් රජුගේ
පාන පාත්‍රා සියල්ලම රනින් විය.
ලෙබනොන් වනය නම් ගෘහයේ සියලු
භාජනත් පවිත්‍ර රනින් විය. එකක්වත්
රිදීයෙන් නොවීය; රිදී වනාහි සාලමොන්ගේ
දවස්වලදී අනර්ඝකොට සැලකුවේ නැත.
22 මක්නිසාද මුහුදේ, හීරාම්ගේ නැව් සමග
තර්ෂීෂ් නැව් රජුට තිබුණේය. ඒ තර්ෂීෂ්
නැව්වලින් රන්ද රිදීද ඇත්දත්ද වඳුරන්ද
මොනරුන්ද තුන් අවුරුද්දකට වරක්
23 ගෙනෙන ලද්දේය. මෙසේ සාලමොන්
රජ වස්තුවෙනුත් ප්‍රඥාවෙනුත් පොළොවේ
සියලු රජුන්ට වඩා ශ්‍රේෂ්ඨව සිටියේය.
24 දෙවියන්වහන්සේ සාලමොන්ගේ සිතේ
තබා තිබුණු ඔහුගේ ප්‍රඥාව අසන පිණිස
සකල දේශවාසීහු ඔහු වෙතට ආවෝය.
25 ඔව්හු අවුරුද්දෙන් අවුරුද්ද තම තමුන්ගේ
තෑගි වන රිදී භාජනද රන් භාජනද
වස්ත්‍රද යුද්ධායුධද සුවඳ ද්‍රව්‍යද අශ්වයන්ද
26 අශ්වතරයන්ද ගෙනාවෝය. සාලමොන්
වනාහි රථ සහ අසරුවන්ද එක්කාසු
කරගත්තේය. ඔහුට රථ එක්දහස් හාර
සියයක් තිබුණේය, අසරුවන් දොළොස්
දහසක්ද සිටියෝය, රජ ඒවා රථ
නුවරවලද තමා ළඟ යෙරුසලමේද
27 තැබුවේය. තවද රජ යෙරුසලමෙහි, රිදී
ගල් මෙන්ද කිහිරි ගස් පහත ප්‍රදේශවල
තිබෙන අත්තික්කා ගස් මෙන්ද
ප්‍රමාණයෙන් බොහෝ වෙන්ට සැලැස්විය.
සාලමොන්ට සිටි අශ්වයෝ මිසරයෙන් 28
ගෙනෙන ලද්දෝය; රජුගේ වෙළෙන්දෝ
උන් රංචුවක් රංචුවක් වශයෙන් මිල
ගණනකට ලබා ගත්තෝය. රථයක් රිදී 29
ෂෙකෙල් හසියයකටත් අශ්වයෙක් එකසිය
පනහකටත් මිසරයෙන් ගෙනැවිත්
විකුණන්ට යෙදුණේය. ඔවුන් එනකොට
හිත්තීවරුන්ගේ සියලු රජුන්ටත් සිරියේ
රජුන්ටත් ඔව්හු එලෙසම ගෙනත්
දුන්නෝය.

## සාලමොන් රජ පාපයට වැටීම. රජුගේ මරණය

11

සාලමොන් රජ බොහෝ අන්‍යජාති
ස්ත්‍රීන්ට එනම් ඵාරාවෝගේ දුව
ඇතුළුව මෝවබ්වරුන්ගේද අම්මොන්-
වරුන්ගේද ඒදෝම්වරුන්ගේද ශීදොන්-
වරුන්ගේද හිත්තීවරුන්ගේද කාන්තාවන්වූ
බොහෝ අන්‍ය ජාති ස්ත්‍රීවරුන්ටත්
ආදරේවුණේය. සැබවින්ම ඔවුන් 2
තුඹලාගේ සිත් තමුන්ගේ දෙවිවරුන්
වෙතට හරවන බැවින් තුඹලා ඔවුන්
අතරට නොයා යුතුය, ඔවුන්ට තුඹලා
අතරට එන්ට ඉඩ නොදිය යුතුය කියා
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන්ට
යම් යම් ජාතීන් ගැන කීසේක්ද ඒ ජාතීන්ට
සාලමොන් ස්නේහයෙන් ඇලුම්වූයේය.
ඔහුට කුමාරිකා භාර්යාවන් සත්සියයක්ද 3
උපභාර්යාවන් තුන්සියයක්ද සිටියෝය.
ඔහුගේ භාර්යාවෝ ඔහුගේ සිත
හරවාගත්තෝය. එසේය, සාලමොන් 4
මහලුවූ කල ඔහුගේ භාර්යාවෝ ඔහුගේ
සිත අන් දෙවිවරුන් වෙතට හැරෙවුවෝය.
ඔහුගේ සිතද තමාගේ පියවූ දාවිත්ගේ
සිත මෙන් තමාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** කෙරෙහි සම්පූර්ණව නො-
තිබුණේය. මක්නිසාද සාලමොන් ශීදොන්- 5
වරුන්ගේ දේවතාවීවූ අෂ්ටාරොත්ද
අම්මොන්වරුන්ගේ පිළිකුලවූ මිල්කොම්ද
අනුව ගොස්, **ස්වාමීන්වහන්සේගේ** ඇස් 6
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය,

ඔහු තමාගේ පියවූ දාවිත් මෙන්
**ස්වාමීන්වහන්සේ** අනුව සම්පූර්ණ ලෙස
7 ගියේ නැත. එකල සාලමොන් යෙරුසලම
ඉදිරියෙහිවූ කන්දේ මෝවබ්වරුන්ගේ
පිළිකුලවූ කෙමොෂ්ටත් අම්මොන්
පුත්‍රයන්ගේ පිළිකුලවූ මොලෙක්ටත්
8 උස්තැනක් ගොඩනැගුවේය. තමුන්ගේ
දෙවිවරුන්ට සුවඳ දුම්ද පූජාද ඔප්පු-
කළාවූ තමාගේ සියලු අන්‍ය ජාතික
භාර්යාවන්ටත් ඔහු එසේම සාදුදුන්නේය.
9 මෙසේ සාලමොන් තමාට දෙවරක්
පෙනී, අන් දෙවිවරුන් පසුව නොයන
ලෙස තමාට අණකළාවූ ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** කෙරෙන්
තමාගේ සිත අහක්කරගත් බැවින්,
10 **ස්වාමීන්වහන්සේ** ඔහුට උදහස්වූසේක.
**ස්වාමීන්වහන්සේ** ඔහුට අණකළ දේ
11 ඔහු පැවැත්තුවේ නැත. එබැවින් **ස්වාමීන්-
වහන්සේ** සාලමොන්ට කථාකොට: නුඹ
මාගේ ගිවිසුමද මා නුඹට අණකළ
මාගේ පනත්ද නොපවත්වා මෙසේ කළ
බැවින්, මම සැබවින්ම රාජ්‍යය නුඹෙන්
උදුරා නුඹේ මෙහෙකරුවාට දෙන්නෙමි.
12 එහෙත් නුඹේ පියවූ දාවිත් නිසා මම
නුඹේ දවස්වලදී ඒක නොකොට නුඹේ
පුත්‍රයාගේ අතින් ඒක පැහැරගන්නෙමි.
13 නුමුත් මුළු රාජ්‍යය පැහැර නොගෙන
මාගේ මෙහෙකරුවූ දාවිත් නිසාත් මා
විසින් තෝරාගත් යෙරුසලම නිසාත්
නුඹේ පුත්‍රයාට එක ගෝත්‍රයක් දෙන්නෙමියි
කීසේක.
14 තවද **ස්වාමීන්වහන්සේ** සාලමොන්ට
විරුද්ධකාරයෙකු කොට ඒදෝමීය හදද්
නැගිටෙවූසේක. ඔහු ඒදෝම් රජ වංශයේ
15 කෙනෙකි. එනම් දාවිත් ඒදෝමිහි සිටිද්දී
ඒදෝමිහි සියලු පිරිමින් මරාදැමූවායින්
පසු සේනාපතිවූ යෝවාබ් මැරුම්කෑ
තැනැත්තන් තැන්පත් කරන පිණිස ගිය
16 කල මෙසේ විය. (මක්නිසාද යෝවාබ්ද
සියලු ඉශ්‍රායෙල්වරුද ඒදෝමිහි සියලු
පිරිමින් සිඳදමන තුරු එහි හමාසයක්
17 නැවතුණෝය.) නුමුත් හදද් සහ ඔහු
සමග ඔහුගේ පියාගේ සේවකයන්ගෙන්
ඒදෝමිහි සමහර මනුෂ්‍යයෝ මිසරයට
යන පිණිස පලාගියෝය; මෙකල හදද්
කුඩා ළමයෙක්ව සිටියේය. ඔව්හු 18
මිදියන් දේශයේ සිට පිටත්ව පාරාන්ට
පැමිණ පාරාන් දේශයෙන් මනුෂ්‍යයන්
කැඳවාගෙන මිසරයේ රජවූ ඵාරාවෝ
වෙතට මිසරයට ගියෝය; රජ්ජුරුවෝ
ඔහුට ගෙයක්දී, ආහාර නියමකොට,
ගම් බිම්ද දුන්නාහ. ඵාරාවෝ හදද් 19
කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිය බැවින්
තමාගේ භාර්යාවගේ සහෝදරී වන
තාපෙනෙස් බිසවගේ සහෝදරී ඔහුට
භාර්යා කොට පාවාදුන්නේය. තාපෙනෙස් 20
බිසවගේ සහෝදරී ඔහු නිසා ගෙනුබත්
නම්වූ පුත්‍රයා වැදුවාය, තාපෙනෙස්
ඵාරාවෝගේ ගෘහයේදී ඔහු කිරෙන්
වැරෙව්වාය. ගෙනුබත් ඵාරාවෝගේ
ගෘහයෙහි ඵාරාවෝගේ පුත්‍රයන් අතරේ
සිටියේය. දාවිත් තමාගේ පියවරුන් සමග 21
සැතපුණු බවත් යෝවාබ් සේනාපතියා
මළ බවත් හදද් මිසරයේදී අසා: මාගේ
රටට යන්ට මා හැරිය මැනවයි ඵාරාවෝට
කීවේය. එවිට ඵාරාවෝ ඔහුට කථා- 22
කොට: නුඹේ රටට යන්ට හදන්නේ
මා ළඟ නුඹට මොන හිඟයක් වීදැයි
ඇසුවේය. හිඟයක් නැත, එහෙත්
කොහොම නුමුත් මට යන්ට අවකාශ
දුනමැනවැයි ඔහු උත්තරදුන්නේය.
දෙවියන්වහන්සේ ඔහුට තවත් විරුද්ධ- 23
කාරයෙකු නැගිටෙවූසේක, එනම්
තමාගේ ස්වාමිවූ සෝබායේ රජවූ
හදද්එසෙර් වෙතින් පලාගියාවූ එලියාදගේ
පුත්‍රවූ රෙසොන්ය. ඔහු දාවිත් සෝබායේ 24
මනුෂ්‍යයන් මරාදමන කල තමා ළඟට
මිනිසුන් රැස්කරගෙන සමූහයක අධිපතියා
වුණේය. ඔව්හු දමස්කයට ගොස් එහි
වාසයකරමින් දමස්කයෙහි රජකම්
කළෝය. හදද් කළ අනතුර ඇර 25
ඔහුද සාලමොන්ගේ සියලු දවස්වල
ඉශ්‍රායෙල්වරුන්ට සතුරෙක්ව සිට,
ඉශ්‍රායෙල්වරුන් පිළිකුල්කොට, සිරිය රට
කෙරෙහි රජකම්කෙළේය.
තවද ශෙරේදයේ එප්‍රායිමියයෙක්වූ 26
නෙබාත්ගේ පුත්‍රවූ, සාලමොන්ගේ
සේවකයෙක්වූ යෙරොබොවම්ද රජුට
විරුද්ධව තමාගේ අත එසෙවූවේය.
වැන්දඹු ස්ත්‍රියෙක්ව සිටිය ඔහුගේ මවුගේ

27 නම ශෙරුවාය. ඔහු රජුට විරුද්ධව
අත එසෙවුවේ මේ කාරණය නිසාය.
සාලමොන් මිල්ලෝ ගොඩනගමින්ද
තමාගේ පියවූ දවිත්ගේ නුවර කැඩුම්
28 හරිගස්සමින්ද සිටියේය. යෙරොබොවම්
වනාහි බලසම්පන්න මනුෂ්‍යයෙක්
විය. සාලමොන් ඒ තරුණයා කඩිසර
කෙනෙක් බව දැක යෝසෙප්ගේ වංශයට
නියමවූ බර වැඩ සියල්ල කෙරෙහි ඔහු
29 පත්කෙළේය. ඒ කාලයේදී යෙරොබොවම්
යෙරුසලමෙන් පිටතට යන කල අලුත්
සළුවක් පෙරවාගන සිටි ෂිලොනීය
අහියානම් අනාගතවක්තෘට ඔහු මගදී
සම්බවිය; ඒ දෙදෙනා පමණක් කෙතෙහි
30 සිටියෝය. අහියා තමා ඇඳගන සිටිය
අලුත් සළුව අල්වා කැලි දොළොසකට
31 ඉරා, යෙරොබොවම්ට කථාකොට: නුඹ
කැලි දහයක් ගනින්න. මක්නිසාද
ඉශ්‍රායෙල් දෙවිවූ ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක–මම සාලමොන්ගේ
රාජ්‍යය පැහැරගන නුඹට ගෝත්‍ර දසයක්
32 දෙන්නෙමි. (එක ගෝත්‍රයක් මාගේ
මෙහෙකරුවූ දවිත් නිසාත් ඉශ්‍රායෙල්ගේ
සියලු ගෝත්‍රවලින් මා විසින් තෝරාගත්
නුවර වන යෙරුසලම නිසාත් ඔහුට
33 වන්නේය.) මා මෙසේ කරන්නේ ඔවුන්
ඔහුගේ පියවූ දවිත් මෙන් මාගේ ඇස්
හමුයෙහි හරිව තිබුණු දේද මාගේ
පනත්ද විනිශ්චයයන්ද ඉෂ්ටකරමින්
මාගේ මාර්ගවල නොහැසිර මා
අත්හැර, සීදොන්වරුන්ගේ දේවතාවීවූ
අෂ්ටාරොත්ටද මෝවබ්වරුන්ගේ දෙවිවූ
කෙමොෂ්ටද අම්මොන් පුත්‍රයන්ගේ දෙවිවූ
මිල්කොම්ටද නමස්කාරකළ නිසාය.
34 එහෙත් මම මුළු රාජ්‍යය ඔහුගේ අතින්
නොගෙන මා විසින් තෝරාගත්තාවූ,
මාගේ ආඥාද පනත්ද පැවැත්තුවාවූ,
මාගේ මෙහෙකරුවූ දවිත් නිසා ඔහුගේ
ජීවිතයේ සියලු දවස්වල අධිපතියාව
35 සිටින්ට ඔහුට ඉඩ හැර, ඔහුගේ පුත්‍රයා
අතින් රාජ්‍යය ගෙන, ගෝත්‍ර දහයක්
36 නුඹට දෙන්නෙමි. මාගේ නාමය තබන්ට
මා විසින් තෝරාගත් නුවරවූ
යෙරුසලමේ මාගේ මෙහෙකරුවූ දවිත්ට
මා ඉදිරියෙහි නිතරම පහනක් තිබෙන
පිණිස මම ඔහුගේ පුත්‍රයාට එක
ගෝත්‍රයක් දෙන්නෙමි. නුඹේ සිත 37
ආසාවෙන සියල්ල කෙරෙහි නුඹ
රජකම්කරමින් ඉශ්‍රායෙල් කෙරෙහි රජ
වෙන පිණිස නුඹ පිළිගන්නෙමි. මාගේ 38
මෙහෙකරුවූ දවිත් කළාක්මෙන් නුඹ
මාගේ පනත්ද ආඥාද පවත්වමින්, මා
විසින් නුඹට අණකරන සියල්ලට
ඇහුම්කන්දී, මාගේ මාර්ගවල හැසිර,
මාගේ ඇස් හමුයෙහි හරිවූ දේ කරන්නෙහි
නම්, මම නුඹ සමග සිට දවිත්ට ස්ථිරවූ
ගෘහයක් ගොඩනගාදුන්නාක් මෙන්
නුඹටත් ගොඩනගාදී, ඉශ්‍රායෙල්වරුන්
නුඹට භාරදෙන්නෙමි. දවිත්ගේ වංශයට 39
මේ කාරණය නිසා පීඩාකරන්නෙමි,
එහෙත් සෑම කාලයටම නොවේය කියා
කියනසේකැයි කීවේය. ඒ නිසා 40
සාලමොන් යෙරොබොවම් මරන්ට
සෙවීය. එහෙත් යෙරොබොවම් පිටත්වී
මිසරයේ රජවූ ෂීෂක් වෙත මිසරයට
පලාගොස්, සාලමොන්ගේ මරණය
දක්වා එහි සිටියේය.

සාලමොන්ගේ අනික් කාරණාද ඔහු 41
කළ සියල්ලද ඔහුගේ ප්‍රඥාවද සාලමොන්ගේ
පවත් සඳහන්වූ පොතේ ලියා තිබෙනවා
නොවේද? සාලමොන් යෙරුසලමේ මුළු 42
ඉශ්‍රායෙල් කෙරෙහි රජකම් කළ කාලය
සතළිස් අවුරුද්දක්ය. සාලමොන් තමාගේ 43
පියවරුන් සමග සැතපී තමාගේ පියවූ
දවිත්ගේ නුවර තැන්පත්කරනු ලැබුවේය.
ඔහුගේ පුත්‍රවූ රෙහොබොවම් ඔහු
වෙනුවට රජවුණේය.

## රෙහොබොවම් රජවීම. ගෝත්‍ර දශය වෙන්වීම

12 රෙහොබොවම් ෂෙකෙම්ට ගියේය.
මක්නිසාද ඔහු රජකොට පත්කරන
පිණිස සියලු ඉශ්‍රායෙල්වරු ෂෙකෙම්ට
ආවෝය. තවද සාලමොන් රජු කෙරෙන් 2
පලාගොස් මිසරයෙහි වාසයකළාවූ,
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්
මිසරයෙහි සිටියදීම ඒ බව ඔහුට

3 සැලව්ය. ඔව්හු පණිවුඩයක් යවා ඔහු
ගෙන්වා ගත්තෝය. යෙරොබොවම්ද මුළු
ඉශ්‍රායෙල් සභාවද ඇවිත් රෙහොබොවම්ට
4 කථාකොට: ඔබගේ පියාණෝ අප පිට
බර වියගහක් තැබුවාහ. එබැවින් ඔබගේ
පියාණන්ගේ දුෂ්කර සේවයද ඔහු අප
පිට තැබූ බර වියගහද සැහැල්ලුකළ
මැනවි, එවිට අපි ඔබට සේවය-
5 කරන්නෙමුයයි කීවෝය. තුඹලා ගොස්
තුන් දවසකින් මා ළඟට නැවත
වරෙල්ලායයි ඔහු ඔවුන්ට කීවේය.
6 සෙනඟ පිටත්ව ගියෝය. රෙහොබොවම්
රජ තමාගේ පියවූ සාලමොන් ජීවත්ව
සිටියදී ඔහු ඉදිරියෙහි සිටි වැඩිමහල්ලන්
සමඟ මන්ත්‍රණය කරමින්: මේ සෙනඟට
උත්තරදෙන පිණිස තුඹලා මට දෙන
7 දැනමුතුකම කුමක්දැයි ඇසුවේය. ඔව්හු:
ඔබ අද මේ සෙනඟට සේවකයෙක් වී,
ඔවුන්ට සේවයකොට, ප්‍රිය වචන ඔවුන්ට
කථාකර උත්තරදෙන්නෙහි නම්, ඔවුන්
සෑමකල්ම ඔබගේ සේවකයන් වෙනවා
8 ඇතැයි ඔහුට කීවෝය. එහෙත්
වැඩිමහල්ලන් ඔහුට කීවාවූ දැනමුතුකම
ඔහු අත්හැර, තමා සමඟ වැඩුණාවූ තමා
ඉදිරියෙහි සිටියාවූ තරුණයන් සමඟ
9 මන්ත්‍රණය කරමින්, ඔවුන්ට කථාකොට:
ඔබගේ පියාණන් අප පිට තැබූ වියගහ
සැහැල්ලුකළමැනවැයි මට කීවාවූ මේ
සෙනඟට අප විසින් උත්තර දෙන පිණිස
තුඹලා මන්ත්‍රණයකර කියන්නේ කුමක්දැයි
10 ඔවුන්ගෙන් ඇසුවේය. ඔහු සමඟ වැඩුණු
තරුණයෝ ඔහුට කථාකොට: ඔබගේ
පියාණෝ අප පිට බර වියගහක්
තැබූහ, එහෙත් ඔබ ඒක අපට සැහැල්ලු-
කළමැනවැයි කියා ඔබට කීවාවූ මේ
සෙනඟට ඔබ මෙසේ කිය යුතුය–මාගේ
පියාණන්ගේ තුනටියට වඩා මාගේ
11 සුළඟිල්ල ලොකුය. එසේය, මාගේ
පියාණෝ තුඹලා පිට බර වියගහක්
තැබුවාහ, මම වනාහි තුඹලාගේ වියගහ
තව වඩා බර කරන්නෙමි. මාගේ
පියාණෝ කසවලින් තුඹලාට දඬුවම්
කළාහ, මම ගෝනුස්සන්ගෙන් තුඹලාට
දඬුවම්කරන්නෙමියි කියා ඔවුන්ට කිය
යුතුයයි කීවෝය. තුන්වෙනි ද නැවත 12
මා ළඟට වරෙල්ලායයි රජ නියමකළ
හැටියට යෙරොබොවම්ද මුළු සෙනඟද
තුන්වෙනි ද රෙහොබොවම් ළඟට ආවෝය.
තවද රජ සෙනඟට තද ලෙස උත්තර- 13
දෙමින්, වැඩිමහල්ලන් ඔහුට දුන්
දැනමුතිකම අත්හැර, තරුණයන්ගේ 14
දැනමුතිකමේ හැටියට ඔවුන්ට කථාකොට:
මාගේ පියාණෝ තුඹලා පිට බර වියගහක්
තැබුවාහ, නුමුත් මම තුඹලාගේ වියගහ
තව වඩා බර කරන්නෙමි. මාගේ
පියාණෝ කසවලින් තුඹලාට දඬුවම්
කළාහ, මම වනාහි ගෝනුස්සන්ගෙන්
තුඹලාට දඬුවම් කරන්නෙමියි කීවේය.
මෙසේ රජ සෙනඟට ඇහුම්කන් නුදුන්නේය; 15
මක්නිසාද **ස්වාමින්වහන්සේ** පිලොනිය
අහියා ලවා නෙබාත්ගේ පුත්‍රවූ
යෙරොබොවම්ට කියෙවූ තමන්ගේ වචනය
ඉෂ්ටකරන පිණිස ඒ කාරණය **ස්වාමීන්-**
**වහන්සේගෙන්** විය. සියලු ඉශ්‍රායෙල්වරු 16
රජ තමුන්ට ඇහුම්කන් නුදුන් බව
දුටු කල, සෙනඟ රජුට උත්තරදෙමින්:
දවිත්ගෙන් අපට ඇති කොටස කිමෙක්ද?
යෙස්සේගේ පුත්‍රයාගෙන් අපට උරුමයක්
නැත. ඉශ්‍රායෙල්වරුනි, තුඹලාගේ
කූඩාරම්වලට පලයල්ලා. ඉතින් දවිත්,
තුඹ තුඹේම වංශය බලාගනින්නැයි
කීවෝය. මෙසේ ඉශ්‍රායෙල්වරු තමුන්ගේ
කූඩාරම්වලට ගියෝය. නුමුත් යූද 17
නුවරවල විසූ ඉශ්‍රායෙල් පුත්‍රයන් කෙරෙහි
රෙහොබොවම් රජකම් කෙළේය. එවිට 18
රෙහොබොවම් රජ රාජකාරියේ
මුලාදෑනියාවූ අදෝරාම් යැවීය; සියලු
ඉශ්‍රායෙල්වරු ඔහුට ගල් ගසා ඔහු
මැරුවෝය. එවිට රෙහොබොවම් රජ
යෙරුසලමට පලායන පිණිස ඉක්මනින්
රථයට නැගුණේය. මෙසේ අද දක්වා 19
තිබෙන ප්‍රකාරයට ඉශ්‍රායෙල්වරු දවිත්ගේ
වංශයට විරුද්ධව කැරළිගැසුවෝය.
යෙරොබොවම් නැවත ආ බව සියලු 20
ඉශ්‍රායෙල්වරු අසා සභාවට ඔහු ගෙන්වා-
ගෙන සියලු ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි

ඔහු රජකොට පත්කළෝය. යූද
ගෝත්‍රයම මිස දාවිත්ගේ වංශය අනුව
ගියාවූ වෙන කිසිවෙක් නොවීය.
21 රෙහොබෝවම් යෙරුසලමට පැමිණි
විට, ඉශ්‍රායෙල් වංශයට විරුද්ධව
යුද්ධ කොට සාලමොන්ගේ පුත්‍රවූ
රෙහොබෝවම්ට රාජ්‍යය නැවත ගෙනදෙන
පිණිස ඔහු මුළු යූද වංශයද බෙන්යමින්
ගෝත්‍රයද වූ තෝරාගත් යුද්ධකාරයන්
22 එක්ලක්ෂ අසූ දහසක් රැස්කෙළේය. එහෙත්
දෙවියන්වහන්සේගේ වචනය දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාවූ ෂෙමායා වෙතට
23 පැමිණ කියනුයේ: නුඹ සාලමොන්ගේ
පුත්‍රවූ යූදහි රජවූ රෙහොබෝවම්ටත්
මුළු යූද වංශයටත් බෙන්යමින් වංශයටත්
ඉතිරි සෙනඟටත් කථාකොට මෙසේ
24 කියාපන්න—නුඹලා නොයල්ලා, ඉශ්‍රායෙල්
පුත්‍රයන් වන නුඹලාගේ සහෝදරයන්ට
විරුද්ධව යුද්ධ නොකරල්ලා. එක්
එක්කෙනා තම තමාගේ ගෙදරට හැරී
පලයල්ලා. මක්නිසාද මේ කාරණය
පැමුණුණේ මාගෙන්ය කියා ස්වාමින්-
වහන්සේ කියනසේකැයි කීයේය. මෙසේ
ඔව්හු ස්වාමීන්වහන්සේගේ වචනයට
ඇහුම්කන්දී ස්වාමීන්වහන්සේගේ වචනය
ලෙස හැරී ගියෝය.

## යෙරොබෝවම් රූප වන්දනාව පිහිටුවීම

25 යෙරොබෝවම් එනාහි එප්‍රායිම් කඳුරටෙහි
ෂෙකෙම් ගොඩනගා එහි වාසය කෙළේය;
ඔහු එතැනින් ගොස් පෙනුයෙල්
26 ගොඩනැගුවේය. තවද යෙරොබෝවම්
තමාගේ සිතින් සිතනුයේ: ඉතින් රාජ්‍යය
27 දාවිත්ගේ වංශයට හැරීයන්නේය. මේ
සෙනඟ යෙරුසලමේ තිබෙන ස්වාමීන්-
වහන්සේගේ ගෘහයෙහි පූජා ඔප්පුකරන්ට
ගියොත් මේ සෙනඟගේ සිත් තමුන්ගේ
ස්වාමිවූ යූදවරුන්ගේ රජවූ රෙහොබෝවම්
වෙතට හැරී යන්නේය; තවද ඔවුන් මා
මරා යූදහි රජවූ රෙහොබෝවම් වෙතට
28 හැරී යනවා ඇතැයි කීවේය. එවිට රජ
මන්ත්‍රණයකොට රන් වස්සන් දෙන්නෙක්
සාදවා: යෙරුසලමට නැගීයාම නුඹලාට
අමාරු වැඩිය; ඉශ්‍රායෙල්වරුනි, නුඹලා
මිසර දේශයෙන් ගෙනාවාවූ නුඹලාගේ
දෙවිවරු මේයයි ඔවුන්ට කීවේය. ඔහු 29
එකෙක් බෙතෙල්හි සිටවා අනිකා දාන්හි
තැබීය. ඒ කාරණය පාපයක් විය, 30
මක්නිසාද මිනිස්සු ඒ ඉදිරියෙහි වඳින
පිණිස දාන් දක්වා ගියේය. ඔහු උස්තැන් 31
ගෙවල් කොට, ලෙවී පුත්‍රයන් නුවූ මුළු
සෙනඟ අතරෙන් පූජකයන් පත්කෙළේය.
තවද යූදහි පවත්වන මංගල්‍යය 32
මෙන් යෙරොබෝවම් අටවෙනි මාසයේ
පසළොස්වෙනි ද මංගල්‍යයක් නියමකොට
පූජාසනය පිට පූජා ඔප්පුකෙළේය; ඔහු
බෙතෙල්හිදීත් එසේම කරමින් තමා සෑදූ
වස්සන්ට පූජාකෙළේය. තමා සෑදූ උස්
තැන්වල පූජකයන් ඔහු බෙතෙල්හි
සිටෙවුවේය. ඔහු බෙතෙල්හි සෑදූ 33
පූජාසනයට තමාගේම සිතින්
නියමකරගත් මාසය වන අටවෙනි
මාසේ පසළොස්වෙනි ද ගියේය. ඔහු
ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මංගල්‍යයක්
නියමකොට, සුවඳ දුම් ඔප්පුකරන
පිණිස පූජාසනයට නැගී ගියේය.

## යෙරොබෝවම් දඬුවම්කරනු ලැබීම

13 යෙරොබෝවම් සුවඳ දුම් ඔප්පු
කරමින් පූජාසනය ළඟ සිටිද්දී
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක්
ස්වාමීන්වහන්සේගේ ආඥාව පිට යූද සිට
බෙතෙල්ට ඇවිත්, ස්වාමීන්වහන්සේගේ 2
ආඥාව පිට පූජාසනයට විරුද්ධව
මොරගසා; එම්බා පූජාසනය, පූජාසනය,
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක—
යොසියා නම්වූ පුත්‍රයෙක් දාවිත්ගේ වංශයට
ඉපිද, තා පිට සුවඳ දුම් ඔප්පුකරන උස්
තැන්වල පූජකයන් තා පිට පූජාකරන්නේය,
මිනී ඇටද තා පිට දවනු ලබන්නේයයි
කියනසේකැයි කීවේය. ඔහු එම දවසේ 3
ලකුණක් දෙමින්: ස්වාමීන්වහන්සේ කී
ලකුණ නම්, පූජාසනය පැළී එය පිට
තිබෙන අළු විසිර වැටීමයයි කීවේය.

4 දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා බෙතෙල්හි
පූජාසනයට විරුද්ධව මොරගසා කී
වචන යෙරොබොවම් රජ ඇසූ විට
ඔහු පූජාසනය වෙතින් තමාගේ අත
දිගුකර: ඔහු අල්ලාගනිව්යයි කීවේය.
ඔහුට විරුද්ධව ඔහු දිගුකළ තමාගේ
අත දෙවනු නමාගන්ට බැරිලෙස
5 වියළුණේය. තවද දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා ස්වාමීන්වහන්සේගේ අණ පරිදි
දුන් ලකුණේ හැටියට පූජාසනය පැළී
6 අලු පූජාසනයෙන් විසිර වැටුණේය. රජ-
තෙමේ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාට
කථාකොට: මාගේ අත සුවවෙන පිණිස
නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට කන්නලව්-
කර මා උදෙසා යාච්ඤා කරන්නැයි
කීවේය. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා
ස්වාමීන්වහන්සේට කන්නලව්කෙළේය.
එවිට රජුගේ අත සුවවී පෙර තිබුණාක්
7 මෙන් විය. රජද: මා සමග ගෙදරට
ඇවිත් විඩා හැරගනින්න, නුඹට
ප්‍රසාද පඬුරක් දෙමියි දෙවියන්වහන්සේගේ
8 මනුෂ්‍යයාට කීවේය. දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා: නුඹේ ගෙයින් දෙකෙන්
පංගුවක් මට දෙනත් මම නුඹ සමග
එහි නොයමි, මේ ස්ථානයේදී මා විසින්
කෑම කන්නේවත් වතුර බොන්නේවත්
9 නැත. මක්නිසාද ස්වාමීන්වහන්සේගේ
වචනයෙන් මට මෙසේ අණකොට–නුඹ
කෑම කන්ටවත් වතුර බොන්ටවත් නුඹ
ආ මගින් හැරී යන්ටවත් එපාය කියා
මට කියන ලද්දේයයි රජුට කීවේය.
10 මෙසේ ඔහු බෙතෙල්ට ආ මාර්ගයෙන්
නැවත නොගොස් වෙන මාර්ගයකින්
ගියේය.

## අකීකරු ප්‍රොපේත තැනගේ දුක්ඛිත අන්තිමය

11 බෙතෙල්හි මහලු ප්‍රොපේත කෙනෙක්
වාසයකෙළේය; ඔහුගේ පුත්‍රයන්ගෙන්
එක්කෙනෙක් ඇවිත් දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා එද බෙතෙල්හිදී කළ සියලු
ක්‍රියාවල් ඔහුට කීයේය. ඔහු විසින් රජුට
කී වචනද ඔව්හු තමුන්ගේ පියාට
12 කීවෝය. ඔවුන්ගේ පියා: ඔහු කොයි
මගින් ගියේදැයි ඔවුන්ගෙන් ඇසුවේය.
යූදහි සිට ආ දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා ගිය මාර්ගය ඔහුගේ පුත්‍රයන්
විසින් දක්නාලද්දේය. මට කොටළුවා 13
සූදනම්කරදියල්ලායයි ඔහු තමාගේ
පුත්‍රයන්ට කීය. ඔවුන් ඔහුට කොටළුවා
සූදනම් කර දුන් විට ඔහු ඌ පිට නැගී,
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා පස්සේ 14
ගොස් ඔහු අලෝන ගහක් යට ඉන්නවා
දැක: යූද සිට ආ දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා නුඹදැයි ඔහුගෙන් ඇසීය. ඒ
මමයයි ඔහු කීවේය. එවිට ඔහු: මා 15
සමග ගෙදර ඇවිත් කෑම කාපන්නැයි
ඔහුට කීවේය. ඔහුද: නුඹ සමග හැරී 16
එන්ටවත් නුඹේ ගෙදරට ඇතුල්වෙන්ටවත්
මට නොපිළිවන. මේ ස්ථානයේදී නුඹ
සමග කෑම නොකමි, වතුරද නොබොමි.
මක්නිසාද–නුඹ එහිදී කෑම කන්ටවත් 17
වතුර බොන්ටවත් නුඹ යන මාර්ගයෙන්
හැරී එන්ටවත් එපාය කියා ස්වාමීන්-
වහන්සේගේ වචනයෙන් මට කියන ලද්දේ-
යයි කීවේය. එවිට ඔහු: මමත් නුඹ 18
වාගේම අනාගතවක්තෘ කෙනෙක්මි;
දේවදූතයෙක් ස්වාමීන්වහන්සේගේ
වචනයෙන් මට කථාකොට–ඔහු කෑම
කන පිණිසත් වතුර බොන පිණිසත්
නුඹේ ගෙදරට කැඳවාගන වරෙන්න
කියා කීයේයයි ඔහුට කීවේය. ඔහු
ඔහුට කීවේ බොරුය. මෙසේ ඔහු 19
සමග ඔහු හැරී ගොස් ඔහුගේ ගෙදර
කෑම කා වතුර බීවේය. ඔවුන් මේසේ 20
හිඳින කල ඔහු ආ පසු කැඳවාගන
ආ ප්‍රොපේත තැන වෙතට ස්වාමීන්-
වහන්සේගේ වචනය පැමුණුණේය. යූද 21
සිට ආ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාට
ඔහු මොරගසා: ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක–නුඹ ස්වාමීන්වහන්සේගේ
වචනයට අකීකරුව, නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ නුඹට අණකළ ආඥාව
රක්ෂානොකොට, හැරී ඇවිත්, යම් 22
ස්ථානයකදී කෑම කන්ටවත් වතුර
බොන්ටවත් එපාය කියා නුඹට
කීසේක්ද, ඒ ස්ථානයෙහිදී නුඹ කෑම
කා වතුර බිවූ නිසා, නුඹේ මළකඳ
නුඹේ පියවරුන්සේ සොහොන්ගෙට
නොපැමිණෙන්නේයයි කීය. තවද 23
ඔහු කෑ බී පසු ඔහු විසින් ආපසු
කැඳවාගන එනලද ප්‍රොපේත තැනට
කොටළුවා සූදනම්කර දෙන ලද්දේය.
ඔහු ගියායින් පසු මාර්ගයේදී සිංහයෙක් 24

ඔහුට සම්බවී ඔහු මැරුවේය. ඔහුගේ
මළකඳ මාර්ගයෙහි දමනලද්දේය,
කොටළුවා ඒ ළඟ සිටියේය; සිංහයාත්
25 මළකඳ ළඟ සිටියේය. ඒ ළඟින් යන
මනුෂ්‍යයෝ මළකඳ මාර්ගයෙහි වැටී
තිබෙනවාත් සිංහයා මළකඳ ළඟ
සිටිනවාත් දැක මහලු ප්‍රොපේත තැන
විසූ නුවරට ඇවිත් ඒ බව කීවෝය.
26 මාර්ගයෙන් ඔහු කැඳවාගත් අනාගත-
වක්තෘ එපවත් අසා: ඒ වනාහි **ස්වාමීන්-
වහන්සේගේ** වචනයට අකීකරුවූ දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාය. එබැවින්
**ස්වාමීන්වහන්සේ** ඔහුට කී වචනය ලෙස
ඔහු සිංහයාම පාවාදුන්සේක; ඌ ඔහු
27 ඉරා මරා දැමුවේයයි කීවේය. තවද
ඔහු: කොටළුවා මට සූදනම්කරදියල්ලා-
යයි තමාගේ පුත්‍රයන්ට කීවේය. ඔවුන්
28 ඌ සූදනම් කළ විට ඔහු ගියේය. එවිට
මළකඳ මාර්ගයෙහි වැටී තිබෙනවාත්
කොටළුවාද සිංහයාද මළකඳ ළඟ
සිටිනවාත් ඔහුට සම්බවිය. සිංහයා
මළකඳ කාලා තිබුණේවත් කොටළුවා
29 ඉරාදමා තිබුණේවත් නැත. ඒ මහලු
අනාගතවක්තෘද දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා ගැන වැලපී, ඔහු තැන්පත්
කරන පිණිස ඔහුගේ මළකඳ ඔසවා
කොටළුවා පිට තබා, තමාගේ නුවරට
30 ගෙනගොස්, තමාගේම සොහොන් ගෙයි
තැබුවේය; ඔව්හුද: අහෝ මාගේ
සහෝදරය! කියා ඔහු ගැන
31 වැලපුණෝය. තවද ඔහු විසින් ඔහු
තැන්පත්කළ පසු ඔහු තමාගේ පුත්‍රයන්ට
කථාකොට: මා මැරුණාම දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයා තැන්පත්කරන-
ලද සොහොන්ගෙයි මාත් තැන්පත්-
කරපල්ලා; ඔහුගේ ඇට ළඟ මාගේ ඇට
32 තබාපල්ලා. මක්නිසාද ඔහු බෙතෙල්හි
පූජාසනයටත් සමාරිය නුවරවල උස්
තැන්හි තිබෙන සියලු ගෘහවලටත්
විරුද්ධව **ස්වාමීන්වහන්සේගේ** ආඥාව
පරිදි මොරගසා කී වචනය ඉෂ්ටවෙනවාම
ඇතැයි කීවේය.

මේ දෙයට පසුවවත් යෙරොබොවම් 33
තමාගේ නපුරු මාර්ගයෙන් නොහැරී,
නැවතත් සියලු මිනිසුන්ගෙන් උස්
තැන්වලට පූජකයන් පත්කෙළේය. කැමතිවූ
කොයි අය නුමුත් උස් තැන්වල පූජකයන්
වීමට ඔහු කැපකෙළේය. මේ කාරණය 34
වනාහි යෙරොබොවම්ගේ වංශය සිඳ
දමා පොළෝතලයෙන් විනාශකිරීමට
ඔවුන් කෙරෙහි පාපයක් විය.

## යෙරොබොවම්ට තරවටුකිරීම. ඔහුගේ මරණය

14 ඒ කාලයෙහි යෙරොබොවම්ගේ
පුත්‍රවූ අබියා ලෙඩ වුණේය.
යෙරොබොවම් තමාගේ භාර්යාවට 2
කථාකොට: නුඹ යෙරොබොවම්ගේ
භාර්යාව බව නොදැනෙන හැටියට
වෙස්වලා පිටත්වී ෂීලෝට පලයන්න;
මා මේ සෙනඟ කෙරෙහි රජ වන්නේ-
යයි මා ගැන කීවාවූ අහියා
අනාගතවක්තෘ එහි සිටියි. නුඹේ අතින් 3
රොටි දසයක්ද බැදපු කැවුම්ද මීපැණි
භාජනයක්ද රැගෙන ඔහු ළඟට
පලයන්න. ළමයාට මක්වේද කියා ඔහු
නුඹට දන්වනවා ඇතැයි කීවේය.
යෙරොබොවම්ගේ භාර්යාව එසේ කොට 4
පිටත්වී ෂීලෝට ගොස් අහියාගේ
ගෙදරට පැමිණියාය. මහලුකම නිසා
අහියාගේ ඇස් නොපෙනෙන ලෙස අඳුරුව
තිබුණේය. නුමුත් **ස්වාමීන්වහන්සේ** 5
අහියාට කථාකොට: බලව, යෙරො-
බොවම්ගේ භාර්යාව ලෙඩින් ඉන්න
ඇගේ පුත්‍රයා ගැන නුඹෙන් විචාරන්ට
එන්නීය. ඇට මේ මේ ආකාර කථා-
කරපන්න. ඈ එන විට අන් තැනැත්තියක්
මෙන් පෙන්වනවා ඇතැයි කීසේක.
දොරකඩින් ඇතුල්වෙන ඇගේ අඩි 6
ශබ්දය අහියාට ඇසුණු විට ඔහු
කථාකොට: යෙරොබොවම්ගේ භාර්යාව,
ඇතුළට වරෙන්න; නුඹ අන් තැනැත්-
තියක් මෙන් පෙන්වන්නේ කුමටද?
දුක්බිත ආරංචි දන්වන්ට නුඹ වෙතට
එවනු ලැබීමි. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 7
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේකැයි

තුඹ ගොස් යෙරොබොවම්ට කියාපන්න–
මම සෙනඟ අතරෙන් තුඹ උසස්කර,
මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි
8 අධිපතියා කොට පත්කර, දවිත්ගේ
වංශයෙන් රාජ්‍යය උදුරා තුඹට දුනිමි.
තුමුත් තුඹ වනාහි මාගේ ආඥා
පැවත්තුවාවූ, මාගේ ඇස් හමුයෙහි හරිව
තිබෙන දේවල් පමණක් කරමින් තමාගේ
මුළු සිතින් මා අනුව ආවාවූ මාගේ
9 මෙහෙකරුවූ දවිත් මෙන් නොසිට, තුඹට
පළමුවෙන් සිටි සියල්ලන්ට වඩා
නපුරුකම් කරමින්, මා කෝපකරන
හැටියට අන් දෙවිවරුන්ද වාත්තු පිළිමද
10 සාදගන මට පිටිපෑ බැවින්, මම
යෙරොබොවම්ගේ වංශය පිටට විපත්ති
පමුණුවා, යෙරොබොවම්ගේ සියලු
පිරිමින් ඉශ්‍රායෙල්වරුන් අතරෙහි දසයන්
වුවත් නිර්දසයන් වුවත් සිඳ දමා,
නිමාවටම කුණු පිස දමන්නාක් මෙන්
යෙරොබොවම්ගේ වංශය සහමුලින්ම
11 පිසදමන්නෙමි. නුවරදී මැරෙන
යෙරොබොවම්ට අයිති කෙනෙකු
බල්ලෝ කන්නෝය; පිටතදී මැරෙන
කෙනෙකු ආකාශයේ පක්ෂීහු කන්නෝය.
කුමක් හෙයින්ද ස්වාමීන්වහන්සේ එය
12 කීසේක. එබැවින් තුඹ පිටත්ව තුඹේ
ගෙදරට පලයන්න. තුඹේ පාද නුවර
ඇතුලේ තබනකොටම ළමයා මැරෙනවා
13 ඇත. සියලු ඉශ්‍රායෙල්වරු ඔහු ගැන
වැලපී ඔහු තැන්පත්කරන්නෝය;
මක්නිසාද යෙරොබොවම්ගේ වංශය
අතරෙන් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ කෙරෙහි යහපත්වූ යමක් ඔහු
තුළ ඇති බැවින් යෙරොබොවම්ගේ
වංශයෙන් ඔහු පමණක් සොහොනකට
14 පැමිණෙන්නේය. ඇරත් ඒ දවසේදී
යෙරොබොවම්ගේ වංශය සිඳ දැමීමට
ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් කෙරෙහි
රජෙක් නැගුටුවා ගන්නවා ඇත. මේ
15 දැන්ම වුවත් මොකද? තවද ඉශ්‍රායෙල්-
වරුන් තමුන්ගේ අෂේරා කණු සාදගත
ස්වාමීන්වහන්සේ කෝපකළ බැවින්,
බටගහ වතුරේ සෙලවෙන්නාක් මෙන්
සෙලවෙන්ට ස්වාමීන්වහන්සේ ඔවුන්ට
පහරදී, උන්වහන්සේ ඔවුන්ගේ පියවරුන්ට
දුන් මේ හොඳ දේශයෙන් ඔවුන් උදුරා,
*ගංගාවෙන් එතෙරට ඔවුන් විසුරුවා
දමනවා ඇත. යෙරොබොවම් කළාවූද 16
ඉශ්‍රායෙල්වරුන්ට කරන්ට සැලැස්සුවාවූද
පාපවල් නිසා උන්වහන්සේ ඉශ්‍රායෙල්
අත්හැර දමනවා ඇතැයි කීවේය.
යෙරොබොවම්ගේ භාර්යාව පිටත්ව 17
ගොස් තිර්ශාට පැමිණියාය. ඈ ගෙයි
එළිපත්ත ළඟට ආ විට ළමයා මළේය.
සියලු ඉශ්‍රායෙල්වරු ස්වාමීන්වහන්සේ 18
තමන් මෙහෙකරුවූ අහියා අනාගතවක්තෘ
ලවා කියෙවූ වචනයේ හැටියට ඔහු
තැන්පත්කොට ඔහු ගැන වැලපුණෝය.
යෙරොබොවම්ගේ අනික් කාරණා එනම්, 19
ඔහු යුද්ධකළ හැටිද රජකම්කළ හැටිද
ඉශ්‍රායෙල් රජවරුන්ගේ ලේකම් පොතේ
ලියා තිබේ. යෙරොබොවම් රජකම්කළ 20
කාලය විසි දැවුරුද්දක්ය. ඔහු තමාගේ
පියවරුන් සමග සැතපුණේය, ඔහුගේ
පුත්‍රවූ නාදබ් ඔහු වෙනුවට රජ වුණේය.

## යූදවරුන් පව්කිරීම. රෙහොබොවම්ගේ මරණය

සාලමොන්ගේ පුත්‍රවූ රෙහොබොවම් 21
යූදහි රජකම්කෙළේය. රෙහොබොවම්
රජ වෙන කල සතළිස් එක් අවුරුද්දක්
වයස් ව සිටියේය, ඔහු වනාහි ස්වාමීන්-
වහන්සේ තමන්ගේ නාමය තබන්ට සියලු
ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් තෝරාගත් නුවරවූ
යෙරුසලමේ දහහත් අවුරුද්දක් රජකම්
කෙළේය. අම්මොනිය ස්ත්‍රියෙක්වූ ඔහුගේ
මවුගේ නම නයමාය. යූදවරුද ස්වාමීන්- 22
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබුණු
දේ කොට, තමුන් කළ පාපවලින්
තමුන්ගේ පියවරුන් කළ සියල්ලට වඩා
උන්වහන්සේ කෝපකළෝය. මව්හුද 23
සියලු උස් හෙල් පිටත් සියලු අමු ගස්
යටත් උස් තැන්ද රූප-කුළුනුද අෂේරා

*එනම්, ප්‍රාත් ගංගාවෙන්.

24 කණුද සාදගත්තෝය; *සොදමියයෝද
දේශයෙහි සිටියෝය. ඔව්හු **ස්වාමීන්-**
**වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙන්
පන්නාදමූ ජාතීන්ගේ සියලු පිළිකුල් ක්‍රියා
25 ප්‍රකාරයට කළෝය. තවද රෙහොබොවම්
රජුගේ පස්වෙනි අවුරුද්දේදී මිසරයේ
රජවූ ෂීෂක් යෙරුසලමට විරුද්ධව
26 ඇවිත්, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
වස්තුද රජගෙයි වස්තුද හැරගෙන ගියේය;
ඔහු සියල්ලම රැගෙන, සාලමොන් විසින්
සාද තිබුණු සියලු රන් පලිස්ද ගෙන
27 ගියේය. රෙහොබොවම් රජ ඒ වෙනුවට
පිත්තල පලිස් සාද රජගෙයි දෙරකඩ
රැකවල් කළ මුරකාරයන්ගේ අධිපතීන්
28 අතට භාරදුන්නේය. රජ **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයට එන සියලු
ප්‍රස්තාවයන්හිදී මුරකාරයෝ ඒවා
උසුලාගන ඇවිත් නැවත මුරගෙට
29 ගෙනගියෝය. රෙහොබොවම්ගේ අනික්
කාරණාද ඔහු කළ සියල්ලද යූද රජුන්ගේ
ලේකම් පොතෙහි ලියා තිබෙනවා
30 නොවේද? රෙහොබොවම් සහ
යෙරොබොවම් අතරේ නිතරම යුද්ධ
31 පැවතුණේය. රෙහොබොවම් තමාගේ
පියවරුන් සමග සැතපී තමාගේ පියවූ
දාවිත්ගේ නුවර තමාගේ පියවරුන් සමග
තැන්පත් කරනු ලැබුවේය. අම්මොනිය
ස්ත්‍රියෙක්වූ ඔහුගේ මවුගේ නම නයමාය.
ඔහුගේ පුත්‍රවූ අබියාම් ඔහු වෙනුවට
රජවුණේය.

## අබියාම් යූදහි රජකම්කිරීම

15 නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්
රජුගේ දහඅටවෙනි අවුරුද්දේදී
2 අබියාම් යූද කෙරෙහි රජ වී, තුන්
අවුරුද්දක් යෙරුසලමේ රජකම්කෙළේය.
ඔහුගේ මවුගේ නම මයකාය, ඈ අබ්-
3 සලොම්ගේ දූවෙක්ය. ඔහුද තමාගේ පියා
තමාට පළමුවෙන් කළ සියලු පාපවල
හැසුරුණේය. ඔහුගේ සිතද ඔහුගේ පියවූ
දාවිත්ගේ සිත මෙන් ඔහුගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** කෙරෙහි සම්පූර්ණව නො-
4 තිබුණේය. එහෙත් දාවිත් නිසා ඔහුගේ

*එනම්, දූෂ්‍යකමට කැපවූවෝ.

දෙවිවූ **ස්වාමීන්වහන්සේ** ඔහුට පසුව
ඔහුගේ පුත්‍රයා නැගිටවීමෙන්ද යෙරුසලම
ස්ථිරකිරීමෙන්ද යෙරුසලමේ ඔහුට
පහනක් දුන්සේක. මක්නිසාද හිත්තීය 5
ඌරියාගේ කාරණය ගැන මිස **ස්වාමීන්-**
**වහන්සේ** දාවිත්ට අණකළ කිසි දෙයකින්
ඔහු තමාගේ ජීවිතයේ සියලු දවස්වල
අහක්ව නොගොස් උන්වහන්සේගේ ඇස්
හමුවෙහි හරිව තිබුණු දේවල්ම කෙළේය.
රෙහොබොවම් සහ යෙරොබොවම් 6
අතරේ ඔහුගේ ජීවිතයේ සියලු දවස්වල
යුද්ධ තිබුණේය. අබියාම්ගේ අනික් 7
කාරණාද ඔහු කළ සියල්ලද යූද
රජුන්ගේ ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද? අබියාම් සහ යෙරොබොවම්
අතරේ යුද්ධ පැවතුණේය. අබියාම්ද 8
තමාගේ පියවරුන් සමග සැතපුණේය;
ඔව්හු දාවිත්ගේ නුවර ඔහු තැන්පත්-
කළෝය. ඔහුගේ පුත්‍රවූ ආසා ඔහු
වෙනුවට රජවුණේය.

## ආසා යූද රට කෙරෙහි රජවීම

ඉශ්‍රායෙල් රජවූ යෙරොබොවම්ගේ 9
විසිවෙනි අවුරුද්දේ ආසා යූද කෙරෙහි
රජවුණේය. ඔහු යෙරුසලමෙහි සතළිස් 10
එක් අවුරුද්දක් රජකම්කෙළේය. ඔහුගේ
මවුගේ නම මයකාය, ඈ අබ්සලොම්ගේ
දූවෙක්ය. ආසා තමාගේ පියවූ දාවිත් 11
කළ ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය. ඔහු 12
සොදෙමියයන් දේශයෙන් පහකොට
තමාගේ පියවරුන් සෑදූ සියලු දේවරූපද
අහක්කර දැමුවේය. තමාගේ මවුවූ මයකා 13
අෂේරා කණුවක් පිණිස පිළිකුල් රූපයක්
සෑදූ බැවින් ඔහු ඈ බිසෝකමෙන්
අහක්කර, ඈගේ රූපය කපාදමා,
කිද්‍රොන් ඔය ළඟදී පුලුස්සාදැමුවේය.
එහෙත් උස්තැන් පහනොකරනලද්දේය. 14
එසේවී නුමුත් ආසාගේ සිත ඔහුගේ
සියලු දවස්වලදී **ස්වාමීන්වහන්සේ** කෙරේ
සම්පූර්ණව තිබුණේය. ඔහු තමාගේ පියා 15
විසින්ද තමා විසින්ද කැපකළ රන් රිදී
සහ බඩුත් **ස්වාමීන්වහන්සේගේ** ගෘහය

16 ඇතුළට ගෙනායේය. ආසා සහ ඉශ්‍රායෙල්
රජවූ බාෂා අතරේ ඔවුන්ගේ සියලු
17 දවස්වල යුද්ධ පැවතුණේය. ඉශ්‍රායෙල්
රජවූ බාෂා යූදට විරුද්ධව ගොස් යූදහි
රජවූ ආසා වෙතට පිටතට යන්ට හෝ
ඇතුළට එන්ට හෝ කිසිවෙකුට ඉඩ
නොදෙන පිණිස රාමා ගොඩනැගුවේය.
18 එවිට ආසා **ස්වාමීන්වහන්සේගේ** ගෘහ
ගබඩාවල ඉතුරුව තිබුණු රන් රිදී
සියල්ලද රජගෙයි තිබුණු වස්තුද ගෙන
තමාගේ සේවකයන්ගේ අතට භාරදී,
දමස්කයෙහි විසූ සිරියේ රජවූ, හෙශි-
යොන්ගේ පුත්‍රයා වන තබ්රිම්මොන්ගේ
පුත්‍රවූ බෙන්-හදද්ට ඒවා යවමින්:
19 මා සහ ඔබ අතරේද මාගේ සහ
ඔබගේ පියා අතරේද ගිවිසුමක් තිබේ;
මෙන්න රන් රිදී තෑග්ගක් ඔබට එවමි;
ඉශ්‍රායෙල් රජවූ බාෂා මා වෙතින්
අහක්ව යන පිණිස ඔබ ඇවිත් ඔහු
සමග කර තිබෙන ඔබගේ ගිවිසුම
20 කඩකළ මැනවැයි කියා ඇරියේය. එවිට
බෙන්-හදද් ආසා රජුට ඇහුම්කන්දී,
තමාගේ සේනාපතියන් ඉශ්‍රායෙල්
නුවරවලට විරුද්ධව යවා, ඊයොන්ටත්
දාන්ටත් ආබෙල්-බෙත්-මයකාටත් මුළු
නප්තලී දේශය ඇතුළුව මුළු කින්නරෝත්ටත්
21 පහරදුන්නේය. බාෂා ඒ අසා රාමා
ගොඩනැගීම නවත්වා, තිර්ශාහි වාසය
22 කෙළේය. එවිට ආසා රජ කිසිවකු අත්නැර
සියලු යූදවරුන්ට අඬගස්වා, රාමා
ගොඩනැගීමට බාෂා විසින් ගත් ගල්ද
ලීද ඔවුන් ලවා ගෙන්වාගෙන, එයින්
බෙන්යමින්හි ගෙබාද මිශ්පාද
23 ගොඩනැගුවේය. ආසාගේ අනික් සියලු
කාරණාද ඔහුගේ සියලු බලවත්කම්ද
ඔහු කළ සියල්ලද ඔහු ගොඩනැගූ
නුවරවල්ද යූදහි රජුන්ගේ ලේකම් පොතේ
ලියා තිබෙනවා නොවේද? නුමුත් ඔහුගේ
මහලු වයසේදී ඔහුගේ පාදවල රෝගයක්
24 සෑදී තිබුණේය. ආසා තමාගේ පියවරුන්
සමග සැතපී තමාගේ පියවූ දාවිත්ගේ
නුවර තමාගේ පියවරුන් ළඟ තැන්පත්-
කරනු ලැබීය. ඔහුගේ පුත්‍රවූ යෙහෝෂාපාට්
ඔහු වෙනුවට රජ වුණේය.

යෙරොබොවම්ගේ පුත්‍රවූ නාදාබ් යූදහි 25
රජවූ ආසාගේ දෙවෙනි අවුරුද්දේ
ඉශ්‍රායෙල් කෙරෙහි රජ වී දෑවුරුද්දක්
රජකම්කෙළේය. ඔහු **ස්වාමීන්වහන්සේගේ** 26
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ කොට,
තමාගේ පියාගේ මාර්ගයෙහිද
ඉශ්‍රායෙල්ට පව්කරන්ට සැලැස්සුවාවූ
ඔහුගේ පාපයෙහිද හැසුරුණේය. තවද 27
ඉස්සාකර් වංශයේ අහියාගේ පුත්‍රවූ බාෂා
නාදාබ්ට විරුද්ධව කුමන්ත්‍රණය කොට,
නාදාබ් සහ සියලු ඉශ්‍රායෙල්වරුන්
පිලිස්තිවරුන්ට අයිති ගිබ්බෙතෝන්
වටලාගෙන සිටින අතර එහිදී ඔහුට
පහරදුන්නේය. යූදහි රජවූ ආසාගේ 28
තුන්වෙනි අවුරුද්දේදී බාෂා තෙමේ නාදාබ්
මරා ඔහු වෙනුවට රජවුණේය. තවද 29
රජවූ වහාම ඔහු යෙරොබොවම්ගේ මුළු
වංශය නැසුවේය; විනාශනොකර
පණපිටින් කිසිවෙකු ඔහු යෙරොබොවම්ට
ඉතුරු නොකෙළේය. එසේ වුණේ 30
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
උදහස්කරන ලෙස යෙරොබොවම් විසින්
කළාවූද ඉශ්‍රායෙල්වරුන්ට කරන්ට
සැලැස්සුවාවූද පව් නිසා **ස්වාමීන්-
වහන්සේ** තමන්ගේ දාසයාවූ ෂීලෝනිය
අහියා ලවා කියෙවූ උන්වහන්සේගේ
වචනයේ හැටියටය. නාදාබ්ගේ අනික් 31
කාරණාද ඔහු කළ සියල්ලද ඉශ්‍රායෙල්
රජුන්ගේ ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද? ආසා සහ ඉශ්‍රායෙල්හි රජවූ 32
බාෂා අතරේ ඔවුන්ගේ සියලු දවස්වල
යුද්ධ පැවතුණේය.

යූදහි ආසාගේ තුන්වෙනි අවුරුද්දේදී 33
අහියාගේ පුත්‍රවූ බාෂා තිර්ශාහි සියලු
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජවී විසිහතර
අවුරුද්දක් රජකම්කෙළේය. ඔහු **ස්වාමීන්-** 34
**වහන්සේගේ** ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ කොට යෙරොබොවම්ගේ
මාර්ගයෙහිද ඉශ්‍රායෙල්ට පව් කරන්ට
සැලැස්සුවාවූ ඔහුගේ පාපයේ හැටියටද
හැසුරුණේය.

## නාදබ් සහ බාෂා ඉශ්‍රායෙල් කෙරෙහි රජවීම

16 එවිට **ස්වාමීන්වහන්සේගේ** වචනය
බාෂාට විරුද්ධව හනානීගේ පුත්‍රවූ
2 යේහු වෙතට පැමිණ කථාකොට: මම
දූවිල්ල කෙරෙන් තුඹ උසස්කර මාගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා
කොට පත්කෙළෙමි; නුමුත් තුඹ
යෙරොබෝවම්ගේ මාර්ගයෙහි හැසිරෙමින්
තමුන්ගේ පාපවලින් මා කෝපකරවන
හැටියට මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්වරුන්ට
3 පව්කරන්ට සැලැස්වූ බැවින්, මම බාෂා
හා ඔහුගේ වංශය සහමුලින්ම පිසදමා,
තුඹේ වංශය නෙබාත්ගේ පුත්‍රවූ යෙරො-
බොවම්ගේ වංශය මෙන් වෙන්ට
4 සලස්වන්නෙමි. නුවරදී මැරෙන බාෂාට
අයිති කෙනෙකු බල්ලෝ කන්නෝය;
පිටතදී මැරෙන ඔහුට අයිති කෙනෙකු
ආකාශයේ පක්ෂීන් විසින් කනවා ඇතැයි
5 කීවේය. බාෂාගේ අනික් කාරණාද ඔහු
කළ දේවල්ද ඔහුගේ බලවන්තකම්ද
ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම් පොතේ ලියා
6 තිබෙනවා නොවේද? බාෂා තමාගේ
පියවරුන් සමග සැතපී තිර්ශාහි
තැන්පත්කරන ලද්දේය; ඔහුගේ පුත්‍රවූ
ඒලා ඔහු වෙනුවට රජ වුණේය.
7 ඇරත් හනානීගේ පුත්‍රවූ යේහු අනාගත-
වක්තෘ අතින් **ස්වාමීන්වහන්සේගේ**
වචනය බාෂාටත් ඔහුගේ වංශයටත්
විරුද්ධව පැමුණුණේ ඔහු යෙරොබොවම්ගේ
වංශයට සමානවෙන හැටියට තමාගේ
අත් වැඩවලින් **ස්වාමීන්වහන්සේ**
කෝපකරවමින් උන්වහන්සේගේ ඇස්
හමුයෙහි කළාවූ සියලු නපුරුකම් නිසාත්
ඔහු ඒ වංශය නැසූ නිසාත්ය.

## ඒලා, බාෂා, සිම්රි සහ ඔම්රි යන ඉශ්‍රායෙල් රජවරු

8 යූදහි රජවූ ආසාගේ විසි හවෙනි
අවුරුද්දේදී බාෂාගේ පුත්‍රවූ ඒලා
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජ වී තිර්ශාහි
9 දෑවුරුද්දක් රජකම්කෙළේය. ඔහුගේ
රථවලින් දෙකෙන් කොටසකට
අධිපතියාව සිටි ඔහුගේ සේවකවූ සිම්රි
ඔහුට විරුද්ධව කුමන්ත්‍රණයකොට, ඔහු
තිර්ශාහි ගෙදර ප්‍රධානියාවූ අර්සාගේ
ගෙයිදී බීමත්වී සිටින අතර, සිම්රි 10
ඇතුල්වී යූදහි රජවූ ආසාගේ විසි
හත්වෙනි අවුරුද්දේදී ඔහුට පහරදී ඔහු
මරා, ඔහු වෙනුවට රජවුණේය. තවද 11
ඔහු රජවී තමාගේ සිංහාසනය පිට
හිඳගත් වහාම බාෂාගේ නෑයන්ගෙන්වත්
මිත්‍රයන්ගෙන්වත් කිසි පිරිමියෙක්වත් ඔහුට
ඉතුරු නොකොට ඔහුගේ වංශයේ
සියල්ලන්ට පහරදුන්නේය. මෙසේ සිම්රි 12
බාෂාගේ මුළු වංශය විනාශකළේ බාෂාද
ඔහුගේ පුත්‍රවූ ඒලාද තමන්ගේ නිරර්ථක
රූපවලින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** කෝපකරවමින් ඔවුන් විසින්
කළාවූද, ඉශ්‍රායෙල්ට කරන්ට සැළැස්- 13
සුවාවූද ඔවුන්ගේ සියලු පාපවල්
නිසා **ස්වාමීන්වහන්සේ** අනාගතවක්තෘවූ
යේහු ලවා බාෂාට විරුද්ධව කියෙවූ
උන්වහන්සේගේ වචනයේ හැටියටය.
ඒලාගේ අනික් ක්‍රියාද ඔහු කළ සියල්ලද 14
ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම් පොතේ ලියා
තිබෙනවා නොවේද?

යූදහි රජවූ ආසාගේ විසි හත්වෙනි 15
අවුරුද්දේදී සිම්රි තිර්ශාහි සත් දවසක්
රජකම් කෙළේය. එවිට සෙනඟ පිලිස්ති-
වරුන්ට අයිති ගිබ්බෙතෝන්ට විරුද්ධව
කඳවුරු බැඳගෙන සිටියෝය. සිම්රි 16
කුමන්ත්‍රණයකොට රජුටත් පහරදුන්නේය
කියා කඳවුරු බැඳගෙන සිටි සෙනඟ
ඇසූ විට සියලු ඉශ්‍රායෙල්වරු
සේනාපතිවූ ඔම්රි ඒ දවසේ කඳවුරේදී
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජකමට පත්
කළෝය. ඔම්රිද ඔහු සමග සියලු 17
ඉශ්‍රායෙල්වරුද ගිබ්බෙතෝන් සිට ගොස්
තිර්ශා වටලාගත්තෝය. තවද නුවර 18
අල්ලාගත් බව සිම්රි දුටු විට ඔහු
රජගෙයි බලකොටුවට ඇතුල්වී රජගෙට
ගිනිලාගෙන මෙළේය. එසේ වුණේ ඔහු 19
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කරමින් යෙරො-
බොවම්ගේ මාර්ගයෙහිද ඉශ්‍රායෙල්ට
පව්කරන්ට සලස්වන ලෙස ඔහු කළාවූ

පාපයේ හැටියටද හැසිරෙමින් ඔහු
20 කළාවූ පාපවල් නිසාය. සිම්රීගේ අනික්
ක්‍රියාද ඔහු කළ ද්‍රෝහිකම්ද ඉශ්‍රායෙල්
රජුන්ගේ ලේකම් පොතෙහි ලියා
තිබෙනවා නොවේද?
21 එකල ඉශ්‍රායෙල් සෙනඟ දෙපක්ෂයකට
බෙදී සෙනඟගෙන් දෙකෙන් කොටසක්
ගීනත්ගේ පුත්‍රවූ තිබ්නී රජකරගන්ට ඔහුට
එකතුවුණේය; අනික් කොටස ඔම්රීට
22 එකතුවුණේය. නුමුත් ඔම්රීට එකතුවුණ
සෙනඟ ගීනත්ගේ පුත්‍රවූ තිබ්නීට
එකතුවුණ සෙනඟ පරාජය කළෝය.
මෙසේ තිබ්නී මළේය, ඔම්රී රජවුණේය.
23 යූදාහි රජවූ ආසාගේ තිස් එක්වෙනි
අවුරුද්දේදී ඔම්රී ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි රජවී දොළොස් අවුරුද්දක්
රජකම්කෙළේය. තිර්ශාහි ඔහු අවුරුදු
24 හයක් රජකම්කෙළේය. ඔහු සමාරිය කන්ද
රිදී තලෙන්ත දෙකකට ෂෙමෙර්ගෙන්
මිලේට ගෙන කන්දෙහි ගොඩනගා, තමා
ගොඩනැගූ නුවරට කන්ද අයිතිකාරයාවූ
ෂෙමෙර්ගේ නාමය ප්‍රකාර සමාරිය යන
25 නම තැබුවේය. ඔම්රී ස්වාමීන්වහන්සේගේ
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ කොට
තමාට පළමුවෙන් සිටි සියල්ලටම වඩා
26 දුෂ්ටලෙස ක්‍රියාකෙළේය. මක්නිසාද ඔහු
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්ගේ
සියලු මාර්ගවලද තමාගේ නිරර්ථක
රූපවලින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ කෝපකරවන හැටියට
ඉශ්‍රායෙල්ට පව් කරන්ට සැලැස්සුවාවූ
ඔහුගේ පාපවල හැටියටද හැසුරුණේය.
27 ඔම්රී කළාවූ අනික් ක්‍රියාද ඔහු කළ
බලවත්තකම්ද ඉශ්‍රායෙල් රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා
28 නොවේද? ඔම්රී තමාගේ පියවරුන්
සමඟ සැතපී සමාරියෙහි තැන්පත්කරනු
ලැබුවේය. ඔහුගේ පුත්‍රවූ ආහබ් ඔහු
වෙනුවට රජවුණේය.

## ආහබ් රජකමට පැමිණීම

29 යූදාහි රජවූ ආසාගේ තිස් අටවෙනි
අවුරුද්දේදී ඔම්රීගේ පුත්‍රවූ ආහබ්
ඉශ්‍රායෙල් කෙරෙහි රජ වී, සමාරියේ
විසිදෑවුරුද්දක් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
රජකම්කෙළේය. ඔම්රීගේ පුත්‍රවූ ආහබ්ද 30
තමාට පළමුවෙන් සිටි සැමදෙනාට වඩා
ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය. තවද ඔහු 31
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්ගේ
පාපවල හැසුරුණා මදිවාක් මෙන්
ශීදෝන්වරුන්ගේ රජවූ එත්බාල්ගේ දූවූ
යෙසෙබෙල් භාර්යා කොට පාවා-
ගත්තේය, ඔහු ගොස් බාල්ට සේවය
කරමින් නමස්කාරකෙළේය. තවද ඔහු 32
සමාරියේ ගොඩනැගූ බාල්ගේ ගෘහයෙහි
බාල්ට පූජාසනයක් සෑදුවේය. ආහබ් 33
අෂේරා කණුත් සෑදුවේය; ආහබ් තෙම
තමාට පළමු සිටි සියලු ඉශ්‍රායෙල්
රජුන්ටත් වඩා ඉශ්‍රායෙල් දෙවිවූ ස්වාමීන්-
වහන්සේ කෝපකරවීමට කාරණා කෙළේය.
ඔහුගේ කාලයේදී බෙතෙලීය හීයෙල් 34
විසින් යෙරිකෝව ගොඩනගනලද්දේය.
ස්වාමීන්වහන්සේ නූන්ගේ පුත්‍රවූ යෝෂුවා
ලවා කියෙවූ උන්වහන්සේගේ වචනය
ලෙස ඔහු ඒකේ අත්තිවාරම දමන විට
ඔහුගේ කුලුඳුලාවූ අබිරාම්ද ඔහු ඒකේ
දොරටු පිහිටුවන විට ඔහුගේ බාල පුත්‍රවූ
සෙගුබ්ද නැසුණෝය.

## එලියා සහ ශාරෙපත්හි වැන්දඹු ස්ත්‍රී

17 තවද ගිලියද්හි විසූවන්ගෙන්
එක්කෙනෙක්වූ තිෂ්බිය එලියා
ආහබ්ට කථාකොට: මා සේවයකරන
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
ජීවමාන බව සැබෑවා සේම මාගේ
වචනය ලෙස මිස මේ අවුරුදුවල
පිනිවත් වැස්සවත් නොවන්නේයයි
කීයේය. ස්වාමීන්වහන්සේගේ වචනය 2
ඔහු වෙතට පැමිණ: මෙතැනින් පිටත්ව 3
පූර්ව දිශාවට ගොස් යොර්දන් ඉදිරිපිට
තිබෙන කෙරිත්නම් ඔය ළඟ සැඟවී
සිටපන්න. ඒ ඔයෙන් නුඹට බොන්නට 4
පුළුවන; එහිදී නුඹට කෑම දෙන්ට
කපුටුවන්ට මම අණකෙළෙමියි කීසේක.
ඔහු ගොස් ස්වාමීන්වහන්සේගේ වචනය 5

ලෙස කෙළේය. ඔහු ගොස් යොර්දන්
ඉදිරිපිට තිබෙන කෙරිත් ඔය ළඟ
6 වාසයකෙළේය. කපුටුවෝ උදයේ රොටි
සහ මස්ද සවස රොටි සහ මස්ද
ගෙනාවෝය; ඔහු ඔයෙන් වතුර බීවේය.
7 තවද දේශයට වැස්ස නැති නිසා කලකට
පසු ඔය හිඳී ගියේය.
8 ස්වාමීන්වහන්සේගේ වචනය ඔහු
9 වෙතට පැමිණ: නුඹ පිටත්වී ශීදොන්ට
අයිති ශාරෙපත්ට ගොස් එහි වාසයකරපන්න.
නුඹට ආහාර දෙන්ට එහි සිටින වැන්දඹු
ස්ත්‍රියෙකට අණකෙළෙමියි කීසේක.
10 එහෙයින් ඔහු පිටත්ව ශාරෙපත්ට ගොස්
නුවර දොරකඩට පැමිණි කල, වැන්දඹු
ස්ත්‍රියෙක් එහි දර අවුලනවා දැක, ඈට
අඬගසා: කරුණාකර මට බොන්ට
භාජනයකට වතුර ටිකක් ගෙනෙන්නැයි
11 කීවේය. ඈ ඒ ගෙනෙන්ට යන අතර
ඔහු ඈට අඬගසා: කරුණාකර නුඹේ
අතින් රොටි කෑල්ලකුත් මට ගෙනෙන්නැයි
12 කීවේය. එවිට ඈ කථාකොට: නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ ජීවමාන බව
සැබෑවා සේම මුට්ටියක පිටි මිටකුත්
කුලාවක තෙල් ටිකකුත් මිස මා ළඟ
රොටියක් නැත. ඒවා මා සහ මාගේ
පුත්‍රයා විසින් කාලා නසින පිණිස ඒවා
සාදා ගන්ට දර කෑලි දෙකක් අවුලමියි
13 කීවාය. එලියා ඈට කථාකොට: භය
නොවෙන්න; ගොස් නුඹ කී හැටියට
කරපන්න. එහෙත් පළමුකොට එයින්
මට කුඩා රොටියක් සාදා පිටතට මා
ළඟට ගෙනෙන්න, පසුව නුඹටත් නුඹේ
14 පුත්‍රයාටත් සාදගනින්න. මක්නිසාද
ස්වාමීන්වහන්සේ භූමිය පිටට වැස්ස
එවන දවස දක්වා පිටි මුට්ටිය
ඉවරවෙන්නේවත් තෙල් කුළාව අඩු-
වෙන්නේවත් නැතැයි ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ කියනසේකැයි කීවේය.
15 ඈ ගොස් එලියා කී හැටියට කළාය.
එසේ ඈද ඔහුද ඈගේ ගෙයි වැසියෝද
16 බොහෝ දවස් ඒවා කෑවෝය. ස්වාමීන්-
වහන්සේ එලියා ලවා කියෙවූ
උන්වහන්සේගේ වචනය ප්‍රකාරයට පිටි
මුට්ටිය නිම නොවීය, තෙල් කුළාවද
17 අඩුනොවීය. ඉක්බිති මෙයින් පසු ගෙදර
ස්වාමිදුවවූ ඒ ස්ත්‍රියගේ පුත්‍රයා රෝගාතුර
විය; ඔහුගේ රෝගය කොපමණ බලවත්
වීද යතහොත් ඔහු තුළ හුස්ම නැතිවිය.
එවිට ඈ එලියාට කථාකොට: දෙවියන්- 18
වහන්සේගේ මනුෂ්‍යය, ඔබගෙන් මට
කම මොකද? මාගේ පාපය සිහි-
කරවන්ටත් මාගේ පුත්‍රයා මරන්ටත් මා
ළඟට ආයෙහියයි එලියාට කීවාය.
ඔහුද: නුඹේ පුත්‍රයා මට දියන්නැයි ඈට 19
කියා ඈගේ ළයෙන් ඔහු රැගෙන, තමා
විසූ උඩු මහලට ගෙනගොස්, තමාගේම
ඇඳේ ඔහු තැබුවේය. තවද ඔහු ස්වාමීන්- 20
වහන්සේට යාච්ඤාකරමින්: මාගේ දෙවිවූ
ස්වාමීන්වහන්ස, මට නවාතැන් දුන්
වැන්දඹුවගේ පුතා නැසීමෙන් ඔබ ඈට
විපතක් පැමිණවූසේක්ද? කියා තුන්වරක් 21
ළමයා පිට දිගාවී ස්වාමීන්වහන්සේට
යාච්ඤාකොට: මාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්ස, මේ ළමයාගේ ප්‍රාණය නැවත
ඔහු තුළට පැමිණේවයි කීවේය. ස්වාමීන්- 22
වහන්සේ එලියාගේ හඬට ඇහුම්කන්දුන්-
සේක; ළමයාගේ ප්‍රාණය නැවත ඔහු
තුළට පැමිණ ඔහු ජීවත්වුණේය. එලියා 23
ළමයා රැගෙන උඩුමහලින් ගෙට
ගෙනැවිත් ඔහුගේ මවුට දී: මෙන්න,
නුඹේ පුතා ජීවත්ව සිටීයයි කීවේය.
ස්ත්‍රිද: ඔබ දෙවියන්වහන්සේගේ මනුෂ්‍ය- 24
යෙක් බවත් ඔබගේ මුඛයෙහි තිබෙන
ස්වාමීන්වහන්සේගේ වචනය සැබෑ බවත්
දැන් දනිමියි එලියාට කීවාය.

## එලියා ප්‍රොපේතවරයා සහ බාල් පූජකයෝ

18 තවද බොහෝ දවසකට පසු
තුන්වෙනි අවුරුද්දේදී ස්වාමීන්-
වහන්සේගේ වචනය එලියා වෙතට
පැමිණ: නුඹ ගොස් ආහබ්ට පෙනියන්න;
මම භූමිය පිටට වැස්ස එවන්නෙමියි
කීසේක. එලියා ආහබ්ට පෙනෙන්ට 2
ගියේය. සාගතය සමාරියෙහි බලවත්ව
තිබුණේය. ආහබ් ගෙදර ප්‍රධානියාවූ 3
ඔබදියාට අඬගැසුවේය. (ඔබදියා වනාහි
ස්වාමීන්වහන්සේ කෙරෙහි බොහෝ-

4 සෙයින් භය ඇති කෙනෙක්ය. මක්නිසාද
යෙසෙබෙල් ස්වාමීන්වහන්සේගේ ප්‍රෝ-
පේතවරුන් සිඳ දමූ කල්හි ඔබදියා
ප්‍රොපේතවරුන් සිය දෙනෙක් රැගෙන
ගොස් පනස පනස බැගින් ඔවුන් ගුහාවල
සඟවා ආහාර සහ වතුර දී ඔවුන්
5 පෝෂ්‍යයකෙළේය.) ආහබ් ඔබදියාට
කථාකොට: දේශයෙහි සියලු දිය
උල්පත්ද ඔයවල්ද ළඟට පලයන්න.
සියලු සිවුපාවුන් නැතිවෙන්ට නොදී
අශ්වයන්ද අශ්වතරයන්ද රක්ෂා-
කරගන්න පිණිස සමහරවිට අපට තෘණ
6 සම්බවේයයි කීවේය. මෙසේ දේශය
මුළුල්ලේ යන පිණිස ඔවුන් ඒක බෙදගන
ආහබ් එක මාර්ගයකින් වෙනම ගියේය,
ඔබදියා වෙන්ව වෙන මාර්ගයකින්
7 ගියේය. ඔබදියා යද්දී එලියා ඔහුට
සම්බ විය. ඔබදියා ඔහු ඇඳින මුහුනින්
වැටී: මාගේ ස්වාමිවූ එලියා ඔබදැයි
8 කීයේය. ඔහුද: ඒ මමය. එලියා මෙහි
ඉන්නවාය කියා තුඹ ගොස් තුඹේ
ස්වාමියාට කියාපන්නැයි ඔහුට කීවේය.
9 එවිට ඔහු කථාකොට: ඔබගේ
මෙහෙකරුවූ මා මරන පිණිස ආහබ්ගේ
අතට පාවාදීමට මම මොන පාපයක්
10 කෙළෙම්ද? ඔබගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ජීවමාන බව සැබෑවා සේම
ඔබ සොයන පිණිස මාගේ ස්වාමියා
විසින් මිනිසුන් නොහැරිය ජාතියක්වත්
රාජ්‍යයක්වත් නැත. ඔහු මෙහි නැත
කියා ඔවුන් කී කල ඔබ ඔවුන්ට සම්බනුණු
බවට ඔහු ඒ රාජ්‍යවලිනුත් ජාතීන්ගෙනුත්
11 දිවුරුම් ගත්තේය. එහෙත්: එලියා මෙහි
ඉන්නේය කියා ගොස් තුඹේ ස්වාමියාට
12 කියාපන්නැයි ඔබ කියන්නෙහිය. තවද
මා ඔබ වෙතින් අහක්ව ගිය වහාම
ස්වාමීන්වහන්සේගේ ආත්මය මා නො-
දන්නා තැනකට ඔබ ගෙනයනවා ඇත;
මා ගොස් ආහබ්ට කීකල ඔහුට ඔබ
සම්බ නොවන නිසා මා මරනවා ඇත.
එහෙත් ඔබගේ මෙහෙකරුවූ මම
බාලවයසේ පටන් ස්වාමීන්වහන්සේ
13 කෙරෙහි භය ඇතුව සිටිමි. යෙසෙබෙල්
ස්වාමීන්වහන්සේගේ ප්‍රොපේතවරුන් මරා
දමන කල මා කළ දේ එනම් ස්වාමීන්-
වහන්සේගේ ප්‍රොපේතවරුන්ගෙන් සිය
දෙනෙකු පනස පනස බැගින් ගුහාවල
සඟවා රොටිත් වතුරත් දී ඔවුන් පෝෂ්‍යය-
කළ හැටි මාගේ ස්වාමියාට නොකියන
ලද්දේද? දැනුදු: එලියා මෙහි ඉන්නේය 14
කියා තුඹ ගොස් තුඹේ ස්වාමියාට
කියාපන්නැයි ඔබ කියන්නෙහිය. ඔහු
මා මරනවා ඇතැයි කීවේය. එලියාද: 15
මා සේවයකරන සේනාවල ස්වාමීන්-
වහන්සේ ජීවමාන බව සැබෑවා සේම
මම ඒකාන්තයෙන් ඔහුට පෙනෙන්නෙමියි
කීවේය. එවිට ඔබදියා ආහබ් සම්බ- 16
වෙන්ට ගොස් ඔහුට දැන්නුවේය. ආහබ්
එලියා සම්බවෙන්ට ගියේය. තවද ආහබ් 17
එලියා දුටු විට ඔහුට කථාකොට:
ඉශ්‍රායෙල් කලඹන තැනැත්තේ තුඹදැයි
ඔහුට කීවේය. ඔහුද: මා නොව තුඹ 18
සහ තුඹේ පියාගේ වංශය ස්වාමීන්-
වහන්සේගේ ආඥා අත්හැර බාල් දේවතා-
වන් පස්සේ ගිය කාරණයෙන් තුඹලා
ඉශ්‍රායෙල් කැලඹුවහුය. ඉතින් දැන් 19
පණිවුඩ යවා සියළු ඉශ්‍රායෙල්වරුන්ද
බාල්ගේ ප්‍රොපේතවරුන් හාරසිය පනසද
යෙසෙබෙල්ගේ මේසයේ කන අෂේරිය
ප්‍රොපේතවරුන් හාරසියදෙනාද මා ළඟට
කර්මෙල් කන්දට රැස්කරවන්නැයි කීවේය.
එවිට ආහබ් සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන් 20
අතරට පණිවුඩ යවා ප්‍රොපේතවරුන්
කර්මෙල් කන්දට රැස්කෙරෙවුවේය. එවිට 21
එලියා මුළු සෙනඟ ළඟට ඇවිත්
කථාකොට: තුඹලා කොපමණ කල්
*කල්පනා දෙකක් අතරේ හිරවී සිටිනවාද?
ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ නම්
උන්වහන්සේ අනුව පලයල්ලා. බාල්
දෙවියන්වහන්සේ නම් ඔහු අනුව
පලයල්ලායයි කීවේය. නුමුත් සෙනඟ
ඔහුට කිසි උත්තරයක් දුන්නේ නැත.
එවිට එලියා සෙනඟට කථාකොට: 22
ස්වාමීන්වහන්සේගේ ප්‍රොපේත කෙනෙක්ව
ඉතුරුව ඉන්නේ මම පමණකි; නුමුත්
බාල්ගේ ප්‍රොපේතවරු හාරසිය පනස්-
දෙනෙක් සිටිති. එබැවින් අපට ගොන් 23
දෙන්නෙක් දෙත්වා; ඔව්හු එක ගොනෙක්
තෝරාගෙන කැබෙලිකර කපා දර පිට
තබා, යටින් ගිනි නොතබත්වා. මමත්
අනික් ගොනා පිළියෙළකොට දර පිට

*මුල් භාෂාවෙහි: කොරගගහා යනවාද?

24 තබා, යටින් ගිනි නොතබන්නෙමි. තුඹලා
තුඹලාගේ දෙවියන්ගේ නාමය කියා
යාච්ඤාකරපල්ලා, මමත් **ස්වාමීන්-
වහන්සේගේ** නාමය කියා යාච්ඤා-
කරන්නෙමි. එවිට ගිනි එවීමෙන්
උත්තරදෙන දෙවියන්වහන්සේම දෙවියන්-
වහන්සේ වනසේක්වයි කීවේය. මුළු
සෙනඟ උත්තරදෙමින්: ඒ කීම යහපතැයි
25 කීවෝය. එලියා බාල්ගේ ප්‍රොපේතවරුන්ට
කථාකොට: තුඹලා බොහෝදෙනෙකු
බැවින් පළමුකොට තුඹලාට ගොනෙකු
තෝරාගෙන පිළියෙළකර, තුඹලාගේ
දෙවියන්ගේ නාමය කියා යාච්ඤාකරපල්ලා,
නුමුත් යටින් ගිනි නොතබල්ලායයි
26 කීවේය. ඔව්හු තමුන්ට ලැබුණු ගොනා
රැගෙන පිළියෙළකොට උදය පටන්
ඉරමුදුන් වේලාව දක්වා බාල්ගේ
නාමයෙන් යාච්ඤාකරමින්: අහෝ, බාල්,
ඔබ අපට උත්තරදුනමැනවයි කීවෝය.
නුමුත් කිසි හඬක්වත් උත්තර දුන්
කිසිවෙක්වත් නොවීය. ඔව්හු සාදා තිබුණු
පූජාසනය වටේට නට නටා ඇවිද්දෝය.
27 ඉරමුදුන් වේලාවේ එලියා ඔවුන්ට කවට-
කම්කොට: හයියෙන් මොරගසාපල්ලා;
මක්නිසාද ඔහු දෙවිකෙනෙක්! ඔහු
මෙනෙහිකරමින් හෝ බැහැර ගොසින්
හෝ ගමනක් යමින් හෝ ඇත,
සමහරවිට ඔහු නිදාගන සිටියි, ඒ නිසා
28 පුබුදුවන්ට වුවමනායයි කීවේය. ඔව්හු
මහත් හඬින් මොරගසා තමුන්ගේ සිරිතේ
හැටියට ලේ ඇඟේ වැගිරෙන තුරු
පිහියාවලිනුත් හෙල්ලවලිනුත් තමුන්ගේ
29 ශරීර කපාගත්තෝය. ඉරමුදුන් වේලාව
පසුවී සවස යාගය ඔප්පුකරන වේලාව
දක්වා ඔව්හු ධර්ම වාක්‍ය දෙසුවෝය;
නුමුත් කිසි හඬක්වත් උත්තරදුන්
කිසිවෙක්වත් සැලකූ කෙනෙක්වත්
30 නොවීය. එවිට එලියා: මා ළඟට
වරෙල්ලායයි මුළු සෙනඟට කීය; මුළු
සෙනඟ ඔහු ළඟට ආවෝය. ඔහු වනාහි
කඩාදමා තිබුණු **ස්වාමීන්වහන්සේගේ**
31 පූජාසනය හරිගස්සා: තුඹේ නාමය
ඉශ්‍රායෙල් වන්නේය යන **ස්වාමීන්-
වහන්සේගේ** වචනය ලැබූ යාකොබ්ගේ
පුත්‍රයන්ගේ ගෝත්‍රවල ගණන ලෙස ගල්
දොළොසක් රැගෙන, **ස්වාමීන්වහන්සේගේ** 32
නාමයෙන් පූජාසනයක් ගොඩනගා, ඒ
පූජාසනය වටේට බිජුවට නැළි දෙකක්
අල්ලන තරම්වූ අගළක් කපා, දර 33
පිළිවෙළින් තබා, ගොනා කැබෙලිකොට
කපා දර පිට තැබුවේය. තවද: වතුර
සැළි සතරක් පුරවා දවන යාගය පිටත්
දර පිටත් වත්කරපල්ලායයි ඔහු කීවේය.
දෙවෙනි වරත් එසේම කරපල්ලායයි 34
කීවේය; ඔව්හු දෙවෙනි වරත් එසේ
කළෝය. තුන්වෙනි වරත් එසේම
කරපල්ලායයි ඔහු කීවේය; ඔව්හු
තුන්වෙනි වරත් එසේ කළෝය. වතුර 35
පූජාසනය වටේට ගලාගියේය; අගළද
ඔහු වතුරෙන් පිරෙවුවේය. තවද සවස 36
යාගය ඔප්පු කරන වේලාවේ එලියා
අනාගතවක්තෘ තෙමේ ළංවී කථාකොට:
ආබ්‍රහම්ගේද ඊසාක්ගේද ඉශ්‍රායෙල්ගේද
දෙවිවූ **ස්වාමීන්වහන්ස**, ඔබ ඉශ්‍රායෙල්හි
දෙවියන්වහන්සේ බවද මා ඔබගේ
සේවකයා බවද මා මේ දේ කළේ ඔබගේ
වචනය ලෙස බවද අද දනගන්ට
ලැබේවා. **ස්වාමීන්වහන්ස**, මට උත්තර- 37
දුනමැනව, **ස්වාමීවූ** ඔබ දෙවියන්වහන්සේ
බවත් මේ සෙනඟගේ සිත් නැවත
හරවාගත්තේ ඔබම බවත් මොවුන්
දනගන්නා පිණිස මට උත්තරදුනමැනවයි
කීවේය. එවිට **ස්වාමීන්වහන්සේ** වෙතින් 38
ගිනි බැස පූජාවත් දරත් ගලුත් ධූලිත්
දවා අගළේ වතුරත් වියළවා දැම්මේය.
මුළු සෙනඟ ඒ දැක මුහුණින් වැටී: 39
**ස්වාමීන්වහන්සේම** දෙවියන්වහන්සේය,
**ස්වාමීන්වහන්සේම** දෙවියන්වහන්සේ-
යයි කීවෝය. එලියා ඔවුන්ට කථාකොට: 40
බාල්ගේ ප්‍රොපේතවරුන්ගෙන් එක්කෙ-
නෙකුටවත් ගැළවී යන්ට නොදී ඔවුන්
අල්වාගනිල්ලායයි කීවේය. ඔව්හු
ඔවුන් අල්වාගත්තෝය. එලියා ඔවුන්
කීෂොන් ඔය ළඟට ගෙනගොස් එහිදී
ඔවුන් මැරුවේය. එලියා ආහබ්ට 41
කථාකොට: හැරී ගොස් කාපන්න,
බීපන්න; මක්නිසාද මහත් වර්ෂා
ශබ්දයක් තිබේයයි කීවේය. ආහබ් 42
කන බොන පිණිස හැරී ගියේය.
එලියා කර්මෙල් කන්ද මුදුනට නැඟී
බිම වැටී දණ දෙකට අතරේ මුහුණ
තබාගන: තුඹ ගොස් මුහුද දෙස 43
බලාපන්නැයි තමාගේ වැඩකාරයාට

කීවේය. ඔහු ගොස් බලා ඇවිත්: කිසිවක්
නැතැයි කීවේය. නැවත සත්වරක්
44 පලයන්නැයි ඔහු කීවේය. සත්වෙනි වර
ඔහු කථාකොට: මනුෂ්‍යයෙකුගේ අතක්
මෙන් කුඩා වලාකුළක් මුහුදෙන් නැගී
එන්නේයයි කීවේය. ඔහුද: වැස්ස ඔබ
නොවලක්වන පිණිස ඔබගේ රථය
සූදානම්කරගෙන ගිය මැනවැයි කියා නුඹ
ගොස් ආහබ්ට කියාපන්නැයි කීවේය.
45 ඉක්බිති මද වේලාවකින් අහස
වලාකුල්වලින්ද සුළඟින්ද අඳුරුවුණේය,
මහත් වැස්සක්ද විය. ආහබ් රථයට
46 නැගී යෙස්‍රෙයෙල්ට ගියේය. ස්වාමීන්-
වහන්සේගේ හස්තය එලියා කෙරෙහි
පැමිණි නිසා, ඔහු තමාගේ කටිය
බැඳගෙන ආහබ්ට පෙරටුව යෙස්‍රෙයෙල්ට
ඇතුල්වෙන තැන දක්වා දිවුවේය.

## එලියා හොරෙබ්හි විසීම

19 එලියා කළ සියල්ලත් ඔහු
සියලු ප්‍රොපේතවරුන් කඩුවෙන්
මරාදැමූ බවත් ආහබ් යෙසෙබෙල්ට
2 දන්නුවේය. එවිට යෙසෙබෙල්: මා විසින්
හෙට මේ වේලාවට පමණ නුඹේ ප්‍රාණය
ඔවුන්ගෙන් එක්කෙනෙකුගේ ප්‍රාණය මෙන්
වෙන්ට සැලැස්සුවේ නැත්නම් දෙවිවරු
මට එසේමත් ඊට වැඩියෙනුත් කෙරෙත්වයි
පණිවිඩකාරයෙකු අත එලියාට කියා
3 ඇරියාය. ඔහු ඒ අසා නැගිට තමාගේ
ප්‍රාණය ගළවා ගැනීමට යනුයේ යූදට
අයිති බෙයෙර්-ෂෙබාට පැමිණ තමාගේ
4 වැඩකාරයා එහි නවතින්ට හැර, තමාම
දවසක ගමන් කාන්තාරයට ගොස්
රෝතෙම් ගසක් යට හිඳගන, තමා
මැරෙන ලෙස ඉල්ලමින්: ස්වාමීන්වහන්ස,
ඉතින් ඇත; දැන් ස්වාමීන්වහන්ස, මාගේ
ප්‍රාණය ගත මැනව; මක්නිසාද මාගේ
පියවරුන්ට වඩා මම උතුම් නොවෙමියි
5 කීවේය. ඔහු රෝතෙම් ගසක් යට වැතිර
නිදාගත්තේය; එවිට දේවදූතයෙක් ඔහුට
අතගසා: නැගිට කාපන්නැයි ඔහුට
6 කීවේය. ඔහු බැලූ විට ඔහුගේ හිස ළඟ
අඟුරු පිට පිළිස්සූ රොටියක්ද වතුර
භාජනයක්ද තිබෙනු දැක, කා බී නැවත
7 වැතුරුණේය. තවද ස්වාමීන්වහන්සේගේ
දූතයා දෙවෙනි වර ඇවිත් ඔහුට
අතගසා: ගමන නුඹට දුර වැඩි නිසා
නැගිට කාපන්නැයි කීවේය. ඔහු නැගිට 8
කා බී, ඒ කෑමේ සවියෙන් දවල්
සතළිසක්ද රෑ සතළිසක්ද ගොස්, දෙවියන්-
වහන්සේගේ කන්දවූ හොරෙබ් ළඟට
පැමිණ, එහි ගුහාවකට ඇතුල්ව නවාතැන් 9
ගත්තේය; ස්වාමීන්වහන්සේගේ වචනයද
ඔහු වෙතට පැමිණියේය, උන්වහන්සේ
ඔහුට කථාකොට: එලියා, නුඹ මෙහි
මක්කරනවාදැයි ඔහුගෙන් ඇසූසේක.
ඔහුද: මම සේනාවල දෙවිවූ ස්වාමීන්- 10
වහන්සේ උදෙසා බොහෝ ජ්වලිතව
සිටියෙමි; කුමක් හෙයින්ද ඉශ්‍රායෙල්
පුත්‍රයෝ ඔබගේ ගිවිසුම අත්හැර, ඔබගේ
පූජාසන කඩාදමා, ඔබගේ ප්‍රොපේත-
වරුන්ද කඩුවෙන් මැරුවෝය. ඉතුරුව
සිටින්නේ මම පමණක්ය; ඔව්හු මාගේ
ප්‍රාණයත් නැතිකරන්ට සොයතියි
කීවේය. උන්වහන්සේද: පිටතට ඇවිත්, 11
කන්ද උඩ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
සිටින්නැයි කීසේක. එවිට ස්වාමීන්-
වහන්සේ ඒ ළඟින් ගියසේක, ස්වාමීන්-
වහන්සේට පෙරටුවෙන් මහත්වූ බලවත්වූ
හුළඟක් කඳු දෙදරවා පර්වත බිඳගෙන
ගියේය; එහෙත් ස්වාමීන්වහන්සේ
හුළඟෙහි නොවූසේක. හුළඟට පසු
පොළෝකම්පාවක් විය; එහෙත්
ස්වාමීන්වහන්සේ පොළෝකම්පාවෙහි
නොවූසේක. පොළෝකම්පාවට පසු 12
ගින්නක් විය; එහෙත් ස්වාමීන්වහන්සේ
ගින්නෙහි නොවූසේක. ගින්නට පසු සියුම්
නිශ්චලතාවේ හඬක් විය. එලියා ඒ 13
අසා තමාගේ මුහුණ සළුවෙන් වසාගෙන
පිටත්ව ගොස් ගුහාවේ දොරකඩ සිටියේය.
එවිට හඬක් ඔහු වෙතට පැමිණ: එලියා,
නුඹ මෙහි මක්කරනවාදැයි ඇසුවේය.
ඔහුද: මම සේනාවල දෙවිවූ ස්වාමීන්- 14
වහන්සේ උදෙසා බොහෝ ජ්වලිතව
සිටියෙමි; කුමක් හෙයින්ද ඉශ්‍රායෙල්
පුත්‍රයෝ ඔබගේ ගිවිසුම අත්හැර, ඔබගේ
පූජාසන කඩාදමා, ඔබගේ ප්‍රොපේත-
වරුන් කඩුවෙන් මැරුවෝය; ඉතුරුව
සිටින්නේ මම පමණක්ය; මාගේ ප්‍රාණයත්
නැතිකරන්ට ඔව්හු සොයතියි කීවේය.
ස්වාමීන්වහන්සේ ඔහුට කථාකොට: 15
පලයන්න, නුඹ දමස්කයේ කාන්තාර
මාර්ගයෙන් හැරීඑන විට හසායෙල්
සිරිය රට කෙරෙහි රජකමට ආලේප-
කරපන්න. නිම්ෂිගේ පුත්‍රවූ යේහු ඉශ්‍රායෙල් 16

කෙරෙහි රජකමට ආලේපකරපන්න.
ආබෙල්-මෙහොලාහි ෂාපාත්ගේ පුත්‍රවූ
එලිෂා නුඹ වෙනුවට අනාගතවක්තෘකමට
17 ආලේපකරපන්න. හසායෙල්ගේ කඩුවෙන්
ගැළවෙන අය යේහු මරන්නේය. යේහුගේ
කඩුවෙන් ගැළවෙන අය එලිෂා මරන්නේය.
18 එසේ වුවත් බාල්ට නොනැමූ දණද ඔහු
නොසිම්බාවූ මුඛද ඇති සියල්ලන් වන
සත්දහස් දෙනෙක් ඉශ්‍රායෙල්වරුන්
අතරෙහි ඉතුරුකරගන්නෙමියි ඔහුට
කීසේක.

## එලිෂා කැඳවනු ලැබීම

19 මෙසේ ඔහු එතැනින් ගියවිට ෂාපාත්ගේ
පුත්‍රවූ එලිෂා ඔහුට සම්බවුණේය, එලිෂා
ගවයන් දොළොස් බානක් පස්සේ හාමින්
දොළොස්වෙනි බාන සමග සිටිනවා ඔහු
දුටුවේය. එලියා ඔහු ළඟට ගොස්
20 තමාගේ සළුව ඔහු පිට හෙළීය. එවිට
ඔහු ගවයන් අත්හැර එලියා පස්සේ
දුවගොස්: මාගේ පියාණන් හා මෑණියන්
සිඹ එන්ට මට අවසර ලැබේවා, ඉන්පසු
ඔබ අනුව එන්නෙමියි කීවේය. ඔහුද:
*හැරී පලයන්න; මම නුඹට කුමක්
21 කෙළෙම්දැයි ඔහුට කීවේය. එවිට ඔහු
වෙතින් ඔහු හැරී ගොස් ගවයන් බාන
රැගෙන මරා, ගවයන්ගේ වියදඬුවලින්
උන්ගේ මස් තම්බා, මිනිසුන්ට දුන්නේය,
ඔව්හුද කෑවෝය. පසුව ඔහු නැගිට
එලියා අනුව ගොස් ඔහුට සේවයකෙළේය.

## සිරියවරුන් ආහබ්ට විරුද්ධව ඇවිත් සමාරිය වටලාගත් අතර පරාජයවීම

20 තවද සිරියේ රජවූ බෙන්-හදද්
තමාගේ මුළු සේනාව රැස්කර-
ගෙන තවත් රජවරුන් තිස්දෙදෙනෙක්ද
අශ්වයන්ද රථද ඇතුව ඇවිත් සමාරිය
වටලාගෙන ඊට විරුද්ධව යුද්ධකෙළේය.
2 ඔහු නුවරට, ඉශ්‍රායෙල් රජවූ ආහබ්
වෙතට, පණිවිඩකාරයන් යවමින්:

*හෙවත්, හැරීගොස් මම නුඹට කුමක්
කෙළෙම්ද කියා කල්පනාකර
බලාපන්නැයි ඔහුට කීවේය.

නුඹේ රන් රිදී මාගේය; නුඹේ 3
භාර්යාවරුන්ගෙන්ද දරුවන්ගෙන්ද ඉතා
ශෝභන අයත් මාගේය කියා බෙන්-
හදද් කියන්නේයයි ඔහුට කියා ඇරියේය.
ඉශ්‍රායෙල් රජද: මාගේ ස්වාමිවූ 4
රජ්ජුරුවෙනි, ඔබගේ කීම ප්‍රකාරයට
මමත් මට ඇති සියල්ලත් ඔබගේයයි
උත්තරදුන්නේය. පණිවිඩකාරයෝ නැවත 5
ඇවිත් කථාකොට: බෙන්-හදද් මෙසේ
කියන්නේය—නුඹේ රන් රිදීද නුඹේ අඹු
දරුවන්ද නුඹ මට දෙන්ට ඕනෑයයි
නුඹට කියා එවමි; ඇරත් හෙට මේ 6
වේලාවට පමණ මාගේ සේවකයන්
නුඹ ළඟට එවන්නෙමි, ඔවුන් නුඹේ
ගේත් නුඹේ සේවකයන්ගේ ගෙවලුත්
සෝදිසිකර, නුඹට ප්‍රසන්නවූ සියල්ලම
ඔවුන්ගේ අතට ගෙන එනවා ඇත කියා
බෙන්-හදද් කියන්නේයයි කීවෝය. එවිට 7
ඉශ්‍රායෙල් රජ දේශයේ සියලු වැඩිමහල්ලන්
කැඳවා: මේ මනුෂ්‍යයා නපුරක් සොයන
හැටි කල්පනාකර බලාපල්ලා. ඔහු මාගේ
භාර්යාවන්ද මාගේ දරුවන්ද මාගේ
රන් රිදීද මාගෙන් ඉල්ලා එවූ විට,
දෙන්ට බැරිය කියා මම නොකීවෙමියි
කීවේය. සියලු වැඩිමහල්ලෝද මුළු 8
සෙනඟද කථාකොට: ඔබ ඇහුම්කන්
නුදුන මැනවි, ඊට එකඟනූන මැනවියි
ඔහුට කීවේය. එබැවින් ඔහු බෙන්- 9
හදද්ගේ පණිවිඩකාරයන්ට කථාකොට:
ඔබ පළමුවෙන් ඔබගේ මෙහෙකරුවාට
කියාඑවූ සියල්ලම කරන්නෙමි. නුමුත්
මේ දේ මට කරන්ට බැරිය කියා මාගේ
ස්වාමිවූ රජ්ජුරුවන්ට කියාපල්ලායයි
කීවේය. පණිවිඩකාරයෝ පිටත්ව ගොස්
ඔහුට උත්තරය කීවෝය. බෙන්-හදද්ද: 10
සමාරියේ ධූලි මා අනුව එන සියල්ලන්ගෙන්
එක එකාට මිට මිට බැගින් ගන්ටවත්
මදිවෙන තරම් මහත්වූ සෙනඟක්
නාවොත් දෙවිවරු මටත් එසේමද ඊටත්
වැඩියෙන්ද කෙරෙත්වයි ඔහුට කියා
ඇරියේය. ඉශ්‍රායෙල් රජ උත්තරදෙමින්: 11
යුද්ධායුධ ගළවා දමන්නා මෙන් ඒවා
පැළඳගන්නා ගරුකම් නොකියාවයි ඔහුට
කියාපල්ලායයි කීවේය. රජුන් සමග 12
කූඩාරම්වල බොමින් සිටියාවූ බෙන්-
හදද් තෙමේ ඒ කීම ඇසූ විට: යුද්ධයට

සැරසියල්ලායයි තමාගේ සේවකයන්ට
කීවේය. ඔව්හුද නුවරට විරුද්ධව සැරසී
13 සිටගත්තෝය. ප්‍රොපේත කෙනෙක්
ඉශ්‍රායෙල්හි රජවූ ආහබ් ළඟට ඇවිත්
කථාකොට: මේ මුළු මහත් සමූහයා
නුඹ දුටුවාද? මා **ස්වාමීන්වහන්සේ**
බව නුඹ දැනගන්නා පිණිස මම අද
ඔවුන් නුඹ අතට පාවාදෙමියි කියා
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි කීවේය.
14 ආහබ්: කා ලවාදැයි ඇසුවේය. ඔහුද:
ජනපදවල අධිපතීන්ගේ සේවකයන්
ලවායයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේකැයි කීවේය. එවිට ආහබ්: සටන
පටන්ගන්නේ කවුදැයි ඇසුවේය. ඔහුද:
15 ඔලයයි උත්තරදුන්නේය. එවිට ආහබ්
ජනපදවල අධිපතීන්ගේ සේවකයන්
රැස්කෙළේය, ඔව්හු දෙසිය තිස් දෙදෙනෙක්
වූහ. ඔවුන්ට පසුව ඔහු මුළු සෙනඟ
වන සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන්ද රැස්කෙළේය,
16 ඔව්හු සත් දහසක් වූහ. ඉරමුදුන් වේලේ
ඔව්හු පිටතට ගියෝය. එහෙත් බෙන්-
හදද් වනාහි තමාට උපකාරකරන
රජවරුන් තිස් දෙනාත් සමග මත්වෙන
තරම් කූඩාරම්වල බීබී හුන්නේය.
17 ජනපදවල අධිපතීන්ගේ සේවකයෝ
පළමුකොට පිටතට ගියෝය; බෙන්-
හදද් විභාගකෙරෙවූ විට: සමහර
මිනිස්සු සමාරියෙන් පිටතට ආවෝය
18 කියා ඔහුට දන්වනලද්දේය. ඔහුද: ඔවුන්
සමාදානය පිණිස ආ නුමුත් පණපිටින්
අල්වාගනිල්ලා, යුද්ධය පිණිස ආ නුමුත්
පණපිටින් අල්වාගනිල්ලායයි කීවේය.
19 මෙසේ ජනපදවල අධිපතීන්ගේ
සේවකයෝද ඔවුන් අනුව ගිය සේනාවද
20 නුවරින් පිටතට ගොස්, එකිනෙකා එක
මනුෂ්‍යයෙකු බැගින් මැරුවේය; එවිට
සිරියවරු පලාගියෝය, ඉශ්‍රායෙල්වරු
ඔවුන් පස්සේ එළවාගන ගියෝය. සිරියේ
රජවූ බෙන්-හදද් අශ්වයෙකු පිට නැගී
21 අසරුවන් සමග ගැළවී ගියේය. ඉශ්‍රායෙල්
රජ පිටතට ගොස් අශ්වයන්ටද රථවලටද
පහරදී, සිරියවරුන් අතරෙහි මහත්
22 විනාශයක් කෙළේය. ප්‍රොපේත තෙමේ
ඉශ්‍රායෙල් රජු ළඟට ඇවිත්: එන
අවුරුද්දේ සිරියේ රජ ඔබට විරුද්ධව
එනවා ඇත, ඉන්නිසා ඔබ ශක්තිමත්වී
කුමක් කටයුතුද කියා කල්පනාකර
බැලුව මැනවැයි කීවේය.
තවද සිරියේ රජුගේ සේවකයෝ ඔහුට 23
කථාකොට: ඔවුන්ගේ දෙවියෝ කඳු-
වල දෙවිකෙනෙක්ය; එබැවින් ඔව්හු අපට
වඩා බලවත්වූවෝය. නමුත් සමභූමියෙහි
ඔවුන්ට විරුද්ධව සටන්කරමු, එවිට
අපි සැබවින් ඔවුන්ට වඩා බලවත්
වන්නෙමුව. මෙසේ කරන්ට ඕනෑය; 24
රජවරුන් තම තමුන්ගේ ස්ථානවලින්
අහක්කර, ඔවුන් වෙනුවට සේනාපතියන්
සිටවා, නැතිවුණු ඔබගේ සේනාව මෙන් 25
සේනාවක්ද අශ්වයන් මෙන් අශ්වයන්ද
රථ මෙන් රථද ගණන්කරගතමැනවි.
එවිට අපි සමභූමියෙහි ඔවුන්ට විරුද්ධව
සටන්කරන්නෙමුව, එවිට අපි සැබවින්
ඔවුන්ට වඩා බලවත් වන්නෙමුයයි
ඔහුට කීවෝය. ඔහු ඔවුන්ගේ හඬට
ඇහුම්කන්දී එසේ කෙළේය. ඊට පසු 26
අවුරුද්දේ බෙන්-හදද් සිරියවරුන්
රැස්කොට ඉශ්‍රායෙල්ට විරුද්ධව සටනට
අපෙක්ට ගියේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ 27
රැස්කරනු ලැබුවෝය, ඔව්හු ආහාර ලැබ
ඔවුන්ට විරුද්ධව ගියෝය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝ කුඩා එළු රැළවල් දෙකකට
සමානව ඔවුන් ඉදිරියේ කඳවුරු බැඳ
සිටියෝය; නුමුත් සිරියවරුන්ගෙන් දේශය
පිරී තිබුණේය. දෙවියන්වහන්සේගේ 28
මනුෂ්‍යයෙක් ළංවී ඉශ්‍රායෙල් රජුට
කථාකොට: **ස්වාමීන්වහන්සේ** කඳුවල
දෙවිකෙනෙක්වා මිස මිටියාවත්වල
දෙවිකෙනෙක් නොවේයයි සිරියවරුන්
කී නිසා, මා **ස්වාමීන්වහන්සේ** බව
නුඹලා දැනගන්න පිණිස මේ මුළු මහත්
සමූහයා නුඹ අතට පාවාදෙන්නෙමියි
කියා **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කීවේය. තවද එක සෙනඟක් අනික් 29
සෙනඟට ඉස්සරහපිටින් සත් දවසක්
කඳවුරු බැඳගන සිටියේය. සත් වෙනිද
යුද්ධය කෙරුණේය; ඉශ්‍රායෙල් පුත්‍රයෝ

සිරියවරුන්ගෙන් පාබළ මනුෂ්‍යයන්
30 ලක්ෂයක් එක දවසකදී මැරුවෝය. ඉතිරි
අය අපෙක් නම් නුවර ඇතුළට පලා
ගියෝය; එහිදී ඉතිරිව සිටිය විසි හත්
දහසක් මනුෂ්‍යයන් පිට පවුරු වැටුණේය.
බෙන්-හදද් පලා ගොස් නුවරට
31 පැමිණ ඇතුල් ගෙයකට ගියේය. එවිට
ඔහුගේ සේවකයෝ ඔහුට කථාකොට:
ඉශ්‍රායෙල් වංශයේ රජවරුන් කරුණාවන්ත
රජවරුන් බව අප විසින් අසා තිබේ.
ඉතින් අපේ කටිවල ගෝණි රෙදි
බැඳගෙන, හිස් පිට ලනු දමාගන,
ඉශ්‍රායෙල් රජු ළඟට අපට යන්ට
දෙනු මැනවි. සමහරවිට ඔහු ඔබගේ
ප්‍රාණය ආරක්ෂාකරනවා ඇතැයි
32 කීවෝය. එසේ ඔව්හු තමුන්ගේ කටිවල
ගෝණි රෙදි බැඳගෙන, හිස් පිට ලනු
දමාගෙන, ඉශ්‍රායෙල් රජු ළඟට ඇවිත්:
ඔබගේ මෙහෙකරුවූ බෙන්-හදද්—මාගේ
ප්‍රාණය ආරක්ෂාකළ මැනවියි කියන්නේ-
යයි කීවෝය. ආහබ් කථාකොට: ඔහු
තවම ජීවත්ව සිටීද? ඔහු මාගේ
33 සහෝදරයායයි කීවේය. ඒ මනුෂ්‍යයෝ
රජු කී වචනය හොඳ ලකුණක් කොට
සලකා, ඒ වචනය වහාම අල්වාගෙන:
ඔබගේ සහෝදරවූ බෙන්-හදද්යයි
කීවෝය. ඔහුද: නුඹලා ගොස් ඔහු
කැඳවාගන වරෙල්ලායයි කීවේය. එකල
බෙන්-හදද් ඔහු වෙතට ආයේය. රජ
34 ඔහු රථයට නංවාගත්තේය. බෙන්-
හදද්ද: මාගේ පියාණන් විසින් ඔබගේ
පියාණන්ගෙන් ගත් නුවරවල් දෙවනු
දෙන්නෙමි; මාගේ පියාණන් සමාරියෙහි
වීථි සෑදුවාක් මෙන් ඔබට දමස්කයෙහි
සාදගන්ට පුළුවනැයි කීවේය. ආහබ්ද:
මමත් මේ ගිවිසුම පිට ඔබට යන්ට
හරිමියි කියා, ඔහු සමග ගිවිසුමක් කර
ඔහු යන්ට හැරියේය.

## ආහබ් විසින් සිරියේ රජවූ බෙන්-හදද් මුදහැරීමේ දෝෂය

35 ප්‍රොපේතවරුන්ගේ පුත්‍රයන්ගෙන් එක්තරා
මනුෂ්‍යයෙක් තමාගේ සහකාරයාට
**ස්වාමීන්වහන්සේගේ** වචනයෙන් කථා-
කොට: මට ගසාපන්නැයි කීය. නමුත් ඒ
මනුෂ්‍යයා ඔහුට ගසන්ට අකැමැතිවුණේය.
එවිට ඔහු: නුඹ **ස්වාමීන්වහන්සේගේ** 36
හඬට කීකරුනුණ නිසා නුඹ මා ළඟින්
අහක්ව ගිය කෙණෙහිම සිංහයෙක් නුඹ
මරන්නේයයි කීවේය. ඔහු ළඟින් ඔහු
අහක්ව ගිය කෙණෙහිම සිංහයෙක්
ඔහුට සම්මුඛවී ඔහු මැරුවේය. තවත් 37
මනුෂ්‍යයෙකුට ඔහු සම්මුඛවී: මට
ගසාපන්නැයි කීවේය. ඒ මනුෂ්‍යයා ඔහුට
ගසා, එසේ ගැසීමෙන් තුවාලකෙළේය.
එවිට ප්‍රොපේත තෙම පිටත්ව තමාගේ 38
හිස්කඩ ඇස් වසා බැඳ, වෙස්මාරු-
කරගන, රජ එන තෙක් මග බලා
සිටියේය. රජු ඒ ළඟින් යන කල ඔහු 39
රජුට මොරගසා: ඔබගේ මෙහෙකරුවූ
මම සටන් මධ්‍යයට ගියෙමි; එවිට එක්
මනුෂ්‍යයෙක් තවත් මනුෂ්‍යයෙකු මා
ළඟට ගෙනැවිත් කථාකොට—මේ
මනුෂ්‍යයා බලාගනින්න. ඔහු යම්
අන්දමකින් ගැළවී ගියොත් ඔහුගේ
ප්‍රාණය වෙනුවට නුඹේ ප්‍රාණය දෙන්ට
වේ, නැතහොත් රිදී තලෙන්තයක් ගෙවන්ට
ඕනැයයි කීවේය. නුමුත් ඔබගේ 40
මෙහෙකරුවා එහෙ මෙහෙ කටයුතු කරන
අතර ඔහු සැඟවී ගියේයයි කීවේය.
ඉශ්‍රායෙල් රජ: නුඹේ තීන්දුව එසේම
වන්නේය; නුඹම ඒක තීන්දු කෙළෙහි-
යයි කීවේය. එවිට ඔහු වහාම හිස්කඩ 41
තමාගේ ඇස්වලින් ඉවත්කෙළේය; එවිට
ඔහු ප්‍රොපේතවරයෙක් බව ඉශ්‍රායෙල්
රජ හැඳිනගත්තේය. ඔහු රජුට 42
කථාකොට: **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක—මා විසින් විනාශයට
කැපකළ මනුෂ්‍යයා නුඹ නිදහස් කර
හැරිය බැවින් ඔහුගේ ප්‍රාණය වෙනුවට
නුඹේ ප්‍රාණයද ඔහුගේ සෙනඟ වෙනුවට
නුඹේ සෙනඟද දෙන්ට වේය කියා
වදරනසේකැයි කීවේය. ඉශ්‍රායෙල් රජ 43
ශෝකව අසන්තෝෂව තමාගේ ගෙදරට
ගොස් සමාරියට ආයේය.

## නාබොත්ගේ මිදිවත්ත

21 ඉන්පසු මෙසේ සිද්ධවිය. සමාරියේ
රජවූ ආහබ්ගේ මාලිගාවට සමීපව
යෙස්‍රෙයෙලිය නාබොත්ට යෙස්‍රෙයෙල්හි

2 මිදිවත්තක් තිබුණේය. ආහබ් නාබොත්ට
කථාකොට: නුඹේ මිදිවත්ත මාගේ ගෙට
සමීපව තිබෙන නිසා ඒක මට එළවළු
වත්තක් පිණිස දියන්න; ඒ වෙනුවට ඊට
වඩා හොඳ මිදිවත්තක් නුඹට දෙන්නෙමි.
නොහොත් නුඹ කැමති නම් එය වටිනා
3 මිල නුඹට දෙන්නෙමියි කීවේය. මාගේ
පියවරුන්ගේ උරුමය ඔබට දීමෙන්
**ස්වාමීන්වහන්සේ** මා වලක්වනසේක්වයි
4 නාබොත් ආහබ්ට කීවේය. එසේ යෙස්‍රෙ-
යෙලිය නාබොත්: මාගේ පියවරුන්ගේ
උරුමය ඔබට නොදෙමියි කී වචනය
නිසා ආහබ් ශෝකව අසන්තෝෂව
තමාගේ ගෙට ගොස්; ඇඳේ වැතිර, මුහුණ
අහකට හරවාගෙන, කෑම නොකා
5 සිටියේය. එවිට ඔහුගේ භාර්යාවවූ
යෙසෙබෙල් ඔහු ළඟට ඇවිත්: නුඹේ
සිත අප්‍රසන්නව තිබෙන්නෙත් නුඹ
කෑම නොකා සිටින්නෙත් මක්නිසාදැයි
6 ඔහුගෙන් ඇසුවාය. ඔහුද: මම
යෙස්‍රෙයෙලිය නාබොත්ට කථාකොට—
නුඹේ මිදිවත්ත මට මිලේට දියන්න;
නැතහොත් නුඹ කැමති නම් මම ඒක
වෙනුවට නුඹට මිදිවත්තක් දෙන්නෙමියි
ඔහුට කීවෙමි. නුමුත් ඔහු මට
උත්තරදෙමින්—මාගේ මිදිවත්ත ඔබට
නොදෙන්නෙමියි කීවේයයි ඈට කීය.
7 ඔහුගේ භාර්යාවවූ යෙසෙබෙල්: දැන්
ඉශ්‍රායෙල් රාජ්‍යය පාලනයකරන්නේ
නුඹ නොවේද? නැගිට කෑම කා නුඹේ
සිත ප්‍රීතිකරගනින්න. මම යෙස්‍රෙයෙලිය
නාබොත්ගේ මිදිවත්ත නුඹට දෙන්නෙමියි
8 ඔහුට කීවාය. ඈ ආහබ්ගේ නමින්
ලියුම් ලියා ඔහුගේ මුද්‍රයෙන් මුද්‍රාකොට
නාබොත් සමග ඔහුගේ නුවර විසූ
වැඩිමහල්ලන්ටත් උත්තමයන්ටත් ඒ ලියුම්
9 යැවුවාය. ඈ ලියුම්වල ලියූ වගන්තිය
නම්: නුඹලා උපවාසයක් ප්‍රකාශකොට,
නාබොත් සෙනඟ අතරේ උස් තැනක
සිටුවා, ඔහු ඉදිරියෙහි *දුර්ජන මනුෂ්‍යයන්
10 දෙදෙනෙකු සිටුවාපල්ලා. ඔව්හු—නුඹ
දෙවියන්වහන්සේටත් රජුටත් ශාප
කෙළෙහියයි ඔහුට විරුද්ධව සාක්ෂි
දෙත්වා. පසුව ඔහු පිටතට ගෙනගොස්

*හෙවත්, බෙලියල්ගේ පුත්‍රයන්.

ගල්ගසා මරාපල්ලාය යනුය. ඔහුගේ 11
නුවර මනුෂ්‍යයෝ වන ඒ නුවර විසූ
වැඩිමහල්ලෝද උත්තමයෝද යෙසෙබෙල්
තමුන්ට යැවූ ලියුම්වල ලියා තිබුණු
ප්‍රකාරයට කළෝය. ඔව්හු නිරාහාරව 12
සිටීමක් ප්‍රකාශකොට නාබොත් සෙනඟ
ඉදිරිපිට උසක සිටෙවුවෝය. *දුර්ජන 13
මනුෂ්‍යයන් දෙදෙනෙක් ඇවිත් ඔහු
ඉදිරියෙහි හිඳ: නාබොත් දෙවියන්-
වහන්සේටත් රජුටත් ශාපකෙළේයයි
සෙනඟ ඉදිරියේ නාබොත්ට විරුද්ධව
සාක්ෂි දරුවෝය. එවිට ඔව්හු ඔහු
නුවරින් පිටතට ගෙනගොස් ගල්ගසා
මරා: නාබොත් ගල්ගසනු ලැබ මෙළේ- 14
යයි යෙසෙබෙල්ට කියා යැවුවෝය. තවද 15
නාබොත් ගල්ගසනු ලැබ මළ බව
යෙසෙබෙල් ඇසූ විට ඈ ආහබ්ට
කථාකොට: යෙස්‍රෙයෙලිය නාබොත්
නුඹට දෙන්ට අකැමැතිවුණ ඔහුගේ
මිදිවත්ත නුඹ ගොස් හිමිකරගන්න.
මක්නිසාද නාබොත් ජීවත්ව නැත, ඔහු
මැරිලායයි කීවාය. නාබොත් මළ බව 16
ආහබ් ඇසූ විට ඔහු යෙස්‍රෙයෙලිය
නාබොත්ගේ මිදිවත්ත අයිතිකරගන්න
පිණිස එහි යන්ට පිටත්වුණේය.

## ආහබ් දඬුවමට නියමකරනු ලැබීම. ඔහුගේ පශ්චාත්තාපය

තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය 17
තිෂ්බිය එලියා වෙතට පැමිණ: නුඹ 18
පිටත්ව සමාරියේ වසන ඉශ්‍රායෙල් රජවූ
ආහබ් රජ සම්මුඛවෙන්ට පලයන්න.
ඔහු නාබොත්ගේ මිදිවත්ත අයිතිකරගන්ට
එහි ගොස් සිටියි. නුඹ ඔහුට කථාකොට— 19
නුඹ මිනීමරා අයිතිකරගත්තෙහිදැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි කියා-
පන්න. තවද—බල්ලෝ යම් තැනකදී
නාබොත්ගේ ලේ ලෙවකෑවෝද එතැන්හිදී
බල්ලෝ නුඹේ ලේ, එසේය නුඹේ
ලේත් ලෙවකන්නෝයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි ඔහුට කියාපන්නැයි කී-
සේක. ආහබ්ද: අහෝ මාගේ සතුර, 20
නුඹ මා සොයාගත්තෙහිදැයි එලියාට

*හෙවත්, බෙලියල්ගේ පුත්‍රයන්.

කීය. ඔහුද: නුඹ සොයාගත්තෙමි.
මක්නිසාද නුඹ **ස්වාමීන්වහන්සේගේ**
ඇස් හමුයෙහි නපුරුව තිබෙන දේ
21 කරන්ට නුඹම භාරවී සිටිනෙහිය. බලව,
මම නුඹ පිටට විපත පමුණුවා නුඹ
සහමුලින්ම අහකට පිසදමා ආහබ්ගේ
සියලු පිරිමින් ඉශ්‍රායෙල්වරුන් අතරෙහි
දසයන් වුවත් නිර්දසයන් වුවත්
22 සිඳදමා, නුඹ මා කෝපකරවමින්
ඉශ්‍රායෙල්ට පව්කරන්ට සලස්වමින් කළ
ක්‍රියාව නිසා නුඹේ වංශය නෙබාත්ගේ
පුත්‍රවූ යෙරොබොවම්ගේ වංශය මෙන්ද
අහියාගේ පුත්‍රවූ බාෂාගේ වංශය මෙන්ද
කරන්නෙමියි කියනසේකැයි කීවේය.
23 **ස්වාමීන්වහන්සේ** යෙසෙබෙල් ගැනද
කථාකොට: බල්ලෝ යෙසෙබෙල්
යෙස්‍රෙයෙල්හි පවුර ළඟදී කන්නෝය.
24 ආහබ්ගේ වංශයෙන් නුවරදී මැරෙන
අය බල්ලෝ කන්නෝය; පිටතදී මැරෙන
අය පක්ෂීහු කන්නෝයයි කීවේය.
25 (සැබවින්ම තමාගේ භාර්යාවවූ
යෙසෙබෙල් විසින් පොළඹවනු ලැබ
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කරන්ට තමාම
භාරවුණාවූ ආහබ්ට සමාන කිසිවෙක්
26 නොසිටියේය. **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රා-
යෙල් පුත්‍රයන් ඉදිරිපිටින් පන්නාදැමූ
අමෝරිවරුන් කළ සියල්ල ලෙස ඔහු
දේව රූප පස්සේ ගොස් ඉතා පිළිකුල්
27 ලෙස ක්‍රියාකෙළේය.) ආහබ් ඒ වචන
ඇසූ විට තමාගේ ඇඳුම් ඉරාගෙන,
ඇඟේ මාංශයට ගෝණිරෙදි දමාගෙන
නිරාහාරව ගෝණිරෙදි පිටින් නිදගනිමින්,
28 අවනත භාවයෙන් හැසුරුණේය. එකල්හි
**ස්වාමීන්වහන්සේගේ** වචනය තිෂ්බිය
29 එලියා වෙතට පැමිණ: ආහබ් මා
ඉදිරියෙහි යටත්වුණ බව නුඹ දුටුවෙහිද?
ඔහු මා ඉදිරියෙහි යටත්වුණ බැවින් ඒ
විපත ඔහුගේ දවස්වලදී නොව ඔහුගේ
පුත්‍රයාගේ දවස්වලදී ඔහුගේ වංශය පිටට
පමුණුවන්නෙමියි කීසේක.

## ආහබ් සහ මීකායා

**22** සිරියවරුන්ද ඉශ්‍රායෙල්වරුන්ද
අතරේ තුන් අවුරුද්දක් යුද්ධ නැතුව
2 තිබුණේය. තුන්වෙනි අවුරුද්දේ යූදහි
රජවූ යෙහෝෂාපාට් ඉශ්‍රායෙල් රජු
ළඟට ආයේය. ඉශ්‍රායෙල් රජ තමාගේ 3
සේවකයන්ට කථාකොට: රාමොත්-
ගිලියද් අපට අයිති බව නුඹලා
දන්නහුද? දැනගනත් අප ඒක සිරියේ
රජු අතින් නොගෙන නිකම් සිටිනවා
නොවේදැයි කීවේය. ඔහු යෙහෝ- 4
ෂාපාට්ට කථාකොට: යුද්ධයට මා
සමග රාමොත්-ගිලියද්ට යන්නෙහිදැයි
ඇසුවේය. යෙහෝෂාපාට්ද: මමත් ඔබ
වාගේය, මාගේ සෙනඟත් ඔබගේ සෙනඟ
වාගේය, මාගේ අශ්වයොත් ඔබගේ
අශ්වයන් වාගේයයි ඉශ්‍රායෙල් රජුට
කීවේය. තවද යෙහෝෂාපාට්: **ස්වාමීන්-** 5
**වහන්සේගේ** වචනයෙන් අද විභාග-
කළමැනවැයි ඉශ්‍රායෙල් රජුට කීය.
එවිට ඉශ්‍රායෙල් රජ ප්‍රොපේතවරුන් වන 6
හාරසියයක් පමණ මනුෂ්‍යයන් රැස්කොට:
මම රාමොත්-ගිලියද්ට විරුද්ධව යුද්ධයට
යම්ද නොයම්දැයි ඔවුන්ගෙන් ඇසුවේය.
ඔව්හු: ගිය මැනවි; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ ඒක රජු අතට පාවාදෙන-
සේකැයි කීවෝය. නුමුත් යෙහෝෂාපාට්: 7
අප විසින් විචාරන පිණිස මෙහි තව
**ස්වාමීන්වහන්සේගේ** ප්‍රොපේත කෙනෙක්
නැද්දැයි ඇසුවේය. ඉශ්‍රායෙල් රජද: 8
**ස්වාමීන්වහන්සේගෙන්** විචාරන පිණිස
ඉම්ලාගේ පුත්‍රවූ මීකායා නම් තව
එක්කෙනෙක් සිටියි. එහෙත් ඔහු මා
ගැන අනාගත වචනයෙන් නරකක් මිස
යහපතක් නොකියන නිසා මම ඔහුට
වෛරවෙමියි යෙහෝෂාපාට්ට කීවේය.
යෙහෝෂාපාට්ද: රජ්ජුරුවෝ එසේ
නොකියත්වයි කීවේය. එකල ඉශ්‍රායෙල් 9
රජ ඇමතියෙකුට අඬගසා: ඉම්ලාගේ
පුත්‍රවූ මීකායා ඉක්මනින් ගෙන්වාපන්නැයි
කීවේය. ඉශ්‍රායෙල් රජද යූදහි රජවූ 10
යෙහෝෂාපාට්ද ස්වකීය වස්ත්‍ර පැළඳගෙන
සමාරිය දොරටුවේ එළිමහන් තැනක තම
තමුන්ගේ සිංහාසනවල වාඩිවී උන්නෝය;
සියලු ප්‍රොපේතවරු ඔවුන් ඉදිරිපිට
අනාගතවාක්‍ය කීවෝය. තවද කෙනා- 11
නාගේ පුත්‍රවූ ශෙදෙකියා යකඩ අං
සාදගෙන: ඔබ සිරියවරුන් නැතිකරන-
තුරු මේවායින් ඔවුන්ට අනිනවා ඇත
කියා **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කීවේය. ප්‍රොපේතවරුන් සියල්ලෝ 12

එලෙසම අනාගතවාක්‍ය කියමින්:
රාමොත්-ගිලියද්ට ගොස් ජයගත මැනවි.
මක්නිසාද ස්වාමීන්වහන්සේ එය රජු
අතට පාවාදෙනසේකැයි කීවෝය.
13 මීකායා කැඳවාගන එන්ට ගිය
පණිවිඩකාරයා ඔහුට කථාකොට:
බලව, ප්‍රොපේතවරුන්ගේ වචන එකලෙස
රජු ගැන යහපත පවසති. නුඹේ වචනයත්
ඔවුන්ගෙන් එක්කෙනෙකුගේ වචනය මෙන්
වෙන පිණිස යහපත කියන්නැයි කීවේය.
14 මීකායා: ස්වාමීන්වහන්සේ ජීවමාන බව
සැබෑවා සේම ස්වාමීන්වහන්සේ මට
කියන දෙයම කථාකරන්නෙමියි කීවේය.
15 ඔහු රජු ළඟට ආ කල රජු ඔහුට
කථාකොට: මීකායා, අපි රාමොත්-
ගිලියද්ට විරුද්ධව යුද්ධයට යමුද
නොයමුදැයි ඔහුගෙන් ඇසුවේය. ඔහුද:
ගොස් ජයගත මැනවි; ස්වාමීන්වහන්සේ
එය රජු අතට පාවාදෙනසේකැයි
16 උත්තරදුන්නේය. රජ: ස්වාමීන්වහන්සේගේ
නාමයෙන් සැබෑව මිස වෙන කිසිවක්
මට නොකියන හැටියට මම කීවරක්
17 නුඹ දිවුරවම්දැයි ඔහුට කීවේය. එවිට
ඔහු කථාකොට: සියලු ඉශ්‍රායෙල්වරුන්
එඬේරෙකු නැති බැටළුවන් මෙන් කඳුවල
විසිර ඉන්නවා දුටුවෙමි. තවද ස්වාමීන්-
වහන්සේ-මොවුන්ට ස්වාමියෙක් නැත,
එක එකා තම තමාගේ ගෙදරට
සමාදානයෙන් හැරී යේවයි කියා
18 කීසේකැයි කීවේය. ඉශ්‍රායෙල් රජ: ඔහු
මා ගැන අනාගතවාක්‍යයෙන් නරකක්
මිස යහපතක් කියන්නේ නැත කියා
මම ඔබට නොකීයෙම්දැයි යෙහෝෂාපාට්ට
19 කීවේය. මීකායා කථාකොට: එබැවින්
ඔබ ස්වාමීන්වහන්සේගේ වචනය ඇසුව
මැනවි. ස්වාමීන්වහන්සේ තමන්ගේ
සිංහාසනයේ හිඳිනවාත් මුළු ස්වර්ග
සේනාව උන්වහන්සේ ළඟ උන්වහන්සේගේ
දකුණු පැත්තේද වම්පැත්තේද සිටිනවාත්
20 දුටුවෙමි. ස්වාමීන්වහන්සේ කථාකොට-
ආහබ් රාමොත්-ගිලියද්ට ගොස් එහිදී
වැටෙන පිණිස එහි යන්ට ඔහු
පොළඹවන්නේ කවුදැයි ඇසූසේක.
එක්කෙනෙක් මේ ආකාරද එක්කෙනෙක්
21 ඒ ආකාරද කීවේය. එකල ආත්මයෙක්
නික්ම ඇවිත් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
සිට-මම ඔහු පොළඹවන්නෙමියි කීවේය.
ස්වාමීන්වහන්සේ-කුමකින්දැයි ඔහුගෙන් 22
ඇසූසේක. ඔහු-මම ගොස් ඔහුගේ සියලු
ප්‍රොපේතවරුන්ගේ මුඛවල බොරුකාර
ආත්මයක් වන්නෙමියි කීවේය.
උන්වහන්සේද-නුඹ ඔහු පොළඹවා
ජයගන්නවා ඇත. ගොස් එසේ කරපන්නැයි
කීසේක. එබැවින් ස්වාමීන්වහන්සේ 23
ඔබගේ මේ සියලු ප්‍රොපේතවරුන්ගේ
මුඛවල බොරුකාර ආත්මයක් තැබූ-
සේක; තවද ස්වාමීන්වහන්සේ ඔබ ගැන
නපුරක් කථාකළසේකැයි කීවේය. එවිට 24
කෙනානාගේ පුත්‍රවූ ශෙදෙකියා ළංවී
මීකායාගේ කන්මුලට ගසා: ස්වාමීන්-
වහන්සේගේ ආත්මය නුඹට කථාකරන්ට
මා කෙරෙන් ගියේ කොයි මාර්ගයෙන්දැයි
ඇසුවේය. එවිට මීකායා: නුඹ සැඟවෙන 25
පිණිස ඇතුල්ගෙයකට යන දවසෙහි
දැනගන්නෙහියයි කීවේය. ඉශ්‍රායෙල් 26
රජ: නුඹ මීකායා රැගෙන නුවර
අධිපතියාවූ ආමොන්ද රජුගේ පුත්‍රවූ
යෝවාෂ්ද ළඟට ගෙන ගොස්
කථාකොට: නුඹලා මූ හිරගෙයි ලා 27
මා සමාදානයෙන් එනතුරු මූට දුක්
සහිත කෑමද දුක් සහිත වතුරද දීපල්ලා-
යයි රජු කියන්නේය කියා කියාපන්නැයි
කීවේය. මීකායාද: ඔබ ඇත්තටම 28
සමාදානයෙන් හැරී ආවොත්, ස්වාමීන්-
වහන්සේ මා ලවා කථාකෙරෙවුවේ නැත.
ජනයිනි, නුඹලා සියල්ලෝම අසාපල්ලා-
යයි කීවේය.

## ආහබ්ගේ මරණය

මෙසේ ඉශ්‍රායෙල් රජද යූදාහි රජවූ 29
යෙහෝෂාපාට්ද රාමොත්-ගිලියද්ට
ගියෝය. ඉශ්‍රායෙල් රජ යෙහෝෂාපාට්ට 30
කථාකොට: මම වෙස් මාරුකරගන
යුද්ධයට පැමිණෙමි; නුමුත් ඔබ ඔබගේම
වස්ත්‍ර පැළඳගත මැනවැයි කීවේය. එසේ
ඉශ්‍රායෙල් රජ වෙස් මාරුකරගන
යුද්ධයට ගියේය. සිරියේ රජු තමාගේ 31
රථාධිපතීන් තිස්දෙනාට කථාකොට:
නුඹලා ඉශ්‍රායෙල් රජුට විරුද්ධව මිස
ලොකු කුඩා වෙන කිසිවෙකුට විරුද්ධව
සටන් නොකරල්ලායයි අණකර තිබුණේය.
තවද රථාධිපතීහු යෙහෝෂාපාට් 32

දුටුකල: මොහු ඉශ්‍රායෙල් රජමයයි
කියා ඔහුට විරුද්ධව සටන්කරන්ට
හැරුණෝය. එවිට යෙහෝෂාපාට්
33 මොරගැසීය. ඒ ඉශ්‍රායෙල් රජු නොවන
බව දක රථාධිපතීහු ඔහු වෙතින්
34 හැරී ගියෝය. නුමුත් එක් මනුෂ්‍යයෙක්
අහම්බෙන් දුන්න තැත්කවා ඉශ්‍රායෙල්
රජුගේ සන්නාහයේ සන්ධි අතරෙන්
ඔහුට විද්දේය. එවිට ඔහු: නුඹේ අත
දමා මා සේනාවෙන් පිටතට ගෙනියාපන්න;
මට බොහෝ තුවාලවීයයි රථාචාරියාට
35 කීය. ඒ දවසේ යුද්ධය තදබල වුණේය.
රජතෙමේ සිරියවරුන්ට ඉදිරිපිටින්,
ආධාර ඇතුව රථයේ කෙලින් සිටුවතුලැබ,
සවස මළේය. තුවාලයෙන් ලේ රථයේ
36 පතුලට ගලාගෙන ගියේය. එක එක
මනුෂ්‍යයා තම තමාගේ නුවරටත් රටටත්
යේවයි කියා ඉර බහින වේලේ සේනාව
මුළුල්ලෙහි ප්‍රසිද්ධයක් කරනලද්දේය.
37 මෙසේ රජ මැරී සමාරියට ගෙනයන
ලද්දේය; ඔව්හු රජු සමාරියේ තැන්පත්
38 කළෝය. තවද ඔව්හු වේශ්‍යාවන් නාන
තැනවූ සමාරියේ පොකුණෙන් රථය
සේදුවෝය; ස්වාමීන්වහන්සේ කී වචනයේ
හැටියට බල්ලෝ ඔහුගේ ලේ ලෙවකෑවෝය.
39 ආහබ්ගේ අනික් කාරණාද ඔහු කළ
සියල්ලද ඔහු සෑදූ ඇත් දත් ගෙයද
ගොඩනැගූ සියලු නුවරවල්ද ඉශ්‍රායෙල්
රජුන්ගේ ලේකම් පොතෙහි ලියා
40 තිබෙනවා නොවේද? මෙසේ ආහබ්
තමාගේ පියවරුන් සමග සැතපුණේය;
ඔහුගේ පුත්‍රවූ අහසියා ඔහු වෙනුවට
රජ වුණේය.

## යෙහෝෂාපාට් යූද කෙරෙහි රජවීම

41 ඉශ්‍රායෙල් රජවූ ආහබ්ගේ සතරවෙනි
අවුරුද්දේදී ආසාගේ පුත්‍රවූ යෙහෝෂාපාට්
තෙමේ යූද කෙරෙහි රජවුණේය.
42 යෙහෝෂාපාට් රජවෙන කල අවුරුදු
තිස් පහක් වයස්ව සිටියේය; ඔහු
යෙරුසලමේ විසි පස් අවුරුද්දක් රජකම්
කෙළේය. ඔහුගේ මවුගේ නම අසූබාය,
43 ඈ ෂිල්හීගේ දුවය. ඔහු තමාගේ පියවූ
ආසාගේ මුළු මාර්ගයෙහි හැසිරෙමින්,
එයින් අහක්නොවී, ස්වාමීන්වහන්සේගේ
ඇස් හමුයෙහි හරිව තිබුණ දේ කෙළේය.
එසේ වුවත් උස් තැන් පහනොකරන
ලද්දේය; එවකටත් සෙනඟ පූජාද සුවඳ
දුම්ද උස් තැන්වල ඔප්පු කළෝය.
යෙහෝෂාපාට් ඉශ්‍රායෙල් රජු සමග 44
සමාදනවිය. යෙහෝෂාපාට්ගේ අනික් 45
කාරණාද ඔහු කළ බලවන්තකම්ද
යුද්ධකළ හැටිද යූද රජුන්ගේ ලේකම්
පොතේ ලියා තිබෙනවා නොවේද?
තමාගේ පියවූ ආසාගේ දවස්වල 46
ඉතුරුවුණ *සොදොමීයයන් ඔහු දේශයෙන්
සිඳදැමුවේය. එකල ඒදොම්හි රජෙක් 47
නොවීය. යුව රජෙක් රජකම්කෙළේය.
යෙහෝෂාපාට් රත්‍රන් ගෙනෙන පිණිස 48
ඕපිර්ට යන්ට තර්ෂීෂ් නැව් සෑදුවේය.
නුමුත් ඒවා ගියේ නැත; කුමක්හෙයින්ද
ඒ නැව් එශියොන්-ගෙබෙර්හිදී බිඳුණේය.
එකල ආහබ්ගේ පුත්‍රවූ අහසියා: මාගේ 49
සේවකයෝ නුඹේ සේවකයන් හා සමග
නැව්වල යෙත්වයි යෙහෝෂාපාට්ට
කීවේය. නුමුත් යෙහෝෂාපාට් කැමති
වුණේ නැත. යෙහෝෂාපාට් තමාගේ 50
පියවරුන් සමග සැතපී තමාගේ පියවූ
දාවිත්ගේ නුවර තමාගේ පියවරුන් ළඟ
තැන්පත්කරන ලද්දේය. ඔහුගේ පුත්‍රවූ
යෙහෝරාම් ඔහු වෙනුවට රජවුණේය.

## අහසියා ඉශ්‍රායෙල් කෙරෙහි රජවීම

යූදෙහි රජවූ යෙහෝෂාපාට්ගේ දසසත්වෙනි 51
අවුරුද්දේදී ආහබ්ගේ පුත්‍රවූ අහසියා
ඉශ්‍රායෙල් කෙරෙහි සමාරියේ රජවී
දෑවුරුද්දක් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
රජකම්කෙළේය. ඔහු ස්වාමීන්වහන්සේගේ 52
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ කොට,
තමාගේ පියාගේ මාර්ගයේද තමාගේ
මෑණියන්ගේ මාර්ගයේද ඉශ්‍රායෙල්වරුන්ට
පවුකරන්ට සැලැස්සුවාවූ, නෙබාත්ගේ
පුත්‍රවූ යෙරොබොවම්ගේ මාර්ගයේද
හැසුරුණේය. ඔහු බාල්ට සේවයකර 53
ඔහුට නමස්කාරකරමින් තමාගේ පියා
කළ ප්‍රකාරයටම ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ කෝපකෙළේය.

*එනම්, දූෂ්‍යකමට කැපවූවන්.

# රාජාවලියේ දෙවෙනි පොත

## අහසියා සහ එලියා. අහසෙන් ගිනි බැස්සවීම

1 ආහබ් මැරුණු පසු මෝවබ්වරු
ඉශ්‍රායෙල්ට විරුද්ධව කැරළිගැසුවෝය.
2 තවද අහසියා සමාරියෙහි තමාගේ
උඩුමහලේ ගරාදි අතරෙන් වැටී රෝගා-
තුරවිය. නුඹලා ගොස් මම මේ රෝග-
යෙන් සුවවෙන්නෙම්දැයි එක්‍රෝන්හි දෙවිවූ
බාල්-සෙබූබ්ගෙන් විචාරාපල්ලායයි
කියා ඔහු පණිවිඩකාරයන් ඇරියේය.
3 නුමුත් ස්වාමීන්වහන්සේගේ දූතයා
තිෂ්බිය එලියාට කථාකොට: නැගිට
සමාරියේ රජුගේ පණිවිඩකාරයන්ගේ
පෙරමගට ගොස්–නුඹලා එක්‍රෝන්හි
දෙවිවූ බාල්-සෙබූබ්ගෙන් විචාරන්ට
යන්නේ ඉශ්‍රායෙල්හි දෙවි කෙනෙක් නැති
4 නිසාද? එබැවින්–නුඹ නැගී ඉන්න ඇඳෙන්
නොබැස සැබවින් මැරෙන්නෙහියයි
ස්වාමීන්වහන්සේ වදරනසේක කියා
ඔවුන්ට කියාපන්නැයි කීවේය. එලියා
5 පිටත්ව ගියේය. එවිට පණිවිඩකාරයෝ
රජු ළඟට හැරී ආවෝය, නුඹලා හැරී
ආවේ මක්නිසාදැයි ඔහු ඔවුන්ගෙන්
6 ඇසුවේය. ඔව්හු: මනුෂ්‍යයෙක් අපේ
පෙරමගට ඇවිත්–නුඹලා එවූ රජු ළඟට
හැරී ගොස්: නුඹ එක්‍රෝන්හි දෙවිවූ
බාල්-සෙබූබ්ගෙන් විචාරන්ට අරින්නේ
ඉශ්‍රායෙල්හි දෙවි කෙනෙක් නැති නිසාද?
එබැවින් නුඹ ඉන්න ඇඳෙන් නොබැස
සැබවින් මැරෙන්නෙහියයි ස්වාමීන්-
වහන්සේ වදරනසේක කියා ඔහුට කියා-
7 පල්ලායයි අපට කීවෝය. නුඹලාගේ
පෙරමගට ඇවිත් මේ වචන නුඹලාට
කී මනුෂ්‍යයාගේ අන්දම කොයි හැටිදැයි
8 ඔහු ඔවුන්ගෙන් ඇසුවේය. ඔව්හු ඔහුට
උත්තරදෙමින්: ඔහු ලෝම වස්ත්‍රයක්
ඇඳ ඉහටියෙහි සම්පටියක් බැඳගත්
මනුෂ්‍යයෙකැයි කීවෝය. ඔහු: ඒ තිෂ්බිය
එලියායයි කීවේය. එවිට රජ පන- 9
සාධිපතියෙකු ඔහුගේ පනස්දෙනා සමඟ
ඔහු වෙතට ඇරියේය. හෙතෙමේ කන්ද
මුදුනේ හිඳගන උන් එලියා ළඟට ගොස්:
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යය, බැස
වරෙන්න කියා රජු කියන්නේයයි ඔහුට
කීවේය. එලියා පනසාධිපතියාට උත්තර- 10
දෙමින්: මම දෙවියන්වහන්සේගේ මනුෂ්‍ය-
යෙක් නම් අහසින් ගිනි බැස නුඹද
නුඹේ පනස්දෙනාද දවාදමාවයි කීවේය.
එවිට අහසින් ගිනි බැස ඔහුද ඔහුගේ
පනස්දෙනාද දවාදැමුවේය. රජ නැවත 11
තවත් පනසාධිපතියෙකු ඔහුගේ පනස්-
දෙනා සමඟ ඔහු ළඟට ඇරියේය.
ඔහු කථාකොට: දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යය, ඉක්මනින් බැස වරෙන්න කියා
රජ කියන්නේයයි ඔහුට කීවේය. එලියා 12
උත්තරදෙමින්: මම දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයෙක් නම් අහසින් ගිනි බැස
නුඹද නුඹේ පනස්දෙනාද දවාදමාවයි
ඔවුන්ට කීවේය. එවිට දෙවියන්-
වහන්සේගේ ගිනි අහසින් බැස ඔහුද
ඔහුගේ පනස්දෙනාද දවාදැමුවේය. රජ 13
නැවතත් තුන්වෙනි වර පනසාධිපතියෙකු
ඔහුගේ පනස්දෙනා සමඟ ඇරියේය.
පනසට අධිපතිවූ තුන්වෙනියාද නැගී
ගොස් එලියා ඉදිරියෙහි දණින් වැටී
යාච්ඤාකරමින්: දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යය, මාගේ ප්‍රාණයද ඔබගේ
මෙහෙකරුවන්වූ මේ පනස්දෙනාගේ
ප්‍රාණද ඔබගේ ඇස් හමුයෙහි අනර්ඝ
වේවා. බැලුව මැනවි, අහසින් ගිනි බැස 14
පළමු පනසාධිපතීන් දෙදෙනාද ඔවුන්ගේ
පනසවල්ද දවාදැමුවේය. නුමුත් දැන්
මාගේ ප්‍රාණය ඔබගේ ඇස් හමුයෙහි
අනර්ඝ වේවයි ඔහුට කීවේය. එවිට 15
ස්වාමීන්වහන්සේගේ දූතයා කථාකොට:

භයනොවී ඔහු සමග පලයන්නැයි
එලියාට කීවේය. ඔහු නැගිට ඔහු සමග
16 රජු ළඟට බැස ගියේය. ඔහු කථාකොට:
තුඹ එක්‍රෝන්හි දෙවිවූ බාල්-සෙබූබ්ගෙන්
විචාරන්ට පණිවිඩකාරයන් ඇරියේ
දේව වාක්‍යයෙන් විචාරන්ට ඉශ්‍රායෙල්-
වරුන්ගේ දෙවිකෙනෙක් නැති නිසාද?
එබැවින් තුඹ නැගී ඉන්න ඇඳෙන්
නොබැස සැබවින්ම මැරෙන්නෙහියයි
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි ඔහුට
17 කීවේය. මෙසේ එලියා කී **ස්වාමීන්-
වහන්සේගේ** වචනය ලෙස ඔහු මළේය.
ඔහුට පුත්‍රයෙකු නොසිටිය බැවින් ඔහු
වෙනුවට යෙහෝරාම් යූදහි රජවූ
යෙහෝෂාපාට්ගේ පුත්‍රවූ යෙහෝරාම්-
ගේ දෙවෙනි අවුරුද්දේදී රජවුණේය.
18 අහසියා කළ අනික් ක්‍රියා ඉශ්‍රායෙල්
රජුන්ගේ ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද?

## එලියා ස්වර්ගයට ගෙනයනු ලැබීම. එලිෂා කළ නොයෙක් ආශ්චර්යයෝ

**2** තවද **ස්වාමීන්වහන්සේ** එලියා සුළි
හුළඟකින් ස්වර්ගයට ගන්ට කැමතිවූ
ප්‍රස්ථාවේදී එලියා එලිෂා සමග ගිල්-
2 ගාල්හි සිට ගියේය. එලියා: **ස්වාමීන්-
වහන්සේ** මා බෙතෙල්ට යවන නිසා
මෙහි නවතින්නැයි එලිෂාට කීවේය.
එලිෂාද: **ස්වාමීන්වහන්සේ** ජීවමාන බව
සැබැවා සේම, ඔබගේ ප්‍රාණයද ජීවත්-
වන බව සැබැවා සේම, මම ඔබ අත්-
නොහරිමියි කීවේය. මෙසේ ඔව්හු
3 බෙතෙල්ට බැස ගියෝය. බෙතෙල්හි සිටි
ප්‍රොපේත පුත්‍රයෝ එලිෂා ළඟට ඇවිත්:
**ස්වාමීන්වහන්සේ** අද තුඹේ ස්වාමියා
තුඹ කෙරෙන් ගන්නා බව දන්නෙහිදැයි
ඔහුගෙන් ඇසුවෝය. ඔහු: එසේය, මම
දනිමි; නිශ්ශබ්දවෙයල්ලායයි කීය.
4 එලියා ඔහුට කථාකොට: එලිෂා, මෙහි
නැවතියන්න; මක්නිසාද **ස්වාමීන්-
වහන්සේ** මා යෙරිකෝවට යවනසේකැයි
කීවේය. ඔහුද: **ස්වාමීන්වහන්සේ** ජීවමාන
බව සැබැවා සේම, ඔබගේ ප්‍රාණයද
ජීවත්වන බව සැබැවා සේම මම ඔබ
අත්නොහරිමියි කීවේය. මෙසේ ඔව්හු
යෙරිකෝවට ආවෝය. යෙරිකෝවෙහි 5
සිටි ප්‍රොපේත පුත්‍රයෝ එලිෂා ළඟට
ඇවිත්: **ස්වාමීන්වහන්සේ** අද තුඹේ
ස්වාමියා තුඹ කෙරෙන් ගන්නා බව
දන්නෙහිදැයි ඔහුගෙන් ඇසුවෝය. ඔහුද:
එසේය, මම දනිමි; නිශ්ශබ්දවෙයල්ලායයි
උත්තර දුන්නේය. එලියාද: **ස්වාමීන්-** 6
**වහන්සේ** මා යොර්දනට යවන නිසා
මෙහි නැවතියන්නැයි ඔහුට කීවේය. ඔහු:
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව සැබැවා
සේම, මම ඔබ අත්නොහරිමියි කීවේය.
එවිට ඒ දෙදෙනාම ගියෝය. ප්‍රොපේත 7
පුත්‍රයන්ගෙන් පනස්දෙනෙක්ද ගොස්
ඔවුන් ඉස්සරහපිට දුරින් සිටියෝය. ඒ
දෙදෙනාද යොර්දන ළඟ සිටියෝය.
එවිට එලියා තමාගේ උතුරු සළුව 8
රැගෙන අකුළා වතුරට ගැසීය, වතුර
දැතට බෙදී ගියේය, ඒ දෙදෙනා වියළි
බිම පිට එගොඩවූවෝය. තවද ඔවුන් 9
එගොඩවූ කල එලියා කථාකොට: තුඹ
වෙතින් මා ගන්ට පළමුවෙන් තුඹට
මගෙන් ඕනෑ දෙයක් ඉල්ලාපන්නැයි
එලිෂාට කීය. එලිෂාද: ඔබට තිබෙන
ආත්මයෙන් දෙගුණයක් මා කෙරෙහි
පැමිණේවයි කීවේය. ඔහුද: තුඹ අමාරු 10
දෙයක් ඉල්ලුවෙහිය. එහෙත් තුඹ වෙතින්
මා ගන්න විට තුඹ මා දුටුවොත් තුඹට
එසේ වන්නේය; නැතහොත් එසේ
නොවන්නේයයි කීය. තවද ඔවුන් කථා- 11
කරකර යද්දී ගිනි රථයක්ද ගිනි
අශ්වයෝද පෙනී ඔවුන් දෙදෙනා
වෙන්කළෝය; එලියා සුළි හුළඟකින්
ස්වර්ගයට නැගී ගියේය. එලිෂා ඒ දැක: 12
ඉශ්‍රායෙල්ට රථ සහ අසරුවන් වැනිවූ
මාගේ පියාණෙනි, මාගේ පියාණෙනියි
කීවේය. ඔහු තවත් ඔහු නුදුටුවේය. එවිට
ඔහු තමාගේ වස්ත්‍ර අල්ලා දෙකට
ඉරා, එලියාගෙන් වැටුණු ඔහුගේ සළුව 13
රැගෙන හැරී ඇවිත් යොර්දන අද්දර
සිට, එලියාගෙන් වැටුණු ඔහුගේ සළුව 14
අරගෙන: එලියාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** කොයිද කියා වතුරට
ගැසුවේය. ඔහුත් වතුරට ගැසූවිට එය

දැතට බෙදී ගියේය. එලිෂා එගොඩ-
15 වුණේය. ඔහු ඉස්සරහින් යෙරිකෝවේ
සිටි ශිෂ්‍ය ප්‍රොපේතවරු ඔහු දැක:
එලියාට තිබුණු ආත්මය එලිෂා කෙරෙහි
පිහිටා තිබේය කියා ඔහුගේ පෙරමගට
ගොස් බිමට නැමී ඔහුට වැන්දෝය.
16 ඔව්හු ඔහුට කථාකොට: මෙහි ඔබගේ
මෙහෙකරුවන් අතරේ ශක්තිමත් මනු-
ෂ්‍යයෝ පනස් දෙනෙක් සිටිති; ඔව්හු
ගොස් ඔබගේ ස්වාමියා සොයත්වා.
සමහරවිට **ස්වාමීන්වහන්සේගේ** ආත්මය
ඔහු ගෙනගොස් යම් කිසි කන්දක්
පිටවත් යම් කිසි මිටියාවතකවත් දමන්ට
17 ඇතැයි ඔහුට කීවෝය. ඔහුද: අරින්ට
එපායයි කීය. නුමුත් ඔහු බේදයට
පත්වෙන තුරුම ඔවුන් ඔහුට කරදරකළ
බැවින්: හැරපල්ලායයි ඔහු කීවේය. එවිට
ඔව්හු මනුෂ්‍යයන් පනස්දෙනෙකු හැරි-
යෝය; ඔවුන් තුන් දවසක් සෙවූ නුමුත්
18 ඔහු සම්බනුණේය. ඔව්හු යෙරිකෝවේ
නැවතී සිටි ඔහු ළඟට හැරී ආවෝය;
ඔහුද: නොයල්ලායයි මා නුඹලාට කීවා
නොවේදැයි ඔවුන්ට කීවේය.
19 ඒ නුවර මනුෂ්‍යයෝ එලිෂාට කථාකොට:
මෙන්න, මාගේ ස්වාමියාට පෙනෙන
හැටියට මේ නුවර පිහිටා තිබෙන
ස්ථානය ප්‍රසන්නය. නුමුත් වතුර නරකය,
පොළොවත් වඳ වෙන්ට සලස්වනවායයි
20 කීවෝය. ඔහුද: අලුත් සැළියක් මා ළඟට
ගෙනැවිත් එහි ලුණු දමාපල්ලායයි
කීවේය. ඔව්හුද එය ඔහු ළඟට ගෙනා-
21 වෝය. ඔහු වතුර උල්පත ළඟට ගොස්
එහි ලුණු දමා: මේ වතුර සුවපත්
කෙළෙමියි කියාත් තවත් එයින් මරණ-
යවත් වඳවීමවත් නොවන්නේය කියාත්
**ස්වාමීන්වහන්සේ** වදරනසේකැයි කීවේය.
22 මෙසේ එලිෂා කී වචනය ලෙස ඒ වතුර
අද දක්වා සුවපත්ව පවතියි.
23 ඔහු එතැනින් බෙතෙල්ට ගියේය. ඔහු
පාරේ යද්දී පුංචි ළමයි නුවරින් පිටත්ව
ඇවිත් ඔහුට කවටකම්කරමින්: පලායව
තට්ටයා, පලායව තට්ටයායයි කීවෝය.
24 ඔහු පස්සට හැරී ඔවුන් දැක **ස්වාමීන්-
වහන්සේගේ** නාමයෙන් ඔවුන්ට ශාප-
කෙළේය. එවිට වැළහින්නියන් දෙන්නෙක්
කැලෑවෙන් ඇවිත් ඒ ළමයින්ගෙන්
සතළිස් දෙදෙනෙකු ඉරා දැමුවෝය.
හෙතෙම එතැනින් කර්මෙල් කන්දට ගොස් 25
එයින් සමාරියට හැරී ආවෝය.

## ඉශ්‍රායෙල් රජවූ යෙහෝරාම් මෝවබ්ට විරුද්ධව යාම

3 තවද ආහබ්ගේ පුත්‍රවූ යෙහෝරාම්
යූදෙහි රජවූ යෙහෝෂාපාට් දහ
අටවෙනි අවුරුද්දේදී සමාරියෙහි
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජ වී දෙ-
ළොස් අවුරුද්දක් රජකම්කෙළේය. ඔහු 2
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය; එහෙත්
තමාගේ පියාද මවුද මෙන් නොවේ.
මක්නිසාද ඔහු තමාගේ පියා සෑදූ
බාල්ගේ රූපස්තම්භය පහකෙළේය. එසේ 3
වුවත් ඔහු ඉශ්‍රායෙල්ට පව්කරන්ට
සැලැස්සුවාවූ නෙබාත්ගේ පුත්‍රවූ යෙරො-
බොවම්ගේ පාපවලින් අහක්නොවී,
ඒවාට ඇලුම්ව සිටියේය.
මෝවබ්හි රජවූ මෙෂා බැටළු හිමියෙක් ව 4
සිටියේය; ඔහු ඉශ්‍රායෙල් රජුට එක්
ලක්ෂයක් බැටළු පැටවුන්ගේද එක්
ලක්ෂයක් බැටළුවන්ගේද ලෝම දෙන
සිරිතක් තිබුණේය. නුමුත් ආහබ් මැරුණු 5
කල මෝවබ්හි රජ ඉශ්‍රායෙල් රජුට
විරුද්ධව කැරළිගැසීය. යෙහෝරාම් 6
රජද ඒ කාලයේ සමාරියෙන් පිටත්ව
ගොස් සියලු ඉශ්‍රායෙල්වරුන් රැස්කොට
ගණන්කෙළේය. තවද ඔහු ගොස් යූදෙහි 7
රජවූ යෙහෝෂාපාට් වෙත පණිවිඩයක්
යවමින්: මෝවබ්හි රජ මට විරුද්ධව
කැරළිගැසුවේය, ඔබ මා සමග මෝවබ්-
වරුන්ට විරුද්ධව යුද්ධයට යන්නෙහිදැයි
අසා ඇරියේය. ඔහුද: යන්නෙමි. මම
ඔබ වාගේය, මාගේ සෙනඟත් ඔබගේ
සෙනඟ වාගේය, මාගේ අශ්වයොත්
ඔබගේ අශ්වයන් වාගේයයි කීවේය. ඔහු: 8
අපි කුමන පාරකින් යමුදැයි ඇසුවේය.
ඔහුද: ඒදෝම් කාන්තාරයේ පාරෙන්යයි
උත්තරදුන්නේය. මෙසේ ඉශ්‍රායෙල්හි 9
රජද යූදෙහි රජද ඒදෝම්හි රජද ගියෝය.
ඔවුන් සත් දවසක ගමන් වටේට ගිය

විට සේනාවටත් ඔවුන් අනුව ගිය
10 සිව්පාවුන්ටත් වතුර නැතිවිය. එවිට
ඉශ්‍රායෙල් රජ: අහෝ **ස්වාමීන්වහන්සේ**
මෝවබ් අතට පාවාදෙන්ට මේ රජුන්
තුන්දෙනා ගෙන්වූසේකැයි කීය.

## එලිෂාගෙන් විභාගකිරීම

11 නුමුත් යෙහෝෂාපාට් කථාකොට: අප
විසින් **ස්වාමීන්වහන්සේගෙන්** විචාරන
පිණිස **ස්වාමීන්වහන්සේගේ** ප්‍රොපේත-
වරයෙක් මෙහි නැද්දැයි ඇසුවේය. එවිට
ඉශ්‍රායෙල් රජුගේ සේවකයෙක් උත්තර-
දෙමින්: එලියාගේ අත්වලට වතුර
වත්කළාවූ, ෂාපාත්ගේ පුත්‍රවූ එලිෂා මෙහි
12 ඉන්නේයයි කීවේය. යෙහෝෂාපාට්ද:
**ස්වාමීන්වහන්සේගේ** වචනය ඔහු වෙත
තිබේයයි කීය. මෙසේ ඉශ්‍රායෙල් රජද
යෙහෝෂාපාට්ද ඒදෙම්හි රජද ඔහු ළඟට
13 ගියෝය. එලිෂා ඉශ්‍රායෙල් රජුට කථා-
කොට: මාගෙන් නුඹට කම මොකද?
නුඹේ පියාගේ ප්‍රොපේතවරුන් ළඟටත්
නුඹේ මවුගේ ප්‍රොපේතවරුන් ළඟටත්
ගිය මැනවැයි කීවේය. ඉශ්‍රායෙල් රජද:
එසේ නොවේවා. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** මෝවබ්වරුන් අතට පාවාදෙන
පිණිස මේ රජුන් තුන්දෙනා ගෙන්වූ-
14 සේකැයි ඔහුට කීවේය. එලිෂා කථා-
කොට: මා සේවයකරන සේනාවල
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව සැබෑවා
සේම සැබවින් යූදහි යෙහෝෂාපාට්
රජු මෙහි සිටින කාරණය නිසා මිස
නැත්නම් මා නුඹ දෙස බලන්නේවත්
15 නුඹ දකින්නේවත් නැත. දැන් ඉතින් වීණා
කාරයෙකු මා ළඟට ගෙනෙල්ලායයි
කීවේය. වීණාකාරයා ගායනා කරද්දී
**ස්වාමීන්වහන්සේගේ** හස්තය එලිෂා
16 පිටට පැමිණියේය. ඔහු කථාකොට:
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක–මේ
මිටියාවත පුරාම අගල් කපාපල්ලා.
17 මක්නිසාද නුඹලා හුළඟක්වත් වැස්සවත්
නොදකින නුමුත් නුඹලාටත් නුඹලාගේ
සිවුපාවුන්ටත් නුඹලාගේ මෘගයන්ටත්
බීමට මේ මිටියාවත වතුරෙන් පිරෙනවා
ඇතැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
මේත් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි සුළු 18
දෙයක. උන්වහන්සේ මෝවබ්වරුන්ද
නුඹලා අතට පාවාදෙනසේක. නුඹලා 19
පවුරු ඇති සියලු නුවරවල්ද සියලු
අනර්ඝ නුවරවල්ද නාස්තිකර, සියලු
හොඳ ගස් කපා දමා, සියලු දිය උල්පත්
වසා, සියලු හොඳ බිම් ගල්දමා නරක්-
කරන්නනුයයි කීවේය. පසුවද උදය 20
පූජාව ඔප්පුකරන වේලාව පමණේදී
ඒදෙම් දිශාවෙන් වතුර ඇවිත් එයින්
රට පිරී ගියේය.

## මෝවබ්වරුන් පරාජයවීම

තවද සියලු මෝවබ්වරු තමුන්ට 21
විරුද්ධව යුද්ධකරන්ට රජුන් ආ බව
ඇසූ විට යුද්ධායුධ පළඳින්ට පුළුවන්
වයසේ සිට ඊට වැඩි වයස්වූද සියල්ලෝ
රැස්වී සීමාව ළඟ සිටියෝය. ඔවුන් 22
අලුයම නැගිට් කල ඒ වතුර පිටට
හිරුරැස් වැටුණේය, මෝවබ්වරු තමුන්
ඉදිරිපිට තිබුණු වතුර ලේ මෙන් රතුව
තිබෙනවා දැක: මේ නම් ලේය; සැබවින් 23
රජවරු විනාශවූවෝය, ඔවුන් එකි-
නෙකා මරාගන්ට ඇත. ඉතින්, මෝවබ්-
වරුනි, කොල්ලය ගැනීමට වරෙල්ලායයි
කීවෝය. ඔවුන් ඉශ්‍රායෙල් කඳවුරට 24
පැමිණි විට ඉශ්‍රායෙල්වරු නැගිට
මෝවබ්වරුන් තමුන් ඉදිරියෙන් පලායන
තුරු ඔවුන්ට පහරදී, ඔවුන්ගේ රටටත්
ගොස් මෝවබ්වරුන්ට පහර දුන්නෝය.
ඔව්හු නුවරවල් කඩාදමා, රටේ සියලු 25
හොඳ බිම්වලට එකිනෙකා ගලක් බැගින්
දමා ඒවා පුරවා, සියලු දිය උල්පත්
වසා, සියලු හොඳ ගස් කපාදැමුවෝය.
කීර්-හරෙසෙත්හි ඉතුරුකළේ ගල්
පමණක්ය; ගල්පටිකාරයෝ ඒක වටලා-
ගෙන ඊට පහර දුන්නෝය. මෝවබ් රජ 26
සටන තමාට ඉතා සැරව තිබුණු බව
දැක ඒදෙම් රජු කරා සේනාව මැදින්
බිඳගන යන පිණිස කඩු ගත් මනුෂ්‍යයන්
සත් සියයක් රැගෙන ආවේය. එහෙත්
ඔවුන්ට යන්ට නුපුළුවන්විය. එකල ඔහු 27
තමා වෙනුවට රජ වෙන්ට සිටි තමාගේ
කුළුඳුල් පුත්‍රයා රැගෙන දවන පූජාවක්

කොට පවුර පිට පුදකෙළේය. මහත්
උදහසක්ද ඉශ්‍රායෙල් පිටට පැමුණුණේය.
එවිට ඔව්හු ඔහු වෙතින් අහක්වී තමුන්ගේ
දේශයට හැරී ගියෝය.

## වැන්දඹුවගේ තෙල්කුළාව

4 ප්‍රොපේත පුත්‍රයන්ගේ භාර්යාවන්-
ගෙන් එක්තරා ස්ත්‍රියෙක් එලිෂාට
මොරගසා: ඔබගේ මෙහෙකරුවූ මාගේ
පුරුෂයා මෙළේය. ඔබගේ මෙහෙකරුවා
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය ඇතුව
සිටි බව ඔබ දන්නෙහිය. ණය හිමියා
මාගේ දරුවන් දෙදෙනා තමාට දසයන්
කොට ගන්ට ඇවිත් සිටීයයි කීවාය.
2 එලිෂා කථාකොට: මම නුඹට කුමක්
කරම්ද? ගෙයි නුඹට තිබෙන්නේ
මොනවාදැයි මට කියාපන්නැයි ඇට
කීවේය. තෙල් කුළාවක් මිස ගෙයි වෙන
කිසිවක් ඔබගේ දසියට නැතැයි ඈ
3 කීවාය. එවිට ඔහු: නුඹ පිටත ගොස්
නුඹේ සියලු අසල්වාසීන්ගෙන් භාජන
එනම් හිස් භාජන බොහොමයක් ඉල්ලා
4 ගනින්න. නුඹත් නුඹේ පුත්‍රයනුත් ඇතුල්වී
දෙර පියාගෙන, ඒ සියලු භාජනවල
තෙල් වත්කොට, පිරුණු ඒවා පැත්තක
5 තබාපන්නැයි කීවේය. ඈ ඔහු ළඟින්
ගොස්, ඈත් ඇගේ පුත්‍රයොත් ඇතුල්වී
දෙර පියාගත්තෝය; ඔව්හු ඈ ළඟට
භාජන ගෙනාවෝය, ඈ තෙල් වත්කළාය.
6 භාජන පිරුණු කල ඈ: තවත් භාජන-
යක් මට ගෙනෙන්නැයි ඇගේ පුත්‍රයාට
කීවාය. තවත් භාජනයක් නැතැයි ඔහු
7 ඇට කීවේය. තෙල් නැවතුණේය. එවිට
ඈ ඇවිත් දෙවියන්වහන්සේගේ මනුෂ්‍ය-
යාට දන්නුවාය. ඔහුද: නුඹ ගොස් තෙල්
විකුණා ණය ගෙවා ඉතිරි මුදලෙන්
නුඹත් නුඹේ පුත්‍රයොත් රක්ෂාවෙයල්ලා-
යයි කීවේය.

## ෂූනෙම්මිය ස්ත්‍රියගේ ළමයාට ජීවනය දීම

8 එක් දවසක් එලිෂා ෂූනෙම්ට ගියේය.
එහි සිටි උත්තම ස්ත්‍රියෙක් කෑම කන්ට
ඔහුට පෙරැත්තකළාය. මෙසේ ඔහු යන
එන සෑම විටම කෑම කන පිණිස
එහි නැවතුණේය. ඈ ඇගේ පුරුෂයාට 9
කථාකොට: නිතරම අප ළඟින් යන
එන මොහු දෙවියන්වහන්සේගේ ශුද්ධ
මනුෂ්‍යයෙක් බව මට පෙනෙයි. අපි 10
භිත්ති ඇති කුඩා උඩුමහලක් සාද ඇඳකුත්
මේසයකුත් පුටුවකුත් පහනකුත් එහි
තබමු. එවිට ඔහු අප ළඟට ආ කල
එහි සිටින්ට පුළුවනැයි කීවාය. එක් දවසක් 11
ඔහු එහි පැමිණ උඩුමහලට ගොස්
නිදාගත්තේය. තවද ඔහු: ෂූනෙම්මිය ස්ත්‍රීට 12
අඬගසාපන්නැයි තමාගේ වැඩකාරයාවූ
ගෙහාසීට කීය. ඔහු ඇට අඬගැසූ
විට ඔහු ඉදිරියට ආවාය. එලිෂාද 13
කථාකොට: මේ සියලු සැලකිලිවලින්
නුඹ අප ගැන සැලකුවෙහිය; නුඹ
උදෙසා කුමක් කටයුතුද? රජුට හෝ
සේනාපතියාට හෝ නුඹ වෙනුවට
කථාකරනවාට කැමතිද කියා ඇගෙන්
අසාපන්නැයි ගෙහාසීට කීවේය. ඈද:
මාගේම සෙනඟ අතරේ වාසයකරමියි
උත්තරදුන්නාය. එසේවීනම් ඈ උදෙසා 14
කරන්ට තිබෙන්නේ කිමෙක්දැයි ඔහු
ඇසුවේය. ගෙහාසී: ඇට පුත්‍රයෙක් නැත;
ඇගේ පුරුෂයාත් මහලුයයි කීවේය. ඇට 15
අඬගසාපන්නැයි ඔහු කීය. ඔහු ඇට
අඬගැසූ කල ඈ දෙරකඩ ළඟට ආවාය.
ඔහු: ලබන අවුරුද්දේ මේ කාලය 16
පැමිණි විට නුඹ පුත්‍රයෙකු වැළඳගන්නීයයි
කීවේය. ඈද: නැත, මාගේ ස්වාමිනි,
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යය, ඔබගේ
දසීට බොරු කියන්ට එපායයි කීවාය.
ඒ ස්ත්‍රී ගර්භිණීව එලිෂා ඇට කී හැටියට 17
ඊළඟ අවුරුද්දේ ඒ කාලය පැමිණි විට
පුත්‍රයෙකු වැදුවාය. ඒ ළමයා වැඩුණු 18
කල එක් දවසක් ගොයම් කපන්නන්
අතරේ සිටි තමාගේ පියා ළඟට ගියේය.
එවිට ඔහු: අනේ මගේ ඔළුව, මගේ 19
ඔළුව යයි තමාගේ පියාට කීය. පියාද:
ඔහුගේ මවු ළඟට ඔහු ගෙනියාපන්නැයි
තමාගේ වැඩකාරයාට කීවේය. වැඩ- 20
කාරයා ඔහු රැගෙන ඔහුගේ මවු
ළඟට ගෙනගියේය. ඔහු ඉරමුදුන් වේලාව
දක්වා ඇගේ උකුළේ හිඳ මෙළේය.

21 එවිට ඈ නැගී ගොස් දෙවියන්වහන්සේ-
ගේ මනුෂ්‍යයාගේ ඇඳේ ඔහු බාවා දෙර
22 පියා පිටතට ගියාය. තවද ඈ තමාගේ
පුරුෂයාට අඬගසා: දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා ළඟට හණික ගොස් එන
පිණිස වැඩකාරයෙකුත් කොටළු
දෙනෙකුත් මට එවන්නයයි කීවාය.
23 ඔහුද: තුඹ අද ඔහු ළඟට යන්නේ
මොකටද? අමාවකවත් සබත් දිනයවත්
නොවේයයි කීවේය. ඈ ඒකට කමක්
24 නැත කියා, කොටළුදෙන සූදනම්කර
ඇගේ වැඩකාරයාට කථාකොට:
දක්කාගෙන පලයන්න; මා තුඹට
නොකියා, මා නිසා තුඹේ දක්කීම බාල
25 නොකරන්නැයි කීවාය. මෙසේ ඈ ගොස්
කර්මෙල් කන්දට, දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා ළඟට පැමිණියාය. තවද
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා ඈ දුරදී
දැක තමාගේ මෙහෙකරුවූ ගෙහාසීට
26 කථාකොට: අන්න, අර ෂූනෙම්මිය ස්ත්‍රී
එනවා. දැන්ම ඇගේ පෙරමගට දිවගොස්:
තුඹ සුවසේද? තුඹේ පුරුෂයා සුවසේද?
ළමයා සුවසේද කියා ඇගෙන්
අසාපන්නැයි කීවේය. සුවසේයයි ඈ
27 උත්තරදුන්නාය. ඈ වනාහි කන්දේ
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා ළඟට
පැමිණ ඔහුගේ පාද අල්වාගත්තාය.
එවිට ගෙහාසී ඈ අහක්කරන පිණිස
ළංවිය; නුමුත් දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා කථාකොට: ඈ නිකම්
උන්නාවේ. ඇගේ ආත්මය ශෝකව
තිබෙයි; ස්වාමීන්වහන්සේ එය මට
නොදන්වා, මාගෙන් සැඟවූසේකැයි
28 කීවේය. එවිට ඈ: මාගේ ස්වාමීන්ගෙන්
මම පුත්‍රයෙකු ඉල්ලුවෙම්ද? මා රවටන්ට
29 එපායයි නොකීයෙම්දැයි කීවාය. එවිට
ඔහු ගෙහාසීට කථාකොට: ඉඟටිය
බැඳගෙන මාගේ සැරයටිය අතින්
රැගෙන පලයන්න. යමෙක් සම්බවුණත්
ඔහුට ආචාර කරන්නේවත් යමෙක්
තුඹට ආචාරකළත් ඔහුට උත්තර-
දෙන්නේවත් නැතුව ගොස්, මාගේ
සැරයටිය ළමයාගේ මුහුණ පිට
30 තබාපන්නැයි කීවේය. නුමුත් ළමයාගේ
මවු: ස්වාමීන්වහන්සේ ජීවමාන බව
සැබෑවා සේම, ඔබගේ ප්‍රාණයත්
ජීවත්වන බව සැබෑවා සේම, මම ඔබ
අත්හැර නොයමියි කීවාය. එවිට ඔහු
පිටත්වී ඈ අනුව ගියේය. ගෙහාසී ඔවුන්ට 31
ඉස්සරව ගොස් සැරයටිය ළමයාගේ
මුහුණ පිට තැබුවේය; නුමුත් කිසි
හඬක්වත් සැලකීමක්වත් නොවීය.
එබැවින් ගෙහාසී ඔහුගේ පෙරමගට හැරී
ඇවිත්: ළමයා පිබිදුණේ නැතැයි ඔහුට
දන්නුවේය. එලිෂා ඒ ගෙදරට පැමුණුණ 32
විට ළමයා මැරී තමාගේ ඇඳේ බාවා
ඉන්නවා දුටුවේය. එවිට ඔහු ඇතුල්වී 33
ඔවුන් දෙදෙනා සිටිද්දී දෙර වසාගන
ස්වාමීන්වහන්සේට යාච්ඤාකෙළේය. තවද 34
ඔහු නැගී ගොස් ළමයා පිට වැතිර
තමාගේ කට ඔහුගේ කට පිටද තමාගේ
ඇස් ඔහුගේ ඇස් පිටද තමාගේ අත්
ඔහුගේ අත් පිටද තබා ළමයා පිට
දිගාවුණේය; ළමයාගේ මාංසයද උණුහුම්
වුණේය. එවිට ඔහු හැරී ඇවිත් ගෙයි 35
එහා මෙහා වරක් ඇවිද නැවත නැගී
ගොස් ඔහු පිට දිගාවුණේය. එවිට
ළමයා සත් වරක් කිඹිස ඇස් ඇරියේය.
ඔහු ගෙහාසී කැඳවා: ඒ ෂූනෙම්මිය 36
ස්ත්‍රියට අඬගසාපන්නැයි කීවේය. ඔහු
ඈට අඬගැසුවේය. ඈ ඔහු ළඟට ආ
කල: තුඹේ පුත්‍රයා අරගනින්නැයි ඔහු
කීවේය. ඈද ඇතුල්වී ඔහුගේ පාමුල 37
වැටී බිමට නැමී වැඳ, ඇගේ පුත්‍රයා
අරගෙන ගියාය.

## එලිෂාගේ තවත් ආශ්චර්යයන් දෙකක්

එලිෂා ගිල්ගාල්ට නැවත ඇවිත් සිටියදී 38
දේශයෙහි දුර්භික්ෂයක් තිබුණේය; ශිෂ්‍ය
ප්‍රොපේතවරුද ඔහු ඉදිරියෙහි ඉඳගන
උන්නෝය. ලොකු සැළිය ලිපේ
තබා ප්‍රොපේතවරුන්ට කෑම පිසපන්නැයි
ඔහු තමාගේ මෙහෙකරුවාට කීවේය.
ඒක්කෙනෙක් පලා එකතුකරන්ට කෙතට 39
ගොස් වල් වැළක් සම්බවී එයින් වල්
කැකිරි කඩා තමාගේ ඔඩොක්කුව
පුරවාගන ඇවිත් ඒවා කැලිකොට කපා
කෑම සැළියේ දැමීය. මක්නිසාද ඔව්හු

ඒ මොනවාදැයි දැන නොගත්තෝය.
40 තවද ඔව්හු ඒවා මිනිසුන්ට කන පිණිස
වත්කර දුන්නෝය. නුමුත් ඔව්හු ඒ කෑම
කන අතර මොරගසා: දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යය, සැළියේ මරණය
41 තිබේයයි කීවෝය. ඔවුන්ට ඒවා කන්ට
නොහැකිවිය. ඔහුද: එසේවීනම් පිටි
ගෙනෙල්ලායයි කියා ඒවා සැළියෙහි
දමා කථාකොට: කන පිණිස සෙනඟට
වත්කර දීපල්ලායයි කීවේය. එවිට
සැළියෙහි කිසි වසක් නොවීය.
42 තවද බාල්-ෂාලිෂාහි සිට මනුෂ්‍යයෙක්
ප්‍රථම අස්වැන්නෙන් රොටිද යව රොටි
විස්සක්ද අලුත් ගොයම් කරල්ද තමාගේ
මල්ලේ දමා දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා වෙතට ගෙනාවේය. ඔහුද:
සෙනඟට කන්ට දීපන්නැයි කීවේය.
43 ඔහුගේ මෙහෙකරුවා: කිමෙක්ද? මේවා
මනුෂ්‍යයන් සියයක් ඉදිරියෙහි තබන්ටදැයි
කීවේය. එහෙත් ඔහු: ඒවා සෙනඟට
කන්ට දීපන්න; මක්නිසාද—ඔවුන් කා
ඉතුරුකරනවා ඇත කියා ස්වාමීන්-
44 වහන්සේ වදාරනසේකැයි කීවේය. එවිට
ඔහු ඒවා ඔවුන් ඉදිරියෙහි තැබීය, ඔව්හු
එයින් කා ස්වාමීන්වහන්සේගේ වචනය
ලෙස ඉතුරු කළෝය.

## නාමන්ගේ කුෂ්ඨය සුවකිරීම

5 සිරියේ රජුගේ සේනාපතියාවූ
නාමන් තමාගේ ස්වාමියා වෙත
උත්තමයෙක් ව ගරුකරනු ලැබූ
මනුෂ්‍යයෙක් ව සිටියේය, මක්නිසාද ඔහු
කරණකොටගෙන ස්වාමීන්වහන්සේ
සිරියවරුන්ට ජය දී තිබුණේය. හෙතෙම
බලසම්පන්න වික්‍රමාන්විත කෙනෙක්වූ
2 නුමුත් කුෂ්ඨ රෝගියෙක් විය. සිරියවරුන්
සමූහ වශයෙන් පිටත්ව ගිය විටක ඔවුන්
ඉශ්‍රායෙල් දේශයෙන් කුඩා කෙල්ලක්
අල්ලාගෙන ඇවිත් තිබුණේය; ඈ
3 නාමන්ගේ භාර්යාවට සේවයකළාය. ඈ
වනාහි ඇගේ ස්වාමිදුවට කථාකොට:
මාගේ ස්වාමියා සමාරියේ අනාගත-
වක්තෘ ඉදිරියෙහි පෙනීසිටියොත් හොඳය,
එවිට ඔහු ඔහුගේ කුෂ්ඨය සුවකරනවා
ඇතැයි කීවාය. එවිට එක්කෙනෙක් 4
ඇතුළට ගොස්: ඉශ්‍රායෙල් දේශයෙන්
ආ කෙල්ල මේ මේ හැටියට කීවාය
කියා තමාගේ ස්වාමියාට කීය. සිරියේ 5
රජද: ඉතින් නුඹ එහි පලයන්න, මම
ඉශ්‍රායෙල් රජුට ලියුමක් හරින්නෙමියි
කීවේය. ඔහු රිදී තලෙන්ත දසයකුත්
රන් ෂෙකෙල් හදහකුත් ඇඳුම් කුට්ටම්
දසයකුත් රැගෙන පිටත්ව ගියේය.
ඔහු ඒ ලියුම ඉශ්‍රායෙල් රජ වෙතට 6
ගෙනාවේය. මේ ලියුම ඔබට ලැබුණොම
නාමන් නම් මාගේ සේවකයාගේ
කුෂ්ඨය සුවකරන පිණිස ඔහු ඔබ ළඟට
එවීමියි එහි ලියා තිබුණේය. ඉශ්‍රායෙල් 7
රජ ලියුම කියවා තමාගේ ඇඳුම්
ඉරාගෙන: මනුෂ්‍යයෙකුගේ කුෂ්ඨය
සුවකරන්ට කියා මොහු මට ලියා
එවන්නේ මරන්ටත් ජීවත්කරන්ටත්
මම දෙවියන්වහන්සේද? මොහු මට
විරුද්ධව ඩබරයකට කාරණයක්
සොයන හැටි කල්පනාකර බලා-
පල්ලායයි කීවේය. ඉශ්‍රායෙල් රජු 8
තමාගේ ඇඳුම් ඉරාගත් බව දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාවූ එලිෂා අසා:
නුඹ මක්නිසා නුඹේ ඇඳුම් ඉරා-
ගත්තෙහිද? ඔහු මා ළඟට ආවාවේ,
එවිට ඔහු ඉශ්‍රායෙල්හි අනාගතවක්තෘ
කෙනෙකු සිටින බව දැනගන්නේයයි
රජුට කියා ඇරියේය. මෙසේ නාමන් 9
තමාගේ අශ්වයන්ද රථද ඇතුව අවුත්
එලිෂාගේ ගෙයි දොරකඩ ළඟ සිටියේය.
එලිෂා: නුඹ ගොස් යොර්දනෙහි සත් 10
වරක් නාපන්න, එවිට නුඹේ මාංසය
හරිගැහී නුඹ පවිත්‍රවන්නෙහියයි පණිවිඩ-
කාරයෙකු අත කියා ඇරියේය. නුමුත් 11
නාමන් කෝපව යන්ට ගියේය, හෙතෙම
කියනුයේ: ඔහු පිටතට මා ළඟට ඇවිත්
සිටගෙන, තමාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ නාමය කියා යාච්ඤාකර,
කුෂ්ඨය මත්තෙහි තමාගේ අත වනා
රෝගියා සුවකරනවා ඇතැයි සිතුවෙමි.
දමස්කයෙහි ගංගා වන අබානා සහ 12
පර්පර් ඉශ්‍රායෙල් දේශයේ සියලු ජල-
වලට වඩා හොඳ නොවේද? ඒවායේ
නාලා පවිත්‍රවෙන්ට මට බැරිදැයි කීවේය.

මෙසේ ඔහු කෝපයෙන් හැරී ගියේය.
13 ඔහුගේ සේවකයෝ ළඟට අවුත් ඔහුට
කථාකර: මාගේ පියාණෙනි, අනා-
ගතවක්තෘ මහත් දෙයක් කරන්ට ඔබට
කීවේ නම් ඔබ කරන්නේ නැද්ද? එසේවී-
නම් නාලා පවිත්‍රවන්නැයි ඔහු ඔබට
කී කල ඒක කරන්ට බැරිද්දැයි කීවෝය.
14 එවිට ඔහු බැස ගොස් දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාගේ කීම ලෙස
යොර්දනෙහි සත්වරක් ගිලුණේය. ඔහුගේ
මාංසයද කුඩා ළමයෙකුගේ මාංසය
මෙන් හරිගැහී ඔහු පවිත්‍රවුණේය.
15 එවිට ඔහු තමාගේ මුළු පිරිවර සමග
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා ළඟට
හැරී ඇවිත් ඔහු ඉදිරියේ සිට කථාකොට:
ඉතින් ඉශ්‍රායෙල්හි සිටින දෙවියන්-
වහන්සේ මිස මුළු පොළොවේ වෙන
දෙවිකෙනෙක් නැති බව දැන් දනිමි.
එබැවින් දැන් ඔබගේ මෙහෙකරුවාගෙන්
සතුටු පඬුරක් පිළිගත මැනවැයි කීවේය.
16 ඔහුද: මා සේවයකරන **ස්වාමීන්-
වහන්සේ** ජීවමාන බව සැබෑවා සේම
මම කිසිවක් පිළිනොගනිමියි කීවේය.
එවිට ඔහු එය පිළිගන්න හැටියට ඔහුට
පෙරැත්ත කෙළේය; එහෙත් ඔහු නො-
17 කැමති විය. එවිට නාමන්: එසේ නැත්නම්
අශ්වතරයන් දෙන්නෙකුගේ බරට පස්වත්
ඔබගේ මෙහෙකරුවාට ලැබේවා; මක්-
නිසාද මින් මතු ඔබගේ මෙහෙකරුවා
**ස්වාමීන්වහන්සේට** මිස වෙන දෙවි-
වරුන්ට දවන පූජාවක්වත් යාගයක්වත්
18 ඔප්පුකරන්නේ නැත. මේ කාරණය
ගැන **ස්වාමීන්වහන්සේ** ඔබගේ මෙහෙ-
කරුවාට කමාවනසේක්වා: එනම්, මාගේ
ස්වාමියා රිම්මොන්ගේ ගෘහයෙහි වඳින්ට
එහි මාගේ අතේ හේත්තුවී යන විට
මාත් රිම්මොන්ගේ ගෘහයෙහිදී වැන්දෙත්,
එසේ රිම්මොන්ගේ ගෘහයෙහිදී වඳින
විට, **ස්වාමීන්වහන්සේ** ඒ කාරණය ගැන
ඔබගේ මෙහෙකරුවාට කමාවන-
19 සේක්වයි කීවේය. ඔහුද: සමාදන-
යෙන් පලයන්නැයි ඔහුට කීවේය. එවිට
ඔහු එලිෂා වෙතින් පිටත්ව ටිකක් දුර
ගියේය.

## ගෙහාසි කෙරෙහි දඬුවම් පැමිණවීම

එකල දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා 20
වන එලිෂාගේ වැඩකාරයාවූ ගෙහාසී
කල්පනාකොට: බලව, මාගේ ස්වාමියා
මේ සිරියවූ නාමන් ගෙනා දේවල් ඔහුගේ
අතින් පිළිනොගෙන නිකම් ඇරියේය.
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව සැබෑවා
සේම, මම ඔහු පස්සේ දිවගොස් ඔහුගෙන්
මොකවත් ලබාගනිමියි කීවේය. මෙසේ 21
ගෙහාසී නාමන් පස්සේ ගියේය. නාමන්
තමා පස්සේ කෙනෙක් දුවගන එනවා
දැක ඔහු සම්බවෙන්ට රථයෙන් බැස:
සියල්ල හොඳද්දැයි ඇසීය. ඔහුද: සියල්ල 22
හොඳය; මාගේ ස්වාමියා—ශිෂ්‍ය
ප්‍රොපේතවරුන්ගෙන් තරුණයෝ දෙදෙ-
නෙක් එප්‍රායිම් කඳු රටේ සිට මේ දැන්
මා වෙතට ආවෝය; ඔවුන්ට රිදී තලෙන්-
තයකුත් ඇඳුම් කුට්ටම් දෙකකුත් දුන-
මැනවැයි කියන්ට මා එවූවේයයි කීවේය.
නාමන්ද: තුඹ තලෙන්ත දෙකක් ගන්ට 23
සතුටුවෙයන්නැයි කියා ඔහුට පෙරැත්ත
කර, රිදී තලෙන්ත දෙකක් මලු දෙකක
බැඳ, ඇඳුම් කුට්ටම් දෙකකුත් සමග
තමාගේ වැඩකාරයන් දෙදෙනෙකු පිට
තැබුවේය; ඔව්හු ඔහුට පෙරටුවෙන්
ඒවා උසුලාගෙන ගියෝය. හෙල ළඟට 24
පැමිණි විට ඔහු ඔවුන් අතින් ඒවා
රැගෙන ගෙයි තබා ඒ මනුෂ්‍යයන් යන්ට
හැරියේය, ඔව්හු ගියෝය. ඔහු වනාහි 25
ඇතුල්වී තමාගේ ස්වාමියා ඉදිරියෙහි
සිටියේය. එලිෂා කථාකොට: ගෙහාසී,
තුඹ කොහේ ගොහින් ආවාදැයි ඔහුගෙන්
ඇසීය. ඔබගේ මෙහෙකරුවා කොහේවත්
ගියේ නැතැයි ඔහු කීවේය. එලිෂා: ඒ 26
මනුෂ්‍යයා තමාගේ රථයෙන් බැස තුඹ
සම්බවෙන්ට හැරී ආ විට මාගේ ආත්-
මය තුඹ සමග ගියේ නැද්ද? මේක
මුදල් පිළිගන්ටත් ඇඳුම්ද ඔලීවවතුද
මිදිවතුද බැටළුවන්ද ගවයන්ද දාස
දාසීන්ද පිළිගන්ටත් වේලාවක්ද? එබැවින් 27
නාමන්ගේ කුෂ්ඨය තුඹටත් තුඹේ
වංශයටත් නිරතුරුම ඇලෙන්නේයයි
ඔහුට කීවේය. එවිට ඔහු හිම මෙන්
කුෂ්ඨය ඇතුව ඔහු වෙතින් පිටතට
ගියේය.

## එලිෂා විසින් පොරෝතලය පාවෙන්ට සැලැස්වීම

6 ශිෂ්‍ය ප්‍රොපේතවරු එලිෂාට
කථාකොට: බැලුව මැනවි, අප ඔබ
ඉදිරියෙහි වසන මේ ස්ථානය අපට
2 ඉඩ මදිය. යොර්දන ළඟට ගොස්
එතනින් එක එකා ලීයක් බැගින්
රැගෙන අපේ වාසයට එහි ස්ථානයක්
සාදගන්ට අපට අවසර ලැබේවයි
කීවෝය. පලයල්ලායයි ඔහු කීවේය.
3 එක්කෙනෙක්: ඔබද ඔබගේ මෙහෙ-
කරුවන් සමග යන්ට සතුටුවුවමැනවැයි
කීවේය. මම යමියි කියා, ඔහු ඔවුන්
4 සමග ගියේය. ඔව්හු යොර්දන ළඟට
5 පැමිණ ගස් කැපුවෝය. එක් කෙනෙක්
ලීයක් කපද්දී පොරෝතලය වතුරේ
වැටුණේය. ඔහු: අනේ මාගේ ස්වාමිනි,
ඒක ඉල්ලාගත් එකකැයි කෑගසා කීවේය.
6 එවිට දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා:
ඒක වැටුණේ කොතනදැයි ඇසුවේය. ඔහු
ඒ ස්ථානය ඔහුට පෙන්නූ විට ඔහු
දණ්ඩක් කපා එහි දැමුවේය, එවිට යකඩය
7 පාවුණේය. ඔහු: ඒක අරගනින්නැයි කීය.
හෙතෙම අත දිගුකර ඒක ගත්තේය.

## සිරියවරුන්ගේ වටලෑම වියවුල්කිරීම

8 සිරියේ රජ ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
යුද්ධකරන විට තමාගේ සේවකයන්
සමග මන්ත්‍රණයකරමින්: අසවල් අසවල්
තැන මාගේ කඳවුර විය යුතුයයි කීවේය.
9 දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාද: සිරිය-
වරුන් අසවල් තැනට බැස එන නිසා
ඒ ළඟින් නොයන හැටියට බලාගත
මැනවැයි ඉශ්‍රායෙල් රජුට කියා ඇරියේය.
10 දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා තමාට
ප්‍රවේසම්වෙන්ට කියා දැනුම්දුන් ස්ථාන-
යට ඉශ්‍රායෙල් රජ මනුෂ්‍යයන් යවා
ගැළවීගත්තේය; එසේ වුණේ වරක්
11 දෙවරක් පමණක් නොවේය. මේ කාරණය
ගැන සිරියේ රජුගේ සිත කැළඹී ඔහු
තමාගේ සේවකයන් කැඳවා: අපෙන්
ඉශ්‍රායෙල් රජුගේ පක්ෂයට සිටින්නේ
කවුද කියා නුඹලා මට දන්වන්නේ
නැද්දැයි කීවේය. ඔහුගේ සේවකයන්ගෙන් 12
එක්කෙනෙක්: මාගේ ස්වාමිවූ රජ්ජුරුවනි,
එසේ නොවේ. ඔබගේ යහන් ගබඩාවේදී
ඔබ කියන වචන ඉශ්‍රායෙල්හි අනා-
ගතවක්තෘවූ එලිෂා ඉශ්‍රායෙල් රජුට
දන්වන්නේයයි කීවේය. එවිට ඔහු: මා 13
විසින් ඔහු ගෙන්වා ගන්නා පිණිස
ඔහු කොතනද කියා නුඹලා ගොස්
බලාපල්ලායයි කීවේය. ඔහු දෝතාන්හි
සිටින්නේයයි ඔහුට දන්වන ලද්දේය.
එබැවින් ඔහු අශ්වයන්ද රථද මහත් 14
සමූහවක්ද එහි ඇරියේය. ඔව්හු රාත්‍රියේ
ඇවිත් නුවර වටලාගත්තෝය. දෙවියන්- 15
වහන්සේගේ මනුෂ්‍යයාගේ සේවකයා
අලුයම නැගිට පිටතට ගිය කල සමූහවක්
අශ්වයන් හා රථ ඇතුව නුවර වටේට
සිටිනවා දුටුවේය. එවිට ඔහු: අහෝ
ස්වාමිනි, අපි මක්කරමුදැයි ඔහුට කීය.
ඔහුද: භයනොවන්න. මක්නිසාද ඔවුන් 16
සමග සිටින්නන්ට වඩා අප සමග
සිටින්නෝ බොහෝයයි කීවේය. එවිට 17
එලිෂා යාච්ඤාකොට: **ස්වාමීන්වහන්ස,**
දකින පිණිස මොහුගේ ඇස් පැහැදුව
මැනවයි කීවේය. **ස්වාමීන්වහන්සේ**
තරුණයාගේ ඇස් පැහැදූසේක. එවිට
එලිෂා වටේට ගිනි අශ්වයන්ගෙන්ද
ගිනි රථවලින්ද කන්ද පිරී තිබෙන
බව ඔහු දුටුවේය. ඔවුන් එලිෂා 18
ළඟට බැස්ස කල ඔහු: මේ සෙනඟ
අන්ධකළ මැනවයි **ස්වාමීන්වහන්සේට**
යාච්ඤාකෙළේය. උන්වහන්සේ එලිෂාගේ
වචනය ලෙස ඔවුන් අන්ධකළසේක.
එවිට එලිෂා ඔවුන්ට කථාකොට: ඒ 19
පාර මේක නොවේ, ඒ නුවරත් මේක
නොවේ. මා පසුපස්සේ වරෙල්ලා, නුඹලා
සොයන මනුෂ්‍යයා ළඟට මම නුඹලා
ගෙනයන්නෙමියි කියා ඔවුන් සමාරියට
ගෙනගියේය. තවද ඔවුන් සමාරියට 20
පැමුණුණු විට එලිෂා: **ස්වාමීන්වහන්ස,**
පෙනෙන පිණිස මොවුන්ගේ ඇස් පැහැදුව
මැනවයි කීවේය. **ස්වාමීන්වහන්සේ**
ඔවුන්ගේ ඇස් පැහැදූසේක; ඔව්හු බැලූ
විට තමුන් සමාරිය මැද සිටින බව
දුටුවෝය. ඉශ්‍රායෙල් රජ ඔවුන් දැක: 21
මාගේ පියාණෙනි, ඔවුන්ට පහරදෙම්ද?

පහරදෙම්දැයි එලිෂාගෙන් ඇසුවේය.
22 ඔහු: තුඹ ඔවුන්ට පහර නොදිය යුතුය;
තුඹේ කඩුවෙන්ද තුඹේ දුන්නෙන්ද
අල්වාගත් තැනැත්තන්ට තුඹ පහර
දෙන්නෙහිද? ඔවුන් කා බී තමුන්ගේ
ස්වාමියා ළඟට යන පිණිස ඔවුන්
ඉදිරියෙහි කෑමද වතුරද තබන්නැයි
23 කීවේය. ඔහු ඔවුන්ට මහත් කෑමක්
පිළියෙළ කෙළේය. ඔවුන් කැවායින්
බීවායින් පසු ඔහු ඔවුන් පිටත්කර
හැරියේය, ඔව්හු තමුන්ගේ ස්වාමියා
ළඟට ගියෝය. සිරියේ සේවා කණ්ඩායම්
තවත් ඉශ්‍රායෙල් රටට නාවෝය.

## සමාරිය වටලාගැනීම

24 ඉත්පසු සිරියේ රජවූ බෙන්-හදද්
තමාගේ මුළු සේනාව රැස්කරගන ඇවිත්
සමාරිය වටලා ගත්තේය. මහත්
25 සාගතයක්ද සමාරියෙහි විය. කොටළු
හිසක් රිදී ෂෙකෙල් අසූවකටත් පරෙවි
වසුරු *කැබ් එකකින් සතරෙන් කොටසක්
රිදී ෂෙකෙල් පහකටත් විකිණෙන තෙක්
ඔව්හු සමාරිය වටලාගෙන සිටියෝය.
26 ඉශ්‍රායෙල් රජු පවුර පිට යන කල
ස්ත්‍රියක්: මාගේ ස්වාමිවූ රජ්ජුරුවනි,
පිහිටවූවමැනවැයි කියා මොරගැසුවාය.
27 ඔහු: ස්වාමින්වහන්සේ තුඹට පිහිට
නොවනසේක් නම් මම කොතැනින් තුඹට
පිහිටවෙම්ද? පාවරෙන්ද නොහොත්
28 මිදි පැසෙන්දැයි කියා: තුඹට මක්වෙලාදැයි
ඇගෙන් ඇසුවේය. ඈද: තුඹේ පුත්‍රයා
අද අපට කන්ට දියන්න, මගේ පුත්‍රයා
හෙට අපි කන්නෙමුයයි මේ ස්ත්‍රී මට
29 කීවාය. එසේ අපි මගේ පුතා උයා
කෑවෙමුව. පසුවද-තුඹේ පුත්‍රයා අපට
කන්ට දියන්නැයි ඈට කීවෙමි. නුමුත්
ඈගේ පුත්‍රයා ඈ සඟවාගන ඉන්නවා-
30 යයි කීවාය. එකල රජ පවුර පිට යමින්
සිටියේය. ඔහු වනාහි ස්ත්‍රියගේ වචන
අසා තමාගේ ඇඳුම් ඉරාගත්තේය.
සෙනඟද බලා, ඔහු ඇඟ යටට ගෝණි
31 රෙදි ඇඳ තිබෙනවා දුටුවෝය. එවිට
ඔහු: ෂාපාත්ගේ පුත්‍රවූ එලිෂාගේ හිස
අද නොසිඳ තිබෙන්ට හැරියොත්
දෙවියන්වහන්සේ මටත් එසේමද ඊට
වැඩියෙන්ද කරනසේක්වයි කීවේය. එලිෂා 32
වැඩිමහල්ලන් සමග තමාගේ ගෙදර
වාඩිව ඉන්දද්දී රජ තමා වෙතින්
මනුෂ්‍යයෙකු යැවීය. නුමුත් පණිවිඩකාරයා
ඔහු ළඟට එන්ට පළමුවෙන් එලිෂා
වැඩිමහල්ලන්ට කථාකොට: අර මිනී-
මරුවාගේ පුතා මාගේ හිස කපාදමන්ට
එවූ බව තුඹලාට පෙනෙනවාද? තුඹලා
බලා සිට පණිවිඩකාරයා ආවාම ඔහුට
ඇතුල්වෙන්ට ඉඩ නොදී දොර වසා එය
තදකරගන සිටපල්ලා. ඔහුට පස්සෙන්
එන ඔහුගේ ස්වාමියාගේ අඩි ශබ්දය
ඇසෙන්නේ නැද්දැයි කීවේය. ඔහු ඔවුන් 33
සමග කථාකරද්දීම පණිවිඩකාරයා
ඔහු ළඟට ආවේය. රජු කථාකොට:
මේ නපුර ස්වාමීන්වහන්සේගෙන්ය;
ස්වාමීන්වහන්සේ ගැන මා තවත්
බලාපොරොත්තු වෙන්නේ මොකටදැයි
කීවේය. එවිට එලිෂා කථාකොට:

7

ස්වාමීන්වහන්සේගේ වචනය
අසාපල්ලා-හෙට මේ වේලාවට පමණ
ෂෙකෙලයකට සිහින් පිටි මිම්මක්ද
ෂෙකෙලයකට යව මිම් දෙකක්ද සමාරියේ
දොරටුවෙහි විකිණෙනවා ඇත කියා
ස්වාමීන්වහන්සේ වදාරනසේකැයි කීවේය.
එවිට රජු අත පිට හේත්තුවී සිටි අධිපති 2
තෙමේ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාට
උත්තරදෙමින්: ස්වාමීන්වහන්සේ අහසේ
කවුළු සෑදුවත් මේක සිද්ධවිය හැකිදැයි
කීවේය. ඒක තුඹේ ඇස්වලින් දක්නෙහිය,
නුමුත් එයින් නොකන්නෙහියයි ඔහු
කීවේය.

## සමාරිය ගළවාගැනීම

කුෂ්ඨරෝගීන් සතරදෙනෙක් වාසල් 3
දොරකඩ සිටියෝය. ඔව්හු එකිනෙකාට
කථාකොට: අපි නහින තුරු කුමට
මෙහි සිටිමුද? අපි නුවරට ඇතුල්වෙමුයයි 4
කීවත් නුවර සාගතය තිබෙන බැවින්
අප එහි නසිනවා ඇත. මෙහි සිටියත්
නසිනවා ඇත. ඉත්නිසා දැන් වරෙල්ලා,
අපි සිරියවරුන්ගේ සේනාවට එකතුවෙමු.

*එනම්, සේරු බාගයක්.

ඔවුන් අප ආරක්ෂාකළොත් අපි ජීවත්-
වන්නෙමුව; ඔවුන් අප මැරුවොත් අපට
මරණය සිද්ධවෙනවා පමණකැයි
5 කීවෝය. එසේ ඔව්හු සිරියවරුන්ගේ
කඳවුරට යන පිණිස අරුණු වේලෙහිම
නැගුටුණෝය. නුමුත් ඔවුන් සිරියවරුන්ගේ
කඳවුරේ සීමාවට පැමුණුණ විට එහි
6 කිසිවෙක් නැති බව දුටුවෝය. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** රථ ඝෝෂාවක්ද අශ්ව
ඝෝෂාවක්ද යන මහත් සේනාවක
ඝෝෂාවක් සිරියවරුන්ගේ සේනාවට
ඇසෙන්ට සැලැස්වූසේක. ඔව්හු එකි-
නෙකාට කථාකොට: ඉශ්‍රායෙල් රජ
හිත්තීවරුන්ගේද මිසරවරුන්ගේද රජුන්
අපට විරුද්ධව කුලියට ගෙන්වාගත්තේය
7 කියා, නැගිට රෑයින් පලාගියෝය.
ඔව්හු තමුන්ගේ කූඩාරම්ද අශ්වයන්ද
කොටළුවන්ද ඇතුළුව කඳවුර තිබුණු
හැටියටම අත්හැර තමුන්ගේ ප්‍රාණය
8 ගළවාගන්ට පලාගියෝය. ඒ කුෂ්ඨරෝගීන්
කඳවුරේ සීමාවට පැමුණුණවිට ඔව්හු
එක් කූඩාරමකට ඇතුල්වී කා බී, එතනින්
රන් රිදී සහ වස්ත්‍ර රැගෙන ගොස් සඟවා
තබා, නැවත හැරී ඇවිත් වෙන කූඩාරමකට
ඇතුල්වී, එතැනිනුත් රැගෙන ගොස්
9 සඟවා තැබුවෝය. එවිට ඔව්හු එකිනෙකාට
කථාකොට: අප කරන දේ හරි නැත.
අද දවස හොඳ ආරංචි ඇති දවසක් ව
තිබෙද්දී අපි නිශ්ශබ්දව සිටිමුව. උදය
එළිවෙන තුරු ප්‍රමාදවුණොත් අපට වරද
පැමිණෙයි. ඉන්නිසා වරෙල්ලා, අපි
10 රජ ගෙදරට දන්වමුයයි කීවෝය. මෙසේ
ඔව්හු ඇවිත් නුවර දොරටුපාලයන්ට හඬ-
ගසා කථාකොට: අපි සිරියවරුන්ගේ
කඳවුරට ගියෙමුව, එහි කිසි මනුෂ්‍ය-
යෙක්වත් මනුෂ්‍ය හඬක්වත් නැත, බැඳපු
අශ්වයොත් බැඳපු කොටළුවොත් සිටිති,
කූඩාරම්ද තිබුණු හැටියටම තිබේයයි
11 ඔවුන්ට දන්නුවෝය. දොරටුපාලයෝ හඬ-
ගසා රජ ගෙදර වැසියන්ට දන්නුවෝය.
12 රජතෙමේ රාත්‍රියේ නැගිට තමාගේ
සේවකයන්ට කථාකොට: ඉතින් සිරිය-
වරුන් අපට කර තිබෙන කාරණය
නුඹලාට දන්වමි. අපට බඩගිනි ඇති
බව ඔව්හු දනිති; එබැවින් අප නුවරින්
පිටත ආ කල ඔව්හු අප පණපිටින්
අල්ලා නුවරට ඇතුල්වෙන්ට සිතාගන
පිටත සැඟවී ඉන්ට කඳවුර අත්හැර
ගියෝයයි කීවේය. සේවකයන්ගෙන් 13
එක්කෙනෙක් උත්තරදෙමින්: නුවර
ඉතුරුව සිටින අශ්වයන්ගෙන් පස්දෙනෙකු
රැගෙන ගොස් බලන්ට මනුෂ්‍යයන් යවමු,
ඔවුන් මෙහි ඉතුරුව සිටින මුළු ඉශ්‍රායෙල්
සමූහයා මෙන්ය; ඔවුන් විනාශවූ මුළු
ඉශ්‍රායෙල් සමූහයා මෙන්යයි කීවේය.
ඔව්හු අශ්වයන් යෙදූ රථ දෙකක් ගත්- 14
තෝය; ගොස් බලාපල්ලාය කියා රජ
සිරිය සේනාව පස්සේ ඔවුන් යැවීය.
ඔව්හු ඔවුන් පස්සේ යොර්දන් දක්වා 15
ගියෝය. මාවත දිගටම සිරියවරුන්
ඉක්මනින් පලායද්දී වීසිකළ වස්ත්‍රවලින්
සහ භාජනවලින් පිරී තිබුණේය. පණිවිඩ-
කාරයෝ හැරී ඇවිත් රජුට දන්නුවෝය.
සෙනඟ ගොස් සිරියවරුන්ගේ කඳවුර 16
කොල්ල කෑවෝය. මෙසේ **ස්වාමීන්-
වහන්සේගේ** වචනය ලෙස ෂෙකෙලයකට
සිහින් පිටි නැළියක්ද ෂෙකෙලයකට යව
නැළි දෙකක්ද විකිණෙන්ට යෙදුණේය.
තමාගේ අත පිට රජු හේත්තුවී සිටි 17
අධිපතියා රජු විසින් දොරටුව බලා-
ගැනීමට පත්කරනලද්දේය. ඔහු දොරටු-
වේදී සෙනඟට පෑගී මැරුණේය. මෙසේ
රජු දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා
ළඟට ගිය විට ඔහු කී ලෙස සිද්ධවුණේය.
යව නැළි දෙකක් ෂෙකෙලයකටද සිහින් 18
පිටි නැළියක් ෂෙකෙලයකටද හෙට මේ
වේලාවට පමණ සමාරියේ දොරටුවෙහි
විකිණෙනවා ඇත කියා දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයා රජුට කථාකර
කී විට, ඒ අධිපතියා දෙවියන්වහන්සේ- 19
ගේ මනුෂ්‍යයාට උත්තරදෙමින්: බලව,
**ස්වාමීන්වහන්සේ** අහසේ කවුළු සෑදුවත්
එබඳු දෙයක් සිද්ධවිය හැකිදැයි කීවේය.
එලිෂා කථාකොට: නුඹ ඒක නුඹේ
ඇස්වලින් දක්නෙහිය, නුමුත් එයින්
නොකන්නෙහියයි කීවේය. එසේම ඔහුට 20
සිද්ධවිය; ඔහු දොරටුවේදී සෙනඟට පෑගී
මැරුණේය.

## ෂුනෙම්මිය ස්ත්‍රීගේ දේපළ. හසායෙල් රජවීම

8 තවද එලිෂා විසින් නැවත පණ
දුන්නාවූ ළමයාගේ මවුට ඔහු
කථාකොට: තුඹේ ගෙයි වැසියන් සමග
තුඹ පිටත්ව ගොස් තුඹට පොරොත්තුව
සිටින්ට පුළුවන් තැනක සිටපන්න.
මක්නිසාද ස්වාමීන්වහන්සේ සාගතයක්
නියමකර තිබේ; එය සත් අවුරුද්දක්
2 දේශයෙහි පවතිනවා ඇතැයි කීවේය. ඒ
ස්ත්‍රී දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාගේ
වචනය ලෙස කරමින් ඈගේ ගෙයි
වැසියන් සමග පිටත්ව ගොස් පිලිස්ති-
වරුන්ගේ දේශයෙහි සත් අවුරුද්දක්
3 සිටියාය. සත් අවුරුද්ද කෙළවරදී ඒ
ස්ත්‍රී පිලිස්තිවරුන්ගේ දේශයෙන් හැරී
ආවාය. තවද ඈ ඈගේ ගෙය සහ බිම්
ගැන රජුට අයදින්ට පිටත්ව ආවාය.
4 එකල්හි රජ: එලිෂා කළාවූ සියලු
මහත් දේවල් මට කියාපන්නැයි කියා
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාගේ වැඩ-
කාර ගෙහාසී සමග කථාකරකර
5 සිටියේය. ඔහු විසින් මළ කෙනෙකු
ජීවත්කළ හැටි රජුට කියද්දීම, බලව,
එසේ ඔහු විසින් නැවත පණ දුන්නාවූ
ළමයාගේ මවු තමාගේ ගෙය සහ බිම්
ගැන රජුට අයැද සිටියාය. ගෙහාසී:
මාගේ ස්වාමිවූ රජ්ජුරුවෙනි, මැ ඒ
ස්ත්‍රීය, මේ එලිෂා විසින් නැවත පණ
6 දුන් ඈගේ පුත්‍රයායයි කීය. රජුද ස්ත්‍රී-
ගෙන් ඇසූ විට ඈ ඔහුට කීවාය.
තවද රජ තෙමේ ඈ ගැන එක්තරා
මුලාදෑනියෙකු නියමකොට: ඈට
අයිතිවූ සියල්ලද ඈ දේශය අත්හැර
ගිය ද පටන් මේ වන තුරු බිමෙන්
හටගත් සියලු එලද ඈට ලබාදීපන්නැයි
කීවේය.
7 එලිෂා දමස්කයට පැමුණුණේය; එකල්හි
බෙන්-හදද් රජ ලෙඩින් සිටියේය. එවිට:
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා මෙහි
ආයේය කියා ඔහුට දන්වන ලද්දේය.
8 රජ හසායෙල්ට කථාකොට: තුඹේ අතේ
තෑග්ගක් රැගෙන දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයා සම්මුඛවෙන්ට ගොස්-මේ
ලෙඩෙන් මට සුව වන්නේදැයි ඔහු ලවා
ස්වාමීන්වහන්සේගෙන් විචාරවාපන්නැයි
කීවේය. එවිට හසායෙල් තමාගේ අතේ 9
තෑග්ගක් ගෙන, දමස්කයේ සියලු ආකාර
හොඳ දේවල් ඔටුවන් සතළිස් දෙනෙකු
පිට පටවාගන ඔහු වෙතට පැමිණ
ඔහු ඉදිරියෙහි සිට: මේ ලෙඩෙන් මට
සුවවන්නේද කියා විචාරන්ට ඔබගේ
පුත්‍රවූ සිරියේ රජවූ බෙන්-හදද් මා ඔබ
ළඟට එවුවේයයි කීවේය. එලිෂාද: තුඹ 10
ගොස්-සැබවින් ඔබට සුවවන්නේයයි
ඔහුට කියාපන්න; නුමුත් ඔහු සැබවින්
නසින බව ස්වාමීන්වහන්සේ මට
පෙන්වා තිබේයයි ඔහුට කීවේය. තවද 11
බේදයට පත්වෙන තුරුම දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයා ඔහු දෙස
තදින් බලාසිට පසුව ඇඬුවේය. එවිට 12
හසායෙල්; මාගේ ස්වාමියා අඬන්නේ
මක්නිසාදැයි ඇසීය. ඔහු උත්තරදෙමින්:
තුඹ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කරන්ට යන
නපුර මා දන්නා නිසාය. තුඹ ඔවුන්ගේ
බලකොටු ගිනිලා, ඔවුන්ගේ යෞවනයන්
කඩුවෙන් නසා, ඔවුන්ගේ දරුවන්
බිමගසා මරා, ඔවුන්ගේ ගර්භිණීන්
ඉරා දමන්නෙහියයි කීවේය. හසායෙල්ද: 13
බල්ලෙක් වැනිවූ ඔබගේ මෙහෙකරුවා
විසින් ඒ බරපතළ දේ කරන්ට ඔහු
කවුදැයි කීවේය. එලිෂා: තුඹ සිරිය
කෙරෙහි රජ වෙන බව ස්වාමීන්වහන්සේ
මට පෙන්වා තිබේයයි කීවේය. ඔහු 14
එලිෂා වෙතින් ගොස් තමාගේ ස්වාමියා
ළඟට පැමිණි විට එලිෂා තුඹට කීවේ
කුමක්දැයි හෙතෙම ඔහුගෙන් ඇසුවේය.
සැබවින් ඔබට සුවවෙනවා ඇතැයි මට
කීයේයයි ඔහු කීය. පසුවද ඔහු දළ 15
රෙද්දක් ගෙන වතුරේ ගල්වා ඔහුගේ
මුහුණ පිට එළා තැබුවේය, එයින් ඔහු
මැරුණේය. හසායෙල් ඔහු වෙනුවට
රජවුණේය.

## යෙහෝරාම්ගේ හා අහසියාගේ රාජ්‍ය පාලනය

ඉශ්‍රායෙල් රජවූ ආහබ්ගේ පුත්‍රවූ 16
යෝරාම්ගේ පස්වෙනි අවුරුද්දේ

යෙහෝෂාපාට් යූදාහි රජව සිටියදී
යූදාහි රජවූ යෙහෝෂාපාට්ගේ පුත්‍රවූ
17 යෙහෝරාම් රජ වුණේය. ඔහු තිස්
දෑවුරුදු වයසේදී රජ වී යෙරුසලමේ
18 අට අවුරුද්දක් රජකම්කෙළේය. ආහබ්ගේ
වංශය කළාක් මෙන් ඔහු ඉශ්‍රායෙල්
රජුන්ගේ මාර්ගයෙහි හැසුරුණේය.
මක්නිසාද ඔහු ආහබ්ගේ දූව සරණ-
පාවාගෙන **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය.
19 එසේවීනුමුත් **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
මෙහෙකරුවූ දාවිත්ට ඔහුගේ පුත්‍රයන්
අතරෙන් නිතරම පහනක් දෙන්ට
පොරොන්දුවුණු ලෙස, ඔහු නිසා යූදා
20 නැතිකරන්ට අකමැතිවූසේක. ඔහුගේ
කාලයේදී ඒදෝම්වරු කැරළිගසා, යූදා
යටතෙන් අහක්ව, තමුන්ට රජෙකු
21 පත්කරගත්තෝය. එවිට යෝරාම් තමා-
ගේ සියලු රථ රැගෙන ශායීර්ට ගොස්
රෑ නැගිට තමා වටකරගත සිටි
ඒදෝම්වරුන්ටත් රථාධිපතීන්ටත් පහර-
දුන්නේය. එවිට සෙනඟ තමුන්ගේ
22 කූඩාරම්වලට පලාගියෝය. මෙසේ
ඒදෝම්වරු අද දක්වා යූදාවරුන්ට
විරුද්ධව කැරළිගසන්නෝය. එම
කාලයේදී ලිබ්නාවරුද කැරළිගැසුවෝය.
23 යෝරාම්ගේ අනික් ක්‍රියාවල්ද ඔහු කළ
සියල්ලද යූදා රජුන්ගේ ලේකම් පොතේ
24 ලියා තිබෙනවා නොවේද? යෝරාම්
තමාගේ පියවරුන් සමග සැතපී තමාගේ
පියවරුන් සමග දාවිත්ගේ නුවර තැන්පත්-
කරනු ලැබීය. ඔහුගේ පුත්‍රවූ අහසියා
ඔහු වෙනුවට රජවුණේය.

25 ඉශ්‍රායෙල් රජවූ ආහබ්ගේ පුත්‍රවූ
යෝරාම්ගේ දොළොස්වෙනි අවුරුද්දේදී
යූදාහි රජ වන යෙහෝරාම්ගේ පුත්‍රවූ
26 අහසියා රජ වුණේය. අහසියා විසි
දෑවුරුදු වයසේදී රජවී යෙරුසලමේ
අවුරුද්දක් රජකම්කෙළේය. ඔහුගේ මවුගේ
නම අතාලියාය, ඈ ඉශ්‍රායෙල් රජවූ
27 ඔම්රීගේ දූවෙක්ය. ඔහු ආහබ්ගේ වංශයේ
මාර්ගයෙහි හැසිර, ආහබ්ගේ වංශය
කළ ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය.
මක්නිසාද ඔහු ආහබ්ගේ පවුලට බැනා
වුණේය. ඔහු ආහබ්ගේ පුත්‍රවූ යෝරාම් 28
සමග සිරියේ රජවූ හසායෙල්ට විරුද්ධව
රාමොත්-ගිලියද්හි යුද්ධ කරන්ට ගියේය.
සිරියවරු යෝරාම්ට තුවාල කළෝය.
යෝරාම් රජ තමා සිරියේ රජවූ 29
හසායෙල්ට විරුද්ධව යුද්ධ කරද්දී
රාමාහිදී සිරියවරුන් විසින් ඔහුට කළ
තුවාල යෙස්‍රෙයෙල්හි සුවකර ගන්නා
පිණිස හැරී ආවේය. යූදාහි රජවූ යෙහෝ-
රාම්ගේ පුත්‍රවූ අහසියාද ආහබ්ගේ පුත්‍රවූ
යෝරාම් රෝගාතුරව සිටිය නිසා ඔහු
බලන්ට යෙස්‍රෙයෙල්ට ගියේය.

## යේහු. ඔහු විසින් ලේ වැගිරවීම

9 අනාගතවක්තෘවූ එලිෂා ශිෂ්‍ය
ප්‍රොපේතවරුන්ගෙන් එක්කෙනෙකුට
අඬගසා: නුඹ ඉඟටිය බැඳගෙන මේ
තෙල් කුලාව අතින් රැගෙන රාමොත්-
ගිලියද්ට පලයන්න. නුඹ එහි පැමිණි 2
කල නිම්ෂීගේ පුත්‍රයා වන යෙහෝෂාපාට්-
ගේ පුත්‍රවූ යේහු සොයාගන එහි ඇතුල්වී,
ඔහුගේ සහෝදරයන් අතරෙන් ඔහු
කැඳවාගන ඇතුල් ගෙයකට ගොස්, තෙල් 3
කුලාව රැගෙන ඔහුගේ හිසේ වත්කොට:
මම නුඹ ඉශ්‍රායෙල් කෙරෙහි රජකොට
ආලේපකෙළෙමියි **ස්වාමීන්වහන්සේ**
වදාරනසේක කියා, දොර හැර ප්‍රමාද
නොවී පලායන්නැයි කීවේය. මෙසේ ඒ 4
තරුණ ප්‍රොපේත තැන රාමොත්-ගිලියද්ට
ගියේය. ඔහු ඇතුල්වෙන කොට සේනා- 5
පතියෝ හිඳගෙන උන්නෝය; එවිට ඔහු:
අධිපතියාණෙනි, නුඹට වචනයක් කියන්ට
මට තිබේයයි කීය. අප සියල්ලන්ගෙන්
කාටදැයි යේහු ඇසීය. අධිපතියාණෙනි,
නුඹටයයි ඔහු කීවේය. හෙතෙම නැගිට 6
ගේ ඇතුළට ගියේය; එවිට ඒ තරුණයා
ඔහුගේ හිසේ තෙල් වත්කොට: ඉශ්‍රා-
යෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ
වදාරනසේක—**ස්වාමීන්වහන්සේගේ** සෙන-
ඟවූ ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජකමට
නුඹ ආලේපකෙළෙමි. මාගේ මෙහෙ- 7
කරුවන්වූ ප්‍රොපේතවරුන්ගේ ලේද
**ස්වාමීන්වහන්සේගේ** සියලු මෙහෙ-

කරුවන්ගේ ලේද ගැන මා විසින්
යෙසෙබෙල්ගෙන් පළිගන්නා පිණිස නුඹේ
ස්වාමිවූ ආහබ්ගේ වංශයට පහර දීපන්න.
8 ආහබ්ගේ මුළු වංශය විනාශවන්නේය.
ඉශ්‍රායෙල්වරුන් අතරේ දසයන් නුමුත්
නිර්දසයන් නුමුත් ආහබ්ගේ සියලු
9 පිරිමින් සිඳදමා, ආහබ්ගේ වංශය
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්ගේ
වංශය මෙන්ද අහියාගේ පුත්‍රවූ බාෂාගේ
වංශය මෙන්ද වන්ට සලස්වන්නෙමි.
10 බල්ලෝ යෙස්‍රෙයෙල් බිම් කොටසෙහිදී
යෙසෙබෙල් කන්නෝය, ඈ තැන්පත්කරන්ට
කිසිවෙක් නොසිටින්නේයයි කීසේකැයි
11 ඔහුට කියා දෙර හැර පලාගියේය. එකල
යේහු තමාගේ ස්වාමියාගේ සේවකයන්
වෙතට ආයේය. එක්කෙනෙක්: සියල්ල
හොඳද? ඒ පිස්සා නුඹ ළඟට ආවේ
මක්නිසාදැයි ඔහුගෙන් ඇසීය. ඔහුද: ඒ
මනුෂ්‍යයාත් ඔහුගේ කථාවත් නුඹලා
12 දන්නහුයයි ඔවුන්ට කීවේය. ඒ බොරුය,
අපට කියාපන්නැයි ඔව්හු කීවෝය.
හෙතෙමේ: මම ඉශ්‍රායෙල් කෙරෙහි නුඹ
රජකමට ආලේපකෙළෙමියි ස්වාමීන්-
වහන්සේ වදරනසේක කියා මේ මේ
13 හැටියට මට කීවේයයි කීය. එවිට ඔව්හු
ඉක්මන්ව එකිනෙකා තම තමාගේ
වස්ත්‍රය රැගෙන ඔහුට යටින් ඒවා
පඩිපෙළ මත්තෙහි එළා, හොරණෑ පිඹ:
14 යේහු රජ්ජුරුවෝයයි කීවෝය. මෙසේ
නිම්ෂීගේ පුත්‍රවූ යෙහෝෂාපාට්ගේ පුත්‍රවූ
යේහු යෝරාම්ට විරුද්ධව කුමන්ත්‍රණය-
කළේය. (එකල යෝරාම්ද සියලු
ඉශ්‍රායෙල්වරුද සිරියේ රජවූ හසායෙල්
නිසා රාමොත්-ගිලියද් මුරකරමින්
15 සිටියෝය.) නුමුත් යෝරාම් රජ තමා
සිරියේ රජවූ හසායෙල්ට විරුද්ධව
යුද්ධකරන අතර සිරියවරුන් විසින්
තමාට කළ තුවාල සුවකරගන්න පිණිස
යෙස්‍රෙයෙල්ට හැරී ඇවිත් සිටියේය. තවද
යේහු: නුඹලා කැමතිනම් යෙස්‍රෙයෙල්ට
ගොස් දන්වන පිණිස නුවරින් කාටවත්
ගැළවී යන්ට ඉඩනොදෙල්ලාය කියා,
16 රථයට නැගී යෙස්‍රෙයෙල්ට ගියේය;
මක්නිසාද යෝරාම් එහි ඔත්පළව
උන්නේය. යුදෙහි රජවූ අහසියාද යෝරාම්
බලන්ට එහි ඇවිත් සිටියේය. යෙස්‍රෙ- 17
යෙල්හි කොටුව උඩ සිටි මුරකාරයා
යේහුගේ සමූහව එනවා දැක: සමූහයක්
මට පෙනේයයි කීය. යෝරාම්ද: නුඹ
අසරුවෙකුට අඬගසා–සමාදනයෙන්දැයි
අසන්ට ඔවුන්ගේ පෙරමගට ඇරපන්නැයි
කීවේය. මෙසේ එක්කෙනෙක් අශ්වයෙකු 18
පිට නැගී ඔහුගේ පෙරමගට ගොස්:
සමාදනයෙන්දැයි රජ අසන්නේයයි කීය.
යේහුද: සමාදනයෙන් නුඹට ඇති කම
මොකද? හැරී මා පස්සෙන් වරෙන්නැයි
කීවේය. මුරකාරයා කථාකොට:
පණිවිඩකාරයා ඔවුන් ළඟට පැමුණුණ
නුමුත් ආපසු නොඑන්නේයයි කීවේය.
එවිට ඔහු දෙවෙනි අසරුවෙකු යැවීය, 19
ඔහුද ඔවුන් ළඟට ඇවිත්: සමාදන-
යෙන්දැයි රජ අසන්නේයයි කීය. යේහුද:
සමාදනයෙන් නුඹට ඇති කම මොකද?
හැරී මා පස්සෙන් වරෙන්නැයි කීවේය.
මුරකාරයාද: ඔහු ඔවුන් ළඟට පැමුණුණ 20
නුමුත් නැවත නොඑන්නේය. දැක්කීම
නම් නිම්ෂීගේ පුත්‍රවූ යේහුගේ දැක්කීම
වාගේය; මක්නිසාද ඔහු වේගයෙන්
දක්කන්නේය කියා දැන්නුවේය. යෝ- 21
රාම්ද: රථය සූදනම්කරපල්ලායයි කීවේය.
ඔව්හු ඔහුගේ රථය සූදනම් කළෝය.
ඉශ්‍රායෙල් රජවූ යෝරාම්ද යූදෙහි රජවූ
අහසියාද තම තමාගේ රථයට නැගී
පිටත්වී යේහුගේ පෙරමගට ගොස්,
යෙස්‍රෙයෙලිය නාබොත්ගේ බිම් කොට-
සේදී ඔහුට සම්මුඛවුණෝය. යෝරාම් 22
යේහු දුටු විට: යේහු, සමාදනයෙන්දැයි
ඇසීය. ඔහු උත්තරදෙමින්: නුඹේ
මවුවූ යෙසෙබෙල්ගේ වේශ්‍යාකමද ඇගේ
මායාද මෙපමණ තිබියදී මොන
සමාදනයක්දැයි කීවේය. එවිට යෝරාම් 23
හැරී පලායමින්: අහෝ අහසියා, මෙන්න,
ද්‍රෝහිකමය කියා අහසියාට කීවේය.
නුමුත් යේහු මුළු ශක්තියෙන් දුන්න ඇද 24
යෝරාම්ගේ බාහු දෙක අතරට විද්දේය,
ඊගහ වනාහි ඔහුගේ හෘදයෙන් පිට-
වුණේය, ඔහු රථයෙහි වැටුණේය. එවිට 25
යේහු තමාගේ අධිපතියාවූ බිද්කර්ට
කථාකොට: ඔහු රැගෙන යෙස්‍රෙයෙලිය
නාබොත්ගේ බිම් කොටසෙහි දමාපන්න.

මක්නිසාද මාත් තුඹත් එක්ව ඔහුගේ
පියවූ ආහබ් පස්සෙන් අසුන් පිට යන
විට **ස්වාමීන්වහන්සේ** ඔහුට විරුද්ධව
26 කී තීරණ-වාක්‍යය සිහිකරපන්න; එනම්:
සැබවින් නාබොත්ගේද ඔහුගේ පුත්‍රයන්-
ගේද ලේ ඊයේ දුටුවෙමියි **ස්වාමීන්-
වහන්සේ** වදරනසේක. තවද මම මේ
බිම් කොටසේදී තුඹට ප්‍රතිඵල දෙන්-
නෙමියි **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කීවේය. එබැවින් ඔහු රැගෙන **ස්වාමීන්-
වහන්සේගේ** වචනය ලෙස මේ බිම්
27 කොටසෙහි දමාපන්නැයි කීවේය. යූදහි
රජවූ අහසියා ඒ දැක *උයනේ ගේ
මගින් පලාගියේය. යේහු ඔහු පස්සේ
එළවාගනගොස්: ඔහුටත් රථයේ ඉන්දද්දී
පහරදීපල්ලායයි කීවේය. එසේ ඔව්හු
ඉබ්ලියාම් ළඟ ගූර් නම් ගොඩැල්ලේදී
ඔහුට පහරදුන්නෝය. ඔහු මෙගිද්දෝට
28 පලාගොස් එහිදී මළේය. ඔහුගේ
සේවකයෝ ඔහු රථයකින් යෙරුසලමට
ගෙනගොස් දාවිත්ගේ නුවර ඔහුගේ
පියවරුන් සමග ඔහුගේ සොහොන්ගෙයි
තැන්පත්කළෝය.
29 ආහබ්ගේ පුත්‍රවූ යෝරාම්ගේ එකො-
ළොස්වෙනි අවුරුද්දේදී අහසියා යූද
කෙරෙහි රජවුණේය.
30 යේහු යෙස්‍රෙයෙල්ට ආ කල යෙසෙබෙල්
ඒ අසා ඇගේ ඇස්වල අඳුන් ගා හිස
31 සරසාගෙන කවුළුවෙන් බැලුවාය. යේහු
දොරටුවෙන් ඇතුල්වෙන විට ඈ කථා-
කොට: ස්වකීය ස්වාමියා මැරූ සිම්රි,
32 තුඹ සමාදානයෙන්දැයි ඇසුවාය. ඔහු
කවුළුව දෙසට මුහුණ ඔසවා: මාගේ
පැත්තට සිටින්නේ කවුද? කවුදැයි
ඇසුවේය. එවිට නපුංසකයන් දෙතුන්-
33 දෙනෙක් ඔහු දෙස බැලුවෝය. ඈ
පහළට හෙළාපල්ලායයි ඔහු කීය. ඔව්හු
ඈ පහළට හෙළුවෝය. ඇගේ ලේවලින්
මදක් භිත්තියෙත් අශ්වයන් පිටත්
34 ඉසුණේය. ඔහු ඈ පාගාගත්තේය. ඔහු
ඇතුල්වී පසුව කා බී: ඒ ශාපලත්
ස්ත්‍රිය රජෙකුගේ දුවෙක් නිසා බලා ඈ
35 තැන්පත්කරපල්ලායයි කීවේය. ඔව්හු ඈ
තැන්පත්කරන්ට ගිය විට ඇගේ

*හෙවත්, බෙත්-හගක් දෙසට.

ඉස්කබලද පාදද දෙඅල්ලද මිස ඇගෙන්
වෙන කිසිවක් සම්බනොවී, හැරී ගොස් 36
ඔහුට දන්නුවෝය. ඔහු කථාකොට:
මේ **ස්වාමීන්වහන්සේ** තමන්ගේ මෙහෙ-
කරුවූ තිෂ්බිය එලියා ලවා කියෙවූ
වචනයය-යෙස්‍රෙයෙල් බිම් කොටසේදී
බල්ලෝ යෙසෙබෙල්ගේ මාංස කන්නෝය.
මේ යෙසෙබෙල්යයි කියන්ට බැරි වන 37
ලෙස යෙසෙබෙල්ගේ මළකඳ යෙස්‍රෙයෙල්
බිම් කොටසෙහි පොළොව මතුපිට කසළ
මෙන් වන්නේය කියා කීසේකැයි කීවේය.

## රාජකුමාරයන් මරාදැමීම

10 ආහබ්ගේ පුත්‍රයන් සැත්තෑදෙනෙක්
සමාරියේ සිටියෝය. යේහු ලියුම්
ලියා සමාරියේ සිටි යෙස්‍රෙයෙල්හි
අධිපතීන්වූ වැඩිමහල්ලන්ටද ආහබ්ගේ
දරුවන් ඇතිදැඩිකළ තැනැත්තන්ටද
ඇරියේය. එහි ලියා තිබුණේ: තුඹලාගේ 2
ස්වාමියාගේ පුත්‍රයන් තුඹලා ළඟ සිටින
නිසාත් රථ සහ අශ්වයන්ද පවුරු ඇති
නුවරක්ද යුද්ධායුධද තිබෙන නිසාත්
මේ ලියුම තුඹලාට ලැබුණු වහාම,
තුඹලාගේ ස්වාමියාගේ පුත්‍රයන්ගෙන් 3
ඉතා හොඳ සුදුසු තැනැත්තා තෝරාගෙන
ඔහුගේ පියාගේ සිංහාසනයේ හිඳුවා,
තුඹලාගේ ස්වාමියාගේ වංශය උදෙසා
සටන්කරපල්ලාය යනුය. නුමුත් ඔව්හු 4
අතිශයින් භයව කථාකොට: බලව, ඒ
රජවරුන් දෙදෙනාට ඔහු ඉදිරිපිට සිටින්ට
නුපුළුවන්විය, එසේ නම් අපි කෙසේ
සිටිමුදැයි කීවෝය. එවිට ගෙයි ප්‍රධානියාද 5
නුවර ප්‍රධානියාද වැඩිමහල්ලෝද රාජ
කුමාරයන් ඇතිදැඩිකළ අයද යේහු
වෙතට පණිවිඩයක් යවමින්: අපි ඔබගේ
මෙහෙකරුවෝය, ඔබ අපට අණකරන
සියල්ල කරන්නෙමුව; කිසිවෙකු රජකර
නොගන්නෙමුව. ඔබට යහපත්ව පෙනෙන
හැටියට කළමැනවැයි කීවෝය. එවිට 6
ඔහු දෙවෙනි වර ඔවුන්ට ලියුමක් ලියා:
තුඹලා මාගේ පක්ෂයට සිට මාගේ
හඬට ඇහුම්කන් දෙනවා නම්, තුඹලාගේ
ස්වාමියාගේ පුත්‍රවූ මනුෂ්‍යයන්ගේ හිස්
රැගෙන හෙට මේ වේලාවට මා ළඟට

යෙස්‍රෙයෙල්ට වරෙල්ලායයි කියා
හැරියේය. රජුගේ පුත්‍රයන් හැත්තෑදෙනා
වනාහි ඔවුන් ඇතිදැඩිකළ නුවර
7 මූලාදෑනීන් වෙත සිටියෝය. තවද ඒ
ලියුම ඔවුන්ට ලැබුණු කල ඔව්හු රජුගේ
පුත්‍රයන් අල්වා, හැත්තෑ දෙනෙක්වූ ඔවුන්
මරා, ඔවුන්ගේ හිස් පැස්වල දමා, ඔහු
8 වෙතට යෙස්‍රෙයෙල්ට යැවුවෝය. එවිට
පණිවිඩකාරයෙක් ඇවිත්: රජුගේ පුත්‍ර-
යන්ගේ හිස් ගෙනැත් තිබේයයි ඔහුට
දන්නුවේය. හෙට වෙන තුරු ඒවා
ගොඩවල් දෙකක් කොට දොරටුව ළඟ
9 තබාපල්ලායයි ඔහු කීවේය. පසුවද
උදෑසන ඔහු පිටතට ගොස් සිටගෙන
මුළු සෙනඟට කථාකොට: නුඹලා
ධර්මිෂ්ඨයෝය. මම මාගේ ස්වාමියාට
විරුද්ධව කුමන්ත්‍රණය කොට ඔහු
මැරීමි; නුමුත් මොවුන් සියල්ලන් මැරුවේ
10 කවුද? එබැවින් **ස්වාමීන්වහන්සේ**
ආහබ්ගේ වංශයට විරුද්ධව කී තමන්ගේ
වචනයෙන් කිසිවක් හිස් නොවන බව
දැනගනිල්ලා. **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
මෙහෙකරුවූ එලියා ලවා කියෙවූ දේ
11 ඉෂ්ටකළසේකැයි කීවේය. මෙසේ යේහු
යෙස්‍රෙයෙල්හි ආහබ්ගේ වංශයෙන්
ඉතුරුව සිටි සියල්ලන්ද ඔහුගේ සියලු
ප්‍රධාන තැනැත්තන්ද ඔහුගේ නෑයන්ද
ඔහුගේ පූජකයන්ද ඔහුට එක්කෙනෙක්වත්
12 ඉතුරුනොකර මැරුවේය. ඔහු නැගිට
සමාරියට යන්ට පිටත්වුණේය. ඔහු
මගදී *බැටළු ලොම් කපන්නන්ගේ ගෙට
13 ළංව සිටියදී, යූදාහි රජවූ අහසියාගේ
සහෝදරයන් යේහුට සම්බවී: නුඹලා
කවුරුදැයි ඇසුවේය. අපි අහසියාගේ
සහෝදරයෝය. රජුගේ පුත්‍රයන්ටත්
බිසවගේ පුත්‍රයන්ටත් ආචාරකරන්ට
14 යමුයයි ඔව්හු කීවෝය. ඔහුද: ඔවුන්
පණපිටින් අල්ලාගනිල්ලායයි කීය.
ඔව්හු ඔවුන් පණපිටින් අල්ලාගෙන
මනුෂ්‍යයන් සතළිස් දෙනෙක්වූ ඔවුන්
*බැටළු ලොම් කපන්නන්ගේ ගෙය ළඟදී
මැරුවෝය; ඔවුන්ගෙන් එක්කෙනෙක්වත්
ඔහු ඉතුරුකළේ නැත.

*හෙවත්, බෙත්-එකෙද් ළඟදී

ඔහු එතැනින් ගිය විට ඔහුගේ පෙර- 15
මගට ආ රේකාබ්ගේ පුත්‍රවූ යෙහෝනාදබ්
සම්බවී ඔහුට ආචාරකොට: මාගේ
සිත නුඹේ සිත කෙරේ අවංකව
තිබෙන්නාක් මෙන් නුඹේ සිතත් අවංකදැයි
ඇසුවේය. යෙහෝනාදබ්: එසේයයි කී
විට: එසේ නම් මට නුඹේ අත දියන්නැයි
ඔහු කීවේය. ඔහු තමාගේ අත ඔහුට
දුන්නේය. එවිට යේහු තමාගේ රථයට 16
ඔහු නංවාගෙන කථාකොට: **ස්වාමීන්-**
**වහන්සේ** උදෙසාවූ මාගේ ජ්වලිතකම
බලන්ට මා සමග වරෙන්නැයි කීවේය.
මෙසේ ඔව්හු ස්වකීය රථයෙහි ඔහු
නංවාගෙන ගියෝය. ඔහු සමාරියට ආ 17
කල **ස්වාමීන්වහන්සේ** එලියා ලවා කී
වචනය ලෙස සමාරියෙහි ආහබ්ගෙන්
ඉතුරුව සිටි සියල්ලන් ඔහුගේ වංශය
විනාශවනතුරු මරා දැමුවෝය.

## බාල් අදහන්නන් මරාදැමීම

තවද යේහු මුළු සෙනඟ රැස්කර ඔවුන්ට 18
කථාකොට: ආහබ් බාල්ට ස්වල්ප
වශයෙන් සේවයකෙළේය. නුමුත් යේහු
ඔහුට බොහෝසෙයින් සේවය
කරන්නේය. එබැවින් බාල්ගේ සියලු 19
ප්‍රොපේතවරුන්ද ඔහු අදහන සියල්ලන්ද
සියලු පූජකයන්ද එක්කෙනෙක්වත් නැර
මා වෙතට අඬගහගන වරෙල්ලා.
මක්නිසාද මා විසින් බාල්ට මහත්
පූජාවක් ඔප්පුකරන්ට තිබේ; නේන
සියල්ලෝම මරණයට පත්වන්නෝයයි
කීවේය. නුමුත් යේහු බාල් අදහන්නන්
නැතිකරන පිණිස ප්‍රයෝගයෙන් ඒක
කෙළේය. තවද යේහු: බාල් උදෙසා ශුද්ධ 20
රැස්වීමක් නියමකරපල්ලායයි කීවේය.
ඔව්හු එසේ ප්‍රසිද්ධකළෝය. එසේ යේහු 21
ඉශ්‍රායෙල් රට මුළුල්ලේම පණිවිඩ
යැවූ විට බාල්ගේ සේවකයන්ගෙන්
එක්කෙනෙක්වත් නැවිත් නොසිට
සියල්ලෝම බාල්ගේ ගෘහයට ඇතුල්
වුණෝය; බාල්ගේ ගෘහය එක් කෙළවරක
පටන් අනික් කෙළවර දක්වා පිරී ගියේය.
ඔහු වස්ත්‍ර ගබඩාවේ මූලාදෑනියාට 22
කථාකොට: බාල් අදහන සියල්ලන්ට

වස්ත්‍ර ගෙනෙන්නැයි කීවේය. ඔහු වස්ත්‍ර
23 ගෙනායේය. යේහුද රේකාබ්ගේ පුත්‍රවූ
යෙහෝනාදබ්ද බාල්ගේ ගෘහයට ගොස්:
බාල් අදහන සියල්ලන් මිස මෙහි නුඹලා
සමග **ස්වාමීන්වහන්සේගේ** සේවකයන්
කිසිවෙකු නොසිටින ලෙස සොයා
බලාපල්ලායයි බාල් අදහන්නන්ට
24 කීවේය. ඔව්හු යාගද දවන පූජාද
ඔප්පුකරන්ට ඇතුළට ගියෝය. එවිට
යේහු මනුෂ්‍යයන් අසූදෙනෙක් පිටත
සිටුවා: මා විසින් නුඹලා අතට
අසුකරදෙන මනුෂ්‍යයන්ගෙන් කිසිවෙකු
ගැළවී ගියොත්, ඔහු යන්ට අරින අයගේ
ප්‍රාණය ඔහුගේ ප්‍රාණය වෙනුවට දෙන්ට
25 වේයයි කියා තිබුණේය. තවද යේහු
දවන පූජාව පුද නිමකළ කෙණෙහිම
ඔහු මුරකාරයන්ටත් ඔවුන්ගේ මූලා-
දෑනීන්ටත් කථාකොට: ඇතුළට ගොස්
කාටවත් පිටතට එන්ට නෑර ඔවුන්
මරාපල්ලායයි කීවේය. එසේ මුර-
කාරයෝද මූලාදෑනිහුද කඩුමුවහතින්
ඔවුන් මරා පිටතට දමා, බාල්ගේ ගෙයි
26 මළුව දක්වාත් ගියෝය. තවද ඔව්හු
බාල්ගේ ගෘහයේ රූප-කුළුනු පිටතට
27 ගෙනැවිත් පුලුස්සාදමා, බාල්ගේ රූපස්-
තම්භ බිඳදමා, බාල්ගේ ගෘහයත්
බිඳදමා, අද දක්වා තිබෙන හැටියට
28 එය වැසිකිළියක් කළෝය. මෙසේ යේහු
ඉශ්‍රායෙල්වරුන් අතරෙන් බාල් නැතිකර
29 දැමුවේය. එසේවීනුමුත් බෙතෙල්හිද
දාන්හිද තිබුණ රන් වස්සන් කරණකොට-
ගෙන ඉශ්‍රායෙල්වරුන්ට පව්කරන්ට
සැලැස්සුවාවූ නෙබාත්ගේ පුත්‍රවූ යෙරො-
බොවම්ගේ පාපවලින් යේහු අහක්-
30 නොවීය. **ස්වාමීන්වහන්සේ** යේහුට
කථාකොට: නුඹ මාගේ ඇස් හමුයෙහි
හරිව තිබෙන දේ කිරීමෙන් යුතු ලෙස
ක්‍රියාකොට, මාගේ සිතේ තිබුණ සියල්ල
ප්‍රකාර ආහබ්ගේ වංශයට කළ බැවින්,
නුඹේ පුත්‍රයෝ සතරවෙනි පරම්පරාව
දක්වා ඉශ්‍රායෙල් සිංහාසනයෙහි හිඳ-
31 ගන්නෝයයි කීසේක. එහෙත් යේහු
තමාගේ මුළු සිතින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** ව්‍යවස්ථාව ප්‍රකාර
හැසිරෙන්ට ප්‍රවේසම් නුවූයේය. ඉශ්‍රායෙල්-
වරුන්ට පව්කරන්ට සැලැස්වූ යෙරො-
බොවම්ගේ පාපවලින් ඔහු අහක්නොවීය.
ඒ කාලයේදී **ස්වාමීන්වහන්සේ** 32
ඉශ්‍රායෙල් හීනකරන්ට පටන්ගත්සේක.
හසායෙල් යොර්දනට නැගෙනහිරින් 33
තිබෙන ඉශ්‍රායෙල්ගේ සියලු පළාත්වූ
අර්ණොන් මිටියාවත ළඟවූ අරොයේර්
පටන් තිබෙන මුළු ගිලියද් දේශයෙහිත්
බාෂාන්හිත් විසූ ගාද්වරුන්ටත්
රූබෙන්වරුන්ටත් මනස්සේවරුන්ටත්
පහරදුන්නේය. යේහුගේ අනික් ක්‍රියාද 34
ඔහු කළ සියල්ලද ඔහුගේ සියලු
බලවන්තකම්ද ඉශ්‍රායෙල් රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද? යේහු තමාගේ පියවරුන් 35
සමග සැතපී සමාරියෙහි තැන්පත්කරනු
ලැබුවේය. ඔහුගේ පුත්‍රවූ යෙහෝවාහාස්
ඔහු වෙනුවට රජ වුණේය. යේහු 36
සමාරියෙහි ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
රජකම්කළ කාලය විසිඅට අවුරුද්දක්ය.

## අතලියා රාජ්‍යය පැහැරගැනීම. යෝවාෂ් රජකොට ප්‍රකාශකිරීම

11
අහසියාගේ මවුවූ අතලියා ඇගේ
පුත්‍රයා මළ බව දැක නැගිට මුළු
රාජ වංශය විනාශකළාය. නුමුත් 2
යෝරාම් රජුගේ දූවූ අහසියාගේ සහෝ-
දරීවූ යොහෝෂෙබා තොමෝ මරනු
ලැබූ රජුගේ පුත්‍රයන් අතරෙන් අහසියා-
ගේ පුත්‍රවූ යෝවාෂ්ද ඔහුගේ කිරිමවද
යහන්ගෙට හොරෙන් ගෙනගියාය;
ඔහු මරනු නොලබන ලෙස ඔව්හු
අතලියාගෙන් ඔහු සැඟෙවුවෝය. ඔහු 3
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි ඈ සමග
අවුරුදු හයක් සැඟවී සිටියේය. අතලියා
දේශය කෙරෙහි රජකම්කළාය.
සත්වෙනි අවුරුද්දේදී යෙහෝයාද 4
පණිවිඩ යවා කාරියවරුන්ගේද මුර-
කාරයන්ගේද ශතාධිපතීන් ගෙන්වා
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට තමා
ළඟට පමුණුවාගෙන, ඔවුන් සමග
ගිවිසුමක් කොට, **ස්වාමීන්වහන්සේගේ**

ගෘහයෙහිදී ඔවුන්ගෙන් දිවුරුම්ගෙන,
රජුගේ පුත්‍රයා ඔවුන්ට පෙන්වා
5 කථාකොට: තුඹලා විසින් කරන්ට ඕනෑ
දේ මේය—සබත් දවසේදී ඇතුල්වෙන
තුඹලාගෙන් තුනෙන් කොටසක් රජ
6 ගෙදර මුරට සිට, තුනෙන් කොටසක්
සූර් දෙරටුවේද තුනෙන් කොටසක්
මුරකාරයන්ට එහායින් තිබෙන දෙරටු-
වේද සිටපල්ලා. මෙසේ ගෘහය මුරකර
7 ආරක්ෂාකරපල්ලා. තුඹලාගෙන් කොට්-
ඨාස දෙකක් වන සබත් දවසේදී පිටත
යන සියල්ලෝම රජු ළඟ **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයෙහි මුරකරපල්ලා.
8 තුඹලා එක එකා තම තමාගේ ආයුධ
අතින් ගෙන රජු වටකර සිට පන්ති
ඇතුළට එන තැනැත්තා මරන්ට ඕනෑය.
රජ යන එන විට තුඹලා ඔහු සමග
සිටපල්ලාය කියා ඔවුන්ට අණකෙළේය.
9 ශතාධිපතියෝ යෙහෝයාද පූජකයා
අණකළ සියල්ල ලෙස කරමින්, එකිනෙකා
තම තමාගේ මිනිසුන් වන සබත් දවසේදී
ඇතුල්වෙන තැනැත්තන් සබත් දවසේදී
පිටත යන තැනැත්තන්ද සමග කැඳවා-
ගත යෙහෝයාද පූජකයා ළඟට
10 ආවෝය. පූජකයා **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි තිබුණු දාවිත් රජුගේ හෙල්ල
හා පලිස් ශතාධිපතීන්ට දුන්නේය.
11 මුරකාරයෝ එකඑකා තම තමාගේ අතින්
ආයුධ රැගෙන ගෘහයේ දකුණු පැත්තේ
පටන් වම් පැත්ත දක්වා පූජාසනයත්
ගෘහයත් ළඟ රජු වටකර සිටියෝය.
12 එවිට ඔහු රජුගේ පුත්‍රයා පිටතට
ගෙනැවිත් ඔහුගේ හිස පිට ඔටුන්න
තබා, ව්‍යවස්ථාව ඔහුට දුන්නේය; ඔව්හු
රජකමට ඔහු ආලේපකොට අත්-
පොළසන්දී: රජතුමා සැරදේවයි කීවෝය.
13 අතලියා තොමෝ මුරකාරයන්ගෙත්
සෙනඟගෙත් ඝෝෂාව අසා **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයෙහි සිටි සෙනඟ ළඟට
14 ආවාය. ඈ බැලූ විට සිරිත් ප්‍රකාර රජු
*කණුව ළඟ සිටිනවා සහ රජු ළඟ
අධිපතීන්ද නළාකාරයන්ද සිටිනවාත්
දේශයේ මුළු සෙනඟ ප්‍රීතිව හොරණෑ
පිඹිනවාත් දැක ඇගේ ඇඳුම් ඉරාගෙන:
ද්‍රෝහිකමය, ද්‍රෝහිකමය කියා මොර-
ගැසුවාය. එවිට යෙහෝයාද පූජකයා 15
සේනාවේ ප්‍රධානීන්වූ ශතාධිපතීන්ට
කථාකොට: ඈ පන්ති අතරෙන් පිටතට
ගෙනයාපල්ලා; ඈ පස්සේ යමෙක්
ආවොත් ඔහු කඩුවෙන් මරාපල්ලායයි
අණකළේය. මක්නිසාද: **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේදී ඈ මරනු නො-
ලබාවයි පූජකයා කීවේය. මෙසේ ඔව්හු 16
ඈට යන්ට ඉඩ ඇරියෝය; ඈ රජ-
ගෙදරට අශ්වයන් ඇතුල්වෙන මාර්ග-
යෙන් ගොස් එහිදී මරනු ලැබුවාය.
යෙහෝයාද තෙමේ **ස්වාමීන්වහන්සේගේ** 17
සෙනඟ ව සිටින හැටියට **ස්වාමීන්-
වහන්සේ** සහ රජුද සෙනඟද අතරේ
ගිවිසුමක් කෙරෙව්වේය. එසේම රජුද
සෙනඟද අතරේත් කෙරෙවුවේය. දේශයේ 18
මුළු සෙනඟ බාල්ගේ ගෘහයට ගොස්
ඒක කඩා, ඔහුගේ පූජාසනද රූපද
මුළුමනින්ම බිඳදමා, පූජාසන ඉදිරියෙහිදී
බාල්ගේ පූජකයාවූ මත්තාන් මැරුවෝය.
පූජක තෙමේ **ස්වාමීන්වහන්සේගේ** ගෘහය
කෙරෙහි මුලාදෑනීන් පත්කෙළේය. තවද 19
ඔහු ශතාධිපතීන්ද කාරියවරුන්ද මුර-
කාරයන්ද දේශයේ මුළු සෙනඟද කැඳවා-
ගෙන **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ සිට
රජු ගෙනගොස්, මුරකාරයන්ගේ දෙරටු
මාර්ගයෙන් රජගෙදරට පැමුණුණේය.
එවිට ඔහු රජවරුන්ගේ සිංහාසනයෙහි
හිඳගත්තේය. මෙසේ දේශයේ මුළු සෙනඟ 20
ප්‍රීතිවූවෝය, නුවරද නිශ්චලව තිබුණේය.
ඔව්හු අතලියා රජගෙදරදී කඩුවෙන්
මැරුවෝය.

## යෙහෝවාෂ් (හෙවත් යෝවාෂ්)ගේ රාජ්‍ය පාලනය

**12**

යෙහෝවාෂ් රජවෙන විට අවුරුදු 21
සතක් වයස්ව සිටියේය. යේහුගේ
සත්වෙනි අවුරුද්දේදී යෙහෝවාෂ් රජ
වී යෙරුසලමේ සතළිස් අවුරුද්දක්
රජකම්කෙළේය. ඔහුගේ මවුගේ නම
ශිබියාය, ඈ බෙයෙර්-ෂෙබාහි කෙ-
නෙක්ය. යෙහෝවාෂ් වනාහි යෙහෝයාද 2

*හෙවත්, මංචකය උඩ.

පූජකයා විසින් තමාට දනමුතුකම් දුන්
කාලය මුළුල්ලෙහි **ස්වාමීන්වහන්සේගේ**
ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය.
3 නුමුත් උස් තැන් පහනොකරනලද්දේය.
ඒ කාලයෙත් සෙනඟ උස්තැන්වල පූජා
ඔප්පුකොට සුවඳ දුම් දැවූහ.
4 යෙහෝවාෂ් වනාහි පූජකයන්ට කථා-
කොට: **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ගෙනෙනලද්දවූ කැපකළ දේවල මිල
සියල්ලද එනම් එක් එක්කෙනා විසින්
ගෙවන්ට නියමවෙන මුදල්ද එක් එක්-
කෙනා තම තමාගේ කැමැත්තෙන්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට ගෙනෙන
5 සියලු මුදල්ද, පූජකයෝ තම තමුන්
අඳුනන්නවුන්ගෙන් ව්‍යවහාර මුදලින්
ගනිත්වා, ඔව්හුද ගෘහයේ කොයියම්
තැනක නුමුත් දකින කැඩුම් හරි-
6 ගස්සත්වයි කීවේය. එහෙත් පූජකයන්
විසින් යෙහෝවාෂ් රජුගේ විසිතුන්වෙනි
අවුරුද්ද දක්වා ගෘහයේ කැඩුම් හරි
7 නොගස්සා තිබුණේය. එවිට යෙහෝවාෂ්
රජ පූජකවූ යෙහෝයාදටත් අනික් පූජක-
යන්ටත් හඬගසා: තුඹලා ගෘහයේ කැඩුම්
හරිනොගස්සන්නේ මක්නිසාද? ඉතින්
තුඹලා අඳුනන්නන්ගෙන් තවත් මුදල්
නොගෙන ඒවා කැඩුම් හරිගස්සන්ට
8 භාරදීපල්ලායයි කීවේය. පූජකයෝ
සෙනඟගෙන් තවත් මුදල් නොගන්ටත්
ගෘහයේ කැඩුම් හරිනොගස්සන්ටත්
9 එකඟවූවෝය. එහෙත් පූජකවූ යෙහෝයාද
පෙට්ටියක් ගෙන පියනේ සිදුරක් කොට
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට එන මාර්-
ගයේ දකුණු පැත්තේ පූජාසනය ළඟ
තැබුවේය. තවද **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට ගෙනා මුදල් සියල්ලම දොරටු-
පාලයෝවූ පූජකයෝ එහි දැමුවෝය.
10 තවද පෙට්ටියේ බොහෝ මුදල් තිබෙන
බව දුටු විට රජුගේ ලේකමද නායක
පූජකයාද ඇවිත් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි තිබුණ ඒ මුදල් ගණන්කරමින්
11 මිටි බැන්දෝය. කිරාදෙනලද ඒ මුදල්
ඔව්හු **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
වැඩකළාවූද වැඩකෙරෙවුවාවූද තැනැත්-
තන් අතට දුන්නෝය. ඔව්හුද **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයේ වැඩකළ වඩුවන්ටත්
ගොඩනගන්නන්ටත්, පෙදරේරුවරුන්ටත් 12
ගල්කපන්නන්ටත් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේ කැඩුම් හරිගැස්සීමට ලී සහ
කැපූ ගල් මිලේට ගන්නා පිණිසත් ගෘහය
අලුත්වැඩියා කිරීමට ඕනෑකළ සියල්-
ලටත් ඒ මුදල් දුන්නෝය. එහෙත් 13
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය නිසා රිදී
කුසලාන්ද පහන් කතුරුද තලිද හොර-
ණෑද යම් රන් භාජන හෝ රිදී භාජනද
නොසාද, ඒ මුදල් වැඩේ කළ තැනැත්- 14
තන්ට දී, එයින් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහය අලුත්වැඩියා කෙරෙවුවෝය. තවද 15
වැඩකරන්නන්ට දෙන්ට මිල භාරදෙනු
ලැබූ මනුෂ්‍යයන් විශ්වාස ලෙස කටයුතු
කළ බැවින් ඔවුන්ගෙන් ගණනක් නො-
ගන්නා ලද්දේය. අපරාධ පූජා සහ 16
පාප පූජා උදෙසා දුන් මිල **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයට නොගෙනෙන-
ලද්දේය. ඒ මිල පූජකයන්ගේ විය.
එකල සිරියේ රජවූ හසායෙල් ඇවිත් 17
ගාද්ට විරුද්ධව යුද්ධකොට ඒක
අල්ලාගෙන, යෙරුසලමටත් විරුද්ධව
එන්ට තමාගේ මුහුණ යොමුකෙළේය.
එවිට යූදාහි රජවූ යෙහෝවාෂ් තමාගේ 18
පියවරුන්වූ යෙහෝෂාපාට්ද යෙහෝ-
රාම්ද අහසියාද යන යූදාහි රජවරුන්
විසින් කැපකළ සියලුම ශුද්ධ දේවල්ද
තමාගේම ශුද්ධ දේවල්ද **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයේ ගබඩාවලත් රජ
ගෙයිත් තිබුණාවූ සියලු රන්ද රැගෙන
සිරියේ රජවූ හසායෙල්ට හැරියේය. එවිට
ඔහු යෙරුසලමෙන් අහක්ව ගියේය.
යෝවාෂ්ගේ අනික් ක්‍රියාද ඔහු කළ 19
සියල්ලද යූදාහි රජුන්ගේ ලේකම් පොතේ
ලියා තිබෙනවා නොවේද? ඔහුගේ 20
සේවකයෝ නැගිට කුමන්ත්‍රණයකොට,
සිල්ලාට යන මාර්ගයෙහි තිබෙන
මිල්ලෝහි ගෙයිදී යෝවාෂ් මැරුවෝය.
ඔහුගේ සේවකයෝ වන ෂිමෙයාත්ගේ 21
පුත්‍රවූ යෝසාබාර්ද ෂෝමෙර්ගේ පුත්‍රවූ
යෙහෝසාබාද්ද ඔහුට පහරදී මැරුවෝය;
ඔව්හු ඔහු දාවිත්ගේ නුවර තමාගේ
පියවරුන් ළඟ තැන්පත් කළෝය. ඔහු-
ගේ පුත්‍රවූ අමශියා ඔහු වෙනුවට රජ-
වුණේය.

## යෙහෝවාහාස් සහ යෙහෝවාෂ් ඉශ්‍රායෙල් කෙරෙහි රජකම් කිරීම

**13** අහසියාගේ පුත්‍රවූ යූදහි රජවූ
යෝවාෂ්ගේ විසිතුන්වෙනි අවුරුද්දේ
යේහුගේ පුත්‍රවූ යෙහෝවාහාස් සමාරියේ
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජවී දහහත්
2 අවුරුද්දක් රජකම් කෙළේය. ඔහු **ස්වාමීන්-**
**වහන්සේගේ** ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ කරමින් ඉශ්‍රායෙල්වරුන්ට
පව්කිරීමට සැලැස්සුවාවූ නෙබාත්ගේ
පුත්‍රවූ යෙරොබොවම්ගේ පාපවලින්
අහක්නොවී ඒවායේ හැටියට හැසු-
3 රුණේය. **ස්වාමීන්වහන්සේගේ** උදහස
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි ඇවිළ උන්-
වහන්සේ සිරියේ රජවූ හසායෙල් අතටත්
හසායෙල්ගේ පුත්‍රවූ බෙන්-හදද් අතටත්
ඒ කාලය මුළුල්ලෙහි ඔවුන් පාවා-
4 දුන්සේක. නුමුත් යෙහෝවාහාස්
**ස්වාමීන්වහන්සේට** කන්නලව්කළ විට
**ස්වාමීන්වහන්සේ** ඔහුට ඇහුම්කන්
දුන්සේක. මක්නිසාද සිරියේ රජ
ඉශ්‍රායෙල්ට පීඩා කරන විට, ඔවුන්ට
පැමුණුණු පීඩාව **ස්වාමීන්වහන්සේ**
5 දුටුසේක. (තවද **ස්වාමීන්වහන්සේ**
ඉශ්‍රායෙල්වරුන් සිරියවරුන්ගේ අත යට-
තින් නිදහස්වෙන ලෙස ඔවුන්ට ගැළවුම්-
කාරයෙකු දුන්සේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ
පළමු ලෙස තමුන්ගේ කූඩාරම්වල
6 වාසයකළෝය. එසේවීනුමුත් ඔව්හු
ඉශ්‍රායෙල්වරුන් පව්කරන්ට සැලැස්සුවාවූ
යෙරොබොවම්ගේ වංශයේ පාපවලින්
අහක්නොවී ඒවායෙහි හැසුරුණෝය.
අෂේරාකණුද ඒ වන තෙක් සමාරියේ
7 තිබුණේය.) සිරියේ රජ යෙහෝවාහාස්ට
සේනාවෙන් ඉතුරුකළේ අසරුවන්
පනසක්ද රථ දශයක්ද පාබලසෙනඟ
දසදහසක්ද පමණය: මක්නිසාද ඔහු
ඔවුන් විනාශකොට, ඔවුන් මැඩ දූවිලි
8 මෙන් කෙළේය. යෙහෝවාහාස්ගේ අනික්
ක්‍රියාද ඔහු කළ සියල්ලද ඔහුගේ
වික්‍රමයද ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම්
පොතේ ලියාතිබෙනවා නොවේද?
9 යෙහෝවාහාස්ද තමාගේ පියවරුන්
සමග සැතපී සමාරියෙහි තැන්පත්කරනු
ලැබුවේය. ඔහුගේ පුත්‍රවූ යෝවාෂ් ඔහු
වෙනුවට රජ වුණේය.
යූදහි රජවූ යෝවාෂ්ගේ තිස්හත්වෙනි 10
අවුරුද්දේදී යෙහෝවාහාස්ගේ පුත්‍රවූ
යෙහෝවාෂ් සමාරියේ ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි රජවී අවුරුදු දහසයක් රජ-
කම්කෙළේය. ඔහු **ස්වාමීන්වහන්සේගේ** 11
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ කොට,
ඉශ්‍රායෙල්වරුන් පව්කරන්ට සැලැස්සුවාවූ
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්ගේ
සියලු පාපවලින් අහක් නොවී, ඒවායෙහි
හැසුරුණේය. යෝවාෂ්ගේ අනික් ක්‍රියාද 12
ඔහු කළ සියල්ලද ඔහුගේ බලවත්තකම්
වන ඔහු යූදහි රජවූ අමශියාට විරුද්ධව
යුද්ධකළ හැටිද ඉශ්‍රායෙල් රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද? යෝවාෂ්ද තමාගේ පියවරුන් 13
සමග සැතපුණේය: යෙරොබොවම්
ඔහුගේ සිංහාසනයෙහි හිඳගත්තේය.
යෝවාෂ් සමාරියෙහි ඉශ්‍රායෙල් රජුන්
සමග තැන්පත්කරනු ලැබුවේය.
එලිෂාට තමාගේ මරණීය ලෙඩේ 14
වැලඳුණුවිට ඉශ්‍රායෙල් රජවූ යෝවාෂ්
ඔහු වෙතට ගොස් ඔහු ළඟ සිටගෙන
අඬා: මාගේ පියාණෙනි, මාගේ
පියාණෙනි, ඉශ්‍රායෙල්වරුන්ගේ රථ සහ
ඔවුන්ගේ අසරුවෝයයි කීය. එලිෂාද: 15
දුන්නක් හා ඊගස් ගනින්නැයි ඔහුට
කීය. ඔහු දුන්න සහ ඊගස් ගත්තේය.
එලිෂා: නුඹේ අත දුන්න පිට තබාපන්නැයි 16
ඉශ්‍රායෙල් රජුට කීවේය. ඔහු තමාගේ
අත තැබුවේය. එවිට එලිෂා තමාගේ
අත් රජුගේ අත් පිට තබා: නැගෙනහිර 17
කවුළුව ඇරපන්නැයි කීවේය. ඔහු ඒක
ඇරියවිට: විදපන්නැයි එලිෂා කීවේය.
ඔහු විද්දේය. එවිට එලිෂා ඒ **ස්වාමීන්-**
**වහන්සේගේ** ජය ඊගසය: එනම් සිරිය-
වරුන්ගෙන් ජයගැනීමේ ඊගසය. නුඹ
සිරියවරුන් නැතිකරන තුරු අපෙක්හිදී
ඔවුන්ට පහර දෙන්නෙහියයි කීවේය.
ඔහු: ඊගස් ගනින්නැයි කීවේය. ඔහු 18
ගත්විට: බිම ගසාපන්නැයි ඔහු ඉශ්‍රායෙල්
රජුට කීවේය. ඔහු තුන් වරක් ගසා
නැවතුණේය. එවිට දෙවියන්වහන්සේගේ 19

මනුෂ්‍යයා ඔහු කෙරෙහි උදහස්වී: නුඹ
පස්වරක් හෝ හයවරක් ගසන්ට යුතුව
තිබුණේය; එසේ කෙළේවී නම් නුඹ
සිරියවරුන් විනාශවන තුරු ඔවුන්ට
පහරදෙනවා ඇත. නුමුත් දැන් නුඹ
තුන්වරක් පමණක් සිරියවරුන්ට පහර-
දෙන්නෙහියයි කීවේය.

## එලිෂාගේ මරණය

20 එලිෂා මැරී තැන්පත්කරනු ලැබුවේය.
ඊළඟ අවුරුද්දේ මෝවබ්වරුන්ගේ සමූද-
21 වල් දේශයට ඇතුල්වූවෝය. මිනිස්සු
මිනියක් වළලන්ට යනවිට සමූදවක්
දැක එලිෂාගේ සොහොන්ගෙයි ඒ මිනිය
දැමූවෝය. ඒ මිනිය එලිෂාගේ ඇටවලට
තැවරුණු හැටියේම පණ ලැබ නැගිට
සිටියේය.
22 සිරියේ රජවූ හසායෙල් යෙහෝ-
වාහාස්ගේ මුළු කාලයෙහි ඉශ්‍රායෙල්-
23 වරුන්ට පීඩාකෙළේය. නුමුත් ස්වාමීන්-
වහන්සේ ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද
සමග කළ තමන්ගේ ගිවිසුම නිසා
ඔවුන්ට කරුණාකොට, ඔවුන් කෙරෙහි
අනුකම්පාකොට, ඔවුන් සැලකුසේක.
උන්වහන්සේ ඔවුන් නැතිකරන්ට
අකැමැතිව, ඒ වන තුරු ඔවුන් තමන්
ඉදිරියෙන් අහක නොදමා සිටිසේක.
24 සිරියේ රජවූ හසායෙල් මළේය: ඔහුගේ
පුත්‍රවූ බෙන්-හදද් ඔහු වෙනුවට රජ-
25 වුණේය. යෙහෝවාහාස්ගේ පුත්‍රවූ
යෙහෝවාෂ් තමාගේ පියවූ යෙහෝ-
වාහාස් අතින් හසායෙල් විසින් යුද්ධ-
කොට අල්ලාගත් නුවරවල් ඔහුගේ
පුත්‍රයාවූ බෙන්-හදද්ගේ අතින් නැවත
අල්ලාගත්තේය. යෝවාෂ් තුන්වරක්
ඔහුට පහරදී ඉශ්‍රායෙල් නුවරවල් දෙවනු
ගත්තේය.

## යූදහි අමශියාද ඉශ්‍රායෙල්හි යෙරොබොවම්ද රජකම්කිරීම

14 ඉශ්‍රායෙල් රජවූ යෝවාහාස්ගේ
පුත්‍රවූ යෝවාෂ්ගේ දෙවෙනි
අවුරුද්දේදී යූදහි රජවූ යෝවාෂ්ගේ පුත්‍රවූ
2 අමශියා රජවුණේය. ඔහු විසිපස් අවුරුදු
වයසේදී රජ වී යෙරුසලමෙහි විසිනව
අවුරුද්දක් රජකම්කෙළේය. ඔහුගේ මවුගේ
නම යෙහෝයද්දින්ය, ඈ යෙරුසලමේ
ස්ත්‍රියෙක්ය. ඔහු ස්වාමීන්වහන්සේගේ 3
ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය,
නුමුත් තමාගේ පියවූ දාවිත් මෙන්
නොවේය. තමාගේ පියවූ යෝවාෂ් කළ
සියල්ල ලෙස ඔහු කෙළේය. එසේ වී 4
නුමුත් උස් තැන් අහක් නොකරනලද්දේය.
ඒ වනතෙක් සෙනඟ උස් තැන්වල
පූජාකොට සුවඳ ද්‍රව්‍ය දැවූවෝය. තවද 5
රජකම ඔහු අතේ ස්ථිරවූ කෙණෙහිම
ඔහු තමාගේ පියරජු මැරුවාවූ තමාගේ
සේවකයන් මැරුවේය. නුමුත්: දරුවන් 6
නිසා පියවරුවත් පියවරුන් නිසා
දරුවෝවත් මරනු නොලබන්වා; එක
එකා තම තමාගේම පාපය නිසා මරනු
ලබාවයි කියා ස්වාමීන්වහන්සේ අණකළ
පරිද්දෙන් මෝසෙස්ගේ ව්‍යවස්ථා පොතේ
ලියා තිබෙන ලෙස, ඔහු ඒ මිනීමරුවන්-
ගේ දරුවන් නොමැරුවේය. ඔහු ලුණු 7
මිටියාවතේදී ඒදෝම්වරුන් දසදහසක් මරා,
යුද්ධකොට සේලා අල්ලාගන, අද දක්වා
තිබෙන හැටියට ඊට යොක්තෙයේල් යන
නම තැබුවේය.
එකල අමශියා පණිවිඩකාරයන් යවා: 8
වරෙන්න, අපි මුණගැසෙමු කියා යේහුගේ
පුත්‍රවූ යෙහෝවාහාස්ගේ පුත්‍ර වන
ඉශ්‍රායෙල් රජවූ යෙහෝවාෂ්ට කියා
ඇරියේය. ඉශ්‍රායෙල් රජවූ යෙහෝවාෂ් 9
උත්තරදෙමින්: නුඹේ දුව මාගේ පුතාට
භාර්යාකොට දියන්නැයි ලෙබනොන්හිවූ
ගොකටුගස ලෙබනොන්හිවූ කිහිරි ගසට
කියා ඇරියේය. නුමුත් ලෙබනොන්හි
වන මෘගයෙක් ඒ ළඟින් යන විට කටුගස
පාගාදැමුවේය. නුඹ ඒදෝම්වරුන්ට පහර 10
දුන්නා සැබෑය, නුඹේ සිතද උඩඟුවී
තිබේ. ඒ ගෞරවය ඇතුව ගෙදර
සිටපන්න; නුඹද නුඹ සමග යූදවරුන්ද
වැටෙනලෙස නුඹ අන්තරායට මැදි-
වෙන්නේ මක්නිසාදැයි යූදහි රජවූ අම-
ශියාට කියා ඇරියේය. එහෙත් අමශියා 11
ඇහුම්කන් දුන්නේ නැත. ඒ නිසා
ඉශ්‍රායෙල් රජවූ යොහෝවාෂ් ගියේය:
ඔහුද යූදහි රජවූ අමශියාද යූදට අයිති

බෙත්-ෂෙමෙෂ්හිදී එකිනෙකා මුණ-
12 ගැසුණෝය. යූදවරු ඉශ්‍රායෙල්වරුන්ට
පරාජයවී සියල්ලෝම තම තමුන්ගේ
13 කූඩාරම්වලට පලාගියෝය. ඉශ්‍රායෙල්
රජවූ යෙහෝවාෂ් අහසියාගේ පුත්‍රවූ
යෙහෝවාෂ්ගේ පුත්‍රයා වන යූදහි රජවූ
අමශියා බෙත්-ෂෙමෙෂ්හිදී අල්ලාගෙන
යෙරුසලමට ඇවිත්, එප්‍රායිම් දොරටුවේ
සිට කොනේ දොරටුව දක්වා යෙරුසලමේ
පවුරෙන් රියන් හාරසියයක් බිඳහෙලා,
14 **ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහිත් රජ-
ගෙයි ගබඩාවලත් තිබුණු රන් රිදී
සියල්ලද භාජන සියල්ලද ඇපකාරයන්ද
රැගෙන, සමාරියට හැරී ගියේය.
15 යෙහෝවාෂ් කළ අනික් ක්‍රියාද ඔහුගේ
වික්‍රමයද ඔහු යූදහි රජවූ අමශියාට
විරුද්ධව යුද්ධ කළ හැටිද ඉශ්‍රායෙල්
රජුන්ගේ ලේකම් පොතේ ලියා තිබෙනවා
16 නොවේද? යෙහෝවාෂ්ද තමාගේ
පියවරුන් සමග සැතපී සමාරියෙහි
ඉශ්‍රායෙල් රජුන් ළඟ තැන්පත් කරනු
ලැබුවේය; ඔහුගේ පුත්‍රවූ යෙරොබොවම්
ඔහු වෙනුවට රජවුණේය.
17 යෙහෝවාහාස්ගේ පුත්‍රවූ ඉශ්‍රායෙල්
රජවූ යෙහෝවාෂ්ගේ මරණයෙන් පසු
යෝවාෂ්ගේ පුත්‍රවූ යූදයේ රජවූ අමශියා
අවුරුදු පහළොහක් ජීවත්වුණේය.
18 අමශියාගේ අනික් ක්‍රියා යූද රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා
19 නොවේද? මිනිස්සු ඔහුට විරුද්ධව
යෙරුසලමෙහි කුමන්ත්‍රණයක් කළෝය;
ඔහු ලාකීෂ්ට පලාගියේය. නුමුත් ඔව්හු
ඔහු පස්සේ ලාකීෂ්ට මිනිසුන් යවා,
20 එහිදී ඔහු මරා අශ්වයන් පිට තබා
ගෙනවුත් යෙරුසලමෙහි දාවිත්ගේ නුවර
ඔහුගේ පියවරුන් ළඟ තැන්පත්කළෝය.
21 එකල යූදහි මුළු සෙනඟ දහසය අවුරුදු
වයස්ව සිටි අශරියා කැඳවාගෙන ඔහුගේ
පියවූ අමශියා වෙනුවට රජකමට පත්-
22 කළෝය. රජ තමාගේ පියවරුන් සමග
සැතපුණු පසු ඔහු ඒලත් ගොඩනගා
එය යූදට නැවත අයිතිකරගත්තේය.
23 යූදහි රජවූ යෝවාෂ්ගේ පුත්‍රවූ අම-
ශියාගේ පසළොස්වෙනි අවුරුද්දේදී
ඉශ්‍රායෙල් රජවූ යෝවාෂ්ගේ පුත්‍රවූ
යෙරොබොවම් සමාරියෙහි රජ වී සතළිස්
එක් අවුරුද්දක් රජකම්කෙළේය. ඔහු 24
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය. ඉශ්‍රායෙල්ට
පව්කරන්ට සැලැස්සුවාවූ නෙබාත්ගේ
පුත්‍රවූ යෙරොබොවම්ගේ සියලු පාපවලින්
ඔහු අහක්නුණේය. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 25
**ස්වාමීන්වහන්සේ** තමන්ගේ මෙහෙකරුවූ,
ගාත්-හෙපෙර්හි අනාගතවක්තෘවූ
අමිත්තයිගේ පුත්‍රවූ යෝනා ලවා කියෙවූ
වචනය ලෙස හමාත්ට ඇතුල්වන තැන්
පටන් අරබා සමහුමියේ මුහුද දක්වා
ඉශ්‍රායෙල්වරුන්ගේ සීමාව ඔහු නැවත
ලබාගත්තේය. මක්නිසාද ඉශ්‍රායෙල්- 26
වරුන්ගේ පීඩිතකම ඉතා බරපතළ බවත්
දාසයන්ද නිර්දාසයන්ද නැතිවී ගිය බවත්
ඉශ්‍රායෙල්ට උපකාරකරන කෙනෙක් නැති
බවත් **ස්වාමීන්වහන්සේ** දුටුසේක. තවද 27
ඉශ්‍රායෙල් යන නාමය අහස යටින්
මකා දමන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
නොකීසේක. එබැවින් උන්වහන්සේ
යෝවාෂ්ගේ පුත්‍රවූ යෙරොබොවම් ලවා
ඔවුන් ගැළෙව්වුසේක. යෙරොබොවම්ගේ 28
අනික් ක්‍රියාත් ඔහු කළ සියල්ලත් ඔහුගේ
වික්‍රමය එනම් ඔහු යුද්ධකළ හැටිත්
යූදට අයිතිව තිබූ දමස්කයද හමාත්ද
ඔහු නැවත ඉශ්‍රායෙල්වරුන්ට ලබාගත්
හැටිත් ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම් පොතේ
ලියා තිබෙනවා නොවේද? යෙරොබො- 29
වම්ද තමාගේ පියවරුන් වන ඉශ්‍රායෙල්
රජුන් සමග සැතපුණේය; ඔහුගේ පුත්‍රවූ
සෙකරියා ඔහු වෙනුවට රජවුණේය.

## නොයෙක් රජවරුන්ගේ ප්‍රවෘත්ති

15 ඉශ්‍රායෙල් රජවූ යෙරොබොවම්ගේ
විසිහත්වෙනි අවුරුද්දේදී යූදහි රජවූ
අමශියාගේ පුත්‍රවූ අශරියා රජවුණේය.
ඔහු දහසය අවුරුදු වයසේදී රජවී 2
යෙරුසලමේ පනස් දෑවුරුද්දක් රජකම්-
කෙළේය. ඔහුගේ මවුගේ නම යෙකො-
ලියාය, ඈ යෙරුසලමේ ස්ත්‍රියෙක්ය. ඔහු 3
තමාගේ පියවූ අමශියා කළ සියල්ල
ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි

4 හරිව තිබුණු දේ කෙළේය. එසේ වුවත්
උස් තැන් පහ නොකරන ලද්දේය. ඒ
වනතෙක් සෙනඟ උස් තැන්වල පූජා-
5 කොට සුවඳ ද්‍රව්‍ය දැවූවෝය. **ස්වාමීන්-
වහන්සේ** රජුට පහර දුන්සේක, ඔහු
මැරෙන දවස දක්වා කුෂ්ඨරෝගියෙක්ව,
වෙනම ගෙයක වාසයකෙළේය. රජුගේ
පුත්‍රවූ යෝතාම් රජගෙදර ප්‍රධානියාව
සිට දේශයේ සෙනඟ විනිශ්චයකෙළේය.
6 අශරියාගේ අනික් ක්‍රියාද ඔහු කළ
සියල්ලද යූදාහි රජුන්ගේ ලේකම් පොතේ
7 ලියා තිබෙනවා නොවේද? අශරියා
තමාගේ පියවරුන් සමඟ සැතපුණේය;
දාවිත්ගේ නුවර ඔහුගේ පියවරුන් ළඟ
ඔහු තැන්පත්කරනු ලැබීය. ඔහුගේ පුත්‍රවූ
යෝතාම් ඔහු වෙනුවට රජවුණේය.
8 යූදාහි රජවූ අශරියාගේ තිස්අටවෙනි
අවුරුද්දේදී යෙරොබෝවම්ගේ පුත්‍රවූ
ශෙකරියා සමාරියේ ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි හමාසයක් රජකම්කෙළේය.
9 ඔහු තමාගේ පියවරුන් කළාක්මෙන්
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය. ඔහු
ඉශ්‍රායෙල්ට පව්කරන්ට සැලැස්සුවාවූ
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබෝවම්ගේ
10 පාපවලින් අහක්නුණේය. යාබෙෂ්ගේ
පුත්‍රවූ ෂල්ලුම් ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය
කොට සෙනඟ ඉදිරියේ ඔහුට පහරදී
මරා, ඔහු වෙනුවට රජවුණේය.
11 ශෙකරියාගේ අනික් ක්‍රියා ඉශ්‍රායෙල්
රජුන්ගේ ලේකම් පොතේ ලියා තිබේ.
12 මෙය වනාහි: නුඹේ පුත්‍රයෝ සතරවෙනි
පරම්පරාව දක්වා ඉශ්‍රායෙල් සිංහාසන-
යෙහි හිඳින්නෝයයි **ස්වාමීන්වහන්සේ**
යේහුට වදාළ වචනයය. එලෙසම සිද්ධ-
වුණේය.
13 යාබෙෂ්ගේ පුත්‍රවූ ෂල්ලුම් යූදාහි රජවූ
*උස්සියාගේ තිස්නවවෙනි අවුරුද්දේදී
රජවී මාසයක කාලය සමාරියෙහි
14 රජකම්කෙළේය. එවිට ගාදීගේ පුත්‍රවූ
මෙනහෙම් තීර්ශා සිට පිටත්වී සමාරියට
ඇවිත් යාබෙෂ්ගේ පුත්‍රවූ ෂල්ලුම්ට
සමාරියේදී පහරදී ඔහු මරා, ඔහු
15 වෙනුවට රජවුණේය. ෂල්ලුම්ගේ අනික්
ක්‍රියාද ඔහු කළාවූ කුමන්ත්‍රණයද
ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම් පොතේ ලියා
තිබේ. එකල මෙනහෙම් තිප්සාටත් එහි 16
සිටි සියල්ලන්ටත් තීර්ශා පටන් එහි
පළාත්වලටත් පහර දුන්නේය. ඔවුන්
ඔහුට නුවර දොරටු නොහැරිය බැවින්
ඔහු ඔවුන්ට පහරදී එහි සිටි සියලු
ගර්භිණීන් ඉරාදැමුවේය.
යූදාහි රජවූ අශරියාගේ තිස්නවවෙනි 17
අවුරුද්දේදී ගාදීගේ පුත්‍රවූ මෙනහෙම්
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජවී සමාරියේ
දස අවුරුද්දක් රජකම් කෙළේය. ඔහු 18
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය. ඉශ්‍රායෙල්-
වරුන්ට පව්කරන්ට සැලැස්සුවාවූ
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබෝවම්ගේ
පාපවලින් ඔහු තමාගේ සියලු දවස්වල
අහක්නොවී සිටියේය. අෂූර්හි රජවූ පූල් 19
දේශයට විරුද්ධව ආයේය; මෙනහෙම්ද
රජකම තමාගේ අතේ ස්ථිරකරගැනීමට
පූල් තමාට උදව්වෙන පිණිස රිදී
තලෙන්ත දහසක් ඔහුට දුන්නේය.
මෙනහෙම් තෙමේ අෂූර්හි රජුට දෙන 20
පිණිස එක් එක්කෙනාගෙන් රිදී ෂෙකෙල්
පනහක් බැගින් ඉශ්‍රායෙල්හි සියලු
පොහොසත් බලවතුන්ගෙන් අයකෙළේය.
එවිට අෂූර්හි රජ දේශයේ නොනැවතී
හැරීගියේය. මෙනහෙම්ගේ අනික් ක්‍රියාද 21
ඔහු කළ සියල්ලද ඉශ්‍රායෙල් රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද? මෙනහෙම්ද තමාගේ පියවරුන් 22
සමඟ සැතපුණේය; ඔහුගේ පුත්‍රවූ
පෙකහියා ඔහු වෙනුවට රජවුණේය.
යූදාහි රජවූ අශරියාගේ පනස්වෙනි 23
අවුරුද්දේදී මෙනහෙම්ගේ පුත්‍රවූ
පෙකහියා සමාරියේ ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි රජ වී දැවුරුද්දක් රජකම්-
කෙළේය. ඔහු **ස්වාමීන්වහන්සේගේ** ඇස් 24
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය.
ඉශ්‍රායෙල්ට පව්කරන්ට සැලැස්සුවාවූ
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබෝවම්ගේ
පාපවලින් ඔහු අහක්නොවීය. ඔහුගේ 25
රථාධිපතියාවූ රෙමලියාගේ පුත්‍රවූ පෙකා
ඔහුට විරුද්ධව කුමන්ත්‍රණයකොට
ගිලියද්වරුන්ගේ පුත්‍රයන්ගෙන් මනුෂ්‍යයන්

*එනම්, පළමුවෙනි පදයේ: අශරියා.

පනස්දෙනෙකුත් කැඳවාගන ඇවිත්,
සමාරියෙහි රජගෙයි බලකොටුවේදී
ඔහුටත් අර්ගොබ්ටත් අරියාටත් පහරදී
26 මරා ඔහු වෙනුවට රජ වුණේය. පෙක-
හියාගේ අනික් ක්‍රියාද ඔහු කළ සියල්ලද
ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම් පොතේ
ලියා තිබේ.
27 යූදහි රජවූ අශරියාගේ පනස්දෙවෙනි
අවුරුද්දේදී රෙමලියාගේ පුත්‍රවූ පෙකා
සමාරියෙහි ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
රජවී විසි අවුරුද්දක් රජකම්කෙළේය.
28 ඔහු **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය. ඉශ්‍රායෙල්ට
පව්කරන්ට සැලැස්සුවාවූ නෙබාත්ගේ
පුත්‍රවූ යෙරොබොවම්ගේ පාපවලින් ඔහු
29 අහක්නොවීය. ඉශ්‍රායෙල් රජවූ පෙකා-
ගේ කාලයේදී අෂූර්හි රජවූ තිග්ලත්-
පිලෙසෙර් ඇවිත් ඊයෝන්ද ආබෙල්-
බෙත්-මයකාද යනෝවාද කෙදෙෂ්ද
හාශෝර්ද ගිලියද්ද ගලීලයද එනම් මුළු
නප්තලී දේශයද අල්ලාගෙන දේශවාසීන්
30 අෂූර්ට ගෙන ගියේය. උස්සියාගේ පුත්‍රවූ
යෝතාම්ගේ විසිවෙනි අවුරුද්දේදී ඒලා-
ගේ පුත්‍රවූ හෝෂෙයා රෙමලියාගේ පුත්‍රවූ
පෙකාට විරුද්ධව කුමන්ත්‍රණයකොට,
ඔහුට පහරදී මරා, ඔහු වෙනුවට රජ-
31 වුණේය. පෙකාගේ අනික් ක්‍රියාද ඔහු
කළ සියල්ලද ඉශ්‍රායෙල් රජුන්ගේ ලේකම්
පොතේ ලියා තිබේ.
32 රෙමලියාගේ පුත්‍රවූ ඉශ්‍රායෙල්හි රජවූ
පෙකාගේ දෙවෙනි අවුරුද්දේදී යූදහි රජවූ
උස්සියාගේ පුත්‍රවූ යෝතාම් රජවුණේය.
33 ඔහු විසිපස් අවුරුදු වයසේදී රජවී
යෙරුසලමේ දහසය අවුරුද්දක් රජකම්-
කෙළේය. ඔහුගේ මවුගේ නම යෙරූෂාය,
34 ඈ ශාදොක්ගේ දුවණියක්ය. ඔහු **ස්වාමීන්-
වහන්සේගේ** ඇස් හමුයෙහි හරිව තිබුණු
දේ කරමින් තමාගේ පියවූ උස්සියා
35 කළ සියල්ල ලෙස කෙළේය. නුමුත් උස්
තැන් පහනොකරන ලද්දේය. ඒ වන
තෙක් සෙනඟ උස් තැන්වල පූජාකොට
සුවඳ ද්‍රව්‍ය දැවුවෝය. ඔහු **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ ඉහළ දොරටුව
36 ගොඩනැඟුවේය. යෝතාම්ගේ අනික්
ක්‍රියාද ඔහු කළ සියල්ලද යූද රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා
නොවේද? ඒ දවස්වලදී **ස්වාමීන්වහන්සේ** 37
සිරියේ රජවූ රෙශීන්ද රෙමලියාගේ පුත්‍රවූ
පෙකාද යූදට විරුද්ධව යවන්ට පටන්-
ගත්සේක. යෝතාම් තමාගේ පියවරුන් 38
සමග සැතපී තමාගේ පියවූ දාවිත්ගේ
නුවර තමාගේ පියවරුන් ළඟ තැන්පත්-
කරනු ලැබුවේය. ඔහුගේ පුත්‍රවූ ආහාස්
ඔහු වෙනුවට රජවුණේය.

## ආහාස් රජ සහ අෂූර් රට

16
රෙමලියාගේ පුත්‍රවූ පෙකාගේ
දහහත්වෙනි අවුරුද්දේදී යූදහි
රජවූ යෝතාම්ගේ පුත්‍රවූ ආහාස්
රජවුණේය. ආහාස් විසි අවුරුදු වයසේදී 2
රජවී යෙරුසලමේ දහසය අවුරුද්දක්
රජකම්කෙළේය. ඔහු තමාගේ පියවූ
දාවිත් මෙන් තමාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** ඇස් හමුයෙහි හරිව
තිබුණු දේ නොකර, ඉශ්‍රායෙල් රජුන්ගේ 3
මාර්ගයෙහි හැසිර, **ස්වාමීන්වහන්සේ**
ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙන් පහකරදැමූ
ජාතීන්ගේ පිළිකුල් හාවිතා ලෙස තමාගේ
පුත්‍රයා ගිනිමැදින් යවා පූජාකෙළේය.
ඔහු උස් තැන්වලත් හෙල් පිටත් සියලු 4
විශාල ගස් යටත් පූජා ඔප්පුකොට
සුවඳ ද්‍රව්‍ය දැවුවේය. එකල සිරියේ රජවූ 5
රෙශීන්ද රෙමලියාගේ පුත්‍රවූ ඉශ්‍රායෙල්
රජවූ පෙකාද යුද්ධ කරන පිණිස
යෙරුසලමට ඇවිත් ආහාස් වටලූ
නුමුත් ඔහු පරදවන්ට බැරි වූවෝය. ඒ 6
කාලයේදී සිරියේ රජවූ රෙශීන් ඒලත්
නැවත සිරියට ලබාගෙන යූදවරුන් ඒලත්
කෙරෙන් පහකරදැමුවේය. සිරියවරු
ඒලත්ට ඇවිත් අද දක්වා එහි වසති.
එකල ආහාස් අෂූර්හි රජවූ තිග්ලත්- 7
පිලෙසෙර් වෙතට පණිවිඩකාරයන්
යවා: මම ඔබගේ මෙහෙකරුවාය,
ඔබගේ පුත්‍රයාය. ඇවිත් මට විරුද්ධව
නැගිට සිටින සිරියේ රජුගේ අතිනුත්
ඉශ්‍රායෙල් රජුගේ අතිනුත් මා ගැළවුව-
මැනවැයි කියා යැවුවේය. තවද ආහාස් 8
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහිත් රජ-
ගෙදර ගබඩාවලත් තිබුණු රන් රිදී
රැගෙන අෂූර්හි රජුට තෑග්ගක් කොට

9 ඇරියේය. අෂූර්හි රජ ඔහුට ඇහුම්කන්දී
දමස්කයට විරුද්ධව ගොස්, එය
අල්ලාගෙන, එහි වැසියන් වහලුන් කොට
කීර්ට ගෙනගියේය, රෙශීන්ද මැරුවේය.
10 ආහාස් රජ අෂූර්හි රජවූ තිග්ලත්-
පිලෙසෙර් සම්බවෙන්ට දමස්කයට
ගොස් දමස්කයේ තිබුණු පූජාසනය
දැක, පූජාසනයේ සියලු වැඩවල හරි
ආදර්ශයක්ද එහි හැඩයද උරියා පූජ-
11 කයාට එවුවේය. උරියා පූජක තෙමේ
පූජාසනය ගොඩනැගුවේය. ආහාස් රජ
දමස්කයෙන් එවූ සියල්ලේ හැටියට උරියා
පූජක තෙමේ ආහස් රජ දමස්කයෙන්
12 එන්ට පළමුවෙන් ඒක සෑදුවේය. රජ
දමස්කයෙන් ඇවිත් ඒ පූජාසනය දැක
13 ඊට ළංව ඒ පිට පූජාකෙළේය. ඔහු
තමාගේ දවන පූජාවත් ආහාර පූජාවත්
දවා, තමාගේ පාන පූජාව වත් කොට,
තමාගේ ශාන්ති පූජාවල ලේ පූජාසනය
14 පිට ඉස්සේය. **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
තිබුණු පිත්තල පූජාසනය වූකලී ගෘහය
ඉදිරියෙන් එනම් තමාගේ පූජාසනයටත්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයටත් අතරෙන්
අහක් කොට තමාගේ පූජාසනයට උතුරු
15 පැත්තේ තැබුවේය. ආහාස් රජ පූජකවූ
උරියාට අණකරමින්: උදේ දවන පූජාවත්
සවස ආහාර පූජාවත් රජුගේ දවන
පූජාවත් ඔහුගේ ආහාර පූජාවත් දේශයේ
මුළු සෙනඟගේ දවන පූජාවත් සවස
ඔවුන්ගේ ආහාර පූජාවත් ඔවුන්ගේ පාන
පූජාවලුත් මහත් පූජාසනය පිට දවා
දවන පූජාවේ සියලු ලේත් පූජාවේ සියලු
ලේත් ඊ පිට ඉසපන්න. පිත්තල පූජා-
සනය වනාහි මා විසින් විභාගකරන
16 පිණිස වන්නේයයි කීය. ආහාස් රජු
අණකළ සියල්ල ලෙස පූජකවූ උරියා
17 කෙළේය. තවද ආහාස් රජ අෂූර්හි රජු
නිසා මැහිවල පතේල කපා දමා ඒවා
උඩ තිබුණු භාජනය අහක් කෙළේය;
මුහුද යට තිබුණු පිත්තල ගවයන්ගේ
පිටෙන් මුහුද බස්වා ගල් අතුළ බිමක
18 තැබුවේය. සබත් දවසේ යාම පිණිස
ගෘහයෙහි සාද තිබුණ ඇහුරු මාර්ගයද
රජුට ඇතුල්වීමට තිබුණු පිට ස්ථානයද
ඔහු **ස්වාමීන්වහන්සේගේ** ගෘහය දෙසට
හරවා තැබීය. බලව, ආහාස් කළ අනික් 19
ක්‍රියා යූදහි රජුන්ගේ ලේකම්පොතේ
ලියා තිබෙනවා නොවේද? ආහාස් 20
තමාගේ පියවරුන් සමග සැතපී දාවිත්-
ගේ නුවර තමාගේ පියවරුන් ළඟ
තැන්පත්කරනු ලැබුවේය. ඔහුගේ පුත්‍රවූ
හෙසකියා ඔහු වෙනුවට රජවුණේය.

## හෝෂෙයා රජ.
## ඉශ්‍රායෙල් වාලට ගෙනයාම

17 යූදහි රජවූ ආහාස්ගේ දෙළොස්-
වෙනි අවුරුද්දේදී ඒලාගේ පුත්‍රවූ
හෝෂෙයා සමාරියෙහි ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි රජවී නව අවුරුද්දක් රජකම්-
කෙළේය. ඔහු **ස්වාමීන්වහන්සේගේ** ඇස් 2
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය,
එහෙත් තමාට පළමුවෙන් සිටි ඉශ්‍රායෙල්
රජවරුන් මෙන් නොවේය. අෂූර්හි රජවූ 3
ෂල්මනෙසෙර් ඔහුට විරුද්ධව ආයේය;
හෝෂෙයා ඔහුට මෙහෙකරුවී කප්පන්
දුන්නේය. නුමුත් හෝෂෙයා මිසරයේ 4
සෝ රජු ළඟට පණිවිඩකාරයන් යැවූ
නිසාත් අවුරුදුපතා කළ හැටියට අෂූර්හි
රජුට කප්පන් ගෙනත් නුදුන් නිසාත්
ඔහු කුමන්ත්‍රණය කළ බව අෂූර්හි රජ
දැනගෙන ඔහු හිර අඩස්සිකොට බැන්-
දේය. එවිට අෂූර්හි රජ දේශය මුළුල්ලේ 5
ගොස් සමාරියට පැමිණ තුන් අවුරුද්දක්
ඒක වටලාගන සිටියේය. තවද හෝ- 6
ෂෙයාගේ නවවෙනි අවුරුද්දේ අෂූර්හි
රජ සමාරිය අල්ලාගන ඉශ්‍රායෙල්වරුන්
අෂූර්ට ගෙනගොස් හලාහිද ගෝසාන්
ගංගාව වන හාබෝර් ළඟද මේදවරුන්-
ගේ නුවරවලද පදිංචි කෙරෙවුවේය. එසේ 7
වුණේ ඉශ්‍රායෙල් පුත්‍රයන් ඵාරාවෝගේ
අත යටතින් තමුන් නිදහස්කොට මිසර
දේශයෙන් ගෙනාවාවූ තමුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව පව්-
කරමින්, වෙන දෙවිවරුන්ට භයව,
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන් 8
ඉදිරියෙන් පන්නා දැමූ ජාතීන්ගේ පනත්-
වලද ඉශ්‍රායෙල් රජුන් සාදගත් පනත්-
වලද හැටියට හැසුරුණු නිසාය. තවද 9
ඉශ්‍රායෙල් පුත්‍රයෝ තමුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව අයුතු

දේවල් රහසින් කරමින්, මුරකාරයන්ගේ
කොටු පටන් පවුරු ඇති නුවර දක්වා
තමුන්ගේ හැම නුවරවල උස් තැන්
10 සාදගෙන, උස්වූ සියලු හෙල් පිටද සියලු
විශාල ගස් යටද රූපස්තම්භ සහ
11 අෂේරා කණු පිහිටුවාගෙන, ඔවුන්
ඉදිරියෙන් ස්වාමීන්වහන්සේ ගෙන ගිය
ජාතීන් කළාක් මෙන් ඒ සියලු උස්තැන්-
වල සුවඳ දුම් ඔප්පුකළෝය; ස්වාමීන්-
වහන්සේට උදහස් උපදවන හැටියට
12 නපුරු දේවල්ද කළෝය. රූපවලට සේවය
නොකරල්ලායයි ස්වාමීන්වහන්සේ
ඔවුන්ට කී නුමුත් ඔව්හු ඒ දේ කළෝය.
13 එහෙත් ස්වාමීන්වහන්සේ තමන්ගේ
සියලු ප්‍රොපේතවරුන්ද දර්ශකයන්ද
ලවා ඉශ්‍රායෙල්වරුන්ටත් යූදවරුන්ටත්
අවවාද කරවමින්: තුඹලාගේ නපුරු
මාර්ගවලින් අහක්වී, තුඹලාගේ පිය-
වරුන්ට මා අණකළාවූ, මාගේ සේවක-
යන්වූ ප්‍රොපේතවරුන් අත තුඹලාට
එවූවාවූ මාගේ මුළු ව්‍යවස්ථාවේ හැටියට
මාගේ ආඥා පවත්වාපල්ලායයි කීසේක.
14 නුමුත් ඔව්හු ඇහුම්කන් නොදී, තමුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ කෙරෙහි නො-
ඇදහූ ඔවුන්ගේ පියවරුන්ගේ කුළල්
මෙන් තමුන්ගේ කුළල් තදකරගෙන,
15 උන්වහන්සේගේ පනත්ද ඔවුන්ගේ
පියවරුන් සමග කළාවූ උන්වහන්සේගේ
ගිවිසුමද ඔවුන්ට උන්වහන්සේ දුන්නාවූ
උන්වහන්සේගේ අවවාදවල්ද ඔවුන්
එපාකර, නිස්සාරකම අනුව ගොස්,
නිස්සාරකම් කරමින්, ඔවුන් වටකර
සිටි ජාතීන් මෙන් නොකරන හැටියට
ස්වාමීන්වහන්සේ ඔවුන්ට අණකළ නුමුත්,
16 ඒ ජාතීන් අනුව ගියෝය. ඔව්හු තමුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ සියලු ආඥා
අත්හැර, වාත්තු කළ පිළිම වන වස්සන්
දෙන්නෙක්ද අෂේරා කණුවක්ද සාදගෙන,
මුළු අහස් සේනාවට නමස්කාරකරමින්,
17 බාල්ට සේවයකළෝය. ඔව්හු තමුන්ගේ
පුත්‍රයන්ද දූවරුන්ද ගිනි මැදින් යවා
පූජා කළෝය, පේනකීමද ශාස්ත්‍රබැලී-
මද භාවිතාකළෝය, ස්වාමීන්වහන්සේ
උදහස්කරවන ලෙස උන්වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කිරීමටද
හාරවුණෝය. ඒ නිසා ස්වාමීන්වහන්සේ 18
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි ඉතා උදහස්වී
තමන්ගේ ඇස් හමුයෙන් ඔවුන් පහකළ-
සේක. ඉතුරුවුණේ යූද ගෝත්‍රය පමණක්ය.
යූදවරුත් තමුන්ගේ දෙවිවූ ස්වාමීන්- 19
වහන්සේගේ ආඥා රක්ෂානොකොට,
ඉශ්‍රායෙල්වරුන් විසින් සාදගත් පනත්
ලෙස හැසුරුණෝය. ස්වාමීන්වහන්සේද 20
මුළු ඉශ්‍රායෙල් වංශය අත්හැර, ඔවුන්ට
පීඩාකොට, ඔවුන් තමන්ගේ ඇස්
හමුයෙන් අහක්කරදමනතුරු කොල්ල-
කාරයන්ගේ අතට ඔවුන් පාවාදුන්සේක.
මක්නිසාද උන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන් 21
දාවිත්ගේ වංශයෙන් වෙන්කළසේක;
ඔව්හුද නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම්
රජකොට පත්කරගත්තෝය. යෙරො-
බොවම් ස්වාමීන්වහන්සේ වෙතින්
ඉශ්‍රායෙල්වරුන් අහක්කොට, ඔවුන් විසින්
මහත් පාපයක් කරන්ට සැලැස්සුවේය.
මෙසේ ස්වාමීන්වහන්සේ තමන්ගේ සියලු 22
මෙහෙකරුවන්වූ ප්‍රොපේතවරුන් ලවා
කියවූ ලෙස ඉශ්‍රායෙල් පුත්‍රයන් තමන්ගේ
ඇස් හමුයෙන් පහකරන තෙක්, ඔව්හු
යෙරොබොවම් කළ සියලුම පාපවලින්
අහක් නොවී ඒවායෙහි හැසුරුණෝය.
මෙසේ ඉශ්‍රායෙල්වරු තමුන්ගේ දේශයෙන් 23
අෂූර්ට ගෙනයන ලදුව අද දක්වා එහි
සිටිති.

## සමාරියයන්ගේ පටන්ගැන්ම සහ නමස්කාර විධිය

අෂූර්හි රජ බබිලෝනියෙන්ද කූතාවෙන්ද 24
අව්වායෙන්ද හමාතෙන්ද සෙපර්වයිමෙන්ද
මිනිසුන් ගෙනවුත් ඉශ්‍රායෙල් පුත්‍රයන්
වෙනුවට සමාරියේ නුවරවල පදිංචි-
කෙරෙවුවේය. ඔව්හු සමාරිය හිමිකරගෙන
එහි නුවරවල වාසයකළෝය. ඔව්හු 25
එහි වාසයකරන්ට පටන්ගන්න කල
ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතුව
නොසිටියෝය. එබැවින් ස්වාමීන්වහන්සේ
ඔවුන් අතරට සිංහයන් යැවූසේක, උන්
ඔවුන්ගෙන් සමහර දෙනෙකුන් මැරුවෝය.
එබැවින් ඔව්හු අෂූර්හි රජුට කථාකොට: 26
ඔබ විසින් ගෙනවුත් සමාරියේ නුවරවල

පදිංචිකෙරෙවූ ජාතීහු ඒ දේශයේ
දෙවියන්ගේ අන්දම නොදනිති. ඒ නිසා
උන්වහන්සේ ඔවුන් අතරට සිංහයන්
එවූසේක, ඔවුන් දේශයේ දෙවියන්ගේ
විධිය නොදන්නා නිසා සිංහයෝ ඔවුන්
27 මරතියි කීවෝය. එවිට අෂූර්හි රජ
අණකරමින්: තුඹලා එතැනින් ගෙනා
පූජකයන්ගෙන් එක්කෙනෙකු එහි
කැඳවාගන පලයල්ලා. ඔහු ගොස් එහි
වාසය කරමින් ඒ දේශයේ දෙවියන්ගේ
විධිය ඔවුන්ට උගන්වා දේවයි කීවේය.
28 මෙසේ ඔවුන් සමාරියෙන් ගෙනගිය
පූජකයන්ගෙන් එක්කෙනෙක් ඇවිත්
බෙතෙල්හි වාසයකොට, **ස්වාමීන්-
වහන්සේ** කෙරෙහි භයවිය යුතු අන්දම
29 ඔවුන්ට ඉගැන්නුවේය. එසේ වුවත් ඒ
ඒ ජාතීහු තම තමුන්ගේ දෙවිවරුන්
සාදගෙන, ඒ ඒ ජාතීන් විසූ නුවරවල
තිබුණාවූ උස් තැන්හි ගෘහවල ඒවා
30 තැබුවෝය. එසේ බබිලෝනි මනුෂ්‍යයෝ
සුක්කොත්-බෙනොත්ද, කූත්හි මනුෂ්‍ය-
යෝ නේර්ගල්ද, හමාත්හි මනුෂ්‍යයෝ
31 අෂිමාද, අව්විවරු නිබ්හස්ද තර්තාක්ද
යන දෙවිවරුන් සෑදුවෝය, සෙපර්විවරුද
සෙපර්වයිමේ දෙවිවරුන්වූ අද්‍රම්මෙලෙක්
සහ අනම්මෙලෙක් සඳහා තමුන්ගේ
32 දරුවන් ගින්නෙන් දැවූවෝය. ඔව්හු
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය පවත්-
වමින්, උස් තැන්හි ගෘහවල ඔවුන් උදෙසා
පූජාකරන පිණිස තමුන් අතරෙන් උස්
තැන්වල පූජකයන් පත්කර ගත්තෝය.
33 ඔව්හු **ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය
ඇතිව, තමුන් අත්ඇර ආවාවූ ඒ ජාතීන්-
ගේ විධියේ හැටියට තමුන්ගේ දෙවි-
34 වරුන්ට සේවයකළෝය. අද දක්වා
ඔව්හු පළමු විධි ලෙස කෙරෙති. ඔව්හු
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය ඇතුව
නොසිටිති, තමුන්ගේම නියෝගද පනත්ද
ලෙස නොකෙරෙති, **ස්වාමීන්වහන්සේ**
ඉශ්‍රායෙල් යන නම තැබූ, යාකොබ්ගේ
පුත්‍රයන්ට අණකළ උන්වහන්සේගේ
ව්‍යවස්ථාවේද ආඥාවේද හැටියට නො-
35 කෙරෙති; **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්
පුත්‍රයන් සමග ගිවිසුමක් කරමින්: අන්
දෙවිවරුන් කෙරෙහි භය නොපවත්වා,
ඔවුන්ට නමස්කාර නොකොට, සේවය
නොකොට, පූජා නොකොට, මහත් 36
බලයෙන්ද දිගුකළ හස්තයකින්ද මිසර
දේශයෙන් තුඹලා ගෙනාවාවූ **ස්වාමීන්-
වහන්සේ** කෙරෙහි භය පවත්වා, උන්-
වහන්සේටම නමස්කාරකොට, උන්-
වහන්සේටම පූජා කරපල්ලා. අන් 37
දෙවිවරුන් කෙරෙහි භය නොපවත්වා,
උන්වහන්සේ ලියා දුන් නියෝගද පනත්ද
ව්‍යවස්ථාද ආඥාද සෑම කල්හිම පවත්-
වන්ට බලාගනිල්ලා. මා විසින් තුඹලා 38
සමග කළාවූ ගිවිසුම මතකනැති නො-
කරල්ලා; වෙන දෙවිවරුන් කෙරෙහි
භය නොපවත්වා. තුඹලාගේ දෙවිවූ 39
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය ඇතුව
සිටපල්ලා; උන්වහන්සේ තුඹලාගේ සියලු
සතුරන් අතින් තුඹලා ගළවනවා ඇතැයි
කීසේක. එසේවීනුමුත් ඔව්හු ඇහුම්කන් 40
නොදී, තමුන්ගේ පළමු විධිය ලෙස
කළෝය. මෙසේ මේ ජාතීහු **ස්වාමීන්-** 41
**වහන්සේ** කෙරෙහි භය පවත්වමින්
තමුන්ගේ රූපවලට සේවයකළෝය;
එලෙසම ඔවුන්ගේ දරුවෝද දරුවන්ගේ
දරුවෝද තමුන්ගේ පියවරුන් කළ
හැටියට අද දක්වා කෙරෙති.

## හෙසකියා සහ සෙනකෙරිබ්

18 ඒලාගේ පුත්‍රවූ ඉශ්‍රායෙල් රජවූ
හෝෂෙයාගේ තුන්වෙනි අවුරුද්දේදී
යූදාහි රජවූ ආහාස්ගේ පුත්‍රවූ හෙසකියා
රජවුණේය. ඔහු විසිපස් අවුරුදු වයසේදී 2
රජවී විසිනව අවුරුද්දක් යෙරුසලමේ
රජකම්කළේය. ඔහුගේ මවුගේ නම් අබීය,
ඈ සෙකරියාගේ දුවෙක්ය. ඔහුගේ පියවූ 3
දාවිත් කළ සියල්ල ලෙස ඔහු **ස්වාමීන්-
වහන්සේගේ** ඇස් හමුයෙහි හරිව තිබුණු
දේ කෙළේය. ඔහු උස් තැන් පහකර, 4
රූපස්තම්භ කඩා, අෂේරා කණු කපා-
දමා, මෝසෙස් විසින් සෑදූ පිත්තල
සර්පයාත් කැබලිකොට දැමුවේය; මක්-
නිසාද ඒ දවස් දක්වා ඉශ්‍රායෙල් පුත්‍රයෝ
ඊට සුවඳ දුම් ඔප්පුකළෝය; ඔහු ඊට

5 *නෙහුෂ්තාන්යයි නම තැබුවේය. ඔහු
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කෙරෙහි විශ්වාස කෙළේය; ඔහුට
සමාන කිසිවෙක් ඔහුට පසුවවත් ඔහුට
ප්‍රථමවත් යූදුහි සියලු රජුන් අතරේ
6 නොසිටියේය. ඔහු **ස්වාමීන්වහන්සේට**
ඇලුම්ව සිට, උන්වහන්සේ අනුව යාම
අත්නොහැර, **ස්වාමීන්වහන්සේ** විසින්
මෝසෙස්ට අණකළ උන්වහන්සේගේ
7 ආඥ රක්ෂාකෙළේය. **ස්වාමීන්වහන්සේද**
ඔහු හා සමග සිටිසේක; ඔහු ගිය ගිය
තැන සමෘද්ධවිය. ඔහු අෂූර්හි රජුට
විරුද්ධව කැරළි ගසා, ඔහුට සේවය
8 නොකොට සිටියේය. ඔහු ගාසා සහ
එහි සීමාවල් දක්වාද මුර කොටුව පටන්
පවුරු සහිත නුවර දක්වාද පිලිස්තිවරුන්ට
පහර දුන්නේය.
9 ඒලාගේ පුත්‍රවූ ඉශ්‍රායෙල් රජවූ
හෝෂෙයාගේ සත්වෙනි අවුරුද්ද වන
හෙසෙකියා රජුගේ. සතරවෙනි අවුරුද්-
දේදී අෂූර්හි රජවූ ෂල්මනෙසෙර් සමාරි-
යට විරුද්ධව ඇවිත් ඒක වටලාගෙන,
10 තුන් අවුරුද්දකට පසු ඒක අල්ලා-
ගත්තේය. ඉශ්‍රායෙල් රජවූ හෝෂෙයාගේ
නවවෙනි අවුරුද්ද වන හෙසකියාගේ
හවෙනි අවුරුද්දේදී සමාරිය අල්ලා-
11 ගන්නාලද්දේය. අෂූර්හි රජද ඉශ්‍රායෙල්-
වරුන් අෂූර්ට ගෙනගොස් හලාහිද
ගෝෂාන්හි ගංගාව වන හාබෝර් ළඟද
මේදවරුන්ගේ නුවරවලද පදිංචි-
12 කෙරෙවුවේය. මෙසේ සිද්ධවුණේ ඔවුන්
තමුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
හඬට කීකරුනොවී, උන්වහන්සේගේ
ගිවිසුම වන, **ස්වාමීන්වහන්සේගේ**
මෙහෙකරුවූ මෝසෙස් විසින් අණකළ
සියල්ල කඩකළ නිසාය, ඔව්හු ඒවා
අසන්ටවත් කරන්ටවත් නොකැමැති වූහ.
13 හෙසකියා රජුගේ දහහතරවෙනි
අවුරුද්දේදී අෂූර්හි රජවූ සෙනකෙරිබ්
යූදුහි රජවරුන්ගේ නුවරවලට විරුද්ධව
14 ඇවිත් ඒවා අල්වාගත්තේය. එවිට යූදුහි
රජවූ හෙසකියා: මම වරද කෙළෙමි;
මා වෙතින් හැරී ගියමැනවි. ඔබ මා
පිට තබන දෙයක් දරන්නෙමියි කියා
ලාකීෂ්හි සිටි අෂූර්හි රජුට කියා
ඇරියේය. අෂූර්හි රජද රිදී තලෙන්ත
තිහක්ද දෙන්ට යූදුහි රජවූ හෙසකියාට
නියමකෙළේය. හෙසකියා **ස්වාමීන්**- 15
**වහන්සේගේ** ගෘහයෙත් රජ ගෙදර
ගබඩාවලත් තිබුණු රිදී සියල්ල ඔහුට
දුන්නේය. ඒ කාලයෙහි හෙසකියා 16
**ස්වාමීන්වහන්සේගේ** මාලිගාවේ දෙරපු-
වලින්ද යූදුහි රජවූ හෙසකියා රනින්
වැසුවාවූ කුළුනුවලින්ද රන් කපාගෙන
ඒවා අෂූර්හි රජුට දුන්නේය. නුමුත් අෂූර්හි 17
රජ තර්තාන්ද රබ්-සාරිස්ද රබ්-ෂාකේද
මහත් සේනාවක් සමග හෙසකියා රජු
ළඟට ලාකීෂ්හි සිට යෙරුසලමට හැරී-
යේය. ඔව්හු නැගී අවුත් යෙරුසලමට
පැමිණියෝය. තවද ඔව්හු අපුල්ලන්නන්-
ගේ පිට්ටනියේ මාවත තිබෙන ඉහළ
පොකුණේ කාණුව ළඟ සිට රජුට
අඬගැස්සෙවුවෝය. එවිට රජ ගෙදර 18
ප්‍රධානියාවූ හිල්කියාගේ පුත්‍රවූ එලියා-
කිම්ද ෂෙබ්නා ලේකම්ද වාර්තාකරුවා
වන ආසාප්ගේ පුත්‍රවූ යෝවාද පිටත්ව
ඔවුන් ළඟට ගියෝය. එවිට රබ්-ෂාකේ 19
ඔවුන්ට කථාකොට: අෂූර්හි රජ වූ
මහරජ්ජුරුවෝ මෙසේ කියන්නාහ—නුඹ
විශ්වාසය තබන ඔය දේ කිමෙක්ද?
යුද්ධය පිණිස මන්ත්‍රණයද බලයද 20
තිබේයයි නුඹ කියන්නෙහිය. නුමුත්
ඒවා හිස් වචනය. ඉතින් නුඹ මට
විරුද්ධව කැරළිගැසුවේ කා කෙරෙහි
විශ්වාසකරගනද? මෙන්න, නුඹ 21
විශ්වාසකරන්නේ ඒ තැළුණු බට දණ්ඩ
වන මිසරය කෙරෙහිය; යමෙක් ඒකට
බර වුණොත් ඒක ඔහුගේ අතට ඇනී
හිල්වෙයි. මිසරයේ රජවූ ඵාරාවෝ
කෙරෙහි විශ්වාසකරන සියල්ලන්ට ඔහු
එසේමය. නුමුත්—අපේ දෙවිවූ **ස්වාමීන්**- 22
**වහන්සේ** කෙරෙහි විශ්වාසකරමුයයි
නුඹලා සමහරවිට මට කියනවා ඇත.
නුමුත් නුඹලා යෙරුසලමෙහි මේ පූජා-
සනය ඉදිරියෙහි නමස්කාරකළ යුතුයයි
යූදවරුන්ටත් යෙරුසලමේ වැසියන්-
ටත් කියා, හෙසකියා උන්වහන්සේගේ
උස් තැන්ද පූජාසනද පහකරදමුවා
නොවේද? ඉතින් අශ්වයන් පිට නැගී 23

*එනම්, පිත්තල කෑල්ලක්.

යන්ට අසරුවන් සොයාගන්ට නුඹට
පුළුවන් නම්, නුඹ අෂූර්හි රජවූ මාගේ
ස්වාමියාට ඇපදුන්නොත්, මම නුඹට
24 අශ්වයන් දෙදහසක් දෙන්නෙමි. එසේ
නුඹට බැරි නම් නුඹ මාගේ ස්වාමිහුගේ
සුළු සේවකයන්ගෙන් එක මුලාදෑනියෙක්
වුවත් එළවාදමන්නේ කොහොමද? රථද
අසරුවන්ද ගැන මිසරය කෙරෙහි
25 විශ්වාසකරගන සිටිනවාවද? මා දැන්
මේ ස්ථානය විනාශකරන්ට ඊට විරුද්ධව
ආවේ ස්වාමීන්වහන්සේ නැතුවද? මේ
දේශයට විරුද්ධව ගොස් ඒක විනාශ-
කරපන්නැයි ස්වාමීන්වහන්සේ මට
කීසේක කියා නුඹලා හෙසකියාට කියා-
26 පල්ලායයි කීවේය. එකල හිල්කියාගේ
පුත්‍රවූ එලියාකිම්ද ෂෙබ්නාද යෝවාද
රබ්-ෂාකේට කථාකොට: පවුර පිට
සිටින සෙනඟට ඇසෙන්ට යුදෙව්
භාෂාවෙන් අපට කථානොකොට, නුඹේ
මෙහෙකරුවන්වූ අපට සිරියේ භාෂාව
තේරෙන නිසා ඒ භාෂාවෙන් කථා-
27 කළමැනවැයි කීවෝය. එහෙත් රබ්-
ෂාකේ ඔවුන්ට උත්තරදෙමින්: මාගේ
ස්වාමියා මේ වචන කියන්ට මා එවූවේ
නුඹේ ස්වාමියාත් නුඹත් ළඟටද? නො-
හොත් පවුර පිට ඉන්න මනුෂ්‍යයන්
නුඹලා සමග තමුන්ගේ අශුචි කන
පිණිසත් තමුන්ගේ මූත්‍ර බොන පිණිසත්
28 ඔවුන් ළඟට නොවේදැයි කීවේය. එවිට
රබ්-ෂාකේ සිටගෙන යුදෙව් භාෂාවෙන්
මහත් ශබ්දයකින් මොරගසා: අෂූර්හි
රජ වන මහ රජ්ජුරුවන්ගේ වචන
29 අසාපල්ලා. නුඹලා රවටන්ට හෙසකියාට
ඉඩ නොදෙල්ලා; මක්නිසාද මාගේ
අතින් නුඹලා ගළවාගන්ට ඔහුට බැරිය.
30 ස්වාමීන්වහන්සේ සැබවින් අප ගළවා-
ගන්නසේකැයි කියාද මේ නුවර අෂූර්හි
රජු අතට අසුවෙන්නේ නැත කියාද
ස්වාමීන්වහන්සේ කෙරෙහි නුඹලා
31 විශ්වාසකරවන්ටත් ඉඩනාරිල්ලා. හෙස-
කියාට ඇහුම්කන් නොදෙල්ලා. කුමක්
හෙයින්ද අෂූර්හි රජ මෙසේ කියයි–මා
හා සමග සමාදනයකට පැමිණ මා
වෙතට වරෙල්ලා; එවිට මම ඇවිත්,
නුඹලාගේ දේශයට සමානවූ, ධාන්‍ය
හා මුද්‍රිකපානය ඇති, කෑමද මීදිවතුද
ඇති, ඔලීව තෙල්ද මීපැණිද ඇති
දේශයකට නුඹලා ගෙනයන තුරු,
නුඹලා එකිනෙකාට තම තමාගේ මුද්‍රික 32
වැලෙන්ද තම තමාගේ අත්තික්කා
ගසෙන්ද කන්ටත් තම තමාගේ ළිඳේ
වතුර බොන්ටත් පුළුවන. මෙසේ නුඹලා
නොනැසී ජීවත්වන්නහුය. ස්වාමීන්-
වහන්සේ අප ගළවාගන්නවා ඇත කියා
හෙසකියා නුඹලා පොළඹවන කල ඔහුට
ඇහුම්කන් නොදෙල්ලා. ජාතීන්ගේ දෙවි- 33
වරු තම තමුන්ගේ දේශ අෂූර්හි රජුගේ
අතින් කිසිසේත් ගළවාගත්තෝද?
හමාත්හිද අර්පාද්හිද දෙවිවරු කොයිද? 34
සෙපර්වයිම්හිද හේනාහිද ඉව්වාහිද
දෙවිවරු කොයිද? ඔව්හු සමාරිය මාගේ
අතින් ගළවාගත්තෝද? ස්වාමීන්වහන්සේ 35
යෙරුසලම මාගේ අතින් ගළවාගන්නවා
ඇත කියා සිතන්ට පුළුවන් වන ලෙස
දේශවල සියලු දෙවිවරුන් අතරෙන්
තමුන්ගේ දේශ මාගේ අතින් ගළවාගත්තේ
කොයි දෙවිවරුද කියා අසන්නේයයි
කීවේය. නුමුත් සෙනඟ ඔහුට කිසි 36
උත්තරයක් නොදී නිශ්ශබ්දව සිටියෝය.
මක්නිසාද: ඔහුට උත්තරදෙන්ට එපාය
කියා රජුගේ ආඥාවක් තිබුණේය. එවිට 37
රජ ගෙදර ප්‍රධානියෝවූ හිල්කියාගේ
පුත්‍රවූ එලියාකිම් නම් ගෘහාධිපතියාද
ෂෙබ්නා ලේකමද වාර්තාකරුවා වන
ආසාප්ගේ පුත්‍රවූ යෝවාද තමුන්ගේ ඇඳුම්
ඉරාගෙන හෙසකියා ළඟට ඇවිත්,
රබ්-ෂාකේගේ වචන ඔහුට දැන්නුවෝය.

## හෙසකියා විසින් යෙසායාට කළ අයදුම

19
හෙසකියා රජ ඒ අසා තමාගේ
ඇඳුම් ඉරා, ගෝණිරෙදි පෙරවාගන
ස්වාමීන්වහන්සේගේ ගෘහයට ඇතුල්-
වුණේය. තවද ඔහු රජගෙදර ප්‍රධානියා 2
වන එලියාකිම්ද ෂෙබ්නා ලේකමද පූජ-
කයන්ගේ වැඩිමහල්ලන්ද ගෝණි රෙදි
හඳවා ආමොස්ගේ පුත්‍රවූ යෙසායා
අනාගතවක්තෘ ළඟට ඇරියේය. ඔව්හු 3
ඔහුට කථාකොට: හෙසකියා මෙසේ

කියන්නේය–අද දවස දුකද තරවටුවද
අපහාසයද ඇති දවසක්ය. මක්නිසාද
ළදරුවෝ බිහිවෙන්ට ළංව සිටිති, නුමුත්
4 වදන්ට ශක්තිය නැත. ජීවමාන දෙවියන්-
වහන්සේට අපහාස කරන්ට අෂූර්හි රජු
විසින් එවුවාවූ, ඔහුගේ සේවකවූ රබ්-
ෂාකේගේ සියලු වචන සමහරවිට නුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අසා ඒ ඇසූ
වචනවලට උන්වහන්සේ ප්‍රති තර්ජනයක්
කරනසේක. එබැවින් තවම ඉතුරුව
සිටින්නන් උදෙසා යාච්ඥා ඔප්පු-
කරන්නැයි කියන්නේයයි කීවෝය.
5 මෙසේ හෙසකියා රජුගේ මෙහෙකරුවෝ
6 යෙසායා ළඟට පැමුණුණෝය. යෙසායා
ඔවුන්ට කථාකොට: නුඹ ඇසුවාවූ,
අෂූර්හි රජුගේ සේවකයන් විසින් මට
අපහාස කොට කීවාවූ වචනවලට
7 භයනොවන්න. ඔහු ආරංචියක් අසා
තමාගේ දේශයට හැරී යන ලෙස මම
ඔහු පිටට ආත්මයක් පමුණුවා, ඔහුගේ
දේශයේදී ඔහු කඩුවෙන් වැටෙන්ට
සලස්වන්නෙමියි කියනසේකැයි නුඹලාගේ
ස්වාමියාට දන්වාපල්ලායයි කීවේය.
8 අෂූර්හි රජු ලාකීෂ්හි සිට පිටත්ව ගිය
බව රබ්-ෂාකේ අසා හැරීගිය විට, ඔහු
ලිබ්නාට විරුද්ධව යුද්ධකරන බව දැන-
9 ගත්තේය. කූෂ්හි රජවූ තිර්හාකා රජ
නුඹට විරුද්ධව යුද්ධකරන්ට එන්නේ-
යයි ඔහුට සැලවිය. එවිට ඔහු හෙසකියා
ළඟට නැවත පණිවිඩකාරයන් එවා:
10 නුඹලා යූදහි රජවූ හෙසකියාට මෙසේ
කියාපල්ලා–අෂූර්හි රජු අතට යෙරුසලම
අසුනොවන්නේය කියා නුඹ විශ්වාස-
කරන නුඹේ දෙවියන්වහන්සේට නො-
11 රැවටෙන්න. මෙන්න, අෂූර්හි රජවරුන්
සියලු දේශවලට කළ දේ එනම් ඒවා
විනාශකර දැමූ බව නුඹ අසා තිබේ.
එසේ නම් නුඹ ගැළවෙනවා ඇද්ද?
12 මාගේ පියවරුන් විසින් නැතිකළාවූ
ගෝසාන්ද හාරාන්ද රෙශෙප්ද තෙ-
ලස්සාර්හි සිටි ඒදෙන් පුත්‍රයන්ද යන
ජාතීන්ගේ දෙවිවරු ඔවුන් ගළවා-
13 ගත්තෝද? හමාත්හි රජද අර්පාද්හි
රජද සෙපර්වයිම් නුවරෙත් හේනාහිත්
ඉව්වාහිත් රජද කොතැනදැයි කියා-
පල්ලායයි කීවේය. හෙසකියා පණිවිඩ- 14
කාරයන් අතින් ලියුම ගෙන කියවා,
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට ගොස්,
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි ඒක
විදහා පා, **ස්වාමීන්වහන්සේ** ඉදිරි- 15
යෙහි යාච්ඥා කරමින්: කෙරුබ්වරුන්
අතරේ වැඩවසන ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, පොළොවේ සියලු
රාජ්‍යයන් කෙරෙහි ඔබම, ඔබ පමණක්ම
දෙවියන්වහන්සේය; ඔබ අහසත් පො-
ළොවත් මැවූසේක. **ස්වාමීන්වහන්ස**, 16
ඔබගේ කන නමා ඇසුවමැනව;
**ස්වාමීන්වහන්ස**, ඔබගේ ඇස් ඇර බැලුව
මැනව; ජීවමාන දෙවියන්වහන්සේට
අපහාසකරන පිණිස සෙනකෙරිබ් කියා
එවූ වචන ඇසුව මැනව. **ස්වාමීන්වහන්ස**, 17
අෂූර්හි රජවරුන් ජාතීන්ද ඔවුන්ගේ
දේශවල්ද පාළුකොට ඔවුන්ගේ දෙවි- 18
වරුන් ගින්නෙහි හෙළුවා සැබෑය. මක්-
නිසාද ඒවා දෙවිවරු නොව මනුෂ්‍යයන්-
ගේ හස්තකර්මාන්තයවූ ලී සහ ගල් ව
තිබුණේය; ඒ නිසා ඔව්හු ඒවා විනාශ-
කළෝය. එබැවින් අපේ දෙවිවූ **ස්වාමීන්-** 19
**වහන්ස**, ඔබම, ඔබ පමණක්ම **ස්වාමිවූ**
දෙවියන්වහන්සේ බව පොළොවේ සියලු
රාජ්‍යවල් දැනගන්නා පිණිස ඔහුගේ අතින්
අප ගැළෙවුව මැනවයි කීවේය.
එවිට ආමොස්ගේ පුත්‍රවූ යෙසායා 20
හෙසකියාට මෙසේ කියා ඇරියේය:
අෂූර්හි රජවූ සෙනකෙරිබ් ගැන නුඹ
මට කළ යාච්ඥාව මම ඇසීමියි
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කියනසේක. ඔහු ගැන **ස්වාමීන්වහන්සේ** 21
කියන වචනය මේය–සියොනේ කන්‍යා
දුව නුඹ සුළුකරනවාය, නුඹට කවටකම්-
කරනවාය; යෙරුසලමේ දුව නුඹට ඉස
වනනවාය. නුඹ නින්දාකළෙත් අප- 22
හාසකළෙත් කාටද? නුඹ හඬනැගුවෙත්
නුඹේ ඇස් උඩට එසෙවුවෙත් කාට
විරුද්ධවද? ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්-
වහන්සේට විරුද්ධවය. නුඹේ පණිවිඩ- 23
කාරයන් ලවා නුඹ **ස්වාමීන්වහන්සේට**
නින්දාකරවා කථාකොට: මාගේ රථ
සමූහය හා සමග මම කඳුවල මුදුනට
එනම් ලෙබනොන්හි ඈත ප්‍රදේශවලට

නැඟුණෙමි; එහි උස්වූ කිහිරි ගස්ද අනර්ඝ
දේවදාර ගස්ද කපා දමා, ඒකේ දුරස්තර
නිවාසවලටත් උයනක් වැනි ඒකේ
24 වනයටත් ඇතුල්වන්නෙමි. මම භාරා
අන්‍ය දේශවල වතුර බීවෙමි, මාගේ අඩි
තැබීමෙන් මිසරයේ සියලු ගංගා හින්ද-
25 වන්නෙමියි කීයෙහිය. මම බොහෝ
කාලයක සිට ඒක අභිප්‍රායකර,
පුරාණයේ දවස්වල පටන් ඒක නියම
කළ බව තුඹ ඇසුවේ නැද්ද? දැන්
තුඹ පවුරු ඇති නුවරවල් නාස්තිකොට
ජරාවාස ගොඩවල් කරන හැටියට
26 ඒක ඉෂ්ට කෙළෙමි. එබැවින් ඒවායේ
වැසියෝ බෙලහීනව සිටියෝය, ඔව්හු
කැලඹී වියවුලට පත්වුණෝය; ඔව්හු
කෙතේ තෘණද අමුපලාද පියසි උඩ
තණකොළද වැඩෙන්ට පළමුවෙන්
27 වේළුන ගොයම්ද මෙන් වූවෝය. නුමුත්
මම තුඹේ හිඳීමද තුඹේ යාමඊමද
මට විරුද්ධව තිබෙන තුඹේ කැරළිකාර-
28 කමද දනිමි. මට විරුද්ධව තිබෙන තුඹේ
කැරළිකාරකම නිසාද තුඹේ අහංකාරය
මගේ කන්වලට පැමුණුණ නිසාද තුඹේ
නාසයේ මාගේ වළල්ලත් තුඹේ කටේ
මාගේ කටකලියාවත් දමා, තුඹ ආ
මාර්ගයෙන් තුඹ හරවා යවන්නෙමි
29 යනුයි. මෙය තුඹට ලකුණු වන්නේය.
එනම් මේ අවුරුද්දේ ඉබේම හටගන්නා
ධාන්‍ය සහ දෙවෙනි අවුරුද්දේ එයින්
හටගන්න ඒවාත් තුඹලා කනවා ඇත;
තුන්වෙනි අවුරුද්දේ තුඹලා වපුරා
කපාගනිල්ලා, මිදිවතුත් වවා ඒවායේ
30 එල කාපල්ලා. යූද වංශයෙන් ගැළවී
ඉතිරිව සිටින කොටස නැවත පහළට
මුල් ඇද ඉහළින් එල දරනවා ඇත.
31 මක්නිසාද ඉතිරි ගණනක් යෙරුසලමෙන්ද
මිදුණ ගණනක් සියොන් කන්දෙන්ද
නික්මෙනවා ඇත. **ස්වාමීන්වහන්සේගේ**
ජ්වලිතකම මෙය ඉෂ්ටකරන්නේය.
32 එබැවින් **ස්වාමීන්වහන්සේ** අෂූර්හි රජු
ගැන මෙසේ කියනසේක: අෂූර්හි රජ
මේ නුවරට ඇතුල්වෙන්නේවත් ඊගහක්
ඊට විදින්නේවත් ඒ ඉදිරිපිටට පලිහක්
රැගෙන එන්නේවත් ඊට විරුද්ධව
33 ගොඩැල්ලක් නගන්නේවත් නැත. ඔහු
මේ නුවර තුළට නැවිත් තමා ආ
මගින් හැරී යන්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද මා නිසාත් මාගේ 34
මෙහෙකරුවූ දවිත් නිසාත් මේ නුවර
ගළවන්ට මම ඒක රැකගන්නෙමියි
කියනසේකැයි කියා ඇරියේය.

## අෂූර්වරුන් විනාශවීම

ඒ රාත්‍රියේ **ස්වාමීන්වහන්සේගේ** දූතයා 35
පිටත්ව ගොස් අෂූර්වරුන්ගේ කඳවුරෙහි
එක් ලක්ෂ අසූපන් දහසකට පහරදුන්නේය.
මිනිසුන් අලුයම නැගිටුණ විට, බලව,
ඒ සියල්ලන් මැරීලාය. එවිට අෂූර්හි 36
රජවූ සෙනකෙරිබ් පිටත්ව ගොස්
නිනිවෙහි වාසයකෙළේය. තවද ඔහු 37
තමාගේ දෙවිවූ නිස්රොක්ගේ ගෘහයෙහි
නමස්කාරකරද්දී ඔහුගේ පුත්‍රයෝ වන
අද්‍රම්මෙලෙක්ද ෂරෙශෙර්ද ඔහු කඩුවෙන්
මරා, අරාරාත් දේශයට පලාගියෝය.
ඔහුගේ පුත්‍රවූ ඒසර්-හද්දෝන් ඔහු වෙනුවට
රජවුණේය.

## හෙසකියාගේ රෝගය සහ සුවවීම

20 ඒ කාලයේදී හෙසකියා රෝගීව
මරණාසන්න විය. ආමොස්ගේ
පුත්‍රවූ යෙසායා අනාගතවක්තෘ ඔහු
ළඟට ඇවිත්: තුඹේ ගෙදර කාරණා
බේරා තබාපන්න; මක්නිසාද තුඹ
මැරෙන්නෙහිය, ජීවත් නොවන්නෙහිය
කියා **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
ඔහුට කීවේය. එවිට ඔහු තමාගේ 2
මුහුණ භිත්තිය දෙසට හරවාගෙන
**ස්වාමීන්වහන්සේට** යාච්ඥාකරමින්: අහෝ 3
**ස්වාමීන්වහන්ස**, මා සැබෑකමිනුත්
සම්පූර්ණ සිතකිනුත් ඔබ ඉදිරියෙහි
හැසිර, ඔබගේ ඇස් හමුයෙහි හරිව තිබුණු
දේ කළ බව සිහිකළ මැනවයි කියා
අතිශයින් ඇඬුවේය. යෙසායා මැද මිදුල 4
දක්වා යන්ට පළමුවෙන් **ස්වාමීන්-
වහන්සේගේ** වචනය ඔහු වෙතට පැමිණ
කියනුයේ: තුඹ හැරී ගොස් මාගේ 5
සෙනඟගේ අධිපතියාවූ හෙසකියාට
මෙසේ කියාපන්න—තුඹේ පියා වන
දවිත්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ

කියනසේක: මම නුඹේ යාච්ඤාව ඇසීමි,
නුඹේ කඳුලු දුටිමි. බලව, මම නුඹ
සුවපත්කරන්නෙමි. තුන්වෙනි දින නුඹ
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට යන්නෙහිය.
6 නුඹේ වයසට පහළොස් අවුරුද්දක්
එකතුකරන්නෙමි; මම අෂූර්හි රජුගේ
අතින් නුඹ සහ මේ නුවර ගළවා, මා
නිසාත් මාගේ මෙහෙකරුවූ දාවිත් නිසාත්
මේ නුවර රැකගන්නෙමියි කියා කියා-
7 පන්නැයි කීවේය. එවිට යෙසායා:
අත්තික්කා කැටියක් ගෙනෙල්ලායයි කීය.
ඔව්හු ගෙනවුත් එය ගෙඩිය පිට තැබූ-
8 වෝය, එවිට ඔහුට සුවවිය. හෙසකියා
යෙසායාට කථාකොට: **ස්වාමීන්-
වහන්සේ** මා සුවපත් කරන බවටත්
තුන්වෙනිද මා **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට යන බවටත් ලකුණ කිමෙක්-
9 දැයි ඇසුවේය. යෙසායා කථාකොට:
**ස්වාමීන්වහන්සේ** කී දේ කරන බවට
**ස්වාමීන්වහන්සේගෙන්** නුඹට ලැබෙන
ලකුණ මේය එනම් ඡායාව අංශක
දසයක් ඉස්සරහට යන්ටද නැතහොත්
10 පස්සට හැරී එන්ටදැයි ඇසීය. හෙස-
කියාද: ඡායාව අංශක දශයක් බසින
එක සුළු දෙයක්ය; එසේ නොව ඡායාව
අංශක දශයක් පස්සට හැරී ඒවයි කීවේය.
11 එවිට අනාගතවක්තෘවූ යෙසායා
**ස්වාමීන්වහන්සේට** යාච්ඤා කෙළේය.
උන්වහන්සේ ආහාස්ගේ හෝරා මණ්-
ඩලය පිට ඡායාව බැසගිය තැනින්
අංශක දශයක් පස්සට පැමිණෙවූසේක.

## බබිලෝනියේ රජු වෙතින් පණිවිඩකාරයින් පැමිණීම

12 ඒ කාලයේදී බලදන්ගේ පුත්‍රවූ
බබිලෝන්හි රජවූ බෙරොදක්-බලදන්
හෙසකියා රෝගීව සිටිය බව අසා
ලියුම්ද තෑග්ගක්ද ඔහු වෙතට හැරියේය.
13 හෙසකියා ඔවුන්ට ඇහුම්කන්දී තමාගේ
මුළු සම්පත් ගබඩාවද එහි තිබුණු රන්
රිදීද සුවඳ ද්‍රව්‍යද අනර්ඝ තෙල්ද තමාගේ
මුළු යුද්ධායුධ ගෙයද තමාගේ ගබඩාවල
තිබුණු සියල්ලද ඔවුන්ට පෙන්නුවේය.
තමාගේ ගෙදරවත් මුළු රාජ්‍යයෙහිවත්
හෙසකියා ඔවුන්ට නොපෙන්නූ කිසිවක්
නොවීය. එවිට අනාගතවක්තෘවූ යෙසායා 14
හෙසකියා රජු ළඟට ඇවිත්: ඒ මනුෂ්‍යයෝ
කුමක් කීවෝද? ඔව්හු කොතැනින් නුඹ
වෙතට ආවෝදැයි ඔහුගෙන් ඇසුවේය.
හෙසකියාද: ඔව්හු දුර රටක්වූ බබිලෝ-
නියේ සිට ආවෝයයි කීවේය. එවිට 15
ඔහු: ඔව්හු නුඹේ ගෙයි කුමක් දුටුවෝදැයි
ඇසුවේය. මාගේ ගෙයි තිබෙන සියල්ල
ඔව්හු දුටුවෝය. මාගේ වස්තු අතරෙහි
මා විසින් නොපෙන්නූ කිසිවක් නැතැයි
හෙසකියා කීවේය. එවිට යෙසායා 16
හෙසකියාට කථාකොට: **ස්වාමීන්-
වහන්සේගේ** වචනය අසන්න—බලව, 17
නුඹේ ගෙයි තිබෙන සියල්ලත් නුඹේ
පියවරුන් විසින් අද දක්වා රැස්කර
තැබූ දේවලුත් කිසිවක් ඉතුරු නො-
කොට බබිලෝනියට ගෙනයන දවස්
පැමිණෙන්නේය. නුඹ තුළින් නික්මෙන 18
නුඹට දාව උපදින නුඹේ පුත්‍රයන්-
ගෙන් සමහරෙක් බබිලෝනියේ රජුගේ
මාලිගාවෙහි නපුංසකයන් වන පිණිස
ගනු ලබන්නෝයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කීවේය. එවිට හෙසකියා: 19
නුඹ කී **ස්වාමීන්වහන්සේගේ** වචනය
යහපත්යයි යෙසායාට කීවේය. තවද
ඔහු: සමාදානයත් සැබෑකමත් මාගේ
දවස්වල ඇත්නම් හොඳ නොවේදැයි
යෙසායාට කීවේය. හෙසකියාගේ අනික් 20
ක්‍රියාද ඔහුගේ සියලු බලවත්තකම්ද ඔහු
පොකුණ සහ ජල කානුවත් සාදා නුවරට
වතුර ගෙනා හැටිද යූදාහි රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා නො-
වේද? හෙසකියා තමාගේ පියවරුන් 21
සමඟ සැතපුණේය. ඔහුගේ පුත්‍රවූ මනස්-
සේ ඔහු වෙනුවට රජවුණේය.

## මනස්සේ රජ කිරීම

**21**
මනස්සේ දෙළොස් අවුරුදු
වයසේදී රජවී පනස්පස් අවුරුද්දක්
යෙරුසලමෙහි රජකම්කෙළේය. ඔහුගේ
මවුගේ නම හෙප්සීබාය. **ස්වාමීන්-** 2
**වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙන්
පන්නාදැමූ ජාතීන්ගේ පිළිකුල් ලෙස

ඔහු ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි
3 නපුරුව තිබුණු දේ කෙළේය. තමාගේ
පියවූ හෙසකියා නැතිකළ උස් තැන්
ඔහු නැවත ගොඩනගා, බාල්ට පූජාසන
තනා, ඉශ්‍රායෙල්හි රජවූ ආහබ් සෑදුවාක්
මෙන් අෂේරා කණුවක්ද සෑදුවේය, ඔහු
මුළු අහස් සේනාවට නමස්කාරකරමින්
4 ඒවාට සේවයකෙළේය. තවද: මාගේ
නාමය යෙරුසලමෙහි තබන්නෙමියි
ස්වාමීන්වහන්සේ යම් ගෘහයක් ගැන
කීසේක්ද ඒ ගෘහයෙහි ඔහු පූජාසන
5 ගොඩනැගුවේය. ස්වාමීන්වහන්සේගේ
ගෘහයේ මිදුල් දෙකෙහි මුළු අහස්
සේනාවටත් පූජාසන ගොඩනැගුවේය.
6 ඔහු තමාගේ පුත්‍රයා ගිනි මැදින් යවා
පූජාකෙළේය, මායම්ද ශාස්ත්‍ර බැලීම්ද
භාවිතාකරමින් ආත්ම බන්ධනකාරයන්ද
අනාවිනකාරයන්ද පත්කෙළේය. ඔහු
ස්වාමීන්වහන්සේ කෝපකරවන හැටියට
උන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුවූ
7 බොහෝ දේ කෙළේය. තමා සෑදූ අෂේරා
රූපයද ඔහු ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි තැබීය. ඒ ගෘහය ගැන
ස්වාමීන්වහන්සේ දාවිත්ටත් ඔහුගේ
පුත්‍රවූ සාලමොන්ටත් කථාකොට: මේ
ගෘහයෙහිද මා විසින් සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රවලින් තෝරාගත් යෙරුසලමේද
මාගේ නාමය සදාකාලේටම තබන්-
8 නෙමි. මා විසින් ඉශ්‍රායෙල්වරුන්ට
අණකළ සියල්ල ප්‍රකාරයටද මාගේ
මෙහෙකරුවූ මෝසෙස් ඔවුන්ට අණ-
කළ මුළු ව්‍යවස්ථාවේ ප්‍රකාරයටද
කරන්ට ඔවුන් බලාගත්තොත් ඔවුන්ගේ
පියවරුන්ට මා විසින් දුන් දේශයෙන්
ඔවුන්ගේ පාද තවත් මුළාව යන්ට
9 නොසලස්වන්නෙමියි කීසේක. එහෙත්
ඔව්හු ඇහුම්කන් නුදුන්නෝය. ස්වාමීන්-
වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙන්
විනාශකළාවූ ජාතීන්ට වඩා නපුරු-
කම්කරන ලෙස මනස්සේ ඔවුන්
10 මුළාකෙළේය. ස්වාමීන්වහන්සේ තමන්
මෙහෙකරුවූ අනාගතවක්තෘන් ලවා
11 කථාකරවා: යූදාහි රජවූ මනස්සේ මේ
පිළිකුල්කම් කරමින් ඔහුට පළමුවෙන්
සිටි අමෝරිවරුන් කළ සියල්ලට වඩා
නපුරුකම් කොට, යූදවරුන්ටද තමාගේ
දේව රූපවලින් පව්කරන්ට සැලැස්වූ
නිසා, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්- 12
වහන්සේ මෙසේ කියනසේක—බලව,
අසන සියල්ලන්ගේ කන්දෙක ලෙළදෙන
තරම් මම යෙරුසලම සහ යූදවරුන්
පිටට විපත්තිය පමුණුවන්නෙමි. තවද 13
සමාරිය මැන්න ලනුවද ආහබ්ගේ
වංශයේ ලඹයද යෙරුසලම කෙරෙහි
අල්ලා, මනුෂ්‍යයෙක් තැටියක් පිසදමා,
පිසදමූවාම මුණින් පෙරළා තබන්නාක්
මෙන් යෙරුසලම පිසදමන්නෙමි. මාගේ 14
උරුමයෙන් ඉතුරු කොටස මම අත්-
හැරදමා, ඔවුන් තමුන්ගේ සියලු සතුරන්ට
ගොදුරක්ද කොල්ලයක්ද වෙන පිණිස
ඔවුන්ගේ සතුරන් අතට ඔවුන් පාවා-
දෙන්නෙමි; මක්නිසාද ඔවුන්ගේ පියවරුන් 15
මිසරයෙන් පිටත්ව ආ දවස පටන් අද
දවස දක්වාම ඔව්හු මාගේ ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කොට මා කෝප-
කළෝයයි වදාරනසේකැයි කියෙවූසේක.
තවද ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි 16
නපුරුව තිබුණු දේ කරන ලෙස එසේ
යූදට පව්කරන්ට සැලැස්වීමෙන් ඔහු
විසින් කළ පාපය හැර, ඔහු යෙරුසලම
එක් කෙළවරක පටන් අනික් කෙළවර
දක්වා පිරෙන තෙක් නිදෙස් ලේ බො-
හෝකොට වැගිරවීය. මනස්සේගේ අනික් 17
ක්‍රියාද ඔහු කළ සියල්ලද ඔහු කළ
පාපයද ගැන යූද රජුන්ගේ ලේකම්
පොතේ ලියා තිබෙනවා නොවේද?
මනස්සේ තමාගේ පියවරුන් සමග 18
සැතපී, තමාගේ ගෙට අයිති උයන වන
උස්සාගේ උයනෙහි තැන්පත්කරනු
ලැබුවේය. ඔහුගේ පුත්‍රවූ ආමොන් ඔහු
වෙනුවට රජවුණේය.

## ආමොන්ගේ රජ කිරීම

ආමොන් විසි අවුරුදු වයසේදී රජවී 19
දෑවුරුද්දක් යෙරුසලමෙහි රජකම්-
කෙළේය. ඔහුගේ මවුගේ නම මෙෂුල්-
ලෙමෙත්ය, ඇ යොත්බාහි හාරුශ්ගේ
දුවෙක්ය. ඔහු තමාගේ පියවූ මනස්සේ 20
කළ ලෙස ස්වාමීන්වහන්සේගේ ඇස්

හමුයෙහි නපුරුව තිබුණු දේ කොට,
21 තමාගේ පියා හැසුරුණු මුළු මාර්ග-
යෙහිම හැසිර, තමාගේ පියා සේවයකළ
දේව රූපවලට සේවයකරමින් ඒවාට
22 නමස්කාරකෙළේය. ඔහු ස්වාමීන්-
වහන්සේගේ මාර්ගයෙහි නොහැසිර
තමාගේ පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්-
23 වහන්සේ අත්හැරියේය. ආමොන්ගේ
සේවකයෝ ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය
කොට ඔහුගේ ගෙදරදී ඔහු මැරුවෝය.
24 නුමුත් දේශයේ සෙනඟ ආමොන් රජුට
විරුද්ධව කුමන්ත්‍රණය කළ සියල්ලන්
මරා ඔහුගේ පුත්‍රවූ යොෂියා ඔහු වෙනුවට
25 රජකමට පත්කළෝය. ආමොන් කළ
අනික් ක්‍රියා යූද රජුන්ගේ ලේකම් පොතේ
26 ලියා තිබෙනවා නොවේද? උස්සාගේ
උයනේ තිබුණු ඔහුගේ සොහොන් ගෙයි
ඔහු තැන්පත් කරනු ලැබුවේය. ඔහුගේ
පුත්‍රවූ යොෂියා ඔහු වෙනුවට රජවුණේය.

## යොෂියාගේ කාලයේදී ව්‍යවස්ථා පොත සම්බවීම

22 යොෂියා අට අවුරුදු වයසේදී
රජවී තිස් එක් අවුරුද්දක්
යෙරුසලමෙහි රජකම්කෙළේය. ඔහුගේ
මවුගේ නම යෙදීදය, ඈ බොශ්කත්හි
2 අදයාගේ දුවෙක්ය. ඔහු ස්වාමීන්-
වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබුණු
දේ කොට, දකුණටවත් වමටවත් නො-
හැරී, තමාගේ පියවූ දවිත්ගේ මුළු මාර්ග-
යෙහි හැසුරුණේය.
3 යොෂියා රජ තමාගේ දහඅටවෙනි
අවුරුද්දේදී මෙෂුල්ලාම්ගේ පුත්‍රයා වන
අශලියාගේ පුත්‍රවූ ෂාපාන් ලේකම
ස්වාමීන්වහන්සේගේ ගෘහයට යවමින්
4 කථාකොට: නුඹ නායක පූජකයාවූ
හිල්කියා වෙතට ගොස් ස්වාමීන්-
වහන්සේගේ ගෘහයට ගෙනෙනලද මුදල්
වන දොරටුපාලයන් සෙනඟගෙන් එකතු-
කරගත් ඒවා භාරදෙන ලෙස ඔහුට
5 දන්වාපන්න. ඒවා ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි වැඩකරවීමට පත්ව සිටින
තැනැත්තන් අතට දෙනු ලැබේවා; ඔව්හුද
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ කැඩුම්
හරිගැස්සීමට කර්මාන්තකාරයන්ට,
එනම් වඩුවන්ටත් ගොඩනගන්නන්ටත් 6
පෙදරේරුවන්ටත් ගෘහය අලුත්වැඩියා-
කිරීමට ලී සහ කැපූ ගල්ද මිලේට ගැනීම
පිණිස ඒවා දෙත්වයි කීවේය. එසේ වී 7
නුමුත් ඔවුන් විශ්වාස ලෙස කටයුතු
කළ බැවින් ඔවුන් අතට දුන් මුදල්
ගැන ඔවුන්ගෙන් ගණන් ගැනීමක්
නොවූයේය. නායක පූජකවූ හිල්කියා 8
ෂාපාන් ලේකමට කථාකොට: ව්‍යවස්ථා
පොත ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි
මට සම්බවීයයි කියා පොත ෂාපාන්ට
දුන්නේය, ඔහු ඒක කියෙවුවේය. ලේකම 9
වන ෂාපාන් තෙම රජු ළඟට හැරී
අවුත්: ගෘහයෙහි තිබුණු මුදල් ඔබගේ
සේවකයෝ රැගෙන ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි වැඩ කරවීමට පත්ව සිටින්නන්
අතට දුන්නෝයයි රජුට කීවේය. තවද 10
ෂාපාන් ලේකම කථාකොට: පූජකවූ
හිල්කියා පොතක් මට දුන්නේය කියා
රජුට දන්වා ඒක රජු ඉදිරියෙහි
කියෙවුවේය. රජු ඒ ව්‍යවස්ථා පොතේ 11
වචන ඇසූ කල තමාගේ ඇඳුම් ඉරා-
ගෙන, පූජකවූ හිල්කියාටත් ෂාපාන්- 12
ගේ පුත්‍රවූ අහිකාම්ටත් මිකායාගේ පුත්‍රවූ
අක්බෝර්ටත් ෂාපාන් ලේකමටත් රජුගේ
සේවකයාවූ අසායාටත් අණකොට:
නුඹලා ගොස් මේ සම්බවුණු පොතේ 13
වචන ගැන මා උදෙසාත් සෙනඟ
උදෙසාත් සියලු යූදවරුන් උදෙසාත්
ස්වාමීන්වහන්සේගෙන් විචාරාපල්ලා.
මක්නිසාද අප ගැන ලියා තිබෙන
සියල්ලේ ප්‍රකාරයට කරන ලෙස අපේ
පියවරුන් විසින් මේ පොතේ වචනවලට
ඇහුම්කන් නුදුන් නිසා අප කෙරේ ඇවිළ
තිබෙන ස්වාමීන්වහන්සේගේ උදහස
මහත්යයි කීවේය.

## හුල්ද නම් අනාගතවක්තෘයගෙන් විමසීම

එවිට පූජකවූ හිල්කියාද අහිකාම්ද 14
අක්බෝර්ද ෂාපාන්ද අසායාද හර්හස්ගේ
පුත්‍රයා වන තික්වාගේ පුත්‍රවූ වස්ත්‍ර
භාරකාරයාවූ ෂල්ලූම්ගේ භාර්යාව වන

හුල්දා අනාගතවක්තෘිය ළඟට ගොස්
ඇට කථාකළෝය. ඈ යෙරුසලමේ
දෙවෙනි කොට්ඨාසයෙහි වාසයකළාය.
15 ඈ ඔවුන්ට කියන්නී: ඉශ්‍රායෙල්හි දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක—
නුඹලා මා වෙතට එවූ මනුෂ්‍යයාට
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේකැයි
16 කියාපල්ලා: මම මේ ස්ථානය පිටටත්
මෙහි වැසියන් පිටටත් යූදාහි රජු විසින්
කියෙවූ පොතේ සියලු වචනවල හැටියට
17 විපත පමුණුවන්නෙමි. ඔව්හු මා අත්හැර
තමුන්ගේ අත්වල සියලු ක්‍රියාවලින් මා
කෝපකරවන ලෙස වෙන දෙවිවරුන්ට
සුවඳ දුම් ඔප්පුකළ බැවින්, මාගේ උදහස
මේ ස්ථානය කෙරෙහි ඇවිලෙන්නේය,
18 ඒක නිවෙන්නේ නැත. නුමුත් **ස්වාමීන්-**
**වහන්සේගෙන්** විචාරන පිණිස නුඹලා
එවූ යූදාහි රජුට මෙසේ කියාපල්ලා: නුඹ
ඇසූ වචන ගැන වනාහි ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
19 සේක—පාළුවක්ද ශාපයක්ද වේය කියා
මා විසින් මේ ස්ථානයටත් මෙහි
වැසියන්ටත් විරුද්ධව කියා තිබෙන
කාරණා නුඹ ඇසූ විට නුඹේ සිත
මෘදුවී, නුඹ **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
යටහත්වී, නුඹේ ඇඳුම් ඉරාගෙන මා
ඉදිරියෙහි හැඬූ නිසා, මමත් නුඹට
ඇහුම්කන්දුන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
20 කියනසේක. එබැවින් නුඹේ පියවරුන්
ළඟට නුඹ පමුණුවන්නෙමි, මා විසින්
මේ ස්ථානයට පමුණුවන සියලුම
විපත්ති නුඹේ ඇස්වලින් නොදක,
නුඹේ සොහොනට නුඹ සමාදනයෙන්
පැමිණෙන්නෙහිය කියා වදරනසේකැයි
කීවාය. ඔව්හු හැරී ඇවිත් රජුට කීවෝය.

## යෝෂියාගේ ධාර්මික ක්‍රියා සහ මරණය

23 එවිට රජ යූදාහිද යෙරුසලමේද
සියලු වැඩිමහල්ලන් තමා ළඟට
2 රැස්කරවාගෙන, යූදාහි සියලු මනුෂ්‍යයන්ද
යෙරුසලමේ සියලු වැසියන්ද පූජකයන්ද
අනාගතවක්තෘන්ද ලොකු කුඩා සියලු
සෙනඟද සමඟ **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට ගොස් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි සම්බවුණු ගිවිසුම් පොතේ
සියලු වචන ඔවුන් අසාගෙන සිටිද්දී
කියෙවුවේය. තවද රජ මණ්ඩපය උඩ 3
සිට, ඒ පොතේ ලියා තිබුණු ඒ ගිවිසුමේ
වචන ඉෂ්ටකරන පිණිස **ස්වාමීන්-**
**වහන්සේ** අනුව යන ලෙසත් උන්-
වහන්සේගේ ආඥද උන්වහන්සේගේ
ශික්ෂාද පනත්ද මුළු සිතින් හා මුළු
ආත්මයෙන් පවත්වන ලෙසත් **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි ගිවිසුමක් කර-
ගත්තේය. මුළු සෙනඟද ගිවිසුමට
එකඟවූවෝය. එවිට බාල්ටත් අෂේරාටත් 4
මුළු අහස් සේනාවටත් සාදා තිබුණු
සියලු භාජන **ස්වාමීන්වහන්සේගේ**
මාලිගාවෙන් පිටතට ගෙනයන්ට කියා
රජ නායක පූජකවූ හිල්කියාටත් දෙවෙනි
පන්තියේ පූජකයන්ටත් දොරටු පාලයන්-
ටත් අණකෙළේය. ඔහු යෙරුසලමෙන්
පිටත කිද්‍රොන් භූමිවල ඒවා පුලුස්සාදමා,
ඒවායේ අලු බෙතෙල්ට ගෙනාවේය. යූදාහි 5
නුවරවලද යෙරුසලම වටකරද තිබුණු
උස් තැන්වල සුවඳ දුම් ඔප්පු කරන
පිණිස යූදාහි රජුන් විසින් පත්කරනලද
කපුවන්ද බාල්ට සහ ඉර සඳටත්
ග්‍රහතාරකාවලට සහ මුළු අහස්
සේනාවටත් සුවඳ දුම් ඔප්පු කළ කපුවන්ද
ඔහු පහකෙළේය. ඔහු අෂේරා පිළිමය 6
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙන් අහක්-
කොට යෙරුසලමෙන් පිටත කිද්‍රොන්
ඔයට ගෙන ගොස්, කිද්‍රොන් ඔය ළඟ
පුලුස්සාදමා කුඩුකර, ඒ කුඩු පොදු
සෙනඟගේ මිනීවළවල් උඩ විසුරුවා
දැමුවේය. **ස්වාමීන්වහන්සේගේ** ගෘහය 7
ළඟ තිබුණාවූ *සොදෙමියයන්ගේ
ගෙවලුත් ඔහු බිඳදැම්මේය. එහි ස්ත්‍රීහු
අෂේරා රූපවලට තිර වියුවෝය. තවද 8
ඔහු යූදාහි නුවරවලින් සියලු පූජකයන්
කැඳවාගෙන, ගෙබා පටන් බෙයෙර්-ෂෙබා
දක්වා පූජකයන් විසින් සුවඳ දුම් ඔප්පු
කළ උස් තැන් දූෂ්‍යකෙළේය; දොරටු ළඟ
තිබුණු උස් තැන්ද නුවර අධිපතියාවූ
යෝෂුවාගේ දොරටුව වන නුවර දොරටුවට
වම් පැත්තෙහි තිබුණු උස් තැන්ද කඩා-

*හෙවත්, දූෂ්‍යකමට කැපවූවන්ගේ.

9 දැමුවේය. එසේ වී නුමුත් උස් තැන්වල
පූජකයෝ තමුන්ගේ සහෝදරයන් සමග
මුහුන් නොදැමූ රොටි කෑවෝය, නුමුත්
යෙරුසලමෙහි **ස්වාමීන්වහන්සේගේ**
10 පූජාසනය ළඟට නාවෝය. කිසිවෙක්
තමාගේ පුත්‍රයෙක්වත් දුවෙක්වත් මො-
ලෙක්ට ගින්නෙන් කැප නොකරන පිණිස
ඔහු හින්නොම් පුත්‍රයන්ගේ මිටියාවතෙහි
11 තිබෙන තොපෙත් දූෂ්‍යකෙළේය. යූදාහි
රජුන් විසින් සූර්යයාට කැපකළ අශ්වයන්
ඔහු **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ඇතුල්වෙන තැනින් අහක්කොට උප
නගරයෙහි සිටි ඇමතියාවූ නාතන්-
මෙලෙක්ගේ ගෙට ඇරියේය; සූර්ය
12 රථද ගින්නෙන් පුලුස්සාදැමුවේය. ඔහු
ආහාස්ගේ උඩුමහලේ පියස්ස උඩ
තිබුණාවූ, යූදාහි රජවරුන් විසින් සෑදුවාවූ
පූජාසනද **ස්වාමීන්වහන්සේගේ** මිදුල්
දෙකේ මනස්සේ විසින් සෑදූ පූජාසනද
කඩා එතනින් හෙළාදමා, ඒවායේ කුඩු
13 කිද්‍රොන් ඔයට වීසිකෙළේය. යෙරුසලම
ඉදිරිපිටින් *විනාශ කන්දට දකුණෙන්
තිබුණාවූ සීදෝන්වරුන්ගේ පිළිකුලවූ
අෂ්ටොරෙත්ටත් මෝවබ්වරුන්ගේ පිළි-
කුලවූ කෙමොෂ්ටත් අම්මොන් පුත්‍රයන්ගේ
පිළිකුලවූ මිල්කොම්ටත් ඉශ්‍රායෙල් රජවූ
සාලමොන් විසින් ගොඩනැගූ උස්තැන්
14 රජ දූෂ්‍යකෙළේය. ඔහු රූප කුළුනුද
බිඳ. අෂේරා රූප කපාදමා, ඒවා තිබුණු
15 තැන් මිනී ඇටවලින් පිරෙවුවේය. තවද
බෙතෙල්හි තිබුණ පූජාසනයද ඉශ්‍රා-
යෙල්වරුන්ට පව්කරන්ට සැලැස්සුවාවූ
නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබොවම් සෑදූ
උස්තැනද එන පූජාසනයත් උස්තැනත්
ඔහු කඩා දමා, උස්තැන පුලුස්සා දමා
කුඩු කර, අෂේරා පිළිමයද පුලුස්සා-
16 දැමුවේය. යොෂියා හැරුණු විට එහි
කන්දේ තිබුණු සොහොන් ගෙවල් දැක,
මේ කාරණා ප්‍රකාශකළාවූ දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයා විසින් ප්‍රකාශකළ
**ස්වාමීන්වහන්සේගේ** වචනය ප්‍රකාර
ඒවා පූජාසනය පිට පුලුස්සා ඒක දූෂ්‍ය
17 කෙළේය. තවද ඔහු: මට පෙනෙන අර

*නොහොත්, බාධා කන්ද.

සොහොන් කොත මොකදැයි ඇසීය.
නුවර මනුෂ්‍යයෝ: ඒක යූදා සිට ඇවිත්
බෙතෙල්හි පූජාසනයට විරුද්ධව ඔබ
කළ මේ දේවල් කලින් ප්‍රකාශකළාවූ
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාගේ
සොහොන්ගේයයි ඔහුට කීවෝය. රජද: 18
ඔහු එහෙම උන්නාවේ; කිසිවෙක්
ඔහුගේ ඇටවලට අත නොගසාවයි
කීවේය. මෙසේ ඔව්හු ඔහුගේ ඇටද
සමාරියෙන් ආ අනාගතවක්තෘගේ
ඇටද තිබෙන්ට ඇරියෝය. සමාරියේ 19
නුවරවල තිබුණාවූ, **ස්වාමීන්වහන්සේ**
කෝපකරවන ලෙස ඉශ්‍රායෙල් රජුන්
විසින් සෑදුවාවූ උස්තැන්හිවූ සියලු
ගෙවල් යොෂියා පහකොට, බෙතෙල්හිදී
කළ සියලු ක්‍රියාවල ප්‍රකාර ඒවාටත්
කෙළේය. එහි සිටි උස්තැන්වල සියලු 20
පූජකයන්ද පූජාසන පිට මරා, ඒවා
පිට මිනී ඇට පුලුස්සා, ඔහු යෙරුසලමට
හැරී ආවේය.
තවද රජ කථාකොට: මේ ගිවිසුම් 21
පොතේ ලියා තිබෙන ප්‍රකාර නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** පාස්කුව
පවත්වාපල්ලායයි මුළු සෙනඟට අණ-
කෙළේය. ඉශ්‍රායෙල්වරුන් විනිශ්චයකළ 22
විනිශ්චයකාරයන්ගේ දවස්වල පටන්
ඉශ්‍රායෙල් රජුන්ගේද යූදා රජුන්ගේද මුළු
කාලයෙහි සැබවින්ම එබඳු පාස්කුවක්
නොපවත්වන ලද්දේය. ඒ පාස්කුව 23
**ස්වාමීන්වහන්සේ** උදෙසා යෙරුසලමේ
පවත්වනලද්දේ යොෂියා රජුගේ දහඅට-
වෙනි අවුරුද්දේදීය. තවද **ස්වාමීන්-** 24
**වහන්සේගේ** ගෘහයේදී පූජකවූ හිල්කියාට
සම්බවුණ පොතේ ලියා තිබුණු ව්‍යවස්-
ථාවේ වචන ඉෂ්ටකරන පිණිස යො-
ෂියා ආත්මබන්ධනකාරයන්ද අනවින-
කාරයන්ද දේවතාරූපද පිළිමද යූදා
දේශයෙහිත් යෙරුසලමෙහිත් දක්නාලද
අනික් සියලු පිළිකුල්ද පහකරදැමුවේය.
මෝසෙස්ගේ මුළු ව්‍යවස්ථාව ලෙස 25
තමාගේ මුළු සිතින්ද තමාගේ මුළු
ආත්මයෙන්ද තමාගේ මුළු ශක්තියෙන්ද
**ස්වාමීන්වහන්සේ** වෙතට හැරුණාවූ ඔහු
හා සමාන රජෙක් ඔහුට පළමුවෙන්වත්
ඔහුට පසුවවත් නොසිටියේය. එසේවී- 26
නුමුත් මනස්සේ විසින් **ස්වාමීන්වහන්සේ**

කෝපකළ සියලු කාරණා නිසා යූද
කෙරෙහි ඇවිළී තිබුණ උන්වහන්සේගේ
මහත් උදහසේ බලවත්කම උන්වහන්සේ
27 පහකර නොගත්සේක. **ස්වාමීන්වහන්සේ**
කථාකොට: මා විසින් ඉශ්‍රායෙල් පහ-
කරදැමුවාක්මෙන් යූදත් මාගේ ඇස්
හමුයෙන් පහකරදමා, මා තෝරාගත්
මේ නුවර වන යෙරුසලමද මාගේ නාමය
එහි පවතින්නේයයි මා කී ගෘහයද
28 අත්හැර දමන්නෙමියි කීසේක. යෝ-
ෂියාගේ අතික් ක්‍රියාද ඔහු කළ සියල්ලද
යූද රජුන්ගේ ලේකම් පොතේ ලියා
29 තිබෙනවා නොවේද? ඔහුගේ දවස්වලදී
මිසරයේ රජවූ ඵාරාවෝ-නෙකෝ අෂූර්හි
රජුට විරුද්ධව ප්‍රාත් ගඟ ළඟට ගියේය;
එවිට යෝෂියා රජ ඔහුට විරුද්ධව
ගියේය. මිසරයේ රජද මෙගිද්දෝ-
30 හිදී ඔහු දුටු විට ඔහු මැරීය. ඔහුගේ
සේවකයෝ මළාවූ ඔහු රථයකින්
මෙගිද්දෝ සිට යෙරුසලමට ගෙනවුත්
ඔහුගේම සොහොන්ගෙයි ඔහු තැන්-
පත්කළෝය. එවිට දේශයේ සෙනඟ
යෝෂියාගේ පුත්‍රවූ යෙහෝවාහාස්
කැඳවාගෙන ආලේපකොට ඔහුගේ පියා
වෙනුවට ඔහු රජකමට පත්කළෝය.

## යෙහෝවාහාස්ගේ සහ යෙහෝයාකිම්ගේ රජකිරීම

31 යෙහෝවාහාස් විසිතුන් ඇවිරිදි වයසේදී
රජවී තුන් මසක් යෙරුසලමෙහි රජකම්-
කෙළේය. ඔහුගේ මවුගේ නම හමුතල්ය,
ඈ ලිබ්නාහි යෙරෙමියාගේ දූවක්ය.
32 ඔහුගේ පියවරුන් කළ සියල්ල ලෙස
ඔහු **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
33 නපුරුව තිබුණු දේ කෙළේය. එවිට ඔහු
යෙරුසලමෙහි රජකම් නොකරන පිණිස
ඵාරාවෝ-නෙකෝ හමාත් දේශයේ
රිබ්ලාහිදී ඔහු හිර අඩස්සි කොට, රිදී
තලෙන්ත සියයකුත් රන් තලෙන්තයකුත්
34 දේශයට දඩගැසුවේය. තවද ඵාරාවෝ-
නෙකෝ තෙමේ යෝෂියා රජුගේ පුත්‍රවූ
එලියාකිම් ඔහුගේ පියවූ යෝෂියා
වෙනුවට රජකමට පත්කොට, ඔහුගේ
නාමය යෙහෝයාකිම්ය කියා වෙනස්
කෙළේය. නුමුත් ඔහු යෙහෝවාහාස්
රැගෙන මිසරයට ගියේය; එහිදී ඔහු
මළේය. යෙහෝයාකිම් ඒ රිදීද රන්ද 35
ඵාරාවෝට දුන්නේය; නුමුත් ඵාරාවෝ-
ගේ ආඥාවේ ප්‍රකාර ඒ මුදල් දෙන
පිණිස ඔහු දේශයට ගණන නියමකොට,
ඵාරාවෝ-නෙකෝට දීමට එකිනෙකාට
නියමකළ හැටියට ඒ රිදීද රන්ද දේශයේ
සෙනඟගෙන් අයකෙළේය.
යෙහෝයාකිම් විසිපස් අවුරුදු 36
වයසේදී රජවී එකොළොස් අවුරුද්දක්
යෙරුසලමෙහි රජකම් කෙළේය. ඔහුගේ
මවුගේ නම ශෙබිදය, ඈ රූමාහි පෙදයාගේ
දූවක්ය. ඔහු තමාගේ පියවරුන් කළ 37
සියල්ල ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය.

**24**

ඔහුගේ දවස්වලදී බබිලෝ-
නියේ රජවූ නෙබුකද්නෙශර්
පැමිණියේය, යෙහෝයාකිම්ද තුන් අවු-
රුද්දක් ඔහුට සේවය කොට පසුව
ඔහුට විරුද්ධව කැරළිගැසුවේය. **ස්වාමීන්-** 2
**වහන්සේ** කල්දිවරුන්ගේ සමූහවල්ද
සිරියවරුන්ගේ සමූහවල්ද මෝවබ්වරුන්ගේ
සමූහවල්ද අම්මොන් පුත්‍රයන්ගේ සමූහ-
වල්ද ඔහුට විරුද්ධව එවූසේක, තමන්ගේ
මෙහෙකරුවූ ප්‍රොපේතවරුන් ලවා
**ස්වාමීන්වහන්සේ** කියෙවූ වචනයේ
හැටියට යූද නැතිකරන පිණිස ඊට
විරුද්ධව උන්වහන්සේ ඔවුන් එවූසේක.
යූදවරුන් තමන්ගේ ඇස් හමුයෙන් පහ- 3
කරන පිණිස **ස්වාමීන්වහන්සේගේ** ආඥා-
වෙන් මෙය ඔවුන් පිටට පැමුණුණේ
මනස්සේගේ පාපවල් වන ඔහු කළ
සියල්ල නිසාත්; ඔහු වැගිරෙවූ නිදෙස් 4
ලේ නිසාත්ය; මක්නිසාද ඔහු නිදෙස්
ලේවලින් යෙරුසලම පිරෙවුවේය.
**ස්වාමීන්වහන්සේද** කමාවෙන්ට නො-
කැමැතිවූසේක. යෙහෝයාකිම්ගේ අතික් 5
ක්‍රියාද ඔහු කළ සියල්ලද යූද රජුන්ගේ
ලේකම් පොතේ ලියා තිබෙනවා නො-
වේද? යෙහෝයාකිම් තමාගේ පියවරුන් 6
සමඟ සැතපුණේය. ඔහුගේ පුත්‍රවූ යෙහෝ-
යාකින් ඔහු වෙනුවට රජවිය. බබිලෝ- 7
නියේ රජු මිසරයේ ඔය පටන් ප්‍රාත්
ගංගාව දක්වා මිසර රජුට අයිති සියල්ල
ගත් නිසා මිසරයේ රජ තවත් තමාගේ
දේශයෙන් පිටතට ආවේ නැත.

## යූද සෙනඟ පළමුවෙනි වර වාලට ගෙනයනු ලැබීම

8 යෙහෝයාකින් දහඅට අවුරුදු වයසේදී
රජවී තුන් මසක් යෙරුසලමෙහි රජකම්-
කෙළේය. ඔහුගේ මවුගේ නම නෙහෂ්-
තාය, ඈ යෙරුසලමේ එල්නාතාන්ගේ
9 දුවෙක්ය. ඔහු තමාගේ පියා කළ සියල්ල
ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
10 නපුරුව තිබුණු දේ කෙළේය. ඒ කාල-
යෙහි බබිලෝනියේ රජවූ නෙබුකද්-
නෙශර්ගේ සේවකයෝ යෙරුසලමට
විරුද්ධව ආවෝය, නුවරද වටලන-
11 ලද්දේ විය. ස්වකීය සේවකයන් නුවර
වටලාගන සිටිද්දී බබිලෝනියේ රජවූ
12 නෙබුකද්නෙශර්ද එතැනට ආයේය. එවිට
යූදහි රජවූ යෙහෝයාකින්ද ඔහුගේ
මෑණියෝද ඔහුගේ සේවකයෝද ඔහුගේ
අධිපතියෝද ඔහුගේ ඇමතියෝද පිටතට
බබිලෝනියේ රජු ළඟට ගියෝය. බබි-
ලෝනියේ රජතෙමේ තමාගේ රජකම්
කිරීමේ අටවෙනි අවුරුද්දේදී ඔහු අල්ලා-
13 ගත්තේය. ඔහු **ස්වාමීන්වහන්සේ** කී ලෙස
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ වස්තු
සියල්ලද රජගෙයි වස්තුද එතැනින්
පිටතට ගෙනයනුයේ, ඉශ්‍රායෙල් රජවූ
සාලමොන් විසින් **ස්වාමීන්වහන්සේගේ**
මාලිගාවෙහි සාදා තිබුණු සියලු රන්
14 භාජන කැබලිකොට කැපීය. ඔහු මුළු
යෙරුසලමද සියලු අධිපතීන්ද සියලු
යුද්ධකාරයන්ද වන දසදහස් දෙනෙක්
සහ සියලු කර්මාන්තකාරයන්ද ආචාරීන්ද
හිරගණනට ගෙන ගියේය; දේශයේ ඉතා
දුප්පතුන් මිස කිසිවෙක් ඉතුරු නොවීය.
15 ඔහු යෙහෝයාකින් බබිලෝනියට
ගෙනගියේය; රජුගේ මෑණියන්ද රජුගේ
භාර්යාවන්ද ඔහුගේ ඇමතියන්ද දේශයේ
බලවන්තයන්ද ඔහු හිරගණනට ගෙන
යෙරුසලමේ සිට බබිලෝනියට ගෙනගියේය.
16 සත් දහසක් වූ සියලු යුද්ධකාරයන්ද
කර්මාන්තකාරයන් සහ ආචාරීන්
දහසක්ද වන යුද්ධ කරන සියලු බලවන්-
තයන් බබිලෝනියේ රජ හිරගණනේ
17 බබිලෝනියට ගෙනගියේය. බබිලෝනියේ
රජද ඔහුගේ බාප්පා වන මත්තනියා
ඔහු වෙනුවට රජකමට පත්කොට ඔහුගේ
නම ශෙදෙකියාය කියා වෙනස්කෙළේය.

## ශෙදෙකියා රජ. දෙවෙනි වර වාලට ගෙනයනු ලැබීම

ශෙදෙකියා විසිඑක් අවුරුදු වයසේදී 18
රජවී එකොළොස් අවුරුද්දක් යෙරුසල-
මෙහි රජකම්කෙළේය. ඔහුගේ මවුගේ
නම හමුතල්ය, ඈ ලිබ්නාහි යෙරෙමි-
යාගේ දුවෙක්ය. ඔහු යෙහෝයාකිම් 19
කළ සියල්ල ලෙස **ස්වාමීන්වහන්සේගේ**
ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ
කෙළේය. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 20
ඔවුන් තමන් ඉදිරියෙන් පහකර දමන
තරමට උන්වහන්සේගේ උදහස නිසා
යෙරුසලමටත් යූදටත් මෙසේ සිද්ධ
වුණේය. ශෙදෙකියා බබිලෝනියේ රජුට
විරුද්ධව කැරළිගැසීය.

**25**

තවද
ඔහුගේ රජකමේ නවවෙනි
අවුරුද්දේ දහවෙනි මාසයේ දහවෙනිද
බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර්
තමාගේ මුළු සේනාව සමග යෙරුසලමට
විරුද්ධව ඇවිත් ඊට විරුද්ධව කඳවුරු
බැඳ, වටකරින් ඊට විරුද්ධව කොටු
ගොඩනැගුවේය. මෙසේ ශෙදෙකියා 2
රජුගේ එකොළොස්වෙනි අවුරුද්ද දක්වා
නුවර වටලා තිබුණේය. සතරවෙනි 3
මාසයේ නවවෙනිද දේශයේ සෙනඟට
කෑම නැතිවෙන තරම් සාගතය නුවර
තුළ බලවත් විය. එකල නුවර අසුවී 4
කල්දිවරුන් නුවර වටකර සිටිද්දී, සියලු
යුද්ධකාරයෝ රජ උයන ළඟ පවුරු
දෙකට අතරේ තිබෙන දොරටුවෙන්
රාත්‍රියේ පලාගියෝය. රජ අරබා සමභූමි
පාරෙන් ගියේය. එහෙත් කල්දිවරුන්ගේ 5
සේනාව රජු පස්සේ එළවාගන ගොස්
යෙරිකෝවේ සමභූමිවලදී ඔහු කිට්ටුකර
ආවෝය. ඔහුගේ මුළු සේනාවද ඔහු
වෙතින් විසිර ගියාය. ඔව්හු රජු අල්ලා 6
බබිලෝනියේ රජු ළඟට රිබ්ලාට ගෙන
ගියෝය; එවිට ඔව්හු ඔහු ගැන තීන්දුව
දුන්නෝය. ඔව්හු ශෙදෙකියාගේ පුත්‍රයන් 7
ඔහුගේ ඇස් හමුයෙහි මරා, ඔහුගේ ඇස්
අන්ධකොට, ඔහු විලංගු දමා බබිලෝ-
නියට ගෙන ගියෝය.
තවද බබිලෝනියේ රජවූ නෙබුකද්- 8
නෙශර් රජුගේ දහනවවෙනි අවුරුද්දේ
පස්වෙනි මාසයේ සත්වෙනිද බබිලෝ-
නියේ රජුගේ සේවකයෙක්වූ රැකවලුන්ගේ

අධිපතිවූ නෙබුසරදන් යෙරුසලමට
9 ඇවිත්, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයද
රජ ගෙයද යෙරුසලමේ සියලු ගෙවල්ද
ගිනිලෑවේය, ලොකු ගෙවල් සියල්ලම
10 ඔහු ගින්නෙන් දවාදැමුවේය. රැකවලුන්ගේ
අධිපතියා සමග සිටි කල්දිවරුන්ගේ
මුළු සේනාව යෙරුසලමේ පවුරු හාත්-
11 පසින්ම බිඳදැමුවෝය. සෙනඟගෙන් නුවර
ඉතුරුව සිටිය අයද සැඟවී ගොස්
බබිලෝනියේ රජුගේ පක්ෂයටවූ අයද
සමූහයාගෙන් අනික් අයද රැකවලුන්ගේ
අධිපතිවූ නෙබුසරදන් තෙමේ අල්ලා-
12 ගත ගියේය. නුමුත් මිදිවතු වවන්ටත්
ගොවිතැන් කරන්ටත් රැකවලුන්ගේ අධි-
පතියා දේශයේ ඉතා දිළිඳුන්ගෙන් සමහ-
13 රෙක් ඉතුරුකොට ගියේය. තවද කල්දි-
වරු **ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි
තිබුණු පිත්තල කණුද මැහිද **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයෙහි තිබුණු පිත්තල
මුහුදද කඩාගෙන ඒවායේ පිත්තල
14 බබිලෝනියට ගෙනගියෝය. ඇතිලිද හැඳිද
පහන් කතුරුද පාත්‍රාද මෙහෙයට පාවි-
ච්චිකළ පිත්තල බඩු සියල්ලද ඔව්හු
15 ගත්තෝය. ගිනිකබල්ද තාළිද රන් බඩු-
වල රන්ද රිදී බඩුවල රිදීද රැකවලුන්-
ගේ අධිපතියා විසින් ගන්නාලද්දේය.
16 සාලමොන් විසින් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට සෑදූ කුළුනු දෙකත් මුහුදත්
මැහිත් යන සියලු බඩුවල පිත්තල බර
17 ගණනක් නැතුව තිබුණේය. එක එක
කුළුනේ උස දහඅට රියනක්ය, ඒක පිට
පිත්තල පේකඩයක් විය. පේකඩයේ උස
තුන් රියනක්ය; පේකඩය පිට වටකරින්
දැල් වැඩක් සහ දෙළුම් ගෙඩිත් තිබුණේය,
ඒ සියල්ල පිත්තලෙන් විය. දෙවෙනි
කුළුන පිටත් එයාකාරම දැල් වැඩ
18 තිබුණේය. තවද රැකවලුන්ගේ අධිපති-
තෙම නායක පූජකයාවූ සෙරායාද
දෙවෙනි පූජකයාවූ ශෙපනියාද දොරටු-
පාලයන් තුන්දෙනාද අල්ලාගත්තේය.
19 යුද්ධකාරයන්ගේ අධිපතියෙක්වූ ඇමති-
යෙක්ද රජු ඉදිරියෙහි සිටිය මනුෂ්‍යයන්-
ගෙන් නුවර සිටිය පස්දෙනෙක්ද දේශයේ
සෙනඟ යුද්ධයට රැස්කළ සේනාපතියාගේ
ලේකම්ද නුවර සිටිය දේශයේ සෙනඟ-
ගෙන් හැට දෙනෙක්ද අල්ලාගත්තේය.
එවිට රැකවලුන්ගේ අධිපතියාවූ නෙබු- 20
සරදන් ඔවුන් බබිලෝනියේ රජු ළඟට
රිබ්ලාට ගෙනගියේය. බබිලෝනියේ රජ 21
හමාත් රටේ රිබ්ලාහිදී ඔවුන්ට පහරදී
ඔවුන් මැරුවේය. මෙසේ යූදවරු තමුන්ගේ
ප්‍රවේණි භූමියෙන් ගෙනයනලද්දෝය.
තවද ඔහු යූද දේශයෙහි ඉතුරුව සිටියාවූ, 22
බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර්
ඉතුරුකර ගියාවූ සෙනඟ කෙරෙහි
ෂාපාන්ගේ පුත්‍රයා වන අහිකාම්ගේ පුත්‍රවූ
ගෙදලියා අධිපතියා කොට පත්කෙළේය.

## යූද රට බබිලෝනියේ රජු විසින් ආණ්ඩුකිරීම

බබිලෝනියේ රජු විසින් ගෙදලියා 23
ආණ්ඩුකාරයා කොට පත්කළ බව සේනා-
වල සියලු අධිපතීන්ද ඔවුන්ගේ මිනිසුන්ද
ඇසූ විට ඔව්හු එනම් නෙතනියාගේ
පුත්‍රවූ ඉෂ්මායෙල්ද කාරියාගේ පුත්‍රවූ
යෝහානාන්ද නෙටොපාතිය තන්හුමෙත්ගේ
පුත්‍රවූ සෙරායාද මයකාතියයාගේ පුත්‍රවූ
යාශනියාද ඔවුන්ගේ මිනිස්සුද ගෙදලියා
ළඟට මිශ්පාට ආවෝය. ගෙදලියා 24
ඔවුන්ටත් ඔවුන්ගේ මිනිසුන්ටත් දිවුරුම්දී
කථාකොට: කල්දිවරුන්ගේ සේවකයන්ට
භයනොවී දේශයෙහි වාසයකොට
බබිලෝනියේ රජුට සේවයකරපල්ලා,
එවිට නුඹලාට ශුභසිද්ධවන්නේයයි
කීවේය. නුමුත් සත්වෙනි මාසයේදී 25
රාජ වංශයේ එලිෂාමාගේ පුත්‍රයා
වන නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්
මනුෂ්‍යයන් දසදෙනෙකුත් සමග ඇවිත්
ගෙදලියාටත් මිශ්පාහි ඔහු සමග සිටි
යුදෙව්වරුන්ටත් කල්දිවරුන්ටත් පහරදී
මැරුවේය. එවිට ලොකු කුඩා සියලු 26
මනුෂ්‍යයෝද සේනාවන්ගේ අධිපතීහුද
මිසරයට පිටත්ව ගියෝය. මක්නිසාද
ඔව්හු කල්දිවරුන්ට භයවූහ.
යූදහි රජවූ යෙහෝයාකින් ගෙනයනු 27
ලැබ තිස්හත්වෙනි අවුරුද්දේ දොළොස්වෙනි
මාසයේ විසිහත්වෙනිද, බබිලෝනියේ
රජවූ එවිල්-මෙරොදක් තමා රජවුණු
අවුරුද්දේදී යූදහි යෙහෝයාකින්ගේ
හිස ඔසවා, හිරගෙයින් ඔහු නිදහස්

28 කර, ඔහුට කරුණාවෙන් කථාකොට,
බබිලෝනියෙහි ඔහු සමග සිටි රජුන්ගේ
සිංහාසනවලට වඩා ඔහුගේ සිංහාසනය
29 උසස්කෙළේය. ඔහුගේ හිරකාර ඇඳුම්ද
මාරුකෙළේය, තවද ඔහු තමාගේ
ජීවිතයේ සියලු දවස්වල නිතරම රජු
ඉදිරියෙහි කෑම කෑවේය. ඔහුගේ ආහාර 30
කොටසද නියමලෙස දවස්පතාම රජු
වෙතින් ඔහුගේ ජීවිතයේ සියලු දවස්වල
ඔහුට දෙනලද්දේය.

# පළමුවෙනි ලේකම් පොත

## ආදම් පටන් ආබ්‍රහම් දක්වා පෙළපත

1 1, 2 ආදම්, සෙත්, ඒනොෂ්; කේනාන්,
3 මහලලෙල්, යරෙද්; ඒනොක්, මෙතූ-
4 සෙලා, ලාමෙක්; නෝවා, ෂෙම්, හාම්
සහ යඵෙත්ය.
5 යඵෙත්ගේ පුත්‍රයෝනම්: ගොමෙර්,
මාගොග්, මාදයි, යාවාන්, තුබල්,
6 මෙෂෙක් සහ තීරාස්ය. ගොමෙර්ගේ
පුත්‍රයෝනම්: අෂ්කෙනස්, *ඩීඵත් සහ
7 තොගර්මාය. යාවාන්ගේ පුත්‍රයෝනම්:
එලිෂා, තර්ෂිෂ්, කිත්තිවරු සහ රොදනි-
වරුය.
8 හාම්ගේ පුත්‍රයෝනම්: කූෂ්, මිශ්‍රයිම්,
9 පූට් සහ කානාන්ය. කූෂ්ගේ පුත්‍රයෝ-
නම්: සෙබා, හවීලා, සබ්තා, රායමා
සහ සබ්තෙකාය. රායමාගේ පුත්‍රයෝනම්:
10 ෂෙබා සහ දෙදන්ය. කූෂ්ට දව නිම්රොද්
උපන්නේය. ඔහු පොළොවේ බලවන්-
11 තයෙක් වෙන්ට පටන්ගත්තේය. මිශ්‍රයිම්ට
දව ලූදිවරුද අනාමිවරුද ලෙහාබිවරුද
12 නප්තුහිවරුද, පත්‍රුසිවරුද කස්ලුහිවරුද
(පිලිස්තිවරුන් නික්ම ආවේ ඔවුන්-
ගෙන්ය) කප්තොරිවරුද උපන්නෝය.
13 කානාන්ට දව තමාගේ කුලුඳුලාවූ සීදොන්
14 සහ හෙත්ද; යෙබූසියයාද අමෝරියයාද
15 ගිර්ගාෂියයාද; හිවීයයාද අර්කියයාද
16 සීනියයාද; අර්වාදියයාද ශෙමරියයාද
හමාතියයාද උපන්නෝය.
17 ෂෙම්ගේ පුත්‍රයෝ නම්: ඒලාම්, අෂූර්,
අර්පක්ෂද්, ලූද්, අරාම්, ඌශ්, හූල්, ගෙතෙර්
18 සහ මෙෂෙක්ය. අර්පක්ෂද්ට දව ෂෙලා
උපන්නේය, ෂෙලාට දව ඒබෙර් උපන්නේය.
19 ඒබෙර්ට පුත්‍රයන් දෙදෙනෙක් උපන්නෝය.
එක්කෙනෙකුගේ නම පෙලෙග්ය; මක්-
නිසාද ඔහුගේ දවස්වලදී පොළොව
බෙදන්ට යෙදුණේය; ඔහුගේ සහෝ-
දරයාගේ නම යොක්තාන්ය. යොක්- 20
තාන්ට දව අල්මෝදද්ද ෂෙලෙප්ද හසර්-
මාවෙත්ද යෙරාක්ද; හදෝරාම්ද ඌසාල්ද 21
දික්ලාද; ඒබාල්ද අබිමායෙල්ද ෂෙබාද; 22
ඕපීර්ද හවීලාද යෝබාබ්ද උපන්නෝය. 23
මේ සියල්ලෝ යොක්තාන්ගේ පුත්‍රයෝය.
ෂෙම්, අර්පක්ෂද්, ෂෙලා; ඒබෙර්, 24,25
පෙලෙග්, රෙව්; සෙරුග්, නාහොර්, 26
තේරා සහ ආබ්‍රම් (එනම් ආබ්‍රහම්) ය. 27

## ආබ්‍රහම් පටන් යාකොබ් දක්වා පෙළපත

ආබ්‍රහම්ගේ පුත්‍රයෝ නම්: ඊසාක් සහ 28
ඉෂ්මායෙල්ය.
ඔවුන්ගේ පරම්පරා මේය: ඉෂ්මායෙල්ගේ 29
කුලුඳුලාවූ නෙබායොත්, ඊළඟට කේදර්,
අද්බෙයෙල්, මිබ්සාම්, මිෂ්මා, දූමා,
මස්සා; හදද්, තේමා, යෙතූර්, නාපීෂ් 30
සහ කේදෙමාය. මොව්හු ඉෂ්මායෙල්ගේ 31
පුත්‍රයෝය.
ආබ්‍රහම්ගේ උපභාර්යාවවූ කෙතූරාගේ 32
පුත්‍රයෝ මොව්හුය: ඈ සිම්රාන්, යොක්ෂාන්,
මෙදන්, මිදියාන්, ඉෂ්බාක් සහ ෂූවා
වැදුවාය. යොක්ෂාන්ගේ පුත්‍රයෝ නම්:
ෂෙබා සහ දෙදන්ය. මිදියාන්ගේ පුත්‍රයෝ 33
නම්: ඒපා, ඒපෙර්, හනොක්, අබිද සහ
එල්දයාය. මේ සියල්ලෝ කෙතූරාගේ
පුත්‍රයෝය.
ආබ්‍රහම්ට දව ඊසාක් උපන්නේය. 34
ඊසාක්ගේ පුත්‍රයෝ නම්: ඒසව් සහ
ඉශ්‍රායෙල්ය.
ඒසව්ගේ පුත්‍රයෝ නම්: එලීපස්, රෑවෙල්, 35
යෙවූෂ්, යලාම් සහ කෝරාය. එලීපස්ගේ 36
පුත්‍රයෝ නම්: තේමාන්, ඕමාර්, ශෙපී,
ගාතාම්, කෙනස්, තිම්නා සහ අමලෙක්ය.

*උත්පත්ති. 10.3 හි: රීඵත්.

37 රූවෙල්ගේ පුත්‍රයෝ නම්: නාහත්, සෙරා,
38 ෂම්මා සහ මිස්සාය. සේයීර්ගේ පුත්‍රයෝ
නම්: ලෝතාන්, ෂෝබාල්, ගිබියොන්,
අනා, දීෂොන්, එශෙර් සහ දීෂාන්ය.
39 ලෝතාන්ගේ පුත්‍රයෝ නම්: හෝරී සහ
හෝමාම්ය. තිම්නා ලෝතාන්ගේ
40 සහෝදරිය. ෂෝබාල්ගේ පුත්‍රයෝ නම්:
අල්වාන්, මානහත්, ඒබාල්, ෂෙපී සහ
ඕනාම්ය. ශිබියොන්ගේ පුත්‍රයෝ නම්:
41 ආයා සහ ආනාය. ආනාගේ පුත්‍රයෝ:
දීෂොන්ය. දීෂොන්ගේ පුත්‍රයෝ නම්:
හම්රාන්, එෂ්බාන්, ඉත්රාන් සහ
42 කෙරාන්ය. ඒශෙර්ගේ පුත්‍රයෝ නම්:
බිල්හාන්, සයවාන් සහ යකාන්ය.
දීෂාන්ගේ පුත්‍රයෝ නම්: ඌශ් සහ අරාන්ය.
43 ඉශ්‍රායෙල් පුත්‍රයන් කෙරෙහි කිසි රජෙකු
රජකම්කරන්ට පළමුවෙන් ඒදෙම් රටේ
රජකම්කළ රජවරු මොව්හුය: බෙයෝර්-
ගේ පුත්‍රවූ බෙලාය; ඔහුගේ නුවර නම
44 දින්හාබාය. බෙලා මැරුණායින් පසු
බොශ්රාහි සෙරාගේ පුත්‍රවූ යෝබාබ්
45 ඔහු වෙනුවට රජකම්කෙළේය. යෝබාබ්
මැරුණායින් පසු තේමාන්වරුන්ගේ රටේ
හූෂාම් ඔහු වෙනුවට රජකම්කෙළේය.
46 හූෂාම් මැරුණායින් පසු මෝවබ් රටේදී
මිදියන්ට පහර දුන් බෙදද්ගේ පුත්‍රවූ හදද්
ඔහු වෙනුවට රජකම්කෙළේය. ඔහුගේ
47 නුවර නම අවිත්ය. හදද් මැරුණායින්
පසු මස්රේකාහි සම්ලා ඔහු වෙනුවට
48 රජකම්කෙළේය. සම්ලා මැරුණායින් පසු
*ගංගාව ළඟ තිබුණු රෙහොබොත්හි
ෂාවුල් ඔහු වෙනුවට රජකම්කෙළේය.
49 ෂාවුල් මැරුණායින් පසු අක්බෝර්ගේ
පුත්‍රවූ බාල්-හානාන් ඔහු වෙනුවට
50 රජකම්කෙළේය. බාල්-හානාන් මැරුණා-
යින් පසු හදද් ඔහු වෙනුවට රජකම්-
කෙළේය; ඔහුගේ නුවර නම පායිය.
ඔහුගේ භාර්යාවගේ නම මෙහෙතා-
බෙල්ය, ඈ මේ-සාහාබ්ගේ දුවවූ
51 මට්රේද්ගේ දුවය. හදද් මෙළේය. ඒදෙම්හි
අධිපතිවරු නම්: අධිපතිවූ තිම්නාය,
අධිපතිවූ අල්වාය, අධිපතිවූ යෙතේත්ය;
52 අධිපතිවූ ඕහොලිබාමාය, අධිපතිවූ
53 ඒලාය, අධිපතිවූ පීනොන්ය; අධිපතිවූ

*එනම්–ප්‍රාත් ගංගාව.

කෙනස්ය, අධිපතිවූ තේමාන්ය, අධිපතිවූ
මිබ්ශාර්ය; අධිපතිවූ මග්දීයෙල්ය, 54
අධිපතිවූ ඊරාම්ය. මොව්හු ඒදෙම්හි
අධිපතියෝය.

2 ඉශ්‍රායෙල්ගේ පුත්‍රයෝ නම්: රූබෙන්,
සිමියොන්, ලෙවී, සහ යූදය, ඉස්සාකර්
සහ සාබුලොන්ය; දන්, යෝසෙප්, සහ 2
බෙන්යමින්ය, නප්තලී, ගාද් සහ ආෂෙර්ය.

## යූදගේ ගෝත්‍රය

යූදගේ පුත්‍රයෝ නම්: ඒර්, ඕනාන් සහ 3
ෂේලාය. මේ තුන්දෙනා කානානිය බැත්-
ෂුවාගෙන් ඔහු නිසා උපන්නෝය. යූදගේ
කුලුඳුලාවූ ඒර් ස්වාමීන්වහන්සේ ඉදිරි-
යෙහි දුෂ්ටව සිටිය බැවින් උන්වහන්සේ
ඔහු නැසූසේක. ඔහුගේ යෙහෙළීවූ 4
තාමාර් තොමෝ පෙරෙශ්ද සෙරාද ඔහු
නිසා වැදූවාය. යූදගේ සියලු පුත්‍රයෝ
පස්දෙනෙක්ය. පෙරෙශ්ගේ පුත්‍රයෝ නම්: 5
හෙශ්රෝන් සහ හාමුල්ය. සෙරාගේ 6
පුත්‍රයෝ නම්: සිම්රී, ඒතාන්, හේමාන්,
කල්කොල් සහ දරාය. ඒ සියල්ලෝ
පස්දෙනෙක්ය. කැපවූ දේ ගැන 7
අපරාධයක් කර ඉශ්‍රායෙල් කැලඹූවාවූ
ආකාර් කර්මීගේ පුත්‍රයෙක්ය. අසරියා 8
ඒතාන්ගේ පුත්‍රයෙක්ය. හෙශ්රෝන්ට උපන් 9
ඔහුගේ පුත්‍රයෝ නම්: යෙරාමෙයෙල්,
රාම් සහ කෙලුබයිය. රාම්ට දව අම්මිනාදබ් 10
උපන්නේය; අම්මිනාදබ්ට දව යූදගේ
පුත්‍රයන්ට අධිපතියාවූ නාෂොන්
උපන්නේය. නාෂොන්ට දව සල්මාද 11
සල්මාට දව බෝවස්ද උපන්නෝය;
බෝවස්ට දව ඕබෙද්ද ඕබෙද්ට දව 12
යෙස්සේද උපන්නෝය; යෙස්සේට දව 13
ඔහුගේ කුලුඳුලාවූ එලියාබ්ද දෙවෙනියාවූ
අබිනාදබ්ද තුන්වෙනියාවූ ෂිමෙයාද;
සතරවෙනියාවූ නෙතනෙල්ද පස්වෙනියාවූ 14
රද්දයිද; හවෙනියාවූ ඔශෙම්ද සත්වෙනි- 15
යාවූ දවිත්ද උපන්නෝය. මොවුන්ගේ 16
සහෝදරියෝ නම්: ශෙරුයා සහ අබිගයිල්ය.
ශෙරුයාගේ පුත්‍රයෝ නම්: අබිෂයිද
යෝවාබ්ද අසාහෙල්ද යන තුන්දෙනාය.
අබිගයිල් තොමෝ අමාසා වැදූවාය. 17
අමාසාගේ පියා නම් ඉෂ්මායෙලිතයාවූ

18 යෙතෙර්ය. හෙශ්රොන්ගේ පුත්‍රවූ
කාලෙබ්ට දුව ඔහුගේ භාර්යාවවූ
අසුබාගෙන්ද යෙරියෝත්ගෙන්ද පුත්‍රයෝ
උපන්නෝය. ඇගේ පුත්‍රයෝ නම්: යේෂෙර්,
19 ෂෝබාබ් සහ අර්දෝන්ය. අසුබා මැරුණු
පසු කාලෙබ් එප්‍රාත් පාවාගත්තේය,
20 ඈ ඔහු නිසා හූර් වැදුවාය. හූර්ට දුව
ඌරී උපන්නේය, ඌරීට දුව බෙශලෙල්
21 උපන්නේය. පසුව හෙශ්රොන් තමා හැට
අවුරුදු වයස්වූ කල, ගිලියද්හට පියවූ
මාකීර්ගේ දුව පාවාගෙන ඈ වෙතට
පැමුණුණේය; ඇයට ඔහු නිසා සෙගුබ්
22 උපන්නේය. සෙගුබ්ට දුව යායීර් උපන්-
නේය, ඔහුට ගිලියද් දේශයෙහි නුවරවල්
23 විසිතුනක් තිබුණේය. ගෙෂූර්වරුද
සිරියවරුද යායීර්හි නුවරවල් සහ
කෙනාත්ද ඊට අයිති ගම් වන නුවරවල්
සැටක්ද ඔවුන්ගෙන් අල්ලාගත්තෝය.
මේ සියල්ලෝ ගිලියද්ගේ පියවූ මාකීර්ගේ
24 පුත්‍රයෝය. හෙශ්රොන් කාලෙබ්-එප්‍රාතාහිදී
මැරුණු පසු හෙශ්රොන්ගේ භාර්යාවවූ
අබියා *තෙකෝවාගේ පියවූ අෂ්හූර්
25 ඔහු නිසා වැදුවාය. හෙශ්රොන්ගේ
කුලුඳුලාවූ යෙරාමෙයෙල්ගේ පුත්‍රයෝ
නම්: කුලුඳුලාවූ රාම්, බූනා, ඔරෙන්,
26 ඔශෙම් සහ අහියාය. යෙරාමෙයෙල්ට
අටාරානම් වෙන භාර්යාවක් වූවාය;
27 ඈ ඕනාම්ගේ මවුය. යෙරාමෙයෙල්ගේ
කුලුඳුලාවූ රාම්ගේ පුත්‍රයෝ නම්: මයශ්,
28 යාමීන් සහ ඒකෙර්ය. ඕනාම්ගේ පුත්‍රයෝ
නම්: ෂම්මයි සහ යාදය. ෂම්මයිගේ
පුත්‍රයෝ නම්: නාදබ් සහ අබිෂූර්ය.
29 අබිෂූර්ගේ භාර්යාවගේ නම අබිහයිල්ය;
ඈ ආබාන් සහ මෝලිද් ඔහු නිසා
30 වැදුවාය. නාදබ්ගේ පුත්‍රයෝ නම්: සෙලෙද්
සහ අප්පයිම්ය. සෙලෙද් දරුවන් නොලැබ
31 මෙළේය. අප්පයිම්ගේ පුත්‍රයෝ: ඉෂීය.
ඉෂීගේ පුත්‍රයෝ: ෂේෂාන්ය. ෂේෂාන්ගේ
32 පුත්‍රයෝ: ආලයිය. ෂම්මයිගේ සහෝදරවූ
යාදගේ පුත්‍රයෝ නම්: යෙතෙර් සහ
යොනාතාන්ය. යෙතෙර් දරුවන් නොලැබ
33 මෙළේය. යොනාතාන්ගේ පුත්‍රයෝ නම්:

*එනම්–තෙකෝවේ වාසීන්ගේ මුල් පියා යනුයි. මෙබඳු තැන්හි අර්ථයන් මේ පිළිවෙළින් දතයුතුයි.

පෙලෙත් සහ සාසාය. මොව්හු
යෙරාමෙයෙල්ගේ පුත්‍රයෝය. ෂේෂාන්ට 34
දූවරුන් මිස පුත්‍රයෝ නොසිටියෝය.
ෂේෂාන්ට මිසරයෙක්වූ යර්හා නම් වැඩ-
කාරයෙක් සිටියේය. ෂේෂාන් තමාගේ 35
වැඩකාරයාවූ යර්හාට තමාගේ දුව
භාර්යාකොට දුන්නේය; ඈ ඔහු නිසා
අත්තයි වැදුවාය. අත්තයිට දුව නාතාන් 36
උපන්නේය, නාතාන්ට දුව සාබාද්
උපන්නේය; සාබාද්ට දුව එප්ලාල් 37
උපන්නේය, එප්ලාල්ට දුව ඕබෙද්
උපන්නේය; ඕබෙද්ට දුව යේහු උපන්නේය, 38
යේහුට දුව අසරියා උපන්නේය; අසිරියාට 39
දුව හෙලෙශ් උපන්නේය, හෙලෙශ්ට දුව
එලෙයාසා උපන්නේය; එලෙයාසාට දුව 40
සිස්මයි උපන්නේය, සිස්මයිට දුව ෂල්ලූම්
උපන්නේය; ෂල්ලූම්ට දුව යෙකම්යා 41
උපන්නේය, යෙකම්යාට දුව එලිෂාමා
උපන්නේය. යෙරාමෙයෙල්ගේ සහෝදරවූ 42
කාලෙබ්ගේ පුත්‍රයෝ නම්: ඔහුගේ
කුලුඳුලාවූ, සීප්ගේ පියවූ මේෂා සහ
හෙබ්‍රොන්ගේ පියවූ මරේෂාගේ පුත්‍ර-
යෝත්ය. හෙබ්‍රොන්ගේ පුත්‍රයෝ නම්: 43
කෝරා, තප්පූවා, රෙකෙම් සහ ෂෙමාය.
ෂෙමාට දුව යෝර්කෙයාම්ගේ පියාවූ 44
රහම් උපන්නේය; රෙකෙම්ට දුව ෂම්මයි
උපන්නේය. මායොන් ෂම්මයිගේ පුත්‍රයාය; 45
මායොන් *බෙත්-ශූර්ගේ පියාය.
කාලෙබ්ගේ උපභාර්යාවවූ ඒපා හාරාන්ද 46
මෝශාද ගාසෙස්ද වැදුවාය. හාරාන්ට
දුව ගාසෙස් උපන්නේය. යාදයිගේ 47
පුත්‍රයෝ නම්: රෙගෙම්, යෝතාම්,
ගේෂාන්, පෙලෙට්, ඒපා සහ ෂයප්ය.
කාලෙබ්ගේ උපභාර්යාවූ මයකා ෂෙබෙර් 48
සහ තිර්හනා වැදුවාය. ඈ මද්මන්නා- 49
ගේ පියවූ ෂයප්ද මක්බේනාගේ සහ
ගිබෙයාගේ පියවූ ෂෙවාද වැදුවාය;
කාලෙබ්ගේ දුව අක්සාය. මොව්හු 50
කාලෙබ්ගේ පුත්‍රයෝය; එප්‍රාතාගේ කුලු-
ඳුලාවූ බෙන්හූර්ය, *කිරියත්-යෙයාරීම්ගේ
පියවූ ෂෝබාල්; බෙත්-ලෙහෙම්ගේ 51
පියවූ සල්මා සහ බෙත්-ගාදෙර්ගේ

*මෙබඳු නාම ගැන 1 ලේකම් 2.24 සංලක්ෂණය බලනු.

52 පියවූ හාරෙප්ය. කිරියත්-යෙයාරීම්ගේ
පියවූ ෂෝබාල්ට පුත්‍රයෝ සිටියෝය;
එනම් හාරොවේ සහ මෙනුහොත්-
වරුන්ගෙන් දෙකෙන් කොටසක්ය.
53 කිරියත්-යෙයාරීම්ගේ පවුල් නම් ඉත්‍රිය-
වරු, පූතිවරු, ෂූමාතිවරු සහ මිෂ්‍රායි-
වරුය; මොවුන්ගෙන් ශොරාතිවරුද
එෂ්තායෝලිවරුද පැවත ආවෝය.
54 සල්මාගේ පුත්‍රයෝ නම්: බෙත්-ලෙහෙම්-
වරු, නෙටෝපාතිවරු, අටිරොත්-බෙත්-
යෝවාබ්, මානහතිවරුන්ගෙන් දෙකෙන්
55 කොටසක් සහ ශොරියවරුත්ය. යාබේශ්හි
විසූ ලියන්නන්ගේ පවුල් නම්: තිරාතිවරු,
ෂිමියාතිවරු සහ සූකාතිවරුය. මොව්හු
රේකාබ්ගේ වංශයේ පියවූ හම්මත්ගෙන්
පැවත ආ කේනිවරුය.

# 3

හෙබ්‍රොන්හිදී දවිත්ට උපන් ඔහුගේ
පුත්‍රයෝ මොව්හුය: කුලුඳුලා
යෙස්‍රෙයෙලිය අහිනොවම්ගෙන් උපන්
අම්නොන්ය. දෙවෙනියා කර්මෙලීය
2 අබිගයිල්ගෙන් උපන් දනියෙල්ය; තුන්-
වෙනියා ගෙෂූර්හි රජ වන තල්මයිගේ
දුවවූ මයකාගේ පුත්‍රවූ අබ්සලොම්ය;
හතරවෙනියා හග්ගිත්ගේ පුත්‍රවූ අදෝනියාය;
3 පස්වෙනියා අබිටල්ගෙන් උපන් ෂෙපතියාය;
හවෙනියා ඔහුගේ භාර්යාවූ එග්ලාගෙන්
4 උපන් ඉත්රෙයාම්ය. හදෙනෙක් හෙබ්‍රොන්හිදී
ඔහුට උපන්නෝය; එහි ඔහු සත් අවුරුදු
හමාසයක්ද යෙරුසලමෙහි තිස්තුන් අවු-
5 රුද්දක්ද රජකම්කෙළේය. යෙරුසලමේදී
ඔහුට දව උපන් අය මොව්හුය: ෂිමෙයා,
ෂෝබාබ්, නාතාන් සහ සාලමොන්ය,
මේ හතරදෙනා අම්මියෙල්ගේ දූවූ
6 බැත්-ෂුවාගෙන් උපන්නෝය. ඉබ්හාර්,
7 එලිෂමා, එලිපෙලෙත්; නොගා, නෙපෙග්,
8 යාපියා; එලිෂාමා, එල්යාද, එලිපෙලෙත්
9 යන නවදෙනාත්ය. උපභාර්යාවන්ගේ
පුත්‍රයන් ඇතුළුව මොවුන් සියල්ලෝ
දවිත්ගේ පුත්‍රයෝය; තාමර් මොවුන්ගේ
10 සහෝදරීය. සාලමොන්ගේ පුත්‍රයා
රෙහොබොවම්ය, ඔහුගේ පුත්‍රයා අබියාය,
ඔහුගේ පුත්‍රයා ආසාය, ඔහුගේ පුත්‍රයා
11 යෙහෝෂාපාට්ය; ඔහුගේ පුත්‍රයා
යොරාම්ය, ඔහුගේ පුත්‍රයා අහසියාය,
ඔහුගේ පුත්‍රයා යෝවාෂ්ය; ඔහුගේ පුත්‍රයා 12
අමශියාය, ඔහුගේ පුත්‍රයා අසරියාය,
ඔහුගේ පුත්‍රයා යෝතාම්ය; ඔහුගේ පුත්‍රයා
ආහාස්ය, ඔහුගේ පුත්‍රයා හෙසකියාය, 13
ඔහුගේ පුත්‍රයා මනස්සේය; ඔහුගේ පුත්‍රයා 14
ආමොන්ය, ඔහුගේ පුත්‍රයා යොෂියාය.
යොෂියාගේ පුත්‍රයෝ නම්: කුලුඳුලා 15
යෝහානාන්ය, දෙවෙනියා යෙහෝයා-
කිම්ය, තුන්වෙනියා ශෙදෙකියාය,
හතරවෙනියා ෂල්ලුම්ය. යෙහෝ- 16
යාකිම්ගේ පුත්‍රයෝ නම්: ඔහුගේ පුත්‍රවූ
යෙකොනියා සහ ඔහුගේ පුත්‍රවූ
ශෙදෙකියාය. හිරකාරවූ යෙකොනියාගේ 17
පුත්‍රයෝ නම්: ඔහුගේ පුත්‍රවූ ෂෙයල්- 18
තියෙල් සහ මල්කිරාම්, පෙදයා,
ෂෙනශ්ශර්, යෙකමියා, හෝෂාමා සහ
නෙදබියාය. පෙදයාගේ පුත්‍රයෝ නම්: 19
සෙරුබ්බාබෙල් සහ ෂිමෙයිය. සෙරුබ්-
බාබෙල්ගේ පුත්‍රයෝ නම්: මෙෂුල්ලාම්
සහ හනනියාය; ඔවුන්ගේ සහෝදරී
ෂෙලෝමිත්ය. හෂුබා, ඔහෙල්, බෙරෙකියා, 20
හසදියා, යූෂබ්-හෙසෙද් යන පස්දෙනාත්ය.
හනනියාගේ පුත්‍රයෝ නම්: පෙලටියා 21
සහ යෙෂායාය. රෙපායාගේ පුත්‍රයෝය,
අර්ණොන්ගේ පුත්‍රයෝය, ඔබදියාගේ
පුත්‍රයෝය, ෂෙකනියාගේ පුත්‍රයෝය.
ෂෙකනියාගේ පුත්‍රයෝ නම්: ෂෙමායාද 22
ෂෙමායාගේ පුත්‍රයෝවූ හට්ටූෂ්, ඉගාල්,
බාරියා, නෙයරියා, ෂාපත් යන හදෙනාය.
නෙයරියාගේ පුත්‍රයෝ නම්: එලියෝ- 23
යේනයි, හිස්කියා, අස්රිකාම් යන තුන්-
දෙනාය. එලියෝයේනයිගේ පුත්‍රයෝ නම්: 24
හෝදවියා, එලියාෂිබ්, පෙලායා, අක්කුබ්,
යෝහානාන්, දෙලායා, අනානී යන
සත්දෙනාය.

# 4

යූදගේ පුත්‍රයෝ නම්: පෙරෙශ්,
හෙශ්රොන්, කර්මි, හූර් සහ
ෂෝබාල්ය. ෂෝබාල්ගේ පුත්‍රවූ රෙයායාට 2
දව යහත් උපන්නේය; යහත්ට දව අහුමයි
සහ ලාහද් උපන්නෝය. මොව්හු
ශොරාතිවරුන්ගේ පවුල්ය. ඒතාම්ගේ 3
පියාගෙන් උපන් අය නම්: යෙස්‍රෙයෙල්,
ඉෂ්මා සහ ඉඩ්බාෂ්ය. ඔවුන්ගේ
සහෝදරීගේ නම හශ්ශෙලෙල්පොනීය.
ගෙදෙර්ගේ පියවූ පෙනුවේල්ය, හූෂාගේ 4
පියවූ එසෙර්ය. මොව්හු එප්‍රාතාගේ

කුලුඳුලාවූ, බෙත්-ලෙහෙම්ගේ පියවූ
5 හූර්ගේ පුත්‍රයෝය. තෙකෝවාගේ පියවූ
අෂ්හූර්ට හෙලෙයා සහ නයරා යන
6 භාර්යාවෝ දෙදෙනෙක් වූහ. නයරා
ඔහු නිසා අහුස්සාම්ද හේපෙර්ද තේමෙනිද
හාහෂ්තාරිද වැදුවාය. නයරාගේ පුත්‍රයෝ
7 මොව්හුය. හෙලෙයාගේ පුත්‍රයෝ නම්:
ශෙරෙත්, ඉශ්හාර් සහ එත්නන්ය.
8 හක්කොශ්ට දාව ආනූබ්ද ශොබේබාද
හාරුම්ගේ පුත්‍රවූ අහර්හෙල්ගේ පවුල්ද
9 උපන්නෝය. යාබෙශ් තමාගේ සහෝදර-
යන්ට වඩා ගෞරව ලැබුවේය. ඔහුගේ
මවු: මම වේදනාවෙන් ඔහු වැදුවෙමියි
කියා ඔහුට යාබෙශ් යන නම තැබුවාය.
10 යාබෙශ්ද ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්-
වහන්සේට යාච්ඤාකොට: අහෝ, ඔබ
මට ආශීර්වාදකර, මාගේ සීමාව විශාල
කර, ඔබගේ අතින් මට පිහිටවී, මට
දුක් නූපදිනලෙස විපතෙන් මා ආරක්ෂා
කළ මැනවයි කීවේය. දෙවියන්වහන්සේද
11 ඔහුගේ ඉල්ලීම ඉෂ්ටකළසේක. ෂූහාගේ
සහෝදරවූ කෙලූබ්ට දාව මෙහිර් උපන්නේය,
12 ඔහු එෂ්තොන්ගේ පියාය. එෂ්තොන්ට
දාව බෙත්-රාපාද පසේයාද ඊර්-නාහාෂ්ගේ
පියවූ තෙහින්නාද උපන්නෝය. මොව්හු
13 රේකාහි මනුෂ්‍යයෝය. කෙනස්ගේ පුත්‍රයෝ
නම්: ඔත්නියෙල් සහ සෙරායාය.
ඔත්නියෙල්ගේ පුත්‍රයෝ: හතත්ය.
14 මෙයෝනොතයිට දාව ඔප්රා උපන්නේය.
සෙරායාට දාව *ගෙ-හරාෂිවරුන්ගේ පියවූ
යෝවාබ් උපන්නේය; ඔව්හු කර්මාන්-
15 තකාරයෝය. යෙපුන්නෙගේ පුත්‍රවූ
කාලෙබ්ගේ පුත්‍රයෝ නම්: ඊරු, ඒලා
සහ නයම්ය. ඒලාගේ පුත්‍රයන් සහ
16 කෙනස්ය. යෙහල්ලෙලෙල්ගේ පුත්‍රයෝ
නම්: සීප්, සීපා, තිරියා සහ අසරේල්ය.
17 එස්රාගේ පුත්‍රයෝ නම්: යෙතෙර්, මෙරේද්,
ඒපෙර් සහ යාලොන්ය. මෙරෙද් පාවාගත්-
තාවූ, ඵාරාවොගේ දුවවූ බිතියාගේ
පුත්‍රයෝ මොව්හුය. ඇ මිරියාම්ද ෂම්මයිද
එෂ්තෙමෝවාගේ පියවූ ඉෂ්බාද වැදුවාය.

*හෙවත්, කර්මාන්තකාරයන්ගේ
මිටියාවතේ.

ඔහුගේ යුදෙව් භාර්යාව ගෙදෙර්ගේ පියවූ 18
යෙරෙද්ද ශෝකෝගේ පියවූ හෙබෙර්ද
ශානොවාගේ පියවූ යෙකූතියෙල්ද වැදුවාය.
කෙයිලාගේ පියා වන නහම්ගේ සහෝදරීවූ, 19
හෝදියාගේ භාර්යාවගේ පුත්‍රයෝ නම්:
ගර්මී සහ මයකාතිය එෂ්තෙමෝවාය.
ෂිමොන්ගේ පුත්‍රයෝ නම්: අම්නොන්, 20
රින්නා, බෙන්-හානාන් සහ තීලොන්ය.
ඉෂිගේ පුත්‍රයෝ නම්: සෝහෙත් සහ
බෙන්-සෝහෙත්ය. යූදාගේ පුත්‍රවූ ෂේලා- 21
ගේ පුත්‍රයෝ නම්: ලේකාගේ පියවූ
ඒර්ද මරේෂාගේ පියවූ ලයෙදාද අෂ්බෙයාගේ
වංශය වන සිහින් හණ රෙදි වියන්නන්ගේ
වංශයේ පවුල්ද; යෝකීම්ද කොසේබාහි 22
මනුෂ්‍යයෝද මෝවබ්වරුන් කෙරෙහි
ආණ්ඩුකළාවූ යෝවාෂ් සහ සාරාප්ද
යාෂූබි-ලෙහෙම්ද යන මොව්හුය. මේවා
වනාහි පුරාණ කාරණාය. මොව්හු 23
*කුම්භකාරයෝව නෙතායිම්හිද ගෙ-
දෙරාහිද විසුවෝය. මොව්හු රජුගේ
වැඩ කරන පිණිස එහි ඔහු සමග
වාසයකළෝය.

## සිමියොන්ගේ ගෝත්‍රය

සිමියොන්ගේ පුත්‍රයෝ නම්: නෙමුවෙල්, 24
යාමීන්, යාරිබ්, සෙරා සහ ෂාවුල්ය.
ඔහුගේ පුත්‍රයා ෂල්ලුම්ය, ඔහුගේ පුත්‍රයා 25
මිබ්සාම්ය, ඔහුගේ පුත්‍රයා මිෂ්මාය.
මිෂ්මාගේ පුත්‍රයෝ නම්: ඔහුගේ පුත්‍රවූ 26
හම්මුවෙල්ය, ඔහුගේ පුත්‍රවූ ශක්කූර්ය,
ඔහුගේ පුත්‍රවූ ෂිමෙයිය. ෂිමෙයිට 27
පුත්‍රයන් දහසය දෙනෙකුත් දූවරුන් හය
දෙනෙකුත් සිටියෝය; නුමුත් ඔහුගේ
සහෝදරයන්ට බොහෝ දරුවෝ නො-
සිටියෝය, ඔවුන්ගේ මුළු වංශය යූදා
පුත්‍රයන් මෙන් වැඩිනොවීය. ඔව්හු 28
බෙයෙර්-ෂෙබාහිද මොලාදාහිද හශර්-
ෂූවාල්හිද; බිල්හාහිද එශෙම්හිද 29
තෝලාද්හිද; බෙතුයෙල්හිද හොර්මාහිද 30
ශික්ලග්හිද; බෙත්-මර්කාබොත්හිද හශර්- 31
සූසීම්හිද බෙත්-බිරියෙහිද ෂයරාම්හිද

*නොහොත්—තාප්පවලින් වටවූ ගස්
පන්තිවල වාසයකරන්නෝව සිටියෝය.

විසුවෝය. දවිත් රජකමට පැමිණෙන
තුරු මේවා ඔවුන්ගේ නුවරවල් ව
32 තිබුණේය. ඔවුන්ගේ ගම් ඒතාම්, ආයින්,
රිම්මෝන්, තොකෙන්, ආෂාන් යන
33 නුවරවල් පහක් සහ බාල් දක්වා එම
නුවරවල් වටේට තිබුණු සියලු ගමුත්ය.
ඔවුන්ගේ වාසස්ථානද ඔවුන්ගේ පෙළපත්
34 ලේඛනයද මේවාය. මෙෂෝබාබ්ද
යම්ලෙක්ද අමශියාගේ පුත්‍රවූ යෝෂාද;
35 යෝවෙල්ද, අසියෙල්ගේ පුත්‍රයා වන
සෙරායාගේ පුත්‍රවූ යෝෂිබියාගේ පුත්‍රයා
36 වන යේහුද; එලියෝයේනයිද යාකොබාද
යෙෂෝහායාද ආසායාද අදීයෙල්ද
37 යෙසිමියෙල්ද බෙනායාද; ෂෙමායාගේ
පුත්‍රයා වන ෂිම්රීගේ පුත්‍රවූ යෙදයාගේ
පුත්‍රයා වන අල්ලොන්ගේ පුත්‍රවූ ෂිපීගේ
38 පුත්‍රයා වන සීසාද යන, නම් වශයෙන්
සඳහන් කළ මොව්හු තමුන්ගේ පවුල්වල
අධිපතියෝ වූහ. ඔවුන්ගේ පිය පෙළපත්ද
39 බොහෝසෙයින් වර්ධනයවිය. ඔව්හු
තමුන්ගේ එළු බැටළු රැළවලට තණබිම්
සොයමින් මිටියාවතේ නැගෙනහිර
අතට ගෙදෝර්ට ඇතුල්වෙන තැන දක්වා
40 ගියෝය. හොඳ සරු තණබිම් ඔවුන්ට
සම්බවිය, දේශයද දැනටම විශාලව
නිශ්චලව සමාදන සහිතව තිබුණේය;
මක්නිසාද ප්‍රථම එහි වාසය කළ
41 අය හාම්ගෙන් පැවත ආවෝය. නම්
වශයෙන් ලියනලද මොව්හු යූදහි රජවූ
හෙසකියාගේ කාලයේදී ඇවිත් එහි
සම්බවුණු මෙයූනිවරුන්ටත් ඔවුන්ගේ
කූඩාරම්වලටත් පහරදී, අද දක්වා
තිබෙන හැටියට ඔවුන් මුළුමනින්ම
නැතිකරදමා ඔවුන් වෙනුවට එහි වාසය
කළෝය. මක්නිසාද ඔවුන්ගේ එළු බැටළු
රැළවලට එහි තණබිම් තිබුණේය.
42 සිමියොන්ගේ පුත්‍රයෝ වන ඔවුන්ගෙන්
සමහර දෙනෙක් එනම් මනුෂ්‍යයන්
පන්සියයක් ඉෂීගේ පුත්‍රවූ පෙලතියාද
නෙයරියාද රෙපායාද උස්සීයෙල්ද
ප්‍රධානකමට තබාගෙන සේයීර් කන්දට
43 ගොස්, ගැළවී ඉතුරුව සිටි අමලෙක්වරුන්ට
පහරදුන්නෝය, අද දක්වාත් ඔව්හු එහි
වාසයකරති.

## රූබෙන්ගෙත් ගාද්ගෙත් ගෝත්‍ර සහ මනස්සේගේ අර්ධ ගෝත්‍රය

5
ඉශ්‍රායෙල්ගේ කුලුඳුලාවූ රූබෙන්ගේ
පුත්‍රයෝ මොව්හුය. (ඔහු කුලුඳුලාව
සිටිය නුමුත් තම පියාගේ යහන කිලුටුකළ
නිසා ඔහුගේ කුලුඳුල්කම ඉශ්‍රායෙල්ගේ
පුත්‍රවූ යෝසෙප්ගේ පුත්‍රයන්ට දෙනලද්දේය;
කුලුඳුල්කමේ හැටියට පෙළපත ගණන්-
නොගන්නා ලද්දේය. යූද වනාහි තමාගේ 2
සහෝදරයන් අතරේ බලවත්වුණේය,
ඔහුගෙන් අධිපතියා පැවතආයේය;
නුමුත් කුලුඳුල්කම යෝසෙප්ට අයිතිය.)
ඉශ්‍රායෙල්ගේ කුලුඳුලාවූ රූබෙන්ගේ 3
පුත්‍රයෝ නම්: හනොක්, පල්ලූ, හෙශ්රොන්
සහ කර්මිය. යෝවෙල්ගේ පුත්‍රයෝ නම්: 4
ඔහුගේ පුත්‍රයා ෂෙමායාය, ඔහුගේ පුත්‍රයා
ගොග්ය, ඔහුගේ පුත්‍රයා ෂිමෙයිය; ඔහුගේ 5
පුත්‍රයා මීකාය, ඔහුගේ පුත්‍රයා රෙයායාය,
ඔහුගේ පුත්‍රයා බාල්ය; ඔහුගේ පුත්‍රයා 6
බෙයේරාය, ඔහු අෂූර්හි රජවූ තිල්ගත්-
පිල්නෙසෙර් විසින් වාලට ගෙනයනු
ලැබුවේය. ඔහු රූබෙන්වරුන්ගේ අධි-
පතියාය. තමුන්ගේ පරම්පරා ලේඛනයෙහි 7
ලියා තිබෙන තමුන්ගේ පවුල්වල හැටියට
ඔහුගේ සහෝදරයෝ නම්: ප්‍රධානියාවූ
යෙයීයෙල් සහ සෙකරියාය, යෝවෙල්ගේ 8
පුත්‍රවූ ෂෙමාගේ පුත්‍රයා වන ආසාස්ගේ
පුත්‍රවූ බෙලාය. ඔහු අරොයෙර්හිද
නෙබෝ සහ බාල්-මෙයෝන් දක්වාද
වාසයකෙළේය. නැගෙනහිරට ඔව්හු ප්‍රාත් 9
ගංගාවේ පටන් කාන්තාරයට ඇතුල්වෙන
තැන දක්වා වාසයකළෝය. මක්නිසාද
ඔවුන්ගේ සිව්පාවෝ ගිලියද් දේශයෙහි
බහුලව සිටියෝය. ඔව්හු සාවුල්ගේ 10
දවස්වලදී හග්රිවරුන් සමග යුද්ධකොට
ඔවුන් නැතිකර, ගිලියද්ට නැගෙනහිරෙන්
තිබෙන දේශය මුළුල්ලෙහි ඔවුන්ගේ
කූඩාරම්වල වාසයකළෝය.
ගාද්ගේ පුත්‍රයෝ ඔවුන්ට ඉදිරිපිටින් 11
බාෂාන් දේශයේ සලෙකා දක්වා වාසය-
කළෝය. ඔව්හු නම්: ප්‍රධානියාවූ යෝවෙල්, 12
දෙවෙනියාවූ ෂාපාම්, යානයි සහ ෂාපාත්ය;

13 ඔව්හු බාෂාන්හි සිටියෝය. තමුන්ගේ
පිය වංශ ප්‍රකාරයට ඔවුන්ගේ සහෝදරයෝ
නම්: මීකායෙල්ද මෙෂුල්ලාම්ද ෂෙබාද
යෝරයිද යාකාන්ද ශීයද එබෙර්ද යන
14 සත් දෙනාය. මොව්හු බූස්ගේ පුත්‍රයා
වන යාඩෝගේ පුත්‍රවූ යෙෂීෂයිගේ පුත්‍රයා
වන මීකායෙල්ගේ පුත්‍රවූ ගිලියද්ගේ
පුත්‍රයා වන යාරොවාගේ පුත්‍රවූ හූරිගේ
පුත්‍රයා වන අබීහයිල්ගේ පුත්‍රයෝය;
15 ගුනීගේ පුත්‍රවූ අබ්දියෙල්ගේ පුත්‍රයා වන
අහී ඔවුන්ගේ පිය වංශවල ප්‍රධානියාය.
16 ඔව්හු ගිලියද්හිද බාෂාන්හිද එහි නුවර-
වලද ෂාරෝන්හි සියලු පිට-බිම්වලද
තමුන්ගේ සීමා දක්වා වාසයකළෝය.
17 මේ සියල්ලෝම යූදාහි රජවූ යෝතාම්ගේ
දවස්වලදීද ඉශ්‍රායෙල් රජවූ යෙරො-
බොවම්ගේ දවස්වලදීද පෙළපත් වශයෙන්
ලියවුණෝය.
18 රූබෙන් පුත්‍රයන්ගෙන්ද ගාද්වරුන්ගෙන්ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන්ද පලිහත්
කඩුවත් පාවිච්චිකරන්නාවූ, දුන්නෙන්
විදින්නාවූ, යුද්ධයට දක්ෂවූ වික්‍රමාන්විත
මනුෂ්‍යයෝ හතළිස් හාරදස් හත්සිය
හැටක් වූවෝය; ඔව්හු යුද්ධයට යන්ට
19 පුළුවන් අයය. ඔව්හු හග්‍රීවරුන්ද
යෙටූර්ද නාපීෂ්ද නෝදබ්ද සමග යුද්ධ-
20 කළෝය. ඒ අයට විරුද්ධව ඔවුන්ට පිහිට
ලැබුණු බැවින් හග්‍රීවරුද ඔවුන් සමග
සිටි සියල්ලෝද ඔවුන් අතට පාවා-
දෙනලද්දෝය. මක්නිසාද සටනේදී
ඔව්හු දෙවියන්වහන්සේට යාච්ඤාකළෝය;
ඔවුන් උන්වහන්සේ කෙරෙහි විශ්වාසකළ
බැවින් උන්වහන්සේ ඔවුන්ට ඇහුම්කන්
21 දුන්සේක. ඔව්හු ඔවුන්ගේ සිව්පාවුන් වන
ඔවුන්ගේ ඔටුවන් පනස්දහසක්ද බැටළුවන්
දෙලක්ෂ පනස්දහසක්ද කොටළුවන්
දෙදහසක්ද මිනිසුන් ලක්ෂයක්ද අල්ලා-
22 ගෙන ගියෝය. යුද්ධය දෙවියන්වහන්සේ
කෙරෙන් වූ නිසා බොහෝ දෙනෙක්ම
මැරුම්කා වැටුණෝය. වාල්කමට ගෙනයාම
දක්වා ඔව්හු මොවුන්ගේ ඉඩමෙහි
වාසයකළෝය.
23 මනස්සේගේ අර්ධ ගෝත්‍රයේ පුත්‍රයෝ
දේශයෙහි වාසයකළෝය. ඔව්හු බාෂාන්
පටන් බාල්-හෙර්මොන්ද සෙනීර්ද
හෙර්මොන් කන්දද දක්වා ගණනින්
වැඩිවූවෝය. ඔවුන්ගේ පිය වංශවල 24
ප්‍රධානියෝ මොව්හුය: ඒපෙර්, ඉෂී, එලි-
යෙල්, අස්‍රියෙල්, යෙරෙමියා, හෝදවියා
සහ යාදියෙල්ය. ඔව්හු බලවන්තයෝව
කීර්තිමත් මනුෂ්‍යයෝ ව තමුන්ගේ පිය
වංශවල ප්‍රධානියෝ ව සිටියෝය.
නුමුත් ඔව්හු තමුන්ගේ පියවරුන්ගේ 25
දෙවියන්වහන්සේට විරුද්ධව ද්‍රෝහිකම්
කොට උන්වහන්සේ ඔවුන් ඉදිරියෙන්
විනාශකළ රටවැසියන්ගේ දෙවිවරුන්
අනුව යාමෙන් වේශ්‍යාකම්කළෝය.
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේද අෂූර්හි 26
රජවූ පූල්ගේ සිතත් අෂූර්හි රජවූ තිල්ගත්-
පිල්නෙසෙර්ගේ සිතත් පොළඹවා, ඔවුන්
එනම් රූබෙන්වරුන්ද ගාද්වරුන්ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයද ගෙන
ගොස්, හලාටත් හාබෝර්ටත් හාරාටත්
ගෝසාන්හි ගංගාව ළඟටත් පැමිණෙවූ-
සේක, ඔව්හු අද දක්වා එහි සිටිති.

## ලෙවීගේ ගෝත්‍රය

6 ලෙවීගේ පුත්‍රයෝ නම්: ගේර්ෂොන්,
කොහාත් සහ මෙරාරීය. කොහාත්- 2
ගේ පුත්‍රයෝ නම්: අම්රාම්, ඉස්හාර්,
හෙබ්‍රොන් සහ උස්සීයෙල්ය. අම්රාම්ගේ 3
දරුවෝ නම්: ආරොන්, මෝසෙස් සහ
මිරියාම්ය. ආරොන්ගේ පුත්‍රයෝ නම්:
නාදබ්, අබිහු, එලෙයාසාර් සහ ඊතාමාර්ය.
එලෙයාසාර්ට දාව පීනෙහාස්ද පීනෙහාස්ට 4
දාව අබිෂූවාද; අබිෂූවාට දාව බුක්කීද 5
බුක්කීට දාව උස්සීද; උස්සීට දාව සෙරහියාද 6
සෙරහියාට දාව මෙරායොත්ද; මෙරායොත්ට 7
දාව අමරියාද අමරියාට දාව අහිතුබ්ද;
අහිතුබ්ට දාව ශාදොක්ද ශාදොක්ට දාව 8
අහිමයාශ්ද; අහිමයාශ්ට දාව අසරියාද 9
අසරියාට දාව යොහානාන්ද යොහානාන්ට 10
දාව අසරියාද උපන්නෝය. (සාලමොන්
විසින් යෙරුසලමේ ගොඩනැගූ ගෘහයෙහි
පූජක තනතුර ඉෂ්ටකළේ ඔහුය.) අසරියාට 11
දාව අමරියාද අමරියාට දාව අහිතුබ්ද;
අහිතුබ්ට දාව ශාදොක්ද ශාදොක්ට දාව 12
ෂල්ලූම්ද; ෂල්ලූම්ට දාව හිල්කියාද හිල්කියාට 13
දාව අසරියාද; අසරියාට දාව සෙරායාද 14

සෙරායාට දව යෙහෝශාදක්ද උපන්නෝය;
15 **ස්වාමීන්වහන්සේ** නෙබුකද්නෙශර් අතින්
යුදවරුන්ද යෙරුසලමේ වැසියන්ද වාල්-
කමට හරින විට යෙහෝශාදක්ද ගියේය.
16 ලෙවීගේ පුත්‍රයෝ නම්: ගේර්ෂොම්,
17 කොහාත් සහ මෙරාරීය. ගේර්ෂොම්ගේ
පුත්‍රයන්ගේ නාම නම්: ලිබ්නී සහ
18 ෂිමෙයිය. කොහාත්ගේ පුත්‍රයෝ නම්:
අම්රාම්, ඉශ්හාර්, හෙබ්‍රොන් සහ
19 උස්සීයෙල්ය. මෙරාරීගේ පුත්‍රයෝ නම්:
මාලී සහ මූෂිය. ලෙවීවරුන්ගේ පවුල්
ඔවුන්ගේ පියවරුන්ගේ වංශ ප්‍රකාරයට
20 මෙසේය: ගේර්ෂොම්ගේ පුත්‍රයා ලිබ්නීය,
ඔහුගේ පුත්‍රයා යහත්ය, ඔහුගේ පුත්‍රයා
21 සිම්මාය; ඔහුගේ පුත්‍රයා යෝවාය,
ඔහුගේ පුත්‍රයා ඉද්දෝය, ඔහුගේ පුත්‍රයා
සෙරාය, ඔහුගේ පුත්‍රයා යෙයාතෙරයිය.
22 කොහාත්ගේ පුත්‍රයෝ නම්: ඔහුගේ පුත්‍රයා
අම්මිනාදබ්ය, ඔහුගේ පුත්‍රයා කෝරාය,
23 ඔහුගේ පුත්‍රයා අස්සීර්ය; ඔහුගේ පුත්‍රයා
එල්කානාය, ඔහුගේ පුත්‍රයා එබියාසාප්ය,
24 ඔහුගේ පුත්‍රයා අස්සීර්ය; ඔහුගේ පුත්‍රයා
තහත්ය, ඔහුගේ පුත්‍රයා උරියෙල්ය, ඔහුගේ
පුත්‍රයා උස්සියාය, ඔහුගේ පුත්‍රයා
25 ෂාවුල්ය. එල්කානාගේ පුත්‍රයෝනම්:
26 අමාසයි සහ අහීමොත්ය. ඔහුගේ පුත්‍රයා
එල්කානාය, ඔහුගේ පුත්‍රයා එල්කානා-
27 ශෝපයිය, ඔහුගේ පුත්‍රයා නහත්ය; ඔහුගේ
පුත්‍රයා එලියාබ්ය, ඔහුගේ පුත්‍රයා
යෙරොහාම්ය, ඔහුගේ පුත්‍රයා එල්කානාය.
28 සාමුවෙල්ගේ පුත්‍රයෝ නම්: කුලුඳුලාවූ
යෝවෙල් සහ දෙවෙනියාවූ අබියාය.
29 මෙරාරීගේ පුත්‍රයෝ නම්: මාලීය, ඔහුගේ
පුත්‍රයා ලිබ්නිය, ඔහුගේ පුත්‍රයා ෂිමෙයිය,
30 ඔහුගේ පුත්‍රයා උස්සාය; ඔහුගේ පුත්‍රයා
ෂිමෙයාය, ඔහුගේ පුත්‍රයා හග්ගියාය,
ඔහුගේ පුත්‍රයා අසායාය.
31 ගිවිසුම් පෙට්ටිය පිහිටෙවුවායින් පසු
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි ගීතිකා
මෙහෙයට දාවිත් විසින් පත්කරනු ලැබුවෝ
32 මොව්හුය. සාලමොන් යෙරුසලමෙහි
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය ගොඩනගන
තුරු ඔව්හු සම්මුඛවීමේ කූඩාරම වන
මණ්ඩපය ඉදිරිපිට ගීතිකා මෙහෙය
පවත්වමින් තමුන්ගේ පත්ති පරිද්දෙන්
තමුන්ගේ තනතුරෙහි යෙදී සිටියෝය.
එසේ සිටි අය සහ ඔවුන්ගේ පුත්‍රයෝ 33
මොව්හුය: කොහාත් පුත්‍රයන්ගෙන්
ගායනාකාර හේමාන්ය. ඔහු යෝවෙල්ගේ
පුත්‍රයාය, ඔහු සාමුවෙල්ගේ පුත්‍රයාය;
ඔහු එල්කානාගේ පුත්‍රයාය, ඔහු 34
යෙරොහාම්ගේ පුත්‍රයාය, ඔහු
එලියෙල්ගේ පුත්‍රයාය, ඔහු තෝවාගේ
පුත්‍රයාය; ඔහු සූප්ගේ පුත්‍රයාය, ඔහු 35
එල්කානාගේ පුත්‍රයාය, ඔහු මහත්ගේ
පුත්‍රයාය, ඔහු අමාසයිගේ පුත්‍රයාය; ඔහු 36
එල්කානාගේ පුත්‍රයාය, ඔහු යෝවෙල්ගේ
පුත්‍රයාය, ඔහු අසරියාගේ පුත්‍රයාය, ඔහු
ශෙපනියාගේ පුත්‍රයාය; ඔහු තහත්ගේ 37
පුත්‍රයාය, ඔහු අස්සීර්ගේ පුත්‍රයාය, ඔහු
එබියාසාප්ගේ පුත්‍රයාය, ඔහු කෝරාගේ
පුත්‍රයාය; ඔහු ඉශ්හාර්ගේ පුත්‍රයාය, ඔහු 38
කොහාත්ගේ පුත්‍රයාය, ඔහු ලෙවීගේ
පුත්‍රයාය, ඔහු ඉශ්‍රායෙල්ගේ පුත්‍රයාය.
ඔහුට දකුණෙන් සිටියාවූ ඔහුගේ 39
සහෝදරවූ ආසාප්ය. ආසාප් බෙරෙ-
කියාගේ පුත්‍රයාය, ඔහු ෂිමෙයාගේ
පුත්‍රයාය; ඔහු මීකායෙල්ගේ පුත්‍රයාය, 40
ඔහු බයසෙයාගේ පුත්‍රයාය, ඔහු
මල්කියාගේ පුත්‍රයාය; ඔහු එත්නිගේ 41
පුත්‍රයාය, ඔහු සෙරාගේ පුත්‍රයාය, ඔහු
අදායාගේ පුත්‍රයාය; ඔහු ඒතාන්ගේ 42
පුත්‍රයාය, ඔහු ශිම්මාගේ පුත්‍රයාය, ඔහු
ෂිමෙයිගේ පුත්‍රයාය; ඔහු යහත්ගේ 43
පුත්‍රයාය, ඔහු ගේර්ෂොම්ගේ පුත්‍රයාය,
ඔහු ලෙවීගේ පුත්‍රයාය. ඔවුන්ගේ 44
සහෝදරයෝ වන මෙරාරීගේ පුත්‍රයෝ
වමෙන් සිටියෝය. එනම්: ඒතාන්ය. ඔහු
*කීෂිගේ පුත්‍රයාය, ඔහු අබ්දීගේ පුත්‍රයාය,
ඔහු මල්ලූක්ගේ පුත්‍රයාය; ඔහු හෂබියාගේ 45
පුත්‍රයාය, ඔහු අමශියාගේ පුත්‍රයාය, ඔහු
හිල්කියාගේ පුත්‍රයාය; ඔහු අම්සීගේ 46
පුත්‍රයාය, ඔහු බානීගේ පුත්‍රයාය, ඔහු
ෂෙමෙර්ගේ පුත්‍රයාය; ඔහු මාලීගේ 47
පුත්‍රයාය, ඔහු මූෂීගේ පුත්‍රයාය, ඔහු
මෙරාරීගේ පුත්‍රයාය, ඔහු ලෙවීගේ

*පරි. 15.17 හි: කුෂාය.

48 පුත්‍රයාය. ඔවුන්ගේ සහෝදරයෝවූ
ලෙවීවරු දෙවියන්වහන්සේගේ ගෘහය
වන මණ්ඩපයේ මුළු මෙහෙයට පත්වී
සිටියෝය.
49 නුමුත් ආරොන්ද ඔහුගේ පුත්‍රයෝද
දෙවියන්වහන්සේගේ මෙහෙකරුවූ
මෝසෙස් විසින් අණකළ සියල්ල
ලෙස දවන පූජා පුදන පූජාසනයත්
දුම් පූජාසනයත් පිට ඔප්පුකරන්ටද අති
ශුද්ධ ස්ථානයේ මුළු මෙහෙය කරන්ටද
ඉශ්‍රායෙල්වරුන් උදෙසා සමගිකම්
50 කරන්ටද නියමව සිටියෝය. ආරොන්ගේ
පුත්‍රයෝ මොව්හුය; ඔහුගේ පුත්‍රයා
එලෙයාසර්ය, ඔහුගේ පුත්‍රයා පීනෙහාස්ය,
51 ඔහුගේ පුත්‍රයා අබිෂුවාය; ඔහුගේ පුත්‍රයා
බුක්කීය, ඔහුගේ පුත්‍රයා උස්සීය, ඔහුගේ
52 පුත්‍රයා සෙරහියාය; ඔහුගේ පුත්‍රයා
මෙරායොත්ය, ඔහුගේ පුත්‍රයා අමරියාය,
53 ඔහුගේ පුත්‍රයා අහිතූබ්ය; ඔහුගේ පුත්‍රයා
ශාදෙක්ය, ඔහුගේ පුත්‍රයා අහිමයාශ්ය.
54 කොහාත්වරුන්ගේ පවුල් අතරෙන්
ආරොන්ගේ පුත්‍රයන්ගේ වාසස්ථාන
ඔවුන්ගේ සීමා තුළෙහිවූ ඔවුන්ගේ
කඳවුරුවල හැටියට මේවාය, මක්නිසාද
55 පස ඇටය වැටුණේ ඔවුන්ටය. යූද
දේශයෙහි වූ හෙබ්‍රොන් සහ ඒ වටකරින්වූ
ඒකේ පිට-බිම්ද ඔවුන්ට දෙනලද්දේය;
56 නුමුත් නුවර කෙත්ද ඒකේ ගම්ද යෙපුන්-
නෙගේ පුත්‍රවූ කාලෙබ්ට දෙනලද්දේය.
57 ආරක්ෂා නුවරක් වූ හෙබ්‍රොන්ද ලිබ්නා
සහ ඒකේ පිට-බිම්ද යත්තීර්ද එෂ්-
58 තෙමොව සහ ඒකේ පිට-බිම්ද; හිලේන්
සහ ඒකේ පිට-බිම්ද දෙබීර් සහ ඒකේ
59 පිට-බිම්ද; ආෂාන් සහ ඒකේ පිට-
බිම්ද බෙත්-ෂෙමෙෂ් සහ ඒකේ පිට-
60 බිම්ද; බෙන්යමින් ගෝත්‍රයෙන් ගෙබා
සහ ඒකේ පිට-බිම්ද අල්ලෙමෙත් සහ
ඒකේ පිට-බිම්ද අනතෝත් සහ ඒකේ
පිට-බිම්ද ආරොන්ගේ පුත්‍රයන්ට දෙන-
ලද්දේය. ඔවුන්ගේ මුළු පවුල් ප්‍රකාරයට
ඔවුන්ගේ සියලු නුවරවල් දහතුනක්ය.
61 කොහාත්ගේ අනික් පුත්‍රයන්ට [එප්‍රායිම්]
ගෝත්‍රයේ පවුල්වලින්ද මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන්ද නුවරවල් දහයක් පස ඇට
දමීමෙන් ලැබුණේය. ගේර්ෂොම්ගේ 62
පුත්‍රයන්ට තමුන්ගේ පවුල් ප්‍රකාරයට
ඉස්සාකර් ගෝත්‍රයෙන්ද ආෂෙර්
ගෝත්‍රයෙන්ද නප්තලී ගෝත්‍රයෙන්ද
බාෂාන්හි සිටිය මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන්ද නුවරවල් දහතුනක් ලැබු-
ණේය. මෙරාරීගේ පුත්‍රයන්ට ඔවුන්ගේ 63
පවුල් ප්‍රකාරයට රූබෙන් ගෝත්‍රයෙන්ද
ගාද් ගෝත්‍රයෙන්ද සාබුලොන් ගෝත්‍ර-
යෙන්ද නුවරවල් දොළොසක් පස ඇට
දමීමෙන් ලැබුණේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ 64
මේ නුවරවල් සහ ඒවායේ පිට-බිම්ද
ලෙවීවරුන්ට දුන්නෝය. යූද පුත්‍රයන්ගේ 65
ගෝත්‍රයෙන්ද සිමියොන් පුත්‍රයන්ගේ
ගෝත්‍රයෙන්ද බෙන්යමින් පුත්‍රයන්ගේ
ගෝත්‍රයෙන්ද නම් වශයෙන් කියනලද
මේ නුවරවල් ඔව්හු පස ඇට දමා
දුන්නෝය. කොහාත්ගේ පුත්‍රයන්ගෙන් 66
අනික් පවුල්වලට ඔවුන්ගේ සීමා
තුළෙහි වූ නුවරවල් එප්‍රායිම්ගේ ගෝත්‍ර-
යෙන් ලැබුණේය. මෙසේ එප්‍රායිම් 67
කඳු රටේ තිබෙන ආරක්ෂා නුවරක්වූ
ෂෙකෙම් සහ ඒකේ පිට-බිම්ද ගෙසෙර්
සහ ඒකේ පිට-බිම්ද; යොක්මෙයාම් සහ 68
ඒකේ පිට-බිම්ද බෙත්-හෝරොන් සහ
ඒකේ පිට-බිම්ද; අයාලෝන් සහ ඒකේ 69
පිට-බිම්ද ගැත්-රිම්මෝන් සහ ඒකේ
පිට-බිම්ද; මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන් 70
ආනේර් සහ ඒකේ පිට-බිම්ද බිලෙයාම්
සහ ඒකේ පිට-බිම්ද කොහාත් පුත්‍රයන්-
ගේ අනික් පවුල්වලට දෙනලද්දේය.
ගේර්ෂොම්ගේ පුත්‍රයන්ට මනස්සේගේ 71
අර්ධ ගෝත්‍රය යන පවුලෙන් බාෂාන්හි
ගෝලාන් සහ ඒකේ පිට-බිම්ද අෂ්තා-
රොත් සහ ඒකේ පිට-බිම්ද; ඉස්සාකර් 72
ගෝත්‍රයෙන් කෙදෙෂ් සහ ඒකේ පිට-
බිම්ද දබෙරත් සහ ඒකේ පිට-බිම්ද;
රාමොත් සහ ඒකේ පිට-බිම්ද ආනේම් 73
සහ ඒකේ පිට-බිම්ද; ආෂෙර් ගෝත්‍රයෙන් 74
මාෂාල් සහ ඒකේ පිට-බිම්ද අබ්දෝන්
සහ ඒකේ පිට-බිම්ද; හුකොක් සහ ඒකේ 75
පිට-බිම්ද රෙහොබ් සහ ඒකේ පිට-
බිම්ද; නප්තලී ගෝත්‍රයෙන් ගලීලයේ 76
කෙදෙෂ් සහ ඒකේ පිට-බිම්ද හම්මෝන්

සහ ඒකේ පිට-බිම්ද කිරියාතයිම් සහ
77 ඒකේ පිට-බිම්ද ලැබුණේය. මෙරාරීගේ
අනික් පුත්‍රයන්ට සාබුලොන් ගෝත්‍ර-
යෙන් රිම්මෝනො සහ ඒකේ පිට-
බිම්ද තාබෝර් සහ ඒකේ පිට-බිම්ද;
78 යෙරිකෝව ළඟ යොර්දනෙන් එගොඩ
යොර්දනට නැගෙනහිරෙන් රූබෙන්
ගෝත්‍රයෙන් කාන්තාරයෙහි තිබෙන
බෙසෙර් සහ ඒකේ පිට-බිම්ද යහෙශා
79 සහ ඒකේ පිට-බිම්ද; කෙදේමොත් සහ
ඒකේ පිට-බිම්ද මේපයත් සහ ඒකේ
80 පිට-බිම්ද; ගාද් ගෝත්‍රයෙන් ගිලියද්හි
රාමොත් සහ ඒකේ පිට-බිම්ද
හෙෂ්බොන් සහ ඒකේ පිට-බිම්ද යාසේර්
සහ ඒකේ පිට-බිම්ද ලැබුණේය.

## ඉස්සාකර්ගේ ගෝත්‍රය

7 ඉස්සාකර්ගේ පුත්‍රයෝ නම්: තෝලා,
පූවා, යාෂුබ්, ෂිම්රොන් යන සතර-
2 දෙනාය. තෝලාගේ පුත්‍රයෝ නම්: උස්සී,
රෙපායා, යෙරීයෙල්, යාමයි, ඉබ්සාම්
සහ ෂෙමුවෙල්ය; ඔව්හු තෝලාට
අයිති තමුන්ගේ පිය වංශවල ප්‍රධානි-
යෝව තමුන්ගේ පෙළපත්වල බලවන්ත
මනුෂ්‍යයෝ වූහ. දාවිත්ගේ කාලයේදී
ඔවුන්ගේ ගණන විසිදෙදස් හයසියයක්ය.
3 උස්සීගේ පුත්‍රයෝ නම්: ඉස්රායා සහ
ඉස්රායාගේ පුත්‍රයෝවූ මීකායෙල්ද
ඔබදියාද යෝවෙල්ද ඉෂ්ෂියාද යන
පස්දෙනාය. ඒ සියල්ලෝ ප්‍රධාන
4 මනුෂ්‍යයෝය. ඔවුන් සමග තමුන්ගේ
පරම්පරා වශයෙන්ද තමුන්ගේ පිය
වංශවල ප්‍රකාරයටද ගණනින් තිස්දහසක්
වූ යුද්ධ සමූහවල් සිටියෝය. ඔවුන්ට
බොහෝ භාර්යාවරුත් පුත්‍රයෝත් වූහ.
5 සියලු ඉස්සාකර් පවුල් අතරෙහි බල-
වන්ත මනුෂ්‍යයන්ව සිටියාවූ ඔවුන්ගේ
සහෝදරයෝ, සියල්ලන්ගේ ලේඛනයේ
හැටියට, අසූහත් දහසක් වූවෝය.

## බෙන්යමින්ගේ ගෝත්‍රය

6 බෙන්යමින්ගේ පුත්‍රයෝ නම්: බෙලා,
බෙකෙර්, යෙදීයයෙල් යන තුන්දෙනාය.
7 බෙලාගේ පුත්‍රයෝ නම්: එශ්බොන්, උස්සීය,
උස්සීයෙල්, යෙරීමොත්, ඊරී යන පස්-
දෙනාය; ඔව්හු තමුන්ගේ පිය වංශවල
ප්‍රධානියෝව බලවන්ත මනුෂ්‍යයෝව
සිටියෝය; ඔව්හු පෙළපත් වශයෙන්
ගණන්කරනලදුව විසිදෙදස් තිස්හතර
දෙනෙක් වූහ. බෙකෙර්ගේ පුත්‍රයෝ 8
නම්: සෙමිරා, යෝවාෂ්, එලියෙසෙර්,
එලියෝයේනයි, ඔම්රී, යෙරේමොත්,
අබියා, අනතෝත් සහ ආලෙමෙත්ය.
මේ සියල්ලෝ බෙකෙර්ගේ පුත්‍රයෝය.
ඔවුන්ගේ පෙළපත් වශයෙන්, තමුන්ගේ 9
පරම්පරා හැටියට, තමුන්ගේ පියවංශවල
ප්‍රධානියෝව සිටි බලවන්ත මනුෂ්‍යයන්
විසිදස් දෙසියයක්ය. යෙදීයයෙල්ගේ 10
පුත්‍රයෝ: බිල්හාන්ය. බිල්හාන්ගේ
පුත්‍රයෝ නම්: යෙවූෂ්, බෙන්යමින්, ඒහුද්,
කෙනානා, ශේතාන්, තර්ෂීෂ් සහ
අහිෂාහර්ය. මේ සියල්ලෝ තමුන්ගේ 11
පියවංශවල ප්‍රකාරයට යෙදීයයෙල්ගේ
පුත්‍රයෝව, සේනා වශයෙන් යුද්ධයට
යන්ට පුළුවන්වූ බලවන්ත මනුෂ්‍යයෝව
සිටියෝය, ඔව්හු දහහත්දස් දෙසිය
දෙනෙක්ය. ෂුප්පීම්ද හුප්පීම්ද *ඊර්ගේ 12
පුත්‍රයෝය. හුෂීම් අහෙර්ගේ පුත්‍රයෙක්ය.

## නප්තලීගේ ගෝත්‍රය

නප්තලීගේ පුත්‍රයෝ නම්: බිල්හාගේ 13
පුත්‍රයෝවූ යාහසියෙල්, ගූනී, යේසෙර්
සහ ෂල්ලූම්ය.

## මනස්සේගේ ගෝත්‍රය

මනස්සේගේ පුත්‍රයෝ: ඔහුගේ භාර්යාව 14
වැදූ අසරියෙල්ය. (ඔහුගේ අරමීය
උපභාර්යාව ගිලියද්ගේ පියවූ මාකීර්
වැදුවාය. මාකීර් හුප්පිම් සහ ෂුප්පීම්ගේ 15
සහෝදරීවූ මයකා භාර්යාකොට
පාවාගත්තේය.) දෙවෙනියාගේ නම
ශෙලොපෙහාද්ය. ශෙලොපෙහාද්ට දූවරු
සිටියෝය. මාකීර්ගේ භාර්යාවවූ මයකා 16
පුත්‍රයෙකු වදා ඔහුට පෙරෙෂ් යන නම
තැබුවාය; ඔහුගේ සහෝදරයාගේ නම
ෂෙරෙෂ්ය; ඔහුගේ පුත්‍රයෝ නම්: ඌලාම්

*7 වෙනි පදයෙහි: ඊරී.

17 සහ රාකෙම්ය. ඌලාම්ගේ පුත්‍රයෝ:
බෙදන්ය. මොව්හු මනස්සේගේ පුත්‍රයා
වන මාකීර්ගේ පුත්‍රවූ ගිලියද්ගේ පුත්‍රයෝය.
18 ඔහුගේ සහෝදරීවූ හම්මොලෙකෙත්
ඊෂ්හොද් සහ අබියෙසෙර්ද මාලාද
19 වැදුවාය. ෂෙමිදගේ පුත්‍රයෝ නම්:
අහෙයාන්, ෂෙකෙම්, ලික්හි සහ
අනියාම්ය.

## එප්‍රායිම්ගේ ගෝත්‍රය

20 එප්‍රායිම්ගේ පුත්‍රයෝ: ෂුතෙලාය. ඔහුගේ
පුත්‍රයා බෙරෙද්ය, ඔහුගේ පුත්‍රයා තහත්ය,
ඔහුගේ පුත්‍රයා එලියාදය, ඔහුගේ පුත්‍රයා
21 තහත්ය, ඔහුගේ පුත්‍රයා සාබාද්ය, ඔහුගේ
පුත්‍රයා ෂුතෙලාය. ඒ ඇර එසේර් සහ
එලෙයාද්ය. මොවුන් දේශයේ උපන්
ගාත්හි මනුෂ්‍යයන්ගේ සිව්පාවුන්
ගෙනයන්ට බැස ආ බැවින් ඒ මනුෂ්‍යයෝ
22 මොවුන් මැරුවෝය. මොවුන්ගේ පියවූ
එප්‍රායිම්ද බොහෝ දවස් වැලපුණේය,
ඔහුගේ සහෝදරයෝ ඔහු සනසන්ට
23 ආවෝය. ඔහු තමාගේ භාර්යාව කරා
පැමිණි කල ඇ ගර්භිණීව පුත්‍රයෙකු
වැදුවාය, තමාගේ පවුලට විපත්තිය
පැමිණි නිසා ඔහු ඔහුට බෙරියා යන
24 නම තැබීය. ඔහුගේ දුව ෂෙයෙරාය, ඇ
පහළ සහ ඉහළ බෙත්-හෝරොන්ද
උස්සේන්-ෂෙයෙරාද ගොඩනැගුවාය.
25 ඔහුගේ පුත්‍රයා රෙපාය, ඔහුගේ පුත්‍රයෝ
රෙෂෙප් සහ තෙලාය, ඔහුගේ පුත්‍රයා
26 තහන්ය; ඔහුගේ පුත්‍රයා ලාදන්ය, ඔහුගේ
පුත්‍රයා අම්මිහුද්ය, ඔහුගේ පුත්‍රයා
27 එලිෂාමාය; ඔහුගේ පුත්‍රයා නූන්ය, ඔහුගේ
28 පුත්‍රයා යෝෂුවාය. ඔවුන්ගේ උරුම සහ
වාසස්ථාන නම්: බෙතෙල් සහ ඒකේ
ගම්ද නැගෙනහිරට නයරාන්ද බස්නාහිරට
ගෙසෙර් සහ ඒකේ ගම්ද; අස්සා සහ
ඒකේ ගම්ද දක්වා ෂෙකෙම් සහ ඒකේ
29 ගම්ද; මනස්සේ පුත්‍රයන්ගේ සීමා දිගට
බෙත්-ෂෙයාන් සහ ඒකේ ගම්ද තයනාක්
සහ ඒකේ ගම්ද මෙගිද්දෝ සහ ඒකේ
ගම්ද දෝර් සහ ඒකේ ගම්ද යන
මේවාය. මේවායෙහි ඉශ්‍රායෙල්ගේ පුත්‍රවූ
යෝසෙප්ගේ පුත්‍රයෝ වාසයකළෝය.

## ආෂෙර්ගේ ගෝත්‍රය

ආෂෙර්ගේ පුත්‍රයෝ නම්: ඉම්නා, ඉෂ්වා, 30
ඉෂ්වී, බෙරියා සහ ඔවුන්ගේ සහෝදරීවූ
සෙරාය. බෙරියාගේ පුත්‍රයෝ නම්: හෙබෙර් 31
සහ මල්කියෙල්ය, ඔහු බිර්සායිත්ගේ
පියාය. හෙබෙර්ට දුව යප්ලෙත්ද ෂෝමෙර්ද 32
හෝතාම්ද ඔවුන්ගේ සහෝදරීවූ ෂුවාද
උපන්නෝය. යප්ලෙත්ගේ පුත්‍රයෝ නම්: 33
පාසක්, බිම්හාල් සහ අෂ්වාත්ය. මොව්හු
යප්ලෙත්ගේ පුත්‍රයෝය. ෂෙමෙර්ගේ 34
පුත්‍රයෝ නම්: අහි, රොහ්ගා, යෙහුබ්බා
සහ අරාම්ය. ඔහුගේ සහෝදරවූ හේ- 35
ලෙම්ගේ පුත්‍රයෝ නම්: ශෝපා, ඉම්නා,
ෂේලෙෂ් සහ අමාල්ය. ශොපාගේ 36
පුත්‍රයෝ නම්: සූවා, හර්නෙපෙර්, ෂුවාල්,
බේරී, ඉම්රා; බෙශෙර්, හෝඩ්, ෂම්මා, 37
ෂිල්ෂා, ඉත්රාන් සහ බෙයේරාය.
යෙතෙර්ගේ පුත්‍රයෝ නම්: යෙපුන්නෙ, 38
පිස්පා සහ අරාය. උල්ලාගේ පුත්‍රයෝ 39
නම්: ආරහ්, හන්නියෙල් සහ රිසියාය.
මේ සියල්ලෝ ආෂෙර්ගේ පුත්‍රයෝය. 40
ඔව්හු තමුන්ගේ පිය වංශවල ප්‍රධානි-
යෝව, උතුම්වූ බලවන්ත මනුෂ්‍යයෝව,
ප්‍රධාන අධිපතියෝව සිටියෝය. පෙළපත්
හැටියට යුද්ධ සේවයට ගණන්ගන්නා-
ලද්දෝ විසිහදහසක්ය.

## බෙන්යමින් ගෝත්‍රය

(තවත් ලේඛනයක්)

8 බෙන්යමින්ට දුව ඔහුගේ කුලුඳු-
ලාවූ බෙලාද දෙවෙනියාවූ අෂ්බෙල්ද
තුන්වෙනියාවූ අහරාද; සතරවෙනියාවූ 2
නෝහාද පස්වෙනියාවූ රාපාද උපන්නෝය.
බෙලාට පුත්‍රයෝ සිටියෝය, එනම්: අද්දර්, 3
ගේරා, අබිහුද්; අබිෂුවා, නාමාන්, 4
අහෝවා; ගේරා, ෂෙපුපාන් සහ හුරාම්ය. 5
ඒහුද්ගේ පුත්‍රයෝ මොව්හුය. මොව්හු 6
ගෙබාහි වැසියන්ගේ පිය වංශවල
ප්‍රධානියෝය, මොව්හු ඔවුන් මානහත්ට
ගෙන ගියෝය. ඊට පසු ඔහු නාමාන් 7
අහියා සහ ගේරා ගෙන ගියේය; ඊට
පසු ඔහුට දුව උස්සාද අහිහුද්ද
උපන්නෝය. ෂහරයිම් ඔවුන් හැරිය පසු 8

මෝවබ් දේශයේදී ඔහුට දව ඔහුගේ
භාර්යාවන්වූ හුෂීම්ගෙන්ද බයරාගෙන්ද
9 දරුවෝ උපන්නෝය. ඔහුගේ භාර්යාවවූ
හොඩෙෂ්ගෙන් යෝබාබ්ද ශීබියාද
10 මේෂාද මල්කාම්ද; යෙවුශ්ද ෂාබියාද
මිර්මාද ඔහු නිසා උපන්නෝය. මොව්හු
ඔහුගේ පුත්‍රයෝව පිය වංශවල ප්‍රධානි-
11 යෝව සිටියෝය. හුෂීම්ගෙන් අබිතුබ්
සහ එල්පයල් ඔහු නිසා උපන්නෝය.
12 එල්පයල්ගේ පුත්‍රයෝ නම්: ඒබෙර්,
මිෂාම් සහ ෂෙමෙඩ්ය, ඔහු ඕනෝද
ලොද්ද එහි ගම්ද ගොඩනැගුවේය.
13 අයාලෝන්හි වැසියන්ගේ පියවංශ-
වල ප්‍රධානියෝවූ, ගාත්හි වැසියන්
පන්නාදමුවාවූ බෙරියා සහ ෂෙමාය;
14 අහියෝද ෂාෂාක්ද යෙරේමොත්ද;
15,16 සෙබදියාද ආරාද්ද එදෙර්ද; මීකායෙල්ද,
ඉෂ්පාද යෝහාද බෙරියාගේ පුත්‍රයෝය;
17 සෙබදියාද මෙෂුල්ලාම්ද හිස්කීද
18 හෙබෙර්ද; ඉෂ්මෙරයිද ඉස්ලියාද
යෝබාබ්ද එල්පයල්ගේ පුත්‍රයෝය;
19,20 යාකීම්ද සික්රීද සබ්දීද; එලියේනයිද
21 ශිල්ලෙතයිද එලියෙල්ද; අදයාද බෙරායාද
22 ෂිම්රාත්ද ෂිමෙයිගේ පුත්‍රයෝය; ඉෂ්-
23 පාන්ද එබෙර්ද එලියෙල්ද; අබ්දෙන්ද
24 සික්රිද හානාන්ද; හනනියාද ඒලාම්ද
25 අන්තොතියාද; ඉප්දෙයාද පෙනුයෙල්ද
26 ෂාෂාක්ගේ පුත්‍රයෝය; ෂම්ෂෙරයිද
27 ෂෙහරියාද අතලියාද; යාරෙෂියාද එලියාද
28 සික්රිද යෙරොහාම්ගේ පුත්‍රයෝය. මොව්හු
තමුන්ගේ පරම්පරාවලින් පිය පෙළපත්වල
මූලික ප්‍රධානියෝ ව සිටියෝය. මොව්හු
29 යෙරුසලමෙහි විසුවෝය. ගිබියොන්ගේ
පියවූ යෙයීයෙල් ගිබියොන්හි විසුවේය,
ඔහුගේ භාර්යාවගේ නම මයකාය.
30 ඔහුගේ කුලුඳුල් පුත්‍රයා අබ්දෝන්ය, අනික්
31 පුත්‍රයෝ ශූර්, කීෂ්, බාල්, නාදබ්; ගෙදෙර්,
32 අහියෝ සහ සෙකෙර්ය. මික්ලොත්ට
දව ෂිමෙයා උපන්නේය. ඔව්හුද තමුන්ගේ
සහෝදරයන් සමග තමුන්ගේ සහෝදරයන්
ඉදිරිපිටින් යෙරුසලමෙහි වාසයකළෝය.
33 නේර්ට දව කීෂ්ද කීෂ්ට දව සාවුල්ද
සාවුල්ට දව යොනාතාන්ද මල්කී-ෂූවාද
අබිනාදබ්ද එෂ්බාල්ද උපන්නෝය.
34 මෙරිබ්-බාල් යොනාතාන්ගේ පුත්‍රයාය;
මෙරිබ්-බාල්ට දව මීකා උපන්නේය.
මීකාගේ පුත්‍රයෝ නම්: පීතොන්, මෙලෙක්, 35
තාරෙයා සහ ආහාජ්ය. ආහාජ්ට දව 36
යෙහෝවද්දද යෙහෝවද්දට දව ආලෙ-
මෙත්ද අස්මාවෙත්ද සිම්රිද උපන්නෝය;
සිම්රීට දව මෝශාද; මෝශාට දව 37
බිනෙයාද උපන්නෝය; ඔහුගේ පුත්‍රයා
රාපාය, ඔහුගේ පුත්‍රයා එලෙයාසාය,
ඔහුගේ පුත්‍රයා ආශෙල්ය. ආශෙල්ට 38
පුත්‍රයන් හදෙනෙක් සිටියෝය, ඔවුන්ගේ
නාම මේවාය: අස්රීකාම්, බොකෙරු,
ඉෂ්මායෙල්, ෂෙයරියා, ඔබදියා සහ
හානාන්ය. මේ සියල්ලෝ ආශෙල්ගේ
පුත්‍රයෝය. ඔහුගේ සහෝදරවූ එෂෙක්ගේ 39
පුත්‍රයෝ නම්: ඔහුගේ කුලුඳුලාවූ ඌ-
ලාම්ය, දෙවෙනියාවූ යෙවූෂ්ය, තුන්-
වෙනියාවූ එලිපෙලෙත්ය. ඌලාම්ගේ 40
පුත්‍රයෝ බලවත්ත මනුෂ්‍යයෝව දුනු-
කාරයෝව සිටියෝය, ඔවුන්ට පුත්‍රයෝද
පුත්‍රයන්ගේ පුත්‍රයෝද බොහෝ දෙනෙක්
එනම් එකසිය පනහක් සිටියෝය. මේ
සියල්ලෝ බෙන්යමින්ගේ පුත්‍රයෝය.

## යෙරුසලමේ පවුල්වල ප්‍රධානියෝ

9 මෙසේ මුළු ඉශ්‍රායෙල් පෙළපත්
වශයෙන් ලියවුණෝය; ඒවා
ඉශ්‍රායෙල් රජවරුන්ගේ පොතේ ලියා
තිබේ. යූදවරු තමුන්ගේ ද්‍රෝහිකම නිසා
බබිලෝනියට ගෙනයනලද්දෝය. තමුන්ගේ 2
උරුමවලද නුවරවලද වාසයකළ පළමු-
වෙනි වැසියෝ නම්: ඉශ්‍රායෙල්වරුන්
පූජකයොත් ලෙවීවරුන් *නෙතිනිම්-
වරුන්ය. යූද පුත්‍රයන්ගෙනුත් බෙන්යමින් 3
පුත්‍රයන්ගෙනුත් එප්‍රායිම් සහ මනස්සේ
පුත්‍රයන්ගෙනුත් යෙරුසලමෙහි වාසයකළ
අය නම්: යූදගේ පුත්‍රයා වන පෙරෙශ්ගේ 4
පුත්‍රයන්ගෙන් බානිගේ පුත්‍රවූ ඉම්රිගේ
පුත්‍රයා වන ඔම්රිගේ පුත්‍රවූ අම්මිහූද්ගේ
පුත්‍රයා වන ඌතයිය. ෂිලෝනිවරුන්ගෙන් 5
කුලුඳුලාවූ අසායා සහ ඔහුගේ පුත්‍රයෝය.
සෙරාගේ පුත්‍රයන්ගෙන් යෙවූයෙල් සහ 6
ඔවුන්ගේ සහෝදරයෝ හයසිය අනූදෙනෙක්ය.
බෙන්යමින් පුත්‍රයන්ගෙන් හස්සෙනුවා- 7
ගේ පුත්‍රයා වන හොදවියාගේ පුත්‍රවූ

*දේවමාලිගාවේ මෙහෙකරුවෝ.

මෙෂුල්ලාම්ගේ පුත්‍රයා වන සල්ලූද;
8 යෙරොහාම්ගේ පුත්‍රවූ ඉබ්නෙයාද මික්රි-
ගේ පුත්‍රයා වන උස්සිගේ පුත්‍රවූ ඒලාද
ඉබ්නියාගේ පුත්‍රයා වන රෙවූයෙල්ගේ
පුත්‍රවූ ෂෙපටියාගේ පුත්‍රයා වන මෙෂුල්-
9 ලාම්ද; ඔවුන්ගේ පරම්පරාවල හැටියට
ඔවුන්ගේ සහෝදරයන් නවසිය පනස්-
හදෙනෙක්ද යන අයය. මේ සියලු
මනුෂ්‍යයෝ තම තමුන්ගේ පිය වංශ
ලෙස පිය වංශවල ප්‍රධානියෝ වූහ.
10 පූජකයන්ගෙන් යෙදයාද යෙහෝයාරීබ්ද
11 යාකීන්ද; දෙවියන්වහන්සේගේ ගෘහයට
අධිපතියාවූ අහිතුබ්ගේ පුත්‍රයා වන
මෙරායොත්ගේ පුත්‍රවූ ශාදෙක්ගේ පුත්‍රයා
වන මෙෂුල්ලාම්ගේ පුත්‍රවූ හිල්කියාගේ
12 පුත්‍රයා වන අසරියාද; මල්කියාගේ පුත්‍රයා
වන පෂ්හූර්ගේ පුත්‍රවූ යෙරොහාම්ගේ
පුත්‍රයා වන අදයාද ඉම්මේර්ගේ පුත්‍රවූ
මෙෂිල්ලේමීත්ගේ පුත්‍රයා වන මෙෂුල්ලාම්-
ගේ පුත්‍රවූ යාසේරාගේ පුත්‍රයා වන
13 අදියෙල්ගේ පුත්‍රවූ මයසයිද; තමුන්ගේ
පිය වංශවල ප්‍රධානියන්වූ දෙවියන්-
වහන්සේගේ ගෘහයේ මෙහෙයේ කටයුතු
කිරීමට ඉතා සමර්ථවූ ඔවුන්ගේ
සහෝදරයන් වන එක්දස් සත්සිය
14 හැටදෙනෙක්ද යන අයය. ලෙවීවරුනම්:
මෙරාරීගේ පුත්‍රයන්ගෙන් හෂබියාගේ
පුත්‍රයා වන අස්රිකාම්ගේ පුත්‍රවූ හෂ්ෂුබ්-
15 ගේ පුත්‍රයා වන ෂෙමායාය; බක්බක්කර්,
හෙරෙෂ්, ගාලාල් සහ ආසාප්ගේ පුත්‍රවූ
සික්රිගේ පුත්‍රයා වන මීකාගේ පුත්‍රවූ
16 මත්තනියාය; යෙදූතුන්ගේ පුත්‍රයා වන
ගාලාල්ගේ පුත්‍රවූ ෂෙමයියාගේ පුත්‍රයා
වන ඔබදියාය, නෙටොපාතිවරුන්ගේ
ගම්වල විසූ එල්කානාගේ පුත්‍රයා වන
17 ආසාගේ පුත්‍රවූ බෙරෙකියාය. දෙරටු-
පාලයෝවූ ෂල්ලූම්, අක්කුබ්, ටල්මොන්,
අහිමාන් සහ ඔවුන්ගේ සහෝදරයොත්ය.
18 ෂල්ලූම් ප්‍රධානියාය. මේ දක්වා මොව්හු
ලෙවීගේ පුත්‍රයන්ගේ කඳවුරු උදෙසා
නැගෙනහිරට තිබෙන රජුගේ දෙරටුවේ
19 දෙරටුපාලයෝ වූහ. කොරාගේ පුත්‍රවූ
එබියාසාප්ගේ පුත්‍රයා වන කෝරේගේ
පුත්‍රවූ ෂල්ලූම්ද ඔහුගේ පිය වංශයට
අයිති ඔහුගේ සහෝදරයෝ වන කො-
රහිවරුද සේවයේ කටයුතුවලට පත්වී
සභාමණ්ඩප දෙරටුවල රැකවල්ලු වූහ.
ඔවුන්ගේ පියවරු ස්වාමීන්වහන්සේගේ
කඳවුරට ඇතුල්වෙන තැන රැකවලුන්
ලෙස සිටියෝය; එලෙයාසර්ගේ පුත්‍රවූ 20
පීනෙහාස් පළමු ඔවුන් කෙරෙහි
අධිපතියාව සිටියේය, ස්වාමීන්වහන්සේ
ඔහු සමග සිටිසේක. මෙෂෙලෙමියාගේ 21
පුත්‍රවූ ශෙකරියා සම්මුඛවීමේ කූඩාරමේ
දෙරකඩ දෙරටුපාලයාව සිටියේය.
දෙරකඩවල දෙරටුපාලයන් කොට 22
තෝරාගන්නාලද ඒ සියල්ලෝ දෙසිය
දොළොස් දෙනෙක්ය. ඔවුන්ගේ ගම්වල
හැටියට ඔව්හු ලියවුණෝය, දවිත් සහ
දර්ශනකාරයාවූ සාමුවෙල්ද ඔවුන්ගේ
නිලවලට ඔවුන් පත්කළෝය. ඔව්හුද 23
ඔවුන්ගේ පුත්‍රයෝද ගෘහ මණ්ඩපය වන
ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි දෙරටු,
වාර පිළිවෙළින් බලාගත්තෝය. නැගෙ- 24
නහිරද බස්නාහිරද උතුරද දකුණද යන
සතර පැතිවල දෙරටුපාලයෝ සිටියෝය.
ඔවුන්ගේ ගම්වල සිටි ඔවුන්ගේ සහෝ- 25
දරයෝද සත්දවසකට වරක් ඔවුන් සමග
මාරුවෙන් මාරුවට ආවෝය. මක්නිසාද 26
ඒ ලෙවීවරු වන ප්‍රධාන දෙරටුපාලයන්
සතරදෙනා නියම නිලයෙහි සිට
දෙවියන්වහන්සේගේ ගෘහයෙහි ඇතුල්
ගෙවල්ද ගබඩාවල්ද බලාගත්තෝය.
දෙවියන්වහන්සේගේ ගෘහය රැකවල්- 27
කිරීම ඔවුන්ගේ යුතුකමව තිබුණු නිසා
ඔව්හු ඒ ගෘහය වටකර නැවතී සිටි-
යෝය, උදයෙන් උදය එහි දෙරවල් ඇරීම
ඔවුන්ගේ බාරේ තිබුණේය. ඔවුන්ගෙන් 28
සමහරෙක් මෙහෙයට අයිති භාජන
බලාගත්තෝය; මක්නිසාද ඒවා ඇතුළට
ගන්ටත් පිටතට ගන්ටත් යෙදුණේ
ගණන්කරලාය. ඔවුන්ගෙන් සමහරෙක් 29
බඩුබාහිරාදියද ශුද්ධස්ථානයේ සියලු
භාජනද සිහින් පිටිද මුද්රික පානයද
තෙල්ද තුවරලාද සුවඳ ද්‍රව්‍යද බලා-
ගන්ට පත්කරන ලද්දෝය. පූජකයන්ගේ 30

පුත්‍රයන්ගෙන් සමහරෙක් සුවඳ ද්‍රව්‍යවලින්
31 තෛලය සෑදුවෝය. ලෙවීවරුන් අතරෙන්
කොරහිය ෂල්ලුම්ගේ කුලුඳුලාවූ මත්ති-
තියා ඇතිළිවල පිසූ දේ බලාගැනීමට
32 පත්ව සිටියේය. ඔවුන්ගේ සහෝදරයන්
වන කොහාත්වරුන්ගේ පුත්‍රයන්ගෙන්
සමහරෙක් එක එක සබත් දවසේ පිදීමේ
රොටි සූදානම්කිරීමට පත්ව සිටියෝය.
33 මොව්හු ගීතිකාකාරයෝව, ලෙවීවරුන්ගේ
පිය වංශවල ප්‍රධානියෝව, ඇතුල්ගෙවල
වාසයකළෝය, රෑ දවල් සේවයේ යෙදී
සිටි නිසා මොව්හු අනික් මෙහෙවලින්
34 නිදහස්ව සිටියෝය. මොව්හු තමුන්ගේ
පරම්පරාවල ලෙවීවරුන්ගේ පිය වංශවල
ප්‍රධානියෝව, යෙරුසලමෙහි වාසයකළෝය.

## සාවුල්ගේ පෙළපත නැවත දැක්වීම

35 ගිබියෝන්ගේ පියවූ යෙයීයෙල් ගිබියෝන්හි
විසුවේය, ඔහුගේ භාර්යාවගේ නම
36 මයකාය. ඔහුගේ කුලුඳුල් පුත්‍රයා
අබ්දෝන්ය; අනික් පුත්‍රයෝ ශූර්, කීෂ්,
37 බාල්, නේර්, නාදබ්; ගෙදෝර්, අහියෝ,
38 සෙකරියා සහ මික්ලොත්ය. මික්ලොත්ට
දව ෂිමෙයාම් උපන්නේය. මොව්හු
තමුන්ගේ සහෝදරයන් සමග තමුන්ගේ
සහෝදරයන් ඉදිරිපිටින් යෙරුසලමෙහි
39 වාසයකළෝය. නේර්ට දව කීෂ්ද කීෂ්ට
දව සාවුල්ද සාවුල්ට දව යොනාතාන්ද
මල්කී-ෂුවාද අබිනාදබ්ද එෂ්බාල්ද
40 උපන්නෝය. මෙරිබ්-බාල් යොනාතාන්ගේ
පුත්‍රයාය; මෙරිබ්-බාල්ට දව මීකා
41 උපන්නේය. මීකාගේ පුත්‍රයෝ නම්:
පීතොන්, මෙලෙක්, තාරෙයා සහ
42 ආහාස්ය. ආහාස්ට දව යයිරා
උපන්නේය. යයිරාට දව අලෙමෙත්ද
අස්මාවෙත්ද සිම්රීද උපන්නෝය; සිම්රීට
43 දව මෝශාද; මෝශාට දව බිනෙයාද
උපන්නෝය; ඔහුගේ පුත්‍රයා රෙපායාය,
ඔහුගේ පුත්‍රයා එලියාසාය, ඔහුගේ පුත්‍රයා
44 ආශෙල්ය. ආශෙල්ට පුත්‍රයන් හදෙනෙක්
සිටියෝය, ඔවුන්ගේ නාම නම්: අස්රී-
කාම්, බොකෙරු, ඉෂ්මායෙල්, ෂෙයරියා,
ඔබදියා සහ හානාන්ය. ආශෙල්ගේ
පුත්‍රයෝ මොව්හුය.

## සාවුල් රජුගේ පරාජය සහ මරණය

10
තවද පිලිස්තිවරු ඉශ්‍රායෙල්ට
විරුද්ධව යුද්ධකළෝය. ඉශ්‍රායෙල්
මනුෂ්‍යයෝ පිලිස්තිවරුන් ඉදිරියෙන්
පලාගොස් ගිල්බොවා කන්දේ මැරී
වැටුණෝය. පිලිස්තිවරු සාවුල්ද ඔහුගේ 2
පුත්‍රයන්ද පස්සේ එළවාගෙන ගොස්
සාවුල්ගේ පුත්‍රවූ යොනාතාන්ද
අබිනාදබ්ද මල්කී-ෂුවාද මැරුවෝය.
සටන සාවුල්ට විරුද්ධව තදබල විය, 3
ඔහු දුනුවායන්ට අසුවී දුනුවායන් විසින්
තුවාල කරනු ලැබීය. එවිට සාවුල් 4
තමාගේ ආයුධ ගෙනයන්නාට කථා-
කොට: අර අචර්මඡේදිතයන් ඇවිත්
මට අවමන් නොකරන පිණිස තුඹේ
කඩුව ඇද මට ඇනපන්නැයි කීය.
නුමුත් ඔහුගේ ආයුධ ගෙනයන්නා ඊට
කැමතිවුණේ නැත; ඔහු එසේ කරන්ට
බොහෝසෙයින් භයවිය. එබැවින් සාවුල්
තමාගේ කඩුව රැගෙන, තෙමේම එය
පිට වැටුණේය. සාවුල් මැරුණු බව 5
ඔහුගේ ආයුධ ගෙනයන්නා දැක ඔහුත්
තමාගේ කඩුව පිට වැටී මළේය. මෙසේ 6
සාවුල්ද ඔහුගේ පුත්‍රයන් තුන්දෙනාද
මළෝය; ඔහුගේ පවුලේ සියල්ලෝ
එකවිට මැරුණෝය. ඉශ්‍රායෙල් මිනිසුන් 7
පලාගිය බවත් සාවුල් සහ ඔහුගේ
පුත්‍රයන් මැරුණු බවත් මිටියාවතෙහි
සිටි සියලු ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ දැක
තමුන්ගේ නුවරවල් අත්හැර පලාගියෝය;
පිලිස්තිවරු ඇවිත් එහි වාසය කළෝය.
තවද පසුවද පිලිස්තිවරු මැරුම්- 8
කෑවුන්ගෙන් කොල්ලය ගන්ට ආ කල,
සාවුල්ද ඔහුගේ පුත්‍රයන්ද ගිල්බොවා
කන්දේ වැටී ඉන්නවා දුටුවෝය. ඔව්හු 9
ඔහුගේ ඇඳුම් ගළවා, ඔහුගේ හිසත්
ආයුධත් රැගෙන, එපවත් තමුන්ගේ
දේවාලවලත් සෙනඟටත් ප්‍රකාශකරන
පිණිස පිලිස්තිවරුන්ගේ දේශය මුළුල්-
ලෙහි හැරියෝය. ඔහුගේ ආයුධ ඔව්හු 10
තමුන්ගේ දෙවියන්ගේ ගෘහයෙහි තබා,
ඔහුගේ හිස දාගොන්ගේ ගෘහයෙහි එල්ලා
තැබුවෝය. යාබෙෂ්-ගිලියද්හි සියල්ලන් 11

පිලිස්තිවරුන් සාවුල්ට කළ සියල්ල ඇසූ
12 විට, සියලු නිර්භීත මනුෂ්‍යයෝ පිටත්ව
ගොස් සාවුල්ගේ ශරීරයද ඔහුගේ
පුත්‍රයන්ගේ ශරීරද රැගෙන යාබේෂ්ට
අවුත්, ඔවුන්ගේ ඇට යාබේෂ්හි අලෝන
ගස යට වළලා, සත් දවසක් නිරාහාරව
13 උන්නෝය. ස්වාමීන්වහන්සේගේ වචනය
රක්ෂානොකෙරීමෙන් ස්වාමීන්වහන්සේට
විරුද්ධව කළ වරද නිසාත් ස්වාමීන්-
වහන්සේගෙන් නොවිචාරා ආත්ම
බන්ධනකාරියෙකුගෙන් කරුණු අසා
විචාළ නිසාත් සාවුල් මෙසේ නැසුණේය.
14 ඒ නිසා උන්වහන්සේ ඔහු නසා, රජකම
අහක්කොට යෙස්සේගේ පුත්‍රවූ දාවිත්ට
දුන්සේක.

## දාවිත් රජු මෙන් අභිෂේකකිරීම

11 එකල සියලු ඉශ්‍රායෙල්වරු
හෙබ්‍රොන්හි සිටි දාවිත් වෙතට
රැස්වී කථාකොට: අපි ඔබගේ ඇටද
2 මාංසයද වමුව. පසුගිය කාලවල, සාවුල්
රජව සිටියදී පවා, ඉශ්‍රායෙල් පිටතට
ගෙනගියෙත් ඇතුළට ගෙනාවෙත් ඔබය.
ඔබගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ—තුඹ
මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල් පාලනය-
කරන්නෙහිය, තුඹ මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා වන්-
නෙහියයි ඔබට කීසේකැයි කීවෝය.
3 මෙලෙස ඉශ්‍රායෙල්හි සියලු වැඩි-
මහල්ලෝ හෙබ්‍රොන්හි සිටි රජු වෙතට
පැමිණියාහ; දාවිත්ද හෙබ්‍රොන්හිදී
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි ඔවුන් සමග
ගිවිසුමක් කෙළේය; ඔව්හු ස්වාමීන්-
වහන්සේ සාමුවෙල් ලවා කියෙවූ වචනය
ලෙස දාවිත් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
රජකොට ආලේපකළෝය.

## යෙරුසලම රාජධානිය කරගැනීම

4 පසුව දාවිත්ද සියලු ඉශ්‍රායෙල්වරුද
යෙබූස නම්වූ යෙරුසලමට ගියෝය;
දේශවාසීවූ යෙබූසිවරු එහි සිටියෝය.
5 යෙබූස වැසියෝ: තුඹ මෙහි ඇතුල්
නොවන්නෙහියයි දාවිත්ට කීවෝය.
නුමුත් දාවිත් සියොන් බලකොටුව
අල්වාගත්තේය; එය දාවිත්ගේ නුවරය.
දාවිත් කථාකොට: පළමුකොට යෙබූසි- 6
වරුන්ට පහරදෙන කවරෙක් නුමුත්
ප්‍රධානියාද අධිපතියාද වන්නේයයි
කීවේය. ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ්
පළමුකොට නැගී ගොස් ප්‍රධානියා
වුණේය. දාවිත් බලකොටුවෙහි වාසය- 7
කෙළේය; ඒ නිසා ඊට දාවිත්ගේ නුවර-
යයි නම් කළෝය. ඔහු මිල්ලෝ පටන් 8
වටකරින්ම නුවර ගොඩනැගුවේය.
යෝවාබ් නුවර ඉතිරි කොටස අලුත්-
වැඩියා කෙළේය. දාවිත් වඩ වඩා උසස් 9
වූයේය; මක්නිසාද සේනාවල ස්වාමීන්-
වහන්සේ ඔහු හා සමග සිටිසේක.

## දාවිත් රජුගේ යුද්ධ දක්ෂ භටයෝ

ඉශ්‍රායෙල් ගැන ස්වාමීන්වහන්සේගේ 10
වචනය ප්‍රකාරයට දාවිත් රජකමට
පත්කරන පිණිස සියලු ඉශ්‍රායෙල්වරුන්
සමග ඔහුගේ රජකම ගැන ඔහුට
උපකාරකළ ප්‍රධාන බලවන්තයෝ
මොව්හුය. දාවිත්ට සිටි බලවන්තයන්ගේ 11
ගණන මේය: හක්මොනියෙකුගේ පුත්‍රවූ,
තිස්දෙනාගෙන් ප්‍රධානියාවූ යාෂො-
බෙයාම්ය; ඔහු එක් වතාවකදී තුන්සිය
දෙනෙකුට විරුද්ධව තමාගේ හෙල්ලය
ඔසවා ඔවුන් මැරීය. ඊළඟට අහෝහිය 12
දෝදෝගේ පුත්‍රවූ එලෙයාසර් සිටියේය,
ඔහු බලවන්තයන් තුන්දෙනාගෙන් එක්-
කෙනෙක්ය. පැස්-දම්මීම්හි, යව පුරාම 13
තිබුණු, පිලිස්තිවරුන් යුද්ධයට සැරසී
සිටි බිම් කොටසක ඔහු දාවිත් සමග
සිටියේය; සෙනඟ පිලිස්තිවරුන් ඉදිරියෙන්
පලාගියෝය. ඔව්හු ඒ බිම මැද සිට 14
එය ආරක්ෂාකරගෙන පිලිස්තිවරුන්
මැරුවෝය; ස්වාමීන්වහන්සේ මහත්
ජයක් ලබාදී ඔවුන් ගැළවූසේක. ප්‍රධාන 15
තිස්දෙනාගෙන් තුන්දෙනෙක් අදුල්ලම්
ගුහාවේ සිටි දාවිත් වෙතට පර්වතයට
ගියෝය; පිලිස්තිවරුන්ගේ සමූදව රෙපා-
වරුන්ගේ මිටියාවතෙහි කඳවුරු බැඳගෙන

16 සිටියෝය. දාවිත් එවකට බලකොටුවෙහි
සිටියේය, පිලිස්තිවරුන්ගේ මුර සේනාව
එවකට බෙත්-ලෙහෙමෙහි සිටියෝය.
17 දාවිත් තද ආශාවෙන් කියනුයේ: අනේ
බෙත්-ලෙහෙමේ දොරටුව ළඟ තිබෙන
ළිඳෙන් කවුරුවත් මට බොන්ට වතුර
18 ගෙනත් දුන්නොත්! කියා කීවේය. එවිට
ඒ තුන්දෙනා පිලිස්තිවරුන්ගේ සමූදාව
මැදින් බිඳගන ගොස් බෙත්-ලෙහෙමේ
දොරටුව සමීපයෙහිවූ ළිඳෙන් වතුර ඇද
දාවිත් වෙතට ගෙනාවෝය. නුමුත් දාවිත්
ඒවා බොන්ට නොකැමැතිව, ඒවා
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි වත්කොට
19 කියනුයේ: මේ දේ කිරීමෙන් මාගේ
දෙවියන්වහන්සේ මා වළක්වනසේක්වා.
තමුන්ගේ ජීවිතයට වියහැකි අන්තරාය
නොසලකා ගියාවූ මේ මනුෂ්‍යයන්ගේ
ලේ මා විසින් බොන්ටද? මක්නිසාද
ඔව්හු තමුන්ගේ ජීවිත අන්තරායෙහි
තබා මේවා ගෙනාවෝයයි කීය. එහෙයින්
ඔහු ඒවා බොන්ට නොකැමැතිවිය. ඒ
බලවන්තයන් තුන්දෙනා මේ දේ කළෝය.
20 යෝවාබ්ගේ සහෝදරවූ අබිෂයි තුන්-
දෙනාගෙන් ප්‍රධානියාව සිටියේය. ඔහු
තමාගේ හෙල්ලය තුන්සිය දෙනෙකුට
විරුද්ධව ඔසවා ඔවුන් මරා, තුන්දෙනා
21 අතරේ නාමයක් ලැබුවේය. දෙවෙනි
තුන්දෙනාගෙන් ඔහු අනික් දෙදෙනාට
වඩා ගරුකටයුතු වූයෙන්, ඔවුන්ගේ
අධිපතියා විය. එසේ වී නුමුත් ඔහු
පළමුවෙනි තුන්දෙනා තරමට නො-
22 පැමිණියේය. බලවත් ක්‍රියාවල් කළාවූ
කබ්සෙයෙල්හි වික්‍රමාන්විත මනුෂ්‍ය-
යෙකුගේ පුත්‍රවූ යෙහෝයාදගේ පුත්‍රයා
වන බෙනායා මෝවබ්හි අරියෙල්ගේ
පුත්‍රයන් දෙදෙනා මැරුවේය. ඔහු හිම
වැටෙන දවසකදී බැස ගොස් වළක්
23 ඇතුළෙහි සිංහයෙකුත් මැරුවේය. ඔහු
පස් රියනක් උස ඇති ලොකු මනුෂ්‍ය-
යෙක්වූ මිසරයෙකුත් මැරීය; මිසරයාගේ
අතේ වියන දණ්ඩක් වැනි හෙල්-
ලයක් තිබුණේය; ඔහු පොල්ලක් ඇතුව
මිසරයා ළඟට ගොස්, ඔහුගේ අතින්
හෙල්ලය උදුරා, ඔහුගේම හෙල්ලයෙන්
ඔහු මරාදැමුවේය. යෙහෝයාදගේ පුත්‍රවූ 24
බෙනායා මේ දේවල් කොට බලවන්-
තයන් තුන්දෙනා අතරේ නාමයක්
ලැබුවේය. ඔහු ඒ තිස්දෙනාට වඩා 25
ගරුතර කෙනෙක් විය, ඒ නුමුත් ඔහු
පළමුවෙනි තුන්දෙනාගේ ගණනට
පැමුණුණේ නැත. දාවිත් තමාගේ *මුර
සමූදාව කෙරෙහි ඔහු පත්කෙළේය.
සේනාවල බලවන්තයෝ නම්: යෝවාබ්ගේ 26
සහෝදරවූ අසාහෙල්ය, බෙත්-ලෙහෙමේ
දෝදෝගේ පුත්‍රවූ එල්හානාන්ය; හරෝ- 27
රිය ෂම්මොත්ය, පෙලෝනිය හෙලෙශ්ය;
තෙකෝයිය ඉක්කේෂ්ගේ පුත්‍රවූ ඊරාය, 28
අනතෝතිය අබියෙසෙර්ය; හුෂාතිය 29
සිබ්බෙකයිය, අහොහීය ඉලයිය;
නෙටොපාතිය මහරයිය, නෙටොපාතිය 30
බානාගේ පුත්‍රවූ හේලෙද්ය; බෙන්යමින් 31
පුත්‍රයන්ගේ ගිබියාහි රීබයිගේ පුත්‍රවූ
ඊතයිය, පිරාතෝනිය බෙනායාය; ගයෂ් 32
ඔයවල හුරයිය, අර්බාත්‍ය අබියෙල්ය;
බහරුමීය අස්මාවෙත්ය, ෂයල්බොනිය 33
එලියාබාය; ගිසෝනිය හාෂෙම්ගේ 34
පුත්‍රයෝය, හරාරිය ෂාගේගේ පුත්‍රවූ
යොනාතාන්ය; හරාරිය සාකාර්ගේ පුත්‍රවූ 35
අහියාම්ය, ඌර්ගේ පුත්‍රවූ එලිපාල්ය;
මෙකේරාතිය හේපෙර්ය, පෙලෝනිය 36
අහියාය; කර්මෙලිය හෙශ්රොය, 37
එශ්බයිගේ පුත්‍රවූ නයරයිය; නාතාන්ගේ 38
සහෝදරවූ යෝවෙල්ය, හග්රීගේ පුත්‍රවූ
මිබ්හාර්ය; අම්මොනිය ශෙලෙක්ය, 39
ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ්ගේ ආයුධ
ගෙනයන්නා වන බේරොතිය නහරයිය;
ඉත්රිය ඊරාය, ඉත්රිය ගාරෙබ්ය; හිත්තිය 40,41
ඌරියාය, ආලයිගේ පුත්‍රවූ සාබාද්ය;
රූබෙන්වරුන්ගේ ප්‍රධානියාව සිටි 42
රූබෙනිය ෂීශාගේ පුත්‍රවූ අදීනාය, ඔහු
සමග තිස්දෙනෙක් සිටියෝය; මයකාගේ 43
පුත්‍රවූ හානාන්ය, මිත්නිය යෝෂාපාට්ය;
අෂ්තෙරාතිය උස්සියාය, අරොයෙරිය 44
හෝතාම්ගේ පුත්‍රවූ ෂාමා සහ යෙයී-
යෙල්ය; ෂිම්රිගේ පුත්‍රවූ යෙදීයයෙල් සහ 45
ඔහුගේ සහෝදරවූ තිශිය යෝහාය.
මහවිය එලීයෙල්ය, එල්නයම්ගේ 46
පුත්‍රයෝවූ යෙරිබයි සහ යෝෂාවියාය,
මෝවබිය ඉත්මාය; එලීයෙල්ය, ඕබෙද්ය, 47
මෙසොබායවූ යයසීයෙල්ය.

*නොහොත්, මන්ත්‍රණ සභාව.

## සාවුල්ගේ කාලයේදී දාවිත්ට පක්ෂවූ බලවන්තයෝ

12 දාවිත් කීෂ්ගේ පුත්‍රවූ සාවුල් නිසා
සැඟවී ශික්ලග්හි සිටියදී ඔහු
ළඟට පැමිණි මනුෂ්‍යයෝ මොව්හුය.
මොව්හු යුද්ධයේදී ඔහුට උපකාර වූ
බලවන්තයන්ගේ ගණනට අයිති වූහ.
2 ඔව්හු දකුණතින්ද වමතින්ද ගල්
වීසිකරන්ටත් දුන්නෙන් ඊගස් විදින්ටත්
පුරුදු දුනුවායෝව, බෙන්යමින්හි සාවුල්ගේ
3 සහෝදරයෝව සිටියෝය. එනම්
ප්‍රධානියාවූ අහියෙසෙර් සහ යෝවාෂ්ය,
ඔව්හු ගිබියාතිය ෂෙමායාගේ පුත්‍රයෝය;
අස්මාවෙත්ගේ පුත්‍රයෝවූ යෙසීයෙල්
සහ පෙලෙත්ය; බෙරාකාය; අනතෝතිය
4 යේහුය; බලවන්තයන් තිස්දෙනාගෙන්
එක්කෙනෙක්ව තිස්දෙනාගේ ප්‍රධානි-
යාව සිටිය ගිබියෝනිය ඉෂ්මයියාය;
යෙරෙමියාය, යහසියෙල්ය, යෝහානාන්ය,
5 ගෙදේරාතිය යොසාබාද්ය; එල්යූසයිය,
යෙරීමොත්ය, බෙයාලියාය, ෂෙමරියාය,
6 හරූපිය ෂෙපතියාය; එල්කානා සහ
ඉෂ්ෂියාද අසරීයෙල්ද යෝවෙසෙර්ද
යෂොබෙයාම්ද යන කොරාවරුය.
7 ගෙඩෝර්හි යෙරොහාම්ගේ පුත්‍රයෝවූ
8 යොයේලා සහ සෙබදියාය. ගාද්-
වරුන්ගෙනුත් බලවන්ත මනුෂ්‍යයෝ
වෙන්ව ගොස් දාවිත් වෙතට කාන්තාර-
යේ බලකොටුවට එක්වූවෝය, ඔව්හු
යුද්ධයට පුහුණුවූ, පලිහත් හෙල්ලයත්
දරන්ට සමර්ථවූ, සිංහ මුහුණු වැනි
මුහුණු ඇත්තාවූ, වේගවත් කමින් කඳු-
වල තිත්මුවන්ට සමානවූ මනුෂ්‍යයෝය;
9 ප්‍රධානියා ඒසෙර්ය, දෙවෙනියා ඔබ-
10 දියාය, තුන්වෙනියා එලියාබ්ය; සතර-
වෙනියා මිෂ්මන්නාය, පස්වෙනියා
11 යෙරෙමියාය; හවෙනියා අත්තයිය,
12 හත්වෙනියා එලීයෙල්ය; අටවෙනියා
යෝහානාන්ය, නවවෙනියා එල්සාබාද්ය;
13 දසවෙනියා යෙරමියාය, එකොළොස්-
14 වෙනියා මක්බන්නයිය. මොව්හු ගාද්ගේ
පුත්‍රයෝව සේනාවට මුලාදෑනියෝව
සිටියෝය. මොවුන්ගෙන් කුඩා තැනැත්තා
සියයකටත් ලොකු තැනැත්තා දහසකටත්
15 වඩා බලවත් විය. මොව්හු පළමුවෙනි
මාසයේ, යොර්දානේ වතුර එහි සියලු
ඉවුරු උඩින් ගලා තිබියදී, එගොඩවී
නැගෙනහිරත් බස්නාහිරත් මිටියාවත්වල
වාසයකළ සියල්ලන් එළවාදැම්මෝය.
බෙන්යමින්ගේද යූදාගේද පුත්‍රයන්ගෙනුත් 16
සමහරෙක් දාවිත් වෙතට බලකොටුවට
ආවෝය. දාවිත් ඔවුන් සම්බවෙන්ට 17
පිටතට ගොස් ඔවුන්ට කථාකොට:
තුඹලා මට උපකාරකරන්ට සමාදානයෙන්
මා ළඟට ආවහු නම්, මාගේ සිත තුඹලා
කෙරෙහි ඇලුම්වන්නේය. නුමුත් මා අත
වරදක් නැතුව තිබෙද්දී මාගේ එදිරි-
කාරයන්ට මා පාවාදෙන පිණිස ආවා
නම්, අපේ පියවරුන්ගේ දෙවියන්-
වහන්සේ එය බලා යුක්තිය කරන-
සේක්වයි කීවේය. එවිට තිස්දෙනාගේ 18
ප්‍රධානියාවූ අමාසයි පිටට ආත්මය
පැමිණ ඔහු කියනුයේ: දාවිත්නි, අපි
තුඹේ පක්ෂයටද, යෙස්සේගේ පුත්‍රය,
අපි තුඹ සමගද සිටින්නෙමුව. සමාදානය,
සමාදානයම තුඹට වේවා, තුඹට
උපකාරකරන්නන්ටත් සමාදානය වේවා;
මක්නිසාද තුඹේ දෙවියන්වහන්සේ තුඹට
උපකාරකරනසේකැයි කීවේය. එවිට
දාවිත් ඔවුන් පිළිගෙන සමූදවේ ප්‍රධානීන්
කෙළේය. තවද දාවිත් පිලිස්තිවරුන් සමග 19
සාවුල්ට විරුද්ධව සටනට ගිය විට
මනස්සේවරුන්ගෙන් සමහරෙකුත් ඔහුට
එකතුවුණෝය, නුමුත් ඔව්හු පිලිස්ති-
වරුන්ට උපකාර නොකළෝය. මක්-
නිසාද පිලිස්තිවරුන්ගේ අධිපතීහු
මන්ත්‍රණයකොට: ඔහු අපේ හිස් අන්-
තරායට පැමිණෙන ලෙස තමාගේ
ස්වාමියාවූ සාවුල්ට එකතුවෙනවා ඇතැයි
කියා ඔහු යන්ට හැරියෝය. එසේ ඔහු 20
ශික්ලග්ට යද්දී මනස්සේවරුන්ගෙන්
සහස්‍රාධිපතියෝවූ අද්නාද යෝසාබාද්ද
යෙදීයයෙල්ද මීකායෙල්ද යෝසාබාද්ද
එලීහුද ශිල්ලෙතයිද ඔහුට එකතුවුණෝය.
ඔව්හු කොල්ලකාර සමූදවට විරුද්ධව 21
දාවිත්ට උපකාරකළෝය. මක්නිසාද ඔවුන්
සියල්ලෝම බලවන්තයෝව සේනාවේ
අධිපතියෝව සිටියෝය. එසේ දෙවියන්- 22
වහන්සේගේ සේනාව වැනි මහත්
සේනාවක් වන තෙක් දාවිත්ට උපකාර-
කරන පිණිස මිනිස්සු දවසින් දවස ඔහු
ළඟට ආවෝය.

## හෙබ්‍රොන්හිදී දාවිත් රජකර ගත් යුද්ධ දක්ෂයෝ

23 ස්වාමීන්වහන්සේගේ වචනය ප්‍රකාරයට
සාවුල්ගේ රජකම දාවිත්ට හරවාදෙන
පිණිස යුද්ධයට සන්නද්ධව දාවිත් වෙතට
හෙබ්‍රොන්ට ආවාවූ මනුෂ්‍යයන්ගේ
24 ගණන මෙසේය: යූදා පුත්‍රයන්ගෙන්
පලිහද හෙල්ලයද දරන්නාවූ යුද්ධයට
සන්නද්ධවූ හදස් අටසිය දෙනෙක්ය.
25 සිමියොන් පුත්‍රයන්ගෙන් යුද්ධයට
බලවන්ත මනුෂ්‍යයෝ හත්දස් එක-
26 සියයක්ය. ලෙවී පුත්‍රයන්ගෙන් හාරදස්
27 හසියයක්ය. ආරොන්ගේ වංශයේ
අධිපතියාවූ යෙහෝයාද සහ ඔහු සමග
28 තුන්දස් හත්සියයක්ය; බලවන්ත යෞවන-
යෙක්වූ ශාදෙක් සහ ඔහුගේ පිය වංශයේ
29 අධිපතිවරු විසිදෙදෙනෙක්ය. සාවුල්ගේ
සහෝදරයන්වූ බෙන්යමින් පුත්‍රයන්ගෙන්
තුන්දහසක්ය. ඔවුන්ගෙන් වැඩි කොටස
මේ වන තුරු සාවුල්ගේ වංශයට
30 පක්ෂව සිටියෝය. එප්‍රායිම් පුත්‍රයන්ගෙන්
බලවන්තයෝව තමුන්ගේ පිය වංශවල
කීර්තිමත් මනුෂ්‍යයෝව සිටි විසිදස්
31 අටසියදෙනෙක්ය. දාවිත් රජකමට පත්-
කිරීමට එන පිණිස මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන් නම් සඳහන්කරනු ලැබූ
32 දහ අටදහක්ය. ඉශ්‍රායෙල්වරුන් විසින්
කළ යුතු දේ කිමෙක්දැයි දනෙන හැටියට
කාලවල් ගැන තේරුම් ඇත්තාවූ
ඉස්සාකර් පුත්‍රයන්ගේ ප්‍රධානියෝද
දෙසිය දෙනෙක්ය; ඔවුන්ගේ සියලු
සහෝදරයෝද ඔවුන්ගේ අණට යටත්ව
33 සිටියෝය. සාබුලොන්වරුන්ගෙන්, සියලු
ආකාර යුද්ධායුධ ඇතුව යුද්ධ පිළිවෙළට
පැමිණ දෙසිත් නැතුව පිළිවෙළින් සිටින්ට
34 පුළුවන්වූ අය පනස් දහසක්ය. නප්තලී-
වරුන්ගෙන්, අධිපතිවරු දහසක් සහ
ඔවුන් සමග පලිහද හෙල්ලයද ඇති අය
35 තිස්හත් දහසක්ය. දාන්වරුන්ගෙන්, යුද්ධ
පිළිවෙළට පැමිණෙන අය විසිඅටදස්
36 හසියයක්ය. ආෂේර්වරුන්ගෙන්, සටනට
ගොස් යුද්ධ පිළිවෙළින් සිටින්ට පුළුවන්වූ
37 අය සතළිස් දහසක්ය. යොර්දානෙන්
එගොඩ රූබෙන්වරුන්ගෙන්ද ගාද්-
වරුන්ගෙන්ද මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන්ද සටනට සියලු ආකාර
යුද්ධායුධ ඇති අය එක්ලක්ෂ විසි-
දහසක්ය. යුද්ධ පිළිවෙළට පැමිණෙන්ට 38
පුළුවන්වූ මේ සියලු යුද්ධකාරයෝ සියලු
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි දාවිත් රජකමට
පත්කිරීමට සම්පූර්ණ සිතින් හෙබ්‍රොන්ට
ආවෝය. අනික් සියලු ඉශ්‍රායෙල්වරුත්
දාවිත් රජකමට පත්කිරීමට එක්සිත්ව
සිටියෝය. ඔව්හු කමින් බොමින් දාවිත් 39
ළඟ තුන් දවසක් සිටියෝය. මක්නිසාද
ඔවුන්ගේ සහෝදරයන් විසින් ඔවුන්ට
එසේ පිළියෙළකර තිබුණේය. තවද 40
ඉස්සාකර්ද සාබුලොන්ද නප්තලීද දක්වා
ඔවුන් අසල සිටි අය කොටළුවන්ද
ඔටුවන්ද අශ්වතරයන්ද ගොනුන්ද පිට
රොටි සහ පිටි කැමත් වියළි අත්තික්කා
කැටි සහ මිදිපොකුරුත් මුද්‍රිකපානයත්
තෙලුත් ගොනුන් සහ බැටළුවනුත්
බොහෝසෙයින් ගෙනාවෝය. මක්නිසාද
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි ප්‍රීතිය වූයේය.

## ගිවිසුම් පෙට්ටිය ගෙන ඊම

13 තවද දාවිත් සහස්‍රාධිපතීන්ද
ශතාධිපතීන්ද සියලු නායකයන්ද
සමග මන්ත්‍රණයකරමින් මුළු ඉශ්‍රායෙල් 2
සභාවට කථාකොට: තුඹලාට හොඳව
පෙනේ නම්, අපේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේත්** කැමතිවනසේක් නම්, මුළු
ඉශ්‍රායෙල් දේශයෙහි ඉතුරුව සිටින අපේ
සහෝදරයන්ටද ඔවුන් සමග තමුන්ගේ
පිට-බිම් සහිත නුවරවල සිටින
පූජකයන්ටද ලෙවීවරුන්ටද අප ළඟට
රැස්වෙන්ට කියා සෑම දිශාවලට කියා
යවා, අපේ දෙවියන්වහන්සේගේ ගිවිසුම් 3
පෙට්ටිය අප වෙතට නැවත ගෙනෙමු.
මක්නිසාද සාවුල්ගේ දවස්වලදී අපි ඒක
ඉදිරියෙහි නොවිචාළෙමුයයි කීවේය.
මුළු සෙනඟගේ ඇස් හමුයෙහි එය හරිව 4
පෙනුණු නිසා, එසේ කරන්ට කැමති
බව මුළු සභාව කියා සිටියාය. ඒ 5
නිසා දාවිත් දෙවියන්වහන්සේගේ ගිවිසුම්

පෙට්ටිය කිරියත්-යෙයාරිම් සිට
ගෙනෙන්ට මීසරයේ ෂීහෝර් ඔය පටන්
හමාත්ට ඇතුල්වෙන තැන දක්වා සිටි
සියලු ඉශ්‍රායෙල්වරුන් රැස්කෙළේය.
6 කෙරුබ්වරුන් අතරේ වැඩ ඉන්න
**ස්වාමීන්වහන්සේගේ** නාමය තබා තිබෙන
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
යූදට අයිති බාලා නම්වූ කිරියත්-
යෙයාරිම් සිට ගෙනෙන පිණිස දාවිත්
සහ සියලු ඉශ්‍රායෙල්වරුද එහි ගියෝය.
7 ඔව්හු දෙවියන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය අබිනාදබ්ගේ ගෙයින් අලුත්
රථයක තබා ගෙනාවෝය. උස්සාද
8 අහියෝද ගැළ දක්කුවෝය. දාවිත්ද සියලු
ඉශ්‍රායෙල්වරුද ගීතිකාවලිනුත් වීණා-
වලිනුත් කුඩා වීණාවලිනුත් රබන්-
වලිනුත් අත්තල්වලිනුත් නළාවලිනුත්
දෙවියන්වහන්සේ ඉදිරියෙහි මුළු
9 ශක්තියෙන් ගායනාකළෝය. කීදෝන්ගේ
පාවරට ආ කල හරක් දාහලූ බැවින්
උස්සා ගිවිසුම් පෙට්ටිය අල්ලන්ට තමා-
10 ගේ අත දිගුකෙළේය. එවිට **ස්වාමීන්-
වහන්සේගේ** උදහස උස්සාට විරුද්ධව
ඇවිළුණේය, ඔහු ගිවිසුම් පෙට්ටියට
තමාගේ අත දිගුකළ බැවින් උන්වහන්සේ
ඔහුට පහරදුන්සේක. ඔහු එහිදී දෙවියන්-
11 වහන්සේ ඉදිරියෙහි මෙළේය. **ස්වාමීන්-
වහන්සේ** උස්සාට කළ හදිසි පහර දීම
නිසා දාවිත් අප්‍රසන්න විය. ඔහු ඒ
ස්ථානයට *පෙරෙශ්-උස්සා යන නාමය
තැබීය, ඒ නාමය අද දක්වා ඊට තිබේ.
12 ඒ දවසේදී දාවිත් දෙවියන්වහන්සේට
භයව: දෙවියන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය මා ළඟට කෙසේ ගෙනෙම්දැයි
13 කීවේය. ඒ නිසා දාවිත් ගිවිසුම් පෙට්ටිය
තමා වෙතට දාවිත්ගේ නුවරට නොගෙන
අහකට හරවා, එය ගිත්තිය ඕබෙද්-
14 ඒදොම්ගේ ගෙට ගෙන ගියේය. එසේ
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
ඕබෙද්-ඒදොම්ගේ පවුල සමග ඔහුගේ
ගෙයි තුන් මාසයක් තිබුණේය. **ස්වාමීන්-
වහන්සේ** ඕබෙද්-ඒදොම්ගේ ගෙදරටත්
ඔහු සන්තක සියල්ලටත් ආශීර්වාද-
කළසේක.

*එනම්, උස්සා ප්‍රහාරය.

## දාවිත් රජුගේ මාලිගාව සහ පවුල. පිලිස්තිවරුන් පරාජය කිරීම

14 තීර්හි රජවූ හීරාම් දාවිත්ට ගෘහයක්
ගොඩනැගීම පිණිස ඔහු වෙතට
පණිවිඩකාරයන්ද කිහිරි ලීද ගල්-
වඩුවන්ද වඩුවන්ද එවුවේය. දාවිත්ද තමා 2
ඉශ්‍රායෙල් කෙරෙහි රජ කොට **ස්වාමීන්-
වහන්සේ** විසින් ස්ථිර කළ බව දැන-
ගත්තේය, මක්නිසාද උන්වහන්සේගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් උදෙසා ඔහුගේ
රාජ්‍යය උසස්වී තිබුණේය.
දාවිත් යෙරුසලමේදී තවත් භාර්යාවන් 3
පාවාගත්තේය. දාවිත්ට දාව තව පුත්‍රයොත්
දූවරුත් උපන්නෝය. යෙරුසලමේදී ඔහුට 4
උපන් පුත්‍රයන්ගේ නාම මෙසේය: ෂම්මුවා,
ෂෝබාබ්, නාතාන් සහ සාලමොන්ය;
ඉබ්හාර්, එලීෂූවා සහ එල්පෙලෙත්ය; 5
නොගා, නෙපෙග් සහ යපියාය; එලීෂාමා, 6,7
බෙයෙලියාද සහ එලීපෙලෙත්ය.
දාවිත් මුළු ඉශ්‍රායෙල් කෙරෙහි රජ කොට 8
ආලේපකරනු ලැබූ බව පිලිස්තිවරුන්
ඇසූ කල ඔවුන් සියල්ලෝම දාවිත්
සොයා ආවෝය. දාවිත් ඒ අසා ඔවුන්ට
විරුද්ධව පිටතට ගියේය. පිලිස්තිවරු 9
ඇවිත් රෙපායිම් මිටියාවතෙහි පැතිර
කොල්ල කෑවෝය. දාවිත්: මා පිලිස්ති- 10
වරුන්ට විරුද්ධව යන්ටද? ඔබවහන්සේ
ඔවුන් මා අතට පාවාදෙනසේක්ද
කියා දෙවියන්වහන්සේගෙන් පිළිවිසීය.
**ස්වාමීන්වහන්සේද**: යව; මම ඔවුන් තුඹ
අතට පාවාදෙමියි ඔහුට කීසේක. ඔව්හු 11
බාල්-පෙරාශීම්ට ආවෝය, දාවිත් එහිදී
ඔවුන්ට පහරදී: දෙවියන්වහන්සේ මා
අතින් මාගේ සතුරන් ජලගැලීමක් මෙන්
විසුරුවා හැරියසේකැයි කීවේය. ඒ නිසා
ඒ ස්ථානයට බාල්-පෙරාශීම් යන නම
තැබූහ. ඔව්හු තමුන්ගේ දේව රූප එහි 12
අත්හැර ගියෝය; එකල දාවිත් දුන් ආඥාව
ලෙස ඒවා ගින්නෙන් පුළුස්සාදමන
ලද්දේය. නැවතත් පිලිස්තිවරු මිටියාව- 13
තෙහි පැතිර කොල්ල කෑවෝය. දාවිත් 14

නැවත දෙවියන්වහන්සේගෙන් විචාළේය;
දෙවියන්වහන්සේද: නුඹ ඔවුන් පස්සේ
නොගොස් ඔවුන් වෙතින් හැරී වටකර
ගොස් ඇඹිල්ල ගස්වලට ඉස්සරහපිටින්
15 ඔවුන් වෙතට පැමිණියන්න. තවද ඇඹිල්ල
ගස් මුදුන්වල අඩි තබාගෙන යන ශබ්ද-
යක් නුඹට ඇසෙන විට සටනට පිටත්ව
පලයන්න. මක්නිසාද දෙවියන්වහන්සේ
පිලිස්තිවරුන්ගේ සේනාවට පහරදෙන්ට
නුඹට පෙරටුවෙන් පිටත්ව යනසේකැයි
16 ඔහුට කීසේක. දාවිත් දෙවියන්වහන්සේ
අණ කළ ලෙස කෙළේය. ඔව්හු ගිබියොන්
සිට ගෙසෙර් දක්වා පිලිස්තිවරුන්ගේ
17 සේනාවට පහරදුන්නෝය. දාවිත්ගේ
කීර්තිය සියලු රටවල පතළවී ගියේය;
**ස්වාමීන්වහන්සේ** සියලු ජාතීන් පිටට
ඔහු කෙරෙහි භයක් පැමිණෙවූසේක.

## ගිවිසුම් පෙට්ටිය යෙරුසලමට ගෙනඒම

15 දාවිත් තෙමේ දාවිත්ගේ නුවර
තමාට ගෙවල් සාදගත්තේය; ඔහු
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටියට
ස්ථානයක් පිළියෙළකොට ඊට කූඩා-
2 රමක් පිහිටෙවුවේය. එවිට දාවිත් කථා-
කොට: දෙවියන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය ගෙනයන්ටත් සැම කල්හිම උන්-
වහන්සේට සේවයකරන්ටත් **ස්වාමීන්-
වහන්සේ** ලෙවීවරුන් තෝරාගත් නිසා
දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
ගෙනයන්ට ඔවුන්ට මිස වෙන කාටවත්
3 යුතු නැතැයි කීවේය. දාවිත් තමා
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටියට
පිළියෙළකළ ස්ථානයට එය ගෙනෙන
පිණිස සියලු ඉශ්‍රායෙල්වරුන් යෙරු-
4 සලමට රැස්කෙළේය. දාවිත් ආරොන්ගේ
5 පුත්‍රයන්ද ලෙවීවරුන්ද රැස්කෙළේය. එසේ
රැස්කළේ කොහාත්ගේ පුත්‍රයන්ගේ
ප්‍රධානියාවූ උරියෙල් සහ ඔහුගේ සහෝ-
6 දරයන් එකසිය විසිදෙනෙක්ය. මෙරාරීගේ
පුත්‍රයන්ගෙන් ප්‍රධානියාවූ අසායා සහ
ඔහුගේ සහෝදරයන් දෙසිය විසි-
දෙනෙක්ය. ගේර්ෂෝම්ගේ පුත්‍රයන්ගෙන් 7
ප්‍රධානියාවූ යෝවෙල් සහ ඔහුගේ
සහෝදරයන් එකසිය තිස්දෙනෙක්ය.
එලීශාපාන්ගේ පුත්‍රයන්ගෙන් ප්‍රධානියාවූ 8
ෂෙමායා සහ ඔහුගේ සහෝදරයන්
දෙසිය දෙනෙක්ය. හෙබ්‍රොන්ගේ පුත්‍රයන්- 9
ගෙන් ප්‍රධානියාවූ එලීයෙල් සහ
ඔහුගේ සහෝදරයන් අසූ දෙනෙක්ය.
උස්සීයෙල්ගේ පුත්‍රයන්ගෙන් ප්‍රධානියාවූ 10
අම්මිනාදබ් සහ ඔහුගේ සහෝදරයන්
එකසිය දොළොස් දෙනෙක්ය. දාවිත් වනාහි 11
පූජකයන්වූ ශාදොක්ට සහ අබියාතර්ටද
ලෙවීවරුන්වූ උරියෙල්, ආසායා, යෝවෙල්,
ෂෙමායා, එලීයෙල් සහ අම්මිනාදබ්ටද
අඬගසා ඔවුන්ට කථාකොට: නුඹලා 12
ලෙවීවරුන්ගේ පිය වංශවල ප්‍රධානියෝය.
නුඹලාත් නුඹලාගේ සහෝදරයෝත්
පිරිසිදුවී, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය මා විසින්
ඊට පිළියෙළකර තිබෙන ස්ථානයට
ගෙනෙල්ලා. පළමු වතාවේදී ඒක ගෙනා 13
අය නුඹලා නොවූ බැවින් අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අපට පහරදුන්සේක,
මක්නිසාද නියෝගය ලෙස අපි උන්-
වහන්සේ නොසෙවූවෙමුයයි කීවේය.
පූජකයෝද ලෙවීවරුද ඉශ්‍රායෙල්ගේ 14
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම්
පෙට්ටිය ගෙනෙන පිණිස පිරිසිදු
වූණෝය. **ස්වාමීන්වහන්සේගේ** වචනය 15
ප්‍රකාර, මෝසෙස් විසින් අණ කළ ලෙස,
ලෙවීගේ පුත්‍රයෝ දෙවියන්වහන්සේගේ
ගිවිසුම් පෙට්ටියේ පොලු තමුන්ගේ
කරපිට තබාගෙන එය ගෙනගියෝය. තවද 16
දාවිත් කුඩා වීණාද මහ වීණාද අත්-
තල්ද යන තූර්ය භාණ්ඩවලින් ගායනා-
කරමින් ප්‍රීති හඬ පැවැත්වීමට තමුන්ගේ
සහෝදරයන්වූ ගීතිකාකාරයන් නියම-
කරන්ට ලෙවීවරුන්ගේ ප්‍රධානීන්ට කීවේය.
මෙසේ ලෙවීවරු යෝවෙල්ගේ පුත්‍රවූ 17
හේමාන්ද ඔහුගේ සහෝදරයන්ගෙන්
බෙරකියාගේ පුත්‍රවූ ආසාප්ද තමුන්ගේ
සහෝදරයන්වූ මෙරාරීගේ පුත්‍රයන්ගෙන්

18 කුෂායාගේ පුත්‍රවූ ඒතාන්ද; ඔවුන් සමග
දෙරටුපාලයන් කොට තමුන්ගේ බාල
සහෝදරයන් වන සෙකරියාද බෙන්ද
යයසීයෙල්ද ෂෙමිරාමොත්ද යෙහීයෙල්ද
උන්නිද එලියාබ්ද බෙනායාද මයසේයාද
මත්තිතියාද එලීපෙලේහුද මික්නේයාද
ඕබෙද්-ඒදොම්ද යෙයීයෙල්ද පත්කළෝය.
19 හේමාන්ද ආසාප්ද ඒතාන්ද යන
ගායනාකාරයෝ පිත්තල අත්තල්වලින්
20 ශබ්දකිරීමටත්; සෙකරියාද අසීයෙල්ද
ෂෙමිරාමොත්ද යෙහීයෙල්ද උන්නිද
එලීයාබ්ද මයසේයාද බෙනායාද යන
මොව්හු අලමොත් නම් කුඩා වීණාවලින්
21 හීන් ශබ්ද පැවැත්වීමටත්; මත්තිතියාද
එලීපෙලේහුද මික්නේයාද ඕබෙද්-ඒදොම්ද
යෙයීයෙල්ද අසසියාද ෂෙමීනිත් නම්
මහ වීණාවලින් මූලික මහ ශබ්ද
22 පැවැත්වීමටත් නියමවුණෝය. කෙනනියා
ගායනාකිරීම ගැන ලෙවීවරුන්ගේ
ප්‍රධානියාව සිටියේය; ඔහු ඊට දක්ෂව
සිටි බැවින් ගායනාකරන්ට ඉගැන්නුවේය.
23 බෙරෙකියාද එල්කානාද ගිවිසුම් පෙට්ටිය
උදෙසා දෙරටුපාලයෝව සිටියෝය.
24 පූජකයෝවූ ෂෙබනියාද යෝෂාපාට්ද
නෙතනෙල්ද අමසයිද සෙකරියාද
බෙනායාද එලීයෙසෙර්ද දෙවියන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය පෙරටුවෙන්
නළා පිම්බෝය. ඕබෙද්-ඒදොම්ද යෙහියාද
ගිවිසුම් පෙට්ටිය උදෙසා දෙරටුපාලයෝව
25 සිටියෝය. මෙසේ දාවිත් හා ඉශ්‍රායෙල්
වැඩිමහල්ලෝද සහස්‍රාධිපතීහුද ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ඕබෙද්-
ඒදොම්ගේ ගෙදරින් ගෙනෙන පිණිස
26 ප්‍රීතියෙන් ගියෝය. තවද ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙන යන
ලෙවීවරුන්ට දෙවියන්වහන්සේ පිහිටවූ
කල ඔව්හු ගොන් හත්දෙනෙක්ද
බැටළුවන් හත්දෙනෙක්ද පූජාකළෝය.
27 දාවිත්ද ගිවිසුම් පෙට්ටිය උසුලාගත්
සියලු ලෙවීවරුද ගීතිකාකාරයෝද
ගීතිකාකාරයන් අතරේ ගායනාකිරීමට
ප්‍රධානියාව සිටි කෙනනියාද සිහින් හණ
සළු ඇඳගෙන සිටියෝය. දාවිත් හණ
ඒපොද් සැට්ටයක් පැළඳගෙන සිටියේය.
28 මෙසේ සියලු ඉශ්‍රායෙල්වරු ඔල්වර හඬත්
හොරණෑ-ශබ්දයත් ඇතුව, නළාවලිනුත්
අත්තල්වලිනුත් වීණාවලිනුත් මහ වීණා-
වලිනුත් ශබ්ද පවත්වමින්, ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනා-
වෝය. ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් 29
පෙට්ටිය දාවිත්ගේ නුවරට පැමිණෙනවිට,
සාවුල්ගේ දූවූ මීකල් කවුළුවෙන් බලා
රජවූ දාවිත් පනිනවාත් නටනවාත්
දැක, ඇගේ සිතින් ඔහු හෙළා දැක්කාය.

## 16

ඔව්හු දෙවියන්වහන්සේගේ ගිවිසුම් 1
පෙට්ටිය ගෙනවුත් දාවිත් විසින් ඒ
සඳහා පිහිටුවා තිබුණු කූඩාරම තුළ
තබා, දවන පූජාවල්ද ශාන්ති පූජාවල්ද
දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඔප්පුකළෝ-
ය. දාවිත් දවන පූජාවද ශාන්ති පූජාද 2
ඔප්පුකර නිමවූ විට, ඔහු ස්වාමීන්-
වහන්සේගේ නාමයෙන් සෙනඟට
ආශීර්වාද කෙළේය. තවද ඔහු ඉශ්‍රායෙල් 3
මිනිසුන් සියල්ලන්ගෙන් එක එක
පුරුෂයාටත් ස්ත්‍රියටත් රොටියක්ද මස්-
කැල්ලක්ද වියළි මුද්‍රිකඵල කැටියක්ද
බැගින් දුන්නේය.

### නමස්කාර විධිය නියමකිරීම

තවද ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් 4
පෙට්ටිය ඉදිරියෙහි සේවයකිරීමටත්
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
වර්ණනාකිරීමටත් උන්වහන්සේට ස්තුති
ප්‍රශංසාකිරීමටත් ඔහු ලෙවීවරුන්ගෙන්
සමහරෙකු නියමකෙළේය. එනම් ප්‍රධා- 5
නියා ආසාප්ය, ඔහු ළඟට ශෙකරියා,
යෙයීයෙල්, ෂෙමිරාමොත්, යෙහීයෙල්,
මත්තිතියා, එලීයාබ්, බෙනායා, ඕබෙද්-
ඒදොම් සහ යෙයීයෙල්ය; මොව්හු වීණා-
වලින්ද මහ වීණාවලින්ද ගායනාකළෝය;
නුමුත් ආසාප් අත්තල්වලින් ශබ්ද පැවැත්-
තුවේය; පූජකයෝවූ බෙනායාද යහසී- 6
යෙල්ද දෙවියන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය ඉදිරියෙහි නිතරම නළා
පිම්බෝය.

දාවිත් ආසාප්ද ඔහුගේ සහෝදරයන්ද 7
ලවා ස්වාමීන්වහන්සේට ස්තුතිකරවීමට
පළමුවෙන් නියමකෙළේ ඒ දවසේදීය.

ස්වාමීන්වහන්සේට ස්තුතිකරව්, 8

උන්වහන්සේගේ නාමය කියා
යාච්ඤාකරව්;
ජනයන් අතරේ උන්වහන්සේගේ
ක්‍රියා දන්වව්.
9 උන්වහන්සේට ගීතිකා කියව්,
උන්වහන්සේට ප්‍රශංසා ගී කියව්;
උන්වහන්සේගේ සියලු පුදුම ක්‍රියා
මෙනෙහිකරව්.
10 උන්වහන්සේගේ ශුද්ධවූ නාමය ගැන
පාරට්ටුකරගනිව්.
ස්වාමීන්වහන්සේ සොයන්නවුන්ගේ
සිත් ප්‍රීතිමත් වේවා.
11 ස්වාමීන්වහන්සේද උන්වහන්සේගේ
බලයද ගැන විමසව්;
උන්වහන්සේගේ මුහුණ නිතරම සොයව්.
12 උන්වහන්සේගේ මෙහෙකරුවූ
ඉශ්‍රායෙල්ගේ වංශයෙනි,
උන්වහන්සේ විසින් තෝරාගත්
තැනැත්තන් වන යාකොබ්ගේ පුත්‍රයෙනි,
13 උන්වහන්සේ කළ පුදුම ක්‍රියාද
උන්වහන්සේගේ ආශ්වර්යයන්ද
උන්වහන්සේගේ මුඛයේ
විනිශ්වයයන්ද සිහිකරව්.
14 උන්වහන්සේ අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේය.
උන්වහන්සේගේ විනිශ්වයයෝ මුළු
පොළොවෙහි තිබේ.
15 උන්වහන්සේගේ ගිවිසුම සදකාලේටත්
උන්වහන්සේ අණකළ වචනය පරම්පරා
දහසකටත් සිහිකරව්.
16 එය උන්වහන්සේ ආබ්‍රහම් සමග
කළසේක,
ඊසාක්ටද දිවුරා දුන්සේක;
17 එය උන්වහන්සේ යාකොබ්ට පනතක්ද
ඉශ්‍රායෙල්ට සදකාල ගිවිසුමක්ද
කොට ස්ථිරකරමින්:
18 තුඹලාගේ උරුම කොටස කොට
කානාන් දේශය තුඹට දෙන්නෙමියි
කියා
19 තුඹලා ගණනින් ස්වල්ප දෙනෙක්ව,
ඉතා ස්වල්ප දෙනෙක්ව, එහි විදේශීන්ව
සිටියදී කීසේක.
20 ඔව්හු ජාතියකින් ජාතියකටද
එක රාජ්‍යයක සිට තව සෙනඟක්
වෙතටද ගියෝය.
ඔවුන්ට අයුක්තියක් කරන්ට උන්වහන්සේ 21
කිසිම මනුෂ්‍යයෙකුට ඉඩ
නුදුන්සේක;
එසේය, උන්වහන්සේ ඔවුන් නිසා
රජුන්ට තරවටුකොට:
මාගේ අභිෂේකලද්දවුන්ට අතනොගසව්, 22
මාගේ ප්‍රොපේතවරුන්ට අනතුරු
නොකරව්යයි කීසේක.
පොළොවාසී සියල්ලෙනි, ස්වාමීන්ට 23
ගී කියව්;
උන්වහන්සේගේ ගැළවීම දිනෙන් දින
ප්‍රකාශකරව්.
ජාතීන් අතරෙහි උන්වහන්සේගේ 24
මහිමයද
සියලු ජනයන් අතරෙහි උන්වහන්සේගේ
ආශ්වර්යමත් ක්‍රියාද පතළ කරව්.
මක්නිසාද ස්වාමීන්වහන්සේ උතුම්ව 25
බොහෝසෙයින් ප්‍රශංසා කටයුතුව
සිටිනසේක.
සියලු දෙවිවරුන්ට වඩා උන්වහන්සේ
භයවිය යුත්තෙක.
මක්නිසාද ජනයන්ගේ සියලු දෙවිවරු 26
පිළිම පමණක්ය.
නුමුත් ස්වාමීන්වහන්සේ ආකාශ
මණ්ඩලය සෑදූසේක.
ගෞරවයද මහත්තත්වයද උන්වහන්සේ 27
ඉදිරියෙහි පවත්නේය;
ශක්තියද සන්තෝෂයද උන්වහන්සේගේ
ස්ථානයෙහි ඇත්තේය.
ජනයෙනි, ස්වාමීන්වහන්සේට දෙව්, 28
ගෞරවයද බලයද ස්වාමීන්වහන්සේට
දෙව්.
ස්වාමීන්වහන්සේගේ නාමයට අයිති 29
ගෞරවය දෙව්.
පඬුරක් රැගෙන උන්වහන්සේ ඉදිරියට
එව්.
ශුද්ධවූ අලංකාරය ඇතුව ස්වාමීන්ට
නමස්කාරකරව්.
පොළොවාසී සියල්ලෙනි, උන්වහන්සේ 30
ඉදිරියේ වෙවුලමින් සිටිව්.
නොසෙල්වෙන ලෙස ලෝකයත් ස්ථිරව
තිබේ.

31 ස්වර්ගයෝ සන්තෝෂවෙත්වා,
පොළොවද ප්‍රීතිවේවා;
ස්වාමීන්වහන්සේ රජකම්කරනසේක‍ැයි
ජාතීන් අතරේ කියත්වා.
32 මුහුදත් එහි සම්පූර්ණකමත් ගර්ජනා
කෙරෙත්වා;
කෙත් සහ එහි ඇති සියල්ල ප්‍රීතිමත්
වෙත්වා.
33 එවිට වනයේ වෘක්ෂයෝ ස්වාමීන්
ඉදිරියෙහි ප්‍රීතියෙන් ගී කියන්නාහ,
මක්නිසාද උන්වහන්සේ පොළොව
විනිශ්චයකරන පිණිස එනසේක.
34 ස්වාමීන්වහන්සේට ස්තුතිකරව්;
මක්නිසාද උන්වහන්සේ යහපත්ය.
උන්වහන්සේගේ කරුණාව සදකල්
පවත්නේය.
35 අපේ ගැළවීමේ දෙවියන්වහන්ස,
ඔබගේ ශුද්ධවූ නාමයට ස්තුතිකරන
පිණිසත්,
ඔබගේ ප්‍රශංසා ගැන ජයඝෝෂා
පවත්වන පිණිසත්,
අප ගළවා, ජාතීන් අතරෙන් අප
රැස්කොට, අප නිදහස්කළ මැනවයි
කියව්.
36 ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්ට
සදකාලයෙන් සදකාලයට ප්‍රශංසා වේවා.
මුළු සෙනඟද: ආමෙන් කියා ස්වාමීන්-
වහන්සේ වර්ණනාකළෝය.
37 ඉක්බිති ස්වාමීන්වහන්සේගේ ගිවිසුම්
පෙට්ටිය ඉදිරියෙහි නිතරම එක එක
දවසට සුදුසු ලෙස සේවයකිරීමට ඔහු
පෙට්ටිය ඉදිරියෙහි ආසාප්ද ඔහුගේ
38 සහෝදරයන්ද, ඕබෙද්-ඒදෝම් සහ ඔවුන්ගේ
සහෝදරයන් හැට අටදෙනෙක්ද සිටෙවුවේය;
යෙදූතුන්ගේ පුත්‍රවූ ඕබෙද්-ඒදෝම්ද හෝසාද
දොරටුපාලයන් කොට නියමකෙළේය.
39 ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්ට අණකළාවූ
උන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ලියා
තිබෙන සියල්ල ප්‍රකාරයට, දවන පූජා
පුදන පූජාසනය පිට දවන පූජා නිතරම
උදය සවස ස්වාමීන්වහන්සේට ඔප්පු
40 කරන පිණිස, පූජකවූ ශාදොක්ද පූජකයන්වූ
ඔහුගේ සහෝදරයන්ද, ගිබියොන්හි
උස්තැන තිබෙන ස්වාමීන්වහන්සේගේ
මණ්ඩපය ඉදිරියෙහි සිටින්ට නියමකෙළේය.
ඔවුන් සමග හේමාන්ද යෙදූතුන්ද නම් 41
සඳහන්කර තෝරාගනු ලැබූ අනික්
අයද: ස්වාමීන්වහන්සේගේ කරුණාව
සදකාලයටම පවත්නේය කියා උන්-
වහන්සේට ස්තුතිකිරීමට නියමකෙළේය.
ඔවුන් සමග හේමාන්ද යෙදූතුන්ද 42
නියමකරනු ලැබුයේ නළාවලිනුත්
අත්තල්වලිනුත් දෙවියන්වහන්සේට
ගීතිකා සඳහා තූර්ය භාණ්ඩවලිනුත්
ශබ්දකිරීමටය. යෙදූතුන්ගේ පුත්‍රයන්ද
දොරටුපාලයන් කොට පත් කෙළේය. පසුව 43
මුළු සෙනඟ තම තමුන්ගේ ගෙදරවලට
ගියෝය. දාවිත් තමාගේ ගෙදරවාසීන්ට
ආශීර්වාදකරන පිණිස හැරීගියේය.

## දේවමාළිගාවක් සෑදීමේ ආශාව

17 තවද දාවිත් තමාගේ ගෙයි වසන
කල්හි ප්‍රොපේත නැතවූ නාතාන්ට
කථාකොට: මෙන්න, මම කිහිරි ලී
ගෙයක වාසයකරමි, නුමුත් ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය තිර
ඇතුළෙහි වාසයකෙරේයයි කීවේය.
නාතාන්ද: ඔබගේ සිතේ තිබෙන සියල්ල 2
කළ මැනව; මක්නිසාද දෙවියන්වහන්සේ
ඔබ සමග සිටිනසේක‍ැයි දාවිත්ට කීය.
තවද එම රාත්‍රියේ දෙවියන්වහන්සේගේ 3
වචනය නාතාන්ට පැමිණ කියනුයේ:
නුඹ ගොස් ස්වාමීන්වහන්සේ මෙසේ 4
කියනසේක‍ැයි මාගේ මෙහෙකරුවූ දාවිත්ට
කියව–මාගේ වාසය පිණිස නුඹ ගෘහයක්
ගොඩනොනගන්නෙහිය. මක්නිසාද මම 5
ඉශ්‍රායෙල්වරුන් ගෙනා දවස පටන් අද
දක්වා ගෘහයක වාසය නොකොට
කූඩාරමෙන් කූඩාරමටද මණ්ඩපයෙන්
මණ්ඩපයටද යමින් හැසුරුණෙමි. මාගේ 6
සෙනඟ පාලනයකරන්ට මා විසින්
අණ කළ ඉශ්‍රායෙල් විනිශ්චයකාරයන්ගෙන්
යමෙකුට–නුඹලා මට කිහිරි ලී ගෘහයක්
ගොඩනොනැගුවේ මක්නිසාද යන
වචනයක් මා සියලු ඉශ්‍රායෙල්වරුන්

අතරෙහි හැසුරුණ කොයි ස්ථානයකදීවත්
7 කීයෙම්ද? එබැවින් මාගේ මෙහෙකරුවූ
දාවිත්ට මෙසේ කියව—සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: මාගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා
තුඹ වෙන පිණිස තෘණ බිමෙන්ද
බැටළුවන් පස්සේ යාමෙන්ද මම තුඹ
8 අහක්කොට ගතිමි. තුඹ ගිය හැම
තැන්හිම මම තුඹ සමග සිට, තුඹේ
සියලු සතුරන් තුඹ ඉදිරියෙන් සිඳ දැමීමි;
පොළොවේ සිටින උත්තමයන්ගේ නාම
මෙන් තුඹට නාමයක් උපදවන්නෙමි.
9 මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල් තමුන්ගේම
ස්ථානයෙහි වාසයකොට මතු එයින්
නොයන ලෙස මම ඔවුන්ට ස්ථානයක්
නියම කොට ඔවුන් පිහිටුවන්නෙමි; තවද
10 මුලදී සිදුවූවාක් මෙන්ද, මා විසින්
මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි
විනිශ්චයකාරයන් පත්කළ කාලයේ සිට
සිදුවූවාක් මෙන්ද දුෂ්ට මනුෂ්‍යයෝ තවත්
ඔවුන් නාස්තිනොකරන්නෝය; තුඹේ
සියලු සතුරන් යටත්කරන්නෙමි. ඇරත්
**ස්වාමීන්වහන්සේ** තුඹට *ගෘහයක්
11 ගොඩනගන බව තුඹට දන්වමි. තුඹේ
පියවරුන් ළඟට යාමට තුඹේ දවස්
සම්පූර්ණවූ කල, මම තුඹේ පුත්‍රයෙක්වූ
තුඹේම දරුවෙක් තුඹට පසුව පිහිටුවා,
12 ඔහුගේ රාජ්‍යය ස්ථිරකරන්නෙමි. ඔහු
මට ගෘහයක් ගොඩනගන්නේය,
ඔහුගේ සිංහාසනයද මම සදාකාලයටම
13 ස්ථිරකරන්නෙමි. මම ඔහුට පියෙක්
වන්නෙමි, ඔහුද මට පුත්‍රයෙක් වන්නේය.
තුඹට පළමු සිටි තැනැත්තාගෙන්
මාගේ කරුණාව පහකළාක් මෙන් මම
14 ඔහුගෙන් පහනොකර, මාගේ ගෘහයෙහිද
මාගේ රාජ්‍යයෙහිද ඔහු සදාකාලේටම
පිහිටුවන්නෙමි. ඔහුගේ සිංහාසනයද
සදාකාලේටම ස්ථිරකරනු ලබන්නේය
15 කියා කියනසේකැයි කීවේය. මේ සියලු
වචන ප්‍රකාරයටත් මේ මුළු දර්ශනයේ
ප්‍රකාරයටත් නාතාන් දාවිත්ට කීවේය.

එවිට දාවිත් රජ ඇතුළට ගොස් **ස්වාමීන්-** 16
**වහන්සේ** ඉදිරියෙහි හිඳ: දෙවිවූ **ස්වාමීන්-**
**වහන්ස**, ඔබ විසින් මෙපමණ දුරට මා
ගෙනඊමට මම කවුද? මාගේ වංශය
මොකක්ද? එහෙත් දෙවියන්වහන්ස, 17
මේකත් ඔබගේ ඇස් හමුයෙහි මදිව,
මතු කාලයට ඔබගේ මෙහෙකරුවාගේ
වංශය ගැන ඔබ කථාකොට, දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, උත්තම මනුෂ්‍යයෙකු
හැටියට ඔබ මා සැලකුසේක. ඔබගේ 18
මෙහෙකරුවාට කළ ගෞරවය ගැන
දාවිත් ඔබට තවත් කුමක් කියන්ටද?
මක්නිසාද ඔබවහන්සේ ඔබගේ
මෙහෙකරුවා දන්නාසේක. **ස්වාමීන්-** 19
**වහන්ස**, ඔබ මේ මුළු මහත් දෙය කොට
මේ සියලු මහත් දේ දන්නුවේ ඔබගේ
මෙහෙකරුවා උදෙසාත් ඔබගේ සිතේ
හැටියටත්ය. **ස්වාමීන්වහන්ස**, අපේ කන්- 20
වලින් අප ඇසූ සියල්ල ලෙස ඔබට
සමාන කෙනෙක් නැත, ඔබවහන්සේ
හැර වෙන කිසි දෙවිකෙනෙක්ද නැත.
ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට සමානව 21
ඉන්නේ පොළොවේ කොයි ජාතියද?
මක්නිසාද දෙවියන්වහන්සේ තමන්ට
සෙනඟක් කොට ඔවුන් මුදාගන්න පිණිස
ගොස් මිසරයෙන් මුදාගත් ඔබගේ සෙනඟ
ඉදිරියෙන් ජාතීන් එළවාදමා, මහත්වූ
භයානකවූ දේවල් කිරීමෙන් ඔබට
නාමයක් උපදවාගත්සේක. මෙසේ ඔබගේ 22
සෙනඟවූ ඉශ්‍රායෙල් සදාකාලයටම ඔබට
සෙනඟක් කොට තබාගෙන, ඔබම,
**ස්වාමීන්වහන්ස**, ඔවුන්ගේ දෙවියන්වහන්-
සේ වී සිටිනසේක. දැනුදු, **ස්වාමීන්වහන්ස**, 23
ඔබගේ මෙහෙකරුවාත් ඔහුගේ වංශයත්
ගැන ඔබ කී වචනය සදාකාලයටම
ස්ථිරවේවා, ඔබ කී ලෙසම කළ
මැනව. ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ ව, 24
ඉශ්‍රායෙල්වරුන් උදෙසා දෙවිකෙනෙක් ව
සිටින්නේ සේනාවල **ස්වාමීන්වහන්සේ-**
යයි කීමෙන් එසේ ඔබගේ නාමය ස්ථිරව
සදාකාලයටම උතුම් වේවා. ඔබගේ
මෙහෙකරුවූ දාවිත්ගේ වංශයද ඔබ
ඉදිරියෙහි ස්ථිරව තිබේ. මක්නිසාද, 25
මාගේ දෙවියන්වහන්ස, ඔබගේ මෙහෙකරුවා

*එනම්—වංශයක්,

උදෙසා ඔබ *ගෘහයක් ගොඩනගන බව
ඔබ ඔහුට එළිදරව් කළසේක. එබැවින්
ඔබ ඉදිරියෙහි යාච්ඤාකරන්ට ඔබගේ
26 මෙහෙකරුවාට කල්පනාවිය. දැනුදු,
**ස්වාමීන්වහන්ස,** ඔබම දෙවියන්-
වහන්සේය, ඔබගේ මෙහෙකරුවාට මේ
27 යහපත් දේ පොරොන්දුවූසේක. එසේ
ඔබගේ මෙහෙකරුවාගේ වංශයට
ආශීර්වාදකරන්ට ඔබ ප්‍රසන්නවූයේ එය
සදාකාලේටම ඔබ ඉදිරියෙහි පවතින
පිණිසය. මක්නිසාද, **ස්වාමීන්වහන්ස,**
ඔබවහන්සේ ආශීර්වාදකළ බැවින් එය
සදාකල්ම ආශීර්වාද ලබන්නේයයි කීයේය.

## දාවිත් විසින් අන්‍ය ජාතීන් යටත් කිරීම. දාවිත්ගේ අධිපතීහු

18 මින්පසු දාවිත් පිලිස්තිවරුන්ට
පහරදී ඔවුන් යටත්කරගන, ගාත්ද
ඊට අයිති නුවරවල්ද පිලිස්තිවරුන්ගේ
2 අතින් ගත්තේය. ඔහු මෝවබ්වරුන්ටත්
පහරදුන්නේය; මෝවබ්වරු දාවිත්ට
මෙහෙකරුවෝ වී කප්පන් ගෙනාවෝය.
3 තවද ශෝබාහි රජවූ හදර්එසෙර් ප්‍රාත්
ගඟ ළඟ තමාගේ බලය පිහිටුවන්ට
යද්දී, දාවිත් හමාත් දක්වා ඔහුට පහරදී,
4 රථ දහසක්ද අසරුවන් සත් දහසක්ද
පාබළ සෙනඟ විසි දහසක්ද ඔහුගෙන්
අල්ලාගෙන, රථ-අශ්වයන් සියයක් ඉතුරු-
කරගෙන, අනික් සියලු අශ්වයන්ගේ කුදි
5 කැපුවේය. දමස්කයේ සිරියවරු ශෝබාහි
රජවූ හදර්එසෙර්ට උපකාරකරන්ට
ආවෝය. එවිට දාවිත් සිරියවරුන්ගෙන්
මනුෂ්‍යයන් විසිදෙදහසකට පහරදී,
6 දමස්කයේ සිරියෙහි මුර සමුදවල් තැබූ-
වේය; සිරියවරු දාවිත්ට මෙහෙකරුවෝ
වී කප්පන් ගෙනාවෝය. දාවිත් ගිය ගිය
තැන **ස්වාමීන්වහන්සේ** ඔහුට ජය දුන්-
7 සේක. දාවිත් හදර්එසෙර්ගේ සේවකයන්ට
තිබුණු රන් පලිස් රැගෙන ඒවා යෙරූ-
8 සලමට ගෙනාවේය. තිබ්හත්ද කූන්ද යන
හදර්එසෙර්ගේ නුවරවලින් දාවිත් බොහෝ
පිත්තල ගත්තේය, එයින් සාලමොන්
පිත්තල මුහුදත් කුළුනුත් පිත්තල භාජනත්
සෑදීය. දාවිත් ශෝබාහි රජවූ හදර්- 9
එසෙර්ගේ මුළු සේනාවට පහරදුන් බව
හමාත්හි රජවූ තෝයූ අසා, දාවිත් එසේ 10
හදර්එසෙර්ට විරුද්ධව සටන්කොට
ඔහුට පහරදුන් බැවින්, දාවිත්ට
ආචාරකරන්ටත් ඔහුට ආශීර්වාද-
කරන්ටත් ඔහු වෙතට තමාගේ පුත්‍රවූ
හදෝරාම් සහ සියලු ආකාර රන් රිදී
පිත්තල බඩුත් එවූවේය; මක්නිසාද
හදර්එසෙර් සහ තෝයූ අතරේ යුද්ධ
තිබුණේය. ඒ බඩුත් දාවිත් රජ සියලු 11
ජාතීන්ගෙන් එනම් ඒදෝම්වරුන්ගෙන්ද
මෝවබ්වරුන්ගෙන්ද අම්මොන් පුත්‍රයන්-
ගෙන්ද පිලිස්තිවරුන්ගෙන්ද අමලෙක්-
වරුන්ගෙන්ද ගත්තාවූ රන් රිදී සමඟ
**ස්වාමීන්වහන්සේට** කැපකෙළේය. ඇරත් 12
ශෙරුයාගේ පුත්‍රවූ අබිෂයි ලුණු
මිටියාවතේදී ඒදෝම්වරුන්ගෙන් දහඅට
දහසකට පහරදුන්නේය. ඔහු ඒදෝමිහි 13
මුර සමුදවල් තැබුවේය; සියලු ඒදෝම්වරු
දාවිත්ට මෙහෙකරුවෝ වූවෝය. දාවිත්
ගිය ගිය තැන **ස්වාමීන්වහන්සේ** ඔහුට
ජය දුන්සේක.
දාවිත් මුළු ඉශ්‍රායෙල් කෙරෙහි 14
රජකම්කරමින් තමාගේ මුළු සෙනඟට
විනිශ්චයද යුක්තියද ඉෂ්ටකෙළේය.
ශෙරුයාගේ පුත්‍රවූ යෝවාබ් සේනාපතියාව 15
සිටියේය; අහිලූද්ගේ පුත්‍රවූ යෙහෝ-
ෂාපාට් වාර්තාකරුව සිටියේය. අහිතුබ්- 16
ගේ පුත්‍රවූ ශාදෝක් සහ අබියාතර්ගේ පුත්‍රවූ
අබිමෙලෙක් පූජකයෝව සිටියෝය;
ෂව්ෂා ලේකම්ව සිටියේය. යෙහෝයාදාගේ 17
පුත්‍රවූ බෙනායා කෙරෙතිවරුන්ටත්
පෙලෙතිවරුන්ටත් ප්‍රධානියාව සිටියේය;
දාවිත්ගේ පුත්‍රයෝද රජු වෙත ප්‍රධානියෝව
සිටියෝය.

## අම්මොන්වරුන් සමඟ කළ යුද්ධය

19 ඉක්බිති අම්මොන් පුත්‍රයන්ගේ
රජවූ නාහාෂ් මළේය, ඔහුගේ
පුත්‍රයා ඔහු වෙනුවට රජවිය. දාවිත් 2

*එනම්–වංශයක්.

වනාහි: හානූන්ගේ පියවූ නාහාෂ් මට
කරුණාව පෙන්වූ නිසා මමත් හානූන්ට
කරුණාව පෙන්වන්නෙමියි කියා ඔහුගේ
පියා ගැන ඔහු සනසන පිණිස දූතයන්
යැවීය. දාවිත්ගේ සේවකයෝ හානූන්
සනසන්ට අම්මොන් පුත්‍රයන්ගේ දේශයට
3 ඔහු වෙතට පැමුණුණෝය. එවිට අම්මොන්
පුත්‍රයන්ගේ අධිපතීහු හානූන්ට කථාකොට:
දාවිත් ඔබ ළඟට සැනසිලිකාරයන් එවූ
නිසා ඔහු ඔබගේ පියාණන්ට ගෞරව-
කරන්නේයයි ඔබ සිතනවාද? ඔහුගේ
සේවකයන් ඔබ වෙතට ආවේ දේශය
විභාගකර, ඔත්තු බලා, ඒක නාස්තිකරන
4 අදහසින් නොවේදැයි කීවෝය. එවිට
හානූන් දාවිත්ගේ සේවකයන් අල්වා,
ඔවුන්ගේ රැවුල් බූගා, කළවාමුල් දක්වා
ඔවුන්ගේ ඇඳුම් මැදින් කපාදමා ඔවුන්
5 යන්ට හැරියේය. මිනිස්සු ඇවිත් ඒ
මනුෂ්‍යයන් ගැන දාවිත්ට දැන්නූහ.
එවිට ඔවුන් සම්බවෙන්ට ඔහු මිනිසුන්
යැවූවේය; මක්නිසාද ඒ මනුෂ්‍යයෝ
බොහෝසෙයින් ලජ්ජාවට පත්ව සිටි-
යෝය. රජ: තුඹලාගේ රැවුල් වැඩෙනකල්
යෙරිකෝවෙහි නැවතී පසුව වරෙල්ලා-
6 යයි කියා හැරියේය. තවද අම්මොන්
පුත්‍රයෝ තමුන් දාවිත් ඉදිරියෙහි පිළිකුල්ව
සිටින බව දැක, හානූන් සහ අම්මොන්
පුත්‍රයෝද මෙසොපොතාමියේ සිරිය-
වරුන්ගෙනුත් මයකාහි සිරියවරුන්-
ගෙනුත් ශෝබායෙනුත් රථ සහ
අසරුවන් කුලියට ගන්ට රිදී තලෙන්ත
7 දහසක් යැවූහ. මෙසේ ඔව්හු රථ තිස්
දෙදහසක්ද මයකාහි රජුද ඔහුගේ
සෙනඟද කුලියට ගත්තෝය; ඔව්හු ඇවිත්
මේදෙබා ඉදිරිපිට කඳවුරු බැඳගත්තෝය.
8 අම්මොන් පුත්‍රයෝත් තමුන්ගේ නුවර-
වලින් රැස්ව සටනට ආවෝය. දාවිත් ඒ
අසා යෝවාබ්ද බලවන්තයන්වූ මුළු
9 සේනාවද යැවීය. අම්මොන් පුත්‍රයෝද
පිටතට ඇවිත් නුවර දොරටුව ළඟ යුද්ධ
පිළිවෙළින් සිටියෝය. ආවාවූ රජවරු
10 භූමියෙහි වෙනම සිටියෝය. ඉදිරියෙන්ද
පස්සෙන්ද සටන තමාට විරුද්ධව
පැමිණෙන්ට තිබෙන බව යෝවාබ් දැක
සියලු බලවන්ත ඉශ්‍රායෙල්වරුන්ගෙන්
කොටසක් තෝරාගන සිරියවරුන්ට
විරුද්ධව සිටවා, ඉතිරි සෙනඟ අම්මොන් 11
පුත්‍රයන්ට විරුද්ධව සිටින පිණිස
තමාගේ සහෝදරවූ අබිෂයි අතට
භාරදුන්නේය. තවද ඔහු කථාකොට: 12
සිරියවරුන් මට වඩා බලවත්වුණොත්
තුඹ මට උපකාරකරපන්න. අම්මොන්
පුත්‍රයන් තුඹට වඩා බලවත් වුණොත්
මම තුඹට උපකාරකරන්නෙමි.
ධෛර්යවත්ව සිටපන්න, අපේ සෙනඟ 13
උදෙසාත් අපේ දෙවියන්වහන්සේගේ
නුවරවල් උදෙසාත් බලවත්ව ක්‍රියාකරමු.
ස්වාමීන්වහන්සේ තමන්ට යහපත්ව
පෙනෙන ලෙස කරනසේක්වයි කීවේය.
මෙසේ යෝවාබ්ද ඔහු සමග සිටි 14
සෙනඟද සිරියවරුන්ට විරුද්ධව සටනට
ළංවූහ; එවිට ඔව්හු ඔහු ඉදිරියෙන්
පලාගියෝය. සිරියවරුන් පලාගිය බව 15
අම්මොන් පුත්‍රයන් දුටුවිට, ඔව්හුද
ඔහුගේ සහෝදරවූ අබිෂයි ඉදිරියෙන්
පලාගොස් නුවරට ඇතුල්වූහ. එවිට
යෝවාබ් යෙරුසලමට ආයේය. සිරියවරු 16
තමුන් ඉශ්‍රායෙල් ඉදිරිපිට පැරදුණු
බව දැක පණිවිඩකාරයන් යවා *ගංගාවට
එගොඩින් සිටි සිරියවරුන් ගෙන්වා-
ගත්තෝය. හදර්එසෙර්ගේ සේනා-
පතියාවූ ෂෝපාක් ඔවුන්ට පෙරටුව
ආවේය. එපවත් දාවිත්ට දැන්වූ කල ඔහු 17
සියලු ඉශ්‍රායෙල්වරුන් රැස්කරගන
යොර්දනෙන් එගොඩව ඔවුන් ළඟට
ඇවිත්, ඔවුන්ට විරුද්ධව යුද්ධ පිළිවෙළින්
සිටියේය. එසේ දාවිත් සිරියවරුන්ට
විරුද්ධව යුද්ධ පිළිවෙළින් සිටි විට
ඔව්හු ඔහුට විරුද්ධව සටන්කළෝය.
තුමුත් ඉශ්‍රායෙල්වරුන් ඉදිරියෙන් 18
සිරියවරු පලාගියෝය; දාවිත් සිරිය-
වරුන්ගෙන් රථ සත් දහසක මිනිසුන්ද
පාබළ සෙනඟ සතළිස් දහසක්ද
මරාදමා, සේනාපතියාවූ ෂෝපාක්ද

*එනම්—ප්‍රාත් ගංගාවට

19 මැරුවේය. හදර්එසෙර්ගේ සේවකයෝ
තමුන් ඉශ්‍රායෙල් ඉදිරිපිට පැරදුණු බව
දැක දවිත් සමග සමාදානවී ඔහුට
මෙහෙකළෝය. සිරියවරු අම්මොන්
පුත්‍රයන්ට තවත් උපකාරකරන්ට කැමති
නොවූහ.

20 තවද ඊළඟ අවුරුද්දේ රජවරුන්
සටනට පිටත්ව යන කාලය
පැමුණුණු විට, යෝවාබ් යුද්ධ සේනාව
ගෙනගොස් අම්මොන් පුත්‍රයන්ගේ රට
පාළුකොට, රබ්බාට ඇවිත් ඒක වටලා-
ගත්තේය. නුමුත් දවිත් යෙරුසලමෙහි
නැවතී සිටියේය. යෝවාබ් රබ්බාට
2 පහරදී එය නාස්තිකෙළේය. දවිත්
ඔවුන්ගේ රජුගේ ඔටුන්න ඔහුගේ හිසෙන්
ගෙන එය රන් තලෙන්තයක බර ඇති
බව දැනගත්තේය, එහි අනර්ඝ මැණික්ද
තිබුණේය; එය දවිත්ගේ හිස පිට
තබනලද්දේය. ඔහු කොල්ලගත් බඩු
රාශියක් නුවරින් පිටතට ගෙනාවේය.
3 ඔහු එහි සිටි සෙනඟ පිටතට ගෙන්වා
කියත්වලින්ද යකඩ දැතිපෝරුවලින්ද
පොරෝවලින්ද ඔවුන් කැපුවේය. ඔහු
අම්මොන් පුත්‍රයන්ගේ සියලු නුවරවලට
මෙසේ කෙළේය. එවිට දවිත්ද මුළු
සෙනඟද යෙරුසලමට හැරී ආවෝය.

## පිලිස්තියයන් යුද්ධයෙන් පරාජයකිරීම

4 ඉන්පසු පිලිස්තිවරුන් සමග ගෙසෙර්හි
යුද්ධයක් හටගත්තේය. එකල හූෂාතිය
සිබ්බෙකයි තෙමේ යෝධයාගේ
පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්වූ සිප්පයි
මැරුවේය. ඔව්හු යටත්කරනු ලැබුවෝය.
5 නැවතත් පිලිස්තිවරුන් සමග යුද්ධයක්
විය; යායිර්ගේ පුත්‍රවූ එල්හානාන් ගිත්තිය
ගොලියත්ගේ සහෝදරවූ ලහ්මී මැරුවේය.
ඔහුගේ හෙල්ලයේ මිට වියන දණ්ඩකට
6 සමාන විය. නැවතත් ගාත්හි යුද්ධයක්
විය. එහි ඉතා උස මහත ඇති මනුෂ්‍යයෙක්
සිටියේය, ඔහුට අත්පා ඇඟිලි හය හය
බැගින් ඇඟිලි විසිහතරක් තිබුණේය;
7 ඔහුද යෝධයාට දව උපන්නේය. ඔහු
ඉශ්‍රායෙල්වරුන්ට මිගකී කල දවිත්ගේ
සහෝදරයා වන ෂිමියාගේ පුත්‍රවූ
යොනාතාන් ඔහු මැරුවේය. මොව්හු 8
ගාත්හිදී යෝධයාට දව උපන් අයය;
ඔව්හු දවිත් අතින්ද ඔහුගේ සේවකයන්
අතින්ද පැරදී වැටුණෝය.

## දවිත් රජු සෙනඟ ගණන්කරවීම සහ ඊට දඬුවම

21 සාතන් ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
නැගිට ඔවුන් ගණන්කරන්ට දවිත්
පෙළඹෙවුවේය. දවිත් යෝවාබ්ටත් 2
සෙනඟගේ අධිපතීන්ටත් කථාකොට: මා
විසින් සෙනඟගේ ගණන දැනගන්නා
පිණිස නුඹලා ගොස් බෙයෙර්-ෂෙබා
පටන් දාන් දක්වා ඔවුන් ගණන්කර
ඔවුන්ගේ ගණන මා ළඟට ගෙනෙල්ලා-
යයි කීවේය. යෝවාබ් කථාකොට: දැන් 3
සිටින පමණට වඩා **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ සෙනඟ සියක් ගුණයක් වැඩි-
කරනසේක්වා. එහෙත්, මාගේ ස්වාමිවූ
රජ්ජුරුවෙනි, ඔවුන් සියල්ලෝම මාගේ
ස්වාමියාගේ සේවකයෝ නොවෙද්ද?
මාගේ ස්වාමියා මේක අණකර
ඉශ්‍රායෙල්වරුන් පිටට වරද පමුණුවන්නේ
මක්නිසාදැයි කීය. එහෙත් යෝවාබ්ගේ 4
වචනය නොව රජුගේ වචනය ස්ථිරවිය.
ඒ නිසා යෝවාබ් පිටත්වී මුළු ඉශ්‍රායෙල්
දේශයෙහි ඇවිද, යෙරුසලමට ඇවිත්, 5
ගණන්ගත් සෙනඟගේ මුළු ගණන දවිත්ට
දුන්නේය. කඩුව පාවිච්චිකරන ඉශ්‍රායෙල්
මනුෂ්‍යයන් සියල්ලෝ එකොළොස්
ලක්ෂයක්ය. කඩුව පාවිච්චිකරන යූද
මනුෂ්‍යයෝ හාරලක්ෂ සැත්තෑ දහසක්ය.
නුමුත් රජුගේ වචනය යෝවාබ්ට පිළි- 6
කුල්ව තිබුණු නිසා ඔහු ලෙවීවරුන්ද
බෙන්යමින්වරුන්ද ඔවුන් අතරේ
ගණන්කළේ නැත. දෙවියන්වහන්සේ මේ 7
කාරණයට අප්‍රසන්නවී ඉශ්‍රායෙල්ට
පහරදුන්සේක. දවිත් දෙවියන්වහන්සේට 8
කථාකොට: මම මේ දේ කිරීමෙන්
බොහෝකොට පව්කෙළෙමි. එහෙත්
දැන් ඔබගේ මෙහෙකරුවාගේ අපරාධය

පහකළ මැනව; මක්නිසාද මම බොහෝ
අනුවණ ලෙස ක්‍රියාකෙළෙම්යි කීවේය.
9 ස්වාමීන්වහන්සේ දවිත්ගේ දර්ශනකාරයාවූ
10 ගාද්ට කථාකොට: නුඹ ගොස්–මම
කාරණා තුනක් නුඹ ඉදිරියේ තබමි; මා
විසින් නුඹට කරන පිණිස එයින් එකක්
තෝරාගනින්නැයි ස්වාමීන්වහන්සේ
වදරනසේක කියා දවිත්ට කියාපන්නැයි
11 කීසේක. ගාද් දවිත් ළඟට ඇවිත් ඔහුට
12 කථාකොට: තුන් අවුරුදු සාගතයක්
හෝ තුන් මාසයක් නුඹේ එදිරිකාරයන්ගේ
කඩුවට නුඹ අසුවී නුඹේ සතුරන් අතින්
විනාශවීම හෝ තුන් දවසක් ස්වාමීන්-
වහන්සේගේ කඩුව වන වසංගතය
දේශයට පැමිණ ස්වාමීන්වහන්සේගේ
දූතයා විසින් ඉශ්‍රායෙල් පළාත් මුළුල්ලෙහි
විනාශකිරීම හෝ තෝරාගනින්නැයි
ස්වාමීන්වහන්සේ කියනසේක. ඒ නිසා
මා එවූ තැනන්වහන්සේට මා විසින්
මොන උත්තරයක් දෙන්ටද කියා
13 කල්පනාකරපන්නැයි කීවේය. දවිත්ද: මම
මහත් අමාරුවකට පැමිණ සිටිමි. ඉතින්
ස්වාමීන්වහන්සේ අතට අසුවන්නෙමි;
මක්නිසාද උන්වහන්සේගේ අනුකම්පාව
ඉතා මහත්ය. මනුෂ්‍යයාගේ අතට අසුවන්ට
මට සිද්ධනොවේවයි ගාද්ට කීවේය.
14 එබැවින් ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්-
වරුන් අතරට වසංගතයක් එවූසේක.
එයින් ඉශ්‍රායෙල්වරුන්ගෙන් සැත්තෑ
15 දහසක් මනුෂ්‍යයෝ මළෝය. දෙවියන්-
වහන්සේ යෙරුසලම විනාශකරන්ට
දූතයෙකු යැවූසේක. ඔහු ඒක විනාශ-
කරන්ට යන විට ස්වාමීන්වහන්සේ බලා
ඒ විපත ගැන තැවී, විනාශකාර දූතයාට
කථාකොට: ඉතින් ඇත; නුඹේ අත
නවතාගනින්නැයි කීසේක. ස්වාමීන්-
වහන්සේගේ දූතයා යෙබූසිය ඔර්ණාන්ගේ
16 කමත ළඟ සිටියේය. දවිත් තමාගේ
ඇස් ඔසවා ස්වාමීන්වහන්සේගේ දූතයා
තමාගේ කඩුව ඇද යෙරුසලම කෙරෙහි
දිගුකරගන පොළොවටත් අහසටත්
අතරේ සිටිනවා දුටුවේය. එවිට ගෝණි
රෙදි ඇඳගන සිටි දවිත්ද වැඩිමහල්ලෝද
මුහුණින් වැටුණෝය. දවිත් දෙවියන්- 17
වහන්සේට කථාකොට: සෙනඟ ගණන්-
කරන්ට අණකළ තැනැත්තා මම
නොවෙම්ද? පව්කොට ඉතා දුෂ්ට ලෙස
ක්‍රියාකළේ මමය; නුමුත් මේ බැටළුවෝ
මක්කළෝද? අනේ මාගේ දෙවිවූ
ස්වාමීන්වහන්ස, පහරදීම පිණිස ඔබගේ
අත ඔබගේ සෙනඟ පිටට නොව මා
පිටටත් මාගේ පිය වංශය පිටටත්
පැමිණේවයි කීවේය. එවිට ස්වාමීන්- 18
වහන්සේගේ දූතයා ගාද්ට කථාකොට:
යෙබූසිය ඔර්ණාන්ගේ කමතේ ස්වාමීන්-
වහන්සේට පූජාසනයක් ගොඩනගන
පිණිස නැගී යන ලෙස දවිත්ට කියන්ට
අණකෙළේය. දවිත් ස්වාමීන්වහන්සේගේ 19
නාමයෙන් ගාද් කී වචනය ලෙස නැගී
ගියේය. තිරිඟු මඩිමින් සිටි ඔර්ණාන් 20
පස්සට හැරී දූතයා දුටීය; ඔහු සමග
සිටි ඔහුගේ පුත්‍රයන් සතරදෙනා
සැඟවුණෝය. දවිත් ඔර්ණාන් ළඟට 21
ගියේය. ඔර්ණාන් බලා දවිත් දැක,
කමතෙන් පිටතට ඇවිත් මුහුණින් බිම
වැටී, දවිත්ට වැන්දේය. එවිට දවිත්: 22
සෙනඟ අතරෙන් වසංගතය පහවන
පිණිස ස්වාමීන්වහන්සේට පූජාසනයක්
ගොඩනැගීමට කමතේ ඉඩම මට
දියන්න; සම්පූර්ණ මිල ගණනට ඒක
මට දෙන්ට ඕනෑයයි ඔර්ණාන්ට
කීවේය. ඔර්ණාන්ද: මාගේ ස්වාමිවූ 23
රජ්ජුරුවෝ ඒක පිළිගෙන තමන්ට
හොඳව පෙනෙන දේ කෙරෙත්වා. මෙන්න,
දවන පූජාවලට ගවයන්ද දර සඳහා
මඩින උපකරණද ආහාර පූජාවට
තිරිඟුද දෙමි; ඒ සියල්ලම දෙමියි දවිත්ට
කීවේය. දවිත් රජද: එසේ නොවේ; 24
සම්පූර්ණ මිල ගණනට ඒක නුඹෙන්
ගන්නෙමි. මක්නිසාද නුඹට අයිති දේ
මම ස්වාමීන්වහන්සේ උදෙසා නො-
ගන්නෙමි, වියදමක් නැතුව දවන පූජා
නොපුදන්නෙමියි ඔර්ණාන්ට කීවේය.
මෙසේ දවිත් ඒ ඉඩමට ෂෙකෙල් 25
හයියයක බර රන් ඔර්ණාන්ට දුන්නේය.
එහි දවිත් ස්වාමීන්වහන්සේට පූජාසනයක් 26

ගොඩනගා, දවන පූජාද ශාන්ති පූජාද
ඔප්පුකොට, **ස්වාමීන්වහන්සේට** යාච්ඤා-
කෙළේය; උන්වහන්සේද දවන පූජාසනය
පිටට අහසෙන් ගිනි එවා ඔහුට
27 උත්තරදුන්සේක. තවද **ස්වාමීන්වහන්සේ**
දේවදූතයාට අණකළ විට ඔහු තමාගේ
කඩුව නැවත කොපුවේ දමාගත්තේය.
28 ඒ කාලයෙහි **ස්වාමීන්වහන්සේ**
යෙබූසිය ඔර්ණාන්ගේ කමතේදී තමාට
උත්තරදුන් බව දවිත් දැක එහිදී පූජා
29 ඔප්පුකෙළේය. මක්නිසාද මෝසෙස්
කාන්තාරයේදී සෑදූ **ස්වාමීන්වහන්සේගේ**
මණ්ඩපයත් දවන පූජාසනයත් ඒ
කාලයෙහි ගිබියොන්හි උස්තැන
30 තිබුණේය. එහෙත් **ස්වාමීන්වහන්සේගේ**
දූතයාගේ කඩුවට භයවූ නිසා දෙවියන්-
වහන්සේගෙන් විචාරන පිණිස ඒක
ඉදිරියට යන්ට දවිත්ට නොහැකි විය.
1 **22** එවිට දවිත් කථාකොට: දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය මේය,
ඉශ්‍රායෙල්ගේ දවන පූජා ඔප්පුකරන
පූජාසනයද මේයයි කීවේය.

## දේවමාලිගාව සෑදීමට දවිත්ගේ සූදනම

2 තවද දවිත් ඉශ්‍රායෙල් දේශයෙහි සිටි
සියලු විදේශීන් රැස්කරන්ට අණකොට,
දෙවියන්වහන්සේගේ ගෘහය ගොඩනගන
පිණිස හතරැස් ගල් කපන්ට ගල්
3 වඩුවන් පත්කෙළේය. දොරටුවල දොර
ඇණ පිණිසත් සන්ධි පිණිසත් දවිත්
යකඩ බොහෝමයක් සූදනම්කෙළේය;
ගණන් නැති බොහෝ පිත්තලත් ගණන්
නැති කිහිරි ලීත් සූදනම්කළේය.
4 මක්නිසාද ශීදොන්වරුද තීර්වරුද කිහිරි
ලී බොහෝසෙයින්ම දවිත් ළඟට
5 ගෙනාවෝය. දවිත් කථාකොට: මාගේ
පුත්‍රවූ සාලමොන් ළාබාලය, **ස්වාමීන්-
වහන්සේට** ගොඩනගන්ට තිබෙන
ගෘහයේ කීර්තියද තේජසද සියලු
රටවලට පතළවී යන හැටියට එය
අතිශයින් අලංකාරව තිබෙන්ට ඕනෑය.
එබැවින් මම ඒ පිණිස සූදනම්කරන්-
නෙමියි කීවේය. මෙසේ දවිත් තමාගේ
මරණයට පළමුවෙන් බොහෝ දේ
සූදනම්කෙළේය.

එවිට ඔහු තමාගේ පුත්‍රවූ සාලමොන් 6
කැඳවා ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** ගෘහයක් ගොඩනගන්ට ඔහුට
අණකෙළේය. දවිත් තමාගේ පුත්‍රවූ සාල- 7
මොන්ට කථාකොට: මාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** නාමයට ගෘහයක්
ගොඩනගන්ට මාගේ සිතේ තිබුණේය.
එහෙත් **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 8
වෙතට පැමිණ: නුඹ බොහෝසේ ලේ
වැගිරීමත් මහත් යුද්ධත් කෙළෙහිය. එසේ
නුඹ මා ඉදිරියෙහි බොහෝ ලේ බිම
වැගිරෙවූ නිසා මාගේ නාමයට ගෘහයක්
ගොඩනොනගන්නෙහිය. නුමුත් නුඹට 9
උපදින පුත්‍රයෙක් ශාන්තදාන්ත මනුෂ්‍යයෙක්
වන්නේය; හාත්පසින්ම ඔහුගේ සියලු
සතුරන්ගෙන් ඔහුට නිදහස දෙන්නෙමි.
එසේය, ඔහුගේ නාමය *සාලමොන්
වන්නේය, ඔහුගේ දවස්වලදී ඉශ්‍රායෙල්ට
සමාදනයද නිශ්චලතාවද දෙන්නෙමි.
ඔහුම මාගේ නාමයට ගෘහයක් ගොඩ- 10
නගනවා ඇත; ඔහු මට පුත්‍රයෙක් වන්නේය,
මම ඔහුට පියෙක් වන්නෙමි; ඔහුගේ
රාජ්‍යයේ සිංහාසනය ඉශ්‍රායෙල්වරුන්
කෙරෙහි සදාකාලයටම ස්ථිරකරන්-
නෙමියි කීසේක. ඉතින් මාගේ පුත්‍රය, 11
නුඹ සඵලවී, නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** නුඹ ගැන කී ලෙස උන්-
වහන්සේගේ ගෘහය ගොඩනගන පිණිස
උන්වහන්සේ නුඹ සමග වනසේක්වා.
එසේය, නුඹ නුඹේ දෙවිවූ **ස්වාමීන්- 12
වහන්සේගේ** ව්‍යවස්ථාව රක්ෂාකරන
පිණිස නුඹට නුවණත් බුද්ධියත් දී,
ඉශ්‍රායෙල් ගැන භාරයක් නුඹට දෙන-
සේක්වා. **ස්වාමීන්වහන්සේ** මෝසෙස් 13
ලවා ඉශ්‍රායෙල්ට අණකෙරෙවූ පනත්
හා විනිශ්චයයත් පවත්වන්ට බලා-
ගත්තොත් නුඹ සඵල වන්නෙහිය. ශක්ති-
මත්ව සවිව සිටපන්න; භයනොවන්න,
තැතිනොගනින්න. මෙන්න, මාගේ විපතේදී 14
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට රන්
තලෙන්ත ලක්ෂයකුත් රිදී තලෙන්ත දශ

*එනම්, ශාන්තවත්.

ලක්ෂයකුත් ගණන් නැති තරම් පිත්තලත්
යකඩත් සූදනම්කෙළෙමි; ඒවා අතිශයින්
බොහෝය. ඒ ඇර ලීද ගල්ද සූදනම්-
කෙළෙමි; ඒවාට තව එකතුකරන්ට නුඹට
15 පුළුවන. තවද කර්මාන්තකාරයෝ වන
ගල්වඩුවෝද ගල් හා ලී වැඩ කරන්නෝද
සියලු ආකාර වැඩවලට සියලු ආකාර
ප්‍රඥාවන්තයෝද බොහෝ දෙනෙක්ම
16 නුඹට සිටිති; ගණන් නැති තරම් රන්ද
රිදීද පිත්තලද යකඩද තිබේ; නැගිට
වැඩ පටන්ගනින්න, ස්වාමීන්වහන්සේ
17 නුඹ සමග වනසේක්වයි කීය. තවද
දාවිත් තමාගේ පුත්‍රවූ සාලමොන්ට
උපකාරකරන පිණිස ඉශ්‍රායෙල්හි සියලු
18 අධිපතීන්ට අණකරමින්: නුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹලා සමග
සිටිනවා නොවේද? හැම අතින්ම
උන්වහන්සේ නුඹලාට නිශ්චලකම දී
තිබෙනවා නොවේද? මක්නිසාද උන්-
වහන්සේ දේශයේ වැසියන් මා අතට
පාවාදී තිබේ; දේශය ස්වාමීන්වහන්සේටද
උන්වහන්සේගේ සෙනඟටද යටත්-
19 කරනලද්දේය. ඉතින් නුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ සොයන්ට නුඹලාගේ
සිතත් ආත්මයත් යොමුකරපල්ලා;
ස්වාමීන්වහන්සේගේ නාමයට ගොඩ-
නගන්ට තිබෙන ගෘහය තුළට ස්වාමීන්-
වහන්සේගේ ගිවිසුම් පෙට්ටියද දෙවියන්-
වහන්සේගේ ශුද්ධ භාණ්ඩද ගෙනයන
පිණිස නැගිට දෙවිවූ ස්වාමීන්වහන්සේ-
ගේ ශුද්ධස්ථානය ගොඩනගාපල්ලායයි
කීවේය.

## සාලමොන් රජකොට පත්කරනු ලැබීම. ලෙවීවරුන්ගේ මෙහෙය

23 දාවිත් මහලුව වයසින් පූර්ණවූ විට
තමාගේ පුත්‍රවූ සාලමොන්
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජකොට
2 පත්කෙළේය. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ
සියලු අධිපතීන්ද පූජකයන්ද ලෙවීවරුන්ද
3 රැස්කෙළේය. ලෙවීවරුන්ගෙන් ගණන්-
ගන්නාලද්දේ තිස් අවුරුද්ද පටන් ඉන්
ඉහළට වයස් ඇති අයය. එසේ එක්-
කෙනෙක් එක්කෙනෙක් පාසා ගණන්-
ගන්නාලද පුරුෂයන්ගේ ගණන තිස්අට
දහසක් විය. මොවුන්ගෙන් විසිහතර 4
දහසක් ස්වාමීන්වහන්සේගේ ගෘහයේ
වැඩ බලාගැනීමට සිටියෝය; හදහසක්
මුලාදෑනියෝව විනිශ්චයකාරයෝව
සිටියෝය. හාරදහසක් දොරටුපාලයෝය; 5
හාරදහසක් වනාහි: ප්‍රශංසාකිරීමට මම
සෑදූවෙමියි දාවිත් කී තූර්යභාණ්ඩවලින්
ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකරන්නෝව
සිටියෝය. දාවිත් ගේර්ෂොන්ද කොහාත්ද 6
මෙරාරීද යන ලෙවීගේ පුත්‍රයන් වංශවල
හැටියට පන්තිවලට බෙදුවේය. ගේර්- 7
ෂොන්වරුන්ගෙන් ලාදන් සහ ෂිමෙයිය.
ලාදන්ගේ පුත්‍රයෝ නම්: ප්‍රධානියාවූ 8
යෙහීයෙල්ද සේතාම්ද යෝවෙල්ද යන
තුන්දෙනාය. ෂිමෙයිගේ පුත්‍රයෝ නම්: 9
ෂෙලොමොත්ද හසීයෙල්ද හාරාන්ද යන
තුන්දෙනාය. මොව්හු ලාදන්ගේ පිය
පෙළපත්වල ප්‍රධානියෝය. ෂිමෙයිගේ 10
පුත්‍රයෝ නම්: යාහත්, ශීනා, යෙයූෂ්
සහ බෙරීයාය. මේ හතරදෙන ෂිමෙයිගේ
පුත්‍රයෝය. යාහත් ප්‍රධානියාය, ශීශා 11
දෙවෙනියාය. නුමුත් යෙයූෂ්ටත්
බෙරීයාටත් බොහෝ පුත්‍රයෝ නුවූහ;
එබැවින් ඔව්හු එක පිය පෙළපතක්
කොට ගණන්ගනු ලැබුවෝය. කො- 12
හාත්ගේ පුත්‍රයෝ නම්: අම්රාම්ද ඉශ්හාර්ද
හෙබ්‍රොන්ද උස්සීයෙල්ද යන සතර
දෙනාය. අම්රාම්ගේ පුත්‍රයෝ නම්: 13
ආරොන් සහ මෝසෙස්ය. ආරොන්ද
ඔහුගේ පුත්‍රයෝද ඉතා ශුද්ධ දේ
කැපකරන පිණිසත් ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පුකරන පිණිසත්
උන්වහන්සේට සේවය කරන පිණිසත්
සෑම කල්හිම උන්වහන්සේගේ නාමයෙන්
ආශීර්වාදකරන පිණිසත් හැම කලටම
වෙන්කරනු ලැබුවෝය. නුමුත් දෙවියන්- 14
වහන්සේගේ මනුෂ්‍යයාවූ මෝසෙස්ගේ
පුත්‍රයෝ ලෙවී ගෝත්‍රයට අයිති-
යයි ගණන්ගන්නාලද්දෝය. මෝසෙස්- 15
ගේ පුත්‍රයෝ නම්: ගේර්ෂොම් සහ

16 එලියෙසෙර්ය. ගේර්ෂෝම්ගේ පුත්‍රයෝ
17 නම්: ප්‍රධානියාවූ ෂෙබුයෙල්ය. එලියෙසෙර්ගේ
පුත්‍රයෝ: ප්‍රධානියාවූ රෙහෙබියාය.
එලියෙසෙර්ට වෙන පුත්‍රයෝ නුවූහ; නුමුත්
රෙහෙබියාට පුත්‍රයෝ බොහෝදෙනෙක්
18 සිටියෝය. ඉශ්හාර්ගේ පුත්‍රයෝ:
19 ප්‍රධානියාවූ ෂෙලොමිත්ය. හෙබ්‍රොන්ගේ
පුත්‍රයෝ: ප්‍රධානියාවූ යෙරියාය,
දෙවෙනියාවූ අමරියාය, තුන්වෙනියාවූ
යහසීයෙල්ය, හතරවෙනියාවූ යෙක-
20 මෙයාම්ය. උස්සීයෙල්ගේ පුත්‍රයෝ:
ප්‍රධානියාවූ මීකාය, දෙවෙනියාවූ
21 ඉෂ්ෂියාය. මෙරාරීගේ පුත්‍රයෝ: මාලී
සහ මූෂීය. මාලීගේ පුත්‍රයෝ: එලෙයාසර්
22 සහ කීෂ්ය. එලෙයාසර් මෙළේය, ඔහුට
දූවරුන් මිස පුත්‍රයෝ නොසිටියෝය. ඒ
තැනැත්තියන්ගේ සහෝදරයෝවූ කීෂ්ගේ
23 පුත්‍රයෝ ඔවුන් පාවාගත්තෝය. මූෂීගේ
පුත්‍රයෝ: මාලීද එදෙර්ද යෙරේමොත්ද
24 යන තුන්දෙනාය. ඔව්හු තමුන්ගේ පිය
පෙළපත්වල හැටියට, පිය පෙළපත්වල
ප්‍රධානියෝ වන විසි අවුරුදු වයසේ
පටන් ඉන් ඉහළට එක්කෙනෙක්
එක්කෙනෙක් පාසා නම් වශයෙන්
ගණන්කරනලද්දවූ, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහ සේවයේ වැඩේ කළාවූ ලෙවීගේ
25 පුත්‍රයෝය. මක්නිසාද: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
සෙනඟට නිශ්චලකම දී තිබේයයි කියාද
උන්වහන්සේ යෙරුසලමෙහි සැමකල්හිම
26 වාසයකරනසේකැයි කියාද මණ්ඩපය
සහ එහි සේවයට අයිති සියලු බඩුත්
ලෙවීවරුන්ට තවත් ගෙනයන්ට වෙන්නේ
27 නැත කියාද දාවිත් කීවේය. දාවිත්ගේ
අන්තිම වචනවල හැටියට විසි අවුරුද්ද
පටන් ඉන් ඉහළට වයස් ඇති පුත්‍රයෝ
28 ගණන්ගන්නාලද්දෝය. මක්නිසාද
ඔවුන්ගේ තනතුර නම් **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ සේවය සම්-
බන්ධයෙන් ආරොන්ගේ පුත්‍රයන්ට
උපකාර කිරීමය. එනම්: මිදුල්ද ඇතුල්
ගෙවල්ද සියලු ශුද්ධ දේවල් පවිත්‍ර-
කිරීමද දෙවියන්වහන්සේගේ ගෘහයේ
29 සේවයේ වැඩද පිදීමේ රොටිද ආහාර
පූජාවටත් මුහුන් නැති රොටිවලටත්
ඇතිලියටත් පොහවන ඒවාටත් මිනැ-
කරන සිහින් පිටිද සියලු ආකාර මිම්ද
මැනීම්ද බලාගැනීමත්, සියලු දවස්වල 30
උදේ සවස **ස්වාමීන්වහන්සේට** ස්තුති
ප්‍රශංසාකිරීමට සිටීමත්, සබත් දවස්- 31
වලදීද අමාවක දවස්වලදීද මංගල්‍ය-
වලදීද ගණනින් නියම ප්‍රකාරයට නිතරම
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි සියලු දවන
පූජා ඔප්පුකිරීමත්, සම්මුඛවීමේ කූඩා- 32
රමේ භාරයද ශුද්ධස්ථානයේ භාරයද
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ සේවය
සම්බන්ධයෙන් තමුන්ගේ සහෝදරයන්වූ
ආරොන්ගේ පුත්‍රයන්ගේ භාරයද බලා-
ගැනීමත්ය.

## පූජක පන්ති නියමකිරීම

24
ආරොන් පුත්‍රයන්ගේ පන්ති මේය.
ආරොන්ගේ පුත්‍රයෝ නම්: නාදබ්,
අබීහු, එලෙයාසර් සහ ඊතාමාර්ය. නාදබ් 2
සහ අබීහු තමුන්ගේ පියාට පළමුවෙන්
මැරුණෝය, ඔවුන්ට පුත්‍රයෝ නො-
සිටියෝය. ඒ නිසා එලෙයාසර් සහ
ඊතාමාර් පූජක තනතුරේ වැඩ කළෝය.
තවද දාවිත් එලෙයාසර්ගේ පුත්‍රයන්ගෙන් 3
ශාදෙක්ද ඊතාමාර් පුත්‍රයන්ගෙන්
අහිමෙලෙක්ද සමග ඔවුන්ගේ මෙහෙයේ
නියමයේ ප්‍රකාරයට ඔවුන් බෙදුවේය.
ඊතාමාර්ගේ පුත්‍රයන් අතරේ සිටි ප්‍රධාන 4
මනුෂ්‍යයන්ගේ ගණනට වඩා එලෙයාසර්
පුත්‍රයන් අතරේ සිටියෝය; මෙලෙස
ඔව්හු බෙදනු ලැබුවෝය. එලෙයාසර්
පුත්‍රයන්ට පිය වංශවල ප්‍රධානීන් දහසය
දෙනෙක්ද ඊතාමාර් පුත්‍රයන්ට ඔවුන්ගේ
පිය වංශවල ප්‍රධානීන් අට දෙනෙක්ද
සිටියෝය. දෙගොල්ල ගැනම එකට 5
පසඇට දමා බෙදුවෝය; මක්නිසාද
ශුද්ධස්ථානයේ අධිපතියොත් දෙවියන්-
වහන්සේගේ අධිපතියොත් එලෙයාසර්
පුත්‍රයන් අතරේ සහ ඊතාමාර් පුත්‍රයන්
අතරේත් වූහ. ලෙවීයයෙක්වූ නෙත- 6
නේල්ගේ පුත්‍රවූ ෂෙමායා නම් ලේකම
රජුද අධිපතීන්ද ශාදෙක් පූජකයාද

අබියාතර්ගේ පුත්‍රවූ අහීමෙලෙක්ද
පූජකයන්ගේ සහ ලෙවීවරුන්ගේ පිය
වංශවල ප්‍රධානීන්ද ඉදිරියෙහි ඔවුන්ගේ
නාම ලියුවේය. එලෙයාසර්ට එක පිය
වංශයක්ද ඊතාමාර්ට එක පිය වංශයක්ද
7 බැගින් ගන්නාලද්දේය. පළමුවෙනි
පසඇටය වැටුණේ යෙහෝයාරීබ්ටය,
8 දෙවෙනි එක යෙදයාටය; තුන්වෙනි එක
හාරිම්ටය, හතරවෙනි එක සෙයො-
9 රිම්ටය; පස්වෙනි එක මල්කියාටය,
10 හවෙනි එක මියාමින්ටය; හත්වෙනි එක
හක්කොශ්ටය, අටවෙනි එක අබියාටය;
11 නවවෙනි එක යේෂුවාටය, දසවෙනි එක
12 ෂෙකනියාටය; එකොළොස්වෙනි එක
එලියාෂිබ්ටය, දොළොස්වෙනි එක
13 යාකීම්ටය; දහතුන්වෙනි එක හුප්පාටය,
දහසතරවෙනි එක යෙෂෙබෙයාබ්ටය;
14 පහළොස්වෙනි එක බිල්ගාටය, දහස-
15 වෙනි එක ඉම්මෙර්ටය; දහහත්වෙනි
එක හෙසීර්ටය, දහඅටවෙනි එක
16 හප්පිශ්ශෙශ්ටය; දහනවවෙනි එක
පෙතහියාටය, විසිවෙනි එක යෙහෙස්-
17 කෙල්ටය; විසිඑක්වෙනි එක යාකීන්ටය,
18 විසිදෙවෙනි එක ගාමූල්ටය; විසි-
තුන්වෙනි එක දෙලායාටය, විසි-
19 හතරවෙනි එක මයසියාටය. ඉශ්‍රා-
යෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ඔවුන්ගේ පියවූ ආරොන්ට අණකළ
ප්‍රකාරයට ඔහු ලවා කෙරෙවූ නියෝගය
ලෙස **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ඇතුල්වීමට ඔවුන්ගේ මෙහෙයේ පිළිවෙළ
මේය.

## ලෙවීවරුන්ගේ පවුල්

20 ලෙවීගේ අනික් පුත්‍රයෝ නම්:
අම්රාම්ගේ පුත්‍රයන්ගෙන් ෂූබායෙල්ය;
ෂූබායෙල්ගේ පුත්‍රයන්ගෙන් යෙදෙයාය.
21 රෙහබියාගෙන් එනම් රෙහබියාගේ
පුත්‍රයන්ගෙන් ප්‍රධානියාවූ ඉෂ්ෂියාය.
22 ඉශ්හාරිවරුන්ගෙන් ෂෙලොමොත්ය;
ෂෙලොමොත්ගේ පුත්‍රයන්ගෙන් යාහත්ය.
23 හෙබ්‍රොන්ගේ පුත්‍රයෝ: ප්‍රධානියාවූ
යෙරියාය, දෙවෙනියාවූ අමරියාය,
තුන්වෙනියාවූ යහසීයෙල්ය, සතර-
වෙනියාවූ යෙකමෙයාම්ය. උස්සීයෙල්ගේ 24
පුත්‍රයන්ගෙන් මීකාය; මීකාගේ පුත්‍රයන්-
ගෙන් ෂාමීර්ය. මීකාගේ සහෝදරයාවූ 25
ඉෂ්ෂියාය. ඉෂ්ෂියාගේ පුත්‍රයන්ගෙන්
ශෙකරියාය. මෙරාරීගේ පුත්‍රයෝ: මාලී 26
සහ මූෂීය. යාසියාගේ පුත්‍රයෝ:
බෙනෝය. මෙරාරීගේ පුත්‍රයෝ: තමාගේ 27
පුත්‍රවූ යාසියා නිසා උපන් බෙනෝ,
ෂොහම්, සක්කූර් සහ ඉබ්රීය. මාලී 28
නිසා උපන් එලෙයාසර්ය, ඔහුට පුත්‍රයෝ
නුවූහ. කීෂ්ගෙන් එනම් කීෂ්ගේ 29
පුත්‍රයන්ගෙන් වූ යෙරාමෙයෙල්ය. මූෂීගේ 30
පුත්‍රයෝ: මාලී, ඒදෙර් සහ යෙරීමොත්ය.
ඔව්හු තමුන්ගේ පිය වංශ ප්‍රකාරයට
ලෙවීගේ පුත්‍රයෝය. ඔව්හුද තමුන්ගේ 31
සහෝදරයන් වන ආරොන්ගේ පුත්‍රයන්
මෙන්ම දාවිත් රජුද ශාදොක්ද අහි-
මෙලෙක්ද පූජකයන්ගේ සහ ලෙවී-
වරුන්ගේ පිය වංශවල ප්‍රධානීන්ද
ඉදිරියෙහි පසඇට දැමුවෝය; පිය වංශවල
ප්‍රධානියා තමාගේ බාල සහෝදරයා
මෙන්ම පසඇට දැමුවේය.

## ගායනාකාරයෝ

25 තවද දාවිත්ද සේනාවේ අධිපති-
යෝද ආසාප්ගෙත් හේමාන්ගෙත්
යෙදූතූන්ගෙත් පුත්‍රයන්ගෙන් වීණා
හා කුඩා වීණාවලින්ද අත්තල්වලින්ද
ගායනාකරන තැනැත්තන් සේවයට
වෙන්කළෝය. තමුන්ගේ සේවයේ වැඩය
කළාවූ ඒ මනුෂ්‍යයන්ගේ ගණන මෙසේය:
ආසාප්ගේ පුත්‍රයන්ගෙන් සක්කූර්ද 2
යෝසෙප්ද නෙතනියාද අෂරේලාද යන
ආසාප්ගේ පුත්‍රයෝය; මොව්හු රජුගේ
අණ ලෙස ධර්මවාක්‍ය ගායනා-
කළාවූ ආසාප් යටතේ සිටියෝය.
යෙදූතූන්ගේ පුත්‍රයෝ වූ ගෙදලියාද ශෙරීද 3
යෙෂායාද හෂබියාද මත්තිතියාද යන
*හදෙනාය. මොව්හු **ස්වාමීන්වහන්සේට**
ස්තුති ප්‍රශංසාකිරීමට මහ වීණාවෙන්

*මේ ගණන 17 වෙනි පදේ සඳහන් ෂිමෙයි ඇතුළුවය.

ගායනාකළ තමුන්ගේ පියවූ යෙදූතූන්
4 යටතේ සිටියෝය. හේමාන්ගේ පුත්‍රයෝවූ
බුක්කියා, මත්තනියා, උස්සීයෙල්,
ෂෙබූයෙල්, යෙරීමොත්, හනනියා, හනානි,
එලියාතා, ගිද්දල්තී, රොමම්තී-එසෙර්,
යොෂ්බෙකාෂා, මල්ලෝතී, හෝතීර් සහ
5 මහසියොත්ය. ඔවුන් සියල්ලෝ දෙවියන්-
වහන්සේගේ කාරණා ගැන රජුගේ
දර්ශනකාරයාව සිටියාවූ, හොරණෑවෙන්
නාදකළාවූ හේමාන්ගේ පුත්‍රයෝය.
දෙවියන්වහන්සේ හේමාන්ට පුත්‍රයන්
දහහතරදෙනෙකුත් දූවරුන් තුන්දෙනෙකුත්
6 දුන්සේක. මේ සියල්ලෝ දෙවියන්-
වහන්සේගේ ගෘහයේ සේවය පිණිස
අත්තල්වලින්ද කුඩා වීණාවලින්ද මහ
වීණාවලින්ද ස්වාමීන්වහන්සේගේ ගෘහ-
යෙහි ගායනාකිරීමට තමුන්ගේ පියා
යටතේ සිටියෝය; ආසාප්ද යෙදූතූන්ද
හේමාන්ද රජු යටතේ සිටියෝය.
7 ස්වාමීන්වහන්සේට ගීතිකාකිරීම ගැන
ඉගෙනගෙන දනගැන්ම ඇතුව සිටි
ඔවුන්ගේ සියලු සහෝදරයන් ඇතුළුව
ඔවුන්ගේ ගණන වනාහි දෙසිය අසූ
8 අට දෙනෙක්ය. ඔව්හු ලොකු අය මෙන්
කුඩා අයද ගෝලයා මෙන් ගුරුවරයාද
තමුන්ගේ මෙහෙය ගැන පසඇට
9 දැමුවෝය. පළමුවෙනි කොටස වැටුණේ
ආසාප්ට අයිති යෝසෙප්ටය. දෙවෙනි
එක ගෙදලියාද ඔහුද ඔහුගේ
සහෝදරයන්ද පුත්‍රයන්ද යන දෙළොස්
10 දෙනෙකුටය. තුන්වෙනි එක සක්කූර්ද
ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද යන
11 දෙළොස් දෙනෙකුටය. හතරවෙනි එක
ඉශ්රීද ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද
12 යන දෙළොස් දෙනෙකුටය. පස්වෙනි
එක නෙතනියාද ඔහුගේ පුත්‍රයන්ද
සහෝදරයන්ද යන දෙළොස්දෙනෙකුටය.
13 හවෙනි එක බුක්කියාද ඔහුගේ පුත්‍රයන්ද
සහෝදරයන්ද යන දෙළොස් දෙනෙකුටය.
14 හත්වෙනි එක යෙෂරේලාද ඔහුගේ
පුත්‍රයන්ද සහෝදරයන්ද යන දෙළොස්
දෙනෙකුටය. අටවෙනි එක යෙෂායාද 15
ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද යන
දෙළොස්දෙනෙකුටය. නවවෙනි එක 16
මත්තනියාද ඔහුගේ පුත්‍රයන්ද සහෝ-
දරයන්ද යන දෙළොස්දෙනෙකුටය.
දහවෙනි එක ෂිමෙයිද ඔහුගේ පුත්‍රයන්ද 17
සහෝදරයන්ද යන දෙළොස්දෙනෙකුටය.
එකොළොස්වෙනි එක අසරේල්ද ඔහුගේ 18
පුත්‍රයන්ද සහෝදරයන්ද යන දෙළොස්-
දෙනෙකුටය. දෙළොස්වෙනි එක 19
හෂබියාද ඔහුගේ පුත්‍රයන්ද සහෝ-
දරයන්ද යන දෙළොස්දෙනෙකුටය.
දහතුන්වෙනි එක ෂූබායෙල්ද ඔහුගේ 20
පුත්‍රයන්ද සහෝදරයන්ද යන දෙළොස්-
දෙනෙකුටය. දහහතරවෙනි එක මත්ති- 21
තියාද ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද
යන දෙළොස්දෙනෙකුටය. පහළොස්- 22
වෙනි එක යෙරේමොත්ද ඔහුගේ
පුත්‍රයන්ද සහෝදරයන්ද යන දෙළොස්-
දෙනෙකුටය. දහසවෙනි එක හනනියාද 23
ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද යන
දෙළොස් දෙනෙකුටය. දහහත්වෙනි එක 24
යොෂ්බෙකාෂාද ඔහුගේ පුත්‍රයන්ද
සහෝදරයන්ද යන දෙළොස්දෙනෙ-
කුටය. දහඅටවෙනි එක හනානිද ඔහුගේ 25
පුත්‍රයන්ද සහෝදරයන්ද යන දෙළොස්
දෙනෙකුටය. දහනවවෙනි එක මල්- 26
ලෝතීද ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද
යන දෙළොස් දෙනෙකුටය. විසිවෙනි 27
එක එලියාතාද ඔහුගේ පුත්‍රයන්ද
සහෝදරයන්ද යන දෙළොස් දෙනෙ-
කුටය. විසිඑක්වෙනි එක හෝතීර්ද 28
ඔහුගේ පුත්‍රයන්ද සහෝදරයන්ද යන
දෙළොස්දෙනෙකුටය. විසිදෙවෙනි එක 29
ගිද්දල්තීද ඔහුගේ පුත්‍රයන්ද සහෝ-
දරයන්ද යන දෙළොස් දෙනෙකුටය.
විසිතුන්වෙනි එක මහසියොත්ද ඔහුගේ 30
පුත්‍රයන්ද සහෝදරයන්ද යන දෙළොස්-
දෙනෙකුටය. විසිහතරවෙනි එක රොමම්තී- 31
එසෙර්ද ඔහුගේ පුත්‍රයන්ද සහෝදර-
යන්ද යන දෙළොස් දෙනෙකුටය.

## දෙරටුපාලයන්ගේ පන්ති ආදිය

26 දෙරටුපාලයන්ගේ පන්ති මෙසේය.
කොරාවරුන්ගෙන් ආසාප්ගේ
පුත්‍රයෙක් වන කෝරේගේ පුත්‍රවූ මෙෂෙ-
2 ලෙමියාය. මෙෂෙලෙමියාගේ පුත්‍රයෝ වන
කුලුඳුලාවූ ශෙකරියාය, දෙවෙනියාවූ
යෙදියායෙල්ය, තුන්වෙනියාවූ සෙබදියාය,
3 හතරවෙනියාවූ යත්නියෙල්ය; පස්වෙනි-
යාවූ ඒලාම්ය, හවෙනියාවූ යෙහෝහා-
නාන්ය, හත්වෙනියාවූ එලියෙහෝ-
4 යේනයිය. ඕබෙද්-ඒදෝම්ගේ පුත්‍රයෝ වන
කුලුඳුලාවූ ෂෙමායාය, දෙවෙනියාවූ
යෙහෝසාබාද්ය, තුන්වෙනියාවූ යෝවාය,
හතරවෙනියාවූ සාකාර්ය, පස්වෙනියාවූ
5 නෙතනේල්ය; හවෙනියාවූ අම්මීයෙල්ය,
හත්වෙනියාවූ ඉස්සාකර්ය, අටවෙනියාවූ
පෙයුල්ලෙතයිය. මක්නිසාද දෙවියන්-
වහන්සේ ඔහුට ආශීර්වාදකළසේක.
6 ඔහුගේ පුත්‍රවූ ෂෙමායා නිසාත්
පුත්‍රයෝ උපන්නෝය, ඔව්හු බලවන්ත
මනුෂ්‍යයෝව සිටි නිසා තමුන්ගේ පිය
වංශයෙහි ආණ්ඩුකාරයෝව සිටියෝය.
7 ෂෙමායාගේ පුත්‍රයෝ වන ඔත්නී,
රෙපායෙල්, ඕබෙද් සහ එල්සාබාද්ය;
ඔහුගේ සහෝදරයෝ වන බලවන්ත
මනුෂ්‍යයෝවූ එලීහු සහ සෙමාකියාය.
8 මොවුන් සියල්ලෝ ඕබෙද්-ඒදෝම්ගේ
පුත්‍රයෝය. ඔව්හුද ඔවුන්ගේ පුත්‍රයෝද
සහෝදරයෝද සේවයට බලවන්තව
ශක්තිමත්ව සිටියෝය; මෙසේ ඕබෙද්-
ඒදෝම්ගේ හැටදෙදෙනෙක් සිටියෝය.
9 මෙෂෙලෙමියාට බලවන්තයන් වන
පුත්‍රයන්ද සහෝදරයන්ද දහඅටදෙනෙක්
10 වූවෝය. මෙරාරීගේ පුත්‍රයෙක්වූ හො-
සාගේ පුත්‍රයෝ වන ප්‍රධානියාවූ ෂිම්රීය.
(ඔහු කුලුඳුලා නොවන නුමුත් ඔහුගේ
පියා ඔහු ප්‍රධානකමට පත්කෙළේය.)
11 දෙවෙනියාවූ හිල්කියාය, තුන්වෙනියාවූ
ටෙබලියාය, සතරවෙනියාවූ ශෙකරියාය.
හොසාගේ සියලු පුත්‍රයන් හා සහෝ-
12 දරයන් දහතුන්දෙනෙක්ය. ස්වාමීන්-
වහන්සේගේ ගෘහයෙහි මෙහෙකරන
පිණිස තමුන්ගේ සහෝදරයන් සමග
මාරුවට සිටියාවූ ප්‍රධාන මනුෂ්‍යයන්වූ
ඔවුන්ට දෙරටුපාලයන්ගේ පන්ති වැටු-
ණේය. ඔව්හුද තමුන්ගේ පිය වංශ ලෙස 13
ලොකු අය මෙන්ම කුඩා අයත් එක
එක දෙරටුව ගැන පසඇට දැමුවෝය.
නැගෙනහිර පැත්තේ පසඇටය වැටුණේ 14
ෂෙලෙමියාටය. ඉන්පසු ඔහුගේ පුත්‍රවූ
ඥනවත් මන්ත්‍රියෙක්වූ ශෙකරියා ගැන
පසඇට දැමුවෝය; ඔහුගේ පසඇටය
වැටුණේ උතුරු පැත්තටය. ඕබෙද්- 15
ඒදෝම්ට වැටුණේ දකුණු පැත්තය; ඔහුගේ
පුත්‍රයන්ට වැටුණේ භාණ්ඩාගාරයය.
බස්නාහිර පැත්තේ නගින මාවතෙහි 16
තිබෙන ෂල්ලෙකෙත් දෙරටුව ෂුප්පිම්ටත්
හොසාටත් වැටුණේය, ඔව්හු මාරුවෙන්
මාරුවට සිටියෝය. නැගෙනහිරට සිටියේ 17
ලෙවීවරු හදෙනෙක්ය, උතුරට දවසට
හතරදෙනෙක්ය, දකුණට දවසට හතර-
දෙනෙක්ය, භාණ්ඩාගාරය ළඟ දෙදෙන
දෙදෙනාය. බස්නාහිරට *පර්බර් ළඟ 18
මාවතේ හතරදෙනෙක්ය, *පර්බර්හි
දෙදෙනෙක්ය. කොරාගේ පුත්‍රයන්ගෙන්ද 19
මෙරාරීගේ පුත්‍රයන්ගෙන්ද තෝරාගත්
දෙරටුපාලයන්ගේ පන්ති මේවාය.
අනික් ලෙවීවරුන්ගෙන් අහියා 20
දෙවියන්වහන්සේගේ ගෘහයේ ගබඩා
සහ කැපකරපු දේවල ගබඩා කෙරෙහි
පත්ව සිටියේය. ලාදන්ගේ වංශයේ 21
ගේර්ෂොන්වරුන්ගේ පුත්‍රයෝ වන
ලාදන්ගේ පිය වංශවල ප්‍රධානියෝව
සිටි ගේර්ෂොන්වරුවූ ලාදන්ගේ පුත්‍රයෝ
නම්: යෙහියෙලී සහ යෙහියෙලීගේ 22
පුත්‍රයෝවූ සේතාම් සහ ඔහුගේ
සහෝදරවූ යෝවෙල්ය. ඔව්හු ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ ගබඩා කෙරෙහි
පත්ව සිටියෝය. අම්රාම්වරුත් ඉෂ්හාර්- 23
වරුත් හෙබ්‍රොන්වරුත් උස්සීයෙල්වරුත්
වූවෝය. මෝසෙස්ගේ පුත්‍රයා වන 24
ගේර්ෂොම්ගේ පුත්‍රවූ ෂෙබුයෙල් ගබඩා
කෙරෙහි ප්‍රධානියාව සිටියේය. එලි- 25
යෙසෙර්ගෙන් පැවත ආවාවූ ඔහුගේ
සහෝදරයෝත් සිටියෝය. ඔහුගේ පුත්‍රයා

*එනම්–කණුපෙළ සහිත බරාඳය.

රෙහබියාය, ඔහුගේ පුත්‍රයා යෙෂායාය,
ඔහුගේ පුත්‍රයා යෝරාම්ය, ඔහුගේ
පුත්‍රයා සික්රිය, ඔහුගේ පුත්‍රයා ෂෙලො-
26 මොත්ය. මෙම ෂෙලොමොත් සහ ඔහුගේ
සහෝදරයෝ දවිත් රජු විසින්ද සහ-
ස්‍රාධිපතීන්ව ශතාධිපතීන්ව සිටි පිය
වංශවල ප්‍රධානීන් විසින්ද සේනාවේ
අධිපතීන් විසින්ද කැපකරනලද්දවූ ශුද්ධ
දේවල සියලු ගබඩා කෙරෙහි පත්ව
27 සිටියෝය. ඔව්හු යුද්ධවලදී ලබාගත්
කොල්ලයෙන් කොටසක් **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහය අලුත්වැඩියාකිරීම
28 පිණිස කැපකළෝය. දර්ශනකාරයාවූ
සාමුවෙල්ද කීෂ්ගේ පුත්‍රවූ සාවුල්ද
නේර්ගේ පුත්‍රවූ අබ්නේර්ද ශෙරුයාගේ
පුත්‍රවූ යෝවාබ්ද විසින් කැපකළ
සියල්ලත් කා විසින් නුමුත් කැප-
කළ දේත් ෂෙලොමොත් සහ ඔහුගේ
29 සහෝදරයන් යටතේ තිබුණේය. ඉශ්-
හාර්වරුන්ගෙන් කෙනනියාද ඔහුගේ
පුත්‍රයෝද පිටත කටයුතු ගැන
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි මූලාදෑනි-
යෝව විනිශ්චයකාරයෝව සිටියෝය.
30 හෙබ්‍රොන්වරුන්ගෙන් හෂබියාද ඔහුගේ
සහෝදරයෝද යන බලවන්තයන්
එක්දහස් හත්සියයක් බස්නාහිර දිසාවේ
යෝර්දනෙන් මෙගොඩ **ස්වාමීන්-**
**වහන්සේගේ** සියලු කාරණා ගැනද
රජුගේ වැඩ ගැනද ඉශ්‍රායෙල්වරුන්
31 කෙරෙහි පත්ව සිටියෝය. හෙබ්‍රොන්-
වරුන්ගේ පිය පෙළපත් ප්‍රකාර හෙබ්‍රොන්-
වරුන්ගේ ප්‍රධානියා නම් යෙරියාය.
දවිත්ගේ රජකම්කිරීමේ සතළිස්වෙනි
අවුරුද්දේදී ඔවුන් ගැන විභාගකොට
බලවන්ත මනුෂ්‍යයන් ගිලියද්-යාසේර්හි
ඔවුන් අතරේ සිටිනවා සම්බවුණේය.
32 බලවන්තයෝව පිය වංශවල ප්‍රධානි-
යෝව සිටි ඔහුගේ සහෝදරයෝ දෙදස්
හත්සියයක් වූහ; දවිත් රජ ඔවුන්
දෙවියන්වහන්සේගෙත් රජුගෙත් සියලු
කාරණා ගැන රූබෙන්වරුන්ද ගාද්-
වරුන්ද මනස්සේගේ අර්ධ ගෝත්‍රයද
කෙරෙහි මූලාදෑනීන් කොට පත්කෙළේය.

## යුද්ධ මූලාදෑනීන් සහ වෙනත් ප්‍රධානියෝ

27
අවුරුද්දේ සියලු මාසවල මාසයෙන්
මාසයට ඇතුළට ආවාවූද, පිටතට
ගියාවූද, පන්තිවල සියලු කාරණා
ගැන රජුට සේවයකළාවූද ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ පිය වංශවල ප්‍රධානීන්ගෙත්
සහස්‍රාධිපතීන්ගෙත් ශතාධිපතීන්ගෙත්
ඔවුන්ගේ මූලාදෑනීන්ගෙත් ගණන නම්
එක එක පන්තියට විසිහතර දහසක්ය.
පළමුවෙනි මාසයට පන්තිය කෙරෙහි 2
සබ්දියෙල්ගේ පුත්‍රවූ යාෂොබෙයාම් පත්ව
සිටියේය. ඔහුගේ පන්තියෙහි විසිහතර
දහසක් සිටියෝය. ඔහු පෙරෙශ් 3
පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්ව පළමුවෙනි
මාසයේ සේනාවල සියලු අධිපතීන්ගේ
ප්‍රධානියාව සිටියේය. දෙවෙනි මාසයට 4
පන්තිය කෙරෙහි අහෝහිය දෝදයි පත්ව
සිටියේය. ඔහුගේ පන්තියේ මූලාදෑනියා
මික්ලොත්ය. ඔහුගේ පන්තියෙහි විසිහතර
දහසක් සිටියෝය. තුන්වෙනි මාසයට 5
තුන්වෙනි සේනාවේ අධිපතියා නම් පූජකවූ
යෙහෝයාදගේ පුත්‍රයා වන ප්‍රධානියාවූ
බෙනායාය. ඔහුගේ පන්තියෙහි විසිහතර
දහසක් සිටියෝය. බෙනායා වනාහි ඒ 6
තිස්දෙනාගෙන් බලවන්තයාව තිස්දෙනා
කෙරෙහි අධිපතියාව සිටියේය. ඔහුගේ
පුත්‍රවූ අම්මිසාබාද් ඔහුගේ පන්තියේ
සිටියේය. හතරවෙනි මාසයට හතරවෙනි 7
අධිපතියා නම් යෝවාබ්ගේ සහෝදරවූ
අසාහෙල්ය, ඔහුට පසුව ඔහුගේ පුත්‍රවූ
සෙබදියාය. ඔහුගේ පන්තියෙහි විසිහතර
දහසක් සිටියෝය. පස්වෙනි මාසයට 8
පස්වෙනි අධිපතියා නම් ඉස්‍රාහිය
ෂම්හූත්ය. ඔහුගේ පන්තියෙහි විසිහතර
දහසක් සිටියෝය. හවෙනි මාසයට 9
හවෙනි අධිපතියා නම් තෙකෝයීය
ඉක්කෙෂ්ගේ පුත්‍රවූ ඊරාය. ඔහුගේ
පන්තියෙහි විසිහතර දහසක් සිටියෝය.
හත්වෙනි මාසයට හත්වෙනි අධිපතියා 10
නම් එප්‍රායිම් පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්
වූ පෙලෝනිය හේලෙශ්ය. ඔහුගේ
පන්තියෙහි විසිහතර දහසක් සිටියෝය.
අටවෙනි මාසයට අටවෙනි අධිපතියා 11

නම් සෙරෙහිවරුන්ගෙන් එක්කෙනෙක්වූ
හුෂාතිය සිබ්බෙකයිය. ඔහුගේ පන්තියෙහි
12 විසිහතර දහසක් සිටියෝය. නවවෙනි
මාසයට නවවෙනි අධිපතියා නම්
බෙන්යමින් වංශයට අයිතිවූ අනාතෝ-
තිය අබියෙසෙර්ය. ඔහුගේ පන්තියෙහි
13 විසිහතර දහසක් සිටියෝය. දසවෙනි
මාසයට දසවෙනි අධිපතියා නම් සෙරහි-
වරුන්ගෙන් එක්කෙනෙක්වූ නෙටොපාතිය
මහරයිය. ඔහුගේ පන්තියෙහි විසිහතර
14 දහසක් සිටියෝය. එකොළොස්වෙනි
මාසයට එකොළොස්වෙනි අධිපතියා
නම් එප්‍රායිම් පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්වූ
පිරාතෝනිය බෙනායාය. ඔහුගේ
පන්තියෙහි විසිහතර දහසක් සිටියෝය.
15 දෙළොස්වෙනි මාසයට දෙළොස්වෙනි
අධිපතියා නම් ඔත්නියෙල්ගේ වංශයට
අයිති නෙටොපාතිය හෙල්දයිය. ඔහුගේ
පන්තියෙහි විසිහතර දහසක් සිටියෝය.
16 තවද ඉශ්‍රායෙල් ගෝත්‍රවල ප්‍රධානියෝ
නම් මොව්හුය. රූබෙන්වරුන්ට ආණ්ඩු-
කාරයාව සිටියේ සික්රීගේ පුත්‍රවූ
එලියෙසෙර්ය; සිමියොන්වරුන්ට මයකා-
17 ගේ පුත්‍රවූ ෂෙපටියාය; ලෙවීවරුන්ට
කෙමුයෙල්ගේ පුත්‍රවූ හෂබියාය. ආරොන්
18 වංශයට ශාදෙක්ය. යූදවරුන්ට දාවිත්ගේ
සහෝදරයෙක්වූ එලිහුය. ඉස්සාකර්-
වරුන්ට මීකායෙල්ගේ පුත්‍රවූ ඔම්රීය.
19 සාබුලොන්වරුන්ට ඔබදියාගේ පුත්‍රවූ
ඉෂ්මායාය. නප්තලිවරුන්ට අස්රියෙල්ගේ
20 පුත්‍රවූ යෙරෙමොත්ය. එප්‍රායිම් පුත්‍රයන්ට
අසසියාගේ පුත්‍රවූ හෝෂෙයාය. මනස්සේ
අර්ධ ගෝත්‍රයට පෙදයාගේ පුත්‍රවූ
21 යෝවෙල්ය. ගිලියද්හි සිටි මනස්සේගේ
අර්ධ ගෝත්‍රයට ශෙකරියාගේ පුත්‍රවූ
ඉද්දෝය. බෙන්යමින්වරුන්ට අබ්නේර්-
22 ගේ පුත්‍රවූ යාසයෙල්ය. දන්වරුන්ට
යෙරොහාම්ගේ පුත්‍රවූ අසරේල්ය.
ඉශ්‍රායෙල් ගෝත්‍රවල අධිපතියෝ
23 මොව්හුය. නුමුත්: අහසේ තාරකා
මෙන් ඉශ්‍රායෙල්වරුන් වැඩිකරන්-
නෙමියි ස්වාමීන්වහන්සේ කියා තිබුණු
නිසා විසි අවුරුදු වයසේ පටන් ඊට
බාලවූ තැනැත්තන් දාවිත් ගණන්-
කළේ නැත. ශෙරුයාගේ පුත්‍රවූ 24
යෝවාබ් ගණන්කරන්ට පටන්ගත්
නුමුත් තීන්දු කළේ නැත; තවද
ඒ ගැන ඉශ්‍රායෙල් පිටට උදහස
පැමුණුණේය; ඒ ගණනද දාවිත්
රජුගේ ලේකම් පොතේ ඇතුළත්
නොකරනලද්දේය.

රජුගේ ගබඩා කෙරෙහි අදියෙල්ගේ 25
පුත්‍රවූ අස්මාවෙත් පත්ව සිටියේය.
පිටිසර පළාත්වලද නුවරවලද ගම්වලද
කොටුවලද පිහිටි ගබඩා කෙරෙහි
උස්සියාගේ පුත්‍රවූ යොනාතාන් පත්ව
සිටියේය. ගොවිතැන්කිරීමට කෙත්වල 26
වැඩකළවුන් කෙරෙහි කෙලූබ්ගේ පුත්‍රවූ
එස්රී පත්ව සිටියේය. මිදිවතු කෙරෙහි 27
රාමාතිය ෂිමෙයි පත්ව සිටියේය. මිදි
වතුවල තිබුණු මුද්‍රික ගබඩා කෙරෙහි
ෂිප්මිය සබ්දී පත්ව සිටියේය. පාත රටේ 28
තිබුණු ඔලීව ගස්ද අත්තික්කා ගස්ද
කෙරෙහි ගෙදේරිය බාල්-හානාන් පත්ව
සිටියේය. තෙල් ගබඩා කෙරෙහි යෝවාෂ්
පත්ව සිටියේය. ෂාරොන්හි ගොදුරු කෑ 29
ගවයන් කෙරෙහි ෂාරෝනිය ෂිත්රයිද
මිටියාවත්වල උන් ගවයන් කෙරෙහි
අද්දයිගේ පුත්‍රවූ ෂාපාත්ද පත්ව සිටියෝය.
ඔටුවන් කෙරෙහි ඉෂ්මායෙලිය ඕබිල්ද 30
කොටළුවන් කෙරෙහි මෙරොනොතිය
යේදෙයාද එළුබැටළු රැළවල් කෙරෙහි 31
හග්රිය යාසීස්ද පත්ව සිටියෝය. මේ
සියල්ලෝ දාවිත් රජුගේ සම්පත්වල
අධිපතියෝව සිටියෝය.

දාවිත්ගේ බෑනාවූ යොනාතාන් මන්ත්‍රී- 32
යෙක්ව තේරුම් ඇති මනුෂ්‍යයෙක්ව
ලියන්නෙක්ව සිටියේය. හක්මෝනිගේ
පුත්‍රවූ යෙහීයෙල් රජුගේ පුත්‍රයන් සමග
සිටියේය. අහිතොපෙල් වනාහි රජුගේ 33
මන්ත්‍රීයාව සිටියේය. අර්කීය හූෂයි
රජුගේ මිත්‍රයා විය. අහිතොපෙල් ළඟට 34
බෙනායාගේ පුත්‍රවූ යෙහෝයාද සහ
අබියාතර්ද මන්ත්‍රීයෝව සිටියෝය.
රජුගේ සේනාපතියා යෝවාබ්ය.

## දේවමාලිගාව සෑදීම ගැන දාවිත් දුන් උපදෙස්

**28** තවද දාවිත් ඉශ්‍රායෙල්හි සියලු
අධිපතීන් වන ගෝත්‍රවල අධිපතීන්ද
රජුට සේවයකළ පන්තිවල අධිපතීන්ද
සහස්‍රාධිපතීන්ද ශතාධිපතීන්ද රජුටත්
ඔහුගේ පුත්‍රයන්ටත් අයිති සියලු වස්තුව
සහ සම්පත්වල අධිපතීන්ද ඇමතියන්
සහ බලවන්තයිනුත් සියලු බලවන්ත
යුද්ධකාරයිනුත් සමග යෙරුසලමට
2 කැඳවාගත්තේය. එකල දාවිත් රජ නැගී
සිට කථාකොට: මාගේ සහෝදරයෙනි,
මාගේ ජනයෙනි, මට ඇහුම්කන්දියල්ලා.
**ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය
තැබීමටද අපේ දෙවියන්වහන්සේගේ
පාපුටුව කොටද විශ්‍රාම නිවාසයක්
ගොඩනගන්ට මාගේ සිතේ තිබුණේය;
ඒක ගොඩනැගීමට මා විසින් සූදානම්-
3 කරලාත් තිබුණේය. නුමුත් දෙවියන්-
වහන්සේ මට කථාකොට: නුඹ මාගේ
නාමයට ගෘහයක් ගොඩ නොන-
ගන්නෙහිය, මක්නිසාද නුඹ යුද්ධකාර
මනුෂ්‍යයෙක, ලේ වැගිරෙවූවෙහියයි
4 කීසේක. නුමුත් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
සදාකල්ම රජව සිටීමට ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මාගේ පියාගේ
මුළු වංශයෙන් මා තෝරාගත්සේක.
මක්නිසාද උන්වහන්සේ යූදාද යූදාගේ
වංශයෙන් මාගේ පියාගේ පවුලද
අධිපතිකමට තෝරාගෙන සියලු
ඉශ්‍රායෙල් කෙරෙහි රජකමට මා
පත්කරන්ට මාගේ පියාගේ පුත්‍රයන්
අතරෙන් මා කෙරෙහි ප්‍රසන්න වූසේක.
5 **ස්වාමීන්වහන්සේ** මට බොහෝ පුත්‍රයන්
දුන්සේක; නුමුත් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
**ස්වාමීන්වහන්සේගේ** රජකම්කිරීමේ
සිංහාසනයේ හිඳින පිණිස මාගේ
සියලු පුත්‍රයන් අතරෙන් මාගේ පුත්‍රවූ
6 සාලමොන් තෝරාගත්සේක. උන්-
වහන්සේ මට කථාකොට: නුඹේ පුත්‍රවූ
සාලමොන්ම මාගේ ගෘහයද මළුද
සාදන්නේය. මක්නිසාද මාගේ පුත්‍රයෙක්
කොට ඔහු තෝරාගතිමි, මම ඔහුට
පියෙක් වන්නෙමි. අද දවසේ මෙන් ඔහු 7
මාගේ ආඥාද විනිශ්චයවල්ද රක්ෂා-
කරමින් ස්ථිරව සිටියොත් ඔහුගේ රජකම
සදාකාලයටම ස්ථිර කරන්නෙමියි කී-
සේක. ඉතින් නුඹලා මේ හොඳ දේශය 8
භුක්තිවිඳ, නුඹලාට පසුව නුඹලාගේ
පුත්‍රයන්ට ඒක සදාකාලේටම උරුම-
කරදෙන පිණිස, නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** සියලු ආඥා පවත්-
වමින් ඒවා සොයාපල්ලාය කියා
**ස්වාමීන්වහන්සේගේ** සභාව වන සියලු
ඉශ්‍රායෙල්වරුන්ගේ ඇස් ඉදිරිපිටද
අපේ දෙවියන්වහන්සේට ඇසෙන ලෙසද
මම නුඹලාට අවවාදකරමි. සාලමොන්, 9
මාගේ පුත්‍රය, නුඹ නුඹේ පියාගේ
දෙවියන්වහන්සේ හැඳින සම්පූර්ණ
සිතකින් හා ප්‍රසන්න ආත්මයකින්
උන්වහන්සේට මෙහෙකරපන්න. මක්-
නිසාද **ස්වාමීන්වහන්සේ** සියලු සිත්
විමසා කල්පනාවල සියලු අදහස්
තේරුම්ගන්නාසේක. නුඹ උන්වහන්සේ
සොයනවා නම් උන්වහන්සේ නුඹට
සම්බවෙනවා ඇත; නුමුත් නුඹ උන්-
වහන්සේ අත්හැරියොත් උන්වහන්සේ
නුඹ සදාකාලයටම අහක දමනවා ඇත.
ඉතින් බලාගනින්න; මක්නිසාද ශුද්ධ- 10
ස්ථානයක් කොට ගෘහයක් ගොඩ-
නැගීමට **ස්වාමීන්වහන්සේ** නුඹ
තෝරාගෙන සිටිනසේක. ශක්තිමත්ව
සිට ඒක කරපන්නැයි කීවේය.
එවිට දාවිත් දේවමාලිගාවේ ද්වාර- 11
මණ්ඩපයෙත්, එහි ගෙවලත්, එහි
ගබඩාවලත්, එහි උඩුමහල්වලත්, එහි
ඇතුල් ගෙවල්වලත්, කරුණාසනයේ
ගෙයිත් ආදෘශ සටහනද, තමාගේ හිතේ 12
තිබුණු සියල්ලවූ **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේ මළුවලත්, වටකර කාමරවලත්,
දෙවියන්වහන්සේගේ ගෘහයේ ගබඩා-
වලත්, කැපකරනලද දේ තිබූ ගබඩා-
වලත්, පූජකයන්ගේද ලෙවීවරුන්ගේද 13
පන්තිවලත්, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේ මෙහෙය පිණිස සියලු

කර්මාන්තවලත්, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේ මෙහෙය පිණිස සියලු බඩුවලත්
ආදෘශයද තමාගේ පුත්‍රවූ සාලමොන්ට
14 දුන්නේය. එක එක සේවයේ සියලු රන්
බඩුවල ආදෘශයද, රන්වල බරද, සියලු
රිදී බඩුවල අදෘශයද, එක එක සේවයේ
15 සියලු බඩුවල බරද, රන් පහන් රුක්වලත්
ඒවායේ රන් පහන්වලත් බරද, එක එක
පහන්රුකෙත් එහි පහන්වලත් බරද, රිදී
පහන් රුක්වලත් එක එක පහන්රුකේ
වැඩලෙස එක එකේ සහ ඒවායේ
16 පහන්වලත් බරද, පිදීමේ රොටි තබන
එක එක මේසයේ රන් බරද. රිදී
17 මේසවලට රිදී බරද, පවිත්‍ර රන් මස්-
කොකුවලත් තාලිවලත් පාත්‍රාවලත් රන්
කුසලාන්වලත් ආදෘශයද, එක එක
කුසලානේ බරද, රිදී කුසලාන්වල
ආදෘශයද, එක එක කුසලානේ බරද,
18 පවිත්‍ර රන් දුම්පූජාසනයේ ආදෘශයද
බරද, පියාපත් දිගහැර **ස්වාමීන්-
වහන්සේගේ** ගිවිසුම් පෙට්ටිය වසාගන්න
රන්කෙරුබ් රථයේ ආදෘශයද කියා-
19 දුන්නේය. මේ සටහනේ සියලු වැඩ
තේරුම්කර දුන්නාවූ **ස්වාමීන්වහන්සේගේ**
අතින් මා ලවා සියල්ලම ලියවා
20 තිබේයයි දාවිත් කීවේය. තවද දාවිත්
තමාගේ පුත්‍රවූ සාලමොන්ට කථා-
කොට: තුඹ ශක්තිමත්ව සවිව සිට ඒක
ඉෂ්ටකරපන්න; භයනොවන්න, නො-
කැලඹෙන්න. මක්නිසාද මාගේ දෙවියන්-
වහන්සේ වන දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
තුඹ සමග වනසේක; **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ මෙහෙය පිණිස
සියලු කර්මාන්ත නිමවනතුරු උන්-
වහන්සේ තුඹෙන් ඉවත්නොවන-
21 සේක, තුඹ අත්නොහරිනසේක. ඇරත්
පූජකයන්ගේද ලෙවීවරුන්ගේද පන්තිවල
අය දෙවියන්වහන්සේගේ ගෘහයේ සියලු
වැඩ පිණිස සිටිති. සියලු කටයුතුවලදී
සියලු ආකාර වැඩට ප්‍රඥාවද කැමැත්තද
ඇති හැම දෙනාත් තුඹ සමග සිටිති.
ඇරත් අධිපතියෝත් මුළු සෙනඟත් තුඹේ
අණට මුළුමනින් යටත්වන්නාහුයයි
කීවේය.

## දේවමාලිගාව ගොඩනැගීමට දුන් දේ

29 තවද දාවිත් රජ මුළු සභාවට
කථාකොට කියනුයේ: දෙවියන්-
වහන්සේ විසින් තෝරාගත් එකම
තැනැත්තා වන මාගේ පුත්‍රවූ සාලමොන්
තවම ළාබාලය, වැඩෙත් මහත්ය.
මක්නිසාද මාලිගාව මනුෂ්‍යයාට නොව
දෙවිවූ **ස්වාමීන්වහන්සේටය**. එබැවින් 2
මාගේ මුළු ශක්තියෙන් මාගේ
දෙවියන්වහන්සේගේ ගෘහය ගැන රන්
වැඩට රන්ද රිදී වැඩට රිදීද පිත්තල
වැඩට පිත්තලද යකඩ වැඩට යකඩද
ලී වැඩට ලීද තබමාණික්‍යද බැඳීමට
ගල්ද ඔබ්බන පිණිස ගල්ද විසිතුරු
ගල්ද සියලු ආකාර අනර්ඝ ගල්ද
කිරිගරුඬ ගල්ද බොහෝසෙයින්ම
සූදානම්කෙළෙමි. තවද ශුද්ධවූ ගෘහයට 3
මා විසින් සූදානම්කර තිබෙන සියල්ල
හැර මාගේ දෙවියන්වහන්සේගේ ගෘහය
කෙරෙහි ඇත්තාවූ මාගේ ළැදිකම නිසා
මාගේම සම්පත වන රන්ද රිදීද මාගේ
දෙවියන්වහන්සේගේ ගෘහයට දුන්නෙමි.
එනම් ගෘහවල හිත්ති වසාලන පිණිසද, 4
රන් වැඩවලටත් රිදී වැඩවලටත්
කර්මාන්තකාරයන්ගේ සියලු වැඩ-
වලටත් පාවිච්චිකරන පිණිසද, ඕපීර්හි 5
රන් තලෙන්ත තුන් දහසකුත් පවිත්‍රකළ
රිදී තලෙන්ත සත්දහසකුත් එසේ දුන්-
නෙමි. ඉතින් අද අත්පුරා කැමැත්තෙන්ම
**ස්වාමීන්වහන්සේට** පූජාකරන්නේ කවුදැයි
කීවේය. එවිට පිය වංශවල අධිපතීහුද 6
ඉශ්‍රායෙල් ගෝත්‍රවල අධිපතීහුද සහ-
ස්‍රාධිපතීහුද ශතාධිපතීහුද රජුගේ
වැඩවල අධිපතීහුද කැමැත්තෙන්ම
ඔප්පුකරමින් දෙවියන්වහන්සේගේ ගෘහ- 7
යේ මෙහෙයට රන් තලෙන්ත පන්දහසක්
සහ *දරික් මිල දස දහසකුත් රිදී
තලෙන්ත දසදහසකුත් පිත්තල තලෙන්ත
දහඅට දහසකුත් යකඩ තලෙන්ත
ලක්ෂයකුත් දුන්නෝය. අනර්ඝ ගල් 8
ඇත්තෝද ගේර්ෂොනිය යෙහීයෙල් අතින්

*දරික් මිලය රුපියල් 15 ක් පමණ වේ.

ඒවා **ස්වාමීන්වහන්සේගේ** ගෘහ ගබඩා-
9 වට දුන්නෝය. සෙනඟ එසේ කැමැත්-
තෙන්ම ඔප්පු කළ බැවින් ඔව්හු ප්‍රීති-
වුණෝය, මක්නිසාද ඔව්හු අවංක
සිතකින් **ස්වාමීන්වහන්සේට** පූජාකළෝය.
දාවිත් රජද මහත් ප්‍රීතියකින් ප්‍රීතිවුණේය.

## දාවිත් රජුගේ ස්තෝත්‍රය

10 දාවිත් මුළු සභාව ඉදිරියෙහි **ස්වාමීන්-**
**වහන්සේට** ප්‍රශංසාකරමින් කථාකොට:
අපේ පියවූ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබට සදාකාලයටම
11 ප්‍රශංසාවේවා; **ස්වාමීන්වහන්ස**, මහත්-
තත්ත්වයද පරාක්‍රමයද තේජසද ජයද
මහිමයද අයත් ඔබටය. මක්නිසාද
ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ඇති
සියල්ල ඔබගේය; රාජ්‍යයත්, **ස්වාමීන්-**
**වහන්ස**, ඔබට අයිතිය, ඔබ සියල්ල
කෙරෙහි හිස මෙන් උසස්ව සිටිනසේක.
12 වස්තුවද ගෞරවයද පැමිණෙන්නේ
ඔබගෙන්ය, ඔබ සියල්ල කෙරෙහි
ආණ්ඩුකරනසේක; බලයද පරාක්‍රමයද
ඔබගේ අතෙහිය; සියල්ලන් උසස්-
කරන්ටත් ශක්තිමත්කරන්ටත් බලය
13 තිබෙන්නේ ඔබ අතෙහිය. එබැවින්, අපේ
දෙවියන්වහන්ස, අපි ඔබට ස්තුතිකරමින්
ඔබගේ තේජවත් නාමය වර්ණනාකරමුව.
14 නුමුත් මේ ආකාරයෙන් ඔබට ඔප්පු-
කිරීමට පොහොසත්වූ මමත් මාගේ
සෙනඟත් කවුරුද? මක්නිසාද සියල්ලම
පැමිණෙන්නේ ඔබගෙන්ය, ඔබගේම
15 දෙයින් අපි ඔබට දුනිමුව. මක්නිසාද
අපේ සියලු පියවරුන් මෙන් අපි
ඔබ ඉදිරියෙහි ආගන්තුකයෝව ප්‍රවාසි-
යෝව සිටිමුව. පොළොවේ අපේ දවස්
සෙවණැල්ලක් මෙන්ය, පැතීමක්ද
16 නැත්තේය. අපේ දෙවිවූ **ස්වාමීන්වහන්ස**,
ඔබගේ ශුද්ධවූ නාමය උදෙසා ඔබට
ගෘහයක් ගොඩනැගීමට අප විසින්
සූදානම්කළ මේ මහත් ද්‍රව්‍ය රාශිය
පැමිණෙන්නේ ඔබගේ අතින්ය, සියල්ලම
17 ඔබගේය. මාගේ දෙවියන්වහන්ස, ඔබ
සිත සෝදිසිකරන බවත් අවංකකමට
ප්‍රසන්න බවත් දනිමි. මම වනාහි මාගේ
සිතේ අවංකකමින් මේ සියල්ල
කැමැත්තෙන්ම ඔප්පුකෙළෙමි. දැන් මෙහි
සිටින ඔබගේ සෙනඟද සතුටු සිතින්
ඔබට පූජාකරන බව ප්‍රීතියෙන් දුටිමි.
අපේ පියවරුන්වූ ආබ්‍රහම්ගේද ඊසාක්- 18
ගේද ඉශ්‍රායෙල්ගේද දෙවිවූ **ස්වාමීන්-**
**වහන්ස**, මේ අදහස හා කල්පනා ඔබගේ
සෙනඟගේ සිත්වල සදාකාලේටම
පිහිටුවා, ඔවුන්ගේ සිත් ඔබ වෙතටම
නමාගතමැනව. ඔබගේ ආඥාද ශික්ෂාද 19
පනත්ද පවත්වන්ටත්, මේ සියල්ලම
ඉෂ්ටකරන්ටත්, මා විසින් සූදානම්කර
තිබෙන මාලිගාව ගොඩනගන්ටත් මාගේ
පුත්‍රවූ සාලමොන්ට සම්පූර්ණ සිතක්
දුනමැනවයි කීවේය. එවිට දාවිත් මුළු 20
සභාවට කථාකොට: නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** ප්‍රශංසාකරපල්ලා-
යයි කීය. මුළු සභාවද තමුන්ගේ පිය-
වරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
ප්‍රශංසාකරමින්, හිස නමා **ස්වාමීන්-**
**වහන්සේටත්** රජුටත් වැන්දෝය. ඒ දවසට 21
පසුවද ඔව්හු **ස්වාමීන්වහන්සේට** පූජා
ඔප්පුකරමින්, ගොන් දහසකුත් බැටළුවන්
දහසකුත් බැටළු වස්සන් දහසකුත් දවන
පූජාවල් කොටද ඒවායේ පාන පූජා
සමඟ වෙනත් පූජාද බොහෝසෙයින්ම
සියලු ඉශ්‍රායෙල්වරුන් උදෙසා **ස්වාමීන්-**
**වහන්සේට** ඔප්පුකළෝය.

## සාලමොන් රජකමට පැමිණීම. දාවිත්ගේ මරණය

ඔව්හු ඒ දවසේ **ස්වාමීන්වහන්සේ** 22
ඉදිරියෙහි මහත් සන්තෝෂයෙන් කමින්
බොමින් දෙවෙනි වර දාවිත්ගේ පුත්‍රවූ
සාලමොන් රජකමට පත්කළෝය,
තවද ඔහු **ස්වාමීන්වහන්සේ** උදෙසා
ප්‍රධානාධිපතියා කොටද ශාදෝක්
පූජකයා කොටද ආලේපකළෝය. එවිට 23
සාලමොන් තමාගේ පියවූ දාවිත් වෙනුවට
රජව **ස්වාමීන්වහන්සේගේ** සිංහාසනයෙහි
හිඳ සඵලවුණේය; සියලු ඉශ්‍රායෙල්වරු
ඔහුට කීකරුවූවෝය. සියලු අධිපතීහුද 24
බලවන්තයෝද දාවිත් රජුගේ සියලු

පුත්‍රයෝද සාලමොන් රජුට යටත්වුණෝය.
25 ස්වාමීන්වහන්සේද මුළු ඉශ්‍රායෙල්ගේ ඇස්
හමුයෙහි සාලමොන් ඉතා උසස්කොට,
ඉශ්‍රායෙල්හි ඔහුට පළමුවෙන් සිටි කිසි
රජෙකුට නොතිබුණු පරිද්දෙන් ඔහුට
රාජේශ්වර්යය දුන්සේක.
26 යෙස්සේගේ පුත්‍රවූ දාවිත් මුළු ඉශ්‍රායෙල්
27 කෙරෙහි රජකම්කළේය. ඔහු ඉශ්‍රායෙල්-
වරුන් කෙරෙහි රජකම්කළ කාලය නම්
සතළිස් අවුරුද්දකි; ඔහු හෙබ්‍රොන්හි
හත් අවුරුද්දක්ද යෙරුසලමෙහි තිස්-
28 තුන් අවුරුද්දක්ද රජකම්කෙළේය. ඔහු
වයසෙන්ද වස්තුවෙන්ද ගෞරවයෙන්ද
පූර්ණව හොඳ මහලු වයසේදී මෙළේය.
ඔහුගේ පුත්‍රවූ සාලමොන් ඔහු වෙනුවට
රජකම්කෙළේය. මුල පටන් අන්තිම 29
දක්වා දාවිත් රජුගේ කාරණා එනම්
ඔහුගේ මුළු රජකමද බලවත්තකම්ද
ඔහුටත් ඉශ්‍රායෙල්වරුන්ටත් දේශවල 30
සියලු රාජ්‍යවලටත් සිදුවූ කාරණාද
යන සියල්ල දර්ශනකාර සාමුවෙල්ගේ
ඉතිහාසයෙහිත්, අනාගතවක්තෘවූ
නාතාන්ගේද දර්ශනකාර ගාද්ගේද
ඉතිහාසයෙහිත් ලියා තිබේ.

# දෙවෙනි ලේකම් පොත

## සාලමොන් රජුගේ තෝරාගැනීම. එතුමගේ ධන සම්පත්තිය

1 දාවිත්ගේ පුත්‍රවූ සාලමොන් තමාගේ
රජකමෙහි ස්ථිරවිය, ඔහුගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඔහු සමග සිට ඔහු
2 ඉතාම උසස්කළසේක. සාලමොන් සියලු
ඉශ්‍රායෙල්වරුන්ට එනම් සහස්‍රාධිපතීන්ටද
ශතාධිපතීන්ටද විනිශ්චයකාරයන්ටද
පිය වංශවල ප්‍රධානීන් වූ මුළු ඉශ්‍රායෙල්හි
අධිපතීන් සියල්ලන්ටද අණකෙළේය.
3 ඉක්බිති සාලමොන්ද ඔහු සමග මුළු
සභාවද ගිබියොන්හි තිබෙන උස්-
තැනට ගියෝය; මක්නිසාද **ස්වාමීන්-
වහන්සේගේ** මෙහෙකරුවූ මෝසෙස්
විසින් කාන්තාරයේදී සෑදූ දෙවියන්-
වහන්සේගේ සම්මුඛවීමේ කූඩාරම එහි
4 තිබුණේය. නුමුත් දෙවියන්වහන්සේගේ
ගිවිසුම්පෙට්ටිය දාවිත් ඊට සූදානම්කළ
ස්ථානයට කිරියත්-යෙයාරීම් සිට දාවිත්
විසින් ගෙනැවිත් තිබුණේය. මක්නිසාද
ඔහු යෙරුසලමෙහි ඊට කූඩාරමක්
5 පිහිටුවා තිබුණේය. තවද හූර්ගේ පුත්‍රයා
වන ඌරීගේ පුත්‍රවූ බෙශල්යෙල් සෑදූ පිත්තල
පූජාසනය **ස්වාමීන්වහන්සේගේ** මණ්ඩපය
ඉදිරිපිට තිබුණේය. සාලමොන්ද සභාවද
6 ඊට ළඟාවුණෝය. එහි සාලමොන්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි සම්මුඛ-
වීමේ කූඩාරම ඉදිරිපිට තිබෙන පිත්තල
පූජාසනය පිට දවන පූජාවල් දහසක්
ඔප්පුකෙළේය.
7 එදා රාත්‍රියේ දෙවියන්වහන්සේ
සාලමොන්ට පෙනී: මා විසින් තුඹට
දිය යුතු කුමක්ද කියා ඉල්ලවයි ඔහුට
8 කීසේක. සාලමොන්ද: ඔබ මාගේ පියවූ
දාවිත්ට මහත් කරුණාව පෙන්වමින් ඔහු
වෙනුවට මා රජකොට පත්කළසේක.
දැනුදු දෙවිවූ **ස්වාමීන්වහන්ස**, ඔබ මාගේ 9
පියවූ දාවිත්ට දුන් පොරොන්දුව ස්ථිරවේවා.
මක්නිසාද ගණනින් පොළොවේ ධූලි
මෙන් වූ සෙනඟක් කෙරෙහි ඔබ මා
රජකොට පත්කළසේක. එබැවින් මා 10
මේ සෙනඟ ඉදිරියෙහි යන එන
පිණිස මට ප්‍රඥාවත් දැනගැන්මත් දුන
මැනව. මක්නිසාද ඔබගේ මේ
මහත්වූ සෙනඟ විනිශ්චයකරන්ට කාට
පුළුවන්දැයි දෙවියන්වහන්සේට කීවේය.
දෙවියන්වහන්සේ සාලමොන්ට කථා- 11
කොට: මේක තුඹේ සිතේ තිබී, තුඹ
වස්තුවවත් සම්පත්වත් ගෞරවයවත්
තුඹට වෛරවෙන්නන්ගේ ජීවිතවත්
ඉල්ලන්නේ නැතුව, දීර්ඝායුෂද නොඉල්ලා,
තුඹේ පාලනයට මා විසින් භාරදුන්
මාගේ සෙනඟ විනිශ්චයකරන පිණිස
ප්‍රඥාවද දැනගැන්මද ඉල්ලූ නිසා, ප්‍රඥාවත් 12
දැනගැන්මත් තුඹට දෙනිමි; තවද තුඹට
පළමුවෙන් සිටි කොයි යම් රජකෙනෙකුටවත්
නොතිබුණාවූ, තුඹට පසුව කොයි
රජකෙනෙකුටවත් නොලැබෙන තරම්
වස්තුවත් සම්පතත් ගෞරවයත් තුඹට
දෙන්නෙමියි කීසේක. එවිට සාලමොන් 13
ගිබියොන්හි උස්තැන තිබුණ සම්මුඛවීමේ
කූඩාරම වෙතින් යෙරුසලමට ආවේය;
ඔහු ඉශ්‍රායෙල් කෙරෙහි රජකම් කෙළේය.
තවද සාලමොන් රථද අසරුවන්ද 14
රැස්කරගත්තේය. ඔහු එක්දහස් හාරසියයක්
රථද දොළොස් දහසක් අසරුවන්ද ඇතුව
සිටියේය. ඔහු ඒවා රථ-නුවරවලද රජු
ළඟ යෙරුසලමෙහිද තැබුවේය. ඇරත් 15
රජ රන් රිදී යෙරුසලමෙහි ගල් මෙන්ද,
කිහිරි ගස් පාත රටෙහි තිබෙන
අත්තික්කා ගස් මෙන්ද ගණනින්

16 වැඩිවෙන්ට සැලැස්සුවේය. සාලමොන්ට
සිටි අශ්වයෝ මිසරයෙන් ගෙනෙනලද්දෝය;
රජුගේ වෙළෙන්දෝ උන් රැළක් රැළක්
වශයෙන් මිල ගණනකට ලබාගත්තෝය.
17 ඔව්හු රථයක් රිදී ෂෙකෙල් හසියය
බැගින්ද අශ්වයෙක් එකසිය පනහ
බැගින්ද මිසරයෙන් ගෙනාවෝය. එසේම
ඔව්හු හිත්තීවරුන්ගේ සියලු රජුන්ටත්
සිරියේ රජුන්ටත් ගෙනත් දුන්නෝය.

## දේවමාලිගාව සාදන්ට සූදානම්වීම

2 සාලමොන් **ස්වාමීන්වහන්සේගේ**
නාමයට ගෘහයක්ද තමාගේ රාජ්‍යයට
ගෘහයක්ද ගොඩනගන්ට අදහස්කරගෙන,
2 බර අදින පිණිස මිනිසුන් සැත්තෑ
දහසක්ද කඳුවල ලී කපන මිනිසුන්
අසූ දහසක්ද ඔවුන් කෙරෙහි මූලාදෑනීන්
තුන්දහස් හසියයක්ද නියමකෙළේය.
3 සාලමොන් තීර්හි හූරාම් රජුට
පණිවිඩයක් යවමින්: මාගේ පියවූ දාවිත්ට
වාසයකිරීමට ගෙයක් ගොඩනැගීම
පිණිස ඔබ කිහිරි ලී එවීමෙන් ඔහු
සමග ක්‍රියාකළාක් මෙන් මා සමගත්
4 ක්‍රියාකළමැනවි. මම මාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** නාමයට ගෘහයක්
ගොඩනගා උන්වහන්සේ ඉදිරියෙහි සුවඳ
දුම් ඔප්පුකරන පිණිසත්, නිරන්තර පිදීමේ
රොටි තබන පිණිසත්, උදේ සවසද
සබත් දවස්වලද අමාවක්වලද අපේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** නියම
මංගල්‍යවලදීද දවන පූජා ඔප්පුකරන
පිණිසත්, ඒක උන්වහන්සේට කැප-
කරන්ට යමි. මේක සදාකල්ම ඉශ්‍රායෙල්ට
5 නියෝගයක්ය. අපේ දෙවියන්වහන්සේ
සියලු දෙවිවරුන්ට වඩා උතුම් නිසා
මා විසින් ගොඩනගන ගෘහය මහත්ය.
6 නුමුත් ස්වර්ගයද ස්වර්ගවල ස්වර්ගයද
උන්වහන්සේ දරන්ට අනවකාශව
තිබෙද්දී උන්වහන්සේට ගෘහයක්
ගොඩනගන්ට කාට පුළුවන්කම තිබේද?
උන්වහන්සේ ඉදිරියෙහි සුවඳදුම්
ඔප්පුකිරීමට මිස උන්වහන්සේට ගෘහයක්
7 ගොඩනගන්ට මම කවරෙක්ද? ඉතින්
මාගේ පියවූ දාවිත් විසින් සොයා දුන්නාවූ
මා ළඟ යූදාහිත් යෙරුසලමෙහිත් සිටින
දක්ෂ ප්‍රඥාවන්ත මිනිසුන් සමග, රන්
රිදී පිත්තල යකඩ වැඩත් රත්තිල්, රතු,
නිල්වන් නූල් වැඩත් කිරීමට දක්ෂවූ,
සියලු ආකාර කැටයම්-වැඩ කරන්ට
දන්නාවූ මනුෂ්‍යයෙකු මා ළඟට එවුව-
මැනවි. කිහිරි ලීද දේවදාර ලීද හඳුන් 8
ලීද ලෙබනොන්හි සිට මා වෙත එවුව-
මැනවි. මක්නිසාද ඔබගේ මෙහෙකරුවන්
ලෙබනොන්හි ලී කපන්ට දක්ෂ බව
දනිමි; මාගේ මෙහෙකරුවන් ඔබගේ
මෙහෙකරුවන් සමග සිටිනු ඇත. මට 9
ලී බොහෝසෙයින්ම සූදානම්කළ යුතුව
තිබේ. මක්නිසාද මා විසින් ගොඩනගන
ගෘහය මහත්වූ ආශ්චර්යමත්වූ එකක්
වන්නේය. මම ලී කපන්නන් වන ඔබගේ 10
මෙහෙකරුවන්ට භෝජන පිණිස තිරිඟු
*කෝර විසි දහසක්ද යව කෝර විසි
දහසක්ද මුද්‍රිකපාන †බාත් විසි
දහසක්ද තෙල් බාත් විසි දහසක්ද
දෙන්නෙමියි කියා යැවීය. එවිට තීර්හි 11
රජවූ හූරාම් සාලමොන්ට ලියුමකින්
උත්තරදෙමින්: **ස්වාමීන්වහන්සේ** තමන්-
ගේ සෙනඟට ප්‍රේමකරන නිසා
උන්වහන්සේ ඔබ ඔවුන් කෙරෙහි
රජකොට පත්කළසේකැයි කීය. තවද 12
හූරාම් කියනුයේ: අහසත් පොළොවත්
මැවූවාවූ, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** ප්‍රශංසා වේවා, මක්නිසාද
**ස්වාමීන්වහන්සේට** ගෘහයක්ද තමා-
ගේ රාජ්‍යයට ගෘහයක්ද ගොඩනැගීමට
සිහිකල්පනාවෙන් හා නුවණින් යුක්තවූ
ප්‍රඥාවන්ත පුත්‍රයෙකු උන්වහන්සේ දාවිත්
රජුට දුන්සේක. ඉතින් මට පියෙක්වූ, 13
ප්‍රඥාවන්තවූ, නුවණින් යුක්තවූ මනුෂ්‍යයෙක්
වන හූරාම් එවමි. ඔහු දාන්ගේ දූවරුන්- 14
ගෙන්වූ තැනැත්තියෙකුගේ පුත්‍රයාය,
ඔහුගේ පියා තීර්හි මනුෂ්‍යයෙක්ය.
ඔබගේ දක්ෂ මනුෂ්‍යයන්ද ඔබගේ
පියවූ මාගේ ස්වාමිවූ දාවිත්ගේ දක්ෂ

*කෝර එකක් බුසල් අටයි.
†බාත් එකක් ගැලොම් හැටයි.

මනුෂ්‍යයන්ද සමග ඔහුට නියමකරන
සියලු ආකාර වැඩ සොයා දනගන්ටද
රන්, රිදී, පිත්තල, යකඩ, ගල්, ලී වැඩ
හා රත්නිල්, නිල්වන්, සිහින් හණ, රතු
නූල් වැඩ කරන්ටද කොයියම් කැටයම්
වැඩක් නුමුත් කරන්ටද ඔහු සමර්ථය.
15 ඉතින් මාගේ ස්වාමියා කී තිරිඟුද යවද
තෙල්ද මුද්‍රිකපානයද තමන් මෙහෙ-
16 කරුවන්ට එවනු ලැබේවා. අපිද ඔබගේ
මුළු ඕනෑකමේ හැටියට ලෙබනොන් සිට
ලී කපා ඒවා පහුරුබැඳ, යොප්පාවට
මුහුදෙන් ඔබට ගෙනැවිත් දෙන්නෙමුව;
එවිට ඔබට ඒවා යෙරුසලමට ගෙන්වා
17 ගත හැකියයි කීවේය. සාලමොන්
ඉශ්‍රායෙල් දේශයෙහි සිටි සියලු විදේශීන්
තමාගේ පියවූ දාවිත් ඔවුන් ගණන් කළ
ලෙස නැවත ගණන්කෙළේය; ඔව්හු
එක්ලක්ෂ පනස් තුන්දස් හසියයක්
18 වූවෝය. ඔහු ඔවුන්ගෙන් හැත්තෑදහක්
බර අදින පිණිසද අසූ දහසක් කඳුවල
ලී කැපීමටද තුන්දහස් හසියයක් සෙනඟ
ලවා වැඩකරවන මූලාදෑනීන් කොටද
පත්කෙළේය.

## දේවමාලිගාව ගොඩනැගීමේ තොරතුරු

3 එකල සාලමොන් යෙරුසලමෙහි
තමාගේ පියවූ දාවිත්ට ස්වාමීන්-
වහන්සේ පෙනුණු මොරියා කන්දේ
යෙබූසියවූ ඔර්ණන්ගේ කමතේ දාවිත්
විසින් නියමකළ ස්ථානයෙහි ස්වාමීන්-
වහන්සේගේ ගෘහය ගොඩනගන්ට පටන්-
2 ගත්තේය. ඔහු තමාගේ රජකමේ හතර-
වෙනි අවුරුද්දේ දෙවෙනි මාසයේ
දෙවෙනිද ඒක ගොඩනගන්ට පටන්ගත්තේය.
3 දෙවියන්වහන්සේගේ ගෘහය ගොඩනැගීමට
සාලමොන් ලූ අත්තිවාරම මේය. පළමු
තිබුණ රියන් මිම්මේ හැටියට දිග හැට
4 රියනක්ය, පළල විසි රියනක්ය. ඉස්සරහ
තිබුණ ද්වාරමණ්ඩපයේ දිග ගෘහයේ
පළල ලෙසම විසි රියනක්ය, උස එකසිය
විස්සක්ය. එහි ඇතුළත ඔහු පවිත්‍ර රනින්
5 වැසුවේය. ඔහු ලොකු ගෘහයේ ඇතුළ
දේවදාර ලීවලින් වසා, එහි හොඳ රත්රන්
වසා, ඒ මතුපිට තල්ගස්ද දම්වැල්ද සාදා,
අලංකාරය පිණිස අනර්ඝ ගල්වලින් 6
ගෘහය සැරසුවේය. ඒ රන් පර්වායිම්හි
රන්ය. ඔහු ගෘහයද බාල්කද උළුවහුද 7
ඒකේ භිත්තිද දොරවල්ද ඇතුළුව රනින්
වැසුවේය. භිත්තිවල කෙරුබ්-රූපද
කැටයම්කළේය. ඔහු අති ශුද්ධ ගෘහයක් 8
සෑදුවේය; ඒකේ දිග ගෘහයේ පළල
ලෙසම විසි රියනක්ය, ඒකේ පළලත්
විසි රියනක්ය. ඔහු එය හොඳ රන්
තලෙන්ත හසියයකින් පමණ වැසුවේය.
ඇණවල බර රන් ෂෙකෙල් පනහක්ය. 9
ඔහු උඩුමහල් ගෙවලුත් රනින් වැසුවේය.
ඔහු අති ශුද්ධස්ථානයෙහි කෙරුබ්-රූප 10
දෙකක් කපා සාදා තැබුවේය; ඒවා
රනින් වසන ලද්දේය. කෙරුබ්-රූපවල 11
පියාපත්වල දිග විසි රියනක්ය. එකක
පියාපතක් රියන් පහක් දිගව ගෘහයේ
භිත්තියට තට්ටුවෙන ලෙසද අනික්
පියාපත රියන් පහක් දික්ව අනික්
කෙරුබ්-රූපයේ පියාපතකට තට්ටුවෙන
ලෙසද තිබුණේය. අනික් කෙරුබ්-රූපයේ 12
පියාපතක් රියන් පහක් දිගව ගෘහයේ
භිත්තියට තට්ටුවෙන ලෙසද අනික්
පියාපතත් රියන් පහක් දිගව අනික්
කෙරුබ්-රූපයේ පියාපතකට වැදෙන
ලෙසද තිබුණේය. මේ කෙරුබ්-රූපවල 13
පියාපත් විසි රියනක් විහිදී තිබුණේය.
ඒවා කෙළින් පිහිටී තිබුණේය, ඒවායේ
මුහුණු ගෘහය දෙසට විය. ඔහු 14
නිල්, රත් නිල්, රතු නූල්වලිනුත් සිහින්
හණ නූල්වලිනුත් තිරයද ඒ පිට
කෙරුබ්-රූපද සෑදුවේය. ගෘහය ඉදිරිපිට 15
ඔහු රියන් තිස් පහක් උස ඇති කුළුනු
දෙකක් සෑදුවේය, එක එකේ මුදුන පිට
තිබුණ පේකඩය පස් රියනක්ය. දේව 16
වාක්‍යස්ථානයෙහි ඔහු දම්වැල් සාදා,
ඒවා කුළුනු මුදුන්වල තබා දෙළුම්
සියයක් සාදා, ඒවා දම්වැල්වල එල්ලුවේය.
ඔහු මාලිගාව ඉදිරිපිට ඒ කුළුනු, එකක් 17
දකුණු පැත්තේද එකක් වම් පැත්තේද
පිහිටුවා, දකුණු එකට *යාකීන් යන නමද
වම් එකට †බෝවස් යන නමද තැබුවේය.

*එනම්, ඔහු පිහිටුවන්නේය.
†එනම්, එහි ශක්තිය තිබේ.

## දේවමාලිගාවේ පූජාසනය යනාදිය

4 ඔහු පිත්තල පූජාසනයක්ද සෑදුවේය.
ඒකේ දිග විසි රියනක්ය, පළල විසි
2 රියනක්ය, උස දස රියනක්ය. ඔහු මුහුදත්
වාත්තුකර සෑදුවේය. ඒකේ ගැටියේ එක
පැත්තක සිට අනික් පැත්ත දක්වා
රියන් දහයක්ය, එය වටකුරුව තිබුණේය,
ඒකේ උස පස් රියනක්ය, ඒකේ වට
3 ප්‍රමාණය තිස් රියනක් විය. ඒකේ පහළ
කොට්ඨාසයේ රියනකට ගවරූප දසයක්
බැගින්, එය වාත්තුකරන විට වාත්තු-
කළ දෙපේළියක ගවරූප වටකරින්ම
4 තිබුණේය. ඒක ගවරූප දොළොසක් පිට
තබා තිබුණේය. තුනක් උතුරු දෙසටද
තුනක් බටහිර දෙසටද තුනක් දකුණු
දෙසටද තුනක් නැගෙනහිර දෙසටද හැරී
තිබුණේය. මුහුද ඒවාට උඩින් ඒවා පිට
තිබුණේය, ඒවායේ පස්සා කොට්ඨාස
5 සියල්ලම ඇතුළට තිබුණේය. ඒකේ
ඝනකම අල්ලක පළලය; ඒකේ ගැටිය
කුසලාන් ගැටියක වැඩ මෙන් මානෙල්
මලක් ලෙස සාද තිබුණේය. එහි බාත්
6 තුන්දහසක් ඇල්ලුවේය. සේදීම පිණිස
ඔහු භාජන දසයක් සාද පහක් දකුණු
පැත්තේද පහක් වම් පැත්තේද තැබුවේය;
දවන පූජාව සම්බන්ධ දේ එහි සෝදන-
ලද්දේය. නුමුත් මුහුද තිබුණේ පූජකයන්ට
7 සේදීම පිණිසය. රන් පහන්-රුක් දසයත්
ඒවායේ නියමයේ හැටියට ඔහු සාද
මාලිගාවෙහි දකුණේ පහකුත් වමේ
8 පහකුත් තැබුවේය. ඔහු මේස දසයක්ද
සාද, පහක් මාලිගාවෙහි දකුණේද පහක්
වමේද තැබුවේය. ඔහු රන් තලි සියයකුත්
9 සෑදුවේය. පූජකයන්ගේ මළුවද මහ
මළුවද ඒ මළුවට දොරවල්ද සාද, ඒ
10 දොරවල් පිත්තලෙන් වැසුවේය. මුහුද වනාහි
ඔහු දකුණු පැත්තෙන් පූර්ව දිශාවටත්
දකුණු දිශාවටත් අතරෙහි තැබුවේය.
11 තවද හූරාම් සැළිත් හැඳිත් තාලිත්
සෑදුවේය. මෙසේ හූරාම් දෙවියන්-
වහන්සේගේ ගෘහයෙහි සාලමොන් රජුට
කළ වැඩ ඉෂ්ටකොට නිමකෙළේය. එනම් 12
කුළුනු දෙකද, කුළුනු මුදුන් පිට ගෝල
සහ පේකඩ දෙකද, කුළුනු මුදුන් පිට
තිබුණු පේකඩවල ගෝල දෙක වැසීමට
දැල් වැඩ දෙකද, කුළුනු පිට තිබුණු 13
පේකඩවල ගෝල දෙක වැසීමට එක
එක දැල් වැඩේට දෙළුම් දෙපේළියක්
බැගින් දැල් වැඩ දෙකට දෙළුම් හාර-
සියයද යන මේවාය. ඔහු මැහිද සෑදුවේය, 14
මැහි පිට තිබුණු භාජනද එක මුහුදද ඒ 15
යට ගවයන් දොළොසද සැළිද හැඳිද 16
මස් කොකුද ඒවායේ සියලු බඩුද ඔහු
සෑදුවේය. ඔහුට පියෙක්වූ හූරාම්
ස්වාමීන්වහන්සේගේ ගෘහය උදෙසා
සාලමොන් රජුට සෑදූ ඒ බඩු ඔපදැමූ
පිත්තලෙන්ය. යොර්දන් සමභූමියෙහි 17
සුක්කොත්ද ශෙරේදද අතරේ තිබෙන
මැටි බිමෙහි රජ ඒවා වාත්තුකෙරෙවුවේය.
මෙසේ සාලමොන් මේ සියලු භාණ්ඩ 18
මහත් රාශියක් සෑදුවේය. පිත්තලවල
බරද දනගත නොහැකි විය. සාලමොන් 19
දෙවියන්වහන්සේගේ ගෘහයෙහි සියලු
බඩු වන රන් පූජාසනයද පිදීමේ රොටි
තිබුණු මේසද; දේව වාක්‍යස්ථානය 20
ඉදිරිපිට නියමයේ හැටියට දැල්වීමට
පවිත්‍ර රන් පහන්-රුක්ද ඒවායේ පහන්ද;
රනින් එනම් ඉතා අනර්ඝ රනින් මල්ද 21
පහන්ද අඬුද; පවිත්‍ර රනින් පහන් කතුරුද 22
තලිද හැඳිද ගිනි කබල්ද සෑදෙවුවේය.
ගෘහයට ඇතුල්වන තැන එනම් අති
ශුද්ධස්ථානයේ ඇතුල් දොරවල්ද ගෘහයේ
එනම් මාලිගාවේ දොරවල්ද රනින්
5 විය. මෙසේ සාලමොන් ස්වාමීන්-
වහන්සේගේ ගෘහය උදෙසා කළාවූ සියලු
වැඩ සම්පූර්ණවිය. සාලමොන් තමාගේ
පියවූ දාවිත් විසින් කැපකර තිබුණු දේවල්
එනම් රිදීද රන්ද සියලු භාණ්ඩද ඇතුළට
ගෙනවුත් දෙවියන්වහන්සේගේ ගෘහයේ
ගබඩාවල තැබුවේය.

## ගිවිසුම් පෙට්ටිය දේවමාලිගාවට ගෙනඒම. දිව්‍ය තේජස ප්‍රකාශවීම

එකල සාලමොන් ස්වාමීන්වහන්සේගේ 2

ගිවිසුම් පෙට්ටිය දාවිත්ගේ නුවරවූ
සියොන්හි සිට ගෙනෙන්ට ඉශ්‍රායෙල්ගේ
වැඩිමහල්ලන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ පිය
වංශවල අධිපතීන් වූ ගෝත්‍රවල සියලු
ප්‍රධානීන්ද යෙරුසලමට රැස්කෙරෙවුවේය.
3 සියලු ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝද සත්වෙනි
මාසයේ පැවැත්වූ මංගල්‍යයේදී රජු වෙතට
4 රැස්වූවෝය. ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු
වැඩිමහල්ලන් ආ කල ලෙවීවරු ගිවිසුම්
5 පෙට්ටිය උසුලාගත, පෙට්ටියද
සම්මුඛවීමේ කූඩාරමද කූඩාරමෙහි
තිබුණු සියලු ශුද්ධ භාණ්ඩද ගෙනාවෝය;
පූජකයොත් ලෙවීවරුත් ඒවා ගෙනාවෝය.
6 සාලමොන් රජු හා ඔහු වෙත රැස්ව
සිටිය මුළු ඉශ්‍රායෙල් සභාව කියන්ටවත්
ගණින්ටවත් බැරි තරම් බැටළුවන්ද
ගවයින්ද පූජා කරමින් ගිවිසුම් පෙට්ටිය
7 ඉදිරියෙහි සිටියෝය. පූජකයෝද
ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය අති
ශුද්ධස්ථානය වන ගෘහයේ දේව වාක්‍ය-
ස්ථානයට ගෙනැවිත්, කෙරුබ්වරුන්ගේ
පියාපත් යට ඊට නියම ස්ථානයෙහි
8 තැබුවෝය. එසේ පෙට්ටියේ ස්ථානයට
උඩින් විහිදී තිබුණ කෙරුබ්-
වරුන්ගේ පියාපත්වලට පෙට්ටියත් ඒකේ
9 පොලුත් උඩින් වැසී තිබුණේය. පොලු
දිග බැවින් පොලුවල කෙළවරවල්
ගිවිසුම් පෙට්ටියෙන් පිට දේව වාක්‍ය-
ස්ථානය ඉදිරියෙහි පෙනුණේය; නුමුත්
ඒවා පිටතට පෙනුණේ නැත. ඒවා අද
10 දක්වාම එහි තිබේ. ඉශ්‍රායෙල් පුත්‍රයන්
මිසරයෙන් ආවායින් පසු ස්වාමීන්-
වහන්සේ ඔවුන් සමග ගිවිසුමක් කළ
විට, මෝසෙස් හෝරෙබ්හිදී එහි තිබූ
ගල්ලෑලි දෙක මිස පෙට්ටියේ වෙන
11 කිසිවක් නොතිබුණේය. (එතැන සිටි
පූජකයෝ පන්ති පිළිවෙළ නොපවත්වා,
12 සියල්ලෝම පිරිසිදු වී සිටියෝය. ආසාප්ද
හේමාන්ද යෙදූතූන්ද ඔවුන්ගේ පුත්‍රයෝද
සහෝදරයෝද යන ගීතිකාකාරයෝවූ
ලෙවීවරු සියල්ලෝම සිහින් හණ සළු
හැඳ, අත්තල්ද වීණාද මහ වීණාද ඇතුව,
පූජාසනයට පෙර දිගින් සිටියෝය, ඔවුන්
සමග පූජකයෝ එකසිය විසිදෙනෙක්
නළා පිඹිමින් සිටියෝය.) එවිට පූජකයන් 13
ශුද්ධස්ථානයේ සිට පිටතට අවුත්
ස්වාමීන්වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමට
නළා පිඹින්නන් හා ගීතිකාකාරයන්
එක ශබ්දයක් ඇසෙන පිණිස එක්-
කෙනෙකු මෙන් සිට, නළාවලින්ද
අත්තල්වලින්ද වෙනත් තූර්ය භාණ්ඩ-
වලින්ද: මක්නිසාද උන්වහන්සේ යහ-
පත්ය. උන්වහන්සේගේ කරුණාව
සදාකාලේටම පවත්නේය කියා ස්වාමීන්-
වහන්සේට ප්‍රශංසාකිරීමෙන් ශබ්ද
පැවැත්වූ කල, ගෘහය එනම් ස්වාමීන්-
වහන්සේගේ ගෘහය වලාපටලයෙන් පිරී
ගියේය. ඒ වලාපටලය නිසා පූජකයන්ට 14
සේවය කිරීම පිණිස සිටින්ට බැරිවිය.
මක්නිසාද ස්වාමීන්වහන්සේගේ තේජසින්
දෙවියන්වහන්සේගේ ගෘහය පිරී ගියේය.

## දේවමාලිගාව කැපකිරීම. සාලමොන් රජුගේ යාච්ඤාව

6
එවිට සාලමොන් කථාකොට:
තමන්වහන්සේ ඝනාන්ධකාරයෙහි
වසනසේකැයි ස්වාමීන්වහන්සේ වදාළ-
සේක. නුමුත් මම ඔබට නිවාස ගෘහයක්ද 2
සදාකල්ම ඔබට වැඩසිටීමට ස්ථානයක්ද
ගොඩනැගුවෙමියි කීවේය. රජතෙමේ 3
මුහුණ හරවා මුළු ඉශ්‍රායෙල් සභාව
නැගිට සිටිද්දී මුළු ඉශ්‍රායෙල් සභාවට
ආශීර්වාදකෙළේය. ඔහු කථාකොට 4
කියනුයේ: ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ප්‍රශංසාවේවා, මක්නිසාද
උන්වහන්සේ ස්වකීය මුඛයෙන් මාගේ
පියවූ දාවිත්ට කථාකොට—මා විසින් 5
මාගේ සෙනඟ මිසර දේශයෙන් ගෙනා
දවසේ පටන් මාගේ නාමය එහි වන
පිණිස ගෘහයක් ගොඩනගන්ට සියලු
ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් කිසි නුවරක්
තෝරා නොගතිමි; මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියාව සිටින්ට
කිසි මනුෂ්‍යයෙක්ද තෝරා නොගතිමි.
නුමුත් මාගේ නාමය තැබීමට යෙරුසලමද 6
මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල් කෙරෙහි
ප්‍රධානියා වන පිණිස දාවිත්ද තෝරා-
ගතිමියි කියා ස්වකීය හස්තයෙන් එය

7 ඉෂ්ටකළසේක. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** නාමයට ගෘහයක්
ගොඩනගන්ට මාගේ පියවූ දාවිත්ගේ
8 සිතේ තිබුණේය. නුමුත් **ස්වාමීන්වහන්සේ**
මාගේ පියවූ දාවිත්ට කථාකොට: මාගේ
නාමයට ගෘහයක් ගොඩනගන්ට නුඹේ
සිතේ තිබුණේය, එය නුඹේ සිතේ පැවතීම
9 හොඳය. එසේ වී නුමුත් නුඹ ඒ ගෘහය
ගොඩ නොනගන්නෙහිය; නුඹ තුළෙන්
නික්මෙන නුඹේ පුත්‍රයාම මාගේ නාමයට
ඒ ගෘහය ගොඩනගන්නේයයි කීසේක.
10 **ස්වාමීන්වහන්සේ** තමන් කී වචනය
ඉෂ්ටකර තිබේ; මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** කී හැටියට මම මාගේ
පියවූ දාවිත් වෙනුවෙන් නැගිට ඉශ්‍රායෙල්
සිංහාසනයේ හිඳ, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** නාමයට ගෘහයක්
11 ගොඩනැගුවෙමි. **ස්වාමීන්වහන්සේ**
ඉශ්‍රායෙල් පුත්‍රයන් සමග කළ ගිවිසුම
අඩංගුවූ පෙට්ටිය එහි තැබුවෙමියි කීවේය.
12 එවිට ඔහු මුළු ඉශ්‍රායෙල් සභාව
ඉදිරියෙහි **ස්වාමීන්වහන්සේගේ** පූජාසනය
ඉදිරිපිට සිට තමාගේ අත් විදහා ගත්තේය.
13 මක්නිසාද සාලමොන් පස් රියනක් දිග
ඇති, පස් රියනක් පළල ඇති, තුන්
රියනක් උස ඇති පිත්තල මංචකයක්
සාදා, මළුව මැද තබා තිබුණේය; ඔහු
ඒක උඩ සිට මුළු ඉශ්‍රායෙල් සභාව
ඉදිරියේ දණ නමා, අහස දෙසට
තමාගේ අත් විදහාගන කියනුයේ:
14 ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්ස,**
ස්වර්ගයෙහිවත් පොළොවෙහිවත් ඔබට
සමානවූ දෙවිකෙනෙක් නැත. ඔබ වනාහි
ඔබ ඉදිරියෙහි තමුන්ගේ මුළු සිතින්
හැසිරෙන්නාවූ ඔබගේ මෙහෙකරුවන්
සමග ගිවිසුමත් කරුණාවත් පවත්වන-
15 සේක. ඔබගේ මෙහෙකරුවූ මාගේ පියවූ
දාවිත්ට ඔබ පොරොන්දුවූ දේ ඔබ ඔහුට
ඉෂ්ටකරදුන්සේක. එසේය, ඔබ ස්වකීය
මුඛයෙන් ඒක කියා, අද දවසේ තිබෙන
ප්‍රකාරයට ස්වකීය හස්තයෙන් එය
16 ඉෂ්ටකළසේක. එබැවින්, ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්ස,** ඔබ ස්වකීය
මෙහෙකරුවූ මාගේ පියවූ දාවිත්ට කථා-
කොට: නුඹ මා ඉදිරියෙහි හැසුරුණාක්
මෙන් නුඹේ දරුවෝ මාගේ ව්‍යවස්ථාව
පවත්වන හැටියට තමුන්ගේ මාර්ගය
ගැන ප්‍රවේසම්වන්නෝ නම් ඉශ්‍රායෙල්
සිංහාසනයෙහි හිඳීමට මා ඉදිරියෙහි
නුඹට කෙනෙක් නැතුව නොයන්නේය
කියා ඔබ කී කාරණය ඔහුට ඉෂ්ට
කළමැනව. එබැවින් දැන් ඉශ්‍රායෙල්ගේ 17
දෙවිවූ **ස්වාමීන්වහන්ස,** ඔබගේ
මෙහෙකරුවාවූ දාවිත්ට ඔබ කී ඔබගේ
වචනය ස්ථිරවේවා. නුමුත් දෙවියන්- 18
වහන්සේ සැබවින්ම මනුෂ්‍යයන් සමග
පොළොවේ වසනසේක්ද? ස්වර්ගයද
ස්වර්ගවල ස්වර්ගයද ඔබට ඉඩ මදිය;
එසේ නම් මා විසින් ගොඩනැගූ මේ
ගෘහය ඊටත් වඩා කොපමණ මදිද!
එහෙත්, මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්ස,** 19
ඔබගේ මෙහෙකරුවාගේ යාච්ඤාවද
කන්නලව්වද සලකා, ඔබ ඉදිරියෙහි
ඔබගේ මෙහෙකරුවා ඔප්පුකරන
ඉල්ලීමද යාච්ඤාවද ඇසුව මැනව. ඔබ 20
යම් ස්ථානයක් ගැන–මාගේ නාමය
එහි තබන්නෙමියි කීසේක්ද ඒ ස්ථානය
වන මේ ගෘහය දෙස ඔබගේ ඇස් රෑ
දවල් ඇරී තිබේවා; මේ ස්ථානය දෙසට
හැරී ඔබගේ මෙහෙකරුවා ඔප්පුකරන
යාච්ඤාවද ඇසුව මැනව. ඔබගේ 21
මෙහෙකරුවාද ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්ද මේ ස්ථානය දෙසට
හැරී ඔප්පුකරන ඔවුන්ගේ කන්නලව්වට
කන්දුන මැනව. එසේය, ඔබගේ වාස-
ස්ථානය වන ස්වර්ගයේ සිට ඇසුව
මැනව; අසා කමාකළ මැනව. යමෙක් 22
තමාගේ අසල්වාසියාට විරුද්ධව වරද
කොට, ඔහු දිවුරවන පිණිස දිවුරුමක්
ඔහු පිට තබනලදුව, ඔහු ඇවිත් මේ
ගෘහයේ ඔබගේ පූජාසනය ඉදිරිපිට
දිවුළොත්, ඔබ ස්වර්ගයෙහි සිට අසා 23
වදාරමින්, දුෂ්ටයාට ප්‍රතිඵල දී, ඔහුගේ
මාර්ගය ඔහුගේ හිස පිටට පමුණුවා
ධර්මිෂ්ඨයා නිදොස්කර, ඔහුගේ
ධර්මිෂ්ඨකමේ හැටියට ඔහුට විපාක
දෙමින්, ඔබගේ මෙහෙකරුවන් විනිශ්චය
කළ මැනව. ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල් 24

ඔබට විරුද්ධව පව්කළ බැවින් සතුරා
ඉදිරියෙහි පරාජයවූ කල ඔව්හු ඔබ
වෙතට හැරී ඔබගේ නාමය ප්‍රකාශකර
මේ ගෘහයෙහිදී ඔබට යාච්ඤාකොට
25 කන්නලව්කරන්නෝ නම්, ඔබ
ස්වර්ගයෙහි සිට අසා, ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්වරුන්ගේ පාපය කමාකොට,
ඔවුන්ටත් ඔවුන්ගේ පියවරුන්ටත් ඔබ
දුන් දේශයට ඔවුන් නැවත පැමිණෙවුව
26 මැනව. ඔවුන් ඔබට විරුද්ධව පව්කළ
බැවින් අහස පියවී වර්ෂාව නැතුව යන
විට, ඔබ ඔවුන්ට මෙසේ දඬුවම්කරන
බැවින් ඔව්හු මේ ස්ථානය දෙසට හැරී
යාච්ඤාකොට ඔබගේ නාමය ප්‍රකාශ-
කර තමුන්ගේ පාපය අත්හරින්නෝ
27 නම්, ඔබ ස්වර්ගයෙහි සිට අසා,
ඔවුන් විසින් යා යුතු යහපත් මාර්ගය
ඔවුන්ට පෙන්නාදුන් කල, ඔබගේ
මෙහෙකරුවන්ගෙත් ඔබගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්ගෙත් පාපයට කමාවී,
උරුමයක් කොට ඔබගේ සෙනඟට ඔබ
දී තිබෙන ඔබගේ දේශයට වර්ෂාව
28 එවුව මැනව. දේශයට සාගතයක්
පැමුණුණොත්, නොහොත් වංසගතයක්
ආවොත්, නොහොත් ගොයම් වියළීයාම
හෝ ගොයම් රෝගය හෝ පළඟැටියන්
හෝ දළඹුවන් හෝ පැමුණුණොත්,
ඔවුන්ගේ දේශයේ නුවරවල ඔවුන්ගේ
සතුරන් විසින් ඔවුන් වටලාගන්ට හෝ
මොන පීඩාවක් නුමුත් මොන රෝගයක්
නුමුත් පැමිණෙන්ට හෝ යෙදුණොත්,
29 කොයි මනුෂ්‍යයෙකු විසින් නුමුත්, ඔබගේ
මුළු සෙනඟවූ ඉශ්‍රායෙල් විසින් නුමුත්,
තම තමුන්ගේ සිත්වල පීඩාවද දුකද
දැනගෙන මේ ගෘහය දෙසට තමුන්ගේ
අත් විදහාගෙන යම් යාච්ඤාවක් හෝ
30 කන්නලව්වක් හෝ ඔප්පුකළොත්, ඔබගේ
වාසස්ථානය වන ස්වර්ගයෙහි සිට අසා,
කමාවී, ඔබ අපේ පියවරුන්ට දුන්
භූමිය මතු පිට ඔවුන් ජීවත්වෙන සියලු
දවස්වල ඔබ කෙරෙහි භයවී ඔබගේ
31 මාර්ගවල හැසිරෙන පිණිස, සිත් දන්නාවූ
ඔබ එකිනෙකාට තම තමාගේ සියලු
මාර්ගවල හැටියට විපාක දුන මැනව;
(මක්නිසාද ඔබ පමණක්ම සියලු මනුෂ්‍ය
32 පුත්‍රයන්ගේ සිත් දන්නාසේක.) තවද
ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල් නොවන
විදේශීන් ඔබගේ උතුම් නාමයත් බලවත්
හස්තයත් දිගුකළ බාහුවත් නිසා දුරු
රටක සිට ඇවිත් මේ ගෘහය දෙසට
හැරී යාච්ඤාකළොත්, ඔබගේ සෙනඟවූ 33
ඉශ්‍රායෙල් මෙන් පොළොවේ සියලු
සෙනඟද ඔබගේ නාමය හැඳිනගෙන ඔබ
කෙරෙහි භයවෙන පිණිසත්, මා විසින්
ගොඩනැගූ මේ ගෘහයට ඔබගේ නාමය
තබා තිබෙන බව දැනගන්නා පිණිසත්,
ඔබගේ වාසස්ථානය වන ස්වර්ගයේ
සිට අසා, විදේශියා ඔබගෙන් ඉල්ලන
සියල්ල ලෙස ඔහුට කළමැනව. ඔබගේ 34
සෙනඟ තමුන්ගේ සතුරන්ට විරුද්ධව
යුද්ධකරන්ට ඔබ විසින් යවන යම්
මාර්ගයකින් ගොස්, ඔබ තෝරාගත්
නුවරද ඔබගේ නාමයට මා විසින්
ගොඩනගනලද ගෘහයද දෙසට හැරී
ඔබට යාච්ඤාකරන්නෝ නම්, ඔබ 35
ස්වර්ගයේ සිට ඔවුන්ගේ යාච්ඤාවද
කන්නලව්වද අසා, ඔවුන්ට යුක්තිය
කළමැනව. ඉදින් ඔව්හු ඔබට විරුද්ධව 36
පව්කළොත් (මක්නිසාද පව් නොකරන
කෙනෙක් නැත), ඔබ ඔවුන් කෙරෙහි
උදහස්වී ඔවුන්ගේ සතුරන්ට ඔවුන් පාවා
දුන්නොත්, ඔවුන් වාලට ගන්න අය
විසින් දුර හෝ ළඟ හෝ තිබෙන
දේශයකට ඔවුන් ගෙනයනු ලැබුවොත්,
ඔවුන් වාලුන් කොට ගෙනයනු ලැබූ 37
දේශයේදී ඔවුන් කල්පනාකොට, හැරී,
ඔවුන් වාල්ව සිටින දේශයේදී ඔබට
කන්නලව්කර: අපි පව්කෙළෙමුව, අපි
හිතුවක්කාරකම්කොට දුෂ්ට ලෙස
ක්‍රියාකෙළෙමුයයි කියමින්, ඔවුන් වාලට 38
ගෙනගියවුන්ගේ දේශයෙහිදී ඔවුන්ගේ
මුළු සිතින්ද මුළු ආත්මයෙන්ද ඔබ දෙසට
හැරී, ඔබ ඔවුන්ගේ පියවරුන්ට දුන්
ඔවුන්ගේ දේශයද ඔබ තෝරාගත් නුවරද
ඔබගේ නාමයට මා විසින් ගොඩනැගූ
ගෘහයද දෙසට හැරී යාච්ඤාකරන්නෝ
නම්, ඔබගේ වාසස්ථානය වන 39
ස්වර්ගයේ සිට ඔබ ඔවුන්ගේ යාච්ඤාවද
කන්නලව්වද අසා, ඔවුන්ට යුක්තිය
කොට, ඔබට විරුද්ධව පව්කළාවූ ඔබගේ
සෙනඟට කමාවුව මැනව. දැන්, මාගේ 40
දෙවියන්වහන්ස, මේ ස්ථානයෙහිදී කරන
යාච්ඤාවට ඔබගේ ඇස් ඇරී ඔබගේ

41 කන් යොමුවී තිබේවා. ඉතින්, දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබ නැගිට ඔබගේ
බලයේ ගිවිසුම් පෙට්ටිය සමග ඔබගේ
නිවාසයට වැඩිය මැනව. දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබගේ පූජකයෝ
ගැළවීම පැළඳගෙන සිටිත්වා, ඔබගේ
ශුද්ධවන්තයෝද යසසින් ප්‍රීතිවෙත්වා.
42 දෙවිවූ **ස්වාමීන්වහන්ස**, ඔබගේ අභිෂේක-
ලත් තැනැත්තාගේ මුහුණ ඉවත නො-
හැරෙවුව මැනව. ඔබගේ මෙහෙකරුවූ
දාවිත්ට දුන් කරුණාවල් සිහිකළමැනවයි
කියා යාච්ඤාකෙළේය.

## සාලමොන් රජු පූජා ආදිය පැවැත්වීම

7 සාලමොන් යාච්ඤාකොට නිමකළ
විට අහසින් ගිනි බැස ඇවිත්
දවන පූජාවද යාගයන්ද දවාදැම්මේය;
**ස්වාමීන්වහන්සේගේ** තේජසින් ගෘහය
2 පිරිගියේය. **ස්වාමීන්වහන්සේගේ** තේජසින්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය පිරී තිබුණු
නිසා පූජකයන්ට **ස්වාමීන්වහන්සේගේ**
3 ගෘහයට ඇතුල්වෙන්ට බැරිවිය. සියලු
ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත්
**ස්වාමීන්වහන්සේගේ** තේජය ගෘහය පිට
තිබෙනවාත් දැක, ගල් අතුළ බිමට
තමුන්ගේ මුහුණු නමා නමස්කාරකොට:
මක්නිසාද උන්වහන්සේ යහපත්ය;
උන්වහන්සේගේ කරුණාව සදාකල්
පවත්නේය කියමින් **ස්වාමීන්වහන්සේට**
4 ස්තුතිකළෝය. පසුව රජද මුළු සෙනඟද
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි පූජා ඔප්පු-
5 කළෝය. සාලමොන් රජ ගවයින් විසි
දෙදහසක්ද බැටළුවන් එක්ලක්ෂ විසි
දහසක්ද ඔප්පුකෙළේය. මෙසේ රජද
මුළු සෙනඟද දෙවියන්වහන්සේගේ ගෘහය
6 කැපකළෝය. පූජකයෝද තම තමුන්ගේ
තනතුරුවල යෙදී සිටියෝය; ලෙවීවරුත්
**ස්වාමීන්වහන්සේගේ** තූර්ය භාණ්ඩ
රැගෙන සිටියෝය, ඔවුන් ලවා දාවිත් රජ
ප්‍රශංසාකරවන විට: මක්නිසාද උන්-
වහන්සේගේ කරුණාව සදාකාලේටම
පවත්නේය කියා **ස්වාමීන්වහන්සේට**
ස්තුතිකිරීමට දාවිත් විසින් ඒවා සාදවා
තිබුණේය. පූජකයෝද ඔවුන් ඉදිරිපිටින්
සිට තළා පිඹබෝය; සියලු ඉශ්‍රායෙල්වරුද
නැගිට සිටියෝය. තවද සාලමොන් 7
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය ඉදිරිපිට
තිබුණු මිදුලේ මැද භාගය විශුද්ධ-
කෙළේය; මක්නිසාද ඔහු දවන පූජාද
ශාන්ති පූජාවල තෙලද එහි ඔප්පු-
කෙළේය. එසේ කළේ සාලමොන් සෑදූ
පිත්තල පූජාසනය දවන පූජාවද ආහාර
පූජාවද තෙලද අල්ලන්ට මදි නිසාය.
මෙසේ ඒ කාලයේදී සාලමොන්ද ඔහු 8
සමග සියලු ඉශ්‍රායෙල්වරුද හමාත්ට
ඇතුල්වෙන තැන පටන් මිසරයේ ඔය
දක්වා සිට ආවාවූ ඉතාමහත් සමූහයක්ද
මංගල්‍යය පැවැත්තුවෝය. අටවෙනිද 9
ඔව්හු මංගල්‍ය රැස්වීමක් පැවැත්වූහ.
මක්නිසාද ඔව්හු සත් දවසක් පූජාසනයේ
කැපකිරීමද සත් දවසක් මංගල්‍යයද
පැවැත්තුවෝය. සත්වෙනි මාසයේ විසි 10
තුන්වෙනිද ඔහු සෙනඟ තමුන්ගේ
කූඩාරම්වලට යන්ට හැරියේය, ඔව්හුද
**ස්වාමීන්වහන්සේ** දාවිත්ටත් සාලමොන්ටත්
තමන්ගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ටත් කළ
යහපත ගැන ප්‍රීතිව සන්තෝෂ සිත් ඇතුව
ගියෝය.

## දෙවියන්වහන්සේගේ පොරොන්දු

මෙසේ සාලමොන් **ස්වාමීන්වහන්සේගේ** 11
ගෘහයද රජුගේ ගෘහයද නිමකෙළේය.
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහිත්
තමාගේම ගෘහයෙහිත් කරන්ට
සාලමොන්ගේ සිතට ආ සියල්ලත් ඉෂ්ට
කෙළේය. එවිට **ස්වාමීන්වහන්සේ** රාත්‍රියේ 12
සාලමොන්ට පෙනී කථාකොට: මම
නුඹේ යාච්ඤාව අසා මේ ඉඩම මට
පූජා ගෘහයක් කොට තෝරාගතිමි. වැසි 13
නොවසින ලෙස මම අහස වසන්නෙම්
නම්, නොහොත් රට පාළුකිරීමට
පළඟැටියන්ට අණකරන්නෙම් නම්,
නොහොත් මාගේ සෙනඟ අතරට
වසංගතය එවන්නෙම්නම්, මාගේ නාමය 14
දරන මාගේ සෙනඟ යටත්වී යාච්ඤාකර
මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු
මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ
සිට අසා ඔවුන්ගේ පව් කමාකොට
ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි. දැනුදු 15

මේ ස්ථානයේදී කරන යාච්ඤාවට මාගේ
ඇස් ඇරී මාගේ කන් යොමුකරනු
16 ලැබේ. මෙසේ මාගේ නාමය මේ
ගෘහයෙහි සදාකාලේටම තිබෙන පිණිස
මෙය තෝරාගෙන විශුද්ධ කෙළෙමි.
මාගේ ඇස්ද මාගේ සිතද නිතරම මෙහි
17 වන්නේය. ඉතින් නුඹේ පියවූ දාවිත්
හැසුරුණාක් මෙන් නුඹ මා ඉදිරියෙහි
හැසිරෙමින්, මා විසින් නුඹට අණකළ
සියල්ල ලෙස කරමින්, මාගේ පනත්ද
විනිශ්චයන්ද පවත්වන්නෙහි නම්:
18 ඉශ්‍රායෙල්හි ආණ්ඩුකාරයෙක් වීමට
නුඹෙන් කෙනෙක් නැතිව නොයන්නේය
කියා මා විසින් නුඹේ පියවූ දාවිත්ට
ගිවිස්වූ ලෙස නුඹේ රාජ්‍යයේ
19 සිංහාසනය ස්ථිරකරන්නෙමි. නුමුත්
නුඹලා හැරී මා විසින් නුඹලා ඉදිරියෙහි
තබා තිබෙන මාගේ පනත්ද ආඥාද
අත්හැර ගොස් වෙන දෙවිවරුන්ට
සේවයකර ඔවුන්ට නමස්කාරකරන්නහු
20 නම්, මා විසින් ඔවුන්ට දී තිබෙන මාගේ
දේශයෙන් මම ඔවුන් සහමුලින්ම
පහකරදමන්නෙමි; මාගේ නාමයට මා
විසින් විශුද්ධකළ මේ ගෘහයත් මාගේ
ඇස් හමුයෙන් අහකදමා, ඒක සියලු
ජාතීන් අතරේ උපමාවක්ද නින්ද
21 පාඨයක්ද කරන්නෙමි. මෙපමණ උසස්ව
තිබෙන මේ ගෘහය ළඟින් යන සියල්ලෝ
විස්මයට පත්ව: ස්වාමීන්වහන්සේ මේ
දේශයටත් මේ ගෘහයටත් මක්නිසා
22 මෙසේ කළසේක්දැයි අසන්නෝය. එවිට
මනුෂ්‍යයන් කථාකොට: ඔවුන් මිසර
දේශයෙන් ගෙන ආ ඔවුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ අත්හැර අන්
දෙවිවරුන්ට ඇලුම්ව ඔවුන්ට නමස්කාර-
කොට සේවය කළ නිසා උන්වහන්සේ
මේ සියලු විපත්ති ඔවුන් පිටට
පැමිණෙවූසේකැයි කියනවා ඇතැයි ඔහුට
කීසේක.

## නුවරවල් ගොඩනැගීම. මුහුදෙන් එතර වෙළඳම

8 සාලමොන් ස්වාමීන්වහන්සේගේ
ගෘහයද තමාගේ ගෘහයද ගොඩ-
නැගීමට ගතකළ විසි අවුරුද්දට පසු,
2 හූරාම් විසින් සාලමොන්ට දුන් නුවරවල්
සාලමොන් ගොඩනගා, එහි ඉශ්‍රායෙල්
පුත්‍රයන් වාසයකෙරෙවූවේය.
සාලමොන් හමාත්-සෝබාට ගොස් 3
එය යටත්කරගත්තේය. ඔහු කාන්තාර- 4
යෙහි තද්මෝර්ද හමාත්හි ගොඩනැගූ
ගබඩා-නුවරවල් සියල්ලද ගොඩ-
නැගුවේය. එසේම ඉහළ බෙත්-හෝරොන්ද 5
පහළ බෙත්-හෝරොන්ද යන පවුරු, දොරටු
හා අගුල් ඇති බලකොටු සහිත නුවරවල්ද;
බාලාත්ද සාලමොන්ට තිබුණ සියලු 6
ගබඩා-නුවරවල්ද තමාගේ රථවලට
සියලු නුවරවල්ද තමාගේ අසරුවන්ට
නුවරවල්ද යෙරුසලමෙහිත්, ලෙබනොන්-
හිත්, තමාගේ ආණ්ඩුවට අඩංගුවූ මුළු
දේශයෙහිත් සාලමොන් තමාගේ සතුට
පිණිස ගොඩනගන්ට කැමතිවූ සියල්ලද
ගොඩනැගුවේය. ඉශ්‍රායෙල්ගෙන් නුවූ, 7
ඉශ්‍රායෙල් පුත්‍රයන් විසින් විනාශනොකළාවූ
හිත්තිවරුන්ගෙන්ද අමෝරිවරුන්ගෙන්ද
පෙරිස්සිවරුන්ගෙන්ද හිව්වරුන්ගෙන්ද 8
යෙබූසිවරුන්ගෙන්ද ඉතිරිවූ මුළු සෙනඟට
පසුව දේශයෙහි ඉතිරිව සිටියාවූ ඔවුන්ගේ
පුත්‍රයන් සාලමොන් අද දවස දක්වා
රාජකාරියට ගත්තේය. නුමුත් ඉශ්‍රායෙල් 9
පුත්‍රයන්ගෙන් සාලමොන් තමාගේ වැඩට
කිසිවෙකු දාසයෙකු කොට පත් නොකෙළේය.
ඔව්හු වනාහි යුද්ධ කාරයෝව ඔහුගේ
අධිපතියෝව ඔහුගේ රථාධිපතියෝව
ඔහුගේ අසරුවෝව සිටියෝය. සෙනඟ 10
කෙරෙහි ආණ්ඩුකළාවූ ප්‍රධාන
මුලාදෑනිවරුන් දෙසිය පනස්දෙනෙකුත්
සාලමොන් රජුට සිටියෝය. සාලමොන් 11
වනාහි ඵාරාවෝගේ දුව දාවිත්ගේ නුවරින්
කැඳවාගෙන විත්, ඇය උදෙසා ගොඩනැගූ
ගෘහයට ගෙනාවේය. මක්නිසාද:
ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය
පැමුණුණ ස්ථාන ශුද්ධ බැවින් මාගේ
භාර්යාවක් ඉශ්‍රායෙල් රජවූ දාවිත්ගේ
ගෘහයෙහි නොවිසිය යුතුයයි ඔහු කීවේය.
එකල සාලමොන් ද්වාරමණ්ඩපය 12
ඉදිරිපිට තමා ගොඩනගා තිබුණ
ස්වාමීන්වහන්සේගේ පූජාසනය පිට
ස්වාමීන්වහන්සේට දවන පූජා ඔප්පු-
කෙළේය. සබත් දවස්වලදීද අමාවක්- 13
වලදීද නියම මංගල්‍යවලදීද අවුරුද්දට
තුන්වතාවක් පවත්වන මුහුන් නැති
රොටි මංගල්‍යයේදීද සති මංගල්‍යයේදීද

කූඩාරම් මංගල්‍යයේදීද මෝසෙස්ගේ
ආඥාවේ හැටියට එක එක දවසට සුදුසු
14 ලෙස ඔහු පූජා ඔප්පුකෙළේය. තවද ඔහු
තමාගේ පියවූ දාවිත්ගේ නියෝගය ලෙස
පූජක පන්ති ඔවුන්ගේ සේවයටද ලෙවී-
වරුන් එක එක දවසට සුදුසු ලෙස
පූජකයන් ඉදිරියෙහි සේවයකිරීමත්
ප්‍රශංසාකිරීමත් යන ඔවුන්ට භාරවූ
වැඩටද දොරටුපාලයන් ඔවුන්ගේ
පන්තිවල හැටියට එක එක දොරටුවටද
නියමකෙළේය. මක්නිසාද දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාවූ දාවිත් මෙසේ
15 අණකර තිබුණේය. කොයි කාරණයක්
ගැනවත් අගනා වස්තු ගැනවත්
පූජකයන්ට සහ ලෙවීවරුන්ට රජු දුන්
ආඥාවෙන් ඔව්හු ඉවත් නොවූහ.
16 **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ අත්තිවාරම
ලූ දවස දක්වාත් ඒක නිමවන තුරුත්
සාලමොන්ගේ සියලු වැඩ සූදානම්ව
තිබුණේය. මෙසේ **ස්වාමීන්වහන්සේගේ**
ගෘහය සම්පූර්ණ විය.
17 එකල සාලමොන් ඒදොම් දේශයේ
මුහුදුබඩ තිබෙන එශියොන්-ගෙබෙර්ටත්
18 ඒලොත්ටත් ගියේය. හූරාම් තමාගේ
සේවකයන් අත නැව්ද මුහුදේ කාරණා
දත්තාවූ සේවකයන්ද ඔහු වෙතට එවුවේය;
ඔව්හු සාලමොන්ගේ සේවකයන් සමග
ඕෆීර්ට ගොස් එතැනින් රත් තලෙන්ත
හාරසිය පනහක් සාලමොන් රජු වෙතට
ගෙනාවෝය.

## ෂෙබාහි බිසවගේ පැමිණීම

9 ෂෙබාහි බිසව සාලමොන්ගේ කීර්තිය
අසා ගැටලු ප්‍රශ්නවලින් ඔහු
පරීක්ෂාකරන පිණිස ඉතා මහත්
පිරිවරක්ද සුවඳ ද්‍රව්‍ය සහ රන් මහත්
රාශියකුත් අනර්ඝ ගලුත් පැටවූ ඔටුවන්ද
ඇතුව යෙරුසලමට ආවාය. ඈ
සාලමොන් වෙතට පැමිණ ඈගේ සිතේ
තිබුණු සියල්ල ගැන ඔහු සමග
2 කථාකළාය. සාලමොන්ද ඈගේ සියලු
ප්‍රශ්න ඈට තෝරා කීයේය. ඈට පැහැදිලි
කළ නොහැකිවන ලෙස කිසිවක්
සාලමොන්ගෙන් සැඟවී නොතිබුණේය.
3 ෂෙබාහි බිසව සාලමොන්ගේ ප්‍රඥාවද
ඔහු විසින් ගොඩනගනලද ගෘහයද
ඔහුගේ මේසයේ කෑමද ඔහුගේ 4
මෙහෙකරුවන්ගේ හිඳීම හා ඔහුගේ
ඇමතියන්ගේ සේවයද ඔවුන්ගේ ඇඳුම්ද
ඔහුගේ පානපාත්‍රා දරන්නන් හා ඔවුන්ගේ
ඇඳුම්ද ඔහු **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
නගින පඩි පෙළද දුටු කල ඕතොම
මවිතවූවාය. ඈ රජුට කථාකොට: 5
මාගේ දේශයේදී ඔබගේ කාරණාද ඔබගේ
ප්‍රඥාවද ගැන මා ඇසූ ප්‍රවෘත්තිය සැබෑය.
එසේ වී නුමුත් ඇවිත් මාගේම ඇස්වලින් 6
දකින තුරු ඔවුන්ගේ වචන විශ්වාස
නොකෙළෙමි. ඔබගේ ප්‍රඥාවේ මහත්කමෙන්
අර්ධයක්වත් මට නොකියනලද්දේය. මා
ඇසූ කීර්ති ප්‍රමාණයටත් වඩා ඔබ
උසස්ව සිටිනෙහිය. ඔබගේ මිනිස්සු 7
වාසනාවන්තයෝය, ඔබ ඉදිරියෙහි
නිතරම සිට ඔබගේ ප්‍රඥාව අසන ඔබගේ
මේ මෙහෙකරුවෝ වාසනාවන්තයෝය.
ඔබගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** උදෙසා 8
රජකොට තමන්ගේ සිංහාසනයෙහි ඔබ
පිහිටුවන්ට ඔබ කෙරෙහි ප්‍රසන්නවූ ඔබගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසාවේවා.
ඔබගේ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට
ප්‍රේමකළ බැවින් ඔවුන් සදාකාලයටම
ස්ථිරකරන පිණිස ඔවුන්ට විනිශ්චයත්
යුක්තියත් ඉෂ්ට කරන්ට උන්වහන්සේ
ඔබ ඔවුන් කෙරෙහි රජකොට පත්කළ-
සේකැයි කීවාය. තවද ඕතොම රන් 9
තලෙන්ත එකසිය විස්සක්ද සුගන්ධ ද්‍රව්‍ය
මහත් රාශියක්ද අනර්ඝ ගල්ද රජුට
දුන්නාය. ෂෙබාහි බිසව සාලමොන්
රජුට දුන් සුගන්ධ ද්‍රව්‍ය සමාන ඒවා
තවත් නොලැබුණේය. ඕෆීර් සිට 10
රන් ගෙනා හූරාම්ගේ සේවකයෝද
සාලමොන්ගේ සේවකයෝද හඳුන් ලී
සහ අනර්ඝ ගල් ගෙනාවෝය. රජ ඒ 11
හඳුන් ලීවලින් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි සහ රාජ ගෘහයෙහිත්
*ගරාදිවැටවල්ද ගායනාකාරයන්ට
වීණා සහ කුඩා වීණාද සෑදෙවුවේය.
ඊට පළමුවෙන් එබඳු ඒවා යූදා දේශයේ
නොදක්නා ලද්දේය. ෂෙබාහි බිසව 12

*නොහොත්, පඩි පෙළවල්.

සාලමොන් රජුට ගෙනාවාවූ දේවල්
වෙනුවට දුන් ඒවා හැර ඈගේ මුළු
කැමැත්තලෙස ඈ ඉල්ලූ සියල්ලත් රජ-
තෙමේ ඈට දුන්නේය. මෙසේ ඈත් ඈගේ
සේවකයොත් තමුන්ගේ දේශයට හැරී
ගියෝය.

## සාලමොන් රජුගේ ඓශ්වර්යය

13 සාලමොන්ට ගමන්කාර වෙළෙන්දන්-
ගෙන්ද වෙනත් වෙළඳුන්ගෙන්ද ලැබුණ
රන් හැර අවුරුද්දකට ලැබුණු රන්වල
බර තලෙන්ත හසිය හැටහයක්ය.
14 අරාබියේ සියලු රජවරුද දේශයේ
ආණ්ඩුකාරයෝද සාලමොන්ට රන් රිදී
15 ගෙනාවෝය. සාලමොන් රජ තළාපු
රනින් පලිස් දෙසියයක් සෑදුවේය. එක
එක පලිහට තලාපු රන් ෂෙකෙල් හසියයක්
16 ඇල්ලුවේය. ඔහු කුඩා පලිස් තුන්සියයක්
තළාපු රනින් සෑදුවේය; එක එක කුඩා
පලිසට රන් ෂෙකෙල් තුන්සියයක්
ඇල්ලුවේය. රජ ලෙබනොන් වනය නම්
17 ගෘහයෙහි ඒවා තැබුවේය. තවද රජ
ඇත්දත්වලින් මහත් සිංහාසනයක් සාද
18 පවිත්‍ර රනින් ඒක වැසුවේය. සිංහාසනයට
සවිකළ පඩි හයක්ද රන් පාපුටුවක්ද
ආසනයේ දෙපැත්තෙහි අත්දඬු සහ අත්දඬු
ළඟ සිංහ රූප දෙකක්ද තිබුණේය.
19 පඩි හය පිට දෙපැත්තේ සිංහ රූප
දෙළොසක්ද වූහ. කොයි රාජ්‍යයකවත්
එබඳු එකක් සාද තිබුණේ නැත.
20 සාලමොන් රජුගේ පානපාත්‍රා සියල්ලම
රනින් වූයේය, ලෙබනොන් වනය නම්
ගෘහයෙහි සියලු භාජනත් පවිත්‍ර රනින්
විය. සාලමොන්ගේ දවස්වලදී රිදී අගයක්
21 නොවීය. මක්නිසාද හූරාම්ගේ සේවකයන්
සමග තර්ෂීෂ්ට යන නැව් රජුට
තිබුණේය. ඒ තර්ෂීෂ් නැව්වලින් රන්ද
රිදීද ඇත්දත්ද වඳුරන්ද මොනරුන්ද තුන්
අවුරුද්දකට වරක් ගෙනෙන ලද්දේය.
22 මෙසේ සාලමොන් රජ වස්තුවෙනුත්
ප්‍රඥාවෙනුත් පොළොවේ සියලු රජවරුන්ට
23 වඩා උතුම්ව සිටියේය. දෙවියන්වහන්සේ
සාලමොන්ගේ සිතේ තබා තිබුණු ප්‍රඥාව
අසන පිණිස පොළොවේ සියලු රජවරු
ඔහු වෙතට ආවාහ. ඔව්හු අවුරුද්දෙන් 24
අවුරුද්ද තම තමුන්ගේ තෑගි වන රිදී
භාජනද රන් භාජනද වස්ත්‍රද යුද්ධා-
යුධද සුගන්ධ ද්‍රව්‍යද අශ්වයන්ද අශ්ව-
තරයන්ද නියම ගණනක් ගෙනාවෝය.
සාලමොන්ට ගාල් හාර දහසක 25
අශ්වයෝ සිටියෝය, රථද තිබුණේය.
අසරුවෝ දෙළොස් දහසකුත් සිටියෝය.
රජ ඒවා රථ-නුවරවලද තමා ළඟ
යෙරුසලමෙහිද තැබුවේය. ඔහු ගංගාවේ 26
පටන් පිලිස්තිවරුන්ගේ දේශය සහ
මිසරයේ සීමාව දක්වා සිටිය සියලු
රජවරුන් කෙරෙහි ආණ්ඩුකෙළේය. තවද 27
රජ යෙරුසලමෙහි, රිදී ගල් මෙන්ද කිහිරි
ලී පාත රටේ තිබෙන අත්තික්කා ගස්
මෙන්ද බොහෝ වෙන්ට සැලැස්සුවේය.
මිසරයෙනුත් සියලු දේශවලිනුත් අශ්වයෝ 28
සාලමොන්ට ගෙනෙනලදහ.
සාලමොන්ගේ අතික් ක්‍රියා මුල පටන් 29
අග දක්වා ප්‍රොපේතවූ නාතාන්ගේ
ඉතිහාසයේද ෂිලෝනිය අහියාගේ
අනාගතවාක්‍යයේද නෙබාත්ගේ පුත්‍රවූ
යෙරොබොවම් ගැන දිවස් ඇත්තා වන
ඉද්දෝ ලියූ දර්ශනයේද ලියා තිබෙනවා
නොවේද? සාලමොන් මුළු ඉශ්‍රායෙල් 30
කෙරෙහි යෙරුසලමෙහි හතළිස් අවුරුද්දක්
රජකම්කෙළේය. සාලමොන් තමාගේ 31
පියවරුන් හා සමග සැතපී තමාගේ
පියවූ දාවිත්ගේ නුවර තැන්පත්කරනු ලැබීය.
ඔහුගේ පුත්‍රවූ රෙහොබොවම් ඔහු
වෙනුවට රජවිය.

## රෙහොබොවම් රජකමට පැමිණීම. ගෝත්‍ර දශය කැරළිගැසීම

10 තවද රෙහොබොවම් ෂෙකෙම්ට
ගියේය. මක්නිසාද ඔහු රජකමට
පත්කරන පිණිස සියලු ඉශ්‍රායෙල්වරු
ෂෙකෙම්ට ආවෝය. සාලමොන් රජු 2
ඉදිරියෙන් පලා ගොස් සිටි නෙබාත්ගේ
පුත්‍රවූ යෙරොබොවම් මිසරයේදී ඒ බව
අසා මිසරයෙන් හැරී ආයේය. ඔව්හු 3
පණිවිඩයක් යවා ඔහු ගෙන්වාගත්තෝය;
එවිට යෙරොබොවම්ද සියලු ඉශ්‍රායෙල්වරුද
ඇවිත් රෙහොබොවම්ට කථාකොට:

4 ඔබගේ පියාණෝ අපේ වියගහ බර
කළහ. ඒ නිසා ඔබගේ පියාණන්ගේ
අමාරු සේවයද ඔහු අප පිට තැබූ
ඔහුගේ බර වියගහද සැහැල්ලුකළ මැනවි,
එවිට අපි ඔබට සේවයකරන්නෙමුයයි
5 කීවෝය. ඔහුද: තුඹලා තුන් දවසකින්
නැවත මා ළඟට වරෙල්ලායයි ඔවුන්ට
6 කීවේය. සෙනඟ ගියෝය. රෙහොබෝවම්
රජ තමාගේ පියවූ සාලමොන් ජීවත්ව
සිටියදී ඔහු ඉදිරියෙහි සිටි වැඩිමහල්ලන්
සමග මන්ත්‍රණයකරමින්: මා විසින් මේ
සෙනඟට උත්තරදෙන පිණිස තුඹලා
මන්ත්‍රණයකර කියන්නේ කුමක්දැයි
7 ඇසුවේය. ඔව්හුද: ඔබ මේ සෙනඟට
කරුණාවන්තව, ඔවුන් ප්‍රසන්නකොට,
ප්‍රිය වචන ඔවුන්ට කථාකළොත්, ඔවුන්
සෑම කල්හිම ඔබගේ මෙහෙකරුවන්
8 වෙනවා ඇතැයි ඔහුට කීවෝය. එහෙත්
වැඩිමහල්ලන් ඔහුට දුන්නාවූ දනම්තිකම
ඔහු අත්හැර, තමා සමග වැඩුණාවූ
තමා ඉදිරියෙහි සිටි තරුණයන් සමග
9 මන්ත්‍රණයකරමින්: ඔබගේ පියාණන් අප
පිට තැබූ වියගහ සැහැල්ලු කළ මැනවැයි
මට කීවාවූ මේ සෙනඟට උත්තර දෙන
පිණිස තුඹලා මන්ත්‍රණයකර කියන්නේ
10 කුමක්දැයි ඔවුන්ගෙන් ඇසුවේය. ඔහු
සමග වැඩුණ තරුණයෝ ඔහුට
කථාකොට: ඔබගේ පියාණෝ අපේ
වියගහ බරකළහ, එහෙත් ඔබ ඒක අපට
සැහැල්ලුකළ මැනවැයි කියා ඔබට කීවාවූ
ඒ සෙනඟට ඔබ කථාකොට—මාගේ
පියාණන්ගේ තුනටියට වඩා මාගේ
11 හුළඟිල්ල ලොකුය. මාගේ පියාණෝ
තුඹලා පිට බර වියගහක් තැබුවාහ,
මම තුඹලාගේ වියගහ වඩා බර
කරන්නෙමි. මාගේ පියාණෝ කසවලින්
තුඹලාට දඬුවම්කළහ, මම වනාහි
තුඹලාට ගෝනුස්සන්ගෙන් දඬුවම්-
කරන්නෙමියි කිය යුතුයයි කීවෝය.
12 තුන්වෙනිද නැවත මා ළඟට වරෙල්ලා-
යයි රජ කී හැටියට යෙරොබෝවම්ද
මුළු සෙනඟද තුන්වෙනිද රෙහොබෝවම්
13 ළඟට ආවෝය. රජ ඔවුන්ට රළු
ලෙස උත්තරදෙමින්, වැඩිමහල්ලන්ගේ
14 මන්ත්‍රණය අත්හැර, තරුණයන්ගේ
මන්ත්‍රණය ප්‍රකාර ඔවුන්ට කථාකොට:
මාගේ පියාණෝ තුඹලාගේ වියගහ
බරකළහ, මම එය වඩා බරකරන්-
නෙමි. මාගේ පියාණෝ කසවලින්
තුඹලාට දඬුවම්කළහ, මම තුඹලාට
ගෝනුස්සන්ගෙන් දඬුවම්කරන්නෙමියි
කීවේය. මෙසේ රජ සෙනඟට ඇහුම්කන් 15
නුදුන්නේය; මක්නිසාද ස්වාමීන්වහන්සේ
ෂිලෝනිය අහියා ලවා නෙබාත්ගේ පුත්‍රවූ
යෙරොබෝවම්ට කියෙවූ ස්වකීය වචනය
ඉෂ්ටකරන පිණිස ඒ කාරණය දෙවියන්-
වහන්සේගෙන් පැමුණුණේය. සියලු 16
ඉශ්‍රායෙල්වරු රජ තමුන්ට ඇහුම්කන්
නුදුන් බව දුටු කල, සෙනඟ රජුට
උත්තරදෙමින්: දාවිත්ගෙන් අපට ඇති
කොටස කිමෙක්ද? යෙස්සේගේ පුත්‍රයා-
ගෙන් අපට උරුමයක් නැත. ඉශ්‍රායෙල්-
වරුනි, තුඹලාගේ කූඩාරම්වලට
පලයල්ලා. ඉතින් දාවිත්නි, තුඹේම වංශය
බලාගනින්නැයි කීවෝය. මෙසේ සියලු
ඉශ්‍රායෙල්වරු තමුන්ගේ කූඩාරම්වලට
ගියෝය. තුමූත් යූද නුවරවල විසූ 17
ඉශ්‍රායෙල් පුත්‍රයන් කෙරෙහි රෙහොබෝවම්
රජකම්කෙළේය. එවිට රෙහොබෝවම් 18
රජ රාජකාරියේ මුලාදෑනියාවූ හදෝරාම්
යැවුවේය; ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඔහුට ගල්ගසා
ඔහු මැරුවෝය. එවිට රෙහොබෝවම්
රජ යෙරුසලමට පලායන පිණිස ඉක්මනින්
රථයට නැගුණේය. මෙසේ අද දවස 19
දක්වා තිබෙන පරිදි ඉශ්‍රායෙල්වරු
දාවිත්ගේ වංශයට විරුද්ධව කැරළිගැසූහ.

11 රෙහොබෝවම් යෙරුසලමට
පැමුණුණ විට, තමාට රාජ්‍යය
නැවත ලබාගන්ට ඉශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව යුද්ධකරන පිණිස ඔහු යූද
වංශයද බෙන්යමින් වංශයද වන තෝරාගත්
යුද්ධකාරයන් එක්ලක්ෂ අසූදහසක්
රැස්කෙළේය. තුමුත් ස්වාමීන්වහන්සේගේ 2
වචනය දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ
ෂෙමායා වෙතට පැමිණ කියනුයේ:
තුඹ සාලමොන්ගේ පුත්‍රවූ යූදහි 3
රජවූ රෙහොබෝවම්ටත් යූද සහ
බෙන්යමින්හි සියලු ඉශ්‍රායෙල්වරුන්ටත්
කථාකොට—තුඹලා නොයල්ලා, 4
තුඹලාගේ සහෝදරයන්ට විරුද්ධව යුද්ධ
නොකරල්ලා, එක එකා තම තමාගේ
ගෙදරට හැරී පලයල්ලා; මක්නිසාද

මේ කාරණය පැමුණුණේ මාගෙන්ය
කියා ස්වාමීන්වහන්සේ වදරනසේකැයි
කියාපන්නැයි කීය. එවිට ඔව්හු ස්වාමීන්-
වහන්සේගේ වචනවලට ඇහුම්කන්දී,
යෙරොබොවම්ට විරුද්ධව නොගොස්
හැරී ආවෝය.

## රෙහොබොවම් විසින් යූද රාජ්‍යය ස්ථිරකරගැනීම

5 රෙහොබොවම් යෙරුසලමෙහි වාසය
කරමින් ආරක්ෂාව පිණිස යූදහි නුවරවල්
6 ගොඩනැගුවේය. ඔහු බෙත්-ලෙහෙම්,
7 ඒතාම්, තෙකෝවා, බෙත්-ශූර්, සෝකෝ,
8,9 අදුල්ලාම්, ගාත්, මාරේෂා, ශීප්, අදෙරයිම්,
10 ලාකීෂ්, අසේකා, ශොරා, අයාලොන්,
හෙබ්‍රොන් යන යූදහිද බෙන්යමින්හිද
තිබෙන නුවරවල් බලකොටු නුවරවල්
11 කෙළේය. ඔහු බලකොටු සවිකර, එහි
අධිපතීන් සිටුවා, ආහාර සහ තෙල්ද
12 මුද්‍රිකපානයද රැස්කොට තැබුවේය. යළිත්
හෙතෙම එක එක නුවර පලිස් සහ
හෙල්ල තබා, ඒවා ඉතා බලවත් ලෙස
සවිකෙළේය. ඔහුට තිබුණේ යූද
13 සහ බෙන්යමින් ප්‍රදේශවල්ය. සියලු
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි සිටි පූජකයෝද
ලෙවීවරුද තමුන්ගේ සියලු පළාත්වලින්
14 ඔහු වෙතට ආවෝය. මක්නිසාද
යෙරොබොවම් සහ ඔහුගේ පුත්‍රයන්
විසින් ස්වාමීන්වහන්සේගේ පූජක
තනතුරෙන් ලෙවීවරුන් අහක්කළ නිසා,
ඔව්හු තමුන්ගේ පිට-බිම්ද තමුන්ගේ
උරුමයද අත්හැර යූදටත් යෙරුසලමටත්
15 ආවෝය. තවද ඔහු තමා විසින් සෑදූ
උස්තැන්වලටත් *එළුවන්ටත් වස්සන්ටත්
16 පූජකයන් පත්කරගත්තේය. යළිදු, ලෙවී-
වරුන්ට පසු සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින්
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ සොයන්ට තමුන්ගේ සිත්
යොමුකරගත් අය තමුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට පූජාකරන
17 පිණිස යෙරුසලමට ආවෝය. මෙසේ
ඔව්හු යූද රාජ්‍යය ශක්තිමත්කොට
සාලමොන්ගේ පුත්‍රවූ රෙහොබොවම් තුන්
අවුරුද්දකට ස්ථිරකළෝය. මක්නිසාද
ඔව්හු තුන් අවුරුද්දක් දාවිත්ගේද
සාලමොන්ගේද මාර්ගයෙහි හැසුරුණෝය.
තවද රෙහොබොවම් දාවිත්ගේ පුත්‍රවූ 18
යෙරීමොත්ගේද යෙස්සේගේ පුත්‍රවූ
එලියාබ්ගේ දුව වන අබිහයිල්ගේද දූවූ
මාහලත් භාර්යාව කොට පාවාගත්තේය.
ඈ යෙවූෂ්ද ෂෙමරියාද සාහම්ද යන 19
පුත්‍රයන් ඔහු නිසා වැදුවාය. ඈට පසුව 20
ඔහු අබ්සලොම්ගේ දූවූ මයකා පාවා-
ගත්තේය; ඈ අබියාද අත්තයිද සීසාද
ෂෙලොමිත්ද ඔහු නිසා වැදුවාය.
රෙහොබොවම් තමාගේ සියලු භාර්යා- 21
වන්ටත් උප භාර්යාවන්ටත් වඩා
අබ්සලොම්ගේ දූවූ මයකාට ආදරවිය.
ඔහු භාර්යාවන් දහඅටදෙනෙකුත් උප
භාර්යාවන් හැටදෙනෙකුත් පාවා-
ගත්තේය, පුත්‍රයන් විසිඅටදෙනෙක්ද
දූවරුන් හැටදෙනෙක්ද ඔහුට උපන්නෝය.
රෙහොබොවම් මනාහි මයකාගේ පුත්‍රවූ 22
අබියා රජකමට පත්කරන්ට සිතා ඔහු
ඔහුගේ සහෝදරයන් අතරේ අධිපතියා
කොට ප්‍රධානකමට පත්කෙළේය. ඔහු 23
නුවණින් හැසිර, තමාගේ සියලු පුත්‍රයන්-
ගෙන් කීපදෙනෙක් යූදහිත් බෙන්යමින්හිත්
පළාත් මුළුල්ලෙහි එනම් සියලු බලකොටු
නුවරවලට බෙද යවා, බොහෝසෙයින්
ඔවුන්ට ආහාර දුන්නේය. ඔවුන්ට
බොහෝ භාර්යාවන්ද සොයාදුන්නේය.

## මිසරයේ ෂීෂක් රජුගේ වටලෑම රෙහොබොවම්ගේ මරණය

12 තවද රෙහොබොවම්ට රාජ්‍යය
ස්ථිරවී ඔහු බලවත්වූ කල්හි,
ඔහුත් සියලු ඉශ්‍රායෙල්වරුත් ස්වාමීන්-
වහන්සේගේ ව්‍යවස්ථාව අත්හැරියෝය.
ඔවුන් ස්වාමීන්වහන්සේට විරුද්ධව 2
ද්‍රෝහිකම්කළ නිසා රෙහොබොවම්
රජුගේ පස්වෙනි අවුරුද්දේදී මිසරයේ
රජවූ ෂීෂක්, දෙළොස් සියයක් රථද 3
සැටදහසක් අසරුවන්ද ඇතුව
යෙරුසලමට විරුද්ධව ආයේය; ඔහු

*හෙවත්, වන දේවතාවන්ටත්.
ලෙවී. 17.7 බලනු.

සමග මිසරයෙන් ආ සෙනඟ වන
ලුබිවරුද සුක්කිවරුද කූෂ්වරුද
4 ගණනාවක් නැතුව සිටියෝය. ඔහු යූදට
අයිති බලකොටු නුවරවල් අල්ලා, පසුව
5 යෙරුසලම දක්වා ආයේය. එවිට
ප්‍රොපේතවූ ෂෙමායා රෙහොබොවම්
වෙතටත් ෂීෂක්ට භයින් යෙරුසලමෙහි
රැස්ව සිටි යූදහි අධිපතීන් වෙතටත් ඇවිත්
ඔවුන්ට කථාකොට: නුඹලා මා අත්-
හැරියහුය, එබැවින් මමත් නුඹලා ෂීෂක්
අතට අත්හැරියෙමියි **ස්වාමීන්වහන්සේ**
6 වදාරනසේකැයි කීවේය. එවිට ඉශ්‍රායෙල්හි
අධිපතීහුද රජද යටත්වී: **ස්වාමීන්-**
7 **වහන්සේ** ධර්මිෂ්ඨසේකැයි කීවෝය. ඔවුන්
යටත්වූ බව **ස්වාමීන්වහන්සේ** දුටු විට
උන්වහන්සේගේ වචනය ෂෙමායා වෙතට
පැමිණ: ඔව්හු යටත්වූවෝය; මම ඔවුන්
විනාශ නොකොට ස්වල්ප කලකින්
ඔවුන්ට ගැළවීම දෙන්නෙමි, මාගේ
උදහසද ෂීෂක් අතින් යෙරුසලම පිටට
8 වගුරුවනු නොලබන්නේය. එසේ වී නුමුත්
මාගේ සේවයද දේශවල රාජ්‍යයන්ගේ
සේවයද ඔවුන් දැනගන්නා පිණිස ඔව්හු
ඔහුගේ සේවකයෝ වන්නෝයයි වදාළසේක.
9 මෙසේ මිසරයේ රජවූ ෂීෂක් යෙරුසලමට
විරුද්ධව ඇවිත් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේ වස්තුද රජගෙයි තිබුණු වස්තුද
හැරගෙන ගියේය; ඔහු සියල්ලම ගෙන-
ගියේය. සාලමොන් සෑදූ රන් පලිස්ද
10 ඔහු ගෙනගියේය. රෙහොබොවම් රජ
ඒ වෙනුවට පිත්තල පලිස් සාද රජගෙයි
දොරකඩ රැකවල්කළ මුරකාරයන්ගේ
11 අධිපතීන් අතට භාරදුන්නේය. රජු
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට එන සියලු
ප්‍රස්තාවයන්හිදී මුරකාරයෝ ඒවා
ඔසවාගෙන ඇවිත් නැවත මුරගෙට
12 ගෙනගියෝය. තවද ඔහු යටත්වුණ විට
ඔහු මුළුමනින්ම විනාශ නොකරන
හැටියට **ස්වාමීන්වහන්සේගේ** උදහස ඔහු
කෙරෙන් හැරුණේය. ඇරත් යූදහිද යහපත්
13 දේ සම්බවුණේය. මෙසේ රෙහොබොවම්
රජ යෙරුසලමෙහි ස්ථිරවී රජකම්-
කෙළේය. රෙහොබොවම් තෙම රජවෙන
කල සතළිස් එක් අවුරුද්දක් වයස්ව
සිටියේය, ඔහු **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
නාමය තබන්ට සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රවලින් තෝරාගත් නුවරවූ
යෙරුසලමෙහි දහහත් අවුරුද්දක්
රජකම්කෙළේය. අම්මොනිය ස්ත්‍රියෙක්වූ
ඔහුගේ මවුගේ නම නයමාය. ඔහු 14
**ස්වාමීන්වහන්සේ** සෙවීමට තමාගේ සිත
යොමුනොකර නපුරුකම් කෙළේය. මුල 15
පටන් අන්තිම දක්වා රෙහොබොවම්ගේ
ක්‍රියා ප්‍රොපේතවූ ෂෙමායාගේද ඉද්දෝ
නම් දිවස් ඇත්තාගේද කථාන්තරවල
පරම්පරා වශයෙන් ලියා තිබෙනවා
නොවේද? රෙහොබොවම් සහ
යෙරොබොවම් අතරේ නිතරම යුද්ධ
පැවතුණේය. රෙහොබොවම් තමාගේ 16
පියවරුන් සමග සැතපී දාවිත්ගේ නුවර
තැන්පත්කරනලද්දේය. ඔහුගේ පුත්‍රවූ
අබියා ඔහු වෙනුවට රජවුණේය.

## අබියා යෙරොබොවම් සමග යුද්ධකොට ජයගැනීම

13
යෙරොබොවම් රජුගේ දහඅටවෙනි
අවුරුද්දේදී අබියා යූද කෙරෙහි
රජවී තුන් අවුරුද්දක් යෙරුසලමෙහි 2
රජකම්කෙළේය. ඔහුගේ මවුගේ නම
මීකායාය, ඈ ගිබියාහි උරියෙල්ගේ
දුවෙක්ය. අබියාද යෙරොබොවම්ද
අතරේ යුද්ධ තිබුණේය. එවිට අබියා 3
යුද්ධයට බලවන්තයන්වූ තෝරාගත්
මනුෂ්‍යයන් සාරලක්ෂයකින් යුත්
සේනාවක් ඇතුව යුද්ධාරම්භකෙළේය.
යෙරොබොවම්ද ඔහුට විරුද්ධව බල-
සම්පන්න තෝරාගත් මනුෂ්‍යයන්
අටලක්ෂයක් ඇතුව යුද්ධ පිළිවෙළින්
සිටියේය. එවිට අබියා එප්‍රායිම් කඳු 4
රටේ තිබෙන ශෙමරායිම් කන්ද උඩ
සිට කියනුයේ: යෙරොබොවම් සහ සියලු
ඉශ්‍රායෙල්වරුනි, මාගේ බස් අසාපල්ලා;
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** 5
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි රජකම්කිරීම
දාවිත්ටද ඔහුගේ පුත්‍රයන්ටද ලුණු
ගිවිසුමකින් සදකාලේටම දුන් බව නුඹලා
දැනගතයුතු නොවේද? එහෙත් දාවිත්ගේ 6
පුත්‍රයා වන සාලමොන්ගේ සේවකවූ

නෙබාත්ගේ පුත්‍රවූ යෙරොබෝවම් නැගිට
තමාගේ ස්වාමියාට විරුද්ධව කැරළි
7 ගැසුවේය. *කමකට නැති දුර්ජනයෝවූ
මනුෂ්‍යයෝ ඔහුට එකතුව සාලමොන්ගේ
පුත්‍රවූ රෙහොබෝවම්ට විරුද්ධව තමුන්ම
සවිකරගත්තෝය, ඔහු බාලව සිතින්
මෘදුව සිටි බැවින් ඔවුන්ට විරුද්ධව
8 සිටින්ට ඔහුට බැරිවුණේය. දැන්
තුඹලා දාවිත්ගේ පුත්‍රයන් අතේ තිබෙන
**ස්වාමීන්වහන්සේගේ** රාජ්‍යයට විරුද්ධව
සිටින්ට කල්පනාකරන්නහුය; තුඹලා
මහත් සමූහයක්ය, දෙවිවරුන් කොට
යෙරොබෝවම් තුඹලාට සාදාදුන් රන්
9 වස්සොත් තුඹලා සමග වෙති. තුඹලා
ආරොන්ගේ පුත්‍රයන් වන **ස්වාමීන්-
වහන්සේගේ** පූජකයන්ද ලෙවීවරුන්ද
එළවාදමා වෙන දේශවල ජාතීන් මෙන්
පූජකයන් නියමකරගත්තා නොවේද?
මෙසේ කැපවෙන පිණිස නාඹු ගොනෙකුත්
බැටළුවන් සත්දෙනෙකුත් රැගෙන එන
කවුරු තුමුත් දෙවි නොවන්නන්ට
10 පූජකයෙක් වන්නේය. තුමුත් අපේ
දෙවියන්වහන්සේ නම් **ස්වාමීන්වහන්සේය**,
අපි උන්වහන්සේ අත්නොහැරියෙමුව;
**ස්වාමීන්වහන්සේට** සේවයකරන
පූජකයෝවූ ආරොන්ගේ පුත්‍රයෝද
තමුන්ගේ මෙහෙයේ යෙදෙන ලෙවීවරුද
11 අපට සිටිති. ඔව්හු **ස්වාමීන්වහන්සේට**
හැම උදයද හැම සවසද දවන පූජාත්
සුවඳ දුම් ඔප්පුකරති. පිදීමේ රොටි රන්
මේසය උඩ තබති, රන් පහන්-රුක
සමග එහි පහන් හැම සවසම දල්වති.
මක්නිසාද අපි අපේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** භාරය පවත්වමුව; තුමුත්
තුඹලා උන්වහන්සේ අත්හැරියහුය.
12 මෙන්න, දෙවියන්වහන්සේ අප කෙරෙහි
ප්‍රධානව අප සමග සිටිනසේක,
තුඹලාට විරුද්ධව පිඹින පිණිස
හොරණෑ ගත් උන්වහන්සේගේ පූජකයෝද
සිටිති. ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, තුඹලාගේ
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව සටන් නොකරල්ලා; මක්නිසාද
තුඹලා සඵල නොවන්නහුයයි කීවේය.

*හෙවත්, බෙලියල්ගේ පුත්‍රයෝවූ.

තුමුත් ඔවුන්ට පිටිපසින් එන පිණිස 13
යෙරොබෝවම් රහසින් සේනාවක්
වටේට යැවීය. මෙසේ ඔව්හු යූදවරුන්ට
ඉස්සරහපිටින්ද රහස් සේනාව ඔවුන්ට
පිටිපස්සෙන්ද සිටියෝය. යූදවරු හැරී 14
බැලූවිට තමුන්ට විරුද්ධව ඉස්සරහින්ද
පස්සෙන්ද යුද්ධය තිබෙන බව දැක
**ස්වාමීන්වහන්සේට** මොරගැසුවෝය,
පූජකයෝ හොරණෑ පිම්බෝය. එවිට 15
යූද මනුෂ්‍යයන් ඔල්වර හඬ ගැසූකල
දෙවියන්වහන්සේ යෙරොබෝවම් සහ
සියලු ඉශ්‍රායෙල්වරුන් අබියාටත් යූද-
වරුන්ටත් පැරදෙවූසේක. එවිට ඉශ්‍රායෙල් 16
පුත්‍රයෝ යූදවරුන් ඉදිරියෙන් පලා-
ගියෝය. දෙවියන්වහන්සේ ඔවුන් යූද
අතට පාවාදුන්සේක. අබියාද ඔහුගේ 17
සෙනඟද මහත් මැරීමකින් ඔවුන්
මැරුවෝය. තෝරාගත් ඉශ්‍රායෙල් මනුෂ්‍යයන්
පන්ලක්ෂයක් මැරුම්කා වැටුණෝය.
මෙසේ ඒ කාලයේදී ඉශ්‍රායෙල් පුත්‍රයෝ 18
යටත්කරනලද්දෝය, යූදවරු තමුන්ගේ
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කෙරේ විශ්වාසය තැබූ නිසා ජයගත්හ.
අබියා තෙමේ යෙරොබෝවම් ලුහුබැඳවා 19
ගොස් බෙතෙල් සහ ඊට අයිති නුවරවල්ද
යෙෂානා සහ ඊට අයිති නුවරවල්ද
එප්‍රෝන් සහ ඊට අයිති නුවරවල්ද
අල්ලාගත්තේය. තවද යෙරොබෝවම් 20
අබියාගේ කාලයේදී නැවත බලවත්
නොවීය. **ස්වාමීන්වහන්සේ** ඔහුට
පහරදුන්සේක, ඔහු මළේය. තුමුත් 21
අබියා බලවත්විය, හෙතෙම භාර්යාවන්
දහහතර දෙනෙකු පාවාගත්තේය, පුත්‍රයන්
විසි දෙදෙනෙක්ද දූවරුන් දහසය
දෙනෙක්ද ඔහුට දාව උපන්නෝය.
අබියාගේ අනික් ක්‍රියාද ඔහුගේ මාර්ගද 22
කියමන්ද ප්‍රොපේතවූ ඉද්දෝගේ අටුවා
පොතෙහි ලියා තිබේ.

### ආසා රජකමට පැමිණීම

14 මෙසේ අබියා තමාගේ පියවරුන්
සමග සැතපී දාවිත්ගේ නුවර තැන්-
පත්කරනු ලැබුවේය, ඔහුගේ පුත්‍රවූ ආසා

ඔහු වෙනුවට රජවුණේය. ඔහුගේ
කාලයෙහි දස අවුරුද්දක් දේශය
2 නිශ්චලව තිබුණාය. ආසා තමාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි
යහපත්ව හරිව තිබුණ දේ කෙළේය.
3 මක්නිසාද ඔහු අන්‍ය පූජාසනද
උස් තැන්ද පහකොට, රූපස්තම්භ බිඳ,
4 අෂේරා කණු කපාදැමුවේය; තවද
තමුන්ගේ පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ සොයන්ටද ව්‍යවස්ථාවත්
ආඥාවත් පවත්වන්ටද යූදවරුන්ට
5 අණකෙළේය. ඔහු යූදාහි සියලු නුවරවලින්
උස්තැන් සහ සූර්ය-රූප පහකෙළේය.
රාජ්‍යයද ඔහු ඉදිරියෙහි නිශ්චලව
6 තිබුණේය. තවද ඔහු යූදාහි බලකොටු
නුවරවල් ගොඩනැගුවේය. මක්නිසාද
ස්වාමීන්වහන්සේ ඔහුට නිවාඩුව දුන්
බැවින් දේශය නිශ්චලව තිබුණාය, ඒ
අවුරුදුවල ඔහුට යුද්ධයක් නොවීය.
7 ඔහු යූදවරුන්ට කථාකොට: අපි මේ
නුවරවල් ගොඩනගා අවට පවුරුද
කොටුද දොරටුද අගුල්ද සාදමු; අප
විසින් අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
සෙවූ බැවින් දේශය තවම නිරවුල්ව අප
ඉදිරියෙහි තිබේ; අපි උන්වහන්සේ
සෙවුවෙමුව, උන්වහන්සේද හැම අතින්ම
අපට නිවාඩුව දී තිබේයයි කීවේය. මෙසේ
ඔව්හු ගොඩනගමින් සඵලවූවෝය.
8 යූදවරුන්ගෙන් පලිස් සහ හෙල්ල දරන
තුන්ලක්ෂයකින්ද බෙන්යමින්ගෙන් පලිස්
දරන දුනුගත් දෙලක්ෂ අසූදහසකින්ද
යුක්තවූ සේනාවක් ආසාට සිටියාය.
මේ සියල්ලෝ බලවත් වික්‍රමාන්විත
9 මනුෂ්‍යයෝය. ඔවුන්ට විරුද්ධව කූෂ්හි
සෙරා දශලක්ෂයක් සෙනඟද රථ
තුන්සියයක්ද අඩංගුවූ සේනාවක් ඇතුව
10 පිටත්වී මාරේෂා දක්වා ආයේය. ආසා
වනාහි ඔහුට විරුද්ධව ගියේය. එවිට
මාරේෂාහි ශෙපාතා මිටියාවතෙහි ඔව්හු
11 යුද්ධ පිළිවෙළින් සිටගත්තෝය. ආසා
තමාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
යාච්ඤා කොට ස්වාමීන්වහන්ස, බල-
සම්පන්න අයත් බෙලහීන අයත් අතරේ
පිහිටවෙන්ට ඔබ හැර කිසිවෙක්
නැත්තේය. අපේ දෙවිවූ ස්වාමීන්වහන්ස,
අපට පිහිටවුවමැනව; මක්නිසාද අපි
ඔබ කෙරේ විශ්වාසය තබා, ඔබගේ
නාමයෙන් මේ සමූහයාට විරුද්ධව ඇවිත්
සිටිමුව. ස්වාමීන්වහන්ස, ඔබ අපේ
දෙවියන්වහන්සේය; ඔබට විරුද්ධව
මනුෂ්‍යයා ජය නොගනීවායි කීවේය.
ස්වාමීන්වහන්සේ ආසා සහ යූදවරුන් 12
ඉදිරියෙහි කූෂ්වරුන් පැරදවූසේක; කූෂ්වරු
පලාගියෝය. ආසාද ඔහු සමග සිටි 13
සෙනඟද ගෙරාර් දක්වා ඔවුන් ලුහු-
බැන්දෝය. කූෂ්වරුන්ගෙන් කිසිවෙක්
ජීවත්ව ඉතුරු නොවෙන ලෙස
ඔව්හු වැටුණෝය; මක්නිසාද ඔව්හු
ස්වාමීන්වහන්සේද උන්වහන්සේගේ
සේනාවද ඉදිරියෙන් විනාශකරනු
ලැබුවෝය; ඔව්හු ඉතා මහත්
කොල්ලයක්ද අරගෙන ආවෝය. ගෙරාර් 14
අවට සියලු නුවරවලට ඔව්හු පහර-
දුන්නෝය; මක්නිසාද ස්වාමීන්වහන්සේ
කෙරෙන් ඔවුන් පිටට භීතියක්
පැමුණුණේය. ඔව්හු ඒ සියලු නුවරවල්
කොල්ලකෑවෝය; ඒවායේ බොහෝ
කොල්ලය තිබුණේය. ඔව්හු සිව්පාවුන්ගේ 15
මඩුවලටත් පහරදී බොහෝ බැටළුවන්ද
ඔටුවන්ද අල්ලාගෙන යෙරුසලමට හැරී
ආවෝය.

## අසරියා ප්‍රොපේත තැන. ආසා රජුගේ වැඩ

15
තවද දෙවියන්වහන්සේගේ ආත්මය
ඕදෙද්ගේ පුත්‍රවූ අසරියා කෙරෙහි
පැමිණියේය. ඔහු ආසාගේ පෙරමගට 2
ගොස් කථාකොට: ආසා සහ සියලු
යූදවරුනි, බෙන්යමින්වරුනි, මට
ඇහුම්කන්දියල්ලා, තුඹලා ස්වාමීන්-
වහන්සේ සමග සිටින තුරු උන්වහන්සේ
තුඹලා සමග සිටිනසේක; තුඹලා
උන්වහන්සේ සොයනවා නම්
උන්වහන්සේ තුඹලාට සම්බවෙනවා
ඇත. තුඹලා උන්වහන්සේ අත්හැරියොත්
උන්වහන්සේද තුඹලා අත්හරිනවා ඇත.
බොහෝ කාලයක සිට ඉශ්‍රායෙල්වරු 3

සැබෑවූ දෙවියන්වහන්සේද උගන්වන
පූජකයෙක්ද ව්‍යවස්ථාවද නැතුව
4 සිටියෝය. නුමුත් ඔවුන් තමුන්ගේ
විපතේදී ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ දෙසට හැරී උන්වහන්සේ සෙවූ
කල උන්වහන්සේ ඔවුන්ට සම්බවූසේක.
5 ඒ කාලවලදී පිටත ගිය කෙනෙකුටවත්
ඇතුළට ආ කෙනෙකුටවත් කිසි
සමාදානයක් නැතුව දේශවල සියලු
වැසියන්ට මහත් පීඩා පැමුණුණේය.
6 ජාතියක් කරණකොටගෙන ජාතියක්ද
නුවරක් කරණකොටගෙන නුවරක්ද
පොඩිකරනු ලැබුවෝය. මක්නිසාද
දෙවියන්වහන්සේ සියලු ආකාර
7 විපත්තිවලින් ඔවුන් පෙළුසේක. එහෙත්
නුඹලා අත් හෙළා නොගෙන ශක්තිමත්
වෙයල්ලා. මක්නිසාද නුඹලාගේ
වැඩට විපාක ලැබෙන්නේයයි කීවේය.
8 ආසා මේ වචනය ප්‍රොපේතවූ ඕදෙද්ගේ
අනාගතවාක්‍යයද ඇසූ කල ධෛර්ය
උපදවාගෙන, යූදවරුන්ගෙත් බෙන්යමින්-
වරුන්ගෙත් මුළු දේශයෙන්ද එප්‍රායිම්
කඳු රටින් තමා විසින් අල්ලාගත්
නුවරවලින්ද පිළිකුල් දේවල් අහක්-
කෙළේය; ඔහු ස්වාමීන්වහන්සේගේ
ද්වාරමණ්ඩපය ඉදිරිපිට තිබුණු
ස්වාමීන්වහන්සේගේ පූජාසනයද අලුත්-
9 වැඩියාකෙළේය. තවද ඔහු සියලු
යූදවරුන්ද බෙන්යමින්වරුන්ද ඔවුන්
සමග එප්‍රායිම්ගෙන්ද මනස්සේගෙන්ද
සිමියොන්ගෙන්ද ඇවිත් සිටියාවූ
ආගන්තුකයන්ද රැස්කරගත්තේය. මක්-
නිසාද ඔහුගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඔහු සමග සිටින බව දුටු කල
ඉශ්‍රායෙල්ගෙන් බොහෝ දෙනෙක් ඔහුට
10 එකතුවුණෝය. ආසාගේ රජකම්කිරීමේ
පහළොස්වෙනි අවුරුද්දේ තුන්වෙනි
මාසයේදී ඔව්හු යෙරුසලමට රැස්වූහ.
11 ඔවුන් ගෙනාවාවූ කොල්ලයෙන් ගවයන්
සත් සියයකුත් බැටළුවන් සත් දහසකුත්
ස්වාමීන්වහන්සේට ඔව්හු ඒ දවසේ
12 පූජාකළෝය. තවද ඔව්හු තමුන්ගේ
පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
තමුන්ගේ මුළු සිතින්ද මුළු ආත්ම-
යෙන්ද සොයන්ටත් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 13
ස්වාමීන්වහන්සේ නොසොයන සියල්ලන්
ලොකු වුවත් කුඩා වුවත් පුරුෂයෙක්
වුවත් ස්ත්‍රියෙක් වුවත් මරණයට
පත්කරන්ටත් ගිවිසුමක් කළෝය. ඔව්හු 14
මහත් හඬද සෝභාවද හොරණෑවලත්
නළාවලත් ශබ්දයද ඇතුව ස්වාමීන්-
වහන්සේට දිවුරුම් දුන්නෝය. සියලු 15
යූදවරු ඒ දිවුරුම ගැන ප්‍රීතිවූහ.
මක්නිසාද ඔව්හු තමුන්ගේ මුළු සිතින්
දිවුරා, තමුන්ගේ මුළු කැමැත්තෙන්
උන්වහන්සේ සෙවුවෝය; ස්වාමීන්-
වහන්සේද ඔවුන්ට සම්බව හාත්පසින්ම
ඔවුන්ට විශ්‍රාමය දුන්සේක. ආසා රජුගේ 16
මෑණියන්වූ මයකා විසින් අෂේරාට
පිළිකුල් රූපයක් සෑදූ නිසා ආසා ඇය
බිසෝකමෙන් අහක්කර, ඇගේ පිළිමය
කපාදමා සුණුකර, කිද්‍රොන් ඔය ළඟදී
එය පුලුස්සා දැමුවේය. නුමුත් ඉශ්‍රායෙල් 17
කෙරෙන් උස්තැන් පහකරනු නො-
ලැබුවේය. එසේ වුවත් ආසාගේ සිත
ඔහුගේ සියලු දවස්වලදී සම්පූර්ණව
තිබුණේය. ඔහු තමාගේ පියා විසින්ද 18
තමා විසින්ද කැප කළ රන් රිදී සහ
බඩු දෙවියන්වහන්සේගේ ගෘහය ඇතුළට
ගෙනාවේය. ආසාගේ රජකම්කිරීමේ 19
තිස්පස්වෙනි අවුරුද්ද දක්වා තවත් යුද්ධ
නොවීය.

## ආසා රජ බයෙෂා සමග යුද්ධකිරීම

ආසාගේ රජකම්කිරීමේ තිස්හ- 16
වෙනි අවුරුද්දේදී ඉශ්‍රායෙල් රජවූ
බයෙෂා රජ යූදට විරුද්ධව ගොස් යූදහි
රජවූ ආසා වෙතට කිසිවෙකුට යන්ට
එන්ට ඉඩ නාරින පිණිස රාමා
නගරය ගොඩනැගුවේය. එවිට ආසා 2
ස්වාමීන්වහන්සේගේ ගෘහයේද රජ
ගෙයිද ගබඩාවලින් රන් රිදී පිටතට
ගෙනවුත්, දමස්කයෙහි වාසයකළාවූ
සිරියේ රජවූ බෙන්හදද්ට ඒවා යවමින්:
මාගේ පියාද ඔබගේ පියාද අතරේ 3
තිබුණාක් මෙන් මා සහ ඔබ අතරේද
ගිවිසුමක් තිබේ. මෙන්න, රන් රිදී ඔබට

එවම්; ඉශ්‍රායෙල්හි රජවූ බයෙෂා මා
වෙතින් අහක්ව යන පිණිස ඇවිත් ඔබ
ඔහු සමග තිබෙන ගිවිසුම කඩකළ
4 මැනවැයි කියා හැරියේය. එවිට බෙන්හදද්
ආසා රජුට ඇහුම්කන්දී, තමාගේ යුද්ධ
සේනාපතීන් ඉශ්‍රායෙල් නුවරවලට
විරුද්ධව යැවීය; ඔව්හු ඊයොන්ටත්
දන්ටත් ආබෙල්-මයිම්ටත් නප්තලීහි
සියලු ගබඩා නුවරවලටත් පහර
5 දුන්නෝය. බයෙෂා ඒ ඇසූ විට ඔහු
රාමා නගරය ගොඩනැගීමෙන් නැවතී
6 තමාගේ වැඩ අත්හිටෙවුවේය. එවිට
ආසා රජ සියලු යූදවරුන් කැඳවාගන
ගොස්, බයෙෂා ගොඩනැගූ රාමාහි ගල්ද
ලීද ඔවුන් ලවා ගෙන්වාගෙන, එයින්
7 ගෙබාද මිශ්පාද ගොඩනැගුවේය. එකල්හි
හනානි නම් දිවස් ඇත්තා යූදහි රජවූ
ආසා ළඟට අවුත් කථාකොට: තුඹේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** කෙරෙහි තුඹ
විශ්වාසය නොතබා සිරියේ රජු කෙරෙහි
විශ්වාසය තැබූ බැවින් සිරියේ රජුගේ
සේනාව තුඹේ අතින් ගැළවී ගියාය.
8 කූෂ්වරුන්ද ලූබිවරුන්ද රථ සහ අසරුවන්
මහත් රාශියක් ඇති මහත් සේනාවක්ව
සිටියා නොවේද? එහෙත් තුඹ **ස්වාමීන්-**
**වහන්සේ** කෙරෙහි විශ්වාසය තැබූ නිසා
උන්වහන්සේ ඔවුන් තුඹ අතට පාවා-
9 දුන්සේක. මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
කෙරෙහි සම්පූර්ණ සිත් ඇත්තන්ට
පිහිටවෙන පිණිස උන්වහන්සේගේ බලය
පාමින්, උන්වහන්සේගේ ඇස් පොළොව
මුළුල්ලෙහි ඔබමොබ දුවන්නේය. මේ
ගැන තුඹ අණුවණ ලෙස ක්‍රියා-
කෙළෙහිය; මෙතැන් පටන් තුඹට විරුද්ධව
10 යුද්ධ ඇතිවන්නේයයි කීවේය. එවිට
ආසා තෙමේ දිවස් ඇත්තා කෙරෙහි
කෝපව ඔහු හිරගෙයි දැමීය; මක්නිසාද
ඔහු මේ කාරණය ගැන ඔහු සමග
උදහස්ව සිටියේය. එම කාලයේම
ආසා සෙනඟගෙන් සමහරෙකුටත්
11 පීඩාකෙළේය. බලව, ආසාගේ ක්‍රියා මුල
පටන් අග දක්වා යූදහිද ඉශ්‍රායෙල්හිද
12 රජුන්ගේ පොතෙහි ලියා තිබේ. ආසාගේ
රජකම්කෙරීමේ තිස්නවවෙනි අවුරුද්දේදී
ඔහුගේ පාදවල රෝගයක් විය; ඔහුගේ
රෝගය තදබල විය. එහෙත් ඔහු තමාගේ
රෝගයේදී **ස්වාමීන්වහන්සේ** නොව
වෙදුන් සෙවුවේය. ආසා තමාගේ 13
පියවරුන් සමග සැතපුණේය, ඔහු
මැරුණේ තමාගේ රජකම්කිරීමේ සතළිස්
එක්වෙනි අවුරුද්දේදීය. ඔව්හු දාවිත්ගේ 14
නුවර ඔහු තමාට කපාගන තිබුණු
ඔහුගේම සොහොන් ගෙයි ඔහු තැන්පත්-
කළෝය, යළිත් තෛල මිශ්‍රකරන්නාගේ
ශාස්ත්‍රය ලෙස පිළියෙළකළ නොයෙක්
ආකාර සුවඳ ද්‍රව්‍යයෙන් පිරූ යහනේ
ඔහු තැබූහ. ඔව්හු ඔහු උදෙසා ඉතා
මහත් ගිනිමැලයක් දැල්වූවෝය.

## යෙහෝෂාපාට් රජයට පැමිණ බලවත්වීම

17 ඔහුගේ පුත්‍රවූ යෙහෝෂාපාට්
ඔහු වෙනුවට රජවී ඉශ්‍රායෙල්ට
විරුද්ධව තමාගේ බලය පිහිටුවාගත්තේය.
ඔහු යූද රටේ සියලු බලකොටු නුවරවල 2
සමුද්‍රවන් සිටුවා, යූද දේශයෙහිද තමාගේ
පියවූ ආසා අල්ලාගත් එප්‍රායිම් නුවරවලද
මුර සේනාවන් සිටෙවුවේය. **ස්වාමීන්-** 3
**වහන්සේ** යෙහෝෂාපාට් සමග සිටිසේක.
මක්නිසාද ඔහු තමාගේ පියවූ දාවිත්ගේ
ප්‍රථම මාර්ගවල හැසිර, බාල් දේවතා-
වුන්ට සේවය නොකර, තමාගේ පියාගේ 4
දෙවියන්වහන්සේට සේවයකරමින්,
ඉශ්‍රායෙල්වරුන්ගේ ක්‍රියාවල ප්‍රකාරයට
නොව උන්වහන්සේගේ ආඥාවල
ප්‍රකාරයට හැසුරුණේය. එබැවින් 5
**ස්වාමීන්වහන්සේ** රාජ්‍යය ඔහු අතේ
ස්ථිරකළසේක; සියලු යූදවරු යෙහෝ-
ෂාපාට්ට තෑගි ගෙනාවෝය; වස්තුවද
ගෞරවයද ඔහුට බොහෝසෙයින්
තිබුණේය. ඔහුගේ සිතද **ස්වාමීන්-** 6
**වහන්සේගේ** මාර්ගවල ධෛර්යවත්වී,
නැවත ඔහු යූද රටින් උස්තැන්ද අෂේරා
කණුද පහකෙළේය. තවද ඔහු තමාගේ 7
රජකමේ තුන්වෙනි අවුරුද්දේදී යූද
නුවරවල උගන්වන පිණිස තමාගේ
අධිපතීන් වන බෙන්-හයිල්ද ඔබදියාද
ශෙකරියාද නෙතනේල්ද මීකායාද,

8 ඔවුන් සමග ලෙවීවරුන් වන ෂෙමායාද
නෙතනියාද ශෙබදියාද අසාහෙල්ද
ෂෙමීරාමොත්ද යෙහෝනාතාන්ද අදෝනියාද
ටෝබියාද ටෝබ්-අදෝනියාද ඔවුන්
සමග පූජකයන්වූ එලීෂාමාද
9 යෙහෝරාම්ද යැවුවේය. ඔව්හුද යූදහි
උගන්වමින්, **ස්වාමීන්වහන්සේගේ**
ව්‍යවස්ථා පොත රැගෙන යූදහි සියලු
නුවරවලට ගොස්, සෙනඟ අතරෙහි
10 ඉගැන්නුවෝය. යූද අවට දේශවල සියලු
රාජ්‍යයන් පිටට **ස්වාමීන්වහන්සේගෙන්**
භීතියක් පැමුණුණ නිසා ඔව්හු
යෙහෝෂාපාට්ට විරුද්ධව යුද්ධ නො-
11 කළෝය. පිලිස්තිවරුන්ගෙන් සමහරෙක්
යෙහෝෂාපාට්ට තෑගිද රිදීද කප්පන්
පිණිස ගෙනාවෝය; අරාබිවරුත්
බැටළුවන් හත්දස් හත්සියයක්ද
එළුවන් හත්දස් හත්සියයක්ද යන
12 සිවුපාවුන් ගෙනාවෝය. යෙහෝෂාපාට්
අතිශයින් උතුම්ම යූදහි බලකොටුද
ගබඩා නුවරවල්ද ගොඩනැගුවේය.
13 ඔහුට යූද නුවරවල බොහෝ වැඩපළ
තිබුණේය; යුද්ධකාර බලවත්
වික්‍රමාන්විත මනුෂ්‍යයොත් යෙරුසලමෙහි
14 සිටියෝය. ඔවුන්ගේ පියවංශ ලෙස
ඔවුන්ගේ ගණන් මේය: යූදගෙන්
සහස්‍රාධිපතියෝ නම්–අධිපතියාවූ
අද්නාය, ඔහු සමග බලවත් වික්‍රමාන්විත
මනුෂ්‍යයෝ තුන්ලක්ෂයක් සිටියෝය.
15 ඊළඟට අධිපතියාවූ යෙහෝහානාන්ය,
ඔහු සමග දෙලක්ෂ අසූදහක් සිටියෝය;
16 ඊළඟට කැමැත්තෙන්ම **ස්වාමීන්-**
**වහන්සේට** භාරවුණාවූ සික්රීගේ පුත්‍රවූ
අමසියාය; ඔහු සමග බලවත් වික්‍රමාන්-
විත මනුෂ්‍යයෝ දෙලක්ෂයක් සිටියෝය.
17 බෙන්යමින්ගෙන් බලවත් වික්‍රමාන්විත
මනුෂ්‍යයෙක්වූ එල්යාදය, ඔහු සමග දුනු
හා පලිස්වලින් සන්නද්ධවූ මනුෂ්‍යයෝ
18 දෙලක්ෂයක් වූවෝය. ඊළඟට යෙහෝ-
සාබාද්ය, යුද්ධයට සැරසී සිටි එක්ලක්ෂ
19 අසූදහක් ඔහු සමග වූවෝය. ඔව්හු රජුට
මෙහෙකළාවූ අයය, ඔවුන් ඇර රජු
විසින් මුළු යූදහි බලකොටු නුවරවල
සිටෙවූ අයත් මෙහෙකළෝය.

## යෙහෝෂාපාට්ගේ හා ආහබ්ගේ නෑකම් බැඳීම. රාමොත්-ගිලියද්හි යුද්ධය

18 තවද යෙහෝෂාපාට්ට බොහෝ-
සෙයින් වස්තුවද ගෞරවයද
තිබුණේය; ඔහු ආහබ් සමග නෑකම්
බැඳගත්තේය. අවුරුදු ගණනකට පසු 2
ඔහු සමාරියට ආහබ් ළඟට ගියේය.
එවිට ආහබ් ඔහුද ඔහු සමග සිටි
සෙනඟද උදෙසා බොහෝ බැටළුවන්ද
ගවයන්ද මරා, තමා සමග රාමොත්-
ගිලියද්ට යන්ට ඔහු පෙළඹෙවුවේය.
ඉශ්‍රායෙල් රජවූ ආහබ් නැවත යූදහි 3
රජවූ යෙහෝෂාපාට්ට කථාකොට: ඔබ
මා සමග රාමොත්-ගිලියද්ට යන්-
නෙහිදැයි ඇසුවේය. ඔහුද: මමත් ඔබ
වාගේය, මාගේ සෙනඟත් ඔබගේ සෙනඟ
වාගේය; යුද්ධයේදී අපි ඔබ සමග
සිටින්නෙමුයයි ඔහුට උත්තරදුන්නේය.
තවද යෙහෝෂාපාට්: අද **ස්වාමීන්-** 4
**වහන්සේගේ** වචනය විචාළ මැනවැයි
ඉශ්‍රායෙල් රජුට කීවේය. එකල ඉශ්‍රායෙල් 5
රජ ගණනින් හාරසියයක්වූ ප්‍රොපේත-
වරුන් රැස්කොට: අප යුද්ධ පිණිස
රාමොත්-ගිලියද්ට යන්ටද නොහොත්
මා නොගොස් සිටින්ටදැයි ඔවුන්ගෙන්
ඇසුවේය. ඔව්හුද: ගිය මැනවි; දෙවියන්-
වහන්සේ එය රජු අතට පාවාදෙන-
සේකැයි කීවෝය. නුමුත් යෙහෝෂාපාට් 6
මොවුන් හැර අප විසින් විචාරන පිණිස
**ස්වාමීන්වහන්සේගේ** ප්‍රොපේත කෙනෙක්
මෙහි නැද්දැයි ඇසුවේය. ඉශ්‍රායෙල් රජද: 7
**ස්වාමීන්වහන්සේගෙන්** විචාරන පිණිස
ඉම්ලාගේ පුත්‍රවූ මීකායා නම්වූ තව
එක්කෙනෙක් සිටියි, නුමුත් ඔහු නිතරම
මා ගැන නපුරක් මිස යහපතක් අනාගත-
වාක්‍යයෙන් නොකියන නිසා මම ඔහුට
වෛරවෙමියි යෙහෝෂාපාට්ට කීවේය.
යෙහෝෂාපාට්: රජ්ජුරුවෝ එසේ නො-
කියත්වයි කීවේය. එවිට ඉශ්‍රායෙල් රජ 8
ඇමතියෙකුට අඬගසා: ඉම්ලාගේ පුත්‍රවූ
මීකායා ඉක්මනින් ගෙන්වාපන්නැයි

9 කීවේය. ඉශ්‍රායෙල් රජද යූදහි රජවූ
යෙහෝෂාපාට්ද රාජවස්ත්‍ර හැඳ තම
තමුන්ගේ සිංහාසනවල හිඳගත්තෝය,
ඔව්හු සමාරියේ දොරකඩ එළිමහන්
තැනක වාඩිවී උන්නෝය; සියලු
ප්‍රොපේතවරු ඔවුන් ඉදිරියෙහි අනාගත-
10 වාක්‍ය කීවෝය. කෙනයනාගේ පුත්‍රවූ
ශෙදෙකියා යකඩ අං සාදගෙන: ඔබ
සිරියවරුන් විනාශවන තුරු මේවායින්
ඔවුන්ට අනින්නෙහිය කියා **ස්වාමීන්-**
11 **වහන්සේ** වදරනසේකැයි කීවේය. සියලු
ප්‍රොපේතවරුද එසේම අනාගතවාක්‍ය
කියමින්: රාමොත්-ගිලියද්ට ගොස්
සඵලවුණ මැනවි. **ස්වාමීන්වහන්සේ** එය
රජු අතට පාවාදෙනසේකැයි කීවෝය.
12 මීකායා කැඳවාගෙන එන්ට ගිය
පණිවිඩකාරයා ඔහුට කථාකොට:
බලව, ප්‍රොපේතවරුන්ගේ වචන එක
ලෙසම රජු ගැන යහපත්ව තිබේ. ඒ
නිසා තුඹේ වචනයත් ඔවුන්ගෙන්
එක්කෙනෙකුගේ වචනය මෙන් වෙන
පිණිස යහපත කියන්නැයි කීවේය.
13 මීකායාද: **ස්වාමීන්වහන්සේ** ජීවමාන
බව සැබෑවාසේම මාගේ දෙවියන්වහන්සේ
කියන දෙයම කථාකරන්නෙමියි කීවේය.
14 ඔහු රජු ළඟට ආකල රජු ඔහුට
කථාකොට: මීකායා, අප යුද්ධ පිණිස
රාමොත්-ගිලියද්ට යන්ටද නැතහොත්
මා නොගොස් සිටින්ටදැයි ඔහුගෙන්
ඇසුවේය; ඔහුද: ගොස් සඵලවෙයල්ලා;
ඔව්හු තුඹලා අතට පාවාදෙනු ලබන්-
15 නෝයයි කීය. රජතෙමේ: **ස්වාමීන්-**
**වහන්සේගේ** නාමයෙන් සැබෑව මිස
වෙන කිසිවක් මට නොකියන ලෙස
මම කී වරක් තුඹ දිවුරවම්දැයි ඔහුට
16 කීය. එවිට ඔහු කථාකොට: සියලු
ඉශ්‍රායෙල්වරුන් එඬේරෙකු නැති
බැටළුවන් මෙන් කඳුවල විසිර ඉඳිනු
දුටුමි. එවිට **ස්වාමීන්වහන්සේ**—මොවුන්ට
ස්වාමියෙක් නැත; එකිනෙකා තම තමාගේ
ගෙදරට සමාදානයෙන් හැරීයේවයි කියා
17 වදාළසේකැයි කීවේය. ඉශ්‍රායෙල් රජද:
ඔහු මා ගැන අනාගත වාක්‍යයෙන්
නරකක් මිස යහපතක් නොකියන්නේය
කියා මම ඔබට නොකීයෙම්දැයි යෙහෝ-
ෂාපාට්ට කීවේය. මීකායා කථාකොට: 18
එබැවින් **ස්වාමීන්වහන්සේගේ** වචනය
අසාපල්ලා. **ස්වාමීන්වහන්සේ** තමන්
සිංහාසනයෙහි වැඩහිඳිනවාත් මුළු
ස්වර්ග සේනාව උන්වහන්සේගේ දකුණු
පැත්තේද වම් පැත්තේද සිටිනවාත්
දුටුමි. **ස්වාමීන්වහන්සේද**—ඉශ්‍රායෙල් රජවූ 19
ආහබ් රාමොත්-ගිලියද්හිදී වැටෙන
පිණිස එහි යන්ට ඔහු කැමතිකරවන්නේ
කවුදැයි ඇසූසේක. එවිට එක්කෙනෙක්
මේ ආකාරද අනික් කෙනෙක් ඒ
ආකාරද කීවේය. එකල ආත්මයෙක් 20
ඇවිත් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
සිට: මම ඔහු කැමතිකරවමියි කීය.
කුමකින්දැයි **ස්වාමීන්වහන්සේ** ඔහුගෙන්
ඇසූසේක. මම ගොස් ඔහුගේ සියලු 21
ප්‍රොපේතවරුන්ගේ මුඛවල බොරුකාර
ආත්මයක් වෙමියි ඔහු කීවේය. උන්-
වහන්සේද: තුඹ ගොස් ඔහු පොළඹවා
සඵලවන්නෙහිය. ගොස් එසේ කරපන්-
නැයි කීසේක. එබැවින් **ස්වාමීන්වහන්සේ** 22
ඔබගේ මේ ප්‍රොපේතවරුන්ගේ මුඛ-
වල බොරුකාර ආත්මයක් තැබූසේක;
**ස්වාමීන්වහන්සේ** ඔබ ගැන නරකක්
කියා තිබේයයි කීවේය. එවිට කෙන- 23
යනාගේ පුත්‍රවූ ශෙදෙකියා ළංවී මීකායා-
ගේ කම්මුලට ගසා: **ස්වාමීන්වහන්සේගේ**
ආත්මය තුඹට කථාකරන්ට මා කෙරෙන්
ගියේ මොන මාර්ගයෙන්දැයි ඇසුවේය.
මීකායාද: බලව, තුඹ සැඟවෙන්ට ඇතුල් 24
ගෙයකට යන දවසේදී දැනගන්නෙහියයි
කීවේය. ඉශ්‍රායෙල් රජ: තුඹලා මීකායා 25
රැගෙන නුවර අධිපතියාවූ ආමොන්ද
රජුගේ පුත්‍රවූ යෝවාෂ්ද ළඟට ගෙනගොස්,
මූ හිරගෙයි ලා, මා සමාදානයෙන් හැරී 26
එන තුරු මූට කන්ට දුක් කෑමද දුක්
වතුරද දීපල්ලාය කියා කියාපල්ලායයි
කීවේය. මීකායාද: ඔබ ඇත්තටම 27
සමාදානයෙන් හැරී ආවොත් **ස්වාමීන්-**
**වහන්සේ** මා ලවා කථාකෙරෙවුවේ
නැතැයි කියා: ජනයෙනි, තුඹලා සියල්-
ලෝම අසාපල්ලායයි කීවේය.
මෙසේ ඉශ්‍රායෙල් රජද යූදහි රජවූ 28
යෙහෝෂාපාට්ද රාමොත්-ගිලියද්ට
ගියෝය. ඉශ්‍රායෙල් රජ යෙහෝෂාපාට්ට 29

කථාකොට: මම වෙස් මාරුකරගෙන
යුද්ධයට යන්නෙමි; නුමුත් ඔබ ඔබගේ
වස්ත්‍ර හැඳගතමැනවියි කීවේය. මෙසේ
ඉශ්‍රායෙල් රජ වෙස් මාරුකරගත්තේය;
30 ඔව්හු සටනට ගියෝය. සිරියේ රජ
තමාගේ රථාධිපතීන්ට අණකරමින්:
ඉශ්‍රායෙල් රජු සමග මිස ලොකු
කුඩා වෙන කිසිවෙකු සමග සටන්
නොකරල්ලායයි අණකර තිබුණේය.
31 රථාධිපතීහු යෙහෝෂාපාට් දුටු විට:
මොහු ඉශ්‍රායෙල් රජය කියා ඔහුට
විරුද්ධව සටන්කරන්ට ඔහු වටකර-
ගත්තෝය. එවිට යෙහෝෂාපාට්
මොරගැසීය, **ස්වාමීන්වහන්සේ** ඔහුට
පිහිටවී ඔහු වෙතින් ඔවුන් අහක්-
32 කෙරෙවුසේක. ඔහු ඉශ්‍රායෙල් රජු නොවන
බව රථාධිපතීහු දැක, ඔහු ලුහුබැඳ
33 යාමෙන් ආපසු හැරුණෝය. නුමුත්
එක්තරා මනුෂ්‍යයෙක් දුන්න තැත්කවා
නොදැනම ඉශ්‍රායෙල් රජුගේ සන්නාහයේ
සන්ධි අතරෙන් ඔහුට විද්දේය. එවිට
ඔහු: නුඹේ අත හරවා මා සේනාවෙන්
පිටතට ගෙනියාපන්න; මක්නිසාද මට
හොඳටම තුවාලවීයයි රථාචාර්යයාට
34 කීවේය. ඒ දවසේ යුද්ධය තදබල විය.
එසේවී නුමුත් ඉශ්‍රායෙල් රජ සවස්වෙන
තුරු සිරියවරුන්ට ඉස්සරහපිට ආධාර
ඇතුව රථයේ කෙළින් සිටුවනු ලැබ, ඉර
බසින වේලාව පමණේදී මෙළේය.

## යේහු විසින් තරවටුකිරීම. යෙහෝෂාපාට්ගේ යහපත් වැඩ

19 යුදහි රජවූ යෙහෝෂාපාට්
යෙරුසලමේ තමාගේ ගෙට
2 සමාදනයෙන් හැරීගියේය. නුමුත්
හනානිගේ පුත්‍රවූ යේහු නම් දිවස් ඇත්තා
යෙහෝෂාපාට් රජුගේ පෙරමගට පිටත්ව
ගොස් ඔහුට කථාකොට: දුෂ්ටයාට
උපකාරකිරීමත් **ස්වාමීන්වහන්සේට**
වෛරවෙන්නන්ට ප්‍රේමකිරීමත් නුඹට
යුතුද? මේ කාරණය නිසා නුඹ කෙරෙහි
**ස්වාමීන්වහන්සේගේ** උදහස පැමිණ
3 තිබේ. එසේ වුවත් නුඹ අෂේරා කණු
දේශයෙන් පහකරදැමීමද, දෙවියන්-
වහන්සේ සෙවීමට නුඹේ සිත යොමු-
කිරීමද නම්වූ යහපත් කාරණා නුඹට
ඇත්තේයයි කීවේය.
යෙහෝෂාපාට් යෙරුසලමෙහි වාසය 4
කෙළේය. ඔහු නැවත බෙයෙර්-ෂෙබා
පටන් එප්‍රායිම් කඳුරට දක්වා සෙනඟ
අතරට ගොස්, ඔවුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** වෙතට ඔවුන්
හරවාගත්තේය. ඔහු යුද දේශයේ සියලු 5
බලකොටු නුවරවල නුවරක් නුවරක්
පාසා විනිශ්චයකාරයන් සිටුවා කථා-
කොට: නුඹලා කරන්නේ මොකද 6
කියා බලාගනිල්ලා. මක්නිසාද නුඹලා
විනිශ්චයකරන්නේ මනුෂ්‍යයා උදෙසා
නොව **ස්වාමීන්වහන්සේ** උදෙසාය;
විනිශ්චයේදී උන්වහන්සේ නුඹලා සමග
වනසේක. එබැවින් **ස්වාමීන්වහන්සේ** 7
කෙරෙහි භය ඇතුව ප්‍රවේසමින් ක්‍රියා-
කරපල්ලා; මක්නිසාද අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** වෙත අයුක්තියක්වත්
මනුෂ්‍යයන්ගේ තරාතිරම් බැලීමක්වත්
අල්ලස් ගැනීමක්වත් නැතැයි විනිශ්චය-
කාරයන්ට කීවේය. තවද යෙහෝෂාපාට් 8
ලෙවීවරුන්ගෙන්ද පූජකයන්ගෙන්ද
ඉශ්‍රායෙල් පියවංශවල ප්‍රධානීන්ගෙන්ද
සමහරෙකුත් **ස්වාමීන්වහන්සේගේ** විනිශ්-
චය උදෙසාත් පැමිණිලි උදෙසාත්
යෙරුසලමෙහි සිටෙවුවේය. ඔව්හු
යෙරුසලමට හැරී ආවෝය. ඔහු ඔවුන්ට 9
අණකොට: **ස්වාමීන්වහන්සේ** කෙරෙහි
භය ඇතුව විශ්වාසකමින්ද සම්පූර්ණ
සිතින්ද මෙසේ කරපල්ලා. තමුන්ගේ 10
නුවරවල වාසය කරන නුඹලාගේ
සහෝදරයන්ගේ ලේ වැගිරවීම ගැනවත්
ව්‍යවස්ථාව සහ ආඥාව ගැනවත් පනත්
හා විනිශ්චයයන් ගැනවත් නුඹලා වෙතට
පැමිණෙන සියලු පැමිණිලිවලදී ඔවුන්
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව වරද-
කාරයන් නොවන පිණිසත්, නුඹලා සහ
නුඹලාගේ සහෝදරයන් කෙරෙහි උදහස
නොපැමිණෙන පිණිසත්, ඔවුන්ට
අවවාදකරපල්ලා. නුඹලා වරදකාරයන්
නොවන පිණිස මෙසේ කරපල්ලා.
මෙන්න, **ස්වාමීන්වහන්සේගේ** සියලු 11
කාරණා ගැන උත්තම පූජකවූ අමරියාද

රජුගේ සියලු කාරණා ගැන යූද
වංශයේ අධිපතියාවූ ඉෂ්මායෙල්ගේ පුත්‍රවූ
සෙබදියාද තුඹලාගේ ප්‍රධානියෝය.
ලෙවීවරුද තුඹලා ඉදිරියෙහි මුලාදෑනීහු
වෙති. ධෛර්යවත්ව ක්‍රියාකරපල්ලා,
**ස්වාමීන්වහන්සේ** යහපතුන් සමග
වනසේක්වයි කීවේය.

## මෝවබීයයන්ගේ වටලෑම. යෙහෝෂාපාට්ගේ යාච්ඤාවට උත්තරය

20 මින්පසු මෝවබ් පුත්‍රයෝද
අම්මොන් පුත්‍රයෝද ඔවුන් සමග
*අම්මොනිවරුන්ගෙන් සමහරෙක්ද
යෙහෝෂාපාට්ට විරුද්ධව යුද්ධයට
2 ආවෝය. එවිට සමහරෙක් ඇවිත්
යෙහෝෂාපාට්ට කථාකොට: මුහුද
එගොඩින් සිරියේ සිට මහත් සමූහයක්
ඔබට විරුද්ධව එන්නාහ; ඔව්හු
හශශොන්-තාමාර්හි (ඒන්-ගෙදිය
කියන්නෙත් ඊටමයි) සිටිතියි කියා
3 දැන්නුවෝය. එවිට යෙහෝෂාපාට් භයවී,
**ස්වාමීන්වහන්සේ** සොයන්ට සිත යොමු-
කර, යූද මුළුල්ලෙහි උපවාසයක් ප්‍රකාශ-
4 කෙළේය. **ස්වාමීන්වහන්සේගෙන්** පිහිට
ඉල්ලන පිණිස යූදවරු රැස්වූවෝය. යූදහි
සියලු නුවරවලින් ඔව්හු **ස්වාමීන්-**
5 **වහන්සේ** සොයන්ට ආවෝය. එවිට
යෙහෝෂාපාට් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි අලුත් මළුව ඉදිරිපිට යූද සහ
යෙරුසලමේ සිට රැස්වූ සභාව මැද
6 සිට කියනුයේ: අපේ පියවරුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබ ස්වර්ගයෙහි
දෙවියන්වහන්සේ නොවනසේක්ද?
ජාතීන්ගේ සියලු රාජ්‍යවල් කෙරෙහි
ආණ්ඩුකරන්නෙත් ඔබ නොවේද? ඔබගේ
අතේ බලය හා පරාක්‍රමය තිබේ, ඔබට
විරුද්ධව සිටින්ට පුළුවන් කෙනෙකුත්
7 නැති අපේ දෙවියන්වහන්ස, ඔබගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් ඉදිරිපිටින් ඔබම
මේ දේශයේ වැසියන් පන්නාදමා, ඔබගේ
මිත්‍රවූ ආබ්‍රහම්ගේ වංශයට ඒක
සදාකාලයටම නුදුන්සේක්ද? ඔව්හු මෙහි 8
වාසයකොට, ඔබගේ නාමයට මෙහි
ශුද්ධස්ථානයක් ගොඩනගා කථාකොට–
අප පිටට යම් විපත්තියක් එනම් කඩුව 9
හෝ දඬුවමක් හෝ වසංගතයක් හෝ
සාගතයක් හෝ පැමුණුණොත්, ඔබගේ
නාමය මේ ගෘහයෙහි තබා තිබෙන
නිසා, අපි මේ ගෘහය හා ඔබ ඉදිරියෙහි
සිට අපේ දුකේදී ඔබට යාච්ඤා-
කරන්නෙමුව, එවිට ඔබ ශ්‍රවණය කොට
ගළවනසේකැයි කීවෝය. බැලුවමැනව, 10
ඉශ්‍රායෙල් මිසරයෙන් ආකල අම්මොන්
සහ මෝවබ් පුත්‍රයන්ද සෙයිර් කඳුකරයේ
වැසියන්ද අතරට පැමිණෙන්ට ඔබ
ඔවුන්ට ඉඩ නුදුන් බැවින්, ඔව්හු ඔවුන්
විනාශනොකර, ඔවුන් වෙතින් අහක්ව
ගියෝය. එහෙත් ඔබ අපට හිමිකරදුන් 11
ඔබගේ උරුමයෙන් අප පන්නාදමන්ට
ඊමෙන් ඔවුන් අපට ප්‍රතිඵල දෙන හැටි
බැලුවමැනව. අපේ දෙවියන්වහන්ස, ඔබ 12
ඔවුන් විනිශ්චය නොකරනසේක්ද?
මක්නිසාද අපට විරුද්ධව එන මේ මහත්
සමූහයා ඉදිරියෙහි සිටින්ට අපට
ශක්තිය නැත; අපි මක්කරමුද කියාත්
නොදනිමුව. නුමුත් අපේ ඇස් ඔබ දෙසම
යොමුකර තිබේයයි කීවේය. මුළු යූද 13
තමුන්ගේ අතදරුවන්ද භාර්යාවන්ද
දරුවන්ද සමග **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි සිටියෝය. එවිට **ස්වාමීන්-** 14
**වහන්සේගේ** ආත්මය සභාව මැද සිටි
ආසාප්ගේ පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්වූ
ලෙවීය මත්තනියාගේ පුත්‍රවූ යෙයියෙල්ගේ
පුත්‍රයා වන බෙනායාගේ පුත්‍රවූ
සෙකරියාගේ පුත්‍රයා වන යහසීයෙල්
කෙරෙහි පහළ වූයේය. ඔහු කථාකොට: 15
සියලු යූදවරුනි, යෙරුසලමේ වැසියෙනි,
යෙහෝෂාපාට් රජ්ජුරුවෙනි, ඇහුම්කන්
දියල්ලා. **ස්වාමීන්වහන්සේ** තුඹලාට
මෙසේ කියනසේක–මේ මහත් සමූහයා
නිසා භයනොවෙල්ලා, නොකැලඹෙල්ලා;
මක්නිසාද මේ යුද්ධය තුඹලාගේ නොව
දෙවියන්වහන්සේගේය. හෙට ඔවුන්ට 16
විරුද්ධව පලයල්ලා. බලව, ඔව්හු ශීශ්
නම් නැගුමෙන් නැගී එති; යෙරුයෙල්

*නොහොත්, මෙයූනිවරුන්ගෙන්.

කාන්තාරයට ඉස්සරහපිට මිටියාවතේ
කෙළවරදී ඔව්හු තුඹලාට සම්බවන්නෝය.
17 යුදවරුනි, යෙරුසලමේ වැසියෙනි, මේ
යුද්ධයේදී තුඹලා සටන්කරන්ට ඕනෑ
නැත. සැරසී නිශ්චලව සිට **ස්වාමීන්-
වහන්සේ** තුඹලාට දෙන ගැළවීම බලා-
සිටපල්ලා. **ස්වාමීන්වහන්සේ** තුඹලා
සමග සිටින නිසා භයනොවී, නොකැලඹී,
හෙට ඔවුන් වෙතට පිටත්ව පලයල්ලාය
18 කියා වදරනසේකැයි කීවේය. එවිට
යෙහෝෂාපාට් මුහුණින් බිමට
නැමුණේය. සියලු යුදවරුද යෙරුසලමේ
වැසියෝද **ස්වාමීන්වහන්සේට** නමස්-
කාරකරමින් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
19 වැඳ වැටුණෝය. කොහාතිවරුන්ගේ
පුත්‍රයෝද කෝරාවරුන්ගේ පුත්‍රයෝද වන
ලෙවීවරු ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** ඉතා මහත් හඬකින් ප්‍රශංසා
20 කිරීමට නැගුටුණෝය. ඔව්හු අලුයම
නැගිට තෙකෝවා කාන්තාරයට පිටත්ව
ගියෝය. ඔවුන් පිටත්වෙද්දී යෙහෝ-
ෂාපාට් නැගිට සිට කථාකොට: යුද-
වරුනි, යෙරුසලමේ වැසියෙනි, මාගේ
වචන අසාපල්ලා; තුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි විශ්වාසය
තබාපල්ලා, එවිට තුඹලා ස්ථිරවන්නහුය;
උන්වහන්සේගේ ප්‍රොපේතවරුන් විශ්වාස
කරපල්ලා, එවිට තුඹලා සඵලවන්නහු-
21 යයි කීවේය. ඔහු සෙනඟ සමග
මන්ත්‍රණයකොට **ස්වාමීන්වහන්සේට**
ගීතිකාකරන්නන් පත්කෙළේය. ඔව්හු
යුද්ධ සේනාවට පෙරටුව යමින්, ශුද්ධ-
කමේ අලංකාරයෙන් යුක්තව ප්‍රශංසා
කරමින්—**ස්වාමීන්වහන්සේට** ස්තුති-
කරපල්ලා, මක්නිසාද උන්වහන්සේගේ
කරුණාව සදකල්ම පවත්නේයයි කීවෝය.

## වටලෑමට පැමිණි අය විනාශවීම

22 ඔවුන් ප්‍රීති ඝෝෂාවද ප්‍රශංසාවද
පටන්ගත් වේලාවේදී යුදට විරුද්ධව
ඇවිත් සිටි අම්මොන් සහ මෝවබ්
පුත්‍රයන්ටද සෙයිර් කඳුකරයේ වැසියන්ටද
විරුද්ධව **ස්වාමීන්වහන්සේ** රැක සිටින
සේනාවක් සිටෙවූසේක; ඔව්හු පැරදු-
ණෝය. මක්නිසාද අම්මොන් සහ 23
මෝවබ් පුත්‍රයන් සෙයිර් කඳුකරයේ
වැසියන් සිඳදමා විනාශකරන පිණිස
ඔවුන්ට විරුද්ධව නැගිට්ටෝය. සෙයිර්
වැසියන් මුළුමනින්ම නැතිකළායින් පසු
ඔව්හු එකෙක් අනිකෙකු විනාශකරන්ට
උපකාරවූහ. යුදවරු වනාහි කාන්තාරයේ 24
මුරකොටුව උඩට ඇවිත් ඒ සමූහයා
දෙස බැලූ විට, ඔවුන් මළකඳන්ව බිම
වැටී ඉන්නවා දුටුවෝය, ගැළවුණාවූ
කිසිවෙක්ද නොසිටියේය. යෙහෝ- 25
ෂාපාට්ද ඔහුගේ සෙනඟද ඔවුන්ගෙන්
කොල්ලය ගන්ට ආ කල වස්තුවද
*මළකඳන්ද අනර්ඝ බඩුද ඔවුන්ට
සම්බවුණේය; ගෙනයන්ට බැරි තරමට
ඔව්හු ඒවා ගළවාගත්තෝය. කොල්ලය
අධික බැවින් ඔවුන් තුන් දවසක් ඒවා
එකතුකරමින් සිටියෝය. සතරවෙනිද 26
ඔව්හු †බෙරාකා මිටියාවතේ රැස්-
වුණෝය; ඔවුන් එහිදී **ස්වාමීන්-
වහන්සේට** ප්‍රශංසාකළ බැවින් අද දක්වා
තිබෙන පරිදි ඒ ස්ථානයට †බෙරාකා
මිටියාවතයයි කියනලද්දේය. එවිට යුද 27
සහ යෙරුසලමේ සියලු මනුෂ්‍යයෝද
ඔවුන්ට පෙරටුව යෙහෝෂාපාට්ද
ප්‍රීතියෙන් යෙරුසලමට හැරී යන්ට පිටත්
වුණෝය; මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
ඔවුන්ගේ සතුරන් ගැන ප්‍රීතිවෙන්ට
ඔවුන්ට සැලැස්සූසේක. ඔව්හු වීණාද 28
මහ වීණාද හොරණෑද ඇතුව යෙරුසල-
මට **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ආවෝය. **ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල්ගේ 29
සතුරන්ට විරුද්ධව සටන්කළ බව දේශ-
වල සියලු රාජ්‍යයන් ඇසූ විට ඔවුන්
පිටට දෙවියන්වහන්සේගෙන් භීතියක්
පැමින්නාය. මෙසේ යෙහෝෂාපාට්ගේ 30
රාජ්‍යය නිශ්චලව තිබුණේය. මක්නිසාද
ඔහුගේ දෙවියන්වහන්සේ හාත්පසින්ම
ඔහුට සමාදානය දුන්සේක.

## යෙහෝෂාපාට්ගේ රජකමේ සංක්ෂේප ප්‍රවෘත්තිය

යෙහෝෂාපාට් යුද කෙරෙහි රජකම් 31

*සමහර පුරාණ පිටපත්වල: වස්ත්‍රද
†ප්‍රශංසා මිටියාවත.

කෙළේය. ඔහු රජවෙනකල අවුරුදු
තිස්පහක් වයස්ව සිටියේය; ඔහු
යෙරුසලමෙහි විසිපස් අවුරුද්දක්
රජකම්කෙළේය. ඔහුගේ මෑණියන්ගේ
32 නම අසුබාය, ඈ ෂිල්හීගේ දුවය. ඔහු
තමාගේ පියවූ ආසාගේ මාර්ගයෙහි
හැසිරෙමින්, එයින් අහක්නොවී, **ස්වාමීන්-**
**වහන්සේගේ** ඇස් හමුයෙහි හරිව තිබුණු
33 දේ කෙළේය. එසේ වුවත් උස්තැන්
අහක්නොකරනලද්දේය; ඒ වන තුරු
සෙනඟ තමුන්ගේ පියවරුන්ගේ දෙවියන්-
වහන්සේ දෙසට තමුන්ගේ සිත් යොමු-
34 කළෙත් නැත. යොහෝෂාපාට්ගේ ඉතිරි
ක්‍රියා මුල පටන් අග දක්වා ඉශ්‍රායෙල්
රජුන්ගේ පොතෙහි අන්තර්ගතවූ,
හනානීගේ පුත්‍ර යේහුගේ ඉතිහාසයෙහි
ලියා තිබේ.
35 මින්පසු යූදහි රජවූ යොහෝෂාපාට්
ඉතා දුර්ජන ලෙස හැසුරුණු ඉශ්‍රායෙල්
36 රජවූ අහසියාට එකතුවුණේය. ඔහු
තර්ෂීෂ්ට යාමට නැව් සාදන
පිණිස ඔහුට එකතුවිය. ඔව්හු
එශියොන්-ගෙබෙර්හි නැව් සෑදුවෝය.
37 එවිට මරේෂාහි දෝදවාහුගේ පුත්‍රවූ
එලියෙසෙර් යොහෝෂාපාට්ට විරුද්ධව
අනාගතවාක්‍ය පවසමින්: තුඹ අහසියාට
එකතුවුණු නිසා **ස්වාමීන්වහන්සේ** තුඹේ
වැඩ බින්දසේකැයි කීයේය. තවද නැව්
බිඳී තර්ෂීෂ්ට යන්ට බැරිවිය.

## යෙහෝරාම් රජුගේ අයහපත් ආණ්ඩුව

21 යොහෝෂාපාට් තමාගේ පියවරුන්
සමග සැතපී දාවිත්ගේ නුවර තමාගේ
පියවරුන් සමග තැන්පත්කරනලද්දේය.
ඔහුගේ පුත්‍රවූ යෙහෝරාම් ඔහු වෙනුවට
2 රජවුණේය. යොහෝෂාපාට්ගේ පුත්‍රයෝවූ
අසරියාද යෙහීයෙල්ද සෙකරියාද
අසරියාද මීකායෙල්ද ෂෙපාටියාද යන
මොව්හු ඔහුගේ සහෝදරයෝය. මේ
සියල්ලෝ ඉශ්‍රායෙල් රජවූ යොහෝෂාපාට්ගේ
3 පුත්‍රයෝය. ඔවුන්ගේ පියා රන් රිදීද
අනර්ඝ දේවල්ද වන බොහෝ තෑගි
යූදහි බලකොටු නුවරවල් ඇතුළුව ඔවුන්ට
දුන්නේය. නුමුත් යෙහෝරාම් කුලුඳුලා
නිසා ඔහුට රාජ්‍යය දුන්නේය. යෙහෝරාම්ද 4
තමාගේ පියාගේ රාජ්‍යයට පැමිණ
බලවත්වූ කල, තමාගේ සියලු සහෝදරයන්ද
ඉශ්‍රායෙල්හි සමහර අධිපතීන්ද කඩුවෙන්
මැරීය. යෙහෝරාම් තිස් දෑවුරුදු වයසේදී 5
රජවී යෙරුසලමෙහි අට අවුරුද්දක්
රජකම්කෙළේය. ආහබ්ගේ වංශය 6
කළාක් මෙන් ඔහු ඉශ්‍රායෙල් රජුන්ගේ
මාර්ගයෙහි හැසුරුණේය. මක්නිසාද ඔහු
ආහබ්ගේ දුවෙක් සරණපාවාගත්තේය.
මෙසේ ඔහු **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේය.
නුමුත් **ස්වාමීන්වහන්සේ** දාවිත් සමග 7
කළ ගිවිසුම නිසාද ඔහුටත් ඔහුගේ
දරුවන්ටත් සැම කල්හිම පහනක් දෙන්ට
පොරොන්දුවූ නිසාද දාවිත්ගේ වංශය
නැතිකරන්ට අකමැතිවූසේක. ඔහුගේ 8
කාලයේදී ඒදෝම්වරු කැරළිගසා යූදවරුන්
යටතෙන් අහක්ව, තමුන් කෙරෙහි රජෙකු
පත්කරගත්තෝය. එවිට යෙහෝරාම් 9
තමාගේ අධිපතීන්ද සියලු රථද සමග
ගොස් රාත්‍රියේ නැගිට තමා වටකර
සිටි ඒදෝම්වරුන්ටත් රථාධිපතීන්ටත්
පහරදුන්නේය. මෙසේ ඒදෝම්වරු අද 10
දක්වා යූදවරුන් යටතෙන් අහක්වී සිටිති.
තවද ලිබ්නාවරුත් එම කාලයේදී කැරළි-
ගසා ඔහු යටතෙන් අහක්වුණෝය.
මෙසේ වුණේ ඔහු තමාගේ පියවරුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අත්හැරිය
නිසාය. ඇරත් ඔහු යූද කඳුවල උස්තැන් 11
සාද යෙරුසලමේ වැසියන් *වේශ්‍යාකමට
පමුණුවා, යූදවරුන් මුළාකෙරෙවුවේය.
තවද ප්‍රොපේතවූ එලියාගෙන් ඔහුට 12
ලියවිල්ලක් ලැබුණේය, එනම්: තුඹේ
පියවූ යොහෝෂාපාට්ගේ මාර්ගවලත්
යූදහි රජවූ ආසාගේ මාර්ගවලත් තුඹ
නොහැසිර, ඉශ්‍රායෙල් රජුන්ගේ මාර්ග- 13
යෙහි හැසිරෙමින්, ආහබ්ගේ වංශය
කළාක් මෙන් යූදවරුන්ද යෙරුසලමේ
වැසියන්ද *වේශ්‍යාකමට පමුණුවා, තුඹේ
පියාගේ වංශය වන තුඹට වඩා යහපත්වූ

*එනම්, අන් දෙවිවරුන් ඇදහීමට.

තුඹේ සහෝදරයන් මැරූ බැවින්,
14 ස්වාමීන්වහන්සේ තුඹේ සෙනඟටත් තුඹේ
දරුවන්ටත් තුඹේ භාර්යාවන්ටත් තුඹේ
සියලු සම්පත්වලටත් මහත් පීඩාවකින්
15 පීඩාකරනවා ඇත. තුඹේ බඩවැල් දවසින්
දවස රෝගාතුරකමෙන් වැටීයන ලෙස
තුඹේ බඩවැල්වල දරුණු රෝග වන්නේ-
යයි තුඹේ පියා වන දාවිත්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ වදාරනසේකැයි එහි
16 ලියා තිබුණේය. ඒ හැටියට ස්වාමීන්-
වහන්සේ පිලිස්තිවරුන්ගේද කූෂ්වරුන්ට
ළංව වාසයකරන අරාබිවරුන්ගේද සිත්
යෙහෝරාම්ට විරුද්ධව පෙළඹවූසේක.
17 ඔව්හු යූදට විරුද්ධව අවුත් ඇතුළට
වැද, රජගෙදර තිබුණු සම්පත් සියල්ලද
ඔහුගේ පුත්‍රයන්ද භාර්යාවන්ද රැගෙන
ගියෝය; ඔහුගේ පුත්‍රයන්ගෙන් බාලයාවූ
යෙහෝවාහාස් හැර වෙන කිසි පුත්‍රයෙක්
18 ඔහුට ඉතිරිනොවීය. මේ සියල්ලට පසු
ඔහුගේ බඩවැල්වල වැළඳී අසාධ්‍ය
රෝගයකින් ස්වාමීන්වහන්සේ ඔහුට
19 පහරදුන්සේක. කල්යාමෙන්, දෑවුරුද්දක්
පසුවූ කල, ඔහුගේ රෝගය නිසා ඔහුගේ
බඩවැල් වැටී ගියේය, ඔහු දරුණු රෝග
වේදනාවෙන් මෙළේය. ඔහුගේ පියවරුන්
ගැන ගිනි මැලයක් දල්වූවාක් මෙන්
ඔහුගේ සෙනඟ ඔහු ගැන ගිනි මැලයක්
20 නොදල්වූහ. ඔහු තිස් දෑවුරුදු වයසේදී
රජවී අට අවුරුද්දක් යෙරුසලමෙහි
රජකම්කෙළේය. ඔහුගේ මරණය ගැන
කිසිවෙක් කනගාටුනුණේය; ඔව්හු
දාවිත්ගේ නුවර ඔහු තැන්පත් කළෝය,
නුමුත් රජවරුන්ගේ සොහොන්ගෙවල්හි
නොවේය.

## අහසියාගේ රජකම

22 යෙරුසලමේ වැසියෝ ඔහුගේ බාල
පුත්‍රවූ අහසියා ඔහු වෙනුවට රජ-
කමට පත්කළෝය. මක්නිසාද අරාබි-
වරුන් සමග කඳවුරට ආ සමූදව සියලු
වැඩිමහල් පුත්‍රයන් මැරුවෝය. එබැවින්
යූදහි රජවූ යෙහෝරාම්ගේ පුත් අහසියා
2 රජකම්කෙළේය. අහසියා හතළිස් දෑවුරුදු
වයසේදී රජවී, අවුරුද්දක් යෙරුසලමෙහි
රජකම්කෙළේය. ඔහුගේ මවුගේ නම
අතලියාය, ඈ ඔම්රීගේ දූවෙක්ය.
ඔහුද ආහබ්ගේ වංශයේ මාර්ගවල 3
හැසුරුණේය. මක්නිසාද දුෂ්ටකම් කිරීමට
ඔහුගේ මවුතොමෝ ඔහුගේ මන්ත්‍රණකාරී
වූවාය. ආහබ්ගේ වංශය කළාක් මෙන් 4
ඔහු ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය. මක්නිසාද
ඔහුට විනාශය පැමිණෙන ලෙස ඔව්හු
ඔහුගේ පියාගේ මරණයෙන් පසු ඔහුට
මන්ත්‍රණකාරයෝ වූහ. ඔහුත් ඔවුන්ගේ 5
මන්ත්‍රණය ලෙස හැසිර, ආහබ්ගේ පුත්‍රවූ
ඉශ්‍රායෙල් රජවූ යෙහෝරාම් සමග
සිරියේ රජවූ හසායෙල්ට විරුද්ධව
රාමොත්-ගිලියද්හි යුද්ධකරන්ට ගියේය.
සිරියවරු යෝරාම්ට තුවාලකළෝය. ඔහු 6
සිරියේ රජවූ හසායෙල්ට විරුද්ධව
සටන්කරන අතර රාමාහිදී සිරියවරුන්
විසින් ඔහුට කළ තුවාල යෙස්‍රෙයෙල්හිදී
සුවකරවාගන්න පිණිස ඔහු හැරී
ආවේය. යූදහි රජවූ යෙහෝරාම්ගේ පුත්‍රවූ
අහසියාද ආහබ්ගේ පුත්‍රවූ යෙහෝරාම්
රෝගාතුරව සිටි බැවින් ඔහු බලන්ට
යෙස්‍රෙයෙල්ට ගියේය. යෝරාම් ළඟට 7
යාම නිසා අහසියාටවූ විනාශය
දෙවියන්වහන්සේ කෙරෙන් විය. මක්-
නිසාද ඔහු ගිය කල ආහබ්ගේ වංශය
සිඳ දමන පිණිස ස්වාමීන්වහන්සේ විසින්
ආලේපකළාවූ නිම්ෂීගේ පුත්‍රවූ යේහුට
විරුද්ධව ඔහු යෙහෝරාම් සමග ගියේය.
තවද යේහු ආහබ්ගේ වංශය කෙරෙහි 8
විනිශ්චය ඉෂ්ටකරද්දී යූදහි අධිපතීන්ද
අහසියාට සේවයකළ අහසියාගේ
සහෝදරයන්ගේ පුත්‍රයන්ද සම්බව ඔහු
ඔවුන් මැරුවේය. ඔහු අහසියා සොයා 9
ගියේය, ඔව්හු සමාරියේ සැඟවී සිටි
ඔහු අල්වා යේහු ළඟට ගෙනවුත්
මැරුවෝය; තවද ඔව්හු කථාකොට:
මොහු වනාහි තමාගේ මුළු සිතින්
ස්වාමීන්වහන්සේ සෙවූ යෙහෝෂාපාට්ගේ
පුත්‍රයායයි කියා ඔහු තැන්පත් කළෝය.
රාජ්‍යය පවත්වාගන්ට අහසියාගේ
වංශයේ කිසිවෙක් සිටියේ නැත.
එකල අහසියාගේ මවුවූ අතලියා 10
තමාගේ පුත්‍රයා මළ බව දැක නැගිට

11 මුළු යූද රාජවංශය නැතිකළාය. නුමුත්
රජුගේ දූවූ යෙහෝෂබත් මරනු ලැබූ
රාජ පුත්‍රයන් අතරෙන් අහසියාගේ පුත්‍රවූ
යෝවාෂ් හොරෙන් හැරගෙන ගොස්,
ඔහුද ඔහුගේ කිරි මවද යහන් තුබූ
ගබඩාවෙහි සඟවා තැබුවාය. මෙසේ
යෙහෝරාම් රජුගේ දූවූ, යෙහෝයාද
පූජකයාගේ භාර්යාවවූ, අහසියාගේ
සහෝදරීවූ යෙහෝෂබත් අතලියා විසින්
ඔහු නොමරන ලෙස ඈ කෙරෙන් ඔහු
12 සැඟෙවුවාය. ඔහු දෙවියන්වහන්සේගේ
ගෘහයෙහි ඔවුන් සමග අවුරුදු හයක්
සැඟවී සිටියේය. අතලියා දේශය කෙරෙහි
රජකම්කළාය.

## යෝවාෂ් රජකමට පත්කිරීම. අතලියා මැරීම

**23** සත්වෙනි අවුරුද්දේදී යෙහෝයාද
ධෛර්ය උපදවාගෙන, ශතාධිපතීන්
වන යෙරොහාම්ගේ පුත්‍රවූ අසරියාද
යෙහෝහානාන්ගේ පුත්‍රවූ ඉෂ්මායෙල්ද
ඕබෙද්ගේ පුත්‍රවූ අසරියාද අදයාගේ පුත්‍රවූ
මයසේයාද සික්‍රීගේ පුත්‍රවූ එලීෂාපාට්ද
2 ගිවිසුමකින් බැඳගත්තේය. ඔව්හු යූදහි
ඔබ මොබ ගොස්, යූදහි සියලු නුවර-
වලින් ලෙවීවරුන්ද ඉශ්‍රායෙල්වරුන්ගේ
පියවංශවල ප්‍රධානීන්ද රැස්කරගෙන
3 යෙරුසලමට ආවෝය. මුළු සභාව
දෙවියන්වහන්සේගේ ගෘහයේදී රජු හා
සමග ගිවිසුමක් කරගත්තාය. යෙහෝ-
යාද ඔවුන්ට කථාකොට: **ස්වාමීන්-
වහන්සේ** දාවිත්ගේ පුත්‍රයන් ගැන කී
ප්‍රකාරයට රජුගේ පුත්‍රයා රජවිය යුතුය.
4 නුඹලා කරන්ට ඕනෑ දේ මේය: සබත්
දවසේදී ඇතුල්වෙන පූජකයන්ද ලෙවී-
වරුන්ද වන නුඹලාගෙන් තුනෙන්
කොටසක් දොරටුපාලයන් විය යුතුය;
5 තුනෙන් කොටසක් රජගෙයිද තුනෙන්
කොටසක් අත්තිවාරම් දොරටුවෙහිද සිටිය
යුතුය. මුළු සෙනඟද **ස්වාමීන්වහන්සේගේ**
6 ගෘහයෙහි මණ්ඩපවල සිටිත්වා. නුමුත්
පූජකයන්ද ලෙවීවරුන්ගෙන් සේවය-
කරන්නන්ද හැර වෙන කිසිවෙක්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට ඇතුල්
නොවේවා; ඔව්හු විශුද්ධව සිටින
නිසා ඇතුල්වෙත්වා. නුමුත් මුළු සෙනඟ
**ස්වාමීන්වහන්සේගේ** නියමය පවත්වාවා.
ලෙවීවරුද එක්එක් කෙනා තම තමාගේ 7
ආයුධ අතින් ගෙන රජු වටකර සිටිත්වා;
ගෘහයට ඇතුල්වෙන කවුරු නුමුත්
මරනු ලබාවා. රජු ඇතුල්වන කල්හිද
පිටත යන කල්හිද නුඹලා ඔහු සමග
සිටපල්ලායයි කීවේය. ලෙවීවරුද සියලු 8
යූදවරුද යෙහෝයාද පූජකයා විසින්
අණකළ සියල්ල ලෙස කොට, එකිනෙකා
තම තමාගේ මිනිසුන් වන සබත් දවසේදී
ඇතුල්වෙන තැනැත්තන් පිටත යන
තැනැත්තන් සමග කැඳවාගත්තෝය;
මක්නිසාද යෙහෝයාද පූජක තෙම
රැකවල් පන්ති නිදහස්කර නොහැරියේය.
යෙහෝයාද පූජකයා දෙවියන්වහන්සේ- 9
ගේ ගෘහයෙහි තිබුණු දාවිත් රජුගේ හෙල්ල
සහ පලිස්ද මහ පලිස්ද ශතාධිපතීන්ට
දී, මුළු සෙනඟ එකිනෙකා තම තමාගේ 10
ආයුධය අතේ ඇතුව ගෘහයේ දකුණු
පැත්තේ සිට ගෘහයේ වම්පැත්ත දක්වා
පූජාසනයත් ගෘහයත් ළඟ රජු වටකර
සිටෙවුවේය. එවිට ඔව්හු රාජ පුත්‍රයා 11
පිටතට ගෙනවුත් ඔහු මත්තෙහි ඔටුන්න
තබා, ව්‍යවස්ථාව ඔහුට දී, ඔහු රජකමට
පත්කළෝය. යෙහෝයාදද ඔහුගේ
පුත්‍රයෝද ඔහු ආලේපකොට: රජ
සැරදේවායි කීවෝය. සෙනඟ දුවමින් 12
රජු වර්ණනාකරන ඝෝෂාව අතලියාට
ඇසුණ විට, ඈ **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි සිටි සෙනඟ ළඟට ආවාය.
ඈ බැලූ විට ඇතුල්වෙන තැන රජ 13
තමාගේ මංචකය ළඟ සිටිනවා සහ
රජු ළඟ අධිපතීන්ද නළාකාරයන්ද
සිටිනවාත්, දේශයේ මුළු සෙනඟ ප්‍රීතිමත්ව
හොරණෑ පිඹිනවාත්, ගීකියන්නන්ද තූර්ය
භාණ්ඩවලින් ගායනා කරන්නන්ද ප්‍රශංසා
ගී කියනවාත් දැක ඇගේ ඇඳුම් ඉරාගෙන:
ද්‍රෝහිකමය, ද්‍රෝහිකමයයි කීවාය.
එවිට යෙහෝයාද පූජකයා සේනාවේ 14
ප්‍රධානීන්වූ ශතාධිපතීන් පිටතට ගෙනවුත්
ඔවුන්ට කථාකොට: ඇය පේළි අතරෙන්
පිටතට ගෙනියාපල්ලා; ඈ පස්සේ
යමෙක් ආවොත් ඔහු කඩුවෙන් මරා-
පල්ලායයි අණකෙළේය. මක්නිසාද:
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේදී ඈ මරනු
නොලබාවයි පූජකයා කීවේය. ඈට 15
දෙපසින් ඉඩඇරිය විට ඈ රජගෙදරට

අශ්ව දෙරටුවෙන් ගියාය. එහිදී ඔව්හු
ඈ මැරුවෝය.

## දේව නමස්කාරය නැවත පිහිටුවීම

16 **ස්වාමීන්වහන්සේගේ** සෙනඟ ව සිටින
ලෙස යෙහෝයාද තමා සහ මුළු
සෙනඟත් රජුත් අතරේ ගිවිසුමක්
17 කෙළේය. මුළු සෙනඟ බාල්ගේ ගෘහයට
ගොස් ඒක කඩාදමා, ඔහුගේ පූජාසනද
ඔහුගේ පිළිමද බිඳදමා, පූජාසන ඉදිරි-
යේදී බාල්ගේ පූජකයාවූ මත්තන්
18 මැරුවෝය. තවද දාවිත්ගේ නියමයේ
ප්‍රකාරයට ප්‍රීතියද ගීකීමද ඇතුව
**ස්වාමීන්වහන්සේගේ** දවන පූජා
මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහි ලියා
තිබෙන ලෙස ඔප්පුකිරීමට, යෙහෝයාද
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ මෙහෙයවල්
දාවිත් විසින් **ස්වාමීන්වහන්සේගේ** ගෘහය
කෙරෙහි බෙදා නියමකළ ලෙවීවරුන්වූ
19 පූජකයන් අතට භාරකෙළේය. යම් හෙය-
කින් අපවිත්‍ර කිසිවෙක් ඇතුල් නොවන
පිණිස ඔහු **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
දෙරකඩවල දෙරටුපාලයන් සිටෙවුවේය.
20 තවද ඔහු ශතාධිපතීන්ද වංශාධිපතීන්ද
සෙනඟගේ ආණ්ඩුකාරයන්ද දේශයේ
මුළු සෙනඟද කැඳවාගෙන, **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ සිට රජු ගෙන-
ගියේය. ඔව්හු ඉහළ දෙරටුවෙන් රජගෙට
පැමිණ රජ්ජුරුවන් රාජාසනයෙහි
හිඳෙවුවෝය. මෙසේ දේශයේ මුළු සෙනඟ
21 ප්‍රීතිවූහ, නුවරද නිශ්චලව තිබුණාය. තවද
ඔව්හු අතලියා කඩුවෙන් මැරුවෝය.

## යෝවාෂ් රජු යටතේ දේව ගෘහය ප්‍රකෘතිමත්කිරීම

**24** යෝවාෂ් සත් අවුරුදු වයසේදී රජවී
යෙරුසලමෙහි සතළිස් අවුරුද්දක්
රජකම්කෙළේය. ඔහුගේ මවුගේ
නම ශිබියාය, ඈ බෙයෙර්-ෂෙබාහි
2 ස්ත්‍රියෙක්ය. යෙහෝයාද පූජකයාගේ
කාලය මුළුල්ලෙහි යෝවාෂ් **ස්වාමීන්-
වහන්සේගේ** ඇස් හමුයෙහි හරිව
3 තිබුණු දේ කෙළේය. යෙහෝයාද ඔහුට
භාර්යාවන් දෙදෙනෙකු ගෙනදුන්නේය;
ඔහුට දාව පුත්‍රයොත් දූවරුත් උපන්නෝය.
ඉන්පසු යෝවාෂ් **ස්වාමීන්වහන්සේගේ** 4
ගෘහය ප්‍රකෘතිමත්කරන්ට සිතට ගෙන,
පූජකයන්ද ලෙවීවරුන්ද රැස්කරගෙන 5
ඔවුන්ට කියනුයේ: තුඹලා යූදාහි නුවර-
වලට ගොස් අවුරුද්දෙන් අවුරුද්ද
තුඹලාගේ දෙවියන්වහන්සේගේ ගෘහය
අලුත්වැඩියාකරන පිණිස සියලු
ඉශ්‍රායෙල්වරුන්ගෙන් මුදල් එකතු-
කරපල්ලා, ඒ කාරණය ගැන ඉක්මන්-
වෙයල්ලායයි කීවේය. නුමුත් ලෙවීවරු
ඉක්මන් නොවූහ. එවිට රජ තෙමේ 6
ප්‍රධානියාවූ යෙහෝයාද කැඳවා:
**ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවූ
මෝසෙස්ද ඉශ්‍රායෙල් සභාවද විසින්
සාක්ෂි-කූඩාරම උදෙසා නියමකළ
සුංගම් මිල ලෙවීවරුන් විසින් යූදා සහ
යෙරුසලමෙන් එකතුකර ගෙනෙන
හැටියට නුඹ බලානොගත්තේ මක්-
නිසාදැයි ඇසුවේය. මක්නිසාද දුෂ්ටවූ 7
අතලියා සහ ඇගේ පුත්‍රයෝ දෙවියන්-
වහන්සේගේ ගෘහය කඩා, **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ කැපවූ සියලු
දේවල් බාල් දේවතාවුන් උදෙසා
පාවිච්චියට ගත්තෝය. තවද පෙට්ටියක් 8
සාදා **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
දෙරකඩ පිටතින් තබන ලෙස රජ අණ-
කෙළේය. එවිට දෙවියන්වහන්සේගේ 9
මෙහෙකරුවාවූ මෝසෙස් කාන්තාර-
යේදී ඉශ්‍රායෙල්ට නියමකළ සුංගම
**ස්වාමීන්වහන්සේ** උදෙසා ගෙනෙන්ට
කියා යූදාහි සහ යෙරුසලමෙහි
ප්‍රසිද්ධයක් කරනලද්දේය. එවිට සියලු 10
අධිපතීහුද මුළු සෙනඟද සන්තෝෂව,
තීන්දුවෙන තුරු මුදල් ගෙනැවිත්
පෙට්ටියේ දැම්මෝය. මෙයාකාරයෙන් 11
ඒ පෙට්ටිය ලෙවීවරුන් ලවා රාජ
ගබඩාවට ගෙන්වන විටත්, බොහෝ
මුදල් තිබෙන බව දකින විටත්, රජුගේ
ලේකම්ද උත්තම පූජකයාගේ සේවකයාද
ඇවිත් පෙට්ටිය හිස්කර, ඒක නැවත
ගෙන ගොස් පළමු තිබුණු තැන
තැබුවෝය. ඔව්හු දවසින් දවස මෙසේ

12 කොට බොහෝ මිල එකතුකළෝය. රජු
සහ යෙහෝයාදා ස්වාමීන්වහන්සේගේ
ගෘහ මෙහෙයේ කටයුතු කරවන්නන්ට
ඒවා දුන්නෝය; ඔව්හු ස්වාමීන්-
වහන්සේගේ ගෘහය අලුත් වැඩියා කරන
පිණිස ගල්වඩුවන්ද වඩුවන්ද ස්වාමීන්-
වහන්සේගේ ගෘහය හරිගැස්සීමට යකඩ
සහ පිත්තල වැඩ කරන්නන්ද කුලියට
13 ගත්තෝය. කම්කරුවෝ වීර්යයෙන්
වැඩකළෝය, මෙසේ ඔවුන් විසින් ඒ
වැඩ සම්පූර්ණකරනලද්දේය; ඔව්හු
දෙවියන්වහන්සේගේ ගෘහය නිසි ලෙස
14 පිහිටුවා ඒක සවිකළෝය. වැඩ නිමකළ
පසු ඔව්හු ඉතිරි මිල රජු සහ යෙහෝයාදා
ඉදිරිපිටට ගෙනාවෝය, එයින් ස්වාමීන්-
වහන්සේගේ ගෘහයට භාණ්ඩ එනම්
මෙහෙයටත් පූජා ඔප්පුකිරීමටත් බඳුද
හැඳිද රන් රිදී භාජනද සාදනලද්දේය.
යෙහෝයාදාගේ සියලු දවස්වලදී
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ දවන පූජා
නිතරම ඔප්පුකරනලද්දේය.

## යෝවාෂ්ගේ වැටීයාම සහ මරණය

15 නුමුත් යෙහෝයාදා මහලුව වයසින්
පූර්ණව මළේය; මැරෙන කල ඔහු
අවුරුදු එකසිය තිහක් වයස්ව සිටියේය.
16 ඔහු ඉශ්‍රායෙල්හිද දෙවියන්වහන්සේ
සහ උන්වහන්සේගේ ගෘහය උදෙසාද
යහපතකළ බැවින් දාවිත්ගේ නුවර රජ-
වරුන් අතරේ තැන්පත්කරනු ලැබීය.
17 යෙහෝයාදා මැරුණු පසු යූදාහි අධිපතීහු
ඇවිත් රජුට වැන්දෝය. එවිට රජ
18 ඔවුන්ට ඇහුම්කන්දුන්නේය. ඔව්හු තමුන්-
ගේ පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ ගෘහය අත්හැර අෂේරා
කණුවලටත් පිළිමවලටත් සේවය-
කළෝය. ඔවුන්ගේ මේ වරද නිසා යූදාද
යෙරුසලමද පිටට උදහස පැමිණියේය.
19 නුමුත් ඔවුන් ස්වාමීන්වහන්සේ වෙතට
හරවන පිණිස උන්වහන්සේ ප්‍රොපේත-
වරුන් ඔවුන් අතරට එවූසේක; ඒ
ප්‍රොපේතවරුන් ඔවුන්ට අවවාදකළ
නුමුත් ඔව්හු ඇහුම්කන් නුදුන්නෝය.
දෙවියන්වහන්සේගේ ආත්මය යෙහෝ- 20
යාදා පූජකයාගේ පුත්‍රවූ ශෙකරියා
කෙරෙහි පැමිණියේය; ඔහු සෙනඟට
ඉහළින් නැගිට සිට ඔවුන්ට කථාකොට:
දෙවියන්වහන්සේ මෙසේ කියන-
සේක—තුඹලා ස්වාමීන්වහන්සේගේ ආඥා
කඩකරන්නේ මක්නිසාද? තුඹලාට
සඵලයක් නොවන්නේය. තුඹලා ස්වාමීන්-
වහන්සේ අත්හැරිය නිසා උන්වහන්සේත්
තුඹලා අත්හැරියසේකැයි කීවේය. ඔව්හු 21
රජුගේ ආඥාව පිට ඔහුට විරුද්ධව
කුමන්ත්‍රණයකොට ස්වාමීන්වහන්සේගේ
ගෘහයේ මළුවේදී ඔහුට ගල් ගැසුවෝය.
මෙසේ යෝවාෂ් රජ ඔහුගේ පියවූ 22
යෙහෝයාදා තමාට කළ කරුණාව සිහි
නොකොට ඔහුගේ පුත්‍රයා මැරීය. ඔහු
මැරෙද්දී කථාකොට: ස්වාමීන්වහන්සේ
මේක බලා ප්‍රතිඵල දෙනසේක්වයි කීවේය.
ඊළඟ අවුරුද්දෙහි සිරියවරුන්ගේ සේනාව 23
ඔහුට විරුද්ධව ආවෝය. ඔව්හු යූදාටත්
යෙරුසලමටත් පැමිණ, සෙනඟ අතරෙන්
සෙනඟගේ සියලු අධිපතීන් නැතිකරදමා,
ඔවුන්ගෙන් ගත් මුළු කොල්ලය දමස්කයේ
රජුට ඇරියෝය. සිරියවරුන්ගේ සේනාව 24
ගණනින් ස්වල්ප දෙනෙක්ව ආවේවී
නමුත්, යූදාවරුන් තමුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ අත්හැරිය නිසා
ස්වාමීන්වහන්සේ ඉතා මහත් සේනාවක්
ඔවුන් අතට පාවාදුන්සේක. මෙසේ ඔව්හු
යෝවාෂ් කෙරෙහි දඬුවම් පැමිණෙවුවෝය.
ඔහු බොහෝ තුවාලවී සිටිද්දී ඔවුන් 25
ඔහු අත්හැර ඔහු වෙතින් ගියාට පසු,
ඔහුගේ සේවකයෝ පූජකවූ යෙහෝයාදා-
ගේ පුත්‍රයන්ගේ ලේ ගැන ඔහුට විරුද්ධව
කුමන්ත්‍රණයකොට, ඔහුගේ ඇඳේදී ඔහු
මැරුවෝය, මෙසේ ඔහු මළේය. ඔව්හු
දාවිත්ගේ නුවර ඔහු තැන්පත්කළ නුමුත්
රජවරුන්ගේ සොහොන් ගෙවල තැන්පත්
නොකළෝය. ඔහුට විරුද්ධව කුමන්- 26
ත්‍රණයකළ අය නම්: අම්මොනිය ස්ත්‍රියෙක්
වන ෂිමෙයාත්ගේ පුත්‍රවූ සාබාත් සහ
මෝවබිය ස්ත්‍රියෙක් වන ෂිම්රීත්ගේ පුත්‍රවූ

27 යෙහෝසාබාද්ය. ඔහුගේ පුත්‍රයන් ගැනද
ඔහු පිට තබනලද බරේ මහත්කම සහ
දෙවියන්වහන්සේගේ ගෘහය දෙවනු
ගොඩනැගීම ගැනද රාජාවලි අටුවා
පොතෙහි ලියා තිබේ. ඔහුගේ පුත්‍රවූ
අමශියා ඔහු වෙනුවට රජවුණේය.

## අමශියා රජ

25 අමශියා විසිපස් අවුරුදු වයසේදී
රජවී යෙරුසලමෙහි විසිනව
අවුරුද්දක් රජකම්කෙළේය. ඔහුගේ මවුගේ
නම යෙහෝයද්දන්ය, ඈ යෙරුසලමේ
2 ස්ත්‍රියෙක්ය. ඔහු **ස්වාමීන්වහන්සේගේ**
ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය,
3 නුමුත් සම්පූර්ණ සිතකින් නොවේය. තවද
රජකම ඔහු කෙරෙහි ස්ථිරවුණ කල,
ඔහු තමාගේ පිය රජ්ජුරුවන් මැරුවාවූ
4 තමාගේ සේවකයන් මරාදම්මේය. නුමුත්:
දරුවන් නිසා පියවරුවත් පියවරුන් නිසා
දරුවෝවත් මරනු නොලබත්වා, එක
එකා තම තමාගේම පාපය නිසා මරනු
ලබාවයි කියා **ස්වාමීන්වහන්සේ** අණකළ
ලෙස, මෝසෙස්ගේ පොතේ ව්‍යවස්ථාවෙහි
ලියා තිබෙන පරිද්දෙන් ඔහු ඔවුන්ගේ
5 දරුවන් නොමරා හැරියේය. තවද
අමශියා යූදවරුන් රැස්කර, මුළු යූදහිද
බෙන්යමින්හිද ඔවුන්ගේ පිය වංශවල
හැටියට ඔවුන් සහස්‍රාධිපතීන්ද ශතාධි-
පතීන්ද යටතේ පත්කොට, විසි අවුරුද්ද
පටන් ඉන් ඉහළට වයස්වූවන් ගණන්-
කර, හෙල්ලද පලිස්ද දරා යුද්ධයට
යන්ට දක්ෂවූ තෝරාගත් මනුෂ්‍යයන්
තුන් ලක්ෂයක් සිටින බව දැනගත්තේය.
6 තවද ඔහු ඉශ්‍රායෙල්වරුන්ගෙන් යුද්ධ
දක්ෂයන් ලක්ෂයක් රිදී තලෙන්ත
7 සියයකට කුලියට ගත්තේය. නුමුත්
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ඔහු
ළඟට ඇවිත්: රජ්ජුරුවෙනි, සියලු
එප්‍රායිම් පුත්‍රයන් වන ඉශ්‍රායෙල්වරුන්
සමග **ස්වාමීන්වහන්සේ** නොසිටින නිසා
ඉශ්‍රායෙල් යුද්ධ සේනාව ඔබ සමග
8 නොයත්වා. නුමුත් ඔබ යන්නෙහි නම්,
ශක්තිමත්ව සටනට බලවත් වෙයන්න;
දෙවියන්වහන්සේ සතුරා ඉදිරියෙහි ඔබ
හෙළාදමනසේක; මක්නිසාද උපකාර-
කරන්ටත් හෙළාදමන්ටත් දෙවියන්-
වහන්සේට බලය ඇත්තේයයි කීවේය.
අමශියාද: එසේ නම් මා ඉශ්‍රායෙල් 9
සේනාවට දුන් තලෙන්ත සියය ගැන
අපි මක්කරමුදැයි දෙවියන්වහන්සේගේ
මනුෂ්‍යයාගෙන් ඇසුවේය. දෙවියන්-
වහන්සේගේ මනුෂ්‍යයාද: ඊට වඩා ඔබට
දෙන්ට **ස්වාමීන්වහන්සේට** පුළුවනැයි
කීවේය. එකල අමශියා එප්‍රායිම්හි සිට 10
තමා වෙතට ආ සමූදව ස්වකීය
ස්ථානයට යන පිණිස වෙන්කෙළේය.
ඒ නිසා ඔවුන්ගේ කෝපය යූද කෙරෙහි
බොහෝසෙයින් ඇවිළ, ඔව්හු තද
කෝපයෙන් තමුන්ගේ ස්ථානයට හැරී
ගියෝය. ඉක්බිති අමශියා ධෛර්ය 11
උපදවා, තමාගේ සෙනඟ කැඳවාගෙන
ලුණු මිටියාවතට පැමිණ සෙයීර්
පුත්‍රයන්ගෙන් දසදහසක් මැරීය. යූද 12
පුත්‍රයෝ තව දසදහසක් පණපිටින්
අල්ලාගෙන, ඔවුන් පර්වතයේ මුදුනට
ගෙන ගොස් පර්වතය මුදුනෙන් පහළට
හෙළා දැමුවෝය, ඔවුන් සියල්ලෝද
සුනුවිසුනු වූහ. අමශියා තමා සමග 13
යුද්ධයට නොයන පිණිස ආපසු හැරියාවූ
සමූදවේ මනුෂ්‍යයෝ සමාරියේ සිට
බෙත්හෝරොන් දක්වා යූදහි නුවරවලට
වැද, එහිදී තුන්දහසකට පහරදී බොහෝ
කොල්ලය ගත්තෝය.
අමශියා ඒදෝම්වරුන් මරා ආවායින් 14
පසු ඔහු සෙයීර් පුත්‍රයන්ගේ දෙවිවරුන්
ගෙනැවිත් තමාට දෙවිවරුන් කොට
තබාගෙන, ඒවා ඉදිරියෙහි වැඳ වැටී
ඒවාට සුවඳ දුම් ඔප්පුකෙළේය. එවිට 15
**ස්වාමීන්වහන්සේගේ** උදහස අමශියා
කෙරෙහි ඇවුළුණේය, උන්වහන්සේ
ප්‍රොපේත කෙනෙකු ඔහු වෙතට යැවූ-
සේක. ඔහු කථාකොට: තමුන්ගේ සෙනඟ
නුඹේ අතින් ගළවා නොගත් සෙනඟගේ
දෙවියන් වෙතට මක්නිසා හැරුණෙහිදැයි
ඔහුගෙන් ඇසුවේය. මෙසේ ඔහු රජු 16
සමග කථාකරද්දී අමශියා ඔහුට
කථාකොට: නුඹ රජුගේ මන්ත්‍රියෙකු
කොට පත්කෙළෙමුද? නිකම් සිටපන්න;

තුඹ මරනු ලබන්නේ කුමටදැයි කීවේය.
එවිට ප්‍රොපේත තෙම නැවතී: තුඹ මාගේ
දූනමිතිකම නොඅසා මේක කළ බැවින්
දෙවියන්වහන්සේ තුඹ විනාශකරන්ට
නියමකරගත් බව මට පෙනේයයි කීවේය.
17 එකල යූදහි රජවූ අමශියා මන්ත්‍රණය-
කොට: වරෙන්න, අපි මූණගැසෙමුව
කියා යේහුගේ පුත්‍රවූ යෙහෝවාස්ගේ
පුත්‍රයා වන ඉශ්‍රායෙල් රජවූ යෝවාෂ්ට
18 කියා හැරියේය. ඉශ්‍රායෙල් රජවූ යෝවාෂ්
උත්තරදෙමින්: තුඹේ දූව මාගේ පුත්‍රයාට
භාර්යා කොට පාවාදියන්නැයි
ලෙබනොන්හි තිබෙන ගොකටු ගස
ලෙබනොන්හි තිබෙන කිහිරි ගසට
කියා ඇරියේය. නුමුත් ලෙබනොන්හි
වනමෘගයෙක් එහි යන විට ගොකටු
19 ගස පාගාදැමීය. මෙන්න, ඒදෙම්වරුන්ට
පහරදුන්නෙමියි තුඹ කියයි; තුඹේ
සිතද පාරට්ටු කරන පිණිස අහංකාරවී
තිබේ. ගෙදර සිටපන්න; තුඹද තුඹ
සමග යූදවරුන්ද වැටෙන ලෙස තුඹ
අන්තරායට මැදිවෙන්නේ මක්නිසාදැයි
යූදහි රජවූ අමශියාට කියා හැරියේය.
20 නුමුත් අමශියා ඇහුම්කන් නුදුන්නේය;
මක්නිසාද ඔවුන් ඒදෙම්හි දෙවිවරුන්
වෙතට හැරුණු බැවින් ඔවුන් පාවාදෙන
පිණිස ඒක දෙවියන්වහන්සේ කෙරෙන්
21 පැමුණුණේය. මෙසේ ඉශ්‍රායෙල්හි රජවූ
යෝවාෂ් පිටත්ව ගියේය; ඔහුද යූදහි
රජවූ අමශියාද යූදට අයිති බෙත්-
22 ෂෙමෙෂ්හිදී මූණගැසුණෝය. යූදවරුන්
ඉශ්‍රායෙල්වරුන්ට පරාජයවී එක් එක්-
කෙනා තම තමාගේ කූඩාරමට පලා-
23 ගියේය. ඉශ්‍රායෙල්හි රජවූ යෝවාෂ්
තෙමේ යෙහෝවාහාශ්ගේ පුත්‍රවූ
යෝවාෂ්ගේ පුත්‍රයා වන යූදහි රජවූ
අමශියා බෙත්-ෂෙමෙෂ්හිදී අල්ලාගෙන
යෙරුසලමට ගෙනවුත්, එප්‍රායිම් දොරටුව
සිට කොනේ දොරටුව දක්වා යෙරුසලමේ
පවුරෙන් රියන් හාරසියයක් බිඳහෙළා,
24 දෙවියන්වහන්සේගේ ගෘහයෙහි ඕබෙද්-
ඒදෙම් ළඟ තිබුණු රන් රිදී සියල්ලද
සියලු භාජනද රජ ගෙයි වස්තුද ඇප-
කාරයන්ද රැගෙන සමාරියට හැරීගියේය.
යෙහෝවාහාස්ගේ පුත්‍රවූ ඉශ්‍රායෙල් 25
රජවූ යෝවාෂ්ගේ මරණයෙන් පසු යූදහි
රජවූ යෝවාෂ්ගේ පුත්‍රවූ අමශියා අවුරුදු
පහළොහක් ජීවත්ව සිටියේය. අමශියා- 26
ගේ අනික් ක්‍රියා මුල පටන් අග දක්වා
යූදහි රජුන්ගේද ඉශ්‍රායෙල් රජුන්ගේද
පොතෙහි ලියා තිබෙනවා නොවේද?
අමශියා **ස්වාමීන්වහන්සේ** වෙතින් 27
අහක්ව ගිය පසු මනුෂ්‍යයෝ යෙරුසල-
මෙහි ඔහුට විරුද්ධව කුමන්ත්‍රණයක්
කළෝය; ඔහු ලාකීෂ්ට පලාගියේය.
නුමුත් ඔව්හු ඔහු පස්සේ ලාකීෂ්ට
මිනිසුන් යවා එහිදී ඔහු මරා, අශ්වයන් 28
පිට තබා ගෙනවුත්, දාවිත්ගේ නුවර
ඔහුගේ පියවරුන් ළඟ ඔහු තැන්පත්-
කළෝය.

## උස්සියාගේ රජකම්කිරීම

26 එකල යූදහි මුළු සෙනඟ දහසය
අවුරුදු වයස්වූ උස්සියා කැඳවාගන
ඔහුගේ පියවූ අමශියා වෙනුවට රජකමට
පත්කළෝය. රජු තමාගේ පියවරුන් සමග 2
සැතපුණු පසු ඔහු ඒලොත් ගොඩනගා
එය යූදට නැවත අයිතිකරගත්තේය.
උස්සියා දහසය අවුරුදු වයසේදී රජවී 3
යෙරුසලමෙහි පනස් දෑවුරුද්දක් රජකම්-
කෙළේය. ඔහුගේ මවුගේ නම යෙකි-
ලියාය, ඈ යෙරුසලමේ ස්ත්‍රියෙක්ය. ඔහු 4
තමාගේ පියවූ අමශියා කළ සියල්ල
ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
හරිව තිබුණු දේ කෙළේය. දේවදර්ශන 5
පිළිබඳ තේරුම් ඇත්තාවූ ශෙකරියාගේ
දවස්වලදී ඔහු දෙවියන්වහන්සේ සෙවූ-
වේය. ඔහු **ස්වාමීන්වහන්සේ** සෙවූතාක්ම
දෙවියන්වහන්සේ ඔහු සඵල කළසේක.
ඔහු නික්ම ගොස් පිලිස්තිවරුන්ට 6
විරුද්ධව යුද්ධකොට, ගාත්හි පවුරත්
යබ්නෙහි පවුරත් අෂ්දෝද්හි පවුරත්
බිඳදමා, අෂ්දෝද් රටෙහිද පිලිස්තිවරුන්
අතරේද නුවරවල් ගොඩනැගුවේය.
දෙවියන්වහන්සේ පිලිස්තිවරුන්ටත් ගූර්- 7
බාල්හි සිටි අරාබිවරුන්ටත් මෙයූනි-
වරුන්ටත් විරුද්ධව ඔහුට උපකාර-
කළසේක. අම්මොනිවරුන් උස්සියාට 8

තැගී දුන්නෝය. ඔහු ඉතාම බලවත්වූ
බැවින් ඔහුගේ නාමය මිසරයේ සීමාව
9 දක්වා පතළව ගියේය. තවද උස්සියා
යෙරුසලමේ කොනේ දොරටුව උඩද
මිටියාවතේ දොරටුව උඩද පවුරු මුළු-
වලද මුරකොටු ගොඩනගා ඒවා සවි-
10 කෙළේය. ඔහුට පාත රටෙහිත් සම-
භූමියෙහිත් බොහෝ සිවුපාවුන් සිටි
නිසා ඔහු කාන්තාරයෙහි මුර
කොටු ගොඩනගා බොහෝ ජලාසයන්ද
සෑදුවේය. ඔහු ගොවි කර්මාන්තයට
ප්‍රසන්නව සිටි බැවින් කඳුවලත් සරු
කෙත්වලත් ගොවියෝද මිදිවතු වවන්-
11 නෝද ඔහුට සිටියෝය. යුද්ධයට යන්-
නාවූ සේනාවක්ද උස්සියාට සිටියාය.
ලේකම් වන යෙයියෙල් විසින්ද මූලා-
දැනියාවූ මයසේයා විසින්ද ඔවුන් ගණන්
කළ ගණනේ හැටියට ඔව්හු රජුගේ
අධිපතියෙක්වූ හනනියාගේ අත යටතේ
සමූද වශයෙන් සේවයට පිටත්ව ගියෝය.
12 බලවත් වික්‍රමාන්විත මනුෂ්‍යයන්ගේ
පියවංශවල ප්‍රධානීන්ගේ මුළු ගණන
13 දෙදස් හයසියයක්ය. ඔවුන් යටතේ සතුරාට
විරුද්ධව රජුට උදව්වන පිණිස බලවත්
ලෙස යුද්ධකරන මිනිසුන් තුන්ලක්ෂ
හත්දස් පන්සියයකින් යුත් යුද්ධ සේනා-
14 වක් සිටියාය. උස්සියා ඒ මුළු සේනාවට
පලිස්ද හෙල්ලද තොප්පිද යුද්ධ සැට්ටද
දුනුද වීසිකිරීමට ගල්ද පිළියෙළ කෙළේය.
15 තවද ඔහු ඊගස්වලින්ද ලොකු ගල්වලින්ද
විදින්ට මුර කොටු උඩත් කොත් උඩත්
තබන පිණිස දක්ෂ මිනිසුන් විසින්
සොයා දැනගත් යන්ත්‍ර යෙරුසලමෙහි
සෑදෙවුවේය. ඔහුගේ නාමය දස දෙස
පතළව ගියේය; මක්නිසාද බලවත්වන
ලෙස පුදුමාකාරයෙන් ඔහුට උපකාර
ලැබුණේය.

## රජ කුෂ්ඨරෝගියෙක් වීම

16 තුමුත් ඔහු බලවත්වූ කල, නපුර කරන
ලෙස ඔහුගේ සිත උඩඟුවිය; ඔහු දුම්
පූජාසනය පිට සුවඳ දුම් ඔප්පුකරන
පිණිස ස්වාමීන්වහන්සේගේ මාලිගාවට
ඇතුල්වීමෙන් තමාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට විරුද්ධව වරද කෙළේය.
තුමුත් අසරියා පූජකයාද ඔහු සමග 17
වික්‍රමාන්විත මනුෂ්‍යයන්ව සිටි ස්වාමීන්-
වහන්සේගේ පූජකයන් අසූ දෙනෙක්ද
උස්සියා රජු පස්සේ ගොස් ඇතුල්වී,
ඔහුට විරුද්ධව සිටිමින්, ඔහුට කථා- 18
කොට: උස්සියානි, සුවඳ දුම් ඔප්පුකිරීමට
කැපකරනලද ආරොන්ගේ පුත්‍රයන් වන
පූජකයන්ට මිස ස්වාමීන්වහන්සේ ඉදිරි-
යෙහි සුවඳ දුම් ඔප්පුකිරීම ඔබට අයිති
වැඩක් නොවේ. ශුද්ධස්ථානයෙන් පිටතට
යන්න; මක්නිසාද ඔබ වරද කෙළෙහිය;
මෙය දෙවිවූ ස්වාමීන්වහන්සේගෙන් ඔබට
ගෞරව පිණිස නොවන්නේයයි කීවෝය.
එවිට උස්සියා උදහස් විය; සුවඳ දුම් 19
ඔප්පුකිරීමට දුම් භාජනයක් ඔහුගේ අතේ
තිබුණේය; ස්වාමීන්වහන්සේගේ ගෘහයේ
දුම් පූජාසනය ළඟ ඔහු පූජකයන් සමග
උදහස්ව සිටියදී, පූජකයන් ඉදිරියෙහි
ඔහුගේ නළලේ කුෂ්ඨරෝගය හටගත්තේය.
උත්තම පූජකයාවූ අසරියාද සියලු 20
පූජකයෝද ඔහු දෙස බැලූ විට ඔහුගේ
නළලේ කුෂ්ඨරෝගය තිබෙන බව දැක,
ඔහු එතනින් වහාම නෙරපාදැමුවෝය;
එසේය, ස්වාමීන්වහන්සේ තමාට පහර-
දුන් නිසා පිටතට යන්ට ඔහුම ඉක්මන්-
කෙළේය. උස්සියා රජ තෙමේ තමාගේ 21
මරණයේ දවස දක්වා කුෂ්ඨරෝගියෙක්ව
සිටියේය, කුෂ්ඨරෝගියෙක් ලෙස වෙන්වූ
නිසා ඔහු ගිලන් ගෙයක වාසයකෙළේය;
මක්නිසාද ස්වාමීන්වහන්සේගේ ගෘහයට
ඇතුල්වීම ඔහුට තහනම්ව තිබුණේය.
ඔහුගේ පුත්‍රවූ යෝතාම් රජගෙදර
ප්‍රධානියාව සිට දේශයේ සෙනඟ
විනිශ්චයකෙළේය. උස්සියාගේ අනික් 22
ක්‍රියා මුල පටන් අග දක්වා ආමොශ්ගේ
පුත්‍රවූ අනාගතවක්තෘවූ යෙසායා විසින්
ලියනලද්දේය. උස්සියා තමාගේ පිය- 23
වරුන් සමග සැතපුණේය; මනුෂ්‍යයෝ
ඔහු කුෂ්ඨරෝගියෙක කියා ඔහුගේ
පියවරුන් ළඟ රජවරුන්ගේ සොහොන්-
පළේ පිට්ටනියෙහි ඔහු තැන්පත්කෙළෝය.
ඔහුගේ පුත්‍රවූ යෝතාම් ඔහු වෙනුවට
රජවුණේය.

## යෝතාම් රජ

27 යෝතාම් විසිපස් අවුරුදු
වයසේදී රජවී, යෙරුසලමෙහි
දහසය අවුරුද්දක් රජකම්කෙළේය. ඔහු-
ගේ මවුගේ නම යෙරූෂාය, ඈ ශාදෝක්ගේ
2 දුවෙක්ය. තමාගේ පියවූ උස්සියා කළ
සියල්ල ලෙස ඔහු ස්වාමීන්වහන්සේගේ
ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය.
නුමුත් ඔහු ස්වාමීන්වහන්සේගේ මාලිගා-
වට ඇතුල්වුණේ නැත. ඒ කාලයෙහිත්
3 සෙනඟ දුෂ්ටකම් කළෝය. ඔහු ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ ඉහළ දෙරටුවද
ඕපෙල් පවුරේ බොහෝ තැන්ද ගොඩ-
4 නැඟුවේය. යූද කඳු රටෙහි නුවරවල්ද
මූකළාන්වල බලකොටුද මුරකොටුද ඔහු
5 ගොඩනැඟුවේය. ඔහු අම්මොන් පුත්‍රයන්-
ගේ රජුට විරුද්ධව යුද්ධකොට ඔවුන්-
ගෙන් ජයගත්තේය. අම්මොන් පුත්‍රයෝ
ඒ අවුරුද්දේ රිදී තලෙන්ත සියයක්ද
තිරිඟු *කෝර දසදහසක්ද යව දස-
දහසක්ද ඔහුට දුන්නේය. දෙවෙනි
තුන්වෙනි අවුරුදුවලදීත් අම්මොන්
6 පුත්‍රයෝ එසේම ගෙවුවෝය. මෙසේ
යෝතාම් තමාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි හරි මාර්ගවල
7 හැසුරුණු බැවින් බලවත් විය. යෝතාම්-
ගේ අනික් ක්‍රියාද සියලු යුද්ධද ඔහුගේ
මාර්ගද ඉශ්‍රායෙල් සහ යූද රජුන්ගේ
8 පොතෙහි ලියා තිබේ. ඔහු විසිපස් අවුරුදු
වයසේදී රජවී යෙරුසලමෙහි දහසය
9 අවුරුද්දක් රජකම්කෙළේය. යෝතාම්
තමාගේ පියවරුන් සමග සැතපී දාවිත්ගේ
නුවර තැන්පත් කරනලද්දේය. ඔහුගේ
පුත්‍රවූ ආහාස් ඔහු වෙනුවට රජවිය.

## ආහාස් රජ. යුද්ධ කරණකොටගෙන දඬුවම් ලැබීම

28 ආහාස් විසි අවුරුදු වයසේදී රජවී
යෙරුසලමෙහි දහසය අවුරුද්දක්
2 රජකම්කෙළේය. ඔහු තමාගේ පියවූ දාවිත්
කළාක් මෙන් ස්වාමීන්වහන්සේගේ ඇස්
හමුයෙහි හරිව තිබුණු දේ නොකොට,
ඉශ්‍රායෙල් රජුන්ගේ මාර්ගවල හැසිරෙමින්,
බාල් දේවතාවුන්ට වාත්තු පිළිමද
සෑදුවේය. ඇරත් ඔහු හින්නොම්ගේ 3
පුත්‍රයාගේ මිටියාවතෙහි සුවඳ දුම්
ඔප්පුකොට, ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්
පුත්‍රයන් ඉදිරියෙන් පන්නාදැමූ ජාතීන්ගේ
පිළිකුල්වල හැටියට තමාගේ පුත්‍රයන්
ගින්නෙහි දැවුවේය. ඔහු උස්තැන්වලත් 4
හෙල් පිටත් සියලු අමු ගස් යටත් පූජාද
සුවඳ දුම්ද ඔප්පුකෙළේය. ඒ නිසා 5
ඔහුගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ ඔහු
සිරියේ රජු අතට පාවාදුන්සේක; සිරිය-
වරු ඔහුට පහරදී ඔහුගේ සෙනඟ-
ගෙන් මහත් සමූහයක් අල්ලා දමස්කයට
ගෙනගියෝය. ඔහු ඉශ්‍රායෙල් රජු අතටත්
අසුවී ඒ රජ තෙමේ මහත් මැරීමකින්
ඔහුට පහර දුන්නේය. රෙමලියාගේ පුත්‍රවූ 6
පෙකා බලවත්තයන්ව සිටි එක්ලක්ෂ
විසි දහසක් එක දවසේ යූදහිදී මැරු-
වේය; මෙසේ වුණේ ඔවුන් තමුන්ගේ
පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
අත්හැරිය නිසාය. එප්‍රායිම්හි බලසම්පන්න 7
මනුෂ්‍යයෙක්වූ සික්රී තෙම රජුගේ පුත්‍රවූ
මයසේයාද රජ ගෙයි අධිපතියාවූ අස්-
රිකාම්ද රජුගේ දෙවෙනියාවූ එල්කානාද
මැරුවේය. තවද ඉශ්‍රායෙල් පුත්‍රයෝ 8
තමුන්ගේ සහෝදරයන්ගෙන් ස්ත්‍රීන්ද
පුත්‍රයන්ද දූවරුන්ද දෙලක්ෂයක් අල්ලා-
ගෙන, ඔවුන්ගෙන් මහත් කොල්ලයකුත්
රැගෙන, ඒ කොල්ලය සමාරියට ගෙන-
ගියෝය. නුමුත් එහි සිටි ඕදෙද් යන 9
නමැති ස්වාමීන්වහන්සේගේ ප්‍රොපේත
කෙනෙක් සමාරියට ආ සේනාව
සම්මුඛවෙන්ට පිටත්ව ගොස් ඔවුන්ට
කථාකොට: නුඹලාගේ පියවරුන්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ යූද කෙරෙහි
උදහස්වූ නිසා උන්වහන්සේ ඔවුන්
නුඹලා අතට පාවාදුන්සේක, නුඹලා
අහසට නැගෙන තරම් මහත් කෝප-
යකින් ඔවුන් මැරුවහුය. දැනුත් යූදහිද 10
යෙරුසලමේද දරුවන් දාසයන්ද දාසීන්ද
කොට යටත්කරගන්ට නුඹලා අදහස්
කරන්නහුය. නුමුත් නුඹලාගේ දෙවිවූ

*කෝරයක් බුසල් අටයි.

ස්වාමීන්වහන්සේට විරුද්ධව කළ
11 අපරාධ නුඹලා පිටත් නැද්ද? එබැවින්
මට ඇහුම්කන්දී නුඹලාගේ සහෝ-
දරයන්ගෙන් අල්වාගත් තැනැත්තන්
ආපසු යවාපල්ලා. මක්නිසාද ස්වාමීන්-
වහන්සේගේ තද උදහස නුඹලා කෙරෙහි
12 තිබේයයි කීවේය. එකල එප්‍රායිම් පුත්‍රයන්-
ගේ ප්‍රධානීන්ගෙන් සමහරෙක් වූ
යොහානාන්ගේ පුත්‍රවූ අසරියාද
මෙෂිල්ලේමොත්ගේ පුත්‍රවූ බෙරෙකියාද
ෂල්ලූම්ගේ පුත්‍රවූ යෙහිස්කියාද හද්ලයිගේ
පුත්‍රවූ අමාසාද යුද්ධයෙන් ආ අයට
13 විරුද්ධව නැගිට සිට, ඔවුන්ට කථා-
කොට: අල්ලාගන ආ තැනැත්තන් මෙහි
නොගෙනායුතුය, මක්නිසාද ස්වාමීන්-
වහන්සේට විරුද්ධව අප කළ වරද
හැර අපේ පාප සහ අපේ අපරාධ
වැඩිකරන්ට නුඹලා සිතන්නහුය.
මක්නිසාද අපේ අපරාධය මහත්ය, තද
උදහසද ඉශ්‍රායෙල් කෙරෙහි තිබේයයි
14 කීවේය. එවිට ආයුධ ගත් තැනැත්තෝ
අල්ලාගනු ලැබූ අයින් සහ කොල්ලය
අධිපතීන් සහ මුළු සභාව ඉදිරියෙහි
15 හැරදමා ගියෝය. එවිට නම් සඳහන්වූ
මනුෂ්‍යයෝ නැගිට, අසුවුණු අය
කැඳවාගෙන, ඔවුන් අතරේ වස්ත්‍ර නැති
සියල්ලන්ට කොල්ලයෙන් ගත් දෙයින්
වස්ත්‍ර දී, ඔවුන්ට පළඳවා, ඔවුන්ට වහන්ද
කෑම බීමද දී, තෙල් ගා, බෙලහීනව
සිටි සියල්ලන් කොටළුවන් පිට නංවා,
ඉඳිගස් නුවරවූ යෙරිකෝවට ඔවුන්ගේ
සහෝදරයන් වෙතට ගෙනවුත්, පසුව
සමාරියට හැරී ගියෝය.
16 ඒ කාලයෙහි ආහාස් රජ තමාට
උපකාරකරන්ට කියා අෂූර්හි රජුන්
17 වෙතට පණිවිඩයක් ඇරියේය. මක්නිසාද
ඒදෝම්වරු නැවත ඇවිත් යූදවරුන්ට
පහරදී සමහරුන් අල්ලාගන ගියෝය.
18 පිලිස්තිවරුද පාත රටේ සහ යූදහි දකුණු
දිශාවේ නුවරවලට වැද, බෙත්-ෂෙමෙෂ්ද
අයාලෝන්ද ගෙදේරෝත්ද සොකෝව
සහ ඒකේ ගම්ද තිම්නා සහ ඒකේ ගම්ද
ගිම්සෝ සහ ඒකේ ගම්ද අල්ලාගෙන,
19 එහි වාසයකළෝය. මක්නිසාද යූදහි
රජවූ ආහාස් යූදවරුන් සල්ලාලකමට
පමුණුවා ස්වාමීන්වහන්සේට විරුද්ධව
ද්‍රෝහිකම්කළ බැවින්, ස්වාමීන්වහන්සේ
යූද මනුෂ්‍යයන් යටත්කළසේක. අෂූර්හි 20
රජවූ තිල්ගත්-පිල්නේසර් ඔහු වෙතට
ඇවිත් ඔහුට පීඩාකළා මිස ඔහු ශක්තිමත්
කළේ නැත. ආහාස් ස්වාමීන්වහන්සේගේ 21
ගෘහයෙන්ද රජුගෙත් අධිපතීන්ගෙත්
ගෙදරවලින්ද වස්තු රැගෙන අෂූර්හි රජුට
දුන් නුමුත් එයින් ඔහුට පලක් නොවීය.
මෙම ආහාස් රජු තමාට විපත පැමිණි 22
කාලයේදී තව තව ස්වාමීන්වහන්සේට
විරුද්ධව ද්‍රෝහිකම්කෙළේය. තමාට 23
පහරදුන් දමස්කයේ දෙවිවරුන්ට ඔහු
පූජාකොට: සිරියේ රජුන්ගේ දෙවිවරුන්
ඔවුන්ට පිහිටවෙන බැවින් ඔවුන් මටත්
පිහිටවෙන පිණිස මම ඔවුන්ට පූජා-
කරමියි කීය. නුමුත් ඔව්හු ඔහුගේද මුළු
ඉශ්‍රායෙල්ගේද විනාශයට හේතුවූහ.
ආහාස් දෙවියන්වහන්සේගේ ගෘහයේ 24
භාණ්ඩ එකතුකර, දෙවියන්වහන්සේගේ
ගෘහයේ භාණ්ඩ කැබෙලිකොට කපා,
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ දොරවල්
වසා, යෙරුසලමේ සියලු මුළුවල
පූජාසන සාදගත්තේය. යූදහි සියලු 25
නුවරවලම අන් දෙවිවරුන්ට සුවඳ දුම්
ඔප්පුකරන පිණිස ඔහු උස්තැන්
සාද තමාගේ පියවරුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ කෝපකෙළේය. මුල 26
පටන් අග දක්වා ඔහුගේ අනික් ක්‍රියාද
ඔහුගේ සියලු මාර්ගද යූද සහ ඉශ්‍රායෙල්
රජුන්ගේ පොතෙහි ලියා තිබේ. ආහාස් 27
තමාගේ පියවරුන් සමග සැතපුණේය,
ඔව්හු යෙරුසලම් නුවර ඔහු තැන්පත්
කළෝය; මක්නිසාද ඔව්හු ඉශ්‍රායෙල්
රජුන්ගේ සොහොන් ගෙවල ඔහු නො-
තැබුවෝය. ඔහුගේ පුත්‍රවූ හෙසකියා ඔහු
වෙනුවට රජ විය.

## හෙසකියා රජුගේ ආගමික මෙහෙය

29 හෙසකියා විසිපස් අවුරුදු
වයසේදී රජවී විසිනව අවුරුද්දක්
යෙරුසලමෙහි රජකම්කෙළේය. ඔහුගේ
මවුගේ නම අබියාය, ඈ ශෙකරියාගේ

2 දුවෙක්ය. ඔහුගේ පියවූ දාවිත් කළ සියල්ල
ලෙස ඔහු ස්වාමීන්වහන්සේගේ ඇස්
හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය.
3 ඔහු තමාගේ රජකම්කිරීමේ පළමුවෙනි
අවුරුද්දේ පළමුවෙනි මාසයේදී ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ දොරවල් ඇර ඒවා
4 හරිගැස්සුවේය. ඔහු පූජකයන්ද ලේවී-
වරුන්ද ගෙන්වාගෙන, නැගෙනහිරින්
වූ එළිමහන් තැන ඔවුන් රැස්කර,
5 ඔවුන්ට කථාකොට: ලේවීවරුනි, මට
ඇහුම්කන්දියල්ලා; තුඹලාම දැන්
පවිත්‍රවී, තුඹලාගේ පියවරුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ ගෘහයත් පවිත්‍ර-
කොට, ශුද්ධස්ථානයෙන් කිලුටුකම
6 පහකරපල්ලා. මක්නිසාද අපේ පිය-
වරු ද්‍රෝහිකම්කරමින්, අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කොට, උන්වහන්සේ
අත්හැර ස්වාමීන්වහන්සේගේ වාසස්-
ථානය වෙතින් තමුන්ගේ මුහුණු
7 අහක්කරගන පිටිපෑවෝය. ද්වාර-
මණ්ඩපයේ දොරටුත් ඔව්හු වසා
තබා, පහන් නිවා, ශුද්ධස්ථානයෙහි
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේට සුවඳ
දුම්වත් දවන පූජාවත් ඔප්පු නොකළෝය.
8 ඒ නිසා ස්වාමීන්වහන්සේගේ උදහස
යූද සහ යෙරුසලම කෙරෙහි පැමිණියේය,
තුඹලාගේ ඇස්වලට පෙනෙන හැටියට
ඔබ මොබ වීසිකරනු ලැබීමටත් පුදුමයක්
සහ නින්දාවක් වීමටත් උන්වහන්සේ ඔවුන්
9 පාවාදුන්සේක. මේ නිසා අපේ පියවරු
කඩුවෙන් වැටුණෝය, අපේ පුත්‍රයෝද
දූවරුද භාර්යාවෝද වහල්කමෙහි සිටිති.
10 ඉතින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ තද උදහස අප කෙරෙන්
පහව යන පිණිස උන්වහන්සේ සමග
ගිවිසුමක් කරන්ට මාගේ සිතේ තිබේ.
11 මාගේ පුත්‍රයෙනි, දැන් අලසව නොසිටිල්ලා.
මක්නිසාද ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
සිටින්ටත් උන්වහන්සේට සේවයකරන්ටත්
උන්වහන්සේගේ සේවකයන්ව සුවඳ දුම්
ඔප්පුකරන්ටත් උන්වහන්සේ තුඹලා
තෝරාගත්සේකැයි කීවේය.

එවිට කොහාත්වරුන්ගේ පුත්‍රයන්ගෙන් 12
අමසයිගේ පුත්‍රවූ මාහත්ද අසරියාගේ
පුත්‍රවූ යෝවෙල්ද මෙරාරීගේ පුත්‍රයන්ගෙන්
අබ්දීගේ පුත්‍රවූ කීෂ් සහ යෙහල්ලෙලෙල්ගේ
පුත්‍රවූ අසරියාද; ගේර්ෂොන්වරුන්ගෙන්
සිම්මාගේ පුත්‍රවූ යෝවාද යෝවාගේ පුත්‍රවූ
ඒදෙන්ද; එලිශාපාන්ගේ පුත්‍රයන්ගෙන් 13
ෂිම්රීද යෙවූයෙල්ද; ආසාප්ගේ පුත්‍රයන්-
ගෙන් සෙකරියාද මත්තනියාද; හේමාන්- 14
ගේ පුත්‍රයන්ගෙන් යෙහූවෙල්ද ෂිමෙයිද;
යෙදූතුන්ගේ පුත්‍රයන්ගෙන් ෂෙමායාද
උස්සීයෙල්ද යන ලේවීවරු නැගිට,
තමුන්ගේ සහෝදරයන් රැස්කර, තමූම 15
පවිත්‍රවී, රජුගේ ආඥව පරිද්දෙන්
ස්වාමීන්වහන්සේගේ වචනය ලෙස
ස්වාමීන්වහන්සේගේ ගෘහය පිරිසිදුකරන්ට
ආවෝය. පූජකයෝ ස්වාමීන්වහන්සේගේ 16
ගෘහය පිරිසිදුකරන පිණිස එහි ඇතුළට
ගොස් ස්වාමීන්වහන්සේගේ මාලිගාවෙහි
සම්බවුණ සියලු කිලුටු දේ ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ මළුවට ගෙනා-
වෝය. ලේවීවරු ඒවා කිද්‍රොන් ඔයට
ගෙනයන පිණිස අරගත්තෝය. ඔව්හු 17
පළමුවෙනි මාසයේ පළමුවෙනිද පවිත්‍ර-
කරන්ට පටන්ගෙන, මාසයේ අටවෙනිද
ස්වාමීන්වහන්සේගේ ද්වාර මණ්ඩපයට
ආවෝය; අට දවසකින් ඔව්හු ස්වාමීන්-
වහන්සේගේ ගෘහය පවිත්‍රකර, පළමුවෙනි
මාසයේ දහසයවෙනිද නිමකළෝය.
එවිට ඔව්හු හෙසකියා රජු වෙතට රාජ 18
මාලිගාව ඇතුළට ගොස් කථාකොට:
අපි ස්වාමීන්වහන්සේගේ මුළු ගෘහයත්
දවන පූජා පුදන පූජාසනයත් ඊට අයිති
සියලු භාණ්ඩත් රොටි මේසයත් ඊට
අයිති සියලු භාණ්ඩත් පිරිසිදුකෙළෙමුව.
ඇරත් ආහාස් රජු රජකම්කරන කල 19
තමාගේ ද්‍රෝහිකමේදී අහකදැමූ සියලු
භාණ්ඩත් අපි සූදානම්කර පවිත්‍ර
කෙළෙමුව; ඒවා ස්වාමීන්වහන්සේගේ
පූජාසනය ඉදිරිපිට තිබේයයි කීවෝය.
එවිට හෙසකියා රජ අලුයම නැගිට 20
නුවර අධිපතීන් රැස්කරවා ස්වාමීන්-
වහන්සේගේ ගෘහයට ගියේය. ඔව්හු 21
රාජ්‍යයද ශුද්ධස්ථානයද යූදවරුන්ද

උදෙසා පාප පූජාවක් පිණිස ගොනුන්
සත්දෙනෙකුත් බැටළුවන් සත්දෙනෙකුත්
බැටළුපැටවුන් සත්දෙනෙකුත් එළුවන්
සත්දෙනෙකුත් ගෙනාවෝය. උන්
**ස්වාමීන්වහන්සේගේ** පූජාසනය පිට
ඔප්පුකරන්ට ඔහු පූජකයන්වූ ආරොන්-
22 ගේ පුත්‍රයන්ට කීවේය. ගොනුන් මැරූ
විට පූජකයෝ ලේ රැගෙන පූජාසනය
පිට ඉස්සෝය. බැටළුවන්ද මරා ලේ
පූජාසනය පිට ඉස්සෝය. එසේම බැටළු-
පැටවුන්ද මරා ලේ පූජාසනය පිට
23 ඉස්සෝය. පාප පූජාවේ එළුවන් ඔව්හු
රජු සහ සභාව ඉදිරියට ගෙනාවෝය;
ඔව්හු තමුන්ගේ අත් උන් පිට තැබුවෝය.
24 එවිට පූජකයෝ උන් මරා, මුළු ඉශ්‍රායෙල්
උදෙසා සමගිකමක් කරන පිණිස උන්ගේ
ලේ පාප පූජාවක් කොට පූජාසනය
පිට ඉස්සෝය. මක්නිසාද මුළු ඉශ්‍රායෙල්
උදෙසා දවන පූජාවත් පාප පූජාවත්
ඔප්පුකළ යුතුයයි රජ නියමකෙළේය.
25 තවද ඔහු දවිත්ගේද රජුගේ දිවස් ඇත්-
තාවූ ගාද්ගේද ප්‍රොපේතවූ නාතාන්ගේද
අණ පරිද්දෙන් අත්තල්ද වීණාද මහ
වීණාද ඇතුව ලෙවීවරුන් **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයෙහි සිටෙවුවේය.
මක්නිසාද ඒ ආඥාව **ස්වාමීන්-
වහන්සේගෙන්** ප්‍රොපේතවරුන් අතින්
26 වූයේය. ලෙවීවරු දවිත්ගේ තූර්යභාණ්ඩද
පූජකයෝ හොරණෑද රැගෙන සිටියෝය.
27 හෙසකියාද පූජාසනය පිට දවන පූජාව
ඔප්පුකරන්ට අණකෙළේය. දවන පූජාව
පටන්ගන්න වේලාවට **ස්වාමීන්-
වහන්සේගේ** ගීතිකාවද හොරණෑද
ඉශ්‍රායෙල් රජවූ දවිත්ගේ තූර්යභාණ්ඩ
28 ඇතුව පටන්ගන්නාලද්දේය. මුළු සභාව
වැඳවැටී උන්නාය, ගී කියන්නෝ ගී
කීවෝය, හොරණෑකාරයෝ නළා
පිම්බෝය; දවන පූජාව නිමවන තුරු
29 සියල්ල එසේ පැවතුණේය. පූජාකර නිමවූ
කල රජද ඔහු සමග සිටි සියල්ලෝද
30 නැමී වැන්දෝය. හෙසකියා රජද
අධිපතීහුද දවිත්ගෙත් දිවස් ඇත්තා වන
ආසාප්ගෙත් වචනවලින් **ස්වාමීන්-
වහන්සේට** ප්‍රශංසා ගී කියන්ට ලෙවී-
වරුන්ට අණකළෝය. ඔව්හු ප්‍රීතියෙන්
ප්‍රශංසා ගී කියා, හිස් නමා වැන්දෝය.
එවිට හෙසකියා කථාකොට: දැන් තුඹලාම 31
**ස්වාමීන්වහන්සේට** කැපවී සිටින බැවින්
ළංවී යාගද ස්තුති පූජාද **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයට ගෙනෙල්ලායයි
කීවේය; සභාව යාගද ස්තුති පූජාද
කැමති සියල්ලෝ දවන පූජාද ගෙනා-
වෝය. සභාව ගෙනා දවන පූජාවල 32
ගණන ගොනුන් හැත්තෑවකුත් බැටළුවන්
සියයකුත් බැටළුපැටවුන් දෙසියයකුත්ය.
මේ සියල්ල **ස්වාමීන්වහන්සේට** දවන
පූජාවක් පිණිසය. කැපකළ දේ නම් 33
ගොන් හසියයකුත් බැටළුවන් තුන්
දහසකුත්ය. නුමුත් පූජකයන් මදිවූ නිසා 34
සියලු දවන පූජා හම ගහන්ට බැරි-
විය. ඒ නිසා ඔවුන්ගේ සහෝදරයෝවූ
ලෙවීවරු වැඩේ තීන්දු වෙන තුරුත් අනික්
පූජකයන් පවිත්‍රවෙන තුරුත් ඔවුන්ට
උදව්වූවෝය. මක්නිසාද තුමූම පවිත්‍රවීම
ගැන ලෙවීවරු පූජකයන්ට වඩා අවංකව
සිටියෝය. ශාන්ති පූජාවල තෙලත් දවන 35
යාග සඳහාවූ පාන පූජාවලුත් ඇතුළුව
දවන පූජා බොහෝසෙයින් තිබුණේය.
මෙසේ **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
මෙහෙය පිළිවෙළට යොදනලද්දේය.
දෙවියන්වහන්සේ සෙනඟ උදෙසා 36
සූදනම්කළ දේ ගැන හෙසකියාද මුළු
සෙනඟද ප්‍රීතිවූහ. මක්නිසාද මේ
කාරණය හදිසියෙන් සිද්ධකරනලද්දේය.

## මහත් පාස්කු මංගල්‍යයක් පැවැත්වීම

30 ඉන්පසු ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** පාස්කුව පවත්-
වන පිණිස යෙරුසලමෙහි **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයට එන්ට කියා
හෙසකියා ඉශ්‍රායෙල් රටද යූද දේශයද
මුළුල්ලෙහි කියා ඇරියේය, එප්‍රායිම් සහ
මනස්සේටත් ලියුම් ලියා ඇරියේය.
සෑහෙන පමණ පූජකයන් පවිත්‍ර නොවූ 2
නිසාත්, සෙනඟ යෙරුසලමට රැස්නුණු
නිසාත්, නියම කාලයට පාස්කුව
පවත්වන්ට නොහැකිව, දෙවෙනි මාසයේ 3

එය පවත්වන්ට රජද ඔහුගේ අධිපතීහුද
4 සම්මතකරගත්තෝය. ඒ කාරණය
රජුටත් මුළු සභාවටත් හරිව පෙනුණේය.
5 ලියා තිබෙන හැටියට පාස්කුව බොහෝ
කාලයක පටන් නොපැවැත්වූ බැවින්,
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
පාස්කුව යෙරුසලමෙහි පවත්වන පිණිස
එන්ට කියා ඔව්හු බෙයෙර්-ෂෙබා සිට
දන් දක්වා ඉශ්‍රායෙල් රට මුළුල්ලෙහි
ප්‍රසිද්ධකරන ලෙස නියෝගයක් කළෝය.
6 මෙසේ පණිවිඩකාරයෝ රජුගෙන්ද
ඔහුගේ අධිපතීන්ගෙන්ද ලැබූ ලියුම්
රැගෙන, රජුගේ ආඥාවේ ප්‍රකාරයට
ඉශ්‍රායෙල් රටද යූද දේශයද මුළුල්ලෙහි
ගොස් කථාකොට: ඉශ්‍රායෙල් පුත්‍රයෙනි,
ආබ්‍රහම්ගේද ඊසාක්ගේද ඉශ්‍රායෙල්ගේද
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** වෙතට හැරී-
යල්ලා, එවිට උන්වහන්සේ අෂූර්හි
රජුන්ගේ අතින් ගැළවී ඉතුරුව සිටින
7 තුඹලා වෙතට හැරෙනවා ඇත. තමුන්ගේ
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව ද්‍රෝහිකම්කළාවූ තුඹලාගේ
පියවරුන්ටත් සහෝදරයන්ටත් සමාන
නොවෙල්ලා; තුඹලාට පෙනෙන හැටියට
උන්වහන්සේ ඔවුන් ව්‍යසනයට පාවා-
8 දුන්සේක. ඉතින් තුඹලාගේ පියවරුන්
මෙන් තුඹලාගේ කුළල් තදකර නො-
ගෙන, **ස්වාමීන්වහන්සේට** ගිවිසුම් දී,
උන්වහන්සේ සදාකාලයටම පවිත්‍රකළ
උන්වහන්සේගේ ශුද්ධස්ථානයට ඇතුල්වී,
උන්වහන්සේගේ තද උදහස තුඹලා
කෙරෙන් පහවන පිණිස තුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** සේවය-
9 කරපල්ලා. මක්නිසාද තුඹලා **ස්වාමීන්-**
**වහන්සේ** වෙතට හැරුණොත්, තුඹලාගේ
සහෝදරයන්ද දරුවන්ද තමුන් අල්ලා-
ගත ගිය අයගෙන් කරුණාව ලැබ මේ
දේශයට නැවත හැරී එනවා ඇත.
මක්නිසාද තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** දයාවද අනුකම්පාවද ඇත්තාවූ
කෙනෙක්ය, තුඹලා උන්වහන්සේ වෙතට
හැරුණොත් උන්වහන්සේ ස්වකීය
මුහුණ තුඹලා කෙරෙන් හරවා
නොගන්නාසේකැයි කීවෝය. මෙසේ 10
පණිවිඩකාරයෝ එප්‍රායිම් සහ මනස්සේ
රට මුළුල්ලෙහි සාබුලොන් දක්වාම
නුවරින් නුවරට ගියෝය. නුමුත් මිනිස්සු
ඔවුන්ට සිනාසී සරදම්කළෝය. එසේ 11
වුවත් ආෂෙර්හිද මනස්සේහිද සාබු-
ලොන්හිද නොයෙක් දෙනෙක් යටත්වී
යෙරුසලමට ආවෝය. **ස්වාමීන්-** 12
**වහන්සේගේ** වචනයේ හැටියට රජුගේ
සහ අධිපතීන්ගේ ආඥාව පවත්වන
පිණිස යූදවරුන් එක්සිත්කරවන ලෙස
දෙවියන්වහන්සේගේ හස්තය ඔවුන්
පිටද වූයේය. මෙසේ දෙවෙනි මාසයේ 13
මුහුන් නොදැමූ රොටි මංගල්‍යය පවත්-
වන පිණිස ඉතා මහත් සභාවක්වූ
බොහෝ සෙනඟ යෙරුසලමට රැස්-
වුණෝය. ඔව්හු නැගිට යෙරුසලමෙහි 14
තිබුණු පූජාසන පහකළෝය, සියලු
දුම් පූජාසනත් පහකොට කිද්‍රොන්
ඔයට දැමුවෝය. යළිත් ඔව්හු දෙවෙනි 15
මාසයේ දහහතරවෙනිද පාස්කු
බැටළුපැටවුන් මැරුවෝය. පූජකයෝද
ලෙවීවරුද ලජ්ජාවට පැමිණ, තමුම
පවිත්‍රවී, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
දවන පූජා ගෙනාවෝය. ඔව්හු දෙවියන්- 16
වහන්සේගේ මනුෂ්‍යයාවූ මෝසෙස්ගේ
ව්‍යවස්ථාවේ හැටියට තමුන්ගේ පිළිවෙ-
ළින් තමුන්ගේ ස්ථානවල සිටියෝය.
පූජකයෝ ලෙවීවරුන්ගේ අතින් ලේ
රැගෙන ඉස්සෝය. මක්නිසාද පවිත්‍ර 17
නොවූ බොහෝ දෙනෙක් සභාවෙහි
සිටියෝය. ඒ නිසා **ස්වාමීන්වහන්සේට**
පවිත්‍රකරන පිණිස පිරිසිදු නොවූ
සියල්ලන් උදෙසා පාස්කු බැටළුපැටවුන්
මැරීම ලෙවීවරුන්ට බාරවිය. මක්නිසාද 18
ජනයන්ගෙන් මහත් සමූහයක් එනම්
එප්‍රායිම්ගෙන්ද මනස්සේගෙන්ද ඉස්සා-
කර්ගෙන්ද සාබුලොන්ගෙන්ද බොහෝ
දෙනෙක් පිරිසිදු නොවී, ලියවී තිබෙන
අන්දමට වෙනස්ව, පාස්කුව කෑවෝය.
හෙසකියා ඔවුන් උදෙසා යාච්ඤා-
කරමින්: ශුද්ධස්ථානයේ පවිත්‍රකිරීම 19
ලෙස පිරිසිදු නොවී නුමුත් තමුන්ගේ

පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
වන දෙවියන්වහන්සේ සොයන්ට
තමුන්ගේ සිත් යොමුකරගත සිටින
සියල්ලන්ට කරුණාවන්තවූ **ස්වාමීන්-**
**වහන්සේ** කමාවනසේක්වයි කීවේය.
20 **ස්වාමීන්වහන්සේ** හෙසකියාට ඇහුම්-
21 කන්දී සෙනග සුවකළසේක. යෙරුසල-
මෙහි සිටි ඉශ්‍රායෙල් පුත්‍රයෝද මුහුන්
නොදැමූ රොටි මංගල්‍යය සත්
දවසක් මහත් ප්‍රීතියකින් පැවැත්තුවෝය.
ලෙවීවරුද පූජකයෝද බොහෝ ශබ්ද
ඇති තූර්යභාණ්ඩ රැගෙන ගී කියමින්,
**ස්වාමීන්වහන්සේට** දවසින් දවස
22 ප්‍රශංසාකළෝය. හෙසකියා **ස්වාමීන්-**
**වහන්සේගේ** මෙහෙය ගැන සමර්ථකම
ඇති සියලු ලෙවීවරුන්ට මිත්‍රකමින්
කථාකෙළේය. ඔව්හු ශාන්ති පූජා
ඔප්පුකරමින්ද තමුන්ගේ පියවරුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** ස්තුති ප්‍රශංසා
කරමින්ද සත් දවසක් මංගල්‍ය පූජාවලින්
23 කෑවෝය. මුළු සභාවද තවත් සත් දවසක්
මංගල්‍යය පවත්වන්ට සම්මතකරගෙන,
එය සත් දවසක් ප්‍රීතියෙන් පැවැත්තුවෝය.
24 මක්නිසාද යූදාහි රජවූ හෙසකියා ගොනුන්
දහසක් සහ බැටළුවන් හත්දහසක්ද පූජා
සඳහා සභාවට දුන්නේය; අධිපතීහුද
ගොනුන් දහසක් හා බැටළුවන් දස-
දහසක් සභාවට දුන්නෝය. පූජකයන්-
ගෙන් බොහෝ දෙනෙක්ද පවිත්‍රවුණෝය.
25 යූදාහි මුළු සභාවද පූජකයෝද ලෙවීවරුද
ඉශ්‍රායෙල් දේශයෙන් ඇවිත් සිටියාවූ
නොහොත් යූදාහි වාසයකළාවූ විදේශි-
26 යෝද ප්‍රීතිවුණෝය. මෙසේ යෙරුසලමෙහි
මහත් ප්‍රීතියක් විය. මක්නිසාද දාවිත්ගේ
පුත්‍රවූ ඉශ්‍රායෙල් රජවූ සාලමොන්ගේ
කාලයට පසු යෙරුසලමෙහි එයාකාර
27 සිද්ධියක් නොවීය. එවිට ලෙවීවරුවූ
පූජකයෝ නැගිට සෙනගට ආශීර්වාද-
කළෝය. ඔවුන්ගේ හඬ අසනු ලැබ,
ඔවුන්ගේ යාච්ඤාව උන්වහන්සේගේ
පිරිසිදු වාසස්ථානය වන ස්වර්ගයට
නැංගේය.

## පූජකයන්ගේ සේවය නැවත පිහිටුවීම

31 මේ සියල්ල නිමවූ කල එහි සිටි
සියලු ඉශ්‍රායෙල්වරු යූදාහි නුවර-
වලට ගොස් රූපස්තම්භ බිඳදමා, අෂේරා
කණු කපාදමා, මුළු යූදාගෙන්ද බෙන්-
යමින්ගෙන්ද එප්‍රායිම්ගෙන්ද මනස්-
සේගෙන්ද උස්තැන් සහ පූජාසන නැතිවී
යන තුරු ඒවා කඩාදැමුවෝය. ඉන්පසු
සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ තම තමුන්ගේ
නුවරවල තම තමුන්ගේ උරුම දේශවලට
හැරී ගියෝය.

## රූප විනාශකිරීම

හෙසකියා දවන පූජා සහ ශාන්තිපූජා 2
ඔප්පුකරන්ටත් **ස්වාමීන්වහන්සේගේ**
අන්දයමේ දෙරටුවල සේවයකරන්ටත්
ස්තුති ප්‍රශංසා කරන්ටත් පූජකයන්ගෙත්
ලෙවීවරුන්ගෙත් පන්තිවල ප්‍රකාරයට
පූජකයන්ගෙන්ද ලෙවීවරුන්ගෙන්ද
එකිනෙකාගේ සේවයේ හැටියට ඔවුන්ගේ
පන්ති නියමකෙළේය. තවද **ස්වාමීන්-** 3
**වහන්සේගේ** ව්‍යවස්ථාවේ ලියා තිබෙන
පරිද්දෙන් දවන පූජා සඳහා එනම් උදේ
සවස දවන පූජාද සබත් දවස්, අමාවක
සහ නියම මංගල්‍ය සම්බන්ධ දවන
පූජාද සඳහා ඔහු ස්වකීය සම්පතින්
රාජ කොටස නියමකෙළේය. ඇරත් 4
පූජකයන්ද ලෙවීවරුන්ද **ස්වාමීන්-**
**වහන්සේගේ** ව්‍යවස්ථාවෙහි යෙදී සිටින
පිණිස ඔවුන්ගේ කොටස දෙන්ට කියා
ඔහු යෙරුසලමෙහි විසූ සෙනගට
අණකෙළේය. මේ ආඥාව පතළවුණ විට 5
ඉශ්‍රායෙල් පුත්‍රයෝ බොහෝසෙයින්ම
ධාන්‍යවලත් මුද්‍රික යුසයෙත් තෙල්වලත්
මීපැණිවලත් භූමියේ සියලු අස්වැන්නෙහිත්
ප්‍රථම ඵල සහ සියල්ලෙන් දසයෙන්
කොටසක්ද යහමින් ගෙනාවෝය. යූදාහි 6
නුවරවල විසූ ඉශ්‍රායෙල් සහ යූදා පුත්‍රයෝ
ගොනුන්ගෙනුත් බැටළුවන්ගෙනුත්
දසයෙන් කොටසක් ගෙනාවෝය,
ඔවුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
කැපකළාවූ පවිත්‍ර දේවලින් දසයෙන්

කොටසක්ද ඔව්හු ගෙනවුත් ගොඩවල්
7 වශයෙන් තැබුවෝය. ඔව්හු තුන්වෙනි
මාසයේදී ඒ ගොඩවල් තබන්ට පටන්-
ගෙන හත්වෙනි මාසයේදී නිමකළෝය.
8 හෙසකියාද අධිපතීහුද ඇවිත් ගොඩ-
වල් බලා **ස්වාමීන්වහන්සේටත්** උන්-
වහන්සේගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ටත්
9 ප්‍රශංසාකළෝය. හෙසකියා ඒ ගොඩවල්
ගැන පූජකයන්ගෙන්ද ලෙවීවරුන්ගෙන්ද
10 විභාගකෙළේය. එවිට ශාදෙක්ගේ වංශයේ
උත්තම පූජකයාවූ අසරියා ඔහුට
උත්තරදෙමින්: සෙනඟ **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයට පඬුරු ගෙනෙන්ට
පටන්ගත් ද සිට අපි සෑහෙන පමණ
කා බොහෝ සෙයින් ඉතුරු කෙළෙමුව.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** ස්වකීය
සෙනඟට ආශීර්වාදකළසේක; මේ
රාශියද ඉතිරිවී තිබේයයි කීවෝය.
11 එකල හෙසකියා **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි ඇතුල්ගෙවල් පිළියෙළ කරන්ට
අණකෙළේය; ඔව්හු එසේ පිළියෙළකොට,
12 පඬුරුද දසයෙන් කොටස්ද කැපකළ
දේවල්ද විශ්වාසලෙස ඇතුළට ගෙනාවෝය.
ලෙවීයවූ කොනනියා ඒවා බලාගැනීමට
පත්ව සිටියේය, ඔහුගේ සහෝදර ෂිමෙයි
13 ඔහුට දෙවෙනියාව සිටියේය. හෙසකියා
රජුගෙත් දෙවියන්වහන්සේගේ ගෘහයේ
අධිපතියාවූ අසරියාගෙත් නියමයේ
ප්‍රකාරයට කොනනියා සහ ඔහුගේ
සහෝදරවූ ෂිමෙයි යටතේ යෙහීයෙල්ද
අසසියාද නහත්ද අසාහෙල්ද යෙරීමොත්ද
යෝසාබාද්ද එලීයෙල්ද ඉස්මාඛියාද
මාහත්ද බෙනායාද යන මොව්හු මුලා-
14 දෑනියෝව සිටියෝය. නැගෙනහිර දොරටු
පාලයාවූ, ලෙවීයවූ, ඉම්නාගේ පුත්‍රවූ
කෝරේ **ස්වාමීන්වහන්සේගේ** පඬුරුත්
අති ශුද්ධදේත් බෙදදෙන පිණිස සිය
කැමැත්තෙන්ම දෙවියන්වහන්සේට
ඔප්පුකළ දේවල් කෙරෙහි පත්ව සිටියේය.
15 ඔහු යටතේ වාර පිළිවෙළින් තමුන්ගේ
සහෝදරයන්ගෙන් ලොකු අයටත්
කුඩා අයටත් බෙදදෙන පිණිස ඒදෙන්ද
මිනියාමින්ද යේෂුවාද ෂෙමායාද
අමරියාද ෂෙකනියාද පූජකයන්ගේ
නුවරවල පත්ව සිටියෝය. තුන් අවුරුදු 16
වයසේ පටන් වංශ වශයෙන් ලියවුණු
ඔවුන්ගේ පිරිමින් හැර තමුන්ගේ පන්තිවල
හැටියට තමුන්ගේ තනතුරු ලෙස සේවය
කිරීමට දවසින් දවස **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට ඇතුල්වූ සියල්ලන්ටත් එසේ
දුන්නෝය. එනම් තමුන්ගේ පියවංශවල 17
හැටියට ලියවුණාවූ, අවුරුදු විස්සේ පටන්
ඉන් ඉහළට වයස් ඇත්තාවූ, තමුන්ගේ
පන්තිවල තමුන්ගේ තනතුරුවල සිටියාවූ
පූජකයන්ද ලෙවීවරුන්ද, ලියවුණාවූ 18
ඔවුන්ගේ සියලු බාලයන්ද ඔවුන්ගේ
භාර්යාවන්ද පුත්‍රයන්ද දූවරුන්ද යන
මුළු සභාවට දුන්නෝය. තවද තමුන්ගේ
නියම සේවය සඳහා ඔව්හු විශුද්ධව
සිටියෝය. තවද තමුන්ගේ නගරබද 19
පිට-බිම්වල විසූ පූජකයන්වූ ආරොන්ගේ
පුත්‍රයන් උදෙසාත්, පූජකයන්ගේ සියලු
පිරිමින්ට හා ලියවුණු සියලු ලෙවීවරුන්ට
කොටස් දෙන පිණිස, නම් සඳහන්වූ
මනුෂ්‍යයෝ සියලු නුවරවල පත්ව
සිටියෝය. හෙසකියා යූදා මුළුල්ලෙහි 20
මෙසේ කරමින් තමාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි යහපත්ව,
හරිව, යුතුව තිබුණු දේ කෙළේය. ඔහු 21
තමාගේ දෙවියන්වහන්සේ සොයමින්
උන්වහන්සේගේ ගෘහයේ මෙහෙයද
ව්‍යවස්ථාවද ආඥාවද සම්බන්ධව පටන්-
ගත් සියලු කර්තව්‍යයන් තමාගේ මුළු
සිතින් ඉෂ්ටකොට සඵලවිය.

## අෂූර් රජු විසින් යූදා රට වටලෑම

32 මේ කාරණාවලටත් මේ විශ්වාස
මෙහෙයටත් පසුව අෂූර්හි
රජවූ සෙනකෙරිබ් ඇවිත් යූදාට ඇතුල්ව,
පවුරු ඇති නුවරවල් අල්ලාගන්ට
සිතා ඒවාට විරුද්ධව කඳවුරු බැන්-
දේය. සෙනකෙරිබ් ඇවිත් යෙරුසලමට 2
විරුද්ධව යුද්ධකරන්ට යන බව හෙස-
කියා දැක, නුවරට පිටතින් තිබුණු 3
උල්පත්වල වතුර නවත්වන්ට තමාගේ

අධිපතීන්ද බලවන්තයන්ද සමග
මන්ත්‍රණයකරගත්තේය; ඔව්හු ඔහුට
4 උපකාරකළෝය. මෙසේ මහත් සෙනඟක්
රැස්ව කථාකොට: අෂූර්හි රජුන් ආ
විට ඔවුන්ට බොහෝ වතුර ලැබෙන්ට
ඉඩ තබන්නේ කුමටදැයි කියා, සියලු
උල්පත්ද දේශය මැදින් ගලායන ඔයද
5 නැවැත්තුහ. ඔහු ධෛර්ය උපදවාගෙන,
කඩා වැටී තිබුණු මුළු පවුර කොත්
දක්වා ගොඩනැඟුවේය, පිටතින් ඔහු
තවත් පවුරක් ගොඩනගා, දාවිත්ගේ නුවර
තිබුණ මිල්ලෝ සවිකර, බොහෝ
6 ආයුධ හා පලිස් සෑදුවේය. ඔහු සෙනඟ
කෙරෙහි යුද්ධාධිපතීන් පත්කොට, නුවර
දොරකඩ එළිමහන් තැන ඔවුන් රැස්-
කරගෙන ඔවුන්ට මිත්‍රකමින් කථාකොට:
7 අෂූර්හි රජුටවත් ඔහු සමග සිටින මුළු
සමූහයාටවත් භයනොවී නොකැලඹී
බලවත්ව සවිව සිටපල්ලා. මක්නිසාද
ඔහු සමග සිටින්නන්ට වඩා
බලවන්තයෙක් අප සමග සිටින්නේය.
8 ඔහු සමග ඇත්තේ මාංසමය හස්තයක්ය;
නුමුත් අපට පිහිටවී අපේ යුද්ධයන්
කරන පිණිස අප සමග සිටින්නේ අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේයයි කීවේය.
සෙනඟ යූදාහි රජවූ හෙසකියාගේ වචන
කෙරෙහි විශ්වාසය තැබූහ.
9 මින්පසු අෂූර්හි රජවූ සෙනකෙරිබ් තෙම
තමාගේ මුළු සේනාව ඇතුව ලාකීෂ්
ඉදිරිපිට සිටියදී, යෙරුසලමෙහි සිටි යූදාහි
රජවූ හෙසකියාටත් යෙරුසලමෙහි සිටි
සියලු යූදවරුන්ටත් තමාගේ සේවකයන්
10 අත කියා යවනුයේ: අෂූර්හි රජවූ
සෙනකෙරිබ් මෙසේ කියන්නේය—නුඹලා
යෙරුසලමේ බලකොටුවෙහි සිටින්නේ
11 කුමක් කෙරෙහි විශ්වාසකරගෙනද? අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ අෂූර්හි රජුගේ
අතින් අප ගළවාගන්නසේකැයි කියමින්
හෙසකියා නුඹලා පොළඹන්නේ
සාපිපාසයෙන් මැරෙන්ට නුඹලා භාරදෙන
12 පිණිස නොවේද? උන්වහන්සේගේ උස්
තැන්ද පූජාසනද පහකොට: නුඹලා
එකම පූජාසනයක් ඉදිරියෙහි
නමස්කාරකරන්ටත් ඊපිට සුවඳ දුම්
ඔප්පුකරන්ටත් ඕනෑය කියා යූදටත්
යෙරුසලමටත් අණකළේ මේ හෙසකියා
නොවේද? මා සහ මාගේ පියවරුන් 13
විසින් දේශවල සියලු ජනයන්ට කළ
දේ නුඹලා දන්නේ නැද්ද? දේශවල
ජාතීන්ගේ දෙවිවරුන්ට කොයි අන්-
දමකින්වත් ඔවුන්ගේ දේශය මාගේ අතින්
ගළවාගන්ට පුළුවන්වුණේද? නුඹලා 14
මාගේ අතින් ගළවන්ට නුඹලාගේ
දෙවියන්ට පුළුවන්වෙන ලෙස, මාගේ
පියවරුන් විසින් සිඳදැමූ ඒ ජාතීන්ගේ
සියලු දෙවිවරුන් අතරෙන් තමාගේ
සෙනඟ මාගේ අතින් ගළවන්ට කාට
පුළුවන්වීද? එබැවින් නුඹලා රවටන්ට- 15
වත් මෙලෙස නුඹලා පොළඹන්ටවත්
හෙසකියාට ඉඩ නොදෙල්ලා, ඔහු
විශ්වාස නොකරල්ලා. මක්නිසාද කවර
ජාතියක හෝ රාජ්‍යයක හෝ කිසි
දෙවිකෙනෙකුටවත් තමාගේ සෙනඟ
මාගේ අතින්වත් මාගේ පියවරුන්ගේ
අතින්වත් ගළවාගන්ට පුළුවන් නොවීය.
එසේවීනම් නුඹලාගේ දෙවියන්වහන්සේ
නුඹලා මාගේ අතින් ගළවන්නේ
කොහොමදැයි කීවේය. ඔහුගේ 16
සේවකයෝ දෙවිවූ ස්වාමීන්වහන්සේ-
ටත් උන්වහන්සේගේ මෙහෙකරුවූ
හෙසකියාටත් විරුද්ධව තව දුරටත්
කථාකළෝය. තවද ඔහු දේශවල 17
ජාතීන්ගේ දෙවිවරුන් තමුන්ගේ සෙනඟ
මා අතින් නොගැළවූවාක් මෙන්
හෙසකියාගේ දෙවියනුත් තමන්ගේ
සෙනඟ මාගේ අතින් ගළවන්නේ නැත
කියා ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට නින්දාකර, උන්වහන්සේට
විරුද්ධව කථාකරන පිණිස ලියුම් ලියා
එවුවේය. ඔවුන් නුවර අල්ලාගන්න 18
පිණිස, පවුර පිට සිටි යෙරුසලමේ
සෙනඟ භයගන්වන්ටත් ඔවුන් කලඹන්-
ටත් ඔව්හු යුදෙව් භාෂාවෙන් මහත්
හඬකින් මොරගසා, මනුෂ්‍ය අත්වැඩ 19
වන පොළොවේ ජනයන්ගේ දෙවි-
වරුන් ගැන කථාකරන්නාක් මෙන්
යෙරුසලමේ දෙවියන්වහන්සේ ගැන
කථාකළෝය.

## යාච්ඤාවෙන් ජය ලබාගැනීම

20 ඒ නිසා හෙසකියා රජද ආමොස්ගේ
පුත්‍රවූ අනාගතවක්තෘවූ යෙසායාද
යාච්ඤාකොට ස්වර්ගයට මොරගැසූහ.
21 එවිට **ස්වාමීන්වහන්සේ** දේවදූතයෙකු
එවූසේක, ඔහු අෂූර්හි රජුගේ කඳවුරේ
සියලු බලවන්ත යුද්ධකාරයන්ද
ප්‍රධානීන්ද අධිපතීන්ද සිඳදැමූවේය. මෙසේ
ඔහු ලජ්ජා මුහුණින් යුක්තව තමාගේ
දේශයට හැරීගියේය. ඔහු තමාගේ
දෙවියන්ගේ ගෘහයට ගිය විට, තමාට
දාව උපන් තැනැත්තෝ එහිදී ඔහු කඩුවෙන්
22 මැරුවෝය. මෙසේ **ස්වාමීන්වහන්සේ**
හෙසකියාද යෙරුසලමේ වැසියන්ද
අෂූර්හි රජවූ සෙනකෙරිබ්ගේ අතින්ද
අනික් සියල්ලන්ගේ අතින්ද ගළවා, හැම
23 අතින්ම ඔවුන් ආරක්ෂාකළසේක. එවිට
බොහෝ දෙනෙක් **ස්වාමීන්වහන්සේට**
පඬුරුද යූදාහි රජවූ හෙසකියාට අනර්ඝ
දේද යෙරුසලමට ගෙනාවෝය. එතැන්
පටන් ඔහු සියලු ජාතීන් ඉදිරියෙහි
උතුම්ව සිටියේය.

## හෙසකියා රජ ලෙඩවීම. තානාපතීන් පැමිණීම. රජුගේ මරණය

24 ඒ කාලයේදී හෙසකියා මරණාසන්න
වන තරම් රෝගාතුරව, **ස්වාමීන්වහන්සේට**
යාච්ඤාකෙළේය; උන්වහන්සේ ඔහුට
කථාකොට ලකුණක් ඔහුට දුන්සේක.
25 එහෙත් හෙසකියා තමාට ලැබුණු
කරුණාවේ හැටියට යුතු ලෙස නො-
හැසිර සිතින් උඩඟුවිය. ඒ නිසා ඔහු
පිටටත් යූදා සහ යෙරුසලම පිටටත්
26 උදහස පැමිණියේය. නුමුත් තමාගේ
සිතේ උඩඟුකම ගැන හෙසකියාද
යෙරුසලමේ වැසියන්ද යටත්වූ නිසා
හෙසකියාගේ දවස්වලදී **ස්වාමීන්-
වහන්සේගේ** උදහස ඔවුන් පිටට
27 නොපැමිණියේය. හෙසකියාට වස්තුද
ඓශ්වර්යද අතිශයින්ම තිබුණේය. ඔහු
රන් රිදීවලටත් අනර්ඝ ගල්වලටත් සුවඳ
ද්‍රව්‍යවලටත් පලිස්වලටත් සියලු ආකාර
අනර්ඝ බඩුවලටත් ගබඩාගෙවල්ද,
ධාන්‍යවල අස්වැන්නටත් මුද්‍රික පානය- 28
ටත් තෙල්වලටත් ගබඩාද, සියලු ආකාර
මෘගයන්ට පට්ටිද, රැළවලට ගාල්ද
සෑදෙවූවේය. දෙවියන්වහන්සේ ඔහුට 29
සම්පත් අතිශයින්ම දුන් නිසා ඔහු
නුවරවල්ද බොහෝ එළු බැටළු
රැළවල්ද ගව රැළවල්ද සපයාගත්තේය.
මෙම හෙසකියා ගීහොන්හි වතුරේ ඉහළ 30
උල්පත නවත්වා ඒවා දාවිත්ගේ නුවරට
බස්නාහිරෙන් කෙළින් බැසවන්ට
සැලැස්සුවේය. හෙසකියා තමාගේ සියලු
වැඩවලදී සඵලවුණේය. එසේවුවත් 31
දේශයෙහි සිද්ධවුණු ආශ්චර්යය ගැන
විභාග කරන්ට බබිලෝනියේ අධිපතීන්
විසින් තානාපතියන් ඔහු ළඟට එවූ
කල, ඔහුගේ සිතේ තිබුණු සියල්ල
දැනගන්න පිණිස දෙවියන්වහන්සේ
ඔහු සෝදිසි කිරීමට අත්හැරියසේක.
හෙසකියාගේ අනික් ක්‍රියාද ඔහුගේ 32
භක්තිමත් කෘත්‍යයන්ද ආමොස්ගේ පුත්‍රවූ
යෙසායා අනාගතවක්තෘතැනගේ දර්ශන
පොතෙහිද යූදා සහ ඉශ්‍රායෙල් රජුන්ගේ
පොතෙහිද ලියා තිබේ. හෙසකියා 33
තමාගේ පියවරුන් සමග සැතපී දාවිත්ගේ
පුත්‍රයන්ගේ සොහොන් ගෙවල ඉහළ
කොට්ඨාසයෙහි තැන්පත්කරනු ලැබුවේය.
ඔහුගේ මරණයේදී සියලු යූදාවරුද
යෙරුසලමේ වැසියෝද ඔහුට ගෞරව-
කළෝය. ඔහුගේ පුත්‍රවූ මනස්සේ ඔහු
වෙනුවට රජවිය.

## මනස්සේ නම් නපුරු රජ

**33**
මනස්සේ දොළොස් අවුරුදු
වයසේදී රජවී පනස්පස් අවුරුද්-
දක් යෙරුසලමෙහි රජකම්කෙළේය.
**ස්වාමීන්වහන්සේ** ඉශ්‍රායෙල් පුත්‍රයන් 2
ඉදිරියෙන් පන්නාදැමූ ජාතීන්ගේ
පිළිකුල්වල හැටියට ඔහු **ස්වාමීන්-
වහන්සේගේ** ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ කෙළේය. තමාගේ පියවූ 3
හෙසකියා කඩාදැමූ උස්තැන් ඔහු නැවත
ගොඩනගා, බාල් දේවතාවන්ට පූජාසන
නගා, අෂේරා කණුද සෑදුවේය. ඔහු අහසේ
මුළු සේනාවටත් නමස්කාරකරමින්

4 ඒවාට සේවයකෙළේය. තවද: මාගේ
නාමය යෙරුසලමෙහි සදාකාලේටම
පවතින්නේයයි ස්වාමීන්වහන්සේ කීවාවූ
ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි ඔහු
5 පූජාසන ගොඩනැගුවේය. තවද ඔහු
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ මණ්ඩප
දෙකේ මුළු අහස් සේනාවට පූජාසන
6 ගොඩනැගුවේය. ඔහු තමාගේ පුත්‍රයන්
හින්නොම්ගේ පුත්‍රයාගේ මිටියාවතේදී
ගින්නෙන් කැපකෙළේය. ඔහු නිමිති
බැලීම්ද ශාස්ත්‍රකීම්ද මායම්ද ව්‍යවහාර-
කොට, ආත්ම බන්ධනකාරයන්ද අන-
විනකාරයන්ද ආශ්‍රයකෙළේය. ස්වාමීන්-
වහන්සේ කෝපකරවන හැටියට
උන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව
තිබුණු දේ ඔහු බොහෝසෙයින්ම
7 කෙළේය. ඔහු සෑදූ දේවතා රූපයද
දෙවියන්වහන්සේගේ ගෘහයෙහි තැබීය.
ඒ ගෘහය ගැන දෙවියන්වහන්සේ දාවිත්ටත්
ඔහුගේ පුත්‍රවූ සාලමොන්ටත් කථාකොට:
මේ ගෘහයෙහිත් මා විසින් සියලු
ඉශ්‍රායෙල් ගෝත්‍ර අතරෙන් තෝරාගත්
යෙරුසලමෙහිත් මාගේ නාමය
8 සදාකාලේටම තබන්නෙමි. මෝසෙස්
අතින් ඉශ්‍රායෙල්වරුන් ලැබූ මුළු
ව්‍යවස්ථාවේද පනත්වලද නියෝගවලද
ප්‍රකාරයට මා ඔවුන්ට අණ කළ සියල්ල
කරන හැටියට ඔව්හු බලාගන්නෝනම්,
තුඹලාගේ පියවරුන්ට මා නියමකළ
දේශයෙන් ඔවුන්ගේ පාද තවත් අහක්ව
යන්ට නොසලස්වන්නෙමියි කීසේක.
9 නුමුත් ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්
පුත්‍රයන් ඉදිරියෙන් විනාශකරදැමූ ජාතීන්ට
වඩා නපුරුකම් කරන හැටියට මනස්සේ
යූදාවරුන්ද යෙරුසලමේ වැසියන්ද
10 මුළාකෙළේය. ස්වාමීන්වහන්සේ මනස්-
සේටත් ඔහුගේ සෙනඟටත් කථාකළ
නුමුත් ඔව්හු ඇහුම්කන් නුදුන්නෝය.

## රජු වාලට ගෙනයාම. ඔහුගේ පශ්චාත්තාපය

11 ඒ නිසා ස්වාමීන්වහන්සේ අෂූර්හි
රජුගේ සේනාපතීන් ඔවුන්ට විරුද්ධව
පැමිණෙවූසේක. ඔව්හු මනස්සේ අල්වා
විලංගුවලින්ද දම්වැල්වලින්ද බැඳ
12 බබිලෝනියට ගෙන ගියෝය. ඔහු
තමාගේ විපතේදී තමාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට කන්නලව්කොට,
තමාගේ පියවරුන්ගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි ඉතා යටහත්වී, උන්වහන්සේට 13
යාච්ඤාකෙළේය; උන්වහන්සේ ඔහුට
ඇහුම්කන්දී ඔහුගේ කන්නලව්ව අසා
යෙරුසලමටත් ඔහුගේ රාජ්‍යයටත්
නැවත ඔහු පැමිණෙවූසේක. එවිට
ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ බව
මනස්සේ දැනගත්තේය.
මින්පසු ඔහු දාවිත්ගේ නුවරින් පිට 14
ගීහොන්ට බස්නාහිරෙන් මිටියාවතෙහි
මත්ස්‍ය-දොරටුවෙන් ඇතුල්වන තැන
දක්වා ඕපෙල් වටේට ඉතා උසට පවුරක්
ගොඩනගා, යුද්ධහි පවුරු ඇති සියලු
නුවරවල සේනාපතීන් සිටෙවුවේය. ඔහු 15
ස්වාමීන්වහන්සේගේ ගෘහයෙන් අන්
දෙවිවරුන්ද පිළිමයද ස්වාමීන්වහන්සේගේ
ගෘහයේ කන්දෙහිත් යෙරුසලමෙහිත් ඔහු
ගොඩනගා තිබුණ සියලු පූජාසනද
පහකොට නුවරින් පිටත දැමුවේය. තවද 16
ඔහු ස්වාමීන්වහන්සේගේ පූජාසනය
පිහිටුවා, ඒ පිට ශාන්ති පූජාද ස්තුති
පූජාද ඔප්පු කොට, ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට සේවයකරන්ට
යූදාවරුන්ට අණකෙළේය. එහෙත් සෙනඟ 17
ඊට පසුත් උස්තැන්වල පූජාකළෝය,
නුමුත් එසේ කෙළේ තමුන්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට පමණක්ය. මනස්සේ- 18
ගේ අනික් ක්‍රියාද ඔහු තමාගේ දෙවියන්-
වහන්සේට ඔප්පුකළ යාච්ඤාවද
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ නාමයෙන් ඔහුට කථාකළ
දිවස් ඇත්තන්ගේ වචනද ඉශ්‍රායෙල්
රජවරුන්ගේ කථාන්තරයෙහි ලියා තිබේ.
ඔහුගේ යාච්ඤාවද දෙවියන්වහන්සේ 19
ඔහුට ඇහුම්කන්දුන් හැටිද ඔහුගේ සියලු
පාපයන්ද ඔහුගේ ද්‍රෝහිකමද ඔහු
යටහත්වෙන්ට පළමුවෙන් උස්තැන්
ගොඩනැගුවාවූ, අෂේරා කණු සහ කැපූ
රූප සිටෙවුවාවූ ස්ථානද හෝසයිගේ
කථාන්තර පොතෙහි ලියා තිබේ. මෙසේ 20
මනස්සේ තමාගේ පියවරුන් සමග සැතපී
තමාගේ ගෙයි තැන්පත් කරනු ලැබුවේය.
ඔහුගේ පුත්‍රවූ ආමොන් ඔහු වෙනුවට
රජවිය.

## ආමොන් රජ

21 ආමොන් විසිදෑවුරුදු වයසේදී රජවී
දෑවුරුද්දක් යෙරුසලමෙහි රජකම්කෙළේය.
22 ඔහු තමාගේ පියවූ මනස්සේ කළාක්
මෙන් **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කරමින්, තමාගේ
පියවූ මනස්සේ සෑදූ සියලු රූපවලට
23 පූජාකොට සේවයකෙළේය. ඔහුගේ පියවූ
මනස්සේ යටහත් වුණාක්මෙන් ඔහු
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි යටහත්
නොවීය; මක්නිසාද මෙම ආමොන්
24 වඩ වඩා අපරාධකෙළේය. ඔහුගේ
සේවකයෝ ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය-
කොට ඔහුගේම ගෙයිදී ඔහු මැරුවෝය.
25 නුමුත් දේශයේ සෙනඟ ආමොන් රජුට
විරුද්ධව මන්ත්‍රණය කළ සියල්ලන් මරා
ඔහුගේ පුත්‍රවූ යොෂියා ඔහු වෙනුවට
රජකමට පත් කළෝය.

## යොෂියා නම් යහපත් රජ. රූප වන්දනාව නැතිකිරීම

34 යොෂියා අට අවුරුදු වයසේදී
රජවී තිස්එක අවුරුද්දක්
2 යෙරුසලමෙහි රජකම්කෙළේය. ඔහු
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි හරිව
තිබුණු දේ කරමින්, දකුණටවත් වමටවත්
නොහැරී, තමාගේ පියවූ දාවිත්ගේ මාර්ග-
3 වල හැසුරුණේය. ඔහුගේ රජකම්කිරීමේ
අටවෙනි අවුරුද්දේ, ඔහු බාලව සිටියදීම,
තමාගේ පියවූ දාවිත්ගේ දෙවියන්වහන්සේ
සොයන්ට පටන්ගෙන, දොළොස්වෙනි
අවුරුද්දේදී උස්තැන්ද අෂේරා කණුද
කැපූ රූපද වාත්තු රූපද පහකර,
යූදය සහ යෙරුසලම පිරිසිදුකරන්ට
4 පටන්ගත්තේය. ඔහු ඉදිරිපිටදී බාල්ගේ
පූජාසන කඩාදමනලද්දේය; ඒවාට උඩින්
තිබුණු සූර්ය-රූප ඔහු කපාදමා, අෂේරා
කණුද කැපූ රූපද වාත්තු රූපද බිඳ
කුඩුකොට, ඒවාට පූජා කළ අයවලුන්ගේ
5 මිනීවළවල් පිට ඉස්සේය. පූජකයන්ගේ
ඇට ඔවුන්ගේ පූජාසන පිට ඔහු පුළුස්සා,
6 යූදය යෙරුසලමද පිරිසිදුකෙළේය. එසේම
ඔහු නප්තලී දක්වා හාත්පසින්ම
මනස්සේහිද එප්‍රායිම්හිද සිමියොන්හිද
නුවරවල් මුළුල්ලෙහි ඔවුන්ගේ ගෙවල්
බිඳදැම්මේය. ඔහු ඉශ්‍රායෙල් දේශය 7
මුළුල්ලෙහි තිබුණ පූජාසන කඩාදමා,
අෂේරා කණුද කැපූ රූපද බිඳදමා,
කුඩුකර, සියලු සූර්ය-රූප කපාදමා,
යෙරුසලමට හැරීආයේය.

## දේවමාලිගාව ප්‍රකෘතිමත් කිරීම

තවද ඔහුගේ රජකම්කිරීමේ දහඅටවෙනි 8
අවුරුද්දේදී දේශයත් ගෘහයත් පවිත්‍ර-
කළාට පසු, තමාගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහය අලුත්වැඩියාකරන
පිණිස, අසලියාගේ පුත්‍රවූ ෂාපාන්ද නුවර
අධිපතියාවූ මයසේයාද වාර්තාකරුවා
වන යෝවාහාස්ගේ පුත්‍රවූ යෝවාද
හැරියේය. ඔව්හු උත්තම පූජකයාවූ 9
හිල්කියා ළඟට පැමිණ, දෙවියන්-
වහන්සේගේ ගෘහයට ගෙනෙන ලද්දාවූ,
දොරටුපාලයන් වන ලෙවීවරුන් විසින්
මනස්සේවරුන්ගෙන්ද එප්‍රායිම්වරුන්ගෙන්
සහ ඉතුරුව සිටිය සියලු ඉශ්‍රායෙල්-
වරුන්ගෙන්ද සියලු යූදවරුන්ගෙන්ද
බෙන්යමින්වරුන්ගෙන්ද යෙරුසලමේ
වාසීන්ගෙන්ද එකතුකර ගත්තාවූ මුදල්
භාරගෙන, **ස්වාමීන්වහන්සේගේ** ගෘහය 10
හරිගැස්සීමටත් අලුත්වැඩියාකිරීමටත්
ගෘහයේ වැඩේ කරන කර්මාන්ත-
කාරයන්ට දෙන පිණිස, **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ වැඩ කිරීමට පත්වී
සිටිය තැනැත්තන් අතට ඒවා දුන්නෝය.
ඔව්හු කැපූ ගල්ද යූද රජුන් විසින් 11
නැතිකළ ගෙවල යටලීවලට සහ
බාල්කවලටත් ලීද මිලේට ගන්න පිණිස
වඩුවන්ටත් ගල්වඩුවන්ටත් ඒවා
දුන්නෝය. ඒ මනුෂ්‍යයෝ විශ්වාස- 12
ලෙස වැඩකළෝය. වැඩ බලා කරවීමට
ඔවුන් කෙරෙහි මෙරාරීගේ පුත්‍රයන්-
ගෙන් ලෙවීවරුවූ යහත්ද ඔබදියාද
කොහාත්ගේ පුත්‍රයන්ගෙන් සෙකරියාද
මෙෂුල්ලාම්ද පත්වී සිටියෝය. ලෙවීවරු
සියල්ලෝම තූර්ය භාණ්ඩ ගැන තේරුම්
ඇති අය වූහ. ඔව්හු බර උසුලන්නන් 13
කෙරෙහිත් එක එක සේවයේ වැඩය
කරන සියල්ලන් කෙරෙහිත් මූලා-
දෑනියෝව සිටියෝය. ලෙවීවරුන්ගෙන්
සමහරු ලියන්නෝව මූලාදෑනියෝව
දොරටුපාලයෝව සිටියෝය.

## ව්‍යවස්ථා පොත සම්බවීම. ගිවිසුමට නැවත බැඳීම

14 තවද ස්වාමීන්වහන්සේගේ ගෘහයට
ගෙනා මුදල් ඔවුන් එළියට ගන්න කල
මෝසෙස්ගේ අතින් දෙනලද ස්වාමීන්-
වහන්සේගේ ව්‍යවස්ථා පොත හිල්කියා
15 පූජකයාට සම්බවිය. හිල්කියා තෙමේ
ලේකම්වූ ෂාපාන්ට කථාකොට:
ව්‍යවස්ථා පොත ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි තිබී මට සම්බවීයයි කියා ඒ
16 පොත ෂාපාන්ට භාරදුන්නේය. ෂාපාන්ද
පොත අරන් නැවත රජු ළඟට ගෙන-
ගොස්: ඔබගේ මෙහෙකරුවන්ට භාරදුන්
17 සියල්ලම ඔව්හු කෙරෙති. ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ තිබුණු මුදල් ගෙන
ඔව්හු මුලාදෑනීන් අතටත් කර්මාන්ත-
කාරයන් අතටත් දුන්නෝයයි රජුට
18 දන්විය. තවද ලේකම්වූ ෂාපාන් රජුට
කථාකොට: පූජකවූ හිල්කියා මට
පොතක් භාරදුන්නේය කියා, රජු
19 ඉදිරිපිට එයින් කියෙව්වේය. රජ වනාහි
ව්‍යවස්ථාවේ වචන ඇසූ විට තමාගේ
20 ඇඳුම් ඉරාගත්තේය. තවද රජ හිල්කියාටද
ෂාපාන්ගේ පුත්‍රවූ අහිකාම්ටද මීකාගේ
පුත්‍රවූ අබ්දෝන්ටද ලේකම්වූ ෂාපාන්ටද
රජුගේ සේවකයාවූ අසායාටද අණකොට:
21 තුඹලා ගොස් මා උදෙසාත් ඉශ්‍රායෙල්ගෙන්ද
යූදාගෙන්ද ඉතුරුව සිටින්නන් උදෙසාත්
සම්බවූ පොතේ වචන ගැන ස්වාමීන්-
වහන්සේගෙන් විමසාපල්ලා. මක්නිසාද
මේ පොතෙහි ලියා තිබෙන සියල්ලේ
හැටියට කරන ලෙස අපේ පියවරුන්
ස්වාමීන්වහන්සේගේ වචනය රක්ෂා
නොකළ බැවින් අප කෙරෙහි වගුරුවා
තිබෙන ස්වාමීන්වහන්සේගේ උදහස
22 මහත්යයි කීවේය. එවිට හිල්කියාද රජුගේ
ආඥාව ලැබූ අනික් අයද හස්රාගේ පුත්‍රයා
වන තොක්හත්ගේ පුත්‍රවූ වස්ත්‍ර භාර-
කාරයාවූ ෂල්ලුම්ගේ භාර්යාව වන හුල්දා
නම් ප්‍රොපේතවරිය වෙතට ගොස් ඒ
හැටියට ඈට කථාකළෝය; ඕතොම
යෙරුසලමේ දෙවෙනි කොටසෙහි
23 විසුවාය. ඈ ඔවුන්ට කියන්නී: ඉශ්‍රායෙල්-
ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක-තුඹලා මා වෙතට එවූ
මනුෂ්‍යයාට ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේකැයි කියාපල්ලා: බලව, මම 24
මේ ඉඩම පිටටත් මෙහි වැසියන් පිටටත්
විපත එනමි, යූදා රජු ඉදිරියෙහි කියෙවූ
පොතෙහි ලියා තිබෙන සියලු ශාපවල්
පමුණුවන්නෙමි. ඔවුන් මා අත්හැර 25
තමුන්ගේ අත්වල සියලු ක්‍රියාවලින් මා
කෝපකරන හැටියට වෙන දෙවිවරුන්ට
සුවඳ දුම් ඔප්පුකළ බැවින් මාගේ උදහස
මේ ඉඩම පිටට වගුරුවා තිබේ, ඒක
නිවෙන්නෙත් නැත. තුමූත් ස්වාමීන්- 26
වහන්සේගෙන් විචාරන පිණිස තුඹලා
එවූ යූදාහි රජුට මෙසේ කියාපල්ලා-තුඹ
ඇසූ වචන සම්බන්ධව ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ මෙසේ කියන-
සේක: මේ ඉඩමටත් මෙහි වැසියන්ටත් 27
විරුද්ධව දෙවියන්වහන්සේ කියා තිබෙන
වචන තුඹ ඇසූ විට තුඹේ සිත
මොළොක්වී තුඹ උන්වහන්සේ ඉදිරියෙහි
යටහත්වූ බැවිනුත්, තුඹ මා ඉදිරියෙහි
යටහත්වී තුඹේ ඇඳුම් ඉරාගෙන මා
ඉදිරියෙහි ඇඬූ බැවිනුත්, මමත් තුඹට
කන්දුනිමියි ස්වාමීන්වහන්සේ කියනසේක.
මම තුඹේ පියවරුන් වෙතට තුඹ 28
පමුණුවන්නෙමි, මා විසින් මේ ඉඩමටත්
මෙහි වැසියන්ටත් පමුණුවන සියලු
විපත්ති තුඹේ ඇස්වලින් නොදක,
තුඹේ සොහොනට තුඹ සමාදානයෙන්
පැමිණෙන්නෙහිය කියා වදාරනසේකැයි
කීවාය. ඔව්හුද හැරී ඇවිත් රජුට සැල-
කළෝය.

එවිට රජ පණිවිඩකාරයන් යවා යූදා 29
සහ යෙරුසලමේ සියලු වැඩිමහල්ලන්
රැස්කරවාගෙන, යූදාහි සියලු මනුෂ්‍යයන්ද 30
යෙරුසලමේ වැසියන්ද පූජකයන්ද
ලෙවීවරුන්ද ලොකු කුඩා මුළු සෙනඟද
සමග ස්වාමීන්වහන්සේගේ ගෘහයට
ගියේය. තවද ඔහු ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි තිබී සම්බවූ ගිවිසුම් පොතේ
සියලු වචන ඔවුන් අසාගෙන සිටිද්දී
කියෙව්වේය. රජ ස්වකීය ස්ථානයෙහි 31
සිට ඒ පොතෙහි ලියනලද ගිවිසුමේ
වචන ඉෂ්ටකිරීමට, ස්වාමීන්වහන්සේ

අනුවයන හැටියටත් උන්වහන්සේගේ
ආඥද ශික්ෂාද පනත්ද තමාගේ මුළු
සිතින්ද තමාගේ මුළු ආත්මයෙන්ද
පවත්වන හැටියටත් **ස්වාමීන්වහන්සේ**
32 ඉදිරියෙහි ගිවිසුමක් කෙළේය. ඔහු
යෙරුසලමෙහිද බෙන්යමින්හිද සිටි
සියල්ලන් ඊට එකඟවෙන්ට සැලැස්-
සුවේය. යෙරුසලමේ වැසියෝද දෙවියන්-
වහන්සේගේ එනම් තමුන්ගේ පියවරුන්-
ගේ දෙවියන්වහන්සේගේ ගිවිසුම ලෙස
33 කළෝය. යෝෂියා වනාහි ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට අයිති සියලු රටවලින් සියලු
පිළිකුල් දේවල් පහකොට, ඉශ්‍රායෙල්හි
සිටි සියල්ලන් තමුන්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේට** සේවයකරන්ට සැලැස්සුවේය.
ඔහුගේ සියලු දවස්වල ඔව්හු තමුන්ගේ
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
වෙතින් පහව නොගියෝය.

## මහත් පාස්කු මංගල්‍යයක් පැවැත්වීම

**35** යෝෂියා යෙරුසලමෙහි **ස්වාමීන්-
වහන්සේට** පාස්කු මංගල්‍යයක්
පැවැත්තුවේය. ඔව්හු පළමුවෙනි මාසයේ
දහහතරවෙනිද පාස්කු බැටළුපැටවුන්
2 මැරුවෝය. ඔහු පූජකයන් ඔවුන්ගේ
තනතුරුවල සිටුවා, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේ මෙහෙයට ඔවුන් ධෛර්ය-
3 කෙරෙවුවේය. සියලු ඉශ්‍රායෙල්වරුන්ට
ඉගැන්නුවාවූද **ස්වාමීන්වහන්සේ** උදෙසා
ශුද්ධව සිටියාවූද ලෙවීවරුන්ට ඔහු
කථාකොට: ඉශ්‍රායෙල් රජවූ දාවිත්ගේ
පුත්‍රවූ සාලමොන් විසින් සෑදූ ගෘහයෙහි
ශුද්ධ පෙට්ටිය තබාපල්ලා; නුඹලාගේ
කර පිට තවත් බරක් නැත. දැන් නුඹලා-
ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේටත්** උන්-
වහන්සේගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ටත්
4 සේවය කර, ඉශ්‍රායෙල් රජවූ දාවිත්ගේ
ලියවිල්ලේද ඔහුගේ පුත්‍රවූ සාලමොන්ගේ
ලියවිල්ලේද ප්‍රකාරයට නුඹලාගේ
පියවංශවල හැටියට නුඹලාගේ පන්ති
5 ලෙස සූදානම්වී, සෙනඟගේ පුත්‍රයන් වන
නුඹලාගේ සහෝදරයන් උදෙසා පියවංශවල
බෙදීම්වල හැටියටද ලෙවීවරුන් උදෙසා
පියවංශයකින් කොටසක් ඇතුවද
ශුද්ධස්ථානයෙහි සිට, පාස්කු බැටළු- 6
පැටවුන් මරාපල්ලා. නුඹලා පවිත්‍රව,
මෝසෙස් අතින් ලැබුණු **ස්වාමීන්-
වහන්සේගේ** වචනයේ හැටියට කිරීමට
නුඹලාගේ සහෝදරයන් උදෙසා උන්
සූදානම්කරපල්ලායයි කීවේය. යෝෂියා 7
රජද, ඇවිත් සිටි සෙනඟගේ පුත්‍රයන්
සියල්ලන්ට පාස්කු පූජා පිණිසම ගණනේ
හැටියට බැටළුපැටවුන්ද එළුපැටවුන්ද
තිස්දහසකුත් ගොනුන් තුන්දහසකුත්
තමාගේම සම්පතෙන් දුන්නේය. ඔහුගේ 8
අධිපතීහුද සෙනඟටත් පූජකයන්ටත්
ලෙවීවරුන්ටත් සිය කැමැත්තෙන්ම
දුන්නෝය. දෙවියන්වහන්සේගේ ගෘහයේ
අධිපතියෝවූ හිල්කියාද සෙකරියාද
යෙහියෙල්ද පාස්කු පූජා පිණිස බැටළු-
පැටවුන් දෙදස් හසියයකුත් ගොනුන්
තුන්සියයකුත් පූජකයන්ට දුන්නෝය.
ලෙවීවරුන්ගේ අධිපතියෝවූ කොන- 9
නියාද ෂෙමායා සහ නෙතනෙල් යන
ඔහුගේ සහෝදරයෝද හෂබියාද
යෙයියෙල්ද යෝසාබාද්ද පාස්කු පූජා
පිණිස බැටළුපැටවුන් පන්දහසකුත්
ගොනුන් පන්සියයකුත් ලෙවීවරුන්ට
දුන්නෝය. මෙසේ සේවය සූදානම්- 10
කරනලද්දේය, පූජකයෝ තමුන්ගේ
ඉඩමේද ලෙවීවරු තමුන්ගේ පන්තිවල
ප්‍රකාරයටද රජුගේ ආඥාව පරිද්දෙන්
සිටියෝය. ඔව්හු පාස්කු බැටළුපැටවුන් 11
මැරුවෝය, පූජකයෝද ඔවුන් අතින්
ලේ රැගෙන ඉස්සෝය, ලෙවීවරු සතුන්
හම්ගැසුවෝය. ඔව්හු මෝසෙස්ගේ 12
පොතෙහි ලියා තිබෙන ලෙස
**ස්වාමීන්වහන්සේට** ඔප්පුකරන පිණිස
දවන පූජාව සෙනඟගේ පුත්‍රයන්ගේ
පියවංශ බෙදීම්වල හැටියට දීමට වෙන්
කළෝය. ගවයින් ගැනත් එසේම කළෝය.
ඔව්හු පාස්කුව ව්‍යවහාරය ලෙස 13
ගින්නෙන් පුලුස්සා, ශුද්ධවූ අනික් ඒවා
ඇතිලිවලද කටාරම්වලද හැළිවලද
තම්බා, ඉක්මනින් මුළු සෙනඟට ගෙනැත්
දුන්නෝය. ඉන්පසු ඔව්හු තමුන්- 14
ටත් පූජකයන්ටත් පිළියෙළකළෝය;

මක්නිසාද ආරොන්ගේ පුත්‍රයෝවූ
පූජකයෝ දවන පූජාද තෙලද
රෑ වෙනතුරු ඔප්පුකරමින් සිටියෝය.
ලෙවීවරුද තමුන්ටත් ආරොන්ගේ පුත්‍රයන්
වන පූජකයන්ටත් පිළියෙළකළෝය.
15 ආසාප්ගේ පුත්‍රයෝවූ ගීතිකාකාරයෝද
දාවිත්ගෙත් ආසාප්ගෙත් හේමාන්ගෙත්
රජුගේ දිවස් ඇත්තාවූ යෙදුතුන්ගෙත්
ආඥාවේ ප්‍රකාරයට තමුන්ගේ ස්ථාන-
යෙහි සිටියෝය; දොරටුපාලයෝ එක
එක දොරටුවෙහි සිටියෝය. තමුන්ගේ
සේවයෙන් අහක්ව යන්ට ඔවුන්ට
ඕනෑකළේ නැත, මක්නිසාද ඔවුන්ගේ
සහෝදරවූ ලෙවීවරු ඔවුන් උදෙසා
16 පිළියෙළකළෝය. මෙසේ යොෂියා රජු-
ගේ ආඥාව ලෙස පාස්කුව පවත්වන්ටත්
ස්වාමීන්වහන්සේගේ පූජාසන පිට දවන
පූජා ඔප්පුකරන්ටත් ස්වාමීන්වහන්සේගේ
මුළු මෙහෙය එම දවසේ පිළියෙළකර
17 තිබුණේය. එහි සිටි ඉශ්‍රායෙල් පුත්‍රයෝ
පාස්කුවත් මුහුන් නොදැමූ රොටි
මංගල්‍යයත් ඒ කාලයෙහි සත් දවසක්
18 පැවැත්තුවෝය. එයාකාර පාස්කුවක්
ප්‍රොපේතවූ සාමුවෙල්ගේ කාලයට පසුව
ඉශ්‍රායෙල්වරුන් අතරේ නොපවත්වන-
ලද්දේය; යොෂියාද පූජකයන්ද ලෙවී-
වරුන්ද එහි සිටි යූදා හා ඉශ්‍රායෙල්හි
සියල්ලන්ද යෙරුසලමේ වැසියන්ද
පැවැත්තුවාක් මෙන් ඉශ්‍රායෙල් රජුන්-
ගෙන් කිසිවෙක්වත් එයාකාර පාස්කුවක්
19 පැවැත්තුවේ නැත. ඒ පාස්කුව පැවැත්තුවේ
යොෂියාගේ රජකම්කිරීමේ දහඅටවෙනි
අවුරුද්දේදීය.

## යොෂියා යුද්ධයේදී තුවාලවී මරණයට පැමිණීම

20 යොෂියා මේ සියල්ල කර ගෘහය
පිළියෙළකළාට පසු, මිසරයේ රජවූ
නෙකෝ ප්‍රාත් ළඟ තිබෙන කර්කෙමිෂ්ට
විරුද්ධව යුද්ධකරන්ට ආවේය. යොෂියා
21 ඔහුට විරුද්ධව පිටත්ව ගියේය. නුමුත්
ඔහු තානාපතියන් ඔහු වෙතට එවමින්:
යූදාහි රජ්ජුරුවෙනි, මාගෙන් ඔබට කම
මොකද? ඔබට විරුද්ධව නොව මා
සමග යුද්ධකරන වංශයට විරුද්ධව
අද මම එමි; ඉක්මන්වෙන්ට කියා
දෙවියන්වහන්සේ මට අණකළසේක.
දෙවියන්වහන්සේ මා සමග සිටිනසේක.
උන්වහන්සේ ඔබ විනාශ නොකරන
පිණිස උන්වහන්සේගේ කාරණා ගැන
හරස් නොවිය යුතුයයි කියා එවුවේය.
නුමුත් යොෂියා නෙකෝ කී දෙවියන්- 22
වහන්සේගේ වචනය නාසා, ඔහු වෙතින්
අහක්ව නොගොස්, ඔහු සමග යුද්ධකරන
පිණිස, වෙස් මාරුකරගන, මෙගිද්දෝ
මිටියාවතෙහි සටනට පැමුණුණේය.
දුනුකාරයෝ යොෂියා රජුට විද්දෝය; 23
එවිට රජ: මට බොහෝ තුවාලවූ බැවින්
මා අහකට ගෙනියාපල්ලායයි තමාගේ
සේවකයන්ට කීය. ඔහුගේ සේවකයෝ 24
රථයෙන් ඔහු රැගෙන ඔහුගේ දෙවෙනි
රථයට නංවාගන යෙරුසලමට ආවෝය;
ඔහු මැරී තමාගේ පියවරුන්ගේ
සොහොන් ගෙවල තැන්පත්කරනලද්දේය.
සියලු යූදාවරුද යෙරුසලමේ වැසියෝද
යොෂියා ගැන වැලපුණාහ. යෙරෙමියා 25
වනාහි යොෂියා ගැන විලාප ගීතිකාවක්
කෙළේය. ගී කියන සියලු මිනිස්සුද ගී
කියන සියලු ස්ත්‍රීහුද අද දක්වා තමුන්ගේ
විලාප ගීතිකාවලින් යොෂියා ගැන
කථාකරති; ඔව්හු ඒවා ඉශ්‍රායෙල්
අතරෙහි නියෝගයක් කොට දුන්නෝය.
ඒවා විලාප ගීතිකාවල ලියා තිබේ. 26
යොෂියාගේ අනික් ක්‍රියාද ස්වාමීන්-
වහන්සේගේ ව්‍යවස්ථාවේ ලියා තිබෙන
හැටියට ඔහු කළ භක්තිමත් වැඩද, මුල 27
පටන් අග දක්වා ඔහුගේ කාරණාද
ඉශ්‍රායෙල් සහ යූදා රජවරුන්ගේ පොතෙහි
ලියා තිබේ.

## යෙහෝවාහාස් ආදී රජවරු. යෙරුසලම විනාශවීම

36 එවිට දේශයේ සෙනඟ යොෂියා-
ගේ පුත්‍රවූ යෙහෝවාහාස් කැඳවා-
ගෙන, ඔහුගේ පියා වෙනුවට ඔහු

යෙරුසලමෙහි රජකමට පත්කළෝය.
2 යෝවාහාස් විසිතුන් අවුරුදු වයසේදී
රජවී, යෙරුසලමෙහි තුන් මාසයක්
3 රජකම්කෙළේය. මිසරයේ රජතෙමේ
යෙරුසලමේදී ඔහු අහක්කර, රිදී
තලෙන්ත සියයකුත් රන් තලෙන්තයකුත්
4 දේශයට දඩගසා, ඔහුගේ සහෝදරවූ
එලියාකීම් යූදා සහ යෙරුසලම කෙරෙහි
රජකමට පත්කොට, ඔහුගේ නාමය
යෙහෝයාකීම්ය කියා වෙනස්කෙළේය.
තවද නෙකෝ ඔහුගේ සහෝදරවූ
යෝවාහාස් රැගෙන මිසරයට ගියේය.
5 යෙහෝයාකීම් විසිපස් අවුරුදු වයසේදී
රජවී, එකොළොස් අවුරුද්දක් යෙරුසල-
මෙහි රජකම්කෙළේය. ඔහු තමාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
6 නපුරුව තිබුණු දේ කෙළේය. බබිලෝ-
නියේ රජවූ නෙබූකද්නෙශර් ඔහුට
විරුද්ධව ඇවිත්, බබිලෝනියට ගෙනයන
පිණිස දම්වැල්වලින් ඔහු බැන්දේය.
7 **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ සමහර
භාණ්ඩත් නෙබූකද්නෙශර් බබිලෝනියට
ගෙනගොස් බබිලෝනියේ තමාගේ
8 මාලිගාවෙහි තැබුවේය. යෙහෝයාකීම්ගේ
අනික් ක්‍රියාද ඔහු කළ පිළිකුල් දේවල්ද
ඔහුට විරුද්ධව දැනගත් කාරණාද
ඉශ්‍රායෙල් සහ යූදා රජවරුන්ගේ පොතෙහි
ලියා තිබේ. ඔහුගේ පුත්‍රවූ යෙහෝයාකීන්
ඔහු වෙනුවට රජවිය.
9 යෙහෝයාකීන් දහඅට අවුරුදු වයසේදී
රජකම්කරන්ට පටන්ගෙන, තුන්මස් දස
දවසක් යෙරුසලමෙහි රජකම්කෙළේය.
ඔහු **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
10 නපුරුව තිබුණු දේ කෙළේය. ඊළඟ
අවුරුද්දේදී නෙබූකද්නෙශර් රජ ඔහු
සහ **ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි
අනර්ඝ භාණ්ඩත් බබිලෝනියට ගෙන්වා,
ඔහුගේ සහෝදරවූ ශෙදෙකියා යූදා සහ
යෙරුසලම කෙරෙහි රජකොට පත්කෙළේය.
11 ශෙදෙකියා විසිඑක් අවුරුදු වයසේදී
රජවී, එකොළොස් අවුරුද්දක් යෙරුසලමෙහි
12 රජකම්කෙළේය. ඔහු තමාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
නපුරුව තිබුණු දේ කෙළේය; **ස්වාමීන්-
වහන්සේගේ** වචන කී අනාගතවක්තෘවූ
යෙරෙමියා ඉදිරියෙහි ඔහු යටහත්වුණේත්
නැත. තවද ඔහු දෙවියන්වහන්සේගේ 13
නමින් ඔහු දිවුරෙවූ නෙබූකද්නෙශර්
රජුට විරුද්ධව කැරළිගැසුවේය. ඔහු
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
වෙතට නොහැරෙන ලෙස තමාගේ
කුළල තදකරගන තමාගේ සිත දැඩි-
කරගත්තේය. පූජකයන්ගේ සියලු 14
ප්‍රධානීහුද සෙනඟද ජාතීන්ගේ සියලු
පිළිකුල්වල හැටියට බොහෝ-
සේ අපරාධකරමින්, **ස්වාමීන්වහන්සේ**
යෙරුසලමෙහි විශුද්ධකළ උන්වහන්සේ-
ගේ ගෘහය අපවිත්‍රකළෝය. ඔවුන්ගේ 15
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
ස්වකීය සෙනඟටත් ස්වකීය වාසස්-
ථානයටත් අනුකම්පාකළ නිසා උන්-
වහන්සේ අලුයම්හි නැගිට පණිවිඩ-
කාරයන් අත ඔවුන්ට කියා ඇරියසේක.
එහෙත් පුවයක් නැති තරම් **ස්වාමීන්-** 16
**වහන්සේගේ** කෝපය තමන්ගේ
සෙනඟට විරුද්ධව පැමිණෙන ලෙස ඔව්හු
දෙවියන්වහන්සේගේ පණිවිඩකාරයන්ට
සරදම්කර, උන්වහන්සේගේ වචන
සුළුකර, උන්වහන්සේගේ ප්‍රොපේතවරුන්ට
නින්දකළෝය. ඒ නිසා උන්වහන්සේ 17
ඔවුන්ට විරුද්ධව කල්දිවරුන්ගේ රජු
පැමිණෙවූසේක. ඔහු ඔවුන්ගේ ශුද්ධ-
ස්ථාන ගෘහයෙහිදී ඔවුන්ගේ යෞවනයන්
කඩුවෙන් මැරුවෝය. ඔහු යෞවනයා-
ටවත් කන්‍යාවටවත් මහල්ලාටවත්
පැසුණු හිසකේ ඇත්තාටවත් අනුකම්පා
නොකෙළේය. උන්වහන්සේ ඔවුන්
සියල්ලන් ඔහු අතට පාවාදුන්සේක. ඔහු 18
දෙවියන්වහන්සේගේ ගෘහයේ ලොකු
කුඩා සියලු භාණ්ඩද **ස්වාමීන්වහන්සේ-
ගේ** ගෘහයේ වස්තුද රජුගෙත් ඔහුගේ
අධිපතීන්ගෙත් වස්තුද යන සියල්ලම
බබිලෝනියට ගෙනගියේය. ඔව්හු 19
දෙවියන්වහන්සේගේ ගෘහය දවාදමා,
යෙරුසලමේ පවුර කඩාදමා, එහි සියලු
මාලිගා ගින්නෙන් දවා, එහි තිබුණු
අනර්ඝවූ සියලු බඩු විනාශකළෝය.
කඩුවෙන් ගැළවුණු අය ඔහු බබිලෝනියට 20
ගෙනගියේය; ඔව්හු පාර්සිවරුන්ගේ
රජකම්කිරීම දක්වා ඔහුටත් ඔහුගේ

21 පුත්‍රයන්ටත් දාසයෝව සිටියෝය. මෙසේ
වුණේ දේශය ඒකේ සබත් කාලවල්
භුක්තිවිඳිනතුරු යෙරෙමියාගේ මුඛයෙන්
කියවනලද ස්වාමීන්වහන්සේගේ වචනය
සම්පූර්ණවෙන පිණිසය. සැත්තෑ
අවුරුද්දක් සම්පූර්ණවෙනතුරු, දේශය
පාළුව තිබුණු කාලය මුළුල්ලෙහි එය
විශ්‍රාමගත්තාය.

### කෝරෙෂ් රජුගේ ප්‍රකාශ පත්‍රය

22 නුමුත් ස්වාමීන්වහන්සේ යෙරමියාගේ
මුඛයෙන් කියෙවූ වචනය සම්පූර්ණවෙන
පිණිස පාර්සියාවේ රජවූ කෝරෙෂ්ගේ
පළමුවෙනි අවුරුද්දේදී ස්වාමීන්වහන්සේ
පාර්සියාවේ රජවූ කෝරෙෂ්ගේ සිත
පෙළඹෙවූසේක. ඔහු වනාහි: ස්වර්ගයේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ පොළොවේ
සියලු රාජ්‍යයන් මට දී තිබේ; තවද 23
උන්වහන්සේ යූදහි තිබෙන යෙරුසලමෙහි
උන්වහන්සේට ගෘහයක් ගොඩනගන්ට
මට අණකර තිබේ. උන්වහන්සේගේ මුළු
සෙනඟගෙන් තුඹලා අතරේ සිටින්නේ
කවුද? ඔහු සමග ඔහුගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ සිටිනසේක්වා, ඔහු
එතැනට යේවයි පාර්සියාවේ කෝරෙෂ්
කියන්නේය කියා තමාගේ රාජ්‍යය
මුළුල්ලෙහි ප්‍රසිද්ධියක් කොට, ලියවිල්-
ලෙනුත් එය පතළ කෙරෙවූවේය.

# එස්රාගේ පොත

## යුදෙව්වරු බබිලෝනියෙන් පිටත්වීම

1 තවද පාර්සියාවේ රජවූ කෝරෙෂ්ගේ
පළමුවෙනි අවුරුද්දේදී **ස්වාමීන්-**
**වහන්සේ** යෙරෙමියාගේ මුඛයෙන් කියවූ
වචනය ඉෂ්ටවෙන පිණිස **ස්වාමීන්-**
**වහන්සේ** පාර්සියාවේ රජවූ කෝරෙෂ්ගේ
2 සිත පෙළඹවූසේක. ඔහු තමාගේ
රාජ්‍යය මුළුල්ලෙහි ප්‍රකාශයක් කරනුයේ:
ස්වර්ගයේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
පොළොවේ සියලු රාජ්‍යයන් මට දී
තිබේ; තවද උන්වහන්සේ යූදහි තිබෙන
යෙරුසලමෙහි උන්වහන්සේට ගෘහයක්
ගොඩනගන්ට මට අණකර තිබේ.
3 උන්වහන්සේගේ මුළු සෙනඟගෙන් තුඹලා
අතරේ සිටින්නේ කවුද? ඔහු සමග
ඔහුගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
සිටිනසේක්වා, ඔහු යූදහිවූ යෙරුසලමට
ගොස් යෙරුසලමෙහි සිටින ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ගෘහය
ගොඩනගාවා. (උන්වහන්සේ දෙවියන්-
4 වහන්සේය.) යම් කෙනෙක් ඉතිරිව යම්
තැනක සිටීද ඔහුට ඒ ස්ථානයේ
මනුෂ්‍යයෝ යෙරුසලමෙහි තිබෙන
දෙවියන්වහන්සේගේ ගෘහය උදෙසා සිය
කැමැත්තෙන් දෙන පඬුර හැර රන්
රිදීද බඩු සහ මෘගයන්ද දෙමින්
උපකාරකෙරෙත්වයි පාර්සියාවේ රජවූ
කෝරෙෂ් කියන්නේය කියා හඬිනුත්
5 ලියවිල්ලෙනුත් පතළකෙළේය. එවිට
යූදවරුන්ගෙත් බෙන්යමින්වරුන්ගෙත්
පියවංශවල ප්‍රධානීහුද පූජකයෝද
ලෙවීවරුද එනම් යෙරුසලමෙහි **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහය ගොඩනගන පිණිස
යන්ට දෙවියන්වහන්සේ විසින් සිත්
පොළඹවනලද සියල්ලෝම සූදනම්වුණෝය.
ඔවුන් අවට සිටි සියල්ලෝද සිය 6
කැමැත්තෙන් දුන් සියලු පඬුරු හැර රිදී
භාණ්ඩවලිනුත් රන්වලිනුත් බඩුවලිනුත්
මෘගයන්ගෙනුත් අනර්ඝ දේවලිනුත්
ඔවුන්ට උපකාරකළෝය. තවද කෝරෙෂ් 7
රජ නෙබුකද්නෙශර් විසින් යෙරුසලමෙන්
ගෙනවුත් තමාගේ දෙවියන්ගේ ගෘහයෙහි
තබනලද **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
භාණ්ඩ පිටතට ගෙන්නෙවූවේය.
පාර්සියාවේ රජවූ කෝරෙෂ් ඒවා 8
භාණ්ඩාගාරිකවූ මිත්රෙදත් ලවා පිටතට
ගෙන්වා, යූදහි අධිපතියාවූ ෂෙෂ්බශර්ට
ගණන්කර දුන්නේය. ඒවායේ ගණන 9
නම්: රන් තළි තිහකුත් රිදී තළි දහසකුත්
පිහියා විසිනවයකුත්, රන් පාත්‍රා තිහකුත් 10
දෙවෙනි තරමේ රිදී පාත්‍රා හාරසිය
දසයකුත් වෙන භාණ්ඩ දහසකුත්ය. රන් 11
රිදී සියලු භාණ්ඩ පන්දස් හාරසියයක්ය.
වාල්කමේ සිටි අය බබිලෝනියෙන්
යෙරුසලමට ආ කල්හි ෂෙෂ්බශර් විසින්
මේ සියල්ල ගෙනෙනලද්දේය.

## බබිලෝනියෙන් හැරී ආවුන්ගේ නාම ලේඛනය

2 බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර්
විසින් අල්ලා බබිලෝනියට
ගෙනයනලද්දවුන්ගෙන් වාල්කමින් මිදී,
යෙරුසලමටත් යූදහි තම තමුන්ගේ
නුවරවලටත් සෙරුබ්බාබෙල්ද යේෂුවාද 2
නෙහෙමියාද සෙරායාද රේලායාද
මොර්දෙකයිද බිල්ෂාන්ද මිස්පාර්ද
බිග්වායිද රෙහූම්ද බානාද සමග හැරී
ආවාවූ රටේ පුත්‍රයෝ මොව්හුය.
ඉශ්‍රායෙල් සෙනඟවූ මනුෂ්‍යයන්ගේ
ගණන මෙසේය: පරොෂ්ගේ පුත්‍රයෝ 3

දෙදස් එකසිය හැත්තෑ දෙදෙනෙක්ය.
4 ෂෙපටියාගේ පුත්‍රයෝ තුන්සිය හැත්තෑ
5 දෙදෙනෙක්ය. ආරාගේ පුත්‍රයෝ හත්සිය
6 හැත්තෑපස් දෙනෙක්ය. පාහත්-මෝවබ්ගේ
පුත්‍රයෝවූ යේෂුවාගේද යෝවාබ්ගේද
පුත්‍රයෝ දෙදස් අටසිය දොළොස්
7 දෙනෙක්ය. ඒලාම්ගේ පුත්‍රයෝ එක්දස්
8 දෙසිය පනස් හතර දෙනෙක්ය. ශට්ටූගේ
පුත්‍රයෝ නවසිය හතළිස් පස් දෙනෙක්ය.
9 ශක්කායිගේ පුත්‍රයෝ හත්සිය හැට
10 දෙනෙක්ය. බානීගේ පුත්‍රයෝ හසිය
11 හතළිස් දෙදෙනෙක්ය. බෙබායිගේ
පුත්‍රයෝ හසිය විසිතුන් දෙනෙක්ය.
12 අස්ගාද්ගේ පුත්‍රයෝ එක්දස් දෙසිය විසි
13 දෙදෙනෙක්ය. අදෝනිකාම්ගේ පුත්‍රයෝ
14 හසිය හැට හදෙනෙක්ය. බිග්වායිගේ
පුත්‍රයෝ දෙදස් පනස් හදෙනෙක්ය.
15 ආදීන්ගේ පුත්‍රයෝ හාරසිය පනස් හතර
16 දෙනෙක්ය. හෙසකියාගෙන්වූ ආටෙර්ගේ
17 පුත්‍රයෝ අනූ අට දෙනෙක්ය. බේශායිගේ
පුත්‍රයෝ තුන්සිය විසිතුන් දෙනෙක්ය.
18 යෝරාගේ පුත්‍රයෝ එකසිය දොළොස්
19 දෙනෙක්ය. හාෂුම්ගේ පුත්‍රයෝ දෙසිය
20 විසිතුන් දෙනෙක්ය. ගිබ්බාර්හි පුත්‍රයෝ
21 අනූපස් දෙනෙක්ය. බෙත්-ලෙහෙමේ
පුත්‍රයෝ එකසිය විසිතුන් දෙනෙක්ය.
22 නෙටොපාහි මනුෂ්‍යයෝ පනස්
23 හදෙනෙක්ය. අනාතෝත්හි මනුෂ්‍යයෝ
24 එකසිය විසිඅට දෙනෙක්ය. අස්මාවෙත්හි
25 පුත්‍රයෝ හතළිස් දෙදෙනෙක්ය. කිරියත්-
ආරීමෙත් කෙපිරායෙත් බෙයේරෝතෙත්
පුත්‍රයෝ හත්සිය හතළිස් තුන් දෙනෙක්ය.
26 රාමාහිත් ගෙබාහිත් පුත්‍රයෝ හසිය විසි
27 එක්දෙනෙක්ය. මික්මාස්හි මනුෂ්‍යයෝ
28 එකසිය විසි දෙදෙනෙක්ය. බෙතෙල්හිද
හායිහිද මනුෂ්‍යයෝ දෙසිය විසිතුන්
29 දෙනෙක්ය. නෙබෝහි පුත්‍රයෝ පනස්
30 දෙදෙනෙක්ය. මග්බීෂ්හි පුත්‍රයෝ එකසිය
31 පනස් හදෙනෙක්ය. අනික් ඒලාම්හි
පුත්‍රයෝ එක්දස් දෙසිය පනස් හතර
32 දෙනෙක්ය. හාරීම්හි පුත්‍රයෝ තුන්සිය
33 විසි දෙනෙක්ය. ලොද්හිද හාදීද්හිද
ඕනෝහිද පුත්‍රයෝ හත්සිය විසිපස්
34 දෙනෙක්ය. යෙරිකෝවේ පුත්‍රයෝ තුන්සිය
35 හතළිස් පස් දෙනෙක්ය. සෙනායාහි
පුත්‍රයෝ තුන්දස් හසිය තිස් දෙනෙක්ය.
36 පූජකයෝ නම්: යේෂුවාගේ වංශයේ
යෙදයාගේ පුත්‍රයෝ නවසිය හැත්තෑ තුන්
දෙනෙක්ය. ඉම්මේර්ගේ පුත්‍රයෝ එක්දස් 37
පනස් දෙදෙනෙක්ය. පෂ්හූර්ගේ පුත්‍රයෝ 38
එක්දස් දෙසිය හතළිස් හත් දෙනෙක්ය.
හාරීම්ගේ පුත්‍රයෝ එක්දස් දහහත් 39
දෙනෙක්ය. ලෙවීවරු නම්: හෝදවියාගේ 40
පුත්‍රයන්ගෙන්වූ යේෂුවාගේද කද්මී-
යෙල්ගේද පුත්‍රයෝ හැත්තෑ හතර
දෙනෙක්ය. ගීතිකාකාරයෝවූ ආසාප්ගේ 41
පුත්‍රයෝ එකසිය විසිඅට දෙනෙක්ය.
දොරටුපාලයන්ගේ පුත්‍රයෝ එනම් 42
ෂල්ලූම්ගේ පුත්‍රයෝද ආටෙර්ගේ
පුත්‍රයෝද ටල්මෝන්ගේ පුත්‍රයෝද
අක්කුබ්ගේ පුත්‍රයෝද හටීටාගේ පුත්‍රයෝද
ෂොබයිගේ පුත්‍රයෝද යන සියල්ලෝ
එකසිය තිස්නව දෙනෙක්ය. නෙතිනීම්වරු 43
නම්: ශිහාගේ පුත්‍රයෝය, හසූපාගේ
පුත්‍රයෝය, ටබ්බාවෝත්ගේ පුත්‍රයෝය;
කේරෝස්ගේ පුත්‍රයෝය, සියහාගේ 44
පුත්‍රයෝය, පාදෝන්ගේ පුත්‍රයෝය;
ලෙබානාගේ පුත්‍රයෝය, හගාබාගේ 45
පුත්‍රයෝය, අක්කුබ්ගේ පුත්‍රයෝය;
හාගාබ්ගේ පුත්‍රයෝය, ෂම්ලායිගේ 46
පුත්‍රයෝය, හානාන්ගේ පුත්‍රයෝය;
ගිද්දෙල්ගේ පුත්‍රයෝය, ගහර්ගේ 47
පුත්‍රයෝය, රෙයායාගේ පුත්‍රයෝය;
රෙශින්ගේ පුත්‍රයෝය, නෙකෝදගේ 48
පුත්‍රයෝය, ගස්සාම්ගේ පුත්‍රයෝය;
උස්සාගේ පුත්‍රයෝය, පාසේයාගේ 49
පුත්‍රයෝය, බේසයිගේ පුත්‍රයෝය;
අස්නාගේ පුත්‍රයෝය, මෙයූනිම්ගේ 50
පුත්‍රයෝය, නෙපීසිම්ගේ පුත්‍රයෝය;
බක්බූක්ගේ පුත්‍රයෝය, හකූපාගේ 51
පුත්‍රයෝය, හර්හූර්ගේ පුත්‍රයෝය;
බශ්ලූත්ගේ පුත්‍රයෝය, මෙහිදගේ 52
පුත්‍රයෝය, හර්ෂාගේ පුත්‍රයෝය;
බර්කෝස්ගේ පුත්‍රයෝය, සීසෙරාගේ 53
පුත්‍රයෝය, තෙමාගේ පුත්‍රයෝය;
නෙයියාගේ පුත්‍රයෝය, හටීපාගේ 54
පුත්‍රයෝය. සාලමොන්ගේ සේවකයන්ගේ 55
පුත්‍රයෝ නම්: සෝටයිගේ පුත්‍රයෝය,
හස්සොපෙරෙත්ගේ පුත්‍රයෝය, පෙරූදගේ
පුත්‍රයෝය; යයලාගේ පුත්‍රයෝය, 56
දර්කොන්ගේ පුත්‍රයෝය, ගිද්දෙල්ගේ
පුත්‍රයෝය; ෂෙපටියාගේ පුත්‍රයෝය, 57

හට්ටීල්ගේ පුත්‍රයෝය, පොකෙරෙත්-
හශ්ශෙබායිම්ගේ පුත්‍රයෝය, ආමීගේ
58 පුත්‍රයෝය. නෙතිනීම්වරුද සාලමොන්ගේ
සේවකයන්ගේ පුත්‍රයෝද යන සියල්ලෝ
59 තුන්සිය අනූ දෙදෙනෙක්ය. තේල්-මෙලා,
තේල්-හර්ෂා, කෙරුබ්, අද්දන්, ඉම්මේර්
යන ස්ථානවල සිට ආවාවූ, තමුන්
ඉශ්‍රායෙල්වරුන් බවට තමුන්ගේ පිය
පෙළපතත් තමුන්ගේ වංශයත් පෙන්-
60 වන්ට බැරිවුණාවූ අය නම්: දෙලායාගේ
පුත්‍රයෝද ටෝබියාගේ පුත්‍රයෝද
නෙකෝදගේ පුත්‍රයෝද යන මොව්හු
61 හයසිය පනස් දෙදෙනෙක්ය. පූජකයන්ගේ
පුත්‍රයන්ගෙන් හබායාගේ පුත්‍රයොත්
හක්කොශ්ගේ පුත්‍රයොත් ගිලියදිය
බර්සිල්ලයිගේ දූවරුන්ගෙන් භාර්යාවකු
පාවගෙන ඔවුන්ගේ නාමය ලැබූ
62 බර්සිල්ලයිගේ පුත්‍රයොත්ය. මොව්හු
පෙළපත් වශයෙන් ගණන් ගන්නාලද
ලේඛනයෙහි තමුන්ගේ නම් සෙවූ නුමුත්
සම්බනුණ බැවින් අපවිත්‍රයයි සලකනු
ලැබ, පූජක තනතුරෙන් අහක්කරනු
63 ලැබුවෝය. *ඌරීම් සහ තුම්මීම් දරන
පූජකයෙක් නැගිටින තුරු අති ශුද්ධ
දේවලින් නොකන හැටියට †තිර්ෂාතා
64 තෙමේ ඔවුන්ට කීවේය. මුළු සභාවේ
ගණන වනාහි හතළිස් දෙදස් තුන්සිය
65 හැටක්ය. ඒ හැර ඔවුන්ගේ වැඩකාරයොත්
වැඩකාරියොත් හත්දස් තුන්සිය තිස්හත්
දෙනෙක් සිටියෝය. ඔවුන් අතරේ ගී
කියන මිනිස්සුත් ගී කියන ස්ත්‍රීහුත්
66 දෙසියයක් සිටියෝය. ඔවුන්ගේ අශ්වයෝ
හත්සිය තිස් හදෙනෙක්ය; ඔවුන්ගේ අශ්ව-
තරයෝ දෙසිය හතළිස් පස්දෙනෙක්ය;
67 ඔවුන්ගේ ඔටුවෝ හාරසිය තිස්පස්
දෙනෙක්ය; කොටළුවෝ හදස් හත්සිය
68 විසි දෙනෙක්ය. තවද පියවංශවල
ප්‍රධානීන්ගෙන් සමහරු යෙරුසලමෙහි
තිබෙන ස්වාමීන්වහන්සේගේ ගෘහයට
පැමිණි කල්හි දෙවියන්වහන්සේගේ
ගෘහය ස්වකීය ස්ථානයෙහි ගොඩනගන
පිණිස සිය කැමැත්තෙන් දුන් පඬුරු
69 ඔප්පුකළෝය. ඔව්හු තමුන්ගේ පුළුවන්කමේ

*හෙවත්, ආලෝකයද සැබෑකමද ප්‍රකාශකරන ඒවා.
†එනම්, ආණ්ඩුකාරයා.

හැටියට රන් *දරික් මිල සැට එක්
දහසක්ද රිදී රාත්තල් පන්දහසක්ද පූජක
වස්ත්‍ර සියයක්ද කර්මාන්ත ගබඩාවට
දුන්නෝය. මෙසේ පූජකයෝද ලෙවීවරුද 70
සෙනඟගෙන් සමහරුද ගීතිකාකාරයෝද
දොරටුපාලයෝද නෙතිනීම්වරුද ස්වකීය
නුවරවල විසුවෝය, සියලු ඉශ්‍රායෙල්වරුද
ස්වකීය නුවරවල විසූහ.

## පූජාසන ආදිය පිහිටුවීම. දේවමාලිගාවේ අත්තිවාරම් තැබීම

3 හත්වෙනි මාසය පැමිණ ඉශ්‍රායෙල්
පුත්‍රයන් තමුන්ගේ නුවරවල සිටින
අතර සෙනඟ එක් කෙනෙකු මෙන්
යෙරුසලමට රැස්වූවෝය. එකල යෝශා- 2
දක්ගේ පුත්‍රවූ යේෂුවාද පූජකයෝවූ ඔහුගේ
සහෝදරයෝද ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ
සෙරුබ්බාබෙල්ද ඔහුගේ සහෝදරයෝද
නැගිට දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ
මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ලියා තිබෙන
ලෙස දවන පූජා ඔප්පුකරන පිණිස
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්වහන්සේගේ
පූජාසනය ගොඩනැගුවෝය. ඔව්හු 3
පූජාසනය ඊට නියම ස්ථානයෙහි
පිහිටෙවුවෝය; මක්නිසාද ඔව්හු ඒ
රටවල සිටි ජනයන් ගැන භයපත්ව
සිටියෝය. ඔව්හු ස්වාමීන්වහන්සේට
දවන පූජා එනම් උදය සවස පූජා ඒ 4
පූජාසනය පිට ඔප්පුකළෝය. ලියා
තිබෙන ලෙස කූඩාරම් මංගල්‍යය
පවත්වමින් එක එක දවසේ නියමයේ
හැටියට ගණන වශයෙන් දවස්පතා දවන
පූජා ඔප්පුකළෝය. ඉන්පසු ඔව්හු 5
නිරන්තර දවන පූජාද අමාවක්වලත්
ස්වාමීන්වහන්සේගේ සියලු නියම ශුද්ධ
මංගල්‍යවලත් පූජාද ස්වාමීන්වහන්සේට
කැමැත්තෙන්ම ඔප්පුකරන සියල්ලන්-
ගෙන් ස්වේච්ඡා පූජාද ඔප්පුකළෝය.
ඔව්හු හත්වෙනි මාසයේ පළමුවෙනිද 6
පටන් ස්වාමීන්වහන්සේට දවන පූජා
ඔප්පුකරන්ට පටන්ගත්තෝය. නුමුත්

*දරික් එකක් සිලිම් විසිදෙකයි.

ස්වාමීන්වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම ඒ වන තෙක් නොදමනලද්දේය.
7 තවද ඔව්හු ගල් වඩුවන්ටත් වඩුවන්ටත්
මුදල්ද පාර්සියාවේ රජවූ කෝරෙෂ්ගෙන්
තමුන්ට ලැබුණු අවසරයේ හැටියට
ලෙබනොන්හි සිට මුහුදෙන් යොප්පාවට
කිහිරි ගස් ගෙනෙන පිණිස ශීදෙන්
වැසියන්ටත් තීර් වැසියන්ටත් කෑම බීම
හා තෙල්ද දුන්නෝය.
8 මෙසේ යෙරුසලමෙහි තිබෙන
දෙවියන්වහන්සේගේ ගෘහය වෙතට
ඔවුන්ගේ පැමිණීමේ දෙවෙනි අවුරුද්දේ
දෙවෙනි මාසයේදී ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ
සෙරුබ්බාබෙල්ද යෝශාදාක්ගේ පුත්‍රවූ
යේෂුවාද ඔවුන්ගේ අනික් සහෝදරයෝවූ
පූජකයෝද ලෙවීවරුද වාල්කමෙන් මිදී
යෙරුසලමට ආ සියල්ලෝද පටන්ගෙන
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ වැඩ
බලාගැනීමට විසි අවුරුදු වයසේ පටන්
ඉන් ඉහළට වයස් ඇති ලෙවීවරුන්
9 නියමකළෝය. එවිට යේෂුවා සහ ඔහුගේ
පුත්‍රයෝද සහෝදරයෝද කද්මීයෙල් සහ
ඔහුගේ පුත්‍රයෝවූ යූදාගේ පුත්‍රයෝ සහ
හෙනාදද්ගේ පුත්‍රයෝද ඔවුන්ගේ පුත්‍රයෝද
සහෝදරයෝද යන ලෙවීවරු දෙවියන්-
වහන්සේගේ ගෘහයේ වැඩකරන්නන්
බලාගැනීමට එක්කෙනෙකු මෙන්
10 සිටියෝය. ගොඩනගන්නෝ ස්වාමීන්-
වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම
දමන කල ඉශ්‍රායෙල්හි රජවූ දාවිත්ගේ
පිළිවෙළේ හැටියට ස්වාමීන්වහන්සේට
ප්‍රශංසාකරන පිණිස පූජකයෝ ස්වකීය
ඇඳුමෙන් සැරසී හොරණෑ ඇතුවද
ආසාප්ගේ පුත්‍රයෝ වන ලෙවීවරු අත්තල්
11 ඇතුවද සිටගත්තෝය. ඔව්හු ස්වාමීන්-
වහන්සේට ස්තුති ප්‍රශංසාකරමින්:
උන්වහන්සේ යහපත්ය, මක්නිසාද
ඉශ්‍රායෙල් කෙරෙහි උන්වහන්සේගේ
කරුණාව සදාකල්ම පවත්නේය කියා
ඔවුනොවුන් ගී කීවෝය. ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ අත්තිවාරම දමන
නිසා ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකළ
විට මුළු සෙනඟ මහත් ඝෝෂාවකින්
12 ඝෝෂාකළෝය. නුමුත් පළමු ගෘහය දුටු
මහලුවූ බොහෝ පූජකයෝද ලෙවීවරුද
පියවංශවල ප්‍රධානියෝද ඔවුන්ගේ ඇස්
ඉදිරියෙහි මේ ගෘහයේ අත්තිවාරම දමන
විට මහත් හඬකින් ඇඬුවෝය; බොහෝ
දෙනෙක්ද ප්‍රීති-ඝෝෂා පැවැත්තුවෝය.
මෙසේ ප්‍රීති-ඝෝෂාවේ ශබ්දය මේකය, 13
සෙනඟගේ ඇඬීමේ ශබ්දය මේකයයි
සෙනඟට වෙන් වෙන් වශයෙන් දැනගත
නොහැකිවිය. මක්නිසාද සෙනඟ මහත්
ඝෝෂාවකින් ඝෝෂාකළෝය, ඒ ශබ්දය
බොහෝ දුරට ඇසුණේය.

## සමාරියයන්ගේ විරුද්ධවීම

4 වහල්කමෙන් මිදී ආ තැනැත්තන්
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට මාලිගාවක් ගොඩනගන බව
යූදාවරුන්ගේද බෙන්යමින්වරුන්ගේද
එදිරිකාරයෝ අසා, සෙරුබ්බාබෙල්ද 2
පියවංශවල ප්‍රධානීන්ද ළඟට ඇවිත්
ඔවුන්ට කථාකොට: නුඹලා හා සමග
මාලිගාව ගොඩනගන්ට අපට ඉඩදියල්ලා.
මක්නිසාද නුඹලා සේම අපිත් නුඹලාගේ
දෙවියන්වහන්සේ අදහමුව; මෙතැනට
අප ගෙනාවාවූ අෂූර්හි රජවූ ඒසර්-
හද්දෝන්ගේ කාලයේ පටන් අපි
උන්වහන්සේට පූජාකරන්නෝව සිටිමු-
යයි කීවෝය. නුමුත් සෙරුබ්බාබෙල්ද 3
යේෂුවාද ඉශ්‍රායෙල් පියවංශවල අනික්
ප්‍රධානියෝද ඔවුන්ට කථාකොට: අපේ
දෙවියන්වහන්සේට ගෘහයක් ගොඩ-
නැඟීමේදී නුඹලා අප සමග එක්වීමට
කිසි කරුණක් නැත. පාර්සියාවේ
කෝරෙෂ් රජ්ජුරුවන් අපට අණකර
තිබෙන හැටියට අපි පමණක්ම
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
එය ගොඩනගන්නෙමුයයි කීවෝය. එවිට 4
දේශයේ සෙනඟ යූදා සෙනඟගේ අත්
දුර්වලකර, ගොඩනැඟීමේදී ඔවුන් කලඹා,
පාර්සියාවේ රජවූ කෝරෙෂ්ගේ කාලය 5
මුළුල්ලේ, එනම් පාර්සියාවේ රජවූ දාරියුෂ්
රජකමට පැමිණෙන තුරුම, ඔවුන්ගේ
අභිප්‍රාය නිෂ්ප්‍රභාකරන පිණිස ඔවුන්ට
විරුද්ධව මන්ත්‍රීන් කුලියට ගත්තෝය.
අහෂ්වේරොෂ් රජවුණු විට, ඔහුගේ 6

රජකම්කිරීමේ පටන්ගැන්මේදී, ඔව්හු
යුදහිද යෙරුසලමේද වැසියන්ට විරුද්ධව
දෙස් පැවරූ ලියුමක් ලියා හැරියෝය.
7 තවද අර්තක්ෂස්තාගේ දවස්වලදී
බිෂ්ලාම්ද මිත්‍රෙදත්ද මාබෙයෙල්ද ඔහුගේ
අනික් සහකාරයෝද පාර්සියාවේ රජවූ
අර්තක්ෂස්තාට ලියුමක් ලියා ඇරියෝය;
ඒ ලියුම අරාම් අකුරුවලින්ද අරාම්
8 භාෂාවෙන්ද ලියනලද්දේය. ආණ්ඩුකාරයාවූ
රෙහූම්ද ලේකම්වූ ෂිම්ෂයිද යෙරුසලමට
විරුද්ධව අර්තක්ෂස්තා රජුට ලියුමක්
9 මේ ආකාරයෙන් ලියා ඇරියෝය. එවිට
ආණ්ඩුකාරයාවූ රෙහූම්ද ලේකමවූ
ෂිම්ෂයිද ඔවුන්ගේ අනික් සහකාරයෝ
වන දිනාවරුද අපර්සත්කාවරුද
ටර්පෙලාවරුද අපාර්සාවරුද අර්ක්වාවරුද
බබිලෝනිවරුද ෂූෂන්කාවරුද දේහාවරුද
10 ඒලාම්වරුද, උතුම්වූ ගරුතරවූ ඔස්නප්පර්
විසින් ගෙනවුත් සමාරියේ නුවරවල
පදිංචිකෙරෙවූ අනික් ජාතීහුද ගංගාවෙන්
මෙගොඩ සිටින අනික් තැනැත්තෝද
11 වන ඔව්හු මේ ආදිය ලිව්වෝය. ඔවුන්
අර්තක්ෂස්තා රජු වෙතට ලියා ඇරිය
ලියුමේ පිටපත මේය: ගඟ මෙගොඩ
සිටින මනුෂ්‍යයන් ආදිවූ ඔබගේ දාසයන්
12 විසින් ලියා එවන වග නම්–ඔබ වෙතින්
අප ළඟට ආ යුදෙව්වන් යෙරුසලමට
පැමිණ ඒ කැරළිකාර නපුරු නුවර
ගොඩනගන බවත් පවුරු තීන්දුකර
අත්තිවාරම අලුත්වැඩියාකරන බවත්
13 රජතුමා දැනගනීවා. ඉතින් මේ නුවර
ගොඩනගා පවුරු තීන්දුකළොත් මොවුන්
තීරුවවත් ආදායමවත් සුංගමවත්
නොදෙන බවත් මෙසේ අන්තිමේදී රජුන්ට
එයින් අලාභ සිද්ධවෙන බවත් රජතුමා
14 දැනගනීවා. ඉතින් අප මාලිගාවේ ලුණු
කමින් සිටියදී රජ්ජුරුවන්ට අලාභ
පැමිණෙනවා බලාඉඳීම අපට නුසුදුසු
බැවින් ඔබගේ පියවරුන්ගේ ලේකම්
පොත විභාගකරන පිණිස රජ්ජුරුවන්ට
15 දන්වා එවීමුව. මෙසේ ඔබ ලේකම්
පොතෙහි සොයා බැලුවොත් මේ නුවර
කැරළිකාරවූ, රජවරුන්ටත් රටවලටත්
අලාභකරන්නාවූ නුවරක් බවත්, පුරාණ
කාලයේ පටන් එහි ද්‍රෝහිකම්
උපදවනලද බවත්, එම කාරණය නිසා
ඒ නුවර නාස්තිකරන ලද බවත් ඔබට
දැනගන්ට ලැබෙනවා ඇත. මේ නුවර 16
ගොඩනගා පවුරු සාදා නිමකළොත් ගඟ
මෙගොඩ ඔබට කිසි කොටසක් ඉතුරු
නොවෙන බව අපි රජ්ජුරුවන්ට දන්වා
සිටිමුව යනුය. එවිට රජ්ජුරුවෝ රෙහූම් 17
ආණ්ඩුකාරයාටත් ෂිම්ෂයි ලේකමටත්
සමාරියේ වාසයකළ ඔවුන්ගේ අනික්
සහකාරයන්ටත් ගඟ එගොඩ සිටින අනික්
තැනැත්තන්ටත් උත්තරයක් වශයෙන්
ලියා ඇරියේ මෙසේය: සමාදානය වේවා
යනාදියෙන් ලියා එවන වගනම්–නුඹලා 18
අපට එවූ ලියුම මා ඉදිරියෙහි පැහැදිලි-
ලෙස කියවනලද්දේය; මා විසින් 19
අණදෙන ලදුව විභාගයක්ද කරන-
ලද්දේය. එවිට ඒ නුවර පුරාණ කාලයේ
විරුද්ධකම්කළ බවත් එහි කැරළිද
ද්‍රෝහිකම්ද සිදුවූ බවත්, ගඟ එගොඩ 20
තිබෙන මුළු රට ආණ්ඩුකළ බලවත්
රජුන් යෙරුසලමෙහි සිටි බවත් තීරුවද
ආදායමද සුංගමද ඔවුන්ට දෙනලද බවත්
දැනගන්ට ලැබුණේය. එබැවින් මා විසින් 21
නියෝගයක් කරන තුරු ඒ නුවර ගොඩ
නොනගන පිණිස ඒ මනුෂ්‍යයන්
නවත්වන හැටියට නියෝගයක්
කරපල්ලා. අප්‍රමාදව මේක කරන ලෙස 22
බලාගනිල්ලා. රජවරුන්ට අලාභ
පැමිණෙන හැටියට අනතුරු වැඩිවෙන්ට
ඉඩදෙන්නේ මක්නිසාද යනුය. අර්- 23
තක්ෂස්තා රජුගේ ලියුමේ පිටපත රෙහූම්ද
ෂිම්ෂයි ලේකමද ඔවුන්ගේ සහකාරයන්ද
ඉදිරියෙහි කියෙවූ හැටියේම ඔව්හු
යෙරුසලමෙහි සිටි යුදෙව්වරුන් ළඟට
ඉක්මනින් ගොස් බලාත්කාරයෙන් හා
බලයෙන් ඔවුන් නැවැත්තුවෝය. එකල 24
යෙරුසලමෙහි තිබෙන දෙවියන්-
වහන්සේගේ ගෘහයේ වැඩ නැවතුණේය;
පාර්සියාවේ රජවූ දාරියුෂ්ගේ රජ-
කම්කිරීමේ දෙවෙනි අවුරුද්ද දක්වා එය
නැවතී තිබුණේය.

## අනාගතවක්තෘවරුන්ගෙන් ධෛර්ය ලැබීම. දරියුෂ් රජු වෙත ඉල්ලුම්කිරීම

5 එකල අනාගතවක්තෘවූ හග්ගයිද
ඉද්දෝගේ පුත්‍රවූ සෙකරියාද යන
අනාගතවක්තෘවරු යූදහිද යෙරුසලමෙහිද
සිටි යුදෙව්වරුන්ට අනාගතවාක්‍ය
කීවෝය. ඔව්හු ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවියන්වහන්සේගේ නාමයෙන් ඔවුන්ට
2 අනාගතවාක්‍ය පැවසුවෝය. එවිට
ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ සෙරුබ්බාබෙල්ද
යෝශාදක්ගේ පුත්‍රවූ යේෂුවාද නැගිට
යෙරුසලමෙහි තිබෙන දෙවියන්වහන්සේගේ
ගෘහය ගොඩනගන්ට පටන්ගත්තෝය;
ඔවුන් සමග දෙවියන්වහන්සේගේ
අනාගතවක්තෘවරුද ඔවුන්ට උපකාර-
3 කරමින් සිටියෝය. ඒ කාලයේදී ගඟ
මෙගොඩ සිටි තත්තෙනයි නම්
දිශාධිපතියාද ෂෙතර්-බෝසෙනයිද
ඔවුන්ගේ සහකාරයෝද ඔවුන් ළඟට
ඇවිත් කථාකොට: මේ ගෘහය ගොඩ-
නගන්ටත් මේ පවුර නිමකරන්ටත්
තුඹලාට නියෝගයක් කළේ කවුදැයි
4 ඔවුන්ගෙන් ඇසුවෝය. එවිට ඔව්හු
ඔවුන්ට මෙයාකාරයෙන් කථාකොට:
මේ ස්ථානය ගොඩනගන මනුෂ්‍යයන්ගේ
5 නම් මොනවාදැයි ඇසුවෝය. නුමුත්
යුදෙව්වරුන්ගේ දෙවියන්වහන්සේගේ ඇස
ඔවුන්ගේ වැඩිමහල්ලන් කෙරෙහි වූ
හෙයින් ඒ කාරණය දරියුෂ් වෙතට
පැමිණ පසුව ඒ ගැන උත්තරයක් ලියා
එවනතුරු ඔව්හු ඔවුන් නොනැවැත්තුවෝය.
6 ගඟ මෙගොඩ සිටි දිශාධිපති තැනවූ
තත්තෙනයිද ෂෙතර්-බෝසෙනයිද ගඟ
මෙගොඩ සිටි අපර්සෙකාවරුන්වූ ඔහුගේ
සහකාරයන්ද විසින් දරියුෂ් රජුට යැවූ
7 ලියුමේ පිටපතය. මෙයාකාර ලියා තිබුණ
පත්‍රයක් ඔව්හු ඔහුට ඇරියෝය. එනම්–
දරියුෂ් රජ්ජුරුවන්ට සියලු ආකාරයෙන්
8 සමාදනය වේවා. රජ්ජුරුවන් වෙත දන්වා
එවන වගනම්: අපි යූද රටේ තිබෙන
උතුම්වූ දෙවියන්වහන්සේගේ ගෘහයට
ගියෙමුව, ඒක ලොකු ගල්වලින්
ගොඩනගාගන යති, භිත්ති පිට ලී
තබා තිබේ, මේ වැඩේ ඉක්මනින් කෙරී
ඔවුන් අතේ දියුණුවෙයි. අපිද එහි 9
වැඩිමහල්ලන්ගෙන් විභාගකර: මේ
ගෘහය ගොඩනගන්ටත් මේ පවුර
නිමකරන්ටත් තුඹලාට නියෝගයක්
කළේ කවුදැයි ඔවුන්ගෙන් ඇසුවෙමුව.
ඔවුන්ට ප්‍රධානව සිටින මනුෂ්‍යයන්ගේ 10
නම් ලියාගන ඔබට දන්වන පිණිස
ඔවුන්ගේ නාම මොනවාද කියා ඔවුන්-
ගෙන් ඇසීමුව. ඔව්හු උත්තරදෙමින්: 11
අපි ස්වර්ගයෙත් පොළොවෙත් දෙවියන්-
වහන්සේගේ මෙහෙකරුවෝ වම්හ. මීට
බොහෝ අවුරුදු ගණනකට ප්‍රථම
ගොඩනගනලද්දවූ, ඉශ්‍රායෙල්හි මහත්
රජෙකු විසින් ගොඩනගා නිමකරන-
ලද්දවූ ගෘහය අපි නැවත ගොඩනගමුව.
නුමුත් අපේ පියවරුන් විසින් ස්වර්ගයේ 12
දෙවියන්වහන්සේ උදහස්කෙරෙවූ බැවින්
උන්වහන්සේ කල්දියවූ බබිලෝනියේ
රජවූ නෙබුකද්නෙශර් අතට ඔවුන්
පාවාදුන්සේක; ඔහුද මේ ගෘහය විනාශ-
කොට සෙනඟ බබිලෝනියට ගෙන-
ගියේය. එහෙත් බබිලෝනියේ රජවූ 13
කෝරෙෂ්ගේ පළමුවෙනි අවුරුද්දේදී
දෙවියන්වහන්සේගේ මේ ගෘහය ගොඩ-
නගන්ට කෝරෙෂ් රජ නියෝගයක්
කෙළේය. තවද නෙබුකද්නෙශර් 14
යෙරුසලමෙහි තිබුණු මාලිගාවෙන්
ගෙනගොස් බබිලෝනියේ දේවාලයේ
තැබූ දෙවියන්වහන්සේගේ ගෘහයේ රන්
රිදී භාණ්ඩ කෝරෙෂ් රජු බබිලෝනියේ
දේවාලයෙන් රැගෙන තමා විසින්
දිශාධිපතියා කළාවූ ෂෙෂ්බශර් යන
නාමය ඇති තැනැත්තාට භාරදී ඔහුට
කථාකොට: මේ බඩු ගෙන ගොස් 15
යෙරුසලමෙහි තිබෙන මාලිගාවෙහි
තබාපන්න, දෙවියන්වහන්සේගේ ගෘහයද
ස්වකීය ස්ථානයෙහි ගොඩනගනු
ලබාවයි කීවේය. එවිට එම ෂෙෂ්බශර් 16
ඇවිත් යෙරුසලමෙහි තිබෙන දෙවියන්-
වහන්සේගේ ගෘහයේ අත්තිවාරම
තැබුවේය. එතැන් පටන් මේ දක්වා එය

ගොඩනගන නුමුත් තවම තීන්දු නොවී-
17 යයි අපට කීවෝය. ඒ නිසා රජ්ජුරුවන්ට
යහපත්ව පෙනේ නම් යෙරුසලමෙහි
දෙවියන්වහන්සේගේ මේ ගෘහය
ගොඩනගන්ට කෝරෙෂ් රජු විසින්
නියෝගයක් කරනලදදැයි බබිලෝනියේ
තිබෙන රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයෙහි
සොයා බලවා මේ කාරණය ගැන
රජ්ජුරුවන්ගේ කැමැත්ත අපට දන්වා
එවුව මැනව කියාය.

## ගොඩනැගීමට අවසර ලැබීම. වැඩ තීන්දුකිරීම

6 එකල දරියුෂ් රජු කළ නියෝගයක්
පිට බබිලෝනියෙහි වස්තු නිධාන-
කරනලද පොත්-ගබඩාවෙහි සොයා
2 බලනලද්දේය. එවිට මෙයාකාර
සටහනක් ලියා තිබෙන පොතක්
මේදියා දනව්වේ තිබෙන අක්මෙතා
3 බලකොටුවෙහි තිබී සම්බවිය. කෝරෙෂ්
රජුගේ පළමුවෙනි අවුරුද්දේදී කෝරෙෂ්
රජ යෙරුසලමෙහි තිබෙන දෙවියන්-
වහන්සේගේ ගෘහය ගැන නියෝගයක්
කෙළේය. ඒ මෙසේය: ඒ ගෘහය පූජා
ඔප්පු කරන ස්ථානයක් කොට
ගොඩනගනු ලැබේවා, ඒකේ අත්තිවාරම්
සවිකොට පිහිටුවනු ලැබේවා; හැට
රියනක් උසටද හැට රියනක් පළලටද,
4 මහත් ගල් පේළි තුනක් සහ අලුත් ලී
පේළියකුත් ඇතුව එය සාදනු ලැබේවා.
වියදමද රජ ගෙයින් දෙනු ලැබේවා.
5 තවද නෙබුකද්නෙසර් විසින්
යෙරුසලමෙහි තිබෙන මාලිගාවෙන්
රැගෙන බබිලෝනියට ගෙනෙනලද
දෙවියන්වහන්සේගේ ගෘහයේ රන් රිදී
භාණ්ඩ ආපසු දෙනු ලැබ යෙරුසලමෙහි
තිබෙන මාලිගාවේ නියම තැන්වල
තිබීමට ගෙනයනු ලබාවා, ඒවා
දෙවියන්වහන්සේගේ ගෘහයෙහි තුඹ
6 විසින් තැබිය යුතුය යනුය. ඒ නිසා ගඟ
එගොඩ සිටින දිශාධිපති තැන වන
තත්තෙනයිද ෂෙතර්-බෝසෙනයිද ගඟ
එගොඩ සිටින අපර්සෙකාවරු වන
තුඹලාගේ සහකාරයෝද යන තුඹලා
එතැනින් ඈත්ව සිටපල්ලා. දෙවියන්- 7
වහන්සේගේ මේ ගෘහයේ වැඩ කෙරීගන
ගියාවේ. යුදෙව්වරුන්ගේ දිශාධිපතියාද
යුදෙව්වරුන්ගේ වැඩිමහල්ලෝද දෙවියන්-
වහන්සේගේ මේ ගෘහය ස්වකීය
ස්ථානයෙහි ගොඩනගත්වා. ඇරත් 8
දෙවියන්වහන්සේගේ මේ ගෘහයේ
ගොඩනැගීම පිණිස තුඹලා විසින්
යුදෙව්වරුන්ගේ ඒ වැඩිමහල්ලන්ට
කළයුතු දේ කිමෙක්දැයි නියෝගයක්
කරමි: එනම් ඒ මනුෂ්‍යයන්ට අවහිරයක්
නොවන පිණිස රාජසන්තක දෙයින්
එනම් ගඟ එගොඩින් ලැබෙන ආදායමෙන්
ඉක්මනින් ඔවුන්ට වියදම දෙන ලෙසය.
ඔවුන් ස්වර්ගයේ දෙවියන්වහන්සේට 9
මිහිරි සුවඳ ඔප්පු කර රජුගේද ඔහුගේ
පුත්‍රයන්ගේද ජීවිත ශුභසිද්ධිය උදෙසා
යාච්ඤාකරන පිණිස, ඔවුන්ට ඕනෑකරන 10
දේ එනම් යෙරුසලමෙහි සිටින
පූජකයන්ගේ නියමය ප්‍රකාර ස්වර්ගයේ
දෙවියන්වහන්සේට දවන පූජා ඔප්පු-
කිරීමට ගොන්නාම්බන්ද බැටළුවන්ද
බැටළුපැටවුන්ද තිරිඟුද ලුණුද මුද්‍රික-
පානයද තෙල්ද දවස්පතා නොවරදවා
ඔවුන්ට දෙනු ලැබේවා. තවද යමෙක් 11
මේ ආඥාව කඩකළොත් ඔහුගේ ගෙයින්
බාල්කයක් උදුරා තබා ඔහු උස්සා එහි
ගසා තබන හැටියටත් ඔහුගේ ගෙයද
මේ නිසා කසළ ගොඩක් කරනු ලබන
හැටියටත් නියෝගයක් කරමි. මේක 12
වෙනස්කර යෙරුසලමෙහි තිබෙන
දෙවියන්වහන්සේගේ මේ ගෘහය
විනාශකරන්ට තමුන්ගේ අත දිගුකරන
සියලු රජුන්ද ජාතීන්ද ස්වකීය නාමය
එහි පිහිටෙවුවාවූ දෙවියන්වහන්සේ
විනාශකරනසේක්වා. දරියුෂ් නම් මම
නියෝගයක් කෙළෙමි; එය ඉක්මනින්
ඉෂ්ටකරනු ලැබේවා යනුයි.
එවිට ගඟ මෙගොඩ සිටි දිශාධිපති- 13
තැනවූ තත්තෙනයිද ෂෙතර්-බෝසෙනයිද
ඔවුන්ගේ සහකාරයෝද දරියුෂ් රජු විසින්
ආඥාව එවූ බැවින් ඉක්මනින් ඒ හැටියට
කළෝය. යුදෙව්වරුන්ගේ වැඩිමහල්ලෝද 14

අනාගතවක්තෘවූ හග්ගයිගෙත් ඉද්දෝගේ
පුත්‍රවූ ශෙකරියාගෙත් අනාගතවාක්‍ය
හේතුකොටගෙන ගොඩනගා සඵලවූ-
වෝය. ඔව්හු ඉශ්‍රායෙල්හි දෙවියන්-
වහන්සේගේ ආඥාවේ හැටියටත්
කෝරෙෂ්ගේද දරියුෂ්ගේද පාර්සියාවේ
රජවූ අර්තක්ෂස්තාගේද නියෝගයේ
හැටියටත් ගොඩනගා නිමකළෝය.
15 දරියුෂ් රජුගේ රජකම්කිරීමේ හවෙනි
අවුරුද්දේ අදර් මාසයේ තුන්වෙනි දින
16 මේ ගෘහය නිමකරන ලද්දේය. ඉශ්‍රායෙල්
පුත්‍රයෝද පූජකයෝද ලෙවීවරුද වාල්-
කමෙන් මිදී ආවාවූ අනික් අයද
දෙවියන්වහන්සේගේ ගෘහයේ කැපකිරීමේ
කෘත්‍යය ප්‍රීතියෙන් පැවැත්තුවෝය.
17 තවද ඔව්හු දෙවියන්වහන්සේගේ මේ
ගෘහය කැපකිරීමේදී ගොනුන් සියයක්ද
බැටළුවන් දෙසියයක්ද බැටළුපැටවුන්
හාරසියයක්ද ඉශ්‍රායෙල්හි ගෝත්‍රවල
ගණන ලෙස සියලූ ඉශ්‍රායෙල්වරුන්
උදෙසා පාප පූජාවක් කොට එළුවන්
දොළොස් දෙනෙක්ද ඔප්පුකළෝය.
18 මෝසෙස්ගේ පොතේ ලියා තිබෙන
ප්‍රකාරයට ඔව්හු පූජකයන් ඔවුන්ගේ
කොට්ඨාසවල හැටියටත් ලෙවීවරුන්
ඔවුන්ගේ පන්තිවල හැටියටත්
යෙරුසලමෙහි දෙවියන්වහන්සේගේ
මෙහෙය පිණිස පත්කළෝය.
19 වහල්කමෙන් මිදී ආ තැනැත්තෝ
පළමුවෙනි මාසයේ දහහතරවෙනි
20 දින පාස්කුව පැවැත්තුහ. මක්නිසාද
පූජකයෝද ලෙවීවරුද එක්කෙනෙකු
මෙන් පිරිසිදුවී සිටියෝය; ඔවුන්
සියල්ලෝ පිරිසිදුව සිට, වාල්කමෙන්
මිදී ආ සියල්ලන් උදෙසාද පූජකයන්වූ
තමුන්ගේ සහෝදරයන් උදෙසාද තමුන්ම
උදෙසාද පාස්කු බැටළුපැටවුන්
21 මැරුවෝය. එසේ වාල්කමෙන් හැරී ආ
ඉශ්‍රායෙල් පුත්‍රයෝත් ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** සොයන්ට
දේශයේ ජාතීන්ගේ අපිරිසිදුකමෙන්
වෙන්වී ඔවුන්ට එකතුවුණ සියල්ලොත්
22 පාස්කුව වළඳ, මුහුන් නොදැමූ රොටි
මංගල්‍යය සත් දවසක් ප්‍රීතියෙන් පැවැත්-
තුවෝය. මක්නිසාද දෙවියන්වහන්සේගේ
එනම් ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේගේ
ගෘහයේ වැඩට ඔවුන්ගේ අත් සවිකරන
හැටියට අෂූර්හි රජුගේ සිත ඔවුන් වෙතට
හැරවීමෙන් **ස්වාමීන්වහන්සේ** ඔවුන්
ප්‍රීතිකෙරෙවුසේක.

## එස්රා යෙරුසලමට ගමන්ගැනීම

7 මේ කාරණාවලට පසු පාර්සියාවේ
අර්තක්ෂස්තාගේ රජකම්කිරීමේදී
එස්රා බබිලෝනියෙන් ගියේය. එස්රා
සොරායාගේ පුත්‍රයාය, ඔහු අසරියාගේ
පුත්‍රයාය, ඔහු හිල්කියාගේ පුත්‍රයාය, ඔහු
ෂල්ලුම්ගේ පුත්‍රයාය, ඔහු ශාදෙක්ගේ 2
පුත්‍රයාය, ඔහු අහිටූබ්ගේ පුත්‍රයාය, ඔහු 3
අමරියාගේ පුත්‍රයාය, ඔහු අසරියාගේ
පුත්‍රයාය, ඔහු මෙරායොත්ගේ පුත්‍රයාය,
ඔහු සෙරහියාගේ පුත්‍රයාය, ඔහු උස්සීගේ 4
පුත්‍රයාය, ඔහු බුක්කීගේ පුත්‍රයාය, ඔහු 5
අබිෂූවාගේ පුත්‍රයාය, ඔහු පීනෙහාස්ගේ
පුත්‍රයාය, ඔහු එලෙයාසර්ගේ පුත්‍රයාය,
ඔහු උත්තම පූජකයාවූ ආරොන්ගේ
පුත්‍රයාය. මේ එස්රා ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 6
**ස්වාමීන්වහන්සේ** විසින් දුන් මෝසෙස්ගේ
ව්‍යවස්ථාව ගැන සමර්ථ ලියන්නෙක්ය.
ඔහු කෙරෙහි තිබුණු ඔහුගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** හස්තය ප්‍රකාරයට
ඔහු ඉල්ලූ සියල්ල රජ්ජුරුවෝ ඔහුට
දුන්නාහ. තවද අර්තක්ෂස්තා රජුගේ 7
සත්වෙනි අවුරුද්දේදී ඉශ්‍රායෙල් පුත්‍රයන්-
ගෙන්ද පූජකයන්ගෙන්ද ලෙවීවරුන්-
ගෙන්ද ගායනාකාරයන්ගෙන්ද දොරටු-
පාලයන්ගෙන්ද නෙතිනීම්වරුන්ගෙන්ද
සමහරුන් යෙරුසලමට ආවෝය. ඔහු 8
රජුගේ සත්වෙනි අවුරුද්දේ පස්වෙනි
මාසයේදී යෙරුසලමට ආයේය. මක්- 9
නිසාද ඔහු පළමුවෙනි මාසයේ පළමු-
වෙනිද බබිලෝනියෙන් පිටත්ව, ඔහු
කෙරෙහි තිබුණු ඔහුගේ දෙවියන්-
වහන්සේගේ යහපත් හස්තය ප්‍රකාරයට
පස්වෙනි මාසයේ පළමුවෙනිද යෙරුසලමට
පැමුණුණේය. එස්රා **ස්වාමීන්වහන්සේගේ** 10
ව්‍යවස්ථාව සොයන්ටත් පවත්වන්ටත්
ඉශ්‍රායෙල්හි පනත්ද විනිශ්චයයන්ද
උගන්වන්ටත් තමාගේ සිත යොමුකර
ගත්තේය.
**ස්වාමීන්වහන්සේගේ** ආඥාවල වචනද 11
ඉශ්‍රායෙල්ට දුන් උන්වහන්සේගේ පනත්ද
ගැන තේරුම් ඇති කෙනෙක්වූ ලියන්නා
එනම් එස්රා පූජකයාට අර්තක්ෂස්තා

රජු විසින් දෙනලද ලියුමේ පිටපත මේය:
12 රාජාධිරාජවූ අර්තක්ෂස්තා විසින්
ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්-
ථාවේ සම්පූර්ණ ලියන්නෙක්ව සිටින
පූජකවූ එස්රාට... යනාදි ලියාළුවන
13 වගනම් – මාගේ රාජ්‍යයේ සිටින
ඉශ්‍රායෙල් සෙනඟගෙන්ද ඔවුන්ගේ
පූජකයන්ගෙන්ද ලෙවීවරුන්ගෙන්ද
යෙරුසලමට යන්ට කැමති සියල්ලන්ට
නුඹ සමග යන්ට පුළුවන කියා
14 නියෝගයක් කරමි. මක්නිසාද නුඹ අතේ
තිබෙන නුඹේ දෙවියන්වහන්සේගේ
ව්‍යවස්ථාව ලෙස යූදා සහ යෙරුසලම
15 ගැන විභාග කරන පිණිසත්, රජු සහ
ඔහුගේ මන්ත්‍රීන් විසින් යෙරුසලමෙහි
වාසස්ථානය ඇති ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේට කැමැත්තෙන් පිදූ රිදීද
රන්ද මුළු බබිලෝනි රටේ නුඹට
16 ලැබෙන රන් රිදී සියල්ලද, යෙරුසලමෙහි
තිබෙන තමුන්ගේ දෙවියන්වහන්සේගේ
ගෘහය උදෙසා සෙනඟ සහ පූජකයන්
කැමැත්තෙන් දෙන පඬුරුත් සමග
ගෙනයන පිණිසත්, රජු සහ ඔහුගේ
මන්ත්‍රීන් සත්දෙනා විසින් නුඹ යවනු
17 ලබන්නෙහිය. එබැවින් නුඹ ගොනුන්ද
බැටළුවන්ද බැටළුපැටවුන්ද ඒ සමග
ඕනෑකරන ආහාර පූජා සහ පාන
පූජාද කඩිනමින් මේ මුදලෙන් ගෙන
යෙරුසලමෙහි තිබෙන නුඹලාගේ
දෙවියන්වහන්සේගේ ගෘහයේ පූජාසනය
18 පිට ඔප්පුකරපල්ලා. ඉතුරුවෙන රන්
රිදීවලින් නුඹටත් නුඹේ සහෝදරයන්ටත්
කරන්ට හොඳව පෙනෙන දෙයක්
නුඹලාගේ දෙවියන්වහන්සේගේ කැමැත්ත
19 ලෙස කරපල්ලා. තවද නුඹේ දෙවියන්-
වහන්සේගේ ගෘහයේ මෙහෙය පිණිස
නුඹට දෙන ලද භාණ්ඩ යෙරුසලමේ
දෙවියන්වහන්සේ ඉදිරියෙහි බාරදීපන්න.
20 තවත් නුඹේ දෙවියන්වහන්සේගේ ගෘහය
උදෙසා දෙන්ට නුඹට ඕනෑකරන දේවල්
රජුගේ භාණ්ඩාගාරයෙන් රැගෙන
21 දීපන්න. අර්තක්ෂස්තා රජු වන මම
ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්-
ථාවේ ලියන්නා වන පූජකවූ එස්රා
විසින් නුඹලාගෙන් ඉල්ලන සියල්ල,
22 රිදී තලෙන්ත සියයක් වූවත් තිරිඟු
*කෝර සියයක් වූවත් මුද්‍රිකපාන

*කෝර එකක් බුසල් අටයි.

*බාත් සියයක් වූවත් තෙල් බාත් සියයක්
වූවත් ලුණු කොපමණ වූවත් ඉක්මනින්
දෙන හැටියට ගඟ එගොඩ සිටින සියලු
ගබඩාකාරයන්ට නියෝගයක් කරමි.
ස්වර්ගයේ දෙවියන්වහන්සේ විසින් 23
අණකර තිබෙන සියල්ල ස්වර්ගයේ
දෙවියන්වහන්සේගේ ගෘහය උදෙසා
හරියාකාර කරනු ලැබේවා; එසේය,
රජුගෙත් ඔහුගේ පුත්‍රයන්ගෙත් රාජ්‍යය
කෙරෙහි උදහස පැමිණෙන්ට වෙන්නේ
මක්නිසාද? තවද පූජකයන්, ලෙවී- 24
වරුන්, ගායනාකාරයන්, දොරටුපාලයන්,
නෙතිනීම්වරුන් යන මොවුන් කිසි-
වෙකුගෙන්වත් දෙවියන්වහන්සේගේ මේ
ගෘහයේ මෙහෙකරුවන්ගෙන්වත් තීරුවද
ආදයම්ද සුංගම්ද අයකරන්ට නුඹලාට
බලය නැති බව දනගනිල්ලා. එස්රා, 25
නුඹ වනාහි ගඟ එගොඩ සිටින සියලු
සෙනඟ විනිශ්චයකරන පිණිස නුඹේ
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්
දන්නාවූ විනිශ්චයකාරයන්ද නඩු-
කාරයන්ද නුඹේ අතේ තිබෙන නුඹේ
දෙවියන්වහන්සේගේ ප්‍රඥාව ලෙස
පත්කරපන්න; ඒවා නොදන්න අයට
උගන්වාපල්ලා. නුඹේ දෙවියන්වහන්සේගේ 26
ව්‍යවස්ථාවද රාජ ආඥාවද නොපවත්වන
සියල්ලන්ට මරණයෙන් හෝ රටින්
පිටදැමීමෙන් හෝ †දේපළ රාජසන්තක
කිරීමෙන් හෝ හිර අඩස්සිකිරීමෙන් හෝ
වහාම යුක්තිය ඉෂ්ටකරනු ලැබේවා
යනුය.

මෙසේ යෙරුසලමෙහි තිබෙන **ස්වාමීන්-** 27
**වහන්සේගේ** ගෘහය අලංකාර කරන්ට
රජුගේ සිතෙහි කැමැත්තක් ඉපදෙවූවාවූ,
රජද රජුගේ මන්ත්‍රීවරුන්ද රජුගේ සියලු
බලවන්ත අධිපතීන්ද ඉදිරියෙහි මට
කරුණාව ලැබීමට සැලස්සූවාවූ අපේ
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
ප්‍රශංසාවේවා. මම වනාහි මා කෙරෙහි 28
තිබුණු මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
හස්තය නිසා බලවත්වී, මා සමග යාමට
ඉශ්‍රායෙල්වරුන් අතරෙන් ප්‍රධානීන්
රැස්කරගත්තෙමි.

*බාත් එකක් ගැලොම් හතරහමාරයි.
†හෙවත්, දඩගැසීමෙන්.

## එස්රා සමග ගිය තැනැත්තෝ

8 අර්තක්ෂස්තා රජුගේ රජකම්-
කිරීමේදී මා සමග බබිලෝනියේ
සිට ආවාවූ අයගේ පියවංශවල ප්‍රධානීහු
මොව්හුය. ඔවුන්ගේ පෙළපත් ලේඛනයත්
2 මෙසේය. පීනෙහාස්ගේ පුත්‍රයන්ගෙන්
ගේර්ෂොමය. ඊතාමාර්ගේ පුත්‍රයන්ගෙන්
දනියෙල්ය. දාවිත්ගේ පුත්‍රයන්ගෙන්
3 හට්ටූෂ්ය. පරොෂ්ගේ පුත්‍රයන්ගෙන්
එක්කෙනෙක්වූ ෂෙකනියාගේ පුත්‍රයන්-
ගෙන් සෙකරියාය. ඔහු සමග පෙළපත්
වශයෙන් පිරිමි එකසිය පනසක්
4 ලියවුණෝය. පාහත්-මෝවබ්ගේ
පුත්‍රයන්ගෙන් ශෙරහියාගේ පුත්‍රවූ
එලියෙහෝනයි සහ ඔහු සමග පිරිමි
5 දෙසියයක්ය. ෂෙකනියාගේ පුත්‍රයන්-
ගෙන් යහසීයෙල්ගේ පුත්‍රයා සහ ඔහු
6 සමග පිරිමි තුන්සියයක්ය. ආදීන්ගේ
පුත්‍රයන්ගෙන් යොනාතාන්ගේ පුත්‍රවූ
ඒබෙද් සහ ඔහු සමග පිරිමි පනසක්ය.
7 ඒලාම්ගේ පුත්‍රයන්ගෙන් අතලියාගේ පුත්‍රවූ
යෙෂායා සහ ඔහු සමග පිරිමි
8 හැත්තෑවක්ය. ෂෙපටියාගේ පුත්‍රයන්ගෙන්
මීකායෙල්ගේ පුත්‍රවූ සෙබදියා සහ ඔහු
9 සමග පිරිමි අසූවක්ය. යෝවාබ්ගේ
පුත්‍රයන්ගෙන් යෙහියෙල්ගේ පුත්‍රවූ
ඔබදියා සහ ඔහු සමග පිරිමි දෙසිය
10 දහඅටදෙනෙක්ය. ෂෙලොමීත්ගේ
පුත්‍රයන්ගෙන් . යෝසිපියාගේ පුත්‍රයා
සහ ඔහු සමග පිරිමි එකසිය හැටක්ය.
11 බේබයිගේ පුත්‍රයන්ගෙන් බේබයිගේ
පුත්‍රවූ සෙකරියා සහ ඔහු සමග
12 පිරිමි විසිඅටදෙනෙක්ය. අස්ගාද්ගේ
පුත්‍රයන්ගෙන් හක්කාටාන්ගේ පුත්‍රවූ
යෝහානාන් සහ ඔහු සමග පිරිමි
13 එකසිය දහදෙනෙක්ය. අදෝනිකාම්ගේ
පුත්‍රයන්ගෙන් අන්තිමයන්වූ එලීපෙලෙත්ද
යෙවූයෙල්ද ෂෙමායාද යන නම් සඳහන්
අය සහ ඔවුන් සමග පිරිමි හැටක්ය.
14 බිග්වායිගේ පුත්‍රයන්ගෙන් ඌතයි
සහ සබ්බූද්ය; ඔවුන් සමග පිරිමි
හැත්තෑවකුත්ය.

## යෙරුසලමට ගිය ගමනේ තොරතුරු

අහවාට ගලායන ගංගාව ළඟට මම 15
ඔවුන් රැස්කෙළෙමි; අපි එහි තුන් දවසක්
කූඩාරම් ගසාගන සිටියෙමු. මම
සෙනඟද පූජකයන්ද බලා ලෙවී
පුත්‍රයන්ගෙන් කිසිවෙකු නැති බව දුටිමි.
එවිට මම එලියෙසර්ද අරියෙල්ද ෂෙමායාද 16
එල්නාතාන්ද යාරිබ්ද එල්නාතාන්ද
නාතාන්ද සෙකරියාද මෙෂුල්ලාම්ද යන
ප්‍රධානීන් සහ යෝයාරිබ්ද එල්නාතාන්ද
යන උගත්වන්නන්ද කැඳවාගෙන,
කාසිපියා යන ස්ථානයේ සිටිය ප්‍රධානියාවූ 17
ඉද්දෝ වෙතට ඔවුන් යවමින්, අපේ
දෙවියන්වහන්සේගේ ගෘහයට සේවකයන්
අප වෙතට කැඳවාගෙන එන පිණිස
ඉද්දෝටත් කාසිපියා යන ස්ථානයෙහි
සිටිය ඔහුගේ සහෝදරයන් වන
නෙතිනීම්වරුන්ටත් කිය යුතු දේ ඔවුන්ට
කීමි. ඔව්හුද අප කෙරෙහි තිබුණු අපේ 18
දෙවියන්වහන්සේගේ යහපත් හස්තය
ප්‍රකාරයට ඉශ්‍රායෙල්ගේ පුත්‍රයා වන
ලෙවීගේ පුත්‍රවූ මාලීගේ පුත්‍රයන්ගෙන්
බුද්ධිමත් මනුෂ්‍යයෙකුත්, ෂේරෙබියාද
ඔහුගේ පුත්‍රයන් සහ සහෝදරයන්ද
දහඅට දෙනෙකුත්, හෂබියාද ඔහු සමග 19
මෙරාරීගේ පුත්‍රයන්ගෙන් යෙෂායාද
ඔහුගේ සහෝදරයන්ද ඔවුන්ගේ පුත්‍රයන්ද
විසි දෙනෙකුත්, ලෙවීවරුන්ගේ මෙහෙයට 20
දාවිත් සහ අධිපතීන් විසින් නියමකළ
නෙතිනීම්වරුන්ගෙන් නෙතිනීම්වරුන්
දෙසිය විසි දෙනෙකුත් අප වෙතට
කැඳවාගෙන ආවෝය. ඔවුන් සියල්ලෝම
නම් වශයෙන් සඳහන්කරනලද්දෝය.
එවිට අපේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි 21
යටහත්වී අපටත් අපේ බාලයන්ටත් අපේ
සියලු සම්පත්වලටත් සඵලවත් ගමනක්
ලැබෙන හැටියට උන්වහන්සේගෙන්
ඉල්ලන පිණිස එහි අහවා ගංගාව ළඟදී
උපවාසයක් ප්‍රසිද්ධකෙළෙමි. මක්නිසාද: 22
අපේ දෙවියන්වහන්සේගේ හස්තය
උන්වහන්සේ සොයන සියල්ලන් කෙරෙහි

යහපත පිණිස වන්නේය කියාත්, උන්-
වහන්සේගේ බලයද උදහසද උන්-
වහන්සේ අත්හරින සියල්ලන්ට විරුද්ධව
පවත්නේය කියාත් අප විසින් රජුට
කියා තිබුණු නිසා, ගමන් මාර්ගයේදී අප
සතුරන්ගෙන් ආරක්ෂාකරන පිණිස
හේවා සමුදුවක්ද අසරුවන්ද රජුගෙන්
23 ඉල්ලන්ට ලජ්ජාවීමි. එබැවින් අපි
නිරාහාරව සිට මේ ගැන අපේ
දෙවියන්වහන්සේට යාච්ඤාකෙළෙමු.
උන්වහන්සේද අපේ කන්නලව්ව
24 පිළිගත්සේක. එවිට මම ප්‍රධාන
පූජකයන්ගෙන් දෙළොස් දෙනෙක් එනම්
ෂේරෙබියාද හෂබියාද ඔවුන් සමග
ඔවුන්ගේ සහෝදරයන්ගෙන් දස
25 දෙනෙක්ද තෝරාගෙන, රජුද ඔහුගේ
මන්ත්‍රීවරුන්ද අධිපතීන්ද එහි සිටි
සියලු ඉශ්‍රායෙල්වරුන්ද විසින් අපේ
දෙවියන්වහන්සේගේ ගෘහය උදෙසා
ඔප්පුකළ පඬුර වන රිදීද රන්ද භාණ්ඩද
26 ඔවුන්ට කිරා භාරදුනිමි. රිදී තලෙන්ත
හසිය පනහකුත් රිදී භාණ්ඩ තලෙන්ත
27 සියයකුත්; රන් තලෙන්ත සියයකුත්; *දරික්
මිල දහසක් වටින රන් තලි විස්සකුත්;
රන්මෙන් අනර්ඝවූ හොඳ දීප්තිමත්
පිත්තල භාජන දෙකකුත් ඔවුන් අතට
28 කිරා දුනිමි. මම ඔවුන්ට කථාකොට:
නුඹලා ස්වාමීන්වහන්සේට ශුද්ධ අයය;
භාණ්ඩත් ශුද්ධය; මේ රන් රිදී නුඹලාගේ
පියවරුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
කරනලද ස්වේච්ඡා පූජාවක්ය.
29 යෙරුසලමෙහි ස්වාමීන්වහන්සේගේ
ගෘහයේ ඇතුල් ගෙවල්වලදී නුඹලා
ප්‍රධාන පූජකයන් සහ ලෙවීවරුන්ද
ඉශ්‍රායෙල් පියවංශවල අධිපතීන්ද
ඉදිරිපිටදී කිරන තුරු මුර කරමින්, මේවා
30 ප්‍රවේසම්කරගනිල්ලායයි කීමි. මෙසේ
පූජකයෝත් ලෙවීවරුත් කිරනලද ඒ
රිදීද රන්ද භාණ්ඩද යෙරුසලමේ අපේ
දෙවියන්වහන්සේගේ ගෘහයට ගෙනෙන
පිණිස භාර ගත්තෝය.

*දරික් එකක් සිලිම් විසිදෙකයි.

ඉක්බිති අපි පළමුවෙනි මාසයේ 31
දෙළොස්වෙනිද යෙරුසලමට යන පිණිස
අහවා ගඟ ළඟ සිට පිටත්වුණෙමු. අපේ
දෙවියන්වහන්සේගේ හස්තය අප කෙරෙහි
විය, උන්වහන්සේ සතුරන්ගේ අතිනුත්
මග රැක සිටි අයගෙනුත් අප ගැළෙවූ-
සේක. අපි එනාහි යෙරුසලමට පැමිණ 32
තුන් දවසක් උන්නෙමු. සතරවෙනිද ඒ 33
රිදීද රන්ද බඩුද සියල්ලම ගණන හා
බර ප්‍රකාරයට, පූජකයාවූ උරියාගේ පුත්‍රවූ
මෙරේමොත් අතට අපේ දෙවියන්-
වහන්සේගේ ගෘහයේදී කිරා දෙනලද්දේය.
ඒ මුළු බරද ඒ කාලයෙහි ලියන්ට 34
යෙදුණේය. ඔහු සමග පීනෙහාස්ගේ
පුත්‍රවූ එලෙයාසර් සිටියේය; ඔවුන්
සමග යේෂුවාගේ පුත්‍රවූ යෝසාබාද්ද
බින්නුයිගේ පුත්‍රවූ නොවදියාද යන
ලෙවීවරුත් සිටියෝය. හැරී ආවාවූ 35
වාල්කමේ පුත්‍රයෝ ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේට දවන පූජා පිණිස
සියලු ඉශ්‍රායෙල්වරුන් උදෙසා ගොන්
දෙළොස් දෙනෙක්ද බැටළුවන් අනූ
හදෙනෙක්ද බැටළුපැටවුන් හැත්තෑ හත්
දෙනෙක්ද පාප පූජාවක් පිණිස එළුවන්
දෙළොස් දෙනෙක්ද ඔප්පුකළෝය. ඒ
සියල්ල ස්වාමීන්වහන්සේට ඔප්පුකළ
දවන පූජාවක්ය. තවද ඔව්හු රජුගේ 36
ආඥා ගඟ මෙගොඩ සිටිය රජුගේ
දිශාධිපතීන්ටත් ආණ්ඩුකාරයන්ටත්
භාරදුන්නෝය. ඔව්හු සෙනඟටත්
දෙවියන්වහන්සේගේ ගෘහයටත් උපකාර-
කළෝය.

## අන්‍ය ජාතීන් සමග මිශ්‍රවීම ගැන එස්රාගේ දුක්වීම හා යාච්ඤාව

9 මේ කාරණා නිමවූ කල අධිපතීහු
මා ළඟට ඇවිත් කථාකොට:
ඉශ්‍රායෙල් සෙනඟත් පූජකයෝත්
ලෙවීවරුත් දේශවල වැසියන්වූ
කානාන්වරුන්ගේද හිත්තීවරුන්ගේද
පෙරිස්සිවරුන්ගේද යෙබූසිවරුන්ගේද
අම්මෝනිවරුන්ගේද මෝවබ්වරුන්ගේද
මිසරවරුන්ගේද අමෝරිවරුන්ගේද පිළිකුල්

ක්‍රියා කරමින්, ඔවුන්ගෙන් වෙන්නොවී
2 සිට, ඔව්හු තමුන්ටත් තමුන්ගේ
පුත්‍රයන්ටත් ඔවුන්ගේ දූවරුන්ගෙන්
භාර්යාවන් ගත්තෝය; මෙසේ
ශුද්ධවංශය දේශවල ජනයන් සමග
මිශ්‍රවූය. එසේය, මේ අපරාධයට මූලි-
කවූවෝත් අධිපතීන් හා මූලාදෑනියෝ-
3 යයි කීවෝය. මම මේ කාරණාව අසා,
මාගේ වස්ත්‍රයත් සළුවත් ඉරාගෙන,
මාගේ හිසකේද රැවුලද උදුරා, ත්‍රස්තවී
4 හිඳගතිමි. එවිට වාල්කමෙන් ආ
තැනැත්තන්ගේ අපරාධය නිසා
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්වහන්සේගේ
වචනවලට වෙවුලූ හැමදෙනම මා ළඟට
රැස්වූවෝය; මම වනාහි සවස පූජාව
5 ඔප්පුකරන තුරු ත්‍රස්තව හිඳගතිමි. සවස
පූජාවේ වේලාවට මාගේ ශෝක
භාවයෙන් නැගිට, ඉරාගත් මාගේ
වස්ත්‍රයද මාගේ සළුවද ඇතුව දණින්
හිඳ, මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
දෙසට මාගේ අත් විදහාගන
6 කථාකොට: මාගේ දෙවියන්වහන්ස, මම
ලජ්ජාවට පත්වී, මාගේ දෙවිවූ ඔබ
දෙසට මාගේ මුහුණ ඔසවන්ට
විළිබියෙන් සිටිමි. මක්නිසාද අපේ
අපරාධ අපේ ඉස්වලටත් උඩින් වැඩිවී,
අපේ වරදකාරකම ස්වර්ගය දක්වා නැගී
7 තිබේ. අපේ පියවරුන්ගේ දවස්වල පටන්
අද දක්වා අපි අතිශයින් වරදකාරයෝව
සිට, අපේ අපරාධ නිසා අපිද අපේ
රජවරුද අපේ පූජකයෝද අද දවසේ
තිබෙන හැටියට දේශවල රජවරුන්
අතටත් කඩුවටත් වාල්කමටත්
කොල්ලකෑමටත් මුහුණේ ලජ්ජාවටත්
8 පාවාදෙනු ලැබීමුව. එහෙත් දැන් අපෙන්
ස්වල්ප දෙනෙකු ඉතුරු කරන පිණිසත්
ස්වකීය ශුද්ධස්ථානයෙහි අප පිහිටුවන
පිණිසත් ස්වල්ප වේලාවකට අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගෙන් අපට කරුණාව
ලැබී තිබේ. මෙසේ අපේ දෙවියන්වහන්සේ
අපේ ඇස් එළියකර, අපේ වාල්කමේදී
අපට ස්වල්ප සහනයක් දෙනසේක.
9 මක්නිසාද අපි වාල්ලුය; නුමුත් අපේ
වාල්කමේදී අපේ දෙවියන්වහන්සේ අප
අත් නොහැර, අපේ දෙවියන්වහන්සේගේ
ගෘහය ගොඩනැගීමටත් ඒකේ බිඳුම්
හරිගැස්සීමටත් අප ජීවත්කරන හැටියටද,
යූදහිත් යෙරුසලමෙහිත් අපට පවුරක්
දෙන හැටියටද, පාර්සියාවේ රජවරුන්ගේ
ඇස් හමුයෙහි අපට කරුණාව පෙන්නූ-
සේක. එබැවින් අපේ දෙවියන්වහන්ස, 10
මෙසේ වූ කල්හි අපි කුමක් කියමුද?
මක්නිසාද ඔබගේ මෙහෙකරුවන්වූ
ප්‍රොපේතවරුන් ලවා ඔබ අණකෙරෙවූ
ඔබගේ ආඥාවන් අපි අත්ඇරියෙමුව.
එනම්: නුඹලා හිමිකරගන්ට යන දේශය 11
එහි ජනයන්ගේ පිළිකුල්වලින්ද
කිලුටුකම්වලින්ද එක් කෙළවරක සිට
අනික් කෙළවර දක්වා පිරී තිබේ;
ඔවුන්ගේ අපවිත්‍රකම නිසා ඒක අපවිත්‍ර
දේශයක්ව තිබේ. ඒ නිසා නුඹලා 12
බලවත්ව සිට, දේශයේ සාරවත්කම
භුක්තිවිඳ, ඒක සදාකාලයටම නුඹලාගේ
දරුවන්ට උරුමකරදෙන පිණිස,
නුඹලාගේ දූවරුන් ඔවුන්ගේ පුත්‍රයන්ට
දෙන්ටවත් ඔවුන්ගේ දූවරුන් නුඹලාගේ
පුත්‍රයන්ට ගන්ටවත් ඔවුන්ගේ සමාදානයද
ශුභසිද්ධියද කිසිකලක සොයන්ටවත්
එපායයි ඔබ අණකර තිබේ. ඉතින් 13
අපේ නපුරු ක්‍රියාද මහත් වරදකාරකමද
නිසා අපට පැමිණි සියල්ලට පසුව,
අපේ දෙවිවූ ඔබ විසින් අපේ අයුතුකම්වල
තරමට අචිවූ නොකර මෙයාකාර
ගැළවීමක් අපට ඉතිරිකරදී තිබියදීත්,
අපි නැවත ඔබගේ ආඥා කඩකර, මේ 14
පිළිකුල් දේ කරන ජනයන් හා සමග
නෑකම් බඳිමුද? එසේ කළොත්,
එක්කෙනෙක්වත් ගැළවී ඉතුරු නොවෙන
ලෙස අප නැතිකර දමන තුරු ඔබ
අප කෙරෙහි උදහස් නොවනසේක්ද?
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්ස, 15
ඔබ ධර්මිෂ්ඨය; මක්නිසාද අද තිබෙන
ලෙස අපි ස්වල්ප දෙනෙක්ව ඉතුරුව
සිටිමුව. මෙන්න, අපි ඔබ ඉදිරියේ අපේ
අපරාධවල ගැළී සිටිමුව; මක්නිසාද
මේ කාරණය නිසා ඔබ ඉදිරියේ
කිසිවෙකුට සිටිය නොහැකියයි කීවේය.

## සෙනඟ පසුතැවිලිවී කාරණා හරිගැස්සීම

10 එස්රා අඬමින් දෙවියන්වහන්සේ-
ගේ ගෘහය ඉදිරියේ වැටී ඉඳ
යාච්ඥාකොට පව් කියා සිටියදී,
ඉශ්‍රායෙල්වරුන්ගෙන් පුරුෂයන්ද ස්ත්‍රීන්ද
ළමයින්ද ඉතා මහත් සමූහයක් ඔහු
වෙතට රැස්වුණෝය. මක්නිසාද සෙනඟ
2 බොහෝසෙයින්ම ඇඬුවෝය. එවිට
ඒලාම්ගේ පුත්‍රයෙක්වූ යෙහීයෙල්ගේ පුත්‍රවූ
ෂෙකනියා එස්රාට උත්තරදෙමින්: අපේ
දෙවියන්වහන්සේට විරුද්ධව වරදකොට
දේශයේ ජනයන්ගෙන් අන්‍ය ජාති ස්ත්‍රීන්
පාවාගතිමු. එසේ වුවත් ඉශ්‍රායෙල්ට
3 මේ ගැන බලාපොරොත්තු තිබේ. ඒ
නිසා ඒ සියලු භාර්යාවන්ද ඔවුන්ගෙන්
උපන් දරුවන්ද පහකරන ලෙස මාගේ
ස්වාමිහුගේද අපේ දෙවියන්වහන්සේගේ
ආඥාවට වෙවුලන්නන්ගේද දනමුතුකමේ
හැටියට අපේ දෙවියන්වහන්සේ සමග
ගිවිසුමක් කරමු; ව්‍යවස්ථාව ලෙසද
4 කරනු ලැබේවා. නැගිටින්න; මේ කාරණය
නුඹට අයිතිය, අපිත් නුඹ සමග සිටිමුව.
බලවත්ව සිට ඒක කරන්නැයි එස්රාට
5 කීවේය. එවිට එස්රා නැගිට ඒ වචනයේ
ප්‍රකාරයට කරන ලෙස පූජකයන්ගේද
ලෙවීවරුන්ගේද සියලු ඉශ්‍රායෙල්වරුන්ගේද
අධිපතීන් දිවුරෙවුවේය. ඔව්හු දිවුළෝය.
6 එවිට එස්රා දෙවියන්වහන්සේගේ ගෘහය
ඉදිරියෙන් නැගිට එලියාෂීබ්ගේ පුත්‍රවූ
යෙහෝහානාන්ගේ ඇතුල් ගෙට ගියේය.
ඔහු එහි ගොස් කෑම නොකා වතුර
නොබී සිටියේය. මක්නිසාද වාල්කමෙන්
ආ අයගේ අපරාධය ගැන ඔහු වැලපුණේය.
7 එවිට යෙරුසලමට රැස්වෙන්ට කියාද,
අධිපතීන්ගෙත් වැඩිමහල්ලන්ගෙත්
දනමුතුකමේ හැටියට තුන් දවසක්
8 ඇතුළතදී යමෙක් නාවොත්, ඔහුගේ සියලු
දේපළ දඬයට ගන්ටත් වාල්කමෙන්
ආවාවූ අයවලුන්ගේ සභාවෙන් ඔහු
වෙන්කරන්ටත් වේය කියාද, වාල්කමෙන්
ආ සියල්ලන්ට යූදාහි සහ යෙරුසලමෙහිත්
9 ඔව්හු ප්‍රකාශකළෝය. එවිට යූදාහිද
බෙන්යමින්හිද සියලු මනුෂ්‍යයෝ තුන්
දවස ඇතුළත යෙරුසලමට රැස්වූවෝය;
ඒ දවස නවවෙනි මාසයේ විසි වෙනිදය.
මුළු සෙනඟ මේ කාරණය නිසාත් තද
වර්ෂාව නිසාත් දෙවියන්වහන්සේගේ
ගෘහය ඉදිරිපිට එළිමහනේ වෙවුලමින්
ඉඳගෙන උන්නෝය. එස්රා පූජකයා 10
නැගිට සිට ඔවුන්ට කථාකොට:
ඉශ්‍රායෙල්ගේ වරදකාරකම වැඩිකරන
හැටියට නුඹලා අන්‍ය ජාති ස්ත්‍රීන්
පාවාගත්තහුය. එබැවින් දැන් නුඹලාගේ 11
පියවරුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
පව් කියාදී, උන්වහන්සේගේ කැමැත්ත
කරමින්, දේශයේ ජාතීන්ගෙනුත් අන්‍ය
ජාති ස්ත්‍රීන්ගෙනුත් වෙන්වෙයල්ලායයි
කීවේය. එවිට මුළු සභාව මහත් හඬකින් 12
උත්තරදෙමින්: ඔබ අප ගැන කී ලෙස
අප විසින් කළ යුතුය. නුමුත් සෙනඟ 13
බොහෝය, මේක තද වර්ෂා කාලයක්
නිසා අපට එළියේ සිටින්ටත් බැරිය,
මේක දවසකවත් දෙදවසකවත් වැඩක්
නොවේය. මක්නිසාද මේ කාරණය
සම්බන්ධව අපි බොහෝසේ වරද
කෙළෙමුව. දැන් අපේ අධිපතියෝ මුළු 14
සභාව වෙනුවෙන් පත් කරනු ලබත්වා,
අපේ දෙවියන්වහන්සේගේ බලවත්
උදහස අප කෙරෙන් පහවෙන තුරු, මේ
කාරණය ඉෂ්ටකරන තුරු, අපේ නුවරවල
අන්‍ය ජාති ස්ත්‍රීන් පාවාගන සිටින
සියල්ලෝද ඔවුන් සමග එක එක නුවර
වැඩිමහල්ලෝද විනිශ්චයකාරයෝද
නියම කාලවලදී පැමිණෙත්වයි කීවෝය.
මීට විරුද්ධවුණේ අසාහෙල්ගේ පුත්‍රවූ 15
යෝනාතාන්ද තික්වාගේ පුත්‍රවූ යාසෙයාද
පමණක්ය. මෙෂුල්ලාම්ද ලෙවීයවූ
ෂබ්බෙතයිද ඔවුන්ට උපකාරකළෝය.
වාල්කමෙන් ආවාවූ අය එසේ කළෝය. 16
පූජකවූ එස්රාද තමුන්ගේ පියවංශවල
හැටියට පියවංශවල ප්‍රධාන මනුෂ්‍යයෝද
එකිනෙකා නාම වශයෙන් වෙන්කරනු
ලැබ, ඔව්හු මේ කාරණය විභාගකරන්ට
දසවෙනි මාසයේ පළමුවෙනිද ඉඳගත්තෝය.
අන්‍ය ජාති ස්ත්‍රීන් සරණපාවාගෙන සිටි 17
සියලු මනුෂ්‍යයන් ගැන කාරණය
ඔව්හු පළමුවෙනි මාසයේ පළමුවෙනිද

18 තීන්දුකළෝය. පූජකයන්ගේ පුත්‍රයන්
අතරෙන් අන්‍ය ජාති ස්ත්‍රීන් සරණපාවාගත්
සමහර දෙනෙක් සම්බවූවෝය. එනම්:
යෝශාදක්ගේ පුත්‍රවූ යේෂුවාගේ පුත්‍රයන්-
ගෙන්ද ඔහුගේ සහෝදරයන්ගෙන්ද
මයසේයා, එලීයෙසෙර්, යාරීබ් සහ
19 ගෙදලියාය. ඔව්හු තමුන්ගේ භාර්යාවන්
අත්හරිනවාය කියා අතදී පොරොන්-
දුවුණෝය; තවද තමුන්ගේ වරදකාරකම
ගැන රැළෙන් බැටළුවෙකු ඔප්පුකළෝය.
20 ඉම්මෙර්ගේ පුත්‍රයන්ගෙන් හනානි සහ
21 සෙබදියාය. හාරීම්ගේ පුත්‍රයන්ගෙන්
මයසේයා, එලියා, ෂෙමායා, යෙහීයෙල්
22 සහ උස්සියාය. පෂ්හූර්ගේ පුත්‍රයන්ගෙන්
එලියෝයේනයි, මයසේයා, ඉෂ්මායෙල්,
නෙතනෙල්, යෝසාබාද් සහ එලාසාය.
23 ලෙවීවරුන්ගෙන් යෝසාබාද්, ෂිමෙයි,
කේලායා (එනම් කෙලීටා), පෙතහියා,
24 යූදා සහ එලීයෙසෙර්ය. ගීතිකා-
කාරයන්ගෙන් එලියාෂීබ්ය; දෙරටු-
පාලයන්ගෙන් ෂල්ලුම්, ටෙලෙම් සහ
25 ඌරීය. ඉශ්‍රායෙල්වරුන් අතරෙන්
පරෝෂ්ගේ පුත්‍රයන්ගෙන් රමියා, ඉස්සියා,
මල්කියා, මියාමින්, එලෙයාසර්, මල්කියා
26 සහ බෙනායාය. ඒලාම්ගේ පුත්‍රයන්ගෙන්
මත්තනියා, සෙකරියා, යෙහීයෙල්, අබ්දී,
27 යෙරේමොත් සහ එලියාය. සට්ටූගේ
පුත්‍රයන්ගෙන් එලියෝයේනයි, එලියාෂීබ්,
මත්තනියා, යෙරේමොත්, සාබාද් සහ
අසීසාය, බේබයිගේ පුත්‍රයන්ගෙන් 28
යෙහෝහානාන්, හනනියා, සබ්බයි සහ
අත්ලයිය. බානීගේ පුත්‍රයන්ගෙන් 29
මෙෂුල්ලාම්, මල්ලුක්, අදායා, යාෂුබ්,
ෂෙයාල් සහ යෙරේමොත්ය. පාහත්- 30
මෝවබ්ගේ පුත්‍රයන්ගෙන් අද්නා, කෙලාල්,
බෙනායා, මයසේයා, මත්තනියා,
බෙසලෙල්, බින්නුයි සහ මනස්සේය.
හාරීම්ගේ පුත්‍රයන්ගෙන් එලීයෙසෙර්, 31
ඉෂ්ෂියා, මල්කියා, ෂෙමායා, ෂිමෙයොන්;
බෙන්යමින්, මල්ලුක් සහ ෂෙමරියාය. 32
හාෂුම්ගේ පුත්‍රයන්ගෙන් මත්තෙනයි, 33
මත්තත්තා, සාබාද්, එලීපෙලෙත්,
යෙරේමයි, මනස්සේ සහ ෂිමෙයිය.
බානීගේ පුත්‍රයන්ගෙන් මයදයි, අම්රාම් 34
සහ ඌයෙල්ය; බෙනායා, බේදෙයා, 35
කෙලුහී; වනියා, මෙරේමොත්, එලියාෂීබ්; 36
මත්තනියා, මත්තෙනයි සහ යාසූය; 37
බානී, බින්නුයි සහ ෂිමෙයිය; ෂෙලෙමියා, 38,39
නාතාන් සහ අදායාය; මක්නදෙබයි, 40
ෂාෂයි, ෂාරයි; අසරේල්, ෂෙලෙමියා, 41
ෂෙමරියා; ෂල්ලුම්, අමරියා සහ 42
යෝසෙප්ය. නෙබෝගේ පුත්‍රයන්ගෙන් 43
යෙයීයෙල්, මත්තිතියා, සාබාද්, සෙබීනා,
ඉද්දෝ, යෝවේල් සහ බෙනායාය. මේ 44
හැම දෙනම අන්‍ය ජාති ස්ත්‍රීන්
පාවාගෙන සිටියෝය. ඒ භාර්යාවන්ගෙන්
සමහරු දරුවන්ද ලැබ සිටියෝය.

# නෙහෙමියාගේ පොත

## යෙරුසලම ගැන කනගාටු ආරංචි. නෙහෙමියාගේ යාච්ඤාව

1 හකලියාගේ පුත්‍රවූ නෙහෙමියාගේ
කථාවස්තුවයි. විසිවෙනි අවුරුද්දේ
කිස්ලෙව් මාසයේ ෂූෂන් මාලිගාවේ මා
2 සිටි කල, මාගේ සහෝදරයන්ගෙන්
එක්කෙනෙක්වූ හනානීද ඔහු සමග
තවත් මනුෂ්‍යයෝද යූදයෙන් ආවෝය;
එවිට වාල්කමෙන් ගැළවී ඉතුරුවූණු
යුදෙව්වරුන් ගැනද යෙරුසලම ගැනද
3 ඔවුන්ගෙන් විචාළෙමි. ඔව්හු කථාකොට:
වාල්කමෙන් ඉතුරුවී ඒ රටේ සිටින්නෝ
මහත් විපත්තියෙහුත් නින්දවෙහුත්
පෙළෙති. යෙරුසලමේ පවුරද කඩාදමා
තිබේ, ඒකේ දොරවල්ද ගින්නෙන් දවාදමා
4 තිබේයයි මට කීවෝය. මම ඒ වචන
ඇසූ කල හිඳගෙන අඩා, කීප දවසක්
වැලපී නිරාහාරව සිට, ස්වර්ගයේ
දෙවියන්වහන්සේ ඉදිරියෙහි මෙසේ
5 යාච්ඤාකෙළෙමි: අහෝ ස්වර්ගයේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබට ප්‍රේමකරමින්
ඔබගේ ආඥා රක්ෂාකරන්නන්ට ගිවිසුමත්
කරුණාවත් පවත්වන්නාවූ මහත්වූ
6 භයානකවූ දෙවියන්වහන්ස, ඔබගේ
මෙහෙකරුවූ ඉශ්‍රායෙල් පුත්‍රයන් උදෙසා
ඔබගේ මෙහෙකරුවා වූ මා විසින් දැනට
රෑ දවල් ඔබ ඉදිරියෙහි ඔප්පුකරන
යාච්ඤාවද, ඉශ්‍රායෙල් පුත්‍රයන්වූ අප විසින්
ඔබට විරුද්ධව කළ පව් කියාදීමද
අසන පිණිස ඔබගේ කන යොමා,
ඔබගේ ඇස්ද ඇරී තිබේවයි ඔබගෙන්
ඉල්ලා සිටිමි. එසේය, මමත් මාගේ
7 පියවංශයත් පව්කෙළෙමුව. අපි ඔබට
විරුද්ධව ඉතා දූෂ්‍ය ලෙස ක්‍රියාකෙළෙමුව,
ඔබගේ මෙහෙකරුවාවූ මෝසෙස්ට ඔබ
අණකළ ආඥාද පනත්ද විනිශ්චයන්ද
රක්ෂානොකෙළෙමුව. අහෝ ඔබගේ 8
මෙහෙකරුවාවූ මෝසෙස්ට ඔබ අණකළ
දෙය සිහිකළ මැනව. එනම්: තුඹලා
ද්‍රෝහිකම්කළොත් මම තුඹලා ජාතීන්
අතරේ විසුරුවන්නෙමි. එහෙත් තුඹලා 9
මා වෙතට හැරී, මාගේ ආඥා රක්ෂාකරමින්,
ඒවා ඉෂ්ටකළොත්, තුඹලාගෙන් සමහ-
රෙක් පන්නාදමනු ලැබ අහසේ කෙළවර
සිටියත්, මම ඔවුන් එතැනින් රැස්කර,
මාගේ නාමය පිහිටුවන්ට මා විසින්
තෝරාගත් ස්ථානයට ඔවුන් ගෙ-
නෙන්නෙමියි ඔබ කීසේක. මොව්හු 10
වනාහි ඔබගේ මහත් බලයෙන්ද බලවත්
හස්තයෙන්ද ඔබ විසින් මුදගත් ඔබගේ
මෙහෙකරුවන් හා සෙනඟත්ය. අහෝ 11
**ස්වාමීන්වහන්ස**, ඔබගේ මෙහෙකරුවාගේ
යාච්ඤාවටත් ඔබගේ නාමය කෙරෙහි
භය පක්ෂව සිටීමට ප්‍රියවෙන ඔබගේ
මෙහෙකරුවන්ගේ යාච්ඤාවටත් ඔබගේ
කන් යොමා, අද ඔබගේ මෙහෙකරුවාට
සඵලය දී, මේ මනුෂ්‍යයා ඉදිරියෙහි
ඔහුට කරුණාව ලැබෙන්ට සැලැස්සුව
මැනවයි කීමි. මම වනාහි රජුගේ
පාත්‍රාධාරීව සිටියෙමි.

## නෙහෙමියා රජුගෙන් අවසර ලැබීම

2 තවද අර්තක්ෂස්තා රජුගේ විසිවෙනි
අවුරුද්දේ නීසාන් මාසයේ ඔහු
ඉදිරිපිට මුද්‍රිකපානය තිබෙද්දී මම
මුද්‍රිකපානය රැගෙන රජුට දුනිමි. මීට
ප්‍රථම මම ඔහු ඉදිරියේදී මලානිකව
නොසිටියෙමි. එවිට රජු මට කථාකර: 2
තුඹට අසනීපයක් නැති කොට තුඹේ
මුහුණ මලානිකව තිබෙන්නේ මන්ද?
මේක සිතේ කනගාටුවක් මිස වෙන

3 කිසිවක් නොවේයයි කීවේය. එවිට
මම ඉතාමත් භයව රජුට කථාකොට:
රජතුමා සදාකල්ම ජීවත්වේවා. මාගේ
පියවරුන්ගේ සොහොන් තිබෙන
නුවර පාළුවී, ඒකේ දොරටු ගින්නෙන්
දලා තිබෙද්දී, මාගේ මුහුණ මලානික
4 නොවන්නේ කෙසේදැයි කීමි. එවිට
රජ: නුඹ ඉල්ලා සිටින්නේ කුමක්දැයි
මාගෙන් ඇසීය. එවිට මම ස්වර්ගයේ
දෙවියන්වහන්සේට යාච්ඤාකොට රජුට
5 කථාකරමින්: රජතුමා ප්‍රසන්න නම්,
ඔබගේ දාසයා ඔබ ඉදිරියෙහි කරුණාව
ලබාසිටී නම්, යූදාහි මාගේ පියවරුන්ගේ
සොහොන් තිබෙන නුවර ගොඩනගන
පිණිස මා එහි හැරිය මැනවැයි කීමි.
6 මෙසේ රජතෙම බිසවත් තමා ළඟ
වාඩිවී ඉන්දදී, කථාකොට: නුඹේ
ගමනට කොපමණ කල් අල්ලනවා
ඇද්ද කියාත් නුඹ නැවත එන්නේ කවදාද
කියාත් මාගෙන් ඇසුවේය. මෙසේ රජ
මා හරින්ට ප්‍රසන්න විය. මමද රජුට
7 කාලයක් නියම කර කීවෙමි. ඇරත්
මම රජුට කථාකොට: රජතුමා ප්‍රසන්න
නම් මා යූදායට පැමිණෙන තුරු රට
මැදින් මට යන්ට දෙන ලෙස එගොඩ
සිටින දිශාධිපතීන්ට දීමට ලියුම්ද,
8 ගෘහයට අයිති කොටුවේ දොරටුවල
බාල්කවලටත් නුවර පවුරුවලටත් මා
පදිංචිවෙන ගෙටත් ලී දෙන ලෙස රජුගේ
මූකළාන භාරකාරවූ ආසාප්ට දීමට
ලියුමක්ද මට ලැබේවයි රජුට කීමි.
මාගේ දෙවියන්වහන්සේගේ යහපත්
හස්තය මා කෙරෙහි තිබුණු හෙයින්
රජතෙම එසේම මට දුන්නේය.

## යෙරුසලමට පැමිණීම. පවුරු ගොඩනගන්ට නියමකර ගැනීම

9 එකල මම ගඟ මෙගොඩ සිටි දිශාධි-
පතීන් ළඟට ඇවිත් රජුගේ හසුන්පත්
ඔවුන්ට දුනිමි. රජ වනාහි සේනාධි-
පතීන්ද අසරුවන්ද මා සමඟ එවුවේය.
10 හොරොනිය සන්බලට්ද සේවකයාවූ
අම්මොනිය ටෝබියාද ඒ අසා ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ ශුභසිද්ධිය දියුණුකරන්ට
මනුෂ්‍යයෙකු ආවාට ඉතාමත් අම-
නාපවූහ. මෙසේ මම යෙරුසලමට ඇවිත් 11
තුන් දවසක් එහි සිටියෙමි. තවද මම 12
මනුෂ්‍යයන් ස්වල්ප දෙනෙකු සමඟ
රාත්‍රියේ නැගිට, යෙරුසලම උදෙසා
කරන්ට මාගේ දෙවියන්වහන්සේ මාගේ
සිතෙහි තැබූ කල්පනාව කිසිම
මනුෂ්‍යයෙකුට නොදන්වා, මා නැගී ගිය
සතා මිස වෙන යම් සතෙකු නැතුව,
රාත්‍රියේ මිටියාවතේ දොරටුවෙන් පිටත්වී,
නාග උල්පත ළඟටත් කසළ දොරටුව 13
ළඟටත් ගොස්, යෙරුසලමේ කඩා
දමනලද පවුරත් ගින්නෙන් දගොස්
තිබුණු ඒකේ දොරටුත් බලා, පසුව උල්පත් 14
දොරටුව සහ රජ පොකුණ ළඟට ගියෙමි.
නුමුත් මා නැගී උන් සතාට යන්ට ඉඩ
නොතිබුණේය. මම රාත්‍රියේ ඔය ළඟින් 15
ගොස් පවුර බලා, ආපසු හැරී මිටියාවතේ
දොරටුවෙන් ඇතුල්වී ආයෙමි. මා ගිය 16
තැනවත් කළ දෙයවත් මූලාදෑනීහු
දැනනොගත්තෝය; මම ඒ වන තුරු
යුදෙව්වරුන්ට හෝ පූජකයන්ටවත්
උත්තමයන්ට හෝ මූලාදෑනීන්ටවත්
වැඩේ කළ අනික් අයටවත් එය
නොදන්වීමි. එකල මම ඔවුන්ට 17
කථාකොට: අපට තිබෙන විපත්තිය
එනම් යෙරුසලම පාළුව තිබෙන හැටිද
ඒකේ දොරටු ගින්නෙන් දලා තිබෙන
හැටිද නුඹලාට පෙනෙයි. ඉතින් තවත්
අපට නින්ද නොපැමිණෙන පිණිස
යෙරුසලමේ පවුර ගොඩනගමුයයි
කියා, මාගේ දෙවියන්වහන්සේගේ 18
යහපත් හස්තය මා කෙරෙහි තිබෙන
බවද රජු මට කී වචන ගැනද ඔවුන්ට
දන්වීමි. ඔව්හුද: අපි නැගිට ගොඩ-
නගමුයයි කීවෝය. මෙසේ ඔව්හු ඒ
යහපත් වැඩේ සඳහා තමුන්ගේ අත්
සවිකර ගත්තෝය. නුමුත් හොරොනිය 19
සන්බලට්ද සේවකයාවූ අම්මොනිය
ටෝබියාද අරාබිය ගෙෂෙම්ද ඒ අසා
අපට කවටකම්කර අප හෙළාදක:
නුඹලා කරන මේ දෙය මොකද? නුඹලා
රජුට විරුද්ධව කැරළිගසන්ට යනවාදැයි
කීවෝය. එවිට මම ඔවුන්ට උත්තරදෙමින්: 20
ස්වර්ගයේ දෙවියන්වහන්සේම අපේ

කාරණය සඵලකරනවා ඇත; එබැවින්
උන්වහන්සේගේ සේවකයෝවූ අපි නැගිට
ගොඩනගන්නෙමුව. නුමුත් නුඹලාට
යෙරුසලමෙහි කිසි කොටසක් හෝ
අයිතිවාසිකමක්වත් සිහිවීමේ ලකුණක්වත්
නැතැයි කීවෙමි.

## ගොඩනැගීම කළ ඒ ඒ අයගේ වැඩ

3 එකල උත්තම පූජකයාවූ එලියාෂීබ්
තෙම පූජකයන්වූ ඔහුගේ සහෝ-
දරයන් සමග නැගිට බැටළු දොරටුව
ගොඩනගා, ඒක විශුද්ධකොට, ඒකේ
දොරවල් තැබුවෝය; හම්මේයාහ කොතද
හනනේල්ගේ කොතද දක්වා ඔව්හු ඒක
2 විශුද්ධකළෝය. ඔහු ගාව යෙරිකෝවේ
මනුෂ්‍යයෝ පවුර ගොඩනැගුවෝය.
ඔවුන් ගාව ඉම්රීගේ පුත්‍රවූ සක්කූර්
3 ගොඩනැගුවේය. මත්ස්‍ය දොරටුව
හස්සෙනායාගේ පුත්‍රයෝ ගොඩ-
නැගුවෝය; ඔව්හු ඒකේ බාල්ක පිහිටුවා
ඒකේ දොරවල් හා තහඩුද අගුල්ද
4 තැබුවෝය. ඔවුන් ගාව හක්කොශ්ගේ
පුත්‍රවූ උරියාගේ පුත්‍රයා වන මෙරේමොත්
අලුත්වැඩියාකෙළේය. ඔවුන් ගාව
මෙෂේසබෙල්ගේ පුත්‍රවූ බෙරෙකියාගේ
පුත්‍රයා වන මෙෂුල්ලාම් අලුත්වැඩියා-
කෙළේය. ඔවුන් ගාව බානාගේ පුත්‍රවූ
5 ශාදෙක් අලුත්වැඩියාකෙළේය. ඔවුන්
ගාව තෙකෝවරු අලුත්වැඩියාකළෝය;
නුමුත් ඔවුන්ගේ උත්තමයෝ තමුන්ගේ
*ස්වාමීන්ගේ සේවයට කර නුදුන්නෝය.
6 පරණ දොරටුව පාසේයාගේ පුත්‍රවූ
යෝයාදද බෙසෝදෙයාගේ පුත්‍රවූ
මෙෂුල්ලාම්ද අලුත්වැඩියාකළෝය, ඔව්හු
ඒකේ බාල්ක පිහිටුවා, ඒකේ දොරවල්
7 හා තහඩුද අගුල්ද තැබුවෝය. ඔවුන්
ගාව ගිබියෝනිය මෙලෙටියාද
මෙරොනොතිය යාදෙන්ද ගිබියොන් සහ
මිශ්පාහි මනුෂ්‍යයෝද අලුත්වැඩියාකළෝය,
ඔව්හු වනාහි ගඟ මෙගොඩ සිටි
දිශාධිපතියාගේ ආණ්ඩුබලය යටතේය.

*නොහොත්, ස්වාමිවරුන්ගේ හෝ
ස්වාමීන්වහන්සේගේ

ඔවුන් ගාව රන්කරුවන්වූ හර්හායාගේ 8
පුත්‍රවූ උස්සීයෙල් අලුත්වැඩියාකෙළේය.
ඔහු ගාව සුගන්ධ ද්‍රව්‍ය මිශ්‍රකරන්නන්-
ගෙන් කෙනෙක්වූ හනනියා අලුත්වැඩියා-
කෙළේය, ඔව්හු පළල් පවුර දක්වා
යෙරුසලම සවිකළෝය. ඔවුන් ගාව 9
යෙරුසලම් පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියාවූ හූර්ගේ පුත්‍රවූ
රෙපායා අලුත්වැඩියාකෙළේය. ඔහු ගාව 10
හරුමප්ගේ පුත්‍රවූ යෙදයා තමාගේ
ගෙය ඉදිරිපිට අලුත්වැඩියාකෙළේය. ඔහු
ගාව හෂබ්නෙයාගේ පුත්‍රවූ හට්ටූෂ්
අලුත්වැඩියාකෙළේය. හාරිම්ගේ පුත්‍රවූ 11
මල්කියාද පාහත්-මෝවබ්ගේ පුත්‍රවූ
හප්ෂූබ්ද තව කොටසක් හා උදුන්
කොත අලුත්වැඩියාකෙළෝය. ඔහු 12
ගාව යෙරුසලම් පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියාවූ හල්ලොහෙෂ්ගේ
පුත්‍රවූ ෂල්ලූම්ද ඔහුගේ දූවරුද
අලුත්වැඩියාකළෝය. මිටියාවතේ 13
දොරටුව හානූන්ද සානොවේ වැසියෝද
අලුත්වැඩියාකළෝය; ඔව්හු ඒක
ගොඩනගා, ඒකේ දොරවල් හා තහඩුද
අගුල්ද තබා, කසළ දොරටුව දක්වා 14
පවුරෙන් රියන් දහක්ද අලුත්වැඩියා-
කළෝය. කසළ දොරටුව බෙත්-හක්කෙරෙම්
පළාතේ අධිපතියාවූ රේකාබ්ගේ පුත්‍රවූ
මල්කියා අලුත්වැඩියාකෙළේය; ඔහු
ඒක ගොඩනගා ඒකේ දොරවල් හා
තහඩුද අගුල්ද තැබුවේය. උල්පත් දොරටුව 15
මිශ්පා පළාතේ අධිපතියාවූ කොල්-
හොසෙගේ පුත්‍රවූ ෂල්ලූන් අලුත්-
වැඩියාකෙළේය. ඔහු ඒක ගොඩනගා
වසා ඒකේ දොරවල් හා තහඩුද අගුල්ද
තබා, රජ උයන ළඟ දාවිත්ගේ නුවර
සිට බසින පඩි පෙළ දක්වා ෂෙලහේ
පොකුණේ පවුර ගොඩනැගුවේය. ඔහු 16
ගාව බෙත්-ශූර් පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියාවූ අශ්බුක්ගේ
පුත්‍රවූ නෙහෙමියා දාවිත්ගේ සො-
හොන්පළවල් ඉදිරිපිටට පැමිණෙන
තුරුත් සාදනලද පොකුණ දක්වාත්
බලවතුන්ගේ ගෙය දක්වාත් අලුත්වැඩියා-
කෙළේය. ඔහු ගාව ලෙවීවරු බානීගේ 17
පුත්‍රවූ රෙහූම් [යටතේ] අලුත්වැඩියා-
කළෝය. ඔහු ගාව කෙයිලා පළාතෙන්

දෙකෙන් කොටසකට හෂබියා තමාගේ
පළාත වෙනුවට අලුත්වැඩියාකෙළේය.
18 ඔහු ගාව ඔවුන්ගේ සහෝදරයෝ
කෙයිලා පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියාවූ හේනාදද්ගේ
පුත්‍රවූ බව්වයි [යටතේ] අලුත්වැඩියා-
19 කළෝය. ඔහු ගාව මිශ්පායේ
අධිපතියාවූ යේෂුවාගේ පුත්‍රවූ එසෙර්
පවුරු කොනේ ආයුධ ගබඩාවේ නැගුම
ඉදිරිපිට තව කොටසක් අලුත්-
20 වැඩියාකෙළේය. ඔහු ගාව සබ්බයිගේ
පුත්‍රවූ බාරුක් පවුරු කොනේ සිට උත්තම
පූජකයාවූ එලියාෂිබ්ගේ ගෙයි දොරකඩ
දක්වා තව කොටසක් ජ්වලිතකමින්
21 අලුත්වැඩියාකෙළේය. ඔහු ගාව
හක්කෝස්ගේ පුත්‍රවූ ඌරියාගේ පුත්‍රයා
වන මෙරේමොත් එලියාෂිබ්ගේ ගෙයි
දොරකඩ පටන් එලියාෂිබ්ගේ ගෙයි
කෙළවර දක්වා තව කොටසක් අලුත්-
22 වැඩියාකෙළේය. ඔහු ගාව සමභූමියේ
මනුෂ්‍යයෝවූ පූජකයෝ අලුත්වැඩියා-
23 කළෝය. ඔවුන් ගාව බෙන්යමින්ද
හෂ්ෂුබ්ද තමුන්ගේ ගෙය ඉදිරිපිට
අලුත්වැඩියාකළෝය. ඔවුන් ගාව
අනනියාගේ පුත්‍රයා වන මයසේයාගේ
පුත්‍රවූ අසරියා තමාගේ ගෙය ළඟ
24 අලුත්වැඩියාකෙළේය. ඔහු ගාව හේනා-
දද්ගේ පුත්‍රවූ බින්නුයි අසරියාගේ ගෙය
පටන් පවුරේ හැරෙන තැන සහ කොන
දක්වාත් තව කොටසක් අලුත්වැඩියා-
25 කෙළේය. ඌසයිගේ පුත්‍රවූ පාලාල්
පවුරු කොනත් හිරගෙයි මිදුල ළඟ
ඉහළ රජගෙදරට ඉස්සරහපිටින් තිබෙන
කොතත් අලුත්වැඩියාකෙළේය. ඔහු
ගාව පරෝෂ්ගේ පුත්‍රවූ පෙදයා
26 අලුත්වැඩියාකෙළේය. (එකල නෙතිනීම්-
වරු නැගෙනහිර දිසාවේ වතුර දොරටුවද
පිටතින් තිබෙන කොතද ඉදිරිපිට තැන
27 දක්වා ඕපෙල්හි විසුවෝය.) ඔහු ගාව
තෙකෝවරු පිටතින් තිබෙන ලොකු
කොත ඉදිරිපිටද ඕපෙල්හි පවුර දක්වාද
තව කොටසක් අලුත්වැඩියාකළෝය.
28 අශ්ව දොරටුවට ඉහළින් පූජකයෝ
එකිනෙකා තම තමාගේ ගෙය ඉදිරිපිට
29 අලුත්වැඩියාකළෝය. ඔවුන් ගාව
ඉම්මේර්ගේ පුත්‍රවූ ශාදොක් තමාගේ ගෙය
ඉදිරිපිට අලුත්වැඩියාකෙළේය. ඔහු
ගාව නැගෙනහිර දොරටුවේ රැකවලාවූ
ෂෙකනියාගේ පුත්‍රවූ ෂෙමායා අලුත්-
වැඩියාකෙළේය. ඔහු ගාව ෂෙලෙමියාගේ 30
පුත්‍රවූ හනනියාද ශාලාප්ගේ හවෙනි
පුත්‍රයාවූ හානූන්ද තව කොටසක්
අලුත්වැඩියාකළෝය. ඔහු ගාව
බෙරකියාගේ පුත්‍රවූ මෙෂුල්ලාම් තමාගේ
ගෙය ඉදිරිපිට අලුත්වැඩියාකෙළේය.
ඔහු ගාව රන්කරුවෙක්වූ මල්කියා 31
හම්මිප්කාද් දොරටුව ඉදිරිපිට
නෙතිනීම්-වරුන්ගේද වෙළෙන්දන්ගේද
ගෙවල් දක්වාත් කොනේ උඩුමහල
දක්වාත් අලුත්වැඩියාකෙළේය. කොනේ 32
උඩුමහලටත් බැටළුදොරටුවටත් අතරේ
රන්කරුවෝද වෙළෙන්දෝද අලුත්-
වැඩියාකළෝය.

## වැඩේට විරුද්ධවීම. නෙහෙමියා උපා යෙදීම

අප විසින් පවුර සාදන බව
සන්බලාට් ඇසූ විට ඔහු 4
කෝපවී, අතිශයින් උදහස්ව, යුදෙව්-
වරුන්ට නින්දකරමින්, තමාගේ 2
සහෝදරයන් සහ සමාරියේ සේනාව
ඉදිරියේදී කථාකොට: මේ බෙලහීන
යුදෙව්වෝ මක්කරද්ද? *මිනිසුන් ඔවුන්ට
ඉඩදෙනවා ඇද්ද? ඔවුන් පූජාකරනවා
ඇද්ද? දවසකින් තීන්දුකරනවා ඇද්ද?
දවා දමන්ට යෙදුණු ගල් නැවත පස්
ගොඩවලින් උපදවාගන්නවා ඇද්දැයි
කීවේය. ඔහු ළඟ සිටි අම්මොනිය 3
ටෝබියාද කථාකොට: ඔවුන් ගොඩ-
නගන ඒවාත් මොනවාද? හිවලෙක්
නැගුණොත් ඌ ඔවුන්ගේ ගල් පවුර
කඩාදමනවා ඇතැයි කීවේය. අපේ 4
දෙවියන්වහන්ස, ඇසුව මැනව; මක්-
නිසාද අපි සුළුකරනු ලබමුව. ඔවුන්
කරන නින්දව ඔවුන්ගේ ඉස පිටට හරවා,
වාල්කමේ රටක ඔවුන් කොල්ලකෑමට
පාවාදුනමැනව. ඔවුන්ගේ අපරාධය 5
නොවැසුවමැනව, ඔවුන්ගේ පාපයද ඔබ
ඉදිරියෙන් නොමැකේවා. මක්නිසාද

*නොහොත්, ඔවුන් තමුන් කොටුවෙන් ශක්තිමත් කරගන්නවා ඇද්ද?

ගොඩනගන්නන් ඉදිරිපිටදී ඔව්හු
6 ඔබ උදහස්කළෝය. තුමුත් අපි පවුර
ගොඩනැගීමුව; මෙසේ භාගයක් උසට
මුළු පවුර සාදනලද්දේය. එසේය,
වැඩකරන්ට සෙනඟට හිත තිබුණේය.
7 තවද යෙරුසලමේ පවුරු හරිගැස්සීම
ඉෂ්ටවෙන බවත් එහි බිඳුම් අහුරා-
ගනයන බවත් සන්බලාට්ද ටෝබියාද
අරාබිවරුද අම්මොන්වරුද අෂ්දෝද්වරුද
8 අසා ඉතා කෝපවූහ; ඔවුන් සියල්ලෝම
යෙරුසලමට විරුද්ධව යුද්ධකර එහි
වියවුලක් හටගන්වන්ට එක්ව
9 කුමන්ත්‍රණයකළෝය. තුමුත් අපි, අපේ
දෙවියන්වහන්සේට යාච්ඤාකොට ඔවුන්
නිසා රෑ දවල් ඔවුන්ට විරුද්ධව
10 මුරතැබීමුව. යූදවරු කථාකොට: බර
ගෙනයන්නන්ගේ ශක්තිය හීනවී තිබේ,
පස්ගොඩගැසී තිබේ; එබැවින් අපට පවුර
11 ගොඩනගන්ට බැරියයි කීවෝය. අපේ
එදිරිකාරයෝ කථාකොට: අප ඔවුන්
මැදට පැමිණ ඔවුන් මරා දමා, වැඩේ
නවත්වන තුරු, ඔවුන්ට දනෙන්නේවත්
12 පෙනෙන්නේවත් නැතැයි කීවෝය. තවද
ඔවුන් ළඟ විසූ යුදෙව්වරු සියලු
ස්ථානවලින් ඇවිත් දස වරක් අපට
කථාකොට: තුඹලා අප ළඟට හැරී
13 එන්ට ඕනෑයයි කීවෝය. ඒ නිසා මම
පවුරට පිටිපස්සෙන් පහත්වූ එළිමහන්
ඉඩම්වල සෙනඟ තමුන්ගේ පවුල්වල
ප්‍රකාරයට කඩුත් හෙල්ලත් දුනුත් ඇතුව
14 සිටෙවුවෙමි. මම බලා, නැගිට,
උත්තමයන්ටත් මුලාදෑනීන්ටත් ඉතිරි
මිනිසුන්ටත් කථාකොට: ඔවුන් ගැන
භය නොවෙල්ලා. මහත්ව භයංකරව
සිටින ස්වාමීන්වහන්සේ සිහිකරමින්
තුඹලාගේ සහෝදරයන්ද පුත්‍රයන්ද
දූවරුන්ද භාර්යාවන්ද ගෙවල්ද උදෙසා
15 සටන්කරපල්ලායයි කීවෙමි. තවද අප
ඒක දැනගත් බවද දෙවියන්වහන්සේ
ඔවුන්ගේ මන්ත්‍රණය නිෂ්ඵල කළ බවද
අපේ සතුරන්ට ආරංචිවූ කල, අපි
සියල්ලෝම එකිනෙකා තම තමාගේ
16 වැඩ කිරීමට පවුරට හැරීගියෙමු. එතැන්
පටන් මාගේ සේවකයන්ගෙන් දෙකෙන්
කොටසක් වැඩේ යෙදී සිටියෝය,
කොටසක් හෙල්ලද පලිස්ද දුනුද යුද්ධ
සැට්ටද රැගෙන සිටියෝය; අධිපතියෝද
මුළු යූද වංශයට පස්සෙන් සිටියෝය.
පවුර ගොඩනගන්නෝද බර ගෙන- 17
යන්නෝද තුමූම බර පටවාගෙන, එක
අතකින් වැඩකරමින්, අනික් අතින්
ආයුධයක් රැගෙන සිටියාහ. ගොඩ- 18
නගන්නෝද එකිනෙකා තම තමාගේ
කඩුව ඉඟටියේ බැඳගන ගොඩ-
නැගුවෝය. හොරණෑ පිඹින්නා මා
ළඟ සිටියේය. මම උත්තමයන්ටත් 19
මුලාදෑනීන්ටත් ඉතිරි මිනිසුන්ටත්
කථාකොට: මේ වැඩේ මහත්ය, විශාලය,
අපි පවුර පිට විසිරී එකිනෙකාගෙන්
දුරව සිටිමුව. යම් තැනකින් තුඹලාට 20
හොරණෑ ශබ්දය ඇසේද, එහි අප ළඟට
රැස්වෙයල්ලා; අපේ දෙවියන්වහන්සේ
අප උදෙසා සටන්කරනසේකැයි කීමි.
මෙසේ වැඩේ යෙදී සිටියෙමු. ඔවුන්ගෙන් 21
දෙකෙන් කොටසක් අලුයම් වේලේ පටන්
තරු පෙනෙන තුරු හෙල්ල රැගෙන
සිටියෝය. එම කාලයේ මම සෙනඟට 22
තවත් කථාකොට: රාත්‍රියේ අපට
රැකවලක් වන පිණිසත් දහවල්
වැඩකරන පිණිසත් එක එකා තම
තමාගේ මෙහෙකරුවා සමග රාත්‍රියේ
යෙරුසලමෙහි සිටීවයි කීවෙමි. මමවත් 23
මාගේ සහෝදරයෝවත් මාගේ
සේවකයෝවත් මා කැටුව ආවාවූ
රැකවල්ලූවත් ඇඳුම් නොගැළෙවුවෙමු,
එකිනෙකා තම තමාගේ ආයුධ ඇතුවම
වතුර ළඟට ගියේය.

## සෙනඟට වූ හිංසා පීඩා ගැන නෙහෙමියා ක්‍රියාකිරීම

5 එකල සෙනඟද ඔවුන්ගේ
භාර්යාවෝද තමුන්ගේ සහෝදර
යුදෙව්වරුන්ට විරුද්ධව මහත් ඝෝෂාවක්
කළෝය. සමහර දෙනෙක්: අපේ 2
පුත්‍රයන්ද දූවරුන්ද ඇතුළුව අපි බොහෝ
දෙනෙක් කාලා ජීවත්වෙන පිණිස ධාන්‍ය
ලබාගනිමුයයි කීවෝය. සමහරු: 3
සාගින්න නිසා ධාන්‍ය ලබාගන්න පිණිස
අප විසින් අපේ කෙත්ද මිදි වතුද ගෙවල්ද
උකස්කරනවායයි කීවෝය. තවත් 4

සමහරෙක්: රජුගේ තීරුව දීමට අපේ
බිම්ද මිදිවතුද බැඳ මිල ණයට ගතිමු.
5 ඉතින් අපේ මාංසය අපේ සහෝදරයන්ගේ
මාංසය වාගේය, අපේ දරුවෝත්
ඔවුන්ගේ දරුවන් වාගේය. එහෙත්
අපේ පුත්‍රයන්ද දූවරුන්ද දාසකමට
යටත්කරදෙමුව, අපේ දූවරුන්ගෙන්
සමහරෙක් දැනටම දාසකමට පත්ව සිටිති.
එය වෙනස්කරන්ට අපට පුළුවන්කමකුත්
නැත; අපේ බිම්ද මිදිවතුද අනුන්ට වී:
6 තිබේයයි කිවෝය. මම ඔවුන්ගේ
ඝෝෂාවද මේ වචනද ඇසූ විට: ඉතා
7 උදහස්වුණෙමි. මම මාගේ සිතින්
කල්පනාකොට, පසුව උත්තමයන්ටද
මූලාදෑනීන්ටද තරවටුකර: නුඹලා එක
එකා තම තමාගේ සහෝදරයාගෙන්
පොළිගන්නවායයි ඔවුන්ට කීවෙමි. මම
ඔවුන්ට විරුද්ධව මහත් සමූහයක්
8 රැස්කරවා ඔවුන්ට කථාකොට: අන්‍ය
ජාතීන්ට විකිණී සිටිය යුදෙව්වරුන් වන
අපේ සහෝදරයන් අපේ පුළුවන්කමේ
හැටියට අපි මිලදී මුදාගතිමු, ඉතින්
නුඹලාම නුඹලාගේ සහෝදරයන්
විකුණනවාද? ඔවුන් අපටත් විකුණනු
ලැබිය යුතුදැයි කීවෙමි. එවිට ඔව්හු
නිශ්ශබ්දව කිසි උත්තරයක් නැතුව
9 සිටියෝය. තවත් මම කථාකොට:
නුඹලා කරන දේ හොඳ නැත. අපේ
සතුරන්වූ ජාතීන්ගේ නින්ද නිසා නුඹලා
අපේ දෙවියන්වහන්සේට භය ඇතුව
10 හැසිරිය යුතු නොවේද? මමත් මාගේ
සහෝදරයොත් සේවකයොත් ඔවුන්ට
මුදල්ද ධාන්‍යද පොළියට දෙමින් සිටිමුව.
මෙයාකාර පොළිගැනීම අත්හරිමු.
11 ඔවුන්ගේ කෙත්ද මිදි වතුද ඔලීව වතුද
ගෙවල්ද, මුදල්වලටත් ධාන්‍යවලටත්
මුද්‍රික පානයටත් තෙල්වලටත් නුඹලා
ඔවුන්ගෙන් අයකරන සියයෙන් කොටසද,
අදම ඔවුන්ට නැවත දීපල්ලායයි කීමි.
12 එවිට ඔව්හු: අපි ඒවා නැවත දී,
ඔවුන්ගෙන් කිසිත් අය නොකර, ඔබ
කියන ලෙසම කරන්නෙමුයයි කීවෝය.
එවිට මම පූජකයන්ට අඬගසා, මේ
13 කීම ලෙස කරන්ට ඔවුන් දිවුරවා, මාගේ
ඔඩොක්කුව ගසාදමා කථාකොට: මේ
කීම ඉෂ්ට නොකරන කවුරු නුමුත් තම
තමාගේ ගෙයිනුත් වැඩපළවලිනුත්
දෙවියන්වහන්සේ මෙසේ ගසාදමනසේක්වා;
ඔහු මෙසේ ගසාදමනු ලැබ හිස්වේවයි
කීවෙමි. එවිට මුළු සභාව: ආමෙන්
කියා ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකළාහ.
සෙනඟ මේ කීමේ හැටියට කළෝය.
තවද යූද දේශයේ ඔවුන්ගේ දිශාධිපතියා 14
කොට මා පත්කරනු ලැබූ දවසේ සිට,
එනම් අර්තක්ෂස්තා රජුගේ විසිවෙනි
අවුරුද්දේ පටන් තිස්දෙවෙනි අවුරුද්ද
දක්වා දොළොස් අවුරුද්දක් මුළුල්ලේ,
මමවත් මාගේ සහෝදරයෝවත්
දිශාධිපතියාට නිසි කෑම නොකෑවෙමු.
නුමුත් මට ඉස්සරින් සිටි පළමු 15
දිශාධිපතීහු සෙනඟට බරක් වී, කෑමත්
මුද්‍රික පානයත් හැර රිදී ෂෙකෙල්
හතළිහකුත් ගත්තෝය; එසේය, ඔවුන්ගේ
සේවකයෝ පවා සෙනඟ කෙරෙහි
ආණ්ඩුකළෝය. එහෙත් මම දෙවියන්-
වහන්සේ කෙරෙහි භය ඇතුව සිටි නිසා
එසේ නොකෙළෙමි. එසේය, මම පවුරේ 16
වැඩේම යෙදී සිටියෙමි, අපි කිසි
බිමක් මිලේට නොගතිමු. මාගේ
සියලු සේවකයෝද ඒ වැඩේට එහි
රැස්වී සිටියෝය. ඇරත් යුදෙව්වරුන් 17
සහ මූලාදෑනීන් එකසිය පනස් දෙනෙක්ද
අප අවට සිටිය ජාතීන් වෙතින් අප
ළඟට ආ තැනැත්තෝද මාගේ මේසයේ
හිඳගත්තෝය. මට දවස්පතා පිළියෙළ 18
කරනලද්දේ ගොනෙකුත් තර බැටළුවන්
හදෙනෙකුත්ය; මේ හැර පක්ෂීන්ද දස
දවසකට වරක් සියලු වර්ගවල මුද්‍රිකපාන
බොහොමයක්ද පිළියෙළ කරනලද්දේය.
එසේ වී නුමුත් මෙහෙවරය මේ සෙනඟට
බරක්ව තිබුණු නිසා දිශාධිපතියාට නිසි
කෑම නොඉල්ලීමි. මාගේ දෙවියන්වහන්ස, 19
මේ සෙනඟ උදෙසා මා කළ සියල්ල
මට යහපත පිණිස සිහිකළ මැනව.

## තවත් විරුද්ධකම්. පවුර නිමවීම

6 කිසි කැඩුමක් ඉතුරු නොවන ලෙස
මා විසින් පවුර ගොඩනගන ලද
බව සන්බලාට්ටද ටෝබියාටද අරාබිය

ගෙෂෙම්ටද අපේ අනික් සතුරන්ටද
සැලවුණේය. එහෙත් ඒ කාලය
වෙනතුරුම මා විසින් දොරටුවල දොරවල්
2 තබා නොතිබුණේය. එවිට සන්බලාට්ද
ගෙෂෙම්ද: එන්න, අපි ඕනෝහි
සමභූමියේ ගම්වලින් එකක සම්මුඛවෙමු-
යයි මට කියා එවූවෝය. නුමුත් ඔව්හු
3 මට අනතුරු කරන්ට සිතුවෝය. මම
ඔවුන් ළඟට පණිවිඩකාරයන් යවමින්:
මම මහත් වැඩක යෙදී සිටිමි, ඒ නිසා
එන්ට බැරිය. මා විසින් වැඩ අත්හැර
දමා නුඹලා වෙතට එන පිණිස වැඩය
4 නවතින්නේ කුමටදැයි කියෙවුවෙමි. ඔව්හු
මේ ප්‍රකාරයට සතර වරක් මට කියා
එවූවෝය; මම වනාහි ඒ ප්‍රකාරයට
5 ඔවුන්ට උත්තර ඇරියෙමි. එවිට
සන්බලාට් තෙම එපරිද්දෙන්ම තමාගේ
සේවකයා අත නොපියෙවූ ලියුමක්
6 පස්වෙනි වරට මා ළඟට එවූවේය. එහි
මෙසේ ලියා තිබුණේය; නුඹත් යුදෙව්-
වරුත් කැරළිගසන්ට සිතන බවත්, ඒ
නිසා නුඹ පවුර ගොඩනගන බවත්,
මෙයාකාරයෙන් නුඹ ඔවුන්ගේ රජ
7 වෙන්ට සිටින බවත්–යූදහි රජෙක්
සිටීයයි නුඹ ගැන යෙරුසලමෙහි
ප්‍රකාශකරන්ට නුඹ ප්‍රොපේතවරුන්
නියමකළ බවත් මේ ජාතීන් අතරෙහි
සැලවී තිබේ, ගෂ්මු තෙමේද එසේ කියයි.
ඉතින් මේ වචනවල හැටියට රජ්ජුරුවන්ට
දන්වනු ලබනවා ඇත, ඒ නිසා වරෙන්න,
අපි එක්ව මන්ත්‍රණයකරගනිමු යනුයි.
8 එවිට මම පණිවිඩයක් යවා; නුඹ කියන
ඔය කාරණාවල හැටියට සිද්ධවෙලා
නැත, නුඹම ඒවා නුඹේ සිතින් උපදවා-
9 ගත්තෙහියයි කීමි. මක්නිසාද: ඒ වැඩ
ඉෂ්ට නොවෙන හැටියට ඔවුන්ගේ අත්
එයින් නවතීයයි සිතා, ඔවුන් සියල්ලෝම
අප භයගන්වන්ට උත්සාහ කළෝය.
එහෙත් දෙවියන්වහන්ස, දැන් මාගේ අත්
සවිකළමැනව.
10 ඉක්බිති මම මෙහේටබෙල්ගේ පුත්‍රවූ
දෙලායාගේ පුත්‍රයා වන ෂෙමායාගේ
ගෙදරට ගියෙමි, ඔහු දොර වසාගන
සිටියේය; එවිට ඔහු: අපි එක්ව
දෙවියන්වහන්සේගේ ගෘහයේ මන්දිරය
ඇතුළට ගොස් මන්දිරයේ දොරවල්
පියාගන සිටිමු. මක්නිසාද ඔවුන් නුඹ
මරන්ට එනවා ඇත; නුඹ මරන්ට රාත්‍රියේ
එනවායයි කීවේය. මමද: මා වැනි 11
කෙනෙකුට පලායන්ට හරිද? මා වැනි
කවරෙක් ජීවිතය ගළවාගන්න පිණිස
දේව මාලිගාවට ඇතුල්වේද? මම ඇතුල්
නොවන්නෙමියි කීවෙමි. පසුව මම 12
විභාගකර, දෙවියන්වහන්සේ ඔහු එවූවා
නොව, ටෝබියාද සන්බලාට්ද ඔහුට
අල්ලස් දුන් නිසා ඔහු මා ගැන ඒ
අනාගතවචනය කී බව දැනගතිමි. ඔවුන් 13
ඔහුට අල්ලස් දුන්නේ, මා භයවී එසේ
කර පව්කරන පිණිසත්, එයින් මට
නින්දකිරීමට නපුරු ප්‍රවෘත්තියක්
පතළකරන්ට කාරණා තමුන්ට ලැබෙන
පිණිසත්ය. මාගේ දෙවියන්වහන්ස, 14
ටෝබියාද සන්බලාට්ද කළ මේ ක්‍රියාවල
හැටියට, ඔවුන් සහ ප්‍රොපේතවරිය වූ
නෝවදියාද මා භයගන්වන්ට උත්සාහකළ
අනික් ප්‍රෝපේතවරුන්ද සිහි කළ මැනව.
පවුර වනාහි පනස් දෙදවසකින් එලුල් 15
මාසයේ විසිපස්වෙනිද නිමවූ විය. අපේ 16
සියලු සතුරන් ඒ බව ඇසූ කල අප
අවට සිටි සියලු ජාතීහු භයවූහ, ඔවුන්ගේ
ධෛර්යයද බොහෝ අඩුවුණේය.
මක්නිසාද මේ වැඩ ඉෂ්ටවුණේ අපේ
දෙවියන්වහන්සේ කරණකොටගෙන බව
ඔවුන්ට පෙනුණේය. තවද ඒ දවස්වලදී 17
යූදහි උත්තමයෝ ලියුම් බොහොමයක්
ටෝබියාට ඇරියෝය, ටෝබියාගෙන්ද
ඔවුන්ට ලියුම් ලැබුණේය. මක්නිසාද 18
ඔහු ආරාගේ පුත්‍රවූ ෂෙකනියාගේ බෑනා
නිසාත් ඔහුගේ පුත්‍රවූ යෙහෝහානාන්
බෙරෙකියාගේ පුත්‍රවූ මෙෂුල්ලාම්ගේ දුව
පාවාගත් නිසාත් යූදහි බොහෝ දෙනෙක්
ඔහු සමග දිවුරුමකින් බැඳී සිටියෝය.
තවද ඔහුගේ හොඳ ක්‍රියා ගැන ඔව්හු 19
මා ඉදිරියේදී කීවෝය, මාගේ වචනද
ඔහුට දන්නුවෝය. ටෝබියාද මා
භයගන්වන්ට ලියුම් එවීය.

## නුවර ආරක්ෂාකිරීමට විධි විධාන

පවුර ගොඩනැගුවායින් පසු මම 7
දොරවල් පිහිටෙවුවෙමි, දොරටුපාලයෝද
ගායනාකාරයෝද ලෙවීවරුද පත්කරනු

2 ලැබුවෝය. තවද මම මාගේ සහෝදරවූ
හනානිද බලකොටුවේ අධිපතියාවූ හන-
නියාද යෙරුසලම කෙරෙහි පත්කෙළෙමි.
මක්නිසාද හනනියා විශ්වාසවූ බොහෝ
මිනිසුන්ට වඩා දෙවියන්වහන්සේ
කෙරෙහි භය ඇත්තාවූ මනුෂ්‍යයෙක්ව
3 සිටියේය. මම ඔවුන්ට කථාකොට: අව්ව
සැරවෙන තුරු යෙරුසලමේ දොරවල්
ඇරීන්ට නොදෙල්ලා; ඔවුන් මුරකරන
අතරම දොරවල් වසා පොලු දමන්ට
යෙදේවා. යෙරුසලමේ වැසියන්ගෙන්
මුරකාරයන් එක් එක් කෙනා වශයෙන්
තම තමාගේ ගෙය ඉදිරිපිට මුරට
සිටුවාපල්ලායයි කීවෙමි.

## බබිලෝනියෙන් පැමිණියවුන්ගේ නාම

4 නුවර විශාලව මහත්ව තිබුණාය.
නුමුත් එහි සිටි සෙනඟ ස්වල්පය, ගෙවල්
5 ගොඩනගා තිබුණේත් නැත. පෙළපත්
වශයෙන් ගණන් කරන පිණිස
උත්තමයන්ද මූලාදෑනීන්ද සෙනඟද
රැස්කරන්ට මාගේ දෙවියන්වහන්සේ
මාගේ සිත පෙළඹෙවුසේක. පළමුවෙන්ම
ආ අයින්ගේ පෙළපත් ලේඛනය මට
සම්බවිය. එහි ලියා තිබුණේ මෙසේය:
6 බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර් විසින්
ගෙනගිය අයින්ගෙන් වාල්කමෙන් මිදී
යෙරුසලමටත් යූදහි තම තමුන්ගේ
7 නුවරවලටත් සෙරුබ්බාබෙල්ද යේෂුවාද
නෙහෙමියාද අසරියාද රයමියාද
නහමානීද මොර්දෙකයිද බිල්ෂාන්ද
මිස්පෙරෙත්ද බිග්වායිද නෙහුම්ද බානාද
සමග හැරී ආවාවූ දේශයේ පුත්‍රයෝ
මොව්හුය. ඉශ්‍රායෙල් සෙනඟවූ
මනුෂ්‍යයන්ගේ ගණන මෙසේය:
8 පරොෂ්ගේ පුත්‍රයෝ දෙදස් එකසිය හැත්තෑ
9 දෙදෙනෙක්ය. ෂෙපටියාගේ පුත්‍රයෝ
10 තුන්සිය හැත්තෑ දෙදෙනෙක්ය. ආරාගේ
පුත්‍රයෝ හසිය පනස් දෙදෙනෙක්ය.
11 පාහත්-මෝවබ්ගේ පුත්‍රයෝවූ යේෂුවාගේද
යෝවාබ්ගේද පුත්‍රයන් දෙදස් අටසිය
12 දහඅට දෙනෙක්ය. ඒලාම්ගේ පුත්‍රයෝ
එක්දස් දෙසිය පනස්හතර දෙනෙක්ය.
13 සට්ටුගේ පුත්‍රයෝ අටසිය හතළිස්පස්
දෙනෙක්ය. සක්කයිගේ පුත්‍රයෝ හත්සිය 14
හැට දෙනෙක්ය. බින්නුයිගේ පුත්‍රයෝ 15
හසිය හතළිස්අට දෙනෙක්ය. බේබයිගේ 16
පුත්‍රයෝ හසිය විසිඅට දෙනෙක්ය.
අස්ගාද්ගේ පුත්‍රයෝ දෙදස් තුන්සිය විසි 17
දෙදෙනෙක්ය. අදෙනිකාම්ගේ පුත්‍රයෝ 18
හසිය හැටහත් දෙනෙක්ය. බිග්වායිගේ 19
පුත්‍රයෝ දෙදස් හැටහත් දෙනෙක්ය.
ආදීන්ගේ පුත්‍රයෝ හසිය පනස්පස් 20
දෙනෙක්ය. හෙසකියාගේ වංශයට 21
අයිතිවූ ආටෙර්ගේ පුත්‍රයෝ අනූඅට
දෙනෙක්ය. හාෂුම්ගේ පුත්‍රයෝ තුන්සිය 22
විසිඅට දෙනෙක්ය. බේශායිගේ පුත්‍රයෝ 23
තුන්සිය විසි හතර දෙනෙක්ය. හාරීප්ගේ 24
පුත්‍රයෝ එකසිය දොළොස් දෙනෙක්ය.
ගිබියෝන්හි පුත්‍රයෝ අනූපස් දෙනෙක්ය. 25
බෙත්-ලෙහෙමේ සහ නොටොපාහි 26
මනුෂ්‍යයෝ එකසිය අසූඅට දෙනෙක්ය.
අනාතෝත්හි මනුෂ්‍යයෝ එකසිය විසි 27
අට දෙනෙක්ය. බෙත්-අස්මාවෙත්හි 28
මනුෂ්‍යයෝ හතළිස් දෙදෙනෙක්ය.
කිරියත්-යෙයාරීම්හිද කෙපීරාහිද 29
බෙයේරොත්හිද මනුෂ්‍යයෝ හත්සිය
හතළිස්තුන් දෙනෙක්ය. රාමාහිත් 30
ගෙබාහිත් මනුෂ්‍යයෝ හසිය විසිඑක්
දෙනෙක්ය. මික්මාස්හි මනුෂ්‍යයෝ 31
එකසිය විසි දෙදෙනෙක්ය. බෙතෙල්හිද 32
හායිහිද මනුෂ්‍යයෝ එකසිය විසිතුන්
දෙනෙක්ය. අනික් නෙබෝහි මනුෂ්‍යයෝ 33
පනස් දෙදෙනෙක්ය. අනික් ඒලාම්හි 34
පුත්‍රයෝ එක්දස් දෙසිය පනස් හතර
දෙනෙක්ය. හාරීම්හි පුත්‍රයෝ තුන්සිය 35
විසි දෙනෙක්ය. යෙරිකෝවේ පුත්‍රයෝ 36
තුන්සිය හතළිස්පස් දෙනෙක්ය. ලොද්හිද 37
හාදිද්හිද ඕනෝහිද පුත්‍රයෝ හත්සිය
විසිඑක් දෙනෙක්ය. සෙනායාහි පුත්‍රයෝ 38
තුන්දස් නවසිය තිස් දෙනෙක්ය. පූජකයෝ 39
නම්: යේෂුවාගේ වංශයේ යෙදයාගේ
පුත්‍රයෝ නවසිය හැත්තෑතුන් දෙනෙක්ය.
ඉම්මේර්ගේ පුත්‍රයෝ එක්දස් පනස් 40
දෙදෙනෙක්ය. පෂ්හූර්ගේ පුත්‍රයෝ එක්දස් 41
දෙසිය හතළිස්හත් දෙනෙක්ය. හාරීම්ගේ 42
පුත්‍රයේ එක්දස් දහහත් දෙනෙක්ය.
ලෙවීවරු නම්: හෝදෙවාගේ පුත්‍රයන්ගෙන් 43
කෙනෙක්වූ කද්මීයෙල්ගෙන් පැවත
ආවාවූ යේෂුවාගේ පුත්‍රයෝ හැත්තෑහතර

44 දෙනෙක්ය. ගීතිකාකාරයෝවූ ආසාප්ගේ
පුත්‍රයෝ එකසිය හතළිස්අට දෙනෙක්ය.
45 දෙරටුපාලයෝවූ ෂල්ලුම්ගේ පුත්‍රයෝද
ආටෙර්ගේ පුත්‍රයෝද ටල්මොන්ගේ
පුත්‍රයෝද අක්කුබ්ගේ පුත්‍රයෝද
හටීටාගේ පුත්‍රයෝද ෂෝබයිගේ පුත්‍රයෝද
46 එකසිය තිස්අට දෙනෙක්ය. නෙතිනීම්වරු
නම්: ශීහාගේ පුත්‍රයෝය, හසුපාගේ
පුත්‍රයෝය, ටබ්බාවොත්ගේ පුත්‍රයෝය;
47 කෙරොස්ගේ පුත්‍රයෝය, සියාගේ
පුත්‍රයෝය, පාදොන්ගේ පුත්‍රයෝය;
48 ලෙබානාගේ පුත්‍රයෝය, හගාබාගේ
පුත්‍රයෝය, සල්මයිගේ පුත්‍රයෝය;
49 හානාන්ගේ පුත්‍රයෝය, ගිද්දෙල්ගේ
පුත්‍රයෝය, ගහර්ගේ පුත්‍රයෝය;
50 රෙයායාගේ පුත්‍රයෝය, රෙශීන්ගේ
පුත්‍රයෝය, නෙකෝදගේ පුත්‍රයෝය;
51 ගස්සාම්ගේ පුත්‍රයෝය, උස්සාගේ
පුත්‍රයෝය, පාසේයාගේ පුත්‍රයෝය;
52 බේසයිගේ පුත්‍රයෝය, මෙයුනීම්ගේ
පුත්‍රයෝය, නෙෆූෂෙසිම්ගේ පුත්‍රයෝය;
53 බක්බූක්ගේ පුත්‍රයෝය, හකුපාගේ
පුත්‍රයෝය, හර්හූර්ගේ පුත්‍රයෝය;
54 බශ්ලීත්ගේ පුත්‍රයෝය, මෙහිදගේ
පුත්‍රයෝය, හර්ෂාගේ පුත්‍රයෝය.
55 බර්කොස්ගේ පුත්‍රයෝය, සීසෙරාගේ
පුත්‍රයෝය, තෙමාගේ පුත්‍රයෝය;
56 නෙශීයාගේ පුත්‍රයෝය, හටීපාගේ
57 පුත්‍රයෝය. සාලමොන්ගේ සේවකයන්ගේ
පුත්‍රයෝ නම්: සෝටයිගේ පුත්‍රයෝය,
සොපෙරෙත්ගේ පුත්‍රයෝය, පෙරීදගේ
58 පුත්‍රයෝය; යයලාගේ පුත්‍රයෝය,
දර්කොන්ගේ පුත්‍රයෝය, ගිද්දෙල්ගේ
59 පුත්‍රයෝය; ෂෙපටියාගේ පුත්‍රයෝය,
හට්ටිල්ගේ පුත්‍රයෝය, පොකෙරෙත්-
හශ්ශෙබායිම්ගේ පුත්‍රයෝය, ආමොන්ගේ
60 පුත්‍රයෝය. නෙතිනීම්වරුද සාලමොන්ගේ
සේවකයන්ගේ පුත්‍රයෝද යන සියල්ලෝ
61 තුන්සිය අනූ දෙදෙනෙක්ය. තේල්-
මෙලෙහෙන්ද තේල්-හර්ෂායෙන්ද
කෙරුබෙන්ද අද්දෝනෙන්ද ඉම්මේරෙන්ද
ආවාවූ, තමුන් ඉශ්‍රායෙල්වරුන් බවට
තමුන්ගේ පියවංශයත් තමුන්ගේ
පෙළපතත් පෙන්වන්ට බැරිවූ අය නම්:
62 දෙලායාගේ පුත්‍රයෝත් ටෝබියාගේ
පුත්‍රයෝත් නෙකෝදගේ පුත්‍රයෝත් හසිය
හතළිස් දෙදෙනෙක්ය. පූජකයන්ගෙන් 63
හෝබායාගේ පුත්‍රයෝත් හක්කොශ්ගේ
පුත්‍රයෝත් ගිලියදිය බර්සිල්ලයිගේ
දූවරුන්ගෙන් භාර්යාවකු පාවාගෙන
ඔවුන්ගේ නාමය ලැබූ බර්සිල්ලයිගේ
පුත්‍රයොත්ය. මොව්හු නාම සටහන්වූ 64
තමුන්ගේ පෙළපත් ලේඛනය සෙවූ
නුමුත් සම්බනූණ බැවින් අපවිත්‍ර අය
මෙන් ගණන්ගන්නාලදුව පූජකකමෙන්
අහක්කරනු ලැබුවෝය. *ඌරීම් සහ 65
තුම්මීම් ඇති පූජකයෙක් නැගිටින තුරු
ඔවුන් විසින් ඉතා ශුද්ධ දේවල් නොකෑ
යුතුයයි †තිර්ෂාතා තෙමේ ඔවුන්ට
කීවේය. මුළු සභාවේ ගණන නම් හතළිස් 66
දෙදස් තුන්සිය හැටක්ය. ඒ ඇර ඔවුන්ගේ 67
වැඩකාරයොත් වැඩකාරියොත් හත්දස්
තිස්හත් දෙනෙක් වූවෝය. ඔවුන් අතරේ
ගී කියන පුරුෂයොත් ගී කියන ස්ත්‍රීවරුත්
දෙසිය හතළිස්පස් දෙනෙක් සිටියෝය.
ඔවුන්ගේ අශ්වයෝ හත්සිය තිස් 68
හදෙනෙක්ය; ඔවුන්ගේ අශ්වතරයෝ
දෙසිය හතළිස්පස් දෙනෙක්ය. ඔටුවෝ 69
හාරසිය තිස්පස් දෙනෙක්ය; කොටළුවෝ
හදස් හත්සිය විසි දෙනෙක්ය.

## වැඩේට පඬුරු දීම

තවද පියවංශවල ප්‍රධානීන් අතරෙන් 70
සමහරු වැඩේට දයකවුණෝය †තිර්ෂාතා
රන් දරික් මිල දහසකුත් පාත්‍රා පනසකුත්
පූජක-ඇඳුම් පන්සිය තිහකුත් ගබඩාවට
දුන්නේය. පියවංශවල ප්‍රධානීන්ගෙන් 71
සමහරු රන් දරික් මිල විසිදහසකුත්
රිදී රාත්තල් දෙදස් දෙසියයකුත් වැඩ-
ගබඩාවට දුන්නෝය. සෙනඟගෙන් ඉතිරි 72
අය දුන්නේ රන් දරික් මිල විසි දහසකුත්
රිදී රාත්තල් දෙදහසකුත් පූජක-ඇඳුම්
හැට හතකුත්ය. මෙසේ පූජකයෝද 73
ලෙවීවරුද දෙරටුපාලයෝද ගායනා-
කාරයෝද සෙනඟගෙන් සමහරුද
නෙතිනීම්වරුද සියලු ඉශ්‍රායෙල්වරුද
තමුන්ගේ නුවරවල විසුවෝය.

*එනම්, ආලෝක සහ සම්පූර්ණකම්
ප්‍රකාශ කරන පස ඇට විශේෂයක්.
†හෙවත්, දිශාධිපතියා.

## ව්‍යවස්ථාපොත කියවා තේරුම් කරදීම

හත්වෙනි මාසය පැමිණි කල ඉශ්‍රායෙල්
පුත්‍රයෝ තමුන්ගේ නුවරවල සිටියෝය.
8 මුළු සෙනඟද එක්කෙනෙකු මෙන්
වතුර-දොරටුව ඉදිරිපිට තිබුණු
එළිමහනෙහි රැස්වූහ. එවිට, ස්වාමීන්-
වහන්සේ විසින් ඉශ්‍රායෙල්වරුන්ට
අණකළ මෝසෙස්ගේ ව්‍යවස්ථාපොත
ගෙනෙන්ට ලියන්නා වන එස්රාට
2 කීවෝය. පූජකයාවූ එස්රාද හත්වෙනි
මාසයේ පළමුවෙනිද සභාව ඉදිරියට
එනම් පුරුෂයන්ද ස්ත්‍රීන්ද අසා
තේරුම්ගන්ට පුළුවන්වූ සියල්ලන්ද
3 ඉදිරියට ව්‍යවස්ථාපොත ගෙනවුත්, වතුර
දොරටුව ඉස්සරහපිට තිබුණු එළිමහන්
ඉඩම ඉදිරිපිට සිට, පුරුෂයන්ද ස්ත්‍රීන්ද
තේරුම්ගන්ට පුළුවන් තැනැත්තන්ද
ඉදිරියේදී පහන් වේලාවේ පටන් ඉර
මුදුන් වේලාව දක්වා ඒ පොත කියෙවුවේය;
මුළු සෙනඟද ව්‍යවස්ථාපොතට ඇහුම්කන්
4 දුන්නෝය. ඒ පිණිස සාදනලද ලී
මංචකයක් පිට ලියන්නාවූ එස්රා
සිටියේය; ඔහු ළඟ ඔහුගේ දකුණු
පැත්තෙන් මත්තිතියාද ෂෙමාද අනායාද
ඌරියාද හිල්කියාද මයසේයාද; වම්
පැත්තෙන් පෙදයාද මිෂායෙල්ද
මල්කියාද හාෂුම්ද හෂ්බද්දනාද
5 ශෙකරියාද මෙෂුල්ලාම්ද සිටියෝය. මුළු
සෙනඟට ඉහළින් සිටි එස්රා මුළු
සෙනඟගේ ඇස් හමුයෙහි පොත
දිගඇරියේය: ඔහු ඒක දිගඇරින විට
6 මුළු සෙනඟ නැගිට්ටෝය. එස්රා උතුම්
දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකෙළේය.
මුළු සෙනඟද අත් ඔසවමින්: ආමෙන්
ආමෙන් කියා, මුහුණින් බිමට නැමී
ස්වාමීන්වහන්සේට නමස්කාරකළෝය.
7 තවද යේෂුවාද බානීද ෂේරෙබියාද
යාමීන්ද අක්කුබ්ද ෂබ්බෙතයිද හෝදියාද
මයසේයාද කෙලීටාද අසරියාද
යෝසාබාද්ද හානාන්ද පෙලායාද
ලෙවීවරුද ව්‍යවස්ථාව සෙනඟට
තේරුම්කරදුන්නෝය. සෙනඟ තමුන්ගේ
8 ස්ථානයෙහි සිටියෝය. මෙසේ ඔව්හු
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාපොත
පැහැදිලිලෙස කියවා අර්ථය
තෝරාදුන්නෝය, මිනිස්සුද කියෙවූ
දේ තේරුම්ගත්තෝය. *තිර්ෂාතාවූ 9
නෙහෙමියාද ලියන්නාවූ පූජක එස්රාද
සෙනඟට ඉගැන්වූ ලෙවීවරුද මුළු
සෙනඟට කථාකොට: අද දවස
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට
ශුද්ධය; වැලපෙන්ටවත් අඬන්ටවත්
එපායයි කීවෝය. මක්නිසාද මුළු සෙනඟ
ව්‍යවස්ථාවේ වචන ඇසූකල ඇඬුවෝය.
එවිට ඔහු ඔවුන්ට කථාකොට: නුඹලා 10
ගොස් රසවත් දේවල් කා, මිහිරි පානය
බී, කිසිවක් සූදනම් කර නොගත් අයට
කොටස් ඇරපල්ලා. මක්නිසාද අද දවස
අපේ ස්වාමීන්වහන්සේට ශුද්ධය.
ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිවීම
නුඹලාගේ ශක්තියය, එබැවින් ශෝක
නොවෙල්ලායයි කීවේය. ලෙවීවරුද: අද 11
දවස ශුද්ධ නිසා නිශ්ශබ්දවෙයල්ලා;
ශෝක නොවෙල්ලායයි කියා මුළු
සෙනඟ නිශ්චලකළෝය. එසේ මුළු 12
සෙනඟ කන්ටත් බොන්ටත් කොටස්
අරින්ටත් බොහෝසේ ප්‍රීතිවෙන්ටත්
ගියෝය, මක්නිසාද තමුන්ට දන්වනලද
වචන ඔව්හු තේරුම්ගත්තෝය.

## පැල් මංගල්‍යය නැවත පිහිටුවීම

දෙවෙනිද මුළු සෙනඟගේ පියවංශවල 13
ප්‍රධානියෝද පූජකයෝද ලෙවීවරුද
ව්‍යවස්ථාවේ වචන කල්පනාකරන පිණිස
ලියන්නාවූ එස්රා වෙතට රැස්වුණෝය.
එවිට හත්වෙනි මාසයේ මංගල්‍යයේදී 14
ඉශ්‍රායෙල් පුත්‍රයන් පැල්වල වාසයකළ
යුතුය කියාත්, ලියා තිබෙන හැටියට:
පැල් සාදන පිණිස නුඹලා කඳුකරයට 15
ගොස් ඔලීව අතුද වල් ඔලීව අතුද
මරඳ අතුද තල් අතුද අතු සනව තිබෙන
ගස්වල අතුද ගෙනෙල්ලායයි ඔවුන්ගේ
සියලු නුවරවලද යෙරුසලමෙහිද
ප්‍රසිද්ධකර දන්විය යුතුය කියාත්
ස්වාමීන්වහන්සේ මෝසෙස් ලවා
අණකෙරෙවූ බව ව්‍යවස්ථාවේ ලියා
තිබෙනවා සම්බවුණෝය. එබැවින් සෙනඟ 16

*එනම්, දිශාධිපතියා.

ගොස් ඒවා ගෙනැවිත්, එක් එක්කෙනා
තම තමාගේ පියස්ස උඩත් තමුන්ගේ
මිදුල්වලත් දෙවියන්වහන්සේගේ ගෘහයේ
මිදුල්වලත් වතුර-දෙරටුවේ එළිමහනෙත්
එප්‍රායිම් දෙරටුවේ එළිමහනෙත් පැල්
17 සාදගත්තෝය. වාල්කමෙන් මිදී ආ
තැනැත්තන්වූ මුළු සභාව පැල් සාදගන
පැල්වල විසුවෝය. නූන්ගේ පුත්‍රවූ
යේෂුවාගේ දවස්වල පටන් ඒ දවස දක්වා
ඉශ්‍රායෙල් පුත්‍රයෝ එසේ නොකළෝය.
18 ඉතා මහත් සන්තෝෂයක්ද විය. තවද
පළමුවෙනිද පටන් අන්තිම දවස දක්වා
ඔහු දවසින් දවස දෙවියන්වහන්සේගේ
ව්‍යවස්ථාපොත කියෙවුවේය. ඔව්හු සත්
දවසක් මංගල්‍යය පැවැත්තුවෝය;
අටවෙනිද නියමය ලෙස ගරුමය
මංගල්‍යය රැස්වීමක් වූයේය.

## සෙනඟ නිරාහාරව හිඳීම සහ කන්නලවුකිරීම

9 තවද ඒ මාසයේ විසි හතරවෙනිද
ඉශ්‍රායෙල් පුත්‍රයෝ නිරාහාරව
ගෝණි රෙදි හැඳ, තමුන්ගේ හිස පිට
2 පස් ලාගෙන, රැස්ව සිටියෝය. ඉශ්‍රායෙල්
වංශය සියලු අන්‍ය ජාතීන්ගෙන් වෙන්ව
සිටගන තමුන්ගේ පව්ද තමුන්ගේ
පියවරුන්ගේ අපරාධද කියාදුන්නෝය.
3 ඔව්හු තමුන්ගේ ස්ථානයෙහි නැගිට සිට,
දවසෙන් හතරෙන් කොටසක් තුළ
තමුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
ව්‍යවස්ථාපොත කියෙවුවෝය; තවත්
හතරෙන් කොටසක් තුළ පව් කියාදී
තමුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
4 නමස්කාරකළෝය. එවිට යේෂුවාද
බානීද කද්මීයෙල්ද ෂෙබනියාද බුන්නීද
ෂේරෙබියාද බානීද කෙනානීද
ලෙවීවරුන්ගේ මංචකයේ පඩි පිට සිට
මහත් හඬකින් තමුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** යාච්ඤාකළෝය.
5 පසුව යේෂුවාද කද්මීයෙල්ද බානීද
හෂබ්නෙයාද ෂේරෙබියාද හෝදියාද
ෂෙබනියාද පෙතහියාද යන ලෙවීවරු
කථාකොට: තුඹලා නැගිට තුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** සදාකාලයෙන්
සදාකාලයට ප්‍රශංසාකරපල්ලා. එසේය,
සියලු ප්‍රශංසාවලටත් වර්ණනාවලටත්
වඩා උසස්ව තිබෙන ඔබගේ තේජවත්
නාමයට ප්‍රශංසාවේවා. ඔබම, ඔබ 6
පමණක්ම, **ස්වාමීන්වහන්සේය**; ඔබ
ස්වර්ගය සහ ස්වර්ගවල ස්වර්ගයද එහි
සියලු සේනාවන්ද පොළොව සහ එහි
මතු පිට ඇති සියල්ලද සමුද්‍රය සහ එහි
ඇති සියල්ලද මැවූසේක. ඔබම ඒ
සියල්ල රක්ෂණය කරනසේක; ස්වර්ග
සේනාවද ඔබට නමස්කාරකෙරෙති. ඔබ 7
වනාහි ආබ්‍රම් තෝරාගෙන, ඌර් නම්වූ
කල්දිවරුන්ගේ නුවරින් ඔහු ගෙනවුත්,
ආබ්‍රහම් යන නම ඔහුට තැබුවාවූ දෙවිවූ
**ස්වාමීන්වහන්සේය**; ඔබ ඉදිරියෙහි ඔහුගේ 8
සිත විශ්වාසව තිබෙන බව දැක, ඔබ
කානානිවරුන්ගේද හිත්තීවරුන්ගේද
අමෝරිවරුන්ගේද පෙරිස්සිවරුන්ගේද
යෙබූසිවරුන්ගේද ගිර්ගාෂිවරුන්ගේද
දේශය දෙන්ට–ඔහුගේ වංශයට දෙන්ට–
ඔහු සමග ගිවිසුමක් කර, ඔබගේ වචන
ඉෂ්ටකළසේක; මක්නිසාද ඔබ ධර්මිෂ්ඨය.
තවද මිසරයේදී අපේ පියවරුන්ගේ 9
පීඩාව ඔබ දුටුසේක, රතු මුහුද ළඟදී
ඔවුන්ගේ මොරගැසීමද ඔබ ඇසූසේක;
ඵාරාවෝද ඔහුගේ සියලු සේවකයන්ද 10
ඔහුගේ දේශයේ මුළු සෙනඟද කෙරෙහි
ලකුණු හා ආශ්චර්යකර වදාළසේක;
මක්නිසාද ඔවුන්ට විරුද්ධව ඒ අය
උඩඟුකම් කරන බව ඔබ දැනගෙන
සිටිසේක; ඔබද අද දවසේ තිබෙන ලෙස
ඔබට නාමයක් උපදවා ගත්සේක. තවද 11
ඔවුන් මුහුද මැදින් වියළි බිම පිට යන
ලෙස ඔවුන්ට පෙරටුවෙන් ඔබ මුහුද
බෙදූසේක; ඔවුන් ඔස්සේ ලුහුබැඳවාගෙන
ආ තැනැත්තන් ඔබ මහත් ජලයෙහි
ගලක් දමන්නාක් මෙන් ගැඹුරට හෙළූ-
සේක. ඔබ දවල් වලා ටැඹකින්ද ඔවුන් 12
යන මාර්ගයේදී ඔවුන්ට එළිය දෙන
පිණිස රෑ ගිනි ටැඹකින්ද ඔවුන්
ගෙනගියසේක. ඔබ සීනයි කන්ද 13
පිටට බැස, ස්වර්ගයේ සිට ඔවුන්
සමග කථාකර, හරිවූ විනිශ්චයන්ද
සැබෑ ව්‍යවස්ථාවන්ද යහපත් පනත්ද
ආඥාද ඔවුන්ට දුන්සේක. ඔබගේ 14
මෙහෙකරුවාවූ මෝසෙස් ලවා ඔබගේ
ශුද්ධවූ සබත් දවස්ද ඔබ ඔවුන්ට දන්වා,

ආඥාද පනත්ද ව්‍යවස්ථාවක්ද ඔවුන්ට
15 නියමකළසේක. ඔවුන්ගේ බඩගින්නට
ඔබ ස්වර්ගයෙන් ඔවුන්ට කෑම දුන්සේක,
ඔවුන්ගේ පිපාසයට පර්වතයෙන් ඔවුන්ට
වතුර නික්මෙවුසේක, ඔබ ඔවුන්ට දෙන
ලෙස ඔබගේ අත ඔසවා දිවුළ දේශය
හිමිකරගැනීමට ඇතුල්වෙන්ට කියාද
16 ඔවුන්ට අණකළසේක. නුමුත් ඔව්හුද
අපේ පියවරුද උඩඟුකම්කර, තමුන්ගේ
කුළල් තදකරගන, ඔබගේ ආඥාවන්ට
17 ඇහුම්කන්නොදී සිටියෝය. ඔව්හු
කීකරුවෙන්ට අකැමැතිවී, ඔවුන් අතරේ
ඔබ කළ පුදුමවල් සිහි නොකර, තමුන්ගේ
කුළල් තදකරගෙන, වාල්කමට හැරී යන
පිණිස තමුන්ගේ කැරළිකාරකමෙන්
ප්‍රධානියෙකු පත්කරගත්තෝය. එහෙත්
ඔබ කමාවෙන්නාවූ, දයාබරවූ,
අනුකම්පාවෙන් පූර්ණවූ, ඉවසිලිවන්තවූ,
කරුණාභරිතවූ දෙවිකෙනෙක් බැවින්,
18 ඔබ ඔවුන් අත් නොහැරියසේක. එසේය,
ඔව්හු තමුන්ට වාත්තු වස්සෙක්
සාදගෙන: මිසරයෙන් නුඹ ගෙනාවාවූ
නුඹේ දෙවියන්වහන්සේ මේයයි කියා
මහත් දේව අපහාසයන් කළ විටත්,
19 ඔබගේ මහත් අනුකම්පාව නිසා ඔබ
ඔවුන් කාන්තාරයෙහි අත් නො-
හැරියසේක. මාර්ගයේ ඔවුන් ගෙනගිය
වලා ටැඹ දවාලේවත්, ඔවුන් යා යුතු
මාර්ගයේදී ඔවුන්ට එළිය දුන් ගිනි ටැඹ
රාත්‍රියේවත් ඔවුන් කෙරෙන් පහ නොවීය.
20 ඔවුන්ට ගුරුකම් දෙන පිණිස ඔබගේ
යහපත් ආත්මය ඔබ දුන්සේක, ඔවුන්ගේ
මුඛයෙන් ඔබගේ මන්නා ඔබ අහක්කර
නොගත්සේක, ඔවුන්ගේ පිපාසයටද
21 ඔබ ඔවුන්ට වතුර දුන්සේක. එසේය,
ඔබ හතළිස් අවුරුද්දක් කාන්තාරයේදී
ඔවුන් පෝෂණයකළසේක, ඔවුන්ට
කිසි හිඟකමක් නොවීය; ඔවුන්ගේ
ඇඳුම් පරණවුණේවත් ඔවුන්ගේ පාද
22 ඉදිමුණේවත් නැත. තවද ඔබ රාජ්‍යයන්ද
ජනයන්ද ඔවුන්ට දී, ඔවුන් පළාත්වලට
බෙදා නියමකළසේක. මෙසේ ඔව්හු
සීහොන්ගේ දේශය එනම් හෙෂ්බොන්හි
රජුගේ දේශයත් බාෂාන්හි රජවූ ඕග්ගේ
23 දේශයත් හිමිකරගත්තෝය. ඔබ අහසේ
තාරකා මෙන් ඔවුන්ගේ දරුවන් වැඩිකර,
හිමිකරගන්ට ඔවුන් ඇතුල්විය යුතුය
කියා ඔබ ඔවුන්ගේ පියවරුන්ට කී
දේශයට ඔවුන් පැමිණෙවුසේක. ඔවුන්ගේ 24
දරුවෝද ඇතුල්වී දේශය හිමිකරගත්-
තෝය. ඔබ ඔවුන්ට පෙරටුවෙන් දේශයේ
වැසියන්වූ කානානිවරුන් යටත්කර,
ඔවුන්ගේ කැමැත්ත ලෙස කිරීමට ඒ
තැනැත්තන්ද ඔවුන්ගේ රජවරුන්ද
දේශයේ ජාතීන්ද ඔවුන් අතට පාවාදුන්-
සේක. ඔව්හු පවුරු ඇති නුවරවල්ද සාරවූ 25
රටක්ද අල්ලාගන, සියලු ආකාර හොඳ
දේවලින් පිරී තිබුණු ගෙවල්ද හෑරූ
තටාකද මිදි වතුද ඔලීව වතුද ඵලදෙන
බොහෝ ගස්ද හිමිකරගන, කා
තෘප්තියට පැමිණ තරවී, ඔබගේ මහත්
යහපත්කම කරණකොටගෙන සැපෙන්
පසුවූවෝය. එසේ වී නුමුත් ඔව්හු 26
අකීකරුව ඔබට විරුද්ධව කැරළි ගසා,
ඔබගේ ව්‍යවස්ථාව තමුන් පිටිපස්සට
දමා, ඔබ වෙතට ඔවුන් හරවාගන්ට
ඔවුන්ට අවවාදකළ ඔබගේ ප්‍රොපේතවරුන්
මරා, මහත් දේව අපහාසයන් කළෝය.
එහෙයින් ඔබ ඔවුන්ගේ එදිරිකාරයන් 27
අතට ඔවුන් පාවාදුන්සේක, ඔව්හු
ඔවුන්ට පීඩාකළෝය. ඔවුන්ගේ පීඩා
කාලයේදී ඔවුන් ඔබට මොරගැසූ කල
ඔබ ස්වර්ගයේ සිට අසා, ඔබගේ
මහත් අනුකම්පාව නිසා ඔවුන්ගේ
එදිරිකාරයන්ගේ අතින් ඔවුන් ගළවාගත්
ගැළවුම්කාරයන් ඔවුන්ට දුන්සේක. නුමුත් 28
ඔවුන්ට නිදහස ලැබුණ විට ඔව්හු නැවත
ඔබ ඉදිරියෙහි නපුරුකම් කළෝය. එවිට
ඔවුන්ගේ සතුරන් ඔවුන් කෙරෙහි බලය
පවත්වන පිණිස ඔබ ඔවුන් සතුරන්ගේ
අතට අත්හැරියසේක. එහෙත් ඔවුන්
නැවතත් මොරගැසූවිට ඔබ ස්වර්ගයේ
සිට අසා, ඔබගේ අනුකම්පාවල හැටියට
බොහෝ වතාවල ඔවුන් නිදහස්කළ-
සේක; ඔබගේ ව්‍යවස්ථාවට ඔවුන් 29
හරවාගන්ට ඔබ ඔවුන්ට අවවාදකළ-
සේක. එහෙත් ඔව්හු උඩඟුකම්කර, ඔබගේ
ආඥාවලට ඇහුම්කන් නොදී, මනුෂ්‍යයා
ජීවත්වෙන පිණිස ඔහු විසින් කළ
යුතුවූ ඔබගේ විනිශ්චයවලට විරුද්ධව
පව්කොට, පෙරළිකාර කරක් ඇතුව,
තමුන්ගේ කුළල් තදකරගන, ඇහුම්කන්

30 නොදී සිටියෝය. එහෙත් ඔබ බොහෝ
අවුරුදු ගණනක් ඔවුන් ගැන ඉවසා,
ඔබගේ ආත්මයෙන් ඔබගේ ප්‍රොපේතවරුන්
ලවා ඔවුන්ට අවවාදකෙරෙවුසේක. නුමුත්
ඔව්හු ඇහුම්කන් නුදුන්නෝය. ඔබද
දේශවල ජනයන් අතට ඔවුන් පාවාදුන්-
31 සේක. එසේ වී නුමුත් ඔබගේ මහත්
අනුකම්පාව නිසා ඔබ ඔවුන් මුළුමනින්ම
නැතිකරදැමූවේවත් ඔවුන් අත්හැරදැමූ-
වේවත් නැත; මක්නිසාද ඔබ දයාබරවූ
අනුකම්පා ඇත්තාවූ දෙවිකෙනෙක්ය.
32 ඉතින් අපේ දෙවියන්වහන්ස, මහත්වූ,
බලවත්තවූ, භයානකවූ, ගිවිසුම්ද
කරුණාවද පවත්වන්නාවූ දෙවියන්-
වහන්ස, අෂූර්හි රජුන්ගේ කාලයේ සිට
අද දක්වා අපටත් අපේ රජවරුන්ටත්
අපේ අධිපතීන්ටත් අපේ පූජකයන්ටත්
අපේ ප්‍රොපේතවරුන්ටත් අපේ පිය-
වරුන්ටත් ඔබගේ මුළු සෙනඟටත්
පැමිණි සියලු දුක් ගැහැට ඔබ ඉදිරියෙහි
33 සුළුව නොපෙනේවා. ඔබ වනාහි
අපට පැමිණි සියල්ල ගැන ධර්මිෂ්ඨව
සිටිනසේක; මක්නිසාද ඔබ සැබෑ ලෙස
ක්‍රියාකළසේක, අපි නම් දුෂ්ටකම්
34 කෙළෙමුව. අපේ රජවරුන්ද අපේ
අධිපතීන්ද අපේ පූජකයන්ද අපේ
පියවරුන්ද ඔබගේ ව්‍යවස්ථාව
පැවැත්තුවේවත්, ඔබගේ ආඥාවලටද ඔබ
ඔවුන්ට කළ ඔබගේ අවවාදවලටද
35 ඇහුම්කන් දුන්නේවත් නැත. ඔවුන්
තමුන්ගේ රාජ්‍යයේදීද ඔබ ඔවුන්ට දුන්
මහත් යහපත්කම්න්ද ඔබ ඔවුන්ට
දුන් විශාල සාරවත් දේශයේදීද ඔබට
සේවයකළේවත්, තමුන්ගේ නපුරු ක්‍රියා-
36 වලින් අහක්වුණේවත් නැත. මෙන්න, අපි
දැනට දසයෝය, උපදින ඵලද හොඳ
දේවල්ද භුක්තිවිඳින්ට ඔබ අපේ පිය-
වරුන්ට දුන් දේශයෙහිම මෙන්න, අපි
37 දසයෝව සිටිමුව. එය අපේ පව් නිසා
ඔබ අප කෙරෙහි පත්කළ රජුන්ට බොහෝ
අස්වැන්න උපදවන්නේය. ඔව්හු තමුන්ගේ
කැමැත්ත පරිදි අපේ ශරීර කෙරෙහිත්
බලය පවත්වති, අපිද මහත් දුකින්
38 සිටිමුව. මේ සියල්ල තිබෙද්දීත් අපි
ස්ථිරවූ ගිවිසුමක් කර, ඒක ලියා තබමුව;
අපේ අධිපතීහුද අපේ ලෙවීවරුද අපේ
පූජකයෝද ඒක මුද්‍රාකෙරෙතියි කීවෝය.

## ගිවිසුමට බැඳුණු අය. එහි කාරණා

10 මුද්‍රාකළ අය නම්: හකලියාගේ
පුත්‍රවූ *තිර්ෂාතාවූ නෙහෙමියාද
ශෙදකියාද; සෙරායාද අසරියාද යෙරමියාද; 2
පෂ්හූර්ද අමරියාද මල්කියාද; හට්ටූෂ්ද 3,4
ෂෙබනියාද මල්ලූක්ද; හාරීම්ද මෙරේමොත්ද 5
ඔබදියාද; දනියෙල්ද ගින්නෙතොන්ද 6
බාරුක්ද; මෙෂුල්ලාම්ද අබියාද මියාමින්ද; 7
මයසියාද බිල්ගයිද ෂෙමායාද යන 8
පූජකයෝය. ලෙවීවරු වන අසනියාගේ 9
පුත්‍රවූ යේෂූවාද හෙනාදද්ගේ පුත්‍රයන්ගෙන්
එක්කෙනෙක්වූ බින්නූයිද කද්මීයෙල්ද;
ඔවුන්ගේ සහෝදරයෝවූ ෂෙබනියාද 10
හෝදියාද කෙලීටාද පෙලායාද හානාන්ද;
මීකාද, රෙහොබ්ද, හෂබියාද; සක්කූර්ද 11,12
ෂේරෙබියාද ෂෙබනියාද; හෝදියාද 13
බානීද බෙනීනුද යන තැනැත්තෝය.
සෙනඟගේ ප්‍රධානියෝවූ පාරෝෂ්ද 14
පාහත්-මෝවබ්ද ඒලාම්ද සට්ටූද බානීද;
බුන්නීද අස්ගාද්ද බේබයිද; අදෝනියාද 15,16
බිග්වායිද ආදීන්ද; ආටෙර්ද හෙසකියාද 17
අස්සූර්ද; හෝදියාද හාෂුම්ද බේශයිද; 18
හාරීප්ද අනාතෝත්ද නේබයිද; 19
මග්පියාෂ්ද මෙෂුල්ලාම්ද හේසීර්ද; 20
මෙෂේසබියෙල්ද ශාදෝක්ද යද්දූවාද; 21
පෙලටියාද හානාන්ද අනායාද; හෝෂෙයාද 22,23
හනනියාද හෂ්ෂූබ්ද; හල්ලෝහෙෂ්ද 24
පිල්හාද ෂෝබෙක්ද; රෙහූම්ද හෂබ්නාද 25
මයසේයාද; අහියාද හානාන්ද ආනාන්ද; 26
මල්ලූක්ද හාරීම්ද බානාද යන 27
තැනැත්තෝය. සෙනඟගෙන් ඉතිරි අයද 28
පූජකයෝද ලෙවීවරුද දොරටුපාලයෝද
ගීතිකාකාරයෝද නෙතිනීම්වරුද දේශවල
ජනයන්ගෙන් වෙන්ව දෙවියන්වහන්සේ-
ගේ ව්‍යවස්ථාවට හැරුණු සියල්ලෝද
ඔවුන්ගේ භාර්යාවෝද ඔවුන්ගේ
පුත්‍රයන්ගෙන් සහ දූවරුන්ගෙනුත් දැනුම්
තේරුම් ඇති සියල්ලෝද, තමුන්ගේ 29
උත්තමයන් වන තමුන්ගේ සහෝදරයන්ට
එකතුවී, දෙවියන්වහන්සේගේ මෙහෙ-
කරුවාවූ මෝසෙස් අතින් දෙනලද
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි
හැසිරෙන හැටියටත්, අපේ ස්වාමිවූ

*එනම්, දිශාධිපතියා.

ස්වාමීන්වහන්සේගේ ආඥාවද විනිශ්-
චයන්ද පනත්ද පවත්වා ඉෂ්ටකරන
30 හැටියටත්, දේශයේ ජාතීන්ට අපේ දූවරුන්
නොදෙන හැටියටත්, ඔවුන්ගේ දූවරුන්
අපේ පුත්‍රයන්ට නොගන්නා හැටියටත්,
31 දේශයේ ජනයන් විකිණීමට බඩු හෝ
ආහාර හෝ සබත් දවසේ ගෙනාවොත්
ඒවා සබත් දවසේවත් ශුද්ධ දවසකවත්
ඔවුන්ගෙන් මිලේට නොගන්නා හැටියටත්,
හත්වෙනි අවුරුද්දේ පල ප්‍රයෝජන
සහ සියලු ණයද අත්හරින හැටියටත්
ශාපයකින් හා දිවුරුමකින් බැඳුණෝය.
32 තවද අපේ දෙවියන්වහන්සේගේ ගෘහයේ
සේවයවූ සබත් දවස්වලද අමාවක්වලද
පිදීමේ රොටි සඳහාත් නිරන්තර ආහාර
පූජාව සඳහාත්, නිරන්තර දවන පූජාව
සඳහාත් නියම මංගල්‍ය සඳහාත්,
ඉශ්‍රායෙල් උදෙසා සමගිකම්කිරීමේ පාප
33 පූජා සඳහාත්, අපේ දෙවියන්වහන්සේගේ
ගෘහයේ මුළු වැඩ සඳහාත් ෂෙකෙලකින්
තුනෙන් පංගුවක් අවුරුදු පතා දෙන
34 ලෙස අපට නියෝග පනවාගතිමු. තවද
ව්‍යවස්ථාවේ ලියා තිබෙන ලෙස අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ පූජාසනය
පිට ගිනි දල්වන පිණිස අවුරුද්දෙන්
අවුරුද්ද නියම කාලවලට අපේ පියවංශවල
ප්‍රකාරයට අපේ දෙවියන්වහන්සේගේ
ගෘහයට දෙන දර පඬුරු ගෙනඊම ගැන
පූජකයෝද ලෙවීවරුද සෙනඟද වන
35 අපි පස ඇට දැමුවෙමු. අපේ බිම්වල
ප්‍රථම අස්වැන්නද සියලු ආකාර ගස්වල
සියලු ඵලවලින් ප්‍රථම ඵලද අවුරුද්දෙන්
අවුරුද්ද ස්වාමීන්වහන්සේගේ ගෘහයට
36 ගෙනෙන හැටියටත්, ව්‍යවස්ථාවෙහි ලියා
තිබෙන ප්‍රකාරයට අපේ පුත්‍රයන්ගෙන්
සහ සිව්පාවුන්ගෙන් කුලුඳුලන්ද අපේ
ගවයින්ගෙන් හා බැටළුවන්ගෙන්
කුලුඳුලන්ද අපේ දෙවියන්වහන්සේගේ
ගෘහයට එනම් අපේ දෙවියන්වහන්සේගේ
ගෘහයෙහි සේවයකරන පූජකයන් වෙතට
37 ගෙනෙන හැටියටත්, අපේ අනාපු පිටිවලින්
ප්‍රථම ඒවාද අපේ එසවීම් පූජාවල්ද
සියලු ආකාර ගස්වල ඵලද මුද්‍රික යුස
හා තෙල්ද අපේ දෙවියන්වහන්සේගේ
ගෘහයේ ඇතුල් ගෙවලට පූජකයන්
වෙතටද අපේ සියලු ගොවිතැන් නුවරවල
දසයෙන් කොටසක් ලෙවීවරුන්ට නියම
බැවින් අපේ බිම්වල අස්වැන්නෙන්
දසයෙන් කොටසක් ලෙවීවරුන් වෙතටද
ගෙනෙන හැටියටත්, ලෙවීවරුන් ඒ 38
කොටස්වලින් දසයෙන් කොටසක් අපේ
දෙවියන්වහන්සේගේ ගෘහයේ ගබඩාවේ
ඇතුල් ගෙවලට ගෙනෙන පිණිස දසයෙන්
කොටසක් දෙන විට ආරොන්ගේ
පුත්‍රයෙක්වූ පූජකයෙක් ඔවුන් සමග සිටින
හැටියටත් නියමකරගතිමු. මක්නිසාද 39
ශුද්ධස්ථානයට අයිති භාණ්ඩ තිබෙන්නාවූ,
සේවයකරන පූජකයන්ද දොරටුපාලයන්ද
ගීතිකාකාරයන්ද සිටින්නාවූ ඇතුල්
ගෙවලට ඉශ්‍රායෙල් පුත්‍රයන්ද ලෙවී
පුත්‍රයන්ද ධාන්‍යවලිනුත් මුද්‍රික යුසයෙනුත්
තෙල්වලිනුත් එසවීම් පඬුර ගෙනෙන්ට
ඕනෑය. තවද අපි අපේ දෙවියන්වහන්සේගේ
ගෘහය අත් නොහරින්නෙමු.

## යෙරුසලමෙහි සහ වෙනත් නුවරවල සෙනඟ වාසයකරවීම

11 තවද සෙනඟගේ අධිපතීහු
යෙරුසලමෙහි වාසයකළෝය.
අනික් සෙනඟ තමුන් අතරෙන් දස-
දෙනෙකුගෙන් එක්කෙනෙකු බැගින් ශුද්ධ
නුවර වන යෙරුසලමෙහි වාසයකිරීමට
එවන පිණිස පසඇට දැමුවෝය, නව
කොටසක් අනික් නුවරවල වාසය-
කළෝය. යෙරුසලමෙහි වාසයකිරීමට 2
කැමැත්තෙන්ම ආවාවූ සියලු මනුෂ්‍යයන්ට
සෙනඟ ආශීර්වාදකළෝය. යූදාහි නුවරවල 3
ඉශ්‍රායෙල්වරුද පූජකයෝද ලෙවීවරුද
නෙතිනීම්වරුද සාලමොන්ගේ සේවක-
යන්ගේ පුත්‍රයෝද තමුන්ගේ නුවරවල
තිබුණු තම තමුන්ගේ උරුමවල වාසය-
කළෝය. යෙරුසලමෙහි වාසයකළ රටේ
ප්‍රධානියෝ නම් මොව්හුය. යූදා පුත්‍රයන්- 4
ගෙන්ද බෙන්යමින් පුත්‍රයන්ගෙන්ද
සමහරෙක් යෙරුසලමෙහි වාසයකළෝය.
යූදා පුත්‍රයන් අතරෙන්, පෙරෙශ්ගේ
පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්වූ මහලලේල්-
ගේ පුත්‍රවූ ෂෙපටියාගේ පුත්‍රයා වන
අමරියාගේ පුත්‍රවූ සෙකරියාගේ පුත්‍රයා
වන උස්සියාගේ පුත්‍රවූ අතායාය.
ෂිලොනියයාගේ පුත්‍රවූ සෙකරියාගේ 5

පුත්‍රයා වන යෝයාරීබ්ගේ පුත්‍රවූ අදයාගේ
පුත්‍රයා වන හසායාගේ පුත්‍රවූ කොල්-
හොසෙක්ගේ පුත්‍රයා වන බාරුක්ගේ
6 පුත්‍රවූ මයසේයාය. යෙරුසලමෙහි විසූ
පෙරෙශ්ගේ සියලු පුත්‍රයෝ නම්
වික්‍රමාන්විත මනුෂ්‍යයෝ හාරසිය
7 හැටඅට දෙනෙක්ය. බෙන්යමින්ගේ
පුත්‍රයෝ නම් යෙෂායාගේ පුත්‍රවූ
ඊතියෙල්ගේ පුත්‍රයා වන මයසේයාගේ
පුත්‍රවූ කෝලායාගේ පුත්‍රයා වන
පෙදයාගේ පුත්‍රවූ යෝවෙද්ගේ පුත්‍රයා
8 වන මෙෂුල්ලාම්ගේ පුත්‍රවූ සල්ලුය. ඔහු
ළඟට ගබ්බයි සහ සල්ලයි ආදිවූ නවසිය
9 විසිඅට දෙනෙක්ය. සික්රීගේ පුත්‍රවූ
යෝවෙල් ඔවුන් කෙරෙහි මූලාදෑනියාව
සිටියේය. හස්සෙනුවාගේ පුත්‍රවූ යූදතෙම
නුවර කෙරෙහි දෙවෙනියාව සිටියේය.
10 පූජකයන්ගෙන් යෝයාරීබ්ගේ පුත්‍රවූ
11 යෙදයාද, යාකීන්ද, දෙවියන්වහන්සේගේ
ගෘහයෙහි අධිපතියාවූ අහිටුබ්ගේ පුත්‍රවූ
මෙරායොත්ගේ පුත්‍රයා වන ශාදෙක්ගේ
පුත්‍රවූ මෙෂුල්ලාම්ගේ පුත්‍රයා වන
12 හිල්කියාගේ පුත්‍රවූ සෙරායාද, ගෘහයේ
වැඩපළ කළාවූ ඔවුන්ගේ සහෝදරයන්
අටසිය විසි දෙදෙනෙක්ද, මල්කියාගේ
පුත්‍රවූ පෂ්හූර්ගේ පුත්‍රයා වන සෙකරියාගේ
පුත්‍රවූ අම්සීගේ පුත්‍රයා වන පෙලලියාගේ
පුත්‍රවූ යෙරොහාම්ගේ පුත්‍රයා වන අදයාද,
13 පියවංශවල ප්‍රධානීන් වන ඔහුගේ
සහෝදරයන් දෙසිය හතළිස් දෙදෙනෙක්ද,
ඉම්මෙර්ගේ පුත්‍රවූ මෙෂිල්ලේමොත්ගේ
පුත්‍රයා වන අඃසයිගේ පුත්‍රවූ අසරේල්ගේ
14 පුත්‍රයා වන අමෂ්සයිද, බලවත්
වික්‍රමාන්විත මනුෂ්‍යයන්වූ ඔවුන්ගේ
සහෝදරයන් එකසිය විසිඅට දෙනෙක්ද
යන මොව්හුය. හග්ගෙදෝලීම්ගේ පුත්‍රවූ
සබ්දීයෙල් ඔවුන් කෙරෙහි මූලාදෑනියාව
15 සිටියේය. ලෙවීවරුන්ගෙන් බුන්නීගේ
පුත්‍රවූ හෂබියාගේ පුත්‍රයා වන අස්රීකාම්ගේ
පුත්‍රවූ හෂ්ෂුබ්ගේ පුත්‍රයා වන ෂෙමායාද,
16 ලෙවීවරුන්ගේ ප්‍රධානීන්ගෙන් දෙවියන්-
වහන්සේගේ ගෘහයේ පිටත කාරණා
බලාගත්තාවූ ෂබ්බෙතයිද යෝසාබාද්ද;
17 යාච්ඥාවේදී ස්තුතිදීම පටන්ගැනීමට
ප්‍රධානියාව සිටියාවූ ආසාෆ්ගේ පුත්‍රයා
වන සබ්දීගේ පුත්‍රවූ මීකාගේ පුත්‍රයා
වන මත්තනියාද, ඔහුගේ සහෝදරයන්
අතරේ දෙවෙනියාවූ බක්බුකියාද,
යෙදූතුන්ගේ පුත්‍රවූ ගාලාල්ගේ පුත්‍රයා
වන ෂම්මුවාගේ පුත්‍රවූ අබ්දද යන
මොව්හුය. ශුද්ධ නුවර සිටිය සියලු 18
ලෙවීවරු දෙසිය අසූ හතර දෙනෙක්ය.
තවද දොරටු රැකවල්කළාවූ අක්කුබ්ද 19
ටල්මොන්ද ඔවුන්ගේ සහෝදරයෝවූ
දොරටුපාලයෝද එකසිය හැත්තෑ
දෙදෙනෙක්ය. අනික් ඉශ්‍රායෙල්වරුද 20
පූජකයෝද ලෙවීවරුද යූදහි සියලු
නුවරවල එකිනෙකා තම තමාගේ උරුම
භූමියෙහි සිටියෝය. නුමුත් නෙතිනීම්වරු 21
ඕපෙල්හි වාසයකළෝය. සීහාද ගිෂ්පාද
නෙතිනීම්වරුන්ට ප්‍රධානියෝව සිටියෝය.
යෙරුසලමෙහි සිටි ලෙවීවරුන්ගේ 22
මූලාදෑනියා නම් ගීතිකාකාරයන් වන
ආසාෆ්ගේ පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්වූ
මීකාගේ පුත්‍රවූ මත්තනියාගේ පුත්‍රයා
වන හෂබියාගේ පුත්‍රවූ බානීගේ පුත්‍රයා
වන උස්සීය; ඔහු දෙවියන්වහන්සේගේ
ගෘහයේ වැඩපළ කෙරෙහි පත්ව සිටියේය.
මක්නිසාද ගීතිකාකාරයන් ගැන රජුගේ 23
ආඥාවක් තිබුණේය, ඔවුන් උදෙසා
දවස්පතා උවමනාවූ කොටසක්ද
නියමකර තිබුණේය. යූදගේ පුත්‍රයා වන 24
සෙරාගේ පුත්‍රයන්ගෙන් එක්කෙනෙක්වූ
මෙෂෙශබෙල්ගේ පුත්‍රයා වන පෙතහියා
සෙනඟගේ සියලු කාරණා ගැන රජු
වෙත සිටියේය. ගම් සහ ඒවායේ 25
කෙත් ගැන වනාහි යූද පුත්‍රයන්ගෙන්
සමහරෙක් කිරියත්-අර්බා සහ ඒකේ
ගම්වලද, දීබොන්හි සහ ඒකේ ගම්වලද,
යෙකබ්සෙයෙල්හි සහ ඒකේ ගම්-
වලද; යේෂුවාහිද මොලාදහිද බෙත්- 26
පෙලෙට්හිද; හශර්-ෂුවාල්හිද බෙයෙර්- 27
ෂෙබාහි සහ ඒකේ ගම්වලද; සික්ලග්හිද 28
මෙකෝනාහි සහ ඒකේ ගම්වලද;
ඒන්-රිම්මෝන්හිද ශොරාහිද යර්මූත්හිද; 29
සානොවාහිද අදුල්ලාම්හි සහ ඒවායේ 30
ගම්වලද, ලාකීෂ්හි සහ ඒකේ කෙත්වලද,
අසේකාහි සහ ඒකේ ගම්වලද විසුවෝය.
මෙසේ ඔව්හු බෙයෙර්-ෂෙබා සිට
හින්නෝම්ගේ මිටියාවත දක්වා කුඩාරම්
ගසාගත්තෝය. බෙන්යමින්ගේ පුත්‍ර- 31
යෝත් ගෙබා සිට මික්මාෂ්හිද අයියාහිද
බෙතෙල්හිද ඒවායේ ගම්වලද;

32 අනාතෝත්හිද නොබ්හිද අනනියාහිද;
33 හාශෝර්හිද රාමාහිද ගිත්තයිම්හිද;
34 හාදීද්හිද ශෙබෝයිම්හිද නෙබල්ලාට්හිද;
35 කර්මාන්තකාරයන්ගේ මිටියාවතේ
තිබෙන ලොද්හිද ඕනෝහිද විසුවෝය.
36 ලෙවීවරුන්ගෙන්ද යූදහි සමහර පන්ති
බෙන්යමින්හි සිටියෝය.

## බබිලෝනියෙන් ආ පූජකයන් සහ ලෙවීවරු

12 ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ සෙරුබ්-
බාබෙල්ද යේෂුවාද සමග
ආවාවූ පූජකයෝත් ලෙවීවරුත්
2 මොව්හුය: සෙරායා, යෙරෙමියා, එස්රා;
3 අමරියා, මල්ලූක්, හට්ටුෂ්; ෂෙකනියා,
4 රෙහූම්, මෙරේමොත්; ඉද්දෝ, ගින්නෙ-
5 තොයි, අබියා; මියාමීන්, මයදියා, බිල්ගා;
6,7 ෂෙමායා, යෝයාරීබ්, යෙදයා; සල්ලු,
ආමොක්, හිල්කියා සහ යෙදයාය.
මොව්හු යේෂුවාගේ දවස්වලදී පූජකයන්-
ගෙන්ද ඔවුන්ගේ සහෝදරයන්ගෙන්ද
8 ප්‍රධානියෝව සිටියෝය. තවද ලෙවීවරු
නම්: යේෂුවා, බින්නුයි, කද්මීයෙල්,
ෂේරෙබියා, යූද සහ මත්තනියාය. ඔහුත්
ඔහුගේ සහෝදරයොත් ස්තුති ගායනා
කණ්ඩායම් කෙරෙහි පත්ව සිටියෝය.
9 තවද ඔවුන්ගේ සහෝදරයෝ වන
බක්බුකියාද උන්නෝද ඔවුන් ඉදිරිපිට
10 වාර පිළිවෙළින් සිටියෝය. යේෂුවාට
දව යෝයාකීම් උපන්නේය, යෝයාකීම්ට
දව එලියාෂීබ් උපන්නේය, එලියාෂීබ්ට
11 දව යෝයාද උපන්නේය. යෝයාදට දව
යොනාතාන් උපන්නේය. යොනාතාන්ට
12 දව යද්දූවා උපන්නේය. යෝයාකීම්ගේ
දවස්වල පියපෙළපත්වල ප්‍රධානියෝවූ
පූජකයෝ නම්: සෙරායාගෙන් මෙරා-
යාය; යෙරෙමියාගෙන් හනනියාය;
13 එස්රාගෙන් මෙෂුල්ලාම්ය; අමරියාගෙන්
14 යෙහෝහානාන්ය; මල්ලූකීගෙන් යො-
නාතාන්ය; ෂෙබනියාගෙන් යෝසෙප්ය;
15 හාරිම්ගෙන් අද්නාය; මෙරායොත්ගෙන්
16 හෙල්කයිය; ඉද්දෝගෙන් ශෙකරියාය;
ගින්නෙතොන්ගෙන් මෙෂුල්ලාම්ය;
17 අබියාගෙන් සික්රිය; මිනියාමින්ගෙන්
18 මොවාදියාගේ පිල්ටයිය; බිල්ගාගෙන්
ෂම්මූවාය; සෙමායාගෙන් යෙහෝනා-
තාන්ය; යෝයාරීබ්ගෙන් මත්තෙනයිය; 19
යෙදයාගෙන් උස්සීය; සල්ලයිගෙන් 20
කල්ලයිය; ආමොක්ගෙන් ඒබෙර්ය;
හිල්කියාගෙන් හෂබියාය; යෙදයාගෙන් 21
නෙතනේල්ය. එලියාෂිබ්ගේද යෝයා- 22
දගේද යෝහානාන්ගේද යද්දූවාගේද
දවස්වල ලෙවීවරුන්ගේ පියපෙළපත්වල
ප්‍රධානියෝ ලියවුණෝය. පූජකයොත්
පාර්සියාවේ දරියුෂ්ගේ රජකම්කිරීම
දක්වා එසේ වූය. පියපෙළපත්වල 23
ප්‍රධානියෝවූ ලෙවීගේ පුත්‍රයෝ එලියා-
ෂීබ්ගේ පුත්‍රවූ යොහානාන්ගේ දවස්
දක්වාම ලේකම් පොතෙහි ලියවුණෝය.
ලෙවීවරුන්ගේ ප්‍රධානියන්වූ හෂබියා, 24
ෂේරෙබියා සහ කද්මීයෙල්ගේ පුත්‍රවූ
යේෂුවාද තමුන්ගේ සහෝදරයන් ඉදිරිපිට
ඇතුව දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ
දාවිත්ගේ අණ ලෙස ස්තුති ප්‍රශංසා
කිරීමට මාරුවෙන් මාරුවට සිටියෝය.
මත්තනියාද බක්බුකියාද ඔබදියාද 25
මෙෂුල්ලාම්ද ටල්මොන්ද අක්කුබ්ද දොරටු
ගබඩාවල දොරටුපාලයෝව සිට රැක-
වල්කළෝය. මොව්හු යොශාදක්ගේ 26
පුත්‍රවූ යේෂුවාගේ පුත්‍රයා වන
යෝයාකීම්ගේ දවස්වලද දිශාධිපතියාවූ
නෙහෙමියාගෙත් ලියන්නාවූ පූජක
එස්රාගෙත් දවස්වලද සිටියෝය.

## පවුරු කැපකිරීම

යෙරුසලමේ පවුර කැපකිරීමේදී 27
ස්තුතිකිරීමෙන්ද ගීතිකාකිරීමෙන්ද
අත්තල්වලින්ද වීණාවලින්ද මහ
වීණාවලින්ද ප්‍රීති සහිතව කැපකිරීමේ
උත්සවය පවත්වන පිණිස ලෙවීවරුන්
යෙරුසලමට ගෙනෙන්ට ඔවුන්ගේ සියලු
ස්ථානවලින් ඔවුන් සොයාගත්තෝය.
එවිට ගීතිකාකාරයන්ගේ පුත්‍රයෝ 28
යෙරුසලම වටකර සමතලා ප්‍රදේශයෙනුත්
නෙටොපාතිවරුන්ගේ ගම්වලිනුත් බෙත්- 29
ගිල්ගාලෙනුත් ගෙබාහිද අස්මාවෙත්හිද
කෙත්වලිනුත් රැස්වූවෝය. මක්නිසාද
ගීතිකාකාරයෝ යෙරුසලම අවට ගම්
සාදගෙන සිටියෝය. පූජකයොත් 30

ලෙවීවරුත් පවිත්‍රවී සෙනඟද දොරටුද
31 පවුරද පවිත්‍රකළෝය. එවිට මම යූදාහි
අධිපතීන් පවුර පිටට නගින්ට සලස්වා,
ස්තුතිකිරීමටත් පෙරහරින් යාමටත් මහත්
කණ්ඩායම් දෙකක් නියමකෙළෙමි; එයින්
එකක් දකුණට පවුර පිට කසළ දොරටුව
32 දෙසට ගියේය. ඔවුන් පස්සේ හෝෂායාද
33 යූදාහි අධිපතීන්ගෙන් භාගයක්ද, අසරියාද
34 එස්රාද මෙෂුල්ලාම්ද, යූදා සහ බෙන්-
35 යමින්ද සෙමායාද යෙරෙමියාද, නළා
ඇතිව පූජකයන්ගේ පුත්‍රයන්ගෙන් සමහ-
රෙක් එනම් ආසාප්ගේ පුත්‍රවූ සක්කූර්ගේ
පුත්‍රයා වන මීකායාගේ පුත්‍රවූ මත්ත-
නියාගේ පුත්‍රයා වන ෂෙමායාගේ පුත්‍රවූ
යෝනාතාන්ගේ පුත්‍රයා වන සෙකරියා
36 සහ, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ
දාවිත්ගේ තූර්යභාණ්ඩ ඇතුව ඔහුගේ
සහෝදරයෝ වන ෂෙමායාද අසරේල්ද
මිලලයිද ගිලලයිද මායයිද නෙතනේල්ද
යූදාද හනානීද ඔවුන්ට පෙරටුවෙන් සිටි
37 ලියන්නාවූ එස්රාද ගියෝය. ඔව්හු
උල්පත් දොරටුව ළඟින්ද තමුන් ඉදිරිපිටද
තිබුණු දාවිත්ගේ ගෙට ඉහළින් පවුරට
නැගුමෙහි දාවිත්ගේ නුවර පඩිවලින් නැගී,
නැගෙනහිරට තිබෙන වතුර-දොරටුව
38 ළඟට ගියෝය. අනික් අතට ස්තුතිකරන
දෙවෙනි කණ්ඩායමද ඔවුන් පස්සේ මමද
සෙනඟගෙන් භාගයක්ද, පවුර පිට උදුන්
කොත උඩින් පළල් පවුර දක්වාත්,
39 එප්‍රායිම් දොරටුවට උඩිනුත් පුරාණ
දොරටුව ළඟිනුත් මත්ස්‍ය-දොරටුවද හන-
නේල්ගේ කොත සහ හම්මෙයාගේ
කොත ළඟිනුත් බැටළු-දොරටුව දක්වා
ගොස්, හිරගෙයි දොරටුව ළඟ නැවතුණෝය.
40 මෙසේ දෙවියන්වහන්සේගේ ගෘහයෙහි
ස්තුති දෙන කණ්ඩායම් දෙකද මමද
මා සමග මූලාදෑනීන්ගෙන් භාගයක්ද,
41 නළා ඇතුව එලියාකීම්, මයසේයා,
මිනියාමින්, මීකායා, එලියෝයේනයි,
ශෙකරියා, හනනියා යන පූජකයෝද;
42 මයසේයා, ෂෙමායා, එලෙයාසර්, උස්සී,
යෙහෝහානාන්, මල්කියා, ඒලාම්, ඒසෙර්
යන මොව්හුද සිටියෝය. ගීතිකාකාරයෝ
වනාහි යෙශ්‍රාහිය, තමුන්ගේ ප්‍රධානියා
කොට ඇතුව ශබ්දනගා ගායනාකළෝය.
එද ඔව්හු මහත් පූජා ඔප්පුකොට ප්‍රීතිවූහ; 43
මක්නිසාද දෙවියන්වහන්සේ ඔවුන්ට
මහත් ප්‍රීතියකින් ප්‍රීතිවෙන්ට සැලැස්වූ-
සේක; ස්ත්‍රීහුද දරුවෝද ප්‍රීතිවූවෝය.
මෙසේ යෙරුසලමේ ප්‍රීති ඝෝෂාව දුරට
ඇසුණේය.

## දේව මාලිගාවේ මෙහෙය පිහිටුවීම

ඒ දවසේ පූජකයන්ටත් ලෙවීවරුන්ටත් 44
ව්‍යවස්ථාවෙන් නියමවූ කොටස්
නුවරවල කෙත්වල හැටියට ගබඩා
ගෙවල්වල රැස්කර තබන පිණිස ඒවා
කෙරෙහි එසවීම් පූජාද ප්‍රථම ඵලද ඔතුද
සම්බන්ධව මනුෂ්‍යයෝ පත්වුණෝය.
මක්නිසාද සේවයකරමින් සිටි පූජකයන්ද
ලෙවීවරුන්ද ගැන යූදවරු සන්තෝෂවූවෝය.
ඔව්හුද ගීතිකාකාරයෝද දොරටුපාලයෝද 45
දාවිත්ගේ සහ ඔහුගේ පුත්‍රවූ සාලමොන්ගේ
ආඥාව ලෙස තමුන්ගේ දෙවියන්-
වහන්සේගේ නියම මුරයත් පවිත්‍රවීම
පිළිබඳ නියම මුරයත් පැවැත්තුවෝය.
මක්නිසාද ඉස්සර දාවිත්ගේද ආසාප්ගේද 46
දවස්වල ප්‍රධාන ගීතිකාකාරයෝ
සිටියෝය, දෙවියන්වහන්සේට ස්තුති
ප්‍රශංසා ගීතිකාද පැවතුණේය. සියලුම 47
ඉශ්‍රායෙල්වරුද සෙරුබ්බාබෙල්ගේ දවස්-
වලත් නෙහෙමියාගේ දවස්වලත්
දවසින් දවස ගීතිකාකාරයන්ගෙත්
දොරටුපාලයන්ගෙත් කොටස් සහ ලෙවී-
වරුන්ට කැපකළ යුතුවූ දේවලුත්
දුන්නෝය; ලෙවීවරුද ආරොන්ගේ
පුත්‍රයන්ට කැපකළ යුතුවූ දේවල්
දුන්නෝය.

## වැරදි දේ හරිගැස්සීම

13 ඒ දවසේ සෙනඟ ඉදිරියෙහි
මෝසෙස්ගේ පොත කියවද්දී:
අම්මොන්වරුන්ද මෝවබ්වරුන්ද රොටි
සහ වතුර රැගෙන ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ
පෙරමගට නැවිත් ඔවුන්ට ශාප කරන
පිණිස බාලාම් කුලියට ගත් නිසා,
අම්මොනියයෙක්වත් මෝවබියයෙක්වත් 2
දෙවියන්වහන්සේගේ සභාවට කිසිකලක

ඇතුල් නොවන්නේය කියා ලියා
තිබෙනවා සම්බව්ය. ඒ ශාපය අපේ
දෙවියන්වහන්සේ ආශීර්වාදයකට
3 හැරෙවූසේක. තවද ඔව්හු ව්‍යවස්ථාව
අසා, මුළු මිශ්‍ර සමූහයා ඉශ්‍රායෙල්ගෙන්
වෙන්කළෝය.
4 මීට පළමුවෙන් අපේ දෙවියන්-
වහන්සේගේ ගෘහයේ ඇතුල් ගෙවල්
කෙරෙහි පත්ව සිටියාවූ, ටෝබියාට
5 නෑකම් ඇත්තාවූ, පූජකවූ එලියාෂිබ්
ආහාර පූජාද තුවරලාද භාණ්ඩද,
ලෙවීවරුන්ගෙත් ගීතිකාකාරයන්ගෙත්
දෙරටුපාලයන්ගෙත් නියම කොටසවූ
ධාන්‍යයෙන් සහ මුද්‍රික යුසයෙනුත්
තෙලිනුත් දසයෙන් කොටසද, පූජකයන්ට
ලැබෙන එසවීම් පූජාද, පළමු තැබූ
ස්ථානයෙහි, ටෝබියාට මහත් ඇතුල්
6 ගෙයක් සාදදී තිබුණේය. ඒ සියල්ලේදී
මම යෙරුසලමෙහි නොසිටියෙමි. මක්නිසාද
බබිලෝනියේ රජවූ අර්තක්ෂස්තාගේ
තිස්දෙවෙනි අවුරුද්දේදී මම රජු
ළඟට ගියෙමි, තවද දවස් ගණනකට
පසු රජුගෙන් අවසර ඉල්ලාගෙන,
7 යෙරුසලමට ආවෙමි. එවිට එලියාෂිබ්
දෙවියන්වහන්සේගේ ගෘහයේ මළුවල
ටෝබියාට ඇතුල් ගෙයක් සූදනම්කර
දීමෙන් ඔහු උදෙසා කළ නපුර
8 දැනගත්තෙමි. ඊට මම ඉතා අප්‍රසන්නවී,
ටෝබියාගේ ගෙයි බඩු සියල්ල ඇතුල්
9 ගෙයින් පිටතට දැමුවෙමි. එවිට මාගේ
ආඥාව පිට ඔව්හු ඇතුල් ගෙවල්
පිරිසිදුකළෝය. තවද දෙවියන්වහන්සේගේ
ගෘහයේ භාණ්ඩද ආහාර පූජාද
තුවරලාද මම නැවත එතැනට ගෙනා-
10 යෙමි. ලෙවීවරුන්ගේ කොටස් ඔවුන්ට
නුදුන් බවද වැඩපළ කරන ලෙවීවරුන්ද
ගීතිකාකාරයන්ද තම තමුන්ගේ කෙත්-
11 වලට පලාගිය බවද දැක, මම මුලා-
දැනීන්ට කථාකර: දෙවියන්වහන්සේගේ
ගෘහය අත්හරිනු ලැබුවේ මක්නිසාද
කියා තරවටුකෙළෙමි. තවද මම ඔවුන්
රැස්කරවා, ඔවුන්ගේ ස්ථානවලට ඔවුන්
12 පත්කෙළෙමි. එවිට සියලු යුදවරු ධාන්‍ය-
යෙනුත් මුද්‍රික යුසයෙනුත් තෙලිනුත්
දසයෙන් කොටස ගබඩාවලට
ගෙනාවෝය. ගබඩාවල් කෙරෙහි පූජකවූ 13
ෂෙලෙමියාද ලියන්නාවූ සාදොක්ද
ලෙවීවරුන්ගෙන් පෙදායාද ඔවුන් යටතේ
මත්තනියාගේ පුත්‍රයාවූ සක්කූර්ගේ පුත්‍රවූ
හානාන්ද ගබඩාකාරයන්කෙළෙමි.
මක්නිසාද ඔව්හු විශ්වාස අයකොට
සලකනලද්දෝය, තමුන්ගේ සහෝ-
දරයන්ට බෙදදීම ඔවුන්ට භාරව
තිබුණේය. මාගේ දෙවියන්වහන්ස, මේ 14
ගැන මා සිහිකළ මැනව, මාගේ
දෙවියන්වහන්සේගේ ගෘහයද ඒකේ නියම
පිළිවෙත්ද උදෙසා මා විසින් කළ යහපත්
ක්‍රියා නොමැකුව මැනව.

## සබත් දවස පැවැත්වීම ගැන

ඒ දවස්වලදී යූදහි සමහරුන් සබත් 15
දවසේ මුද්‍රික යන්ත්‍රය පාගන බවත්,
ගොයම් මිටි ගෙනැවිත් ඒවා සහ මුද්‍රික
පානයද මුද්‍රික වලුද අත්තික්කා ඵලද
සියලු ආකාර බරද කොටළුවන් පිට
පටවාගන සබත් දවසේදී යෙරුසලමට
ගෙනෙන බවත් මම දැක, ඔවුන් ආහාර
විකුණන දවසේදී ඔවුන්ට තරවටු-
කෙළෙමි. තීර්වරුත් එහි වාසයකොට 16
මාලු සහ සියලු ආකාර බඩු ගෙනැවිත්
යූද පුත්‍රයන්ටත් යෙරුසලමෙහිත් සබත්
දවසේදී වික්කෝය. එබැවින් මම යූදහි 17
උත්තමයන්ට තරවටුකරමින්: සබත් දවස
දූෂ්‍ය කොට නුඹලා කරන මේ නපුරු
ක්‍රියාව මොකද? නුඹලාගේ පියවරුන් 18
මෙසේ කළ බැවින් අපේ දෙවියන්-
වහන්සේ මේ සියලු විපත්ති අප පිටටත්
මේ නුවර පිටටත් පැමිණෙවූවා
නොවේද? එසේ වී නුමුත් නුඹලා සබත්
දවස දූෂ්‍යකිරීමෙන් ඉශ්‍රායෙල් කෙරෙහි
උදහස වැඩිකරන්නහුයයි ඔවුන්ට කීවෙමි.
තවද සබත් දවසට ඉස්සරින් යෙරුසලමේ 19
දෙරටුවලට අඳුර වැටෙන කල දෙරවල්
පියන්ටත්, සබත් දවස පසුවෙන තුරු
ඒවා නාරීන්ටත් අණකර, සබත් දවසේ
කිසි බරක් ඇතුළට නොගෙනෙන පිණිස
මාගේ මෙහෙකරුවන්ගෙන් සමහරෙකු
දෙරටු ළඟ සිටෙවුවෙමි. ඒ නිසා 20
වෙළෙන්දෝද සියලු ආකාර බඩු

විකුණන්නෝද වරක් දෙවරක් යෙරු-
21 සලමෙන් පිට නැවතුණෝය. මම ඔවුන්ට
තරවටුකොට: තුඹලා පවුර ළඟ නව-
තින්නේ මක්නිසාද? තුඹලා නැවත
එසේ කළොත් තුඹලා අල්ලාගන්නෙමියි
ඔවුන්ට කීවෙමි. එතැන් පටන් ඔව්හු
22 සබත් දවසේදී නාවෝය. තවද සබත්
දවස ශුද්ධ ලෙස පවත්වන පිණිස
පිරිසිදුවී ඇවිත් දොරටු රැකවල් කරන්ටය
කියා මම ලෙවීවරුන්ට අණකෙළෙමි.
මාගේ දෙවියන්වහන්ස, මේ නිසාත් මා
සිහිකර, ඔබගේ කරුණාවේ මහත්කම
පරිද්දෙන් මට දයාවී වදාළ මැනව.

## අන්‍ය ජාති ස්ත්‍රීන් පාවාගැනීම ගැන

23 තවද ඒ දවස්වලදී සමහර යූදවරුන්
අෂ්දෝද්හිද අම්මොන්හිද මෝවබ්හිද
ස්ත්‍රීන් පාවාගන සිටිනවා දුටුවෙමි.
24 ඔවුන්ගේ දරුවෝද අර්ධයක් වශයෙන්
අෂ්දෝද් භාෂාවෙන් කථාකළෝය.
යුදෙව් භාෂාවෙන්ම කථාකරන්ට ඔවුන්
නොදන ඒ සෙනඟගෙත් මේ සෙනඟගෙත්
25 භාෂාවලින් කථාකළෝය. මම ඔවුන්ට
තරවටුකර, ඔවුන්ට ශාපකර, ඔවුන්ගෙන්
සමහරෙකුට ගසා, ඔවුන්ගේ හිසකේ
උගුළා, තුඹලාගේ දූවරුන් ඔවුන්ගේ
පුත්‍රයන්ට දෙන්ටවත් ඔවුන්ගේ දූවරුන්
තුඹලාගේ පුත්‍රයන්ට හා තුඹලාට
ගන්ටවත් එපාය කියා දෙවියන්වහන්සේ
ගැන ඔවුන් දිවුරවා, ඔවුන්ට කථාකොට: 26
ඉශ්‍රායෙල් රජවූ සාලමොන් මේ දේ
කිරීමෙන් පව්කළා නොවේද? බොහෝ
ජාතීන් අතරේ ඔහුට සමාන රජෙක්
සිටියේ නැත, ඔහුගේ දෙවියන්වහන්සේද
ඔහුට ප්‍රේම කොට මුළු ඉශ්‍රායෙල්
කෙරෙහි ඔහු රජ කළසේක. එසේ වී
නුමුත් ඔහු පවා අන්‍ය ජාති ස්ත්‍රීන්
විසින් පව්කරන්ට සලස්වනලද්දේය.
එසේනම් අන්‍ය ජාති ස්ත්‍රීන් පාවා- 27
ගැනීමෙන් මේ මුළු මහත් නපුර කොට
අපේ දෙවියන්වහන්සේට විරුද්ධව
වරදකරන හැටියට තුඹලාට ඇහුම්කන්-
දෙන්නෙමුදැයි කීමි. උත්තම පූජකවූ 28
එලියාෂිබ්ගේ පුත්‍රයා වන යෝයාදගේ
පුත්‍රයෙක් හොරොනිය සන්බලාට්ට
බෑනාව සිටිය නිසා ඔහු මා වෙතින්
එළෙවූවෙමි. මාගේ දෙවියන්වහන්ස, 29
ඔවුන් පූජක තනතුරද පූජකකමෙත්
ලෙවීවරුන්ගෙත් ගිවිසුමද අපිරිසිදුකළ
නිසා ඔවුන් සිහිකළ මැනව. මෙසේ මම 30
විදේශී *සියල්ලන් පහකිරීමෙන් ඔවුන්
පිරිසිදුකර, එක් එක්කෙනා තම තමාගේ
වැඩේ ප්‍රකාරයට පූජකයන්ගෙත් ලෙවී- 31
වරුන්ගෙත් කටයුතු නියම කාලවලට
දර පඬුරුද ප්‍රථම ඵලද ගැන නියම-
කෙළෙමි. මාගේ දෙවියන්වහන්ස, යහපත
පිණිස මා සිහිකළ මැනව.

*නොහොත්, සියල්ල.

# එස්තර්ගේ පොත

## වස්ති බිසවගේ අකීකරුකම සහ පහකරනු ලැබීම

1 තවද ඉන්දියාව පටන් කුෂ් දක්වා
රටවල් එකසිය විසිහතක් කෙරෙහි
රජකම්කළ අහෂ්වේරොෂ්ගේ දවස්වලදී
2 මෙසේ සිද්ධවිය. අහෂ්වේරොෂ් රජුගේ
රජකම්කිරීමේ තුන්වෙනි අවුරුද්දේ ඔහු
ෂූෂන් *බලකොටුවේ තිබුණ තමාගේ
රාජ්‍යයේ සිංහාසනයෙහි වැඩහුන්
3 දවස්වලදී, තමාගේ සියලු අධිපතීන්ද
සේවකයන්ද වන පාර්සියාවේ සහ
මේදියාවේ සේනාධිපතීන්ටද රටවල
උත්තමයන්ටද අධිපතීන්ටද තමා
ඉදිරියෙහි මංගල්‍ය කෑමක් දුන්නේය.
4 එකල්හි ඔහු තමාගේ රාජ්‍යයේ උතුම්
වස්තුද තමාගේ මහිමශ්‍රීයේ අනර්ඝතාවද
බොහෝ දවස් එනම් දවස් එකසිය
5 අසූවක් පෙන්නුවේය. ඒ දවස් පසුවුණ
විට රජතෙමේ ෂූෂන් *බලකොටුවේ
සිටි ලොකු කුඩා සියලු සෙනඟට
රජමාලිගාවේ උයනේ මළුවෙහි සත්
6 දවසක් මංගල්‍ය කෑමක් දුන්නේය. එහි
සුදු පාටද අමු පාටද නිල් පාටද ඇති
තිර සිහින් හණ ලනුවලිනුත් රත්නිල්
ලනුවලිනුත් රිදී මුදුවලින් සුදුගල්
කුළුනුවලට බැඳ තිබුණේය. රතු සුදු
කහ කළු යන පාට ඇති ගල් අල්ලාපු
7 බිමක් පිට රන් රිදී යහන් වූහ. බොන්ට
දුන්නේ රන් කුසලාන්වලින්ය. කුසලාන්ද
එකිනෙකට වෙනස්ව තිබුණේය. රාජ
මුද්‍රිකපානය රජුගේ ත්‍යාගවත්කම ලෙස
8 බොහෝසෙයින්ම තිබුණේය. බොන්ට
යෙදුණේ නියෝගය ලෙසය; කිසිවෙකුට
බලාත්කාරකළේ නැත. මක්නිසාද එක
එක මනුෂ්‍යයාගේ ප්‍රසන්නකමේ හැටියට
කරන ලෙස රජු විසින් තමාගේ ගෙයි
සියලු මූලාදෑනීන්ට නියමකර තිබුණේය.
වස්ති බිසවද අහෂ්වේරොෂ් රජුට අයිති 9
මාලිගාවේදී ස්ත්‍රීන්ට මංගල්‍ය කෑමක්
දුන්නාය. සත්වෙනිද රජුගේ සිත 10
මුද්‍රිකපානයෙන් පිනාගිය විට, වස්ති
බිසව පෙනීමට ඉතා ලක්ෂණ නිසා ඇගේ
අලංකාරකම ජනයන්ටත් අධිපතීන්ටත්
පෙන්වන පිණිස, ඇට ඔටුන්න පළඳවා 11
රජු ඉදිරිපිටට කැඳවාගෙන එන්ට
අහෂ්වේරොෂ් රජ තමා ඉදිරියෙහි
සේවයකළාවූ මෙහූමාන්ද බිස්තාද
හර්බෝනාද බිග්තාද අබග්තාද සේතර්ද
කර්කස්ද යන නපුංසකයන් සත්දෙනාට
අණකෙළේය. නුමුත් නපුංසකයන් අත 12
රජු කියා ඇරිය අණට එන්ට වස්ති
බිසව අකැමැතිවූවාය. එබැවින් රජ ඉතා
උදහස්වී, ඔහුගේ කෝපය ඔහු තුළ
ඇවිළුණේය. එවිට රජ කාලයන් දන්නාවූ 13
ප්‍රඥාවන්තයන්ට කථාකොට: අහෂ්-
වේරොෂ් රජ නපුංසකයන් අත කියා
ඇරිය ආඥාව වස්ති බිසව ඉෂ්ටනොකළ
බැවින් නීතිය ප්‍රකාරයට ඈට මක් කළ
යුතුදැයි ඇසුවේය. මක්නිසාද රජුගේ 14
කාරණා නීතියත් විනිශ්චයත් දන්න
සියල්ලන් ඉදිරියට පමුණුවන සිරිතක්
තිබුණේය. ඔහු ළඟම සිටියේ රජුගේ 15
මුහුණ දක රාජ්‍යයේ ප්‍රධාන ස්ථානයෙහි
ඉඳගත්තාවූ, පාර්සියාවේද මේදියාවේද
අධිපතීන් සත්දෙනා වන කර්ෂෙනා,
ෂේතාර්, අද්මාතා, තර්ෂිෂ්, මෙරෙස්,
මර්සෙනා සහ මෙමූකාන්ය. මෙමූකාන් 16
රජු සහ අධිපතීන් ඉදිරියෙහි උත්තර-
දෙමින්: වස්ති බිසව රජුට පමණක් නොව
සියලු අධිපතීන්ටත් අහෂ්වේරොෂ් රජුගේ
සියලු රටවල සිටින සියලුම ජාතීන්ටත්

*නොහොත්, මාලිගාවේ.

17 වරදක් කළාය. මක්නිසාද බිසවගේ මේ
ක්‍රියාව සියලු ස්ත්‍රීන්ට සැලවුණාම:
අහෂ්වේරොෂ් රජ තමා ඉදිරියට වස්ති
බිසව කැඳවාගෙන එන්ට අණකළ නුමුත්
ඈ ආවේ නැතැයි ඔවුන් කියා තමුන්ගේ
පුරුෂයන් සුළුකොට සිතනවා ඇත.
18 පාර්සියාවේද මේදියාවේද වංශවත්
ස්ත්‍රීන්ට බිසවගේ ක්‍රියාව ගැන
සැලවුණාම රජුගේ සියලු අධිපතීන්ට
අද දවසේදී එසේම කියනවා ඇත. එයින්
සුළුකම්කිරීමද උදහසද බොහෝසෙයින්
19 හටගන්නවා ඇත. රජ්ජුරුවන් සතුටු නම්
වස්ති තවත් අහෂ්වේරොෂ් රජු ඉදිරියට
නොඑන ලෙස රජ්ජුරුවන්ගෙන් රාජ
ආඥවක් පතළ වෙන්ටත්, එය වෙනස්
නොවන පිණිස පාර්සිවරුන්ගේද
මේදවරුන්ගේද ව්‍යවස්ථා අතරෙහි ලියා
තබන්ටත් යෙදේවා; ඇගේ බිසෝකමද
ඈට වඩා හොඳ තැනැත්තියකට
20 රජ්ජුරුවන් විසින් දෙනු ලැබේවා. රජු
විශාලවූ ස්වකීය රාජ්‍යය මුළුල්ලෙහි
පතවන නියෝගය ඇසූ කල්හි සියලුම
භාර්යාවන් ලොකු කුඩාවූ තම තමුන්ගේ
පුරුෂයන්ට ගෞරව දෙනවා ඇතැයි
21 කීවෝය. ඒ කීමට රජද අධිපතීහුද
ප්‍රසන්නවූහ; රජ මෙමූකාන්ගේ කීම ලෙස
22 කරමින්, එක එක පුරුෂයා විසින් තම
තමාගේ ගෙදර ආණ්ඩුකරන හැටියටද,
තමාගේ සෙනඟගේ භාෂාවෙන් එය
ප්‍රකාශකරන හැටියටද, එක එක රටේ
අකුරුවලිනුත් එක එක සෙනඟගේ
භාෂාවෙනුත් ලියුම් ලියා ඇරියේය.

## එස්තර් බිසෝකොට තෝරාගනු ලැබීම. මොර්දෙකයි විසින් කුමන්ත්‍රණයක් පෙන්වාදීම

2 මේ කාරණාවලට පසු, අහෂ්-
වේරොෂ්ගේ කෝපය සංසිඳුණු
කල්හි, ඔහු වස්ති සහ ඈ කළ දේද ඈට
විරුද්ධව කළ නියමයද සිහිකෙළේය.
2 එවිට රජුට සේවයකළ ඔහුගේ මෙහෙ-
කරුවෝ කථාකොට: රූපසම්පන්න
කන්‍යා තරුණියන් රජු උදෙසා සොයත්වා.
එබඳු රූපසම්පන්න සියලු කන්‍යා 3
තරුණියන් ශූෂන් බලකොටුවේ
තිබෙන ස්ත්‍රීන්ගේ ගෙයි රජ්ජුරුවන්ගේ
නපුංසකයාවූ, ස්ත්‍රීන්ගේ රැකවලාවූ
හෙගයිගේ රැකවරණයට රැස්කරගන
එන පිණිස රජ්ජුරුවන් තමාගේ රාජ්‍යයේ
සියලු රටවල මුලාදෑනීන් නියමකරන්ටත්,
ඒ තැනැත්තියන්ගේ පවිත්‍රවීම පිණිස නිසි
දේ ඔවුන්ට දෙන්ටත් යෙදේවා. එවිට 4
රජ්ජුරුවන්ට ප්‍රියව පෙනෙන තරුණිය
වස්ති වෙනුවට බිසෝ වේවයි කීවෝය.
ඒ කාරණාවට රජ ප්‍රසන්නවී එලෙස
කෙළේය.

බබිලෝනියේ රජවූ නෙබූකද්නෙශර් 5
විසින් අල්ලාගන ගිය යූදහි රජවූ
යෙකොනියා සමග ගෙනයනු ලැබූ අය
අතරේ යෙරුසලමෙන් ගෙනයනලද 6
බෙන්යමියයෙක්වූ කීෂ්ගේ පුත්‍රයා වන
ෂිමෙයිගේ පුත්‍රවූ යායිර්ගේ පුත්‍රයා වන
මොර්දෙකයි නම්වූ යුදෙව්වෙක් ශූෂන්
බලකොටුවෙහි සිටියේය. ඔහු තමාගේ 7
බාප්පාගේ දුවවූ හදස්සා එනම් එස්තර්
ඇතිකරගත්තේය. මක්නිසාද ඇගේ
පියාවත් මවුවත් ජීවත්ව සිටියේ නැත,
ඈ වනාහි ශෝභනවූ රූපසම්පන්න
තැනැත්තියක් වූවාය; ඇගේ මවුපියන්
නැසුණු කල මොර්දෙකයි ඈ තමාට
දුවෙක් කොට පිළිගත්තේය. තවද රජුගේ 8
ආඥවත් නියෝගයත් සැලවූ කල්හි
බොහෝ තරුණියන් ශූෂන් බලකොටුවට
හෙගයිගේ රැකවරණයට රැස්වෙද්දී,
එස්තර්ද රජගෙට, ස්ත්‍රීන්ගේ රැකවලාවූ
හෙගයිගේ රැකවරණයට, ගෙනෙනලද්දීය.
තරුණිද ඔහුට ප්‍රියවී ඔහුගෙන් කරුණාව 9
ලැබුවාය; ඔහු ඉක්මන්කර ඇගේ
පවිත්‍රවීම සඳහා දේවල්ද ඇගේ ආහාර
කොටසද දුන්නේය; ඈට දීමට සුදුසුවූ,
රජ ගෙදරින් තෝරනලද තරුණියන්
සත්දෙනෙක්ද ඈට දී, ඈ සහ ඇගේ
වැඩකාරියන් ස්ත්‍රීන්ගේ ගෙයි ඉතා හොඳ
ස්ථානයට පැමිණෙවුවේය. එස්තර් 10
තොමෝ ඇගේ ජාතියවත් ඇගේ
සෙනඟවත් එළිදරව් නොකළාය;
මක්නිසාද එළිදරව් නොකරන ලෙස
මොර්දෙකයි ඈට අණකර තිබුණේය.

11 මොර්දෙකයි වනාහි එස්තර්ගේ
ශුභසිද්ධියත් ඇට මක්වේද කියාත්
දැනගන්න පිණිස ස්ත්‍රීන්ගේ ගෙයි මිදුල
12 ඉස්සරහපිට දවස්පතා ඇවිද්දේය. එක
එක තරුණිය ස්ත්‍රීන්ගේ නියෝගය
ප්‍රකාරයට දෙළොස් මාසයක් වන
ඔවුන්ගේ පවිත්‍රවීමේ කාලයෙන් පසු,
එනම් සුවඳලාවූ තෙල් හමාසයක්ද
සුගන්ධ ද්‍රව්‍ය සහ ස්ත්‍රීන්ගේ පවිත්‍රවීමේ
තෙල හමාසයක්ද පාවිච්චිකළායින්
පසු, අහෂ්වේරොෂ් රජු ළඟට යන්ට ඒ
ඒ තැනැත්තියගේ වාරය පැමුණුණාම,
13 ඈ රජු ළඟට පැමුණුණේ මෙසේය, එනම්
ස්ත්‍රීන්ගේ ගෙයින් ඈ සමග ගෙනයන
පිණිස ඈ ඉල්ලූ කොයි දෙයක් වුවත්
14 ඇට දෙනලද්දේය. ඈ සවස ගොස්
පසුවද ස්ත්‍රීන්ගේ දෙවෙනි ගෙට, රජුගේ
නපුංසකයාවූ උප භාර්යාවන්ගේ
රැකවලාවූ ෂයෂ්ගාස්ගේ රැකවරණයට,
හැරී ආවාය. රජු ඇට ප්‍රියව නම කියා
ඇට අඬගැසුවොත් මිස නැත්නම් ඈ
රජු ළඟට තවත් පැමුණුණේ නැත.
15 මොර්දෙකයි විසින් දුවකොට හදාගත්තාවූ,
තමාගේ බාප්පා වන අබිහයිල්ගේ දූවූ
එස්තර්ට රජු ළඟට යාමට වාරය
පැමුණුණ විට රජුගේ නපුංසකයාවූ,
ස්ත්‍රීන්ගේ රැකවලාවූ හෙගයි නියමකළ
දේ හැර ඈ වෙන කිසිවක් නොඉල්ලුවාය.
එස්තර් දුටු සියල්ලෝ ඇට ප්‍රියවුණෝය.
16 මෙසේ එස්තර් තොමෝ අහෂ්වේරොෂ්
රජුගේ රජකම්කිරීමේ සත්වෙනි අවුරුද්දේ
තේබෙත් නම් දසවෙනි මාසයේදී රජ-
ගෙට රජු වෙතට ගෙනයනු ලැබුවාය.
17 රජද සියලුම ස්ත්‍රීන්ට වඩා එස්තර්ට
ආදරේවී, සියලු කන්‍යාවන්ට වඩා ඇට
කරුණාවද ආදරයද පෙන්වා, ඇගේ
හිසේ රාජ ඔටුන්න තබා, වස්ති වෙනුවට
18 ඈය බිසව කරගත්තේය. රජ තමාගේ
සියලු අධිපතීන් හා සේවකයන්ට
එස්තර්ගේ මංගල්‍යය වන මහත් මංගල්‍ය
කෑමක් පිළියෙළ කර දුන්නේය; රටවලට
නිදහසක්ද දී රජුගේ ත්‍යාගවත්කම ලෙස
19 තෑගි දුන්නේය. දෙවෙනි වතාවේ
කන්‍යාවන් රැස්කරන කල මොර්දෙකයි
20 රජවාසල හිඳගන උන්නේය. එස්තර්
මොර්දෙකයි ඇට අණකළ ලෙස ඇගේ
සෙනඟත් ජාතියත් නොදන්වා සිටියාය.
මක්නිසාද එස්තර් මොර්දෙකයි වෙත
වැඩෙද්දී කළාක්මෙන් ඈ ඔහුගේ කීම
ඉෂ්ටකළාය. ඒ දවස්වලදී මොර්දෙකයි 21
රජ වාසල වාඩිව ඉන්න කල්හි වාසල්
රැකවලුන් අතරෙන් රජුගේ නපුංසකයන්
දෙදෙනෙක් වන බිග්තාන් සහ තෙරෙෂ්
කෝපවී, අහෂ්වේරොෂ් රජු මරන්ට
සෙවුවෝය. මොර්දෙකයිට ඒ බව 22
දැනගන්ට ලැබී ඔහු එස්තර් බිසවට
දැන්නුවේය. එස්තර්ද මොර්දෙකයිගේ
නාමයෙන් රජුට කීවාය. ඒ කාරණය 23
විභාගකළ කල්හි සැබෑ බව පෙනීගිය
නිසා ඔවුන් දෙදෙනා ගසක එල්ලනු
ලැබූහ. ඒ කාරණය රජු ඉදිරියේදී ලේකම්
පොතෙහි ලියා තබනලද්දේය.

## යුදෙව්වරුන්ට විරුද්ධව හාමාන් උපා යෙදීම

3 මේ කාරණාවලට පසු අහෂ්වේරොෂ්
රජ අගාගිය හම්මෙදාතාගේ
පුත්‍රවූ හාමාන් උසස්කරමින් උතුම්කමට
පමුණුවා, තමා වෙත සිටිය සියලු
අධිපතීන්ට වඩා උත්තම ආසනයක්
ඔහුට දුන්නේය. රජවාසල සිටි රජුගේ 2
සියලු සේවකයෝද හාමාන්ට නැමී
වැන්දෝය. මක්නිසාද ඔහු ගැන රජ
එසේ අණකර තිබුණේය. නුමුත්
මොර්දෙකයි ඔහුට හිස නැමුවේවත්
වැන්දේවත් නැත. එවිට රජවාසල සිටි 3
රජුගේ සේවකයෝ: නුඹ රජුගේ අණ
කඩකරන්නේ මක්නිසාදැයි මොර්දෙකයිට
කීවෝය. ඔවුන් දවස්පතා ඔහුට මෙසේ 4
කී නුමුත් ඔහු ඇහුම්කන් නුදුන් බැවින්,
මොර්දෙකයිගේ කාරණා ස්ථිරවේදෝ
කියා බලන පිණිස ඔව්හු හාමාන්ට
දැන්නුවෝය. මක්නිසාද තමා යුදෙව්වෙක්
බව මොර්දෙකයි ඔවුන්ට කියා තිබුණේය.
මොර්දෙකයි තමාට නැමී නමස්කාර 5
නොකරන බව හාමාන් දැක කෝපයෙන්
පිරුණේය. නුමුත් මොර්දෙකයි කෙරෙහි 6
පමණක් අත් හෙළීම ඔහුට ඉතා සුළුව
පෙනුණේය; මක්නිසාද මොර්දෙකයිගේ
ජාතිය ගැන ඔහුට දන්වනලද්දේය. එබැවින්

හාමාන් අහෂ්වේරොෂ්ගේ මුළු
රාජ්‍යයෙහි සිටි මොර්දෙකයිගේ සෙනඟවූ
සියලු යුදෙව්වරුන් නැතිකරන්ට
7 සෙවුවේය. අහෂ්වේරොෂ් රජුගේ
දෙළොස්වෙනි අවුරුද්දේ නීසාන් මාසය
නම්වූ පළමුවෙනි මාසයේ පටන් හාමාන්
ඉදිරියෙහි දවසින් දවස මාසයෙන්
මාසය අදර් මාසය නම්වූ දෙළොස්වෙනි
මාසය දක්වා පූර් එනම් පසඇට
8 දැමුවෝය. එවිට හාමාන් අහෂ්වේරොෂ්
රජුට කථාකොට: ඔබගේ රාජ්‍යයේ
සියලු රටවල ජාතීන් අතරේ එක්තරා
සෙනඟක් විසිර වෙනම සිටිති; ඔවුන්ගේ
ව්‍යවස්ථා සියලු ජනයන්ගේ ව්‍යවස්ථා-
වලට වෙනස්ය; ඔවුන් රජුගේ ව්‍යවස්ථා
පවත්වන්නේ නැත. එහෙයින් ඔවුන්ට
සිටින්ට ඉඩදීම රජ්ජුරුවන්ට වටින්නේ
9 නැත. රජතුමා ප්‍රසන්න නම් ඔවුන්
නැතිකරදමන හැටියට ලියාහරිනු
ලැබේවා. මමද රාජ භාණ්ඩාගාරයට
ගෙනෙන පිණිස රාජකාරිය භාරකාරයන්
අතට රිදී තලෙන්ත දසදහසක් කිරා
10 දෙන්නෙමියි කීවේය. රජ තමාගේ අතින්
මුද්‍රුව ගළවා යුදෙව්වරුන්ගේ සතුරාවූ
අගාගිය හම්මෙදතාගේ පුත්‍රවූ හාමාන්ට
11 දී ඔහුට කථාකොට: රිදී තුඹට වේවා,
තුඹට හොඳව පෙනෙන දෙයක් කරන්ට
ඒ සෙනඟ එසේම තුඹට දී තිබේයයි
12 කීවේය. එවිට පළමුවෙනි මාසයේ
දහතුන්වෙනිද රජුගේ ලේකම්වරුන්ට
අඬගස්වා, හාමාන් අණකළ සියල්ල
ලෙස රජුගේ දිසාධිපතීන්ටද සියලු
රටවල ආණ්ඩුකාරයන්ටද එක එක
සෙනඟගේ අධිපතීන්ටද එක එක රටේ
අකුරුවලින් සහ එක එක සෙනඟගේ
භාෂාවෙන්ද ලියුම් ලියවා හැරියේය;
අහෂ්වේරොෂ් රජුගේ නමින් ඒවා
13 ලියා රජුගේ මුද්‍රුවෙන් මුද්‍රාකළේය. අදර්
මාසය නම්වූ දෙළොස්වෙනි මාසයේ
දහතුන්වෙනිද තරුණයන්ද මහල්ලන්ද
බාලයන්ද ස්ත්‍රීන්ද යන සියලු යුදෙව්වරුන්
එක දවසේම නැතිකරදමන්ටත් මරන්ටත්
විනාශකරන්ටත් ඔවුන්ගේ දේපළ
කොල්ලකන්ටත් කියා රජුගේ සියලු
රටවලට පණිවිඩකාරයන් අත ලියුම්
අරිනලද්දේය. ඒ දවසට සූදනම්ව සිටින 14
ලෙස එක එක පළාතට නියෝගයක්
දෙන පිණිස ඒ ලියවිල්ලේ පිටපතක්
සියලු ජනයන්ට ප්‍රසිද්ධකරනලද්දේය.
පණිවිඩකාරයෝ රජුගේ ආඥාව පිට 15
ඉක්මන්කර පිටත්ව ගියෝය, ඒ නියෝගය
ෂූෂන් බලකොටුවේදී දෙන ලද්දේය. රජද
හාමාන්ද බීමට හිඳගත්තෝය; නුමුත්
ෂූෂන් නුවර කැලඹුණාය.

## මොර්දෙකයි විසින් එස්තර් බිසව වෙත කළ ඉල්ලීම

4 තවද කෙරුණු සියල්ල
මොර්දෙකයි දැනගත් විට ඔහු
තමාගේ වස්ත්‍ර ඉරා, අලු ඇතුව, ගෝණි
රෙදි හැඳගන, නුවර මැදට ගොස් මහත්වූ
දුක්බිතවූ හඬකින් මොරගසමින්,
රජවාසල ඉදිරිපිටටම පැමුණුණේය. 2
රජවාසලට වනාහි ගෝණි රෙදි
හැඳගෙන කිසිවෙකුට ඇතුල්වෙන්ට
අවසර නැත. තවද රජුගේ ආඥාවද 3
නියෝගයද පැමුණුණු සියලු රටවල
යුදෙව්වරුන් අතරේ මහත් වැලපීමද
නිරාහාරව සිටීමද ඇඬීමද විලාපකීමද
විය; බොහෝ දෙනෙක් ගෝණි රෙදි
සහ අලු පිට වැතිරගත්තෝය. එවිට 4
එස්තර්ගේ මෙහෙකාරියෝද නපුංසකයෝද
අවුත් එපවත් ඈට දැන්නූහ; එකල බිසව
ඉතා ශෝක වුණාය. මොර්දෙකයිගෙන්
ගෝණි රෙදි ගළවාදමා අන්දවන පිණිස
ඈ ඔහුට ඇඳුම් යැවුවාය. නුමුත් ඔහු
ඒවා පිළිගත්තේ නැත. එවිට එස්තර් 5
ඈට මෙහෙකරන පිණිස රජු විසින්
පත්කළ නපුංසකයන්ගෙන් එක්කෙනෙක්වූ
හාතාක්ට අඬගසා, කාරණාව මොකද
කියාත් මේ මක්නිසාද කියාත් ගොස්
මොර්දෙකයිගෙන් දැනගන්ට අණකළාය.
මෙසේ හාතාක් රජවාසල ඉදිරිපිට තිබුණු 6
නුවර වීදියට මොර්දෙකයි ළඟට ගියේය.
එවිට මොර්දෙකයි තමාට සිද්ධවුණ 7
සියල්ලත් යුදෙව්වරුන් නැති කරන පිණිස
හාමාන් විසින් ඔවුන් ගැන රාජ
භාණ්ඩාගාරයට ගෙවන්ට පොරොන්දුවූ
මුළු මුදල් ගණනත් ඔහුට කීයේය. තවද 8
ඔවුන් විනාශකරන්ට ෂූෂන්හිදී දුන්

නියෝගපත්‍රයේ පිටපත එස්තර්ට පෙන්වා
දන්වන පිණිස ඔහුට දී, ඈ රජු ළඟට
ගොස් ඔහුට කන්නලව් කර ඇගේ
සෙනඟ උදෙසා ඔහුගෙන් කරුණාව
ඉල්ලන පිණිස ඈට අණකරන ලෙසද
9 ඔහුට කීයේය. හාතාක් ඇවිත්
මොර්දෙකයිගේ වචන එස්තර්ට දැන්නුවේය.
10 එකල එස්තර් හාතාක්ට කථාකොට:
අඬගසනු නොලැබ ඇතුල් මළුවට රජු
11 වෙතට ඇතුල්වෙන කොයි පුරුෂයෙකු
වුවත් ස්ත්‍රියෙකු වුවත් නොනස්නා පිණිස
රජ ඒ අය දෙසට රන් ජයකොන්තය
දිගුකළොත් මිස, නැත්නම් ඔහු ගැන
ඇත්තේ එකම නියමයක් බව එනම් ඔහු
මැරිය යුතු බව රජුගේ සියලු සේවකයෝද
රජුගේ රටවල සෙනඟද දනිති. ඇරත්
රජු ළඟට යන්ට දැනට තිස් දවසකින්
මම කැඳවනු නොලැබීමියි කියා
මොර්දෙකයිට කියන්ට අණකළාය.
12 එස්තර්ගේ වචන මොර්දෙකයිට
13 දන්වනලද්දේය. එවිට මොර්දෙකයි
එස්තර්ට උත්තර යවමින්: රජගෙදර
ඉන්න නිසා සියලු යුදෙව්වරුන්ගෙන්
තුඹ පමණක් ගැළවේය කියා සිතා
14 නොගනින්න. මක්නිසාද මේ ප්‍රස්තාවේදී
තුඹ නිශ්ශබ්දවම සිටියොත් වෙන
තැනකින් යුදෙව්වරුන්ට නිදහසත්
ගැළවීමත් පැමිණෙනවා ඇත, නුමුත්
තුඹ සහ තුඹේ පියවංශය නැතිවන්නේය.
තුඹ රාජ්‍යයට පැමුණුණේ මෙවැනි
ප්‍රස්තාවක් නිසාම නොවේද කියා දන්නේ
කවුද්දැයි කියා කියන්ට අණකෙළේය.
15 එවිට එස්තර් මොර්දෙකයිට උත්තර
16 යවමින්: ගොස් ෂූෂන්හි සිටින සියලු
යුදෙව්වරුන් රැස්කරවා, මා උදෙසා
ඔවුන් සමග දවස් තුනක් රෑ දවල් නොකා
නොබී නිරාහාරව සිටින්න. මමත් මාගේ
වැඩකාරියොත් එසේම නිරාහාරව
ඉන්නෙමුව; එවිට නීතියට එකඟ නැති
නුමුත් මම රජු ළඟට යන්නෙමි. මා
නැතිවුණොත් නැතිවුණාවේ කියා
17 කියන්ට කීවාය. එවිට මොර්දෙකයි
ගොස් තමාට එස්තර් අණකළ සියල්ල
ලෙස කෙළේය.

## එස්තර් බිසව රජු වෙත කළ අයදුම

5

තවද තුන්වෙනිද එස්තර් රාජ
වස්ත්‍ර පැළඳගන රජගෙය ඉදිරිපිට
තිබුණ රජගෙයි ඇතුල් මිදුලට ගොස්
සිටියාය. රජ තෙමේ රජගෙයි රාජ
සිංහාසනයෙහි ගෙයි දොරකඩ ඉදිරිපිට
වැඩහුන්නේය. එවිට රජ එස්තර් බිසව 2
මිදුලේ සිටිනවා දැක ඈ කෙරෙහි
කරුණාකොට, තමාගේ අත තිබුණු රන්
ජයකොන්තය ඈ දෙසට දිගුකෙළේය.
එස්තර් ළංව ජයකොන්තයේ මුදුනේ
අග ස්පර්ශකළාය. එකල රජ ඈට 3
කථාකොට: එස්තර් බිසව, තුඹට ඕනෑ
මොකද? තුඹේ අයදීම මොකද?
රාජ්‍යයෙන් දෙකෙන් පංගුවක් වුණත්
තුඹට දෙනු ලැබේයයි කීයේය. එස්තර්ද: 4
රජ්ජුරුවන්ට හොඳව පෙනේනම් මා
විසින් රජ්ජුරුවන්ට පිළියෙළකර තිබෙන
මංගල්‍ය කෑමට රජ්ජුරුවන්ද හාමාන්ද
අද අවමැනවැයි කීවාය. එවිට රජ එස්තර් 5
කී ලෙස කරන්ට හාමාන් ඉක්මන්-
කරවාපල්ලායයි කීවේය. මෙසේ රජද
හාමාන්ද එස්තර් පිළියෙළකළ
මංගල්‍යයට ආවෝය. රජතෙමේ මුද්‍රිකපාන 6
මංගල්‍යයේදී එස්තර්ට කථාකොට:
තුඹේ ඉල්ලීම මොකද? ඒක තුඹට දෙනු
ලැබෙන්නේය, තුඹේ අයදුම මොකද?
රාජ්‍යයෙන් දෙකෙන් පංගුවක් වුණත්
ඒක ඉෂ්ටකරනු ලැබේයයි කීවේය.
එවිට එස්තර් උත්තරදෙමින්: රජ්ජුරුවන්- 7
ගෙන් මට කරුණාව ලැබී තිබේ
නම්, එසේම මා ඉල්ලන දේ දෙන්ටත් 8
මාගේ අයදුම ඉෂ්ටකරන්ටත් රජතුමා
ප්‍රසන්න නම්, මාගේ ඉල්ලීම සහ
අයදුම නම් රජ්ජුරුවන්ටත් හාමාන්ටත්
මා විසින් පිළියෙළකරන මංගල්‍යයට
ඔබ සහ හාමාන් එන ලෙසය,
එවිට රජුගේ කීම ලෙස හෙට
කරන්නෙමියි කීවාය. හාමාන්ද ඒ 9
දවසේදී සන්තෝෂවී ප්‍රීතිමත් සිතකින්
පිටතට ගියේය. එහෙත් හාමාන් තෙම
රජවාසල උන් මොර්දෙකයි තමා ඉදිරි-
යෙහි නැගිට්ටේවත් තමා සැලකුවේවත්

නැති බව දැක ඔහු කෙරෙහි උදහසින්
10 පිරුණේය. එසේ වුවත් ඔහු කෝපය
සංසිඳුවාගෙන, ගෙට ඇවිත් තමාගේ
මිත්‍රයන්ද තමාගේ භාර්යාවවූ සෙරෙෂ්ද
11 කැඳවාගෙන, තමාගේ වස්තුවේ වෛශ්-
වර්යයද තමාගේ දරුවන් රාශියද රජ
විසින් තමා උසස්කළ හැටිද රජුගේ
අනික් අධිපතීන්ටත් සේවකයන්ටත් වඩා
තමා ප්‍රධානකළ හැටිද යනාදිවූ සියල්ල
12 පැවසුවේය. හාමාන් තවත් කථාකොට:
එස්තර් බිසව පිළියෙළකළ මංගල්‍ය
කෑමට මා මිස රජු සමග වෙන කිසිවෙක්
ගෙන්නෙව්වෙත් නැත; හෙටත් රජු සමග
එන්ට ඈ විසින් ආරාධනාකරනු ලැබීමි.
13 එහෙත් යුදෙව්වා වන මොර්දෙකයි
රජවාසල ඉඳගන ඉන්නවා මට
පෙනෙනකල් මේ සියල්ල මට මොකට-
14 දැයි කීවේය. එකල ඔහුගේ භාර්යාවවූ
සෙරෙෂ්ද ඔහුගේ සියලු මිත්‍රයෝද ඔහුට
කථාකොට: පනස් රියනක් උස ඇති
එල්ලුම් ගහක් සාදවා, මොර්දෙකයි ඒකේ
එල්ලා දමන පිණිස හෙට උදේ රජුට
කථාකර, ඉන්පසු රජු සමග මංගල්‍යයට
ප්‍රීතියෙන් පැමිණෙන්නැයි කීවෝය. ඒ
කීමට හාමාන් ප්‍රසන්නව එල්ලුම් ගහ
සෑදෙවුවේය.

## මොර්දෙකයි උසස්කරනු ලැබීම

6 එද රාත්‍රියේ රජුට නින්ද
නොගොස් ඉකුත්වූ කාලයේ
කරුණු සඳහන්වූ ලේකම් පොත
ගෙනෙන්ට අණකෙළේය, එය රජු
2 ඉදිරියෙහි කියවන ලද්දේය. එවිට
අහෂ්වේරොෂ් රජු මරන්ට සෙවුවාවූ
වාසල් රැකවලුන්ගෙන් රජුගේ නපුංසක-
යන් දෙදෙනෙක් වන බිග්තාන්ද
තෙරෙෂ්ද ගැන මොර්දෙකයි දැන්වූ වග
3 ලියා තිබෙනවා සම්බවිය. මේ ගැන
මොර්දෙකයිට මොන ගරු සම්මානයක්
කරනලද්දේදැයි රජු ඇසුවේය. ඔහුට
කිසි දෙයක් කළේ නැතැයි රජුට
සේවයකරන මෙහෙකරුවෝ කීවෝය.
4 රජද: මිදුලේ ඉන්නේ කවුදැයි ඇසීය.
හාමාන් වනාහි තමා විසින් මොර්දෙකයිට
සෑදූ එල්ලුම්ගහේ ඔහු එල්ලාදමන්ට
රජුට කථාකරන පිණිස රජගෙදර පිටත
මිදුලට ඇවිත් සිටියේය. හාමාන් මිදුලේ 5
සිටිනවායයි රජුගේ මෙහෙකරුවෝ ඔහුට
කීවෝය. ඔහු ඇතුළට ඒවයි රජ කීය.
හාමාන් ඇතුල්වුණ විට රජ ඔහුට 6
කථාකොට: රජු විසින් ගෞරවකරන්ට
කැමති මනුෂ්‍යයාට කරන්ට ඕනෑ
මොකදැයි ඇසුවේය. හාමාන්ද: මට
මිස රජු ගෞරවකරන්ට කැමති කාටදැයි
තමාගේ සිතින් සිතාගෙන, රජුට
කථාකොට: රජ්ජුරුවන් ගෞරවකරන්ට 7
කැමැති මනුෂ්‍යයාට මෙසේ කළ යුතුය–
රජ්ජුරුවන් පළඳින රාජ වස්ත්‍රයක්ද 8
රජ්ජුරුවන් නැගී යන්නාවූ, රාජ ඔටුන්න
හිසේ දරන්නාවූ අශ්වයාද ගෙනවුත්,
වස්ත්‍රයද අශ්වයාද රජුගේ ඉතා උතුම් 9
අධිපතීන්ගෙන් එක්කෙනෙකු අතට
භාරදෙන්ටත්, රජ්ජුරුවන් ගෞරවකරන්ට
කැමති මනුෂ්‍යයාට එය පළඳවා ඔහු
අශ්වයා පිට නංවා නුවර වීථිය දිගේ
ගෙනයමින්–රජ්ජුරුවන් ගෞරවකරන්ට
කැමති මනුෂ්‍යයාට මෙසේ කරනු ලැබේ-
යයි ඔහුට පෙරටුවෙන් ඝෝෂණයකර
කියන්ටත් යෙදේවයි කීවේය. එවිට රජ 10
හාමාන්ට කථාකොට: ඉක්මන්කර නුඹ
කී වස්ත්‍රයද අශ්වයාද රැගෙන, රජවාසල
හිඳින යුදෙව්වාවූ මොර්දෙකයිට එසේ
කරපන්න; නුඹ කී සියල්ලෙන් කිසිවක්
අඩුනොවේවයි කීවේය. එවිට හාමාන් 11
වස්ත්‍රයද අශ්වයාද රැගෙන මොර්දෙකයි
සරසා, ඔහු නුවර වීථිය දිගේ අසුපිටින්
යන්ට සලස්වා: රජ්ජුරුවන් විසින්
ගෞරවකරන්ට කැමති මනුෂ්‍යයාට
මෙසේ කරනු ලැබේයයි ඔහුට පෙරටුව
ඝෝෂණයකර කීවේය. පසුව මොර්දෙකයි 12
රජවාසලට හැරී ආවේය. නුමුත් හාමාන්
වැලපෙමින් හිස වසාගෙන තමාගේ
ගෙදරට ඉක්මනින් ගොස්, තමාට සිද්ධවූ 13
සියල්ල තමාගේ භාර්යාවවූ සෙරෙෂ්ටද
තමාගේ සියලු මිත්‍රයින්ටද කීවේය. එවිට
ඔහුගේ උපදේශකයෝද ඔහුගේ භාර්යාවවූ
සෙරෙෂ්ද ඔහුට කථාකොට: නුඹ
මොර්දෙකයි ඉදිරියෙහි වැටෙන්ට
පටන්ගත්තෙහිය, ඔහු යුදෙව් වංශයේ
කෙනෙක් නම් ඔහුට විරුද්ධව සිටින්ට
නුඹට බැරිවෙයි, ඔහු ඉදිරියෙහි නුඹ

14 වැටෙනවාම ඇතැයි කීවෝය. ඔවුන් ඔහු
සමග කථාකරද්දීම රජුගේ නපුංසකයෝ
ඇවිත් එස්තර් පිළියෙළකළ මංගල්‍යයට
හාමාන් කැඳවාගනයන්ට ඉක්මන්කළෝය.

## හාමාන් එල්ලා දමනු ලැබීම

7 මෙසේ රජද හාමාන්ද එස්තර් බිසව
සමග පාන උත්සවයට ආවෝය.
2 දෙවෙනි දවසෙත් මුද්‍රිකපාන මංගල්‍යයේදී
රජ එස්තර්ට කථාකොට: එස්තර් බිසව,
තුඹේ ඉල්ලීම මොකද? ඒක තුඹට දෙනු
ලැබේ; තුඹේ අයදුම මොකද? එය
රාජ්‍යයෙන් දෙකෙන් පංගුවක් වුවත්
3 ඉෂ්ටකරනු ලැබේයයි කීය. එවිට එස්තර්
බිසෝ උත්තරදෙමින්: රජ්ජුරුවෙනි,
ඔබගෙන් මට කරුණාව ලැබී තිබේ
නම්, එසේම රජ්ජුරුවන් ප්‍රසන්න නම්,
මාගේ ඉල්ලීමට මාගේ ප්‍රාණයද මාගේ
අයදුමට මාගේ ජාතියද මට දෙනු
4 ලැබේවා. මක්නිසාද මමත් මාගේ
ජාතියත් නාස්තියටද මරාදැමීමටද
විනාශයටද විකුණනු ලැබීමුව. දස
දසීන් කොට අප වික්කා පමණක් නම්
නිශ්ශබ්දව සිටින්නෙමි, තුමුත් එදිරි-
කාරයාට රජුගේ අලාභය පිරි-
5 මසාදෙන්ට නුපුළුවනැයි කීවාය. එවිට
අහෂ්වේරොෂ් රජ එස්තර් බිසවට
කථාකොට: මෙසේ කරන්ට සිතින්
නිර්භීතව සිටින තැනැත්තා කවුද?
6 ඔහු කොතැනදැයි ඇසීය. එස්තර්ද:
එදිරිකාරයෙක්ද සතුරෙක්ද වූ මේ දුෂ්ට
හාමාන්යයි කීවාය. එවිට හාමාන්
7 රජුද බිසවද ඉදිරියෙහි භයපත්විය. රජ
කෝපව මුද්‍රිකපාන මංගල්‍යයෙන් නැගිට
මාලිගාවේ උයනට ගියේය. රජු විසින්
තමාට විරුද්ධව නපුරක් නියමකර
තිබෙන බව දැක හාමාන් තමාගේ
ප්‍රාණය උදෙසා එස්තර් බිසවට
8 කන්නලව් කරන්ට නැවතුණේය. රජ
මාලිගාවේ උයනෙන් මුද්‍රිකපාන
ශාලාවට හැරී ආවිට හාමාන් එස්තර්
උන් යහන පිට වැටී උන්නේය. එවිට
රජ: ගෙයි මා ඉදිරිපිටදී ඔහු බිසවට
බලාත්කාරකරන්ටත් යනවාදැයි කීවේය.
මේ වචනය රජුගේ මුඛයෙන් නික්මුණු
හැටියේම ඔව්හු හාමාන්ගේ මුහුණ වැසූහ.
නපුංසකයන්ගෙන් එක්කෙනෙක්වූ හර්- 9
බෝනා රජු ඉදිරියෙහි කථාකොට: ඇරත්
රජුගේ ශුභසිද්ධියට කථාකළාවූ
මොර්දෙකයිට හාමාන් විසින් සෑදෙවූ
පනස් රියනක් උස ඇති එල්ලුම්ගහ
හාමාන්ගේ ගෙදර ළඟ හිටවා තිබේ-
යයි කීය. ඔහු ඒකේ එල්ලාදමාපල්ලා-
යයි රජ කීවේය. එසේ හාමාන් විසින් 10
මොර්දෙකයිට සෑදූ එල්ලුම්ගහේම
හාමාන් එල්ලා දැමුවෝය. ඉක්බිති රජුගේ
කෝපය සංසිඳුණේය.

## යුදෙව්වන්ගේ වාසියට රජ අණදීම

8 ඒ දවසේදී අහෂ්වේරොෂ් රජ
යුදෙව්වරුන්ගේ සතුරාවූ හාමාන්ගේ
ගේදෙර එස්තර් බිසවට දුන්නේය. තවද
මොර්දෙකයි රජු ඉදිරියට පැමුණුණේය;
මක්නිසාද එස්තර් විසින් ඇයට ඔහු
ඇති නැකම රජුට දන්වා තිබුණේය.
රජතෙමේ හාමාන්ගෙන් ආපසු ගත්තාවූ 2
තමාගේ මුදුව ගළවා මොර්දෙකයිට
දුන්නේය. එස්තර් තොමෝ මොර්දෙකයි
හාමාන්ගේ ගේදෙර කෙරෙහි ප්‍රධානියා
කළාය. එස්තර් නැවතත් රජු ඉදිරියෙහි 3
කථාකොට රජුගේ පාමුල වැටී: අගාගිය
හාමාන් අදහස් කළ නපුරද
යුදෙව්වරුන්ට විරුද්ධව ඔහු යෝජනා
කළ උපායද පහකරන මෙන් අඬා
කන්නලව්කළාය. රජ එස්තර් දෙසට 4
රන් ජයකොන්තය දිගුකෙළේය. එවිට
එස්තර් නැගිට රජු ඉදිරියෙහි සිට
කථාකොට: රජ්ජුරුවන් ප්‍රසන්න නම්, 5
ඔබගෙන් මට කරුණාවද ලැබී තිබේ
නම්, එසේම කාරණය රජ්ජුරුවන්ට හරිව
පෙනේ නම්, මා රජුගේ ඇස් හමුයෙහි
ප්‍රියවී නම්, රජුගේ සියලු රටවල සිටින
යුදෙව්වරුන් විනාශකරන්ට අගාගිය
හම්මෙදතාගේ පුත්‍රවූ හාමාන් කළ
යෝජනාව එනම් ඔහු ලියා යැවූ ලියුම්
අවලංගුකරන පිණිස ලියා අරිනු
ලැබේවා. මක්නිසාද මාගේ ජාතියට 6

පැමිණෙන නපුර දක දක මා ඉවසාගන
ඉන්නේ කොහොමද? මාගේ නෑයන්ගේ
විනාශය දක දක ඉවසාගන ඉන්නේ
7 කොහොමදැයි කීවාය. එවිට අහෂ්වේරොෂ්
රජ එස්තර් බිසවටත් යුදෙව්වාවූ මොර්-
දෙකයිටත් කථාකොට: හාමාන්ගේ
ගෙය එස්තර්ට දුනිමි, ඔහු යුදෙව්වරුන්
පිට අත හෙළූ නිසා ඔහු එල්ලුම් ගහේ
8 එල්ලාදැමුවෝය. ඉතින් නුඹලාට හොඳව
පෙනෙන හැටියට නුඹලා යුදෙව්වරුන්
උදෙසා රජුගේ නාමයෙන් ලියුම් ලියා
රජුගේ මුදුවෙන් මුද්‍රාකර ඇරපල්ලා.
මක්නිසාද රජුගේ නාමයෙන් ලියා
රජුගේ මුදුවෙන් මුද්‍රාකළ පත්‍රයක්
කාටවත් අවලංගුකරන්ට බැරියයි කීවේය.
9 එකල සීවාන් මාසය වන තුන්වෙනි
මාසයේ විසිතුන්වෙනිද රජුගේ ලේකම්-
වරුන් ගෙන්වනු ලැබ, මොර්දෙකයි
අණකළ සියල්ල ලෙස යුදෙව්වරුන්ටද
රටවල් එකසිය විසිහතක්වූ ඉන්දියාවේ
සිට කූෂ් දක්වා තිබෙන රටවල
දිශාධිපතීන්ටද ආණ්ඩුකාරයන්ටද
පළාත්වල අධිපතීන්ටද එක එක රටේ
අකුරුවලින් සහ එක එක සෙනඟගේ
භාෂාවෙන්ද යුදෙව්වරුන්ට ඔවුන්ගේ
අකුරුවලින් සහ ඔවුන්ගේ භාෂාවෙන්ද
10 ලියා යවනලද්දේය. ඔහු අහෂ්වේරොෂ්
රජුගේ නාමයෙන් ලියා, රජුගේ මුදුවෙන්
මුද්‍රාකොට, රජුගේ අස්හලේ උපන් රාජ
සේවයෙහි යෙදූ ශීඝ්‍ර සෛන්ධවයන්
පිට නැඟීයන පණිවිඩකාරයන් අත
11 ලියුම් හැරියේය. එහි ලියා තිබුණේ:
එක දවසේම එනම් අදර් මාසයවූ
දෙළොස්වෙනි මාසයේ දහතුන්වෙනි දින
12 රැස්වී, තමුන්ගේ ප්‍රාණ උදෙසා විරුද්ධව
සිටින්ටත් තමුන්ට අන්තරායකරන්ට
කැමතිවූ සෙනඟද දේශවාසීන්ද යන
සියලුම සේනාවල් බාලයන්ද ස්ත්‍රීන්ද
ඇතුළුව නැතිකරන්ටත් මරාදමන්ටත්
විනාශකරන්ටත් ඔවුන්ගේ දේපළ
කොල්ලකාගන්ටත් අහෂ්වේරොෂ් රජුගේ
සියලුම රටවල එක එක නුවර සිටින
යුදෙව්වරුන්ට රජ අවසර දෙන්නේය
යනුයි. එක එක පළාතට නියෝගය 13
දෙන පිණිසත් යුදෙව්වරුන් තමුන්ගේ
සතුරන්ගෙන් පළිගැනීමට ඒ දවසට
සූදානම්ව සිටින පිණිසත් ඒ ලියවිල්ලේ
පිටපතක් සියලුම ජනයන් වෙත ප්‍රසිද්ධ-
කර යවනලද්දේය. පණිවිඩකාරයෝ 14
රාජසේවයෙහි යෙදූ ශීඝ්‍ර සෛන්ධවයන්
පිට නැඟී, රජුගේ අණ නිසා ඉක්මනින්
කඩිසර ලෙස පිටත්ව ගියෝය; ඒ
නියෝගය ෂූෂන් බලකොටුවේදී දෙන-
ලද්දේය. මොර්දෙකයි නිල් හා සුදු රාජ 15
වස්ත්‍රද ලොකු රන් ඔටුන්නක්ද රත්නිල්
සිහින් හණ සළුවක්ද පැළඳගෙන රජු
ඉදිරියෙන් පිටතට ගියේය. ෂූෂන් නුවර
වැසියෝද සෝෂාකර ප්‍රීතිවූහ. යුදෙව්- 16
වරුන්ට එළියද ප්‍රීති සන්තෝෂයද
ගෞරවයද ලැබුණේය. රජුගේ අණ සහ 17
නියෝගය පැමිණි සියලු රටවලත් සියලු
නුවරවලත් යුදෙව්වරුන්ට ප්‍රීති සන්-
තෝෂයද මංගල්‍යයක් සහ ශුභ දවසක්ද
විය. දේශයේ ජනයන්ගෙන් බොහෝ
දෙනෙක් යුදෙව්වෝ වුණෝය; මක්නිසාද
යුදෙව්වරුන් නිසා භයක් ඔවුන් පිටට
පැමුණුණේය.

## යුදෙව්වන් විසින් තමුන්ගේ සතුරන් මරාදැමීම

9 රජුගේ ආඥාව සහ නියෝගය
ඉෂ්ටවීමට පැමිණිනාවූ, යුදෙව්වරුන්ගේ
සතුරන් ඔවුන් කෙරෙහි බලය පවත්වන්ට
බලාපොරොත්තුව සිටි නුමුත් යුදෙව්-
වරුන්ම තමුන්ගේ වෛරකාරයන්
කෙරෙහි බලය පවත්වන හැටියට කරුණු
අනික් අතට හැරුණාවූ දවස වන අදර්
මාසය නම්වූ දෙළොස්වෙනි මාසයේ
දහතුන්වෙනිද, යුදෙව්වරු තමුන්ට 2
අනතුරු කරන්ට උපා යෙදූ අය පිට
අත්හෙළන පිණිස අහෂ්වේරොෂ් රජුගේ
සියලු රටවල තමුන්ගේ නුවරවල
රැස්වුණෝය. ඔවුන්ට විරුද්ධව සිටින්ට
කිසිවෙකුට නුපුළුවන්විය; මක්නිසාද
ඔවුන් නිසා භයක් සියලු ජනයන් පිට

3 පැමුණුණේය. රටවල සියලු අධිපතියෝද
දිශාධිපතියෝද ආණ්ඩුකාරයෝද
රාජකාරිය කරන්නෝද යුදෙව්වරුන්ට
උපකාරකළෝය; මක්නිසාද මොර්දෙකයි
නිසා භයක් ඔවුන් පිටට පැමිණ
4 තිබුණේය. කුමක්හෙයින්ද මොර්දෙකයි
රජගෙදර උත්තමයෙක්ව සිටියේය,
ඔහුගේ කීර්තියද සියලු රටවල පතළවී
ගියේය. මොර්දෙකයි නම් ඒ පුරුෂ තෙමේ
5 වඩ වඩාත් උසස් විය. එසේ යුදෙව්වරු
තමුන්ගේ සියලු සතුරන්ට කඩුවෙන්
පහරදී මරා විනාශ කළෝය, තමුන්ගේ
වෛරකාරයන්ට තමුන්ගේ කැමැත්තේ
6 හැටියට කළෝය. ෂූෂන් බලකොටුවේදී
යුදෙව්වරු මනුෂ්‍යයන් පන්සියයක් මරා
7 නැතිකරදැමූහ. යුදෙව්වරුන්ගේ එදිරිකාරවූ
හම්මෙදතාගේ පුත්‍රවූ හාමාන්ගේ පුත්‍රයන්
දසදෙනාවූ පර්ෂාන්දතාද දල්පොන්ද
8 අස්පාතාද, පෝරාතාද අදලියාද අරීදතාද,
9 පර්මෂ්තාද අරීසයිද අරීදයිද වයිසාතාද
10 ඔවුන් විසින් මරාදමනු ලැබුවෝය. නුමුත්
කොල්ලයට ඔව්හු අත නොපෙවූවෝය.
11 එද ෂූෂන් බලකොටුවේදී මැරුම්කෑ
අයින්ගේ ගණන රජු ඉදිරිපිටට
12 ගෙනෙනලද්දේය. එවිට රජ එස්තර්
බිසවට කථාකොට: ෂූෂන් බලකොටු-
වේදී යුදෙව්වරු වනාහි මනුෂ්‍යයන්
පන්සියයක්ද හාමාන්ගේ පුත්‍රයන්
දසදෙනාද මරා නැතිකළෝය. රජුගේ
අනික් රටවල මක්කරන්ට නැද්ද? ඉතින්
නුඹේ ඉල්ලීම මොකද? ඒක නුඹට දෙනු
ලැබේ. තවත් නුඹේ අයදුම මොකද?
13 ඒක ඉෂ්ටකරනු ලැබේවයි කීවේය. එවිට
එස්තර් කථාකොට: රජ්ජුරුවන් ප්‍රසන්න
නම් ෂූෂන්හි සිටින යුදෙව්වරුන්ට අද
දවසේ නියෝගයේ හැටියට හෙටත්
කරන්ට අවසර ලැබේවා, හාමාන්ගේ
පුත්‍රයන් දසදෙනාද එල්ලුම්ගහේ එල්ලා
තබත්වයි කීවාය. රජ එසේ කරන්ට
14 අණකෙළේය. එවිට ෂූෂන්හි නියෝගයක්
දෙන්ට යෙදුණේය; ඔව්හු හාමාන්ගේ
පුත්‍රයන් දසදෙනා එල්ලා තැබුවෝය.
15 ෂූෂන්හි සිටි යුදෙව්වරුද අදාර් මස
දහහතරවෙනි දවසෙත් රැස්වී ෂූෂන්හි
මනුෂ්‍යයන් තුන්සියයක් මරාදැමුවෝය;
නුමුත් කොල්ලයට ඔව්හු අත නො-
පෙවූවෝය. රජුගේ රටවල සිටි අනික් 16
යුදෙව්වරුද රැස්ව, තමුන්ගේ ජීවිතා-
රක්ෂාව සඳහා විරුද්ධව සිට, තමුන්ගේ
සතුරන්ගෙන් නිදහස්වී, තමුන්ගේ වෛර-
කාරයන්ගෙන් හැත්තෑ පන්දහසක් මරා-
දැමුවෝය; නුමුත් කොල්ලයට අත නො-
පෙවූවෝය. අදාර් මස දහතුන්වෙනිද ඔව්හු 17
එසේ කර දහහතරවෙනිද නිවාඩුගෙන,
ඒ දවස ප්‍රීතිමත්වූ මංගල්‍ය දවසක්
කරගත්තෝය. ෂූෂන්හි සිටිය යුදෙව්වරු 18
වනාහි ඒ මාසයේ දහතුන්වෙනිදත්
දහහතරවෙනිදත් රැස්වී, පහළොස්වෙනිද
නිවාඩු ගෙන, ඒ දවස ප්‍රීතිමත්වූ මංගල්‍ය
දවසක් කරගත්තෝය. ඒ නිසා පවුරු 19
නැති නුවරවල වාසයකරන පිටිසර
යුදෙව්වරු අදාර් මාසයේ දහහතරවෙනි
දවස ප්‍රීතිමත්වූ, සන්තෝෂ සහිතවූ,
එකිනෙකාට තෑගි කොටස් අරින්නාවූ
මංගල්‍ය දවසක් කරගනිති.

## පූරිම් මංගල්‍යය පිහිටුවීම

මොර්දෙකයිද මේ දේවල් ලියා 20
අහෂ්වේරොෂ් රජුගේ සියලුම රටවල ළඟ
හා දුර සිටි සියලු යුදෙව්වරුන්ට ලියුම්
යවා, අදාර් මාසයේ දහහතරවෙනිදත් 21
පහළොස්වෙනිදත් යුදෙව්වරුන් තමුන්ගේ
සතුරන්ගෙන් නිදහස්වුණ දවස් කොටද
ඔවුන්ගේ ශෝකය ප්‍රීතියටත් ඔවුන්ගේ
වැලපීම සන්තෝෂ දවසකටත් හැරුණු
මාසය කොටද අවුරුදු පතා පවත්වමින්,
ඒවා ප්‍රීතිමත්වූ, එකිනෙකාට තෑගි 22
කොටස් අරින්නාවූ, දිළිඳුන්ට දන්
දෙන්නාවූ මංගල්‍ය දවස් කරගන්ට කියා
ඔවුන්ට නියමකෙළේය. යුදෙව්වරු වනාහි 23
තමුන් පටන්ගත් ලෙසත් මොර්දෙකයි
තමුන්ට ලියා ඇරිය ලෙසත් කරන්ට
එකඟවුණෝය; මක්නිසාද යුදෙව්වරුන්ගේ 24
එදිරිකාරයාවූ අගාගිය හම්මෙදතාගේ
පුත්‍රවූ හාමාන් යුදෙව්වරුන් නැතිකිරීමට
ඔවුන්ට විරුද්ධව යෝජනාකර ඔවුන්

විනාශකරන්ට පූර් එනම් පසඇට
25 දැමුවේය; නුමුත් ඒ කාරණය රජු ඉදිරියට
පැමිණි කල, රජ හාමාන් විසින්
යුදෙව්වරුන්ට විරුද්ධව කළ නපුරු
යෝජනාව ඔහුගේම හිස පිටට හැරෙන
හැටියට අණකර ලියා ඇරියේය; ඔහු
සහ ඔහුගේ පුත්‍රයෝ ගහේ එල්ලා
26 තබනලද්දෝය. එබැවින් පූර් යන
නාමයේ හැටියට ඒ දවස්වලට පූරීම්
යන නම තැබුවෝය. එසේ යුදෙව්වරු
ඒ පත්‍රයේ සියලු වචනද ඒ ගැන තමුන්
දුටු දේද තමුන්ට සිද්ධවුණ දේද නිසා,
27 ඒ දවස් දෙක ගැන ලියූ ප්‍රකාරයටත්
ඒවායේ නියම කාලයේ ප්‍රකාරයටත්
ඒවා අවුරුද්දෙන් අවුරුද්ද නොවරදවා
පවත්වන ලෙසද, පරම්පරාවෙන්
පරම්පරාවට එක එක පවුල විසිනුත්
එක එක රටෙත් එක එක නුවරත් ඒ
28 දවස් සිහිකර පවත්වන ලෙසද, පූරීම්
දවස් යුදෙව්වරුන් අතරෙන් පහවෙන්ටවත්
ඒවා සිහිකිරීම තමුන්ගේ වංශයෙන්
අත්හිටින්ටවත් නොදෙන ලෙසද
නියමකර, තමුන්ද තමුන්ගේ වංශයද
තමුන්ට එකතුවෙන සියල්ලන්ද වෙනුවට
29 පිළිගත්තෝය. එවිට අබිහයිල්ගේ දුවවූ
එස්තර් බිසවද යුදෙව්වාවූ මොර්දෙකයිද
ඒ පූරීම් පත්‍රය ස්ථිරකරන්ට ඉතා බලවත්
ලෙස මේ දෙවෙනි ලියුම ලියා ඇරියෝය.
30 එසේ අහෂ්වේරොෂ්ගේ රාජ්‍යයේ රටවල්
එකසිය විසිහතේ සිටිය සියලු යුදෙව්-
වරුන්ට සමාදන සහිතවූ සත්‍යවූ වචන
ඇති ලියුම් ලියා ඇර, නිරාහාරවීමෙත් 31
ඔවුන්ගේ වැලපීමෙත් කාරණා ගැන
යුදෙව්වාවූ මොර්දෙකයිද එස්තර් බිසවද
ඔවුන්ට නියමකළ හැටියටත්, ඔවුන්ම
තමුන්ටද තමුන්ගේ වංශයටද නියම
කරගත් හැටියටත්, ඒ පූරීම් දවස් ඒවායේ
නියම කාලයට ස්ථිරකළෝය. එස්තර්ගේ 32
ආඥාවෙන් ඒ පූරීම් සම්බන්ධ කාරණා
ස්ථිරවිය; එය පොතෙහිද ලියා තබන-
ලද්දේය.

## මොර්දෙකයිගේ උසස්භාවය

10 අහෂ්වේරොෂ් රජ දේශයටත්
මුහුදේ දිවයින්වලටත් කප්පන්
නියමකෙළේය. ඔහුගේ බලපරාක්‍රමයේ 2
සියලු ක්‍රියාද රජු විසින් උසස්කළ
මොර්දෙකයිගේ උසස්කමේ විස්තරද
මේදියාවේත් පාර්සියාවේත් රජවරුන්ගේ
ලේකම් පොතෙහි ලියා තිබෙනවා
නොවේද? යුදෙව්වාවූ මොර්දෙකයි 3
අහෂ්වේරොෂ් රජුට දෙවෙනියාව,
යුදෙව්වරුන් අතරේ උත්තමයෙක්ව,
තමාගේ සහෝදර සමූහයාට ප්‍රිය
කෙනෙක්ව සිටියේය; ඔහු තමාගේ
සෙනඟගේ ශුභසිද්ධිය සොයමින්,
තමාගේ මුළු වංශයේ සමාදනය උදෙසා
ක්‍රියාකෙළේය.

# යෝබ්ගේ පොත

## යෝබ්ගේ ධන සම්පත්තිය හා මහුට පත් විපත්ති

1 යෝබ් නම්වූ මනුෂ්‍යයෙක් ඌශ්
දේශයෙහි සිටියේය; ඒ මනුෂ්‍යයා
වනාහි නිර්දෝෂවූ, අවංකවූ, දෙවියන්-
වහන්සේ කෙරෙහි භය ඇත්තාවූ,
නපුරෙන් වැලකී සිටියාවූ කෙනෙකි.
2 ඔහුට පුත්‍රයන් සත්දෙනෙක්ද දූවරුන්
3 තුන්දෙනෙක්ද උපන්නෝය. ඔහුගේ
සම්පත් නම් බැටළුවන් සත් දහසකුත්
ඔටුවන් තුන් දහසකුත් ගොන් බාන්
පන්සියයකුත් කොටළුදෙනුන් පන්සියයකුත්
වැඩකාරයන් ඉතා මහත් ගණනකුත්ය;
මෙසේ ඒ මනුෂ්‍යයා නැගෙනහිර දිශාවේ
සියලු මනුෂ්‍යයන්ට වඩා ශ්‍රේෂ්ඨව
4 සිටියේය. තවද ඔහුගේ පුත්‍රයෝ ගොස්
එකිනෙකා තම තමාගේ දවසේ,
තම තමාගේ ගෙදරදී, මංගල්‍යයක්
පවත්වන්ටත් තමුන් සමග කෑම බීම
පිණිස තමුන්ගේ සහෝදරියන් තුන්-
දෙනාට අඬගස්වා අරින්ටත් පුරුදුව
5 සිටියෝය. ඔවුන්ගේ මංගල්‍ය දවස් ගතවූ
පසු යෝබ් පණිවිඩ යවා ඔවුන්
පිරිසිදුකරවා, පසුවද අලුයම නැගිට
ඔවුන් සියල්ලන්ගේ ගණන ලෙස
දවන පූජා ඔප්පුකෙළේය. මක්නිසාද:
සමහරවිට මාගේ පුත්‍රයන් පව්කොට,
තමුන්ගේ සිත්වලින් දෙවියන්වහන්සේට
දෙස්කීවාවෙන්ට පුළුවනැයි යෝබ් කීවේය.
යෝබ් සෑමවිටම මෙසේ කෙළේය.
6 තවද එක් දවසක දෙවියන්වහන්සේගේ
පුත්‍රයන් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
පෙනීසිටින්ට ආ කල්හි *සාතන්ද ඔවුන්
7 අතරෙහි ආයේය. එවිට **ස්වාමීන්වහන්සේ:**
තුඹ කොතැන සිට ආයෙහිදැයි සාතන්-
ගෙන් ඇසූසේක. සාතන් **ස්වාමීන්-
වහන්සේට** උත්තරදෙමින්: පොළොවෙහි
ගමන්කොට ඔබ මොබ ඇවිද ආවෙමියි
කීවේය. එවිට **ස්වාමීන්වහන්සේ:** තුඹ 8
මාගේ මෙහෙකරුවූ යෝබ් ගැන
කල්පනාකෙළෙහිද? ඔහු මෙන්
නිර්දෝෂවූ, අවංකවූ, දෙවියන්වහන්සේ
කෙරෙහි භය ඇත්තාවූ, නපුරෙන් වැලකී
සිටින්නාවූ මනුෂ්‍යයෙක් පොළොවෙහි
නැතැයි කීසේක. සාතන් **ස්වාමීන්-** 9
**වහන්සේට** උත්තරදෙමින්: යෝබ්
දෙවියන්වහන්සේ කෙරෙහි භයවන්නේ
නිකමටද? ඔබවහන්සේ ඔහු වටකරත් 10
ඔහුගේ ගෙදර වටකරත් ඔහුට ඇති
සියල්ල වටකරත් හැම අතින්ම වැට
බැඳ තිබෙනවා නොවේද? ඔබ ඔහුගේ
අත් වැඩට ආශීර්වාදකළසේක, ඔහුගේ
සම්පත්ද දේශයෙහි වර්ධනයවී තිබේ.
නුමුත් ඔබගේ අත දිගුකර ඔහුට ඇති 11
සියල්ලට ගැසුවොත් ඔහු ඔබගේ
මුහුණ ඉදිරියෙහිම ඔබ අත්හරිනවා
ඇතැයි කීවේය. එවිට **ස්වාමීන්වහන්සේ** 12
සාතන්ට කථාකොට: බලව, ඔහුට
ඇති සියල්ල තුඹේ අත යටතේය; නුමුත්
ඔහුට විරුද්ධව නම් තුඹේ අත දිගු
නොකරන්නැයි කීසේක. සාතන්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙන් පිටතට
ගියේය.
තවද එක් දවසක් ඔහුගේ පුත්‍රයන් හා 13
දූවරුන් තමුන්ගේ වැඩිමහල් සහෝදරයාගේ
ගෙදර ආහාර ගනිමින් මුද්‍රික පානය
බොමින් සිටියදී මෙසේ සිද්ධවිය.
පණිවිඩකාරයෙක් යෝබ් වෙතට ඇවිත්: 14
ගවයන් සීසාමින්ද උන් ළඟ කොටළු
දෙනුන් තණ කමින්ද සිටින අතර

---

*එනම්, එදිරිකාරයා.

15 ෂෙබාවරු හදිසියෙන් ඇවිත් උන්
අල්ලාගෙන ගියෝය; මෙහෙකරුවන්ද
කඩුවෙන් මැරුවෝය; ඔබට දන්වන්ට
ගැළවුණේ මා පමණක්මයයි කීවේය.
16 ඔහු කථාකරද්දීම තවත් කෙනෙක් ඇවිත්:
දෙවියන්වහන්සේගේ ගිනි අහසෙන් වැටී
බැටළුවන්ටත් මෙහෙකරුවන්ටත් ඇවිළී,
ඔවුන් දවා දැමුවේය; ඔබට දන්වන්ට
ගැළවුණේ මා පමණක්මයයි කීවේය.
17 ඔහු කථාකරද්දීම තවත් කෙනෙක් ඇවිත්:
කල්දිවරු කණ්ඩායම් තුනක් සැදී ඔටුවන්
ළඟට පැමිණ උන් අල්ලාගෙන ගියෝය,
මෙහෙකරුවන්ද කඩුවෙන් මැරුවෝය;
ඔබට දන්වන්ට ගැළවුණේ මා පමණක්ම-
18 යයි කීවේය. ඔහු කථාකරද්දීම තවත්
කෙනෙක් ඇවිත්: ඔබගේ පුත්‍රයන් සහ
දූවරුන් තමුන්ගේ වැඩිමහල් සහෝදරයාගේ
ගෙයි කමින්ද මුද්‍රිකපානය බොමින්ද
19 සිටියදී, තද හුළඟක් කාන්තාරයට
එහායින් ඇවිත් ගෙයි සතර කොනට
වැදී, ඒක තරුණයන් පිට වැටුණේය,
ඔව්හු මැරුණෝය; ඔබට දන්වන්ට
ගැළවුණේ මා පමණක්මයයි කීවේය.
20 එවිට යෝබ් නැඟිට, තමාගේ සළුව
ඉරාගෙන, ඉස මුඩුකරගෙන, බිම වැටී
21 වැඳ: නග්නව මාගේ මවු කුසින් ආවෙමි,
එසේම නග්නව හැරී යන්නෙමි. ස්වාමීන්-
වහන්සේ දුන්සේක, ස්වාමීන්වහන්සේ
ගත්සේක; ස්වාමීන්වහන්සේගේ නාමයට
22 ප්‍රශංසාවේවයි කීවේය. මේ සියල්ලේදී
යෝබ් පව්කෙළේවත් අඥනකමින්
දෙවියන්වහන්සේට දෙස් තැබුවේවත් නැත.

## යෝබ් පරීක්ෂාකරනු ලැබීම

2 නැවතත් දෙවියන්වහන්සේගේ
පුත්‍රයන් ස්වාමීන්වහන්සේ ඉදිරිපිට
පෙනීසිටින්ට ආ කල්හි සාතන්ද ස්වාමීන්-
වහන්සේ ඉදිරියෙහි පෙනීසිටින්ට ඔවුන්
2 අතරෙහි ආයේය. එවිට ස්වාමීන්වහන්සේ:
තුඹ කොතැන සිට ආයෙහිදැයි සාතන්-
ගෙන් ඇසූසේක. සාතන් ස්වාමීන්-
වහන්සේට උත්තරදෙමින්: පොළොවෙහි
ගමන්කොට ඔබ මොබ ඇවිද ආයෙමියි
3 කීවේය. එවිට ස්වාමීන්වහන්සේ: තුඹ
මාගේ මෙහෙකරුවූ යෝබ් ගැන කල්පනා
කෙළෙහිද? ඔහු මෙන් නිර්දෝෂවූ,
අවංකවූ, දෙවියන්වහන්සේ කෙරෙහි භය
ඇත්තාවූ, නපුරෙන් වැලකී සිටින්නාවූ
කෙනෙක් පොළොවෙහි නැත. කරුණක්
නැතුව ඔහු නාස්තිකරන්ට තුඹ ඔහුට
විරුද්ධව මා පෙළඹෙවූ නුමුත්, ඔහු
තමාගේ අවංකකම තවම පවත්වාගන
සිටීයයි සාතන්ට කීසේක. සාතන් 4
ස්වාමීන්වහන්සේට උත්තරදෙමින්: හම
වෙනුවට හමත්, එසේය, තමාගේ
ප්‍රාණය වෙනුවට තමාට ඇති සියල්ලත්
මනුෂ්‍යයා දෙන්නේය. නුමුත් ඔබගේ අත 5
දිගුකර ඔහුගේ ඇටවලටත් ඔහුගේ
මාංසයටත් තැබුවොත්, ඔහු ඔබගේ
මුහුණ ඉදිරියෙහිම ඔබට දෙස් කියනවා
ඇතැයි කීවේය. එවිට ස්වාමීන්වහන්සේ: 6
බලව, ඔහු තුඹ අතෙහිය; නුමුත් ඔහුගේ
ජීවිතය ඉතුරුකරපන්නැයි සාතන්ට
කීසේක. සාතන් ස්වාමීන්වහන්සේ 7
ඉදිරියෙන් පිටතට ගොස් යෝබ්ගේ පතුල
පටන් ඔහුගේ හිස් මුදුන දක්වා නපුරු
ගඩු හටගැන්වීමෙන් ඔහුට පහරදුන්නේය.
ඔහු තමාගේ ඇඟ කසාගන්ට කැබි- 8
ලිත්තක් ගත්තේය; තවද ඔහු අළුවල
හිඳගත්තේය. එවිට ඔහුගේ භාර්යාව: 9
තුඹේ අවංකකම තවම පවත්වාගන
ඉන්නවාද? දෙවියන්වහන්සේ අත්හැරදමා
මැරෙවයි කීවාය. එහෙත් ඔහු ඈට 10
කථාකොට: තුඹ අඥන ස්ත්‍රීන්ගෙන්
එක්කෙනෙක් කථාකරන්නාක් මෙන්
කථාකෙරෙහිය. අපි දෙවියන්වහන්සේගේ
අතින් යහපත පිළිගනිමු නම් අයහපතත්
පිළිගන්ට ඕනෑ නොවේදැයි කීවේය. මේ
සියල්ලේදී යෝබ් වචසින් පව් කළේ
නැත.

## මිත්‍රයන් තුන්දෙනාගේ පැමිණීම

යෝබ්ගේ යහළුවන් තුන්දෙනා වන 11
තේමානිය එලීපස්ද ෂූහිය බිල්දද්ද
නයමාතිය සෝපර්ද ඔහුට පැමිණි මේ
මුළු විපත්තිය ගැන අසා තම තමුන්ගේ
ස්ථානවල සිට ආවෝය. ඔහු හා සමග
ශෝකවී ඔහු සනසන පිණිස එන්ට
ඔව්හු තමුන් අතරේ නියමකරගත්තෝය.
ඔව්හු දුරදීම තමුන්ගේ ඇස් ඔසවා බලා, 12

ඔහු නැඳින, ශබ්ද නඟා අඬා, තම
තමුන්ගේ සළු ඉරාගෙන, අහස දෙසට
තමුන්ගේ හිස් පිට පස් ඉහගත්තෝය.
13 මෙසේ ඔව්හු රෑ සතකුත් දවල් සතකුත්
ඔහු සමග බිම හිඳගෙන උන්නෝය,
කිසිවෙක්ද ඔහුට වචනයක්වත් කීවේ
නැත. මක්නිසාද ඔහුගේ ශෝකය ඉතා
මහත් බව ඔව්හු දුටුවෝය.

## යෝබ් උපන්දිනට ශාපකර විලාප කීම

3 ඉන්පසු යෝබ් තමාගේ මුඛය
හැර තමාගේ දවසට ශාපකෙළේය.
2 යෝබ් කථාකොට මෙසේ කීවේය:
3 මා උපන් දවසත්
පිරිමි ළමයෙක් පිළිසිඳුණේය කී
රාත්‍රියත් නැති වේවා.
4 ඒ දවස අන්ධකාරය වේවා;
දෙවියන්වහන්සේ ඉහළ සිට ඒක
නොසලකා හරිනසේක්වා,
ඒ කෙරෙහි ආලෝකය
නොබැබළේවා.
5 අඳුරත් මරණ සෙවණත් ඒක
හිමිකර ගනිත්වා;
වලාපටලයක් ඒ පිට රැඳී තිබේවා;
දවාල කළුවරකරන සියල්ලට ඒක
භයපත්වේවා.
6 ඒ රාත්‍රිය වනාහි ඝනාන්ධකාරයට
අසුවේවා.
ඒක අවුරුද්දේ දවස් අතරේ
ප්‍රීති නොවේවා;
ඒක මාසවල ගණනට නොපැමිණේවා.
7 ඒ රාත්‍රිය වඳ එකක් වේවා;
ඒ තුළ කිසි ප්‍රීතිමත් හඬක්
නොඇසේවා.
8 දවස්වලට ශාපකරන්නාවූ,
ලෙවියාතන් පුබුදුවන්ට
සමර්ථව සිටින්නාවූ
අය ඊට ශාපකෙරෙත්වා.
9 ඒකේ සවස්කාලයේ තාරකාවෝ
අඳුරුවෙත්වා.
එළිය ගැන බලා සිටින තුමුත් එය
ඊට නොලැබේවා;
අලුයම නමැති ඇසිපිය දකින්ටත්
නොලැබේවා.

මක්නිසාද ඒක මා වැදූ කුසේ දෙරවල් 10
නොවැසුවේය,
මාගේ ඇස්වලින් දුකද නොසැඟෙවුවේය.
මා උපන් සැටියේම නොමැරුණේ 11
මන්ද?
කුසින් බිහිවෙද්දී මගේ පණ තුරන්
නොවූයේ මක්නිසාද?
උකුළ මා පිළිගත්තේ මන්ද? 12
මා කිරිබොන පිණිස තන සූදානම්ව
තිබුණේ මක්නිසාද?
එසේ නොතිබුණා නම් මා දැන් සැතපී, 13
නිෂ්කලංකව නිදාගන්ට යෙදෙනවා ඇත.
එසේ, නටබුන් තැන් ගොඩනගා 14
ගත්තාවූ,
පොළොවේ රජුන් හා මන්ත්‍රීන් සමග,
නොහොත් රන් ඇත්තාවූ, 15
තමුන්ගේ ගෙවල් රිදීයෙන් පුරවා
ගත්තාවූ අධිපතීන් සමග, මට
නිශ්චලයෙන් ඉන්ට තිබුණේය.
නොහොත් සඟවනලද ගැස්සාවක් 16
මෙන්ද
එළිය නුදුටු ළදරුවන් මෙන්ද මට
පැවැත්මක් නොවෙනවා ඇත.
එහි දුෂ්ටයෝ කරදරකිරීමෙන් නැවතී 17
හිඳිති,
වෙහෙසට පත්වූවෝ එහි විශ්‍රාමය
ලබති.
හිරකාරයෝ එහි එක්ව පහසු විඳිති; 18
විධාන දෙන්නාගේ හඬ ඔවුන්ට
නොඇසෙයි.
කුඩා අයත් ලොකු අයත් එහි සිටිති; 19
දාසයාද තම ස්වාමියාගෙන් නිදහස්ව
සිටියි.
උන්වහන්සේ දුඃඛිත අයට එළියත් 20
ශෝක සිත් ඇත්තන්ට ජීවිතයත්
දෙන්නේ මන්ද?
ඔවුන් මරණය ගැන බලාපොරොත්තුවෙන 21
තුමුත්,
නිදන් වස්තුවලට වඩා එය සොයන
තුමුත්, ඒක නොපැමිණෙන්නේය.
මිනීවළ සම්මුඛවෙන කල 22
ඔව්හු සන්තෝෂව, අතිශයින් ප්‍රීති
වන්නෝය.
දෙවියන්වහන්සේ මනුෂ්‍යයෙකු 23
වටකොට වැටක් බැඳ, ඔහුගේ
මාර්ගය නොපෙනී තිබියදී,

ඔහුට එළිය දී තිබෙන්නේ මක්නිසාද?
24 එසේය, මාගේ කෑම මෙන් මාගේ
සුසුම්ලෑම පැමිණෙන්නේය,
මාගේ කෙඳිරිගෑමද වතුර මෙන්
වැගිරෙන්නේය.
25 මක්නිසාද මා භයවන දේ මට
පැමිණෙන්නේය,
මා භයපත්කරන දේ මට සිද්ධවෙන්නේය.
26 මට පහසුවක් නැත, මට නිශ්චලතාවක්
නැත, නිවාඩුවක් නැත;
එහෙත් දුක පැමිණේයයි කීවේය.

## එලීපස්ගේ පළමුවෙනි කථාව

4 එවිට තේමානිය එලීපස් උත්තර
දෙමින් කියනුයේ:
2 යමෙක් තුඹ සමග කථාකරන්ට සිතට
ගත්තොත් තුඹ අප්‍රසන්නවන්නෙහිද?
නුමුත් කථාව නවතාගන්ට පුළුවන්
කාටද?
3 බලව, තුඹ බොහෝදෙනෙකුට
දැනමුතුකම් දී,
හෙළා වැටුණු අත් බලවත්කෙළෙහිය.
4 සෙලවෙන තැනැත්තා තුඹේ
වචනවලින් තුඹ ස්ථිරකෙළෙහිය,
නැමෙන දණහිස් සවිකෙළෙහිය.
5 එහෙත් දැන් ඒක තුඹට පැමිණි බැවින්
තුඹ ක්ලාන්තවන්නෙහිය;
එය තුඹට වදින නිසා තුඹ
කැලඹෙන්නෙහිය.
6 තුඹේ විශ්වාසය තුඹේ භක්තියත්,
තුඹේ බලාපොරොත්තුව තුඹේ
මාර්ගවල අවංකකමත් නොවේද?
7 නිදොස්ව සිට විනාශවුණේ කවුද කියාත්
අවංක අය සිඳිනු ලැබුවේ කොතැනද
කියාත් කල්පනාකරපන්න.
8 මා දැක තිබෙන හැටියට
අධර්මිෂ්ඨකම හාලා
අයුක්තිය වපුරන්නෝ ඒවාම
කපාගනිති.
9 දෙවියන්වහන්සේගේ හුස්මට ඔව්හු
විනාශවන්නෝය,
උන්වහන්සේගේ උදහස නමැති සුළං
පහරින් ඔව්හු පහව යන්නෝය.
10 සිංහයාගේ ගර්ජනාවත් රෞද්‍ර
සිංහයාගේ හඬත් නැතිවිය,
තරුණ සිංහයන්ගේ දත්ද බිඳී තිබේ.
මහලු සිංහයා ගොදුරු නැතුව විනාශ 11
වන්නේය,
සිංහධේනුවගේ පැටවිද විසිරයන්නෝය.
කාරණාවක් රහසින් මට 12
දන්වනලද්දේය,
එහි ශබ්දය හෙමින් මාගේ කනේ
වැටුණේය.
බරවූ නින්ද මනුෂ්‍යයන් පිට පැමිණෙන 13
වේලාවට,
රාත්‍රි දර්ශනවලින් භටගන්නා
සිතිවිලිවලදී,
මාගේ සියලුම ඇට වෙවුලෙවුවාවූ 14
භීතියක්ද චංචලයක්ද මට
පැමුණුණේය.
එවිට ආත්මයක් මාගේ මුහුණ 15
ඉදිරියෙන් ගියේය;
මාගේ ඇඟේ මයිල්ද කෙලින් සිටියේය.
ආත්මය නැවතුණේය, නුමුත් ඒකේ 16
ආකාරය දැනගන්ට මට නොහැකි විය;
මාගේ ඇස් ඉදිරියෙහි ස්වරූපයක්
තිබුණේය.
නිශ්ශබ්දකමක්ද වූයේය, එවිට හඬක්
මට ඇසුණේය; එනම්,
මනුෂ්‍යයා දෙවියන්වහන්සේට වඩා 17
ධර්මිෂ්ඨද?
මනුෂ්‍යයෙක් තමාගේ
මැවුම්කාරයාණන්ට වඩා පිරිසිදුද?
බලව, උන්වහන්සේ තමන් 18
මෙහෙකරුවන් කෙරෙහි විශ්වාසය
නොතබනසේක;
තමන්ගේ දූතයෝ අනුවණයෝයයි
ඔවුන්ට දෙස් තබනසේක.
ධූලියෙහි අත්තිවාරම ඇති, මැටි ගෙවල 19
වාසයකරන්නන්ට
ඊට කොපමණ වැඩියෙන් එසේ
නොවන්නේද!
කාවෙකු මෙන් ඔව්හු පොඩිකරනු
ලබති.
උදය පටන් සවස දක්වා ඔව්හු පොඩිවී 20
යති,
ඔව්හු සදාකාලයටම නැතිවී යති,
කිසිවෙක් එය නොසලකයි.
ඔවුන් තුළ තිබෙන උතුම්කම පහව 21
නොයන්නේද?
ඔව්හු ප්‍රඥාව නැතුවම මැරෙති.

5 ඉතින් අඬගසාපන්න; තුඹට
උත්තරදෙන කෙනෙක් ඇද්ද?
තුඹ ශුද්ධ තැනැත්තන්ගෙන් කවරෙකු
දෙසට හැරෙන්නෙහිද?
2 මක්නිසාද නොසතුටුභාවය අඥනයා
නසන්නේය,
ඊර්ෂ්‍යාවද තුවණ නැත්තා මරන්නේය.
3 අඥනයා මුල් අදිනවා මම දුටිමි;
තුමුත් වහාම ඔහුගේ නිවසට ශාප
කෙළෙමි.
4 ඔහුගේ දරුවෝ සුරක්ෂිතකමෙන්
දුරුව සිටිති,
ඔව්හු දොරටුවේදී පොඩිකරනු ලබති,
ඔවුන් ගළවන්ට කිසිවෙක්ද නැත්තේය.
5 ඔවුන්ගේ අස්වැන්න බඩගිනි ඇත්තා
කන්නේය,
එය කටුගස් අතරෙන් පවා ගන්නේය,
මලපත ඔවුන්ගේ වස්තුව ගිලගන්ට
කට අයා සිටියි.
6 මක්නිසාද විපත්තිය ධූලියෙන් හට
නොගනියි,
දුක භූමියෙන් පැන නොනගියි.
7 එසේය, ගිනි පුපුරු උඩට
නගින්නාක්මෙන්
මනුෂ්‍යයා දුක් විඳීමට උපදින්නේය.
8 එහෙත් මම නම් දෙවියන්වහන්සේ
දෙසට හැරී,
මාගේ කාරණය දෙවියන්වහන්සේට
භාරදෙන්නෙමි.
9 සොයා දනගන්ට බැරි මහත් දේද
ගණන් නැති පුදුම දේද උන්වහන්සේ
කරනසේක.
10 පහත්ව ඉන්නන් උසස්කරන්ටත්,
ශෝකයෙන් ඉන්නන්
සුරක්ෂිතකරන්ටත්,
11 උන්වහන්සේ පොළොව පිටට වැසි
වස්වනසේක,
කෙත් පිටට වතුරත් එවනසේක.
12 ප්‍රයෝගකාරයන්ගේ අතින් කරන්ට
ගත් දෙය ඉෂ්ටකරන්ට බැරිවන
ලෙස
උන්වහන්සේ ඔවුන්ගේ උපායන්
නිෂ්ඵලකරනසේක.
13 උන්වහන්සේ ප්‍රඥවන්තයන් ඔවුන්ගේම
ප්‍රයෝගයෙන් අසුකරගන්නසේක.
රැවටිලිකාරයන්ගේ මන්ත්‍රණයද
පෙරළී යන්නේය.
ඔව්හු දවාලේදී අන්ධකාරයට අසුවී, 14
රාත්‍රියෙහි මෙන් ඉරමුදුන් වේලේදී
අතගගා යති.
එසේ උන්වහන්සේ ඔවුන්ගේ මුඛය 15
නමැති කඩුවෙන්ද
බලවත්තයාගේ අතින්ද දිළින්දා
ගළවනසේක.
මෙසේ දුප්පතාට බලාපොරොත්තුව 16
තිබේ,
අධර්මිෂ්ඨකමද තමාගේ කට
පියාගනියි.
බලව, දෙවියන්වහන්සේගෙන් දඬුවම් 17
ලබන මනුෂ්‍යයා
වාසනාවන්තයෙක්ය.
එබැවින් සර්වපරාක්‍රමයාණන්ගේ
දඬුවම්කිරීම සුළු නොකරන්න.
මක්නිසාද උන්වහන්සේ 18
තුවාලකරනසේක, උන්වහන්සේම
තුවාලය බඳිනසේක;
උන්වහන්සේ පහරදෙනසේක,
උන්වහන්සේගේම අත්වලින්
සුවකරනසේක.
විපත්ති හයකින් උන්වහන්සේ තුඹ 19
ගළවනසේක;
එසේය, හතකිනුත් තුඹට අනතුරක්
නොවන්නේය.
සාගතයේදී මරණයෙන්ද 20
යුද්ධයේදී කඩුවේ බලයෙන්ද
උන්වහන්සේ තුඹ මුදනසේක.
දිව නමැති කසයෙන් තුඹ සඟවනු 21
ලබන්නෙහිය;
විනාශය එන කල හයනොවී
සිටින්නෙහිය.
විනාශයටත් කෑම හානියටත් තුඹ 22
සිනාසෙන්නෙහිය;
පොළොවේ මෘගයන්ටද හයනොවී
සිටින්නෙහිය.
මක්නිසාද වනයේ ගල් සමග පවා 23
තුඹේ ගිවිසුමක් වන්නේය;
වනයේ මෘගයෝද තුඹ සමග
සමාදනයෙන් ඉන්නෝය.
මෙසේ තුඹේ කූඩාරම සමාදනයෙන් 24
තිබෙන බව තුඹ දනගන්නෙහිය;
තුඹේ ගාල බලන්ට ගිය කල කිසිවක්
නැතිනුවූ බවද දකින්නෙහිය.

25 තවද තුඹේ වංශය බොහෝ බවද
තුඹෙන් පැවත එන්නන් පොළොවේ
තණකොළ මෙන් වන බවද තුඹ
දනගන්නෙහිය.
26 ගොයම් මිටියක් නියම කාලයේදී
ගෙනයනු ලබන්නාක්මෙන්
තුඹ වයසින් පූර්ණව සොහොනට
පැමිණෙන්නෙහිය.
27 මෙන්න මේක අපි සෝදිසිකර, එසේම
බව දනගතිමුව;
තුඹ මේක අසා, තුඹ උදෙසාම
දනගනින්නැයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

6 එවිට යෝබ් උත්තරදෙමින් මෙසේ
කීවේය:
2 අනේ මාගේ ශෝකය කිරා බලන්ටත්
මාගේ මුළු විපත්තිය තරාදිවල
දමන්ටත් යෙදුණොත් යහපත!
3 එවිට ඒක මුහුදේ වැලිවලට වඩා
බරවන්නේය.
එබැවින් මාගේ වචන අනුවණව
තිබුණේය.
4 මක්නිසාද සර්වපරාක්‍රමයාණන්ගේ
ඊගස් මා තුළට වැදී තිබේ,
ඒවායේ විෂය මාගේ ආත්මයට
බීගන්නේය.
දෙවියන්වහන්සේගේ භයානකකම්
මට විරුද්ධව සැරසී තිබේ.
5 තණකොළ තිබෙන විට වල්
කොටළුවා රාවය දෙයිද?
පිදුරු ළඟ තිබෙද්දී ගොනා තප්පුලයිද?
6 රස නැති දේ ලුණු නැතුව කනවාද?
නොහොත් බිත්තර සුදු මදයේ
රසක් ඇද්ද?
7 මාගේ ආත්මය ඒවාට අතගසන්ට
අකැමැතිය;
ඒවා මට පිළිකුල් ආහාර මෙන්ය.
8 අහෝ මාගේ ඉල්ලීම මට ලැබුණොත්,
මා ආශාවන දෙය දෙවියන්වහන්සේ
මට දුන්නොත් යහපත!
9 එනම් දෙවියන්වහන්සේ මා
පොඩිකරදමන්ට සතුටුවී,
ස්වකීය හස්තය දිගුකොට මා
සිඳදමනසේක්වා!

එසේ මට නැවත සැනසීම වන්නේය; 10
මමද මා ඉතුරු නොකරන වේදනාවට
ප්‍රීතිමත් වන්නෙමි.
මක්නිසාද මම ශුද්ධ
තැනැන්වහන්සේගේ වචන එපා
නොකෙළෙමි.
මා බලාපොරොත්තුව සිටින පිණිස 11
මාගේ ශක්තිය මොකක්ද?
මා ඉවසිල්ලෙන් පසුවෙන පිණිස
මාගේ අන්තිමය මොකක්ද?
මාගේ ශක්තිය ගල්වල ශක්තියද? 12
නොහොත් මාගේ මාංසය පිත්තලද?
මාගේ උපකාරය මා තුළෙහි නැතිවී, 13
පිහිට මාගෙන් සහමුලින් පහව ගියා
නොවේද?
ක්ලාන්තවෙන්ට ළංව සිටින අයට තම 14
මිත්‍රයාගෙන් කරුණාව ලැබිය යුතුය;
නොලැබුණොත්, ඹහු
සර්වපරාක්‍රමයාණන් කෙරෙහි
භයවීම අත්හරින්නේය,
මාගේ සහෝදරයෝ ඔයක් මෙන්ද 15
පහවී යන ඔයවල දිය පාරවල් මෙන්ද
රැවටිලි ලෙස ක්‍රියාකළෝය.
ඒවා හිම කැටිවලින් කළුපාට වන්නේය, 16
හිම ඒවායෙහි නොපෙනී යන්නේය.
ඒවා උණුවූ කල නොපෙනී යන්නේය. 17
ග්‍රීෂ්මවෙනවිට ඒවායේ ස්ථානයෙන්
හිඳී යන්නේය.
ඒවායේ මාර්ගවල යන ගමන්කාර 18
සමූහයෝ අහකට හැරී,
කාන්තාරයට ගොස් විනාශවන්නෝය.
තේමාහි ගමන්කාර සමූහයෝ ඒවා 19
ගැන බලා සිටියෝය,
ෂෙබාහි සමූහයෝ ඒවා
බලාපොරොත්තුවුණෝය.
ඔව්හු බලාපොරොත්තුව සිට ලජ්ජාවට 20
පත්වුණෝය;
ඔව්හු එතැනට පැමිණ වියවුල්වූවෝය.
එලෙසම දැන් තුඹලා හිස්කම වූණහුය; 21
තුඹලා භයංකරකමක් දැක භයවී
ඉන්නහුය.
මට යමක් දියල්ලාය කියාවත්, 22
තුඹලාගේ දෙයින් මා උදෙසා තෑග්ගක්
දියල්ලාය කියාවත්,

23 එදිරිකාරයාගේ අතින් මා
ගළවාගනිල්ලාය කියාවත්,
පීඩාකරන්නන්ගේ අතින් මා මුදපල්ලාය
කියාවත් මම කීයෙම්ද?
24 මට උගන්වාපල්ලා, එවිට මම
නිශ්ශබ්දව සිටින්නෙමි.
මට වැරදුණේ කුමක් ගැනද කියාත්
මට තේරුම්කර දියල්ලා.
25 අවංකකමේ වචන කොපමණ බලවත්ද!
නුමුත් නුඹලාගේ අවවාදයෙන්
තරවටුකරන්නේ කුමක් ගැනද?
26 බලාපොරොත්තුවක් නැත්තාගේ කීම
සුළඟට යද්දී
නුඹලා වචනවලට තරවටුකරන්ට
සිතන්නහුද?
27 එසේය, නුඹලා පියා නැත්තා ගැන
පවා පසඇට දමා,
නුඹලාගේ මිත්‍රයා වෙළඳම් බඩුවක්
කරගන්නහුය.
28 ඉතින් කරුණාකර මා දෙස බලාපල්ලා;
නුඹලාගේ මුහුණ ඉදිරියෙහිම මම
බොරුකියම්ද?
29 ඉතින් හැරියල්ලා, කිසි අයුත්තක්
සිද්ධ නොවේවා;
එසේය, හැරියල්ලා, මාගේ කාරණය
සාධාරණය.
30 මාගේ දිවෙහි අයුක්තියක් තිබේද?
මාගේ රසේන්ද්‍රියයට නපුරු දේ
දැනගන්ට බැරිද?

7 පොළොවේදී යුද්ධ සේවයක්
මනුෂ්‍යයාට තිබෙනවා නොවේද?
ඔහුගේ දවස් කුලීකාරයෙකුගේ දවස්
මෙන් නොවේද?
2 සෙවණැල්ලට ඉතා ආශාවන්නාවූ
මෙහෙකරුවෙකු මෙන්ද,
කුලී ලබන්ට බලා ඉන්නාවූ
කුලීකාරයෙකු මෙන්ද,
3 නිෂ්ඵලකමේ මාස මට උරුමව තිබේ,
වෙහෙස ගෙනදෙන රෑයවල්ද මට
නියමවී තිබේ.
4 මා නින්දට යන කල:
රාත්‍රිය පසුවී කොයි වේලේ
නැගිටින්නෙම්දැයි කියමි;
පහන්වෙන තුරු මම පෙරළි පෙරළී
ඉදිමි.
5 පණුවන්ගෙන්ද පස්කැටිවලින්ද මාගේ
මාංසය වැසී තිබේ;
මාගේ හම ඇකිළී වණවී තිබේ.
මාගේ දවස් වියන්නාගේ නඩාවට 6
වඩා ඉක්මන්ව,
බලාපොරොත්තුවක් නැතුව ගෙවී
යන්නේය.
අනේ මාගේ ජීවිතය සුළඟක් බව 7
සිහිකළ මැනව.
මාගේ ඇස තවත් ශුභය නොදක්නේය.
මා දකින අයගේ ඇස තවත් මා 8
නොදක්නේය.
ඔබගේ ඇස් මා දෙස තිබේ, නුමුත්
මා නැත්තේය.
වලාකුළ නැතිවී නොපෙනී යන්නා 9
සේම
*ෂෙයෝල්ට බසින අය තවත් නැගී
නොඑන්නේය.
ඔහු නැවත තමාගේ ගෙදරට හැරී 10
නොඑන්නේය,
ඔහුගේ ස්ථානයද නැවත ඔහුව දැන
නොගන්නේය.
ඒ නිසා මම මාගේ මුඛය නවත්වා 11
නොගෙන,
මාගේ ආත්මයේ තද වේදනාවෙන්
කථාකර,
මාගේ ප්‍රාණයේ ශෝකයෙන් විලාප
කියන්නෙමි.
ඔබ මට විරුද්ධව මුර තබන්නේ 12
මම මුහුදක්ද? නොහොත් තල්මසෙක්ද?
මාගේ ඇඳ මා සනසන්නේය කියාත් 13
මාගේ යහන මාගේ ශෝකය සහනය
කරන්නේය කියාත් මා කියන කල,
ඔබ ස්වප්නවලින් මා භයගන්වනසේක, 14
දර්ශනවලින්ද මා ත්‍රස්තකරනසේක.
ඒ නිසා බෙල්ල මිරිකා නසනු 15
ලැබීමටත්,
මාගේ මේ ඇටවලට වඩා මරණයටත්
මාගේ ආත්මය කැමතිවන්නේය.
මම ක්ෂයවී ඉදිමි; මම සැමකල්ම 16
ජීවත් නොවන්නෙමි.
මාගේ දවස් හුස්මක්ව තිබෙන නිසා
මාගෙන් ඔබගේ අත අහකට ගත
මැනව.
ඔබ විසින් මනුෂ්‍යයා උසස්කරන්ටත්, 17

*එනම්, මිනීවළට.

ඔහු කෙරෙහි ඔබගේ සිත තබන්ටත්,
18 උදයෙන් උදය ඔහු සලකන්ටත්,
මොහොතෙන් මොහොත ඔහු
සෝදිසිකරන්ටත් ඔහු මොකක්ද?
19 කෙල ගිලිනතුරුවත් ඔබ මා කෙරෙන්
ඉවත නොබලා සිටින්නෙත්,
මට නිකම් ඉන්ට නැර සිටින්නෙත්
කොපමණ කල්ද?
20 මනුෂ්‍යයන්ගේ ආරක්ෂාකාර
තැනන්වහන්ස, මා පව්කර තිබෙන
නුමුත් ඔබට කුමක් කරම්ද?
මා මටම බරක් වන ලෙස,
ඔබ විසින් පහරදීමට ඉලක්කයක්
කොට මා තබාගත්තේ මක්නිසාද?
21 ඔබ මාගේ වරදට කමාවී, මාගේ
අපරාධය පහ නොකරන්නේ
මක්නිසාද?
මම ඉක්මනින් ධූලියෙහි නිදන්නෙමි,
ඔබ මා බොහෝසේ සොයන නුමුත්
මම නොසිටින්නෙමියි කීවේය.

## බිල්දද්ගේ පළමුවෙනි කථාව

8 එකල ෂූහිය බිල්දද් උත්තරදෙමින්
කියනුයේ:
2 නුඹ මේවා පවසන්නෙත්
නුඹේ මුඛයේ වචන බලවත් හුළඟක්ව
තිබෙන්නෙත් කොපමණ කල්ද?
3 දෙවියන්වහන්සේ විනිශ්චය
පෙරළනසේක්ද?
නොහොත් සර්වපරාක්‍රමයාණෝ
යුක්තිය පෙරළනසේක්ද?
4 නුඹේ දරුවන් උන්වහන්සේට විරුද්ධව
පව්කරන්ටත්,
උන්වහන්සේ ඔවුන්ගේ අපරාධයේ
බලයට ඔවුන් පාවාදෙන්ටත්
යෙදුණේ නම්,
5 නුඹ දෙවියන්වහන්සේ ඕනෑකමින්
සොයා,
සර්වපරාක්‍රමයාණන්ට
කන්නලව්කරන්නෙහි නම්,
6 නුඹ පිරිසිදුව අවංකව සිටින්නෙහි නම්,
සැබෑවටම දැන් නුඹ උදෙසා
උන්වහන්සේ පිබිද,
නුඹේ ධර්මිෂ්ඨකමේ නිවාසය
සමාදානයෙන් වර්ධනයකරනසේක.
නුඹේ පටන්ගැන්ම කුඩා නුමුත් 7
නුඹේ අන්තිමය බොහෝසෙයින්
වැඩිවන්නේය.
එසේය, ප්‍රථම පරම්පරාවෙන් 8
අසාපන්න,
ඔවුන්ගේ පියවරුන් විභාගකළ දේට
සිත යොමුකරපන්න.
(මක්නිසාද අපි නම් ඊයේ දවසේ 9
අයවල්ය, කිසිවක් නොදනිමුව,
මක්නිසාද පොළොවෙහි අපේ දවස්
සෙවණැල්ලක්ය.)
ඔව්හු නුඹට උගන්වා නුඹට කියාදී, 10
තමුන්ගේ සිතින් නික්මෙන වචන
නොකියන්නෝද?
මඩ නැති තැන පන් වැවේද? 11
වතුර නැතුව මහ පන් වැඩේද?
ඒවා කපා නොදමා අමුව තිබෙද්දීම 12
සියලු පලා ජාතිවලට පළමුවෙන්
මැලවෙන්නේය.
දෙවියන්වහන්සේ සිහිනැතිකරන 13
සියල්ලන්ගේ මාවත් එසේමය;
අභක්තිකයාගේ බලාපොරොත්තුවද
නැතිවන්නේය.
ඔහුගේ විශ්වාසය සිඳී යන්නේය, 14
ඔහුගේ රක්ෂාස්ථානයද මකුළු දැලක්ය.
ඔහු තමාගේ ගෙට හේත්තුවුණාම 15
ඒක නොතිබී යයි;
ඔහු එය තදින් ඇල්ලුවාම ඒක
නොපවතියි.
ඔහු සූර්යයා ඉදිරියෙහි සශ්‍රීකවී, 16
ඔහුගේ රිකිළි ඔහුගේ වත්තේ සැම
තැනම විහිදී යන්නේය.
ඔහුගේ මුල් ගල් ගොඩ උඩ 17
එතෙන්නේය.
ඔහු ගල් ඉඩමට පැමිණෙන්නේය.
ඔහු තමාගේ ස්ථානයෙන් නාස්තිවී 18
ගියාම:
මම නුඹ නුදුටිමියි කියා, ඒක ඔහු
එපාකරන්නේය.
ඔහුගේ මාර්ගයේ ප්‍රීතිය නම් මේය, 19
ඒ බිමෙන් වෙන අය නැගී එන්නෝය.
දෙවියන්වහන්සේ සම්පූර්ණ 20
මනුෂ්‍යයෙක් පහකර දමන්නේවත්
නපුර කරන්නන්ට ආධාරවෙන්නේවත්
නැත.
උන්වහන්සේ නුඹේ මුඛය සිනාවෙනුත් 21

තුඹේ තොල් ප්‍රීති සෝෂාවෙනුත් පුරවනසේක.
22 තුඹට වෛරවෙන්නෝ ලජ්ජාවෙන් අඳවනු ලබන්නෝය;
දුෂ්ටයන්ගේ කූඩාරම නැතිවන්නේයයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

9 එකල යෝබ් උත්තරදෙමින් කියනුයේ:
2 ඒ එසේමයයි මම සැබවින් දනිමි.
නුමුත් මනුෂ්‍යයා දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨවන්නේ කෙසේද?
3 උන්වහන්සේ ඔහු සමග විවාදකරන්ට කැමතිවුණොත්,
උන්වහන්සේට දහසකින් එකකටවත් උත්තරදෙන්ට ඔහුට බැරිය.
4 උන්වහන්සේ සිතින් ප්‍රඥාවන්තය, ශක්තියෙන් බලසම්පන්නය.
උන්වහන්සේට විරුද්ධව සිත් දැඩිකරගන සමාදනයෙන් වර්ධනයවුණේ කවුද?
5 උන්වහන්සේ හදිසියෙන්ම කඳු පහකර,
තමන්ගේ උදහසින් ඒවා පෙරළා දමනසේක.
6 උන්වහන්සේ පොළොව ඒකේ ස්ථානයෙන් සොලවා හරිනසේක,
ඒකේ කණුද වෙවුලන්නේය.
7 ඉර නොපායන හැටියට උන්වහන්සේ අණකරනසේක;
තාරකා මුද්‍රකර තබනසේක.
8 උන්වහන්සේ පමණක්ම අහස දිග හරිනසේක,
මුහුදු රළ පිටද ඇවිදිනසේක.
9 උන්වහන්සේ මහවලසාද මුවසිරසද හත්දින්නද
දක්ෂිණ නිවාසද සාදනසේක.
10 උන්වහන්සේ සොයා දැනගන්ට බැරිවූ මහත් දේද
ගණන් නැති පුදුමවල්ද කරනසේක.
11 බලව, උන්වහන්සේ මා ළඟින් යන නුමුත් මට පෙනෙන්නේ නැත;
මා පසුකර යන නුමුත් මට දැනෙන්නේ නැත.
12 උන්වහන්සේ අල්ලාගන්න කල උන්වහන්සේ වලක්වන්නේ කවුද?
ඔබ මක්කරනවාදැයි උන්වහන්සේට කියන්ට පුළුවන් කාටද?
දෙවියන්වහන්සේ තමන් උදහස පහකර නොගන්නාසේක; 13
උඩඟු උපකාරකාරයෝ උන්වහන්සේට යටත්වෙති.
එසේවී නම් මම උන්වහන්සේට උත්තර දෙමින්, 14
උන්වහන්සේ සමග විවාදකරන්ට මාගේ වචන තෝරාගන්නේ කොහොමද?
මම ධර්මිෂ්ඨවුවත්, උන්වහන්සේට උත්තර නොදී, 15
මාගේ විරුද්ධකාරයාට කන්නලව් කරන්නෙමි.
මා යාච්ඤාකළ විට උන්වහන්සේ මට උත්තරදුන්නත්, 16
උන්වහන්සේ මාගේ හඬට කන්දුන් බව විශ්වාස නොකරන්නෙමි.
මක්නිසාද උන්වහන්සේ කුණාටුවකින් මා පොඩිකර, 17
නිකරුණේ මාගේ තුවාල වැඩිකරනසේක.
උන්වහන්සේ මට හුස්ම ගන්ට නොදී, 18
තික්තකම්වලින් මා පුරවනසේක.
ශක්තිය ගැන කථාකරමු නම් එය ඇත්තේ උන්වහන්සේටය; 19
විනිශ්චය ගැන නම් මට කාලයක් නියමකරන්නේ කවරෙක්ද?
මම ධර්මිෂ්ඨයයි කීවත් මාගේ මුඛය මා වරදට පත්කරන්නේය, 20
මම නිදෙස්යයි කීවත් එය මා වරදකාරයෙක් බව ඔප්පුකරන්නේය.
මා නිදෙස් වුවත් මාගේ ප්‍රාණය ගැන නොසලකමි; 21
මාගේ ජීවිතය සුළුකොට සිතමි.
කොයි එකත් එකය; එහෙයින්: 22
උන්වහන්සේ සම්පූර්ණ අය සහ දුෂ්ටයාද විනාශකරනසේකැයි කියමි.
විපත නමැති කස පහරින් හදිසියෙන් මරණය වුවත්, 23
නිදෙස් අයගේ විපත්තියට උන්වහන්සේ සිනාසෙනසේක.
පොළොව දුෂ්ටයාගේ අතට භාරදී 24

තිබේ.
එහි විනිශ්චයකාරයන්ගේ මුහුණු
උන්වහන්සේ වසනසේක;
ඒ උන්වහන්සේ නොවේනම් වෙන කවුද?
25 මාගේ දවස් දුවන පණිවිඩකාරයෙකුට
වඩා වේගවත්ය.
ඒවා හොඳක් නොදැක පලායයි.
26 ඒවා ඉක්මනින් දුවන නැව් මෙන්ද
ගොදුර පිටට වේගයෙන් බැස යන
රාජාලියෙකු මෙන්ද පහව ගියේය.
27 මාගේ විලාපය මතකනැතිකර,
මාගේ දුක්මුසු පෙනීම වෙනස්කරගෙන,
සොම්නස්වන්නෙමියි කීවත්,
28 මාගේ සියලු දුක්වලට භයෙන් සිටිමි,
ඔබ මා නිර්දෝෂ කොට ගණන්
නොගන්න බව දනිමි.
29 මම වරදකාරයෙක් වන්නෙමි;
එබැවින් නිෂ්ඵලයේ කුමට
වෙහෙසෙම්ද?
30 මා හිම දියෙන් නාගන,
මාගේ අත් කොපමණ පවිත්‍රකරගත්තත්,
31 ඔබ මා මඩ වළේ හෙළනසේක,
මාගේම ඇඳුම් මට පිළිකුල්ය.
32 මක්නිසාද මා විසින් උන්වහන්සේට
උත්තරදෙන්ටත්, මා උන්වහන්සේ
සමග විනිශ්චයට පැමිණෙන්ටත්
පුළුවන්වන ලෙස,
උන්වහන්සේ මා වාගේ මනුෂ්‍යයෙක්
නොවේය,
33 අප දෙගොල්ල කෙරෙහි තමාගේ
අත තබන්ට
අප අතරේ බේරුම්කාරයෙක් නැත.
34 උන්වහන්සේ තමන් ඉපල මා කෙරෙන්
පහකරගන්නසේක්වා,
උන්වහන්සේගේ භීතිය මා ත්‍රස්ත
නොකෙරේවා.
35 එවිට මම උන්වහන්සේට භය නැතුව
කථාකරන්නෙමි;
මක්නිසාද එසේ වීමට මා තුළ
කාරණයක් නැත.

10 මාගේ ආත්මයට මාගේ ජීවිතය
වෙහෙසක්ය;
මාගේ විලාපය වලක්වා නොගෙන,
මාගේ ආත්මයේ ශෝකයෙන්
කථාකරන්නෙමි.
දෙවියන්වහන්සේට මම මෙසේ 2
කියන්නෙමි: මා වරදට පත්
නොකළ මැනව;
කුමක් නිසා මා සමග
විවාදකරනසේක්දැයි මට දන්නුව
මැනව.
ඔබ විසින් පීඩාකිරීමත්, 3
ඔබගේ අත්වැඩය හෙළාදැකීමත්,
දුෂ්ටයන්ගේ මන්ත්‍රණය කෙරෙහි
බැබළීමත් ඔබට සුදුසුද?
ඔබට මාංසමය ඇස් තිබේද? 4
නොහොත් මනුෂ්‍යයාට
පෙනෙන්නාක්මෙන් ඔබට
පෙනෙන්නේද?
ඔබගේ දවස් මනුෂ්‍යයාගේ දවස් 5
වාගේද?
නොහොත් ඔබගේ අවුරුදු
මනුෂ්‍යයාගේ අවුරුදු වාගේද?
මක්නිසාද මා දුෂ්ටයෙක් නොවන 6
බවද
ඔබගේ අතින් මුදන්ට පුළුවන්
කිසිකෙනෙක් නැති බවද ඔබ දන්න
නුමුත්,
ඔබ මාගේ අපරාධය විමසනසේක, 7
මාගේ පාපයක් සොයා බලනසේක.
ඔබගේ අත්වලින් මා හැඩහුරුකොට 8
සහමුලින්ම මා සෑදූ නුමුත්, ඔබ මා
නාස්තිකරනසේක.
ඔබ මා මැටිවලින් මෙන් සෑදූ බව 9
සිහිකරන ලෙස අයදිමි:
ඔබ මා නැවත පස්වලට
හරවනසේක්ද?
ඔබ මා කිරි මෙන් වත්කර, 10
මිදුණු කිරි මෙන් මිදෙන්ට සලස්වා,
හමෙන්ද මාංසයෙන්ද මා පළඳවා, 11
ඇටවලින්ද නහරවලින්ද මා වියන්ට
නොයෙදුණේද?
ඔබ මට ජීවිතයත් කරුණාවත් දී, 12
ඔබගේ දයා බැල්මෙන් මාගේ ආත්මය
ආරක්ෂාකළසේක.
එහෙත් මේ දේවල් ඔබගේ සිතෙහි 13
සඟවා තබාගත්සේක;
මේ කාරණය ඔබගේ කල්පනාවෙහි

තිබුණු බව දනිමි.
14 මම පව්කෙරෙමිනම් ඔබ එය
බලාගන්නසේක,
මාගේ අපරාධයෙන් ඔබ මා නිදෙස්
නොකරනසේක.
15 මා දුෂ්ටයෙක්නම් මට දුක්වේ;
මා ධර්මිෂ්ඨ වුවත්, ලජ්ජාවෙන් පිරී,
මාගේ පීඩාව දෙස බලමින්,
මාගේ හිස නොඔසවා ඉන්නෙමි.
16 මාගේ හිස එසෙවුවොත් ඔබ සිංහයෙකු
මෙන් මා පස්සේ එළවා,
නැවත පුදුම ලෙස මා කෙරෙහි
බලයපානසේක.
17 අමුතු සාක්ෂි මට විරුද්ධව පමුණුවා,
මා කෙරෙහි ඔබගේ උදහස
වැඩිකරනසේක;
සේනාව පිට සේනාව මා කරා
එන්නාහ.
18 එබැවින් ඔබ මා කුසෙන් බිහිකළේ
මන්ද?
එසේ නොකළානම් මා නැසී කිසි
ඇසකට නොපෙනී යනවා ඇත.
19 එකල මා නුවූවාක්මෙන් වෙනවා ඇත;
කුසෙන් මිනිවළට ගෙනයනු ලබනවා
ඇත.
20 මාගේ දවස් ස්වල්ප නොවේද? එබැවින්
නැවතුණ මැනව;
හැරී නේන ස්ථානයට,
21 එනම් අන්ධකාරයේද මරණ සෙවණේද
දේශයවූ,
අන්ධකාරය වැනි තද කළුවරද
22 පිළිවෙළක් නැතුව මරණ සෙවණද
ඇත්තාවූ,
එළියත් අන්ධකාරයව පවත්නාවූ
දේශයට මා යන්ට පළමුවෙන්,
මට ස්වල්පයක් සැනසිල්ල ලැබෙන
පිණිස, මාගෙන් අහක්වුව මැනවයි
කීවේය.

## ශෝපර්ගේ පළමුවෙනි කථාව

11 එවිට නයමාතිය ශෝපර් උත්තර
දෙමින් කියනුයේ:
2 වචන රාශියට උත්තරදිය යුතු
නොවේද?
නොහොත් අධික කථාකාරයාම
නිර්දෝෂ වේද?
මනුෂ්‍යයන් නුඹේ ප්‍රලාපවලට 3
නිශ්ශබ්දව සිටින්ටද?
නුඹ කවටකම්කරන කල කිසිවෙක්
නුඹ ලජ්ජාවට නොපමුණුවන්නේද?
මක්නිසාද: මාගේ හැසිරීම නිදෙස්ය, 4
මම ඔබගේ ඇස් හමුයෙහි පවිත්‍රව
සිටිමියි නුඹ කියන්නෙහිය.
අහෝ, දෙවියන්වහන්සේ කථාකොට, 5
නුඹට විරුද්ධව උන්වහන්සේගේ
තොල් විවරකරනසේක්වා!
ප්‍රඥාවේ රහස්ද උන්වහන්සේගේ 6
ඥානය නානාප්‍රකාර බවද
නුඹට පෙන්වනසේක්වා!
එබැවින් දෙවියන්වහන්සේ නුඹේ
සියලු අයුතුකම්වල ප්‍රමාණයට වඩා
අඩුවෙන් නුඹට දඬුවම්කරන බව
දැනගනින්න.
දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් 7
දැනගන්ට නුඹට පුළුවන්ද?
සර්වපරාක්‍රමයාණන්වහන්සේ සම්පූර්ණ
ලෙස දැනගන්ට නුඹට පුළුවන්ද?
ඒක ස්වර්ගය මෙන් උසය; නුඹට 8
මක්කරන්ට පුළුවන්ද?
*ෂෙයෝලට වඩා ගැඹුරුය; නුඹට
දැනගන්ට පුළුවන් කුමක්ද?
ඒකේ මිම්ම පොළොවට වඩා දිගය, 9
මුහුදට වඩා පළලය.
උන්වහන්සේ අවුත් හිරකොට 10
විනිශ්චයට අඬගැසුවොත්, උන්වහන්සේ
වලක්වන්නේ කවුද?
මක්නිසාද උන්වහන්සේ බොරුකාරයන් 11
දන්නාසේක;
කල්පනා නොකරන්නාක්මෙන් සිටින
නුමුත් උන්වහන්සේ අධර්මිෂ්ඨකම
දක්නාසේක.
නුමුත් නිරර්ථක මනුෂ්‍යයා අනුවණව 12
සිටින්නේය,
එසේය, මනුෂ්‍යයා වල් කොටළුවෙක්ව
උපදින්නේය.
නුඹේ අතේ අයුක්තිය තිබේ නම් ඒක 13

---

*හෙවත්, මිනීවළට.

පහකරපන්න,
අධර්මිෂ්ඨකමද නුඹේ කූඩාරම්වල
වාසය නොකෙරේවා.
14 එවිට නුඹ නුඹේ සිත හරි ආකාර
යොමුකොට
උන්වහන්සේ දෙසට නුඹේ අත්
දිගුකළොත්.
15 නුඹ කැලලක් නැතුව නුඹේ මුහුණ
ඔසවාගන,
ස්ථිරව භය නැතුව සිටිනවා ඇත.
16 එසේය, නුඹ නුඹේ දුක මතකනැතිකර,
බැසගිය ජලය මෙන් ඒ ගැන සිතනවා
ඇත.
17 නුඹේ ජීවිතය ඉරමුදුන් වේලාවටත්
වඩා දීප්තිමත් වන්නේය;
අන්ධකාරය තිබෙන නුමුත් එය පහන්
වේලාව මෙන් වන්නේය.
18 බලාපොරොත්තුව තිබෙන බැවින්
නුඹ විශ්වාසයෙන් සිටින්නෙහිය;
එසේය, නුඹ වටකර සෝදිසිකර බලා,
සුරක්ෂිතව සැතපෙන්නෙහිය.
19 නුඹ කිසිවෙකුගෙන් භයක් නොලැබ
නිදාගන්නෙහිය;
එසේය, බොහෝ දෙනෙක් නුඹෙන්
කරුණාව සොයන්නෝය.
20 නුමුත් දුෂ්ටයන්ගේ ඇස් ක්ෂයවන්නේය,
ඔවුන්ට ගැළවීමක් නොලැබෙන්නේය,
ඔවුන්ගේ බලාපොරොත්තුවද ප්‍රාණය
ඉකුත්වීමයයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

12 එකල යෝබ් උත්තර
දෙමින් කියනුයේ:
2 නොඅනුමානවම මිනිස්සු නම්
නුඹලාය.
නුඹලා නසින විට ප්‍රඥාවත් නසිනවා
ඇත.
3 මටත් නුඹලාට වාගේම බුද්ධිය තිබේ;
මම නුඹලාට අඩු නැත.
එසේය, මෙබඳු දේ නොදන්නේ කවුද?
4 මම දෙවියන්වහන්සේට යාච්ඤාකොට
උන්වහන්සේගෙන් උත්තර ලැබූ
මනුෂ්‍යයෙක් නුමුත්
තමාගේ අසල්වාසියාට විහිලුවක් වූ
කෙනෙක් මෙනි.
ධර්මිෂ්ඨවූ අවංක මනුෂ්‍යයා
විහිලුවක්ය.
5 සැපෙන් සිටින අය තමාගේ සිතින්
විපත්තිය ඇත්තා සුළුකරන්නේය:
පාද ලිස්සන්නාවූ අයට ඒ සුළුකිරීම
සූදානම්ව තිබේ.
6 කොල්ලකාරයන්ගේ කූඩාරම් සඵල
වෙති.
දෙවියන්වහන්සේ උදහස්කරවන්නෝද
සුරක්ෂිතව සිටිති:
දෙවියන්වහන්සේ ඔවුන් අතට
බොහෝසෙයින් දෙනසේක.
7 එහෙත් මෘගයන්ගෙන් අසාපන්න,
උන් නුඹට උගන්වනවා ඇත;
අහසේ පක්ෂීන්ගෙන් අසාපන්න. උන්ද
නුඹට දන්වනවා ඇත.
8 නොහොත් පොළොවට කථාකරපන්න,
එවිට ඒක නුඹට උගන්වනවා ඇත:
මුහුදේ මත්ස්‍යයන් නුඹට කියාදෙනවා
ඇත.
9 ස්වාමීන්වහන්සේගේ අත මෙය
කළ බව
මේ සියල්ලෙන් දැන නොගන්නේ කවුද?
10 ජීවත්වෙන සියලු සත්ත්වයන්ගේ පණද
මුළු මනුෂ්‍ය වර්ගයාගේ ආත්මද
උන්වහන්සේගේ අතෙහිය.
11 උඩුතල්ල කෑම රසබලන්නාක්මෙන්,
කන වනාහි වචන විමසනවා
නොවේද?
12 ප්‍රඥාව මහල්ලන් අතරෙහිය,
වයස් වැඩිවීම ඥානයය.
13 ප්‍රඥාවත් බලයත් ඇත්තේ උන්වහන්සේ
වෙතය;
මන්ත්‍රණය හා නුවණ ඇත්තේ
උන්වහන්සේටය.
14 බලව, උන්වහන්සේ කඩාදැමුවාම
ගොඩනගනු නොලබන්නේය;
උන්වහන්සේ මනුෂ්‍යයෙකු වසාතැබුවාම
නිදහසක් නොවන්නේය.
15 උන්වහන්සේ වතුර නැවැත්තුවාම ඒවා
හිඳී යන්නේය:
නැවත උන්වහන්සේ ඒවා යැවුවාම
ඒවාට පොළොව පෙරළෙන්නේය.
16 බලයත් සමර්ථකමත් තිබෙන්නේ
උන්වහන්සේ වෙතය;
මුළාවෙන්නාත් මුළාකරන්නාත්
උන්වහන්සේට අයිතිය.
17 උන්වහන්සේ මන්ත්‍රීන් වහල්කමට
පමුණුවනසේක,

විනිශ්චයකාරයන්ද මෝඩයන්
කරනසේක.
18 උන්වහන්සේ රජුන්ගේ බැම්ම ලිහා
දමා,
ඔවුන්ගේ කටියෙහි පටියක්
බඳිනසේක.
19 උන්වහන්සේ පූජකයන් වහල්කමට
පමුණුවනසේක,
බලවතුන් හෙළාදමනසේක.
20 උන්වහන්සේ විශ්වාස අයගෙන් කථාව
පහකරනසේක;
වැඩිමහල්ලන්ගේ දැනගැන්මද ඉවත්
කරනසේක.
21 උන්වහන්සේ අධිපතීන් කෙරෙහි
නින්දව වගුරුවා,
සවි ඇත්තන්ගේ ඉඟපටිය මුදනසේක.
22 උන්වහන්සේ අන්ධකාරයෙන් ගැඹුරු
දේ එළිදරව්කර,
මරණ සෙවණ ආලෝකයට
පමුණුවනසේක.
23 උන්වහන්සේ ජාතීන් වර්ධනය
කරනසේක, ඔවුන් නැතිකරනසේක.
උන්වහන්සේ ජාතීන් පැතිරයන්ට
සලස්වනසේක, ඔවුන් වාලටත්
ගෙනයනසේක.
24 උන්වහන්සේ පොළොවේ ජන
ප්‍රධානීන්ගේ බුද්ධිය පහකොට,
ඔවුන් පාරක් නැති කාන්තාරයක
මුළාවයන්ට සලස්වනසේක.
25 ඔව්හු එළිය නැතුව අඳුරේ අතගගා
යන්නෝය,
උන්වහන්සේ ඔවුන් බේබද්දෙකු
මෙන් ඔබ මොබ යන්ට
සලස්වනසේක.

13 බලව, මේ සියල්ල මාගේ
ඇසින් දැක,
මාගේ කනින් අසා තේරුම්ගතිමි.
2 තුඹලා දන්නා දේ මමත් දනිමි.
මම තුඹලාට අඩු නැත.
3 සැබවින් මම සර්වපරාක්‍රමයාණන්ට
කථාකොට,
දෙවියන්වහන්සේට කාරණා කියා
සිටින්ට කැමැත්තෙමි.
4 තුඹලා නම් බොරු ගොතන්නෝය,
තුඹලා සියල්ලෝම නොවටිනා
වෙද්දුය.
තුඹලා නිශ්ශබ්දවම සිටියොත් හොඳය. 5
එය තුඹලාට ප්‍රඥාව වන්නේය.
ඉතින් මාගේ උත්තරය අසා, 6
මාගේ තොල්වල විවාදවලට ඇහුම්කන්
දියල්ලා.
තුඹලා දෙවියන්වහන්සේ උදෙසා 7
අසාධාරණ ලෙස කථාකරනවාද?
උන්වහන්සේ උදෙසා වංචාකාර
ලෙස කථාකරනවාද?
තුඹලා උන්වහන්සේගේ තරම 8
බලනවාද?
දෙවියන්වහන්සේ වෙනුවට
වගකියනවාද?
උන්වහන්සේ තුඹලා විමසා බැලුවොත් 9
හොඳද?
නොහොත් මනුෂ්‍යයෙකු
රවටන්නාක්මෙන් උන්වහන්සේ
රවටන්ට
තුඹලාට පුළුවන්ද?
තුඹලා රහසින් තරාතිරම බලනවා 10
නම්
උන්වහන්සේ තුඹලාට දඬුවම්කරනවාම
ඇත.
උන්වහන්සේගේ මහිමතාව තුඹලා 11
භය නොගන්වන්නේද?
උන්වහන්සේගේ භයංකරකම තුඹලා
පිටට නොපැමිණෙන්නේද?
තුඹලාගේ පැණවත් කීම් අළු වැනි 12
උපදේශවල්ය,
තුඹලාගේ බලකොටු මැටි බලකොටුය.
නිශ්ශබ්දවෙයල්ලා, මට කථාකරන්ට 13
ඉඩඇරපල්ලා.
සිද්ධවෙන දෙයක් සිද්ධවුණාවේ.
මා විසින් මාගේ මාංසය මාගේ 14
දත්වලින් ඩැහැගන යන්නෙත්
මාගේ ප්‍රාණය මාගේ අතේ තබාගන
ඉන්නෙත් මක්නිසාද?
උන්වහන්සේ මා මරනවා ඇත; මට 15
බලාපොරොත්තුවක් නැත්තේය;
එහෙත් උන්වහන්සේ ඉදිරිපිට මාගේ
මාර්ග හරි බවට ඔප්පුදෙන්නෙමි.
මේකත් මාගේ ගැළවීම වන්නේය; 16
මක්නිසාද අභක්තිකයෙක් උන්වහන්සේ

ඉදිරියට නොඑන්නේය.
17 මාගේ කථාව හොඳකාර අසාපල්ලා,
මාගේ කීමද නුඹලාගේ කන්වල
වැටේවා.
18 මෙන්න, මම මාගේ විත්තිය පිළියෙළ
කෙළෙමි;
මා නිදෙස්වෙන බව මම දනිමි.
19 මට විරුද්ධව නඩුකියන කෙනෙක්
ඇද්ද?
එසේ ඇත්නම් මම නිශ්ශබ්දව සිට
නසින්නෙමි.
20 කාරණා දෙකක් පමණක් මට
නොකළමැනව.
එවිට ඔබ ඉදිරියෙන් නොසැඟවී
සිටින්නෙමි.
21 ඔබගේ අත මා කෙරෙන් අහක්කරගත
මැනව;
ඔබගේ භයංකරකම මා බිය
නොකෙරේවා.
22 එවිට ඔබ අඬගැසුවාම
උත්තරදෙන්නෙමි;
නොහොත් මට කථාකරන්ට ඉඩදී
උත්තරදුන මැනව.
23 මාගේ අපරාධ සහ පව් කොපමණද?
මාගේ වරදත් මාගේ පාපයත් මට
දන්නුව මැනව.
24 ඔබගේ මුහුණ ඔබ සඟවා,
මා ඔබගේ සතුරෙකුකොට ගණන්
ගන්නේ මක්නිසාද?
25 හුළඟට ගසාගෙන යන කොළයකට
ඔබ හිරිහැරකරනසේක්ද?
වියළි ඉපනැල්ල පස්සෙන් එළවාගෙන
යනසේක්ද?
26 මක්නිසාද ඔබ මට විරුද්ධව කර්කශ
කාරණා ලියනසේක.
මාගේ යෞවන කාලයේ අයුතුකම්ද
මගේ ගණනට තබනසේක.
27 ක්ෂයවෙන්නාවූ දිරාගිය දෙයක් මෙන්ද
කාවුන් කෑ වස්ත්‍රයක් මෙන්ද වෙමි
නමුත්,
28 ඔබ මාගේ පාද දඬුකඳේ දමා, මාගේ
සියලුම මාවත් රැකසිටිනසේක;
ඔබ මාගේ පතුල්වලට මායිම්
තබනසේක.

## 14

ස්ත්‍රියගෙන් උපන් මනුෂ්‍යයා
ස්වල්ප දවසක් පවතින්නාවූ
කරදරයෙන් පූර්ණවූ කෙනෙක්ය.
ඔහු මලක් මෙන් හටගෙන 2
පහවීයන්නේය.
ඔහු නොපැවතී සෙවණැල්ල මෙන්
පලායන්නේය.
එබඳු අයෙකු දෙස ඔබගේ ඇස් 3
අරිනසේක්ද?
මා ඔබ හමුයෙහි විනිශ්චයට
පමුණුවනසේක්ද?
අපවිත්‍ර දෙයකින් පවිත්‍ර දෙයක් 4
උපදවන්ට කාට පුළුවන්ද? කාටවත්
බැරිය.
ඔහුගේ දවස් නියමව, ඔහුගේ මාස 5
ගණන ඔබ වෙත තිබෙන නිසාත්,
ඔහු පිටතට නොයන හැටියට ඔබ
ඔහුගේ මායිම් පිහිටුවා තිබෙන
නිසාත්,
ඔහු තමාගේ දවස කුලීකාරයෙකු 6
මෙන් භුක්තිවිඳ නිමවෙන තුරු,
ඔහු නිෂ්කලංකය ලබන පිණිස, ඔබගේ
ඇස් ඔහු කෙරෙන් හරවාගත
මැනව.
මක්නිසාද ගහක් කපාදැමුවොත් ඒක 7
දෙවනු ලියලා,
ඒකේ රිකිලි හටගන්නේය යන
බලාපොරොත්තුව ඇත්තේය.
ඒකේ මුල බොහෝ කල් පොළොවෙහි 8
පරණවී,
ඒකේ කඳ බිමෙහි මැරුණත්,
වතුරට පෙනීමෙන් ඒක දළුලා, 9
පැළැටියක් මෙන් අතු ලියලනවා ඇත.
නුමුත් මනුෂ්‍යයා මැරී දිරායන්නේය. 10
එසේය, මනුෂ්‍යයා තුරන්ව ගියාම
ඔහු කොතනද?
වැවකින් වතුර අඩුවෙන්නාක්මෙන්ද 11
ගංගාවක් හිඳී වියළීයන්නාක්මෙන්ද
මනුෂ්‍ය තෙම සැතපුණු කල 12
නොනැගිටින්නේය;
අහස නැතිවීයන තුරු ඔව්හු
නොපිබිදෙන්නෝය.

තමුන්ගේ නින්දෙන් නැඟුටුවනු
නොලබන්නෝය.
13 අහෝ, ඔබවහන්සේ මා *ෂෙයෝල්ලෙහි
වසා තබා,
ඔබගේ උදහස පහවන තුරු මා සඟවා,
මට කාලයක් නියමකොට, මා
සිහිකරනසේක් නම් කැමැත්තෙමි!
14 මනුෂ්‍යයෙක් මැරුණාම ඔහු නැවත
ජීවත්වේද?
මාගේ නිදහස පැමිණෙන තෙක්,
මාගේ සටනේ සියලු දවස්වල
බලාසිටින්නෙමි.
15 ඔබ අඬගසනසේක, මමද උත්තර
දෙන්නෙමි;
ඔබගේ අත් වැඩියට ඔබ
ආශාවනසේක.
16 එසේ නුමුත් දැන් ඔබ මාගේ පියවර
ගණන්කරනසේක;
ඔබ මාගේ පාපය ගැන රැකසිටිනවා
නොවේද?
17 මාගේ වරද මල්ලක දමා මුද්‍රාකර
තිබේ;
ඔබ මාගේ අපරාධය මහලා
තබනසේක.
18 සැබවින් කන්ද වැටී පොඩිවෙන්නේය,
පර්වතයද ඒකේ ඉඩමෙන්
පහවයන්නේය;
19 ගල් වතුරට ගෙවීයන්නේය;
ඒවායේ ගැලීමට පොළොවේ පස්
ගහගන යන්නේය;
එසේම ඔබ මනුෂ්‍යයාගේ
බලාපොරොත්තුව
නැතිකරනසේක.
20 ඔබ නිතරම ඔහු පරාජයකරනසේක,
ඔහු අහක්ව යන්නේය;
ඔබවහන්සේ ඔහුගේ මුහුණ වෙනස්කර
ඔහු හරිනසේක.
21 ඔහුගේ පුත්‍රයන් ගෞරවයට පැමිණෙන
නමුත් ඔහු නොදනියි;
ඔවුන් සුළුකරනු ලබන නුමුත් ඔවුන්
ගැන ඔහු නොදන්නේය.
එහෙත් ඔහුගේ මාංසයට ඒකේම 22
වේදනා දැනෙන්නේය.
ඔහුගේ ප්‍රාණයද ඔහු තුළෙහිම
වැලපෙන්නේයයි කීවේය.

*හෙවත්, මිනිවළෙහි.

## එලීපස්ගේ දෙවෙනි කථාව

15

එකල තේමානිය එලීපස් උත්තර
දෙමින් කියනුයේ:
ප්‍රඥාවන්තෙක් සුළඟ වැනි හිස්වූ 2
දැනගැන්මෙන් උත්තරදෙමින්,
නැගෙනහිර සුළඟින් තමාගේ ළය
පුරවාගන්නේද?
ඔහු නිෂ්ඵල වචනවලින් හෝ 3
අප්‍රයෝජන කථාවලින් හෝ
විවාදකරනවා ඇද්ද?
එසේය, නුඹ භක්තිය දුරුකර, 4
දෙවියන්වහන්සේ ඉදිරියෙහි
මෙනෙහිකිරීම නවත්වන්නෙහිය.
නුඹ ප්‍රයෝගකාරයන්ගේ දිව 5
තෝරාගන්න නුමුත්,
නුඹේ අයුතුකම නුඹේ මුඛයෙන්
ඔප්පුවෙන්නේය.
මා නොව නුඹේම මුඛය නුඹ වරදට 6
පත්කරන්නේය;
එසේය, නුඹේම තොල් නුඹට විරුද්ධව
සාක්ෂිදෙන්නේය.
උපන්නාවූ පළමුවෙනි මනුෂ්‍යයා 7
නුඹද?
නොහොත් නුඹ හෙල්වලට පළමුවෙන්
ඉපදුණාද?
නුඹ දෙවියන්වහන්සේගේ 8
මන්ත්‍රණසභාවෙහි හිඳ,
නුඹ වෙත ප්‍රඥාව තබාගන්නෙහිද?
අප නොදන්න මොන දෙයක් නුඹ 9
දන්නවාද?
අපට නැති මොන දැනගැන්මක් නුඹට
තිබෙනවාද?
නුඹේ පියාටත් වඩා මහලුවූ 10
හිස පැසුණු අයද ඉතා

වයස්ගතවූවෝද අප අතරේ සිටිති.
11 දෙවියන්වහන්සේගේ සැනසිලිත්
තුඹ සමග මෘදුලෙස කථාකරන
වචනයත් තුඹට මදිද?
12 දෙවියන්වහන්සේට විරුද්ධව තුඹේ
සිත හරවා,
තුඹේ කටින් මෙබඳු වචන නික්මවන
හැටියට,
13 තුඹේ සිත තුඹව ගෙනයන්නේ මන්ද?
තුඹේ ඇස් ඉඟිකරන්නෙත් මක්නිසාද?
14 මනුෂ්‍යයා පිරිසිදුව පෙනෙන්ටත්
ස්ත්‍රියගෙන් උපන් තැනැත්තා
ධර්මිෂ්ඨව පෙනෙන්ටත් ඔහු
මොකක්ද?
15 බලව, උන්වහන්සේ තමන්
ශුද්ධවන්තයන් කෙරෙහි විශ්වාසය
නොතබනසේක.
එසේය, ස්වර්ගවල් උන්වහන්සේගේ
ඇස් ඉදිරිපිට පිරිසිදු නැත.
16 එසේ නම් පිළිකුල්වූ, කිළිටුවූ,
අපරාධය වතුර මෙන් බොන්නාවූ
මනුෂ්‍යයා පිරිසිදුකමින් ඊටත්
කොපමණ අඩු නොවන්නේද?
17 තුඹට පෙන්වන්නෙමි, මා කියන දේ
අසාපන්න;
මා දැක තිබෙන දේද කියාදෙන්නෙමි.
18 එය ප්‍රඥාවන්තයෝ තමුන්ගේ
පියවරුන්ගෙන් දැනගෙන,
නොසඟවා දන්නුවෝය.
19 දේශය දෙනලද්දේ ඔවුන්ට පමණක්ය,
විදේශිකයෙක්ද ඔවුන් අතරට
නොපැමුණුණේය.
20 දුෂ්ටයා තමාගේ සියලු දවස්වලද
බලාත්කාරකාරයාට නියමකර
තිබෙන අවුරුදු ගණන මුළුල්ලෙහිද
වේදනාවෙන් පෙළෙන්නේය.
21 භයංකර ශබ්ද ඔහුගේ කන්වලට
ඇසෙන්නේය;
සමෘද්ධියේදී නාස්තිකරන්නා ඔහු පිටට
පැමිණෙන්නේය.
22 තමා අන්ධකාරයෙන් මිදෙන්නේය
කියා ඔහු විශ්වාස නොකරයි;
ඔහු කඩුවට නියමව සිටින්නේය.
23 කෑම කොතැන තිබේද කියා
සොයමින් ඔහු ඔබ මොබ යන්නේය;
අන්ධකාරයේ දවස තමාගේ අත ළඟ
සූදානම්ව තිබෙන බව ඔහු දන්නේය.
විපත්තියත් වේදනාවත් ඔහු භයගන්වා, 24
සටනට සැරසී සිටින රජෙකු මෙන්
ඔහු පරාජයකරන්නේය.
මක්නිසාද ඔහු දෙවියන්වහන්සේට 25
විරුද්ධව තමාගේ අත දිගුකෙළේය,
සර්වපරාක්‍රමයාණන්ට විරුද්ධව
උඩඟුකම් කර,
තමාගේ පලිස් ඝන ලෙස එකිනෙකට 26
යාකරගෙන,
තද කුළලක් ඇතුව උන්වහන්සේට
විරුද්ධව දුවන්නේය.
ඔහු තමාගේ මුහුණ තරකමෙන් වසා, 27
තුනටිය තරකරගෙන,
පාළු නුවරවලද වැසියන් නැත්තාවූ 28
ගල් ගොඩවල් වෙන්ට නියමවූ
ගෙවල්වලද වාසයකෙළේය.
ඔහු පොහොසත් වන්නේවත්, 29
ඔහුගේ වස්තුව පවතින්නේවත්,
ඔවුන්ගේ සම්පත් පොළොවෙහි පැතිර
යන්නේවත් නැත.
ඔහු අන්ධකාරයෙන් පිටවී 30
නොයන්නේය;
ගිනි දළුවට ඔහුගේ අතු වියළී,
උන්වහන්සේගේ මුඛයේ හුස්මට ඔහු
පහව යන්නේය.
තමාම රවටාගනිමින් ඔහු දුෂ්ටකම 31
කෙරෙහි විශ්වාසය නොතබාවා.
මක්නිසාද දුෂ්ටකම ඔහුගේ විපාකය
වන්නේය.
ඔහුගේ කාලයට පළමුවෙන් එය 32
ඉෂ්ට වන්නේය,
ඔහුගේ තල්අත්ත අමුව
නොතිබෙන්නේය.
ඔහු මිදිකවැල මෙන් තමාගේ 33
නොපැසුණු ඵල හෙළාදමන්නේය,
ඔලීව ගස මෙන් තමාගේ මල්
සොලවාදමන්නේය.
මක්නිසාද අභක්තිකයාගේ සමාගම 34
නිස්සාරය;
අල්ලස් ගැනීමේ කූඩාරම්ද ගින්නට
දලා යන්නේය.
ඔව්හු අයුක්තිය පිළිසිඳගෙන අපරාධය 35
වදන්නෝය,
ඔවුන්ගේ ගර්භයද ප්‍රයෝගය
යොදන්නේයයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

16 එවිට යෝබ් උත්තරදෙමින් කියනුයේ:
2 ඔබඳු බොහෝ දේ මා විසින් අසා තිබේ.
නුඹලා සියල්ලෝම දුක්දෙන සැනසිලිකාරයෝය.
3 සුළඟ වැනි වචනවල කෙළවරක් ඇද්ද?
නොහොත් උත්තරදීමට නුඹ පොළඹවන්නේ කුමක්ද?
4 මටත් නුඹලා වාගේ කථාකරන්ට පුළුවන;
මා සිටින ස්වභාවෙහි නුඹලා සිටියොත්,
නුඹලාට විරුද්ධව වචන ගොතා,
නුඹලා දෙසට මාගේ හිස වනන්ට මට පුළුවන.
5 එහෙත් මාගේ මුඛයෙන් නුඹලා ශක්තිමත්කර,
මාගේ තොල්වල සැනසිල්ලෙන් නුඹලා උසුලන්නෙමි.
6 මා කථාකරන නුමුත් මාගේ ශෝකය නොසන්සිඳෙයි.
කථා නොකර උන්නත් මට ලැබෙන පහසුව කිමෙක්ද?
7 සැබවින්ම උන්වහන්සේ මා වෙහෙසූසේක;
ඔබවහන්සේ මාගේ මුළු සමාගම පාළුකළසේක.
8 ඔබ මා අල්ලාගත්සේක, ඒක මට විරුද්ධව සාක්ෂියක්ය.
මාගේ කෙට්ටුකම මට විරුද්ධව නැගිටියි, ඒක මාගේ මුහුණ ඉදිරියෙහි සාක්ෂිදෙයි.
9 උන්වහන්සේ තමන් කෝපයෙන් මා ඉරා දමා මට ද්වේෂකළසේක;
උන්වහන්සේ මට විරුද්ධව දත්මිටිකෑසේක.
මාගේ එදිරිකාරයා මා දෙසට තමාගේ ඇස් යොමුකරන්නේය.
10 ඔව්හු මට විරුද්ධව තමුන්ගේ කට අයා,
නින්දාකරමින් මාගේ කම්මුලට ගැසුවෝය.
ඔව්හු එක්ව මට විරුද්ධව සම්බන්ධවෙති.
11 දෙවියන්වහන්සේ අභක්තිකයාට මා පාවාදෙනසේක;
දුෂ්ටයන්ගේ අත්වලට මා විසිකරනසේක.
12 මම සුවසේ සිටියෙමි, උන්වහන්සේ මා පොඩිකළසේක;
මාගේ බෙල්ල අල්ලා, මා බිමගසා සුන්කර,
ඉලක්කයක් කොට මා තබාගත්සේක.
13 උන්වහන්සේගේ දුනුවායෝ මා වටකරගන සිටිති,
උන්වහන්සේ කරුණා නොකර, මාගේ වකුගඩු පළා,
මාගේ පිත බිම වගුරුවනසේක.
14 උන්වහන්සේ බිඳුම් පිට බිඳුම් කොට, මා පොඩිකරනසේක;
යුද්ධකාරයෙකු මෙන් මට විරුද්ධව දුවඑනසේක.
15 ගෝණි රෙදි මාගේ හම පිට මහගන,
මාගේ අඟ දූවිල්ලෙහි දමාගන සිටිමි.
16 මාගේ මුහුණ ඇඬීමෙන් රතුවී තිබේ,
මාගේ ඇසිපිය පිටද මරණයේ සෙවණ තිබේ.
17 කිසි බලාත්කාරකමක් මාගේ අත්වල නැති නුමුත්,
මාගේ යාච්ඤාව පිරිසිදු නුමුත්, මට එසේ වී තිබේ.
18 එම්බා පොළොව, මාගේ ලේ වසා නොගනින්න,
නැවතීමේ ඉඩමක්ද මාගේ මොරගෑසීමට නොතිබේවා.
19 දැන් පවා මාගේ සාක්ෂිය ස්වර්ගයෙහිය;
මාගේ සාක්ෂිකාරයාද උසස්ථානයෙහි සිටියි.
20 මාගේ යහළුවෝ මට නින්දාකෙරෙති.
මාගේ ඇස දෙවියන්වහන්සේ දෙසට කඳුළු වගුරුවයි.
21 එසේ කරන්නේ මනුෂ්‍ය පුත්‍රයෙක් තවත් මනුෂ්‍යයෙකුට යුක්තිය කරන්නාක්මෙන්
දෙවියන්වහන්සේ තමන් ඉදිරියෙහි මනුෂ්‍යයෙකුට යුක්තිය කරන පිණිසය.
22 මක්නිසාද අවුරුදු ස්වල්පයකට පසු,
මම ආපසු නොඑන මාවතෙහි යන්නෙමි.

17 මාගේ ආත්මය ක්ෂයවී මාගේ
දවස් ගෙවී ගියේය,
මට ඇත්තේ මිනීවළය.
2 සැබැවටම සරදම්කාරයෝ මා වෙත
සිටිති,
මාගේ ඇස ඔවුන්ගේ විරුද්ධකම්
දෙසටම යොමුවී තිබේ.
3 ඔබ වෙතම උකසක් තබාගෙන මට
ඇපවුව මැනව;
මාගේ අතට අතගසන්ට ඉන්නේ
වෙන කවුද?
4 මක්නිසාද ඔබවහන්සේ ඔවුන්ගේ
සිත්වලින් නුවණ සඟවා තිබේ.
එබැවින් ඔබ ඔවුන් උසස්
නොකරනසේක.
5 තමාගේ මිත්‍රයන් කොල්ලයක් පිණිස
පාවාදෙන යමෙක් ඇද්ද,
ඔහුගේ දරුවන්ගේ ඇස් පවා ක්ෂයවී
යනවා ඇත.
6 උන්වහන්සේ මා සෙනඟ අතරේ
නින්ද පාඨයක් කළසේක;
මම ඔවුන්ට කෙළගීමක් වී සිටිමි.
7 මාගේ ඇස් ශෝකයෙන් අඳුරුවී
තිබේ,
මාගේ අවයව සියල්ලම සෙවණැල්ලක්
මෙන්ය.
8 අවංක මිනිස්සු මේ ගැන විස්මිත වෙති,
නිර්දෝෂ තැනැත්තා අභක්තිකයාට
විරුද්ධව ඇවිස්සී සිටින්නේය.
9 එහෙත් ධර්මිෂ්ඨයා තමාගේ මාර්ගයේම
පවතින්නේය,
පිරිසිදු අත් ඇත්තා වඩ වඩා
ශක්තිමත්වන්නේය.
10 නුමුත් නුඹලා සියලු දෙනා දන්
හැරී වරෙල්ලා.
නුඹලා අතරේ ප්‍රඥාවන්තයෙක් මට
සම්බ නොවන්නේය.
11 මාගේ දවස් පහවී,
මාගේ සිතේ සම්පත වන මාගේ අදහස්
කඩවී තිබේ.
12 ඔව්හු රාත්‍රිය දවාලට පෙරළති.
එළිය අන්ධකාරයට ළඟයයි කියති.
මාගේ ගෙය කොට *ෂෙයෝල ගැන 13
බලා සිටිමි,
අන්ධකාරයෙහි මාගේ යහන අතුළෙමි.
නුඹ මාගේ පියායයි කුණුවීමටත් 14
නුඹ මාගේ මවු සහ සහෝදරීයයි
පණුවාටත් කීවෙමි.
එසේ නම් මාගේ බලාපොරොත්තුව 15
කොතැනද?
මාගේ බලාපොරොත්තුව පෙනෙන්නේ
කාටද?
ධූලියෙහි නිශ්චලය ලැබූ හැටියේම 16
ඒක †ෂෙයෝලේ අගුල් දක්වා
බසිනවා ඇතැයි කීවේය.

## බිල්දද්ගේ දෙවෙනි කථාව

18 එවිට ෂූහියවූ බිල්දද්
උත්තරදෙමින් කියනුයේ:
‡නුඹලා කොපමණ කල් වචනවලට 2
උගුල් තබන්නහුද?
තේරුම්ගනිල්ලා, පසුව කථාකරමුව.
අප තිරිසනුන් මෙන් ගණන්ගනු 3
ලබන්නෙත්
නුඹලාගේ ඇස්වලට අපවිත්‍රව
පෙනෙන්නෙත් මක්නිසාද?
තමාගේ කෝපයෙන් තමාම ඉරාගන්න 4
කෙනෙක්වූ
නුඹ නිසා, පොළොව අත්හරිනු
ලබන්ටත්
නොහොත් පර්වතය ස්වකීය
ස්ථානයෙන් අහක්ව යන්ටත් ඕනැද?
එසේය, දුෂ්ටයාගේ එළිය නිවීයන්නේය, 5
ඔහුගේ ගිනිදැල්ද නොබැබළෙන්නේය.
එළිය ඔහුගේ කූඩාරමෙහි අඳුරු 6
වන්නේය.
ඔහුට උඩින් ඔහුගේ පහනද නිවී
යන්නේය.
ඔහුගේ වේගවත් අඩි හිරවන්නේය, 7
තමාගේම මන්ත්‍රණයෙන් ඔහු
වැටෙන්නේය.
මක්නිසාද තමාගේ පාදවලින් ඔහු 8

*හෙවත්, මිනීවළ.
†එනම්, මිනීවළේ.
‡හෙවත්, නුඹලාගේ කථාව නිමවන්නේ
කවදාද?

දලකට අසුවන්නේය,
ඔහු මලපත් උඩ ඇවිදින්නේය.
9 උගුලක් ඔහුගේ විලුඹ අසුකරගන්නේය,
මලපතක් ඔහු අල්ලාගන්නේය.
10 ඔහුට බිම තොණ්ඩුවක්ද
පාරේ උගුලක්ද සඟවා තබා තිබේ.
11 භීතිය ඔහු හාත්පසින් භයගන්වමින්
ඔහුගේ පාද ළඟම එළවා යන්නේය.
12 බඩගින්නෙන් ඔහුගේ ශක්තිය හීන
වන්නේය,
කොරගසමින් යන ඔහුට විපත්තිය
ළංවන්නේය,
13 එය ස්වකීය හමේ කොටස්
කාදමන්නේය,
ඔහුගේ කුලුදුලා ඔහුගේ අවයව කා
දමන්නේය.
14 ඔහු තමාගේ විශ්වාසය වන තමාගේ
කූඩාරමෙහි උදුරනු ලැබ,
*භයංකරකම්වල රජු ළඟට ගෙනයනු
ලබන්නේය.
15 ඔහුට අයිති නැති අය ඔහුගේ
කූඩාරමෙහි වසන්නෝය;
ඔහුගේ නිවස පිටටද ගෙන්දගම්
වස්වනු ලබන්නේය.
16 යටින් ඔහුගේ මුල් වියළීයයි,
උඩින් ඔහුගේ අතු කපාදමනු
ලබන්නේය.
17 ඔහු ගැන සිහිවීම පොළොවෙන්
නැතිවීයන්නේය,
පසල් ගම්වල ඔහුගේ නම
නොකියවෙන්නේය.
18 එළියෙන් අඳුරට ඔහු තල්ලුකරනු ලැබ,
ලෝකයෙන් එළවනු ලබන්නේය.
19 ඔහුගේ සෙනඟ අතරේ ඔහුට
දරුවෙක්වත් මුනුබුරෙක්වත් නොසිටී,
ඔහුගේ වාස භූමියෙහි ඉතුරුව සිටින
කෙනෙක්ද නැත.
20 භීතිය පළමු සිටි අය
අසුකරගත්තාක්මෙන්
පසුව පැමිණෙන අය ඔහුගේ දවස
ගැන විස්මපත්වන්නෝය.
21 සැබවින් අධර්මිෂ්ඨයන්ගේ වාසස්ථාන
මෙසේය,
දෙවියන්වහන්සේ නාඳුනන්නාගේ
ඉඩමද මෙයාකාරයයි කීවේය.

*එනම්, මරුවා.

## යෝබ්ගේ උත්තරය

(තමාගේ මිදුම්කාරයා කෙරෙහි
විශ්වාසය.)

19

එකල යෝබ් උත්තරදෙමින්
කියනුයේ:
නුඹලා කොපමණ කල් මාගේ ආත්මය 2
වෙහෙසමින්,
වචනවලින් මා පොඩිකරන්නහුද?
දැන් දස වරක් නුඹලා මට නින්ද 3
කළහුය;
ලජ්ජා නැතුව මට අයුක්තිය කළහුය.
මා ඇත්තටම වැරදි කළා නම්, 4
මාගේ වැරැද්ද පවතින්නේ මා
කෙරෙහිමය.
නුඹලා සැබෑවටම මට විරුද්ධව 5
උසස්වෙන්ට නම්,
මාගේ නින්දව මට විරුද්ධව
ඔප්පුකරපල්ලා.
ඉතින් දෙවියන්වහන්සේ මාගේ 6
කාරණා පෙරළා,
තමන් දල මා වටකර හෙළා තිබෙන
බව දැනගනිල්ලා.
මෙන්න, මා අයුත්ත ගැන මොරගසන 7
නුමුත්, මට උත්තරයක් නැත.
පිහිට ඉල්ලා මොරගසන නුමුත්
යුක්තිය ඉෂ්ටවීමක් නැත.
මා පිටත නොයන හැටියට 8
උන්වහන්සේ මාගේ පාර අහුරා,
මාගේ මාවත්වල අන්ධකාරය තබා
තිබේ.
උන්වහන්සේ මාගේ ඉසුර මාගෙන් 9
උදුරාදමා,
මාගේ හිසෙන් ඔටුන්න පහකර තිබේ.
මා නැතිවීයන හැටියට වටකරින් 10
උන්වහන්සේ මා කඩාදමා,
මාගේ බලාපොරොත්තුව ගහක් මෙන්
උදුරා දමූසේක.
උන්වහන්සේ තමන් උදහස මට 11
විරුද්ධව අවුළුවා,
තමන්ගේ එදිරිකාරයෙකු ලෙස මා
ගණන්ගන්නාසේක.
උන්වහන්සේගේ සමූහයෝ එක්ව 12
ඇවිත් මට විරුද්ධව තමුන්ගේ
මාර්ගය උසට ගොඩනගා,
මාගේ කූඩාරම වටකරින් කඳවුරු

බඳිති.
13 උන්වහන්සේ මාගේ සහෝදරයන්
මා වෙතින් දුරුකළසේක,
මාගේ ඇඳුනුම්කාරයෝද මාගෙන්
සම්පූර්ණයෙන්ම වෙන්වුණෝය.
14 මාගේ නෑයෝ අහක්වී,
මාගේ හිතේසි මිත්‍රයෝ මා මතක
නැතිකළෝය.
15 මාගේ ගෙදර නැවතී සිටින්නෝද
මාගේ වැඩකාරියෝද මා අන්‍යයෙකු
කොට ගණන්ගනිති.
ඔවුන්ට මම විදේශියෙකු මෙන්ය.
16 මාගේ වැඩකාරයාට අඬගැසුවත්
ඔහු මට උත්තර නොදෙයි,
මාගේ මුඛයෙන් ඔහුට කන්නලව්
කරන්ට සිදුවී තිබේ.
17 මාගේ හුස්ම මාගේ භාර්යාවට අප්‍රියය,
මාගේ මවුගේ කුසේ උපන් දරුවන්ට
මම පිළිකුලක්ය.
18 බාලයෝ පවා මා හෙළාදකිති;
මා නැගිටින්ට හදන විට ඔව්හු මට
විරුද්ධව කථාකෙරෙති.
19 මාගේ සියලු හිත මිත්‍රයෝම මට
පිළිකුල්කරති.
මා විසින් ප්‍රේමකළ අය මට විරුද්ධවී
සිටිති.
20 මාගේ ඇට මාගේ හමටත් මාංසයටත්
ඇලී තිබේ,
මා ඉතිරිවී ඉන්නේ මාගේ දත්වල
හම පමණක් ඇතුවය.
21 අනේ මාගේ මිත්‍රයෙනි, මට
අනුකම්පාකරපල්ලා,
අනුකම්පාකරපල්ලා;
මක්නිසාද දෙවියන්වහන්සේගේ
හස්තය මට පහරදුන්නේය.
22 තුඹලා දෙවියන්වහන්සේ මෙන් මා
පස්සේ එළවාගෙන එන්නෙත්
මාගේ මාංසය කැමෙන් තෘප්තියට
නොපැමිණ සිටින්නෙත් මක්නිසාද?
23 අනේ මාගේ වචන දන් ලියනු
ලැබුවොත් කොපමණ හොඳද!
ඒවා පොතක සටහන්කර තබන්ටත්,
24 යකඩ පන්හිඳකින් හා ඊයම්වලින්
සදාකාලේටම පර්වතයෙහි කොටා
තබන්ටත් යෙදුණොත් කොපමණ
හොඳද!
එහෙත් මාගේ මිදුම්කාරයාණන් 25
ජීවත්ව සිටින බවද
අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට
සිටින බවද දනිමි.
මේ මාගේ හම නැතුව ගියායින් පසු, 26
මාගේ මාංසය නැතුව නුමුත්
දෙවියන්වහන්සේ දකින්නෙමි.
මමම උන්වහන්සේ දකින්නෙමි, 27
අන්‍යයෙක් නොව මාගේම ඇස්
උන්වහන්සේ දකින්නේය.
මාගේ හෘදයවස්තුව මා තුළෙහි
ක්ෂයවී තිබේ.
කාරණාවේ මුල මා තුළ සම්බවූ 28
හෙයින්,
අපි ඔහුට කෙසේ පීඩාකරමෝදැයි
තුඹලා කියන්නහු නම්,
කඩුවට භයවෙයල්ලා; 29
මක්නිසාද විනිශ්චයක් ඇති බව
තුඹලා දැනගන්න පිණිස
උදහස කඩුවේ දඬුවම
පමුණුවන්නේයයි කීවේය.

## ශෝපර්ගේ දෙවෙනි කථාව

එකල නයමාතිය ශෝපර් 20
උත්තරදෙමින් කියනුයේ:
ඒ නිසා එනම් මා තුළ තිබෙන මාගේ 2
ඉක්මන්කම නිසා
මාගේ සිතිවිලිවලින් මට උත්තර
ලැබෙන්නේය.
මා ලජ්ජාවට පමුණුවන තරවටුව 3
ඇසීමි,
මාගේ තේරුම්ගැනීමේ ආත්මයද මට
උත්තරදෙන්නේය.
පුරාණයේ සිටම, මනුෂ්‍යයා 4
පොළොවෙහි පිහිටුණ තැන් පටන්,
වුණාවූ මේ කාරණාව එන,
දුෂ්ටයන්ගේ ජයඝෝෂාව ලුහුඬු බවත් 5
අභක්තිකයාගේ ප්‍රීතිය මොහොතකට
පමණක් බවත් නොදන්නෙහිද?
ඔහුගේ උතුම්කම අහස දක්වා 6
නැග්ගත්,
ඔහුගේ ඉස වලාකුල්වලට හැපුණත්,
ඔහුගේම අශුචි මෙන් ඔහු 7
සදාකාලයටම නැතිවී යන්නේය,
ඔහු දුටු අය: ඔහු කොයිදැයි

අසත්තෝය.
8 ඔහු හීනයක් මෙන් පහව් ගොස්
නොපෙනී යන්නේය.
රාත්‍රියේ දර්ශනයක් මෙන් පන්නනු
ලබන්නේය.
9 ඔහු දුටු ඇස තවත් ඔහු නොදකින්නේය;
ඔහුගේ ඉඩමෙහිද ඔහු තවත්
නොපෙනෙන්නේය.
10 ඔහුගේ දරුවෝ දුප්පතුන්ගේ කරුණාව
සොයන්නෝය,
ඔහුගේ අත් ඔහුගේ සම්පත් ආපසු
දෙන්නේය.
11 ඔහුගේ ඇට ඔහුගේ යෞවනභාවයෙන්
පිරී තිබෙන නුමුත්,
එය ඔහු සමග ධූලියෙහි වැදහෙන්නේය.
12 දුෂ්ටකම ඔහුගේ මුඛයෙහි මිහිරිව
තිබෙන නුමුත්,
ඔහු ඒක තමාගේ දිව යට සඟවා
ගන්න නුමුත්;
13 ඒක අත් නොහැර ඉතුරුකොට
තමාගේ මුඛය තුළ තබාගන්න නුමුත්;
14 ඔහුගේ කෑම ඔහුගේ අතුණුවල
වෙනස්වී,
ඔහු තුළ සර්පයන්ගේ විෂ වන්නේය.
15 ඔහු වස්තු ගිලගත් නුමුත් ඒවා
වමාරන්නේය.
දෙවියන්වහන්සේ ඒවා ඔහුගේ බඩෙන්
පිටකරනසේක.
16 ඔහු සර්පයන්ගේ විෂ උරාබොන්නේය.
පොළඟාගේ දිවෙන් ඔහු මැරුම්
කන්නේය.
17 ඔහු ඔයවල්ද මීපැණි හා ගිතෙල්
ගලා යන
ගංගාද නොදකින්නේය.
18 ඔහු උත්සාහකොට ලබාගත් දේ
භුක්ති නොවිඳ ආපසු දෙන්නේය;
තමා ලබාගත් සම්පත් ප්‍රමාණයට
ප්‍රීති නොවන්නේය.
19 මක්නිසාද ඔහු දුප්පතුන්ට පීඩා කොට
ඔවුන් අත්ඇරියේය;
තමා ගොඩ නොනැගූ ගෙවල් ඔහු
බලාත්කාරයෙන් ගත්තේය.
20 ඔහු තමාගේ ළය තුළ නිශ්චලය නැතුව
සිටි බැවින්,
තමා ප්‍රියවන දේවලින් කිසිවක් ගළවා
නොගන්නේය.
ඔහුගේ තෘෂ්ණාවට ගොදුරු නොවූ 21
දෙයක් නැත;
එබැවින් ඔහුගේ සැපත නොපවත්නේය.
ඔහු බහුලත්වයෙන් සෑහී සිටින කල 22
ඔහුට හිඟවන්නේය.
දුඃඛිතයන්ට පැමිණෙන හැම දුකම
ඔහු පිටට පැමිණෙන්නේය.
ඔහු තමාගේ බඩ පුරවාගන්ට හදන 23
කල,
දෙවියන්වහන්සේ තමන් බලවත්
උදහස ඔහු පිට හෙළනසේක,
ඔහු කෑම කන කල උන්වහන්සේ
එය ඔහු පිටට වස්වනසේක.
ඔහු යකඩ ආයුධයෙන් පලාගියත්, 24
පිත්තල දුන්නෙන් ඔහු සිදුරුකරනු
ලබන්නේය.
ඔහු ඒක අදින විට ඒක ඔහුගේ 25
ඇඟෙන් නික්මෙන්නේය.
එසේය, දිලියෙන තුඩ ඔහුගේ
පිතෙන් පිටවෙන්නේය;
භීති ඔහු කෙරෙහි වන්නේය.
ඔහුගේ නිධාන වෙනුවට සියලු ආකාර 26
අන්ධකාරය රැස්කර තිබේ.
මනුෂ්‍යයා විසින් නොදල්වූ ගින්නක්
ඔහු දවා දමා,
ඔහුගේ කූඩාරමෙහි ඉතිරිව තිබෙන
දේ නාස්තිකරන්නේය.
අහස ඔහුගේ අයුතුකම් එළිදරවූ 27
කරන්නේය.
පොළොවද ඔහුට විරුද්ධව
නැගිටින්නේය.
ඔහුගේ ගෙයි සම්පත් පහව යන්නේය, 28
උදහස් දවසේදී ඒවා පාවී යන්නේය.
දුෂ්ට මනුෂ්‍යයාට දෙවියන්වහන්සේගෙන් 29
පැමිණෙන කොටසත්
දෙවියන්වහන්සේ ඔහුට නියමකළ
උරුමයත් මේයයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

21
එවිට යෝබ් උත්තරදෙමින්
කියනුයේ:
මාගේ කථාව සැලකිල්ලෙන් 2
අසාපල්ලා;
මේක නුඹලාගේ සැනසීම් වේවා.
මටත් කථාකරන්ට ඉඩ ඇරපල්ලා; 3

මා කථාකළායින් පසු නින්දකරපල්ලා.
4 මාගේ පැමිණිල්ල කරන්නේ
මනුෂ්‍යයාටද?
මා ඉවසිලි නැතුව නොසිටින්ට
කාරණය මොකද?
5 මා දෙස බලා විස්මපත්වී,
අතින් කට වසාගනිල්ලා.
6 සිහිවෙන විටම මම කැලඹෙමි,
තැතිගැන්ම මාගේ මාංසය අල්වාගනියි.
7 දුෂ්ටයන් ජීවත්වන්නෙත්,
වෘද්ධ වයසට පැමිණ බලවත්වන්නෙත්
මක්නිසාද?
8 ඔවුන් ඉදිරියෙහි ඔවුන්ගේ වංශයද
ඔවුන්ගේ ඇස් හමුයෙහි ඔවුන්ගෙන්
පැවත එන්නෝද ඔවුන් සමග
පිහිටෙන්නෝය.
9 ඔවුන්ගේ ගෙවල් භයින් තොරව
සුරැකිව තිබේ,
දෙවියන්වහන්සේගේ ඉපලද ඔවුන් පිට
නැත.
10 ඔවුන්ගේ ගොනා නොවරද්ද පැටවුන්
ජනිතකරයි;
ඔවුන්ගේ එළදෙන ගස්සා නොවී වදයි.
11 ඔවුන්ගේ බාලයන් බැටළු රැළක් මෙන්
පිටතට යවති,
ඔවුන්ගේ දරුවෝද නටති.
12 ඔව්හු රබානද වීණාවද ඇතුව ගීතිකා
කියති,
නළාවේ ශබ්දයටද ප්‍රීතිවෙති.
13 ඔව්හු සැපතින් දවස් යවති,
ඇසිල්ලකින් *මෙයෝලට බැසයති.
14 ඔව්හු දෙවියන්වහන්සේට කථාකොට:
අප වෙතින් අහක්ව ගිය මැනව;
මක්නිසාද ඔබගේ මාර්ග දැනගැන්මට
අපි නොකැමැත්තෙමුව.
15 අප විසින් සර්වපරාක්‍රමයාණන්ට
මෙහෙකරන්ට උන්වහන්සේ කවුද?
උන්වහන්සේට යාච්ඤාකළත් අපට
මොන ප්‍රයෝජනයක් වේදැයි
කීවෝය.
16 බලව, ඔවුන්ගේ සමෘද්ධිය ඔවුන්ගේ
අතේ නොවේය.
දුෂ්ටයන්ගේ මන්ත්‍රණය මාගෙන් දුරුව
තිබේ.
දුෂ්ටයන්ගේ පහන නිවී, 17
ඔවුන්ගේ විපත්තිය ඔවුන් පිටට
පැමිණෙන්නෙත්,
දෙවියන්වහන්සේ ස්වකීය කෝපයෙන්
දුක් බෙදදෙන්නෙත්,
ඔවුන් සුළඟට ගහගනයන ඉපනැල්ල 18
මෙන්ද
සුළඟට අසුවීයන බොල් මෙන්ද
වෙන්නෙත් කොපමණ වාරවලද?
දෙවියන්වහන්සේ ඔහුගේ අපරාධය 19
ඔහුගේ දරුවන්ට රැස්කර
තබනසේකැයි නුඹලා කියන්නහුය.
ඔහු දැනගන්න පිණිස උන්වහන්සේ
ඔහුටම ප්‍රතිඵල පමුණුවනසේක්වා.
ඔහුගේ විනාශය ඔහුගේම ඇස්වලට 20
පෙනේවා,
ඔහු සර්වපරාක්‍රමයාණන්ගේ උදහස
පානයකෙරේවා.
ඔහුගේ මාස ගණන මැදින් සිඳිනු 21
ලැබූ කල්හි
තමාට පසුව සිටින ඔහුගේ පවුලෙන්
ඔහුට මොන සතුටක්ද?
උත්තමයන් විනිශ්චයකරන්නාවූ 22
දෙවියන්වහන්සේට
දැනගැන්ම උගන්වන්ට යමෙකුට
පුළුවන්ද?
එක්කෙනෙක් සම්පූර්ණයෙන් 23
සැපපහසු ඇතුව
මුළු ශක්තියෙන් සිටියදී මියයන්නේය.
ඔහුගේ ඇළපත් තෙලෙන් පිරී, 24
ඔහුගේ ඇටමිදුළු තෙත්ව තිබෙන්නේය.
තවත් කෙනෙක් කිසි සැපතක් නොවිඳ, 25
සිත් ශෝකයෙන් සිට මියයන්නේය.
ඔව්හු එක්ව දූවිල්ලෙහි වැදහෙති, 26
පණුවෝද ඔවුන් වසාගනිති.
බලව, නුඹලාගේ සිතිවිලිත් 27
නුඹලා අයුතුලෙස මට විරුද්ධව කරන
යෝජනාත් දනිමි.
මක්නිසාද: අධිපතියාගේ ගෘහය 28
කොතැනද කියාත්
දුෂ්ටයන් වාසයකළ කූඩාරම
කොතැනද කියාත් නුඹලා අසති.
මගයන්නන්ගෙන් නුඹලා අහලා නැද්ද? 29
එසේනම් නුඹලා ඔවුන්ගේ සලකුණු

*එනම්, මිනීවළට.

නොදන සිටිනවාද?
30 එනම් නපුරා විපත්ති දවසට ඉතුරුකර
සිටින බවත්
ඔවුන් උදහස් දවසට පිටත ගෙනයනු
ලබන බවත්ය.
31 ඔහුගේ මාර්ගය ඔහුගේ මුහුණ
ඉදිරියෙහි ප්‍රකාශකරන්නේ කවුද?
ඔහු කළ දෙයට ඔහුට විපාක දෙන්නේ
කවුද?
32 එහෙත් ඔහු පවා මිනීවළට ගෙනයනු
ලබන්නේය,
සොහොනද මුරකරනු ලැබේ.
33 මිටියාවතේ පිඩලි ඔහුට මිහිරිවන්නේය,
සියලු මනුෂ්‍යයෝ ඔහුට පස්සෙනුත්
ඔහුට පෙරටුවෙනුත්
ගණනාවක් නැතුව පෙළ නොකැඩී
යති.
34 එසේනම් නුඹලාගේ උත්තරවල බොරුව
පමණක් තිබෙද්දී
නිරර්ථකලෙස නුඹලා මා සනසන්ට
හදන්නේ කෙසේදැයි කීවේය.

## එලීපස්ගේ තුන්වෙනි කථාව

22 එකල තේමානිය එලීපස්
උත්තරදෙමින් කියනුයේ:
2 මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේට
ප්‍රයෝජනවිය හැකිද?
සැබවින් නුවණ ඇති තැනැත්තේ
තමාටම ප්‍රයෝජනවත්ව සිටියි.
3 නුඹ ධර්මිෂ්ඨව සිටියත්
සර්වපරාක්‍රමයාණන්ට එයින් කිසි
සතුටක් ඇද්ද?
නුඹ නුඹේ මාර්ග සම්පූර්ණකරගත්තත්
එයින් උන්වහන්සේට කිසි ලාභයක්
ඇද්ද?
4 උන්වහන්සේ නුඹට තරවටුකර
නුඹ සමග විනිශ්වයට පැමිණෙන්නේ
නුඹේ භක්තිය නිසාද?
5 නුඹේ දුෂ්ටකම මහත්ව තිබෙනවා
නොවේද?
නුඹේ අයුතුකම්වලට කෙළවරක් නැත.
6 මක්නිසාද නුඹ කාරණයක් නැතුව
නුඹේ සහෝදරයාගෙන් උකස්
ගත්තෙහිය,
ඇඳුම් නැත්තන්ගෙන් වස්ත්‍රය උදුරා
ගත්තෙහිය.
ක්ලාන්ත අයට නුඹ බොන්ට වතුර 7
නුදුන්නෙහිය,
බඩගිනි අයට කෑම නොදී සිටියෙහිය.
නුමුත් බලවතාට දේශය අයිති විය; 8
ගරුකටයුතු තැනැත්තේද එහි
වාසයකෙළේය.
නුඹ වැන්දඹුවන් සිස් අතින් ඇරියෙහිය, 9
පියා නැත්තන්ගේ අත්ද කඩනලද්දේය.
ඒ නිසා නුඹ වටකර මලපත් තිබෙයි, 10
හදිසි භීතිය නුඹ කලඹන්නේය,
නොහොත් නුඹට නොපෙනෙන 11
හැටියට අන්ධකාරයද
ජල රාශියද නුඹ වසාගන්නේය.
දෙවියන්වහන්සේ ස්වර්ගයේ උසස් 12
තැන්හි නොසිටිනසේක්ද?
මුදුන්ම තාරකාව කොපමණ උසදැයි
බලාපන්න!
නුඹ කථාකොට: දෙවියන්වහන්සේ 13
දන්නේ කුමක්ද?
ඝනාන්ධකාරය මැදින් සිට
උන්වහන්සේට විනිශ්වයකරන්ට
පුළුවන්ද?
උන්වහන්සේට නොපෙනෙන හැටියට 14
ඝන වලාකුල් උන්වහන්සේට
මුවාවක්ව තිබේ;
උන්වහන්සේ ආකාශ කුක්ෂිය මත්තෙහි
ගමන්කරනසේකැයි කියන්නෙහිය.
දුෂ්ට මනුෂ්‍යයන් ඇවිද්දවූ 15
පුරාණ මාවතෙහිම නුඹ
හැසිරෙන්නෙහිද?
ඔව්හු නියම කාලයට පළමුවෙන් 16
උදුරාගනු ලැබුවෝය,
ඔවුන්ගේ අත්තිවාරමද ජලප්‍රවාහයකින්
මෙන් ගහගන ගියේය.
අප වෙතින් අහක්ව ගිය මැනව 17
කියාත්
සර්වපරාක්‍රමයාණන් අපට මක්කරනවා
ඇද්ද කියාත් ඔව්හු
දෙවියන්වහන්සේට කීවෝය.
එහෙත් උන්වහන්සේ යහපත් දෙයින් 18

ඔවුන්ගේ ගෙවල් පිරෙවුසේක.
නුමුත් දුෂ්ටයන්ගේ මන්ත්‍රණය මාගෙන් දුරුව තිබේ.
19 ධර්මිෂ්ඨයෝ ඒ දැක සන්තෝෂවෙති;
නිර්දෝෂ අය අපහාසයෙන් ඔවුන්ට සිනාසී:
20 අපට විරුද්ධව නැගුටුණු අය සැබවින් සිඳිනු ලැබුවෝය,
ඔවුන්ගේ ඉතිරිවූ දෙය ගින්නෙන් දලා ගියේයයි කියති.
21 ඉතින් උන්වහන්සේ ඇඳිනගෙන සමාදනවෙයන්න.
එයින් නුඹට ශුභසිද්ධ වන්නේය.
22 උන්වහන්සේගේ මුඛයෙන් ව්‍යවස්ථාව පිළිගෙන,
උන්වහන්සේගේ වචන නුඹේ හිතේ තබාගනින්න.
23 නුඹ සර්වපරාක්‍රමයාණන් වෙතට හැරී,
අධර්මිෂ්ඨකම නුඹේ කූඩාරම්වලින් පහකළොත්, නුඹ පිහිටුවනු ලබන්නෙහිය.
24 නුඹේ ලෝභ වස්තුව ධූලියෙහිද
ඕපීර්හි රන් දොළවල ගල් අතරේද දමාපන්න;
25 එවිට සර්වපරාක්‍රමයාණෝ නුඹේ වස්තුවද
නුඹට අනර්ඝ රිදීද වනසේක.
26 මක්නිසාද එකල නුඹ සර්වපරාක්‍රමයාණන් කෙරෙහි ප්‍රීතිමත්වී,
නුඹේ මුහුණ දෙවියන්වහන්සේ දෙසට ඔසවනවා ඇත.
27 නුඹ උන්වහන්සේට යාච්ඤාකරන කල උන්වහන්සේ නුඹට උත්තර දෙනවා ඇත;
නුඹද නුඹේ භාර ඉෂ්ටකරනවා ඇත.
28 නුඹ කාරණයක් නියමකරගත් කල්හි ඒක නුඹට ස්ථිරවන්නේය;
නුඹේ මාර්ග කෙරෙහිද එළිය බැබළෙන්නේය.
29 ඔවුන් පහකරනු ලබන විට: උසස්වීම ඇත කියා නුඹ කියන්නෙහිය;
උන්වහන්සේද යටහත් ඇස් ඇති අය ගළවනසේක.
30 නිදෙස් නොවන තැනැත්තා පවා
උන්වහන්සේ මුදනසේක;
එසේය, නුඹේ අත්වල පිරිසිදුකම නිසා ඔහු මුදනු ලැබේයයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

**23** එවිට යෝබ් උත්තරදෙමින් කියනුයේ:
අද දක්වාම මාගේ විලාපය දුක්ඛිතය; 2
මට වැදී තිබෙන පහර මාගේ කෙඳිරිගෑමට වඩා බරය.
අහෝ උන්වහන්සේගේ ආසනය 3
ළඟටම පැමිණ,
උන්වහන්සේ සම්බවෙන්ට පුළුවන් තැන දනගන්ට ඇත්නම්!
එවිට උන්වහන්සේ ඉදිරියෙහි මාගේ 4
නඩුව පිළිවෙළට තබන්නෙමි,
මාගේ මුඛයද තර්කවලින් පුරවන්නෙමි.
උන්වහන්සේ මට උත්තරදෙන වචන 5
දනගන්නෙමි,
මට කියන දේ තේරුම්ගන්නෙමි.
උන්වහන්සේ තමන් බලයේ 6
මහත්කමින් මා සමග විවාදකරනවා ඇද්ද?
නැත, උන්වහන්සේ මට ඇහුම්කන් දෙනවා ඇත.
එහිදී ධර්මිෂ්ඨ අයට උන්වහන්සේ 7
සමග කාරණා කියා සිටින්ට පුළුවන;
මෙසේ මාගේ විනිශ්චයකාරයාණන්ගෙන් සදකාලයටම මිදෙන්ට මට පුළුවන්වන්නේය.
නුමුත් මා ඉස්සරහට ගියත් උන්වහන්සේ 8
එහි නැත;
මා පස්සට ගියත් උන්වහන්සේ දකින්ට නොහැකිවෙමි.
වම් පැත්තෙහි උන්වහන්සේ ක්‍රියා කරන 9
කල උන්වහන්සේ දකිනු නොහැක්කෙමි.
දකුණු පැත්තෙහිද මට නොපෙනෙන ලෙස උන්වහන්සේ සැඟවෙනසේක.
එහෙත් උන්වහන්සේ මා යන මාර්ගය 10
දන්නාසේක;
උන්වහන්සේ මා පරීක්ෂාකළ කල්හි මම රන් මෙන් නික්ම එන්නෙමි.
මාගේ පාදය උන්වහන්සේගේ අඩිපාර 11

අනුවම ගියේය;
මම අහක් නොවී උන්වහන්සේගේ
මාර්ගයෙහිම ගියෙමි.
12 උන්වහන්සේගේ තොල්වල ආඥාවෙන්
අහක්ව නොගොස්,
*මාගේ වුවමනා ආහාරයට වඩා
උන්වහන්සේගේ මුඛයේ වචන
අගේ කොට තබාගතිමි.
13 එහෙත් උන්වහන්සේගේ අදහස
එකක්මය, උන්වහන්සේ හරවන්නේ
කවුද?
තමන්වහන්සේගේ සිතට කැමති
දෙයම උන්වහන්සේ කරනසේක.
14 එසේය, මා ගැන නියමකර තිබෙන
දේ උන්වහන්සේ ඉෂ්ටකරනසේක.
එබඳු බොහෝ කාරණා උන්වහන්සේ
වෙත තිබේ.
15 එබැවින් මම උන්වහන්සේ ඉදිරියෙහි
කැලඹෙමි;
කල්පනාකරන කල උන්වහන්සේ ගැන
භයවෙමි.
16 දෙවියන්වහන්සේ මාගේ සිත ක්ලාන්ත
කළසේක,
සර්වපරාක්‍රමයාණෝ මා කැලඹූසේක.
17 ඒ වනාහි අන්ධකාරය පැමිණෙන්ට
මත්තෙන් මා සිඳිනු නොලැබූ නිසාත්
උන්වහන්සේ මාගේ මුහුණෙන්
ඝනාන්ධකාරය නොසැඟෙවූ නිසාත්ය.

24 සර්වපරාක්‍රමයාණන් විසින්
කාලයන් නියමකර නැත්තේ
මන්ද?
උන්වහන්සේ අඳුනන අය
උන්වහන්සේගේ දවස් නොදකින්නේ
මන්ද?
2 මායිම් පහකරන්නාවූ අය සිටිති;
ඔව්හු මෘග රැළවල් පැහැරගෙන
ගොස් තණ කවති.
3 ඔව්හු පියා නැත්තාගේ කොටළුවා
දක්කාගන යති,
වැන්දඹුවගේ හරකා උකසට ගනිති.
4 ඔව්හු දිළිඳුන් මාර්ගයෙන් හරවති.
පොළොවේ දුප්පත් සියල්ලෝ එක්ව
සැඟවෙති.
5 කාන්තාරයේ වල් කොටළුවන් මෙන්

*නොහොත්, මාගේම නියෝගයකට වඩා.

ඔව්හු කෑම සොයමින්ම තමුන්ගේ
වැඩේට පිටත්ව යති;
මරුකතර ඔවුන්ගේ දරුවන්ට කෑම
දෙයි.
ඔව්හු කෙතේ කවුඩර බෝග කපාගනිති; 6
දුෂ්ටයාගේ මිදිවත්තේ ඉතිරි ඵලද
අවුලාගනිති.
ඔව්හු රෑ මුළුල්ලේ වස්ත්‍ර නැතුව නග්නව 7
ලගිති,
ශීතලට වැස්මකුත් ඔවුන්ට නැත.
ඔව්හු කඳුවල වැස්සට තෙමී, 8
මුවාවක් නැති හෙයින් පර්වතයට
ඇලී හිඳිති.
පියා නැත්තා ළයෙන් උදුරාගන්නොත් 9
අසරණයාගෙන් උකසක් ගන්නොත්
ඇත.
එබැවින් ඔව්හු ඇඳුම් නැතුව නග්නව 10
ඇවිදිති,
සාගින්නෙන් යුක්තව ගොයම් මිටි
ගෙනයති;
ඒ මනුෂ්‍යයන්ගේ තාප්ප ඇතුළෙහි 11
ඔව්හු තෙල් හිඳිති;
මිදි යන්ත්‍ර පාගමින් පිපාසය විඳිති.
ජනගහනවූ නුවර තුළ සිට මිනිස්සු 12
කෙඳිරිගාති,
තුවාලවූවන්ගේ ආත්මද මොරගසති.
එහෙත් දෙවියන්වහන්සේ ඒ වරද
නොසලකනසේක.
මොව්හු ආලෝකයට විරුද්ධව කැරළි 13
ගසන්නෝ වෙති;
මොව්හු ඒකේ මාර්ගයන් නොදනිති,
ඒකේ මාවත්වල නොපවතිති.
මිනීමරුවා එළිවෙන විටම නැගිට 14
අසරණයාත් දිළින්දත් මරන්නේය;
රාත්‍රියේ ඔහු සොරෙකු මෙන් වේ.
කාමමිථ්‍යාචාරිකයාගේ ඇසද 15
ඇඳිරිවෙන තුරු බලා සිට:
කිසි ඇසකට මා නොපෙනෙන්නේය
කියා
ඔහු තමාගේ මුහුණේ වැස්මක් දමාගනී.
ඔව්හු අන්ධකාරයේදී ගෙවල් උමංකණිති. 16
දවාලෙහි සැඟවී ඉඳිති;
ඔව්හු එළිය නොදනිති.
මක්නිසාද පහන්වීම ඔවුන් සියල්ලන්ට 17
මරණ සෙවණ වැනිය;

මක්නිසාද ඔව්හු මරණ සෙවණේ
භයංකරකම් දනිති.
18 ඔහු වනාහි ජලය මතුපිට තිබෙන
සැහැල්ලු දෙයක් මෙන්ය;
ඔවුන්ගේ කොටස පොළොවෙහි
ශාපලත් එකක්ය.
මිදිවතු දෙසට ඔහු නොහැරෙයි.
19 නියඟය හා ග්‍රීෂ්මය හිම වතුර
සිඳදමන්නේ යම්සේද,
*මෙයෝල වනාහි පව්කළ අයට එසේම
කරන්නේය.
20 ඔහු වැදූ තැනැත්තී ඔහුව මතක
නැතිකරයි; ඔහු පණුවන්ට මිහිරි
කෑමක් වන්නේය.
ඔහු තවත් සිහි නොවන්නේය.
අධර්මිෂ්ඨකමද ගහක් මෙන්
කඩාදමනු ලබන්නේය.
21 දරුවන් නොවදන වඳ ස්ත්‍රියට ඔහු
පීඩාකරයි;
වැන්දඹුවට යහපත කරන්නෙත් නැත.
22 ඔහු තමාගේ බලයෙන් බලවත් අය
අහකට ඇද දමයි.
ඔහු නැගිටින කල කිසිවෙකුට තමාගේ
ජීවිතය ගැන විශ්වාසයක් නැත.
23 දෙවියන්වහන්සේ ඔවුන්ට සුවසේ
සිටින්ට දෙන විට ඔව්හු නිශ්චලව
සිටිති;
උන්වහන්සේගේ ඇස් ඔවුන්ගේ
මාර්ග දෙස තිබෙයි.
24 ඔව්හු උසස්වෙන නුමුත් ටික කලකින්
නැතුව යති;
එසේය, ඔව්හු පහත්කරනු ලැබ අන්
සියල්ලන් මෙන් තුරන්ව යති,
ගොයම් කරල් මෙන් කපනු ලබති.
25 ඒ එසේ නොවේනම් මා
බොරුකාරයෙක් බව ඔප්පුකොට
මාගේ කථාව නිෂ්ප්‍රභාකරන්නේ
කවුදැයි කීවේය.

## බිල්දද්ගේ තුන්වෙනි කථාව

25 එවිට ෂූහියවූ බිල්දද් උත්තර
දෙමින් කියනුයේ:
2 අධිපතිකමද භයංකරකමද උන්වහන්සේ
වෙත තිබේ;
උන්වහන්සේ තමන් උස් තැන්වලදී

*හෙවත්, මිනීවළ.

සමාදනය සිදුකරනසේක.
උන්වහන්සේගේ සමූහවලට ගණනක් 3
තිබේද?
උන්වහන්සේගේ එළිය නොපායන්නේ
කා කෙරෙහිද?
එසේනම් මනුෂ්‍යයා දෙවියන්වහන්සේ 4
ඉදිරියෙහි ධර්මිෂ්ඨවන්නේ
කොහොමද?
නොහොත් ස්ත්‍රියෙකුගෙන් උපන්
තැනැත්තා පවිත්‍රවන්නේ කොහොමද?
බලව, චන්ද්‍රයා පවා දීප්තිමත් නොවේ; 5
තාරකාද උන්වහන්සේ ඉදිරියෙහි
පිරිසිදු නොවෙති.
පණුවෙක් වැනිවූ මනුෂ්‍යයාත් 6
පණුවෙක් වැනිවූ මනුෂ්‍ය පුත්‍රයාත්
ඊට කොපමණ වැඩියෙන් එසේ
නොවන්නේදැයි කීවේය.

## යෝබ්ගේ උත්තරය

26 එවිට යෝබ් උත්තරදෙමින්
කියනුයේ:
නුඹ ශක්තිය නැත්තාට උපකාරකළ 2
හැටි!
බලය නැති හස්තය මුදුදුන් හැටි!
නුවණ නැත්තාට දනුමැතිකම් දී, 3
සැබෑ දනගැන්ම බොහෝසෙයින්
ප්‍රකාශකළ හැටි!
නුඹ කාට වචන කීවෙහිද? 4
නුඹෙන් නික්ම ආවේ කාගේ
*ආත්මයද?
ජලය හා එහි වැසියන්ට යටින් 5
නැසීගිය අය වෙව්ලති.
†මෙයෝල උන්වහන්සේ ඉදිරිපිට ඇරී 6
තිබේ,
‡අබද්දෙනටද වැස්මක් නැත.
උන්වහන්සේ ගුවන්තලය මතුයෙහි 7
උතුරු ප්‍රදේශය දිගහරිනසේක,
පොළොවද අවකාශයෙහි එල්ලා
තබනසේක.
උන්වහන්සේ තමන්ගේ ඝන 8
වලාකුල්වල වතුර බැඳ තබනසේක;
වලාකුළද ඒ යටින් නොපැළෙයි.

*හෙවත්, හුස්ම.
†එනම්, මිනීවළ.
‡එනම්, විනාශය.

9 උන්වහන්සේ තමන් වලාකුළ අතුරා,
සිංහාසනය නොපෙනෙන ලෙස
වසනසේක.
10 එළිය අඳුරට මාරුවෙන මායිම දක්වා
උන්වහන්සේ ජල මතුයෙහි වක්‍රයක්
ඇඳ තිබේ.
11 උන්වහන්සේගේ තරවටුවට
අහසේ කණු වෙවුලා ත්‍රස්තවෙති.
12 උන්වහන්සේ තමන්ගේ බලයෙන්
මුහුද *නිශ්චලකරනසේක;
තමන්වහන්සේගේ නුවණින් †රාහබ්ට
ඇන දමනසේක.
13 උන්වහන්සේගේ ආත්මය
කරණකොටගෙන අහස අලංකාරව
තිබේ;
උන්වහන්සේගේ අත ශීඝ්‍ර සර්පයා
තුවාලකළසේක.
14 මේ වනාහි උන්වහන්සේගේ මාර්ගවල
අල්පමාත්‍රයක් පමණකි.
එයින් අපට ඇසෙන්නේ කෙතරම්
හීන් ශබ්දයක්ද!
එසේනම් උන්වහන්සේගේ
පරාක්‍රමයේ ගර්ජනාව තේරෙන්නේ
කාටදැයි කීවේය.

27 නැවත යෝබ් තමාගේ කථාව
පටන්ගෙන කියනුයේ:
2 මාගේ යුක්තිය වැළැක්වූ
දෙවියන්වහන්සේද
මාගේ ආත්මය ශෝකකළාවූ
සර්වපරාක්‍රමයාණන්ද ජීවමාන බව
සැබෑවා සේම,
3 (මාගේ හුස්ම මා තුළේද,
දෙවියන්වහන්සේ දුන් පණ මාගේ
නාසේද තිබෙන තුරුම,)
4 සැබවින් මාගේ තොල්වලින්
අධර්මිෂ්ඨ දෙයක් නොකියන්නෙමි,
මාගේ දිවෙන් ප්‍රයෝගයක්
නොනික්මවන්නෙමි.
5 නුඹලා නිදෙස්කිරීම මාගෙන් දුරුවේවා.
මා නසින තුරුම මාගේ අවංකකම
පහ නොකරන්නෙමි.
6 මාගේ ධර්මිෂ්ඨකම අත්නැර ඒක
අල්ලාගනම සිටින්නෙමි.

මට දිවි ඇති තාක් මාගේ සිත මට
වරද නොතබන්නේය.
මාගේ සතුරා දුෂ්ටයෙකු මෙන්ද 7
මාගේ විරුද්ධකාරයා අධර්මිෂ්ඨයෙකු
මෙන්ද වේවා.
අභක්තිකයා කොල්ලකාගන්න නුමුත්, 8
දෙවියන්වහන්සේ ඔහුගේ ප්‍රාණය
අහක්කරගන්න විට ඔහුගේ
බලාපොරොත්තුව කුමක්ද?
විපත ඔහු පිටට පැමිණෙන විට 9
දෙවියන්වහන්සේ ඔහුගේ හඬගෑසීම
අසනවා ඇද්ද?
ඔහු සර්වපරාක්‍රමයාණන් තුළ ප්‍රීතිවී, 10
නිතරම දෙවියන්වහන්සේට
යාච්ඤාකරනවා ඇද්ද?
සර්වපරාක්‍රමයාණන් වෙත තිබෙන දේ 11
නොසඟවා,
දෙවියන්වහන්සේගේ හස්තය ගැන
නුඹලාට උගන්වන්නෙමි.
බලව, නුඹලා සියල්ලෝම එය 12
දුටුවෝය;
එසේනම් නුඹලා මෙසේ නිෂ්ඵල දේ
කථාකරන්නේ මක්නිසාද?
දෙවියන්වහන්සේගෙන් දුෂ්ට 13
මනුෂ්‍යයෙකුට ලැබෙන කොටසත්
බලාත්කාරකාරයන්ට
සර්වපරාක්‍රමයාණන්ගෙන් ලැබෙන
උරුමයත් මේය.
ඔහුගේ දරුවන් බෝවෙතත් ඒ 14
කඩුවටය;
ඔහුගෙන් පැවත එන්නෝද කෑමෙන්
තෘප්තියට නොපැමිණෙන්නෝය.
ඔහුගෙන් ඉතුරු අය වසංගතයෙන් 15
මිනීවළට පත්වන්නෝය,
ඔහුගේ වැන්දඹුවෝද
නොවැලපෙන්නෝය.
ඔහු පස් වාගේ රිදී ගොඩකරගන, 16
මැටි වාගේ වස්ත්‍ර සපයාගත්තත්,
ඔහු සපයන ඒවා ධර්මිෂ්ඨයා ඇඳගන, 17
නිර්දෝෂ අය ඒ රිදී බෙදාගන්නවා
ඇත.

*නොහොත්, චංචලකරනසේක.
†එනම්, උඩඟුකම හෙළාදමනසේක.

18 *කාවා මෙන්ද පැල් රකින්නා සාදන
මඩුවක් මෙන්ද
ඔහු තමාගේ ගෙය ගොඩනගයි.
19 ඔහු පොහොසත්ව සැතපෙන නුමුත්
†තවත් එසේ නොකරන්නේය;
ඔහු තමාගේ ඇස් ඇර බලන්නේය,
එවේලේම නැතිවී යන්නේය.
20 භයානකකම් ජලයන් මෙන් ඔහු පිටට
පැමිණෙන්නේය;
රාත්‍රියේදී කුණාටුවක් ඔහු පැහැරගෙන
යන්නේය.
21 පෙරදිග සුළඟින් ඔහු ගෙනයනු
ලබන්නේය, ඔහුද පහව යයි;
එය ඔහුගේ ස්ථානයෙන් ඔහු හෙළා
දමයි.
22 ඔහු දෙවියන්වහන්සේගේ හස්තය
කෙරෙන් පලායන්ට හදන නුමුත්,
උන්වහන්සේ ඔහුට කරුණා නොකොට
ඔහු පිටට පහර එවනවා ඇත.
23 මනුෂ්‍යයෝ අත්පිඩිගසා නිග්‍රහකොට
ඔහුගේ ස්ථානයෙන් ඔහු පන්නා
දමන්නාහුය.

(දිව්‍ය ප්‍රඥාවේ රහස.)

28 සැබවින් රිදී තිබෙන
ආකරයක්ද
පිරිසිදුකරන රනට ස්ථානයක්ද තිබේ.
2 යකඩ පොළොවෙන් හාරාගනු ලැබේ.
ගල් උණුකර පිත්තල ලබාගනිති.
3 මනුෂ්‍යයා අන්ධකාරය පහකොට
ඝනාන්ධකාරයෙන් මරණ සෙවණෙන්
ගල් තීන්දුවටම සොයයි.
4 මිනිසුන් වාසයකරන තැනට දුරින්
ඔහු පොළොව හාරා බසියි;
ඔව්හු මනුෂ්‍යයන්ගෙන් ඈත්ව, පාදයට
නොදැනෙන හැටියට
එල්ලී ඉද එහා මෙහා පදිති.
5 පොළොවෙන් කෑම හටගනියි.
නුමුත් ඇතුළත ගින්නෙන් මෙන්
පෙරළා තිබේ.

ඒකේ ගල් අතරේ නීලමාණික්‍යද 6
රන් සුණුද තිබේ.
ඒ මාවත කිසි පක්ෂියෙක් නොදනියි, 7
උකුස්සාගේ ඇසට ඒක නොපෙනුණේය.
චණ්ඩ මෘගයෝ එහි පය 8
නොතැබුවෝය,
රෞද්‍ර සිංහයෙක්ද ඒ ළඟින් නොගියේය.
ඔහු තමාගේ අත ගිනිගල් පර්වතයට 9
විරුද්ධව දිගුකොට,
කඳු මුලින්ම පෙරළන්නේය.
ඔහු පර්වතවල දිය පාරවල් කපා 10
සියලු ආකාර අනර්ඝ දේ තමාගේ
ඇසින් දකින්නේය.
නොවෑස්සෙන හැටියට ඔහු ගංගා 11
අහුරයි;
සැඟවී තිබෙන දේ එළියට ගෙනෙයි.
නුමුත් ප්‍රඥාව සම්බවන්නේ කොතැන්හිද? 12
නුවණ තිබෙන තැන කොහේද?
මනුෂ්‍යයා ඒකේ අගය නොදනියි; 13
ජීවතුන්ගේ දේශයෙහි ඒක සම්බනොවෙයි.
ඒක මා තුළ නැතැයි ගැඹුර කියන්නේය. 14
ඒක මා වෙත නැතැයි මුහුදත්
කියන්නේය.
රත්රන් දීලා ඒක ගන්ට බැරිය, 15
ඒකේ වටිනාකමට රිදී කිරා දීලාවත්
එය ලබාගත නොහැකිය.
ඒක ඕෆීර්හි රනින්වත් 16
අනර්ඝ තබමාණික්‍යයෙන්වත් නීල
කාන්තයෙන්වත් මිලකරන්ට බැරිය.
රන්වත් වීදුරුවත් ඊට සමාන නොවේ; 17
පවිත්‍ර රන් ආභරණවලට ඒක
මාරුකරන්ට බැරිය.
රතුකැට සහ පළිඟු සඳහන්කරන්ටවත් 18
වුවමනා නැත.
එසේය, ප්‍රඥාව මුතුවලටත් වඩා අගේය.
කූෂ්හි පුෂ්පරාග ඊට සමාන නොවේ. 19
පවිත්‍ර රනින් ඒකේ අගය
නියමකරන්ට බැරිය.
එසේ වී නම් ප්‍රඥාව පැමිණෙන්නේ 20
කොතැනින්ද?
නුවණ තිබෙන තැන කොහේද?

*නොහොත්, මකුළුවා.
†නොහොත්, වළලනු නොලබන්නේය.

21 ඒක පණ ඇති සියල්ලන්ගේ ඇස්වලට නොපෙනී,
ආකාශ පක්ෂීන්ගෙන්ද සැඟවී තිබේ.
22 ඒකේ කීර්තිය අපේ කන්වලින් ඇසීමුයයි
*විනාශයත් මරණයත් කියති.
23 ඒකේ මාර්ගය දෙවියන්වහන්සේට තේරුම් තිබේ,
එය තිබෙන ස්ථානයද උන්වහන්සේ දන්නාසේක.
24 මක්නිසාද උන්වහන්සේ පොළොවේ කෙළවරවල් දක්වා බලා,
අහස යට සියල්ල දකිනසේක.
25 උන්වහන්සේ හුළඟ නිසි බරට හදන්ටත්,
ජලයත් මිම්මකින් මනින්ටත්,
26 වර්ෂාවට නියෝගයක්ද
ගර්ජනාවේ විදුලියට මාර්ගයක්ද සාදන්ටත් යෙදුණු විට,
27 උන්වහන්සේ ඒක දක කියාදුන්සේක;
ඒක ස්ථිරකර සෝදිසිකළසේක.
28 උන්වහන්සේ මනුෂ්‍යයාට කථාකොට:
ප්‍රඥාව නම් ස්වාමීන්වහන්සේ කෙරෙහි භයින් සිටීමත්
නුවණ නම් නපුරෙන් වැලකී සිටීමත්යයි වදාළසේකැයි කීවේය.

(ඉහතදී යෝබ්ට තිබුණු සැපත හා උසස් භාවය.)

29 නැවතත් යෝබ් තමාගේ කථාව පටන්ගෙන කියනුයේ:
2 අනේ, ඉස්සර මාස වන දෙවියන්වහන්සේ මා රැකවල්කළ දවස්වලදී මෙන්
මට සිටින්ට ඇත්නම්!
3 එකල උන්වහන්සේගේ පහන මාගේ හිසට උඩින් බැබළුණේය,
මමද උන්වහන්සේගේ එළියෙන් අන්ධකාරය මැදින් ගියෙමි;
4 මාගේ සරත් කාලයෙහි මා සිටි ලෙසම සිටින්ට ඇත්නම්!
එකල දෙවියන්වහන්සේගේ *මිත්‍රලාභය මාගේ කූඩාරම කෙරෙහි තිබුණේය;
සර්වපරාක්‍රමයාණෝ ඒ දක්වා මා සමග සිටිසේක, 5
මාගේ දරුවෝද මා වටකර සිටියෝය.
එකල මාගේ පියවර ගිතෙලින් සෝදගතිමි, 6
පර්වතයෙන්ද තෙල් ගංගා මා වෙත ගලා ආවේය.
මා නුවර දොරටුව ළඟට නික්ම ගොස් 7
එළිමහනෙහි මාගේ ආසනය තැබූ කල,
තරුණයෝ මා දැක සැඟවුණෝය, 8
මහල්ලෝද නැගිට සිටියෝය.
අධිපතීහු කථාව නවත්වා සිටියෝය, 9
අතින් තමුන්ගේ කට වසාගත්තෝය.
උත්තමයින්ගේ හඬ නැවතී, 10
ඔවුන්ගේ දිව ඔවුන්ගේ උඩුතල්ලේ ඇලුණේය.
මක්නිසාද කන ඇසූ කල්හි මට ආශීර්වාදකෙළේය; 11
ඇසද මා දුටු කල්හි මා ගැන වර්ණනාකෙළේය.
මක්නිසාද හඬා සිටි අසරණයාද 12
පියා නැත්තා සහ උපකාරකාරයෙක් නැත්තාද ගැළෙවුවෙමි.
නාස්තිවෙන්ට ළංව සිටි අයගේ 13
ආශීර්වාදය මා පිටට පැමුණුණේය.
වැන්දඹුවගේ සිතත් ප්‍රීතියෙන් පිනායන්ටද සැලැස්වීමි.
මම ධර්මිෂ්ඨකම පැළඳගතිමි, එයද 14
මා පැළඳගත්තේය;
මාගේ යුක්තිය සළුවක්ද මකුටයක්ද මෙන් තිබුණේය.
මම අන්ධයාට ඇස්ව 15
කොරාට පාදව සිටියෙමි.
මම දිළිඳුට පියෙක් වීමි; 16
මා නොදන්න සිටි අයගේ කාරණය සොයා බැලීමි.
මම අධර්මිෂ්ඨයාගේ හක්ක බිඳදමා, 17
ඔහුගේ දත්වලින් ගොදුර උදුරා හැරියෙමි.

*පරිච්ඡේද 26.6 බලනු.

*එනම්, සමෘද්ධිය ඇතිවූ කාලය.

18 එවිට මම කථාකොට: මාගේ
කැදැල්ලෙහි නසින්නෙමි,
මාගේ දවස්ද වැලි මෙන් වැඩිවන්නේය.
19 මාගේ මුල ජලය දක්වා පැතිර ගියේය,
පිනිද රෑ මුළුල්ලේ මාගේ අත්ත පිට
පවතින්නේය.
20 මාගේ ඉසුර මා කෙරෙහි අමුව තිබේ,
මාගේ දුන්නද මාගේ අතෙහි
අලුත්වන්නේයයි කීමි.
21 මනුෂ්‍යයෝ මට ඇහුම්කන්දී බලාසිට,
මාගේ දැනමුතුකම ලබන්ට
නිශ්ශබ්දවුණෝය.
22 මාගේ වචනවලට පසු ඔව්හු කථා
නොකර සිටියෝය;
මාගේ කථාව පිනි මෙන් ඔවුන් පිට
වැටුණේය.
23 වැස්ස ගැන මෙන් ඔව්හු මා ගැන
බලාසිටියෝය;
අන්තිම වර්ෂාව ගැන මෙන් තමුන්ගේ
මුඛය ඇරගන සිටියෝය.
24 මා සිනාසී ඔවුන් දෙස බැලූ කල
ඔව්හු විශ්වාස නොකළෝය;
මාගේ මුහුණේ එළියද නොසලකා
නොසිටියෝය.
25 මම ඔවුන්ගේ මාර්ගය නියමකරදී,
ප්‍රධානියාව හිඳ,
සමුද්‍රවෙහි රජෙකු මෙන්ද
වැලපෙන්නන් සනසන්නෙකු මෙන්ද
වාසයකෙළෙමි.

(තමාට දැනට තිබෙන විපත.)

30 නුමුත් දැන් වයසින් මට වඩා
බාලයෝ මට සරදම්කරති,
ඔවුන්ගේ පියවරුන් මාගේ මෑග
රැළේ බල්ලන් සමග සිටවන්ටවත්
වටියයි නොසිතුවෙමි.
2 එසේය, ඔවුන්ගේ අත්වල ශක්තියෙන්
මට ඇති කම මොකද?
ඔව්හු වනාහි බලය පිරිහී ගියාවූ
මනුෂ්‍යයෝය.
3 හිඟකමද සාගතයද නිසා ඔව්හු
කෘශව සිටිති;
ඔව්හු පාළුවූ නිස්සාරවූ අඳුරු ඉඩම්වලදී,
*වියළි බිම්හි කෑම සොයමින්,
ලුණු ගස් පඳුරු පිටින් උදුරාගනිති; 4
රොතෙම් මුල් ඔවුන්ගේ කෑම වේ.
ඔව්හු මනුෂ්‍යයන් අතරෙන් එළවනු 5
ලබති;
මනුෂ්‍යයෝ සොරෙකුට මෙන් ඔවුන්ට
විරුද්ධව කෑගසමින් ඔවුන්
ලුහුබඳිති.
අඳුරු මිටියාවත් කුහරවලද 6
පොළොවේත් පර්වතවලත් ගුහාවලද
ඔව්හු වාසයකෙරෙති.
පඳුරු අතරේ ඔව්හු මොරගසති, 7
කටුගස් යට ලගිති.
ඔව්හු මෝඩයන්ගේ පුත්‍රයෝය, 8
එසේය, නීචයන්ගේ පුත්‍රයෝය;
ඔව්හු දේශයෙන් තල්ලුකරදමනු
ලැබුවෝය.
දැන් වනාහි මම ඔවුන්ගේ ගීතිකාව වී 9
සිටිමි,
එසේය, ඔවුන්ට නින්ද පාඨයක්ව
සිටිමි.
ඔව්හු මා පිළිකුල්කොට මාගෙන් 10
දුරුවෙති,
මාගේ මුහුණ ඉදිරියෙහි කෙළගසන්ට
භය නැත්තෝය.
උන්වහන්සේ තමන්ගේ පටිය ලිහා 11
මට පීඩාකළ බැවින්,
ඔව්හු මා ඉදිරියෙහි කටකලියාව අහක
දැමුවෝය.
මාගේ දකුණු පැත්තෙහි කොලුරැළක් 12
නැගිටිති;
ඔව්හු මාගේ පාද තල්ලුකරදමති,
මට විරුද්ධව ඔවුන්ගේ විනාශකාර
මාර්ග ගොඩකරති.
ඔව්හු මාගේ පාර පෙරළාදමති, 13
උදව්කාරයෙක් නැතුව සිටියදී,
ඔව්හු මාගේ විපත්තිය වැඩිකරති.
ඔව්හු පළල් කපල්ලකින් මෙන් වැද, 14
බිඳුණු තැන මැදින් මා පිටට පෙරළී
එති.

*නොහොත්, මරුකතරෙන් යන්තම්
රක්ෂාවෙමින්.

15 භයානකකම් මා පිටට හැරී තිබේ;
ඒවා සුළඟ මෙන් මාගේ ගරුත්වය
ලුහුබැඳ එති;
මාගේ ඉසුර වලාකුළක් මෙන් පහව
ගියේය.
16 දැන් මාගේ ආත්මය මා තුළ වැගිරෙයි;
විපත්ති දවස් මා අල්ලාගත්තේය.
17 රාත්‍රියේදී මාගේ ඇට මා තුළ සිදුරුවේ;
මා විකාකන වේදනාවෝ විශ්‍රාම
නොගනිති.
18 මාගේ රෝගයේ තදකම නිසා මාගේ
වස්ත්‍රය දුර්වර්ණවී තිබේ.
මාගේ සළුවේ කරපටිය මෙන් එය
මා වටේ ඇලී තිබේ.
19 උන්වහන්සේ මා මඩේ හෙළුසේක,
මම දූවිලි සහ අළු මෙන් වී සිටිමි.
20 මා ඔබට හඬගසන නුමුත් ඔබ මට
උත්තර නොදෙනසේක;
මා නැගිට සිටින නුමුත් ඔබ මා දෙස
නිකම් බලාසිටිනසේක.
21 ඔබ මට කෲරතර වී සිටිනසේක,
ඔබගේ අතේ බලයෙන් මට
පීඩාකරනසේක.
22 ඔබවහන්සේ මා සුළඟට අසුකරදී,
ගසාගන ගොස්,
කුණාටුවෙන් දියවෙන්ට
සලස්වනසේක.
23 මක්නිසාද ඔබ මරණයටත්
ජීවත්ව සිටින සියල්ලන්ට නියමවූ
ගෙටත් මා පමුණුවන බව දනිමි.
24 සැබවින් උන්වහන්සේ ජරාවාස පස්
ගොඩකට විරුද්ධව තමන් අත දිගු
නොකරනසේක;
මේ කාරණා නිසා තමාගේ විනාශයේදී
වුවත් යමෙකුට
මොරගැසිය හැක්කේය.
25 දුකට පත්වූ අය ගැන මා වැලපුණේ
නැද්ද?
දිළිඳුන් ගැන මාගේ ආත්මය ශෝක
නොවීද?
26 මා විසින් සැපත බලාසිටි කල විපත
පැමිණියේය;
එළිය ගැන බලාසිටිද්දී අන්ධකාරය
පැමිණියේය.
මාගේ බඩවැල් නොනැවතී වංචල 27
වෙති;
විපත්ති දවස් මා පිටට පැමිණ තිබේ.
මම අව්වෙන් නොව ශෝකයෙන් 28
කළුවී ඇවිදිමි;
සභාවෙහි නැගිට පිහිට ඉල්ලා කෑගසමි.
මම සිවලුන්ට සහෝදරයෙක්ද 29
පැස්බරුන්ට සමාගම්කාරයෙක්ද වී
සිටිමි.
මාගේ හම කළුවී මා කෙරෙන් 30
වැටෙන්නේය,
මාගේ ඇට උෂ්ණයෙන් දැවෙන්නේය.
එබැවින් මාගේ වීණාව වැලපීමටත් 31
මාගේ නළාව හඬන්නන්ගේ ශබ්දයටත්
මාරුවී තිබේ.

(යෝබ්ගේ නිර්දෝෂකම කියා සිටීම.)

31

මාගේ ඇස් සමග ගිවිසුමක්
කෙළෙමි;
එබැවින් කන්‍යාවක් දෙස බලන්නේ
කොහොමද?
ඉහළ සිටින දෙවියන්වහන්සේගෙන් 2
ලැබෙන කොටසත්
උසස් තැන්හි සිටින
සර්වපරාක්‍රමයාණන්ගෙන් ලැබෙන
උරුමයත් කිමෙක්ද?
අධර්මිෂ්ඨයාට විනාශයත් 3
අයුතුකම්කරන්නන්ට විපත්තියත්
නොවේද?
උන්වහන්සේ මාගේ මාර්ග දැක, 4
මාගේ සෑම අඩි ගණන්කරනවා
නොවේද?
මා බොරුකාරකමෙන් හැසිරෙන්ටත් 5
මාගේ පය වංචාවට ඉක්මන්වෙන්ටත්
යෙදුණා නම්,
(උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නමැති 6
තරාදියෙන් මා කිරාබලනසේක්වා,
එවිට දෙවියන්වහන්සේ මාගේ
අවංකකම දැනගන්නවා ඇත;)
මාගේ අඩිය මාර්ගයෙන් අහක්ව 7
යන්ටත්,
මාගේ සිත මාගේ ඇස් අනුව යන්ටත්,

මාගේ අත්වලට කිසි කිලුටක්
ඇලෙන්ටත් යෙදුණා නම්,
8 මා වපුරන ඒවා වෙන කෙනෙක්
අනුභව කෙරේවා;
එසේය, මාගේ කෙතේ අස්වැන්න
උදුරාදමනු ලැබේවා.
9 මාගේ සිත ස්ත්‍රියෙක් කෙරෙහි ඇදී
ගියේ නම්,
මම මාගේ අසල්වාසියාගේ දෙරකඩ
ළඟ රැක සිටියෙම් නම්,
10 මාගේ භාර්යාව වෙන කෙනෙකුට
ධාන්‍ය අඹරාවා,
අන්‍යයෝද ඈ සමග
සයනයකෙරෙත්වා.
11 මක්නිසාද එය දූෂ්‍ය අපරාධයක්ය;
එසේය, එය විනිශ්චයකාරයන් විසින්
දඬුවම්කළ යුතුවූ අයුතුකමක්ය.
12 එය විනාශය දක්වාම දවන ගින්නක්ය,
එයින් මාගේ මුළු සම්පත උදුරාදමනු
ලබන්නේය.
13 මාගේ වැඩකාරයාවත් වැඩකාරීවත්
මා සමග විවාදකරන විට
මම ඔවුන්ගේ යුක්තිය නොසලකා
ඇරියෙම් නම්,
14 දෙවියන්වහන්සේ නැගිටින විට මම
කුමක් කරම්ද?
උන්වහන්සේ විභාගකරන කල මා
කවර උත්තරයක් දෙන්ටද?
15 කුසෙහි මා සෑදූ උන්වහන්සේ ඔහුත්
නොසෑදූසේක්ද?
ගර්භයෙහි අප තැනුවේ එක්කෙනෙක්ම
නොවේද?
16 (පියා නැත්තා මාගේ බාල වයසේ
පටන් පිය කෙනෙකු ළඟ මෙන් මා
ළඟ ඇතිකළාවූද
මාගේ මවු කුස පටන් වැන්දඹුවට
ආධාරවුණාවූද මම)
17 දුප්පතුන් ආශාවූ දේ ඔවුන්ගෙන්
වැළැක්වීම් නම්,
නොහොත් වැන්දඹුවගේ ඇස්
ක්ෂයවෙන්ට සැලැස්වීම් නම්,
18 පියා නැත්තාට මාගේ කොටසෙන්
කන්ට නොදී
තනියම ඒක කෑවෙම් නම්,
19 යමෙක් වස්ත්‍ර නැතිකමින් නසින බවත්
දිළින්දට වැස්මක් නැති බවත් මා
දුටු විට,
20 මට ආශීර්වාදකරන හැටියට
ඔහුගේ ඉඟටිය මාගේ බැටළුලොම්වලින්
උණුහුම් නොවී නම්,
21 මාගේ උපකාරකාරයෙක් දොරටුවේ
සිටිනවා මා දුටු නිසා
පියා නැත්තාට විරුද්ධව මාගේ අත
එසවීම් නම්,
22 මාගේ උරඉස ඒකේ සන්ධිස්ථානයෙන්
ගැළවී වැටේවා,
මාගේ හස්තය ඒකේ වැලමිටෙන්
බිඳීයේවා.
23 මක්නිසාද දෙවියන්වහන්සේගෙන්
පැමිණෙන විනාශය මට භීතියක්
විය,
උන්වහන්සේගේ මහත්තත්ත්වය
ඉදිරියෙහිද මට කිසිවක් කළ
නොහැකිවිය.
24 මම රත්රන් මාගේ බලාපොරොත්තුව
කොට ගතිම් නම්,
තුඹ මාගේ විශ්වාසයයයි පවිත්‍ර රනට
කීයෙම් නම්,
25 මාගේ සම්පත වැඩි නිසාත්
මාගේ අත හුඟක් සම්බකරගත්
නිසාත් ප්‍රීතිවීම් නම්,
26 ඉර බැබළෙන හැටිද
හඳ දීප්තිමත්ව ගමන්කරන බවද මා
දුටු විට
27 මාගේ සිත රහසින් පෙලඹී,
මාගේ මුඛය මාගේ අත සිඹගත්තේ
නම්,
28 ඉහළ සිටින දෙවියන්වහන්සේ මා
විසින් එපාකළ නිසා,
ඒකත් විනිශ්චයකාරයන් විසින්
දඬුවම්කළ යුතු අපරාධයක්ය.
29 මට වෛරවූ අයට පැමිණි විනාශයට
මම සන්තෝෂවී,
ඔහු විපත්තියට අසුවූ විට ප්‍රීතිවීම්
නම්,
30 (එසේය, ඔහුගේ ජීවිතයට විරුද්ධව
දෙස් කීමෙන්
මාගේ මුඛයට පව්කරන්ට ඉඩනැරියෙමි;)
31 ඔහුගේ කෑමෙන් තෘප්තිමත් නොවූ
කෙනෙක් පෙන්වන්නේ කවුද්දයි

මාගේ කුඩාරමේ මනුෂ්‍යයෝ
නොකීවෝ නම්,
32 අමුත්තා රාත්‍රිය එළියේ පසු නොකෙළේය;
ගමන්කාරයාට මාගේ දොරවල්
ඇරියෙමි;
33 මාගේ අයුතුකම මාගේ ළයේ සඟවා
ගනිමින්
මනුෂ්‍ය අන්දමින් මාගේ අපරාධ
වැසීම් නම්,
34 මහත් සමූහයාට මා භයවූ නිසාත්,
පවුල්වල හෙළාදැක්ම මා කැලඹූ නිසාත්,
මා නිශ්ශබ්දව සිටි ගෙයින් පිට
නොගියෙම් නම්–
35 අහෝ, මාගේ බස් අසන කෙනෙක්
මට ඇත්නම්!
(මෙන්න, මාගේ අත්සන තබමි,
සර්වපරාක්‍රමයාණෝ මට
උත්තරදෙනසේක්වා;)
මාගේ එදිරිකාරයා මට විරුද්ධව ලියූ
පැමිණිලි පත්‍රය මට ඇත්නම්!
36 සැබවින් ඒක මාගේ කර පිට
තබාගන්නෙමි;
ඔටුන්නක් මෙන් බැඳගන්නෙමි.
37 මාගේ අඩිවල ගණන උන්වහන්සේට
කියා සිටින්නෙමි;
අධිපතියෙකු මෙන් උන්වහන්සේ
ළඟට යන්නෙමි.
38 මාගේ බිම මට විරුද්ධව කෑගසා නම්,
එහි සියලු හීවිටි අඩා පැමිණිලිකෙරේ
නම්,
39 මම මිල නොදී ඒකේ අස්වැන්න කා,
ඒකේ අයිතිකාරයන්ගේ ප්‍රාණ හානි
කෙළෙම් නම්,
40 තිරිඟු වෙනුවට කටුගස්ද
යව වෙනුවට වල්ගස්ද වැවේවායි
කීවේය.
යෝබ්ගේ වචන නිමි.

## එලීහුගේ කථාව

(දුක් පීඩා පැමිණෙන්නේ යහපතට
බවත් දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ බවත්.)

32 තමාම ධර්මිෂ්ඨයයි යෝබ් සිතූ
බැවින් මේ මනුෂ්‍යයන් තුන්දෙන
2 ඔහුට උත්තරදීම නැවැත්තුවෝය. එවිට
රාම්ගේ පෙළපතේ බූසිය බාරකෙල්ගේ
පුත්‍රවූ එලීහුගේ උදහස ඇවුළුණේය. යෝබ්
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නොව
තමාගේ ධර්මිෂ්ඨකම කියාගත් බැවින්
ඔහුගේ උදහස යෝබ්ට විරුද්ධව
ඇවුළුණේය. ඔහුගේ මිත්‍රයන් තුන්දෙනාද 3
යෝබ් කෙරෙහි වරද තැබූ නුමුත් ඔහුට
උත්තරදෙන්ට ඔවුන්ට බැරිවුණ බැවින්
ඔවුන්ටත් විරුද්ධව ඔහුගේ උදහස
ඇවුළුණේය. එලීහු යෝබ්ට උත්තර 4
නොදී ප්‍රමාදව සිටියේය, මක්නිසාද
ඔව්හු ඔහුට වඩා වැඩිමහල්ය. මේ 5
මනුෂ්‍යයන් තුන්දෙනාගේ මුඛයෙහි
උත්තරයක් නැති බව එලීහු දුටු විට
ඔහුගේ උදහස ඇවුළුණේය.
එකල බූසිය බාරකෙල්ගේ පුත්‍රවූ එලීහු 6
උත්තරදෙමින් කියනුයේ:
මම වයසින් බාලව සිටිමි නුඹලා නම්
වයෝවෘද්ධයෝය;
එබැවින් මම පස්සට වී මා දන්නා දේ
නුඹලාට කියන්ට භයවීමි.
*වෘද්ධ වයස කථාකළ යුතුය, 7
අවුරුදු රාශිය ප්‍රඥව ඉගැන්විය
යුතුයයි කීමි.
එහෙත් මනුෂ්‍යයා තුළ ආත්මයක් 8
ඇත්තේමය,
සර්වපරාක්‍රමයාණන්ගේ හුස්මද ඔවුන්ට
ඥනය දෙන්නේය.
ප්‍රඥවන්තව සිටින්නේ මහත් අයම 9
නොවේ,
යුක්තිය දැනෙන්නේ වැඩිමහල්ලන්ටම
නොවේ.
එබැවින්: මාගේ වචන අසාපන්න; 10
මමත් දන්න දේ කියන්නෙමියි කීමි.
මම නුඹලාගේ වචන ගැන 11
බලාසිටියෙමි,
කුමක් කිය යුතුදැයි නුඹලා
සොයාගන්න තුරු
නුඹලාගේ වාදයට ඇහුම්කන්දුනිමි,
එසේය, නුඹලාට මගේ සිත යොමු 12
කෙළෙමි,
එහෙත් යෝබ් හඟිස්වන්ටවත්

*එනම්, වයෝවෘද්ධයන්

ඔහුගේ වචනවලට උත්තරදෙන්ටවත්
කෙනෙක් නුඹලා අතරේ නොවීය.
13 එබැවින්: අපට ප්‍රඥව සම්බවිය;
මනුෂ්‍යයා නොව දෙවියන්වහන්සේ
ඔහු පරාජයකරනවා ඇතැයි
නොකියන්ට බලාගනිල්ලා.
14 මක්නිසාද ඔහු තමාගේ වචන මට
විරුද්ධව යොමු නොකළේය;
මමත් නුඹලාගේ කථාවලින් ඔහුට
උත්තර නොදෙන්නෙමි.
15 ඔව්හු කැලඹී තවත් උත්තර නොදී
සිටිති,
කියන්ට ඔවුන්ට වචන නැත.
16 එසේ ඔවුන් කථානොකර,
තවත් උත්තරනොදී, නිකම් සිටින නිසා
මම බලා සිටිම්ද?
17 ඉතින් මමත් මාගේ වාරයේදී උත්තර
දෙන්නෙමි,
මමත් දන්න දේ කියන්නෙමි.
18 මක්නිසාද මම වචනවලින් පිරී සිටිමි;
මා තුළ තිබෙන ආත්මය මා
පොළඹවන්නේය.
19 මෙන්න, මාගේ බඩ රුස්නොගිය
මුද්‍රකපානයත්
පිපිරෙන්ට ළංවූ අලුත් සම්භාජනත්
මෙන්ය.
20 මට පහසු ලැබෙන පිණිස කථාකර,
මාගේ තොල් ඇර උත්තරදෙන්නෙමි.
21 මනුෂ්‍යයෙකුගේ තරාතිරම බලන්ට
මට සිද්ධ නොවේවා;
කිසි මනුෂ්‍යයෙකුට ඉච්චා
නොකරන්නෙමි.
22 මක්නිසාද ඉච්චාකරන්ට මම
නොදනිමි.
එසේ කළොත් මාගේ
මැවුම්කාරයාණන්වහන්සේ
ඉක්මනින් මා තුරන්කරනවා ඇත.

33 ඒ කොයිහැටි නුඹුත්, යෝබ්,
මාගේ කථාව අසා,
මාගේ සියලු වචනවලට ඇහුම්කන්
දියන්න.
2 මෙන්න, මාගේ මුඛය ඇරියෙමි,
මාගේ මුඛයෙහි මාගේ දිව කථාකෙළේය.
3 මාගේ කීම් මාගේ සිතේ අවංකකමින්
වන්නේය;
මාගේ තොල්ද තමුන් දන්නා දේ පිරිසිදු
ලෙස කථාකරන්නේය.
දෙවියන්වහන්සේගේ ආත්මය මා 4
සෑදුවේය,
සර්වපරාක්‍රමයාණන්ගේ හුස්ම මා
ජීවත්කරන්නේය.
නුඹට පුළුවන්නම් මට උත්තරදියන්න; 5
මට විරුද්ධව සැරසී නැගිට සිටපන්න.
දෙවියන්වහන්සේ වෙත නුඹ යම්සේද 6
මමත් එසේ වෙමි.
මමත් මැටියෙන් සාදනලද්දෙමි.
මාගේ භීතිය නුඹ ත්‍රස්ත 7
නොකරන්නේය;
මාගේ බලගතුකම නුඹට බරක්
නොවන්නේය.
සැබවින් මා අසාගන සිටියදී, 8
නුඹේ වචනවල ශබ්දය මට ඇසෙන
ලෙස නුඹ කථාකොට:
මම පවිත්‍රව වරදක් නැතුව සිටිමි; 9
මම නිදෙස්ව අයුතුකමක් නැතුව
සිටිමි.
උන්වහන්සේ මා ගැන විරුද්ධ 10
කාරණා සොයාගන,
සතුරෙකු කොට මා
ගණන්ගන්නාසේක;
මාගේ පාද දඬුගසනසේක; 11
මාගේ සියලු මාවත්වල
මුරකරනසේකැයි කීවෙහිය.
මේ ගැන නුඹ ධර්මිෂ්ඨලෙස 12
කථානොකෙළෙහිය, මම නුඹට
උත්තර දෙන්නෙමි;
මක්නිසාද දෙවියන්වහන්සේ
මනුෂ්‍යයාට වඩා උතුම්ය.
උන්වහන්සේට විරුද්ධව නුඹ විවාද 13
කරන්නේ මක්නිසාද?
උන්වහන්සේ වනාහි තමන්ගේ කිසි
කාරණයක් ගැන උත්තර
නොදෙනසේක.
මක්නිසාද මනුෂ්‍යයා නොසලකන 14
නුමුත්
දෙවියන්වහන්සේ එක වරක්, එසේය,
දෙවරක්,
ස්වප්නයකින් හෝ, රාත්‍රියේ 15
දර්ශනයකින් හෝ
මනුෂ්‍යයන්ට බර නින්ද පැමිණෙන
විට,

යහන පිට නින්දේදී කථාකරනසේක.
16 එකල මනුෂ්‍යයා ඔහුගේ අදහසින්
හරවන පිණිසද,
උඩඟුකම මනුෂ්‍යයාගෙන් පහකර,
17 ඔහුගේ ප්‍රාණය මිනීවළෙනුත්
ඔහුගේ ජීවිතය කඩුවේ විනාශයෙනුත්
ආරක්ෂාකරන පිණිසද,
18 උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ කන් අරවා,
ඔවුන්ට දූන් දනමුතුකම්
මුද්‍රාකරනසේක.
19 ඔහු තමාගේ යහනේදී වේදනාවෙන්ද
තමාගේ ඇටවල නිරන්තර
පොරයකින්ද දඬුවම් ලබන්නේය.
20 ඔහුගේ ප්‍රාණය කෑමටද
ඔහුගේ ආත්මය රස භෝජනයටද
අප්‍රියකරන්නේය.
21 නොපෙනෙන ලෙස ඔහුගේ මාංසය
ක්ෂයවී,
නොපෙනුණාවූ ඔහුගේ ඇට පෑදෙන්නේය.
22 එසේය, ඔහුගේ ප්‍රාණය මිනීවළටත්
ඔහුගේ ජීවිතය විනාශකාරයන්ටත්
ළංවන්නේය.
23 මනුෂ්‍යයාට ඔහුගේ යුතුකම දක්වන
පිණිස
දහසක් අතරෙන් එක්කෙනෙක් වන
දූතයෙකු එනම් තේරුම්කරදෙන
කෙනෙකු ඔහුට ඇත්නම්,
24 උන්වහන්සේ ඔහුට කරුණාකොට:
මිනීවළට නොබසින ලෙස ඔහු
මුදපන්න,
මිදීමේ මිලයක් මට සම්බවීයයි
කියනවා ඇත.
25 එවිට දරුවෙකුගේ මාංසයට වඩා
ඔහුගේ මාංසය අලුත්වී,
ඔහු තමාගේ යෞවන දවස්වලට
නැවත පැමිණෙනවා ඇත.
26 ඔහු දෙවියන්වහන්සේට
යාච්ඤාකරනවා ඇත, උන්වහන්සේ
ඔහු පිළිගෙන,
උන්වහන්සේගේ මුහුණ ප්‍රීතියෙන්
දකින්ට සලස්වා,
නැවත මනුෂ්‍යයාට ඔහුගේ
ධර්මිෂ්ඨකම පමුණුවනවා ඇත.
27 ඔහු මනුෂ්‍යයන් ඉදිරියේ ගීතිකා කරමින්:
මම පව්කොට යුක්තිය පෙරළුවෙමි,
එහෙත් මට කිසි ප්‍රතිඵලයක් නොවීය.
මිනීවළට යාමෙන් උන්වහන්සේ 28
මාගේ ප්‍රාණය මිදූසේක,
මාගේ ජීවිතයද එළිය දකින්නේයයි
කියනවා ඇත.
මනුෂ්‍යයාට ජීවත්වීමේ එළිය ලැබීමට 29
ඔහුගේ ප්‍රාණය මිනීවළෙන් නැවත
ගෙනෙන පිණිස,
දෙවියන්වහන්සේ දෙවරක්, එසේය, 30
තුන්වරක්,
මේ සියල්ල ඔහුට කරනසේක.
එම්බා, යෝබ්, සැලකිල්ලෙන් 31
ඇහුම්කන්දියන්න;
නිශ්ශබ්දව සිටපන්න, මම
කථාකරන්නෙමි.
කියන්ට යමක් ඇත්නම් මට උත්තරදී, 32
කථාකරපන්න, මක්නිසාද නුඹ
ධර්මිෂ්ඨ බව පෙන්වන්ට
කැමැත්තෙමි.
නැත්නම් මට ඇහුම්කන්දී, 33
නිශ්ශබ්දව සිටපන්න, මම නුඹට
ප්‍රඥාව උගන්වන්නෙමියි කීවේය.

## 34

ඇරත් එලීහු උත්තරදෙමින්
කියනුයේ:
ප්‍රඥාවන්තයෙනි, මාගේ වචන 2
අසාපල්ලා;
දනගැන්ම ඇත්තෙනි, මට
ඇහුම්කන්දියල්ලා.
මක්නිසාද උඩුතල්ල කෑම රස 3
බලන්නාක්මෙන්
කනද වචන විමසන්නේය.
අපිම යුක්තිය සෝදිසිකර, 4
යහපත කොයි එකද කියා අප
අතරෙහි දනගනිමු.
මක්නිසාද යෝබ් කථාකොට: මම 5
ධර්මිෂ්ඨයෙමි,
දෙවියන්වහන්සේ මාගේ යුක්තිය
පහකළසේක.
යුක්තිය මා කෙරෙහි තිබෙන නුමුත් 6
මම බොරුකාරයෙකැයි ගණන්ගනු
ලබමි,
මා අත අපරාධයක් නැති නුමුත්
මාගේ තුවාලය අසාධ්‍යයයි කීවේය.
යෝබ්ට සමාන මනුෂ්‍යයා කවරේද? 7

ඔහු නින්දාව වතුර මෙන් බොන්නේය.
8 අයුතුකම්කරන්නන් හා සමාගම්වී,
දුෂ්ට මනුෂ්‍යයන් සමග හැසිරෙන්නේය.
9 මක්නිසාද: දෙවියන්වහන්සේ කෙරෙහි
ප්‍රීතිවීමෙන්
මනුෂ්‍යයෙකුට කිසි ප්‍රයෝජනයක්
නැතැයි ඔහු කීය.
10 එබැවින් තේරුම් ඇති මනුෂ්‍යයෙනි,
මට ඇහුම්කන්දියල්ලා;
දෙවියන්වහන්සේගෙන් දුෂ්ටකම්
කිරීමද
සර්වපරාක්‍රමයාණන්ගෙන් අයුතුකම්
කිරීමද දුරුවේවා.
11 මක්නිසාද උන්වහන්සේ මනුෂ්‍යයෙකුගේ
ක්‍රියා ලෙස ඔහුට ප්‍රතිඵල දී,
ඒ ඒ අයගේ හැසිරීමේ හැටියට ඔහුට
සිද්ධවෙන්ට සලස්වනසේක.
12 එසේය, සැබවින්ම දෙවියන්වහන්සේ
දුෂ්ටකම් නොකරනසේක,
සර්වපරාක්‍රමයාණෝ යුක්තිය
නොපෙරළනසේක.
13 උන්වහන්සේට පොළොව භාරදුන්නේ
කවුද?
නොහොත් සකල ලෝකය පිහිටෙවුවේ
කවුද?
14 උන්වහන්සේ තමන් සිත මනුෂ්‍යයා
දෙසට යොමුකොට,
ඔහුගේ ආත්මයද හුස්මද තමන්
වෙතට එකතුකරගත්තොත්,
15 මාංසමයවූ සියල්ලෝ එකවිටම
නසින්නෝය,
මනුෂ්‍යයා දූවිල්ලට හැරීයන්නේය.
16 ඉතින් තුඹට ඥානය ඇත්නම් මේක
අසා,
මාගේ වචනවල හඬට ඇහුම්කන්
දියන්න.
17 සැබවින්ම යුක්තියට වෛරවෙන
කෙනෙකුට ආණ්ඩුකරන්ට පුළුවන්ද?
ධර්මිෂ්ඨවූ බලවත්වූ තැනන්වහන්සේ
පිට තුඹ වරද තබන්නෙහිද?
18 රජෙකුට: නපුරාය කියාවත්
උත්තමයන්ට: දුෂ්ටයෝය කියාවත්
කියන්ට යුතුද?
19 එසේනම් අධිපතීන්ගේ තරාතිරම්
නොබලන්නාවූ,
දිළින්දාට වැඩියෙන් ධනවතාට
කරුණාව නොදක්වන්නාවූ
තැනන්වහන්සේට එසේ කියන්නේ
කොහොමද?
මක්නිසාද ඔවුන් සියල්ලෝම
උන්වහන්සේගේ අත්වල කර්මාන්තය.
ඇසිල්ලකින්, මධ්‍යම රාත්‍රියෙහි පවා, 20
ඔව්හු නසින්නෝය;
සෙනඟ කලඹනු ලැබ පහව යන්නෝය,
බලවන්තයෝද *අතක් නැතුව පහකරනු
ලබන්නෝය.
මක්නිසාද උන්වහන්සේගේ ඇස් 21
මනුෂ්‍යයාගේ මාර්ග කෙරෙහිය,
ඔහුගේ සියලු යාම් ඊම් උන්වහන්සේ
දක්නාසේක.
අයුතුකම්කරන්නන්ට සැඟවී ඉන්ට 22
පුළුවන්වූ
අන්ධකාරයක්වත් මරණ සෙවණක්වත්
නැත.
මක්නිසාද මනුෂ්‍යයෙක් 23
දෙවියන්වහන්සේ වෙතට
විනිශ්චයට පමුණුවන පිණිස,
ඔහු ගැන වැඩි කල් කල්පනාකරන්ට
උන්වහන්සේට ඕනෑ නැත.
විභාගයක් නැතුව උන්වහන්සේ 24
බලවතුන් පොඩිකරදමා,
ඔවුන් වෙනුවට වෙන තැනැත්තන්
සිටුවනසේක.
එබැවින් උන්වහන්සේ ඔවුන්ගේ 25
ක්‍රියා දැන,
ඔවුන් සුන්වන ලෙස රාත්‍රියේදී ඔවුන්
පෙරළාදමනසේක.
ඔවුන් උන්වහන්සේ අනුවයාමෙන් 26
අහකට හැරී,
උන්වහන්සේගේ සියලුම මාර්ග
නොසලකා හැර,
දුප්පතාගේ මොරගැසීම උන්වහන්සේ 27
වෙතට පැමිණෙන්ට සැලැස්වූ
බැවින්ද,
අසරණයන්ගේ මොරගැසීම
උන්වහන්සේට ඇසුණු බැවින්ද,
මනුෂ්‍යයන්ට පෙනෙන ස්ථානයේදී 28

*එනම්, මනුෂ්‍ය ක්‍රියාවක් නැතුව.

උන්වහන්සේ දුෂ්ටයන් හැටියට ඔවුන්ට
පහරදෙනසේක.
29 උන්වහන්සේ ශාන්තිය දෙන විට
වරද තබන්නේ කවුද?
උන්වහන්සේ තමන් මුහුණ සඟවන
විට එය දකින්නේ කවුද?
30 එසේ අභක්තික මනුෂ්‍යයා රජකම්
නොකරන ලෙසද,
කිසිවෙකු විසින් සෙනඟ මලපතට
අසුකර නොගන්න ලෙසද,
ජාතියක් ගැන වේවා, එක මනුෂ්‍යයෙක්
ගැන වේවා, එකාකාර සිද්ධ වන්නේය.
31 මක්නිසාද යමෙක් දෙවියන්වහන්සේට
කථාකොට:
මම දඬුවම වින්දෙමි, තවත් වරද
නොකරන්නෙමි.
32 මට නොපෙනෙන දේ මට පෙන්නුව
මැනව.
මම අපරාධ කෙළෙම්නම් තවත්
නොකරන්නෙමියි කීවේද?
33 උන්වහන්සේගේ විපාකය නුඹ එපා
කරන්නේ එය නුඹ කැමති ලෙස
දිය යුතු නිසාද?
මක්නිසාද මා විසින් නොව නුඹම
තෝරාගත යුතුය.
එබැවින් නුඹ දන්න දේ කියාපන්න.
34 සිහි ඇති මනුෂ්‍යයෝද
මාගේ වචන අසන සියලු නුවණ
ඇත්තෝද කථාකොට:
35 යෝබ් දැනගැන්ම නැතුව
කථාකරන්නේය,
ඔහුගේ වචන ප්‍රඥා රහිතයයි මට
කියන්නෝය.
36 දුෂ්ට මනුෂ්‍යයන් මෙන් යෝබ්
උත්තරදෙන බැවින්
ඔහු තීන්දුවටම සෝදිසිකරනු
ලබන්නේනම් යෙහෙකි.
37 මක්නිසාද ඔහු තමාගේ පාපයට
කැරළිකාරකම එකතුකොට,
අප අතරේ අත්පිඩිගසා,
දෙවියන්වහන්සේට විරුද්ධව තමාගේ
වචන වැඩිකෙරේයයි කීවේය.

35 එලීහු තවත් කථාකරමින්
කියනුයේ:
2 මාගේ ධර්මිෂ්ඨකම
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමට
වැඩියයි
නුඹ කී එක හරිය කියා නුඹ
සිතනවාද?
මක්නිසාද: එයින් නුඹට ඇති වාසිය 3
මොකද කියාත්,
මා පව්කළානම් ලැබෙනවාට වඩා
මට මොන ප්‍රයෝජනයක් ලැබේද
කියාත් නුඹ කියන්නෙහිය,
නුඹටත් නුඹ සමග සිටින නුඹේ 4
මිත්‍රයන්ටත්
මම උත්තරදෙමි.
අහස දෙසට ඇස් ඔසවා බලා, 5
නුඹට ඉතා ඉහළින් තිබෙන ආකාශය
බලා කල්පනාකරපන්න.
නුඹ පව්කළත් නුඹ උන්වහන්සේට 6
විරුද්ධව කුමක් කරනවාද?
නුඹේ වරද වැඩිවුණත් නුඹ එයින්
උන්වහන්සේට කරන්නේ කුමක්ද?
නුඹ ධර්මිෂ්ඨව සිටියත් නුඹ 7
උන්වහන්සේට දෙන්නේ කුමක්ද?
නොහොත් නුඹේ අතින් උන්වහන්සේට
ලැබෙන්නේ කුමක්ද?
නුඹේ දුෂ්ටකමෙන් නුඹ වැනි 8
මනුෂ්‍යයෙකුට නපුරක් පැමිණෙන්ට
පුළුවන;
එසේම නුඹේ ධර්මිෂ්ඨකමෙන් මනුෂ්‍ය
පුත්‍රයෙකුට ප්‍රයෝජනයක් වෙන්ටත්
පුළුවන.
පීඩා රාශිය නිසා ඔව්හු කෑගසති; 9
බල ඇත්තන්ගේ හස්තය නිසා
මොරගසති.
එහෙත්: පොළොවේ මෘගයන්ට වඩා 10
අපට උගන්වන්නාවූ,
ආකාශයේ පක්ෂීන්ට වඩා අප
ප්‍රඥාවන්ත කරන්නාවූ,
රාත්‍රියේදී ගීතිකා දෙන්නාවූ 11
මාගේ මැවුම්කාර දෙවියන්වහන්සේ
කොතැනදැයි කිසිවෙක්
නොඅසන්නේය.
එහි ඔවුන් කෑගසන නුමුත්, නපුරන්ගේ 12
උඩඟුකම නිසා,
කිසිවෙක් උත්තර නොදෙන්නේය.
සැබවින්ම දෙවියන්වහන්සේ 13
නිෂ්ඵලකමට ඇහුම්කන්
නොදෙනසේක,

සර්වපරාක්‍රමයාණෝ ඒක
නොසලකනසේක.
14 එසේනම්: මම උන්වහන්සේ දෙස
නොබලමියි තුඹ කියන විට ඊට
කොපමණ වැඩියෙන් එසේ
නොවන්නේද?
නඩුව උන්වහන්සේ ඉදිරියෙහි තිබේ,
උන්වහන්සේ ගැන බලාසිටපන්න.
15 තුමුත් දන් උන්වහන්සේ උදහසින්
දඬුවම් නොකළ නිසාත්,
අපරාධය තදලෙස නොසලකන
නිසාත්,
16 යෝබ් තමාගේ මුඛය නිෂ්ඵලලෙස
ඇර,
දනගැන්ම නැතුව වචන වැඩිකර
ගත්තේයයි කීවේය.

36 එලීහු තවත් කථාකරමින් කියනුයේ:
2 මා තුඹට පෙන්වාදෙන පිණිස මා
ගැන ටිකක් ඉවසාපන්න;
මක්නිසාද දෙවියන්වහන්සේ උදෙසා
තවත් දේ කියන්ට තිබේ.
3 මාගේ දනගැන්ම දුර සිට ගෙනැවිත්,
මාගේ මැවුම්කාරයාණන්වහන්සේ
ධර්මිෂ්ඨ බව පෙන්වන්නෙමි.
4 මක්නිසාද සැබවින්ම මාගේ වචන
බොරු නැත.
හරි දනගැන්ම ඇත්තෙක් තුඹ වෙත
සිටින්නේය.
5 මෙන්න, දෙවියන්වහන්සේ බලවත්ය,
එහෙත් කිසිවෙකු සුළු
නොකරනසේක.
උන්වහන්සේ ඥානශක්තියෙන් බලවත්ය.
6 උන්වහන්සේ දුෂ්ටයන් ආරක්ෂා
නොකරනසේක.
තුමුත් අසරණවූ අයට යුක්තිය ඉෂ්ට
කරදෙනසේක.
7 උන්වහන්සේ තමන් ඇස් ධර්මිෂ්ඨයන්
වෙතින් අහක් නොකර,
ඔවුන් උසස්වෙන හැටියට රජුන් සමග
නිතරම සිංහාසනයෙහි සිටුවනසේක.
8 ඔව්හු විලංගුවලින් බඳිනු ලැබ,
දුක් පීඩා නමැති බැඳුම්වලට අසුවී
සිටිත්නම්,
9 උන්වහන්සේ ඔවුන්ගේ ක්‍රියාවද
ඔවුන්ගේ අපරාධ එනම් ඔවුන්
උඩඟුකම්කළ බවද ඔවුන්ට පෙන්වා,
10 දනමුතුකමට ඔවුන්ගේ කන් අරවා,
අයුතුකමෙන් හැරෙන්ට කියා ඔවුන්ට
අණකරනසේක.
ඔව්හු ඇහුම්කන්දී උන්වහන්සේට 11
මෙහෙකළොත්,
තමුන්ගේ දවස් ඉසුරෙන්ද
තමුන්ගේ අවුරුදු සැපතින්ද
පසුකරන්නෝය.
තුමුත් නාසා සිටියොත්, ඔව්හු 12
කඩුවෙන් විනාශවන්නෝය,
අනුවණකමින් නසින්නෝය.
තුමුත් අභක්තික සිත් ඇත්තෝ 13
උදහස රැස්කරගනිති.
උන්වහන්සේ ඔවුන් බඳිනකල ඔව්හු
කන්නලව් නොකරති.
ඔව්හු යෞවන වයසේදී නසිති; 14
ඔවුන්ගේ ජීවිතය දූෂ්‍යවූවන් අතරේ
විනාශවෙයි.
උන්වහන්සේ පීඩා විඳින්නන් 15
පීඩාකරණකොටගෙන මුදා,
පීඩිතකමේදී ඔවුන්ගේ කන් අරිනසේක.
එසේය, උන්වහන්සේ තුඹ 16
විපත්තිවලින් මුදා
අවහිරකමක් නැති විශාල තැනකට
පමුණුවනසේක;
තුඹේ මේසයෙහි භෝජනයද
තරකමින් පූර්ණවන්නේය.
තුමුත් තුඹ දුෂ්ටයාගේ දඬුවමින් 17
පිරී සිටින්නෙහිය.
විනිශ්චය හා යුක්තිය තුඹ
අල්වාගන්නේය.
එබැවින් දඬුවමට විරුද්ධව 18
කෝපයෙන් නොපෙළඹෙන්න;
මිදීමේ මිලයේ මහත්කම නිසා
මුළානොවෙන්න.
දුකට පත් නොවෙන ලෙස තුඹේ 19
වස්තුවවත්
තුඹේ ශක්තියේ මුළු බලයවත්
සෑහෙන්නේද?
ජනයන් තමුන්ගේ ස්ථානයෙන් සිඳිනු 20
ලබන
රාත්‍රියට ආශා නොවෙන්න.
ප්‍රවේසම්වෙයන්න, අධර්මිෂ්ඨකමට සිත 21
නොදෙන්න.
මක්නිසාද පීඩාවට වඩා තුඹ ඒක
තෝරාගත්තෙහිය.
බලව, දෙවියන්වහන්සේ ස්වකීය 22
බලයෙන් උසස්ව සිටිනසේක.
උන්වහන්සේට සමාන ගුරුවරයා

කවුද?
23 උන්වහන්සේගේ මාර්ගය උන්වහන්සේට
නියමකෙළේ කවුද?
නොහොත්: ඔබ අධර්මිෂ්ඨකම්
කළසේකැයි කියන්ට පුළුවන් කාටද?
24 මනුෂ්‍යයන් ගීයෙන් ප්‍රශංසාකළාවූ
උන්වහන්සේගේ කර්මාන්ත
වර්ණනාකරන්ට සිහිකරගනින්න.
25 සියලු මනුෂ්‍යයෝ ඒ දෙස බැලුවෝය;
මනුෂ්‍යයා දුර සිට බලන්නේය.
26 බලව, අපට දැනගත නොහැකි තරම්
දෙවියන්වහන්සේ උතුම්ය;
උන්වහන්සේගේ අවුරුදුවල ගණන
සොයා දැනගත නොහැකිය.
27 උන්වහන්සේ දිය බින්දු ඉහළට
ඇදගන්න කල
උන්වහන්සේගේ මීදුමෙන් වැස්ස
සෑදෙන්නේය.
28 ඒවා වලාකුල්වලින් වැගිරී
බොහෝසේ මනුෂ්‍යයන් පිටට
වහින්නේය.
29 තුමුත් වලාපටලයේ පැතිර යාම වන
උන්වහන්සේගේ මණ්ඩපයේ ගර්ජනා
යමෙකුට තේරුම්ගත හැක්කේද?
30 බලව, *උන්වහන්සේ තමන් ආලෝකය
තමන් වටකර විහිදුවා,
මුහුදේ පතුල වසනසේක.
31 මක්නිසාද එයින් උන්වහන්සේ ජනයන්ට
දඬුවම්කරනසේක;
ආහාරද බොහෝසෙයින් දෙනසේක.
32 උන්වහන්සේ ස්වකීය අත් විදුලියෙන්
පුරවාගෙන,
නියම ලකුණට වදින ලෙස ඊට අණ
කරනසේක.
33 ඒකේ ගර්ජනාව උන්වහන්සේ ගැන
දන්වන්නේය,
පැමිණෙන කුණාටුව ගවයන්ටද
දැනෙන්නේය.

37 එසේය, ඊට මාගේ සිත
වෙවුලා
ඒකේ ස්ථානයෙන් ඉවත්වෙයි.
2 උන්වහන්සේගේ හඬේ ගර්ජනාවත්
උන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන
ගෙරවීමත් හොඳට අසාපල්ලා.

*නොහොත්–උන්වහන්සේ තමන්
වලාකුල් තමන් අවට විහිදුවා
එයින් කඳු මුදුන් වසනසේක.

උන්වහන්සේ ඒක මුළු අහස යටද 3
තමන්ගේ විදුලිය පොළොවේ කෙළවර
දක්වාද යවනසේක.
ඊට පස්සෙන් ශබ්දයක් ගොරවාගන 4
යන්නේය;
උන්වහන්සේ තමන් මහත්තත්ත්වයේ
හඬින් ගර්ජනාකරනසේක.
උන්වහන්සේගේ හඬ ඇසෙන විට
උන්වහන්සේ ඒවා ප්‍රමාදකරන්නෙත්
නැත.
දෙවියන්වහන්සේ ස්වකීය හඬින් 5
පුදුමලෙස ගර්ජනාකරනසේක.
අප නොදන්න මහත් දේ කරනසේක.
මක්නිසාද උන්වහන්සේ හිමවලටත් 6
එසේම වර්ෂාවටත්
තමන් තද වර්ෂාවලටත් කථාකොට:
පොළොවට බසිව්යයි කියනසේක.
උන්වහන්සේගේ කර්මාන්තය වන 7
සියලු මනුෂ්‍යයන් ඒක දැනගන්නා
පිණිස
උන්වහන්සේ හැම මිනිසුන්ගේ අත්
මුද්‍රාකර තබනසේක.
එකල මෘගයෝත් ගුහාවලට ඇතුල්වී, 8
උන්ගේ බෙනවල නවතින්නෝය.
දකුණු නිවාසයෙන් සුළිඹුළඟද 9
උතුරෙන් ශීතලයද පැමිණෙන්නේය.
දෙවියන්වහන්සේගේ හුස්මෙන් 10
වතුර මිදෙන්නේය.
පළල් ජලධාරා අවහිරවන්නේය.
එසේය, උන්වහන්සේ දියෙන් 11
වලාපටලය බරකරනසේක;
ස්වකීය විදුලි-වලාකුළ
විහිදුවනසේක.
දඬුවමක් වශයෙන් හෝ තමන්ගේ 12
පොළොව උදෙසා හෝ
කරුණාවක් වශයෙන් හෝ
උන්වහන්සේ ඒවා පමුණුවන විට,
උන්වහන්සේ ඒවාට අණකරන 13
සියල්ලම
මිනිස් වාසයවූ ලෝකය මතුපිට එයින්
සිද්ධවෙන පිණිස,
ඒවා උන්වහන්සේගේ නියමය ප්‍රකාර
හැම දිශාවලට හැරී යන්නෝය.
එම්බා, යෝබ්, මීට ඇහුම්කන්දීගන 14
සිටපන්න.
නිශ්චලව සිට දෙවියන්වහන්සේගේ

පුදුම ක්‍රියා කල්පනාකරපන්න.
15 දෙවියන්වහන්සේ ඒවාට අණදී,
තමන් වලාකුළේ විදුලිය බැබළෙන්ට
සලස්වන්නේ කොහොමද කියා නුඹ
දන්නෙහිද?
16 දැනගැන්මෙන් සම්පූර්ණව සිටින
තැනන්වහන්සේගේ පුදුම ක්‍රියා එනම්,
වලාපටල එල්ලී තිබෙන ආකාරය
නුඹ දන්නවාද?
17 දකුණු සුළඟින් පොළොව නිශ්චලවූ
කල
නුඹේ ඇඳුම් උණුහුම්වෙන්නේ කෙසේදැයි
දන්නවාද?
18 වාත්තු කැඩපතක් මෙන් සවි ඇති
අහස
උන්වහන්සේ වාගේ අතුරන්ට නුඹට
පුළුවන්ද?
19 අප විසින් උන්වහන්සේට කිය යුතු
දේ නුඹ අපට දන්වාපන්න.
අන්ධකාරය නිසා අපේ කථාව
පිළියෙළකරන්ට අපට බැරිය.
20 මා කථාකරන්ට කැමති බව
උන්වහන්සේට දන්වන්ටද?
නොහොත් මනුෂ්‍යයෙක් නාස්ති කරනු
ලබන්ට ආශාවිය යුතුද?
21 ඉතින් හුළඟ ගසා අහස පැහැදුණාම,
එහි දීප්තිමත් එළිය දරන්ට
මනුෂ්‍යයන්ට බැරිය.
22 උතුරු දිගින් රන්වන් අලංකාරය
පැමිණෙන්නේය.
දෙවියන්වහන්සේ වෙත භයානක
මහිමය ඇත්තේය.
23 සර්වපරාක්‍රමයාණන්වහන්සේනම් අපට
සොයා දැනගන්ට බැරි කෙනෙක්ය;
උන්වහන්සේ පරාක්‍රමයෙන්ද
යුක්තිය හා සම්පූර්ණ ධර්මිෂ්ඨකමෙන්ද
උතුම්ව සිටිනසේක, උන්වහන්සේ
පීඩා නොකරනසේක.
24 එබැවින් මනුෂ්‍යයෝ උන්වහන්සේට
භයවෙති.
උන්වහන්සේ ප්‍රඥාසිත් ඇත්තන්
නොසලකනසේකැයි කීවේය.

## ස්වාමීන්වහන්සේගේ පළමුවෙනි උත්තරය

(තමන්වහන්සේගේ බලය හා ප්‍රඥාව ස්වකීය මැවිලිවලින් දක්වීම.)

38 එවිට ස්වාමීන්වහන්සේ
කුණාටුවේ සිට යෝබ්ට
උත්තරදෙමින් මෙසේ කීසේක:
අනුවණ වචනවලින් 2
මන්ත්‍රණය අඳුරුකරන මොහු කවුද?
ඉතින් පුරුෂයෙකු මෙන් නුඹේ ඉහටිය 3
බැඳගෙන,
මා නුඹෙන් අසන විට මට කියාපන්න.
මා පොළොව පිහිටෙවූ කල නුඹ 4
කොතැන සිටියෙහිද?
නුඹ දන්නෙහිනම් කියාපන්න.
ඒකේ මිමි නියමකළේ කවුද? 5
නුඹ දන්නෙහිද?
නොහොත් ඊපිට ලනුව ඇද්දේ කවුද?
ඒකේ අත්තිවාරම් දැමුවේ මොකක්පිටද? 6
පහන් තාරකා එක්ව ගීතිකාකරමින්,
දෙවියන්වහන්සේගේ සියලු පුත්‍රයන් 7
ප්‍රීති ඝෝෂා පවත්වද්දී,
ඒකේ කොනේ ගල තැබුවේ කවුද?
මුහුද බිහිවී ගැබින් නික්ම ආ විට, 8
ඒක දොරවලින් වසා තැබුවෙත්
කවුද?
මා විසින් වලාකුල් ඒකේ වස්ත්‍රයද 9
ඝනාන්ධකාරය ඊට වෙළන පටියද
කොට තබා,
ඊට මාගේ මායිම නියමකර, 10
අගුල් සහ දොරවල්ද තබා:
මෙතැන් දක්වා එන්නෙහිය, මින් එහා 11
නොයන්නෙහිය;
තාගේ උඩඟු රළ පතර මෙහි
නවතින්නේයයි කීවෙමි.
එළිය පොළොවේ කෙළවරට 12
පැමිණීමෙන්
දුෂ්ටයන් එතැනින් හෙළාදමනු ලබන
හැටියට,
නුඹේ සෑම දවස්වල නුඹ උදයට 13
අණකොට
අලුයමට ඒකේ ස්ථානය දන්නෙවුවෙහිද?

14 එය මුද්‍රා තබනලද මැටි මෙන්
සියල්ල වෙනස්වී, වස්ත්‍රයකින් පැළඳී
තිබෙන්නාක්මෙන් පෙනෙන්නේය.
15 එවිට දුෂ්ටයන්ගේ එළිය ඔවුන්ගෙන්
පහවන්නේය,
එසෙවූ හස්තයද බිඳදමනු ලබන්නේය.
16 නුඹ මුහුදේ උල්පත් ළඟට පැමිණියෙහිද?
නොහොත් ගැඹුරේ රහස් තැන්වල
ඇවිද්දෙහිද?
17 මරහුගේ දොරටු නුඹට ප්‍රකාශවීද?
නොහොත් මරණ සෙවණේ දොරටු
නුඹ දුටුවෙහිද?
18 නුඹ පොළොවේ පළල කල්පනාකර
බැලුවෙහිද?
ඒ සියල්ල දන්නෙහිනම් කියාපන්න.
19 නුඹ එළිය ඒකේ මායිමට ගෙනයන
පිණිසත්,
ඒකේ නිවාසයට යන මාවත් නුඹ
විසින් තේරුම්ගන්නා පිණිසත්,
20 එය වාසයකරන තැනට යන මාර්ගය
කොහේද?
අන්ධකාරයේ ස්ථානයත් කොතැනද?
21 නුඹ එවකට ඉපිද සිටිය බැවින්ද
නුඹේ දවස් ගණනත් බොහෝ බැවින්ද
නිසැකව නුඹ දන්නෙහිය!
22 කැලඹීමේ කාලයටද
යුද්ධ හා සටනේ දවසටද මා විසින්
ඉතුරුකර තබා තිබෙන
23 හිම ගබඩා ළඟට නුඹ පැමිණියෙහිද?
නොහොත් ගල්වැසි ගබඩා දුටුවෙහිද?
24 එළිය විහිදෙන්නෙත්
නැගෙනහිර සුළඟ පොළොව පිට
පැතිරෙන්නෙත් මොන මාර්ගයෙන්ද?
25 මනුෂ්‍යයෙකු නැති දේශයකටත්
කිසි මනුෂ්‍යයෙකු නැති කාන්තාරයටත්
වැසි වස්වා,
26 වනයද පාළු තැන්ද සනහා,
තෘණ වැවෙන්ට සැලැස්වීමට,
27 වර්ෂාවට පාරවල්ද
අකුණුවල විදුලියට මාර්ගයක්ද විවර
කළේ කවුද?
28 වර්ෂාවට පියෙක් ඇද්ද?
පිනි බින්දු ඉපදෙවුවේ කවුද?
29 හිමකැට කාගේ ගැබෙන් නික්මුණාද?
අහසේ සීනිදු හිම ජනිතකළේ කවුද?
ගලක් ඇතුළෙහි මෙන් වතුර සැඟවී 30
තිබේ,
ගැඹුරේ මතුපිටද මිදී තිබේ.
හත්දින්නේ තරුවැළ බඳින්ට නුඹට 31
පුළුවන්ද?
නොහොත් මුවසිරසේ බැඳුම් මුදන්ට
පුළුවන්ද?
*මස්සරොත් ඒවායේ නියම කාලයට 32
නික්මවන්ට නුඹට පුළුවන්ද?
පිරිවර සහිත මහ වලසා ගෙනයන්ට
නුඹට පුළුවන්ද?
නුඹ අහසේ නියෝග දන්නවාද? 33
නොහොත් ඒකේ ආණ්ඩුබලය
පොළොව කෙරෙහි පිහිටුවන්ට
නුඹට පුළුවන්ද?
වතුර රාශියක් නුඹ පිටට පැමිණෙන 34
හැටියට
වලාකුල්වලට නුඹේ හඬ නගන්ට
පුළුවන්ද?
විදුලිලතා නික්මයන ලෙස ඒවා 35
යවන්ට නුඹට පුළුවන්ද?
ඒවා: අපි මෙහියයි නුඹට කියනවා
ඇද්ද?
අධ්‍යාත්මයෙහි ප්‍රඥාව තැබුවේ කවුද? 36
නොහොත් සිතට නුවණ දුන්නේ
කවුද?
ධූලි කැටි ගැසෙන කල්හිද, 37
පිඩලි එකට ඇලෙන කල්හිද,
ප්‍රඥාවෙන් වලාකුල් ගනින්ට කාට 38
පුළුවන්ද?
අහසේ භාජනවලින් දිය වගුරුවන්ට
කාට පුළුවන්ද?
නුඹ සිංහධේනුවට ගොදුරු දඩයම් 39
කර දෙන්නෙහිද?
තරුණ සිංහයන් උන්ගේ ගුහාවල
ලැග,
කැලෑවේ සැඟවී බලා සිටින විට, 40
නුඹ උන්ගේ ආශාව සංසිඳවනවාද?
කපුටුවාගේ පැටවුන් කෑම නැතුව 41
ඔබ මොබ ගොස් දෙවියන්වහන්සේට
කෑගසන විට
උෟට ගොදුරු සපයාදෙන්නේ කවුද?

*එනම්, රාශිලග්න.

39 පර්වතවල වල් එළුවන් වදන
කාලය නුඹ දන්නවාද?
නොහොත් මුවදෙනුන් විළිරුජා විඳින
වේලාව නුඹට දනගන්ට පුළුවන්ද?
2 උන්ට සම්පූර්ණවන මාස
ගණන්කරන්ට නුඹට පුළුවන්ද?
උන් වදන කාලය නුඹ දන්නවාද?
3 උන් නැමී උන්ගේ පැටවුන් වද
උන්ගේ රුජා පහකරගනිති.
4 උන්ගේ පැටව් ලොකුවී, එළියෙහි වැඩී,
පිටත්ව ගොස් නැවත් සිටිති.
5 වල් කොටළුවා නිදහස්කර හැරියේ
කවුද?
නොහොත් වල් කොටළුවාගේ බැඳුම්
මිදුවේ කවුද?
6 මම කාන්තාරය උගේ ගෙයද
ලුණු භූමිය උගේ වාසස්ථානයද කොට
නියමකෙළෙමි.
7 ඌ නගරයේ ඝෝෂාවට සිනාසෙයි,
දක්කන්නාගේ මොරගැසීම් ඌට
නැසෙයි.
8 කඳුකර පළාත උගේ ගොදුරු බිමය,
ඌ සෑම අමු දේ සොයයි.
9 කුළුහරකා නුඹට වැඩකරන්ට
කැමතිවේද?
ඌ නුඹේ ගාලේ ලගිනවා ඇද්ද?
10 කුළුහරකා ලනුවකින් හීව්වේ බඳින්ට
නුඹට පුළුවන්ද?
නොහොත් ඌ නුඹ පස්සේ මිටියාවත්
පෝරුගානවා ඇද්ද?
11 උගේ ශක්තිය මහත් බැවින් නුඹ ඌ
විශ්වාසකර,
නුඹේ වැඩ ඌට භාරදෙන්නෙහිද?
12 ඌ නුඹේ අස්වැන්න ගෙනැවිත්
නුඹේ පාවරට එකතුකරනවා ඇත
කියා නුඹ ඌ කෙරෙහි විශ්වාසය
තබන්නෙහිද?
13 පැස්බරාගේ පියාපත් ප්‍රීතිමත්ලෙස
වැනෙයි,
නුමුත් ඒ පියාපත් හා පිහාටු
කරුණාවත්ද?
14 නැත, ඌ උගේ බිජු බිම දමා,
ධූලියෙහි උණුසුම්කර,
15 ඒවා පයට පෑගෙන්ටත්
වල් සතුන්ට පොඩිවෙන්ටත් පුළුවන්
බව මතකනැතිකරන්නේය.
උගේ පැටවුන් ඌට අයිති නැතුවාක් 16
මෙන් ඌ උන්ට තදකම් පාන්නේය.
උගේ මහන්සිය නිෂ්ඵල නුමුත් ඊට
උගේ සැලකිල්ලක් නැත;
මක්නිසාද දෙවියන්වහන්සේ උගෙන් 17
ප්‍රඥාව වලක්වා,
ඌට නුවණ නොදී ඇරියසේක.
ඌ පියාපත් උස්සා ගසාගන යන කල, 18
ඌ අශ්වයාටත් අසරුවාටත්
සිනාසෙන්නේය.
නුඹ අශ්වයාට වෙර දුන්නෙහිද? 19
ලෙළදෙන කෙඳිවලින් උගේ බෙල්ල
පැළදෙව්වෙහිද?
ඌට පළඟැටියෙකු මෙන් පනින්ට 20
සැලැස්සුවෙහිද?
උගේ හේෂාවරයේ බලවත්කම
භයංකරය.
ඌ මිටියාවතෙහි කුරගසා, ශක්තිය 21
නිසා ප්‍රීතිමත්වී,
යුද්ධායුධවලට මූණපාන්ට යන්නේය.
ඌ භයට සරදම්කොට තැති නොගෙන 22
සිටින්නේය;
කඩුවටද පිටු නොපාන්නේය.
ඊකොපුවද දිලියෙන හෙල්ලයද 23
කුඩා හෙල්ලයද
ඌට වැදී ශබ්ද නගින්නේය.
සැරකමෙන්ද කෝපයෙන්ද ඌ 24
වේගයෙන් පැනයන්නේය;
ඇසෙන්නේ හොරණෑ ශබ්දය බව ඌ
විශ්වාස නොකර,
ඇසෙන එක එක හොරණෑ ශබ්දයට 25
ඌ: අහා! කියමින්,
දුරදීම සටනටද
සේනාපතීන්ගේ ගර්ජනාව හා
ඝෝෂාවටද ඉව අල්ලයි.
උකුස්සා ඉහළ නැගී දකුණු දිශාව 26
දෙසට
උගේ පියාපත් විදහන්නේ නුඹේ
නුවණින්ද?
නොහොත් රාජාලියා උඩට ඉගිලී 27
උගේ කැදැල්ල උස් තැන සාදන්නේ
නුඹේ අණටද?
ඌ පර්වතය පිට වාසයකරන්නේය, 28

පර්වතයේද පර්වත කූටයේද
වසන්නේය.
29 එතැන සිට ඌ ගොදුරු සොයන්නේය;
දුරදීම උගේ ඇස්වලට පෙනෙන්නේය.
30 උගේ පැටව්ද ලේ උරා බොති.
මළකඳන් ඇති තැනම ඌ සිටින්නේයයි
කීසේක.

## යෝබ් තමාගේ වරද පිළිගැනීම

40 තවද ස්වාමීන්වහන්සේ යෝබ්ට
උත්තරදෙමින්:
2 පොරට සිටින්නා සර්වපරාක්‍රමයාණන්-
වහන්සේ සමග වාදකරන්නේද?
දෙවියන්වහන්සේ සමග විවාදකරන්නා
ඊට උත්තරදෙවයි කීසේක.
3 එකල යෝබ් ස්වාමීන්වහන්සේට
උත්තරදෙමින්:
4 මම නීචයෙක්මි; ඔබට උත්තරයක්
දෙන්නේ කෙසේද?
මාගේ අතින් කට වසාගනිමි.
5 මම එක වරක් කථාකෙළෙමි, එහෙත්
උත්තර නොදෙන්නෙමි;
එසේය, දෙවරක් කථාකෙළෙමි, නුමුත්
තවත් එසේ කථා නොකරන්නෙමියි
කීය.
6 එවිට ස්වාමීන්වහන්සේ කුණාටුවේ සිට
යෝබ්ට උත්තරදෙමින් කියනසේක්:
7 ඉතින් පුරුෂයෙකු මෙන් නුඹේ
ඉඟටිය බැඳගෙන,
මා නුඹෙන් අසන අතර මට
දන්වාපන්න.
8 නුඹ මාගේ විනිශ්චය පවා අවලංගු
කර,
නුඹම ධර්මිෂ්ඨව පෙනෙන පිණිස මට
වරද තබන්නෙහිද?
9 නොහොත් දෙවියන්වහන්සේට වාගේ
හස්තයක් නුඹට තිබේද?
උන්වහන්සේ වාගේ ශබ්දයකින්
ගර්ජනාකරන්ට නුඹට පුළුවන්ද?
10 උත්කෘෂ්ටකමෙන්ද ඓශ්වර්යයෙන්ද
සැරසී,
මහිමයද මහත්තත්වයද
පැළඳගනින්න.
නුඹේ උදහස වගුරුවා හැර, 11
උඩඟු සියල්ලන් බලා, ඔවුන්
පහත්කරපන්න.
උඩඟු සියල්ලන් බලා යටත්කර, 12
දුෂ්ටයන් ඔවුන්ගේ ස්ථානයෙහි
පාගාදමාපන්න.
ඔවුන් සියල්ලන් ධූලියෙහි සඟවා, 13
ඔවුන්ගේ මුහුණු කළුවර ස්ථානයෙහි
බැඳ තබාපන්න.
එවිට නුඹේ දකුණත නුඹ ගළවන්ට 14
පොහොසත් බැවින්,
මමත් නුඹට ප්‍රශංසාකරන්නෙමි.
*බෙහෙමොත් බලාපන්න, නුඹ 15
මෙන් ඌත් සෑදුවෙමි;
ඌ ගොනෙකු මෙන් තණකොළ කයි.
උගේ නුනටියෙහි තිබෙන උගේ 16
ශක්තියත්
උගේ බඩේ මස්ගොබවල තිබෙන
උගේ බලයත් කල්පනාකරපන්න.
ඌ උගේ වල්ගය කිහිරි ගසක් මෙන් 17
වනන්නේය;
උගේ කළවාවල නහර එකට ගෙතී
තිබේ.
උගේ ඇට පිත්තල වැනිය; 18
උගේ ඉළඇට යකඩ පොලු වාගේය.
දෙවියන්වහන්සේගේ වැඩවලින් ඌ 19
ප්‍රධානියාය.
ඌ සෑදූ තැනන්වහන්සේ උගේ
කඩුව සපයාදෙනසේක.
මක්නිසාද ඌට කෑම සම්බවෙන්නේ 20
වනයේ සියලු සත්ත්වයන් ක්‍රීඩාකරන
කඳුවලය.
ඌ නෙළුම් ගස් යට, 21
බටවලද වගුරේද මුවාවෙහි ලගින්නේය.
නෙළුම් ගස් ඌට සෙවණ දෙයි; 22
දෙළේ නළා ගස්වලින් ඌ වටවී සිටියි.
ගංගාවක් ගලන නුමුත් ඌ තැති 23
නොගන්නේය,
යොර්දන උගේ කට දක්වා ගලා එන
නුමුත් ඌ නිර්භීතව සිටියි.
ඌ බලාසිටියදී ඌ අල්ලාගන්ටවත් 24
උගේ නාසය මලපත්වලින් සිදුරු
කරන්ටවත් පුළුවන්ද?

*එනම්, ගංගා හස්තියා.

41 කිඹුලා බිලිකටුවකින් අදින්ටවත්
උගේ දිව ලනුවකින් පහත්කරන්ටවත්
තුඹට පුළුවන්ද?
2 උගේ නාසයේ වැල්පටක් දමන්ටවත්
උගේ හක්ක උලකින් සිදුරුකරන්ටවත්
තුඹට පුළුවන්ද?
3 ඌ තුඹට බොහෝ කන්නලව්කරනවා
ඇද්ද?
නොහොත් මෘදු වචන තුඹට කියනවා
ඇද්ද?
4 තුඹ හැම කලටම ඌ
මෙහෙකරුවෙක්කොට ගන්න පිණිස
ඌ තුඹ සමග ගිවිසුමක් කරනවා
ඇද්ද?
5 පක්ෂියෙකු සමග මෙන් තුඹ ඌ සමග
සෙල්ලම්කරනවාද?
නොහොත් තුඹේ තරුණියන්ට ඌ
බැඳ දෙනවාද?
6 මසුන් අල්ලන්නෝ උගෙන් වෙළඳාම්
කර,
වෙළඳුන් අතරේ ඌ බෙදන්නෝද?
7 උගේ හමට හෙල්ලවලින්වත්
උගේ ඔළුවට මස් හෙල්ලවලින්වත්
අනින්ට තුඹට පුළුවන්ද?
8 තුඹේ අත ඌ පිට තබා,
සටන සිහිකරපන්න, තවත් එසේ
නොකරන්න.
9 අන්න, ඌ ගැන බලාපොරොත්තුවීම
නිෂ්ඵලය.
යමෙක් ඌ දුටු පමණින් වැටෙනවා
නොවේද?
10 ඌ අවුස්සන තරමට ධෛර්ය
ඇති කෙනෙක් නැත.
එසේ වීනම් මා ඉදිරියෙහි සිටින්ට
පුළුවන් කාටද?
11 පළමුකොට මට යමක් දුන්නේ කවුද?
දුන්නානම් ඔහුට ප්‍රතිඵල
දෙන්නෙමි.
මුළු අහස යට තිබෙන සියල්ල මාගේය.
12 උගේ ගාත්‍රාද බලයේ ශක්තියද
නිසි ශරීර ලක්ෂණද ගැන නිශ්ශබ්දව
නොසිටින්නෙමි.
13 උගේ පිට වස්ත්‍රය ගළවන්ට කාට
පුළුවන්ද?
උගේ දත් දෙපේළියට ළංවන්නේ කවුද?
උගේ මුහුණේ දොරවල් අරින්ට පුළුවන් 14
කාටද?
උගේ දත් අවට්න් භීතිය තිබේ.
තද මුද්‍රාවකින් වැසුවාක්මෙන්වූ 15
උගේ ශක්තිමත් කොරපොතු උගේ
පාරට්ටුවය.
ඒවා අස්සට හුළඟ ඇතුල් නොවෙන 16
හැටියට
ඒවා එකිනෙකට යාව තිබේ.
ඒවා එකිනෙකට ඇලී, වෙන්කරන්ට 17
බැරි ලෙස
එකිනෙකට සම්බන්ධව තිබේ.
උගේ කිඹිසීම්වලින් එළියක් බබළයි; 18
උගේ ඇස් අලුයම නමැති ඇසිපිය
වැනිය.
උගේ කටින් ගිනිදල් නික්මෙන්නේය. 19
ගිනිපුපුරු පැනනගින්නේය.
ලිපේ තිබෙන හැළියකින්ද දැවෙන 20
කටාරමකින්ද මෙන්
උගේ නාස්පුටවලින් දුම් නගින්නේය.
උගේ හුස්මට අඟුරු පත්තුවෙන්නේය. 21
ගිනිදලක්ද උගේ කටින් නික්මෙන්නේය.
උගේ බෙල්ලෙහි බලය රැඳ තිබේ, 22
ඌ ඉදිරියෙහි භීතිය නටන්නේය.
උගේ මස්පිඬු එකට ඇලී, 23
නොසෙල්වෙන හැටියට ඌ පිට තදව
තිබේ.
උගේ සිත ගලක් මෙන් තදය; 24
එසේය, යට ඇඹරුම් ගල මෙන් තදය.
ඌ නැගිටින කල බලවන්තයෝ 25
භයපත්වී,
අධික භය නිසා උමතුවෙති.
කඩුවද හෙල්ලයද කුඩා හෙල්ලයද 26
ඊතලයද ඇතුව
ඌට විරුද්ධව පැමිණ්නත්, ඒවා
නිෂ්ඵලවෙයි.
යකඩ පිදුරු මෙන්ද 27
පිත්තල දිරාගිය ලී මෙන්ද ඌ
ගණන්ගන්නේය.
ඊගස කෙරෙන් ඌ පලා නොයන්නේය; 28
පටියෙන් ගසන ගල් ඌට ඉපනැලි
මෙන් වේ.
පොලු ඉපනැල්ල මෙන් ඌ 29
ගණන්ගන්නේය;

කුඩා හෙල්ලය සොලවන විට උඃ
සිනාසෙන්නේය.
30 උගේ යටිපැත්ත තියුණු කැබලිති
වැනිය.
මඩින යන්ත්‍රයක් මෙන් උඃ මඩේ
ඇදෙන්නේය.
31 සැළියක වතුර මෙන් උඃ ගැඹුර
නටවන්නේය.
මුහුද තෙලයක් මෙන් කරන්නේය.
32 උඃ යන කල පස්සෙන් පාර
දිලියෙන්නේය;
ගැඹුරට පැසුණු හිසකේ ඇතිවූවාක්
මෙන් පෙනීයයි.
33 උඃට සමාන එකෙක් භූමිය මතුපිට
නැත;
භය නොගන්න හැටියට උඃ මවනු
ලැබුවේය.
34 උඃ උසස්ව තිබෙන සියල්ල බලන්නේය.
උඃ සියලු චණ්ඩ මෘගයන් කෙරෙහි
රජ ව සිටින්නේයයි කීසේක.

## යෝබ් නැවත තමාගේ වරද පිළිගෙන පසුතැවිලිවීම

**42** එවිට යෝබ් **ස්වාමීන්වහන්සේට**
උත්තරදෙමින් කියනුයේ:
2 ඔබවහන්සේට සියල්ලම පුළුවන් බවත්
ඔබගේ කිසි අදහසක් වලක්වන්ට
බැරි බවත් දනිමි.
3 දනගැන්ම නැතිකමෙන් මන්ත්‍රණය
අඳුරුකරන මොහු කවුද?
එබැවින් මට නොතේරෙන්නාවූ,
මා දනනොගත්, මට ඉතා පුදුමවූ
දේවල් කීවෙමි.
4 අනේ ඇසුව මැනව, එවිට මම කථා
කරන්නෙමි;
මා ඔබගෙන් අසන කල්හි මට දන්නුව
මැනව.
5 මා ඔබ ගැන කනින් අසා තිබුණේය;
නුමුත් දන් මාගේ ඇසින් ඔබ දකිමි.
6 එබැවින් මම මටම පිළිකුල්කොට,
දූවිල්ලෙත් අලුවලත් හිඳ
පශ්චාත්තාපවෙමියි කීවේය.

## යෝබ් නැවත පිළිගනු ලැබ සමෘද්ධියට පත්වීම

තවද **ස්වාමීන්වහන්සේ** මේ වචන 7
යෝබ්ට කී පසු **ස්වාමීන්වහන්සේ**
තේමානිය එලීපස්ට කථාකොට: මාගේ
සේවකයාවූ යෝබ් මෙන් නුඹත් නුඹේ
මිත්‍රයන් දෙන්නාත් මා ගැන හරි ලෙස
කථා නොකළ බැවින් මාගේ උදහස
නුඹලා කෙරෙහි ඇවිළ තිබේ. එබැවින් 8
නුඹලා ගොන් සත්දෙනෙකුත් බැටළුවන්
සත්දෙනෙකුත් රැගෙන මාගේ සේවකයාවූ
යෝබ් ළගට ගොස්, නුඹලා වෙනුවට
දවන පූජාවක් ඔප්පුකරපල්ලා. මාගේ
සේවකයාවූ යෝබ් නුඹලා උදෙසා
යාච්ඤාකරන්නේය; එවිට නුඹලාගේ
මෝඩකමේ හැටියට මා විසින් නුඹලාට
නොකරන පිණිස ඔහු පිළිගන්නෙමි;
මක්නිසාද මාගේ සේවකයාවූ යෝබ්
වාගේ නුඹලා මා ගැන හරි ලෙස
කථාකළේ නැතැයි කීසේක. එබැවින් 9
තේමානිය එලීපස්ද ෂූහිය බිල්දද්ද
නයමාතිය ශෝපර්ද ගොස් **ස්වාමීන්-
වහන්සේ** ඔවුන්ට අණකළ ලෙස
කළෝය. **ස්වාමීන්වහන්සේද** යෝබ්
පිළිගත්සේක. තවද යෝබ් තමාගේ 10
මිත්‍රයන් උදෙසා යාච්ඤාකළ විට
**ස්වාමීන්වහන්සේ** ඔහුගේ වහල්කම
පහකොට, පෙර තිබුණු සියල්ලට වඩා
දෙගුණයක් වැඩිකොට ඔහුට දුන්සේක.
එවිට ඔහුගේ සියලු සහෝදරයෝද 11
ඔහුගේ සියලු සහෝදරියෝද පළමු ඔහු
ඇඳින සිටි සියල්ලෝද ඔහු ළඟට ඇවිත්,
ඔහුගේ ගෙදර ඔහු සමග කෑම කා,
**ස්වාමීන්වහන්සේ** ඔහුට පැමිණෙවූ සියලු
විපත්ති ගැන ඔහු සමග ශෝකවී, ඔහු
සැනසුවෝය. එක් එක්කෙනා කෙසීටා
[නම්] මිලයකුත් එක් එක්කෙනා රන්
මුද්දුවකුත් ඔහුට දුන්නේය. මෙසේ 12
**ස්වාමීන්වහන්සේ** යෝබ්ගේ පටන්-
ගැන්මට වඩා ඔහුගේ අන්තිමයට
ආශීර්වාදකළසේක. බැටළුවන්ද එළුවන්ද

දහහතර දහසකුත් ඔටුවන් හදහසකුත්
ගොන්බාන් දහසකුත් කොටළුදෙනුන්
13 දහසකුත් ඔහුට සිටියෝය. ඒ ඇර
පුත්‍රයන් සත්දෙනෙක්ද දූවරුන් තුන්-
14 දෙනෙක්ද ඔහුට සිටියෝය. ඔහු
පළමුවෙනි තැනැත්තීට යෙමීමා යන
නමද දෙවෙනි තැනැත්තීට කෙෂියා යන
නමද තුන්වෙනි තැනැත්තීට කෙරෙන්-
15 හප්පූක් යන නමද තැබීය. යෝබ්ගේ
දූවරුන් මෙන් රූව ඇති ස්ත්‍රීහු ඒ මුළු
දේශයෙහි නොසිටියාහ. ඔවුන්ගේ පියා
ඔවුන්ගේ සහෝදරයන් අතරේ ඔවුන්ට
උරුමයක් දුන්නේය. ඉන්පසු යෝබ් 16
එකසිය හතළිස් අවුරුද්දක් ආයු වළඳ,
සතරවෙනි පරම්පරාව දක්වා තමාගේ
පුත්‍රයන්ද පුත්‍රයන්ගේ පුත්‍රයන්ද දුටුවේය.
ඉක්බිති යෝබ් මහලුව වයසින් පූර්ණව 17
මළේය.

---

# ගීතාවලිය

## පළමුවෙනි කාණ්ඩය

### ධර්මිෂ්ඨයා සහ දුෂ්ටයා

**1** දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව
නොයන්නාවූ,
පව්කාරයන්ගේ මාර්ගයෙහි
නොසිටින්නාවූ,
නින්දකරන්නන්ගේ ආසනයෙහි
නොහිඳින්නාවූ,
2 ස්වාමීන්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ,
උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දවල්
මෙනෙහිකරන්නාවූ, මනුෂ්‍යයා
*ආශීර්වාදලද්දේය.
3 ඔහු දිය ඇළවල් ළඟ හිඳුවූ,
නියම කලට ඵල දෙන,
නොමැලවෙන කොළ ඇති ගසක්
හා සමාන වන්නේය;
ඔහු කරන සියල්ල සඵලවෙයි.
4 දුෂ්ටයෝ එසේ නොව,
සුළඟින් විසිර යන බොල් හා සමානය.
5 එබැවින් දුෂ්ටයෝ විනිශ්චයෙහිද
පව්කාරයෝ ධර්මිෂ්ඨයන්ගේ
සමාගමෙහිද නොසිටින්නෝය.
6 මක්නිසාද ස්වාමීන්වහන්සේ
ධර්මිෂ්ඨයන්ගේ මාර්ගය දන්නාසේක.
නුමුත් දුෂ්ටයන්ගේ මාර්ගය විනාශ
වන්නේය.

### අභිෂේකලත් තැනැත්තාගේ රාජ්‍යය

**2** මනුෂ්‍ය ජාතීහු කුමට කෝලාහල
කෙරෙද්ද?
මනුෂ්‍ය වර්ගයෝ කුමට නිෂ්ඵල දෙයක්
යෝජනාකෙරෙද්ද?
ස්වාමීන්ටද උන්වහන්සේගේ 2
අභිෂේකලත් තැනැත්තාණන්ටද
විරුද්ධව
පොළොවේ රජවරු සැරසෙති,
අධිපතියෝද එක්ව මන්ත්‍රණයකෙරෙති.
අපි ඔවුන්ගේ බැමි කඩා දමා, 3
ඔවුන්ගේ ලණු අප කෙරෙන්
ඉවතලමුයයි කියති.
ස්වර්ගයෙහි හිඳින තැනන්වහන්සේ 4
සිනාසෙනසේක.
ස්වාමීන්වහන්සේ ඔවුන්ට පරිහාස
කරනසේක.
එකල්හි උන්වහන්සේ කෝපයෙන් 5
ඔවුන්ට කථාකොට,
තමන් උදහසින් ඔවුන්
කලඹනසේක්:
මම සියොන්නම් මාගේ පිරිසිදු කන්ද 6
මතුයෙහි
මාගේ රජ්ජුරුවන් පිහිටුවීමියි
කියනසේක.
මම නියමය ප්‍රකාශකරන්නෙමි. 7
ස්වාමීන්වහන්සේ මට කථාකොට:
නුඹ මාගේ පුත්‍රයෙහිය;
අද නුඹ ජනිතකෙළෙමි.
මාගෙන් ඉල්ලව, එවිට නුඹේ උරුමයට 8
ජාතීන්ද
නුඹේ කොටසට පොළොවේ සීමාන්තය
දක්වාද දෙන්නෙමි.
නුඹ ඔවුන් යදණ්ඩකින් බිඳ, 9
කුඹලෙකුගේ භාජනයක් මෙන් ඔවුන්
සුණුකරන්නෙහියයි කීසේක.
එබැවින් රජදරුවෙනි, දූන් ඥනවන්ව 10
සිටිව්.

---

*හෙවත්, පිනැත්තේය.

පොළොවේ විනිශ්චයකාරයෙනි,
ගුරුකම් ගනිව්.
11 ස්වාමීන්ට භයින් මෙහෙකරව්,
වෙවුලුම් සහිතව ප්‍රීතිවව්.
12 පුත්‍රයාණන් සිඹිව්, නැතහොත්
උන්වහන්සේ උදහස්වනසේක,
තුඹලාද මාර්ගයේදී විනාශවන්නහුය,
මක්නිසාද උන්වහන්සේගේ උදහස
වහාම ඇවිලෙන්නේය.
උන්වහන්සේ සරණකොට ගන්න
සියල්ලෝ ආශීර්වාදලද්දෝය.

## දෙවියන්වහන්සේ තුළ ධෛර්ය ඇතුව සිටීම

3 තමාගේ පුත්‍රවූ අබ්සලොම් පලාගිය
කල දාවිත් ලියූ ගීතයකි.
1 ස්වාමිනි, මාගේ එදිරිකාරයෝ
කොපමණ වැඩිවූද!
මට විරුද්ධව නැගිටින්නෝ බොහෝය.
2 දෙවියන්වහන්සේ තුළ ඔහුට ගැළවීමක්
නැතැයි
මාගේ ප්‍රාණය ගැන කියන්නෝ
බොහෝය.
3 තුමුත් ස්වාමිනි, ඔබ මා අවට පලිහක්ද
මාගේ ගෞරවයද මාගේ හිස
ඔසවන්නාද වනසේක.
4 ස්වාමීන්ට මාගේ ශබ්දයෙන් හඬගසමි,
උන්වහන්සේ තමන්ගේ ශුද්ධ කන්දේ
සිට මට උත්තරදෙනසේක.
5 මම වැදහෙව නිදගතිමි;
මම පිබිදුණෙමි; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ මා දරනසේක.
6 මට විරුද්ධව මා වටකොට රැස්ව
සිටින්නාවූ
දස දහස් ගණන් සෙනඟට භය
නොවන්නෙමි.
7 ස්වාමිනි, නැගුටුණ මැනව; මාගේ
දෙවියන්වහන්ස, මා ගැළෙවුව මැනව.
මක්නිසාද ඔබ මාගේ සියලු
සතුරන්ගේ කන්සයට ගැසූසේක;
දුෂ්ටයන්ගේ දත් බින්දසේක.
ගැළවීම ස්වාමීන්ට අයිතිය. 8
ඔබගේ ආශීර්වාදය ඔබගේ සෙනඟ
කෙරෙහි වේවා.

## දෙවියන්වහන්සේ තුළ නිශ්චලවීම

4 නායක වාද්‍යකරුටයි; වීණා
ඇතුව ගායනාකිරීමටයි.
දාවිත්ගේ ගීතයකි.
මාගේ ධර්මිෂ්ඨකමේ දෙවියන්වහන්ස, 1
මා හඬගසන කල මට උත්තර
දුන මැනව;
විපත්තියේදී ඔබ මා මිදූසේක.
මට කරුණාකොට මාගේ යාච්ඤාව
ඇසුව මැනව.
මනුෂ්‍ය පුත්‍රයෙනි, මාගේ ගෞරවය 2
කොපමණ කල් අගෞරවයට
පෙරළන්නහුද?
තෙපි කොපමණ කල් නිෂ්ඵල දේට
ඇලුම්ව බොරුව සොයන්නහුද?
තුමුත් ස්වාමීන්වහන්සේ භක්තිවන්තයා 3
තමන්ටම වෙන්කරගත් බව දැනගනිව්.
ස්වාමීන්ට මා හඬගසන කල
උන්වහන්සේ අසනසේක.
භයින් සිටිව්, පව් නොකරව්. 4
යහනේදී තොපගේම සිතින් විමසා
නිශ්චලවව්.
ධර්මිෂ්ඨකමේ පූජා පුදමින්, 5
ස්වාමීන් කෙරෙහි විශ්වාසය තබව්.
අපට යහපතක් දක්වන්නේ කවරෙක්දැයි 6
බොහෝ දෙන කියති.
ස්වාමිනි, ඔබගේ මුහුණේ එළිය අප
කෙරෙහි බැබළෙවුව මැනව.
ඔවුන්ගේ ධාන්‍ය හා මුද්‍රිකපානය 7
වැඩිවූ කල්හි ඔවුන්ට ඇති ප්‍රීතියට
වඩා
ඔබ මාගේ සිතේ ප්‍රීතියක් දූසේක.
මම සමාදානයෙන් වැදහෙව නිදන්නෙමි. 8
මක්නිසාද ස්වාමිනි, ඔබ මා උදක්ම
සුවසේ වාසයකරවනසේක.

## සතුරන්ගෙන් මිදීම පිණිස යාච්ඤාව

5 නායක වාද්‍යකරුටයි; නළා ඇතුව ගීතිකාකිරීමටයි. දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමිනි, මාගේ වචනවලට කන් යොමුකර,
මාගේ භාවනාව සැලකුව මැනව.
2 මාගේ රජ්ජුරුවෙනි, මාගේ දෙවියන්වහන්ස, ඔබට යාච්ඤාකරමි;
මාගේ හඬගෑසීමේ ශබ්දයට ඇහුම්කන්දුන මැනව.
3 ස්වාමිනි, උදය වේලෙහි ඔබ මාගේ හඬ අසනසේක;
උදය වේලෙහි ඔබට මාගේ යාච්ඤාව පිළියෙළකොට බලාසිටින්නෙමි.
4 මක්නිසාද ඔබ දුෂ්ටකමට ප්‍රියවූ දෙවිකෙනෙක් නොවනසේක.
*නපුර ඔබ වෙත නොරඳන්නේය.
5 අහංකාරීහු ඔබගේ ඇස් හමුයෙහි නොසිටින්නෝය.
අපරාධ ක්‍රියාකරන සියල්ලන්ට ඔබ ද්වේෂකරනසේක.
6 ඔබ බොරු කියන්නන් විනාශකරනසේක.
මිනීමරුවූ ප්‍රයෝගකාරවූ මනුෂ්‍යයාට ස්වාමීන්වහන්සේ පිළිකුල්කරනසේක.
7 මම වනාහි ඔබගේ අධික කරුණාගුණය පෙරදැරිකොට ඔබගේ ගෘහයට ඇතුල්වන්නෙමි.
ඔබ කෙරෙහි භයින් යුක්තව ඔබගේ ශුද්ධවූ මන්දිරය දෙසට නමස්කාර කරන්නෙමි.
8 ස්වාමිනි, මාගේ සතුරන් නිසා ඔබගේ ධර්මිෂ්ඨකමෙහි මා ගෙනගිය මැනව;
මා ඉදිරියෙහි ඔබගේ මාර්ගය සමතලා කළ මැනව.
9 මක්නිසාද ඔවුන්ගේ මුඛයෙහි කිසි සැබෑකමක් නැත;
ඔවුන්ගේ සිත අතිශයින් දුෂ්ටය.
ඔවුන්ගේ උගුර විවරවූ මිනීවළක්ය;
ඔව්හු දිවෙන් චාටු බස් කියති.
දෙවියන්වහන්ස, ඔවුන් වරදකාරයන් මෙන් සැලකුව මැනව; 10
ඔව්හු ස්වකීය මන්ත්‍රණයෙන්ම වැටෙත්වා.
ඔවුන්ගේ අපරාධ රාශිය නිසා ඔවුන් බැහැරකළ මැනව;
මක්නිසාද ඔව්හු ඔබට විරුද්ධව කැරළිගැසූය.
නුමුත් ඔබ සරණකොට ගන්න සියල්ලෝ සන්තෝෂවෙත්වා, 11
ඔබ ඔවුන් ආරක්ෂාකරන බැවින් සදකල් ප්‍රීතිනාදකෙරෙත්වා.
ඔබගේ නාමයට ප්‍රේමකරන්නෝ ඔබ කෙරෙහි ප්‍රීතිවෙත්වා.
මක්නිසාද ඔබ ධර්මිෂ්ඨයාට ආශීර්වාද කරනසේක; 12
ස්වාමිනි, ඔබ පලිහකින් මෙන් කරුණාවෙන් ඔහු වටකරනසේක.

*නොහොත්, නපුරා.

## ලෙඩේදී යාච්ඤා කිරීම

නායක වාද්‍යකරුටයි; මහා ශබ්දය ඇති වීණා සහිතව ගීතිකාකිරීමටයි. දාවිත්ගේ ගීතයකි. 6

ස්වාමිනි, ඔබගේ උදහසින් මට තරවටු නොකළ මැනව, 1
ඔබගේ තද කෝපයෙන් මට දඬුවම් නොකළ මැනව.
ස්වාමිනි, මම මැලවී සිටිමි; එබැවින් මට කරුණාකළ මැනව. 2
ස්වාමිනි, මාගේ ඇට චලිතව තිබේ; එබැවින් මා සුවකළ මැනව.
මාගේ ආත්මයද අතිසයින් කැලඹී තිබේ. 3
ස්වාමිනි, ඔබ ප්‍රමාදවන්නේ කොපමණ කල්ද?
ස්වාමිනි, හැරී මාගේ ප්‍රාණය නිදහස් කළ මැනව. 4
ඔබගේ කරුණාව නිසා මා ගැළවුව මැනව.

5 මක්නිසාද *මරණයේදී ඔබ සිහිකිරීමක් නැත.
†මෙයෝල්දී ඔබට ස්තුතිකරන්නේ කවරෙක්ද?
6 මාගේ සුසුම්ලීමෙන් වෙහෙසව සිටිමි;
රැයක් පාසා මාගේ යහන උල්පවමි;
මාගේ කඳුළෙන් මාගේ ඇඳ තෙමමි.
7 මාගේ ඇස ශෝකයෙන් ක්ෂයවී
මගේ සියලු එදිරිකාරයන් නිසා වැහැරයයි.
8 අයුතුකම් කරන සියල්ලෙනි, මා කෙරෙන් පහව යව්;
මක්නිසාද ස්වාමීන්වහන්සේ මාගේ විලාප ශබ්දය ඇසූසේක.
9 ස්වාමීන්වහන්සේ මාගේ කන්නලව්ව ඇසූසේක;
ස්වාමීන්වහන්සේ මාගේ යාච්ඤාව පිළිගන්නාසේක.
10 මාගේ සියලු සතුරෝ ලජ්ජාවට පැමිණ බොහෝසෙයින්ම කැලඹෙන්නාහුය.
ඔව්හු පසුබටව හදිසියෙන් ලජ්ජාවට පැමිණෙන්නාහුය.

## නිදෙස්වීම සඳහා දෙවියන්වහන්සේට අයැදීම

**7** බෙන්යමිය කුෂ්ගේ වචන නිසා දාවිත් විසින් ස්වාමීන්වහන්සේට ගීතිකාකළ කාව්‍යයකි.

1 මාගේ දෙවිවූ ස්වාමිනි, ඔබ සරණකොට ගනිමි.
මා ලුහුබැඳ එන්නාවූ සියල්ලන්ගෙන් මා ගළවා නිදහස්කළ මැනව.
2 නැතහොත් ගළවන්නෙක් නැති කල්හි
ඔහු සිංහයෙකු මෙන් මාගේ ආත්මය කැබලිකොට ඉරාදමන්නේය.
3 මාගේ දෙවිවූ ස්වාමිනි, මම මේක කෙළෙම්නම්;
මා අත අයුතුකමක් ඇත්නම්;
4 මා සමග සමාදානයෙන් සිටිය තැනැත්තාට නපුරක් කෙළෙම් නම්;
(සැබවින් නිකරුණේ මට එදිරිව සිටි තැනැත්තා මම ගැළවීමි.)
සතුරා මාගේ ආත්මය ලුහුබැඳ අල්වා අසුකර ගනීවා; 5
එසේය, ඔහු මාගේ ප්‍රාණය බිමදමා, පාගා,
මාගේ ගෞරවය ධූලියෙහි හෙළාවා.
ස්වාමිනි, ඔබගේ උදහසින් නැගුටුණ මැනව, 6
මාගේ එදිරිකාරයන්ගේ කෝපවේගයට විරුද්ධව සිටිය මැනව.
මා උදෙසා පිබිදුණ මැනව; ඔබ විසින් විනිශ්චය නියමකර තිබේ.
ජන සමූහයෝ රැස්ව ඔබ වටකර සිටිත්වා. 7
ඔබද ඔවුන් මතුයෙන් උසස්ථානයට නැවත වැඩිය මැනව.
ස්වාමීන්වහන්සේ මනුෂ්‍යජාතීන්ට යුක්තිය සලසා දෙනසේක. 8
ස්වාමිනි, මාගේ ධර්මිෂ්ඨකම හා මා තුළ පවතින අවංකකම පරිද්දෙන් මා විනිශ්චයකළ මැනව.
අනේ දුෂ්ටයන්ගේ දුෂ්ටකම කෙළවර වේවා, නුමුත් ධර්මිෂ්ඨයා ස්ථිරකළ මැනව. 9
මක්නිසාද ධර්මිෂ්ඨවූ දෙවියන්වහන්සේ සිත් හා අදහස් පරීක්ෂාකරනසේක.
මාගේ පලිහ අවංක සිත් ඇත්තන් ගළවන 10
දෙවියන්වහන්සේ සමගය.
දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ විනිශ්චයකාරයෙක, 11
එසේය, සැමදම උදහස්වන දෙවිකෙනෙක.
යමෙක් නොහැරේනම් උන්වහන්සේ තමන්ගේ කඩුව මුවහත්කරනසේක; 12
උන්වහන්සේ දුන්න තැත්කවා සූදානම්කළසේක.
උන්වහන්සේ ඔහුට මරණායුධ පිළියෙළකළසේක; 13
උන්වහන්සේ තමන් ඊගස් ගිනි-ඊගස්

*හෙවත්, මරණින් පසු.
†හෙවත්, පාතාලයේදී.

කරනසේක.
14 බලව, ඔහු අයුතුකම ප්‍රසූතකිරීමට
වේදනා විඳියි;
එසේය, ඔහු නපුරුකම ගැබ්ගෙන,
බොරුව ප්‍රසූතකෙළේය.
15 ඔහු වළක් කැණ ගැඹුරුකොට
හැරුවේය,
තමා හැරූ බොරු වළේ තෙමේම
වැටුණේය.
16 ඔහුගේ නපුරුකම ස්වකීය හිස පිටට
හැරෙන්නේය,
ඔහුගේ බලාත්කාරකම ස්වකීය
ඉස්මුදුනෙහි වැටෙන්නේය.
17 ස්වාමීන්ගේ ධර්මිෂ්ඨකම පරිද්දෙන්
උන්වහන්සේට ස්තුතිකරන්නෙමි.
මහෝත්තමවූ ස්වාමීන්ගේ නාමයට
ප්‍රශංසා ගී කියන්නෙමි.

## මනුෂ්‍යයාගේ උතුම්කම

8 නායක වාද්‍යකරුටයි; ගිත්තීත් යන තූර්ය ඇතුව ගීතිකා කිරීමටයි. දාවිත්ගේ ගීතයකි.

1 අපගේ ස්වාමිවූ *ස්වාමීන්වහන්ස,
ඔබගේ නාමය පෘථිවිය මුළුල්ලෙහි
කොපමණ උතුම්ද!
ඔබ ස්වකීය මහිමය අහස්තල මත්තෙහි
තැබූසේක.
2 සතුරාද පළිගන්නාද නිශ්ශබ්දකරන
පිණිස,
ඔබගේ එදිරිකාරයන් නිසා,
ඔබ බාලයන්ගේද කිරිබොන
බිළිඳුන්ගේද මුඛයෙන් බලය
පිහිටෙවූසේක.
3 ස්වකීය ඇඟිලිවැඩයවූ ඔබගේ අහස්
තලයත්
ඔබ පිහිටෙවූ සඳ හා තාරකාත් බලා
කල්පනාකරන කල;
4 ඔබ මනුෂ්‍යයා සිහිකිරීමට ඔහු
කවරෙක්ද?
ඔබ මනුෂ්‍යපුත්‍රයා සැලකීමට ඔහු
කවරෙක්ද?

*එනම්, යෙහෝවාවහන්ස.

ඔබ ඔහු *දෙවියන්වහන්සේට මදක් 5
පමණක් පහත්කොට සෑදූසේක,
මහිමය හා ගෞරවය නමැති
ඔටුන්නෙන් ඔහු සරසනසේක.
ඔබගේ හස්තකර්ම කෙරෙහි ඔහු 6
අධිපති කළසේක;
එසේය, සියල්ල ඔහුගේ පාද යට
දැමූසේක.
එනම් සියලු බැටළුවන් සහ ගවයෝද, 7
එසේය, වනයෙහි මෘගයෝද;
ආකාශයෙහි පක්ෂීන් සහ මුහුදේ 8
මත්ස්‍යයෝද,
මුහුදු මාර්ගවල යන්නාවූ සියල්ලෝද
යන මොව්හුය.
අපගේ ස්වාමිවූ ස්වාමීන්වහන්ස, 9
ඔබගේ නාමය මුළු පොළොවෙහි
කොපමණ උතුම්ද!

## ධර්මිෂ්ඨ විනිශ්චය ගැන ස්තුතිකිරීම

9 නායක වාද්‍යකරුටයි; මුත්ලබ්බෙන් නම් වෘත්තයයි. දාවිත්ගේ ගීතයකි.

ස්වාමීන්ට මාගේ මුළු සිතින් ස්තුති 1
කරන්නෙමි;
ඔබගේ ආශ්චර්ය ක්‍රියා සියල්ල දක්වා
දෙන්නෙමි.
ඔබ කෙරෙහි ප්‍රීතිව සන්තෝෂවන්නෙමි; 2
මහෝත්තමයාණෙනි, ඔබගේ නාමයට
ප්‍රශංසා ගී කියන්නෙමි.
මාගේ සතුරන් ආපසු හැරෙන කල, 3
ඔව්හු ඔබ ඉදිරියෙහි පැකිල
විනාශවෙති.
මක්නිසාද ඔබ මාගේ කාරණයද 4
යුක්තියද ඉෂ්ටකළසේක;
ඔබ ධර්මිෂ්ඨලෙස විනිශ්චයකරමින්
සිංහාසනයෙහි වැඩහුන්සේක.
ඔබ ජාතීන්ට තරවටුකොට දුෂ්ටයන් 5
විනාශකළසේක,
සදාකාලේටම ඔවුන්ගේ නාමය
මැකූසේක.

*නොහොත්, දේවදූතයන්ට.

6 සතුරෝ කෙළවරකට පැමිණියෝය,
ඔව්හුද ඔබ විසින් පෙරළාදැමූ
නුවරවල්ද සදකාලයටම නාස්තිවූය;
ඒවා ගැන සිහිවීම පවා නැතිවිය.
7 එහෙත් ස්වාමීන්වහන්සේ සදකල්ම
රජව වැඩහිඳිනසේක.
උන්වහන්සේ තමන් සිංහාසනය
විනිශ්චය පිණිස පිළියෙළකළසේක.
8 උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් ලෝකයා
විනිශ්චයකරනසේක,
අවංකකමින් ජනයන්ට යුක්තිය
සලස්වාදෙනසේක.
9 ස්වාමීන්වහන්සේ පීඩා ඇත්තවුන්ට
උස් කොටුවක් වනසේක,
විපත්ති කාලවලදී උස් කොටුවක්
වනසේක;
10 ඔබගේ නාමය දන්නෝ ඔබ කෙරෙහි
විශ්වාසකරන්නාහුය;
මක්නිසාද ස්වාමිනි, ඔබ සොයන්නන්
ඔබ අත්නැරියසේක.
11 සියොන්හි වාසයකරන ස්වාමීන්ට
ප්‍රශංසා ගී කියව්;
සෙනඟ අතරේ උන්වහන්සේගේ
ක්‍රියා ප්‍රකාශකරව්.
12 මක්නිසාද ලේ ගැන විභාගකරන්නාවූ
උන්වහන්සේ ඔවුන් සිහිකරනසේක.
දිළිඳුගේ මොරගැසීම මතකනැති
නොකරනසේක.
13 මා විසින් ඔබගේ ප්‍රශංසා සියල්ල
ප්‍රකාශකරන පිණිසද,
සියොන් දුවගේ දොරටුවලදී
ඔබගේ ගැළවීම කෙරෙහි ප්‍රීතිවන
පිණිසද,
14 ස්වාමිනි, මට කරුණාකළ මැනව;
මරණ ද්වාරවලින් මා ඔසවන්නාවූ
ඔබ,
මට ද්වේෂකරන්නන්ගෙන් මා විඳින
පීඩා බැලුව මැනව.
15 ජාතීහු තමුන් හෑරූ වළේ කිඳගොස්
සිටිති.
ඔවුන් රහසින් හෙළූ දැලට ඔවුන්ගේම
පා අසුවී තිබේ.
16 ස්වාමීන්වහන්සේ යුක්තිය ඉෂ්ටකොට
තමන්ම දක්වූසේක;
දුෂ්ටයා තමා අතින් කළ ක්‍රියායෙහිම
අසුවී සිටියි.
දුෂ්ටයෝ, එසේය, දෙවියන්වහන්සේ 17
සිහිනැතිකරන සියලු ජාතීහු
*මෙයෝල්ට හැරීයන්නාහුය.
මක්නිසාද දුප්පතා නිතරම මතක 18
නැති නොවන්නේය,
දිළිඳුන්ගේ බලාපොරොත්තුව
සදකාලේටම විනාශ නොවන්නේය.
ස්වාමිනි, නැඟුටුණ මැනව; මනුෂ්‍යයා 19
ජය නොගනීවා.
ජාතීහු ඔබ ඉදිරියේ විනිශ්චයකරනු
ලබත්වා.
ස්වාමිනි, ඔවුන්ට භය පැමිණෙවුව 20
මැනව,
ජාතීහු තමුන් මනුෂ්‍යයන් පමණක්
බව දැනගනිත්වා.

## දුඃඛිතයන්ගේ යාච්ඤාව

10

ස්වාමිනි, ඔබ කුමට දුරුව
සිටිනසේක්ද?
විපත්ති කාලවලදී කුමට සැඟවී
සිටිනසේක්ද?
දුෂ්ටයාගේ අහංකාරකමෙන් දිළිඳ 2
දවෙන්නේය;
ඔවුන් විසින් යොදන ප්‍රයෝගවලින්
තුමූම අසුවෙත්වා.
මක්නිසාද දුෂ්ටයා තමාගේ සිතේ 3
ආශාව ඉෂ්ටවීම ගැන පාරට්ටුකර
ගනියි,
ලෝභි තැනැත්තේද ස්වාමීන් අත්හරියි,
එසේය, උන්වහන්සේ හෙළාදකියි.
දුෂ්ටයා අහංකාරයෙන් කථාකොට: 4
උන්වහන්සේ පළි නොගන්නසේකැයි
කියයි.
දෙවිකෙනෙක් නැත යනු ඔහුගේ
මුළු සිතිවිල්ල වේ.
ඔහුගේ මාර්ග සෑමවිටම ස්ථිරය; 5
ඔබගේ විනිශ්චයෝ ඔහුට
නොපෙනෙන තරම් ඉහළය.

*හෙවත්, පාතාලයට.

ඔහු තමාගේ සියලු සතුරන් කෙරේ
අහංකාරයෙන් පිඹෙයි.
6 ඔහුද: මම නොසෙල්වන්නෙමි;
සියලු පරම්පරා දක්වා විපත්ති
නොවිඳින්නෙමියි සිතින් කියයි.
7 ඔහුගේ මුඛය ශාපයෙන්ද රැවටිල්ල
හා බලාත්කාරයෙන්ද පිරී තිබේ.
ඔහුගේ දිව යට නපුරුකම හා අයුතුකම
ඇත.
8 ඔහු ගම්වල රැක හිඳින තැන්හි
නැවතී සිට
අප්‍රකාශ ස්ථානවලදී නිර්දෝෂයන්
මරයි.
ඔහුගේ ඇස් අසරණ අයට විරුද්ධව
රහසින් යොමා තිබේ.
9 සිංහයා ගුහාවේ රැක සිටින්නාක්
මෙන් ඔහු අප්‍රකාශ ස්ථානයෙහි
රැක සිටියි.
දිළිඳු අල්ලාගන්ට මග රැකසිටියි.
ඔහුගේ දැල ඇද දිළිඳු අල්ලයි.
10 ඔහු බිම ලැග සිටියි, නැඹුරුව සිටියි,
ඔහුගේ බලවතුන් කරණකොටගෙන
අසරණ අය වැටෙති.
11 ඔහු කථාකොට: දෙවියන්වහන්සේට
මතකනැතිවිය;
උන්වහන්සේ මුහුණ සඟවාගන්නාසේක;
උන්වහන්සේ කිසිකලෙක
එය නොදක්නේයයි සිතින් කියයි.
12 ස්වාමිනි, නැඟිටුණ මැනව;
දෙවියන්වහන්ස, ඔබගේ අත එසෙවුව
මැනව.
දිළිඳුන් මතකනැති නොකළ මැනව.
13 දුෂ්ටයා දෙවියන්වහන්සේට නින්දා
කරන්නෙත්
ඔබ පළි නොගන්නසේකැයි සිතින්
කියන්නෙත් මක්නිසාද?
14 ඔබ එය දුටුසේක; මක්නිසාද ස්වකීය
හස්තයෙන් විපාකදෙන පිණිස
ඔබ නපුරුකම සහ වෛරය දෙස
බලනසේක.
අසරණ තැනැත්තේ ඔබට භාරවෙයි;
ඔබ පියා නැත්තාගේ
උපකාරකාරයාණෝ වූසේක.

දුෂ්ටයාගේ බාහුව බින්ද මැනව; 15
නපුරාගේ දුෂ්ටකම කිසිත් ඉතුරු
නොවී යනතුරු සෙවුව මැනව.
ස්වාමීන්වහන්සේ සදාකාලයටම 16
රජ්ජුරුවෝය.
ජාතීහු උන්වහන්සේගේ දේශයෙන්
විනාශවූවෝය.
ස්වාමිනි, ඔබ යටහතුන්ගේ කැමැත්ත 17
ඇසූසේක.
භූමිකවූ මනුෂ්‍යයාගෙන් තවත් භය
නොපැමිණෙන පිණිස,
පියා නැත්තා සහ පීඩා විඳින්නා 18
විනිශ්චයකරන්ට,
ඔබ ඔවුන්ගේ සිත් සූදානම්කරන-
සේක, ඔබ කන්දී අසනසේක.

## ස්ථිර ඇදහීමේ ගීතය

11

නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ ගීතයකි.
මම ස්වාමීන් සරණ කොට ගනිමි. 1
පක්ෂියෙකු මෙන් නුඹේ කන්දට
පලායවයි
මාගේ ආත්මයට නුඹලා කෙසේ
කියවුද?
බලව, දුෂ්ටයෝ දුන්න නමති, 2
අවංක සිත් ඇත්තන්ට අඳුරෙහි විදින
පිණිස
ඔව්හු ඊගස දුනුදියෙහි යොදති.
අත්තිවාරම් විනාශවූවොත් 3
ධර්මිෂ්ඨයා කුමක් කළ හැක්කේද?
ස්වාමීන්වහන්සේ ස්වකීය ශුද්ධ 4
මන්දිරයෙහි වැඩ සිටිනසේක,
ස්වාමීන්ගේ සිංහාසනය ස්වර්ගයෙහිය;
උන්වහන්සේගේ ඇස්වලින් මනුෂ්‍ය
පුත්‍රයන් බලා ඇසිපියවලින් ඔවුන්
පරීක්ෂාකරනසේක.
ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨයා 5
විමසනසේක.
නුමුත් උන්වහන්සේගේ ආත්මය
දුෂ්ටයාටත් බලාත්කාරකමට
ප්‍රියවෙන්නාටත් ද්වේෂකරයි.
දුෂ්ටයන් පිට උන්වහන්සේ මලපත් 6
වස්වනසේක;

ගිනිද ගෙන්දගම්ද දවන සුළඟද
ඔවුන්ගේ කුසලානට බෙදෙන
කොටස වන්නේය.
7 මක්නිසාද ස්වාමීන්වහන්සේ
ධර්මිෂ්ඨසේක; උන්වහන්සේ
ධර්මිෂ්ඨකමට ප්‍රියවනසේක.
අවංක අය උන්වහන්සේගේ මුහුණ
දකින්නෝය.

## අභක්තිය පැවති කාලයේදී කළ යාච්ඤාවක්

12 නායක වාද්‍යකරුටයි;
ෂෙමීනීත් නම් මහා
වීණාවෙන් ගායනාකිරීමටයි.
දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමිනි, පිහිටවුව මැනව; මක්නිසාද
භක්තිවන්තයෝ පිරිහෙති;
විශ්වාස අය මනුෂ්‍යපුත්‍රයන් අතරෙන්
නැතිවෙති.
2 ඔවුන් සෑම දෙන තමුන්ගේ අසල්වාසියා
සමග නිෂ්ඵල දේ කථාකරති.
ඔව්හු වාටු සහිත මුඛයෙන් හා
දෙසිතින් කථාකෙරෙති.
3 අපේ දිවෙන් ජයගන්නෙමුව;
අපේ තොල් අපේමය; අපට ස්වාමියා
කවුදැයි කියන්නාවූ
4 වාටු සහිත මුඛ සහ මහත් කාරණා
කියන දිවද
ස්වාමීන්වහන්සේ කපාහරිනසේක.
5 දිළිඳුන්ගෙන් කොල්ලකෑම නිසාද
දුප්පතුන්ගේ සුසුම්ලීම නිසාද
මම දැන් නැගිට,
අපහාසකරනු ලැබූ අය සුරක්ෂිත
ලෙස පිහිටුවන්නෙමියි
ස්වාමීන්වහන්සේ කියනසේක.
6 පොළොවේ උදුනක සත් වරක්
පවිත්‍රකළ රිදී මෙන්
ස්වාමීන්ගේ වචන පිරිසිදුය.
7 ස්වාමිනි, ඔබ ඔවුන්
ආරක්ෂාකරනසේක,
මේ පරම්පරාවෙන් සෑමකල්ම ඔබ
ඔවුන් රැකගන්නසේක.
8 දුශ්චරිතය මනුෂ්‍යපුත්‍රයන් අතරෙහි
උසස්වෙන කල
දුෂ්ටයෝ සියලු දෙසම ඇවිදිති.

## ස්වාමීන්වහන්ස, කොතෙක් කල්ද?

නායක වාද්‍යකරුටයි. 13
දාවිත්ගේ ගීතයකි.

ස්වාමිනි, ඔබ කොපමණ කල් මා 1
නිතරම සිහි නොකර සිටිනසේක්ද?
කොපමණ කල් ඔබගේ මුහුණ මාගෙන්
සඟවනසේක්ද?
කොපමණ කල් මාගේ ආත්මයෙන් 2
මන්ත්‍රණ යොදමින්,
දවස මුළුල්ලේ මාගේ සිතෙහි ශෝකය
ඇතුව සිටිම්ද?
කොපමණ කල් මාගේ සතුරා මා
කෙරේ උසස්වන්නේද?
මාගේ දෙවිවූ ස්වාමිනි, මා සලකා 3
මට උත්තරදුන මැනව.
මරණ නින්දට මා නොපැමිණෙන
පිණිස මාගේ ඇස් එළියකළ
මැනව.
නැත්නම්: ඔහුගෙන් ජයගතිමියි 4
මාගේ සතුරා කියන්නේය;
මා චංචලවන කල මාගේ
එදිරිකාරයෝද ප්‍රීතිවන්නෝය.
එහෙත් මම වනාහි ඔබගේ කරුණාව 5
විශ්වාසකෙළෙමි;
මාගේ සිත ඔබගේ ගැළවීමෙහි
ප්‍රීතිවන්නේය.
ස්වාමීන්වහන්සේ මට යහපත්කම් කළ 6
නිසා
උන්වහන්සේට ගායනාකරන්නෙමි.

## දේවඅභක්තික ලෝකයා ගැන දුක්වීම

නායක වාද්‍යකරුටයි. 14
දාවිත්ගේ ගීතයකි.

අඥනයා: දෙවිකෙනෙක් නැතැයි 1
සිතින් කීය.
ඔව්හු දුශ්චරිතයෙහි සිටිති, ඔව්හු
පිළිකුල් ක්‍රියා කළෝය;
යහපත කරන්නෙක් නැත.
නුවණින් ක්‍රියාකරන්නාවූ, 2
දෙවියන්වහන්සේ සොයන්නාවූ
යමෙක් ඇද්දැයි දකින පිණිස,

ස්වාමීන්වහන්සේ ස්වර්ගයේ සිට
මනුෂ්‍යපුත්‍රයන් දෙස බැලූසේක.
3 සියල්ලෝම මුළාව ගොස් සිටිති; එක
ලෙස කිලුටුව සිටිති;
යහපත කරන්නෙක් නැත, එසේය,
එක්කෙනෙක්වත් නැත.
4 ආහාර කන්නාක්මෙන් මාගේ සෙනඟ
කාදමන්නාවූ,
ස්වාමීන්ට හඬ නොගසන්නාවූ,
අයුතුකම් කරන සියල්ලන්ට
කිසිදැනගැන්මක් නැද්ද?
5 ඔව්හු එහි මහත් භයින් සිටියෝය.
මක්නිසාද දෙවියන්වහන්සේ
ධර්මිෂ්ඨයන්ගේ පරම්පරාවෙහි
සිටිනසේක.
6 ස්වාමීන්වහන්සේ දිළිඳුගේ
රක්ෂාස්ථානය බැවින්
තුඹලා ඔහුගේ මන්ත්‍රණය ලජ්ජාවට
පෙරළන්නහුය.
7 අහෝ සියොන් කෙරෙන් ඉශ්‍රායෙල්ගේ
ගැළවීම පැමුණුණොත් යහපත!
ස්වාමීන්වහන්සේ තමන් සෙනඟ
වහල්කමින් මුදා ගෙනෙන කල්හි,
යාකොබ් ප්‍රීතිවන්නේය, ඉශ්‍රායෙල්
සන්තෝෂවන්නේය.

## සත්පුරුෂයාගේ චරිතය

15 දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමිනි, ඔබගේ මණ්ඩපයෙහි
සිටින්නේ කවුද?
ඔබගේ පිරිසිදු කන්දේ වසන්නේ
කවුද?
2 අවංකලෙස හැසිරෙන්නාවූ, ධර්මිෂ්ඨකම්
කරන්නාවූ,
සිතින් සැබෑව කියන්නාවූ තැනැත්තේය.
3 ඔහු තමාගේ දිවෙන් කේලාම්
නොකියයි,
තමාගේ මිත්‍රයාට නපුර නොකරයි,
තමාගේ අසල්වාසියාට විරුද්ධව නින්දා
බසක් පතළ නොකරයි.
4 අසත්පුරුෂයා ඔහුගේ ඇසට පිළිකුල්ව
පෙනෙයි;
නුමුත් ඔහු ස්වාමීන් කෙරෙහි
භය ඇත්තන්ට ගෞරවකරයි.
තමාට අලාභ පැමිණෙන දිවුරුමක්
කළ නුමුත් එය වෙනස් නොකරයි.
ඔහු මුදල් පොළියට නොදෙයි, 5
නිර්දෝෂයාට විරුද්ධව අල්ලස්ද
නොගනියි.
මෙසේ කරන තැනැත්තේ කිසිකලෙකත්
නොසෙල්වන්නේය.

## ස්වාමීන්වහන්සේ පරම සැපත බව

16 දාවිත්ගේ මික්තාම් නම්
කාව්‍යමකි.

දෙවියන්වහන්ස, මා ආරක්ෂාකළ 1
මැනව. මක්නිසාද ඔබ සරණ
කොට ගනිමි.
ඔබ මාගේ ස්වාමීන්වහන්සේය, 2
ඔබ හැර යහපතක් මට නැතැයි
ස්වාමීන්ට කීමි.
පොළොවේ සිටින ශුද්ධවන්තයෝ 3
වනාහි
මාගේ මුළු ප්‍රීතිය උපදවන
උත්තමයෝය.
ස්වාමීන් අත්හැර අන් දෙවිකෙනෙකු 4
පිළිගන්නන්ගේ දුක් බෝ වන්නේය.
ඔවුන් ලෙයින් කරන පාන පූජා මම
පූජා නොකරන්නෙමි,
ඔවුන්ගේ නම් මාගේ කටින්
නොකියන්නෙමි.
මාගේ උරුම කොටසත් කුසලාන්- 5
කොටසත් ස්වාමීන්වහන්සේය.
ඔබ මාගේ කොටස රක්ෂාකරනසේක.
මට මායිම් වූණේ ප්‍රසන්න තැන්වලය; 6
එසේය, මට ප්‍රියකරු උරුමයක් ඇත.
මට දැනමිතිකම් දුන්නාවූ ස්වාමීන්ට 7
ස්තුති ප්‍රශංසාකරන්නෙමි;
එසේය, රාත්‍රි භාගයෙහිදී මාගේ
සිතිවිලිවලින් මට ගුරුකම් ලැබේ.
ස්වාමීන් නිතර මා ඉදිරියෙහි 8
තබා ගතිමි.
උන්වහන්සේ මාගේ දකුණු පැත්තෙහි
සිටින බැවින් මම නොසෙල්වන්නෙමි.
එබැවින් මාගේ සිත සන්තෝෂවේ, 9
මාගේ ගෞරවය ප්‍රීතියෙන් පිනයි.

මාගේ මාංසයද සුරැකිව වසන්නේය.
10 මක්නිසාද ඔබ මාගේ ආත්මය
*මෙයෝල්ලෙහි තිබෙන්ට නාරිනසේක;
ඔබගේ ශුද්ධ තැනැත්තාට කුණුවීම
දකින්ට නොදෙනසේක.
11 ඔබ මට ජීවන මාර්ගය දක්වනසේක.
ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම
ඇත්තේය;
ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලේටම
සැපත ඇත්තේය.

## විරුද්ධකාරයාගේ මාවත්වලින් මිදීම.

17 දාවිත්ගේ යාච්ඤාවකි.

1 ස්වාමිනි, යුක්තිය අසාව මැනව,
මාගේ හඬගැසීම සැලකුව මැනව;
වංකවූ තොල්වලින් නොනික්මෙන
මාගේ යාච්ඤාවට කන්දුන මැනව.
2 මාගේ නඩුතීන්දුව ඔබ ඉදිරියෙන්
පැමිණේවා;
ඔබගේ ඇස් යුක්තිය බලාවා,
3 ඔබ මාගේ සිත පරීක්ෂාකළසේක;
රාත්‍රියේ මා බැලූසේක;
ඔබ මා විමසූසේක, මා තුළ කිසි
නපුරු අදහසක් නොදක්නාසේක;
මාගේ මුඛයෙන් වරද නොකරන්ට
නියමකරගතිමි.
4 මනුෂ්‍යයන්ගේ ක්‍රියා කෙසේ වුවත්
මම ඔබගේ තොල්වල වචනය
කරණකොටගෙන
බලාත්කාරකරන්නන්ගේ මාර්ගවලින්
වැලකී සිටියෙමි.
5 මාගේ අඩි ඔබගේ මාවත්වල ස්ථිර
ලෙස පිහිටියේය,
මාගේ පාද නොලිස්සුවේය.
6 දෙවියන්වහන්ස, ඔබ මට උත්තර
දෙන නිසා මම ඔබට හඬගැසීමි.
ඔබගේ කන් මා දෙසට යොමුකොට
මාගේ බස් අසාව මැනව.
7 ඔබ කෙරෙහි සරණගන්නවුන්
විරුද්ධකාරයන්ගෙන් ඔබගේ
දකුණතින්
ගළවන තැනන්වහන්ස,
ඔබගේ පුදුමවූ කරුණාගුණය දක්වුව
මැනව.

*හෙවත්, පාතාලයෙහි.

මාගෙන් කොල්ලකන්නාවූ 8
දුෂ්ටයන්ගෙන්ද
මා මරන්ට කැමතිවූ මා වටකරගන්න
සතුරන්ගෙන්ද
ඇසේ කළුරුවාව මෙන් මා රක්ෂාකළ 9
මැනව,
ඔබගේ පියාපත් සෙවණෙහි මා
සඟවාගත මැනව.
ඔව්හු තමුන්ගේම තෙලින් තරවී සිටිති. 10
කටින් උඩඟුලෙස කථාකරති.
දැනුදු ඔව්හු අපේ අඩිපාර බලා අප 11
වටකරගන සිටිති.
අප බිම හෙළන්ට ඇස් යොමුකර
සිටිති.
ඔහු ගොදුරට ගිජුවූ සිංහයෙකුටත් 12
රහස් තැන්වල රැකහිඳින තරුණ
සිංහයෙකුටත් සමානය.
ස්වාමිනි, නැඟුටුණ මැනව, 13
ඔහුට විරුද්ධව සිටිය මැනව, ඔහු
පහත හෙළුව මැනව;
ස්වාමිනි, ඔබගේ කඩුවෙන් 14
දුෂ්ටයන්ගෙන්ද,
ඔබගේ අතින් මනුෂ්‍යයන්ගෙන්,
එනම්, ඔවුන්ගේ කොටස මේ ජීවිතයෙහි
ලද්දාවූ,
ඔබගේ වස්තුවෙන් ඔබ විසින් බඩ
පුරවන්නාවූ,
දරුවන් නිසා තෘප්තියට පැමිණ,
ළදරුවන්ට ඉතිරි දේ තබායන්නාවූ
ලෞකික මනුෂ්‍යයන්ගෙන්ද මාගේ
ආත්මය ගැළවුව මැනව.
මම වනාහි ධර්මිෂ්ඨකමින් ඔබගේ 15
මුහුණ දක්නෙමි.
මම පුබුදින කල ඔබගේ ස්වරූපයෙන්
තෘප්තියට පැමිණෙන්නෙමි.

## රාජකීය ස්තුතියක්

18 නායක වාද්‍යකරුටයි. ස්වාමීන්වහන්සේගේ, මෙහෙකරුවූ දාවිත්ගේ ගීතයකි. ඔහුගේ සියලු සතුරන්ගෙන්ද සාවුල්ගේ අතින්ද ස්වාමීන්වහන්සේ ඔහු මිදූ කල ඔහු මේ ගීතිකාවේ වචන ස්වාමීන්වහන්සේට කීවේය. එනම්:

1 මාගේ ශක්තියවූ ස්වාමිනි, ඔබට
ප්‍රේමකරමි.

2 ස්වාමීන්වහන්සේ මාගේ පර්වතයය,
මාගේ බලකොටුවය, මාගේ
මිදුම්කාරයාණෝය;
මාගේ දෙවියන්වහන්සේය, මාගේ
ශක්තිමත් පර්වතයය, උන්වහන්සේ
සරණ කොට ගන්නෙමි;
උන්වහන්සේ මාගේ පලිහය, මාගේ
ගැළවීමේ අඟය, මාගේ උස්
කොටුවය.
3 ප්‍රශංසා ලැබිය යුතුවූ ස්වාමීන්ට
හඬගසන්නෙමි.
මෙසේ මාගේ සතුරන්ගෙන් ගළවනු
ලබන්නෙමි.
4 මරහුගේ ලනුවලින් වෙළනු ලැබීමි,
අධර්මය නමැති ජල ප්‍රවාහයෝ මා
භයගැන්වූය.
5 *මෙයෝලේ බැඳුම් මා වටින් විය.
මරණයේ මලපත් මා පිටට ආයේය.
6 මාගේ විපත්තියේදී ස්වාමීන්ට
හඬගැසීමි,
මාගේ දෙවියන්වහන්සේට මොරගැසීමි.
උන්වහන්සේ තමන් මාලිගාවෙහි සිට
මාගේ හඬ ඇසූසේක,
උන්වහන්සේ ඉදිරියෙහි මාගේ
මොරගැසීමද උන්වහන්සේගේ
කණෙහි වැටුණේය.
7 එවිට පොළොව සෙලවී කම්පාවූවාය,
කඳුවල අත්තිවාරම්ද දෙදරා
සෙලවුණේය,
මක්නිසාද උන්වහන්සේ උදහස්වූසේක.
8 උන්වහන්සේගේ නාස්පුටවලින් දුමක්
නැංගේය,
උන්වහන්සේගේ මුඛයෙන් ගිනි නික්ම
විනාශකෙළේය.
එයින් අඟුරු ඇවිළගත්තේය.
9 උන්වහන්සේ අහස නමාගෙන
බැස්සසේක;
උන්වහන්සේගේ පාද යට
ඝනාන්ධකාරය විය.
10 උන්වහන්සේ කෙරුබයෙක් පිට නැඟී
පියාසරකළසේක,
එසේය, උන්වහන්සේ සුළඟ නමැති
පියාපත් මතුයෙහි වේගයෙන්
ගමන්කළසේක.
උන්වහන්සේ අන්ධකාරය තමන්ට 11
ආවරණයක්ද,
ජලධාරාවල අන්ධකාරය සහ ආකාශ
ඝන වලාකුල් තමන් වටකොට
මණ්ඩපයක්ද කරගත්සේක.
උන්වහන්සේ ඉදිරියෙහිවූ දීප්තිය 12
නිසා උන්වහන්සේගේ ඝන වලාකුල්
පහව ගියේය;
ගල්වැසිද ගිනි අඟුරුද විය.
ස්වාමීන්වහන්සේ අහසෙහි 13
ගර්ජනාකළසේක,
මහෝත්තමයාණෝද තමන් හඬ
නිකුත්කළසේක;
ගල්වැසිද ගිනි අඟුරුද විය.
උන්වහන්සේ තමන් ඊගස් විද ඔවුන් 14
විසිරවූසේක;
එසේය, බොහෝ විදුලි එවා ඔවුන්
පරාජයකළසේක.
එවිට ස්වාමිනි, ඔබගේ 15
තරවටුකිරීමෙන්ද
ඔබගේ නාසා වාත වේගයෙන්ද
ජල පාරවල් ප්‍රකාශවුණේය,
ලෝකයේ අත්තිවාරම්ද ප්‍රකාශවිය.
උන්වහන්සේ උඩින් අත පොවා මා 16
අල්වාගත්සේක;
බොහෝ ජලධාරාවලින් මා
ඇදගත්සේක.
උන්වහන්සේ මාගේ බලවත් 17
සතුරාගෙන්ද මට වෛරවූවන්ගෙන්ද
මා මුදගත්සේක,
මක්නිසාද ඔව්හු මට වඩා
බලසම්පන්න වූය.
මාගේ විපත්ති දවසේදී ඔව්හු මට 18
විරුද්ධව ආවෝය.
නුමුත් ස්වාමීන්වහන්සේ මට
ආධාරවූසේක.
උන්වහන්සේ විශාල ස්ථානයකට මා 19
ගෙනාසේක;
උන්වහන්සේ මා කෙරෙහි ප්‍රසන්නවූ
බැවින් මා මිදූසේක.
ස්වාමීන්වහන්සේ මාගේ ධර්මිෂ්ඨකම 20
ලෙස මට විපාක දුන්සේක;

*හෙවත්, පාතාලයේ.

මාගේ අත්වල පිරිසිදුකම ලෙස මට
ප්‍රතිඵල දුන්සේක.
21 මක්නිසාද මම ස්වාමීන්ගේ මාර්ගවල
පැවතුණෙමි,
මාගේ දෙවියන්වහන්සේ කෙරෙන්
දුෂ්ටලෙස අහක්ව නොගියෙමි.
22 මක්නිසාද උන්වහන්සේගේ සියලු
විනිශ්චයෝ මා ඉදිරියෙහි වූහ,
උන්වහන්සේගේ පනත්ද මා කෙරෙන්
පහ නොකෙළෙමි.
23 මම උන්වහන්සේ වෙත නිර්දෝෂව
සිටියෙමි,
මාගේ අයුතුකමෙන් වැලකී සිටියෙමි.
24 එබැවින් ස්වාමීන්වහන්සේ මාගේ
ධර්මිෂ්ඨකම ලෙසත්
උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි
මාගේ අත්වල පිරිසිදුකම ලෙසත්
මට ප්‍රතිඵල දුන්සේක.
25 කරුණාවන්තයා සමග ඔබද
කරුණාවන්ත බව දක්වනසේක;
*නිර්දෝෂ තැනැත්තා සමග †නිර්දෝෂ
බව දක්වනසේක;
26 පිරිසිදු අය සමග ඔබ පිරිසිදු බව
දක්වනසේක;
හිතුවක්කාර අය සමග විරුද්ධ බව
දක්වනසේක.
27 මක්නිසාද ඔබ පීඩිතවූ සෙනඟ
ගළවනසේක;
තුමූත් උඩඟු ඇස් පහත්කරනසේක.
28 එසේය, ඔබ මාගේ පහන
දල්වනසේක.
මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මාගේ
අන්ධකාරය ආලෝකකරනසේක.
29 මක්නිසාද ඔබ කරණකොටගෙන
සමූහයකට විරුද්ධව දුවමි;
මාගේ දෙවියන්වහන්සේ
කරණකොටගෙන පවුරකින් පනිමි.
30 දෙවියන්වහන්සේගේ මාර්ගය
සම්පූර්ණය.
ස්වාමීන්ගේ වචනය නිර්මලය;
උන්වහන්සේ තමන් සරණ කොටගන්න
සියල්ලන්ට පලිහක් වනසේක.

*හෙවත්, සම්පූර්ණ මනුෂ්‍යයා.
†හෙවත්, සම්පූර්ණ බව.

මක්නිසාද ස්වාමීන් හැර දෙවිකෙනෙක් 31
කවුද?
අපේ දෙවියන්වහන්සේ හැර පර්වතයක්
කවරේද?
මාගේ ඉණ බලයෙන් සරසන්නේ 32
දෙවියන්වහන්සේය,
උන්වහන්සේ මාගේ මාර්ගය *නිර්මල
කරනසේක.
උන්වහන්සේ මාගේ පාද මුවන්ගේ පාද 33
මෙන් කරනසේක.
මාගේ උස්තැන්වල මා පිහිටුවනසේක.
උන්වහන්සේ යුද්ධයට මාගේ අත් 34
පුරුදුකරනසේක;
එහෙයින් මාගේ බාහු පිත්තල දුන්නක්
නමති.
තවද ඔබගේ ගැළවීම නමැති පලිහ 35
ඔබ මට දුන්සේක.
ඔබගේ දකුණත මා දරුවේය,
ඔබගේ මෘදුකම මා උසස්කෙළේය.
ඔබ මාගේ අඩිපාර පළල්කළසේක, 36
මාගේ පාදයෝද නොලිස්සුවෝය.
මාගේ සතුරන් ලුහුබැඳ අල්ලාගත්තෙමි. 37
ඔවුන් විනාශවෙන තුරු හැරී
නොඑන්නෙමි.
නැගිටින්ට බැරිවන ලෙස ඔවුන්ට 38
පහරදෙන්නෙමි.
ඔව්හු මාගේ පාද යට වැටෙන්නාහුය.
මක්නිසාද ඔබ මාගේ ඉණ බලයෙන් 39
සැරසූසේක.
මට විරුද්ධව නැගුටුණු අය ඔබ මා
යටතේ මැඩපැවැත්වූසේක.
මාගේ වෛරකාරයන් මා විසින් සිඳිනු 40
ලබන පිණිස
ඔබ මාගේ සතුරන් මට පිටුපාන්ට
සැලැස්සූසේක.
ඔව්හු මොරගැසුවෝය, තුමූත් ගළවන්ට 41
කිසිවෙක් නොවීය.
ස්වාමීන්ට මොරගැසුවෝය, තුමූත්
උන්වහන්සේ ඔවුන්ට උත්තර
නුදුන්සේක.
එකල මම සුළඟ ඉදිරියෙහි ධූලි මෙන් 42
ඔවුන් සුණු කෙළෙමි.
වීථිවල මඩ මෙන් ඔවුන් වීසිකෙළෙමි.

*හෙවත්, සම්පූර්ණ

43 ඔබ සෙනඟගේ විවාදවලින් මා
මුදා ගත්සේක;
ඔබ මා ජාතීන්ගේ ප්‍රධානියා
කළසේක.
මා විසින් ඇඳින නොගත් සෙනඟක්
මට මෙහෙකරන්නේය.
44 ඔව්හු මා ගැන ඇසූ කෙණෙහිම මට
කීකරුවන්නාහුය.
විදේශීහු මට යටත්වන්නාහුය.
45 විදේශීහු මලානිකව,
තමන් සැඟවී හුන් තැන්වලින්
වෙවුලමින් පිටත එන්නෝය.
46 ස්වාමීන්වහන්සේ ජීවත්වනසේක;
මාගේ පර්වතයවූ උන්වහන්සේට
ප්‍රශංසාවේවා;
මාගේ ගැළවීමේ දෙවියන්වහන්සේ
උසස්වනසේක්වා.
47 උන්වහන්සේ වනාහි මා උදෙසා
පළිගන්නාවූ,
ජාතීන් මට යටත්කරදෙන්නාවූ
දෙවියන්වහන්සේය.
48 උන්වහන්සේ මාගේ සතුරන්ගෙන් මා
මුදගන්නාසේක.
එසේය, මට විරුද්ධව නැඟිටින්නන්ට
වඩා ඔබ මා උසස්කරනසේක.
බලාත්කාරකරන්නාගෙන් මා
ගළවා ගන්නසේක.
49 එබැවින් ස්වාමිනි, ජාතීන් අතරේ
ඔබට ස්තුතිකරන්නෙමි,
ඔබගේ නාමයට ප්‍රශංසා ගී
කියන්නෙමි.
50 උන්වහන්සේ තමන් රජහට මහත්
ගැළවීම දෙනසේක;
තමන්ගේ අභිෂේකලත් තැනැත්තා
වන
දාවිත්ටත් ඔහුගේ වංශයටත් සදකල්
කරුණාව පෙන්වනසේක,

## මැවිල්ලේ හා ව්‍යවස්ථාවේ මහිමය

**19** නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ ගීතයකි,

1 අහස දෙවියන්වහන්සේගේ මහිමය
ප්‍රකාශකරයි;
ගුවන්තලය උන්වහන්සේගේ
හස්තකර්මාන්තය දක්වයි.
2 දවාල දවාලට කථාකරයි,
රාත්‍රිය රාත්‍රියට ඥානය දක්වයි.
කථාවක්වත් වචනයක්වත් නැත; 3
ඒවායේ ශබ්දය නොඇසෙයි.
ඒවායේ මායිම පොළොව මුළුල්ලේද 4
ඒවායේ වචන ලෝකයේ කෙළවර
දක්වාද පැතිරගියේය.
එහි උන්වහන්සේ සූර්යයාට
මණ්ඩපයක් පිහිටෙවූසේක.
ඔහු තමාගේ භවනයෙන් නික්මෙන 5
මනමාලයෙකු වැනිය,
තමාගේ ගමන දුවන්ට ශක්තිමත්
කෙනෙකුමෙන් ප්‍රීතිවෙයි.
ඔහුගේ නික්මයාම අහසේ කෙළවරෙන් 6
වේ,
වටේට යාමත් එහි කෙළවර දක්වා වේ,
ඒකේ රස්නය නොවැදෙන කිසිවක්
නැත්තේය.

ස්වාමීන්ගේ ව්‍යවස්ථාව සම්පූර්ණය, 7
ආත්මය ප්‍රාණවත්කරන්නේය.
ස්වාමීන්ගේ සාක්ෂිය සත්‍යය, නුවණ
නැත්තන් ඥානවත්කරන්නේය.
ස්වාමීන්ගේ පනත් සාධාරණය, සිත 8
ප්‍රීතිකරවන්නේය.
ස්වාමීන්ගේ ආඥාව පවිත්‍රය, ඇස්
එළියකරන්නේය.
ස්වාමීන් කෙරෙහි භය පිරිසිදුය, සදකල් 9
පවතින්නේය.
ස්වාමීන්ගේ විනිශ්චයයෝ සැබෑය,
සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨය.
ස්වර්ණයටත්, එසේය අනර්ඝ ස්වර්ණ 10
රාශියකටත් වඩා ඊට ආශාවිය
යුතුය,
මීපැණියටත් *මීවදයටත් වඩා මිහිරිය.
තවද එයින් ඔබගේ මෙහෙකරුවාට 11
අවවාද ලැබේ.
ඒවා පැවැත්වීමෙන් මහත් විපාක
ඇත්තේය.
ස්වකීය වැරදි දැනගත හැකි කාටද? 12
නොදන්නා වරදවලින් මා නිදෙස්
කළ මැනව.
එඩිතරව පව්කිරීමෙන් ඔබගේ 13
මෙහෙකරුවා වැලැක්වුව මැනව;
ඒවා මා කෙරෙහි අධිපතිකම්
නොකෙරේවා. එවිට මම †නිර්දෝෂ
වන්නෙමි,

*හෙවත්, පැණි වැස්සෙන මීවදයටත්.
†නොහොත්, සම්පූර්ණ.

මහත් අපරාධයෙන් නිදොස්වන්නෙමි.
14 මාගේ පර්වතයද මිදුම්කාරදවූ ස්වාමීනි,
මාගේ මුඛයෙහි වචන හා සිතෙහි භාවනාද ඔබ ඉදිරියෙහි පිළිගැන්මට සුදුසු වේවා.

## යුද්ධයට යෑමේදී කළ යාච්ඤාව

20 නායක වාද්‍යකරුටයි. දාවිත්ගේ ගීතයකි.

1 විපත්ති දවසේදී ස්වාමීන්වහන්සේ නුඹට උත්තරදෙනසේක්වා;
යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ නාමය නුඹ උසස්කෙරේවා;
2 ශුද්ධස්ථානයෙන් නුඹට පිහිට එවනසේක්වා,
සියොන්හි සිට නුඹ ශක්තිමත්කරනසේක්වා;
3 නුඹේ පූජා සියල්ල සිහිකරනසේක්වා,
නුඹේ දවන පූජාව පිළිගන්නාසේක්වා;
4 නුඹේ සිතේ ආශාව ලෙස නුඹට දෙනසේක්වා,
නුඹේ මන්ත්‍රණ සියල්ල ඉෂ්ටකරනසේක්වා.
5 නුඹේ ගැළවීම ගැන අපි ජය සෝෂා කරන්නෙමුව,
අපේ දෙවියන්වහන්සේගේ නමින් අපගේ කොඩි නගන්නෙමුව.
ස්වාමීන්වහන්සේ නුඹේ සියලු ඉල්ලීම් ඉෂ්ටකරනසේක්වා.
6 ස්වාමීන්වහන්සේ තමන් අභිෂේකලත් තැනැත්තා ගළවන බව දැන් දනිමි;
උන්වහන්සේ තමන් ශුද්ධවූ ස්වර්ගයේ සිට,
තමන් දකුණතේ ගැළවීමේ ශක්තියෙන් ඔහුට උත්තරදෙනසේක.
7 සමහරු රථ කෙරෙහිද සමහරු අශ්වයන් කෙරෙහිද විශ්වාසකෙරෙති.
නුමුත් අපි අපේ දෙවිවූ ස්වාමීන්ගේ නාමය සඳහන්කරන්නෙමුව.
8 ඔව්හු නැමී වැටී සිටිති.
නුමුත් අපි නැගිට කෙළින් සිටිමුව.
9 ස්වාමීනි, *ගැළවුව මැනව.
අප හඬගසන කල රජ්ජුරුවෝ අපට උත්තරදෙනසේක්වා.

## ජයගැනීම් ගැන ප්‍රශංසාව

21 නායක වාද්‍යකරුටයි. දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමීනි, රජතෙම ඔබගේ ශක්තියෙන් ප්‍රීතිවන්නේය;
ඔබගේ ගැළවීම කෙරෙහි ඔහු කොපමණ මහත් ලෙස ප්‍රීතිවන්නේද!
2 ඔහුගේ සිතේ ආශාව ලෙස ඔබ ඔහුට දුන්සේක,
ඔහුගේ මුඛයෙන් ඉල්ලූ දේ ඔහුගෙන් නොවැළැක්වූසේක.
3 මක්නිසාද ඔබ යහපත් වරයන් රැගෙන ඔහු ඉදිරියට එනසේක,
ඔහුගේ හිස පිට පවිත්‍ර රන් ඔටුන්නක් තබනසේක.
4 ඔහු ඔබගෙන් ජීවිතය ඉල්ලුවේය;
ඔබ ඔහුට සදාකල් පවතින දීර්ඝායුස දුන්සේක.
5 ඔබගෙන් ලැබුණු ගැළවීම කරණකොටගෙන ඔහුගේ ප්‍රශංසාව මහත්ය.
ඔබ ගෞරවය හා මහිමය ඔහු පිට තබනසේක.
6 මක්නිසාද ඔබ සදාකල්ම ඔහු ඉතා ආශීර්වාදලද්දෙක් කරනසේක.
ඔබ ඉදිරියෙහිවූ ප්‍රීතියෙන් ඔහු සන්තෝෂකරවනසේක.
7 මක්නිසාද රජතෙම ස්වාමීන් කෙරෙහි විශ්වාසකරයි,
මහෝත්තමයාණන්ගේ කරුණාගුණයෙන් ඔහු නොසෙල්වී සිටින්නේය.
8 නුඹේ අතට නුඹේ සියලු සතුරෝද
නුඹේ දකුණතට නුඹට වෛරවන්නෝද අසුවන්නෝය.
9 ඔබ කෝපවූ කල ඔවුන් ගිනි උදුනක් මෙන් කරනසේක.

*නොහොත්–රජ්ජුරුවන් ගැළවුව මැනව.

ස්වාමීන්වහන්සේ තමන් උදහසින්
ඔවුන් නැතිකර දමනසේක,
ගින්නද ඔවුන් දවා ලන්නේය.
10 ඔබ ඔවුන්ගේ වංශය පොළොවෙන්ද
ඔවුන්ගෙන් පැවත එන්නන් මනුෂ්‍ය
පුත්‍රයන් අතරෙන්ද
විනාශකරනසේක.
11 මක්නිසාද ඔව්හු ඔබට විරුද්ධව නපුර
සිතුවෝය.
තමුන්ට ඉෂ්ටකරන්ට බැරිවූ උපායක්
යෙදුවෝය.
12 මක්නිසාද ඔවුන් පිටුපාන්ට ඔබ
සලස්වනසේක,
ඔබගේ දුනුදිය රැගෙන ඔවුන්ගේ
මුහුණු දෙසට යොදනසේක.
13 ස්වාමීනි, ස්වකීය ශක්තියෙන් උසස්
වුවමැනව.
එවිට අපි ගී කියමින් ඔබගේ බලය
ගැන ප්‍රශංසාකරන්නෙමුව.

## දේවසේවකයාගේ දුක්විඳීම

**22** නායක වාද්‍යකරුටයි; අලුයමේ
මුවදෙන නම්වූ වෘත්තයයි.
දාවිත්ගේ ගීතයකි.
1 මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ
මා අත්හැරියේ මක්නිසාද?
මට පිහිට නොවී, මාගේ මොරගැසීමේ
වචනවලින් මෙසේ දුරුව
සිටින්නේ මක්නිසාද?
2 මාගේ දෙවියනි, දවල් ඔබට හඬගසමි,
එහෙත් ඔබ උත්තර නොදෙනසේක;
රාත්‍රියේද නිශ්ශබ්දව නොසිටිමි.
3 නුමුත් ඉශ්‍රායෙල්ගේ ප්‍රශංසා මධ්‍යයෙහි
වාසයකරන්නාවූ
ඔබ ශුද්ධසේක.
4 අපේ පියවරු ඔබ කෙරෙහි විශ්වාස
කළෝය.
ඔව්හු විශ්වාසකළෝය, ඔබද ඔවුන්
මිදූසේක.
5 ඔව්හු ඔබට හඬගැසුවෝය,
මුදනුලැබුවෝය;
ඔබ කෙරෙහි විශ්වාසකළෝය,
ලජ්ජානුවූවෝය.
මම නම් මනුෂ්‍යයෙක් නොව 6
පණුවෙක්මි;
මිනිසුන් අතරෙහි නින්දිතයෙක්මි,
සෙනඟ විසින් හෙළාදක්නා
ලද්දෙක්මි.
මා දකින සියල්ලෝම මට කවටකම් 7
කෙරෙති.
ඔව්හු තොල් දික්කරමින්, හිස වනමින්:
ස්වාමීන්ට භාරවෙව; උන්වහන්සේ 8
ඔහු මුදනසේක්වා;
උන්වහන්සේ ඔහු කෙරෙහි ප්‍රසන්න
බැවින් ඔහු මුදනසේක්වයි කියති.
එහෙත් මවු කුසින් මා බිහිකළ 9
තැනන්වහන්සේ ඔබමය;
මාගේ මවුගේ ළයෙහි හුන්කල ඔබ
මා විශ්වාසයෙන් සිටින්ට
සැලැස්සූසේක.
මවු ගැබෙහි පටන් ඔබගේ ආරක්ෂාවට 10
භාරදෙනු ලදිමි,
මාගේ මවගේ කුසෙහි පටන් මාගේ
දෙවියන්වහන්සේ ඔබය.
මා කෙරෙන් දුරුනුව මැනව; මක්නිසාද 11
දුක ළඟය;
පිහිටවෙන්ට කිසිවෙක් නැත්තේය.
බොහෝ ගොන්නු මා වටකර සිටිති. 12
බාෂාන්හි සවි ඇති ගොන්නු මා වටලා
සිටිති.
ගොදුරුකමින් ගොරවන සිංහයෙකු 13
මෙන්
ඔව්හු මා දෙස බලා කට අරිති.
මම වතුර මෙන් වැගිරයෙමි, 14
මාගේ ඇට සියල්ල අවසන්ධිවේ.
මාගේ සිත ඉටි මෙන් වේ;
එය මා තුළෙහි උණුවී තිබේ.
මාගේ සවිය කැබිලිත්තක් මෙන් 15
වියළී තිබේ;
මාගේ දිවද තල්ලේ ඇලෙයි;
ඔබ මා මරණ ධූලියට ගෙනාසේක.
මක්නිසාද බල්ලෝ මා වටකළෝය. 16
නපුරන් රැළ මා වටලා ගත්තුය;
ඔව්හු මාගේ අත්පා සිදුරුකළෝය.
මාගේ ඇට සියල්ල ගණින්කළ 17

හැක්කෙමි;
ඔව්හු මා දෙස රවා බලති.
18 මාගේ වස්ත්‍ර ඔවුන් අතරේ බෙදා ගනිති,
මාගේ සළුව පිණිස පසඇට දමති.
19 නුමුත්, ස්වාමීනි, ඔබ දුරුනූව මැනව.
මාගේ බලය වන ඔබ, මට පිහිට
වෙන්ට ඉක්මන්වුව මැනව.
20 මාගේ ප්‍රාණය කඩුවෙන්ද
මාගේ *ප්‍රිය ප්‍රාණය බල්ලාගේ
බලයෙන්ද මිදුව මැනව.
21 සිංහයාගේ මුඛයෙන් මා ගැළවුව මැනව;
එසේය, වල් ගොනුන්ගේ අං අතරෙහි
වූ මට ඔබ උත්තරදුන්සේක.
22 ඔබගේ නාමය මාගේ සහෝදරයන්ට
ප්‍රකාශකරන්නෙමි,
සභා මධ්‍යයෙහි ඔබට
ප්‍රශංසාකරන්නෙමි.
23 ස්වාමීන් කෙරෙහි භය ඇත්තෙනි,
උන්වහන්සේට ප්‍රශංසාකරව්;
යාකොබ් වංශයේ සියල්ලෙනි,
උන්වහන්සේට ගෞරවකරව්;
ඉශ්‍රායෙල් වංශයේ සියල්ලෙනි,
උන්වහන්සේ කෙරෙහි භයින් සිටිව්.
24 මක්නිසාද උන්වහන්සේ විපත් පැමිණි
තැනැත්තාගේ විපතට නින්දා
නොකළසේක, එය පිළිකුල්කොට
නොසිතුසේක;
ඔහු කෙරෙන් තමන් මුහුණ සඟවා
නොගත්සේක;
ඔහු හඬගැසූ කල උන්වහන්සේ
ඇසූසේක.
25 මහත් සභාවේදී මාගේ ප්‍රශංසාව
පැමිණෙන්නේ ඔබ කෙරෙන්ය.
උන්වහන්සේට භයවෙන්නන් ඉදිරියේ
මාගේ භාර ඉෂ්ටකරන්නෙමි.
26 යටහත් සිත් ඇත්තෝ අනුභවකොට
තෘප්තියට පැමිණෙන්නාහුය.
ස්වාමීන් සොයන්නෝ උන්වහන්සේට
ප්‍රශංසාකරන්නාහුය.
තුඹලාගේ සිත සදාකල් ජීවත්වේවා.
27 පොළොවේ සියලු සීමාවෝ සිහිකරමින්
ස්වාමීන් වෙතට හැරෙන්නෝය.
ජාතීන්ගේ සියලු ගෝත්‍රයෝ ඔබ
ඉදිරියෙහි නමස්කාරකරන්නෝය.
මක්නිසාද රාජ්‍යය 28
ස්වාමීන්වහන්සේගේය.
උන්වහන්සේ ජාතීන් කෙරෙහි
ආණ්ඩුකාරයාණෝය.
පොළොවේ පුෂ්ටිමත් සියල්ලෝ 29
අනුභවකොට නමස්කාරකරන්නාහුය.
ධූලියට බසින්නෝ, එනම් තමුන්ගේ
දිවි රැකගත නොහැකි අය,
උන්වහන්සේ ඉදිරියෙහි වැඳ
වැටෙන්නාහුය.
වංශයක් උන්වහන්සේට 30
මෙහෙකරන්නේය;
මතුපරම්පරාවට ස්වාමීන් ගැන එපවත්
කියනු ලබන්නේය.
ඔව්හු පැමිණ උන්වහන්සේ මෙසේ 31
කළසේක කියා
මතු උපදින සෙනඟකට උන්වහන්සේගේ
ධර්මිෂ්ඨකම ප්‍රකාශකරන්නාහුය.

*නොහොත්, තනිවූ ප්‍රාණය.

## යහපත් බැටළු එඬේරාණෝ

දාවිත්ගේ ගීතයකි. **23**

ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය; 1
මට හිඟයක් නොවන්නේය.
උන්වහන්සේ නිල් ගොදුරු බිම්වල 2
මා ලගින්ට සලස්වනසේක.
නිශ්චලවූ දිය අසලින් මා
ගෙනයනසේක.
උන්වහන්සේ මාගේ ආත්මය 3
ප්‍රාණවත්කරනසේක;
ස්වකීය නාමය නිසා ධර්මිෂ්ඨකමේ
මාවත්වල මා ගෙනයනසේක.
එසේය, මරණ සෙවණේ මිටියාවත 4
මැදින් යන්නෙමි නමුත්,
කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි;
මක්නිසාද ඔබ මා සමඟය.
ඔබගේ දණ්ඩෙන් හා සැරයටියෙන්
මට සැනසිල්ල ලැබේ.
මාගේ සතුරන් ඉදිරියෙහි ඔබ මට 5
කෑම මේසයක් පිළියෙළකරනසේක.
මාගේ හිස තෙලින් ආලේපකළසේක;

මාගේ කුසලාන උතුරායයි.
6 සැබවින් යහපත්කමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියලු දවස්වල මා අනුව එන්නේය.
මම සදාකල්ම ස්වාමීන්ගේ ගෘහයෙහි වාසයකරන්නෙමි.

## තේජසේ රජ්ජුරුවෝ

24 දවිත්ගේ ගීතයකි.

1 පොළොව හා එහි සම්පූර්ණත්වයද ලෝකය හා එහි වැසියෝද ස්වාමීන්ගේය.
2 මක්නිසාද උන්වහන්සේ එය මුහුදු පිට පිහිටෙවූසේක,
ගංගා පිට ස්ථිරකළසේක.
3 ස්වාමීන්ගේ කන්දට නගින්නේ කවුද?
උන්වහන්සේගේ ශුද්ධස්ථානයෙහි සිටින්නේ කවුද?
4 පවිත්‍ර අත් සහ පිරිසිදු සිතක් ඇත්තාවූ,
තමාගේ ආත්මය *නිෂ්ඵලකමට යොමු නොකළාවූ,
වංචාවෙන් නොදිවුළාවූ තැනැත්තේමය.
5 ඔහු ස්වාමීන්ගෙන් ආශීර්වාදයක්ද තමාගේ ගැළවීමේ දෙවියන්වහන්සේගෙන් ධර්මිෂ්ඨකමද ලබන්නේය.
6 උන්වහන්සේ සොයන්නන්ගේ, එනම් යාකෝබ්ගේ දෙවියන්වහන්ස, ඔබගේ මුහුණ සොයන්නන්ගේ පරම්පරාව මේය.
7 ද්වාරයෙනි, තොපගේ හිස් ඔසවව්;
†සදාකාලික ද්වාරයෙනි, උස්වව්.
තේජසේ රජ්ජුරුවෝ ඇතුල්වනසේක.
8 තේජසේ රජ්ජුරුවෝ කවුද?
බලපරාක්‍රම සහිත ස්වාමීන්වහන්සේය,
යුද්ධයෙහි බලසම්පන්නවූ ස්වාමීන්වහන්සේය.
9 ද්වාරයෙනි, තොපගේ හිස් ඔසවව්.
එසේය, †සදාකාලික ද්වාරයෙනි, හිස් ඔසවව්.
තේජසේ රජ්ජුරුවෝ ඇතුල්වනසේක.
මේ තේජසේ රජ්ජුරුවෝ කවුද? 10
සේනාවල ස්වාමීන්වහන්සේය,
තේජසේ රජ්ජුරුවෝ උන්වහන්සේය.

*නොහොත්, බොරුකාරකමට.
†නොහොත් පුරාණ.

## ලුහුඬු යාච්ඤා පෙළක්

දවිත්ගේ ගීතයකි. 25

ස්වාමීනි, ඔබ දෙසට මාගේ ආත්මය ඔසවමි. 1
මාගේ දෙවියන්වහන්ස, ඔබ කෙරෙහි විශ්වාසකෙළෙමි, 2
මම ලජ්ජා නොවෙම්වා;
මා කෙරෙහි ජය නාද පවත්වන්ට මාගේ සතුරන්ට ඉඩ නුදුන මැනව.
එසේය, ඔබ කෙරෙහි බලා සිටින 3
කවරෙක්වත් ලජ්ජා නොවන්නේය.
නිෂ්කාරණයේ ද්‍රෝහිකම්කරන්නෝ ලජ්ජාවන්නෝය.
ස්වාමීනි, ඔබගේ මාර්ග මට දක්වුව 4
මැනව;
ඔබගේ මාවත් මට ඉගැන්නුව මැනව.
ඔබගේ සැබෑකමෙහි මා හසුරුවමින් 5
මට ඉගැන්නුව මැනව;
මක්නිසාද ඔබ මාගේ ගැළවීමේ දෙවියන්වහන්සේය;
දවස මුළුල්லේ ඔබ කෙරෙහි බලාසිටිමි.
ස්වාමීනි, ඔබගේ මෘදුවූ දයාබරකම්ද 6
කරුණාගුණයන්ද සිහිකළ මැනව;
මක්නිසාද ඒවා පෙර සිට පවත්නේය.
ස්වාමීනි, මාගේ යෞවන වයසේ 7
පව්වත් මාගේ අපරාධවත් සිහි නොකළ මැනව.
ස්වාමීනි, ඔබගේ යහපත්කම නිසා ඔබගේ කරුණාව පරිද්දෙන් මා සිහිකළ මැනව.
ස්වාමීන්වහන්සේ යහපත්ය, අවංකය. 8
එහෙයින් උන්වහන්සේ පව්කාරයන්ට මාර්ගය උගන්වනසේක.
උන්වහන්සේ යටහතුන් යුක්තියෙහි 9
හසුරුවනසේක.
යටහතුන්ට තමන්ගේ මාර්ගය උගන්වනසේක.

10 ස්වාමීන්ගේ ගිවිසුමද ශික්ෂාද
රක්නවුන්ට
උන්වහන්සේගේ සියලු මාවත්
කරුණාව හා සැබෑකමද වෙති.
11 ස්වාමිනි, මාගේ අයුතුකම මහත්
බැවින්
ඔබගේ නාමය නිසා ඊට කමාවුව
මැනව.
12 ස්වාමීන් කෙරෙහි භය ඇත්තේ
කවරේද?
ඔහු විසින් තෝරාගත යුතු මාර්ගය
උන්වහන්සේ උගන්වනසේක.
13 ඔහුගේ ආත්මය සුවසේ වසන්නේය;
ඔහුගේ වංශය දේශය
උරුමකරගන්නේය.
14 ස්වාමීන්ගේ *රහස උන්වහන්සේ
කෙරෙහි භය ඇත්තන් හා සමගය;
උන්වහන්සේ ස්වකීය ගිවිසුම ඔවුන්ට
දන්වනසේක.
15 මාගේ ඇස් නිතරම ස්වාමීන් දෙසට
යොමුව තිබේ;
මක්නිසාද උන්වහන්සේ මාගේ පාද
දැලෙන් මුදගන්නාසේක.
16 මා දෙසට හැරී මට කරුණාකළ
මැනව;
මක්නිසාද මම අසරණයෙමි,
පීඩිතයෙමි.
17 මාගේ සිතේ දුක් වැඩිව තිබේ.
මාගේ විපත්තිවලින් මා මුදගත මැනව.
18 මාගේ පීඩාව සහ වේදනාවද බැලුව
මැනව;
මාගේ සියලු පව් කමාකළ මැනව.
19 මාගේ සතුරන් බැලුව මැනව, මක්නිසාද
ඔව්හු බොහෝය;
කෲරවූ වෛරයෙන් ඔව්හු මට වෛර
වෙති.
20 මාගේ ආත්මය ආරක්ෂාකොට මා
මිදුව මැනව.

*එනම්, මිත්‍රකම.

ඔබ කෙරෙහි විශ්වාසකරන බැවින්
මම ලජ්ජා නොවෙම්වා.
සත්‍යකමත් අවංකකමත් මා රකීවා, 21
මක්නිසාද ඔබ කෙරෙහි බලා සිටිමි.
දෙවියන්වහන්ස, ඉශ්‍රායෙල් 22
ඔහුගේ සියලු දුක්වලින් මිදුව මැනව.

## සම්පූර්ණ හෙවත් අවංක අයගේ ඉල්ලීම

දාවිත්ගේ ගීතයකි. 26

ස්වාමිනි, මා විනිශ්චයකළ මැනව, 1
මක්නිසාද මම *නිර්දෝෂකමින්
හැසුරුණෙමි.
මම නොසෙල්වී ස්වාමීන් කෙරෙහි
විශ්වාසකෙළෙමි.
ස්වාමිනි, මා සෝදිසිකොට 2
පරීක්ෂාකළ මැනව;
මාගේ හෘදයත් සිතත් විමසා බැලුව
මැනව.
මක්නිසාද ඔබගේ කරුණාගුණය 3
මාගේ ඇස් හමුයෙහිය;
ඔබගේ සැබෑකමෙහි හැසුරුණෙමි.
මම බොරුකාර මිනිසුන් සමග 4
හිඳ නොගතිමි;
රැවටිලිකාරයන් සමගද නොයමි.
නපුරුකම් කරන්නන්ගේ සමාගමට 5
වෛරවෙමි,
දුෂ්ටයන් සමග හිඳ නොගන්නෙමි.
ස්වාමිනි, ස්තුති ශබ්දය ඇසෙන්ට 6
සලස්වන පිණිසද,
ඔබගේ සියලු ආශ්චර්යමත් ක්‍රියා
ප්‍රකාශකරන පිණිසද,
නිදෙස්කමින් මාගේ අත් සෝද, 7
ඔබගේ පූජාසනය ප්‍රදක්ෂිණාකරන්නෙමි.
ස්වාමිනි, ඔබගේ ගෘහ වාසයටත් 8
ඔබගේ තේජස පිහිටි ස්ථානයටත්
ප්‍රේමකරමි.
පව්කාරයන් සමග මාගේ ආත්මයත් 9
මිනීමරන්නන් සමග මාගේ ජීවිතයත්
එක් නොකළ මැනව.
ඔවුන්ගේ අත්වල පව්ටුකම ඇත්තේය, 10

*නොහොත්, සම්පූර්ණකමින්.

ඔවුන්ගේ දකුණත අත්ලසින් පිරී තිබේ.
11 මම වනාහි *නිර්දෝෂකමින්
හැසිරෙන්නෙමි.
මා මුදා මට කරුණාකළ මැනව.
12 මගේ පය සමබිමෙක්හි පිහිටා තිබේ.
සභාවලදී ස්වාමීන්ට
ප්‍රශංසාකරන්නෙමි.

## දෙවියන්වහන්සේ තුළ ප්‍රීති සහිත විශ්වාසය

**27** දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමීන්වහන්සේ මාගේ ආලෝකයත්
ගැළවීමත්ය; මම කාට භයවන්නෙම්ද?
ස්වාමීන්වහන්සේ මාගේ ජීවිතයේ
ශක්තියය; මම කාට භීතවන්නෙම්ද?
2 නපුරුකම්කරන්නෝ එනම් මාගේ
එදිරිකාරයන් හා සතුරෝ
මාගේ මාංසය කන පිණිස මට
විරුද්ධව ආ කල පැකිල වැටුණෝය.
3 සේනාවක් මට විරුද්ධව කඳවුරු
බැන්දත්,
මාගේ සිත භය නොවන්නේය.
මට විරුද්ධව යුද්ධයක් හටගත්තත්,
එකල්හිත් මම සුරක්ෂිතව
සිටින්නෙමි.
4 ස්වාමීන්ගෙන් එක දෙයක් ඉල්ලීමි,
ඒක සොයන්නෙමි;
එනම් ස්වාමීන්ගේ අලංකාරය දකින
පිණිසත් උන්වහන්සේගේ මාලිගාවේදී
භාවනාකරන පිණිසත්
මාගේ ජීවිතයේ සියලු දවස්වලදී
ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය
කිරීමය.
5 මක්නිසාද විපත්ති දවසේදී
උන්වහන්සේ ස්වකීය විමානයෙහි
මා වසා තබනසේක,
ස්වකීය මණ්ඩපයෙහි වූ
අප්‍රකාශස්ථානයෙහි මා
සඟවනසේක;
උන්වහන්සේ පර්වතයක් පිට මා ඔසවා
තබනසේක.
6 දැනුදු මා අවට සිටින මාගේ සතුරන්ට
ඉහළින් මාගේ හිස ඔසවනු
ලබන්නේය;

*නොහොත්, සම්පූර්ණකමින්.

උන්වහන්සේගේ මණ්ඩපයෙහි ප්‍රීති පූජා
පුදන්නෙමි;
ස්වාමීන්ට ගීතිකා කරන්නෙමි, එසේය,
ප්‍රශංසා ගී කියන්නෙමි.
ස්වාමීනි, මාගේ ශබ්දයෙන් හඬගසන 7
කල ඇසුව මැනව.
මට කරුණාකොට උත්තරදුන මැනව.
මාගේ මුහුණ සොයවයි ඔබ කී 8
කල,
ස්වාමීනි, ඔබගේ මුහුණ
සොයන්නෙමියි මාගේ සිත ඔබට
කීය.
ඔබගේ මුහුණ මා කෙරෙන් සඟවා 9
නොගත මැනව;
උදහසින් ඔබගේ මෙහෙකරුවා බැහැර
නොකළ මැනව.
ඔබ මාගේ පිහිට වූසේක;
මාගේ ගැළවීමේ දෙවියන්වහන්ස, මා
පහ නොකළ මැනව, අත් නොහළ
මැනව.
මාගේ පියාද මවුද මා අත්හැරියෝය, 10
නුමුත් ස්වාමීන්වහන්සේ මා
පිළිගන්නසේක.
ස්වාමීනි, ඔබගේ මාර්ගය මට 11
ඉගැන්නුව මැනව;
මාගේ සතුරන් නිසා
සමතලා මාර්ගයෙක්හි මා ගෙනගිය
මැනව.
මාගේ එදිරිකාරයන්ගේ කැමැත්තට 12
මා භාර නුදුන මැනව.
මක්නිසාද බොරු සාක්ෂිකාරයෝද
කෲරකමින් තර්ජනකරන්නෝද
මට විරුද්ධව නැගිට සිටිති.
ජීවතුන්ගේ දේශයෙහි 13
*ස්වාමීන්ගේ යහපත්කම දකින්ට
ලැබේයයි නොඇදහුවෙම්නම්
කොපමණ අසරණද?
ස්වාමීන් කෙරෙහි බලාසිටුව. 14
ශක්තිමත් වෙව, තාගේ සිත ධෛර්යමත්
වේවා;
එසේය, ස්වාමීන් කෙරෙහි බලාසිටුව.

*නොහොත්, ස්වාමීන්ගේ ධර්මිෂ්ඨකම
මට දකින්ට ලැබේයයි විශ්වාසකරමි.

## අපරාධකරන්නන් මධ්‍යයෙහි යාච්ඤාකිරීම

28 දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමීනි, ඔබට හඬගසන්නෙමි;
මාගේ පර්වතයාණෙනි මට කන්නොදී නොසිටිය මැනව.
ඔබ නිශ්ශබ්දවූසේක්නම්,
වළට බසින්නන් හා සමාන වන්නෙමි.
2 මා ඔබට හඬගසන කලද
ඔබගේ ශුද්ධ වාග්භූමිය දෙසට මාගේ අත් ඔසවන කලද මාගේ කන්නලව් ශබ්දය ඇසුව මැනව.
3 තමුන්ගේ අසල්වාසීන් සමග සමාදානයෙන් කථාකරන නුමුත්
සිත්වල නපුරුකම ඇත්තාවූ
දුෂ්ටයන්ද අයුතුකම් කරන්නන්ද සමග
මා *ඇද නොදමුව මැනව.
4 ඔවුන්ගේ ක්‍රියාව හැටියටත් හැසිරීම්වල දුෂ්ටකම හැටියටත් ඔවුන්ට විපාක දුන මැනව.
ඔවුන් අතින් කළ ක්‍රියා ලෙස ඔවුන්ට කළ මැනව;
ඔවුන්ට සුදුසුලෙස ප්‍රතිඵල දුන මැනව.
5 ඔවුන් ස්වාමීන්ගේ ක්‍රියා හෝ
උන්වහන්සේගේ හස්තකර්ම හෝ නොසලකන බැවින්
උන්වහන්සේ ඔවුන් බිඳ දමනසේක, ගොඩ නොනගනසේක.
6 ස්වාමීන්ට ප්‍රශංසා වේවා,
මක්නිසාද උන්වහන්සේ මාගේ කන්නලව් ශබ්දය ඇසූසේක.
7 ස්වාමීන්වහන්සේ මාගේ ශක්තියය, මාගේ පලිහය;
මාගේ සිත උන්වහන්සේ කෙරෙහි විශ්වාසකෙළේය, මම උපකාර ලැබුයෙමි.
එබැවින් මාගේ සිත අතිශයින් ප්‍රීතිවන්නේය;
මාගේ ගීයෙන් උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙමි.
ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ ශක්තියය, 8
උන්වහන්සේ තමන්ගේ අභිෂේකලත් තැනැත්තාට ගැළවීමේ බලකොටුවක් වනසේක.
ඔබගේ සෙනඟ ගළවා, ඔබගේ උරුමය 9
වූවන්ට ආශීර්වාදකළ මැනව.
ඔවුන් පෝෂණයකරමින්, සදාකල්ම ඉසුලුව මැනව.

*නොහොත්–පහනොකළ මැනව හෝ ගණන් නොගත මැනව.

## කුණාටුවේදී දෙවියන්වහන්සේගේ හඬ

දාවිත්ගේ ගීතයකි. 29

බලවතුන්ගේ පුත්‍රයෙනි, ස්වාමීන්ට 1
දෙව්,
මහිමයත් බලයත් ස්වාමීන්ට දෙව්.
ස්වාමීන්ගේ නාමයට දියයුතු මහිමය 2
දෙව්;
ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමීන්ට නමස්කාරකරව්.
ස්වාමීන්ගේ ශබ්දය ජල මතුයෙහිය. 3
මහිමයෙන් යුක්තවූ දෙවියන්වහන්සේ,
එනම් ජල රාශි මතුයෙහි වැඩ සිටින ස්වාමීන්වහන්සේ ගර්ජනාකරන සේක.
ස්වාමීන්ගේ ශබ්දය බලවත්ය; 4
ස්වාමීන්ගේ ශබ්දය මහිමයෙන් පූර්ණය.
ස්වාමීන්ගේ ශබ්දය කිහිරිගස් බිඳියි; 5
එසේය, ස්වාමීන්වහන්සේ ලෙබනොන්හි කිහිරිගස් කැබලිකොට බිඳිනසේක.
උන්වහන්සේ ඒවා වස්සෙකු මෙන්ද 6
ලෙබනොන් සහ සිරියොන් කුඩා තරුණ වල් ගොනෙකු මෙන්ද පෙංකෙළින්ට සලස්වනසේක.
ස්වාමීන්ගේ ශබ්දය ගිනිදැල් බෙදයි. 7
ස්වාමීන්ගේ ශබ්දය වනාන්තරය 8
සොලවයි;
ස්වාමීන්වහන්සේ කාදෙෂ් වනාන්තරය සොලවනසේක.
ස්වාමීන්ගේ ශබ්දය මුවදෙනුන් 9

ප්‍රසවයකරවයි,
වනය පාළුකරයි.
උන්වහන්සේගේ මාලිගාවෙහි සියල්ල:
මහිමය වේවා) කියයි.
10 ස්වාමීන්වහන්සේ ජලගැල්මෙහිදී
රජෙකු මෙන් වැඩහුන්සේක;
එසේය, ස්වාමීන්වහන්සේ රජෙකු
මෙන් සදකල් වැඩහිඳිනසේක.
11 ස්වාමීන්වහන්සේ තමන් සෙනඟට
ශක්තිය දෙනසේක;
ස්වාමීන්වහන්සේ තමන් සෙනඟට
සමාදනයෙන් ආශීර්වාදකරනසේක.

## සුවය ගැන ප්‍රශංසාව

**30** වන ගෘහය කැපකිරීමේ ගීතිකාවයි. දවිත්ගේ ගීතයකි.

1 ස්වාමීනි, ඔබ වර්ණනාකරමි;
මක්නිසාද ඔබ මා උසස්කළසේක,
මාගේ සතුරන්ට මා සඳහා ප්‍රීති වෙන්ට
නුදුන්සේක.
2 මාගේ දෙවිවූ ස්වාමීනි,
ඔබට මොරගැසීමි, ඔබද මා
සුවකළසේක.
3 ස්වාමීනි, ඔබ *මෙයෝලෙන් මාගේ
ආත්මය ගොඩගත්සේක.
මා වළට නොබසින පිණිස මාගේ
ජීවිතය ආරක්ෂාකළසේක.
4 ස්වාමීන්ගේ ශුද්ධවන්තයෙනි,
උන්වහන්සේට ප්‍රශංසා ගී කියව්,
උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට
ස්තුතිකරව්.
5 මක්නිසාද උන්වහන්සේගේ උදහස
ඇසිල්ලකට පමණය;
උන්වහන්සේගේ කරුණාව
දිවිහිම්කොටය.
රාත්‍රියේ හැඩීම පවතින නුමුත්,
උදය ප්‍රීතිය පැමිණෙන්නේය.
6 මම වනාහි සැපතේදී කථාකොට:
කිසිකලෙකත් නොසෙල්වන්නෙමියි කීමි.
7 ස්වාමීනි, ඔබගේ කරුණාවෙන් ඔබ
මාගේ කන්ද ශක්තිමත්කොට
පිහිටෙවූසේක.
ඔබ මුහුණ සඟවාගත්සේක; මම
කැලඹුණෙමි.
ස්වාමීනි, ඔබට හඬගැසීමි; 8
ස්වාමීන්ට කන්නලව්කෙළෙමි.
මා වළට බසින කල මාගේ ලෙයින් 9
ඇති ප්‍රයෝජනය කිමද?
ධූලි ඔබට ප්‍රශංසාකරන්නේද? ඔබගේ
සත්‍යතාව ප්‍රකාශකරන්නේද?
ස්වාමීනි, ඇහුම්කන්දී මට 10
කරුණා කළ මැනව.
ස්වාමීනි, ඔබ මාගේ
ආධාරකාරයා වුව මැනව.
ඔබ මාගේ වැලපීම නැටීමට 11
පෙරළුසේක;
ඔබ මාගේ ගෝණිරෙදි මුදා
සතුටු පිළියෙන් මාගේ ඉණ
සැරසූසේක.
කුමටද? මාගේ මහිමය නිශ්ශබ්ද 12
නොවී ඔබට ප්‍රශංසා ගී කියන
පිණිසය.
මාගේ දෙවිවූ ස්වාමීනි, සදකල්ම ඔබට
ස්තුතිකරන්නෙමි.

## දෙවියන්වහන්සේගේ අතට භාරවීම

නායක වාද්‍යකරුටයි. දවිත්ගේ ගීතයකි. **31**

ස්වාමීනි, ඔබ කෙරෙහි විශ්වාසකරමි; 1
කිසිකලකත් ලජ්ජා නොවෙම්වා.
ඔබගේ ධර්මිෂ්ඨකමින් මා මිදුව මැනව.
මා දෙසට ඔබගේ කන නමා, 2
ඉක්මනින් මා මිදුව මැනව.
මා ගළවන්ට ශක්තිමත් පර්වතයක්ද
ආරක්ෂා ගෘහයක්ද වුව මැනව.
මක්නිසාද ඔබ මාගේ පර්වතය සහ 3
බලකොටුවය;
එබැවින් ඔබගේ නාමය නිසා මට
මඟපෙන්වමින් මා ගෙනගිය මැනව.
ඔවුන් රහසින් මට හෙළූ දැලින් මා 4
බැහැරගත මැනව;

*හෙවත්, පාතාලයෙන්.

මක්නිසාද ඔබ මාගේ රක්ෂාස්ථානයය.
5 ඔබ අතට මාගේ ආත්මය භාරදෙමි.
සැබෑකමේ දෙවිවූ **ස්වාමිනි**, ඔබ මා
මිදූසේක.
6 බොරුවූ හිස්වූ දේ සලකන්නන්ට
ද්වේෂකරමි.
නුමුත් මම **ස්වාමීන්** කෙරෙහි විශ්වාස
කරමි.
7 ඔබගේ කරුණාව ගැන සතුටුව
ප්‍රීති වන්නෙමි.
මක්නිසාද ඔබ මාගේ පීඩාව දුටුසේක;
පීඩාවලදී මාගේ ආත්මය
හැඳිනගත්සේක.
8 ඔබ සතුරාගේ අතේ මා හිරකොට
නොතැබූසේක;
විශාල භූමියක මාගේ පාද
පිහිටෙවූසේක.
9 **ස්වාමිනි**, මට කරුණාකළ මැනව,
මක්නිසාද මම දුකින් සිටිමි.
මාගේ ඇස, එසේය, මාගේ ආත්මයත්
ශරීරයත් ශෝකයෙන් වැහැරයයි.
10 මාගේ ජීවිතය කනගාටුවෙන්ද මාගේ
අවුරුදු සුසුම්ලීමෙන්ද ගෙවී තිබේ.
මාගේ අයුතුකම නිසා මාගේ ශක්තිය
පිරිහෙයි, මාගේ ඇටද ක්ෂයවී තිබේ.
11 මාගේ සියලු එදිරිකාරයන් නිසා
අධික වශයෙන්
මාගේ අසල්වාසීන්ට නින්දවක්ව සිටිමි,
මා අඳුනන්නන්ට භීතියක්ව සිටිමි.
පිටතදී මා දුටුවෝ මා කෙරෙන් පලා
ගියෝය.
12 සිතින් තොරවූ මළ තැනැත්තෙකු
මෙන් මතක් නොවී සිටිමි.
බිඳුණු භාජනයක් මෙන් වෙමි.
13 මක්නිසාද බොහෝ දෙනෙකුගේ
කෙලසුම් බස් ඇසීමි,
භාත්පස භීතිය ඇත්තේය.
මට විරුද්ධව එක්ව මන්ත්‍රණයකරද්දී,
ඔව්හු මාගේ ජීවිතය පැහැරගන්ට
උපා යෙදුවෝය.
14 එහෙත් **ස්වාමිනි**, මම ඔබ කෙරෙහි
විශ්වාසකෙළෙමි.
ඔබ මාගේ දෙවියන්වහන්සේයයි කීමි.
මාගේ කාලයන් ඔබ අතේය. 15
මාගේ සතුරන් අතින්ද මට පීඩා
කරන්නන්ගෙන්ද මා මුදාහැරිය මැනව.
ඔබගේ මෙහෙකරුවා කෙරෙහි ඔබගේ 16
මුහුණ බැබළෙවුව මැනව.
ඔබගේ කරුණාවෙන් මා ගැළෙවුව
මැනව.
**ස්වාමිනි**, මම ලජ්ජා නොවෙම්වා; 17
මක්නිසාද ඔබට හඬගැසීමි.
දුෂ්ටයෝ ලජ්ජාවෙත්වා, *ෂෙයෝලෙහි
නිශ්ශබ්දවෙත්වා.
ආඩම්බරයෙන් හා හෙළාදැක්මෙන් 18
ධර්මිෂ්ඨයාට විරුද්ධව උඩඟුලෙස
කථාකරන්නාවූ
බොරුකියන තොල් නිශ්ශබ්දවේවා.
ඔබ කෙරෙහි භය ඇත්තන්ට 19
නිධාන කොට තැබූවාවූ,
ඔබ කෙරෙහි විශ්වාසය තබන්නන්ට
මනුෂ්‍ය පුත්‍රයන් ඉදිරියෙහි ඔබ
කළාවූ ඔබගේ යහපත්කම
කොපමණ මහත්ද!
මනුෂ්‍යයාගේ කුමන්ත්‍රණවලින් ඔබ 20
හමුයෙහිවූ අප්‍රකාශස්ථානයෙහි ඔබ
ඔවුන් සඟවනසේක.
මුඛ විවාදයෙන් ඔවුන් විමානයෙක්හි
රහස්ලෙස ආරක්ෂාකරනසේක.
**ස්වාමීන්ට** ප්‍රශංසාවේවා; 21
මක්නිසාද උන්වහන්සේ ශක්තිමත්
නුවරකදී තමන් පුදුමවූ කරුණාගුණය
මට පෙන්වූසේක.
මම වනාහි: ඔබගේ ඇස් හමුයෙන් 22
සිඳිනු ලබමියි ඉක්මන්කමින් කීයෙමි.
එහෙත් මා ඔබට මොරගැසූ කල ඔබ
මාගේ කන්නලව් ශබ්දය ඇසූසේක.
**ස්වාමීන්ගේ** සියලු ශුද්ධවන්තයෙනි, 23
උන්වහන්සේට ප්‍රේමකරව්.
**ස්වාමීන්වහන්සේ** විශ්වාස ඇත්තන්
ආරක්ෂාකරනසේක,
උඩඟුලෙස ක්‍රියාකරන්නාට
බොහෝ සෙයින් ප්‍රතිඵලදෙනසේක.
**ස්වාමීන්** කෙරෙහි බලා සිටින 24
සියල්ලෙනි,
ශක්තිමත් වව්; තොපගේ සිත
ධෛර්යවත් වේවා.

*හෙවත්, පාතාලයෙහි.

## කමාව ලැබීමේ වාසනාවන්තකම

**32** දාවිත්ගේ අනුශාසනා ගීතයකි.

1 අපරාධයට කමාවත් පාපයට වැස්මත් ලැබූ තැනැත්තේ ආශීර්වාදලද්දෙක්ය.
2 ස්වාමීන්වහන්සේ යමෙකුගේ ගණනට අයුතුකම නොතබනසේක්ද,
යමෙකුගේ සිතේ වංචාවක් නැත්තේද, ඒ මනුෂ්‍යයා ආශීර්වාදලද්දෙක්ය.
3 මා නිශ්ශබ්දව සිටි කල,
දවස මුළුල්ලේ හඬා මොරගැසීමෙන් මාගේ ඇට ක්ෂයවිය.
4 මක්නිසාද දිවා රාත්‍රී දෙක්හිම ඔබගේ හස්තය මා පිට බරවිය.
මාගේ ඕජස් ගතිය ග්‍රීෂ්ම කාලයේ වියළීම මෙන් විය.
5 මාගේ පාපය ඔබට ප්‍රකාශකෙළෙමි, මාගේ අයුතුකම නොසැඟවීමි.
මාගේ වරද ස්වාමීන්ට කියාදෙන්නෙමියි කීමි;
ඔබද මාගේ පාපයේ අයුතුකම කමාකළසේක.
6 එසේ හෙයින් ඔබ සම්බවිය හැකි ප්‍රස්තාවයකදී සෑම භක්තිවන්තයාම ඔබට යාච්ඤාකෙරේවා.
සැබවින් මහත් ජලධාරාවන් ගලන කල ඒවා ඔහු වෙතට නොපැමිණෙන්නේය.
7 මාගේ සැඟවෙන ඉඩම නම් ඔබය; දුකට නොපැමිණෙන ලෙස ඔබ මා ආරක්ෂාකරනසේක;
මිදීමේ ගීතිකාවලින් ඔබ මා වටකරනසේක.
8 තට උගන්වන්නෙමි, තා විසින් යා යුතු මාර්ගයෙහි තට ගුරුකම් දෙන්නෙමි.
මාගේ ඇස තා කෙරේ යොමුකොට තට දැනමිතිකම් දෙන්නෙමි.
9 තේරුම් නැති අශ්වයෙක් හෝ අශ්වතරයෙක් මෙන් නොවව්.
උන් දමනයකරන පිණිස කටකලියාව සහ පටිය දැමිය යුතුය,
නැතහොත් උන් තට ළං නොවෙති.
දුෂ්ටයාට බොහෝ දුක් 10
පැමිණෙන්නේය.
නුමුත් ස්වාමීන් කෙරෙහි විශ්වාස කරන තැනැත්තේ කරුණාවෙන් වටකරනු ලබන්නේය.
ධර්මිෂ්ඨයෙනි, ස්වාමීන් කෙරෙහි 11
සතුටුව ප්‍රීතිවව්.
අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති නාද කරව්.

## මුදනු ලැබූ සෙනඟගේ ප්‍රශංසාව

**33**

ධර්මිෂ්ඨයෙනි, ස්වාමීන් කෙරෙහි 1
ප්‍රීතිමත් වව්.
ප්‍රශංසාකිරීම අවංකයන්ට හොබනේය.
වීණාවෙන් ස්වාමීන්ට ස්තුතිකරව්. 2
තත් දසයේ වීණාව රැගෙන උන්-වහන්සේට ප්‍රශංසා ගීතිකා කියව්.
උන්වහන්සේට අලුත් ගීතිකාවක් 3
ගායනාකරව්;
මහත් ශබ්දයකින් දක්ෂලෙස වාදනය කරව්.
මක්නිසාද ස්වාමීන්ගේ වචනය සෘජුය; 4
උන්වහන්සේගේ ක්‍රියා සියල්ල විශ්වාසකමෙන් කෙරෙන්නේය.
උන්වහන්සේ ධර්මිෂ්ඨකමටත් 5
යුක්තියටත් ප්‍රියවනසේක.
පොළොව ස්වාමීන්ගේ කරුණාගුණයෙන් පූර්ණය.
ස්වාමීන්ගේ වචනයෙන් ආකාශයද 6
උන්වහන්සේගේ මුඛයේ හුස්මෙන් එහි සියලු සේනාවද මවනලද්දේය.
උන්වහන්සේ සමුද්‍ර ජලාධාරාවන් 7
ගොඩක් සේ රැස්කොට,
ගැඹුරු ජලයන් ගබඩාවල නිධානකොට තබනසේක.
මුළු පොළොව ස්වාමීන්ට භයවේවා. 8
ලෝ වැසි සියල්ලෝ උන්වහන්සේ කෙරෙහි භයින් සිටිත්වා.
මක්නිසාද උන්වහන්සේ කථාකළ 9
පමණින් ඉෂ්ටවිය;
ආඥාකළ පමණින් ස්ථිරවිය.
ස්වාමීන්වහන්සේ ජාතීන්ගේ මන්ත්‍රණය 10

නිරර්ථක කරනසේක.
මනුෂ්‍ය වර්ගයන්ගේ සිතිවිලි නිෂ්ඵල
කරනසේක.
11 ස්වාමීන්ගේ මන්ත්‍රණය සදාකාලයටද
උන්වහන්සේගේ සිත්හි කල්පනා සියලු
පරම්පරාවලටද පවත්නේය.
12 ස්වකීය දෙවියන් කොට ස්වාමීන්-
වහන්සේ ඇතුව සිටින ජාතියද,
උන්වහන්සේ විසින් ස්වකීය උරුමය
කොට තෝරාගත් සෙනඟද
ආශීර්වාද ලද්දෝය.
13 ස්වාමීන්වහන්සේ ස්වර්ගයේ සිට
බලනසේක;
සියලු මනුෂ්‍ය පුත්‍රයන් දක්නාසේක;
14 උන්වහන්සේ ස්වකීය වාසස්ථානයේ
සිට
පොළෝවාසි සියල්ලන් දෙස
බලනසේක;
15 ඔවුන් සියල්ලන්ගේ සිත් සාදන්නේ
උන්වහන්සේමය,
ඔවුන්ගේ සියලු ක්‍රියා සලකන්නෙත්
උන්වහන්සේමය.
16 මහත් සේනාව කරණකොටගෙන
ගැළවුණු රජෙක් නැත.
බලසම්පන්න මනුෂ්‍යයෙක් තමාගේ
මහත් ශක්තියෙන් නොගැළවෙයි.
17 ආරක්ෂා පිණිස අශ්වයෙක් නිෂ්ඵලය.
ඌ ස්වකීය මහත් බලයෙන් කිසිවෙකු
නොගළවන්නේය.
18 බලව, ස්වාමීන් කෙරෙහි භය ඇත්තන්
සහ උන්වහන්සේගේ කරුණාව බලා
සිටින්නන්ගේ ආත්මය
මරණයෙන් ගළවන පිණිසත්,
19 දුර්භික්ෂයේදී ඔවුන්ගේ ජීවිත
ආරක්ෂා කරන පිණිසත්,
උන්වහන්සේගේ ඇස ඔවුන් කෙරෙහි
යොමුකොට තිබේ.
20 අපේ ආත්මය ස්වාමීන් කෙරෙහි
බලා සිටියේය.
අපේ උපකාරයත් පලිහත් උන්වහන්සේය.
21 අප උන්වහන්සේගේ ශුද්ධ නාමය
විශ්වාසකළ නිසා
අපේ සිත උන්වහන්සේ කෙරෙහි
ප්‍රීතිමත් වන්නේය.
ස්වාමිනි, ඔබ කෙරෙහි අප 22
බලාපොරොත්තුව සිටිය
ආකාරයෙන්
ඔබගේ කරුණාව අප කෙරෙහි වේවා.

## ස්වාමීන්වහන්සේ තුළ හැම කල්හිම ප්‍රීතිවීම

## 34

අබිමෙලෙක් ඉදිරියේදී දාවිත් තමාගේ ගතිය වෙනස්කර දක්වීම නිසා පන්නනු ලැබූ පසු සෑදූ දාවිත්ගේ ගීතයකි.

සෑම කල්හිම ස්වාමීන්ට ප්‍රශංසා කරමි. 1
උන්වහන්සේගේ වර්ණනාව මාගේ
මුඛයෙහි නිතරම පවත්නේය.
මාගේ ආත්මය ස්වාමීන්ගේ ගුණ 2
වර්ණනාකරන්නේය.
යටහත් සිත් ඇත්තෝ ඒ අසා
සන්තෝෂවන්නෝය.
මා සමග ස්වාමීන් වර්ණනාකරව්, 3
අපි එක්ව උන්වහන්සේගේ නාමය
උසස්කරමු.
ස්වාමීන් සෙවීමි, උන්වහන්සේ මට 4
උත්තරදී,
මාගේ සියලු භයින් මා මිදූසේක.
ඔව්හු උන්වහන්සේ දෙස බලා එළිය 5
ලැබුවෝය.
ඔවුන්ගේ මුහුණු කිසි කලකත් ලජ්ජා
නොවන්නේය.
මේ දුප්පතා මොරගැසුවේය, 6
ස්වාමීන්වහන්සේ ඔහුගේ බස් අසා,
ඔහුගේ සියලු දුක්වලින් ඔහු
ගැළවූසේක.
ස්වාමීන්ගේ දූතයා උන්වහන්සේට භය 7
ඇත්තන් හාත්පස කඳවුරු බැඳ,
ඔවුන් මුදාහරියි.
ස්වාමීන් යහපත් බව රස බලා 8
දැනගනිව්.
උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන
මනුෂ්‍යයා ආශීර්වාදලද්දේය.
ස්වාමීන්ගේ ශුද්ධවන්තයෙනි, 9
උන්වහන්සේට භයවව්.

මක්නිසාද උන්වහන්සේට භයවන්නන්ට
කිසි හිඟයක් නැත.
10 තරුණ සිංහයෝ හිඟ ඇතිව සාගින්න විඳිති.
නුමුත් ස්වාමීන් සොයන්නන්ට කිසි
යහපත් දෙයකින් හිඟයක්
නොවන්නේය.
11 දරුවෙනි, එව්, මට කන්දෙව්.
ස්වාමීන් කෙරෙහි භයවීම තොපට
උගන්වන්නෙමි.
12 ජීවිතයට කැමතිවූ,
යහපත දක්නා පිණිස බොහෝ
දවස්වලට ප්‍රියවූ මනුෂ්‍යයා කවරේද?
13 නුඹේ දිව නපුරෙන්ද
නුඹේ තොල් වංචා කථාවෙන්ද
වලකාගනුව.
14 නපුරෙන් ඉවත්ව යහපත්කම් කරව;
සමාදානය සොයමින් එය අනුව යව.
15 ස්වාමීන්ගේ ඇස් ධර්මිෂ්ඨයන් දෙසටත්
උන්වහන්සේගේ කන් ඔවුන්ගේ
මොරගැසීමටත් යොමා තිබේ,
16 නපුරුකම් කරන්නන් ගැන සිහිවීම
පොළොවෙන් සිඳ දමන පිණිස
ස්වාමීන්ගේ මුහුණ ඔවුන්ට විරුද්ධවේ.
17 ධර්මිෂ්ඨයෝ මොරගැසුවෝය,
ස්වාමීන්වහන්සේ අසා
ඔවුන්ගේ සියලු දුක්වලින් ඔවුන්
ගැළවූසේක.
18 ස්වාමීන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන්ට
ළංව සිටිනසේක.
තැළුණු ආත්ම ඇත්තන් ගළවනසේක.
19 ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය.
නුමුත් ස්වාමීන්වහන්සේ ඒ
සියල්ලෙන් ඔහු ගළවනසේක.
20 උන්වහන්සේ ඔහුගේ ඇට සියල්ල
ආරක්ෂාකරනසේක.
එයින් එකක්වත් නොබිඳේ.
21 නපුර දුෂ්ටයා නසන්නේය.
ධර්මිෂ්ඨයාට ද්වේෂකරන්නෝ වරදට
පත්කරනු ලබන්නෝය.
22 ස්වාමීන්වහන්සේ ස්වකීය
මෙහෙකරුවන්ගේ ආත්මය
මුදනසේක.
උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන
කිසිවෙක්වත් වරදට පත්කරනු
නොලබන්නේය.

## විරුද්ධකාරයන් ගැන කාරණා දක්වීම

දාවිත්ගේ ගීතයකි. **35**

ස්වාමීනි, මා සමග විවාදකරන්නන් 1
සමග විවාදකළ මැනව.
මට විරුද්ධව යුද්ධකරන්නන්ට
විරුද්ධව යුද්ධකළ මැනව.
පලිහත් මහ පලිහත් ගෙන, 2
මට පිහිටවෙන පිණිස නැගිටුණ මැනව.
හෙල්ලයත් ඇද මා ලුහුබඳින්නන් 3
වැලැක්වුව මැනව.
මම තාගේ ගැළවීමයයි මාගේ
ආත්මයට කිව මැනව.
මාගේ ප්‍රාණය සොයන්නෝ ලජ්ජාවී 4
අගෞරවයට පැමිණෙත්වා.
මට අන්තරාය යොදන්නෝ පස්සට
හරවනු ලැබ වියවුල්වෙත්වා.
ඔව්හු හුළඟ ඉදිරියෙහි බොල් මෙන් 5
වෙත්වා,
ස්වාමීන්ගේ දූතයා ඔවුන් එළවා යේවා.
ඔවුන්ගේ මාර්ගය අඳුරුව ලිස්සන්නේ 6
වේවා,
ස්වාමීන්ගේ දූතයා ඔවුන් ලුහුබඳීවා.
මක්නිසාද ඔව්හු නිෂ්කාරණයේ මට 7
ඔවුන්ගේ දැල වළක සඟවා තැබූය,
නිෂ්කාරණයේ මාගේ ප්‍රාණයට වළක්
හෑරුවෝය.
නොදැනී විනාශය ඔහු පිටට පැමිණේවා; 8
ඔහු සඟවා තිබූ දැලට ඔහුම අසු වේවා;
ඔහු විනාශයට පැමිණ එහි වැටේවා.
මාගේ ආත්මය ස්වාමීන් කෙරෙහි 9
සතුටුවන්නේය.
උන්වහන්සේගේ ගැළවීම කෙරෙහි
ප්‍රීතිවන්නේය.
ස්වාමීනි, දුප්පතා ඔහුට වඩා 10
බලවත්තයාගෙන් මුදන්නාවූ,
දුප්පතා හා දිළිඳු කොල්ලකාරයාගෙන්
ගළවන්නාවූ

ඔබ සමාන කවරේදැයි මාගේ ඇට
සියල්ලෙන් කියවෙන්නේය.
11 අධර්මිෂ්ඨ සාක්ෂිකාරයෝ නැඟිට,
මා නොදන්න කාරණා ගැන මාගෙන්
අසති.
12 මාගේ ආත්මය අසරණවන ලෙස
ඔව්හු මට යහපත වෙනුවට නපුර
කෙරෙති.
13 මම වනාහි ඔවුන් රෝගාතුරවූ කල
ගෝණිරෙදි ඇන්දෙමි.
නිරාහාරව සිටීමෙන් මාගේ ආත්මයට
පීඩාකරගතිමි;
මාගේ යාච්ඤාවද මාගේම ළයට හැරී
ආයේය.
14 මාගේ මිත්‍රයෙක් නොහොත්
සහෝදරයෙක් මෙන් ඔහු ගැන
ක්‍රියා කෙළෙමි.
මෑණියන් ගැන ශෝකවන්නෙකු සේ
දුකින් වැතිර සිටියෙමි.
15 එහෙත් මා පැකිලුණු කල ඔව්හු
ප්‍රීතිමත්ව රැස්වූවෝය.
නීචයෝ මට විරුද්ධව රැස්වූය, එය
දැන නොගත්තෙමි;
ඔව්හු නොනැවතී මා ඉරාදැමූවෝය.
16 මංගල්‍යවලදී අභක්තික කවටයන් මෙන්
ඔව්හු මට එදිරිව දත්මිටිකෑවෝය.
17 **ස්වාමීනි**, ඔබ කොපමණ කල්
බලා සිටිනසේක්ද?
මාගේ ආත්මය ඔවුන් යොදන
විනාශවලින්ද
මාගේ ප්‍රිය ප්‍රාණය සිංහයන්ගෙන්ද
මුදාගත මැනව.
18 මහත් සභාවේදී ඔබට
ස්තුතිකරන්නෙමි.
බොහෝ සෙනඟ අතරේ ඔබට ප්‍රශංසා
කරන්නෙමි.
19 මට සතුරුව සිටින්නෝ අයුත්තේ මා
ගැන ප්‍රීතිමත් නොවෙත්වා.
නිෂ්කාරණයේ මට වෛරවන්නෝ ඇස
ඉඟි නොකෙරෙත්වා.
20 මක්නිසාද ඔව්හු සමාදානය පිණිස
කථා නොකෙරෙති.
දේශයෙහි නිශ්චලව සිටින්නන්ට
විරුද්ධව වංචා වචන යොදති.
එසේය, ඔව්හු මට විරුද්ධව කට අයා: 21
ඔහෝ, ඔහෝ, අපේ ඇසින් දුටිමුයයි
කීවෝය.
**ස්වාමීනි**, ඔබ එය දුටුසේක, 22
නිශ්ශබ්ද නුව මැනව.
**ස්වාමීනි**, මා කෙරෙන් ඈත් නුව මැනව;
මාගේ දෙවියනි, මාගේ **ස්වාමීනි**, 23
මාගේ යුක්තිය පිණිස එනමි මාගේ
කාරණය සඳහා පිබිද නැඟුටුණ
මැනව.
මාගේ දෙවිවූ **ස්වාමීනි**, ඔබගේ 24
ධර්මිෂ්ඨකම ලෙස මා විනිශ්චයකළ
මැනව;
මා ගැන ඔව්හු ප්‍රීති නොවෙත්වා.
ඔහෝ, අපේ කැමැත්ත සිදුවීයයි 25
ඔව්හු සිතින් නොකියත්වා.
අපි ඔහු ගිලගතිමුයයි නොකියත්වා.
මාගේ අන්තරායට ප්‍රියවන්නෝ එක්ව 26
ලජ්ජාවී වියවුල්වෙත්වා.
මට විරුද්ධව උඩඟුවෙන්නෝ තුමූම
ලජ්ජාවෙනුත් නින්දවෙනුත් හැඳවනු
ලබත්වා.
මාගේ ධර්මිෂ්ඨ කාරණයට 27
ප්‍රියවන්නෝ ප්‍රීතිඝෝෂා කෙරෙත්වා,
සන්තෝෂවෙත්වා.
එසේය: තමන් මෙහෙකරුවාගේ
යහපතට ප්‍රියවූ **ස්වාමීන්වහන්සේ**
උසස්වනසේක්වයි ඔව්හු නිතරම
කියත්වා.
මාගේ දිව ඔබගේ ධර්මිෂ්ඨකම ගැනද 28
ප්‍රශංසාව ගැනද
දවස මුළුල්ලේ කථාකරන්නේය.

## නපුරාගේ දුෂ්ටකම සහ දෙවියන්වහන්සේගේ යහපත්කම

# 36

නායක වාද්‍යකරුටයි.
**ස්වාමීන්වහන්සේගේ**
සේවකයාවූ දාවිත්ගේ
ගීතයකි.

දුෂ්ටයාගේ ඇස් හමුයේ 1
දෙවියන්වහන්සේට භයක් නැති බව
ඔහුගේ අපරාධය මාගේ සිතට හඟවා

දෙයි.
2 මක්නිසාද ස්වකීය අයුතුකම
එළිදරව්වෙන්නේවත්
පිළිකුල්වන්නේවත් නැතැයි
ඔහු තමාගේ ඇස් හමුයෙහි තමාටම
වාටුකරගනියි.
3 ඔහුගේ මුඛයෙහි වචන අයුතුකම හා
වංචාව වේ.
ඔහු නුවණැතිව සිටීමෙන්ද යහපත්කම්
කිරීමෙන්ද වැලකී සිටී.
4 ඔහු තමාගේ යහනේදී අයුතුකම
යොදයි;
යහපත් නුවූ මාර්ගයක හැසිරෙයි;
නපුරට පිළිකුල් නොකරයි.
5 ස්වාමිනි, ඔබගේ කරුණාගුණය
ස්වර්ගයෙහිය;
ඔබගේ විශ්වාසකම ආකාශය දක්වා
පවත්නේය.
6 ඔබගේ ධර්මිෂ්ඨකම
දෙවියන්වහන්සේගේ කඳු මෙනි;
ඔබගේ විනිශ්චයෝ මහමුහුද මෙන්
ගැඹුරුය.
ස්වාමිනි, ඔබ මනුෂ්‍යයාද මෘගයාද
ආරක්ෂාකරනසේක.
7 දෙවියන්වහන්ස, ඔබගේ
කරුණාගුණය කොපමණ අනර්ඝද!
මනුෂ්‍ය පුත්‍රයෝ ඔබගේ පියාපත්
සෙවණෙහි ආරක්ෂාව ලබති.
8 ඔව්හු ඔබගේ ගෘහයේ පූර්ණකමෙන්
බොහෝසේ තෘප්තියට
පැමිණෙන්නෝය;
ඔබගේ ප්‍රීතිය නමැති ගංගාවෙන් ඔබ
ඔවුන්ට පානයකරවනසේක.
9 මක්නිසාද ජීවනයේ උල්පත ඔබ
සමගය.
ඔබගේ එළියෙන් අපි එළිය දක්නෙමුව.
10 ඔබ අඳුනන්නන්ට ඔබගේ
කරුණාගුණයත්
අවංක සිත් ඇත්තන්ට ඔබගේ
ධර්මිෂ්ඨකමත් පැවැත්තුව මැනව.
11 උඩඟුකමේ පය මට විරුද්ධව නොඑන්වා,
දුෂ්ටයන්ගේ අත මා නොඑළවන්නේ
වේවා.
අයුතුකම්කරන්නෝ වැටී සිටිති. 12
ඔව්හු හෙළනු ලැබුවෝය, නැගිටින්ට
නොහැකිවන්නෝය.

## නපුර කරන්නන්ගේ අන්තිමය. ධර්මිෂ්ඨයන්ගේ විපාකය

දාවිත්ගේ ගීතයකි. **37**

නපුරකරන්නන් නිසා කල නොකිරෙව, 1
අධර්මිෂ්ඨකම් කරන්නන්ට ඊර්ෂ්‍යා
නොකරව.
මක්නිසාද ඔව්හු තෘණ මෙන් වහාම 2
කපනු ලබන්නෝය,
නිල් පලා මෙන් වියළෙන්නෝය.
ස්වාමීන් කෙරෙහි විශ්වාසය තබා 3
යහපත්කම් කරව;
දේශයෙහි වාසයකරමින් විශ්වාසකම
අනුව යව.
ස්වාමීන් කෙරෙහි ප්‍රීතිමත්වෙව; 4
උන්වහන්සේද තාගේ සිතෙහි ආශාවන්
ඉෂ්ටකරනසේක.
තාගේ මාර්ගය ස්වාමීන්ට භාරදෙව; 5
උන්වහන්සේ කෙරෙහි විශ්වාසයද
තබව, උන්වහන්සේ එය
ඉෂ්ටකරනසේක.
උන්වහන්සේ තාගේ ධර්මිෂ්ඨකම එළිය 6
මෙන්ද
තාගේ යුක්තිය මද්දහන මෙන්ද
නික්මවනසේක.
*ස්වාමීන් කෙරෙහි රඳා, ඉවසිල්ලෙන් 7
උන්වහන්සේ බලා සිටුව.
තමාගේ මාර්ගයෙහි දියුණුවන්නාද
නපුරු ප්‍රයෝග ඉෂ්ටකරගන්නාද
නිසා කල නොකිරෙව.
තරහෙන් වැලකී උදහස අත්හරුව. 8
කල නොකිරෙව, එයින් හටගන්නේ
නපුරු ක්‍රියා පමණක්ය.
මක්නිසාද නපුරු ක්‍රියා කරන්නෝ 9
සිඳිනු ලබන්නෝය.
නුමුත් ස්වාමීන් කෙරෙහි බලා
සිටින්නෝ දේශය
උරුමකරගන්නෝය.

*හෙවත්, ස්වාමීන් තුළ නිශ්චලව සිට.

10 මද කලකින් දුෂ්ටයා නැතිවන්නේය.
එසේය, නුඹ ඔහුගේ ස්ථානය
පරීක්ෂා කර බලන්නෙහිය, ඔහු
සම්බනොවන්නේය.
11 නුමුත් මොළොක් ගුණ ඇත්තෝ දේශය
උරුමකරගන්නෝය;
ඔව්හු මහත් සමාදනයෙන් ප්‍රීතිමත්
වන්නෝය.
12 දුෂ්ටයා ධර්මිෂ්ඨයාට විරුද්ධව
උපා යොදමින්
ඔහුට විරුද්ධව දත්මිටිකයි.
13 ස්වාමීන්වහන්සේ ඔහුට
සිනාසෙනසේක.
මක්නිසාද ඔහුගේ දවස පැමිණෙන
බව උන්වහන්සේට පෙනෙයි.
14 දුෂ්පතා සහ දිළිඳු හෙළාදමන පිණිසත්
අවංකලෙස හැසිරෙන්නන් මරන
පිණිසත්
දුෂ්ටයෝ කඩුව ඇද්දෝය, දුන්නද
නැත්කැවුවෝය.
15 ඔවුන්ගේ කඩුව ඔවුන්ගේම හෘදයට
ඇතුල්වන්නේය.
ඔවුන්ගේ දුනුද බිඳිනු ලබන්නේය.
16 බොහෝ දුෂ්ටයන්ගේ වස්තු රාශියට
වඩා
ධර්මිෂ්ඨයාට ඇති ස්වල්පය යහපත.
17 මක්නිසාද දුෂ්ටයන්ගේ බාහු බිඳිනු
ලබන්නේය.
නුමුත් ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨයන්ට
පිහිටවනසේක.
18 *භක්තිවන්තයන්ගේ දවස් ස්වාමීන්-
වහන්සේ දන්නාසේක.
ඔවුන්ගේ උරුමයද සදකල්
පවතින්නේය.
19 ඔව්හු විපත්ති කාලයේදී ලජ්ජා
නොවන්නෝය.
දුර්භික්ෂ දවස්වලදී තෘප්තියට
පැමිණෙන්නෝය.
20 නුමුත් දුෂ්ටයෝ විනාශවන්නෝය,
ස්වාමීන්ගේ සතුරෝද †ගොදුරු බිම්වල
සාරවූ කොටස මෙන් වන්නෝය.
ඔව්හු ක්ෂයවන්නෝය; දුම මෙන්
සහමුලින්ම ක්ෂයවන්නෝය.
දුෂ්ටයා ණය ගෙන, නැවත නොගෙවයි. 21
නුමුත් ධර්මිෂ්ඨයා කරුණාවෙන්
ක්‍රියාකරමින් ප්‍රදනයකරයි.
මක්නිසාද උන්වහන්සේගෙන් 22
ආශීර්වාදලද්දෝ දේශය උරුමකර
ගන්නෝය;
උන්වහන්සේගෙන් ශාපලද්දෝ සිඳිනු
ලබන්නෝය.
මනුෂ්‍යයෙකුගේ ගමන් ස්වාමීන් 23
කරණකොටගෙන ස්ථිරවෙයි;
උන්වහන්සේ ඔහුගේ මාර්ගය ගැන
ප්‍රීතිවනසේක.
ඔහු වැටෙන නුමුත් සහමුලින්ම හෙළනු 24
නොලබන්නේය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ ස්වකීය
හස්තයෙන් ඔහුට
ආධාරකරනසේක.
මම යෞවනව සිටියෙමි, දැන් මහලුව 25
සිටිමි;
එසේවී නුමුත් ධර්මිෂ්ඨයා අත්හරිනු
ලැබූ බවවත්,
ඔහුගේ වංශය කෑම සිඟන බවවත්
නුදුටිමි.
දවස මුළුල්ලේ ඔහු කරුණාවෙන් 26
ක්‍රියාකරමින් ණයට දෙයි;
ඔහුගේ වංශයද ආශීර්වාද ලබයි.
නපුරෙන් ඉවත්ව යහපත්කම් කරමින් 27
සදකල් පවතුව.
මක්නිසාද ස්වාමීන්වහන්සේ යුක්තියට 28
ප්‍රියවනසේක,
ස්වකීය ශුද්ධවන්තයන් අත්
නාරිනසේක;
ඔව්හු සදකල් ආරක්ෂාකරනු ලබති.
නුමුත් දුෂ්ටයන්ගේ වංශය සිඳිනු
ලබන්නේය.
ධර්මිෂ්ඨයෝ දේශය 29
උරුමකරගන්නෝය,
එහි සදකල් වාසයකරන්නෝය.
ධර්මිෂ්ඨයාගේ මුඛය ඥානය 30
කථාකරයි,
ඔහුගේ දිවද යුක්තිය කියයි.

*හෙවත්, සම්පූර්ණ තැනැත්තන්ගේ.
†නොහොත්, බැටළු පොව්වන්ගේ තෙල්.

31 ඔහුගේ දෙවියන්වහන්සේගේ
ව්‍යවස්ථාව ඔහුගේ සිතෙහිය;
ඔහුගේ අඩිවලින් එකක්වත්
නොලිස්සන්නේය.
32 දුෂ්ටයා ධර්මිෂ්ඨයා බලා රැක හිඳ
ඔහු මරන්ට සොයයි.
33 ස්වාමීන්වහන්සේ ඔහුගේ අතට ඔහු
අත් නාරිනසේක,
ඔහු විනිශ්චයකරනු ලබන කල වරදට
පත් නොකරනසේක.
34 ස්වාමීන් කෙරෙහි බලාසිටිමින්
උන්වහන්සේගේ මාර්ගය රක්ෂාකරව,
දේශය තට උරුමවන පිණිස
උන්වහන්සේ තා උසස්කරනසේක.
දුෂ්ටයන් සිඳිනු ලබන කල තා එය
දකින්නෙහිය.
35 දුෂ්ටයා ඉතා බලවත්ව
ජන්ම භූමියෙහි වැවෙන අමු ගසක්
මෙන් විශාලවෙනවා දුටිමි.
36 එහෙත් යමෙක් ළඟින් ගිය කල, බලව,
ඔහු එහි නැත.
එසේය, ඔහු සෙවුවෙමි, නුමුත් මට
සම්බ නොවීය.
37 *නිර්දෝෂ තැනැත්තා කල්පනාකොට
අවංක තැනැත්තා බලාගනුව.
මක්නිසාද ඒ මනුෂ්‍යයාගේ අනාගතය
සමාදනය වේ.
38 අපරාධකාරයෝ එකට විනාශකරනු
ලබන්නෝය;
දුෂ්ටයන්ගේ †දිවි කෙළවර සිඳිනු
ලබන්නේය.
39 නුමුත් ධර්මිෂ්ඨයන්ගේ ගැළවීම
ස්වාමීන්ගෙන්ය.
විපත්ති කාලයේදී උන්වහන්සේ
ඔවුන්ගේ බලකොටුව වනසේක.
40 ස්වාමීන්වහන්සේ ඔවුන්ට පිහිටව,
ඔවුන් මුදනසේක.
ඔවුන් උන්වහන්සේ සරණගත් නිසා,
උන්වහන්සේ ඔවුන් දුෂ්ටයන්ගෙන්
මුදා ගළවනසේක.

*හෙවත්, සම්පූර්ණ තැනැත්තා.
†නොහොත්, වංශය.

## දුක්විඳින්නෙකුගේ පශ්චාත්තාපවත් යාච්ඤාව

දාවිත්ගේ ගීතයකි;
සිහිකරවීමටයි. **38**

ස්වාමිනි, ඔබගේ උදහසින් මට තරවටු 1
නොකළ මැනව.
ඔබගේ කෝපයෙන් මට දඬුවම්
නොකළ මැනව.
මක්නිසාද ඔබගේ ඊගස් මට තදින් 2
ඇනී තිබේ,
ඔබගේ අතද මා පිට බරවේ.
ඔබගේ උදහස නිසා මාගේ මාංසයෙහි 3
කිසි නිරෝගී බවක් නැත;
මාගේ පාපය නිසා මාගේ ඇටවලට
කිසි සැපයක් නැත.
මක්නිසාද මාගේ අයුතුකම් මාගේ 4
ඉස වසා නැංගේය.
ඒවා අධික බරක් මෙන් මට ඉතා
බර වෙයි.
මාගේ මෝඩකම නිසා 5
මාගේ තුවාල දුර්ගන්ධව පිළිකුල්ව
තිබේ.
මම වේදනා විඳිමින් අතිශයින් නැමී 6
වැතිර සිටිමි;
දවස මුළුල්ලේම වැලපෙමින් පසු වෙමි.
මක්නිසාද මාගේ තුනටිය දැවිල්ලෙන් 7
පිරී තිබේ;
මාගේ මාංසයෙහි කිසි නිරෝගී බවක්
නැත.
මම ක්ලාන්තව බොහෝසෙයින් තැළී 8
සිටිමි.
මාගේ සිතේ කැළඹීම නිසා මොර ගැමී.
ස්වාමිනි, මාගේ මුළු ආශාව ඔබ 9
ඉදිරියෙහිය;
මාගේ සුසුම්ලෑමද ඔබගෙන් සැඟවී
නැත.
මාගේ හෘදය සැලෙයි, මාගේ ශක්තිය 10
හීනවෙයි.
මාගේ ඇසේ එළිය පවා මා කෙරෙන්
පහව ගියේය.
මට ආදර ඇත්තෝද මාගේ මිත්‍රයෝද 11
මාගේ විපත්තිය කෙරෙන් ඈත්ව
සිටිති;

මාගේ නෑයෝ දුරින් සිටිති.
12 මාගේ ප්‍රාණය නසන්ට සොයන්නෝ
මට මලපත් තබති;
මට අන්තරායකරන්ට සොයන්නෝ
නපුරු දේ කථාකරමින්,
දවස මුළුල්ලේ ප්‍රයෝග යොදති.
13 එහෙත් මම බිහිරෙකු මෙන්
නොඅසන්නෙමි;
කට නාරින ගොළුවෙකුද මෙන් වෙමි.
14 එසේය, මම නොඇසෙන්නාවූ,
තමාගේ මුඛයෙහි තරවටුකිරීම්
නැත්තාවූ මනුෂ්‍යයෙකු මෙන් වෙමි.
15 මක්නිසාද, **ස්වාමීනි**, මම ඔබ කෙරෙහි
බලා සිටිමි.
මාගේ දෙවිවූ ස්වාමීනි, ඔබම
උත්තර දෙනසේක.
16 මක්නිසාද: ඔව්හු මා කෙරෙහි ප්‍රීති
නොවෙත්වායි මම කීයෙමි.
මාගේ පය ලිස්සන විට ඔව්හු මට
විරුද්ධව තමුන්ම උසස්කරගනිති.
17 මම පැකිලෙන්ට ළංව සිටිමි,
මාගේ දුකද නිතරම මා ඉදිරියෙහිය.
18 මක්නිසාද මාගේ අයුතුකම කියා දෙමි;
මාගේ පාපය නිසා දුක්වෙමි.
19 නුමුත් මාගේ සතුරෝ ප්‍රාණවත්වෙති,
බලවත්වෙති.
අයුතුලෙස මට වෛරවන්නෝද
වැඩිවූවෝය.
20 මා යහපත අනුව යන නිසා,
යහපතට නපුරකරන්නොත් මට
සතුරු වෙති.
21 **ස්වාමීනි**, මා අත් නැරිය මැනව.
මාගේ දෙවියන්වහන්ස, මා කෙරෙන්
දුරුව නොසිටිය මැනව.
22 මාගේ ගැළවීම වූ ස්වාමීනි,
මට උපකාර පිණිස ඉක්මන්වූව මැනව.

## මනුෂ්‍යයාගේ දුර්වලකම් සහ සැබෑ බලාපොරොත්තුව

**39** නායක වාද්‍යකරුවූ
යෙදූතුන්ටයි. දාවිත්ගේ
ගීතයකි.

1 මාගේ දිවෙන් පව් නොකරන පිණිස
මාගේ හැසිරීම බලාගන්නෙමියි කියාත්,
දුෂ්ටයා මා ඉදිරියෙහි සිටින අතර
කටකලියාවකින් මාගේ මුඛය
රැකගන්නෙමියි කියාත් කීයෙමි.
මම නිශ්ශබ්දව ගොළුවීමි, යහපත 2
ගැන පවා කථාවෙන් වැලකුණෙමි;
එවිට මාගේ ශෝකය ඇවිස්සුණේය.
මාගේ සිත මා තුළ උණුවිය; 3
මා මෙනෙහිකරද්දීම ගින්න
ඇවිළුණේය.
එවිට මාගේ දිවෙන් කථාකෙළෙමි.
**ස්වාමීනි**, මාගේ දිවි කෙළවරත් 4
මාගේ දවස්වල ගණන කොපමණද
කියාත් මට දැනගන්ට සැලැස්සුව
මැනව;
මම කොපමණ බෙලහීනයෙම්දැයි
මට දැනේවා.
බැලුව මැනව, ඔබ මාගේ දවස් වියතක් 5
මෙන් කළසේක;
මාගේ වයස ඔබ ඉදිරියෙහි කිසිත්
නැතුවාක්මෙනි.
සැබවින් කොයි මනුෂ්‍යයාත් ස්වකීය
උත්තම අවස්ථාවෙහි පවා
සහමුලින්ම නිෂ්ඵලකමය.
සැබවින් කොයි මනුෂ්‍යයාත් 6
නිෂ්ඵලභාවයෙන් හැසිරෙයි.
සැබවින් ඔව්හු නිෂ්කාරණයේ
කැලඹෙති.
ඔහු වස්තු රැස්කරයි, ඒවා
හිමිකරගන්නේ කවුදැයි නොදනියි.
දැන් වනාහි, ස්වාමීනි, මම කුමක් 7
බලා සිටිම්ද?
මාගේ බලාපොරොත්තුව ඔබ
කෙරෙහිය.
මාගේ සියලු වරදවලින් මා මිදුව 8
මැනව.
අඥනයාට මා නින්ද හේතුවක්
නොකළ මැනව.
ඔබ එය කළ නිසා, 9
මම ගොළුවීමි, මුඛය නොහැර සිටියෙමි.
ඔබගේ පහර මා කෙරෙන් ඉවත්කළ 10
මැනව.
ඔබගේ අත් පහරෙන් මම ක්ෂයවීමි.
ඔබ අයුතුකම නිසා තරවටුකිරීම්- 11
වලින් මනුෂ්‍යයාට දඬුවම්කරන කල
කාවෙකු මෙන් ඔහුගේ අලංකාරය

ක්ෂයකරවනසේක.
සැබවින් කොයි මනුෂ්‍යයාත්
නිෂ්ඵලකමය.
12 ස්වාමිනි, මාගේ යාච්ඤාව අසා, මාගේ
මොරගැසීමට කන්දුන මැනව;
මාගේ කඳුළු දැක නිශ්ශබ්ද නුව මැනව.
මක්නිසාද මම ඔබ ඉදිරියෙහි
විදේශියෙක්ද
මාගේ පියවරුන් මෙන් මාර්ගිකයෙක්ද
වෙමි.
13 මා මෙයින් ගොස්, නැතිවී යන්ට ප්‍රථම,
මට ශක්තිය ලැබෙන පිණිස කල්දුන
මැනව.

## ස්තුති සහිත ආත්ම පරිත්‍යාගය

40 නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ ගීතයකි.
1 මම ඉවසිල්ලෙන් ස්වාමීන් ගැන
බලාසිටියෙමි;
උන්වහන්සේ කන් යොමා මාගේ
මොරගැසීම ඇසූසේක.
2 උන්වහන්සේ භයානක වළකින්,
හැල්පතෙන්, මා ඔසවා,
පර්වතයක් පිට මාගේ පා තබා, මාගේ
ගමන් ස්ථිරකළසේක.
3 උන්වහන්සේ අලුත් ගීතිකාවක්
එනම් අපේ දෙවියන්වහන්සේට
ස්තුති ගීතිකාවක් මාගේ මුඛයෙහි
තැබූසේක.
බොහෝදෙනෙක් ඒ දැක, භයව,
ස්වාමීන් කෙරෙහි විශ්වාසකරන්නෝය.
4 ස්වාමීන් කෙරෙහි විශ්වාසකරන්නාවූ,
උඩඟුකාරයන්වත් බොරුවලට
හැරෙන්නන්වත් නොසලකන්නාවූ
තැනැත්තේ ආශීර්වාදලද්දෙක්ය.
5 මාගේ දෙවිවූ ස්වාමිනි, ඔබ විසින්
කළ පුදුම ක්‍රියාද,
අප කෙරෙහි ඇති ඔබගේ සිතිවිලිද
බොහෝය.
ඒවා ඔබ ඉදිරියෙහි පිළිවෙළින්
තැබිය නොහැකිය;
ඒවා ප්‍රකාශකරන්ටත් ඒ ගැන
කථාකරන්ටත් කැමැත්තෙමි,
නුමුත් ඒවා ගණන්කරන්ට
පුළුවන්වාටත් වැඩිය.
ඔබ පූජාවටත් පඬුරටත් ප්‍රසන්න නැත; 6
ඔබ මාගේ කන් පැදූසේක.
ඔබ දවන පූජා සහ පාප පූජා වුවමනා
නොකළසේක.
එවිට මම කථාකොට: මෙන්න, මම 7
ඇවිත් සිටිමි;
පොත් කාණ්ඩයෙහි මා ගැන ලියන
ලද්දේය.
මාගේ දෙවියන්වහන්ස, ඔබගේ 8
කැමැත්ත කරන්ට ප්‍රියවෙමි;
එසේය, ඔබගේ ව්‍යවස්ථාව මාගේ සිත
තුළෙහියයි කීමි.
මහත් සභාවේදී ධර්මිෂ්ඨකම ප්‍රකාශ 9
කෙළෙමි;
බැලුව මැනව, මාගේ තොල්
නොවලක්වන්නෙමි,
ස්වාමිනි, ඔබ දන්නාසේක.
ඔබගේ ධර්මිෂ්ඨකම මාගේ සිත 10
තුළෙහි සඟවා නොගතිමි;
ඔබගේ විශ්වාසකම හා ගැළවීම
ප්‍රකාශකෙළෙමි.
ඔබගේ කරුණාගුණයත් සැබෑකමත්
මහත් සභාවෙන් නොසැඟවීමි.
ස්වාමිනි, ඔබගේ දයාව මාගෙන් 11
නොවැළැක්වුව මැනව.
ඔබගේ කරුණාගුණයත් සැබෑකමත්
නිතර මා ආරක්ෂාකෙරේවා.
මක්නිසාද ගණන් නැති උවදුරින් 12
වටකරනු ලදිමි,
*හිස නගන්ට බැරි තරම් මාගේ
අයුතුකම් මා පිට පැමුණුණේය;
ඒවා මාගේ හිසකෙස්වලට වැඩිය,

*නොහොත–ඇස් නොපෙනී යන
තරම්.

මාගේ සිතද *මා හැර ගියේය.
13 **ස්වාමිනි**, මා මුදන්ට සතුටුවුව මැනව.
**ස්වාමිනි**, මට උපකාරකරන්ට
ඉක්මන්වුව මැනව.
14 මාගේ ප්‍රාණය නසන්ට සොයන්නෝ
එක්ව ලජ්ජාවෙත්වා, වියවුල්වෙත්වා.
මාගේ අන්තරායට ප්‍රියවන්නෝ
ආපසු හැරී අගෞරවයට පැමිණෙත්වා.
15 මට: ඔහෝ, ඔහෝ කියන්නෝ
තමුන්ට වූ ලජ්ජාව නිසා
අසරණවෙත්වා.
16 ඔබ සොයන සියල්ලෝ ඔබ කෙරෙහි
සන්තෝෂවෙත්වා, ප්‍රීතියට
පැමිණෙත්වා.
ඔබගේ ගැළවීමට ප්‍රියවන්නෝ:
**ස්වාමීන්වහන්සේ** උතුම්වනසේක්වයි
නිතර කියත්වා.
17 නුමුත් මම දුප්පත්මි, දිළින්දෙමි;
එහෙත් **ස්වාමීන්වහන්සේ** මා
සිහි කරනසේක.
ඔබ මාගේ උපකාරයය, මාගේ
මිදුම්කාරයාණෝය;
මාගේ දෙවියන්වහන්ස, පමා නුවූ
මැනව.

## දුක්විඳින්නාගේ සැනසීම

# 41

නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ ගීතයකි.

1 දිළින්ද සලකන්නා ආශීර්වාදලද්දේය.
විපත්ති දවසේදී **ස්වාමීන්වහන්සේ**
ඔහු මුදනසේක.
2 **ස්වාමීන්වහන්සේ** ඔහු රක්ෂාකරන-
සේක, ඔහුගේ දිවි රක්නාසේක,
ඔහු පොළොවෙහි ආශීර්වාදලද්දෙක්
වන්නේය;
ඔහුගේ සතුරන්ගේ කැමැත්තට ඔහු
භාර නුදුන මැනව.
3 **ස්වාමීන්වහන්සේ** ඔහු ගිලන්ව ඇඳේ
යහනේදී උපුලනසේක.

රෝගයේදී ඔබ ඔහුගේ මුළු යහන
සකස්කරනසේක.
මම කථාකොට: **ස්වාමිනි**, මට 4
කරුණාකළ මැනව.
ඔබට විරුද්ධව පව්කෙළෙමි, එබැවින්
මාගේ ආත්මය සුවකළ මැනවයි
කීමි.
මාගේ සතුරෝ මට විරුද්ධව නපුර 5
කථාකරමින්:
කවද ඔහු මැරෙන්නේද? කවද ඔහුගේ
නාමය මැකෙන්නේදැයි කියති.
ඔහු මා බලන්ට ආවොත් නිෂ්ඵල දේ 6
කථාකරයි;
ඔහුගේ සිත අයුතුකම් රැස්කරගනියි.
ඔහු පිටත යන කල එය ප්‍රකාශකරයි.
මට වෛරවෙන සියල්ලෝ මට 7
විරුද්ධව එක්ව කොඳුරති.
ඔව්හු මට අන්තරායකිරීමට උපා
යොදති.
නපුරු ලෙඩක් මොහුට වැළඳී තිබේ; 8
ඔත්පළව ඉන්න මොහු ආයෙත්
නොනැගිටින්නේයයි කියති.
එසේය, මා විසින් විශ්වාසකළාවූ, 9
මාගේ භෝජනයෙන් කෑවාවූ මාගේ
හිතේසි මිත්‍රයා
මට විරුද්ධව විලුඹ එසවිය.
නුමුත් මා විසින් ඔවුන්ට විපාක දෙන 10
පිණිස,
**ස්වාමිනි**, මට කරුණාකොට මා
නැගිටෙවුව මැනව.
මාගේ සතුරා මා කෙරෙහි ජය ඝෝෂා 11
නොපවත්වන්නේය,
ඔබ මා කෙරෙහි ප්‍රිය බව මෙයින්
දනිමි.
මා වනාහි ඔබ මාගේ අවංකකමෙහි 12
දරා සිටිනසේක,
සදාකල්ම ඔබ ඉදිරියෙහි මා
තබාගන්නාසේක.
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 13
**ස්වාමීන්වහන්සේට** සදාකාලයෙන්
සදාකාලයටම ප්‍රශංසාවේවා.
ආමෙන්, ආමෙන්.

*හෙවත්, ක්ලාන්තවිය.

# දෙවෙනි කාණ්ඩය

## පිටවහල්කර සිටින්නාගේ ආත්ම පිපාසය

42 නායක වාද්‍යකරුටයි; කෝරාගේ පුත්‍රයන්ටයි. අනුශාසනාවකි.

1 දෙවියන්වහන්ස, මුවා දිය දෙළවලට
ඉතා ආශාවන්නාක්මෙන්
මාගේ ආත්මය ඔබ කෙරෙහි ඉතා
ආශා ඇත්තේය.
2 දෙවියන්වහන්සේ කෙරෙහි එනම්
ජීවමාන දෙවියන්වහන්සේ කෙරෙහි
මාගේ ආත්මය පිපාසවේ.
මම කවද ඇවිත් දෙවියන්වහන්සේ
ඉදිරියෙහි පෙනෙම්ද?
3 නුඹේ දෙවියන්වහන්සේ කොයිදැයි
ඔවුන් නිතර මට කියන කල,
මාගේ කඳුළු දිවා රාත්‍රි දෙක්හි මට
කෑම විය.
4 මංගල්‍ය පවත්වන සමූහයකට පෙරටුව,
ප්‍රීති ප්‍රශංසා ශබ්ද සහිතව,
ඔවුන් කැටුව දේවමන්දිරයට ගිය
ආකාරය සිහිකරමින්,
මාගේ ආත්මය වගුරුවමි.
5 එම්බා මාගේ ආත්මය, මක්නිසා
මලානිකව ඉන්නෙහිද?
මක්නිසා මා තුළ කැලඹෙන්නෙහිද?
දෙවියන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවෙව.
මක්නිසාද මාගේ මුහුණේ සැපදයකවූ,
මාගේ දෙවිවූ උන්වහන්සේට තවම
ස්තුති ප්‍රශංසා කරන්නෙමි.
6 මාගේ දෙවියන්වහන්ස, මාගේ
ආත්මය මා තුළෙහි මලානිකවෙයි.
එබැවින් යොර්දන් දේශයෙන්
හෙර්මොන් කඳුවලන් මිශාර් කන්දෙන්
සිට ඔබ සිහිකරමි.
7 ඔබගේ ජලධාරාවල ඝෝෂාවෙන්
ගැඹුර ගැඹුරට හඬගසයි.
ඔබගේ සියලු රළ සහ තරංගයෝ
මා වසාගත්තෝය.
එහෙත් ස්වාමීන්වහන්සේ තමන්ගේ 8
කරුණාගුණය දිවාභාගයේදී
නියමකරනසේක,
රාත්‍රිභාගයේදීත් උන්වහන්සේට
ගීතිකාවක්,
එනම් මාගේ ජීවනයේ
දෙවියන්වහන්සේට යාච්ඤාවක්, මා
සමග වන්නේය.
ඔබ කුමට මා සිහිනැතිකළසේක්ද? 9
සතුරාගේ පීඩාව නිසා කුමට විලාප
කියමින් පසුවෙම්දැයි මාගේ
පර්වතයවූ දෙවියන්වහන්සේට
කියන්නෙමි.
මාගේ එදිරිකාරයෝ: නුඹේ 10
දෙවියන්වහන්සේ කොයිදැයි නිතර
මට කියමින්,
මාගේ ඇටවලට කඩුවකින්
ඇන්නාක්මෙන් මට නින්දකෙරෙති.
එම්බා මාගේ ආත්මය, මක්නිසා 11
මලානිකව ඉන්නෙහිද?
මක්නිසා මා තුළ කැලඹෙන්නෙහිද?
දෙවියන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවෙව;
මක්නිසාද මාගේ මුහුණේ සැපදයකවූ,
මාගේ දෙවිවූ උන්වහන්සේට
තවම ස්තුති ප්‍රශංසා කරන්නෙමි.

43 දෙවියන්වහන්ස, මා විනිශ්චය-
කොට, අභක්තික ජාතියකට
විරුද්ධව මා උදෙසා කාරණා කිව
මැනව.
කපටිවූ අසාධාරණවූ මනුෂ්‍යයාගෙන්
මා මුදගත මැනව.
මක්නිසාද ඔබ මාගේ ශක්තියවූ 2

දෙවියන්වහන්සේය; කුමක් නිසා ඔබ
මා පහකළසේක්ද?
සතුරාගේ පීඩාව නිසා කුමට විලාප
කියමින් පසුවෙම්ද?
3 ඔබගේ එළියත් සැබෑකමත් එවුව මැනව;
ඒවා මා ගෙනයෙත්වා.
ඒවා ඔබගේ ශුද්ධවූ කන්දටත්
ඔබගේ මණ්ඩපවලටත් මා පමුණුවත්වා.
4 එවිට මම දෙවියන්වහන්සේගේ
පූජාසනය ළඟට,
එනම් මාගේ අධික ප්‍රීතියවූ
දෙවියන්වහන්සේ වෙතට, යන්නෙමි.
දෙවියන්වහන්ස, මාගේ
දෙවියන්වහන්ස, වීණාවෙන් ඔබට
ප්‍රශංසා කරන්නෙමි.
5 එම්බා මාගේ ආත්මය, මක්නිසා
මලානිකව ඉන්නෙහිද?
මක්නිසා මා තුළ කැලඹෙන්නෙහිද?
දෙවියන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවෙව.
මක්නිසාද මාගේ මුහුණේ සැපදයකවූ,
මාගේ දෙවිවූ උන්වහන්සේට
තවම ස්තුති ප්‍රශංසා කරන්නෙමි.

## ජාතිය නින්ද ලත් කාලයේදී කන්නලව්කිරීම

**44** නායක වාද්‍යකරුටයි,
කෝර්‍රාගේ පුත්‍රයන්ටයි.
අනුශාසනාවකි.

1 දෙවියන්වහන්ස, පුරාණ කාලය වන,
අපේ පියවරුන්ගේ දවස්වලදී,
ඔබ කළ ක්‍රියා අපේ කනින් ඇසීමුව,
අපේ පියවරු අපට කීවෝය.
2 ඔබ ස්වකීය හස්තයෙන් ජාතීන් පිටත
එළවා, මොවුන් වාසයකෙරෙවූසේක;
ඔබ මනුෂ්‍ය වර්ගයන්ට පීඩාකොට
මොවුන් පැතිරවූසේක.
3 මක්නිසාද ඔබ මොවුන්ට ප්‍රසන්න
බැවින්,
ඔබගේ දකුණතින්ද ඔබගේ බාහුවෙන්ද
ඔබගේ මුහුණේ එළියෙන්ද
ගැළවුණා මිස,
මොවුන්ගේ කඩුවෙන් දේශය උරුමකර
නොගත්තෝය,
ස්වකීය බාහුවද මොවුන්
නොගැළෙවුවේය.
දෙවියන්වහන්ස, ඔබ මාගේ 4
රජ්ජුරුවෝය.
යාකොබ්ට මිදීම වේවයි අණකළ
මැනව.
ඔබ කරණකොටගෙන අපේ 5
එදිරිකාරයන් හෙළාදමන්නෙමුව.
අපට විරුද්ධව නැගිටින්නන් ඔබගේ
නාමය කරණකොටගෙන පාගා
දමන්නෙමුව.
මක්නිසාද මාගේ දුන්න විශ්වාස 6
නොකරන්නෙමි,
මාගේ කඩුවද මා නොගළවන්නේය.
ඔබ අපේ එදිරිකාරයන්ගෙන් අප 7
ගළවා,
අපට වෛරවෙන්නන් ලජ්ජාවට
පැමිණවූසේක.
අපි දවස මුළුල්ලේම දෙවියන්වහන්සේ 8
වර්ණනාකෙළෙමුව,
ඔබගේ නාමයට සදකල්
ස්තුතිකරන්නෙමුව.
නුමුත් ඔබ අප පහකොට අගෞරවයට 9
පැමිණවූසේක;
අපේ සේනාවන් සමග නොයනසේක.
ඔබ එදිරිකාරයා කෙරෙන් අප ආපසු 10
හරවනසේක.
අපට වෛරවන්නෝද කොල්ලකාගනිති.
කෑම පිණිස නියමවූ බැටළුවන් මෙන් 11
ඔබ අප පාවාදී,
ජාතීන් අතරේ අප විසිරවූසේක.
ඔබ ස්වකීය සෙනඟ නොමිලයේ 12
විකුණනසේක,
ඔවුන්ගේ අගයෙන්ද ඔබ වස්තු වැඩිකර
නොගත්සේක.
ඔබ අපේ අසල්වාසීන්ට අප නින්දවක්ද, 13
අප අවට සිටින්නන්ට හෙළාදක්මක්
හා අපහාසයක්ද වෙන්ට
සලස්වනසේක.
ඔබ ජාතීන් අතරේ අප නින්ද 14
වාක්‍යයක්ද,
මනුෂ්‍ය වර්ගයන් අතරේ හිස් වැනීමට
කරුණක්ද වෙන්ට සලස්වනසේක.

15 නින්දකරන්නාගෙත්
අපහාසකරන්නාගෙත්
ශබ්දය නිසාද,
සතුරා සහ පළිගන්නා නිසාද,
16 දවස මුළුල්ලේ මාගේ අගෞරවය මා
ඉදිරියෙහිය,
මාගේ මුහුණේ ලජ්ජාවද මා
වසාගත්තේය.
17 මේ සියල්ල අපට පැමිණියේය; එහෙත්
ඔබ සිහිනැති නොකෙළෙමුව,
ඔබගේ ගිවිසුම ගැන වංචාවෙන්
ක්‍රියා නොකෙළෙමුව.
18 සිවලුන්ගේ වාසස්ථානයේදී ඔබ අප
සම්පූර්ණයෙන් බින්ද *ලෙසත්,
මරණ සෙවණෙන් අප වැසූ *ලෙසත්,
19 අපේ සිත පසුබට නොවීය,
අපේ පාද ඔබගේ මාර්ගයෙන් ඉවත්
නොවීය.
20 අපේ දෙවියන්වහන්සේගේ නාමය
සිහිනැති කෙළෙමු නම්,
අන් දෙවියෙකුට අත් දිගුකෙළෙමු
නම්,
21 දෙවියන්වහන්සේ එය
නොසොයනසේක්ද?
මක්නිසාද උන්වහන්සේ සිතේ රහස්
දන්නාසේක.
22 එසේය, දවස මුළුල්ලේ ඔබ නිසා අපි
මරනු ලබමුව;
මැරීමට නියම බැටළුවන් මෙන්
ගණිනලද්දෝ වමුව.
23 ස්වාමිනි, පිබිදුණ මැනව, ඔබ
මක්නිසා නිදනසේක්ද?
නැගුටුණ මැනව, සදාකාලයටම අප
පහ නොකළ මැනව.
24 කුමක්හෙයින් ඔබගේ මුහුණ සඟවමින්,
අපේ විපත්තිය සහ පීඩාව සිහිනැති
කරනසේක්ද?
25 අපේ ආත්මය ධූලියට නැමී තිබේ.
අපේ උදරයද බිමට ඇලෙයි.
26 අපට උපකාර පිණිස නැගුටුණ මැනව,
ඔබගේ කරුණාගුණය නිසා අප
මිදුව මැනව.

*නොහොත්, තුමුත්.

## රාජකීය මංගල්‍ය ගීතයක්

## 45

නායක වාද්‍යකරුටයි;
ෂොෂන්නීම් යන තූර්ය
ඇතුව ගීතිකාකිරීමටයි;
කෝරාගේ පුත්‍රයන්ටයි.
අනුශාසනාවක් වන
ප්‍රේමවන්තියන් ගැන
සැදූ ගීතිකාවකි.

යහපත් කාරණයකින් මාගේ සිත 1
ඉතිරී යයි.
මම රජ්ජුරුවන් සඳහා කවි කියමි.
මාගේ දිව දක්ෂ ලියන්නෙකුගේ
පන්හිඳ වේ.
ඔබ මනුෂ්‍ය පුත්‍රයන්ට වඩා රුව 2
ඇතිසේක;
ඔබගේ තොල්වල අනුග්‍රහය
වගුරුවනලද්දේය.
එබැවින් දෙවියන්වහන්සේ ඔබට
සදාකාලයටම ආශීර්වාදකළසේක.
බලවන්තයාණෙනි, ඔබගේ තේජස 3
හා මහිමය නමැති කඩුව
ඉඟටියෙහි බැඳගත මැනව.
සැබෑකමත් මොළොක්කමත් 4
ධර්මිෂ්ඨකමත් සඳහා
ස්වකීය මහිමයෙන් යුක්තව ජය
රථයෙන් වැඩිය මැනව.
ඔබගේ දකුණත ඔබට භයානක
කාරණා උගන්වන්නේය.
ඔබගේ ඊගස් තියුණුය; 5
මනුෂ්‍ය වර්ගයෝ ඔබට පරාජයව
වැටෙති,
රජුගේ සතුරන්ගේ හෘදයට ඒවා ඇනී
තිබේ.
දෙවියන්වහන්ස, ඔබගේ සිංහාසනය 6
සදාකාලේටම පවතින්නේය.
ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය
සාධාරණකමේ ජයකොන්තයක්ය.
ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රියව, දුෂ්ටකමට 7
ද්වේෂකළසේක.
එබැවින් දෙවියන්වහන්සේ, ඔබගේ
දෙවියන්වහන්සේ,
ඔබගේ පංගුකාරයන්ට වඩා ඔබ
සන්තෝෂ නමැති තෛලයෙන්
ආලේපකළසේක.
ඔබගේ වස්ත්‍ර සියල්ලෙන් ගන්ධරස 8
අගිල් සහ කුරුඳු සුවඳ නික්මෙයි;

ඇත්දත්මයවූ මාලිගා තුළින් වීණාවෝ
ඔබට ප්‍රීති ඉපදෙවූවෝය.
9 ඔබගේ කුල ස්ත්‍රීන් අතරෙහි රාජ
දූවරු සිටිති.
ඕපීර්හි රනින් සැරසී බිසව් තොමෝ
ඔබගේ දකුණෙන් සිටින්නීය.
10 දියණියෙනි, අසව, කල්පනාකරව,
කන් යොමුකරව;
නුඹේම සෙනඟත් නුඹේ පියාණන්ගේ
ගෙදරත් සිහිනැතිකරව;
11 එවිට රජතෙම නුඹේ රූපශ්‍රීයට
ආශා වෙයි.
මක්නිසාද උන්වහන්සේ නුඹේ ස්වාමීය;
උන්වහන්සේට නමස්කාර කරව.
12 තීර්හි දූව පඬුරක් රැගෙන එන්නීය;
සෙනඟ අතරේ ධනවන්තයෝ පවා
නුඹෙන් කරුණාව ඉල්ලන්නෝය.
13 රාජදූ තොමෝ මාලිගාව තුළෙහි
සියලු ආකාර තේජසින්
යුක්තවන්නීය.
ඇගේ වස්ත්‍ර රනින් විසිතුරු කරන
ලද්දේය.
14 මල්කම්කළ සළුවෙන් සරසනලද ඈ
රජු වෙත පමුණුවනු ලබන්නීය.
ඈ අනුව යන්නාවූ ඇගේ යහළු
කන්‍යාවෝ
ඔබ වෙත පමුණුවනු ලබන්නෝය.
15 ඔව්හු සන්තෝෂයෙන් හා ප්‍රීතියෙන්
ගෙනයනු ලබන්නෝය.
ඔව්හු රාජ මාලිගාවට
ඇතුල්වන්නෝය.
16 ඔබගේ පියවරුන් වෙනුවට දරුවෝ
සිටින්නාහුය,
ඔබ ඔවුන් මුළු පොළොවෙහි අධිපතීන්
කරන්නෙහිය.
17 මම ඔබගේ නාමය සියලු
පරම්පරාවන්හි සිහිකරවන්නෙමි.
එබැවින් මනුෂ්‍ය වර්ගයෝ සදකල්හිම
ඔබට ස්තුතිකරන්නෝය.

## ජාතියේ රක්ෂාස්ථානය

# 46

නායක වාද්‍යකරුටයි;
කෝරාගේ පුත්‍රයන්ටයි;
හීන් ශබ්දයෙන් ගායනා-
කිරීමට ගීතිකාවකි.

1 දෙවියන්වහන්සේ අපේ සරණ හා
ශක්තියය,
දුකේදී ඉතා ළංවූ පිහිටක්ය.
එබැවින් පොළොව වෙනස්වෙතත්, 2
මුහුද මැද පර්වත සැලෙතත්,
එහි ජල ගුගුරා කැලඹෙතත්, 3
එහි නගින රළ වේගයෙන් පර්වත
කම්පාවෙතත් භය නොවන්නෙමුව.

ගංගාවක් ඇත, එහි දියපාරවල් 4
මහෝත්තමයාණන්ගේ මණ්ඩපවල
ශුද්ධස්ථානය වන
දෙවියන්වහන්සේගේ නුවර
ප්‍රීතිමත්කරයි.
දෙවියන්වහන්සේ ඒ මැද සිටිනසේක; 5
එය නොසෙල්වන්නේය.
දෙවියන්වහන්සේ අලුයම්හිම එයට
උපකාරකරනසේක.
ජාතීහු කෝලාහල කළෝය, රාජ්‍යයෝ 6
සෙලවුණෝය.
උන්වහන්සේ ස්වකීය හඬ නිකුත්-
කළසේක, පොළොව දියවූවාය.
සේනාවල ස්වාමීන්වහන්සේ අප 7
සමගය;
යාකොබ්ගේ දෙවියන්වහන්සේ අපේ
බලකොටුවය.

එව්, ස්වාමීන්ගේ ක්‍රියාවන්, එනම් 8
උන්වහන්සේ පොළොවෙහි සිදුකළ
විනාශයන්, බලව්.
උන්වහන්සේ පොළෝ කෙළවර දක්වා 9
යුද්ධ නවත්වනසේක;
දුන්න බිඳ, හෙල්ලය කපාදමා,
රථ ගින්නෙන් දවනසේක.
නිශ්චලවව්, මා දෙවියන්වහන්සේ බව 10
දැනගනිව්.
ජාතීන් අතරේ උසස්වන්නෙමි,
පොළොවෙහි උසස්වන්නෙමි.
සේනාවල ස්වාමීන්වහන්සේ අප 11
සමගය;
යාකොබ්ගේ දෙවියන්වහන්සේ අපේ
බලකොටුවය.

## පොළොවේ රජවූ දෙවියන්වහන්සේ

# 47

නායක වාද්‍යකරුටයි;
කෝරාගේ පුත්‍රයන්ගේ
ගීතයකි.

සියලු මනුෂ්‍ය වර්ගයෙනි, 1
අත්පොළසන්දෙව්;

ජයනාදයෙන් දෙවියන්වහන්සේට
හඬනගව්.
2 මක්නිසාද මහෝත්තමවූ ස්වාමීන්-
වහන්සේ භයංකරය;
උන්වහන්සේ මුළු පොළොව කෙරෙහි
මහත් රජෙක් වනසේක.
3 උන්වහන්සේ අපට මනුෂ්‍ය වර්ගයන්ද
අපේ පාදවලට ජාතීන්ද
යටත්කරදෙනසේක.
4 උන්වහන්සේ තමන්ට ප්‍රියවූ
යාකොබ්ගේ මහිමය නැමැති
අපේ උරුමය අප සඳහා
තෝරාදෙනසේක.
5 දෙවියන්වහන්සේ ජයඝෝෂාවක් ඇතුව
නැගී ගියසේක,
ස්වාමීන්වහන්සේ හොරණෑ ශබ්දයක්
ඇතුව නැගී ගියසේක.
6 දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කියව්,
ප්‍රශංසා ගී කියව්,
අපේ රජ්ජුරුවන්ට ප්‍රශංසා ගී කියව්,
ප්‍රශංසා ගී කියව්.
7 මක්නිසාද දෙවියන්වහන්සේ මුළු
පොළොවට රජ්ජුරුවෝය.
අර්ථ දන ප්‍රශංසා ගී කියව්.
8 දෙවියන්වහන්සේ ජාතීන් කෙරෙහි
රජකම්කරනසේක.
දෙවියන්වහන්සේ ස්වකීය ශුද්ධ
සිංහාසනයෙහි වැඩහිඳිනසේක.
9 ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේගේ
සෙනඟ වන පිණිස,
මනුෂ්‍ය වර්ගයන්ගේ අධිපතීහු රැස්ව
සිටිති.
මක්නිසාද පොළොවේ පලිස්
දෙවියන්වහන්සේට අයිතිය;
උන්වහන්සේ අතිශයින් උසස්ව
සිටිනසේක.

## සියොන් කන්දේ තේජස

48 ගීතිකාවකි; කෝරාගේ
පුත්‍රයන්ට ගීතයකි.

1 අපේ දෙවියන්වහන්සේගේ නුවර වන
උන්වහන්සේගේ ශුද්ධ කන්දෙහි
ස්වාමීන්වහන්සේ උතුම්ය, බොහෝ
සෙයින් ප්‍රශංසා කටයුතුය.
2 උතුරු පැත්තේ තිබෙන
මහා රජ්ජුරුවන්ගේ නුවරවූ සියොන්
කන්ද
උසින් අලංකාරය, මුළු පොළොවට
ප්‍රියකරුය.
දෙවියන්වහන්සේ බලකොටුවක් පිණිස 3
එහි මාලිගාවල තමන්ම
ප්‍රකාශවූසේක.
මක්නිසාද රජවරු රැස්වූවෝය, 4
ඔව්හු එක්ව ගියෝය.
ඔව්හු එය දැක විස්මයට පත්වූවෝය; 5
ඔහු තැතිගෙන පලාගියෝය.
එහිදී ඔවුන්ට වෙවුලුමත් 6
ප්‍රසූතිකාවකට සේ වේදනාවත්
හටගත්තේය.
ඔබ පෙරදිග හුළඟෙන් 7
තර්ෂිෂ්හි නැව් බිඳිනසේක.
අප විසින් ඇසූ ලෙසම සේනාවල 8
ස්වාමීන්ගේ නුවරදී,
අපේ දෙවියන්වහන්සේගේ නුවරදී,
දුටිමුව.
දෙවියන්වහන්සේ එය සදකල්
පිහිටුවනසේක.
දෙවියන්වහන්ස, ඔබගේ මන්දිරය මැදදී 9
ඔබගේ කරුණාගුණය මෙනෙහිකෙළෙමුව.
දෙවියන්වහන්ස, ඔබගේ නාමය 10
ලෙසම
ඔබගේ ප්‍රශංසාවත් පොළොවේ සීමා
දක්වා වේ.
ඔබගේ දකුණත ධර්මිෂ්ඨකමින්
පූර්ණය.
ඔබගේ විනිශ්චයන් නිසා 11
සියොන් කන්ද සන්තෝෂවේවා,
යූදගේ දූවරු ප්‍රීතිවෙත්වා.
මතු පරම්පරාවට කියන පිණිස 12
සියොන් වට ඇවිදිව්, එහි හාත්පස
යව්.
එහි බලකොටු ගණන්කරව්; 13
එහි ප්‍රාකාර හොඳින් බලා,
එහි මාලිගා සෝදිසිකරව්.
මක්නිසාද මේ දෙවියන්වහන්සේ 14
සදකල්හිම අපේ දෙවියන්වහන්සේය.
උන්වහන්සේ මරණය දක්වා අපට
මඟ පෙන්වනසේක.

## ලෝකයේ සම්පත්වල නිෂ්ඵලකම

49 නායක වාද්‍යකරුටයි;
කෝරාගේ පුත්‍රයන්ට
ගීතයකි.

සියලු මනුෂ්‍ය වර්ගයෙනි, මෙය අසව්; 1
උත්තමාධම

2 පොහොසත් අපොහොසත්
ලෝවැසි සියල්ලෙනි, එක්ව කන්දෙව්.
3 මාගේ මුඛය ඥනය කථාකරන්නේය;
මාගේ සිතේ භාවනාකිරීම ප්‍රඥව
ගැන වන්නේය.
4 උපමාවකට කන යොමුකරන්නෙමි.
මාගේ ගාම්භීර වාක්‍ය වීණාවෙන්
එළිදරව්කරන්නෙමි.
5 මා ලුහුබඳින අයුතුකම මා වටකරන කල,
විපත්ති දවස්වලදී කුමට භයවෙම්ද?
6 ස්වකීය ධනය විශ්වාසකරන්නාවූ,
තමුන්ගේ වස්තු වැඩිකමෙන් අහංකාර
වෙන්නාවූ කිසිවෙක්,
7 තමාගේ සහෝදරයා සදකල් ජීවත්
වන පිණිසද
කුණුවීම නොදක්නා පිණිසද
8 ඔහු නිදහස්කරන්ටවත්
ඔහු උදෙසා දෙවියන්වහන්සේට
මිදීමේ මිලයක් දෙන්ටවත් කිසිසේත්
සමර්ථ නොවේ.
9 ඔවුන්ගේ ආත්ම මිදීම අගනා දෙයක්
බැවින්,
එකතුකරන්ට කිසිකලක උත්සාහ
නොකළ යුතුය.
10 මක්නිසාද ප්‍රඥවන්තයන් මැරී යන
බවත්,
අඥනයාද අල්ප බුද්ධි ඇත්තාද යන
දෙදෙනම විනාශවෙන බවත්,
ස්වකීය ධනය අනුන්ට තබා යන බවත්
ඔහු දක්නේය.
11 ඔවුන්ගේ සිතේ කල්පනාව නම්,
තමුන්ගේ ගෙවල් සදකාලේටද
තමුන්ගේ වාසස්ථාන පරම්පරාවෙන්
පරම්පරාවටද පවතින්නේය යනුයි;
ඔවුන්ගේ ගම්බිම්වලට ස්වකීය නම්
තබති.
12 එහෙත් මනුෂ්‍යයා ගෞරවයෙන්
යුක්තව නොපවත්නේය;
ඔහු විනාශවන තිරිසනුන් හා
සමානය.
13 ඔවුන්ගේ මේ විධිය ඔවුන්ගේ
මෝඩකමය.
එහෙත් ඔවුන්ට පසුව එන්නෝ ඔවුන්ගේ
කීම් පිළිගනිති.
14 බැටළු රැළක් මෙන් *ෂෙයෝල්ට
ඔව්හු
නියමකරනු ලබති;
මරණය ඔවුන්ගේ එඬේරා වන්නේය.
අවංකයෝ උදය කාලයෙහි ඔවුන්
කෙරෙහි බල පවත්වන්නෝය;
ඔවුන්ගේ අලංකාරය වාසස්ථානයක්
නොලැබ විනාශවන පිණිස
*ෂෙයෝල්ට කැපවන්නේය.
තුමුත් දෙවියන්වහන්සේ මා පිළිගන්න 15
නිසා
†ෂෙයෝල්ගේ බලයෙන් මාගේ ආත්මය
මුදගන්නාසේක.
යමෙක් ධනවත් වන කල්හිද 16
ඔහුගේ ගෙයි ඓශ්වර්යය වැඩිවන
කල්හිද භය නොවව.
මක්නිසාද ඔහු මැරෙන කල කිසිවක් 17
ගෙන නොයන්නේය;
ඔහුගේ ඉසුර ඔහු අනුව නොයන්නේය.
ඔහු ජීවත්ව සිටියදී තමා ගැනම 18
පාරට්ටුකරගත්තේවී තුමුත්,
තුඹ තුඹටම ශුභසිද්ධකරගන්නා කල්හි
මනුෂ්‍යයන් තුඹට ප්‍රශංසාකරන
තුමුත්,
ඔහු තම පියවරුන්ගේ පරම්පරාවට 19
යන්නේය;
ඔව්හු කිසිකලෙකත් එළිය නොදක්නෝය.
ගෞරව ලබන්නාවූ නුවණ නැත්තාවූ 20
මනුෂ්‍යයා
විනාශවෙන තිරිසනුන් හා සමානය.

## යෝග්‍ය පූජා ඔප්පුකිරීමට දිව්‍ය ආරාධනාව

ආසාප්ගේ ගීතයකි. **50**

දෙවියන්වහන්සේ, ස්වාමිවූ 1
දෙවියන්වහන්සේ කථාකරමින්
නැගෙනහිර පටන් බස්නාහිර දක්වා
පෘථිවියට හඬගැසූසේක.
අලංකාරයේ සම්පූර්ණත්වය වූ 2
සියොන්හි සිට
දෙවියන්වහන්සේ බැබළුසේක.
අපේ දෙවියන්වහන්සේ වඩිනසේක, 3
නිශ්ශබ්ද නොවනසේක.

*හෙවත්, පාතාලයට.

*හෙවත්, පාතාලයට.
†හෙවත්, පාතාලයේ.

උන්වහන්සේ ඉදිරියෙහි ගින්නක්
විනාශකරන්නේය,
උන්වහන්සේ හාත්පසින්ද සැර කුණාටු
අධිකවන්නේය.
4 උන්වහන්සේ තමන්ගේ සෙනඟ
විනිශ්චයකරන පිණිස
ඉහළ අහසටත් පෘථිවියටත්
හඬගසනසේක.
5 පූජා කරණකොටගෙන මා සමග
ගිවිසුමක් කළාවූ
මාගේ ශුද්ධවන්තයන් මා වෙතට
රැස් කරව්.
6 අහස උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
ප්‍රකාශකරන්නේය;
මක්නිසාද දෙවියන්වහන්සේම
විනිශ්චයකාරයාණෝය.
7 එම්බා, මාගේ සෙනඟෙනි, අසව්, මම
කථාකරන්නෙමි;
එම්බා, ඉශ්‍රායෙල්, තට විරුද්ධව සාක්ෂි
දෙන්නෙමි.
මම දෙවියන්වහන්සේය, එසේය, තාගේ
දෙවියන්වහන්සේය.
8 තාගේ පූජා ගැන තට තරවටු
නොකරන්නෙමි;
තාගේ දවන පූජාද නිතර මා ඉදිරියෙහි
තිබේ.
9 තාගේ ගෙයින් ගොනෙක්වත්
තාගේ ගාල්වලින් එළුවන්වත්
නොගන්නෙමි.
10 මක්නිසාද වනයේ සියලු සතුන් සහ
*දහස් ගණන් කඳුවල ගවයොත්
මාගේය.
11 කඳුවල සියලු පක්ෂීන් දනිමි.
කෙතේ වල් සත්තුද මාගේය.
12 මට බඩගිනි වීනම්, තට
නොකියන්නෙමි.
මක්නිසාද ලෝකයත් එහි පූර්ණකමත්
මාගේය.
13 මම ගව මස් අනුභවය හෝ
එළු ලේ පානය කෙරෙම්ද?
14 දෙවියන්වහන්සේට ස්තුති යාගය පුදව;
මහෝත්තමයාණන්ට තාගේ භාර
ඉෂ්ටකරව.
තවද විපත්ති දවසේදී මට යාච්ඤා කරව; 15
මම තා මුදාහරින්නෙමි, තෝ මට
ගෞරවකරන්නෙහිය.
නුමුත් දුෂ්ටයාට දෙවියන්වහන්සේ 16
කථාකොට:
මාගේ පනත් ප්‍රකාශකිරීමෙන් හෝ
මාගේ ගිවිසුම තාගේ කටට ගැන්මෙන්
තට කම් කිම්ද?
මක්නිසාද තා ගුරුකම් ලැබීමට 17
අප්‍රියවන්නෙහිය,
මාගේ වචනවලට පිටුපාන්නෙහිය.
තෝ සොරෙකු දුටු කල ඔහු හා 18
සමාගම් වූණෙහිය,
කාමමිථ්‍යාචාරිකයන් සමග
කොටස්කාරයෙක් වූවෙහිය.
තාගේ කට නපුරට දී තිබේ, 19
තාගේ දිවද රැවටිලි යොදයි.
තා ඉඳගෙන තාගේ සහෝදරයාට 20
විරුද්ධව කථාකෙරෙහිය;
තාගේම මෑණියන්ගේ පුත්‍රයාට
විරුද්ධව කේලාම්කියන්නෙහිය.
මේවා තෝ කෙළෙහිය, මමද 21
නිශ්ශබ්දව සිටියෙමි;
මමත් සියලු ආකාරයෙන් තට
සමානයයි සිතුයෙහිය.
එහෙත් තට තරවටුකරන්නෙමි, තාගේ
ඇස් හමුයෙහි ඒවා පිළිවෙළින්
තබන්නෙමියි කියනසේක.
දෙවියන්වහන්සේ සිහිනැතිකරන්නෙනි, 22
මා විසින් ඉරතු නොලබන පිණිසත්
ගළවන්ට කෙනෙක් නැති නොවන
පිණිසත් මෙය කල්පනාකරව්.
ස්තුතිපූජා කරන තැනැත්තේ මට 23
ගෞරවකරයි;
ස්වකීය හැසිරීම හරිලෙස පවත්වා
ගන්නාට
දෙවියන්වහන්සේගෙන් ලැබෙන
ගැළවීම දක්වන්නෙමි.

*නොහොත්, කඳුවල වසන
දහස් ගණන්.

## පසුතැවිලිවෙන්නාගේ කන්නලව්ව

51 නායක වාද්‍යකරුටයි. දාවිත් බැත්-ෂෙබා කරා පැමිණීම නිසා අනාගතවක්තෘවූ නාතාන් ඔහු වෙතට ගිය පසු දාවිත් සෑදූ ගීතයකි.

1 දෙවියන්වහන්ස, ඔබගේ කරුණා
ගුණය ලෙස මට දයාවුව මැනව.
ඔබගේ අධික දයාබරකම ලෙස මාගේ
අපරාධ මැකුව මැනව.
2 මාගේ අයුතුකමින් මා සම්පූර්ණයෙන්ම
සේදුව මැනව,
මාගේ පාපයෙන් මා පිරිසිදුකළ මැනව.
3 මක්නිසාද මාගේ අපරාධ මම
ඒත්තු ගනිමි.
මාගේ පාපයද නිතරම මා ඉදිරියෙහිය.
4 ඔබට විරුද්ධව, ඔබට පමණක්ම
විරුද්ධව, පව්කෙළෙමි,
ඔබගේ ඇස් හමුයෙහි නපුරුව තිබෙන
දේ කෙළෙමි.
එබැවින් ඔබ කථාකරන කල
සාධාරණසේක,
විනිශ්චයකරන කල ඔබ ශුද්ධසේක.
5 බැලුව මැනව, මම අයුතුකම සහිතව
සාදනු ලැබීමි;
මාගේ මෑණියෝ පාප සහිතව මා
ගැබ්ගත්තාය.
6 බැලුව මැනව, අධ්‍යාත්මයෙහි
සත්‍යතාවට ඔබ කැමතිවනසේක.
අප්‍රකාශවූ හෘදයෙහි ඔබ මට ඥානය
දනගන්ට සලස්වනසේක.
7 හිසොපින් මා පිරිසිදුකළ මැනව, එවිට
මම පවිත්‍රවන්නෙමි.
මා සේදුව මැනව. එවිට මම හිමට
වඩා සුදුවන්නෙමි.
8 ඔබ බින්දවූ ඇටවලට සැප ලැබෙන
පිණිස
ප්‍රීති සන්තෝෂය මට ඇසෙන්ට
සැලැස්සුව මැනව.
9 මාගේ පාපය කෙරෙන් ඔබගේ මුහුණ
සඟවාගත මැනව,
මාගේ සියලු අයුතුකම් මැකුව මැනව.
දෙවියන්වහන්ස, පවිත්‍ර සිතක් මා තුළ 10
මැවුව මැනව;
ස්ථිර ආත්මයක් මා තුළෙහි අලුතෙන්
සෑදුව මැනව.
ඔබ ඉදිරියෙන් මා බැහැර නොකළ 11
මැනව;
ඔබගේ ශුද්ධාත්මය මාගෙන් පහ
නොකළ මැනව.
ඔබගේ ගැළවීමේ ප්‍රීතිය මට නැවත 12
දුන මැනව.
නිදහස් ආත්මයකින් මා දරුව මැනව.
එවිට මම අපරාධකාරයන්ට ඔබගේ 13
මාර්ග උගන්වන්නෙමි;
පව්කාරයෝද ඔබ වෙතට හරවනු
ලබන්නෝය.
දෙවියන්වහන්ස, මාගේ ගැළවීමේ 14
දෙවියන්වහන්ස, මිනීමැරීමේ
අපරාධයෙන් මා මුදහැරිය මැනව;
මාගේ දිවද ඔබගේ ධර්මිෂ්ඨකම ගැන
ශබ්දනගා ගීතිකාකරන්නේය.
ස්වාමිනි, කට ඇරින්ට මට පිහිටවුව 15
මැනව;
එවිට මාගේ මුඛය ඔබගේ ප්‍රශංසාව
දන්වන්නේය.
මක්නිසාද ඔබ පූජාවට නොකැමති- 16
සේක; කැමතිසේක් නම් එය
දෙන්නෙමි.
ඔබ දවන පූජාවට ප්‍රසන්න
නොවනසේක.
දෙවියන්වහන්සේට කළ යුතු පූජා නම් 17
බිඳුණාවූ සිතක්ය.
දෙවියන්වහන්ස, බිඳුණාවූ තැළුණාවූ
සිතක් ඔබ සුළුකොට
නොසිතනසේක.
ඔබගේ ප්‍රසන්නයෙන් සියොනට යහපත 18
සිදුකළ මැනව;
යෙරුසලමේ පවුරු ගොඩනැගුව
මැනව.
එකල ධර්මිෂ්ඨකමේ පූජාවලට, එනම් 19
දවන පූජාව හා මුළු දවන පූජාවට,
ඔබ ප්‍රියවනසේක.
එවිට ඔව්හු ඔබගේ පූජාසනය පිට
ගොනුන් පූජාකරන්නාහුය.

## බලාත්කාරකම් කරන්නාගේ විනාශය

52 නායක වාද්‍යකරුටයි. දවිත් අහිමෙලෙක්ගේ ගෙදරට ඇතුල්වීයයි ඒදෝමිය දොවෙග් විත් සාවුල්ට දැන්වූවාට පසු දවිත් ලියූ අනුශාසනාවකි.

1 එම්බා බලවන්තය, තුඹ නපුරු ක්‍රියායෙහි කුමට පාරට්ටුකරගන්නෙහිද?
දෙවියන්වහන්සේගේ කරුණාව නිතරම පවත්නේය.
2 තුඹේ දිව තියුණු දැළි පිහියකට සමානව රැවටිලිකරමින්,
දුෂ්ටකමම යෝජනාකරයි.
3 තුඹ යහපතට වඩා නපුරටත් ධර්මිෂ්ඨකම කථාකිරීමට වඩා බොරු කීමටත් ප්‍රිය ඇත්තෙහිය.
4 එම්බා කපටි දිව,
තෝ සියලු ආකාර නාස්තික වචනවලට ප්‍රිය ඇත්තෙහිය.
5 දෙවියන්වහන්සේ තුඹ සදකාලේටම බිඳ දමනසේක,
උන්වහන්සේ තුඹ අල්වා තුඹේ කූඩාරමෙන් ඇද දමනසේක,
ජීවතුන්ගේ දේශයෙන් තුඹ උදුරා දමනසේක.
6 ධර්මිෂ්ඨයෝ ඒ දැක භයවී,
ඔහුට සිනාසෙමින්:
7 බලව, දෙවියන්වහන්සේ තමාගේ *ශක්තිය කොට නොගත්තාවූ,
තමාගේ බොහෝ වස්තු කෙරේ විශ්වාසය තැබුවාවූ,
තමාගේ දුෂ්ටකමෙහි බලවත්වූ මනුෂ්‍යයා මේයයි කියන්නෝය.
8 මම වනාහි දෙවියන්වහන්සේගේ ගෘහයෙහි සරු ඔලීව ගහක් වැන්නෙමි.
දෙවියන්වහන්සේගේ කරුණාව කෙරෙහි සදකාලයටම විශ්වාසය තබමි.
ඔබ එසේ කළ නිසා සදකල් ඔබට ස්තුතිකරන්නෙමි. 9
තවද ඔබගේ ශුද්ධවන්තයන් ඉදිරියෙහිදී ඔබගේ නාමය කෙරෙහි බලාසිටින්නෙමි, මක්නිසාද ඒ යහපත්ය.

*නොහොත්, ආරක්ෂා ස්ථානය.

## දේව අභක්ති ලෝකයා ගැන දුක්වීම

53 නායක වාද්‍යකරුටයි; මහලත් වෘත්තයට දවිත් ලියූ අනුශාසනාවකි.

අඥනයා: දෙවිකෙනෙක් නැතැයි තමාගේ සිත තුළ කියාගත්තේය. 1
ඔව්හු දූෂ්‍යව, පිළිකුල්වූ අයුතුකම් කළෝය;
යහපත කරන්නෙක් නැත.
නුවණින් හැසිරෙන්නාවූ, 2
දෙවියන්වහන්සේ සොයන්නාවූ යමෙක් ඇද්දැයි දක්නා පිණිස,
දෙවියන්වහන්සේ ස්වර්ගයේ සිට මනුෂ්‍ය පුත්‍රයන් දෙස බැලූසේක.
ඔවුන් සියලු දෙනාම ආපසු ගියෝය; 3
ඔව්හු එක ලෙස කිලුටුවී සිටිති;
යහපත කරන්නෙක් නැත,
එක්කෙනෙක්වත් නැත.
ආහාර කන්නාක් මෙන් මාගේ සෙනඟ කාදමන්නාවූ, 4
දෙවියන්වහන්සේට යාච්ඤා නොකරන්නාවූ,
අයුතුකම් කරන්නන්ට දැනුමක් නැද්ද?
භයක් නැති තැනදී ඔව්හු බොහෝ සෙයින් භයපත්වූවෝය. 5
මක්නිසාද දෙවියන්වහන්සේ තුඹට විරුද්ධව කඳවුරු බැඳගත් තැනැත්තාගේ ඇට විසිරවූසේක;
දෙවියන්වහන්සේ ඔවුන් එපාකළ නිසා තුඹ ඔවුන් ලජ්ජාවට පත්කෙළෙහිය.
අහෝ සියොන් කෙරෙන් ඉශ්‍රායෙල්ගේ ගැළවීම පැමුණුණොත් යහපත! 6

දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ
වහල්කමෙන් මුදා ගෙනෙන කල්හි
යාකොබ් ප්‍රීතිවන්නේය, ඉශ්‍රායෙල්
සන්තෝෂවන්නේය.

## අන්තරායෙන් මිදීම

**54** නායක වාද්‍යකරුටයි; වීණා ඇතුව ගීතිකා කිරීමටයි. සිප්වරුන් ඇවිත්: දාවිත් අප අතරේ සැඟවී ඉන්නවා නොවේදැයි සාවුල්ට කී පසු දාවිත් විසින් ලියූ අනුශාසනාවකි.

1 දෙවියන්වහන්ස, ඔබගේ නාමය කරණකොටගෙන මා ගැළෙවුවමැනව,
ඔබගේ බලයෙන් මට යුක්තිය කළ මැනව.
2 දෙවියන්වහන්ස, මාගේ යාච්ඤාව ඇසුව මැනව;
මාගේ මුඛයේ වචනවලට කන්දුන මැනව.
3 මක්නිසාද විදේශීහු මට විරුද්ධව නැගිට සිටිති,
බලාත්කාරකරන්නෝද මාගේ ප්‍රාණය හානිකරන්ට සෙවුවෝය.
ඔව්හු තමුන් ඉදිරියෙහි දෙවියන්වහන්සේ තබා නොගත්තෝය.
4 බලව, දෙවියන්වහන්සේ මාගේ උපකාරකාරයාණෝය.
මාගේ ප්‍රාණය ආරක්ෂාකරන්නන් අතරේ ස්වාමීන්වහන්සේ සිටිනසේක.
5 උන්වහන්සේ මාගේ සතුරන්ට නපුරට විපාක දෙනසේක.
ඔබගේ සැබෑකම නිසා ඔවුන් විනාශ කළ මැනව.
6 මම ස්වේච්ඡා පූජාවක් රැගෙන ඔබට පුදන්නෙමි.
ස්වාමිනි, ඔබගේ නාමයට ස්තුතිකරන්නෙමි, මක්නිසාද ඒ යහපත්ය.
7 මක්නිසාද උන්වහන්සේ සෑම දුක්වලින් මා මිදූසේක;
තවද මාගේ සතුරන් ගැන මාගේ ආශාව ඉෂ්ටවූ බව මාගේ ඇසින් දුටිමි.

## ද්‍රෝහිකාර මිත්‍රයෙකු ගැන පැමිණිල්ල

**55** නායක වාද්‍යකරුටයි; වීණා ඇතුව ගීතිකාකිරීමටයි. දාවිත් විසින් ලියූ අනුශාසනාවකි.

දෙවියන්වහන්ස, මාගේ යාච්ඤාවට 1
කන්දුන මැනව;
මාගේ කන්නලව්ව කෙරෙන් නොසැඟවුණ මැනව,
මා දෙසට කන් යොමා මට උත්තර 2
දුන මැනව.
සතුරාගේ ශබ්දය නිසාත්,
දුෂ්ටයාගේ පීඩාව නිසාත්,
මම කැලඹුණු සිතින් මැසිවිලි කියමින් කෙඳිරිගාමි.
මක්නිසාද ඔව්හු මා පිට අයුතුකම් 3
පවරති,
තරහෙන් මට පීඩාකෙරෙති.
මාගේ සිත මා තුළ තද වේදනා 4
සහිත වෙයි.
මරණ භීතිය මා පිට වැටී තිබේ.
භයත් වෙව්ලුමත් මා කරා පැමිණ 5
තිබේ,
භයංකරය මා වසාගත්තේය.
මමද කථාකොට: අනේ මට 6
කොබෙයියෙකුට මෙන් පියාපත් ඇත්නම්!
එවිට ඉගිලී ගොස් නිශ්චලව සිටින්නෙමි.
බලව, එසේනම් මම ඈත පලා ගොස්, 7
වනයෙහි නවාතැන් ගන්නෙමි.
සැර හුළඟෙන්ද කුණාටුවෙන්ද 8
ආරක්ෂා ස්ථානයකට ඉක්මන්කර යන්නෙමියි කීයෙමි.
ස්වාමිනි, නාස්තිකළ මැනව, ඔවුන්ගේ 9
කථාව භේදකළ මැනව.
මක්නිසාද නුවර බලාත්කාරයත් විවාදයත් දුටිමි.
ඔව්හු දිවා රාත්‍රී දෙක්හි ඒකේ පවුරු 10
පිට ඔබ මොබ යති.
අයුතුකමත් අපරාධයත් එහි මැද ඇත්තේය.

11 ඒ මැද දුෂ්ටකමත් ඇත්තේය.
බලාත්කාරයත් වංචාවත් එහි වීථිවලින්
ඉවත්ව නොයන්නේය.
12 මක්නිසාද මට නින්දකළේ සතුරෙක්
නොවේ;
එසේ වූයේනම් මට ඉවසිය හැක්කේය.
මට විපක්ෂව තමාම උසස්කරගත්තේ
මට වෛරවූ තැනැත්තේ නොවේ;
එසේ වූයේනම් මම ඔහු කෙරෙන්
සැඟවී යන්නෙමි.
13 නුමුත් එසේ කළේ මා සමාන
මනුෂ්‍යයෙක්වූ,
මාගේ සමාගම්කාරයෙක්වූ, මාගේ
හිතේසි මිත්‍රයෙක්වූ නුඹමය.
14 අපි එක්ව ප්‍රිය මන්ත්‍රණ පැවැත්වීමුව,
සමූහයා සමග දෙවියන්වහන්සේගේ
ගෘහයෙහි සක්මන්කෙළෙමුව.
15 හදිසියෙන් ඔවුන්ට මරණය
පැමිණේවා,
ඔව්හු පණපිටින් වළට බසිත්වා.
මක්නිසාද දුෂ්ටකම ඔවුන්ගේ
වාසස්ථානයෙහි, ඔවුන් මැද,
ඇත්තේය.
16 මම වනාහි දෙවියන්වහන්සේට
යාච්ඤාකරන්නෙමි;
එවිට ස්වාමීන්වහන්සේ මා
ගළවනසේක.
17 සවස සහ උදයද දවල්ද දුක් කියමින්
සුසුම්ලන්නෙමි.
උන්වහන්සේද මාගේ බස් අසනසේක.
18 මට විරුද්ධව පැමුණුණ සටනෙන්
උන්වහන්සේ මාගේ ප්‍රාණය මුදා
සමාදනය දුන්සේක.
මක්නිසාද බොහෝ දෙනෙක්ම මට
විරුද්ධව සිටියාහුය.
19 දෙවියන්වහන්සේ, එනම් පුරාණයේ
සිට වැඩවසන තැනන්වහන්සේ අසා,
විපරීති රහිතවූ,
දේව භය නැත්තාවූ
ඔවුන්ට උත්තරදෙනසේක.
20 ඔහු තමා සමග සමාදනයෙන් සිටි
අයට විරුද්ධව අත් දිගුකෙළේය.
තමාගේ ගිවිසුම කඩකෙළේය.
21 ඔහුගේ කට වෙඩරු මෙන් සිනිඳුව
තිබුණේය,
නුමුත් ඔහුගේ සිතෙහි යුද්ධය විය.
ඔහුගේ වචන තෙලට වඩා මොළොක්ව
තිබුණේය,
එහෙත් ඒවා ඇඳගත් කඩුය.
නුඹේ බර ස්වාමීන් පිට තබව, 22
උන්වහන්සේ නුඹ උසුලනසේක.
උන්වහන්සේ කිසිකලෙකත් ධර්මිෂ්ඨයා
සෙලවෙන්ට නොදෙනසේක.
නුමුත් දෙවියන්වහන්ස, ඔබ ඔවුන් 23
විනාශයේ වළට බස්වනසේක.
මිනීමරුවූ කපටි මනුෂ්‍යයෝ තමුන්ගේ
ආයුසයෙන් අර්ධයක්වත් ජීවත්
නොවන්නෝය;
එහෙත් මම ඔබ කෙරෙහි විශ්වාස
කරන්නෙමි.

## අන්තරාවේදී භය නොවීම

# 56

නායක වාද්‍යකරුටයි; දුරස්තර නිශ්ශබ්ද පරෙවියා ගැනයි. පිලිස්තිවරුන් ගාත්හිදී දවිත් අල්ලාගත් පසු ඔහු ලියූ ගීතයකි.

දෙවියන්වහන්ස, මට කරුණාකළ 1
මැනව; මක්නිසාද මනුෂ්‍යයා මා
ගිලගන්ට කැමැත්තේය.
ඔහු දවස මුළුල්ලේම යුද්ධකරමින්
මට පීඩාකරයි.
මාගේ එදිරිකාරයෝ දවස මුළුල්ලේම 2
මා ගිලදමන්ට කැමැත්තෝය.
මක්නිසාද බොහෝ දෙනෙක්ම
උඩඟුකමින් මට විරුද්ධව
යුද්ධකරති.
මට භය ඇති කල්හි 3
මම ඔබ කෙරෙහි විශ්වාසකරන්නෙමි.
මම දෙවියන්වහන්සේ තුළ, 4
උන්වහන්සේගේ වචනය වර්ණනා
කරන්නෙමි.
දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය
තබා සිටිමි, භය නොවන්නෙමි;
මාංසමයවූ මනුෂ්‍යයා මට කුමක්
කරයිද?
දවස මුළුල්ලේම ඔව්හු මාගේ වචන 5
වරදවා පෙන්වති.
ඔවුන්ගේ කල්පනා සියල්ලම මට
උපද්‍රව පිණිසය.
ඔව්හු රැස්වෙති, සැඟවී සිටිති. 6

මාගේ ප්‍රාණය නසන්ට ඔවුන් බලා සිටියාක්මෙන්ම,
ඔව්හු මාගේ අඩිපාර රැක ඉඳිති.
7 ඔව්හු අයුතුකම් කරණකොටගෙන ගැළවී යන්නෝද?
දෙවියන්වහන්ස, උදහසින් මනුෂ්‍ය වර්ගයන් හෙළාදමුව මැනව.
8 ඔබ මාගේ මුළාවයාම් ගණිනසේක.
මාගේ කඳුළු ඔබගේ භාජනයෙහි තැබුව මැනව;
ඒවා ඔබගේ පොතෙහි ලියනලද්දේ නොවේද?
9 මා යාච්ඤාකරන දවසේ මාගේ සතුරෝ ආපසු හැරී යන්නෝය.
මෙය මම දනිමි, දෙවියන්වහන්සේ මාගේ පක්ෂයෙහිය.
10 මම දෙවියන්වහන්සේ තුළ, උන්වහන්සේගේ වචනය වර්ණනා කරන්නෙමි.
ස්වාමීන්වහන්සේ තුළ උන්වහන්සේගේ වචනය වර්ණනාකරන්නෙමි.
11 දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා සිටිමි, භය නොවන්නෙමි;
මනුෂ්‍යයා මට කුමක් කරයිද?
12 දෙවියන්වහන්ස, ඔබට වූ භාර මා පිට තිබේ.
මම ඔබට ස්තුති පූජා පුදන්නෙමි.
13 මක්නිසාද ඔබ මාගේ ප්‍රාණය මරණයෙන් මිදූසේක.
මා ජීවතුන් පිළිබඳ එළියෙහි
දෙවියන්වහන්සේ ඉදිරිපිට හැසිරෙන පිණිස
ඔබ මාගේ පාද පැකිලීමෙන් නොවැලැක්වූසේක්ද?

## විපත්තියේදී විශ්වාසය ඇතුව සිටීම

57 නායක වාද්‍යකරුටයි; 'නාස්ති නොකළ මැනව.' දාවිත් සාවුල් ඉදිරියෙන් ගුහාවට පලාගියාට පසු ඔහු ලියූ ගීතයකි.

1 දෙවියන්වහන්ස, මට කරුණාකළ මැනව, මට කරුණාකළ මැනව;
මක්නිසාද මාගේ ආත්මය ඔබ සරණ කොට ගනියි.
එසේය, මේ විපත්ති නිමවන තෙක්,
ඔබගේ පියාපත් සෙවණ සරණ කොට ගන්නෙමි.
මහෝත්තමවූ දෙවියන්වහන්සේට, 2
එනම් මට සියලු දේ කරදෙන්නාවූ දෙවියන්වහන්සේට හඬගසන්නෙමි.
මා ගිලගන්ට කැමති තැනැත්තා 3
නින්දාකරන කල
උන්වහන්සේ ස්වර්ගයෙන් පිහිට එවා මා ගළවනසේක;
දෙවියන්වහන්සේ ස්වකීය කරුණාවත් සැබෑකමත් එවනසේක.
මාගේ ප්‍රාණය සිංහයන් අතරෙහිය; 4
ගිනි මෙන් රළුවූ තැනැත්තන් අතරෙහි,
එනම් හෙල්ල සහ ඊගස් වැනි දත්ද
තියුණු කඩුවක් වැනි දිව්ද ඇත්තාවූ මනුෂ්‍ය පුත්‍රයන් අතරෙහි වැතිර සිටිමි.
දෙවියන්වහන්ස, ඔබ අහසට වඩා 5
උසස්වුව මැනව;
ඔබගේ මහිමය මුළු පොළොවට ඉහළින් තිබේවා.
ඔව්හු මාගේ පාදවලට දැලක් එළූය; 6
මාගේ ආත්මය අවනතව තිබේ.
ඔව්හු මා ඉදිරියේ වළක් හෑරුවෝය;
තුමූම ඒ මැදට වැටුණෝය.
දෙවියන්වහන්ස, මාගේ සිත ස්ථිරය, 7
මාගේ සිත ස්ථිරය.
මම ගීතිකාකරන්නෙමි, එසේය,
ප්‍රශංසා ගී කියන්නෙමි.
මාගේ ගෞරවය පිබිදෙව; කුඩා 8
වීණාවත් මහ වීණාවත් පිබිදෙව්.
මමත් ඉතා අලුයම පුබුදින්නෙමි.
ස්වාමිනි, මනුෂ්‍ය වර්ගයන් අතරේ 9
ඔබට ස්තුතිකරන්නෙමි;
ජාතීන් අතරේ ඔබට ප්‍රශංසා ගී කියන්නෙමි.
මක්නිසාද ඔබගේ කරුණාව අහස 10
දක්වාද
ඔබගේ සැබෑකම වළාකුල් දක්වාද විශාලව තිබේ.
දෙවියන්වහන්ස, ඔබ අහසට වඩා 11
උසස්වුව මැනව;
ඔබගේ මහිමය මුළු පොළොවට ඉහළින් තිබේවා.

## අධර්මිෂ්ඨ විනිශ්චයකාරයන්ට තරවටුකිරීම

**58** නායක වාද්‍යකරුටයි; 'නාස්ති නොකළ මැනව.' දාවිත්ගේ ගීතයකි.

1 බලවන්තයෙනි, සැබවින් තුඹලා යුක්තිය ප්‍රකාශකරවුද?
මනුෂ්‍ය පුත්‍රයෙනි, තුඹලා අවංක ලෙස විනිශ්චයකරවුද?
2 එසේය, තුඹලා සිතින් දුෂ්ටකම්කරන්නහුය;
පොළොවෙහි තුඹලාගේ අත්වල බලාත්කාරය කිරා දෙන්නහුය.
3 දුෂ්ටයෝ මවු කුස පටන් නොමග යති.
ඔව්හු උපන්තැන් පටන් බොරු කියමින් මුළාව යති.
4 ඔවුන්ගේ විෂ සර්පවිෂ මෙන්ය.
ඔව්හු කන් වසාගන්න බිහිරි පොළඟාට සමානය;
5 මතුරන්නන් කොපමණ සමර්ථලෙස මැතුරුවත්
ඌ ඔවුන්ගේ හඬට කන් නොදෙයි.
6 දෙවියන්වහන්ස, ඔවුන්ගේ මුඛයෙහි ඔවුන්ගේ දළ බින්ද මැනව.
ස්වාමීනි, තරුණ සිංහයන්ගේ මහා දත් බිඳදමුව මැනව.
7 ඉක්මනින් බහින වතුරු මෙන් ඔව්හු දියව යෙත්වා.
*උන්වහන්සේ තමන්ගේ ඊගස් තැත්කවන කල ඔව්හු සිදිනු ලැබූවන් මෙන් වෙත්වා.
8 දියව යන ගොම්බෙල්ලෙකු මෙන්ද,
ස්ත්‍රියෙකගේ හිරු නුදුටු අකාල ගර්භ ඵලය මෙන්ද ඔව්හු පහවෙත්වා.
9 තුඹලාගේ සැළිවලට කටුදරඋෂ්ණය වදින්ට පළමුවෙන්,
උන්වහන්සේ අමු දරත් දැවෙන දරත් එක ලෙසම සුළඟුළඟකින් පහකරනසේක.
10 පළිගැනීම දකින කල ධර්මිෂ්ඨයා ප්‍රීතිවන්නේය.

*නොහොත්–ඔහු තමාගේ ඊගස් යොදන කල ඒවා සිදිනු ලැබුවාක් මෙන් වෙත්වා.

දුෂ්ටයාගේ ලෙයින් තමාගේ පාද සෝදගන්නේය.
එවිට: සැබවින්ම ධර්මිෂ්ඨයාට විපාකයක් ඇත්තේය, 11
සැබවින්ම පොළොවෙහි විනිශ්චය කරන දෙවිකෙනෙක් ඇත්තේයයි මනුෂ්‍යයෝ කියන්නෝය.

## දුෂ්ට සතුරන්ගෙන් මිදීම

නායක වාද්‍යකරුටයි; 'නාස්ති නොකළ මැනව.' දාවිත් මරන පිණිස ගෙය රැක සිටීමට සාවුල් මනුෂ්‍යයන් යැවූ පසු දාවිත් ලියූ ගීතයකි. **59**

මාගේ දෙවියන්වහන්ස, මාගේ සතුරන්ගෙන් මා මිදුව මැනව. 1
මට විරුද්ධව නැගිටින්නන් කෙරෙන් උස්තැනක මා සිටෙවුව මැනව.
අයුතුකම් කරන්නන්ගෙන් මා මුදා, 2
මිනීමරු මිනිසුන්ගෙන් මා ගැළෙවුව මැනව.
මක්නිසාද ඔව්හු මාගේ ප්‍රාණය නසන්ට රැක හිඳිති; 3
බලවන්තයෝ මට විරුද්ධව රැස්වෙති.
ස්වාමීනි, ඒ මාගේ අපරාධයක්වත් පාපයක්වත් නිසා නොවේ.
මාගේ දෝෂයක් නැතුව ඔව්හු දුව ඇවිත් සූදානම්වෙති. 4
මට උපකාරකරන්ට පිබිද බැලුව මැනව.
සේනාවල දෙවිවූ, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීනි, 5
සියලු අන්‍ය ජාතීන් විමසන පිණිස නැගිටුණ මැනව.
දුෂ්ටවූ අපරාධකාර කිසිවෙකුටත් කරුණා නොකළ මැනව.
ඔව්හු සවස ආපසු එති, බල්ලෙකු මෙන් ගොරවමින්, 6
නුවර වටකර යති.
බලව, ඔවුන්ගේ කටින් ශබ්ද නික්මවති; 7
ඔවුන්ගේ තොල්වල කඩු ඇත.
මක්නිසාද: ඇසෙන්නේ කාටදැයි ඔව්හු කියති.
එහෙත් ස්වාමීනි, ඔබ ඔවුන්ට 8

සිනාසෙනසේක;
ඔබ සියලු අන්‍ය ජාතීන්ට කවටකම් කරනසේක.
9 මාගේ ශක්තියවූ තැනන්වහන්ස,
ඔබ පතා සිටින්නෙමි.
මක්නිසාද දෙවියන්වහන්සේ මාගේ බලකොටුවය.
10 මට කරුණාකරන දෙවියන්වහන්සේ මා පෙරටුව යනසේක.
දෙවියන්වහන්සේ මාගේ සතුරන් කෙරෙහි මාගේ ආශාව ඉෂ්ටවූ බව දකින්නට සලස්වනසේක.
11 අපේ පලිහවූ ස්වාමිනි,
මාගේ සෙනඟට මතකනැති නොවන පිණිස, ඔවුන් නොනැසුව මැනව.
ඔබගේ බලයෙන් ඔවුන් විසුරුවා පහත හෙළුව මැනව.
12 ඔවුන්ගේ කටේ පාපය හා තොල්වල වචන නිසාද,
ඔවුන් කියන ශාප බොරු බස් නිසාද,
ඔව්හු අහංකාරයෙන් සිටියදීම අසුවෙත්වා.
13 උදහසින් ඔවුන් විනාශකළ මැනව,
නැතිවෙන පිණිස විනාශකළ මැනව.
දෙවියන්වහන්සේ පොළොවේ කෙළවර දක්වා
යාකොබ් අතරෙහි ආණ්ඩුකරන බව ඔව්හු දැනගනිත්වා.
14 ඔව්හු සවස ආපසු එත්වා, බල්ලෙකු මෙන් ගොරවමින්
නුවර වටකර යෙත්වා.
15 ඔව්හු ගොදුරු පිණිස ඔබ මොබ යමින්,
තෘප්තිමත් නොවූ නම් මුළු රාත්‍රිය ගතකරන්නෝය.
16 නුමුත් මම ඔබගේ ශක්තිය ගැන ගී කියන්නෙමි;
එසේය, අලුයම්හි ශබ්ද නගා ඔබගේ කරුණාව වර්ණනාකරන්නෙමි.
මක්නිසාද ඔබ මාගේ බලකොටුවද
මාගේ විපත්ති දවසේදී මට රක්ෂාස්ථානයක්ද වූසේක.
17 මාගේ ශක්තියවූ ඔබට ප්‍රශංසා ගී කියන්නෙමි.
මක්නිසාද දෙවියන්වහන්සේ මාගේ බලකොටුවය, මට කරුණාකරන දෙවියන්වහන්සේය.

## පරාජයවීමේදී මොරගැසීම

## 60

නායක වාද්‍යකරුටයි; ෂූෂන්-ඒඩූත් යන තූර්යය ඇතුව ගීතිකාකිරීමටයි. මෙසොපොතාමියේ සිරියයන්ද ශොබායේ සිරියයන්ද සමග දාවිත් යුද්ධකරන්ටත් යෝවාබ් හැරී ඇවිත් ලුණු මිටියාවතේදී ඒදෝම්වරුන් දෙලොස් දහසකට පහර දෙන්ටත් යෙදුණු කල දාවිත් ලියූ ගීතයකි. ඉගැන්වීමටයි.

දෙවියන්වහන්ස, ඔබ අප ඉවතලූසේක, 1
අප විසුරුවා දැමූසේක;
ඔබ උදහස්වූසේක; අප පළමු ස්වභාවයට පැමිණෙවුව මැනව.
ඔබ දේශය කම්පාකරවූසේක; එය 2
ඉරා දැමූසේක.
ඒකේ බිඳුම් පිළියම්කළ මැනව;
මක්නිසාද එය සෙලවෙයි.
ඔබ ස්වකීය සෙනඟට දුෂ්කර දේ 3
දක්වූසේක.
මත්කරවන මුද්‍රිකපානය අපට පෙවූසේක.
සත්‍යතාව සඳහා නංවා පෙන්වන 4
පිණිස,
ඔබ කෙරෙහි භය ඇත්තන්ට ඔබ ධජයක් දුන්සේක.
ඔබගේ ප්‍රිය තැනැත්තන් මුදනු ලබන 5
පිණිස
ඔබගේ දකුණතින් ගළවා අපට උත්තරදුන මැනව.
දෙවියන්වහන්සේ ස්වකීය ශුද්ධකමින් 6
කථාකළසේක; මම ප්‍රීතිමත් වන්නෙමි.
ෂෙකෙම් බෙදා දෙන්නෙමි, සුක්කොත් මිටියාවත මැන දෙන්නෙමි.
ගිලියද් මාගේය, මනස්සේද මාගේය; 7
එප්‍රායිම්ද මාගේ හිසට ආරක්ෂාවය;
යූදා මාගේ ජයකොත්තයය.

8 මෝවබ් මාගේ සෝදන භාජනයය;
ඒදෙම් පිට මාගේ වහන් හෙළන්නෙමි.
එම්බා පිලිස්තියාව, මා නිසා ඝෝෂා
පවත්වව.
9 බලවත් නුවරට මා පමුණුවන්නේ
කවුද?
ඒදෙම්ට මා පැමිණෙවුවේ කවුද?
10 දෙවියන්වහන්ස, අප ඉවත හළේ
ඔබ නොවේද?
ඇරත්, දෙවියන්වහන්ස, ඔබ අපේ
සේනාවන් සමග නොයනසේක.
11 එදිරිකාරයාට විරුද්ධව අපට පිහිටවූව
මැනව.
මක්නිසාද මනුෂ්‍යයාගේ පිහිට
නිෂ්ඵලය.
12 දෙවියන්වහන්සේ කරණකොටගෙන
වික්‍රමාන්විතව ක්‍රියාකරන්නෙමුව.
මක්නිසාද අපේ එදිරිකාරයන් පාගා
දමන්නේ උන්වහන්සේමය.

## සිත ක්ලාන්තව තිබෙද්දී විලාප කීම

61 නායක වාද්‍යකරුටයි; වීණා
ඇතුව ගායනාකිරීමටයි.
දාවිත්ගේ ගීතයකි.
1 දෙවියන්වහන්ස, මාගේ මොරගැසීම
ඇසුව මැනව;
මාගේ යාච්ඤාවට කන්දුන මැනව.
2 මාගේ සිත ක්ලාන්තවන කල
පොළොවේ කෙළවර සිට ඔබට
හඬගසන්නෙමි.
මා විසින්ම නැංග නොහැකි පර්වතයට
මා ගෙනගිය මැනව.
3 මක්නිසාද ඔබ මට රක්ෂාස්ථානයක්ද
සතුරා කෙරෙන් බලකොටුවක්ද
වූසේක.
4 මම ඔබගේ මණ්ඩපයෙහි සදකල්
වාසයකරන්නෙමි.
ඔබගේ පියාපත් සෙවණ සරණකොට
ගන්නෙමි.
5 මක්නිසාද, දෙවියන්වහන්ස, ඔබ
මාගේ භාර ඇසූසේක.
ඔබගේ නාමය කෙරෙහි භය
ඇත්තන්ගේ උරුමය මට දුන්සේක.
ඔබ රජහුගේ ආයුෂ වැඩිකරනසේක. 6
ඔහුගේ අවුරුදු බොහෝ පරම්පරා
මෙන් වන්නේය.
ඔහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි 7
සදකල් වසන්නේය.
ඔහු ආරක්ෂාකරන පිණිස කරුණාවත්
සත්‍යතාවත් පිළියෙළකළ මැනව.
එවිට මාගේ භාර දවස්පතා 8
ඉෂ්ට කරන පිණිස
ඔබගේ නාමයට සදකල් ප්‍රශංසා ගී
කියන්නෙමි.

## දෙවියන්වහන්සේ කෙරෙහි පමණක් විශ්වාසකිරීම

62 නායක වාද්‍යකරුටයි;
යෙදූතුන්ගේ වෘත්තයටයි.
දාවිත්ගේ ගීතයකි.
මාගේ ආත්මය දෙවියන්වහන්සේ 1
කෙරෙහි පමණක් බලා සිටියි.
මාගේ ගැළවීම පැමිණෙන්නේ
උන්වහන්සේගෙන්ය.
මාගේ පර්වතයත් මාගේ ගැළවීමත් 2
උන්වහන්සේ පමණක්ය.
උන්වහන්සේ මාගේ බලකොටුවය;
මම බොහෝසෙයින්
නොසෙල්වන්නෙමි.
මනුෂ්‍යයෙකු ඇල ගැසූ භිත්තියක් 3
මෙන්ද සෙලවෙන වැටක් මෙන්ද
නැතිකරන පිණිස
තුඹලා සියල්ලෝ කොපමණ කල්
ඔහුට විරුද්ධව සිටින්නහුද?
ඔහුගේ උතුම්කමෙන් ඔහු නෙරපා 4
හෙළන්ට පමණක් ඔව්හු
මන්ත්‍රණයකෙරෙති;
ඔව්හු බොරුවට ප්‍රියවෙති;
තමුන්ගේ මුඛයෙන් ආශීර්වාදකරන
නුමුත් සිතින් ශාපකෙරෙති.
මාගේ ආත්මය, දෙවියන්වහන්සේ 5
කෙරෙහි පමණක් බලා සිටුව;
මක්නිසාද මාගේ බලාපොරොත්තුව
උන්වහන්සේ කෙරෙන්ය.
මාගේ පර්වතයත් මාගේ ගැළවීමත් 6
උන්වහන්සේ පමණක්ය.

උන්වහන්සේ මාගේ බලකොටුවය;
මම නොසෙල්වන්නෙමි.
7 මාගේ ගැළවීමත් මාගේ උතුම්කමත්
දෙවියන්වහන්සේගෙන්ය;
මාගේ ශක්තියේ පර්වතයත් මාගේ
රක්ෂාස්ථානයත් දෙවියන්වහන්සේ
තුළෙහිය.
8 ජනයෙනි, සැමවිටම උන්වහන්සේ
කෙරෙහි විශ්වාසකරව්;
උන්වහන්සේ ඉදිරියේ නුඹලාගේ
සිත් වගුරුවව්.
දෙවියන්වහන්සේ අපට
රක්ෂාස්ථානයක්ය.
9 සැබවින් අධමයෝ නිෂ්ඵලකමය,
උත්තමයෝද බොරුවක්ය.
තරාදියෙහි දැමුවොත් ඔවුන් ඉහළට
යනවා ඇත;
ඔව්හු එක්වූවත් නිෂ්ඵලකමට වඩා
සැහැල්ලුය.
10 බලාත්කාරකම කෙරෙහි විශ්වාස
නොකරව්,
කොල්ලකෑම ගැන අහංකාර නොවව්.
වස්තු වැඩිවුණොත් ඒවා කෙරෙහි
සිත නොතබව්.
11 දෙවියන්වහන්සේ එක් වරක් කීසේක,
මම මෙය දෙවරක් ඇසීමි;
එනම් බලය දෙවියන්වහන්සේට අයිති
බවත්,
12 ස්වාමිනි, කරුණාවත් ඔබට අයිති
බවත්ය.
මක්නිසාද ඔබ එක එක මනුෂ්‍යයාට
ක්‍රියාවේ හැටියට ප්‍රතිඵල දෙනසේක.

## දෙවියන්වහන්සේ සහ ශුද්ධස්ථානය කෙරෙහි ආශාවීම

**63** දාවිත් යූදයේ වනාන්තරයෙහි සිටියදී ලියූ ගීතයකි.

1 දෙවියන්වහන්ස, ඔබ මාගේ
දෙවියන්වහන්සේය; අලුයම ඔබ
සොයන්නෙමි.
වතුර නැති, වියලුණු, වෙහෙස
උපදවන්නාවූ දේශයකදී
මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා
ඇත්තේය, මාගේ මාංසය ඔබ
කෙරෙහි ආශා ඇත්තේය.
මෙසේ ඔබගේ බලයත් ඔබගේ 2
මහිමයත් දකින පිණිස
ශුද්ධස්ථානයේදී ඔබ දෙස බලා
සිටියෙමි.
මක්නිසාද ඔබගේ කරුණාගුණය 3
ජීවිතයට වඩා යහපත;
මාගේ තොල් ඔබට ප්‍රශංසාකරන්නේය.
මෙසේ මම ජීවත්ව සිටින තෙක් 4
ඔබට ප්‍රශංසාකරන්නෙමි.
ඔබගේ නාමයෙන් මාගේ අත්
ඔසවන්නෙමි.
මාගේ යහනේදී ඔබ සිහිකරන කලද, 5
රෑ යාම්වලදී ඔබ මෙනෙහිකරන කලද,
මාගේ ආත්මය ඇටමිදුලුවලින්ද 6
තෙලින්ද මෙන් තෘප්තියට
පැමිණෙන්නේය;
මාගේ මුඛයද ප්‍රීතිමත් තොල්වලින්
ඔබට ප්‍රශංසාකරන්නේය.
මක්නිසාද ඔබ මාගේ පිහිට වූසේක, 7
මම ඔබගේ පියාපත් සෙවණෙහි
ප්‍රීතිවන්නෙමි.
මාගේ ආත්මය ඔබට ඇලුම්ව ඔබ 8
අනුව යයි.
ඔබගේ දකුණත මා උසුලයි.
නුමුත් මාගේ ආත්මය විනාශකරන්ට 9
සොයන්නෝ
පොළොවේ ගැඹුරු තැන්වලට
යන්නෝය.
ඔව්හු කඩුවේ බලයට පාවාදෙනු 10
ලබන්නෝය.
සිවලුන්ට ගොදුරක් වන්නෝය.
නුමුත් රජතෙමේ දෙවියන්වහන්සේ 11
කෙරෙහි ප්‍රීතිවන්නේය.
උන්වහන්සේ ගැන දිවුරන සියල්ලෝ
ප්‍රීති ප්‍රකාශකරන්නෝය;
මක්නිසාද බොරු කියන්නන්ගේ කට
පියනු ලබන්නේය.

## තපුරන් කෙරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චය

**64** නායක වාද්‍යකරුටයි. දාවිත්ගේ ගීතයකි.

දෙවියන්වහන්ස, මාගේ විලාපයේදී
මාගේ හඬට කන්දුන මැනව.
සතුරු භයින් මාගේ ප්‍රාණය රැකගත

මැනව.
2 නපුරුකම් කරන්නන්ගේ රහස් මන්ත්‍රණයෙන්ද
අයුතුකම් කරන්නන්ගේ කෝලාහලයෙන්ද මා සඟවාගත මැනව.
3 රහස් තැන්වලදී නිර්දෝෂ අයට විදින පිණිස
ඔව්හු කඩුවක් මෙන් තමුන්ගේ දිව මුවහත් කොට,
4 තික්ත වචන නමැති ඊගස් යෙදූවෝය.
හදිසියෙන් ඔව්හු ඔහුට විද භයක් නැතුව සිටිති.
5 ඔව්හු නපුරු කාරණයෙක්හි තමුන්ම ධෛර්යකරගනිති;
මලපත් සඟවා තැබීම ගැන කථාකෙරෙති;
ඒවා පෙනෙන්නේ කාටදැයි ඔව්හු කියති.
6 ඔව්හු අයුතුකම් සොයති; අපි නියුණු යෝජනාවක් කරගතිමුයයි කියති.
හැමදෙනාගේම අභ්‍යන්තර කල්පනාවත් සිතත් ගැඹුරුය.
7 නුමුත් දෙවියන්වහන්සේ ඔවුන්ට විදිනසේක;
ඊගහකින් හදිසියෙන් ඔවුන්ට තුවාල වන්නේය.
8 ඔවුන්ගේ දිව මෙසේ තමුන්ටම විරුද්ධවී, ඔවුන්ගේ පැකිලීම සිද්ධවන්නේය.
ඔවුන් දකින සියල්ලෝ හිස වනන්නෝය.
9 සියලු මනුෂ්‍යයෝ භයවන්නෝය;
ඔව්හු දෙවියන්වහන්සේ කළ දේ ප්‍රකාශකරන්නෝය,
උන්වහන්සේගේ ක්‍රියාව ගැන නුවණින් කල්පනාකරන්නෝය.
10 ධර්මිෂ්ඨයා ස්වාමින් තුළ සන්තෝෂ වන්නේය, උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන්නේය;
අවංක සිත් ඇති සියල්ලෝද ජය ප්‍රකාශකරන්නෝය.

## ගොයම් කැපීමේ කාලය සහ අනතුරෙන් මිදීම ගැන ගීතය

## 65

නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ කාව්‍ය ගීතයකි.

දෙවියන්වහන්ස, සියොන්හි ඔබට ප්‍රශංසාව නිශ්චලව තිබේ. 1
භාරයද ඔබට ඔප්පුකරනු ලබන්නේය.
යාච්ඤා අසන තැනන්වහන්ස, 2
මාංසමයවූ සියල්ලෝම ඔබ වෙතට පැමිණෙන්නෝය.
අයුතුකම් මාගෙන් ජයගනියි. 3
ඔබ වනාහි අපේ අපරාධ පහකර දමනසේක.
ඔබගේ මිදුල්වල වාසයකරන පිණිස 4
ඔබ තෝරාගන්නාවූ, ඔබට ළංවෙන්ට සලස්වන්නාවූ තැනැත්තේ ආශිර්වාදලද්දේය.
ඔබගේ ගෘහයවූ ඔබගේ ශුද්ධ මන්දිරයේ යහපතින්
අපි තෘප්තියට පැමිණෙන්නෙමුව.
පොළොවේ සියලු සීමාවලද 5
මුහුදේ දුරස්තර තැන්වලද සිටින්නන්ගේ විශ්වාසයවූ
අපේ ගැළවීමේ දෙවියන්වහන්ස,
ඔබ භයානක දේවලින් ධර්මිෂ්ඨලෙස අපට උත්තරදෙනසේක.
උන්වහන්සේ බලය නමැති ඉහපටියෙන් සැරසුණුසේක්, 6
තමන් ශක්තියෙන් කඳු ස්ථිරකොට පිහිටුවනසේක.
උන්වහන්සේ මුහුදු ඝෝෂාවද එහි රළ ඝෝෂාවද 7
මනුෂ්‍ය වර්ගයන්ගේ කෝලාහලයද සංසිඳුවනසේක.
ඉතා දුර සීමාවල වසන්නෝද ඔබගේ ලකුණුවලට භයවෙති. 8
ඔබ උදයද සවසද නික්මෙන ස්ථාන ප්‍රීතිමත්කරවනසේක.
ඔබ පොළොව බලා ඊට වැසිවස්වනසේක, 9
බොහෝසෙයින් එය සාරවත්කරනසේක;
දෙවියන්වහන්සේගේ ගංගාව වතුරෙන් පිරී තිබේ.

ඔබ පොළොව මෙසේ පිළියෙළකොට
ඔවුන්ට ධාන්‍ය සපයාදෙනසේක.
10 ඔබ එහි හීවිටි බොහෝසේ තෙමමින්,
එහි පිඩලි සමතලා කරනසේක.
ඔබ වැස්සෙන් එය බුරුල්කරමින්,
එහි පැළෑටිවලට
ආශීර්වාදකරනසේක.
11 ඔබ ස්වකීය යහපත්කම නමැති
ඔටුන්නෙන් අවුරුද්ද සරසනසේක;
ඔබගේ මාවත්වලින් සාරත්වය
වැගිරෙයි.
12 ඒවා වනයෙහි පිට්ටනිවල වැගිරෙයි.
හෙල්ද ප්‍රීතිය නමැති පටියෙන් සැරසී
තිබේ.
13 ගොදුරු බිම් සිව්පා රැළවලින්
පැළඳීයයි;
මිටියාවත්ද ගොයමින් වැසී තිබේ;
ඒවා ප්‍රීතියෙන් සෝෂාකරමින් ගායනා
කරති.

## ජාතික මිදීම හා පුද්ගලික මිදීම ගැන ප්‍රශංසාව

**66** නායක වාද්‍යකරුටයි.
කාව්‍ය ගීතයකි.

1 පොළෝවැසි සියල්ලෙනි,
දෙවියන්වහන්සේට ප්‍රීති නාද පවත්වව්.
2 උන්වහන්සේගේ නාමයේ මහිමය ගැන
ගී කියව්.
උන්වහන්සේගේ ප්‍රශංසාව කීර්තිමත්
කරව්.
3 ඔබගේ ක්‍රියා කොපමණ භයංකරද!
ඔබගේ බලයේ මහත්කම නිසා ඔබගේ
සතුරෝ ඔබට යටත්වන්නෝය.
4 පොළොවේ සියල්ලෝම ඔබට
නමස්කාරකරන්නෝය,
ඔබට ගී කියන්නෝය;
ඔබගේ නාමයට ගී කියන්නෝයයි
දෙවියන්වහන්සේට කියව්.
5 එව්, දෙවියන්වහන්සේගේ ක්‍රියා බලව්;
මනුෂ්‍ය පුත්‍රයන් කෙරෙහි
උන්වහන්සේගේ ක්‍රියාකිරීම
භයංකරය.
6 උන්වහන්සේ මුහුද වියළි බිමක්
කළසේක.
ඔව්හු ගංගාව මැදින් පයින් ගියෝය.
එහිදී අපි උන්වහන්සේ කෙරෙහි
ප්‍රීතිවීමුව.
7 උන්වහන්සේ තමන් බලයෙන් සදකල්
ආණ්ඩුකරනසේක;
උන්වහන්සේගේ ඇස් ජාතීන් කෙරෙහි
යොමා තිබේ.
කැරළිකාරයෝ තුමූම උඩඟු
නොවෙත්වා.
8 මනුෂ්‍ය වර්ගයෙනි, අපේ
දෙවියන්වහන්සේට ප්‍රශංසාකරව්,
උන්වහන්සේට නහන ප්‍රශංසා හඬ
ඇසෙන්ට සලස්වව්.
9 අපේ ප්‍රාණය ජීවත්කරන්නෙත්
අපේ පාද ලිස්සන්ට නාරින්නෙත්
උන්වහන්සේය.
10 මක්නිසාද දෙවියන්වහන්ස, ඔබ අප
සෝදිසිකළසේක.
රිදී පරීක්ෂාකරන්නාක්මෙන් ඔබ අප
පරීක්ෂාකළසේක.
11 ඔබ අප දැලට පැමිණෙවූසේක;
අපේ තුනටිය පිට තද බරක්
තැබූසේක.
12 ඔබ මනුෂ්‍යයන් අපේ හිසට උඩින්
යැවූසේක;
ගිනි මැදින් හා ජල මැදින්ද ගියෙමුව;
නුමුත් ඔබ අප එයින් සාරවත් තැනකට
පැමිණවූසේක.
13 මම දවන පූජා රැගෙන ඔබගේ
ගෘහයට ඇතුල්වෙන්නෙමි,
මාගේ විපත්තියේදී මාගේ තොල්වලින්
කීවාවූ,
14 මාගේ මුඛයෙන් කථාකළාවූ
මාගේ භාර ඔබට ඔප්පුකරන්නෙමි.
15 බැටළුවන්ගේ සුවඳ දුම් සහිතව,
තර සතුන් දවන පූජාවන් කොට ඔබට
පුදන්නෙමි;
ගොනුන්ද එළුවන් සමග
පූජාකරන්නෙමි.
16 දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇති
සියල්ලෙනි, ඇවිත් අසව්,
උන්වහන්සේ මාගේ ආත්මය උදෙසා
කළ දේ ප්‍රකාශකරන්නෙමි.
17 මාගේ මුඛයෙන් උන්වහන්සේට
මොරගැසීමි,

මාගේ දිවෙන් උන්වහන්සේ උසස් කරනු ලැබූසේක.
18 අයුතුකම් කිරීමේ අභිප්‍රායක් මාගේ සිතෙහි ඇත්නම්,
ස්වාමීන්වහන්සේ මාගේ බස් නාසනසේක.
19 නුමුත් සැබවින්ම දෙවියන්වහන්සේ ඇසූසේක;
මාගේ යාච්ඤා ශබ්දයට කන්දුන්සේක.
20 මාගේ යාච්ඤාවද මා කෙරෙන් තමන් කරුණාවද පහ නොකළාවූ
දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා.

## ඉශ්‍රායෙල් කරණකොටගෙන ලෝකයාට ආශීර්වාද ඉල්ලීම

67 නායක වාද්‍යකරුටයි; වීණා ඇතුව ගායනාකිරීමට කාව්‍ය ගීතයකි.

1 පොළොවෙහි ඔබගේ මාර්ගයද
සියලු ජාතීන් අතරේ ඔබගේ ගැළවීමද ප්‍රකාශවෙන පිණිස
2 දෙවියන්වහන්සේ අපට කරුණා කරනසේක්වා,
ආශීර්වාදකරනසේක්වා,
ස්වකීය මුහුණ අප කෙරෙහි බබළවනසේක්වා.
3 දෙවියන්වහන්ස, මනුෂ්‍ය වර්ගයෝ ඔබට *ප්‍රශංසාකෙරෙත්වා;
සියලු මනුෂ්‍ය වර්ගයෝ ඔබට *ප්‍රශංසාකෙරෙත්වා.
4 ජාතීහු සන්තෝෂව ප්‍රීතියෙන් ගී කියත්වා.
මක්නිසාද ඔබ යුක්තියෙන් මනුෂ්‍ය වර්ගයන් විනිශ්චයකරනසේක,
පොළොවේ ජාතීන් පාලනයකරනසේක.
5 දෙවියන්වහන්ස, මනුෂ්‍ය වර්ගයෝ ඔබට ප්‍රශංසාකෙරෙත්වා;
සියලු මනුෂ්‍ය වර්ගයෝ ඔබට ප්‍රශංසාකෙරෙත්වා.
6 පොළොව ස්වකීය වර්ධනය දී තිබේ.
දෙවියන්වහන්සේ, එනම් අපේම දෙවියන්වහන්සේ, අපට ආශීර්වාද කරනසේක.
7 දෙවියන්වහන්සේ අපට ආශීර්වාද කරනසේක;
පොළොවේ සියලු සීමාවෝද උන්වහන්සේට භයවන්නෝය.

*හෙවත්, ස්තුතිකෙරෙත්වා.

## අතීතයේ ඉශ්‍රායෙල්හිද අනාගතයෙහි ලෝකයෙහිද ස්වාමීන්වහන්සේගේ ජයග්‍රහණය

68 නායක වාද්‍යකරුටය. දාවිත්ගේ කාව්‍ය ගීතයකි.

1 දෙවියන්වහන්සේ නැගිටිනසේක්වා,
උන්වහන්සේගේ සතුරෝ විසිරයෙත්වා;
උන්වහන්සේට වෛරවන්නෝද උන්වහන්සේ ඉදිරියෙන් පලායෙත්වා.
2 දුම් පහව යන්නාක්මෙන් ඔවුන් පහ කළ මැනව.
ගිනි ඉදිරිපිට ඉටි දියවන්නාක්මෙන්
දුෂ්ටයෝ දෙවියන්වහන්සේ හමුයෙහි විනාශවෙත්වා.
3 නුමුත් ධර්මිෂ්ඨයෝ සතුටුවෙත්වා;
දෙවියන්වහන්සේ ඉදිරියෙහි ප්‍රීතිමත්වෙත්වා.
එසේය, ඔව්හු සන්තෝෂයෙන් ප්‍රීතිවෙත්වා.
4 දෙවියන්වහන්සේට ගීතිකාකරව්,
උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා ගී කියව්.
කාන්තාර මැදින් නැගී යන්නාවූ උන්වහන්සේට මාවතක් සාදව්;
යාඃ යනු උන්වහන්සේගේ නාමයවේ;
උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රීතිමත්වව්.
5 ස්වකීය ශුද්ධ නිවාසයෙහි වැඩවසන දෙවියන්වහන්සේ
පියා නැත්තන්ට පියෙක්ද වැන්දඹුවන්ට විනිශ්චයකාරයෙක්ද වනසේක.
6 දෙවියන්වහන්සේ හුදකලාවූවන් පවුල්වල වස්වනසේක.
හිරකාරයන් අභිවෘද්ධියට පමුණුවනසේක.
නුමුත් කැරළිකාරයෝ දඟිය තැනක වසති.

7 දෙවියන්වහන්ස, ඔබ තමන් සෙනඟට
පෙරටුව නික්ම ගිය කලද
වනාන්තරය මැදින් ගිය කලද
8 පොළොව කම්පාවූවාය,
දෙවියන්වහන්සේ අභිමුඛයෙහි
අහස්තලයද පොද හෙළීය.
සීනයි පවා දෙවියන්වහන්සේ, එනම්
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ,
අභිමුඛයෙහි වෙවුලීය.
9 දෙවියන්වහන්ස, ඔබ මහත් වර්ෂාවක්
එවූසේක,
ඔබගේ උරුමය විඩාවූ විට ඔබ එය
ශක්තිමත්කළසේක.
10 ඔබගේ රැළ එහි වාසයකළාය.
දෙවියන්වහන්ස, ඔබගේ යහපත්කමින්
ඔබ දුප්පතුන්ට උවමනා දේ
සපයාදුන්සේක.
11 ස්වාමීන්වහන්සේ වචනය දෙනසේක.
ආරංචිය පතුරුවන ස්ත්‍රීහු මහත්
සේනාවක්ය.
12 සේනාවන්ගේ රජවරු පලායති, ඔව්හු
පලායති.
ගෙදර සිටින තැනැත්තීද කොල්ලය
බෙදාගන්නීය.
13 රිදී පැහැ ඇති කොබෙයියෙකුගේ
පියාපත් මෙන්ද
උගේ කහපාට රත්රන් අත්තටු මෙන්ද
වූ තෙපි බැටළු ගාල්වල
සයනයකරන්නහුද?
14 සර්වපරාක්‍රමයාණන්වහන්සේ විසින්
රජවරුන් එහි විසිරවූ කල,
එය ශල්මෝන පිටට හිම
වැටෙන්නාක්මෙන් විය.
15 බාෂාන් කන්ද දෙවියන්වහන්සේගේ
කන්දක්ය;
බාෂාන් කන්ද උස් කන්දක්ය.
16 එම්බා උස් කඳු, දෙවියන්වහන්සේ
ස්වකීය වාසස්ථානය කොට ගන්ට
කැමතිවූ කන්ද දෙස
තෙපි කුමට ඊර්ෂ්‍යාවෙන් බලවුද?
එසේය, ස්වාමීන්වහන්සේ එහි සදකල්
වසනසේක.
17 දෙවියන්වහන්සේගේ රථ විසිදහසක්ය,
දහස්වර දහස් ගණන්ය.
ස්වාමීන්වහන්සේ සීනයිහි මෙන්,
ශුද්ධස්ථානයෙහි, ඒවා මැද
වනසේක.
ඔබ උසස්ථානයට නැගී ගියසේක, 18
වහල්කමට ගත්තවුන් වහල්කමට
ගෙනගියසේක.
ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්
සමග එනම් කැරළිකාරයන් අතරේ
පවා වාසයකරන පිණිස
ඔබ ඔවුන් අතරේ තෑගි ලැබූසේක.
දවස්පතා අපේ බර උසුලන්නාවූ, 19
අපේ ගැළවුම්කාරවූ දෙවිවූ
ස්වාමීන්වහන්සේට ප්‍රශංසාවේවා.
දෙවියන්වහන්සේ වනාහි අපට ගැළවීම 20
දෙන දෙවිකෙනෙක්ය;
මරණින් මිදෙන මාර්ග අයිතිවන්නේ
ස්වාමිවූ යෙහෝවඃවහන්සේටය.
නුමුත් දෙවියන්වහන්සේ තමන්ගේ 21
සතුරන්ගේ හිස,
එනම් තමාගේ වරදෙහි නිතර
පවතින්නාගේ කේශ සහිතවූ මුදුන
පොඩිකරනසේක.
තාගේ පාදය ලෙයෙහි ගල්වන පිණිසත්, 22
තාගේ බල්ලන්ගේ දිවට සතුරන්ගෙන්
කොටස ලැබෙන පිණිසත්,
මම ඔවුන් නැවත බාෂාන් සිට 23
ගෙනෙන්නෙමි,
මුහුදේ ගැඹුරේ සිට ඔවුන් නැවත
ගෙනෙන්නෙමියි ස්වාමීන්වහන්සේ
කීසේක.
දෙවියන්වහන්ස, ඔව්හු ඔබගේ 24
ගමන්,
එසේය, ශුද්ධස්ථානයට යන මාගේ
රජවූ මාගේ දෙවියන්වහන්සේගේ
ගමන් දුටුවෝය.
රබන් ගසන කන්‍යාවන් මැද 25
ගී කියන්නෝ පෙරටුව ගියෝය,
ගායනාකාරයෝ පසුව ගියෝය.
ඉශ්‍රායෙල්ගේ උල්පතෙන් වූ තැනැත්තෙනි, 26
දෙවියන්වහන්සේට, එසේය,
ස්වාමීන්වහන්සේට සභාවලදී
ප්‍රශංසාකරව්.
ඔවුන්ගේ ආණ්ඩුකාරයා වන කුඩා 27
බෙන්යමින්ද
යූදාගේ අධිපතීන් හා මන්ත්‍රී සභාවද
සාබුලොන්ගේ අධිපතීන් හා
නප්තලීගේ අධිපතීහුද එහි සිටිති.

28 නුඹේ දෙවියන්වහන්සේ නුඹේ ශක්තිය නියමකළසේක,
දෙවියන්වහන්ස, ඔබ අපට ඉෂ්ටකරදුන් දේ ස්ථිරකළ මැනව.
29 යෙරුසලමෙහි ඔබගේ මාලිගාව නිසා රජවරු ඔබ වෙතට පඬුරු ගෙනෙන්නෝය.
30 නළාගස් අතරෙහිවූ වල් සතාටද ගොන් සමූහයා සහ වස්සන් වැනි ජනයන්ටද තරවටුකළ මැනව;
රිදී මිල සහිතව එකිනෙකා යටත්වේ;
යුද්ධයට ප්‍රියවූ මනුෂ්‍ය වර්ගයන් විසරවුව මැනව.
31 මිසරයෙන් අධිපතීහු නික්ම එන්නෝය;
කුෂ් දේශය දෙවියන්වහන්සේ දෙසට අත් දිගුකරන්ට ඉක්මන්කරන්නේය.
32 පොළොවේ රාජ්‍යයෙනි, දෙවියන්වහන්සේට ගී කියව්;
ස්වාමීන්වහන්සේට ප්‍රශංසා ගී කියව්;
පෙර සිට පවත්නා ආකාශවල ආකාශයන්හි නැගීයන්නාවූ තැනන්වහන්සේට ගී කියව්;
33 බලව, උන්වහන්සේ ස්වකීය හඬ එනම් බලවත්වූ හඬක් නික්මවනසේක.
34 බලය දෙවියන්වහන්සේට අයිති බව කියව්.
උන්වහන්සේගේ උතුම්කම ඉශ්‍රායෙල් කෙරෙහිය,
උන්වහන්සේගේ ශක්තිය ආකාශයන්හිය.
35 දෙවියන්වහන්ස, ඔබගේ ශුද්ධස්ථානවල සිට ඔබ භයංකරව පෙනෙනසේක.
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේම ස්වකීය සෙනඟට ශක්තියත් බලයත් දෙනසේක.
දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා.

## අධික දුක්විඳින්නාගේ කන්නලව්ව

69 නායක වාද්‍යකරුටයි; ෂෝෂන්නීම් නම් තූර්යය ඇතිව ගායනාකිරීමටයි. දාවිත්ගේ ගීතයකි.

1 දෙවියන්වහන්ස, මා ගැළෙවුව මැනව;
මක්නිසාද ජලධාරා මාගේ ප්‍රාණය තෙක් පැමිණ තිබේ.
සිටින්ට තැනක් නැති ගැඹුරු මඩෙහි කිඳී සිටිමි. 2
ගැඹුරු ජලයට පැමිණ සිටිමි,
ජලධාරාවෝ මා උඩින් ගලායති.
මාගේ මොරගැසීමෙන් වෙහෙසව සිටිමි; 3
මාගේ උගුර වියළී තිබේ.
මාගේ දෙවියන්වහන්සේ ගැන බලා සිටීමෙන් මාගේ ඇස් ක්ෂයවේ.
නිෂ්කාරණයේ මට වෛරවන්නෝ 4
මාගේ ඉසකේවලට වැඩිය.
අයුතුලෙස මට සතුරුව මා සිඳදමන්ට කැමැත්තෝ බලවත්ය.
එවිට මා විසින් පැහැර නොගත් දෙය දෙන්ට සිදුවිය.
දෙවියන්වහන්ස, ඔබ මාගේ අඥනකම 5
දන්නාසේක;
මාගේ පව්ද ඔබගෙන් සැඟවී නැත.
සේනාවල දෙවිවූ ස්වාමිනි, ඔබ 6
කෙරෙහි බලාසිටින්නෝ මා නිසා ලජ්ජාවට නොපැමිණෙත්වා,
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්ස, ඔබ සොයන්නෝ මා නිසා අගෞරවයට නොපැමිණෙත්වා.
මක්නිසාද මම ඔබ නිසා නින්ද 7
ඉවසීමි;
මාගේ මුහුණ ලජ්ජාවෙන් වැසී ගියේය.
මාගේ සහෝදරයන්ට 8
ආගන්තුකයෙක්ව,
මාගේ මෑණියන්ගේ දරුවන්ට විදේශියෙක්ව සිටිමි.
මක්නිසාද ඔබගේ ගෘහය සඳහා ඇති 9
ජ්වලිතය මා දවුවේය;
ඔබට නින්දකරන්නන්ගේ නින්ද මා පිට වැටී තිබේ.
මා ඇඬූ කලද නිරාහාරව සිටීමෙන් 10
මාගේ ආත්මයට දුක් ඉපදවූ කලද
එය මට නින්දවක් විය.
ගෝණි මාගේ ඇඳුම් කොට ගත් කල 11
මම ඔවුන්ට නින්ද වාක්‍යයක් වීමි.
නුවර දොරකඩ හිඳින අය මා ගැන 12
කථාකෙරෙති;
බේබද්දන්ගේ කවි මා ගැන වෙයි.
එහෙත් ස්වාමිනි, මම වනාහි පිළිගන්නා 13

කාලයකදී මාගේ යාච්ඤාව
ඔබට පුදමි.
දෙවියන්වහන්ස, ඔබගේ අධික
දයාවෙන්,
ඔබගේ ගැළවීමේ සැබෑකමින් මට
උත්තරදුන මැනව.
14 ගිලීයන්ට නොදී මා මඩෙන් ගොඩගත
මැනව.
මට වෛරවෙන්නන්ගෙන්ද ගැඹුරු
ජලයෙන්ද ගැළවෙම්වා.
15 ජලගැල්ම මා යට නොකෙරේවා,
ගැඹුර මා ගිල නොගනීවා;
වළද මා රැගෙන කට පියා නොගනීවා.
16 ස්වාමිනි, මට උත්තරදුන මැනව;
මක්නිසාද ඔබගේ කරුණාගුණය
යහපත්ය.
ඔබගේ දයාබරකම් රාශිය ලෙස මා
දෙසට හැරුණ මැනව.
17 ඔබගේ මෙහෙකරුවාගෙන් ඔබගේ
මුහුණ සඟවා නොගත මැනව;
මක්නිසාද විපතට පත්ව සිටිමි;
ඉක්මනින් මට උත්තරදුන මැනව.
18 මාගේ ප්‍රාණයට ළංවී එය මිදුව මැනව.
මාගේ සතුරන් නිසා මා නිදහස්කළ
මැනව.
19 ඔබ මාගේ නින්දවද ලජ්ජාවද
අවනම්බුවද දන්නාසේක.
මාගේ සියලු එදිරිකාරයෝ ඔබ
ඉදිරියෙහිය.
20 නින්දවෙන් මාගේ සිත බිඳුණේය; මම
ශෝකයෙන් පිරී සිටිමි.
අනුකම්පාකරන්නෙකු බලාසිටියෙමි
නුමුත් කිසිවෙක් නොවීය;
සනසන්නන් සෙවීමි, නුමුත් සම්බ
නොවීය.
21 ආහාර පිණිස ඔව්හු මට තික්ත ද්‍රව්‍ය
දුන්නෝය;
පිපාසාවූ කල කාඩි බොන්ට දුන්නෝය.
22 ඔවුන්ගේ මේසය ඔවුන් ඉදිරියෙහි
මලපතක් වේවා;
ඔවුන්ට සමාදනය ඇති කල එය
උගුලක්ද වේවා.
23 නොපෙනෙන ලෙස ඔවුන්ගේ ඇස්
අඳුරුවේවා;
ඔවුන්ගේ කටි නිතරම වෙවුලන්ට
සැලැස්සුව මැනව.
ඔවුන් පිට ඔබගේ කෝපය වත්කළ 24
මැනව,
ඔබගේ කෝපාග්නිය ඔවුන් පිට
වැටේවා.
ඔවුන්ගේ වාසස්ථානය පාළුවේවා; 25
ඔවුන්ගේ කූඩාරම්වල
වාසයකරන්නෙක් නොවේවා.
මක්නිසාද ඔබ පහරදුන් අයට ඔව්හු 26
පීඩාකෙරෙති;
ඔබ තුවාලකළ අයගේ දුක ගැන
කථාකෙරෙති.
ඔවුන්ගේ අයුතුකමට අයුතුකම එකතු- 27
කළ මැනව.
ඔව්හු ඔබගේ ධර්මිෂ්ඨකමට ඇතුල්
නොවෙත්වා,
ඔව්හු ජීවන පොතෙන් මැකීයෙත්වා, 28
ධර්මිෂ්ඨයන් සමග නොලියවෙත්වා.
එහෙත් මම දුප්පත්මි, දුක්ඛිතයෙමි. 29
දෙවියන්වහන්ස, ඔබගේ ගැළවීම මා
උසස්කෙරේවා.
ගීතිකාවකින් දෙවියන්වහන්සේගේ 30
නාමයට ප්‍රශංසාකරන්නෙමි,
ස්තුතිකිරීමෙන් උන්වහන්සේ උසස්
කරන්නෙමි.
ගොනෙකුට හෝ අං ඇති කුර ඇති 31
හරකෙකුට වඩා
ස්වාමීන්වහන්සේ මීට
ප්‍රසන්නවනසේක.
මොළොක්ගුණ ඇත්තෝ ඒ දැක 32
සන්තෝෂවෙති.
දෙවියන්වහන්සේ සොයන්නෙනි,
නුඹලාගේ සිත ජීවත්වේවා.
මක්නිසාද ස්වාමීන්වහන්සේ දිළිඳුන්ට 33
කන්දෙනසේක,
තමන් හිරකාරයන් සුළුකොට
නොසිතනසේක.
අහස හා පොළොවද 34
මුහුදු හා එහි හැසිරෙන සියල්ලෝද
උන්වහන්සේට ප්‍රශංසාකෙරෙත්වා.
මක්නිසාද දෙවියන්වහන්සේ සියොන් 35
ගළවනසේක, යූදගේ නුවරවල්
ගොඩනගනසේක;

ඔව්හු එහි වෙසෙමින් එය
භුක්තිවිඳින්නෝය.
36 උන්වහන්සේගේ මෙහෙකරුවන්ගේ
වංශය එහි උරුමය ලබන්නෝය.
උන්වහන්සේගේ නාමයට
ප්‍රේමකරන්නෝ එහි
වාසයකරන්නෝය.

## ඉක්මනින් උපකාර ලැබීම සඳහා යාච්ඤාව

70 නායක වාද්‍යකරුටයි. දාවිත්ගේ ගීතයකි; සිහිකරවීමටයි.
1 දෙවියන්වහන්ස, මා මිදුව මැනව;
ස්වාමීනි, මට උපකාරකරන්ට
ඉක්මන්වුව මැනව.
2 මාගේ ජීවිතය සොයන්නෝ
ලජ්ජාවෙත්වා, වියවුල් වෙත්වා.
මට පැමිණි අන්තරාය ගැන
ප්‍රීතිවන්නෝ
පසුබසිත්වා, අගෞරවයට
පැමිණෙත්වා.
3 ඔහෝ! ඔහෝ! කියන්නෝ
තමුන්ට වූ ලජ්ජාව නිසා පසුබසිත්වා;
4 ඔබ සොයන සියල්ලෝම ඔබ කෙරෙහි
ප්‍රීතිවෙත්වා, සන්තෝෂවෙත්වා;
ඔබගේ ගැළවීමට ප්‍රේමවන්නෝ:
දෙවියන්වහන්සේ උසස්වනසේක්වයි
නිතරම කියත්වා.
5 නුමුත් මම දුප්පත්මි, දිළින්දෙමි;
දෙවියන්වහන්ස, මා වෙතට ඉක්මනින්
අවමැනව.
මාගේ පිහිටත් මිදුම්කාරයාණෝත්
ඔබය.
ස්වාමීනි, පමා නූව මැනව.

## මහලු ඇඳහිලිවන්තයාගේ යාච්ඤාව

71 ස්වාමීනි, ඔබ විශ්වාසකරමි.
කිසිකලකත් ලජ්ජා නොවෙම්වා.
2 ඔබගේ ධර්මිෂ්ඨකමින් මා මුදා නිදහස්
කළ මැනව.
ඔබගේ කන මා දෙසට නමා මා
ගැළෙවුව මැනව.
3 මා නිතරම යන පිණිස මට පර්වත
නිවාසයක් වුව මැනව.
මා ගළවන්ට ඔබ අණ දී තිබේ;
මක්නිසාද මාගේ පර්වතය හා
බලකොටුවත් ඔබය.
මාගේ දෙවියන්වහන්ස, දුෂ්ටයාගේ 4
අතින්, එනම්
අධර්මිෂ්ඨවූ කෲරවූ මනුෂ්‍යයාගේ අතින්,
මා මුදගත මැනව.
මක්නිසාද ස්වාමිවූ දෙවියන්වහන්ස, 5
මාගේ බලාපොරොත්තුව ඔබය.
තරුණ වයස පටන් මාගේ විශ්වාසය
ඔබය.
මවු ගැබෙහි පටන් ඔබ මා 6
ඉසුලූසේක.
මවු කුසින් මා පිටතට ගත්තේ ඔබය.
මාගේ ප්‍රශංසාව නිතරම ඔබ ගැන
වන්නේය.
මම බොහෝ දෙනෙකුට විස්මයක් 7
මෙන් වෙමි;
නුමුත් ඔබ මාගේ බලවත්
රක්ෂාස්ථානයය.
මාගේ මුඛය දවස මුළුල්ලේ ඔබට 8
ප්‍රශංසාකිරීමෙන්ද
ගෞරවකිරීමෙන්ද පිරෙන්නේය.
මහලු වයසේදී මා ඉවත නොහළ 9
මැනව;
මාගේ ශක්තිය පිරිහෙන කල මා
අත්නෑරිය මැනව.
මක්නිසාද මාගේ සතුරෝ මා ගැන 10
කථාකෙරෙති;
මාගේ ප්‍රාණය ගැන රැකසිටින්නෝ
එක්ව මන්ත්‍රණයකරමින්:
දෙවියන්වහන්සේ ඔහු 11
අත්හැරියසේක.
ලුහුබඳිමින් ඔහු අල්වාගනිව්; මක්නිසාද
ඔහු මුදන්ට කිසිවෙක් නැතැයි කියති.
දෙවියන්වහන්ස, මා කෙරෙන් දුරු 12
නූව මැනව,
මාගේ දෙවියන්වහන්ස, මට උපකාර
කරන්ට ඉක්මන්වුව මැනව.
මාගේ ප්‍රාණයට විරුද්ධව සිටින්නෝ 13
ලජ්ජාවටත් විනාශයටත්
පැමිණෙත්වා;
මට අන්තරායකරන්ට සොයන්නෝ
නින්දවෙනුත් අගෞරවයෙනුත්

වැසීයෙත්වා.
14 එහෙත් මම නිතරම
බලාපොරොත්තුවෙමින්
වඩ වඩා ඔබට ප්‍රශංසාකරන්නෙමි.
15 මාගේ මුඛය දවස මුළුල්ලේ ඔබගේ
ධර්මිෂ්ඨකම හා
ඔබගේ ගැළවීම ප්‍රකාශකරන්නේය;
මක්නිසාද එහි ගණන නොදනිමි.
16 ස්වාමිවූ දෙවියන්වහන්සේගේ බලවත්
ක්‍රියා පෙරටුකොටගෙන එන්නෙමි.
ඔබගේ ධර්මිෂ්ඨකම පමණක්ම
සඳහන්කරන්නෙමි.
17 දෙවියන්වහන්ස, මාගේ යෞවන
කාලයේ පටන් ඔබ මට
ඉගැන්වූසේක;
මේ දක්වා ඔබගේ ආශ්චර්ය ක්‍රියා
ප්‍රකාශකෙළෙමි.
18 දෙවියන්වහන්ස, ඔබගේ ශක්තිය
එන පරම්පරාවටත්
ඔබගේ බලය මතු පැමිණෙන
සියල්ලන්ටත් මා විසින් ප්‍රකාශකරන
තෙක්,
මහලුව හිස පැසුණු කල්හි පවා මා
අත්නෑරිය මැනව.
19 දෙවියන්වහන්ස, ඔබගේ ධර්මිෂ්ඨකම
ඉතා උසස්ය;
මහත් දේවල් කළාවූ දෙවියන්වහන්ස,
ඔබට සමාන කවුද?
20 බොහෝ තද දුක් අපට පැමිණෙවූ
ඔබ
නැවත අප ජීවත්කොට,
පොළොවේ ගැඹුරු තැන්වලින් අප
නැවත ගොඩගන්නාසේක.
21 මාගේ උතුම්කම වැඩිකොට,
නැවත හැරී මා සැනසුව මැනව.
22 මාගේ දෙවියන්වහන්ස, ඔබ, එනම්
ඔබගේ සැබෑකම,
කුඩා වීණාවෙන් වර්ණනාකරන්නෙමි.
ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්ස,
මහ වීණාවෙන් ඔබට
ගායනාකරන්නෙමි.
23 මා විසින් ඔබට ප්‍රශංසා ගී කියන
කල මාගේ තොල්ද
ඔබ මිදුවාවූ මාගේ ආත්මයද බොහෝ
කොට ප්‍රීතිවන්නේය.
මාගේ දිවද දවස මුළුල්ලේම ඔබගේ 24
ධර්මිෂ්ඨකම ගැන කථාකරන්නේය.
මක්නිසාද මට අන්තරායකරන්ට
සොයන්නෝ ලජ්ජාවටත්
වියවුල්භාවයටත් පැමුණුණෝය.

## එන්ට සිටින්නාවූ රජ්ජුරුවෝ

සාලමොන්ගේ ගීතයකි. **72**

දෙවියන්වහන්ස, රජ්ජුරුවන්ට ඔබගේ 1
විනිශ්චයන්ද
රාජ පුත්‍රයාණන්ට ඔබගේ
ධර්මිෂ්ඨකමද දුන මැනව.
*උන්වහන්සේ ඔබගේ සෙනඟ 2
ධර්මිෂ්ඨකමින්ද
ඔබගේ දුප්පතුන් යුක්තියෙන්ද
විනිශ්චයකරන්නේය.
කඳුද හෙල්ද ධර්මිෂ්ඨකමින් 3
සෙනඟට සමාදනය හටගන්වන්නේය.
උන්වහන්සේ සෙනඟ අතරේහි වූ 4
දුප්පතුන් විනිශ්චයකරන්නේය,
දිළිඳුන්ගේ දරුවන් ගළවන්නේය,
පීඩාකරන්නා කැබලිකරන්නේය.
ඔව්හු හිර සඳ පවතිනා තෙක් 5
සියලු පරම්පරාවල ඔබට භයවන්නෝය.
තණකොළ කැපූ කෙත් පිට වැස්ස 6
මෙන්ද
බිම තෙමන වැසිවලා මෙන්ද
උන්වහන්සේ පහළවන්නේය.
උන්වහන්සේගේ දවස්වලදී ධර්මිෂ්ඨයා 7
සඵලවන්නේය;
සඳ නැතිවන තෙක්ම බොහෝ
සමාදනයද වන්නේය.
උන්වහන්සේ මුහුදෙන් මුහුදටත් 8
ප්‍රාත් ගංගාව පටන් පොළොවේ
කෙළවර දක්වාත්
අධිපතිකම්කරන්නේය.
වනයෙහි වසන්නෝ උන්වහන්සේ 9
ඉදිරියෙහි වැඳ වැටෙන්නෝය;
උන්වහන්සේගේ සතුරෝද ධූලි
ලෙවකන්නෝය.
තර්ෂීෂ් රටේද ද්වීපවලද රජවරු තෑගි 10
ගෙනෙන්නෝය.

*ඒ තෙමේ-මෙසේ දිගටම,

ෂෙබායේද සෙබායේද රජවරු පඩුරු
පුදන්නෝය.
11 එසේය, සියලු රජවරු උන්වහන්සේ
ඉදිරියෙහි වැඳ වැටෙන්නෝය.
සියලු ජාතීහු උන්වහන්සේට මෙහෙ
කරන්නෝය.
12 මක්නිසාද උන්වහන්සේ මොරගසන
දිළිඳුද
උපකාරකාරයෙක් නැති දුප්පතාද
මුදහරින්නේය.
13 උන්වහන්සේ දුප්පතුන් සහ දිළිඳුන්
කෙරෙහි අනුකම්පාකරන්නේය,
දිළිඳුන්ගේ ප්‍රාණයන් ගළවන්නේය.
14 උන්වහන්සේ ඔවුන්ගේ ප්‍රාණය
පීඩාවෙන්ද බලාත්කාරයෙන්ද
මුදන්නේය;
ඔවුන්ගේ ලේ උන්වහන්සේගේ ඇස්
හමුයෙහි අනර්ඝ වන්නේය.
15 ඔව්හු ජීවත්වන්නෝය; ෂෙබායේ රන්
උන්වහන්සේට දෙනු ලබන්නේය.
මනුෂ්‍යයෝ නොකඩව උන්වහන්සේ
උදෙසා යාච්ඤාකරන්නෝය;
දවස මුළුල්ලේම උන්වහන්සේට
ප්‍රශංසාකරන්නෝය.
16 පොළොවේ කඳු මුදුන්හි බොහෝ
ශස්‍ය වන්නේය;
එහි කරල් ලෙබනොන් මෙන් ලෙළ
දෙන්නේය.
නුවර වැසියෝ පොළොවේ තෘණ මෙන්
සඵලවන්නෝය.
උන්වහන්සේගේ නාමය සදකල් 17
පවතින්නේය;
හිරු පවත්නා තෙක් උන්වහන්සේගේ
නාමය පවතින්නේය.
මනුෂ්‍යයෝ උන්වහන්සේ
කරණකොටගෙන ආශීර්වාද
ලබන්නෝය;
සියලු ජාතීහු උන්වහන්සේ
වාසනාවන්තයයි කියන්නෝය.

ආශ්චර්ය කිරීමේ එකම කර්තෘවූ, 18
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ, ස්වාමීවූ
දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා.
උන්වහන්සේගේ ශ්‍රීමත් නාමයට සදකල් 19
ප්‍රශංසාවේවා;
මුළු පොළොව උන්වහන්සේගේ
මහිමයෙන් පිරේවා.
ආමෙන්, ආමෙන්.

යෙස්සේගේ පුත්‍රවූ දාවිත්ගේ යාච්ඤා 20
නිමි.

# තුන්වෙනි කාණ්ඩය

## දුෂ්ටයන්ගේ ශුභසිද්ධිය ගැන ඊර්ෂ්‍යා නොවිය යුතු බව

**73** ආසාප්ගේ ගීතයකි.

1 සැබවින් දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට,
එනම්
පිරිසිදු සිත් ඇත්තන්ට, යහපත්ය.
2 එහෙත් මාගේ පාද ඉවතයන්ට ළංවිය;
මාගේ අඩි නොලිස්සුවා පමණය.
3 මක්නිසාද මම දුෂ්ටයන්ගේ
අභිවෘද්ධිය දුටු කල,
අහංකාරීන් කෙරෙහි ඊර්ෂ්‍යාකෙළෙමි.
4 මක්නිසාද ඔවුන්ගේ මරණයේදී
වේදනා නැත.
ඔවුන්ගේ ශක්තිය ස්ථිරය.
වෙන මනුෂ්‍යයන්ට මෙන් ඔවුන්ට 5
විපත්ති නැත.
වෙන මනුෂ්‍යයන්ට මෙන් පීඩාද
නැත.
එබැවින් ආඩම්බරය ඔවුන්ගේ බෙල්ලේ 6
මාලාවක් මෙන්ය;
බලාත්කාරය වස්ත්‍රයක් මෙන් ඔවුන්
සරසයි.
ඔවුන්ගේ ඇස් තරකමින් නෙරා තිබේ. 7
ලබන්ට ආශාවෙනවාටත් වඩා ඔවුන්ට
සම්පත් ඇත.
ඔව්හු ගර්හාකෙරෙති, දුෂ්ටකමින් 8
බලාත්කාරය ගැන කථාකෙරෙති.
උඩඟුලෙස කථාකෙරෙති,
ඔව්හු තමුන්ගේ මුඛය අහසෙහි තබා 9
තිබේ,

ඔවුන්ගේ දිවද මුළු පොළොවෙහි
සංචාරයකරයි.
10 එබැවින් උන්වහන්සේගේ සෙනඟ
මෙතැනට හැරී එති.
පිරුණු කුසලානකින් ඔව්හු වතුර
බේරා බොති.
11 ඔව්හු කථාකොට: දෙවියන්වහන්සේ
කෙසේ දන්නාසේක්ද?
මහෝත්තමයාණන්ට දැනුම ඇද්දැයි
කියති.
12 බලව, දුෂ්ටයෝ මොව්හුය;
මොව්හු නිතර සැපසේ වෙසෙමින්
වස්තුවෙන් වර්ධනයවෙති.
13 සැබවින් මාගේ සිත පවිත්‍රකරගැනීමත්
නිදෙස්කමින් මාගේ අත් සේදීමත්
නිෂ්ඵලවිය;
14 මක්නිසාද දවස මුළුල්ලේම පීඩාකරනු
ලැබීම්,
උදයක් පාසා තරවටුද ලැබීම්.
15 මම මෙසේ කථාකරන්නෙමියි
කීයෙම් නම්;
බලව, ඔබගේ දරුවන්ගේ පරම්පරාවට
ද්‍රෝහියෙක් වෙමි.
16 මා විසින් දෙවියන්වහන්සේගේ
ශුද්ධස්ථානයට ගොස්
ඔවුන්ගේ අන්තිමය ගැන කල්පනා
කරන තෙක්,
17 එය මට අධික වේදනා සහිත විය;
එය දැනගත හැකි කෙසේදැයි සිතමින්
සිටියෙමි.
18 සැබවින් ඔබ ඔවුන් ලිස්සන තැන්වල
සිටුවනසේක.
ඔබ ඔවුන් විනාශයට හෙළනසේක.
19 ඔවුන් ක්ෂණයකින් ශුන්‍යවූ හැටි!
භීතිවලින් ඔව්හු සහමුලින්ම විනාශ
වූවෝය.
20 යමෙක් පිබිදෙන කල ඔහුට හීනයක්
යම්සේද,
ස්වාමිනි, ඔබ පිබිදෙන කල ඔබ
ඔවුන්ගේ රූපාකාරය එසේ
හෙළාදක්නාසේක.
21 එහෙත් මාගේ සිත කැලඹුණේය,
මාගේ හෘදයට ඇන්නාක්මෙන් විය.
22 මම මෘගාකාර වීමි, අඥාන වීමි;
ඔබ ඉදිරියෙහි තිරිසනෙකු මෙන් වීමි.
එසේ නුමුත් මම නිතරම ඔබ සමගය. 23
ඔබ මාගේ දකුණත අල්ලාගත්සේක.
ඔබගේ මන්ත්‍රණයෙන් මට මග 24
පෙන්වනසේක,
පසුව තේජසට මා පිළිගන්නාසේක.
ස්වර්ගයෙහි ඔබ හැර මට ඇත්තේ 25
කවුද?
පොළොවෙහිද ඔබ හැර මා ආශා
කරන කිසිවෙක් නැත.
මාගේ මාංසයත් සිතත් ක්ෂයවේ. 26
දෙවියන්වහන්සේ මාගේ සිතේ ශක්තියද
සදාකාලයට මාගේ කොටසද
වනසේක.
මක්නිසාද ඔබ කෙරෙන් ඈත්ව 27
සිටින්නෝ විනාශවන්නෝය.
මිථ්‍යාචාරලෙස ඔබ කෙරෙන් පහව
යන සියල්ලන් ඔබ
විනාශකළසේක.
දෙවියන්වහන්සේට ළංවීම මට යහපත. 28
ඔබගේ සියලු ක්‍රියා ප්‍රකාශකරන
පිණිස,
ස්වාමිවූ දෙවියන්වහන්සේ මාගේ
සරණ කරගතිමි.

## අත්හරිනු ලැබූ සෙනඟගේ විලාපය

74

ආසාප් විසින් ලියූ
අනුශාසනාවකි.
දෙවියන්වහන්ස, ඔබ සදාකාලයටම 1
අප පහකළේ කුමටද?
ඔබගේ ගොදුරු බිමේ බැටළුවන්ට
විරුද්ධව ඔබගේ උදහසේ දුම
නගින්නේ මක්නිසාද?
ඔබ පුරාණ කාලයේදී මිලේටගත්තාවූ, 2
ඔබගේ උරුම-ගෝත්‍රය වන පිණිස
මුදගත්තාවූ ඔබගේ සභාවද
ඔබ විසූ සියොන් කන්දද සිහිකළ
මැනව.
ශුද්ධස්ථානයෙහි සතුරා විසින් කර 3
තිබෙන මුළු හානිය වන
නිරන්තර විනාශයන් කරා ඔබගේ
පාද නගා අවමැනව.
ඔබගේ එදිරිකාරයෝ ඔබගේ සභා 4

මධ්‍යයෙහි ගර්ජනාකළෝය;
ලකුණු පිණිස තමුන්ගේ කොඩි
එසෙවුවෝය.
5 ඔව්හු මූකළානේදී
පොරෝ ඔසවන්නන් මෙන්
පෙනුණෝය.
6 දැන් ඔව්හු පොරොවෙන් හා මිටිවලින්
එහි කැටයම් වැඩ සහමුලින්ම
කඩාදමති.
7 ඔව්හු ඔබගේ ශුද්ධස්ථානය
ගිනිලෑවෝය;
ඔබගේ නාමයේ නිවාසය බිම හෙළා
දූෂණයකළෝය.
8 සහමුලින්ම ඔවුන් විනාශකරන්නෙමු
යයි ඔව්හු සිතින් කීවෝය.
දේශයෙහි දෙවියන්වහන්සේගේ
සිනගෝග සියල්ල පුලුස්සාදැමූය.
9 අපේ ලකුණු අපට නොපෙනෙයි.
අනාගතවක්තෘ කෙනෙක් තවත්
නැත්තේය;
කොතෙක් කල්දැයි දන්නාවූ කිසිවෙකුත්
අප අතරෙහි නැත.
10 දෙවියන්වහන්ස, එදිරිකාරයා නින්ද
කරන්නේ කොපමණ කල්ද?
සතුරා ඔබගේ නාමයට සදකල්
අපහාසකරන්නේද?
11 ඔබගේ අත, එසේය ඔබගේ දකුණත,
කුමක් නිසා නවතනසේක්ද?
එය ඔබගේ ළයෙන් ඉවත ගෙන
ඔවුන් විනාශකළ මැනව.
12 පොළෝ මැද ගැළවීම සිද්ධකරන
දෙවියන්වහන්සේ
පුරාතන සිට මාගේ රජ්ජුරුවෝය.
13 ඔබ ස්වකීය ශක්තියෙන් මුහුද
බෙදූසේක.
ඔබ ජලයෙහි මහා සත්ත්වයන්ගේ හිස්
බින්දසේක.
14 ඔබ ලෙවියාතන්ගේ හිස පොඩිකොට,
වනයෙහි වාසයකරන සෙනඟට
භෝජන පිණිස දුන්සේක.
15 ඔබ උල්පතට හා ජලධාරාවටත්
මාර්ගය දෙදුරුකළසේක.
මහත් ගංගා වියළවූසේක.
16 දිවාභාගය ඔබගේය, රාත්‍රියත්
ඔබගේය.
ඔබ ආලෝකයද සූර්යයාද පිළියෙළ
කළසේක.
ඔබ පොළොවේ සියලු සීමා 17
පිහිටෙවූසේක.
ග්‍රීෂ්ම කාලයද ශීත කාලයද
සෑදූසේක.
ස්වාමිනි, සතුරා නින්දකළ බවත් 18
අඥාන සෙනඟක් ඔබගේ නාමයට
අපහාසකළ බවත් සිහිකළ මැනව.
ඔබගේ කොබෙයියාගේ ප්‍රාණය වන 19
මෘගයාට නුදුන මැනව.
ඔබගේ අසරණ රැළ සදකාලේටම
සිහිනැති නොකළ මැනව.
ගිවිසුම සැලකුව මැනව. 20
මක්නිසාද පොළොවේ අඳුරු තැන්
බලාත්කාරයේ වාසස්ථානවලින්
පිරී තිබේ.
පීඩා ලත් තැනැත්තේ ලජ්ජාවී ආපසු 21
නොඒවා,
දුප්පතාද දිළිඳුද ඔබගේ නාමයට
ප්‍රශංසාකෙරෙත්වා.
දෙවියන්වහන්ස, නැගිට ඔබගේ 22
යුක්තිය කියා සිටිය මැනව.
අඥානයා දවස මුළුල්ලේ ඔබට නින්ද
කරන හැටි සිහිකළ මැනව.
ඔබගේ විරුද්ධකාරයන්ගේ ශබ්දය 23
සිහි නැති නොකළ මැනව.
ඔබට විරුද්ධව නැගිටින්නන්ගේ
කෝලාහල ශබ්දය නිතර නැගේ.

## දෙවියන්වහන්සේගේ වැඩසිටීම හා බලය ගැන ස්තුති කිරීම

### 75

නායක වාද්‍යකරුටයි; 'නාස්ති නොකළ මැනව.' ආසාප්ගේ කාව්‍ය ගීතයකි.

දෙවියන්වහන්ස, අපි ඔබට ස්තුති 1
කරමුව;
ඔබගේ නාමය සමීප බැවින් ස්තුති
කරමුව.
මනුෂ්‍යයෝ ඔබගේ පුදුම ක්‍රියා
ප්‍රකාශකරති.
නියම කාලය ලැබූ කල 2
මම අවංකලෙස විනිශ්චයකරන්නෙමි.

3 පොළොවද එහි සියලු වැසියෝද
දියව ගියෝය.
මම ඒකේ ටැම් සිටුවීමි.
4 අහංකාරලෙස ක්‍රියා නොකරව්යයි
අහංකාරීන්ටත්
අඟ උස් නොකරව්යයි දුෂ්ටයන්ටත්
කීමි.
5 තොපගේ අඟ උස් නොකරව්;
තද කුළල් ඇතිව කථා නොකරව්.
6 මක්නිසාද උසස්කම නැගෙනහිරින්වත්
බස්නාහිරින්වත් දකුණෙන්වත්
නොවන්නේය.
7 නුමුත් දෙවියන්වහන්සේ
විනිශ්චයකාරයාණෝය.
උන්වහන්සේ එක්කෙනෙකු පහත්
කරනසේක, අනිකෙකු උසස්
කරනසේක.
8 මක්නිසාද ස්වාමීන්ගේ අතේ
කුසලානක් ඇත, එහි මුද්‍රිකපානය
පෙණ දමයි;
එය මිශ්‍ර ද්‍රව්‍යයෙන් පිරී තිබේ,
උන්වහන්සේ එයින් වත්කරනසේක.
සැබවින් පොළොවේ සියලු දුෂ්ටයෝ
එහි මණ්ඩි මිරිකා බොන්නෝය.
9 එහෙත් මම සදකල් ප්‍රකාශකරන්නෙමි,
යාකොබ්ගේ දෙවියන්වහන්සේට
ප්‍රශංසා ගී කියන්නෙමි.
10 දුෂ්ටයන්ගේ අං සියල්ලද
කපාදමන්නෙමි;
නුමුත් ධර්මිෂ්ඨයන්ගේ අං ඔසවනු
ලබන්නේය.

## ජයග්‍රහණයේදී දෙවියන්වහන්සේගේ ගුණ වර්ණනා කිරීම

**76** නායක වාද්‍යකරුටයි; වීණා ඇතුව ගීතිකා කිරීමටයි. ආසාප්ගේ කාව්‍ය ගීතයකි.

1 දෙවියන්වහන්සේ යූදෙහි ප්‍රසිද්ධසේක.
ඉශ්‍රායෙල්හි උන්වහන්සේගේ නාමය
උතුම්ය.
2 උන්වහන්සේගේ මණ්ඩපය සාලෙම්හිය,
උන්වහන්සේගේ වාසස්ථානය
සියොන්හිය.
එහිදී උන්වහන්සේ දුන්නේ ඊගස් හා 3
පලිහද කඩුව හා සටනද බින්දසේක.
කොල්ලගත් කඳුවල සිට ඔබ 4
තේජෝමහිමයෙන් යුක්තවනසේක.
සවි සිත් ඇත්තෝ කොල්ලකනු 5
ලැබුවෝය, තමුන්ගේ නින්දට
පැමිණියෝය;
බලවත්වූ කිසිවෙකුගේ අතෙහි ශක්තිය
නොවීය.
යාකොබ්ගේ දෙවියන්වහන්ස, ඔබගේ 6
තරවටුකිරීමෙන්
රථ සේනාව සහ අසරුවෝ බර නින්දට
හෙළනු ලැබුවෝය.
භයවිය යුත්තේ ඔබටය, ඔබට 7
පමණක්මය.
ඔබ කෝපවූ කල්හි ඔබ ඉදිරියෙහි
සිටින්ට හැකි කාටද?
ඔබ ස්වර්ගයෙන් නඩුතීන්දුව ඇසෙන්ට 8
සැලැස්වූසේක;
පොළොවේ සියලු යටහතුන් ගළවන
පිණිස
දෙවියන්වහන්සේ විනිශ්චයට නැගිටි 9
කල,
පොළොව භයව නිශ්චලවිය.
සැබවින් මනුෂ්‍යයාගේ උදහසින් ඔබට 10
ප්‍රශංසා ලැබෙන්නේය.
උදහසේ ඉතිරි කොටස ඔබ
ආයුධකොට *බැඳගන්නාසේක.
තොපගේ දෙවිවූ ස්වාමීන්ට භාරයක් 11
වී එය ඔප්පුකරව්.
උන්වහන්සේ වටකර සිටින සියල්ලෝ
භයවිය යුතුවූ උන්වහන්සේට
පඬුරු ගෙනෙත්වා.
උන්වහන්සේ අධිපතීන්ගේ එඩි 12
මඩිනසේක.
පොළොවේ රජුන්ට භයංකර
වනසේක.

*නොහොත්, නවත්වනසේක.

## දුකේදී විලාපය සහ දෙවියන්වහන්සේගේ ක්‍රියාවලින් සැනසීම

**77** යෙදුතුන්වරුන්ගේ නායක වාද්‍යකරුටයි. ආසාප්ගේ ගීතයකි.

1 මාගේ හඬින් දෙවියන්වහන්සේට, එසේය,
මාගේ හඬින් දෙවියන්වහන්සේට මොරගසන්නෙමි, උන්වහන්සේ මට කන්දෙනසේක.
2 දුක් ඇති දවසේදී ස්වාමීන් සෙවීමි.
රාත්‍රියේදී මාගේ අත නොනැවතී දිගුකර තිබුණේය;
මාගේ ආත්මය සැනසෙන්ට අකමැති විය.
3 මම දෙවියන්වහන්සේ සිහිකොට චංචලව සිටිමි.
මම මෙනෙහිකරමි, මාගේ ආත්මයද ශෝකයෙන් පිරී ගියේය.
4 ඔබ මාගේ ඇස්වලින් නින්ද වලක්වනසේක.
කථාකරන්ට බැරි තරම් කැලඹී සිටිමි.
5 මම පුරාණයේ දවස්ද
පූර්ව කාලවල අවුරුදුද කල්පනාකෙළෙමි.
6 රාත්‍රියේ මාගේ ගීතිකාව සිහිකොට,
මාගේම සිත සමග කථාකරමි;
මාගේ ආත්මයද ඕනෑකමින් විමසුවේය.
7 ස්වාමීන්වහන්සේ සදාකාලේටම පහකරනසේක්ද?
තවත් කරුණා නොකරනසේක්ද?
8 උන්වහන්සේගේ දයාව සහමුලින්ම පහව ගියේද?
උන්වහන්සේගේ පොරොන්දුව සදාකල් ඉෂ්ට නොවන්නේද?
9 දෙවියන්වහන්සේ කරුණාකරන්ට මතකනැතිකළසේක්ද?
කෝපයෙන් ස්වකීය දයාව වැලැක්වූසේක්ද?

එවිට මම කථාකොට: මේ මාගේ දුර්වලකමය; 10
නුමුත් මහෝත්තමයාණන්ගේ දකුණතේ අවුරුදු සිහිකරන්නෙමි.
ස්වාමීන්ගේ ක්‍රියා සඳහන්කරන්නෙමි; 11
මක්නිසාද ඔබගේ පුරාණ ආශ්චර්යයන් සිහිකරන්නෙමි.
ඔබගේ කර්මාන්ත සියල්ල ගැන භාවනාකරන්නෙමි, 12
ඔබගේ ක්‍රියා ගැන මෙනෙහිකරන්නෙමියි කීයෙමි.
දෙවියන්වහන්ස, ඔබගේ මාර්ගය ශුද්ධස්ථානයෙහිය. 13
දෙවියන්වහන්සේ මෙන් උතුම් දෙවි කෙනෙක් කවුද?
පුදුම දේ කරන දෙවියන්වහන්සේ නම් ඔබය. 14
ඔබ මනුෂ්‍ය වර්ගයන් අතරේ ඔබගේ ශක්තිය දක්වූසේක.
ඔබ යාකොබ්ගේද යෝසෙප්ගේද පුත්‍රයන් වන 15
ඔබගේ සෙනඟ ඔබගේ බාහුවෙන් මුදාගත්සේක.
දෙවියන්වහන්ස, ජලධාරාවෝ ඔබ දුටුවෝය; 16
ජලධාරාවෝ ඔබ දැක භයවූවෝය.
ගැඹුරු තැන්ද සෙලවුණෝය.
වලාකුල් දිය වැගිරෙවූවෝය; 17
අහස ශබ්දයක් නික්මවිය.
ඔබගේ ඊගස්ද විහිද ගියේය.
ඔබගේ ගර්ජනා ශබ්දය සුළි හුළඟෙහි විය; 18
විදුලිද ලෝකය ආලෝකකෙළේය.
පොළොව සෙලවී කම්පාවූවාය.
ඔබගේ මාර්ගය මුහුදේ විය, 19
ඔබගේ මාවත් මහත් ජලධාරාවන්හි විය,
ඔබගේ පා සලකුණු ප්‍රකාශ නොවීය.
ඔබ මෝසෙස් හා ආරොන් ලවා 20
බැටළු රැළක් මෙන් ඔබගේ සෙනඟ ගෙනගියසේක.

## ඉශ්‍රායෙල්වරුන්ගේ කථාන්තරය සිහිකරවාදීම

**78** ආසාප්ගේ අනුශාසනාවකි.

1 එම්බා මාගේ සෙනඟ, මාගේ
ව්‍යවස්ථාවට කන්දෙව්.
මාගේ මුඛයේ වචනවලට කන්
යොමුකරව්.
2 උපමාවකින් මාගේ කට අරින්නෙමි;
අප විසින් ඇසුවාවූ, දැනගත්තාවූ,
3 අපේ පියවරුන් අපට කියාදුන්නාවූ
පුරාණයේ වාක්‍යයන්
ප්‍රකාශකරන්නෙමි.
4 අපි ඔවුන්ගේ දරුවන් කෙරෙන් ඒ
දේ නොසඟවා,
ස්වාමීන්ගේ ප්‍රශංසාවත් ශක්තියත්
උන්වහන්සේ කළ ආශ්චර්ය ක්‍රියාත්
මතු එන පරම්පරාවට
ප්‍රකාශකරන්නෙමුව.
5 එසේ උන්වහන්සේ යාකොබ්හි
සාක්ෂියක් පිහිටුවා,
ඉශ්‍රායෙල්හි ව්‍යවස්ථාවක් පනවා,
ඒවා තමුන්ගේ දරුවන්ට දන්වන්ට
අපේ පියවරුන්ට අණකළසේක.
6 මෙසේ කළේ එන්නාවූ පරම්පරාව,
එනම් උපදින්ට සිටින දරුවන්,
ඒවා දැනගෙන,
නැගිට ස්වකීය දරුවන්ට කියාදෙන
පිණිසත්,
7 තමුන්ගේ විශ්වාසය දෙවියන්වහන්සේ
කෙරෙහි තබා,
උන්වහන්සේගේ ක්‍රියා සිහිනැති
නොකොට,
උන්වහන්සේගේ ආඥා රක්ෂාකරන
පිණිසත්,
8 මුරණ්ඩු කැරළිකාර පරම්පරාවක් වූ,
තමුන්ගේ සිත් එකඟකර නොගත්තාවූ,
දෙවියන්වහන්සේ කෙරෙහි ස්ථිර
සිතක් නැත්තාවූ පරම්පරාවක්ව සිටි
ඔවුන්ගේ පියවරුන් මෙන් නොවන
පිණිසත්ය.
9 යුද්ධයට සැරසී දුනු ගත් එප්‍රායිම්
පුත්‍රයෝ
සටන් දවසේදී පස්සට හැරුණෝය.

ඔව්හු දෙවියන්වහන්සේගේ 10
ගිවිසුම රක්ෂා නොකළෝය,
උන්වහන්සේගේ ව්‍යවස්ථාව ලෙස
හැසිරෙන්ට නොකැමැතිවූවෝය;
උන්වහන්සේ කළ දේද 11
උන්වහන්සේ තමුන්ට දැක්වූ ආශ්චර්ය
ක්‍රියාද ඔව්හු මතකනැතිකළෝය.
උන්වහන්සේ මිසර දේශයෙහි ශෝවාන් 12
කෙතේදී
ඔවුන්ගේ පියවරුන්ගේ ඇස් හමුයෙහි
පුදුම දේ කළසේක.
උන්වහන්සේ මුහුද බෙදා ඔවුන් ඒ 13
මැදින් යන්ට සැලැස්වූසේක;
උන්වහන්සේ ජලධාරාවන් කන්දක්
මෙන් සිටෙවුසේක.
දවාලේ වලාකුළකින්ද 14
මුළු රෑ ගිනි එළියකින්ද උන්වහන්සේ
ඔවුන් ගෙනගියසේක.
වනාන්තරයෙහිදී පර්වත පළා, 15
ගැඹුරුවලින් මෙන් බොහෝකොට
ඔවුන්ට වතුර බොන්ට දුන්සේක.
පර්වතයෙන් දිය පාරවල්ද නගා, 16
ගංගා මෙන් ජලය ගලායන්ට
සැලැස්වූසේක.
එහෙත් ඔව්හු කාන්තාරයෙහිදී 17
මහෝත්තමයාණන්ට විරුද්ධව
කැරළි ගසමින්,
උන්වහන්සේට විරුද්ධව තව තව
පව් කළෝය.
තමුන්ගේ තෘෂ්ණාවලට කෑම 18
ඉල්ලීමෙන්
සිතින් දෙවියන්වහන්සේ පරීක්ෂා
කළෝය.
එසේය, ඔව්හු දෙවියන්වහන්සේට 19
විරුද්ධව කථාකරමින්:
වනාන්තරයෙහි මේසයක් පිළියෙළ
කරන්ට දෙවියන්වහන්සේට
පුළුවන්ද?
බලව, උන්වහන්සේ පර්වතයට ගැසූ 20
කල ජලය වැගුරුණේය,
දියපාරවල් ගලාගියේය;
රොටිත් දෙන්ට හැකිසේක්ද?
ස්වකීය සෙනඟට මාංස
සපයාදෙනසේක්දැයි කීවෝය.
එබැවින් ස්වාමීන්වහන්සේ අසා 21

උදහස්වූසේක.
යාකොබ්ට විරුද්ධව ගින්නක් ඇවුළුණේය,
ඉශ්‍රායෙල්ට විරුද්ධව කෝපයද නැංගේය;
22 මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේ කෙරෙහි නොඇදහුවෝය,
උන්වහන්සේගෙන් ලැබෙන ගැළවීම විශ්වාස නොකළෝය.
23 එසේ වුවත් උන්වහන්සේ ඉහළින් ආකාශයට අණකොට,
ස්වර්ගයේ දොරවල් ඇරියසේක;
24 කෑම පිණිස මන්නා වස්වමින්,
ස්වර්ග ශස්‍යයෙන් ඔවුන්ට දුන්සේක.
25 මනුෂ්‍යයා බලවතුන්ගේ රොටි කෑයේය.
සෑහෙන පමණ ආහාර උන්වහන්සේ ඔවුන්ට එවුසේක.
26 උන්වහන්සේ අහසෙහි පෙරදිග සුළඟ හමන්ට සැලැස්වූසේක.
ස්වකීය බලයෙන් දකුණු දිග සුළඟ ගෙනාසේක.
27 උන්වහන්සේ ධූලි මෙන් මාංසද
මුහුදු වැලි මෙන් පියාපත් ඇති පක්ෂීන්ද ඔවුන් පිට වැස්සෙවුසේක.
28 එය ඔවුන්ගේ වාසස්ථාන අවට
කඳවුර මැදට හෙළුසේක.
29 ඔව්හු මෙසේ කා බොහෝසේ තෘප්තියට පැමිණියෝය;
ඔවුන් ආශාවූ දේ උන්වහන්සේ ඔවුන්ට දුන්සේක.
30 ඔවුන්ගේ ආශාව සංසිඳෙන්ට ප්‍රථම,
කෑම ඔවුන්ගේ කටේ තිබියදීම,
31 දෙවියන්වහන්සේගේ උදහස ඔවුන්ට විරුද්ධව හටගෙන,
ඔවුන්ගෙන් ඉතා පුෂ්ටිමත්වූවන් නසා,
ඉශ්‍රායෙල්ගේ තරුණයන්ට පහරදුන්සේක.
32 මේ සියල්ල සිදුවුවත් ඔව්හු තවත් පව්කළෝය,
උන්වහන්සේගේ ආශ්චර්ය ක්‍රියා විශ්වාස නොකළෝය.
33 එබැවින් උන්වහන්සේ ඔවුන්ගේ දවස් නිෂ්ඵලකමෙන්ද
ඔවුන්ගේ අවුරුදු භීතියෙන්ද ගෙවෙන්ට සැලැස්වූසේක.
34 උන්වහන්සේ ඔවුන් මැරූ කල ඔව්හු උන්වහන්සේ ගැන විචාළෝය.
ඔව්හු හැරී අප්‍රමාදව දෙවියන්වහන්සේ සෙවුවෝය.
35 දෙවියන්වහන්සේ තමුන්ගේ පර්වතය බවත්
මහෝත්තම දෙවියන්වහන්සේ තමුන්ගේ මිදුම්කාරයාණන් බවත් ඔව්හු සිහිකළෝය.
36 නුමුත් ඔව්හු කටින් උන්වහන්සේට වාටුකළෝය,
දිවෙන් උන්වහන්සේට බොරු කීවෝය.
37 මක්නිසාද ඔවුන්ගේ සිත් උන්වහන්සේ කෙරෙහි ස්ථිර නොවීය,
උන්වහන්සේගේ ගිවිසුමට ඔව්හු විශ්වාසව නොසිටියෝය.
38 නුමුත් අනුකම්පාවෙන් යුක්තවූ උන්වහන්සේ ඔවුන්ගේ අයුතුකම කමා කළසේක, ඔවුන් විනාශ නොකළසේක.
එසේය, උන්වහන්සේ නොයෙක්විට තමන්ගේ කෝපය ඉවත හරවා,
තමන්ගේ මුළු උදහස ඇවිස්සෙන්ට නුදුන්සේක.
39 ඔවුන් මාංසයම බවත්
පහව යන්නාවූ නැවත නොඑන්නාවූ හුළඟක් බවත් සිහිකළසේක.
40 කී වරක් ඔව්හු වනයෙහිදී උන්වහන්සේට විරුද්ධව කැරළිගැසුවෝද,
කාන්තාරයේදී උන්වහන්සේට දුක් දුන්නෝද!
41 ඔව්හු නැවත හැරී දෙවියන්වහන්සේ පරීක්ෂාකළෝය,
ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේ උදහස්කළෝය.
42 ඔව්හු උන්වහන්සේගේ හස්තයවත්,
උන්වහන්සේ සතුරාගෙන් තමුන් මුදගත් දවසවත්,
43 මිසර දේශයේදී ස්වකීය හාස්කම් සහ ශෝවාන් කෙතේදී ආශ්චර්යයන් කළ හැටිවත් සිහි නොකළෝය.
44 බොන්ට බැරි ලෙස උන්වහන්සේ

ඔවුන්ගේ ගංගාද
දිය පාරවල්ද ලේ කළසේක.
45 උන්වහන්සේ ඔවුන් අතරට නාස්ති
කරන මැසි රංචුද
විනාශකරන මැඩියන්ද යැවූසේක.
46 ඔවුන්ගේ භෝග දළඹුවන්ටත්
ඔවුන්ගේ ගොවිතැන් පළඟැටියන්ටත්
දුන්සේක.
47 ඔවුන්ගේ මිදිවැල් ගල් වැස්සෙන්ද
අත්තික්කා ගස් තුෂාරයෙන්ද විනාශ
කළසේක.
48 උන්වහන්සේ ඔවුන්ගේ ගවයන් ගල්
වැස්සටත්
සිව්පා රැළවල් හෙණගින්නටත්
පාවාදුන්සේක.
49 උන්වහන්සේ විපත්ති දයක දූත
සමූහයක් වන
දැඩි රෝෂය සහ උදහසත්
කෝපය සහ දුකත් ඔවුන් පිට
හෙළූසේක.
50 උන්වහන්සේ ස්වකීය කෝපයට
මාවතක් සෑදූසේක;
ඔවුන්ගේ ප්‍රාණය මරණයෙන්
නොවලක්වා,
ඔවුන්ගේ ජීවිතය වසංගතයට භාර
කළසේක;
51 හාම්ගේ කුඩාරම්වල සිටි ඔවුන්ගේ
ශක්තියේ ප්‍රථමඵලවූ
මිසරයේ සියලු කුලුඳුලන්ට
පහරදුන්සේක.
52 නුමුත් උන්වහන්සේ ස්වකීය සෙනඟ
බැටළුවන් මෙන් පිටතට ගෙනගොස්,
බැටළු රැළක් මෙන් වනාන්තරයේදී
ඔවුන්ට මගපෙන්වූසේක.
53 උන්වහන්සේ ඔවුන් සුරැකිකොට
ගෙන ගිය බැවින් ඔව්හු
භයනුවූවෝය.
නුමුත් මුහුද ඔවුන්ගේ සතුරන් වසා
ගත්තේය.
54 උන්වහන්සේ ස්වකීය ශුද්ධස්ථානයේ
සීමාවට
එනම් තමන් දකුණතින් ගත් මේ
කන්දට ඔවුන් ගෙනාසේක.
55 ඔවුන් ඉදිරියෙන් ජාතීන් එළවා,
ලනුවෙන් ඔවුන්ට උරුමයක් බෙදදී,
ඔවුන්ගේ කුඩාරම්වල ඉශ්‍රායෙල්
ගෝත්‍රයන් වාසයකෙරෙවූසේක.
එසේවී නුමුත් ඔව්හු 56
මහෝත්තමයාණන්වූ
දෙවියන්වහන්සේ
පරීක්ෂා කරමින්, උන්වහන්සේට
විරුද්ධව කැරළිගැසුවෝය,
උන්වහන්සේගේ ශික්ෂා රක්ෂා
නොකළෝය.
තමුන්ගේ පියවරුන් මෙන් ඔව්හු ආපසු 57
හැරී ද්‍රෝහි ලෙස ක්‍රියාකළෝය.
හොර දුන්නක් මෙන් වැරදි අතට
හැරුණෝය.
මක්නිසාද ඔව්හු තමුන්ගේ උස් 58
තැන්වලින් උන්වහන්සේ කෝපයට
පැමිණෙවූවෝය,
තමුන්ගේ කැපූ රූපවලින්
උන්වහන්සේගේ ජ්වලිතය
ඇවිස්සුවෝය.
දෙවියන්වහන්සේ මේ අසා 59
උදහස්වූසේක,
ඉශ්‍රායෙල් ඉතා පිළිකුල්කළසේක.
මෙසේ උන්වහන්සේ මනුෂ්‍යයන් අතරේ 60
තමන් පිහිටෙවූ කුඩාරම වන
ෂීලෝහි මණ්ඩපය අත්හැරදමා,
ස්වකීය ශක්තිය වහල්කමටත් 61
ස්වකීය මහිමය එදිරිකාරයාගේ
අතටත් පාවාදුන්සේක.
ස්වකීය සෙනඟ කඩුවට භාරදුන්සේක; 62
ස්වකීය උරුමයට උදහස්වූසේක.
ගින්න ඔවුන්ගේ තරුණයන් නාස්ති 63
කෙළේය;
ඔවුන්ගේ තරුණියන්ට විවාහ ගීයක්
නොවීය.
ඔවුන්ගේ පූජකයෝ කඩුවෙන් 64
වැටුණෝය;
ඔවුන්ගේ වැන්දඹුවෝ
නොවැලපුණෝය.
එවිට ස්වාමීන්වහන්සේ නින්දෙන් 65
පිබිදි අයෙකු මෙන්ද
මුද්‍රික පානය බී ඝෝෂාකරන
බලවන්තයෙකු මෙන්ද පිබිදිසේක.
උන්වහන්සේ තමන්ගේ එදිරිකාරයන්ට 66

ගසා ආපදසු එළවා,
ඔවුන් නිරන්තර නින්දාවකට
පත්කළසේක.
67 උන්වහන්සේ යෝසෙප්ගේ කූඩාරම
එපාකළසේක,
එප්‍රායිම් ගෝත්‍රය තෝරා
නොගත්සේක;
68 නුමුත් යූදා ගෝත්‍රය, තමන් ප්‍රේමකළ
සියොන් කන්ද, තෝරාගත්සේක.
69 උන්වහන්සේ උස්වූ ස්ථාන මෙන්ද
සදාකාලේට තමන් පිහිටෙවූ
පොළොව මෙන්ද
ස්වකීය ශුද්ධස්ථානය ගොඩනැගුසේක.
70 උන්වහන්සේ ස්වකීය මෙහෙකරුවූ
දාවිත් තෝරාගෙන,
බැටළු ගාල්වලින් ඔහු ගත්සේක.
71 උන්වහන්සේ තමන්ගේ සෙනඟවූ
යාකොබ් සහ ස්වකීය උරුමයවූ
ඉශ්‍රායෙල් පෝෂණයකරන පිණිස
කිරි දෙන බැටළු දෙනුන් අනුවයාමෙන්
ඔහු ගත්සේක.
72 මෙසේ ඔහු තමාගේ සිතේ සත්‍යතාවෙන්
ඔවුන් පෝෂණයකෙළේය;
තමාගේ අත්වල සමර්ථකමෙන් ඔවුන්ට
මගපෙන්වීය.

## යෙරුසලම් විනාශය ගැන විලාපය

**79** ආසාප්ගේ ගීතයකි.

1 දෙවියන්වහන්ස, අන්‍ය ජාතීහු ඔබගේ
උරුමයට ඇතුල්වූවෝය;
ඔව්හු ඔබගේ ශුද්ධ මාලිගාව අපවිත්‍ර
කළෝය;
යෙරුසලම ජරාවාස ගොඩවල්
කළෝය.
2 ඔබගේ මෙහෙකරුවන්ගේ මළකඳන්
ඔව්හු ආකාශ පක්ෂීන්ටද
ඔබගේ ශුද්ධවන්තයන්ගේ මාංස
පොළෝතලයේ සතුන්ටද
ගොදුරුකොට දුන්නෝය.
3 ඔවුන්ගේ ලේ යෙරුසලම හාත්පස
ජලය මෙන් වැගිරෙවූවෝය;
ඔවුන් වළලන්ට කිසිවෙක් නොවීය.
4 අපි අපේ අසල්වාසීන්ට නින්දා
භූමියක්ද
අප අවට සිටින්නන්ට හෙළාදැක්මට
හා අපහාසයට කරුණක්ද වී
සිටිමුව.
5 ස්වාමිනි, කොපමණ කල් ඔබ
නිරන්තරයෙන් උදහස්ව
සිටිනසේක්ද?
ඔබගේ ජ්වලිතය ගින්න මෙන්
දැවෙන්නේද?
6 ඔබ නාඳුනන අන්‍ය ජාතීන් පිටද
ඔබගේ නාමයෙන් යාච්ඤා නොකරන
රාජ්‍යයන් පිටද ඔබගේ උදහස
වැගිරෙවූව මැනව.
7 මක්නිසාද ඔව්හු යාකොබ්
නාස්තිකොට
ඔහුගේ වාසස්ථාන පාළුකළෝය.
8 අපේ පියවරුන්ගේ අයුතුකම් අපට
විරුද්ධව සිහි නොකළ මැනව.
අප බොහෝසෙයින් පහත වැටී සිටින
බැවින්,
ඔබගේ මෘදුවූ දයාව වහාම *අප
කෙරෙහි පැමිණේවා.
9 අපේ ගැළවීමේ දෙවියන්වහන්ස,
ඔබගේ නාමයේ ගෞරවය සඳහා
අපට පිහිටවූව මැනව.
ඔබගේ නාමය උදෙසා අප නිදහස්
කොට අපේ පව් පහකරදුමුව
මැනව.
10 මොවුන්ගේ දෙවියෝ කොතැනදැයි
අන්‍ය ජාතීහු කුමට කියත්ද?
ඔබගේ මෙහෙකරුවන්ගේ වගුළ ලේ
ගැන පළිගන්න බව
අන්‍ය ජාතීන් අතරේ අපේ ඇස් හමුයෙහි
ප්‍රකාශවේවා.
11 හිරකාරයාගේ සුසුම්ලීම ඔබ ඉදිරියට
පැමිණේවා;
මරණයට කැපවූවන් ඔබගේ බලයේ
උතුම්කම ලෙස රක්ෂාකළ මැනව.
12 ස්වාමිනි, අපේ අසල්වාසීන් විසින්
ඔබට කළ නින්දාව

*නොහොත්, අප පෙරටුව යේවා.

ඔවුන්ගේ ළයට සත් ගුණයක් කොට
හරවාදුන මැනව.
13 එවිට ඔබගේ සෙනඟද ඔබ පාලනය
කරන බැටළුවෝද වූ අපි
සදකල්ම ඔබට ස්තුතිකරන්නෙමුව;
සියලු පරම්පරාවලට ඔබගේ ප්‍රශංසාව
ප්‍රකාශකරන්නෙමුව.

## ඉශ්‍රායෙල් නමැති බැටළු රැළ සහ මිදිවැල

# 80

නායක වාද්‍යකරුටයි;
ෂෝෂන්නීම් ඒදූත්
යන තූර්යය ඇතුව
ගායනාකිරීමටයි.
ආසාප්ගේ ගීතයකි.

1 බැටළු රැළක් මෙන් යෝසෙප් ගෙන
යන්නාවූ,
ඉශ්‍රායෙල්ගේ එඬේරාණෙනි, කන්දුන
මැනව;
කෙරුබිම් පිට වැඩහිඳින තැනන්වහන්ස,
බැබළුව මැනව.
2 එප්‍රායිම්ද බෙන්යමින්ද මනස්සේද
ඉදිරියෙහි ඔබගේ බලය පාමින්,
අප ගළවන පිණිස වැඩිය මැනව.
3 දෙවියන්වහන්ස, අප නැවත හැරෙවුව
මැනව;
ඔබගේ මුහුණ බැබළෙවුව මැනව,
එවිට අපි ගැළවෙන්නෙමුව.
4 සේනාවල දෙවිවූ ස්වාමීන්වහන්ස,
ඔබගේ සෙනඟගේ යාච්ඤාවට විරුද්ධව
කෝපමණ කල් උදහස්ව
සිටිනසේක්ද?
5 ඔබ කඳුළු නමැති කෑම ඔවුන්ට
කැවූසේක,
බොහෝකොට කඳුළු පෙවූසේක.
6 අපේ අසල්වාසීන්ට අප ඩබරයට
හේතුවක් වෙන්ට ඔබ
සලස්වනසේක;
අපේ සතුරෝ ඔවුනොවුන් අතරේ
සිනාසෙති.
7 සේනාවල දෙවියන්වහන්ස, අප නැවත
හැරෙවුව මැනව;
ඔබගේ මුහුණ බැබළෙවුව මැනව,
එවිට අපි ගැළවෙන්නෙමුව.

ඔබ මිසරයෙන් මිදිවැලක් ගෙනාසේක. 8
ඔබ ජාතීන් එළවා එය
රෝපණයකළසේක.
ඔබ ඊට ඉඩමක් එළිකළසේක, 9
එය ගැඹුරට මුල් ඇද්දේය, එයින් දේශය
පිරුණේය.
ඒකේ සෙවණෙන් කඳු වැසුණේය, 10
ඒකේ අතු දෙවියන්වහන්සේගේ කිහිරි
ගස් මෙන් විය.
ඒකේ අතු මුහුද දක්වාත් 11
ඒකේ රිකිළි ප්‍රාත් ගංගාව දක්වාත්
විහිද ගියේය.
මග යන සියල්ලන් විසින් එයින් 12
නෙළාගන්නා ලෙස
ඔබ ඒකේ වැටවල් කුමට
බිඳදැමූසේක්ද?
වල් ඌරා එය විනාශකරයි, 13
කෙත්හි වල් සත්තු එය කති.
සේනාවල දෙවියන්වහන්ස, හැරී 14
අව මැනව,
ස්වර්ගයේ සිට ඇස් යොමා මේ මිදි
වැලද
ඔබගේ දකුණතින් රෝපණයකළ 15
මුල හා
ඔබටම සවිකරගත් අත්තද විමසා
බැලුව මැනව.
එය ගින්නෙන් දවනලද්දේය, කපා 16
දමනලද්දේය.
ඔව්හු ඔබගේ මුහුණේ තර්ජනයෙන්
විනාශවෙති.
ඔබගේ හස්තය ස්වකීය දකුණතේ 17
මනුෂ්‍යයා කෙරෙහි,
එනම් ඔබටම ඔබ ශක්තිමත්කළ
මනුෂ්‍ය පුත්‍රයා කෙරෙහි, වේවා.
එවිට අපි ඔබ කෙරෙන් ආපසු 18
නොයන්නෙමුව.
අප ජීවත්කළ මැනව, අපිද ඔබගේ
නාමයෙන් යාච්ඤාකරන්නෙමුව.
සේනාවල දෙවිවූ ස්වාමීන්වහන්ස, 19
නැවත හැරෙවුව මැනව;
ඔබගේ මුහුණ බැබළෙවුව මැනව,
එවිට අපි ගැළවෙන්නෙමුව.

## මංගල්‍ය පැවැත්වීමට ආරාධනාවක්

81 නායක වාද්‍යකරුටයි; ගිත්තීත් යන තූර්යය ඇතුව ගායනා කිරීමටයි. ආසාප්ගේ ගීතයකි.

1 අපේ ශක්තියවූ දෙවියන්වහන්සේට
උස්වූ ශබ්ද නගා ගී කියව්.
යාකොබ්ගේ දෙවියන්වහන්සේට ප්‍රීති
නාද පවත්වව්.
2 ගීතිකා පටන්ගෙන, රබානත්
මිහිරි වීණාව සහ කුඩා වීණාවත්
ගෙනෙව්.
3 අමාවක දවසේදීද පූරා හඳ දවසේදීද
අපේ මහා මංගල්‍ය දවසේදීද
හොරණෑව පිඹිව්.
4 මක්නිසාද එය ඉශ්‍රායෙල්ට
නියෝගයක්ය,
යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ
පනතක්ය.
5 මා විසින් නොදත් භාෂාවක් ඇසුවාවූ
මිසර දේශයෙහි උන්වහන්සේ ගිය කල,
මෙය යෝසෙප්ට සාක්ෂියක් කොට
නියමකළසේක.
6 ඔහුගේ කර බරෙන් නිදහස්කෙළෙමි.
කුඩා ඇදීමෙන් ඔහුගේ අත් මිදුණේය.
7 විපතේදී තෝ අඬගැසුවෙහිය, මම තා
මිදූවෙමි;
ගර්ජනාවේ රහස් තැනදී තට උත්තර
දුනිමි;
මෙරීබාහි වතුර ළඟදී තා පරීක්ෂා
කෙළෙමි.
8 මාගේ සෙනඟෙනි, අසව්, මම තොපට
සාක්ෂිදෙන්නෙමි;
අහෝ, ඉශ්‍රායෙල්, මට ඇහුම්කන්
දෙන්නෙහි නම් යහපත!
9 තා වෙත අන් දෙවියෙක් නොවේවා;
විදේශී දෙවියෙකුටද නමස්කාර
නොකරව.
10 මිසර දේශයෙන් තා පිටතට ගෙනාවාවූ
තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මමය.
තාගේ කට හොඳටම හරුව, මමද
එය පුරවන්නෙමි.
11 එහෙත් මාගේ සෙනඟ මාගේ ශබ්දය
නොඇසූය;
ඉශ්‍රායෙල්ද මට කිසි සැලකිල්ලක්
නොකළෝය.
එහෙයින් ඔවුන් තමුන්ගේ මන්ත්‍රණවල 12
හැසිරෙන ලෙස
ඔවුන්ගේ සිත් දඩිකමෙහි ඔවුන්
අත්හැරියෙමි.
අහෝ මාගේ සෙනඟ මට කන් 13
දුන්නොත්
ඉශ්‍රායෙල් මාගේ මාර්ගවල
හැසුරුණොත්, යහපත!
එවිට මම ඉක්මනින් ඔවුන්ගේ 14
සතුරන් දමනයකරන්නෙමි,
ඔවුන්ගේ එදිරිකාරයන්ට විරුද්ධව
මාගේ අත හරවන්නෙමි.
ස්වාමීන්ට වෛරවන්නෝ 15
උන්වහන්සේට යටත්වන්නෝය.
නුමුත් මොවුන්ගේ කාලය සදාකල්
පවත්නේය.
උන්වහන්සේ ඉතා හොඳ ගෝධුමයෙන් 16
ඔවුන් පෝෂණයකරනසේක.
පර්වතයෙන් ගත් මීපැණියෙන් මම තා
තෘප්තියට පමුණුවන්නෙමි.

## අධර්මිෂ්ඨ විනිශ්චයකාරයන්ට තරවටුවක්

ආසාප්ගේ ගීතයකි. 82

දෙවියන්වහන්සේ දේව සභාවෙහි 1
නැගිට සිටිනසේක;
උන්වහන්සේ දෙවිවරුන් අතරේ
විනිශ්චයකරනසේක.
තෙපි කොතෙක් කල් අසාධාරණ ලෙස 2
විනිශ්චයකරමින්
දුෂ්ටයන්ගේ තරාතිරම් සලකන්නහුද?
දුප්පතා සහ පියා නැත්තාද 3
විනිශ්චයකරව්.
පීඩිතයාටත් අසරණයාටත් යුක්තිය
ඉෂ්ටකරව්.
දුප්පතා හා දිළිඳු මුදහරිව්. 4
දුෂ්ටයාගේ අතින් ඔවුන්
නිදහස්කරව්.
ඔව්හු නොදනිති, තේරුම්ද නොගනිති; 5
අන්ධකාරයෙහි ඔබ මොබ හැසිරෙති.
පොළොවේ අත්තිවාරම් සියල්ල

සෙලවේ.
6 තෙපි දෙවිවරුය,
තෙපි සියල්ලෝම මහෝත්තමයාණන්ගේ පුත්‍රයෝයයි කීයෙමි.
7 එහෙත් තෙපි මනුෂ්‍යයන් මෙන් මැරෙන්නහුය,
අධිපතීන්ගෙන් එක්කෙනෙකු මෙන් වැටෙන්නහුය.
8 දෙවියන්වහන්ස, නැගිට පොළොව විනිශ්චයකළ මැනව.
මක්නිසාද ඔබ සියලු ජාතීන් හිමිකර ගන්නාසේක.

## බලවත් වටලෑමකින් මිදීම පිණිස යාච්ඤාව

**83** ආසාප්ගේ කාව්‍ය ගීතයකි.

1 දෙවියන්වහන්ස, නිශ්ශබ්දනුව මැනව;
දෙවියන්වහන්ස, කථා නොකර නොසිටිය මැනව, නිශ්චලනුව මැනව.
2 මක්නිසාද ඔබගේ සතුරෝ කෝලාහලකෙරෙති.
ඔබට වෛරවන්නෝ හිස එසෙවූවෝය.
3 ඔව්හු ඔබගේ සෙනඟට විරුද්ධව ප්‍රයෝග උපා යොදති,
ඔබගේ සඟවනලද්දවුන්ට විරුද්ධව මන්ත්‍රණයකෙරෙති,
4 ඔව්හු කථාකොට: වරෙව්, ඉශ්‍රායෙල් යන නම මතු සිහි නොවන පිණිස,
ජාතියක් නොවන ලෙස ඔවුන් සිඳ දමමුයයි කියති.
5 ඔව්හු එක අදහසින් එක්ව මන්ත්‍රණය කළෝය;
ඔබට විරුද්ධව ඔව්හු ගිවිසුමක් කෙරෙති.
6 ඔව්හු එනාහි ඒදෙමේ කූඩාරම් වැසියන් සහ ඉෂ්මායෙලිතයෝය;
මෝවබ් සමග හගරීනයෝය;
7 ගෙබාල්, අම්මොන් සහ අමලෙක්ය;
තීර් වැසියන් සමග පිලිස්තියෝය.
8 අෂූර්ද ඔවුන්ට එකතුවූවෝය;
ඔව්හු ලොත්ගේ පුත්‍රයන්ට උපකාර කළෝය.
9 මිදියන්ටත් කීෂොන් ගඟ ළඟදී
සීසෙරාටත් යාබින්ටත් කළ ලෙස මොවුන්ට කළ මැනව.
ඔව්හු එන්දෝර්හි විනාශවී, 10
බිමට පොර මෙන් වූවෝය.
ඔවුන්ගේ උත්තමයන් ඔරෙබ් සහ ශීබ් මෙන්ද 11
ඔවුන්ගේ අධිපතීන් සියල්ලන් සෙබා සහ ශල්මුන්නා මෙන්ද කළමැනව.
දෙවියන්වහන්සේගේ වාසස්ථාන 12
හිමිකරගනිමුයයි ඔව්හු කීවෝය.
මාගේ දෙවියන්වහන්ස, ඔවුන් 13
කරකැවෙන ධූලි මෙන්ද
සුළඟින් විසිරයන ඉපනැලි මෙන්ද කළ මැනව.
වනය පුළුස්සන ගිනි යම්සේද, 14
කඳු දල්වන ගිනිදැල යම්සේද,
එසේම ඔබගේ කුණාටුවෙන් ඔවුන් 15
ලුහුබඳවා,
ඔබගේ සැර සුළඟෙන් ඔවුන් භය ගැන්නුව මැනව.
ස්වාමිනි, ඔබගේ නාමය සොයන 16
පිණිස
ඔවුන්ගේ මුහුණ වියවුලෙන් පිරෙවුව මැනව.
යෙහෝවා නම්වූ ඔබ පමණක් මුළු 17
පොළොවට මහෝත්තමයාණන්
බව ඔවුන් දැනගන්නා පිණිස,
ඔව්හු සදකල් ලජ්ජාවී තැතිගනිත්වා; 18
එසේය, වියවුල්වී විනාශවෙත්වා.

## දේව ගෘහය ගැන තද ආශාව

**84** නායක වාද්‍යකරුටයි; ගිත්තීත් යන තූර්යය ඇතුව ගායනාකිරීමටයි. කෝරාගේ පුත්‍රයන්ගේ ගීතයකි.

සේනාවල ස්වාමීන්වහන්ස, ඔබගේ 1
මණ්ඩප කොපමණ පියකරුද!
ස්වාමීන්ගේ මන්දිර උදෙසා මාගේ 2
ආත්මය මහත් ආශාවෙන් යුක්තව වැරීයයි;
මාගේ සිතත් මාගේ මාංසයත් ජීවමාන දෙවියන්වහන්සේට මොරගසති.
එසේය, ගේකුරුල්ලියට ගෙයක්ද 3

වැහිලිහිණියට ඇගේ පැටවුන් තබන
පිණිස කැදැල්ලක් සම්බවිය.
එනම්, සේනාවල ස්වාමීනි, මාගේ
රජ්ජුරුවන්වහන්ස, මාගේ
දෙවියන්වහන්ස,
ඔබගේ පූජාසනමය.
4 ඔබගේ ගෘහයෙහි වසන්නෝ
ආශීර්වාදලත්තෝය.
ඔව්හු නිරතුරුම ඔබට
ප්‍රශංසාකරන්නෝය.
5 තමාගේ ශක්තිය ඔබ තුළෙහි ඇත්තාවූ,
සියොන්ට යන මාවත් තමාගේ සිතෙහි
ඇත්තාවූ මනුෂ්‍යයා
ආශීර්වාදලද්දේය.
6 ඔව්හු වැලපීමේ මිටියාවත මැදින්
යමින් එය උල්පත් ඇති ඉඩමක්
කරගනිති;
එසේය, ප්‍රථම වර්ෂාව එය
ආශීර්වාදවලින් වසයි.
7 ඔව්හු බලයෙන් බලයට යෙති,
දෙවියන්වහන්සේ ඉදිරියෙහි
සියොන්හිදී එකිනෙකා පෙනී සිටිති.
8 සේනාවල දෙවිවූ ස්වාමීන්වහන්ස,
මාගේ යාච්ඤාව ඇසුව මැනව.
යාකොබ්ගේ දෙවියන්වහන්ස, කන්
දුන මැනව.
9 අපේ පලිහවූ දෙවියන්වහන්ස, බැලුව
මැනව,
ඔබගේ අභිෂේකලත් තැනැත්තාගේ
මුහුණ බැලුව මැනව.
10 මක්නිසාද ඔබගේ මණ්ඩපවල එක
දවසක් දවස් දහසකට වඩා යහපත.
දුෂ්ටකමේ කූඩාරම්වල විසීමට වඩා
මාගේ දෙවියන්වහන්සේගේ ගෘහයෙහි
දොරටුපාලයෙක්ව ඉන්ට කැමැත්තෙමි.
11 මක්නිසාද දෙවිවූ ස්වාමීන්වහන්සේ
සූර්යයෙක්ය, පලිහක්ය.
ස්වාමීන්වහන්සේ අනුග්‍රහයත් මහිමයත්
දෙනසේක.
අවංකලෙස හැසිරෙන්නන්ගෙන් කිසි
යහපතක් නොවලක්වනසේක.
12 සේනාවල ස්වාමීනි,
ඔබ කෙරෙහි විශ්වාසයකරන
මනුෂ්‍යයා ආශීර්වාදලද්දේය.

## කරුණාව නැවත ලබාගැනීමට යාච්ඤාව

## 85

නායක වාද්‍යකරුටයි.
කෝරාගේ පුත්‍රයන්ගේ
ගීතයකි.
ස්වාමීනි, ඔබගේ දේශයට ඔබ 1
කරුණාකළසේක.
යාකොබ් වහල්කමින් මුදා ගෙනාසේක.
ඔබගේ සෙනඟගේ අයුතුකම කමා 2
කළසේක,
ඔවුන්ගේ පව් සියල්ල වැසූසේක.
ඔබගේ මුළු උදහස පහකරදැමූසේක. 3
ස්වකීය තද කෝපයෙන් හැරුණුසේක.
අපේ ගැළවීමේ දෙවියන්වහන්ස, 4
අප හැරෙවුව මැනව,
අප කෙරෙහි වූ ඔබගේ කෝපය
නැවැත්වුව මැනව.
ඔබ අප සමග සදාකල්ම 5
උදහස්වනසේක්ද?
සියලු පරම්පරාවලට ඔබගේ උදහස
පවත්වනසේක්ද?
ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිමත් 6
වන පිණිස
අප නැවත ජීවත් නොකරනසේක්ද?
ස්වාමීනි, ඔබගේ කරුණාව අපට 7
දක්වුව මැනව,
ඔබගේ ගැළවීම අපට දුන මැනව.
දෙවිවූ ස්වාමීන්වහන්සේ කුමක් 8
කියනසේක්දැයි අසන්නෙමි.
මක්නිසාද උන්වහන්සේ ස්වකීය
සෙනඟටත් ශුද්ධවන්තයන්ටත්
සමාදානය වදරනසේක.
නුමුත් ඔව්හු අඥානකමට නැවත
නොහැරෙත්වා.
තේජස අපේ දේශයේ වසන පිණිස 9
සැබවින්ම උන්වහන්සේගේ ගැළවීම
උන්වහන්සේට භයවෙන්නන්
සමීපයෙහිය.
කරුණාවත් සැබෑකමත් සම්මුඛවූය; 10
ධර්මිෂ්ඨකමත් සමාදානයත් ඔවුනොවුන්
සිපගත්තුය.
සැබෑකම පොළොවෙන් හටගනී; 11
ධර්මිෂ්ඨකමද ස්වර්ගයේ සිට බැලුවේය.
එසේය, ස්වාමීන්වහන්සේ යහපත් දේ 12
දෙනසේක;
අපේ දේශයද එහි ඵල දෙන්නේය.
ධර්මිෂ්ඨකම උන්වහන්සේට පෙරටුව 13

යමින්
උත්වහන්සේගේ පා සලකුණු
මාර්ගයක් වන්ට සලස්වන්නේය.

## දුකට පත්ව සිටින විශ්වාස මෙහෙකරුවාගේ යාච්ඤාව

**86** දාවිත්ගේ යාච්ඤාවකි.

1 ස්වාමිනි, ඔබගේ කන නමා මට
උත්තරදුන මැනව;
මක්නිසාද මම දුප්පත්මි, දිළින්දෙමි.
2 මාගේ ප්‍රාණය රක්ෂාකළ මැනව;
මක්නිසාද මම භක්තිවන්තයෙමි.
මාගේ දෙවියන්වහන්ස, ඔබ කෙරෙහි
විශ්වාසකරන ඔබගේ මෙහෙකරුවා
ගැළෙවුව මැනව.
3 ස්වාමිනි, දවස මුළුල්ලේම ඔබට හඬා
සිටින බැවින්
මට කරුණාකළ මැනව.
4 ස්වාමිනි, ඔබ දෙසට මාගේ ආත්මය
ඔසවන බැවින්
ඔබගේ මෙහෙකරුවාගේ ආත්මය
ප්‍රීතිමත්කළ මැනව.
5 මක්නිසාද ස්වාමිනි, ඔබ යහපත්ය,
කමාවෙන්ට සූදානම්සේක,
ඔබට යාච්ඤාකරන සියල්ලන්ට ඔබ
බොහෝ කරුණාවන්තය.
6 ස්වාමිනි, මාගේ යාච්ඤාවට කන්දුන
මැනව;
මාගේ කන්නලව් ශබ්දය ඇසුව
මැනව.
7 මාගේ විපත්ති දවසේදී ඔබට යාච්ඤා
කරන්නෙමි;
මක්නිසාද ඔබ මට උත්තරදෙනසේක.
8 ස්වාමිනි, දෙවිවරුන් අතරේ ඔබට
සමාන කිසිවෙක් නැත;
ඔබගේ ක්‍රියාවන්ට සමානවූ ක්‍රියාද
නැත.
9 ස්වාමිනි, ඔබ මැවූ සියලු ජාතීහු ඔබ
ඉදිරියට ඇවිත් නමස්කාරකරමින්,
ඔබගේ නාමයට ගෞරවකරන්නෝය.
10 මක්නිසාද ඔබ උතුම්ය, ආශ්චර්ය
ක්‍රියා කරනසේක.
ඔබ පමණක් දෙවියන්වහන්සේය.
11 ස්වාමිනි, ඔබගේ මාර්ගය මට
ඉගැන්නුව මැනව; ඔබගේ
සැබෑකමෙහි හැසිරෙන්නෙමි.
ඔබගේ නාමයට භයවෙන පිණිස
මාගේ සිත එකඟකළ මැනව.
මාගේ දෙවිවූ ස්වාමිනි, මාගේ මුළු 12
සිතින් ඔබට ප්‍රශංසාකරන්නෙමි;
සදකල් ඔබගේ නාමයට ගෞරව
කරන්නෙමි.
මක්නිසාද මා කෙරෙහි ඔබගේ 13
කරුණාව මහත්ය;
*ඉතා ගැඹුරු වළෙන් ඔබ මාගේ
ප්‍රාණය මුදාගත්සේක.
දෙවියන්වහන්ස, උදරම්කාරයෝ 14
මට විරුද්ධව නැගිට සිටිති,
බාලාත්කාරකරන්නන්ගේ සභාව
මාගේ ප්‍රාණය සෙවීය,
ඔවුන් තමුන් ඉදිරියෙහි ඔබ තබාගන
නැත.
එහෙත් ස්වාමිනි, ඔබ අනුකම්පාවෙන්ද 15
කරුණාවෙන්ද පූර්ණවූ,
කෝපවීමට ප්‍රමාදවන්නාවූ, දයාවෙන්
හා සත්‍යයෙන් මහත්වූ
දෙවිකෙනෙක්ය,
මා දෙසට හැරී මට කරුණාකළ 16
මැනව;
ඔබගේ මෙහෙකරුවාට ඔබගේ
ශක්තිය දී,
ඔබගේ මෙහෙකාරීගේ පුත්‍රයා ගැළෙවුව
මැනව.
ස්වාමිනි, ඔබ මට උපකාරකොට 17
සැනසූ බැවින්,
මට වෛරවෙන්නන් විසින් දැක
ලජ්ජාවන පිණිස,
මා සඳහා ශුද්ධ නිමිත්තක් පෙන්නුව
මැනව.

## සියොනේ තේජස

කෝරාගේ පුත්‍රයන්ගේ **87**
කාව්‍ය ගීතයකි.

උත්වහන්සේගේ [නුවර] අත්තිවාරම 1
ශුද්ධ කඳුවලය.
ස්වාමීන්වහන්සේ යාකොබ්ගේ 2
වාසස්ථාන සියල්ලට වඩා
සියොන් දොරටුවලට ප්‍රේමවනසේක.
එම්බා දෙවියන්වහන්සේගේ නුවර, 3
තී ගැන කීර්තිමත් දේ කියා තිබේ.
මා අඳුනන්නන් අතරෙහි මෙන් 4
†රාහබ් සහ බබිලෝනිය ගැන
සඳහන්කරන්නෙමි.

*හෙවත්, පහත ෂෙයෝලෙන්.
†එනම්, මිසරය.

පිලිස්තියා සහ තීර්ද *කූෂ් රටද
බලව;
මේ තෙමේ එහි උපන්නේය.
5 එසේය, සියොන් ගැන: ඔහුද මොහුද
ඈ තුළ උපන්නේයයි කියනු
ලබන්නේය;
මහෝත්තමයාණෝම ඈ
ස්ථිරකරනසේක.
6 ස්වාමීන්වහන්සේ මනුෂ්‍ය වර්ගයන්ගේ
නම් ලියන කල:
මේ තෙමේ එහි උපන්නේයයි ගණන්
ගන්නාසේක.
7 ගී කියන්නෝද නටන්නෝද:
මාගේ උල්පත් සියල්ල තී
තුළෙහියයි කියන්නෝය.

## දුඃඛිතයාගේ මොරගැසීම

**88** නායක වාද්‍යකරුටයි; කෝරාගේ පුත්‍රයන්ගේ කාව්‍ය ගීතයකි; මහලත් ලෙයනොත් නම් තූර්යට එස්රාහිය හේමාන් විසින් ලියූ අනුශාසනාවකි.

1 මාගේ ගැළවීමේ දෙවිවූ ස්වාමිනි,
රෑ දවල් දෙක්හි ඔබ ඉදිරියේ
මොරගසා සිටියෙමි.
2 මාගේ යාච්ඤාව ඔබ ඉදිරියට
පැමිණේවා;
ඔබගේ කන මාගේ මොරගැසීමට
යොමුකළ මැනව.
3 මක්නිසාද මාගේ ආත්මය දුකින් පිරී
තිබේ,
මාගේ ප්‍රාණය †ෂෙයෝල්ට ළංවේ.
4 වළට බසින්නන් සමග ගණන්ගනු
ලබමි,
පිහිටක් නැති කෙනෙකු මෙන් වෙමි.
5 ඔබ විසින් තවත් සිහිනොකරන්නාවූ,
ඔබගේ අත කෙරෙන් පහව ගියාවූ,
මරනාලදුව මිනීවළේ නිදනවුන්
මෙන්,
මළවුන් අතරේ හරිනාලද්දෙමි.

*එතියෝපියාව.
†එනම්, පාතාලයට.

ඔබ ඉතා ගැඹුරු වළෙහි 6
අඳුරු තැන්වලත් ගැඹුරු තැන්වලත්
මා තැබූසේක.
ඔබගේ උදහස මා පිට බරවේ, 7
ඔබගේ සියලු රැළවලින් ඔබ මට පීඩා
කළසේක.
මා අඳුනන්නන් ඔබ මාගෙන් දුරු 8
කළසේක;
ඔවුන්ට මා පිළිකුලක් කළසේක.
හිරකරනලදුව පිටත එන්ට
නොහැක්කෙමි.
පීඩාව නිසා මාගේ ඇස ක්ෂයවේ. 9
ස්වාමිනි, දවස්පතා ඔබට යාච්ඤා
කෙළෙමි,
ඔබ දෙසට මාගේ අත් දිගුකළෙමි.
ඔබ මළවුන්ට ආශ්චර්යයන් 10
දක්වනසේක්ද?
මළාහු නැගිට ඔබට
ප්‍රශංසාකරන්නෝද?
ඔබගේ කරුණාගුණය මිනීවළේදීත් 11
ඔබගේ විශ්වාසකම
විනාශස්ථානයෙහිදීත් ප්‍රකාශකරනු
ලබන්නේද?
ඔබගේ ආශ්චර්යයෝ අඳුරේදීත් 12
ඔබගේ ධර්මිෂ්ඨකම මතක් නොවෙන
දේශයේදීත් දන්වනු ලබන්නේද?
එහෙත් ස්වාමිනි, මම ඔබට 13
මොරගැසීමි;
උදය මාගේ යාච්ඤාව ඔබ ඉදිරියට
පැමිණෙන්නේය.
ස්වාමිනි, කුමට මාගේ ආත්මය 14
ඉවතලනසේක්ද?
කුමට ඔබගේ මුහුණ මා කෙරෙන්
සඟවා ගන්නාසේක්ද?
බාල වයසේ පටන් මම පීඩිතව 15
මරණාසන්නවෙමි.
ඔබගෙන් පැමිණෙන භීති විඳින කල
විකලවෙමි.
ඔබගේ තද උදහස මා මතුයෙන් 16
ගියේය;
ඔබගෙන් පැමිණෙන භීති මා සිඳ
දැම්මේය.
ඒවා දවස මුළුල්ලේම ජලය මෙන් 17

මා වටකර ආයේය;
එකට රැස්ව මා වටකෙළේය.
18 ප්‍රේමකරන්නාත් මිත්‍රයාත් ඔබ මා කෙරෙන් දුරුකොට,
මා අඳුනන්නන් අඳුරෙහි හෙළුසේක.

## ගිවිසුමේ කරුණාවල් ගැන ප්‍රශංසා හා යාච්ඤාව

**89** එස්‍රාහිය ඒතාන්ගේ අනුශාසනාවකි.

1 ස්වාමීන්ගේ කරුණාවන් ගැන සදකල් ගීතිකාකරන්නෙමි,
මාගේ කටින් ඔබගේ විශ්වාසකම සියලු පරම්පරාවලට දන්වන්නෙමි.
2 මක්නිසාද: කරුණාව සදකාලේටම පිහිටුවනු ලබන්නේය,
ඔබගේ විශ්වාසකම ස්වර්ගයන්හිම ඔබ පිහිටුවනසේකැයි කීයෙමි.
3 තාගේ වංශය සදකල් ස්ථිරකරන්නෙමි,
තාගේ සිංහාසනය සියලු පරම්පරාවලට පිහිටුවන්නෙමියි කියා
4 මාගේ තෝරාගත් තැනැත්තා සමග ගිවිසුමක් කෙළෙමි,
මාගේ මෙහෙකරුවූ දාවිත්ට දිවුරුම් දුනිමි.
5 ස්වාමිනි, ස්වර්ගයෝ ඔබගේ ආශ්වර්යයන් වර්ණනාකරන්නෝය;
ශුද්ධවන්තයන්ගේ රැස්වීමේදී ඔබගේ විශ්වාසකම වර්ණනාකරනු ලබන්නේය.
6 මක්නිසාද ආකාශයෙහි කවරෙක් ස්වාමීන්ට සමානකළ හැකිද?
බලවතුන්ගේ පුත්‍රයන්ගෙන් කවරෙක් ස්වාමීන්ට සමානවන්නේද?
7 උන්වහන්සේ වනාහි ශුද්ධවන්තයන්ගේ සභාවේදී ඉතා භයානකවූ,
තමන් අවට සිටින සියල්ලන්ට වඩා භයවිය යුතුවූ දෙවිකෙනෙක්ය.
8 සේනාවන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්ස, යාඃ නම්වූ ඔබ හා සමාන බලසම්පන්න කෙනෙක් කවරේද?
ඔබගේ විශ්වාසකම ඔබ හාත්පසය.
9 ඔබ මුහුදේ උඩඟුකම දමනයකරනසේක.
එහි රැළ නගින කල ඒවා නිශ්චල කරනසේක.
*රාහබ් මරනු ලැබූ කෙනෙකු මෙන් කැබලිකොට බින්දසේක; 10
ඔබගේ බලය නමැති බාහුවෙන් ඔබගේ සතුරන් පළවා හැරියසේක.
ස්වර්ගයෝ ඔබගේය, පොළොවත් ඔබගේය. 11
ලෝකයද එහි පූර්ණකමද ඔබ පිහිටෙවූසේක.
උතුරත් දකුණත් මැවූවේ ඔබය. 12
තාබෝර් සහ හෙර්මොන් ඔබගේ නාමය කෙරෙහි ප්‍රීතිවෙති.
ඔබට බලවත් බාහුවක් ඇත්තේය. 13
ඔබගේ අත ශක්තිමත්ය, දකුණත උසස්ය.
ධර්මිෂ්ඨකමත් යුක්තියත් ඔබගේ සිංහාසනයේ අත්තිවාරමය. 14
කරුණාවත් සැබෑකමත් ඔබට පෙරටුව යති.
ප්‍රීතිමත් හඬ දන්නාවූ සෙනඟ ආශීර්වාදලද්දෝය. 15
ස්වාමිනි, ඔව්හු ඔබගේ මුහුණේ එළියෙහි හැසිරෙති.
ඔව්හු දවස මුළුල්ලේම ඔබගේ නාමය ගැන ප්‍රීතිමත්වෙති. 16
ඔබගේ ධර්මිෂ්ඨකම කරණකොටගෙන උසස් භාවයට පැමිණෙති.
මක්නිසාද ඔවුන්ගේ ශක්තියේ අලංකාරය නම් ඔබය. 17
ඔබගේ කරුණාවෙන් අපේ අඟ උසස් වන්නේය.
මක්නිසාද අපේ පලිහ ස්වාමීන්ටත් 18
අපේ රජ්ජුරුවන් ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේටත් අයිතිය.
ඔබගේ ශුද්ධවන්තයන්ට ඔබ දර්ශනයකින් කථාකොට: 19
උපකාරකිරීමේ භාරය බලවන්තයෙකුට පැවරුවෙමි;
සෙනඟ අතරෙන් තෝරාගත් කෙනෙකු උසස්කෙළෙමි.
මාගේ මෙහෙකරුවූ දාවිත් සොයාගෙන, 20
මාගේ ශුද්ධ තෛලයෙන් ඔහු ආලේප කෙළෙමි.
මාගේ හස්තය ඔහු සමග ස්ථිරවන්නේය; 21
මාගේ බාහුවද ඔහු ශක්තිමත්

*එනම්, මිසර දේශය.

කරන්නේය.
22 සතුරා ඔහුට පීඩා නොකරන්නේය;
දුෂ්ටකමේ පුත්‍රයා ඔහුට හිංසා
නොකරන්නේය.
23 ඔහුගේ එදිරිකාරයන් ඔහු ඉදිරියෙහි
යටත්කරන්නෙමි,
ඔහුට වෛරවන්නන්ට පහරදෙන්නෙමි.
24 මාගේ විශ්වාසකමත් මාගේ
කරුණාවත් ඔහු සමග වන්නේය;
මාගේ නාමයෙන් ඔහුගේ අඟ උසස්
වන්නේය.
25 ඔහුගේ අත මුහුද පිටත්
ඔහුගේ දකුණු අත ගංගා පිටත්
තබන්නෙමි.
26 ඔහු මට මොරගසා: ඔබ මාගේ
පියාණෝය,
මාගේ දෙවියන්වහන්සේය, මාගේ
ගැළවීමේ පර්වතයයයි කියන්නේය.
27 මමද ඔහු මාගේ කුලුඳුලා කොටද
පොළොවේ රජුන්ට උත්තමයා කොටද
තබන්නෙමි.
28 මාගේ කරුණාව සදකල් ඔහු උදෙසා
පවත්වන්නෙමි,
මාගේ ගිවිසුම ඔහු සමග ස්ථිරව
පවතින්නේය.
29 ඔහුගේ වංශය සදකල්ද
ඔහුගේ සිංහාසනය ස්වර්ගයේ දවස්
මෙන්ද පවතින්ට සලස්වන්නෙමි.
30 ඔහුගේ දරුවෝ මාගේ ව්‍යවස්ථාව
අත්හැර,
මාගේ විනිශ්චයවල නොහැසිරෙත් නම්,
31 මාගේ පනත් කඩකොට,
මාගේ ආඥවත් රක්ෂා නොකෙරෙත්
නම්,
32 ඔවුන්ගේ අපරාධයට ඉපලෙන්ද
ඔවුන්ගේ අයුතුකමට පහරවලින්ද
දඬුවම්කරන්නෙමි.
33 එහෙත් මාගේ කරුණාව ඔහු කෙරෙන්
සහමුලින්ම අහක්කර නොගන්නෙමි,
මාගේ විශ්වාසකමත් පිරිහෙන්ට
නොදෙන්නෙමි.
34 මාගේ ගිවිසුම කඩ නොකරන්නෙමි,
මාගේ තොල්වලින් නික්මුණු දේද
වෙනස් නොකරන්නෙමි.
35 මාගේ ශුද්ධකම කියා එක් වරක්
දිවිරීමි;
දාවිත්ට බොරු නොකියන්නෙමි;
ඔහුගේ වංශය සදකල්ද 36
ඔහුගේ සිංහාසනය මා ඉදිරියෙහි
සූර්යයා මෙන්ද පවතින්නේය.
එය චන්ද්‍රයා මෙන්ද 37
ආකාශයෙහි විශ්වාස සාක්ෂිය මෙන්ද
සදකල් පිහිටුවනු ලබන්නේයයි
කීසේක.

එහෙත් ඔබ පහකොට 38
එපාකළසේක,
ඔබගේ අභිෂේකලත් තැනැත්තා
සමග උදහස්වූසේක.
ඔබගේ මෙහෙකරුවාගේ ගිවිසුමට 39
ඔබ පිළිකුල්කළසේක.
ඔහුගේ ඔටුන්න බිම හෙළා දූෂණය
කළසේක.
ඔහුගේ සියලු වැටවල් ඔබ 40
බිඳහෙළුසේක;
ඔහුගේ බලකොටු ඔබ
විනාශකළසේක.
මග යන සියල්ලෝ ඔහුගෙන් 41
කොල්ලකති.
තම අසල්වාසීන්ට ඔහු නින්ද හුමියක්
වී සිටී.
ඔබ ඔහුගේ එදිරිකාරයන්ගේ දකුණත 42
උසස්කළසේක;
ඔහුගේ සියලු සතුරන්
ප්‍රීතිකෙරෙවූසේක.
එසේය, ඔබ ඔහුගේ කඩු මුවාත 43
නැමූසේක,
සටනේදී ඔහුට කෙළින් සිටින්ට
නුදුන්සේක.
ඔහුගේ දීප්තිය ඔබ 44
කෙළවරකළසේක,
ඔහුගේ සිංහාසනය බිම හෙළුසේක.
ඔහුගේ යෞවන දවස් ලුහුඬුකොට, 45
ඔහු ලජ්ජාවෙන් වැසූසේක.
ස්වාමිනි, ඔබ කොපමණ කල් 46
නිරන්තරයෙන් සැඟවෙනසේක්ද?
ඔබගේ උදහස කොපමණ කල් ගිනි
මෙන් ඇවිළෙන්නේද?
මාගේ කාලය කොපමණ ලුහුඬුදැයි 47
සිහිකළ මැනව.
ඔබ සියලු මනුෂ්‍ය පුත්‍රයන් මැවුවේ
කුමන නිෂ්ඵලකමකටද!
මරණය නොදක ජීවත්වෙන, 48
*ෂෙයෝල්ලේ බලයෙන් ස්වකීය ප්‍රාණය

*හෙවත්, පාතාලයේ.

ගළවාගන්න මනුෂ්‍යයා කවරේද?
49 ස්වාමිනි, ඔබගේ විශ්වාසකමින් දවිත්ට දිවුළාවූ
ඔබගේ පළමු කරුණාවල් කොයිද?
50 ස්වාමිනි, ඔබගේ මෙහෙකරුවන්ට පැමිණි නින්දව,
එනම් සියලු බලවත් මනුෂ්‍ය වර්ගයන්ගෙන් ලැබෙන බර, මාගේ ළයෙහි දරන බව සිහිකළ මැනව.
51 ස්වාමිනි, ඔබගේ සතුරෝ නින්ද කළෝය.
ඔබගේ අභිෂේකලත් තැනැත්තාගේ පා සලකුණුවලට නින්දකළෝය.
52 ස්වාමීන්ට සදකල් ප්‍රශංසාවේවා.
ආමෙන්, ආමෙන්.

## සතරවෙනි කාණ්ඩය.

### අපේ සදකාල වාසස්ථානය වන දෙවියන්වහන්සේ

**90** දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාවූ මෝසෙස්ගේ යාච්ඤාවකි.

1 ස්වාමිනි, සියලු පරම්පරාවල ඔබ අපේ වාසස්ථානය වූසේක.
2 කඳුවල උත්පත්තියටත් ඔබ විසින් පොළොව හා ලෝකය සෑදීමටත් පළමුවෙන්,
සදකාලයෙන් සදකාලයටම ඔබ දෙවියන්වහන්සේය.
3 ඔබ මනුෂ්‍යයා *විනාශයට හරවමින්:
මනුෂ්‍ය පුත්‍රයෙනි, හැරී වරෙව්යයි කියනසේක.
4 මක්නිසාද ඔබ ඉදිරියෙහි අවුරුදු දහසක්
පසුවූ ඊයේ දවසටත්
රෑ යාමයකටත් සමානය.
5 ඔබ සැඩපාරකින් මෙන් ඔවුන් ගෙන යනසේක; ඔව්හු නින්දක් මෙන්ය.
උදය කාලයේදී ඔව්හු වැඩෙන්නාවූ තණකොළ සමානවෙති.
6 උදයේ ඒවා සශ්‍රීකවෙමින් වැඩෙයි;
සවස කපනු ලැබ වියළීයයි.
7 මක්නිසාද ඔබගේ කෝපයෙන් අපි විනාශවෙමුව,
ඔබගේ උදහසින් කැලඹෙමුව.
8 ඔබ අපේ අයුතුකම් ඔබ ඉදිරියෙහිද අපේ රහස් පව් ඔබගේ මුහුණේ එළියෙහිද තැබූසේක.
9 මක්නිසාද අපේ සියලු දවස් ඔබගේ උදහසින් ගෙවීයයි.
අපේ අවුරුදු කථාවක් මෙන් කෙළවරකරමුව.
10 අපේ ජීවිතයේ දවස් අවුරුදු හැත්තෑවක්ය,
ශක්තිය ඇත්නම් අවුරුදු අසූවක්ය;
එසේ වුවත් ඒවායේ යහපත් භාගය පවා වෙහෙස හා දුකමය;
මක්නිසාද එය වහාම ගතවෙයි, අපිද ඉගිලී යමුව.
11 ඔබගේ කෝපයේ බලයත්
ඔබට භයවිය යුතු ප්‍රමාණයේ හැටියට ඔබගේ උදහසත් දන්නේ කවුද?
12 ඥානවන්ත සිතක් ලබාගන්නා පිණිස
අපේ දවස් ගණින්ට ඉගැන්නුව මැනව.
13 ස්වාමිනි, හැරී අවමැනව; කොපමණ කල්ද?
ඔබගේ මෙහෙකරුවන් ගැන තැවුණ මැනව.
14 අපේ සියලු දවස්වලදී ප්‍රීතිසන්තෝෂවෙන පිණිස,
උදය කාලයෙහි ඔබගේ කරුණාවෙන් අප තෘප්තියට පැමිණෙවුව මැනව.
15 ඔබ අපට පීඩාකළ දවස් ගණන ලෙසද
අප විසින් නපුර දුටු අවුරුදු ගණන ලෙසද අප සන්තෝෂකළ මැනව.

*හෙවත්, දූවිල්ලට.

16 ඔබගේ ක්‍රියාව ඔබගේ
මෙහෙකරුවන්ටත්
ඔබගේ තේජස ඔවුන්ගේ දරුවන්
කෙරෙහිත් පෙනේවා.
17 අපේ දෙවිවූ ස්වාමීන්ගේ අලංකාරය
අප කෙරෙහි වේවා.
අපේ අත්වල වැඩ අප කෙරෙහි
ස්ථිර කළ මැනව;
එසේය, අපේ අත්වල වැඩ ස්ථිරකළ
මැනව.

## දෙවියන්වහන්සේ කෙරෙහි අදහන්නාගේ සුරක්ෂිත භාවය

91 මහෝත්තමයාණන්ගේ
රහස් ස්ථානයෙහි වසන
තැනැත්තේ
සර්වපරාක්‍රමයාණන්ගේ සෙවණෙහි
වාසයකරන්නේය.
2 උන්වහන්සේ මාගේ රක්ෂාස්ථානයය,
මාගේ බලකොටුවය;
මා විසින් විශ්වාසකරන මාගේ
දෙවියන්වහන්සේයයි ස්වාමීන් ගැන
කියන්නෙමි.
3 මක්නිසාද උන්වහන්සේ පක්ෂි වැද්දගේ
මලපතින්ද
විනාශකරන වසංගතයෙන්ද නුඹ
මුදහරිනසේක.
4 උන්වහන්සේ ස්වකීය පියාපතින් නුඹ
වසනසේක,
නුඹ උන්වහන්සේගේ පියාපත් යට
ආරක්ෂාවෙන්නෙහිය.
උන්වහන්සේගේ සත්‍යවාදිකම
පලිහක්ය, මහා පලිහක්ය.
5 රාත්‍රියේ භීතියටවත්,
දවාලේ විදින ඊගසටවත්,
6 අඳුරේ යන වසංගතයටවත්,
ඉරමුදුන් වේලේ පාළුකරන
විනාශයටවත් නුඹ භය
නොවන්නෙහිය.
7 නුඹේ පැත්තක දහසක්ද
දකුණු පැත්තෙහි දසදහසක්ද
වැටෙන්නෝය;
එහෙත් එය නුඹට ළං නොවන්නේය.
8 නුඹේ ඇස්වලින් බලා,
දුෂ්ටයාගේ විපාකය දකිනවා
පමණක්ය.
මක්නිසාද ස්වාමිනි, ඔබ මාගේ 9
රක්ෂාස්ථානයය.
නුඹ මහෝත්තමයාණන් නුඹේ
වාසස්ථානය කරගත්තෙහිය;
නුඹට කිසි නපුරක් 10
නොපැමිණෙන්නේය,
නුඹේ කූඩාරමට වසංගතයක් ළං
නොවන්නේය.
මක්නිසාද නුඹේ සියලු මාර්ගවලදී 11
නුඹ ආරක්ෂාකරන පිණිස
උන්වහන්සේ ස්වකීය දූතයන්ට නුඹ
ගැන අණදෙනසේක.
ඔව්හු නුඹේ පය ගලක නොවදින 12
පිණිස
ඔවුන්ගේ අත් පිට නුඹ උසුලා
ගන්නෝය.
නුඹ සිංහයාත් පොළභාත් 13
පාගන්නෙහිය.
තරුණ සිංහයාත් සර්පයාත්
පයින් පාගන්නෙහිය.
ඔහු මා කෙරෙහි ඇලුම්වූ බැවින් ඔහු 14
මුදහරින්නෙමි.
මාගේ නාමය දන සිටින බැවින් ඔහු
උසස්කරන්නෙමි.
ඔහු මට යාච්ඤාකරන්නේය, මමද 15
උත්තරදෙන්නෙමි;
දුකේදී ඔහු සමග සිටින්නෙමි.
ඔහු මුදා ගෞරවයට පමුණුවන්නෙමි.
දීර්ඝායුෂයෙන් ඔහු සෑහීමට පමුණුවා, 16
මාගේ ගැළවීම ඔහුට දක්වන්නෙමි.

## ධර්මිෂ්ඨයාගේ සමෘද්ධ භාවය

92
සබත් දිනට කාව්‍ය ගීතයකි.
ස්වාමීන්ට ස්තුතිකිරීමත්, 1
මහෝත්තමයාණෙනි, ඔබගේ නාමයට
ප්‍රශංසා ගී කීමත් යහපත.
තත් දසයේ වීණාවෙන්ද කුඩා 2
වීණාවෙන්ද
මහා වීණාවේ ගරුවූ ශබ්දයෙන්ද
උදය ඔබගේ කරුණාගුණයත් 3
සෑම රාත්‍රියේම ඔබගේ විශ්වාසකමත්
ප්‍රකාශකිරීම යහපත.
මක්නිසාද ස්වාමිනි, ඔබගේ ක්‍රියාවෙන් 4
ඔබ මා සන්තෝෂකළසේක.

ඔබගේ හස්තකර්ම ගැන ප්‍රීති ප්‍රකාශ කරන්නෙමි.
5 ස්වාමිනි, ඔබගේ ක්‍රියා කොපමණ මහත්ද!
ඔබගේ කල්පනා ඉතා ගැඹුරුය.
6 මේක මෝඩ මනුෂ්‍යයා නොදනියි;
අඥනයා තේරුම් නොගනියි;
7 දුෂ්ටයන් තණකොළ මෙන් වැඩෙන්නෙත්,
අයුතුකම්කරන සියල්ලන් සඵලවන්නෙත්,
ඔවුන් සදාකාලේට විනාශවන පිණිසය.
8 නුමුත් **ස්වාමිනි**, ඔබ සදාකල්ම උසස්ථානයෙහි වැඩසිටිනසේක.
9 මක්නිසාද **ස්වාමිනි**, ඔබගේ සතුරෝ, එසේය, ඔබගේ සතුරෝ, විනාශවන්නෝය;
අයුතුකම්කරන සියල්ලෝම විසුරුවනු ලබන්නෝය.
10 නුමුත් ඔබ කුළු ගොනාගේ අඟ මෙන් මාගේ අඟ උස්කළසේක;
මම අලුත් තෙලින් ගාගන සිටිමි.
11 මාගේ සතුරන් ගැන මාගේ ආශාව ඉෂ්ටවූ බව මාගේ ඇසට පෙනුණේය,
මට විරුද්ධව නැගිටින්නාවූ නපුරුකම්කරන්නන් ගැන මාගේ ආශාව ඉෂ්ටවූ බව මාගේ කන්වලට ඇසුණේය.
12 ධර්මිෂ්ඨයා තාල වෘක්ෂය මෙන් සශ්‍රීකවන්නේය.
ඔහු ලෙබනොන්හි කිහිරි ගසක් මෙන් වැඩෙන්නේය.
13 **ස්වාමීන්ගේ** ගෘහයෙහි හිඳුවනලද්දෝ අපේ දෙවියන්වහන්සේගේ මිදුල්වල සඵලවන්නෝය.
14 **ස්වාමීන්වහන්සේ** අවංක බවත්, මාගේ පර්වතය බවත්,
උන්වහන්සේ තුළ කිසි අධර්මිෂ්ඨකමක් නැති බවත් පෙන්වන පිණිස,
15 ඔව්හු මහලු වයසේදීත් ඵලදෙමින් සාරවත්වන්නෝය, සශ්‍රීකවන්නෝය.

## පොළොවේ රජවූ ස්වාමීන්වහන්සේ

93 **ස්වාමීන්වහන්සේ** රජකම් කරනසේක; උන්වහන්සේ මහිමශ්‍රීය පැළඳ සිටිනසේක;
**ස්වාමීන්වහන්සේ** පැළඳ සිටිනසේක,
උන්වහන්සේ ශක්තිය නමැති ඉහපටිය බැඳගන සිටිනසේක.
ලෝකයද නොසෙල්වෙන ලෙස පිහිටා තිබේ.
ඔබගේ සිංහාසනය ආදියේ පටන් පිහිටා තිබේ. 2
ඔබ සදාකාලයේ පටන් සිටිනසේක.
**ස්වාමිනි**, ජල ධාරාවෝ නැගුණෝය, 3
ජල ධාරාවෝ ශබ්දනැගුවෝය;
ජල ධාරාවෝ රළ නගිති.
මහත් ජල සෝෂාවන්ටත් 4
මුහුදේ බලවත් රළවලටත් වඩා
උසස්ථානයෙහි **ස්වාමීන්වහන්සේ** බලවත්ය.
ඔබගේ ශික්ෂා ඉතා ස්ථිරය. 5
**ස්වාමිනි**, සදාකල්ම
ශුද්ධකම ඔබගේ ගෘහයට හොබනේය.

## පොළොවේ විනිශ්චයකාරවූ ස්වාමීන්වහන්සේ

94 පළිගැන්ම අයත් දෙවිවූ **ස්වාමිනි**,
පළිගැන්ම අයත් දෙවියන්වහන්ස, බැබළුව මැනව.
පොළොවේ විනිශ්චයකාරයාණෙනි, 2
නැගිටුණ මැනව.,
උඩඟුවූවන්ට ප්‍රතිඵල දුන මැනව.
**ස්වාමිනි**, දුෂ්ටයෝ කොපමණ කල්, 3
දුෂ්ටයෝ කොපමණ කල් ජය සෝෂා කරන්නෝද?
ඔව්හු දෙඩවති, අහංකාරලෙස කථා කෙරෙති. 4
අයුතුකම්කරන සියල්ලෝම පාරට්ටු කරගනිති.
**ස්වාමිනි**, ඔව්හු ඔබගේ සෙනඟ කැබලිකරති, 5
ඔබගේ උරුමයට පීඩාකෙරෙති.
ඔව්හු වැන්දඹුව සහ විදේශියාද නසති, 6
පියා නැත්තන් මරති.
**ස්වාමීන්වහන්සේ** නොදක්නාසේක, 7
යාකොබ්ගේ දෙවියන්වහන්සේ නොසලකනසේකැයි කියති.
සෙනඟ අතරේ මෝඩයෙනි, 8

කල්පනාකරව්.
ආඥනයෙනි, තෙපි කවද
ඥනවන්තවන්නහුද?
9 කන පිහිටෙවූ තැනන්වහන්සේට
නොඇසෙන්නේද?
ඇස සෑදූ තැනන්වහන්සේට
නොපෙනෙන්නේද?
10 ජාතීන්ට දඬුවම්කරන තැනන්වහන්සේ,
එනම් මනුෂ්‍යයාට ඥනය
උගන්වන්නාවූ තැනන්වහන්සේ,
දඬුවම් නොකරනසේක්ද?
11 මනුෂ්‍යයාගේ සිතිවිලි නිෂ්ඵල බව
ස්වාමීන්වහන්සේ දන්නාසේක.
12 ස්වාමිනි, දුෂ්ටයාට වළ හෑරෙන තුරු,
විපත්ති දවස්වලින් නිවාඩු දෙන පිණිස,
13 ඔබ විසින් දඬුවම්කොට
ඔබගේ ව්‍යවස්ථාවෙන් උගන්වනු ලබන
මනුෂ්‍යයා පිනැත්තෙක්ය.
14 මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන්
සෙනඟ ඉවත නොදමනසේක,
තමන් උරුමයද අත් නොහරිනසේක.
15 මක්නිසාද විනිශ්චය ධර්මිෂ්ඨකමට
හැරෙන්නේය.
අවංක සිත් ඇති සියල්ලෝ එය අනුව
යන්නෝය.
16 නපුරුකම්කරන්නන්ට විරුද්ධව මාගේ
පක්ෂයට නැගිටින්නේ කවුද?
අයුතුකම්කරන්නන්ට විරුද්ධව මාගේ
පක්ෂයට සිටින්නේ කවුද?
17 ස්වාමීන්වහන්සේ මට පිහිට
නුවූසේක්නම්
මාගේ ආත්මය නිශ්ශබ්ද ස්ථානයෙහි
වාසයට ළංවිය.
18 මාගේ පාද ලිස්සන්නේයයි මා කී
කල,
ස්වාමිනි, ඔබගේ කරුණාව මා
ඉසිලීය.
19 මා තුළ මාගේ සිතිවිලි බොහෝවූ
කල,
ඔබගේ සැනසීම මාගේ ආත්මයට සැප
දෙයි.
20 පනතෙන් නපුර යොදන්නාවූ
දුෂ්ටකමේ සිංහාසනය ඔබ හා
සම්බන්ධ වන්නේද?
21 ධර්මිෂ්ඨයාගේ ප්‍රාණයට විරුද්ධව
ඔව්හු රැස්ව
*නිදෙස් ලෙය වරදට පත්කරති.
තුමුත් ස්වාමීන්වහන්සේ මාගේ 22
බලකොටුව වූසේක;
මාගේ දෙවියන්වහන්සේ මාගේ
ආරක්ෂා පර්වතය වූසේක.
උන්වහන්සේ ඔවුන්ගේ අයුතුකම 23
ඔවුන් පිටට පෙරළූසේක,
ඔවුන්ගේම නපුරුකමෙහි ඔවුන්
සිඳදමනසේක;
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
ඔවුන් සිඳදමනසේක.

## අපේ මැවූම්කාර දෙවියන්වහන්සේට නමස්කාරකිරීම

## 95

එව්, ස්වාමීන්ට ගායනා
කරමු.
අපේ ගැළවීමේ පර්වතයට ප්‍රීති ඝෝෂා
පවත්වමු.
ස්තුතිදෙමින් උන්වහන්සේ ඉදිරියට 2
පැමිණෙමු,
ගීතිකාවලින් උන්වහන්සේට ප්‍රීතිනාද
පවත්වමු.
මක්නිසාද ස්වාමීන්වහන්සේ මහත් 3
දෙවිකෙනෙක්ය,
සියලු දෙවිවරුන්ට වඩා මහත් රජ
කෙනෙක්ය.
පොළොවේ ගැඹුරු තැන් 4
උන්වහන්සේගේ අතෙහිය;
කඳු ශිඛරද උන්වහන්සේගේය.
මුහුද උන්වහන්සේගේය, උන්වහන්සේ 5
එය මැවූසේක;
උන්වහන්සේ ස්වකීය අත්වලින් වියළි
බිම තැනූසේක.
එව්, නමස්කාරකරමින් වැඳවැටෙමු; 6
අපේ මැවූම්කාර ස්වාමීන් ඉදිරියේ
දණගසමු.
මක්නිසාද උන්වහන්සේ අපේ 7
දෙවියන්වහන්සේය,
අපි උන්වහන්සේගේ ගොදුරු බිමේ
සෙනඟය, උන්වහන්සේගේ අතේ
බැටළුවෝය.
අද දවසේ තුඹලා උන්වහන්සේගේ
හඬට කීකරුවන්නහුනම් යහපත!
විවාදයෙහි මෙන්ද වනාන්තරයේදී 8
පරීක්ෂාකළ දවසෙහි මෙන්ද
තුඹලාගේ සිත් දැඩිකර නොගනිව්.

*හෙවත්, නිදෙස් තැනැත්තා.

9 එකල නුඹලාගේ පියවරු මා පරීක්ෂා කොට
මා විමසා මාගේ ක්‍රියාව දුටුවෝය.
10 මම සතළිස් අවුරුද්දක් ඒ පරම්පරාව කෙරෙහි කලකිරී:
ඔව්හු සිතින් මුළාවයන සෙනඟක්ය,
ඔව්හු මාගේ මාර්ගයන් දන නොගත්තෝයයි කීයෙමි.
11 එබැවින්: ඔව්හු මා දෙන නිවාඩුවට නොපැමිණෙන්නෝයයි
මාගේ උදහසින් දිවුළෙමි.

## සර්වපරාක්‍රමයාණන්වහන්සේට ප්‍රශංසාකිරීම

96 ස්වාමීන්ට අලුත් ගීතිකාවක් ගීතිකාකරව්;
පොළොවේ සියල්ලෙනි, ස්වාමීන්ට ගීතිකාකරව්.
2 ස්වාමීන්ට ගීතිකාකරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාකරව්;
උන්වහන්සේ දෙන ගැළවීම දිනෙන් දින ප්‍රකාශකරව්.
3 උන්වහන්සේගේ මහිමය ජාතීන් අතරේද
උන්වහන්සේගේ ආශ්චර්ය ක්‍රියා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරේද ප්‍රකාශකරව්.
4 මක්නිසාද ස්වාමීන්වහන්සේ උතුම්ය, බොහෝ ප්‍රශංසනීයය;
උන්වහන්සේ සියලු දෙවිවරුන්ට වඩා භයංකරය.
5 මනුෂ්‍ය වර්ගයන්ගේ සියලු දෙවිවරු පිළිම පමණක්ය.
නුමුත් ස්වාමීන්වහන්සේ ආකාශ මණ්ඩලය සෑදූසේක.
6 ගෞරවයත් මහිමතාවත් උන්වහන්සේ ඉදිරියෙහිය.
ශක්තියත් අලංකාරයත් උන්වහන්සේගේ ශුද්ධස්ථානයෙහිය.
7 මනුෂ්‍ය වර්ගයෙනි, ස්වාමීන්ට දෙව්,
මහිමයත් බලයත් ස්වාමීන්ට දෙව්.
8 ස්වාමීන්ගේ නාමයට දිය යුතු මහිමය දෙව්.
පූජාවක් රැගෙන උන්වහන්සේගේ මණ්ඩපවලට ඇතුල්වව්.
ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමීන්ට නමස්කාරකරව්. 9
පොළොවේ සියල්ලෙනි, උන්වහන්සේ ඉදිරියෙහි වෙවුලමින් සිටිව්.
ස්වාමීන්වහන්සේ රජකම්කරනසේක කියාත්, 10
නොසෙලවෙන ලෙස ලෝකය පිහිටා තිබේය කියාත්,
උන්වහන්සේ මනුෂ්‍ය වර්ගයන් සාධාරණකමින් විනිශ්චයකරනසේක කියාත් ජාතීන් අතරේ කියව්.
ආකාශය සන්තෝෂවේවා, පොළොව ප්‍රීතිවේවා; 11
මුහුදත් එහි පූර්ණකමත් ගර්ජනාකෙරෙත්වා;
කෙත සහ එහි ඇති සියල්ලද ප්‍රීතිමත් වේවා; 12
එවිට වනයෙහි සියලු ගස් ස්වාමීන් ඉදිරියෙහි ප්‍රීතියෙන් ගී කියන්නේය.
මක්නිසාද උන්වහන්සේ එනසේක; 13
පොළොව විනිශ්චයකරන පිණිස එනසේක.
උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් පොළොවද,
ස්වකීය සැබෑකමින් මනුෂ්‍ය වර්ගයන්ද විනිශ්චයකරනසේක.

## ස්වාමීන්වහන්සේගේ ධර්මිෂ්ඨ විනිශ්චය ප්‍රකාශ කිරීමේ එල

97 ස්වාමීන්වහන්සේ රජකම් කරනසේක; පොළොව ප්‍රීතිවේවා;
ද්වීප සමූහය සන්තෝෂවෙත්වා.
වලාකුල් සහ අන්ධකාරය උන්වහන්සේ හාත්පසය. 2
ධර්මිෂ්ඨකම සහ යුක්තිය උන්වහන්සේගේ සිංහාසනයේ අත්තිවාරමය.
උන්වහන්සේ ඉදිරියේ ගින්නක් යමින් 3
හාත්පස උන්වහන්සේගේ විරුද්ධකාරයන් දවයි.
උන්වහන්සේගේ විදුලි ලෝකය ආලෝකකෙළේය. 4
පොළොව ඒ දැක කම්පාවිය.

5 හෙල් ස්වාමීන් ඉදිරියෙහි,
එනම් මුළු පොළොවේ ස්වාමීන්
ඉදිරියෙහි, ඉටි මෙන් උණුවූය.
6 ආකාශය උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
ප්‍රකාශකරයි,
සියලු මනුෂ්‍ය වර්ගයෝ
උන්වහන්සේගේ මහිමය දුටුවෝය.
7 රූපවලට මෙහෙකරන්නාවූ,
පිළිම ගැන පාරට්ටුකරගන්නාවූ
සියල්ලෝ ලජ්ජාවෙත්වා.
දෙවිවරු සියල්ලෙනි, උන්වහන්සේට
නමස්කාරකරව්.
8 ස්වාමිනි, සියොන් අසා සන්තෝෂ
වූවාය,
යූදගේ දූවරු
ඔබගේ විනිශ්චයන් නිසා ප්‍රීතිවූය.
9 මක්නිසාද ස්වාමිනි, ඔබ මුළු
පොළොවට උතුම්සේක.
ඔබ සියලු දෙවිවරුන්ට වඩා අතිශයින්
උසස්ව සිටිනසේක.
10 ස්වාමීන්ට ප්‍රේමකරන්නෙනි, නපුරට
වෛරකරව්.
උන්වහන්සේ ස්වකීය ශුද්ධවන්තයන්ගේ
ප්‍රාණ ආරක්ෂාකරනසේක;
දුෂ්ටයන්ගේ අතින් ඔවුන් ගළවනසේක.
11 ධර්මිෂ්ඨයන්ට එළියත්
අවංක සිත් ඇත්තන්ට ප්‍රීතියත්
වපුරනලද්දේය.
12 ධර්මිෂ්ඨයෙනි, ස්වාමීන් කෙරෙහි
ප්‍රීතිවව්.
උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට
ස්තුතිකරව්.

## දෙවියන්වහන්සේගේ ගැළවීම ගැන ප්‍රශංසාකිරීම

**98** ගීතයකි.

1 ස්වාමීන්ට අලුත් ගීතිකාවක්
ගායනාකරව්;
මක්නිසාද උන්වහන්සේ ආශ්චර්යයන්
කළසේක.
ස්වකීය දකුණු අතින්ද ශුද්ධවූ
බාහුවෙන්ද තමන්වහන්සේට ගැළවීම
ඉෂ්ටකරගත්සේක.
2 ස්වාමීන්වහන්සේ ස්වකීය ගැළවීම
දන්වූසේක.
ස්වකීය ධර්මිෂ්ඨකම ජාතීන්ගේ ඇස්
හමුයෙහි එළිදරව්කළසේක.
උන්වහන්සේ ඉශ්‍රායෙල් වංශය කෙරෙහි 3
ඇති ස්වකීය කරුණාවත්
විශ්වාසකමත් සිහිකළසේක.
පොළොවේ සියලු සීමාවෝ අපේ
දෙවියන්වහන්සේගේ ගැළවීම
දුටුවෝය.
පොළොවේ සියල්ලෙනි, ස්වාමීන්ට 4
ප්‍රීති නාද පවත්වව්.
ශබ්දනගා ප්‍රීතියෙන් ගී කියව්, එසේය
ප්‍රශංසා ගී කියව්.
ස්වාමීන්ට වීණාවෙන්ද 5
වීණාවෙන් හා ගී නාදයෙන්ද ගායනා
කරව්.
හොරණෑවලින්ද නළා ශබ්දයෙන්ද 6
රජවූ ස්වාමීන් ඉදිරියේ ප්‍රීතිනාද
පවත්වව්.
මුහුදද එහි ඇති සියල්ලද 7
ගර්ජනාකෙරෙත්වා;
ලෝකයද එහි වැසියෝද
ගර්ජනාකෙරෙත්වා.
ස්වාමීන් ඉදිරියෙහි ජල ධාරාවෝ 8
අත්පොළසන්දෙත්වා;
හෙල්ද එක්ව ප්‍රීතියෙන් ගී කියත්වා;
මක්නිසාද උන්වහන්සේ ලෝකය 9
විනිශ්චයකරන පිණිස එනසේක.
උන්වහන්සේ ලෝකය ධර්මිෂ්ඨකමින්ද
මනුෂ්‍ය වර්ගයන් සාධාරණකමින්ද
විනිශ්චයකරනසේක.

## ස්වාමීන්වහන්සේ උසස්කිරීම

**99**

ස්වාමීන්වහන්සේ රජකම්
කරනසේක; මනුෂ්‍ය වර්ගයෝ
වෙව්ලත්වා.
උන්වහන්සේ කෙරුබිම් පිට
වැඩහිඳිනසේක; පොළොව සෙලවේවා.
ස්වාමීන්වහන්සේ සියොන්හි උතුම්ය; 2
උන්වහන්සේ සියලු මනුෂ්‍ය වර්ගයන්ට
වඩා උසස්ය.
ඔව්හු ඔබගේ උතුම්වූ භයංකරවූ 3
නාමයට ප්‍රශංසාකෙරෙත්වා;
උන්වහන්සේ ශුද්ධසේක.

4 රජ්ජුරුවන්ගේ ශක්තිය විනාහි
යුක්තියට ප්‍රියවෙයි;
සාධාරණකම පිහිටුවන්නේ ඔබය,
යාකොබ්හි යුක්තියත් ධර්මිෂ්ඨකමත්
සිදුකරන්නේ ඔබය.
5 අපේ දෙවිවූ ස්වාමීන් උසස්කරව්,
උන්වහන්සේගේ පාපුටුව වෙත
නමස්කාරකරව්.
උන්වහන්සේ ශුද්ධසේක.
6 උන්වහන්සේගේ පූජකයන් අතරේ
මෝසෙස් සහ ආරොන්ද
උන්වහන්සේගේ නාමයෙන් යාච්ඤා
කරන්නන් අතරේ සාමුවෙල්ද
ස්වාමීන්ට යාච්ඤාකළෝය, උන්-
වහන්සේද ඔවුන්ට උත්තරදුන්සේක.
7 උන්වහන්සේ වලා ටැඹින් ඔවුන්ට
කථාකළසේක.
ඔව්හු උන්වහන්සේගේ ශික්ෂා හා
ඔවුන්ට දුන් පනත පැවැත්වූවෝය.
8 අපේ දෙවිවූ ස්වාමිනි: ඔබ ඔවුන්ට
උත්තරදුන්සේක.
ඔබ ඔවුන්ගේ ක්‍රියාවලට පළිගත්
නුමුත්,
ඔවුන්ට කමාව දුන් දෙවිකෙනෙක්
වූසේක.
9 අපේ දෙවිවූ ස්වාමීන් උසස්කරව්,
උන්වහන්සේගේ ශුද්ධ කන්දේදී
නමස්කාරකරව්;
මක්නිසාද අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ ශුද්ධසේක.

## සියලු පොළෝවාසීන්ගේ නමස්කාරය

**100** ස්තුතිකිරීමේ ගීතයකි.

1 පොළොවේ සියල්ලෙනි, ස්වාමීන්ට
ප්‍රීතිනාද පවත්වව්.
2 ස්වාමීන්ට ප්‍රීතියෙන් මෙහෙකරව්.
ගීතිකාකරමින් උන්වහන්සේ ඉදිරියට
පැමිණෙව්.
3 ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ
බව දනගනිව්.
උන්වහන්සේ අප මැවූසේක, අපි
උන්වහන්සේගේය;
අපි උන්වහන්සේගේ සෙනඟය,
උන්වහන්සේගේ ගොදුරුබිමේ
බැටළුවෝය.
ස්තුතිකරමින් උන්වහන්සේගේ 4
දොරටුවලින් ඇතුල්ව,
ප්‍රශංසාකරමින් උන්වහන්සේගේ
මණ්ඩපවලට පැමිණෙව්.
උන්වහන්සේට ස්තුතිකරමින්
උන්වහන්සේගේ නාමයට
ප්‍රශංසාකරව්.
මක්නිසාද ස්වාමීන්වහන්සේ යහපත්ය; 5
උන්වහන්සේගේ කරුණාව
සදකාලේටද
උන්වහන්සේගේ විශ්වාසකම සියලු
පරම්පරාවලටද පවත්නේය.

## යහපත් රජුගේ අභිප්‍රායවල්

දාවිත්ගේ ගීතයකි. **101**

කරුණාවද යුක්තියද ගැන ගී 1
කියන්නෙමි.
ස්වාමිනි, ඔබට ප්‍රශංසා ගී
කියන්නෙමි.
නුවණැතිව නිර්දෝෂ මාර්ගයක 2
හැසිරෙන්නෙමි.
ඔබ කවදා මා වෙත එනසේක්ද?
*මම නිදෙස් සිතකින් මාගේ ගෙයි
හැසිරෙන්නෙමි.
මාගේ ඇස් හමුයෙහි කිසි නීච දෙයක් 3
තබා නොගන්නෙමි.
ඉවතට හැරෙන්නන්ගේ ක්‍රියාව
නුරුස්සමි;
එය මට නො ඇලෙන්නේය.
මුරණ්ඩු සිතක් මා කෙරෙන් 4
දුරුවන්නේය.
නපුරු දෙයක් දන නොගන්නෙමි.
යමෙක් ස්වකීය අසල්වාසියා ගැන 5
රහසේ කේලාම්කියයිද ඔහු විනාශ
කරන්නෙමි.
උඩඟු බැල්මක් හා ආඩම්බර සිතක්
ඇත්තා නොඉවසන්නෙමි.
දේශයේ විශ්වාසකටයුතු අය මා සමග 6
වසන පිණිස ඔවුන් කෙරෙහි මාගේ

*හෙවත්, මාගේ සිතේ අවංකකමින්.

ඇස් යොමා තිබෙන්නේය.
නිර්දෝෂ මාර්ගයෙක්හි හැසිරෙන
තැනැත්තේම මට මෙහෙකරන්නේය.
7 වංචාකරන කිසිවෙක් මාගේ ගෙයි
නොවසන්නේය;
බොරුකියන කිසිවෙක් මාගේ ඇස්
හමුයෙහි පිහිටුවනු නොලබන්නේය.
8 අයුතුකම් කරන සියල්ලන් ස්වාමීන්ගේ
නුවරින් සිඳදමන පිණිස
දේශයේ සියලු දුෂ්ටයන් උදයක් පාසා
විනාශකරන්නෙමි.

## සදාකාල දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවීම

**102** තද විපතින් ක්ලාන්ත භාවයට පත්ව තමාගේ විලාපය ස්වාමීන්-වහන්සේ ඉදිරියෙහි වගුරුවන තැනැත්තාගේ යාච්ඤාවකි.

1 ස්වාමිනි, මාගේ යාච්ඤාව ඇසුව
මැනව,
මාගේ මොරගැසීම ඔබ වෙතට
පැමිණේවා.
2 මට විපත්ති පැමිණි දවසේදී ඔබගේ
මුහුණ මා කෙරෙන් සඟවා නොගත
මැනව.
මා දෙසට ඔබගේ කන යොමුකළ
මැනව;
මා අඬගසන දවසේ ඉක්මනින් මට
උත්තරදුන මැනව.
3 මක්නිසාද මාගේ දවස් දුම් මෙන්
ගෙවීයයි,
මාගේ ඇට ගිනිපෙනෙල්ලක් මෙන්
දැවෙයි.
4 මාගේ සිත තණකොළ මෙන් තැළී
වියළී තිබේ;
මක්නිසාද ආහාර ගැනීම මට මතක
නැතිවෙයි.
5 මාගේ සුසුම්ලීමේ ශබ්දය නිසා
මාගේ ඇට මසට ඇලෙයි.
6 මම වනයේ කරවැල්කොකෙකු
සමානයෙමි;
පාළු තැන්හි වසන බකමූණෙකු මෙන්
වෙමි.
මම නිදි නොගෙන 7
වහල පිට තනිව සිටින ගේකුරුල්ලෙකු
සමානයෙමි.
මාගේ සතුරෝ දවස මුළුල්ලේ මට 8
නින්දාකෙරෙති;
මට ක්‍රෝධවත්තෝ මා මතක්කොට
ශාපකරති.
ඔබගේ කෝපය හා උදහස නිසා 9
ආහාර මෙන් අළු අනුභවකෙළෙමි,
මාගේ බීම වැලපීමෙන් මිශ්‍රකෙළෙමි. 10
මක්නිසාද ඔබ මා ඔසවා පහතට
හෙළුසේක.
මාගේ දවස් බැසයන සෙවණැල්ලක් 11
මෙන්ය;
මම තණකොළ මෙන් වියළී සිටිමි.
එහෙත් ස්වාමිනි, ඔබ සදාකල් වැඩ 12
ඉන්නසේක;
ඔබ සිහිවීමද සියලු පරම්පරාවලට
වන්නේය.
ඔබ නැගිට සියොන්ට 13
කරුණාකරනසේක.
ඊට අනුකම්පාකළ යුතු කාලය දැන්ය,
එසේය, නියම කාලය පැමිණ තිබේ.
මක්නිසාද ඔබගේ මෙහෙකරුවෝ 14
එහි ගල්වලට ප්‍රියවෙති,
එහි දූවිල්ලට අනුකම්පාකෙරෙති.
එහෙයින් ජාතීහු ස්වාමීන්ගේ 15
නාමයටත්
පොළොවේ සියලු රජවරු ඔබගේ
මහිමයටත් භයවන්නෝය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ සියොන් 16
ගොඩනැගුසේක,
ස්වකීය මහිමයෙන් ප්‍රකාශවූසේක;
උන්වහන්සේ අසරණයන්ගේ යාච්ඤාව 17
සැලකූසේක,
ඔවුන්ගේ යාච්ඤාව හෙළා
නොදක්කසේක.
මෙය මතු එන පරම්පරාව උදෙසා 18

ලියනු ලබන්නේය.
මවනු ලබන සෙනඟක්ද ස්වාමීන්ට
ප්‍රශංසාකරන්නේය.
19 මනුෂ්‍ය වර්ගයන්ද රාජ්‍යවල්ද
ස්වාමීන්ට මෙහෙකිරීමට එකට රැස්
වූකල,
20 මනුෂ්‍යයන් විසින් සියොන්හිදී
ස්වාමීන්ගේ නාමයත්
යෙරුසලමේදී උන්වහන්සේගේ
ප්‍රශංසාවත් ප්‍රකාශකරන පිණිස,
21 හිරකාරයාගේ සුසුම්ලීම අසන්ටත්
මරණයට නියමවූවන් මුදන්ටත්
22 ස්වාමීන්වහන්සේ ස්වකීය ශුද්ධවූ
උසස්ථානයේ සිට පහළ බැලූසේක;
උන්වහන්සේ ස්වර්ගයේ සිට පොළොව
බැලූසේක.
23 උන්වහන්සේ මාර්ගයේදී මාගේ ශක්තිය
හීනකොට,
මාගේ දවස් ලුහුඩුකළසේක,
24 මමද කථාකොට: මාගේ
දෙවියන්වහන්ස, මාගේ දවස්
මධ්‍යයෙහිදී
මා අහක් නොකළ මැනව.
ඔබගේ අවුරුදු සියලු පරම්පරාවලට
වන්නේයයි කීයෙමි.
25 ආදියෙහි ඔබ පොළොවේ අත්තිවාරම
ලූසේක;
ආකාශය ඔබගේ අත් වැඩය වේ.
26 ඒවා විනාශවන්නේය, නුමුත් ඔබ
පවත්නාසේක.
එසේය, ඒ සියල්ල වස්ත්‍රයක් මෙන්
පරණවන්නේය;
උතුරු සළුවක් මෙන් ඔබ ඒවා මාරු
කරනසේක, ඒවාද
මාරුවන්නේය.
27 නුමුත් ඔබ එකාකාරමය,
ඔබගේ අවුරුදු කෙළවර නොවන්නේය.
28 ඔබගේ මෙහෙකරුවන්ගේ දරුවෝ
පවතින්නෝය,
ඔවුන්ගේ වංශයද ඔබ ඉදිරියෙහි
පිහිටුවනු ලබන්නේය.

## දෙවියන්වහන්සේගේ කරුණාව සහ අනුකම්පාව ගැන ප්‍රශංසාකිරීම

දාවිත්ගේ ගීතයකි. **103**

මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා 1
කරව;
මා තුළ ඇති සියල්ල උන්වහන්සේගේ
ශුද්ධවූ නාමයට ප්‍රශංසාකරව්.
මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා 2
කරව,
උන්වහන්සේගේ උපකාර සියල්ල
සිහිනැති නොකරව.
උන්වහන්සේ තාගේ සියලු අයුතුකම් 3
කමාකරනසේක;
තාගේ සියලු රෝග සුවකරනසේක;
තාගේ ජීවිතය විනාශයෙන් මුදා 4
කරුණාගුණය හා දයාව නමැති
ඔටුන්නෙන් තා සරසනසේක.
රාජාලියෙකු මෙන් තාගේ යෞවනකම 5
අලුත්වන පිණිස
උන්වහන්සේ තාගේ කට යහපත්
දෙයින් තෘප්තියට පමුණුවනසේක.
ස්වාමීන්වහන්සේ පීඩා විඳින සියල්ලන් 6
උදෙසා
ධර්මිෂ්ඨ ක්‍රියා හා යුක්තිය
ඉෂ්ටකරනසේක.
උන්වහන්සේ ස්වකීය මාර්ග 7
මෝසෙස්ටත්
තමන් ක්‍රියා ඉශ්‍රායෙල් පුත්‍රයන්ටත්
දන්වූසේක.
ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා 8
දයාවෙන් පිරී සිටිනසේක,
කෝපවීමට ප්‍රමාදය, අතිශයින්
කරුණාවන්තය.
උන්වහන්සේ නිතර තරවටු 9
නොකරනසේක;
සදාකාලයට කෝපය
නොපවත්වනසේක,
උන්වහන්සේ අපේ පාපවල ප්‍රකාරයට 10
අප කෙරෙහි ක්‍රියා නොකළසේක,
අපේ අයුතුකම්වල ප්‍රකාරයට විපාක
නුදුන්සේක.
මක්නිසාද පොළොවට උඩින් අහස 11

උස්ව තිබෙන්නාක්මෙන්
උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට
උන්වහන්සේගේ කරුණාව මහත්ය.
12 නැගෙනහිර බස්නාහිරෙන් දුරව
තිබෙන්නාක්මෙන්
උන්වහන්සේ අපේ වරද අපෙන් දුරු
කළසේක.
13 පියෙක් තම දරුවන්ට අනුකම්පා
කරන්නාක්මෙන්
ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි
භය ඇත්තන්ට
අනුකම්පාකරනසේක.
14 මක්නිසාද උන්වහන්සේ අපේ
ස්වභාවය දන්නාසේක;
අප ධූලි බව උන්වහන්සේ
සිහිකරනසේක.
15 මනුෂ්‍යයාගේ දවස් වනාහි තණකොළ
මෙන්ය;
ඔහු කෙතේ මලක් මෙන් සශ්‍රීකවේ.
16 මක්නිසාද හුළඟ වැදී එය නැතිවීයයි;
එය තිබුණු ස්ථානයද තවත් එය
දැන නොගන්නේය.
17 නුමුත් ස්වාමීන්වහන්සේගේ කරුණාව
තමන්ට භය ඇත්තන් කෙරෙහි
සදාකාලයෙන් සදාකාලයටද,
උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
දරුවන්ගේ දරුවන්ටද පවත්නේය.
18 එනම් උන්වහන්සේගේ ගිවිසුම රක්ෂා
කරන්නන්ටත්
උන්වහන්සේගේ ශික්ෂා ඉෂ්ටකිරීම
පිණිස ඒවා සිහිකරන්නන්ටත්ය.
19 ස්වාමීන්වහන්සේ තමන් සිංහාසනය
ස්වර්ගයෙහි පිහිටෙවූසේක;
උන්වහන්සේගේ රාජ්‍යයද සියල්ල
කෙරෙහි බලපවත්වයි.
20 උන්වහන්සේගේ වාග් ශබ්දය අසා
උන්වහන්සේගේ වචන ඉෂ්ටකරන්නාවූ
ශක්තියෙන් බලවන්තයෙනි,
ස්වාමීන්ගේ දූතයෙනි, උන්වහන්සේට
ප්‍රශංසාකරව්.
21 ස්වාමීන්ගේ සේනා සියල්ලෙනි,
එනම් උන්වහන්සේගේ කැමැත්ත
ඉෂ්ටකරන්නාවූ
උන්වහන්සේගේ මෙහෙකරුවෙනි,
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
ස්වාමීන්ගේ රාජ්‍යයේ සියලු තැන්හි 22
තිබෙන
උන්වහන්සේගේ සියලු කර්මාන්තයෙනි,
උන්වහන්සේට ප්‍රශංසා කරව්.
මාගේ ආත්මය ස්වාමීන්ට ප්‍රශංසා
කරව.

## දෙවියන්වහන්සේගේ මැවිල්ල ගැන ප්‍රශංසාව

## 104

මාගේ ආත්මය, ස්වාමීන්ට
ප්‍රශංසාකරව; මාගේ දෙවිවූ
ස්වාමිනි, ඔබ ඉතා උතුම්සේක;
ඔබ ගෞරවයෙන් හා මහිමයෙන් සැරසී
සිටිනසේක.
ඔබ වස්ත්‍රයක් මෙන් එළිය පොරවා 2
ගන්නසේක;
වියනක් මෙන් ආකාශය
දිගහරිනසේක.
ඔබ තමන් උඩුමහල් දිය පිට 3
පිහිටුවනසේක;
වලාකුල් ස්වකීය රථය
කරගන්නසේක;
හුළං නමැති පියාපත් පිට යනසේක.
උන්වහන්සේ හුළං ස්වකීය දූතයන්ද 4
ඇවිළෙන ගිනි දළු ස්වකීය
මෙහෙකරුවන්ද කරගන්නසේක.
පොළොව සදාකල්ම නොසෙලවෙන 5
ලෙස
උන්වහන්සේ ඒකේ අත්තිවාරම්
ලූසේක.
උතුරු සළුවකින් මෙන් ගැඹුරෙන් එය 6
පෙරවූසේක;
ජලය කඳුවලට ඉහළින් විය.
ඔබගේ තරවටුවෙන් ඒවා පලාගියේය; 7
ඔබගේ ගර්ජනා ශබ්දයට ඒවා යුහුව
ගියේය.
ඒවා කඳුවලින් නැගී ඔබ ඊටම පිහිටෙවූ 8
ස්ථානයට
මිටියාවත්වලින් බැස ගියේය.
ජලය ගලා නොයන පිණිසත්, 9
පොළොව වසාගන්ට නැවත හැරී
නොඑන පිණිසත්, ඔබ සීමාවක්

තැබූසේක.
10 උන්වහන්සේ මිටියාවත්වලට උල්පත් යවනසේක.
ඒවා කඳු අතරේ ගලායයි.
11 ඒවා වනයේ සියලු මෘගයන්ට පැන්දෙයි;
වල් කොටළුවෝ එයින් පිපාසා සන්සිඳුවාගනිති.
12 ඒවා අද්දර ආකාශ පක්ෂීහු වැස,
අතු අතරේ නාදකෙරෙති.
13 උන්වහන්සේ තමන් උඩුමහල්වලින් කඳු තෙමනසේක.
පොළොව ඔබගේ ක්‍රියාවල ඵලයෙන් තෘප්තියට පැමිණෙන්නීය.
14 උන්වහන්සේ පොළොවෙන් කෑම හටගන්වන පිණිස
සිව්පාවුන්ට තණකොළත්,
මනුෂ්‍යයාගේ ප්‍රයෝජනයට පලා ජාතිත්,
15 මනුෂ්‍යයාගේ සිත සතුටුකරන මුද්‍රික පානයත්,
ඔහුගේ මුහුණ පැහැපත්කරන්ට තෙලුත්,
සිත ශක්තිමත්කරන ආහාරත් හට ගන්වනසේක.
16 ස්වාමීන්ගේ වෘක්ෂයෝ,
එනම් උන්වහන්සේ සිටෙවූ,
ලෙබනොන්හි කිහිරි වෘක්ෂයෝ,
තෘප්තියට පැමිණෙති;
17 එහි කුරුල්ලෝ කූඩු සාදගනිති.
මානකොකාගේ ගෙය නම් දේවදාර ගස්ය.
18 උස් කඳු වල් එළුවන්ටය;
පර්වත සාවුන්ට ආරක්ෂාස්ථානයක් වේ.
19 උන්වහන්සේ කාල විශේෂ පිණිස සඳ සෑදූසේක.
සූර්යයා තමාගේ බැසයාම දනියි.
20 ඔබ අඳුර පමුණුවනසේක, එවිට රෑ වේ;
එකල වනයේ සියලු මෘගයෝ බැහැර යෙති.
21 තරුණ සිංහයෝ ගොදුරු ගැන ගර්ජනාකරමින්,
දෙවියන්වහන්සේගෙන් කෑම ඉල්ලති.
හිරු උදාවන කල උන් පහවගොස් 22
උන්ගේ ගුහාවල ලගිති.
මනුෂ්‍යයා සවස දක්වා 23
තමාගේ කර්මාන්තයටත් වැඩටත් නික්ම යයි.
ස්වාමිනි, ඔබගේ කර්මාන්ත 24
කොපමණ නානාප්‍රකාරද!
ඔබ මේ සියල්ල ප්‍රඥාවෙන් සෑදූසේක.
පොළොව ඔබගේ සම්පත්තියෙන් පූර්ණය.
අන්න මහත්වූ විශාලවූ මුහුද, 25
එහි කුඩා මහත් සත්ත්වයෝ
අසංඛ්‍ය ගණන් හැසිරෙති.
එහි නැව් යති; 26
එහි ක්‍රීඩාකරන්ට ඔබ සෑදූ
ලෙවියාතන් එහි සිටියි.
උන්ගේ කෑම සුදුසු කාලයේදී ඔබගෙන් 27
ලබන පිණිස
උන් සියල්ලෝ ඔබ දෙස බලා සිටිති.
ඔබ උන්ට දෙන දේ උන් එකතුකර 28
ගනිති;
ඔබගේ අත විදහන කල යහපතින් තෘප්තියට පැමිණෙති.
ඔබගේ මුහුණ සඟවන කල උන් 29
කැලඹෙති;
ඔබ උන්ගේ හුස්ම පැහැරගන්න කල උන් නැසී
දූවිල්ලට හැරීයෙති.
ඔබ ස්වකීය ආත්මය එවන කල උන් 30
මවනු ලබති;
ඔබ පොළෝතලය අලුත්කරනසේක.
ස්වාමීන්ගේ මහිමය සදකල් පවතීවා; 31
ස්වාමීන්වහන්සේ ස්වකීය කර්මාන්ත කෙරෙහි සන්තෝෂවනසේක්වා.
උන්වහන්සේ පොළොව දෙස බලන 32
කල එය කම්පාවේ;
උන්වහන්සේ කඳු ස්පර්ශකරන කල එයින් දුම් නගියි.
දිවි ඇති තාක් ස්වාමීන්ට ගී 33
කියන්නෙමි.
මා පවතින තෙක් මාගේ
දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කියන්නෙමි.
මාගේ භාවනාව උන්වහන්සේට මිහිරි 34

වේවා.
මම ස්වාමීන් කෙරෙහි ප්‍රීතිවන්නෙමි.
35 පව්කාරයෝ පොළොවෙන් විනාශ
වෙත්වා.
දුෂ්ටයෝ තවත් නොසිටිත්වා.
මාගේ ආත්මය ස්වාමීන්ට ප්‍රශංසා
කරව.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## ඉශ්‍රායෙල් උදෙසා දෙවියන්වහන්සේ කළ පුදුම ක්‍රියා

105 ස්වාමීන්ට ස්තුතිකරව්.
උන්වහන්සේගේ නාමය
කියා යාච්ඤාකරව්.
මනුෂ්‍ය වර්ගයන් අතරේ
උන්වහන්සේගේ ක්‍රියා ප්‍රකාශකරව්.
2 උන්වහන්සේට ගීතිකාකරව්, ප්‍රශංසා
ගී කියව්;
උන්වහන්සේගේ සියලු ආශ්චර්යමත්
ක්‍රියා ගැන කථාකරව්.
3 උන්වහන්සේගේ ශුද්ධවූ නාමය ගැන
පාරට්ටුකරගනිව්.
ස්වාමීන් සොයන්නන්ගේ සිත
ප්‍රීතිමත්වේවා.
4 ස්වාමීන් හා උන්වහන්සේගේ ශක්තිය
සොයව්;
උන්වහන්සේගේ මුහුණ නිතරම
සොයව්.
5 උන්වහන්සේගේ මෙහෙකරුවූ
ආබ්‍රහම්ගෙන් පැවතඑන්නෙනි,
උන්වහන්සේ විසින් තෝරාගත්තවුන්
වන යාකොබ්ගේ දරුවෙනි,
6 උන්වහන්සේ කළ පුදුම ක්‍රියාද
උන්වහන්සේගේ ආශ්චර්යයන්ද
උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු
විනිශ්චයන්ද සිහිකරව්.
7 උන්වහන්සේ අපේ දෙවිවූ
ස්වාමීන්වහන්සේය.
උන්වහන්සේගේ විනිශ්චයෝ මුළු
පොළොවෙහිය.
8 උන්වහන්සේ පරම්පරා දහසකට ආඥ
කළ වචනය වන
ස්වකීය ගිවිසුම සදාකාලයට
සිහිකළසේක.
ඒ වනාහි උන්වහන්සේ ආබ්‍රහම් සමග 9
කළ ගිවිසුමය,
ඊසාක්ට දුන් උන්වහන්සේගේ දිවුරුමය;
එය උන්වහන්සේ යාකොබ්ට පනතක්ද 10
ඉශ්‍රායෙල්ට සදාකාල ගිවිසුමක්ද
කොට ස්ථිරකරමින්:
තොපගේ උරුම කොටස වූ 11
කානාන් දේශය තට දෙන්නෙමියි
කියා,
ඔවුන් ගණනින් ස්වල්පව, 12
එසේය, ඉතා ස්වල්පව, එහි විදේශීව
සිටියදී ඔවුන්ට කීසේක.
ඔව්හු ජාතියකින් ජාතියකටත් 13
එක රාජ්‍යයකින් තවත් සෙනඟක්
වෙතටත් ගියෝය.
උන්වහන්සේ ඔවුන්ට අයුත්තක් 14
කරන්ට කිසිවෙකුට අවකාශ
නුදුන්සේක;
එසේය, ඔවුන් ගැන රජුන්ට තරවටු
කරමින්:
මාගේ අභිෂේකලද්දවුන්ට අත 15
නොගසව්,
මාගේ අනාගතවක්තෘවරුන්ට හිංසා
නොකරව්යයි කීසේක.
උන්වහන්සේ දේශයට දුර්භික්ෂයක් 16
පමුණුවා,
මුළු ආහාර වෘත්තිය සිඳදැමූසේක.
ඔවුන්ට පෙරටුව මනුෂ්‍යයෙකු 17
යැවූසේක;
යෝසෙප් දසයෙක් කොට විකුණන
ලද්දේය.
ඔව්හු ඔහුගේ පාද විලංගු ලා 18
රිදෙවුවෝය;
ඔහු යදම්වලින් බඳිනලද්දේය.
ඔහුගේ වචනය සිදුවන තෙක් 19
ස්වාමීන්ගේ වාක්‍යය ඔහු පරීක්ෂා
කෙළේය.
රජතෙම මනුෂ්‍යයන් යවා ඔහු මිදුවේය; 20
එසේය, මනුෂ්‍ය වර්ගයන්ගේ
ආණ්ඩුකාරයා ඔහු නිදහස්කර
ඇරියේය.
තමාගේ ආණ්ඩුකාරයන් කැමතිලෙස 21
බඳින්ටත්,

තමාගේ මන්ත්‍රීන්ට නුවණ දෙන්ටත්,
22 තමාගේ ගෙට ස්වාමියෙක්ද
තමාගේ සියලු සම්පත්තියට
අධිපතියෙක්ද කොට ඔහු
පත්කෙළේය.
23 ඉශ්‍රායෙල්ද මිසරයට ආයේය;
යාකොබ් හාම්ගේ දේශයෙහි විදේශීව
සිටියේය.
24 උන්වහන්සේ ස්වකීය සෙනඟ අතිශයින්
වැඩිකරමින්,
ඔවුන්ගේ එදිරිකාරයන්ට වඩා
බලවත්කළසේක.
25 උන්වහන්සේගේ සෙනඟට වෛර
කරන්ටත්
උන්වහන්සේගේ මෙහෙකරුවන්ට
ප්‍රයෝගකරන්ටත් ඔවුන්ගේ සිත්
හැරෙවූසේක.
26 උන්වහන්සේ ස්වකීය මෙහෙකරුවූ
මෝසෙස්ද
තමන් විසින් තෝරාගත් ආරොන්ද
යැවූසේක.
27 ඔව්හු ඔවුන් අතරේ උන්වහන්සේගේ
ලකුණුද
හාම්ගේ දේශයෙහි ආශ්චර්යයන්ද
කළෝය.
28 උන්වහන්සේ අන්ධකාරය යවා එය
අඳුරුකළසේක;
ඔව්හු උන්වහන්සේගේ වචනයට
විරුද්ධව කැරළි නොගැසුවෝය.
29 උන්වහන්සේ ඔවුන්ගේ ජලය ලේ කොට,
ඔවුන්ගේ මත්ස්‍යයන් නැසූසේක.
30 ඔවුන්ගේ දේශය, තමුන්ගේ රජුන්ගේ
ඇතුල් ගෙවල්හි පවා,
මැඩියන්ගෙන් පිරී ගියාය.
31 උන්වහන්සේ කථාකළසේක, එවිට
මැසිරංචුද
ඔවුන්ගේ රට මුළුල්ලෙහි කිනිතුල්ලෝද
පිරුණෝය.
32 උන්වහන්සේ ඔවුන්ට වැසි වෙනුවට
ගල් වැස්සද
ඔවුන්ගේ දේශයට ගිනිදැල්ද එවූසේක.
33 ඔවුන්ගේ මිදිවැල් සහ අත්තික්කා
ගස්වලට පහරදී,
ඔවුන්ගේ සීමා තුළ ගස් බින්දසේක.
34 උන්වහන්සේ කථාකළසේක,
පළගැටියෝද
අසංඛ්‍ය ගණන් දළඹුවෝද ආවුත්,
ඔවුන්ගේ දේශයෙහි සියලු පලාජාති 35
කෑවෝය,
ඔවුන්ගේ භූමියේ ඵලද කෑවෝය.
උන්වහන්සේ ඔවුන්ගේ සකල ශක්තියේ 36
මුලවූ
ඔවුන්ගේ දේශයෙහි සියලු කුලුඳුලන්ට
පහරදුන්සේක.
තවද උන්වහන්සේ රන්රිදී ඇතුව 37
ඔවුන් පිටත ගෙනාසේක.
උන්වහන්සේගේ ගෝත්‍රවල කිසි
දුර්වලයෙක්ද නොසිටියේය.
ඔවුන් පිටත්ව ගිය කල මිසරය 38
සන්තෝෂවූවාය;
මක්නිසාද එහි වැසියන්ට ඔවුන් ගැන
භයක් පැමිණ තිබුණේය.
උන්වහන්සේ ආවරණය පිණිස 39
වලාකුළක්ද
රාත්‍රියේදී එළිය දීමට ගින්නක්ද
විදහා තැබූසේක.
ඔව්හු ඉල්ලුවෝය, උන්වහන්සේ වටුවන් 40
එවූසේක,
ස්වර්ගීය භෝජනයෙන් ඔවුන්
තෘප්තියට පැමිණවූසේක.
උන්වහන්සේ පර්වතය විවරකළසේක, 41
ජලය පැන නැගී,
ගංගාවක් මෙන් වියළි ස්ථානවල ගලා
ගියේය.
මක්නිසාද උන්වහන්සේ ස්වකීය 42
ශුද්ධ වචනයද
තමන් මෙහෙකරුවූ ආබ්‍රහම්ද
සිහිකළසේක.
උන්වහන්සේ ස්වකීය සෙනඟ ප්‍රීතියද 43
තමන් තෝරාගත්තවුන් ගීතයද
ඇතුව පිටත ගෙනාසේක.
ඔවුන් උන්වහන්සේගේ පනත් රක්ෂා 44
කරන පිණිසත්,
උන්වහන්සේගේ ව්‍යවස්ථා පවත්වන
පිණිසත්,
උන්වහන්සේ ජාතීන්ගේ දේශයන් 45
ඔවුන්ට දුන්සේක;
ඔව්හු මනුෂ්‍ය වර්ගයන්ගේ උත්සාහයේ
ලාභය අයිතිකරගත්තෝය.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## ඉශ්‍රායෙල්ගේ කෙළෙහිගුණ නොසැලකීම සහ අපරාධ

106 ස්වාමීන්ට ප්‍රශංසාකරව්. ස්වාමීන්ට ස්තුතිකරව්; මක්නිසාද
උන්වහන්සේ යහපත්ය.
උන්වහන්සේගේ කරුණාව සදකල් පවත්නේය.
2 ස්වාමීන්ගේ බලවත් ක්‍රියා කියන්ටත්
උන්වහන්සේගේ සියලු ප්‍රශංසාව ප්‍රකාශකරන්ටත් කාට පුළුවන්ද?
3 යුක්තිය රක්ෂාකරන්නෝද
හැම කල්හි ධර්මිෂ්ඨකම් කරන තැනැත්තාද ආශීර්වාදලද්දෝය.
4 මා විසින් ඔබගේ තෝරාගත්තවුන්ගේ ශුභසිද්ධිය දකින පිණිසත්,
ඔබගේ ජාතියගේ සන්තෝෂයට භාගිවන පිණිසත්,
ඔබගේ උරුමයවූවන් සමග ජය ප්‍රකාශකරන පිණිසත්,
5 ස්වාමිනි, ඔබගේ සෙනඟ කෙරෙහි පවත්වන කරුණාවෙන් මා සිහිකළ මැනව;
ඔබගේ ගැළවීම මට ගෙනදුන මැනව.

6 අපි අපේ පියවරුන් හා සමග පව් කෙළෙමුව,
අයුතුකම් කෙළෙමුව, දුෂ්ටලෙස ක්‍රියාකෙළෙමුව.
7 අපේ පියවරු මිසරයේදී ඔබගේ ආශ්චර්යයන් තේරුම් නොගත්තෝය;
ඔබගේ කරුණා රාශිය සිහි නොකළෝය;
මුහුද, එනම් රතු මුහුද ළඟදී කැරළිගැසුවෝය.
8 එසේ වුවත් උන්වහන්සේ තමන් බලපරාක්‍රමය දක්වන පිණිස
ස්වකීය නාමය නිසා ඔබුන් ගැළවූසේක.
9 උන්වහන්සේ රතු මුහුදට තරවටු කළසේක, එය වියළුණේය.
වනයක් මැදින් මෙන් ගැඹුර මැදින් ඔවුන් ගෙනගියසේක.
10 ඔවුන්ට වෛරවූවාගේ අතින් ඔවුන් ගැළවූසේක,
සතුරාගේ අතින් ඔවුන් මිදූසේක.
ජලධාරාවෝ ඔවුන්ගේ 11
විරුද්ධකාරයන් වසාගත්තෝය.
ඔවුන්ගෙන් එක්කෙනෙක්වත් ඉතුරු නොවීය.
එවිට ඔව්හු උන්වහන්සේගේ වචන 12
විශ්වාසකොට,
උන්වහන්සේගේ ප්‍රශංසාව ගායනා කළෝය.
ඔව්හු උන්වහන්සේගේ ක්‍රියා වහාම 13
සිහිනැතිකරමින්,
උන්වහන්සේගේ මන්ත්‍රණය බලා නොසිටියෝය.
වනාන්තරයේදී අධිකලෙස තෘෂ්ණාවට 14
අසුවී,
කාන්තාරයේදී දෙවියන්වහන්සේ පරීක්ෂාකළෝය.
උන්වහන්සේ ඔවුන්ගේ ඉල්ලීම ඉෂ්ට 15
කළසේක;
නුමුත් ඔවුන්ගේ ආත්මය කෘශභාවයට පැමිණවූසේක.
කඳවුරේදී ඔව්හු මෝසෙස්ටත් 16
ස්වාමීන්වහන්සේගේ ශුද්ධ තැනැත්තාවූ ආරොන්ටත් ඊර්ෂ්‍යාකළෝය.
පොළොව විවරව දතාන් ගිලගත්තාය, 17
අබිරාම්ගේ කණ්ඩායමද වසාගත්තාය.
ඔවුන්ගේ කණ්ඩායම මැද ගින්නක් 18
ඇවිළුණේය;
ගිනිදළ දුෂ්ටයන් දවාදැමීය.
ඔව්හු හොරේබ්හිදී වස්සෙකු සාද; 19
වාත්තු රූපයකට නමස්කාරකළෝය.
මෙසේ ඔව්හු තමුන්ගේ මහිමයවූ 20
තැනැත්වහන්සේ
තණකොළ කන ගොනෙකුගේ ස්වරූපයට මාරුකළෝය.
ඔව්හු මිසරයේදී මහත් දේද 21
හාම්ගේ දේශයේදී ආශ්චර්ය ක්‍රියාද
රතු මුහුද ළඟදී භයංකර ක්‍රියාද 22
කළාවූ
තමුන්ගේ ගැළවුම්කාර දෙවියන්වහන්සේ මතකනැතිකළෝය.
එබැවින් උන්වහන්සේ: ඔවුන් විනාශ 23
කරන්නෙමියි කීසේක.
උන්වහන්සේ ඔවුන් විනාශ නොකරන

ලෙස උන්වහන්සේගේ උදහස
පහකරන පිණිස,
උන්වහන්සේ විසින් තෝරාගත්
මෝසෙස් උන්වහන්සේ ඉදිරියේ
කෝප දෙරටුවෙහි නොසිටියේ නම්,
එසේ කරනවා ඇත.
24 ඔව්හු ප්‍රිය උපදවන දේශය හෙළා
දක්කෝය,
උන්වහන්සේගේ වචනය අදහා
නොගත්තෝය.
25 නුමුත් තමුන්ගේ කූඩාරම්වලදී
කොඳුළෝය,
ස්වාමීන්ගේ ශබ්දයට ඇහුම්කන්
නුදුන්නෝය.
26 එබැවින් උන්වහන්සේ, ඔවුන්
වනාන්තරයෙහි හෙළා දමන බවත්,
ඔවුන්ගේ වංශය ජාතීන් අතරේ
හෙළා දමන බවත්,
27 ඔවුන් දේශවල විසුරුවන බවත් කියා,
ස්වකීය හස්තය ඔසවා දිවුළසේක.
28 ඔව්හු බාල්පෙයොර්ටත් බැඳී,
මළවුන්ට පිදූ දේ කෑවෝය.
29 මෙසේ ඔව්හු තමුන්ගේ ක්‍රියාවලින්
උන්වහන්සේ උදහස්කෙරෙවුවෝය;
වසංගතයද ඔවුන් අතරට පැමිණියේය.
30 එවිට පීනෙහාස් නැගිට යුක්තිය
ඉෂ්ටකෙළේය.
මෙසේ වසංගතය නවත්වනලද්දේය.
31 එය සදකල්ම සියලු පරම්පරාවලට
ඔහුට ධර්මිෂ්ඨකම කොට ගණන්
ගන්නාලද්දේය.
32 ඔව්හු මෙරිබාහි වතුර ළඟදීත්
උන්වහන්සේ උදහස්කළෝය,
එබැවින් ඔවුන් නිසා මෝසෙස්ට
නපුර සිද්ධවිය.
33 මක්නිසාද ඔව්හු ඔහුගේ ආත්මයට
විරුද්ධව කැරළිගැසුවෝය,
ඔහුද තමාගේ කටින් අවිචාරයෙන්
කථාකෙළේය.
34 ස්වාමීන් අණකළ ලෙස
ඔව්හු මනුෂ්‍ය වර්ගයන් විනාශ
නොකොට,
35 අන්‍ය ජාතීන් හා මිශ්‍රව,
ඔවුන්ගේ ක්‍රියා ඉගෙනගත්තෝය.
ඔව්හු ඔවුන්ගේ රූපවලට 36
මෙහෙකළෝය,
ඒවා මොවුන්ට මලපතක් විය.
එසේය, ඔව්හු තමුන්ගේ පුත්‍රයන්ද 37
දූවරුන්ද යක්ෂයන්ට පූජාකළෝය,
ඔව්හු නිදෙස් ලේ, එනම් කානාන්හි 38
රූපවලට පූජාකරනු ලැබූ
තමුන්ගේ පුත්‍රයන්ගෙත් දූවරුන්ගෙත්
ලේ වැගිරෙවුවෝය;
දේශයද ලෙයින් දූෂණය විය.
මෙසේ ඔව්හු ස්වකීය කර්මාන්තවලින් 39
කිලුටුව,
තමුන්ගේ ක්‍රියාවලින් වේශ්‍යාකම්
කළෝය.
එබැවින් ස්වාමීන්ගේ උදහස තමන් 40
සෙනඟට විරුද්ධව ඇවිළුණේය,
උන්වහන්සේ තමන් උරුමය
පිළිකුල්කොට,
ජාතීන්ගේ අතට ඔවුන් පාවාදුන්සේක; 41
ඔවුන්ට වෛරවූවෝ ඔවුන් කෙරෙහි
ආණ්ඩුකළෝය.
ඔවුන්ගේ සතුරෝද ඔවුන්ට පීඩා 42
කළෝය,
ඔව්හු සතුරන්ගේ අත යට යටත්
කරනු ලැබුවෝය.
උන්වහන්සේ බොහෝ වර ඔවුන් 43
මිදූසේක;
නුමුත් ඔව්හු ස්වකීය මන්ත්‍රණයෙන්
කැරළිගසා,
ස්වකීය අයුතුකම නිසා පහත්කරනු
ලැබුවෝය.
එසේ වී නුමුත් උන්වහන්සේ ඔවුන්ගේ 44
මොරගැසීම අසා,
ඔවුන්ගේ විපත්තිය බැලූසේක.
ඔවුන් උදෙසා ස්වකීය ගිවිසුම සිහි 45
කොට,
තමන් අධික කරුණාව ලෙස
කැවුණුසේක.
ඔවුන් වහල්කොට ගෙනගිය 46
සියල්ලන්ගෙන්
ඔවුන්ට අනුකම්පාව ලැබෙන්ට
සැලැස්වූසේක.
අපගේ දෙවිවූ ස්වාමීනි, 47
ඔබගේ ශුද්ධවූ නාමයට ස්තුතිකරන

පිණිසත්,
ඔබට ප්‍රශංසාකිරීමෙන් ජය නාද
පවත්වන පිණිසත්,
අප ගළවා ජාතීන් අතරෙන්
රැස් කොටගත මැනව.

ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්ට 48
සදකාලයෙන් සදකාලයටම ප්‍රශංසා
වේවා.
මුළු සෙනඟ ආමෙන් කියත්වා.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## පස්වෙනි කාණ්ඩය.

### ස්වාමීන්වහන්සේගේ කරුණාවන්ත ක්‍රියා ගැන ප්‍රශංසාකිරීමට ආරාධනාවක්

107 ස්වාමීන්ට ස්තුතිකරව්;
මක්නිසාද උන්වහන්සේ
යහපත්ය.
උන්වහන්සේගේ කරුණාව සදකල්
පවත්නේය.
2 ස්වාමීන් විසින් මුදනලද්දෝ එසේ
කියත්වා.
මක්නිසාද උන්වහන්සේ
එදිරිකාරයාගේ අතින් ඔවුන් මුද,
3 දේශවලින් එනම් නැගෙනහිරින් හා
බස්නාහිරින්ද
උතුරෙන් හා දකුණෙන්ද
ඔවුන් රැස්කොට ගත්සේක.
4 ඔව්හු වනාන්තරයෙහි කාන්තාර
මාර්ගයක මුළාව ගියෝය;
වාසයට නුවරක් නොලැබුවෝය.
5 සයින් පීඩිතව පිපාසිතව,
ඔවුන්ගේ ආත්මය ඔවුන් තුළ
ක්ලාන්තවිය.
6 එවිට ඔව්හු තමුන්ගේ විපතේදී
ස්වාමීන්ට මොරගැසුවෝය,
උන්වහන්සේ ඔවුන්ගේ විපත්තිවලින්
ඔවුන් මුදගත්සේක.
7 වාසයකිරීමට යෝග්‍යවූ නුවරකට
පැමිණෙන පිණිස
උන්වහන්සේ හරි මගකින් ඔවුන්
ගෙනගියසේක.
8 ස්වාමීන්ගේ යහපත්කම හා මනුෂ්‍ය
පුත්‍රයන්ට කරන පුදුම ක්‍රියා ගැන
මනුෂ්‍යයෝ උන්වහන්සේට ස්තුති
කෙරෙත්වා.

මක්නිසාද උන්වහන්සේ පිපාසිතයා 9
තෘප්තියට පමුණුවා,
ක්ෂුධා ඇත්තා යහපතින් පිනවනසේක.
සමහරෙක් පීඩාවෙන් සහ යදමින් 10
බඳිනු ලැබ,
අඳුරෙහිද මරණ සෙවණෙහිද
සිටියෝය;
කුමක් හෙයින්ද ඔව්හු 11
දෙවියන්වහන්සේගේ වචනවලට
විරුද්ධව කැරළිගසා,
මහෝත්තමයාණන්ගේ මන්ත්‍රණය
හෙළාදක්කෝය.
ඒ නිසා උන්වහන්සේ වෙහෙස 12
පැමිණවීමෙන් ඔවුන්ගේ සිත්
පහත්කළසේක.
ඔව්හු වැටුණෝය, පිහිටවෙන්ට
කිසිවෙක් නොවීය.
එවිට ඔව්හු තමුන්ගේ විපතේදී 13
ස්වාමීන්ට මොරගැසුවෝය,
උන්වහන්සේ ඔවුන්ගේ විපත්තිවලින්
ඔවුන් ගැළෙවුසේක.
උන්වහන්සේ අඳුරෙන්ද මරණ 14
සෙවණෙන්ද ඔවුන් පිටතට ගෙන,
ඔවුන්ගේ බැමි බින්දසේක.
ස්වාමීන්ගේ යහපත්කම හා මනුෂ්‍ය 15
පුත්‍රයන්ට කරන පුදුම ක්‍රියා ගැන
මනුෂ්‍යයෝ උන්වහන්සේට ස්තුති
කෙරෙත්වා.
මක්නිසාද උන්වහන්සේ පිත්තල 16
දොරවල් බිඳ,
යකඩ පොලු කපාදැමූසේක.
මෝඩයෝ තමුන්ගේ අපරාධ නිසාත් 17
අයුතුකම් නිසාත් පීඩා විඳිති.
ඔවුන්ට සියලු ආකාර කෑම අප්‍රිය වේ; 18

ඔව්හු මරණ ද්වාරවලට ළංවෙති.
19 එවිට ඔව්හු තමුන්ගේ විපතේදී
ස්වාමීන්ට මොරගසති.
උන්වහන්සේ ඔවුන්ගේ විපත්තිවලින්
ඔවුන් ගළවනසේක.
20 උන්වහන්සේ ස්වකීය වචනය එවා
ඔවුන් සුවකොට
ඔවුන්ගේ විනාශවලින්
මුදහරිනසේක.
21 ස්වාමීන්ගේ යහපත්කම හා මනුෂ්‍ය
පුත්‍රයන්ට කරන පුදුම ක්‍රියා ගැන
මනුෂ්‍යයෝ උන්වහන්සේට ස්තුති
කෙරෙත්වා.
22 ඔව්හු ස්තුති පූජා පුද,
ගී කීමෙන් උන්වහන්සේගේ ක්‍රියාවන්
ප්‍රකාශකෙරෙත්වා.
23 නැව්වලින් මුහුදේ යන්නාවූ,
මහත් ජලයේ වැඩකරන්නාවූ
තැනැත්තෝ
24 ස්වාමීන්ගේ ක්‍රියාද
ගැඹුරෙහි උන්වහන්සේගේ පුදුමද
දකිති.
25 මක්නිසාද උන්වහන්සේ අණකොට,
එහි රළ නංවන්නාවූ තද කුණාටුව
හටගන්වනසේක.
26 ඔව්හු අහසට නගිති, ගැඹුරට බසිති.
ඒ විපතින් ඔවුන්ගේ ප්‍රාණය දියවෙයි.
27 ඔව්හු බේබද්දෙකු මෙන් ඇලවෙවී
ඔබ මොබ වැනි වැනී යති,
ඔවුන්ගේ නුවණ නැතිවී යයි.
28 එවිට ඔව්හු තමුන්ගේ විපතේදී
ස්වාමීන්ට මොරගසති,
උන්වහන්සේ ඔවුන්ගේ විපත්තිවලින්
ඔවුන් පිටතට ගෙනෙනසේක.
29 උන්වහන්සේ මුහුදේ රළ නිශ්චලවන
ලෙස
කුණාටුව සන්සිඳවනසේක.
30 එවිට නිශ්චලයක් වූ බැවින් ඔව්හු
සන්තෝෂවෙති;
උන්වහන්සේද රිසිවූ වරායට ඔවුන්
පමුණුවනසේක.
31 ස්වාමීන්ගේ යහපත්කම හා මනුෂ්‍ය
පුත්‍රයන්ට කරන පුදුම ක්‍රියා ගැන
මනුෂ්‍යයෝ උන්වහන්සේට ස්තුති
කෙරෙත්වා.
ඔව්හු ජන සමාගමේදී උන්වහන්සේ 32
උසස්කරමින්,
වැඩිමහල්ලන්ගේ ආසනයේදී
උන්වහන්සේට ප්‍රශංසාකෙරෙත්වා.
උන්වහන්සේ ගංගා කාන්තාරයක්ද 33
දිය උල්පත් වියළි බිමක්ද
කරනසේක;
වැසියන්ගේ දුෂ්ටකම නිසා 34
සාරවූ දේශය ලවණ කාන්තාරයක්
කරනසේක.
උන්වහන්සේ කාන්තාරයක් දිය 35
පොකුණක්ද
වියළි බිමක් දිය උල්පත්ද කරනසේක.
බඩගිනිවූවන් විසින් වාසයට යෝග්‍ය 36
වූ නුවරක් සාදන පිණිසත්,
කෙත් වපුරා, මිදිවතු වවා,
එල ලබාගන්නා පිණිසත්, 37
ඔවුන් එහි වාසයකරවනසේක.
ඔවුන් අතිශයින් බෝවන ලෙස 38
උන්වහන්සේ ඔවුන්ට
ආශීර්වාදකරනසේක;
ඔවුන්ගේ සිව්පාවුන් අඩුවෙන්ට
නොදෙනසේක.
ඉන්පසු ඔව්හු පීඩා, විපත්ති හා දුක් 39
නිසා
අඩුවී පහත්කරනු ලබති.
උන්වහන්සේ අධිපතීන් කෙරෙහි 40
නින්දව වගුරුවා,
මං නැති පාළු තැන්වල මුළාවයන්ට
සලස්වනසේක.
එහෙත් උන්වහන්සේ දිළිඳු පීඩාවෙන් 41
මුදා උසස්කොට,
බැටළු රැළක් මෙන් ඔහුගෙන් පවුල්
උපදවනසේක.
අවංකයෝ ඒ දැක සන්තෝෂවන්නෝය; 42
සියලු ආකාර අයුතුකමද කට
පියාගන්නේය.
නුවණැත්තේ මේ දේ සිතට ගනියි, 43
ඔව්හු ස්වාමීන්ගේ කරුණාවන්තකම්
කල්පනාකරන්නෝය.

## වර්ණනාකිරීම. පිහිට ලැබීමට යාච්ඤා කිරීම

# 108

දාවිත්ගේ කාව්‍ය ගීතයකි.

1 දෙවියන්වහන්ස, මාගේ සිත ස්ථිරය;
මම ගී කියන්නෙමි, එසේය, මාගේ
මහිමයෙන් ප්‍රශංසා ගී කියන්නෙමි.
2 වීණාව සහ මහා වීණාව පිබිදෙව්,
මමද ඉතා අලුයම පුබුදින්නෙමි.
3 ස්වාමිනි, මනුෂ්‍ය වර්ගයන් අතරේ
ඔබට ස්තුතිකරන්නෙමි,
ජාතීන් අතරේ ඔබට ප්‍රශංසා ගී
කියන්නෙමි.
4 මක්නිසාද ඔබගේ කරුණාව ස්වර්ග
ඉක්මවා මහත්ව තිබේ,
ඔබගේ සත්‍යයද අහස දක්වා
පවත්නේය.
5 දෙවියන්වහන්ස, ඔබ ස්වර්ගවලට වඩා
උසස්වුව මැනව.
ඔබගේ මහිමයද මුළු පොළොවෙහි
උසස්වේවා.
6 ඔබගේ ප්‍රිය තැනැත්තන් මුදනු ලබන
පිණිස,
ඔබගේ දකුණතින් ගළවා, අපට
උත්තරදුන මැනව.
7 දෙවියන්වහන්සේ ස්වකීය ශුද්ධකමින්
කථාකළසේක; මම ප්‍රීතිමත්වන්නෙමි.
ෂෙකෙම් බෙදන්නෙමි, සුක්කොත්
මිටියාවත මැනදෙන්නෙමි.
8 ගිලියද් මාගේය; මනස්සේ මාගේය;
එප්‍රායිම්ද මාගේ හිසට ආරක්ෂාවය;
යූදා මාගේ ජයකොන්තයය.
9 මෝවබ් මාගේ පා සෝදන භාජනයය;
ඒදොම පිට මාගේ වහන් හෙළන්නෙමි,
පිලිස්තියාව සඳහා ජයඝෝෂා
පවත්වන්නෙමි.
10 බලකොටු සහිත නුවරට මා
පමුණුවන්නේ කවුද?
ඒදොමට මා ගෙනගියේ කවුද?
11 දෙවියන්වහන්ස, ඔබ අප පහ
නොකළසේක්ද?
දෙවියන්වහන්ස, ඔබ අපේ සේනාවන්
සමග නොයනසේක.
12 එදිරිකාරයාට විරුද්ධව අපට පිහිටවුව
මැනව,
මක්නිසාද මනුෂ්‍යයාගේ පිහිට
නිෂ්ඵලය.
දෙවියන්වහන්සේ කරණකොටගෙන 13
වික්‍රමාන්විතව ක්‍රියාකරන්නෙමුව.
මක්නිසාද අපේ එදිරිකාරයන් පාගා
හෙළන්නේ උන්වහන්සේය.

## සතුරාගෙන් පළිගැනීමට ඉල්ලීම

# 109

නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ ගීතයකි.

මාගේ ප්‍රශංසා භූමියවූ දෙවියන්වහන්ස, 1
නිශ්ශබ්දනූව මැනව;
මක්නිසාද දුෂ්ටයාගේ මුඛයද රැවටිලි 2
මුඛයද මට විරුද්ධව ඇරියෝය.
ඔව්හු බොරු කියන දිවකින් මට කථා
කළෝය.
ඔව්හු ද්වේෂ වචනවලින් මා වට කොට, 3
නිෂ්කාරණයේ මට විරුද්ධව සටන්
කළෝය.
මාගේ ප්‍රේමය වෙනුවට ඔව්හු මට 4
එදිරිකාරයෝව සිටිති.
නුමුත් මම යාච්ඤාවෙහිම යෙදීසිටිමි.
තවද මට ඔව්හු යහපතට අයහපතද 5
මාගේ ප්‍රේමයට වෛරයද කළෝය.
ඔහු කෙරෙහි දුෂ්ටයෙකු පත්කළ මැනව. 6
විරුද්ධකාරයෙක් ඔහුගේ දකුණතින්
සිටීවා.
විනිශ්චයේදී ඔහු වරදකාරයෙක් වේවා; 7
ඔහුගේ යාච්ඤාවද පාපයක් වේවා.
ඔහුගේ දවස් ස්වල්ප වේවා, 8
ඔහුගේ තනතුර අනිකෙක් ගනීවා,
ඔහුගේ දරුවෝ පියා නැත්තෝ 9
වෙත්වා,
ඔහුගේ භාර්යාවද වැන්දඹුවක් වේවා.
ඔහුගේ දරුවෝ පාදඩයෝව 10
සිඟාකත්වා;
ඔව්හු තමුන්ගේ පාළු ඉඩම්වලින් කෑම
සොයත්වා.
ණය හිමියා ඔහු සන්තක සියල්ලම 11
අල්වා ගනීවා;
විදේශියෝ ඔහුගේ උත්සාහයේ ලාභය
කොල්ලකත්වා.

12 ඔහුට කරුණාකරන්ට කිසිවෙක් නොවේවා;
ඔහුගේ පියා නැති දරුවන්ට අනුකම්පාකරන්ට කිසිවෙක් නොසිටීවා.
13 ඔහුගෙන් පැවතඑන්නෝ සිඳදමනු ලබත්වා;
එන පරම්පරාවේදී ඔවුන්ගේ නම මැකේවා.
14 ඔහුගේ පියවරුන්ගේ අයුතුකම ස්වාමීන් ඉදිරියෙහි සිහිව පවතීවා,
ඔහුගේ පාපය නොමැකේවා.
15 ඔවුන් සිහිවීම ස්වාමීන් විසින් පොළොවෙන් සිඳදමන පිණිස
ඒවා උන්වහන්සේ ඉදිරියෙහි නිතරම පවතීවා.
16 මක්නිසාද ඔහු දයා පැවැත්වීම සිහි නොකොට,
දුප්පතා හා දිළිඳුද
බිඳුණු සිත් ඇත්තාද මරන පිණිස පීඩාකෙළේය.
17 එසේය, ශාපකිරීමට ඔහු ප්‍රියවිය, ඒක ඔහුට පැමුණුණේය;
ඔහු ආශීර්වාදකිරීමට ප්‍රිය නොවීය, ඒක ඔහුගෙන් දුරුව තිබුණේය.
18 ඔහු ශාපකිරීම තමාගේ වස්ත්‍රය මෙන් හැඳගත්තේය,
එය ඔහු තුළට දිය මෙන්ද
ඔහුගේ ඇට තුළට තෙල් මෙන්ද ආයේය.
19 එය තමා පොරවන වස්ත්‍රය මෙන්ද
නිතර බඳින ඉඟපටිය මෙන්ද ඔහුට වේවා.
20 මාගේ එදිරිකාරයන්ටත් මාගේ ප්‍රාණයට විරුද්ධව නපුර කථාකරන්නන්ටත්
ස්වාමීන්ගෙන් ලැබෙන විපාකය මේය.
21 නුමුත් ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ නාමය නිසා මා සමග ක්‍රියාකළ මැනව.
ඔබගේ කරුණාව යහපත් බැවින් මා මුදගත මැනව.
22 මක්නිසාද මම දුප්පත්මි, දිළින්දෙමි,
මාගේ සිත මා තුළේ තුවාලවී තිබේ.
බැසයන සෙවණැල්ලක් මෙන් පහව යමි. 23
පළඟැටියා මෙන් ඔබ මොබ එළවනු ලබමි.
නිරාහාරව සිටීමෙන් මාගේ දණහිස් දුර්වලය; 24
මාගේ මාංසයේ තරකමක් නැත.
මම ඔවුන්ට නින්දාවක්ව සිටිමි. 25
ඔව්හු මා දකිනවිට හිස් වනති.
මාගේ දෙවිවූ ස්වාමීනි, මට පිහිටවුව මැනව; 26
ඔබගේ කරුණාව ප්‍රකාර මා ගැළෙවුව මැනව.
එවිට මෙය ඔබගේ හස්තය බවත්, 27
ස්වාමීනි, ඔබ මේක කළ බවත් ඔව්හු දැනගන්නෝය.
ඔවුන් ශාපකළාවේ, නුමුත් ඔබ ආශීර්වාදකළ මැනව; 28
ඔව්හු නැගිටින කල ලජ්ජාවන්නෝය, නුමුත් ඔබගේ මෙහෙකරුවා ප්‍රීතිවන්නේය.
මාගේ එදිරිකාරයෝ අගෞරවයෙන් පළඳනු ලබත්වා, 29
උතුරු සළුවකින් මෙන් තමුන්ගේ ලජ්ජාවෙන් තමුන්ම වසාගනිත්වා.
මාගේ මුවෙන් ස්වාමීන්ට බොහෝසෙයින් ස්තුතිකරන්නෙමි; 30
එසේය, සමූහයා අතරේදී උන්වහන්සේට ප්‍රශංසාකරන්නෙමි.
මක්නිසාද දිළිඳුගේ ආත්මය විනිශ්චය කරන්නන්ගෙන් ගළවන පිණිස 31
උන්වහන්සේ ඔහුගේ දකුණතින් සිටිනසේක.

## පූජකවූ රජ්ජුරුවන්ගේ ආනුභාව

දාවිත්ගේ ගීතයකි.

# 110

ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්ට කථාකොට: 1
මා විසින් නුඹේ සතුරන් නුඹේ පාපුටුව කරනතෙක් මාගේ දකුණු පැත්තෙහි හිඳින්නැයි කීසේක.

2 ස්වාමීන්වහන්සේ සියොන්හි සිට
ඔබගේ ශක්තිය නැමති සැරයටිය
එවනසේක.
ඔබගේ සතුරන් මැද ආණ්ඩුකළ මැනව.
3 ඔබගේ පරාක්‍රමයේ දවසේදී ඔබගේ
සෙනඟ කැමැත්තෙන් පූජාවෙති.
උදය ගර්භයෙන් නිකුත්වූ, ශුද්ධකමේ
අලංකාරයෙන් යුක්තවූ
ඔබගේ යෞවනකමේ පිනි ඔබට
ඇත්තේය.
4 තුඹ මෙල්කිසදෙක්ගේ පිළිවෙළින්
සදකාලයටම පූජකයෙකැයි
ස්වාමීන්වහන්සේ දිවුළසේක; එය
වෙනස් නොකරනසේක.
5 ඔබගේ දකුණු පැත්තෙහි සිටින
ස්වාමීන්වහන්සේ
ස්වකීය උදහසේ දවසේදී රජුන්
ගසා හෙළනසේක.
6 උන්වහන්සේ ජාතීන් අතරෙහි
විනිශ්චයකරනසේක,
මළකඳන්වලින් දේශයන් පුරවමින්,
බොහෝ රටවල අධිපතීන්
ගසාහෙළනසේක.
7 උන්වහන්සේ මාර්ගයෙහිදී දෙළින්
පානයකරනසේක;
එබැවින් හිස ඔසවනසේක.

## ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකිරීමට ඇති කාරණා

111 ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකරව්.
අවංකයින්ගේ සමාගමේදීද
සභාවේදීද
මාගේ මුළු සිතින් ස්වාමීන්ට ස්තුති
කරන්නෙමි.
2 ස්වාමීන්ගේ ක්‍රියා මහත්ය,
ඒවාට ප්‍රියවන සියල්ලෝ ඒවා සොයා
මෙනෙහිකරති.
3 උන්වහන්සේගේ ක්‍රියාව ගෞරවයෙන්
හා මහිමයෙන් යුක්තය.
උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සදකල්
පවත්නේය.
4 උන්වහන්සේ තමන් ආශ්චර්ය ක්‍රියා
සිහිවෙන්ට සැලැස්වූසේක.
ස්වාමීන්වහන්සේ දයාවන්තය,
අනුකම්පාවෙන් පූර්ණය.
උන්වහන්සේ තමන් කෙරෙහි භය 5
ඇත්තන්ට කෑම දුන්සේක.
උන්වහන්සේ ස්වකීය ගිවිසුම සදකල්ම
සිහිකරනසේක.
උන්වහන්සේ ජාතීන්ගේ උරුමය තමන් 6
සෙනඟට දීමෙන්
තමන් ක්‍රියා බලය ඔවුන්ට
පෙන්වූසේක.
උන්වහන්සේගේ කර්මාන්තයෝ සත්‍යය 7
හා යුක්තිය වෙති;
උන්වහන්සේගේ පනත් සියල්ල නියතය.
ඒවා නිතරම සදකාලයටම පිහිටුවා 8
තිබේ,
ඒවා සැබෑකමෙන් හා අවංකකමින්
කරන ලද්දේය.
උන්වහන්සේ තමන් සෙනඟට මිදීම 9
එවූසේක;
තමන් ගිවිසුම සදකාලයටම
නියමකළසේක.
උන්වහන්සේගේ නාමය ශුද්ධය,
ගරුකටයුතුය.
ස්වාමීන් කෙරෙහි භයවීම ප්‍රඥාවේ 10
පටන්ගැන්මය;
ඊට එකඟව හැසිරෙන සියල්ලන්ට
යහපත් බුද්ධියක් ඇත්තේය.
උන්වහන්සේගේ ප්‍රශංසාව සදකල්
පවත්නේය.

## ස්වාමීන්වහන්සේට භයවන්නාගේ වාසනාවන්තකම

112 ස්වාමීන්ට ප්‍රශංසාකරව්.
ස්වාමීන් කෙරෙහි භයවන්නාවූ
උන්වහන්සේගේ ආඥාවලට ඉතා
ප්‍රියවන්නාවූ මනුෂ්‍යයා පිනැත්තේය.
ඔහුගේ වංශය පොළොවෙහි බලවත් 2
වන්නේය.
අවංකයන්ගේ පරම්පරාව ආශීර්වාද
ලබන්නේය.
සම්පත්ද වස්තුද ඔහුගේ ගෙයි ඇත්තාහ. 3
ඔහුගේ ධර්මිෂ්ඨකම සදකල්
පවත්නේය.
සත්පුරුෂයාට අන්ධකාරයෙහිදී 4
ආලෝකය උදවේ.

ඔහු දයාවන්තය, අනුකම්පාවෙන්
පූර්ණය, ධර්මිෂ්ඨය.
5 කරුණාකරන, ණයට දෙන
මනුෂ්‍යයාට ශුභ සිද්ධවේ;
ඔහු විනිශ්චයේදී තමාගේ කාරණය
ඉෂ්ටකරගන්නේය.
6 මක්නිසාද ඔහු කිසි කලෙකත්
නොසෙල්වන්නේය;
ධර්මිෂ්ඨයා සදකල්ම සිහිකරනු
ලබන්නේය.
7 ඔහු නරක ආරංචිවලට භය
නොවන්නේය.
ඔහුගේ සිත ස්වාමීන් කෙරෙහි
විශ්වාසය තබමින් ස්ථිරව තිබේ.
8 ඔහුගේ සිත සවිව තිබේ,
තමා කැමති ලෙස එදිරිකාරයන්ට
සිදුවෙනවා දකිනතුරු ඔහු භය
නොවන්නේය.
9 ඔහු විසිරවූයේය, දිළිඳුන්ට දුන්නේය;
ඔහුගේ ධර්මිෂ්ඨකම සදකල්
පවත්නේය.
ඔහුගේ අඟ ගෞරවයෙන්
උසස්වන්නේය.
10 දුෂ්ටයා ඒ දැක ශෝකවන්නේය;
ඔහු දත්මිටිකා පහව යන්නේය.
දුෂ්ටයන්ගේ ආශාව ඉෂ්ට
නොවන්නේය.

## ස්වාමීන්වහන්සේගේ අතිඋත්තමභාවයේ වර්ණනාව

113 ස්වාමීන්ට ප්‍රශංසාකරව්.
ස්වාමීන්ගේ මෙහෙකරුවෙනි,
ප්‍රශංසාකරව්,
ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසාකරව්.
2 මෙතැන් පටන් සදකල්
ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසාවේවා;
3 නැගෙනහිර පටන් බස්නාහිර දක්වා
ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසා
කටයුතුය.
4 ස්වාමීන්වහන්සේ සියලු ජාතීන්ට
උසස්ව සිටිනසේක,
උන්වහන්සේගේ තේජස ස්වර්ගවලට
වඩා උසස්ය.
උසස් තැන්හි වැඩ හිඳින්නාවූ, 5
ස්වර්ගයේද පෘථිවියේද තිබෙන දේ
බලන්ට තමන්ම යටත්වන්නාවූ 6
අපේ දෙවිවූ ස්වාමීන්ට සමාන කවුද?
අධිපතීන් සමග, 7
එනම්, ස්වකීය සෙනඟගේ අධිපතීන්
සමග, හිඳුවන පිණිස
උන්වහන්සේ දුප්පතා ධූලියෙන් 8
නැගුටුවනසේක,
දිළිඳු කසල ගොඩින් ඔසවනසේක.
උන්වහන්සේ වඳ ස්ත්‍රිය 9
දරුවන් ඇති ගෙය රක්නාවූ ප්‍රීතිමත්
මවෙක් කරවනසේක.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## ස්වාමීන්වහන්සේ ගෙනදුන් මවිතවූ මිදීම

114 ඉශ්‍රායෙල් මිසරයෙන්ද
යාකොබ්ගේ වංශය අන්‍ය
භාෂාවක් ඇති මනුෂ්‍ය ජාතියකින්ද
නික්ම ගිය කල
යූද උන්වහන්සේගේ ශුද්ධස්ථානය විය, 2
ඉශ්‍රායෙල් උන්වහන්සේගේ රාජ්‍යය විය.
මුහුද ඒ දැක පලාගියේය; 3
යොර්දන් ගඟ ආපසු හරවනු ලැබුවාය.
කඳු බැටළුවන් මෙන්ද 4
කුඩා හෙල් බැටළුපැටවුන් මෙන්ද
පෙංකෙළියෝය.
එම්බා මුහුද, තා පලායන්නෙත්, 5
යොර්දන, තී ආපසු හැරෙන්නෙත්
තොපට කුමක් වෙලාද?
එම්බා කඳු, තොප බැටළුවන් මෙන්ද 6
කුඩා හෙල්, තොප බැටළුපැටවුන්
මෙන්ද පෙංකෙළින්නේ තොපට
කුමක් වෙලාද?
එම්බා පොළොව පර්වතය දිය 7
පොකුණක්ද
ගිනිගල දිය උල්පතක්ද කළාවූ
ස්වාමීන් ඉදිරියෙහි, 8
එනම් යාකොබ්ගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි, වෙවුලව.

## දේවතා රූප නොව, දෙවියන්වහන්සේ ඇදහිය යුතු බව

115 ස්වාමිනි, අපට නොව, අපට
නොව,
ඔබගේ කරුණාව නිසාත් සැබෑකම
නිසාත්
ඔබගේ නාමයට ගෞරවය දුන මැනව.
2 ඔවුන්ගේ දෙවියෝ දැන් කොතැන්හිදැයි
ජාතීන් විසින් කියන්ට ඉඩදෙන්නේ
මන්ද?
3 එහෙත් අපේ දෙවියන්වහන්සේ
ස්වර්ගයෙහිය.
උන්වහන්සේ කැමති කොයි දෙයක්
නුමුත් කළසේක.
4 ඔවුන්ගේ දේවතා රූප රන් රිදීය,
මනුෂ්‍යයන්ගේ හස්තකර්මාන්තයෝය.
5 ඒවාට කටවල් ඇත, එහෙත්
කථා නොකෙරෙති;
ඇස් ඇත, එහෙත් නොදකිති;
6 කන් ඇත, එහෙත් නොඅසති;
නාස් ඇත, එහෙත් ගඳ සුවඳ නොදනිති;
7 අත් ඇත, එහෙත් නාල්ලති;
පා ඇත, එහෙත් නොඇවිදිති;
උගුරෙන් කථා නොකෙරෙති.
8 ඒවා සාදන්නොත්
ඒවා කෙරෙහි විශ්වාසය තබන
සියල්ලොත් ඒවාට සමානවන්නෝය.
9 එම්බා ඉශ්‍රායෙල්, **ස්වාමීන්** කෙරෙහි
විශ්වාසකරව.
ඔවුන්ගේ උපකාරයත් පලිහත්
උන්වහන්සේය.
10 එම්බා ආරොන්ගේ වංශය, **ස්වාමීන්**
කෙරෙහි විශ්වාසකරව්.
ඔවුන්ගේ උපකාරයත් පලිහත්
උන්වහන්සේය.
11 **ස්වාමීන්** කෙරෙහි භය ඇත්තෙනි,
**ස්වාමීන්** කෙරෙහි විශ්වාසකරව්.
ඔවුන්ගේ උපකාරයත් පලිහත්
උන්වහන්සේය.
12 **ස්වාමීන්වහන්සේ** අප සිහිකළසේක;
අපට ආශීර්වාදකරනසේක.
උන්වහන්සේ ඉශ්‍රායෙල් වංශයට
ආශීර්වාදකරනසේක;
උන්වහන්සේ ආරොන්ගේ වංශයට
ආශීර්වාදකරනසේක.
13 **ස්වාමීන්** කෙරෙහි භය ඇති ලොකු
කුඩා සියල්ලන්ට
උන්වහන්සේ ආශීර්වාදකරනසේක.
**ස්වාමීන්වහන්සේ** නුඹලා හා නුඹලාගේ 14
දරුවන්
වඩ වඩා වර්ධනයකරනසේක්වා.
අහසත් පොළොවත් මැවූ 15
**ස්වාමීන්ගෙන්** නුඹලා
ආශීර්වාදලද්දෝය.
ස්වර්ග වනාහි **ස්වාමීන්ගේ** ස්වර්ගය; 16
නුමුත් පොළොව උන්වහන්සේ මනුෂ්‍ය
පුත්‍රයන්ට දුන්සේක.
මළාහුවත් නිශ්ශබ්ද ස්ථානයට 17
යන්නාහුවත්
**ස්වාමීන්ට** ප්‍රශංසා නොකෙරෙති;
නුමුත් අපි මෙතැන් පටන් සදාකල්ම 18
**ස්වාමීන්** වර්ණනාකරන්නෙමුව.
**ස්වාමීන්ට** ප්‍රශංසාකරව්.

## මරණීය අනතුරෙන් මිදීම ගැන ස්තුති දීම

116 **ස්වාමීන්ට** ප්‍රේමකරමි,
මක්නිසාද උන්වහන්සේ
මාගේ ශබ්දයද මාගේ කන්නලව්වද
ඇසූසේක.
උන්වහන්සේ මා දෙසට කන් නැමූ 2
බැවින්
ජීවත්ව සිටින තෙක් මම උන්වහන්සේට
යාච්ඤාකරන්නෙමි.
මරණයේ රැහැනෙන් වටකරනු ලැබීමි, 3
*මෙයෝලේ වේදනා මා
අල්වාගත්තේය.
විපත හා දුක මට පැමුණුණේය.
එවිට මම **ස්වාමීන්ගේ** නාමයෙන් 4
යාච්ඤාකරමින්:
**ස්වාමිනි**, මාගේ ප්‍රාණය මිදුව මැනවයි
කීයෙමි.
**ස්වාමීන්වහන්සේ** දයාවන්තය, 5
ධර්මිෂ්ඨය;
එසේය, අපේ දෙවියන්වහන්සේ
අනුකම්පාවෙන් යුක්තය.

*හෙවත්, පාතාලයේ

6 ස්වාමීන්වහන්සේ යටහතුන්
ආරක්ෂාකරනසේක.
මම පහත්කරනු ලැබීම්, උන්වහන්සේ
මා ගළවාගත්සේක.
7 මාගේ ආත්මය, තාගේ නිවාඩුවට
හැරී යව;
මක්නිසාද ස්වාමීන්වහන්සේ තට
බොහෝසේ යහපත්කම් කළසේක.
8 මක්නිසාද ඔබවහන්සේ මාගේ ආත්මය
මරණයෙන්ද
මාගේ ඇස් කඳුළෙන්ද
මාගේ පාද පැකිලීමෙන්ද ගැළවූසේක.
9 ජීවතුන්ගේ දේශයෙහි
ස්වාමීන් ඉදිරියෙහි හැසිරෙන්නෙමි.
10 මම විශ්වාසකරමි, එබැවින්
කථාකරන්නෙමි.
මම බොහෝසේ පීඩිතවීමි.
11 සියලු මනුෂ්‍යයෝම බොරුවකැයි
මාගේ ඉක්මන්කමින් කීමි.
12 ස්වාමීන් විසින් මට කළාවූ සියලු
යහපත්කම් ගැන
උන්වහන්සේට කුමක් දෙම්ද?
13 මම ගැළවීමේ කුසලාන රැගෙන,
ස්වාමීන්ගේ නාමයෙන්
යාච්ඤාකරන්නෙමි.
14 එසේය, ස්වාමීන්ගේ මුළු සෙනඟ
ඉදිරියෙහි
මාගේ භාර උන්වහන්සේට
ඉෂ්ටකරන්නෙමි.
15 ස්වාමීන්ගේ ශුද්ධවන්තයන්ගේ මරණය
උන්වහන්සේ ඉදිරියෙහි අනර්ඝය.
16 ස්වාමීනි, සැබවින් මම ඔබගේ
මෙහෙකරුයෙමි.
ඔබගේ මෙහෙකරුයෙමි, ඔබගේ
දසියගේ පුත්‍රයෙමි;
ඔබ මාගේ බැඳුම් මිදූසේක.
17 මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි,
ස්වාමීන්ගේ නාමයෙන්
යාච්ඤාකරන්නෙමි.
18 එසේය, ස්වාමීන්ගේ මුළු සෙනඟ
ඉදිරියෙහි
මාගේ භාර උන්වහන්සේට
ඉෂ්ටකරන්නෙමි.
ස්වාමීන්ගේ ගෘහ මළුවලදීත් 19
එම්බා යෙරුසලම, තී මැදදීත් එසේ
කරන්නෙමි.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## ප්‍රශංසාකිරීමට ආරාධනාව

117

සියලු ජාතීනි, ස්වාමීන්ට
ප්‍රශංසාකරව්;
සියලු මනුෂ්‍ය වර්ගයෙනි, උන්වහන්සේ
වර්ණනාකරව්.
මක්නිසාද අප කෙරෙහි 2
උන්වහන්සේගේ කරුණාව මහත්ය;
ස්වාමීන්ගේ සැබෑකම සදාකාලයට
පවත්නේය.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## පාස්කු මංගල්‍ය ස්තුති ගීයක්

118

ස්වාමීන්ට ස්තුතිකරව්;
මක්නිසාද උන්වහන්සේ
යහපත්ය.
උන්වහන්සේගේ කරුණාව සදාකාලයට
පවත්නේය.
උන්වහන්සේගේ කරුණාව සදාකාලයට 2
පවත්නේයයි
ඉශ්‍රායෙල් දැන් කියත්වා.
උන්වහන්සේගේ කරුණාව සදාකාලයට 3
පවත්නේයයි
ආරොන්ගේ වංශය දැන් කියත්වා.
ස්වාමීන්ගේ කරුණාව සදාකාලයට 4
පවත්නේයයි
උන්වහන්සේ කෙරෙහි භය ඇත්තෝ
දැන් කියත්වා.
මාගේ විපත්තියේදී ස්වාමීන්ට 5
යාච්ඤාකෙළෙමි.
ස්වාමීන්වහන්සේ මට උත්තරදෙමින්,
නිදහස් තැනක මා සිටෙවූසේක.
ස්වාමීන්වහන්සේ මාගේ පක්ෂයෙහිය; 6
භය නොවන්නෙමි.
මනුෂ්‍යයා මට කුමක් කළ හැක්කේද?
මට උපකාරකරන්නන් අතරෙහි 7
ස්වාමීන්වහන්සේ මාගේ

පක්ෂයෙහිය.
එබැවින් මට වෛරවන්තන්ට මාගේ
ආශාව සිද්ධවෙනවා දකින්නෙමි.
8 මනුෂ්‍යයා කෙරෙහි විශ්වාසය තැබීමට
වඩා
**ස්වාමීන්** කෙරෙහි ඇදහීම යහපත.
9 අධිපතීන් කෙරෙහි විශ්වාසය තැබීමට
වඩා
**ස්වාමීන්** කෙරෙහි ඇදහීම යහපත.
10 සියලු මනුෂ්‍ය ජාතීහු මා වටකළෝය.
**ස්වාමීන්**ගේ නාමයෙන් මම ඔවුන්
සිඳදමන්නෙමි.
11 ඔව්හු මා වටකළෝය; එසේය, මා
වටකළෝය.
**ස්වාමීන්**ගේ නාමයෙන් මම ඔවුන්
සිඳ දමන්නෙමි.
12 ඔව්හු මීමැස්සන් මෙන් මා වටකළෝය;
කටු දර ගින්නක් මෙන් නිවීගියෝය.
**ස්වාමීන්**ගේ නාමයෙන් ඔවුන්
සිඳදමන්නෙමි.
13 වැටෙන පිණිස තුඹ තදින් මා
තෙරපූයෙහිය.
තුමුත් **ස්වාමීන්**වහන්සේ මට පිහිට
වූසේක.
14 **ස්වාමීන්**වහන්සේ මාගේ ශක්තිය හා
ගීතිකාවය;
උන්වහන්සේ මාගේ ගැළවීම වී
සිටිනසේක.
15 ප්‍රීතිවීමේ හා ගැළවීමේ ශබ්දය
ධර්මිෂ්ඨයන්ගේ කූඩාරම්වලය.
**ස්වාමීන්**ගේ දකුණු හස්තය
වික්‍රමාන්විතව ක්‍රියාකරයි.
16 **ස්වාමීන්**ගේ දකුණු හස්තය උසස්ය.
**ස්වාමීන්**ගේ දකුණු හස්තය
වික්‍රමාන්විතව ක්‍රියාකරයි.
17 මම නොනැසී, ජීවත්ව සිට,
**ස්වාමීන්**ගේ ක්‍රියා ප්‍රකාශකරන්නෙමි.
18 **ස්වාමීන්**වහන්සේ දඬුවම්කොට මා
හික්මවූසේක.
තුමුත් මා මරණයට පාවා
නුදුන්සේක.
19 මට ධර්මිෂ්ඨකමේ දොරටු හරිව්
මම එයින් ඇතුල්ව **ස්වාමීන්**ට ස්තුති
කරන්නෙමි.
**ස්වාමීන්**ගේ දොරටුව මේය; 20
ධර්මිෂ්ඨයෝ එයින් ඇතුල්වන්නෝය.
මම ඔබට ස්තුතිකරන්නෙමි, මක්නිසාද 21
ඔබ මට උත්තරදී,
මාගේ ගැළවීම වී සිටිනසේක.
ගෙය සාදන්නන් විසින් එපාකළ 22
ගලම
කොනේ ප්‍රධාන ගල විය.
මේක **ස්වාමීන්**ගේ ක්‍රියාවය; 23
එය අපේ ඇසට ආශ්චර්යමත්ය.
**ස්වාමීන්** විසින් සෑදූ දවස මේය; 24
එහිදී අපි ප්‍රීතිවෙමුව, සන්තෝෂවෙමුව.
**ස්වාමීනි**, දැන් අප ගැළෙවුව මැනව. 25
**ස්වාමීනි**, දැන් අප සඵලකළ මැනව.
**ස්වාමීන්**ගේ නාමයෙන් එන තැනැත්තේ 26
ආශීර්වාදලද්දේය.
**ස්වාමීන්**ගේ ගෘහයේ සිට අපි තුඹලාට
ආශීර්වාදකෙළෙමුව.
**ස්වාමීන්**වහන්සේ දෙවියන්වහන්සේය, 27
උන්වහන්සේ අපට එළිය දුන්සේක.
පූජාසනයේ අංවල පූජාව රැහැනින්
බඳිව්.
ඔබ මාගේ දෙවියන්වහන්සේය, ඔබට 28
ස්තුතිකරන්නෙමි.
ඔබ මාගේ දෙවියන්වහන්සේය, ඔබ
උසස්කරන්නෙමි.
**ස්වාමීන්**ට ස්තුතිකරව්; මක්නිසාද 29
උන්වහන්සේ යහපත්ය.
උන්වහන්සේගේ කරුණාව සදාකල්
පවත්නේය.

## දේව පනතේ මාහැඟිකම
## א ආලෙෆ්

# 119

*නිර්දෝෂ මාර්ගයෙහි
යන්නාවූ,
**ස්වාමීන්**ගේ ව්‍යවස්ථාවෙහි
හැසිරෙන්නාවූ තැනැත්තෝ
භාග්‍යවන්තයෝය.

*හෙවත්, සම්පූර්ණ.

2 උන්වහන්සේගේ ශික්ෂා පවත්වන්නාවූ,
මුළු සිතින් උන්වහන්සේ සොයන්නාවූ
තැනැත්තෝ භාග්‍යවන්තයෝය.
3 එසේය, ඔව්හු කිසි අධර්මිෂ්ඨකමක්
නොකෙරෙති;
ඔව්හු උන්වහන්සේගේ මාර්ගවල
හැසිරෙති.
4 අප විසින් ඔබගේ නියෝග
උත්සාහයෙන් පවත්වන පිණිස
ඔබ ඒවා අපට අණකළසේක.
5 ඔබගේ පනත් පවත්වන පිණිස
මාගේ මාර්ග ස්ථිර නම් කොපමණ
යහපත්ද!
6 ඔබගේ ආඥා සියල්ල සලකන විට
මම ලජ්ජා නොවන්නෙමි.
7 ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් මා
ඉගෙනගන්න කල
සිතේ අවංකකමින් ඔබට
ස්තුතිකරන්නෙමි.
8 ඔබගේ පනත් පවත්වන්නෙමි,
මා සහමුලින්ම අත් නොහළ මැනව.

## ב බෙත්

9 තරුණයෙක් තමාගේ මාර්ගය පවිත්‍ර
කරගන්නේ කුමකින්ද?
ඔබගේ වචනය ප්‍රකාර පැවැත්මෙනි.
10 මාගේ මුළු සිතින් ඔබ සෙව්වෙමි.
ඔබගේ ආඥාවලින් මුළාවයන්ට මට
ඉඩ නුදුන මැනව.
11 ඔබට විරුද්ධව පව් නොකරන පිණිස
ඔබගේ වචනය මාගේ සිතේ නිධාන
කරගතිමි.
12 ස්වාමිනි, ඔබ ප්‍රශංසිතය.
ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව.
13 ඔබගේ මුඛයේ සියලු විනිශ්චයන්
මාගේ තොල්වලින් ප්‍රකාශකෙළෙමි.
14 සියලු සම්පතෙහි මෙන්
ඔබගේ ශික්ෂා මාර්ගයෙහි ප්‍රීතිමත්වීමි.
15 ඔබගේ නියෝග භාවනාකරන්නෙමි,
ඔබගේ මාර්ග සලකන්නෙමි.
16 ඔබගේ පනත්වලට ප්‍රියවන්නෙමි.
ඔබගේ වචනය සිහිනැති
නොකරන්නෙමි.

## ג ගීමෙල්

මා ජීවත්වන පිණිස ඔබගේ 17
මෙහෙකරුවාට බොහෝසේ
යහපත්කම් කළ මැනව;
එවිට ඔබගේ වචනය පවත්වන්නෙමි.
ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්යමත් 18
දේ දක්නා පිණිස
මාගේ ඇස් පැහැදුව මැනව.
මම පොළොවෙහි විදේශිකයෙක්ව 19
සිටිමි.
ඔබගේ ආඥාවන් මාගෙන් නොසැඟවුව
මැනව.
සෑමවිටම ඔබගේ විනිශ්චයන් කෙරෙහි 20
ඇති ආශාවෙන්
මාගේ සිත බිඳේ.
ඔබගේ ආඥාවලින් මුළාව යන්නාවූ, 21
ශාපලද්දාවූ උඩඟුවූවන්ට ඔබ තරවටු
කළසේක.
නින්දාවත් අවමාන්නයත් මා කෙරෙන් 22
පහකළ මැනව;
මක්නිසාද ඔබගේ ශික්ෂා
රක්ෂාකෙළෙමි.
අධිපතියෝද හිඳගෙන මට විරුද්ධව 23
කථාකෙළෝය.
නුමුත් ඔබගේ මෙහෙකරුවා ඔබගේ
පනත් භාවනාකෙළේය.
ඔබගේ ශික්ෂාද මාගේ ප්‍රීතිය හා 24
මාගේ මන්ත්‍රීහුය.

## ד ඩාලෙත්

මාගේ ආත්මය ධූලියට ඇලේ. 25
ඔබගේ වචනය ලෙස මා ප්‍රාණවත්
කළ මැනව.
මාගේ මාර්ග කියාදුනිමි, ඔබ මට 26
උත්තරදුන්සේක.
ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව.
ඔබගේ නියෝග මාර්ගය මට 27
තේරුම්කරදුන මැනව.
එවිට ඔබගේ ආශ්චර්ය ක්‍රියා ගැන
භාවනාකරන්නෙමි.
ශෝකය නිසා මාගේ ආත්මය දියවේ. 28
ඔබගේ වචනය පරිද්දෙන් මා
ශක්තිමත්කළ මැනව.
වංකකමේ මාර්ගය මා කෙරෙන් පහ 29

කළමැනව.
ඔබගේ ව්‍යවස්ථාව කරුණාවෙන් මට
දුන මැනව.
30 විශ්වාසකමේ මාර්ගය තෝරාගතිමි.
ඔබගේ විනිශ්චයන් මා ඉදිරියෙහි
තබාගතිමි.
31 ඔබගේ ශික්ෂාවලට ඇලුම්වෙමි.
ස්වාමිනි, මා ලජ්ජාවට නොපැමිණුවුව
මැනව.
32 ඔබ මාගේ සිත පහදන කල්හි
ඔබගේ ආඥා මාර්ගයෙහි දුවන්නෙමි.

## ה හේ

33 ස්වාමිනි, ඔබගේ ව්‍යවස්ථා මාර්ගය
මට ඉගැන්නුව මැනව;
එය කෙළවර දක්වා පවත්වන්නෙමි.
34 මට තේරුම දුන මැනව, එවිට ඔබගේ
ව්‍යවස්ථාව රක්ෂාකරන්නෙමි;
එසේය, මාගේ මුළු සිතින් එය
පවත්වන්නෙමි.
35 ඔබගේ ආඥා මාර්ගයෙහි මා යැවුව
මැනව;
මක්නිසාද ඊට ප්‍රියවෙමි.
36 ලාභයට නොව
ඔබගේ ශික්ෂාවලට මාගේ සිත
යොමුකළ මැනව.
37 නිෂ්ඵල දේ බැලීමෙන් මාගේ ඇස්
හරවා,
ඔබගේ මාර්ගයන්හි මා ප්‍රාණවත්කළ
මැනව.
38 ඔබ කෙරෙහි භයවීමට හේතුවූ
ඔබගේ වචනය ඔබගේ මෙහෙකරුවාට
ස්ථිරකරකළමැනව.
39 මට භය උපදවන මාගේ නින්දව මා
කෙරෙන් පහකළ මැනව;
මක්නිසාද ඔබගේ විනිශ්චයෝ
යහපත්ය.
40 ඔබගේ නියෝගවලට ආශාවීමි.
ඔබගේ ධර්මිෂ්ඨකමෙහි මා
ප්‍රාණවත්කළ මැනව.

## ו වාව්

41 ස්වාමිනි, ඔබගේ වචනය පරිද්දෙන්
ඔබගේ කරුණාව,
එනම් ඔබගේ ගැළවීම, මා වෙතට
පැමිණේවා.
එවිට මට නින්දකරන්නාට දිය යුතු 42
උත්තරයක් මට ඇතිවන්නේය;
මක්නිසාද මම ඔබගේ වචනය
කෙරෙහි විශ්වාසකරමි.
තවද සත්‍ය වචනය මාගේ කටින් 43
සහමුලින්ම ඉවත් නොකළ මැනව;
මක්නිසාද ඔබගේ විනිශ්චයන් කෙරෙහි
බලාපොරොත්තුවීමි.
මෙසේ ඔබගේ ව්‍යවස්ථාව සදාකල්හිම 44
නිතරම පවත්වන්නෙමි.
මම නිදහස්ලෙස හැසිරෙන්නෙමි; 45
මක්නිසාද ඔබගේ නියෝග සෙවීමි.
රජුන් ඉදිරියෙහිත් ඔබගේ ශික්ෂා ගැන 46
ලජ්ජා නොවී කථාකරන්නෙමි.
මා ප්‍රේමකළාවූ 47
ඔබගේ ආඥාවන් කෙරෙහි ප්‍රීතිවන්නෙමි.
මා ප්‍රේමකළාවූ ඔබගේ ආඥාවන් 48
දෙස මාගේ අත් ඔසවමින්,
ඔබගේ පනත් භාවනාකරන්නෙමි.

## ז ශයින්

බලාපොරොත්තුවෙන්ට ඔබ මට 49
සැලැස්වූ හෙයින්
ඔබගේ මෙහෙකරුවාට කී වචනය
සිහිකළ මැනව.
මාගේ දුකේදී මාගේ සැනසීම නම් 50
මේය.
මක්නිසාද ඔබගේ වචනය මා
ප්‍රාණවත්කෙළේය.
උඩඟු අය මට අතිශයින් අපහාස 51
කළෝය.
එහෙත් මම ඔබගේ ව්‍යවස්ථාවෙන්
ඉවත නොගියෙමි.
ස්වාමිනි, පුරාණයේ සිට තිබුණ 52
ඔබගේ විනිශ්චයන් සිහිකොට
සැනසීම ලබාගතිමි.
ඔබගේ ව්‍යවස්ථාව අත්හරින දුෂ්ටයන් 53
නිසා
ඇවිළෙන කෝපය මා පිටට
පැමිණියේය.
මාගේ නවාතැන් ගෙයිදී 54
ඔබගේ පනත් මාගේ ගායනා විය.

55 ස්වාමිනි, රාත්‍රියේදී ඔබගේ නාමය සිහිකොට
ඔබගේ ව්‍යවස්ථාව පැවැත්වීමි.
56 මෙය මට ලැබුණේ
මා ඔබගේ නියෝග රක්ෂාකළ නිසාය.

## ח ඛෙත්

57 මාගේ කොටස නම් ස්වාමීන්වහන්සේය.
ඔබගේ වචන පවත්වන්නෙමියි කීයෙමි.
58 මාගේ මුළු සිතින් ඔබගේ කරුණාව ඉල්ලීමි.
ඔබගේ වචනය පරිද්දෙන් මට කරුණාකළ මැනව.
59 මාගේ මාර්ග කල්පනාකොට
ඔබගේ ශික්ෂාවලට මාගේ පාද හරවාගතිමි.
60 ඔබගේ ආඥා පැවැත්වීමට
මම පමානූණෙමි, ඉක්මන්වීමි.
61 දුෂ්ටයන්ගේ රැහැන් මා වටේ එතුණේය;
නුමුත් ඔබගේ ව්‍යවස්ථාව සිහිනැති නොකෙළෙමි.
62 ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් නිසා
මධ්‍යම රාත්‍රියෙහි ඔබට ස්තුතිකරන්ට නැඟිටින්නෙමි.
63 මම ඔබ කෙරෙහි භය ඇති සියල්ලන්ගේද
ඔබගේ නියෝග පවත්වන්නන්ගේද සමාගම්කාරයෙක්මි.
64 ස්වාමිනි, පොළොව ඔබගේ කරුණාවෙන් පිරී තිබේ.
ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව.

## ט ටෙත්

65 ස්වාමිනි, ඔබගේ වචනය ප්‍රකාර
ඔබගේ මෙහෙකරුවාට ඔබ යහපත කළසේක.
66 යහපත් විමර්ශනශක්තියත් ඥානයත් මට ඉගැන්නුව මැනව;
මක්නිසාද මම ඔබගේ ආඥා විශ්වාස කෙළෙමි.
67 මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි;
නුමුත් දැන් ඔබගේ වචනය පවත්වමි.
ඔබ යහපත්ය, යහපත කරනසේක; 68
ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව.
උඩඟු අය මට විරුද්ධව බොරුවක් යෙදූවෝය. 69
මාගේ මුළු සිතින් ඔබගේ නියෝග රක්ෂාකරන්නෙමි.
ඔවුන්ගේ සිත් තෙල මෙන් තරය; 70
නුමුත් මම ඔබගේ ව්‍යවස්ථාවට ප්‍රිය වෙමි.
ඔබගේ පනත් ඉගෙනගන්නා පිණිස 71
මට විපත්ති පැමුණුණ යහපති.
රන්රිදී දහස් ගණනකට වඩා 72
ඔබගේ මුඛයෙන් නික්මුණු ව්‍යවස්ථාව මට යහපත්ය.

## י යොද්

ඔබගේ හස්තයෝ මා සාදා නිර්මිත කළෝය. 73
ඔබගේ ආඥා ඉගෙනගන්නා පිණිස මට නුවණ දුන මැනව.
ඔබ කෙරෙහි භය ඇත්තෝ මා දැක සන්තෝෂවන්නෝය. 74
මක්නිසාද මම ඔබගේ වචනය කෙරෙහි බලාපොරොත්තුවීමි.
ස්වාමිනි ඔබගේ විනිශ්චයන් ධර්මිෂ්ඨ බවත්, 75
විශ්වාසකමින් ඔබ මට පීඩාකළ බවත් දනිමි.
ඔබගේ මෙහෙකරුවාට ඔබ කී වචනය පරිද්දෙන් 76
ඔබගේ කරුණාගුණය මාගේ සැනසීම පිණිස වේවා.
මා ජීවත්වන පිණිස ඔබගේ 77
අනුකම්පාව මා කරා පැමිණේවා.
මක්නිසාද ඔබගේ ව්‍යවස්ථාව මාගේ ප්‍රීතියය.
උඩඟු අය අයුතුලෙස මා හෙළාදමූ 78
බැවින් ඔව්හු ලජ්ජාවෙත්වා.
නුමුත් මම ඔබගේ නියෝග භාවනා කරන්නෙමි.
ඔබ කෙරෙහි භය ඇත්තෝ මා 79
වෙතට හැරී එත්වා,
එවිට ඔව්හු ඔබගේ ශික්ෂා දැනගන්නෝය.

80 මා ලජ්ජා නොවන පිණිස
මාගේ සිත ඔබගේ පනත්වල සම්පූර්ණව
පවතීවා.

## ɔ කප්

81 මාගේ ආත්මය ඔබගේ ගැළවීමට
ආශාවෙන් වැරෙයි.
මම ඔබගේ වචනය කෙරෙහි
බලාපොරොත්තුවෙමි.
82 ඔබ කවද මා සනසනසේක්දැයි
කියන අතර
ඔබගේ වචනය ගැන බලා සිටීමෙන්
මාගේ ඇස් ක්ෂයවේ.
83 මක්නිසාද මම දුමෙහි තුබූ
සම්භාජනයක් මෙන් වීමි;
නුමුත් ඔබගේ පනත් සිහිනැති
නොකරමි.
84 ඔබගේ මෙහෙකරුවාගේ දවස්
කොපමණද?
මට පීඩාකරන්නන් කෙරෙහි ඔබ
කවද යුක්තිය ඉෂ්ටකරනසේක්ද?
85 ඔබගේ ව්‍යවස්ථාව ලෙස
නොහැසිරෙන්නාවූ
උඩඟු අය මට වළවල් හැරුවෝය.
86 ඔබගේ ආඥ සියල්ල විශ්වාසකටයුතුය.
ඔව්හු අයුතුලෙස මට පීඩාකෙරෙති;
මට පිහිටවුව මැනව.
87 ඔව්හු පොළොවේදී සහමුලින්ම
වාගේ මා නැතිකළෝය;
එහෙත් මම ඔබගේ නියෝග
අත්නොහැරියෙමි.
88 ඔබගේ කරුණාගුණය ලෙස මා
ප්‍රාණවත්කළ මැනව;
එවිට ඔබගේ මුඛයේ ශික්ෂාව
පවත්වන්නෙමි.

## ל ලාමෙද්

89 ස්වාමිනි, සදකාලේටම
ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා
තිබේ.
90 ඔබගේ විශ්වාසකම සියලු
පරම්පරාවලට පවත්නේය.
ඔබ පොළොව පිහිටෙවූසේක, ඒක
පවතී.
ඔබගේ නියමයන් ලෙස ඒවා අද 91
දක්වා පවතී;
කුමක්හෙයින්ද ඒ සියල්ල ඔබට
මෙහෙකරුය.
ඔබගේ ව්‍යවස්ථාව මාගේ ප්‍රීතිය 92
නොවී නම්,
මාගේ විපත්තියේදී මා විනාශවෙන්ට
තිබුණේය.
ඔබගේ නියෝග කිසිකලක සිහිනැති 93
නොකරන්නෙමි;
මක්නිසාද ඔබ එයින් මා ප්‍රාණවත්
කළසේක.
මම ඔබගේය, මා ගැළෙවුව මැනව; 94
මක්නිසාද ඔබගේ නියෝග සෙවීමි.
දුෂ්ටයෝ මා විනාශකරන්ට 95
බලාසිටියෝය;
එහෙත් මම ඔබගේ ශික්ෂා කල්පනා
කරන්නෙමි.
සියලු සම්පූර්ණකමේ කෙළවර දුටිමි; 96
එහෙත් ඔබගේ ආඥව අති විශාලය.

## מ මෙම්

ඔබගේ ව්‍යවස්ථාවට මම කොපමණ 97
ප්‍රේමකරම්ද!
දවස මුළුල්ලේම ඒක මාගේ
භාවනාවය.
ඔබගේ ආඥ මාගේ සතුරන්ට වඩා 98
මා නැණවත්කරයි;
මක්නිසාද ඒවා නිතර මා සමගය.
මාගේ සියලු ගුරුවරුන්ට වඩා මට 99
නුවණ ඇත්තේය;
මක්නිසාද මාගේ භාවනාව ඔබගේ
ශික්ෂා ගැනය.
මා ඔබගේ නියෝග රක්ෂාකළ 100
බැවින්
වැඩිමහල්ලන්ට වඩා මට තේරුම්
ඇත්තේය.
ඔබගේ වචනය පවත්වන පිණිස 101
සියලු නපුරු මාර්ගවලින් මාගේ පාද
වලක්වාගතිමි.
ඔබගේ විනිශ්චයන්ගෙන් ඉවත්ව 102
නොගියෙමි;
මක්නිසාද ඔබ මට ඉගැන්වූසේක.
ඔබගේ වචන මාගේ දිවට කොපමණ 103

මිහිරිද!
එසේය, ඒවා මාගේ කටට මීපැණිවලට වඩා මිහිරිය.
104 ඔබගේ නියෝගවලින් මට නුවණ ලැබේ.
එබැවින් සියලු වංක මාර්ග නුරුස්සාහරිමි.

## נ නුන්

105 ඔබගේ වචන මාගේ පාදයන්ට පහනක්ය,
මාගේ මාවතට එළියක්ය.
106 ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් පවත්වන්නෙමියි කියා
දිවුළෙමි, ඒක ඉෂ්ටකෙළෙමි.
107 මම බොහෝසේ පීඩිතයෙමි.
ස්වාමිනි, ඔබගේ වචනය ප්‍රකාර මා ප්‍රාණවත්කළ මැනව.
108 ස්වාමිනි, මාගේ මුඛයෙන් පැවසූ සතුටු පූජා පිළිගෙන,
ඔබගේ විනිශ්චයන් මට ඉගැන්නුව මැනව.
109 මාගේ ප්‍රාණය නිතරම මාගේ අතෙහිය;
එහෙත් ඔබගේ ව්‍යවස්ථාව සිහි නැති නොකරමි.
110 දුෂ්ටයෝ මට මලපතක් තැබුවෝය;
එහෙත් ඔබගේ නියෝගවලින් මුළාව නොගියෙමි.
111 ඔබගේ ශික්ෂා සදාකාලයට උරුමයක් කොට ගතිමි;
මක්නිසාද ඒවා මාගේ සිතේ ප්‍රීතියය.
112 සදාකාලේටම, අන්තිම දක්වා,
ඔබගේ පනත් ඉෂ්ටකරන්ට මාගේ සිත නැමුවෙමි.

## ס සාමෙක්

113 දෙසිත් ඇත්තවුන්ට ද්වේෂකරමි;
නුමුත් ඔබගේ ව්‍යවස්ථාවට ප්‍රේම කරමි.
114 ඔබ මාගේ සැඟවෙන ඉඩමත් පලිහත්ය.
ඔබගේ වචනය කෙරෙහි බලාපොරොත්තුවෙමි.
115 නපුරුකම් කරන්නෙනි, මා වෙතින් පහවයව්.
මාගේ දෙවියන්වහන්සේගේ ආඥවන් පවත්වන්නෙමි.
මා ජීවත්වන පිණිස ඔබගේ වචනය 116
ප්‍රකාර මා දරුව මැනව;
මාගේ බලාපොරොත්තුව ගැන ලජ්ජා නොවෙම්වා.
මා දරුව මැනව, එවිට මම සුරක්ෂිතව 117
සිට,
ඔබගේ පනත් නිතරම සලකන්නෙමි.
ඔබගේ පනත්වලින් මුළාවයන සියල්ලන් 118
ඔබ සුළුකොට සිතුසේක.
මක්නිසාද ඔවුන්ගේ වංචාව නිෂ්ඵලය.
ඔබ පොළොවේ සියලු දුෂ්ටයන් 119
බොර මෙන් පහකරනසේක.
එබැවින් ඔබගේ ශික්ෂාවලට ප්‍රේම කරමි.
ඔබට භයින් මාගේ මාංසය තැතිගනියි; 120
ඔබගේ විනිශ්චයන්ට භයවෙමි.

## ע අයින්

යුක්තියත් ධර්මිෂ්ඨකමත් කෙළෙමි. 121
මට පීඩාකරන්නන්ට මා නොහැරිය මැනව.
යහපත පිණිස ඔබගේ මෙහෙකරුවාට 122
ඇපවුව මැනව.
උඩඟු අය මට පීඩා නොකෙරෙත්වා.
ඔබ දෙන ගැළවීම හා 123
ඔබගේ ධර්මිෂ්ඨ වචනය ගැන බලා සිටීමෙන් මාගේ ඇස් ක්ෂයවේ.
ඔබගේ කරුණාව පරිද්දෙන් ඔබගේ 124
මෙහෙකරුවාට ක්‍රියාකරමින්,
ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව.
මම ඔබගේ මෙහෙකරුයෙමි; 125
ඔබගේ ශික්ෂා දැනගන්නා පිණිස මට නුවණ දුන මැනව.
ස්වාමීන්වහන්සේ විසින් ක්‍රියාකිරීමට 126
සුදුසු කාලය දැන්ය;
මක්නිසාද ඔව්හු ඔබගේ ව්‍යවස්ථාව කඩකළෝය.
එබැවින් රනට වඩා, එසේය, පවිත්‍ර 127
රනට වඩා,
ඔබගේ ආඥවලට ප්‍රේමකරමි.
එබැවින් සියලු දේ ගැන ඔබගේ 128

නියෝග සියල්ල හරියයි සලකමි;
සියලු වංක මාර්ග නුරුස්සා හරිමි.

## ඞ පේ

129 ඔබගේ ශික්ෂා ආශ්චර්යමත්ය.
එබැවින් මාගේ ආත්මය ඒවා රක්ෂා කරයි.
130 ඔබගේ වචන එළිදරව්වීමෙන් ආලෝකය ලැබේ;
එයින් නුවණ නැත්තන්ට තේරුම් ලැබේ.
131 මම ඔබගේ ආඥාවලට ආශාවූ නිසා කට ඇර හතිදැමීමි.
132 ඔබගේ නාමයට ප්‍රේමවන්නන්ට ඔබගේ ව්‍යවහාරය ලෙස,
මා දෙසට හැරී මට කරුණාකළ මැනව.
133 ඔබගේ වාක්‍ය මාර්ගයෙහි මාගේ පාද හැසිරෙවුව මැනව;
කිසි අයුත්තකට මා කෙරෙහි බල පවත්වන්ට ඉඩ නුදුන මැනව.
134 මනුෂ්‍යයාගේ බලාත්කාරයෙන් මා මිදුව මැනව.
එවිට ඔබගේ නියෝග පවත්වන්නෙමි.
135 ඔබගේ මුහුණ ස්වකීය මෙහෙකරුවා කෙරෙහි බබළවමින්,
ඔබගේ පනත් මට ඉගැන්නුව මැනව.
136 මනුෂ්‍යයන් ඔබගේ ව්‍යවස්ථාව නොපවත්වන බැවින්,
මාගේ ඇස්වලින් දිය ධාරා ගලායෙති.

## ඍ ච්ශාධෙ

137 ස්වාමිනි, ඔබ ධර්මිෂ්ඨය,
ඔබගේ විනිශ්චයෝ සෘජුය.
138 ඔබ ධර්මිෂ්ඨකමින්ද
මහත් විශ්වාසකමින්ද ඔබගේ ශික්ෂා නියමකළසේක.
139 මාගේ එදිරිකාරයන් ඔබගේ වචන සිහි නැතිකළ නිසා
මාගේ ජ්වලිතය මා සිඳදැම්මේය.
140 ඔබගේ වචනය ඉතා පිරිසිදුය;
එබැවින් ඔබගේ මෙහෙකරුවා ඊට ප්‍රේමකරයි.
141 මම සුළු කෙනෙක්මි, නින්දා ලද්දෙක්මි.
එහෙත් ඔබගේ නියෝග සිහිනැති නොකරමි.
ඔබගේ ධර්මිෂ්ඨකම සදාකාලික ධර්මිෂ්ඨකමක්ය, 142
ඔබගේ ව්‍යවස්ථාවද සත්‍යයය.
විපත හා සිත් වේදනාව මා කරා පැමිණ තිබේ. 143
එහෙත් ඔබගේ ආඥා මාගේ ප්‍රීතියය.
ඔබගේ ශික්ෂා සදාකාලේටම ධර්මිෂ්ඨය. 144
මා ජීවත්වන පිණිස මට නුවණ දුන මැනව.

## ק කෝෆ්

මම මුළු සිතින් යාච්ඤාකෙළෙමි; 145
ස්වාමිනි, මට උත්තරදුන මැනව.
ඔබගේ පනත් රක්ෂාකරන්නෙමි.
මම ඔබට අඬගැසීමි; මා ගැළෙවුව මැනව, 146
එවිට ඔබගේ ශික්ෂා පවත්වන්නෙමි.
මම අලුයමට පළමුවෙන් නැගිට මොරගැසීමි, 147
ඔබගේ වචන කෙරෙහි බලාපොරොත්තුවීමි.
ඔබගේ වචනය භාවනාකරන පිණිස 148
රෑ යාම්වලට පළමුවෙන් මාගේ ඇස් ඇරුණේය.
ඔබගේ කරුණාගුණය පරිද්දෙන් මාගේ ශබ්දය ඇසුව මැනව. 149
ස්වාමිනි, ඔබගේ විනිශ්චයන් ලෙස මා ප්‍රාණවත්කළ මැනව.
දුෂ්ටකම අනුව යන්නෝ ළංවෙති; 150
ඔව්හු ඔබගේ ව්‍යවස්ථාවෙන් දුරුව සිටිති.
ස්වාමිනි, ඔබ ළංව සිටිනසේක; 151
ඔබගේ සියලු ආඥා සත්‍යයය.
ඔබගේ ශික්ෂා සදාකාලේටම පිහිටෙවූ බව 152
පෙර සිට එයින් දැනගතිමි.

## ר රේෂ්

මාගේ විපත්තිය බලා මා ගැළෙවුව මැනව; 153
මක්නිසාද ඔබගේ ව්‍යවස්ථාව සිහි

නැති නොකරමි.
154 මාගේ යුක්තිය කියා මා මිදුව මැනව;
ඔබගේ වචනය ලෙස මා ප්‍රාණවත්
කළ මැනව.
155 ගැළවීම දුෂ්ටයන්ගෙන් දුරය;
මක්නිසාද ඔව්හු ඔබගේ පනත්
නොසොයති.
156 ස්වාමීනි, ඔබගේ අනුකම්පා මහත්ය.
ඔබගේ විනිශ්චයන් ලෙස මා
ප්‍රාණවත්කළ මැනව.
157 මට පීඩාකරන්නෝද මාගේ
එදිරිකාරයෝද බොහෝය;
එහෙත් මම ඔබගේ ශික්ෂාවලින්
ඉවත නොගියෙමි.
158 මම ද්‍රෝහිකම්කරන්නන් දැක දුක්වීමි;
මක්නිසාද ඔව්හු ඔබගේ වචනය
නොපවත්වති.
159 ඔබගේ නියෝගවලට මා ප්‍රේම
කරන හැටි කල්පනාකළ මැනව.
ස්වාමීනි, ඔබගේ කරුණාගුණය
පරිද්දෙන් මා ප්‍රාණවත්කළ මැනව.
160 ඔබගේ වචනයේ මුළු අදහස නම්
සත්‍යයය;
ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් සියල්ල
සදාකල් පවත්නේය.

## ෂ ෂීන්

161 අධිපතීහු නිකරුණේ මට පීඩාකළෝය;
නුමුත් මාගේ සිත ඔබගේ වචනවලට
භයින් පවතී.
162 මහත් කොල්ලයක් ලබන කෙනෙකු
මෙන්
මම ඔබගේ වචනයෙහි ප්‍රීතිමත් වෙමි.
163 බොරුවට වෛරකොට පිළිකුල් කරමි;
නුමුත් ඔබගේ ව්‍යවස්ථාවට ප්‍රේම
කරමි.
164 ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් නිසා
දවසට සත් වරක් ඔබට ප්‍රශංසා
කරමි.
165 ඔබගේ ව්‍යවස්ථාවට ප්‍රේමකරන්නන්ට
මහත් සමාදානයක් ඇත;
පැකිලීමට කිසිවක්ද ඔවුන්ට නැත්තේය.
166 ස්වාමීනි, ඔබගේ ගැළවීම බලා
සිටියෙමි,
ඔබගේ ආඥා ඉෂ්ටකෙළෙමි.
මාගේ ආත්මය ඔබගේ ශික්ෂා 167
පැවැත්විය;
මම ඒට බොහෝසෙයින් ප්‍රේමකරමි.
මම ඔබගේ නියෝග හා ශික්ෂා 168
පැවැත්වීමි;
මක්නිසාද මාගේ සියලු මාර්ග ඔබ
ඉදිරියෙහිය.

## ත ටාව්

ස්වාමීනි, මාගේ මොරගැසීම ඔබ 169
ඉදිරියට පැමිණේවා.
ඔබගේ වචනය පරිද්දෙන් මට නුවණ
දුන මැනව.
මාගේ අයැදීම ඔබ ඉදිරියට පැමිණේවා. 170
ඔබගේ වචනය ලෙස මා මිදුව
මැනව.
ඔබගේ පනත් ඔබ මට උගන්වන 171
බැවින්
මාගේ තොල් ප්‍රශංසාව ප්‍රකාශ
කෙරේවා.
ඔබගේ සියලු ආඥා ධර්මිෂ්ඨකම වන 172
බැවින්
මාගේ දිව ඔබගේ වචනය ගැන ගී
කියාවා.
ඔබගේ හස්තය මට උපකාර පිණිස 173
සූදානම්වේවා;
මක්නිසාද මම ඔබගේ නියෝග
තෝරාගතිමි.
ස්වාමීනි, මම ඔබ දෙන ගැළවීම 174
ගැන ආශාවෙමි;
ඔබගේ ව්‍යවස්ථාවද මාගේ ප්‍රීතියය.
මාගේ ආත්මය ජීවත්වේවා, එවිට 175
එය ඔබට ප්‍රශංසාකරන්නේය;
ඔබගේ විනිශ්චයෝ මට උපකාර
කෙරෙත්වා.
නැතිවූ බැටළුවෙකු මෙන් මුළාව 176
ගියෙමි; ඔබගේ මෙහෙකරුවා
සෙවුව මැනව;
මක්නිසාද ඔබගේ ආඥා සිහිනැති
නොකරමි.

## වංචාකාර දිවෙන් මිදීම

120 ආරෝහණ ගීයකි.

1 මාගේ විපත්තියේදී ස්වාමීන්ට, මොරගැසීමි,
උන්වහන්සේද මට උත්තරදුන්සේක.
2 ස්වාමිනි, බොරු කියන තොල්වලින්ද වංචාකාර දිවෙන්ද
මාගේ ආත්මය ගැළෙව්වව මැනව.
3 එම්බා වංචාකාර දිව,
තට දිය යුත්තේ කිමෙක්ද? තට තවත් කරන්නේ කිමෙක්ද?
4 රෝතෙම් ගිනි අඟුරු සමග
බලවන්තයාගේ තියුණු ඊගස්ය.
5 අහෝ, මෙෂෙක්හි විදේශීව සිටීමද
කේදර්හි කූඩාරම් අතරේ වාසය කිරීමද මට දුකක්ය.
6 සමාදනයට ද්වේෂකරන්නා සමග
මාගේ ආත්මය බොහෝ කල් වාසය කෙළේය.
7 මම සමාදනයට කැමැත්තෙමි.
නුමුත් මා කථාකරන කල ඔව්හු සටනට සැරසෙති.

## ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්ගේ ආරක්ෂාකාරයාණෝය

121 ආරෝහණ ගීයකි.

1 කඳු දෙසට මාගේ ඇස් ඔසවන්නෙමි.
මට උපකාර පැමිණෙන්නේ කොතැනින්ද?
2 මට උපකාර පැමිණෙන්නේ
අහස පොළොව මැවූ ස්වාමීන්ගෙන්මය.
3 උන්වහන්සේ තුඹේ පය සෙලවෙන්ට නොදෙනසේක.
තුඹ ආරක්ෂාකරන තැනන්වහන්සේ නොනිදනසේක.
4 බලව, ඉශ්‍රායෙල් ආරක්ෂාකරන තැනන්වහන්සේට
නිදිබරවීමක්වත් නිදගැනීමක්වත් නැත්තේය.
5 ස්වාමීන්වහන්සේ තුඹ ආරක්ෂා කරන තැනන්වහන්සේය.
ස්වාමීන්වහන්සේ දකුණතින් තුඹට සෙවණය.
6 දවාලේ ඉරවත් රාත්‍රියේ සඳවත්
තුඹට පහර නොදෙන්නේය.
7 ස්වාමීන්වහන්සේ සියලු නපුරෙන් තුඹ ආරක්ෂාකරනසේක.
තුඹේ ප්‍රාණය ආරක්ෂාකරනසේක.
8 දුන් පටන් සදකාලේටම
ස්වාමීන්වහන්සේ තුඹේ යාම ඊම ආරක්ෂාකරනසේක.

## යෙරුසලම ගැන වන්දනාකාරයාගේ ප්‍රීතිය

122 ආරෝහණ ගීයකි; දවිත් විසිනි.

1 ස්වාමීන්ගේ ගෘහයට යමුයයි
ඔවුන් මට කී විට මම සන්තෝෂවීමි.
2 එම්බා යෙරුසලම,
අපේ පාද තිගේ දොරටු ඇතුළේ තබා තිබේ.
3 එම්බා යෙරුසලම, මනාකොට සෑදූ
නුවරක් මෙන් තී ගොඩනගනලද්දීය.
4 ගෝත්‍රයෝ, ස්වාමීන්ගේ ගෝත්‍රයෝ,
ඉශ්‍රායෙල්ට සාක්ෂියක් වශයෙන්
ස්වාමීන්ගේ නාමයට ස්තුතිකරන පිණිස එතැනට යෙති.
5 මක්නිසාද සිංහාසන, එනම් දවිත්ගේ වංශයේ සිංහාසන,
විනිශ්වය පිණිස එහි පිහිටා තිබේ.
6 යෙරුසලමේ සමාදනය උදෙසා යාච්ඤාකරව්.
තිට ප්‍රේමකරන්නෝ දියුණුවන්නෝය.
7 තිගේ පවුරු ඇතුළත සමාදනයත්
තිගේ මාළිගා තුළ අභිවෘද්ධියත් වේවා.
8 මාගේ සහෝදරයන් හා සමාගම්කාරයන් නිසා:
තී ඇතුළේ සමාදනය වේවයි කියමි.
9 අපේ දෙවිවූ ස්වාමීන්ගේ ගෘහය නිසා
තිගේ යහපත සොයන්නෙමි.

## නින්ද ලැබීමේදී ස්වාමීන්වහන්සේ දෙස බලාහිඳීම

**123** ආරෝහණ ගීයකි.

1 ස්වර්ගයෙහි වැඩහිඳින තැනන්වහන්ස,
ඔබ දෙසට මාගේ ඇස් ඔසවමි.
2 බලව, මෙහෙකරුවන්ගේ ඇස් ඔවුන්ගේ
ස්වාමියාගේ අත දෙසත්
මෙහෙකාරියෙකුගේ ඇස් ඇගේ
ස්වාමි දුවගේ අත දෙසත්
බලන්නාක්මෙන්,
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අපට
කරුණාකරන තෙක්,
අපේ ඇස් උන්වහන්සේ දෙස යොමා
තිබේ.
3 ස්වාමීනි, අපට කරුණාකළ මැනව,
අපට කරුණාකළ මැනව.
මක්නිසාද අපි අධික ලෙස නින්දවෙන්
පිරී සිටිමුව.
4 සැපෙන් සිටින [අභක්තීන්ගේ]
අපහාසයෙන්ද
අහංකාරීන්ගේ නින්දවෙන්ද
අපේ ආත්මය අධික ලෙස පිරී තිබේ.

## අන්තරායෙන් මිදුවේ ස්වාමීන්වහන්සේමය

**124** ආරෝහණ ගීයකි; දාවිත් විසිනි.

1 ඉශ්‍රායෙල් දැන් මෙසේ කියත්වා:
අපේ පක්ෂයෙහි සිටියේ
ස්වාමීන්වහන්සේ නොවී නම්,
2 මනුෂ්‍යයන් අපට විරුද්ධව නැගිටි කල
අපේ පක්ෂයෙහි සිටියේ
ස්වාමීන්වහන්සේ නොවී නම්,
3 ඔවුන්ගේ උදහස අපට විරුද්ධව
ඇවිළුණු කල,
ඔවුන් අප පණපිටින් ගිලගන්ට
තිබුණේය.
4 එකල්හි ජලය අප වසාගන්නවා ඇත,
දියපාර අපේ ප්‍රාණය යටකොට
ගලනවා ඇත.
5 එකල්හි උඩඟු ජලය අපේ ප්‍රාණය
යටකොට ගලනවා ඇත.
ඔවුන්ගේ දත්වලට අප ගොදුරුකොට 6
නුදුන්
ස්වාමීන්ට ප්‍රශංසාවේවා.
පක්ෂි වැද්දන්ගේ උගුලෙන් පක්ෂියෙකු 7
මෙන් අපේ ප්‍රාණය ගැළවුණේය.
උගුල බිඳී ගියේය, අපි ගැළවුණෙමුව.
අපේ උපකාරය අහසත් පොළොවත් 8
මැවූ
ස්වාමීන්ගේ නාමය කෙරෙහිය.

## අදහාගන්නන්ගේ ස්ථිරභාවය

ආරෝහණ ගීයකි. **125**

ස්වාමීන් කෙරෙහි විශ්වාසකරන්නෝ 1
සෙලවිය නොහැකිවූ සදාකල්
පවතින්නාවූ සියොන් කන්ද මෙන්ය.
යෙරුසලම හාත්පස කඳු 2
තිබෙනාක්මෙන්,
දැන් පටන් සදාකල්ම,
ස්වාමීන්වහන්සේ ස්වකීය සෙනඟ
හාත්පසින් සිටිනසේක.
මක්නිසාද ධර්මිෂ්ඨයන් අයුතුකමට 3
අත් දිගු නොකරන පිණිස
දුෂ්ටකමේ ජයකොන්තය
ධර්මිෂ්ඨයන්ගේ උරුමකොටසෙහි
නොරඳන්නේය.
ස්වාමීනි, යහපතුන්ටත් 4
අවංක සිත් ඇත්තන්ටත් යහපත
කළ මැනව.
තමුන් වංක මාර්ගවලට හැරී 5
යන්නන් වනාහි
ස්වාමීන්වහන්සේ අයුතුකම් කරන්නන්
සමඟ ගෙනයනසේක.
ඉශ්‍රායෙල් කෙරෙහි සමාදානය වේවා.

## මුදනු ලැබුවාවූ පිටවහලාගේ ස්තුති ගීය

ආරෝහණ ගීයකි. **126**

ස්වාමීන්වහන්සේ සියොන් කෙරෙන් 1
වාලට ගෙනයනලද්දවුන්
ආපසු ගෙනා කල,

අපි හීනයක් දුටුවන් මෙන් වීමුව.
2 එකල අපේ කට සිනාවෙන්ද
අපේ දිව ගායනාවෙන්ද පිරුණේය.
එකල: ස්වාමීන්වහන්සේ මොවුන්
උදෙසා මහත් දේ කළසේකැයි
ජාතීන් අතරේ කියනලද්දේය.
3 ස්වාමීන්වහන්සේ අප උදෙසා මහත්
දේ කළසේක;
එබැවින් අපි සන්තෝෂවෙමුව.
4 ස්වාමිනි, අපෙන් වහල්ව සිටින්නන්
දකුණු දිසාවේ ඇළවල් මෙන් ආපසු
ගෙන අව මැනව.
5 කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන්
කපන්නෝය.
6 ඔහු බීජ මල්ල රැගෙන හඬමින්
පිටත්ව යන්නේ නුමුත්,
තමාගේ ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන්
එන්නේය.

## මූළු සඵලය දෙවියන්-වහන්සේගෙන් පැමිණෙන බව

## 127

ආරෝහණ ගීයකි;
සාලමොන් විසිනි.

1 ස්වාමීන්වහන්සේ ගෙය
නොසාදනසේක් නම්,
සාදන්නෝ නිෂ්ඵලයේ වෙහෙසෙති.
ස්වාමීන්වහන්සේ නුවර ආරක්ෂා
නොකරනසේක් නම්,
රැකවලා නිෂ්ඵලයේ අවදිව සිටියි.
2 වේලාසනින් නැගිටීමත්, බොහෝ
රෑවෙනකල්ම නිවාඩු නොගැනීමත්,
වෙහෙසව සපයාගත් භෝජන බුදීමත්
නුඹලාට නිෂ්ඵලවේ.
මක්නිසාද උන්වහන්සේ තමන් ප්‍රිය
තැනැත්තාට එසේ නින්ද දෙනසේක.
3 බලව, දරුවෝ ස්වාමීන්වහන්සේ
දෙන උරුමයක්ය.
කුසේ ඵලයද උන්වහන්සේගෙන්
ලැබෙන විපාකයක්ය.
4 බලවන්තයෙකුගේ අතෙහි ඊගස්
යම්සේද
යෞවන මවුපියන්ගේ දරුවොත්
එසේමය.
එයින් පිරුණු ඊකොපුව ඇති මනුෂ්‍යයා 5
වාසනාවන්තයෙක්ය.
ඔව්හු දෙරටුවේදී සතුරන් සමග
කථාකරන විට
ලජ්ජාවට පත් නොවන්නෝය.

## දේව භය ඇත්තාගේ පවුලේ දියුණුව

ආරෝහණ ගීයකි.

## 128

ස්වාමීන්වහන්සේ කෙරෙහි 1
භයවන්නාවූ,
උන්වහන්සේගේ මාර්ගවල
හැසිරෙන්නාවූ සියල්ලෝම
භාග්‍යවන්තයෝය.
මක්නිසාද නුඹ නුඹේ අත් වැඩේ 2
ඵල කන්නෙහිය.
නුඹ වාසනාවන්තවන්නෙහිය, නුඹට
ශුභ සිද්ධවන්නේය.
නුඹේ භාර්යාව නුඹේ ගෙය ඇතුළෙහි 3
ඵලදෙන මිදිවැලක් මෙන් වන්නීය.
නුඹේ දරුවෝ නුඹේ මේසේ අවට
ඔලීව පැළ මෙන් වන්නෝය.
බලව, ස්වාමීන් කෙරෙහි භයවන 4
තැනැත්තේ
මෙසේ ආශීර්වාද ලබන්නේය.
ස්වාමීන්වහන්සේ සියොන්හි සිට 5
නුඹට ආශීර්වාදකරනසේක.
නුඹේ ජීවිතයේ සියලු දවස්වල
යෙරුසලමේ යහපත දක්නෙහිය.
එසේය, නුඹේ දරුවන්ගේ දරුවන් 6
දක්නෙහිය.
ඉශ්‍රායෙල්ට සමාදනය වේවා.

## පීඩාවලින් මිදීම. නපුරන්ට ජය නොලැබීම.

ආරෝහණ ගීයකි.

## 129

ඉශ්‍රායෙල් දැන් මෙසේ කියත්වා: 1
මාගේ තරුණ වයසේ පටන් ඔව්හු
බොහෝ වර මට පීඩාකළෝය.
මාගේ තරුණ වයසේ පටන් ඔව්හු 2
බොහෝ වර මට පීඩාකළෝය.
එහෙත් මාගෙන් ජය නොගත්තෝය.

3 ඔහු නාසෝ මාගේ පිටෙහි හෑවෝය;
තමුන්ගේ හීවිටි දීර්ඝකොට හෑරූය.
4 ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨය.
උන්වහන්සේ දුෂ්ටයන්ගේ
බැමි කපා හැරියසේක.
5 සියොන්ට ද්වේෂකරන සියල්ලෝ
ලජ්ජාවී ආපසු හරවනු ලබත්වා.
6 වැඩෙන්ට පළමුවෙන් වියළීයන්නාවූ
වහල පිට තෘණ මෙන් වෙත්වා.
7 කපන්නා එයින් තමාගේ මිටවත්
මිටි බදින්නා තමාගේ තුරුල්ලවත්
නොපුරවයි.
8 මගයන්නෝද: ස්වාමීන්ගේ ආශීර්වාදය
තුඹලාට වේවා;
ස්වාමීන්ගේ නාමයෙන් තුඹලාට
ආශීර්වාදකරමුයයි නොකියති.

## ගැඹුරේ සිට යාච්ඥා කිරීම

130 ආරෝහණ ගීයකි.

1 ස්වාමිනි, ගැඹුරු තැන්වල සිට ඔබට
මොරගැසීමි.
2 ස්වාමිනි, මාගේ ශබ්දය අසනුව මැනව.
මාගේ කන්නලව් ශබ්දයට
ඔබගේ කන් යොමුවේවා.
3 ස්වාමිනි, ඔබ අයුතුකම් ගණනට
ගන්නාසේක් නම්,
ස්වාමිනි, කාට සිටින්ට හැක්කේද?
4 නුමුත් ඔබ කෙරෙහි භය ඇතුව
සිටින පිණිස
ඔබ වෙත කමාව ඇත්තේය.
5 මම ස්වාමීන් කෙරෙහි බලාසිටිමි,
මාගේ ආත්මය බලාසිටින්නේය.
උන්වහන්සේගේ වචනය කෙරෙහි
බලාපොරොත්තුවෙමි.
6 අලුයම බලාසිටින මුරකාරයන්ට වඩා,
එසේය, අලුයම බලාසිටින
මුරකාරයන්ට වඩා,
මාගේ ආත්මය ස්වාමීන් කෙරෙහි
බලා සිටියි.
7 එම්බා ඉශ්‍රායෙල්, ස්වාමීන් කෙරෙහි
බලාපොරොත්තුවෙව;
මක්නිසාද ස්වාමීන් වෙත දයාව
ඇත්තේය,
උන්වහන්සේ වෙත බොහෝසෙයින්
මිදීමද ඇත්තේය.
උන්වහන්සේ ඉශ්‍රායෙල් 8
ඔහුගේ අයුතුකම් සියල්ලෙන්
මුදා හරිනසේක.

## ළමයෙකු මෙන් හාරවීම

ආරෝහණ ගීයකි;
දාවිත් විසිනි. 131

ස්වාමිනි, මාගේ සිත උඩඟු නොවේ, 1
මාගේ ඇස්ද උදුර නොවේ;
මහත් කාරණාවලවත්
මාගේ පමණට වැඩිවූ මහත්
ක්‍රියාවලවත් මැදි නොවෙමි.
සැබවින් මාගේ ආත්මය සනසා 2
නිශ්චලකරගතිමි;
කිරිවැරූ ළදරුවෙක් මවු වෙත යම්
සේද,
මාගේ ආත්මය මා වෙත කිරිවැරූ
ළදරුවෙකු මෙන් වේ.
එම්බා ඉශ්‍රායෙල්, මෙතැන් පටන් 3
සදා කල්ම
ස්වාමීන් කෙරෙහි බලාපොරොත්තු
වෙව.

## දාවිත් සමග කළ ගිවිසුම ස්ථිරකිරීම

ආරෝහණ ගීයකි. 132

ස්වාමිනි, දාවිත්ගේ දුක් සියල්ල 1
ඔහු උදෙසා සිහිකළ මැනව;
එනම් ස්වාමීන්ට ස්ථානයක්ද 2
යාකොබ්ගේ පරාක්‍රමයාණන්වහන්සේට
මණ්ඩපයක්ද සොයාගන්නා තෙක්
සැබවින් මාගේ ගෙයි මණ්ඩපයට 3
ඇතුල් නොවන්නෙමි,
මාගේ යහනට නොනගින්නෙමි;
මාගේ ඇස්වලට නින්දවත් 4
ඇසිපියවලට නිදිබරවත්
නොදෙන්නෙමියි කියා
ඔහු ස්වාමීන්ට දිවුරමින් 5
යාකොබ්ගේ පරාක්‍රමයාණන්වහන්සේට

හාරයක් වූ හැටි සිහිකළ මැනව.
6 බලව, එප්‍රාතාහිදී එපවත් ඇසීමුව.
වන පෙදෙස්හි එය අපට සම්බවුණේය.
7 අපි උන්වහන්සේගේ මණ්ඩපවලට
යන්නෙමුව;
උන්වහන්සේගේ පාපුටුව ළඟ
නමස්කාරකරන්නෙමුව,
8 **ස්වාමිනි**, නැගිට ඔබගේ ශක්තියේ
ගිවිසුම්-පෙට්ටිය ඇතිව,
ඔබගේ නිවාඩු ස්ථානයට වැඩිය
මැනව.
9 ඔබගේ පූජකයෝ ධර්මිෂ්ඨකමින්
සැරසෙත්වා;
ඔබගේ ශුද්ධවන්තයෝ ප්‍රීතිශබ්ද
කෙරෙත්වා.
10 ඔබගේ මෙහෙකරුවූ දවිත් නිසා
ඔබගේ අභිෂේකලත් තැනැත්තාගේ
මුහුණ ඉවත් නොකළ මැනව.
11 තාගේ ශරීර ඵලයෙන් තාගේ
සිංහාසනයෙහි හිඳුවන්නෙමියි
කියාද,
තාගේ පුත්‍රයෝ මාගේ ගිවිසුමද
මා ඔවුන්ට උගන්වන ශික්ෂාද
රක්ෂාකරන්නෝ නම්,
12 ඔවුන්ගේ පුත්‍රයොත් තාගේ සිංහාසනය
පිට සදාකල් හිඳින්නෝය කියාද,
**ස්වාමීන්වහන්සේ** දවිත්ට සැබෑ ලෙසින්
දිවුළසේක;
උන්වහන්සේ එයින් නොහැරෙනසේක.
13 මක්නිසාද **ස්වාමීන්වහන්සේ** සියොන්
තෝරාගත්සේක;
ස්වකීය නිවාසය ලෙස ඊට
ආශාවූසේක.
14 මෙය සදාකල්ම මාගේ නිවාඩු
ස්ථානයය.
මෙහි වසන්නෙමි; මක්නිසාද ඊට
ආශාවීමි.
15 සියොනේ ආහාරයට බොහෝසෙයින්
ආශීර්වාදකරන්නෙමි.
එහි දුප්පතුන් කෑමෙන් තෘප්තියට
පමුණුවන්නෙමි.
එහි පූජකයන්ද ගැළවීමෙන් 16
පළඳවන්නෙමි.
එහි ශුද්ධවන්තයොත් ප්‍රීතියෙන්
ඝෝෂාකරන්නෝය.
එහි දවිත්ගේ අඟ ලියලවන්නෙමි. 17
මාගේ අභිෂේකලත් තැනැත්තාට
පහනක් පිළියෙළකෙළෙමි.
ඔහුගේ සතුරන් ලජ්ජාවස්ත්‍රයෙන් 18
පළඳවන්නෙමි.
නුමුත් ඔහු මත්තේ ඔහුගේ ඔටුන්න
ශෝභමාන වන්නේය.

## සහෝදර සමාගමේ අලංකාරය

ආරෝහණ ගීතයකි;
දවිත් විසිනි. **133**

බලව, සහෝදරයන් එකඟව වාසය කිරීම 1
කොපමණ යහපත්ද, කොපමණ
ප්‍රසන්නද!
එය හිස පිට වත්කළාවූ, රැවුල දිගේ, 2
එනම් ආරොන්ගේ රැවුල දිගේ,
ඔහුගේ වස්ත්‍රවල වාටිය දක්වා
බැස්සාවූ
අනර්ඝ තෙලය හා සමානය;
සියොන් කඳු පිටට බසින්නාවූ 3
හෙර්මොන්හි පිනි හා සමානය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** එහිදී
ආශිර්වාදය,
එනම් සදාකාල ජීවනය, නියමකළසේක.

## රාත්‍රි මෙහෙය පවත්වන්නන්ට ආචාරය

ආරෝහණ ගීයකි. **134**

රාත්‍රිභාගයේ **ස්වාමීන්ගේ** ගෘහයෙහි 1
සිටින්නාවූ
**ස්වාමීන්ගේ** සියලු මෙහෙකරුවෙනි,
**ස්වාමීන්ට** ප්‍රශංසාකරව්.
ශුද්ධස්ථානය දෙසට අත් ඔසවා, 2
**ස්වාමීන්ට** ප්‍රශංසාකරව්.
**ස්වාමීන්වහන්සේ**, එසේය, අහසත් 3

පොළොවත් මැවූ තැනන්වහන්සේ,
සියොන්හි සිට නුඹට
ආශීර්වාදකරනසේක්වා.

## මැවිල්ලෙන් හා ක්‍රියාවලින් ප්‍රකාශවන ස්වාමීන්වහන්සේ වර්ණනාකිරීම

135 ස්වාමීන්ට ප්‍රශංසාකරව්;
ස්වාමීන්ගේ නාමයට
ප්‍රශංසාකරව්.
ස්වාමීන්ගේ මෙහෙකරුවෙනි,
2 ස්වාමීන්ගේ ගෘහයෙහි,
අපේ දෙවියන්වහන්සේගේ ගෘහ මළුවල
සිටින්නෙනි, උන්වහන්සේට
ප්‍රශංසාකරව්.
3 ස්වාමීන්ට ප්‍රශංසාකරව්; මක්නිසාද
ස්වාමීන්වහන්සේ යහපත්ය.
උන්වහන්සේගේ නාමය ප්‍රියකරු
නිසා ගී කියමින් එය වර්ණනාකරව්.
4 මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන්ටම
යාකොබ්ද
තමන්ගේ විශේෂ වස්තුව කොට
ඉශ්‍රායෙල්ද තෝරාගත්සේක.
5 මක්නිසාද ස්වාමීන්වහන්සේ මහත්
බවත්
අපේ ස්වාමීන්වහන්සේ සියලු
දෙවිවරුන්ට වඩා උසස් බවත් දනිමි.
6 ස්වාමීන්වහන්සේ යමකට
කැමතිවූසේක්ද
එය අහසෙහිද පොළොවෙහිද මුහුදුවල
සහ හැම ගැඹුරු තැන්හිද
ඉෂ්ටකළසේක.
7 උන්වහන්සේ පොළෝ කෙළවරින්
වලාකුල් නංවනසේක;
වර්ෂාවට විදුලි සාදනසේක;
ස්වකීය ගබඩාවලින් හුළඟ
නික්ම වනසේක.
8 උන්වහන්සේ මිසරයේ මනුෂ්‍යයන්ගෙත්
මෘගයන්ගෙත්
කුලුඳුලන්ට පහරදුන්සේක.
9 එම්බා මිසරය, තී මැදට, ඵාරාවෝ
සහ ඔහුගේ සියලු මෙහෙකරුවන්
කෙරෙහි,
උන්වහන්සේගේ ලකුණු හා හාස්කම්
පැමිණවූසේක.
උන්වහන්සේ බොහෝ ජාතීන්ට පහරදී, 10
බලවත් රජුන් නැසූසේක;
අමෝරීවරුන්ගේ රජවූ සීහොන්ද 11
බාෂාන්හි රජවූ ඕග්ද
කානාන්හි සියලු රාජ්‍යයන්ද නසා,
ඔවුන්ගේ දේශය උරුමයක් පිණිස, 12
ස්වකීය සෙනඟවූ ඉශ්‍රායෙල්ට
උරුමයක් පිණිස, දුන්සේක.
ස්වාමිනි, ඔබගේ නාමය සදකල් 13
පවත්නේය;
ස්වාමිනි, ඔබ සිහිකිරීම සියලු
පරම්පරා දක්වා වන්නේය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන් 14
සෙනඟ විනිශ්චයකරනසේක,
ස්වකීය මෙහෙකරුවන් ගැන
තැවෙනසේක.
ජාතීන්ගේ රූප රන් රිදීය, 15
මනුෂ්‍යයන්ගේ අත් වැඩය.
ඒවාට කටවල් ඇත, එහෙත් කථා 16
නොකෙරෙති;
ඇස් ඇත, එහෙත් නොදකිති;
කන් ඇත, එහෙත් නොඅසති; 17
ඒවායේ කටවල හුස්මත් නැත.
ඒවා සාදන්නොත්, 18
එසේය, ඒවා කෙරෙහි විශ්වාසකරන
සියල්ලොත් ඒවාට සමානවන්නෝය.
එම්බා ඉශ්‍රායෙල් වංශය, ස්වාමීන්ට 19
ප්‍රශංසාකරව්.
එම්බා ආරොන්ගේ වංශය, ස්වාමීන්ට
ප්‍රශංසාකරව්.
එම්බා ලෙවී වංශය, ස්වාමීන්ට 20
ප්‍රශංසාකරව්.
ස්වාමීන් කෙරෙහි භය ඇත්තෙනි,
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.
යෙරුසලමෙහි වසන ස්වාමීන්වහන්සේ 21
සියොන්හි සිට ප්‍රශංසා ලබනසේක්වා.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## සදකාල කරුණාවෙන් යුත් ස්වාමීන්වහන්සේ වර්ණනාකිරීම

136 ස්වාමීන්ට ස්තුතිකරව්;
මක්නිසාද උන්වහන්සේ
යහපත්ය.
උන්වහන්සේගේ කරුණාව සදකල්
පවත්නේය.
දෙවිවරුන්ගේ දෙවියන්ට ස්තුති කරව්; 2

මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
3 ස්වාමිවරුන්ගේ ස්වාමීන්ට
ස්තුතිකරව්;
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
4 මහත් ආශ්චර්යයන් කරන එකම
තැනන්වහන්සේට (ස්තුතිකරව්);
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
5 නුවණින් අහස මැවූ තැනන්වහන්සේට
(ස්තුතිකරව්);
මක්නිසාද උන්වහන්සේ කරුණාව
සදකල් පවත්නේය.
6 ජල මතුයෙහි පොළොව අතුළාවූ
තැනන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
7 මහත් ආලෝක මැවූ තැනන්වහන්සේට
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
8 දවාලෙහි ආණ්ඩුකිරීමට සූර්යයා මැවූ
තැනන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
9 රාත්‍රියෙහි ආණ්ඩුකිරීමට සඳ සහ
තාරකා මැවූ තැනන්වහන්සේට
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
10 කුලුදුලන් නැසීමෙන් මිසරයට පහරදුන්
තැනන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
11 ඔවුන් අතරෙන් ඉශ්‍රායෙල් පිටත ගෙනා
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
12 බලවත් හස්තයකින් හා දිගුකළ
බාහුවකින් එසේ කළ උන්වහන්සේට
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
13 රතු මුහුද දෙකට බෙදූ
තැනන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
ඉශ්‍රායෙල්වරුන්ද ඒ මැදින් යැවූ 14
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
ඵාරාවෝ සහ ඔහුගේ සේනාව රතු 15
මුහුදේ හෙළාදැමූ උන්වහන්සේට
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
ස්වකීය සෙනඟ කාන්තාරය මැදින් 16
ගෙනගිය තැනන්වහන්සේට
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
මහත් රජුන්ට පහරදුන් 17
තැනන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
කීර්තිමත් රජුන් නැසූ උන්වහන්සේට 18
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
අමෝරිවරුන්ගේ රජවූ සීහොන් නැසූ 19
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
බාෂාන්හි රජවූ ඕග්ද නැසූ 20
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
ඔවුන්ගේ දේශය උරුමයක් කොට දුන් 21
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
ස්වකීය මෙහෙකරුවූ ඉශ්‍රායෙල්ට එය 22
උරුමයක් කොට දුන් උන්වහන්සේට
[ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
අපේ පහත් ස්වභාවයෙහිදී අප සිහි කළ 23
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව

සදකල් පවත්නේය.
24 අපේ එදිරිකාරයන්ගෙන් අප මිදූ
උන්වහන්සේට [ස්තුතිකරව්];
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
25 උන්වහන්සේ මාංසමයවූ සියල්ලන්ට
ආහාර දෙනසේක.
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.
26 ස්වර්ගයේ දෙවියන්වහන්සේට
ස්තුතිකරව්;
මක්නිසාද උන්වහන්සේගේ කරුණාව
සදකල් පවත්නේය.

## පිටහල්කම සිහිකිරීමේ දුක් සහිත ගීය

137 බබිලෝනියේ ගංගා ළඟ
ඉඳගතිමුව, එසේය,
එහිදී
සියොන් සිහිවූ කල ඇඬීමුව.
2 එහි මැද නළාගස්වල
අපේ වීණා එල්ලා තැබීමුව.
3 මක්නිසාද අප වහල්කොට ගෙනගිය
අය එහිදී ගී කියන ලෙස අපෙන්
ඉල්ලුවෝය,
අපට පීඩාකළ අය:
සියොන් ගීතිකාවලින් එකක් කියා
සෙල්ලම්කරන්ට කිවුය.
4 අන්‍ය දේශයකදී
ස්වාමීන්ගේ ගීය කෙසේ ගායනා
කරමුද?
5 එම්බා යෙරුසලම, තී මට සිහිනැතිවී
නම්,
මාගේ දකුණු අතට ඒකේ හුරුකම
සිහිනැතිවේවා.
6 මම තී සිහි නොකෙරෙම් නම්,
මාගේ ප්‍රධාන ප්‍රීතියට වඩා
යෙරුසලම උතුම්කොට නොසිතම් නම්,
මාගේ දිව උඩුතල්ලේ ඇලේවා.
7 බිඳහෙළව්,
අත්තිවාරම දක්වා බිඳහෙළව්යයි කී
ඒදොම්ගේ පුත්‍රයන්ට විරුද්ධව,
ස්වාමිනි, යෙරුසලමේ දවස සිහිකළ
මැනව.

විනාශයට කැපවූ බබිලෝන් 8
දියණියෙනි,
තී අපට කළාක්මෙන්
තිට විපාකදෙන තැනැත්තේ
වාසනාවන්තවන්නේය.
තිගේ ළදරුවන් රැගෙන 9
ගලේ ගසන තැනැත්තේ වාසනාවන්ත
වන්නේය.

## ස්වාමීන්වහන්සේ කෙරෙහි ස්තුතිවන්තකම හා විශ්වාසය ප්‍රකාශකිරීම

දාවිත්ගේ ගීතයකි. 138

මාගේ මුළු සිතින් ඔබට 1
ස්තුතිකරන්නෙමි.
දෙවිවරුන් ඉදිරියෙහි ඔබට ගීයෙන්
ප්‍රශංසාකරන්නෙමි.
ඔබගේ ශුද්ධ මාළිගාව දෙසට 2
නමස්කාරකරමින්,
ඔබගේ කරුණාගුණය සහ සත්‍යය
නිසා ඔබගේ නාමයට
ස්තුතිකරන්නෙමි.
මක්නිසාද ඔබගේ මුළු නාමයට
ඉහළින් ඔබගේ වචනය
උතුම්කළසේක.
මා ඔබට අඬගැසූ දවසේදී ඔබ මට 3
උත්තරදී,
මාගේ ආත්මය ශක්තිමත්කොට
ධෛර්යදුන්සේක.
ස්වාමිනි, පොළොවේ සියලු රජවරු 4
ඔබගේ මුඛයේ වචන ඇසූ බැවින්
ඔබට ස්තුතිකරන්නෝය.
එසේය, ස්වාමීන්ගේ මහිමය උතුම් 5
නිසා,
ඔව්හු ස්වාමීන්ගේ මාර්ග ගැන
ගීතිකාකරන්නෝය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ උසස් 6
තුමුත් පහත් අය සලකනසේක.
තුමුත් උඩඟු අය දුරදීම දන්නාසේක.
මම විපත්ති මැද හැසිරෙම් තුමුත් ඔබ 7

මා ප්‍රාණවත්කරනසේක;
ඔබ මාගේ සතුරන්ගේ උදහසට
විරුද්ධව ඔබගේ හස්තයද
දිගුකරනසේක,
ඔබගේ දකුණු හස්තයද මා
ගළවන්නේය.
8 ස්වාමීන්වහන්සේ මා සම්බන්ධ
කාරණය සම්පූර්ණකරනසේක.
ස්වාමිනි, ඔබගේ කරුණාව සදකල්
පවත්නේය;
ඔබගේම හස්තකර්ම අත් නොහළ
මැනව.

## ස්වාමීන්වහන්සේගේ සර්වඥතාව හා සර්වස්ථාන ව්‍යාප්තිය

139 නායක වාද්‍යකරුටයි.
දාවිත්ගේ ගීතයකි.
1 ස්වාමිනි, ඔබ මා විමසා බලා
දැන ගත්සේක.
2 ඔබ මාගේ හිඳීමද නැගිටීමද
දන්නාසේක,
දුරදීම මාගේ සිතිවිල්ල ඔබට තේරෙයි.
3 ඔබ මාගේ ගමනත් සයනයත් විමසා
බලනසේක,
මාගේ සියලු මාර්ග දැනගෙන
සිටිනසේක.
4 මක්නිසාද, ස්වාමිනි, ඔබ මුළුමනින්ම
නොදන්නාවූ
කිසි වචනයක් මාගේ දිවේ නැත්තේය.
5 ඉදිරියෙන්ද පස්සෙන්ද ඔබ මා වට
කරමින්,
ඔබගේ හස්තය මා පිට තැබූසේක.
6 මෙවැනි ඥානය මට අතිශයින් පුදුමය;
එය උසස්ය, ඊට ළඟාවෙන්ට
නොහැකිවෙමි.
7 ඔබගේ ආත්මය කෙරෙන් කොතැනට
යන්නෙම්ද?
ඔබ ඉදිරියෙන් කොතැනට
පලායන්නෙම්ද?
8 මම ස්වර්ගයට නැගුණෙම් නුමුත් ඔබ
එහිය.
*ෂෙයෝල්ලෙහි මාගේ යහන පිළියෙළ
කෙරෙම් නුමුත් ඔබ එහිය.
මා අරුණු පියාපතින් ගොස් 9
මුහුදේ ඉතා දුරු කෙළවර විසුවත්;
එහිදීත් ඔබගේ හස්තය මට 10
මගපෙන්වන්නේය,
ඔබගේ දකුණු හස්තය මා
අල්ලන්නේය.
සැබවින් අන්ධකාරය මා 11
වසාගන්නේය,
මා වටකරින් වූ එළිය රාත්‍රිය
වන්නේයයි කීයෙම් නුමුත්,
අන්ධකාරය ඔබගෙන් කිසිවක් 12
නොසඟවයි,
රාත්‍රියද දවාල මෙන් බබළයි.
අන්ධකාරයත් එළියත් ඔබට එක
සමානය.
මක්නිසාද ඔබ මාගේ හදවත 13
හිමිකරගත්සේක.
මාගේ මවු කුසෙහි මා වැසූසේක.
මම ඔබට ස්තුතිකරන්නෙමි; මක්නිසාද 14
මම භයානකලෙසත් පුදුම ලෙසත්
සාදනලද්දෙමි.
ඔබගේ කර්මාන්ත ආශ්චර්යමත්ය;
මාගේ ආත්මයද ඒ බව මනාකොට
දනියි.
මා රහසින් මවනු ලැබ, 15
පොළොවේ ගැඹුරු තැන්වල
පුදුමාකාරයෙන් තනනු ලැබූ කල,
මාගේ ශරීරරූපය ඔබගෙන් සැඟවී
නොතිබුණේය.
ඔබගේ ඇස්වලට මාගේ ශරීර ධාතුව 16
පෙනුණේය,
ඔබගේ පොතෙහි මාගේ සියලු
අවයවයෝ ලියනලද්දෝය,
ඒවායින් එකක්වත් නැති කල්හි
දවසින් දවස ඒවා සාදනලද්දේය.
දෙවියන්වහන්ස, ඔබගේ සිතිවිලි 17

*හෙවත්, පාතාලයෙහි.

මට කොපමණ අනර්ඝද!
ඒවායේ ගණන කොපමණ මහත්ද!
18 ඒවා ගණින්නෙම් නම් වැලිවලටත් වැඩිය.
මම පිබිදෙන විටත් ඔබ සමග වෙමි.
19 දෙවියන්වහන්ස, සැබවින් ඔබ දුෂ්ටයා මරනසේක.
එබැවින් මිනීමරුවෙනි, මා වෙතින් අහක්ව යව්.
20 මක්නිසාද ඔව්හු දුෂ්ටලෙස ඔබට විරුද්ධව කථාකෙරෙති,
ඔබගේ සතුරෝ ඔබගේ නාමය නිරර්ථකයේ කියති.
21 ස්වාමීනි, ඔබට වෛරවන්නන්ට මම වෛර නොකරම්ද?
ඔබට විරුද්ධව නැඟිටින්නන් සඳහා මම කල නොකිරෙම්ද?
22 සම්පූර්ණ වෛරයකින් ඔවුන්ට වෛරකරමි.
ඔවුන් මාගේ සතුරන් කොට ගණන්ගනිමි.
23 දෙවියන්වහන්ස, මා විමසා බලා, මාගේ සිත දැනගත මැනව.
මා පරීක්ෂාකොට, මාගේ සිතිවිලි දැනගත මැනව.
24 යම් නපුරු මාර්ගයක් මා තුළේ ඇද්දැයි බලා,
සදාකාල මාර්ගයෙහි මා ගෙනගිය මැනව.

## දුෂ්ට හතුරන්ගෙන් ආරක්ෂාකිරීමට යාච්ඤාව

**140** නායක වාද්‍යකරුටයි. දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමීනි, නපුරු මනුෂ්‍යයාගෙන් මා ගැළෙවුව මැනව;
බලාත්කාරකරන්නාගෙන් මා ආරක්ෂා කළ මැනව.
2 ඔව්හු සිතින් නපුරු උපා යොදති;
නොකඩවම යුද්ධ උපදවති.
ඔව්හු සර්පයෙකු මෙන් තමුන්ගේ දිව තියුණුකළෝය; 3
ඔවුන්ගේ තොල් යට පොළොං විෂ ඇත.
ස්වාමීනි, දුෂ්ටයාගේ අත්වලින් මා රැකගත මැනව; 4
බලාත්කාරකරන්නාගෙන් මා ආරක්ෂා කළ මැනව.
ඔව්හු මාගේ පාද නෙරපාදමන්ට සිතුවෝය.
උඩඟු අය මට මලපතක් තබා රැහැන් ඇද්දෝය; 5
ඔව්හු මග අසබඩ දැලක් එළා,
මට මලපත් තැබූය.
ඔබ මාගේ දෙවියන්වහන්සේයයි ස්වාමීන්ට කීමි. 6
ස්වාමීනි, මාගේ කන්නලව් ශබ්දයට ඇහුම්කන්දුන මැනව.
මාගේ ගැළවීමේ ශක්තියවූ ස්වාමිවූ දෙවියන්වහන්ස, 7
යුද්ධ දවසේදී ඔබ මාගේ හිස වැසූසේක.
ස්වාමීනි, දුෂ්ටයාගේ ආශාව ඉෂ්ට නොකළ මැනව; 8
ඔහුගේ නපුරු උපා දියුණු නොකළ මැනව; කළහොත් ඔව්හු උඩඟු වන්නෝය.
මා වටකරගන සිටින්නන්ගේ හිස 9
තමුන්ගේම තොල්වල නපුරුකමින් වැසේවා.
ඔවුන් පිට ගිනි අඟුරු වැටේවා. 10
ඔව්හු ගින්නෙහිද
ගොඩ එන්ට බැරි ගැඹුරු වළවලද හෙළනු ලබත්වා.
නපුරුවූ කේලාම්කාර මනුෂ්‍යයා පොළොවෙහි ස්ථිර නොවන්නේය. 11
බලාත්කාරකරන්නා හෙළන පිණිස නපුර ලුහුබඳින්නේය.
ස්වාමීන්වහන්සේ පීඩිතයාගේ කාරණයත් 12
දිළිඳුගේ යුක්තියත් ඉෂ්ටකරන බව දනිමි.

13 සැබවින් ධර්මිෂ්ඨයෝ ඔබගේ නාමයට
ස්තුතිකරන්නෝය.
අවංකයෝ ඔබ ඉදිරියෙහි
වාසයකරන්නෝය.

## පරීක්ෂාවෙන් හා පීඩාවෙන් මිදීම පිණිස යාච්ඤාව

141 දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමිනි, මම ඔබට යාච්ඤාකෙළෙමි;
මා ළඟට ඉක්මනින් අව මැනව.
ඔබට යාච්ඤාකරන කල මාගේ
ශබ්දයට ඇහුම්කන්දුන මැනව.
2 මාගේ යාච්ඤාව ඔබ ඉදිරියේ සුවඳ
දුම් මෙන්ද
මාගේ අත් එසවීම සන්ධ්‍යා පූජාව
මෙන්ද පිහිටා ගනීවා.
3 ස්වාමිනි, මාගේ කටෙහි රැකවලක්
තබා,
මාගේ තොල් නමැති දොර රක්ෂාකළ
මැනව.
4 අයුතුකම්කරන මනුෂ්‍යයන් සමග
දුෂ්ට ක්‍රියාවල පවතින ලෙස,
කිසි නපුරු දෙයකට මාගේ සිත
යොමුවෙන්ට නොහළ මැනව;
ඔවුන්ගේ මිහිරි දේද අනුභව
නොකෙරෙම්වා.
5 ධර්මිෂ්ඨයා මට පහරදේවා, ඒක
කරුණාවක් වන්නේය;
ඔහු මට තරවටුකෙරේවා, එය හිසපිට
තෙල් මෙන් වන්නේය;
මාගේ හිස ඊට අප්‍රිය නොකෙරේවා.
මක්නිසාද ඔවුන්ගේ දුෂ්ටකම අතරේදී
පවා මාගේ යාච්ඤාව පවතින්නේය.
6 ඔවුන්ගේ විනිශ්චයකාරයෝ
ප්‍රපාතවලින් හෙළනු ලබති;
ඔව්හු මාගේ වචන අසන්නෝය;
මක්නිසාද ඒවා මිහිරිය.
7 පොළොව හාලා පෙරළන කල්හි
මෙන්
අපේ ඇට මිනීවළේ කට ළඟ ඉසිරී
තිබේ.
8 එසේය, ස්වාමිවූ දෙවියන්වහන්ස,
මාගේ ඇස් ඔබ දෙස යොමුවී
තිබේ.
මාගේ විශ්වාසය ඔබ කෙරෙහි තබමි;
මාගේ ප්‍රාණය අසරණවෙන්ට
නොහළ මැනව.
ඔවුන් මට තැබූ මලපතින්ද 9
අයුතුකම්කරන්නන්ගේ උගුල්වලින්ද මා
මා ආරක්ෂාකළ මැනව.
මා ගැළවීයන අතර 10
දුෂ්ටයෝ තමුන්ගේම දැල්වල වැටෙත්වා.

## බලවත් අනතුරු අඩියක සිට කන්නලව්කිරීම

ගුහාවෙහි තමාගේ
සිටීම ගැන දාවිත්ගේ 142
අනුශාසනා යාච්ඤාවකි.
මාගේ ශබ්දය නගා ස්වාමීන්ට 1
මොරගසමි;
ස්වාමීන්ට මාගේ ශබ්දය නගා
කන්නලව් කරමි.
මාගේ විලාපය උන්වහන්සේ ඉදිරියෙහි 2
වගුරුවමි;
උන්වහන්සේ ඉදිරියෙහි මාගේ දුක
පෙන්වා සිටිමි.
මාගේ ආත්මය මා තුළ ක්ලාන්තවූ 3
කල ඔබ මාගේ මාවත
දැනගත්සේක.
මා ගමන්කරන මාර්ගයෙහි ඔව්හු මට
මලපතක් සඟවා තැබුවෝය.
මාගේ දකුණතට ඇස් හෙළා බැලුව 4
මැනව; මක්නිසාද මා අඳුනන
කිසිවෙක් නැත්තේය.
මට රක්ෂාස්ථානයත් නැතිවිය;
කිසිවෙක් මාගේ ප්‍රාණය ගැන
සලකන්නේ නැත.
ස්වාමිනි, මම ඔබට මොරගැසීමි; 5
ඔබ මාගේ රක්ෂාස්ථානයත්
ජීවතුන්ගේ දේශයෙහි මාගේ
කොටසත්යයි කීයෙමි.
මාගේ මොරගැසීමට කන්දුන මැනව; 6
මක්නිසාද මම ඉතා පහත්කරනු

ලැබීමි.
මට පීඩාකරන්නන්ගෙන් මා ගැළෙවුව
මැනව; මක්නිසාද ඔව්හු මට වඩා
බලවත්ය.
7 මා විසින් ඔබගේ නාමයට ස්තුති
කරන පිණිස මාගේ ආත්මය හිර
ගෙයින් මිදුව මැනව.
ඔබ මට යහපත්කම්කරන බැවින්
ධර්මිෂ්ඨයෝ මා පිරිවරාගන්නෝය.

## ක්ලාන්තවූ ආත්මයේ කන්නලව්ව

143 දාවිත්ගේ ගීතයකි.

1 ස්වාමීනි, මාගේ යාච්ඤාව අසුව
මැනව; මාගේ කන්නලව්වට
ඇහුම්කන්දුන මැනව.
ඔබගේ විශ්වාසකමින්ද
ධර්මිෂ්ඨකමින්ද මට උත්තරදුන
මැනව.
2 ඔබගේ මෙහෙකරුවා විනිශ්චයකිරීමට
නොපැමිණුණ මැනව;
මක්නිසාද ජීවත්වෙන කිසිවෙක් ඔබ
ඉදිරියෙහි නිදෙස් නොවන්නේය.
3 සතුරා මාගේ ආත්මයට පීඩාකෙළේය;
ඔහු මාගේ ජීවිතයට පහරදී බිම
හෙළුවේය.
ඔහු වනාහි මැරී බොහෝ කල් ගියවුන්
මෙන් අඳුරු තැන්වල විසීම
මට සැලැස්වීය.
4 එබැවින් මාගේ ආත්මය මා තුළ
ක්ලාන්තවේ;
මාගේ සිත මා තුළෙහි සැනසීම් රහිතය.
5 පුරාණ දවස් සිහිකරමි;
ඔබගේ සියලු ක්‍රියා භාවනාකරමි.
ඔබගේ හස්තකර්ම මෙනෙහිකරමි.
6 මාගේ අත් ඔබ දෙසට දිගුකරමි.
වියළි බිමක් මෙන් මාගේ ආත්මය
ඔබට පිපාසාවේ.
7 ස්වාමීනි, ඉක්මනින් මට උත්තරදුන
මැනව; මාගේ ආත්මය ක්ලාන්තවේ.
වළට බසින්නන්ට මා සමාන නොවන
පිණිස
ඔබගේ මුහුණ මා කෙරෙන් සඟවා
නොගත මැනව.
උදය ඔබගේ කරුණාගුණය මට 8
ඇසෙන්ට සැලැස්සුව මැනව;
මක්නිසාද ඔබ කෙරෙහි විශ්වාසය
තබමි.
මා විසින් යා යුතු මාර්ගය මට දක්වුව
මැනව;
මක්නිසාද ඔබ දෙසට මාගේ සිත
ඔසවමි.
ස්වාමීනි, මාගේ සතුරන්ගෙන් මා 9
ගැළෙවුව මැනව.
සැඟවෙන පිණිස ඔබ වෙතට පලා එමි.
ඔබගේ කැමැත්ත කරන්ට මට 10
ඉගැන්වුව මැනව; මක්නිසාද ඔබ
මාගේ දෙවියන්වහන්සේය.
ඔබගේ ආත්මය යහපත්ය; අවංකකමේ
දේශයෙහි මා ගෙනගිය මැනව.
ස්වාමීනි, ඔබගේ නාමය උදෙසා මා 11
ප්‍රාණවත්කළ මැනව.
ඔබගේ ධර්මිෂ්ඨකම නිසා මාගේ
ආත්මය විපතින් මිදුව මැනව.
ඔබගේ අධික කරුණාවෙන් මාගේ 12
සතුරන් සිඳදමා,
මාගේ ආත්මයට පීඩාකරන සියල්ලන්
විනාශකළ මැනව;
මක්නිසාද මම ඔබගේ මෙහෙකරුයෙමි.

## ජය දෙන්නාවූ ස්වාමීන්වහන්සේට ප්‍රශංසාව

දාවිත්ගේ ගීතයකි. 144

යුද්ධයට මාගේ අත්ද 1
සටනට මාගේ ඇඟිලිද පුරුදුකරවන්නාවූ
මාගේ පර්වතයවූ ස්වාමීන්ට ප්‍රශංසා
වේවා.
උන්වහන්සේ මට කරුණා නිධානයය, 2
මාගේ බලකොටුවය,
මාගේ උස් කොටුව හා මාගේ
මිදුම්කරුය;
මාගේ පලිහ හා මා විසින් විශ්වාසය
තබන තැනන්වහන්සේය;

මාගේ සෙනඟ මට යටත්කරදෙන්නේ
උන්වහන්සේය.
3 ස්වාමිනි, ඔබ විසින් මනුෂ්‍යයා ගැන
කල්පනාකිරීමට හෝ
මනුෂ්‍ය පුත්‍රයා සැලකීමට හෝ ඔහු
කවුද?
4 මනුෂ්‍යයා වනාහි හිස්කමට සමානය.
ඔහුගේ දවස් පහවයන සෙවණැල්ලක්
වැනිය.
5 ස්වාමිනි, ඔබගේ අහස නමාගෙන
බැස්ස මැනව.
කඳු ස්පර්ශකළ මැනව, එවිට එයින්
දුම් නගින්නේය.
6 විදුලි විහිදුවා ඔවුන් විසිරවුව මැනව;
ඔබගේ ඊගස් විද ඔවුන් පැරදවුව
මැනව.
7 ඉහළින් ඔබගේ හස්තය දිගුකළ
මැනව;
මහත් ජලධාරාවලින්ද
විදේශීන්ගේ අතින්ද මා උදුරා මුද
ගත මැනව.
8 ඔවුන්ගේ මුඛය නිෂ්ඵල දේ කියයි,
ඔවුන්ගේ දකුණත බොරුවෙන්
යුක්තවූ දකුණතක්ය.
9 දෙවියන්වහන්ස, ඔබට අලුත් ගීයක්
ගායනාකරන්නෙමි.
තත් දසයේ වීණාව ගෙන ඔබට
ප්‍රශංසා ගී කියන්නෙමි.
10 රජුන්ට ගැළවීම දෙන්නෙත්
ස්වකීය මෙහෙකරුවූ දාවිත් හිංසාකරන
කඩුවෙන් මුදගන්නෙත් උන්වහන්සේය.
11 විදේශීන්ගේ අතින් මා උදුරා මුදගත
මැනව.
ඔවුන්ගේ මුඛය නිෂ්ඵල දේ කියයි,
ඔවුන්ගේ දකුණත බොරුවෙන්
යුක්තවූ දකුණතක්ය.
12 යම් කලෙක අපේ පුත්‍රයෝ තරුණ
වයසේදී වැඩුණු පැළ මෙන් හා
අපේ දූවරු මාලිගා කැටයම් ප්‍රකාර
කැටයම් කළ කොනේ ගල් මෙන්
වන්නෝද,
අපේ ගබඩාවල් සියලු ආකාර 13
ධාන්‍යයෙන් පිරී තිබෙන්නේද,
අපේ කෙත්වලදී බැටළුවෝ දහස් ගණන්,
දස දහස් ගණන්, වර්ධනය වන්නෝද,
අපේ ගොන්නු මනාසේ බර පටවනු 14
ලබන්නෝද,
බලාත්කාරයෙන් ඇතුල්වීමක්වත්
පිටත යාමක්වත් නොවන්නේද,
අපේ වීථිවල කෝලාහලයක්වත්
නොවන්නේද,
එකල්හි ඒ ආකාර සෙනඟ 15
වාසනාවන්තයෝය.
එසේය, ස්වාමීන්වහන්සේ තමුන්ගේ
දෙවියන්වහන්සේ කොට ගත්
සෙනඟ වාසනාවන්තයෝය.

## සියල්ලන්ට යහපත්කම් කරන්නාවූ දෙවියන්වහන්සේ

ප්‍රශංසා ගීතයකි; දාවිත් **145**
විසිනි.
මාගේ දෙවිවූ රජ්ජුරුවන්වහන්ස, 1
ඔබ උසස්කරන්නෙමි;
ඔබගේ නාමයට සදාකාලේටම
ප්‍රශංසාකරන්නෙමි.
සැමදාම ඔබට ප්‍රශංසාකරන්නෙමි; 2
සදාකාලේටම ඔබගේ නාමය වර්ණනා
කරන්නෙමි.
ස්වාමීන්වහන්සේ උතුම්ය, බොහෝ 3
සෙයින් ප්‍රශංසා ලැබිය
යුතුය;
උන්වහන්සේගේ උතුම්කමද සොයා
දැනගත නොහැකිය.
එක් පරම්පරාවක් තවත් පරම්පරාවකට 4
ඔබගේ කර්මාන්ත වර්ණනා
කරමින්,
ඔබගේ බලවත් ක්‍රියා ප්‍රකාශකරන්නේය.

5 මම ඔබගේ ගෞරවයේ තේජෝමහිමයත්
ඔබගේ පුදුම ක්‍රියාත් මෙනෙහි කරන්නෙමි.
6 මනුෂ්‍යයෝ ඔබගේ භයානක ක්‍රියා බලය ගැන කථාකරන්නෝය;
මමද ඔබගේ උතුම්කම ප්‍රකාශකරන්නෙමි.
7 ඔව්හු ඔබගේ මහත් යහපත්කමේ සිහිවීම ප්‍රකාශකරමින්,
ඔබගේ ධර්මිෂ්ඨකම ගැන ගී කියන්නෝය.
8 **ස්වාමීන්වහන්සේ** දයාවන්තය, අනුකම්පාවෙන් පූර්ණය;
උදහස්වීමට ප්‍රමාදය, මහත් කරුණාවෙන් යුක්තය.
9 **ස්වාමීන්වහන්සේ** සියල්ලන්ට යහපත්ය;
උන්වහන්සේගේ දයාබරකම් උන්වහන්සේගේ සියලු කර්මාන්ත කෙරෙහිය.
10 **ස්වාමීනි**, ඔබගේ සියලු කර්මාන්තයෝ ඔබට ස්තුතිකරන්නෝය;
ඔබගේ ශුද්ධවන්තයෝද ඔබට ප්‍රශංසා කරන්නෝය.
11 දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාත් උන්වහන්සේගේ රාජ්‍යයේ තේජෝමහිමයත්
මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වන පිණිස,
12 ඔව්හු ඔබගේ රාජ්‍යයේ මහිමය වර්ණනාකරන්නෝය,
ඔබගේ බලය ගැනද කථාකරන්නෝය.
13 ඔබගේ රාජ්‍යය සදාකාලික රාජ්‍යයක්ය,
ඔබගේ අධිපතිකමද සියලු පරම්පරාවලම පවත්නේය.
14 **ස්වාමීන්වහන්සේ** වැටෙන සියල්ලන්ට ආධාරසේක,
නැමී සිටින සියල්ලන් කෙළින් සිටුවනසේක.
15 සියල්ලන්ගේ ඇස් ඔබ දෙස යොමුකර තිබේ;
ඔබද සුදුසු කාලයේ ඔවුන්ට කෑම දෙනසේක.
ඔබ ස්වකීය හස්තය විදහා, 16
ජීවමාන සියල්ලන්ගේ ආශාව පූර්ණ කරනසේක.
**ස්වාමීන්වහන්සේ** ස්වකීය සියලු මාර්ගයන්හි ධර්මිෂ්ඨය, 17
ස්වකීය සියලු ක්‍රියාවලින් දයාවන්තය.
**ස්වාමීන්වහන්සේ** තමන්ට යාච්ඤාකරන සියල්ලන්ට, 18
එනම් සැබවින් උන්වහන්සේට යාච්ඤාකරන සියල්ලන්ට, ළංව සිටිනසේක.
උන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ගේ ආශාව ඉෂ්ටකරදෙනසේක; 19
ඔවුන්ගේ මොරගැසීම අසා ඔවුන් ගළවනසේක.
**ස්වාමීන්වහන්සේ** තමන්ට ප්‍රේමකරන සියල්ලන් ආරක්ෂාකරනසේක; 20
නුමුත් සියලු දුෂ්ටයන් විනාශකරනසේක.
මාගේ මුඛය **ස්වාමීන්ගේ** ප්‍රශංසාව කියන්නේය; 21
මාංසමයවූ සියල්ලෝද සදාකාලේටම උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ප්‍රශංසාකෙරෙත්වා.

## සර්ව බලසම්පන්න උපකාරකාරයාණෝ

146

**ස්වාමීන්ට** ප්‍රශංසාකරව්.
මාගේ ආත්මය, **ස්වාමීන්ට** ප්‍රශංසාකරව.
දිවිහිමියෙන් **ස්වාමීන්ට** ප්‍රශංසාකරන්නෙමි. 2
මා පවතින තුරු මාගේ දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කියන්නෙමි.
අධිපතීන් කෙරෙහිවත් 3
පිහිටවිය නොහැකි මනුෂ්‍ය පුත්‍රයා

කෙරෙහිවත් විශ්වාසය නොතබව්.
4 ඔහුගේ හුස්ම නික්ම යයි, ඔහු
ස්වකීය භූමියට හැරී යයි;
එදම ඔහුගේ කල්පනා නැතිවේ.
5 යාකොබ්ගේ දෙවියන්වහන්සේ
උපකාරකොට ඇත්තාවූ,
තමාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
කෙරෙහි තමාගේ බලාපොරොත්තුව
ඇත්තාවූ තැනැත්තේ වාසනාවන්තය.
6 උන්වහන්සේ අහසත් පොළොවත්
මුහුදත් එහි ඇති සියල්ලත් මැවූසේක;
උන්වහන්සේ සදාකල්ම සත්‍යය
පවත්වනසේක.
7 උන්වහන්සේ පීඩා විඳින්නන්ට යුක්තිය
ඉෂ්ටකරනසේක;
උන්වහන්සේ බඩගිනිවූවන්ට කෑම
දෙනසේක.
ස්වාමීන්වහන්සේ හිරකාරයන්
මුදනසේක.
8 ස්වාමීන්වහන්සේ අන්ධයන්ගේ ඇස්
පහදනසේක;
ස්වාමීන්වහන්සේ නැමී ගියවුන් කෙළින්
සිටුවනසේක;
ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨයන්ට
ප්‍රේමකරනසේක;
9 ස්වාමීන්වහන්සේ විදේශීන් ආරක්ෂා
කරනසේක;
පියානැත්තා හා වැන්දඹුවට
උන්වහන්සේ උපකාරකරනසේක;
නුමුත් දුෂ්ටයන්ගේ මාර්ගය වියවුල්
කරනසේක.
10 එම්බා සියොන් නගරය,
ස්වාමීන්වහන්සේ, එනම් තිගේ
දෙවියන්වහන්සේ,
සදාකාලේටද සියලු පරම්පරා දක්වාද
රජකම්කරනසේක.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## දෙවියන්වහන්සේගේ දයාව සහ බලය වර්ණනාකිරීම

147 ස්වාමීන්ට ප්‍රශංසාකරව්;
මක්නිසාද අපේ දෙවියන්-
වහන්සේට ප්‍රශංසා ගී කීම යහපත්ය.
එයින් ප්‍රීතිය උපදනේය, ප්‍රශංසාකිරීම
හොබනේය.
ස්වාමීන්වහන්සේ යෙරුසලම 2
ගොඩනගනසේක;
පන්නාදමනු ලැබූ ඉශ්‍රායෙල් සෙනඟ
රැස්කරනසේක.
උන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන් 3
සුවකරනසේක,
ඔවුන්ගේ තුවාල බඳිනසේක.
උන්වහන්සේ තාරකාවන් ගණන්කොට, 4
ඒ සියල්ලට නම් තබනසේක.
අපේ ස්වාමීන්වහන්සේ උතුම්ය, මහා 5
බලයෙන් යුක්තය;
උන්වහන්සේගේ ඥානය අනන්තය.
ස්වාමීන්වහන්සේ යටහතුන්ට 6
උපකාරකරනසේක;
දුෂ්ටයන් බිම හෙළනසේක.
ස්තුති දීමෙන් ස්වාමීන්ට ගී කියව්; 7
වීණාවෙන් අපේ දෙවියන්වහන්සේට
ප්‍රශංසා ගී කියව්.
උන්වහන්සේ අහස වලාකුළින් 8
වසනසේක,
පොළොවට වැසි වස්වනසේක,
කඳුවල තෘණ අටගන්වනසේක.
උන්වහන්සේ මෘගයාටත් 9
අඬන කපුටු පැටවුන්ටත් කෑම
දෙනසේක.
අශ්වයාගේ ශක්තියට උන්වහන්සේ 10
ප්‍රිය නොවනසේක.
මනුෂ්‍යයෙකුගේ පාදයන්හි
උන්වහන්සේට ප්‍රසන්නයක් නැත.
ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය 11
ඇත්තන්ටත්
තමන්ගේ කරුණාව ගැන
බලාසිටින්නන්ටත් ප්‍රසන්නවනසේක.
එම්බා යෙරුසලම, ස්වාමීන්ට ප්‍රශංසා 12
කරව;
සියොන් නගරය, තිගේ
දෙවියන්වහන්සේට ප්‍රශංසාකරව.
මක්නිසාද උන්වහන්සේ තිගේ වාසල් 13
දොරටුවල අගුල් සවිකළසේක;
තී තුළ තිගේ දරුවන්ට
ආශීර්වාදකළසේක.

14 තිගේ සීමා තුළ සමාදනය
සිදුකරනසේක;
ඉතා උතුම් ගෝධූමයෙන් තී
පුරවනසේක.
15 උන්වහන්සේ ස්වකීය ආඥාව
පොළොවෙහි යවනසේක;
උන්වහන්සේගේ වචන යුහුව දුවයි.
16 උන්වහන්සේ බැටළු ලොම් මෙන් හිම
වස්වනසේක;
අලු මෙන් මිදුණු පිනි විසුරුවනසේක.
17 ස්වකීය හිම කැට කැබෙලි කොට
වීසිකරනසේක.
උන්වහන්සේගේ ශීත හමුයෙහි සිටින්ට
පුළුවන් කාටද?
18 උන්වහන්සේ තමන් වචනය යවා ඒවා
දියකරනසේක.
උන්වහන්සේ තමන් හුළඟ හමන්ට
සලස්වනසේක, එවිට ජලධාරාවෝ
ගලායති.
19 උන්වහන්සේ යාකොබ්ට ස්වකීය
වචනයද
ඉශ්‍රායෙල්ට ස්වකීය පනත් සහ
විනිශ්චයන්ද පෙන්වනසේක.
20 උන්වහන්සේ වෙන කිසි ජාතියකට
මෙසේ නොකළසේක.
උන්වහන්සේගේ විනිශ්චයන් වනාහි
ඔව්හු දැන නොගත්තෝය.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## මුළු මැවිල්ල ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකළ යුතු බව

# 148 ස්වාමීන්ට ප්‍රශංසාකරව්

ස්වර්ගවල සිට ස්වාමීන්ට ප්‍රශංසාකරව්.
උස් තැන්හිදී උන්වහන්සේට ප්‍රශංසා
කරව්.
2 උන්වහන්සේගේ සියලු දූතයෙනි,
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
උන්වහන්සේගේ මුළු සේනාව,
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
3 චන්ද්‍ර සූර්යයෙනි, උන්වහන්සේට
ප්‍රශංසාකරව්.
දීප්තිමත් තාරකා සියල්ලෙනි,
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
ස්වර්ගවල ස්වර්ගයෙනි, 4
අහසට උඩින් තිබෙන ජලයෙනි,
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
ඒ සියල්ලෝ ස්වාමීන්ගේ නාමයට 5
ප්‍රශංසාකෙරෙත්වා.
මක්නිසාද උන්වහන්සේ අණකළසේක,
එවිට ඒවා මවනලද්දේය.
උන්වහන්සේ සදාකාලේටම ඒවා 6
පිහිටෙවූසේක.
උන්වහන්සේ නැතිනොවන නියෝගයක්
කළසේක.
මහා සර්පයන් හා ගැඹුරු තැන් 7
සියල්ලෙනි,
ගිනි සහ ගල් වර්ෂාවෙනි, හිම සහ 8
වාෂ්පයෙනි,
උන්වහන්සේගේ ආඥාව ඉෂ්ටකරන
මාරුතයෙනි,
කඳු හා හෙල් සියල්ලෙනි, 9
එල දෙන ගස් හා කිහිරි වෘක්ෂ
සියල්ලෙනි,
තිරිසතුන් හා සියලු සිව්පාවෙනි, 10
උරගුන් හා පියාඹන පක්ෂීනි,
පොළොවේ රජුන් හා සියලු මනුෂ්‍ය 11
වර්ගයෙනි,
අධිපතීන් හා පොළොවේ සියලු
විනිශ්චයකාරයෙනි,
තරුණයන් හා තරුණියෙනි, 12
මහල්ලන් හා බාලයෙනි,
පොළොවේ සිට ස්වාමීන්ට
ප්‍රශංසාකරව්.
මොව්හු ස්වාමීන්ගේ නාමයට 13
ප්‍රශංසාකෙරෙත්වා;
මක්නිසාද උන්වහන්සේගේ නාමය
පමණක් උසස්ය.
උන්වහන්සේගේ මහිමය ස්වර්ගය හා
පොළොව මත්තෙහි පවත්තේය.
උන්වහන්සේ ස්වකීය සෙනඟගේ අඟ 14
එසෙවූසේක,
ස්වකීය සියලු ශුද්ධවන්තයන්ට
එනම් තමන්ට ළංව සිටින සෙනඟක්
වන ඉශ්‍රායෙල් පුත්‍රයන්ට, ප්‍රශංසා
හේතුවක් නැගුසේක.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## ඉශ්‍රායෙල්ගේ ස්වාමීන්වහන්සේට ප්‍රශංසාව

149 ස්වාමීන්ට ප්‍රශංසාකරව්.
ස්වාමීන්ට අලුත් ගීතිකාවක්ද
ශුද්ධවන්තයන්ගේ සභාවේදී
උන්වහන්සේගේ ප්‍රශංසාවද
ගායනාකරව්.
2 ඉශ්‍රායෙල් තමා මැවූ තැනැත්වහන්සේ
කෙරෙහි ප්‍රීතිවේවා.
සියොන් දරුවෝ තමුන්ගේ රජ්ජුරුවන්
කෙරෙහි ප්‍රීතිමත්වෙත්වා.
3 නටමින් උන්වහන්සේගේ නාමයට
ප්‍රශංසාකෙරෙත්වා.
රබාන සහ වීණාව ගෙන
උන්වහන්සේට ප්‍රශංසා ගී කියත්වා.
4 මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන්
සෙනඟ කෙරෙහි ප්‍රසන්නවනසේක.
යටහතුන් ගැළවීමෙන් සරසනසේක.
5 ශුද්ධවන්තයෝ මහිමයෙන් යුක්තව
සන්තෝෂවෙත්වා;
තමුන්ගේ යහන්වල ඉඳ ප්‍රීතියෙන්
ගායනාකෙරෙත්වා.
6 ඔවුන්ගේ මුඛවල දෙවියන්වහන්සේට
උතුම් ප්‍රශංසාද
අතෙහි දෙමුවහත් කඩුවක්ද වේවා;
7 කුමටදයත්, ජාතීන් කෙරෙහි
පළිගැනීම හා
මනුෂ්‍ය වර්ගයන් කෙරෙහි දඬුවම්
පමුණුවන පිණිසත්,
8 ඔවුන්ගේ රජුන් යදමින්ද
ඔවුන්ගේ අධිපතීන් විලංගුවලින්ද
බඳින පිණිසත්,
9 ලියනලද විනිශ්චය ඔවුන් කෙරෙහි
ඉෂ්ටකරන පිණිසත්ය.
මේ ගෞරවය උන්වහන්සේගේ සියලු
ශුද්ධවන්තයන්ට ඇත්තේය.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## සමස්ත ලෝකයා විසින් ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කළ යුතු බව

150 ස්වාමීන්ට ප්‍රශංසාකරව්.
දෙවියන්වහන්සේගේ
ශුද්ධස්ථානයෙහිදී උන්වහන්සේට
ප්‍රශංසාකරව්.
උන්වහන්සේගේ බල පවත්නා අහස්
තලයෙහි උන්වහන්සේට
ප්‍රශංසාකරව්.
උන්වහන්සේගේ බලවත් ක්‍රියා නිසා 2
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
උන්වහන්සේගේ මහෝත්තමභාවය
පරිද්දෙන් උන්වහන්සේට ප්‍රශංසා
කරව්.
හොරණෑ ශබ්දයෙන් උන්වහන්සේට 3
ප්‍රශංසාකරව්.
කුඩා වීණාව හා මහා වීණාවෙන්
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
රබානෙන් හා නැටීමෙන් 4
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
වීණා තතින් හා නළාවෙන්
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
මහත් ශබ්ද දෙන අත්තලින් 5
උන්වහන්සේට ප්‍රශංසාකරව්.
උස් රාව් දෙන අත්තලින් උන්වහන්සේට
ප්‍රශංසාකරව්.
හුස්ම ඇති සියල්ලෝම ස්වාමීන්ට 6
ප්‍රශංසාකෙරෙත්වා.
ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

# හිතෝපදේශ

## ප්‍රාරම්භය. පව්කාරයන් හා එකඟවීමට විරුද්ධව අවවාද දීම

1 ඉශ්‍රායෙල්ගේ රජවූ දවිත්ගේ පුත්‍ර
සාලමොන්ගේ හිතෝපදේශ.
2 ඒවා වනාහි ප්‍රඥාවද ගුරුකමද
දැනගැනීමටත්;
බුද්ධිමත් වාක්‍ය තේරුම්ගැනීමටත්;
3 ඥානවන්ත හැසිරීමේද ධර්මිෂ්ඨකමේද
යුක්තියේද අවංකකමේද ගුරුකම්
ලබාගැනීමටත්;
4 අනුවණයන්ට ඥානයද
තරුණයාට දැනගැන්ම සහ
සිහිකල්පනාවද දීමටත්ය.
5 හිතෝපදේශයක් හා උපහැරණයක්ද
ඥානවන්තයන්ගේ වචන හා ඔවුන්ගේ
ගැඹුරු කීම්ද තේරුම්ගන්න
හැටියට
6 ඥානවන්තයා අසා ඉගෙනගැන්ම
වැඩිකරගන්නේය;
නුවණ ඇත්තා හොඳ ගුරුකම්
ලබාගන්නේය.
7 ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම
දැනගැන්මේ පටන්ගැන්මය.
අඥානයෝ ප්‍රඥාවද ගුරුකමද
හෙළාදකිති.
8 මාගේ පුත්‍රය, නුඹේ පියාගේ ගුරුකම
අසාපන්න,
නුඹේ මවුගේ උපදෙස්ද අත්
නොහරින්න.
9 මක්නිසාද ඒවා නුඹේ හිසට හොබනා
මාලාවක්ද
නුඹේ බෙල්ලට මාලයක්ද වෙත්.

මාගේ පුත්‍රය, පව්කාරයෝ නුඹ 10
පොළඹත් නම්,
එකඟ නොවන්න.
ඔවුන් කථාකොට: අප සමග වරෙන්න, 11
ලෙය ගැන රැක සිට,
නිකරුණේ නිර්දෝෂ අය ගැන සැඟවී
සිටිමු;
*ෂෙයෝල මෙන් අපි ඔවුන් පණපිටින්ද 12
වළට බසින්නන් මෙන් සහමුලින්ද
ගිලගනිමු;
සියලු ආකාර අනර්ඝ වස්තු අපට 13
සම්බවේ,
අපේ ගෙවල් කොල්ලයෙන් පුරවා
ගන්නෙමු;
නුඹ අප සමග පංගුකාර වෙයන්න; 14
අප සියල්ලන්ට එක පසුම්බියක්ම
තිබේවයි කියන නුමුත්,
මාගේ පුත්‍රය, ඔවුන් සමග ඒ මාර්ගයේ 15
නොයන්න;
නුඹේ පය ඔවුන්ගේ මාවතින්
වළක්වාගනින්න.
මක්නිසාද ඔවුන්ගේ පාදයෝ නපුරට 16
දුවති,
ඔව්හු ලේ වැගිරීමට ඉක්මන්වෙති.
යම්කිසි පක්ෂියෙකුට පෙනෙන ලෙස 17
දැල එළාතැබීම නිෂ්ඵලය.
ඔව්හු වනාහි තමුන්ගේම ලෙය ගැන 18
රැක සිටිති,
තමුන්ගේම ප්‍රාණයට විරුද්ධව සැඟවී
සිටිති.
ලාභයට ලෝභිවූ සියල්ලන්ගේ මාර්ග 19

*එනම්, මිනීවළ

එසේමය;
එය හිම්කාරයන්ගේ ප්‍රාණය එයින්ම හානිවේ.

## ප්‍රඥාව විසින් තරවටුකිරීම

20 ප්‍රඥාව වීථියෙහි මොරගසයි;
එළිමහන් ස්ථානවල ඈගේ හඬ පවත්වයි;
21 මනුෂ්‍යයන් රැස්වෙන මංසන්ධිවල ඈ කෑගසයි;
නුවරට ඇතුල්වෙන දොරටු ළඟ සිට ඈගේ බස් පවසයි.
22 එනම් නුවණ නැත්තෙනි, නුඹලා අනුවණකමට කැමතිවන්නෙත්,
නින්දකරන්නන් නින්දකිරීමට ප්‍රසන්න වන්නෙත්,
අඥානයන් දැනගැන්මට ද්වේෂකරන්නෙත් කොතෙක් කල්ද?
23 මාගේ අවවාදයට හැරියල්ලා.
මෙන්න, මාගේ ආත්මය නුඹලා කෙරෙහි වගුරුවන්නෙමි,
මාගේ වචන නුඹලාට දන්වන්නෙමි.
24 මක්නිසාද මම අඬගැසීම්, නුඹලා අකැමැතිවූහුය;
මාගේ අත දිගුකෙළෙමි, කවරෙක්වත් සැලකුවේ නැත;
25 නුඹලා මාගේ සියලු දැනමුතුකම් සුළුකොට,
මාගේ අවවාදය කොහෙත්ම පිළි නොගත්තාහුය.
26 එබැවින් මමත් නුඹලාගේ විපත්ති දවසේදී සිනාසෙන්නෙමි;
නුඹලාට භය පැමිණෙන විටද,
27 නුඹලාගේ භීතිය කුණාටුවක් මෙන් පැමිණෙන විටද,
නුඹලාගේ විනාශය සුළි හුළඟක් මෙන් එනවිටද,
නුඹලා කෙරෙහි විපතත් දුකත් පැමිණෙන විටද, මම සරදම් කරන්නෙමි.
28 එවිට ඔවුන් මට හඬගසන නුමුත් මම උත්තර නොදෙන්නෙමි;
ඔවුන් බොහෝසේ මා සොයන නුමුත් මා සම්බවන්නේ නැත.
මක්නිසාද ඔව්හු දැනගැන්මට ද්වේෂ කොට, 29
ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම තෝරා නොගෙන සිටියෝය.
ඔව්හු මාගේ දැනමුතුකමට මුළුමනින්ම අප්‍රසන්නවී, 30
මාගේ සියලු අවවාද සුළුකළෝය.
එබැවින් ඔව්හු තමුන්ගේම ක්‍රියාවල ඵල ලබන්නාහුය, 31
තමුන්ගේම මන්ත්‍රණවලින්ද තෘප්තියට පැමිණෙන්නාහුය.
මක්නිසාද නුවණ නැත්තෝ තමුන්ගේ පසුබටවීම නිසා මැරුම්කන්නෝය. 32
අඥානයෝ තමුන්ගේ නොසැලකිලිකම නිසා නැතිවන්නෝය.
නුමුත් මට ඇහුම්කන්දෙන තැනැත්තේ සුවසේ වාසයකොට, 33
විපතට භයනොවී, නිශ්චලව සිටින්නේය.

## ප්‍රඥාවේ මාහැඟිකම

2 මාගේ පුත්‍රය, නුඹ මාගේ කීම් පිළිගෙන,
මාගේ ආඥා නුඹ වෙත තබාගෙන,
ප්‍රඥාවට ඇහුම්කන්දී, 2
ඥානයට නුඹේ සිත යොමුකරන්නෙහි නම්,
එසේය, නුඹ නුවණට හඬගසා, 3
ඥානයට නුඹේ ශබ්දය නගන්නෙහි නම්,
නුඹ රිදී මෙන් ඈය සොයා, 4
නිධාන ගැන මෙන් ඈය ගැන විභාග කරන්නෙහි නම්,
නුඹ ස්වාමීන්වහන්සේ කෙරෙහි 5
භයවීම තේරුම්ගන්නෙහිය,
දෙවියන්වහන්සේ හැඳිනගැනීමටද පැමිණෙන්නෙහිය.
මක්නිසාද ප්‍රඥාව දෙන්නේ 6
ස්වාමීන්වහනසේය;

උත්වහන්සේගේ මුඛයෙන් දැනගැන්මද
ඥානයද පැමිණෙන්නේය.
7 උත්වහන්සේ අවංක තැනැත්තන්ට
හරි ප්‍රඥව රැස්කර තබනසේක,
සෘජුලෙස හැසිරෙන්නන්ට උත්වහන්සේ
පලිහක් වනසේක.
8 එසේ උත්වහන්සේ යුක්තියේ මාවත්
ආරක්ෂාකරමින්,
තමත් භක්තිවන්තයන්ගේ මාර්ගය
සුරක්ෂිතකරනසේක.
9 එවිට නුඹ ධර්මිෂ්ඨකමද යුක්තියද
සෘජුකමද, එසේය, සියලු යහපත්
මාවත්ද තේරුම්ගන්නෙහිය.
10 මක්නිසාද ප්‍රඥව නුඹේ සිතට
ඇතුල්වන්නේය,
දැනගැන්මද නුඹේ ආත්මයට
ප්‍රසන්න වන්නේය;
11 සිහිය නුඹ රැකවල්කරන්නේය,
ඥානයද නුඹ ආරක්ෂාකරන්නේය;
12 නපුරාගේ මාර්ගයෙන්ද
ප්‍රයෝග කථාකරන මිනිසුන්ගෙන්ද
නුඹ ගළවන්නේය.
13 ඔව්හු අන්ධකාරයේ මාර්ගවල යන
පිණිස
අවංක මාවත් අත්හරිති;
14 ඔව්හු නපුර කිරීමට සන්තෝෂවී,
නපුරුකමේ ප්‍රයෝගවලට ප්‍රීතිමත් වෙති.
15 ඔව්හු තමුන්ගේ මාර්ගවල වංකව
තමුන්ගේ මාවත්වල ඇදව සිටිති.
16 එසේම *අන්‍ය ස්ත්‍රියෙක් වන, තමාගේ
වචනවලින් ඉච්චාකරන්නාවූ,
තම යෞවන වයසේ මිත්‍රයා
අත්හරින්නාවූ,
17 තමාගේ දෙවියන්වහන්සේගේ ගිවිසුම
සිහි නැතිකරන්නාවූ
අන් තැනැත්තියගෙන් නුඹ ගැළවෙනවා
ඇත.
18 මක්නිසාද ඇගේ ගෙය මරණයටද
ඇගේ මාවත් මළවුන් වෙතටද
යොමුවන්නේය.
19 ඇය ළඟට යන්නන්ගෙන් කිසිවෙකු
හැරී එන්නේවත්,
ජීවනයේ මාවත්වලට පැමිණෙන්නේවත්
නැත.
මෙසේ කියන්නේ නුඹ යහපතුන්ගේ 20
මාර්ගයේ හැසිරෙමින්,
ධර්මිෂ්ඨයන්ගේ මාවත්වල ගමන්කරන
පිණිසය.
මක්නිසාද අවංක අයවල් දේශයෙහි 21
වාසයකරන්නෝය.
නිර්දෝෂ අයවල්ද එහි නැවතී
සිටින්නෝය.
නුමුත් දුර්ජනයෝ දේශයෙන් 22
සිඳදමනු ලබන්නෝය,
ද්‍රෝහිකම්කරන්නෝද එයින්
උදුරා දමනු ලබන්නෝය.

*එනම්, වේශ්‍යා.

## කීකරුකමේ හා තරවටු ලැබීමේ ප්‍රයෝජන

3
මාගේ පුත්‍රය, මාගේ උපදෙස්
සිහි නැති නොකර,
නුඹේ සිතින් මාගේ ආඥ
රක්ෂාකරපන්න.
මක්නිසාද එයින් දවස් ගණනද 2
ජීවිතයේ අවුරුදුද
සමාදනයද නුඹට වැඩිවන්නේය.
කරුණාව සහ සත්‍යවාදිකම නුඹෙන් 3
පහ නොවේවා.
ඒවා නුඹේ ගෙල වටේ බැඳගනින්න;
නුඹේ සිත නමැති පුවරුවේ ඒවා
ලියාගනින්න.
එවිට නුඹ දෙවියන්වහන්සේගේද 4
මනුෂ්‍යයාගේද ඇස් හමුයෙහි
කරුණාවත් යහපත් කීර්තියත් ලබනවා
ඇත.
නුඹේම නුවණෙහි නොපිහිටා, 5
නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ
කෙරෙහි විශ්වාසකරපන්න.
නුඹේ සියලු මාර්ගවලදී උත්වහන්සේ 6
සලකාපන්න,
එවිට උත්වහන්සේ නුඹේ මාවත්
සමතලාකරනවා ඇත.
නුඹ ඥානවන්තයෙකැයි සිතා 7
නොගනින්න;
ස්වාමීන්වහන්සේ කෙරෙහි භයව
නපුරෙන් දුරුවෙයන්න.
ඒක නුඹේ නහරවලට සනීපයද 8
නුඹේ ඇටවලට ප්‍රාණවත්කමද

වන්නේය.
9 නුඹේ සම්පතින්ද නුඹේ සියලු
අස්වැන්නේ ප්‍රථම ඵලයෙන්ද
ස්වාමීන්වහන්සේට ගෞරවකරපන්න.
10 එවිට නුඹේ අටු බොහෝ ධාන්‍යයෙන්
පිරෙන්නේය,
නුඹේ මුද්‍රික යන්ත්‍රද අලුත් මුද්‍රික
පානයෙන් ඉතිරෙන්නේය.
11 මාගේ පුත්‍රය, ස්වාමීන්වහන්සේගේ
තරවටුකිරීම සුළුකොට නොසිතන්න;
උන්වහන්සේගේ දඬුවමටද
නොකලකිරෙන්න.
12 මක්නිසාද පියෙකු ප්‍රිය පුත්‍රයාට
දඬුවම්කරන්නාක්මෙන්
ස්වාමීන්වහන්සේ තමන් ප්‍රේමකරන
අයට දඬුවම්කරනසේක.
13 ප්‍රඥව සොයාගන්න මනුෂ්‍යයාද
ඥනය ලබාගන්න මනුෂ්‍යයාද
වාසනාවන්තයෝය.
14 මක්නිසාද එහි ප්‍රයෝජනය රිදීවල
ප්‍රයෝජනයටත්
එහි ලාභය පිරිසිදු රනටත් වඩා
හොඳය.
15 ඈ රතුකැටවලට වඩා අනර්ඝය.
නුඹේ සියලුම ප්‍රිය දේ ඈට සමානකළ
නොහැක.
16 ඈගේ දකුණතෙහි දීර්ඝායුෂද
ඈගේ වමතෙහි වස්තුව හා ගෞරවයද
ඇත.
17 ඈගේ මාර්ග ප්‍රසන්න මාර්ගවල්ය,
ඈගේ සියලුම මාවත් සමාදනයය.
18 ඈ අල්ලාගන්නන්ට ඈ ජීවන
වෘක්ෂයක්ය;
ඈ ලබාගන්නෝ වාසනාවන්තයෝය.
19 ස්වාමීන්වහන්සේ ප්‍රඥව
කරණකොටගෙන පොළොවේ
අත්තිවාරම් තැබූසේක;
ඥනය කරණකොටගෙන අහස
පිහිටෙවූසේක.
20 උන්වහන්සේගේ දනගැන්මෙන් ගැඹුරු
තැන් හාරනු ලැබුවේය,
වලාකුල්වලින්ද පිනි වැස්සෙන්නේය.
21 මාගේ පුත්‍රය, ඒවා නුඹේ ඇස්වලින්
පහ නොවේවා;
සාරවූ ඥනයද සිහියද තබාගනින්න;
එවිට ඒවා නුඹේ ආත්මයට ජීවනයත් 22
නුඹේ ගෙලට අලංකාරයත් වන්නේය.
එවිට නුඹේ පය නොපැකිල, 23
නුඹ සුවසේ නුඹේ මාර්ගයෙහි
යන්නෙහිය.
නුඹ සැතපෙන කල භය 24
නොවන්නෙහිය.
එසේය, නුඹ සැතපුණාම නුඹේ නින්ද
මිහිරිවන්නේය.
හදිසි භීතියටවත් 25
දුෂ්ටයන් පිටට පැමිණෙන
කුණාටුවටවත් භය නොවන්න.
මක්නිසාද ස්වාමීන්වහන්සේ නුඹේ 26
විශ්වාස භූමියව,
නුඹේ පය අසු නොවන ලෙස
ආරක්ෂා කරනසේක.
කරුණාව පෙන්වන්ට නුඹේ අතෙහි 27
බලය තිබියදී,
ඕනෑකරන අයගෙන් එය වලක්වා
නොගනින්න.
නුඹ ළඟ තිබෙද්දීත්: 28
ගොස් නැවත වරෙන්න, හෙට
දෙන්නෙමියි
නුඹේ අසල්වාසියාට නොකියන්න.
නුඹේ අසල්වාසියා නුඹ සමීපයෙහි 29
නිසැකව වාසයකරද්දී
ඔහුට විරුද්ධව නපුරක් නොයොදන්න.
මනුෂ්‍යයෙක් නුඹට අනදරයක් නොකර 30
සිටිද්දී
නිකරුණේ ඔහු සමග පොරට
නොයන්න.
බලාත්කාරකරන අයට ඊර්ෂ්‍යා 31
නොකරන්න,
ඔහුගේ මාර්ගවලින් එකක්වත් තෝරා
නොගනින්න.
මක්නිසාද වංක තැනැත්තා 32
ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය.
නුමුත් උන්වහන්සේගේ මිත්‍රකම
අවංක අය සමග ඇත්තේය.
ස්වාමීන්වහන්සේගේ ශාපය දුෂ්ටයාගේ 33
ගෙය පිට තිබේ;
නුමුත් ධර්මිෂ්ඨයන්ගේ නිවාසයට
උන්වහන්සේ ආශීර්වාදකරනසේක.

34 නින්දකරන්නන්ට සැබවින්ම
උන්වහන්සේ නින්දකරනසේක,
යටහතුන්ට නම් කරුණාව දෙනසේක.
35 ඥනවන්තයන්ට ගෞරවය උරුමවේ;
නුමුත් අඥනයන්ට ලැබෙන්නේ
ලජ්ජාවය.

## පියාගේ ගුරුකම සැලකීම

4 මාගේ පුත්‍රයෙනි, පියෙකුගේ ගුරුකම
අසා,
නුවණ දනගැනීමට කන්
යොමුකරපල්ලා.
2 මක්නිසාද මම යහපත් ඉගැන්වීම
නුඹලාට දෙමි;
මාගේ උපදෙස් අත් නොහරිල්ලා.
3 මක්නිසාද මම මාගේ පියාට ප්‍රිය
පුත්‍රයෙක්ව,
මාගේ මවු ඉදිරියෙහි මෘදුවූ එකම
පුත්‍රයෙක්ව සිටියෙමි.
4 ඔහු මට උගන්වමින් මෙසේ කීයේය:
ඒ මාගේ වචන නුඹේ සිතේ
තබාගනින්න;
මාගේ ආඥ රක්ෂාකොට
ජීවත්වෙයන්න.
5 ප්‍රඥව ලබාගනින්න, නුවණ
ලබාගනින්න;
එය සිහිනැති නොකරන්න, මාගේ
මුඛයේ කීම්වලින් අහක්ව නොයන්න.
6 ප්‍රඥව අත් නොහරින්න, එවිට ඈ නුඹ
ප්‍රවේසම්කරනවා ඇත;
ඈට ප්‍රේමකරපන්න, ඈද නුඹ
ආරක්ෂාකරනවා ඇත.
7 ප්‍රඥව ප්‍රධාන දෙයය, එබැවින් ප්‍රඥව
ලබාගනින්න.
එසේය, නුඹ ලබාගන්න සියල්ල
ඇතුළුව, නුවණ ලබාගනින්න.
8 ඇය ශ්‍රේෂ්ඨකරපන්න, ඈද නුඹ උසස්
කරන්නීය.
නුඹ ඇය වැළඳගත්තාම, ඈ නුඹ
ගෞරවයට පමුණුවන්නීය.

ඈ නුඹේ ඉසට ශෝභන මාලාවක් 9
දෙන්නීය;
අලංකාර ඔටුන්නක්ද ඈ නුඹට
පළඳවන්නීය.

## ජීවිතයේ මාර්ග දෙක

මාගේ පුත්‍රය, කන්දී මාගේ කීම් 10
පිළිගනින්න;
එවිට නුඹේ ජීවිතයේ අවුරුදු
බොහෝ වන්නේය.
ප්‍රඥවේ මාර්ගය මම නුඹට උගන්වා, 11
හරිවූ මාවත්වල නුඹ ගෙනගියෙමි.
නුඹ යන කල නුඹේ පාද අවහිර 12
නොවන්නේය;
දුවන කල නුඹ නොපැකිලෙන්නෙහිය.
ගුරුකම තදින් අල්ලාගෙන, අතනෑර, 13
එය තබාගනින්න; මක්නිසාද එය නුඹේ
ජීවනයය.
දුෂ්ටයන්ගේ මාවතට ඇතුල් නොවන්න. 14
නපුරු මිනිසුන්ගේ මාර්ගයෙහි ගමන්
නොකරන්න.
එයින් වැලකී, එහි නොගොස්, 15
එයින් අහකට හැරී පලයන්න.
මක්නිසාද ඔව්හු නපුරක් නොකර 16
නිද නොගනිති;
යමෙකු හෙළා නොදමුවොත් ඔවුන්ගේ
නින්ද පහවෙයි.
මක්නිසාද ඔව්හු දුෂ්ටකම නමැති 17
කෑම කා,
බලාත්කාරකම නමැති මුද්‍රිකපානය
බොති.
නුමුත් ධර්මිෂ්ඨයන්ගේ මාවත ඉර 18
මුදුන් වේලාව දක්වා
වඩ වඩා ආලෝකවේගන යන්නාවූ
අලුයම් ආලෝකය මෙන්ය.
දුෂ්ටයන්ගේ මාර්ගය අන්ධකාරය 19
මෙන්ය.
තුමූ කුමකින් පැකිලෙද්දැයි ඔව්හු
නොදනිති.

මාගේ පුත්‍රය, මාගේ වචනවලට 20
ඇහුම්කන්දී,

මාගේ කීම්වලට නුඹේ කන නමාපන්න.
21 ඒවා නුඹේ ඇස් ඉදිරියෙන් පහ
නොවේවා;
නුඹේ සිත තුළ ඒවා තබාගනින්න.
22 මක්නිසාද ඒවා සම්බවන්නන්ට ඒවා
ජීවනයත්
ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ.
23 සියල්ලටම වඩා නුඹේ සිත ආරක්ෂා
කරගනින්න;
මක්නිසාද එයින් ජීවනය
නික්මෙන්නේය.
24 වංචා මුඛය නුඹෙන් පහකොට,
වංක තොල් නුඹෙන් දුරුකරපන්න.
25 නුඹේ ඇස් ඉස්සරහම බලත්වා,
නුඹේ ඇසිපියද නුඹ ඉදිරියෙහි
කෙළින්ම බලත්වා.
26 නුඹේ පාදවල මාවත
සමතලාකරපන්න,
නුඹේ සියලු මාර්ග ස්ථිරව තිබේවා.
27 දකුණටවත් වමටවත් නොහැරෙන්න.
නුඹේ පාද නපුරෙන් පහකරගනින්න.

## අයුතු තෘෂ්ණාව. පිරිසිදු ප්‍රේමය

5 මාගේ පුත්‍රය, සිහිනුවණ රක්ෂා
කරගැනීම පිණිසද
දැනගැන්ම නුඹේ තොල්වල පවතින
පිණිසද
2 මාගේ ප්‍රඥාවට ඇහුම්කන්දී,
මාගේ ඥානයට නුඹේ කන නමාපන්න.
3 මක්නිසාද *අන් ස්ත්‍රියෙකුගේ
තොල්වලින් මීපැණි වැස්සෙන්නේය,
ඇගේ මුඛය තෙල්වලටත් වඩා සිනිඳුය.
4 එහෙත් ඇගේ අන්තිමය කොසඹ මෙන්
තිත්තව,
දෙමුවහත් කඩුවක් මෙන් තියුණුව
තිබේ.
5 ඇගේ පාද මරණයට බසින්නේය;
ඇගේ අඩි †ෂෙයෝල්ලටම
පැමිණෙන්නේය.

*එනම්, වේශ්‍යා. †එනම්, මිනීවළටම,

ඇට ජීවනයේ මාවත නොපෙනෙන 6
ලෙස
ඇගේ පාරවල් ඇදව තිබේ, ඈ ඒ බව
නොදන්නීය.
එබැවින් මාගේ පුත්‍රයෙනි, මට 7
ඇහුම්කන්දී,
මාගේ මුඛයේ කීම්වලින් ඉවත් නොවී
සිටපල්ලා.
නුඹේ ශෝභනකම අනුන්ටත් 8
නුඹේ අවුරුදු කෲර අයටත් නොදෙන
පිණිසද,
නුඹේ සම්පතින් අන්‍යයන් තෘප්තියට 9
නොපැමිණෙන පිණිසද,
නුඹේ වීර්යයේ ඵල අන්‍ය ගෙදරකට
නොලැබෙන පිණිසද,
අන්තිමේදී නුඹේ මාංසයද ශරීරයද 10
ක්ෂයවන කල
නුඹ කෙඳිරිගා:
අහෝ, මා ගුරුකමට වෛරවී, 11
මාගේ සිත අවවාදය සුළුකළ හැටි!
මාගේ ගුරුවරුන්ගේ හඬට කීකරු 12
නොවී,
මාගේ ඉගැන්නුම්කාරයන්ට මාගේ
කන නොනමා සිටිය හැටි! කියාත්,
මම සභාව සහ සම්මුතිය මැදදී 13
හැම නපුරු ක්‍රියාවලම වාගේ
පැවතුණෙමියි කියාත් නොකියන
පිණිසද,
නුඹේ මාර්ගය ඈය වෙතින් 14
ඉවත්කරපන්න.
ඇගේ ගෙයි දොරකඩට ළං නොවන්න.
නුඹේම පොකුණෙන් වතුරද 15
නුඹේම ළිඳෙන් උනන වතුරද බීපන්න.
නුඹේ උල්පත් පිටතටත් 16
ජල ගංගා වීථිවලටත් විසිරයා යුතුද?
ඒවා නුඹ සමග අන්‍යයන්ට නොව 17
නුඹට පමණක්ම වේවා.
නුඹේ උල්පතට ආශීර්වාද ලැබේවා; 18
නුඹේ යෞවන වයසේ භාර්යාව
කෙරෙහිම ප්‍රීතිවෙයන්න.
ප්‍රේමවත් මුවදෙනකු සහ ප්‍රියකරු 19

වැලිමුවදෙනකු මෙන්
ඇගේ පියයුරුවලින් සැමවිටම සතුටුවී,
ඇගේ ආදරයෙන් නිතරම
ප්‍රීතිමත්වෙයන්න.
20 එසේය, මාගේ පුත්‍රය, නුඹ මක්නිසා
අන්‍ය ස්ත්‍රියෙකු කෙරෙහි ප්‍රීතිමත්ව,
අන්‍ය තැනැත්තියෙකුගේ ළය
වැළඳගන්නෙහිද?
21 මක්නිසාද මනුෂ්‍යයාගේ මාර්ග
ස්වාමීන්වහන්සේගේ ඇස් ඉදිරියෙහිය,
ඔහුගේ සියලු මාවත් උන්වහන්සේ
කල්පනාකර බලනසේක.
22 දුෂ්ටයා තමාගේ අපරාධවලින්ම
අසුවන්නේය,
තමාගේ පාප නමැති ලනුවලින්
බඳිනු ලබන්නේය.
23 ඔහු ඉගැන්වීම නැතිකම නිසා
නසින්නේය;
ඔහු තමාගේ මෝඩකමේ මහත්කම
නිසා මුළාවයන්නේය.

## උපද්‍රව සහිත දේවලින් වැලකීමට අවවාද

6 මාගේ පුත්‍රය, නුඹේ අසල්වාසියාට
නුඹ ඇපවී,
අන් කෙනෙකු උදෙසා නුඹේ අත්ගසා,
2 නුඹේ මුඛයේ කීම්වලින් පටලැවී,
නුඹේ මුඛයේ කීම්වලින් අසුවී
සිටින්නෙහි නම්,
3 මාගේ පුත්‍රය, නුඹේ අසල්වාසියා
අතට නුඹ අසුවී සිටින නිසා,
මෙසේ කොට ගැළවීයන්න:
නුඹ ගොස් නුඹේ අසල්වාසියාගේ
පාමුල වැටී කන්නලව්කරපන්න.
4 නුඹේ ඇස්වලට නින්දවත්
නුඹේ ඇසිපියවලට නිදිබරවත් නොදී,
5 දඩයක්කාරයාගේ අතින් තිත්මුවෙකු
මෙන්ද
පක්ෂි වැද්දාගේ අතින් පක්ෂියෙකු මෙන්ද
ගැළවීයන්න.
6 අලසය, කුහුඹුවා ළඟට ගොස්,
උගේ මාර්ග බලා, ඥානවන්ත
වෙයන්න.
උෟට ප්‍රධානියෙක්වත් 7
මුළාදෑනියෙක්වත් ආණ්ඩුකාරයෙක්වත්
නැති නුමුත්,
ග්‍රීෂ්ම කාලයේ උෟ උගේ ආහාර 8
සපයාගනියි,
ගොයම් කපන කාලයේ උගේ කෑම
රැස්කරගනියි.
අලසය, නුඹ කොපමණ වේලා 9
නිද ඉන්නෙහිද?
නුඹේ නින්දෙන් නුඹ නැගිටින්නේ
කොයි වේලාවේද?
තව ටිකක් නිදගැනීමක්ය, ටිකක් 10
සැතපීමක්ය,
නින්දට ස්වල්ප
අත්පොරවාගැනීමක්යයි
කියන නුඹට දිළිඳුකම හොරෙකු 11
මෙන්ද
හිඟකම අවිගත් කෙනෙකු මෙන්ද
එනවා ඇත.

ප්‍රයෝග මුඛයක් ඇතුව ඇවිදින්නාවූ, 12
තමාගේ ඇස්වලින් ඉඟිකරන්නාවූ,
තමාගේ පාදවලින් හැඟුම්දෙන්නාවූ,
තමාගේ ඇඟිලිවලින් සංඥකරන්නාවූ 13
තැනැත්තේ
දූර්ජනයෙක්ය, අපරාධකාරයෙක්ය.
ඔහුගේ හිතේ ප්‍රයෝගය ඇත්තේය, 14
ඔහු නිතරම නපුර යොදා,
භේද පතුරුවයි.
එබැවින් ඔහුගේ විනාශය හදිසියෙන් 15
පැමිණෙයි;
ගැළවීමක් නැතුව ඔහු මොහොතකින්
පොඩිකරනු ලබයි.
ස්වාමීන්වහන්සේ ද්වේෂකරන 16
කාරණා හයක් තිබේ;
එසේය, උන්වහන්සේට පිළිකුල්වූ
කාරණා සතක් තිබේ:
උඩඟු ඇස්ය, බොරුකාර දිවය, 17
නිදෙස් ලේ වගුරුවන අත්ය,
දුෂ්ට උපා යොදන සිතය, 18

නපුරට දුවන්ට ඉක්මන්වෙන
පාදයෝය,
19 මුසාබස් නික්මවන බොරු
සාක්ෂිකාරයාය,
සහෝදරයන් අතරේ භේද
පතුරුවන්නාය.

20 මාගේ පුත්‍රය, නුඹේ පියාගේ ආඥව
රක්ෂාකරපන්න,
නුඹේ මවුගේ උපදෙස්ද අත්
නොහරින්න.
21 ඒවා නිතරම නුඹේ සිතෙහි බැඳගෙන,
නුඹේ ගෙලෙහි ගැටගසාගනින්න.
22 නුඹ යන එන විට ඒවා නුඹ ගෙන
යන්නේය;
නුඹ නිදන කල නුඹ ළඟ රැකවල්
කරන්නේය;
නුඹ පුබුදින කලද නුඹ සමග කථා
කරන්නේය.
23 මක්නිසාද නපුරු ස්ත්‍රියගෙන්ද
අන් තැනැත්තියෙකුගේ දිවේ
ඉච්චාවෙන්ද නුඹ ආරක්ෂාකරන
පිණිස
24 ආඥව පහනක්ය; උපදේශය එළියක්ය;
ගුරුකමේ අවවාද ජීවනයේ මාර්ගයෝය.
25 ඇගේ රූපශ්‍රීයට නුඹේ සිතින් ආශා
නොවන්න;
ඇගේ ඇසිපියවලින් ඈ නුඹ අසුකර
නොගනීවා.
26 මක්නිසාද වේශ්‍යා ස්ත්‍රියෙක් නිසා
මනුෂ්‍යයෙකුට ඉතුරුවෙන්නේ
රොටි කැබෙල්ලක් පමණක්ය.
මිථ්‍යාචාරී ස්ත්‍රීද අනර්ඝ ප්‍රාණය
අල්ලාගන්ට ලුහුබඳින්නීය.
27 මනුෂ්‍යයෙක් ගින්න තමාගේ ළයට
ගත්තොත්
ඔහුගේ ඇඳුම් නොපිළිස්සේද?
28 යමෙක් ගිනි අඟුරු පිට ඇවිද්දොත්
ඔහුගේ පාද නොදැවේද?
29 තමාගේ අසල්වාසියාගේ භාර්යාව
වෙතට එළඹෙන්නා එසේමය;
ඇට අතගසන කිසිවෙක් අච්චු

නොලැබ නොසිටින්නේය.
30 හොරෙක් තමාට බඩගිනි නිසා
තමාගේ ආශාව සන්සිඳුවාගන්න
පිණිස
හොරකම් කළත්, මනුෂ්‍යයෝ එය
නොසලකා නොහරිති.
31 නුමුත් ඔහු අසුවුණොත් සත් ගුණයක්
ගෙවන්ට ඕනෑය;
තමාගේ ගෙයි මුළු සම්පත වුවත්
දෙන්ට ඕනෑය.
32 ස්ත්‍රියෙකු හා සමග කාමමිථ්‍යාචාරය
කරන්නා නුවණ නැති කෙනෙක්ය.
එය කරන්නා තමාගේම ප්‍රාණය
නාස්තිකරගන්නේය.
33 තුවාල හා ලජ්ජාව ඔහුට වන්නේය;
ඔහුගේ නින්දවද මැකී නොයන්නේය.
34 මක්නිසාද කාම ක්‍රෝධය පුරුෂයෙකු
උදහස්කරවන්නේය;
පළිගන්න දවසේදී ඔහු කරුණා
නොකරන්නේය.
35 ඔහු කිසි මිදීමේ මුදලක් සලකන්නේ
නැත;
නුඹ බොහෝ තෑගි දුන්නත් ඔහු
සතුටුවෙන්නෙත් නැත.

## අනාචාරී ස්ත්‍රීගේ මරණීය උපා

7 මාගේ පුත්‍රය, මාගේ කීම්
රක්ෂාකොට
මාගේ ආඥ නුඹ වෙත තබාගනින්න.
2 මාගේ ආඥ පවත්වා ජීවත්වෙයන්න;
මාගේ උපදෙස්ද නුඹේ ඇසේ
කළුරුවාව මෙන් රක්ෂාකරපන්න.
3 ඒවා නුඹේ ඇඟිලිවල බැඳගනින්න;
නුඹේ සිත නමැති පුවරුවෙහි
ලියාගනින්න.
4 අන් ස්ත්‍රියෙක් වන තමාගේ කීම්වලින්
ඉච්චාකරන
අන්‍ය තැනැත්තියගෙන් නුඹ ආරක්ෂා
වෙන පිණිස
5 ප්‍රඥවට: නුඹ මාගේ සහෝදරීය කියාත්,

තුවණ යෙහෙළිය කියාත් කියාපන්න.
6 මක්නිසාද මාගේ ගෙයි කවුළුවෙන්
ගරාදි අස්සෙන් බලා සිටිද්දී,
7 මොළය නැති තරුණයෙක්
අනුවණයන් අතරේ මට පෙනුණේය;
ඔහු යෞවනයන් අතරේ ඉන්නවා දුටිමි.
8 ඔහු සවස ඇඳිරියෙහි,
මධ්‍යම රාත්‍රියේ කළුවරෙහි.
9 ඇගේ ගෙයි කොන ළඟ වීථිය
පසුකොට,
ඇගේ ගෙට යන මාර්ගයෙහි ගියේය.
10 එවිට වේශ්‍යාවකුගේ වස්ත්‍ර ඇඳ සිටි
රැවටිලි සිත් ඇති ස්ත්‍රියෙක් ඔහුට
මුණගැසුණාය.
11 ඈ ඝෝෂාකාරවූ හිතුවක්කාර
තැනැත්තියෙක්ය;
ඇගේ පාද ඇගේ ගෙයි නොරඳයි.
12 ඈ සමහරවිට වීථිවලද සමහරවිට
එළිමහන් ඉඩම්වලද සිටින්නීය,
සියලු මංසන්ධිවලද රැක සිටින්නීය.
13 මෙසේ ඈ ඔහු අල්ලා සිඹ,
ලජ්ජා නැති මුහුණක් ඇතුව ඔහුට
කථාකොට:
14 ශාන්ති පූජා මා ළඟ තිබේ;
අද මාගේ භාර ඉෂ්ටකෙළෙමි.
15 එබැවින් නුඹේ මුහුණ සොයා.
නුඹ සම්බවෙන පිණිස පිටතට ආවෙමි,
මෙසේ නුඹ සම්බවීය.
16 මිසරයේ නූල්වලින් කළ විසිතුරු
ඇතිරිලි
මා විසින් මාගේ යහනේ අතුරා තිබේ.
17 සුවඳලාටුවලින්ද අගිල්වලින්ද
කුරුඳුවලින්ද
මාගේ ඇඳ සුවඳකෙළෙමි.
18 වරෙන්න. උදය දක්වා අපි ප්‍රේමය
බොමු:
ආදරයෙන් ප්‍රීතිවෙමු.
19 මක්නිසාද ස්වාමිපුරුෂයා ගෙදර නැත.
ඔහු දුර ගමනක් ගියේය.
20 ඔහු මුදල් පසුම්බියක් අතේ ඇතුව
ගියේය;
ඔහු ගෙදර එන්නේ පසළොස්වක
දවසේයයි කීවාය.
ඇගේ බොහෝ මිහිරි කථාවලින් ඔහු 21
කැමැතිකරවා,
ඇගේ තොල්වල ඉච්චාවෙන් ඔහු
ඇදගනයයි.
ගොනෙකු මරණයට යන්නාක් මෙන්ද, 22
අඥනයෙකු විලංගුවේ දඬුවමට
යන්නාක්මෙන්ද.
ඊගසක් ඔහුගේ අක්මාවට වදින තුරු.
මලපත තම ප්‍රාණය හානි කිරීමට 23
තිබෙන බව නොදන
පක්ෂියෙක් ඊට යුහුව යන්නාක් මෙන්ද.
ඔහු එකෙණෙහිම ඇය කැටුව යන්නේය.
එබැවින් මාගේ පුත්‍රයෙනි. මාගේ වචන 24
අසා.
මාගේ මුඛයේ කීම්වලට ඇහුම්කන්
දියල්ලා.
නුඹේ සිත ඇගේ මාර්ගවලට හැරී 25
නොයේවා,
ඇගේ මාවත්වල මුළාව නොයන්න.
මක්නිසාද ඈ බොහෝ දෙනෙකු 26
තුවාළකොට හෙළාදැමුවාය.
එසේය. ඇගේ මැරුම්කෑ අය මහත්
සමූහයක්ය.
ඇගේ ගෙය *මෙයෝල්ලට යන්නාවූ. 27
මරණයේ ඇතුළු ගබඩාවලට
බසින්නාවූ මාර්ගයක්ය.

## ප්‍රඥාවේ විස්තර වර්ණනාව

8

ප්‍රඥාතොමෝ මොර
නොගසන්නීද?
ඥනයද ඇගේ හඬ නොනගින්නීද?
ඈ මග අසල උස් තැන්වල මුදුනෙත් 2
මංසන්ධිවලත් සිටින්නීය:
නගරයට පැමිණෙන වාසල් ළඟත් 3
පිවිසෙන දොරවලත් ඈ ශබ්ද නගා
කියන්නී:
මනුෂ්‍යයෙනි, නුඹලාට අඬගසමි; 4

*එනම්, මිනිවළට.

මනුෂ්‍ය පුත්‍රයන්ට මාගේ හඬ පවත්වමි.
5 අඥනයෙනි, ඥනය ලබාගනිල්ලා;
මෝඩයෙනි, තේරුම් ඇති අය වෙයල්ලා.
6 අසාපල්ලා, මක්නිසාද මම උතුම් කාරණා කියන්නෙමි;
මාගේ තොල්වලින්ද හරි කරුණු නික්මෙන්නේය.
7 එසේය, මාගේ කට සැබෑව කියනවා ඇත;
දුෂ්ටකමද මාගේ තොල්වලට පිළිකුලක්ය.
8 මාගේ මුඛයේ සෑම වචන ධර්මිෂ්ඨය;
ඒවා අතරෙහි වංකවූ හිතුවක්කාරවූ කිසිවක් නැත.
9 ඒ සියල්ල නුවණ ඇත්තාට පැහැදිලිව,
දැනගැන්ම ලබාගන්නන්ට හරිව පෙනෙන්නේය.
10 රිදී නොව මාගේ ගුරුකමද
අනර්ඝ රනට වඩා දැනගැන්මද පිළිගනිල්ලා.
11 මක්නිසාද ප්‍රඥව රතුකැටවලට වඩා හොඳය;
ආශාවිය හැකි සියලු දේවල්ද ඊට සමාන නොවේ.
12 ප්‍රඥව වන මම නුවණ සමග වාසය කොට,
දැනගැන්මද සිහිකල්පනාවද සොයා දැනගනිමි.
13 ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම නම් නපුරට ද්වේෂකිරීමය.
උඩඟුකමටත් අහංකාරයටත් නපුරු මාර්ගයටත්
ප්‍රයෝග මුඛයටත් ද්වේෂකරමි.
14 මන්ත්‍රණය සහ සාරවූ ඥනය මට තිබේ.
මම නුවණය, මට පරාක්‍රමය තිබේ.
15 මා කරණකොටගෙන රජවරු රජකම් කරති,
ආණ්ඩුකාරයෝද යුක්තිය නියමකරති.
16 මා කරණකොටගෙන අධිපතීහුද
උත්තමයෝද එනම් පොළොවේ සියලු විනිශ්චයකාරයෝද ආණ්ඩුකෙරෙති.
මට ප්‍රේමකරන්නන්ට මම ප්‍රේමකෙරෙමි; 17
මා සොයන්නන්ට මම සම්බවන්නෙමි.
වස්තුවද ගෞරවයද 18
එසේය, පවතින සම්පත්ද ධර්මිෂ්ඨකමද මා වෙත තිබේ.
රන්වලටත් පිරිසිදු රත්රන්වලටත් වඩා මාගේ පලදාවද 19
අනර්ඝ රිදීවලට වඩා මාගේ ආදායමද හොඳය.
මට ප්‍රේමවෙන්නන්ට වස්තුව උරුම කරදෙන්ටද, 20
ඔවුන්ගේ ගබඩා පුරවන්ටද,
මම ධර්මිෂ්ඨකමේ මාර්ගයෙහිත් 21
යුක්තියේ මාවත්වලත් හැසිරෙමි.
ස්වාමීන්වහන්සේ තමන් පුරාතන ක්‍රියාවලට පළමුවෙන්, 22
උන්වහන්සේගේ මාර්ගයේ පටන්ගැන්මේදී මා පිහිටෙවූසේක.
පොළොව ඇතිවෙන්ට පළමුවෙන් 23
මුල පටන් සදාකාලයේ සිට පිහිටුවනු ලැබීමි.
ගැඹුරු තැන් නොතිබුණු කල, 24
ජලයෙන් පිරුණු උල්පත් නැති කල, මම ඉපිද සිටියෙමි.
කඳු පිහිටෙන්ට ප්‍රථමයෙන්, 25
හෙල්වලට පළමුවෙන්,
උන්වහන්සේ පොළොව සහ කෙත්ද 26
ලෝකයේ පළමු ධූලිද සාදන්ට පෙර මම ඉපිද සිටියෙමි.
උන්වහන්සේ ස්වර්ගයන් පිහිටෙවූ කල 27
එහි සිටියෙමි.
උන්වහන්සේ ගැඹුර මතුයෙහි චක්‍රයක් ඇන්ද කලද,
ඉහළින් අහස පිහිටෙවූ කලද, 28
ගැඹුරේ උල්පත් සවිවූ කලද,
මුහුදේ ජලය එහි ඉම පසුකර නේන ලෙස 29

උන්වහන්සේ මායිම් තැබූ කලද,
පොළොවේ අත්තිවාරම් ලකුණුකළ කලද,
30 මම උන්වහන්සේ වෙත ප්‍රධාන කර්මාන්තකාරයාව සිටියෙමි;
සැමකල්හිම උන්වහන්සේ ඉදිරියෙහි නිතර සන්තෝෂවෙමින්,
දවසින් දවස උන්වහන්සේගේ ප්‍රීතිය වීමි.
31 උන්වහන්සේගේ වාසයට යෝග්‍යවූ ලෝකය ගැන සන්තෝෂවෙමින්,
මනුෂ්‍ය පුත්‍රයන් සමීපයෙහි ප්‍රීතිවුණෙමි.
32 එබැවින් මාගේ පුත්‍රයෙනි, මට ඇහුම්කන්දියල්ලා.
මක්නිසාද මාගේ මාර්ග රක්ෂා කරන්නෝ වාසනාවන්තයෝය.
33 ඉගැන්වීම එපා නොකොට,
එය අසා නැණවත් වෙයල්ලා.
34 දවසින් දවස මාගේ දොරටු ළඟ බලා සිට,
මාගේ දොරකඩ කණු ළඟ රැකවල් කර,
මාගේ වචන අසන මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය.
35 මක්නිසාද මා සම්බවන අයට ජීවනය සම්බවෙයි,
ස්වාමීන්වහන්සේගෙන් කරුණාවද ලබාගන්නේය.
36 නුමුත් මාගෙන් මුළාවයන්නා තමාගේම ප්‍රාණයට අනතුරු කරගන්නේය;
මට වෛරවෙන සියල්ලෝම මරණයට ප්‍රේමවන්තෝය.

## ප්‍රඥවේ ගෘහය සහ අඥනකමේ ගෘහය

9 ප්‍රඥතොමෝ ඇගේ ගෙය ගොඩනගා,
ඇගේ කුළුනු සත කපා තිබේ.
2 ඇගේ සතුන් මරා, ඇගේ මුද්‍රිකපානය මිශ්‍රකොට,
ඇගේ මේසයද පිළියෙළකර තිබේ.
3 ඇගේ තරුණියන් ඈ පිටත්කර හැර:
අනුවණවූ කවුරු නුමුත් මෙහි හැරී ඒවයි
4 නගරයේ උස් තැන්හි සිට මොරගසන්නීය.
තේරුම් නැති තැනැත්තාට ඈ මෙසේ කියයි:
5 වරෙල්ලා, මාගේ කැමෙත් කා,
මා පෙරා තිබෙන මුද්‍රිකපානයෙන් බීපල්ලා.
6 මෝඩකම් අත්හැර ජීවත්වෙයල්ලා;
ප්‍රඥ මාර්ගයෙහි පලයල්ලා.
7 නින්දකරන්නෙකුට අවවාදකරන්නා තමාට ලජ්ජාවද,
දුෂ්ටයෙකුට තරවටුකරන්නා තමාට කැලලක්ද පමුණුවාගන්නේය.
8 නින්දකරන්නෙකුට තරවටු නොකරන්න, එසේ කළොත් ඔහු නුඹට වෛරවෙයි.
ඥනවන්තයෙකුට තරවටුකරපන්න, ඔහු නුඹට ප්‍රේමකරයි.
9 ඥනවන්තයෙකුට ගුරුකම් දීපන්න, ඔහු වඩා ඥනවන්තවන්නේය.
ධර්මිෂ්ඨයෙකුට උගන්වාපන්න, ඔහු ඉගෙනගැන්මෙහි දියුණුවන්නේය.
10 ප්‍රඥවේ පටන්ගැන්ම නම් ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීමය.
ශුද්ධ තැනැත්වහන්සේ දැනගැනීම නුවණ වේ.
11 මක්නිසාද මා කරණකොටගෙන නුඹේ දවස් වැඩිවෙයි,
ජීවිතයේ අවුරුදුද නුඹට එකතුකරනු ලැබේ.
12 නුඹ ඥනවන්ත නම්, නුඹ ඥනවන්ත වන්නේ නුඹ උදෙසාය.
නුඹ නින්දකරන්නෙහි නම්, නුඹම එය ඉවසන්නෙහිය.

13 අඥාන ස්ත්‍රිය ඝෝෂාකාරීව,
මෝඩව, කිසිත් නොදැන සිටින්නීය.
14 තමුන්ගේ මාර්ගවල කෙළින්ම යමින්
ගමනේ යෙදෙන අයින්ට අඬගසන
පිණිස,
15 නගරයේ උස් තැන්වල
ඇගේ ගෙයි දොරකඩ ආසනයක
හිඳගන්නීය.
16 අනුවණවූ කවුරු නුමුත් මෙහි හැරී
ඒවායි කියන්නීය.
තේරුම් නැති අයට ඈ කථාකොට:
17 සොරෙන් ගත් වතුර මිහිරිය,
රහසින් කන කෑම රසවත්යයි
කියන්නීය.
18 නුමුත් මළවුන් එහි සිටින බවත්
ඈය විසින් කැඳවාගත් අය *මෙයොලෝ
මිටියාවත්වල ඉන්න බවත් ඔහු
නොදනියි.

## නානාවිධ හිතෝපදේශ
(22. 16 දක්වා)

10 සාලමොන්ගේ හිතෝපදේශය.
ඥානවන්ත පුත්‍රයෙක් පියා
ප්‍රීතිකරන්නේය;
එහෙත් අඥාන පුත්‍රයෙක් තමාගේ මවුට
ශෝකයක්ය.
2 දුෂ්ටකමේ වස්තුවලින් උපකාරයක්
නොලැබේ;
එහෙත් ධර්මිෂ්ඨකම මරණයෙන්
ගළවයි.
3 ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨයා
හාමත්වෙන්ට නාරිනසේක;
එහෙත් දුෂ්ටයන්ගේ අභිලාෂය
උන්වහන්සේ නිෂ්ඵලකරනසේක.
4 අලස අතකින් ක්‍රියාකරන්නා දිළිඳු
වන්නේය;
එහෙත් උත්සාහ ඇත්තාගේ හස්තය
ධනය උපදවන්නේය.

*හෙවත්, පාතාලයේ.

ග්‍රීෂ්ම කාලයෙහි රැස්කරගන්නා 5
ඥානවන්ත පුත්‍රයෙක්ය;
ගොයම් කපන කාලයෙහි නිදන්නා
ලජ්ජා ඇතිකරවන පුත්‍රයෙක්ය.
ධර්මිෂ්ඨයාගේ හිස පිට ආශීර්වාද 6
තිබේ;
එහෙත් බලාත්කාරය දුෂ්ටයාගේ මුඛය
වසන්නේය.
ධර්මිෂ්ඨයා සිහිකිරීම වාසනාවන්තය; 7
එහෙත් දුෂ්ටයන්ගේ නම දිරායන්නේය.
ප්‍රඥාවත් සිතක් ඇත්තා ආඥා පිළිගනියි; 8
එහෙත් දෙඩවන මෝඩයා හෙළාදමනු
ලැබේ.
ඇද නැතුව හැසිරෙන්නා සුවසේ සිටියි; 9
එහෙත් තමාගේ මාර්ග ඇදකරගන්න
අය අසුවනු ලබන්නේය.
ඇසින් ඉඟිකරන්නා දුක් උපදවයි; 10
එහෙත් දෙඩවන මෝඩයාද හෙළාදමනු
ලැබේ.
ධර්මිෂ්ඨයාගේ මුඛය ජීවන උල්පතක්ය; 11
එහෙත් බලාත්කාරය දුෂ්ටයාගේ මුඛය
වසයි.
වෛරය ඩබර උපදවයි; 12
එහෙත් ප්‍රේමය සියලු වැරදි වසයි.
නුවණ ඇත්තාගේ තොල්වල ප්‍රඥාව 13
සම්බවේ;
එහෙත් තේරුම්නැත්තාගේ පිටට
ඉපලක් ඇත්තේය.
ඥානවන්තයෝ දනගැන්ම 14
රැස්කරගනිති;
එහෙත් මෝඩයාගේ මුඛය ළඟම
විනාශය ඇත්තේය.
ධනවතාගේ සම්පත ඔහුගේ 15
බලකොටුවය;
දුප්පතුන්ගේ විනාශය ඔවුන්ගේ
දිළිඳුකමය.
ධර්මිෂ්ඨයාගේ උත්සාහලාභය ජීවනය 16
සඳහාය;
දුෂ්ටයාගේ ලාභය ඔහු පාපය කරා
පමුණුවයි.

17 ශික්ෂාව පිළිපදින්නා ජීවන මාර්ගයෙහිය;
එහෙත් අවවාදය එපාකරන්නා මුළාවයන්නේය.
18 වෛරය සඟවන්නා බොරුකාර තොල් ඇති කෙනෙක්ය;
කේලමක් පතළකරන්නාද අඥනයෙක්ය.
19 වචන බහුලවූ කල වරද හිඟ නැත;
එහෙත් තමාගේ තොල් ආණ්ඩුකරගන්නා නුවණ ඇති කෙනෙක්ය.
20 ධර්මිෂ්ඨයාගේ දිව අනර්ඝ රිදී මෙන්ය;
දුෂ්ටයන්ගේ සිත අගය නැත.
21 ධර්මිෂ්ඨයාගේ තොල් බොහෝදෙන පෝෂණයකෙරෙති;
එහෙත් මෝඩයෝ තේරුම් මදිකම නිසා මියයති.
22 ස්වාමීන්වහන්සේගේ ආශීර්වාදය පොහොසත්කම ලබාදෙන්නේය,
උන්වහන්සේ ඊට දුක එකතු නොකරනසේක.
23 නපුරුකම්කිරීම අඥනයාට සෙල්ලමක් වැනිය;
නුවණ ඇති මනුෂ්‍යයාට ප්‍රඥවත් එසේමය.
24 දුෂ්ටයා භයවෙන දේම ඔහු පිටට පැමිණෙයි;
ධර්මිෂ්ඨයා ආශාවන දේ ඔහුට දෙනු ලබන්නේය.
25 සුළිහුළඟ ගසන කල්හි දුෂ්ටයා නැතිවන්නේය;
එහෙත් ධර්මිෂ්ඨයා සදහටම අත්තිවාරමක්ය.
26 දත්වලට කාඩිත් ඇස්වලට දුමත් යම්සේද,
අලසයා ඔහු මෙහෙයවන අයට එසේමය.
27 ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීමෙන් දවස් වැඩිවෙයි;
එහෙත් දුෂ්ටයන්ගේ අවුරුදු හීන වන්නේය.
28 ධර්මිෂ්ඨයන්ගේ ප්‍රාර්ථනාව ප්‍රීතියය;
එහෙත් දුෂ්ටයන්ගේ බලාපොරොත්තුව සුන්වන්නේය.
29 ස්වාමීන්වහන්සේගේ මාර්ගය අවංක අයට බලකොටුවක්ව,
අයුතුකම්කරන්නන්ට විනාශයක්ව තිබේ.
30 ධර්මිෂ්ඨයා කිසිකලෙක නොසෙලවන්නේය;
එහෙත් දුෂ්ටයන්ට දේශයෙහි වාසයක් නොලැබේ.
31 ධර්මිෂ්ඨයාගේ මුඛය ප්‍රඥව නිකුත්කරයි;
එහෙත් ප්‍රයෝගකාර දිව සිඳදමනුලැබේ.
32 ධර්මිෂ්ඨයාගේ තොල් ප්‍රසන්න දේ දනියි;
එහෙත් දුෂ්ටයාගේ මුඛය ප්‍රයෝග කථාකරයි.

## 11

හොර තරාදිය ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය;
එහෙත් හරි කළන්පඩියට උන්වහන්සේ ප්‍රසන්නය.
2 උඩඟුකම පැමිණෙන කල ලජ්ජාවත් පැමිණෙයි;
එහෙත් යටහතුන් වෙත ප්‍රඥව තිබේ.
3 ඇද නැත්තන්ගේ අවංකකම ඔවුන්ට මග පෙන්වයි;
එහෙත් ද්‍රෝහීන්ගේ වංචාකම ඔවුන් විනාශකරයි.
4 උදහස් දවසේදී සම්පතෙන් උපකාර නොලැබේ;
එහෙත් ධර්මිෂ්ඨකම මරණයෙන් ගළවයි.
5 නිර්දෝෂ අයගේ ධර්මිෂ්ඨකම ඔහුගේ මාර්ගය සමතලාකරයි;
එහෙත් දුෂ්ටයා තමාගේම දුෂ්ටකමෙන් වැටෙයි.

6 ඇද නැත්තන්ගේ ධර්මිෂ්ඨකම ඔවුන් ගළවයි;
එහෙත් ද්‍රෝහිකාරයෝ තමුන්ගේ ප්‍රයෝගයෙන් අසුවනු ලබති.
7 දුෂ්ට මනුෂ්‍යයා නසිනකල ඔහුගේ බලාපොරොත්තුව නැතිවෙයි;
අයුතුකම්කරන්නන්ගේ ප්‍රාර්ථනාවද නැතිවෙයි.
8 ධර්මිෂ්ඨයා විපතින් මුදනු ලබයි,
දුෂ්ටයා ඔහු වෙනුවට විපතට පත් වෙයි.
9 අභක්තිකයා තමාගේ මුඛයෙන් තමාගේ අසල්වාසියා විනාශකරයි;
එහෙත් දැනගැන්ම කරණකොටගෙන ධර්මිෂ්ඨයෝ ගැළවෙන්නෝය.
10 ධර්මිෂ්ඨයන්ට ශුභසිද්ධවන කල නගරය ප්‍රීතිවෙයි;
දුෂ්ටයන් නැතිවනකල ඔල්වරහඬ පවත්වයි.
11 ඇද නැත්තන්ගේ ආශීර්වාදයෙන් නගරය උසස්වෙයි;
එහෙත් දුෂ්ටයන්ගේ මුඛයෙන් එය පෙරළාදමනු ලබයි.
12 තමාගේ අසල්වාසියා හෙළාදකින්නා නුවණ නැත්තෙකි;
එහෙත් ඥනය ඇති මනුෂ්‍යයා නිශ්ශබ්දව සිටියි.
13 කේලාම්කියමින් ඇවිදින්නා රහස් එළිදරව්කරයි;
එහෙත් විශ්වාස සිතක් ඇත්තා කාරණය සඟවයි.
14 ඥනවන්ත පාලනයක් නැති විට සෙනඟ වැටෙති;
එහෙත් මන්ත්‍රීවරුන් රාශියක් කරණකොටගෙන ආරක්ෂාව ඇත්තේය.
15 අන්‍යයෙකුට ඇපවෙන්නාට දුක් පැමිණෙයි;
එහෙත් ඇපවීමට මැලිකරන්නා සුරක්ෂිතව සිටින්නේය.
16 ශෝභන ස්ත්‍රියෙක් ගෞරවය රැකගන්නීය;
බලාත්කාරකම්කරන්නෝ වස්තුව රැකගනිති.
17 කරුණාවන්ත මනුෂ්‍යයා තමාගේම ප්‍රාණයට යහපත කරගන්නේය;
එහෙත් ක්‍රෑරයා තමාගේම මංසය කලඹන්නේය.
18 දුෂ්ටයා වංචාකාර ලාභයක් සම්බකරගන්නේය;
එහෙත් ධර්මිෂ්ඨකම වපුරන්නා ස්ථිර ප්‍රතිඵල ලබන්නේය.
19 ධර්මිෂ්ඨකමෙහි ස්ථිරව සිටින්නා ජීවනයට පැමිණෙන්නේය;
නපුර අනුව යන්නා තමාට මරණය ළඟාකරගන්නේය.
20 වංක සිත් ඇත්තෝ ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය.
එහෙත් සම්පූර්ණ මාර්ගයක යන්නන්ට උන්වහන්සේ ප්‍රසන්නසේක.
21 *අතට අත එකතුවුණත් දුෂ්ටයා දඬුවම් නොලැබ නොසිටින්නේය;
එහෙත් ධර්මිෂ්ඨයන්ගේ වංශය මුදනු ලබන්නේය.
22 ඌරෙකුගේ හොස්සේ ලූ රන් මුදුවක් යම්සේද
නුවණ නැති රූපත් ස්ත්‍රියද එසේමය;
23 ධර්මිෂ්ඨයන්ගේ ආශාව යහපතමය;
දුෂ්ටයන්ගේ බලාපොරොත්තුව උදහසය.
24 විසුරුවන තුමුත් වස්තුව වැඩිකරගන්න කෙනෙක්ද
හිඟකමට පැමිණෙන හැටියට අයුතු ලෙස වලක්වාගන්න කෙනෙක්ද ඇත.
25 ත්‍යාගශීලී තැනැත්තේ පුෂ්ටිමත් වන්නේය;
පැන් ඉසින තැනැත්තේ පැන් ඉසිනු ලබන්නේය.
26 ධාන්‍ය නොදෙන්නාට සෙනඟ ශාප

*නොහොත්, ඒකාන්තයෙන්ම.

කරනවා ඇත;
එහෙත් එය විකුණන්නාගේ හිසට
ආශීර්වාදයක් පැමිණෙයි.
27 යහපත ගැන වීර්යකරන්නා කරුණාව
සොයන්නේය;
එහෙත් නපුර සොයන්නාට ඒකම
පැමිණෙන්නේය.
28 තමාගේ වස්තුව කෙරෙහි
විශ්වාසකරන්නා වැටෙන්නේය;
එහෙත් ධර්මිෂ්ඨයා අමු කොළයක්
මෙන් සශ්‍රීකවෙයි.
29 තමාගේ පවුල කලඹන්නාට සුළං
උරුමවන්නේය;
මෝඩයා ප්‍රඥ සිතක් ඇත්තාට
වැඩකාරයෙක් වන්නේය.
30 ධර්මිෂ්ඨයාගේ ඵලය ජීවන
වෘක්ෂයක්ය;
ආත්ම දිනාගන්නා ඥනවන්තයෙක්ය.
31 බලව, ධර්මිෂ්ඨයා පොළොවේදී
ප්‍රතිඵල විඳින්නේය;
ඊට කොපමණ වැඩියෙන් දුෂ්ටයාටත්
පව්කාරයාටත් විපාක
නොලැබෙන්නේද!

12 අවවාදයට ප්‍රේමකරන්නා
දැනගැන්මට ප්‍රේම කරන්නේය;
එහෙත් තරවටුවට ද්වේෂකරන්නා
මෝඩයෙක්ය.
2 සත්පුරුෂයා **ස්වාමීන්වහන්සේගෙන්**
කරුණාව ලබයි;
එහෙත් උන්වහන්සේ දුෂ්ට උපා
යොදන්නා වරදට පත්කරනසේක.
3 මනුෂ්‍යයෙක් දුෂ්ටකමෙන් ස්ථිර
නොවන්නේය;
එහෙත් ධර්මිෂ්ඨයාගේ මුල කිසි
කලකත් නොසෙල්වෙන්නේය.
4 ගුණවත් ස්ත්‍රියෙක් ඇගේ
ස්වාමිපුරුෂයාට ඔටුන්නක්ය;
එහෙත් ලජ්ජා උපදවන තැනැත්තී
ඔහුගේ ඇටවල දිරවීමක් මෙන්ය.
5 ධර්මිෂ්ඨයන්ගේ අදහස් යුක්තියට
එකඟය;
දුෂ්ටයන්ගේ මන්ත්‍රණ වංචාසහිතය.

දුෂ්ටයන්ගේ වචන ලෙය ගැන රැක 6
සිටීමක් වේ;
එහෙත් අවංක අයගේ මුඛය ඔවුන්
ගළවන්නේය.
දුෂ්ටයෝ හෙළාදමනු ලැබ 7
නැතිවන්නෝය;
එහෙත් ධර්මිෂ්ඨයන්ගේ පරම්පරාව
පවතින්නේය.
මනුෂ්‍යයෙක් තමාගේ ප්‍රඥවේ හැටියට 8
වර්ණනාකරනු ලැබේ;
එහෙත් වංක සිතක් ඇත්තා හෙළාදකිනු
ලැබේ.
කෑම හිඟව ඉඳගනත් ගරුකම් 9
කියාගන්නාට වඩා
වැඩකාරයෙක් ඇති සුළු තැනැත්තා
උතුම්ය.
ධර්මිෂ්ඨයා තම තිරිසනාගේ ප්‍රාණය 10
ගැන සලකන්නේය;
එහෙත් දුෂ්ටයන්ගේ මෘදු අනුකම්පා
කෲරය.
තමාගේ බිම අස්වද්දන්නා කෑමෙන් 11
සමෘද්ධියට පැමිණෙයි;
එහෙත් නිෂ්ඵල තැනැත්තන් අනුව
යන්නා තේරුම් නැති කෙනෙක්ය.
දුෂ්ටයා නපුරන්ගේ දැල සොයන්නේය; 12
එහෙත් ධර්මිෂ්ඨයන්ගේ මුල ඵල
දෙන්නේය.
තොල්වල අපරාධයෙහි දුෂ්ටයාට 13
මලපතක් තිබේ;
එහෙත් ධර්මිෂ්ඨයා විපතෙන්
මිදෙන්නේය.
මනුෂ්‍යයෙක් තමාගේ මුඛයේ ඵලය 14
නිසා යහපතෙන් තෘප්තිමත්වන්නේය;
මනුෂ්‍යයෙකුගේ දෑතේ ක්‍රියාවල ඵලයද
ඔහුට දෙනු ලැබේ.
මෝඩයාගේ මාර්ගය තමාගේ ඇස්වලට 15
නම් හරිව පෙනෙන්නේය;
එහෙත් ඥනවන්තයා දැනමිතිකම්
අසන්නේය.
මෝඩයාගේ කෝපවීම එවේලේම 16

එළිදරව්වන්නේය;
එහෙත් බුද්ධිමත් මනුෂ්‍යයා ලජ්ජාව සඟවාගන්නේය.
17 සැබෑව කියන්නා ධර්මිෂ්ඨකමද බොරු සාක්ෂිකාරයා වංචාවද දක්වන්නේය.
18 කඩුවෙන් අනින්නාක්මෙන් රළු බස් කීමක් තිබේ:
එහෙත් ඥානවන්තයාගේ දිව සුවය හටගන්වන්නේය.
19 සැබෑව කියන තොල සදහටම ස්ථිරව පවතියි;
එහෙත් බොරු කියන දිව මොහොතකට පමණක්ය.
20 නපුර යොදන්නන්ගේ සිත්වල වංචාව තිබේ:
එහෙත් සමාදානය පිණිස මන්ත්‍රණය කරන්නන්ට ප්‍රීතිය ඇත්තේය.
21 ධර්මිෂ්ඨයන්ට කිසි අනතුරක් නොවන්නේය:
එහෙත් දුෂ්ටයෝ විපතෙන් පිරීයන්නෝය.
22 බොරුකාර තොල් ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය:
එහෙත් සැබෑලෙස හැසිරෙන්නන්ට උන්වහන්සේ ප්‍රසන්නය.
23 බුද්ධිමත් මනුෂ්‍යයා තමාගේ දැනගැන්ම සඟවන්නේය;
එහෙත් අඥානයන්ගේ සිත මෝඩකම ප්‍රකාශකරන්නේය.
24 කඩිසර අයගේ අත ආණ්ඩුකරන්නේය;
එහෙත් අලසයෝ දස වැඩට යටත් වන්නෝය.
25 මනුෂ්‍යයෙකුගේ සිතේ නලංගුව නිසා එය නැමියයි:
එහෙත් කරුණා සහිත වචනයක් එය සන්තෝෂකරයි.
26 ධර්මිෂ්ඨයා තම අසල්වාසියාට මඟ පෙන්වන්නෙක් වේ;
එහෙත් දුෂ්ටයන්ගේ මාර්ගය ඔවුන් මුළාකරයි.
අලසයා දඩයමෙන් ගත් දේ පුලුස්සා 27
නොගනියි;
එහෙත් කඩිසරවීම මනුෂ්‍යයන්ට අනර්ඝ සම්පතක්ය.
ධර්මිෂ්ඨකමේ මාවතෙහි ජීවනය වේ: 28
ඒකේ මාර්ගයෙහිද මරණය නැත.

13

ඥානවන්ත පුත්‍රයා තම පියාගේ ඔවා බස් අසන්නේය;
එහෙත් නින්දකරන්නා තරවටුව නොඅසන්නේය.
මනුෂ්‍යයෙක් තමාගේ මුඛයේ ඵලයෙන් 2
යසස භුක්තිවිඳියි;
එහෙත් ද්‍රෝහීන්ගේ ප්‍රාණය බලාත්කාරය විඳියි.
කට රැකගන්නා තමාගේ ජීවිතයද 3
රැකවල්කරගනියි;
එහෙත් බොහෝසෙයින් කට අරින්නා විනාශයට පැමිණෙයි.
අලසයාගේ ප්‍රාණය ආශාවන නුමුත් 4
ඔහුට කිසිවක් නැත:
එහෙත් කඩිසරයන්ගේ ප්‍රාණය තරවෙයි.
ධර්මිෂ්ඨයා බොරු කීමට ද්වේෂකෙරේ: 5
එහෙත් දුෂ්ටයා පිළිකුලක්ව ලජ්ජාවට පත්වෙයි.
ධර්මිෂ්ඨකම සෘජු හැසිරීම ඇත්තා 6
රැකවල්කරයි;
එහෙත් දුෂ්ටකම පාපිෂ්ඨයා පෙරළා දමයි.
කිසිත් නැති නුමුත් වස්තුකාරයන් 7
මෙන් පෙන්වන්නෝ සිටිති;
බොහෝ සම්පත් ඇති නුමුත් දිළිඳුන් මෙන් පෙන්වන්නෝද සිටිති.
මනුෂ්‍යයෙකුගේ වස්තුව ඔහුගේ ජීවිතයේ 8
මිදීමේ මිලයක් වන්නේය;
එහෙත් දිළින්දට තර්ජනයෙන් කමක් නැත.
ධර්මිෂ්ඨයන්ගේ එළිය ප්‍රීතියෙන් 9
බැබළෙයි;
එහෙත් දුෂ්ටයන්ගේ පහන නිවියයි.

10 උඩඟුකමෙන් තරගය අටගන්නවා පමණක්ය;
එහෙත් දැනමුතුකම පිළිගන්නන් වෙත ප්‍රඥාව තිබේ.
11 සැහැල්ලුලෙස ලැබූ සම්පත් අඩුවී යන්නේය;
එහෙත් අතේ උත්සාහයෙන් රැස්කර ගන්නාට ඒවා වැඩිවන්නේය.
12 පැතූ දේ ප්‍රමාදවීමෙන් සිත කලකිරෙන්නේය;
එහෙත් ආශාව ඉෂ්ටවීම ජීවන වෘක්ෂයක්ය.
13 දේව වචනය සුළුකර සිතන්නාට විනාශය පැමිණෙයි;
එහෙත් ආඥාවට භය ඇත්තා විපාක ලබයි.
14 ප්‍රඥාවන්තයාගේ උපදේශය මරණයේ මලපත්වලින් ගළවන ජීවන උල්පතක්ය.
15 හොඳ නුවණ නිසා කරුණාව ලැබේ;
එහෙත් ද්‍රෝහීන්ගේ මාර්ගය රළුය.
16 බුද්ධිමත් කවුරු නුමුත් දැනුම ඇතුව ක්‍රියාකරයි;
එහෙත් අඥානයා තමාගේ මෝඩකම පළකරයි.
17 දුෂ්ට පණිවිඩකාරයා විපතට වැටෙයි;
එහෙත් විශ්වාස තානාපතියා සුව උපදවයි.
18 අවවාදය පිළි නොගන්නාට දිළිඳුකමද නින්දාවද වන්නේය;
එහෙත් තරවටුව සලකන්නා ගෞරවයට පැමිණෙයි.
19 ආශාව ඉෂ්ටවීම ආත්මයට මිහිරිය;
එහෙත් නපුරෙන් වෙන්වීම අඥානයන්ට පිළිකුලක්ය.
20 ඥානවන්තයන් කැටුව යන්න, එවිට නුඹ ඥානවන්තවන්නේය;
එහෙත් අඥානයන්ගේ සමාගම්කාරයාට වේදනා සිදුවන්නේය.
21 විපත පාපිෂ්ඨයන් ලුහුබඳවා යයි;
එහෙත් ධර්මිෂ්ඨයන්ට යහපත විපාකයක් ලෙස ලැබේ.
22 සත්පුරුෂයා තමාගේ දරුවන්ගේ දරුවන්ට උරුමයක් තබා යයි;
පාපිෂ්ඨයාගේ වස්තුව ධර්මිෂ්ඨයන්ට තැන්පත්කොට තබා තිබේ.
23 දිළිඳුන්ගේ ගොවිතැනෙන් බොහෝ කෑම ලැබේ;
එහෙත් අයුක්තිය නිසා නාස්තියට පැමිණෙන්නෝද සිටිති.
24 ඉපල පාවිච්චි නොකරන්නා තම පුත්‍රයාට වෛරවන්නේය;
එහෙත් ඔහුට ප්‍රේමවෙන්නා කල්තබා ඔහුට දඬුවම්කරන්නේය.
25 ධර්මිෂ්ඨයාට සෑහෙන පමණට කෑම තිබේ;
එහෙත් දුෂ්ටයාගේ බඩට හිඟකම ඇත්තේය.

## 14

ඥානවන්ත ස්ත්‍රී තොමෝ තම *ගෙය ගොඩනගන්නීය;
එහෙත් අඥාන තැනැත්තී තමාගේම අත්වලින් ඒක කඩාදමයි.
2 තමාගේ සෘජුකමෙන් හැසිරෙන්නා ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවෙන්නේය;
එහෙත් වංක මාර්ග ඇත්තා උන්වහන්සේ සුළුකොට සලකන්නේය.
3 මෝඩයාගේ මුඛයෙහි උඩඟුකම නමැති ඉපලක් ඇත්තේය;
එහෙත් ප්‍රඥාවන්තයන්ගේ තොල් ඔවුන් ආරක්ෂාකරයි.
4 ගවයන් නැති ගාල පවිත්‍රය;
එහෙත් ගොනාගේ ශක්තියෙන් බොහෝ අස්වැන්න ලැබේ.
5 විශ්වාස සාක්ෂිකාරයෙක් බොරු නොකියයි;
එහෙත් බොරු සාක්ෂිකාරයා බොරු නික්මවයි.

*එනම්, පවුල.

6 නින්දකරන්නා ප්‍රඥාව සොයන නුමුත් එය සම්බ නොවන්නේය;
එහෙත් නුවණ ඇත්තාට දැනගැන්ම පහසුය.
7 අඥානයා ඉදිරියට පලයන්න,
එවිට ඔහුට දැනගැනීමේ තොල් නැති බව නුඹට පෙනෙන්නේය.
8 බුද්ධිමත් අයගේ ප්‍රඥාව නම් තමාගේ මාර්ගය තේරුම්ගැනීමය;
එහෙත් අඥානයන්ගේ මෝඩකම වංචාවය.
9 මෝඩයෝ වරද ගැන සරදම්කෙරෙති;
එහෙත් අවංකයන් අතරේ දේව කරුණාව ඇත්තේය.
10 සිත තමාගේම ශෝකය දනියි;
එහි ප්‍රීතියට අන්‍යයෙක් මැදි නොවෙයි.
11 දුෂ්ටයන්ගේ ගෙය හෙළාදමනු ලබන්නේය;
එහෙත් අවංක අයගේ කූඩාරම සඵල වන්නේය.
12 මනුෂ්‍යයෙකුට හරිව පෙනෙන මාර්ගයක් ඇත;
එහෙත් එහි කෙළවරෙහි මරණයේ මාර්ග තිබේ.
13 සිනාසීමේදී පවා සිතේ කනගාටු තිබේ;
ප්‍රීතියේ කෙළවරද ශෝකයය.
14 සිතින් පසුබටවෙන්නා තමාගේම මාර්ගවලින්ද
යහපත් මනුෂ්‍යයා තමාගේම පැවැත්මෙන්ද තෘප්තියට පැමිණෙයි.
15 නුවණ නැත්තා හැම වචනම විශ්වාසකරයි;
එහෙත් බුද්ධිමත් මනුෂ්‍යයා තමාගේ පියවර හොඳට බලාගනියි.
16 ප්‍රඥාවන්තයා භයව නපුරෙන් ඉවත්වෙයි;
එහෙත් අඥානයා උඩඟුකම් පාමින් සැක නැතුව සිටියි.
17 ඉක්මනින් කිපෙන්නා අඥානලෙස ක්‍රියාකරයි;
දුෂ්ට උපා යොදන්නාද වෛරය ලබයි.
නුවණ නැත්තන්ට මෝඩකම 18
උරුමවන්නේය;
එහෙත් බුද්ධිමත්හු දැනගැන්ම නමැති ඔටුන්න පැළඳගනිති.
නපුරෝ යහපතුන් ඉදිරියෙහිද 19
දුෂ්ටයෝ ධර්මිෂ්ඨයාගේ දොරටු ළඟද වැඳ වැටෙති.
දිළින්දාට තමාගේ අසල්වාසියා පවා 20
වෛරකරයි;
එහෙත් වස්තුකාරයාට මිත්‍රයෝ බොහෝය.
තමාගේ අසල්වාසියා හෙළාදකින්නා 21
පව්කරන්නේය;
එහෙත් දුප්පතුන්ට අනුකම්පාකරන්නා වාසනාවන්තයෙක්ය.
නපුර යොදන්නන් වරද්දගන්නවා 22
නොවේද?
එහෙත් යහපත යොදන්නන්ට කරුණාවද සැබෑකමද ලැබෙන්නේය.
සියලු වැඩවලින් ලාභ උපදියි; 23
එහෙත් තොල්වල කථාවෙන් පැමිණෙන්නේ හිඟකම පමණක්ය.
ප්‍රඥාවන්තයන්ගේ වස්තුව ඔවුන්ට 24
ඔටුන්නක්ය;
එහෙත් අඥානයන්ගේ උතුම්කම නම් මෝඩකමය.
සැබෑ සාක්ෂිකාරයෙක් ප්‍රාණ 25
ගළවන්නේය;
එහෙත් බොරු කියන්නෙක් වංචාව නික්මවයි.
ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීමෙන් 26
බලවත් නිසැකකමක් තිබේ;
එසේ භයවන්නන්ගේ දරුවන්ට රක්ෂාස්ථානයක් ලැබේ.

27 ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම
මරහුගේ මලපත්වලින් මිදීමට ජීවන
උල්පතක්ය.
28 රජුගේ මහත්තත්ත්වය නම් සෙනඟ
රාශියක් ඇතිවීමය;
එහෙත් සෙනඟ අඩුකම අධිපතියාට
හානියක්ය.
29 කෝපයට ප්‍රමාදවන්නා බොහෝ
නුවණැත්තෙක්ය;
එහෙත් ඉක්මනින් කිපෙන්නා මෝඩකම
මතුකරන්නේය.
30 මාංසයේ සනීපය නම් නිශ්චල සිතක්ය;
එහෙත් ඊර්ෂ්‍යාව ඇටවලට දිරවීමක්ය.
31 දුප්පතාට පීඩාකරන්නා ඔහුගේ
මැවුම්කාරයාණන්ට නින්දකරන්නේය;
එහෙත් දිළිඳුට කරුණාකරන්නා
උන්වහන්සේට ගෞරවකරන්නේය.
32 දුෂ්ටයා තමාගේ නපුරු ක්‍රියාවේදී
හෙළාදමනු ලබයි;
එහෙත් ධර්මිෂ්ඨයාට මරණයේදී
ආරක්ෂාස්ථානයක් ඇත්තේය.
33 නුවණ ඇත්තාගේ සිතෙහි ප්‍රඥාව
පවතියි;
එහෙත් අඥානයන් තුළ තිබෙන දේ
ප්‍රකාශවේ.
34 ධර්මිෂ්ඨකම ජාතියක් උසස්කරයි;
එහෙත් කවර සෙනඟකට වුවත් පාපය
නින්දවක්ය.
35 රජුගේ ප්‍රසන්නකම නුවණින් හැසිරෙන
සේවකයා කෙරෙහිය;
එහෙත් ලජ්ජාව උපදවන්නාට ඔහුගේ
උදහස පැමිණේ.

15 මෘදු උත්තරයකින් කෝපය
පහවෙයි;
එහෙත් කර්කශ වචනයකින් තරහ
හටගනියි.
2 ප්‍රඥාවන්තයන්ගේ දිව දැනගැන්ම හරි
ලෙස කියාදෙයි;
එහෙත් අඥානයන්ගේ මුඛය මෝඩකම
වගුරුවයි.
ස්වාමීන්වහන්සේගේ ඇස් සෑම තැනම 3
පැවත,
නපුරන්ද යහපතුන්ද බලන්නේය.
ශාන්තිදායක දිව ජීවන වෘක්ෂයක්ය; 4
එහෙත් එහි වංචාව ආත්මය පොඩි
කිරීමක්ය.
මෝඩයා තමාගේ පියාගේ උපදෙස් 5
සුළුකරයි;
එහෙත් අවවාදය සලකන්නා නුවණ
ලබාගනියි.
ධර්මිෂ්ඨයාගේ ගෙයි බොහෝ වස්තු 6
තිබේ;
එහෙත් දුෂ්ටයාගේ ආදායමෙහි කරදර
ඇත්තේය.
ප්‍රඥාවන්තයන්ගේ තොල් දැනගැන්ම 7
පතුරුවයි;
එහෙත් අඥානයන්ගේ සිත ස්ථිර නැත.
දුෂ්ටයන්ගේ පූජාව ස්වාමීන්වහන්සේට 8
පිළිකුලක්ය;
එහෙත් ඇද නැත්තන්ගේ යාච්ඤාවට
උන්වහන්සේ ප්‍රසන්නය.
දුෂ්ටයාගේ මාර්ගය ස්වාමීන්වහන්සේට 9
පිළිකුලක්ය;
එහෙත් ධර්මිෂ්ඨකම අනුව යන්නාට
උන්වහන්සේ ප්‍රේමකරනසේක.
මාවත අත්හැර යන්නාට තද දඬුවමක් 10
පැමිණේ;
අවවාදයට ද්වේෂකරන්නා නසින්නේය.
*ෂෙයෝල්ද †අබද්දෝනද 11
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තිබේ;
ඊට කොපමණ වැඩියෙන් මනුෂ්‍ය
පුත්‍රයන්ගේ සිත් එසේ නොතිබේද!
නින්දකරන්නා අවවාද ලබන්ට කැමති 12
නැත;
ඔහු ප්‍රඥාවන්තයන් ළඟට නොයන්නේය.
තුෂ්ටිමත් සිත මුහුණ පැහැපත්කරයි; 13
එහෙත් සිතේ ශෝකයෙන් ආත්මය

*එනම්, මිනීවළ. †එනම්, විනාශය.

බිදෙයි.
14 නුවණ ඇත්තාගේ සිත දැනගැන්ම සොයයි;
එහෙත් අඥනයන්ගේ මුඛය මෝඩකම අනුභවකරයි.
15 දුක්ඛිතයාගේ සියලුම දවස් නරකය;
එහෙත් සතුටු සිත නිරන්තර මංගල්‍යයක්ය.
16 කරදර ඇතුව බොහෝ වස්තු ඇතිවීමට වඩා
ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම ඇතුව ස්වල්පයක් හොඳය.
17 වෛරය ඇතුව තර ගොනෙකුගේ මසට වඩා
ප්‍රේමය ඇතුව පලා කෑම හොඳය.
18 තරහකාර මනුෂ්‍යයෙක් තරහ උපදවයි;
එහෙත් ඉවසිලි ඇත්තා ඩබරය සන්සිඳුවයි.
19 අලසයාගේ මාර්ගය කටු වැටක් වැනිය;
එහෙත් අවංක අයගේ මාවත මහ පාරක්ය.
20 ප්‍රඥවත් පුත්‍රයෙක් පියා ප්‍රීතිකරවයි;
එහෙත් අඥන මනුෂ්‍යයෙක් තම මවු සුළුකරයි.
21 නුවණ නැත්තාට මෝඩකම ප්‍රීතියකි;
එහෙත් ඥනවන්තයා සෘජුලෙස හැසිරෙයි.
22 මන්ත්‍රණය නැති කල යෝජනා නිෂ්ඵලවන්නේය;
එහෙත් බොහෝ මන්ත්‍රීන් කරණකොටගෙන ඒවා ස්ථිරවන්නේය.
23 මනුෂ්‍යයෙකුට තමාගේ මුඛයේ උත්තරයෙන් ප්‍රීතිය ලැබේ;
කලට සුදුසු වචනය කොපමණ හොඳද!
24 පහළින් තිබෙන *ෂෙයෝලෙන්

*එනම්, මිනීවළෙන්.

අහක්වෙන පිණිස
නුවණින් හැසිරෙන්නා ඉදිරියෙහි ජීවිතයේ මාවත ඉහළට යන්නේය.
ස්වාමීන්වහන්සේ උඩඟු අයගේ ගෙය 25
උදුරාදමනසේක;
එහෙත් වැන්දඹුවගේ සීමාව උන්වහන්සේ ස්ථිරකරනසේක.
දුෂ්ටයන්ගේ යෝජනා, 26
ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය;
එහෙත් පවිත්‍රයන්ගේ වචන උන්වහන්සේට ප්‍රසන්නය.
ලාභයට ලෝභවෙන්නා තමාගේම 27
පවුල කලඹන්නේය;
එහෙත් අල්ලස්වලට ද්වේෂකරන්නා ආයු ලබන්නේය.
ධර්මිෂ්ඨයාගේ සිත උත්තරදෙන පිණිස 28
විමසා බලයි;
එහෙත් දුෂ්ටයාගේ මුඛය නපුරුකම් වගුරුවයි.
ස්වාමීන්වහන්සේ දුෂ්ටයන්ගෙන් ඈත්ව 29
සිටිනසේක;
එහෙත් උන්වහන්සේ ධර්මිෂ්ඨයන්ගේ යාච්ඤව අසනසේක.
ඇස්වල එළියෙන් සිත සන්තෝෂවේ; 30
යහපත් ආරංචියෙන් ඇට තරවේ.
ජීවනදයක අවවාදය අසන කන 31
ප්‍රඥවතුන් අතරෙහි පවතියි.
ගුරුකම එපාකරන්නා තමාගේම 32
ප්‍රාණය සුළුකරන්නේය;
එහෙත් අවවාදය අසන්නා නුවණ ලබාගන්නේය.
ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම 33
ප්‍රඥවේ ගුරුකමය;
ගෞරවයට පළමුවෙන් යටත්කම ඇත්තේය.

## 16

සිත පිළියෙළකිරීම මනුෂ්‍යයාට අයිතිය.
එහෙත් දිවේ උත්තරය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය.
මනුෂ්‍යයෙකුගේ සියලුම මාර්ග 2

තමාගේම ඇසට පිරිසිදුව පෙනේ;
එහෙත් ස්වාමීන්වහන්සේ ආත්ම කිරා බලනසේක.
3 නුඹේ ක්‍රියාවන් ස්වාමීන්වහන්සේට භාරදීපන්න;
එවිට නුඹේ යෝජනා ස්ථිරවන්නේය.
4 ස්වාමීන්වහන්සේ ඒ ඒ දෙය ඒ ඒ අදහසටද
දුෂ්ටයා පවා විපත්ති දවසටද නියමකළසේක.
5 උඩඟු සිත් ඇති කවුරු නුමුත් ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය;
*අතට අත එකතුවුණත් ඔහු දඬුවම් නොලැබ නොසිටින්නේය.
6 කරුණාවත් සැබෑකමත් කරණකොටගෙන අයුතුකම කමාකරනු ලැබේ;
ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීමෙන් මනුෂ්‍යයෝ නපුරෙන් දුරුවෙති.
7 මනුෂ්‍යයෙකුගේ මාර්ගවලට ස්වාමීන්වහන්සේ ප්‍රසන්නවන කල
උන්වහන්සේ ඔහුගේ සතුරන් පවා ඔහු හා සමඟිකරවනසේක.
8 අයුක්තිය ඇතුව බොහෝ සම්පත්වලට වඩා
ධර්මිෂ්ඨකම ඇතුව ස්වල්පයක් හොඳය.
9 මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමුකරවයි:
එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමීන්වහන්සේය.
10 රජුගේ මුවෙහි දිව්‍ය වාක්‍යයක් ඇත;
විනිශ්චයේදී ඔහුගේ මුඛය වරද නොකරන්නේය.
11 යුතු තුලාවක්ද තරාදිද ස්වාමීන්වහන්සේට අයිතිය;
මල්ලේ තිබෙන සියලු කළන්පඩිද උන්වහන්සේගේ වැඩය.

*නොහොත්, ඒකාන්තයෙන්ම.

දුෂ්ටකම්කිරීම රජවරුන්ට පිළිකුලක්ය; 12
මක්නිසාද සිංහාසනය ස්ථිරවෙන්නේ ධර්මිෂ්ඨකමෙන්ය.
ධර්මිෂ්ඨ තොල්වලට රජවරු ප්‍රිය වෙති; 13
යුතුලෙස කථාකරන්නාටද ඔව්හු ප්‍රේමවෙති.
රජුගේ උදහස මරණයේ දූතයන් වැනිය; 14
එහෙත් ප්‍රඥාවත් මනුෂ්‍යයා එය සහනයකරන්නේය.
රජුගේ මුහුණේ එළියෙන් ජීවත්වීම ඇත; 15
ඔහුගේ කරුණාව අන්තිම වර්ෂා කාලයේ වලාකුළක් මෙනි.
ප්‍රඥාව ලබාගැනීම රන්වලට වඩා කොපමණ හොඳද! 16
එසේය, නුවණ ලබාගැනීම රිදීවලටත් වඩා අනර්ඝය.
අවංක අයගේ මහා මාර්ගය නම් නපුරෙන් ඉවත්ව සිටීමය; 17
තමාගේ මාර්ගය බලාගන්න තැනැත්තා තමාගේ ප්‍රාණය ආරක්ෂාකරගන්නේය.
විනාශයට පළමුවෙන් උඩඟුකමද 18
වැටීමට පළමුයෙන් අහංකාර සිතද වෙයි.
උදරම් අය සමග කොල්ලයක් බෙද ගැනීමට වඩා 19
දිළිඳු අය සමග යටත් සිතක් ඇතුව සිටීම හොඳය.
දේව වචනය සලකන්නාට ශුභසිද්ධ වන්නේය; 20
ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නාද වාසනාවන්තයෙක්ය.
සිතින් ප්‍රඥාවත් අය බුද්ධිමත් කෙනෙකැයි කියනු ලබන්නේය; 21
තොල්වල මිහිරිකමින්ද ඉගෙනගැන්ම වැඩිවේ.
නුවණ ඇත්තාට ඒක ජීවන උල්පතක්ය; 22
එහෙත් අඥානයන්ගේ ගුරුකම

මෝඩකමය.
23 ඥානවන්තයාගේ සිත ඔහුගේ මුඛයට
උගන්වා,
ඔහුගේ තොල්වලට ඉගෙනගැන්ම
එකතුකරයි.
24 ප්‍රිය වචන මීවදයක් මෙන්
ආත්මයට මිහිරිය, ඇටවලට
සැපදයකය.
25 මනුෂ්‍යයාට හරිව පෙනෙන මාර්ගයක්
ඇත;
එහෙත් එහි කෙළවර නම් මරණයේ
මාර්ගය.
26 වැඩකරන්නාගේ බඩගින්න ඔහු උදෙසා
වැඩකරයි;
මක්නිසාද ඔහුගේ කට ඔහු
පොළඹවයි.
27 දුර්ජන මනුෂ්‍යයා නපුරු උපා යොදයි;
ඔහුගේ තොල්වල ඇවිළෙන ගිනි
වැන්නක් තිබේ.
28 ප්‍රයෝගකාර මනුෂ්‍යයා තරඟ පතුරු
වන්නේය;
කේලාම් කියන්නාද හිතමිත්‍රයන්
වෙන්කරන්නේය.
29 බලාත්කාර මනුෂ්‍යයා තමාගේ
අසල්වාසියා කැමතිකරවාගෙන,
හොඳ නැති මාර්ගයක ඔහු
ගෙනයන්නේය.
30 ඔහු ප්‍රයෝග යොදන පිණිස තමාගේ
ඇස් පියාගන,
තමාගේ තොල් විකාගන නපුර
පමුණුවයි.
31 පැසුණු ඉස ගෞරවයේ ඔටුන්නක්ය,
එය ධර්මිෂ්ඨ මාර්ගයෙහි සම්බවෙයි;
32 බලවන්තයාට වඩා ඉවසිලි ඇත්තාද
නුවරක් අල්ලාගන්නාට වඩා තමාගේ
සිත ආණ්ඩුකරගන්නාද උතුම්ය.
33 පසඇටය ඔඩොක්කුවට දමනු ලැබේ;
එහෙත් එය මෙහෙයීම මුළුමනින්ම
**ස්වාමීන්වහන්සේගෙන්** පැමිණෙයි.

17 තරඟ ඇත්තාවූ, මංගල
භෝජනවලින් පිරී තිබෙන
ගෙයකට වඩා
සමාදානය ඇතුව වියළි රොටි කෑල්ලක්
හොඳය.
නුවණින් හැසිරෙන මෙහෙකරුවෙක් 2
ලජ්ජාව උපදවන පුත්‍රයෙකු කෙරෙහි
ආණ්ඩුකරයි,
සහෝදරයන් අතරේද ඔහු උරුමය
බෙදගනියි.
රිදීවලට කෝවයද රන්වලට උදුනද 3
තිබේ;
එහෙත් සිත් සෝදිසිකරන්නේ
**ස්වාමීන්වහන්සේය**.
නපුර කරන්නා දුෂ්ට තොල්වලට 4
ඇහුම්කන්දෙයි;
බොරුකාරයා ප්‍රයෝගකාර දිවට කන්
යොමුකරයි.
දිළින්දට සරදම්කරන්නා ඔහුගේ 5
මැවුම්කාරයාණන්ට නින්දකරයි;
විපත්තියට ප්‍රීතිවෙන්නා දඬුවම්
නොලැබ නොසිටියි.
මහල්ලන්ගේ ඔටුන්න නම් දරුවන්ගේ 6
දරුවෝය;
දරුවන්ගේ පාරට්ටුව ඔවුන්ගේ
පියවරුය.
උතුම් කථාව මෝඩයෙකුට 7
නොහොබනේය;
බොරුකාර දිව උත්තමයෙකුට ඊටත්
වඩා නොහොබනේය.
තෑග්ගක් ලබන්නාට එය මැණිකක් 8
මෙන් පෙනේ;
එය කොයි අතට හැරෙතත් සඵලවේ.
වරදක් වසාලන්නා ප්‍රේමය 9
සොයන්නේය.
එහෙත් කාරණයක් නැවත මතු
කරන්නා හිතමිත්‍රයන්
වෙන්කරන්නේය.
අඥනයෙකුට පහර සියයකට වඩා, 10
නුවණ ඇත්තෙකුට තරවටුව
වදින්නේය.
කැරළිකාරයා නපුර පමණක් 11
සොයන්නේය;

එබැවින් ඔහුට විරුද්ධව කෲර
පණිවිඩකාරයෙක් යවනු ලැබේ.
12 අඥානයෙකු තමාගේ මෝඩකමේදී
සම්බවීමට වඩා
පැටවුන් නැතිවුණු වැලහින්නියක්
මනුෂ්‍යයෙකුට සම්බවීම හොඳය.
13 යහපතට නපුර කරන්නාගේ ගෙයින්
විපත පහ නොවන්නේය.
14 ඩබරය පටන්ගැන්ම වක්කඩක්
අරින්නාක්මෙන්ය;
එබැවින් තරගය ඇවිස්සෙන්ට
පළමුවෙන් එය අත්හැරපන්න.
15 දුෂ්ටයා නිදෙස්කරන්නාද ධර්මිෂ්ඨයා
වරදට පත්කරන්නාද
යන දෙදෙනාම ස්වාමීන්වහන්සේට
එකාකාර පිළිකුලක්ය.
16 තේරුම් නැතුව තිබියදී,
ප්‍රඥාව ලබාගැනීමට අඥානයාගේ
අතෙහි මිල තිබීම කුමටද?
17 මිත්‍රයෙක් සෑම කල්හි ප්‍රේමවන්නේය,
සහෝදරයෙක් ඉපද සිටින්නෙත්
විපත්තියේදී පිහිටවීමටය.
18 තේරුම් නැති මනුෂ්‍යයා අතගසමින්
තම අසල්වාසියා ඉදිරියෙහි ඇප
වෙන්නේය.
19 ඩබරයට ප්‍රියවෙන්නා වරදට ප්‍රියවෙයි;
තමාගේ දොරකඩ උස්කොට සාදන්නා
විනාශය සොයයි.
20 වංක සිතක් ඇත්තාට ශුභසිද්ධ
නොවන්නේය;
දිව් දෙකක් ඇත්තාද විපතට
වැටෙන්නේය.
21 අඥානයෙකු උපදවන්නාට ශෝකය
වන්නේය.
මෝඩයෙකුගේ පියාට සන්තෝෂයක්
නැත.
22 තුෂ්ටිමත් සිත හොඳ ඖෂධයකි:
නුමුත් බිඳුණු ආත්මය ඇට වියළවයි.
23 යුක්තියේ මාවත් පෙරළීමට
දුෂ්ටයා ඔඩොක්කුවෙන් තෑග්ගක්
පිළිගනියි.
තේරුම් ඇත්තා ඉදිරියෙහිම ප්‍රඥාව 24
ඇත්තේය;
එහෙත් අඥානයාගේ ඇස් පොළොවේ
කෙළවරට යන්නේය.
අඥාන පුත්‍රයා තම පියාට ශෝකයක්ය. 25
ඔහු වැදූ තැනැත්තීටද දුකක්ය.
ධර්මිෂ්ඨයාට දඩගැසීමවත් 26
අවංකකම නිසා උත්තමයන්ට පහර
දීමවත් හොඳ නැත.
තමාගේ වචන ස්වල්පකරගන්න අය 27
දැනගැන්ම ඇති කෙනෙක්ය:
නිශ්චල ආත්මයක් ඇත්තාද
ඥානවන්තයෙක්ය.
මෝඩයෙක් පවා නිශ්ශබ්දව සිටින 28
විට ප්‍රඥාවන්තයෙකු මෙන්ද,
ඔහු තමාගේ තොල් පියාගන සිටින
විට තේරුම් ඇත්තෙකු මෙන්ද
සලකනු ලැබේ.

## 18

තමාම වෙන්ව සිටින තැනැත්තේ
තමාගේම ආශාව පස්සේ
යමින්,
සියලු යහපත් ප්‍රඥාවට විරුද්ධව
ඇවිස්සෙන්නේය.
අඥානයා තමාගේ සිතිවිලි එළිදරව් 2
කිරීමට මිස
නුවණට ප්‍රසන්න නැත.
දුෂ්ටයා එන කල හෙළාදැකීමත් 3
අවනම්බුව සමග අපහාසයත්
එන්නේය.
මනුෂ්‍යයෙකුගේ මුඛයේ වචන ගැඹුරු 4
වතුරුය:
ප්‍රඥාව නමැති උල්පත වනාහි ගලායන
ඔයක්ය.
දුෂ්ටයාගේ තරම සැලකීමද 5
විනිශ්චයේදී ධර්මිෂ්ඨයාගේ යුක්තිය
පෙරළීමද හොඳ නැත.
අඥානයාගේ තොල් ඔහු විවාදයට 6
පමුණුවයි;
ඔහුගේ මුඛයද පහරවලට අඬගසයි.

7 අඥානයාගේ මුඛය ඔහුට විනාශයක්ය,
ඔහුගේ තොල්ද ඔහුගේ ප්‍රාණයට
මලපතක්ය.
8 කේලාම්කියන්නෙකුගේ වචන රසවත්
බොදුන් මෙනි;
ඒවා බඩ තුළටම බැසයයි.
9 තවද තමාගේ වැඩට අලසව සිටින්නා
නාස්තිකාරයාගේ සහෝදරයාය.
10 ස්වාමීන්වහන්සේගේ නාමය
බලකොටුවක්ය;
ධර්මිෂ්ඨයා එහි දුව ගොස්
සුරක්ෂිතවෙයි.
11 පොහොසතාගේ කල්පනාවේ හැටියට
ඔහුගේ ධනය
ඔහුට බලවත් නගරයක්ව උස්වූ
පවුරකට සමානව තිබේ,
12 විනාශයට පළමුවෙන් මනුෂ්‍යයාගේ
සිත උඩඟුව තිබේ,
ගෞරවයට පළමුවෙන් යටහත්කම
ඇත්තේය.
13 අසන්ට පළමුවෙන් යමෙක් උත්තර
දෙන්නේ නම්,
එය ඔහුට මෝඩකමක්ව ලජ්ජාවක්ව
තිබේ.
14 මනුෂ්‍යයෙකුගේ ආත්මය තමාගේම
දුක උසුලන්නේය;
එහෙත් බිඳුණු ආත්මය දරන්ට පුළුවන්
කාටද?
15 තේරුම් ඇත්තාගේ සිත දැනගැන්ම
ලබාගනියි;
ප්‍රඥාවන්තයාගේ කනද දැනගැන්ම
සොයයි.
16 මනුෂ්‍යයෙකුගේ තෑග්ග ඔහුට ඉඩ
ලබාදී,
උත්තමයන් ඉදිරියට ඔහු පමුණුවයි,
17 තමාගේ පැමිණිල්ල පළමුකොට කියන
අය ධර්මිෂ්ඨව පෙනේ;
එහෙත් ඔහුගේ අසල්වාසියා ඇවිත්
ඔහු සෝදිසිකරන්නේය.
18 පසඇටය තරඟය නවත්වා,
බලවතුන් අතරේ බේරුම්කරයි.
කෝපවූ සහෝදරයෙකු දිනාගැනීම 19
බලවත් නුවරක් දිනාගැනීමට වඩා
අමාරුය;
එබඳු ඩබර වනාහි මාලිගාවක අගුල්
මෙන්ය.
මනුෂ්‍යයෙකුගේ බඩ තමාගේ මුඛයේ 20
ඵලයෙන් පිරෙයි;
තමාගේ තොල්වල අස්වැන්නෙන්
ඔහු සෑහීමට පැමිණෙයි.
මරණයත් ජීවනයත් දිවේ වසඟයෙහි 21
ඇත්තාහ;
ඊට ප්‍රියවන්තෝ එහි ඵල
භුක්තිවිඳින්නෝය.
භාර්යාවකු සම්බකරගන්නා යහපතක් 22
සම්බකරගන්නේය,
ඔහුට ස්වාමීන්වහන්සේගෙන්
කරුණාවද ලැබේ.
දිළින්දා බැගෑපත්ව කථාකරයි, 23
එහෙත් වස්තුකාරයා රළු ලෙස
උත්තරදෙයි.
බොහෝ මිත්‍රයන් ඇතිකරගන්නා 24
නාස්තියට පැමිණේ;
එහෙත් සහෝදරයෙකුට වඩා ඇලුම්
වෙන මිත්‍රයෙක් ඇත්තේය.

## 19

වංචාකාර තොල් ඇති
අඥානයෙකුට වඩා
තමාගේ අවංකකමෙන් හැසිරෙන
දිළින්දා උතුම්ය.
දැනගැන්ම නැතිව සිටීම ආත්මයට 2
හොඳ නැත;
තමාගේ පාදවලින් ඉක්මන්වෙන්නා
වරදට වැටෙන්නේය.
මනුෂ්‍යයෙකුගේ මෝඩකම ඔහුගේ 3
මාර්ගය පෙරළයි;
එවිට ඔහුගේ සිත ස්වාමීන්වහන්සේට
විරුද්ධව කිපෙයි.
වස්තුව බොහෝ මිත්‍රයන් එකතුකර 4
දෙයි;
එහෙත් දිළින්දාගේ මිත්‍රයා ඔහුගෙන්

වෙන්වෙයි.
5 බොරු සාක්ෂිකාරයා දඬුවම් නොලැබ නොසිටියි;
මුසාවාද තික්මවන්නා නිදහස් නොවන්නේය.
6 බොහෝදෙනෙක් ත්‍යාගවන්ත අයගේ හොඳ හිත ලබාගන්ට සොයති;
තෑගි දෙන මනුෂ්‍යයාට කවුරුත් මිත්‍රයෝය.
7 දිළින්දාගේ සියලු සහෝදරයෝ ඔහුට වෛරවෙති;
ඔහුගේ මිත්‍රයෝ කොපමණ වැඩියෙන් ඔහුගෙන් දුරු නොවෙද්ද?
ඔහු ඔවුන්ගේ කීම් පස්සේ දුවයි, එහෙත් ඔවුන් නැත.
8 ප්‍රඥාව ලබාගන්නා තමාගේ ආත්මයට ප්‍රේමවන්නේය;
ඥානය තබාගන්නාට ශුභසිද්ධවේ.
9 බොරු සාක්ෂිකාරයා දඬුවම් නොලැබ නොසිටියි;
මුසාවාද තික්මවන්නාද නැතිවෙයි.
10 සැප ජීවිකාව අඥානයෙකුට නොහොබනේය;
ඊට වඩා, මෙහෙකරුවෙක් අධිපතීන් කෙරෙහි ආණ්ඩුකිරීම නොහොබනේය.
11 සිහි කල්පනාව ඇති මනුෂ්‍යයා ඉක්මනට නොකිපෙයි;
වරදක් නොසලකා හැරීමද ඔහුගේ ගෞරවයක්ය.
12 රජුගේ උදහස සිංහයෙකුගේ ගර්ජනාවට සමානය;
එහෙත් ඔහුගේ කරුණාව තෘණ පිට පිනි මෙන්ය.
13 අඥාන පුත්‍රයෙක් ඔහුගේ පියාට විපත්තියක්ය;
භාර්යාවකුගේ තරහද නොනවතින වතුර බින්දු වැටීමක්ය.
14 ගෙයක් හා සම්පත් පියවරුන්ගෙන් ලැබෙන උරුමයක්ය;
නුමුත් නුවණින් හැසිරෙන භාර්යාවක් ලැබෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය.
15 අලසකම තද නින්දට පමුණුවයි;
කම්මැලි තැනැත්තේ බඩගිනි විඳියි.
16 ආඥාව රක්ෂාකරන්නා තමාගේ ප්‍රාණය ආරක්ෂාකරගන්නේය;
එහෙත් තමාගේ මාර්ග ගැන නොසලකන්නා නසින්නේය.
17 දුප්පතුන්ට අනුකම්පාකරන්නා ස්වාමීන්වහන්සේට ණයට දෙන්නේය;
ඔහුගේ හොඳ ක්‍රියාවට උන්වහන්සේ ඔහුට ප්‍රතිඵලදෙනසේක.
18 බලාපොරොත්තුවක් ඇති බැවින් නුඹේ පුත්‍රයාට දඬුවම්කරපන්න;
නුමුත් ඔහු නැතිකරන්ට කල්පනා නොකරන්න.
19 අධික තරහකාරයා දඬුවම විඳින්නේය;
මක්නිසාද නුඹ ඔහු මිදුවත් නැවත නැවතත් එසේ කරන්ට ඕනෑවෙයි.
20 නුඹේ මතු කාලයෙහි නුඹ ප්‍රඥාවන්තව සිටින පිණිස
මන්ත්‍රණය අසා ගුරුකම පිළිගනින්න.
21 මනුෂ්‍යයෙකුගේ සිතේ බොහෝ යෝජනා ඇත්තේය;
එහෙත් ස්ථිරවෙන්නේ ස්වාමීන්වහන්සේගේ මන්ත්‍රණයය.
22 මනුෂ්‍යයෙකුගේ ප්‍රිය ගතිය ඔහුගේ කරුණාවන්තකමය;
බොරුකාරයෙකුට වඩා දිළින්දෙක් උතුම්ය.
23 ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම ජීවනයට පමුණුවයි;
එය ඇත්තා තෘප්තියට පැමිණ,
විපතට අසු නොවී සිටියි.
24 අලසයා තමාගේ අත තළියේ දමන නුමුත්,
ඒක නැවත තමාගේ කටට ගන්නේවත් නැත.
25 නින්දකරන්නාට තළාපන්න, එවිට අනුවණයා නැණවත් වේ;

තේරුම් ඇත්තාට අවවාදකරපත්න,
එවිට ඔහු දැනගැන්ම තේරුම්ගනියි.
26 තමාගේ පියාගෙන් කොල්ලකමින්
තමාගේ මවු පන්නාදමන්නා
ලජ්ජා උපදවන්නාවූ, නින්ද
පමුණුවන්නාවූ පුත්‍රයෙක්ය.
27 මාගේ පුත්‍රය, දැනගැනීමේ වචන
කෙරෙන්
මුළාකරවන ගුරුකම නොඅසා එයින්
වැලකියන්න.
28 දුර්ජන සාක්ෂිකාරයා යුක්තියට නින්ද
කරයි;
දුෂ්ටයාගේ මුඛයද අයුතුකම ගිලගනියි.
29 නින්දකරන්නන්ට දඬුවමද
අඥනයන්ගේ පිටට පහරද පිළියෙළකර
තිබේ.

20 මුද්‍රිකපානය සරදම්කරන්නෙක්ය,
මද්‍යපානය කෝලාහලකාරයෙක්ය;
එයින් වැනෙන කවුරු නුමුත් ඥනවන්ත
නොවෙයි.
2 රජුගේ භයංකරය සිංහයාගේ
ගර්ජනාව මෙන්ය;
ඔහු කෝපකරවන්නා තමාගේම
ප්‍රාණයට විරුද්ධව වරදකරගන්නේය.
3 තරහයෙන් වැලකී සිටීම මනුෂ්‍යයෙකුට
ගෞරවයකි;
එහෙත් හැම මෝඩයෝම ඩබරකරති.
4 අලසයා ශීත කාලය නිසා හාන්නේ
නැත.
එහෙයින් ඔහු ගොයම් කපන කාලයේ
හිඟමින් කිසිත් නැතුව සිටියි.
5 මනුෂ්‍යයෙකුගේ සිතේ තිබෙන අදහස
ගැඹුරු ජලය මෙන්ය;
එහෙත් ඥනය ඇති මනුෂ්‍යයා එය
ඇදගන්නේය.
6 බොහෝ දෙනෙක් තම තමුන්ගේම
කරුණාවන්තකම ප්‍රකාශකරති;
එහෙත් විශ්වාස මනුෂ්‍යයෙක් කාට
සම්බවේද?
7 තමාගේ ඇදනැතිකමින් හැසිරෙන්නා
ධර්මිෂ්ඨයෙක්ය,
ඔහුට පසු ඔහුගේ දරුවෝ
වාසනාවන්තයෝ වෙති.
රජකෙනෙක් විනිශ්චයාසනයේ හිඳ 8
තමාගේ ඇස්වලින් නපුරුවූ සියල්ල
විසුරුවා දමන්නේය.
මම මාගේ සිත පවිත්‍රකොට, 9
මාගේ පාපයෙන් පිරිසිදුවී සිටිමියි
කියන්ට පුළුවන් කාටද?
ද්විප්‍රකාර කළත්පඩිද ද්විප්‍රකාර 10
මිම්ද යන දෙවගේම
ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය.
ළමයෙකුගේ ක්‍රියාවලින් පවා හරිව 11
තිබේදැයි
ඔහුගේ හැසිරීම පිරිසිදුව ප්‍රකාශවේ.
අසන කනද දකින ඇසද යන දෙකම 12
ස්වාමීන්වහන්සේ සෑදූසේක.
නුඹ දිළිඳු නොවන පිණිස නින්දට 13
ඇලුම් නොවන්න;
නුඹේ ඇස් ඇර සිටින්න, එවිට නුඹ
කැමෙන් තෘප්තියට
පැමිණෙන්නෙහිය.
නරකය, නරකය කියා මිලයට ගන්නා 14
කියයි;
එහෙත් අහක්ව ගොස් ඔහු පාරට්ටු
කරගනියි.
රත්ද රතුකැට රාශියක්ද ඇත්තාහ; 15
එහෙත් දැනගැන්ම ඇති තොල් අනර්ඝ
මාණික්‍යයක්ය.
අන්‍යයෙකුට ඇපවෙන්නාගේ වස්ත්‍රය 16
ගනින්න;
අනුන් නිසා ඔහුගෙන් උකසක් ගනින්න.
වංචාවේ කෑම මනුෂ්‍යයෙකුට මිහිරිය; 17
එහෙත් පසුව ඔහුගේ කට බොරළුවලින්
පිරෙයි.
සියලු අදහස් මන්ත්‍රණයෙන් ස්ථිරවේ; 18
ඥනවන්ත ගුරුකම් පිට යුද්ධකරපන්න.
කේලාම්කියමින් ඇවිදින්නා රහස් 19
එළිදරව්කරන්නේය;
එබැවින් බොහෝසෙයින් කට අරින්නා

සමග සමාගම් නොපවත්වන්න.
20 තමාගේ පියාට හෝ මවුට හෝ
දෙස්කියන්නාගේ පහන
ඝනාන්ධකාරයේදී නිවීයන්නේය.
21 මුලදී ඉක්මනින් ලබාගත්ත උරුමය
කෙළවරදී සඵල නොවන්නේය.
22 නපුරට ප්‍රතිඵල දෙමියි නොකියා
ස්වාමීන්වහන්සේ කෙරෙහි බලා
සිටපන්න, උන්වහන්සේ තුඹ
ගළවනසේක.
23 ද්විප්‍රකාර කළන්පඩි ස්වාමීන්වහන්සේට
පිළිකුලක්ය;
හොර තරාදි හොඳ නැත.
24 මනුෂ්‍යයෙකුගේ ගමන්
ස්වාමීන්වහන්සේගෙන් පැමිණේ;
එසේ නම් මනුෂ්‍යයා තමාගේ මාර්ගය
තේරුම්ගන්නේ කොහොමද?
25 මේක කැපයයි ඉක්මන්වී කියා,
බාරවල් වුණාට පසු විභාගකිරීම
මනුෂ්‍යයෙකුට මලපතක්ය.
26 ප්‍රඥවන්ත රජෙක් දුෂ්ටයන් විසුරුවා
දමන්නේය;
රෝදයක්ද ඔවුන් පිට අදින්නේය.
27 මනුෂ්‍යයාගේ *ආත්මය
ස්වාමීන්වහන්සේගේ පහනය,
එය සියලුම ඇතුල් කොට්ඨාස සෝදිසි
කරන්නේය.
28 කරුණාවද සැබෑකමද රජ්ජුරුවන්
ආරක්ෂාකරයි,
ඔහුගේ සිංහාසනය කරුණාව
හේතුකොටගෙන ස්ථිරවන්නේය.
29 තරුණයන්ගේ පාරට්ටුව ඔවුන්ගේ
ශක්තියය;
වෘද්ධයන්ගේ අලංකාරය නම් පැසුණු
හිසය.
30 තුවාලකරන තැළීම් නපුර පහකරයි;
පහරවල්ද ඇතුල් කොට්ඨාසවලටම
වදියි.

*එනම්, හෘදයසාක්ෂිය.

# 21

රජුගේ සිත දිය පාරවල් මෙන්
ස්වාමීන්වහන්සේගේ අතෙහි
පවතී;
උන්වහන්සේ කැමති අතකට ඒක
හරවනසේක.
මනුෂ්‍යයෙකුගේ සියලු මාර්ග තමාගේම 2
ඇසට හරිව පෙනෙයි;
එහෙත් ස්වාමීන්වහන්සේ සිත් කිරා
බලනසේක.
පූජාවට වඩා ධර්මිෂ්ඨකමද යුක්තියද 3
කිරීම
ස්වාමීන්වහන්සේට ප්‍රියව තිබේ.
අහංකාර බැල්මද උඩඟු සිතද යන 4
දුෂ්ටයන්ගේ පහන පාපයය.
කඩිසර අයගේ යෝජනාවලින් ලාභම 5
ලැබේ;
එහෙත් ඉක්මන්කාරයා ඉක්මන්වෙන්නේ
හිඟවීමට පමණකි.
බොරුකාර දිවකින් වස්තු ලබාගැන්ම 6
හුළඟට ගසාගනයන දුමාරයක්ය;
ඒවා මරණයේ මලපත්ය.
දුෂ්ටයෝ යුක්තිය කිරීමට අකැමැති 7
නිසා
තමුන්ගේ බලාත්කාරකමෙන් බැහැර
කරනු ලබන්නෝය.
වරදෙන් බරවූ අයගේ මාර්ගය ඉතා 8
ඇදය;
එහෙත් පිරිසිදු අයගේ ක්‍රියාව සෘජුය.
ඩබරකාර ස්ත්‍රියෙකු සමග පොදු 9
ගෙයක සිටීමට වඩා
පියස්සේ මුල්ලක ඉඳීම හොඳය.
දුෂ්ටයාගේ ආත්මය නපුරට 10
ආශාවන්නේය;
ඔහුගේ අසල්වාසියාට ඔහුගේ ඇස්
හමුයෙහි කරුණාව නොලැබේ.
නින්දකරන්නාට දඬුවම් ලැබෙන විට 11
නුවණ නැත්තා ප්‍රඥවන්ත වේ.
ප්‍රඥවන්තයාට දැනමුතුකම් දෙන විට
ඔහු දැනගැන්ම ලබයි.
ධර්මිෂ්ඨ තැනන්වහන්සේ දුෂ්ටයාගේ 12

වංශය ගැන කල්පනාකරනසේක;
උන්වහන්සේ දුෂ්ටයන් විපතට
හෙළාදමනසේක.
13 දුප්පතාගේ කන්නලව්වට කන්
වසාගන්නා
මොරගසන කල ඔහුටත් උත්තර
නොලැබේ.
14 රහසින් දෙන තෑග්ගකින් උදහසද
ඔඩොක්කුවට දෙන දීමනාවකින් තද
කෝපයද සන්සිඳෙයි.
15 යුක්තිය කිරීම ධර්මිෂ්ඨයාට ප්‍රීතියක්ව,
අයුතුකම්කරන්නන්ට විනාශයක්ව
තිබේ.
16 ප්‍රඥාවේ මාර්ගයෙන් මුළාවයන
මනුෂ්‍යයා
මළවුන්ගේ සමාගමේ වසන්නේය.
17 සැප සෙල්ලමට ඇලුම්වෙන්නා
හිඟමනට පැමිණෙයි;
මුද්‍රිකපානයටත් තෙලටත් ඇලුම්වෙන්නා
පොහොසත් නොවන්නේය.
18 දුෂ්ටයා ධර්මිෂ්ඨයා උදෙසා මිදීමේ
මිලයක්ය;
අවංක අය වෙනුවට ද්‍රෝහියා
පැමිණෙයි.
19 ඩබරකාරවූ තරහ ගති ඇති ස්ත්‍රියෙක්
සමග විසීමට වඩා
කාන්තාර දේශයක සිටීම හොඳය.
20 අනර්ඝ වස්තුවද තෙල්ද
ප්‍රඥාවන්තයාගේ නිවසෙහි ඇත;
එහෙත් අඥානයා ඒවා ගිලදමයි.
21 ධර්මිෂ්ඨකමද කරුණාවද අනුව
යන්නාට
ජීවිතයද ධර්මිෂ්ඨකමද ගෞරවයද
ලැබේ.
22 ප්‍රඥාවත්තෙම බලවතුන්ගේ නුවරට නැඟී,
ඔවුන් විශ්වාසකරන බලය හෙළා
දමන්නේය.
23 තමාගේ මුඛයත් දිවත් රැකවල්කර
ගන්නා
තමාගේ ප්‍රාණය විපත්තිවලින් රැක
ගන්නේය.

උඩඟු අහංකාර අයගේ නම නින්ද 24
කරන්නාය,
ඔහු අහංකාර මානයෙන් ක්‍රියා
කරන්නේය.
අලසයාගේ ආශාව ඔහු මරයි; 25
මක්නිසාද ඔහුගේ අත් වැඩකරන්ට
අකැමතිය.
දවස මුළුල්ලේ ගිජුලෙස ආශාවන්නෙක් 26
ඇත;
එහෙත් ධර්මිෂ්ඨයා නොවලක්වා
දෙන්නේය.
දුෂ්ටයාගේ පූජාව පිළිකුලක්ය; 27
ඔහු එය ප්‍රයෝග සිතින් ගෙනෙන විට
කොපමණ වැඩියෙන් එසේ
නොවන්නේද?
බොරු සාක්ෂිකාරයා විනාශවන්නේය; 28
එහෙත් ඇහුම්කන්දෙන්නා අවහිරයක්
නැතුව කථාකරන්නේය.
දුෂ්ටයා තමාගේ මුහුණ දැඩිකරගනියි; 29
එහෙත් අවංක තැනැත්තා තමාගේ
මාර්ගය කල්පනාකර බලයි.
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව 30
ප්‍රඥාවක්වත්
නුවණක්වත් මන්ත්‍රණයක්වත් නැත.
අශ්වයා යුද්ධ දවසට සැදී සිටියි; 31
එහෙත් ජය පැමිණෙන්නේ
**ස්වාමීන්වහන්සේගෙන්ය.**

## 22

බොහෝ ධනයට වඩා හොඳ
නමක්ද
රන්රිදීවලට වඩා කරුණාවද අගනේය.
පොහොසතාද දුප්පතාද සම්මුඛ වෙති; 2
ඔවුන් සියල්ලන්ගේ මැවුම්කාරයා
**ස්වාමීන්වහන්සේය.**
නුවණ ඇත්තා විපත්තිය දැක සැඟවෙයි; 3
එහෙත් අනුවණයෝ නොනැවතී ගොස්
අච්චු ලබති.
යටත්කමේද **ස්වාමීන්වහන්සේ** කෙරෙහි 4
භයවීමේද විපාකය නම්
වස්තුවත් ගෞරවයත් ජීවිතයත්ය.
කටුගස්ද මලපත්ද වංක අයගේ 5
මාර්ගයෙහි ඇත;

තමාගේ ප්‍රාණය ආරක්ෂාකරගන්නා
ඒවායින් දුරව සිටියි.
6 දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණු
කරපන්න,
එවිට ඔහු වයස්ගතවූ කලත් එයින්
අහක්ව නොයන්නේය.
7 වස්තුකාරයා දිළිඳුන් කෙරෙහි ආණ්ඩු
කරන්නේය,
ණයගන්නා ණයදෙන්නාට
මෙහෙකරුවෙක්ය.
8 අයුක්තිය වපුරන්නා විපත්තිය කපා
ගන්නේය;
ඔහුගේ *උදහස නමැති ඉපල නැති
වන්නේය.
9 කරුණා ඇසක් ඇත්තාට ආශීර්වාද
ලැබේ;
මක්නිසාද ඔහු තමාගේ කෑමෙන්
දිළින්දාට දෙන්නේය.
10 නින්දකරන්නා පන්නාදමාපන්න,
එවිට තරඟය පහවේ;
එසේය, විවාදයත් ලජ්ජාවත් නවතියි.
11 සිතේ පිරිසිදුකමට ඇලුම්වෙන්නාවූ,
ප්‍රසන්න තොල් ඇත්තාවූ අයට
රජ්ජුරුවෝ මිත්‍රයෙක්ය.
12 **ස්වාමීන්වහන්සේගේ** ඇස් දැනගැන්ම
ඇත්තා බලාගන්නේය,
නුමුත් ද්‍රෝහියාගේ වචන උන්වහන්සේ
පෙරළාදමනසේක.
13 අලසයා කථාකොට: පිටත සිංහයෙක්
ඇත.
වීථිවලදී මට මැරෙන්ට වේයයි
කියන්නේය.
14 අන් ස්ත්‍රීන්ගේ මුඛය ගැඹුරු වළක්ය;
එහි වැටෙන්නේ **ස්වාමීන්වහන්සේ**
කෝපකරවන තැනැත්තේය.
15 මෝඩකම ළමයෙකුගේ සිතට බැඳී
තිබේ;
දඬුවම්කිරීමේ ඉපල එය ඔහුගෙන්
දුරුකරයි.

*නොහොත්, උත්සාහය.

තමාට ලාභය වැඩිකරගන්න පිණිස 16
දිළින්දාට පීඩාකරන්නාද
පොහොසතුන්ට දෙන තැනැත්තාද
සැබවින්ම හිඟකමට පැමිණෙයි.

## ධර්මිෂ්ඨකම හා බුද්ධිය ගැන උපදේශ

(24. 34 දක්වා)

නුඹේ කන නමා ප්‍රඥාවන්තයන්ගේ 17
බස් අසා,
නුඹේ සිත මාගේ ඉගැන්වීමට යොමු
කරපන්න.
මක්නිසාද ඒවා නුඹ තුළෙහි තබාගෙන, 18
ඒවා මුළුමනින්ම නුඹේ තොල්වල
පිහිටන්නේ නම් එය ප්‍රසන්න
දෙයක්ය.
නුඹේ විශ්වාසය **ස්වාමීන්වහන්සේ** 19
කෙරෙහි තිබෙන පිණිස
මම අද ඒවා නුඹට, එසේය, නුඹට
දන්නුවෙමි.
නුඹ එවූවන් වෙතට නුඹ සැබෑකමේ 20
වචනවලින් උත්තර ගෙනෙන පිණිස
සැබෑකමේ වචනවල හරිකම නුඹට
දන්වන්ට,
මම මන්ත්‍රණ සහ දැනගැන්මත් ගැන 21
උතුම්වූ කාරණා නුඹට නොලිව්වෙම්ද?
දිළින්දා දිළිඳු බැවින් ඔහුගෙන් 22
කොල්ල නොකන්න,
අසරණයාට දොරටුවේදී පීඩා
නොකරන්න.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 23
ඔවුන් වෙනුවට විත්ති කියා,
ඔවුන්ගෙන් කොල්ලකන්නන්ගේ
ප්‍රාණය කොල්ලකන්නේය.
තරහ ගති ඇත්තෙකු සමග මිත්‍ර 24
නොවෙන්න;
කෝපාධික මනුෂ්‍යයෙකු සමග
නොගැවසෙන්න.
එසේ කළොත් සමහරවිට නුඹත් 25
ඔහුගේ මාර්ගවල පුහුණුවී,
නුඹේ ප්‍රාණයට මලපතක් පමුණුවා

ගන්නෙහිය.
26 තුඹ අත්ගසන්නෙක්වත්
ණය ගැන ඇපවෙන කෙනෙක්වත්
නොවන්න.
27 ගෙවන්ට තුඹට කිසිවක් නැතුව,
ඔහු කුමක් නිසා තුඹ නිදඉන්න
ඇඳ ගෙනයන්නේද?
28 තුඹේ පියවරුන් පිහිටෙවුවාවූ
පුරාණ මායිම් වෙනස් නොකරන්න.
29 තමාගේ වැඩෙහි දක්ෂවූ මනුෂ්‍යයෙකු
දකින්නෙහිද?
ඔහු පහත් අය ඉදිරියෙහි නොව
රජුන් ඉදිරියෙහි සිටින්නේය.

23 තුඹ ආණ්ඩුකාරයෙකු සමග
කෑමට හිඳින කල.
තුඹ ඉදිරිපිට තිබෙන දේ හොඳට
කල්පනාකර,
2 තුඹ ගිජු කෙනෙක් නම්,
තුඹේ උගුරට පිහියක් තබාගනින්න.
3 ඔහුගේ රසවත් කෑමවලට ආශා
නොවෙන්න.
ඒවා රැවටිලි කෑමය.
4 පොහොසත් වෙන්ට නොවෙහෙසෙන්න:
ඒ අදහස අත්ඇරපත්න.
5 නැතිවීයන දේට තුඹේ ඇස් යොමු
කරන්නෙහිද?
වස්තුව පියාපත් සාදගෙන
රාජාලියෙකු මෙන් අහස දෙසට ඉගිලී
යන්නේමය.
6 අප්‍රසන්න බැල්මක් ඇත්තාගේ කෑම
නොකන්න.
ඔහුගේ රස කෑමවලට ආශා
නොවන්න.
7 මක්නිසාද තමාගේ සිතෙන්
ගණන්ගන්නා ලෙසම ඔහු වන්නේය.
කාපන්න බීපන්නැයි ඔහු තුඹට කියයි;
නුමුත් ඔහුගේ සිත තුඹ සමග නැත.
8 තුඹ කෑ දෙය තුඹ වමාරන්නෙහිය,
තුඹේ ප්‍රසන්න වචනද නැතිවන්නේය.
9 අඥනයා ඉදිරියේ කථා නොකරන්න;
මක්නිසාද ඔහු තුඹේ වචනවල
සාරකම සුළුකරන්නේය.
පුරාණ මායිම වෙනස් නොකරන්න: 10
පියා නැත්තන්ගේ බිම්වලට ඇතුල්
නොවන්න.
මක්නිසාද ඔවුන්ගේ මිදුම්කාරයා 11
බලවත්ය;
උන්වහන්සේ තුඹට විරුද්ධව ඔවුන්ගේ
විත්තිය කියනවා ඇත.
තුඹේ සිත ඉගැන්වීමටද 12
තුඹේ කන් දනගැනීමේ වචනවලටද
යොමුකරපන්න.
දරුවාගෙන් දඬුවම නොවලක්වන්න: 13
ඉපලෙන් තුඹ ඔහුට තළන්නෙහි නම්
ඔහු නහින්නේ නැත.
ඉපලෙන් ඔහුට තළාපන්න; 14
එයින් තුඹ ඔහුගේ ප්‍රාණය *ෂෙයෝලෙන්
ගළවන්නෙහිය.
මාගේ පුත්‍රය. තුඹේ සිත ප්‍රඥවන්ත 15
නම්
මාගේ සිතත් ප්‍රීතිමත් වන්නේය.
එසේය, තුඹේ තොල් හරි දේවල් 16
පවසන විට
මාගේ හෘදය පිනායන්නේය.
තුඹේ සිත පව්කාරයන්ට ඊර්ෂ්‍යා 17
නොකොට,
හැම කල්හිම ස්වාමීන්වහන්සේ
කෙරෙහි භය ඇතුව තිබේවා.
මක්නිසාද සැබවින් විපාකයක් 18
ලැබෙන්ට තිබේ;
තුඹේ බලාපොරොත්තුවද සිඳදමනු
නොලැබේ.
මාගේ පුත්‍රය. අසා ප්‍රඥවන්ත වී. 19
තුඹේ සිත හරි මාර්ගයෙහි ගෙනයන්න.
මුද්‍රිකපානයෙහි ලොල්වූවන්ටවත් 20
මස් කෑමෙහි ගිජුවූවන්ටවත් එක්
නොවන්න.
මක්නිසාද බේබද්දත් කෑදරයාත් 21
දිළිඳුවන්නේය;

*හෙවත්, මිනීවළෙන්.

නිදිමතද වැරහැලි ඇඳීමට
පමුණුවන්නේය.
22 නුඹ ජනිතකළ නුඹේ පියාගේ බස්
අසාපන්න;
නුඹේ මෑණියන් මහලුවූ කල ඈ සුළු
නොකරන්න.
23 සත්‍යයද ප්‍රඥාවද ඉගනගැන්මද නුවණද
මිලේට ගනින්න, ඒවා නොවිකුණා
තබාගනින්න.
24 ධර්මිෂ්ඨයාගේ පියා ඉතා ප්‍රීතිමත්
වන්නේය;
බුද්ධිමත් දරුවෙකු ජනිතකරන්නාද
ඔහු නිසා ප්‍රීතිවන්නේය.
25 නුඹේ පියාද මවුද සතුටුවෙත්වා,
එසේය, නුඹ වැදූ තැනැත්තී ප්‍රීතිමත්
වේවා.
26 මාගේ පුත්‍රය, නුඹේ සිත මට දියන්න,
නුඹේ ඇස් මාගේ මාර්ග ගැන ප්‍රීති
වේවා.
27 මක්නිසාද වේශ්‍යාවක් වනාහි ගැඹුරු
අගළක්ය;
අන් ස්ත්‍රියද පටු වළක්ය.
28 එසේය, ඈ කොල්ලකාරයෙකු මෙන්
රැකසිට,
මනුෂ්‍යයන් අතරේ අවිශ්වාසයන්
වැඩිකරන්නීය.
29 දුක ඇත්තේ කාටද? කාලකණ්ණිකම
කාටද? තරඟ කාටද?
මැසිවිලි කාටද? නිෂ්කාරණ තුවාළ
කාටද?
රතු ඇස් ඇත්තේ කාටද?
30 මුද්‍රිකපානය ළඟ පමාවෙන්නන්ටය;
මිශ්‍රකළ මිදියුස සොයා යන්නන්ටය.
31 මුද්‍රිකපානය රතුව පෙනෙන විටත්,
පාත්‍රයෙහි දිලිහෙන විටත්,
සිනිඳුලෙස වැක්කෙරෙන විටත්, ඒ
දෙස නොබලන්න.
32 අන්තිමේදී එය සර්පයෙකු මෙන්
හපා කා,
පොළඟෙකු මෙන් දෂ්ටකරයි.
නුඹේ ඇසට *අද්භූත දේවල් 33
පෙනෙන්නේය,
නුඹේ සිත හිතුවක්කාර දේවල්
කථාකරන්නේය.
නුඹ මුහුද මැද නිදගන්නෙකු මෙන්ද 34
කුඹගසක මුදුනේ නිදන කෙනෙකු
මෙන්ද වන්නෙහිය.
ඔව්හු මට පහරදුන්නෝය, නුමුත් මට 35
රිදුණේ නැත;
ඔව්හු මට ගැසුවෝය, නුමුත් ඒක මට
දැනුණේ නැත;
මට කොයි වේලේ ඇහැ ඇරේද?
නැවත එය තවත් සොයන්නෙමියි
නුඹ කියන්නෙහිය.

# 24

දුෂ්ට මනුෂ්‍යයන්ට ඊර්ෂ්‍යයා
නොකරන්න,
ඔවුන් සමග සිටීමට ආශා නොවන්න.
මක්නිසාද ඔවුන්ගේ සිත නාස්ති 2
කරන්ට කල්පනාකරයි,
ඔවුන්ගේ තොල්ද අනතුරුකිරීම
ගැන කථාකරයි.
ප්‍රඥාවෙන් ගෙයක් ගොඩනගනු ලැබ, 3
නුවණින් එය ස්ථිරවේ.
දැනගැන්මෙන්ද එහි කාමර 4
සියලු ආකාර අනර්ඝවූ ප්‍රසන්නවූ
වස්තුවලින් පිරෙන්නේය.
ප්‍රඥාවත් මනුෂ්‍යයා බලවත්තය; 5
එසේය, දැනගැන්ම ඇති මනුෂ්‍යයා
ශක්තිය වැඩිකරගනියි.
මක්නිසාද ඥානවන්ත ගුරුකම් පිට 6
නුඹ නුඹේ යුද්ධය කළ යුතුය;
මන්ත්‍රීවරුන් රාශියක් ඇති කල්හි
ආරක්ෂාව තිබේ.
ප්‍රඥාව මෝඩයාට උසස් වැඩිය; 7
දොරටුවේදී ඔහු තමාගේ මුඛය
නොහරියි.
නපුර කිරීමට උපා යොදන්නාට 8

*නොහොත්, අන්‍ය ස්ත්‍රීන්.

ප්‍රයෝගකාරයෙකැයි මනුෂ්‍යයෝ
කියන්නෝය.
9 මෝඩයාගේ යෝජනාව පාපයය;
නින්දකරන්නාද මනුෂ්‍යයන්ට
පිළිකුලක්ය.
10 නුඹ විපත්ති දවසේදී කලකිරෙන්නෙහි
නම්
නුඹේ ශක්තිය අල්පය.
11 මරණයට ගෙනයනු ලබන්නන්
ගළවාගනින්න,
මරනු ලබන්ට වෙවුලමින් යන්නන්ද
මුදලන්ට බලාගනින්න.
12 අපි *මෙය නොදත්තෙමුයයි නුඹ
කියන්නෙහිනම්,
සිත් කිරාබලන තැනන්වහන්සේ එය
නොබලනසේක්ද?
නුඹේ ප්‍රාණය ආරක්ෂාකරන
තැනන්වහන්සේ එය
නොදන්නාසේක්ද?
උන්වහන්සේ ඒ ඒ මනුෂ්‍යයාට තම
තමාගේ ක්‍රියාවේ හැටියට විපාක
නොදෙනසේක්ද?
13 මාගේ පුත්‍රය, මීපැණි හොඳ බැවින්
ඒවාද
නුඹේ දිවට මිහිරිවූ මීවදයේ පැණිද
කාපන්න.
14 නුඹේ ප්‍රාණය උදෙසා ප්‍රඥව එසේම
බව දැනගනින්න;
එය නුඹට සම්බවුණොත් විපාකයක්
ලැබෙන්නේය,
නුඹේ බලාපොරොත්තුවද සිඳදමනු
නොලබන්නේය.
15 දුෂ්ට මනුෂ්‍යය, ධර්මිෂ්ඨයාගේ
නිවෙසට විරුද්ධව රැක නොසිටින්න;
ඔහුගේ වාසස්ථානය කොල්ල
නොකන්න.
16 මක්නිසාද ධර්මිෂ්ඨයා සත් වරක්
වැටුණත් නැගිටින්නේය;
නුමුත් දුෂ්ටයෝ විපත්තිය

*නොහොත්, මොහු

කරණකොටගෙන වැටීයන්නෝමය.
නුඹේ සතුරා වැටෙන කල ප්‍රීති 17
නොවන්න;
ඔහු පැකිළී වැටෙන කලද නුඹේ
සිත ප්‍රීතිමත් නොවේවා.
නැත්නම් සමහරවිට **ස්වාමීන්වහන්සේ** 18
ඒ දැක නොසතුටුව,
තමන් උදහස ඔහු කෙරෙන්
පහකරනසේක.
නපුර කරන්නන් නිසා 19
කලනොකිරෙන්න;
දුෂ්ටයන්ට ඊර්ෂ්‍යා නොවෙන්න.
මක්නිසාද නපුරාට හොඳ විපාකයක් 20
නැත්තේය;
දුෂ්ටයන්ගේ පහන නිවීයයි.
මාගේ පුත්‍රය, **ස්වාමීන්වහන්සේටත්** 21
රජුටත් භයවෙයන්න;
වෙනස්වන සුළු අය සමග සමාගම්
නොපවත්වන්න.
මක්නිසාද ඔවුන්ගේ විපත්තිය 22
හදිසියෙන් පැමිණෙයි;
ඒ දෙදෙනාගෙන් පැමිණෙන විනාශය
දන්නේ කවුද?

මේවාත් ප්‍රඥවන්තයන්ගේ කීම්ය. 23
විනිශ්චයේදී තරම බැලීම හොඳ නැත.
නුඹ ධර්මිෂ්ඨය කියා දුෂ්ටයාට 24
කියන්නාට
ජනයෝ ශාපකරන්නෝය, ජාතීහු
ඔහු පිළිකුල්කරන්නෝය.
එහෙත් ඔහුට තරවටුකරන්නන්ට 25
ප්‍රීතිය වන්නේය,
ශුභාශීර්වාදයක්ද ඔවුන් පිටට
පැමිණෙන්නේය.
සුදුසු උත්තරයක් දෙන අය 26
තොල් සිඹින්නේය.
නුඹේ වැඩය පිටතදී සූදානම්කොට, 27
කෙතෙහි එය පිළියෙළකරගනින්න;
පසුව නුඹේ ගේ සාදපන්න.
කාරණයක් නැතුව නුඹේ 28
අසල්වාසියාට විරුද්ධව

සාක්ෂිකාරයෙක් නොවන්න,
තුඹේ තොල්වලින් වංචා නොකරන්න.
29 ඔහු මට කළ ලෙසම ඔහුටත් කරන්නෙමි,
ඒ මනුෂ්‍යයාගේ ක්‍රියාවේ හැටියට ඔහුට ප්‍රතිඵල දෙන්නෙමියි නොකියන්න.
30 අලසයාගේ කෙත ළඟින්ද
තේරුම් නැත්තාගේ මිදිවත්ත ළඟින්ද ගියෙමි;
31 එහි සැම තැනම කටුගස් වැවී,
මුළුල්ලම කහඹිලියාවලින් වැසී තිබුණේය,
ඒකේ ගල් තාප්පයත් කඩා වැටී තිබුණේය.
32 එවිට මම බලා හොඳින් සිතට ගත්තෙමි;
මම ඒ දැක ගුරුකම් ලැබීමි.
33 තව ටිකක් නිදාගැනීමක්ය. ටිකක් සැතපීමක්ය;
නින්දට ස්වල්ප අත්පොරවාගැන්මක්යයි
34 කියන තුඹට දිළිඳුකම සොරෙකු මෙන්ද
හිඟකම අවිගත් කෙනෙකු මෙන්ද එනවා ඇත.

## චරිතානුකූල හා ආගමානුකූල උපදේශ

(29. 27 දක්වා)

25 මේවාත් යූදාහි රජවූ හෙසකියාගේ මිනිසුන් එකතුකොට ලිවුවාවූ සාලමොන්ගේ හිතෝපදේශය.

2 කාරණයක් සඟවාතැබීම දෙවියන්වහන්සේගේ ගෞරවයක්ය:
රජුන්ගේ ගෞරවය නම් කාරණයක් සොයා දැනගැනීමය.
3 උස නිසා අහසද ගැඹුර නිසා පොළොවද
රජුන්ගේ සිතද සොයා දැනගන්ට බැරිය.
4 රිදීවලින් බොර පහකරපන්න,
එවිට රන්කරුවාට භාජනයක් නික්මෙයි.
5 දුෂ්ටයා රජු ඉදිරියෙන් පහකරපන්න,
එවිට ඔහුගේ සිංහාසනය ධර්මිෂ්ඨකමෙන් ස්ථිරවෙයි.
6 රජු ඉදිරියේදී ඉස්සරහට නොයන්න;
උත්තමයන්ගේ ඉඩමෙහි නොසිටින්න.
7 මක්නිසාද තුඹේ ඇස්වලින් දුටු
අධිපතියා ඉදිරියෙහි තුඹ පහතට යැවීමට වඩා
මෙහි ඉහළට වරෙන්නැයි තුඹට කීම හොඳය.
8 නඩුකීමට ඉක්මන්වී පිටත්ව නොයන්න,
ගියොත්, අන්තිමේදී තුඹේ අසල්වාසියා තුඹ ලජ්ජාවට පත්කළාම,
තුඹ කරන්නේ කුමක්ද?
9 තුඹේ අසල්වාසියා සමගම තුඹේ කාරණය කථාකරපන්න,
අනිකෙකුගේ රහස ප්‍රකාශ නොකරන්න.
10 එසේ කළොත්, එය ඇසූ අය තුඹට නින්දාකරන්නේය,
තුඹේ අපකීර්තියද පහවෙන්නේ නැත.
11 කලට සුදුසු වචනය
රිදී කර්මාන්තවල තිබෙන රන් ජම්බු මෙනි.
12 ප්‍රඥාවන්තලෙස අවවාදකරන්නා, අසන කනට
රන් කුණ්ඩලාභරණයක්ද පවිත්‍ර ස්වර්ණාභරණයක්ද මෙනි.
13 විශ්වාස පණිවිඩකාරයා තමා යවන්නන්ට
ගොයම් කපන කාලයේ හිමේ ශීතල මෙනි;
ඔහු තමාගේ ස්වාමිවරුන්ගේ ආත්මය ප්‍රාණවත්කරන්නේය.
14 යමක් දෙන්නෙමියි කියා බොරුවට වර්ණනාකරන්නා
වර්ෂා නැති වලාකුල්ද හුළඟද මෙනි.
15 ඉවසිලිවන්තකමෙන් ආණ්ඩුකාරයෙකු

තමාගත හැක,
මොළොක් දිවෙන් ඇට බිඳෙයි.
16 තුඹට මීපැණි සම්බවුණොත්, එයින් තෘප්තියට පැමිණ වමනය නොකරන පිණිස,
සෑහෙන තරමට පමණක් කාපන්න.
17 තුඹේ අසල්වාසියාගේ ගෙදරට බොහෝසෙයින් නොයන්න;
ගියොත්, සමහරවිට ඔහු තුඹ ගැන වෙහෙසවී, තුඹට වෛරවෙයි.
18 තමාගේ අසල්වාසියාට විරුද්ධව බොරු සාක්ෂි කියන්නා
පොල්ලක්ද කඩුවක්ද තියුණු ඊයක්ද වැනිය.
19 විපත්ති දවසේදී අවිශ්වාස මනුෂ්‍යයෙකු කෙරෙහි විශ්වාසකිරීම
බිඳුණු දතකුත් වෙවුලන පාදයකුත් මෙනි.
20 දුක්වූ සිතකට ගීතිකාකරන්නා
ශීත කාලයේදී වස්ත්‍රය ගළවාදමන්නෙක්ද වෙඩිලුණුවලට කාඩිද වැනිය.
21 තුඹේ සතුරාට බඩගිනි නම් ඔහුට කන්ට දීපන්න,
පිපාසා නම් බොන්ට වතුර දීපන්න.
22 එසේ තුඹ ඔහුගේ ඉස පිට ගිනි අඟුරු ගොඩකරන්නෙහිය,
ස්වාමීන්වහන්සේද තුඹට විපාක දෙනසේක.
23 උතුරු හුළඟ වර්ෂාව ගෙනෙයි;
එසේම කේලාම්කියන දිව තරහ මුහුණක් උපදවයි.
24 ඩබරකාර ස්ත්‍රියෙක් සමග පොදු ගෙයක සිටීමට වඩා
පියස්සේ මුල්ලක ඉඳීම හොඳය.
25 දුර රටකින් ලැබෙන හොඳ ආරංචි
පිපාසා ඇත්තෙකුට ඇල්වතුර මෙන්ය.
26 දුෂ්ටයා ඉදිරිපිට පසුබසින ධර්මිෂ්ඨයා
කලඹා තිබෙන උල්පතක්ද නරක්කළ ජලාකරයක්ද මෙන්ය.
බොහෝ මීපැණි කෑම හොඳ නැත; 27
*එමෙන්ම මනුෂ්‍යයන්ට තමුන්ගේම ගෞරවය සෙවීම ගෞරවයක් නොවේ.
තමාගේ සිත මැඩපවත්වා නොගන්න 28
මනුෂ්‍යයා
පවුරක් නැති බිඳවැටුණු නුවරක් මෙන්ය.

# 26

ග්‍රීෂ්ම කාලයට හිම මෙන්ද,
ගොයම් කපන කාලයට වර්ෂාව මෙන්ද,
අඥනයෙකුට ගෞරවය නොහොබනේය.
ඔබ මොබ යන ගේකුරුල්ලා මෙන්ද, 2
ඉගිලී යන වැහිලිහිණියා මෙන්ද,
කාරණයක් නැතුව කරන ශාපය නොවදින්නේය.
අශ්වයාට කසයක්ද කොටළුවාට 3
කටකලියාවක්ද
අඥනයන්ගේ පිටට ඉපලක්ද වේත්.
තුඹත් අඥනයාට සමාන නොවන 4
පිණිස,
ඔහුගේ මෝඩකමේ හැටියට ඔහුට උත්තර නොදෙන්න.
අඥනයා තමා ප්‍රඥවන්තයෙකැයි 5
නොසිතන පිණිස,
ඔහුගේ මෝඩකමේ හැටියට ඔහුට උත්තරදීපන්න.
අඥනයෙකු අත පණිවිඩ අරින්නා 6
තමාගේ පාද කපා දමා අලාභ විඳින්නේය.
කොරෙකුගේ කකුල් වලංගු නැත; 7
අඥනයන්ගේ මුඛයෙන් නික්මෙන උපමාවත් එසේමය.
අඥනයෙකුට ගෞරවය දෙන්නා 8
†ගල් ගොඩක තබනලද මැණික්

*ඇතම් පිටපත්හි: බරවූ දේවල් විසඳීමත් බරක්ය.
†ඇතම් පිටපතක: ගල් පටියක ගලක් බඳින්නෙකු මෙනි.

පසුම්බිය මෙන්ය.
9 අඥනයන්ගේ මුඛයෙන් නික්මෙන උපමාව
බේබද්දෙක් අතින් වනන කටුගහක් මෙන්ය.
10 අඥනයෙකු කුලියට ගන්නාද මග යන්නන් කුලියට ගන්නාද
සියල්ලන්ට තුවාලකරන දුනුවායෙකු මෙනි.
11 බල්ලා උගේ වමනයට හැරීයන්නාක් මෙන්
අඥනයා තමාගේ අඥනකම නැවතත් කරන්නේය.
12 තමාම නුවණ ඇත්තෙකැයි සිතන මිනිසෙකු නුඹ දකින්නෙහිද?
ඔහුට වඩා අඥනයෙකු ගැන බලාපොරොත්තුවෙන්ට පුළුවන.
13 අලසයා කථාකොට: සිංහයෙක් මාර්ගයේ සිටියි;
වීථිවල සිංහයෙක් ඇතැයි කියන්නේය.
14 දොර ඒකේ අසච්ච පිට කරකැවෙන්නාක්මෙන්
අලසයා තමාගේ ඇඳ පිට පෙරළෙන්නේය.
15 අලසයා තමාගේ අත තලියේ තබන නුමුත්
නැවත එය තමාගේ කටට ගැනීම ඔහුට වෙහෙසක්ය.
16 අලසයා නුවණින් උත්තරදෙන සත් දෙනෙකුටත් වඩා
තමා ප්‍රඥවතෙකැයි සිතන්නේය.
17 පාරේ යමින් තමාට වැදගැන්මක් නැති ඩබරයකට මැදිවෙන්නා
උගේ කන්වලින් බල්ලෙකු අල්ලා ගන්න කෙනෙක් මෙන්ය.
18 තමාගේ අසල්වාසියා රවටමින්:
මම සෙල්ලමට එය කෙළෙමියි කියන මනුෂ්‍යයා,
19 තමා වටකර ගිනි පෙනෙලිද ඊගස්ද මරණයද විසිකරන පිස්සෙක් වැනිය.
දර නැති තැන ගින්න නිවීයයි; 20
එසේම කේලාම්කියන්නෙක් නැති කල තරහය නවතින්නේය.
ගිනිඅඟුරුවලට අඟුරුත් ගින්නට දරත් යම්සේද, 21
ඩබර අවුස්සන්ට තරහකාර මනුෂ්‍යයා එසේමය.
කේලාම්කියන්නෙකුගේ වචන රසවත් භෝජන මෙනි; 22
ඒවාත් බඩ තුළටම බැසයන්නේය.
සිත නපුරුව තිබෙද්දී ජ්වලිතව තිබෙන තොල් 23
රිදී බොර ගෑවාවූ මැටි භාජනයක් මෙනි.
වෛරවෙන්නා තමාගේ තොල්වලින් වංචාකම් කර, 24
තමා තුළ ප්‍රයෝග තබාගනියි.
ඔහු ප්‍රිය වචන කථාකරන කල විශ්වාස නොකරන්න; 25
මක්නිසාද ඔහුගේ සිතේ පිළිකුල් කාරණා සතක් ඇත්තේය.
ඔහුගේ වෛරය ප්‍රයෝගයෙන් වසා තිබෙන නුමුත් 26
ඔහුගේ දුෂ්ටකම සභාව ඉදිරියෙහි එළිදරව්වන්නේය.
වළක් හාරන්නා එහි වැටෙන්නේය; 27
ගලක් පෙරළාගන යන්නා පිටටම ඒක හැරී එන්නේය.
බොරුකාර දිව එයින් තුවාලවූවන්ට වෛරකරයි; 28
ඉච්චා මුඛයද නාස්තිය උපදවයි.

## 27

හෙට ගැන පාරට්ටුකර නොගනින්න;
මක්නිසාද දවසක් ඇතුළතදී මොනවා සිදුවේදැයි නුඹ නොදන්නෙහිය.
නුඹේම මුඛය නොව වෙන කෙනෙක්ද 2
නුඹේම තොල් නොව අන්‍යයෙක්ද නුඹට ප්‍රශංසාකෙරේවා.
ගලක් බරය, වැලිත් බරය. 3
එහෙත් ඒ දෙකටම වඩා මෝඩයෙකුගේ උරණය බරය.

4 උදහස ක්‍රෑරය, කෝපයද රෞද්‍රය;
එහෙත් කාම ක්‍රෝධය ඉදිරිපිට සිටින්ට පුළුවන් කාටද?
5 ප්‍රසිද්ධියේ තරවටුකිරීම
සැඟවී තිබෙන ප්‍රේමයට වඩා හොඳය.
6 මිත්‍රයෙකු විසින් කරන තුවාල විශ්වාසකමින් වේ;
එහෙත් සතුරෙකුගේ සිඹීම් අධිකව තිබේ.
7 තෘප්තියට පැමිණි අය මීවදයට අප්‍රිය කරයි;
එහෙත් ක්ෂුධාවත් අයට සෑම තික්ත දෙයම මිහිරිය.
8 තමාගේ ස්ථානයෙන් ඈත්ව යන මනුෂ්‍යයා
කැදැල්ලෙන් ඈත්ව යන පක්ෂියෙකු මෙන්ය.
9 විලවුන් හා සුගන්ධ ද්‍රව්‍ය සිත ප්‍රීති කරන්නේය;
එසේම යමෙකුගේ මිත්‍රයාගේ හිතේසි මන්ත්‍රණයෙන් ලැබෙන මිහිරිකමද සිත ප්‍රීතිකරයි.
10 නුඹේම මිත්‍රයාද නුඹේ පියාගේ මිත්‍රයාද අත් නොහරින්න;
නුඹේ විපත්ති දවසේදී නුඹේ සහෝදරයාගේ ගෙට නොයන්න;
ළඟ සිටින අසල්වාසියෙක් දුර සිටින සහෝදරයෙකුට වඩා හොඳය.
11 මාගේ පුත්‍රය, මට නින්දකරන්නාට උත්තරදෙන පිණිස
නුඹ ප්‍රඥාවත්ව සිට මාගේ සිත ප්‍රීති කරපන්න.
12 නුවණැත්තා විපත්තිය දැක සැඟවෙයි;
අනුවණයෝ නොනැවතී ගොස් අව්වු ලබති.
13 අන්‍යයෙකුට ඇපවෙන්නාගේ වස්ත්‍රය ගනින්න.
අන් ස්ත්‍රියෙකුට ඇපවෙන්නාගෙන්ද උකසක් ගනින්න.
14 අලුයම නැගිට තමාගේ මිත්‍රයාට
මහත් හඬින් ආශීර්වාදකරන්නාට
එය ශාපයක් කොට ගණින්නු ලබන්නේය.
15 තද වර්ෂා දවසක නොකඩව වතුර බින්දු වැටීමක්ද
ඩබරකාර ස්ත්‍රියෙක්ද ඒකාකාරය.
16 ඈ නවත්වන්ට හදන්නා හුළඟ නවත්වන්නේය.
ඔහුගේ දකුණතින් තෙල් අල්ලාගන්නේය.
17 යකඩින් යකඩ මුවහත් වේ;
එසේම මනුෂ්‍යයෙක් තම මිත්‍රයාගේ මුහුණ පැහැපත්කරයි.
18 අත්තික්කා ගස බලාගන්න අය එහි එල කන්නේය;
තම ස්වාමියා ගැන සලකන්නාද ගෞරවයට පැමිණෙන්නේය.
19 වතුරෙහි මුහුණ මුහුණට සමානවාක් මෙන්
මනුෂ්‍යයාගේ සිත මනුෂ්‍යයාට සමානය.
20 *ෂෙයෝල්ද †අබද්දෝනද කිසිකලක තෘප්තියට පැමිණෙන්නේ නැත;
මනුෂ්‍යයාගේ ඇස්ද කිසිකලෙක තෘප්තියට නොපැමිණේ.
21 රිදීවලට කෝවයද රන්වලට උදුනද තිබේ;
මනුෂ්‍යයෙක් ඔහුට ලැබෙන ප්‍රශංසාවෙන් පරීක්ෂාකරනු ලබයි.
22 නුඹ මෝඩයෙකු වංගෙඩියේ දමා ධාන්‍ය සමග මෝලෙන් කෙටුවත්
ඔහුගේ මෝඩකම ඔහුගෙන් පහනොවන්නේය.

23 නුඹේ එළු බැටළු රැළවල අන්දම හොඳට දැනගනින්න;
නුඹේ ගව රැළවලට සිත යොමුකරපන්න.
24 මක්නිසාද වස්තු සෑමදම නොපවතියි;

*එනම්, පාතාලය. †එනම්, විනාශය.

ඔවුන්නවත් පරම්පරාවෙන්
පරම්පරාවට පවතින්නේද?
25 තණකොළ පහවී ළා තෘණ
පෙනෙන්නේය,
කඳුවල පලා ජාති එකතුකරනු
ලබන්නේය.
26 බැටළු පැටව් නුඹේ ඇඳුම් පිණිසද
එළුවෝ කෙතක අගය පිණිසද වෙති.
27 නුඹේ කෑමටත් නුඹේ ගෙයි වැසියන්ගේ
කෑමටත්
නුඹේ තරුණියන්ගේ නඩත්තුවටත්
සෑහෙන පමණ එළුකිරි ඇතිවන්නේය.

28 කිසිවෙක් එළවාගෙන නොඑන
නුමුත් දුෂ්ටයෝ පලායති;
එහෙත් ධර්මිෂ්ඨයෝ සිංහයෙකු මෙන්
නිර්භීතව සිටිති.
2 දේශයක කැරළිකාරකම නිසා එහි
අධිපතියෝ බොහෝ වෙති;
එහෙත් තේරුම සහ දැනගැන්ම ඇති
මනුෂ්‍යයන් කරණකොට එය
බොහෝ කල් පවතින්නේය.
3 දුප්පතුන්ට පීඩාකරන දිළිඳු මනුෂ්‍යයෙක්
කෑම ඉතිරි නොවන ලෙස ගහගෙන
යන වැස්සක් මෙන්ය.
4 ව්‍යවස්ථාව අත්හරින්නෝ දුෂ්ටයන්ට
ප්‍රශංසාකෙරෙති;
එහෙත් ව්‍යවස්ථාව පවත්වන්නෝ
ඔවුන්ට විරුද්ධව සිටිති.
5 නපුරු මනුෂ්‍යයෝ යුක්තිය තේරුම්
නොගනිති;
එහෙත් ස්වාමීන්වහන්සේගෙන්
විභාගකරන්නෝ සියල්ල තේරුම්
ගනිති.
6 වංක මාර්ග ඇත්තාවූ
වස්තුකාරයෙකුට වඩා
තමාගේ ඇදනැතිකමින් හැසිරෙන
දිළින්ද හොඳය.
7 ව්‍යවස්ථාව රක්ෂාකරන්නා ඥානවත්
පුත්‍රයෙක්ය;
එහෙත් නාස්තිකාරයන්ගේ යහළුවා
තමාගේ පියා ලජ්ජාවට පමුණුවයි.
පොළිය හා ලාභයෙන් තමාගේ වස්තුව 8
වැඩිකරගන්න අය
ඒවා එකතුකර තබන්නේ දිළිඳුන්ට
කරුණාකරන්නාටය.
ව්‍යවස්ථාව ඇසීමෙන් තමාගේ කන් 9
ඉවත හරවාගන්නාගේ
යාච්ඤාව පවා පිළිකුලක්ය.
නපුරු මාර්ගයක යන ලෙස අවංක අය 10
මුළාකරන තැනැත්තා
තමාගේම වළේ වැටෙයි;
එහෙත් සම්පූර්ණ අයට යහපත
උරුමවේ.
වස්තුකාරයා තෙමේ ප්‍රඥාවතෙකැයි 11
සිතන්නේය;
එහෙත් තේරුම් ඇති දිළින්ද ඔහු
සොයා බලා තේරුම්ගනියි.
ධර්මිෂ්ඨයන් ජය ලබන කල මහත් 12
තේජස තිබේ;
එහෙත් දුෂ්ටයන් උසස් වන කල
මනුෂ්‍යයෝ සැඟවෙති.
තමාගේ වරද සඟවන්නා සඵල 13
නොවන්නේය;
එහෙත් ඒවා කියාදී අත්හරින්නාට
කරුණාව ලැබේ.
නිතරම භයවන්නා 14
වාසනාවන්තයෙක්ය;
එහෙත් තමාගේ සිත දැඩිකරගන්නා
විපතට වැටෙයි.
දිළිඳු සෙනඟක් ආණ්ඩුකරන 15
දුෂ්ටයෙක් වනාහි
ගොරවන සිංහයෙක්ද ගොදුරු සොයා
ඇවිදින වලසෙක්ද මෙනි.
නුවණින් හීනවූ අධිපතියා දරුණු 16
පීඩාකාරයෙක් වන්නේය;
එහෙත් අයුතු ලාභයට ද්වේෂකරන්නා
ආයුෂ වැඩිකරගන්නේය.
යමෙකුගේ ලෙයින් බරවී සිටින 17
මනුෂ්‍යයා
වළට පලායන්නේය; කිසිවෙක් ඔහු

නොවලක්වාවා.
18 ඇදනැතිකමින් හැසිරෙන්නා ගැළවෙයි.
එහෙත් තමාගේ මාර්ගවල වංකවූ
තැනැත්තා හදිසියෙන් වැටෙන්නේය.
19 තමාගේ බිම අස්වද්දන්නාට බොහෝ
සෙයින් කෑම ලැබේ;
එහෙත් නිෂ්ඵල අය අනුව යන්නා
දිළිඳුකමින් පූර්ණවේ.
20 විශ්වාස මනුෂ්‍යයෙකුට බොහෝ
ආශීර්වාද ලැබේ;
එහෙත් වස්තු උපදවාගන්ට ඉක්මන්
වෙන්නා දඬුවම් නොලැබ
නොසිටියි.
21 මනුෂ්‍යයන්ගේ තරම බැලීම හොඳ
නැත;
රොටි කෑල්ලක් නිසා අපරාධකිරීමද
හොඳ නැත.
22 අප්‍රසන්න බැල්මක් ඇති මනුෂ්‍යයා
වස්තුව පස්සේ වේගයෙන් යන්නේය,
තමාට හිඟකම පැමිණෙන බව ඔහු
නොදන්නේය.
23 ඉච්චා බස් කියන්නාට වඩා
මනුෂ්‍යයෙකුට තරවටුකරන්නාට
අන්තිමේදී ප්‍රශංසාව ලැබේ.
24 තමාගේ පියාගෙන් හෝ මව්ගෙන්
හෝ සොරාගෙන: වරදක් නැතැයි
කියන්නා
විනාශකාරයෙකුගේ යහළුවෙක්ය.
25 ගිජු සිත් ඇත්තා තරඟය උපදවයි;
එහෙත් ස්වාමීන්වහන්සේ කෙරෙහි
විශ්වාසකරන්නා පුෂ්ටිමත් වෙයි.
26 තමාගේම සිත කෙරෙහි විශ්වාසය
තබන්නා අඥානයෙක්ය;
එහෙත් නුවණින් හැසිරෙන්නා
ගැළවෙන්නේය.
27 දිළින්දාට දෙන අයට හිඟකමක්
නොවන්නේය;
එහෙත් තමාගේ ඇස් වසාගන්නා
බොහෝ ශාප ලබන්නේය.
28 දුෂ්ටයන් උසස්වෙන කල මනුෂ්‍යයෝ
සැඟවෙති;
එහෙත් ඔවුන් විනාශවෙන කල
ධර්මිෂ්ඨයෝ වැඩිවෙති.

## 29

බොහෝ වර තරවටු ලැබත්
තමාගේ කුළල තදකර
ගන්නා
ගැළවීමක් නැතුව හදිසියෙන්
පොඩිකරනු ලැබේ.
ධර්මිෂ්ඨයන්ට බලය තිබෙන කල 2
සෙනඟ ප්‍රීතිවෙති;
එහෙත් දුෂ්ටයෙක් ආණ්ඩුකරන කල
සෙනඟ සුසුම්ලති.
ප්‍රඥාවට ප්‍රියවන්නා තමාගේ පියා 3
ප්‍රීතිකරන්නේය;
එහෙත් වේශ්‍යාවන් ආශ්‍රයකරන්නා
තමාගේ සම්පත් නැතිකරන්නේය.
රජ තෙමේ යුක්තියෙන් දේශය ස්ථිර 4
කරයි;
එහෙත් බලෙන් තෑගි ලබාගන්න
මනුෂ්‍යයා ඒක පෙරළාදමයි.
තමාගේ අසල්වාසියාට 5
ඉච්චාකරන්නා
ඔහුගේ පාදවලට දැලක් එළයි.
නපුරු මනුෂ්‍යයෙකුගේ වරදකිරීමෙහි 6
මලපතක් ඇත.
එහෙත් ධර්මිෂ්ඨයා ගීතිකා කියමින්
සන්තෝෂවෙයි.
ධර්මිෂ්ඨයා දුප්පතුන්ගේ පැමිණිල්ල 7
දැනගන්නේය;
දුෂ්ටයාට ඒක දැනගන්ට තේරුමක්
නැත.
නින්දකරන මනුෂ්‍යයෝ නගරයෙහි 8
ගිනි අවුළුවති;
එහෙත් ප්‍රඥාවන්තයෝ උදහස පහකරති.
ප්‍රඥාවත් මනුෂ්‍යයෙක් මෝඩ 9
මනුෂ්‍යයෙකු සමග විවාදකරන විට
ඔහු කෝපවුණත් සිනාසුණත් කාරණය
තීන්දු නොවේ.
මිනීමරුවූ මනුෂ්‍යයෝ නිර්දෝෂ අයට 10
වෛරකෙරෙති.
එහෙත් අවංක අය ඔහුගේ
ප්‍රාණය ආරක්ෂාකරති.

11 අඥනයා තමාගේ මුළු උදහස පිටතට ගෙනෙයි;
එහෙත් ප්‍රඥවන්තයා ඒක නවත්වාගනියි;
12 ආණ්ඩුකාරයෙක් මුසාවාදයට ඇහුම්කන්දෙන්නේ නම්
ඔහුගේ සියලුම සේවකයෝ දුෂ්ටයෝ වෙති.
13 දිළින්දද පීඩාකරන්නාද සම්මුඛ වෙති;
ඔවුන් දෙදෙනාගේම ඇස් එළිය කරන්නේ ස්වාමීන්වහන්සේය.
14 දුහැමින් දුප්පතුන් විනිශ්චයකරන රජුගේ සිංහාසනය
සදටම ස්ථිරවන්නේය.
15 ඉපලද තරවටුකිරීමද ප්‍රඥව දෙන්නේය;
එහෙත් තමාගේ කැමැත්තට අත්හරිනු ලබන දරුවා තමාගේ මව් ලජ්ජාවට පමුණුවයි.
16 දුෂ්ටයන් බහුලවන කල අපරාධ වැඩිවෙයි;
එහෙත් ධර්මිෂ්ඨයෝ ඔවුන්ගේ වැටීම දකින්නෝය.
17 තුඹේ පුත්‍රයාට දඬුවම්කරපන්න, එවිට ඔහු තුඹට නිශ්චල භාවය දෙන්නේය;
එසේය, ඔහු තුඹේ ආත්මයට ප්‍රීතිය දෙන්නේය.
18 දර්ශනයක් නැති කල සෙනඟ හිතුවක්කාරවෙති;
එහෙත් ව්‍යවස්ථාව රක්ෂාකරන්නා වාසනාවන්තයෙක්ය.
19 වැඩකාරයෙක් වචනවලට නොහික්මෙන්නේය;
මක්නිසාද ඔහුට තේරෙන නුමුත් උත්තරදෙන්නේ නැත.
20 තමාගේ වචනවලින් ඉක්මන්වෙන මනුෂ්‍යයෙකු තුඹ දුටුවෙහිද?
ඔහුට වඩා අඥනයෙකු ගැන බලාපොරොත්තුවෙන්ට පුළුවන.
21 තමාගේ වැඩකාරයා බාල කාලයේ සිට සැපෙන් ඇතිකරන්නාට
ඔහු අන්තිමේදී පුත්‍රයෙක් වන්නේය.
තරහකාර මනුෂ්‍යයෙක් තරඟ උපදවයි; 22
කෝපවෙන මනුෂ්‍යයෙක්ද බොහෝ වරද කරන්නේය.
මනුෂ්‍යයෙකුගේ උඩඟුකම ඔහු පහතහෙළයි; 23
එහෙත් සිතින් පහත්ව සිටින්නා ගෞරව ලබයි.
හොරෙකු සමග හවුල්වෙන අය තමාගේම ප්‍රාණයට වෛරවන්නේය; 24
ඔහු දිවුරවීම අසන නුමුත් කිසිවක් නොපවසයි.
මනුෂ්‍යයාට භයවීම මලපතක්ය; 25
එහෙත් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන්නා සුරක්ෂිතව සිටියි.
බොහෝදෙනෙක් ආණ්ඩුකාරයාගේ කරුණාව සොයති; 26
එහෙත් මනුෂ්‍යයෙකුගේ යුක්තිය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය.
දුෂ්ට මනුෂ්‍යයෙක් ධර්මිෂ්ඨයන්ට පිළිකුලක්ය; 27
සෘජුව හැසිරෙන්නා දුෂ්ටයන්ට පිළිකුලක්ය.

## හිතෝපදේශ සහ අවවාද

30

යාකේගේ පුත්‍රවූ ආගුර්ගේ වචන, එනම් විශිෂ්ට කියමන්ය.
ඒ මනුෂ්‍යයා ඉතියෙල්ට, එනම් ඉතියෙල්ට සහ උකාල්ට, මෙසේ කීවේය:
සැබවින් මම සියල්ලන්ටම වඩා මූඪව සිටිමි, 2
මනුෂ්‍ය නුවණ මට නැත.
මම ප්‍රඥව ඉගෙන නොගතිමි, 3
ශුද්ධ තැනන්වහන්සේ ගැන දැනගැන්ම මට නැත.
ස්වර්ගයට නැගී බැස ආවේ කවුද? 4
තමාගේ මිටෙහි සුළඟ අඩංගුකර

ගත්තේ කවුද?
වතුර තමාගේ සළුවෙහි බැඳගත්තේ කවුද?
පොළොවේ සියලු සීමා පිහිටෙවුවේ කවුද?
ඔහුගේ නම කුමක්ද? ඔහුගේ පුත්‍රයාගේ නම මොකද? දන්නෙහි නම් කියාපන්න.

5 දෙවියන්වහන්සේගේ සියලු කීම් පවිත්‍රය;
උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන්නන්ට උන්වහන්සේ පලිහක්ය.
6 උන්වහන්සේ නුඹට තරවටු නොකරන පිණිසත් නුඹ බොරුකාරයෙක් නොවන පිණිසත්
උන්වහන්සේගේ වචනවලට කිසිවක් එකතු නොකරන්න.

7 කාරණා දෙකක් ඔබගෙන් ඉල්වීමි;
මාගේ මරණය දක්වා ඒවා මට නොදී නොසිටිය මැනව.
8 වංචාවත් බොරුවත් මාගෙන් දුරුකළ මැනව;
මා පූර්ණවී ඔබ එපාකර:
**ස්වාමීන්වහන්සේ** කවුද්‍යි නොකියන පිණිසත්,
මා දිළිඳුවී සොරකම්කොට,
9 මාගේ දෙවියන්වහන්සේගේ නාමය අගෞරවලෙස සඳහන් නොකරන පිණිසත්,
මට දිළිඳුකමවත් පොහොසත්කමවත් නොදී,
මට සුදුසු කෑමවලින් මා පෝෂ්‍යකළ මැනව.

10 වැඩකාරයෙකු ගැන ඔහුගේ ස්වාමියාට කේලාම් නොකියන්න,
එසේ කළොත් සමහරවිට ඔහු නුඹට ශාපකරන්නේය, නුඹද වරදකාරයෙක් වී දඬුවම් විඳිනවා ඇත.

තමුන්ගේ පියවරුන්ට ශාපකරන්නාවූ, 11
තමුන්ගේ මව්වරුන්ට ආශීර්වාද නොකරන්නාවූ පරම්පරාවක් ඇත්තේය.
තමුන්ගේ කිලුටුකම සෝද නොදැමූ නුමුත් තමුන් පිරිසිදුයයි සිතන්නාවූ පරම්පරාවක් ඇත්තේය. 12
උදරම් ඇස්ද 13
උඩුකුරුකරගත් ඇසිපියද ඇති පරම්පරාවක් ඇත්තේය.
පොළෝතලයෙන් දිළින්දන්ද මනුෂ්‍යයන් අතරෙන් අසරණයන්ද කාදමන්ට 14
කඩු වැනි දත් සහ පිහියා වැනි හකුදත්ද ඇති පරම්පරාවක් ඇත්තේය.
දියන්න, දියන්නැයි කියන දූවරු දෙදෙනෙක් කුඩැල්ලාට ඇත. 15
කිසිකලක තෘප්තියට නොපැමිණෙන්නාවූ දේවල් තුනක් තිබේ,
එසේය, ඇතැයි නොකියන දේවල් සතරක් තිබේ.
එනම්, *මිනීවළද; වඳ ගැබද; 16
ජලයෙන් තෘප්තියට නොපැමිණෙන පොළොවද;
ඇතැයි නොකියන ගින්නද යන මේවාය.

පියාට නින්දකරන්නාවූ, 17
මවුට කීකරුවීම සුළුකරන්නාවූ ඇස දෙණියේ කපුටුවෝ උගුලාගන්නෝය,
රාජාලි පැටව්ද ඒක කන්නෝය.

මට ඉතා පුදුමවූ කාරණා තුනක් තිබේ, 18
එසේය, මා නොදන්න කාරණා සතරක් තිබේ.
එනම්, ආකාශයෙහි රාජාලියෙක් යන මාර්ගය; 19
පර්වතයක් උඩ සර්පයෙක් යන මාර්ගය;

*හෙබ්‍රෙව්: ෂෙයෝල.

මුහුද මැද නැවක් යන මාර්ගය;
කන්‍යාවකු හා සමග පුරුෂයෙකුගේ මාර්ගය යන මේවාය.
20 මිථ්‍යාචාරික ස්ත්‍රියෙකුගේ මාර්ගයත් එසේමය;
ඈ කාලා කට පිහදමා:
මම දුෂ්ටකමක් නොකෙළෙමියි කියන්නීය.

21 කාරණා තුනකට පොළොව චංචලවෙයි,
ඊට දරන්ට බැරි සතරක්ද තිබේ.
22 එනම්, රජබවට පැමිණෙන සේවකයෙක්ය;
කෑමෙන් තෘප්තියට පැමිණියාවූ මෝඩයෙක්ය;
23 ආශා නූපදවන විවාහවූ ස්ත්‍රියක්ය;
ස්වාමිදුවට උරුමක්කාරිය වෙන දසියක්ය යන මේවාය.

24 කුඩා නුමුත් ඉතා ඥානවත්වූ
ජාති සතරක් පොළොවෙහි ඇත:
25 කුහුඹුවෝ බල නැති සමූහයක්ය,
එහෙත් උන් ග්‍රීෂ්ම කාලයෙහි උන්ගේ කෑම සපයති;
26 බෙත්හාවෝ බෙලහීන ජාතියක්ය,
එහෙත් උන් තමුන්ගේ ගෙවල් පර්වතවල සාදගනිති;
27 පළඟැටියන්ට රජෙක් නැත,
එහෙත් උන් සියල්ලෝ කණ්ඩායම් වශයෙන් පිටත්ව යති;
28 හූනා දෑතින් අල්ලාගන,
රජ මාළිගාවල සිටියි.

29 අලංකාරලෙස අඩි තබා යන තුන්දෙනෙක් සිටිති,
එසේය, අලංකාරලෙස ඇවිදින සතරදෙනෙක් සිටිති:
30 මෘගයන් අතරෙන් ඉතා බලවන්තයාවූ,
කිසිවෙකු වෙතින් හැරී නොයන්නාවූ සිංහයා;
31 *හුළංබල්ලා; එළුවා;

*නොහොත්, යුද්ධ අශ්වයා හෝ එඩිතර කුකුළාය.

සේනා සහිතව යන රජ යන මොව්හුය.

32 නුඹ උඩඟුවීමෙන් මෝඩකම් කෙළෙහි නම්,
නොහොත් නපුරක් සිතුවෙහි නම්,
අතින් කට වසාගනින්න.
33 මක්නිසාද කිරි ඇලලීමෙන් වෙඩරු හැදෙන්නේය,
නාසය මිරිකීමෙන් ලේ එන්නේය.
එසේම උදහස ඇවිස්සීමෙන් තරහය හටගන්නේය.

## රජකෙනෙකුට අවවාද

31 ලෙමුවෙල් රජුගේ වචනය;
ඔහුගේ මෑණියන් විසින් ඔහුට ඉගැන්වූ කීම්ය.

2 මාගේ පුත්‍රය, මොකද? අනේ මාගේ කුස ඔත් පුත්‍රය, මොකද?
මාගේ බාරවල පුත්‍රය, මොකද?
3 නුඹේ ශක්තිය ස්ත්‍රීන්ටත්
නුඹේ මාර්ග රජවරුන් නාස්තිකරන්නියන්ටත් නොදෙන්න.
4 ලෙමුවෙල්, මුද්‍රිකපානය බීම රජුන්ටත්
සුරාපානයට ආශාවීම අධිපතීන්ටත් සුදුසු නැත.
5 බීවොත් ඔව්හු සමහරවිට නීතිය සිහිනැතිකොට
අසරණයන්ගේ නඩුව පෙරළන්නෝය.
6 විනාශවෙන්ට යන අයට සුරාපානයද
ශෝක සිත ඇත්තන්ට මුද්‍රිකපානයද දියන්න.
7 ඔහු බී තමාගේ දිළිඳුකම සිහිනැතිකොට,
තමාගේ කාලකණ්ණිකම තවත් මතක් නොකර සිටීවා.
8 නුඹේ මුඛය නිශ්ශබ්දව සිටින්නන් උදෙසාද
අනාථවූ සියලු දරුවන්ගේ කාරණය උදෙසාද ඇරපන්න.
9 නුඹේ මුඛය ඇර, ධර්මිෂ්ඨලෙස

නිශ්වයකර,
අසරණයාටත් දිළින්දාටත් යුක්තිය කරපන්න.

## ගුණවන්ත ස්ත්‍රී

10 ගුණවත් ස්ත්‍රියෙක් කාට සම්බවේද?
ඇගේ අගය රතුකැටවලට වඩා වැඩිය.
11 ඇගේ පුරුෂයාගේ සිත ඇය කෙරෙහි විශ්වාසකරයි,
ඔහුට ලාභයෙන් අඩුවක් නොවන්නේය.
12 ඇගේ ජීවිතයේ සියලු දවස්වල
ඈ ඔහුට අයහපත නොව යහපත කරන්නීය.
13 ඈ ලොම් සහ හණ සොයාගෙන
ප්‍රීතියෙන් ඇගේ අත්වලින් වැඩකරන්නීය.
14 ඈ වෙළඳ නැව් මෙන්ය;
ඇගේ කෑම දුරස්තරයෙන් ගෙන්වාගනියි.
15 ඈ රැයින්ම නැගිට
ඇගේ පවුලේ අයට ආහාරත්
ඇගේ දසීන්ට වැඩත් දෙන්නීය.
16 ඈ කෙතක් ගැන කල්පනාකොට ඒක මිලයට ගන්නීය,
ඇගේ අත්වල ලාභයෙන් ඈ මිදිවත්තක් වවන්නීය.
17 ඈ සවිලෙස ඉහටිය බැඳගෙන,
ඇගේ අත් සවිකරගන්නීය.
18 තම වෙළඳාමෙන් හොඳ ලාභ ලැබෙන බව ඈට දැනේ;
රාත්‍රියේ ඇගේ පහන නොනිවේ.
19 ඈ ඉද්දට ඇගේ අත් පොවා,
ඇගේ හස්තවලින් වඩුන්න අල්ලයි.
20 ඇගේ හස්තය අසරණයා දෙසට විහිදන්නීය;
එසේය, ඇගේ අත් දිළින්දා වෙතට දිගුකරන්නීය;
හිම නිසා ඇගේ පවුල ගැන ඈට භයක් නැත; 21
මක්නිසාද ඇගේ පවුලේ සියල්ලෝ රතු වස්ත්‍ර ඇඳ සිටිති.
ඈ ඇතිරිළි සාදගන්නීය; 22
ඇගේ ඇඳුම් සිහින් හණ රෙදිවලින්ද රත්නිල් රෙදිවලින්ද සාද තිබේ.
ඇගේ පුරුෂයා දේශයේ වැඩිමහල්ලන් සමග 23
දොරටුවල ඉඳගන්නා කල සලකනු ලබන්නේය.
ඈ සිහින් රෙදි සාද විකුණයි; 24
වෙළෙන්දාට බඳපටිත් දෙන්නීය.
බලයත් ගෞරවයත් ඇගේ ඇඳුම්ය; 25
ඈ මතු දවස් ගැන සිනාසෙන්නීය.
ඈ නුවණින් යුක්තව ඇගේ මුඛය විහිදන්නීය; 26
ඇගේ දිවෙහි කරුණාවන්ත දහමුතුකම් තිබේ.
ඈ අලසකමේ කෑම නොකා 27
ඇගේ පවුලේ කාරණා බලාගනියි.
ඇගේ දරුවෝ නැගිට ඈට ආශීර්වාද කරති; 28
ඇගේ පුරුෂයාත් ඈට
ප්‍රශංසාකරමින්:
බොහෝ දූවරු ගුණවත්කමින් හැසුරුණෝය, 29
නුමුත් නුඹ ඔවුන් සියල්ලන්ට වඩා උතුම්යයි කියන්නේය.
රූපශ්‍රීය රැවටිලි සහිතය, ශෝභනකම නිෂ්ඵලය, 30
ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය.
ඇගේ අත්වල ඵලයෙන් ඈට දීපල්ලා; 31
ඇගේ ක්‍රියා දොරටුවලදී ඈට ප්‍රශංසා කෙරෙත්වා.

# දේශනාකාරයාගේ පොත

## සියල්ල නිෂ්ඵල බව

1 දාවිත්ගේ පුත්‍රවූ යෙරුසලමේ රජවූ
දේශනාකාරයාගේ වචනයි.
2 නිෂ්ඵලකම්වල නිෂ්ඵලකමය,
නිෂ්ඵලකම්වල නිෂ්ඵලකමය, සියල්ලම
නිෂ්ඵලකමයයි ධර්මදේශකතෙමේ
3 කියන්නේය. මනුෂ්‍යයා ඉර යට ගන්නාවූ
තමාගේ සියලුම වෙහෙසවලින් ඔහුට
4 ඇති ප්‍රයෝජනය කුමක්ද? පරම්පරාවක්
පහව් යන්නේය, තවත් පරම්පරාවක්
පැමිණෙන්නේය; නුමුත් පොළොව සෑම
5 කල්ම පවතින්නේය. තවද හිරු
උදාවන්නේය, හිරු බැස යන්නේය, ඒක
උදාවුණු තැනටම නැවත ඉක්මනින්
6 පැමිණෙන්නේය. සුළඟ දකුණු දිගට
ගොස් උතුරට හැරීයන්නේය; සුළඟ
නිතරම ඒකේ මාර්ගයෙහි මාරුවෙවී
ගොස් ඒකේ වටවූ ගමන්වලට නැවත
7 පැමිණෙන්නේය. සියලු ගංගා මුහුදට
යති, එහෙත් මුහුද පිරෙන්නේ නැත; ගංගා
8 පිටත්වඑන තැනටම නැවත යති. හැම
දේම වෙහෙසින් පූර්ණය; මනුෂ්‍යයෙකුට
ඒක විස්තරකරන්ට බැරිය. දැකීමෙන්
ඇස තෘප්තියට පැමිණෙන්නේවත්
9 ඇසීමෙන් කන පිරීයන්නේවත් නැත. මතු
ඇතිවන්නේ තිබුණාවූ දේමය; කරන්ට
තිබෙන්නේ කළාවූ දේමය. මෙසේ ඉර
10 යට අමුතු දෙයක් නැත. මෙන්න, මේක
අමුතුයයි මනුෂ්‍යයන් විසින් කියන්ට
කිසිවක් ඇද්ද? ඒක අපට පළමුවෙන්වූ
11 පුරාණ කාලවල තිබුණේය. පළමු සිටි
අය ගැන සිහිවීමක් නැත; මතු
පැමිණෙන පරම්පරා ගැනද ඉන් පසුව
එන්නන් අතරේ සිහිවීමක් නොවන්නේය.
12 දේශනාකාරයා වන මම ඉශ්‍රායෙල්
කෙරෙහි යෙරුසලමෙහි රජව සිටියෙමි.
මම අහස යට කෙරෙන සියල්ල ගැන 13
ප්‍රඥාවෙන් සොයා විභාගකරන්ට මාගේ
සිත යොමුකෙළෙමි. ඒ වනාහි ව්‍යාවෘත
වීමට දෙවියන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන්ට
දී තිබෙන අමාරු වැඩක්ය. ඉර යට 14
කෙරෙන සියලු කර්මාන්ත දුටිමි; ඒ
සියල්ල නිෂ්ඵලකමක්ද හිස්වූ
උත්සාහයක්ද වේ. ඇද දේ කෙළින්කරන්ට 15
බැරිය. නැති දේ ගණින්ටද නොහැකිය.
මම මාගේ සිත සමග කථාකොට: මට 16
පළමුවෙන් යෙරුසලමෙහි සිටි සියල්ලන්ට
වඩා මහත් ප්‍රඥාව ලබාගතිමි. එසේය,
මාගේ සිතට ප්‍රඥාවත් දැනගැන්මත් ගැන
බොහෝ අත්දැකීම ලැබුණේයයි කීමි.
මෙසේ ප්‍රඥාව දැනගන්ටත් මෝහය හා 17
අඥානකම දැනගන්ටත් මාගේ සිත
යොමුකෙළෙමි. එවිට මේකත් හිස්වූ
උත්සාහයක් බව දැනගතිමි. මක්නිසාද 18
බොහෝ ප්‍රඥාවෙන් බොහෝ දුක්
පැමිණෙන්නේය. දැනගැන්ම වැඩිකර-
ගන්නා ශෝකය වැඩිකරගන්නේය.

## ශාරීරික සැප සහ ලෞකික තේජසත් නිෂ්ඵල බව

2 මම කථාකොට: ඉතින් වරෙන්න,
ප්‍රීතිය කරණකොටගෙන නුඹ
සෝදිසිකරන්නෙමි; ඒ නිසා සැප
විඳපන්නැයි සිතින් කියාගතිමි. බලව,
මේකත් නිෂ්ඵලකමක්ය. සිනාසීම ගැන:
ඒක පිස්සුකමය. ප්‍රීතියෙන් ඇති 2
ප්‍රයෝජනය මොකදැයි කීමි. මනුෂ්‍ය 3
පුත්‍රයන්ට තමුන්ගේ ජීවිතයේ සියලුම
දවස්වල අහසින් යට කිරීමට හොඳව
තිබෙන්නේ මොකද කියා දකින තුරු,
මාගේ සිත ප්‍රඥාවෙන් මා හසුරුවන

අතර, මාගේ මාංසය මුද්‍රිකපානයට
හාරදෙන්නෙත් මෝඩකම අල්ලාගන්නෙත්
කොහොමදැයි මාගේ සිතින්
4 විභාගකෙළෙමි. මම මහත් කර්මාන්ත
කෙළෙමි; මම ගෙවල් ගොඩනගාගෙන
5 මිදිවතු වවාගත්තෙමි; මම වතුද උයන්ද
සාදා, සියලු ආකාර ඵලදෙන ගස්
6 ඒවායෙහි සිටවාගතිමි. ගස් වවන
තවානට වතුර වත්කරන පිණිස මම
7 දිය පොකුණු සාදගතිමි. මම දසයන්ද
දසීන්ද මිලේට ගතිමි, මාගේ ගෙයි
උපන් වැඩකාරයෝත් මට සිටියෝය;
යෙරුසලමෙහි මට ඉස්සර සිටි
සියල්ලන්ට වඩා ගව රැළවල් හා එළු
8 බැටළු රැළවල් මට උන්නෝය. මම රන්
රිදීද රජවරුන්ගෙත් දේශවලත් වස්තූද
රැස්කරගතිමි. මම ගායනාකාරයන් හා
ගායනාකාරියන්ද මනුෂ්‍ය පුත්‍රයන්ගේ
ප්‍රීතිය වන බොහෝ භාර්යාවන්ද
9 සපයාගතිමි. මෙසේ යෙරුසලමෙහි මට
පළමුවෙන් සිටි සියල්ලන්ට වඩා මම
උතුම්ව දියුණුවීමි. මාගේ ප්‍රඥවත් මා
10 තුළ පැවතුණේය. මාගේ ඇස් ආශා
කළ කොයි දෙයක්වත් මම ඒවායින්
නොවැලැක්වීමි. කිසි ප්‍රීතියකින්ද මාගේ
සිත නොවැලැක්වීමි, මක්නිසාද මාගේ
සිත මාගේ මුළු වැඩෙන් ප්‍රීතිවුණේය;
මාගේ මුළු වැඩෙන් මට ලැබුණු කොටස
11 මේය. තුමුත් මාගේ අත්වලින් කළාවූ
සියලුම කර්මාන්තද කරන්ට මා වෙහෙස
ගත්තාවූ වැඩද දෙස බැලූ විට ඒ සියල්ල
නිෂ්ඵලකමක්ව හිස්වූ උත්සාහයක්ව
තිබෙන බවත් ඉර යට ප්‍රයෝජනයක්
නැති බවත් දුටිමි.

## ඥානය පවා නිෂ්ඵලය

12 එවිට මම ප්‍රඥවත් මෝහයත්
අඥනකමත් බලන්ට හැරුණෙමි.
මක්නිසාද රජුට පසුව එන මනුෂ්‍යයාට
කරන්ට පුළුවන් කුමක්ද? පුරාණයේදී
13 කළ ඒවාමය. එවිට අන්ධකාරයට වඩා
එළිය උතුම්ව තිබෙන ලෙසම අඥන-
කමට වඩා ප්‍රඥව උතුම් බව දුටිමි.
14 ප්‍රඥවන්තයාගේ ඇස් ඔහුගේ හිසේය,
අඥනයා අන්ධකාරයෙහි ඇවිදින්නේය.
එහෙත් ඔවුන් සියල්ලන්ට සිද්ධවෙන්නේ
එක දෙයක්ම බව දැනගතිමි. එකල: 15
අඥනයාට මෙන් මටත් සිදුවන්නේය;
එසේ නම් මා වඩා ප්‍රඥවන්තව සිටින්නේ
මක්නිසාදැයි මාගේ සිතින් සිතාගත්තෙමි.
එකල: මේකත් නිෂ්ඵලකමක්යයි මාගේ
සිතින් සිතුවෙමි. මක්නිසාද පැමිණෙන්ට 16
තිබෙන දවස්වල සියල්ලත් ගැන
මුළුමනින්ම මතකනැතිවී යන බැවින්,
අඥනයා ගැන මෙන්ම ප්‍රඥවන්තයා
ගැනත් සිහිවීමක් නැත්තේය. අහෝ
අඥනයා මෙන් ප්‍රඥවන්තයාත් නසින
හැටි! එබැවින් ඉර යට කෙරෙන 17
වැඩ මට අයහපත්ව පෙනුණු නිසා,
ජීවිතයට අප්‍රියවීමි. මක්නිසාද සියල්ල
නිෂ්ඵලකමක්ව හිස්වූ උත්සාහයක්ව
තිබේ.
එසේය, ඉර යට මා වීර්යයෙන් කළාවූ, 18
මට පසුව එන මනුෂ්‍යයාට මා විසින්
තබායන්ට ඕනෑවූ මාගේ මුළු වැඩේට
අප්‍රියවීමි. ඔහු ප්‍රඥවන්තයෙක් වේද 19
අඥනයෙක් වේද කියා දන්නේ කවුද?
එහෙත් ඉර යට මා වීර්යයෙන්ද
ප්‍රඥවෙන්ද කළාවූ මාගේ මුළු වැඩය
කෙරෙහි ඔහු බලය පවත්වා ඇත. මේකත්
නිෂ්ඵලකමක්ය. එබැවින් මා ඉර යට 20
වීර්යයෙන් කළාවූ මාගේ මුළු වැඩය
ගැන මාගේ සිත කලකිරෙන්ට හැරියෙමි.
මක්නිසාද ප්‍රඥවෙන්ද දැනගැන්මෙන්ද 21
සමර්ථකමින්ද වැඩක් කළාවූ
මනුෂ්‍යයෙක් ඇත; එහෙත් ඒ ගැන
වෙහෙස නූණාවූ මිනිසෙකුට කොටසක්
කොට ඔහු ඒක තබා යන්ට ඕනෑය.
මේකත් නිෂ්ඵලකමක්ව මහත් නපුරක්ව
තිබේ. මක්නිසාද මනුෂ්‍යයා ඉර යට 22
වෙහෙස ගෙන කරන්නාවූ තමාගේ මුළු
වැඩෙනුත් තමාගේ සිතේ වැයමෙනුත්
ඔහුට ලැබෙන්නේ කුමක්ද? ඔහුගේ හැම 23
දවස් ශෝකයම වේ, ඔහුගේ වෙහෙසීමද
දුකක්ය; එසේය, රාත්‍රියේ පවා ඔහුගේ
සිතට නිවාඩු නොලැබෙයි. මේකත්
නිෂ්ඵලකමක්ය.

24 කා බී තමාගේ වැඩෙන් සැපය
භුක්තිවිඳින්ට තමාගේ ප්‍රාණයට
ඉඩදෙනවාට වඩා හොඳ යසසක්
මනුෂ්‍යයෙකුට නැත. මේකත් දෙවියන්-
වහන්සේගේ අතින් පැමිණෙන බව මම
25 දුටිමි. මක්නිසාද උන්වහන්සේගෙන්
වෙන්ව අනුභවකරන්ටත් සැප
භුක්තිවිඳින්ටත් කාට පුළුවන්ද?
26 දෙවියන්වහන්සේ තමන් ඉදිරියෙහි
යහපත්ව සිටින මනුෂ්‍යයාට ප්‍රඥාවත්
දැනගැන්මත් ප්‍රීතියත් දෙනසේක. නුමුත්
පව්කාරයාට, දෙවියන්වහන්සේ ඉදිරියෙහි
යහපත්ව සිටින අයට දෙන පිණිස,
[වස්තු] රැස්කර තැබීමේ වෙහෙසය දෙන-
සේක. මේකත් නිෂ්ඵලකමක්ව, හිස්වූ
උත්සාහයක්ව තිබේ.

## සියලු කාලයන් සහ ප්‍රස්තාවන් දෙවියන්වහන්සේ යටතේ බව

3 සෑම දේටම ප්‍රස්තාවක්ද අහසින්
යට තිබෙන සෑම කාරණාවලට
2 කාලයක්ද ඇත. උපදින්ට කාලයක් සහ
නසින්ට කාලයක්ය; සිටුවන්ට කාලයක්
සහ සිටෙවූ ඒවා උදුරාදමන්ට කාලයක්ය:
3 මරන්ට කාලයක් සහ සුවකරන්ට
කාලයක්ය: කඩාදමන්ට කාලයක් සහ
4 ගොඩනගන්ට කාලයක්ය: අඬන්ට
කාලයක් සහ සිනාසෙන්ට කාලයක්ය:
විලාපකියන්ට කාලයක් සහ නටන්ට
5 කාලයක්ය; ගල් අහකදමන්ට කාලයක්
සහ ගල් රැස්කරන්ට කාලයක්ය;
වැළඳගන්ට කාලයක් සහ වැළඳගැනීමෙන්
6 වලකින්ට කාලයක්ය: සොයන්ට
කාලයක් සහ නැතිවීමට අරින්ට
කාලයක්ය; තබාගන්ට කාලයක් සහ
7 අහකදමන්ට කාලයක්ය: ඉරන්ට
කාලයක් සහ මහන්ට කාලයක්ය:
නිශ්ශබ්දව සිටින්ට කාලයක් සහ
8 කථාකරන්ට කාලයක්ය: ප්‍රේමකරන්ට
කාලයක් සහ ද්වේෂකරන්ට කාලයක්ය;
යුද්ධයට කාලයක් සහ සමාදානයට
කාලයක්ය. යමක් කරන්නාට තමා 9
වෙහෙසෙන දෙයින් කවර ප්‍රයෝජනයක්ද?
දෙවියන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන්ට 10
කරන්ටදී තිබෙන වැඩ මම දුටිමි.
උන්වහන්සේ සියලු දේම ඒ ඒ කාලයට 11
සුදුසු ලෙස සලස්වා තිබේ. උන්වහන්සේ
*ලෝකයද ඔවුන්ගේ සිත්වල තබා තිබේ,
එහෙත් පටන්ගැන්මේ සිට කෙළවර දක්වා
දෙවියන්වහන්සේ කළ කාරණා මනුෂ්‍යයාට
දැනගන්ට බැරිය. ඔවුන් තමුන්ගේ 12
ජීවිතයේදී ප්‍රීතිවී යහපත කරගැනීමට
වඩා හොඳක් ඔවුන්ට නැති බව දනිමි.
තවද කොයි මනුෂ්‍යයෙක් නුමුත් කා 13
බී තමාගේ මුළු වෑයමේදී සැප
භුක්තිවිඳින්නේ නම් එය දෙවියන්-
වහන්සේගේ දීමනාවක්ය. දෙවියන්- 14
වහන්සේ කරන සියල්ල සදාකාලයටම
පවතින බව දනිමි. ඊට එකතුකරන්ට
කිසිවක් නැත, එයින් අඩුකරන්ටත්
කිසිවක් නැත. දෙවියන්වහන්සේ එය
කළේ මනුෂ්‍යයන් තමන්වහන්සේ
ඉදිරියෙහි භයවන පිණිසය. දැන් තිබෙන 15
දේ ඉහතත් තිබුණේය: වෙන්ට තිබෙන
දේ ඉස්සරත් තිබුණේය. දෙවියන්වහන්සේ
පහව ගිය දේ නැවත පමුණුවනසේක.
තවද ඉර යට විනිශ්චයේ ස්ථානයෙහිම 16
දුෂ්ටකමද යුක්තියේ ස්ථානයෙහිම
දුෂ්ටකමද තිබෙන බව දුටිමි. එවිට මම: 17
දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨයාත් දුෂ්ටයාත්
විනිශ්චයකරනවා ඇත; මක්නිසාද සියලු
කාරණාවලටත් සියලු වැඩවලටත්
කාලයක් පැමිණේයයි මාගේ සිතින්
සිතාගත්තෙමි.

## මනුෂ්‍යයා හා තිරිසනා අතරේ ඇති සමානකම

මනුෂ්‍ය පුත්‍රයන්ගේ කාරණා මෙසේ 18
වන්නේ දෙවියන්වහන්සේ ඔවුන්
සෝදිසිකරන පිණිසත් තමුන් තිරිසනුන්
බව ඔවුන්ට පෙනීයන පිණිසත්යයි
මාගේ සිතින් සිතාගත්තෙමි. මක්නිසාද 19

*නොහොත්, සදාකාලය.

මනුෂ්‍ය පුත්‍රයන්ට සිද්ධවෙන්නේ
තිරිසනුන්ට සිද්ධවෙන දේමය; ඔවුන්ට
සිද්ධවෙන්නේ එක දෙයක්ය. උන්
නසින්නාක්මෙන් ඔව්හුත් නසින්නෝය;
එසේය, සියල්ලන්ටම ඇත්තේ එක
හුස්මය; මෙසේ තිරිසනුන්ට වඩා
මනුෂ්‍යයාට වාසියක් නැත. මක්නිසාද
20 සියල්ලම නිෂ්ඵලකමක්ය. සියල්ලෝම
එකතැනකට යන්නෝය; සියල්ලෝම
පස්වලින් වූහ, සියල්ලෝම නැවත පස්වලට
21 හැරීයන්නෝය. මනුෂ්‍ය පුත්‍රයන්ගේ පණ
ඉහළට නැගී යනවාද කියාවත්
තිරිසනාගේ පණ පොළොව යටට
බසිනවාද කියාවත් දන්නේ කවුද?
22 මෙසේ මනුෂ්‍යයා තමාගේ වැඩවලින්
ප්‍රීතිවෙනවාට වඩා සැපයක් නැති බව
දුටිමි; ඒක ඔහුගේ කොටසය. මක්නිසාද
තමාට පසුව සිදුවන දේ දකින්ට ඔහු
ආපසු ගෙනෙන්නේ කවුද?

## දුක් පීඩාවලට සමහර හේතු

4 නැවත මම හැරී ඉර යට කෙරෙන
සියලුම පීඩා දුටිමි. එවිට පීඩා
ලබන්නන්ගේ කඳුළු දුටිමි, ඔවුන්
සනසන්නෙක්ද නොවීය; ඔවුන්ට පීඩා
කරන්නන්ගේ පක්ෂයට බලය තිබුණේය,
නුමුත් සනසන්නෙක් නොසිටියේය.
2 එබැවින් තවම ජීවත්ව සිටින්නන්ට වඩා
මැරී ගියාවූ අයගේ ස්වභාව යෙහෙකැයි
3 කීයෙමි. එසේය, ඒ දෙපක්ෂයටම වඩා
ඉර යට කෙරෙන නපුරු ක්‍රියා නුදුටුවාවූ,
තවම නූපන්නාවූ මනුෂ්‍යයා හොඳයයි
සිතීමි.
4 තවද සියලු ආකාර වෙහෙසත් සියලු
දක්ෂ වැඩත් නිසා මනුෂ්‍යයෙක් තමාගේ
අසල්වාසියාගෙන් ඊර්ෂ්‍යාව විඳින බව
දුටිමි. මේකත් නිෂ්ඵලකමක්ව හිස්වූ
5 උත්සාහයක්ව තිබේ. අඥනයා තමාගේ
අත් පෙරවාගන, *තමාගේම මාංසය
6 කන්නේය. වෙහෙසීමෙන්ද හිස්වූ
උත්සාහයෙන්ද දෑත පුරවාගන්නවාට
වඩා නිශ්චලකමෙන් එක මිටක්
පුරවාගන ඉඳීම හොඳය.
එකල මම හැරී තව නිෂ්ඵලකමක් ඉර 7
යට තිබෙන බව දුටිමි. තව කෙනෙක් 8
නැතුව තනිව සිටින්නෙක් ඇත්තේය; එසේය,
ඔහුට පුත්‍රයෙක්වත් සහෝදරයෙක්වත් නැත;
එහෙත් ඔහුගේ සියලුම වෙහෙසවලට
කෙළවරක් නැත, ඔහුගේ ඇස් වස්තුවෙන්
තෘප්තියට නොපැමිණෙයි. මම කා
උදෙසා වෙහෙසවී මාගේ ප්‍රාණයට සැප
නොදී සිටිම්දැයි ඔහු නොකියන්නේය.
මේකත් නිෂ්ඵලකමක්ව, එසේය, තදබල
වෙහෙසක්ව තිබේ. එක්කෙනෙකුට වඩා 9
දෙදෙනෙක් හොඳය; මක්නිසාද ඔවුන්ගේ
වෙහෙසෙන් ඔවුන්ට හොඳ විපාකයක්
ලැබෙන්නේය. ඔවුන් වැටුණොත් 10
එක්කෙනෙක් තමාගේ යහළුවා
නැගුටුවනවා ඇත. එහෙත් තමා
නැගුටුවන්ට කෙනෙක් නැතුව තනිව සිට
වැටෙන්නාට දුක්වෙයි. තවද දෙදෙනෙක් 11
එක්ව සැතපුණොත් ඔවුන්ට උණුහුම
ලැබෙන්නේය. නුමුත් තනි කෙනෙක්
උණුහුම්වෙන්නේ කොහොමද? යමෙක් 12
තනි කෙනෙකු පරදවන නුමුත් ඔහුට
විරුද්ධව සිටින්ට දෙන්නෙකුට පුළුවන්-
වෙයි; තුන්පට ලණුවක් ඉක්මනින්
නොකැඩෙන්නේය.
දනමුතුකම් ලබන්ට නොදන්නාවූ 13
අඥන මහලු රජෙකුට වඩා දුප්පත්
ප්‍රඥවන්ත යෞවනයෙක් හොඳය.
මක්නිසාද ඔහු රජවෙන්ට හිරගෙයින් 14
පිටතට ආයේය; එසේය, ඔහු තමාගේ
රාජ්‍යයෙහි දිළින්දෙක්ව උපන්නේය. ඉර 15
යට ඇවිදින ජීවමාන සියල්ලන්ම ඒ
තැනැත්තා වෙනුවට නැගිටින ඒ
යෞවනයා සමග සිටිනවා දුටිමි. ඔහු 16
කෙළවරක් නැති සෙනඟක් ඉදිරියෙහි
සිටියේය. එහෙත් පසුව එන්නෝ ඔහු
ගැන ප්‍රීති නොවන්නෝය. සැබවින්
මේකත් නිෂ්ඵලකමක්ව හිස්වූ
උත්සාහයක්ව තිබේ.

*එනම්–තමාගේ ජීවිතය නාස්තිකර ගන්නේය.

## බාරවල් ගැන උපදේශ

5 තුඹ දෙවියන්වහන්සේගේ ගෘහයට
යන විට තුඹේ පාද බලාගනින්න;
අඥනයන් මෙන් පූජා ඔප්පුකිරීමට වඩා
අසන්ට ළංවීම හොඳය. මක්නිසාද තමුන්
2 නපුර කරන බව ඔව්හු නොදනිති. තුඹේ
මුඛයෙන් ඉක්මන්කාර නොවන්න, තුඹේ
සිතද දෙවියන්වහන්සේ ඉදිරියෙහි
කාරණයක් නිකුත්කරන්ට ඉක්මන්
නොවේවා; මක්නිසාද දෙවියන්වහන්සේ
ස්වර්ගයෙහිය, තුඹ පොළොවෙහිය; ඒ
නිසා තුඹේ වචන ස්වල්ප වේවා.
3 මක්නිසාද ස්වප්නය කාරණා රාශියක්ද
අඥනයාගේ හඬ වචන රාශියක්ද ඇතුව
4 පැමිණෙන්නේය. තුඹ දෙවියන්වහන්සේට
බාරයක් වුණාම එය ගෙවන්ට ප්‍රමාද
නොවෙන්න; මක්නිසාද උන්වහන්සේ
අඥනයන් කෙරෙහි ප්‍රසන්න නැත. තුඹ
5 වුණ බාරය ගෙවාපන්න. තුඹ බාරයක්වී
නොගෙවා සිටිනවාට වඩා බාරයක්
6 නොවී සිටීම හොඳය. තුඹේ මාංසය
ලවා පව්කරවන්ට තුඹේ කටට
ඉඩනොදෙන්න; ඒක වැරදිල්ලකැයි
දේවදූතයා ඉදිරියෙහි නොකියන්න.
දෙවියන්වහන්සේ තුඹේ හඬට උදහස්ව
තුඹේ අත්වල කර්මාන්තය
7 නාස්තිකරන්ට ඕනෑ මන්ද? මක්නිසාද
ස්වප්න හා නිෂ්ඵලකම් රාශියකිනුත්
බොහෝ වචනවලිනුත් මෙසේ සිදුවේ.
එබැවින් තුඹ දෙවියන්වහන්සේට
භයවෙයන්න.

## දිළින්දගේ පීඩාව

8 දිළින්දට පීඩාකිරීමත් විනිශ්චයද
යුක්තියද පෙරළීමත් රටේ තිබෙන බව
තුඹ දකින විට ඒ කාරණාවට විස්මිත
නොවෙන්න. මක්නිසාද උත්තමයන්ට
වඩා උතුම් කෙනෙක් බලාගන්නසේක;
ඉතා උතුම් කෙනෙක් ඔවුන් කෙරෙහිද
9 සිටිනසේක. ඇරත් බිමේ ප්‍රයෝජනය
සියල්ලන්ටම වේ; රජ්ජුරුවෝ පවා
කෙතෙන් රක්ෂාවන්නාහ.

## ලෞකික සම්පත්වල නිෂ්ප්‍රයෝජනකම

රිදීයට ඇලුම්වෙන්නා රිදීයෙන්වත් 10
සම්පත්වලට ඇලුම්වෙන්නා ලාභයෙන්වත්
තෘප්තියට නොපැමිණෙයි. මේකත්
නිෂ්ඵලකමක්ය. දේපළ වැඩිවන විට ඒවා 11
භුක්තිවිඳින්නෝද වැඩිවෙති. ඒවා
අයිතිකාරයාට තමාගේ ඇස්වලින් ඒවා
බැලීම මිස එයින් ඇති ප්‍රයෝජනය
මොකද? වැඩකරන්නා ටිකක් කැවත් 12
හුඟක් කැවත් ඔහුගේ නින්ද මිහිරිය.
නුමුත් පොහොසතාගේ අධික තෘප්තිය
නිසා ඔහුට නිදාගන්ට බැරිය.
ඉර යට මා දුටු මහත් වරදක් තිබේ, 13
එනම් අයිතිකාරයා විසින් තමාට
අන්තරාය වන ලෙස වස්තුව
තබාගැනීමය. ඒ වස්තු යම් නපුරු 14
සිද්ධියකදී නැතිවෙයි; මෙසේ ඔහුට දරු
පුත්‍රයෙක් සිටියත් ඔහු අතේ කිසිත් නැත.
ඔහු තමාගේ මවුගේ කුසෙන් නික්ම ආ 15
ලෙසම නිර්වස්ත්‍රව නැවත යන්නේය,
තමාගේ අතින් ගෙනගිය හැකි කිසිවකුත්
තමාගේ වැඩෙන් ඔහු ගෙනයන්නේ නැත.
මේකත් මහත් වරදක්ය: සියලු 16
ආකාරයෙන්, ඔහු ආ ලෙසම ඔහු
යන්නේය. සුළඟ ගැන වෙහෙසවෙන්නාවූ
ඔහුට ඇති ප්‍රයෝජනය මොකද? ඔහුගේ 17
සියලු දවස්වල ඔහු අන්ධකාරයෙහි කෑම
කන්නේය, ඔහුට තද දුකද වේදනාවද
කෝපයද තිබේ.
බලව, මා දුටු කාරණයක් නම් 18
දෙවියන්වහන්සේ යමෙකුට දෙන්නාවූ
ඔහුගේ ජීවිතයේ සියලු දවස්වල කා බී,
ඔහු ඉර යට ගන්නාවූ තමාගේ සියලු
වෙහෙසවලින් සැපය භුක්තිවිඳීම හොඳව
සුදුසුව තිබෙන බවය. මක්නිසාද ඒක
ඔහුගේ කොටසය. තවද දෙවියන්වහන්සේ 19
යම් මනුෂ්‍යයෙකුට වස්තුද සම්පත්ද දී,
ඒවා භුක්තිවිඳින්ටත් තමාගේ කොටස
රැගෙන තමාගේ වැඩෙන් ප්‍රීතිවෙන්ටත්
බලය දී තිබේද? එය දෙවියන්වහන්සේගේ

20 දීමනාවක්ය. මක්නිසාද ඔහුගේ සිතේ
ප්‍රීතිය තැබීමෙන් දෙවියන්වහන්සේ ඔහුට
උත්තරදෙන බැවින් ඔහු තමාගේ
ජීවිතයේ දවස් වඩා සිහිකරන්නේ නැත.

## සැප විඳීමක් නැතුව යමක් අයිතිව තිබීම නිෂ්ඵල බව

6 ඉර යට මා දුටුවාවූ වරදක් තිබේ,
එය මනුෂ්‍යයන් කෙරෙහි මහත්
2 බරක්ව තිබේ. මනුෂ්‍යයෙක් ආශාවෙන
කොයි දෙයක්වත් ඔහුට නොලැබී
නොයන හැටියට දෙවියන්වහන්සේ ඔහුට
වස්තුද සම්පත්ද ගෞරවයද දෙන නුමුත්,
ඒවා භුක්තිවිඳින්ට ඔහුට බලය නොදෙන
බැවින්, අන්‍ය කෙනෙක් ඒවා
භුක්තිවිඳින්නේය. මේක නිෂ්ඵලකමක්ය,
3 බලවත් ආබාධයක්ය. මනුෂ්‍යයෙකුට දූ
දරුවන් සියයක් උපන්නත්, ඔහු බොහෝ
අවුරුදු ජීවත්වුණත්, ඔහුගේ අවුරුදු
ගණන වැඩිවුණත්, ඔහුගේ ප්‍රාණය
සැපයෙන් තෘප්තියට පැමිණෙන්නේවත්
ඔහුට වැළලීමක් ලැබෙන්නේවත් නැත්නම්,
ඔහුට වඩා ගස්සාවීමක් හොඳයයි
4 කියමි. මක්නිසාද එය නිෂ්ඵල ලෙස
පැමිණ අන්ධකාරයට යයි, ඒකේ නමද
5 අන්ධකාරයෙන් වසනු ලබන්නේය; තවද
ඒක ඉර දුටුවේවත් දැනගත්තේවත් නැත;
ඔහුට වඩා එයට නිශ්චලය තිබේ.
6 එසේය, ඔහු සැපය භුක්ති නොවිඳ අවුරුදු
දෙදහසක් ජීවත්වෙතත්, සියල්ලන් එක
7 තැනකට යනවා නොවේද? මනුෂ්‍යයාගේ
මුළු වෙහෙසීම ඔහුගේ කට උදෙසාය,
එහෙත් ඔහුගේ ආශාව පූර්ණනොවේ.
8 මක්නිසාද අඥානයාට වඩා ප්‍රඥාවන්තයාට
ඇති වාසිය කුමක්ද? ජීවත්වෙන්නන්
ඉදිරියෙහි හැසිරෙන්ට දන්න දුප්පතාටත්
9 ඇති වාසිය කුමක්ද? සිත ආශාවෙන
ඒවාට වඩා ඇස්වලට පෙනෙන ඒවා
හොඳය. මේකත් නිෂ්ඵලකමක්ව හිස්වූ
උත්සාහයක්ව තිබේ.
යමක් තිබුණේද ඒකේ නම පුරාණයේදීම 10
දෙනලද්දේය, ඒ එනාහි මනුෂ්‍යයා බවත්
ඔහුට වඩා බලවත් තැනැත්වහන්සේ
සමග විවාදකරන්ට ඔහුට බැරි බවත්
දැනගන්නාලද්දේය. මක්නිසාද නිෂ්ඵලකම 11
වැඩිකරන බොහෝ දේ තිබේ; මනුෂ්‍යයාට
එයින් ඇති වාසිය මොකද? මනුෂ්‍යයාගේ 12
ජීවිතයෙහි එනම් ඔහු සෙවණැල්ලක්
මෙන් ගතකරන ඔහුගේ නිෂ්ඵල ජීවිතයේ
දවස්වල ඔහුට හොඳව තිබෙන්නේ
කිමෙක්දැයි දන්නේ කවුද? නොහොත්
මනුෂ්‍යයෙකුට ඔහුගෙන් පසුව ඉර යට
සිදුවන්නේ කුමක්ද කියා දන්වන්ට
පුළුවන් කාටද?

## නොයෙක් ගුරුපදේශ

7 හොඳ නාමයක් අනර්ඝ තෛලයට
වඩා උතුම්ය; උපන් දවසට වඩා
මැරෙන දවස හොඳය. මංගල්‍ය ගෙදරට 2
යාමට වඩා වැලපීමේ ගෙදරට යාම
හොඳය. මක්නිසාද එය සියලු
මනුෂ්‍යයන්ගේ අන්තිමය වේ; ජීවත්ව
සිටින්නා ඒක සිතට ගන්නවා ඇත.
සිනාසීමට වඩා ශෝකවීම හොඳය. 3
මක්නිසාද මුහුණේ දුඃඛිතකමෙන්
ආත්මයට හොඳක් සිදුවේ. ප්‍රඥාවන්තයන්ගේ 4
සිත වැලපීමේ ගෙදරද අඥානයන්ගේ සිත
ප්‍රීතිවීමේ ගෙදරද තිබේ. අඥානයන්ගේ 5
ගීතිකාව ඇසීමට වඩා ප්‍රඥාවන්තයාගේ
තරවටුව ඇසීම මනුෂ්‍යයෙකුට හොඳය.
මක්නිසාද සැළිය යට තිබෙන කටුදරවල 6
ශබ්දය යම්සේද අඥානයාගේ සිනාවත්
එසේමය. ඒකත් නිෂ්ඵලකමක්ය. සැබවින්ම 7
බලාත්කාරය නිසා ප්‍රඥාවන්තයා
මෝඩවන්නේය; අල්ලසක් සිත
මුළාකරන්නේය. යම් දෙයක අන්තිමය 8
එහි පටන්ගැන්මට වඩා හොඳය. උඩඟු
අයට වඩා ඉවසිලිවන්තයා උතුම්ය.
කෝපවීමට තුඹේ සිතින් ඉක්මන් 9
නොවෙන්න. මක්නිසාද කෝපය පවතින්නේ
අඥානයන්ගේ ළයෙහිය. පළමු දවස් 10

මේවාට වඩා හොඳව තිබුණේ මොන
කාරණයක් නිසාදැයි නොකියන්න;
මක්නිසාද තුඹ මේ ගැන ප්‍රඥාවෙන්
11 යුක්තව විමසනවා නොවේ. ප්‍රඥාව
උරුමයක් මෙන් හොඳය; එසේය, ඉර
දකිනවුන්ට එය මහත් වාසියක්ය.
12 මක්නිසාද මුදල ආරක්ෂාවක්
වන්නාක්මෙන් ප්‍රඥාවත් ආරක්ෂාවක්ය.
නුමුත් දැනගැන්මෙහි වාසියක් තිබේ, ප්‍රඥාව
වනාහි එය ඇත්තාගේ ජීවිතය
13 ආරක්ෂාකරන්නේය. දෙවියන්වහන්සේගේ
වැඩය මෙනෙහිකරපන්න; මක්නිසාද
උන්වහන්සේ ඇදකළ දේ ඇද අරින්ට
14 පුළුවන් කාටද? සම්පත්ති කාලයේදී
ප්‍රීතිවෙයන්න; නුමුත් විපත්ති කාලයේදී
කල්පනාකරපන්න. දෙවියන්වහන්සේ
ඒකත් මේකත් ළංකොට තැබුවේ
මනුෂ්‍යයා විසින් තමාට පසුව
සිදුවෙන්නාවූ කිසිවක් දැනනොගන්න
පිණිසය.

15 මාගේ නිෂ්ඵලකමේ දවස්වලදී මේ
සියල්ල දුටිමි. සමහරවිට ධර්මිෂ්ඨයෙක්
තමාගේ ධර්මිෂ්ඨකමෙහි නැතිවන්නේය,
දුෂ්ටයෙක්ද තමාගේ දුෂ්ටකමෙහි
16 බොහෝ කල් ජීවත්වන්නේය. පමණට
වඩා ධර්මිෂ්ඨයෙක් නොවෙන්න; පමණට
වඩා ඥානවන්තයෙක්ද නොවෙන්න. කුමක්
නිසා තුඹම විනාශකරගන්නෙහිද?
17 පමණට වඩා දුෂ්ටව නොසිටින්න,
අඥානයෙක්ද නොවෙන්න. තුඹේ
කාලයට පළමුවෙන් තුඹට නසින්ට
18 වෙන්නේ මක්නිසාද? තුඹ මෙය
අල්වාගන්නවා නම් හොඳය; එසේය,
අනික් එකෙනුත් තුඹේ අත පහකර
නොගනින්න. මක්නිසාද දෙවියන්වහන්සේ
කෙරෙහි භය ඇත්තා ඒ සියල්ලෙන්
ගැළවෙනවා ඇත.

19 ප්‍රඥාව වනාහි නුවරක වසන අධිපතීන්
දස දෙනෙකුට වඩා ඥානවන්තයාට
20 ශක්තියක්ය. පව් නොකර යහපතම
කරන ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් සැබවින්ම
පොළොවෙහි නැත. මනුෂ්‍යයන් කියන 21
සියලුම වචනවලට තුඹේ සිත යොමු
නොකරන්න; එසේ කළොත් සමහරවිට
තුඹේ වැඩකාරයා තුඹට දෙස්කියන
බව තුඹ අසනවා ඇත. මක්නිසාද තුඹත් 22
නොයෙක් වර අනුන්ට දෙස් කිවූ බව
තුඹේ සිත දන්නේය.

මේ සියල්ල මම ප්‍රඥාවෙන් සෝදිසි 23
කෙළෙමි. මම ප්‍රඥාවන්තවන්නෙමියි
කීමි; නුමුත් එය මාගෙන් දුරව තිබුණේය.
දුරව ඉතා ගැඹුරුව තිබෙන දේ සොයා 24
දැනගන්නේ කවුද? මම ප්‍රඥාවද කාරණාවල 25
හේතුවද දැනගන්ටත් සෝදිසිකරන්ටත්
සොයාගන්ටත්, දුෂ්ටකම අඥානකම බවද
මෝහය උමතුකම බවද දැනගන්ටත්
මාගේ සිතින් හැරුණෙමි. එවිට මලපත් 26
සහ දැල් වැනි සිතක්ද බැඳුම් වැනි අත්ද
ඇති ස්ත්‍රිය මරණයට වඩා තික්ත බව
දැනගතිමි. දෙවියන්වහන්සේ ඉදිරියෙහි
යහපත්ව සිටින්නා ඇගෙන් ගැළවෙන්නේය;
නුමුත් පව්කාරයා ඇට අසුවන්නේය.
බලව, කාරණය දැනගන්න පිණිස එකක් 27
එකක් පාසා විමසමින්: මේක මම
දැනගතිමියි දේශනාකාරයා කියන්නේය.
මට සම්බනුණාවූ, මාගේ සිත තවමත් 28
සොයන්නාවූ, කාරණයක් මෙසේය:
දහසක් අතරෙහි එක මිනිහෙක් මට
සම්බවුණ නුමුත් එපමණ දෙනෙක්
අතරෙහි එක ස්ත්‍රියක් මට සම්බනොවීය.
මෙන්න, මෙය පමණක් මට සම්බවිය, 29
එනම් දෙවියන්වහන්සේ මනුෂ්‍යයා ඇද
නැතුව මැවූසේක; නුමුත් ඔවුන් බොහෝ
අමුතු උපා යොදගත් බවය.

## රාජාඥා සැලකීම

8 ප්‍රඥාවන්තයාට සමාන කවරෙක්ද?
කාරණයක අර්ථය දන්නේ කවුද?
මනුෂ්‍යයෙකුගේ ප්‍රඥාව නිසා ඔහුගේ
මුහුණ පැහැපත්වන්නේය, ඔහුගේ මුහුණේ
රළුකමද වෙනස්වන්නේය. රජුගේ ආඥාව 2
රක්ෂාකරන්ට තුඹ දෙවියන්වහන්සේට

දිවුරුම් දුන් නිසා එසේ කරන්ට මම
3 නුඹට අවවාදකරමි. ඔහු ඉදිරියෙන්
යන්ට ඉක්මන් නොවන්න; නපුරු දෙයක
නොපවතින්න. මක්නිසාද ඔහු කැමති
කොයි දෙයක් නුමුත් ඔහු කරනවා ඇත.
4 එසේය, රජුගේ වචනය බල සහිතය;
ඔබ මක්කරනවාදැයි ඔහුට කියන්නේ
5 කවුද? ආඥාව රක්ෂාකරන්නා අනතුරක්
නොවිඳින්නේය; ප්‍රඥාවන්තයාගේ සිතද
6 කාලයත් විනිශ්චයත් දන්නේය. මක්නිසාද
හැම කාරණයටම කාලයකුත් විනිශ්චයකුත්
තිබේ; එසේය, මනුෂ්‍යයාගේ දුක ඔහු
7 කෙරෙහි මහත්ව තිබේ. මක්නිසාද මතු
සිදුවෙන්නේ මොකද කියා ඔහු
නොදනියි; ඒක වෙන්නේ කොහොමද
8 කියා ඔහුට දන්වන්නේ කවුද? ප්‍රාණය
නවත්වාගන්න හැටියට ප්‍රාණය කෙරෙහි
බලය ඇති කෙනෙක් නැත; මරණයේ
දවස කෙරෙහි බලය ඇති කෙනෙකුත්
නැත; ඒ යුද්ධයෙන් මිදීමකුත් නැත.
දුෂ්ටකම්කරන්නාද දුෂ්ටකම නිසා
9 නිදහස්වෙන්නේ නැත. මේකී සියල්ලම
මම දැක, ඉර යට කෙරෙන සියලු
වැඩවලට මාගේ සිත යොමුකෙළෙමි.
මනුෂ්‍යයන්ට අනතුරු වෙන හැටියට
මනුෂ්‍යයෙකු විසින් ඔවුන් කෙරෙහි
ආණ්ඩුකරන කාලයක් තිබේ.
10 තවද දුෂ්ටයන් තැන්පත්කරනු ලබන
බවද ඔවුන් මිනීවළට පැමිණෙන බවද
යුක්තිය ඉෂ්ටකළ අය ශුද්ධස්ථානයෙන්
ඉවත්ව ගොස් නුවරෙහි මතකනැතිකරනු
ලබන බවද දුටිමි. මේකත් නිෂ්ඵලකමක්ය.

## දිව්‍ය ආණ්ඩුවේ ගුප්තභාවය

11 නපුරු ක්‍රියාවකට විරුද්ධව නඩු තීන්දුව
ඉක්මනින් ඉෂ්ට නොවන නිසා මනුෂ්‍ය
පුත්‍රයන්ගේ සිත් නපුර කිරීමට ඔවුන්
12 තුළ නිර්භීතවන්නේය. පව්කාරයෙක් සිය
වරක් නපුර කර බොහෝකල් ජීවත්වුණත්,
දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට
එනම් උන්වහන්සේ ඉදිරියෙහි
භයවෙන්නන්ට යහපත සිද්ධවෙන බව
සැබවින් දනිමි. නුමුත් දුෂ්ටයා දෙවියන්- 13
වහන්සේ ඉදිරියෙහි භය නොවන බැවින්
ඔහුට යහපත සිද්ධවෙන්නේවත්
සෙවණැල්ලක් වැනි ඔහුගේ දවස්
දීර්ඝවෙන්නේවත් නැත. පොළොවෙහි 14
කෙරෙන නිෂ්ඵලකමක් ඇත; එනම්
සමහරවිට දුෂ්ටයන්ගේ ක්‍රියාවේ හැටියට
ධර්මිෂ්ඨයන්ට සිද්ධවීමත් ධර්මිෂ්ඨයන්ගේ
ක්‍රියාවේ හැටියට දුෂ්ටයන්ට සිද්ධවීමත්ය.
මේකත් නිෂ්ඵලකමක්යයි කීමි. එවිට 15
ප්‍රීතිය හොඳයයි සිතුවෙමි, මක්නිසාද
කා බී ප්‍රීතිවීමට වඩා ඉර යට
මනුෂ්‍යයාට හොඳ දෙයක් නැත්තේය.
දෙවියන්වහන්සේ ඉර යට ඔහුට දෙන
ඔහුගේ ජීවිතයේ දවස්වල ඔහුගේ
වෙහෙසීමෙන් ඔහුට ඉතිරිවන්නේ ඒකය.
ප්‍රඥාව දැනගන්ටත් පොළොවෙහි 16
කෙරෙන වැඩ දකින්ටත් මාගේ සිත
යොමුකෙළෙමි. (මක්නිසාද දවල්වත් රෑවත්
තමාගේ ඇස්වලින් නින්ද නොදකින
කෙනෙක් ඇත.) එවිට මම දෙවියන්- 17
වහන්සේගේ මුළු වැඩය වන ඉර යට
කෙරෙන වැඩය මනුෂ්‍යයාට තේරුම්ගන්ට
බැරි බව දුටිමි. මක්නිසාද මනුෂ්‍යයා
ඒක සොයා දැනගන්ට කොපමණ
උත්සාහකළත් ඒක තේරුම්ගන්ට
පුළුවන්වෙන්නේ නැත; ප්‍රඥාවන්තයා ඒක
දැනගන්ට සිතන නුමුත් ඔහුට පවා
තේරුම්ගන්ට බැරිවන්නේය.

9

මක්නිසාද මේකී සියල්ල මාගේ
සිතේ තබාගෙන ඒ සියල්ලද සෝදිසි
කෙළෙමි; එනම් ධර්මිෂ්ඨයන්ද ප්‍රඥා-
වන්තයන්ද ඔවුන්ගේ ක්‍රියාද දෙවියන්-
වහන්සේගේ අතේ පවතින නුමුත් එයින්
උන්වහන්සේගේ ප්‍රේමයවත් වෛරයවත්
මනුෂ්‍යයා නොදන්නා බවය. සියල්ල
ඔවුන් ඉදිරියෙහි තිබේ. සියලු දේ 2
සියල්ලන්ට ඒකාකාරයෙන් සිදුවන්නේය.
ධර්මිෂ්ඨයාට සහ දුෂ්ටයාටත් යහපත්
අයට සහ පවිත්‍ර අයටත් අපවිත්‍ර අයටත්

පූජාකරන්නාට සහ පූජා නොකරන්නාටත් සිද්ධවෙන්නේ එක දෙයක්ය. යහපත් මනුෂ්‍යයා සහ පව්කාරයාත් දිවුරන්නා සහ දිවුරුමට භය ඇත්තාත් ඒකාකාරය.
3 ඉර යට කෙරෙන සියල්ල අතරේ ඇති නරකක් නම් සියල්ලන්ට එක සිද්ධියක් ඇතිවීමය. එසේ මනුෂ්‍ය පුත්‍රයන්ගේ සිත් නපුරෙන් පිරී ඔවුන් ජීවත්වන තෙක් මෝහය ඔවුන්ගේ සිත්වල තිබේ, ඉන්පසු
4 ඔව්හු මළවුන් ළඟට යන්නෝය. ජීවත්වන සියල්ලන්ට බලාපොරොත්තුවක් තිබේ. එසේය, මළ සිංහයෙකුට වඩා පණඇති
5 බල්ලෙක් හොඳය. මක්නිසාද ජීවත්වන්නෝ තමුන් නසින්ට ඕනෑ බව දනිති. මළාහු කිසිවක් නොදනිති, ඔවුන්ට තවත් කිසි විපාකයක් නැත; මක්නිසාද ඔවුන් ගැන
6 සිහිවීම නැතිවිය. ඔවුන්ගේ ප්‍රේමයද වෛරයද ඊර්ෂ්‍යාවද දැන් නැතිවී තිබේ. ඉර යට කෙරෙන සියල්ලෙන් තවත් සදාකාලයටම ඔවුන්ට කොටසක් නැත.

## කාලික සැප භුක්තිවිඳීම සහ කඩිසරකම

7 තුඹ ගොස් ප්‍රීතියෙන් තුඹේ කෑම කා තුෂ්ටිමත් සිතින් තුඹේ මුද්‍රිකපානය බීපන්න; මක්නිසාද දෙවියන්වහන්සේ තුඹේ වැඩවලට දැන් ප්‍රසන්නව සිටින-
8 සේක. තුඹේ වස්ත්‍ර නිතරම සුදුව තිබේවා; තුඹේ ඉස තෙල් නැතුව නොතිබේවා.
9 තුඹේ සියලු නිෂ්ඵල දවස්වල, උන්වහන්සේ ඉර යට තුඹට දී තිබෙන තුඹේ නිෂ්ඵල ජීවිතයේ සියලු දවස්වල, තුඹ ප්‍රේමකරන තුඹේ භාර්යාව සමග ජීවිතය භුක්තිවිඳපන්න. මක්නිසාද ජීවිතයෙන්ද ඉර යට තුඹ ගන්නාවූ තුඹේ වෙහෙසෙන්ද තුඹට ලැබෙන
10 කොටස ඒකය. කරන්ට තුඹේ අතට සම්බවෙන සියල්ලම තුඹේ වීර්යයෙන් කරපන්න; මක්නිසාද තුඹ යන *මිනීවළෙහි වැඩක්වත් යෝජනාවක්වත් දැනගැන්මවත් ප්‍රඥාවවත් නැත.

*මෙයෝලෙහි

## ඥානය හොඳය, නුමුත් එහි විපාකය සත්තක නැත

නැවත, මම වනාහි ඉර යට දිවීමේ දිනුම 11
ශීඝ්‍ර අයටවත් යුද්ධයේ ජය බලවන්තයන්ටවත් කෑම ප්‍රඥාවන්තයන්ටවත් වස්තුව තේරුම් ඇත්තන්ටවත් කරුණාව දැනගැන්ම ඇත්තන්ටවත් ලැබෙනවා නොව, කාලයත් හදිසි කාරණාත් ඔවුන් සියල්ලන්ට
සිද්ධවෙන බව දුටිමි. මක්නිසාද නපුරු 12
දැලකට අසුවෙන මත්ස්‍යයන්ද මලපතකට අසුවෙන පක්ෂීන්ද මෙන් මනුෂ්‍යයාත් තමාගේ කාලය නොදැන සිටියි, විපත්ති කාලය මනුෂ්‍ය පුත්‍රයන් පිටට හදිසියෙන් පැමිණෙන විට උන් වාගේ ඔව්හු ඊට අසුවෙති.
ඉර යට මෙයාකාර ප්‍රඥාවක් දුටිමි, 13
එය මට මහත්ව පෙනුණේය. මනුෂ්‍යයන් 14
ස්වල්ප දෙනෙක් ඇති කුඩා නුවරක් විය; මහත් රජෙක් ඊට විරුද්ධව ඇවිත්, එය වටලාගෙන, ඊට විරුද්ධව මහත්
බලකොටු ගොඩනැගුවේය. එහි දිළිඳුවූ 15
ප්‍රඥාවන්ත මනුෂ්‍යයෙක් සිටියේය, ඔහු තමාගේ ප්‍රඥාවෙන් ඒ නුවර ගැළෙවුවේය. එහෙත් කිසිවෙක් ඒ දිළිඳු මනුෂ්‍යයා
සිහිකළේ නැත. එවිට මම: බලවන්තකමට 16
වඩා ප්‍රඥාව හොඳයයි කීවෙමි. එහෙත් දිළින්දාගේ ප්‍රඥාව සුළුකරනු ලැබේ, ඔහුගේ වචනද අසනු නොලැබේ.
අඥානයන් අතරේ ආණ්ඩුකරන්නාගේ 17
කෑගැසීමට වඩා නිශ්චලකමෙන් කියන ප්‍රඥාවන්තයන්ගේ වචන අසනු ලැබේ.
යුද්ධායුධවලට වඩා ප්‍රඥාව වටනේය. 18
නුමුත් එක පව්කාරයෙක් හොඳ බොහෝ කාරණා නැතිකරයි. මළ

10

මැස්සන් නිසා තෛල මිශ්‍රකරන්නාගේ තෙල් ගඳගසා නරක් වේ. එසේම ප්‍රඥාවටත් ගෞරවයටත් වඩා ස්වල්ප
මෝඩකමක් බරය. *ප්‍රඥාවන්තයාගේ 2
හෘදය ඔහුගේ දකුණු පැත්තෙහි තිබේ;

*එනම්–ප්‍රඥාවන්තයාගේ සිත හරි දේටද අඥානයාගේ සිත වැරදි දේටද යොමුවෙයි යනුයි.

තුමුත් අඥානයාගේ හෘදය ඔහුගේ වම්
3 පැත්තෙහිය. එසේය, මෝඩයා මාර්ගයෙහි
යන විට ඔහුගේ සිහිය මදිවී, තමා
මෝඩයෙක්යයි සියල්ලන්ට කියන්නේය.
4 ආණ්ඩුකාරයාගේ සිත තුඹට විරුද්ධව
ඇවිස්සුණොත්, තුඹේ ස්ථානය අත්හැර
නොයන්න; මක්නිසාද මෘදුකමෙන්
5 ලොකු වැරදි වැලකීයයි. අධිපතියා
ඉදිරියෙන් නික්මෙන වැරැද්දක් වන ඉර
6 යට කෙරෙන නරකක් දුටිමි. එනම්,
අඥනකම බොහෝ උසස් ස්ථානවල
පිහිටුවා තිබියදී, උත්තමයන් පහත් තැන
7 ඉන්න බවය. වැඩකාරයන් අශ්වයන්
පිට යනවාත් අධිපතීන් වැඩකාරයන්
මෙන් පයින් යනවාත් දුටිමි.

## ඥනය ගැන නොයෙක් හිතෝපදේශ

8 වළක් හාරා තබන්නා එහි වැටෙන්නේය;
තාප්පයක් කඩන්නාට සර්පයෙක්
9 දෂ්ටකරයි. ගල් කපන්නාට එයින්
තුවාලවෙයි; ලී පළන්නාට එයින්
10 අන්තරාය සිදුවෙයි. යකඩ මොට්ටවූ
විට මුවහත් නොකළොත් වඩා ශක්තිය
යොදන්ට ඕනෑය. ප්‍රඥව වනාහි සඵලය
11 දෙන වාසි ඇති දෙයකි. මතුරන්ට
පළමුවෙන් සර්පයා දෂ්ටකළොත්
මතුරන්නාගෙන් ප්‍රයෝජන නැත.
12 ප්‍රඥවන්තයාගේ මුඛයේ වචන ප්‍රසන්නය;
තුමුත් අඥනයාගේ තොල් ඔහු
13 විනාශකරයි. ඔහුගේ මුඛයේ වචනවල
පටන්ගැන්ම අඥනකමය. ඔහුගේ
කථාවේ තීන්දුවද අන්තරාදයක
14 මෝඩකමය. අඥනයා වචන වැඩිකරයි.
මනුෂ්‍යයා මතු සිදුවන දේ නොදනියි;
ඔහුට පසුව සිදුවන දේ ඔහුට දන්වන්නේ
15 කවුද? අඥනයන්ගේ වැඩ හැමදෙනාටම
වෙහෙසක් වන්නේය, මක්නිසාද ඔහු
16 නුවරට යන්ටවත් දන්නේ නැත. එම්බා
දේශය, තුඹේ රජ බාලයෙක්ව සිටින
විටද, තුඹේ අධිපතීන් උදෑසනම කෑම
17 කන විටද, තුඹට දුක් වේ! එම්බා දේශය,
තුඹේ රජ වංශවත් දරුවෙක් වන විටද,
තුඹේ අධිපතීන් ගිජුකමට නොව ශක්තිය
පිණිස නිසි වේලාවට කෑම කන විටද,
තුඹ වාසනාවන්තය! කම්මැළිකම නිසා 18
වහල දිරා වැටෙන්නේය; අත්වල
අලසකම නිසා ගෙය තෙමෙන්නේය.
සිනාසීම පිණිස භෝජන පිළියෙළකරනු 19
ලැබේ, මුද්‍රිකපානයද ජීවිතය ප්‍රීතිකරයි.
තවද මුදලෙන් සියලු දේ ඉෂ්ටවෙයි.
තුඹේ සිතෙන්වත් රජුට දෙස් 20
නොකියන්න; තුඹේ සැතපෙන ගෙයිදීවත්
වස්තුකාරයන්ට දෙස් නොකියන්න.
මක්නිසාද ආකාශයේ පක්ෂියෙක් ඒ
හඬ ගෙනයනවා ඇත, පියාපත් ඇති
සතෙක්ද කාරණය දන්වනවා ඇත.

11
තුඹේ ආහාර ජලය මතුපිට
දමාපන්න. කුමක්හෙයින්ද බොහෝ
දවසකට පසු ඒවා තුඹට නැවත
සම්බවෙයි. සත්දෙනෙකුට වුණත් අට 2
දෙනෙකුට වුණත් කොටසක් දීපන්න;
මක්නිසාද පොළොවෙහි මොන විපත්තියක්
සිද්ධවේද කියා තුඹ නොදන්නෙහිය.
වලාකුල් පිරී තිබෙන විට වැස්ස 3
පොළොවට වැගිරෙන්නේය. ගසක්
දකුණට හෝ උතුරට හෝ වැටුණොත්
ඒක වැටෙන තැනම තිබෙයි. හුළඟ 4
බලාසිටින්නා නොවපුරන්නේය; වලාකුල්
බලන්නා කපා නොගන්නේය. සුළඟේ 5
මාර්ගය කොහේද කියාවත් ගර්භිණියගේ
කුසේ ඇට සෑදෙන්නේ කෙසේද කියාවත්
තුඹ නොදන්නාක්මෙන් සියල්ල කරන
දෙවියන්වහන්සේගේ වැඩත් තුඹ
නොදන්නෙහිය. උදයේ තුඹේ බීජ 6
වපුරාපන්න, සවසත් තුඹේ අත නවත්වා
නොගනින්න. මක්නිසාද සඵලවෙන්නේ
ඒවාද නොහොත් මේවාද නොහොත්
දෙවගේම ඒකාකාර හොඳ වේද කියා
තුඹ නොදන්නෙහිය. සැබවින් එළිය 7
මිහිරිය, ඉර දකීම ඇස්වලට ප්‍රසන්න
දෙයක්ය. එසේය, මනුෂ්‍යයෙක් බොහෝ 8
අවුරුදු ජීවත්ව සිටියොත් ඔහු ඒ
සියල්ලෙහි ප්‍රීතිවේවා; එහෙත් ඔහු අඳුරු
දවස් සිහිකෙරේවා, මක්නිසාද ඒවා
බොහෝ වන්නේය. පැමිණෙන සියල්ලම
නිෂ්ඵලකමක්ය.

## තරුණ වයසේ ප්‍රස්තාවයන් අල්ලාගත යුතු බව

9 තරුණය, නුඹේ යෞවන වයසේදී
ප්‍රීතිවෙයන්න; නුඹේ යෞවන දවස්වල
නුඹේ සිත නුඹ සන්තෝෂකෙරේවා, නුඹේ
සිතේ මාර්ගවලත් නුඹේ ඇස්වලට
පෙනෙන හැටියටත් හැසිරියන්න. නුමුත්
මේ සියල්ල ගැන දෙවියන්වහන්සේ නුඹ
විනිශ්චයට පමුණුවන බව දැනගනින්න.
10 එසේ නුඹේ සිතෙන් ශෝකය පහකර
නුඹේ මාංසයෙන් දුක දුරුකරපන්න.
මක්නිසාද යෞවන කාලයත් පුරුෂ
අවස්ථාවත් නිෂ්ඵලකමය. තවද නුඹේ
12 යෞවන දවස්වලදී නුඹේ
මැවුම්කාරයා සිහිකරපන්න,
මක්නිසාද විපත්ති දවස් පැමිණෙන්නේය,
මට ඒවා ප්‍රිය නැතැයි නුඹ කියන දවස්ද
2 ළංවන්නේය. ඉරත් එළියත් සඳත්
තාරකාත් අඳුරුවන්නේය, වැස්සට පසුව
3 වලාකුල් හැරී එන්නේය. ඒ කාලයෙහි
ගෙයි රැකවල්ලු වෙවුලන්නෝය,
බලවන්තයෝ නැමෙන්නෝය, අඹරන්නෝ
ස්වල්ප බැවින් නවතින්නෝය, කවුළුවලින්
4 බලන්නෝ අඳුරුවන්නෝය; වීදියේ
දෙරවල් වසනු ලබන්නේය, ඇඹරීමේ
ශබ්දය බාලවන්නේය, ඔහු කුරුල්ලාගේ
හඬට නැගිටින්නේය, ගීතිකා කියන සෑම
5 දූවරුද බෙලහීනවන්නෝය; ඔව්හු උස්වූ
දෙයට භයවන්නෝය, භයානකකම්ද
මාර්ගයෙහි වන්නේය; කොට්ටම්බා ගස
මල්ගන්නේය, පළහැටියා බරක් වන්නේය,
ආශාව පහවන්නේය. මක්නිසාද මනුෂ්‍යයා
තමාගේ සදාකාල ගෙට යන්නේය,
විලාපකියන්නෝද වීදිවල ඇවිදින්නෝය.
6 රිදී ලනුව ලිහී රන් භාජනය පොඩිවෙන්ටත්,
උල්පතේදී කළය බිඳෙන්ටත්, ළිඳේ චක්‍රය
කැඩෙන්ටත්, දූවිල්ල තිබුණු හැටියට 7
පොළොවට හැරියන්ටත්, ආත්මය ඒක
දුන් දෙවියන්වහන්සේ වෙතට හැරියන්-
ටත් පළමුවෙන් උන්වහන්සේ සිහි-
කරපන්න. නිෂ්ඵලකම්වල නිෂ්ඵලකමය, 8
සියල්ල නිෂ්ඵලකමයයි දේශනාකාරයා
කියන්නේය.

## අවසානය

තවද දේශනාකාරයා ප්‍රඥාවන්තව සිටි 9
නිසා ඔහු සෙනඟට තවත් දැනගැන්ම
ඉගැන්වූවේය; එසේය, ඔහු බොහෝ
උපදේශ සෝදිසිකොට, සොයාගෙන,
පිළියෙළකෙළේය. දේශනාකරන ප්‍රිය- 10
වචන සොයාගන්ට උත්සාහකෙළේය,
ලියා තිබෙන ඒවාද හරිවූ සත්‍යවූ
කාරණාය.
ප්‍රඥාවන්තයාගේ වචන කෙවිට්වලටද 11
ඔහුගේ උපදේශ සංග්‍රහය හොඳට ගසා
තැබූ ඇණවලටද සමානය, ඒවා එක
එඬේරෙකු විසින් දෙනලද්දේය. තවද 12
මාගේ පුත්‍රය, මෙයින් දැනමුතුකම්
ලබාපන්න. බොහෝ පොත් සෑදීමේ
කෙළවරක් නැත; බොහෝ ඉගෙන-
ගැන්මෙන්ද මාංසයට වෙහෙස
පැමිණෙන්නේය.
සියල්ල අසනලදී, මුළු කාරණයේ 13
තීන්දුව නම් මේය: දෙවියන්වහන්සේට
භයව උන්වහන්සේගේ ආඥා පවත්වාපන්න;
මේ වනාහි සියලු මනුෂ්‍යයන්ගේ
යුතුකමය. මක්නිසාද යහපත් වේවා, 14
නපුරු වේවා, සියලු ක්‍රියාද සියලු
රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට
පමුණුවනසේක.

# සාලමොන්ගේ ගීතිකාව

හෙවත්

# ගීතිකාවන්ගෙන් උතුම් ගීතිකාව

---

### ප්‍රේමවන්තයන්ගේ හිතේසි ආදරය

1 සාලමොන්ගේ උතුම් ගීතිකාවය.

2 *ඔහු තමාගේ මුඛයේ සිඹීම්වලින් මා
සිඹීවා.
මක්නිසාද නුඹේ ප්‍රේමය මුද්‍රිකපානයට
වඩා හොඳය.
3 නුඹේ විලවුන් මිහිරි සුවඳින් යුක්තය;
නුඹේ නාමය වැගිරෙවූ විලවුන්
මෙන්ය;
එබැවින් කන්‍යාවෝ නුඹට ප්‍රේම
කෙරෙති.
4 මා ඇදගනින්න; අපි නුඹ අනුව
දුවන්නෙමුව.
රජ තමාගේ ඇතුල් ගෙවලට මා
පැමිණෙවූවේය.
අපි නුඹ කෙරෙහි ප්‍රීති සන්තෝෂ
වන්නෙමුව,
මුද්‍රිකපානයට වඩා නුඹේ ප්‍රේමය
සඳහන්කරන්නෙමුව.
ඔවුන් නුඹට ප්‍රේමකරනවා හරිය.

5 යෙරුසලමේ දූවරුනි,
මම කේදර්හි කූඩාරම් මෙන් කළු
නුමුත්,
සාලමොන්ගේ තිර මෙන්
ශෝභනව සිටිමි.

*මෙසේ 'ඔහු' 'නුඹ' යනාදී යෙදෙන තැන්හි 'උන්වහන්සේ' 'ඔබ' යනාදී පිළිවෙළින්ද යොදත හැකියි.

අව්ව මා පිට වැටීමෙන් 6
මා කළුවී සිටින නිසා, මා දෙස බලා
නොසිටිල්ලා;
මාගේ මවුගේ පුත්‍රයෝ මට කෝපවී,
මිදිවතු බලාගන්ට මට නියමකළෝය;
මාගේම මිදිවත්ත මම බලා නොගතිමි.
මාගේ ආත්මය ප්‍රේමකරන තැනැත්ත, 7
නුඹේ රැළට කවන්නේ කොහේද?
ඉරමුදුන් වේලේ උන් ලග්ගවන්නේ
කොහේද කියා මට දන්වන්න.
නුඹේ යහළුවන්ගේ රැළවල් ළඟ මුහුණ
වසාගත්තියෙකු මෙන් සිටින්ට
ඕනෑ මන්ද?

### බලන්ට යාම සහ ආරාධනාව

ස්ත්‍රීන්ගෙන් ඉතා රුව ඇත්තිය, නුඹ 8
නොදන්නෙහි නම්,
රැළේ අඩිපාරේම ගොස්,
එඬේරුන්ගේ කූඩාරම් ළඟ නුඹේ
එළු පැටවුන්ට කවාපන්න.

මාගේ සොඳුර, 9
ඵාරාවෝගේ රථවල අශ්වධේනුවකට
නුඹ සමානකෙළෙමි.
නුඹේ කම්මුල් හිසකේ ගෙතීම්වලින්ද 10
නුඹේ බෙල්ල මැණික් මාලාවලින්ද
ශෝභනව තිබේ.
රිදී පොහොට්ටු ඇති 11
රන් මාලා නුඹට සාද දෙන්නෙමුව.

රජ තමාගේ මේසය ළඟ හිඳිද්දී 12
මාගේ ජටාමාංශ තෙලේ සුවඳ

විහිදුණේය.
13 මාගේ ප්‍රේමවන්තයා මට මාගේ
පියයුරු අතරේ තිබෙන
සුවඳලාටු පොදියක් හා සමානය.
14 මාගේ ප්‍රේමවන්තයා මට එන්-ගෙදියේ
උයන්වල වැවුණු
සපුමල් පොකුරක් වැනිය.

15 බලව, මාගේ සොඳුර, නුඹ රුව ඇත්තීය;
එසේය, නුඹ රුව ඇත්තීය;
නුඹේ ඇස් පරෙවියන් හා සමානය.

16 බලව, මාගේ ප්‍රේමවන්තය, නුඹ රුව
ඇත්තෙහිය, එසේය, ප්‍රියකරුය.
අපේ යහනද නිල්පාටය.
17 අපේ ගෙයි බාල්ක කිහිරි ගස්ය,
අපේ පරාළ දේවදර ගස්ය.

2 මම ෂාරොන්හි සෙව්වන්දි මලක්ය,
මිටියාවත්වල මහනෙල් මලක්ය.

2 කටුගස් අතරේ මහනෙල් මලක් යම්
සේද,
දූවරුන් අතරේ මාගේ සොඳුරත්
එසේය.
3 වනයේ ගස් අතරේ ජම්බු ගස යම්
සේද,
පුත්‍රයන් අතරේ මාගේ ප්‍රේමවන්තයාත්
එසේය.
මම ඔහුගේ සෙවණෙහි ප්‍රීතියෙන්
හිඳගතිම්,
ඔහුගේ ඵලද මාගේ කටට මිහිරි විය.
4 ඔහු මිදිපැන් ගෙයට මා ගෙනායේය,
මට උඩින් ඔහුගේ කොඩිය ප්‍රේමයය.
5 වියළි මිදිපලවලින් මා ශක්තිමත්කර,
ජම්බුවලින් මා ප්‍රාණවත්කරපල්ලා.
මක්නිසාද මම ප්‍රේමාතුරව සිටිමි.
6 ඔහුගේ වමත මාගේ හිස යටය,
දකුණතද මා වැළඳගනියි.

7 යෙරුසලමේ දූවරුනි,
ප්‍රේමය කැමතිවන තුරු
එය නොනැගුටුවන ලෙසත් නුපුබුදුවන
ලෙසත්
මුවදෙනුන් සහ වනයේ මීලුදෙනුන්
නමින් නුඹලා දිවුරවමි.

## බලන්ට යාම සහ ආරාධනාව

අන්න, මාගේ ප්‍රේමවන්තයාගේ හඬ! 8
බලව, ඔහු කඳුවල පනිමින්ද හෙල්වල
පැන නගිමින්ද එන්නේය.
මාගේ ප්‍රේමවන්තයා මුවෙකු නොහොත් 9
මුවපැටවෙකු මෙන්ය.
අන්න, ඔහු අපේ තාප්පයට පිටතින්
සිට,
කවුළුවලින් බලයි,
ගරාදි අතුරෙන් එබීබලයි.
මාගේ ප්‍රේමවන්තයා කථාකර මට 10
කියන්නේ:
මාගේ සොඳුර, ශෝභන තැනැත්තිය,
නැගිට වරෙන්න.
මක්නිසාද ශීත කාලය පසුවිය, 11
වැස්ස නැවතුණේය;
පොළොව පිට මල් පෙනෙයි; 12
කුරුල්ලන් නාදකරන කාලය
පැමිණියේය,
කොබෙයියාගේ හඬ අපේ දේශයෙහි
ඇසෙයි;
දිඹුල් ගසේ අමු ගෙඩි ඉදීගන එයි, 13
මිදිවැල්වල මල් පිපී,
සුවඳ හමයි.
මාගේ සොඳුර, මාගේ ශෝභන
තැනැත්තිය, නැගිට වරෙන්න.
පර්වත විවරවලද උස් කඳුවල රහස් 14
තැන්හිද සිටින මාගේ පරෙවි දෙන,
නුඹේ මුහුණ මට දකින්ටත් නුඹේ
හඬ අසන්ටත් දියන්න;
මක්නිසාද නුඹේ හඬ මිහිරිය, නුඹේ
මුහුණ ශෝභනයයි කීවේය.
මිදිවැල් නරක්කරන සිවලුන් එනම් 15
කුඩා සිවලුන් අල්ලාදියල්ලා;
මක්නිසාද අපේ මිදිවැල්වල මල් පිපී
තිබේ.
මාගේ ප්‍රේමවන්තයා මාගේය, මම 16
ඔහුගේය.

ඔහු මහනෙල් අතරේ රැළ කවයි.
17 මාගේ ප්‍රේමවන්තය, දහවල් සිසිල්වී
සෙවණැලි පහවන තුරු,
බෙතෙර් කඳු පිට යන
මුවෙක් නොහොත් මුව පැටියෙක්
මෙන් හැරී එන්න.

3 රාත්‍රියෙහි මාගේ යහනේදී මාගේ
ආත්මය ප්‍රේමකරන තැනැත්තා
සෙව්මි.
ඔහු සෙවූ නුමුත් මට සම්බවුණේ නැත.
2 ඉතින් මම නැගිට නුවර වීදිවලද
එළිමහන් තැන්හිද ඇවිද:
මාගේ ආත්මය ප්‍රේමකරන තැනැත්තා
සොයන්නෙමියි කීයෙමි.
ඔහු සෙවූ නුමුත් මට සම්බවුණේ නැත.
3 නුවර ඇවිදින රැකවලුන් මට සම්බවී:
මාගේ ආත්මය ප්‍රේමකරන තැනැත්තා
දුටුවහුදැයි ඇසීමි.
4 මා මදක් දුර ඔවුන් පසුකර ගිය විට,
මාගේ ආත්මය ප්‍රේමකරන තැනැත්තා
මට සම්බවිය.
මම ඔහු අල්ලාගෙන,
මාගේ මවුගේ ගෙටත් මා වැදූ
තැනැත්තියගේ ඇතුල් ගෙටත්
ඔහු පමුණුවන තෙක් ඔහු යන්ට
නැරියෙමි.

5 යෙරුසලමේ දූවරුනි,
ප්‍රේමය කැමතිවන තුරු
එය නොනැගුටුවන ලෙසත් නුපුබුදුවන
ලෙසත්
වනයේ මුවදෙනුන් සහ ඕලුදෙනුන්
නමින් නුඹලා දිවුරවමි.

## මංගල්‍ය පෙරහැර

6 ගන්ධරස හා තුවරලාවලත්
වෙළෙන්දගේ සියලු කුඩුවලත් සුවඳින්
යුක්තව,
දුම් කණු මෙන් කාන්තාරයෙන් නැගී
එන මේ තැනැත්තිය කවුද?
7 බලව, ඒ සාලමොන්ගේ දෝලාවය;
ඉශ්‍රායෙල් බලවතුන්ගෙන්
බලවන්තයන් සැටදෙනෙක් එය පිරිවරා
සිටිති.
ඔවුන් සියල්ලෝ කඩුගත් යුද්ධ 8
දක්ෂයෝය.
රාත්‍රියෙහි භය නිසා
එකිනෙකා තම තමාගේ කඩුව
කළවයේ බැඳගෙන සිටියි.
සාලමොන් රජ ලෙබනොන්හි ලීවලින් 9
යහනාවක් සාදගත්තේය.
එහි කණු රිදීයෙන්ද 10
එහි පතුළ රතින්ද, එහි ආසනය
රත්නිල් රෙදිවලින්ද සෑදීය,
එහි ඇතුළත යෙරුසලමේ දූවරුන්ගේ
ප්‍රේම ලකුණෙන් සරසනලද්දේය.
සියොන් දූවරුනි, පිටත ගොස්, 11
සාලමොන් ස්වකීය සරණවීමේ දවසේදී,
තමාගේ සිතේ ප්‍රීතියේ දවසේදී,
ඔහුගේ මෑණියන් විසින් ඔහුට පැළඳෙවූ
ඔටුන්න පැළඳ සිටිනවා බලාපල්ලා.

## මනමාලීගේ ලක්ෂණ

බලව, මාගේ සොඳුර, නුඹ රුව 4
ඇත්තීය; එසේය නුඹ රුව
ඇත්තීය;
නුඹේ මුහුණු වැස්මට ඇතුළෙන්
තිබෙන නුඹේ ඇස් පරෙවියන් වැනිය.
නුඹේ වරලස ගිලයද් කඳු බෑවුමෙහි
ලැග ඉන්න
එළු රැළක් මෙන්ය.
නුඹේ දත් වනාහි තනිවූ එකෙක්වත් 2
නැතුව,
සැමදෙනම නිඹුලුන් ඇත්තාවූ,
ලොම් කපා නාවනු ලැබ නැගීඑන්නාවූ
බැටළු රැළකට සමානය.
නුඹේ තොල් රතු නූලක් මෙන්ය, 3
නුඹේ මුඛය ශෝභමානය.
නුඹේ මුහුණු වැස්මට ඇතුළෙන්
තිබෙන
නුඹේ කම්මුල් දෙළුම් පළුවක් මෙන්ය.
නුඹේ බෙල්ල බලවතුන්ගේ වැසුම් වන 4

පලිස් දහසක් එල්ලා තිබෙන්නාවූ,
ආයුධ තැබීමට ගොඩනැගූ දාවිත්ගේ
කොත මෙන්ය.
5 නුඹේ දෙතන මහනෙල් අතරේ
ගොදුරු කන
මුවදෙනකුගේ නිඹුල් පැටවුන්
දෙදෙනෙකු මෙන්ය.
6 දවාල සිසිල්වී සෙවණැලි පහව යන
තුරු
මම ගන්ධරස කන්දටත්
තුවරලා හෙලටත් යන්නෙමි.
7 මාගේ සොඳුරිය, නුඹ මුළුමනින්ම රූව
ඇත්තීය;
කැලලක් නැත්තීය.
8 මාගේ මනමාලිය, ලෙබනොන්හි සිට,
එසේය,
ලෙබනොන්හි සිට මා සමග වරෙන්න.
අමානායේ මුදුනෙත්
සෙනීර් සහ හෙර්මොන් මුදුනෙත්
සිංහයන්ගේ ගුහාවලත්
අඳුන්දිවියන්ගේ කඳුවලත් සිට
බලාපන්න.
9 මාගේ සහෝදරිය, මාගේ මනමාලිය,
නුඹ මාගේ සිත අල්ලාගත්තෙහිය;
නුඹේ එක ඇසකින්, නුඹේ බෙල්ලේ
එක මාලාවකින්,
මාගේ සිත අල්ලාගත්තෙහිය.
10 මාගේ සහෝදරිය, මාගේ මනමාලිය,
නුඹේ ප්‍රේමය කොපමණ මිහිරිද!
නුඹේ ප්‍රේමය මුද්‍රිකපානයටත්,
නුඹේ විලවුන්වල සුවඳ සියලු සුවඳ
ද්‍රව්‍යවලටත් වඩා කොපමණ හොඳද!
11 මාගේ මනමාලිය, නුඹේ තොල්වලින්
මීවදය මෙන් පැණි වැගිරෙයි.
නුඹේ දිව යට මීපැණිත් කිරිත් තිබේ;
නුඹේ වස්ත්‍රවල සුගන්ධය ලෙබනොන්හි
සුවඳ මෙන්ය.
12 මාගේ සහෝදරී, මාගේ මනමාලී,
වැටකින් වටකළ උයනක්ය,
වසා තිබෙන ළිඳක්ය, මුද්‍රාකර තිබෙන
උල්පතක්ය.
නුඹේ පැලෑටි පංක්තිය වනාහි දෙළුම් 13
ගසුත් අනර්ඝ ඵල ගසුත්
සපු සහ ජටාමාංසත්
ජටාමාංස හා කුංකුමත් 14
වදකහ සහ කුරුඳුත් සෑම තුවරලා
ගසුත්
ගන්ධරස හා අගිල්ද සෑම ප්‍රධාන
සුවඳ ද්‍රව්‍යද දරන ගසුත් යන මේවාය.
නුඹ උයන් උල්පතකුත් 15
ජීවමාන දිය ඇති ළිඳකුත්
ලෙබනොන් සිට ගලායන ඔයවලුත්ය.
එම්බා, උතුරු හුළඟ, පිබිදියන්න; 16
දකුණු හුළඟ, වරෙන්න;
මාගේ උයනේ සුවඳ විහිද යන පිණිස
ඊට හමාපල්ලා.
මාගේ ප්‍රේමවන්තයා තමාගේ උයනට
ඇවිත්
තමාගේ අනර්ඝ ඵල කෑවාවේ.

## ස්වප්නයක්,-එනම් සොයන මනමාලී. මනමාලයාගේ ලක්ෂණ

5 මාගේ සහෝදරිය මාගේ
මනමාලිය, මම මාගේ උයනට
ඇවිත්,
මම මාගේ ගන්ධරස මාගේ
සුවඳ බඩු සමග රැස්කරගතිමි,
මාගේ මීවදේ සමග මාගේ මීපැණි
කෑවෙමි,
මාගේ කිරි සමග මාගේ මුද්‍රිකපානය
බීමි.
මිත්‍රයෙනි, කාපල්ලා;
ප්‍රිය තැනැත්තෙනි, බීපල්ලා, එසේය,
බොහෝසෙයින් බීපල්ලා.
මම නිදගෙන සිටියෙමි නුමුත් මාගේ 2
සිත පිබිද තිබුණේය.
අන්න මාගේ ප්‍රේමවන්තයා තට්ටු
කරන ශබ්දයය:

මාගේ සහෝදරිය, මාගේ සොඳුරිය,
මාගේ පරෙවිදෙන, මාගේ නිර්මල
තැනැත්තිය, මට දොර ඇරපන්න.
මක්නිසාද මාගේ හිස පිනිනෙනුත්
මාගේ කෙස් රොද රෑ පිනිබිඳුවලිනුත්
පෙඟී තිබේයයි කීවේය.
3 මාගේ සැට්ටය මුදා තැබීමි; මා ඒක
ඇඳින්නේ කොහොමද?
මාගේ පාද සේදීමි; ඒවා මම කෙසේ
කිලුටුකරන්නෙම්දැයි කීවෙමි.
4 මාගේ ප්‍රේමවන්තයා දොර සිදුරෙන්
අත දැමුයේය,
මාගේ හෘදයද ඔහු කෙරෙහි ඇදී
ගියේය.
5 මාගේ ප්‍රේමවන්තයාට දොර අරින්ට
නැගිට්ටෙමි;
එවිට අගුලේ මිටිවල තිබුණු
ගන්ධරස මාගේ අත්වලද
දියවර ගන්ධරස මාගේ ඇඟිලිවලද
තැවරී වැටුණේය.
6 මාගේ ප්‍රේමවන්තයාට දොර ඇරියෙමි;
නුමුත් මාගේ ප්‍රේමවන්තයා අහක්ව
ගිහින්ය.
ඔහු කථාකළ විට මට සිහිනැතිවිය.
මම ඔහු සෙව්වෙමි, නුමුත් සම්බවුණේ
නැත;
මා ඔහුට අඬගැසූ නුමුත් ඔහු මට
උත්තරදුන්නේ නැත.
7 නුවර ඇවිදින රැකවල්ලු මට සම්බවී,
මට ගසා තුවාලකළෝය;
පවුරුවල රැකවල්ලු මාගේ පොරෝණය
මාගෙන් පැහැරගත්තෝය.
8 යෙරුසලමේ දූවරුනි, මාගේ
ප්‍රේමවන්තයා නුඹලාට සම්බවුණොත්,
මා ප්‍රේමාතුරව සිටින බව දන්වන
ලෙස නුඹලා දිවුරවමි.
9 ස්ත්‍රීන්ගෙන් ඉතා ලක්ෂණ තැනැත්තිය,
වෙන ප්‍රේමවන්තයෙකුට වඩා නුඹේ
ප්‍රේමවන්තයාට ඇති උතුම්කම
මොකද?
නුඹ මෙසේ අප දිවුරවන්නේ
වෙන ප්‍රේමවන්තයෙකුට වඩා නුඹේ
ප්‍රේමවන්තයාට ඇති උතුම්කම
මොකද?

මාගේ ප්‍රේමවන්තයා සුදුය, රතු කම්මුල් 10
ඇත්තේය,
දසදහසක් අතරේ උතුම්ය.
ඔහුගේ හිස ඉතා පවිත්‍ර රත්රන් මෙන්ය, 11
ඔහුගේ කෙස් රොද ඝනය, කපුටුවා
මෙන් කළුය.
ඔහුගේ ඇස් දිය දෙළවල් ළඟ ඉන්න 12
පරෙවියන් වැනිව,
කිරෙන් සේදී, හොබනා ලෙස පිහිටා
තිබේ.
ඔහුගේ කම්මුල් සුවඳ ගස් පාත්තියක්ද 13
සුවඳ පැළ ඇති ගොඩැලිද මෙන්ය.
ඔහුගේ තොල් මානෙල් මෙනි, දියවර
ගන්ධරස එයින් වැහෙන්නේය.
ඔහුගේ අත් ලශුනිය මැණික් ඇල්লූ 14
රන්මුදු වැනිය.
ඔහුගේ ඇඟ නීලමාණික්‍යවලින් සැරසූ
ඇත්දත් කර්මාන්තයක් මෙන්ය.
ඔහුගේ කෙණ්ඩා අමිශ්‍ර රන් අඩි පිට 15
පිහිටා තිබෙන සුදු ගල් කණු මෙන්ය.
ඔහුගේ ස්වරූපය ලෙබනොන් හා
සමානය, කිහිරිගස් මෙන් උතුම්ය.
ඔහුගේ මුඛය ඉතා මිහිරිය. එසේය, 16
ඔහු මුළුමනින්ම ප්‍රියකරුය.
යෙරුසලමේ දූවරුනි,
මාගේ ප්‍රේමවන්තයා මේ ආකාරය,
මාගේ මිත්‍රයා මෙබන්දෙක්ය.

## මනමාලයා නැවතත් මනමාලීගේ ලක්ෂණ වර්ණනාකිරීම

6 ස්ත්‍රීන්ගෙන් ඉතා රූව ඇත්තිය,
නුඹේ ප්‍රේමවන්තයා කොතැනට
ගියේද?
නුඹේ ප්‍රේමවන්තයා කොයි දෙසට
හැරීගියේද?
අපි නුඹ සමග ඔහු සොයන්නෙමුව.

2 මාගේ ප්‍රේමවන්තයා උයන්වල රැළ
කවන පිණිසත් මහනෙල් නෙලා
ගන්න පිණිසත්
තමාගේ උයනෙහි සුවඳ ගස්
පාත්තිවලට ගියේය.
3 මම මාගේ ප්‍රේමවන්තයාගේය, මාගේ
ප්‍රේමවන්තයා මාගේය.
ඔහු මානෙල් අතරේ තමාගේ රැළ
කවයි.
4 මාගේ සොඳුර, තුඹ තිර්සා මෙන්
අලංකාරය.
යෙරුසලම මෙන් ශෝභනය,
කොඩි ගත් සේනාවක් මෙන්
බලසම්පන්නව සිටින්නීය.
5 තුඹේ ඇස් මා වෙතින් හරවාගනින්න,
මක්නිසාද ඒවා මා වසඟකරයි.
තුඹේ වරලස ගිලියද්හි ලැග ඉන්න
එළු රැළක් මෙන්ය.
6 තුඹේ දත් තනිවූ එකෙක්වත් නැතුව
සැමදෙනම නිඹුලුන් ඇත්තාවූ,
නාවනු ලැබ නැඟී එන්නාවූ බැටළු
දෙනුන් රැළක් මෙන්ය.
7 තුඹේ මුහුණු වැස්මට ඇතුළෙන්
තිබෙන
තුඹේ කම්මුල් දෙළුම් පළුවක් මෙන්ය.
8 බිසෝවරුන් සැටක්ද උපභාර්යාවන්
අසූවක්ද
ගණන් නැති කන්‍යාවෝද සිටිති.
9 මාගේ පරෙවිදෙන, මාගේ නිර්මල
තැනැත්තිය, අසමාන තැනැත්තිය.
ඈ ඇගේ මවුගේ එකම දරුවාය;
ඈ වැදූ ඇත්තීගේ ප්‍රිය තැනැත්තිය.
දූවරු ඈ දැක ඈ වාසනාවන්තීයයි
කීවෝය;
එසේය, බිසෝවරුද උපභාර්යාවෝද
දැක ඇය වර්ණනාකළහ.

## මනමාලීගේ ලක්ෂණ තම පිරිස විසින් වර්ණනාකිරීම

10 අරුණාලෝකය මෙන් නැඟීඑන්නාවූ,
සඳ මෙන් රුව ඇත්තාවූ,
ඉර මෙන් දිළියෙන්නාවූ,
කොඩි ගත් සේනාවක් මෙන්
බලසම්පන්නවූ මැ කවුද?

මම මිටියාවතේ ගස් කොළන් 11
බලන්ටත්,
මිදිවැල් දළු දැමුවේද?
දෙළුම්ගස්වල මල් පිපුණේදැයි බලන්ටත්,
කොට්ටම්බා උයනට බැස ගියෙමි.
මට දැනෙන්ට පළමුවෙන් මාගේ ආත්මය 12
මාගේ වංශාධිපති සෙනඟගේ රථ
අතරේ මා තැබීය.

ෂූලම්මීය, හැරී වරෙන්න, හැරී වරෙන්න; 13
අප තුඹ බලන පිණිස හැරී වරෙන්න,
හැරී වරෙන්න.

*මහනායිම්හි නැටුම මෙන්
තුඹලා ෂූලම්මීය බලන්ට කැමතිවන්නේ
මක්නිසාද?

7

අධිපතියාණන්ගේ දුවණියෙනි,
වහන් සහිත තුඹේ අඩි
තැබීම කොපමණ ලක්ෂණද!
තුඹේ කළවා සන්ධි
දක්ෂ කම්කරුවෙකුගේ අතින් කළ
ආභරණ මෙන්ය.
තුඹේ නාභිය මිශ්‍රකළ පානයෙන් 2
පූර්ණවූ
වටකුරුවූ පාත්‍රයක් මෙන්ය,
තුඹේ උදරය මානෙල්වලින් වටවූ
තිරිඟු ගොඩක් මෙන්ය.
තුඹේ දෙතන නිඹුල් මුවපැටවුන් 3
දෙදෙනෙකු මෙන්ය.
තුඹේ ග්‍රීවය ඇත්දත් කුළුනක් මෙන්ය; 4
තුඹේ ඇස් හෙෂ්බොන්හි බැත්-රබ්බිම්
දොරටුව ළඟ තිබෙන පොකුණු
මෙන්ය;
තුඹේ නාසය දමස්කය දෙස පිහිටි
ලෙබනොන් කොත මෙන්ය.
තුඹ මතුයෙහි තිබෙන තුඹේ සිරස 5
කර්මෙල් කන්ද මෙන්ය,
තුඹේ හිසකේ රත්නිල් කෙඳි මෙන්ය;

*හෙවත්, සේනා දෙකේ

රජතෙමේ ඒ රොදවලින් වසඟවී සිටියි.
6 එම්බා, සොඳුරිය, ප්‍රීතිය වඩවන්ට
තුඹ කොපමණ ලක්ෂණද! කොපමණ
ප්‍රියකරුද!
7 මේ තුඹේ උස ප්‍රමාණය තල් ගසකටත්
තුඹේ පියයුරු මිදි පොකුරුවලටත්
සමානය.
8 මම තල් ගසට නැගී
එහි අතු අල්ලන්නෙමියි කීමි.
තුඹේ පියයුරු මිදි පොකුරු මෙන්ද
තුඹේ හුස්මේ සුවඳ ජම්බු මෙන්ද
9 තුඹේ මුඛය ඉතා හොඳ මුද්‍රිකපානය
මෙන්ද වේවා;
ඒවා මාගේ ප්‍රේමවන්තයාට
හරියන්නේය,
නිදඉන්නන්ගේ තොල් සෙමින්
සොලවන්නේය.

## මනමාලිගේ ගී

10 මම මාගේ ප්‍රේමවන්තයාගේය,
ඔහුගේ ආශාවද මා කෙරෙහිය.
11 මාගේ ප්‍රේමවන්තය, එන්න, අපි ගම්
පෙදෙසට ගොස්,
ගම්වල නැවතී සිටිමු.
12 අපි අලුයම නැගිට මිදිවතුවලට
ගොස්,
මිදිවැල් දළුලා මල් පිපුණේද,
දෙළුම් ගස්වල මල්පිපී තිබේදැයි බලමු.
එහිදී මාගේ ප්‍රේමය තුඹට දෙන්නෙමි.
13 දූද එල සුවඳක් විහිදුවයි,
අපේ දොරටු ළඟ අලුත්වූද පරණවූද
සියලු ආකාර අනර්ඝ පලතුරු තිබේ,
මාගේ ප්‍රේමවන්තය, ඒවා තුඹ උදෙසා
තබාගතිමි.

8 අනේ, තුඹ මාගේ මවුගේ
පියයුරුවලින් කිරි බීවාවූ
මාගේ සොහොයුරා මෙන් වී නම්
කැමැත්තෙමි!
එවිට පිටතදී තුඹ මට සම්බවූ කල
සිඹගත්තත්,
කිසිවෙක් මා හෙළා නොදක්නේය.
මම තුඹ ගෙනගොස් මාගේ මවුගේ 2
ගෙට පමුණුවන්නෙමි,
තුඹ මට උගන්වන්නෙහිය.
මිශ්‍රකළ මුද්‍රිකපානයද
දෙළුම් යුසද තුඹට බොන්ට
දෙන්නෙමි.
ඔහුගේ වමත මාගේ හිස යට තිබේ, 3
දකුණතද මා වැළඳගනියි.

යෙරුසලමේ දූවරුනි, 4
ප්‍රේමය කැමතිවන තුරු
එය නොනැගුටුවන ලෙසත් තුපුබුදුවන
ලෙසත් තුඹලා දිවුරවමි.

## සිහිවීම සහ අවසානය

තම ප්‍රේමවන්තයාට හේත්තුවී 5
කාන්තාරයෙන් නැගීඑන්නාවූ මේ
තැනැත්තිය කවුද?

ජම්බු ගස යටදී මම තුඹ
පිබිදෙවුවෙමි.
එහි තුඹේ මෑණියෝ තුඹ
ගැන රුජා වින්දහ,
එහි තුඹේ දිනිතිය වදන වේදනාවෙන්
සිටියාය.

මුද්‍රාවක් කොට තුඹේ සිතෙහිද මුද්‍රාවක් 6
කොට තුඹේ හස්තයෙහිද මා
තබාගනින්න.
මක්නිසාද ප්‍රේමය මරණය මෙන්
බලවත්ය;
කාම ක්‍රෝධය *මිනීවළ මෙන්
කෲරතරය.
ඒකේ දැල්ල ගිනිදැල්ය,
ස්වාමීන්වහන්සේගෙන් වූ ඇවිළෙන
ගිනිදැල්ලක්මය.
බොහෝ වතුරුවලින් ප්‍රේමය නිවන්ට 7
බැරිය,
ගංගාවලට එය යටකරන්ටත් බැරිය.
මනුෂ්‍යයෙක් ප්‍රේමය දිනාගන්ට
තමාගේ ගෙයි සියලු සම්පත දෙතත්,
ඔහු සහමුලින්ම සුළුකරනු ලැබේ.

*ෂෙයෝල.

8 අපට කුඩා සහෝදරියක් සිටින්නීය,
ඇට පියයුරු නැත.
අපේ සහෝදරී ගැන කථාකරන
දවසේදී
අපි ඈ ගැන මක්කරමුද?
9 ඈ පවුරක් නම්,
ඈ පිට රිදී කොතක් ගොඩනගන්නෙමුව.
ඈ දොරක් නම්,
කිහිරි ලෑලිවලින් ඈ වටකරන්නෙමුව.

10 මම පවුරක්ව සිටියෙමි, මාගේ පියයුරු
එහි කොත්කුළුනු මෙන්ය;
එවිට මම ඔහුගේ ඇස් හමුයෙහි
සමාදානය ලද්දියෙකු මෙන් වීමි.
11 බාල්-හාමොන්හි සාලමොන්ට
මිදිවත්තක් තිබුණේය;
ඔහු ඒ මිදිවත්ත බලන්නන්ට භාර
දුන්නේය;
එහි එල වෙනුවට රිදී දහසක් බැගින්
ගෙනෙන්ට එකිනෙකාට නියමවිය.
මට අයිති මගේ මිදිවත්ත මා ඉදිරියෙහි 12
තිබේ.
සාලමොන්, ඔබට දහසද
එහි එල බලාගන්නන්ට දෙසීයයක්ද
දෙනු ලැබෙන්නේය.

උයන්වල වසන තැනැත්තිය, 13
යහළුවෝ නුඹේ හඬට ඇහුම්කන් දෙති.
ඒක මට අසන්ට ලැබේවා.

මාගේ ප්‍රේමවන්තය, ඉක්මන්කොට, 14
සුවඳ ගස් ඇති කඳු පිට,
තිත්මුවෙකු නොහොත් මුවවස්සෙකු
මෙන් යුහුසුලුවෙයන්න.

# අනාගතවක්තෘවූ යෙසායාගේ පොත

## ස්වාමීන්වහන්සේ යූදා ගැන පැමිණිලිකිරීම

1 යූදහි රජවරුන්වූ උස්සියාගේද
යෝතාම්ගේද ආහාස්ගේද
හෙසකියාගේද දවස්වලදී යූදා සහ
යෙරුසලම ගැන ආමොස්ගේ පුත්‍රවූ
යෙසායා දුටු දර්ශනයය.
2 ස්වර්ගයෙනි, අසාපල්ලා, පෘථිවිය,
කන්දීපන්න, මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
කථාකරනසේක: මම දරුවන් පෝෂණය
කොට ඇතිදැඩිකෙළෙමි, එහෙත් ඔව්හු
3 මට විරුද්ධව කැරළිගැසුවෝය. ගොනා
උගේ අයිතිකාරයාද කොටළුවා උගේ
ස්වාමියාගේ පට්ටියද දනියි. එහෙත්
ඉශ්‍රායෙල් දන්නේ නැත, මාගේ සෙනඟ
කල්පනාකරන්නේ නැතැයි කියනසේක.
4 අනේ පාපිෂ්ඨ ජාතියක්ය, අයුතුකමෙන්
බරවූ සෙනඟක්ය, නපුරුකම් කරන
වංශයක්ය, දූෂ්‍යලෙස ක්‍රියාකරන
දරුවෝය. ඔව්හු **ස්වාමීන්වහන්සේ**
අත්හැර, ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්-
වහන්සේ එපාකොට, වෙන්වී පස්සට
5 හැරී ගියෝය. තුඹලා වඩ වඩා
කැරළිගසා තව පහර ලබන්නේ
මක්නිසාද? මුළු හිස රෝගාතුරව, මුළු
6 සිත දුර්වලව තිබේ. පතුලේ සිට හිස
දක්වා කොයි තැනකවත් කිසි සනීපයක්
නැතුව තුවාලද කැලල්ද පැසවන වණද
තිබේ. ඒවා මිරිකා ඇරියේවත් බැන්දේවත්
තෙල් ගා මොළොක්කළේවත් නැත.
7 තුඹලාගේ දේශය පාළුවී තිබේ;
තුඹලාගේ නුවරවල් ගින්නෙන් දවා දමා
තිබේ; තුඹලාගේ භූමිය තුඹලා ඉදිරියේදී
විදේශියෝ නාස්තිකෙරෙති, ඒක
විදේශීන්ගේ වැනසීමක් ලෙස පාළුවක්
8 වී තිබේ. සියොන් දුව මිදිවත්තක මඩුවක්
මෙන්ද කැකිරි වත්තක පැලක් මෙන්ද
වටලනලද නුවරක් මෙන්ද අත්හරිනු
ලැබුවාය. සේනාවල **ස්වාමීන්වහන්සේ** 9
අපට ස්වල්ප දෙනෙක් ඉතුරුකර නුදුන්-
සේක් නම් අපි සොදෙම මෙන් වී
ගොමොරාවටද සමානවන්නෙමුව.
සොදෙමේ ආණ්ඩුකාරයෙනි, **ස්වාමීන්-** 10
**වහන්සේගේ** වචනය අසාපල්ලා;
ගොමොරාවේ සෙනඟෙනි, අපේ
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට
කන්දීපල්ලා. තුඹලාගේ පූජා රාශියෙන් 11
මට කම් කිම්දැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මුළු බැටළු පූජාවලින්ද
තරකළ සතුන්ගේ තෙලින්ද පිරී
සිටිමි; ගොනුන්ගෙත් බැටළුවස්සන්ගෙත්
එළුවන්ගෙත් ලෙයට මම ප්‍රසන්න
නොවෙමි. තුඹලා මා ඉදිරියෙහි 12
පෙනෙන්ට එන කල එසේ මාගේ
මිදුල් පාගන්ට කියා තුඹලාගෙන්
ඉල්លුවේ කව්ද? නිෂ්ඵල පූජා තවත් 13
නොගෙනෙල්ලා; දුම් පූජාව මට
පිළිකුලක්ය; අමාවකද සබත් දවසද
සභා රැස්කිරීමද එසේමය. දුෂ්ටකම
සහිත මංගල්‍ය රැස්වීම මට ඉවසන්ට
බැරිය. තුඹලාගේ අමාවක්වලටද නියම 14
මංගල්‍යවලටද මාගේ ආත්මය
ද්වේෂකරයි. ඒවා මට බරක්ය; ඒවා
උසුලා වෙහෙසව සිටිමි. තුඹලාගේ අත් 15
විදහනකල මාගේ ඇස් තුඹලාගෙන්
සඟවාගන්නෙමි. එසේය, තුඹලා යාච්ඤා
බොහොමයක් කරන කල්හිත් මම
නොඅසන්නෙමි. තුඹලාගේ අත් ලෙයින් 16
පිරී තිබේ. තුඹලා සෝදාගෙන
පවිත්‍රවෙයල්ලා; තුඹලාගේ ක්‍රියාවල
නපුරුකම මාගේ ඇස් ඉදිරියෙන් පහකර
නපුරුකම් කිරීමෙන් වැලකියල්ලා.

17 යහපත්කම්කරන්ට ඉගෙනගනිල්ලා;
යුක්තිය සොයා, බලාත්කාරය
මැඩපවත්වාපල්ලා, මවුපියන් නැත්තාට
යුක්තිය කර, වැන්දඹුවගේ නඩුව
අසාපල්ලා.
18 ඉතින් වරෙල්ලා, අපි කාරණා
කථාකරගනිමුයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. නුඹලාගේ පව් රතු පාට
මෙන් තිබෙන නුමුත්, ඒවා හිම මෙන්
සුදු වන්නේය; ඒවා ලාක්ෂා මෙන් රතුව
තිබෙන නුමුත් සුදු ලොම් මෙන් වන්නේය.
19 නුඹලා කැමතිව කීකරුවන්නහු නම්,
දේශයේ සාරවත්කම භුක්තිවිඳින්නහුය.
20 නුඹලා අකමැතිව කැරළිගසන්නහු නම්,
කඩුවෙන් මැරුම්කන්නහුය. මක්නිසාද
**ස්වාමීන්වහන්සේගේ** මුඛය එය වදාළ-
සේක.
21 අනේ, විශ්වාස නුවර වේශ්‍යාවක් වූ
හැටි! ඒක යුක්තියෙන් පිරී තිබුණේය!
එහි වාසයකළේ ධර්මිෂ්ඨකමය, නුමුත්
22 දැන් සිටින්නේ මිනීමරන්නෝය. නුඹේ
රිදී බොරවිය, නුඹේ මුද්‍රිකපානයෙහි
23 වතුර මිශ්‍රවී තිබේ. නුඹේ අධිපතීහු
කැරළිකාරයෝය, සොරුන්ගේ සමාගම්-
කාරයෝය; සැමදෙනම අල්ලසට ඇලුම්
වෙති, තෑගි පස්සේ දුවති. මවුපියන්
නැත්තන්ට ඔව්හු යුක්තිය නොකෙරෙති,
වැන්දඹුවගේ නඩුව ඔවුන් වෙතට
පැමිණෙන්නේ නැත.
24 එබැවින් සේනාවල **ස්වාමීන්වහන්සේද**
ඉශ්‍රායෙල්ගේ පරාක්‍රමයාණන්වහන්සේද
වන ස්වාමීන්වහන්සේ කියනසේක්: අහෝ,
මාගේ එදිරිකාරයන්ගෙන් මම නිදහස්වී,
25 මාගේ සතුරන්ගෙන් පළිගන්නෙමි. මාගේ
අත නුඹ පිටට හරවා, නුඹේ බොර
සහමුලින්ම ඉවත්කර, නුඹේ තුත්තනාගම්
26 සියල්ලම පහකරන්නෙමි. මම පළමු
ලෙස නුඹේ විනිශ්චයකාරයන්ද මුලදී
තිබුණු ලෙස නුඹේ මන්ත්‍රීවරුන්ද
නැවත පිහිටුවන්නෙමි. ඉන්පසු නුඹ
ධර්මිෂ්ඨකමේ නුවරය, විශ්වාස නගරය-
27 යයි කියනු ලබන්නීය. සියොන විනිශ්චය
කරණකොටගෙනද ඈ තුළ [දෙවියන්-
වහන්සේ වෙතට] හැරෙන්නෝ ධර්මිෂ්ඨ-
කම කරණකොටගෙනද මුදනු ලබන්-
නෝය. නුමුත් ද්‍රෝහිකම් කරන්නන්ගේද 28
පව්කාරයන්ගේද විනාශය එකවිටම
සිදුවන්නේය, **ස්වාමීන්වහන්සේ** අත්-
හරින්නෝ විනාශවන්නෝය. මක්නිසාද 29
නුඹලා ආශාවූ අලෝන ගස් නිසා
ඔව්හු ලජ්ජාවන්නෝය, නුඹලා තෝරා-
ගත් උයන් නිසා නුඹලා වියවුල්-
වන්නහුය. මක්නිසාද නුඹලා කොළ 30
පරවෙන අලෝන ගසක් මෙන්ද දියනැති
උයනක් මෙන්ද වෙනවා ඇත. බලවතා 31
හණ මෙන්ද ඔහුගේ වැඩේ ගිනි පුපුරක්
මෙන්ද වී, කිසිවෙකු විසින් නිවන්නේ
නැතුව, එකට දලායනවා ඇතැයි
කියනසේක.

## අන්තිම දවස් ගැන පොරොන්දුව

2 යූදා සහ යෙරුසලම ගැන
ආමොස්ගේ පුත්‍රවූ යෙසායා දුටු
කාරණයය.
මතු දවස්වලදී **ස්වාමීන්වහන්සේගේ** 2
ගෘහයේ කන්ද කඳු මුදුනේ පිහිටු-
වනලදුව හෙල්වලට වඩා උස්වන්නේය;
සියලු ජාතීහුද ඒ වෙතට රැස්වී එන්නෝය.
බොහෝ ජනයෝද පිටත්ව කථාකොට: 3
වරෙල්ලා, **ස්වාමීන්වහන්සේගේ** කන්දටත්
යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ
ගෘහයටත් යමු; උන්වහන්සේ තමන්ගේ
මාර්ග අපට උගන්වනසේක, අපිද
උන්වහන්සේගේ මාවත්වල යන්නෙමුයයි
කියන්නෝය. මක්නිසාද ව්‍යවස්ථාව
සියොනෙන්ද **ස්වාමීන්වහන්සේගේ**
වචනය යෙරුසලමෙන්ද නික්ම යන්-
නේය. උන්වහන්සේ ජාතීන් අතරේ 4
විනිශ්චයකොට, බොහෝ ජනයන්ගේ
කාරණා නිශ්චය කරනසේක. ඔව්හු
තමුන්ගේ කඩුවලින් හීවැල්ද හෙල්ලවලින්
දෑකැතිද තළාගන්නෝය. ජාතියක්
ජාතියකට විරුද්ධව කඩුව ඔසවන්නේවත්
තවත් යුද්ධ ඉගෙනගන්නේවත් නැත.

## ආශීර්වාදයට පළමුවෙන් දඬුවම

5 අහෝ යාකොබ්ගේ වංශය, වරෙල්ලා,
ස්වාමීන්වහන්සේගේ එළියෙහි ගමන්
6 කරමු. ඔබ යාකොබ්ගේ වංශය වන
ඔබගේ සෙනඟ අත්හැරියසේක, මක්-
නිසාද ඔව්හු පෙරදිග සිරිත්වලින් පිරී
පිලිස්තිවරුන් මෙන් පේනකියන්නෝව
සිටිති, විදේශීන්ගේ පුත්‍රයන් සමග අතට
7 අත ගසති. ඔවුන්ගේ දේශය රන් රිදී-
වලින් පිරී තිබේ, ඔවුන්ගේ වස්තුවලට
කෙළවරක්ද නැත; ඔවුන්ගේ දේශය
අශ්වයන්ගෙන් පිරී තිබේ, ඔවුන්ගේ රථද
8 කෙළවරක් නැතුව තිබේ. ඔවුන්ගේ දේශය
පිළිමවලින් පිරී තිබේ; තමුන්ගේම
අත්වැඩය වන තමුන්ගේම ඇඟිලිවලින්
9 සෑදූ දේට ඔව්හු වඳිති. මෙසේ පහත්
මිනිහා යටත් කරනු ලැබේ, උසස්
මනුෂ්‍යයාද පහත් කරනු ලැබේ. ඒ
10 නිසා ඔවුන්ට කමානුව මැනව. තුඹ
පර්වතයට ඇතුල්වී ස්වාමීන්වහන්සේගේ
භයානකකමද උන්වහන්සේගේ මහත්-
තත්ත්වයේ තේජසද ඉදිරියෙන් ධූලියෙහි
11 සැඟවෙයන්න. මනුෂ්‍යයාගේ උඩඟු ඇස්
පහත්කරනු ලබන්නේය, මනුෂ්‍යයන්ගේ
උඩඟුකමද යටත්කරනු ලබන්නේය, ඒ
දවසේ ස්වාමීන්වහන්සේ පමණක්
12 උසස්කරනු ලබන්නේය. මක්නිසාද
උඩඟුවූ අහංකාරවූ සියල්ලට විරුද්ධවද
උසස්ව තිබෙන සියල්ලට විරුද්ධවද
13 උස්වූ උසස්ව තිබෙන ලෙබනොන්හි සියලු
කිහිරි ගස්වලට විරුද්ධවද බාෂාන්හි
සියලු අලෝන ගස්වලට විරුද්ධවද;
14 උස්වූ කඳුවලට විරුද්ධවද උසස්ව
තිබෙන සියලු හෙල්වලට විරුද්ධවද;
15 උස්වූ සියලු කොත්වලට විරුද්ධවද
සුරක්ෂිත සියලු පවුරුවලට විරුද්ධවද;
16 තර්ෂිෂ්හි සියලු නැව්වලට විරුද්ධවද
අලංකාර පෙනීමක් ඇති සියල්ලට
විරුද්ධවද, ඒවා පහත්කරන පිණිස,
සේනාවල ස්වාමීන්වහන්සේගේ දවසක්
17 පැමිණෙන්නේය. මෙසේ මනුෂ්‍යයන්ගේ
උඩඟුකම යටත්කරනු ලබන්නේය,
මිනිසුන්ගේ ආඩම්බරයද පහත්කරනු
ලබන්නේය. ස්වාමීන්වහන්සේ පමණක්
18 උසස්කරනු ලබන්නේය. පිළිම සහමුලින්ම
19 පහවන්නේය. පොළොව ත්‍රස්තකරවන්ට
ස්වාමීන්වහන්සේ නැගිටින කල, උන්-
වහන්සේගේ භයානකකමද උන්-
වහන්සේගේ මහත්තත්ත්වයේ තේජසද
ඉදිරියෙන් පර්වතවල ගුහාවලටත්
පොළොවේ කුපවලටත් ඔව්හු ඇතුල්-
වන්නෝය. පොළොව ත්‍රස්තකරවන්ට 20
ස්වාමීන්වහන්සේ නැගිටින කල,
උන්වහන්සේගේ භයානකකමද උන්-
වහන්සේගේ මහත්තත්ත්වයේ තේජසද
ඉදිරියෙන්, පර්වතවල ගුහාවලටත් කඳුවල
විවරවලටත් ඇතුල්වන පිණිස, මනුෂ්‍යයෝ 21
නමස්කාරකිරීමට සාදවාගත් තමුන්ගේ
රිදී පිළිමද රන් පිළිමද මීයන්ටත්
වවුලන්ටත් අත්හැර දමා යන්නෝය.
තමාගේ නාසාපුටවල හුස්ම ඇති 22
මනුෂ්‍යයා තවත් විශ්වාස නොකරල්ලා.
මක්නිසාද ඔහුගේ වටිනාකම කුමක්ද?

3 බලව, සේනාවල ස්වාමීන්වහන්සේ
වන ස්වාමීන්වහන්සේ යෙරුසල-
මෙන්ද යූද රටෙන්ද රුකුලත් යෂ්ටියත්
පහකරනසේක. එනම් මුළු ආහාර පාන
වෘත්තියද; බලවත්තයා සහ යුද්ධ- 2
කාරයාද; විනිශ්චයකාරයා සහ
ප්‍රොපේතයාද පේනකියන්නා සහ
වැඩිමහල්ලාද; පනසාධිපතියා සහ 3
ගරුතර තැනැත්තාද මන්ත්‍රියාද දක්ෂ
ශිල්පියාද මායම් දන්න තැනැත්තාද
පහකරනසේක. මම දරුවන් ඔවුන්ගේ 4
අධිපතීන් කොට පත්කරන්නෙමි, බාලයෝ
ඔවුන් කෙරෙහි ආණ්ඩුකරන්නෝය.
සෙනඟ එකිනෙකාගෙන්ද තම තමාගේ 5
අසල්වාසියාගෙන්ද පීඩා විඳින්නෝය.
බාලයා මහල්ලාටත් නීචයා උත්-
තමයාටත් උඩඟුකම් පාන්නෝය.
මනුෂ්‍යයෙක් තම පියාගේ වංශයෙහි 6
තමාගේ සහෝදරයා අල්වා කථාකොට:
තුඹට සළුවක් ඇත්තේය, තුඹ අපේ
ආණ්ඩුකාරයා වී, මේ නාස්තිය තුඹේ
අත යටතේ වේවයි කීවොත්, ඔහු ඒ 7
දවසේදී ශබ්දනගා: මම සුවකරන්නෙක්
නොවන්නෙමි; මක්නිසාද මාගේ ගෙයි
කෑමවත් සළුවක්වත් නැත. මා සෙනඟගේ
ආණ්ඩුකාරයා නොකරන්නැයි කියන්නේය.
මක්නිසාද ස්වාමීන්වහන්සේගේ තේ- 8
ජාන්විත ඇස් උදහස්කරවන පිණිස
ඔවුන්ගේ දිවත් ක්‍රියාත් උන්වහන්සේට
විරුද්ධව තිබෙන බැවින්, යෙරුසලම

9 නාස්තිවී යූද වැටී තිබේ. ඔවුන්ගේ
මුහුණේ පෙනීම ඔවුන්ට විරුද්ධව සාක්ෂි
දෙයි; සොදෙම මෙන් ඔව්හු තමුන්ගේ
පාපය නොසඟවා ප්‍රකාශකෙරෙති.
ඔවුන්ගේ ආත්මයට දුක් වේ! මක්නිසාද
ඔව්හු තමුන්ටම අනතුරුකරගත්තෝය.
10 ධර්මිෂ්ඨයන්ට යහපත වන්නේයයි
කියාපල්ලා. මක්නිසාද ඔව්හු තමුන්ගේ
11 ක්‍රියාවල ඵල භුක්තිවිඳින්නෝය. අහෝ
දුෂ්ටයාට දුක් වේ! ඔහුට විපත
පැමිණේ. මක්නිසාද ඔහුගේ අත්වල
12 විපාකය ඔහුට ලැබෙන්නේය. මාගේ
සෙනඟගේ පීඩාකාරයෝ නම් දරුවෝය,
ස්ත්‍රීයෝ ඔවුන් කෙරෙහි ආණ්ඩුකරති.
මාගේ සෙනඟෙනි, තුඹට මඟපෙන්වන්නෝ
තුඹ මුළාකර තුඹ යා යුතු මාර්ගය
13 නැතිකරදමති. **ස්වාමීන්වහන්සේ** කාරණා
කියන්ට නැගිට ජනයන් විනිශ්චයකරන්ට
14 සිටිනසේක. **ස්වාමීන්වහන්සේ** තමන්
සෙනඟගේ වැඩිමහල්ලන්ද ඔවුන්ගේ
අධිපතීන්ද විනිශ්චයකිරීමට පැමිණෙන-
සේක. මිදිවත්ත කාදමුවේ තුඹලාය;
අසරණයන්ගෙන් ගත් කොල්ලය
15 තුඹලාගේ ගෙවල තිබේ. තුඹලා මාගේ
සෙනඟ පාගා දමන්නෙත් අසරණයන්ගේ
මුහුණු පොඩිකරන්නෙත් මක්නිසාදැයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** වන
ස්වාමීන්වහන්සේ කියනසේක.
16 තවද **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: සියොන් දූවරුන් උඩඟුව, බෙල්ල
උස්කොට, ඇස් කොනින් බල බලා,
කොට පියවර තබා ඇවිදිමින්, තමුන්ගේ
පාදවලින් ශබ්ද නගමින් යන බැවින්,
17 **ස්වාමීන්වහන්සේ** සියොන් දූවරුන්ගේ
ඉස්මුදුනේ කබලු අටගන්වනසේක,
**ස්වාමීන්වහන්සේ** ඔවුන්ගේ රහසඟ
18 නග්නකරනසේක. ඒ දවසේ **ස්වාමීන්-
වහන්සේ** ඔවුන්ගේ පාවළලුවල අලං-
කාරයද ඉස් දැල්ල චන්ද්‍රලේඛාභරණද;
19 කුණ්ඩලාභරණද අත්වළලුද මුවවස්නාද;
20 මකුටද පාද දමද ඉඟපටිද සුවඳ හෙප්පුද
21,22 යන්ත්‍රද; මුදුද නාසාභරණද; මංගල්‍ය
වස්ත්‍රද සළුද උතුරු සළුද පසුම්බිද; අත් 23
කැඩපත්ද සිහින් හණරෙදිද තලප්පාද
ඇඟ වැසුම්ද පහකරදමනසේක. එවිට 24
සුගන්ධ ද්‍රව්‍ය වෙනුවට කුණුද බඳපටිය
වෙනුවට ලණුවක්ද හොඳට ගෙතූ වරලස
වෙනුවට මුඩුකමද චෝලිය වෙනුවට
ගෝණි බැඳගැනීමද හොබනාකම
වෙනුවට හන්වඩුද ඇතිවන්නේය. තුඹේ 25
පුරුෂයෝ කඩුවෙන්ද තුඹේ බලවන්තයෝ
යුද්ධයෙන්ද වැටෙන්නෝය. ඇගේ දොරටු 26
වැලපෙන්ටත් හඬන්ටත් යෙදෙනවා ඇත;
ඈ අසරණව බිම හිඳගන්නවා ඇත.

## මතු පැමිණෙන රාජ්‍යය පිළිබඳ දර්ශනය

4 ඒ කාලයේදී ස්ත්‍රීන් සත්දෙනෙක්
එක පුරුෂයෙකු අල්ලාගෙන: අපි
අපේම කෑම කන්නෙමුව, අපේම වස්ත්‍ර
අඳින්නෙමුව. තුඹේ නම පමණක් අපට
ලැබේවා; අපේ නින්දාව පහකරපන්නැයි
කියන්නෝය.
ගැළවුණු ඉශ්‍රායෙල්වරුන්ට ඒ දවසේ 2
**ස්වාමීන්වහන්සේගේ** පැළෑටියද අලංකාරව
දීප්තිමත් වන්නේය, දේශයේ ඵල උතුම්ව
ශෝභන වන්නේය. තවද **ස්වාමීන්වහන්සේ** 3
විනිශ්චයේ ආත්මයෙන් සහ දැවීමේ
ආත්මයෙන් සියොන් දූවරුන්ගේ
කිලුටුකම සෝද, යෙරුසලම මැදින් රුධිර
අපරාධය පහකළ විට, සියොන්හි ගැළවී 4
සිටින්නාද යෙරුසලමෙහි ඉතුරුවෙන්නාද,
එනම් යෙරුසලමෙහි ජීවනය පිණිස
ලියවී සිටින සියල්ලෝ, ශුද්ධයයි කියනු
ලබන්නෝය. **ස්වාමීන්වහන්සේ** සියොන් 5
කන්දේ මුළු වාසස්ථානයටත් එහි
රැස්වීම්වලටත් ඉහළින් දවාලේ
වලාකුළක් හා දුමාරයක්ද රාත්‍රියෙහි
ඇවිළෙන ගින්නක දීප්තියද මවා තබන-
සේක. මක්නිසාද මුළු තේජස පිට ඉහළින්
වියනක් වන්නේය. දවාලේදී ග්‍රීෂ්මයෙන් 6
මුවාවීමට සෙවණක් පිණිසත් රක්ෂා-
ස්ථානයක් පිණිසත් කුණාටුවෙන් හා
වර්ෂාවෙන් සැඟවෙන ස්ථානයක්
පිණිසත් කුඩාරමක් වන්නේය.

## සෙනග මිදිවත්තකට උපමා කිරීම. ඒ පිට ශාප හය

5 මාගේ ප්‍රේමවන්තයාගේ මිදිවත්ත
ගැන ඔහුගේ ගීතිකාව මාගේ
ප්‍රේමවන්තයා උදෙසා ගීතිකාකරන්නෙමි.
මාගේ ප්‍රේමවන්තයාට ඉතා සාරවත්
2 කන්දක මිදිවත්තක් තිබුණේය. ඔහු ඒක
වටකොට අගළක් කපා, ගල් අහක්කොට,
ඉතා හොඳ මිදිවැල් හිටුවා, එහි මැද
මුරකොටුවක් ගොඩනගා, එහි මිදි
යන්ත්‍රයක් සාදා, හොඳ මුද්‍රික ඵල
හටගන්නවා ඇත කියා බලාසිටියේය.
නුමුත් හටගත්තේ වල් මිදි ඵලය.
3 ඉතින්, යෙරුසලමේ වැසියෙනි, යූදහි
මනුෂ්‍යයෙනි, මා සහ මාගේ මිදිවත්ත
4 අතරේ විනිශ්චයකරපල්ලා. මාගේ
මිදිවත්ත උදෙසා මා විසින් නොකළාවූ
වෙන කුමක් කරන්ට පුළුවන්ව තිබුණේද?
එහි හොඳ මුද්‍රික ඵල හටගන්නවා මා
බලාසිටි විට වල් මුද්‍රික ඵල හටගත්තේ
5 මක්නිසාද? ඉතින් මාගේ මිදිවත්තට
කරන්ට යන දෙය තුඹලාට කියමි. මම
එහි වැට පහකරන්නෙමි, එවිට ඒක
පාගාදමනු ලබන්නේය. එහි තාප්පය
බිඳදමන්නෙමි, එවිට එය මඩිනු
6 ලබන්නේය. මම ඒක පාළුවට අරින්නෙමි;
එහි අතු පාහිනු ලබන්නේවත් එය
කොටනු ලබන්නේවත් නැත. නුමුත් කටු
ගස් සහ ගොකටු එහි හටගන්නවා
ඇත. එහි වැසි නොවසින හැටියට
7 වලාකුල්වලට අණකරන්නෙමි. මක්නිසාද
සේනාවල **ස්වාමීන්වහන්සේගේ** මිදිවත්ත
නම් ඉශ්‍රායෙල් වංශයය, උන්වහන්සේගේ
ප්‍රිය පැළෑටිය නම් යූද මනුෂ්‍යයෝය.
උන්වහන්සේ යුක්තිය දකින්ට බලා-
සිටිසේක, නුමුත් තිබුණේ අයුක්තියය;
ධර්මිෂ්ඨකම දකින්ට බලාසිටිසේක,
නුමුත් තිබුණේ විලාපයය.
8 දේශ මැද තමුන්ම පමණක් වාසය
කරන පිණිස, ඉඩ නැතිවෙන තරම්,
ගෙයකට ගෙයක් එකතුකරගන්නාවූ,
කෙතකට කෙතක් වැඩිකරගන්නාවූ අයට
9 දුක් වේ! සැබවින්ම මහත්වූ අලංකාරවූ
බොහෝ ගෙවල් වැසියන් නැතුව
පාළුවන්නේයයි සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මාගේ කන්වලට කියනසේක.
අක්කර දසයක මිදිවත්තෙන් *බාත් 10
එකක්ද බුසල් දසයක බීජවලින් බුසලක්ද
අස්වැන්න ලැබෙන්නේය.
මද්‍යපානය පස්සේ යන පිණිස 11
උදෑසනම නැගිටින්නාවූ, මුද්‍රිකපානයෙන්
ඇවිළෙන ලෙස රෑවෙන තුරු ප්‍රමාද
වෙන්නාවූ අයට දුක් වේ! ඔවුන්ගේ 12
මංගල්‍යවල වීණාව සහ කුඩා වීණාවත්
රබානත් නළාවත් මුද්‍රිකපානයත් ඇත.
නුමුත් ඔවුන් **ස්වාමීන්වහන්සේගේ**
ක්‍රියාව සලකන්නේවත් උන්වහන්සේගේ
අත්වල ක්‍රියාව කල්පනාකළේවත් නැත.
එබැවින් මාගේ සෙනග දැනුම නැතුවායින් 13
වහල්කමට ගියෝය. ඔවුන්ගේ උත්-
තමයෝද බඩගිනි විඳිති, ඔවුන්ගේ
සමූහයාද පිපාසායෙන් වේළී සිටිති.
එබැවින් †මිනීවළ ස්වකීය ආශාව අධික 14
කොට, ප්‍රමාණයක් නැතුව කට ඇර
ගත්තේය. ඔවුන්ගේ ඉසුරුද ඔවුන්ගේ
සමූහයාද ඔවුන්ගේ ඝෝෂාවද ඔවුන්
අතරේ ප්‍රීතිවන්නාද ඊට බැසයනවා ඇත.
මෙසේ පහත් මනුෂ්‍යයා යටත් කරනු 15
ලැබේ, උසස් මනුෂ්‍යයාද පහත් කරනු
ලැබේ, උඩඟු අයගේ ඇස්ද පහත්කරනු
ලැබේ. නුමුත් සේනාවල **ස්වාමීන්වහන්සේ** 16
විනිශ්චය කරණකොටගෙන උසස්වන-
සේක. ශුද්ධ තැනන්වහන්සේ වන
දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨකම කරණ-
කොටගෙන ශුද්ධ බව ප්‍රකාශවෙයි. එකල 17
බැටළු පැටවී උන්ගේ පිට්ටනිවල මෙන්
තෘණ කන්නෝය, ධනවතුන්ගේ පාළු
තැන්ද විදේශියෝ භුක්තිවිඳින්නෝය.
නිෂ්ඵලකම නැමති ලනුවලින් අයුතු- 18
කමත් ගැල් රැහැණකින් මෙන් පාපයත්
අදින්නාවූ, අපට පෙනෙන පිණිස උන්- 19
වහන්සේ ඉක්මන් වී තමන්ගේ ක්‍රියාව
කඩිනම්කරනසේක්වා, අප විසින්
දැනගන්ට ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්-
වහන්සේගේ මන්ත්‍රණය ළංව ඒවයි
කියන්නාවූ අයට දුක් වේ!
නපුරට යහපතය කියාද යහපතට 20
නපුරය කියාද කියන්නාවූ, එළිය වෙනුවට
අඳුරත් අඳුර වෙනුවට එළියත් තබන්නාවූ,
මිහිර වෙනුවට තිත්තත් තිත්ත වෙනුවට
මිහිරත් තබන්නාවූ අයට දුක් වේ!
තුමූ ප්‍රඥාවන්තයෝයයි සිතන්නාවූද 21

*ගැලොම් 8 $^{1}/_{2}$ යි. †ෂෙයෝල

තුමූ නුවණැත්තෝයයි කල්පනාකරන්-
නාවූද අයට දුක් වේ!
22 මුද්‍රිකපානය බීමට සමර්ථවූ, සුරා
මිශ්‍ර කිරීමට ධෛර්යමත් මනුෂ්‍යයෝවූ,
23 අල්ලසකට දුෂ්ටයා නිදෙස්කර
ධර්මිෂ්ඨයාගේ යුක්තිය ඔවුන්ගෙන්
24 පහකරන්නාවූ අයින්ට දුක් වේ! එබැවින්
ගිනි දල්ලට ඉපනැල්ල දලායන්නාක්මෙන්ද
වියළි තෘණ ගින්නට වැටීයන්නාක්මෙන්ද
ඔවුන්ගේ මුල දිරුම මෙන් වන්නේය,
ඔවුන්ගේ මල ධූලි මෙන් නැගීයන්නේය.
මක්නිසාද ඔව්හු සේනාවල ස්වාමීන්-
වහන්සේගේ ව්‍යවස්ථාව එපාකර,
ඉශ්‍රායෙල්වරුන්ගේ ශුද්ධ තැනන්-
වහන්සේගේ වචනය සුළුකළෝය.
25 එබැවින් ස්වාමීන්වහන්සේගේ උදහස
තමන්ගේ සෙනඟට විරුද්ධව ඇවිළ,
උන්වහන්සේ ඔවුන්ට විරුද්ධව තමන්ගේ
අත දිගුකොට, හෙල් චංචලවෙන්ටත්
ඔවුන්ගේ මළකඳන් කසළ මෙන් වීථිවල
තිබෙන්ටත් ඔවුන්ට පහරදුන්සේක. මේ
සියල්ල වූ නුමුත් උන්වහන්සේගේ උදහස
පහ නොවී, උන්වහන්සේගේ හස්තය
26 තවම දිගුකර තිබේ. තවද උන්වහන්සේ
දුර සිටින ජාතීන්ට කොඩියක් ඔසවා,
පොළොවේ කෙළවර සිටින ඔවුන්ට
සංඥකර අඬගසනසේක. බලව, ඔව්හු
27 ඉක්මන්වී වේගයෙන් එන්නෝය. ඔවුන්
අතරෙන් කිසිවෙක් ක්ලාන්තවෙන්නේවත්
පැකිලෙන්නේවත් නැත; කිසිවෙක් නිදිමත
නොවන්නේය, නිද නොගන්නේය;
ඔවුන්ගේ ඉඟපටි නොලිහෙන්නේය,
මිරිවැඩි පටිය නොකැඩෙන්නේය.
28 ඔවුන්ගේ ඊගස් තියුණුකර තිබේ,
ඔවුන්ගේ සියලු දුනු නැත්කවා තිබේ;
ඔවුන්ගේ අසුන්ගේ කුර ගිනිගල්ද
ඔවුන්ගේ රථචක්‍ර සුළිහුළඟද කොට
29 ගණන්ගනු ලැබේ. ඔවුන්ගේ ගෙරවීම
සිංහ නාදයකට සමානය, ඔව්හු තරුණ
සිංහයන් මෙන් ගොරවන්නෝය. එසේය,
ඔව්හු ගර්ජනාකොට, ගොදුර අල්ලා
සුරැකිව ගෙනයන්නෝය, ගළවන්ට
30 කිසිවෙක්ද නොවන්නේය. ඔව්හු ඒ දවසේ
මුහුදේ ගර්ජනාව මෙන් මොවුන්ට
විරුද්ධව ගර්ජනාකරන්නෝය. එවිට
දේශය දෙස යමෙක් බැලුවොත්
අන්ධකාරයත් විපතත් පෙනෙයි, එහි
වලාකුල්වල එළිය අඳුරු වී තිබේ.

## අනාගතවක්තෘවරයා කැඳවීම සහ පත්කිරීම

6 උස්සියා රජු නැසුණු අවුරුද්දේදී
ස්වාමීන්වහන්සේ උස්වූ උසස්වූ
සිංහාසනයක වැඩ හිඳිනවා දුටිමි,
උන්වහන්සේගේ වස්ත්‍ර කෙළවරින්
මාළිගාව පිරී තිබුණේය. උන්වහන්සේ 2
අවටින් සෙරාප්වරු සිටියෝය. එක්
එක්කෙනාට පියාපත් හය බැගින්
තිබුණේය; දෙකකින් මුහුණ වසාගත්තේය,
දෙකකින් පාද වසාගත්තේය, දෙකකින්
පියාසර කෙළේය. ඔව්හු එක්කෙනෙක් 3
අනිකෙකුට මොරගසමින්: සේනාවල
ස්වාමීන්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය.
මුළු පොළොව උන්වහන්සේගේ තේජසින්
පිරී තිබේයයි කීවෝය. එවිට මොරගැසූ 4
තැනැත්තාගේ හඬට එළිපත්වල අත්-
තිවාරම් සෙලවුණේය, ගෘහයද දුමෙන්
පිරුණේය. එවිට මම කථාකොට: අහෝ! 5
මට දුක් වේ! මක්නිසාද මට විනාශය
විය; කුමක් හෙයින්ද අපවිත්‍ර තොල්
ඇති මනුෂ්‍යයෙක්ව සිටින්නාවූ, අපවිත්‍ර
තොල් ඇති සෙනඟක් අතරේ වසන්නාවූ
මම සේනාවල ස්වාමිවූ රජ්ජුරුවන්-
වහන්සේ මාගේ ඇස්වලින් දුටුවෙමියි
කීමි. එවිට සෙරාප්වරුන්ගෙන් එක්- 6
කෙනෙක් අඬුවෙන් පූජාසනය මත්තෙන්
ගත් ගිනි අඟුරක් අතින් රැගෙන මා
ළඟට පියාසරකර ඇවිත්, ඒක මාගේ 7
මුඛයෙහි තවරා කථාකොට: බලව, මේක
නුඹේ තොල්වල තැවරුණේය; මෙසේ
නුඹේ අපරාධය පහකරනලද්දේය, නුඹේ
පාපය කමාකරනලද්දේයයි කීය. එවිට: 8
මම කවරෙකු යවම්ද? අප උදෙසා
යන්නේ කවුදැයි කියන්නා වූ ස්වාමීන්-
වහන්සේගේ හඬ මට ඇසුණේය. මමද:
මෙන්න මම මෙහිය; මා යැවුව මැනවයි
කීමි. උන්වහන්සේ: නුඹ ගොස් මේ 9
සෙනඟට කථාකොට–නුඹලා අසමින්ම
තේරුම් නොගෙන දකිමින්ම දැන
නොගෙන සිටිල්ලායයි කියාපන්න. මේ 10
සෙනඟ තමුන්ගේ ඇස්වලින් නොදැක,
තමුන්ගේ කන්වලින් නොඅසා, තමුන්ගේ
සිත්වලින් තේරුම් නොගෙන, නොහැරී,
සුවය නොලැබ සිටින පිණිස, ඔවුන්ගේ
සිත දැඩිකර, ඔවුන්ගේ කන් බිහිරිකර,

ඔවුන්ගේ ඇස් අඳුරුකරපන්නැයි කීසේක.
11 එවිට මම: ස්වාමීන්වහන්ස, කොපමණ
කලකටදැයි ඇසුවෙමි. උන්වහන්සේද:
වැසියෙක් නැතිව නුවරවල්ද මනුෂ්‍යයෙක්
නැතිව ගෙවල්ද පාළුවීමත්, දේශය
12 මුළුමනින්ම පාළුවීමත්, **ස්වාමීන්වහන්සේ**
විසින් මනුෂ්‍යයන් ඈතට පහකිරීමත්,
දේශයෙහි මහත් හිස්කමක් වීමත්
13 සිදුවෙන තුරුය. පසුව දසයෙන් කොටසක්
එහි ඉතුරුවුණත් ඒක නැවත නාස්ති-
කරනු ලබන්නේය. එහෙත් ඒලොන්
ගසක්ද අලෝන ගසක්ද කපාදැමූ කල
එහි පණ තිබෙන්නාක්මෙන්ම ශුද්ධවූ
වංශය ඔවුන්ගේ ප්‍රාණයයයි කීසේක.

## යූදට විරුද්ධවූ සිරිය-ඉශ්‍රාලිත වටලෑම ගැන ධෛර්යදීම

7 තවද උස්සියාගේ පුත්‍රවූ යෝතාම්ගේ
පුත්‍රයා වන යූදහි රජවූ ආහාස්ගේ
දවස්වලදී සිරියේ රජවූ රෙශීන්ද
රෙමලියාගේ පුත්‍රවූ, ඉශ්‍රායෙල්හි රජවූ
පෙකාද යෙරුසලමට විරුද්ධව යුද්ධ
කරන්ට ආවෝය; නුමුත් ජයගන්ට
2 නොහැකි වූවෝය. සිරියවරුන් එප්‍රායිම්හි
සිටින බව දාවිත්ගේ වංශයට දන්වන
ලද්දේය. එවිට රජුගේ සිතද ඔහුගේ
සෙනගගේ සිතද වනයේ ගස් හුළඟට
සෙලවෙන්නාක්මෙන් චංචලවුණෝය.
3 එකල **ස්වාමීන්වහන්සේ** යෙසායාට
කථාකොට: නුඹ සහ නුඹේ පුත්‍රවූ
ෂෙයාර්-යාෂුබ් ආහාස් සම්බවෙන්ට
අපුල්ලන්නන්ගේ පිට්යේ මාවතෙහි ඉහළ
පොකුණේ කාණුවේ කෙළවරට ගොස්
4 ඔහුට කථාකොට: නුඹ භය නොවී
නිශ්චලව සිටින්ට බලාගනින්න; දුම්
නගින ඒ ගිනිපෙනෙලි දෙකෙළවරවූ
රෙශීන් සහ සිරියවරුන්ගෙත්
රෙමලියාගේ පුත්‍රයාගෙත් තද කෝපය
නිසා නුඹේ සිත දුර්වල නොවේවා.
5 සිරියවරුද එප්‍රායිම්ද රෙමලියාගේ
6 පුත්‍රයාද කථාකොට: අපි යූදට විරුද්ධව
ගොස්, ඊට පීඩාකර, ඒක බිඳගන
ඇතුළුවී, ඒ මැද ටාබෙයෙල්ගේ පුත්‍රයා
රජකොට තබමුව කියා නුඹට විරුද්ධව
7 නපුරක් යොදගත් බැවින්, ඒක ස්ථිර
නොවන්නේය. සිද්ධ නොවන්නේයයි
**ස්වාමිවූ දෙවියන්වහන්සේ** කියනසේක.
මක්නිසාද සිරියේ ඉස නම් දමස්කයය, 8
දමස්කයේ ඉස නම් රෙශීන්ය. තව
හැටපස් අවුරුද්දකින් එප්‍රායිම් සෙනගක්ව
නොසිටින හැටියට සුනුවිසුණු කරනු
ලබන්නේය. එප්‍රායිම්ගේ ඉස නම් සමාරියය, 9
සමාරියේ ඉස නම් රෙමලියාගේ
පුත්‍රයාය. නුඹලා විශ්වාස නොකරන්නහු
නම් සැබවින්ම නුඹලා ස්ථිර නොවන්-
නහුයයි ඔහුට කියාපන්නැයි කීසේක.

## එම්මානුවෙල් නමැති ලකුණ

**ස්වාමීන්වහන්සේ** තව දුරටත් ආහාස්ට 10
කථාකොට: නුඹේ දෙවිවූ **ස්වාමීන්-** 11
**වහන්සේ** වෙතින් ලකුණක් නුඹට
ඉල්ලාපන්න; පහත ගැඹුරෙන් හෝ ඉහළ
අහසින් හෝ එය පැමිණෙන ලෙස
ඉල්ලාපන්නැයි කීසේක. නුමුත් ආහාස්: 12
මම නොඉල්ලමි, **ස්වාමීන්වහන්සේ**
පරීක්ෂා නොකරමියි කීවේය. එවිට 13
ඔහු කථාකොට: එම්බා දාවිත්ගේ
වංශය, ඉතින් අසාපල්ලා; නුඹලා
මාගේ දෙවියන්වහන්සේ වෙහෙසන්නේ
මනුෂ්‍යයන් වෙහෙසනවා මදිවාටද?
එබැවින් ස්වාමීන්වහන්සේම නුඹලාට 14
ලකුණක් දෙනසේක; බලව, කන්‍යාව
ගර්භිණීව පුත්‍රයෙකු වදා, එම්මානුවෙල්
යන නම ඔහුට තබන්නීය. ඔහු නපුර 15
එපාකොට යහපත තෝරාගන්ට දැන-
ගන්නා කල, දීකිරිත් මීපැණිත් කන්නේය.
මක්නිසාද දරුවා නපුර එපාකොට 16
යහපත තෝරාගැනීම දැනගන්ට පළමු-
වෙන් නුඹ භයවෙන රජවරුන් දෙදෙනා-
ගේ දේශය අත්හරිනු ලබන්නේයයි
කීවේය. එප්‍රායිම් යූදගෙන් වෙන්වුණ 17
කාලයේ පටන් නොවූ විධියේ දවස් අෂූර්හි
රජු කරණකොටගෙන **ස්වාමීන්වහන්සේ**
නුඹ පිටටත් නුඹේ සෙනග පිටටත් නුඹේ
පිය වංශය පිටටත් පමුණුවනසේක.

## අසිරියයන් විසින් වටලෑමේදී ඉශ්‍රායෙල්ට වන මහත් හිඟකම කලින් දන්වීම

ඒ දවසෙහි, **ස්වාමීන්වහන්සේ** මිසරයේ 18
ගංගාවල් අසබඩ ඉන්න මැස්සන්ටත්
අෂූර් දේශයෙහි ඉන්න මීමැස්සන්ටත්
සංඥාකර හඬගසාගන්නවා ඇත. උන් 19

සියල්ලෝම ඇවිත්, පාළු මිටියාවත්වලද
පර්වත විවරවලද සියලු කටු ගස්වලද
සෑම ගොදුරු බිම්වලද රඳන්නෝය.
20 ඒ දවසෙහි ස්වාමීන්වහන්සේ *ගංගාවට
එගොඩින් කුලියට ගත් දළිපිහිය වන
අෂූර්හි රජු ලවා හිසේද පාදවලද කේශ
කපාදමනවා ඇත. රැවුලත් එයින්
සිඳදමනු ලබන්නේය.
21 ඒ දවසෙහි මනුෂ්‍යයෙක් තරුණ
එළදෙනකුත් බැටළුවන් දෙන්නෙකුත්
තබාගන, උන් දෙන කිරි බොහෝ නිසා
22 දීකිරි කන්නේය. මක්නිසාද දේශයෙහි
ඉතුරු වෙන සියල්ලෝම දීකිරි සහ
මීපැණිත් කන්නෝය.
23 ඒ දවසෙහි රිදී දහසක් වටින මිදි වැල්
දහසක් ඇති සෑම ඉඩම්වල කටු ගස්ද
24 ගොකටුද හටගන්නවා ඇත. එහි යන
තැනැත්තා ඊගස්ද දුනුද ඇතුව යා යුතුය;
මක්නිසාද දේශය මුළුල්ලෙහි කටු ගස්ද
25 ගොකටුද ඇති වන්නේය. උදැල්ලෙන්
කොටන සියලු කඳුවලට වුවත්
කටුගස්වලට සහ ගොකටුවලට භය
නිසා තුඹ නොයන්නෙහිය, එය වනාහි
ගවයන් දක්කා හරින්නාවූ, බැටළුවන්
පාගන්නාවූ ස්ථානයක් වන්නේය.

## සිරියාවේ විනාශය කලින් කීම

8 ස්වාමීන්වහන්සේ මට කථාකොට:
තුඹ මහත් ලෑල්ලක් ගෙන
මනුෂ්‍යයෙකුගේ පත් හිඳෙන් †මහෙර්-
ෂාලාල්-හාෂ්-බස්යයි එහි ලියාපන්න.
2 මමද විශ්වාස සාක්ෂිකාරයින් වන
උරියා පූජකයාත් යෙබෙරෙකියාගේ පුත්‍රවූ
සෙකරියාත් සාක්ෂියට ගන්නෙමියි
3 කීසේක. මම අනාගතවක්තෘය කරා
ගියෙමි; ඈ ගර්භිණීව පුත්‍රයෙකු වැදුවාය.
එවිට ස්වාමීන්වහන්සේ මට කථාකොට:
ඔහුට †මහෙර්-ෂාලාල්-හාෂ්-බස් යන
4 නම තබාපන්න. මක්නිසාද: තාත්තේ,
අම්මේ කියා හඬගසන්ට දරුවා
දැනගන්ට පළමුවෙන් දමස්කයේ වස්-
තුවත් සමාරියේ කොල්ලයත් අෂූර්හි
රජු ඉදිරියට ගෙනයනු ලබන්නේයයි
කීසේක.

*එනම්, ප්‍රාත් ගංගාව
†එනම්, කොල්ලය ඉක්මන්වේ; කොල්ල
කෑම කඩිනම්වේ.

## අසිරියයන්ගේ වටලෑම කලින් දැන්වීම: ඊට භය නොවීම

ස්වාමීන්වහන්සේ නැවතත් මට 5
කථාකොට: මේ සෙනඟ හෙමින් බැස- 6
යන්නාවූ ෂිලොවාහි ජලය එපාකොට
රෙශීන්ද රෙමලියාගේ පුත්‍රයාද කෙරෙහි
ප්‍රීතිවන බැවින්, බලව, ස්වාමීන්වහන්සේ 7
අෂූර්හි රජද ඔහුගේ මුළු තේජසද වන
*ගංගාවේ බලවත්වූ බොහෝවූ ජලයන්
ඔවුන් පිටට පමුණුවනසේක. ඒක එහි
සියලු පාරවලින් පිටතට පැමිණ, එහි
සියලු ඉවුරු උඩින් ගලා ඇවිත්, යූදට 8
වැද ගලා යටකරගන, බෙල්ල දක්වාම
නගිනවා ඇත. එම්බා එම්මානුවෙල්,
ඔහුගේ පියාපත් විහිදීමෙන් තුඹේ දේශය
මුළුල්ලම පිරෙනවා ඇතැයි කීසේක.
ජනයෙනි, ඝෝෂාකරපල්ලා, තුඹලා 9
කැබලිකරනු ලබන්නහුය; දුර රටවල
වසන සියල්ලෙනි, කන්දීපල්ලා. ආයුධ
බැඳගනිල්ලා, තුඹලා කැබලිකරනු
ලබන්නහුය; ආයුධ බැඳගනිල්ලා, තුඹලා
කැබලිකරනු ලබන්නහුය. තුඹලා එක්ව 10
මන්ත්‍රණයකරපල්ලා, ඒක නිෂ්ඵල-
වන්නේය; වචනය කථාකරපල්ලා, ඒක
ස්ථිර නොවන්නේය. මක්නිසාද දෙවියන්-
වහන්සේ අප සමග සිටිනසේක. තවද 11
ස්වාමීන්වහන්සේ බලවත් හස්තයක්
ඇතුව මට කථාකොට, මේ සෙනඟගේ
මාර්ගයෙහි නොයන හැටියට මට
දැනමුතුකම් දෙමින්, මෙසේ කීසේක: මේ 12
සෙනඟ විසින් ද්‍රෝහිකාරකමය කියන
සියල්ලට තුඹලා ද්‍රෝහිකාරකමයයි
නොකියල්ලා; ඔවුන් භයවන දේට
භයනොවෙල්ලා, තැති නොගනිල්ලා.
සේනාවල ස්වාමීන්වහන්සේම ශුද්ධයයි 13
සලකාපල්ලා; තුඹලා භයවෙන්ටත්
තැතිගන්ටත් ඕනෑ උන්වහන්සේ ඉදිරි-
යෙහි පමණක්ය. උන්වහන්සේ ශුද්ධස්- 14
ථානයක් පිණිස වනසේක, එහෙත්
ඉශ්‍රායෙල් වංශ දෙකට බාධාවීමේ ගලක්ව,
පැකිළීමේ පර්වතයක්ව, යෙරුසලමේ
වැසියන්ට උගුලක්ව, මලපතක්ව
සිටිනසේක. බොහෝ දෙනෙක්ද එහි වැටී, 15

*එනම්, ප්‍රාත් ගංගාවේ.

පොඩිවී, මලපතට වැටී, අසුවෙනවා ඇත.
16 තුඹ සාක්ෂිය බැඳ, ව්‍යවස්ථාව මුද්‍රාකර,
මාගේ ගෝලයන් අතරේ තබාපන්නැයි
17 කීසේක. මම වනාහි යාකොබ්ගේ වංශයෙන්
තමන්ගේ මුහුණ සඟවාගන්න **ස්වාමීන්-
වහන්සේ** ගැන බලාසිට, උන්වහන්සේ
18 ගැන බලාපොරොත්තුවන්නෙමි. බලව,
මමද **ස්වාමීන්වහන්සේ** මට දුන්
දරුවෝද සියොන් කන්දෙහි වසන
සේනාවල **ස්වාමීන්වහන්සේ** කෙරෙන්
ඉශ්‍රායෙල්ට ලකුණුද පුදුමද පිණිස
සිටිමුව.
19 ඔව්හු කෙඳිරිගාන්නාවූ තොල්
මතුරන්නාවූ ආත්මබන්ධනකාරයන්-
ගෙන්ද අණවිනකාරයන්ගෙන්ද විභාග-
කරපල්ලායයි තුඹලාට කියන විට,
සෙනඟක් විසින් ස්වකීය දෙවියන්-
වහන්සේගෙන් විභාගකරන්ට යුතු
නොවේද? ජීවතුන් උදෙසා මළවුන්ගෙන්
20 විචාරන්ට යුතුදැයි අසාපල්ලා. ව්‍යවස්ථා-
වද සාක්ෂියද වෙතට යමු! ඒ වචනයේ
හැටියට ඔවුන් නොකීවොත් ඔවුන්ට
පහන්වීමක් නැත.

## මෙසියස්වහන්සේ

21 ඔව්හු අමාරුවට වැටී, බඩගිනිව, රටෙහි
ඔබ මොබ යන්නෝය. ඔවුන්ට
බඩගිනිවන විට තරහවී, තමුන්ගේ
රජුටද තමුන්ගේ දෙවියන්වහන්සේටද
22 දෙස් කියා උඩ බලන්නෝය. ඔව්හු
පොළොව දෙසත් බලන්නෝය, එහි
විපතද අන්ධකාරයද ශෝකයේ අඳුරද
තිබේ; ඔව්හු ඝනාන්ධකාරයට පන්නනු
9 ලබන්නෝය. එහෙත් තද වේදනා-
වෙන් සිටියාවූ ඇට අඳුරක්
නොවන්නේය. පළමු කාලයේදී
උන්වහන්සේ සාබුලොන් රටද නප්තලී
රටද පහත්කළසේක, නුමුත් අන්තිම
කාලයේදී උන්වහන්සේ යොර්දන් අසබඩ
මුහුදු පළාතවූ ජාතීන්ගේ ගලීලය
2 මහිමතාවට පැමිණවූසේක. අන්ධකාරයෙහි
ඇවිද්දවූ සෙනඟ මහත් ආලෝකයක්
දුටුවෝය. මරණ සෙවණ ඇති දේශයෙහි
විසූ අය කෙරෙහි එළියක් බැබළුණේය.
3 ඔබ ජාතිය වැඩිකළසේක, ඔබ ඔවුන්ගේ
ප්‍රීතිය වර්ධනයකළසේක. ගොයම් කපන
කාලයෙහි සන්තෝෂවන්නාක් මෙන්ද
මනුෂ්‍යයන් කොල්ලය බෙදාගන්න කල
ප්‍රීතිවන්නාක්මෙන්ද ඔව්හු ඔබ ඉදිරියෙහි
ප්‍රීතිවෙති. මක්නිසාද ඔහුගේ බරවූ 4
වියගහද ඔහුගේ කරේ දණ්ඩද ඔහුගේ
පීඩාකාරයාගේ යෂ්ටියද මිදියන්හි
දවසේදී මෙන් ඔබවහන්සේ කඩාදැමූ-
සේක. තවද කෝලාහලයට පැමිණෙන 5
යුද්ධකාරයාගේ සියලු යුද්ධ වහන්ද
ලෙයෙහි පෙඟූ වස්ත්‍රද ගින්නෙහි දැවීමට
දර පිණිස වන්නේය. මක්නිසාද අපට 6
ළදරුවෙක් උපන්නේය, අපට පුත්‍රයෙක්
දෙනලද්දේය; ආණ්ඩුවද උන්වහන්සේගේ
කර පිට තිබෙන්නේය. උන්වහන්සේගේ
නාමය අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රම-
වත් දෙවියන්වහන්සේය, සදාකාල
පියාණෝය, සමාදානයේ කුමාරයායයි
කියනු ලබන්නේය. මෙතැන් පටන් 7
සදාකාලයටම දාවිත්ගේ සිංහාසන-
යත් ඔහුගේ රාජ්‍යයත් යුක්තියෙන්ද
ධර්මිෂ්ඨකමෙන්ද ස්ථිරකර පිහිටුවන
පිණිස ඒවා කෙරෙහි උන්වහන්සේගේ
ආණ්ඩුවේ විශාලත්වයටත් සමාදානයටත්
කෙළවරක් නොවන්නේය. සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** ජ්වලිතය මෙය
ඉෂ්ටකරන්නේය.

## දඬුවම් සඳහා එසෙව්වාවූ අත ගැන දර්ශනය

ස්වාමීන්වහන්සේ යාකොබ්ට වචනයක් 8
එවූසේක, ඒක ඉශ්‍රායෙල් වෙතට
බැස්සේය. ගඩොල් වැටීගිය නුමුත් අපි 9
කැපූ ගල්වලින් ගොඩනගන්නෙමුව;
අත්තික්කා ගස් කපාදැමූ නුමුත් අපි ඒ
වෙනුවට කිහිරි ගස් වවන්නෙමුයයි
සිතේ එඩිතරකමෙන්ද අහංකාරයෙන්ද 10
කියන්නාවූ එප්‍රායිම් සහ සමාරියේ
වැසියෝද වන මුළු සෙනඟ ඒක දැන-
ගන්නෝය. එබැවින් **ස්වාමීන්වහන්සේ** 11
රෙශීන්ගේ එදිරිකාරයන් ඔවුන්ට විරුද්-
ධව උසස්කර, ඔවුන්ගේම සතුරන්ද
පොළඹවනසේක; සිරියවරු ඉස්සරින්ද 12
පිලිස්තිවරු පස්සෙන්ද ඇවිත් මුඛය හැර
ඉශ්‍රායෙල් කාදමන්නෝය. මේ සියල්ල

වූ නුමුත් උන්වහන්සේගේ උදහස පහ
නොවී, උන්වහන්සේගේ හස්තය තවම
දිගුකර තිබේ.
13 එහෙත් සෙනඟ තමුන්ට පහරදුන්
තැනන්වහන්සේ වෙතට නොහැරී,
සේනාවල ස්වාමීන්වහන්සේ නො-
14 සෙවූවෝය. එබැවින් ස්වාමීන්වහන්සේ
හිස සහ වල්ගයද තල්අත්ත සහ
පන්ගසද එක දවසේදීම ඉශ්‍රායෙල්ගෙන්
15 කපාදමනසේක. හිස නම් වෘද්ධයා සහ
ගෞරව ඇත්තාය; වල්ගය නම් බොරු
16 උගන්වන අනාගතවක්තෘය. මක්නිසාද
මේ සෙනඟට මඟ පෙන්වන්නෝ ඔවුන්
මුළාකරවති; ඔවුන් විසින් ගෙනයනු
17 ලබන්නෝද නාස්තිවෙති. එබැවින්
ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ යෞවනයන්
කෙරෙහි ප්‍රීති නොවනසේක, ඔවුන්ගේ
පියා නැත්තන්ටත් වැන්දඹුවන්ටත් අනු-
කම්පා නොකරනසේක. මක්නිසාද
ඔවුන් සියල්ලෝම අභක්තිකයෝද
නපුර කරන්නෝද වෙති, සියලු මුඛද
නින්දිත දේ කථාකෙරෙති. මේ සියල්ල
වූ නුමුත් උන්වහන්සේගේ උදහස පහ
නොවී, උන්වහන්සේගේ හස්තය තවම
දිගුකර තිබේ.
18 මක්නිසාද දුෂ්ටකම ගින්න මෙන් දවයි;
ඒක කටුගස්ද ගොකටුද නාස්ති කරයි;
එසේය, එය කැලෑවේ අකුල්වල ඇවිළී,
ඝනවූ දුම්-වලාකුල් ඉහළට නගිති.
19 සේනාවල ස්වාමීන්වහන්සේගේ උදහසින්
දේශය දලා ගියාය. සෙනඟද ගින්නට
දර මෙන් වෙති; කිසිවෙක් තමාගේ
සහෝදරයාට කරුණා නොකෙරෙයි.
20 කෙනෙක් දකුණු පැත්තෙහි ගසාකන
නුමුත්, බඩගිනිව සිටියි; ඔහු වම්
පැත්තෙහි කන නුමුත්, ඔව්හු තෘප්තියට
නොපැමිණෙති. එකිනෙකා තම තමාගේ
21 බාහුවේ මාංසය කන්නේය. මනස්සේ
විසින් එප්‍රායිම්ද එප්‍රායිම් විසින්
මනස්සේද කාදමනවා ඇත. ඔවුන්
දෙගොල්ලම එකතුව යූදට විරුද්ධ-
වන්නෝය. මේ සියල්ල වූ නුමුත්
උන්වහන්සේගේ උදහස පහ නොවී
උන්වහන්සේගේ හස්තය තවම දිගුකර
තිබේ.

10 දුර්වලයන් විනිශ්චයෙන් අහක්
කරන පිණිසත්, මාගේ සෙනඟගේ
දුප්පතුන්ගේ යුක්තිය පෙරළන පිණිසත්,
වැන්දඹුවන් තමුන්ගේ කොල්ලය වන
පිණිසත්, පියා නැත්තවුන් තමුන්ගේ
ගොදුරු කරගන්න පිණිසත්, අධර්මිෂ්ඨ 2
නියෝග නියමකරගන්නන්ටද අයුක්ති
සටහන්කර තබන්නන්ටද දුක් වේ!
පළිගැනීමේ දවසේදීත් දුරින් එන 3
විනාශයේදීත් නුඹලා කුමක් කරන්නහුද?
උපකාර ලැබීම පිණිස නුඹලා කා
ළඟට පලායන්නහුද? නුඹලාගේ තේජස
කොතැන තබා යන්නහුද? ඔවුන් 4
හිරකාරයන් යටතෙහි පහත්වී
මැරුම්කෑවුන් අතරේ වැටෙනවා ඇත.
මේ සියල්ල වූ නුමුත් උන්වහන්සේගේ
උදහස පහ නොවී උන්වහන්සේගේ
හස්තය තවම දිගුකර තිබේ.

## ඉශ්‍රායෙල්ට දඬුවම්කිරීමට අණ ලැබූ අසිරියාවේ වැටීම කලින් දන්වීම

අහෝ මාගේ උදහස නැමැති පොල්ලවූද 5
මාගේ කෝපය නමැති සැරයටිය ස්වකීය
අතෙහි ඇත්තාවූද අෂූරියය! අභක්තික 6
ජාතියකට විරුද්ධව ඔහු එවන්නෙමි,
මාගේ උදහසේ සෙනඟගෙන් කොල්ල-
කන්ටද සම්පත් උදුරාගන්ටද වීථිවල
මඩ මෙන් ඔවුන් පාගාදමන්ටද ඔවුන්ට
විරුද්ධව ඔහුට අණදෙන්නෙමි. නුමුත් 7
ඔහු එසේ අදහස්කරන්නේවත් ඔහුගේ
සිතින් එසේ සිතන්නේවත් නැත;
ස්වල්ප ගණනක් නොවන ජාතීන්
විනාශකරන්ටද සිඳදමන්ටද ඔහුගේ
සිතෙහි තිබේ. ඔහු කථාකොට: මාගේ 8
අධිපතීන් සියල්ලෝම රජවරු නොවේද?
කල්නෝ කර්කෙමිෂ් වාගේ නොවේද? 9
හමාත් අර්පද් වාගේ නොවේද? සමාරිය
දමස්කය වාගේ නොවේද? යෙරුසලමෙත් 10
සමාරියෙත් රූපවලට වඩා රූප ඇති
දේවතාවන්ගේ රාජ්‍යයන් මාගේ අතට
අසුවුණු ලෙසම, මා විසින් සමාරියටත් 11
එහි පිළිමවලටත් කළ ලෙස යෙරුසලමටත්
එහි පිළිමවලටත් නොකරන්නෙම්දැයි
කියන්නේය.

12 මෙසේ ස්වාමීන්වහන්සේ සියොන්
කන්දෙහිත් යෙරුසලමෙහිත් තමන්ගේ
මුළු වැඩය තීන්දුකළ පසු, මම අෂූර්හි
රජුගේ සිතේ අහංකාරකමේ ඵලය ගැනත්
ඔහුගේ උඩඟු ඇස්වල එඩිතරකම ගැනත්
13 දඬුවම්කරන්නෙමි. මක්නිසාද ඔහු
කථාකොට: මා ඒක කළේ මාගේ අතේ
සවියෙනුත් මාගේ ප්‍රඥාවෙනුත්ය. මට
නුවණ ඇත්තේය. මම ජනයන්ගේ
සීමා පහකෙළෙමි, ඔවුන්ගේ සම්පත්ද
පැහැරගෙන, සිංහාසන පිට උන් අය
බලවන්තයෙකු මෙන් හෙළාදැමීමි.
14 ජනයන්ගේ වස්තු පක්ෂි කැදැල්ලක් මෙන්
මාගේ අතට අසුවිය; අත්හැරදැමූ බිජු
එකතුකරන්නාක්මෙන් මම මුළු පො-
ළොව එකතුකරගත්තෙමි. පියාපත්
සෙලවීමක්වත් කට ඇරීමක්වත් ශබ්ද
15 කිරීමක්වත් නොවීයයි කීයේය. පොරොව
ඒකෙන් කපන්නාට විරුද්ධව පාරට්ටු
කරගනීද? නොහොත් කියත එයින්
ඉරන්නාට විරුද්ධව උඩඟුවේද? ඒ
වනාහි පොල්ලක් විසින් ඒක ඔසවන්නන්
සොලවන්නාක්මෙන්ද සැරයටියක් විසින්
ලී නොවන තැනැත්තා ඔසවන්නාක්-
මෙන්ද වන්නේය.
16 එබැවින් සේනාවල ස්වාමිවූ ස්වාමීන්-
වහන්සේ ඔහුගේ තර අය පිටට
කෙට්ටුකම යවනසේක; ඔහුගේ ඉසුර
යටද ගිනි ඇවිළීමක් මෙන් ඇවිළීමක්
17 වන්නේය. ඉශ්‍රායෙල්වරුන්ගේ ආලෝකය
ගින්නක් පිණිසද ඔවුන්ගේ ශුද්ධ
තැනන්වහන්සේ ගිනි දළුවක් පිණිසද
වන්නේය. එය ඔහුගේ කටු ගස් හා
ගොකටු එක දවසේදීම දවා නැතිකර
18 දමන්නේය. උන්වහන්සේ ඔහුගේ වනයේද
ඔහුගේ සාරවූ කෙතේද අලංකාරය, ශරීර
ප්‍රාණ ඇතුළුව නැතිකරදමනසේක. ඒක
කොඩිය උසුලන්නෙකුගේ ක්ලාන්තභාවය
19 මෙන් වෙයි. ඔහුගේ වනයේ ඉතිරි ගස්වල
ගණන ළමයෙකුට ලියන්ට පුළුවන් ලෙස
ස්වල්ප වෙයි.
20 ඒ දවසෙහි ඉශ්‍රායෙල්ගෙන් ඉතිරිවන්නාවූ,
යාකොබ්ගේ වංශයෙන් ගැළවෙන්නාවූ
අය තමුන්ට පහරදුන් අය කෙරෙහි
තවත් පිහිටා නොසිට, ඉශ්‍රායෙල්ගේ
ශුද්ධ තැනන්වහන්සේ වන ස්වාමීන්-
වහන්සේ කෙරෙහි සැබෑකමින් පිහිටා
සිටිනවා ඇත. ඉතිරි අය, එනම් 21
යාකොබ්ගේ ඉතිරි අය, පරාක්‍රමවත්
දෙවියන්වහන්සේ වෙතට හැරී එනවා
ඇත. මක්නිසාද, ඉශ්‍රායෙල්, තුඹේ 22
සෙනඟ මුහුදේ වැලි මෙන් වුණත්,
ඔවුන්ගෙන් ස්වල්ප දෙනෙක් පමණක්
හැරී එනවා ඇත. දිව්‍ය සාධාරණකම
හොඳ හැටි දක්වන්නාවූ නාස්තියක්
නියමකර තිබේ. එසේය, සේනාවල 23
ස්වාමීන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ
මුළු පොළොවෙහි නිශ්චිත නිෂ්ඨාවක්
සිද්ධකරනවා ඇත.
එබැවින් සේනාවල ස්වාමීන්වහන්සේ 24
වන ස්වාමීන්වහන්සේ කියනසේක්:
සියොන්හි වසන මාගේ සෙනඟෙනි,
අෂූරියයා පොල්ලෙන් තුඹට ගසා,
මිසරය කළාක්මෙන් තමාගේ සැරයටිය
තුඹට විරුද්ධව ඔසවන නුමුත්, ඔහුට
භය නොවන්න. මක්නිසාද තව ඉතා 25
ස්වල්ප කලකින් කෝපය හා මාගේ
උදහස ඔවුන් විනාශකිරීමෙන් සම්පූර්ණ-
වන්නේය. සේනාවල ස්වාමීන්- 26
වහන්සේ ඕරෙබ් පර්වතය ළඟදී මිදියන්
මරාදැමූ ලෙස, ඔහුට විරුද්ධව *කසයක්
ඔසවා තමන්ගේ සැරයටිය මුහුදට උඩින්
තබනවා ඇත, මිසරයේදී කළාක් මෙන්
එය ඔසවනවා ඇත. තවද ඒ දවසේදී 27
ඔහුගේ බර තුඹේ කරෙන්ද ඔහුගේ
වියගහ තුඹේ බෙල්ලෙන්ද පහවන්නේය.
තුඹේ තරකම නිසා වියගහද කැඩෙන්-
නේයයි කියනසේක.
ඔහු අයාතට පැමිණ මිග්‍රෝන මැදින් 28
ගියේය; මික්මාෂ්හි ඔහු තමාගේ බඩු
තබන්නේය. ඔව්හු කඳු මාවත පසුකර 29
ඇවිත්, ගෙබාහි නවාතැන් ගෙන සිටිති.
රාමාය කම්පාවෙයි, සාවුල්ගේ ගිබෙයාය
පලාගියේය. ගල්ලීම් දියණියෙනි, තුඹේ 30
හඬ නගා මොරගසාපන්න! ලයිෂා,
ඇහුම්කන්දීපන්න! අනේ අසරණ
අනතොත්! මද්මේනා පලාගියේය; ගේබීම් 31
වැසියෝ පලායන්ට රැස්වෙති. ඔහු අද 32
දවසේම නොබ්හි රඳන්නේය. ඔහු

*එනම්, විනාශකාරයෙක් නැගුටුවා.

යෙරුසලම් හෙල වන සියොන් දූවගේ
කන්දට විරුද්ධව තමාගේ අත
සොලවන්නේය.
33 බලව, සේනාවල ස්වාමීන්වහන්සේ වන
ස්වාමීන්වහන්සේ භයංකරකමින් අතු
කපාදමනසේක. උසින් උසස්වූ ඒවා
කපනු ලබන්නේය, උඩඟු ඒවාද
34 පහත්කරනු ලබන්නේය. උන්වහන්සේ
කැලෑවේ අකුල් යකඩෙන් කපාදමන-
සේක, ලෙබනොන්ද බලවත්තයෙක්
කරණකොටගෙන වැටෙන්නේය.

## දවිත් රජුගෙන් පැවත එන රාජ්‍යය පිහිටුවීම

11 තවද යෙස්සේගේ කඳින් අංකුරයක්
නික්මෙන්නේය, ඔහුගේ මුල්වලින්
වූ පැළයක් එලදරන්නේය. ස්වාමීන්-
2 වහන්සේගේ ආත්මය, එනම් ප්‍රඥාව හා
නුවණේ ආත්මයද මන්ත්‍රණය හා බලයේ
ආත්මයද දැනගැන්ම හා ස්වාමීන්වහන්සේ
කෙරෙහි භයවීමේ ආත්මයද, උන්වහන්සේ
3 කෙරේ පිහිටන්නේය. ස්වාමීන්වහන්සේ
කෙරෙහි භයින් සිටීම උන්වහන්සේගේ
ප්‍රීතිය වන්නේය; උන්වහන්සේ තමන්
ඇසට පෙනෙන හැටියට විනිශ්චය-
කරන්නේවත් තමන්ගේ කනට ඇසෙන
හැටියට නිශ්චයකරන්නේවත් නැතුව,
4 ධර්මිෂ්ඨකමෙන් දිළිඳුන් විනිශ්චය
කොට, පොළොවේ යටහතුන් උදෙසා
යුක්තියෙන් නිශ්චයකරනසේක. ස්වකීය
මුඛය නමැති යෂ්ටියෙන් පොළොවට
පහරදී, තමන්ගේ තොල්වල හුස්මෙන්
5 දුෂ්ටයන් මරනසේක. ධර්මිෂ්ඨකම
උන්වහන්සේගේ ඉඟපටියද විශ්වාසකම
උන්වහන්සේගේ බඳපටියද වන්නේය.
6 වෘකයා බැටළුපැටවා සමග වාසය-
කරන්නේය, දිවියාද එළුපැටවා සමග
ලගින්නේය; වස්සාද තරුණ සිංහයාද
තර සතාද එක්ව සිටින්නෝය; කුඩා
7 දරුවෙක් උන් ගෙනයන්නේය. එළදෙනත්
වලසාත් එක්ව තෘණ කන්නෝය; උන්ගේ
පැටවුද එක්ව ලගින්නෝය. සිංහයා
8 හරකා මෙන් පිදුරු කන්නේය. කිරි
දරුවා නාගයාගේ තුඹස පිට සෙල්ලම්
කරන්නේය, කිරිවැරූ දරුවා පොළඟාගේ
9 ගුල පිට තමාගේ අත තබන්නේය. මාගේ
ශුද්ධ කන්දේ සීමා තුළෙහි කිසි
අනතුරුකිරීමක්වත් විනාශකිරීමක්වත්
නොවන්නේය. මක්නිසාද ජලයෙන්
මුහුද වැසී තිබෙන්නාක්මෙන්, ස්වාමීන්-
වහන්සේ ගැන දැනගැන්මෙන් පොළොව
පිරීයන්නේය.
තවද ඒ දවසෙහි ජනයන්ට කොඩියක් 10
ලෙස සිටින්නාවූ, යෙස්සේගේ රිකිල්ලවූ
උන්වහන්සේ වෙතට ජාතීහු රැස්වන්නෝය;
උන්වහන්සේගේ නිවාසස්ථානයද
තේජවත් වන්නේය.
තවද ඒ දවසෙහි ස්වාමීන්වහන්සේ 11
අෂූරෙන්ද මිසරයෙන්ද පත්‍රෝසෙන්ද කුෂ්
රටෙන්ද ඒලාමෙන්ද ෂිනාරෙන්ද
හමාතෙන්ද මුහුදේ දිවයින්වලින්ද
ඉතිරිවන්නාවූ ස්වකීය සෙනඟ මුදාගන්ට
දෙවෙනි වර තමන් අත දිගුකරනසේක.
උන්වහන්සේ ජාතීන්ට කොඩියක් ඔසවා, 12
පන්වනු ලැබූ ඉශ්‍රායෙල්වරුන් රැස්කර,
විසුරුවනු ලැබූ යූදවරුන් පොළොවේ
සතර කොනින් එකතුකරනසේක.
එප්‍රායිම්ගේ ඊර්ෂ්‍යාව පහවයන්නේය, යූදට 13
හිංසාකරන්නෝ සිඳ දමනු ලබන්නෝය.
එප්‍රායිම් යූදට ඊර්ෂ්‍යාකරන්නේවත් යූද
එප්‍රායිම්ට හිංසාකරන්නේවත් නැත. ඔව්හු 14
ඉගිලී ගොස්, බටහිරෙන් පිලිස්තිවරුන්ගේ
කර පිටට බසින්නෝය; ඔව්හු එක්ව
පෙරදිග වැසියන්ගෙන් කොල්ලකා,
තමුන්ගේ අත ඒදෝම් සහ මෝවබ් පිටට
දිගුකරන්නෝය; අම්මොන් පුත්‍රයෝද
ඔවුන්ට කීකරුවන්නෝය. ස්වාමීන්- 15
වහන්සේ මිසර මුහුදේ *අත්ත සහමුලින්ම
නැතිකර දමනසේක; උන්වහන්සේ තමන්
බලවත් සුළඟින් ස්වකීය හස්තය †ගංගාව
කෙරෙහි දිගුකොට, මනුෂ්‍යයන්ට
තමුන්ගේ මිරිවැඩි නොතෙමා එගොඩ-
වෙන්ට පුළුවන්වන ලෙස දිය පාර
සතකට බෙදීයන්ට ඊට ගසනසේක.
ඉශ්‍රායෙල් මිසර දේශයෙන් ආ දවසේදී 16
මෙන් අෂූරෙන් ඉතුරුවන්නාවූ උන්-
වහන්සේගේ සෙනඟට මහ මාවතක්
වන්නේය.

*හෙවත්, වරාය.

†එනම්, ප්‍රාත් ගංගාව.

## ගැළවුම්කාරවූ ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකිරීම

12 ඒ දවසෙහි නුඹ කථාකොට: **ස්වාමීන්වහන්ස**, ඔබට ස්තුති කරමි;
මක්නිසාද ඔබ මා කෙරෙහි උදහස්ව
සිටිය නුමුත් ඔබගේ උදහස පහව ගියේය,
2 ඔබ මා සනසනසේක. බලව, දෙවියන්-
වහන්සේ මාගේ ගැළවීමය; මම විශ්-
වාසකරමි, භය නොවන්නෙමි. මක්නිසාද
**ස්වාමිවූ** යෙහෝවඃවහන්සේ මාගේ
සවියත් ගීතිකාවත්ය; උන්වහන්සේ මාගේ
3 ගැළවීම වූසේකැයි කියන්නෙහිය. එබැවින්
නුඹලා ප්‍රීති ඇතුව ගැළවීමේ ළින්වලින්
4 දිය ඇදගන්නහුය. ඒ දවසෙහි නුඹලා
කථාකොට: **ස්වාමීන්වහන්සේට** ස්තුති-
කරව්, උන්වහන්සේගේ නාමය කියා
යාච්ඤාකරව්, උන්වහන්සේගේ ක්‍රියා
ජනයන් අතරේ දන්වා, උන්වහන්සේගේ
5 නාමය උසස් බව සඳහන්කරව්. **ස්වාමීන්-
වහන්සේට** ගායනාකරව්; මක්නිසාද
උන්වහන්සේ උතුම් දේ කළසේක. මේ
බව මුළු පොළොවෙහි දන්වනු ලැබේවයි
6 කියන්නහුය. එම්බා සියොන් වැසිය, ශබ්ද
පවත්වා මොරගසාපන්න; මක්නිසාද
නුඹ මධ්‍යයෙහි ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
තැනන්වහන්සේ උතුම්ව සිටිනසේක.

## බබිලෝනියේ විනාශය

13 ආමොස්ගේ පුත්‍රවූ යෙසායාට බබිලොන් ගැන එළිදරව්වූ දිව්‍ය
ප්‍රකාශනයය.
2 උත්තමයන්ගේ දොරටුවලට ඇතුල්වන
පිණිස ගස් නැති කන්දක් උඩ කොඩියක්
ඔසවාපල්ලා, ශබ්දනගා ඔවුන්ට
3 හඬගසාපල්ලා, අත වනාපල්ලා. මාගේ
කැපවූවන්ට මම අණ කෙළෙමි,
එසේය, උඩඟුව ප්‍රීතිමත්වන්නාවූ මාගේ
බලවන්තයන්ට මාගේ උදහස සඳහා
4 අඬගැසීමි. මහත් සෙනඟක ඝෝෂාව
මෙන් සමූහයක ඝෝෂාවක් කඳුවල
ඇත්තේය. ඒ රැස්වූ ජාතීන්ගේ රාජ්‍යවල
කෝලාහල ඝෝෂාවය! සේනාවල
**ස්වාමීන්වහන්සේ** සටනට සේනාව
5 එක්කරනසේක. **ස්වාමීන්වහන්සේ** සහ
උන්වහන්සේගේ උදහසේ ආයුධ වන
ඔව්හු මුළු දේශය වනසන්ට දුර
දේශයකින් අහසේ කෙළවර සිට එති.
මොරගසා වැලපියල්ලා; මක්නිසාද 6
**ස්වාමීන්වහන්සේගේ** දවස ළංව තිබේ;
එය සර්වපරාක්‍රමයාණන් විසින් එවන
විනාශයක් මෙන් පැමිණෙයි. එබැවින් 7
සෑම අත් බෙලහීන වන්නේය, සියලු
මනුෂ්‍යයන්ගේ සිත්ද දියවන්නේය. ඔව්හු 8
කැලඹෙන්නෝය; වේදනාද රුජාද අල්ලා
ඔව්හු වදන ස්ත්‍රියෙකු මෙන් වේදනා
විඳින්නෝය. ඔව්හු එකිනෙකා දෙස
විස්මයෙන් බලන්නෝය; ඔවුන්ගේ මුහුණු
ගිනිදළු මෙන් වන්නෝය. බලව, දේශය 9
පාළුකර එහි සිටින පව්කාරයන් එයින්
නැතිකර දමන පිණිස **ස්වාමීන්-
වහන්සේගේ** දවස රෞද්‍රව, කෝපය හා
බලවත් උදහස ඇතුව එන්නේය.
මක්නිසාද අහසේ තාරකාද ග්‍රහ පන්තිද 10
ඒවායේ එළිය නොදෙන්නෝය. ඉර
ස්වකීය ගමනේදී අඳුරුවන්නේය, සඳද
තමාගේ එළිය බැබළෙන්ට නොදෙන්නේය.
මම ලෝකයාට ඔවුන්ගේ නපුරුකම 11
නිසාත් දුෂ්ටයන්ට ඔවුන්ගේ අයුතුකම
නිසාත් දඬුවම්කරන්නෙමි; උඩඟු
අයගේ අහංකාරය නවත්වා, බලාත්-
කාරකරන්නන්ගේ ආඩම්බරය පහත්-
කරන්නෙමි. මම මනුෂ්‍යයෙකු අමිශ්‍ර රනට 12
වඩා එනම් ඕපීර්හි පවිත්‍ර රත්රන්වලට
වඩා දුර්ලභවන්ට සලස්වන්නෙමි.
එබැවින් සේනාවල **ස්වාමීන්වහන්සේගේ** 13
කෝපයේදීද උන්වහන්සේගේ තද උදහස්
දවසේදීද මම අහස චංචලකරන්නෙමි,
පොළොවද එහි ස්ථානයෙන් සෙලවී
පහවයන්නේය. එවිට එළවනලද තිත් 14
මුවෙකු මෙන්ද කවුරුවත් එක්කර
නොගන්නාවූ බැටළුවන් මෙන්ද ඔවුන්
එකිනෙකා තම තමාගේ සෙනඟ වෙතට
හැරී, තම තමාගේ දේශයට පලායනවා
ඇත. සම්බවෙන එකිනෙකා ඇනුම්- 15
කනවා ඇත; අසුවෙන එකිනෙකා
කඩුවෙන් වැටෙනවා ඇත. ඔවුන්ගේ 16
ළදරුවෝද ඔවුන්ගේ ඇස් ඉදිරියේදී බිම
ගසා මරනු ලබන්නෝය; ඔවුන්ගේ
ගෙවල් කොල්ලකනු ලබන්නේය, ඔවුන්ගේ
භාර්යාවෝ අවමන්කරනු ලබන්නෝය.
බලව, මම මේදවරුන් ඔවුන්ට විරුද්ධව 17
පොළඹවන්නෙමි. ඔවුන් රිදී සලකන්-
නේවත් රනට ප්‍රියවෙන්නේවත් නැත.

18 ඔව්හු දුනුවලින් යෞවනයන් කැබලි-
කරන්නෝය; ඔව්හු ගර්භයේ ඵලයට
අනුකම්පා නොකරන්නෝය; ඔවුන්ගේ
ඇස දරුවන්ට කරුණා නොකරන්නේය.
19 මෙසේ රාජ්‍යවල අලංකාරයද කල්දි-
වරුන්ගේ උඩඟුකමේ තේජසද වූ
බබිලෝනිය දෙවියන්වහන්සේ විසින්
නාස්තිකළ සොදෙමටද ගොමොරාවටද
20 සමානවන්නේය. එහි කවදාවත් වැසියෙක්
නොවන්නේය, පරම්පරාවෙන් පරම්-
පරාවට කිසිවෙක් එහි නොවසන්නේය.
අරාබියයා එහි තමාගේ කූඩාරම
තබාගන්නේවත් එඬේරු තමුන්ගේ
බැටළුවන් එහි ලග්ගවන්නේවත් නැත.
21 වන මෘගයන් එහි ලගිනවා ඇත;
ඔවුන්ගේ ගෙවල් විලාප හඬ දෙන
සතුන්ගෙන් පිරෙනවා ඇත; පැස්බරුන්
එහි වසනවා ඇත. වල් එළුවන්ද එහි
22 නටනවා ඇත. වෘකයන් ඔවුන්ගේ
මාළිගාවලත් සිවලුන් ඔවුන්ගේ සැප
මාළිගාවලත් කෑගසනවා ඇත. ඇගේ
කාලය පැමිණෙන්ට ළඟය, ඇගේ දවස්
ප්‍රමාද නොවන්නේය.

## ඉශ්‍රායෙල් මුදනු ලැබීම. බබිලෝනියේ විනාශය ගැන ගීය

14 මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
යාකොබ්ට අනුකම්පාකොට,
ඉශ්‍රායෙල් නැවත තෝරාගෙන, ඔවුන්ගේම
දේශයෙහි ඔවුන් පිහිටුවනසේක.
විදේශියෝ ඔවුන්ට එකතුව යාකොබ්ගේ
2 වංශයට බැඳෙන්නෝය. ජාතීහු ඔවුන්
කැඳවාගන ඔවුන්ගේ ස්ථානයට ඔවුන්
ගෙනෙන්නෝය. ඉශ්‍රායෙල් වංශයද
**ස්වාමීන්වහන්සේගේ** දේශයේදී ඔවුන්
දාසයන්ද දාසීන්ද කොට උරුමකරගන්නෝය.
ඔව්හු තමුන්ව වාලට ගත් අය වාලට
ගෙන, තමුන්ගේ පීඩාකාරයන් කෙරෙහි
ආණ්ඩුකරන්නෝය.
3 නුඹේ දුකෙනුත් නුඹේ කැලඹීමෙනුත්
නුඹ ලවා කෙරෙවූ බර වැඩෙනුත්
**ස්වාමීන්වහන්සේ** නුඹට නිදහස දෙන
4 දවසේදී, නුඹ බබිලෝනියේ රජුට
විරුද්ධව මේ උපමාව කියන්නෙහිය:
අහෝ පීඩාකාරයා නැවතුණු හැටි! *රන්
නුවර නැවතුණු හැටි! ජනයන්ට නිරන්තර 5
පහරකින් කෝපයෙන් ගැසුවාවූද,
කිසිවෙකු විසින් නොවැලැක්වූ පීඩාවකින්
උදහසින් ජාතීන් ආණ්ඩුකළාවූද 6
දුෂ්ටයන්ගේ මුගුරත් ආණ්ඩුකාරයන්ගේ
යෂ්ටියත් **ස්වාමීන්වහන්සේ** බිඳදමූසේක.
මුළු පොළොව නිශ්කලංකව නිශ්චලව 7
තිබේ; මනුෂ්‍යයෝ ගී කියමින්
මොරගසති. එසේය, දේවදාර ගස්ද 8
ලෙබනොන්හි කිහිරි ගස්ද කථාකොට:
නුඹ හෙළනු ලැබූ තැන් පටන් අප
කපාදමන්ට කිසිවෙක් නැගී නායේයයි
කියමින් නුඹ ගැන ප්‍රීතිවන්නෝය. යට 9
තිබෙන †පාතාලය නුඹේ ඊමේදී
පෙරමගට එන්ට නුඹ නිසා චංචලවේ;
එම මළවුන්, එනම් පොළොවේ සියලු
ප්‍රධානීන්, නුඹ නිසා පුබුදුවයි; එය
ජාතීන්ගේ සියලු රජුන්ද ඔවුන්ගේ
සිංහාසනවලින් නැගිටෙවුවේය. ඔවුන් 10
සියල්ලෝ නුඹට කථාකොට: නුඹත්
අප මෙන් බෙලහීන වූයෙහිද? නුඹ අප
හා සමානවූයෙහිදැයි කියන්නෝය. නුඹේ 11
ඓශ්වර්යයද නුඹේ වීණාවල ශබ්දයද
‡පාතාලයට බැස ආවේය, නුඹ
යට ඇතිරී ඇත්තේ පණුවාය, නුඹ
වසාගන්නෙත් පණුවෝය. දීප්තිමත් පහන් 12
තාරකාව, අලුයම් පුත්‍රය, නුඹ ස්වර්ගයෙන්
වැටුණු හැටි! ජාතීන් හෙළාදැමූවාවූ නුඹ
බිමට සිඳ දමනු ලැබූ හැටි! නුඹ සිත 13
තුළ සිතාගෙන: මම ස්වර්ගයට නැගී,
මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ
තාරකාවලට උඩින් තබා, උතුරේ ඉතා
දුර සීමාවල තිබෙන රැස්වීමේ කන්ද
පිට හිඳගන්නෙමි. මම වලාකුල් 14
මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි;
මහෝත්තමයාණන්ට සමානවන්නෙමියි

*නොහොත්, බලාත්කාරකම්කරන්නී.
†හෙබ්‍රෙව්: ෂෙයෝල.
‡හෙබ්‍රෙව්: ෂෙයෝලට.

15 කීයෙහිය. එහෙත් නුඹ *පාතාලය නම්
16 වළේ ගැඹුරටම බසිනවා ඇත. නුඹ
දකින්නෝ නුඹ දෙස ඕනෑකමින් බලමින්
කල්පනාකොට: පොළොව වෙවුලවා
17 රාජ්‍යයන් සෙලෙවුවාවූ, ලෝකය
කාන්තාරයක් මෙන් කළාවූ, එහි නුවරවල්
නාස්තිකළාවූ, තමාගේ හිරකාරයන්
ගෙදරට යන්ට නැරියාවූ මනුෂ්‍යයා
18 මොහුදැයි කියන්නෝය. ජාතීන්ගේ
රජවරු සියල්ලෝම ගෞරවය ඇතුව
එකිනෙකා තම තමාගේ ගෘහයෙහි සැතපී
19 හිඳිති. නුමුත් නුඹ පිළිකුල් අත්තක් මෙන්ද,
කඩුවෙන් ඇන මැරුම්කා වළේ ගල්වලට
බසින්නන්ගේ වස්ත්‍ර මෙන්ද, පයින්
පාගාදැමූ මළකඳක් මෙන්ද නුඹේ
සොහොන්ගෙයින් පිටත වීසිකරනු
20 ලබන්නෙහිය. නුඹ නුඹේ දේශය
නාස්තිකොට, නුඹේ සෙනඟ මරාදැමූ
බැවින්, ඔවුන් සමග වළලනු නො-
ලබන්නෙහිය; නපුර කරන්නන්ගේ වංශය
කවදාවත් සඳහන්කරනු නොලබන්නේය.
21 ඔහුගේ පුත්‍රයන් නැගිට, දේශය හිමි-
කරගෙන, පොළෝතලය නුවරවලින්
නොපුරවන පිණිස, ඔවුන්ගේ
පියවරුන්ගේ අපරාධ නිසා ඔවුන්
22 මරන්ට සැදී සිටපල්ලා. සේනාවල
**ස්වාමීන්වහන්සේ** කථාකොට: මම
ඔවුන්ට විරුද්ධව නැගිටින්නෙමියි
කියනසේක. බබිලෝනියෙන් නාම
මාත්‍රයද ඉතිරි අයද දරුමුනුබුරන්ද
සිඳදමන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
23 සේක. මම ඒක ඉත්තෑවුන්ට උරුමයක්ද
දිය පොකුණුද කරන්නෙමි. ඒක විනාශය
නැමති මුස්නෙන් අතුගාදමන්නෙමියි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක.

24 සේනාවල **ස්වාමීන්වහන්සේ** දිවුරා
කථාකොට: මා යෝජනාකළ ලෙසම
සිද්ධවන්නේය; මා අදහස්කළ ලෙසම
25 ස්ථිරවන්නේය. එනම්, මම අෂූරියයා
මාගේ දේශයේදී පුන්කොට මාගේ කඳු
පිට ඔහු පාගාදමන්නෙමි. එවිට ඔහුගේ
වියගහ ඔවුන් කෙරෙන් පහවන්නේය,
ඔහුගේ බරද ඔවුන්ගේ කරෙන් පහවන්-
නේයයි කීසේක. මුළු පොළොව කෙරෙහි 26
අදහස්කර තිබෙන අදහස මේය. සෑම
ජාතීන් කෙරෙහි දිගුකර තිබෙන හස්තයත්
මේය. මක්නිසාද සේනාවල **ස්වාමීන්-** 27
**වහන්සේ** අදහස්කළසේක, එය අවලංගු-
කරන්නේ කවුද? උන්වහන්සේගේ අත
දිගුකර තිබේ, එය ආපසු හරවන්නේ
කවුද?

## පිලිස්තිය සම්බන්ධ විනිශ්චය

ආහාස් රජු මැරුණු අවුරුද්දේ මේ 28
දිව්‍ය ප්‍රකාශනය විය.
අහෝ, මුළු පිලිස්තිය, නුඹට පහරදුන් 29
අයගේ යෂ්ටිය කැඩී ගිය බැවින් ප්‍රීති
නොවන්න. මක්නිසාද සර්පයාගේ
මුලෙන් පොළඟෙක් නික්මෙන්නේය, උගේ
ඵලය ඉගිලෙන ගිනි සර්පයෙක්
වන්නේය. දුප්පතුන්ගේ කුලුඳුලන්ට කෑම 30
ලැබෙන්නේය, දිළින්දෝද සුවසේ
නිදාගන්නෝය. මම සාගතයෙන් නුඹේ
මුල නසන්නෙමි, එයින් නුඹේ ඉතිරි අයද
නසනු ලබන්නෝය. එම්බා දොරටුව, 31
මොරගසව; එම්බා නුවර, කෑගසව;
අහෝ මුළු පිලිස්තිය, නුඹ දියවී ගියෙහිය;
මක්නිසාද උතුරෙන් දුමක් එන්නේය,
ඔහුගේ කණ්ඩායම්වල යුද්ධ පිළිවෙළින්
නොසිටින කෙනෙක් නැත්තේය. එවිට 32
ජාතියේ තානාපතියන්ට දිය යුතු
උත්තරය කිමෙක්ද? **ස්වාමීන්වහන්සේ**
සියොන් පිහිටුවා තිබේ, උන්වහන්සේගේ
සෙනඟ අතරෙන් පීඩිත අය එහි
ආරක්ෂාව ලබන්නෝය කියාය.

## මෝවබ් කෙරෙහි විනිශ්චය

මෝවබ් ගැන දිව්‍ය ප්‍රකාශනයය. 15
රාත්‍රියකදී මෝවබ්හි ආර් නගරය පාළු
කොට නැතිකරනලද්දේය; රාත්‍රියකදී
මෝවබ්හි කීර් බලකොටුව පාළුකොට
නැතිකරනලද්දේය. අඬන පිණිස ඔහු 2
ගෘහයටත් දීබොන්හි උස් තැන්වලටත්
ගියේය. මෝවබ් වනාහි නෙබෝ සහ
මේදෙබා ගැන කෑමොරගසයි. ඔවුන්

*හෙබ්‍රෙව්: ෂෙයෝල.

සියල්ලන්ගේ ඉස් මුඩුකර තිබේ, සෑම
3 රැවුල් කපා තිබේ. තමුන්ගේ වීථිවල
ඔව්හු ගෝණිරෙදි හැඳ ඉඳිති. ඔවුන්
සෑමදෙනම තමුන්ගේ පියසි උඩද
එළිමහන් ඉඩම්වලද බොහෝකොට අඬා
4 කෑමොරගසති. හෙෂ්බොන්ද එලෙයාලේද
කෑගසති; ඔවුන්ගේ හඬ යාහශ් දක්වා
ඇසෙයි. ඒ නිසා මෝවබ්හි යුද්ධකාරයෝ
ඝෝෂාකරති; එක් එක්කෙනාගේ ආත්මය
5 ඔහු තුළ කැළඹෙයි. මාගේ සිත මෝවබ්
නිසා කෑගසයි; ඇගේ උත්තමයෝ
ශෝවාර්ටත් එග්ලත්-ෂෙලිෂියටත් පලා
යති. මක්නිසාද ඔව්හු අඬ අඬා ලූහිත්හි
ගොඩැල්ලෙන් නැගී යති: එසේය,
හොරොනායිම් මාර්ගයේදී ඔව්හු
6 විනාශයේ ඝෝෂාවක් පවත්වති. තවද
නිම්රීම්හි ජලවල් සිඳී පාළුවන්නේය.
එසේය, තෘණ මැළවී අමු තෘණ නැතිවී
7 තිබේ. අමුවූ කිසිවක්ද නොතිබේ. එබැවින්
ඔව්හු සපයාගත් සම්පත්ද රැස්කර
තබාගත් දේද නළාගස් ඔය ළඟට
8 ගෙනයන්නෝය. මක්නිසාද කෑගැසීම
මෝවබ්හි සීමාව වටකරින්ම ගියේය:
එහි කෑමොරගැසීම එග්ලයිම් දක්වාද
එහි කෑමොරගැසීම බෙයෙර්-එලීම්
9 දක්වාද ගියේය. දීමොන්හි ජලවල්
ලෙයින් පිරී තිබේ. මක්නිසාද දීමොන්
පිටට තව විපත්ති පමුණුවන්නෙමි.
ගැළවෙන මෝවබ්වරුන් පිටත් දේශයේ
ඉතිරි අය පිටත් සිංහයෙකු පමුණුවන්නෙමි.

16 කාන්තාරය දෙස පිහිටා තිබෙන
සේලා සිට සියොන් දූවගේ කන්දට,
දේශයේ ආණ්ඩුකාරයාට, බැටළු පැටවුන්
2 යවාපල්ලා. මක්නිසාද මෝවබ්හි දූවරු
මුළාව යන කුරුල්ලන් මෙන්, අත්හරිනලද
පක්ෂි කැදැල්ලක් මෙන්, අර්නොන්හි
3 තොටුපළවල සිටින්නෝය. උපදෙස්
දීපන්න. යුක්තිය කරපන්න; ඉරමුදුන්
වේලෙහිම තුඹේ සෙවණැල්ල රාත්‍රියට
සමානකරපන්න. නෙරපනලද්දවුන්
සඟවාගනින්න; පලාඑන තැනැත්තා පාවා
4 නොදෙන්න. නෙරපනලද්දවූ මාගේ
ජනයාට තුඹ සමග සිටින්ට ඉඩදීපන්න;
මෝවබ්ට තුඹ කොල්ලකාරයා ඉදිරියෙන්
ආවරණයක් වෙයන්න. මක්නිසාද
පැහැරගන්නා නැතිවිය, කොල්ලකෑම
නවතියි, පීඩාකරන්නෝ දේශයෙන්
විනාශකරනු ලබති. මෙසේ සිංහාසනයක් 5
කරුණාවෙන් පිහිටෙන්නේය. ඒ පිට
දාවිත්ගේ කූඩාරමෙහි කෙනෙක් සැබෑකමෙන්
සැරහී හිඳ, විනිශ්චයකර, යුක්තිය පවත්වා,
ධර්මිෂ්ඨකම ඉෂ්ටකරන්ට යුහුවන්නේය.

ඉතා උඩඟුවූ මෝවබ්ගේ උඩඟුකමද 6
ඔහුගේ උද්දම්කමද ඔහුගේ ආඩම්බරයද
ඔහුගේ උදහසද ගැන ඇසීමුව, ඔහුගේ
පාරට්ටුකිරීම් හිස්ය. එබැවින් මෝවබ්වරු 7
මෝවබ් නිසා කෑමොරගසන්නෝය.
සියල්ලෝම කෑමොරගසන්නෝය. කීර්-
හරෙසෙත්හි මිදිපල කැවිලි නිසා තුඹලා
වැලපෙන්නහුය. ඒක මුළුමනින්ම පහර
ලැබුවේය. මක්නිසාද හෙෂ්බොන්හි 8
කෙත්ද සිබ්මාහි මිදිවැල්ද මැළවේ:
ජාතීන්ගේ ස්වාමීහු එහි හොඳ වැල්
කඩාදැමුවෝය: ඒවා යාසෙර් දක්වා
විහිදී, කාන්තාරයෙහි එහා මෙහා
ගියේය: එහි අතුද විහිදී, මුහුදෙන් එතරට
ගියේය. එබැවින් යාසෙර් අඬන්නාක්මෙන් 9
මම සිබ්මාහි මිදිවැල ගැන අඬන්නෙමි.
අනේ, හෙෂ්බොන් සහ එලෙයාලේ, තුඹලා
මාගේ කඳුළුවලින් තෙමන්නෙමි.
මක්නිසාද තුඹේ නියඟ කාලයේ ඵල
පිටද අස්වැන්න පිටද යුද්ධ ඝෝෂාව
පැමිණියේය. සාරවත් කෙතෙන් සතුටද 10
ප්‍රීතියද පහකරනලද්දේය; මිදිවතුවල
කවිකීමවත් ප්‍රීති ඝෝෂාවවත් නොවන්නේය.
කිසි මඩින්නෙක් මිදිපැස්වල මුද්‍රිකඵල
මැඩිනොගන්නේය: මම මිදිඵල නෙළීමේ
ප්‍රීති ඝෝෂාව නැවැත්වීමි. එහෙයින් 11
මෝවබ් ගැන මාගේ අතුණුද කීර්-
හෙරෙස් ගැන මාගේ හෘදයද වීණාවක්
මෙන් ශබ්ද දෙන්නේය. තවද මෝවබ් 12
උසස්ථානයෙහි පෙනී, වෙහෙසවී,
යාච්ඤාකරන්ට තමාගේ ශුද්ධස්ථානයට
ඇතුල්වූ කල්හි ඔහුට පිහිට නොලැබේ.
ස්වාමීන්වහන්සේ මෝවබ් ගැන පළමු 13
කී වචනය මේය. නුමුත් දැන් ස්වාමීන්- 14
වහන්සේ කථාකොට: කුලීකාරයෙකුගේ
අවුරුදු ලෙස තුන් අවුරුද්දකින්
මෝවබ්ගේ ඉසුරුමත්කම ඔහුගේ මහත්
සමූහයා ඇතුළුව නීචකමට පැමිණෙනවා
ඇත; ඉතිරිවෙන්නේ ඉතා ස්වල්පවූ
දුර්වලවූ කොටසක්යයි කීසේක.

## සිරියාව සහ ඉශ්‍රායෙල් කෙරෙහි විනිශ්චය

17 දමස්කය ගැන දිව්‍ය ප්‍රකාශනයය.
බලව, දමස්කය නුවරක්ව නොතිබෙන
ලෙස අහක්කරනු ලැබ ජරාවාස ගොඩක්
2 වන්නේය. අරොයෙර්හි නුවරවල්
අත්හරිනලද්දේය. ඒවා එනාහි කිසිවෙකු-
ගෙන් භයක් නොලැබ ලගින එළු බැටළු
3 රැළවලටය. එප්‍රායිම්ගෙන් බලකොටුවද
දමස්කයෙන් රජකමද සිරියෙන් ඉතිරි
කොටසද පහවන්නේය; ඒවා ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ තේජස මෙන් වන්නේයයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියන-
සේක.
4 ඒ දවසෙහි යාකොබ්ගේ තේජස
හීනවන්නේය, ඔහුගේ මාංසයේ තරකමද
5 ක්ෂයවන්නේය. තවද ගොයම් කපන්නා
ගොයම් එකතුකොට තමාගේ අතින්
කරල් කපන්නාක්මෙන්ද රෙපාවරුන්ගේ
මිටියාවතෙහි යමෙක් ගොයම් කරල්
6 ඇහිඳගන්නාක්මෙන්ද සිදුවන්නේය. නුමුත්
ඔලීව ගසක් සොලවන කල ඉහළ මුදුන්
අත්තේ ගෙඩි දෙකක් තුනක්ද ඵල ඇති
ගහේ එහාම අතුවල ගෙඩි හතරක් පහක්ද
ඉතිරිවෙන්නාක් මෙන් එහි ස්වල්ප
දෙනෙක් ඉතිරිවන්නේයයි ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** කියනසේක.
7 ඒ දවසෙහි මනුෂ්‍යයෙක් තමාගේ අත්
වැඩය වන පූජාසන දෙස බලා නොසිට,
තමාගේ ඇඟිලිවලින් සෑදූ දේ වන අෂේරා
කණුවත් සූර්ය රූපවත් නොසලකා,
8 තමාගේ මැවුම්කාරයාණන් දෙස බලන්-
නේය, ඔහුගේ ඇස්ද ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
9 තැනන්වහන්සේ දෙසට හැරෙන්නේය. ඒ
දවසෙහි ඔහුගේ සවි ඇති නුවරවල්
කැලෑවෙහිද කඳුමුදුන්වලද ඉශ්‍රායෙල්
පුත්‍රයන් ඉදිරියෙන් අත්හැරිගිය ඉඩම් මෙන්
10 වී, පාළුවක් වන්නේය. මක්නිසාද නුඹ
නුඹේ ආරක්ෂා පර්වතය සිහිනොකර,
නුඹේ ගැළවීමේ දෙවියන්වහන්සේ
මතකනැතිකෙළෙහිය; එබැවින් නුඹ
ප්‍රියකරු ගස් පන්ති හිටවන්නෙහිය; අන්‍ය
11 පැළැටිද එහිම වවන්නෙහිය. නුඹ හිටවන
දවසේදී වැට බඳින්නෙහිය, උදය නුඹේ
පැළැටි ලියලවන්නෙහිය. එහෙත් ශෝකය
සහ තද දුකේ දවසක් පැමිණ අස්වැන්න
පහවීයන්නේය.
අන්න, බොහෝ ජනසමූහයන්ගේ 12
ඝෝෂාවක්! මුහුදුවල ඝෝෂාව මෙන්
ඔව්හු ඝෝෂාකරති; ජාතීන්ගේ
ගර්ජනාවක්ද ඇසෙන්නේය, බොහෝ
ජලවල ගර්ජනාව මෙන් ඔව්හු
ගර්ජනාකරති. ජාතීන් බොහෝ ජලවල 13
ගර්ජනාව මෙන් ගර්ජනාකරන නුමුත්
උන්වහන්සේ ඔවුන්ට සැරකරනසේක,
ඔව්හු ඈතට පලාගොස් කඳුවල තිබෙන
බොල් හුළඟටත් රොඩු සුළිහුළඟටත්
ගහගනයන්නාක්මෙන් පන්නාදමනු
ලබන්නෝය. බලව, සවස් වේලේ 14
භීතියක්ය; පහන්වන්ට පළමුවෙන් ඔව්හු
නැත. අප නාස්තිකරන්නන්ගේ කොටසද
අපෙන් කොල්ලකන්නන්ගේ විපාකයද
ඒකය.

## එතියෝපියාවට එහා දේශය කෙරෙහි විනිශ්චය

ඒම්බා සේනා පියාපත්වල ශබ්ද 18
ඇත්තාවූ, කූෂ් දේශයේ ගංගාවලට
එගොඩින් සිටින්නාවූ, මුහුදෙන්ද ජල 2
පිට පන් නැව්වලින්ද තානාපතියන්
අරින්නාවූ දේශක්කාරයෙනි, ශීඝ්‍ර
පණිවුඩකාරයෝවූ නුඹලා, උස්වූ සිනිඳුවූ
ජාතියක්ව, මුල පටන් මේ දක්වා
භයානක සෙනඟක්ව, මනින්නාවූ,
පාගාදමන්නාවූ, ගංගාවලින් බෙදී
තිබෙන දේශයක් ඇත්තාවූ ජාතියක්ව
සිටින තැනැත්තන් ළඟට පලයල්ලා.
ලෝකයේ වැසියෝද පොළොවෙහි 3
වාසයකරන්නෝද යන සියල්ලෙනි,
කඳුපිට කොඩියක් ඔසවන විට
බලාපල්ලා; හොරණෑව පිඹින විට
අසාපල්ලා. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 4
මට කථාකොට: මම අව්වෙහි ඇති තද
උෂ්ණය මෙන්ද ගොයම් කපන
කාලයෙහි පිනි වලාකුළක් මෙන්ද
මාගේ වාසස්ථානයෙහි නිශ්චලව
බලාසිටින්නෙමියි කීසේක. එසේය, කපන 5

කාලයට පළමුවෙන් වැඩීම තීන්දුවී
මල්වලින් ඵල සැදී ඉදෙන විට, උන්-
වහන්සේද කැතිවලින් රිකිලි කපාදමා
6 අතුත් කපා පහකරනවා ඇත. ඒවා
කඳුවල ගිජු පක්ෂීන්ටත් පොළොවේ
මෘගයන්ටත් එකසේ අත්හරිනු ලබන්නේය.
ඒවා අතරෙහි පක්ෂීහු ග්‍රීෂ්ම කාලයද
ඒවා අතරෙහි පොළොවේ සියලු
මෘගයෝ ශීත කාලයද පසුකරන්නෝය.
7 ඒ කාලයෙහි උස්වූ සිනිඳුවූ සෙනඟක්ව,
මුලපටන් මේ දක්වා භයානක සෙනඟක්ව,
මනින්නාවූ, පාගාදමන්නාවූ, ගංගාවලින්
බෙදී තිබෙන දේශයක් ඇත්තාවූ
ජාතියක්ව සිටින තැනැත්තන්ගෙන්
සේනාවල ස්වාමීන්වහන්සේගේ නාම-
ස්ථානය වන සියොන් කන්දට සේනාවල
**ස්වාමීන්වහන්සේ** වෙතට තෑග්ගක්
ගෙනෙනු ලබන්නේය.

## මිසරය කෙරෙහි විනිශ්චය

**19** මිසරය ගැන දිව්‍ය ප්‍රකාශනයය.
බලව, **ස්වාමීන්වහන්සේ** ශීඝ්‍ර වලාකුළක්
පිට නැගී මිසරයට එනසේක. මිසරයේ
පිළිම උන්වහන්සේ ඉදිරියෙහි චංචල-
වන්නෝය, මිසරවරුන්ගේ සිත්ද ඔවුන්
2 තුළ දියවෙනවා ඇත. එකිනෙකා තම
තමාගේ සහෝදරයාටත් තම තමාගේ
යහළුවාටත් විරුද්ධවද නුවරක් නුවර-
කටත් රාජ්‍යයක් රාජ්‍යයකටත් විරුද්-
ධවද යුද්ධකරන ලෙස මම මිසරය
මිසරයටම විරුද්ධව පොළඹවන්නෙමි.
3 මිසරවරුන්ගේ ආත්මයද ඔවුන් තුළ
හිස්වන්නේය; මම ඔවුන්ගේ මන්ත්‍රණය
නිෂ්ඵල කරන්නෙමි. ඔවුන් පිළිමවලින්ද
මතුරන්නන්ගෙන්ද ආත්මබන්ධන-
කාරයන්ගෙන්ද අණවිනකාරයන්ගෙන්ද
4 විභාග කරනවා ඇත. මම මිසරවරුන්
කෲර ස්වාමියෙකුගේ අතට භාරදෙන්නෙමි;
බලාත්කාරවූ රජෙක් ඔවුන් කෙරෙහි
ආණ්ඩුකරනවා ඇතැයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** වන ස්වාමීන්වහන්සේ
5 කියනසේක. මුහුදෙන් ජලය පහවන්නේය,
6 ගංගාවද හිඳී වියළෙන්නේය. ගංගා
ගඳගසයි; මිසරයේ ඔයවල් හිස්වී
සිඳීයයි. බටගස්ද පන්ද මැළවෙයි. නයිල් 7
ගඟ ළඟත් ගංගාව අසබඩත් තිබෙන
පිට්ටනිද ගංගාව ළඟ වපුරන සියල්ලද
වේළී පහවී නැතිවන්නේය. මසුන් 8
අල්ලන්නෝ වැලපෙන්නෝය, නයිල් ගඟේ
බිළිබාන සියල්ලෝ ශෝක වන්නෝය,
ජලය පිට දැල් හෙළන්නෝද මලානික-
වන්නෝය. තවද හණ පීරන කර්මාන්ත- 9
කාරයෝද සුදු රෙදි වියන්නෝද
ලජ්ජාවට පත්වන්නෝය. එහි කුලුනු 10
කඩාදමනු ලබන්නේය, කුලියට වැඩකරන
සියල්ලෝ ශෝක සිත් ඇති වන්නෝය.
ශෝවන්හි අධිපතීහු මහා අඥානයෝය; 11
ඵාරාවෝගේ ඉතා ප්‍රඥාවන්ත මන්ත්‍රීන්-
ගේ මන්ත්‍රණය මෝඩවී තිබේ. මම
ප්‍රඥාවන්තයන්ගේ පුත්‍රයෙක්ව පුරාතන
රජවරුන්ගේ පුත්‍රයෙක්ව සිටිමියි තුඹලා
ඵාරාවෝට කියන්නේ කොහොමද?
ඉතින් තුඹේ ප්‍රඥාවන්තයෝ කොතැනද? 12
සේනාවල **ස්වාමීන්වහන්සේ** මිසරය
ගැන නියම කළේ කුමක්ද කියා ඔව්හු
තුඹට දන්වත්වා; නොහොත් තුමූම
දැනගනිත්වා. ශෝවන්හි අධිපතීහු 13
අඥානයෝ වූණෝය, නොප්හි අධිපතීහු
රැවටුණෝය; මිසරවරුන්ගේ ගෝත්‍රවල
මූලිකයෝ ඔවුන් මුළාකෙරෙවූවෝය.
**ස්වාමීන්වහන්සේ** එහි මැද විකල් 14
ආත්මයක් ආරූඪ කළසේක. ඔව්හුද
බේබද්දෙක් තමාගේ වමනයකිරීමේදී
මුළාවෙන්නාක් මෙන් මිසරවරුන් ඔවුන්ගේ
සියලු ක්‍රියාවලදී මුළාකෙරෙවූවෝය.
හිසටවත් වල්ගයටවත් තල්අත්තටවත් 15
පන්ගහටවත් මිසරය උදෙසා කළ හැකි
කිසිවැඩක් නොවන්නේය.
ඒ දවසේ මිසරවරු ස්ත්‍රීන් මෙන් වී, 16
සේනාවල **ස්වාමීන්වහන්සේ** ඔවුන්ට
විරුද්ධව සොලවන උන්වහන්සේගේ
අතේ සෙලවීමට භයපත්වී, වෙවුලන්නෝය.
යූද දේශය මිසරවරුන්ට භීතියක් 17
වන්නේය, එය සඳහන්කරනවා අසන
සියල්ලෝම සේනාවල **ස්වාමීන්වහන්සේ**
ඔවුන්ට විරුද්ධව නියමකර තිබෙන
නියමයට වෙවුලන්නෝය.

18 ඒ දවසෙහි කානාන් භාෂාව
කථාකරන්නාවූ, සේනාවල **ස්වාමීන්-**
**වහන්සේට** දිවුරුම් දෙන්නාවූ නුවරවල්
පහක් මිසර දේශයෙහි වන්නේය; එකකට
*විනාශයේ නුවරයයි කියනු ලබන්නේය.
19 ඒ දවසෙහි **ස්වාමීන්වහන්සේට** මිසර
දේශය මැද පූජාසනයකුත් එහි සීමාව
ළඟ **ස්වාමීන්වහන්සේට** කණුවකුත්
20 වන්නේය. තවද ඔවුන් පීඩාකාරයින්
නිසා **ස්වාමීන්වහන්සේට** යාච්ඤා කරන
විට උන්වහන්සේ බලවත් ගැළවුම්කාරයෙකු
ඔවුන් වෙතට යවා ඔවුන් ගළවනවා
ඇත. සේනාවල **ස්වාමීන්වහන්සේ**
උදෙසා එය මිසර දේශයෙහි ලකුණක්ද
21 සාක්ෂියක්ද වන්නේය. **ස්වාමීන්වහන්සේ**
මිසරවරුන්ට ප්‍රකාශවනසේක, මිසරවරු
ඒ දවසේදී **ස්වාමීන්වහන්සේ** ඇඳිනගන
යාගවලින්ද ආහාර පූජාවලින්ද නමස්-
කාරකරන්නෝය, **ස්වාමීන්වහන්සේට**
භාරයක් වී එය ඉෂ්ටකරන්නෝය.
22 මෙසේ **ස්වාමීන්වහන්සේ** මිසරයට පහර-
දෙනසේක, පහරදී සුවකරනසේක; ඔවුන්
**ස්වාමීන්වහන්සේ** වෙතට හැරෙනවා ඇත,
උන්වහන්සේද ඔවුන්ගේ කන්නලව්ව
පිළිගෙන, ඔවුන් සුවපත්කරනවා ඇත.
23 ඒ දවසෙහි මිසරයේ සිට අෂූර්ට මහ
මාවතක් වන්නේය, අෂූරියයා මිසරයටත්
මිසරයා අෂූර්ටත් පැමිණෙනවා ඇත;
මිසරවරුද අෂූර්වරුන් සමග නමස්කාර
කරන්නෝය.
24 ඒ දවසෙහි ඉශ්‍රායෙල් මිසරයද අෂූර්ද
සමග තුන්වෙනිව සිට පොළොව මැද
25 ආශීර්වාදයක් වන්නේය. මක්නිසාද
සේනාවල **ස්වාමීන්වහන්සේ** කථාකොට:
මාගේ සෙනඟවූ මිසරයටත් මාගේ
හස්තකර්මාන්තයවූ අෂූර්ටත් මාගේ
උරුමයවූ ඉශ්‍රායෙල්ටත් ආශීර්වාද
වේවයි කියා ඔවුන්ට ආශීර්වාදකළ-
සේක.

*නොහොත්–සූර්ය නගරය;

## මිසරයේ විනාශය ගැන යෙසායාගේ ලකුණ

20

අෂූර්හි රජවූ සර්ගොන් විසින්
එවූවාවූ තර්තාන් අෂ්දෝද්ට ඇවිත්
ඊට විරුද්ධව යුද්ධකොට අල්වාගත්
අවුරුද්දේදී, **ස්වාමීන්වහන්සේ** ආමොස්ගේ 2
පුත්‍රවූ යෙසායා ලවා කථාකරමින්: නුඹ
ගොස් නුඹේ ඉහටියෙන් ගෝණි රෙද්ද
මුද නුඹේ පාදවලින් වහන් ගළවාපන්නැයි
කීසේක. ඔහු එසේ කොට වස්ත්‍රද වහන්ද
නැතුව ඇවිද්දේය. **ස්වාමීන්වහන්සේ** 3
කථාකොට: මාගේ මෙහෙකරුවූ
යෙසායා තුන් අවුරුද්දක් මිසරය ගැනත්
කූෂ් දේශය ගැනත් ලකුණක්ද පුදුමයක්ද
වශයෙන් වස්ත්‍රද වහන්ද නැතුව
ඇවිද්දක්මෙන්, අෂූර්හි රජ වාලට 4
ගන්නාලද මිසරවරුන්ද පිටිවහල්ව සිටින
කූෂ්වරුන්ද රැගෙන, වස්ත්‍ර හා වහන්
නැතුව, ඔවුන්ගේ තට්ටම් නග්නව තිබෙද්දී,
මිසරයට නින්දවක් කොට ගෙනයනවා
ඇත. ඔව්හු තමුන්ගේ බලාපොරොත්තුව 5
වන කූෂ් ගැනද තමුන්ගේ පාරට්ටුව
වන මිසරය ගැනද කැලඹී ලජ්ජාවට
පැමිණෙන්නෝය. මේ මුහුදුබඩ වැසියෝ 6
ඒ දවසෙහි කථාකොට: බලව, අෂූර්හි
රජුගෙන් ගැළවෙන පිණිස පිහිට ලබන්ට
අප පලාආවාවූ ස්ථානය වන අපේ
බලාපොරොත්තුවට මෙසේ වූයේ නම්
අපි කෙසේ ගැළවෙන්නෙමුදැයි කියනවා
ඇතැයි කීසේක.

## බබිලෝනියේ වැටීම

21

මුහුදු කාන්තාරය ගැන දිව්‍ය
ප්‍රකාශනයය.
දකුණුදිග සුළිහුළං ගසන්නාක් මෙන්
ඒක භයානක දේශයක් වන
කාන්තාරයෙන් එන්නේය. දුඃඛිත 2
දර්ශනයක් මට ප්‍රකාශකරනලද්දේය;
වංචාකාරයා වංචාකරන්නේය,
නාස්තිකාරයා නාස්තිකරන්නේය. එම්බා
ඒලාම්, නැඟී පලයන්න; එම්බා මේදිය,
වටලාගනින්න; එහි සියලුම සුසුම්ලෑම්
නැවැත්වීමි. එබැවින් මාගේ ඉහටිය 3

වේදනාවෙන් පිරී තිබේ; වදන ස්ත්‍රියෙකුගේ
විළිරුජා මෙන් රුජා මට අල්ලා තිබේ.
කන් නොඇසෙන තරම් වේදනාවෙන්
මිරිකී සිටිමි; ඇස් නොපෙනෙන
4 තරම් කැලඹී සිටිමි. මාගේ සිත
තිගැස්සිවන්නේය, භයංකරය මා
භයගැන්නෙවූවේය. මා ආශාවූ සැන්දෑ
5 කාලය මට වෙවුලුම වී තිබේ. ඔව්හු
මේසය සූදනම් කෙරෙති, මුර සිටුවති,
කමින් බොමින් සිටිති. අධිපතිවරුනි,
නැගිට පලිහ ආලේපකරපල්ලා.
6 මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මට
කථාකොට: තුඹ ගොස් මුරකාරයෙක්
හිටවාපන්න; ඔහු දකින දේ දන්වාවා.
7 ඔහු මෑගයන් පිට එනම් දෙන්න දෙන්න
වශයෙන් අශ්වයන් පිටද කොටළුවන්
පිටද මනුෂ්‍යයන් නැගී එනවා දකිනකල
ඉතා ඕනෑකමින්ම ඇහුම්කන්දෙන්නේ-
8 යයි කීසේක. ඔහු සිංහයෙකු මෙන්
මොරගසා: **ස්වාමීන්වහන්ස,** මම
මුරකොටුව උඩ දවාලේ නිතරම සිටිමි,
රෑ මුළුල්ලේත් මාගේ මුරපළේ සිටිමි,
9 අන්න, දෙන්න දෙන්න වශයෙන් අශ්වයන්
පිට මනුෂ්‍යයෝ නැගීඑතියි කීවේය. ඔහු
උත්තර දෙමින්: බබිලෝනිය වැටුණාය,
වැටුණාය; ඇගේ දෙවිවරුන්ගේ කැපූ
රූප සියල්ලම කඩා බිමදමනලද්දේයයි
10 කීවේය. අහෝ, මඩිනු ලැබූ මාගේ
සෙනඟෙනි, මාගේ පාවරේ දරුවෙනි,
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-**
**වහන්සේගෙන්** මා ඇසූ දේ මම තුඹලාට
දැන්නුවෙමි.

## ඒදෝම සහ අරාබිය කෙරෙහි විනිශ්චය

11 දූමා ගැන දිව්‍ය ප්‍රකාශනයය.
මුරකාරය, රාත්‍රියේ දැන් වේලාව කීයද?
මුරකාරය, රාත්‍රියේ දැන් වේලාව කීයදැයි
සේයිර් සිට කෙනෙක් මට හඬගසයි.
12 මුරකාරයාද: පහන් වේලාව එන්නේය,
රාත්‍රියත් එන්නේය. තුඹලා විභාගකරන්ට
නම් කැමති නැවත ඇවිත් විභාගකර-
පල්ලායයි කීවේය.

අරාබිය ගැන දිව්‍ය ප්‍රකාශනයය. 13
අහෝ කණ්ඩායම් වශයෙන් ගමන්
කරන දෙදන්වරුනි, අරාබියේ පඳුරු
අතරේ තුඹලා නවාතැන් ගන්නවා ඇත.
තේමා දේශයේ වැසියෝ පිපාසා 14
ඇත්තාගේ පෙරමගට වතුර ගෙනාවෝය,
පලායන අය වෙතට කෑම රැගෙන
ආවෝය. මක්නිසාද ඔව්හු කඩු 15
ඉදිරියෙන්ද ඇදගත් කඩුව ඉදිරියෙන්ද
නැත්කැවූ දුන්න ඉදිරියෙන්ද යුද්ධයේ
තදකම ඉදිරියෙන්ද පලාගියෝය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ මට 16
කථාකොට: කුලීකාරයෙකුගේ අවුරුදු
ලෙස තව අවුරුද්දකින් කේදර්හි මුළු
තේජස නැතිව යන්නේය. කේදර් 17
පුත්‍රයන්ගේ බලවත්තයන්වූ දුනුකාරයන්ගේ
ගණනෙන් ඉතිරි අය ස්වල්පවන්නෝය.
මක්නිසාද ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** එසේ වදාළසේකැයි කීවේය.

## යෙරුසලමට තර්ජනයකිරීම

22
දර්ශන මිටියාවත ගැන දිව්‍ය ප්‍රකාශනයය.
ඔල්වරහඬවලින් පූර්ණවූ ඝෝෂා ඇති
නුවරක්ද ප්‍රීතිමත් නගරයක්ද වූ තුඹ
තුළ සිටින සියල්ලන් පියසිවිලට නැගී
ගියේ තුඹට මක්වෙලාද? තුඹ තුළ 2
මැරුම්කෑ අය කඩුවෙන් මරනලද්දෝවත්
සටනේදී මැරුණෝවත් නොවෙති. තුඹේ 3
සියලු අධිපතියෝ එක්ව පලාගිය නුමුත්
දුනුකාරයන්ට අසුවුණෝය; දුරට
පලාගියාවූ, තුඹ තුළ සම්බවුණු
සියල්ලෝ අසුවුණෝය. එබැවින්: මා 4
කෙරෙන් ඉවත බලාපල්ලා. මම තද
ශෝකයෙන් අඬන්නෙමි; මාගේ සෙනඟවූ
දුවගේ නාස්තිය ගැන මා සනසන්ට
වෑයම් නොකරල්ලායයි කීමි. මක්නිසාද 5
ඒ දවස සේනාවල **ස්වාමීන්වහන්සේ**
වන ස්වාමීන්වහන්සේ කෙරෙන් වූ දර්ශන
මිටියාවතෙහි කැලඹීමේද පාගාදැමීමේද
වියවුලේද දවසක්ය; පවුරු බිඳ දැමීමක්
හා කඳුවලට මොරගෑසීමක්ද වේ. ඒලාම් 6
වනාහි රථ සේනාවද අසරුවන්ද ඇතුව
සිට ඊතොපුව දරුවේය; කීර්ද පලිහෙන්

7 වැස්ම ඇරියේය. මෙසේ නුඹේ ඉතා
හොඳ මිටියාවත් රථවලින් පිරී තිබුණේය,
අසරුවෝද දොරටුව ඉදිරියෙහි සිටගත්-
8 තෝය. යූදගේ වැස්ම අහක්කරනලද්දේය,
නුඹ ඒ දවසෙහි වනය නම් ගෘහයේ
9 යුද්ධායුධ දෙස බැලුවෙහිය. දාවිත්ගේ
නුවර බිඳුම් බොහෝ බව නුඹලා දැක
පහළ පොකුණේ දිය රැස්කළහුය.
10 යෙරුසලමේද ගෙවල් ගණන්කොට පවුර
සවිකරන පිණිස ගෙවල් බිඳ හෙළුය.
11 පරණ පොකුණේ වතුරට පවුරු දෙක
අතරේ ජලාශයක් සෑදුවහුය. එහෙත්
ඒක කළ තැනන්වහන්සේ දෙස නුඹලා
බැලුවේවත් මීට බොහෝ කලකට
පළමුවෙන් ඒක තැනූ තැනන්වහන්සේ
12 සැලකුවේවත් නැත. ඒ දවසෙහි සේනාවල
ස්වාමීන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ
ඇඬීමටත් වැලපීමටත් හිස මුඩුකරගන
සිටීමටත් ගෝණිරෙදි ඇඳගැනීමටත් අඬ-
13 ගැසුසේක. එහෙත් ප්‍රීති සන්තෝෂයත්
ගොනුන් සහ බැටළුවන් මැරීමත් මස්
කෑමත් මුද්‍රිකපානය බීමත් තිබේ. අපි
කමු, බොමු, මක්නිසාද හෙට මියන්-
14 නෙමුයයි කියති. සේනාවල ස්වාමීන්-
වහන්සේ මාගේ කනට එළිදරව් කරමින්
කියනසේක්: නුඹලා නසින තුරුම
සැබවින් මේ අපරාධය නුඹලාගෙන්
පහකරනු නොලබන්නේයයි සේනාවල
ස්වාමීන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ
කියනසේකැයි වදාළසේක.

## ද්‍රෝහිකාර ෂෙබ්නා පහකොට විශ්වාස එලියාකීම් උසස්කිරීම

15 සේනාවල ස්වාමීන්වහන්සේ වන
ස්වාමීන්වහන්සේ කියනසේක්: ගෘහාධි-
පතිවූ ෂෙබ්නා නම්වූ මේ ගබඩාකාරයා
ළඟට නුඹ ගොස් මෙසේ කියාපන්න,
16 එනම්: නුඹට මෙහි ඇතිකම මොකද?
නුඹ මෙහි සොහොනක් කොටාගත්තේ
මෙහි නුඹේ කවුරු සිටින නිසාද?
උස් තැනක තමාට සොහොනක්
කොටා ගන්නේය, පර්වතයෙහි තමාට
වාසස්ථානයක් කපාගන්නේය! බලවත් 17
මනුෂ්‍යය, ස්වාමීන්වහන්සේ නුඹ හෙළා-
දමා, වැස්මකින් නුඹ වසා, නුඹ අකුළා 18
ගුලියක් කර, විශාල දේශයකට පන්දුවක්
මෙන් සැබවින්ම නුඹ වීසිකරදමන-
සේක; එහිදී නුඹ නසින්නෙහිය, නුඹේ
ස්වාමියාගේ වංශයේ ලජ්ජාවට හේතුවූ
තැනැත්ත, එහිදී නුඹේ තේජසේ රථ
තිබෙන්නේය. මම නුඹේ නිලයෙන් නුඹ 19
නෙරපාදමන්නෙමි, ඔහු නුඹේ ඉඩමෙන්ද
නුඹ ඇද දමන්නේය. තවද ඒ දවසෙහි 20
හිල්කියාගේ පුත්‍රවූ මාගේ මෙහෙකරුවූ
එලියාකීම් අඬගස්වා, නුඹේ සළුව ඔහුට 21
අඳවා, නුඹේ පටියෙන් ඔහු සවිකොට,
නුඹේ ආණ්ඩුව ඔහු අතට භාරදෙන්නෙමි.
ඔහු යෙරුසලමේ වැසියන්ටත් යූද
වංශයටත් පියෙක් වන්නේය. දාවිත්ගේ 22
වංශයේ යතුරද ඔහුගේ කර පිට
තබන්නෙමි; කිසිවෙක් නොපියන ලෙස
ඔහු අරින්නේය; කිසිවෙක් නාරින ලෙස
ඔහු පියන්නේය. මම සවි තැනක 23
ඇණයක් මෙන් ඔහු පිහිටුවන්නෙමි;
ඔහු වනාහි තමාගේ පිය වංශයට
ඉසුරුමත් ආසනයක් පිණිස වන්නේය.
ඔහුගේ පියාගේ වංශයේ මුළු ඉසුරුවූ 24
වංශය සහ පෙළපතද පාත්‍රා භාජන
පටන් කළගෙඩි දක්වා සියලු කුඩා
භාජනද ඔහු පිට එල්ලා තබනවා ඇත.
ඒ දවසෙහි සවි තැනක පිහිටුවා තිබුණු 25
ඇණය පහවන්නේය; එය කපා දමනු
ලැබ වැටෙන්නේය, ඒ පිට තිබුණු
බර සිඳදමනු ලබන්නේයයි සේනාවල
ස්වාමීන්වහන්සේ කියනසේක; මක්නිසාද
ස්වාමීන්වහන්සේ එසේ වදාළසේක.

## තීර්හි විනාශය

තීර් ගැන දිව්‍ය ප්‍රකාශනයය. **23**
අහෝ තර්ෂීෂ්හි නැව්කාරයෙනි,
කෑමොරගසාපල්ලා; මක්නිසාද ගෙයක්වත්
ඇතුල්වෙන තැනක්වත් නැති තරමට ඒක
නාස්තිවිය. කිත්තිවරුන්ගේ දේශයෙන්
ඒක ඔවුන්ට ආරංචිවිය. මුහුදුබඩ 2
වැසියෙනි, නිශ්ශබ්ද වෙයල්ලා; මුහුදේ

යාත්‍රාකරන ශීදෙන් වෙළඳුන් විසින්
3 නුඹ පූර්ණකොට තිබේ. මහා ජලයන්
කරණකොටගෙන ෂීහෝර්හි බීජ වන
නයිල් ගංගාවේ අස්වැන්න ඇගේ ආදයම
විය; ඈ ජාතීන්ගේ වෙළඳම්පළ වූවාය.
4 එම්බා ශීදෙන්, ලජ්ජාවෙයන්න; මක්-
නිසාද මුහුද, එනම් මුහුදු බලකොටුව
කථාකොට: මම වදන වේදනා
නොවින්දෙමි, දරුවන් නොවැදුවෙමි,
තරුණයන් පෝෂ්‍ය නොකෙළෙමි,
කන්‍යාවන් ඇති නොකෙළෙමියි කීවාය.
5 එය මිසරයට සැලවූ කල තීර්හි ආරංචිය
ගැන ඔවුන්ට තද ශෝක ඇතිවන්නේය.
6 තර්ෂීෂ්ට යාත්‍රාකරපල්ලා; මුහුදුබඩ
7 වැසියෙනි, කෑමොරගසාපල්ලා. පුරාණ
කාලයේ සිට පවත්නාවූ, වාසය පිණිස
බොහෝ දුර පයින් ගමන් ගත් නුඹලාගේ
8 ප්‍රීතිමත් නුවර මේකද? ඔටුනු පළඳ-
වන නුවරවූ තීර්ට විරුද්ධව මේක
යෝජනාකළේ කවුද? ඇගේ වෙළෙන්දෝ
අධිපතියෝය, ඇගේ ගනුදෙනුකාරයෝ
9 පොළොවේ නම්බුකාරයෝය. සියලු
අලංකාරකම්වල උඩඟුකම කෙළහන්ටත්
පොළොවේ සියලු නම්බුකාරයන්
නින්දවට පමුණුවන්ටත් සේනාවල
**ස්වාමීන්වහන්සේ** එය යෝජනාකළ-
10 සේක. එම්බා තර්ෂීෂ්හි දියණියෙනි, නයිල්
ගංගාව මෙන් නුඹේ දේශයෙහි පැතිරී-
යන්න; නුඹ අවටින් බැම්මක් තවත් නැත.
11 උන්වහන්සේ තමන්ගේ හස්තය මුහුද
කෙරෙහි දිගුකර රාජ්‍යයන් සෙල්වූසේක.
කානාන්හි බලකොටු නැතිකරන ලෙස
**ස්වාමීන්වහන්සේ** ඒ ගැන අණකළසේක.
12 බලාත්කාරය වින්ද කන්‍යාව වන
ශීදෙන් දියණියෙනි, නුඹ තවත් ප්‍රීතිමත්
නොවන්නෙහිය. පිටත්ව කිත්තිවරුන්
ළඟට පලයන්න; එහිදීත් නුඹට
නිවාඩුවක් නොලැබෙන්නේයයි උන්-
13 වහන්සේ කීසේක. කල්දිවරුන්ගේ දේශය
බලනු; ඒ සෙනඟ තවත් නැත. අෂූර්-
වරුන් විසින් ඒක වන මෘගයන්ට
නියමකරනලද්දේය. ඔව්හු තමුන්ගේ
බලකොටු ගොඩනගා, එහි මාළිගාවල්
නාස්තිකරදමා, එය ජරාවාසයක්
කළෝය. තර්ෂීෂ්හි නැව්කාරයෙනි, 14
කෑමොරගසාපල්ලා. මක්නිසාද නුඹලා-
ගේ බලකොටුව නාස්තිවිය. තවද ඒ 15
දවසෙහි එක රජෙකුගේ දවස් මෙන්
තීර් අවුරුදු සැත්තෑවක් මතක නැති-
වන්නේය. අවුරුදු සැත්තෑවකට පසුව
වේශ්‍යාවගේ ගීතිකාව මෙන් තීර්ට
සිදුවන්නේය. එම්බා මතකනැතිවුණු 16
වේශ්‍යාව, වීණාවක් ගෙන නුවර ඇවිද,
නුඹ ගැන මතක්වෙන පිණිස මිහිරි ගී
නාද කොට, බොහෝසේ ගී කියාපන්න.
තවද අවුරුදු සැත්තෑවකට පසුව 17
**ස්වාමීන්වහන්සේ** තීර් දෙස බලනසේක,
ඈද තමාගේ කුලියට හැරී ඇවිත්,
පොළෝ මතුපිට ලෝකයේ සියලු
රාජ්‍යවල් සමග ගනුදෙනුකරනවා ඇත.
ඇගේ වෙළඳමද කුලියද **ස්වාමීන්-** 18
**වහන්සේට** ශුද්ධව තිබේ. ඒවා නිධාන
කරනු ලබන්නේවත් රැස්කරනු ලබන්-
නේවත් නැත; මක්නිසාද ඇගේ වෙළඳම
**ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි වාසය-
කරන්නන්ට සෑහෙන පමණ කන
පිණිසත් අලංකාර වස්ත්‍ර පිණිසත්
වන්නේය.

## ලෝකවාසීන්ගේ විනාශවීම

24 බලව, **ස්වාමීන්වහන්සේ** පොළොව
හිස්කොට පාළුකරනසේක, ඒක
පෙරළා එහි වැසියන් විසුරුවාදමන-
සේක. සෙනඟට මෙන් පූජකයාටත් 2
වැඩකරුවාට මෙන් ඔහුගේ ස්වාමියාටත්
වැඩකාරීට මෙන් ඇගේ ස්වාමිදුවටත්
මිලේට ගන්නාට මෙන් විකුණන්නාටත්
ණය දෙන්නාට මෙන් ණය ගන්නාටත්
පොළීගන්නාට මෙන් පොළීදෙන්නාටත්
සිදුවන්නේය. පොළොව සහමුලින්ම 3
හිස්කරනු ලැබ සහමුලින්ම කොල්ලයක්
වන්නේය; මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
මේ වචන වදළසේක. පොළොව වැලපී 4
මලානිකවේ, ලෝකය ක්ලාන්තව
මලානිකවේ, පොළොවේ ජනයන්ගේ
උත්තමයෝ ක්ලාන්තවෙති. පොළොවත් 5
එහි වැසියන් නිසා කිලුටුව තිබේ;
මක්නිසාද ඔව්හු ව්‍යවස්ථාවන්

කඩකොට, නියෝගය වෙනස්කර,
6 සදාකාල ගිවිසුම කඩකළෝය. එබැවින්
ශාපයෙන් පොළොව නාස්තිවී, එහි
වැසියෝ වරදකාරයෝව සිටිති. ඒ නිසා
මනුෂ්‍යයන් ස්වල්පදෙනෙක් ඉතුරුවෙන
හැටියට පොළෝ වැසියෝ දවනු ලැබ
7 සිටිති. අලුත් මිදියුස වැලපේ, මිදිවැල
මැලවේ, සන්තෝෂ සිත් ඇතුව සිටි
8 සියල්ලෝ සුසුම්ලති. රබන්වල ප්‍රීතිය
නවතියි, ප්‍රීතිවත්තන්ගේ ඝෝෂාව
9 අත්හිටියි, වීණාවේ ප්‍රීතිය නවතියි. ඔවුන්
ගී කිය කියා මිදිරස බොන්නේ නැත;
මද්‍යපාන බොන්නන්ට ඒවා තිත්තවන්නේය.
10 පාළුවූ නුවර කඩාදමා තිබේ. කිසිවෙක්
ඇතුල් නොවන ලෙස සියලු ගෙවල්
11 වසා තිබේ. මුද්‍රිකපානය නිසා වීථිවල
කෑගැසීමක් තිබේ; මුළු ප්‍රීතිය අඳුරුවී,
12 දේශයේ සන්තෝෂය පහව ගියේය. නුවර
ඉතුරුව තිබෙන්නේ පාළුකමය, දොරටුව
13 නාස්තිවන සේ පහර ලැබීය. මක්නිසාද
ඔලීව ගසක් සොලවන්නාක්මෙන්ද
මිදිපල කඩා නිමවූ කල ඉතිරි මිදිපල
නෙළාගන්නාක්මෙන්ද පොළොව මැද
14 ජනයන් අතරේ සිදුවන්නේය. මොව්හු
හඬනගා ප්‍රීතියෙන් මොරගසා **ස්වාමීන්-
වහන්සේගේ** මහත්තත්වය නිසා මුහුදේ
15 සිට ශබ්ද පවත්වන්නෝය. එබැවින්
නැගෙනහිර දිසාවලදී **ස්වාමීන්-
වහන්සේටත්** මුහුදේ දිවයින්වලදී
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
නාමයටත් ගෞරවකරපල්ලා.
16 ධර්මිෂ්ඨයාට ගෞරවය ඇත්තේයයි
කියන ගීතිකා පොළොවේ කෙළවරේ
සිට ඇසීමුව. එහෙත් මම කථාකොට:
මම ක්ෂයවෙමි, මම ක්ෂයවෙමි, මට දුක් වේ!
වංචාකාරයෝ වංචාකළෝය; එසේය,
වංචාකාරයෝ බොහෝසෙයින් වංචා-
17 කළෝයයි කීමි. එම්බා පොළෝවැසිය,
භයානකකමක්ද වළක්ද මලපතක්ද නුඹ
18 පිට තිබේ. තවද භයඝෝෂාව නිසා
පලායන්නා වළේ වැටෙන්නේය; වළෙන්
ගොඩවෙන්නා මලපතට අසුවන්නේය.
මක්නිසාද ඉහළ කවුළු ඇරී තිබේ,
පොළොවේ අත්තිවාරම්ද සෙලවෙන්නේය.
පොළොව සහමුලින්ම කැඩී තිබේ, 19
පොළොව එහෙමපිටින්ම දියවී තිබේ,
පොළොව අතිශයින් කම්පාවේ.
පොළොව බේබද්දෙකු මෙන් වැනෙමින් 20
තොටිල්ලක් මෙන් ඔබ මොබ සෙල-
වෙනවා ඇත; එහි අපරාධය එය
කෙරෙහි බරව තිබෙන බැවින් ඒක වැටී
තවත් නොනැගිටින්නේය.
ඒ දවසෙහි **ස්වාමීන්වහන්සේ** උස 21
ස්ථානයෙහි සිටින උත්තමයන්ගේ
සේනාවටත් පොළොවේ සිටින පොළොවේ
රජවරුන්ටත් දඬුවම්කරනසේක. හිර- 22
කාරයන් වළක රැස්කර තබන්නාක් මෙන්
ඔව්හු එකට හිරගෙයි වසාතබනු
ලබන්නෝය, බොහෝ දවසකට පසු
දඬුවම් ලබන්නෝය. එකල චන්ද්‍රයා 23
වියවුල්වන්නේය, සූර්යයා ලජ්ජාවන්නේය;
මක්නිසාද සේනාවල **ස්වාමීන්වහන්සේ**
සියොන් කන්දෙහිද යෙරුසලමෙහිද
උන්වහන්සේගේ පුරාතනයන් ඉදිරියෙහිද
මහිමයෙන් රජකම්කරනසේක.

## දෙවියන්වහන්සේගේ මිදීම ගැන ප්‍රශංසාව.
## යෙරුසලම කෙරෙහි ආශීර්වාදය

25
**ස්වාමීන්වහන්ස**, ඔබ මාගේ
දෙවියන්වහන්සේය; මම ඔබ
උසස්කොට ඔබගේ නාමයට ප්‍රශංසා
කරන්නෙමි; මක්නිසාද ඔබ පුදුම දේ
එනම් පුරාතන මන්ත්‍රණ විශ්වාසයෙන්ද
සැබෑකමෙන්ද ඉෂ්ටකළසේක. එසේය, 2
ඔබ නුවරක් පස් ගොඩකටද බලකොටු
නුවරක් ජරාවාස ගොඩකටද විදේශීන්ගේ
මාළිගාවක් නුවරක් නොවන ලෙසද
හැරෙවූසේක; ඒක කවදාවත් ගොඩනගනු
නොලබන්නේය. එබැවින් බලවත් සෙනඟ 3
ඔබට ගෞරවකරන්නෝය, භයානක
ජාතීන්ගේ නගරයද ඔබට භයවන්නේය.
මක්නිසාද ඔබවහන්සේ භයානකයන්ගේ 4
චණ්ඩ මාරුතය තාප්පයකට ගසන
කුණාටුවක් මෙන් තිබියදී දුප්පතාට
බලකොටුවක්ව දිළිඳුට ඔහුගේ විපත්-
තියේදී බලකොටුවක්ව, කුණාටුවේදී
රක්ෂාස්ථානයක්ව, ග්‍රීෂ්මයේදී සෙවණක්ව

5 සිටිසේක. වියළි තැනක ග්‍රීෂ්මය
මෙන් ඔබ අන් දේශක්කාරයන්ගේ
ඝෝෂාව පහකරනසේක; වලාකුළක
සෙවණ කරණකොටගෙන ග්‍රීෂ්මය
පහවයන්නාක්මෙන් භයානකයන්ගේ
6 ජයගීය යටත්කරනු ලැබේ. සේනාවල
**ස්වාමීන්වහන්සේද** මේ කන්දේදී සියලු
ජනයන්ට සාරවූ දෙයින් මංගල්‍යයක්,
එනම් රසවත් මුද්‍රිකපානයෙන්ද
ප්‍රණීත ආහාරයෙන්ද පෙරූ රසවත්
මුද්‍රිකපානයෙන්ද මංගල්‍යයක් සාදන-
7 සේක. උන්වහන්සේ මේ කන්දේදී සියලු
ජනයන් කෙරෙහි වසා තිබෙන වැස්මත්
සියලු ජාතීන් කෙරෙහි අතුරා තිබෙන
8 තිරයත් නැතිකරදමනසේක. උන්වහන්සේ
මරණය සදකාලයටම ගිලදමූසේක;
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** සියලු
මුහුණුවලින් කඳුළු පිසදමනසේක; තමන්
සෙනඟගේ නින්දාවද මුළු පොළොවෙන්
පහකරනසේක. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** ඒක කීසේක.
9 ඒ දවසෙහි මෙසේ කියනු ලබන්නේය:
බලව, මේ අපේ දෙවියන්වහන්සේය, අපි
උන්වහන්සේ ගැන බලාසිටියෙමුව,
උන්වහන්සේ අප ගළවනසේක. මේ
තැනන්වහන්සේ **ස්වාමීන්වහන්සේය**; අපි
උන්වහන්සේ ගැන බලාසිටියෙමුව, අපි
උන්වහන්සේගේ ගැළවීම ගැන
10 ප්‍රීතිසන්තෝෂවන්නෙමුව. මක්නිසාද
**ස්වාමීන්වහන්සේගේ** හස්තය මේ
කන්දෙහි රඳන්නේය, නුමුත් මෝවබ්
කසළගොඩේ වතුරෙහි පිදුරු මඩින්-
නාක්මෙන් තමාගේ ඉඩමේ මඩිනු
11 ලබන්නේය. පීනන්නෙකු පීනන්ට අත්
විදහන්නාක්මෙන් ඔහු එහි තමාගේ අත්
විදහන්නේය; නුමුත් උන්වහන්සේ ඔහුගේ
ආඩම්බරයත් ඔහුගේ අත්වල ප්‍රයෝගයත්
12 පහත්කරදමනසේක. උන්වහන්සේ නුඹේ
පවුරුවල උස් බලකොටුව හෙළාදමා,
පහත්කොට, බිමේ දූවිල්ලටම පමුණුවන-
සේක.

## නැවත පිහිටුවනු ලැබුවාවූ සෙනඟගේ ප්‍රශංසාව සහ සාක්ෂිය

26
ඒ දවසෙහි මේ ගීතිකාව යූද
දේශයෙහි ගීතිකාකරනු ලබන්නේය:
අපට බලවත් නුවරක් ඇත; තාප්ප හා
පවුරු පිණිස උන්වහන්සේ ගැළවීම
නියමකරනසේක. විශ්වාසකම පවත්වන 2
ධර්මිෂ්ඨ ජාතිය ඇතුල්වෙන පිණිස
දොරවල් ඇරපල්ලා. ඔබ කෙරෙහි 3
සිත තබා සිටින තැනැත්තා, ඔබ
කෙරෙහි විශ්වාසකරන බැවින්, ඔබ ඔහු
ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරන-
සේක. **ස්වාමීන්වහන්සේ** කෙරෙහි 4
සදකාලයටම විශ්වාසකරපල්ලා.
මක්නිසාද යෙහෝවඃ නම්වූ **ස්වාමීන්-**
**වහන්සේ** සදකාල පර්වතයක්ය.
මක්නිසාද උන්වහන්සේ උසස්ථානය 5
වන උස්වූ නගරයේ වැසියන් හෙළා-
දමූසේක. උන්වහන්සේ එය පහත්-
කරනසේක, බිමටම ඒක පහත්කර
ධූලියටම පමුණුවනසේක. පාදය ඒක 6
පාගන්නේය; දිළිඳුන්ගේ පාදත්
දුර්වලයන්ගේ අඩිත් ඒක පාගනවා
ඇත. ධර්මිෂ්ඨයාගේ මාර්ගය ඇද- 7
නැති මාර්ගයක්ය. ඍජුගුණාන්විතවූ
තැනන්වහන්ස, ඔබවහන්සේ ධර්මිෂ්ඨ-
යාගේ මාවත හසුරුවනසේක. එසේය, 8
**ස්වාමීන්වහන්ස**, ඔබගේ විනිශ්චයවල
මාර්ගයෙහි අපි ඔබ ගැන බලාසිටියෙමු;
අපේ ආත්මයේ ආශාව ඔබගේ නාමය
හා ඔබගේ සංඥා නාමය කෙරෙහිය.
මාගේ ආත්මයෙන් මම රාත්‍රියෙහි ඔබ 9
කෙරෙහි ආශාවීමි; එසේය, මා තුළ මාගේ
ආත්මයෙන් අලුයම ඔබ සොයන්-
නෙමි. මක්නිසාද ඔබගේ විනිශ්චයන්
පොළොවේ ඇතිකල්හි ලෝ වැසියෝ
ධර්මිෂ්ඨකම ඉගෙනගනිති. දුෂ්ටයාට 10
කරුණාව ලැබෙන නුමුත් ඔහු ධර්මිෂ්ඨ-
කම ඉගෙනගන්නේ නැත; යුක්තිය
ඇති දේශයෙහිත් ඔහු අපරාධ ක්‍රියා-
කරනවා ඇත, ඔහු **ස්වාමීන්වහන්සේගේ**
මහත්තත්ත්වයද නොදක්නේය.

11 **ස්වාමීන්වහන්ස**, ඔබගේ හස්තය ඔසවා
තිබෙන නුමුත් ඔව්හු නොදකිති. එහෙත්
සෙනඟ උදෙසා ඇති ඔබගේ ජ්වලිතය
දැක ඔව්හු ලජ්ජාවන්නෝය; එසේය,
ගින්න ඔබගේ සතුරන් දවාදමන්-
12 නේය. **ස්වාමීන්වහන්ස**, ඔබ අප උදෙසා
සමාදනය ප්‍රධානයකරනසේක. මක්-
නිසාද අපේ සියලු කාරණාම ඔබ
13 අප උදෙසා කරදුන්සේක. අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබ ඇර වෙන
ස්වාමිවරු අප ආණ්ඩුකළෝය; නුමුත්
අපි ඔබ සහ ඔබගේ නාමය පමණක්
14 සඳහන්කරන්නෙමුව. මළාවූ ඔව්හු ජීවත්
නොවන්නෝය; නැසීගියාවූ ඔව්හු
නොනැගිටින්නෝය. එසේය, ඔබ ඔවුන්
විමසා බලා ඔවුන් විනාශ කොට, ඔවුන්
ගැන මුළු සිහිවීම නැතිකළසේක.
15 **ස්වාමීන්වහන්ස**, ඔබ සෙනඟ වැඩිකළ-
සේක, ඔබ සෙනඟ වැඩිකර ගෞරවය
ලබාගත්සේක. ඔබ දේශයේ සියලු
මායිම්ද විශාලකළසේක.
16 **ස්වාමීන්වහන්ස**, විපතේදී ඔව්හු ඔබ
දෙස බැලුවෝය; ඔබගෙන් ඔවුන්ට දඬුවම
පැමුණුණවිට ඔව්හු කන්නලව්වක්
17 වැගිරෙවුවෝය. ගර්භිණියක් වදන්ට
ළංවෙන විට විළිරුජාවෙන් මිරිකී
කෑගසන්නාක්මෙන්, **ස්වාමීන්වහන්ස**,
18 ඔබ ඉදිරියෙහි අපි සිටියෙමුව. අපි
ගර්භිණීව සිට වේදනා විඳිමින් හුළඟ
වැදුවාක්මෙන් වැදුවෙමුව; දේශයෙහි කිසි
මිදීමක් ඉෂ්ට නොකෙළෙමුව; ලෝ-
19 වැසියෝද නොවැටුණෝය. ඔබගේ
මළාහු ජීවත්වන්නෝය; මාගේ මළකඳන්
නැගිටිනවා ඇත. ධූලියෙහි වසන්නෙනි,
පිබිදී ගී කියාපල්ලා. මක්නිසාද ඔබගේ
පිනි පලාජාතිවල පිනි මෙන්ය, පොළොව
සහ මළවුන් පිට ඔබ ඒවා බසින්ට
සලස්වනසේක.
20 මාගේ සෙනඟ, වරෙල්ලා, තුඹලාගේ
ඇතුල් ගෙවලට ගොස් තුඹලාගේ
දොරවල් වසාගන, කෝපය පහවයන
තුරු ස්වල්ප මොහොතක් සැඟවී
ඉඳිල්ලා. මක්නිසාද මෙන්න, **ස්වාමීන්-** 21
**වහන්සේ**, පොළෝ වාසීන්ගේ අපරාධ
ගැන ඔවුන්ට දඬුවම්කරන්ට තමන්ගේ
ස්ථානයෙන් නික්මී එනසේක. පොළොවද
එහි මැරුම්කෑවුන් තවත් වසා නොගෙන
එහි වැගිරෙවූ ලේ ප්‍රකාශකරනවා ඇත.

## පීඩාලත් සෙනඟ කෙරෙහි දේවාරක්ෂාව

27 ඒ දවසෙහි **ස්වාමීන්වහන්සේ**,
තමන්ගේ තදවූ මහත්වූ බලවත්වූ
කඩුවෙන් ශීඝ්‍ර සර්පයාවූ ලෙවියාතන්ටත්
වක්වෙවීයන සර්පයාවූ ලෙවියාතන්ටත්
දඬුවම්කර, මුහුදේ ඉන්න දීර්ඝයාද
මරනසේක.
ඒ දවසෙහි ප්‍රියකරු මිදිවත්තක් ඇතිවේ, 2
ඒ ගැන ගීතිකාකරපල්ලා. **ස්වාමීන්-** 3
**වහන්සේ** වන මම ඒක ආරක්ෂා කරමි;
මොහොතින් මොහොත ඊට වත්
කරන්නෙමි. කිසිවෙක් ඊට අන්තරා
නොකරන ලෙස මම රෑ දවල් ඒක
ආරක්ෂාකරන්නෙමි. මා තුළ කෝපය 4
නැත. කටුගස්ද ගොකටුද මට විරුද්ධව
යුද්ධයට සිටියොත් යහපති! මම ඒවා
පාගා එකට දවාදමන්නෙමි. නැතහොත් 5
ඔහු මාගේ ශක්තිය අල්වාගෙන මා
සමග සමාදන වේවා; එසේය, ඔහු මා
සමග සමාදන වේවා. මතු පැමිණෙන 6
දවස්වල යාකොබ් මුල් අදින්නේය;
ඉශ්‍රායෙල් මල්ගෙන දළුලන්නේය. ඔවුන්
පොළෝතලය ඵලයෙන් පුරවනවා ඇත.
ඔහුට පහරදුන් අයට උන්වහන්සේ 7
පහරදුන්නාක්මෙන් උන්වහන්සේ ඔහුටත්
පහරදුන්සේක්ද? නොහොත් ඔවුන්
මැරුම්කෑවා වාගේ ඔහු මැරුම්කෑවේද?
ඈ අහකට ඇරීමෙන් ඔබ මදක් ඈට 8
දඬුවම්කරනසේක; පෙරදිගින් හුළඟ
ගසන දවසේදී උන්වහන්සේ තමන්ගේ
තද හුළඟින් ඈ පහකළසේක. එබැවින් 9
මෙයින් යාකොබ්ගේ අපරාධය මැකී-
යන්නේය, එහි මුළු ඵලය නම්,
පූජාසනයේ සියලු ගල් පොඩිවුණ

හුණුගල් මෙන් ඔහු විසින් කරන
හැටියටත් අෂේරා කනුද සූර්යය රූපද
තවත් නොනැගිටින හැටියටත් ඔහුගේ
10 පාපය පහකිරීමය. මක්නිසාද බලකොටු
නුවර කාන්තාරය මෙන් පාළුවූ
අත් අරිනලද නිවාසයක්ව, හුදකලාව
තිබේ. වස්සා ඒකේ තෘණ කන්නේය,
11 ඌ එහි ලැග ඒකේ අතු කන්නේය. ඒකේ
අතු වේළුණාම කඩාදමනු ලැබේ;
ස්ත්‍රියෝ ඇවිත් ඒවා දවන්නෝය.
මක්නිසාද ඔව්හු නුවණ නැති සෙනඟක්ය;
එබැවින් ඔවුන්ගේ මැවුම්කාරයාණෝ
ඔවුන්ට අනුකම්පා නොකරනසේක,
ඔවුන් සෑදූ තැනන්වහන්සේ ඔවුන්ට
කරුණා නොකරනසේක.
12 තවද ඒ දවසෙහි ස්වාමීන්වහන්සේ
*ගංගාවේ සැඩපාරේ පටන් මිසරයේ ඔය
දක්වා ඔහුගේ එල නෙළාගන්නාසේක.
එම්බා ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, තුඹලා එක්
එක්කෙනෙක් පාසා රැස්කරනු ලබන්නහුය.
13 තවද ඒ දවසෙහි මහත් හොරණෑවක්
පිඹිනු ලැබේ; එවිට අෂූර් දේශයෙහි
නැතිවීයන්ට ළංව සිටි අයද මිසර
දේශයෙහි පන්වනු ලැබ සිටි අයද ඇවිත්
යෙරුසලමේ ශුද්ධ කන්දෙහි ස්වාමීන්-
වහන්සේට නමස්කාරකරන්නෝය.

## බීමත්කම සහ අයුක්තිය නිසා එප්‍රායිම්ටත් යූදටත් තර්ජනය කිරීම

28 එප්‍රායිම්හි බේබද්දන්ගේ උද්දරතර
ඔටුන්නටත් මුද්‍රිකපානයට වසඟ-
වෙන්නන්ගේ සාරවත් මිටියාවතේ මුදුන
මත්තෙහි තිබෙන එහි අලංකාර දීප්ති-
මත්කම වන පරවෙන මලටත් දුක් වේ!
2 බලව, ස්වාමීන්වහන්සේගේ බලවත්වූ
සවිවූ කෙනෙක් සිටින්නේය; ගල්වැස්ස
සහිත කුණාටුවක් මෙන්ද විනාශකරන
හුළඟක් මෙන්ද ගලායන මහත් ජල-
ගැලීමක් මෙන්ද ඔහු ඒවා අතින් බිමට

*එනම්, ප්‍රාත් ගංගාවේ.

හෙළන්නේය. එප්‍රායිම්හි බේබද්දන්ගේ 3
උද්දරතර ඔටුන්න පයින් පාගාදමනු
ලබන්නේය. සාරවත් මිටියාවතේ මුදුන 4
මත්තෙහි තිබෙන අලංකාර දීප්තිමත්කම
වන පරවෙන මල නියඟ කලට පෙර
පළමුවෙන් ඉදෙන අත්තික්කා ගෙඩියක්
මෙන් වන්නේය; ඒක දකින අය
එය දුටුවාම අතට ගත් කෙණෙහිම
ගිලගන්නේය. ඒ දවසෙහි සේනාවල 5
ස්වාමීන්වහන්සේ තමන්ගේ ඉතිරි
සෙනඟට අලංකාර ඔටුන්නක්ද දීප්තිමත්
කිරීටයක්ද, විනිශ්චයකිරීමට හිඳින්නාට 6
විනිශ්චයේ ආත්මයක්ද දොරටුව ළඟදී
සටන ආපසු හරවන්නන්ට බලයද වන-
සේක. එහෙත් මොව්හුද මුද්‍රිකපානය 7
කරණකොටගෙන වැනි වැනී යති, සුරා-
පානය කරණකොටගෙන මුළාව යති;
පූජකයාද අනාගතවක්තෘද සුරාපානය
කරණකොටගෙන වැනි වැනී යති,
මුද්‍රිකපානයෙහි ගිලී මද්‍යපානය කරණ-
කොටගෙන මුළාව යති; ඔව්හු දර්ශනය
වරද්දගන විනිශ්චයේදී පැකිලෙති.
මක්නිසාද සියලුම මේස පවිත්‍ර තැනක් 8
නැති තරමට වමනයෙනුත් කැත දෙයිනුත්
පිරී තිබේ. *උන්වහන්සේ දැනගැන්ම 9
උගන්වන්නේ කාටද? පණිවිඩය තේරුම්-
කරදෙන්නේ කාටද? කිරිවැරුවන්ට සහ
තනෙන් වෙන්වුණ දරුවන්ටද? මක්නිසාද 10
අණ පිට අණය, අණ පිට අණය; පනත
පිට පනතය, පනත පිට පනතය; මෙහි
ටිකක්ය, එහි ටිකක්ය. එසේය, උන්- 11
වහන්සේ වියවුල් තොල්වලින්ද වෙන
භාෂාවකින්ද මේ සෙනඟට කථාකරනවා
ඇත. උන්වහන්සේ ඔවුන්ට කථාකොට: 12
නිවාඩුව මේය, වෙහෙසවූ අයට නිවාඩු
දීපල්ලා; නිෂ්කලංකයත් මේයයි කීසේක.
එහෙත් ඔව්හු අසන්ට අකමැතිවූහ.
එබැවින් ඔවුන් ගොස් පස්සට වැටී 13
පොඩිවී මලපතක වැටී අසුවෙන පිණිස:
අණ පිට අණය, අණ පිට අණය; පනත
පිට පනතය, පනත පිට පනතය; මෙහි
ටිකක්ය, එහි ටිකක්ය යන පිළිවෙළින්
ස්වාමීන්වහන්සේගේ වචනය ඔවුන්ට
වන්නේය.

*නොහොත්, ඔහු.

14 එබැවින් යෙරුසලමෙහි සිටින මේ
සෙනඟ ආණ්ඩුකරන නින්දකාර මනුෂ්‍ය-
යෙනි, **ස්වාමීන්වහන්සේගේ** වචනය
15 අසාපල්ලා. අපි මරණය සමග ගිවිසුමක්
කොට *පාතාලය සමග පොරොන්දුවකට
බැඳී සිටිමුව; ගලාඑන විපත පැමිණෙන
විට එය අප වෙතට නොඑන්නේය;
මක්නිසාද අපි බොරුව අපේ රක්ෂාස්-
ථානය කරගන වංචාකමෙහි සැඟවී
16 සිටිමුයයි නුඹලා කීවහුය. ඒ නිසා
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක: බලව, මම අත්තිවාරමක්
පිණිස ගලක් එනම් පරීක්ෂාකරනලද
ගලක්, සවි අත්තිවාරමක්වූ අනර්ඝ
කොනේ ගලක් සියොන්හි තබමි.
17 අදහන අය ඉක්මන් නොවන්නේය. මම
විනිශ්චය ලනුවද ධර්මිෂ්ඨකම ලඹයද
කොට පාවිච්චිකරන්නෙමි. බොරුවේ
රක්ෂාස්ථානය ගල් වර්ෂාවට පහවන්නේය,
සැඟවෙන ඉඩමද වතුරට යටවන්නේය.
18 මරණය සමග තිබෙන නුඹලාගේ
ගිවිසුම අවලංගුවන්නේය, *පාතාලය
සමග තිබෙන නුඹලාගේ පොරොන්දුව
පවතින්නෙත් නැත; ගලාඑන විපත
පැමිණෙන විට නුඹලා එයින් පාගාදමනු
19 ලබන්නහුය. එය එන එන විට නුඹලාව
අල්ලාගන්නවා ඇත; මක්නිසාද උදයෙන්
උදයද රෑ දවල්ද එය එනවා ඇත. ඒ
ආරංචිය තේරුම්ගැනීමම භීතියක්ව
20 තිබෙයි. මක්නිසාද යමෙකුට දිගාවීමට
ඇඳ දිග මදිය; පෙරවාගැනීමට වැස්ම
21 පළල මදිය. එසේය, **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ ක්‍රියාව වන තමන්ගේ අපූරු
ක්‍රියාව කිරීමටත් තමන්ගේ වැඩය වන
තමන්ගේ අපූරු වැඩය ඉෂ්ටකිරීමටත්
පෙරාශීම් කන්දේදී මෙන් නැගිටිනසේක,
ගිබියොන් මිටියාවතේදී මෙන් කෝප-
22 වනසේක. ඒ නිසා නුඹලාගේ බැඳුම්
තද නොවන පිණිස නින්දකරන්නෝ
නොවෙල්ලා. මක්නිසාද මුළු දේශයට
විරුද්ධව විනාශයක් නියමකර තිබෙන
බව මම සේනාවල **ස්වාමීන්වහන්සේ**
වන ස්වාමීන්වහන්සේගෙන් ඇසීමි.

*හෙබ්‍රෙව්: ෂෙයෝල.

නුඹලා කන් යොමුකර මාගේ හඬ 23
අසාපල්ලා; ඇහුම්කන්දී මාගේ වචන
අසාපල්ලා. හාන්නා වපුරන පිණිස 24
සෑමදම හාන්නේද? තොර නැතුව
තමාගේ බිම හාරා පස්කැටි කඩන්නේද?
ඔහු බිම සමතලාකොට, කොල්ලු ඉස, 25
දුරු වපුරා, තිරිඟු පේළි වශයෙන්ද යව
ඊට නියම ඉඩමේද තණහාල් එහි
මායිමේද හිටවනවා නොවේද? මෙසේ 26
ඔහුගේ දෙවියන්වහන්සේ හරි විධිය
ඔහුට පෙන්වා ඔහුට උගන්වනසේක.
තවද කොල්ලු තියුණු යන්ත්‍රයකින් 27
මඩින්නේවත් දුරු පිට රථ රෝදයක්
කරකවන්නේවත් නැත; කොල්ලු ලීයකින්ද
දුරු කෝටුවකින්ද මඩින්නේය. රොටි- 28
ධාන්‍ය අඹරනු ලබන්නේය; මක්නිසාද
ඔහු ඒවා නිතරම තළ තළා නොසිටින්-
නේය. තමාගේ රථ රෝද සහ තමාගේ
අශ්වයන් ඒවා පිට ගෙනගොස් ඒවා
විසුරුවන නුමුත් ඒවා පොඩිකරවන්නේ
නැත. මේකත් සේනාවල **ස්වාමීන්-** 29
**වහන්සේගෙන්** පැමිණෙයි, උන්වහන්සේ
මන්ත්‍රණයෙන් අපූරුව ප්‍රඥාවෙන් උතුම්ව
සිටිනසේක.

## යෙරුසලම වටලෑම කලින් කීම. සෙනඟගේ සිත් දැඩිකම

29

දාවිත් අන්දයම් බැන්ද නුවරවන
අරියෙල්, අරියෙල්, නුඹට දුක්
වේ! අවුරුද්දට අවුරුද්ද එකතුකරපල්ලා;
නියම මංගල්‍ය පැමිණේවා. එකල මම 2
අරියෙල්ට විපත පමුණුවන්නෙමි, එකල්හි
ශෝකය සහ වැලපීම වන්නේය. ඒකද
මට *අරියෙල් මෙන් වන්නේය. මම නුඹට 3
විරුද්ධව හාත්පසින් අන්දයම් බැඳ,
කොටුවක් තනා, නුඹට විරුද්ධව
ගොඩැලි සාදන්නෙමි. නුඹ පහත්කරනු 4
ලැබ බිම සිට කථාකරනවා ඇත, නුඹේ
කථාවද පහත්වී ධූලියෙන් පැමිණෙන්නේය;
නුඹේ හඬ ආත්මබන්ධනකාරයෙකුගේ
හඬ මෙන් බිමෙන් නගින්නේය, නුඹේ
කථාව ධූලියෙන් හෙමින් පැමිණෙන්නේය.
එහෙත් නුඹට සතුරුවූ විදේශි සමූහයා 5

*එනම්—දේව ලිප හෙවත් දේව පූජාසනය.

සිහින් ධූලි මෙන්ද බලාත්කාර සමූහයා
පහව යන බොල් මෙන්ද වන්නේය.
එසේය, ඇසිල්ලකින්ම එය සිදුවන්නේය.
6 සේනාවල **ස්වාමීන්වහන්සේ** වෙතින්
ගර්ජනාවක්ද පොළෝකම්පාවක්ද මහත්
ඝෝෂාවක්ද සුළිහුළඟක්ද කුණාටුවක්ද
විනාශකරන ගිනිදළුවක්ද ඈ පිටට
7 පැමිණෙන්නේය. අරියෙල්ට විරුද්ධව
සටන්කරන සියලු ජාතීන්ගේ සමූහයා
එනම් ඇට සහ ඇගේ බලකොටුවට
විරුද්ධව සටන්කරන්නාවූද ඇට විපත
පමුණුවන්නාවූද සියල්ලෝ හීනයක් එනම්
රාත්‍රියේ දර්ශනයක් මෙන් වන්නෝය.
8 බඩගිනි ඇත්තා කනවාය කියා හීනෙන්
දකින්නාක්මෙන් වේ; ඔහු පිබිදුණාම
ඔහුගේ බඩ හිස්ව තිබේ. නොහොත්
පිපාසා ඇත්තා බොනවාය කියා හීනෙන්
දකින්නාක්මෙන්ය; පිබිදුණාම ඔහු
ක්ලාන්තව පිපාසාව සිටින්නේය. සියොන්
කන්දට විරුද්ධව සටන් කරන සියලු
ජාතීන්ගේ සමූහයාට එසේම වන්නේය.
9 නැවතී සිට විස්මපත්වෙයල්ලා; සැප
විඳ අන්ධවෙයල්ලා. ඔව්හු මත්ව සිටිති,
නුමුත් මුද්‍රිකපානයෙන් නොවේ; ඔව්හු
වැනෙති, නුමුත් සුරාපානයෙන් නොවේ.
10 මක්නිසාද **ස්වාමීන්වහන්සේ** නුඹලා
කෙරෙහි නිදිමත භාවයක් වගුරුවා,
අනාගතවක්තෘවරුන් වන නුඹලාගේ
ඇස් පියෙවූසේක; දර්ශනකාරයන් වන
11 නුඹලාගේ හිස්ද වැසූසේක. දර්ශන
සියල්ලද මුද්‍රකර තිබෙන ලියවිල්ලක
වචන මෙන් නුඹලාට වී තිබේ; අකුරු
දන්න කෙනෙකුට ඒක දී: මේක
කියවාපන්නැයි කීවාම ඔහු—මුද්‍රකර
තිබෙන නිසා මට කියවන්ට බැරියයි
12 කියන්නේය. අකුරු නොදන්න කෙනෙකුට
ලියවිල්ල දී: මේක කියවාපන්නැයි
කීවාම—මම අකුරු නොදනිමියි ඔහු
කියන්නේය.
13 ස්වාමීන්වහන්සේ කථාකොට: මේ
සෙනඟ තමුන්ගේ මුඛයෙන් ළංවී
තමුන්ගේ තොල්වලින් මට ගෞරව කරන
නුමුත්, ඔවුන්ගේ සිත මාගෙන් දුරුකරගත්
බැවින්ද, මා කෙරෙහි තිබෙන ඔවුන්ගේ
භය මනුෂ්‍යයන්ගෙන් ඉගෙනගත් ආඥාවක්ව

තිබෙන බැවින්ද, මම තවත් මේ සෙනඟ 14
අතරේ පුදුම ක්‍රියාවක් එනම් පුදුමවූ
අපූරු ක්‍රියාවක් කරන්ට පටන්ගන්නෙමි.
ඔවුන්ගේ ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාව නැතිවී
යන්නේය, ඔවුන්ගේ නැණවතුන්ගේ
නුවණද සැඟවීයන්නේයයි කීසේක.
**ස්වාමීන්වහන්සේගෙන්** තමුන්ගේ අදහස 15
සඟවන පිණිස කාරණා ගැඹුරුකර,
තමුන්ගේ ක්‍රියාවල් අන්ධකාරයෙහි කර:
අප දකින්නේ කවුද? අප ඇඳින ගන්නේ
කවුදැයි කියන්නාවූ අයට දුක් වේ. නුඹලා 16
කාරණා පෙරළන හැටි! කුම්භ-
කාරයා මැටි වාගේයයි සිතන්ට යුතුද?
කර්මාන්තය ඒක සෑදූ තැනැත්තා ගැන—ඔහු
මා සෑදුවේ නැතැයි කියන්ටවත්, සෑදූ
දෙයක් ඒක සෑදූ තැනැත්තා ගැන—ඔහුට
දැනුමක් නැතැයි කියන්ටවත් යුතුද?
තව ස්වල්ප කලකින් ලෙබනොන් වනය 17
උයනක් වෙන්ටත් උයන වනයක් කොට
ගණන්ගනු ලබන්ටත් තිබෙනවා
නොවේද? ඒ දවසෙහි බිහිරන් පොතේ 18
වචන අසනවා ඇත, කළුවරෙහින්
අන්ධකාරයෙහින් සිටින අන්ධයන්ගේ
ඇස්ද පැහැදෙනවා ඇත. යටහත් අය 19
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි වඩ වඩා
ප්‍රීතිවෙනවා ඇත, මනුෂ්‍යයන් අතරෙන්
දිළින්දෝ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්-
වහන්සේ කෙරෙහි ප්‍රීතිමත්වෙනවා ඇත.
මක්නිසාද බලාත්කාරකම් කරන්නා 20
පහවුණේය, නින්දකරන්නා නැතිවී යයි,
අයුතුකම්කරන්ට බලා සිටින සියල්-
ලෝද සිඳදමනු ලැබුවෝය. ඔව්හු යම් 21
කාරණයකදී මනුෂ්‍යයන් වරදටම
පත්කොට දොරටුවේදී අවවාදකරන්-
නාට මලපතක් තබති, ප්‍රයෝගයෙන්
ධර්මිෂ්ඨයාගේ යුක්තියද පෙරළති.
එබැවින් ආබ්‍රහම් මිදූවාවූ **ස්වාමීන්-** 22
**වහන්සේ** යාකොබ් වංශය ගැන
කථාකොට: යාකොබ් දැන් ලජ්ජා
නොවන්නේය, ඔහුගේ මුහුණද දැන්
සුදුමැලි නොවන්නේය. එහෙත් මාගේ 23
අත්වල වැඩ වන තමාගේ දරුවන් තමා
සමග සිටිනවා ඔහු දුටුවාම ඔව්හු මාගේ
නාමයට ගෞරවකරන්නෝය; එසේය,

ඔව්හු යාකොබ්ගේ ශුද්ධ තැනන්වහන්සේට
ගෞරවකොට, ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව
24 සිටින්නෝය. ආත්මයෙන් මුළාවූ අය
නුවණ දැනගන්නෝය, කැරළිකාර අය
ධර්මය ඉගෙනගන්නෝයයි කීසේක.

## මිසරය සමග ගිවිසගැනීමට තහනම. ඉශ්‍රායෙල්ගේ බලාපොරොත්තුව ස්වාමීන්වහන්සේ කෙරෙහිය

30 පාපයට පාපය එකතුකරන ලෙස
මාගෙන් නොව අන්‍යයන්ගෙන්
මන්ත්‍රණය සොයන්නාවූද, මාගේ
ආත්මය නැතුව ගිවිසුමක් කරගන්-
2 නාවූද, ඵාරාවෝගේ ශක්තියෙන්
ශක්තිමත් වෙන්ටත් මිසරයේ සෙවණ
කෙරෙහි විශ්වාසකරන්ටත් මාගේ
මුඛයෙන් නොවිචාරා මිසරයට යාමට
පිටත්වෙන්නාවූද, කැරළිකාර දරුවන්ට
දුක් වේයයි **ස්වාමීන්වහන්සේ** කියන-
3 සේක. එබැවින් ඵාරාවෝගේ ශක්තිය
නුඹලාට ලජ්ජාවක්ද මිසරයේ සෙවණ
කෙරෙහි විශ්වාසකිරීම නුඹලාට
4 වියවුලක්ද වන්නේය. මක්නිසාද *ඔහුගේ
අධිපතීහු ශොවන්හි සිටිති, *ඔහුගේ
තානාපතීහුද හානේස්ට ඇවිත් සිටිති.
5 ඔවුන් සියල්ලෝම තමුන්ට ප්‍රයෝජන
නොවන්නාවූ, ලජ්ජාවක් සහ නින්දවක්
පමුණුවනවා මිස පිහිටක් හෝ උප-
කාරයක් නොවන්නාවූ සෙනඟක් ගැන
ලජ්ජාවන්නෝය.
6 දකුණු දිසාවේ මෘගයන් ගැන දිව්‍ය
ප්‍රකාශනයය.
සිංහධේනුවද සිංහයාද පොළඟාද
ඉගිලෙන ගිනි සර්පයාද සිටින්නාවූ,
විපතද තද දුෂ්කරයද ඇත්තාවූ දේශය
මැදින් ඔව්හු තමුන්ගේ සම්පත් තරුණ
කොටළුවන්ගේ කර පිටද තමුන්ගේ
වස්තු ඔටුවන්ගේ මොල්ලී පිටද තබා
තමුන්ට ප්‍රයෝජන නොවන සෙනඟක්
7 ළඟට ගෙනයති. මිසරයේ උදව්ව
නිෂ්ඵලය, නිරර්ථකය. එබැවින් නිකම්
ඉන්න රාහබ්යයි ඇට නම් තැබුවෙමි.
8 ඉතින් මතු සදකාලේටම තිබෙන පිණිස
නුඹ ගොස් ඔවුන් ඉදිරියෙහි ඒක ලෑල්ලක
ලියා පොතක සටහන්කර තබාපන්න.
මක්නිසාද ඔව්හු කැරළිකාර සෙනඟක්ය, 9
බොරුකාර දරුවෝය, **ස්වාමීන්-
වහන්සේගේ** ව්‍යවස්ථාව අසන්ට කැමති
නැති දරුවෝය. ඔව්හු දිවස් ඇත්තන්ට: 10
නුඹලා දර්ශන නොදකිල්ලාය කියාද,
ප්‍රොපේතවරුන්ට: නුඹලා හරිවූ දිවස්
වාක්‍ය අපට නොපවසා, මෘදු වචන
කථාකොට, රැවටිලි වාක්‍ය අපට පවසා-
පල්ලාය කියාද: නුඹලා මාර්ගයෙන් 11
පහවී මාවතින් අහක්ව පලයල්ලා,
ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේ
අප ඉදිරියෙන් පහකරපල්ලාය කියාද
කියති. එබැවින් ඉශ්‍රායෙල්ගේ ශුද්ධ 12
තැනන්වහන්සේ මෙසේ කියනසේක:
නුඹලා මේ වචනය සුළුකර, බලාත්-
කාරකම සහ වංකකම කෙරෙහි
විශ්වාසකොට, ඒ කෙරෙහි පිහිටා සිටින 13
බැවින්, මේ අපරාධය උස්වූ භිත්තියක
පිපිරී වැටෙන්ට තිබෙන කැඩුමක් මෙන්
නුඹලාට වන්නේය. ඒකේ කැඩීම
ඇසිල්ලකින්ම පැමිණෙන්නේය. ලිපෙන් 14
ගින්දර ගන්ටවත් පොකුණෙන් වතුර
ගන්ටවත් කබලක් සම්බ නොවන
ලෙස, ඉතුරු නොකර පොඩිකරන
කුම්භකාරයෙකුගේ භාජනයක් බිඳින්-
නාක්මෙන් උන්වහන්සේ ඒක බිඳින-
සේක. මක්නිසාද ඉශ්‍රායෙල්ගේ ශුද්ධ 15
තැනන්වහන්සේ වන ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** කියනසේක්: හැරී නිශ්චලව
සිටීම කරණකොටගෙන නුඹලා
ගැළවෙන්නහුය; නොකැලඹී විශ්වාස-
කිරීමෙන් නුඹලාට බලය ලැබෙන්-
නේයයි කීසේක. නුමුත් නුඹලා අකමැතිවී
කථාකොට: එසේ නොව අපි අසුන් 16
පිට නැගී පලායන්නෙමුයයි කීවහුය;
එබැවින් නුඹලා පලායනවාම ඇත. අපි
ශීඝ්‍ර සතුන් පිට නැගී යන්නෙමුයයි
නුඹලා කීවහුය; එබැවින් නුඹලා ලුහුබැඳ
එන්නෝ ශීඝ්‍රවන්නෝය. නුඹලා කන්ද 17
මුදුනේ රිටක් මෙන්ද හෙලක් පිට කොඩි
ගහක් මෙන්ද ඉතිරිවෙන තුරු, එකදහක්
එක්කෙනෙකුගේ තර්ජනයටද නුඹලා
පස්දෙනෙකුගේ තර්ජනයටද පලායනවා

*මේ හෙසකියා රජු විය හැකියි.

18 ඇත. එබැවින් ස්වාමීන්වහන්සේ නුඹලාට
කරුණාකරන්ට බලා සිටිනසේක.
නුඹලාට අනුකම්පාකරන්ට නැගිටින-
සේක. මක්නිසාද ස්වාමීන්වහන්සේ
විනිශ්චයේ දෙවි කෙනෙක්ය; උන්-
වහන්සේ ගැන බලාසිටින සියල්ලෝම
වාසනාවන්තයෝය.
19 මක්නිසාද සෙනඟ සියොන්හි
යෙරුසලමේ වාසයකරන්නෝය. නුඹ
තවත් අඬන්නේ නැත; උන්වහන්සේ
නුඹේ මොරගැසීමේ හඬට නුඹට දයා-
වෙනවාම ඇත; ඇසුණු කෙණෙහිම
උන්වහන්සේ නුඹට උත්තරදෙනවා
20 ඇත. ස්වාමීන්වහන්සේ විපත නමැති
කෑමද පීඩාව නමැති වතුරද නුඹලාට
දෙන නුමුත්, නුඹේ ගුරුවරයා තවත්
සැඟවී නොසිටින්නේය, නුඹේ ඇස්වලින්
21 නුඹේ ගුරුවරයා දකින්ටත්, නුඹලා
දකුණට හැරෙන විටද නුඹලා වමට
හැරෙන විටද: මාර්ගය මේය, මෙහි
හැසිරියල්ලායයි නුඹට පස්සෙන් කියන
හඬක් නුඹේ කන්වලට ඇසෙන්ටත්
22 යෙදෙනවා ඇත. නුඹේ කැපූ රූපවල
රිදී වැස්මත් නුඹේ වාත්තු රූපවල රන්
වැස්මත් නුඹලා අපවිත්‍රකරන්නහුය.
නුඹ ඒවා කිලුටුකමක් කොට විසුරුවා
දමා: අහක්වෙවයි ඊට කියන්නෙහිය.
23 උන්වහන්සේද නුඹ පොළොවෙහි
වපුරන නුඹේ බීජවලට වර්ෂාවද බිමේ
අස්වැන්නෙන් කෑමද දෙනසේක, එය
සාරවත්ව වර්ධනයවන්නේය. ඒ දවසෙහි
නුඹේ සිව්පාවෝ විශාල ගොදුරු
24 බිම්වල තෘණ කන්නෝය. එසේම බිම
හාන ගවයෝද තරුණ කොටළුවෝද
ස්කෝප්පයෙන් හා කුල්ලෙන් පෙළූ
ලුණු මිශ්‍රවූ ගොදුරු කන්නෝය.
25 බලකොටු වැටෙන මහත් මරාදැමීමේ
දවසේ සියලු උස් කඳු පිටත් සියලු උස්
හෙල් පිටත් ඔයවල් සහ වතුර දෙළවල්
26 වන්නේය. තවද ස්වාමීන්වහන්සේ තමන්
සෙනඟගේ තුවාලය බැඳ ඔවුන්ට ලැබුණු
පහරේ තුවාලය සුවකරන දවසේදී හඳේ
එළිය ඉරේ එළිය මෙන්ද ඉරේ එළිය
සත් ගුණයක් වැඩිවී සත් දවසක එළිය
මෙන්ද වන්නේය.

ස්වාමීන්වහන්සේගේ නාමය උන්- 27
වහන්සේගේ ඇවිළෙන කෝපයද නගින්-
නාවූ ඝන දුම් කඳක්ද ඇතුව දුර සිට
එන්නේය. උන්වහන්සේගේ තොල්
උදහසින් පිරී තිබේ, උන්වහන්සේගේ දිවද
දවා දමන ගින්නක් මෙන්ය. උන්- 28
වහන්සේගේ හුස්මද උතුරා කුළල දක්වා
ගලන ඔයක් මෙන් විනාශය නමැති
කුල්ලෙන් ජාතීන් පොළන පිණිසත්,
මුළාකරවන කටකලියාවක් ජනයන්ගේ
හකුවල දමන පිණිසත් පැමිණෙන්නේය.
ශුද්ධ මංගල්‍යයක් පවත්වන රාත්‍රියේදී 29
මෙන් ගීතිකාවක්ද ස්වාමීන්වහන්සේගේ
කන්දටත් ඉශ්‍රායෙල්ගේ පර්වතයාණන්
වෙතටත් පැමිණෙන්ට නළාවක් පිඹිමින්
යන අයගේ ප්‍රීතිය මෙන් සිතේ ප්‍රීතියද
නුඹලාට වන්නේය. ස්වාමීන්වහන්සේද 30
තමන්ගේ මහිමාන්විත හඬ අස්වනසේක,
උන්වහන්සේ තමන් කෝපයේ උදහසත්
දවා දමන ගිනිදළුවත් වාතවේගයත්
කුණාටුවත් ගල් වර්ෂාවත් ඇතිව තමන්
හස්තයේ පහළවීම පෙන්වනසේක.
මක්නිසාද ස්වාමීන්වහන්සේගේ හඬින් 31
අශූරියයා පොඩිකරනු ලබන්නේය,
උන්වහන්සේ තමන් යෂ්ටියෙන් ඔහුට
පහරදෙනසේක. ස්වාමීන්වහන්සේ විසින් 32
ඔහු පිටට පමුණුවන්නාවූ නියම කළ
සැරයටියේ සියලු පහරවල් සමග රබන්
ගැසීමත් වීණා ගැමත් වන්නේය. කලඹන
සුළු යුද්ධවලින්ද උන්වහන්සේ ඔහු සමග
යුද්ධකරනවා ඇත. මක්නිසාද පුරාණයේ 33
සිට තෝපෙත් ගින්න පිළියෙළකර
තිබේ; එසේය, රජුට ඒක සූදනම්කොට
ගැඹුරුකර පළල්කර තිබේ. ඒ ගොඩ
වනාහි ගිනි සහ දර සෑයක්ය; ගෙන්දගම්
ඔයක් වැනි ස්වාමීන්වහන්සේගේ හුස්මට
එය ඇවිළීයයි.

31
ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්-
වහන්සේ දෙස බලන්නේවත්
ස්වාමීන්වහන්සේ සොයන්නේවත් නැතුව
උපකාර පිණිස මිසරයට යන්නාවූ,
අශ්වයන් කෙරෙහි විශ්වාසය තබන්නාවූ,
රථ බොහෝ නිසා ඒවා කෙරෙහිද
අසරුවන් ඉතා බලවත් නිසා ඔවුන්
කෙරෙහිද විශ්වාසකරන්නාවූ අය-
වලුන්ට දුක්වේ! නුමුත් උන්වහන්සෙත් 2

ප්‍රඥාවන්තසේක; උන්වහන්සේ තමන්ගේ
වචන අවලංගු නොකර, විපත පමුණුවා
නපුර කරන්නන්ගේ වංශයටත් අයුතුකම්
කරන්නන්ගේ උපකාරයටත් විරුද්ධව
3 නැගිටිනසේක. මිසරවරු දෙවියන්-
වහන්සේ නොව මනුෂ්‍යයෝ පමණක්ය;
ඔවුන්ගේ අශ්වයෝද ආත්මය නොව
මාංසයය. **ස්වාමීන්වහන්සේ** තමන්
අත දිගුකරනවිට උපකාරකරන්නා
පැකිලෙන්නේය, උපකාර ලබන්නාද
වැටෙන්නේය, ඔව්හු සියල්ලෝම එක්ව
4 නාස්තිවන්නෝය. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේ** මට මෙසේ කියනසේක:
සිංහයා වුවත් තරුණ සිංහයා වුවත්
ඌට විරුද්ධව එඬේරුන් රාශියක්
අඬගසනු ලැබූ කල උගේ ගොදුර
කෙරෙහි ගොරවා, ඔවුන්ගේ හඬට
නොකැලඹී, ඔවුන්ගේ ඝෝෂාවට යටත්
නොවී සිටින්නාක්මෙන්ම, සේනාවල
**ස්වාමීන්වහන්සේ** සියොන් කන්දද එහි
හෙලද පිට සටන්කරන්ට බසිනසේක.
5 පැටවුන් මත්තෙහි කරන කුරුල්ලන්ගේ
පියාසරය මෙන් සේනාවල **ස්වාමීන්-
වහන්සේ** යෙරුසලම ආවරණ කරන-
සේක; ඒක ආරක්ෂාකොට ගළවනසේක,
එය මතුපිට හැසිරෙමින් ප්‍රවේසම්කරන-
6 සේක. එම්බා ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, තුඹලා
විසින් බොහෝසෙයින් අත්හරිනු ලැබූ
තැනන්වහන්සේ වෙතට හැරියල්ලා.
7 මක්නිසාද පාපයක් වන ලෙස තුඹලාගේ
අත්වලින් තුඹලා සාදගත්තාවූ තුඹලාගේ
රිදී රූපද රන් රූපද ඒ දවසෙහි ඔවුන්
8 එකිනෙකා අහක දමනවා ඇත. එකල
අෂූරියයා මනුෂ්‍යයාගේ නොවන
කඩුවකින් වැටෙන්නේය; මනුෂ්‍යයන්ගේ
නොවන කඩුවකින් ඔහු විනාශවන්නේය.
ඔහු කඩුව ඉදිරියෙන් පලායන්නේය,
ඔහුගේ තරුණයෝ රාජකාරියට
9 යටත්වන්නෝය. ඔහුගේ පර්වතය භීතිය
නිසා පහවී, ඔහුගේ අධිපතීහු කොඩියට
කැලඹෙන්නෝයයි සියොන්හි ගින්නක්ද
යෙරුසලමෙහි උදුනක්ද ඇත්තාවූ
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## ධර්මිෂ්ඨ ආණ්ඩුව ගැන අනාගතකීමක්

32

බලව, ධර්මිෂ්ඨකමින් රජෙක්
රජකම්කරන්නේය, අධිපතීහුද
දැහැමින් අධිපතිකම් කරන්නෝය.
මනුෂ්‍යයෙක් වනාහි සුළඟෙන් මුවාවෙන 2
ඉඩමක් සහ කුණාටුවෙන් ආවරණයක්
මෙන්ද වියළි ප්‍රදේශයක ජල ගංගා
මෙන්ද විඩාවූ දේශයක මහ පර්වතයක
සෙවණ මෙන්ද වන්නේය. දකින්නන්ගේ 3
ඇස් අඳුරු නොවන්නේය, අසන්නන්ගේ
කන් ඇහුම්කන්දෙන්නේය. ඉක්මන්- 4
කාරයන්ගේ සිත දැනගැන්ම තේරුම්-
ගන්නේය, වික්කලුන්ගේ දිව පහසුවෙන්
පැහැදිලිලෙස කථාකරන්නේය. අධමයා 5
උත්තමයෙක්ය කියාවත් ප්‍රයෝගකාරයා
ගුණවන්තයෙක්ය කියාවත් තවත් කියනු
නොලබන්නේය. මක්නිසාද අධමයා 6
අභක්තික ලෙස හැසිරෙමින්ද **ස්වාමීන්-
වහන්සේට** විරුද්ධව අපහාස කථාකරමින්ද
බඩගිනි අයගේ ප්‍රාණය හිස්කරමින්ද
පිපාසා ඇත්තාගේ පානය අහක්-
කරමින්ද දුෂ්ටලෙස කථාකරන්නේය,
ඔහුගේ සිතද අයුතුකම් කරන්නේය.
ප්‍රයෝගකාරයාගේ උපකරණ නපුරුය. 7
දිළින්දා යුක්තිය කථාකරන විට පවා
ඔහු බොරු වචනවලින් යටහතුන්
විනාශකරන්ට දුෂ්ට උපා යොදන්නේය.
එහෙත් ත්‍යාගවත් තැනැත්තා ත්‍යාගවත් 8
දේ යෝජනාකරයි; ඔහු වනාහි ත්‍යාගවත්
දේවලම යෙදී සිටියි.

## නොසැලකිලි ස්ත්‍රීන්ට තරවටු කිරීම.

## හොඳ කාලයක් පසුව පැමිණෙන බව

එම්බා නොසැලකිලි ස්ත්‍රීවරුනි, 9
නැගිටිල්ලා, මාගේ හඬ අසාපල්ලා;
අප්‍රවේසම් දූවරුනි, මාගේ බසට
ඇහුම්කන්දියල්ලා. අප්‍රවේසම් තැනැත්- 10
තියෙනි, අවුරුද්දකට වැඩි කාලයකින්
තුඹලා කැලඹෙන්නහුය. මක්නිසාද
මුදිකඵල ඉවරවන්නේය; ඵල
නෙළාගැනීමක් නොපැමිණෙන්නේය.

11 නොසැලකිලි ස්ත්‍රීවරුනි, වෙවුලාපල්ලා;
අප්‍රවේසම් තැනැත්තියෙනි, චංචලවෙයල්ලා;
වස්ත්‍ර ගළවා දමා, නිර්වස්ත්‍රව්, ඉහටිවල
12 ගෝණි රෙදි බැඳගනිල්ලා. ඔව්හු ප්‍රසන්න
කෙත් ගැනත් සාරවත් මිදිවැල් ගැනත්
13 ළයට ගසාගන්නෝය. මාගේ සෙනඟගේ
බිම්වල කටුද ගොකටුද හටගන්නේය;
ප්‍රීතිමත් නගරයේ සියලුම ප්‍රිය ගෙවල්වල
14 පවා එසේ වන්නේය. මක්නිසාද
මාළිගාව පාළුවී ජනගහනවූ නුවර
අත්හරිනු ලබන්නේය; හෙළත් මුර-
කොටුවත් හැමකාලයටම ගුහාවල්ද වල්
කොටළුවන්ට ප්‍රීතියක්ද රැළවලට තෘණ
15 බිම්ද වන්නේය. එසේ වන්නේ උසස්-
ථානයෙන් ආත්මය අප කෙරෙහි
වගුරුවන්ටත් කාන්තාරය උයනක්
වෙන්ටත් උයන වනයක් කොට ගණන්ගනු
16 ලබන්ටත් යෙදෙන තුරුය. එකල යුක්තිය
කාන්තාරයෙහි වාසයකරන්නේය,
ධර්මිෂ්ඨකම උයනෙහි පවතින්නේය.
17 ධර්මිෂ්ඨකමේ ක්‍රියාව සමාදානයද
ධර්මිෂ්ඨකමේ ඵල සදාකාලයටම
නිශ්චලය හා සුරක්ෂිත භාවයද
18 වන්නේය. මාගේ සෙනඟ සමාදාන
නිවාසයකද සුරක්ෂිත වාසස්ථානවලද
නිවාඩු ස්ථානවලද වසන්නෝය.
19 නුමුත් වනය වැටීයාමේදී ගල්වර්ෂාවක්
වහිනවා ඇත; නුවරද සහමුලින්ම
20 පහත්කමට පැමිණෙනවා ඇත. සෑම
දියපාරවල් ළඟ වපුරන්නාවූ, ගොනා-
ගෙත් කොටළුවාගෙත් පාද මුදන්නාවූ
නුඹලා වාසනාවන්තයෝය.

## ස්වාමීන්වහන්සේ සියොන මුදා ගැනීම. ධර්මිෂ්ඨයන් අතර සමාදානය

33 කිසිවෙකු විසින් කොල්ලකනු
නොලැබ කොල්ලකන්නාවූ,
ද්‍රෝහිකම් කරනු නොලැබ ද්‍රෝහිකම්
කරන්නාවූ නුඹට දුක්වේ! නුඹ
කොල්ලකා නිමවූ විට නුඹෙන් කොල්ල-
කනවා ඇත; නුඹ ද්‍රෝහිකම් කොට
නිමවූ විට නුඹට ද්‍රෝහිකම්කරනවා ඇත.
ස්වාමීන්වහන්ස, අපට දයාවූව මැනව; 2
අපි ඔබ ගැන බලාසිටියෙමුව. උදයක්
පාසා ඔවුන්ගේ බල-හස්තයද විපත්ති
කාලයේදී අපේ ගැළවීමද වුව මැනව.
කෝලාහල හඬට ජනයෝ පලාගියෝය; 3
ඔබගේ උසස්වීමට ජාතීහු විසිර
ගියෝය. දළඹුවා එකතුකරන්නාක්මෙන් 4
නුඹලාගෙන් කොල්ලය එකතුකරනු
ලබන්නේය. පළහැටියන් පනින්නාක්මෙන්
ඔව්හු ඒ පිටට පනින්නෝය. ස්වාමීන්- 5
වහන්සේ උසස්වී සිටිනසේක; මක්නිසාද
උන්වහන්සේ උසස්ථානයෙහි වාසය-
කරනසේක. යුක්තියෙන්ද ධර්මිෂ්ඨ-
කමින්ද උන්වහන්සේ සියොන් පිරෙවූ-
සේක. නුඹේ කාලවලදී ආරක්ෂාවත් 6
අධික ගැළවීමත් ප්‍රඥවත් දැනගැන්මත්
වන්නේය. ස්වාමීන්වහන්සේ කෙරෙහි
භයවීම ඔහුගේ සම්පතය.
බලව, ඔවුන්ගේ වික්‍රමාන්විතයෝ 7
පිටතදී මොරගසති. සමාදානයේ
තානාපතියෝ දුක්බිත ලෙස අඬති.
මහමාවත් පාළුවී තිබේ, මගයන 8
කෙනෙක් නැත. *ඔහු ගිවිසුම කඩ-
කෙළේය, නුවරවල් සුළුකෙළේය, ඔහු
කිසි මනුෂ්‍යයෙකු නොසලකයි. දේශය 9
ශෝකවී මැලවේ. ලෙබනොන් ලජ්ජාවී
වියලෙයි. ෂාරොන් කාන්තාරයක්
මෙන්ය; බාෂාන් සහ කර්මෙල් කොළ
හෙළාදමයි. දැන් නැගිටින්නෙමි; දැන් 10
උසස්වෙන්නෙමි; දැන් උසස්කමට
පැමිණෙන්නෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේක. නුඹලා බොල් පිළිසිඳගෙන 11
ඉපනැලි වදනවා ඇත. නුඹලාගේ
හුස්මද ගින්නක් මෙන් නුඹලා
නාස්තිකරනවා ඇත. ජනයෝ හුණු 12
පිළිස්සීම් මෙන්ද කපා ගින්නෙන්
දවාදමනු ලබන කටුගස් මෙන්ද
වන්නෝය.
දුර සිටින්නෙනි, මා කළ දේ අසාපල්ලා; 13
ළඟ සිටින්නෙනි, මාගේ බලපරාක්‍රමය
දැනගනිල්ලා. සියොන්හි පව්කාරයෝ 14

*එනම්–සතුරා.

හයවෙති; අභක්තීන්ට වෙවුලුම හදිසියෙන්
අල්ලා තිබේ. නාස්තිකරන ගින්නෙහි
සිටින්ට අපෙන් කාට පුළුවන්ද? සදාකාල
දවීම්වල සිටින්ට අපෙන් කාට පුළුවන්ද?
15 ධර්මිෂ්ඨකමින් හැසිරෙන්නාවූ, අවංකකමින්
කථාකරන්නාවූ, බලාත්කාරකමේ
ප්‍රයෝජනය එපාකරන්නාවූ, අල්ලසක්
නාල්ලා අත් අහකට ගන්නාවූ, මිනීමැරීම
ගැන නෑසෙන ලෙස කන් වසාගන්නාවූ,
නපුර නොදකින්ට ඇස් පියාගන්නාවූ
16 තැනැත්තාම උසස්ථානවල වාසය
කරන්නේය. ඔහුගේ රක්ෂාස්ථානය
පර්වත බලකොටුය; ඔහුට කෑම දෙනු
ලබන්නේය; ඔහුට වතුර ලැබීම වරදින්නේ
17 නැත. ස්වකීය ශෝභනකමෙන් යුක්තවූ
රජ්ජුරුවන් නුඹේ ඇසින් දකින්නෙහිය.
විශාලවූ දේශයක් ඔව්හු දකින්නෝය.
18 නුඹේ සිත භීතිය ගැන මෙනෙහිකරන්නේය.
ලේකම කොහේද? ආදායම කිරා බලන්නා
කොහේද? කොටු ගණන්කරන්නා
19 කොහේද? නුඹට නොදැනෙන ගැඹුරු
භාෂාවක්ද නොතේරෙන වික්කල දිවක්ද
ඇති සෙනඟක් වන ඒ රෞද්‍ර සෙනඟ
20 නුඹ තවත් නොදක්නෙහිය. අපේ මංගල්‍ය
නගරය වන සියොන් බලාපන්න.
යෙරුසලම නිශ්චල වාසස්ථානයක්ව
අහක් නොවෙන කූඩාරමක්ව තිබෙනවා
නුඹේ ඇස්වලින් දකිනවා ඇත. ඒකේ
ඇණ කවදාවත් උගුලනු නොලබන්නේය;
ඒකේ කිසි ලනුවක් කඩනු නොලබන්නේය.
21 එසේය, එහි **ස්වාමීන්වහන්සේ** මහිමයෙන්
යුක්තව අප සමග වනසේක, එය පළල්
ගංගා සහ ඔයවල් ඇති ස්ථානයක්ය;
හබල්වලින් පදින නැවක් එහි නොයන්නේය,
මහ නෞකාවක්ද ඒ ළඟින් යාත්‍රා
22 නොකරන්නේය. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේම** අපේ විනිශ්චයකාරයාණෝය,
**ස්වාමීන්වහන්සේ** අපේ නීතිදායකයාණෝය,
**ස්වාමීන්වහන්සේ** අපේ රජ්ජුරුවෝය;
23 උන්වහන්සේම අප ගළවනසේක. නුඹේ
යොත් බුරුල්වී තිබේ; ඒවායින් කුඹගහ
කෙළින් හිටවන්ටවත් රුවල විදහන්ටවත්
නුපුළුවන් විය. එවිට මහත් කොල්ලයක්
බෙදාගන්නාලද්දේය; කොරුත් කොල්ලය
ගත්තෝය. තමා ලෙඩින්යයි කිසි 24
වැසියෙක් නොකියන්නේය. එහි වාසය-
කරන සෙනඟගේ අයුතුකම කමාකරනු
ලබන්නේය.

## ඒදෙම් ප්‍රධානව ජාතීන් කෙරෙහි විනිශ්චය

34 ජාතීනි, අසන්ට ළංවෙයල්ලා;
ජනයෙනි, ඇහුම්කන්දීපල්ලා.
පොළොව සහ ඒකේ පූර්ණකමත්
ලෝකය සහ එහි හටගන්න සියල්ලත්
අසත්වා. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 2
සෑම ජාතීන් කෙරෙහි උදහසද ඔවුන්ගේ
සියලු සේනාවල් කෙරෙහි කෝපයද
ඇතුව සිටිනසේක. උන්වහන්සේ ඔවුන්
විනාශයට කැපකොට මැරුම්කෑමට
භාරදී තිබේ. ඔවුන් අතරෙන් මැරුම්කෑ 3
අය අහක දමනු ලබන්නෝය, ඔවුන්ගේ
මළකඳන් ගඳගසන්නේය, කඳු ඔවුන්ගේ
ලෙයින් දියවන්නේය. මුළු අහස් සේනාව 4
ක්ෂයවී, අහස අකුළන පොතක් මෙන්
ඇකිළී, එහි මුළු සේනාව මිදිවැලෙන්
වැටෙන කොළ මෙන්ද අත්තික්කා ගහෙන්
වියළී වැටෙන කොළයක් මෙන්ද
වැටෙන්නේය. මක්නිසාද මාගේ කඩුව 5
උදහසින් ස්වර්ගයෙහි නෑවී තිබේ. බලව,
ඒක විනිශ්චය පිණිස ඒදෙම පිටටත්
මා විසින් ශාපයට කැපකළාවූ සෙනඟ
පිටටත් බසින්නේය. **ස්වාමීන්වහන්සේගේ** 6
කඩුව ලෙයින් පිරී තිබේ, ඒක තෙලින්ද
බැටළු පැටවුන්ගෙන් එළුවන්ගෙන්
ලෙයින්ද බැටළුවන්ගේ වකුගඩු තෙලින්ද
තරවී තිබේ. මක්නිසාද **ස්වාමීන්වහන්සේට**
බොශ්රාහි පූජාවක්ද ඒදෙම් දේශයෙහි
මහත් මරාදැමීමක්ද තිබේ. වල් මීවෝ 7
උන් සමගද ගොන් නාම්බෝ ගොන්
සමගද බැසඑන්නෝය; ඔවුන්ගේ දේශයද
ලෙයින් පෙඟී යන්නේය, ඔවුන්ගේ ධූලි
තෙලෙන් තරවන්නේය. මක්නිසාද මේක 8
**ස්වාමීන්වහන්සේගේ** පළිගන්න දවසය,
සියොන්හි පැමිණිල්ල ගැන විපාක දෙන

9 අවුරුද්දය. *එහි ඔයවල් කීල්ද එහි ධූලි
ගෙන්දගම්ද වන්නේය, ඒ දේශයද
10 ඇවිළෙන කීල් වන්නේය. ඒක රෑ දවල්
නොනිවී තිබෙයි; ඒකේ දුම සැමකල්ම
නගින්නේය. පරම්පරාවෙන් පරම්පරාවට
එය පාළුව තිබෙයි; සදාකාලයටම
කිසිවෙක් ඒ මැදින් නොයන්නේය.
11 ඔටුමානාටත් ඉත්තෑවාටත් එය උරුම-
වන්නේය; බකමූණාද කපුටාද එහි
වාසයකරති; ඒක පිට පාළුකම නමැති
ලනුවද හිස්කම නමැති ලඹකැටයද
12 අල්ලනු ලැබේ. ඔව්හු ඒකේ උත්තමයන්
රාජ්‍යයට කැඳවන්නෝය, නුමුත් එහි
කිසිවෙක් නොවන්නේය, ඒකේ සියලුම
13 අධිපතියෝද නැතිවන්නෝය. ඒකේ
මාළිගාවල කටුද ඒකේ බලකොටුවල
කසඹිලියා සහ ගොකටුද හැදෙන්නේය.
ඒක සිවලුන්ට වාසයක්ද පැස්බරුන්ට
14 මළුවක්ද වන්නේය. වනයේ වල්
මෘගයෝද වෘකයෝද සම්මුඛවන්නෝය,
වල් එළුවා උගේ සමාගම්කාරයාට
කෑගසන්නේය; එසේය, උලමාත් එහි
ලැග නිශ්චල ඉඩමක් ලබාගන්නේය.
15 එහි පතිත සර්පයා බෙනය සාද, බිජු
දමා, රැක, පැටවුන් ඇගේ සෙවණෙහි
තුරුල්කරගන්නීය. එසේය, කුරුළුගොයිද
එකිනෙකා සමග එහි එකතුවන්නෝය.
16 ස්වාමීන්වහන්සේගේ පොතෙන් සොයා
කියවාපල්ලා. මුන්ගෙන් එකෙක්වත් අඩු
නොවන්නේය, එකෙකුට එකෙක් සම්බ
නොවී නොයන්නේය. මක්නිසාද එය
අණකෙළේ උන්වහන්සේගේ මුඛයය, උන්
රැස්කළෙත් උන්වහන්සේගේ ආත්මයය.
17 උන්වහන්සේම උන් උදෙසා පසඇට
දමා, තමන් අතින් එය ලනුවෙන් උන්ට
බෙදදුන්සේක. උන් එය සදාකාලයට
හිමිකරගන පරම්පරාවෙන් පරම්පරාවට
එහි වාසයකරනවා ඇත.

*එනම්–ඒදේම්හි.

## දෙවියන්වහන්සේගේ සෙනඟට මතු ආශීර්වාද

35
වනාන්තරයද වියළි දේශයද
ප්‍රීතිවන්නේය; කාන්තාරය
ප්‍රීතිමත්වී සෙව්වන්දි මෙන් මල් දරන්-
නේය. සන්තෝෂයද ගී කීමද ඇතුව එය 2
බොහෝසේ මල් දරා ප්‍රීතිමත්වන්නේය;
ලෙබනොන්හි තේජසත් කර්මෙල් සහ
ෂාරොන්හි අලංකාරකමත් ඊට දෙනු
ලබන්නේය. ඔව්හු ස්වාමීන්වහන්සේගේ
තේජසද අපේ දෙවියන්වහන්සේගේ
අලංකාරකමද දකින්නෝය.
බෙලහීන අත් බලවත්කර, වෙවුලන 3
දණහිස් සවිකරපල්ලා. භය සිත් 4
ඇත්තන්ට කථාකොට: භයනොවී
ශක්තිමත් වෙයල්ලා. බලව, තුඹලාගේ
දෙවියන්වහන්සේ පළිගැනීම වන
දෙවියන්වහන්සේගේ විපාකදීම ඇතුව
එනසේක; උන්වහන්සේම ඇවිත් තුඹලා
ගළවනසේකැයි කියාපල්ලා. එකල 5
අන්ධයන්ගේ ඇස් පැහැදෙන්නේය,
බිහිරන්ගේ කන්ද ඇරෙන්නේය. එකල 6
කොරා මුවෙකු මෙන් පැන යන්නේය.
ගොළුවාගේ දිව ගී කියන්නේය.
මක්නිසාද කාන්තාරයෙහි ජලයද
මරුකතරෙහි දොළ පාරවල්ද බිඳඑන්නේය.
මිරිඟු වැල්ල පොකුණක්ද වියළි භූමිය 7
දිය උල්පත්ද වන්නේය. සිවලුන් ලැග්ගාවූ
නිවාසයෙහි බට සහ පන් හටගන්න
ඉඩමක් වන්නේය. එහි මාර්ගයක් වන 8
මහමාවතක් වේ, ඊට ශුද්ධකමේ
මාර්ගයයයි කියනු ලබන්නේය; අපිරිසිදු
කෙනෙක් එහි නොයන්නේය; ඒක
ඔවුන්ටම වන්නේය. ඒ මාර්ගයෙහි යන
කවුරු නුමුත් අඥනව සිටිතත්
මුළාවෙන්නේ නැත. සිංහයෙක් එහි 9
සිටින්නේවත් කිසි චණ්ඩ මෘගයෙක් එහි
නැගීයන්නේවත් උන් එහි සම්බවෙන්-
නේවත් නැත; මුදනු ලැබූ අයවල්ම
එහි ඇවිදින්නෝය. ස්වාමීන්වහන්සේ 10
විසින් නිදහස්කරනලද අය ගී කියමින්
සියොන්ට හැරී එන්නෝය; සදාකාල ප්‍රීතිය
ඔවුන්ගේ ඉස් පිට තිබෙන්නේය. ඔව්හු
ප්‍රීතිය හා සන්තෝෂය ලබන්නෝය, දුකද
සුසුම්ලෑමද පලායන්නේය.

## සෙනකෙරීබ්ගේ වටලෑම සහ තර්ජනයකිරීම්

**36** තවද හෙසකියා රජුගේ දහ
හතරවෙනි අවුරුද්දේදී අෂූර්හි රජවූ
සෙනකෙරීබ් තෙමේ යුදහි පවුරු ඇති
සියලු නුවරවලට විරුද්ධව අවුත් ඒවා
2 අල්ලාගත්තේය. අෂූර්හි රජ රබ්-ෂාකේ
මහත් සේනාවක් සමග ලාකීෂ්හි සිට
හෙසකියා රජු ළඟට යෙරුසලමට
යැවීය. ඔහු අපුල්ලන්නන්ගේ පිට්ටනියේ
මාවත තිබෙන ඉහළ පොකුණේ කානුව
3 ළඟ සිටියේය. එවිට රජ ගෙදර ප්‍රධානියාවූ,
හිල්කියාගේ පුත්‍රවූ එලියාකීම්ද ලේකම්වූ
ෂෙබ්නාද වාර්තාකරුවා වන ආසාප්ගේ
පුත්‍රවූ යෝවාද ඔහු ළඟට ගියෝය.
4 එවිට රබ්-ෂාකේ ඔවුන්ට කථාකොට:
අෂූර්හි රජ වන මහ රජ්ජුරුවෝ මෙසේ
කියන්නාහ–නුඹ විශ්වාසය තබන ඔය
5 දේ මොකක්ද? යුද්ධයට නුවණත් බලයත්
ඇතැයි යන නුඹේ කීම හිස් වචනය.
ඉතින් නුඹ මට විරුද්ධව කැරළිගැසුවේ
6 කා කෙරෙහි විශ්වාස කරගෙනද? බලව,
නුඹ විශ්වාසකරන්නේ ඒ තැළුණු බට
දණ්ඩ වන මිසරය කෙරෙහිය; යමෙක්
ඒකට බරවුණොත් ඒක ඔහුගේ අතේ
ඇනී හිල්වන්නේය. මිසරයේ රජවූ
ඵාරාවෝ කෙරෙහි විශ්වාසකරන
7 සියල්ලන්ට ඔහු එයාකාරය. අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි අපි
විශ්වාසකරමුයයි නුඹ සමහර විට මට
කියනවා ඇත. නුමුත්: නුඹලා මේ
පූජාසනය ඉදිරියෙහි නමස්කාරකළ යුතු-
යයි හෙසකියා යූදවරුන්ටත් යෙරුසලමේ
වැසියන්ටත් කියා පහකරදැමුවේ උන්-
වහන්සේගේ උස් තැන් හා පූජාසන
8 නොවේද? ඉතින් අශ්වයන් පිට නැගී-
යන්ට අසරුවන් සොයාගන්ට නුඹට
පුළුවන් නම්, නුඹ අෂූර්හි රජවූ මාගේ
ස්වාමියාට ඇප දුන්නොත්, මම නුඹට
9 අශ්වයන් දෙදහසක් දෙන්නෙමි. එසේ
නුඹට බැරි නම්, රථද අසරුවන්ද ගැන
මිසරය කෙරෙහි විශ්වාසකරගෙන නුඹ
මාගේ ස්වාමිහුගේ සුළු සේවකයන්ගෙන්
එක මුලාදෑනියෙකු වුවත් එළවා දමන්නේ
කොහොමද? මා දන් මේ දේශය 10
විනාශකරන්ට ඊට විරුද්ධව ආවේ
**ස්වාමීන්වහන්සේ** නැතුවද? ඒ දේශයට
විරුද්ධව ගොස් ඒක විනාශකරපන්නැයි
**ස්වාමීන්වහන්සේ** මට කීසේක කියා
හෙසකියාට කියාපල්ලායයි කීවේය.
එකල එලියාකීම්ද ෂෙබ්නාද යෝවාද 11
රබ්-ෂාකේට කථාකොට: පවුර පිට
සිටින සෙනඟට ඇසෙන්ට යුදෙව්
භාෂාවෙන් අපට කථා නොකොට, නුඹේ
මෙහෙකරුවන්වූ අපට සිරියේ භාෂාව
තේරෙන නිසා ඒ භාෂාවෙන් අපට
කථාකළ මැනවියි කීවෝය. නුමුත් රබ්- 12
ෂාකේ කථාකොට: මාගේ ස්වාමියා
මේ වචන කියන්ට මා එවුවේ නුඹේ
ස්වාමියාත් නුඹත් ළඟටද? නොහොත්
පවුර පිට ඉඳගන ඉන්න මනුෂ්‍යයන්
විසින් නුඹලා සමග තමුන්ගේ අශූචි
කන පිණිසත් තමුන්ගේ මුත්‍ර බොන
පිණිසත් ඔවුන් ළඟට මා එව්වා
නොවේදැයි කීවේය. එකල රබ්-ෂාකේ 13
නැගිට සිට යුදෙව් භාෂාවෙන් මහත්
ශබ්දයකින් මොරගසා: අෂූර්හි රජවූ
මහ රජ්ජුරුවන්ගේ වචන අසාපල්ලා.
නුඹලා රවටන්ට හෙසකියාට ඉඩ 14
නොදෙල්ලා; මක්නිසාද නුඹලා
ගළවාගන්ට ඔහුට බැරිය. **ස්වාමීන්-** 15
**වහන්සේ** සැබවින් අප ගළවාගන්නා-
සේක කියාද මේ නුවර අෂූර්හි රජු
අතට අසුවෙන්නේ නැත කියාද
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි නුඹලා
විශ්වාසකරවන්ට හෙසකියාට ඉඩ-
නාරිල්ලා. හෙසකියාට ඇහුම්කන් 16
නොදෙල්ලා. මක්නිසාද අෂූර්හි රජ
මෙසේ කියන්නේය–මා සමග
සමාදානයකට පැමිණ මා වෙතට
වරෙල්ලා. එවිට මම ඇවිත් නුඹලාගේ 17
දේශයට සමානවූ දේශයකට, ධාන්‍ය
හා මුද්‍රිකපානයද කෑම හා මිදිවතුද
ඇති දේශයකට නුඹලා ගෙනයන තුරු,
නුඹලා කාටත් තම තමාගේ මුද්‍රික
වැලෙන්ද තම තමාගේ අත්තික්කා
ගසෙන්ද කන්ටත් තම තමාගේ ළිඳේ
වතුර බොන්ටත් පුළුවන. **ස්වාමීන්-** 18
**වහන්සේ** අප ගළවාගන්නසේකැයි කියා

හෙසකියා තුඹලා නොපොළඹවන ලෙස
බලාගනිල්ලා. ජාතීන්ගේ දෙවිවරුන්ගෙන්
කවුරු තම තමුන්ගේ දේශ අෂූර්හි රජුගේ
අතින් කිසිසේත් ගළවාගත්තෝද?
19 හමාත්හිද අර්වාද්හිද දෙවිවරු කොයිද?
සෙපර්වයිම්හි දෙවිවරු කොයිද? ඔව්හු
සමාරිය මාගේ අතින් ගළවාගත්තෝද?
20 **ස්වාමීන්වහන්සේ** යෙරුසලම මාගේ
අතින් ගළවාගන්නවා ඇත කියා සිතන්ට
පුළුවන්වන ලෙස තමුන්ගේ දේශ මාගේ
අතින් ගළවාගත්තේ ඒ දේශවල සියලු
21 දෙවිවරුන්ගෙන් කවුරුදැයි කීවේය. නුමුත්
ඔව්හු ඔහුට කිසි උත්තරයක් නොදී
නිශ්ශබ්දව සිටියෝය. මක්නිසාද: ඔහුට
උත්තර දෙන්ට එපාය කියා රජුගේ
22 ආඥවක් තිබුණේය. එවිට රජගෙදර
ප්‍රධානියා වන, හිල්කියාගේ පුත්‍රවූ
එලියාකීම්ද ලේකම් වන ෂෙබ්නාද
වාර්තාකරුවා වන ආසාප්ගේ පුත්‍රවූ
යෝවාද තමුන්ගේ ඇඳුම් ඉරාගෙන
හෙසකියා ළඟට ඇවිත්, රබ්-ෂාකේගේ
වචන ඔහුට දන්නුවෝය.

## දෙවියන්වහන්සේ යෙසායා ලවා ධෛර්ය දෙවීම. අසිරියයන් විනාශවීම

**37** තවද හෙසකියා රජ ඒ අසා,
තමාගේ ඇඳුම් ඉරාගෙන, ගෝණි
රෙදි පෙරවාගෙන, **ස්වාමීන්වහන්සේගේ**
2 ගෘහයට ඇතුල්වී, ගෝණි රෙදි හැඳගත්
රජගෙදර ප්‍රධානියාවූ එලියාකීම්ද ලේකම
වන ෂෙබ්නාද පූජකයන්ගේ වැඩිමහල්ලන්ද
ආමොස්ගේ පුත්‍රවූ යෙසායා අනාගතවක්තෘ
3 ළඟට හැරියේය. ඔව්හු ඔහුට කථාකොට:
හෙසකියා මෙසේ කියන්නේය—අද දවස
දුකද තරවටුවද අපහාසයද ඇති දවසක්ය.
මක්නිසාද ළදරුවෝ බිහිවෙන්ට ළංව
සිටිති, නුමුත් වදන්ට ශක්තිය නැත.
4 ජීවමාන දෙවියන්වහන්සේට අපහාසකරන්ට
අෂූර්හි රජු විසින් එවූවාවූ, ඔහුගේ
සේවකවූ රබ්-ෂාකේගේ සියලු වචන
සමහරවිට තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** අසා ඒ ඇසූ වචන ගැන
උන්වහන්සේ තර්ජනයක් කරනවා ඇත.
එබැවින් තවම ඉතුරුව සිටින සෙස්සන්
උදෙසා තුඹේ යාච්ඥාව ඔප්පුකරන්නැයි
කීවෝය. මෙසේ හෙසකියා රජුගේ 5
මෙහෙකරුවෝ යෙසායා ළඟට
පැමුණුණෝය. යෙසායා ඔවුන්ට 6
කථාකොට: **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක—තුඹ ඇසුවාවූ, අෂූර්හි රජුගේ
සේවකයන් විසින් මට අපහාසකොට
කීවාවූ වචනවලට භය නොවන්න. ඔහු 7
ආරංචියක් අසා තමාගේ දේශයට
හැරීයන ලෙස මම ඔහු පිටට ආත්-
මයක් පමුණුවා, ඔහුගේ දේශයේදී ඔහු
කඩුවෙන් වැටෙන්ට සලස්වන්නෙමියි
කියනසේකැයි තුඹලාගේ ස්වාමියාට
දන්වාපල්ලායයි කීවේය.
අෂූර්හි රජු ලාකීෂ් හැර ගිය බව 8
රබ්-ෂාකේ අසා ආපසු ගිය විට, ඔහු
ලිබ්නාට විරුද්ධව යුද්ධකරන බව
දැනගත්තේය. කූෂ්හි රජවූ තිර්හකා තමාට 9
විරුද්ධව යුද්ධ කරන්ට එන්නේයයි ඔහුට
සැලවිය. ඔහු ඒ අසා හෙසකියා ළඟට
පණිවිඩකාරයන් එවමින් කියනුයේ:
තුඹලා යූදහි රජවූ හෙසකියාට මෙසේ 10
කියාපල්ලා—අෂූර්හි රජුට යෙරුසලම
අසු නොවන්නේය කියා තුඹව රවටන්ට
තුඹ විශ්වාසකරන තුඹේ දෙවියන්ට
ඉඩ නොදෙන්න. ඉතින් අෂූර්හි රජවරුන් 11
සියලු දේශවලට කළ දේ එනම් ඒවා
විනාශකර දැමූ බව තුඹ අසා තිබේ.
එසේ නම් තුඹ ගැළවෙනවා ඇද්ද? මාගේ 12
පියවරුන් විසින් නැතිකළාවූ ගෝසාන්ද
හාරාන්ද රෙශෙප්ද තෙලෙස්සාර්හි සිටි
ඒදෙන් පුත්‍රයන්ද යන ජාතීන්ගේ දෙවිවරු
ඔවුන් ගළවාගත්තෝද? හමාත්හි රජද 13
අර්පාද්හි රජද සෙපර්වයිම් නුවරෙන්
හේනාහිත් ඉව්වාහිත් රජද කොතැනදැයි
කියාපල්ලායයි කීවේය. හෙසකියා 14
පණිවිඩකාරයන්ගේ අතින් ලියුම ගෙන
කියවා, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ගොස් **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
ඒක දිගහැර, **ස්වාමීන්වහන්සේට** 15
යාච්ඥාකරමින්: කෙරුබ්වරුන් අතරේ 16
වැඩවසන ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල
**ස්වාමීන්වහන්ස**, පොළොවේ සියලු
රාජ්‍යයන් කෙරෙහි ඔබ, ඔබ පමණක්ම,

දෙවියන්වහන්සේය; අහසත් පොළොවත්
17 මැවූවේ ඔබවහන්සේය. **ස්වාමීන්වහන්ස**,
ඔබගේ කන නමා අසුව මැනව;
**ස්වාමීන්වහන්ස**, ඔබගේ ඇස් ඇර බැලුව
මැනව; ජීවමාන දෙවියන්වහන්සේට
අපහාසකරන පිණිස සෙනකෙරිබ් කියා
18 එවූ වචන අසුව මැනව. **ස්වාමීන්වහන්ස**,
අෂූර්හි රජවරුන් සියලු දේශවාසීන්ද
19 ඔවුන්ගේ රටවල්ද පාළුකොට, ඔවුන්ගේ
දෙවිවරුන් ගින්නෙහි හෙළුවා සැබෑය.
මක්නිසාද ඒවා දෙවිවරු නොව
මනුෂ්‍යයන්ගේ හස්තකර්මාන්තවූ ලී සහ
ගල්ව තිබුණේය. ඒ නිසා ඔව්හු ඒවා
20 විනාශකළෝය. එබැවින් අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබ, ඔබ පමණක්ම,
**ස්වාමීන්වහන්සේ** බව පොළොවේ සියලු
රාජ්‍යවල් දැනගන්නා පිණිස ඔහුගේ අතින්
අප ගැළෙවුව මැනවයි කීවේය.
21 එවිට ආමොස්ගේ පුත්‍රවූ යෙසායා
හෙසකියාට මෙසේ කියා ඇරියේය:
අෂූර්හි රජවූ සෙනකෙරිබ් ගැන නුඹ
22 මට යාච්ඤාකළ බැවින්, ඉශ්‍රායෙල් දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක–
සියොන් කන්‍යා දුව නුඹ සුළුකරනවාය,
නුඹට සරදම්කරනවාය; යෙරුසලම් දුව
23 නුඹට පස්සෙන් ඉස වනනවාය. නුඹ
නින්දකළෙත් අපහාසකළෙත් කාටද? නුඹ
හඬ නැගුවෙත් උඩගුවෙත් නුඹේ ඇස්
එසෙවුවෙත් කාට විරුද්ධවද? ඉශ්‍රායෙල්ගේ
ශුද්ධ තැනන්වහන්සේට විරුද්ධවය. ඔහු
ගැන **ස්වාමීන්වහන්සේ** කී වචනය මේය.
24 නුඹේ සේවකයන් ලවා නුඹ **ස්වාමීන්-
වහන්සේට** අපහාසකරවා කථාකොට–
මාගේ රථ රාශිය සමග මම කඳුවල
මුදුනට එනම් ලෙබනොන්හි ඇත
පළාත්වලට නැගුණෙමි; එහි උස්වූ කිහිරි
ගස්ද අනර්ඝ දේවදර ගස්ද කපාදමන්නෙමි.
එහි උයන් වතු සහිත වනය වන ඉතා
දුරවූ උස් ප්‍රදේශයටත් ඇතුල්වන්නෙමි.
25 මම හාරා වතුර බීවෙමි, මාගේ පය
තැබීමෙන් මිසරයේ සියලු ගංගා
26 හින්දවන්නෙමියි කීයෙහිය. මම බොහෝ
කාලයක සිට එය අභිප්‍රායකර පුරාණයේ
දවස්වල පටන් එය නියමකළ බව නුඹ
ඇසුවේ නැද්ද? දැන් නුඹ පවුරු ඇති
නුවරවල් නාස්තිකොට ජරාවාස
ගොඩවල් කරන හැටියට ඒක
ඉෂ්ටකෙළෙමි. එබැවින් ඒවායේ වැසියෝ 27
බෙලහීනව සිටියෝය, ඔව්හු කැළඹී
වියවුල්වූහ; ඔව්හු කෙතෙහි තෘණද, අමු
පලාද, පියසි උඩ තණකොළද, වැඩෙන්ට
පළමුවෙන් වේළුණු ගොයම්ද මෙන්
වූවෝය. නුමුත් මම නුඹේ හිඳීමද නුඹේ 28
යාම ඊමද මට විරුද්ධව තිබෙන නුඹේ
කැරළිකාරකමද දනිමි. මට විරුද්ධව 29
තිබෙන නුඹේ කැරළිකාරකම නිසාද
නුඹේ අහංකාර වචන මාගේ කන්වලට
පැමුණුණ නිසාද නුඹේ නාසයේ මාගේ
වළල්ලත් නුඹේ කටේ මාගේ කට-
කලියාවත් දමා, නුඹ ආ මාර්ගයෙන්
නුඹ හරවායවන්නෙමි යනුයි. මේ වනාහි 30
නුඹට ලකුණක් වන්නේය, එනම් මේ
අවුරුද්දේ ඉබේම හටගන්නා ධාන්‍ය
සහ දෙවෙනි අවුරුද්දේ එයින් හටගන්න
ඒවාත් නුඹලා කනවා ඇත; තුන්වෙනි
අවුරුද්දේ නුඹලා වපුරා කපාගනිල්ලා,
මිදිවතුත් වවා ඒවායේ ඵල කාපල්ලා.
යූද වංශයෙන් ගැළවී ඉතිරිව සිටින 31
කොටස නැවත පහළට මුල් ඇද ඉහළ
ඵල දරනවා ඇත. මක්නිසාද ඉතිරි 32
ගණනක් යෙරුසලමෙන්ද මිදී යන
ගණනක් සියොන් කන්දෙන්ද නික්-
මෙනවා ඇත. සේනාවල **ස්වාමීන්-
වහන්සේගේ** ජ්වලිතය මෙය ඉෂ්ටකරන්නේය.
එබැවින් **ස්වාමීන්වහන්සේ** අෂූර්හි රජු 33
ගැන මෙසේ කියනසේක: ඔහු මේ
නුවරට ඇතුල්වෙන්නේවත් ඊගහක් ඊට
විදින්නේවත් ඒ ඉදිරිපිටට පලිහක්
රැගෙන එන්නේවත් ඊට විරුද්ධව
ගොඩැල්ලක් නගන්නේවත් නැත. ඔහු 34
මේ නුවර තුළට නැවිත් ආ මගින්ම
හැරී යනවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද මා නිසාත් 35
මාගේ මෙහෙකරුවූ දාවිත් නිසාත් මේ
නුවර ගළවන්ට මම මේක ආවරණය
කරන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේකැයි කියා හැරියේය.
ඒ රාත්‍රියේදී **ස්වාමීන්වහන්සේගේ** දූතයා 36
පිටත්ව ගොස් අෂූර්වරුන්ගේ කඳවුරෙහි
එක් ලක්ෂ අසූපන්දහස් දෙනෙකුට පහර-

දුන්නේය. මිනිසුන් අලුයම නැගුටුණු විට,
37 බලව, ඒ සියල්ලෝ මළකඳන් වූය. එවිට
අෂූර්හි රජවූ සෙනකෙරීබ් පිටත්ව හැරී
38 ගොස් නිනිවෙහි වාසයකෙළේය. තවද
ඔහු තමාගේ දෙවිවූ නිස්රොක්ගේ
ගෘහයෙහි නමස්කාරකරද්දී ඔහුගේ පුත්‍රවූ
අද්‍රම්මෙලෙක්ද ෂරෙශෙර්ද ඔහු කඩුවෙන්
මරා අරාරාත් දේශයට සැඟවී ගියෝය.
ඔහුගේ පුත්‍රවූ ඒසර්-හද්දෝන් ඔහු වෙනුවට
රජවිය.

## හෙසකියාගේ රෝගය සහ සුවය

38 ඒ කාලයේදී හෙසකියා මරණාසන්න
වන තරම් රෝගාතුර විය. ආමොස්-
ගේ පුත්‍රවූ අනාගතවක්තෘවූ යෙසායා
ඔහු ළඟට ඇවිත්: නුඹේ ගෙදර කාරණා
බේරා තබාපන්න; මක්නිසාද නුඹ
මැරෙන්නෙහිය, ජීවත් නොවන්නෙහිය
කියා **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
2 ඔහුට කීවේය. එවිට හෙසකියා තමාගේ
මුහුණ භිත්තිය දෙසට හරවාගෙන
3 **ස්වාමීන්වහන්සේ**ට යාච්ඤාකරමින්: අහෝ
**ස්වාමීන්වහන්ස**, මා සැබෑකමිනුත්
සම්පූර්ණ සිතකිනුත් ඔබ ඉදිරියෙහි
හැසිර, ඔබගේ ඇස් හමුයෙහි හරිව
තිබෙන දේ කළ බව සිහිකළ මැනවයි
4 කියා තදින් ඇඬුවේය. එවිට **ස්වාමීන්-
වහන්සේ**ගේ වචනය යෙසායා වෙතට
5 පැමිණ කියනුයේ: නුඹ ගොස්
හෙසකියාට මෙසේ කියාපන්න—නුඹේ
පියා වන දාවිත්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: මම නුඹේ යාච්ඤාව
ඇසීමි, නුඹේ කඳුළු දුටිමි. නුඹේ වයසට
අවුරුදු පහළොහක් එකතුකරන්නෙමි.
6 මම අෂූර්හි රජුගේ අතින් නුඹ සහ මේ
නුවර ගළවා, මේ නුවර ආවරණය-
7 කරන්නෙමි. **ස්වාමීන්වහන්සේ** කී දේ
උන්වහන්සේ ඉෂ්ටකරන බවට උන්-
වහන්සේගෙන් නුඹට ලැබෙන ලකුණ
8 මේය: බලව, ආහාස්ගේ හෝරා-යන්ත්‍ර
මණ්ඩලය පිට සෙවණැල්ල බැස ගිය
තැනින් අංශක දශයක් පස්සට යන්ට
සලස්වන්නෙමියි කියාපන්නැයි කීවේය.
එසේ හෝරා-යන්ත්‍ර මණ්ඩලය පිට
සූර්ය-ඡායාව බැස ගොස් තිබුණු තැනින්
අංශක දසයක් පස්සට හැරී ආවේය.

යූදාහි රජවූ හෙසකියා රෝගීව සිට 9
සුවපත්වූ පසු ලියූ ලියවිල්ල මේය—
මාගේ වයසේ මද්දහනේදී මට මිනී 10
වළේ දොරටුවලට යන්ට වෙන්නේය,
මාගේ ඉතිරි අවුරුදු මාගෙන් පහකර
තිබේයයි කීමි.
ජීවත්ව සිටින්නන්ගේ දේශයේදී 11
**ස්වාමීන්වහන්සේ**, එසේය,
**ස්වාමීන්වහන්සේ** දකින්ටවත්
ලෝ වැසියන් සමග සිට මනුෂ්‍යයන්
බලන්ටවත් තවත් මට
නොලැබෙන්නේයයි කීමි.
එඬේර කූඩාරමක් මෙන් මාගේ *වයස 12
මාගෙන් පහකරනු ලැබ මා වෙතින්
ගෙනයනලද්දේය.
වියන්නෙකු සේ මම මාගේ ජීවිතය
අකුලාගතිමි; අළුවෙන් කපාදමන්-
නාක්මෙන් උන්වහන්සේ මා
සිඳදමනසේක.
එක දවසක් ඇතුළතදී ඔබ මා තීන්දු
කරනසේක.
උදය දක්වා මම කල්පනාකෙළෙමි; 13
උන්වහන්සේ සිංහයෙකු මෙන්
මාගේ සියලු ඇට බිඳිනසේක.
එක දවසක් ඇතුළතදී ඔබ මා තීන්දු
කරනසේක.
වැහිලිහිණියෙකු නොහොත් කොකෙකු 14
මෙන් කෑගැසීමි;
පරෙවියෙකු මෙන් වැලපුණෙමි. උඩ
බැලීමෙන් මාගේ ඇස් දුර්වලවී තිබේ;
අහෝ **ස්වාමීන්වහන්ස**, මම පීඩා
විඳිමි, ඔබ මට ඇපවූව මැනව.
මම කුමක් කියම්ද? උන්වහන්සේ 15
මට වදරා, උන්වහන්සේම
ඉෂ්ටකළසේක.
මාගේ ආත්මයේ තද ශෝකය නිසා
මාගේ සියලු අවුරුදුවල
සන්සුන්කමින් යන්නෙමි.
ස්වාමීන්වහන්ස, මේවායින්ම මනුෂ්‍යයෝ 16
ජීවත්වෙති,
ඒවා කෙරෙහිම මාගේ ආත්මයත්
ජීවත්වන්නේය.
එබැවින් මා ශක්තිමත්කොට, මා
ජීවත්කළ මැනව.

*නොහොත්, නිවාසය.

17 බලව, මට තද ශෝකය පැමුණුණේ
මාගේ සමාදනය පිණිසය.
නුමුත් ඔබ මාගේ ආත්මයට ඇති
ප්‍රේමය නිසා විනාශය නමැති
වළෙන් එය මුදගත්සේක;
එසේය, ඔබ මාගේ පව් සියල්ල ඔබ
පිටිපස්සට දැමූසේක.
18 මක්නිසාද ඔබට ප්‍රශංසාකරන්ට මිනී
වළටවත් ඔබ වර්ණනාකරන්ට
මරණයටවත් බැරිය.
වළට බසින්නෝ ඔබගේ විශ්වාසකම
ගැන බලා නොසිටින්නෝය.
19 ජීවත්ව සිටින්නා—ජීවත්ව සිටින්නාම—
අද මා වාගේ ඔබට
ස්තුතිකරන්නේය.
පියා දරුවන්ට ඔබගේ විශ්වාසකම
ගැන දන්වන්නේය.
20 **ස්වාමීන්වහන්සේ** මා ගළවන්ට
සැදී සිටිනසේක.
එබැවින් අපේ ජීවිතයේ සියලුම
දවස්වල **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේදී
මාගේ ගීතිකා ගායනාකරන්නෙමු.
21 යෙසායා කථාකොට: ඔව්හු අත්තික්කා
කැටියක් ගෙන කොටා වණය පිට
තබත්වා, එවිට ඔහුට සුවවන්නේයයි
22 කියා තිබුණේය. හෙසකියාද: මා
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට යන බවට
තිබෙන ලකුණ මොකදැයි අසා තිබුණේය.

## හෙසකියාගේ මූළාව. යුදා වාලටයාම කලින් දන්වීම

39 ඒ කාලයේදී බලදන්ගේ පුත්‍රවූ
බබිලෝනියේ රජවූ මෙරොදක්-
බලදන් හෙසකියා ලෙඩින් සිට සුවවුණ
බව අසා ලියුම් සහ තෑග්ගක් ඔහු
2 වෙතට එවුවේය. හෙසකියාද ඔවුන් ගැන
ප්‍රීතිවී, තමාගේ වස්තු ගබඩාවද එහි
තිබුණු රන්රිදීද සුවඳ ද්‍රව්‍යද අනර්ඝ
තෙල්ද තමාගේ මුළු යුද්ධායුධ ගෘහයද
තමාගේ ගබඩාවල තිබුණු සියල්ලද
ඔවුන්ට පෙන්නුවේය. හෙසකියා තමාගේ
ගෙයිවත් මුළු රාජ්‍යයෙහිවත් ඔවුන්ට
3 නොපෙන්වූ කිසිවක් නොතිබුණේය. එවිට
අනාගතවක්තෘවූ යෙසායා හෙසකියා
රජු ළඟට ඇවිත්: ඒ මනුෂ්‍යයන් කීවේ
මොකද? ඔව්හු කොතනින් නුඹ ළඟට
ආවෝදැයි ඔහුගෙන් ඇසුවේය. ඔව්හු
දුර දේශයක්වූ බබිලෝනියේ සිට මා
ළඟට ආවෝයයි හෙසකියා කීවේය.
එවිට ඔහු: ඔව්හු නුඹේ ගෙයි මොනවා 4
දුටුවෝදැයි ඇසීය. හෙසකියා උත්තර-
දෙමින්: මාගේ ගෙයි තිබෙන සියල්ල
ඔව්හු දුටුවෝය. මාගේ වස්තු අතරේ
මා ඔවුන්ට නොපෙන්වූ කිසිවක් නැතැයි
කීවේය. එවිට යෙසායා හෙසකියාට 5
කථාකොට: සේනාවල **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනය අසන්න: බලව, 6
නුඹේ ගෙයි තිබෙන සියල්ලත් නුඹේ
පියවරුන් විසින් අද දක්වා රැස්කර
තැබූ දේත් කිසිවක් ඉතිරි නොකර
බබිලෝනියට ගෙනයන දවස් පැමි-
ණෙන්නේය. නුඹ තුළින් නික්මෙන, නුඹට 7
දාව උපදින නුඹේ පුත්‍රයන්ගෙන් සමහ-
රෙක් ගෙනයනු ලබන්නෝය; ඔව්හු
බබිලෝනියේ රජුගේ මාළිගාවෙහි
නපුංසකයෝ වන්නෝයයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේකැයි කීවේය. එවිට 8
හෙසකියා: නුඹ කී **ස්වාමීන්වහන්සේගේ**
වචනය යහපතැයි යෙසායාට කීවේය.
මක්නිසාද සමාදනයත් සැබෑකමත්
මාගේ දවස්වලදී වන්නේයයි ඔහු
වැඩිදුරටත් කීවේය.

## සැනසිල්ල හා කමාවීමේ දිව්‍ය පණිවිඩය

40 මාගේ සෙනඟ සනසාපල්ලා,
සනසාපල්ලායයි නුඹලාගේ
දෙවියන්වහන්සේ වදාරනසේක. යෙරූ- 2
සලමට කරුණාවෙන් කථාකොට: ඈගේ
සටන කෙළවරවීයයි කියාද ඈගේ වරද
ගෙවී ගියේය කියාද ඈගේ සියලු
පාපවලට **ස්වාමීන්වහන්සේ** අතින් ඇට
දෙගුණයක් ලැබුණේය කියාද ඈට
මොරගසා කියාපල්ලා.
කාන්තාරයෙහි **ස්වාමීන්වහන්සේගේ** 3
මාර්ගය සාදා, අපේ දෙවියන්වහන්සේට
වනයෙහි මාවතක් සමතලාකරපල්ලා.
සියලු මිටි තැන් උස්වන්නේය, සියලු 4

කඳු හා හෙල් පහත්කරනු ලබන්නේය.
ඇද තැන් ඇදහරිනු ලබන්නේය, රළු
5 තැන් සමතලාකරනු ලබන්නේය. එවිට
**ස්වාමීන්වහන්සේගේ** තේජස ප්‍රකාශ-
වන්නේය, සියලු මනුෂ්‍යයෝ එක්ව එය
දකින්නෝය. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේගේ** මුඛය එය වදාළසේකැයි
මොරගසන්නෙකුගේ හඬක් වන්නේය.
6 මොරගසන්නැයි කියන කෙනෙකුගේ
හඬක් වේ. මම කුමක් කියා මොරගසම්දැයි
කෙනෙක් ඇසීය. මාංසමයවූ සියල්ලෝ
තෘණය, ඔවුන්ගේ සියලු අලංකාරය
7 කෙතේ මලක් මෙන්ය. **ස්වාමීන්වහන්සේගේ**
හුස්ම ඒවාට ගසන බැවින් තණකොළ
වියළෙයි, මල පරවෙයි; සැබවින් සෙනඟ
8 තෘණය. තණකොළ වියළෙයි, මල
පරවෙයි. නුමුත් අපේ දෙවියන්වහන්සේගේ
වචනය සදාකාලේටම පවත්නේය කියාය.
9 සියොනට ශුභ ආරංචි දන්වන්නාවූ
නුඹ උස් කන්දට නැගියන්න;
යෙරුසලමට ශුභ ආරංචි දන්වන්නාවූ
නුඹ හයියෙන් හඬගසාපන්න. භය
නැතුව හඬනගා: මෙන්න, නුඹලාගේ
දෙවියන්වහන්සේයයි යූද නුවරවලට
10 කියාපන්න. බලව, ස්වාමිවූ දෙවියන්-
වහන්සේ බලවත්තයෙකු මෙන් එනසේක,
උන්වහන්සේගේ හස්තයද උන්වහන්සේ
උදෙසා ආණ්ඩුකරන්නේය. උන්-
වහන්සේගේ බැළය උන්වහන්සේ සමගය;
උන්වහන්සේගේ විපාකය උන්වහන්සේ
11 ඉදිරියෙහිය. එඬේරෙකු මෙන් උන්වහන්සේ
තමන්ගේ රැළ පෝෂ්‍යකරනසේක,
බැටළුපැටවුන්ද තමන්ගේ හස්තයෙන්
රැගෙන, තමන්ගේ ළයේ දරමින්, කිරිදෙන
බැටළුදෙනුන් හෙමින් ගෙනයනසේක.

## ස්වාමීන්වහන්සේගේ බලසම්පන්නකම සහ මනුෂ්‍යයාගේ බෙලහීනකම

12 තමාගේ අල්ලෙන් ජලය මැන්නෙත්
අහස වියතින් මැන්නෙත් පොළොවේ
පස් මිම්මක දමා බැලුවෙත් තරාදියකින්
කඳුද තුලාවලින් හෙල්ද කිරුවෙත්
කවුද? **ස්වාමීන්වහන්සේගේ** ආත්මයට 13
මගපෙන්නුවෙත් උන්වහන්සේගේ මන්ත්‍රීව
සිට උන්වහන්සේට ඉගැන්නුවෙත් කවුද?
උන්වහන්සේ කා සමග මන්ත්‍රණයකළ- 14
සේක්ද? උන්වහන්සේට ගුරුකම් දී, යුතු
මාර්ගය ගැන උන්වහන්සේට උගන්වා,
දැනගැන්මද උගන්වා, බුද්ධියේ මාර්ගය
උන්වහන්සේට පෙන්නුවේ කවුද? බලව, 15
ජාතීහු කළයකින් වැටෙන දිය බින්දුවක්
මෙන්ද තුලාවෙහි ධූලි මෙන්ද ගණන්ගනු
ලබන්නෝය. මෙන්න, උන්වහන්සේ
දිවයින් ඉතා කුඩා දෙයක් මෙන් උස්සන-
සේක. දැවීමට ලෙබනොන් මදිය, දවන 16
පූජාවකට එහි සත්තුත් මදිය. සියලු 17
ජාතීහු උන්වහන්සේ ඉදිරියෙහි කිසිත්
නැතිකම මෙන්ය; ඔව්හු උන්වහන්සේට
කිසිත් නැතිකමද හිස්කමද කොට
ගණන්ගනු ලැබෙති. එහෙයින් නුඹලා 18
දෙවියන්වහන්සේ කාට සමකරන්නහුද?
නොහොත් කොයි රූපාකාරයක්
උන්වහන්සේට සමානකරන්නහුද?
කැටයම් රූපය වනාහි කම්කරුවෙකු 19
විසින් වාත්තු කරනලද්දේය, රන්කරුවා
ඒක රනින් වසා ඊට රිදී දම්වැල් සාදයි.
එබඳු යාගයක් පිදීමට වත්කම නැති 20
අය නොදිරන ගහක් තෝරාගනියි; ඔහු
නොසෙල්වෙන කැපූ රූපයක් පිහිටුවන්ට
දක්ෂ කම්කරුවෙකු සොයාගනියි. නුඹලා 21
දන්නේ නැද්ද? අසාලා නැද්ද? මුලපටන්
නුඹලාට දන්වා නැද්ද? පොළොවේ
අත්තිවාරම් ලූ තැන් පටන් නුඹලා ඒක
තේරුම් නොගත්තහුද? පෘථිවි චක්‍රය 22
මතුයෙහි වැඩ ඉන්නේ උන්වහන්සේය,
එහි වැසියෝ පළඟැටියන් වැනිය; අහස
ඇතිරිල්ලක් මෙන් දිගහැර, වාසයකිරීමට
කුඩාරමක් මෙන් එය අතුරා තබන්නෙත්,
අධිපතීන් නාස්තියට පමුණුවන්නෙත්, 23
පොළොවේ විනිශ්චයකාරයන් හිස්කමක්
කරන්නෙත් උන්වහන්සේය. එසේය, ඔවුන් 24
සිටවනු ලැබූ වහාම, වපුරනු ලැබූ වහාම,
එසේය, ඔවුන්ගේ කඳ පොළොවෙහි මුල්
ඇද්ද වහාම, උන්වහන්සේ ඔවුන්ට පිඹින-
සේක, ඔව්හු වියළෙති, ඉපනැලි මෙන්

25 ඔව්හු සුළිහුළඟට ගහගනයති. ඉතින්
තුඹලා මා කාට සමාන කරනවාද?
මා එක සමානව සිටින්නේ කාටදැයි
ශුද්ධ තැනැන්වහන්සේ අසනසේක.
26 තුඹලාගේ ඇස් ඉහළ ඔසවා
බලාපල්ලා, මේවා මැවූවෙත් මේවායේ
සේනාව ගණන් වශයෙන් පිටතට
පමුණුවන්නෙත් කවුද? උන්වහන්සේ මේ
සියල්ලට නම් කියා හඬගසනසේක;
උන්වහන්සේගේ බලයේ මහත්කම නිසාද
උන්වහන්සේ ශක්තියෙන් බලවත් බැවින්ද
එකක්වත් නැවිත් නොතිබේ.
27 මාගේ මාර්ගය **ස්වාමීන්වහන්සේගෙන්**
සැඟවී තිබේය කියාත් මාගේ විනිශ්චය
මාගේ දෙවියන්වහන්සේ වෙතින් පහවේය
කියාත් එම්බා යාකොබ්, තුඹ කියන්නෙත්
එම්බා ඉශ්‍රායෙල්, තුඹ කථාකරන්-
28 නෙත් මක්නිසාද? පොළොවේ සීමාවල
මැවුම්කාරවූ **ස්වාමීන්වහන්සේ** වන
සදාකාල දෙවියන්වහන්සේ ක්ලාන්ත
නොවන බවත් වෙහෙස නොවන
බවත් තුඹ දන්නේ නැද්ද? තුඹ අසාලා
නැද්ද? උන්වහන්සේගේ ඥානය දැනගන්ට
29 බැරිය. උන්වහන්සේ ක්ලාන්තවූ අයට
ශක්තිය දෙනසේක; බලය නැත්තාට
30 සවිය වැඩිකරනසේක. තරුණයෝ
පවා ක්ලාන්තව වෙහෙසවන්නෝය,
යෞවනයෝද මුළුමනින්ම වැටෙන්නෝය.
31 තුමුත් **ස්වාමීන්වහන්සේ** ගැන බලා
සිටින්නෝ තමුන්ගේ සවිය අලුත්-
කරගන්නෝය; ඔව්හු රාජාලීන් මෙන්
පියාඹා නගින්නෝය; ඔව්හු දුවන්-
නෝය, එහෙත් වෙහෙස නොවෙති;
ඔව්හු ඇවිදින්නෝය, එහෙත් ක්ලාන්ත
නොවෙති.

## ස්වාමීන්වහන්සේ තමන් සෙනඟ ආරක්ෂාකරගැනීම

41 ද්වීපයෙනි, මා ඉදිරියෙහි
නිශ්ශබ්දව සිටිව්; ජනයෝ තමුන්-
ගේ සවිය අලුත්කරගෙන, ළංව, පසුව
කථාකෙරෙත්වා. අපි එක්ව විනිශ්චය
2 පිණිස ළඟාවෙමු. පෙරදිගින් කෙනෙකු
නැගුවූවා ධර්මිෂ්ඨකමින් තමන්ගේ
පාමුලට කැඳවාගත්තේ කවුද? උන්-
වහන්සේ ඔහු ඉදිරියේ ජාතීන් පාවාදී,
ඔහු ලවා රජුන් ආණ්ඩුකරවනසේක;
උන්වහන්සේ ඔහුගේ කඩුවට ධූලි මෙන්ද
ඔහුගේ දුන්නට හුළඟින් ගසාගනයන
ඉපනැලි මෙන්ද ඔවුන් පාවා දෙනසේක.
ඔහු ඔවුන් ලුහුබඳවා, ඊට ප්‍රථම තමාගේ 3
පාදවලින් නොගිය මාර්ගයකින් සුවසේ
යන්නේය. පටන්ගැන්මේ සිට පරම්පරාවලට 4
කැඳවමින් කාරණා හදුරුවා ඉෂ්ටකළේ
කවුද? පළමුවෙනියාවූ, අන්තිමයන්
සමගත් සිටින්නාවූ **ස්වාමීන්වහන්සේ**
වන මමය, මම ඒ තැනන්වහන්සේය.
ද්වීපයෝ දැක භයවූවෝය; පොළොවේ 5
සීමාවෝ වෙවුලුවෝය. ඔව්හු ළංවී
ආවෝය; එක එකා තම තමාගේ 6
අසල්වාසියාට උපකාරකොට, තම
තමාගේ සහෝදරයාට: ධෛර්යවන්-
වෙයන්නැයි කීවෝය. මෙසේ වඩුවා 7
රන්කරුවාටද මිටියෙන් මට්ටම්කරන්නා
කිණිහිරය පිට තළන්නාටද ධෛර්ය-
දුන්නේය, පෑස්සීම හොඳයයි කියා ඔහු
ඒක නොසෙල්වෙන ලෙස ඇණවලින්
සවිකෙළේය.
තුමුත් මාගේ මෙහෙකරුවාවූ ඉශ්‍රායෙල්, 8
මා විසින් තෝරාගත් යාකොබ්, මාගේ
මිත්‍රයාවූ ආබ්‍රහම්ගේ වංශය, මා විසින් 9
පොළොවේ කෙළවරින් අල්ලාගෙන, එහි
සීමාවලින් කැඳවාගෙන: තුඹ මාගේ
මෙහෙකරුවාය, මම තුඹ පහකර
නොදමා තෝරාගතිමියි කියා මා විසින්
කියනලද්දවූ තුඹ, භය නොවෙන්න, 10
මක්නිසාද මම තුඹ සමග සිටිමි; තැති
නොගනින්න, මක්නිසාද මම තුඹේ
දෙවියන්වහන්සේය. මම තුඹ ශක්ති-
මත්කොට, තුඹට උපකාර කරන්නෙමි;
එසේය, මාගේ ධර්මිෂ්ඨකම නමැති
දකුණතින් තුඹ උසුලන්නෙමි. තුඹ 11
කෙරෙහි කෝපව සිටින සියල්ලෝම
ලජ්ජාවී වියවුල්වන්නෝය. තුඹ සමග
විවාදකරන්නෝ කිසිත් නැතිකම මෙන්
විනාශවන්නෝය. තුඹ සමග විවාදයට 12
සිටින මනුෂ්‍යයන් තුඹ සොයන තුමුත්,

ඔවුන් සම්බවෙන්නේ නැත. නුඹට
විරුද්ධව යුද්ධකරන මනුෂ්‍යයෝ කිසිත්
නැතිකමත් හිස්කමත් මෙන් වන්නෝය.
13 මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
වන මම: භය නොවෙන්න, මම නුඹට
පිහිටවන්නෙමියි කියමින් නුඹේ දකුණත
14 අල්ලන්නෙමි. පණුවෙක් වැනිවූ යාකොබ්
නුඹද ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි නුඹලාද
භය නොවෙල්ලා; මම නුඹට පිහිටවන්-
නෙමියි ස්වාමීන්වහන්සේ කියනසේක,
නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ
15 ශුද්ධ තැනන්වහන්සේය. බලව, මම නුඹ
මුවහත්වූ අලුත් දති ඇත්තාවූ මඩින
යන්ත්‍රයක් කරන්නෙමි. නුඹ කඳු මැඩ
පොඩිකර, හෙල් බොල් මෙන් කරන්-
16 නෙහිය. නුඹ ඒවා පොළන්නෙහිය, එවිට
ඒවා සුළඟට ගහගන යන්නේය, සුළි-
හුළඟින් විසිරයන්නේය. නුඹ වනාහි
ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතිමත්වී, ඉශ්‍රා-
යෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේ තුළ
17 පාරට්ටුකරගන්නෙහිය. අසරණයන්ද
දිළින්දන්ද වතුර සොයා නොලැබ
ඔවුන්ගේ දිව පිපාසායෙන් වේලෙන
කල, ස්වාමීන්වහන්සේ වන මම ඔවුන්ට
උත්තරදෙන්නෙමි, ඉශ්‍රායෙල්හි දෙවියන්-
වහන්සේ වන මම ඔවුන් අත්නාරින්-
18 නෙමි. මම මුඩු කඳු මුදුන්වල ගංගාද
මිටියාවත් මැද උල්පත්ද විවරකරන්-
නෙමි. කාන්තාරය දිය පොකුණක්ද
වියළි දේශයන් ජල උල්පත්ද කරන්-
19 නෙමි. මම කාන්තාරයෙහි කිහිරි ගස්ද
ෂිට්ටීම් ගස්ද මරඳ ගස්ද තෙල් ගස්ද
හිටවන්නෙමි; වනයෙහි දේවදාර ගස්ද හල්
ගස්ද තෂ්ෂූර් ගස්ද එකට තබන්නෙමි.
20 එසේ කරන්නේ ස්වාමීන්වහන්සේගේ
හස්තය මේක කළ බවද ඉශ්‍රායෙල්ගේ
ශුද්ධ තැනන්වහන්සේ ඒක හටගැන්වූ
බවද ඔවුන් එක්ව දැක, දැනගෙන, සිතට
ගෙන, තේරුම්ගන්න පිණිසය.

## උන්වහන්සේ සියලු දෙවිවරුන්ට වඩා උත්කෘෂ්ට බව

21 නුඹලාගේ පැමිණිල්ල ඉදිරියට
ගෙනෙල්ලායයි ස්වාමීන්වහන්සේ කියන-
සේක; නුඹලාගේ බලවත් කාරණා
පෙන්වාපල්ලායයි යාකොබ්ගේ රජ්ජුරුවෝ
කියනසේක. ඔව්හු ඒවා ඉදිරිපත්කොට, 22
සිද්ධවෙන්ට තිබෙන දේවල් අපට
දන්වත්වා. ඉස්සර දේවල් මොනවාදැයි
අප විසින් කල්පනාකොට ඒවායේ
කෙළවර දැනගන්නා පිණිස ඒවා අපට
දන්වාපල්ලා; නොහොත් පැමිණෙන්ට
තිබෙන දේවල් අපට ප්‍රකාශකරපල්ලා.
මතු සිද්ධවෙන්ට තිබෙන දේවල් දන්- 23
වාපල්ලා, එවිට නුඹලා දෙවිවරුන් බව
අපට දැනගන්ට ලැබෙනවා ඇත. එසේය,
අප එක්ව නැතිගෙන බලන පිණිස
හොඳක් හෝ නරකක් කරපල්ලා. බලව, 24
නුඹලා කිසිත් නැතිකමය, නුඹලාගේ
ක්‍රියාවත් හිස්කමය. නුඹලාව තෝරා-
ගන්න තැනැත්තේ පිළිකුලක්ය.
මම උතුරු දිගින් කෙනෙක් නැගිටවීමි, 25
ඔහු ඇවිත් සිටියි; නැගෙනහිර පටන්
ඔහු මාගේ නාමය කියා යාච්ඤා කරන
කෙනෙක්ය. බදාම මෙන්ද කුම්භකාරයා
මැටි පාගන්නාක්මෙන්ද ඔහු ආණ්ඩු-
කාරයන් පිටට පැමිණෙනවා ඇත. අප 26
විසින් දැනගන්න පිණිස පටන්ගැන්මේ
සිටත්: ඔහු ධර්මිෂ්ඨයයි අප විසින් කියන
පිණිස පුරාණයේදීත් දැන්නුවේ කවුද?
එසේය, දන්වන කිසිවෙක් නැත, එසේය,
ප්‍රකාශකරන කිසිවෙක් නැත, එසේය,
නුඹලාගේ වචන අසන කිසිවෙකුත් නැත.
බලාපන්න, බලාපන්නැයි පළමුකොට 27
සියොනට කීවේ මමය; ශුභ ආරංචි
ගෙනෙන කෙනෙකු මම යෙරුසලමට
දෙන්නෙමි. මා විසින් බලන කල කිසි- 28
වෙක් නැත; මා ඔවුන්ගෙන් අසන කල
කිසි උත්තරයක් දෙන්ට පුළුවන් මන්-
ත්‍රියෙක් ඔවුන් අතරේ නැත. බලව, ඔවුන් 29
සියල්ලෝම කිසිත් නැතිකමය, ඔවුන්ගේ
වැඩ නිෂ්ඵලකමය; ඔවුන්ගේ පිළිම සුළඟ
සහ වියවුලය.

## ස්වාමීන්වහන්සේගේ සේවකයා

42
මා විසින් උසුලන මාගේ
මෙහෙකරුවා මොහුය; මාගේ
සිතට ප්‍රියවූ මාගේ තෝරාගත් තැනැත්තා
මොහුය. මාගේ ආත්මය ඔහු කෙරෙහි

තැබීම්; ඔහු ජාතීන්ට විනිශ්චය ගෙන
2 එන්නේය. ඔහු මොර නොගසන්නේය,
ස්වකීය හඬ නොනගන්නේය, වීථියෙහි
3 එය ඇසෙන්ට නොදෙන්නේය. ඔහු
තැළුණු බටලීයක් නොබිඳින්නේය,
දුම්ගහන පහන්තිරයක් නොනිවන්නේය.
ඔහු සැබෑවෙන් විනිශ්චය ප්‍රකාශකරන්නේය.
4 පොළොවෙහි විනිශ්චය පිහිටුවන තුරු
ඔහු දුර්වල නොවන්නේය, අධෛර්ය
නොවන්නේය. ද්වීපයෝ ඔහුගේ ව්‍යවස්-
5 ථාව ගැන බලා සිටින්නෝය. ආකාශ
මණ්ඩලය මවා ඒවා දිග ඇරියාවූද,
පොළොව සහ එහි සෑදෙන දේ ඇතුරූ-
වාවූද, එහි සෙනඟට හුස්මත් එහි
හැසිරෙන්නන්ට ආත්මයත් දෙන්නාවූද
දෙවිවූ ස්වාමීන්වහන්සේ මෙසේ
6 කියනසේක. ස්වාමීන්වහන්සේ වන මම
ධර්මිෂ්ඨකමින් තුඹ අඬගසාගතිමි, මම
තුඹේ අත අල්ලාගෙන, තුඹ ආරක්ෂා
කොට, සෙනඟගේ ගිවිසුමක් සහ
ජාතීන්ගේ එළියක්ද කොට නියම-
7 කරන්නෙමි. එසේ කරන්නේ අන්ධවූ ඇස්
අරින්ටත් හිරකාරයන් හිරගෙයින්ද
අන්ධකාරයෙහි ඉන්නන් ඇඳිරි ගෙයින්ද
8 පිටතට ගෙනෙන්ටත්ය. මම ස්වාමීන්-
වහන්සේය; මාගේ නාමය ඒකය. මාගේ
ගෞරවය අන් කෙනෙකුටවත් මාගේ
ප්‍රශංසාව රූපවලටවත් නොදෙන්නෙමි.
9 බලව, පළමු කී දේවල් මෙන්න සිද්ධවී
තිබේ, මම අලුතු දේවල් දන්වමි. ඒවා
හටගන්ට පළමුවෙන් ඒවා තුඹලාට
ප්‍රකාශකරමි.

## ස්වාමීන්වහන්සේට ප්‍රශංසා ගීයක්

10 මුහුදට බැසයන්නෙනි, එහි පිරී සිටින
සියල්ලෙනි, දිවයින් හා එහි වැසියෙනි,
ස්වාමීන්වහන්සේට අලුත් ගීතිකාවක්ද
පොළෝ සීමාවේ සිට උන්වහන්සේගේ
11 ප්‍රශංසාවද ගායනාකරව්. කාන්තාරය
සහ එහි නුවරවල්ද කේදාර්වරුන් වාසය-
කරන ගම්ද ශබ්දනගත්වා; පර්වතවල
වැසියෝ ඔල්වරහඬ දෙත්වා, කඳු
12 මුදුන්වල සිට මොරගසත්වා. ඔව්හු
ස්වාමීන්වහන්සේට ගෞරවය දී,
උන්වහන්සේගේ ප්‍රශංසාව දිවයින්වල
ප්‍රකාශකෙරෙත්වා. ස්වාමීන්වහන්සේ 13
බලවන්තයෙකු මෙන් නික්ම එනසේක;
උන්වහන්සේ යුද්ධකාරයෙකු මෙන්
ජ්වලිතය උපදවනසේක; උන්වහන්සේ
කෑගසා, එසේය තදින් මොරගසා,
තමන්ගේ සතුරන්ට විරුද්ධව බලවන්ත-
කම් කරනසේක. මම බොහෝ කල් 14
නිශ්ශබ්දව සිටියෙමි; නිශ්චලව කථා
නොකර සිටියෙමි. දූන් විළිරුජා ඇති
ස්ත්‍රියෙකු මෙන් කෑගසන්නෙමි; එකවිටම
කට ඇර හතිදමන්නෙමි. මම කඳු සහ 15
හෙල් පාළුකර, ඒවායේ සියලු පලා-
ජාති වියළවන්නෙමි; ගංගා ගොඩකර,
පොකුණු හින්දවන්නෙමි. අන්ධයන් ඔවුන් 16
නොදත් මාර්ගයකින් ගෙනයන්නෙමි;
ඔවුන් නොදන්නා මාවත්වලින් යන්ට
සලස්වන්නෙමි. ඔවුන් ඉදිරියෙහි
අන්ධකාරය එළිය කොට, ඇද තැන්
ඇද අරින්නෙමි. මම මේ දේවල් කරන්-
නෙමි, ඔවුන් අත්නාරින්නෙමි. රූප 17
කෙරෙහි විශ්වාසකරන්නාවූ, තුඹලා අපේ
දෙවිවරුයයි පිළිමවලට කියන්නාවූ අය
පස්සට හරවනු ලබන්නෝය, බොහෝ-
සෙයින් ලජ්ජාවට පත්වන්නෝය.

## ස්වාමීන්වහන්සේගේ සේවකවූ ඉශ්‍රායෙල්ගේ අඩුලුහුඩුකම

බිහිරෙනි, අසාපල්ලා; අන්ධයෙනි, 18
දකින පිණිස බලාපල්ලා. මාගේ 19
මෙහෙකරුවා මිස අන්ධව සිටින්නෙත්
මාගේ පණිවිඩකාරයා මෙන් බිහිරිව
සිටින්නෙත් කවුද? මා හා සමාදානයෙන්
සිටින්නා මෙන් අන්ධව සිටින්නෙත්
ස්වාමීන්වහන්සේගේ මෙහෙකරුවා මෙන්
අන්ධව සිටින්නෙත් කවුද? තුඹ බොහෝ 20
දේ දකින නුමුත් නොසලකන්නෙහිය;
ඔහුගේ කන් ඇරී තිබෙද්දීත් ඔහු අසන්නේ
නැත. ස්වාමීන්වහන්සේ තමන්ගේ 21
ධර්මිෂ්ඨකම නිසා ව්‍යවස්ථාව උතුම් කොට
ඊට ගෞරවකරන්ට සතුටුවූසේක. එහෙත් 22
මොව්හු කොල්ලකෑමද පැහැරගැන්මද
වින්දවූ සෙනඟක්ය; මොවුන් සියල්ලෝම

වළවල්හි අසුවී, ඇඳිරි ගෙවල්වල සඟවනු
ලැබ සිටිති. කිසිවෙකු විසින් ගළවනු
නොලැබ, ඔව්හු කොල්ලයක්ව සිටිති;
නිදහස්කරපන්නැයි කිසිවෙකු කියන්නේ
23 නැතුව නාස්තියක්වී සිටිති. තුඹලා
අතරෙන් කවුරු මීට ඇහුම්කන්දී අසා,
24 මින්මත්තට කීකරුවන්නේද? යාකොබ්
කොල්ලයක් පිණිසද ඉශ්‍රායෙල් කොල්ල-
කාරයන්ටද දුන්නේ කවුද? ස්වාමීන්-
වහන්සේ නොවේද? අප පව්කළේ
උන්වහන්සේට විරුද්ධවය, ඔවුන් යන්ට
අකමැතිවුණේ උන්වහන්සේගේ මාර්ග-
වලය; ඔවුන් අකීකරුවුණේ උන්-
25 වහන්සේගේ ව්‍යවස්ථාවටය. ඒ නිසා
උන්වහන්සේ තමන්ගේ බලවත් උදහස
සහ සටනේ දරුණුකම ඔවුන් කෙරෙහි
වැගිරෙවුසේක; එයින් ඔවුන් වටකර
ඔවුන්ට ගිනිඇල්ලූ නුමුත්, ඔව්හු එය
නොදත්තෝය; එයින් ඔවුන් දවූ නුමුත්,
ඒක සිතට නොගත්තෝය.

## තෝරාගත් සෙනඟ මුදාගෙන අලුත්කරනු ලැබීම

**43** එම්බා යාකොබ්, තුඹ මැවුවාවූද
එම්බා ඉශ්‍රායෙල්, තුඹව සැදුවාවූද
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
භය නොවෙන්න, මක්නිසාද මම තුඹ
මුදාගතිමි; තුඹේ නම කියා හඬගැසීමි,
2 තුඹ මාගේය. තුඹ ජල මැදින් යන විට
මම තුඹ සමග සිටින්නෙමි; තුඹ ගංගා
මැදින් යන විට ඒවා තුඹට උඩින්
ගලායන්නේ නැත. තුඹ ගිනි මැදින් යන
විට නොදවෙන්නෙහිය; ගිනිදැල්ල තුඹ
3 කෙරෙහි නොඇවිළෙන්නේය. මක්නිසාද
මම තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය**,
තුඹේ ගැළවුම්කාරයා වන ඉශ්‍රායෙල්ගේ
ශුද්ධ තැනන්වහන්සේය; තුඹේ මිදීමේ
මිලය පිණිස මිසරයද තුඹ වෙනුවට
4 කුෂ් සහ සෙබාද දුනිමි. තුඹ මා ඉදිරියේ
අනර්ඝව ගරුකටයුතුවූ බැවින්ද, මා
තුඹට ප්‍රේමකළ බැවින්ද, තුඹ වෙනුවට
මිනිසුන්ද තුඹේ ජීවිතය වෙනුවට
5 ජනයන්ද දෙන්නෙමි. භය නොවෙන්න;
මක්නිසාද මම තුඹ සමග සිටිමි. තුඹේ
වංශය නැගෙනහිරින් ගෙනෙන්නෙමි,
බස්නාහිරින්ද තුඹ රැස්කරන්නෙමි; මම 6
උතුරු දිසාවට කථාකොට: දියන්නැයි
කියාත්, දකුණු දිසාවට: නවත්වා
නොගන්නැයි කියාත්, දුර සිට මාගේ
පුත්‍රයන්ද පොළොවේ කෙළවරින් මාගේ
දූවරුන්ද, එනම් මාගේ නාමය දරන්නාවූ 7
මාගේ ගෞරවය පිණිස මා විසින් මවා
තනා සැදුවාවූ සියල්ලන් ගෙනෙන්නැයි
කියාත් කියන්නෙමි. ඇස් ඇති අන්ධ 8
සෙනඟද කන් ඇති බිහිරන්ද පිටතට
ගෙනෙන්න. සියලු ජාතීහු එකට 9
රැස්වෙත්වා, ජනයෝද එකතුවෙත්වා.
ඔවුන්ගෙන් කවුරු මෙය දන්වා පළමු
දේවල් අපට ප්‍රකාශකරනවා ඇද්ද?
ඔව්හු තමුන්ගේ සාක්ෂිකාරයන්
ගෙනැවිත් තමුන් ධර්මිෂ්ඨ බව
පෙන්වත්වා. නැත්නම් ඔව්හු අසා:
ඒක සැබෑයයි කියත්වා. මම ඒ 10
තැනන්වහන්සේ බව තුඹලා දැනගෙන මා
විශ්වාසකර තේරුම්ගන්න පිණිස, තුඹලා
මාගේ සාක්ෂිකාරයෝව, මා විසින්
තෝරාගත් මාගේ මෙහෙකරුවාව
සිටින්නහුයයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. මා සිටින්ට පළමුවෙන් කිසි
දෙවිකෙනෙක් සාදනු ලැබුවේ නැත, මට
පසුව සිටින්නෙත් නැත. මම, මමම, 11
**ස්වාමීන්වහන්සේය**; මා ඇර වෙන
ගැළවුම්කාරයෙක් නැත. මමම දැන්වීමි, 12
මමම ගැළවීමි, මමම ප්‍රකාශකෙළෙමි,
අන් දෙවිකෙනෙක් තුඹලා අතරේ සිටියේ
නැත. එබැවින් තුඹලා මාගේ සාක්ෂි-
කාරයෝය, මම දෙවියන්වහන්සේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එසේය, 13
දවස ඇතිවූ තැන් පටන් මම උන්-
වහන්සේය; මාගේ අතින් මුදන්ට
පොහොසත්වූ කිසිවෙක් නැත. මම
ක්‍රියාකරන්නෙමි, වලක්වන්නේ කවුද?
තුඹලාගේ මිදුම්කාරයාණෝද ඉශ්‍රා- 14
යෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේද වන
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
මම තුඹලා උදෙසා බබිලෝනියට යවා,
ඔවුන් සියල්ලන්, එනම් කල්දිවරුන්,
ඔවුන්ගේ ප්‍රීතිඝෝෂා සහිත නැව්වලම

15 හිරකරුවන් කොට ගෙනෙන්නෙමි. මම
තුඹලාගේ ශුද්ධ තැනන්වහන්සේද
ඉශ්‍රායෙල්ගේ මැවුම්කාරයාද තුඹලාගේ
16 රජද වන **ස්වාමීන්වහන්සේය**. මුහුදෙහි
මාර්ගයක්ද මහ ජලයන් මැදින් පාරක්ද
17 සාදන්නාවූ, රථද අශ්වයන්ද සේනාවද
බලවන්තයන්ද පිටතට පමුණුවා, ඔවුන්
නොනැගිටින ලෙස එක්ව වැටීමට
සහ සිඳීයාමටද පහන්තිරය මෙන්
නිවීයාමටද සලස්වන්නාවූ **ස්වාමීන්-**
18 **වහන්සේ** මෙසේ කියනසේක: පළමු
කාරණා සිහි නොකරල්ලා. පුරාණ
19 දේවල්ද කල්පනා නොකරල්ලා. බලව,
මම අමුතු දෙයක් කරන්නෙමි; දැන්
ඒක අටගන්නවා ඇත; තුඹලා ඒක
නොදන්නහුද? මම කාන්තාරයෙහි
පවා මාර්ගයක්ද වනයෙහි ගංගාද
20 සාදන්නෙමි. මා විසින් තෝරාගත්
මාගේ සෙනඟට වතුර දෙන්ට මම
කාන්තාරයෙහි වතුරද වනයෙහි ගංගාද
දෙන නිසා, සිවලුන්ද පැස්බරුන්ද
ඇතුළුව වනයේ සත්ත්වයෝ මට ගෞරව-
21 කරන්නෝය. මා විසින් මටම උපදවාගත්
ඒ සෙනඟ මාගේ ප්‍රශංසාව දක්වනවා
22 ඇත. එහෙත්, යාකොබ්, තුඹ මට යාච්ඤා
නොකෙළෙහිය; ඉශ්‍රායෙල්, තුඹ මා ගැන
23 කලකිරුණෙහිය. තුඹේ දවන පූජාවල
එළු බැටළුවන් තුඹ මට ගෙනාවේවත්
තුඹේ යාගවලින් මට ගෞරව කෙළේවත්
නැත. මම ආහාර පූජාවලින් තුඹට
බරක් නොවීමි, දුම් පූජාවලින් තුඹ
24 නොවෙහෙසීමි. තුඹ මට සුවඳ දඬු
මිලේටගත්තේවත් තුඹේ පූජාවල තෙලෙන්
මා තෘප්තියට පැමිණෙවුවේවත් නැත.
තුඹේ පාපවලින් තුඹ මට බරක් වී,
තුඹේ අයුතුකම්වලින් මා වෙහෙසෙවුවා
25 පමණක්ය. මම, මමම, මා නිසා තුඹේ
පාපවල් සිහි නොකොට, තුඹේ වරද
26 මකාදමන තැනන්වහන්සේය. මට
මතක්කරවාපන්න: අපි එක්ව කාරණා
කියාගනිමු. තුඹ ධර්මිෂ්ඨ බව පෙනෙන
පිණිස තුඹම තුඹේ විත්තිය කියාපන්න.
27 තුඹේ මුල් පියා පව් කෙළේය, තුඹේ
තානාපතියෝද මට විරුද්ධව වරදකළෝය.
එබැවින් මම ශුද්ධස්ථානයේ අධිපතීන් 28
කෙලෙසා, යාකොබ් ශාපයටත් ඉශ්‍රායෙල්
නින්දවටත් පාවාදුන්නෙමි.

## පිළිම සෑදීම සහ රූප වන්දනාව නිෂ්ඵල බව

44
තුඹුත්, මාගේ මෙහෙකරුවූ
යාකොබ්, මා විසින් තෝරාගත්
ඉශ්‍රායෙල්, දැන් අසාපන්න. තුඹ මවු 2
කුසේ පටන් තුඹ සෑදුවාවූ, තුඹට
උපකාරකරන්නාවූ **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: මාගේ මෙහෙ-
කරුවාවූ යාකොබ්, මා විසින් තෝරාගත්
යෙෂුරුන්, භය නොවෙන්න. මක්නිසාද 3
පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියළි
භූමිය කෙරෙහි ජලධාරාද වගුරු-
වන්නෙමි. තුඹේ වංශය කෙරෙහි මාගේ
ආත්මයද තුඹේ දරුවන් කෙරෙහි මාගේ
ආශීර්වාදයද වගුරුවන්නෙමි. ඔවුන් වතුර 4
ළඟ තෘණ මෙන්ද දිය ඔයවල් ළඟ
නළා ගස් මෙන්ද වැඩෙනවා ඇත.
එක්කෙනෙක්: මම **ස්වාමීන්වහන්සේගේ-** 5
යයි කියනවා ඇත; තවත් කෙනෙක්
යාකොබ් යන නාමය තබාගන්නවා
ඇත; තවත් කෙනෙක්ද තමා **ස්වාමීන්-**
**වහන්සේට** අයිතියයි තමාගේ අතෙහි
ලියා තබා, ඉශ්‍රායෙල් යන දෙවෙනි
නාමයක් පවරාගන්නවා ඇත.
ඉශ්‍රායෙල්ගේ රජද ඔහුගේ මිදුම්කාරයාද 6
වූ ස්වාමිවූ සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: මම පළමුවෙනියාය,
අන්තිමයාත් මමය; මා ඇර වෙන
දෙවිකෙනෙක් නැත. මා විසින් පුරාණ 7
සෙනඟ පිහිටෙවූ තැන් පටන් මා වාගේ
ප්‍රකාශකර, යමක් දන්වා, පිළිවෙළට
මට කියන්නේ කවරෙක්ද? ඔව්හු
සිද්ධවෙන දේවල්ද පැමිණෙන්ට තිබෙන
දේවල්ද දන්වත්වා. තැතිගන්ටවත් 8
භයවෙන්ටවත් එපා; මම පුරාණයේ
පටන් තුඹට ප්‍රකාශකර නොදන්නු-
වෙම්ද? තුඹලා මාගේ සාක්ෂිකාරයෝය.
මා ඇර වෙන දෙවිකෙනෙක් ඇද්ද?
නැත, වෙන **පර්වතයක්** නැත; අන්

9 කිසිවෙකු ඇති බවක් නොදනිමි. රූප
සාදන සියල්ලෝම හිස්කමය; ඔවුන්ගේ
ප්‍රිය දේවලින් ප්‍රයෝජන නැත. ඔව්හු
ඔවුන්ගේම සාක්ෂිකාරයෝය; ඔව්හු
නොදකිති, නොදනිති. එබැවින් ඔව්හු
10 ලජ්ජාවට පැමිණෙන්නෝය. දෙවි
කෙනෙකු සාද ප්‍රයෝජන නැති රූපයක්
11 වාත්තුකෙළේ කවුද? බලව, ඒකට
සම්බන්ධව සිටින සියල්ලෝ ලජ්ජාවට
පැමිණෙති; කර්මාන්තකාරයෝ පවා
මනුෂ්‍යයෝය. ඔවුන් සියල්ලෝම රැස්වී
නැගිට සිටිත්වා; ඔව්හු භයව එක්ව
12 ලජ්ජාවන්නෝය. ආචාරියා පොරොවක්
සාදමින්, ගිනි අඟුරුවලින් වැඩකරමින්,
මිටිවලින් ඒක තළා, තමාගේ සවි
හස්තයෙන් ඒක සාදයි. එසේය, ඔහුට
බඩගිනිව ඔහුගේ ශක්තිය හීනවෙයි; ඔහු
13 වතුර නොබී ක්ලාන්තවෙයි. වඩුවා නූලක්
ගසා, අඳින කටුවකින් ඒක සලකුණු-
කර, යතුවලින් යතුගා, කවකටුවෙන්
සලකුණුකොට, ගෙදර වාසය කරන
පිණිස මනුෂ්‍යයෙකුගේ රූපයේ හැටියටත්
මනුෂ්‍යයෙකුගේ ශෝභනකම ප්‍රකාරයටත්
14 ඒක සාදන්නේය. ඔහු කිහිරි ගස්
කපාගන්නේය, ඔහු තිර්සා ගහක්ද
අලෝන ගහක්ද රැගෙන වනයේ ගස්
අතරෙහි වවන්නේය. ඔහු දේවදර ගහක්
15 හිටවයි, ඒක වර්ෂාවෙන් වැවේ. එවිට
ඒක ගිනිදල්වීම පිණිස මනුෂ්‍යයෙකුට
ලැබේ; ඔහු එයින් රැගෙන ගිනිතපින්නේය;
එසේය, එය පත්තුකොට රොටිද පුලුස්-
සන්නේය. එයින් ඔහු දෙවිකෙනෙකුත්
සාද නමස්කාරකරන්නේය. එයින්
රූපයක්ද තනා ඊට වැඳවැටෙන්නේය.
16 ඔහු එයින් කොටසක් ගින්නෙන්
දවන්නේය, කොටසකින් මස් පිස
කන්නේය; ඔහු කෑම පුලුස්සා කා
තෘප්තියට පැමිණෙන්නේය. එසේය, ඔහු
ගිනි තපා: ඔහෝ මම උණුසුම්වීමි,
17 ගින්දර දුටිමියි කියන්නේය. ඉතිරි
කොටසෙන් ඔහු රූපයක් දෙවිකෙනෙක්
පිණිස සාදගන්නේය. ඔහු ඊට වැඳ වැටී
නමස්කාරකරමින් යාච්ඤාකොට: ඔබ
මාගේ දෙවියෝය; ඒ නිසා මා ගැළෙවුව
මැනවයි කියන්නේය. ඔව්හු නොදනිති, 18
ඔව්හු කල්පනා නොකෙරෙති. මක්නිසාද
නොපෙනෙන හැටියට ඔවුන්ගේ ඇස්ද
තේරුම් නොගන්න හැටියට ඔවුන්ගේ
සිත්ද වසා තිබේ. මම කොටසක් දවා 19
එහි අඟුරු පිට රොටි පිළිස්සීමි; මස්
පුලුස්සා කෑවෙමි; ඉතිරි ඒවායෙන්
පිළිකුල් දෙයක් සාද ලී කඳකට
වැඳවැටෙම්දැයි කියන්ට කිසිවෙක් සිතට
ගන්නේවත් ඒ අයට දැනගැන්මද තේරුමද
ඇත්තේවත් නැත. ඔහු කන්නේ අළුය. 20
තමාගේ ප්‍රාණය ගළවාගන්ටවත්: මාගේ
දකුණතේ බොරුවක් තිබෙනවා නොවේදැයි
කියන්ටවත් බැරි ලෙස ඔහුගේ සිත
රැවටී, ඔහු මුළාව ගොස් සිටියි.

## ස්වාමීන්වහන්සේ නැවත පොරොන්දුවීම

එම්බා යාකොබ්, ඉශ්‍රායෙල්, මේ දේවල් 21
සිහිකරපන්න, මක්නිසාද තුඹ මාගේ
මෙහෙකරුවාය. මම තුඹ සෑදීමි; තුඹ
මාගේ මෙහෙකරුවාය. ඉශ්‍රායෙල්, තුඹ
මාගේ සිහියෙන් තොර නොවන්නෙහිය.
මම තුඹේ අපරාධ වලාපටලයක් මෙන්ද 22
තුඹේ පාප වලාකුළක් මෙන්ද මකා-
දමුවෙමි. මා වෙතට හැරී වරෙන්න; මක්-
නිසාද මම තුඹ මිදූවෙමි. ස්වර්ගයෙනි, 23
ගී කියාපල්ලා, මක්නිසාද ස්වාමීන්-
වහන්සේ ඒක කළසේක; පොළොවේ පහත්
තැන් සෝෂාකරපල්ලා; කඳුද වනයද
එහි සියලු ගස්ද යන තුඹලා ප්‍රීතියෙන්
ශබ්ද නගාපල්ලා. මක්නිසාද ස්වාමීන්-
වහන්සේ යාකොබ් මිදූසේක, ඉශ්‍රායෙල්
කරණකොටගෙන ගෞරව ලබාගන්න-
සේක.

තුඹේ මිදුම්කාරයාවූ, කුසේ පටන් 24
තුඹ සෑදුවාවූ ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක: ස්වාමිවූ මම සියල්ලම
කරන්නාවූ තැනන්වහන්සේය; මම වනාහි
තනියම ආකාශ මණ්ඩලය දිගහරින්-
නාවූ, අන් කිසිවෙකු නැතුව පොළොව
අතුරන්නාවූ තැනන්වහන්සේය. මම 25
බොරුකාරයන්ගේ ලකුණු හිස්කරන්නාවූ,

පේනකියන්නන් උමතු කරන්නාවූ.
ශාස්ත්‍රවන්තයන් පස්සට හරවන්නාවූ.
ඔවුන්ගේ දැනගැන්ම මෝඩකමට
26 හරවන්නාවූ තැනන්වහන්සේය. මම
වනාහි තමන් මෙහෙකරුවාගේ වචනය
ස්ථිරකරන්නාවූ. තමන් පණිවිඩ-
කාරයන්ගේ මන්ත්‍රණය ඉෂ්ටකරන්නාවූ.
වැසියෝ එහි සිටින්නෝය කියා
යෙරුසලම ගැනද, ගොඩනගනු ලැබේය
කියා යූදහි නුවරවල් ගැනද: එහි පාළු
ඉඩම් උස්සන්නෙමියි කියාද කියන්නාවූ
27 තැනන්වහන්සේය. ගැඹුරට: හිඳියන්න
කියාද. මම නුඹේ ගංගා හිඳවන්නෙමියි
කියාද කියන තැනන්වහන්සේය.
28 කෝරෙෂ් ගැන: ඔහු මාගේ එඬේරාය,
ඔහු මාගේ මුළු කැමැත්ත ඉෂ්ටකරමින්—
යෙරුසලම ගොඩනගනු ලැබේය කියාද
මාළිගාවේ අත්තිවාරම් තබනු ලැබේය
කියාද කියනවා ඇතැයි කියන තැනන්-
වහන්සේය.

## ස්වාමීන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තා වන කෝරෙෂ්

45 තමන්ගේ අභිෂේකලත් තැනැත්-
තාවූ කෝරෙෂ් ඉදිරියෙහි ජාතීන්
යටත්කිරීමටත් රජවරුන්ගේ ඉහටි
ලිහීමටත් දෙරටු නොවසන ලෙස ඔහු
ඉදිරියෙහි දෙරවල් ඇරීමටත් ඔහුගේ
දකුණත අල්ලාගත්තාවූ ස්වාමීන්වහන්සේ
2 ඔහුට මෙසේ කියනසේක: මම නුඹට
පෙරටුවෙන් ගොස් රළු තැන් සමතලා-
කොට. පිත්තල දෙරවල් බිඳදමා. යකඩ
3 අගුල් කපාදමන්නෙමි. නුඹේ නම කියා
නුඹ කැඳවාගන්නේ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ වන මම බව නුඹ
දැනගන්න පිණිස අන්ධකාරයේ වස්තුද
රහස් තැන්වල නිධානද නුඹට දෙන්-
4 නෙමි. මාගේ මෙහෙකරුවූ යාකොබ්
නිසාත් මා තෝරාගත් ඉශ්‍රායෙල්
නිසාත් නුඹේ නම කියා කැඳවීමි. නුඹ
මා නැඳින්න නුමුත් නුඹට නමක්
5 තැබීමි. මම ස්වාමීන්වහන්සේය. වෙන
කෙනෙක් නැත: මා ඇර වෙන දෙවි-
කෙනෙක් නැත. මා ඇර අන් කෙනෙක් 6
නැති බව නැගෙනහිරද බස්නාහිරද
පටන් මනුෂ්‍යයන් දැනගන්නා පිණිස නුඹ
මා නැඳින්න නුමුත් මම නුඹේ ඉහටිය
බඳින්නෙමි. මම ස්වාමීන්වහන්සේය.
වෙන කෙනෙක් නැත. එළිය සාදන්නාවූ. 7
අන්ධකාරය උපදවන්නාවූ, සමාදානය
දෙන්නාවූ. විපත උපදවන්නාවූ තැනන්-
වහන්සේ වෙමි: මම මේ සියල්ල සිදුකරන
ස්වාමීන්වහන්සේයයි කියනසේක.

## ඉශ්‍රායෙල්ගේ ආරක්ෂාව හා මිදීම ස්වාමීන්වහන්සේ තුළ පමණක් බව

එම්බා අහස. ඉහළින් පොද හෙළව. 8
වලාකුල් ධර්මිෂ්ඨකම වගුරුවත්වා.
ගැළවීම හටගන්න පිණිස පොළොව
ඇරේවා. එකට වැවෙන පිණිස
ධර්මිෂ්ඨකමද නැගී ඒවා; ස්වාමීන්-
වහන්සේ වන මම ඒක සැලැස්වීමි.
තමාගේ මැවුම්කාරයා හා සමග 9
පොරට සිටින්නාට දුක්වේ! මැටි කැබිලිති
අතරේවූ කැබිලිත්තක හැටි! නුඹ හදන්නේ
මොකක්ද කියා මැටි ඒවා අඹන්නාට
කියන්ටවත් නුඹ හැදූ දෙය විසින්:
ඔහුට අත් නැතැයි කියන්ටවත් යුතුද?
නුඹ ජාතකකරන්නේ මොකක්දැයි 10
පියෙකුටවත් නුඹ වදන්නේ කුමක්දැයි
ස්ත්‍රියෙකුටවත් කියන්නාට දුක්වේ.
ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේද 11
ඔහුගේ මැවුම්කාරයාද වූ ස්වාමීන්-
වහන්සේ මෙසේ කියනසේක: මතු
පැමිණෙන දේ ගැන මාගෙන් අසාපල්ලා:
මාගේ පුත්‍රයන් ගැනද මාගේ අතේ
ක්‍රියාවල් ගැනද මට අණකරපල්ලා.
පොළොව සාද ඒ පිට මනුෂ්‍යයා මැවුවේ 12
මමය. මා විසින්. එසේය. මාගේ
අත්වලින් අහස විදහනලද්දේය, මම
එහි මුළු සේනාවට නියමකෙළෙමි. ඔහු 13
ධර්මිෂ්ඨකමින් නැගිටෙවුවේ මමය.
ඔහුගේ සියලු මාර්ග සමතලාකරන්නෙමි.

ඔහු මාගේ නුවර ගොඩනගන්නේය,
පිටවහල්ව සිටින මාගේ ජනයන්
නිදහස්කරන්නේය; එසේ කරන්නේ
මිලයක්වත් තෑග්ගක්වත් පිණිස නොවේ-
යයි සේනාවල ස්වාමීන්වහන්සේ කියන-
සේක.
14 ස්වාමීන්වහන්සේ කියනසේක්:
මිසරයේ සම්පත්ද කුෂ්හි ලාභයද උස
ඇති මනුෂ්‍යයෝවූ සෙබාවරුද නුඹ
වෙතට පැමිණ නුඹට අයිතිවන්නෝය;
ඔව්හු නුඹ පස්සේ එන්නෝය; ඔව්හු
දම්වැල් සහිතව නුඹ වෙතට පැමිණ
නුඹට වැඳ: සැබවින්ම නුඹ වෙත
දෙවියන්වහන්සේ සිටිනසේක; උන්-
වහන්සේ ඇර අන් දෙවිකෙනෙක්
ඇත්තේම නැතැයි කියමින් නුඹට
කන්නලව්කරන්නෝයයි කියනසේක.
15 ගැළවුම්කාරවූ ඉශ්‍රායෙල්ගේ දෙවියන්-
වහන්ස, සැබවින්ම ඔබ සැඟවෙන
16 දෙවිකෙනෙක්ය. දේවරූප සාදන්නෝ
සියල්ලෝම ලජ්ජාවී, නින්දාවට පත්ව,
එක්ව වියවුල් බවට පැමිණෙන්නෝය.
17 නුමුත් ස්වාමීන්වහන්සේ විසින් සදාකාල
ගැළවීමකින් ඉශ්‍රායෙල් ගළවනු
ලබන්නෝය. නුඹලා සදාකාලයටම
ලජ්ජාවටවත් වියවුල් බවටවත් නො-
පැමිණ සිටිනවා ඇත.
18 මක්නිසාද ස්වර්ගයන් මැවූවාවූ,
පොළොව මවා සාදා එය පිහිටෙවූවාවූ,
එය හිස්කමට නොමවා වාසය පිණිස
එය සෑදූවාවූ දෙවියන්වහන්සේ වන
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
මම ස්වාමීන්වහන්සේය, වෙන කෙනෙක්
19 නැත. මා කථාකෙළේ රහසින් නොවේය,
පොළොවේ අඳුරු තැනකදී නොවේය.
නිකමට මා සොයාපල්ලායයි
යාකොබ්ගේ වංශයට නොකීවෙමි.
ස්වාමීන්වහන්සේ වන මම ධර්මිෂ්ඨ
20 දේ කියමි, යුතු දේ ප්‍රකාශකරමි. ජාතීන්
අතරෙන් ගැළවී සිටින තැනැත්තෙනි,
රැස්වී ඇවිත් එක්ව ළංවෙයල්ලා.
තමුන්ගේ ලී රූප උසුලාගෙන යන්නාවූ,
ගළවන්ට බැරි දෙවිකෙනෙකුට යාච්ඤා
21 කරන්නාවූ අයට දැනුම නැත. ඒක දන්වා,
ඉදිරියට ගෙනෙල්ලා; එසේය, ඔව්හු එක්ව
මන්ත්‍රණයකෙරෙත්වා. මේක පුරාණයේ
සිට ප්‍රකාශකළේත් පූර්වයේ පටන්
දන්නුවේත් කවුද? ස්වාමීන්වහන්සේ වන
මම නොවෙම්ද? මා ඇර වෙන දෙවි-
කෙනෙක් නැත; මම ධර්මිෂ්ඨවූ දෙවි-
කෙනෙක්ය, ගැළවුම්කාරයෙක්ය; වෙන
කෙනෙක් නැත. පොළොවේ සීමාවල 22
සිටින සියල්ලෙනි, මා වෙතට හැරී
ගැළවියල්ලා. මක්නිසාද මම දෙවියන්-
වහන්සේය, වෙන කෙනෙක් නැත. සියලු 23
දණහිස් මට නැමෙනවා ඇත, සියලු
දිව්ද මා ගැන දිවුරනවා ඇත කියා
මම මා ගැනම දිවුළෙමි, අවලංගු නො-
වන ධර්මිෂ්ඨකමේ වචනයක් මාගේ
මුඛයෙන් නික්මුණේය. ධර්මිෂ්ඨකමත් 24
බලයත් තිබෙන්නේ ස්වාමීන්වහන්සේ
තුළ පමණක්ය කියා කෙනෙක් මට
කියනවා ඇත. මනුෂ්‍යයෝ උන්වහන්සේ
වෙතට එන්නෝය, උන්වහන්සේ
කෙරෙහි කෝපව සිටි සියල්ලෝද
ලජ්ජාවට පැමිණෙන්නෝය. මුළු 25
ඉශ්‍රායෙල් වංශය ස්වාමීන්වහන්සේ තුළම
ධර්මිෂ්ඨකරනු ලැබ පාරට්ටුකරගන්නවා
ඇත.

## ස්වාමීන්වහන්සේගේ හා බබිලෝනියේ දෙවිවරුන්ගේ වෙනස

46
බේල් පහත්වෙයි, නෙබෝ
නැමෙයි; ඒවායේ රූප මෘගයින්
පිටද සිව්පාවුන් පිටද තිබේ. නුඹලා
විසින් ගෙනගිය ඒවා වෙහෙසවෙන
මෘගයන් පිට බරක් කොට පටවා තිබේ.
ඒ දෙවිවරු එක්ව නැමී පහත්වෙති; ඒ 2
බර ගළවාගන්ට නොහැකිව, තුමූම
වහල්කමට ගොස් සිටිති.
ගර්භයේ සිට මා විසින් උසුලනලද්දවූ, 3
කුසේ සිට ගෙනයනලද්දවූ යාකොබ්
වංශය සහ ඉශ්‍රායෙල් වංශයේ ඉතිරිවූ
සියල්ලෙනි, මාගේ වචන අසාපල්ලා:
මහලු වයස දක්වාත් මම එසේමය, 4
හිස පැසීම දක්වාත් මම නුඹලා
උසුලන්නෙමි. මම සෑදීමි, මමම නුඹලා
දරාගෙන මමම උසුලාගෙන ගළවන්නෙමි.

5 අප ඒකාකාර වන සේ නුඹලා මා
සමාන කරන්නෙත් ඒක සම කරන්නෙත්
6 සදෘශ කරන්නෙත් කාටද? වස්තුකාරයෝ
මල්ලෙන් ගන්න රන්ද රිදීද තරාදියෙන්
කිරා, රන්කරුවෙකු කුලියට ගෙන,
ඒවායින් දෙවිකෙනෙකු සාදවාගෙන, ඊට
7 වැඳවැටී නමස්කාරකෙරෙති. ඔව්හු එය
කර පිට තබා, උසුලා, එය ගෙන ගොස්,
ඊට නියම ඉඩමේ තබති, එයද සිටෙවු
ස්ථානයෙන් නොයයි. එසේය, යමෙක්
ඊට යාච්ඤාකරන නුමුත් උත්තර දෙන්ට-
වත් විපතෙන් ඔහු ගළවන්ටවත් එයට
බැරිය.
8 මේක සිහිකොට මනුෂ්‍යයන් මෙන්
හැසිරියල්ලා. ද්‍රෝහිකාරයෙනි, ඒක සිතට
9 ගනිල්ලා. පුරාණයේ පළමු කාරණා
සිහිකරපල්ලා. මක්නිසාද මමම
දෙවියන්වහන්සේය, වෙන කෙනෙක් නැත;
මම දෙවියන්වහන්සේය, මා සමාන
10 කෙනෙක් නැත. මම වනාහි අන්තිමය
මුල පටන්ද තවම සිද්ධනූණ දේ
පුරාණයේ පටන්ද දන්වන්නාවූ: මාගේ
මන්ත්‍රණ පවත්නේය කියාත් මාගේ මුළු
කැමැත්ත ඉෂ්ටකරන්නෙමියි කියාත්
11 කියන්නාවූ තැනන්වහන්සේය. මම
නැගෙනහිරින් ගිජු පක්ෂියෙක්ද දුර
දේශයකින් මාගේ මන්ත්‍රණයේ
මනුෂ්‍යයාද කැඳවාගන්න තැනන්-
වහන්සේය. එසේය, මම කියා තිබෙන්-
නාක්මෙන්ම ඒක පමුණුවන්නෙමි, මම
යෝජනාකර තිබෙන්නාක්මෙන්ම ඒක
12 කරන්නෙමි. ධර්මිෂ්ඨකමින් ඈත්ව සිටින
දැඩි සිත් ඇත්තෙනි, මාගේ වචන
13 අසාපල්ලා. මාගේ ධර්මිෂ්ඨකම
ළංකරන්නෙමි, ඒක ඈත්ව නොතිබෙන්-
නේය, මාගේ ගැළවීමද ප්‍රමාද නො-
වන්නේය; මාගේ ගෞරවයවූ ඉශ්‍රායෙල්ට
සියොන්හි ගැළවීම දෙන්නෙමි.

## බබිලෝනිය කෙරෙහි වූ විනිශ්චය

47 කන්‍යාවවූ බබිලොන් දියණිය,
බැස ධූලියෙහි හිඳගනින්න; කල්-
දිවරුන්ගේ දියණිය, සිංහාසනයක් නැතුව
බිම හිඳගනින්න. මක්නිසාද: මෘදුවූ
සිව්මැළිවූ තැනැත්තියයි තවත් නුඹට
කියනු නොලැබේ. ඇඹරුම් ගල් ගෙන 2
පිටි අඹරාපන්න. නුඹේ මුහුණු වැස්ම
අහක්කොට, පිට ඇඳුම ගළවා දමා,
කකුල් නග්නකර, ගංගාවලින් එගොඩ-
වෙයන්න. නුඹේ නග්න භාවය ප්‍රකාශ- 3
වන්නේය, නුඹේ ලජ්ජාවත් පෙනෙන්නේය.
මම පළිගන්නෙමි, *කිසි මනුෂ්‍යයෙකු
පිළි නොගන්නෙමි. අපේ මිදුම්කාරයා 4
නම් සේනාවල **ස්වාමීන්වහන්සේ** යන
නාමය ඇති ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
තැනන්වහන්සේය. කල්දිවරුන්ගේ 5
දියණිය, නිශ්ශබ්දව ඉඳ අන්ධකාරයට
ඇතුල්වෙයන්න. මක්නිසාද නුඹ:
රාජ්‍යවල ස්වාමිදුවයයි තවත් කියනු
නොලබන්නීය. මම මාගේ සෙනඟ 6
කෙරෙහි උදහස්වී, මාගේ උරුමය
කෙලෙහා, ඔවුන් නුඹ අතට දුනිමි. නුඹ
ඔවුන්ට අනුකම්පාවක් නොපෙන්වා,
මහල්ලන් පිට නුඹේ වියගහ ඉතා බර
කෙළෙහිය. මම සැම කල්ම ස්වාමිදුවව 7
සිටින්නෙමියි නුඹ කීවෙහිය. මෙසේ නුඹ
මේ දේවල් සිතට ගත්තේවත්, එහි අන්තිමය
සිහිකළේවත් නැත.
ඉතින් සැප ජීවිකාවට ඇලුම්වූ, 8
නොසැලකිලිකමින් වාසයකරන්නාවූ:
තවත් කෙනෙක් නැතුව මමම සිටිමියි
කියාද මා වැන්දඹුවක් වෙන්නේවත්
දරුවන් නැතිවීමක් අත්දකින්නේවත්
නැතැයි කියාද සිත තුළ කියාගන්නාවූ
නුඹ මේක අසාපන්න. නුමුත් ඒ දෙකම 9
එනම් දරුවන් නැතිවීමද වැන්දඹුකමද
එක දවසේම හදිසියෙන් නුඹට
පැමිණෙන්නේය. නුඹේ බොහෝ මායම්ද
නුඹේ රාශි ගණන් මන්ත්‍රද තිබෙද්දීත්
ඒවා සම්පූර්ණයෙන්ම නුඹ පිටට
පැමිණෙන්නේය. මක්නිසාද නුඹේ 10
දුෂ්ටකමෙහි නුඹ නොසැලකිලිව සිට:
මා දකින කෙනෙක් නැතැයි කීවෙහිය;
නුඹේ ප්‍රඥාව හා නුඹේ දැනගැන්ම
කරණකොටගෙන නුඹ මුළාවී: තවත්

*නොහොත්—කිසි මනුෂ්‍යයෙක් මට විරුද්ධ නොවන්නේය.

කෙනෙක් නැතුව මමම සිටිමියි නුඹේ
11 සිත තුළ සිතාගත්තෙහිය. ඒ නිසා
විපත්තිය නුඹ පිටට පැමිණෙන්නේය;
ඒක මතුරාහරින්ට නුඹ නොදන්නෙහිය.
නුඹට පහකරගන්ට බැරි නාස්තියක්
නුඹ පිටට වැටෙන්නේය. නුඹ නොදන්න
විනාශයක්ද හදිසියෙන් නුඹ පිටට
12 පැමිණෙන්නේය. ඉතින් නුඹේ බාල
වයසේ පටන් නුඹ විසින් වෙහෙස ඇතුව
පුරුදුකළාවූ නුඹේ මන්ත්‍රද බොහෝවූ
නුඹේ මායම්ද භාවිතාකරපන්න;
සමහරවිට නුඹට වාසි ලබාගත
හැකිවන්නේය, සමහරවිට නුඹ සතුරන්ට
13 භය උපදවන්නෙහිය. නුඹේ බොහෝ
මන්ත්‍රණවලින් නුඹ වෙහෙසවී සිටිනෙ-
හිය. ඉතින් නක්ෂත්‍රකාරයෝද තාරකා
බලන්නෝද අමාවක්වලදී කාරණා
දන්වන්නෝද නැගිට, නුඹ පිටට
පැමිණෙන දේවලින් නුඹ ගළවත්වා.
14 බලව, ඔව්හු ඉපනැලි මෙන් වන්නෝය;
ගින්න ඔවුන් දවන්නේය; ඔව්හු ගිනිදැල්ලේ
බලයෙන් තමුන්ම ගළවා නොගන්නෝය.
එය ගිනි තපින්ට අඟුරක්වත් ළංව ඉන්ට
15 ගින්නක්වත් නොවන්නේය. නුඹ යම් යම්
දේ සමග වෙහෙසුණෙහිද ඒවා නුඹට
එයාකාර වන්නේය. නුඹේ යෞවන
වයසේ පටන් නුඹ සමග වෙළඳම්කළ
අයවල් තම තමුන්ගේ දිශාවලට අහක්ව
යන්නෝය; නුඹ ගළවන්ට කිසිවෙක්
නොවන්නේය.

## ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසකර බබිලෝනියෙන් පිටතට ඊමට ආරාධනාව

48 ඉශ්‍රායෙල් යන නාමය දරන්නාවූ,
යූද උල්පතෙන් නික්මුණාවූ,
සැබෑකමෙන්වත් ධර්මිෂ්ඨකමෙන්වත්
නොවන නුමුත් ස්වාමීන්වහන්සේගේ
නාමයෙන් දිවුරා ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේ සඳහන්කරන්නාවූ
තැනැත්තන් වන යාකොබ්ගේ වංශය,
2 මේක අසාපල්ලා. මක්නිසාද තමුන් ශුද්ධ
නුවරට අයිතියයි කියාගන ඔව්හු
සේනාවල ස්වාමීන්වහන්සේ යන නාමය
ඇති, ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ
කෙරෙහි පිහිටා සිටිති. පළමු කාරණා 3
පූර්වයේ පටන් දන්වීමි; එසේය, ඒවා
මාගේ මුඛයෙන් නික්මුණේය, මමද ඒවා
ප්‍රකාශකෙළෙමි. මම ඒවා හදිසියෙන්
කෙළෙමි, ඒවා සිදුවුණේය. නුඹ දඩි 4
බවත් නුඹේ බෙල්ල යකඩ නහරයක්
බවත් නුඹේ නළල පිත්තල බවත් මා
දන්නා බැවින්, මම පූර්වයේ පටන් නුඹට 5
දන්වා, එය පැමිණෙන්ට පළමුවෙන්
නුඹට ප්‍රකාශකෙළෙමි. එසේ කළේ:
මාගේ දේව රූපය ඒවා කෙළේය කියාද
මාගේ කැටයම් රූපය සහ මාගේ වාත්තු
පිළිමයත් ඒවා නියමකෙළේය කියාද
නුඹ නොකියන පිණිසය. නුඹ එය අසා 6
තිබේ; මේ සියල්ල බලාපන්න; නුඹලාත්
දන්වන්නේ නැද්ද? මෙතැන් පටන් අමුතු
දේවල්ද නුඹ නොදන්නාවූ සඟවා තිබෙන
දේවල්ද නුඹට ප්‍රකාශකරමි. පූර්වයේ 7
පටන් නොව දැන්ම ඒවා උපදවනලද්දේය.
බලව, මම ඒවා දැනගතිමියි නුඹ
නොකියන පිණිස අද දවසට පළමුවෙන්
නුඹ ඒවා නොඇසුවෙහිය. එසේය, නුඹ 8
ඇසුවේවත් දැනගත්තේවත් නැත; එසේය,
පූර්වයේ පටන් නුඹේ කන් ඇරිනු
ලැබුවේවත් නැත. මක්නිසාද නුඹ
ඉතා ද්‍රෝහිව ක්‍රියාකළ බවද කුසේ
පටන් අපරාධකාරයෙකැයි නුඹට
කියනලද බවද මම දැනගෙන සිටියෙමි.
මාගේ නාමය නිසා මාගේ කෝපය 9
ප්‍රමාදකරන්නෙමි, නුඹ සිඳ නොදමන
පිණිස මාගේ ප්‍රශංසාව උදෙසා නුඹ
ගැන එය නවත්වන්නෙමි. බලව, මම 10
නුඹ පවිත්‍රකෙළෙමි, නුමුත් රිදී මෙන්
නොවේය; පීඩා නමැති උදුණේදී නුඹ
තෝරාගතිමි. මා නිසා, මා නිසාම, 11
ඒක කරන්නෙමි; මක්නිසාද මාගේ
නාමය කෙලහෙන්ට දෙන්නේ
කොහොමද? මාගේ ගෞරවය වෙන
කෙනෙකුට නොදෙන්නෙමි.
එම්බා යාකොබ්, මා විසින් 12
කැඳවාගත් තැනැත්තාවූ ඉශ්‍රායෙල්,
මට ඇහුම්කන්දියන්න. මම [සඳකල්]

සිටින්නාවූ තැනන්වහන්සේය; මම
පළමුවෙනියාය; අන්තිමයාත් මමය.
13 එසේය, මාගේ හස්තය පොළොව
පිහිටෙවූවේය, මාගේ දකුණතද අහස
අතුරා තැබුවේය. මා ඒවාට අඬගසන
විට ඒවා එක්ව නැගිට සිටින්නෝය.
14 තුඹලා සියල්ලෝම රැස්වී අසාපල්ලා;
ඔවුන් අතරෙන් මේ දේ දන්නුවේ කවුද?
**ස්වාමීන්වහන්සේ** ඔහුට ප්‍රේමකළසේක.
ඔහු උන්වහන්සේගේ කැමැත්ත බබි-
ලෝනිය කෙරෙහි ඉෂ්ටකරනවා ඇත,
ඔහුගේ හස්තය කල්දිවරුන් පිටට
15 පැමිණෙන්නේය. මමම කථාකෙළෙමි;
එසේය, මම ඔහු අඬගසාගතිමි. ඔහු
ගෙන්වාගතිමි, ඔහු තමාගේ මාර්ගය
16 සඵලකරගන්නේය. මා ළඟට ඇවිත්
මේක අසාපල්ලා; මා පටන්ගැන්මේ
සිට රහසින් කථාකළා නොවේය; ඒක
ඇතිවූ කාලයේ සිට මම එහි සිටිමි.
දැනුදු ස්වාමිවූ *දෙවියන්වහන්සේ මාත්
උන්වහන්සේගේ ආත්මයත් එවූසේක.
17 තුඹේ මිදුම්කාරයාද ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
තැනන්වහන්සේද වන **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: ප්‍රයෝජන ලබා-
ගැනීමට තුඹට උගන්වන්නෙත් තුඹ යා
යුතු මාර්ගයෙහි තුඹ ගෙනයන්නෙත්
තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** වන
18 මමය. අනේ, තුඹ මාගේ ආඥවලට
ඇහුම්කන්දුන්නා නම් තුඹේ සමාදනය
ගංගාවක් මෙන්ද තුඹේ ධර්මිෂ්ඨකම
19 මුහුදේ රැළ මෙන්ද වන්නේය. තුඹේ
වංශය වැලි මෙන්ද තුඹෙන් පැවත
එන්නෝ එහි වැලිඇට මෙන්ද වන්නෝය.
ඔහුගේ නම මා ඉදිරියෙන් සිඳදමනු
ලබන්නේවත් නැතිකරනු ලබන්නේවත්
නැත.
20 බබිලෝනියෙන් පිටතට පලයල්ලා,
කල්දිවරුන් වෙතින් දුවපල්ලා; ප්‍රීතිමත්
හඬින් මෙය දන්වා, ප්‍රකාශකර,
පොළොවේ කෙළවර දක්වා එය පතළ
කරපල්ලා. එනම්: **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ මෙහෙකරුවාවූ යාකොබ්

*නොහොත්–දෙවියන්වහන්සෙත්
උන්වහන්සේගේ ආත්මයත් මා එවූසේක.

මිදූසේක. උන්වහන්සේ ඔවුන් කාන්තාරය 21
මැදින් ගෙනගිය විට ඔවුන්ට පිපාසා
වුණේ නැත. උන්වහන්සේ ඔවුන් උදෙසා
පර්වතයකින් වතුර ගලන්ට සැලැස්වූ-
සේක. උන්වහන්සේ පර්වතය විවරකළ
විට වතුර ගලා ආයේයයි කියාපල්ලා.
දුෂ්ටයන්ට සමාදනය නැතැයි **ස්වාමීන්**- 22
**වහන්සේ** කියනසේක.

## ස්වාමීන්වහන්සේගේ සේවකයාවූ ඉශ්‍රායෙල්ගේ විශාල මෙහෙය

49
ද්වීපයෙනි, මාගේ බස්
අසාපල්ලා; දුර සිටින සෙනගෙනි,
ඇහුම්කන්දියල්ලා. **ස්වාමීන්වහන්සේ**
කුසේ පටන් මා කැඳවා, මාගේ මවු
ගර්භයේ පටන් මාගේ නම සඳහන්කළ-
සේක. උන්වහන්සේ මාගේ මුඛය තියුණු 2
කඩුවක් මෙන් කොට, තමන්ගේ අත්
සෙවණෙහි මා සැඟවූසේක; උන්වහන්සේ
මා මුවහත්කර තිබෙන ඊගසක් මෙන්
කොට, තමන්ගේ කොපුවේ වසා තබා:
ඉශ්‍රායෙල්, තුඹ මාගේ මෙහෙකරුවාය; 3
තුඹ කරණකොටගෙන ගෞරව
ලබාගන්නෙමියි මට කීසේක. තුමූත් 4
මම කථාකොට: මම පලක් නැතුව
වෙහෙසුණෙමි, හිස්කමටත් නිෂ්ඵලකමටත්
මාගේ ශක්තිය නැතිකරගතිමි. එසේ වී
තුමුත් සැබවින්ම මාගේ විනිශ්චය
**ස්වාමීන්වහන්සේ** වෙතද මාගේ විපාකය
මාගේ දෙවියන්වහන්සේ වෙතද තිබේ-
යයි කීමි. ඉතින් තමන් වෙතට යාකොබ් 5
හැරවීමටත් ඉශ්‍රායෙල්වරුන් තමන්
වෙතට රැස්කිරීමටත් කුසේ පටන් මා
තමන්ට සේවකයෙක් කරගත්තාවූ
**ස්වාමීන්වහන්සේ** මෙසේ වදරනසේක:
(මක්නිසාද **ස්වාමීන්වහන්සේගේ** ඇස්
හමුයෙහි මට ගෞරව ඇත්තේය, මාගේ
දෙවියන්වහන්සේ මාගේ බලයව සිටින-
සේක.) එසේය, උන්වහන්සේ කථාකොට: 6
යාකොබ්ගේ ගෝත්‍ර නැගිටවීමටත්
ආරක්ෂා කරනලද ඉශ්‍රායෙල්වරුන්
හැරවීමටත් තුඹ මාගේ සේවකයා
වුණාට මදිය. පොළොවේ කෙළවර

දක්වා මාගේ ගැළවීම වන පිණිස
නුඹ අන්‍ය ජාතීන්ට එළියක් කොටද
7 දෙන්නෙමියි කියනසේක. ඉශ්‍රායෙල්-
වරුන්ගේ මිදුම්කාරයාද ඔවුන්ගේ ශුද්ධ
තැනන්වහන්සේද වන **ස්වාමීන්වහන්සේ**
මනුෂ්‍යයන් විසින් පුළුකරන්නාවූ, ජාතිය
විසින් පිළිකුල්කරන්නාවූ, ආණ්ඩු-
කාරයන්ගේ සේවකයෙක්වූ තැනැත්තාට
කථාකොට: විශ්වාසව සිටින්නාවූ,
නුඹව තෝරාගත් ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
තැනන්වහන්සේ වන **ස්වාමීන්වහන්සේ**
නිසා රජවරු දැක නැගිටින්නෝය;
අධිපතිහු නමස්කාරකරන්නෝයයි
8 කියනසේක. **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: පිළිගත යුතු කාලයකදී මම
නුඹට උත්තරදී, ගැළවීමේ දවසකදී
නුඹට උපකාරකෙළෙමි. දේශය ප්‍රකෘතිමත්
කිරීමටත් පාළුවූ උරුමවල් ඔවුන්ට
9 හිමිකරදීමටත්, හිරකාරයන්ට: පිටතට
වරෙල්ලායයිද අඳුරේ සිටින්නන්ට:
පෙනියල්ලායයිද කීමටත්, මම නුඹ
ආරක්ෂා කොට සෙනඟට ගිවිසුමක්
කොට දෙන්නෙමි. මාර්ගවල ඔවුන්ට
කෑම ලැබෙයි, සියලු මුඩු කඳු පිටද
10 ඔවුන්ට තණබිම තිබෙයි. ඔවුන්ට
බඩගිනි නොවන්නේය, පිපාසා නො-
වන්නේය. මිරිඟු වැල්ලවත් අව්වවත්
ඔවුන්ට පහර නොදෙන්නේය. මක්නිසාද
ඔවුන්ට අනුකම්පාකරන තැනන්වහන්සේ
ඔවුන් ගෙනගොස්, දිය උල්පත් ළඟින්
11 ඔවුන් කැඳවාගෙන යනවා ඇත. මමද
මාගේ සියලු කඳු මාර්ගයක් කරන්නෙමි,
12 මාගේ මහ මාවත්ද උස්වන්නේය. බලව,
සමහරෙක් දුරින් එන්නෝය. බලව,
සමහරෙක් උතුරෙන් හා බස්නාහිරෙන්ද
සමහරෙක් සීන්වරුන්ගේ දේශයෙන්ද
13 එන්නෝය. ස්වර්ගයෙනි, ගීකියාපල්ලා;
පොළොව, ප්‍රීතිමත්වෙයන්න; එම්බා කඳු,
ප්‍රීතියෙන් ශබ්දනගාපල්ලා. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** තමන්ගේ සෙනඟ
සැනසූසේක, තමන්ගේ දුක්ඛිතයන්ටද
අනුකම්පාකරනසේක.

## ඉශ්‍රායෙල් කෙරෙහි දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය සැලකිල්ල. මහත් සමෘද්ධිය පොරොන්දුවීම

නුමුත් සියොන්: යෙහෝවඃවහන්සේ මා 14
අත්හැරියසේක, **ස්වාමීන්වහන්සේ** මා
මතකනැතිකළසේකැයි කීවාය. ස්ත්‍රියෙක් 15
ඇගේම කුසේ පුත්‍රයාට අනුකම්පා
නොකරන ලෙස ඇගේ කිරි දරුවා
මතකනැතිකරන්ට ඇට පුළුවන්ද?
එසේය, මොවුන්ට මතකනැතිවෙන්ට
පුළුවන, එහෙත් මම නම් නුඹ මතකනැති
නොකරන්නෙමි. බලව, මම මාගේ 16
අතුල්වල නුඹ කොටාගතිමි; නුඹේ පවුරු
මා ඉදිරියේ නිතරම තිබේ. නුඹේ දරුවෝ 17
ඉක්මනින් එති; නුඹව විනාශකළ අයද
නුඹව පාළුකළ අයද නුඹ වෙතින්
අහක්ව යන්නෝය. නුඹේ ඇස් ඔසවා 18
වටකර බලාපන්න. මොවුන් සියල්ලෝම
එකතුව නුඹ ළඟට එති. මා ජීවත්වෙනවා
සැබෑවා සේම, නුඹ ඔවුන් සියල්ලන්
සැබවින්ම ආභරණයක් මෙන් පැළඳ-
ගන්නවා ඇත, මනමාලියෙකු මෙන් ඔවුන්
බැඳගන්නවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද නුඹේ නටබුන් 19
තැන්ද පාළු ඉඩම්ද විනාශකරනලද
නුඹේ දේශයද සැබවින් එහි වැසියන්ට
මදි වන්නේය, නුඹ ගිලගත්තෝද දුරුවන්-
නෝය. නුඹේ දරුවන් නැතිවුණායින් 20
පසු නුඹට ලැබෙන දරුවෝ: මේ
ඉඩම මට මදිය, මට වාසයකරන්ට
ඉඩ දියන්නැයි නැවත කියනවා නුඹට
ඇසෙනවා ඇත. එවිට නුඹේ සිතින් 21
නුඹ කල්පනාකොට: මොවුන් මට
ඉපදෙවුවේ කවුද? මම දරුවන් නැතුව
වඳව, රටෙන් පිට වහල්වී, ඔබ මොබ
ගියෙමි; මොවුන් ඇතිකළේ කවුද? මම
තනිව සිටියෙමි; මොවුන් සිටියේ
කොතැනදැයි කියනවා ඇත.
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ 22
කියනසේක: මම ජාතීන්ට මාගේ අත
ඔසවා, ජනයන්ට මාගේ කොඩිය
නගන්නෙමි. ඔව්හු නුඹේ පුත්‍රයන්

වඩාගෙන එන්නෝය, නුඹේ දූවරුද
ඔවුන්ගේ කර පිට ගෙනෙනු ලබන්නෝය.
23 රජවරු නුඹ ඇතිකරන පියවරුද ඔවුන්ගේ
බිසෝවරු නුඹේ කිරිමවුවරුද වන්නෝය.
ඔව්හු මුහුණින් බිමට නැමී නුඹට වැඳ,
නුඹේ පාදවල ධූලි ලෙවකන්නෝය;
නුඹද **ස්වාමීන්වහන්සේ** වන මා කෙරෙහි
බලාපොරොත්තු වන අය ලජ්ජාවට නො-
24 පැමිණෙන බව දනගන්නෙහිය. බලවත්-
තයාගෙන් කොල්ලය ගන්ට නොහොත්
යුතුලෙස වාලට අසුවුණ අය මුදන්ට
25 පුළුවන්ද? නුමුත් **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: බලවත්තයාගේ වාලුන් පවා
පැහැරගන්නවා ඇත, භයානකයාගේ
කොල්ලයද මුදනවා ඇත. මක්නිසාද
නුඹ සමග විවාදකරන්නා සමග මම
විවාදකරන්නෙමි. නුඹේ දරුවන්ද මම
26 ගළවන්නෙමි. නුඹට පීඩාකරන්නන්ට
ඔවුන්ගේම මාංසය කවන්නෙමි; ඔව්හු
මුද්‍රිකයුසයෙන් මෙන් තමුන්ගේම ලෙයින්
මත්වන්නෝය. මෙසේ **ස්වාමීන්වහන්සේ**
වන මා නුඹේ ගැළවුම්කාරයා බවත්
නුඹේ මිදුම්කාරයාද යාකොබ්ගේ
බලවන්තයාණන්ද බවත් මාංසමයවූ
සියල්ලෝම දනගන්නෝය.

## ස්වාමීන්වහන්සේගේ සේවකයාගේ යටත්වීම සහ ජයගැනීමේ විශ්වාසය

50 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: මා විසින් නුඹලාගේ මවු
අත්හැරිය විට ඇට දුන් අත්හැරීම්-
පත්‍රය කොතනද? නොහොත් මා විසින්
නුඹලා වික්කේ මට ණයදුන් අයගෙන්
කාටද? බලව, නුඹලා විකුණනු ලැබුවේ
නුඹලාගේම අපරාධ නිසාත් නුඹලාගේ
මවු අත්හරිනු ලැබුවේ නුඹලාගේම
2 වරද නිසාත්ය. මා ආ විට කිසිවෙක්
නොසිටියෙත් මා අඬගැසූවිට උත්තර-
දෙන්ට කිසිවෙක් නොසිටියෙත් මක්-
නිසාද? මුදන්ට බැරි හැටියට මගේ
අත ඇත්තටම කොටවී තිබේද? නොහොත්
ගළවන්ට මා වෙත බලය නැද්ද? බලව,
මාගේ තරවටුකිරීමෙන් මුහුද හින්දවමි,
ගංගාවන් කාන්තාරයක් කරමි; වතුර
නැති නිසා එහි මත්ස්‍යයන් ගඳගසනවා
ඇත, පිපාසායෙන් මැරෙනවා ඇත. මම 3
අහසට කළුවර අඳවා එය ගෝණි
රෙදිවලින් වසන්නෙමි.
විඩාවූ අයට වචනවලින් පිහිටවෙන්ට 4
දනගන සිටීමට ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** උගතුන්ගේ දිව මට දී තිබේ.
ගෝලයන් මෙන් ඇසීමට උන්වහන්සේ
උදයක් පාසා පුබුදුවනසේක, මාගේ කන
පුබුදුවනසේක. ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 5
මාගේ කන පැහැදූසේක, මා කැරළි-
කාරවුණේවත් පස්සට හැරුණේවත් නැත.
මම මාගේ පිට තළන්නන්ටත් මාගේ 6
කම්මුල් රැවුල් උදුරන්නන්ටත් දුනිමි.
මාගේ මුහුණ නින්දවෙනුත් කෙළ-
ගැසීමෙනුත් සඟවා නොගතිමි. මක්- 7
නිසාද ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මට
උපකාරවනසේක; එබැවින් වියවුල්
නොවෙමි. එබැවින් මාගේ මුහුණ
ගිනිගලක් මෙන් තබාගෙන සිටිමි, මා
ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි.
මා ධර්මිෂ්ඨකරන තැනන්වහන්සේ 8
ළංව සිටිනසේක; මට එදිරිව සිටින්නේ
කවුද? අපි දෙදෙනාම නැගිට සිටිමු.
මාගේ විරුද්ධකාරයා කවුද? ඔහු මා
ළඟට ඒවා. බලව, ස්වාමිවූ **දෙවියන්-** 9
**වහන්සේ** මට උපකාරකරනසේක; මා
වරදට පත්කරන්නේ කවුද? බලව,
ඔවුන් සියල්ලෝම වස්ත්‍රයක් මෙන්
පරණවන්නෝය; කාවා ඔවුන් කාද-
මන්නේය.
නුඹලා අතරෙන් **ස්වාමීන්වහන්සේ** 10
කෙරෙහි භය ඇත්තාවූ, උන්වහන්සේගේ
මෙහෙකරුවාගේ හඬට කීකරුවෙන්නාවූ
තැනැත්තා කවුද? ආලෝකය නැතුව
අඳුරෙහි ඇවිදින්නාවූ තැනැත්තේ
**ස්වාමීන්වහන්සේගේ** නාමය කෙරෙහි
විශ්වාසකර තමාගේ දෙවියන්වහන්සේ
කෙරෙහි පිහිටා සිටීවා. ගින්නක් දල්වා 11
ගිනි පෙනෙලි වටකර තබාගන්නාවූ
සියල්ලෙනි, නුඹලාගේ ගින්නේ එළියෙහින්

තුඹලා පත්තුකර තිබෙන ගිනිපෙනෙලි
අතරේත් හැසිරියල්ලා. මා අතින්
තුඹලාට ලැබෙන්නේ මේකය; තුඹලා
තද වේදනාවෙන් වැතිර සිටින්නහුය.

## ස්වාමීන්වහන්සේගේ සැනසිලි බස්

51 ධර්මිෂ්ඨකම අනුවයන්නාවූ,
**ස්වාමීන්වහන්සේ** සොයන්නාවූ
තැනැත්තෙනි, මට කන්දියල්ලා. තුඹලාව
කොටාගත්තේ මොන පර්වතයකින්ද
කියාත් තුඹලාව හාරාගත්තේ මොන
ගල්වළකින්ද කියාත් බලාපල්ලා.
2 තුඹලාගේ පියවූ ආබ්‍රහම්ද තුඹලා වැදූ
සාරාද බලාපල්ලා. මක්නිසාද ඔහු
එක්කෙනෙක්ව සිටිද්දී මම ඔහු
කැඳවාගෙන, ඔහුට ආශිර්වාදකොට, ඔහු
3 වැඩිකෙළෙමි. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේ** සියොන් සැනසූසේක. උන්-
වහන්සේ ඇගේ සියලු නටබුන් තැන්
සනසා, ඇගේ වනාන්තරය ඒදන් මෙන්ද
ඇගේ කාන්තාරය **ස්වාමීන්වහන්සේගේ**
උයන මෙන්ද කළසේක; ප්‍රීතිමත්කමද
සන්තෝෂයද ස්තුතිදීම සහ ගීතිකා හඬද
එහි සම්බවේ.
4 මාගේ සෙනඟෙනි, මට ඇහුම්කන්දියල්ලා;
මාගේ ජනයෙනි, මට කන්යොමුකරපල්ලා.
මක්නිසාද ව්‍යවස්ථාවක් මා වෙතින්
නිකුත්වන්නේය, මාගේ විනිශ්චයද
ජාතීන්ට එළියක් කොට පිහිටුවන්නෙමි.
5 මාගේ ධර්මිෂ්ඨකම ළංව තිබේ, මාගේ
ගැළවීම පිටත්ව ගියේය, මාගේ හස්තයන්ද
ජනයන් විනිශ්චයකරනවා ඇත; ද්වීපයෝ
මා ගැන බලාසිට, මාගේ හස්තය
කෙරෙහි බලාපොරොත්තුවෙනවා ඇත.
6 තුඹලාගේ ඇස් අහස දෙසට ඔසවාපල්ලා,
පහළ තිබෙන පොළොවත් බලාපල්ලා.
මක්නිසාද අහස දුම මෙන් පහවීයන්නේය,
පොළොවද වස්ත්‍රයක් මෙන් පරණවන්නේය,
එහි වාසයකරන්නෝද එයාකාරයෙන්ම
නසින්නෝය. තුමුත් මාගේ ගැළවීම
සදාකාලේටම පවතින්නේය, මාගේ
ධර්මිෂ්ඨකමද කඩ නොවන්නේය.

ධර්මිෂ්ඨකම දන්නාවූ, මාගේ 7
ව්‍යවස්ථාව තමුන්ගේ සිත්වල ඇත්තාවූ
සෙනඟෙනි, මට කන්දියල්ලා;
මනුෂ්‍යයන්ගේ නින්දකිරීමට භය
නොවෙල්ලා, ඔවුන්ගේ අපහාසවලට
නොකැලඹෙල්ලා. මක්නිසාද කාවා 8
ඔවුන් වස්ත්‍රයක් මෙන් කාදමන්නේය,
පණුවාද ඔවුන් ලෝම මෙන් කන්නේය.
තුමුත් මාගේ ධර්මිෂ්ඨකම සදාකාලයටත්
මාගේ ගැළවීම සියලු පරම්පරාවලටත්
පවත්නේය.

## පුරාණයේදී මෙන් බලය දක්වන ලෙස දෙවියන්වහන්සේට අයදීම

එම්බා **ස්වාමීන්වහන්සේගේ** හස්තය, 9
පිබිදියන්න, පිබිදියන්න, බලය පැළඳ-
ගනින්න; ප්‍රථම පරම්පරා වන පුරාණ
දවස්වලදී මෙන් පිබිදියන්න. රාහබ්
කැලිකොට කැපුවෙත් දීර්සයා ඇන-
දැමූවෙත් තුඹ නොවේද? මහ ගැඹුරේ 10
ජලය වන මුහුද හින්දවා, මිදුණු අයට
එතරවීමට මුහුදේ ගැඹුරු මාර්ගයක්
කළේ තුඹ නොවේද? **ස්වාමීන්වහන්සේ** 11
විසින් මුදනලද්දෝ ගීකියමින් සියොන්ට
හැරීඑන්නෝය; සදාකාල ප්‍රීතියද ඔවුන්ගේ
ඉස් පිට තිබෙන්නේය. සන්තෝෂයද
ප්‍රීතිමත්කමද ඔවුන් පිටට පැමිණෙන්නේය,
දුකද සුසුම්ලෑමද පලායන්නේය.
තුඹලා සනසන්නේ මමමය. නැසීයන 12
මනුෂ්‍යයාටත් තෘණ මෙන් පහව යන
මනුෂ්‍ය පුත්‍රයාටත් භයවෙන්ටද තුඹේ
මැවුම්කාරවූ, අහස දිගඇරියාවූ, පො- 13
ළොව පිහිටෙවූවාවූ **ස්වාමීන්වහන්සේ**
සිහිනැතිකොට, විනාශකිරීමට පීඩාකාරයා
සූදානම්වෙන විට, ඔහුගේ කෝපය නිසා
නිතරම දවස මුළුල්ලෙහි වෙවුලන්ටද
තුඹ කවුද? පීඩාකාරයාගේ කෝපය
කොතැනද? රටින් පිටවහල්වී සිටින්නා 14
ඉක්මනට මුදනු ලබන්නේය; ඔහු වළේදී
නසින්නේවත් ඔහුගේ කෑම පිරිහෙන්-
නේවත් නැත. මම වනාහි මුහුදේ රළ 15
ගර්ජනාකරන ලෙස එය අවුස්සන්නාවූ,

සේනාවල ස්වාමීන්වහන්සේ යන නාමය
ඇත්තාවූ, නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේය.
16 මා විසින් අහස පිහිටුවීමටත්, පොළොවේ
පදනම් තැබීමටත්: නුඹ මාගේ සෙනඟ-
යයි සියොන්ට කීමටත්, මාගේ වචනය
නුඹේ මුඛයෙහි තබා, මාගේ අතේ
සෙවණෙහි නුඹ සැඟෙවුවෙමි.

## සියොනේ ආරක්ෂාව සහ ජයගැනීම නිසැක බව

17 ස්වාමීන්වහන්සේගේ අතින් උන්වහන්සේ-
ගේ කෝපය නැමති කුසලානෙන් බී,
වැනෙන්ට සලස්වන පාත්‍ර කුසලානෙන්
උරාබීවාවූ යෙරුසලම, පිබිදියන්න,
18 පිබිදියන්න, නැගිටියන්න. ඈ වැදූ සියලුම
පුත්‍රයන් අතරෙන් ඈට මඟපෙන්වන්ට
කෙනෙක් නැත; ඈ ඇතිකළ සියලුම
පුත්‍රයන් අතරෙන් ඇගේ අත අල්වාගන්ට
19 කිසිවෙක් නැත. මේ කාරණා දෙක එනම්
පාළුව සහ විනාශයත් සාගතය සහ
කඩුවත් නුඹට පැමිණී තිබේ; නුඹට
අනුකම්පාව පෙන්වන්නේ කවුද? මම
20 නුඹ කෙසේ සනසන්නෙම්ද? නුඹේ
පුත්‍රයෝ ස්වාමීන්වහන්සේගේ කෝපය
වන නුඹේ දෙවියන්වහන්සේගේ තරවටු-
කිරීමෙන් පිරී, ක්ලාන්තවී, දලක අසුවුණ
ගෝනෙකු මෙන් සියලු වීථි සන්ධිවල
21 වැටී සිටිති. එබැවින් පීඩිතවූ, මුද්‍රිකපානය
නැතුව මත්වී සිටින්නාවූ තැනැත්තිය,
22 මේක අසාපන්න. නුඹේ ස්වාමිවූ
ස්වාමීන්වහන්සේ වන තමන්ගේ සෙනඟ
වෙනුවට මැදහත්වන්නාවූ නුඹේ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේක:
මෙන්න, වැනෙන්ට සලස්වන කුසලාන
වන මාගේ කෝපය නැමති පාත්‍ර
කුසලාන නුඹේ අතින් ගත්තෙමි; නුඹ
තවත් එයින් නැවත නොබොන්නෙහිය.
23 නුමුත්: අප විසින් නුඹ පාගායන පිණිස
වැටී ඉඳින්නැයි නුඹේ ආත්මයට කීවාවූ
නුඹේ පීඩාකාරයන්ගේ අතට ඒක
දෙන්නෙමි. එලෙස නුඹ නුඹේ පිට බිම
මෙන්ද පාගායන්නන්ට වීථිය මෙන්ද
තැබුවෙහිය.

## 52

සියොන්, පිබිදියන්න, පිබිදියන්න,
නුඹේ බලය පැළඳගනින්න; ශුද්ධ
නුවරවූ යෙරුසලම, නුඹේ අලංකාර
වස්ත්‍ර පැළඳගනින්න. මක්නිසාද තවත්
අචර්මඡේදිතයෙක්වත් අපවිත්‍රයෙක්වත්
නැවත නුඹ තුළට නොපැමිණෙන්නේය.
යෙරුසලම, නුඹ ධූලි ගසාදමා, නැගිට 2
වාඩිවෙයන්න. වාලියෙක්වූ සියොන් දුව,
නුඹේ බෙල්ලේ බැඳුම් ගළවාදමාපන්න.
මක්නිසාද ස්වාමීන්වහන්සේ මෙසේ 3
කියනසේක: නුඹලා නිකමට විකුණන
ලද්දහුය; මිල නැතුව නුඹලා මුදනු
ලබන්නහුය. තවද ස්වාමිවූ දෙවියන්- 4
වහන්සේ මෙසේ කියනසේක: මුලදී මාගේ
සෙනඟ මිසරයෙහි විදේශිව සිටින්ට එහි
ගියෝය. අෂූර්වරු නිෂ්කාරණයේ ඔවුන්ට
පීඩාකළෝය. දැනුත් මට මෙහි තිබෙන්නේ 5
කුමක්ද? මක්නිසාද මාගේ සෙනඟ
නිකමට ගෙනයනලද්දේය. ඔවුන්ගේ
ආණ්ඩුකාරයෝ කෑමොරගසති, මාගේ
නාමයද නිතරම දවස මුළුල්ලෙහි
අපහාසකරනු ලැබේයයි ස්වාමීන්වහන්සේ
කියනසේක. එබැවින් මාගේ සෙනඟ 6
මාගේ නාමය දැනගන්නවා ඇත. එබැවින්
කථාකරන්නේ මා බව ඒ දවසේදී ඔවුන්
දැනගන්නවා ඇත. බලව, ඒ මමයයි
ස්වාමීන්වහන්සේ කියනසේක.
ශුභ ආරංචි ගෙනෙන්නාවූ, සමාදානය 7
ප්‍රකාශකරන්නාවූ, යහපත ගැන හොඳ
ආරංචි ගෙනෙන්නාවූ, ගැළවීම ප්‍රකාශ-
කරන්නාවූ: නුඹේ දෙවියන්වහන්සේ
රජකම්කරනසේකැයි සියොන්ට කියන්-
නාවූ තැනැත්තන්ගේ පාද කඳු පිට
කොපමණ අලංකාරද! අන්න, නුඹේ 8
මුරකාරයන්ගේ හඬ! ඔව්හු හඬ නගති,
ඔව්හු එක්ව ගීකියති; මක්නිසාද ස්වාමීන්-
වහන්සේ සියොන් වෙතට හැරී එනවා
ඔවුන් ඇසින්ම දකිනවා ඇත.
යෙරුසලමේ පාළු ඉඩම්, ප්‍රීතියෙන් 9
ඝෝෂාකරමින් එක්ව ගීකියව්. මක්නිසාද
ස්වාමීන්වහන්සේ තමන්ගේ සෙනඟ
සනසා, යෙරුසලම මුදාගන තිබේ.
ස්වාමීන්වහන්සේ තමන්ගේ ශුද්ධ හස්තය 10

සියලු ජාතීන් ඉදිරියෙහි [සටන් පිණිස]
නග්නකළසේක; පොළොවේ සියලු
සීමාවෝද අපේ දෙවියන්වහන්සේගේ
11 ගැළවීම දකින්නෝය. පිටවෙයල්ලා,
පිටවෙයල්ලා, ඔතනින් පිටතට පලයල්ලා,
කිසි අපවිත්‍ර දෙයකට අත නොගසා,
ඈ තුළින් පිටතට පලයල්ලා; **ස්වාමීන්-
වහන්සේගේ** භාණ්ඩ දරන්නෙනි, පිරිසිදුව
12 සිටපල්ලා. මක්නිසාද තුඹලා ඉක්මනින්
පිටතට යන්නේවත් තුඹලා පලායාමකින්
යන්නේවත් නැත. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේ** තුඹලාට පෙරටුව යනසේක;
ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ තුඹලාට
පස්සෙන් එනසේක.

## ස්වාමීන්වහන්සේගේ සේවකයාගේ දුක්විඳීම සහ එහි ඵල

13 බලව, මාගේ සේවකයා නුවණින්
ක්‍රියාකරමින් උසස්වී උතුම්වී, ඉතා
14 උත්කෘෂ්ට වෙනවා ඇත. *උන්වහන්සේගේ
පෙනීම කිසි මනුෂ්‍යයෙකුටත් උන්-
වහන්සේගේ ස්වරූපය මනුෂ්‍ය පුත්‍රයන්-
ටත් වඩා අවලක්ෂණව තිබුණු බැවින්
බොහෝ දෙනෙක් උන්වහන්සේ නිසා
15 විස්මපත්වුණාක්මෙන්ම, උන්වහන්සේ
†බොහෝ ජාතීන්ට ඉසිනවා ඇත;
රජවරු උන්වහන්සේ නිසා තමුන්ගේ
මුඛ වසාගන්නවා ඇත. මක්නිසාද
ඔවුන්ට කියා නුදුන් දේ ඔවුන් දකිනවා
ඇත, ඔවුන් නොඇසූ දේ තේරුම්ගන්නවා
ඇත.

53 අප විසින් දැන්වූ දේ විශ්වාස කළේ
කවුද? **ස්වාමීන්වහන්සේගේ** හස්තය
2 කාට එළිදරව්වීද? මක්නිසාද ‡උන්වහන්සේ
ළා පැලයක් මෙන්ද වියළි බිමින් මතුවෙන
අංකුරයක් මෙන්ද ඔවුන් ඉදිරියෙහි
හටගත්සේක. උන්වහන්සේට රූපවත්
ශෝභනකමවත් නැත; අප විසින්
උන්වහන්සේ දකින විට උන්වහන්සේ
කෙරේ ආශාවීමට ලක්ෂණකමක්ද නැත.
උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් සුළුකොට 3
එපාකරනු ලැබූසේක; වේදනා ඇත්තාවූ
දුක දන්නාවූ මනුෂ්‍යයෙක්ය. මනුෂ්‍යයන්
විසින් තමුන්ගේ මූහුණ සඟවාගන්න
කෙනෙකු මෙන්, උන්වහන්සේ සුළුකරනු
ලැබූසේක, අපිද උන්වහන්සේ නො-
සැලකුවෙමුව.
සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ 4
අපේ දුක්ය, දරාගත්තේ අපේ ශෝකය.
එසේ වී නුමුත් උන්වහන්සේ දඬුවමද
දෙවියන්වහන්සේගෙන් පහරද පීඩාවද
ලැබූ කෙනෙකැයි අපි සිතීමුව. නුමුත් 5
උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ
අපරාධ නිසාය, පොඩිකරනු ලැබුවේ
අපේ අයුතුකම් නිසාය. අපට සමාදනය
ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට
පැමුණුණේය; උන්වහන්සේගේ පහරවලින්
අපට සුවය ලැබී තිබේ. අපි සියල්ලෝම 6
බැටළුවන් මෙන් මුළාවී, එකිනෙකා තම
තමාගේම මාර්ගයට හැරී ගියෙමුව;
**ස්වාමීන්වහන්සේද** අප සියල්ලන්ගේ
අයුතුකම උන්වහන්සේ පිට තැබූසේක.
උන්වහන්සේට පීඩාකළ විට, උන්- 7
වහන්සේ යටත්වී තමන්ගේ මුඛය නැර
සිටිසේක; මරන්ට ගෙනයන බැටළු
පැටවකු මෙන්ද බැටළු දෙනක් ලෝම
කපන්නන් ඉදිරියෙහි නිශ්ශබ්දව
සිටින්නාක්මෙන්ද උන්වහන්සේ තමන්
මුඛය නැර සිටිසේක. උන්වහන්සේ 8
බලාත්කාරකමෙන්ද විනිශ්චයෙන්ද
පහකරනු ලැබූසේක. ජීවත්ව සිටින්නන්ගේ
දේශයෙන් උන්වහන්සේ සිඳදමනු ලැබූ
බව උන්වහන්සේගේ පරම්පරාවෙහි
කවරෙක් කල්පනාකළේද? උන්වහන්සේ
තළනු ලැබුවේ මාගේ සෙනඟගේ වරද
නිසාය. ඔව්හු උන්වහන්සේගේ මිනීවළ 9
දුෂ්ටයන් අතරෙහි තිබෙන්ට නියමකළෝය,
නුමුත් උන්වහන්සේගේ මරණයේදී එය
වස්තුකාරයන් සමග විය; මක්නිසාද
උන්වහන්සේ අධර්මිෂ්ඨකමක් කළේවත්
උන්වහන්සේගේ මුඛයෙහි කිසි ප්‍රයෝගයක්
තිබුණේවත් නැත.

*නොහොත්, ඔහුගේ—මෙසේ දිගටම.
†හෙවත්—බොහෝ ජාතීන්ගෙන් බුහුමන් ලබනවා ඇත.
‡නොහොත්, ඔහු—මෙසේ දිගටම.

10 එහෙත් උන්වහන්සේ පොඩිකරන්ට
**ස්වාමීන්වහන්සේ** කැමතිව දුකට පත්කළ-
සේක. ඔබ උන්වහන්සේගේ ප්‍රාණය පාප-
පූජාවක් කරන විට උන්වහන්සේ
තමන්ගේ වංශය දැක තමන් දවස්
වැඩිකරනසේක, **ස්වාමීන්වහන්සේගේ**
කැමැත්තද උන්වහන්සේගේ අතෙහි
11 සඵලවන්නේය. උන්වහන්සේ තමන්
ආත්ම වේදනාවේ ඵල දැක තෘප්තියට
පැමිණෙනසේක. මාගේ ධර්මිෂ්ඨ
සේවකයා ස්වකීය දැනගැන්ම කරණ-
කොටගෙන බොහෝ දෙනෙකු ධර්මිෂ්ඨ-
කරනවා ඇත. ඔවුන්ගේ අයුතුකම්ද
උන්වහන්සේම දරාගන්නවා ඇත.
12 එබැවින් මම බොහෝ දෙනෙකු
අතරෙහි උන්වහන්සේට කොටසක්
බෙදා දෙන්නෙමි. බලවත්තයන් සමගද
උන්වහන්සේ කොල්ලය බෙදාගන්නවා
ඇත: මෙසේ වන්නේ තමන් ප්‍රාණය
මරණයට වගුරුවා දී. වරදකාරයන්
සමග ගණන්ගනු ලැබ. උන්වහන්සේම
බොහෝ දෙනෙකුගේ පාප උසුලාගත්
නිසාය. වරදකාරයන් උදෙසාද උන්-
වහන්සේ මැදහත්කම්කරනසේක.

## මුදනු ලැබූ සෙනඟ විශාලවීම. ඔවුන්ගේ ආශීර්වාදලත් ස්වභාව

54 දරුවන් නොවැදූ වඳ තැනැත්තිය,
ගීකියාපන්න: විළිරුජාව නොවින්ද
තැනැත්තිය, ගී හඬ නගා ශබ්ද
පවත්වාපන්න. මක්නිසාද පුරුෂයෙක් ඇති
තැනැත්තීගේ දරුවන්ට වඩා අත්හරිනු
ලැබූ තැනැත්තීගේ දරුවෝ බොහෝයයි
2 **ස්වාමීන්වහන්සේ** කියනසේක. නුඹේ
කූඩාරම තිබෙන ස්ථානය විශාලකරපන්න.
ඔව්හු නුඹේ වාසස්ථානවල තිර
දිගහරිත්වා; වලක්වා නොගනින්න. නුඹේ
ලනු දික්කර නුඹේ ඇණ සවිකරපන්න.
3 මක්නිසාද නුඹ දකුණටත් වමටත්
පැතිරයනවා ඇත: නුඹේ වංශය
ජාතීන්ගේ දේශ හිමිකරගෙන. පාළුවූ
නුවරවල් වැසියන්ගෙන් පුරවනවා ඇත.
4 භය නොවන්න: මක්නිසාද නුඹ ලජ්ජාවට
පැමිණෙන්නේ නැත. නොකැලඹෙන්න;
නුඹ නින්දවට නොපැමිණෙන්නෙහිය.
මක්නිසාද නුඹ නුඹේ යෞවන කාලයේ
ලජ්ජාව සිහිනැතිකරන්නෙහිය. නුඹේ
වැන්දඹුකමේ නින්දවද තවත් සිහි
නොකරන්නෙහිය. කුමක් හෙයින්ද 5
නුඹේ ස්වාමිපුරුෂයා නම් නුඹේ
මැවුම්කාරයාණෝය; උන්වහන්සේගේ
නාමය සේනාවල **ස්වාමීන්වහන්සේය**.
නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ
ශුද්ධ තැනන්වහන්සේය: මුළු පොළොවේ
දෙවියන්වහන්සේයයි උන්වහන්සේට
කියනු ලැබේ. මක්නිසාද අත්හරිනලද්දාවූ, 6
ආත්මයෙහි ශෝක ඇත්තාවූ භාර්යාවක්
මෙන්ද පහකරන ලද යෞවන කාලයේ
භාර්යාවක් මෙන්ද **ස්වාමීන්වහන්සේ**
නුඹ කැඳවාගත්සේකැයි නුඹේ දෙවියන්-
වහන්සේ කියනසේක. මම ලුහුඬු 7
මොහොතකට නුඹ අත්හැරියෙමි; නුමුත්
මහත් අනුකම්පාවලින් නුඹ නැවත
කැඳවාගන්නෙමි. මම උදහස වගුරුවා 8
මාගේ මුහුණ මොහොතක් නුඹෙන්
සඟවාගතිමි; නුමුත් සදාකාල කරුණා-
වෙන් නුඹට අනුකම්පාකරමියි නුඹේ
මිදුම්කාරයා වන **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මේක මට නෝවාගේ 9
ජලගැලීම මෙන්ය. මක්නිසාද නෝවාගේ
ජලගැලීම තවත් පොළොවේ නොගලන
හැටියට මා විසින් දිවුරුවාක්මෙන්ම,
නුඹ කෙරෙහි උදහස් නොවන බවටත්
නුඹට තරවටු නොකරන බවටත් මම
දිවුලෙමි. මක්නිසාද කඳු පහවයන්නේය. 10
හෙල්ද සොල්වනු ලබන්නේය; නුමුත්
මාගේ කරුණාව නම් නුඹෙන් පහ
නොවන්නේය. මාගේ සමාදාන ගිවිසුමද
සොල්වනු නොලබන්නේයයි නුඹට අනු-
කම්පාකරන **ස්වාමීන්වහන්සේ** කියන-
සේක.

අසරණවූ. කුණාටුවෙන් සෙලවෙන්නාවූ, 11
සැනසිල්ලක් නැත්තාවූ තැනැත්තිය, බලව.
නුඹේ ගල් අංජන කැටවලින් අල්ලා.
නුඹේ අත්තිවාරම් නීලමාණික්‍යවලින්
දමන්නෙමි. නුඹේ කොත් රක්ත 12
මාණික්‍යවලින්ද නුඹේ දොරටු දීප්තිමත්

මාණික්‍යවලින්ද නුඹේ සියලු මායිම්
13 පියකරු ගල්වලින්ද සාදන්නෙමි. නුඹේ
සියලුම දරුවෝද **ස්වාමීන්වහන්සේ**
විසින් උගන්වනු ලබන්නෝ වෙති; නුඹේ
දරුවන්ගේ සමාදනයද මහත්වන්නේය.
14 නුඹ ධර්මිෂ්ඨකමෙන් පිහිටුවනු ලබනවා
ඇත. නුඹ බලාත්කාරයෙන් දුරුව භය
නැතුව සිටින්නෙහිය; භීතියෙනුත් දුරව
සිටිනවා ඇත, ඒක නුඹට ළං නොවන්-
15 නේය. මෙන්න, මාගේ සංඥවක් නැතුව
මනුෂ්‍යයන් රැස්වෙනවා ඇත. නුඹට
විරුද්ධව එකතුවෙන කවුරු නුමුත් නුඹ
16 නිසා වැටෙන්නෝය. අඟුරුගින්න පිඹ
නියම වැඩයට ආයුධයක් සාදන්නාවූ
ආචාරියා මැවුවේ මමය; වැනසීමට
17 නාස්තිකාරයා මැවුවෙත් මමය. නුඹට
විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල
නොවන්නේය; විනිශ්චයකිරීමට නුඹට
විරුද්ධව නැගිටින සියලුම දිව් නුඹ
විසින් වරදට පත්කරනවා ඇත.
**ස්වාමීන්වහන්සේගේ** මෙහෙකරුවන්ගේ
උරුමයත් මාගෙන් ඔවුන්ට ලැබෙන
ධර්මිෂ්ඨකමත් එයාකාරයයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.

## දෙවියන්වහන්සේ පොරොන්දුවෙන ගැළවීම පිළිගැනීමට ආරාධනාව

**55** එම්බා පිපාසා ඇති සියල්ලෙනි,
වතුර ළඟට වරෙල්ලා, මුදල්
නැත්තෙනි, නුඹලාත් ඇවිත් ධාන්‍ය
අරන් කාපල්ලා; එසේය, ඇවිත් මිලමුදල්
නැතුව මුද්‍රිකපානයද කිරිද ගනිල්ලා.
2 කෑම නොවන දේට මුදල්ද තෘප්තියට
නොපමුණුවන දේට නුඹලාගේ
වස්තුවද වියදම්කරන්නේ මක්නිසාද?
හොඳකාරයෙන් මට ඇහුම්කන්දී හොඳව
තිබෙන දේ කාපල්ලා, නුඹලාගේ
3 ප්‍රාණයද තරකම භුක්තිවිඳීවා. නුඹලාගේ
කන් යොමා මා ළඟට ඇවිත් අසාපල්ලා;
එවිට නුඹලාගේ ප්‍රාණය ජීවත්වන්නේය.
මමද දාවිත්ගේ සහතික කරුණාවල් වන
සදාකාල ගිවිසුමක් නුඹලා සමග
කරන්නෙමි. බලව, උන්වහන්සේ ජනයන්ට 4
සාක්ෂිකාරයෙක්ද ජනයන්ට අධිපති-
යෙක් හා ආණ්ඩුකාරයෙක්ද කොට
දුනිමි. බලව, නුඹ නොදන්න ජාතියක් 5
නුඹ අඬගසාගන්නෙහිය, නුඹව නොදන
සිටි ජාතියක්ද නුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** සහ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
තැනන්වහන්සෙත් නිසා නුඹ ළඟට දුව
එනවා ඇත; මක්නිසාද උන්වහන්සේ
නුඹට ගෞරවකර තිබේ.
**ස්වාමීන්වහන්සේ** සම්බවෙන්ට සිටිද්දී 6
උන්වහන්සේ සොයා. උන්වහන්සේ ළංව
සිටිද්දී උන්වහන්සේට යාච්ඤකරපල්ලා.
දුෂ්ටයා තමාගේ මාර්ගයද අධර්මිෂ්ඨ 7
මනුෂ්‍යයා තමාගේ යෝජනාද අත්හැර,
**ස්වාමීන්වහන්සේ** වෙතට හැරී ඒවා,
උන්වහන්සේ ඔහුට අනුකම්පාකරනවා
ඇත; අපේ දෙවියන්වහන්සේ වෙතට ඔහු
හැරී ඒවා, මක්නිසාද උන්වහන්සේ
අතිශයින් කමාවෙනවා ඇත. මක්නිසාද 8
මාගේ යෝජනා නුඹලාගේ යෝජනා
නොවේය, නුඹලාගේ මාර්ගද මාගේ
මාර්ග නොවේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. අහස පොළොවට වඩා 9
උස්ව තිබෙන්නාක්මෙන් මාගේ මාර්ග
නුඹලාගේ මාර්ගවලටත් මාගේ
යෝජනා නුඹලාගේ යෝජනාවලටත්
වඩා උසස්ව තිබේ. එලෙස වැස්ස සහ 10
හිම අහසෙන් බැස පොළොව පොහවා
සශ්‍රීකකර, එල හටගන්වා, වපුරන්නාට
බීජද කන්නාට කෑමද දෙන තුරු එහි
හැරී නොයන්නාක්මෙන්, මාගේ මුඛයෙන් 11
නික්මෙන මාගේ වචනයත් මා වෙතට
හිස්ව හැරී නැවිත්, මා කැමති දෙය
සිද්ධකොට, මා නියමකළ කාරණය
සඵලකරනවා ඇත. මක්නිසාද නුඹලා 12
ප්‍රීතියෙන් පිටත්ව සමාදනයෙන් ගෙනයනු
ලබන්නහුය. නුඹලාට ඉදිරියෙන් කඳු
හා හෙල් ගී නාදකරන්නෝය, වනයේ
සියලු ගස් අත්පොළසන් දෙන්නෝය.
කටු ගස වෙනුවට දේවදාරු ගසද තිබොල් 13
ගස වෙනුවට මරඳ ගසද අටගන්නේය.
ඒක **ස්වාමීන්වහන්සේට** නාමයක් සහ
මැකී නොයන සදාකාල ලකුණක්ද පිණිස
වන්නේය.

## විදේශීන්ට හා නපුංසකයන්ට ධෛර්‍ය දීම

56 ස්වාමීන්වහන්සේ මෙසේ කියන-
සේක: තුඹලා යුක්තිය පවත්වා
ධර්මිෂ්ඨකම් කරපල්ලා. මක්නිසාද
මාගේ ගැළවීම පැමිණෙන්ටත් මාගේ
ධර්මිෂ්ඨකම එළිදරව්වෙන්ටත් ළඟය.
2 මෙය කරන මනුෂ්‍යයාද මෙය අල්ලාගන
සිටිමින්, සබත් දවස කඩනොකර එය
පවත්වන්නාවූ, කිසි නපුරක් නොකරන
ලෙස තමාගේ අත වළක්වාගන්නාවූ
මනුෂ්‍ය පුත්‍රයාද වාසනාවන්තය.
3 ස්වාමීන්වහන්සේට එකතුවී සිටින විදේ-
ශියාද: ස්වාමීන්වහන්සේ තමන්ගේ
සෙනඟ වෙතින් මා සැබවින් වෙන්කරන-
සේකැයි නොකියාවා. නපුංසකයාද: බලව,
මම වියළි ගසක්යයි නොකියාවා.
4 මක්නිසාද මාගේ සබත් දවස් රක්ෂාකර,
මා ප්‍රසන්න දේ තෝරාගෙන, මාගේ
ගිවිසුම අල්ලාගෙන සිටින නපුංසකයන්
ගැන ස්වාමීන්වහන්සේ මෙසේ කියන-
5 සේක. එනම් මාගේ ගෘහයෙහිද මාගේ
භිත්ති ඇතුළෙහිද පුත්‍රයන්ටත් දූවරුන්ටත්
වඩා සිහිවීම් ලකුණක්ද නාමයක්ද
ඔවුන්ට දෙන්නෙමි; සිඳී නොයන සදාකාල
6 නාමයක් ඔවුන්ට දෙන්නෙමි. ස්වාමීන්-
වහන්සේට මෙහෙකරන්ටත් උන්-
වහන්සේගේ නාමයට ප්‍රේමකරන්ටත්
උන්වහන්සේගේ සේවකයන්ව සිටින්ටත්
ස්වාමීන්වහන්සේට එකතුවන්නාවූ, සබත්
දවස කඩනොකර ඒක රක්ෂාකරන්-
නාවූ, මාගේ ගිවිසුම ස්ථිරලෙස පවත්-
7 වන්නාවූ විදේශීන්ද, මාගේ ශුද්ධ කන්දට
පමුණුවා මාගේ යාච්ඤා-ගෘහයෙහි
ඔවුන් ප්‍රීතිවන්ට සලස්වන්නෙමි; ඔවුන්ගේ
දවන පූජා සහ යාග මාගේ පූජාසනය
පිට පිළිගනු ලබන්නේය. මක්නිසාද
මාගේ ගෘහය සියලු ජනයන්ට යාච්ඤා-
8 ගෘහයක්යයි කියනු ලබන්නේය. පිටකරනු
ලැබූ ඉශ්‍රායෙල්වරුන් එකතුකරන
ස්වාමිවූ දෙවියන්වහන්සේ: ඔවුන් වෙතට
එකතුවී සිටින්නන් හැර මම තවත් අය
ඔවුන් වෙතට එකතුකරදෙන්නෙමියි
කියනසේක.

## සැලකිලි නැති ආණ්ඩුකාරයන්ටත් රූප ඇදහිලිකාර සෙනඟටත් තද තර්ජනය

වනයේ සියලු සත්ත්වයෙනි, කැලෑවෙහි 9
සියලු සත්ත්වයෙනි, කාදමන්ට වරෙල්ලා.
*ඔහුගේ මුරකාරයන් සියල්ලෝම අන්ධව, 10
දැනගැන්ම නැතුව සිටිති; සියල්ලෝම
බුරන්ට බැරි ගොළු බල්ලෝය; ඔව්හු
හීන දකිති, ලැග හිඳිති, නිද ඉන්ට
කැමැත්තෝය. එසේය, ඒ බල්ලෝ ගිජුව, 11
කිසිකලක තෘප්තියට නොපැමිණෙති;
ඔව්හු විමසන්ට නොදන්න එඬේරුය.
ඔවුන් එකිනෙකා තම තමාගේ ප්‍රයෝ-
ජනය පිණිස තම තමාගේම මාර්ගයට
තීන්දුවටම හැරීගියෝය. ඔව්හු කථා- 12
කොට: වරෙල්ලා, මම මුද්‍රික පානය
ගෙනෙන්නෙමි, අපි සුරාපානයෙන්
මත්වන්නෙමුව; හෙටත් අද වාගේ
අධිකතර ලොකු දවසක් වන්නේයයි
කියති.

57 ධර්මිෂ්ඨයා පහවයන්නේය,
නුමුත් කිසිවෙක් එය සිතට
නොගන්නේය; භක්තිවන්ත මනුෂ්‍යයෝද
පහකරනු ලබති, නුමුත් ධර්මිෂ්ඨයා
විපත්තිය ඉදිරියෙන් ගෙනයනු ලබන
බව කිසිවෙක් කල්පනාකරන්නේ නැත.
ඔහු සමාදානයට පැමිණෙයි; තමුන්ගේ 2
අවංකකමින් හැසිරෙන්නෝ තමුන්ගේ
යහන්වල නිශ්චලව සිටින්නෝය.
එහෙත් මායාකාරීගේ පුත්‍රයෙනි, 3
පරදාරිකයාගෙන් වේශ්‍යාවගෙන් වංශය,
මෙහි ළංවෙයල්ලා. තුඹලා කාට 4
විරුද්ධව කවටකම්කරන්නහුද? තුඹලා
කාට විරුද්ධව කට අයා දිව දික්-
කරන්නහුද? අලෝන ගස් අතරෙත් 5
සියලුම ගස් යටත් රාගයෙන් දැවෙන්නාවූ,
මිටියාවත්වල පර්වත විවර යට දරුවන්
මරන්නාවූ තුඹලා කැරළිකාරකමේ
දරුවෝත් බොරුකාර වංශයකුත් නො-
වන්නහුද? තුඹේ කොටස තිබෙන්නේ 6
මිටියාවතේ සිනිඳු ගල් අතරෙහිය; ඒවාම
තුඹේ කොටසය. ඒවාට තුඹ පාන
පූජාවක් වගුරුවා ආහාර පූජාවක්ද

*එනම්, සෙනඟගේ,

ඔප්පුකෙළෙහිය. මේ දේවල් තිබියදී මා
7 නිශ්චලව සිටින්නේ කොහොමද? උස්වූ
උසස්වූ කන්දක් උඩ නුඹේ යහන නුඹ
තබාගත්තෙහිය. එතැනද පූජා ඔප්පු-
8 කිරීමට නුඹ නැඟී ගියෙහිය. දොරටත්
උළුවස්සටත් එහායින් නුඹේ සලකුණ
නුඹ තබා තිබේ. මක්නිසාද නුඹ මට
නොව අනිකෙකුට නුඹම ප්‍රකාශවී නැඟී
ගියෙහිය; නුඹේ යහන පළල්කොට
ඔවුන්ගෙන් පොරොන්දු ලබාගත්තෙහිය;
ඔවුන්ගේ යහන දුටු තැනදී ඊට ආලය
9 වූයෙහිය. නුඹ රජු වෙතට තෙල
රැගෙන පැමුණුණෙහිය, නුඹේ සුවඳ දේද
වැඩිකරගත්තෙහිය, නුඹේ තානාපතීන්
නුඹ දුරු රටවලට ඈර, පාතාලය දක්වා
10 පහතට බැස්සෙහිය. නුඹේ මාර්ගයේ
දීර්ඝකම නිසා නුඹ වෙහෙසවූවෙහිය;
එසේ වුවත්: එය නිෂ්ඵලයයි නුඹ
නොකීවෙහිය. නුඹේ අතේ ප්‍රාණවත්කම
සම්බවූ බැවින් නුඹ දුර්වල නූණෙහිය.
11 නුඹ මා සිහි නොකොට, ඒක සිතට
නොගෙන, බොරුකීවේ කාට නැතිගෙන
භයවෙලාද? මම බොහෝ කලක්ම
නිශ්ශබ්දව නොසිටියෙම්ද? නුමුත්
12 නුඹ මා කෙරෙහි භයක් නැත. මම
නුඹේ ධර්මිෂ්ඨකම දන්වන්නෙමි; නුඹේ
ක්‍රියාවලින් නම් නුඹට ප්‍රයෝජන
13 නොලැබේ. නුඹ මොරගසන විට නුඹ
විසින් රැස්කරගත් ඒ දේවල් නුඹ
ගළවාගනීවා; ඒ සියල්ලම හුළඟට
ගහගන යන්නේය, හුස්මකට පහවන්නේය.
නුමුත් මා කෙරෙහි විශ්වාසකරන්නා
දේශය අත්කරගෙන, මාගේ ශුද්ධවූ කන්ද
14 උරුමකරගන්නේය. කෙනෙක් කථාකොට:
සමතලාකරපල්ලා. සමතලාකර, මාර්ගය
පහදා, පැකිලවන දේ මාගේ සෙනඟගේ
මාර්ගයෙන් අහක්කරපල්ලායයි කියනවා
ඇත.

## පීඩා ලත් විශ්වාස අයට පොරොන්දු දීම

15 මක්නිසාද උසස්වූ, උත්කෘෂ්ටවූ,
සදාකාලයෙහි වසන්නාවූ ශුද්ධය යන
නාමය ඇති තැනන්වහන්සේ මෙසේ
කියනසේක: මම උසස්වූ ශුද්ධවූ
ස්ථානයෙහිද යටහතුන්ගේ ආත්මය
ප්‍රාණවත්කරන්ටත් පොඩිවී සිටින්නන්ගේ
සිත ප්‍රාණවත්කරන්ටත් තැළුණාවූ යටහත්
ආත්මයක් ඇත්තා සමග වාසයකරමි.
මම සදාකල්ම විවාද නොකරන්නෙමි, 16
සෑම කල්ම උදහස්ව නොසිටින්නෙමි.
එසේ සිටියොත් මා ඉදිරියෙහි ආත්මයද
මා විසින් මැවූ ප්‍රාණද ක්ලාන්තවී
යන්නෝය. ඔහුගේ තණ්හාවේ වරද 17
නිසා මම උදහස්වී ඔහුට පහරදී, සැඟවී
උදහස්ව සිටියෙමි. එහෙත් ඔහු
හිතුවක්කාරව තමාගේ සිතේ මාර්ග-
යෙහිම ගියේය. මම ඔහුගේ මාර්ග 18
දුටිමි, ඔහු සුවකරන්නෙමි. මම ඔහුට
මගපෙන්වා, ඔහුටත් ඔහු සමග
වැලපෙන්නන්ටත් නැවත සැනසීම
දෙන්නෙමි. මම තොල්වල ඵල උපදවමි. 19
දුර සිටින්නාටත් ළඟ සිටින්නාටත්
සමාදනය වේවා, සමාදනය වේවා; මම
ඔහු සුවකරන්නෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේක. නුමුත් දුෂ්ටයෝ කැලඹී 20
තිබෙන මුහුදට සමානය; මක්නිසාද
ඊට නිශ්චලවන්ට නුපුළුවන, එහි ජලය
මඩ හා කුණු මතුකරයි. දුෂ්ටයන්ට 21
සමාදනය නැතැයි මාගේ දෙවියන්වහන්සේ
කියනසේක.

## සිරිත් විරිත්වලට වඩා යහපත් හැසිරීම අවශ්‍ය බව

58 නොනැවතී හයියෙන් මොරගසා,
හොරණෑවක් මෙන් නුඹේ හඬ
නගා, මාගේ සෙනඟට ඔවුන්ගේ
වරදවල්ද යාකොබ්ගේ වංශයට ඔවුන්ගේ
පව්ද දන්වාපන්න. ඔව්හු දවස්පතා මා 2
සොයති, මාගේ මාර්ගයන් දනගන්ට
ප්‍රසන්නවෙති. ධර්මිෂ්ඨකම් කොට
තමුන්ගේ දෙවියන්වහන්සේගේ නියෝගය
අත්නැර සිටින ජාතියක් මෙන් ඔව්හු
ධර්මිෂ්ඨ නියෝග මාගෙන් ඉල්ලති,
දෙවියන්වහන්සේ වෙතට ළංවීමට
ප්‍රසන්නවෙති. අප නිරාහාරයෙන් සිටිය 3
නුමුත් ඔබ නොබැලුවෙත් අපේ ප්‍රාණවලට
පීඩාකරගත් නුමුත් ඔබ නොසලකා

සිටින්නෙත් මක්නිසාදයි කියති. බලව,
තුඹලාගේ උපවාස දවසේදී තුඹලා සැප
ගනිති, තුඹලාගේ සියලුම වැඩද
4 කරවාගනිති. තුඹලා නිරාහාරව
සිටින්නේ විවාදයටත් තරහයටත්
දුෂ්ටකමේ මිටින් ගසන්ටත්ය. තුඹලාගේ
හඬ උසස්ථානයේ ඇසෙන්ට සැලසෙන
පරිද්දෙන් තුඹලා අද නිරාහාරව
5 සිටින්නේ නැත. මනුෂ්‍යයෙක් තමාගේ
ප්‍රාණය යටත්කරගන්න දවසක් වන මා
විසින් තෝරාගත් උපවාසය එයාකාරද?
එය තමාගේ හිස පන් ගසක් මෙන්
නමාගෙන, ගෝණි රෙදි සහ අළු
අතුරාගත හිඳීමද? මීට උපවාසයක් සහ
**ස්වාමීන්වහන්සේට** ප්‍රසන්නවූ දවසක්යයි
6 තුඹ කියනවාද? මා විසින් තෝරාගත්
උපවාසය නම් දුෂ්ටකමේ විලංගු
මුදහැරීමත්, වියගහේ බැඳුම් ලිහීමත්,
බලාත්කාරය විඳින්නන් නිදහස්කර
හැරීමත්, සියලුම වියගස් තුඹලා විසින්
7 කඩාදැමීමත් නොවේද? බඩගිනි ඇත්තන්ට
තුඹේ කෑම බෙදදීමත්, ගෙයක් දොරක්
නැති අසරණයන් තුඹ විසින් තුඹේ
ගෙදරට පැමිණවීමත්, නිර්වස්ත්‍ර කෙනෙක්
දුටුවිට ඔහුට ඇඳුම් දීමත්, තුඹේම
නෑසියන්ගෙන් නොසැඟවී සිටීමත්
8 නොවේද? එවිට තුඹේ එළිය පහන්-
වේලාව මෙන් උදවන්නේය, තුඹේ
සුවයද ඉක්මනින් හටගන්නේය. තුඹේ
ධර්මිෂ්ඨකම තුඹට පෙරටුවෙන් යන්නේය;
**ස්වාමීන්වහන්සේගේ** තේජසද තුඹට
9 පස්සෙන් එන්නේය. එවිට තුඹ යාච්ඤා-
කරන්නෙහිය. **ස්වාමීන්වහන්සේ** උත්තර-
දෙනසේක; තුඹ මොරගසන කල්හි: මම
මෙහියයි උන්වහන්සේ කියනසේක. තුඹ
*වියගහද ඇඟිල්ල දික්කිරීමද දුෂ්ටලෙස
කථාකිරීමද තුඹ වෙතින් පහකරන්නෙහි
10 නම්, බඩගිනි ඇත්තා කෙරෙහි කරුණාව
පෙන්වා, අසරණ ප්‍රාණය තෘප්තියට
පමුණුවන්නෙහි නම්, අඳුරේදී තුඹේ
එළිය නැගී එන්නේය, තුඹේ කළුවර-
කම ඉරමුදුන් වේලාව මෙන් වන්නේය.

*එනම් බලාත්කාරය.

**ස්වාමීන්වහන්සේ** නිතරම තුඹට මග 11
පෙන්වා, වියළි තැන්වලදී තුඹේ
ප්‍රාණය තෘප්තියට පමුණුවා, තුඹේ ඇටද
ශක්තිමත්කරනසේක; තුඹ වතුර ඇති
උයනක් මෙන්ද දිය සිඳී නොයන
උල්පතක් මෙන්ද වන්නෙහිය. තුඹෙන් 12
පැවතඑන්නෝ පරණ නටබුන් තැන්
ගොඩනගන්නෝය. තුඹ බොහෝ
පරම්පරාවල අත්තිවාරම් ගොඩන-
ගන්නෙහිය; කැඩුම් හරිගස්සන්නාය,
වාසය පිණිස මාවත් අලුත්වැඩියා-
කරන්නායයි තුඹට කියනු ලැබේ. තුඹ 13
මාගේ ශුද්ධ දවසේදී තුඹේම කැමැත්ත
නොකරන හැටියට තුඹේ පාද සබත්
දවසේදී නවත්වාගන, සබත් දවස ප්‍රිය
එකක්ය කියාද **ස්වාමීන්වහන්සේගේ**
ශුද්ධ දවස ගෞරවණීය එකක්ය කියාද
කියන්නෙහි නම්, තුඹේම මාර්ගවල
නොහැසිර තුඹේම කැමැත්ත නොසොයා,
හිස් වචන කථා නොකර, ඊට ගෞරව-
කරන්නෙහි නම්, තුඹ **ස්වාමීන්වහන්සේ** 14
කෙරෙහි ප්‍රීතිමත්වන්නෙහිය; මමද
පොළොවේ උසස්ථාන මතුයෙහි
නැගීයන්ට තුඹට සලස්වා, තුඹේ පියවූ
යාකොබ්ගේ උරුමයෙන් තුඹ පෝෂණ-
යකරන්නෙමි. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේගේ** මුඛය ඒක වදළේය.

## මිදීම ප්‍රමාදවන්නේ සෙනඟගේ වරද නිසා බව

59 බලව, ගළවන්ට බැරි ලෙස
**ස්වාමීන්වහන්සේගේ** අත කොට-
වේලාවත් නෑසෙන ලෙස උන්වහන්සේගේ
කන බිහිරිවේලාවත් නැත. තුඹුත් 2
තුඹලාගේ අපරාධම තුඹලා සහ
දෙවියන්වහන්සේ අතරේ වෙන්වීමක්
කෙළේය, උන්වහන්සේ නොඅසන ලෙස
තුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ
තුඹලාගෙන් සැඟෙවුවේය. මක්නිසාද 3
තුඹලාගේ අත් ලෙයින්ද තුඹලාගේ ඇඟිලි
අපරාධකමෙන්ද කිලුටුවී තිබේ;
තුඹලාගේ තොල් බොරු කීවේය,
තුඹලාගේ දිව දුෂ්ටකම් නික්මවන්නේය.

4 ධර්මිෂ්ඨකමින් හඬගසන කෙනෙක්වත්
සැබෑකමින් නඩුකියන කෙනෙක්වත් නැත.
ඔව්හු හිස්කම කෙරෙහි විශ්වාසය තබා
බොරු කියති; ඔව්හු නපුර පිළිසිඳගෙන
5 අයුක්තිය වදති. ඔව්හු පොළොං බිජු
රකිති, මකුළු දැල් වියති. ඔවුන්ගේ බිජු
කන අය මැරෙති, බිඳෙන බිජුවෙන්
6 පොළඟෙක් නික්මෙයි. ඔවුන්ගේ නූල්
ඇඳුම්වලට ගන්ටවත් තමුන්ගේ වැඩවලින්
ඇඟ වසාගන්ටවත් ඔවුන්ට බැරිවෙයි.
ඔවුන්ගේ වැඩ අපරාධ වැඩය,
බලාත්කාර ක්‍රියා කිරීමද ඔවුන්ගේ
7 අත්වල තිබේ. ඔවුන්ගේ පාදයෝ නපුරට
දුවති, ඔව්හු නිදෙස් ලේ වැගිරවීමට
ඉක්මන්වෙති. ඔවුන්ගේ සිතිවිලි අයුතු-
කමේ සිතිවිලිය; නාස්තිය හා විනාශය
8 ඔවුන්ගේ මාවත්වල තිබේ. සමාදනයේ
මාර්ගය ඔව්හු නොදනිති; ඔවුන්ගේ
මාවත්වල යුක්තිය නැත. ඔව්හු තමුන්ට
ඇද මාවත් සාදගත්තෝය; එහි යන්නාවූ
කිසිවෙක් සමාදනය නොදන්නේය.
9 එබැවින් විනිශ්චය අපෙන් දුරව තිබේ,
ධර්මිෂ්ඨකම අපට ළං නොවන්නේය.
අප එළිය ගැන බලාසිටින නුමුත්
තිබෙන්නේ අඳුරය; දීප්තිමත්කම ගැන
බලාසිටින නුමුත් යන්නේ කළුවරෙහිය.
10 අන්ධයන් මෙන් අපි භිත්තිය අතගගා
යමුව, එසේය, ඇස් නැත්තන් මෙන් අපි
අතගගා යමුව. අඳුරේදී මෙන් අපි
ඉරමුදුන් වේලාවේ පැකිල, මළවුන්
11 මෙන් ඝනාන්ධකාරයෙහි සිටිමුව. අපි
සියල්ලෝම වලසුන් මෙන් ගොරවමුව,
කොබෙයියන් මෙන් කෙඳිරිගාමුව. අපි
විනිශ්චය ගැන බලාසිටිමුව, නුමුත් එය
එන්නේ නැත; ගැළවීම ගැන බලා සිටිමුව,
12 නුමුත් එය අපෙන් දුරව තිබේ. මක්නිසාද
අපේ අපරාධ ඔබවහන්සේ ඉදිරියෙහි
වැඩිවී තිබේ. අපේ පව්ද අපට විරුද්ධව
සාක්ෂිදෙති. අපේ අපරාධ අප සමග
තිබේ, අපේ අයුතුකම් අපි දනිමුව.
13 එනම් **ස්වාමීන්වහන්සේට** විරුද්ධව
අපරාධකිරීමත් බොරුකීමත් අපේ
දෙවියන්වහන්සේ වෙතින් අහක්වයාමත්
බලාත්කාරයද කැරලිගැසීමද ගැන
කථාකිරීමත් බොරු වචන සිතෙන්
උපදවා කථාකිරීමත්ය. යුක්තිය පස්සට 14
හරවාදමනු ලැබීය. ධර්මිෂ්ඨකමද දුරින්
තිබේ. මක්නිසාද සැබෑකම වීථියේ
වැටුණේය, අවංකකමට ඇතුල්වෙන්ට
බැරිය. එසේය, සැබෑකම ඇත්තේ නැත; 15
නපුරෙන් පහවන්නාද කොල්ලයක්
වන්නේය. **ස්වාමීන්වහන්සේ** ඒ දැක
යුක්තිය නැති බැවින් අප්‍රසන්නවූසේක.
උන්වහන්සේද කිසිවෙක් නැති බව දැක, 16
මැදහත්කාරයෙක් නැති බැවින් පුදුමවූ-
සේක. ඒ නිසා උන්වහන්සේගේම බාහුව
තමන්වහන්සේට ගැළවීම ගෙනායේය;
උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්-
වහන්සේව ඉසුලුවේය. උන්වහන්සේ යුද්ධ 17
සැට්ටයක් කොට ධර්මිෂ්ඨකමද තමන්
හිසේ ගැළවීම නැමති තොප්පියද
පැළඳගත්සේක; තවද ඇඳුම පිණිස
පළිගැනීම නැමති වස්ත්‍ර පැළඳගෙන,
ජ්වලිතකම සළුවක් කොට පෙරවාගන
සිටිසේක. උන්වහන්සේ ඔවුන්ගේ ක්‍රියාවල 18
හැටියට තමන්ගේ එදිරිකාරයන්ට
කෝපයද තමන්ගේ සතුරන්ට දඬුවමද
ප්‍රතිඵල කොට දෙනවා ඇත; උන්වහන්සේ
දිවයින්වලට ප්‍රතිඵල දෙනසේක. එවිට 19
බස්නාහිර සිට **ස්වාමීන්වහන්සේගේ**
නාමයටත් නැගෙනහිර සිට උන්-
වහන්සේගේ තේජසටත් මනුෂ්‍යයෝ
භයවන්නෝය. මක්නිසාද **ස්වාමීන්-
වහන්සේගේ** හුස්මෙන් පිඹහරින්නාවූ,
හිරවෙවී ගලන්නාවූ ජලධාරාවක් මෙන්
උන්වහන්සේ එනසේක, මිදුම්කාරයෙක් 20
සියොන් වෙතටත් යාකොබ් තුළ අපරාධ
අත්හරින්නන් වෙතටත් එනවා ඇතැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. තවද: 21
ඔවුන් සමග කරන මාගේ ගිවිසුම මේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. නුඹ
කෙරෙහි තිබෙන මාගේ ආත්මයද මා
විසින් නුඹේ මුඛයෙහි තබා තිබෙන
මාගේ වචනද නුඹේ මුඛයෙන්වත් නුඹේ
වංශයේ මුඛයෙන්වත් නුඹේ මාංසයෙන්
පැවතඑන්නන්ගේ මුඛයෙන්වත් මෙතැන්
පටන් සදාකාලේටම පහ නොවන්නේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## ජාතීන් අතරෙහි සියොනේ මතු තේජස

60 නැගිට බැබළියන්න, මක්නිසාද
නුඹේ ආලෝකය පැමුණුණේය,
ස්වාමීන්වහන්සේගේ තේජසද නුඹ
2 කෙරෙහි උදවිය. එසේය, පොළොව
අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධ-
කාරයෙන්ද වසනු ලබන්නෝය. නුමුත්
නුඹ කෙරෙහි ස්වාමීන්වහන්සේ උදවන-
සේක, උන්වහන්සේගේ තේජසද නුඹ
3 කෙරෙහි පෙනෙන්නේය. ජාතීන් නුඹේ
ආලෝකයටද රජවරුන් නුඹේ උදවීමේ
4 දීප්තියටද එනවා ඇත. නුඹේ ඇස් ඔසවා
වටකර බලාපන්න. ඔවුන් සියල්ලෝම
රැස්වී නුඹ ළඟට එති. නුඹේ පුත්‍රයන්
දුර සිට එනවා ඇත, නුඹේ දූවරුන්ද
උකුළේ වඩාගත එන්ට යෙදෙනවා ඇත.
5 එකල නුඹ දක ප්‍රීතිවන්නෙහිය, නුඹේ
සිතද පිනාගොස් විශාලවන්නේය;
මක්නිසාද මුහුදේ සම්පත් නුඹ වෙත
හැරීඑන්නේය, ජාතීන්ගේ වස්තුද නුඹ
6 ළඟට පැමිණෙන්නේය. ඔටු සමූහයකින්ද
මිදියන් සහ ඒපාහි තරුණ ඔටුවන්ගෙන්ද
නුඹේ ස්ථානය පිරෙන්නේය; ෂෙබායෙන්
ඔවුන් සියල්ලන් එනවා ඇත. ඔවුන්
රන්ද කට්ටකුමංචල්ද ගෙනවුත්
ස්වාමීන්වහන්සේගේ ප්‍රශංසා ප්‍රකාශ-
7 කරනවා ඇත. කේදර්හි සියලු එළු බැටළු
රැළවල් නුඹ වෙතට රැස්කරනු ලැබෙත්,
නෙබායොත්හි බැටළුවෝ නුඹට
සේවයකරත්. උන් මාගේ පූජාසනය
පිටට පැමිණ පිළිගනු ලැබෙත්. මමද
මාගේ තේජසේ ගෘහය අලංකාරකරන්-
8 නෙමි. වලාකුළක් මෙන්ද පරෙවියන්
උන්ගේ කවුළුවලට ඉගිලෙන්නාක්මෙන්ද
9 අර ඉගිලී එන අය කවුරුද? සැබවින්
ද්වීපයෝද පළමු කොට තර්ෂීෂ්හි නැව්ද
මා ගැන බලාසිටින්නෝය. බලාසිටින්-
නේ දුරින් නුඹේ පුත්‍රයන්ද ඔවුන්
සමග ඔවුන්ගේ රන්රිදීද නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේගේ නාමයත් ඉශ්‍රා-
යෙල්ගේ ශුද්ධ තැනන්වහන්සෙත්
නිසා ගෙනෙන පිණිසය; මක්නිසාද
උන්වහන්සේ නුඹට ගෞරවකර තිබේ.
විදේශීහු නුඹේ පවුරු ගොඩනගන්නෝය, 10
ඔවුන්ගේ රජවරුද නුඹට සේවයකරන්-
නෝය. මක්නිසාද මම මාගේ උදහසෙන්
නුඹට පහරදුන් නුමුත් මාගේ කරුණා-
වෙන් නුඹට අනුකම්පාකෙළෙමි.
ජාතීන්ගේ වස්තු නුඹ ළඟට ගෙනෙන 11
පිණිසද ඔවුන්ගේ රජුන් පෙරටුව එන
පිණිසද නුඹේ දොරටු රෑ දවල් නොවසා
නිතරම ඇරී තිබේ. මක්නිසාද නුඹට 12
සේවය නොකරන ජාතියද රාජ්‍යයද
නැතිවන්නේය; එසේය, ඒ ජාතීහු
සහමුලින්ම විනාශවන්නෝය. මාගේ 13
ශුද්ධස්ථානය අලංකාරකිරීමට ලෙබ-
නොන්හි තේජසද දේවදර ගස්ද හල්
ගස්ද තෂ්ෂුර් ගස්ද එක්ව නුඹ ළඟට
පැමිණෙනවා ඇත; මමද මාගේ පාද-
ස්ථානය තේජවත්කරන්නෙමි. නුඹට 14
පීඩාකළ අයගේ පුත්‍රයන්ද නැමී නැමී
නුඹ වෙතට එනවා ඇත; නුඹව සුළුකළ
සියල්ලන්ද නුඹේ පාමුල වැඳවැටෙනවා
ඇත; ඔවුන් නුඹට: ස්වාමීන්වහන්සේගේ
නුවරය කියාත් ඉශ්‍රායෙල්ගේ ශුද්ධ
තැනන්වහන්සේගේ සියොන්ය කියාත්
කියනවා ඇත. කිසිවෙක් නුඹ ළඟින් 15
නොයන ලෙස නුඹ අත්හරිනු ලැබ
වෛරය විඳිනවා වෙනුවට, මම නුඹ
සදකාල උතුම්කමක්ද පරම්පරාවෙන්
පරම්පරාවට ප්‍රීතියක්ද කරන්නෙමි. නුඹ 16
ජාතීන්ගේ කිරි උරා බොන්නෙහිය,
රජුන්ගේ තන උරන්නෙහිය. ස්වාමීන්-
වහන්සේ වන මම නුඹේ ගැළවුම්කාරයා
බවත් නුඹේ මිදුම්කාරයා යාකොබ්ගේ
බලවන්තයාණන්වහන්සේ බවත් නුඹ
දැනගන්නවා ඇත. මම පිත්තල වෙනුවට 17
රත්රන් ගෙනෙන්නෙමි, යකඩ වෙනුවට
රිදීද ලී වෙනුවට පිත්තලද ගල් වෙනුවට
යකඩද ගෙනෙන්නෙමි. මම නුඹේ
මුලාදෑනීන් සමාදානයද නුඹේ ආඥාදු-
කාරයන් ධර්මිෂ්ඨකමද වෙන්ට සලස්-
වන්නෙමි. නුඹේ දේශයෙහි බලාත්- 18
කාරයද නුඹේ සීමා ඇතුළේ නාස්තිය
හා විනාශයද ගැන තවත් අසන්ට නො-
ලැබෙන්නේය; නුඹේ පවුරු ගැළවීමය

කියාද නුඹේ දෙරටු ප්‍රශංසාවය කියාද
19 නුඹ කියන්නෙහිය. ඉර තවත් නුඹේ
දවාලේ එළිය නොවන්නේය; දීප්තිය
පිණිස සඳද නුඹට එළිය නොදෙන්නේය.
නුමුත් **ස්වාමීන්වහන්සේ** නුඹට සදාකාල
එළියක්ද නුඹේ දෙවියන්වහන්සේ නුඹේ
20 තේජසද වනසේක. නුඹේ ඉර තවත්
බැසයන්නේවත්, නුඹේ සඳ පහව
යන්නේවත් නැත. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** නුඹේ සදාකාල එළිය වනසේක,
නුඹේ වැලපීමේ දවස් කෙළවර වන්නේය.
21 නුඹේ සෙනඟ සියල්ලෝම ධර්මිෂ්ඨව,
මා විසින් සිටෙවූ පැළයක්ව, මාගේ
අත්වල කර්මාන්තයව සිට මා ගෞරවය
ලබන පිණිස සදාකාලේටම පොළොව
22 භුක්තිවිඳින්නෝය. කුඩා නැනැත්තා
දහසක්ද සුළු නැනැත්තා බලවත්
ජාතියක්ද වන්නේය. **ස්වාමිවූ** මම
ඒකේ නියම කලට ඒක ඉක්මන්
කරන්නෙමි.

## ආලේපලත් නැනැත්තාගේ මෙහෙය සහ එහි ඵල

61 ස්වාමිවූ දෙවියන්වහන්සේගේ
ආත්මය මා කෙරෙහිය; මක්නිසාද
දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට
**ස්වාමීන්වහන්සේ** මා ආලේප කළසේක;
බිඳුණු සිත් ඇත්තන් සුවකරන්ටද,
වහලුන්ට නිදහසත් හිරකාරයන්ට
හිරගෙයින් මිදීමත් ප්‍රකාශකරන්ටද,
2 **ස්වාමීන්වහන්සේගේ** කරුණාවේ අවු-
රුද්ද සහ අපේ දෙවියන්වහන්සේගේ
පළිගැනීමේ දවසත් ප්‍රකාශකරන්ටද,
3 වැලපෙන සියල්ලන් සනසන්ටද, සියොන්හි
වැලපෙන්නන් පළඳවමින්, අළු වෙනුවට
මාලාවකුත් වැලපීම වෙනුවට ප්‍රීතිය
නැමති තෛලයත් ක්ලාන්ත සිතක්
වෙනුවට ප්‍රශංසාව නැමති වස්ත්‍රයක්
ඔවුන්ට දෙන්ටද උන්වහන්සේ මා එවූ-
සේක. මෙසේ කළේ **ස්වාමීන්වහන්සේට**
ගෞරව ලැබීමට උන්වහන්සේ විසින්
හිටෙවුවාවූ ධර්මිෂ්ඨකමේ අලෝන ගස්ය
කියා ඔවුන් ගැන කියනු ලබන පිණිසය.
ඔව්හු පරණ නටබුන් ඉඩම් ගොඩ- 4
නගන්නෝය, ඉස්සර කාලයේ නටබුන්වූ
තැන් හරිගස්සන්නෝය, නාස්තිවී
පරම්පරාවෙන් පරම්පරාවට පාළුවට
ගොස් තිබුණු නුවරවල් අලුත්-
වැඩියාකරන්නෝය. විදේශියෝ සිට 5
නුඹලාගේ බැටළු රැළවල් පෝෂ්‍ය-
කරන්නෝය, විදේශියෝ නුඹලාගේ
ගොවියෝද නුඹලාගේ මිදිවතු
වවන්නෝද වන්නෝය. නුඹලා වනාහි 6
**ස්වාමීන්වහන්සේගේ** පූජකයෝයයි
කියනු ලබන්නෝය. මනුෂ්‍යයන්
නුඹලාට: අපේ දෙවියන්වහන්සේගේ
සේවකයෝයයි කියනවා ඇත. නුඹලා
ජාතීන්ගේ සම්පත් භුක්තිවිඳ, ඔවුන්ගේ
තේජස හිමිකරගන්නවා ඇත. නුඹලාගේ 7
ලජ්ජාව වෙනුවට දෙගුණයක් ලබන්නහුය;
නින්දාව වෙනුවට ඔව්හු තමුන්ගේ කොටස
ගැන ප්‍රීතිමත්වන්නෝය. එබැවින් ඔව්හු
තමුන්ගේ දේශයෙහි දෙපංගුවක් භුක්ති-
විඳින්නෝය. සදාකාල ප්‍රීතිය ඔවුන්ට
වන්නේය. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 8
වන මම යුක්තියට ප්‍රියව, අධර්මිෂ්ඨකමින්
කොල්ලකෑමට ද්වේෂකරමි; ඉතින් නිසා
මම ඔවුන්ගේ විපාකය සැබෑකමින්
දෙන්නෙමි, සදාකාල ගිවිසුමක්ද ඔවුන්
සමඟ කරන්නෙමි. ඔවුන්ගේ වංශය 9
ජාතීන් අතරේද ඔවුන්ගෙන් පැවතඑන්නෝ
ජනයන් අතරේද ඇඳිනගනු ලැබෙත්.
ඔවුන් **ස්වාමීන්වහන්සේගෙන්** ආශීර්-
වාදලත් වංශය බව ඔවුන් දකින
සියල්ලෝම දැනගන්නෝය.
මම **ස්වාමීන්වහන්සේ** තුළ බොහෝසේ 10
ප්‍රීතිවන්නෙමි, මාගේ ආත්මය මාගේ
දෙවියන්වහන්සේ තුළ සන්තෝෂවන්නේය;
මක්නිසාද මනමාලයා පූජක මකුටයක්
දමාගන්නාක්මෙන්ද මනමාලී ඇගේ
ආභරණ පැළඳගන්නාක් මෙන්ද උන්-
වහන්සේ ගැළවීම නැමති වස්ත්‍ර මට
පැළඳෙවූසේක, ධර්මිෂ්ඨකම නැමති
සළුවද මට පෙරෙවූසේක. මක්නිසාද 11
පොළොව ස්වකීය දළු උපදවන්නාක්මෙන්ද
උයන එහි වපුළ දේ ලියලවන්නාක්මෙන්ද
**ස්වාමිවූ** දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨකම
සහ ප්‍රශංසාව සියලු ජාතීන් ඉදිරියෙහි
හටගන්වනවා ඇත.

## මුදනු ලැබූ සෙනඟගේ සමෘද්ධිය සහ ප්‍රීතිය

62 මම සියොන් උදෙසාත්
යෙරුසලම උදෙසාත් නිශ්ශබ්දව
නොසිටින්නෙමි. එහි ධර්මිෂ්ඨකම
ආලෝකය මෙන්ද එහි ගැළවීම ඇවිලෙන
පහනක් මෙන්ද නික්මෙන තුරු
2 නොනවතින්නෙමි. ජාතීන් නුඹේ
ධර්මිෂ්ඨකමත් සියලු රජවරුන් නුඹේ
තේජසත් දකිනවා ඇත. **ස්වාමීන්-**
**වහන්සේගේ** මුඛයෙන් කියවෙන අලුත්
නමක්ද නුඹට කියන්ට යෙදෙනවා
3 ඇත. නුඹ **ස්වාමීන්වහන්සේගේ** අතෙහි
අලංකාර ඔටුන්නක්ද නුඹේ දෙවියන්-
වහන්සේගේ අතෙහි රාජකිරීටයක්ද
4 වන්නෙහිය. නුඹ අත්හරිනලද්දීයයි
තවත් කියනු නොලබන්නෙහිය, නුඹේ
දේශයට පාළුයයි තවත් නොකියන්-
නෝය. නුඹ *හෙප්සීබා කියාද නුඹේ
දේශය †බෙයුලා කියාද කියනු ලබන්-
නේය. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** නුඹ
කෙරෙහි ප්‍රසන්නය, නුඹේ දේශයද
5 සරණපාවාගනු ලැබේ. මක්නිසාද
තරුණයෙකු විසින් කන්‍යාවක් පාවා
ගන්නාක්මෙන් නුඹේ පුත්‍රයෝ නුඹ
සරණපාවාගන්නෝය. මනමාලයා
මනමාලී කෙරෙහි ප්‍රීතිවන්නාක්මෙන්
නුඹේ දෙවියන්වහන්සේ නුඹ කෙරෙහි
ප්‍රීතිවනසේක.
6 එම්බා යෙරුසලම, නුඹේ පවුරු පිට
මුරකාරයන් සිටෙවුවෙමි; ඔව්හු රෑවත්
දවල්වත් කොහෙත්ම නිශ්ශබ්ද නො-
වන්නෝය. **ස්වාමීන්වහන්සේට** මතක්-
7 කරවන තැනැත්තෙනි, උන්වහන්සේ
යෙරුසලම පිහිටුවා පොළොවෙහි ඒක
ප්‍රශංසාවක් කරන තුරු නුඹලා නිෂ්-
කලංක නොගනිල්ලා, උන්වහන්සේට
8 නිෂ්කලංක නොදෙල්ලා. **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ දකුණත සහ තමන්ගේ බලවත්
හස්තය ගැන දිවුරමින්: සැබවින් නුඹේ
ධාන්‍ය නුඹේ සතුරන්ට කෑම පිණිස
මම තවත් නොදෙන්නෙමි; නුඹ වැඩකර
ලබාගත් නුඹේ මුද්‍රිකයුෂ විදේශීහු
නොබොන්නෝය. නුමුත් ඒවා එකතුකළ 9
අය ඒවා කා, **ස්වාමීන්වහන්සේට** ප්‍රශංසා
කරන්නෝය; ඒවා රැස්කළ අය මාගේ
ශුද්ධ මළුවලදී ඒවා බොන්නෝයයි
කීසේක.
දෙරටුවලින් ඇතුල්වෙයල්ලා, ඇතුල්- 10
වෙයල්ලා; සෙනඟගේ මාර්ගය
පහදපල්ලා; මහ මාවත සමතලාකරපල්ලා,
සමතලාකරපල්ලා; ගල් අහක්කරපල්ලා;
ජනයන්ට කොඩියක් නගාපල්ලා. බලව, 11
**ස්වාමීන්වහන්සේ** පොළොවේ කෙළවර
දක්වා මෙසේ ප්‍රකාශකර තිබේ; අන්න
නුඹේ ගැළවීම එන්නේය; අන්න
උන්වහන්සේගේ බලය උන්වහන්සේ
සමගය, උන්වහන්සේගේ විපාකය
උන්වහන්සේ ඉදිරියෙහිය කියා සියොන්
දුවට කියාපල්ලා. ඔව්හු: ශුද්ධ සෙනඟය 12
කියාත් **ස්වාමීන්වහන්සේගේ** මුදගත් අයය
කියාත් කියනු ලබන්නෝය. නුඹ වනාහි:
සොයාගත් තැනැත්තීය, අත්නෑරිය
නුවරක්ය කියා කියනු ලබන්නෙහිය.

## දිව්‍ය යුද්ධ දක්ෂයා

63 ඒදෙමේ සිට දීප්තිමත් රතු
ඇඳුම් ඇතුව, තමාගේ වස්ත්‍ර-
වලින් ඉසුරුමත්ව, තමාගේ මහත්
බලයෙන් ගමන්කොට, බොශ්රායෙන්
එන්නාවූ මේ තෙම කවුද? ධර්මිෂ්ඨකමින්
කථාකරන්නාවූ ගළවන්ට බලවත්වූ
මමය. ඔබගේ ඇඳුම් රතුව, ඔබගේ වස්ත්‍ර 2
මුද්‍රික පැස පාගන්නෙකුගේ ඇඳුම් මෙන්
තිබෙන්නේ මක්නිසාද? මම තනියම 3
මිදියන්ත්‍රය පෑගීමි; ජනයන්ගෙන් කිසි
මනුෂ්‍යයෙක් මා සමග නොසිටියේය.
එසේය, මාගේ උදහසින් ඔවුන් පෑගීමි,
මාගේ කෝපයෙන් ඔවුන් පොඩිකෙළෙමි;
ඔවුන්ගේ රුධිරය මාගේ ඇඳුම්වල ඉසිරී
තිබේ, එයින් මාගේ සියලු ඇඳුම්
කැලැල්කරගතිමි. මක්නිසාද පළිගැනීමේ 4
දවස මාගේ සිතේ තිබුණේය, මා විසින්
මුදනු ලැබූවන්ගේ අවුරුද්දත් පැමිණ
තිබේ. මම බැලීමි, පිහිටවෙන්ට කිසිවෙක් 5

*එනම්, ඈ කෙරෙහි ප්‍රසන්නවෙමි.
†එනම්, සරණපාවාගනු ලැබූවා.

නොවීය; උසුලන්ට කිසිවෙක් නැති බැවින්
පුදුමවීමි. ඒ නිසා මාගේම හස්තය මට
ගැළවීම ගෙනදුන්නේය; මාගේ කෝපය
6 මා උසුලාගත්තේය. මාගේ උදහසින්
ජනයන් පාගා, මාගේ කෝපයෙන් ඔවුන්
මත්කරවා, ඔවුන්ගේ රුධිරය බිම
වැගිරෙවුවෙමි.

## පසුගිය කරුණාවල් ගැන ප්‍රශංසාව. වර්තමාන වුවමනාවල් ගැන යාච්ඤාව

7 මම ස්වාමීන්වහන්සේගේ කරුණාවල්ද,
ස්වාමීන්වහන්සේ අපට ගෙනදුන් සියල්ල
ලෙස ස්වාමීන්වහන්සේගේ ප්‍රශංසාවල්ද,
උන්වහන්සේගේ අනුකම්පාවල හැටියටත්
උන්වහන්සේගේ කරුණා රාශියේ
හැටියටත් ඉශ්‍රායෙල් වංශයට පැවැත්වූ
මහත් යහපත්කමද සඳහන්කරන්නෙමි.
8 මක්නිසාද උන්වහන්සේ කථාකොට:
සැබවින් ඔව්හු මාගේ සෙනඟය,
ද්‍රෝහිකමින් ක්‍රියා නොකරන දරුවෝයයි
කීසේක. උන්වහන්සේද ඔවුන්ගේ
9 ගැළවුම්කාරයාවූසේක. ඔවුන්ගේ සියලුම
දුක්වලදී උන්වහන්සේ දුක්වූසේක,
උන්වහන්සේගේ අභිමුඛය වන දූත තෙමේ
ඔවුන් ගැළෙවුවේය. උන්වහන්සේ තමන්ගේ
ප්‍රේමයෙනුත් දයාවෙනුත් ඔවුන් මුදා,
පුරාණයේ සියලුම දවස්වල ඔවුන්
10 උසුලාගෙන ගියසේක. නුමුත් ඔව්හු
කැරළිගසා, උන්වහන්සේගේ ශුද්ධාත්මයට
දුක් ඉපදෙවුවෝය. ඒ නිසා උන්වහන්සේ
ඔවුන්ට සතුරෙක් වී, උන්වහන්සේම
11 ඔවුන්ට විරුද්ධව යුද්ධකළසේක. එවිට
උන්වහන්සේ පුරාතන දවස්ද මෝසෙස්
සහ තමන්ගේ සෙනඟද සිහිකළසේක.
තමන්ගේ රැළේ එඬේරා සමග ඔවුන්
මුහුදෙන් ගෙනා තැනන්වහන්සේ
කොයිද? තමන් ශුද්ධාත්මය ඔවුන්
මැද තැබූ තැනන්වහන්සේ කොයිද?
12 මෝසෙස්ගේ දකුණත ළඟ ස්වකීය
තේජවත් බාහුව යන්ට සැලැස්සුවාවූ,
තමන්ට සදාකාල නාමයක් ලබාගැනීමට
13 ඔවුන් ඉදිරියෙන් ජලය බෙදා, කාන්තාරයෙහි
යන අශ්වයෙකු මෙන් නොපැකිලෙන
හැටියට ඔවුන් ගැඹුරු මැදින් ගෙනගියාවූ
තැනන්වහන්සේ කොයිද? ගවරැළ 14
මිටියාවතට බසින්නාක්මෙන් ස්වාමීන්-
වහන්සේගේ ආත්මය ඔවුන් නිශ්චල
භාවයට පැමිණෙවූසේක. තේජවත්
නාමයක් ලබාගැනීමට ඔබ එසේ ඔබගේ
සෙනඟ ගෙනගියසේක. ස්වර්ගයේ සිට 15
ඇස් යොමා, ඔබගේ ශුද්ධකම සහ
තේජසේ නිවාසයේ සිට බැලුව මැනව.
ඔබගේ ජ්වලිතකම සහ බලවත් ක්‍රියා
කොයිද? මා කෙරෙහි වූ ඔබගේ
දයාවද අනුකම්පාද නැවතී තිබේ. මක්- 16
නිසාද ඔබ අපේ පියාණෝය, ආබ්‍රහම්
අප නොදන්න නුමුත්, ඉශ්‍රායෙල් අප
නාඳුනන නුමුත්, ස්වාමීන්වහන්ස,
ඔබම අපේ පියාණෝය, අපේ මිදුම්-
කාරයාණෝය; එය පුරාණයේ සිට
ඔබගේ නාමයය. ස්වාමීන්වහන්ස, ඔබගේ 17
මාර්ගවලින් අප මුළාවයන්ටත් ඔබ
කෙරෙහි භය නොවන සේ අපේ සිත්
දැඩිවෙන්ටත් හරින්නේ මක්නිසාද? ඔබගේ
උරුම-ගෝත්‍ර වන ඔබගේ මෙහෙකරුවන්
නිසා හැරී අව මැනව. ස්වල්ප කලකට 18
ඔබගේ ශුද්ධවූ සෙනඟ එය භුක්ති-
වින්දෝය. අපේ එදිරිකාරයෝ ඔබගේ
ශුද්ධස්ථානය පාගාදැමුවෝය. අපි ඔබ 19
විසින් කිසිකලක ආණ්ඩු නොකළවුන්
මෙන්ද ඔබගේ නාමය නොදරූ අය
මෙන්ද වී සිටිමුව. අහෝ ඔබගේ

## 64

එදිරිකාරයන්ට ඔබගේ නාමය
දන්වන පිණිසද ඔබ ඉදිරියෙහි
ජාතීන් වෙවුලවන පිණිසද ඔබවහන්සේ
අහස පළාගන බසින්ටත්, ගින්න කැලෑව 2
දල්වන්නාක්මෙන්ද ගින්න වතුර උතුර-
වන්නාක්මෙන්ද ඔබ ඉදිරියෙන් කඳු
දියවයන්ටත් යෙදුණොත් හොඳය! අප 3
බලා නොසිටිය භයානක දේ කරමින්
ඔබ බැස්සසේක, ඔබ ඉදිරියේ කඳු දියවී
ගියේය. තමන් ගැන බලා සිටින අය 4
උදෙසා ක්‍රියාකරන්නාවූ ඔබ හැර වෙන
දෙවිකෙනෙක් ඇති බවක් පුරාණයේ
සිට අසන්ට යෙදුණේවත් කනට
වැටුණේවත් ඇසින් දකින්ට යෙදුණේවත්

නැත. ප්‍රීතිවී ධර්මිෂ්ඨකම් කරන්නාවූ,
5 ඔබගේ මාර්ගවලදී ඔබ සිහිකරන්නාවූ
අයට ඔබ සම්බවනසේක. මෙන්න, ඔබ
කෝපවූසේක. අපි පව්කෙළෙමුව. බොහෝ
කලක සිට අපි ඒවායෙ පැවතුණෙමුව,
6 අපට ගැළවීම ලැබේද? අපි සියල්ලෝම
අපවිත්‍ර කෙනෙකු මෙන් වී සිටිමුව, අපේ
සියලුම ධර්මිෂ්ඨකම්ද කිලුටු වස්ත්‍රයක්
මෙන්ය. අපි සියල්ලෝම කොළයක්
මෙන් පරවෙමුව; අපේ අයුතුකම්ද සුළඟ
7 මෙන් අප පහකරගනයියි. ඔබගේ නාමය
කියා යාච්ඤාකරන්නාවූ, ඔබ අල්වා-
ගන්න පිණිස තමාම ප්‍රබෝධ
කරගන්නාවූ කිසිවෙක් නැත. මක්නිසාද
ඔබවහන්සේ ඔබගේ මුහුණ අපෙන්
සඟවා අපේ අපරාධ නිසා අප දියව යන්ට
8 හැරියසේක. ඉතින් **ස්වාමීන්වහන්ස**, ඔබ
අපේ පියාණෝය, අපි මැටිය. ඔබ අපේ
කුම්භකාරයාය; අපි සියල්ලෝ ඔබගේ
9 අතේ කර්මාන්තයය. **ස්වාමීන්වහන්ස**,
ඉතා උදහස් නුව මැනව, අයුතුකම් සෑම
කල්ම සිහිනොකළ මැනව. අනේ බැලුව
මැනව, අපි සියල්ලෝම ඔබගේ සෙනඟය.
10 ඔබවහන්සේගේ ශුද්ධ නුවරවල් කාන්-
තාරයක් වී, සියොන් කාන්තාරයක් වී,
11 යෙරුසලම පාළුවී තිබේ. අපේ පියවරුන්
විසින් ඔබ වර්ණනාකළාවූ අපේ ශුද්ධවූ
අලංකාර ගෘහය ගින්නෙන් දවා තිබේ;
අපේ සියලු ප්‍රසන්න දේවල් නාස්තිවී
12 තිබේ. **ස්වාමීන්වහන්ස**, ඔබ මේවා
තිබෙද්දීත් නිකම් සිටිනසේක්ද? ඔබ
නිශ්ශබ්දව සිට අප තද දුකට පමුණුවන-
සේක්ද?

## ලබ්ධිභේදකයන්ට දඬුවම්

65 මා ගැන විභාග නොකළ අයට
ප්‍රකාශවුණෙමි; මා නොසෙවූ අයට
සම්බවුණෙමි. මාගේ නාමය නොදරූ
ජාතියකට: මම මෙහිය, මම මෙහියයි
2 කීවෙමි. කැරළිකාරවූ, තමුන්ගේ යෝජනා
අනුව හොඳ නැති මාර්ගයක යන්නාවූ
සෙනඟක් දෙසට දවස මුළුල්ලේම මාගේ
අත් විදහාගන සිටියෙමි. ඒ සෙනඟ මා 3
ඉදිරියේදී නිතරම මා කෝපකරති,
උයන්වල පූජාකරති, ගඩොල් පිටද සුවඳ
දුම් ඔප්පුකරති. ඔව්හු සොහොන් අතරේ 4
හිඳිති, රහස් ස්ථානවලද රාත්‍රිය පසුකරති.
ඔව්හු ඌරු මස් කති, පිළිකුල් ද්‍රව්‍යවල
හොද්ද ඔවුන්ගේ භාජනවල තිබේ. මට 5
ළං නොවී ඈතින් සිටින්න, මම නුඹට
වඩා ශුද්ධයෙමියි ඔව්හු කියති. මොව්හු
මාගේ නාසයට ධූමයක්ය, දවස
මුළුල්ලේම ඇවිළෙන ගින්නක්ය. බලව, 6
ඒක මා ඉදිරියෙහි ලියා තිබේ. මම විපාක
දෙන තුරු නිශ්ශබ්දව නොසිටිමි. එසේය, 7
නුඹලාගේ අයුතුකම්ද කඳු උඩ සුවඳ
දුම් ඔප්පුකොට හෙල් උඩ මට අපහාස
කළාවූ නුඹලාගේ පියවරුන්ගේ අයුතු-
කම්ද නිසා ඔවුන්ගේ ළයට ප්‍රතිඵල
දෙන්නෙමි, ඔවුන්ගේ පළමු ක්‍රියාවල්
ඔවුන්ගේ ළයට මැනදෙන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 8
මිදිවල්ලෙහි යුස තිබෙන බව යමෙක්
දැක–එහි ආශීර්වාදයක් තිබෙන බැවින්
එය නාස්ති නොකරන්නැයි කියන්-
නාක්මෙන්, මාගේ මෙහෙකරුවන් නිසා
කරන්නෙමි, මම සියල්ලන් විනාශ
නොකරන්නෙමි. මම යාකොබ්ගෙන් 9
වංශයක්ද යූදගෙන් මාගේ කඳුවල
උරුමක්කාරයෙක්ද නැඟුටුවන්නෙමි.
මාගේ තෝරාගත් අය ඒක උරුම
කරගන්නවා ඇත, මාගේ මෙහෙකරුවන්ද
එහි වසනවා ඇත. මා සෙවූවාවූ මාගේ 10
සෙනඟ උදෙසා ෂාරොන් එළු බැටළු
රැළවලට තෘණ බිමක්ද ආකෝර්
මිටියාවත ගව රැළවලට ලැගුම්පළක්ද
වන්නේය. නුමුත් **ස්වාමීන්වහන්සේ** 11
අත්හැර, මාගේ ශුද්ධ කන්ද සිහිනැතිකර,
*ශ්‍රීකාන්තාවට මේසයක් පිළියෙළ
කරන්නාවූ, මිශ්‍ර වූ මද්‍යපානය ඉරණම
නම් දේවතාවීට පුරවා දෙන්නාවූ
නැනැත්තෙනි, නුඹලා මම කඩුවට 12
නියමකරන්නෙමි; නුඹලා සියල්ලෝම

*එනම්, වාසනාවේ දේවතාවී.

මැරුම් කෑමට අසුවන්නහුය. මක්නිසාද
මා අඬගැසූ විට නුඹලා උත්තර
නුදුන්නහුය, මා කථාකළ විට නුඹලා
නොඅසා, මාගේ ඇස් හමුයෙහි නපුරුව
තිබෙන දේ කොට, මා කැමති නැති දේ
තෝරාගත්තහුය.
13 එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: මෙන්න, මාගේ
මෙහෙකරුවන්ට කන්ට තිබෙද්දී නුඹලාට
බඩගිනි වන්නේය. මෙන්න, මාගේ
මෙහෙකරුවන්ට බොන්ට තිබෙද්දී
නුඹලාට පිපාසා වන්නේය. මෙන්න,
මාගේ මෙහෙකරුවන් ප්‍රීතිවෙද්දී නුඹලාට
14 ලජ්ජාව ඇතිවන්නේය. මෙන්න, මාගේ
මෙහෙකරුවන් සිතේ ප්‍රීතියෙන් ගීකියන
කල්හි නුඹලා සිතේ වේදනාවෙන්
කෑගසමින් ආත්මයේ පෙළීම නිසා
15 කෑමොරගසන්නහුය. නුඹලාගේ නාමය
ශාපයක් පිණිස මාගේ තෝරාගත්තවුන්ට
නුඹලා තබා යන්නහුය, ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** නුඹ නසා තමන්ගේ
මෙහෙකරුවන්ට වෙන නාමයක් තබනවා
16 ඇත. එයින් පොළොවෙහි තමාට
ආශීර්වාදකරගන්න අය සත්‍යතාවේ
දෙවියන්වහන්සේගේ නම කියා
ආශීර්වාදකරගන්නේය; පොළොවෙහි
දිවුරන අයද සත්‍යතාවේ දෙවියන්-
වහන්සේගේ නම කියා දිවුරන්නේය;
මෙසේ වන්නේ පළමු විපත්ති මතකනැතිවී,
ඒවා මාගේ ඇස්වලින් සැඟවී තිබෙන
නිසාය.

## අලුත් පොළොවෙහි ඉශ්‍රායෙල්ගේ වාසනාවන්තකම

17 මක්නිසාද, බලව, මම අලුත් අහසක්ද
අලුත් පොළොවක්ද මවමි. පළමු දේ
මතක්කරනු ලබන්නේවත් සිහිවෙන්නේවත්
18 නැත. එසේය, මා විසින් මවන දෙය
ගැන සදාකාලේටම සතුටුව ප්‍රීතිවෙයල්ලා.
මක්නිසාද මම යෙරුසලම ප්‍රීතිමත්කමක්ද
එහි සෙනඟ ප්‍රීතියක්ද කොට මවමි.
19 මම යෙරුසලම කෙරේ ප්‍රීතිමත්ව, මාගේ
සෙනඟ කෙරේ ප්‍රීතිවන්නෙමි. ඇඬීමේ
ශබ්දයක්වත් කෑගැසීමේ හඬක්වත් එහි
තවත් නොඇසෙන්නේය. දවස් ගණනක 20
ළදරුවෙක්වත් වයස් නොපිරුණු මහල්-
ලෙක්වත් එතනින් තවත් තුරන්දු නොවී,
බාල දරුවා අවුරුදු සියයක් වයස්ව
නසිනවා ඇත. නුමුත් අවුරුදු සියයක්
වයස්වූ පව්කාරයා ශාප ලබනවා ඇත.
ඔව්හු ගෙවල් ගොඩනගාගන එහි 21
වාසයකරන්නෝය; මිදිවතු වවා එහි
එල කන්නෝය. ඔවුන් ගෙවල් ගොඩ- 22
නැගුවාම වෙන කෙනෙක් වාසය-
කරන්නේවත් ඔවුන් වැවුවාම වෙන
කෙනෙක් කන්නේවත් නැත. මක්නිසාද
මාගේ සෙනඟගේ දවස් වෘක්ෂයක දවස්
මෙන් වන්නේය, මාගේ තෝරාගත්
අය තමුන්ගේ අත් වැඩ බොහෝ කල්
භුක්ති විඳින්නෝය. ඔවුන් නිරර්ථකයේ 23
වෙහෙසෙන්නේවත් විපත්තිය පිණිස
උපදවන්නේවත් නැත; මක්නිසාද ඔව්හු
**ස්වාමීන්වහන්සේගෙන්** ආශීර්වාද ලබන්-
නන්ගේ වංශයය, ඔවුන්ගෙන් පැවත
එන්නෝද ඔවුන් සමඟ වන්නෝය. ඔවුන් 24
යාච්ඤාකරන්ට පළමුවෙන් මම උත්තර-
දෙන්නෙමි, ඔවුන් කථාකරද්දීම අසන්-
නෙමි. වෘකයාද බැටළුවස්සාද එකට 25
තෘණ කන්නෝය, සිංහයා හරකා මෙන්
පිදුරු කන්නේය. ධූලි සර්පයාගේ කෑම
වන්නේය. මාගේ ශුද්ධ කන්දේ
සීමා තුළෙහි කිසි අනතුරුකිරීමක්වත්
විනාශකිරීමක්වත් නැතැයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.

## ආත්මික නමස්කාරය ප්‍රධාන බව. විශ්වාස සෙනඟට ලැබෙන විපාක

66 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: අහස මාගේ සිංහාසනයය,
පොළොව මාගේ පාපුටුවය. නුඹලා
කෙබඳු ගෘහයක් මට සාදන්නහුද?
නොහොත් මාගේ නිවාසස්ථානය
කොතැනද? මේ සියල්ල මාගේ අතින් 2
සාදනලද්දේය, එසේ මේ සියල්ල සිදුවීයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එහෙත්

යටහත්වූ, තැළුණු ආත්මයක් ඇත්තාවූ,
මාගේ වචනයට වෙවුලන්නාවූ මනුෂ්‍යයා
3 දෙස බලමි. ගොනෙකු මරන අය
මනුෂ්‍යයෙකු මරන්නෙකු මෙන් වේ; බැටළු
වස්සෙකු පූජාකරන අය බල්ලෙකුගේ
බෙල්ල කඩන අය මෙන් වේ; ආහාර
පූජාවක් ඔප්පු කරන්නා ඌරු ලේ
පුදන්නෙකු මෙන් වේ; කට්ටකුමංචල්
දවන අය පිළිමයකට බුහුමන්කරන
අය මෙන් වේ. එසේය, ඔව්හු තමුන්ගේම
මාර්ග තෝරාගත්තෝය, ඔවුන්ගේ
ආත්මයද ඔවුන්ගේ පිළිකුල්වලට ප්‍රියවේ.
4 මමත් ඔවුන්ට නිසි විපත්ති නියමකොට,
ඔවුන් භයවන දේ ඔවුන් පිටට පමුණු-
වන්නෙමි; මක්නිසාද මා අඬගැසූ විට
කිසිවෙක් උත්තර නුදුන්නේය; මා
කථාකළ විට ඔව්හු නොඇසුවෝය;
ඔව්හු මාගේ ඇස් හමුයෙහි නපුරුව
තිබෙන දේ කර, මා කැමති නැති දේ
තෝරාගත්තෝය.
5 **ස්වාමීන්වහන්සේගේ** වචනයට වෙවුලන
තැනැත්තෙනි, උන්වහන්සේගේ වචනය
අසාපල්ලා. මාගේ නාමය නිසා
තුඹලාට වෛරවී තුඹලා පන්වා දමුවාවූ
තුඹලාගේ සහෝදරයෝ: **ස්වාමීන්-
වහන්සේ** ගෞරව ලබාගන්නසේක්වා,
එවිට තුඹලාගේ ප්‍රීතිය අපට දකින්ට
ලැබේයයි කියති; නුමුත් ඔවුන්ම ලජ්ජාවට
6 පැමිණෙනවා ඇත. ඝෝෂා හඬක් නුවරින්
පැමිණෙන්නේය, දේව මාළිගාවෙන් හඬක්
පැමිණෙන්නේය; එය වනාහි තමන්ගේ
සතුරන්ට ප්‍රතිඵලදෙන **ස්වාමීන්-
7 වහන්සේගේ** හඬය. ප්‍රසව වේදනාව
පැමිණෙන්ට පළමුවෙන් ඈ වැදුවාය;
ඈට විළිරුජාව අල්ලන්ට පළමුවෙන්
8 ඈ පිරිමි දරුවෙකු ප්‍රසූතකළාය. මෙබඳු
දෙයක් ඇසුවේ කවුද? මෙබඳු දේ දුටුවේ
කවුද? එක දවසකදී දේශයක් උපදිනවා
ඇද්ද? නොහොත් සෙනඟක් එකවිටම
උපදිනවා ඇද්ද? සියොන් ප්‍රසව වේදනා
වින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන්
9 වැදුවාය. බිහිවෙන්ට ළංකරන්නාවූ
මම උපදින්ට නොසලස්වන්නෙම්දැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. නොහොත්
බිහිවන්ට සලස්වන්නාවූ මමම ගර්භය
පියන්නෙම්දැයි තුඹේ දෙවියන්වහන්සේ
කියනසේක.
යෙරුසලමට ප්‍රේමකරන සියල්ලෙනි, 10
ඈ සමග සන්තෝෂවී, ඈ කෙරෙහි
ප්‍රීතිමත්වෙයල්ලා; ඈ ගැන වැලපෙන
සියල්ලෙනි, ප්‍රීතියෙන් ඈ සමග
ප්‍රීතිවෙයල්ලා. මෙසේ තුඹලා ඇගේ 11
සැනසිලි නැමති තන උරා තෘප්තියට
පැමිණෙනවා ඇත; ඇගේ තේජසේ
පූර්ණකමින් දෙවාගන භුක්තිවිඳිනවා
ඇත. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මෙසේ 12
කියනසේක: බලව, මම සමාදනය
ගංගාවක් මෙන්ද ජාතීන්ගේ තේජස
ඉතිරෙන ඔයක් මෙන්ද ඈ වෙතට හරවමි,
තුඹලා එයින් උරා බොන්නහුය; උකුළේ
ගෙනයනු ලබන්නහුය, දෙදණ පිට
සුරතල්කරනු ලබන්නහුය. මනුෂ්‍යයෙකු 13
තමාගේ මවු විසින් සනසනු ලබන්-
නාක්මෙන් මම තුඹලා සනසන්නෙමි;
යෙරුසලම තුළද තුඹලා සැනසෙනවා
ඇත. තුඹලා එය දැක තුඹලාගේ සිත් 14
ප්‍රීතිවන්නේය, තුඹලාගේ ඇටද තෘණ
මෙන් සශ්‍රීකවන්නේය. **ස්වාමීන්-
වහන්සේගේ** හස්තයද තමන්ගේ මෙහෙ-
කරුවන්ට ප්‍රකාශවන්නේය, උන්වහන්සේ
තමන්ගේ සතුරන්ට විරුද්ධව කෝප-
වෙනවා ඇත. මක්නිසාද **ස්වාමීන්-** 15
**වහන්සේ** තමන්ගේ උදහස කෝපයෙන්ද
තමන්ගේ තර්ජනය ගිනිදැල්වලින්ද
ඉෂ්ටකරන පිණිස ගිනි සහිතවද
උන්වහන්සේගේ රථ සුළිහුළඟ මෙන්ද
එනවා ඇත. එසේය, **ස්වාමීන්වහන්සේ** 16
ගින්නෙන්ද තමන්ගේ කඩුවෙන්ද
මාංසමයවූ සියල්ලන් සමග විනිශ්චයට
පැමිණෙනවා ඇත. බොහෝ දෙනෙක්ද
**ස්වාමීන්වහන්සේගෙන්** මැරුම් කනවා
ඇත. මැද සිටින කෙනෙකුට පස්සෙන් 17
උයන්වලට යන පිණිස තමුන් ශුද්ධ
පවිත්‍රකරගන්නාවූ, ඌරු මස් සහ පිළිකුල්
දේද මීයන්ද කන්නාවූ අය එක්ව
නැතිවන්නෝයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද මම ඔවුන්ගේ 18
ක්‍රියා සහ යෝජනා දනිමි. සියලු ජාතීන්

සහ භාෂාවන් මා විසින් රැස්කිරීමට
කාලය පැමිණෙන්නේය; ඔව්හු ඇවිත් මාගේ
19 තේජස දකින්නෝය. මම ඔවුන් අතරේ
ලකුණක් තබා, ඔවුන්ගෙන් ගැළවීයන
අය මාගේ කීර්තිය නෑසුවාවූ, මාගේ
තේජස නුදුටුවාවූ දුරස්තර ද්වීපයන් වන
තර්ෂීෂ්හිද පූල්හිද දුනුවායන් සිටින
ලූද්හිද තුබල්හිද යාවාන්හිද සිටින ජාතීන්
වෙතට යවන්නෙමි; ඔවුන් ජාතීන්
අතරෙහි මාගේ තේජස දන්වනවා ඇත.
20 ඉශ්‍රායෙල් පුත්‍රයන් පිරිසිදු භාජනයක
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට පඬුරු
ගෙනෙන්නාක්මෙන් ඔවුන් තුඹලාගේ
සියලු සහෝදරයන් සියලු ජාතීන්
අතරෙන් අශ්වයන් පිටින්ද රථවලින්ද
දෝලාවලින්ද අශ්වතරයන් පිටින්ද
ඔටුවන් පිටින්ද මාගේ ශුද්ධ කන්ද වන
යෙරුසලමට **ස්වාමීන්වහන්සේට** පඬුරක්
කොට ගෙනෙනවා ඇතැයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. ඔවුන්ගෙන්ද 21
සමහරුන් මම පූජකයන් සහ ලෙවී-
වරුන් කොට ගන්නෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. මක්නිසාද මා 22
විසින් සාදන අලුත් අහසත් අලුත්
පොළොවත් මා ඉදිරියෙහි පවතින්නාක්
මෙන් තුඹලාගේ වංශය සහ තුඹලාගේ
නාමය පවතින්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. තවද අමාවකක් අමාවකක් 23
පාසාද සබත් දවසක් සබත් දවසක්
පාසාද මා ඉදිරියෙහි නමස්කාරකරන්ට
සියලු මනුෂ්‍යයෝ එන්නෝයයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. ඔවුන් පිටතට 24
ගොස් මට විරුද්ධව වරදකළ අයින්ගේ
මළකඳන් බලනවා ඇත. මක්නිසාද
ඔවුන්ගේ පණුවා නහින්නේවත් ඔවුන්ගේ
ගින්න නිවෙන්නේවත් නැත; ඔව්හුද
මාංසමයවූ සියල්ලන්ට පිළිකුලක්
වන්නෝය.

# අනාගතවක්තෘවූ යෙරෙමියාගේ පොත

## යෙරෙමියාගේ කැඳවීම. ඔහුට ධෛර්යදීම

1 බෙන්යමින් රටේ අනාතෝත්හි විසූ
පූජකයන්ගෙන් එක්කෙනෙක්වූ
හිල්කියාගේ පුත්‍රවූ යෙරෙමියාගේ වචනයි.
2 ආමොන්ගේ පුත්‍රවූ යූදහි රජවූ යොෂියා-
ගේ දවස්වල, ඔහුගේ රජකමේ දහතුන්-
වෙනි අවුරුද්දේදී, **ස්වාමීන්වහන්සේගේ**
වචනය යෙරෙමියා වෙතට පැමිණියේය.
3 යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ යෙහෝ-
යාකීම්ගේ දවස්වලදීද යොෂියාගේ
පුත්‍රවූ යූදහි රජවූ ශෙදෙකියාගේ
එකොළොස්වෙනි අවුරුද්දේ කෙළවර
දක්වා, එනම් පස්වෙනි මාසයේ
යෙරුසලමේ වැසියන් දස කොට අල්ලා
ගෙනයාම දක්වාද, ඒ පණිවුඩය
පැමිණියේය.
4 **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
5 වෙතට පැමිණ කියනුයේ: මම තුඹ
ගර්භයෙහි සාදන්ට පළමුවෙන් තුඹ
හඳුනාගෙන සිටියෙමි, තුඹ කුසෙන්
නික්මෙන්ට පළමුවෙන් මම තුඹ කැප-
කොට, ජාතීන්ට අනාගතවක්තෘ කෙ-
නෙකු කොට තුඹ නියමකෙළෙමියි කීය.
6 එවිට මම: අනේ, ස්වාමිවූ **දෙවියන්-
වහන්ස**, මම කථාකරන්ට නොදනිමි,
මක්නිසාද මම බාලයෙක්මියි කීමි.
7 නුමුත් **ස්වාමීන්වහන්සේ** මට කථා-
කොට: මම බාලයෙක්මියි නොකියා,
මා විසින් තුඹ යවන සියල්ලන් ළඟට
ගොස්, මා තුඹට අණකරන සියල්ල
8 කියාපන්න. ඔවුන්ට භය නොවන්න;
මක්නිසාද තුඹ ගළවන්ට මම තුඹ
සමග සිටිමියි **ස්වාමීන්වහන්සේ** කියන-
9 සේකැයි කීසේක. එවිට **ස්වාමීන්-
වහන්සේ** ස්වකීය අත දිගුකොට මාගේ
මුඛය ස්පර්ශකළසේක. තවද **ස්වාමීන්-
වහන්සේ** මට කථාකොට: මෙන්න,
මාගේ වචන තුඹේ මුඛයෙහි තැබීමි.
බලව, උදුරන්ට හා කඩාදමන්ටත් 10
නැතිකරන්ට හා හෙළාදමන්ටත්
ගොඩනගන්ට හා සිටුවන්ටත් අද දවසේ
මම තුඹ ජාතීන් කෙරෙහිද රාජ්‍යවල්
කෙරෙහිද පත්කෙළෙමියි කීසේක.
තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 11
වෙතට පැමිණ: යෙරෙමියා තුඹට
පෙනෙන්නේ කුමක්දැයි ඇසීය. මමද:
*කොට්ටම්බා අත්තක් මට පෙනේයයි
කීමි. එවිට **ස්වාමීන්වහන්සේ**: තුඹට 12
පෙනුණා හරිය. මක්නිසාද මාගේ
වචනය ඉෂ්ටකරන පිණිස මම ඒ ගැන
පිබිද සිටිමියි මට කීසේක. **ස්වාමීන්-** 13
**වහන්සේගේ** වචනය දෙවෙනිවර මා
වෙතට පැමිණ: තුඹට පෙනෙන්නේ
කුමක්දැයි ඇසීය. මමද: උතුරන හැළියක්
මට පෙනෙයි; එහි කට උතුරු දෙසින්
අහකට හැරී තිබේයයි කීමි. එවිට 14
**ස්වාමීන්වහන්සේ** මට කථාකොට:
දේශයේ සියලු වැසියන් පිටට උතුරෙන්
විපත්තිය නික්ම එන්නේය. මක්නිසාද 15
උතුරු දිග රාජ්‍යවල සියලුම වංශවලට
අඬගසන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක; ඔව්හු ඇවිත් තම තමුන්ගේ
සිංහාසන යෙරුසලමේ දොරටුවලද එහි
වටකරින් සියලු පවුරුවලට විරුද්ධවද
යූදහි සියලුම නුවරවලට විරුද්ධවද
තබන්නෝය. ඔවුන් මා අත්හැර, අන් 16
දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පුකර, තමුන්ගේ
අත්වල වැඩට නමස්කාරකළ බැවින්,
ඔවුන්ගේ සියලු නපුරුකම් ගැන මම

*හෙබ්‍රෙව්–පිබිදෙන ගහ.

ඔවුන්ට විරුද්ධව මාගේ විනිශ්චයන්
17 ප්‍රකාශකරන්නෙමි. ඒ නිසා තුඹ තුඹේ
ඉඟටිය බැඳගෙන නැගිට සිට, මා තුඹට
අණකරන සියල්ල ඔවුන්ට කියාපන්න.
මා විසින් ඔවුන් ඉදිරියේදී තුඹ නො-
කලඹන පිණිස තුඹ ඔවුන් ඉදිරියෙහි
18 නොකැලඹී සිටින්න. මෙන්න, මම මුළු
දේශය වන යුදහි රජවරුන්ටත් එහි
අධිපතීන්ටත් එහි පූජකයන්ටත් දේශයේ
සෙනඟටත් විරුද්ධව අද තුඹ සුරක්ෂිත
නුවරක්ද යකඩ කුළුනක්ද පිත්තල
19 පවුරුද කෙළෙමි. ඔව්හු තුඹට විරුද්ධව
යුද්ධකරන්නෝය; නුමුත් තුඹෙන්
ජයගන්ට ඔවුන්ට බැරිවන්නේය. මක්-
නිසාද තුඹ ගළවන්ට මම තුඹ සමග
සිටිමියි **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කීසේක.

## ස්වාමීන්වහන්සේට ඉශ්‍රායෙල්ගේ මහත් අවිශ්වාසකම

2 තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
2 මා වෙතට පැමිණ කියනුයේ: තුඹ
ගොස්–**ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේකැයි යෙරුසලම් වැසියන්ට
ඇසෙන ලෙස ප්‍රකාශකර කියාපන්නැයි
කීය. තුඹේ යෞවන කාලයේ ඇලුම්කමත්
තුඹේ විවාහබැඳීමේ ආදරයත් නොවපුළ
දේශයක් වන කාන්තාරයෙහි මා පස්සේ
තුඹ ආ හැටිත් තුඹේ යහපත පිණිස
3 මම සිහිකරමි. ඉශ්‍රායෙල් වනාහි
**ස්වාමීන්වහන්සේට** ශුද්ධකමව උන්-
වහන්සේගේ අස්වැන්නේ ප්‍රථම ඵලව
සිටියේය. ඔහුව නාස්තිකරන සියල්ලෝ
වරදකාරයෝ වන්නෝය; විපත්තිය ඔවුන්
පිටට පැමිණෙන්නේයයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.
4 එම්බා යාකොබ් වංශය සහ ඉශ්‍රායෙල්
වංශයේ හැම පවුල්වල සෙනඟෙනි,
**ස්වාමීන්වහන්සේගේ** වචනය අසාපල්ලා.
5 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
තුඹලාගේ පියවරුන් මා වෙතින් ඈත්වී
දේවරූප පස්සේ ගොස් නිෂ්ඵලකම් කළේ
මා තුළ මොන අධර්මිෂ්ඨකමක් සම්බවූ
6 නිසාද? මිසර දේශයෙන් අප පිටතට
ගෙන, මරුකතර සහ වළවල් ඇත්තාවූ
දේශයක්ද මරණයේ සෙවණ ඇත්තාවූ
දේශයක්ද කිසිවෙකු නොගැවසුණාවූ
කිසි මනුෂ්‍යයෙකු වාසය නොකළාවූ
දේශයක්ද වන කාන්තාරය මැදින් අප
ගෙනාවාවූ **ස්වාමීන්වහන්සේ** කොයිදැයි
ඔව්හු නැසුවෝය. තවද මම සාරවත් 7
දේශයකට, තුඹලා එහි ඵලද එහි හොඳ
දේවල්ද අනුභවකරන පිණිස තුඹලා
ගෙනාවෙමි; නුමුත් තුඹලා ඇතුල්ව
මාගේ දේශය අපිරිසිදුකර, මාගේ
උරුමය පිළිකුලක් කළහුය. පූජකයෝ: 8
**ස්වාමීන්වහන්සේ** කොයිදැයි නැසුවෝය;
ව්‍යවස්ථාවේ යෙදී සිටින්නෝ මා නැඳින
සිටියෝය. පාලකයෝද මට විරුද්ධව
කැරලිගැසුවෝය, ප්‍රොපේතවරුද බාල්ගේ
නමින් අනාගතවාක්‍ය කියා ප්‍රයෝජන
නොවන දේවල් අනුව ගියෝය. එබැවින් 9
තුඹලා සමග මම තවමත් කාරණා
ගෙනහැර දක්වමි, තුඹලාගේ දරුවන්ගේ
දරුවන් සමගත් කාරණා ගෙනහැර
දක්වන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. මක්නිසාද තුඹලා කිත්තිවරුන්ගේ 10
ද්වීපවලට ගොස් බලා, කේදර්ටත් අසා
යවා, හොඳට කල්පනාකර, මෙයාකාර
දෙයක් වූණාද කියා බලාපල්ලා.
යම් ජාතියක් තමුන්ගේ දෙවිවරුන් 11
දෙවි නොවන නුමුත් ඔවුන් මාරුකළෝද?
එහෙත් මාගේ සෙනඟ තමුන්ගේ
මහිමය ප්‍රයෝජන නොවන දේවලට
මාරුකරගත්තෝය. අහෝ ස්වර්ගයෙනි, 12
මේ ගැන විස්මයට පත්වී ත්‍රස්තවී ඉතා
මවිතවෙයල්ලායයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද මාගේ සෙනඟ 13
නපුරු දේවල් දෙකක් කළෝය; ඔව්හු
ජීවන වතුර උල්පතවූ මා අත්හැර,
කටාරම්, එනම් වතුර නාල්ලන්නාවූ
බිඳුණාවූ කටාරම් තමුන්ට කපාගත්තෝය.
ඉශ්‍රායෙල් දාසයෙක්ද? නොහොත් ඔහු 14
ගෙයි උපන් වහලෙක්ද? ඔහු කොල්ලයක්
වී සිටින්නේ මන්ද? තරුණ සිංහයෝ 15
ඔහුට විරුද්ධව ගොරවා තමුන්ගේ හඬ
පවත්වා ඔහුගේ දේශය පාළුවක් කළෝය;
ඔහුගේ නුවරවල වැසියෙක් නොවසන

16 ලෙස ඒවා දලාගියේය. නොප් සහ තාහ්-
පන්හේස්හි පුත්‍රයෝත් නුඹේ ඉස්මුදුන
17 කාදම්මෝය. මේ දේ නුඹට පමුණුවා
ගත්තේ නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
නුඹ මාර්ගයෙහි ගෙනෙන කල නුඹ
විසින් උන්වහන්සේ අත්හැරිය නිසා
18 නොවේද? ඉතින් *ෂීහෝර්හි වතුර බොන
පිණිස මිසරයට යන මාර්ගයෙන් නුඹට
ඇති කම මොකද? නොහොත්
†ගංගාවේ ජලය බොන පිණිස අෂූර්ට
යන මාර්ගයෙන් නුඹට ඇති කම
19 මොකද? නුඹේ දුෂ්ටකම නුඹට
දඬුවම්කරන්නේය, නුඹේ පසුබටවීම්ද
නුඹට අච්චුකරනවා ඇත. එබැවින් නුඹ
විසින් නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
අත්හැර සිටින කාරණයද මා කෙරෙහි
භය නුඹට නැතිකමද නපුරුවූ තික්තවූ
දෙයක් බව බලා දැනගනින්නැයි
සේනාවල **ස්වාමිවූ ස්වාමීන්වහන්සේ**
20 කියනසේක. මක්නිසාද පුරාණයේ සිට
නුඹ නුඹේ වියගහ බිඳ, නුඹේ බැමි
කඩාදමා: මම සේවය නොකරන්-
නෙමියි කීයෙහිය. මෙසේ උස්වූ
සියලු හෙල් පිටද සියලු අමුගස් යටද
නුඹ නැඹුරුව වේශ්‍යාකම්කෙළෙහිය.
21 එහෙත් මා විසින් නුඹ හොඳ මිදිවැළක්ද
මුළුමනින්ම හරිවූ බීජයක්ද කොට හිටවා
තිබුණේය. එසේ වී නම් නුඹ වෙනස්වී
මට වල් මිදිවැළක නරක්වූ පැළයක්
22 වුණේ කොහොමද? නුඹ යවාක්ෂාර
දියෙන් නුඹම සෝදගන බොහෝ
සබන් ගාගත්තත් නුඹේ අපරාධය මා
ඉදිරියෙහි නොමැකී තිබේයයි **ස්වාමිවූ**
23 **දෙවියන්වහන්සේ** කියනසේක. මම
අපවිත්‍ර නොවීම්, මම බාල්වරුන් පස්සේ
නොගියෙමියි නුඹ කියන්නේ කොහොමද?
මිටියාවතෙහි තිබෙන නුඹේ හැසිරීම
බලාපන්න, නුඹ කළේ මොකද කියා
දැනගනින්න. නුඹ එහා මෙහා දුවන
24 ශීඝ්‍ර ඔටුදෙනකි; කාන්තාරයට පුරුදුවූ,
තෘෂ්ණාවට ඉව අල්ලන්නාවූ වල්
කොටළුදෙනකි; ඇගේ කාලයේදී ඈ
නවත්වන්නේ කවුද? ඈව සොයන
කිසිවෙක් වෙහෙසෙන්නේ නැත; ඇගේ
මාසයේදී ඈ සම්බවෙයි. වහන් නැතුව 25
නොතිබෙන හැටියට නුඹේ පාදද
පිපාස නොවන හැටියට නුඹේ උගුරද
ආරක්ෂාකරගනින්න. නුමුත් නුඹ: ඒක
නිෂ්ඵලය, එසේ නොව මම අන්‍යයන්ට
ආදරේවීම්, ඔවුන් පස්සේද යන්නෙමියි
කීවෙහිය. හොරෙක් අසුවූ විට ලජ්ජාවට 26
පැමිණෙන්නාක්මෙන් ඉශ්‍රායෙල් වංශයද
ඔවුන්ගේ රජවරුද ඔවුන්ගේ අධිපති-
යෝද ඔවුන්ගේ පූජකයෝද ඔවුන්ගේ
ප්‍රොපේතවරුද ලජ්ජාවට පැමිණෙති.
ඔව්හු: මාගේ පියාණෝ නුඹයයි දණ්ඩ- 27
කටද: නුඹ මා ඉපදෙවූවෙහියයි ගල-
කටද කියති. මක්නිසාද ඔව්හු මට
තමුන්ගේ මුහුණ නොව පිට පෑවෝය.
එහෙත් ඔවුන්ගේ විපත්ති කාලයේදී: ඔබ
නැඟිට අප ගැළෙවුව මැනවයි ඔවුන්
කියනවා ඇත. නුමුත් නුඹ සාදගත් 28
දෙවිවරු කොයිද? නුඹේ විපත්ති
කාලයේදී නුඹ ගළවන්ට ඔවුන්ට
පුළුවන් නම් ඔව්හු නැගිටිත්වා. මක්නිසාද,
එම්බා යූද, නුඹේ නුවරවල ගණනට
නුඹට දෙවිවරු සිටිති.
නුඹලා මා සමග විවාදකරන්නේ 29
මක්නිසාද? නුඹලා සියල්ලෝම මට
විරුද්ධව කැරළිගැසුවහුයයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. මා විසින් 30
නුඹලාගේ දරුවන්ට පහරදුන්නා
නිෂ්ඵලය; ඔවුන් දැනමුතුකම පිළිගත්තේ
නැත. නුඹලාගේ කඩුව වනාහි
විනාශකරන සිංහයෙකු මෙන් නුඹලාගේ
ප්‍රොපේතවරුන් කාදමුවේය. එම්බා 31
වංශය, **ස්වාමීන්වහන්සේගේ** වචනය
බලාපල්ලා. මම ඉශ්‍රායෙල්වරුන්ට
කාන්තාරයක්ව නොහොත් ඝනාන්ධකාර
දේශයක්ව සිටියෙම්ද? අපි නිදහසට
පැමුණුණෙමුව, අපි තවත් ඔබ ළඟට
නොඑන්නෙමුයයි මාගේ සෙනඟ
කියන්නේ මක්නිසාද? කන්‍යාවක් ඇගේ 32
ආභරණද මනමාලියක් ඇගේ ඉහපටියද
සිහිනැති කරනවා ඇද්ද? එහෙත් මාගේ
සෙනඟ ගණන් නැති දවස්වල මා

*එනම්, නයිල් ගඟ.
†එනම්, ප්‍රාත් ගංගාවේ.

33 සිහිනැතිකළෝය. තුඹ ආදරය සොයන
පිණිස තුඹ තුඹේ මාර්ග හොඳකරගන්න
හැටි! එසේ තුඹ නපුරු ස්ත්‍රීන්ට පවා
34 තුඹේ මාර්ග ඉගැන්වූවෙහිය. තවද
නිර්දෝෂවූ දිළිඳුන්ගේ ප්‍රාණවල ලේ
තුඹේ වස්ත්‍ර කොන්වල සම්බවිය. රහස්
තැන්වල නොව මේ සියල්ල පිට එය
35 තිබෙනවා මට සම්බවිය. එහෙත්: මම
නිර්දෝෂයෙමි; සැබවින්ම උන්වහන්සේගේ
උදහස මාගෙන් පහව ගියේයයි තුඹ
කියන්නෙහිය. බලව: මම පව් නො-
කෙළෙමියි තුඹ කියන නිසා මම තුඹ
36 සමග විනිශ්චයට පැමිණෙන්නෙමි. තුඹේ
මාර්ගය වෙනස්කරන්ට තුඹ ඔපමණ
තැතින් තැන යන්නේ මක්නිසාද? අෂූර්
නිසා තුඹ ලජ්ජාවට පැමුණුණාක්මෙන්
මිසරය නිසාත් තුඹ ලජ්ජාවට පැමිණෙන්-
37 නෙහිය. එතනිනුත් තුඹ තුඹේ අත් ඉස
පිට තබාගෙන පිටත්ව යන්නෙහිය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** තුඹේ
විශ්වාසයන් එපාකර තිබේ, ඒවායින්
තුඹ සඵල නොවන්නෙහිය.

3 මනුෂ්‍යයෙක් තමාගේ භාර්යාව
අත්හැරිය කල, ඈ ඔහු වෙතින්
ගොස් වෙන මනුෂ්‍යයෙකුට වුණොත්,
ඔහු නැවත ඈ වෙතට හැරෙනවා ඇද්ද?
ඒ දේශය ඉතා පිළිකුල් නොවන්නේදැයි
ඔව්හු කියති. තුඹ වනාහි ආලය ඇත්තන්
බොහෝදෙනෙකු සමග වේශ්‍යාකම්-
කෙළෙහිය; එහෙත් මා වෙතට හැරී-
වරෙන්නැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
2 මුඩු කඳු දෙස තුඹේ ඇස් ඔසවා, තුඹ
සංවාසය නොකළේ කොතැන්හිද කියා
බලාපන්න. කාන්තාරයෙහි අරාබියා
මෙන් තුඹ ඔවුන් ගැන බලා ඉඳ, තුඹේ
වේශ්‍යාකම්වලින්ද දුෂ්ටකමින්ද දේශය
3 කිලුටුකෙළෙහිය. ඒ නිසා වැහිවලා
නැවතුණේය. අන්තිම වර්ෂාවද නොආයේය;
එහෙත් තුඹ වේශ්‍යාවෙකුගේ නළල ඇතුව,
4 කිසි ලජ්ජාවක් නැතුව සිටියෙහිය. මාගේ
පියාණෙනි, ඔබ මාගේ තරුණ වයසේ
මිත්‍රයාව සිටිසේකැයි තුඹ මෙවක්
5 පටන් මට අඬ නොගසන්නෙහිද? උන්-
වහන්සේ තමන් උදහස සදාකාලේටම
තබාගන්නාසේක්ද? එය කෙළවර දක්වා
පවත්වනසේක්ද? මෙන්න, තුඹ මෙසේ
කථාකළ නුමුත් නපුරු දේවල් කොට
තුඹේ කැමැත්ත ඉෂ්ටකරගත්තෙහිය.

## යූදා පමණ දෝෂකාර නොවන ඉශ්‍රායෙල්ට හැරීඑන්ට කීම

තවද යොෂියා රජුගේ දවස්වලදී 6
**ස්වාමීන්වහන්සේ** මට මෙසේ කීසේක:
අහක්ව ගියාවූ ඉශ්‍රායෙල් කළ දේ තුඹ
දුටුවෙහිද? ඈ උස්වූ සියලු කඳු උඩටත්
සියලු අමුගස් යටටත් ගොස් එහිදී
වේශ්‍යාකම්කළාය. ඈ ඒ සියල්ල 7
කළායින් පසු: ඈ මා වෙතට හැරීඑනවා
ඇතැයි කීවෙමි; නුමුත් ඈ හැරී ආවේ
නැත. ඇගේ ද්‍රෝහිකාර සහෝදරීවූ යූදා
එය දුටුවාය. එහෙත් ඒ සියලු කාරණා 8
නිසා එනම් අහක්ව ගියාවූ ඉශ්‍රායෙල්
කාමමිථ්‍යාචාරය කළ නිසා මම ඈ
අත්හැරදමා ඇගේ අත්හැරීම් පත්‍රය ඈට
දුන් නුමුත්, ඇගේ ද්‍රෝහිකාර සහෝදරීවූ
යූදාත් භය නොවී ගොස් වේශ්‍යාකම්
කරන බව දුටිමි. ඇගේ වේශ්‍යාකමේ 9
නින්දිතකමින් ඈ දේශය පිළිකුල් කළාය.
ඈ ගල් සහ දඬු සමග කාමමිථ්‍යාචාරය
කළාය. මේ සියල්ල සිදුවූ නුමුත් ඇගේ 10
ද්‍රෝහිකාර සහෝදරීවූ යූදා ඇගේ මුළු
සිතින් නොව බොරුවෙන් මා වෙතට
හැරීආවායයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. තවද **ස්වාමීන්වහන්සේ** මට 11
කථාකොට: අහක්ව ගිය ඉශ්‍රායෙල්
ද්‍රෝහිකාර යූදාට වඩා තමුන් ධර්මිෂ්ඨ
බව පෙන්වා තිබේ. තුඹ ගොස් උතුරු 12
දෙසට මේ වචන ප්‍රකාශකරපන්න:
අහක්ව ගියාවූ ඉශ්‍රායෙල්, හැරීවරෙන්නැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක; මම තුඹලා
දෙස කෝපයෙන් නොබලන්නෙමි;
මක්නිසාද මම කරුණාවන්තයෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක, මම සදා-
කාලේටම උදහස තබා නොගන්නෙමි.
තුඹේ අයුතුකම පමණක් දැනගනින්න, 13
මක්නිසාද තුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව තුඹ කැරළිගසා, එහා මෙහා
සියලු අමුගස් යට අන්‍යයන් ළඟට

ගියෙහිය, මාගේ හඬට අකීකරුවුණෙහි-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
14 අහක්ව ගියාවූ දරුවෙනි, මා වෙතට
හැරීවරෙල්ලායයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක; මක්නිසාද මම තුඹලාට
ස්වාමිපුරුෂයෙක්ය. මම නුවරකින්
එක්කෙනෙක්ද වංශයකින් දෙදෙනෙක්ද
වුවත් තුඹලා පිළිගෙන සියොන්ට
15 ගෙනෙන්නෙමි. මාගේ සිතට එකඟවූ
එඬේරුන්ද තුඹලාට දෙන්නෙමි, ඔවුන්
දැනගැන්මෙන්ද නුවණින්ද තුඹලා
16 පෝෂ්‍යකරනවා ඇත. තුඹලා ඒ
දවස්වලදී දේශයෙහි වැඩිවී සශ්‍රීකවෙන
කල, මනුෂ්‍යයන්: **ස්වාමීන්වහන්සේගේ**
ගිවිසුම් පෙට්ටියයයි තවත් කියන්නේවත්,
ඒ ගැන සිහිවීමක් වන්නේවත් නැත.
ඔව්හු ඒ ගැන සිහි නොකරන්නෝය;
ඒක නැති බවත් නොදනෙන්නේය; ඒක
තවත් සාදනු නොලබන්නේයයි
17 **ස්වාමීන්වහන්සේ** කියනසේක. ඒ
කාලයෙහි යෙරුසලමට: **ස්වාමීන්-**
**වහන්සේගේ** සිංහාසනයයයි කියනවා
ඇත; සියලු ජාතීහුද ඒක ළඟට,
**ස්වාමීන්වහන්සේගේ** නාමය නිසා
යෙරුසලමට, රැස්වන්නෝය. ඔව්හු
තමුන්ගේ නපුරු සිත්වල මුරණ්ඩුකමේ
18 හැටියට තවත් නොහැසිරෙන්නෝය. ඒ
දවස්වලදී යූද වංශය ඉශ්‍රායෙල් වංශය
සමග ගමන්කර, උතුරු දේශයේ සිට
මා විසින් තුඹලාගේ පියවරුන්ට උරුම-
කරදුන් දේශයට එක්ව එනවා ඇත.

### සැබෑ පශ්චාත්තාපය පිළිගන්ට යෙදෙන බව

19 තුමුත් මම කථාකොට: තුඹ දරුවන්
අතරේ ගණන්ගෙන ප්‍රියවූ දේශයක් වන
රාශි ගණන් ජාතීන් අතරෙන් ඉතා
අලංකාර උරුමය තුඹට දෙන්නේ
කොහොමදැයි කීවෙමි. එවිට—මාගේ
පියාණෙනියි තුඹ මට කියා, මා වෙතින්
අහක් නොවී සිටින්ට ඕනෑයයි කීවෙමි.
20 එහෙත්, ඉශ්‍රායෙල් වංශය, භාර්යාවක්
ඇගේ පුරුෂයාට ද්‍රෝහිකම්කරන්-
නාක්මෙන් තුඹලා මට විරුද්ධව
ද්‍රෝහිකම්කළහුයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. හඬක් මුඩු කඳු උඩ ඇසෙයි, 21
එය වනාහි ඉශ්‍රායෙල් පුත්‍රයන් තමුන්ගේ
මාර්ගය පෙරළාගෙන, තමුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** සිහිනැති කළ නිසා
ඔවුන්ගේ ඇඬීම සහ කන්නලව්කිරීමත්ය.
අහක්ව ගියාවූ දරුවෙනි, හැරීවරෙල්ලා, 22
මම තුඹලාගේ පසුබටවීම් සුවකරන්නෙමි.
මෙන්න, අපි ඔබ වෙතට ඇවිත් සිටිමුව;
මක්නිසාද **ස්වාමීන්වහන්ස**, ඔබම අපේ
දෙවියන්වහන්සේය. සැබවින්ම හෙල්ද 23
කඳු රාශියද කෙරෙහි විශ්වාසකිරීම
නිෂ්ඵලය. සැබවින්ම ඉශ්‍රායෙල්ගේ
ගැළවීම අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
තුළ තිබේ. එහෙත් *නින්දිතයා අපේ බාල 24
වයසේ පටන් අපේ පියවරුන්ගේ වස්තුද
ඔවුන්ගේ බැටළුවන් සහ ගවයන්ද
ඔවුන්ගේ පුත්‍රයන් සහ දූවරුන්ද
කාදමුවේය. අපේ ලජ්ජාවෙහි අපි වැටී 25
ඉදිමු, අපේ නින්දවද අප වසාගනීවා.
මක්නිසාද අපේ බාල වයසේ පටන් අද
දවස දක්වා අපිද අපේ පියවරුද අපේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** හඬට කීකරු
නොවී, අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව පව්කෙළෙමුව.

## 4

ඉදින් ඉශ්‍රායෙල්, තුඹ හැරී-
එන්නෙහිනම් තුඹ හැරීඑන්ට
ඕනෑ මා වෙතටයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. තුඹේ පිළිකුල්කම් තුඹ මා
ඉදිරියෙන් පහකළොත්, තුඹ අහක්කරනු
නොලබන්නෙහිය. තුඹ: **ස්වාමීන්වහන්සේ** 2
ජීවමාන බව සැබෑවා සේම කියා
සැබෑකමෙන්ද යුක්තියෙන්ද ධර්මිෂ්ඨ-
කමින්ද දිවුරුවොත්, ජාතීහු උන්-
වහන්සේගේ නාමයෙන් තමුන්ටම
ආශීර්වාදකරගෙන, උන්වහන්සේ තුළ
පාරට්ටුකරගන්නෝය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** යූදහි 3
මනුෂ්‍යයන්ටත් යෙරුසලමටත් මෙසේ
කියනසේක: කටු අතරේ නොවපුරා
පුරන්බිම කොටාගනිල්ලා. යූදහි 4
මනුෂ්‍යයෙනි, යෙරුසලමේ වැසියෙනි,
තුඹලා **ස්වාමීන්වහන්සේ** උදෙසා

*එනම්, බාල් දෙවියා. 11.13 බලනු.

චර්මඡේදිතවී, නුඹලාගේ සිත්වල
චර්මාග්‍රය පහකරපල්ලා. නැත්නම්
නුඹලාගේ ක්‍රියාවල නපුරුකම නිසා
මාගේ කෝපය ගිනි මෙන් නික්ම කිසි-
වෙකුට නිවන්ට බැරිලෙස ඇවිළෙනවා
ඇත.

## භයානක සතුරෙකු විසින් යූදට දඬුවම්කරන බව

5 දේශයෙහි හොරණෑව පිඹපල්ලාය
කියා යූදහි දන්වා, යෙරුසලමෙහි
ප්‍රකාශකරපල්ලා. බලකොටු සහිත
නුවරවලට අප ඇතුල්වෙන පිණිස
රැස්වෙයල්ලාය කියා හයියෙන්
6 මොරගසාපල්ලා. කොඩියක් සියොන්
දෙසට නගාපල්ලා. ගැළවෙන පිණිස
නොනැවතී දුවපල්ලා. මක්නිසාද මම
උතුරෙන් විපත්තියක්ද මහත් විනාශයක්ද
7 පමුණුවන්නෙමි. සිංහයෙක් තමාගේ
කැලෑවෙන් නික්මුණේය; ජාතීන්
නාස්තිකරන්නෙක්ද නික්ම ගියේය; නුඹේ
දේශය පාළුකරන පිණිස ඔහු තමාගේ
ස්ථානයෙන් පිටත්වී ගමන්කරන්නේය;
වැසියෙක් නොසිටින හැටියට නුඹේ
8 නුවරවල්ද විනාශවන්නේය. ඉන්නිසා
ගෝණි රෙදි බැඳගෙන, විලාප කියමින්
කෑමොරගසාපල්ලා. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේගේ** බලවත් උදහස අපෙන් පහව
9 නොගියේය. ඒ දවසේදී රජුගේ සිතද
අධිපතීන්ගේ සිත්ද බයාදුවන්නෝය;
පූජකයෝ විස්මපත්වන්නෝය, අනා-
ගතවක්තෘවරුද ත්‍රස්තවන්නෝයයි
10 **ස්වාමීන්වහන්සේ** කියනසේක. එවිට මම:
අහෝ ස්වාමිවූ **දෙවියන්වහන්ස**—නුඹලා
මට සමාදානය වන්නේය කියා සැබවින්ම
ඔබ මේ සෙනඟත් යෙරුසලමත්
බොහෝසෙයින් රැවටූසේක; එහෙත්
කඩුව ප්‍රාණය දක්වාම වදින්නේයයි
11 කීවෙමි. ඒ කාලයේදී මේ සෙනඟටත්
යෙරුසලමටත් මෙසේ කියනු ලබන්නේය:
කාන්තාරයේ මුඩු කඳුවල ග්‍රීෂ්ම හුළඟක්
එනම් පෙළීමටවත් ශුද්ධකිරීමටවත්
12 නොව, ඊට වඩා සැරවූ හුළඟක් මා
උදෙසා මාගේ සෙනඟවූ දියණියන්
දෙසට පැමිණෙයි. දැන් මමත් ඔවුන්ට
විරුද්ධව විනිශ්චයන් ප්‍රකාශකරන්නෙමි.
බලව. ඔහු වලාකුල් මෙන්ද ඔහුගේ රථ 13
සුළි හුළඟක් මෙන්ද නැඟී එන්නේය.
ඔහුගේ අශ්වයෝ රාජාලීන්ට වඩා
ශීඝ්‍රය. අහෝ අපට දුක්වේ! මක්නිසාද
අපි නාස්තිවීමුව. එම්බා යෙරුසලම, 14
නුඹ ගැළවෙන පිණිස නුඹේ සිත සෝද
එහි නපුරුකම පහකරපන්න. නුඹේ
නිෂ්ඵල යෝජනා කොපමණ කල් නුඹ
තුළ පවතිනවා ඇද්ද? මක්නිසාද හඬක් 15
දාන් සිට ප්‍රකාශකරමින්, එප්‍රායිම් කඳුරටේ
සිට විපත ප්‍රසිද්ධකරන්නේය. ජාතීන්ට 16
සඳහන්කරපල්ලා; මෙන්න, දුර දේශයකින්
රැකවලුන් ඇවිත් යූදහි නුවරවලට
විරුද්ධව තමුන්ගේ හඬ පවත්වන බව
යෙරුසලමට විරුද්ධව ප්‍රකාශකරපල්ලා.
යෙරුසලම මට විරුද්ධව කැරළි- 17
ගැසූ බැවින් කෙතක රැකවලුන් මෙන්
ඔව්හු ඈ වටකරගෙන සිටිතියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. නුඹේ මාර්ගයත් 18
නුඹේ ක්‍රියාවලුත් නිසා මේවා නුඹට
පැමිණියේය; මෙය නුඹේ දුෂ්ටකමය;
මක්නිසාද ඒක තිත්තය, නුඹේ සිතටම
වදින්නේය.
අහෝ මාගේ අතුණු! මාගේ අතුණු! 19
මාගේ සිත තුළම වේදනා විඳිමි; මාගේ
සිත මා තුළ කැලඹෙන්නේය; මට
නිශ්ශබ්දව සිටින්ට බැරිය; මක්නිසාද
හොරණෑ හඬත් යුද්ධ ඝෝෂාවත්, අහෝ
මාගේ ආත්මය, නුඹට ඇසුණේය.
නාස්තියක් පිට නාස්තියක් ප්‍රකාශකරනු 20
ලබන්නේය; මක්නිසාද මුළු දේශයම
නාස්තිවී තිබේ. හදිසියෙන් මාගේ
කූඩාරම්ද මොහොතකින් මාගේ තිරද
නාස්තිවුණේය. මට කොඩිය දකින්ටත් 21
හොරණෑ හඬණ ඇසෙන්ටත් වෙන්නේ
කොපමණ කල්ද? මක්නිසාද මාගේ 22
සෙනඟ අඥානය, ඔව්හු මා නොහඳුනති;
ඔව්හු මෝඩ දරුවෝය, ඔවුන්ට කිසි
තේරුමක් නැත. ඔව්හු නපුර කිරීමට
ප්‍රඥාවන්තය, නුමුත් යහපත කරන්ට
නොදනිති.
මම පොළොව දෙස බැලූ විට ඒක 23
පාළුව හිස්ව තිබෙන බවත් අහස දෙස

බැලූ විට එහි එළිය නැති බවත් දුටිමි.
24 කඳු දෙස බැලූ විට ඒවා සෙලවෙන
බවත් සියලු හෙල් වැනෙන බවත් දුටිමි.
25 මම බැලූ විට මනුෂ්‍යයෙක් නැති බවත්
ආකාශයේ සියලු පක්ෂීන් පලාගිය බවත්
26 දුටිමි. මම බැලූ විට **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි උන්වහන්සේගේ බලවත් උදහස
නිසා සාරවත් දේශය කාන්තාරයක්වූ
බවත් එහි සියලු නුවරවල් කඩාදමා
27 තිබෙන බවත් දුටිමි. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: මුළු දේශය
පාළුවක් වන්නේය; නුමුත් තීන්දුවටම
28 මම ඒක විනාශ නොකරන්නෙමි. මේ
නිසා පොළොව වැලපෙන්නීය, ඉහළ
අහසද කළුවර වන්නේය; මක්නිසාද
මම ඒක කියා නියමකෙළෙමි, මා ඒ
ගැන නැවුණේවත් එයින් අහක්ව
29 යන්නේවත් නැත. සියලු නුවරවල
වැසියෝ අසරුවන්ගේද දුනුවායින්ගේද
ඝෝෂාවට පලාගොස් බැදිවලට
ඇතුල්වෙති, පර්වතවලටද නගිති. සියලුම
නුවරවල් කිසි මනුෂ්‍යයෙක් ඒවායේ
වාසය නොකරන හැටියට අත්හරිනු
30 ලබති. ඉතින් නුඹ නාස්තිවුණාම
කරන්නේ කුමක්ද? නුඹ රතු වස්ත්‍ර
පැලඳගත්තත් ස්වර්ණාහරණවලින්
සැරසුණත් නුඹේ ඇස්වල අඳුන් ගාගත්තත්
නුඹේ අලංකාරවීම නිෂ්ඵලවන්නේය; නුඹේ
ප්‍රේමවන්තයෝ නුඹ ප්‍රතික්ෂේපකරති,
ඔව්හු නුඹේ ප්‍රාණය හානිකරන්ට
31 සොයන්නෝය. මක්නිසාද විළිරුජා ඇති
ස්ත්‍රියෙකුගේ හඬ මෙන්ද කුලුදුලා වදන
ස්ත්‍රියෙකුගේ ගාවිනාව මෙන්ද සියොන්
දුවගේ හඬ මට ඇසුණේය, ඈ හතිදමා,
කෙඳිරිගාමින්, ඇගේ අත් විදහාගන:
අහෝ මට දුකය! මක්නිසාද මාගේ
ප්‍රාණය මිනීමරුවන් නිසා ක්ලාන්තවී
තිබේයයි කියන්නීය.

## සෙනග සහමුලින්ම දූෂ්‍යව සිටීම. දිව්‍ය පළිගැනීම

5 යෙරුසලමේ වීථිවල ඔබ මොබ
දුවගොස් බලා, ප්‍රසිද්ධ තැන්වල
සොයා දැනගනිල්ලා. නුඹලාට මනුෂ්‍යයෙකු
සොයාගන්ට පුළුවන්නම්, යුක්තිය
කරන්නාවූ, විශ්වාසවූ කෙනෙක් එහි
ඇත්නම්, මම ඒ නුවරට කමාවන්නෙමි.
**ස්වාමීන්වහන්සේ** ජීවමාන බව සැබෑවා 2
සේම කියා ඔවුන් කියන නුමුත් සැබවින්
ඔව්හු බොරුවට දිවුරති. **ස්වාමීන්වහන්ස,** 3
ඔබගේ ඇස් විශ්වාසකම දෙස යොමා
තිබෙනවා නොවේද? ඔබ ඔවුන්ට
පහරදුන්සේක, නුමුත් ඔවුන්ට රිදුණේ
නැත; ඔබ ඔවුන් නාස්තිකළසේක,
නුමුත් ඔව්හු හික්මවීම පිළිනොගෙනම
සිටියෝය. ඔව්හු තමුන්ගේ මුහුණ
පර්වතයකට වඩා දැඩිකරගෙන, හැරී-
එන්ට අකමැතිවූවෝය. එවිට මම 4
කථාකොට: සැබවින් මොව්හු දිළින්දෝය.
මොව්හු **ස්වාමීන්වහන්සේගේ** මාර්ගයද
තමුන්ගේ දෙවියන්වහන්සේගේ විනිශ්චයද
නොදන්න බැවින් මෝඩලෙස හැසිරෙති.
මම උත්තමයන් ළඟට ගොස් ඔවුන්ට 5
කථාකරන්නෙමි; මක්නිසාද ඔව්හු
**ස්වාමීන්වහන්සේගේ** මාර්ගයත් තමුන්ගේ
දෙවියන්වහන්සේගේ විනිශ්චයත් දනිතියි
කීමි. නුමුත් මොව්හු එක්ව වියගහ බිඳ,
බැඳුම් කඩා දැමුවෝය. එබැවින් 6
කැලෑවෙන් එන සිංහයෙක් ඔවුන්
මරන්නේය, සැන්දෑ කාලයෙහි එන
වෘකයෙක් ඔවුන් නාස්තිකරන්නේය,
දිවියෙක් ඔවුන්ගේ නුවරවල් ළඟ රැක
ඉන්නේය, ඒවායින් පිටතට යන
සියල්ලෝ ඉරාදමනු ලබන්නෝය. මක්-
නිසාද ඔවුන්ගේ වරද බොහෝවී
ඔවුන්ගේ පසුබටවීම් වැඩිවී තිබේ. මා 7
නුඹට කමාවෙන්නේ කොහොමද? නුඹේ
දරුවෝ මා අත්හැර දෙවිවරු නො-
වන්නවුන් ගැන දිවුළෝය. මා විසින්
කවා ඔවුන් තෘප්තියට පැමිණෙවූවාට
පසුත් ඔව්හු කාමමිථ්‍යාචාරය කළෝය,
ඔව්හු රංචුගැසී වේශ්‍යාවන්ගේ ගෙවලට
ඇතුල්වුණෝය. ඔව්හු හොඳට පෝෂ්‍යවී 8
ඉන්න අශ්වයන් මෙන් අලුයම නැගිට,
එකිනෙකා තම තමාගේ අසල්වාසියාගේ
භාර්යාවට හේෂාරවය කළෝය. මේ 9
කාරණා නිසා මම දඬුවම් නොකර
සිටින්නෙම්ද? මෙබඳු ජාතියකින් මාගේ
ආත්මය පළි නොගන්නේදැයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක.

10 ඇගේ පවුරුවලට නැගී ගොස්
නාස්තිකරපල්ලා. එහෙත් තීන්දුවටම
නැතිනොකරල්ලා. ඇගේ අතු පහකරපල්ලා;
මක්නිසාද ඒවා **ස්වාමීන්වහන්සේට** අයිති
11 නැත. මක්නිසාද ඉශ්‍රායෙල් වංශය සහ
යූද වංශය මට විරුද්ධව බොහෝසෙයින්
ද්‍රෝහිකම්කළෝයයි **ස්වාමීන්වහන්සේ**
12 කියනසේක. ඔව්හු **ස්වාමීන්වහන්සේ** ගැන
බොරු කියා: ඒ උන්වහන්සේ නොවේ;
විපත්තිය අප පිටට නොපැමිණෙයි;
කඩුවවත් සාගතයවත් දකින්ට අපට
13 සිද්ධවෙන්නේ නැත. අනාගතවක්තෘවරු
හුළඟ වන්නෝය, දේව වචනය ඔවුන්
තුළ නැත. ඔවුන්ට මෙසේ කරනු ලැබේ-
14 යයි කීවෝය. එබැවින් තුඹලා ඔය
වචනය කියන නිසා සේනාවල දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, තුඹේ මුඛයේ තිබෙන මාගේ වචන
ගින්නක්ද මේ සෙනඟ දරද කරන්-
නෙමි, එයින් ඔවුන් දලා යනවා ඇත.
15 මෙන්න, ඉශ්‍රායෙල් වංශය, මම
තුඹලාට විරුද්ධව දුර සිට ජාතියක්
ගෙන්වන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. ඔව්හු බලවත් ජාතියක්ය,
පුරාණ ජාතියක්ය, ඔවුන් තුඹ නොදන්න
භාෂාවක් කථාකරන ජාතියක්ය, ඔවුන්
කියන දේ තුඹට තේරෙන්නේ නැත.
16 ඔවුන්ගේ ඊකොපුව විනාහි ඇරී තිබෙන
මිනීවළක් මෙන්ය, ඔවුන් සියල්ලෝම
17 බලවත්තයෝය. ඔවුන් තුඹේ පුත්‍රයන්ද
දූවරුන්ද විසින් කන්ට යුතුවූ තුඹේ
අස්වැන්නද තුඹේ ආහාරද කා දමනවා
ඇත. ඔවුන් තුඹේ බැටළුවන්ද තුඹේ
ගවයන්ද කා දමනවා ඇත; තුඹේ
මිදිවැල්ද තුඹේ අත්තික්කා ගස්ද කා
දමනවා ඇත; තුඹ විශ්වාසකරන තුඹේ
බලකොටු නුවරවල් ඔවුන් කඩුවෙන්
18 නටබුන්කරනවා ඇත. එසේ වී තුමුත්
ඒ දවස්වලදීත් තීන්දුවටම තුඹලා
නැති නොකරන්නෙමියි **ස්වාමීන්-**
19 **වහන්සේ** කියනසේක. තවද: අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මේ සියල්ල අපට කළේ
මක්නිසාදයි තුඹලා අසන කල-තුඹලා
මා අත්හැර තුඹලාගේම දේශයේදී අන්‍ය
දෙවිවරුන්ට සේවයකළාක්මෙන්ම තුඹලාට
අයිති නැති දේශයකදී තුඹලා අන්‍යයන්ට
සේවයකරන්නහුයයි ඔවුන්ට කියාපන්න.
මේක යාකොබ්ගේ වංශය අතරෙහි 20
දන්වමින්ද, යූදහි ප්‍රකාශකරමින්ද,
කියාපල්ලා: මෝඩවූ තේරුම් නැත්තාවූ, 21
ඇස් තිබෙන තුමුත් නොදකින්නාවූ, කන්
තිබෙන තුමුත් නෑසෙන්නාවූ ජනයෙනි,
මේක අසාපල්ලා: මට තුඹලා භයවන්නේ 22
නැද්ද? මා ඉදිරියෙහි වෙවුලන්නේ නැද්දයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. මම වනාහි
සදාකාල නියෝගයක් කොට මුහුදේ
මායිම් පිණිස වැලි තැබුවාවූ තැනන්-
වහන්සේය. ඒකද එය පසුකර නො-
එන්නේය. එහි රැළ ගසන තුමුත් එය
ඉක්මවා යන්ට පුළුවන්වෙන්නේ නැත;
ඒවා ඝෝෂාකරන තුමුත් එය
පසුකරයන්ට නොහැකිය. තුමුත් මේ 23
සෙනඟට මුරණ්ඩු කැරළිකාර සිතක්
තිබේ; ඔව්හු අහක්වී ගියෝය. වර්ෂාව 24
එනම් පළමුවෙනි වර්ෂාවද අන්තිම
වර්ෂාවද නිසි කාලයට දෙන්නාවූ,
ගොයම් කැපීමට නියම සති අපට
සලස්වා දෙන්නාවූ අපේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** කෙරෙහි භය ඇතිව සිටිමුයයි
ඔව්හු තමුන්ගේ සිත් තුළ නොකියති.
තුඹලාගේ අපරාධ නිසා ඒවා පහවුණේය, 25
තුඹලාගේ පාප නිසා ශුභසිද්ධියද
තුඹලාට නොලැබී ගියේය. මක්නිසාද 26
මාගේ සෙනඟ අතරේ දුෂ්ටයෝ සිටිති.
බලා සිටින පක්ෂි වැද්දන් නැමෙන්නාක්
මෙන් ඔව්හු රැක සිටිති; ඔව්හු මලපතක්
තබා මනුෂ්‍යයන් අසුකරගනිති. පක්ෂීන්- 27
ගෙන් පිරී තිබෙන කූඩුවක් මෙන්
ඔවුන්ගේ ගෙවල් රැවටිල්ලෙන් පිරී
තිබේ. ඒ නිසා ඔව්හු මහත්වී සිටිති,
පොහොසත්වී සිටිති. ඔව්හු තරවී 28
දිලිහෙති. එසේය, ඔව්හු අධික ලෙස
දුෂ්ටකම් කරති. සඵලවන පිණිස යුක්තිය
එනම් පියා නැත්තාගේ කාරණය ඔව්හු
නොඅසති; දිළිඳුන්ගේ යුක්තියත්
විනිශ්චය නොකරති. මේ කාරණා 29
නිසා මම දඬුවම් නොකරන්නෙම්ද?
මෙවැනි ජාතියකින් මාගේ ආත්මය
පළි නොගන්නේදයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක.

# යෙරෙමියා



30 පුදුමවූ භයංකාරවූ දෙයක් දේශයේ
31 සිදුවී තිබේ; අනාගතවක්තෘවරු
බොරුවට අනාගතවාක්‍ය කියති, පූජ-
කයෝද ඔවුන්ගේ ආධාරයෙන් ආණ්ඩු-
කෙරෙති. මාගේ සෙනඟද එසේ වීමට
ප්‍රියවෙති; නුමුත් එහි කෙළවරේදී නුඹලා
කරන්නේ කුමක්ද?

## හැරෙන්ට අකමැතිවූ සෙනඟ සතුරා විසින් විනාශකරන බව

6 බෙන්යමින් පුත්‍රයෙනි, යෙරුසලම
තුළින් පලාගොස්, තෙකෝවාහි
හොරණෑ පිඹ, බෙත්-හක්කෙරෙම් උඩ
ලකුණක් නගාපල්ලා. මක්නිසාද
විපත්තියක්ද මහත් විනාශයක්ද උතුරෙන්
2 පැමිණෙන්ට ළඟය. ශෝභනවූ සිවුමැළිවූ
තැනැත්තී වන සියොන් දුව සිඳදමන්නෙමි.
3 එඬේරු ඔවුන්ගේ රැළවල් ඇතුව ඇ
ළඟට එන්නෝය; ඔව්හු ඇට විරුද්ධව
වටකර තමුන්ගේ කූඩාරම් පිහිටුවා, තම
තමුන් සිටින තැන්වලදී උන් කවන්නෝය.
4 තවද ඔවුන් කථාකොට: ඇට විරුද්ධව
යුද්ධය *පිළියෙළ කරපල්ලා; නැගිටපල්ලා,
අපි ඉරමුදුන් වේලාවේදීම නැගීයමුව.
අනේ අපට දුක්වේ! මක්නිසාද
දවාල පහවන්නේය, සවස් සෙවණැලි
5 දික්වන්නේය. නැගිටපල්ලා, අපි රාත්‍රියෙහි
ගොස් ඇගේ මාළිගා විනාශකරමුයයි
6 කියනවා ඇත. මක්නිසාද සේනාවල
**ස්වාමීන්වහන්සේ** මෙසේ කීසේක: ගස්
කපා, යෙරුසලමට විරුද්ධව ගොඩැල්ලක්
නගාපල්ලා. දඬුවම් ලැබිය යුතු නුවර
මේකය; එහි තුළ තිබෙන්නේ බලාත්-
7 කාරකමමය. ළිඳකින් වතුර උනන්-
නාක්මෙන් ඒකේ නපුරුකම උනා-
එන්නේය. බලාත්කාරයත් පීඩාවත් එහි
ඇසෙන්නේය; වේදනාවද පහරදීමද
8 නිතරම මා ඉදිරියෙහි ඇත්තේය. එම්බා
යෙරුසලම, මාගේ ආත්මය නුඹෙන්
වෙන්වී නොයන පිණිසත් මා විසින්
නුඹ පාළුවක්ද වැසියන් නැති දේශයක්ද
නොකරන පිණිසත් දැනමුතුකම් ලබාපන්න.
9 සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: ඉතුරු මිදිඵල දෙවනුව
නෙළාගන්නාක්මෙන් ඉශ්‍රායෙල්වරුන්ගෙන්
ඉතුරුවෙන අයට කරනු ලබන්නේය.
මිදිඵල නෙළාගන්න කෙනෙකු මෙන්
නුඹේ අත නැවත නැවත රිකිලිවලට
පොවාපන්න. අසන හැටියට මම කාට 10
කථාකර අවවාදකරම්ද? ඔවුන්ගේ
කන් අචර්මඡේදිත නිසා ඔවුන්ට
ඇහුම්කන්දෙන්ට බැරිය. මෙන්න,
**ස්වාමීන්වහන්සේගේ** වචනය ඔවුන්ට
නින්දවක් වී තිබේ; ඔව්හු ඊට ප්‍රිය
නොවෙති. ඒ නිසා මම **ස්වාමීන්-** 11
**වහන්සේගේ** කෝපයෙන් පිරී සිටිමි;
එය දරීමෙන් වෙහෙසවී සිටිමි. වීථියේ
ඉන්න ළමයින් පිටත් යෞවනයන්ගේ
සභාව පිටත් එය එකවිට වගුරුවාපන්න.
මක්නිසාද පුරුෂයා භාර්යාව සමගද
වැඩිමහල්ලා වයසින් පූර්ණවූ තැනැත්තා
සමගද අසුවන්නේය. ඔවුන්ගේ 12
ගෙවල්ද කෙත්ද භාර්යාවෝද එකට
අන්‍යයන්ට අයිති වන්නෝය. එසේය,
දේශයේ වැසියන්ට විරුද්ධව මාගේ
අත දිගුකරන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද ඔවුන්ගෙන් කුඩා 13
අය පටන් ලොකු අය දක්වා සියල්ලෝම
අයුතු ලාභය අනුව යති; ප්‍රොපේතවරයා
පටන් පූජකයා දක්වා සියල්ලෝම
වංචාකම් කරති. සමාදානය නැතුව 14
තිබෙද්දී: සමාදානයය, සමාදානයය කියා
මාගේ සෙනඟගේ තුවාලයද ඔව්හු මඳක්
සුවකර තිබේ. ඔව්හු පිළිකුල් දේ 15
කළ නිසා ලජ්ජාවූවෝද? නැත, ඔවුන්
කොහෙත්ම ලජ්ජාවුණේවත් ඔවුන්ට
නින්දව දැනුණේවත් නැත. එබැවින්
වැටෙන්නන් අතරේ ඔවුන් වැටෙනවා
ඇත. මා විසින් ඔවුන්ට දඬුවම්කරන
කාලයෙහි ඔව්හු පැකිල වැටෙන්නෝ-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
නුඹලා මාර්ගවල නැවතී සිට බලා, 16
හොඳවූ මාර්ගය කොයි එකද කියා
පුරාණ මාවත් ගැන අසාගන එහි
පලයල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට
සහනය ලැබේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. නුමුත් ඔව්හු: අපි එහි
නොයන්නෙමුයයි කීවෝය. මමද ඔවුන් 17
කෙරෙහි රැකවලුන් පත්කොට: හො-
රණෑ ශබ්දයට ඇහුම්කන්දීපල්ලායයි

*හෙබ්‍රෙව්: කැපකරපල්ලා.

කීවෙමි; නුමුත් ඔව්හු: අපි ඇහුම්කන්
18 නොදෙන්නෙමුයයි කීවෝය. එබැවින්
ජාතීනි, අසාපල්ලා, එම්බා සමූහයෙනි,
ඔවුන් අතරේ සිද්ධවෙන දේ දැනගනිල්ලා.
19 එම්බා පොළොව, අසාපන්න. මෙන්න,
මේ සෙනඟ මාගේ වචනවලට ඇහුම්කන්
නොදී, මාගේ ව්‍යවස්ථාව එපාකළ
හෙයින්, මම ඔවුන්ගේ යෝජනාවල
ප්‍රතිඵලය වන විපත්තිය ඔවුන් පිටට
20 පමුණුවන්නෙමි. ෂෙබායෙන් කට්ටකුමංචල්ද
දුර දේශයකින් මිහිරි සුවඳ දඬුද මට
ගෙනෙන්නේ කුමටද? නුඹලාගේ දවන
පූජා මට ප්‍රසන්න නැත, නුඹලාගේ
21 යාගද මට ප්‍රිය නැත. එබැවින් **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: මෙන්න,
මේ සෙනඟ ඉදිරියෙහි පැකිලවන දේවල්
තබමි. පියවරු සහ පුත්‍රයෝද අසල්වාසියා
සහ ඔහුගේ මිත්‍රයාද එක්ව ඒවායේ
පැකිල විනාශවන්නෝය.
22 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
අන්න, උතුරු දේශයෙන් සෙනඟක් එති;
මහත් ජාතියක්ද පොළොවේ ඉතා දුර
23 තැන්වලින් නැගිටිනවා ඇත. ඔව්හු දුනු
හා හෙල්ල දරති; ඔව්හු කෲරය.
කරුණාවක් නැත්තෝය; ඔවුන්ගේ හඬ
මුහුද මෙන් ඝෝෂාකරයි; එම්බා සියොන්
දුව, නුඹට විරුද්ධව යුද්ධකරන්ට ඔවුන්
සියලුදෙනා එක්කෙනෙකු මෙන් පේළිගැසී
24 අශ්වයන් පිට නැගී එති. ඒ ප්‍රවෘත්තිය
අප විසින් අසා තිබේ; අපේ අත් දුර්වලවී
තිබේ. දුක්ද වදන ස්ත්‍රියෙකුට මෙන්
25 වේදනාවද අපට අල්ලා තිබේ. කෙතට
නොයල්ලා, මාර්ගයෙහි නොයල්ලා:
මක්නිසාද සතුරාගේ කඩුවද හැම
26 අතින්ම භීතියද තිබේ. මාගේ දියණිය
වන සෙනඟෙනි, ගෝණි රෙදි බැඳගෙන
අළුවල පෙරළී ඉඳ, එකම පුත්‍රයෙකු
උදෙසා මෙන් ඉතා දුක් සහිත
විලාපයකින් වැලපියන්න; මක්නිසාද
විනාශකරන්නා හදිසියෙන් අපට
27 විරුද්ධව එනවා ඇත. නුඹ මාගේ
සෙනඟගේ මාර්ගය විභාගකර දැන-
ගන්නා පිණිස මම නුඹ ඔවුන් අතරෙහි
විභාගකරන්නෙක්ද බලකොටුවක්ද
28 කෙළෙමි. ඔවුන් සියල්ලෝම මුරණ්ඩුවූ
කැරළිකාරයෝව, කේලාම් කියා
ඇවිදින්නෝව, පිත්තල හා යකඩ වැනිව
සිටිති. සියල්ලෝම දූෂ්‍යකම් කරන්නෝය.
මයිනහම සැරෙන් පිඹිනු ලැබේ; ඊයම්ද 29
ගින්නෙන් ද ගියේය. ඔවුන්ගේ උණුකිරීම
නිෂ්ඵලය; මක්නිසාද දුෂ්ටයෝ
වෙන්කරනු නොලද්දෝය. **ස්වාමීන්-** 30
**වහන්සේ** ඔවුන් එපාකළ නිසා: වෙට්ට
රිදීයයි මනුෂ්‍යයෝ ඔවුන්ට නම්
තබන්නෝය.

## පදුනැවිලි තුණොක් දේව මාළිගාව පවා ආරක්ෂාවක් නොවන බව

7 **ස්වාමීන්වහන්සේගෙන්** යෙරෙමියා
වෙතට පැමිණි වචනය මේය.
නුඹ **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ 2
දොරටුවේ සිට එහිදී මේ වචනය ප්‍රකාශ-
කරපන්න. එනම්: **ස්වාමීන්වහන්සේට**
නමස්කාරකරන්ට මේ දොරටුවලින්
ඇතුල්වන යූදහි සියල්ලෙනි, **ස්වාමීන්-
වහන්සේගේ** වචනය අසාපල්ලා.
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-** 3
**වහන්සේ** මෙසේ කියනසේක: නුඹලාගේ
මාර්ග සහ ක්‍රියාවන් හරිගස්සාගනිල්ලා,
එවිට මම මේ ස්ථානයෙහි නුඹලා
වාසයකරවන්නෙමි. මේක **ස්වාමීන්-** 4
**වහන්සේගේ** මාළිගාවය, **ස්වාමීන්-
වහන්සේගේ** මාළිගාවය, **ස්වාමීන්-
වහන්සේගේ** මාළිගාවයයි කියන බොරු
වචන විශ්වාස නොකරල්ලා. නුමුත් 5
නුඹලාගේ මාර්ගද ක්‍රියාද සැබවින්
හරිගස්සාගන, එකිනෙකා අතරේ
ඇත්තටම යුක්තිය කොට, විදේශියාටද 6
මවුපියන් නැත්තාටද වැන්දඹුවටද පීඩා
නොකර, මේ ස්ථානයෙහි නිදොස් ලේ
නොවගුරුවා, නුඹලාටම අන්තරාය
සිදුවීමට අන්‍ය දෙවිවරුන් පස්සේ
නොගොස් සිටින්නහු නම්, මා විසින් 7
නුඹලාගේ පියවරුන්ට ආදියේ සිට
සදාකාලේටම දුන්නාවූ දේශය වන මේ
ස්ථානයෙහි නුඹලා වාසයකරවන්නෙමි.
මෙන්න, නුඹලා ප්‍රයෝජන නොවන 8
බොරුවචන කෙරෙහි විශ්වාසකරගන

9 සිටින්නහුය. නුඹලා සොරකම්කර,
මිනීමරා, කාමමිථ්‍යාචාරයකර, බොරුවට
දිවුරා, බාල්ට සුවඳදුම් ඔප්පුකර, නුඹලා
නොදන්නා අන්‍ය දෙවිවරුන් පස්සේ
10 ගොස්, පසුව ඇවිත්, මාගේ නාමය
තබා තිබෙන මේ ගෘහයේදී මා ඉදිරියෙහි
සිට: අපි ගැළවුණෙමුයයි කියන්නේ මේ
11 සියලු පිළිකුල්කම් කරන පිණිසද? මාගේ
නාමය තබා තිබෙන මේ ගෘහය
සොරුන්ගේ ගුහාවක්යයි නුඹලා සිතන-
වාද? මටත්, එසේය මටත් පෙනෙනවායයි
12 **ස්වාමීන්වහන්සේ** කියනසේක. එහෙත්
පළමු මා විසින් මාගේ නාමය තැබූ
ෂීලෝහිවූ මාගේ ඉඩමට ගොස් මාගේ
සෙනඟවූ ඉශ්‍රායෙල්වරුන්ගේ දුෂ්ටකම
නිසා මා ඊට කළ දේ බලාපල්ලා.
13 ඉතින් නුඹලා මේ සියලු ක්‍රියාවල් කළ
නිසාත්, මා නුඹලාට කථාකළ නුමුත්,
අලුයම් වේලේ පටන්ම කථාකළ නුමුත්,
නුඹලා ඇසුවේවත් මා නුඹලාට අඬගැසූ
නුමුත් නුඹලා උත්තරදුන්නේවත් නැති
14 නිසාත්, මාගේ නාමය තබා තිබෙන්නාවූ,
නුඹලා විශ්වාසය තැබූ ගෘහයටත් මා
නුඹලාට සහ නුඹලාගේ පියවරුන්ට
දුන්නාවූ ස්ථානයටත් මම ෂීලෝට කළ
15 ලෙස කරන්නෙමි. මම නුඹලාගේ සියලු
සහෝදරයන් වන මුළු එප්‍රායිම් වංශය
අහකදැමූවාක්මෙන් නුඹලාත් මා
ඉදිරියෙන් අහක දමන්නෙමි.
16 එබැවින් නුඹ වනාහි මේ සෙනඟ
උදෙසා යාච්ඤා නොකරන්න, ඔවුන්
උදෙසා විලාපයද යාච්ඤාවද ඔප්පු
නොකරන්න, මට කන්නලව්ද නො-
කරන්න. මක්නිසාද මම නුඹේ බසට
17 කන් නොදෙන්නෙමි. යූදාහි නුවරවලත්
යෙරුසලමේ වීථිවලත් ඔවුන් කරන දේ
18 නුඹට පෙනෙනවා නොවේද? මා කෝප-
කරවන ලෙස *අහස්දේවීහට කැවුම්
සෑදීමටත් අන් දෙවිවරුන්ට පානපූජා
වැගිරවීමටත් දරුවෝ දර එක්කරති,
පියවරු ගිනිමොළවති, ස්ත්‍රීහුද පිටි අනති.
19 ඔවුන් කෝපය උපදවන්නේ මටද? තමුන්ගේ

*එනම්—ශුක්‍ර ග්‍රහයා.

මුහුණු ලජ්ජාවට පත්වන හැටියට
තමුන්ටම නොවේදැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. එබැවින් ස්වාමිවූ දෙවියන්- 20
**වහන්සේ** මෙසේ කියනසේක: බලව,
මාගේ උදහසත් මාගේ කෝපයත් මේ
ස්ථානය පිට එනම් මනුෂ්‍යයාද මෘගයාද
කෙතේ ගස්ද භූමියේ ඵලද කෙරෙහි
වගුරවනු ලබන්නේය; එය නොනිවෙන
ලෙස ඇවිළෙන්නේයයි කියනසේක.
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-** 21
**වහන්සේ** මෙසේ කියනසේක: නුඹලාගේ
යාගවලට නුඹලාගේ දවන පූජාවලුත්
එක්කොට මාංස කාපල්ලා. මක්නිසාද 22
මා විසින් නුඹලාගේ පියවරුන් මිසර
දේශයෙන් ගෙනා කාලයේදී මා ඔවුන්
සමග කථාකළෙත් ඔවුන්ට අණකළෙත්
දවනපූජාද යාගද යන කාරණා ගැන
නොවේය. නුමුත් මා ඔවුන්ට අණකළේ: 23
මාගේ හඬට කීකරුවෙයල්ලා, එවිට
මම නුඹලාගේ දෙවියන්වහන්සේ වන්නෙමි,
නුඹලාද මාගේ සෙනඟ වන්නහුය.
නුඹලාට ශුභසිද්ධවන පිණිස මා නුඹ-
ලාට අණකරන්නාවූ මුළු මාර්ගයෙහි
හැසිරියල්ලාය යන දේය. නුමුත් ඔව්හු 24
අසන්නේවත් තමුන්ගේ කන් යොමු-
කරන්නේවත් නැතුව, තමුන්ගේ නපුරු
සිතේ මන්ත්‍රණවලද මුරණ්ඩුකමේද
හැසිරෙමින්, ඉස්සරහට නොව පස්සට
ගියෝය. නුඹලාගේ පියවරුන් මිසර 25
දේශයෙන් පිටත්ව ආ ද සිට අද දක්වා,
දවස්පතා අලුයම නැඟිට, මාගේ සියලු
සේවකයන්වූ අනාගතවක්තෘවරුන්
නුඹලා ළඟට එවීමි. එහෙත් ඔව්හු මාගේ 26
බස් අසන්නේවත් තමුන්ගේ කන්
යොමුකරන්නේවත් නැතුව, තමුන්ගේ
කුළල් තදකරගෙන, තමුන්ගේ පියවරුන්ට
වඩා නපුරුකම් කළෝය.
නුඹ මේ සියලු වචන ඔවුන්ට 27
කථාකරන නුමුත් ඔව්හු නුඹට කන්
නොදෙන්නෝය. නුඹ ඔවුන්ට අඬගසන
නුමුත් ඔව්හු නුඹට උත්තර නොදෙන්-
නෝය. එබැවින්: මොව්හු තමුන්ගේ දෙවිවූ 28
**ස්වාමීන්වහන්සේගේ** හඬට කන් නුදුන්-
නාවූ, දැනමුතුකම පිළි නොගත්තාවූ
ජාතියය. ඔවුන්ගේ මුඛයෙන් සැබෑව
නැතිවී සිඳී ගියායයි ඔවුන්ට කියාපන්න.

29 යෙරුසලම, නුඹේ හිසකේ කපා
අහකදමා, මුඩු කඳු උඩ විලාපයක්
පවත්වාපන්න: මක්නිසාද **ස්වාමීන්-
වහන්සේ** තමන්ව උදහස් කළ පරම්පරාව
30 එපාකර අත්හැරියසේක. මක්නිසාද යූදහි
දරුවෝ මාගේ ඇස් හමුයෙහි නපුරුව
තිබෙන දේ කළෝයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මාගේ නාමය තබා තිබෙන
ගෘහය අපවිත්‍ර කරන්ට ඔවුන් තමුන්ගේ
31 පිළිකුල් දේවල් එහි තබා තිබේ. ඔවුන්
තමුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද ගින්නෙහි
දවන පිණිස හින්නොම්ගේ පුත්‍රයාගේ
මිටියාවතෙහි තිබෙන තෝපෙත්හි උස්
තැන් ගොඩනැගුවෝය: එය මා විසින්
අණකළේවත් ඒක මාගේ සිතට පැමුණු-
32 ණේවත් නැත. එබැවින් ඊට තෝපෙත්ය
කියාවත් හින්නොම්ගේ පුත්‍රයාගේ
මිටියාවතය කියාවත් තවත් නොකියා,
මැරීමේ මිටියාවතය කියන දවස්
පැමිණෙන්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද වළලන්ට ඉඩ
නැතිවන තරම් තෝපෙත්හි මිනී වළලනවා
33 ඇත. මේ සෙනඟගේ මළකඳන්ද
ආකාශයේ පක්ෂීන්ටත් පොළොවේ
මෘගයන්ටත් ගොදුරුවන්නේය: කිසිවෙක්ද
34 උන් භය නොගන්වන්නේය. එවිට යූද
නුවරවලිනුත් යෙරුසලමේ වීථිවලිනුත්
ප්‍රීති හඬද සන්තෝෂ හඬද මනමාලයා-
ගේ හඬද මනමාලියගේ හඬද නවත්වන්-
නෙමි. මක්නිසාද දේශය පාළුවක්
වන්නේය.

## යූද බලවත් අකීකරුකම නිසා විනාශවීම

8 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: ඒ කාලයෙහි යූද රජවරුන්ගේ
ඇටද ඔවුන්ගේ අධිපතීන්ගේ ඇටද
පූජකයන්ගේ ඇටද අනාගතවක්තෘ-
වරුන්ගේ ඇටද යෙරුසලමේ වැසියන්ගේ
ඇටද ඔවුන්ගේ සොහොන්ගෙවලින්
2 එළියට ගෙනැවිත්, ඔවුන් ප්‍රේමකළාවූද,
සේවයකළාවූද, අනුව ගියාවූද, සේන
අසාගත්තාවූද, නමස්කාරකළාවූද ඉරත්
හඳත් මුළු අහස් සේනාවත් ඉදිරියෙහි
ඒවා අතුරා තබන්නෝය. ඒවා එකතු-
කරන්ටවත් වළලන්ටවත් නොයෙදී,
භූමිය මතුපිට කසළ වන්නේය. මේ නපුරු 3
පෙළපතින් ඉතුරුවෙන අය, මා විසින්
පන්නා දැමූ සෑම තැන්වල ඉතුරුවෙන
ඔවුන් සියල්ලෝම, ජීවත්වීමට වඩා
මරණය තෝරාගන්නෝයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
තවද **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන- 4
සේකැයි ඔවුන්ට කියාපන්න: වැටෙන
අය නැගිටින්නේ නැද්ද? නොහොත්
අහකට ගිය අය හැරීඑන්නේ නැද්ද?
යෙරුසලමේ මේ සෙනඟ නිරන්තරයෙන් 5
අහක්ව සිටින හැටියට අහක්ව ගියේ
මක්නිසාද? ඔව්හු වංචාව තදින් අල්වා-
ගෙන: අපි හැරෙන්නේ නැතැයි කියති.
මම ඇහුම්කන්දී ඇසීමි, නුමුත් ඔව්හු 6
යුතුලෙස කථා නොකළෝය. මා කෙළේ
කුමක්දැයි කියා තමාගේ දුෂ්ටකම ගැන
පසුතැවිලිවෙන කෙනෙක් නැත. අශ්වයා
යුද්ධයට වේගයෙන් දුවන්නාක්මෙන්
ඔවුන් සියල්ලෝම තමුන්ගේ දිවීමට
හැරියති. එසේය, ආකාශයේ මානකොකා 7
උගේ කාලයන් දනියි: කොබෙයියාද
වැහිලිහිණියාද කොකාද උන්ගේ ඊමේ
කාලය දැන සිටිති: නුමුත් මාගේ සෙනඟ
**ස්වාමීන්වහන්සේගේ** විනිශ්චය නොදනිති.
අපි ප්‍රඥාවන්තයෝය, **ස්වාමීන්වහන්සේගේ** 8
ව්‍යවස්ථාව අප වෙත ඇත්තේයයි නුඹලා
කියන්නේ කොහොමද? එහෙත්, බලව,
ලියන්නන්ගේ බොරු පන්හිඳ ඒ ව්‍යවස්ථාව
බොරුවක් කර තිබේ. ප්‍රඥාවන්තයෝ 9
ලජ්ජාවට පැමිණ කැලඹී අසුවුණෝය.
මෙන්න, ඔව්හු **ස්වාමීන්වහන්සේගේ**
වචනය එපාකළෝය: ඔවුන් තුළ ඇති
ප්‍රඥාව කුමක්ද? එබැවින් ඔවුන්ගේ 10
භාර්යාවන් අන්‍යයන්ටද ඔවුන්ගේ කෙත්
ඒවා අල්ලාගන්නන්ටද දෙන්නෙමි.
මක්නිසාද කුඩා අය පටන් ලොකු අය
දක්වා සියල්ලෝම අයුතු ලාභය පස්සේ
යති, අනාගතවක්තෘ පටන් පූජකයා
දක්වා සියල්ලෝම ප්‍රයෝගකරති. සමාදානය 11

නැතුව තිබෙද්දී: සමාදානයය, සමාදානයය
කියා මාගේ දියණිය වන සෙනඟගේ
තුවාලය ඔව්හු මදක් සුවකර තිබේ.
12 ඔව්හු පිළිකුල් දේ කළ නිසා ලජ්ජා-
වූවෝද? නැත, ඔවුන් කොහෙත්ම ලජ්ජා-
වුණේවත් ඔවුන්ට නින්දාව දැනුණේවත්
නැත. එබැවින් වැටෙන්නන් අතරෙහි
ඔවුන් වැටෙනවා ඇත. ඔවුන්ට දඬුවම්
පැමිණෙන කාලයෙහි ඔවුන් පැකිල
වැටෙනවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
13 කියනසේක. මම සහමුලින්ම ඔවුන්
විනාශකරන්නෙමි; මිදි වැලේ වලු නැත,
අත්තික්කා ගහේ ඵල නැත, එහි කොළද
වියළීයන්නේය; මමද ඔවුන් පාගාදමන
අය ඔවුන් ගැන නියමකෙළෙමියි
14 **ස්වාමීන්වහන්සේ** කියනසේක. අපි කුමට
නිකම් හිඳිමුද? නුඹලා රැස්වෙයල්ලා,
අපි පවුරු ඇති නුවරවලට වැද එහි
නිශ්ශබ්දව සිටිමුව. මක්නිසාද අප
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව පව්කළ
නිසා අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** අප
විනාශයට පත්කොට වසදිය අපට
15 පොවා තිබේ. සමාදානය ගැන බලා
සිටියෙමුව, නුමුත් කිසි හොඳක් නැත;
සුවවීමේ කාලයක් ගැන බලා සිටියෙමුව,
16 නුමුත් අහෝ! භීතිය ඇත්තේය. දාන්හි
සිට ඔහුගේ අශ්වයන්ගේ හුංකාරය
ඇසෙයි. ඔහුගේ බලවතුන්ගේ හේෂා-
රවයට මුළු දේශය වෙවුලයි; මක්නිසාද
ඔව්හු ඇවිත් දේශය සහ එහි තිබෙන
සියල්ලද නුවර සහ එහි වැසියන්ද
17 නාස්තිකළෝය. මක්නිසාද, මෙන්න, මම
කිසි මන්ත්‍රයකට නොහික්මෙන
සර්පයන්ද පොළඟුන්ද නුඹලා අතරට
එවන්නෙමි; උන් නුඹලාට දෂ්ටකරනවා
ඇතැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
18 අහෝ මාගේ දුක සනසාගන්ට
බැරිතරම්ය! මාගේ සිත මා තුළ ක්ලාන්-
19 තවී තිබේ. බලව, **ස්වාමීන්වහන්සේ**
සියොන්හි නැද්ද? ඈගේ රජ්ජුරුවෝ
ඈ තුළෙහි නැද්දැයි අසන මාගේ දියණිය
වන සෙනඟගේ විලාප හඬ ඉතා දුර
දේශයකින් ඇසෙන්නේය. ඔව්හු තමුන්ගේ
කැපූ පිළිමවලින්ද අන්‍යයන්ගේ නිෂ්ඵල
රූපවලින්ද කුමට මා කෝපකළෝද?
ගොයම් කපන කාලය පසුවිය, ග්‍රීෂ්ම 20
කාලය කෙළවරවිය, එහෙත් අපි නො-
ගැළවුණෙමුව. මාගේ දියණිය වන 21
සෙනඟගේ තුවාලය නිසා මම තුවාල
ලැබ ශෝකයට පැමුණුණෙමි. විස්මපත්-
කම මා අල්ලාගත්තේය. ගිලියද්හි ගුගුල් 22
නැද්ද? එහි වෙදෙක් නැද්ද? ඇත්නම්
මාගේ දියණිය වන සෙනඟගේ සුවය
ලැබී නැත්තේ මක්නිසාද?

## ද්‍රෝහිකාරත්වය සහ රූප වන්දනාව නිසා දුක් සහිත විනාශය

9 අහෝ මාගේ දියණිය වන
සෙනඟගේ මැරුම්කෑවුන් ගැන
රෑ දවල් අඬන පිණිස මාගේ හිස වතුරද
මාගේ ඇස් කඳුළු උල්පතක්ද වුණොත්
යෙහෙකි! අහෝ මාගේ සෙනඟ අත්හැර 2
ඔවුන් වෙතින් යන පිණිස ගමන්-
කාරයන්ගේ නවාතැනක් කාන්තාරයෙහි
මට ඇත්නම්! මක්නිසාද ඔවුන් සියල්-
ලෝම කාමමිථ්‍යාචාරිකයෝය, ද්‍රෝහි-
කාර සභාවක්ය. ඔව්හු බොරුව විදින 3
පිණිස තමුන්ගේ දිව් නමැති දුනු අදිති;
ඔවුන් දේශයෙහි බලවත්ව සිටින්නේ
විශ්වාසකම උදෙසා නොවේය. මක්නිසාද
ඔව්හු නපුරෙන් නපුරට යති, මා නැඳින
සිටිතියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. නුඹලා එකිනෙකා තම තමාගේ 4
අසල්වාසියාගෙන් ප්‍රවේසම්වෙයල්ලා,
කිසි සහෝදරයෙකුද විශ්වාස නො-
කරල්ලා. මක්නිසාද සියලු සහෝදරයන්
ප්‍රයෝගකරනවාම ඇත, සියලු අසල්-
වාසීන්ද කේලාම් කියමින් ඇවිදිනවා
ඇත. ඔවුන් එකිනෙකා තම තමාගේ 5
අසල්වාසියා රවටනවා ඇත, ඔවුන්
සැබෑව කියන්නේ නැත. ඔව්හු තමුන්ගේ
දිවට බොරු කියන්ට ඉගැන්නුවෝය;
ඔව්හු අපරාධකිරීමට වෙහෙසෙති.
නුඹ වාසයකරන්නේ වංචාව මැදය; 6
වංචාව නිසා ඔව්හු මා ඇඳිනගැනීම
එපාකරතියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක.

7 ඒබැවින් සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක; මම ඔවුන් (ලෝහ
මෙන්) උණුකර විමසන්නෙමි; මක්නිසාද
මාගේ දියණිය වන සෙනඟ ගැන වෙන
8 කුමක් කරම්ද? ඔවුන්ගේ දිව මරණයේ
ඊගසක්ය; ඒක වංචාව කථාකරයි.
යමෙක් සමාදානයෙන් තමාගේ අසල්-
වාසියාට කටින් කථාකරන නුමුත් සිතින්
9 ඔහු ගැන ප්‍රයෝගයක් යොදයි. මේ
කාරණා නිසා මා විසින් ඔවුන්ට
දඬුවම්කරන්ට ඕනෑ නොවේද? මෙවැනි
ජාතියකින් මාගේ ආත්මය පළි-
නොගන්නේදැයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක.
10 කඳු ගැන ඇඬීමක්ද ළතෝනියක්ද
කාන්තාරයේ තෘණ බිම් ගැන
විලාපයක්ද පවත්වන්නෙමි, මක්නිසාද
කිසිවෙක් එහි නොයන හැටියට ඒවා
දලා ගියේය; සිව්පාවුන්ගේ හඬ
නෑසෙන්නේය; ආකාශයේ පක්ෂීහුද
මෘගයෝද පලාගොස් අහක්වුණෝය.
11 මම යෙරුසලම ගොඩවල්ද සිවලුන්ගේ
වාසයක්ද කරන්නෙමි; වැසියෙක්
නොසිටින හැටියට මම යූදාහි නුවරවල්
12 පාළුවක් කරන්නෙමි. මේක තේරුම්ගන්ට
පුළුවන් ප්‍රඥාවන්තයා කවුද? ප්‍රකාශකරන
පිණිස මෙය **ස්වාමීන්වහන්සේගේ**
මුඛයෙන් කියනු ලැබුවේ කාටද? කිසිවෙක්
දේශය මැදින් නොයන ලෙස එය
නටබුන්වුණේත් කාන්තාරයක් මෙන් දලා
ගියෙත් මක්නිසාද?
13 **ස්වාමීන්වහන්සේද**: මා විසින් ඔවුන්
ඉදිරියේ තැබූ මාගේ ව්‍යවස්ථාව ඔවුන්
අත්හැර, මාගේ හඬට කීකරු නොවී,
14 එහි නොහැසිර, තමුන්ගේ සිතේ
මුරණ්ඩුකමේ හැටියටත් ඔවුන්ගේ
පියවරුන් ඔවුන්ට ඉගැන්නූ ලෙස බාල්
දේවතාවුන් පස්සෙන් ගිය නිසායයි
15 කියනසේක. ඒබැවින් ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක; බලව, මම මොවුන්ට,
එනම් මේ සෙනඟට කොසඹ එළ
කවන්නෙමි, වසදිය පොවන්නෙමි.
16 ඔවුන්වත් ඔවුන්ගේ පියවරුන්වත්
දැනනොගත් ජාතීන් අතරට ඔවුන්
විසුරුවා, මම ඔවුන් නැතිකරන තුරු
කඩුව ඔවුන් පසුපස්සේ හරින්නෙමි.

නුඹලා කල්පනාකොට විලාපකියන 17
ස්ත්‍රීන්ට අඬගසා එන්ට කියාපල්ලා;
ප්‍රඥාවන්තියන්ට එන්ට කියා ඇරපල්ලා-
යයි සේනාවල **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. ඔව්හු ඉක්මන්කොට, අපේ 18
ඇස්වලින් කඳුළු වැගිරෙන පිණිසත් අපේ
ඇසිපියවලින් වතුර ගලන පිණිසත්
අප ගැන ළතෝනියක් පවත්වත්වා.
මක්නිසාද: අප නාස්තිවුණ හැටි! අප 19
දේශය අත්හැරිය නිසාද ඔවුන් අපේ
වාසස්ථාන හෙළාදැමූ නිසාද අපි ඉතා
වියවුල්ව සිටිමුව යන ළතෝනි හඬක්
සියොන් කෙරෙන් ඇසුණේය. එහෙත් 20
ස්ත්‍රීවරුනි, **ස්වාමීන්වහන්සේගේ** වචනය
අසාපල්ලා. උන්වහන්සේගේ මුඛයේ
වචනය නුඹලාගේ කන්වල වැටේවා,
නුඹලාගේ දූවරුන්ට ළතෝනි කීමද
එකිනෙකා තම තමාගේ අසල්වාසී
ස්ත්‍රියට විලාපකීමද උගන්වාපල්ලා.
මක්නිසාද වීදිවලින් ළමයින්ද 21
එළිමහන්වලින් යෞවනයන්ද සිඳදමන
පිණිස මරණය අපේ කවුළුවලින් නැගී
ඇවිත් අපේ මාළිගාවලට වැදුණේය.
මනුෂ්‍යයන්ගේ මළකඳන් කෙත් පිට 22
කසළ මෙන්ද ගොයම් කපන්නාට
පස්සෙන් ගොයම් මිටි මෙන්ද වැටෙනවා
ඇත, කිසිවෙක් ඒ එකතු නොකරන්නේය
කියා **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කියාපන්න.

**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 23
ප්‍රඥාවන්තයා තමාගේ ප්‍රඥාව ගැන
පාරට්ටුකර නොගනීවා, බලවන්තයාද
තමාගේ බලය ගැන පාරට්ටුකර
නොගනීවා, වස්තුකාරයා තමාගේ
වස්තුව ගැන පාරට්ටුකර නොගනීවා.
නුමුත් පාරට්ටුකරගන්නා පොළොවෙහි 24
කරුණාවත් විනිශ්චයත් ධර්මිෂ්ඨකමත්
පවත්වන **ස්වාමීන්වහන්සේ** මමයයි
තේරුම්ගෙන, මා දැනගැනීම නම්වූ
කාරණය ගැනම පාරට්ටුකරගනීවා,
මක්නිසාද මා ප්‍රියවෙන්නේ මේ දේවලට-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
බලව, අචර්මඡේදිතව සිටින සියලු 25
චර්මඡේදිතයන්ට, එනම් මිසරයටද 26
යූදාටද ඒදෝම්ටද අම්මොන් පුත්‍රයන්ටද

මෝවබ්ටද තමුන්ගේ රැවුල් කොන්
කපුවාවූ කාන්තාරයෙහි වාසයකරන්නාවූ
සියල්ලන්ටද මා විසින් දඬුවම්කරන
දවස් පැමිණෙන්නේය. මක්නිසාද සෑම
ජාතිහු අචර්මඡේදිතවද මුළු ඉශ්‍රායෙල්
වංශය සිතින් අචර්මඡේදිතවද සිටිතියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## රූප වන්දනාවේ ඇති හිස්කම

10 එම්බා ඉශ්‍රායෙල් වංශය, **ස්වාමීන්-**
**වහන්සේ** තුඹලාට කියන වචනය
2 අසාපල්ලා. **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: ජාතීන්ගේ මාර්ගය ඉගෙන
නොගනිල්ලා, අහසේ ලකුණුවලට ජාතීන්
කැලඹෙන නුමුත් තුඹලා ඒවාට
3 නොකැලඹෙල්ලා; මක්නිසාද ජනයන්ගේ
චාරිත්‍ර නිෂ්ඵලය. එසේය, කෙනෙක්
වනයෙන් ගහක් කපාගනිති; එය
කම්කරුවාගේ අත්වලින් පොරවෙන්
4 කරන වැඩක්ය. ඔව්හු ඒක රන් රිදීවලින්
සරසා, නොසෙල්වෙන ලෙස ඇණවලින්ද
5 මිටිවලින්ද සවිකරති. ඒවා තල්ගහක්
මෙන් වටකුරුකර තිබේ. ඒවා
කථාකරන්නේ නැත. අඩි තබා යන්ට
ඒවාට බැරි නිසා උසුලාගෙනම යන්ට
ඕනෑය. ඒවාට භය නොවෙල්ලා;
මක්නිසාද අනතුරු කරන්ට ඒවාට
බැරිය, යහපත කිරීමද ඒවාට නැත.
6 **ස්වාමීන්වහන්ස,** ඔබට සමානවූ
කිසිවෙක් නැත; ඔබ උතුම්සේක, ඔබගේ
නාමය පරාක්‍රමයෙන් උතුම්ව තිබේ.
7 ජාතීන්ගේ රජ්ජුරුවන්වහන්ස, ඔබට භය
නොවන්නේ කවරෙක්ද? මක්නිසාද
භයවිය යුත්තේ ඔබටය. කුමක් හෙයින්ද
ජාතීන්ගේ සියලු ප්‍රඥවන්තයන් අතරේද
ඔවුන්ගේ සියලුම රාජශ්‍රීයෙහිද ඔබට
8 සමානවූ කිසිවෙක් නැත. ඔව්හු
ඒකාකාරයෙන් මූඪව අඥනව සිටිති. ඒ
පිළිමයන්ගේ ධර්මය, ලීයක් සමානය.
9 තර්ෂීෂෙන් තහඩුකළ රිදීද උපාශෙන්
රන්ද ගෙනෙනු ලැබේ; ඒවා කම්කරුවාගේද
රන්කරුවාගේද අත්වල වැඩක්ය; නිල්
සහ රත්නිල් රෙදි ඒවායේ වස්ත්‍රය; ඒ
සියල්ල දක්ෂ කම්කරුවන්ගේ වැඩක්ය.

නුමුත් **ස්වාමීන්වහන්සේ** සැබෑවූ 10
දෙවියන්වහන්සේය; උන්වහන්සේ ජීවමාන
දෙවියන්වහන්සේය, සදාකාල රජකෙනෙක්ය.
උන්වහන්සේගේ උදහසට පොළොව
වෙව්ලයි, ජාතීන්ට උන්වහන්සේගේ
උදහස දරන්ට බැරිය.
තුඹලා ඔවුන්ට කථාකොට: අහසත් 11
පොළොවත් නොසෑදුවාවූ දෙවිවරු
වනාහි පොළොවෙන්ද අහස යටින්ද
නැතිවන්නෝයයි කියාපල්ලා.
උන්වහන්සේ තමන්ගේ බලයෙන් 12
පොළොව සෑදූසේක, තමන්ගේ ප්‍රඥවෙන්
ලෝකය පිහිටුවා, තමන්ගේ ඥනයෙන්
අහස දිගඇරියසේක. උන්වහන්සේ 13
ස්වකීය හඬ පවත්වන කල අහසෙහි
ජල ඝෝෂාවක් තිබෙයි, උන්වහන්සේ
පොළෝ කෙළවරෙන් වලාකුල් නැගී
එන්ට සලස්වනසේක; වර්ෂාවට විදුලි
සාදනසේක, තමන්ගේ ගබඩාවලින් හුළඟ
ගෙනෙනසේක. සියලු මනුෂ්‍යයෝ 14
දනගැන්ම නැතුව මූඪව සිටිති; සියලු
රන්කරුවෝද ඔවුන්ගේ රූප නිසා
ලජ්ජාවට පැමිණ සිටිති. මක්නිසාද
ඔහුගේ පිළිමය බොරුවක්ය, ඒවා තුළ
හුස්ම නැත. ඒවා නිෂ්ඵලකමය, මායාවේ 15
වැඩක්ය. ඒවාට දඬුවම් කරන කාලයේදී
ඒවා විනාශවන්නේය. යාකොබ්ගේ 16
උරුම-කොටසවූ තැනන්වහන්සේ ඒවාට
සමාන නැත; උන්වහන්සේ වනාහි සියලු
දේම මැවූ තැනන්වහන්සේය; ඉශ්‍රායෙල්ද
උන්වහන්සේගේ උරුම-ගෝත්‍රයය.
උන්වහන්සේගේ නාමය සේනාවල
**ස්වාමීන්වහන්සේය.**

## පැමිණෙන්ට තිබෙන දුක් පීඩාවලදී කරුණාව ලැබෙන ලෙස අයදීම

බලකොටුවෙහි වාසයකරන්නිය, තුඹේ 17
බඩු දේශයෙන් එක්කරගනින්න.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මෙසේ 18
කියනසේක: මෙන්න, මම මේ වතාවේදී
දේශයේ වැසියන් වීසිකරදමමි, ඔවුන්ට
දැනීයන පිණිස ඔවුන් විපතට පමුණුවමි.

19 අහෝ මාගේ රිදුම නිසා මට දුක්වේ!
මාගේ තුවාලය බරපතළය. මමද:
සැබවින් මේ මාගේ දුකය, මේක මා
20 විසින් දරිය යුතුයයි කීවෙමි. මාගේ
කූඩාරම නාස්තිවිය, මාගේ කූඩාරම්
ලණු සියල්ලද කඩාදමනු ලැබුවේය.
මාගේ දරුවෝ මා වෙතින් ගියෝය,
ඔව්හු නැත. තවත් මාගේ කූඩාරම
දිගහැර මාගේ තිර එල්ලන්ට කිසිවෙක්
21 නැත. මක්නිසාද එඬේරු මෝඩවී
**ස්වාමීන්වහන්සේගෙන්** නොවිචාරා
සිටියෝය. එබැවින් ඔව්හු දියුණු නුණෝය,
ඔවුන්ගේ සියලු රැළවල්ද විසිර ගියෝය.
22 අන්න, යූද නුවරවල් පාළුවක්ද හිවලුන්ගේ
වාසයක්ද කිරීමට දූසාමාන කථාවක
හඬක්ද මහත් ඝෝෂාවක්ද උතුරු
23 දේශයෙන් පැමිණෙන්නේය. **ස්වාමීන්-
වහන්ස**, මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට
අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන
මනුෂ්‍යයාට තමාගේ ගමන නියම කිරීම
24 අයිති නැත. **ස්වාමීන්වහන්ස**, ඔබ මා
කිසිත් නැතිකමට නොපමුණුවන පිණිස
ඔබගේ උදහසින් නොව තිසි ප්‍රමාණයෙන්
25 මට දඬුවම් කළ මැනව. ඔබව හැඳින
නොගත් ජාතීන් කෙරෙහිද ඔබගේ
නාමයට යාච්ඤා නොකරන වර්ගයන්
කෙරෙහිද ඔබගේ කෝපය වැගිරෙවුව
මැනව. මක්නිසාද ඔව්හු යාකොබ්
නාස්තිකළෝය, එසේය, ඔව්හු ඔහු
නාස්තිකර නටබුන්කර, ඔහුගේ
වාසස්ථානය පාළුකළෝය.

## කඩනලද ගිවිසුම ගැන පණිවිඩය

11 **ස්වාමීන්වහන්සේගෙන්** යෙරෙමියා
2 වෙත පැමිණි වචනය මේය. තුඹලා
මේ ගිවිසුමේ වචන අසා යූදහි
මනුෂ්‍යයන්ටත් යෙරුසලමේ වැසියන්ටත්
3 මෙසේ කථාකරපල්ලා: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක–මේ ගිවිසුමේ වචනවලට කීකරු
4 නොවන මනුෂ්‍යයාට ශාපවේවා. එය
වනාහි මා විසින් තුඹලාගේ පියවරුන්
මිසර දේශය වන යකඩ උදුනෙන් පිටතට
ගෙනා කල ඔවුන්ට කථාකොට: අද
තිබෙන ප්‍රකාරයට කිරිද මීපැණිද
ගලායන්නාවූ දේශයක් තුඹලාගේ
පියවරුන්ට දෙන හැටියට මා ඔවුන්ට
දිවුළ දිවිරීම ඉෂ්ටකරන පිණිස, තුඹලා
මාගේ හඬට කීකරුවී, මා තුඹලාට
අණකරන්නාවූ සියල්ල ලෙස කරපල්ලා;
එවිට තුඹලා මාගේ සෙනග වන්නහුය; 5
මමද තුඹලාගේ දෙවියන්වහන්සේ
වන්නෙමියි කියා මා අණකර දුන්
ගිවිසුමයයි ඔවුන්ට කියාපන්නැයි කී-
සේක. එවිට මම උත්තරදෙමින්: **ස්වාමීන්-
වහන්ස**, ආමෙන්යයි කීවෙමි.
**ස්වාමීන්වහන්සේ** මට කථාකොට: තුඹ 6
යූද නුවරවලත් යෙරුසලමේ වීථිවලත්
මේ සියලු වචන ප්‍රකාශකොට මෙසේ
කියාපන්න: තුඹලා මේ ගිවිසුමේ වචන
අසා ඒවා පවත්වාපල්ලා. මක්නිසාද 7
මා විසින් තුඹලාගේ පියවරුන් මිසර
දේශයෙන් ගෙනාද පටන් අද දක්වා
මම අලුයම් වේලාවේ පටන්ම ඔවුන්ට
අවවාදකර–තුඹලා මාගේ හඬට
කීකරුවෙයල්ලායයි අවවාදකරමින්
කීවෙමි. නුමුත් ඔව්හු කීකරු නොවී, 8
තමුන්ගේ කන් යොමු නොකර, තම
තමුන්ගේ නපුරු සිත්වල මුරණ්ඩුකමේ
හැටියට හැසුරුණෝය. ඉන් නිසා කරන්ට
මා අණකළ නුමුත් ඔවුන් නොකළාවූ
මේ ගිවිසුමේ සියලු කාරණා ඔවුන්
පිටට පැමිණෙවුවෙමියි කියාපන්නැයි
කීසේක.
**ස්වාමීන්වහන්සේ** මට මෙසේ කීසේක: 9
යූදහි මනුෂ්‍යයන් අතරෙන් යෙරුසලමේ
වැසියන් අතරෙන් කුමන්ත්‍රණයක් සම්බවී
තිබේ. ඔව්හු මාගේ වචන අසන්ට 10
අකමැතිවූ ඔවුන්ගේ පළමු පියවරුන්ගේ
අපරාධවලට හැරී, අන් දෙවිවරුන්ට
සේවයකරන්ට ඒවා පස්සේ ගියෝය.
ඉශ්‍රායෙල් වංශය සහ යූද වංශයත් මා
විසින් ඔවුන්ගේ පියවරුන් හා සමග
කළ ගිවිසුම කඩකර තිබේ. එබැවින් 11
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, ඔවුන්ට ගැළවෙන්ට බැරි විපත්තියක්
ඔවුන් පිටට පමුණුවන්නෙමි; ඔවුන් මට
මොරගැසුවත් මම ඔවුන්ට ඇහුම්කන්

12 නොදෙන්නෙමි. එවිට යූදහි නුවරවල්ද
යෙරුසලමේ වැසියන්ද ගොස් ඔවුන්
විසින් සුගන්ධ ද්‍රව්‍ය ඔප්පුකරන
දෙවිවරුන්ට මොරගසනවා ඇත. නුමුත්
ඔවුන්ගේ විපත්ති කාලයේදී ඒ දෙවිවරු
කොහෙත්ම ඔවුන් ගළවන්නේ නැත.
13 මක්නිසාද, යූද, නුඹේ නුවරවල ගණනට
නුඹේ දෙවිවරු සිටිති; යෙරුසලමේ වීථි
ගණනේ හැටියට නුඹලා ඒ *නින්දිතයාට
පූජාසන එනම් බාල්ට සුවඳ දුම් දවන්ට
14 පූජාසන පිහිටුවා තිබේ. ඒ නිසා නුඹ
මේ සෙනඟ උදෙසා යාච්ඤා නොකරන්න,
ඔවුන් උදෙසා විලාපයද යාච්ඤාවද ඔප්පු
නොකරන්න. මක්නිසාද ඔවුන් තමුන්ගේ
විපත්තිය නිසා මට යාච්ඤාකරන
කාලයේදී මම ඔවුන්ගේ වචන නො-
අසන්නෙමි.
15 මාගේ ප්‍රේමවන්තී බොහෝ නපුරු දේ
කරමින් සිටියදී මාගේ ගෘහයෙහි ඇට
ඇති කම මොකද? භාර සහ ශුද්ධවූ
මාංසය නුඹෙන් නපුරුකම පහකරනවා
ඇද්ද? නොහොත් නුඹ මේවා කරණ-
කොටගෙන නිදහස්වෙනවා ඇද්ද?
16 ශෝභමාන ඵල ඇති අලංකාර අමු
ඔලීව් ගහක්යයි **ස්වාමීන්වහන්සේ** නුඹට
නම් තැබූසේක. දැන් මහත් කෝලාහල
ඝෝෂාවක් ඇතුව උන්වහන්සේ ඊට
ගිනිලා තිබේ, එහි අතුද කඩාවැටී තිබේ.
17 නුඹව සිටෙවුවාවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ**, ඉශ්‍රායෙල් වංශය සහ යූද
වංශයත් බාල්ට සුවඳ දුම් ඔප්පුකිරීමෙන්
මා කෝපකරවන ලෙස සිද්ධකරගත්තාවූ
නපුර නිසා නුඹට විපත්තිය නියමකර
තිබේ.
18 **ස්වාමීන්වහන්සේ** ඒ ගැන මට දැන්වූ-
සේක, එසේ මම දැනගතිමි. එකල ඔබ
19 ඔවුන්ගේ ක්‍රියා මට පෙන්නූසේක. නුමුත්
මම මරණයට ගෙනයන හීලෑ බැටළු-
පැටවෙකු මෙන් සිටියෙමි. අපි ගහද
එහි ඵලද නාස්තිකොට, ඔහුගේ නම
නවත් සිහි නොවෙන පිණිස, ජීවත්ව
සිටින්නන්ගේ දේශයෙන් ඔහු සිඳදමමු-
යයි කියා ඔවුන් මට විරුද්ධව උපා

*එනම්–බාල්දෙවියාට.

යෙදූ බව නොදැන සිටියෙමි. එහෙත්, 20
ධර්මිෂ්ඨලෙස විනිශ්චයකරන්නාවූ,
හෘදයත් සිතත් විමසන්නාවූ සේනාවල
**ස්වාමීන්වහන්ස**, ඔබ ඔවුන්ගෙන්
පළිගන්නවා දකින්ට මට ලැබේවා;
මක්නිසාද මම මාගේ කාරණය ඔබට
ප්‍රකාශකෙළෙමි. එබැවින්: නුඹ අප අතින් 21
මැරුම් නොකන පිණිස **ස්වාමීන්-
වහන්සේගේ** නාමයෙන් අපට අනා-
ගතවාක්‍ය නොකියන්නැයි කියා නුඹේ
ප්‍රාණය හානිකරන්ට සොයන්නාවූ
අනතෝත්හි මනුෂ්‍යයන් ගැන **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: බලව, මම 22
ඔවුන්ට දඬුවම් කරන්නෙමි. යෞවනයෝ
කඩුවෙන් මැරුම්කන්නෝය; ඔවුන්ගේ
පුත්‍රයෝද දූවරුද සාගතයෙන් මැරෙන්-
නෝය; ඔවුන්ගෙන් කිසිවෙක්ද ඉතිරි 23
නොවන්නේය. මක්නිසාද මම අන-
තෝත්හි මනුෂ්‍යයන් පිටට විපත්තිය,
එනම් ඔවුන්ට දඬුවම් කිරීමේ අවුරුද්ද,
පමුණුවන්නෙමියි සේනාවල **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.

## 'දුෂ්ටයන්ගේ සමෘද්ධිය' නමවූ ප්‍රශ්නය

12 **ස්වාමීන්වහන්ස**, මා ඔබ සමග
කාරණා කියන කල ඔබ ධර්මිෂ්ඨය.
එහෙත් ඒ ගැන ඔබ සමග තර්කකරන්ට
කැමැත්තෙමි. දුෂ්ටයන්ගේ මාර්ගය
දියුණුවන්නෙත් තද ද්‍රෝහිකම්කරන
සියල්ලන් සුවසේ සිටින්නෙත් මක්නිසාද?
ඔබ ඔවුන් හිටෙවුසේක; ඔව්හු මුල් ඇද 2
වැඩී ඵලදෙති; ඔව්හු කටින් ඔබට ළංව
සිටින නුමුත් සිතින් ඔබගෙන් දුරුව
සිටිති. එහෙත්, **ස්වාමීන්වහන්ස**, ඔබ 3
මා දන්නාසේක; ඔබ මා දකිනසේක,
මාගේ සිත ඔබ කෙරෙහි තිබෙන්නේ
කොහොමද කියා ඔබ විභාගකරන-
සේක. ඔවුන් මරණයට නියම බැටළුවන්
මෙන් වෙන්කර, මරාදැමීමේ දවසට
සූදානම්කළ මැනව. දේශය වැලපෙන්නෙත් 4
මුළු රටේ තෘණ මැලවෙන්නෙත්
කොපමණ කල්ද? එහි වැසියන්ගේ
දුෂ්ටකම නිසා මෘගයෝද පක්ෂීහුද
නැතුව ගියෝය; මක්නිසාද: ඔහු අපේ
අන්තිමය නොදකින්නේයයි ඔව්හු
කීවෝය. පයින් යන්නන් සමග නුඹ 5

දුවන විට ඔව්හු නුඹ වෙහෙසුවෝ
නම්, නුඹ අශ්වයන් සමග දුවන්නේ
කොහොම්ද? සමාදන දේශයකදී නුඹ
සැහැවෙන්නෙහි නම්, යොර්දන් වනයේදී
6 නුඹ කුමක් කරන්නෙහිද? මක්නිසාද
නුඹේ සහෝදරයෝද නුඹේ පියාගේ
වංශයද පවා නුඹට විරුද්ධව
ද්‍රෝහිකම්කළෝය; ඔව්හු පවා නුඹට
පස්සෙන් තදින් මොරගැසුවෝය. ඔවුන්
නුඹ සමග හොඳින් කථාකරන නුමුත්
ඔවුන් විශ්වාස නොකරන්න.

## අසල්වාසීන් විසින් යූද නාස්ති කිරීම. ඒ සතුරන් ගැන ස්වාමින්වහන්සේ ක්‍රියා කරන අන්දම

7 මාගේ ගෘහය අත්හැරියෙමි, මාගේ
උරුමය පහකර දැමීමි; මාගේ ආත්මයේ
ප්‍රේමවන්තිය ඇගේ සතුරන් අතට
8 භාරදුනිමි. මාගේ උරුමය මට කැලෑවේ
සිංහයෙකු මෙන් වී තිබේ. ඈ මට
විරුද්ධව ඇගේ හඬ පැවැත්තුවාය:
9 එබැවින් ඈට ද්වේෂකෙළෙමි. මට මාගේ
උරුමය මස් කන ලප ඇති පක්ෂියෙකු
මෙන් වේද? ගිජු පක්ෂීහු ඈට විරුද්ධව
අවටින් සිටිත්ද? ගොස් වනයේ සියලුම
සතුන් රැස්කොට ගොදුරු පිණිස
10 ගෙනෙල්ලා. බොහෝ එඬේරු මාගේ
මිදිවත්ත නාස්තිකළෝය, ඔව්හු මාගේ
කොටස පාගාදැමුවෝය, මාගේ ප්‍රිය
කොටස පාළු කාන්තාරයක් කළෝය.
11 ඔව්හු එය පාළුවක් කළෝය: එය
පාළුවක් වී, මා ඉදිරියෙහි වැලපෙන්නේය;
කවුරුවත් සිතට නොගන්න නිසා මුළු
12 දේශය පාළුකරනලද්දේය. නාස්තිකාරයෝ
කාන්තාරයේ සියලුම මුඩු කඳු පිටට
පැමිණ සිටිති, මක්නිසාද **ස්වාමින්-**
**වහන්සේගේ** කඩුව දේශයේ එක
කෙළවරක පටන් දේශයේ අනික්
කෙළවර දක්වා විනාශකරන්නේය.
මාංසමයවූ කිසිවෙකුට සමාදනය නැත.
13 ඔව්හු තිරිඟු වපුරා කටු ගස් කපා-
ගත්තෝය; ඔව්හු වෙහෙසුණු නුමුත්
ප්‍රයෝජන නොලබති; මෙසේ **ස්වාමින්-**
**වහන්සේගේ** බලවත් උදහස නිසා
නුඹලාගේ අස්වැන්න ගැන ලජ්ජාවන්නහුය.

මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට මා 14
හිමිකරදුන් උරුමයට අතගහන මාගේ
සියලුම නපුරු අසල්වාසීන්ට විරුද්ධව
**ස්වාමින්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, මම ඔවුන්ගේ දේශයෙන් ඔවුන්
උදුරාදමන්නෙමි, යූද වංශයද ඔවුන්
අතරෙන් උදුරාදමන්නෙමි. තවද මා 15
විසින් ඔවුන් උදුරාදැමූ පසු මම හැරී
ඔවුන්ට අනුකම්පාකොට, ඔවුන්
එකිනෙකා තම තමාගේ උරුමයටත්
තම තමාගේ දේශයටත් නැවත
පමුණුවන්නෙමි. ඔවුන් මාගේ සෙනඟට 16
බාල් ගැන දිවුරන්ට ඉගැන්වූවාක්මෙන්
ඔව්හු: **ස්වාමින්වහන්සේ** ජීවමාන බව
සැබෑවා සේම කියා මාගේ නාමය
ගැන දිවිරීමට මාගේ සෙනඟගේ
මාර්ගවල් ඉගෙනගන්නෝ නම්, ඔව්හු
මාගේ සෙනඟ අතරේ පිහිටුවනු
ලබන්නෝය. නුමුත් ඔවුන් නෑසුවොත් 17
මම ඒ ජාතිය උදුරාදමන්නෙමි.
උදුරාදමා නැතිකරන්නෙමියි **ස්වාමින්-**
**වහන්සේ** කියනසේක.

## හණපටියේ උපමාව සහ එය අඳළකිරීම

**ස්වාමින්වහන්සේ** මට කථාකොට: 13
නුඹ ගොස් හණ පටියක්
මිලේටගෙන නුඹේ ඉඟටියෙහි බැඳ-
ගනින්න, ඒක වතුරේ නොදමන්නැයි
කීසේක. මමද **ස්වාමින්වහන්සේගේ** වචනය 2
ලෙස පටියක් මිලේටගෙන මාගේ
ඉඟටියෙහි බැඳගත්තෙමි. දෙවෙනි වර 3
**ස්වාමින්වහන්සේගේ** වචනය මා වෙතට
පැමිණ: නුඹ මිලේටගත්තාවූ නුඹේ 4
ඉඟටියෙහි තිබෙන පටිය අරගෙන පිටත්වී,
*ප්‍රාත් ගංගාව ළඟට ගොස් එහි
පර්වතයේ විවරයක ඒක සඟවා
තබාපන්නැයි කීය. මමද **ස්වාමින්-** 5
**වහන්සේ** මට අණකළ ලෙස ගොස්
*ප්‍රාත් ගංගාව ළඟ ඒක සඟවා තැබීමි.
බොහෝ දවසකට පසු **ස්වාමින්-** 6
**වහන්සේ** මට කථාකොට: නුඹ පිටත්වී
*ප්‍රාත් ගංගාව ළඟට ගොස්, එහි සඟවා
තබන්ට මා විසින් නුඹට අණකළ පටිය
එතැනින් ගනින්නැයි කීසේක. මමද *ප්‍රාත් 7

*හෙවත්–(අනතෝත්ට කිට්ටුවූ) පෙරාතට.

ගංගාව ළඟට ගොස්, හාරා, මා විසින්
පටිය සඟවා තැබූ තැනින් ඒක ගතිමි.
එවිට පටිය නරක්ව වැදගැන්මකට නැතුව
8 තිබුණේය. **ස්වාමීන්වහන්සේගේ** වචනයද
මා වෙතට පැමිණ මෙසේ කීය:
9 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක–
මෙයාකාරයෙන් මම යූද රටේ උඩඟු-
කමද යෙරුසලමේ මහත් උඩඟුකමද
10 නරක්කරන්නෙමි. මාගේ වචන අසන්ට
අකමැතිවූ, තමුන්ගේ සිත්වල මුරණ්ඩුකම
ලෙස හැසිර අන් දෙවිවරුන්ට සේවය-
කරන්ටත් නමස්කාරකරන්ටත් ඔවුන්
පස්සේ යන්නාවූ මේ නපුරු සෙනඟ
වැදගැන්මකට නැති මේ පටිය මෙන්
11 වෙනවා ඇත. පටිය මනුෂ්‍යයෙකුගේ
ඉඟට ඇලෙන්නාක්මෙන් මට සෙනඟක්ද
නාමයක්ද ප්‍රශංසාවක්ද තේජසක්ද වන
පිණිස මුළු ඉශ්‍රායෙල් වංශයද මුළු යූද
වංශයද මට ඇලුම්වෙන්ට සැලැස්වීමි.
නුමුත් ඔව්හු අසන්ට අකමැතිවූවෝයයි
12 **ස්වාමීන්වහන්සේ** කියනසේක. තවද සියලු
භාජන මුද්‍රිකපානයෙන් පිරී තිබෙන්නේ-
යයි ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කියනසේක යන මේ වචනය ඔවුන්ට
කියාපන්න. ඔව්හුද: සියලු භාජන
මුද්‍රිකපානයෙන් පිරී තිබෙන්නේය යන
බව අපි නොදනිමෝදැයි නුඹට කියනවා
13 ඇත. එවිට: **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේකැයි ඔවුන්ට කියාපන්න
එනම්,–මේ දේශයේ සියලු වැසියන්ද
දාවිත්ගේ සිංහාසනයෙහි ඉන්න රජවරුන්ද
පූජකයන්ද ප්‍රොපේතවරුන්ද යෙරුසලමේ
සියලු වැසියන්ද මත් ගතියකින් පුරවා,
14 මනුෂ්‍යයෙකු හා ඔහුගේ සහෝදරයාද
පියවරුන් හා පුත්‍රයන්ද එකට ගසන්-
නෙමි; ඔවුන් විනාශ නොකරන හැටියට
මා දයාවෙන්නේවත් කරුණාකරන්-
නේවත් අනුකම්පාකරන්නේවත් නැතැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
15 නුඹලා උඩඟු නොවී අසා කන්යොමු-
කරපල්ලා. මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
16 කථාකළසේක. උන්වහන්සේ අන්ධ-
කාරකරන්ට පළමුවෙන්ද නුඹලාගේ
පාද අඳුරු කඳුවල පැකිලෙන්ටත් නුඹලා
එළිය ගැන බලා සිටිද්දී උන්වහන්සේ
එය මරණයේ සෙවණට හරවා කළුවර-
කරන්ටත් පළමුවෙන්ද නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** ගෞරව දීපල්ලා.
නුමුත් නුඹලා ඒක අසන්නේ නැත්නම්, 17
මාගේ ආත්මය රහස් තැන්වලදී
නුඹලාගේ උඩඟුකම ගැන අඬා,
බොහෝසෙයින් කඳුළු වගුරුවනවා ඇත;
**ස්වාමීන්වහන්සේගේ** රැළද වාලට
ගෙනයනු ලැබූ නිසා මාගේ ඇස්වලින්
කඳුළු ගලනවා ඇත. නුඹලා පහත 18
ඉඳගනිල්ලා. මක්නිසාද නුඹලාගේ
තේජවන්ත ඔටුන්න නුඹලාගේ හිස්වලින්
වැටුණේයයි රජුටත් මවු බිසවටත්
කියාපන්න. දකුණු දිශාවේ නුවරවල් 19
වසා තිබේ, ඒවා අරින්ට කෙනෙක් නැත.
මුළු යූද රට වාලට ගෙනයනු ලැබීය;
සහමුලින්ම ගෙනයනු ලැබීය.
යෙරුසලම, නුඹේ ඇස් ඔසවා, උතුරු 20
දිගින් එන්නන් බලාපන්න. නුඹට දුන්
රැළ වන නුඹේ අලංකාර රැළ කොයිද?
නුඹට යහළුවන් වෙන්ට නුඹම ඉගැන්වූ 21
අයවලුන් උන්වහන්සේ නුඹ කෙරෙහි
ප්‍රධානකමට පත්කරන විට නුඹ
මක්කියන්නෙහිද? වදන ස්ත්‍රියෙකුට මෙන්
නුඹට වේදනා අල්ලන්නේ නැද්ද? මෙවා 22
මට සිද්ධවුණේ මක්නිසාදැයි නුඹේ සිත
තුළ නුඹ ඇසුවාම, නුඹේ අයුතුකමේ
ඇඳුම් අහක්කරනු ලැබ, නුඹේ වහන්ද
උදුරනු ලැබූ බව දනගනින්න. කූෂ් 23
වැසියාට තමාගේ හමවත් අඳුන් දිවියාට
උගේ තිත්වත් වෙනස්කරන්ට පුළුවන්ද?
පුළුවන් නම්, නපුර කරන්ට පුරුදුව සිටින
නුඹලාටත් යහපත කරන්ට පුළුවන්වේ.
ඒ නිසා කාන්තාරයේ සුළඟට ගසාගෙන 24
යන ඉපනැලි මෙන් ඔවුන් විසුරුවා
දමන්නෙමි. නුඹ මා මතකනැතිකොට 25
බොරුවක් කෙරෙහි විශ්වාසකළ නිසා
මේක නුඹේ කොටසත් මා විසින් නුඹට
මැනදෙන පංගුවත්යයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. එබැවින් මමත් නුඹේ 26
ලජ්ජාව පෙනෙන පිණිස නුඹේ ඇඳුම
නුඹේ මූහුණ පිට දමුවෙමි. නුඹේ 27
මිථ්‍යාචාරකම්ද නුඹේ හේෂාරවය කිරීම්ද

පිටත හෙල් පිට තුඹ කරන තුඹේ දූෂ්‍ය
වේශ්‍යාකම්ද යන තුඹේ පිළිකුල්කම් මම
දුටිමි. යෙරුසලම, තුඹට දුක්වේ! තුඹ
පිරිසිදුවෙන්ට අකමැතිය; තව කොපමණ
කලකින් එය සිදුවන්නේද?

## බියකරු නියං කාලය සහ විවිධ දුක් පීඩා.–මැදහත්වීමෙන් ඒවා වලක්වන්ට බැරි බව

14 නියඟ ගැන යෙරෙමියා වෙතට
පැමිණි **ස්වාමීන්වහන්සේගේ**
වචනය.
2 යූද වැලපෙයි, එහි දොරටුද මලානික වෙයි;
කළු ඇඳගෙන ඔව්හු බිම හිඳිති;
යෙරුසලමේ කෑගැසීමද නැගී ගියේය.
3 ඔවුන්ගේ උත්තමයෝ තමුන් යටතේ
සිටින්නන් වතුර ගෙනෙන්ට හරිති. ඔව්හු
ළිං ළඟට පැමිණ වතුර සම්බනොවී,
හිස් භාජන ඇතුව හැරී එති. ඔව්හු
ලජ්ජාවටත් නින්දවටත් පැමිණ තමුන්ගේ
4 හිස් වසාගනිති. දේශයට වර්ෂාව
නොලැබුණු නිසා බිම පැළී තිබෙන
කාරණයෙන් ගොවියෝ ලජ්ජාවට
5 පැමිණ, තමුන්ගේ හිස් වසාගනිති. එසේය,
වනයේ සිටින මුවදෙන පවා වද තෘණ
නැතිකම නිසා පැටවා අත්හැර යන්නීය.
6 වල් කොටළුවෝද මුඩු කඳු පිට සිට
සිවලුන් මෙන් හුළඟට ඉව අල්ලති;
තණකොළ නැති නිසා උන්ගේ ඇස්ද
ක්ෂයවෙයි.
7 **ස්වාමීන්වහන්ස**, අපේ අයුතුකම් අපට
විරුද්ධව සාක්ෂිදෙන නුමුත් ඔබගේ
නාමය නිසා ක්‍රියාකළ මැනව.
මක්නිසාද අපේ පසුබටවීම් බොහෝය;
අපි ඔබට විරුද්ධව පව්කෙළෙමුව.
8 ඉශ්‍රායෙල්වරුන්ගේ බලාපොරොත්තුවද
විපත්ති කාලයේදී ඔවුන්ගේ ගැළවුම්-
කාරයාද වූ තැනන්වහන්ස, ඔබ
දේශයෙහි ආගන්තුකයෙකු මෙන්ද
රැයක් නැවතීමට කූඩාරම පිහිටුවාගත්
ගමන්කාරයෙකු මෙන්ද සිටින්නේ
9 මක්නිසාද? ඔබ ත්‍රස්තවී සිටින
මනුෂ්‍යයෙකු මෙන්ද ගළවන්ට බැරි
බලවන්තයෙකු මෙන්ද සිටින්නෙත්
මක්නිසාද? එහෙත්, **ස්වාමීන්වහන්ස**, ඔබ
අප මධ්‍යයෙහි සිටිනසේක, ඔබගේ
නාමයත් අප කෙරෙහි තබා තිබේ; අප
අත්නැරිය මැනව.
ඔවුන් තමුන්ගේ පාද නවත්වා 10
නොගෙන මුළාවයන්ට මෙපමණ ප්‍රියවූ
බැවින් **ස්වාමීන්වහන්සේ** ඔවුන් කෙරෙහි
අප්‍රසන්නවූසේකැයි කියාත් දැන් උන්-
වහන්සේ ඔවුන්ගේ අපරාධකම සිහි-
කොට ඔවුන්ගේ පාපවලට දඬුවම්-
කරනවා ඇත කියාත් **ස්වාමීන්වහන්සේ**
මේ සෙනඟට කියනසේක. **ස්වාමීන්-** 11
**වහන්සේ** මට කථාකොට: යහපත පිණිස
තුඹ මේ සෙනඟ උදෙසා යාච්ඤා
නොකරන්න. ඔවුන් නිරාහාරව සිටින 12
කල මම ඔවුන්ගේ කන්නලව්ව
නොඅසන්නෙමි; ඔවුන් දවන පූජාවද
ආහාර පූජාවද ඔප්පුකරන විටත්
මම ඒවා පිළිනොගෙන, කඩුවෙන්ද
සාගතයෙන්ද වසංගතයෙන්ද ඔවුන්
විනාශකරන්නෙමියි කීසේක. එකල මම: 13
අහෝ ස්වාමිවූ **දෙවියන්වහන්ස**–තුඹලා
කඩුව දකින්නේවත් තුඹලාට සාගතය
පැමිණෙන්නේවත් නැතුව, ස්ථිර සමාදානය
මේ ස්ථානයෙහි තුඹලාට දෙන්නෙමියි
අනාගතවක්තෘවරු ඔවුන්ට කියතියි කීමි.
එවිට **ස්වාමීන්වහන්සේ** මට මෙසේ 14
කීසේක: අනාගතවක්තෘවරු මාගේ
නාමයෙන් බොරු අනාගතවාක්‍ය කියති.
මා විසින් ඔවුන් එවූවේවත් ඔවුන්ට
අණකළේවත් ඔවුන්ට කථාකළේවත් නැත.
ඔවුන් තුඹලාට බොරු දර්ශනයක්ද
පේනකීමද හිස්කමද තමුන්ගේ සිත්වල
වංචාවද අනාවැකින් කියති. එබැවින්, 15
මා විසින් නොඑවූ නුමුත් මාගේ
නාමයෙන් අනාගතවාක්‍ය කියන්නාවූ–
කඩුවවත් සාගතයවත් මේ දේශයට
නොපැමිණෙන්නේයයි කියන්නාවූ
අනාගතවක්තෘවරුන් ගැන **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: කඩුවෙනුත්
සාගතයෙනුත් ඒ අනාගතවක්තෘවරුම
නැතිවන්නෝය. ඔවුන්ගේ අනාගතවාක්‍ය 16
අසන සෙනඟත් සාගතයද කඩුවද
කරණකොටගෙන යෙරුසලමේ වීථිවල
හෙළාදමනු ලබන්නෝය; ඔවුන්වත්

ඔවුන්ගේ භාර්යාවන්වත් පුත්‍රයන්වත්
දූවරුන්වත් වළලන්ට කිසිවෙක්
නොවන්නේය. මක්නිසාද මම ඔවුන්ගේ
17 දුෂ්ටකම ඔවුන් පිට වගුරුවන්නෙමි. මේ
වචනය ඔවුන්ට කියාපන්න, එනම්:
නොනැවතී රෑ දවල් මාගේ ඇස්වලින්
කඳුළු ගලාවා. මක්නිසාද මාගේ
සෙනඟවූ කන්‍යා දුව මහත් තුවාලයකින්ද
18 ඉතා තද පහරකින්ද පීඩිතවූවාය. මා
පිටතට ගියොත් කඩුවෙන් මැරුම්කෑ
අය පෙනේ! මා නුවරට ඇතුල්වුණොත්
සාගතයෙන් ලෙඩවී ඉන්න අය පෙනේ!
මක්නිසාද අනාගතවක්තෘද පූජකයාද
කිසිවක් නොදන්න දේශයෙහි ඔබමොබ
යති.
19 ඔබ යූද මුළුමනින්ම එපාකළසේක්ද?
සියොන් ඔබගේ ආත්මයට පිළිකුලක්
වී තිබේද? අපට සුවවීමක් නැති හැටියට
ඔබ අපට පහරදුන්නේ මක්නිසාද? අපි
සමාදානය ගැන බලා සිටියෙමුව, නුමුත්
කිසි හොඳක් නොවීය; සුවවීමේ කාලයක්
ගැනද බලා සිටියෙමුව, නුමුත්, මෙන්න,
20 භයානකකම තිබේ. ස්වාමීන්වහන්ස,
අපේ දුෂ්ටකමත් අපේ පියවරුන්ගේ
අපරාධකමත් කියාදෙමුව. මක්නිසාද
21 අපි ඔබට විරුද්ධව පව්කෙළෙමුව. ඔබගේ
නාමය නිසා අප අහක නොදමුව
මැනව; ඔබගේ තේජසේ සිංහාසනයට
අගෞරව නොකළ මැනව. සිහිකළ
මැනව, අප සමග තිබෙන ඔබගේ ගිවිසුම
22 කඩ නොකළ මැනව. වර්ෂාව වස්වන
කෙනෙක් ජාතීන්ගේ නිෂ්ඵල දෙවිවරුන්
අතරේ ඇද්ද? නොහොත් වැහිවලා
දෙන්ට අහසට පුළුවන්ද? අපේ දෙවිවූ
ස්වාමීන්වහන්ස, මේ දේ කරන්නේ ඔබ
නොවේද? එබැවින් අපි ඔබ ගැන
බලාසිටින්නෙමුව; මක්නිසාද ඔබම මේ
සියල්ල කළසේක.

15 එකල ස්වාමීන්වහන්සේ මට
මෙසේ කීසේක: මෝසෙස් සහ
සාමුවෙල් මා ඉදිරියෙහි සිටියත් මාගේ
සිත මේ සෙනඟ දෙසට හැරෙන්නේ
නැත. ඔවුන් පිටතට යන පිණිස මා
2 ඉදිරියෙන් හැරපන්න. අප පිටතට යන්නේ
කොතැනටදැයි ඔවුන් තුඹෙන් ඇසූ කල්හි:
වසංගතයට නියම අය වසංගතයටත්,
කඩුවට නියම අය කඩුවටත්, සාගතයට
නියම අය සාගතයටත්, වාල්කමට
නියම අය වාල්කමටත් යනවා ඇත
කියා ස්වාමීන්වහන්සේ කියනසේකැයි
ඔවුන්ට කියාපන්න. මම සතර වර්ගයක්, 3
එනම් මරා දමන්ට කඩුවද ඉරන්ට
බල්ලන්ද කාදමා නැතිකරන්ට අහසේ
පක්ෂීන් හා පොළොවේ මෘගයන්ද, ඔවුන්
කෙරෙහි නියමකරන්නෙමියි ස්වාමීන්-
වහන්සේ කියනසේක. යූදහි රජවූ 4
හෙසකියාගේ පුත්‍රවූ මනස්සේ විසින්
යෙරුසලමෙහි කළ දේ නිසා පීඩා
විඳීමට ඔවුන් පොළොවේ සියලු
රාජ්‍යවලට භාරදෙන්නෙමි. එම්බා 5
යෙරුසලම, තුඹට අනුකම්පාකරන්නේ
කවුද? තුඹ ගැන වැලපෙන්නේ කවුද?
තුඹේ සුවදුක් අහන්ට තුඹ ළඟට එන්නේ
කවුද? තුඹම මා අත්හැරියෙහියයි 6
ස්වාමීන්වහන්සේ කියනසේක. තුඹ පස්සට
ගියෙහිය. මමද මාගේ අත තුඹට
විරුද්ධව දිගුකොට තුඹ විනාශකෙළෙමි;
නැවීමෙන් වෙහෙසවී සිටිමි. මම 7
කුල්ලකින් දේශයේ දොරටුවලදී ඔවුන්
පොළාදැමුවෙමි; ඔවුන්ගේ දරුවන් ඔවුන්
කෙරෙන් තුරන්කෙළෙමි; තමුන්ගේ
මාර්ගවලින් හැරී නාවාවූ මාගේ සෙනඟ
නැතිකෙළෙමි. මුහුදේ වැලිවලට වඩා 8
ඔවුන්ගේ වැන්දඹුවෝ වැඩිවූවෝය. මම
යෞවනයන්ගේ මවුට විරුද්ධව ඉර
මුදුන් වේලාවේ නාස්තිකරන්නෙක් ඔවුන්
කෙරෙහි පැමිණෙවූවෙමි. වෙවුලුමද
කැළඹීම්ද හදිසියෙන් ඈ පිටට වැටෙන්ට
සැලැස්සුවෙමි. සත්දෙනෙකු වැදූ තැනැත්තී 9
දුර්වල වේ; ඇගේ ප්‍රාණය ඉකුත්විය;
ඇගේ ඉර දවාලේදීම බැස ගියේය;
ඈ ලජ්ජාවටත් පැමුණුණාය. ඔවුන්ගෙන්
ඉතිරි අය ඔවුන්ගේ සතුරන් ඉදිරියේදී
කඩුවට භාරදෙන්නෙමියි ස්වාමීන්-
වහන්සේ කියනසේක.

### අනාගතවක්තෘ තමාගේ දුක ගැන ළතෝනි කීම.— දෙවියන්වහන්සේගේ උත්තරය

අහෝ මාගේ මෑණියෙනි, මුළු දේශය 10
සමග තරහද විවාදද කරන මනුෂ්‍ය-
යෙකු වෙන්ට තුඹ මා වැදූ නිසා

මට දුක්වේ! මම ණය තුදුන්නෙමි, ණය
නොගත්තෙමි; එහෙත් සියල්ලෝම
11 මට ශාපකරති. සැබවින් තුඹේ යහපත
පිණිස තුඹ නිදහස්කරන්නෙමි;
සැබවින්ම නරක කාලයෙහිත් විපත්ති
කාලයෙහිත් සතුරා විසින් තුඹට
කන්නලව් කරන්ට සලස්වන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
12 යකඩ එනම් උතුරු දිශාවේ යකඩ
13 සහ පිත්තලත් කඩන්ට පුළුවන්ද? තුඹේ
සම්පතද තුඹේ වස්තුද මිලයකට නොව
තුඹේ සියලු පළාත්වල තුඹේ සියලු පව්
නිසා කොල්ලයක් කොට දෙන්නෙමි.
14 තුඹ නොදන්න දේශයකදී තුඹේ සතුරන්ට
සේවයකරන්ට සලස්වන්නෙමි. මක්නිසාද
මාගේ උදහසින් ගින්නක් ඇවිළ තිබේ,
ඒක තුඹලා කෙරෙහි ඇවිළෙනවා ඇත.
15 **ස්වාමීන්වහන්ස**, ඔබම දන්නාසේක.
මා සිහිකොට, මා දෙස බලා, මාගේ
පීඩාකාරයන්ගෙන් මා ගැන පළිගත
මැනව; [ඔවුන් කෙරෙහි ඇති] ඔබගේ
ඉවසිලිවන්තකම නිසා, මා තුරන්
නොකළ මැනව, මා ඔබ නිසා නින්දව
16 ඉසිලූ බව සිහිකළ මැනව. ඔබගේ වචන
සම්බවූ විට මම ඒවා කෑවෙමි; ඔබගේ
වචන මට ප්‍රීතියක් සහ සිතට සතුටක්
විය. මක්නිසාද, සේනාවල දෙවිවූ
**ස්වාමීන්වහන්ස**, ඔබගේ නාමය මා
17 කෙරෙහි කියනු ලැබේ. මමද
සිනාසෙන්නන්ගේ සභාවෙහි හිඳගන
ප්‍රීති නොවීමි. ඔබගේ හස්තය නිසා
තනියම හිඳගතිමි; මක්නිසාද ඔබ
18 කෝපයෙන් මා පිරෙවූසේක. මාගේ
වේදනාව නිතරම තිබෙන්නෙත් මාගේ
තුවාලය අසාධ්‍යව තිබෙන්නෙත්
මක්නිසාද? ඒක සුවවෙන්නේම නැත.
සැබවින්ම ඔබ මට වතුර සිඳීයන
අවිශ්වාස ඔයක් මෙන් සිටිනසේක්ද?
19 එබැවින් **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: තුඹ හැරීආවොත්, මම තුඹ නැවත
ගෙනෙන්නෙමි, තුඹද මා ඉදිරියෙහි
සිටින්නෙහිය; තුඹ අනර්ඝ දෙය නීච
දෙයින් වෙන්කළොත්, තුඹ මාගේ මුඛය
මෙන් සිටින්නෙහිය. ඔව්හු තුඹ වෙතට
හැරීඑන්නෝය, එහෙත් තුඹ ඔවුන් වෙතට
හැරී නොයන්න. මම මේ සෙනඟට 20
විරුද්ධව තුඹ බලවත් පිත්තල පවුරක්
කරන්නෙමි; ඔව්හු තුඹට විරුද්ධව
යුද්ධකරන්නෝය, නුමුත් තුඹෙන් ජය
නොගන්නෝය. මක්නිසාද තුඹ
ගළවන්ටත් නිදහස් කරන්ටත් මම තුඹ
සමග සිටිමි. නපුරන්ගේ අතින් තුඹ 21
නිදහස්කරන්නෙමි, භයානකයන්ගේ
මිටෙන් තුඹ මුදන්නෙමියි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.

## භාර්යාවක් නැති අනාගතවක්තෘගේ ලකුණ–එනම් ස්වකීය පාපය නිසා යූදට පැමිණෙන විනාශය

16
තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
මා වෙතට පැමිණ මෙසේ කීය:
මේ ස්ථානයෙහි තුඹ භාර්යාවක් පාවා 2
නොගනින්න, පුත්‍රයෝද දූවරුද තුඹට
නොසිටිත්වා. මක්නිසාද මේ ස්ථානයෙහි 3
උපදින පුත්‍රයන්ද දූවරුන්ද ගැනත් මේ
දේශයෙහි ඔවුන් වැදූ මවුවරුන්ද ඔවුන්
ජාතකකළ පියවරුන්ද ගැනත් **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: ඔව්හු 4
බලවත් රෝගවලින් මැරෙන්නෝය; ඔවුන්
ගැන කිසිවෙක් නොවැලපෙන්නේය,
ඔව්හු වළලනු නොලැබ, භූමිය මතුපිට
කසළ මෙන් වන්නෝය, ඔව්හු කඩුවෙන්ද
සාගතයෙන්ද විනාශවී, ඔවුන්ගේ
මළකඳන් ආකාශයේ පක්ෂීන්ටත්
පොළොවේ මෘගයන්ටත් ගොදුරු
වන්නේය. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 5
මෙසේ කියනසේක: වැලපීමේ ගෙට ඇතුල්
නොවන්න, ළතෝනි කියන්ට නොයන්න,
ඔවුන් ගැන ශෝක නොවන්න. මක්නිසාද
මාගේ සමාදානය, එසේය, කරුණාව
සහ අනුකම්පාව, මේ සෙනඟගෙන්
අහක්කරගතිමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මේ දේශයෙහි ලොකු කුඩා 6
අය මැරෙනවා ඇත. ඔව්හු වළලනු
නොලබන්නෝය, කිසිවෙක් ඔවුන් ගැන
විලාප නොකියන්නේය, ශරීරය කපා
නොගන්නේය, ඔවුන් ගැන හිස

7 මුඩුකර නොගන්නේය. මළ තැනැත්තා
ගැන ඔවුන් සනසන පිණිස වැලපීමේදී
කිසිවෙක් ඔවුන්ට රොටි කඩා
දෙන්නේවත්, ඔවුන්ගේ පියා නිසාවත්
ඔවුන්ගේ මවු නිසාවත් සැනසීමේ
කුසලානෙන් ඔවුන්ට පොවන්නේවත් නැත.
8 නුඹ ඔවුන් සමග හිඳගෙන කනබොන
පිණිස මංගල්‍ය ගෙදරට ඇතුල්
9 නොවන්න. මක්නිසාද ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ, සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: මෙන්න, නුඹලාගේ
ඇස් ඉදිරියේදීත් නුඹලාගේ දවස්වලදීත්
ප්‍රීති සන්තෝෂ හඬද මනමාලයාගේ
සහ මනමාලියගේ හඬද මේ ස්ථානයෙන්
10 නවත්වන්නෙමි. නුඹ මේ සියලු කාරණා
මේ සෙනඟට දන්වූ විට, ඔව්හු: **ස්වාමීන්-
වහන්සේ** ඒ මුළු මහත් විපත්තිය අපට
විරුද්ධව කීවේ මොකක් නිසාද කියාත්
අපේ අයුතුකම මොකද කියාත් අපේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේට** විරුද්ධව අප
විසින් කළ අපේ පාපය මොකද
කියාත් අසන කල, නුඹ ඔවුන්ට
11 කථාකොට—නුඹලාගේ පියවරුන් මා
අත්හැර, අන් දෙවිවරුන් පස්සේ ගොස්,
ඔවුන්ට සේවයකර, නමස්කාරකර, මා
අත්හැර, මාගේ ව්‍යවස්ථාවද නොපවත්වා
12 සිටින්ටත්, නුඹලාම නුඹලාගේ
පියවරුන්ටත් වඩා නපුරු ලෙස
ක්‍රියාකරන්ටත් යෙදුණු නිසාය. බලව,
මට කන් නොදෙන හැටියට නුඹලා
එකිනෙකා තම තමාගේ නපුරු සිතේ
මුරණ්ඩුකම ලෙස හැසිරෙන්නහුය.
13 එබැවින් මම මේ දේශය මතුපිටින්
නුඹලාවත් නුඹලාගේ පියවරුන්වත්
දැන නොගත් දේශය පිටට නුඹලා
හෙළාදමන්නෙමි; එහි නුඹලා රෑ දවල්
අන් දෙවිවරුන්ට සේවයකරනවා ඇත;
මක්නිසාද මම නුඹලාට කරුණාව
නොපෙන්වන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කියාපන්න.
14 එහෙත් **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර
දේශයෙන් ගෙනාවාවූ **ස්වාමීන්වහන්සේ**
ජීවමාන බව සැබෑවා සේම කියා තවත්
15 නොකියා—ඉශ්‍රායෙල් පුත්‍රයන් උතුරු
දේශයෙන්ද උන්වහන්සේ ඔවුන් පන්නාදමූ
සියලු දේශවලින්ද ගෙනාවාවූ **ස්වාමීන්-
වහන්සේ** ජීවමාන බව සැබෑවා සේම
කියා කියන දවස් පැමිණෙන්නේය. මා
විසින් ඔවුන්ගේ පියවරුන්ට දුන් ඔවුන්ගේ
දේශයට ඔවුන් නැවත පමුණුවන්නෙමි.
බලව, ඔවුන් අල්ලන පිණිස මම 16
මසුන් අල්ලන්නන් බොහෝදෙනෙකු
එවන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. ඉන්පසු සියලු කඳුවලද සියලු
හෙල්වලද පර්වත විවරවලද ඔවුන්
දඩයම්කරන පිණිස බොහෝ
දඩයක්කාරයන් එවන්නෙමි. මක්නිසාද 17
මාගේ ඇස් ඔවුන්ගේ සියලු මාර්ගයන්
කෙරෙහි යොමා තිබේ. ඒවා මාගේ
මුහුණෙන් සැඟවී නැත, ඔවුන්ගේ
අයුතුකමද මාගේ ඇස් ඉදිරියෙන් වැසී
නැත. ඔවුන් තමුන්ගේ අශික්ෂිත දේවල 18
මළකඳන්වලින් මාගේ දේශය දූෂ්‍යකොට,
තමුන්ගේ පිළිකුල්වලින් මාගේ උරුමය
පුරවා තිබෙන නිසා, මම පළමුකොට
ඔවුන්ගේ අයුතුකමටත් පාපයටත්
දෙගුණයක් ප්‍රතිඵල දෙන්නෙමි. මාගේ 19
බලයද මාගේ බලකොටුවද විපත්ති
දවසේදී මාගේ රක්ෂාස්ථානයද වූ
**ස්වාමීන්වහන්ස**, ජාතීහු පොළොවේ
සීමාවලින් ඔබ වෙතට ඇවිත් කථාකොට:
කිසි ප්‍රයෝජනයක් නැති නිෂ්ඵලකම
වන බොරුකාරකමම අපේ පියවරු
උරුමකරගෙන සිටියෝය. මනුෂ්‍යයෙක් 20
තමාටම දෙවිවරුන් සාදගන්නේද? ඒවා
දෙවිවරු නොවෙත්යයි කියන්නෝය.
එබැවින්, මෙන්න, මේ වතාවේ පමණක් 21
ඔවුන්ට දැනගන්ට සලස්වන්නෙමි,
මාගේ හස්තයත් මාගේ පරාක්‍රමයත්
දැනගන්ට සලස්වන්නෙමි; මාගේ නාමය
යෙහෝවාවහන්සේ බව ඔව්හු දැන-
ගන්නෝය.

17
යූදාවරුන්ගේ පාපය යකඩ
පන්හිඳකින්ද වජ්‍ර තුඩකින්ද ලියා
තිබේ, ඒක ඔවුන්ගේ සිත නැමති
පුවරුවේද ඔවුන්ගේ පූජාසනයන්හි
අංවලද කොටා තිබේ. එසේම ඔවුන්ගේ 2
දරුවෝද උස්වූ හෙල් උඩ අමු ගස් ළඟ
තිබෙන ඔවුන්ගේ පූජාසනද ඔවුන්ගේ

3 අෂේරා කණුද සිහිකරති. එම්බා එනයේ
තිබෙන මාගේ කන්ද, නුඹේ සම්පතද
නුඹේ සියලුම වස්තූද නුඹේ සියලු
පළාත්වල කළ පාපය නිසා නුඹේ උස්
තැන්ද කොල්ලයක් කොට දෙන්නෙමි.
4 මා විසින් නුඹට දුන් නුඹේ උරුමයෙන්
නුඹ අහක්වන්නෙහිය; නුඹ නොදන්නා
දේශයකදී නුඹේ සතුරන්ට සේවයකරන්ට
නුඹට සලස්වන්නෙමි; මක්නිසාද නුඹලා
මාගේ උදහසින් ගින්නක් දල්වා තිබේ,
එය සදාකාලේටම ඇවිළී යනවා ඇත.
5 ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
මනුෂ්‍යයා කෙරෙහි විශ්වාස කරන්නාවූ,
මාංසය තමාගේ හස්තය කොට
තබාගන්නාවූ, සිතින් ස්වාමීන්වහන්සේ
කෙරෙන් පහවයන්නාවූ මනුෂ්‍යයා
6 ශාපලද්දෙක්ය. ඔහු මරුකතරේ රෝතෙම්
ගහකට සමානවී, යහපත පැමිණෙන
විට එය නොදක, ලුණු භූමියක්ව
තිබෙන්නාවූ, වැසියන් නැත්තාවූ
කාන්තාරයේ වියළි තැන්වල
7 වාසයකරනවා ඇත. ස්වාමීන්වහන්සේ
කෙරෙහි විශ්වාසකොට, ස්වාමීන්වහන්සේ
තමාගේ විශ්වාසය කොට තබාගෙන
සිටින මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය.
8 මක්නිසාද ඔහු ජලය ළඟ හිටවා
තිබෙන්නාවූ, ගඟ ළඟ මුල් අදින්නාවූ,
ග්‍රීෂ්මය පැමිණෙන විට එය නො-
දනෙන්නාවූ, කොළ නොවේළෙන්නාවූ,
නියං අවුරුද්දේදී නොමැලවෙන්නාවූ, එල
දැරීමෙන් තොර නොවෙන්නාවූ ගහකට
9 සමානවන්නේය. සියල්ලට වඩා සිත
රැවටිලිකාරව තිබේ, ඒක දුෂ්ටවම තිබේ.
10 ඒක කාට දනගන්ට පුළුවන්ද? ස්වාමීන්-
වහන්සේ වන මම එකිනෙකාට තම
තමාගේ මාර්ග ලෙසද ක්‍රියාවල එල
ලෙසද දෙන පිණිස සිත විභාගකොට,
11 අදහස් සෝදිසිකරමි. අයුක්තියෙන්
සම්පත් උපදවාගන්නා තමා නොදැමූ
බිජු රකින ඇටිකිකිළියෙකුට සමානය;
ඔහුගේ දවස් මධ්‍යයේදී ඒවා ඔහු අත්හැර
යන්නේය, මෙසේ ඔහු තමාගේ අන්තිමයේදී
අඥනයෙක් වන්නේය.
12 අපේ ශුද්ධස්ථානයේ ඉඩම වනාහි
පටන්ගැන්මේ සිට උසස්වූ තේජවන්තවූ
සිංහාසනයක්ය. අහෝ ඉශ්‍රායෙල්ගේ 13
බලාපොරොත්තුවවූ ස්වාමීන්වහන්ස,
ඔබව අත්හරින සියල්ලෝම ලජ්ජාවට
පත්වන්නෝය; මාගෙන් අහක්වයන්නෝ
ජීවමාන වතුර උල්පත වන ස්වාමීන්-
වහන්සේ අත්හැරිය බැවින්, ඔවුන් ගැන
පොළොව පිට ලියනු ලැබේ. ස්වාමීන්- 14
වහන්ස, මට සුවවන පිණිස මා සුවකළ
මැනව; මා ගැළවෙන පිණිස ඔබ මා
ගැළෙවුව මැනව. මක්නිසාද ඔබම මාගේ
ප්‍රශංසාවය. බලව, ඔව්හු: ස්වාමීන්- 15
වහන්සේගේ වචනය කොයිද? එය
පැමිණේවයි මට කියති. මම නම් 16
එඬේරෙක්ව සිටීමෙන්ද ඔබ අනුව
යාමෙන්ද හැරී නොගියෙමි; කාලකණ්ණි
දවසට මම ආශාද නුණෙමි; ඔබම
දන්නාසේක. මාගේ තොල්වලින් නික්මුණු
කාරණය ඔබගේ මුහුණ ඉදිරියෙහිම
තිබුණේය. ඔබ මට භීතියක්ව නොසිටිය 17
මැනව. විපත්ති දවසේදී ඔබ මාගේ
රක්ෂාස්ථානයය. මට පීඩාකරන්නෝ 18
ලජ්ජාවට පැමිණෙත්වා, මා ලජ්ජාවට
පැමිණෙන්ට ඉඩ නැරිය මැනව; ඔව්හු
කැලඹෙත්වා, මා කැලඹෙන්ට ඉඩ නැරිය
මැනව. විපත්ති දවස ඔවුන් පිටට
පමුණුවා, ද්විගුණ විනාශයකින් ඔවුන්
විනාශකළ මැනව.

## සබත් දවස සම්බන්ධ පණිවිඩය

ස්වාමීන්වහන්සේ මට මෙසේ කීසේක: 19
නුඹ ගොස් යූදහි රජවරුන් යන එන,
සෙනඟගේ පුත්‍රයන්ගේ දොරටුවේද
යෙරුසලමේ සියලු දොරටුවලද සිට
ඔවුන්ට කථාකොට: යූදහි රජවරුනි, 20
සියලු යූදවරුනි, මේ දොරටුවලින්
ඇතුල්වෙන යෙරුසලමේ සියලු වැසියෙනි,
ස්වාමීන්වහන්සේගේ වචනය අසාපල්ලා;
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක—නුඹලා 21
සබත් දවසේදී කිසි බරක් උසුලාගෙන
යෙරුසලමේ දොරටුවලින් එය නො-
ගෙනෙන හැටියටත්, සබත් දවසේදී 22
නුඹලාගේ ගෙවලින් බරක් නොගෙනියන
හැටියටත්, කිසිම වැඩක් නොකරන
හැටියටත්, නුඹලාගේ ප්‍රාණ උදෙසා

බලාගෙන, මා විසින් තුඹලාගේ
පියවරුන්ට අණකළ ප්‍රකාරයට සබත්
23 දවස ශුද්ධලෙස පවත්වාපල්ලා. එහෙත්
ඔව්හු නාසා, තමුන්ගේ කන් යොමු
නොකර, නාසන ලෙසත් දනමුතුකම
පිළි නොගන්න ලෙසත් තමුන්ගේ කුළල්
24 දැඩිකරගත්තෝය. නුමුත් තුඹලා සබත්
දවසේදී මේ නුවර දෙරපුවලින් කිසි බරක්
නොගෙනෙන හැටියට මට ඇහුම්කන්දී,
සබත් දවසේදී කිසිම වැඩක් නොකොට,
25 ඒක ශුද්ධලෙස පැවැත්තුවොත්, දාවිත්ගේ
සිංහාසනයෙහි වාඩිවෙන්නාවූ, රථවල
සහ අශ්වයන් පිට නැගී යන්නාවූ රජවරු
සහ ඔවුන්ගේ අධිපතීහුද යූදහි
මනුෂ්‍යයෝද යෙරුසලමේ වැසියෝද මේ
නුවර දෙරපුවලින් ඇතුල්වන්නාහුය. මේ
නුවරද සදාකාලේටම පවතිනවා ඇත.
26 තවද යූදහි නුවරවලින්ද යෙරුසලම
වටකර තැන්වලින්ද බෙන්යමින්
දේශයෙන්ද පාතරටින්ද කඳුකරයෙන්ද
දකුණු දිශාවෙන්ද මනුෂ්‍යයෝ දවන
පූජාද යාගද ආහාර පූජාද කට්ටකුමංචල්ද
රැගෙන, ස්තුති පූජාද රැගෙන, **ස්වාමීන්-**
27 **වහන්සේගේ** ගෘහයට එන්නෝය. නුමුත්
සබත් දවස ශුද්ධලෙස පවත්වන
හැටියටද සබත් දවසේදී බරක් උසුලාගෙන
යෙරුසලමේ දෙරටුවලට ඇතුල්නොවන
හැටියටද තුඹලා මට ඇහුම්කන්
නුදුන්නොත්, මම එහි දෙරටුවල ගින්නක්
අවුළුවන්නෙමි. එය නොනිවී යෙරුසලමේ
මාළිගා දවාදමන්නේයයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක.

## කුම්භකාරයා සහ මැටි

18 **ස්වාමීන්වහන්සේගෙන්** යෙරෙමියා
වෙතට පැමිණි වචනය මේය:
2 නුඹ නැගිට කුම්භකාරයාගේ ගෙට
පලයන්න, එහිදී මාගේ වචනය නුඹට
3 ප්‍රකාශකරන්නෙමියි කීය. එකල මම
කුම්භකාරයාගේ ගෙට ගියෙමි, බලව,
ඔහු සකපෝරුවෙන් වැඩකරමින්
4 සිටියේය. ඔහු සෑදූ මැටිභාජනය
කුම්භකාරයාගේ අතේ නරක්වූ කල,
නැවත ඒක සාදන්ට කුම්භකාරයාට
හොඳව පෙනුණු ලෙස, ඔහු එයින් වෙන
භාජනයක් සෑදුවේය.

එකල **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 5
වෙතට පැමිණ මෙසේ වදාළේය: එම්බා 6
ඉශ්‍රායෙල් වංශය, මේ කුම්භකාරයා
කරන ලෙස තුඹලාට කරන්ට මට
බැරිදැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
එම්බා ඉශ්‍රායෙල් වංශය, කුම්භකාරයාගේ
අතෙහි තිබෙන මැටි මෙන් තුඹලා මාගේ
අතෙහි සිටින්නාහුය. උදුරා කඩාදමා 7
නැතිකරන්නෙමියි මම කිසියම් ජාතියක්
හෝ රාජ්‍යයක් ගැන කී කල, මා විසින් 8
එසේ කථාකළ ඒ ජාතිය තමුන්ගේ
නපුරුකමෙන් අහක්වුණොත්, මම
ඔවුන්ට පමුණුවන්ට සිතූ විපත්තිය
ගැන පසුතැවිලිවන්නෙමි. ගොඩනගා 9
හිටවන්නෙමියි මා විසින් යම් ජාතියක්
ගැනවත් රාජ්‍යයක් ගැනවත් කී කල්හි:
ඔවුන් මාගේ හඬට කීකරු නොවී, මාගේ 10
ඇස් හමුයෙහි නපුරුව තිබෙන දේ
කළොත්, ඔවුන්ට කරන්නෙමියි මා කී
යහපත ගැන පසුතැවිලිවන්නෙමි.
ඒබැවින් නුඹ යූද මනුෂ්‍යයන්ටත් 11
යෙරුසලමේ වැසියන්ටත් කථාකොට:
මම තුඹලාට විරුද්ධව විපත්තියක්
යොදමින්ද තුඹලාට විරුද්ධව
යෝජනාවක් යෝජනාකරමින්ද සිටිමි.
ඉතින් තුඹලා එකිනෙකා තම තමාගේ
නපුරු මාර්ගයෙන් හැරී, තුඹලාගේ
මාර්ගවල්ද ක්‍රියාවල්ද හරිගස්සාගනිල්ලාය
කියා **ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කියාපන්න. නුමුත් ඔව්හු: ඒක නිෂ්ඵලය. 12
මක්නිසාද අපේම අභිප්‍රායයන් ලෙස
හැසිරෙන්නෙමුව, අපි එකිනෙකා අපේ
නපුරු සිත්වල මුරණ්ඩුකම ලෙස
කරන්නෙමුයයි කියති.
ඒබැවින් **ස්වාමීන්වහන්සේ** මෙසේ 13
කියනසේක: මෙයාකාර දේ ඇසුවේ කවුද
කියා ජාතීන් අතරෙහි විභාගකරපල්ලා:
ඉශ්‍රායෙල් කන්‍යාව ඉතා භයංකර
දෙයක් කළාය. ලෙබනොන්හි හිම 14
වනයේ පර්වතයෙන් නැතිව යන්නේද?
නොහොත් දුරු තැනකින් ගලා එන්නාවූ
ශීතල ජලය සිඳී යන්නේද? එහෙත් මාගේ 15
සෙනඟ මා මතකනැතිකළෝය, ඔව්හු
දේව රූපවලට සුගන්ධ ද්‍රව්‍ය දැවූවෝය;
ඒවා වනාහි හරි නොගැස්සූ මාර්ගයකද

අනුරු පාරවලද යන ලෙස පුරාණ
මාවත් වන ඔවුන්ගේ මාර්ගවල ඔවුන්
16 පැකිලවති. මෙසේ ඔවුන්ගේ දේශය
විස්මයක්ද නිරන්තර කවටකමක්ද කරති;
ඒ ළඟින් යන සියල්ලෝ විස්මපත්ව
17 තමුන්ගේ හිස් වනන්නෝය. පෙරදිග
හුළඟකින් මෙන් සතුරා ඉදිරියෙන් ඔවුන්
විසුරුවන්නෙමි; ඔවුන්ගේ විපත්ති දවසේදී
ඔවුන්ට මුහුණ නොව පිට පාන්නෙමියි
කියාපන්න.
18 එකල ඔව්හු කථාකොට: එරෙල්ලා,
අපි යෙරෙමියාට විරුද්ධව උපා යොදමු;
මක්නිසාද පූජකයාගෙන් ව්‍යවස්ථාවවත්
ප්‍රඥවන්තයාගෙන් මන්ත්‍රණයවත් අනා-
ගතවක්තෘගෙන් වචනයක්වත් නැතිව
නොයන්නේය. එරෙල්ලා, අපි ඔහුට
දිවෙන් පහරදී, ඔහුගේ කිසිම වචනයකට
ඇහුම්කන් නොදී සිටිමුයයි කීවෝය.
19 ස්වාමීන්වහන්ස, ඔබ මා සලකා, මා
සමග විවාදකරන්නන්ගේ ශබ්දය ඇසුව
20 මැනව. යහපතට නපුර කිරීම යුතුද?
මක්නිසාද ඔව්හු මාගේ ප්‍රාණයට වළක්
හෑරුවෝය. ඔවුන් කෙරෙන් ඔබගේ
කෝපය පහකරන පිණිස ඔවුන් වෙනුවට
යහපත කථාකරන්ට මා ඔබ ඉදිරියෙහි
21 සිටිය බව සිහිකළ මැනව. එබැවින්
ඔවුන්ගේ දරුවන් සාගතයට භාරදී,
ඔවුන් කඩුවේ බලයට අත්හැරිය මැනව;
ඔවුන්ගේ භාර්යාවෝ දරුවන් නැත්තියෝද
වැන්දඹුවෝද වෙත්වා; ඔවුන්ගේ පුරුෂයෝ
වසංගතයෙන් මැරෙත්වා, ඔවුන්ගේ
යෞවනයෝද යුද්ධයේදී කඩුවෙන්
22 මැරුම්කත්වා. ඔබ හදිසියෙන් සේනාවක්
ඔවුන්ට විරුද්ධව පමුණුවන කල
ඔවුන්ගේ ගෙවලින් කෑගැසීමක් ඇසේවා.
මක්නිසාද ඔවුන් මා අල්ලාගන්ට වළක්
හාරා, මාගේ පාදවලට මලපත් සඟවා
23 තැබුවෝය. නුමුත්, ස්වාමීන්වහන්ස, මා
මරන්ට මට විරුද්ධව ඔවුන් යොදන
සියලු කුමන්ත්‍රණ ඔබම දන්නාසේක;
ඔවුන්ගේ අයුතුකම් කමා නොකළ
මැනව, ඔවුන්ගේ පාපයද ඔබගේ ඇස්
හමුයෙන් නොමැකුව මැනව. ඔබ
ඉදිරියෙහි ඔව්හු පැකිල වැටෙත්වා; ඔබගේ
උදහස් කාලයේදී ඔවුන්ට ප්‍රතිඵල දුන
මැනව.

## මැටි භාජනය බිඳීම නැමති ලකුණ

19 ස්වාමීන්වහන්සේ මෙසේ කීසේක:
තුඹ ගොස් කුම්භකාරයෙකුගේ
මැටි කළයක් මිලේටගෙන, සෙනඟගේ
වැඩිමහල්ලන්ගෙන්ද පූජකයන්ගේ වැඩි-
මහල්ලන්ගෙන්ද සමහරුන් කැඳවා-
ගෙන, *හාර්සිත් නම් දොරටුව ළඟ තිබෙන 2
හින්නොම් පුත්‍රයාගේ මිටියාවතට
පැමිණ මා විසින් තුඹට කියන වචන
එහිදී ප්‍රකාශකරමින් මෙසේ කියාපන්න:
යූදහි රජවරුනි, යෙරුසලමේ වැසියෙනි, 3
ස්වාමීන්වහන්සේගේ වචනය අසාපල්ලා.
ඉශ්‍රායෙල්ගේ දෙවිඳු, සේනාවල ස්වාමීන්-
වහන්සේ මෙසේ කියනසේක—අසන
සියල්ලන්ගේ කන් ලෙළදෙන තරමට
මේ ස්ථානය පිටට විපත්ති පමුණුවමි.
මක්නිසාද ඔවුන් මා අත්හැර, මේ 4
ස්ථානය අන්‍ය එකක් කර, ඔවුන්වත්
ඔවුන්ගේ පියවරුන්වත් යූදහි රජුන්වත්
දත නොගත් අන් දෙවිවරුන්ට මෙහි
සුවඳ දුම් ඔප්පුකර, නිර්දෝෂයන්ගේ
ලේවලින් මේ ස්ථානය පුරවා තිබේ.
තවද ඔවුන් තමුන්ගේ පුත්‍රයන් බාල්ට 5
දවන පූජා කොට ගින්නෙහි පුලුස්සන
පිණිස බාල්ට උස්තැන් ගොඩනගා
තිබේ. මා එය අණ කළේවත් කීවේවත්
එය මාගේ සිතට පැමුණුණේවත්
නැත. එබැවින් මේ ස්ථානයට තෝපෙත්ය 6
කියාවත් හින්නොම්ගේ පුත්‍රයාගේ
මිටියාවතය කියාවත් නවත් නොකියා.
මැරීමේ මිටියාවතය කියන දවස්
පැමිණෙන්නේයයි ස්වාමීන්වහන්සේ
කියනසේක. මම යූදහිද යෙරුසලමේද 7
මන්ත්‍රණය මේ ස්ථානයේදී හිස්කර,
ඔවුන්ගේ සතුරන්ගේ කඩුවෙන්ද ඔවුන්ගේ
ප්‍රාණය හානිකරන්ට සොයන්නන්ගේ
අත්වලින්ද ඔවුන් වැටෙන්ට සලස්වා,
ඔවුන්ගේ මළකඳන් ආකාශයේ
පක්ෂීන්ටත් පොළොවේ මෘගයන්ටත්
ගොදුරු කොට දෙන්නෙමි. මම 8
මේ නුවර විස්මයක්ද කවටකමක්ද
කරන්නෙමි; ඒ ළඟින් යන සියල්ලෝ

*හෙවත්—කුඹල් දොරටුව.

විස්මපත්වී, ඊට පැමුණුණු සියලු විපත්ති
9 ගැන කවටකම්කරන්නෝය. තමුන්ගේ
පුත්‍රයන්ගේ මාංසද දූවරුන්ගේ මාංසද
ඔවුන් විසින් කන්ට සලස්වන්නෙමි;
ඔවුන්ගේ සතුරන්ද ඔවුන්ගේ ප්‍රාණය
හානිකරන්ට සොයන්නන්ද ඔවුන්ට
කරන අමාරුවේදීත් තද පීඩාවේදීත්,
ඔව්හු එකිනෙකාගේ මාංස කන්නෝයයි
10 කියාපන්න. තවද නුඹ සමග යන
මනුෂ්‍යයන් ඉදිරියේදී කළය බිඳ, ඔවුන්ට
11 මෙසේ කියාපන්න: සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක—නැවත
හරිගස්සන්ට බැරිලෙස කුම්භකාරයාගේ
භාජනය බිඳදමන්නාක්මෙන්ම මම මේ
සෙනඟත් මේ නුවරත් බිඳදමන්නෙමි.
වළලන්ට ඉඩක් නැතිවෙන තුරු
12 තෝපෙත්හි මිනී වළලනු ලැබේ. මම
මේ ස්ථානයටත් මෙහි වැසියන්ටත් එසේ
කොට, මේ නුවර තෝපෙත් මෙන්
13 කරන්නෙමි. යම් යම් පියසි උඩ මුළු
අහස් සේනාවට සුවඳ දුම් ඔප්පුකරන්ටත්
අන් දෙවිවරුන්ට පාන පූජා වගුරුවන්ටත්
යෙදුණේද, අපවිත්‍රවූ ඒ සියලු ගෙවල්
වන යෙරුසලමේ ගෙවල්ද යූදහි
රජවරුන්ගේ ගෙවල්ද තෝපෙත් යන
ස්ථානය මෙන් වන්නේයයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.

## පෂ්හූර්ගේ පළිගැනීම සහ යෙරෙමියාගේ උත්තරදීම

14 ඉක්බිති යෙරෙමියා අනාගතවාක්‍ය
කියන්ට **ස්වාමීන්වහන්සේ** විසින් ඔහු
යැවූ තෝපෙත්හි සිට ඇවිත් **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ මළුවේ සිට මුළු
15 සෙනඟට කථාකොට: ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ, සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේක්: බලව, මම මේ නුවරටත්
ඊට අයිති සියලුම දනව්වලටත් විරුද්ධව
කී මුළු විපත්තිය ඒවා පිටට පමුණු-
වන්නෙමි; මක්නිසාද ඔව්හු මාගේ වචන
නාසන ලෙස තමුන්ගේ කුළල් දැඩිකර-
ගන්නෝයයි කීසේකැයි කීවෝය.

20 **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
ප්‍රධාන මුලාදෑනියාවූ ඉම්මෙර්ගේ
පුත්‍රවූ පෂ්හූර් නම් පූජකයා යෙරෙමියා
ඒ කාරණා අනාගතවාක්‍යයෙන් කියනවා
ඇසූ විට, අනාගතවක්තෘවූ යෙරෙමියාට 2
ගසා, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ ඉහළ
බෙන්යමින් දෙරටුවේ තිබෙන දඬුකඳේ
ඔහු දඬුගැසුවේය. පසුවද පෂ්හූර් 3
යෙරෙමියා දඬුකඳෙන් නිදහස්කළ විට
යෙරෙමියා ඔහුට කථාකොට: නුඹට
*පෂ්හූර් නොව †මාගොර්-මිස්සාබිබියයි
**ස්වාමීන්වහන්සේ** නම් තබා තිබේ.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මෙසේ 4
කියනසේක: බලව, නුඹ සහ නුඹේ සියලු
මිත්‍රයන්ද භීතියට භාරදෙමි. ඔව්හු
තමුන්ගේ සතුරන්ගේ කඩුවෙන්
වැටෙන්නෝය, නුඹද නුඹේම ඇස්වලින්
එය දකින්නෙහිය. මම මුළු යූද දේශයත්
බබිලොන් රජුගේ අතට භාරදෙන්නෙමි,
ඔහුද ඔවුන් බබිලෝනියට ගෙන ගොස්
කඩුවෙන් මරන්නේය. තවද මම මේ 5
නුවර මුළු සම්පතද එහි මුළු ධනයද
එහි සියලු අනර්ඝ දේද, එසේය, යූදහි
රජවරුන්ගේ සියලුම වස්තුද ඔවුන්ගේ
සතුරන් අතට දෙන්නෙමි; ඔවුන් ඒවා
කොල්ලකා බබිලෝනියට ගෙන යනවා
ඇත. එම්බා පෂ්හූර්, නුඹ සහ නුඹේ 6
ගෙයි වැසි සියල්ලෝද වාලට යන්නහුය.
නුඹත් නුඹේ බොරු අනාගතවාක්‍ය ඇසූ
නුඹේ සියලු මිත්‍රයොත් බබිලෝනියට
පැමිණ, එහිදී මැරී වළලනු ලබන්නහුයයි
කීවේය.

## ස්වාමීන්වහන්සේ විසින් පෙළඹීම ගැන යෙරෙමියා පැමිණිලිකර, තමාගේ උපන් දිනට ශාපකිරීම

අහෝ **ස්වාමීන්වහන්ස**, ඔබ මා 7
පෙළඹූසේක, මම පෙළඹුනෙමි. ඔබ මට
වඩා බලවත්ව ජයගත්සේක. මම සැමදම
කවටකමක්ව සිටිමි, සියල්ලෝම මට

*එනම්, වටකර සැපත.
†එනම්, වටකරින්ම භීතිය.

8 කවටකම්කරති. මක්නිසාද මම කථාකරන
සැමවිටම මොරගසමි: බලාත්කාරය
හා නාස්තියයයි කෑගසා කියමි.
මක්නිසාද **ස්වාමින්වහන්සේගේ** වචනය
සැමදම මට නින්දාවක් සහ කවටකමක්
9 කරනලද්දේ විය. උන්වහන්සේ සඳහන්
නොකරන්නෙමියි කියාද උන්වහන්සේගේ
නාමයෙන් තවත් කථා නොකරන්නෙමියි
කියාද කියම් නම්, එය මාගේ ඇට
තුළේ වැසී ඇවිළෙන ගින්නක් මෙන්
මාගේ සිත තුළ තිබේ, දරන්ට මා
10 වෙහෙසෙන නුමුත් මට බැරිය. මක්නිසාද
මා බොහෝ දෙනෙකුගේ කේලාම් අසා
තිබේ, වටකරින්ම භීතිය තිබේ.
දන්වාපල්ලා, අපිත් එය දන්වන්නෙමු-
යයි කියා මාගේ හිතේසි මිත්‍රයන්
සියල්ලෝ මාගේ පැකිළීම ගැන
බලාසිට: සමහරවිට ඔහු පෙළඹෙනවා
ඇත, එවිට අපි ඔහු පරාජයකොට
ඔහුගෙන් පළිගන්නෙමුයයි කියති.
11 නුමුත් **ස්වාමින්වහන්සේ** භයානකවූ
බලවන්තයෙකු මෙන් මා සමග
සිටිනසේක. එබැවින් මාගේ පීඩාකාරයෝ
පැකිලෙන්නෝය, ජය නොගන්නෝය.
ඔව්හු නුවණින් ක්‍රියා නොකළ නිසා
බොහෝසෙයින් ලජ්ජාවට පැමිණෙන්-
නෝය, එය කවදාවත් සිහිනැති නොවන
සදාකාල අවනම්බුවක් වන්නේය.
12 ධර්මිෂ්ඨයා සෝදිසිකරන්නාවූ, අදහස්ද
සිතද දකින්නාවූ සේනාවල **ස්වාමින්-
වහන්ස**, ඔබ ඔවුන්ගෙන් පළිගන්නවා
දකින්ට මට ලැබේවා; මක්නිසාද මාගේ
13 කාරණය ඔබට ප්‍රකාශකෙළෙමි. **ස්වාමින්-
වහන්සේට** ගී කියාපල්ලා. **ස්වාමින්-
වහන්සේට** ප්‍රශංසාකරපල්ලා. මක්නිසාද
උන්වහන්සේ දිළින්දාගේ ප්‍රාණය
නපුරුකරන්නන්ගේ අතින් නිදහස්
කළසේක.
14 මා උපන් දවසට ශාපවේවා. මාගේ
මවු මා වැදූ දවසට ආශීර්වාද නොවේවා.
15 නුඹට පිරිමි දරුවෙක් උපන්නේය කියා
මාගේ පියාට දන්වා ඔහු ප්‍රීතිමත්කළ
16 මනුෂ්‍යයාට ශාපවේවා. මාගේ මවු
මාගේ මිනීවළ වෙන ලෙසත්, ඇගේ
කුසය හැමදම මහත්ව තිබෙන ලෙසත්,
මා කුසේ සිටිද්දී මා නොමැරූ බැවින්.
17 ඒ මනුෂ්‍යයා වනාහි **ස්වාමින්වහන්සේ**
කරුණා නොකර නාස්තිකළ නුවරවල්
මෙන් වේවා. උදයේ කෑගැසීමක්ද ඉර
මුදුන් වේලාවේ ඝෝෂාකිරීමක්ද ඔහුට
ඇසේවා. දුකත් ශෝකයත් දකීමටද 18
මාගේ දවස් ලජ්ජාවෙන් පසුවෙන්ටද
මා කුසෙන් නික්ම ආවේ මක්නිසාද?

## බබිලෝනිය විසින් යෙරුසලම අත්පත්කරගන්න බව ශෙදෙකියාට සහ සෙනඟට දන්වීම

21 ශෙදෙකියා රජු විසින් මල්කියාගේ
පුත්‍රවූ පශ්හූර් සහ පූජකයාවූ
මයසේයාගේ පුත්‍රවූ ශෙපනියාද යෙරෙමියා
ළඟට යැවූ කල **ස්වාමින්වහන්සේගෙන්**
ඔහු වෙතට පැමුණුණු වචනයය. ඔව්හු 2
කථාකොට: අනේ, අප උදෙසා **ස්වාමින්-
වහන්සේගෙන්** විභාගකරපන්න; මක්නිසාද
බබිලෝනියේ රජවූ නෙබුකද්රෙශර් අපට
විරුද්ධව යුද්ධකරන්නේය. සමහරවිට
ඔහු අප වෙතින් අහක්ව යන හැටියට
**ස්වාමින්වහන්සේ** ස්වකීය සියලුම පුදුම
ක්‍රියා ප්‍රකාරයට අප ගැන ක්‍රියාකරනවා
ඇතැයි කීවෝය.
එවිට යෙරෙමියා ඔවුන්ට කථාකොට: 3
නුඹලා ශෙදෙකියාට මෙසේ කියා-
පල්ලායයි කීය. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 4
**ස්වාමින්වහන්සේ** මෙසේ කියනසේක:
පවුරට පිටතින් නුඹලා වටලාගෙන සිටින
බබිලෝනියේ රජුටත් කල්දිවරුන්ටත්
විරුද්ධව යුද්ධකිරීමට ගන්නාවූ
නුඹලාගේ අත්වල තිබෙන යුද්ධායුධ
මම පස්සට හරවා, මේ නුවර මැදට
ඔවුන් රැස්කරන්නෙමි. මමම දිගුකළ 5
අතකින් හා බලවත් හස්තයකින්ද
උදහසකින්ද කෝපයෙන්ද නද
අමනාපයෙන්ද නුඹලාට විරුද්ධව
යුද්ධකොට, මේ නුවර වැසියන්ට, 6
මනුෂ්‍යයන්ටත් මෘගයන්ටත්, පහර-
දෙන්නෙමි. ඔවුන් මහත් වසංගතයකින්
මැරෙනවා ඇත. ඉන්පසු මම යූදාහි 7
රජවූ ශෙදෙකියාද, ඔහුගේ සේවකයන්ද,
සෙනඟද, එනම් වසංගතයෙනුත් කඩු-
වෙනුත් සාගතයෙනුත් මේ නුවර
ඉතුරුවෙන්නන්, බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් අතටත් ඔවුන්ගේ

සතුරන් අතටත් ඔවුන්ගේ ප්‍රාණය
හානිකරන්ට සොයන්නන් අතටත්
පාවාදෙන්නෙමි. ඔහුද ඔවුන්ට කරුණා
නොකොට, අනුකම්පාකරන්නේවත්
දයාවෙන්නේවත් නැතුව, ඔවුන්ට
කඩුමුවහතින් පහර දෙන්නේය කියා
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි කීවේය.
8 තවද මේ සෙනඟට නුඹ මෙසේ
කියාපන්න: **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක–මෙන්න, ජීවත්වීමේ
මාර්ගයත් මරණයේ මාර්ගයත් නුඹලා
9 ඉදිරියෙහි තබමි. මේ නුවර නවතින්නා
කඩුවෙන්ද සාගතයෙන්ද වසංගතයෙන්ද
මැරෙන්නේය. පිටතට ගොස් නුඹලා
වටලාගෙන සිටින කල්දිවරුන්ට
එකතුවෙන්නා ජීවත්වන්නේය. ඔහුගේ
ප්‍රාණයද කොල්ලයක් මෙන් ඔහුට
10 ලැබෙනවා ඇත. මා විසින් ශුභය පිණිස
නොව විපත්තිය පිණිස මාගේ මුහුණ
මේ නුවර කෙරෙහි යොමා තිබේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එය
බබිලෝනියේ රජු අතට පාවාදෙනු
ලබන්නේය, ඔහු එය ගින්නෙන් දවා
දමන්නේය.
11 තවද යූදහි රජුගේ වංශය ගැන **ස්වාමීන්-**
12 **වහන්සේගේ** වචනය අසාපල්ලා; එම්බා
දාවිත්ගේ වංශය, **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: නුඹලාගේ ක්‍රියාවල
නපුරුකම නිසා මාගේ කෝපය ගින්න
මෙන් විහිදී ගොස් කිසිවෙකුට නිවන්ට
බැරි ප්‍රකාර නොඇවිළෙන පිණිස,
කඩිනමින්ම විනිශ්චය පවත්වා,
කොල්ලකනු ලැබූ අය පීඩාකාරයාගේ
13 අතින් නිදහස්කරපල්ලා. අපට විරුද්ධව
බැසඑන්නේ කවුද කියාත් අපේ
වාසස්ථානවලට ඇතුල්වෙන්නේ කවුද
කියාත් කියන්නාවූ, මිටියාවතෙහිද
තලාවේ පර්වතයෙහිද වාසයකරන්නිය,
මම නුඹට විරුද්ධයයි **ස්වාමීන්වහන්සේ**
14 කියනසේක. මම නුඹලාගේ ක්‍රියාවල
ඵල ලෙස නුඹලාට දඬුවම් කරන්නෙමි.
මම ඇගේ කැලෑවෙහි ගින්නක්
අවුළුවන්නෙමි, එයින් ඈ වටකර තිබෙන
සියලු තැන් දලා යනවා ඇතැයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක.

## යූදහි රජවරුන් ගැන අනාගත කීම්

22 **ස්වාමීන්වහන්සේ** මෙසේ කීසේක:
නුඹ යූදහි රජුගේ ගෙට බැස ගොස්
එහිදී මේ වචනය කියාපන්න. දාවිත්ගේ 2
සිංහාසනයෙහි හිඳින යූද රජ්ජුරුවෙනි,
නුඹ සහ නුඹේ සේවකයෝද මේ
දොරටුවලින් ඇතුල්වන නුඹේ සෙනඟද
**ස්වාමීන්වහන්සේගේ** වචනය අසාපල්ලා.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 3
නුඹලා යුක්තියද ධර්මිෂ්ඨකමද කර,
කොල්ලකනු ලැබූ අය පීඩාකාරයාගේ
අතින් නිදහස්කරපල්ලා. විදේශියාටත් පියා
නැත්තාටත් වැන්දඹුවටත් අයුත්තක්වත්
බලාත්කාරයක්වත් මේ ස්ථානයෙහි
නිදෙස් ලේ වැගිරීමක්වත් නොකරල්ලා.
නුඹලා මේ දේ සැබවින්ම කළොත්, 4
දාවිත් වෙනුවට ඔහුගේ සිංහාසනයෙහි
හිඳින්නාවූ, රථවල සහ අශ්වයන් පිට
නැඟීයන්නාවූ රජවරු සහ ඔවුන්ගේ
සේවකයෝද ඔවුන්ගේ සෙනඟද මේ
ගෘහයේ දොරටුවලින් ඇතුල්වන්නෝය.
නුමුත් නුඹලා මේ වචන නෑසුවොත්, 5
මේ ගෘහය පාළුවක් වන්නේය කියා
මම මා ගැනම දිවුරමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද යූදහි රජුගේ 6
ගෘහය ගැන **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: නුඹ මට ගිලියද් සහ
ලෙබනොන් මුදුන වාගේ නුමුත්
සැබවින්ම මම නුඹ කාන්තාරයක්ද
වැසියන් නැති නුවරවල්ද කරන්නෙමි.
මම නුඹට විරුද්ධව හැමදෙනාම තම 7
තමාගේ ආයුධ ගත් විනාශකරන්නන්
වෙන්කොට තබන්නෙමි. ඔව්හු නුඹේ
අනර්ඝ කිහිරි ගස් කපා ගින්නෙහි
දමන්නෝය. බොහෝ ජාතීහුද මේ නුවර 8
ළඟින් යමින්: **ස්වාමීන්වහන්සේ** මේ
මහත් නුවරට මෙසේ කළේ මක්නිසාදැයි
එකිනෙකාගෙන් අසනවා ඇත. එවිට 9
ඔව්හු උත්තරදෙමින්: ඔවුන් තමුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** ගිවිසුම
අත්හැර අන් දෙවිවරුන්ට නමස්කාර
කොට ඔවුන්ට සේවයකළ නිසායයි
කියනවා ඇත.

10 මැරුණු කෙනෙකු ගැන නාඬල්ලා,
ශෝක නොවෙල්ලා. අහක්ව යන්නාවූ
අය ගැන තදින් අඬාපල්ලා; මක්නිසාද
ඔහු තවත් හැරී නොඑන්නේය, තමා
උපන් දේශයද නවත් නොදකින්නේය.
11 මක්නිසාද යොෂියාගේ පුත්‍රවූ, යූදහි
රජවූ, තමාගේ පියවූ යොෂියා වෙනුවට
රජකම්කළාවූ, මේ ස්ථානයෙන් පිටත්ව
ගියාවූ ෂල්ලුම් ගැන **ස්වාමින්වහන්සේ**
මෙසේ කියනසේක: ඔහු මෙහි තවත්
12 හැරී නැවිත්, ඔහු අල්ලාගෙන යනු ලැබූ
ස්ථානයේදීම මැරෙන්නේය, ඔහු තවත්
මේ දේශය නොදක්නේය.
13 තමාගේ ගෙය අධර්මිෂ්ඨකමින්ද
තමාගේ උඩුමහල් අයුක්තියෙන්ද
ගොඩනගන්නාවූ, තමාගේ අසල්වාසියාට
කුලී නොදී නිකමට ඔහුගෙන් වැඩ
14 ගන්නාවූ, මම මහත් ගෙයක්ද විශාලවූ
උඩුමහල්ද ගොඩනගන්නෙමියි කියමින්
කවුළු කපාගන්නාවූ, කිහිරි ලීවලින් වසා
සාදිලිංගම් ගාන්නාවූ අයට දුක්වේ.
15 තුඹ කිහිරි ලීවලින් උසස්වෙන්ට වීර්ය
කරන බැවින් තුඹට රජකම්කරන්ට
ලැබේද? තුඹේ පියා කා බී යුක්තියද
ධර්මිෂ්ඨකමද කළා නොවේද? එවිට
16 ඔහුට ශුභසිද්ධවූයේය. ඔහු අසරණයාගේද
දිළින්දාගේද නඩුව ඇසූවේය; එවිට
ශුභසිද්ධවූයේය. මා ඇඳිනගැනීම නම්
ඒක නොවේදැයි **ස්වාමින්වහන්සේ**
17 කියනසේක. නුමුත් තුඹේ ඇස් සහ තුඹේ
සිතත් ලාභයද නිදෙස් ලේ වැගිරවීමද
පීඩාකිරීමද බලාත්කාරකිරීමද කෙරෙහි
මිස වෙන යමක් කෙරෙහි පිහිටා නැත.
18 එබැවින් යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ
යෙහෝයාකීම් ගැන **ස්වාමින්වහන්සේ**
මෙසේ කියනසේක: අහෝ මාගේ
සහෝදරය! අහෝ සහෝදරිය! කියා
ඔව්හු ඔහු ගැන නොවැලපෙන්නෝය.
අහෝ ස්වාමිනි! අහෝ ඔහුගේ මහිමය!
කියා ඔහු ගැන නොවැලපෙන්නෝය.
19 කොටළුවෙකු වළලන්නාක්මෙන් ඔහු
යෙරුසලමේ දොරටුවලින් එපිටට ඇදගෙන
ගොස් හෙළා වළලනු ලබනවා ඇත.

තුඹේ සියලුම ප්‍රේමවන්තයන් නැතිවී 20
ගිය බැවින් ලෙබනොන්ට නැගීගොස්
මොරගසාපන්න; තුඹේ හඬ බාෂාන්හි
පවත්වා අබාරීම්හි සිට මොරගසාපන්න.
තුඹ සැපතින් සිටිද්දී තුඹට කථාකෙළෙමි; 21
නාසන්නෙමියි තුඹ කීවෙහිය. මාගේ
හඬට කීකරු නොවීම තුඹේ බාල
කාලයේ පටන් තුඹේ විධියව තිබුණේය.
හුළඟ තුඹේ සියලු එඬේරුන් කාදමන්නේය, 22
තුඹේ ප්‍රේමවන්තයෝද වාලට යන්නෝය.
එවිට තුඹේ සියලු නපුරුකම් ගැන තුඹ
ලජ්ජාවටත් නින්දාවටත් පැමිණෙන්නෙහිය.
අහෝ ලෙබනොන්හි වාසයකරමින් කිහිරි 23
ගස්වල කැදැල්ල තබන තැනැත්තිය,
වේදනා එනම් වදන ස්ත්‍රියෙකුට මෙන්
රුජාව තුඹට පැමිණෙන විට තුඹ
කොපමණ කාලකණ්ණි නොවන්නෙහිද?
යෙහෝයාකීම්ගේ පුත්‍රවූ යූදහි රජවූ 24
කොනියා මාගේ දකුණතේ මුද්‍රාව මෙන්
සිටියේවී නුමුත්, මම එතනින් තුඹ
උදුරාදමන්නෙමියි කියා සහතිකකොට
කියමියි **ස්වාමින්වහන්සේ** කියනසේක.
තුඹේ ප්‍රාණය හානිකරන්ට සොයන්නන් 25
අතටත් තුඹ භයවෙන අයින් අතටත්,
එනම් බබිලෝනියේ රජවූ නෙබුකද්රෙශර්
අතටත් කල්දිවරුන් අතටත් මම තුඹ
පාවාදී, තුඹද තුඹ වැදූ තුඹේ මවුද 26
තුඹලා නූපන් අන් දේශයකට හෙළා-
දමන්නෙමි; එහිදී තුඹලා මැරෙනවා ඇත.
ඔවුන් හැරීඑන්ට ආශාවෙන දේශයට 27
නම් ඔව්හු හැරී නොඑන්නෝය. මේ 28
මිනිහා, කොනියා, නීචවූ බිඳුණු
බඳුනක්ද? ඔහු අප්‍රියවූ භාජනයක්ද?
ඔහු සහ ඔහුගේ වංශය අහක්කරනු ලැබ,
ඔවුන් නොදන්න දේශයකට හෙළාදමනු
ලබන්නේ මක්නිසාද? එම්බා පොළොව, 29
පොළොව, පොළොව, **ස්වාමින්-**
**වහන්සේගේ** වචනය අසාපන්න. **ස්වාමින්-** 30
**වහන්සේ** මෙසේ කියනසේක: මේ
මනුෂ්‍යයා දරුවන් නැත්තාවූ, තමාගේ
දවස්වලදී සඵල නොවන්නාවූ මනුෂ්‍ය-
යෙක්යයි ලියාපල්ලා. මක්නිසාද
ඔහුගේ වංශයේ කිසිවෙක් තවත් දාවිත්ගේ
සිංහාසනයේ හිඳ යූදහි ආණ්ඩුකරමින්
සඵල නොවන්නේය.

## බොරු එඬේරුන්ට පසුව සැබෑ රජෙක් පැමිණීම

**23** මාගේ ගොදුරු බිමේ බැටළුවන්
නැතිකරන්නාවූ විසුරුවාදමන්නාවූ
එඬේරුන්ට දුක්වේයයි **ස්වාමීන්වහන්සේ**
2 කියනසේක. එබැවින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මාගේ සෙනඟ
පෝෂණයකරන එඬේරුන්ට විරුද්ධව
මෙසේ කියනසේක: නුඹලා මාගේ
බැටළුවන් බලා නොගෙන, ඔවුන් විසුරුවා
පන්නාදැමුවහුය; බලව, නුඹලාගේ
ක්‍රියාවල නපුරුකමට නුඹලාට
දඬුවම්කරන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
3 කියනසේක. නුමුත් මාගේ රැළෙන්
ඉතුරුවෙන්නන් මා විසින් පන්නාදැමූ
සියලු දේශවලින් මමම රැස්කර, නැවත
ඔවුන්ගේ ගාල්වලට ගෙනෙන්නෙමි;
4 ඔව්හු බෝවී වැඩිවන්නෝය. ඔවුන්
පෝෂණයකරන එඬේරුන්ද ඔවුන්
කෙරෙහි පත්කරන්නෙමි. ඔව්හු නවත්
භය නොවන්නෝය, නොකැලඹෙන්-
නෝය, එකෙක්වත් නැති නොවන්නේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
5 බලව, මා විසින් දාවිත්ට ධර්මිෂ්ඨවූ
**පැළෑටියක්** නැගුප්පවන දවස් පැමි-
ණෙන්නේය, උන්වහන්සේ රජෙක්ව
රජකම්කරමින් නුවණින් ක්‍රියාකොට,
ධර්මිෂ්ඨකමත් යුක්තියත් දේශයෙහි
ඉෂ්ටකරනවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
6 කියනසේක. උන්වහන්සේගේ දවස්වලදී
යූදා ගළවනු ලබන්නේය, ඉශ්‍රායෙල්ද
සුවසේ වසන්නේය. අපේ ධර්මිෂ්ඨකමවූ
**ස්වාමීන්වහන්සේය** යන නාමය
උන්වහන්සේට කියනු ලබන්නේය.
7 එබැවින්: ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර
දේශයෙන් ගෙනාවාවූ **ස්වාමීන්වහන්සේ**
8 ජීවමානයයි නවත් නොකියා, ඉශ්‍රායෙල්
වංශයේ දරුවන් උතුරු දේශයෙන්ද
මා ඔවුන් පන්නාදැමූ සියලු දේශවලින්ද
පමුණුවා ගෙනාවාවූ **ස්වාමීන්වහන්සේ**
ජීවමානය කියා කියන දවස් පැමිණෙන්-
නේය; ඔවුන් තමුන්ගේම දේශයෙහි
වාසයකරනවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක.

## ප්‍රොපේතවරුන්ට තර්ජනය කිරීම

ප්‍රොපේතවරුන් ගැනය. මාගේ සිත 9
මා තුළ බිඳී, මාගේ සියලු ඇට වෙවුලවී
තිබේ; **ස්වාමීන්වහන්සේ** නිසාත්
උන්වහන්සේගේ ශුද්ධවූ වචන
නිසාත් මම මත්වී සිටින්නෙක්ද
මුද්‍රිකපානයට යටවී සිටින මනුෂ්‍යයෙක්ද
මෙන් වෙමි. මක්නිසාද දේශය 10
කාමමිථ්‍යාචාරිකයන්ගෙන් පිරී තිබේ;
ශාපයක් නිසාද දේශය වැලපෙයි;
කාන්තාරයේ තණබිම් වියළී තිබේ;
ඔවුන්ගේ හැසිරීම නපුරුය, ඔවුන්ගේ
බලයද හරි නැත. මක්නිසාද 11
ප්‍රොපේතවරයා සහ පූජකයාත් දූෂ්‍යවී
සිටිති; එසේය, මාගේ ගෘහයෙහි පවා
ඔවුන්ගේ නපුරුකම මට සම්බවීයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එබැවින් 12
ඔවුන්ගේ මාර්ගය අඳුරේ ලිස්සන ඉඬම්
මෙන් ඔවුන්ට වන්නේය. ඔව්හු පන්නනු
ලැබ වැටෙන්නෝය. මම ඔවුන් පිටට
විපත්තිය, එනම් ඔවුන්ට දඬුවම්කිරීමේ
අවුරුද්ද, පමුණුවන්නෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. සමාරියේ 13
ප්‍රොපේතවරුන් අතරේ මම අනුවණකම
දුටිමි; ඔව්හු බාල්ගේ නාමයෙන්
අනාගතවාක්‍ය කියා, මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් මුළාකෙරෙවුවෝය. යෙරූ- 14
සලමේ ප්‍රොපේතවරුන් අතරෙහිත්
භයංකරවූ දෙයක් වන කාමමිථ්‍යාචාරය-
කිරීමත් බොරුකාරකමෙන් හැසිරීමත්
දුටිමි. මෙසේ කිසිවෙක් තමාගේ
නපුරුකමෙන් නොහැරෙන හැටියට ඔව්හු
නපුරකරන්නන්ගේ අත් සවිකරති. ඔවුන්
සියල්ලෝම මට සොදොම මෙන්ද එහි
වැසියෝ ගොමොරාව මෙන්ද වී සිටිති.
එබැවින් ප්‍රොපේතවරුන් ගැන 15
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: බලව, මම ඔවුන්ට
කොළඹ එල කවන්නෙමි, වසදිය
පොවන්නෙමි. මක්නිසාද යෙරුසලමේ
ප්‍රොපේතවරුන්ගෙන් දූෂිතය දේශය
මුළුල්ලෙහි පැතිර ගියේය. සේනාවල 16
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:

තුඹලාට අනාගතවාක්‍ය කියන්නාවූ
ප්‍රොපේතවරුන්ගේ වචනවලට කන්
නොදෙල්ලා; ඔව්හු නිෂ්ඵල ප්‍රාර්ථනා
ඇතිව සිටින්ට තුඹලාට උගන්වති. ඔව්හු
**ස්වාමීන්වහන්සේගේ** මුඛයෙන් නොවන
තමුන්ගේම සිතේ දර්ශනයක් තුඹලාට
17 කියති. තුඹලාට සමාදානය වන්නේය
කියා **ස්වාමීන්වහන්සේ** කියා තිබේයයි
මා සුළුකරන්නන්ට ඔව්හු කිය
කියා සිටිති; විපතක් තුඹලා පිටට
නොපැමිණෙන්නේයයි තමුන්ගේ සිත්වල
මුරණ්ඩුකමේ හැසිරෙන සියල්ලන්ටද
18 ඔව්හු කියති. එසේ කීමට **ස්වාමීන්-**
**වහන්සේගේ** මන්ත්‍රණයෙහි පිහිටා සිට
උන්වහන්සේගේ වචනය දුටුවේවත්
ඇසුවේවත් කවුද? උන්වහන්සේගේ
වචනයට ඇහුම්කන්දී ඇසුවේ කවුද?
19 බලව, **ස්වාමීන්වහන්සේගේ** කුණාටුව,
එනම් උන්වහන්සේගේ කෝපය,
එසේය, කරකැවෙන කුණාටුවක් නික්ම
ගියේය. එය දුෂ්ටයන්ගේ හිස් පිට
20 කඩා වැටෙන්නේය. **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ සිතේ අභිප්‍රායන් ඉෂ්ටකරන
තුරුත් සම්පූර්ණකරන තුරුත්
උන්වහන්සේගේ උදහස නො-
හැරෙන්නේය. මතු දවස්වලදී තුඹලා
එය සම්පූර්ණ ලෙස තේරුම්ගන්නවා
21 ඇත. මම ඒ ප්‍රොපේතවරුන් නොයැවීමි,
නුමුත් ඔව්හු දිවුවෝය. මම ඔවුන්ට
කථා නොකෙළෙමි, නුමුත් ඔව්හු
22 අනාගතවාක්‍ය කීවෝය. ඔව්හු මාගේ
මන්ත්‍රණයෙහි පිහිටා සිටියෝ නම් ඔවුන්
මාගේ වචනවලට කන්දෙන්ට මාගේ
සෙනඟට සලස්වා ඔවුන්ගේ නපුරු
මාර්ගයෙන්ද ඔවුන්ගේ ක්‍රියාවල
නපුරුකමෙන්ද ඔවුන් හරවනවා ඇත.
23 මම ළඟ සිටින දෙවිකෙනෙක් මෙන්ම
දුර සිටින දෙවිකෙනෙක් නොවෙම්දැයි
24 **ස්වාමීන්වහන්සේ** කියනසේක. මට
නොපෙනෙනලෙස යමෙකුට රහස්
තැන්වල සැඟවෙන්ට පුළුවන්දැයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. ස්වර්ගය සහ
පෘථිවිය මාගෙන් පිරී තිබෙනවා නොවේදැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. ස්වප්නයක් 25
දුටිමි, ස්වප්නයක් දුටිමියි කියා මාගේ
නාමයෙන් බොරුවට අනාගතවාක්‍ය කියන
ප්‍රොපේතවරුන් කියන දේ ඇසීමි.
බොරුවට අනාගතවාක්‍ය කියන්නාවූ, 26
තමුන්ගේ සිත්වල වංචාව අනාගතවාක්‍ය
කොට කියන්නාවූ ප්‍රොපේතවරුන්ගේ
සිතේ මෙය කොපමණ කල් පවතින්නේද?
මේ සෙනඟගේ පියවරුන් බාල් නිසා 27
මාගේ නාමය මතකනැතිකළාක්මෙන්,
තමුන් විසින් එකිනෙකාට කියාදෙන
තමුන්ගේ ස්වප්න කරණකොටගෙන
මාගේ සෙනඟ ලවාම මාගේ නාමය
මතකනැතිකරවන්ට ඔව්හු සිතින්
අභිප්‍රායකරති. ස්වප්නයක් දුටු ප්‍රොපේත 28
තෙම ස්වප්නයක් කියාවා; මාගේ වචනය
ඇත්තා මාගේ වචනය විශ්වාස ලෙස
කියාවා; *ධාන්‍ය සමග පිදුරු තිබෙන්ට
යුතුකම මොකදැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මාගේ වචනය ගින්නක් 29
මෙන්ද පර්වතය පොඩිකරන කුළුගෙඩියක්
මෙන්ද නොවේදැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක.

එබැවින් බලව, එකිනෙකාගෙන් මාගේ 30
වචන සොරකම්කරගන කියන
ප්‍රොපේතවරුන්ට මම විරුද්ධයෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. බලව, 31
තමුන්ගේ දිව පාවිච්චිකොට: උන්-
වහන්සේ කියනසේකැයි කියන
ප්‍රොපේතවරුන්ට විරුද්ධයෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. මෙන්න, බොරු 32
ස්වප්න අනාගතවාක්‍ය කොට කියන්නාවූ,
ඒවා කියාදී තමුන්ගේ බොරුවලින්ද
හිස් පාරට්ටුවෙන්ද මාගේ සෙනඟ
මුළාකරවන්නාවූ තැනැත්තන්ට
විරුද්ධයෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. එහෙත් මම ඔවුන් නොයැවීමි,
ඔවුන්ට අණ නොකෙළෙමි; ඔවුන්ගෙන්
මේ සෙනඟට කිසි ප්‍රයෝජනයක්
නොවන්නේයයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. මේ සෙනඟවත් ප්‍රොපේතවරුවත් 33
පූජකයෙක්වත්: **ස්වාමීන්වහන්සේගේ**

*නොහොත්: ධාන්‍යයට සමානකළාම
පිදුරු කිමෙක්දැයි.

*බර කිමෙක්දැයි තුඹෙන් අසන විට–ඒ
බර නම් තුඹලාය, මම තුඹලා අහක්කර
දමන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
34 සේකැයි ඔවුන්ට කියාපන්න. ප්‍රොපේත
කෙනෙක් හෝ පූජකයෙක් හෝ
සෙනඟගෙන් යමෙක් හෝ **ස්වාමීන්-
වහන්සේගේ** *බරයයි කීවොත්, මම ඒ
මනුෂ්‍යයාටත් ඔහුගේ පවුලටත්
35 දඬුවම්කරන්නෙමි. **ස්වාමීන්වහන්සේ**
කුමන උත්තරයක් දුන්සේක්ද? **ස්වාමීන්-
වහන්සේ** කුමක් කීසේක්ද යන
අන්දමෙන් තුඹලා එකිනෙකාටත් තම
තමාගේ සහෝදරයාටත් කියාපල්ලා.
36 **ස්වාමීන්වහන්සේගේ** *බරයයි තවත්
සඳහන් නොකරල්ලා. මක්නිසාද එක
එක මනුෂ්‍යයාට පැමිණෙන *බර
ඔහුගේම වචනය වේ; අපේ දෙවිවූ
සේනාවල **ස්වාමීන්වහන්සේ** වන ජීවමාන
දෙවියන්වහන්සේගේ වචන තුඹලා
37 පෙරළා තිබේ. **ස්වාමීන්වහන්සේ** කුමන
උත්තරයක් තුඹට දුන්සේක්ද? **ස්වාමීන්-
වහන්සේ** කුමක් කථාකළසේක්දැයි යන
අන්දමෙන් ප්‍රොපේත තැනට කියාපන්න.
38 තුමුත් **ස්වාමීන්වහන්සේගේ** *බරයයි
තුඹලා කීවොත්, ඒ ගැන **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: **ස්වාමීන්වහන්සේගේ**
*බරයයි නොකියල්ලාය කියා මා විසින්
තුඹලාට කියා එවූ තුමුත්: **ස්වාමීන්-
වහන්සේගේ** *බර යන වචනය තුඹලා
39 කියන නිසා, මම තුඹලා සහමුලින්ම
මතකනැතිකර දමන්නෙමි, තුඹලා සහ
තුඹලාගේ පියවරුන්ට මා විසින් දුන්
නුවරද මා ඉදිරියෙන් පහකරදමා,
40 සිහිනැති නොවන සදාකාල නින්දාවක්ද
නිරන්තර ලජ්ජාවක්ද තුඹලා පිටට
පමුණුවන්නෙමියි කියනසේක.

## අත්තික්කා පෙට්ටි දෙක

24 බබිලෝනියේ රජවූ නෙබුකද්-
රෙසර් යෙහෝයාකීම්ගේ පුත්‍රවූ
යූදාහි රජවූ යෙකොනියාද යූදාහි අධිපතීන්ද
කර්මාන්තකාරයන්ද ආචාරීන්ද යෙරූ-
සලමෙන් අල්ලාගන ගොස් බබි-
ලෝනියට ඔවුන් පැමිණෙවූවාට පසු,
අත්තික්කාගෙඩි පිරෙවූ පෙට්ටි දෙකක්
**ස්වාමීන්වහන්සේගේ** මාළිගාව ඉදිරිපිට
තබා තිබෙන බව **ස්වාමීන්වහන්සේ** මට
පෙන්වූසේක. එක පෙට්ටියක ප්‍රථමයෙන් 2
ඉදෙන අත්තික්කා වාගේ ඉතා හොඳ
අත්තික්කාද අනික් පෙට්ටියෙහි කන්ට
බැරි තරම් ඉතා නරක අත්තික්කාද
තිබුණේය. එකල **ස්වාමීන්වහන්සේ** 3
මට කථාකොට: යෙරෙමියා, තුඹට
පෙනෙන්නේ මොනවාදැයි මාගෙන්
ඇසූසේක. මමද: අත්තික්කාය; හොඳ
අත්තික්කා ඉතා හොඳය; නරක ඒවා
නරක්කම නිසා කන්ට බැරි තරම් ඉතා
නරකයයි කීමි. **ස්වාමීන්වහන්සේගේ** 4
වචනයද මා වෙතට පැමිණ කියනුයේ:
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** 5
මෙසේ කියනසේක–මා විසින්
මේ ස්ථානයෙන් යහපත පිණිස
කල්දිවරුන්ගේ දේශයට ඇරියාවූ අසුවී
ගියාවූ යූදාවරුන් මම මේ හොඳ
අත්තික්කා මෙන් සලකන්නෙමි. යහපත 6
පිණිස මාගේ ඇස් ඔවුන් කෙරෙහි
යොමුකොට, ඔවුන් මේ දේශයට නැවත
පමුණුවන්නෙමි. ඔවුන් කඩා නොදමා
ගොඩනගන්නෙමි; උදුරා නොදමා
හිටවන්නෙමි. මා **ස්වාමීන්වහන්සේ** බව 7
දැනගැනීම පිණිස ඔවුන්ට සිතක්
දෙන්නෙමි. ඔවුන්ද මාගේ සෙනඟ
වෙනවා ඇත, මම ඔවුන්ගේ
දෙවියන්වහන්සේ වන්නෙමි. මක්නිසාද
ඔවුන් තමුන්ගේ මුළු සිතින් මා වෙතට
හැරෙනවා ඇත. නරක්කම නිසා කන්ට 8
බැරි තරම් නරකව තිබෙන අත්තික්කා
මෙන් මම යූදාහි රජවූ ශෙදෙකියාද
ඔහුගේ අධිපතීන්ද මේ දේශයේ ඉතුරුව
සිටින යෙරූසලමේ ඉතිරි අයද මිසර
දේශයෙහි වසන්නන්ද අහකදමන්නෙමි.
එසේය, මා විසින් ඔවුන් පන්නාදමන 9
සියලු ස්ථානවලදී නින්දාවක්ද උපමාවක්ද
අපහාස කීමක් සහ ශාපයක්ද වීමටත්
ඔවුන් පීඩා විඳීමට පොළොවේ සියලු
රාජ්‍යවල ඔබ මොබ විසුරුවනු
ලැබීමටත් පාවාදෙන්නෙමි. මා විසින් 10
ඔවුන්ටත් ඔවුන්ගේ පියවරුන්ටත් දුන්
දේශය මතුපිටින් ඔවුන් නැතිවී යන
තුරු, ඔවුන් අතරට කඩුවත් සාගතයත්
වසංගතයත් යවන්නෙමියි **ස්වාමීන්-
වහන්සේ** කියනසේකැයි කීය.

*එකම හෙබ්‍රෙව් වචනය 'බර', 'ප්‍රකාශනය' යන අර්ථ දෙකට යෙදේ.

## කල්දිවරුන් කරණකොටගෙන යූදා කෙරෙහි දඬුවම

25 යොෂියාගේ පුත්‍රවූ යූදාහි රජවූ
යෙහෝයාකීම්ගේ සතරවෙනි
අවුරුද්ද වන බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර්ගේ පළමුවෙනි අවුරුද්දේදී
යූදාහි මුළු සෙනඟ ගැන යෙරෙමියා
2 වෙතට පැමිණි වචනයය. එය
අනාගතවක්තෘවූ යෙරෙමියා යූදාහි මුළු
සෙනඟටත් යෙරුසලමේ සියලු
3 වැසියන්ටත් කීවේය. ඔහු මෙසේ
කීය: ආමොන්ගේ පුත්‍රවූ යූදාහි රජවූ
යොෂියාගේ දහතුන්වෙනි අවුරුද්දේ
පටන් අද දක්වා මේ අවුරුදු විසිතුනේම
ස්වාමීන්වහන්සේගේ වචනය මා වෙතට
පැමිණියේය, මමද අලුයම නැගිට
නුඹලාට කථාකෙළෙමි; එහෙත් නුඹලා
4 ඇහුම්කන් දුන්නේ නැත. තවද ස්වාමීන්-
වහන්සේ තමන්ගේ සියලු සේවකයන්වූ
අනාගතවක්තෘවරුන් අලුයම් වේලාවේ
පටන්ම නුඹලා ළඟට එවූසේක; එහෙත්
නුඹලා ඇසුවේවත් අසන්ට නුඹලාගේ
5 කන් යොමුකළේවත් නැත. එනම්:
නුඹලා එකිනෙකා තම තමාගේ නපුරු
මාර්ගයෙන්ද නුඹලාගේ ක්‍රියාවල
නපුරුකමෙන්ද හැරී ස්වාමීන්වහන්සේ
නුඹලාටත් නුඹලාගේ පියවරුන්ටත්
පූරාණයේ සිට සදාකාලයටම දුන්
6 දේශයෙහි වාසයකරපල්ලා. අන්
දෙවිවරුන්ට සේවයකිරීමටද ඔවුන්ට
නමස්කාරකිරීමටද ඔවුන් පස්සේ
නොයල්ලා, නුඹලාගේ අත්වැඩවලින් මා
කෝප නොකරල්ලා; එවිට මම නුඹලාට
අනතුරු නොකරන්නෙමියි කියා එවූ-
7 සේක. නුමුත් නුඹලාට අනතුරු
පැමිණෙන ලෙස නුඹලාගේ අත්වැඩවලින්
මා කෝපකරවන හැටියට නුඹලා
මට ඇහුම්කන් දුන්නේ නැතැයි
8 ස්වාමීන්වහන්සේ කියනසේක. එබැවින්
සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක: නුඹලා මාගේ වචන
9 නොඇසූ බැවින්, මම කියා ඇර උතුරු
දිශාවේ සියලු ජාතීන් ගෙන්වා, මාගේ
සේවකයාවූ බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර්ටත් කියා ඇර, මේ දේශය
සහ මෙහි වැසියන්ටත් වටකර ඉන්න
මේ සියලු ජාතීන්ටත් විරුද්ධව ඔවුන්
පමුණුවා, මොවුන් සහමුලින්ම
විනාශකොට විස්මයක්ද කවටකමක්ද
නිරන්තර පාළුවක්ද කරන්නෙමි. ඇරත් 10
මම ප්‍රීති හඬද සන්තෝෂ හඬද
මනමාලයාගේ හඬද මනමාලියගේ හඬද
ඇඹරුම් ගල්වල ශබ්දය සහ පහනේ
එළියද ඔවුන් අතරෙන් නැතිකරන්නෙමි.
මේ මුළු දේශයද පාළුවක් සහ විස්මයක් 11
වන්නේය; මේ ජාතීහු බබිලෝනියේ රජුට
සැත්තෑ අවුරුද්දක් සේවයකරන්නෝයයි
ස්වාමීන්වහන්සේ කියනසේක. තවද 12
සැත්තෑ අවුරුද්දක් සම්පූර්ණවූ පසු මම
බබිලෝනියේ රජුටත් ඒ ජාතියටත්
කල්දිවරුන්ගේ දේශයටත් ඔවුන්ගේ
අයුතුකම් නිසා දඬුවම් පමුණුවා, ඒ
දේශය සදාකාල පාළු තැනක් කරන්නෙමි.
මා විසින් ඒ දේශයට විරුද්ධව 13
කීවාවූ මාගේ සියලුම වචන වන
යෙරෙමියා සියලු ජාතීන්ට විරුද්ධව
අනාගතවාක්‍යයෙන් කීවාවූ මේ පොතෙහි
ලියා තිබෙන සියල්ලම ඒ දේශය පිටට
පමුණුවන්නෙමි. මක්නිසාද බොහෝ 14
ජාතීහුද මහත් රජවරුද ඔවුන් පවා
දාසකමට ගන්නෝය. මමද ඔවුන්ගේ
ක්‍රියා ලෙසත් ඔවුන්ගේ අත්වල වැඩේ
ලෙසත් ඔවුන්ට ප්‍රතිඵල දෙන්නෙමියි
ස්වාමීන්වහන්සේ කියනසේක.

## ජාතීන් සඳහා වූ දේව උදහස නැමති කුසලාන

ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ 15
මට කථාකොට: කෝපය නැමති මේ
මුද්‍රිකපාන-කුසලාන නුඹ මාගේ අතින්
රැගෙන මා විසින් නුඹ යවන සියලු
ජාතීන්ට එයින් පොවාපන්න. ඔව්හු බී, 16
මා විසින් ඔවුන් අතරට යවන කඩුව
නිසා වැනි වැනී යමින්, උමතුවන්නෝයයි
කීසේක. එවිට මම ස්වාමීන්වහන්සේගේ 17
අතින් කුසලාන රැගෙන ස්වාමීන්වහන්සේ
මා යැවූ සියලු ජාතීන්ට පෙවුවෙමි:
එනම් යෙරුසලමටත් යූදාහි නුවරවලටත් 18
එහි රජවරුන්ටත් එහි අධිපතීන්ටත් අද

දවසේ පෙනෙන ලෙස ඔවුන් පාළුවක්ද
විස්මයක්ද නින්දාවක්ද ශාප-වචනයක්ද
19 කරන පිණිස පෙවුවෙමි. මිසරයේ රජවූ
ඵාරාවෝන්ටත් ඔහුගේ සේවකයන්ටත්
අධිපතීන්ටත් ඔහුගේ මුළු සෙනඟටත්,
20 මිශ්‍රවූ මුළු සේනාවටත් ඌශ් දේශයේ
සියලු රජවරුන්ටත් පිලිස්තිවරුන්ගේ
දේශයේ සියලු රජවරුන්ටත් අෂ්-
කෙලෝන්ටත් ගාසාටත් එක්‍රෝන්ටත්
21 අෂ්දෝද්හි ඉතිරි අයටත්, ඒදෝම් සහ
22 මෝවබ්ටත් අම්මෝන් පුත්‍රයන්ටත්, තීර්හි
සියලු රජුන්ටත් ශීදොන්හි සියලු රජුන්ටත්
මුහුදෙන් එතර පළාත්වල රජුන්ටත්,
23 දෙදන් සහ තේමාටත් බූස්ටත් තමුන්ගේ
ඉසකේ කොන් කපන සියල්ලන්ටත්,
24 අරාබියේ සියලු රජුන්ටත් කාන්තාරයෙහි
වාසයකරන මිශ්‍රවූ සෙනඟගේ සියලු
25 රජවරුන්ටත්, ශිම්රීහි සියලු රජුන්ටත්
ඒලාම්හි සියලු රජුන්ටත් මේදවරුන්ගේ
26 සියලු රජුන්ටත්, එකිනෙකාට සමීපව
සිටින්නන් සහ දුරුව සිටින්නන් වන
උතුරු දිශාවේ සියලු රජුන්ටත්, පොළොව
මතුපිට තිබෙන ලෝකයේ සියලු
රාජ්‍යවලටත් පෙවුවෙමි. මොවුන්ට පසුව
27 *ෂේෂක්හි රජ බොනවා ඇත. තුඹ
ඔවුන්ට කථාකොට: තුඹලා බී මත්වී
වමනයකොට, මා විසින් තුඹලා අතරට
එවන කඩුව නිසා වැටී නොනැගිට
සිටපල්ලාය කියා ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියන-
28 සේකැයි කියාපන්න. එවිට ඔව්හු බොන
පිණිස තුඹේ අතින් කුසලාන ගන්ට
අකමැතිවන්නෝ නම් තුඹ ඔවුන්ට
කථාකොට: සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක—තුඹලා බොන්නහු-
29 මය. මක්නිසාද, මෙන්න, මාගේ නාමය
තබා තිබෙන නුවරට විපත්ති පමුණු-
වන්ට මම පටන්ගනිමි; එසේ නම්
තුඹලා දඬුවම් නොලැබම සිටිනවා
ඇද්ද? තුඹලා දඬුවම් නොලැබ නො-
සිටින්නහුය. මක්නිසාද පොළොවේ
සියලු වැසියන්ට විරුද්ධව කඩුවක්
ගෙන්වමියි සේනාවල **ස්වාමීන්වහන්සේ**

*එනම්—බබිලෝනිය. 51. 41 බලනු.

කියනසේකැයි කියාපන්න. එබැවින් තුඹ 30
ඔවුන්ට අනාගතවාක්‍ය කියා, මේ සියලු
වචන ඔවුන්ට කියාපන්න: **ස්වාමීන්-**
**වහන්සේ** උසස්ථානයේ සිට
ගර්ජනාකොට තමන්ගේ ශුද්ධවූ
වාසස්ථානයේ සිට තමන් හඬ පවත්වන-
සේක; උන්වහන්සේ තමන් පට්ටියට
විරුද්ධව බලවත්ලෙස ගර්ජනාකරන-
සේක; මුද්‍රික ඵල මඩින්නන් මෙන්
සියලු පොළෝ වැසියන්ට විරුද්ධව
ඝෝෂාවක් පවත්වනසේක. මහත් 31
ශබ්දයක් පොළොවේ කෙළවර දක්වා
පැමිණෙන්නේය; මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේට** ජාතීන් සමග නඩුවක් තිබේ,
උන්වහන්සේ මාංසමයවූ සියල්ලන් සමග
විනිශ්චයට පැමිණෙනසේක; දුෂ්ටයන්
වනාහි කඩුවට පාවාදෙනසේකැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ 32
කියනසේක: බලව, විපත්තිය ජාතියෙන්
ජාතියට යන්නේය, මහත් කුණාටුවක්
පොළොවේ ඉතා දුර තැන්වලින්
නගින්නේය. **ස්වාමීන්වහන්සේගෙන්** 33
මැරුම්කන අය ඒ දවසේ පොළොවේ
එක් කෙළවරක පටන් පොළොවේ අනික්
කෙළවර දක්වා වැටී ඉන්නෝය.
ඔවුන් ගැන විලාපකියන්ටවත් ඔවුන්
එකතුකරන්ටවත් වළලන්ටවත් නොයෙදී,
ඔවුන් භූමිය මතුපිට කසළ වෙනවා
ඇත. එඬේරුනි, කෑමොරගසා හඬාපල්ලා; 34
රැළේ ප්‍රධානියෙනි, අලුවල පෙරළී
ඉඳිල්ලා. මක්නිසාද මැරුම්කෑමට
තුඹලාගේ දවස් සම්පූර්ණවී තිබේ; මම
තුඹලා කැබලිකොට බිඳින්නෙමි. තුඹලාද
අනර්ඝ භාජනයක් මෙන් වැටෙනවා
ඇත. එඬේරුන්ට පලායන්ටවත් රැළේ 35
ප්‍රධානීන්ට ගැළවියන්ටවත් නො-
ලැබෙන්නේය. එඬේරුන්ගේ කෑගැසීමේ 36
හඬත් රැළේ ප්‍රධානීන්ගේ මොරගැසීමත්
ඇසෙන්නේය! මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** ඔවුන්ගේ ගොදුරුබිම
පාළුකරනසේක; **ස්වාමීන්වහන්සේගේ** 37
බලවත් කෝපය නිසා සමාදාන පිට්ටනි
නිශ්ශබ්දකරනු ලබයි. උන්වහන්සේ 38
සිංහයා මෙන් තමන් නිවාසය අත්හැර
ගියසේක; මක්නිසාද පීඩාකරන කඩුව
නිසාත් උන්වහන්සේගේ බලවත් උදහස
නිසාත් ඔවුන්ගේ දේශය පාළුවක් විය.

## යෙරෙමියා මරන්ට සෙවූ නුමුත් දේවමාළිගාව විනාශ වන බව කීම

26 යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ
යෙහෝයාකීම්ගේ රජකම් කිරීමේ
පටන්ගැන්මේදී **ස්වාමින්වහන්සේගෙන්**
2 මේ වචනය පැමිණියේය. **ස්වාමින්-**
**වහන්සේ** මෙසේ කියනසේක: නුඹ
**ස්වාමින්වහන්සේගේ** ගෘහයේ මළුවේ
සිට, **ස්වාමින්වහන්සේගේ** ගෘහයෙහි
නමස්කාරකරන්ට එන්නාවූ යූදහි සියලු
නුවරුන්ට කියන්ට මා විසින් නුඹට
අණකළ සියලුම වචන ඔවුන්ට
කියාපන්න; වචනයක්වත් අඩු නො-
3 කරන්න. සමහරවිට ඔවුන් අසා,
එකිනෙකා තම තමාගේ නපුරු
මාර්ගයෙන් හැරෙනවා ඇත; එවිට මම
ඔවුන්ගේ ක්‍රියාවල නපුරුකම නිසා
ඔවුන්ට පමුණුවන්ට සිතන විපත්තිය
4 ගැන පසුතැවිලි වන්නෙමි. නුඹ ඔවුන්ට
කථාකොට: **ස්වාමින්වහන්සේ** මෙසේ
කියනසේක—මා නුඹලා ඉදිරියෙහි තබා
තිබෙන මාගේ ව්‍යවස්ථාවේ ප්‍රකාරයට
හැසිරෙන හැටියටත් මා අලුයම් වේලේ
5 පටන් නුඹලා ළඟට එවන්නාවූ, නුඹලා
විසින් කන් දෙන්ට නොයෙදුණාවූ
අනාගතවක්තෘවරුන් වන මාගේ
සේවකයන්ගේ වචනවලට ඇහුම්කන්-
දෙන හැටියටත් නුඹලා මට ඇහුම්කන්
6 නුදුන්නොත්, මම මේ ගෘහය ෂීලෝ
මෙන් කරන්නෙමි, මේ නුවරද පොළොවේ
සියලු ජාතීන්ට ශාප-වාක්‍යයක්
7 කරන්නෙමියි කියාපන්න. පූජකයෝද
ප්‍රොපේතයෝද මුළු සෙනඟද
යෙරෙමියා මේ වචන **ස්වාමින්වහන්සේගේ**
8 ගෘහයෙහි කියනවා ඇසුවෝය. මුළු
සෙනඟට කියන්ට **ස්වාමින්වහන්සේ**
අණකළ සියල්ල යෙරෙමියා කියා නිමවූ
විට පූජකයෝද ප්‍රොපේතයෝද මුළු
සෙනඟද ඔහු අල්වා: නුඹ සැබවින්
9 මරනු ලබන්නෙහිය. මේ ගෘහය ෂීලෝ
මෙන් වන්නේය කියාත් මේ නුවර
වැසියෙක් නොසිටින හැටියට පාළුවන්නේය
කියාත් නුඹ **ස්වාමින්වහන්සේගේ** නාමයෙන්
අනාගතවාක්‍ය කීවේ මක්නිසාදැයි
කීවෝය. මුළු සෙනඟ යෙරෙමියාට
විරුද්ධව **ස්වාමින්වහන්සේගේ** ගෘහයෙහි
එකතුවුණෝය.
යූදහි අධිපතීහු ඒ කාරණා අසා, 10
රජගෙදර සිට **ස්වාමින්වහන්සේගේ**
ගෘහයට නැගී ඇවිත්, **ස්වාමින්වහන්සේගේ**
ගෘහයේ අලුත් දොරටුවෙහි හිඳගත්තෝය.
එවිට පූජකයෝද ප්‍රොපේතයෝද 11
අධිපතීන්ටත් මුළු සෙනඟටත් කථාකොට:
මේ මනුෂ්‍යයා මැරුම්කන්ට යුතුය:
මක්නිසාද නුඹලාගේ කන්වලින් නුඹලා
ඇසූ ලෙස මොහු මේ නුවරට විරුද්ධව
අනාගතවාක්‍ය කීවේයයි කීවෝය. එවිට 12
යෙරෙමියා සියලුම අධිපතීන්ටත් මුළු
සෙනඟටත් කථාකොට: නුඹලා ඇසූ
සියලු වචන අනාගතවාක්‍ය කොට මේ
ගෘහයටත් මේ නුවරටත් විරුද්ධව
කියන්ට **ස්වාමින්වහන්සේ** මා එවූසේක.
එබැවින් දැන් නුඹලාගේ මාර්ග සහ 13
ක්‍රියා හරිගස්සාගන නුඹලාගේ දෙවිවූ
**ස්වාමින්වහන්සේගේ** හඬට කීකරුවෙයල්ලා;
එවිට **ස්වාමින්වහන්සේ** නුඹලාට විරුද්ධව
කියා තිබෙන විපත්තිය ගැන පසුතැවිලි
වෙනවා ඇත. මම නම් නුඹලාගේ 14
අතෙහිය. නුඹලාගේ ඇස් හමුයෙහි හොඳව
හරිව පෙනෙන හැටියට මට කරපල්ලා.
එහෙත් නුඹලා මා මරනවා නම්, නුඹලා 15
පිටටත් මේ නුවර පිටටත් මෙහි වැසියන්
පිටටත් නුඹලා නිදෙස් ලේ පමුණුවන
බව සහතිකලෙස දැනගනිල්ලා.
මක්නිසාද මේ සියලු වචන නුඹලාට
ඇසෙන ලෙස කියන්ට **ස්වාමින්වහන්සේ**
සැබවින් මා නුඹලා ළඟට එවූසේකැයි
කීය. එවිට අධිපතීහුද මුළු සෙනඟද 16
පූජකයන්ටත් ප්‍රොපේතවරුන්ටත් කථා-
කොට: මේ මනුෂ්‍යයා මැරුම්කන්ට
යුතු නැත; මක්නිසාද මොහු අපට
කථාකළේ අපේ දෙවිවූ **ස්වාමින්-**
**වහන්සේගේ** නාමයෙන්යයි කීවෝය.
එකල දේශයේ වැඩිමහල්ලන්ගෙන් 17
සමහරු නැගිට රැස්ව සිටි මුළු
සෙනඟට මෙසේ කීවෝය. යූදහි රජවූ 18
හෙසකියාගේ දවස්වලදී මොරෂ්තිය
මීකායා අනාගතවාක්‍ය කියමින් යූදහි

මුළු සෙනඟට කථාකොට: සේනා-
වල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක–සියොන් කෙතක් මෙන්
හානු ලබන්නේය, යෙරුසලම ගොඩවල්ද
ගෘහයේ කන්ද කැලෑ මුදුන්ද මෙන්
19 වෙනවා ඇතැයි කීවේය. යූදහි රජවූ
හෙසකියා සහ සියලු යූදවරු ඔහු
මැරුවෝද? ඔහු **ස්වාමීන්වහන්සේට** භයව
**ස්වාමීන්වහන්සේට** කන්නලව් නොකෙළේද?
**ස්වාමීන්වහන්සේද** ඔවුන්ට විරුද්ධව
කී විපත්තිය ගැන පසුතැවිලිවූණා
නොවේද? මෙසේ අපි අපේම ප්‍රාණවලට
විරුද්ධව මහත් නපුරක් කරගන්නෙමුයයි
20 කීවෝය. තවද **ස්වාමීන්වහන්සේගේ**
නාමයෙන් අනාගතවාක්‍ය කීවාවූ
කිරියත්-යෙයාරීම්හි ෂෙමායාගේ පුත්‍රවූ
ඌරියා නම් මනුෂ්‍යයෙක්ද වූයේය; ඔහු
යෙරෙමියාගේ සියලු වචනවල හැටියට
මේ නුවරටත් මේ දේශයටත් විරුද්ධව
21 අනාගතවාක්‍ය කීවේය. යෙහෝයාකීම්
රජු සහ ඔහුගේ සියලු බලවන්තයන්ද
සියලු අධිපතීන්ද ඔහුගේ වචන ඇසූ
විට රජ ඔහු මරන්ට සෙව්ය; ඌරියා
ඒ අසා භයව පලාගොස් මිසරයට
22 පැමුණුණේය. නුමුත් යෙහෝයාකීම් රජ
අක්බෝර්ගේ පුත්‍රවූ එල්නාතාන්ද ඔහු
සමග තවත් මනුෂ්‍යයන්ද මිසරයට
23 යැව්ය. ඔව්හු ඌරියා මිසරයෙන් ගෙනැවිත්
යෙහෝයාකීම් රජු ළඟට පැමිණෙවුවෝය;
රජද ඔහු කඩුවෙන් මරා ඔහුගේ මළකඳ
සාමාන්‍ය ජනයන්ගේ සොහොන්වල
24 දැමුවේයයි කීවෝය. එහෙත් යෙරෙමියා
මරන්ට ඔහු සෙනඟ අතට පාවා
නොදෙන හැටියට ෂාපාන්ගේ පුත්‍රවූ
අහිකාම්ගේ අත ඔහු සමග විය.

## බැඳුම් නැමති ලකුණ. අවට ජාතීන්ට සහ ශෙදෙකියා රජුට යටත්වෙන්ට අවවාද කිරීම

**27** යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ
ශෙදෙකියාගේ රජකම්කිරීමේ
පටන්ගැන්මේදී මේ වචනය **ස්වාමීන්-**
**වහන්සේගෙන්** යෙරෙමියා වෙතට
පැමිණියේය. **ස්වාමීන්වහන්සේ** මට 2
මෙසේ කියනසේක: නුඹ වියබාන් සහ
වියගස් සාදගෙන නුඹේ බෙල්ලේ
තබාගනින්න; පසුව ඒවා යෙරුසලමට, 3
යූදහි රජවූ ශෙදෙකියා වෙතට එන්නාවූ
පණිවිඩකාරයන් අතින් ඒදෝමිහි රජුටද
මෝවබ්හි රජුටද අම්මොන් පුත්‍රයන්ගේ
රජුටද තීර්හි රජුටද සීදෝන්හි රජුටද
යවා, ඔවුන් තමුන්ගේ ස්වාමිවරුන්ට 4
කියන පිණිස මෙසේ ඔවුන්ට
අණකරපන්න: නුඹලාගේ ස්වාමිවරුන්ට
මෙසේ කියාපල්ලායයි ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේක–මමම මාගේ මහත් 5
බලයෙන්ද දිගුකළ මාගේ හස්තයෙන්ද
පොළොව සහ පොළොව මතුපිට සිටින
මනුෂ්‍යයාත් තිරිසනාත් මැවූවෙමි; මට
හරිව පෙනෙන ලෙස මම කැමති අයට
එය දෙමි. දැනුදු මමම මේ සියලු දේශ 6
මාගේ සේවකයාවූ, බබිලෝනියේ රජවූ
නෙබුකද්නෙශර්ගේ අතට දුනිමි; ඔහුට
සේවයකරන්ට වනයේ සත්ත්වයින්ද ඔහුට
දුනිමි. ඔහුගේ දේශයේ කාලය පැමිණ, 7
බොහෝ ජාතීන්ද මහත් රජවරුන්ද
විසින් ඔහු දසකමට ගන්න තුරු, සියලු
ජාතීහු ඔහුටත් ඔහුගේ පුත්‍රයාටත් ඔහුගේ
පුත්‍රයාගේ පුත්‍රයාටත් සේවයකරන්නෝය.
යම් ජාතියක්වත් යම් රාජ්‍යයක්වත් 8
බබිලෝනියේ රජු වන නෙබුකද්නෙශර්ට
සේවය නොකරන්නේ නම්, බබිලෝනියේ
රජුගේ වියගහේ තමුන්ගේ බෙල්ල
නොතබන්නේ නම්, මම ඒ ජාතිය
ඔහු ලවා නැතිකරවනතුරු කඩුවෙන්ද
සාගතයෙන්ද වසංගතයෙන්ද ඔවුන්ට
දඬුවම්කරන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. එබැවින්: නුඹලා 9
බබිලෝනියේ රජුට සේවයකරන්නේ
නැතැයි නුඹලාට කියන නුඹලාගේ
අනාගතවක්තෘවරුන්ටද නුඹලාගේ
පේනකියන්නන්ටද නුඹලාගේ ස්වප්න-
වලටද නුඹලාගේ මායම්කාරයන්ටද
නුඹලාගේ මන්ත්‍රකාරයන්ටද ඇහුම්කන්-
නොදෙල්ලා. මක්නිසාද නුඹලාගේ 10
රටෙන් නුඹලා දුරුකරන හැටියටත්
මා විසින් නුඹලා පන්නාදමන

හැටියටත් නුඹලා නැතිවන හැටියටත්
ඔව්හු බොරුවට නුඹලාට අනාගතවාක්‍ය
11 කියති. නුමුත් බබිලෝනියේ රජුගේ
වියගහ යට තමුන්ගේ බෙල්ල තබා,
ඔහුට සේවයකරන ජාතියට තමුන්ගේම
රටෙහි නැවතී, එය වවා, එහි වාසය
කරන්ට ඉඩහරින්නෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේකැයි කීවේය.
12 මම යූදහි රජවූ ශෙදෙකියාට මේ සියලු
වචනවල හැටියට කථාකොට:
බබිලෝනියේ රජුගේ වියගහේ නුඹලාගේ
බෙල්ල තබා, ඔහුට සහ ඔහුගේ
සෙනඟටත් සේවයකර ජීවත්වෙයල්ලා.
13 බබිලෝනියේ රජුට සේවය නොකරන
ජාතියට විරුද්ධව **ස්වාමීන්වහන්සේ**
කියා තිබෙන ලෙස නුඹ සහ නුඹේ
සෙනඟත් කඩුවෙන්ද සාගතයෙන්ද
වසංගතයෙන්ද මැරෙන්නේ මක්නිසාද?
14 නුඹලා බබිලෝනියේ රජුට සේවය-
කරන්නේ නැතැයි කියන ප්‍රොපේත-
වරුන්ගේ වචනවලට ඇහුම්කන්
නොදෙල්ලා. මක්නිසාද ඔව්හු බොරුවට
15 නුඹලාට අනාගතවාක්‍ය කියති. එසේය,
මම ඔවුන් නොඑවූවෙමි, එහෙත් මා
විසින් නුඹලා පන්නාදමන හැටියටත්
නුඹලා සහ නුඹලාට අනාගතවාක්‍ය
කියන අනාගතවක්තෘවරුන් නැතිවෙන
හැටියටත් ඔව්හු මාගේ නාමයෙන්
බොරුවට අනාගතවාක්‍ය කියතියි කියා
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි කීමි.
16 ඇරත් මම පූජකයන්ටත් මේ මුළු
සෙනඟටත් කථාකොට: **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක—බලව,
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ භාණ්ඩ
දැන් ඉක්මනින්ම බබිලෝනියෙන් නැවත
ගෙනෙනවා ඇත කියා නුඹලාට
අනාගතවාක්‍ය කියන නුඹලාගේ
ප්‍රොපේතවරුන්ගේ වචනවලට ඇහුම්කන්
නොදෙල්ලා. මක්නිසාද ඔව්හු බොරුවට
17 නුඹලාට අනාගතවාක්‍ය කියති. ඔවුන්ට
ඇහුම්කන් නොදෙල්ලා. බබිලෝනියේ
රජුට සේවයකොට ජීවත්වෙයල්ලා. මේ
18 නුවර පාළුවක් වන්නේ කුමටද? ඔව්හු
**ස්වාමීන්වහන්සේගේ** වචනය ඇත්තාවූ
ප්‍රොපේතවරු නම්, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙන් යූදහි රජුගේ ගෘහයෙන්
යෙරුසලමෙන් ඉතුරුව තිබෙන භාණ්ඩ
බබිලෝනියට ගෙනනොයන ලෙස
සේනාවල **ස්වාමීන්වහන්සේට** කන්නලව්-
කරත්වා. මක්නිසාද බබිලෝනියේ රජවූ 19
නෙබුකද්නෙශර් යෙහෝයාකීම්ගේ පුත්‍රවූ
යූදහි රජවූ යෙකොනියාද යූදහි සහ
යෙරුසලමේ සියලු උත්තමයන්ද අල්ලා
යෙරුසලමෙන් බබිලෝනියට ගෙනයද්දී,
ඔහු හැර නොගත්තාවූ කුළුනු ගැනත් 20
මුහුද ගැනත් මැහි ගැනත් මේ නුවර
ඉතිරිව තිබෙන අනික් භාණ්ඩ ගැනත්
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක. සැබවින්ම **ස්වාමීන්-** 21
**වහන්සේගේ** ගෘහයෙන් යූදහි රජුගේ
ගෘහයෙන් යෙරුසලමෙන් ඉතිරිව තිබෙන
භාණ්ඩ ගැන ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: ඒවා බබිලෝනියට 22
ගෙනයනු ලබන්නේය, මා ඒවා විමසා
බලන දවස දක්වා ඒවා එහි තිබෙන්නේය;
එවිට මම ඒවා ගෙනැවිත් නැවත මේ
ස්ථානයට පමුණුවන්නෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේකැයි කීවෙමි.

## නිදහස ගැන හනනියාගේ නිවට අනාගතවාක්‍ය නිසා තර්ජනය ලැබීම සහ මරණය

28
තවද යූදහි රජවූ ශෙදෙකියාගේ
රජකම්කිරීමේ පටන්ගැන්මෙහි එම
අවුරුද්ද වන සතරවෙනි අවුරුද්දේ
පස්වෙනි මාසයේදී අස්සූර්ගේ පුත්‍රවූ,
ගිබියොන්හි පදිංචි ප්‍රොපේතවූ හනනියා
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේදී පූජකයන්
සහ මුළු සෙනඟ ඉදිරියෙහි මට
කථාකොට: ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 2
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක—මම බබිලෝනියේ රජුගේ
වියගහ බින්දෙමි. බබිලෝනියේ රජවූ 3
නෙබුකද්නෙශර් මේ ස්ථානයෙන් රැගෙන
බබිලෝනියට ගෙනගිය **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයේ සියලුම භාණ්ඩ
මම සම්පූර්ණ අවුරුදු දෙකක් ඇතුළතදී
නැවත මේ ස්ථානයට ගෙනෙන්නෙමි.

4 යෙහෝයාකීම්ගේ පුත්‍රවූ යූදාහි රජවූ
යෙකොනියාද, අසුවී බබිලෝනියට
ගෙනයනු ලැබුවාවූ සියලුම යූදවරුන්ද
මම නැවත මේ ස්ථානයට ගෙනෙන්නෙමි.
මක්නිසාද බබිලෝනියේ රජුගේ වියගහ
බිඳින්නෙමියි ස්වාමීන්වහන්සේ කියන-
5 සේකැයි කීවේය. එවිට අනාගතවක්තෘවූ
යෙරෙමියා පූජකයන් ඉදිරියෙහිත්
ස්වාමීන්වහන්සේගේ ගෘහයේ සිටි මුළු
සෙනඟ ඉදිරියෙහිත් ප්‍රොපේතවූ හනනියාට
6 කථාකොට: ආමෙන්, ස්වාමීන්වහන්සේ
එසේ කරනසේක්වා. ස්වාමීන්වහන්සේගේ
ගෘහයේ භාණ්ඩද අල්ලා ගෙනගිය
සියල්ලන්ද නැවත බබිලෝනියෙන්
මේ ස්ථානයට ගෙනෙන ලෙස නුඹ
අනාගතවාක්‍යයෙන් කී වචන ස්වාමීන්-
7 වහන්සේ ඉෂ්ටකරනසේක්වා. එසේ වුවත්
නුඹ ඉදිරියෙහිත් මුළු සෙනඟ ඉදිරියෙහිත්
8 මා කියන මේ වචනය අසාපන්න. මටත්
නුඹටත් පළමුවෙන් පුරාණයේ පටන්
සිටි අනාගතවක්තෘවරුත් බොහෝ
රටවලට සහ මහත් රාජ්‍යවලට
විරුද්ධව යුද්ධයද විපත්තියද වසංගතයද
9 ගැන අනාගතවාක්‍ය කීවෝය. සමාදානය
ගැන අනාගතවාක්‍ය කියන අනාගතවක්තෘ
කෙනෙක් ඇද්ද, ඒ අනාගතවක්තෘගේ
වචනය ඉෂ්ටවුණාම ඔහු සැබවින්
ස්වාමීන්වහන්සේ විසින් එවූ අනාගත-
වක්තෘකෙනෙකු බව පෙනීයන්නේයයි
අනාගතවක්තෘවූ යෙරෙමියා කීවේය.
10 එවිට ප්‍රොපේතවූ හනනියා අනාගත-
වක්තෘවූ යෙරෙමියාගේ බෙල්ලෙන් වියගහ
11 හැරගෙන බින්දේය. හනනියාද මුළු
සෙනඟ ඉදිරියෙහි කථාකොට: සම්පූර්ණ
අවුරුදු දෙකක් ඇතුළතදී බබිලෝනියේ
රජවූ නෙබුකද්නෙශර්ගේ වියගහ
සියලු ජාතීන්ගේ බෙල්ලෙන් මෙසේ
බිඳදමන්නෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේකැයි කීවේය. අනාගත-
වක්තෘවූ යෙරෙමියාද යන්ට ගියේය.
12 නවද ප්‍රොපේතවූ හනනියා අනාගත-
වක්තෘවූ යෙරෙමියාගේ බෙල්ලෙන්
වියගහ බිඳදැමූ පසු ස්වාමීන්-
වහන්සේගේ වචනය යෙරෙමියා
13 වෙතට පැමිණ: නුඹ ගොස්
හනනියාට කථාකොට—ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක: නුඹ බිඳදැමුවේ ලී
වියගස්ය; නුමුත් ඒවා වෙනුවට නුඹ
යකඩ වියගස් සාදන්නෙහිය. මක්නිසාද 14
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල ස්වාමීන්-
වහන්සේ මෙසේ කියනසේක:
බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර්ට
සේවයකරන පිණිස මම යකඩ වියගහක්
මේ සියලු ජාතීන්ගේ බෙල්ලේ තැබුවෙමි;
ඔවුන් ඔහුට සේවයකරනවා ඇත.
මම වනයේ මෘගයන්ද ඔහුට දුනිමියි
කියාපන්නැයි කීසේක. එවිට 15
අනාගතවක්තෘවූ යෙරෙමියා ප්‍රොපේතවූ
හනනියාට කථාකොට: හනනියා,
අසාපන්න; ස්වාමීන්වහන්සේ නුඹ
නොඑවූසේක; නුඹ මිථ්‍යාවක් කෙරෙහි
විශ්වාසය තබන්ට මේ සෙනඟට
සලස්වන්නෙහිය. එබැවින් ස්වාමීන්- 16
වහන්සේ මෙසේ කියනසේක: බලව,
මම නුඹ පොළොව මතුපිටින්
පහකරන්නෙමි. නුඹ ස්වාමීන්වහන්සේට
විරුද්ධව කැරළිකාර වචන කථාකළ
නිසා නුඹ මේ අවුරුද්දේ මැරෙන්නෙහියයි
කීවේය. එසේම ප්‍රොපේතවූ හනනියා 17
එම අවුරුද්දේ සත්වෙනි මාසයේදී
මළේය.

## බබිලෝනියෙන් නිදහස්වීමේ බලාපොරොත්තුවක් නැති නිසා එහි පදිංචිවෙන්ට අවවාදකිරීම

29 යෙකොනියා රජුද මවු බිසවද
නපුංසකයන්ද යූද සහ යෙරුසලමේ
අධිපතීන්ද කර්මාන්තකාරයන්ද
ආචාරීන්ද යෙරුසලමෙන් ගියායින් පසු,
අනාගතවක්තෘවූ යෙරෙමියා විසින්, 2
අසුවී ගියාවූ වැඩිමහල්ලන්ගෙන්
ඉතුරු තැනැත්තන්ටද පූජකයන්ටද
අනාගතවක්තෘවරුන්ටද නෙබුකද්නෙශර්
විසින් යෙරුසලමෙන් බබිලෝනියට
අල්ලාගන ගිය මුළු සෙනඟටද ලියා,
යූදාහි රජවූ ශෙදෙකියා විසින් 3
බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර්
ළඟට බබිලෝනියට යැවුවාවූ, ෂාපාන්ගේ
පුත්‍රවූ එලාසා සහ හිල්කියාගේ පුත්‍රවූ

ගෙමරියා අතින් යෙරුසලමෙන් ඇරිය
4 ලියුමේ වචන මේවාය: අල්ලාගන්නාලදුව,
යෙරුසලමෙන් බබිලෝනියට මා විසින්
ගෙනගියාවූ සියල්ලන්ට ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ සේනාවල **ස්වාමීන්වහන්සේ**
5 මෙසේ කියනසේක—තුඹලා ගෙවල්
ගොඩනගා එහි වාසයකරපල්ලා; වතු
6 වවා ඒවායේ එල කාපල්ලා; භාර්යාවන්
පාවාගෙන පුත්‍රයන්ද දූවරුන්ද
උපදවාපල්ලා; තුඹලාගේ පුත්‍රයන්ටත්
භාර්යාවන් ගනිල්ලා, තුඹලාගේ දූවරුන්
විසින් පුත්‍රයන්ද දූවරුන්ද වදන පිණිස
ඔවුන් පුරුෂයන්ට පාවාදීපල්ලා; මෙසේ
තුඹලා එහි අඩු නොවී වැඩිවෙයල්ලා.
7 මා විසින් තුඹලා දසකමට ගෙනගියාවූ
නුවරේ සමාදානය සොයා එය උදෙසා
**ස්වාමීන්වහන්සේට** යාච්ඤාකරපල්ලා.
මක්නිසාද එහි සමාදානයෙන් තුඹලාට
8 සමාදානය ලැබෙයි. තවද ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: තුඹලා අතරෙහි
සිටින තුඹලාගේ ප්‍රොපේතවරුන්ටද
පේනකියන්නන්ටද නොරැවටෙල්ලා,
තුඹලා දකින තුඹලාගේ ස්වප්නවලටත්
9 ඇහුම්කන් නොදෙල්ලා. මක්නිසාද ඔව්හු
මාගේ නාමයෙන් බොරුවට තුඹලාට
අනාගතවාක්‍ය කියති. මම ඔවුන්
නොඑවුවෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
10 සේක. මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: බබිලෝනියේ අවුරුදු
සැත්තෑවක් සම්පූර්ණවූ කල්හි මම
තුඹලා දෙස බලා නැවත මේ ස්ථානයට
තුඹලා පැමිණවීමෙන් තුඹලා ගැන
මාගේ යහපත් වචනය ඉෂ්ටකරන්නෙමි.
11 මා විසින් තුඹලා ගැන කරන යෝජනා
මමම දනිමි, තුඹලාට මතු කාලයේදී
බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ
නොව සමාදානයේ යෝජනායයි
12 **ස්වාමීන්වහන්සේ** කියනසේක. තුඹලා
මට අඬගසන්නහුය, ගොස් මට යාච්ඤා
කරන්නහුය, මමද තුඹලාට ඇහුම්කන්
දෙන්නෙමි. තුඹලා මා සොයනවා ඇත, 13
තුඹලාගේ මුළු සිතින් මා සොයන කල
මා තුඹලාට සම්බවෙනවා ඇත. මම 14
තුඹලාට සම්බවන්නෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක, මම තුඹලාගේ
වාල්කම පහකොට, සියලු ජාතීන්
අතරෙන්ද මා තුඹලා පන්නාදැමූ සියලු
තැන්වලින්ද තුඹලා එකතුකොට, මා
විසින් තුඹලා යම් ස්ථානයකින්
ගෙනගියාද ඒ ස්ථානයට තුඹලා නැවත
ගෙනෙන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. **ස්වාමීන්වහන්සේ** බබිලෝනියේදී 15
අපට අනාගතවක්තෘවරුන් නැගුටුවවා
දුන්සේකැයි තුඹලා කීවහුය. නුමුත් **ස්වාමීන්-** 16
**වහන්සේ** මෙසේ කියනසේක: දාවිත්ගේ
සිංහාසනයෙහි ඉන්න රජු ගැනද තුඹලා
සමග දසකමට ගෙනයනු නොලැබූ
තුඹලාගේ සහෝදරයන් වන මේ නුවර
වාසයකරන මුළු සෙනඟ ගැනද
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: බලව, මම ඔවුන් අතරට 17
කඩුවද සාගතයද වසංගතයද යවා,
කන්ට බැරි තරම් නරකව තිබෙන පිළිකුල්
අත්තික්කාවලට ඔවුන් සමානකරන්නෙමි.
මම කඩුවද සාගතයද වසංගතයද ඇතුව 18
ඔවුන් පස්සේ එළවාගෙන ගොස්,
පොළොවේ සියලු රාජ්‍යවල ඔබමොබ
විසුරුවනු ලැබීමටත් මා විසින්
ඔවුන් පන්නාදමනලද සියලු ජාතීන්
අතරේ ශාප වචනයක්ද විස්මයක්ද
කවටකමක්ද නින්දාවක්ද වීමටත් ඔවුන්
පාවා දෙන්නෙමි. මෙසේ කරන්නේ මා 19
විසින් අලුයම නැගිට මාගේ සේවකයන්වූ
අනාගතවක්තෘවරුන් ඔවුන් ළඟට ඇරිය
නුමුත් ඔවුන් මාගේ වචන නෑසූ නිසායයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක; තුඹලාද
ඇසුවේ නැතැයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. එබැවින් මා විසින් යෙරුසලමෙන් 20
බබිලෝනියට ඇරියාවූ දසව සිටින
සියල්ලෙනි, තුඹලා **ස්වාමීන්වහන්සේගේ**
වචනය අසාපල්ලා.

21 මාගේ නාමයෙන් බොරුවට නුඹලාට
අනාගතවාක්‍ය කියන්නාවූ, කෝලායාගේ
පුත්‍රවූ අහාබ්ද මයසේයාගේ පුත්‍රවූ
ශෙදෙකියාද ගැන ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක: බලව, මම ඔවුන් බබිලෝනියේ
රජවූ නෙබුකද්රෙශර් අතට පාවා-
දෙන්නෙමි; ඔහු නුඹලාගේ ඇස් හමුයෙහි
22 ඔවුන් මරන්නේය. බබිලෝනියේ දසව
සිටින සියලුම යුදවරුන්ද බබිලෝනියේ
රජු විසින් ගින්නෙන් පිළිස්සුවාවූ
ශෙදෙකියාටත් අහාබ්ටත් ස්වාමීන්-
වහන්සේ නුඹ සමානකරනසේක්වයි
කියා ඔවුන් ගැන ශාප-වචනයක්
23 ව්‍යවහාරකරනවා ඇත. මක්නිසාද ඔව්හු
ඉශ්‍රායෙල්හි දුෂ්ටකම් කොට තමුන්ගේ
අසල්වාසීන්ගේ භාර්යාවන් සමග
කාමමිථ්‍යාචාරයකළෝය, මා විසින්
ඔවුන්ට අණ නොකළ වචන බොරුවට
මාගේ නාමයෙන් කීවෝය; නුමුත් මම
දනිමි, මම සාක්ෂිකාර වෙමියි ස්වාමීන්-
වහන්සේ කියනසේක.
24 නෙහෙලාමිය ෂෙමායා ගැන මෙසේ
25 කියාපන්න: ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක–නුඹ නුඹේම නාමයෙන්
යෙරුසලමෙහි සිටින මුළු සෙනඟටත්
මයසේයාගේ පුත්‍රවූ පූජකයාවූ
ශෙපනියාටත් සියලු පූජකයන්ටත් ලියුම්
26 ලියමින්: උමතුකම්කර අනාගතවාක්‍ය
කියන සියලුදෙනා කෙරෙහි නුඹලා
ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි මුලාදෑනීන්
වන පිණිසත්, නුඹ එබඳු අය දඬුකඳේද
විලංගුවලද දමන පිණිසත්, යෙහෝයාද
පූජකයා වෙනුවට ස්වාමීන්වහන්සේ නුඹ
27 පූජකයා කළසේක. එබැවින් නුඹලාට
අනාගතවාක්‍ය කියන අනාතෝත්හි
යෙරෙමියාට නුඹ තරවටු නොකළේ
28 මක්නිසාද? මෙයාකාර ඔහු අප ළඟට
බබිලෝනියට ලියා එවා: වහල්කමේ
කාලය දීර්ඝය. නුඹලා ගෙවල් ගොඩනගා
වාසයකරපල්ලා; වතු වවා ඒවායේ
ඵල කාපල්ලායයි කියා තිබේ.
අනාගතවක්තෘවූ යෙරෙමියා අසාගෙන 29
සිටිද්දී පූජකවූ ශෙපනියා ඒ ලියුම
කියෙවුවේය. එවිට ස්වාමීන්වහන්සේගේ 30
වචනය යෙරෙමියා වෙතට පැමිණ
මෙසේ කීය: දසව සිටින සියල්ලන්ට 31
නුඹ ලියා ඇර: නෙහෙලාමිය ෂෙමායා
ගැන ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක–මා විසින් ෂෙමායා නොඑවූ
නුමුත් ඔහු නුඹලාට අනාගතවාක්‍ය කියා
බොරුවක් කෙරෙහි විශ්වාසකරන්ට
නුඹලාට සැලැස්සූ නිසා ස්වාමීන්-
වහන්සේ මෙසේ කියනසේක: බලව, මම 32
නෙහෙලාමිය ෂෙමායාටත් ඔහුගේ
වංශයටත් දඬුවම්කරන්නෙමි; ඔහු
ස්වාමීන්වහන්සේට විරුද්ධව කැරළිකාර
වචන කථාකළ බැවින් මේ සෙනඟ
අතරේ වාසයකිරීමට මනුෂ්‍යයෙක් ඔහුට
නොවන්නේය, මා විසින් මාගේ
සෙනඟට කරන යහපත ඔහු දකින්නෙන්
නැත කියා ස්වාමීන්වහන්සේ කියන-
සේකැයි කියා ඇරපන්නැයි කීවේය.

## ඉශ්‍රායෙල්ගේ විපත්ති කාලයේදී දෙවියන්වහන්සේ ඔවුන් සිහිකොට ගැළවීම ගෙනදෙන බව

30 ස්වාමීන්වහන්සේගෙන් යෙරෙමියා
වෙතට පැමිණි වචනය මේය.
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ 2
මෙසේ කියනසේක: මා විසින් නුඹට කී
සියලුම වචන පොතක ලියාපන්න.
මක්නිසාද මා විසින් මාගේ සෙනඟවූ 3
ඉශ්‍රායෙල්වරුන්ගේත් යුදවරුන්ගේත්
වාල්කම පහකරන දවස් පැමිණෙන්නේ-
යයි ස්වාමීන්වහන්සේ කියනසේක. මම
ඔවුන්ගේ පියවරුන්ට දුන් දේශයට ඔවුන්
නැවත ගෙනෙන්නෙමි, ඔව්හුද ඒක
භුක්තිවිඳින්නෝයයි ස්වාමීන්වහන්සේ
කියනසේක.
තවද ඉශ්‍රායෙල්වරුන් සහ යූදවරුන් 4
ගැන ස්වාමීන්වහන්සේ කී වචන මේවාය.

5 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
වෙවුලවීමේ හඬක් අපට ඇසුණේය; ඒය
සමාදනයේ නොව භීතියේ හඬක්ය.
6 පුරුෂයෙක් වදන වේදනා විඳින්නේද
කියා අසා බලාපල්ලා. වදන ස්ත්‍රියෙකු
මෙන් සියලු පුරුෂයන් ඉඟටියේ අත්
තබාගෙන ඉන්නවාත් සියලු මුහුණු
සුදුමැළිව තිබෙනවාත් මට පෙනෙන්නේ
7 මක්නිසාද? අහෝ! ඒ දවස මහත්ය,
ඊට සමානවූ දවසක් නැත. ඒක
යාකොබ්ගේ විපත්ති කාලයය; එහෙත්
ඔව්හු එයින් ගළවනු ලබනවා ඇත.
8 මක්නිසාද ඒ දවසේදී ඔහුගේ වියගහ
තුඹේ බෙල්ලෙන් බිඳදමා, තුඹේ බැඳුම්
කඩාදමන්නෙමියි සේනාවල **ස්වාමීන්-
වහන්සේ** කියනසේක. විදේශියෝ තවත්
9 ඔවුන් යටත්කර නොගන්නෝය. ඔව්හුද
තමුන්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේටත්**
මා විසින් ඔවුන්ට නැඟුටුවාදෙන
තමුන්ගේ රජවූ දාවිත්ටත් සේවයකරන්නෝය.
10 ඒ නිසා: මාගේ මෙහෙකරුවාවූ යාකොබ්,
තුඹ භය නොවන්න; ඉශ්‍රායෙල්,
තොකැලඹෙන්නැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද, බලව, මම
තුඹ දුරස්තරයෙන්ද තුඹේ වංශය
ඔවුන්ගේ වාල්කමේ දේශයෙන්ද ගළවමි;
යාකොබ් හැරී ඇවිත් කිසිවෙකුගෙන්
භයක් නොලැබ, නිශ්චලව සුවසේ
11 සිටිනවා ඇත. මක්නිසාද තුඹ ගළවන්ට
මම තුඹ සමග සිටිමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මා විසින් තුඹ විසුරුවාදැමූ
තැන්වල සියලු ජාතීන් තීන්දුවටම
නැතිකරන නුමුත්, තුඹ තීන්දුවටම
නැතිනොකර, නිසි ප්‍රමාණයෙන් තුඹට
දඬුවම්කරන්නෙමි, නුමුත් තුඹට
අව්වූනොකර නොසිටින්නෙමි.
12 මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: තුඹේ තුවාලය අසාධ්‍යව
13 තුඹේ පහර ඉතා තදව තිබේ. ඒවා
බැඳීමට තුඹේ කාරණය භාරගන්න
කෙනෙක් නැත. තුඹ සුවකරන්ට කිසි
14 ඖෂධයක් නැත. තුඹේ සියලුම
ප්‍රේමවන්තයෝ තුඹ මතකනැතිකළෝය;
ඔවුන් තුඹ ගැන විභාගකරන්නේ නැත.
තුඹේ අයුතුකමේ මහත්කම නිසාද තුඹේ
පව් වැඩිවූ නිසාද සතුරෙකුගේ
පහරවලින්, ක්‍රෑර කෙනෙකුගේ දඬුවමකින්
තුඹට පහරදුනිමි. තුඹේ තුවාලය නිසා 15
තුඹ කෑගසන්නේ මක්නිසාද? තුඹේ
වේදනාව අසාධ්‍යව තිබේ. තුඹේ
අපරාධයේ මහත්කම නිසාද තුඹේ පව්
වැඩිවූ නිසාද මේ දේවල් තුඹට කෙළෙමි.
එහෙත් තුඹව නාස්තිකරන සියල්ලෝම 16
නාස්තිවන්නෝය; තුඹේ එදිරිකාරයන්
සියල්ලෝම වාලට යන්නෝය; තුඹෙන්
කොල්ලකන්නෝ කොල්ලයක් වන්නෝය,
තුඹෙන් උදුරාගන්න සියල්ලන්ද
කොල්ලයක් කොට පාවාදෙන්නෙමි.
පිටදමනු ලැබූ තැනැත්තිය, මෑ කිසිවෙකු 17
විසින් නොසලකන සියොන්ය කියා
තුඹට කියනලද බැවින්, මම තුඹට සනීප
ලබාදී, තුඹේ පහර සුවකරන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. **ස්වාමීන්-** 18
**වහන්සේ** මෙසේ කියනසේක: බලව,
මම යාකොබ්ගේ කූඩාරම්වල වාල්කම
පහකොට, ඔහුගේ වාසස්ථානවලට
අනුකම්පාකරන්නෙමි; නුවරද එහි
හෙලපිට ගොඩනගනු ලැබ, මාළිගාව
තිබුණු හැටියට පවතින්නේය. ඒවායින් 19
ස්තුති කිරීමද සන්තෝෂවන්තයන්ගේ හඬද
නික්මෙන්නේය. මම ඔවුන් ස්වල්පව
නොසිටින හැටියට ඔවුන් වැඩිකර,
ඔවුන් සුළුව නොසිටින හැටියට
ඔවුන්ට ගෞරවකරන්නෙමි. ඔවුන්ගේ 20
දරුවෝ පළමු සිටියාක්මෙන් වන්නෝය,
ඔවුන්ගේ සභාවද මා ඉදිරියෙහි
පිහිටෙනවා ඇත. ඔවුන්ට පීඩාකරන
සියල්ලන්ට දඬුවම්කරන්නෙමි. ඔවුන්ගේ 21
අධිපතියා ඔවුන්ගෙන්ම කෙනෙක්
වන්නේය, ඔවුන්ගේ ආඥාකාරයාද
ඔවුන් අතරෙන්ම නික්ම එන්නේය;
*ඔහු මා වෙතට ළංවන පිණිස

*නොහොත්, උන්වහන්සේ

*ඔහු ළඟට පමුණුවා ගනිමි. මක්නිසාද
මා වෙතට ළංවීමට †නිර්භීතකම ඇති
තැනැත්තා කවුදැයි **ස්වාමීන්වහන්සේ**
22 කියනසේක. තුඹලා මාගේ සෙනඟ
වන්නහුය, මමද තුඹලාගේ දෙවියන්-
වහන්සේ වන්නෙමි.
23 බලව, **ස්වාමීන්වහන්සේගේ** කෝපය
සහිත කුණාටුවක් වන ගසාගන යන
කුණාටුවක් නික්ම ගියේය. එය
දුෂ්ටයන්ගේ හිස් පිට වදිනවා ඇත.
24 **ස්වාමීන්වහන්සේ** තමන්ගේ සිතේ අදහස්
ඉෂ්ටකරන තෙක්ද සම්පූර්ණ කරන
තෙක්ද උන්වහන්සේගේ බලවත් උදහස
නොහැරෙන්නේය. මතු දවස්වලදී තුඹලා
එය තේරුම්ගන්නවා ඇත.

## ඉහතකී ගැළවීමේ ප්‍රීතිය සහ මහිමය.

31 ඒ කාලයෙහි මම සියලුම
ඉශ්‍රායෙල් පවුල්වල දෙවියන්වහන්සේ
වන්නෙමි, ඔව්හුද මාගේ සෙනඟ වන්නෝ-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
2 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
මා ඉශ්‍රායෙල් පිහිටුවන්ට යන විට
කඩුවෙන් ගැළවුණු ඒ සෙනඟට
කාන්තාරයේදී කරුණාව ලැබුණේය.
3 **ස්වාමීන්වහන්සේ** පුරාණයේදී මට
ප්‍රකාශවී—එසේය, සදාකාල ප්‍රේමයකින්
තුඹට ප්‍රේමකෙළෙමි. එබැවින් දයාබරකමින්
4 තුඹ ඇදගතිමියි කීසේක. එම්බා ඉශ්‍රායෙල්
කන්‍යාව, නැවත තුඹ ගොඩනගන්නෙමි,
මෙසේ තුඹ ගොඩනගනු ලබන්නෙහිය.
තුඹ නැවත තුඹේ රබන්වලින් සැරසී
සන්තෝෂවෙන්නන් සමග නටමින්
5 යන්නෙහිය. නැවත තුඹ සමාරියේ
කඳුවල මිදිවැල් හිටවනවා ඇත.
වවන්නෝ ඒවා හිටවා එහි ඵල භුක්ති
6 විඳින්නෝය. මක්නිසාද නැගිටිල්ලා,
සියොන්ට, අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
වෙතට නැගීයමුයයි එප්‍රායිම් කඳුවල
රැකවලුන් මොරගසන දවසක්
පැමිණෙන්නේය. එසේය, **ස්වාමීන්වහන්සේ** 7
මෙසේ කියනසේක: යාකොබ් ගැන
ප්‍රීතියෙන් ගී කියා ජාතීන්ට ප්‍රධාන ජාතිය
ගැන ශබ්දනගාපල්ලා. ප්‍රකාශකරමින්ද,
වර්ණනාකරමින්ද: **ස්වාමීන්වහන්ස,**
ඔබගේ සෙනඟ වන ඉතුරුව සිටින
ඉශ්‍රායෙල්වරුන් ගැළවුව මැනවයි
කියාපල්ලා. බලව, මම උතුරු දේශයෙන් 8
ඔවුන් ගෙනෙන්නෙමි, ඔවුන් පොළොවේ
ඉතා දුරු තැන්වලින් අන්ධයන්ද
කොරුන්ද ගර්භිණීන්ද වදන වේදනා
ඇත්තියන්ද ඇතුළුව රැස්කරගන්නෙමි.
ඔවුන් මහත් සමූහයක්ව මෙහි හැරීඑනවා
ඇත. ඔවුන් ඇඬීමද කන්නලව්ද ඇතුව 9
එනවා ඇත, එලෙස ඔවුන් ගෙනෙන්නෙමි.
වතුර ඔයවල් ළඟටද නොපැකිලෙන්නාවූ
ඇද නැති මාර්ගයකද ඔවුන්
ගෙනයන්නෙමි. මක්නිසාද මම
ඉශ්‍රායෙල්ට පියකෙනෙක් වී සිටිමි,
එප්‍රායිම්ද මාගේ කුලුඳුලාය.
එම්බා ජාතීනි, **ස්වාමීන්වහන්සේගේ** 10
වචන අසා, දුරස්තර දිවයින්වල
දන්වමින් ඉශ්‍රායෙල්වරුන් විසිරෙවූ
තැනන්වහන්සේ ඔවුන් රැස්කර, එඬේරා
තමාගේ රැළ ආරක්ෂාකරන්නාක්මෙන්
ඔවුන් ආරක්ෂාකරනසේකැයි කියාපල්ලා.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** යාකොබ් 11
ගළවා, ඔහුට වඩා බලවත්ව සිටි අයගේ
අතින් ඔහු මිදූසේක. ඔව්හු ඇවිත් 12
සියොන්හි උස් ස්ථානය පිට ගී
කියන්නෝය, ඔව්හු ධාන්‍යද මුද්‍රික යුසද
තෙල්ද බැටළුපැටවුන්ද ගවවස්සන්ද
නිසා **ස්වාමීන්වහන්සේගේ** යහපත්කම
කරා එක්ව ගලාගන එන්නෝය.
ඔවුන්ගේ ආත්මයද ජල සම්පන්න
උයනක් මෙන් වන්නේය; ඔව්හු තවත්
කිසිසේත් මලානික නොවන්නෝය. එවිට 13
කන්‍යාවද තරුණයෝ සහ මහල්ලෝද
එක්ව නටා සන්තෝෂ වන්නෝය.
මක්නිසාද මම ඔවුන්ගේ වැලපීම ප්‍රීතියට
හරවා, ඔවුන්ගේ ශෝකයෙන් පසුව ඔවුන්
ප්‍රීතිකරවන්නෙමි. පූජකයන්ගේ ආත්ම 14
තරකමෙන් පූර්ණකරන්නෙමි, මාගේ
සෙනඟද මාගේ යහපත්කමින් තෘප්තියට
පැමිණෙන්නෝයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක.

*නොහොත්, උන්වහන්සේ.
†හෙබ්‍රෙව්: තමාගේ සිත ඇපයට තැබුවාවූ

15 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
වැලපීමද දුක්ඛිත ඇඬීමද සහිතවූ හඬක්
රාමාහි ඇසෙයි, රාකෙල් ඇගේ දරුවන්
ගැන අඬමින් ඔවුන් නැති නිසා ඇගේ
දරුවන් ගැන සැනසෙන්ට අකමැතිව
16 සිටියි. **ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: නුඹේ හඬ ඇඬීමෙන්ද නුඹේ ඇස්
කඳුළුවලින්ද වලක්වාගනින්න. මක්නිසාද
නුඹේ ක්‍රියාවට විපාක ලැබෙන්නේය;
ඔවුන් සතුරන්ගේ දේශයෙන් හැරීඑනවා
ඇතැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
17 නුඹේ මතු කාලය ගැන බලාපොරොත්තුවක්
තිබේ; නුඹේ දරුවෝ තමුන්ගේ සීමාවට
හැරීඑන්නෝයයි **ස්වාමීන්වහන්සේ** කියන-
18 සේක. ඔබ මට දඬුවම්කළසේක, මමද
වියගහට පුරුදු නැති නාම්බෙකු මෙන්
දඬුවම් ලැබුවෙමි. මා හැරෙන පිණිස
මා හරවාව මැනව; මක්නිසාද ඔබම
මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය.**
19 සැබවින්ම මම හැරුණායින් පසු මම
පශ්චාත්තාපවීමි; දැනමුතුවුණායින් පසු
මම කළවයට ගසාගතිමි. මම මාගේ
යෞවන කාලයේ නින්දාව දරාගත ආ
බැවින් ලජ්ජාවට පැමුණුණෙමි, එසේය,
වියවුල්වීමියි එප්‍රායිම් විලාපකියනවා
20 ඇසීමි. එප්‍රායිම් මාගේ ප්‍රිය පුත්‍රයාද?
ඔහු ප්‍රසන්නවූ දරුවෙක්ද? මක්නිසාද
මම ඔහුට විරුද්ධව කථාකරන සෑම
විටම ඔහු නැවත සිහිකරමි. එබැවින්
මාගේ හෘදය ඔහු ගැන කම්පාවන්නේය;
සැබවින්ම ඔහුට අනුකම්පාකරන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
21 නුඹට මං සලකුණු හිටවා, නුඹට
මගපෙන්වන කණු සාදගෙන, මහමාවත
වන, නුඹ ගිය මාර්ගය දෙස නුඹේ සිත
යොමුකරපන්න. ඉශ්‍රායෙල් කන්‍යාව,
හැරීවරෙන්න, නුඹේ මේ නුවරවලට
22 හැරීවරෙන්න. අහෝ පසුබටවන දූව,
නුඹ කොපමණ කල් ඔබමොබ
යන්නෙහිද? මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
පොළොවෙහි අමුතු දෙයක් මවා තිබේ:
*ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි ඇලුම්ව
බැඳෙන්නීය.

ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-** 23
**වහන්සේ** මෙසේ කියනසේක: මා විසින්
ඔවුන්ගේ වාල්කම පහකළ කල්හි
යූද දේශයෙහිද එහි නුවරවලද
මනුෂ්‍යයන්—එම්බා ධර්මිෂ්ඨකමේ
වාසභූමිය, එම්බා ශුද්ධකමේ කන්ද, නුඹට
**ස්වාමීන්වහන්සේ** ආශීර්වාදකරනසේක්වා
යන කීම නැවත භාවිතාකරනවා ඇත.
එතැන්හි යූද සහ එහි සියලු නුවරවල 24
මනුෂ්‍යයෝද ගොවියෝද සිවුපා රැළ
කැටුව යන්නෝද එක්ව වාසයකරන්නෝය.
මක්නිසාද මම විඩාවූ ආත්මය 25
ප්‍රාණවත්කෙළෙමි, ශෝකවෙන සියලු
ආත්මද සෑහීමට පැමිණෙවීමි. එවිට මම 26
පිබිද බැලුවෙමි; මාගේ නින්ද මට
මිහිරිව තිබුණේය. බලව, මම ඉශ්‍රායෙල් 27
වංශයද යූද වංශයද නැමති කෙත්වල
මනුෂ්‍ය බීජ සහ මෘග බීජද වපුරන
දවස් පැමිණෙන්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. තවද මම උදුරන්ටත් 28
කඩාදමන්ටත් හෙළාදමන්ටත් නැති-
කරන්ටත් විපත්ති පමුණුවන්ටත් ඔවුන්
ගැන පිබිද සිටියාක්මෙන්ම ගොඩ-
නගන්ටත් හිටවන්ටත් ඔවුන් ගැන
පිබිද සිටින්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. පියවරුන් ඇඹුල් මිදිඵල 29
කෑවෝය, දරුවන්ගේ දත් හිරිවැටී
තිබේයයි ඒ දවස්වලදී තවත් කියනු
නොලැබේ. නුමුත් එකිනෙකා තම 30
තමාගේම අයුතුකම නිසා නසින්නේය.
යමෙක් ඇඹුල් මිදිඵල කන්නේද ඔහුගේම
දත් හිරිවැටෙන්නේය.

## ස්වාමීන්වහන්සේගේ අලුත් ගිවිසුම

බලව, මා විසින් ඉශ්‍රායෙල් වංශය 31
සහ යූද වංශය සමග අලුත් ගිවිසුමක්
කරන දවස් පැමිණෙන්නේයයි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. ඒ වනාහි මිසර 32
දේශයෙන් ඔවුන්ගේ පියවරුන් ගෙනෙන
පිණිස මා ඔවුන්ගේ අත ඇල්ලූ දවසේදී
ඔවුන් සමග කළ ගිවිසුම වාගේ
නොවේය; මම ඔවුන්ට ස්වාමිපුරුෂයෙක්ව
සිටියෙමි නුමුත් ඔව්හු ඒ මාගේ
ගිවිසුම කඩකළෝයයි **ස්වාමීන්වහන්සේ**

*එනම්—ඉශ්‍රායෙල් කන්‍යාව
ස්වාමීන්වහන්සේට ඇලුම්වන්නීය.

33 කියනසේක. නුමුත් ඒ දවස්වලට පසු
මා ඉශ්‍රායෙල් වංශය සමග කරන
ගිවිසුම මේයයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. මම මාගේ ව්‍යවස්ථාව ඔවුන් තුළම
තබා, ඒක ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි;
මම ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි,
ඔව්හුද මාගේ සෙනඟ වන්නෝය.
34 **ස්වාමීන්වහන්සේ** හැඳිනගනින්නැයි කියා
එකිනෙකා තම තමාගේ අසල්වාසියාටද
සහෝදරයාටද තවත් නූගන්වන්නේය.
මක්නිසාද ඔවුන්ගෙන් කුඩා අය පටන්
ලොකු අය දක්වා සියල්ලෝම මා
හැඳිනගන සිටින්නෝය. එසේය, මම
ඔවුන්ගේ අපරාධය ක්ෂමාකරන්නෙමි,
ඔවුන්ගේ පාපයද තවත් සිහි
නොකරන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
35 කියනසේක. දවාලෙහි එළියක් පිණිස
ඉරද, රාත්‍රියෙහි එළියක් පිණිස සඳ
සහ තාරකාවල නියෝගද දෙන්නාවූ,
මුහුදේ රළ ඝෝෂාකරන ලෙස එය
කලඹන්නාවූ, සේනාවල **ස්වාමීන්වහන්සේ**
යන නාමය ඇත්තාවූ **ස්වාමීන්වහන්සේ**
36 මෙසේ කියනසේක. ඒ නියෝග මා
ඉදිරියෙන් පහවුණොත් ඉශ්‍රායෙල්
වංශයත් කවදාවත් මා ඉදිරියෙහි
ජාතියක්ව නොසිටින ලෙස පහවෙනවා
ඇතැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
37 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
යමෙකුට ඉහළ අහස මනින්ටත් පහත
පොළොවේ අත්තිවාරම් සොයා දැනගන්ටත්
පුළුවන් නම් මමත් මුළු ඉශ්‍රායෙල් වංශය
ඔවුන් කළ සියල්ල නිසා එපාකරන්නෙමියි
38 **ස්වාමීන්වහන්සේ** කියනසේක. බලව,
හනනෙල්ගේ කොත පටන් කොනේ
දොරටුව දක්වා **ස්වාමීන්වහන්සේ** උදෙසා
නුවර ගොඩනගනු ලබන දවස්
39 පැමිණෙන්නේය. මනින ලනුව තවත් දුරට
ගාරෙබ් හෙල දක්වා කෙළින් ඉස්සරහට
ඇදී ගෝවාය දක්වා වටේට පැමිණෙයි.
40 මළකඳන් සහ අළු දමන මුළු මිටියාවතද,
කිද්‍රොන් ඔය දක්වාද, නැගෙනහිරට
තිබෙන අශ්ව දොරටුවේ කොන දක්වාද
සියලු පිට්ටනි **ස්වාමීන්වහන්සේට**
ශුද්ධවන්නේය; එය තවත් සදාකාලේටම
උදුරනු නොලබන්නේය, හෙළාදමනු
නොලබන්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක.

## හනමෙල්ගේ කෙත මිලේට ගැනීම. එහි අර්ථය ස්වාමීන්වහන්සේ විසින් කියාදීම

32 යූදාහි රජවූ ශෙදෙකියාගේ දසවෙනි
අවුරුද්ද වන නෙබුකද්රෙශර්ගේ
දහඅටවෙනි අවුරුද්දේදී **ස්වාමීන්-
වහන්සේගෙන්** යෙරෙමියා වෙතට පැමිණි
වචනයය. ඒ කාලයේ බබිලෝනියේ රජුගේ 2
සේනාව යෙරුසලම වටලාගන සිටියාය.
අනාගතවක්තෘවූ යෙරෙමියා යූදාහි රජුගේ
ගෙදර පිහිටි හිරගෙයි මළුවේ හිර-
අඩස්සිවී සිටියේය. මක්නිසාද යූදාහි රජවූ 3
ශෙදෙකියා ඔහුට කථාකොට: නුඹ
අනාගතවාක්‍ය කියමින්—**ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: බලව, මම මේ නුවර
බබිලෝනියේ රජුගේ අතට භාරදෙන්නෙමි,
ඔහුද ඒක අල්වාගන්නේය; යූදාහි රජවූ 4
ශෙදෙකියාද කල්දිවරුන්ගේ අතින්
නොගැළවී, සැබවින්ම බබිලෝනියේ
රජුගේ අතට පාවාදෙනු ලැබ, ඔහුගේ
මුඛය මොහුගේ මුඛය සමග
කථාකරන්නේය, ඔහුගේ ඇස් මොහුගේ
ඇස් දකින්නේය. ඔහු ශෙදෙකියා 5
බබිලෝනියට ගෙනයන්නේය, මා මොහු
දෙස බලා විමසන තුරු මොහු එහි
සිටිනවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. නුඹලා කල්දිවරුන්ට
විරුද්ධව යුද්ධකළත් නුඹලාට ජය
නොලැබෙන්නේය කියා **ස්වාමීන්-
වහන්සේ** කියනසේකැයි නුඹ
කියන්නේ මක්නිසාදැයි කියා ඔහු
හිරඅඩස්සිකෙළේය.
තවද යෙරෙමියා කථාකොට: **ස්වාමීන්-** 6
**වහන්සේගේ** වචනය මා වෙතට
පැමිණ—බලව, නුඹේ පියාගේ 7
සහෝදරයාවූ ෂල්ලුම්ගේ පුත්‍රයා වන
හනමෙල් නුඹ ළඟට ඇවිත්: අනාතෝත්හි
තිබෙන මාගේ කෙත මිලේටගනින්න,
මක්නිසාද ඒක මිලේටගන්නා පිණිස
මිදීමේ බලය තිබෙන්නේ නුඹටය කියා
කියන්නේයයි කීවේය. මෙසේ මාගේ 8
පියාගේ සහෝදරයාගේ පුත්‍රවූ හනමෙල්

**ස්වාමීන්වහන්සේගේ** වචනය ලෙස
හිරගෙයි මළුවට මා ළඟට ඇවිත්: අනේ
බෙන්යමින් දේශයේ අනාතෝත්හි තිබෙන
මාගේ කෙත මිලේටගනින්න. මක්නිසාද
උරුමයේ අයිතිවාසිකම තිබෙන්නේ
තුඹටය, නිදහස්කරගැනීමත් තුඹට
අයිතිය; තුඹම ඒක මිලේට ගනින්නැයි
කීය. එවිට මෙය **ස්වාමීන්වහන්සේගේ**
9 වචනය බව දැනගතිමි. මම වනාහි
අනාතෝත්හි තිබෙන කෙත මාගේ
පියාගේ සහෝදරයාගේ පුත්‍රවූ
හනමෙල්ගෙන් මිලේටගෙන, එහි මිල
වන රිදී ෂෙකෙල් දහහතක් ඔහුට
10 කිරාදුනිමි. මම ඔප්පුව අත්සන් කර,
මුද්‍රකොට, සාක්ෂිකාරයන් කැඳවාගෙන,
11 මිල ඔහුට තරාදියෙන් කිරාදුනිමි. මම
ව්‍යවස්ථාව සහ සිරිත ලෙස මුද්‍රකර
තිබුණු විකුණුම්-ඔප්පුවත් නොවසා
12 තිබුණු එකත් රැගෙන, මාගේ පියාගේ
සහෝදරයාගේ පුත්‍රවූ හනමෙල්
ඉදිරියේදීද හිරගෙයි මළුවේ හිඳගන
උන්නාවූ සියලු යුදෙව්වන් ඉදිරියේදීද
විකුණුම්-ඔප්පුව මාසේයාගේ පුත්‍රයා
වන නේරියාගේ පුත්‍රවූ බාරුක්ට දුනිමි.
13 මම ඔවුන් ඉදිරියේදී බාරුක්ට අණකොට:
14 ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: තුඹ මේ
ඔප්පු එනම් මුද්‍රකර තිබෙන මේ
විකුණුම්-ඔප්පුවත් නොවසා තිබෙන මේ
ඔප්පුවත් රැගෙන බොහෝ කල් පවතින
පිණිස මැටි භාජනයක තබාපන්න.
15 මක්නිසාද ගෙවල්ද කෙත්ද මිදිවතුද
නැවත මේ දේශයෙහි මිලේටගන්නවා
ඇත කියා ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි කීවෙමි.
16 මා විසින් විකුණුම්-ඔප්පුව නේරියාගේ
පුත්‍රවූ බාරුක්ට භාරදුන් පසු මම **ස්වාමීන්-
වහන්සේට** මෙසේ යාච්ඤාකෙළෙමි:
17 අහෝ ස්වාමිවූ **දෙවියන්වහන්ස**, ඔබගේ
මහත් බලයෙන්ද දිගුකළ ඔබගේ
හස්තයෙන්ද ඔබ අහසත් පොළොවත්
මැවූසේක; ඔබට බැරිවූ කිසි දෙයක්
18 නැත්තේය. ඔබවහන්සේ දහස් ගණන්
මිනිසුන්ට කරුණාව පෙන්වනසේක, ඔබ
පියවරුන්ගේ අයුතුකම ගැන ඔවුන්ට
පසු ඔවුන්ගේ දරුවන්ගේ ළයට ප්‍රතිඵලද
දෙනසේක. ඔබ මහත්වූ, පරාක්‍රමවත්වූ,
සේනාවල **ස්වාමීන්වහන්සේය** යන
නාමය ඇත්තාවූ, මන්ත්‍රණයෙන් උතුම්ව 19
ක්‍රියාවෙන් බලවත්ව සිටින්නාවූ
දෙවියන්වහන්සේය. එකිනෙකාට තම
තමාගේ මාර්ග ලෙසද ක්‍රියාවල ඵල
ලෙසද දෙන පිණිස ඔබගේ ඇස් මනුෂ්‍ය
පුත්‍රයන්ගේ සෑම මාර්ග දෙස ඇරී තිබේ.
ඔබ අද දවස දක්වාම මිසර දේශයෙහිත් 20
ඉශ්‍රායෙල්වරුන්ද වෙන මනුෂ්‍යයන්ද
අතරෙහිත් ලකුණු සහ ආශ්චර්යයන්
තබා, අද තිබෙන ලෙස ඔබට නාමයක්
උපදවාගත්සේක. ඔබ ලකුණුවලින්ද 21
ආශ්චර්යවලින්ද බලවත් අතකින්ද
දිගුකළ හස්තයකින්ද මහත් භයානක-
කමකින්ද ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල්
මිසර දේශයෙන් පිටතට ගෙනැවිත්,
ඔවුන්ට දෙන ලෙස ඔබ ඔවුන්ගේ 22
පියවරුන්ට දිවුළාවූ, කිරිද මීපැණිද
ගලායන දේශයක් වන මේ දේශය ඔවුන්ට
දුන්සේක; ඔව්හුද ඇතුල්වී ඒක හිමි- 23
කරගත්තෝය; නුමුත් ඔවුන් ඔබගේ හඬට
කීකරුවුණේවත් ඔබගේ ව්‍යවස්ථාවේ
ප්‍රකාරයට හැසුරුණේවත් ඔවුන්ට
කරන්ට ඔබ අණකළ සියල්ල කළේවත්
නැත. ඉන්නිසා ඔබ මේ මුළු විපත්තිය
ඔවුන්ට පැමිණෙවූසේක. මෙන්න, නුවර 24
අල්ලාගැනීමට ගොඩැලි ඊට ළංවී තිබේ;
නුවරද කඩුවත් සාගතයත් වසංගතයත්
කරණකොටගෙන ඊට විරුද්ධව
යුද්ධකරන කල්දිවරුන් අතට දී තිබේ.
ඔබ කී දේ සිද්ධවී තිබේ; මෙන්න,
ඔබ ඒක දක්නාසේක. එහෙත්, අහෝ 25
ස්වාමිවූ **දෙවියන්වහන්ස**, නුවර කල්දි-
වරුන් අතට භාරදී තිබෙන නුමුත්:
කෙත මිලේට ගෙන සාක්ෂිකාරයන්
කැඳවාගනින්න කියා ඔබ මට
කීසේකැයි කීවෙමි.
එවිට **ස්වාමීන්වහන්සේගේ** වචනය 26
යෙරෙමියා වෙතට පැමිණ: බලව, මම 27
මාංසමයවූ සියල්ලන්ගේ දෙවියන්වහන්සේ
වන **ස්වාමීන්වහන්සේය**. මට කරන්ට
අමාරුවූ කිසි දෙයක් ඇද්ද?

28 එබැවින් **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: බලව, මම මේ නුවර
කල්දිවරුන් අතටත් බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් අතටත් භාරදෙමි, ඔහු
29 ඒක අල්ලාගන්නේය. මේ නුවරට
විරුද්ධව යුද්ධකරන කල්දිවරු ඇවිත්
මේ නුවර ගිනිලා, ඒකත්, මා
කෝපකරවන ලෙස යම් යම් ගෙවල
පියසි උඩ බාල්ට සුවඳ දුම් ඔප්පුකරන්ටත්
අන් දෙවිවරුන්ට පාන පූජා වගුරුවන්ටත්
යෙදුණේද, ඒ ගෙවලුත් දවා දමන්නෝය.
30 මක්නිසාද ඉශ්‍රායෙල් පුත්‍රයන් සහ යූද
පුත්‍රයන්ද තමුන්ගේ යෞවන කාලයේ
පටන් කරගන ආවේ මාගේ ඇස්
හමුයෙහි නපුරුව තිබෙන දේවල් පමණක්ය.
එසේය, ඉශ්‍රායෙල් පුත්‍රයන් තමුන්ගේ
අත්වල ක්‍රියාවෙන් මට කළේ මා
කෝපකරවන දේ පමණක්යයි **ස්වාමීන්-**
31 **වහන්සේ** කියනසේක. මක්නිසාද මේ
නුවර මා ඉදිරියෙන් පහකරවන හැටියට
ඒක ගොඩනැගූ ද පටන් අද දක්වා මාගේ
උදහසත් මාගේ කෝපයත් ඉපදවීමට
32 හේතුවක්ව තිබුණේය. එසේ වන්නේ
මා කෝපකරවන හැටියට ඉශ්‍රායෙල්
පුත්‍රයන්ද යූද පුත්‍රයන්ද ඔවුන්ගේ
රජවරුන්ද ඔවුන්ගේ අධිපතීන්ද ඔවුන්ගේ
පූජකයන්ද ඔවුන්ගේ අනාගතවක්තෘවරුන්ද
යූදහි මනුෂ්‍යයන්ද යෙරුසලමේ වැසියන්ද
කළාවූ ඔවුන්ගේ සියලු නපුරුකම් නිසාය.
33 ඔව්හු මට මුහුණ නොව පිට පෑවෝය.
මා අලුයම් වේලාවේ පටන්ම ඔවුන්ට
ඉගැන්වූ නුමුත් ඔව්හු අසා දැනමුතුකම
34 පිළි නොගත්තෝය. මාගේ නාමය තබා
තිබෙන ගෘහය අපවිත්‍ර කරන්ට ඔව්හු
තමුන්ගේ පිළිකුල් දේවල් එහි තැබුවෝය.
35 ඔව්හු තමුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද
මොලෙක්ට දවා කැපකරන්ට හින්නොම්
පුත්‍රයාගේ මිටියාවතෙහි තිබෙන බාල්ගේ
උස් තැන් ගොඩනැගුවෝය. එසේ
යූදවරුන් විසින් පව්කරන හැටියට ඒ
පිළිකුල කිරීමට මා ඔවුන්ට අණකළේවත්
ඒය මාගේ සිතට පැමුණුණේවත් නැත.
36 එහෙත් දැන්: කඩුවෙන්ද සාගතයෙන්ද
වසංගතයෙන්ද බබිලෝනියේ රජු අතට
දී තිබේයයි නුඹලා කියන මේ නුවර
ගැන ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: බලව, 37
මාගේ උදහසින්ද මාගේ කෝපයෙන්ද
තද අමනාපයෙන්ද මා විසින් ඔවුන්
පන්නා දැමූ සියලු රටවලින් ඔවුන්
රැස්කරගෙන, නැවත මේ ස්ථානයට
පමුණුවා, සුවසේ වාසයකරන්ට
සලස්වන්නෙමි. ඔව්හු මාගේ සෙනඟ 38
වන්නෝය, මමද ඔවුන්ගේ දෙවියන්-
වහන්සේ වන්නෙමි. ඔවුන්ටත් ඔවුන්ට 39
පසු ඔවුන්ගේ දරුවන්ටත් ශුභසිද්ධවෙන
පිණිස සෑම කල්හිම මා කෙරෙහි
භයවීමට එක සිතක්ද එක මාර්ගයක්ද
ඔවුන්ට දෙන්නෙමි. මම ඔවුන් වෙතින් 40
අහකට නොහැරී, ඔවුන්ට යහපත කරන
හැටියට ඔවුන් සමග සදාකාල ගිවිසුමක්
කොට, ඔවුන් මා වෙතින් අහක්ව
නොයන ලෙස මා කෙරෙහි භයවීම
ඔවුන්ගේ සිත්වල තබන්නෙමි. එසේය, 41
ඔවුන්ට යහපත කිරීම පිණිස මම ඔවුන්
කෙරෙහි ප්‍රීතිමත්වන්නෙමි, සැබවින්
මාගේ මුළු සිතින්ද මුළු ආත්මයෙන්ද
මේ දේශයෙහි ඔවුන් පිහිටුවන්නෙමි.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මෙසේ 42
කියනසේක: මා විසින් මේ සෙනඟ
පිටට මහත්වූ මේ මුළු විපත්තිය
පමුණුවා තිබෙන්නාක්මෙන් මම
ඔවුන්ට පොරොන්දුවූ මුළු යහපතත්
ඔවුන් පිටට පමුණුවන්නෙමි. මනුෂ්‍ය- 43
යෙක්වත් මෘගයෙක්වත් නැතුව ඒක
පාළුවක් වී කල්දිවරුන් අතට දී
තිබේයයි නුඹලා කියන මේ දේශයෙහි
කෙත් මිලේට ගනු ලබන්නේය.
මනුෂ්‍යයෝ බෙන්යමින් දේශයෙහිත් 44
යෙරුසලම අසල ස්ථානවලත් යූදහි
නුවරවලත් කඳු රටේ නුවරවලත්
පාත රටේ නුවරවලත් දකුණු දිශාවේ
නුවරවලත් කෙත් මිලේටගෙන, ඔප්පු
අත්සන්කොට, මුද්‍රාකර, සාක්ෂිකාරයන්
කැඳවාගන්නෝය. මක්නිසාද මම
ඔවුන්ගේ වාල්කම පහකරන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි
කීයේය.

## දාවිත්ගේ රාජ්‍යය සම්බන්ධ මහත් අනාගත කීම

**33** නවද යෙරෙමියා හිරගෙදර මළුවේ
හිරඅඩස්සියේ සිටිද්දී **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනය දෙවෙනි වර ඔහු
2 වෙතට පැමිණ මෙසේ කීය. ඒක කරන
**ස්වාමීන්වහන්සේද** ඒක පිහිටුවීමට ඒක
යොදන **ස්වාමීන්වහන්සේද** වූ, යෙහෝවඃ
යන නාමය ඇත්තාවූ තැනන්වහන්සේ
3 මෙසේ කියනසේක: මට යාච්ඤාකරපන්න,
එවිට මම නුඹට උත්තරදී, නුඹ
නොදන්න මහත්වූ අමාරු දේ නුඹට
4 පෙන්වන්නෙමි. ගොඩැලි නිසාත් කඩුව
නිසාත් බිඳිනු ලබන මේ නුවර ගෙවල්
ගැනද යූදහි රජවරුන්ගේ ගෙවල් ගැනද
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
5 මෙසේ කියනසේක: කල්දිවරුන්ට
විරුද්ධව යුද්ධකරන්ට ඔව්හු එති, නුමුත්
ඒ වනාහි මාගේ උදහසින්ද කෝපයෙන්ද
මා විසින් මැරුවාවූ, තමුන්ගේ සියලු
නපුරුකම් නිසා මේ නුවරින් මාගේ
මුහුණ සඟවාගන්ට මට සැලැස්සුවාවූ
මනුෂ්‍යයන්ගේ මළකඳන්වලින් ඒවා
6 පිරවීමටය. බලව, මම ඊට සනීපයත්
සුවයත් උපදවා, ඔවුන්ට සුවකොට,
බොහෝ සමාදානය සහ සැබෑකම
7 ඔවුන්ට ප්‍රකාශකරන්නෙමි. යූදවරුන්ගේ
වාල්කමත් ඉශ්‍රායෙල්වරුන්ගේ වාල්කමත්
මම පහකොට මුලදී මෙන් ඔවුන්
8 ගොඩනගන්නෙමි. ඔවුන් මට විරුද්ධව
කළාවූ ඔවුන්ගේ සියලු අයුතුකමෙන්
ඔවුන් පිරිසිදුකරන්නෙමි; මට විරුද්ධව
පව්කිරීමෙන්ද මට විරුද්ධව ද්‍රෝහිකම්-
කිරීමෙන්ද කළාවූ ඔවුන්ගේ සියලුම
9 අයුතුකම් ඔවුන්ට කමාකරන්නෙමි. මා
විසින් ඔවුන්ට කරන මුළු යහපත ගැන
අසන්නාවූ පොළොවේ සියලු ජාතීන්
අතරේ මේ නුවර මට ප්‍රීතිමත් නමක්ද
ප්‍රශංසාවක්ද ගෞරවයක්ද වන්නේය,
මා විසින් ඊට කරදෙන මුළු යහපත
නිසාත් සමාදානය නිසාත් ඔව්හු
10 භයව වෙවුලන්නෝය. **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: මනුෂ්‍යයෙක්වත්
මෘගයෙක්වත් නැතුව ඒක පාළුව
තිබේයයි නුඹලා කියන මේ ස්ථානය
වන මනුෂ්‍යයෙක්වත් වැසියෙක්වත්
මෘගයෙක්වත් නැතුව නාස්තිවී තිබෙන
යූදහි නුවරවලත් යෙරුසලමේ වීථිවලත්,
නැවත ප්‍රීති හඬද සන්තෝෂ හඬද 11
මනමාලයාගේ හඬද මනමාලියගේ
හඬද: සේනාවල **ස්වාමීන්වහන්සේට**
ස්තුතිකරපල්ලා, මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** යහපත්සේක, උන්වහන්සේගේ
කරුණාව සදාකාලේටම පවත්නේයයි
කියන්නන්ගෙන් **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට ස්තුති පූජා ගෙනෙන්නන්ගෙන්
හඬද ඇසෙනවා ඇත. මක්නිසාද
මම මුලදී මෙන් දේශයේ වාල්කම
පහකරන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. සේනාවල **ස්වාමීන්වහන්සේ** 12
මෙසේ කියනසේක: මනුෂ්‍යයෙක්වත්
මෘගයෙක්වත් නැතුව පාළුව තිබෙන මේ
ස්ථානයෙහිද එහි සියලු නුවරවලද
තමුන්ගේ රැළ ලග්ගවන එඬේරුන්ගේ
වාසයක් නැවත වන්නේය. කඳු රටේ 13
නුවරවලද පාත රටේ නුවරවලද දකුණු
දිශාවේ නුවරවලද බෙන්යමින් දේශයෙහිද
යෙරුසලම අසල ස්ථානවලද යූදහි
නුවරවලද බැටළුවන් ගණන්කරන්නාගේ
අත් යටින් රැළවල් නැවත යනවා ඇතැයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
බලව, ඉශ්‍රායෙල් වංශය ගැනත් යූද 14
වංශය ගැනත් මා කියා තිබෙන ඒ
යහපත් වචනය මා විසින් ඉෂ්ටකරන
දවස් පැමිණෙන්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. ඒ දවස්වලදීත් ඒ 15
කාලයටත් මම දාවිත්ට ධර්මිෂ්ඨකමේ
පැළෑටියක් ලියලවන්නෙමි; උන්වහන්සේ
ධර්මිෂ්ඨකමත් යුක්තියත් දේශයෙහි
ඉෂ්ටකරනවා ඇත. ඒ දවස්වලදී 16
යූද ගළවනු ලබන්නේය, යෙරුසලමේ
වැසියෝද සුවසේ වාසයකරන්නෝය.
ඇට කියනු ලබන්නාවූ නාමය මේය:
**ස්වාමීන්වහන්සේ** අපේ ධර්මිෂ්ඨකමය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** මෙසේ 17
කියනසේක: ඉශ්‍රායෙල් වංශයේ
සිංහාසනයෙහි හිඳීමට දාවිත්ගෙන්
කෙනෙක් කවදාවත් නැතුව නොයන්නේය;
එසේම දවන පූජා ඔප්පුකිරීමටත් ආහාර 18
පූජාව දවීමටත් යාග පූජා නිතරම
ඔප්පු කිරීමටත් ලෙවීවරුන් වන
පූජකයන්ගෙන් මා ඉදිරියෙහි කෙනෙක්

19 නැතුව් නොයන්නේයයි කීසේක. තවද
**ස්වාමීන්වහන්සේගේ** වචනය යෙරෙමියා
වෙතට පැමිණ: **ස්වාමීන්වහන්සේ** මෙසේ
20 කියනසේක–දවාලත් රාත්‍රියත් ඒවායේ
නියම් වේලාවලදී නොපැමිණෙන
හැටියට දවාල ගැන තිබෙන මාගේ
ගිවිසුමත් රාත්‍රිය ගැන තිබෙන මාගේ
ගිවිසුමත් නුඹලාට අවලංගු කරන්ට
21 පුළුවන් නම්, මාගේ මෙහෙකරුවූ දාවිත්ගේ
සිංහාසනයෙහි රජකම් කිරීමට ඔහුට
පුත්‍රයෙකු නැතුව යන හැටියට, ඔහු
සමගද මාගේ සේවකයන්වූ පූජකයන්
වන ලෙවීවරුන් සමගද ඇති මාගේ
22 ගිවිසුමත් අවලංගුවන්නේය. අහස් සේනාව
ගණන්කරන්ටවත් මුහුදු වැලි මනින්ටවත්
බැරුවාක්මෙන් මාගේ මෙහෙකරුවාවූ
දාවිත්ගේ වංශයද මට සේවයකරන
ලෙවීවරුන්ද වැඩිකරන්නෙමියි කීය.
23 තවත් **ස්වාමීන්වහන්සේගේ** වචනය
යෙරෙමියා වෙතට පැමිණ මෙසේ කීය:
24 **ස්වාමීන්වහන්සේ** තෝරාගත් වංශ
දෙක උන්වහන්සේ ඒපාකළසේක කියා
මේ සෙනඟ කී දේ නුඹ කල්පනාකරන්නේ
නැද්ද? මෙසේ ඔව්හු මාගේ සෙනඟ
සුළුකොට මොව්හු මින්මතු ජාතියක්ව
25 නොසිටින්නෝයයි කියති. **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක–දවාලද
රාත්‍රියද ගැන තිබෙන මාගේ ගිවිසුම
නොපවතින්නේ නම්, අහසේත්
පොළොවේත් නියෝග මා විසින්
26 පැනෙවුවේ නැත්නම්, මම යාකොබ්ගේද
මාගේ මෙහෙකරුවාවූ දාවිත්ගේද වංශයත්
ඒපාකොට, ඔහුගේ වංශයෙන් කෙනෙක්
ආබ්‍රහම්ගේද ඊසාක්ගේද යාකොබ්ගේද
වංශය කෙරෙහි ආණ්ඩුකිරීමට
නොගෙන සිටින්නෙමි. මක්නිසාද
මම ඔවුන්ගේ වාල්කම පහකොට
ඔවුන්ට අනුකම්පාකරන්නෙමි.

## ශෙදෙකියා වාලට ගෙනයනු ලැබීම ගැන පණිවිඩය

**34** බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර්ද
ඔහුගේ මුළු සේනාවද ඔහුගේ
ආණ්ඩුව යටතේ තිබුණු පොළොවේ
සියලු රාජ්‍යවල්ද සියලු ජනයන්ද
යෙරුසලමට සහ ඊට අයිති සියලු
නුවරවලටත් විරුද්ධව යුද්ධකරද්දී
**ස්වාමීන්වහන්සේගෙන්** යෙරෙමියා
වෙතට පැමිණි වචනයය. ඉශ්‍රායෙල්ගේ 2
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: නුඹ ගොස් යූදහි රජවූ
ශෙදෙකියාට කථාකොට මෙසේ
කියාපන්න–**ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: බලව, මම මේ නුවර
බබිලෝනියේ රජු අතට පාවාදෙමි, ඔහු
ඒක ගින්නෙන් දවාදමන්නේය. නුඹද 3
ඔහුගේ අතින් නොගැළවී, සැබවින් අසුවී,
ඔහු අතට දෙනු ලබන්නෙහිය; නුඹේ
ඇස්ද බබිලෝනියේ රජුගේ ඇස් දකිනවා
ඇත, ඔහුගේ මුඛයද නුඹේ මුඛය සමග
කථාකරනවා ඇත, නුඹ බබිලෝනියට
පැමිණෙනවා ඇත. එහෙත් යූදහි 4
ශෙදෙකියා රජ්ජුරුවෙනි, **ස්වාමීන්-
වහන්සේගේ** වචනය අසන්න. **ස්වාමීන්-
වහන්සේ** නුඹ ගැන මෙසේ කියනසේක:
නුඹ කඩුවෙන් නොමැරී, සමාදානයෙන් 5
නසින්නෙහිය; නුඹට පළමුවෙන් සිටි
ප්‍රථම රජවරුන් වන නුඹේ පියවරුන්
ගැන පැවැත්තුවාවූ දැවීම් මෙන් නුඹ
ගැනත් දැවීමක් පවත්වා: අහෝ
**ස්වාමිනි!** කියා නුඹ ගැන විලාපකියනවා
ඇත, මක්නිසාද ඒ වචනය කීවේ
මමයයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
බබිලෝනියේ රජුගේ සේනාවද 6
යෙරුසලමටත් ඉතුරුව තිබුණු යූදහි
සියලුම නුවරවලටත් ලාකීෂ්ටත්
අසේකාටත් විරුද්ධව යුද්ධකරමින්
සිටි කල්හි, අනාගතවක්තෘවූ යෙරෙමියා 7
යූදහි රජවූ ශෙදෙකියාට මේ සියලු
වචන යෙරුසලමේදී කීවේය; මක්නිසාද
යූද නුවරවල් අතරෙන් මේවා පමණක්
බලකොටු නුවරවල්ව ඉතුරුව තිබුණේය.

## නිදහස ලත් දසයන් වාල්කර ගැනීමට දඬුවම්

එක එකා විසින් තම තමාගේ හෙබ්‍රෙව් 8
වැඩකාරයාත් තම තමාගේ හෙබ්‍රෙව්
වැඩකාරීත් නිදහස්කර හැර, කිසිවෙක්
තමාගේ සහෝදරයින් වන යූදවරුන්වූ
ඔවුන් යටත්කර නොගෙන සිටින හැටියට
ඔවුන්ට නිදහස ප්‍රකාශකිරීමට, ශෙදෙකියා 9

රජු යෙරුසලමේ සිටි මුළු සෙනඟ සමග
ගිවිසුමක් කළ පසු ස්වාමීන්වහන්සේගෙන්
යෙරෙමියා වෙතට පැමිණි වචනයය.
10 එක එකා තම තමාගේ වැඩකාරයාද
තම තමාගේ වැඩකාරීද තවත් යටත්කර
නොගෙන ඔවුන් නිදහස්කර හරින
හැටියට ගිවිසුමට ඇතුළත්වූ සියලු
අධිපතීහුද මුළු සෙනඟද කීකරුවූණෝය;
11 කීකරුවී ඔවුන් යන්ට හැරියෝය. එහෙත්
පසුව ඔව්හු හැරී තමුන් විසින් නිදහස්කර
හැරිය වැඩකාරයන්ද වැඩකාරියන්ද
නැවත ගෙනැවිත් වැඩකාරයන් සහ
වැඩකාරියන් කොට බලාත්කාරයෙන්
12 තබාගත්තෝය. එබැවින් ස්වාමීන්-
වහන්සේගේ වචනය ස්වාමීන්වහන්සේගෙන්
යෙරෙමියා වෙතට පැමිණ මෙසේ කීය.
13 ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක: මම තුඹලාගේ
පියවරුන් මිසර දේශය වන වහල්කමේ
ගෙයින් ගෙනා දවසේදී ඔවුන් සමග
14 ගිවිසුමක් කරමින්—එක එකා තම
තමාට විකුණනු ලැබ හය අවුරුද්දක්
තමාට වැඩකළාවූ තමාගේ සහෝදරවූ
හෙබ්‍රෙව්වා අවුරුදු හතක කෙළවරේදී
තමා වෙතින් නිදහස්කර හැරිය යුතුයයි
කීවෙමි. එහෙත් තුඹලාගේ පියවරු මට
ඇහුම්කන්දුන්නේවත් තමාගේ කන්
15 යොමුකළේවත් නැත. නුමුත් තුඹලා
අලුතකදී හැරී, එක එකා තම තමාගේ
අසල්වාසියාට නිදහස ප්‍රකාශකිරීමෙන්
මාගේ ඇස් හමුයෙහි හරිව තිබෙන දේ
කොට, මාගේ නාමය තබා තිබෙන
ගෘහයෙහි මා ඉදිරියේදී ගිවිසුමක්
16 කළෝය. එහෙත් තුඹලා හැරී මාගේ
නාමය කෙලෙසමින්, තමුන්ගේ කැමැත්ත
ලෙස යන්ට තුඹලා එක එකා
නිදහස්කර හැරියාවූ තම තමාගේ වැඩ-
කාරයාද වැඩකාරීද නැවත ගෙනැවිත්,
තුඹලාට වැඩකාරයන්ද වැඩකාරියන්ද
වීමට ඔවුන්ට බලාත්කාරකළහුය.
17 එබැවින් ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක: තුඹලා එක එකා තම
තමාගේ සහෝදරයාටත් තම තමාගේ
අසල්වාසියාටත් නිදහස ප්‍රකාශ-
කරන්ට තුඹලා මට ඇහුම්කන්දුන්නේ
නැත. බලව, කඩුවටත් වසංගතයටත්
සාගතයටත් අසුවීමට තුඹලාට මම
නිදහස ප්‍රකාශකරමි; පොළොවේ සියලු
රාජ්‍යයන් අතරෙහි තුඹලා ඔබමොබ
විසිරයන්ට සලස්වන්නෙමියි ස්වාමීන්-
වහන්සේ කියනසේක. මාගේ ගිවිසුම 18
කඩකළාවූ, වස්සෙක් දෙපළුකොට ඒ
පළු අතරෙන් ගොස් මා ඉදිරියෙහි
කරගත් ගිවිසුමේ වචන ඉෂ්ට නොකළාවූ
මනුෂ්‍යයන් වන යූදහි අධිපතීන්ද 19
යෙරුසලමේ අධිපතීන්ද නපුංසකයන්ද
පූජකයන්ද වස්සාගේ පළු අතරෙන්
ගියාවූ දේශයේ මුළු සෙනඟද, ඔවුන්ගේ 20
සතුරන් අතටත් ඔවුන්ගේ ප්‍රාණය
හානිකරන්ට සොයන්නන් අතටත්
පාවාදෙන්නෙමි. ඔවුන්ගේ මළකඳන්
ආකාශයේ පක්ෂීන්ටත් පොළොවේ
මෘගයන්ටත් ගොදුරු වන්නේය. මම 21
යූදහි රජවූ ශෙදෙකියාද ඔහුගේ
අධිපතීන්ද ඔවුන්ගේ සතුරන් අතටත්
ඔවුන්ගේ ප්‍රාණය හානිකරන්ට
සොයන්නන් අතටත් තුඹලා වෙතින්
අහක්ව ගිය බබිලෝනියේ රජුගේ සේනාව
අතටත් පාවාදෙන්නෙමි. බලව, මම 22
අණකොට මේ නුවර කරා නැවත ඔවුන්
ගෙනෙන්නෙමි; ඔව්හු ඊට විරුද්ධව
යුද්ධකොට, ඒක අල්ලා, ගින්නෙන් දවා
දමන්නෝය. වැසියෙක් නොසිටින ලෙස
මම යූදහි නුවරවල් පාළුවක් කරන්නෙමියි
ස්වාමීන්වහන්සේ කියනසේකැයි කීවේය.

## රේකාබ්වරුන්ගේ විශ්වාසකම සහ යුදෙව්වරුන්ගේ අකීකරුකම

35 යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ
යෙහෝයාකීම්ගේ දවස්වලදී
ස්වාමීන්වහන්සේගෙන් යෙරෙමියා
වෙතට පැමිණි වචනය මේය: තුඹ 2
රේකාබ්වරුන්ගේ වංශය ළඟට ගොස්
ඔවුන් සමග කථාකොට, ස්වාමීන්-
වහන්සේගේ ගෘහයේ ඇතුල් ගෙයකට
ඔවුන් කැඳවාගන ඇවිත්, ඔවුන්ට
මුද්‍රිකපානය බොන්ට දීපන්නැයි කීය.
එකල මම හබශ්ශිනියාගේ පුත්‍රයා වන 3
යෙරෙමියාගේ පුත්‍රවූ යාසනියාද ඔහුගේ

සහෝදරයන්ද ඔහුගේ සියලු පුත්‍රයන්ද
රේකාබ්වරුන්ගේ මුළු වංශයද
4 අඬගසාගෙන, **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි ෂල්ලුම්ගේ පුත්‍රවූ දොරපාලයාවූ
මයසේයාගේ ඇතුල්ගෙට ඉහළින්
තිබුණාවූ, අධිපතීන්ගේ ඇතුල්ගෙට යාව
තිබුණාවූ, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා
වන ඉග්දලියාගේ පුත්‍රවූ හානාන්ගේ
පුත්‍රයන්ගේ ඇතුල්ගෙට ඇවිත්,
5 මුද්‍රිකපානය පුරවා තිබුණු භාජන සහ
කුසලාන් රේකාබ් වංශයේ පුත්‍රයන්
ඉදිරියෙහි තබා: මුද්‍රිකපානය බීපල්ලායයි
6 කීමි. නුමුත් ඔව්හු: අපි මුද්‍රිකපානය
නොබොම්හ. මක්නිසාද අපේ පියවූ
රේකාබ්ගේ පුත්‍රවූ යෝනාදබ් අපට
අණකරමින්—නුඹලාවත් නුඹලාගේ
පුත්‍රයෝවත් කිසිකලක මුද්‍රිකපානය
7 නොබී සිටපල්ලා. ගෙයක් ගොඩ-
නගන්ටවත් බීජ වපුරන්ටවත් මිදි වත්තක්
වවන්ටවත් අයිතිකරගන්ටවත් එපා.
නුඹලා පොරොත්තුව සිටින දේශයෙහි
බොහෝ දවස් ජීවත්වන පිණිස
නුඹලාගේ සියලුම දවස්වල කූඩාරම්වල
8 වාසයකරපල්ලායයි කීවේය. අපි එනාහි
අපේ පියවූ රේකාබ්ගේ පුත්‍රවූ යෝනාදබ්
අපට අණකළ සියල්ල ගැන ඔහුගේ
හඬට කීකරුවීමුව, කිසිකලක අපිවත්
අපේ භාර්යාවෝවත් අපේ පුත්‍රයෝවත්
9 අපේ දූවරුවත් මුද්‍රිකපානය නොබී, අපට
වාසයකිරීමට ගෙවලුත් ගොඩ නොනගා
සිටිමුව; අපට මිදිවත්තක්වත් කෙතක්වත්
10 බීජවත් නැත. අපි කූඩාරම්වල
වාසයකොට, අපේ පියවූ යෝනාදබ්ට
කීකරුව, ඔහු අපට අණකළ සියල්ල
11 ලෙස කර සිටිමුව. නුමුත් බබිලෝනියේ
රජවූ නෙබුකද්රෙශර් දේශයට විරුද්ධව
ආ කල අපි කථාකොට: එරෙල්ලා,
අපි කල්දිවරුන්ගේ සේනාවද සිරියේ
සේනාවද නිසා යෙරුසලමට ඇතුල්-
වෙමුයයි කීවෙමුව; මෙසේ අපි
යෙරුසලමෙහි වාසයකරමුයයි කීවෝය.
12 එකල **ස්වාමීන්වහන්සේගේ** වචනය
යෙරෙමියා වෙතට පැමිණ මෙසේ කීය.
13 ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: නුඹ ගොස්
යූදහි මනුෂ්‍යයන්ටත් යෙරුසලමේ
වැසියන්ටත් මෙසේ කියාපන්න—මාගේ
වචනවලට කීකරුවෙන හැටියට නුඹලා
දනමුතුකම පිළිගන්නේ නැද්දයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක. රේකාබ්ගේ පුත්‍රවූ 14
යෝනාදබ් මුද්‍රිකපානය බොන්ට එපාය
කියා තමාගේ පුත්‍රයන්ට අණකළ වචන
ඉෂ්ට කරනලද්දේය. ඔව්හු අද දක්වා
ඒවා නොබී, තමුන්ගේ පියාගේ ආඥාවට
කීකරුවෙති. එහෙත් මා අලුයම් වේලාවේ
පටන්ම නුඹලාට කථාකළ නුමුත් නුඹලා
මට ඇහුම්කන්දුන්නේ නැත. මාගේ 15
සියලු සේවකයන්වූ අනාගතවක්තෘවරුන්
නුඹලා ළඟට එව්මි; අලුයම් වේලාවේ
පටන්ම එවා: නුඹලා එකිනෙකා තම
තමාගේ නපුරු මාර්ගයෙන් හැරී, අන්
දෙවිවරුන්ට සේවයකරන්ට ඔවුන් පස්සේ
නොගොස්, නුඹලාගේ ක්‍රියා හරි-
ගස්සාගනිල්ලා, එවිට නුඹලාටත්
නුඹලාගේ පියවරුන්ටත් මා විසින් දුන්
දේශයෙහි නුඹලා වාසයකරන්නහුයයි
කීවෙමි. එහෙත් නුඹලා කන් යොමු-
කළේවත් මට ඇහුම්කන්දුන්නේවත් නැත.
රේකාබ්ගේ පුත්‍රවූ යෝනාදබ්ගේ පුත්‍රයෝ 16
ඔවුන්ගේ පියා ඔවුන්ට අණකළ ආඥාව
ඉෂ්ටකළෝය, නුමුත් මේ සෙනඟ මට
ඇහුම්කන් නුදුන්නෝය. එබැවින් 17
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: බලව,
යූදවරුන්ටත් යෙරුසලමේ සියලු
වැසියන්ටත් විරුද්ධව මා විසින් කියා
තිබෙන මුළු විපත්තිය ඔවුන් පිට‍ට
පමුණුවන්නෙමි. මක්නිසාද මා ඔවුන්ට
කථාකළ නුමුත් ඔව්හු නැසුවෝය;
මා ඔවුන්ට අඬගැසූ නුමුත් ඔව්හු
උත්තර නුදුන්නෝයයි කියාපන්නැයි
කීසේක. තවද යෙරෙමියා රේකාබ්- 18
වරුන්ගේ වංශයට කථාකොට:
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: නුඹලාගේ
පියවූ යෝනාදබ්ගේ ආඥාවට නුඹලා
කීකරුව, ඔහුගේ සෑම ශික්ෂා රක්ෂාකර,
ඔහු නුඹලාට අණකළ සියල්ල ලෙස
කළ නිසා, සෑම කල්හිම මා ඉදිරියෙහි 19

සිටින්ට රේකාබ්ගේ පුත්‍රවූ යෝනාදබ්ගෙන්
කෙනෙක් නැතුව නොයන්නේයයි
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේකැයි කීවේය.

## අකුළන පොත ලිවීම. එය ප්‍රසිද්ධියේ කියවීම සහ දවාදැමීම

**36** යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ
යෙහෝයාකීම්ගේ සතරවෙනි
අවුරුද්දේදී මේ වචනය **ස්වාමීන්-**
**වහන්සේගෙන්** යෙරෙමියා වෙතට
2 පැමුණුණේය. නුඹ අකුළන පොතක්
රැගෙන, යොෂියාගේ දවස්වලදී මා නුඹට
කථාකළද පටන් අද දවස දක්වා
ඉශ්‍රායෙල්වරුන්ද යූදවරුන්ද සියලු
ජාතීන්ද ගැන මා විසින් නුඹට කී
3 සියලුම වචන එහි ලියාපන්න. මා විසින්
යූද වංශයට කරන්ට අදහස්කරන මුළු
විපත්තිය ගැන සමහරවිට ඔවුන් අසා,
මා විසින් ඔවුන්ගේ අයුතුකමත් පාපයත්
කමාකරන පිණිස ඒක ඒකා තම තමාගේ
නපුරු මාර්ගයෙන් හැරෙනවා ඇතැයි
4 කීය. එවිට යෙරෙමියා නේරියාගේ පුත්‍රවූ
බාරුක් කැඳවාගත්තේය; බාරුක්ද
**ස්වාමීන්වහන්සේ** යෙරෙමියාට කියා
තිබුණු උන්වහන්සේගේ සියලුම වචන
ඔහුගේ මුඛයෙන් අසා අකුළන
5 පොතක ලියුවේය. යෙරෙමියා බාරුක්ට
අණකරමින්; මම හිරකරනු ලැබ සිටිමි;
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයට ඇතුල්විය
6 නොහැක්කෙමි. එබැවින් නුඹ ඇතුල්වී,
නුඹ මාගේ මුඛයෙන් අසා ලියා තිබෙන
පොතෙන් **ස්වාමීන්වහන්සේගේ** වචන
උපවාස දවසේදී සෙනඟ අසන
පිණිස **ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි
කියවාපන්න; තමුන්ගේ නුවරවලින්
එන්නාවූ සියලු යූද මිනිසුන්ට ඇසෙන
පිණිස ඒවා ඔවුන්ට කියවාපන්න.
7 සමහරවිට ඔවුන් **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි කන්නලව් ඇතුව වැටී, ඒක
ඒකා තම තමාගේ නපුරු මාර්ගයෙන්
හැරෙනවා ඇත, මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** මේ සෙනඟට විරුද්ධව කියා
තිබෙන උදහස සහ කෝපය මහත්යයි
8 කීවේය. නේරියාගේ පුත්‍රවූ බාරුක්
අනාගතවක්තෘවූ යෙරෙමියා තමාට
අණකළ සියල්ල ලෙස කරමින්, **ස්වාමීන්-**
**වහන්සේගේ** වචන **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයේදී පොතෙන් කියෙවුවේය.
තවද යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ 9
යෙහෝයාකීම්ගේ පස්වෙනි අවුරුද්දේ
නවවෙනි මාසයේදී යෙරුසලමේ මුළු
සෙනඟද යූදහි නුවරවලින් යෙරුසලමට
ආ මුළු සෙනඟද **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි උපවාසයක් ප්‍රකාශකළෝය.
එවිට බාරුක් **ස්වාමීන්වහන්සේගේ** 10
ගෘහයෙහි ඉහළ මළුවේ **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයේ අලුත් දොරටුව ළඟ
තිබුණාවූ, ලේකම වන ෂාපාන්ගේ
පුත්‍රවූ ගෙමරියාගේ ඇතුල් ගෙයි සිට
යෙරෙමියාගේ වචන මුළු සෙනඟට ඇසෙන
පිණිස පොතෙන් කියෙවුවේය. ෂාපාන්ගේ 11
පුත්‍රයා වන ගෙමරියාගේ පුත්‍රවූ මීකායා
**ස්වාමීන්වහන්සේගේ** සියලු වචන
පොතෙන් ඇසූ කල, ඔහු රජගෙදරට 12
ලේකම්ගේ ඇතුල්ගෙට බැසගියේය.
එහි සියලු අධිපතියෝ වන එලිෂාමා
ලේකම්ද ෂෙමායාගේ පුත්‍රවූ දෙලායාද
අක්බෝර්ගේ පුත්‍රවූ එල්නාතාන්ද
ෂාපාන්ගේ පුත්‍රවූ ගෙමරියාද හනනියාගේ
පුත්‍රවූ ශෙදෙකියාද අනික් සියලු
අධිපතියෝද වාඩිවී උන්නෝය. එවිට 13
මීකායා සෙනඟට ඇසෙන පිණිස බාරුක්
පොත කියවද්දී තමා ඇසූ සියලු වචන
ඔවුන්ට දැන්නුවේය. සියලු අධිපතීහුද 14
කූෂිගේ පුත්‍රවූ ෂෙලෙමියාගේ පුත්‍රයා වන
නෙතනියාගේ පුත්‍රවූ යෙහූදී බාරුක් ළඟට
යවමින්: සෙනඟට ඇසෙන පිණිස නුඹ
කියෙවූ පොත අනින් රැගෙන වරෙන්නැයි
කියා ඇරියෝය. නේරියාගේ පුත්‍රවූ බාරුක්
පොත අතින් ගෙන ඔවුන් ළඟට ආයේය.
ඔව්හුද: ඉතින් ඉඳගෙන ඒක අපට 15
ඇසෙන්ට කියවාපන්නැයි ඔහුට කීවෝය.
බාරුක්ද ඔවුන්ට ඇසෙන්ට කියෙවුවේය.
තවද ඔව්හු ඒ සියලු වචන අසා, භයින් 16
යුක්තව, එකිනෙකා දෙසට හැරී: අපි
මේ සියලු වචන සැබවින් රජුට
දන්වන්නෙමුයයි බාරුක්ට කීවෝය. තවද 17
ඔව්හු: නුඹ ඔහුගේ මුඛයෙන් අසා මේ
සියලු වචන ලියුවේ කොහොමදැයි අපට
දන්වාපන්නැයි කියා බාරුක්ගෙන්

18 ඇසුවෝය. බාරුක් උත්තරදෙමින්: ඔහු
මේ සියලු වචන තමාගේ මුඛයෙන්ම
මට කියාදුන්නේය, මමද තීන්තෙන්
19 පොතෙහි ලිව්වෙමියි කීවේය. එවිට
අධිපතීහු: නුඹලා කොතන සිටිනවාද
කියා කිසිවෙකු දන නොගන්න ලෙස
නුඹත් යෙරෙමියාත් ගොස් සැඟවී
20 ඉඳිල්ලායයි බාරුක්ට කීවෝය. ඔව්හු
එලිෂාමා ලේකම්ගේ ඇතුල් ගෙයි පොත
තබා මළුවට රජු ළඟට ගොස් රජු
අසා සිටියදී ඒ සියලු වචන කීවෝය.
21 රජ තෙමේ පොත ගෙනෙන්ට යෙහුදී
යැව්වේය. ඔහු එලිෂාමා ලේකම්ගේ ඇතුල්
ගෙයින් ඒක ගෙනවුත්, රජුටත් රජු ළඟ
සිටි සියලු අධිපතීන්ටත් ඇසෙන ලෙස
22 ඒක කියෙව්වේය. නවවෙනි මාසයේදී
රජ ශීත සෘතු නිවාසයෙහි ඉඳගෙන
උන්නේය. ඔහු ඉදිරියෙහි ගිනි
භාජනයෙහි ගින්දර පත්තුවෙවී තිබුණේය.
23 යෙහුදී තීර තුන හතරක් කියෙවූ කල
රජ ලියන්නාගේ පිහියෙන් ඒක කපා
භාජනයෙහි තිබුණු ගින්නට දැමුවේය,
භාජනයෙහි තිබුණු ගින්නෙන් මුළු පොත
24 දලා ගියේය. එහෙත් රජවත් මේ සියලු
වචන ඇසූ ඔහුගේ සියලු සේවකයෝවත්
බියපත් නුවූවෝය, තමුන්ගේ වස්ත්‍ර
25 ඉරා නොගත්තෝය. තවද එල්නාතාන්ද
දෙලායාද ගෙමරියාද පොත නොදවන
ලෙස රජුගෙන් ඉල්ලා සිටියෝය. නුමුත්
26 ඔහු ඔවුන්ට ඇහුම්කන් නුදුන්නේය. රජ
එනාහි බාරුක් ලේකම සහ යෙරෙමියා
අනාගතවක්තෘ ගෙනෙන්ට රාජ පුත්‍රවූ
යෙරාමෙයෙල්ටත් අස්රීයෙල්ගේ පුත්‍රවූ
සෙරායාටත් අබ්දෙයෙල්ගේ පුත්‍රවූ
ෂෙලෙමියාටත් අණකෙළේය. නුමුත්
**ස්වාමීන්වහන්සේ** ඔවුන් සැඟවූසේක.
27 රජු ඒ පොතද බාරුක් යෙරෙමියාගේ
මුඛයෙන් අසා ලියූ වචනද දැවූ පසු,
**ස්වාමීන්වහන්සේගේ** වචනය යෙරෙමියා
28 වෙතට පැමිණ මෙසේ කීය: නුඹ නැවත
වෙන පොතක් රැගෙන යූදහි රජවූ
යෙහෝයාකීම් දැවුවාවූ පළමු පොතේ
තිබුණු ප්‍රථම වචන සියල්ලම ලියාපන්න.
29 යූදහි රජවූ යෙහෝයාකීම් ගැනත් මෙසේ
කියාපන්න—**ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: බබිලෝනියේ රජ ඇවිත්
මේ දේශය නාස්තිකර, මෙතනින්
මනුෂ්‍යයන්ද මෘගයන්ද පහකරදමන්නේය
කියා නුඹ මේ පොතෙහි ලියුවේ
මක්නිසාදැයි කියමින් නුඹ ඒක දවා-
දැමුවෙහිය. එබැවින් **ස්වාමීන්වහන්සේ** 30
යූදහි රජවූ යෙහෝයාකීම් ගැන මෙසේ
කියනසේක: ඔහුට දාවිත්ගේ සිංහාසනයෙහි
හිඳින්ට කෙනෙක් නොසිටින්නේය. ඔහුගේ
මළකඳ දවාලේ ග්‍රීෂ්මයටත් රාත්‍රියේ
ශීතලයටත් පිටත හෙළාදමනු ලබන්නේය.
මම ඔහුටත් ඔහුගේ වංශයටත් 31
සේවකයන්ටත් ඔවුන්ගේ අයුතුකම් නිසා
දඬුවම්කොට, ඔවුන් පිටටත් යෙරුසලමේ
වැසියන් පිටටත් යූදහි මනුෂ්‍යයන් පිටටත්
ඔවුන් ගැන මා කීවාවූ ඔවුන් නැසුවාවූ
සියලු විපත්ති පමුණුවන්නෙමියි කීවේය.
එවිට යෙරෙමියා වෙන පොතක් ගෙන 32
නේරියාගේ පුත්‍රවූ බාරුක් ලේකම්ට
දුන්නේය; ඔහුද යූදහි රජවූ යෙහෝයාකීම්
ගින්නෙන් දවාදැමුවාවූ පොතේ සියලු
වචන යෙරෙමියාගේ මුඛයෙන් අසා එහි
ලියුවේය. ඒ වාගේ තවත් බොහෝ
වචනත් ඒවාට එකතු කරනලද්දේය.

## නාස්තිකරන පිණිස කල්දිවරුන් පැමිණෙන බව දැනුම්දීම

37 යෙහෝයාකීම්ගේ පුත්‍රවූ කෝනියා
වෙනුවට බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් විසින් යූද දේශයෙහි
රජකමට පත්කළ යොෂියාගේ පුත්‍රවූ
ශෙදෙකියා රජව රජකම්කෙළේය. නුමුත් 2
ඔහුවත් ඔහුගේ සේවකයෝවත් දේශයේ
සෙනඟවත් **ස්වාමීන්වහන්සේ** අනාගත-
වක්තෘවූ යෙරෙමියා ලවා කියෙවූ
උන්වහන්සේගේ වචනවලට ඇහුම්කන්
නුදුන්නෝය.
එහෙත් ශෙදෙකියා රජ ෂෙලෙමියාගේ 3
පුත්‍රවූ යෙහුකල්ද පූජකවූ මයසේයාගේ
පුත්‍රවූ ශෙපනියාද අත: අනේ අප උදෙසා
අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේට**
යාච්ඤාකරපන්නැයි අනාගතවක්තෘවූ
යෙරෙමියාට කියා ඇරියේය. යෙරෙමියා 4
එනාහි සෙනඟ අතරේ යමින් එමින්
සිටියේය. මක්නිසාද ඒතාක්කල් ඔවුන්

5 ඔහු හිරගෙයි දමා තිබුණේ නැත. තවද
ඵාරාවෝන්ගේ සේනාව මිසරයෙන් පිටත්ව
ආවෝය. යෙරුසලම වටලාගත සිටි
කල්දිවරු ඔවුන් ගැන ආරංචි අසා
යෙරුසලම කෙරෙන් අහක්ව ගියෝය.
6 එවිට **ස්වාමීන්වහන්සේගේ** වචනය
අනාගතවක්තෘවූ යෙරෙමියා වෙතට
7 පැමිණ මෙසේ කීය: ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක–
මාගෙන් විභාගකරන්ට නුඹලා මා
වෙතට එවූ යූදහි රජුට මෙසේ කියාපල්ලා:
බලව, නුඹලාට උදව්වෙන්ට පිටත්ව
ආවාවූ ඵාරාවෝන්ගේ සේනාව තමුන්ගේ
දේශය වන මිසරයට හැරී යනවා ඇත.
8 කල්දිවරු හැරීඇවිත් මේ නුවරට විරුද්ධව
යුද්ධකොට, මේක අල්වා, ගින්නෙන්
9 දවාදමනවා ඇත. **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: සැබවින්ම
කල්දිවරුන් අප කෙරෙන් යනවා ඇත
කියා නොරැවටෙල්ලා; මවුන් යන්නේ
10 නැත. මක්නිසාද නුඹලාට විරුද්ධව
යුද්ධකරන කල්දිවරුන්ගේ මුළු
සේනාවට නුඹලා විසින් පහරදී, සැර
තුවාල ලත් මනුෂ්‍යයන් පමණක් එක
එකා තම තමාගේ කූඩාරමෙහි
ඔවුන්ගෙන් ඉතුරුවුණත්, ඔවුන් නැගිට
මේ නුවර ගින්නෙන් දවාදමනවා ඇත
යනුය.

## යෙරෙමියා හිරේ දමනු ලැබීම. රජු විසින් ඔහුට පහසුදීම

11 තවද ඵාරාවෝන්ගේ සේනාවට හයින්
කල්දිවරුන්ගේ සේනාව යෙරුසලම
12 කෙරෙන් ගිය කල, යෙරෙමියා බෙන්යමින්
දේශයේ සෙනඟ අතරේ තමාගේ උරුම
කොටස ලබාගන්නා පිණිස යෙරුසලමෙන්
13 පිටත්ව ගියේය. ඔහු බෙන්යමින්
දොරටුවට පැමිණි කල, හනනියාගේ පුත්‍රවූ
ෂෙලෙමියාගේ පුත්‍රයා වන ඉරියා නම්වූ
මුරපළේ මූලාදෑනියෙක් එහි සිටියේය;
ඔහු අනාගතවක්තෘවූ යෙරෙමියා
අල්ලාගෙන: නුඹ කල්දිවරුන්ට
14 එකතුවෙන්ට යන්නෙහියයි කීය. ඒක
බොරුවක්ය; මම කල්දිවරුන්ට
එකතුවෙන්ට නොයමියි යෙරෙමියා කීය.
නුමුත් ඉරියා යෙරෙමියාට ඇහුම්කන්
නොදී, ඔහු අල්වා, අධිපතීන් ළඟට
ගෙනගියේය. එවිට අධිපතීහු යෙරෙමියා 15
කෙරෙහි උදහස්වී, ඔහුට තළා,
යොනාතාන් ලේකම්ගේ ගෙයි ඔහු
හිරඅඩස්සිකළෝය; මක්නිසාද ඔවුන් ඒක
හිරගෙයක් කර තිබුණේය. යෙරෙමියා 16
හිරගෙයි බිම්ගෙවලට පැමිණ, එහි
බොහෝ දවස් සිටි පසු, ශෙදෙකියා
රජ ඔහු ගෙන්වා: **ස්වාමීන්වහන්සේගෙන්** 17
වචනයක් තිබේදැයි තමාගේ ගෙදරදී
රහසින් ඔහුගෙන් ඇසුවේය. යෙරෙමියාද:
තිබේයයි කියා–නුඹ බබිලෝනියේ
රජුගේ අතට අසුවෙන්නෙහියයි කීවේය.
තවද යෙරෙමියා ශෙදෙකියා රජුට 18
කථාකොට: මා හිරගෙයි දැමීමට
නුඹටවත් නුඹේ සේවකයන්ටවත් මේ
සෙනඟටවත් විරුද්ධව මා විසින් කළ
පාපය මොකද? බබිලෝනියේ රජ 19
නුඹටවත් මේ දේශයටවත් විරුද්ධව
නොඑන්නේය කියා නුඹලාට
අනාගතවාක්‍ය කීවාවූ නුඹලාගේ
අනාගතවක්තෘවරු ඉතින් කොයිද?
එබැවින් මාගේ ස්වාමිවූ රජ්ජුරුවෙනි, 20
අනේ මාගේ බස් අසා, මාගේ
කන්නලව්ව පිළිගෙන, මා නොනසින
පිණිස යොනාතාන් ලේකම්ගේ ගෙට
මා නැවත නැරිය මැනවයි කීවේය.
ශෙදෙකියා රජද, යෙරෙමියා හිරගෙයි 21
මළුවෙහි තබාගන්ටත් රොටි සියල්ලම
නුවරින් කම්මුතුවී යන තුරු දවස්පතා
රොටියක් රොටි සාදන්නන්ගේ වීථියෙන්
ඔහුට ගෙනදෙන්ටත් අණකෙළේය. මෙසේ
යෙරෙමියා හිරගෙයි මළුවෙහි සිටියේය.

## යෙරෙමියා වළකට දමනු ලැබීම. එයින් ගොඩගැනීම

38

එකල මත්තාන්ගේ පුත්‍රවූ
ෂෙපතියාද පෂ්හූර්ගේ පුත්‍රවූ
ගෙදලියාද ෂෙලෙමියාගේ පුත්‍රවූ යූකල්ද
මල්කියාගේ පුත්‍රවූ පෂ්හූර්ද යෙරෙමියා
මුළු සෙනඟට කී වචන ඇසුවෝය. එනම්, 2
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
මේ නුවර නවතින අය කඩුවෙන්ද
සාගතයෙන්ද වසංගතයෙන්ද මැරෙන්නෝය.

පිටතට කල්දිවරුන් වෙතට යන අය
ජීවත්වන්නෝය, මෙසේ ඔහු ජීවත්වන
ලෙස ඔහුගේ ප්‍රාණය ඔහුට කොල්ලයක්
3 මෙන් ලැබෙන්නේය. සැබවින් මේ නුවර
බබිලෝනියේ රජුගේ සේනාව අතට අසුවී
ඔහු ඒක අල්ලාගන්නේයයි **ස්වාමීන්-**
4 **වහන්සේ** කියනසේක යනුය. අධිපතීහු
රජුට කථාකොට: මේ මනුෂ්‍යයා මරනු
ලැබේවා; මක්නිසාද මෙසේ මෙබඳු වචන
කීමෙන් මොහු නුවර ඉතුරුව සිටින
යුද්ධකාරයන්ගේ අත්ද මුළු සෙනඟගේ
අත්ද බෙලහීනකරයි. එසේය, මේ
මනුෂ්‍යයා මේ සෙනඟට ශුභසිද්ධිය
නොව අන්තරායකරන්ට හදන්නේයයි
5 කීවෝය. ශෙදෙකියා රජද: මෙන්න, ඔහු
නුඹලාගේ අතෙහිය. නුඹලාට විරුද්ධව
කිසිවක් කරන්ට රජුට බැරියයි කීවේය.
6 එකල ඔව්හු යෙරෙමියා ගෙන හිරගෙයි
මළුවෙහි තිබුණු රාජ පුත්‍රවූ මල්කියාගේ
වළට ඔහු ලනුවලින් බැස්සෙවුවෝය.
වළේ වතුර නොව මඩ තිබුණේය.
7 යෙරෙමියා මඩේ එරුණේය. යෙරෙමියා
වළේ දැමූ බව රජගෙදර සිටි
නපුංසකයෙක්වූ කූෂිය ඒබෙද්-මෙලෙක්
අසා, බෙන්යමින් දොරටුවේ ඉඳගෙන හුන්
8 රජු වෙතට, රජගෙයින් නික්ම ගොස්
9 රජුට කථාකොට: මාගේ ස්වාමිවූ
රජ්ජුරුවෙනි, මේ මනුෂ්‍යයන් විසින් වළේ
දැමූ අනාගතවක්තෘවූ යෙරෙමියාට ඔවුන්
කළ සියල්ල නපුරුය; ඔහු සිටින තැනදී
බඩගින්නෙන් මැරෙනවා ඇත. මක්නිසාද
නුවර තවත් කෑමට රොටි නැතැයි කීය.
10 එවිට රජ කූෂිය ඒබෙද්-මෙලෙක්ට
අණකර: නුඹ සමග මෙතැනින්
මනුෂ්‍යයන් තිස්දෙනෙක් කැඳවාගෙන
ගොස්, අනාගතවක්තෘවූ යෙරෙමියා
මැරෙන්ට පළමුවෙන් ඔහු වළෙන්
11 ගොඩට ගනින්නැයි කීවේය. ඒබෙද්-
මෙලෙක්ද ඒ මනුෂ්‍යයන් තමා සමග
කැඳවාගෙන රජගෙදර ගබඩාව යටට
වැද, එතනින් පරණ රෙදි කැලිද පරණ
වැරහැලිද ගෙන, ඒවා වළ ඇතුළට
යෙරෙමියා ළඟට ලනුවලින් බෑවේය.
12 කූෂිය ඒබෙද්-මෙලෙක්: මේ පරණ රෙදි
කැලි සහ වැරහැලි නුඹේ කිහිලිවල
ලනු යට තබාගනින්නැයි යෙරෙමියාට
කීවේය. යෙරෙමියා එසේ කෙළේය. එවිට 13
ඔව්හු යෙරෙමියා ලනුවලින් ඇද වළෙන්
ගොඩට ගත්තෝය. යෙරෙමියා හිරගෙයි
මළුවේ සිටියේය.

## යටත්වෙන්ටය කියා රජුට දුන් අන්තිම අවවාදය

එවිට ශෙදෙකියා රජ අනාගතවක්තෘවූ 14
යෙරෙමියා **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
තුන්වෙනි දොරටුවට තමා ළඟට
ගෙන්වාගෙන, යෙරෙමියාට කථාකොට:
මම නුඹෙන් කාරණයක් අසමි; කිසිවක්
මාගෙන් නොසඟවන්නැයි කීය. මම 15
ඔබට දන්නුවොත් සැබවින් ඔබ මා
නොමරන්නෙහිද? මා ඔබට දැනමුතුකම්
දුන්නත් ඔබ මට ඇහුම්කන් දෙන්නේ
නැතැයි යෙරෙමියා ශෙදෙකියාට කීවේය.
එවිට ශෙදෙකියා රජ: මා විසින් නුඹ 16
මරන්නේවත් නුඹේ ප්‍රාණය හානිකරන්ට
සොයන ඒ මනුෂ්‍යයන් අතට නුඹ
පාවාදෙන්නේවත් නැතැයි මේ ප්‍රාණය
අපට මවාදුන් **ස්වාමීන්වහන්සේගේ**
ජීවිතය ගැන දිවුරමියි කියා,
යෙරෙමියාට රහසින් දිවුරුම්දුන්නේය.
එකල යෙරෙමියා ශෙදෙකියාට කථාකොට: 17
සේනාවල දෙවියන්වහන්සේ වන
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: නුඹ ඇත්තටම
බබිලෝනියේ රජුගේ අධිපතීන් ළඟට
පිටතට ගියොත් නුඹේ ප්‍රාණය
ජීවත්වන්නේය, මේ නුවරද ගිනිලනු
නොලබන්නේය; නුඹත් නුඹේ
වංශයත් ජීවත්වන්නෝය. එහෙත් නුඹ 18
බබිලෝනියේ රජුගේ අධිපතීන් ළඟට
පිටතට නොගියොත්, මේ නුවර
කල්දිවරුන් අතට අසුවන්නේය, ඔව්හු
ඒක ගිනිලන්නෝය, නුඹද ඔවුන්ගේ
අතින් ගැළවෙන්නේ නැතැයි කීවේය.
කල්දිවරුන්ට එකතුවූ යුදෙව්වන් මට 19
සරදම්කරන පිණිස ඔවුන් අතට මා
පාවාදේදෝ කියා ඔවුන්ට භයවෙමියි
ශෙදෙකියා රජ යෙරෙමියාට කීවේය.
එවිට යෙරෙමියා: ඔවුන් නුඹ පාවාදෙන්නේ 20
නැත. මා විසින් ඔබට කියන හැටියට
**ස්වාමීන්වහන්සේගේ** හඬට කීකරුවුණ

මැනවි; එයින් තුඹට ශුභසිද්ධවී තුඹේ
21 ප්‍රාණය ජීවත්වන්නේය. එහෙත් තුඹ
යන්නේ නැතැයි කියතොත්, **ස්වාමීන්-**
**වහන්සේ** මට පෙන්වා තිබෙන වචනය
22 මෙසේය: බලව, යූදහි රජුගේ ගෙදර
ඉතුරුව සිටින සියලු ස්ත්‍රීන් බබිලෝනියේ
රජුගේ අධිපතීන් ළඟට ගෙනයනු
ලබනවා ඇත, ඔවුන් කථාකොට—තුඹේ
හිතමිත්‍රයෝ තුඹ පොළඹා තුඹෙන්
ජයගත්තෝය. තුඹේ පාද මඩේ එරුණු
විට ඔව්හු අහක්ව ගියෝයයි කියනවා
23 ඇත. තුඹේ සියලු භාර්යාවන්ද දරුවන්ද
කල්දිවරුන් ළඟට ගෙනයන්ට යෙදෙනවා
ඇත. තුඹත් ඔවුන්ගේ අතින් නොගැළවී
බබිලෝනියේ රජු අතට අසුවන්නෙහිය.
තුඹ මේ නුවරත් ගිනිලන්ට
24 සලස්වන්නෙහියයි කීවේය. ශෙදෙකියාද:
මේ වචන කිසිවෙක් දැන නොගනීවා,
එවිට තුඹ මරණයට පත්වන්නේ නැත.
25 නුමුත් මා තුඹ සමග කථාකළ බව
අධිපතීහු අසා තුඹ ළඟට ඇවිත්: තුඹ
රජුට කීවේ මොකද කියාත් රජු තුඹට
කීවේ මොකද කියාත් අපෙන් නොසඟවා
අපට දන්වාපන්න, එවිට අපි තුඹ
26 නොමරන්නෙමුයයි තුඹට කීවොත්—මා
යොනාතාන්ගේ ගෙයි නොමැරෙන
පිණිස එහි මා නැවත නාරින ලෙස
මාගේ කන්නලව්ව රජ්ජුරුවන් ඉදිරියෙහි
ඔප්පුකෙළෙමියි කියාපන්නැයි යෙරෙමියාට
27 කීවේය. එවිට සියලු අධිපතීහු යෙරෙමියා
ළඟට ඇවිත් ඔහුගෙන් විචාළෝය. රජු
අණකළ මේ සියලු වචනවල හැටියට
ඔහු ඔවුන්ට දන්නුවේය. ඔව්හු නිශ්ශබ්දවී
ඔහු වෙතින් ගියෝය; මක්නිසාද ඒ
කාරණය දැනගන්ට යෙදුණේ නැත.
28 මෙසේ යෙරෙමියා යෙරුසලම අසුවුණු
දවස දක්වා හිරගෙයි මළුවේ සිටියේය.

## යෙරුසලම අල්වාගැනීම. යෙරෙමියා නිදහස්වීම. එබෙද්-මෙලෙක්ට පොරොන්දුව

යෙරුසලම අසුවූ කල්හි, යූදහි
39 රජවූ ශෙදෙකියාගේ රජකම්-
කිරීමේ නවවෙනි අවුරුද්දේ
දසවෙනි මාසයේදී බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් තමාගේ මුළු සේනාව
සමග යෙරුසලමට විරුද්ධව ඇවිත්
ඒක වටලාගත්තේය. ශෙදෙකියාගේ 2
එකොළොස්වෙනි අවුරුද්දේ සතරවෙනි
මාසයේ නවවෙනිද නුවර පවුර
බිඳිනලද්දේය. එවිට බබිලෝනියේ රජුගේ 3
සියලු අධිපතීහු එනම් නේර්ගල්-
ෂරෙශෙර්ද සම්ගර්-නෙබෝද සර්සෙකිම්ද
රබ්-සාරිස්ද නේර්ගල්-ෂරෙශෙර්ද
රබ්-මග්ද බබිලෝනියේ රජුගේ අනික්
සියලු අධිපතීහුද ඇවිත් මැද දොරටුවේ
හිඳගත්තෝය. තවද යූදහි රජවූ 4
ශෙදෙකියාද සියලු යුද්ධකාරයෝද
ඔවුන් දුටු විට, පවුරු දෙකට අතරේ
තිබෙන දොරටුවෙන් රජ උයනේ පාරෙන්
නුවරින් රාත්‍රියේ පිටත්ව පලාගියෝය.
රජද අරබා සමභූමියේ මාර්ගයෙන්
නික්ම ගියේය. නුමුත් කල්දිවරුන්ගේ 5
සේනාව ඔවුන් පස්සේ එළවාගන ගොස්,
යෙරිකෝවේ සමභූමිවලදී ශෙදෙකියාට
ළංවී ඔහු අල්ලා, හමාත් දේශයේ
රිබ්ලාහි සිටි බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් ළඟට ඔහු ගෙනගියෝය,
ඔහුද ඔහු ගැන තීන්දුව දුන්නේය. එවිට 6
බබිලෝනියේ රජ ශෙදෙකියාගේ පුත්‍රයන්
රිබ්ලාහිදී ඔහුගේ ඇස් ඉදිරියේ මැරීය.
බබිලෝනියේ රජ යූදහි සියලු
උත්තමයන්ද මැරීය. තවද ඔහු 7
ශෙදෙකියාගේ ඇස් අන්ධ කොට, ඔහු
බබිලෝනියට ගෙනයන පිණිස විලංගු
දම්මේය. කල්දිවරු රජ ගෙය සහ 8
සෙනඟගේ ගෙවලුත් ගිනිලා, යෙරුසලමේ
පවුරු කඩාදැමුවෝය. තවද රැකවලුන්ගේ 9
අධිපතියාවූ නෙබුසරදන් නුවර ඉතිරිවුණු
සෙනඟද සැහවී ඇවිත් තමාට එකතුවුණු
අයින්ද සෙනඟගෙන් ඉතිරිවුණු අනික්
අයින්ද අල්ලා බබිලෝනියට ගෙනගියේය.
එහෙත් කිසිවක් නැති දිළිඳු සෙනඟගෙන් 10
සමහරෙක් රැකවලුන්ගේ අධිපතියාවූ
නෙබුසරදන් යූද දේශයෙහි ඉතිරිකර
තබා, එකල්හිම ඔවුන්ට මිදිවතු සහ
කෙත්ද දුන්නේය. ඉක්බිති බබිලෝනියේ 11
රජවූ නෙබුකද්රෙශර් යෙරෙමියා ගැන
රැකවලුන්ගේ අධිපතියාවූ නෙබුසරදන්ට
අණකරමින්: තුඹ ඔහු රැගෙන, ඔහු 12

හොඳට බලාගෙන, ඔහුට කිසි අනතුරක්
නොකොට, ඔහු නුඹට කියන හැටියටම
13 ඔහුට කරපන්නැයි කීවේය. මෙසේ
ඊකවලුන්ගේ අධිපතියාවූ නෙබුසරදන්ද
නෙබුෂශ්බාන්ද රබ්-සාරීස්ද නේර්ගල්-
ෂරෙශෙර්ද රබ්-මග්ද බබිලෝනියේ
14 රජුගේ සියලු අධිපතීහුද, යෙරෙමියා
හිරගෙයි මළුවෙන් ගෙන්වාගෙන, ඔහු
ගෙදරට ගෙනයන පිණිස ෂාපාන්ගේ
පුත්‍රවූ අහිකාම්ගේ පුත්‍රයා වන ගෙදලියාට
භාරකළෝය. ඔහු සෙනඟ අතරෙහි
වාසයකෙළේය.

15 යෙරෙමියා හිරගෙයි මළුවේ හිර-
අඩස්සියේ සිටිද්දී ස්වාමීන්වහන්සේගේ
වචනය ඔහු වෙතට පැමිණ මෙසේ කීය:
16 නුඹ ගොස් කූෂිය ඒබෙද්-මෙලෙක්ට
කථාකොට: ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක-බලව, මම මාගේ වචන
මේ නුවර පිටට යහපත පිණිස නොව
විපත්ති පිණිස පමුණුවමි; ඒ දවසේදී
17 ඒවා නුඹ ඉදිරියෙහි ඉෂ්ටවන්නේය. එහෙත්
මම ඒ දවසේදී නුඹ ගළවන්නෙමියි
ස්වාමීන්වහන්සේ කියනසේක. නුඹ භයව
සිටින මනුෂ්‍යයන් අතට නුඹ අසුවෙන්නේ
18 නැත. සැබවින් නුඹ මුදගන්නෙමි,
නුඹ කඩුවෙන් වැටෙන්නේ නැත. නුඹ
මා කෙරෙහි විශ්වාසකළ බැවින්
නුඹේ ප්‍රාණය නුඹට කොල්ලයක්
මෙන් ලැබෙන්නේයයි ස්වාමීන්වහන්සේ
කියනසේකැයි කියාපන්නැයි කීවේය.

## යෙරෙමියා දේශයෙහි නැවතීම. ගෙදෙලියා අධිපතියා ලෙස පත්වීම

40 ඊකවලුන්ගේ අධිපතියාවූ
නෙබුසරදන් විසින් යෙරෙමියා
අල්ලා රාමායෙන් නිදහස්කර හැරිය
පසු ස්වාමීන්වහන්සේගෙන් ඔහු වෙතට
පැමුණුණු වචනයය. බබිලෝනියට
ගෙනයන්ට යෙරුසලමෙන්ද යූද රටෙන්ද
අල්ලාගනු ලැබූ සියල්ලන් අතරෙහි
ඔහු දම්වැල්වලින් බැඳ සිටියේය.
2 ඊකවලුන්ගේ අධිපතියා යෙරෙමියා
ගෙන්වාගෙන ඔහුට කථාකොට: නුඹේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ මේ ස්ථානයට
විරුද්ධව මේ විපත්තිය ගැන කීසේක.
ස්වාමීන්වහන්සේ ඒක පමුණුවා, උන්- 3
වහන්සේ කී ලෙස කළසේක; නුඹලා
ස්වාමීන්වහන්සේට විරුද්ධව පව්කොට,
උන්වහන්සේගේ හඬට කීකරු නොවී
සිටි නිසා, මේ දෙය නුඹලාට පැමුණුණේය.
ඉතින් නුඹේ අත් බැඳ තිබෙන දම්වැල්- 4
වලින් අද නුඹ මුදමි. මා සමඟ බබිලෝනියට
එන්ට නුඹට හොඳව පෙනේ නම් වරෙන්න,
මම නුඹව හොඳට බලාගන්නෙමි; නුමුත්
මා සමඟ බබිලෝනියට එන්ට නුඹට
නරකව පෙනේ නම් නැවතියන්න. මුළු
දේශය නුඹ ඉදිරියෙහිය; නුඹට යන්ට
හොඳව පහසුව පෙනෙන තැනකට
පලයන්නැයි ඔහුට කීවේය. ඔහු තවත් 5
හැරී ආපසු නොගොස් සිටියදී
නෙබුසරදන් කථාකොට: බබිලෝනියේ
රජු විසින් යූද නුවරවල ආණ්ඩුකාරකමට
පත්කළාවූ ෂාපාන්ගේ පුත්‍රයා වන
අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා ළඟට හැරී
ගොස්, නුඹ ඔහු වෙත සෙනඟ අතරෙහි
වාසයකරපන්න; නැත්නම් නුඹට යන්ට
පහසුයයි පෙනෙන කොතනට නුමුත්
පලයන්නැයි කීවේය. තවද ඊකවලුන්ගේ
අධිපතියා ඔහුට ආහාරත් තෑග්ගකුත්
දී ඔහු යන්ට හැරියේය. යෙරෙමියා 6
මිශ්පාට අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා
ළඟට ගොස්, දේශයේ ඉතිරිව සිටි සෙනඟ
අතරේ ඔහු වෙත වාසයකෙළේය.
පිටිසර සිටිය සේනාවල අධිපතීහුද 7
ඔවුන්ගේ මිනිස්සුද බබිලෝනියේ රජු
අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා දේශයේ
ආණ්ඩුකාරයා කොට පත්කළ බවත්
බබිලෝනියට ගෙන නොගිය දේශයේ
ඉතා දිළිඳුවූවන්ගෙන් පුරුෂයන්ද ස්ත්‍රීන්ද
දරුවන්ද ඔහුට භාරකළ බවත් ඇසූ
විට, නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්ද 8
කාරේයාගේ පුත්‍රයන්වූ යොහානාන් හා
යොනාතාන්ද තන්හුමෙත්ගේ පුත්‍රවූ
සෙරායාද නෙටොපාතිය ඒපයිගේ
පුත්‍රයෝද මයකාතියයාගේ පුත්‍රවූ
යෙසනියාද ඔවුන්ගේ මිනිස්සුද මිශ්පාට
ගෙදලියා ළඟට ආවෝය. ෂාපාන්ගේ 9
පුත්‍රයා වන අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා

ඔවුන්ටත් ඔවුන්ගේ මිනිසුන්ටත්
දිවුරුම්දෙමින් කථාකොට: කල්දිවරුන්ට
සේවයකරන්ට භය නොවෙල්ලා.
දේශයෙහි වසමින් බබිලෝනියේ රජුට
සේවයකරපල්ලා, එවිට තුඹලාට
10 ශුභසිද්ධවන්නේය. මම වනාහි අප ළඟට
එන්නාවූ කල්දිවරුන් ඉදිරිපිට පෙනී
සිටින්ට මිශ්පාහි වාසයකරමි. තුඹලා
මුද්‍රිකපානයද ඉදුණු ඵලද තෙල්ද
එකතුකොට තුඹලාගේ භාජනවල තබා,
තුඹලා ලබාගත් නුවරවල වාසයකරපල්ලා-
11 යයි කීවේය. එසේම මෝවබ්හිද අම්මොන්
පුත්‍රයන් අතරේද ඒදෝමිහිද සෑම රටවලද
සිටි සියලු යුදෙව්වරු බබිලෝනියේ රජු
යූදවරුන්ගෙන් සමහරෙක් ඉතිරිකර ගිය
බවද ඔවුන් කෙරෙහි ෂාපාන්ගේ පුත්‍රයා
වන අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා පත්කළ
12 බවද ඇසුවෝය. එවිට සියලු යුදෙව්වරු
තමුන් පන්නනු ලැබූ සියලු තැන්වලින්
හැරී යූද දේශයේ මිශ්පාට ගෙදලියා
ළඟට ඇවිත්, මුද්‍රිකපානයද ඉදුණු ඵලද
බොහොමයක් එකතුකරගත්තෝය.
13 තවද කාරේයාගේ පුත්‍රවූ යොහානාන්ද
පිටිසර සිටි සේනාවල සියලු අධිපතීහුද
මිශ්පාට ගෙදලියා ළඟට ඇවිත්:
14 අම්මොන් පුත්‍රයන්ගේ රජවූ බයලීස් තුඹ
මරන්ට නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්
එවූ බව තුඹ දන්නවාදැයි ඔහුගෙන්
ඇසුවෝය. නුමුත් අහිකාම්ගේ පුත්‍රවූ
ගෙදලියා ඔවුන් විශ්වාස කළේ නැත.
15 එකල කාරේයාගේ පුත්‍රවූ යොහානාන්
මිශ්පාහිදී ගෙදලියාට රහසින්
කථාකොට: මා ගොස් කිසිවෙකු
නොදැනුවත්ව නෙතනියාගේ පුත්‍රවූ
ඉෂ්මායෙල් මරන පිණිස මට අවසර
ලැබේවා. තුඹ වෙතට රැස්වී සිටින සියලු
යුදෙව්වන් විසිර ගොස්, මෙසේ ඉතිරිව
සිටින යූදවරුන් නැතිවෙන හැටියට, ඔහු
16 තුඹ මරන්නේ කුමටදැයි කීවේය. නුමුත්
අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා: තුඹ ඔය
දේ නොකළ යුතුය. මක්නිසාද තුඹ
ඉෂ්මායෙල් ගැන කියන දේ බොරුයයි
කාරේයාගේ පුත්‍රවූ යොහානාන්ට කීවේය.

## ඉෂ්මායෙල් ගෙදලියා සහ වෙනත් අය මැරීම, පසුව අම්මොන්වරුන් වෙතට පලායාම

41 සත්වෙනි මාසයේදී රාජ වංශයට
අයිතිවූ, රජුගේ අධිපතීන්ගෙන්
කෙනෙක් වන එලිෂාමාගේ පුත්‍රවූ
නෙතනියාගේ පුත්‍රයා වන ඉෂ්මායෙල්ද
ඔහු සමග මිනිසුන් දසදෙනෙක්ද
මිශ්පාට අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා
ළඟට ආවෝය. එහි ඔව්හු මිශ්පාහිදී
එක්ව කෑම කෑවෝය. එවිට නෙතනියාගේ 2
පුත්‍රවූ ඉෂ්මායෙල් සහ ඔහු සමග සිටි
මිනිසුන් දසදෙනා බබිලෝනියේ රජු
විසින් දේශයේ ආණ්ඩුකාරකමට
පත්කළාවූ ෂාපාන්ගේ පුත්‍රවූ අහිකාම්ගේ
පුත්‍රයා වන ගෙදලියාට කඩුවෙන් පහරදී
ඔහු මැරුවෝය. තවද ඉෂ්මායෙල් තෙමේ 3
ගෙදලියා සමග මිශ්පාහි සිටි සියලු
යුදෙව්වරුන්ද එහි සම්බවූ යුද්ධකාරයන්
වන කල්දිවරුන්ද මැරුවේය. ගෙදලියා 4
මැරුවායින් පසු දෙවෙනිද කිසිවෙක්
නොදැන සිටිද්දී, ෂෙකෙම්හිද ෂීලෝහිද 5
සමාරියේද සිට මිනිසුන් අසූදෙනෙක්
රැවුල් කපාදමා, ඇඳුම් ඉරාගෙන, ශරීර
කපාගෙන, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයට
ගෙනෙන්ට ආහාර පූජාද කට්ටකුමංචල්ද
තමුන්ගේ අත්වල රැගෙන ආවෝය.
නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල් ඔවුන් 6
පෙරමගට මිශ්පා සිට පිටත්වී අඬ අඬා
ගියේය. ඔවුන් මුණගැසුණු විට:
අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා ළඟට
වරෙල්ලායයි ඔහු ඔවුන්ට කීවේය.
ඔවුන් නුවර මැදට පැමිණුණුවිට, 7
නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල් සහ
ඔහු සමග සිටි මනුෂ්‍යයෝ ඔවුන් මරා
වළ ඇතුළට හෙළුවෝය. නුමුත් ඔවුන් 8
අතරෙහි සිටි මනුෂ්‍යයන් දසදෙනෙක්
ඉෂ්මායෙල්ට කථාකොට: අප
නොමරන්න. මක්නිසාද කෙතෙහි සඟවා
තිබෙන තිරිඟුද යවද මීපැණිද තෙල්ද
අපට තිබේයයි කීවෝය. එවිට ඔහු
ඔවුන්ගේ සහෝදරයන් සමග ඔවුන්
නොමරා හැරියේය. ඉෂ්මායෙල් විසින් 9

ගෙදලියා ළඟ මැරූ මනුෂ්‍යයන්ගේ
මළකඳන් සියල්ල හෙළුවාවූ වළ නම්
ආසා රජු විසින් ඉශ්‍රායෙල්වරුන්ගේ
රජවූ බයෙෂාට භයින් සෑදූ වළය.
නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල් මැරූමිනී
10 අයගෙන් ඒක පිරෙවූවේය. තවද
ඉෂ්මායෙල් සෙනඟගෙන් ඉතිරිවී මිශ්පාහි
සිටි සියල්ලන්, එනම් රජුගේ දූවරුන්ද
රැකවලුන්ගේ අධිපතියාවූ නෙබුසරදන්
විසින් අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියාට
භාරදුන්නාවූ, මිශ්පාහි ඉතිරිව සිටියාවූ
මුළු සෙනඟද අල්ලාගත්තේය.
නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල් ඔවුන්
ගෙන අම්මොන් පුත්‍රයන් ළඟට යන්ට
ගියේය.
11 නුමුත් කාරේයාගේ පුත්‍රවූ යොහානාන්
සහ ඔහු සමඟ සිටි සේනාවල සියලු
අධිපතීහුද නෙතනියාගේ පුත්‍රවූ
ඉෂ්මායෙල් කළ සියලු නපුරුකම් ගැන
12 අසා, සියලු මනුෂ්‍යයන් අඬගහගෙන,
නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්ට
විරුද්ධව යුද්ධකරන්ට ගොස්
ගිබියොන්හි තිබෙන මහ ජලාශය ළඟදී
13 ඔවුන්ට සම්මුඛවූවෝය. එවිට ඉෂ්මායෙල්
සමඟ සිටි මුළු සෙනඟ කාරේයාගේ
පුත්‍රවූ යොහානාන් සහ ඔහු සමඟ සිටි
සේනාවල සියලු අධිපතීන්ද දුටු විට
14 සන්තෝෂ වූවෝය. මිශ්පා සිට
ඉෂ්මායෙල් විසින් අල්ලාගෙන ගිය මුළු
සෙනඟද නැවත හැරී කාරේයාගේ පුත්‍රවූ
15 යොහානාන් ළඟට ගියෝය. නුමුත්
නෙතානියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්
මනුෂ්‍යයන් අටදෙනෙකු සමඟ
යොහානාන් ඉදිරියෙන් ගැළවී අම්මොන්
16 පුත්‍රයන් ළඟට ගියේය. කාරේයාගේ පුත්‍රවූ
යොහානාන්ද ඔහු සමඟ සිටි සේනාවල
සියලු අධිපතියෝද ඉෂ්මායෙල් විසින්
අහිකාම්ගේ පුත්‍රවූ ගෙදලියා මැරූ පසු
ගිබියොන්හි සිට ඔහුගෙන් හරවාගත්තාවූ
ඉතිරිව සිටි මුළු සෙනඟ වන
යුද්ධකාරයන්ද ස්ත්‍රීන්ද දරුවන්ද
නපුංසකයන්ද මිශ්පායෙන් අඬගහගෙන
17 ගොස්, කල්දිවරුන් නිසා මිසරයට
ඇතුල්වෙන්ට යන පිණිස බෙත්-ලෙහෙම
අසල තිබෙන කිම්හාම්ගේ නවාතැනෙහි
නැවතී සිටියෝය. එසේ කළේ 18
නෙතනියාගේ පුත්‍රවූ ඉෂ්මායෙල්
බබිලෝනියේ රජු විසින් දේශයේ
ආණ්ඩුකාරකමට පත්කළ අහිකාම්ගේ
පුත්‍රවූ ගෙදලියාව මැරූ බැවින් ඔවුන්ට
භයවුණ නිසාය.

## යෙරෙමියා විසින් ප්‍රකාශකෙරෙවූ දේවකැමැත්තට විරුද්ධව සෙනඟ මිසරයට පලායාම

42

එවිට සේනාවල සියලු
අධිපතියෝද කාරේයාගේ පුත්‍රවූ
යොහානාන්ද හෝෂායාගේ පුත්‍රවූ
යෙසනියාද කුඩා අය පටන් ලොකු
අය දක්වා මුළු සෙනඟද අනාගතවක්තෘවූ
යෙරෙමියා වෙතට පැමිණ: අනේ නුඹ 2
අපේ කන්නලව්ව පිළිගෙන අප විසින්
යා යුතු මාර්ගයත් අප විසින් කරන්ට
යුතු දේත් නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
අපට දන්වන හැටියට මෙහි ඉතිරිව
සිටින අප සියල්ලන් උදෙසා නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** යාච්ඤාකරපන්න;
මක්නිසාද නුඹේ ඇස්වලට පෙනෙන 3
ලෙස අපි බොහෝ දෙනෙකුගෙන් ස්වල්ප
දෙනෙක්ව ඉතිරිව සිටිමුයයි කීවෝය.
එවිට අනාගතවක්තෘවූ යෙරෙමියා: 4
නුඹලා කී දේ ඇසීමි; මම නුඹලාගේ
වචනවල හැටියට නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේට** යාච්ඤා කොට,
**ස්වාමීන්වහන්සේ** නුඹලාට උත්තරදෙන
කාරණා සියල්ලම නුඹලාගෙන් කිසිවක්
නොසඟවා නුඹලාට දන්වන්නෙමියි
ඔවුන්ට කීවේය. ඔව්හුද: නුඹේ දෙවිවූ 5
**ස්වාමීන්වහන්සේ** නුඹ ලවා අපට කියා
එවන සියලුම කාරණාවල හැටියට අප
විසින් නොකළොත් **ස්වාමීන්වහන්සේ**
අප අතරේ සැබෑවූ විශ්වාසවූ සාක්ෂි-
කාරයෙක් වනසේක්වා. අපේ දෙවිවූ 6
**ස්වාමීන්වහන්සේගේ** හඬට කීකරුවීමෙන්
අපට යහපත සිද්ධවෙන පිණිස
උන්වහන්සේ වෙතට අපි නුඹ යවම්හ;
හොඳක් වුවත් නොහොඳක් වුවත්
අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** හඬට
අපි කීකරුවන්නෙමුයයි යෙරෙමියාට
කීවෝය.

7 දස දවසකට පසු ස්වාමීන්වහන්සේගේ
වචනය යෙරෙමියා වෙතට පැමිණියේය.
8 එවිට ඕහු කාරේයාගේ පුත්‍රවූ
යොහානාන්ද ඔහු සමග සිටි සේනාවල
සියලු අධිපතීන්ද කුඩා අය පටන් ලොකු
අය දක්වා මුළු සෙනඟද කැඳවා ඔවුන්ට
9 කථාකොට: තුඹලාගේ කන්නලව්ව
ඔප්පුකරන පිණිස තුඹලා විසින් මා
යැවුවාවූ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්-
10 වහන්සේ මෙසේ කියනසේක—තුඹලා
මේ දේශයේම සිටින්නහු නම් මම තුඹලා
කඩා නොදමා ගොඩනගන්නෙමි, තුඹලා
උදුරා නොදමා හිටවන්නෙමි. මක්නිසාද
මා විසින් තුඹලාට පැමිණෙවූ විපත්තිය
11 ගැන නැවෙමි. තුඹලා භයින් සිටින
බබිලෝනියේ රජුට භය නොවෙල්ලා;
තුඹලා ගළවා ඔහුගේ අතින් මුදන්ට
මා තුඹලා සමග සිටින බැවින් ඔහුට
භය නොවෙල්ලායයි ස්වාමීන්වහන්සේ
12 කියනසේක. ඔහු විසින් තුඹලාට
අනුකම්පාකොට තුඹලාගේ රටට
හැරීයන්ට ඉඩදෙන හැටියට තුඹලා
කෙරෙහි දයාවෙන්ට සලස්වන්නෙමි.
13 තුමූත් තුඹලා: අපි මේ දේශයෙහි
නොසිටින්නෙමුයයි කියමින් තුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේගේ හඬට කීකරු
14 නොවී කථාකොට—නැත, අපි මිසර
දේශයට යන්නෙමුව; එහිදී යුද්ධයක්
දකින්ටවත් හොරණෑ ශබ්දය අසන්ටවත්
කෑම නැතුව බඩගින්නේ ඉන්ටවත්
වෙන්නේ නැත; එහි සිටින්නෙමුයයි
15 කියන්නහු නම්, එම්බා යූදහි ඉතිරිව
සිටින ජනයෙනි, ස්වාමීන්වහන්සේගේ
වචනය අසාපල්ලා. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක: තුඹලා මිසරයට පැමිණීමට
තුඹලාගේ මුහුණු හරවාගෙන, එහි
පොරොත්තුව සිටීමට යන්ටම අදහස්-
16 කරන්නහු නම්, තුඹලා භයවෙන කඩුව
මිසර දේශයේදී තුඹලා පිටට පැමි-
ණෙන්නේය, තුඹලා භයපත්කරවන
සාගතය තුඹලා කැප්පුවම මිසරයට
යන්නේය; එහිදී තුඹලා මැරෙන්නහුය.
17 මිසරයෙහි පොරොත්තුව සිටින පිණිස
එහි යන්ට තමුන්ගේ මුහුණු හරවාගන්න
සියලු මනුෂ්‍යයෝම කඩුවෙනුත්
සාගතයෙනුත් වසංගතයෙනුත් නසින්-
නෝය. මා විසින් ඔවුන් පිටට
පමුණුවන විපත්තිය නිසා ඔවුන්ගෙන්
කිසිවෙක් ගැළවී ඉතුරු නොවන්නේය.
මක්නිසාද: මාගේ උදහසත් කෝපයත් 18
යෙරුසලමේ වැසියන් පිටට වැගුරුණාක්
මෙන්, තුඹලා මිසරයට පැමුණුණාම
තුඹලා පිටටත් මාගේ කෝපය
වැගිරෙනවා ඇත. තුඹලා ඇවීමක්ද
විස්මයක්ද ශාප-වචනයක්ද නින්දාවක්ද
වන්නහුය; මේ ස්ථානය තුඹලා තවත්
දකින්නෙත් නැතැයි ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක.
යූදහි ඉතිරිව සිටින ජනයෙනි, ස්වාමීන්- 19
වහන්සේ තුඹලා ගැන කථාකළසේක.
මිසරයට නොයල්ලා; මා අද තුඹලාට
අවවාදකළ බව හොඳකාරයෙන්ම දැන-
ගනිල්ලා. සැබවින් තුඹලාගේම ප්‍රාණ- 20
වලට විරුද්ධව තුඹලා ප්‍රයෝගකළහුය;
මක්නිසාද: අපේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට අප උදෙසා යාච්ඤාකර, අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ කියන සියල්ලේ
හැටියට අපට දන්වන්න, අපි ඒක
කරන්නෙමුව කියා තුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ වෙතට තුඹලා මා
යැවුවහුය. මම අද තුඹලාට දන්වීමි; 21
එහෙත් තුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ හඬටවත් උන්වහන්සේ මා
ලවා තුඹලාට කියා එවූ කිසිවකටවත්
තුඹලා කීකරුවූණේ නැත. ඉතින් තුඹලා 22
කලක් තවතින්ට යන්ට ආශාවෙන්නාවූ
ස්ථානයේදී තුඹලා කඩුවෙනුත්
සාගතයෙනුත් වසංගතයෙනුත් නසින
බව සැබවින්ම දැනගනිල්ලායයි කීවේය.

## 43

යෙරෙමියා මුළු සෙනඟට
ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ ඔහු ලවා ඔවුන්ට කියා
ඇරියාවූ ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේගේ සියලු වචන වන ඒ සියලු
වචන කියා නිමවූණු විට, හෝෂායාගේ 2
පුත්‍රවූ අසරියාද කාරේයාගේ පුත්‍රවූ
යොහානාන්ද උඩඟුවූ සියලු මනුෂ්‍යයෝද
යෙරෙමියාට කථාකොට: තුඹ බොරු
කියන්නෙහිය. මිසරයෙහි පොරොත්තුව

සිටීමට එහි යන්ට එපායයි කියන්ට
අපේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** නුඹ
3 එවුවා නොවේ, කල්දිවරුන් විසින් අප
මරන්ටත් බබිලෝනියට අප අල්ලා
ගෙනයන්ටත් ඔවුන්ගේ අතට අප
පාවාදෙන පිණිස නේරියාගේ පුත්‍රවූ
බාරුක් අපට විරුද්ධව නුඹ
4 පොළඹවන්නේයයි කීවෝය. මෙසේ
කාරේයාගේ පුත්‍රවූ යොහානාන්ද
සේනාවල සියලු අධිපතීහුද මුළු සෙනඟද
යූද දේශයෙහි සිටින පිණිස **ස්වාමීන්-**
**වහන්සේගේ** හඬට කීකරු නොවූහ.
5 නුමුත් කාරේයාගේ පුත්‍රවූ යොහානාන්
සහ සේනාවල සියලු අධිපතීහුද යූදවරු
යම් යම් ජාතීන් අතරට පන්නනු
ලැබුවාහුද, යූද දේශයෙහි සිටීමට ඒ
සියලු ජාතීන් අතරෙන් හැරී ආවාවූ
ඉතිරිව සිටි සියලු යූදවරුන් වන,
6 පුරුෂයන්ද ස්ත්‍රීන්ද දරුවන්ද රජුගේ
දූවරුන්ද රැකවලුන්ගේ අධිපතියාවූ
නෙබුසරදන් විසින් ෂාපාන්ගේ පුත්‍රවූ
අහිකාම්ගේ පුත්‍රයා වන ගෙදලියා
වෙත නවත්වා ගියාවූ සියලු ප්‍රාණීන්ද
අනාගතවක්තෘවූ යෙරෙමියාද
නේරියාගේ පුත්‍රවූ බාරුක්ද රැගෙන,
7 **ස්වාමීන්වහන්සේගේ** හඬට කීකරු
නොවී, මිසර දේශයට පැමිණියෝය.
නවද ඔව්හු තාපන්හේස් දක්වා ගියෝය.

## මිසරයන් පරාජය වන බව ප්‍රකාශකිරීම

8 එකල තාපන්හේස්හිදී **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනය යෙරෙමියා වෙතට
9 පැමිණ මෙසේ කීය: නුඹේ අතින් ලොකු
ගල් රැගෙන යූදවරුන් බලා සිටියදී
තාපන්හේස්හි ඵාරාවෝගේ ගෘහයේ
දෙරපුවෙහි තිබෙන ගඩොල් වැඩේ බදම
10 තුළ සඟවා තබා, ඔවුන්ට කථාකොට:
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක—බලව, මම
මිනිසුන් යවා මාගේ සේවකයා වන
බබිලෝනියේ රජවූ නෙබුකද්රෙෂර්
ගෙන්වා, මා විසින් සඟවා තැබූ මේ ගල්
පිට ඔහුගේ සිංහාසනය තබන්නෙමි; ඔහුද
තමාගේ රාජකීය සේසත ඒවා උඩ
තබනවා ඇත. ඔහු ඇවිත් මිසර දේශයට 11
පහරදෙනවා ඇත; මරණයට නියමවූ
අය මරණයටත් වාල්කමට නියමවූ
අය වාල්කමටත් කඩුවට නියමවූ අය
කඩුවටත් අසුවන්නෝය. මමද මිසරයේ 12
දෙවිවරුන්ගේ ගෘහවල ගින්නක්
දල්වන්නෙමි; ඔහු ඒවා දවාදමා,
රැගෙන ගොස්, එඬේරෙක් තමාගේ ඇඳුම
පෙරවාගන්නාක් මෙන් මිසර දේශයේ
පෙරවාගෙන, එතැනින් සමාදානයෙන්
පිටත්ව යන්නේය. ඔහු මිසර දේශයේ 13
තිබෙන බෙත්-ෂෙමෙෂ්හි කුළුනු
බිඳදමන්නේය; මිසරයේ දෙවිවරුන්ගේ
ගෘහද ගින්නෙන් දවන්නේයයි ඔවුන්ට
කියාපන්නැයි කීය.

## 'අහසේ බිසවට' නමස්කාර කිරීමට විරුද්ධව සාක්ෂිදරීම

# 44

මිසර දේශයේ මිග්දෝල්හිද
තාපන්හේස්හිද නොප්හිද පත්‍රෝස්
දේශයෙහිද වාසයකළ සියලු යුදෙව්වරුන්
ගැන යෙරෙමියා වෙතට පැමිණි
වචනයය. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල 2
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
මා විසින් යෙරුසලම පිටටත් යූදහි
සියලු නුවරවල් පිටටත් පැමිණෙවූ සියලු
විපත්ති නුඹලා දුටුවහුය; බලව, අද
ඒවා පාළුවක් වී තිබේ, කිසිවෙක් එහි
නොවසයි. එසේ වූණේ ඔවුන්වත් 3
නුඹලාවත් නුඹලාගේ පියවරුන්වත් දැන
නොගත් අන් දෙවිවරුන්ට සේවයකිරීමට
සුවඳ දුම් ඔප්පුකරන්ට යාමෙන් මා
කෝපකරවන ලෙස ඔවුන් කළාවූ
ඔවුන්ගේ නපුරුකම නිසාය. මමද: අහෝ 4
මා ද්වේෂකරන ඔය පිළිකුල් දෙය
නොකරල්ලායයි කියන්ට ප්‍රොපේතවරුන්
වන මාගේ සියලු සේවකයන් අලුයම්
වේලාවේ පටන්ම නුඹලා ළඟට එවූවෙමි.
නුමුත් ඔව්හු නැසුවෝය, අන් දෙවිවරුන්ට 5
සුවඳ දුම් ඔප්පු නොකරන ලෙස
තමුන්ගේ දුෂ්ටකමෙන් හැරෙන්ට ඔව්හු
කන් යොමු නොකළෝය. ඒ නිසා මාගේ 6
කෝපය හා උදහස වැගිරී, යූදහි නුවරවලද
යෙරුසලමේ වීථිවලද ඇවිළුණේය; ඒවා
අද දවසේ තිබෙන ලෙස පාළුව නාස්තිව

7 තිබේ. එබැවින් සේනාවල දෙවියන්වහන්සේ
වන ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: තුඹලාගෙන්
කිසිවෙකු ඉතුරු නොවන ලෙස තුඹලාගේ
පුරුෂයන්ද ස්ත්‍රීන්ද ළදරුවන්ද කිරි
දරුවන්ද යූදවරුන් අතරෙන් සිඳදැමීමට
තුඹලාගේ ප්‍රාණවලට විරුද්ධව තුඹලා
8 මේ මහත් නපුර කොට, තුඹලා සිඳදමනු
ලබන හැටියටත්, පොළොවේ සියලු
ජාතීන් අතරේ ශාප-වචනයක්ද
නින්දවක්ද වෙන හැටියටත්, තුඹලා
පොරොත්තුව සිටීමට ආවාවූ මිසර
දේශයේදී අන් දෙවිවරුන්ට සුවඳ
දුම් ඔප්පුකිරීමෙන් තුඹලාගේ අත්වල
ක්‍රියාවලින් කුමක් නිසා මා
9 කෝපකරන්නහුද? යූද දේශයෙහිත්
යෙරුසලමේ වීථිවලත් කළාවූ තුඹලාගේ
පියවරුන්ගේ නපුරුකම්ද යූදහි
රජවරුන්ගේ නපුරුකම්ද ඔවුන්ගේ
භාර්යාවන්ගේ නපුරුකම්ද තුඹලාගේම
නපුරුකම්ද තුඹලාගේ භාර්යාවන්ගේ
නපුරුකම්ද තුඹලාට මතකනැතිවීද?
10 ඔවුන් අද දවස දක්වාම යටත්වුණේවත්
භයවුණේවත් මා විසින් තුඹලා සහ
තුඹලාගේ පියවරුන් ඉදිරියෙහි තැබූ
මාගේ ව්‍යවස්ථාවේද නියෝගවලද
11 ප්‍රකාරයට හැසුරුණේවත් නැත. එබැවින්
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: බලව,
තුඹලාට විපත්තිය පිණිසද සියලු
යූදවරුන් සිඳදමන පිණිසද මාගේ මුහුණ
12 තුඹලාට විරුද්ධව තබමි. මිසර
දේශයෙහි පොරොත්තුව සිටීමට එහි
පැමිණෙන්ට තමුන්ගේ මුහුණ
හරවාගත්තාවූ ඉතිරිව සිටින යූදවරුන්
අල්ලාගන්නෙමි, ඔවුන් සියල්ලෝ
නාස්තිවන්නෝය; ඔවුන් සියල්ලෝම
මිසර දේශයේදී නැතිවීයන්නෝය; ඔව්හු
කඩුවෙන්ද සාගතයෙන්ද නාස්තිවන්නෝය;
කුඩා අය පටන් ලොකු අය දක්වා
ඔව්හු කඩුවෙන්ද සාගතයෙන්ද
මැරෙන්නෝය. ඔව්හු ඇවීමක් හා
විස්මයක්ද ශාප-වචනයක්ද නින්දවක්ද
13 වන්නෝය. මම යෙරුසලමට
දඬුවම්කළාක්මෙන් මිසර දේශයෙහි
වාසයකරන්නන්ටත් කඩුවෙන්ද
සාගතයෙන්ද වසංගතයෙන්ද දඬුවම්
කරන්නෙමි. මිසර දේශයෙහි පොරොත්තුව 14
සිටින්ට ගිය ඉතිරි යූදවරුන් යූද
දේශයෙහි විසීමට හැරීඑන්ට ආශාවෙන්
සිටින්නේවී නුමුත්, ඔවුන්ගෙන් කිසිවෙක්
ගැළවී ඉතිරි නොවන්නේය; සැඟවී
යන අය මිස වෙන කිසිවෙක් හැරී
නොඑන්නේයයි කීය.
එවිට තමුන්ගේ භාර්යාවන් අන් 15
දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පුකරන බව
දන්න සියලු පුරුෂයෝද මහත්
සමූහයක්ව ළඟ සිටි සියලු ස්ත්‍රියෝද
මිසර දේශයේ පත්‍රොස්හි විසූ මුළු
සෙනඟද යෙරෙමියාට උත්තරදෙමින්:
තුඹ **ස්වාමීන්වහන්සේගේ** නාමයෙන් 16
අපට කී වචනය ගැන අපි තුඹට කන්
නොදෙන්නෙමුව. අපේ මුඛයෙන් නික්මුණු 17
සියලු වචනවල හැටියටම අපි කොට,
අපද අපේ පියවරුන්ද අපේ රජවරුන්ද
අපේ අධිපතීන්ද යූදහි නුවරවලත්
යෙරුසලමේ වීථිවලත් කළාක්මෙන් අපි
*අහස් දේවීහට සුවඳ දුම් ඔප්පුකොට,
ඇට පානපූජාවන් වගුරුවන්නෙමුව.
මක්නිසාද ඒ කාලයේ අපි බොහෝ
කෑම ලැබ, කිසි විපත්තියක් නොදැක,
සැපසේ සිටියෙමුව. නුමුත් අප විසින් 18
*අහස් දේවීහට සුවඳ දුම් ඔප්පුකිරීමත්
ඇට පානපූජා වැගිරවීමත් අත්හැරිය ද
සිට සෑම දේම අපට හිඟවී, අපි
කඩුවෙන්ද සාගතයෙන්ද නැතිවුණෙමුව.
(ස්ත්‍රීන් වන) අපත් *අහස් දේවීහට සුවඳ 19
දුම් ඔප්පුකර පානපූජා වගුරුවන විට,
අප විසින් එසේ ඈට සේවයකිරීමට
කැවුම් සෑදුවෙත් පානපූජා වැගිරෙවුවෙත්
අපේ පුරුෂයන් නොදැනුවත්වදැයි
කීවෝය. එවිට යෙරෙමියා මුළු සෙනඟ 20
වන පුරුෂයන්ටත් ස්ත්‍රීන්ටත් එනම් ඔහුට
ඒ උත්තරය දුන් මුළු සෙනඟට
කථාකොට: **ස්වාමීන්වහන්සේ** විසින් 21
සිහිකර සිතටගත්තේ තුඹලාද තුඹලා-
ගේ පියවරුන්ද තුඹලාගේ රජවරුන්ද
තුඹලාගේ අධිපතීන්ද දේශයෙහි සෙනඟද
යූදහි නුවරවලත් යෙරුසලමේ වීථිවලත්

*එනම්—ශුක්‍ර ග්‍රහයා.

22 ඔප්පුකළ සුවඳ දුම් නොවේද? එසේ
තුඹලාගේ ක්‍රියාවල නපුරුකම නිසාත්
තුඹලා කළ පිළිකුල්කම් නිසාත් **ස්වාමීන්-
වහන්සේට** තවත් ඉවසන්ට බැරිවිය;
එබැවින් තුඹලාගේ දේශය, අද තිබෙන
හැටියට වැසියෙක් නැතුව පාළුවක්ද
විස්මයක්ද ශාප-වචනයක්ද වී තිබේ.
23 තුඹලා **ස්වාමීන්වහන්සේගේ** හඬට
කීකරු නොවී, උන්වහන්සේගේ
ව්‍යවස්ථාවේද නියෝගවලද ශික්ෂාවලද
හැටියට නොහැසිර, සුවඳ දුම් ඔප්පුකළ
නිසාත්, **ස්වාමීන්වහන්සේට** විරුද්ධව
පව්කළ නිසාත්, අද තිබෙන හැටියට
මේ මුළු විපත්තිය තුඹලාට පැමිණ
තිබේයයි කීවේය.
24 තවද යෙරෙමියා මුළු සෙනඟටත්
සියලු ස්ත්‍රීන්ටත් කථාකොට: මිසර
දේශයේ සිටින යූදවරුනි, **ස්වාමීන්-
වහන්සේගේ** වචන අසාපල්ලා.
25 ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: *අහස්
දේවීහට සුවඳ දුම් ඔප්පුකොට ඈට
පානපූජා වගුරුවන හැටියට අප විසින්
වූණාවූ අපේ භාරවල් තුඹලාත්
තුඹලාගේ භාර්යාවොත් තුඹලාගේ
කටින් කියා, තුඹලාගේ අත්වලින්
සම්පූර්ණකළහුය. ඉතින් ස්ත්‍රීන් වන
තුඹලාගේ භාරවල් ස්ථිරකොට,
තුඹලාගේ භාරවල් ඉෂ්ටකරපල්ලා.
26 එබැවින් මිසර දේශයෙහි වසන සියලු
යූදවරුනි, **ස්වාමීන්වහන්සේගේ** වචනය
අසාපල්ලා: මුළු මිසර දේශයෙහි සිටින
යූදවරුන්ගෙන් කිසිවෙකුට--ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** ජීවමාන බව සැබෑවා
සේම කියා මාගේ නාමය තමාගේ
මුඛයෙන් තවත් සඳහන් කරන්ට
නොලැබේය කියා මාගේ මහත්
නාමයෙන් දිවුළෙමියි **ස්වාමීන්වහන්සේ**
27 කියනසේක. බලව, මම ශුභසිද්ධිය
පිණිස නොව විපත්තිය පිණිස ඔවුන්
ගැන පිබිද සිටිමි. මිසර දේශයෙහි සිටින
සියලුම යූදවරු තීන්දුවෙන තුරු කඩුවෙන්ද
28 සාගතයෙන්ද නැතිවී යන්නෝය. කඩුවෙන්
ගැළවෙන අය ගණනින් ස්වල්පව, මිසර
දේශයෙන් යූද දේශයට හැරී යන්නෝය;

*එනම්--ශුක්‍ර ග්‍රහයා.

මෙසේ ස්ථිරවෙන්නේ මාගේ වචනයද
නොහොත් ඔවුන්ගේ වචනයදැයි මිසර
දේශයේ පොරොත්තුව සිටින්ට එහි ගියාවූ
ඉතිරි සියලු යූදවරුන් දැනගන්නවා ඇත.
මාගේ වචන විපත්තිය පිණිස තුඹලා 29
කෙරෙහි සැබවින්ම ස්ථිරවෙන බව
තුඹලා දැනගන්න පිණිස මේ ස්ථානයේදී
මා තුඹලාට දඬුවම්කරන බවට තුඹලාට
ලැබෙන ලකුණ මේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මා විසින් යූදහි රජවූ 30
ශෙදෙකියා ඔහුගේ සතුරාවූ ඔහුගේ
ප්‍රාණය හානිකරන්ට සෙවූවාවූ
බබිලෝනියේ රජවූ නෙබුකද්රෙසර් අතට
පාවා දුන්නාක්මෙන් මිසරයේ රජවූ
ඵාරාවෝ-හොප්රාත් ඔහුගේ සතුරන්
අතටද ඔහුගේ ප්‍රාණය හානිකරන්ට
සොයන්නන් අතටද පාවාදෙන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේකැයි කීවේය.

## බාරුක්ට තර්ජනයක් සහ පොරොන්දුවක්

*යොෂියාගේ පුත්‍රවූ යූදහි රජවූ 45
යෙහෝයාකීම්ගේ සතරවෙනි
අවුරුද්දේදී නේරියාගේ පුත්‍රවූ බාරුක්
අනාගතවක්තෘවූ යෙරෙමියාගේ මුඛයෙන්
අසා මේ වචන පොතක ලියූ විට
යෙරෙමියා ඔහුට කී වචනයය. එම්බා 2
බාරුක්, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** තුඹට මෙසේ කියනසේක:
අහෝ මට දුන් දුක්වේ! **ස්වාමීන්වහන්සේ** 3
මාගේ වේදනාවට ශෝකය එකතුකළසේක;
මාගේ සුසුම්ලෑමෙන් වෙහෙසව සිටිමි,
සහනයක් මට ලැබී නැතැයි තුඹ
කීයෙහිය. ඔහුට මෙසේ කියාපන්න: 4
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක--
බලව, මම ගොඩනැගූ දෙය කඩාදමමි.
මම සිටෙවූ දෙය උදුරාදමමි; මුළු
දේශයටම මෙසේ වන්නේය. තුඹටම 5
මහත් දේවල් ලබාගන්ට තුඹ
සොයන්නෙහිද? එසේ නොසොයන්න.
මක්නිසාද මාංසමයවූ සියල්ලන් පිටට
විපත්තිය පමුණුවමි. නුමුත් තුඹ යන්නාවූ
සියලුම ස්ථානවලදී තුඹේ ප්‍රාණය
කොල්ලයක් කොට තුඹට දෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

*මේ පරිච්ඡේදය 30 වෙනි පරිච්ඡේදය
හා සම්බන්ධයි.

## පරදේශ ජාතීන්ට විරුද්ධ අනාගතවාක්‍ය.

(පරි: 46-51)

## මිසරය ගැන

46 ජාතීන් ගැන අනාගතවක්තෘවූ
යෙරෙමියා වෙතට පැමිණි **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනයය.
2 මිසරය ගැනය. යොෂියාගේ පුත්‍රවූ
යූදහි රජවූ යෙහෝයාකීම්ගේ සතරවෙනි
අවුරුද්දේදී ප්‍රාත් ගංගාව ළඟ
කර්කෙමිෂ්හි සිටියාවූ බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් විසින් පහරදෙනලද
මිසරයේ රජවූ ඵාරාවෝ-නෙකෝගේ
සේනාව ගැනය.
3 පලිහ සහ මහ පලිහත් සූදානම්කරගන
4 යුද්ධයට පැමිණියල්ලා. අශ්වයන් රථවල
බැඳපල්ලා. අසරුවෙනි, යුද්ධ තොප්පි
දමාගන නැගී සිටපල්ලා; හෙල්ල
මැදගනිල්ලා, යුද්ධසැට්ට හැඳගනිල්ලා.
5 ඔවුන් කැලඹී පස්සට හැරෙනවා මට
පෙනුණේ මක්නිසාද? ඔවුන්ගේ
බලවන්තයෝ පොඩිකරනු ලැබ, පස්ස
නොබලා පලායන්ටම යෙදුණෝය.
වටකරින්ම භීතිය ඇතැයි **ස්වාමීන්-**
6 **වහන්සේ** කියනසේක. ශීඝ්‍ර තැනැත්තේ
පලා නොයේවා, බලවන්තයාද ගැළවී
නොයේවා; ඔව්හු උතුරු දිශාවේ ප්‍රාත්
7 ගංගාව ළඟදී පැකිල වැටුණෝය. නයිල්
ගංගාව මෙන්ද රළගසන ගංගාවල්
8 මෙන්ද නැගී එන මොහු කවුද? මිසරය
නයිල් ගංගාව මෙන් ගලයි, එහි
ජලධාරාවෝ ගංගාවල මෙන් රළ ගසති.
මම නැගී ගොස් දේශය වසාගෙන
නුවරවල්ද එහි වැසියන්ද විනාශ-
9 කරන්නෙමියි ඔහු කියන්නේය. අශ්වයෙනි,
නැගීයව්; රථයෙනි, වේගයෙන් දුවව්;
බලවන්ත මනුෂ්‍යයෝ වන පලිහ අල්ලන
කූෂ්වරුද පූට්වරුද දුනු අල්ලා
තත්කවන ලුදිවරුද පිටතට යෙත්වා.
10 නුමුත් ඒ දවස ස්වාමිවූ සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** දවසක්ය, උන්-
වහන්සේ තමන්ගේ විරුද්ධකාරයන්ගෙන්
පළිගන්න පළිගැනීමේ දවසක්ය.
කඩුව වනාහි නාස්තිකර තෘප්තියට
පැමිණෙන්නේය, ඔවුන්ගේ ලේවලින්
මත්වන්නේය. මක්නිසාද උතුරු දේශයේ
ප්‍රාත් ගංගාව ළඟ ස්වාමිවූ සේනාවල
**ස්වාමීන්වහන්සේ** විසින් කරන්ට යාගයක්
ඇත්තේය. එම්බා මිසරය නම් කන්‍යා 11
දුව, ගිලියද්ට ගොස් ගුගුල් ගනින්න.
තුඹ විසින් බොහෝ බෙහෙත්
පාවිච්චිකිරීම නිෂ්ඵලය; තුඹට සුවවීමක්
නැත. ජාතීන් තුඹේ ලජ්ජාව ගැන අසා 12
තිබේ, තුඹේ කෑගැසීමෙන් පොළොව
පිරී තිබේ. මක්නිසාද බලවන්තයා
බලවන්තයාට හැපී දෙන්නාම එක්ව
වැටුණෝයයි කීසේක.
මිසර දේශයට පහරදීමට බබිලෝනියේ 13
රජවූ නෙබුකද්රෙශර්ගේ පැමිණීම ගැන
**ස්වාමීන්වහන්සේ** අනාගතවක්තෘවූ
යෙරෙමියාට කී වචනයය.
මිසරයෙහි දන්වමින්ද, මිග්දෝල්හි 14
ප්‍රකාශකරමින්ද, නොප්හි සහ
තාපන්හේස්හි ප්‍රසිද්ධකරමින්ද මෙසේ
කියාපල්ලා: ඉදිරියට ඇවිත් සැරසියන්න;
මක්නිසාද කඩුව තුඹ වටකර
නාස්තිකෙළේය. තුඹේ බලසම්පන්න අය 15
පහකරදමනු ලැබුවේ මක්නිසාද? ඔවුන්
නොහිටියේ **ස්වාමීන්වහන්සේ** ඔවුන්
පන්නාදැමූ නිසාය. පැකිලෙන්නන් 16
උන්වහන්සේ වැඩිකළසේක, ඔව්හු
එකිනෙකා පිටටත් වැටුණෝය. තවද
ඔව්හු: නැගිටියන්න, පීඩාකරන කඩුව
ඉදිරියෙන් අපේ සෙනඟ ළඟටත්
අප උපන් දේශයටත් යමුයයි කීවෝය.
මිසරයේ රජවූ ඵාරාවෝ ඝෝෂාවක් 17
පමණය කියාත් ඔහු නියම ප්‍රස්තාව
පසුවී යන්ට හැරියේය කියාත් ඔව්හු
එහිදී මොරගසා කීවෝය. කඳු අතරේ 18
තාබෝර් මෙන්ද මුහුද ළඟ තිබෙන
කර්මෙල් මෙන්ද සැබෑවටම ඔහු
එන්නේය කියා මාගේ ජීවිතය ගැන
කියමියි සේනාවල **ස්වාමීන්වහන්සේ**
නම්වූ රජ්ජුරුවන්වහන්සේ කියනසේක.
අහෝ මිසරයෙහි වාසයකරන දුව, 19
වාල්කමට යන්ට බඩු සාදගනින්න.
මක්නිසාද නොප් වැසියෙක් නැතුව
පාළුවක් වී දවාදමනු ලබන්නේය.
මිසරය ඉතා ලක්ෂණ එළ නැම්බියෙක්ය; 20
එහෙත් විනාශය උතුරෙන් ඈ පිටට
පැමිණ තිබේ. ඈ තුළ සිටින ඈගේ 21

කුලීකාර හේවායොත් තරකරපු වස්සන්ට
සමානය; මක්නිසාද ඔව්හු පවා පස්සට
හැරී එක්ව පලාගියෝය. ඔවුන්ගේ
විපත්ති දවස එනම් ඔවුන්ට දඬුවම්කිරීමේ
කාලය ඔවුන් පිටට පැමුණුණු නිසා
22 ඔව්හු නොසිටියෝය. ඇගේ හඬ
සර්පයෙකුගේ හඬ මෙන් නික්මෙන්නේය;
මක්නිසාද ඔව්හු ලී කපන්නන් මෙන්
පොරෝ ඇතුව, සේනාවක් සමග ඈට
23 විරුද්ධව පැමිණෙන්නෝය. ඇගේ
කැලෑවට වදින්ට බැරි නුමුත් ඔව්හු ඒක
කපා දමන්නෝය; මක්නිසාද ඔව්හු
පළඟැටියන්ට වඩා වැඩිව, ගණනාවක්
නැතුව සිටිත්යයි **ස්වාමීන්වහන්සේ**
24 කියනසේක. මිසර දුව ලජ්ජාවට
පැමිණෙන්නීය; උතුරු සෙනඟගේ අතටද
25 අසුවන්නීය. සේනාවල **ස්වාමීන්වහන්සේ**
වන ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක: බලව, මම නෝහි
ආමොන්ටත් ඵාරාවෝටත් මිසරයටත්
එහි දෙවිවරුන්ටත් එහි රජවරුන්ටත්
ඵාරාවෝට සහ ඔහු කෙරේ
විශ්වාසකරන්නන්ටත් දඬුවම්කරමින්,
26 ඔවුන්ගේ ප්‍රාණය හානිකරන්ට
සොයන්නන් අතටත් බබිලෝනියේ
නෙබුකද්රෙශර් අතටත් ඔහුගේ සේවකයන්
අතටත් ඔවුන් පාවාදෙන්නෙමි. නුමුත්
ඊට පසුව පුරාණ දවස්වල මෙන් වැසියන්
එහි සිටිනවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
27 කියනසේක. එහෙත් මාගේ සේවකයාවූ
යාකොබ්, නුඹ භය නොවන්න. ඉශ්‍රායෙල්,
නුඹ නොකැලඹෙන්න. මක්නිසාද, බලව,
මම නුඹ දුරස්තරයෙන්ද නුඹේ වංශය
තමුන්ගේ වාල්කමේ දේශයෙන්ද
ගළවන්නෙමි; යාකොබ්ද හැරීඇවිත්,
කිසිවෙකුගෙන් භයක් නොලැබ,
28 නිශ්චලව සුවසේ සිටින්නේය. එම්බා
මාගේ සේවකයාවූ යාකොබ්, මා නුඹ
සමග සිටින නිසා භය නොවන්න.
මක්නිසාද මා විසින් නුඹ විසුරුවාදමූ
සියලු ජාතීන් තීන්දුවටම නැතිකරන
නුමුත් මම නුඹ තීන්දුවටම නැති
නොකර, මදලෙස නුඹට දඬුවම්
කරන්නෙමි; නුමුත් නුඹට කොහෙත්ම
අව්වූ නොකර නොසිටින්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## පිලිස්තිවරුන් ගැන

47

ඵාරාවෝ ගාසාට පහරදෙන්ට
පළමුවෙන් පිලිස්තිවරුන් ගැන
අනාගතවක්තෘවූ යෙරෙමියා වෙතට
පැමිණි **ස්වාමීන්වහන්සේගේ** වචනයය.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 2
බලව, වතුරු උතුරෙන් ගලා ඇවිත්,
උතුරා යන ගඟක් වී, දේශය සහ එහි
පූර්ණකමද නුවර සහ එහි වැසියන්ද උඩින්
ගලායන්නේය. මනුෂ්‍යයෝද කෑගසන්නෝය.
දේශයේ සියලු වැසියෝ කෑමොරගසන්නෝය.
ඔහුගේ බලවතුන්ගේ කුර ගැසීමේ 3
ශබ්දයටත් ඔහුගේ රථවල ඝෝෂාවටත්
ඔහුගේ චක්‍රවල ගිගිරීමටත් තමුන්ගේ
අත් හෙළා වැටෙන බැවින් පියවරු
දරුවන් දෙසට නොහැරෙන්නෝය.
මෙසේ වෙන්නේ ඉතිරිවූ සියලු 4
උපකාරකාරයන් තීර් සහ සීදෝන්
කෙරෙන් සිඳදමන පිණිස සියලු
පිලිස්තිවරුන් නාස්තිකිරීමට පැමිණෙන
දවස නිසාය. මක්නිසාද කප්තෝර්
ද්වීපයෙන් ඉතිරිව සිටින්නන් වන
පිලිස්තිවරුන් **ස්වාමීන්වහන්සේ** නාස්ති-
කරනසේක. ගාසාට මුඩුකම 5
පැමිණියේය; අෂ්කෙලෝන් සහ ඔවුන්ගේ
මිටියාවතෙන් ඉතිරි පංගුව නාස්තිවිය.
නුඹ කොපමණ කල් ශරීරය
කපාගන්නෙහිද? එම්බා **ස්වාමීන්-** 6
**වහන්සේගේ** කඩුව, නුඹ කොපමණ
කල් නිශ්චල නොවී සිටින්නෙහිද?
නුඹේ කොපුවට ඇතුල්වී නැවතී
නිකම් හිඳින්න. නුඹ කෙසේ 7
නිශ්චලවන්නෙහිද? මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** අෂ්කෙලෝන්ටත් මුහුදුබඩටත්
විරුද්ධව ඊට ආඥාවක් දී, එතනට ඒක
පත්කළසේක.

## මෝවබ් ගැන

48

මෝවබ් ගැනය. ඉශ්‍රායෙල්ගේ
දෙවිවූ සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: අහෝ නෙබෝට
දුක්වේ! මක්නිසාද එය පාළුවිය;
කිරියාතයිම් ලජ්ජාවට පත්විය, එය
අසුවිය. මිස්ගාබ් ලජ්ජාවටත්
කැලඹීමටත් පැමුණුණේය. හෙෂ්බොන් 2
ගැන මෝවබ් තවත් පාරට්ටු
නොකරන්නේය; වරෙල්ලා, ජාතියක්ව

තොසිටින ලෙස ඇය සිඳදමමුයයි
ඔව්හු ඇට විරුද්ධව නපුර යෝජනාකළෝය.
එම්බා මද්මේන්, නුඹත් නාස්තිවන්නෙහිය;
කඩුව නුඹ පසුපස්සේ එන්නේය.
3 නාස්තියත් මහත් විනාශයත් නිසා
කෑගැසීමේ හඬක් හොරොනයිම්
4 කෙරෙන් පැමිණෙන්නේය. මෝවබ්
කඩාදමනු ලැබුවාය; ඇගේ බාලයෝ
5 කෑගැසීමක් පැවැත්තුවෝය. මක්නිසාද
ලුහිත්හි නැගුමේ ඇඬීම පිට ඇඬීම
නගින්නේය. එසේය, හොරොනයිම්හි
බැස්මේ විනාශයේ දුක්ඛිත කෑගැසීම
6 ඇසුණේය. නුඹලා පලාගොස්, නුඹලාගේ
ප්‍රාණ ගළවාගෙන, කාන්තාරයේ
රෝතෙම් ගස මෙන් වෙයල්ලා.
7 මක්නිසාද නුඹේ විශ්වාසය නුඹේ වැඩ
හා නුඹේ සම්පත්ද කෙරෙහි තිබෙන
බැවින් නුඹත් අසුවන්නෙහිය. කෙමොෂ්ද
ඔහුගේ පූජකයෝද අධිපතීහුද එක්ව
8 වාලට යන්නෝය. නාස්තිකරන්නාද
සියලු නුවරවලට පැමිණෙන්නේය, කිසි
නුවරක් නොගැළවෙන්නේය; **ස්වාමීන්-
වහන්සේ** කී ලෙස මිටියාවත නැතිවන්නේය.
9 තලාව විනාශවන්නේය. ඉගිලී ඉවත්ව
යන පිණිස මෝවබ්ට පියාපත් දීපල්ලා.
එහි නුවරවල් වැසියෙක් නැතුව
10 පාළුවන්නේය. **ස්වාමීන්වහන්සේගේ** වැඩ
අලසකමින් කරන්නාට ශාපවේවා.
ලෙයින් තමාගේ කඩුව වළක්වාගන්නාටත්
11 ශාපවේවා. මෝවබ් භාජනයෙන්
භාජනයට වත්කරනු නොලැබ,
වාල්කමට නොගොස්, තමාගේ
බාලවයසේ පටන් සුවසේ හිඳ, තමාගේ
මණ්ඩි පිටින් නිශ්චලවී සිටියේය.
එබැවින් ඔහුගේ රස ඔහු තුළ නවම
තිබේ, ඔහුගේ සුවඳ වෙනස් නොවී තිබේ.
12 එබැවින් පෙරළා ඉහිරවන්නන් ඔහු ළඟට
මා විසින් අරින දවස් පැමිණෙන්නේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. ඔව්හුද
ඔහු පෙරළා, ඔහුගේ භාජන හිස්කොට,
13 ඔහුගේ පාත්‍ර බිඳදමන්නෝය. ඉශ්‍රායෙල්
වංශය තමුන්ගේ විශ්වාසයවූ බෙතෙල්
නිසා ලජ්ජාවට පැමුණුණාක්මෙන්
මෝවබ් කෙමොෂ් නිසා ලජ්ජාවට
14 පැමිණෙන්නේය. අපි බලවන්තයෝය,
යුද්ධයට බලවත් මනුෂ්‍යයෝයයි නුඹලා
කියන්නේ කොහොමද? මෝවබ් 15
පාළුවිය, ඔව්හු ඇගේ නුවරවලට
ගියෝය, ඔහුගේ තෝරාගත් යෞවනයෝද
මැරුම්කෑමට බැස ගියෝයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** නම්වූ රජ්ජුරුවන්-
වහන්සේ කියනසේක. මෝවබ්ගේ 16
විනාශය පැමිණෙන්ට ළඟය, ඔහුගේ
විපත්තිය ඉතා ඉක්මන්වන්නේය. ඔහු 17
වටකර සිටින සියල්ලෙනි, ඔහුගේ
නාමය දන්නා සියල්ලෙනි, ඔහු
ගැන විලාපකියාපල්ලා: අහෝ බලවත්
ජයකොන්තය වන අලංකාර සැරයටිය
කැඩුණු හැටියයි කියාපල්ලා. අහෝ 18
දීබොන්හි වාසයකරන දියණිය, නුඹේ
වෛශ්වර්යයෙන් හීනව බැස, පිපාසායෙන්
හිඳගනින්න; මක්නිසාද මෝවබ්
නාස්තිකරන්නා නුඹට විරුද්ධව ඇවිත්
නුඹේ බලකොටු විනාශකෙළේය. අහෝ 19
ආරොයේර් වැසිය, මාර්ගයෙහි බලබලා
සිට: මක්වුණාද කියා පලායන
තැනැත්තන්ගෙන්ද ගැළවීයන තැනැත්තන්-
ගෙන්ද අසාපන්න. මෝවබ් ලජ්ජාවට 20
පැමුණුණේය; මක්නිසාද ඒක බිඳින-
ලද්දේය. කෑමොරගසාපල්ලා; මෝවබ්
පාළුවූ බව අර්නෝන්හි දන්වාපල්ලා.
නැනිතලාවේ දේශය වන හොලොන්ද 21
යහශාද මෙපායත්ද, දීබොන්ද නෙබෝද 22
බෙත්-දිබ්ලාතයිම්ද, කිරියාතයිම්ද බෙත්- 23
ගාමුල්ද බෙත්-මෙයෝන්ද, කෙරියෝත්ද 24
බොශ්රාද පිටටත් මෝවබ් දේශයේ
සියලුම නුවරවල් පිටටත් ඒවා දුර වුවත්
ළඟ වුවත් විනිශ්චය පැමිණ තිබේ.
මෝවබ්ගේ අඟ කපාදමා තිබේ, ඔහුගේ 25
හස්තයත් කඩා තිබේයයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක. ඔහු **ස්වාමීන්-** 26
**වහන්සේට** විරුද්ධව අහංකාරවූ නිසා
ඔහු මත්කරපල්ලා. මෝවබ්ද තමාගේ
වමනයේ පෙරළී ඉඳ, කවටකමක්
වන්නේය. මක්නිසාද නුඹට ඉශ්‍රායෙල් 27
කවටකමක් වුණා නොවේද? ඔහු
සොරුන් අතරේ සම්බවීද? මක්නිසාද
නුඹ ඔහු ගැන කථාකරන සෑම
විටම නුඹ හිස වනන්නෙහිය. අහෝ 28
මෝවබ් වැසියෙනි, නුවරවල් අත්හැර

පර්වතවල වාසයකරපල්ලා; ගුහා මුඛයේ
පැතිවල කූඩු බඳින පරෙවියා මෙන්
29 වෙයල්ලා. ඉතා උඩඟුවූ මෝවබ්ගේ
උඩඟුකමත් ඔහුගේ ආඩම්බරයත් ඔහුගේ
උද්දරමත් ඔහුගේ අහංකාරයත් ඔහුගේ
හිතේ උසස්කමත් ගැන ඇසීමුව.
30 ඔහුගේ කෝපය හිස් එකක් බවත්
ඔහුගේ ප්‍රලාපවලින් කිසි සිද්ධියක් නූණ
බවත් දනිමියි **ස්වාමීන්වහන්සේ**
31 කියනසේක. එබැවින් මෝවබ් ගැන
කෑමොරගසන්නෙමි; එසේය, මුළු
මෝවබ් ගැන කෑගසන්නෙමි. කීර්-
හෙරෙස්හි මනුෂ්‍යයන් ගැන ඔව්හු
32 වැලපෙන්නෝය. අහෝ සිබ්මාහි මිදිවැල,
යාසේර්හි ඇඬීමට වඩා නුඹ ගැන
අඬන්නෙමි. නුඹේ අතු මුහුදෙන් එපිටට
ගියේය, ඒවා යාසේර් මුහුද දක්වාම
පැතිර ගියේය. නුඹේ ඵල නෙළාගැනීමේදීත්
නුඹේ මුද්‍රික වලු කපාගැනීමේදීත්
33 නාස්තිකරන්නා පැමුණුණේය. සරු
කෙතෙන්ද මෝවබ් දේශයෙන්ද ප්‍රීතිය
සහ සන්තෝෂය පහවිය; මුද්‍රික
තටාකවල මුද්‍රිකපානය නැතුව යන්ට
සැලැස්වීමි. කිසිවෙක් ඝෝෂාව ඇතුව
මිදිපැස නොමඩින්නේය; ඒ ඝෝෂාව
ප්‍රීති ඝෝෂාවක් නොවන්නේය.
34 හෙෂ්බොන්හි කෑගැසීමට එලෙයාලේද
යහශ්ද දක්වාත්, ශෝවර් සිට
හොරොනායිම්ද එග්ලත්-ෂෙලීෂියද
දක්වාත්, ඔව්හු තමුන්ගේ හඬ
පැවැත්වූවෝය. මක්නිසාද නිම්රීම්හි ජල
35 පවා සිඳීයන්නේය. තවද උසස්ථානයෙහි
පූජාකරන්නාද තමාගේ දෙවිවරුන්ට
සුවඳ දුම් ඔප්පුකරන්නාද මෝවබ්
කෙරෙන් නැතිකරන්නෙමියි **ස්වාමීන්-**
36 **වහන්සේ** කියනසේක. ඒ නිසා මාගේ
සිත මෝවබ් ගැන නළා මෙන් ශබ්දදෙයි,
මාගේ සිත කීර්-හෙරෙස්හි මනුෂ්‍යයන්
ගැනත් නළාවක් මෙන් ශබ්දදෙයි.
මක්නිසාද ඔහු උපදවාගත් සම්පත්
37 නැතිවිය. සියලුම ඉස් මුඩුකර, සියලුම
රැවුල් කපා තිබේ. සියලුම අත්වල කැපීම්ද
38 ඉහටිවල ගෝණි රෙදිද තිබේ. මෝවබ්හි
සියලු පියසි උඩද එහි සියලු වීථිවලද
වැලපීම ඇත්තේය. මක්නිසාද අප්‍රියවූ
භාජනයක් මෙන් මෝවබ් බිඳදැමුවෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. ඒක 39
හෙළාදමනු ලැබූ හැටි! ඔවුන්
කෑමොරගසන හැටි! මෝවබ් පිටිපා
ලජ්ජාවට පැමුණුණු හැටි! මෙසේ
මෝවබ් ඔහු වටකර සිටින සියල්ලන්ට
කවටකමක් සහ භයංකාරකමක්
වන්නේය. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** 40
මෙසේ කියනසේක: බලව, ඔහු
රාජාලියෙකු මෙන් ඉගිලී ඇවිත් මෝවබ්
පිට තමාගේ පියාපත් විහිදනවා ඇත.
නගරවල් අසුවිය, බලකොටුද අල්ලාගනු 41
ලැබීය, ඒ දවසේ මෝවබ්හි බලවතුන්ගේ
සිත වදන ස්ත්‍රියෙකුගේ සිත මෙන්
වන්නේය. මෝවබ් **ස්වාමීන්වහන්සේට** 42
විරුද්ධව අහංකාරකම් කළ නිසා,
ජාතියක්ව නොසිටින ලෙස නැතිකරනු
ලබන්නේය. අහෝ මෝවබ් වැසිය, 43
භීතියත් වළත් මලපතත් නුඹ පිට
තිබේයයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
භීතිය ඉදිරියෙන් පලායන්නා වළේ වැටේ; 44
වළෙන් ගොඩට එන්නා මලපතේ අසුවේ.
මක්නිසාද ඇට, එනම් මෝවබ්ට,
දඬුවම්කරන අවුරුද්ද පමුණුවන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. පලාගිය 45
අය හෙෂ්බොන්හි සෙවණෙහි බලය
නැතුව සිටිති. මක්නිසාද හෙෂ්බොන්හි
සිට ගින්නක්ද සීහොන් ඇතුළෙන්
ගිනිදළුවක්ද නික්ම ඇවිත්, මෝවබ්
පළාත සහ ඝෝෂාකාර පුත්‍රයන්ගේ
හිස්මුදුන්ද දවාදැමුවේය. අහෝ මෝවබ් 46
නුඹට දුක්වේ! කෙමොෂ්ගේ සෙනඟ
නාස්තිවූය. මක්නිසාද නුඹේ පුත්‍රයෝ
වාලටද නුඹේ දූවරු වාල්කමටද
ගෙනයනු ලැබුවෝය. එහෙත් මතු 47
දවස්වලදී මම මෝවබ්ගේ වාල්කම
පහකරන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. මෝවබ්ගේ විනිශ්චය තීන්දුය.

## අම්මොන් ගැන

49

අම්මොන් පුත්‍රයන් ගැනය.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක: ඉශ්‍රායෙල්ට පුත්‍රයෝ නැද්ද? ඔහුට
උරුමක්කාරයෙක් නැද්ද? ඇත්නම්
මල්කාම් ගාද් රට හිමිකරගත්තෙත්

ඔහුගේ සෙනඟ එහි නුවරවල
2 වාසයකරන්නෙත් මක්නිසාද? එබැවින්
අම්මොන් පුත්‍රයන්ගේ රබ්බාහි යුද්ධ
ඝෝෂාවක් ඇසෙන්ට මා විසින් සලස්වන
දවස් පැමිණෙන්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක; ඒක පාළුවූ ගොඩක්
වන්නේය, ඊට අයිති ගම්ද ගින්නේ දවා
දමනු ලබන්නේය. ඉශ්‍රායෙල්ද තමුන්ගේ
දේශය හිමිකරගත් අයගේ දේශය හිමි
කරගන්නවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
3 කියනසේක. අහෝ හෙෂ්බොන්,
කෑමොරගසාපන්න, මක්නිසාද හායි
නටබුන්විය; එම්බා රබ්බාහි ගම්,
කෑගසා, ගෝණි රෙදි හැඳගන, විලාප
කියා තාප්ප අතරේ එහා මෙහා
දුවපල්ලා; මක්නිසාද මල්කාම්ද ඔහුගේ
පූජකයෝද අධිපතීහුද එක්ව වාල්කමට
4 යන්නෝය. පසුබටවන දියණිය, නුඹ
මිටියාවත් ගැන එනම් නුඹේ ගලා යන
මිටියාවත් ගැන පාරට්ටුකරගන්නේ
මක්නිසාද? මට විරුද්ධව පැමිණෙන්නේ
කවුදැයි කියා නුඹේ වස්තු කෙරෙහි
5 නුඹ විශ්වාසකරන්නෙහිය. බලව, නුඹ
වටකර සිටින සියල්ලන්ගෙන් නුඹ පිටට
භීතියක් පමුණුවන්නෙමියි මහෝත්තමවූ
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක;
නුඹලා එකිනෙකා තම තමා ඉදිරිපිටින්
පන්නනු ලබන්නහුය, පලා යන අය
පිළිගැනීමටද කිසිවෙක් නොවන්නේය.
6 නුමුත් පසුව මම අම්මොන් පුත්‍රයන්ගේ
වාල්කම පහකරන්නෙමියි **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක.

## ඒදෙම ගැන

7 ඒදෙම ගැනය. සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: තේමාන්හි
තවත් ප්‍රඥාව නැද්ද? බුද්ධිමත් අය
අතරෙන් මන්ත්‍රණය නැතිවීද? ඔවුන්ගේ
8 ප්‍රඥාව පහවගියාද? දෙදන් වැසියෙනි,
දුවපල්ලා, හැරී දුරස්තරයටම ගොස්
වාසයකරපල්ලා; මක්නිසාද ඒසව්ගේ
විපත්තිය, එනම් මා ඔහුට දඬුවම්කරන
9 කාලය ඔහු පිටට පමුණුවමි. මිදිවල
නෙළන්නෝ නුඹ ළඟට ආවොත් ඔව්හු
මිදිවල ස්වල්පයක්වත් ඉතුරු නොකරද්ද?
රාත්‍රියේ සොරු ආවොත් ඔව්හු තමුන්ට
සෑහෙන පමණ ගන්නා තුරු නාස්ති
නොකරන්නෝද? නුමුත් මම ඒසව් 10
නිර්වස්ත්‍රකෙළෙමි, ඔහු සැඟවෙන ස්ථාන
එළිදරව් කෙළෙමි, ඔහුට සැඟවී සිටින්ට
බැරිවන්නේය. ඔහුගේ වංශයද සහෝදරයෝද
අසල්වාසීහුද නාස්තිවුණෝය, ඔහුද නැත.
නුඹේ පියා නැති දරුවන් අත්හැරපන්න, 11
මම ඔවුන් පණපිටින් ආරක්ෂාකරන්නෙමි;
නුඹේ වැන්දඹුවෝද මා කෙරෙහි
විශ්වාසකරත්වා. මක්නිසාද **ස්වාමීන්-** 12
**වහන්සේ** මෙසේ කියනසේක: බලව,
කුසලානෙන් බොන්ට නියම නැති අය
බොනවාම ඇත; එසේ වීනම් නුඹ කිසි
දඬුවමක් නොලැබ සිටින්නෙහිද? නුඹ
දඬුවම් නොලැබ නොසිට බොනවාම
ඇත. මක්නිසාද බොශ්රා විස්මයක්ද 13
නින්දවක්ද පාළුවක්ද ශාප-වචනයක්ද
එහි සියලු නුවරවල් සදාකාල පාළු ඉඩම්ද
වන්නෝයයි මා ගැනම දිවුළෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. රැස්වී 14
ඇට විරුද්ධව ඇවිත් යුද්ධයට නැඟිටියල්ලා-
යයි කියන්ට ජාතීන් අතරට තානාපතියෙක්
යවනලද්දේය යන ආරංචිය **ස්වාමීන්-**
**වහන්සේගෙන්** ලැබීමි. මක්නිසාද: මෙන්න 15
මම නුඹ ජාතීන් අතරේ කුඩා කෙළෙමි,
මනුෂ්‍යයන් අතරේ සුළුකෙළෙමි. අහෝ 16
පර්වත විවරවල වසන්නාවූ, හෙල්මුදුන්
අල්ලාගෙන සිටින්නාවූ තැනැත්ත, නුඹේ
සිතේ භයංකරකම ගැන නුඹේ සිතේ
උඩඟුකමෙන් නුඹ රැවටුණෙහිය. නුඹේ
කූඩුව රාජාලියා මෙන් ඉහළින් සෑදුවත්
එතැනින් නුඹ පහළට හෙළන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. ඒදෙම 17
විස්මයට හේතුවක් වන්නේය. ඒ ළඟින්
යන සියල්ලෝ විස්මපත්ව, ඊට පැමුණුණු
සියලු විපත්ති ගැන සරදම්කරන්නෝය.
සොදෙම සහ ගොමොරාවේද එහි 18
අසල නුවරවලද විනාශය මෙන්, කිසි
මනුෂ්‍යයෙක් එහි වාසය නොකරන්නේය,
කිසි මනුෂ්‍ය පුත්‍රයෙක් එහි පොරොත්තුව
නොසිටින්නේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. බලව, ඔහු සිංහයෙකු මෙන් 19
යොර්දන් වනයේ සිට බලවත් නිවාසයට
විරුද්ධව නැඟී එන්නේය. මක්නිසාද
මම ඇසිල්ලකින් ඈ වෙතින් ඔහු
දුවන්ට සලස්වන්නෙමි; තෝරාගන්නාලද

කව්රෙකු නුමුත් මම ඈ කෙරෙහි
පත්කරන්නෙමි. මක්නිසාද මට සමාන
කවුද? මට කාලයක් නියමකරන්නේ
කවුද? මා ඉදිරියෙහි සිටින්ට පුළුවන්
20 එඬේරාත් කවුද? එබැවින් **ස්වාමීන්-**
**වහන්සේ** ඒදෙමට විරුද්ධව කරගත්
මන්ත්‍රණයද තේමාන්හි වැසියන්ට
විරුද්ධව කරගත් උන්වහන්සේගේ
යෝජනාද අසාපල්ලා. සැබවින්ම ඔවුන්
රැළේ කුඩා අය ඇදගන යනවා
ඇත: සැබවින්ම උන්වහන්සේ ඔවුන්ගේ
වාසස්ථානය ඔවුන් සමග පාළුකරන-
21 සේක. ඔවුන්ගේ වැටීමේ ශබ්දයට
පොළොව සෙලවේ: කෑගැසීමේ හඬ
22 රතු මුහුද දක්වා ඇසෙයි. බලව, ඔහු
රාජාලියෙකු මෙන් නැගී ඉගිලී
ඇවිත්. බොශ්රා පිට තමාගේ පියාපත්
විදහනවා ඇත. ඒ දවසේ ඒදෙමේ
බලවතුන්ගේ සිත වදන ස්ත්‍රියෙකුගේ
සිත මෙන් වන්නේය.

## දමස්කය ගැන

23 දමස්කය ගැනය. හමාත්ද අර්පාද්ද
ලජ්ජාවට පැමුණුණෝය: මක්නිසාද
ඔව්හු නරක ආරංචියක් අසා දියවී
ගියෝය. මුහුද පිට චංචලය ඇත්තේය:
24 ඊට නිශ්චලවෙන්ට බැරිය. දමස්කය
බෙලහීනව පලායන්ට හැරුණාය,
වෙවුලුම ඈ අල්ලාගත්තේය. වදන
ස්ත්‍රියෙකුට මෙන්, විපත්තියද වේදනාවද
25 ඈට පැමිණ තිබේ. කීර්තිමත් නුවර
වන මාගේ ප්‍රීතියේ නුවර අත්හරිනු
26 ලැබූ හැටි! එබැවින් ඒ දවසේදී ඈගේ
යෞවනයෝ එහි වීථිවල වැටෙන්නෝය.
එහි සියලු යුද්ධකාරයෝද නිශ්ශබ්ද
කරනු ලබන්නෝයයි සේනාවල
27 **ස්වාමීන්වහන්සේ** කියනසේක. මම
දමස්කයේ පවුර ඇතුළෙහි ගින්නක්
අවුළුවන්නෙමි. එයින් බෙන්-හදද්ගේ
මාළිගා දලායන්නේය.

## කේදර් සහ හාශෝර් ගැන

28 කේදර් ගැනත් බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් විසින් පහරදුන් හා
ශෝර්හි රාජ්‍යවල් ගැනත්ය.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
නුඹලා නැගිට කේදර්ට නැගී ගොස්,
නැගෙනහිර දිශාවේ පුත්‍රයන්
නාස්තිකරපල්ලා. ඔවුන්ගේ කූඩාරම්ද 29
බැටළු රැළවල්ද ගෙනයනු ලබන්නෝය.
ඔවුන්ගේ තිරද ඔවුන්ගේ සියලු භාණ්ඩද
ඔවුන්ගේ ඔටුවන්ද තමුන්ටම අරගෙන
යන්නෝය. භීතිය වටකරින්ම ඇත්තේය
කියා ඔව්හු ඔවුන්ට මොරගසන්නෝය.
හාශෝර් වැසියෙනි, දුවපල්ලා. ඈතට 30
පලාගොස් දුරස්තරයෙහි වාසයකරපල්ලා-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
මක්නිසාද බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් නුඹලාට විරුද්ධව
මන්ත්‍රණයක් කරගෙන, නුඹලාට
විරුද්ධව යෝජනාවක්ද කර තිබේ.
නුඹලා නැගිට, නොසැලකිලිව අප්‍රවේසම්- 31
ලෙස වාසයකරන්නාවූ, දොරවල්ද අගුල්ද
නැතිව තනිව වාසය කරන්නාවූ ජාතියට
විරුද්ධව පලයල්ලායයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. ඔවුන්ගේ ඔටුවෝ 32
කොල්ලයක්ද ඔවුන්ගේ ගව සමූහයා
ගොදුරක්ද වන්නෝය. හිසකේ කොන්
කපාදමන අය මම සියලු දිශාවලට
විසුරුවන්නෙමි: එහි සෑම පැතිවලින්ද
ඔවුන්ට විනාශය පමුණුවන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. හාශෝර් 33
වනාහි සිවලුන්ගේ වාසයක්ද සදාකාල
පාළුවක්ද වන්නේය. කිසි මනුෂ්‍යයෙක්
එහි වාසයකරන්නේවත් කිසි මනුෂ්‍ය
පුත්‍රයෙක් එහි නැවතී සිටින්නේවත් නැත.

## ඒලාම ගැන

යූදාහි රජවූ ශෙදෙකියාගේ රජකම් 34
කිරීමේ පටන්ගැන්මේදී ඒලාම ගැන
අනාගතවක්තෲවූ යෙරෙමියා වෙතට
පැමිණි **ස්වාමීන්වහන්සේගේ** වචනයය.
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ 35
කියනසේක: බලව, ඒලාමේ ප්‍රධාන
බලයවූ ඔවුන්ගේ දුන්න කඩා දමමි.
මම ඒලාමට විරුද්ධව අහසේ සතර 36
කොනෙන් හුළං සතරක් පමුණුවා, ඒ
සියලු හුළංවලට ඔවුන් විසුරුවා
දමන්නෙමි; පන්නනු ලබන ඒලාම්වරුන්

තොපැමිණෙන්නාවූ කිසි ජාතියක්
37 නොවන්නේය. එසේය, මම ඒලාම්වරුන්
ඔවුන්ගේ සතුරන්ද ඔවුන්ගේ ප්‍රාණය
හානිකරන්ට සොයන්නන්ද ඉදිරියෙහි
කලඹා, ඔවුන් පිටට විපත්තිය වන මාගේ
බලවත් උදහස පමුණුවා, මා විසින්
ඔවුන් විනාශකරන තුරු ඔවුන් පස්සේ
කඩුව හරින්නෙමියි **ස්වාමීන්වහන්සේ**
38 කියනසේක. මාගේ සිංහාසනයද ඒලාමේ
පිහිටුවා, එතැනින් රජු සහ අධිපතීන්
නැතිකරන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
39 කියනසේක. එහෙත් මතු දවස්වලදී
ඒලාමේ වාල්කම පහකරන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## බබිලෝනිය ගැන

50 බබිලෝනිය සහ කල්දිවරුන්ගේ
දේශය ගැන **ස්වාමීන්වහන්සේ**
අනාගතවක්තෘවූ යෙරෙමියා ලවා
කියෙවූ වචනයය.
2 ජාතීන් අතරේ දන්වා ප්‍රකාශකොට,
කොඩියක් නගාපල්ලා; නොසඟවා,
ප්‍රසිද්ධකොට, මෙසේ කියාපල්ලා:
බබිලෝනිය අසුවිය, බේල් ලජ්ජාවට
පැමුණුණේය, මෙරොදක් කැලඹී සිටියි;
ඇගේ දේවරූප ලජ්ජාවට පැමුණුණේය,
3 ඇගේ රූප කැලඹී තිබේ. මක්නිසාද
ඇට විරුද්ධව උතුරු දිගින් ජාතියක්
එන්නේය, ඔවුන් ඇගේ දේශය පාළුවක්
කරනවා ඇත, කිසිවෙක් එහි
නොවසන්නේය. මනුෂ්‍යයෝද මෘගයෝද
දෙගොල්ලම පලාගියෝය, අහක්ව
4 ගියෝය. ඒ දවස්වලදීත් ඒ කාලයේදීත්
ඉශ්‍රායෙල් පුත්‍රයන් සහ යූද පුත්‍රයෝ
එක්ව ඇවිත්, අඬ අඬා යමින්, තමුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** සොයන්නෝයයි
5 **ස්වාමීන්වහන්සේ** කියනසේක. වරෙල්ලා,
මතකනැති නොවන සදාකාල ගිවිසුමකින්
**ස්වාමීන්වහන්සේට** එකතුවෙමුයයි කියා
ඔවුන් මේ දේශයට මුහුණ හරවාගෙන
සියොන්ට පැමිණෙන මාර්ගය
විභාගකරනවා ඇත.
6 මාගේ සෙනඟ වනාහි නැතිවූ බැටළුවෝව
සිටියෝය. ඔවුන්ගේ එඬේරු ඔවුන්
මුළාකරවා, කඳුවල ඉවත යන්ට
සැලැස්සුවෝය. ඔව්හු කන්දෙන් හෙලට
ගොස්, තමුන්ගේ ලැගුම්පල මතක
නැතිකළෝය. ඔවුන්ට සම්බවුණු 7
සියල්ලෝම ඔවුන් ගොදුරට ගත්තෝය.
ඔවුන්ගේ එදිරිකාරයෝ කථාකොට:
ඔවුන් **ස්වාමීන්වහන්සේ** වන ධර්මිෂ්ඨකමේ
වාස භූමියවූ තමුන්ගේ පියවරුන්ගේ
බලාපොරොත්තුවවූ **ස්වාමීන්වහන්සේට**
විරුද්ධව පව්කළ නිසා, අපි
වැරදිකාරයෝ නොවෙමුයයි කීවෝය.
බබිලෝනිය ඇතුළෙන් පලාගොස්, 8
කල්දිවරුන්ගේ දේශයෙන් පිටත්වී,
රැළට පෙරටුවෙන් යන එළුවන් මෙන්
වෙයල්ලා. මක්නිසාද මම උතුරු 9
දේශයෙන් මහත් ජාතීන් රාශියක්
බබිලෝනියට විරුද්ධව පොළඹවා
ගෙනෙන්නෙමි. ඔවුන් ඇට විරුද්ධව
සැරසී සිටිනවා ඇත; ඈ ඔවුන්ගේ
අතට අසුවෙනවා ඇත. ඔවුන්ගේ ඊගස්
දක්ෂ බලවන්තයෙකුගේ ඊගස් වැනිය;
ඒවා නිකම් හැරීඑන්නේ නැත. කල්- 10
දියාව කොල්ලයක් වන්නීය. ඇගෙන්
කොල්ලකන සියල්ලෝම තෘප්තියට
පැමිණෙන්නෝයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මාගේ උරුමය කොල්ලකන 11
තැනැත්තෙනි, නුඹලා ප්‍රීති සන්තෝෂවෙන
නිසාත්, ගොයම් මඩින එළනැම්බියෙකු
මෙන් පැනනගින නිසාත්, ශක්තිමත්
අශ්වයන් මෙන් හේෂාරවය කරන නිසාත්,
නුඹලාගේ මවු ඉතා ලජ්ජාවන්නීය; 12
නුඹලා වැදූ තැනැත්තී නින්දවට
පත්වන්නීය. බලව, ඈ ජාතීන්ගෙන් ඉතා
පහත් තැනැත්තීද කාන්තාරයක්ද වියළි
භූමියක්ද මරුකතරක්ද වන්නීය. **ස්වාමීන්-** 13
**වහන්සේගේ** කෝපය නිසා ඒක
වැසියෙක් නැතිව සහමුලින්ම පාළු-
වන්නේය. බබිලෝනිය ළඟින් යන
සියල්ලෝම විස්මයට පත්ව ඇගේ සියලු
විපත්තිවලට නින්දකරන්නෝය. දුනු 14
තැත්කවන සියල්ලෙනි, බබිලෝනියට
විරුද්ධව වටකරින් සැරසී සිට, ඒක
ඊගසක්වත් ඉතිරිකර නොගෙන ඇට
විදපල්ලා. මක්නිසාද ඈ **ස්වාමීන්-**
**වහන්සේට** විරුද්ධව පව්කළාය. ඇට 15
විරුද්ධව වටකරින් ඝෝෂාකරපල්ලා;

ඈ යටත්වූවාය; ඇගේ ප්‍රාකාර වැටුණේය,
ඇගේ පවුරුද කඩාදමනලද්දේය.
මක්නිසාද එය **ස්වාමීන්වහන්සේගේ**
පළිගැනීමය; ඇගෙන් පළිගෙන, ඈ කළ
16 හැටියට ඈට කරපල්ලා. වපුරන්නා සහ
ගොයම්කපන කාලයෙහි දෑකැත්ත
පාවිච්චිකරන්නා බබිලෝනියෙන් සිඳ
දමාපල්ලා. පීඩාකරන කඩුවට භයින්
ඔව්හු තම තමුන්ගේ සෙනඟ වෙතට
හැරී තම තමුන්ගේ දේශයට පලායන්නෝය.
17 ඉශ්‍රායෙල් විසිරගිය බැටළුවෙක්ය;
සිංහයෝ ඔහු පන්නාදැමුවෝය. පළමු
කොට අෂූර්හි රජ ඔහු ගොදුරට
ගත්තේය; අන්තිමට බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් ඔහුගේ ඇට බින්දේය.
18 එබැවින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, මා විසින් අෂූර්හි රජුට
දඬුවම්කළාක්මෙන් බබිලෝනියේ රජුටත්
ඔහුගේ දේශයටත් දඬුවම්කරන්නෙමි.
19 ඉශ්‍රායෙල් නැවත ඔහුගේ තෘණ බිමට
ගෙනෙන්නෙමි, එවිට ඔහු කර්මෙල්හිද
බාෂාන්හිද පෝෂ්‍යවෙනවා ඇත, එප්‍රායිම්
හෙල් පිටද ගිලියද්හිද ඔහුගේ ප්‍රාණය
20 තෘප්තියට පැමිණෙන්නේය. ඒ දවස්වල
සහ ඒ කාලයේදී ඉශ්‍රායෙල්ගේ අයුතුකම
සොයන නුමුත් එය නොතිබෙයි; යූදගේ
පාපයන් සොයන නුමුත් ඒවා සම්බ
නොවෙයි. මක්නිසාද මා විසින්
ඉතුරුකරන අයින්ට කමාවන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
21 මෙරාතයිම් දේශයටත් පෙකෝඩ්හි
වැසියන්ටත් විරුද්ධව නැගී ගොස් ඔවුන්
මරා, පසුපස්සේ ගොස් නාස්තිකර, මා
නුඹට අණකළ සියල්ල ලෙස කරපන්නැයි
22 **ස්වාමීන්වහන්සේ** කියනසේක. යුද්ධ-
කිරීමේද මහත් විනාශයේද ශබ්දයක්
23 දේශයෙහි තිබේ. මුළු පොළොවේ
කුළුගෙඩිය දෙකට කපා කඩාදමනු ලැබූ
හැටි! ජාතීන් අතරේ බබිලෝනිය
24 පාළුවක් වූ හැටි! අහෝ බබිලෝනිය,
මම නුඹට මලපතක් තැබීමි, නුඹද
නොදැනුවත්ව අසුවුණෙහිය. නුඹ
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව යුද්ධකළ
නිසා නුඹ අසුවී, අල්ලනලද්දේය.

**ස්වාමීන්වහන්සේ** තමන්ගේ ගබඩාව 25
ඇර, තමන්ගේ කෝපයේ ආයුධ එළියට
ගත්සේක. මක්නිසාද කල්දිවරුන්ගේ
දේශයෙහි ස්වාමිවූ සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** විසින් කරන්ට වැඩක් තිබේ.
ඉතා දුර සීමාවේ සිටම ඈ ළඟට ඇවිත්, 26
ඇගේ ගබඩාවල් ඇර, ගොඩැලි මෙන්
ඈ ගොඩකර, ඈට කිසිවක් ඉතිරි
නොකර, ඈ සිඳදමාපල්ලා. ඇගේ සියලු 27
ගොනුන් මරාපල්ලා; උන් මැරුම්කෑමට
බසිත්වා. ඔවුන්ට දුක්වේ! මක්නිසාද
ඔවුන්ගේ දවස වන, ඔවුන්ට දඬුවම්කරන
කාලය පැමිණ තිබේ. අපේ දෙවිවූ 28
**ස්වාමීන්වහන්සේගේ** පළිගැනීමද උන්-
වහන්සේගේ මාළිගාව ගැන පළි-
ගැනීමද සියොන්හි දන්වන්ට බබිලෝන්
දේශයෙන් ගැළවී පලාඑන්නන්ගේ හඬක්
ඇසෙන්නේය. බබිලෝනියට විරුද්ධව 29
දුනුකාරයන් වන දුනු නැන්කවන
සියල්ලන් අඬගසාගනිල්ලා; ඈට
විරුද්ධව වටකරින් අන්දයම් බැඳ,
කිසිවෙකුට ගැළවීයන්ට ඉඩනැර, ඇගේ
ක්‍රියාකිරීමේ හැටියට ඈට ප්‍රතිඵලදී, ඈ
කළ සියල්ල ලෙස ඈට කරපල්ලා.
මක්නිසාද ඈ **ස්වාමීන්වහන්සේ** වන
ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේට
විරුද්ධව එඩිතරවූවාය. එබැවින් ඒ 30
දවසේදී ඇගේ යෞවනයන් ඇගේ වීථිවල
වැටෙනවා ඇතැයිද ඇගේ සියලු
යුද්ධකාරයන් මැරී නිශ්ශබ්දවෙනවා
ඇතැයිද **ස්වාමීන්වහන්සේ** කියනසේක.
බලව, උඩඟුවූ තැනැත්ත, මම නුඹට 31
විරුද්ධයයි ස්වාමිවූ සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. මක්නිසාද නුඹේ
දවස වන මා නුඹට දඬුවම්කරන කාලය
පැමිණ තිබේ. උඩඟු තැනැත්තා පැකිල 32
වැටෙයි, කිසිවෙක් ඔහු නොනැගුටු-
වන්නේය. මම ඔහුගේ නුවරවල
ගින්නක් අවුළුවන්නෙමි, එයින් ඔහු
වටකර තිබෙන සියල්ල දලායනවා ඇත.
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ 33
කියනසේක: ඉශ්‍රායෙල් පුත්‍රයෝද යූද
පුත්‍රයෝද එක්ව පීඩා විඳින්නෝය. ඔවුන්
වාලට ගත් සියල්ලෝ ඔවුන් අත්හරින්ට
අකමැතිව ඔවුන් අල්ලාගනම සිටිති.

34 ඔවුන්ගේ මිදුම්කාරයා බලවත්ව
සිටිනසේක; උන්වහන්සේගේ නාමය
සේනාවල **ස්වාමීන්වහන්සේය**. පොළොව
නිශ්චලකරන පිණිසත් බබිලෝනියේ
වැසියන් චංචල කරන පිණිසත් උන්-
වහන්සේ ඔවුන්ට යුක්තිය කරදෙනවාම
35 ඇත. කඩුවක් කල්දිවරුන්ද බබිලෝනියේ
වැසියන්ද ඇගේ අධිපතීන්ද ඇගේ
ප්‍රඥාවන්තයන්ද පිටට පැමිණේයයි
36 ස්වාමීන්වහන්සේ කියනසේක. කඩුවක්
පාරට්ටුකාරයන් පිටට පැමිණ, ඔවුන්
මෝඩයන් වෙනවා ඇත. කඩුවක් ඇගේ
බලවන්තයන් පිටට පැමිණ ඔවුන්
37 කැලඹෙනවා ඇත. කඩුවක් ඔවුන්ගේ
අශ්වයන් පිටටත් ඔවුන්ගේ රථ පිටටත්
ඈ තුළ සිටින මිශ්‍රවූ මුළු සේනාව පිටටත්
පැමිණ, ඔවුන් ස්ත්‍රීන් මෙන් වෙනවා
ඇත. කඩුවක් ඇගේ වස්තු පිටට පැමිණ,
38 ඒවා කොල්ලකනු ලබනවා ඇත. නියඟක්
ඇගේ ජලයන් පිටට පැමිණ, ඒවා
හිඳීයනවා ඇත. මක්නිසාද එය කැපූ
රූප ඇති දේශයක්ය, ඒ භයානක දේවල්
39 ගැනද ඔව්හු උමතුවී සිටිති. එබැවින්
වනයේ සත්තුද වෘකයෝද එහි
වසන්නෝය, පැස්බරුද එහි වාසය-
කරන්නෝය. එහි නවත් කවදාවත්
වැසියෝ නොවන්නෝය; පරම්පරාවෙන්
පරම්පරාවට කිසිවෙක් එහි නො-
40 වසන්නේය. දෙවියන්වහන්සේ විසින්
සොදොමද ගොමෝරාවද එහි අසල
නුවරවල්ද නාස්තිකළ කාලයේ මෙන්,
මනුෂ්‍යයෙක් එහි වාසය නොකරන්නේය,
කිසි මනුෂ්‍ය පුත්‍රයෙක් එහි පොරොත්තුව
නොසිටින්නේයයි **ස්වාමීන්වහන්සේ**
41 කියනසේක. අන්න, උතුරෙන් සෙනඟක්
එන්නේය; මහත් ජාතියක්ද බොහෝ
රජවරුද පොළොවේ ඉතා දුර සීමාවලින්
42 නැගිට එන්නෝය. ඔව්හු දුනුද හෙල්ලද
දරන්නෝය; ඔව්හු කෲරය, කරුණාවක්
නොපෙන්වති; ඔවුන්ගේ හඬ මුහුද මෙන්
ඝෝෂාකරයි, ඔව්හු අසුන් පිට නැගී
එති; බබිලොන් දියණිය, ඔව්හු එකෙකු
මෙන් නුඹට විරුද්ධව යුද්ධකරන්ට
43 පෙළට සැදී සිටිති. බබිලෝනියේ රජු
ඔවුන් ගැන කීර්තිය අසා තිබේ, ඔහුගේ
අත් හෙළා වැටී තිබේ. දුක්ද වදන
ස්ත්‍රියෙකුට මෙන් වේදනාවද ඔහුට
අල්ලා තිබේ. බලව, ඔහු සිංහයෙකු 44
මෙන් යොර්දනේ වනයේ සිට බලවත්
නිවාසයට විරුද්ධව නැගී එන්නේය.
මක්නිසාද මම ඇසිල්ලකින් ඈ වෙතින්
ඔවුන් දුවන්ට සලස්වන්නෙමි;
තෝරාගන්නා ලද කවරෙකු නුමුත් මම
ඔහු ඈ කෙරෙහි පත්කරන්නෙමි.
මක්නිසාද මට සමාන කවුද? මට
කාලයක් නියමකරන්නේ කවුද? මා
ඉදිරියෙහි සිටින්ට පුළුවන් එඬේරාත්
කවුද? එබැවින් **ස්වාමීන්වහන්සේ** 45
බබිලෝනියට විරුද්ධව කරගත්
මන්ත්‍රණයද කල්දිවරුන්ගේ දේශයට
විරුද්ධව කරගත් උන්වහන්සේගේ
යෝජනාද අසාපල්ලා. සැබවින්ම ඔවුන්
රැළේ කුඩා අය ඇදගන යනවා ඇත.
සැබවින්ම උන්වහන්සේ ඔවුන්ගේ
වාසස්ථානය ඔවුන් සමග පාළුකරන-
සේක. බබිලෝනිය අල්ලාගනු ලැබුණේය යන හඬට 46
පොළොව සෙලවෙන්නේය, කෑගැසීමද
ජාතීන් අතරේ ඇසෙන්නේය.

51

**ස්වාමීන්වහන්සේ** මෙසේ කියන-
සේක. බලව, මම බබිලෝනියට
විරුද්ධවද *ලෙබ් කමයි වැසියන්ට
විරුද්ධවද නාස්තිකරන හුළඟක්
හටගන්වන්නෙමි. මම බබිලෝනියට 2
පොළන්නන් යවන්නෙමි, ඔවුන් ඈ
පොළා ඇගේ දේශය හිස්කරදමනවා
ඇත. මක්නිසාද ඔව්හු විපත්ති දවසේදී
වටකරින්ම ඈට විරුද්ධවන්නෝය.
දුනුවායා තමාගේ දුන්න නැත් 3
නොකවාවා, ඔහු තමාගේ යුද්ධ සැට්ටය
හැඳගෙන නැගිට නොසිටීවා. නුඹලා
ඇගේ යෞවනයන්ට කරුණා නොකොට
ඇගේ මුළු සේනාව සිඳදමාපල්ලා. ඔව්හු 4
මැරුම්කා කල්දිවරුන්ගේ දේශයෙහිද
ඇනුම් ලැබ එහි වීථිවලද වැටෙන්නෝය.
මක්නිසාද ඉශ්‍රායෙල්වරුන්ගේද යූද- 5
වරුන්ගේද දේශය ඉශ්‍රායෙල්හි ශුද්ධ
තැනන්වහන්සේට විරුද්ධව කළ වරදෙන්
පිරී තිබෙන නුමුත්, ඔවුන්ගේ දෙවිවූ
සේනාවල **ස්වාමීන්වහන්සේ** විසින් එය

*එනම් කල්දියාවේ.

6 *අන්තරීනු නොලැබීය. බබිලෝනිය
කෙරෙන් පලා ගොස් නුඹලා එකිනෙකා
තම තමාගේ ප්‍රාණය ගළවාගනිල්ලා:
ඇගේ අයුතුකමෙන් නාස්තිනොවෙල්ලා.
මක්නිසාද මෙය **ස්වාමීන්වහන්සේගේ**
පළිගැනීමේ කාලයය: උන්වහන්සේ ඇට
7 ප්‍රතිඵලදෙනසේක. බබිලෝනිය වනාහි
**ස්වාමීන්වහන්සේගේ** අතේ තිබුණු මුළු
පොළොව මත්කළාවූ රන් කුසලානක්ය.
ඇගේ මුද්‍රික පානයෙන් ජාතීහු බීවෝය;
8 එබැවින් ජාතීහු උමතුව සිටිති. බබිලෝනිය
හදිසියෙන් වැටී විනාශවූවාය. ඈ ගැන
කැමොරගසාපල්ලා: ඇට සුවවේදෝ
කියා බලන පිණිස ඇගේ තුවාලයට
9 ගුගුල් ගෙනෙල්ලා. අපි බබිලෝනිය
සුවකරන්ට උත්සාහකෙළෙමුව. නුමුත්
ඇට සුවවෙලා නැත. ඇය අත්හැරපල්ලා.
අපි එකිනෙකා තම තමාගේ රටට යමු.
මක්නිසාද ඇගේ විනිශ්චය අහසට ළංවී
10 වලාකුල් දක්වා නැගුණේය. **ස්වාමීන්-
වහන්සේ** අපේ ධර්මිෂ්ඨකම එළිදරව්කළ-
සේක. වරෙල්ලා. අපේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේගේ** ක්‍රියාකිරීම සියොන්හි
11 ප්‍රකාශකරමු. ඊතල මැදලා උල්කර පලිස්
තදින් අල්ලාගනිල්ලා. **ස්වාමීන්වහන්සේ**
මේදියාවේ රජවරුන්ගේ සිත් පෙළඹෙවූ-
සේක: මක්නිසාද බබිලෝනිය නටබුන්
කිරීමට උන්වහන්සේගේ යෝජනාව ඊට
විරුද්ධව තිබේ. මෙය වනාහි **ස්වාමීන්-
වහන්සේගේ** පළිගැනීමය. උන්වහන්සේගේ
12 මාළිගාව ගැන පළිගැනීමය. බබිලෝනියේ
පවුරුවලට විරුද්ධව කොඩියක් ඔසවා,
මුරපළ සවිකර, මුරකාරයන් සිටවා,
රහස් සේනාව සූදනම්කරපල්ලා.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** බබි-
ලෝනියේ වැසියන්ට විරුද්ධව කී දේ
උන්වහන්සේ යෝජනාකළාක්මෙන්ම
13 ඉෂ්ටකළසේක. එම්බා බොහෝ ජලයන්
පිට වසන්නාවූ, බොහෝ වස්තු ඇත්තාවූ
තැනැත්තිය, නුඹේ තණ්හාවේ මිම්ම වන
14 නුඹේ අන්තිමය පැමුණුණේය. පළගැටියන්
මෙන් මනුෂ්‍යයන්ගෙන් නුඹ පුරවන්නෙමි:
ඔවුන් නුඹට විරුද්ධව ඝෝෂාවක් නගනවා
ඇත කියා සේනාවල **ස්වාමීන්වහන්සේ**
තමන් ගැනම දිවුළසේක.

උන්වහන්සේ තමන්ගේ බලයෙන් 15
පොළොව සාද, තමන්ගේ ප්‍රඥාවෙන්
ලෝකය පිහිටුවා, තමන්ගේ බුද්ධියෙන්
අහස දිගහැරියසේක. උන්වහන්සේ 16
ස්වකීය හඬ පවත්වන කල අහසෙහි
ජල ඝෝෂාවක් ඇත්තේය. උන්වහන්සේ
පොළොවේ කෙළවරෙන් වලාකුල්
නැගීඑන්ට සලස්වනසේක; වර්ෂාවට
විදුලි සාදනසේක. තමන්ගේ ගබඩා-
වලින් හුළඟ ගෙනෙනසේක. සියලු 17
මනුෂ්‍යයෝ දැනගැන්ම නැතුව මෘගයන්
මෙන් සිටිති: සියලු රන්කරුවෝද
තමුන්ගේ කැපූ රූප නිසා ලජ්ජාවට
පැමිණ සිටිති. මක්නිසාද ඔවුන්ගේ
වාත්තු රූප බොරුවක්ය, ඒවා තුළ
හුස්ම නැත. ඒවා නිෂ්ඵලකමය, රැවටිල්ලේ 18
වැඩක්ය. ඒවාට දඬුවම්කරන කාලයේදී
ඒවා නැතිවන්නේය. යාකොබ්ගේ 19
කොටසවූ තැනන්වහන්සේ ඒවාට සමාන
නැත: උන්වහන්සේ වනාහි සෑම දේම
මැවූ තැනන්වහන්සේය: ඉශ්‍රායෙල්
උන්වහන්සේගේ උරුම ගෝත්‍රයය.
උන්වහන්සේගේ නාමය සේනාවල
**ස්වාමීන්වහන්සේය.**

නුඹ මාගේ යුද්ධ කෙටේරිය හා 20
යුද්ධායුධය. මම නුඹ ලවා ජාතීන්
පොඩිකරවා, රාජ්‍යයන් නටබුන්කරවන්-
නෙමි: නුඹ ලවා අශ්වයාත් උඟ පිට 21
නගින්නාත් පොඩිකරවන්නෙමි: නුඹ 22
ලවා රථය සහ එහි නැගීයන්නාත්
පොඩිකරවන්නෙමි: නුඹ ලවා ස්ත්‍රිය සහ
පුරුෂයාත් පොඩිකරවන්නෙමි: නුඹ ලවා
මහල්ලා සහ බාලයාත් පොඩිකරවන්නෙමි:
නුඹ ලවා තරුණයා සහ කන්‍යාවත්
පොඩිකරවන්නෙමි: නුඹ ලවා එඬේරා 23
සහ ඔහුගේ රැළත් පොඩිකරවන්නෙමි:
නුඹ ලවා ගොවියා සහ ඔහුගේ ගොන්
බානත් පොඩිකරවන්නෙමි: නුඹ ලවා
ආණ්ඩුකාරයන් සහ මුලාදෑනීන්ද
පොඩිකරවන්නෙමි. මෙසේ මම 24
බබිලෝනියට සහ කල්දියාවේ සියලු
වැසියන්ට නුඹලාගේ ඇස් හමුයේ
සියොන්හිදී ඔවුන් විසින් කළාවූ සියලු
නපුරුකම් ගැන ප්‍රතිඵල දෙන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

*හෙබ්‍රෙව්: වැන්දඹුකමට
නොපැමිණෙවුසේක.

25 එම්බා මුළු පොළොව නාස්තිකරන්නාවූ
නාස්තිකාර කන්ද, මම නුඹට විරුද්ධයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. මම මාගේ
අත නුඹට විරුද්ධව දිගුකොට,
පර්වතවලින් නුඹ පෙරළා දමා, දලාගිය
26 කන්දක් කරන්නෙමි. කොනකට ගලක්වත්
අත්තිවාරම්වලට ගලක්වත් නුඹෙන්
ගනු නොලබන්නේය; නුඹ සදාකාලයටම
පාළුවක් වන්නෙහියයි **ස්වාමීන්වහන්සේ**
27 කියනසේක. දේශයෙහි කොඩියක් ඔසවා,
ජාතීන් අතරෙහි හොරණෑවක් පිඹ, ඈට
විරුද්ධව ජාතීන් සූදානම්කරපල්ලා.
අරාරාත්ද මින්නීද අෂ්කෙනස්ද යන
රාජ්‍යයන් ඈට විරුද්ධව අඬගසාගෙන,
ඈට විරුද්ධව සේනාධිපතියෙකු
පත්කොට, කෙඳි-පළහැටියන් මෙන්
අශ්වයන් නැගී එන්ට සලස්වාපල්ලා.
28 ජාතීන්ද මේදයේ රජවරුන්ද එහි
ආණ්ඩුකාරයන්ද එහි සියලු මුලාදෑනීන්ද
ඔවුන්ගේ ආණ්ඩුවේ මුළු දේශයද ඈට
29 විරුද්ධව සූදානම්කරපල්ලා. දේශය
චංචලවී වේදනා විඳියි. මක්නිසාද
බබිලොන් දේශයෙහි වැසියෙක් නොසිටින
හැටියට පාළුකිරීමට තිබෙන **ස්වාමීන්-**
**වහන්සේගේ** යෝජනා බබිලෝනියට
30 විරුද්ධව ස්ථිරව තිබේ. බබිලෝනියේ
බලවන්තයෝ සටනින් වැලකී තමුන්ගේ
බලකොටුවල නැවතී සිටිති: ඔවුන්ගේ
බලය හීනවී ඔව්හු ස්ත්‍රීන් මෙන් වී
සිටිති. ඈගේ වාසස්ථාන ගිනිලා තිබේ:
31 ඈගේ අගුල් කඩාදමනු ලැබීය. ඔහුගේ
නුවර හැම පැත්තෙන්ම අසුවී, තොටුපළවල්
අල්ලනු ලැබූ බවත්. බටගස් ගිනිලෑ
බවත්, යුද්ධකාරයන් කැලඹී ඉන්න
32 බවත්. බබිලෝනියේ රජුට දන්වන
පිණිස පණිවිඩකාරයෙකුගේ පෙරමගට
පණිවිඩකාරයෙක්ද දූනුම්දෙන අයගේ
පෙරමගට දූනුම්දෙන අයෙක්ද දුවනවා
ඈත.
33 මක්නිසාද: බබිලොන් දුව මඬිනු ලබන
කලවිටක් මෙන්ය; තව ටිකකින් ගොයම්
කපන කාලය ඈට පැමිණේයයි
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල **ස්වාමීන්-**
34 **වහන්සේ** කියනසේක. බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් මා කාදමා. මා
නාස්තිකොට, මා හිස් භාජනයක්
කෙළේය. ඔහු දීර්ඝයෙකු මෙන් මා ගිල.
මාගේ ප්‍රියවූ දේවලින් තමාගේ බඩ
පුරවාගෙන, මා අහකදම්මේය. මටත් 35
මාගේ මාංශයටත් කළ බලාත්කාරය
බබිලෝනිය පිටට පැමිණේවයි සියොන්හි
වැසියා කියනවා ඇත: මාගේ ලේ
කල්දියාවේ වැසියන් පිටට පැමිණේවයි
යෙරුසලමද කියනවා ඇත. එබැවින් 36
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව. මම නුඹට යුක්තිය කරදී, නුඹ
උදෙසා පළිගන්නෙමි: මම ඈගේ මුහුද
හින්දවා, ඈගේ උල්පත් වියළවන්නෙමි.
බබිලෝනිය වැසියෙක් නැතුව ජරාවාස 37
ගොඩවල්ද සිවලුන්ගේ වාසයක්ද
විස්මයක්ද කවටකමක්ද වන්නීය. ඔවුන් 38
සිංහයන් මෙන් එක්ව නාදකර
සිංහපැටියන් මෙන් ගොරවනවා ඇත.
ඔවුන් රත්ව සිටින කල මම ඔවුන්ට 39
මංගල්‍යය පිළියෙළකරදී, ඔවුන් ප්‍රීතිමත්ව.
නොපිබිදෙන හැටියට සදාකාල නින්දකට
පැමිණෙන පිණිස, ඔවුන් මත්කර-
වන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
බැටළුපැටවුන්ද බැටළුවන් සහ එළුවන්ද 40
මෙන් මැරුම්කෑමට ඔවුන් ගෙනෙන්නෙමි.
ෂේෂක් අසුවූ හැටි! මුළු පොළොවේ 41
කීර්තිය ඇත්තී අල්ලනු ලැබූ හැටි!
බබිලෝනිය ජාතීන් අතරේ පාළුවක්වූ
හැටි! මුහුද බබිලෝනිය පිටට ගලා 42
ආයේය. ඈ එහි රළ රාශියෙන්
වැසීගියේය. ඈගේ නුවරවල් පාළුවක්ද 43
වියළි භූමියක්ද මරුකතරක්ද කිසි
මනුෂ්‍යයෙක් වාසය නොකරන්නාවූ, කිසි
මනුෂ්‍ය පුත්‍රයෙක් ගමන් නොකරන්නාවූ
දේශයක්ද වී තිබේ. මම බබිලෝනියේදී 44
බේල්ට දඬුවම්කොට, ඔහු ගිලගත් දේ
ඔහුගේ මුඛයෙන් එළියට නික්මවන්නෙමි:
ජාතීහු ඔහු වෙතට තවත් ගලාගෙන
නොයන්නෝය. එසේය, බබිලෝනියේ
පවුර වැටෙන්නේය.
මාගේ සෙනඟ. ඈ මධ්‍යයෙන් පිටවී 45
ගොස් එකිනෙකා තම තමාගේ ප්‍රාණය
**ස්වාමීන්වහන්සේගේ** බලවත් උදහසෙන්
ගළවාගනිල්ලා. දේශයේදී අසන 46

ආරංචියට තුඹලාගේ සිත් දුර්වලවෙන්ට
ඉඩ නොදෙල්ලා, භය නොවෙල්ලා;
මක්නිසාද එක අවුරුද්දකදී ආරංචියක්ද
ඊට පසු අවුරුද්දේ ආරංචියක්ද දේශ-
යෙහි බලාත්කාරකමද ආණ්ඩුකාරයෙක්
ආණ්ඩුකාරයෙකුට විරුද්ධවීමද
47 පැමිණෙන්නේය. එබැවින් බබිලෝනියේ
තිබෙන කැපූ රූපවලට මා විසින්
දඬුවම්කරන දවස් පැමිණෙන්නේය, ඇගේ
මුළු දේශය ලජ්ජාවට පැමිණෙන්නේය;
ඈ තුළ මැරුම්කන සියල්ලෝ ඈ
48 තුළම වැටෙන්නෝය. එකල ස්වර්ගයද
පොළොවද එහි සිටින සියල්ලෝද
බබිලෝනිය ගැන ප්‍රීතියෙන් ගීකියන්නෝය;
මක්නිසාද නාස්තිකරන්නෝ උතුරුදිග
සිට ඈ ළඟට එන්නෝයයි **ස්වාමීන්-**
49 **වහන්සේ** කියනසේක. ඉශ්‍රායෙල්වරුන්
මැරුම්කා වැටෙන්ට බබිලෝනිය විසින්
සැලැස්සුවාක්මෙන් මුළු දේශයේ
මැරුම්කෑවුන් බබිලෝනියේදී වැටෙනවා
50 ඇත. කඩුවෙන් ගැළවුණාවූ තැනැත්තෙනි,
නැවතී නොසිට පලයල්ලා; දුරදීම
**ස්වාමීන්වහන්සේ** සිහිකොට යෙරුසලම
51 මතක්කරගනිල්ලා. අපි නින්දාව ඇසූ
බැවින් ලජ්ජාවට පැමිණියෙමුව; විදේශීන්
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ ශුද්ධ-
ස්ථානවලට ඇතුල්වූ බැවින් අපේ මුහුණු
52 වියවුල්කමින් වැසී තිබේ. එබැවින් මා
විසින් ඇගේ රූපවලට දඬුවම්කරන
දවස් පැමිණෙන්නේය; ඇගේ දේශය
මුළුල්ලෙහි තුවාල ලැබූ අය
කෙඳිරිගානවා ඇතැයි **ස්වාමීන්වහන්සේ**
53 කියනසේක. බබිලෝනිය අහස දක්වා
නැගුණත්, ඇගේ ශක්තියේ උස් කොටුව
ඉතා බලවත්කළත්, මා වෙතින්
නාස්තිකරන්නන් ඈ කරා පැමිණෙනවා
ඇතැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
54 මොරගැසීමේ ශබ්දයක් බබිලෝනියෙන්ද
මහත් විනාශයේ ශබ්දයක් කල්දිවරුන්ගේ
55 දේශයෙන්ද ඇසෙන හැටි! මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** බබිලෝනිය
නාස්තිකරනසේක, එතනින් මහත්
ශබ්දයද නැතිකරනසේක; ඔවුන්ගේ
රැළවල් මහත් ජලයන් මෙන්
ඝෝෂාකෙරෙති, ඔවුන්ගේ කෝලාහල
ශබ්දය නගියි. මක්නිසාද ඈට එනම් 56
බබිලෝනියට විරුද්ධව නාස්තිකරන්නා
පැමිණියේය, ඇගේ බලවන්තයෝ
අසුවුණෝය, ඔවුන්ගේ දුනුද කඩාදමනු
ලැබුවේය. මක්නිසාද **ස්වාමීන්වහන්සේ**
විපාකදෙන දෙවියන්වහන්සේය, උන්-
වහන්සේ ප්‍රතිඵල දෙනවාම ඇත. මම 57
ඇගේ අධිපතීන්ද ඇගේ ප්‍රඥාවන්තයන්ද
ඇගේ ආණ්ඩුකාරයන්ද ඇගේ මුලාදෑනීන්ද
ඇගේ බලවතුන්ද මත්කරවන්නෙමි;
ඔව්හුද නොපිබිදෙන හැටියට සදකාල
නින්දකට පැමිණෙන්නෝයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** නම්වූ රජ්ජුරුවන්-
වහන්සේ කියනසේක. සේනාවල 58
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
බබිලෝනියේ පළල්වූ පවුරු සහමුලින්ම
හෙළාදමනු ලබන්නේය, ඇගේ උස්
දොරටුද ගින්නෙන් දවනු ලබන්නේය:
මෙසේ ජනයෝ හිස්කමටද ජාතීහු
ගින්නටද පමණක් වීර්යකර වෙහෙ-
සෙන්නෝය.

මයසේයාගේ පුත්‍රවූ නේරියාගේ පුත්‍රයා 59
වන සෙරායා යූදාහි රජවූ ශෙදෙකියාගේ
රජකම්කිරීමේ සතරවෙනි අවුරුද්දේදී
ඔහු සමග බබිලෝනියට යන විට
අනාගතවක්තෘවූ යෙරෙමියා සෙරායාට
අණකළ වචනයය. සෙරායා එනාහි
ගබඩා නිලමේ විය. බබිලෝනියට 60
පැමිණෙන සියලු විපත්ති එන
බබිලෝනියට විරුද්ධව ලියා තිබෙන
මේ සියලුම වචන යෙරෙමියා පොතක
ලිවීය. යෙරෙමියා සෙරායාට කියනුයේ: 61
තුඹ බබිලෝනියට පැමිණි කල මේ
සියලු වචන කියවා කථාකොට—අහෝ, 62
**ස්වාමීන්වහන්ස**, මේ ස්ථානයෙහි
මනුෂ්‍යයෙක් වුවත් මෘගයෙක් වුවත් කිසිම
වැසියෙක් නැතුව එය සදකාල පාළුවක්
වෙන හැටියට එය සිඳදැමීමට ඔබ ඊට
විරුද්ධව කථාකර තිබේයයි කියාපන්න.
තවද තුඹ මේ පොත කියවා නිමවූ විට 63
ඊට ගලක් බැඳ ප්‍රාත් ගංගාව මැදට
හෙළා: මෙසේම බබිලෝනිය කිඳී, මා 64
විසින් ඈ පිටට පමුණුවන විපත්තියෙන්
ගොඩ නොඑන්නීය. ඔව්හු වෙහෙස-
වන්නෝයයි කියාපන්නැයි කීවේය.

යෙරෙමියාගේ වචන මෙයින් නිමි.

## යූදගේ විනාශය සහ වාලට ගෙනයනු ලැබීම

52 ශෙදෙකියා විසි එක් අවුරුදු
වයසේදී රජකමට පැමිණ
එකොළොස් අවුරුද්දක් යෙරුසලමෙහි
රජකම්කෙළේය. ඔහුගේ මවුගේ නම
හමූටල්ය, ඈ ලිබ්නාහි යෙරෙමියාගේ
2 දූවෙක්ය. ඔහු යෙහෝයාකීම් කළ සියල්ල
ලෙස **ස්වාමීන්වහන්සේගේ** ඇස් හමුයෙහි
3 නපුරුව තිබෙන දේ කෙළේය. මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** ඔවුන් තමන් ඉදිරියෙන්
පහකරදමන තුරු උන්වහන්සේගේ උදහස
නිසා යෙරුසලමටත් යූදටත් මෙසේ
සිද්ධවිය. ශෙදෙකියාද බබිලෝනියේ
4 රජුට විරුද්ධව කැරළිගැසුවේය. ඔහුගේ
රජකම් කිරීමේ නවවෙනි අවුරුද්දේ
දසවෙනි මස දසවෙනිද බබිලෝනියේ
රජවූ නෙබුකද්රෙශර් තමාගේ මුළු
සේනාව සමග යෙරුසලමට විරුද්ධව
ඇවිත්, ඊට විරුද්ධව කඳයුරු බැඳ,
වටකරින් ඊට විරුද්ධව බලකොටු
5 ගොඩනැගුවේය. එසේ ශෙදෙකියා රජුගේ
එකොළොස්වෙනි අවුරුද්ද දක්වා නුවර
6 වටලනලද්දේ විය. හතරවෙනි මස
නවවෙනිද දේශයේ සෙනඟට කිසි කෑමක්
නැතිවන තරම් සාගතය නුවර තුළ
7 බලවත්විය. එවිට නුවර බිඳිනු ලැබීය,
සියලු යුද්ධකාරයෝ වනාහි කල්දිවරුන්
නුවරට විරුද්ධව වටකර සිටියදී, රජ
උයන ළඟ පවුරු දෙකට අතරේ තිබෙන
දොරටුවෙන් රාත්‍රියෙහි නුවරින් පිටත්වී,
අරබා සමභූමි මාර්ගයෙන් පලාගියෝය.
8 නුමුත් කල්දිවරුන්ගේ සේනාව රජු
පස්සේ එළවාගන ගොස්, යෙරිකෝවේ
සමභූමිවලදී ශෙදෙකියාට ළංව, ඔහු
අල්ලාගත්තේය; ඔහුගේ මුළු සේනාව
9 ඔහු වෙතින් විසිර ගියේය. එකල ඔව්හු
රජු අල්වා හමාත් දේශයේ රිබ්ලාට,
බබිලෝනියේ රජු ළඟට, ගෙනගියෝය;
හෙතෙම ඔහු ගැන නඩු තීන්දුව දුන්නේය.
10 එවිට බබිලෝනියේ රජ ශෙදෙකියාගේ
පුත්‍රයන් ඔහුගේ ඇස් ඉදිරියෙහි මැරීය;
යූදහි සියලු අධිපතීන්ද රිබ්ලාහිදී
11 මැරුවේය. තවද බබිලෝනියේ රජ
ශෙදෙකියාගේ ඇස් අන්ධකර, ඔහුට
විලංගු දමා, බබිලෝනියට ගෙනගොස්,
ඔහුගේ මරණ දවස දක්වා ඔහු හිරගෙයි
දමා තැබීය.
තවද බබිලෝනියේ රජවූ නෙබුකද්රෙශර් 12
රජුගේ දහනවවෙනි අවුරුද්දේ පස්වෙනි
මස දසවෙනිද බබිලෝනියේ රජුට
සේවයකළාවූ ආරක්ෂකයන්ගේ අධිපතියාවූ
නෙබුසරදන් යෙරුසලමට ඇවිත්,
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයද රජගෙයද 13
ගිනිලෑවුවේය; යෙරුසලමේ සියලු ගෙවල්ද
එනම් හැම ලොකු ගෙවල්ද ගිනිලෑවුවේය.
ආරක්ෂකයන්ගේ අධිපතියා සමග සිටි 14
කල්දිවරුන්ගේ මුළු සේනාව යෙරුසලම
හාත්පස පවුරු සියල්ල බිඳදැමුවෝය.
තවද ආරක්ෂකයන්ගේ අධිපතියාවූ 15
නෙබුසරදන් දිළිඳු සෙනඟගෙන්
සමහරෙක්ද සෙනඟගෙන් නුවර ඉතිරිව
සිටි අයද සැහවී ගොස් බබිලෝනියේ
රජුගේ පක්ෂයට වූ අයද සමූහයාගෙන්
අනික් අයද අල්ලාගෙන ගියේය. නුමුත් 16
මිදිවතු වවන්ටත් ගොවිතැන් කරන්ටත්
ආරක්ෂකයන්ගේ අධිපතියාවූ නෙබුසරදන්
දේශයේ දිළිඳුන්ගෙන් සමහරෙකු
ඉතිරිකර ගියේය. තවද **ස්වාමීන්-** 17
**වහන්සේගේ** ගෘහයට අයිති පිත්තල
කුළුනුද **ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙහි
තිබුණු මැසිද පිත්තල මුහුදද කල්දිවරු
කඩාගෙන, ඒවායේ පිත්තල සියල්ලම
බබිලෝනියට ගෙනගියෝය. ඇතිළිද 18
හැඳිද පහන් කතුරුද තාළිද පාත්‍රාද
සේවයට පාවිච්චිකළ පිත්තල බඩු
සියල්ලද ඔව්හු ගෙනගියෝය. තළිද 19
ගිනි-භාජනද තාළිද ඇතිළිද පහන් කඳුද
පාත්‍රාද කෙණ්ඩිද යන රන් බඩුවල රන්ද
රිදී බඩුවල රිදීද ආරක්ෂකයන්ගේ අධිපතියා
ගෙනගියේය. සාලමොන් රජ **ස්වාමීන්-** 20
**වහන්සේගේ** ගෘහයට සෑදූ කුළුනු දෙකත්
එක මුහුදත් මැසි යට තිබුණු පිත්තල
ගව රූප දොළොසත් යන සියලු
භාණ්ඩයන්හි පිත්තලවල බර ගණනක්
නැතුව තිබුණේය. ඒ කුළුනුවලින් එක 21
එක කුළුනේ උස දහඅට රියනක්ය; ඒ
වටේට දොළොස් රියන් පටියක් තිබුණේය;
එහි ඝනකම අඟල් සතරක්ය. ඒක කුහරව

22 තිබුණේය. එය පිට පිත්තල පේකඩයක්
විය; එක එක පේකඩයේ උස
පස්රියනක්ය, පේකඩය පිට වටකරින්
දැල් වැඩක් සහ දෙළුම් ගෙඩිත් තිබුණේය,
ඒ සියල්ල පිත්තලෙන්ය. දෙවෙනි කුළුනත්
ඒ ආකාරව දෙළුම් සහිතව තිබුණේය.
23 දෙළුම් අනූහයක් පැතිවල තිබුණේය; දැල්
වැඩ පිට වටකරින් තිබුණු දෙළුම්
24 සියල්ල සියයක් විය. තවද රැකවලුන්ගේ
අධිපතියා උත්තම පූජකයාවූ සෙරායාද
දෙවෙනි පූජකයාවූ ශෙපනියාද දොරටු-
පාලයන් තුන්දෙනාද අල්ලාගත්තේය.
25 යුද්ධකාරයන්ගේ අධිපතියෙක්වූ
ඇමතියෙක්ද රජු ඉදිරියේ සිට
මනුෂ්‍යයන්ගෙන් නුවරෙහි සම්බවූ
සත්දෙනෙක්ද දේශයේ සෙනඟ යුද්ධයට
රැස්කළ සේනාධිපතියාගේ ලේකම්ද නුවර
සම්බවූ දේශයේ සෙනඟගෙන් හැට-
26 දෙනෙක්ද අල්ලාගත්තේය. එවිට රැක-
වලුන්ගේ අධිපතියාවූ නෙබුසරදන්
මොවුන් රිබ්ලාට, බබිලෝනියේ රජු
27 ළඟට, ගෙනගියේය. බබිලෝනියේ රජ
හමාත් දේශයේ රිබ්ලාහිදී ඔවුන්ට පහරදී
ඔවුන් මැරුවේය. මෙසේ යූදවරු තමුන්ගේ
දේශයෙන් වහල්කමට ගෙනයනලද්දෝය.
28 නෙබුකද්රෙශර් විසින් අල්ලාගෙන ගිය
සෙනඟ නම්: හත්වෙනි අවුරුද්දේදී
යුදෙව්වරුන් තුන්දස් විසිතුන් දෙනෙක්ය.
29 නෙබුකද්රෙශර්ගේ දහඅටවෙනි අවුරුද්දේදී
ඔහු යෙරුසලමේ සිට අටසිය
තිස්දෙදෙනෙකු අල්ලාගෙන ගියේය.
නෙබුකද්රෙශර්ගේ විසිතුන්වෙනි 30
අවුරුද්දේදී රැකවලුන්ගේ අධිපතියාවූ
නෙබුසරදන් යුදෙව්වරුන් හත්සිය හතළිස්
පස්දෙනෙකු අල්ලාගෙන ගියේය. ඒ
සියල්ලෝම හාරදස් හසියයක්ය.

## යෙහෝයාකීන් රජුගේ අන්තිම කාලය

තවද යූදහි රජවූ යෙහෝයාකීන් 31
ගෙනයනු ලැබ තිස්හත්වෙනි අවුරුද්දේ
දොළොස්වෙනි මාසයේ විසිපස්වෙනිද
එනම් බබිලෝනියේ රජවූ එවිල්-
මෙරොදක් රජවුණු අවුරුද්දේදී ඔහු යූදහි
රජවූ යෙහෝයාකීන්ගේ හිස ඔසවා,
හිරගෙයින් ඔහු නිදහස්කොට, ඔහුට 32
කරුණාවෙන් කථාකොට, බබිලෝනියේ
ඔහු සමග සිටි රජුන්ගේ සිංහාසනවලට
වඩා ඔහුගේ සිංහාසනය උසස්කෙළේය.
ඔහුගේ හිර ඇඳුම්ද මාරුකෙළේය. තවද 33
ඔහු තමාගේ ජීවිතයේ සියලු දවස්වලදී
නිතරම රජු ඉදිරියෙහි කෑම කෑයේය.
ඔහුගේ කෑම කොටසද නියමලෙස 34
දවස්පතාම බබිලෝනියේ රජු වෙතින්
ඔහුගේ මරණයේ දවස දක්වා, ඔහුගේ
ජීවිතයේ සියලු දවස්වල ඔහුට දෙන-
ලද්දේය.

# යෙරෙමියාගේ විලාප ගී

## සියොන් නුවර පාළුව තිබීම පිළිබඳ ශෝකවීම

1 සෙනඟගෙන් පිරී තිබුණු නුවර
තනිව හිඳින හැටි!
ඈ වැන්දඹුවක් මෙන් වූ හැටි!
ජාතීන් අතරෙහි උතුම්ව දනව්
අතරෙහි කුමාරිකාවක්ව සිටි
තැනැත්තී
ආදයමට යටත්වූ හැටි!
2 ඈ රාත්‍රියෙහි අතිශයින් හඬයි,
ඇගේ කඳුළු ඇගේ කම්මුල් පිට
තිබේ:
ඇගේ සියලු ප්‍රේමවතුන්ගෙන් ඈ
සනසන්ට කිසිවෙක් නැත.
ඇගේ සියලු මිත්‍රයෝ ඈට ද්‍රෝහිකම්
කළෝය,
ඔව්හු ඈට සතුරෝ වී සිටිති.
3 පීඩාව නිසාද අධික දාසකම නිසාද
යූද වාල්කමට ගියාය:
ඈ මිථ්‍යාදෘෂ්ටි ජාතීන් අතරෙහි වසයි,
ඈ කිසි සහනයක් නොලබයි.
ඈ පස්සේ එළවාගෙනගිය හැමදෙන
කඳු පාරවලදී ඈ අසුකරගත්තෝය.
4 මංගල්‍ය රැස්වීමට එන කෙනෙක්
නැති බැවින් සියොන්ට යන
මාර්ගයෝ වැලපෙන්නාහ:
ඇගේ සියලු දොරටු පාළුව තිබේ.
ඇගේ පූජකයෝ සුසුම්ලති.
ඇගේ කන්‍යාවෝ ශෝකවෙති. ඈම
තික්තකමෙහි සිටියි.
5 ඇගේ එදිරිකාරයෝ ප්‍රධානයෝ වූහ,
ඇගේ සතුරෝ සමෘද්ධවෙති:
මක්නිසාද ඇගේ අපරාධ රාශිය නිසා
**ස්වාමීන්වහන්සේ** ඈට
පීඩාකළසේක.
ඇගේ බාලයෝ එදිරිකාරයාට
පෙරටුවෙන් වාල්කමට ගියෝය.
සියොන් දියණියගේ මුළු මහිමශ්‍රීය 6
ඇගෙන් පහව ගියේය.
ඇගේ අධිපතීහු කෑම නොලැබූ
මුවන්ට සමානවුණෝය.
එළවාගෙන එන්නා ඉදිරියෙහි ඔව්හු
බෙලහීනව ගියෝය.
යෙරුසලම ඇගේ පීඩාව සහ දුක් 7
දවස්වලදී
පුරාණ දවස් පටන් ඈට තිබුණු
ඇගේ සියලු ප්‍රිය දේ සිහිකරයි.
ඈට උපකාරකරන්නෙක් නැතුව.
ඇගේ සෙනඟ එදිරිකාරයා අතට
අසුවූ විට.
එදිරිකාරයෝ ඈ දැක, ඇගේ විනාශය
ගැන සිනාසුණෝය.
යෙරුසලම බලවත්ලෙස පව්කළ 8
බැවින් ඈ කිලුටක් වී සිටින්නීය.
ඈට ගෞරවකළ සියල්ලෝම ඇගේ
නග්නකම දුටු නිසා ඈ හෙළා
දකිති.
එසේය, ඈ සුසුම්ලා පස්සට හැරීයයි.
ඇගේ අපවිත්‍රකම ඇගේ වස්ත්‍ර පිට 9
තිබුණේය: ඈ තමාගේ මතු
කාලය සිහි නොකළාය:
එබැවින් ඈ පුදුමලෙස පහළ බැස්සාය;
ඈට සැනසිලිකාරයෙක් නැත.
**ස්වාමීන්වහන්ස**, මාගේ දුක බැලුව
මැනව: මක්නිසාද සතුරා
උඩඟුකම්කෙළේය.
එදිරිකාරයා ඇගේ සියලු ප්‍රියවූ දේ 10
පිට තමාගේ අත හෙළුවේය.
මක්නිසාද ඔබගේ සභාවට ඇතුල්
නොවෙන හැටියට ඔබ අණකළ

ජාතීන්
ඇගේ ශුද්ධස්ථානයට ඇතුල්වෙනවා
ඇ දුටුවාය.
11 ඇගේ මුළු සෙනඟ කෑම සොයමින්
සුසුම්ලති;
පණ රැකගන්න පිණිස ඔව්හු තමුන්ගේ
ප්‍රිය දේ ආහාර වෙනුවට දුන්නෝය.
**ස්වාමීන්වහන්ස**, මා නීචවී සිටින
බව බලා සැලකුව මැනව.
12 මඟ යන සියල්ලෙනි, තුඹලා මෙය
නොසලකන්නහුද?
මට පැමිණ තිබෙන්නාවූ,
**ස්වාමීන්වහන්සේ** තමන් බලවත්
උදහසේ දවසේදී
මට පැමිණෙවූවාවූ මාගේ ශෝකය
වැනි ශෝකයක් ඇද්දැයි බලා
දැනගනිල්ලා.
13 උන්වහන්සේ ඉහළින් මාගේ ඇට
තුළට ගින්න එවූසේක, එය එහි
බලය පවත්වයි.
උන්වහන්සේ මාගේ පාදවලට දැලක්
හෙළූසේක, මා පස්සට
හැරවූසේක;
මා පාළුවක්ද දවස මුළුල්ලේ
බෙලහීනයෙක්ද කළසේක.
14 මාගේ අපරාධ නැමති වියගහ බැඳ
තිබෙන්නේ උන්වහන්සේගේ
අතින්ය;
ඒවා ගෙතී මාගේ බෙල්ල පිට සනාවී
තිබේ; එයින් මාගේ ශක්තිය හීන
විය.
මට නැගිටින්ට බැරිලෙස සතුරන්
අතට ස්වාමීන්වහන්සේ මා පාවා
දුන්සේක.
15 මා තුළ සිටි මාගේ සියලු බලවතුන්
ස්වාමීන්වහන්සේ හෙළාදැක්කසේක;
මාගේ යෞවනයන් සුන්කරන්ට
උන්වහන්සේ මට විරුද්ධව මංගල්‍ය
සභාවක් අඬගසාගත්සේක.
ස්වාමීන්වහන්සේ මිදි පැසක් මෙන්
යූදගේ කන්‍යා දුව පෑගුසේක.
16 මේ දේවල් නිසා අඬමි; මාගේ ඇසින්,
එසේය, මාගේ ඇසින් කඳුළු
ගලන්නේය;
මක්නිසාද මා ප්‍රාණවත්කරන්නාවූ
සැනසිලිකාරයා මාගෙන් ඈත්ව
සිටියි.
සතුරා ජයගත් බැවින් මාගේ දරුවෝ
අසරණව සිටිති.
සියොන් ඇගේ අත් විදහාගන ඉඳියි; 17
ඈ සනසන්ට කෙනෙක් නැත;
යාකොබ් අවට සිටින්නන් ඔහුගේ
සතුරන් වන ලෙස **ස්වාමීන්වහන්සේ**
අණකර තිබේ.
යෙරුසලම ඔවුන් අතරෙහි කිලුටක්
වී තිබේ.
**ස්වාමීන්වහන්සේ** ධර්මිෂ්ඨය; 18
මක්නිසාද මම උන්වහන්සේගේ
ආඥාවට විරුද්ධව කැරළිගැසීමි.
අනේ සියලු ජනයෙනි, අසා මාගේ
ශෝකය බලාපල්ලා.
මාගේ කන්‍යාවෝද මාගේ
යෞවනයෝද වාල්කමට ගියෝය.
මාගේ ප්‍රේමවන්තයන්ට අඬගැසීමි, 19
නුමුත් ඔව්හු මා රැවටුවෝය.
මාගේ පූජකයෝද මාගේ
වැඩිමහල්ලෝද තමුන්ගේ ප්‍රාණ
රැකගන්න පිණිස
තමුන්ට කෑම සොයන අතර නුවරදී
නැසී ගියෝය.
**ස්වාමීන්වහන්ස**, බැලුව මැනව; 20
මක්නිසාද විපතට පත්ව සිටිමි;
මාගේ බඩවැල් කැලඹී තිබේ;
මාගේ හෘදය මා තුළ පෙරළී තිබේ;
මක්නිසාද මම බලවත්ලෙස
කැරළිගැසීමි.
පිටතදී කඩුව දරුවන් නැතිකරන්නේය,
ගෙයි මරණය වැන්නක්
ඇත්තේය.
මා සුසුම්ලනවා ඔව්හු ඇසුවෝය; මා 21
සනසන්ට කෙනෙක් නැත;
මාගේ සියලු සතුරෝ මාගේ විපත්තිය
ගැන ඇසුවෝය; ඔබ ඒක කළ
නිසා ඔව්හු සතුටුවෙති.
ඔබ ප්‍රකාශකළ දවස ඔබ
පමුණුවනසේක, ඔව්හුද මා හා
සමාන වන්නෝය.

22 ඔවුන්ගේ සියලු දුෂ්ටකම් ඔබ ඉදිරියට
පැමිණේවා;
මාගේ සියලු අපරාධ නිසා ඔබ මට
කළාක්මෙන් ඔවුන්ටත් කළ මැනව.
මක්නිසාද මාගේ සුසුම්ලෑම් බොහෝය,
මාගේ සිතද ක්ලාන්තව තිබේ.

## මේ දුක් පීඩා ස්වාමීන්වහන්සේගේ කෝපය නිසා වන බව

2 ස්වාමීන්වහන්සේ තමන්ගේ
උදහසින් සියොන් දුව
වලාකුළකින් වැසූ හැටි!
උන්වහන්සේ ඉශ්‍රායෙල්ගේ අලංකාරය
ස්වර්ගයෙන් පොළොවට
හෙළූසේක,
තමන් උදහසේ දවසේදී තමන් පා
පුටුව සිහි නොකළසේක.
2 ස්වාමීන්වහන්සේ අනුකම්පා
නොකොට, යාකොබ්ගේ සියලු
වාසස්ථාන නටබුන්කළසේක;
උන්වහන්සේ තමන් කෝපයෙන්
යූද දුවගේ බලකොටු
බිඳහෙළූසේක;
ඒවා බිමටම ගෙනාසේක.
උන්වහන්සේ රාජ්‍යයද එහි අධිපතීන්ද
කෙලෙසූසේක.
3 උන්වහන්සේ බලවත් උදහසෙන්
ඉශ්‍රායෙල්ගේ අඟ සහමුලින්
සිඳදැමූසේක;
තමන්ගේ දකුණත සතුරා ඉදිරියෙන්
පස්සට ඇදගත්සේක.
වටකරින් නාස්තිකරන ඇවිළෙන
ගින්නක් මෙන් උන්වහන්සේ
යාකොබ් දැවූසේක.
4 උන්වහන්සේ සතුරෙකු මෙන් තමන්
දුන්න තැත්කැවූසේක, එදිරිකාරයෙකු
මෙන් සිය දකුණත ඔසවා,
ඇසට ප්‍රියවූ සියල්ලන් නැසූසේක.
සියොන් දුවගේ කූඩාරමෙහි ගින්නක්
මෙන් තමන් කෝපය
වැගිරෙවූසේක.
5 ස්වාමීන්වහන්සේ සතුරෙකු
මෙන් වූසේක,
ඉශ්‍රායෙල් නටබුන්කළසේක;
උන්වහන්සේ ඇගේ සියලු මාළිගා
නටබුන්කොට, ඔහුගේ බලකොටු
විනාශකළසේක.
යූද දුව කෙරෙහි වැලපීමත් ශෝකයත්
වැඩිකළසේක.
උන්වහන්සේ තමන් මණ්ඩපය වත්තක් 6
මෙන් පාළුකරදැමූසේක;
ස්වකීය රැස්වීමේ ස්ථානය
විනාශකළසේක.
ස්වාමීන්වහන්සේ සියොන්හි මංගල්‍යය
සහ සබත් දවස මතකනැති
කෙරෙවූසේක,
තමන් උදහසේ කෝපයෙන් රජු සහ
පූජකයා එපාකළසේක.
ස්වාමීන්වහන්සේ තමන් පූජාසනය 7
අහකදැමූසේක, තමන් ශුද්ධස්ථානය
පිළිකුල්කළසේක,
ඇගේ මාළිගාවල පවුරු සතුරා අතට
පාවාදුන්සේක.
මංගල්‍ය දවසකදී මෙන් ඔව්හු
ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි
ශබ්ද පැවැත්තුවෝය.
ස්වාමීන්වහන්සේ සියොන් දුවගේ 8
පවුර නාස්තිකරන්ට
අදහස්කළසේක;
ලනුව ඇද නටබුන්කිරීමෙන් තමන්
අත අහක්කර නොගත්සේක.
උන්වහන්සේ කොටු-තාප්පය සහ
පවුර වැලපෙන්ට සැලැස්වූසේක;
ඒවා එක්ව මලානිකවෙති.
ඇගේ දොරටු පොළොවට ගිලුණේය; 9
උන්වහන්සේ ඇගේ අගුල් නාස්තිකර
කඩාදැමූසේක.
ඇගේ රජද අධිපතීහුද ජාතීන්
අතරේ සිටිති; ව්‍යවස්ථාවක් නැත.
එසේය, ඇගේ ප්‍රොපේතවරු ස්වාමීන්-
වහන්සේගෙන් දර්ශනයක් නොලබති.
සියොන් දුවගේ වැඩිමහල්ලෝ බිම 10
හිඳගෙන නිශ්ශබ්දව සිටිති;
ඔව්හු තමුන්ගේ හිස් පිට ධූලි
දමාගෙන, ගෝණි රෙදි හැඳ සිටිති.
යෙරුසලමේ කන්‍යාවෝ තමුන්ගේ

හිස් බිමට නමාගෙන හිඳිති.
11 මාගේ දියණිය වන සෙනඟගේ
විනාශය නිසා මාගේ ඇස් කඳුළින්
ක්ෂයවේ,
මාගේ බඩවැල් කැලඹී, මාගේ අක්මාව
බිම වැගිරී තිබේ;
මක්නිසාද ළමයින් සහ කිරි දරුවෝ
නුවර වීථිවලදී ක්ලාන්තවෙති.
12 නුවර වීථිවල තුවාලවූවන් මෙන්
ඔව්හු ක්ලාන්තවෙමින්,
තමුන්ගේ ප්‍රාණ තමුන්ගේ මවුවරුන්ගේ
ළයෙහි වගුරුවන කල්හි,
ධාන්‍ය සහ මුද්‍රිකපානයත් කොයිදැයි
තමුන්ගේ මවුවරුන්ට කියති.
13 යෙරුසලමේ දියණියෙනි, මම නුඹට
මොන දැනමුතුකමක් දෙම්ද?
නුඹට කුමක් සමානකරම්ද?
සියොන් කන්‍යා දියණියෙනි, මා විසින්
නුඹ සනසන පිණිස නුඹට කුමක්
සමකරම්ද?
මක්නිසාද නුඹේ බිඳුම මුහුද මෙන්
මහත්ය. නුඹට සුවකරන්ට කාට
පුළුවන්ද?
14 නුඹේ ප්‍රොපේතවරු බොරු නිරර්ථක
දර්ශන නුඹට දුටුවෝය;
ඔව්හු නුඹේ වාල්කම පහකිරීමට
නුඹේ අපරාධය එළිදරව්
නොකළෝය.
නිෂ්ඵලකමේ අනාගත කීම්ද රටෙන්
පිටිවහල් කිරීමට කරුණුද නුඹට
දුටුවෝය.
15 මග යන සියල්ලෝ නුඹට විරුද්ධව
අත්පුඩිගසති;
ඔව්හු පරිහාසකොට, යෙරුසලම්
දුවට විරුද්ධව තමුන්ගේ හිස්
වනමින්:
පරම අලංකාරකමය, මුළු පොළොවට
ප්‍රීති හේතුවයයි කී නුවර මේකදැයි
කියති.
16 නුඹේ සියලු සතුරෝ නුඹට විරුද්ධව
තමුන්ගේ මුඛය විදහා,
පරිහාසකොට, දත්මිටිකති: අපි ඈ
නටබුන්කෙළෙමුව,
සැබවින්ම අප බලා සිටි දවස මේය;
අපි ඊට පැමිණ දුටිමුයයි කියති.
ස්වාමීන්වහන්සේ තමන් යෝජනා 17
කළ දේ ඉෂ්ටකළසේක;
උන්වහන්සේ පුරාණ දවස්වල සිට
නියමකර තිබුණු තමන් කීම
සම්පූර්ණකළසේක;
උන්වහන්සේ අනුකම්පා නොකොට,
හෙළාදැමූසේක.
සතුරා නුඹට විරුද්ධව
සන්තෝෂවෙන්ට සලස්වා,
නුඹේ එදිරිකාරයන්ගේ අඟ
එසෙවූසේක.
ඔවුන්ගේ සිත් ස්වාමීන්වහන්සේට 18
කෑගැසීය.
අහෝ සියොන් දුවගේ පවුර, රෑ දවල්
ගඟක් මෙන් කඳුළු වගුරුවාපන්න;
නිස්කලංක නොගනින්න; නුඹේ
ඇසේ කළුඉංගිරියාව නොනවතීවා.
නැගිට, රාත්‍රි යාමවල මුලදී සෝෂා 19
කොට,
නුඹේ සිත ස්වාමීන්වහන්සේගේ
මුහුණ ඉදිරිපිට වතුර මෙන්
වගුරුවාපන්න.
සියලු වීථි සන්ධිවලදී බඩගින්නෙන්
ක්ලාන්තවෙන්නාවූ
නුඹේ ළමයින්ගේ ප්‍රාණ උදෙසා නුඹේ
අත් උන්වහන්සේ දෙසට ඔසවාපන්න.
**ස්වාමීන්වහන්ස**, ඔබ මෙසේ කළේ 20
කාටදැයි බලා කල්පනාකළ මැනව.
ස්ත්‍රීහු ස්වකීය ඵල වන අත දරුවන්
කන්නෝද?
පූජකයා සහ ප්‍රොපේතයාත් ස්වාමීන්-
වහන්සේගේ ශුද්ධස්ථානයෙහිදී
මරනු ලබන්නෝද?
බාලයාද මහල්ලාද වීථිවල බිම වැතිර 21
සිටිති;
මාගේ කන්‍යාවෝද මාගේ යෞවනයෝද
කඩුවෙන් වැටුණෝය.
ඔබ ස්වකීය උදහසේ දවසේදී ඔවුන්
නැසූසේක; අනුකම්පා නොකොට,
මරාදැමූසේක.
මංගල්‍ය රැස්වීමකදී මෙන් භීති මා 22
වටකරින්ම එන ලෙස ඔබ
අඬගැසූසේක,

කිසිවෙක් ස්වාමීන්වහන්සේගේ
උදහස් දවසේදී ගැළවී ඉතුරු
නොවීය.
මා විසින් වඩා ඇතිකළවුන් මාගේ
සතුරා නාස්තිකෙළේය.

## සියොන් දුවගේ බලාපොරොත්තුව දෙවියන්වහන්සේගේ කරුණාව කෙරෙහි බව

3 උන්වහන්සේගේ කෝපය නැමති
දණ්ඩෙන් දුක අත්දුටුවාවූ
මනුෂ්‍යයා මමය.
2 උන්වහන්සේ මා ගෙනගොස් එළියෙහි
නොව අන්ධකාරයෙහි ඇවිදින්ට
සැලැස්වූසේක.
3 සැබවින්ම උන්වහන්සේ දවස මුළුල්ලේ
මට විරුද්ධව නැවත නැවත
තමන් අත හරවනසේක.
4 උන්වහන්සේ මාගේ මාංසයත් හමත්
ජරාවට පමුණුවා, මාගේ ඇට
බින්දසේක.
5 උන්වහන්සේ මට විරුද්ධව පවුරු
ගොඩනගා, තික්තකමෙන්ද
ගාවිනාවෙන්ද මා වටකළසේක.
6 පුරාණයේ නැසීගියවුන් මෙන්
උන්වහන්සේ අඳුරු තැන්වල විසීම
මට සැලැස්වූසේක.
7 පිටත යන්ට බැරි ලෙස උන්වහන්සේ
මා වසා තැබූසේක; මාගේ විලංගුව
බරකළසේක.
8 එසේය, මා කෑගසා පිහිට ඉල්ලන
විට උන්වහන්සේ මාගේ යාච්ඤාව
වලක්වනසේක.
9 උන්වහන්සේ මාගේ මාර්ග කැපූ
ගල්වලින් අහුරා, මාගේ මාවත්
ඇදකළසේක.
10 උන්වහන්සේ මාහට රැක සිටින
වලසෙක්ද රහස් තැන්වල ඉන්න
සිංහයෙක්ද මෙන්ය.
11 උන්වහන්සේ මාගේ මාර්ග ඉවත්කොට
මා ඉරාදැමූසේක; මා
පාළුකළසේක.
12 උන්වහන්සේ තමන් දුන්න තත්කවා,
ඊගහට ඉලක්කයක් කොට
මා තැබූසේක.
13 උන්වහන්සේ තමන් කොපුවේ ඊගස්
මාගේ කටියට විද්දසේක.
14 මම මාගේ මුළු සෙනඟට හිනාවක්ද
දවස මුළුල්ලේ ඔවුන්ගේ කවියද
වී සිටිමි.
15 උන්වහන්සේ තික්ත රසයෙන් මා
පුරවා, මට කොසඹ පෙවූසේක.
16 උන්වහන්සේ බොරළුවලින් මාගේ
දත් බින්දසේක, අලුයෙන් මා
වැසූසේක.
17 ඔබ මාගේ ආත්මය සමාදානය කෙරෙන්
දුරුකළසේක; සැපත මට
මතකනැතිවිය.
18 මාගේ සවියත් ස්වාමීන්වහන්සේ
කෙරෙන් මාගේ බලාපොරොත්තුවත්
නැතිවී ගියේයයි කීමි.
19 කොසඹ සහ වසද වැනිවූ මාගේ
පීඩාවත් මාගේ දුකත් සිහිකළ මැනව.
20 මාගේ ආත්මය තවම ඒවා සිහිකර මා
තුළ පහත්වන්නේය.
21 මේක මතක්කරගන්නෙමි, එබැවින්
මට බලාපොරොත්තුව ඇත්තේය.
22 අප විනාශ නූණේ ස්වාමීන්වහන්සේගේ
කරුණාවල් නිසාත් උන්වහන්සේගේ
අනුකම්පාවල් නොනවතින නිසාත්ය.
23 ඒවා උදයෙන් උදය අලුත්ව තිබේ;
ඔබගේ විශ්වාසකම මහත්ය.
24 මාගේ කොටස නම් ස්වාමීන්වහන්සේ-
යයි මාගේ ආත්මය කියයි; එබැවින්
උන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවන්නෙමි.
25 ස්වාමීන්වහන්සේ ගැන බලා
සිටින්නන්ටත් උන්වහන්සේ සොයන
ආත්මයටත් උන්වහන්සේ යහපත්ය.
26 ස්වාමීන්වහන්සේගෙන් වන ගැළවීම
නිශ්චලව බලා සිටීම මනුෂ්‍යයෙකුට
හොඳය.

27 තමාගේ බාල වයසේදී වියගහ දැරීම
මනුෂ්‍යයෙකුට යහපත.

28 උන්වහන්සේ ඒක ඔහු පිට තැබූ
නිසා ඔහු තනියම හිඳ නිශ්ශබ්දව
සිටීවා.
29 සමහරවිට බලාපොරොත්තුවක්
තිබේය කියා තමාගේ මුඛය
දූවිල්ලෙහි තබාගන හිඳීවා.
30 ඔහු තමාට පහරදෙන අයට කම්මුල
පෑවාවේ; නින්දවෙන් පූර්ණවූණාවේ.

31 මක්නිසාද ස්වාමීන්වහන්සේ
සදකාලයටම අහකදමන්නේ නැත.
32 උන්වහන්සේ ශෝකය පමුණුවන
නුමුත්, තමන්ගේ බොහෝවූ
කරුණාව ලෙස
අනුකම්පාකරනසේක.
33 මක්නිසාද උන්වහන්සේ මනුෂ්‍ය
පුත්‍රයන්ට කැමැත්තෙන් පීඩා
නොකරනසේක, ඔවුන් ශෝකයට
නොපමුණුවනසේක.

34 පොළොවේ සෑම හිරකාරයන් පාදයට
පොඩිකිරීමටත්,
35 මහෝත්තමයාණන්ගේ මුහුණ ඉදිරියේදී
මනුෂ්‍යයෙකුගේ යුක්තිය පෙරළා
දැමීමටත්,
36 මනුෂ්‍යයෙකුට ඔහුගේ නඩුවේදී
අයුක්තිය කිරීමටත් ස්වාමීන්වහන්සේ
සතුටු නොවනසේක.

37 ස්වාමීන්වහන්සේ අණ නොකළසේක්-
නම් යමක් සිද්ධවේයයි කියන්නේ
කවුද?
38 මහෝත්තමයාණන්ගේ මුඛයෙන්ම
විපතත් සැපතත් නොනික්මේද?
39 ජීවත්ව සිටින මනුෂ්‍යයෙක් තමාගේ
පව් ගැන දඬුවම ලබන නිසා
කොඳුරන්නේ මන්ද?

40 අපේ මාර්ග සෝදිසිකර විමසා
**ස්වාමීන්වහන්සේ** වෙතට නැවත
හැරෙමු.
41 ස්වර්ගයෙහි සිටින දෙවියන්වහන්සේ
වෙතට අපගේ අත් සමග අපේ
සිත්ද ඔසවමු.
අපි වනාහි වරදකොට කැරළිගැසීමුව; 42
ඔබ කමා නොකළසේක.

ඔබවහන්සේ උදහසින් සැඟවී සිට 43
අප පස්සේ එළවාගන ආසේක;
අනුකම්පා නොකොට,
මරාදැමූසේක.
අපේ යාච්ඤාව ඔබ වෙතට 44
නොපැමිණෙන ලෙස ඔබ
වලාකුළකින් ඔබම
වසාගෙන සිටිනසේක.
ඔබ ජනයන් අතරෙහි අප කසළ සහ 45
බොර මෙන් කළසේක.

අපේ සියලු සතුරෝ අපට විරුද්ධව 46
බොහෝසේ කට ඇරියෝය.
භයානකකම සහ වළත් නාස්තිය 47
සහ විනාශයත් අපට පැමිණ තිබේ.
මාගේ සෙනඟ වන දියණියගේ 48
විනාශය නිසා මාගේ ඇස්වලින්
කඳුළු ගංගා ගලන්නේය.

**ස්වාමීන්වහන්සේ** ස්වර්ගයේ සිට බලා 49
සලකන තුරු,
මාගේ ඇස්වලින් නොනැවතී කඳුළු 50
වැගිරෙන්නේය.
මාගේ නුවර සියලු දූවරුන් නිසා 51
මාගේ ඇස්වලින් මාගේ ආත්මයට
වේදනා පැමිණෙන්නේය.

නිෂ්කාරණයේ මට සතුරුව සිටින අය 52
මා කුරුල්ලෙකු මෙන් තදින්
එළෙව්වෝය.
ඔව්හු මාගේ ප්‍රාණය හිරගෙයිදී සිඳ 53
දමා, මා පිට ගලක් හෙළුවෝය.
වතුරු මාගේ හිසට උඩින් ගලා 54
ගියේය; මම සිඳදමනු ලැබීමියි
කීවෙමි.

**ස්වාමීන්වහන්ස**, මම ගැඹුරු වළේ 55
සිට ඔබගේ නාමය කියා යාච්ඤා
කෙළෙමි.
ඔබ මාගේ හඬ ඇසූසේක; මාගේ 56
හුස්ම ගැනීමටත් මාගේ
හඬගැසීමටත් ඔබගේ කන වසා
නොගත මැනව.

57 මා ඔබට යාච්ඤාකළ දවසේදී ඔබ
ළංවී: භය නොවන්නැයි කීසේක.
58 ස්වාමීන්වහන්ස, ඔබ මාගේ ආත්මය
වෙනුවට කාරණා කීසේක; මාගේ
ප්‍රාණය මිදූසේක.
59 **ස්වාමීන්වහන්ස**, ඔබ මාගේ පීඩාව
දුටුසේක; මට යුක්තිය කරදුන
මැනව.
60 ඔවුන්ගේ සියලුම පළිගැනීම් සහ මට
විරුද්ධව තිබෙන ඔවුන්ගේ සියලු
යෝජනා ඔබ දුටුසේක.
61 **ස්වාමීන්වහන්ස**, ඔවුන්ගේ නින්ද
කිරීම සහ මට විරුද්ධව තිබෙන
ඔවුන්ගේ සියලු යෝජනාද,
62 මට විරුද්ධව නැගුටුණවුන්ගේ වචනද
දවස මුළුල්ලේ මට විරුද්ධව තිබෙන
ඔවුන්ගේ අදහස්ද ඔබ ඇසූසේක.
63 ඔවුන්ගේ හිඳීමත් නැගිටීමත් බැලුව
මැනව; මම ඔවුන්ගේ කවියය.
64 **ස්වාමීන්වහන්ස**, ඔවුන්ගේ අත්වල
ක්‍රියා ලෙස ඔබ ඔවුන්ට ප්‍රතිඵල
දෙනසේක.
65 සිත් දැඩිකම වන ඔබගේ ශාපය
ඔබ ඔවුන්ට දෙනසේක.
66 ඔබ උදහසින් ඔවුන් එළවාගෙන
ගොස්, **ස්වාමීන්වහන්සේගේ**
අහස යටින් ඔවුන්
විනාශකරදමනසේක.

## සියොන් නුවරේ ප්‍රථම තේජස හා වර්තමාන අසරණකම සමානකිරීම

4 රත්රන් අඳුරුවී තිබෙන හැටි!
පවිත්‍ර රත්රන් වෙනස්වී තිබෙන
හැටි!
ශුද්ධස්ථානයේ ගල් සියලු වීථි
සන්ධිවල විසුරුවා තිබේ.
2 රනට සමානවූ සියොන්හි උතුම් පුත්‍රයන්
කුම්භකාරයාගේ අත්වල වැඩ වන
මැටි භාජන මෙන් සලකනු ලබන
හැටි!
3 සිවල්දෙන්නු පවා තනය ඇද උන්ගේ
පැටවුන්ට කිරි පොවති.
මාගේ සෙනඟගේ දූව කාන්තාරයේ
පැස්බරුන් මෙන් කෲරවූවාය.
කිරිදරුවාගේ දිව පිපාසාය නිසා 4
තල්ලේ ඇලෙයි.
ළමයි කෑම ඉල්ලති, කිසිවෙක්
ඔවුන්ට කඩා නොදෙයි.
රස කෑම කෑ අය අසරණව වීථිවල 5
හිඳිති.
රතු ඇතිරිලි පිට හිඳ ඇතිවුණ අය
කසළ ගොඩවල් වැලඳගෙන
හිඳිති.
මක්නිසාද, කිසිවෙකු විසින් අත් 6
හෙළන්නේ නැතුව ඇසිල්ලකින්
මෙන් විනාශවුණ
සොදෙමේ පාපයට වඩා මාගේ
සෙනඟ වන දියණියගේ අයුතුකම
මහත්ය.
ඇගේ වංශාධිපතීහු හිමවලට වඩා 7
පිරිසිදුව, කිරිවලට වඩා සුදුව සිටියෝය,
රතුකැටවලට වඩා ඔවුන්ගේ ශරීර
රතුව තිබුණෝය, ඔවුන්ගේ ඔපය
නීලමාණික්‍යය මෙන් විය.
දැන් ඔවුන්ගේ පෙනීම අඟුරුවලට 8
වඩා කළුය; ඔවුන් වීථිවලදී ඇඳින
ගන්ට බැරිය.
ඔවුන්ගේ හම ඔවුන්ගේ ඇටවලට
ඇලෙයි; ඒක වියළී, ලීයක් මෙන්
වී තිබේ.
සාගින්නෙන් මැරුම්කන්නන්ට වඩා 9
කඩුවෙන් මැරුම්කන්නන්ට
පහසුව ඇත්තේය;
මක්නිසාද මොවුහු කෙතේ අස්වැන්න
නැතිකමින් පීඩිතව ක්ෂයවී යති.
දයාවන්ත ස්ත්‍රීහු තමුන්ගේ අත්වලින් 10
සිය දරුවන් පිසුවෝය;
උන් මාගේ සෙනඟ වන දුවණියගේ
විනාශයේදී ඔවුන්ට කෑම විය.
**ස්වාමීන්වහන්සේ** තමන් කෝපය 11
නිත්දුවට ඉෂ්ටකොට, තමන් බලවත්
උදහස වැගිරෙවූසේක;
සියොන්හි ගින්නක් ඇවුළුවූසේක,
එයින් එහි අත්තිවාරම් දගියේය.
පොළොවේ රජවරුද ලෝකයේ 12

සියලු වැසියෝද
එදිරිකාරයා සහ සතුරා යෙරුසලමේ
දෙරටුවලට ඇතුල්වන්නේයයි
විශ්වාස නොකළෝය.
13 මෙසේ වුණේ ධර්මිෂ්ඨයන්ගේ ලේ ඇ
තුළ වැගිරෙවුවාවූ
ප්‍රොපේතවරුන්ගේ පව් නිසාත්
පූජකයන්ගේ අපරාධ නිසාත්ය.
14 ඔව්හු අන්ධයන් මෙන් වීථිවල
ඔබමොබ යති,
මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වස්ත්‍රවල
තැවරෙන්ට බැරි තරමට ඔව්හු
ලෙයින් කිලුටුවී සිටිති.
15 අහක්වෙයල්ලා, අපවිත්‍රය!
අහක්වෙයල්ලා, අහක්වෙයල්ලා,
තැවරෙන්ට එපායයි ඔව්හු ඔවුන්ට
මොරගැසුවෝය.
ඔවුන් පලාගොස් ඔබමොබ ගිය විට:
ඔව්හු තවත් මෙහි නොසිටින්නෝ-
යයි ජාතීන් අතරේ කියනලද්දේය.
16 **ස්වාමීන්වහන්සේගේ** උදහස
ඔවුන් හේදකෙළේය; උන්වහන්සේ
තවත් ඔවුන් නොසලකනසේක.
ඔව්හු පූජකයන්ගේ මුහුණට ගරු
නොකළෝය, වැඩිමහල්ලන්ට
කරුණා නොකළෝය.
17 නිෂ්ඵලවූ උපකාර ගැන බලාසිටීමෙන්
අපේ ඇස් තවම ක්ෂයවන්නේය.
ගළවන්ට බැරි ජාතියක් ගැන මුර
කුළුනු උඩ අපි බලා සිටියෙමුව.
18 අපේ වීථිවල අපට යන්ට බැරිවන
ලෙස ඔව්හු අපේ අඩිපාරේ එළවති.
අපේ අන්තිමය ආසන්නය, අපේ
දවස් තීන්දුය; මක්නිසාද අපේ
අන්තිමය පැමුණුණේය.
19 අප පස්සේ එළවාගන ආ තැනැත්තෝ
අහසේ රාජාලීන්ට වඩා
වේගවත්වූහ.
ඔව්හු කඳුවල අප පස්සේ එළවාගන
ආවෝය, අප අල්ලන්ට
කාන්තාරයෙහි රැක සිටියෝය.
20 ඔහුගේ සෙවණෙහි ජාතීන් අතරේ
අපට ජීවත්වෙන්ට ලැබේයයි අප
කීවාවූ,
අපගේ නාසයේ හුස්ම වැනිවූ,
**ස්වාමීන්වහන්සේගේ** අභිෂේකලත්
තැනැත්තේ ඔවුන්ගේ වළවල
අසුවුණේය.
ඌශ් දේශයෙහි වාසයකරන ඒදෙම් 21
දුව, ප්‍රීති සන්තෝෂවෙයන්න.
කුසලාන තුඹ වෙතටත් පැමිණෙන්නේය;
තුඹ මත්ව නිර්වස්ත්‍රව සිටින්නීය.
එම්බා සියොන් දියණිය, තුඹේ 22
අයුතුකමේ දඬුවම ඉෂ්ටවිය;
උන්වහන්සේ තවත් තුඹ වාලට ගෙන
නොයනසේක.
එම්බා ඒදෙම් දියණිය, උන්වහන්සේ
තුඹේ අයුතුකමට
දඬුවම්කරනසේක;
තුඹේ පව් එළිදරව්කරනසේක.

## මිදීම සඳහා සියොන් දුව ඕනෑකමින් යාච්ඤා කිරීම

5

**ස්වාමීන්වහන්ස**, අපට සිද්ධවී
තිබෙන දේ සිහිකළ මැනව.
අපේ නින්දව බලා සැලකුව මැනව.
අපේ උරුමය අන්‍යයන්ටත්, 2
අපේ ගෙවල් විදේශීන්ටත් අයිතිවී
තිබේ.
අපි කාත් නැත්තෝය, පියා නැති 3
දරුවෝය,
අපේ මවුවරුන් වැන්දඹුවන් මෙන්ය.
අපි අපේම වතුර මිලේට ගෙන බීමුව, 4
අපේම දර අපට විකුණනු ලැබේ.
අප ලුහුබදින්නෝ අපට ඉතා 5
ආසන්නය.
අපි වෙහෙසුණෙමුව, අපට සහනයක්
නැත.
සෑහෙන පමණ කෑම ලැබෙන පිණිස 6
මිසරවරුන්ටත් අෂූර්වරුන්ටත් අත
දුනිමුව.
අපේ පියවරු පව්කළෝය, ඔව්හු 7
නැත;
අපි ඔවුන්ගේ අයුතුකම් දරුවෙමුව.
වැඩකාරයෝ අප කෙරෙහි ආණ්ඩු 8
කරති.
ඔවුන් අතින් අප ගළවාගන්ට කෙනෙක්
නැත.

9 කාන්තාරයේ තිබෙන කඩුව නිසා,
අපේ ප්‍රාණයට අන්තරාය ඇතුව අපේ
කෑම ලබාගනිමුව.
10 සාගින්නේ තද උෂ්ණය නිසා
අපේ හම උදුනක් මෙන් රත්ව තිබේ.
11 සියොන්හි ස්ත්‍රීන්ටත්
යූද නුවරවල කන්‍යාවන්ටත් ඔව්හු
බලාත්කාරකළෝය.
12 අධිපතීහු තමුන්ගේ අත්වලින් එල්ලනු
ලැබුවෝය.
වැඩිමහල්ලන්ගේ මුහුණුවලට ගෞරව
නොලැබුණේය.
13 යෞවනයෝ ඇඹරුම්ගල උසුලාගන
ගියෝය,
ළමයි දරවල බරින් වැටී ගියෝය.
14 වැඩිමහල්ලෝ දෙරටුවෙන් පහව
ගියෝය,
යෞවනයෝ තමුන්ගේ ගීතිකාකිරීමෙන්
වැලකුණෝය.
15 අපේ සිතේ ප්‍රීතිය නැවතුණේය;
අපේ නැටීම වැලපීමට පෙරළුණේය.
16 අපේ හිසින් ඔටුන්න වැටුණේය.
අපට දුක්වේ! මක්නිසාද අපි පව්
කෙළෙමුව.
මේ නිසා අපේ සිත ක්ලාන්තවී තිබේ; 17
මේ දේවල් නිසා–
පාළුව තිබෙන සියොන් කන්ද නිසා– 18
අපේ ඇස් අඳුරුවී තිබේ;
සිවල්ලු එහි ඇවිදිති.
**ස්වාමීන්වහන්ස**, ඔබ සදාකාලයටම 19
සිටිනසේක;
ඔබගේ සිංහාසනය පරම්පරාවෙන්
පරම්පරාවට පවත්නේය.
ඔබ නිතරම අප මතකනැතිකරන්නෙත් 20
මෙපමණ කල් අප අත්හරින්නෙත්
මක්නිසාද?
**ස්වාමීන්වහන්ස**, අප හැරීඑන 21
පිණිස ඔබ වෙතට අප හරවාගත
මැනව;
පුරාණයේදී මෙන් අපට [සමාදාන]
දවස් නැවත දුන මැනව.
මක්නිසාද ඔබ සහමුලින් අප පහකර 22
දැමූසේක,
ඔබ අප කෙරෙහි අතිශයින් කෝපව
සිටිනසේක.

# අනාගතවක්තෘවූ එසකියෙල්ගේ පොත

## ප්‍රාරම්භ දර්ශනය. බබළන සිංහාසනය

1 තිස්වෙනි අවුරුද්දේ සතරවෙනි
මාසයේ පස්වෙනිද කෙබාර් ගංගාව
ළඟ වාලට අසුවූවන් අතරේ මා සිටින
කල්හි අහස විවෘතවී දේවදර්ශන මට
2 පෙනුණේය. යෙහෝයාකීන් රජුගේ
වහල්කමේ පස්වෙනි අවුරුද්දේ මාසයේ
3 පස්වෙනිද, කල්දිවරුන්ගේ දේශයෙහි
කෙබාර් ගංගාව ළඟ බූසීගේ පුත්‍රවූ
එසකියෙල් නම් පූජකයා වෙතට
**ස්වාමීන්වහන්සේගේ** වචනය පැමුණු-
ණේය; **ස්වාමීන්වහන්සේගේ** අතද එහිදී
4 ඔහු පිට විය. මා බැලූ විට හුළං
කුණාටුවක් උතුරෙන් එනවා දුටිමි,
මහත් වලාපටලයක්ද ඇවිළීයන
ගින්නක්ද ඒ වටකර දීප්තිමත්කමක්ද
දිලිහෙන පිත්තල මෙන් ගින්න මැද සිට
5 බැබළීමක්ද වූයේය. තවද එහි මැද සිට
සත්ත්වයන් සතර දෙනෙකුගේ ස්වරූප
නික්මුණේය. ඔවුන්ගේ පෙනීම මෙසේය:
ඔවුන්ට මනුෂ්‍ය ස්වරූපය තිබුණේය.
6 ඔවුන් එකිනෙකාට මුහුණු සතරක්ද
එකිනෙකාට පියාපත් සතරක්ද විය.
7 ඔවුන්ගේ පාද ඇද නැති පාදය: ඔවුන්ගේ
පාද පතුල් වස්සෙකුගේ පාද පතුල්
මෙන්ය. ඒවා දීප්තිමත් පිත්තල මෙන්
8 දිලිසුණේය. ඔවුන්ගේ සතර පැතිවල
ඔවුන්ගේ පියාපත් යට මනුෂ්‍ය අත්
තිබුණේය. ඒ සතරදෙනාගේ මුහුණු සහ
9 පියාපත්ද මෙසේය: ඔවුන්ගේ පියාපත්
එකිනෙකට බැඳී තැවරී තිබුණේය; ඔව්හු
යන විට නොහැරී කෙළින් ඉස්සරහට
10 ගියෝය. ඔවුන්ගේ මුහුණුවල ස්වරූපය
මෙසේය: ඔවුන්ට මනුෂ්‍ය මුහුණක්ද
ඔවුන් සතරදෙනාට දකුණු පැත්තේ සිංහ
මුහුණක්ද ඔවුන් සතරදෙනාට වම්
පැත්තේ ගව මුහුණක්ද ඔවුන් සතර-
දෙනාට රාජාලි මුහුණක්ද බැගින්
තිබුණේය. ඔවුන්ගේ මුහුණුද ඔවුන්ගේ 11
පියාපත්ද ඉහළින් වෙන්ව තිබුණේය;
එකිනෙකාගේ පියාපත් දෙකක් තවත්
කෙනෙකුගේ පියාපත් දෙකකට වැදී
තිබුණේය. දෙකකින් ඔවුන්ගේ ශරීරය
වැසී තිබුණේය. ඔවුන් එක එකා කෙළින් 12
ඉස්සරහට ගියේය. ආත්මය යම් තැනකට
යන්ට කැමතිවීද ඔව්හු එහි ගියෝය;
ඔව්හු යන විට නොහැරුණෝය. ඒ 13
සත්ත්වයන්ගේ ස්වරූපය මෙසේය:
ඔවුන්ගේ පෙනීම ඇවිළෙන ගිනිඅඟුරු
මෙන්ය, පන්දම්වල පෙනීම මෙන්ය:
ගින්න සත්ත්වයන් අතරේ එහා මෙහා
ගියේය. එය දීප්තිමත්ව තිබුණේය, ඒ
ගින්නෙන් විදුලි නික්මුණේය. ඒ 14
සත්ත්වයෝ විදුලි කෙටීමක පෙනීම මෙන්
දිවගොස් හැරී ආවෝය. මා සත්ත්වයන් 15
දෙස බලා සිටියදී සත්ත්වයන් ළඟ එක
එකාගේ මුහුණු සතරට චක්‍රයක් බැගින්
පොළොව පිට තිබෙනවා දුටිමි. චක්‍රවලද 16
ඒවායේ කර්මාන්තවලද පෙනීම
රත්කාන්තියක පාට මෙන්ය. ඒ සතර-
ටම තිබුණේ එකාකාර ස්වරූපයක්ය.
ඒවායේ පෙනීමද ඒවායේ කර්මාන්තද
එක චක්‍රයක් තවත් චක්‍රයක් තුළ
තිබෙන්නාක්මෙන් වූයේය. ඒවා යන විට 17
නොහැරී ඒවායේ පැති සතරේ ප්‍රකාරයට
ගියේය. ඒවායේ වළලු වනාහි උස්ව 18
භයානකව තිබුණේය. ඒ සතරේම වළලු
වටේට පුරාම ඇස් තිබුණේය. සත්ත්වයන් 19
යන විට චක්‍රත් ඔවුන් කැටුව ගියේය.

සත්ත්වයන් පොළොවෙන් නගින විට
20 චක්‍රද නැංගේය. ආත්මය යන්ට සිටි
කොයි තැනකට නුමුත් ඔව්හු ගියෝය;
ආත්මය යන්ට කැමතිවූ ස්ථානයකට
චක්‍රත් ඔවුන් එක්වම නැංගේය; මක්නිසාද
සත්ත්වයාගේ ආත්මය චක්‍රවල තිබුණේය.
21 ඔවුන් යන විට ඒවාත් ගියේය; ඔවුන්
නැවතුණු විට ඒවාත් නැවතුණේය; ඔවුන්
පොළොවෙන් නගින විට ඔවුන් එක්වම
චක්‍රත් නැංගේය. මක්නිසාද සත්ත්වයා-
22 ගේ ආත්මය චක්‍රවල තිබුණේය. තවද
සත්ත්වයාගේ හිසට උඩින් භයානක
පළිඟුවල පාට වැනි ආකාශයක
සමානත්වයක් තිබුණේය, එය ඔවුන්ගේ
හිස්වලට ඉහළින් විහිදී තිබුණේය.
23 ආකාශයට යටින් ඔවුන්ගේ පියාපත්
එකකට එකක් කෙළින්ව තිබුණේය.
එකිනෙකාගේ ශරීරයේ එහා පැත්ත
දෙකකින්ද මෙහා පැත්ත දෙකකින්ද වැසී
24 තිබුණේය. ඔවුන් යන විට, ඔවුන්ගේ
පියාපත්වල ශබ්දය බොහෝ ජල
ධාරාවන්ගේ ශබ්දය මෙන්ද සර්ව-
පරාක්‍රමයාණන්ගේ හඬ මෙන්ද මට
ඇසුණේය, එය සේනාවක ඝෝෂාව මෙන්
කෝලාහල ඝෝෂාවක්ය. ඔවුන් හිටින
විට තමුන්ගේ පියාපත් පහත්කරගත්-
25 තෝය. ඔවුන්ගේ හිස්වලට උඩින් තිබුණු
ආකාශයට ඉහළින් හඬක් පැමුණුණේය.
ඔවුන් හිටින විට තමුන්ගේ පියාපත්
26 පහත්කරගත්තෝය. ඔවුන්ගේ හිස්වලට
උඩින් තිබුණු ආකාශයට ඉහළින්
නීලමාණික්‍යයක පෙනීම ඇති සිංහා-
සනයක ස්වරූපයක් තිබුණේය.
සිංහාසනයේ ස්වරූපය උඩ මනුෂ්‍ය
පෙනීමක් ඇති ස්වරූපයක් තිබුණේය.
27 එහි තුළ වටකරින් උන්වහන්සේගේ
ඉඟටිය වැනිවූ පෙනීමේ සිට ඉහළට
ගිනිපෙනීමක් වැනි දිලිහෙන පිත්තලවල
බැබළීමක් වාගේ දුටිමි; උන්වහන්සේගේ
ඉඟටිය වැනිවූ පෙනීමේ සිට පහළටත්
ගිනිපෙනීමක් මෙන්ද ඒ වටකර
28 දීප්තිමත්කමක්ද දුටිමි. වටකර තිබුණු
දීප්තිමත්කමේ පෙනීම වර්ෂා දවසක
වලාකුළේ තිබෙන දේදුන්නේ පෙනීම
මෙන්ය. මේ වනාහි ස්වාමීන්වහන්සේගේ
තේජසේ ස්වරූපයේ පෙනීමය. මම එය
දුටු කල මුහුණින් වැටුණෙමි, කථාකරන
කෙනෙකුගේ හඬ මට ඇසුණේය.

## කැරළිකාර සෙනඟ කරා අනාගතවක්තෘ යැවීම

උන්වහන්සේ මට කථාකොට: **2**
මනුෂ්‍ය පුත්‍රය, නැගිට සිටපත්න,
මම තුඹ සමග කථාකරන්නෙමියි
කීසේක. උන්වහන්සේ මට කථාකළ විට 2
ආත්මය මා තුළට ඇතුල්වී, මා නැගුටුවා
සිටෙවුවේය; මට කථාකළ තැනන්-
වහන්සේගේ වචනද මට ඇසුණේය.
උන්වහන්සේද: මනුෂ්‍ය පුත්‍රය, මට 3
විරුද්ධව කැරළිගැසුවාවූ කැරළිකාර
ජාතීන් වන ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙතට
තුඹ යවමි. ඔව්හුද ඔවුන්ගේ පියවරුද
අද දවස දක්වාම මට විරුද්ධව ද්‍රෝහි-
කම්කළෝය. තද මුහුණුද දැඩි සිත්ද 4
ඇති පුත්‍රයන් වන ඔවුන් වෙතට තුඹ
යවමි; තුඹද: ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේකැයි ඔවුන්ට කියාපත්න.
ඔවුන් කැරළිකාර වංශයක් බැවින්, ඔවුන් 5
අසතත් නොඅසතත් තමුන් අතරෙහි
අනාගතවක්තෘ කෙනෙක් සිටි බව ඔවුන්
දැනගන්නවා ඇත. මනුෂ්‍ය පුත්‍රය, ඔවුන් 6
තුඹට කහඹිලියා සහ කටුගස් මෙන්
වන්නේවී නුමුත්, තුඹ ගෝනුස්සන් අතරේ
වාසයකරන්නේවී නුමුත්, ඔවුන්ටවත්
ඔවුන්ගේ වචනවලටවත් භය නොවන්න,
ඔවුන් කැරළිකාර වංශයක් නුමුත්
ඔවුන්ගේ වචනවලට භය නොවන්න,
ඔවුන්ගේ මුහුණුවලට නොකැලඹෙන්න.
ඔවුන් ඉතා කැරළිකාර බැවින් ඔවුන් 7
අසතත් නොඅසතත් මාගේ වචන
ඔවුන්ට කියාපත්න.

## අනාගතවක්තෘට දේවානුභාවය හා ධෛර්ය ලැබීම

මනුෂ්‍ය පුත්‍රය, තුඹ වනාහි මා තුඹට 8
කියන දේ අසාපත්න; ඒ කැරළිකාර
වංශය මෙන් තුඹ කැරළිකාරයෙක්
නොවන්න. තුඹේ කට ඇර මා විසින්
තුඹට දෙන දෙය කාපත්නැයි මට
කීසේක. මා බැලූ කල මා දෙසට අතක් 9
දිගුකර තිබෙනවා දුටිමි; බලව, අකුළන
පොතක් එහි තිබුණේය; උන්වහන්සේ 10

ඒක මා ඉදිරියේ දිග හැරියසේක; එහි
ඇතුළත් පිටත් ලියා තිබුණේය. එහි
ලියා තිබුණේ විලාපත් වැලපීමත්
3 ළතෝනියත්ය. උන්වහන්සේද:
මනුෂ්‍ය පුත්‍රය, තුඹට සම්බවෙන
ඒක කාපන්න; මේ පොත කාලා, ගොස්,
ඉශ්‍රායෙල් වංශයට කථාකරපන්නැයි මට
2 කීසේක. එවිට මම මාගේ කට ඇරියෙමි,
උන්වහන්සේද ඒ පොත කන්ට මට
3 සැලැස්සූසේක. තවද: මනුෂ්‍ය පුත්‍රය, මා
තුඹට දෙන මේ පොත තුඹ කා, තුඹේ
බඩ පුරවාගනින්නැයි උන්වහන්සේ මට
කීසේක. මම කෑවෙමි; එය මාගේ කටට
මීපැණි මෙන් මිහිරිව තිබුණේය.
4 උන්වහන්සේ කථාකොට: මනුෂ්‍ය පුත්‍රය,
තුඹ ගොස් ඉශ්‍රායෙල් වංශය වෙතට
පැමිණ, මාගේ වචන කියා ඔවුන්ට
5 කථාකරපන්න. මක්නිසාද තුඹ යවන්නේ
අන් භාෂාවක්ද අමාරු වචනද ඇති
සෙනඟක් ළඟට නොව ඉශ්‍රායෙල් වංශය
6 ළඟටය; තුඹට තේරුම්ගන්ට බැරි වචන
ඇති, අන් භාෂාවක්ද අමාරු වචනද
ඇති බොහෝ ජනයන් ළඟට නොවේ.
සැබවින් ඔවුන් ළඟට මම තුඹ යැවුවොත්
ඔවූන් තුඹට ඇහුම්කන් දෙනවා ඇත.
7 නුමුත් ඉශ්‍රායෙල් වංශය මට ඇහුම්-
කන්දෙන්ට කැමති නැති බැවින්
ඔව්හු තුඹට ඇහුම්කන්දෙන්ට කැමති
නොවෙති. මක්නිසාද මුළු ඉශ්‍රායෙල්
වංශය දැඩිවූ නළල්ද තද සිත්ද ඇත්තෝය.
8 බලව, මම ඔවුන්ගේ මුහුණුවලට
විරුද්ධව තුඹේ මුහුණත් ඔවුන්ගේ
නළල්වලට විරුද්ධව තුඹේ නළලත්
9 දැඩිකෙළෙමි. තුඹේ නළල ගිනිගලට වඩා
තදවූ විදුරක් මෙන් කෙළෙමි. ඔවුන්
කැරලිකාර වංශයක් නුමුත් ඔවුන්ට භය
නොවන්න, ඔවුන්ගේ රවාබැල්මට නො-
10 කැලඹෙන්නැයි මට කීසේක. තවද
උන්වහන්සේ මට කථාකොට: මනුෂ්‍ය
පුත්‍රය, තුඹට කියන මාගේ සියලුම වචන
තුඹේ සිතේ තබාගනින්න, තුඹේ
11 කන්වලින් අසාපන්න. වාල්ව සිටින තුඹේ
සෙනඟගේ පුත්‍රයන් ළඟට ගොස්–ඔවුන්
අසතත් නොඅසතත්–ඔවුන්ට කථාකොට:
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේකැයි ඔවුන්ට කියාපන්නැයි
කීසේක.

## පිටවහල්කර සිටි යුදෙවුවන්ට එසකියෙල් මුරකාරයෙකු කොට පත්කිරීම

එවිට ආත්මය මා ඔසවාගත්තේය. 12
ස්වකීය ස්ථානයේ සිට ස්වාමීන්-
වහන්සේගේ මහිමයට ප්‍රශංසාවේවයි
කියන මහත් ඝෝෂා ශබ්දයක් මා
පස්සෙන් මට ඇසුණේය. එකිනෙකට 13
වැදුණු සත්ත්වයන්ගේ පියාපත්වල ළඟ
තිබුණු රෝදවල ශබ්දයද මහත් ඝෝෂා
ශබ්දයක්ද මට ඇසුණේය. මෙලෙස 14
ආත්මය මා ඔසවා, මා ගෙනගියේය.
මමද මාගේ ආත්මයෙහි උදහසිනුත්
තද දුකිනුත් යුක්තව ගියෙමි, ස්වාමීන්-
වහන්සේගේ අතද මා කෙරෙහි බලවත්ව
තිබුණේය. එවිට මම කෙබාර් ගංගාව 15
ළඟ තේල්-ආබීබ් යන ස්ථානයෙහි විසූ
වාල්කමේ සිටියවුන් ළඟට පැමිණ, එහි
සත් දවසක් ඔවුන් අතරෙහි විස්මපත්ව
හිඳගත උනිමි.
තවද සත් දවසකට පසු ස්වාමීන්- 16
වහන්සේගේ වචනය මා වෙතට පැමිණ
මෙසේ කීය: මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල් 17
වංශයට තුඹ මුරකාරයෙකු කෙළෙමි. තුඹ
මාගේ මුඛයෙන් වචනය අසා, මාගේ
නාමයෙන් ඔවුන්ට අවවාදකරපන්න.
තුඹ සැබවින් නසින්නෙහියයි මා විසින් 18
දුෂ්ටයාට කියන කල, තුඹ ඔහුට අවවාද
නොකරන්නෙහි නම්, දුෂ්ටයා ජීවත්වෙන
පිණිස තමාගේ දුෂ්ට මාර්ගයෙන්
හැරෙන ලෙස ඔහුට අවවාදකිරීමට
ඔහුට කථා නොකරන්නෙහි නම්, දුෂ්ටවූ
ඔහු තමාගේ අයුතුකමෙහි නසිනවා
ඇත; එහෙත් ඔහුගේ ලේ තුඹ අතින්
අයකරන්නෙමි. නුමුත් තුඹ දුෂ්ටයාට 19
අවවාදකළාම ඔහු තමාගේ දුෂ්ටකමෙන්ද
තමාගේ දුෂ්ට මාර්ගයෙන්ද නොහැරෙන්නේ
නම්, ඔහු තමාගේ අයුතුකමෙහි නසිනවා
ඇත; නුමුත් තුඹ තුඹේ ප්‍රාණය ගළවා-
ගන්නෙහිය. තවද ධර්මිෂ්ඨයෙක් තමාගේ 20

ධර්මිෂ්ඨකම අත්හැර අයුතුකම් කළාම,
පැකිළීමට කාරණයක් මම ඔහු ඉදිරියෙහි
තබන විට ඔහු නසිනවා ඇත. නුඹ
ඔහුට අවවාද නොකළ නිසා ඔහු
තමාගේ පාපයෙහි නසිනවා ඇත. ඔහු
කළාවූ ඔහුගේ ධර්මිෂ්ඨකම සිහිකරනු
නොලබන්නේය; ඔහුගේ ලේද නුඹ අතින්
21 අයකරන්නෙමි. නුමුත් ධර්මිෂ්ඨයා පව්
නොකරන ලෙස නුඹ ධර්මිෂ්ඨයාට
අවවාදකළාම, ඔහු පව් නොකර
සිටියොත්, අවවාදය පිළිගත් බැවින් ඔහු
සැබවින්ම ජීවත්වන්නේය; නුඹද නුඹේ
ප්‍රාණය ගළවාගත්තෙහියයි කීය.

## එසකියෙල් තමාගේ ගෙදර නවතින ලෙස අණ ලැබීම

22 එවිට ස්වාමීන්වහන්සේගේ අත එහිදී
මා පිටට පැමුණුණේය; උන්වහන්සේද:
නැගිට සමභූමියට පලයන්න, එහිදී නුඹ
සමග කථාකරන්නෙමියි මට කීසේක.
23 එකල මම නැගිට සමභූමියට ගියෙමි.
එවිට කෙබාර් ගඟ ළඟදී මා දුටු තේජස
මෙන් ස්වාමීන්වහන්සේගේ තේජස එහි
තිබෙනවා දුටිමි. මම මුහුණින් වැටුණෙමි.
24 නුමුත් ආත්මය මට ඇතුල්වී, මා
නැගිටුවා සිටුවා, මා සමග කථාකොට:
නුඹේ ගෙට වැද දොර වසාගන හිඳින්න.
25 තවද මනුෂ්‍ය පුත්‍රය, ඔවුන් නුඹ පිට
බැඳුම් දමා, නුඹ ඔවුන් අතරට නේන
26 පිණිස ඒවායින් නුඹ බඳිනවා ඇත. මම
නුඹේ දිව නුඹේ උඩුතල්ලේ ඇලෙන්ට
සලස්වන්නෙමි, එවිට නුඹ ගොළුවී,
ඔවුන්ට තරවටුකරන මනුෂ්‍යයෙක් නොවී
සිටිනවා ඇත. මක්නිසාද ඔව්හු
27 කැරළිකාර වංශයක්ය. එහෙත් මා නුඹ
සමග කථාකරන කල නුඹේ මුඛය
අරින්නෙමි, නුඹද: ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේකැයි ඔවුන්ට
කියාපන්න. අසන තැනැත්තේ අසාවා;
නාසන තැනැත්තේ නාසා සිටීවා.
මක්නිසාද ඔව්හු කැරළිකාර වංශයක්-
යයි කීසේක.

## යෙරුසලම වටලනු ලබන බවට උපමා ලකුණු

4 තවද මනුෂ්‍ය පුත්‍රය, පැතලි
ගඩොළක් ගෙන ඒක නුඹ
ඉදිරියෙහි තබාගන නුවරක්, එනම්
යෙරුසලම, ඒකේ සිතියම් කරපන්න.
ඊට විරුද්ධව වටලාගැනීමක් පිහිටුවා, 2
ඊට විරුද්ධව බලකොටු ගොඩනගා,
ඊට විරුද්ධව ගොඩැල්ලක් සාද, ඊට
විරුද්ධව අන්දයම් තබා, වටකරින් ඊට
විරුද්ධව යුද්ධ යන්ත්‍ර තබාපන්න. තවද 3
යකඩ තැටියක් ගෙන යකඩ පවුරක්
මෙන් කොට ඒක නුඹටත් නුවරටත්
අතරේ තබා, ඒක වටලනු ලබන පිණිස
ඊට විරුද්ධව නුඹේ මුහුණ පිහිටුවා,
ඒක වටලාගනින්න. මෙය ඉශ්‍රායෙල්
වංශයට ලකුණක්ය.
තවද නුඹේ වම් අංශයට හාන්සිවී, 4
ඉශ්‍රායෙල් වංශයේ අයුතුකම ඊ පිට
තබාගන හිඳින්න. නුඹ ඊ පිට හාන්සිවී
ඉන්න දවස් ගණන මුළුල්ලෙහි නුඹ
ඔවුන්ගේ අයුතුකම දරන්නෙහිය. මක්- 5
නිසාද මම ඔවුන්ගේ අයුතුකමේ අවුරුදු
නුඹට දවස් ගණනක් කොට එනම්
තුන්සිය අනූ දවසක් නියමකෙළෙමි.
මෙලෙස නුඹ ඉශ්‍රායෙල් වංශයේ අයුතුකම
දරන්නෙහිය. නුඹ ඒවා ඉෂ්ටකළ පසු, 6
නුඹේ දකුණු අංශයට නැවත හාන්සිවී,
යූද වංශයේ අයුතුකම සතළිස් දවසක්
දරාගන හිඳින්න. අවුරුද්දකට දවසක්
බැගින් නුඹට නියමකෙළෙමි. නුඹේ 7
මුහුණද යෙරුසලම වටලෑමට
පිහිටුවාගන හිඳ, නුඹේ හස්තය නග්න
කර, ඊට විරුද්ධව අනාගතවාක්‍ය
කියාපන්න. බලව, නුඹේ වටලෑමේ දවස් 8
නුඹ තීන්දුකරන තුරු නුඹේ එක
අංශයකින් අනික් අංශයට නොහැරෙන
පිණිස මම නුඹ පිට බැඳුම් තබමි. තවද 9
නුඹ තිරිඟුද යවද මෑද කොල්ලුද
කුරක්කන්ද තණහාල්ද රැගෙන එක
භාජනයක තබා, එයින් රොටි
සාදගනින්න; නුඹේ අංශයට නුඹ
හාන්සිවෙන දවස් ගණන වන තුන්සිය
අනූ දවසක් ඒවා කාපන්න. නුඹ කන්නාවූ 10

තුඹේ කෑමද දවසට බර ගණනින්
*ෂෙකෙල් විස්සක්ව තිබෙන්ට ඕනෑය.
11 වරින් වර ඒවා කාපන්න. වතුරත් දවසට
නැළියෙන් සතරෙන් තුන් පංගුවක් මැන
බොන්ට ඕනෑය. වරින් වර බීපන්න.
12 යව රොටි වාගේ ඒ කෑම කාපන්න,
මනුෂ්‍යයා පහරන අශුචිවලින් ඔවුන්ගේ
13 ඇස් හමුයෙහි ඒවා පිසපන්න. මා විසින්
ඉශ්‍රායෙල් පුත්‍රයන් ජාතීන් අතරට පන්නා
දැමූ කල්හි ඔවුන් එසේ එහිදී තමුන්ගේ
අපවිත්‍රවූ කෑම කනවා ඇතැයි ස්වාමීන්-
14 වහන්සේ කීසේක. එවිට මම: අහෝ
ස්වාමිවූ දෙවියන්වහන්ස! මාගේ ප්‍රාණය
අපවිත්‍ර නොවීය. මාගේ බාල වයසේ
පටන් දැන් දක්වාම කුණපවත් මෘගයන්
විසින් ඉරාදැමූ සතෙක්වත් නොකෑවෙමි;
පිළිකුල් මාංස මාගේ කටට ඇතුල්
15 නොවීයයි කීමි. එවිට උන්වහන්සේ:
මෙන්න, මනුෂ්‍ය අශුචි වෙනුවට
ගවයින්ගේ ගොම තුඹට නියමකෙළෙමි,
ඒවායින් තුඹේ රොටි පිසපන්නැයි මට
16 කීසේක. තවද උන්වහන්සේ මට
කියනසේක්: මනුෂ්‍ය පුත්‍රය, ඔවුන්ට කෑමද
වතුරද නැතුව ගොස්; එකිනෙකා සමග
විස්මයට පත්ව, තමුන්ගේ අයුතුකම නිසා
17 ක්ෂයවී යන පිණිස, මම යෙරුසලමේ
කෑම නැමති යෂ්ටියද නැතිකරන්නෙමි.
මෙසේ ඔව්හු කෑම කිරා පිරිමසාගන
කන්නෝය; කනස්සලුකමින් වතුර මැන
බොන්නෝයයි කීසේක.

5 තවද මනුෂ්‍ය පුත්‍රය, තියුණු කඩු-
වක් ගනින්න, එය පනික්කියන්ගේ
දැළිපිහියක් මෙන් හැරගෙන, තුඹේ
හිසද තුඹේ රැවුලද එයින් බූගා, කිරන
තරාදියක් රැගෙන ඒ කේශ බෙදපන්න.
2 ඉන් තුනෙන් පංගුවක් වටලෑමේ දවස්
සම්පූර්ණවූ කල්හි නුවර මැද ගින්-
නෙන් දවාපන්න; තුනෙන් පංගුවක්
රැගෙන වටකරින් ඒවාට කඩුවෙන්
ගසාපන්න; තුනෙන් පංගුවක් හුළඟට
විසුරුවාදමාපන්න, මමද ඒවා පසු-
3 පස්සෙන් කඩුවක් දිගුකරන්නෙමි. එයින්
ගණනින් ස්වල්පයක් රැගෙන ඒවා තුඹේ
රෙදි කොන්වල බැඳගනින්න. නැවත 4
එයින් ස්වල්පයක් රැගෙන ඒවා ගින්න
මැදට හෙළා, ඒවා ගින්නෙන් දවාපන්න;
එයින් මුළු ඉශ්‍රායෙල් වංශයට විරුද්ධව
ගින්නක් නික්මෙන්නේය.

## ඉහතකී උපමා ලකුණු විස්තරකිරීම

ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ 5
කියනසේක. මේක යෙරුසලමය: ඈ
ජාතීන් මැද පිහිටෙවුවෙමි. ඈ අවටින්
රටවල් තිබේ. ඈ දුෂ්ටකම්කොට, 6
ජාතීන්ට වඩා මාගේ විනිශ්චයන්ටත්
ඈ වටකර තිබෙන රටවලට වඩා මාගේ
පනත්වලටත් විරුද්ධව කැරළිගැසුවාය.
මක්නිසාද ඔව්හු මාගේ විනිශ්චයන්
එපාකළෝය, මාගේ පනත් ප්‍රකාරයට
නොහැසුරුණෝය. එබැවින් ස්වාමිවූ 7
දෙවියන්වහන්සේ මෙසේ කියනසේක:
තුඹලා අවට සිටින ජාතීන්ට වඩා තුඹලා
කෝලාහලකර, මාගේ පනත් ප්‍රකාරයට
නොහැසිර, මාගේ විනිශ්චයන් රක්ෂා
නොකර, තුඹලා අවට සිටින ජාතීන්ගේ
විනිශ්චයන් ලෙසවත් නොකර හැරිය
බැවින්, ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ 8
කියනසේක–බලව, මම, මමම පවා,
තුඹට විරුද්ධව ජාතීන්ගේ ඇස් හමුයෙහි
තුඹ තුළ විනිශ්චයන් ඉෂ්ටකරන්නෙමි.
මා කළේවත් නැවත කරන්නේවත් නැති 9
ආකාර දේවල් තුඹේ සියලු පිළිකුල්කම්
නිසා තුඹ තුළ කරන්නෙමි. එබැවින් 10
තුඹ තුළ පියවරු පුත්‍රයන්ද පුත්‍රයෝ
තමුන්ගේ පියවරුන්ද කන්නාහ; මම තුඹ
තුළ විනිශ්චයන් ඉෂ්ටකොට, තුඹේ ඉතිරි
සියල්ලන් දස දෙස විසුරුවාදමන්නෙමි.
එබැවින් මා ජීවත්වෙනවා සැබෑවා සේම 11
මෙසේ කියමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක: තුඹේ සියලු අශික්ෂිතකම්-
වලින්ද තුඹේ සියලු පිළිකුල්කම්වලින්ද
තුඹ මාගේ ශුද්ධස්ථානය අපවිත්‍රකළ
නිසා සැබවින්ම මමත් තුඹ අඩුබවට
පමුණුවන්නෙමි; මාගේ ඇස දයාව
නොපෙන්වන්නේය, මමද කරුණා නො-
කරන්නෙමි. තුඹෙන් තුනෙන් කොටසක් 12

*ෂෙකෙල් එකක් රාත්තල් බාගයක් පමණය.

වසංගතයෙන් මියන්නෝය, ඔව්හු සාගත-
යෙන් තුඹ තුළ නැතිවන්නෝය; තුනෙන්
කොටසක් තුඹ අවටින් කඩුවෙන්
වැටෙනවා ඇත; තුනෙන් කොටසක්ද
මම දස දෙස විසුරුවාදමා, ඔවුන්
පසුපස්සෙන් කඩුවක් දිගුකරන්නෙමි.
13 මෙසේ මාගේ උදහස ඉෂ්ටවන්නේය,
ඔවුන් කෙරෙහි මාගේ කෝපය සංසිඳුවා
පළිගන්නෙමි. මා විසින් මාගේ කෝපය
ඔවුන් කෙරෙහි ඉෂ්ටකරන විට ස්වාමිවූ
මම මාගේ ජ්වලිතකමෙන් කථාකළ බව
14 ඔවුන් දැනගන්නවා ඇත. තුඹ ළඟින්
යන සියල්ලන්ගේ ඇස් හමුයෙහි තුඹ
අවට සිටින ජාතීන් අතරෙහි තුඹ
15 පාළුවක්ද නින්දවක්ද කරන්නෙමි. මා
විසින් උදහසින්ද කෝපයෙන්ද රෞද්‍ර
තරවටුවලින්ද තුඹ තුළ විනිශ්චයන්
ඉෂ්ටකරන කල්හිත්, විනාශකරන්නාවූ,
තුඹලා විනාශ කිරීමට මා එවන්නාවූ
සාගතය නමැති විපත්ති-ඊගස් මා
16 තුඹලා අතරට එවන කල්හිත්, තුඹලා
වටකර සිටින ජාතීන්ට එය නින්දවක්
සහ කවටකමක්ද ගුරුකමක් සහ
විස්මයට හේතුවක්ද වන්නේය. ස්වාමිවූ
මම කීවෙමි. මම තුඹලා කෙරෙහි
සාගතය වැඩිකොට තුඹලාගේ ආහාර
17 නැමති යෂ්ටිය බිඳින්නෙමි. තුඹේ දරුවන්
නැතිකිරීමට මම තුඹලාට විරුද්ධව
සාගතයද චණ්ඩ මෘගයන්ද එවන්නෙමි;
වසංගතය හා ලේ වැගිරීම තුඹලා අතරට
පැමිණෙන්නේය; මම තුඹ පිටට කඩුවක්
පමුණුවන්නෙමියි ස්වාමිවූ මම කීවෙමියි
කීසේක.

## රූප වන්දනාව පවත්වන ඉශ්‍රායෙල් කඳුවලට විරුද්ධව අනාගත කීම

6 ස්වාමීන්වහන්සේගේ වචනය මා
2 වෙතට පැමිණ කියනුයේ; මනුෂ්‍ය
පුත්‍රය, තුඹේ මුහුණ ඉශ්‍රායෙල් කඳු
දෙසට හරවාගෙන ඒවාට විරුද්ධව
මෙසේ අනාගතවාක්‍ය කියාපන්න–
3 එම්බා ඉශ්‍රායෙල් කඳු, ස්වාමිවූ දෙවියන්-
වහන්සේගේ වචනය අසාපල්ලා. කඳු-
වලටත් හෙල්වලටත් දියපාරවලටත්
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන-
සේක: මෙන්න, මම, මමම, තුඹලා පිටට
කඩුවක් පමුණුවා, තුඹලාගේ උස්තැන්
නැතිකරන්නෙමි. තුඹලාගේ පූජාසන 4
පාළුවන්නේය, තුඹලාගේ සූර්යරූප
කඩාදමනු ලබන්නේය. තුඹලාගේ
මැරුම්කෑ අය තුඹලාගේ දේවරූප
ඉදිරිපිට හෙළන්නෙමි. ඉශ්‍රායෙල් 5
පුත්‍රයන්ගේ මළකඳන් ඔවුන්ගේ දේව-
රූප ඉදිරියෙහි දමා, තුඹලාගේ ඇට
තුඹලාගේ පූජාසන වටකරින් විසුරුවන්-
නෙමි. තුඹලාගේ පූජාසන පාළුවී, 6
නාස්තිවී, තුඹලාගේ දේවරූප කඩාදමනු
ලැබ නැතිවී, තුඹලාගේ සූර්යරූප
කඩාදමනු ලැබ, තුඹලාගේ කර්මාන්ත
මැකීයන පිණිස, තුඹලාගේ සියලු
වාසස්ථානවල නුවරවල් නටබුන්-
වන්නේය, උස්තැන්ද පාළුවන්නේය.
තුඹලා අතරෙහි මැරුම්කෑවුන් වැටෙනවා 7
ඇත. මෙසේ මා ස්වාමීන්වහන්සේ බව
තුඹලා දැනගන්නවා ඇත. එසේවී තුමුත් 8
දේශවල තුඹලා විසුරුවනු ලබන කල,
තුඹලාගෙන් සමහරෙක් කඩුවෙන් ගැළවී
ජාතීන් අතරේ සිටින පිණිස කොටසක්
ඉතිරිකරන්නෙමි. තුඹලාගෙන් ඉතිරිවෙන 9
අය මා වෙතින් අහක්ව ගියාවූ ඔවුන්ගේ
වේශ්‍යා සිත්ද තමුන්ගේ දේවරූප පස්සේ
වේශ්‍යාකමින් යන ඔවුන්ගේ ඇස්ද මා
විසින් බිඳදැම්මාම, ඔවුන් වාලට
ගෙනයන ජාතීන් අතරේදී මා සිහිකොට,
තමුන්ගේ සියලු පිළිකුල් ක්‍රියාවලින්
තමුන් කළාවූ නපුරුකම් නිසා තමුන්-
ටම පිළිකුල්කරන්නෝය. මා ස්වාමීන්- 10
වහන්සේ බව ඔව්හු දැනගන්නෝය.
ඔවුන්ට මේ විපත්තිය පමුණුවන්නෙමියි
කියා මා විසින් නිෂ්ඵල ලෙස කීවා
නොවේයයි කීය.
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ 11
කියනසේක: තුඹේ අත් පා ගසමින්–
අහෝ! කඩුවෙන්ද සාගතයෙන්ද
වසංගතයෙන්ද වැටෙන්ට සිටින
ඉශ්‍රායෙල් වංශයේ සියලු නපුරු පිළිකුල්

12 දේවල හැටියයි කියාපන්න. ඈත සිටින
අය වසංගතයෙන් මැරෙනවා ඇත; ළඟ
සිටින අය කඩුවෙන් වැටෙන්නෝය;
ඉතුරුවී වටලෑමට අසුවෙන අය
සාගතයෙන් නසිනවා ඇත. මෙලෙස
මම ඔවුන් කෙරේ මාගේ කෝපය ඉෂ්ට-
13 කරන්නෙමි. ඔවුන් තමුන්ගේ සියලු
දේවරූපවලට මිහිරි සුවඳ ඔප්පුකළ
ස්ථාන වන උස්වූ සියලු හෙල්වලත්
සියලු කඳු මුදුන්වලත් සියලු අමුගස්
යටත් ඝන අතු ඇති සියලු අලෝන ගස්
යටත් ඔවුන්ගේ පූජාසන වටකර ඔවුන්-
ගේ දේවරූප අතරෙහි ඔවුන්ගේ මැරුම්-
කෑවුන් වැටී සිටින කල, මා **ස්වාමීන්-
වහන්සේ** බව තුඹලා දනගන්නවා ඇත.
14 මම ඔවුන්ට විරුද්ධව මාගේ අත දිගු-
කොට, කාන්තාරය පටන් දිබ්ලා දෙසට
පිහිටි ඔවුන්ගේ වාසස්ථාන මුළුල්ලෙහි
දේශය පාළුවක්ද නාස්තියක්ද කරන්-
නෙමි. මෙසේ මා **ස්වාමීන්වහන්සේ** බව
ඔවුන් දනගන්නවා ඇත.

## ඉශ්‍රායෙල්ගේ සම්පූර්ණ විනාශය ගැන විලාපය

7 තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
2 මා වෙතට පැමිණ කියනුයේ මනුෂ්‍ය
පුත්‍රය, ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
ඉශ්‍රායෙල් දේශය ගැන මෙසේ කියන-
සේක–තීන්දුවක්, එනම් දේශයේ සතර
3 කොනට තීන්දුවක් පැමිණ තිබේ. තුඹ
පිටට තීන්දුව දන් පැමිණ තිබේ, මාගේ
උදහස තුඹට විරුද්ධව එවා, තුඹේ
මාර්ග ලෙස තුඹ විනිශ්චයකොට, තුඹේ
සියලු පිළිකුල්කම් තුඹ පිටට පමුණු-
4 වන්නෙමි. මාගේ ඇස තුඹ කෙරෙහි
දයානොවන්නේය, මම කරුණා නො-
කරන්නෙමි. තුඹේ මාර්ග තුඹ පිටට
පමුණුවන්නෙමි, තුඹේ පිළිකුල් දේ තුඹ
මධ්‍යයෙහි වන්නේය. මෙසේ මා **ස්වාමීන්-
වහන්සේ** බව තුඹලා දනගන්නහුය.
5 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක: විපත්තියක්ය, එක්තරා
විපත්තියක්ය; බලව, ඒක පැමිණෙයි.
තීන්දුවක් පැමුණුණේය, තීන්දුව පැමුණු- 6
ණේය, ඒක තුඹට විරුද්ධව පිබිද තිබේ;
බලව, ඒක පැමිණෙන්නේය. එම්බා 7
දේශයේ වැසිය, තුඹේ දඬුවම් වාරය
පැමිණියේය. කාලය පැමිණ තිබේ, දවස
කිට්ටුය; එය වනාහි ප්‍රීතිඝෝෂා දවසක්
නොව කඳුවල කෑලඹීමේ ඝෝෂා
දවසක්ය. දන් ඉක්මනින් මාගේ කෝපය 8
තුඹ පිටට වගුරුවා, මාගේ උදහස තුඹ
කෙරෙහි ඉෂ්ටකරන්නෙමි. තුඹේ මාර්ග
ලෙස තුඹ විනිශ්චය කොට, තුඹේ සියලු
පිළිකුල්කම් තුඹ පිටට පමුණුවන්නෙමි.
මාගේ ඇස දයා නොවන්නේය, මම 9
කරුණා නොකරන්නෙමි, මම තුඹේ
මාර්ග ලෙස තුඹ පිටට [දඬුවම්]
පමුණුවන්නෙමි, තුඹේ පිළිකුල්කම්ද තුඹ
තුළට පැමිණෙනවා ඇත; පහරදෙන්නේ
**ස්වාමිවූ** මා බව මෙසේ තුඹලා දන-
ගන්නවා ඇත. මෙන්න, ඒ දවස! බලව, 10
එය පැමිණෙයි! තුඹේ දඬුවම් වාරය
පැමුණුණේය; ඉපල මල්ගත්තේය,
උඩඟුකමද දළුලෑවේය. බලාත්කාරය 11
දුෂ්ටකමේ දණ්ඩක් පිණිස නැගුටුණේය;
ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ සමූහයන්ගෙන්
හෝ කිසිවෙක්වත් ඔවුන්ගේ වස්තුවෙන්
කිසිවක්වත් ඉතිරි නොවන්නේය. ඒවා
අතරේ උත්තමකමක්ද නොවන්නේය.
කාලය පැමිණ තිබේ, දවස ළංවී 12
තිබේ. මිලේට ගන්නා ප්‍රීති නොවේවා,
විකුණන්නා නොවැලපේවා. මක්නිසාද
කෝපය එහි මුළු සමූහයා පිට තිබේ.
විකුණන්නාද ජීවත්ව සිටින්නන් අතරෙහි 13
ජීවත්ව සිටියත්, ඔහු වික්ක උරුමයට
නැවත නොපැමිණෙන්නේය. මක්නිසාද
මේ දර්ශනය එහි මුළු සමූහයාට
විරුද්ධව තිබේ, කිසිවෙක් හැරීඑන්නේ
නැත; කිසිවෙක්ද තමාගේ අයුතුකමින්
තමාගේ ජීවිතය බලවත්කර නො-
ගන්නේය. ඔවුන් හොරණෑව පිඹ සියල්ල 14
සූදනම් කර තිබේ; නුමුත් කිසිවෙක්
සටනට නොයයි. මක්නිසාද මාගේ
කෝපය එහි මුළු සමූහයා කෙරෙහි
ඇත්තේය. පිටත කඩුවත් ඇතුළත 15

විසංගතය හා සාගතයත් තිබේ. කෙතේ
සිටින අය කඩුවෙන් මැරෙනවා ඇත:
නුවර සිටින අය සාගතයෙන්ද
16 විසංගතයෙන්ද විනාශවන්නෝය. එහෙත්
ඔවුන් අතරෙන් ගැළවෙන අය ගැළවී
ගොස්, සියල්ලෝ එකිනෙකා තම තමාගේ
අයුතුකම නිසා මිටියාවත්වල පරෙවියන්
මෙන් කෙඳිරිගාමින් කඳුවල සිටින්නෝය.
17 සියලු අත් හෙළා වැටෙන්නේය, සියලු
දණහිස්ද වතුර මෙන් බෙලහීනවන්නේය.
18 ඔව්හු ගෝණි රෙදි ඇඳගන්නෝය, භයා-
නකකම ඔවුන් වසාගන්නේය; සියලු
මුහුණුවල ලජ්ජාවත් ඔවුන් සියල්ලන්ගේ
19 හිස් පිට මුඩුකමත් ඇතිවන්නේය. ඔවුන්
තමුන්ගේ රිදී වීථිවල වීසිකරනවා ඇත,
ඔවුන්ගේ රන්ද අපවිත්‍ර දෙයක් මෙන්
වන්නේය; ඔවුන්ගේ රන් රිදී කරණ-
කොටගෙන **ස්වාමීන්වහන්සේගේ** උදහස්
දවසේදී ඔවුන්ට ගැළවෙන්ට නො-
හැකිවන්නේය; එයින් ඔවුන්ගේ ආශාව
තෘප්තියට පැමිණෙන්නේවත් ඔවුන්ගේ
බඩ පිරෙන්නේවත් නැත. මක්නිසාද
ඔවුන්ගේ අයුතුකම නැමති පැකිලීමේ
20 ගල එකය. උන්වහන්සේගේ ආභරණවල
අලංකාරය වනාහි ඔව්හු අහංකාරකමට
පෙරළාගත්තෝය. තමුන්ගේ පිළිකුල් රූප
වන තමුන්ගේ අශික්ෂිත දේ එහි
සාදගත්තෝය. එබැවින් මම ඒක ඔවුන්ට
21 අපවිත්‍ර දෙයක් කොට තැබුවෙමි. මම
එය විදේශීන්ට කොල්ලයක්ද පොළොවේ
දුෂ්ටයන්ට කොල්ලකෑමක්ද පිණිස
22 දෙමි; ඔවුන් ඒක කෙලෙසනවා ඇත. මාගේ
මුහුණ ඔවුන් වෙතින් හරවාගනිමි, ඔවුන්
මාගේ රහස් ස්ථානය කෙලෙසනවා ඇත.
කොල්ලකාරයන්ද ඊට ඇතුල්වී කෙලෙසනවා
23 ඇත. දම්වැළ සාදපන්න. මක්නිසාද
දේශය මිනීමැරීමේ අපරාධයෙන් පිරී
තිබේ, නුවරත් බලාත්කාරයෙන් පිරී
24 තිබේ. එබැවින් මම ඉතා නපුරු
ජාතීන් ගෙන්වන්නෙමි, ඔව්හු මොවුන්-
ගේ ගෙවල් උරුමකරගන්නෝය. මම
බලවතුන්ගේ උඩඟුකම නවත්වන්නෙමි;
මොවුන්ගේ ශුද්ධස්ථානද කෙලෙසනු
ලබන්නේය. විනාශය පැමිණෙන්නේය; 25
ඔව්හු සමාදානය සොයන්නෝය. නුමුත්
ලැබෙන්නේ නැත. විපත්තියක් පාසා 26
විපත්තියක්ද ආරංචියක් පාසා
ආරංචියක්ද පැමිණෙන්නේය; ඔවුන්
අනාගතවක්තෘවරයාගෙන් දර්ශනයක්
සොයනවා ඇත; නුමුත් පූජකයා-
ගෙන් ව්‍යවස්ථාවද වැඩිමහල්ලන්ගෙන්
මන්ත්‍රණයද නැතිවන්නේය. රජ වැල- 27
පෙන්නේය, අධිපතියා පාළුකම පැළඳ-
ගන්නේය, දේශයේ සෙනඟගේ අත්
කැලඹෙන්නේය. මම ඔවුන්ගේ මාර්ග
ලෙස ඔවුන්ට කරන්නෙමි, ඔවුන්ගේ
විනිශ්චයවල හැටියට ඔවුන් විනිශ්චය-
කරන්නෙමි; මෙසේ මා **ස්වාමීන්-
වහන්සේ** බව ඔවුන් දැනගන්නවා ඇතැයි
කීය.

## යෙරුසලමේ පැවති රූප වන්දනාව

8 නවද හවෙනි අවුරුද්දේ හවෙනි
මාසයේ පස්වෙනිද මා මාගේ
ගෙදරද, යූදහි වැඩිමහල්ලන් මා
ඉදිරියෙහිද හිඳගනඋන් කල, ස්වාමිවූ
**දෙවියන්වහන්සේගේ** හස්තය එහිදී මා
පිටට පැමුණුණේය. මම බැලූ විට ගින්නේ 2
පෙනීමක් වැනි ස්වරූපයක් දුටිමි;
උන්වහන්සේගේ ඉඟටිය වැනිවූ පෙනීමේ
සිට පහළට ගිනිද උන්වහන්සේගේ
ඉඟටියේ සිට ඉහළට දීප්තිමත් පිත්තල-
වල දිලිහීම මෙන් බැබළෙන පෙනී-
මක්ද තිබුණේය. උන්වහන්සේ අතක 3
ආකාරයක් දිගුකොට මාගේ හිසේ
රොදකින් මා අල්වාගත්සේක; ආත්මයද
දෙවියන්වහන්සේගේ දර්ශනවලින්
පොළොවටත් අහසටත් අතරේ මා
උස්සාගන ගොස්, යෙරුසලමේ උතුරු
දෙසට තිබෙන්නාවූ, **ස්වාමීන්වහන්සේගේ**
ජ්වලිතය උපදවන ජ්වලිතකමේ රූපා-
සනය තිබෙන්නාවූ, ඇතුල් දොරටුවට
මා පැමිණෙවුවේය. එවිට මා විසින් 4
සමභූමියෙහි දුටු පෙනීම මෙන් ඉශ්‍රායෙල්
දෙවියන්වහන්සේගේ තේජස එහි

5 තිබෙනවා දුටිමි. උන්වහන්සේද: මනුෂ්‍ය
පුත්‍රය, නුඹේ ඇස් දන් උතුරු දෙසට
ඔසවාපන්නැයි මට කීසේක. මම උතුරු
දෙසට මාගේ ඇස් එසෙවූ කල පූජා-
සනයේ දොරටුවට උතුරෙන්, ඇතුල්වෙන
තැන, ඒ ජ්වලිතකම උපදවන රූපය
6 තිබෙනවා දුටිමි. උන්වහන්සේද: මනුෂ්‍ය
පුත්‍රය, ඔවුන් කරන දේ එනම් මා විසින්
මාගේ ශුද්ධස්ථානයෙන් දුරුව යන
හැටියට ඉශ්‍රායෙල් වංශය මෙහි කරන
මහත් පිළිකුල්කම් නුඹට පෙනෙන්නේද?
එහෙත් නුඹ තව මහත් පිළිකුල් දේ
නැවතත් දකින්නෙහියයි මට කීසේක.
7 උන්වහන්සේ මළුවේ දොරකඩට මා ගෙනා-
සේක; මම බැලූ විට භිත්තියේ සිදුරක්
8 තිබෙනවා දුටිමි. එකල උන්වහන්සේ:
මනුෂ්‍ය පුත්‍රය, භිත්තිය හාරාපන්නැයි
මට කීසේක. මම භිත්තිය හෑරූ කල
9 දොරකඩක් දුටිමි. උන්වහන්සේද: ඇතුළට
ගොස් ඔවුන් මෙහි කරන නපුරු
පිළිකුල්කම් බලාපන්නැයි මට කීසේක.
10 මම ඇතුල්වී බැලූ විට, බඩගා යන
සියලු ආකාර සතුන්ගෙත් පිළිකුල්
තිරිසනුන්ගෙත් රූපද ඉශ්‍රායෙල් වංශයේ
සියලු දේවරූපද භිත්තියේ වටකරින්ම
11 සිතියම්කර තිබෙනවා දුටිමි. ඉශ්‍රායෙල්
වංශයේ වැඩිමහල්ලන්ගෙන් සැත්තෑ-
දෙනෙක්ද ඔවුන් මැද ෂාපාන්ගේ පුත්‍රවූ
යාසනියාද එක එකා තම තමාගේ
අතේ තම තමාගේ දුම් භාජනය ඇතුව
ඒවා ඉදිරියෙහි සිටියෝය; දුම් වලාකුළේ
12 සුගන්ධය ඉහළට නැංගේය. එවිට
උන්වහන්සේ: මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල්
වංශයේ වැඩිමහල්ලන් අන්ධකාරයෙහි
එක එකා තම තමාගේ රූප ගබඩා-
වලදී කරන දේ දුටුවෙහිද? මක්නිසාද:
**ස්වාමීන්වහන්සේ** අප දකින්නේ නැත;
**ස්වාමීන්වහන්සේ** දේශය අත්හැරිය-
සේකැයි ඔව්හු කියතියි මට කීසේක.
13 ඔවුන් කරන තවත් මහත් පිළිකුල්කම්
නුඹ නැවත දකින්නෙහියයි උන්වහන්සේ
14 මට කීසේක. එකල උන්වහන්සේ උතුරට
තිබෙන **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
දොරටුවේ දොරකඩට මා ගෙනාසේක;
එවිට ස්ත්‍රීන් තම්මුස් ගැන අඬමින් එහි
ඉඳගෙන ඉන්නවා දුටිමි. උන්වහන්සේද: 15
මනුෂ්‍ය පුත්‍රය, නුඹ මේක දුටුවෙහිද?
තවත් මේවාට වඩා මහත් පිළිකුල්කම්
නැවත නුඹ දකින්නෙහියයි මට කී-
සේක. උන්වහන්සේ **ස්වාමීන්වහන්සේගේ** 16
ගෘහයේ ඇතුල් මළුවට මා ගෙනාසේක,
බලව, එහි මනුෂ්‍යයන් විසිපස් දෙනෙක්
පමණ **ස්වාමීන්වහන්සේගේ** මාළිගාවේ
දොරකඩ ද්වාර මණ්ඩපය සහ පූජාසනය
අතරේ **ස්වාමීන්වහන්සේගේ** මාළිගාවට
තමුන්ගේ පිටද නැගෙනහිරට තමුන්ගේ
මුහුණද හරවාගෙන, නැගෙනහිර දෙස
සූර්යයාට නමස්කාරකළෝය. එවිට 17
උන්වහන්සේ: මනුෂ්‍ය පුත්‍රය, ඒක
දුටුවෙහිද? යූද වංශය මෙහි කරන
පිළිකුල්කම්කිරීම ඔවුන්ට සුළු දෙයක්ද?
මක්නිසාද ඔව්හු දේශය බලාත්කාරකමෙන්
පුරවා තිබේ, ඔව්හු නැවත නැවත මා
කෝපකරති. බලව, ඔව්හු අත්ත තමුන්ගේ
නාසයට අල්ලති. එබැවින් මමත් 18
කෝපයෙන් ක්‍රියාකරන්නෙමි. මාගේ ඇස
දයා නොකරන්නේය, මම කරුණා
නොකරන්නෙමි. ඔවුන් මහත් හඬකින්
මාගේ කන්වලට මොරගැසුවත් මම
ඔවුන්ට ඇහුම්කන් නොදෙන්නෙමියි මට
කීසේක.

## රූප වන්දනාකාරයින් මරාදැමීම

9 ඉක්බිති උන්වහන්සේ: මේ නුවර
මුරකාරයන් එකිනෙකා තම තමාගේ
විනාශකිරීමේ ආයුධය අතේ ඇතුව
ළංවන්ට සලස්වාපන්න කියා මහත්
හඬින් මොරගසනවා මට ඇසුණේය.
එවිට උතුරු දෙස තිබෙන ඉහළ දොරටුවේ 2
මාර්ගයෙන් මනුෂ්‍යයන් හය දෙනෙක්
එකිනෙකා තම තමාගේ මරණායුධය
අතේ ඇතුව ආවෝය; ඔවුන් මැද එක්
මනුෂ්‍යයෙක් හණ වස්ත්‍ර හැඳගෙන,
තමාගේ පැත්තක එල්ලෙන තීන්ත
කුඩුවක් ඇතුව සිටියේය. ඔව්හු ඇතුල්වී
පිත්තල පූජාසනය ළඟ සිටියෝය.
එවිට ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේගේ 3

තේජස එය නැවතී තිබුණු ස්ථානය
වන කෙරුබ් කෙරෙන් නැගී ගෘහයේ
එළිපත්ත ළඟට ගොස්, හණ වස්ත්‍ර හැඳ-
ගෙන තමාගේ පැත්තක එල්ලෙන තීන්ත
කුඩුවක් ඇතුව සිටිය මනුෂ්‍යයාට
4 මොරගැසීය. ස්වාමීන්වහන්සේ ඔහුට
කථාකොට: නුවර මුළුල්ලෙහි, එනම්
යෙරුසලම මුළුල්ලෙහි ගොස්, ඒ තුළ
කෙරෙන සියලු පිළිකුල්කම් ගැන සුසුම්ලා
කෙඳිරිගාන මනුෂ්‍යයන්ගේ නළල්වල
5 ලකුණක් කරපන්නැයි කීසේක. මා අසා
සිටියදී උන්වහන්සේ අනික් තැනැත්තන්ට
කථාකොට: තුඹලා නුවර තුළට ඔහු
පස්සේ ගොස් පහරදීපල්ලා. තුඹලාගේ
ඇස් දයා නොකෙරේවා, තුඹලා කරුණා
6 නොකරල්ලා. මාගේ ශුද්ධස්ථානයෙන්
පටන්ගෙන මහල්ලන්ද යෞවනයන්ද
කන්‍යාවන්ද බාලයන්ද ස්ත්‍රීන්ද මරා
නාස්තිකර දමාපල්ලා. නුමුත් ලකුණ ඇති
කිසිවෙකුට ළං නොවෙල්ලායයි කීසේක.
එවිට ඔව්හු ගෘහය ඉදිරියෙහි සිටි වැඩි-
මහල් මනුෂ්‍යයන්ගෙන් පටන්ගත්තෝය.
7 තුඹලා ගෘහය අපවිත්‍රකරමින්, මැරුම්-
කෑවුන්ගෙන් මිදුල් පුරවා, පිටත පලයල්-
ලායයි උන්වහන්සේ ඔවුන්ට කීසේක.
ඔව්හු පිටත ගොස් නුවර ඇතුළෙහි
8 පහරදුන්නෝය. ඔවුන් පහරදෙද්දී
මම ඉතිරිවී මුහුණින් වැටී: අහෝ
ස්වාමිවූ දෙවියන්වහන්ස! ඔබගේ
කෝපය යෙරුසලම පිට වගුරුවන අතර
ඉශ්‍රායෙල්වරුන්ගෙන් ඉතිරිව සිටින
සියල්ලන්ම ඔබ නාස්තිකරනසේක්දැයි
9 කියා මොරගැසීමි. එවිට උන්වහන්සේ:
ඉශ්‍රායෙල් සහ යූද වංශයේ අයුතුකම
ඉතාම මහත්ය, දේශය ලෙයින් පිරී
තිබේ, නුවරද අයුක්තියෙන් පිරී තිබේ.
මක්නිසාද—ස්වාමීන්වහන්සේ දේශය
අත්හැරියසේක කියාද උන්වහන්සේ
නොදක්නාසේක කියාද ඔව්හු කියති.
10 එබැවින් මාගේ ඇස දයාකරන්නේවත්
මා විසින් කරුණාකරන්නේවත් නැතුව,
ඔවුන්ගේ මාර්ගය ඔවුන්ගේ හිස් පිටට
පමුණුවන්නෙමියි මට කීසේක. එවිට
හණ වස්ත්‍ර හැඳගෙන තමාගේ පැත්තෙහි
තීන්ත කුඩුව ඇතුව සිට මනුෂ්‍යයා හැරී
ඇවිත්: ඔබවහන්සේ අණකළ ලෙස
කෙළෙමියි කීවේය.

## යෙරුසලම ගින්නෙන් විනාශවීම

10
තවද මම බැලූ විට, කෙරුබ්-
වරුන්ගේ හිස්වලට උඩින් තිබුණු
ආකාශයෙහි නීල මාණික්‍ය වැන්නක්
ඔවුන්ට ඉහළින් තිබෙනවා දුටිමි. එය
සිංහාසනයක සමානත්වයේ පෙනීමක්
මෙන් ඔවුන්ට උඩින් පෙනුණේය. උන්- 2
වහන්සේ හණ වස්ත්‍ර හැඳගෙන සිටි
මනුෂ්‍යයාට කථාකොට: තුඹ කෙරුබ්ට
යටින් කරකැවෙන චක්‍ර අතරට ඇතුල්වී,
කෙරුබ්වරුන් අතරේ තිබෙන ගිනි
අඟුරුවලින් තුඹේ දෑත පුරවාගෙන, නුවර
පිට විසුරුවාපන්නැයි කීසේක. ඔහු මා
ඉදිරියෙහි ඇතුල්වුණේය. ඒ මනුෂ්‍යයා 3
ඇතුල්වෙන කොට කෙරුබ්වරු ගෘහයේ
දකුණු පැත්තෙහි සිටියෝය; ඇතුල් මළුවද
වලාකුළෙන් පිරුණේය. එවිට ස්වාමීන්- 4
වහන්සේගේ තේජස කෙරුබ් කෙරෙන්
නැගී ගෘහයේ එළිපත්ත මතුයෙහි
නැවතුණේය; ගෘහය වලාකුළෙන්
පිරුණේය, මළුවද ස්වාමීන්වහන්සේගේ
තේජසේ දීප්තියෙන් පිරුණේය.
කෙරුබ්වරුන්ගේ පියාපත්වල ශබ්දයද 5
සර්වපරාක්‍රම දෙවියන්වහන්සේ කථා-
කරන හඬ මෙන් පිටත මළුව දක්වා
ඇසුණේය. කරකැවෙන චක්‍ර අතරෙන් 6
එනම් කෙරුබ්වරුන්ට අතරෙන් ගිනි
අරගන්න කියා හණ වස්ත්‍ර හැඳගත
සිටි මනුෂ්‍යයාට උන්වහන්සේ අණකළ
විට ඔහු ඇතුල්වී චක්‍රයක් ළඟ
සිටගත්තේය. ඒ කෙරුබ් තෙමේ 7
කෙරුබ්වරුන්ට අතරේ තිබුණු ගින්නට
තමාගේ අත කෙරුබ්වරුන් අතරෙන්
දිගුකොට එයින් රැගෙන, හණ වස්ත්‍ර
හැඳගත සිටි තැනැත්තාගේ දෑතට
දුන්නේය. ඔහුද අරගෙන පිටතට ගියේය.
කෙරුබ්වරුන්ගේ පියාපත් යට මනුෂ්‍ය 8
අතක ස්වරූපයක් පෙනුණේය. මම බැලූ 9
විට මෙසේ දුටිමි: කෙරුබ්වරුන් ළඟ
රෝද සතරක් එනම් එක කෙරුබ්

කෙනෙක් ළඟ එක රෝදයක්ද තවත්
කෙරුබ් කෙනෙක් ළඟ තවත් රෝදයක්ද
වශයෙන් තිබුණේය. රෝදවල පෙනීමද
10 රන්කාන්තියක දිලිහීම වාගේය. ඒ
සතරටම තිබුණේ එකාකාර ස්වරූපයක්ය,
ඒවායේ පෙනීම වනාහි රෝදයක් තුළ
11 රෝදයක් තිබෙන්නාක්මෙන්ය. ඒවා යන
කල නොහැරී ඒවායේ සතර පැති දෙසට
ගියෝය; ඒවා යන කල නොහැරී හිස
තිබෙන දිශාවටම ඒ පස්සේ ගියෝය.
12 ඔවුන්ගේ මුළු ශරීරවලද ඔවුන්ගේ පිට-
වල්වලද අත්වලද පියාපත්වලද රෝද-
වලද වටකර පුරාම ඇස් තිබුණේය, ඒ
සතර දෙනාටත් ඔවුන්ගේ රෝදවලටත්
13 එසේ තිබුණේය. ඒ රෝදවලට කර-
කැවෙන චක්‍රයයි නම් තබනවා මට
14 ඇසුණේය. එකිනෙකාට මූහුණු සතරක්
විය. පළමුවෙනි මුහුණ කෙරුබ් මුහුණය,
දෙවෙනි මුහුණ මනුෂ්‍ය මුහුණය,
තුන්වෙනි එක සිංහ මුහුණය, සතරවෙනි
එක රාජාලි මුහුණය. කෙරුබ්වරුද
15 ඉහළට නැංගෝය. ඒ වනාහි කෙබාර්
16 ගඟ ළඟදී මා දුටු සත්ත්වයාය. තවද
කෙරුබ්වරුන් යන විට රෝදත් ඔවුන්
කැටුව ගියෝය. පොළොව මතුපිටින්
නගින්ට කෙරුබ්වරුන් තමුන්ගේ පියාපත්
එසවූ විට රෝදත් ඔවුන් වෙතින් අහක්
17 නූණෝය. ඔවුන් නැවතුණු කල ඒවාත්
නැවතුණාහ; ඔවුන් නගින කල ඒවාත්
ඔවුන් සමග නැංගෝය. මක්නිසාද
සත්ත්වයාගේ ආත්මය ඒවා තුළ විය.
18 එවිට **ස්වාමීන්වහන්සේගේ** තේජස
ගෘහයේ එළිපත්ත මතුපිටින් පිටතට
ගොස් කෙරුබ්වරුන්ට උඩින් සිටියේය.
19 කෙරුබ්වරු පිටතට යන විට තමුන්ගේ
පියාපත් ඔසවා මාගේ ඇස් හමුයෙහි
පොළොවෙන් නැංගෝය, රෝදත් ඔවුන්
එක්කම නැංගෝය. ඔව්හු **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ නැගෙනහිර
දෙරකඩ සිටියෝය; ඉශ්‍රායෙල්ගේ
දෙවියන්වහන්සේගේ තේජසද ඔවුන්ට
20 උඩින් තිබුණේය. ඒ වනාහි කෙබාර්
ගංගාව ළඟදී ඉශ්‍රායෙල්ගේ දෙවියන්-
වහන්සේට පහළින් සිටිනවා මා දුටු
සත්ත්වයාය; ඔවුන් කෙරුබ්වරුන් බව
දැනගතිමි. එක එකාට මුහුණු සතරක් 21
බැගින්ද එක එකාට පියාපත් සතරක්ද
ඔවුන්ගේ පියාපත් යට මනුෂ්‍ය අත්
වැනි ස්වරූපයක්ද තිබුණේය. ඔවුන්ගේ 22
මුහුණුවල ස්වරූපයේ හැටියට ඒවායේ
පෙනීමත් ඒවාත් මා කෙබාර් ගඟ ළඟදී
දුටු මුහුණුය; ඔව්හු එකිනෙකා කෙළින්ම
ඉස්සරහට ගියෝය.

## දුෂ්ට මූලිකයන් විනාශවන බවට තර්ජනය. පිටවහල්වී සිටි යුදෙව්වන්ට සැනසීම

11 තවද ආත්මය මා උස්සාගන
ගොස් නැගෙනහිර දෙසට තිබෙන
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ නැගෙනහිර
දොරටුවට මා පැමිණෙවුවේය. බලව,
මනුෂ්‍යයන් විසිපස් දෙනෙක් දෙරකඩ
සිටියෝය; ඔවුන් අතරේ සෙනඟගේ
අධිපතියන් වන අස්සූර්ගේ පුත්‍රවූ යාසනි-
යාද බෙනායාගේ පුත්‍රවූ පෙලතියාද
සිටිනවා දුටිමි. උන්වහන්සේද: මනුෂ්‍ය 2
පුත්‍රය, මේ නුවර දුෂ්ටකම් යෝජනා-
කරන්නාවූ, නපුරු මන්ත්‍රණ යොදන්නාවූ
මනුෂ්‍යයෝ මොව්හුය. මොව්හු කථා- 3
කොට—ගෙවල් ගොඩනගන්ට කාලය ළං
නොවීය. හැළිය නම් මේ නුවරය, මාංසය
අපියයි කියති. එබැවින් ඔවුන්ට විරුද්ධව 4
අනාගතවාක්‍ය කියාපන්න, මනුෂ්‍ය
පුත්‍රය, අනාගතවාක්‍ය කියාපන්නැයි
මට කීසේක. එවිට **ස්වාමීන්වහන්සේගේ** 5
ආත්මය මා කෙරෙහි පැමිණ කියනුයේ:
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේකැයි
කියාපන්න—අනේ, ඉශ්‍රායෙල් වංශය,
තුඹලා එසේ කීවහුය; තුඹලාගේ සිත්වල
හටගන්නා දේවල් දනිමි. තුඹලා මේ 6
නුවර තුළ බොහෝසෙයින්ම මිනීමරා
එහි වීථි මැරුම්කෑවුන්ගෙන් පුරවා තිබේ.
එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 7
මෙසේ කියනසේක: මාංසය නම් නුවර
තුළ තුඹලා විසින් දමුවාවූ, තුඹලා
අතින් මැරුම්කෑවාවූ අයය; හැළිය මේ
නුවරය. තුඹලා වනාහි මෙය තුළෙන්

8 පිටකරන්නෙමි. නුඹලා කඩුවට භයව
සිටිහුය; මමද නුඹලා පිටට කඩුව
පමුණුවන්නෙමියි ස්වාමිවූ **දෙවියන්-**
9 **වහන්සේ කියනසේක.** මම නුඹලා මෙය
තුළෙන් පිටකර, විදේශීන් අතට නුඹලා
පාවාදී, විනිශ්චයන් නුඹලා කෙරෙහි
10 ඉෂ්ටකරන්නෙමි. නුඹලා කඩුවෙන්
වැටෙනවා ඇත; ඉශ්‍රායෙල් සීමාවේදී
නුඹලා විනිශ්චයකරන්නෙමි; එසේ මා
**ස්වාමීන්වහන්සේ** බව නුඹලා දැන-
11 ගන්නහුය. මේ නුවර නුඹලාගේ හැළිය
නොවන්නේය, නුඹලා මෙය තුළ
මාංසයද නොවන්නහුය; ඉශ්‍රායෙල්
සීමාවේදී නුඹලා විනිශ්චයකරන්නෙමි;
12 එසේ මාගේ නියෝග ප්‍රකාර නොහැසිර,
මාගේ විනිශ්චයන් ඉෂ්ට නොකොට,
නුඹලා අවට සිටින ජාතීන්ගේ පනත්
ප්‍රකාරයට කළාවූ නුඹලා මා **ස්වාමීන්-**
**වහන්සේ** බව දැනගන්නවා ඇතැයි
13 කීසේක. මා විසින් එසේ අනාගතවාක්‍ය
කියද්දී බෙනායාගේ පුත්‍රවූ පෙලතියා
මළේය. එවිට මම මුහුණින් වැටී:
අනේ, **දෙවියන්වහන්ස!** ඉතිරිව සිටින
ඉශ්‍රායෙල්වරුන් ඔබ තීන්දුවටම නැති-
කරනසේක්දැයි මහත් හඬින් මොරගසා
කීවෙමි.
14 නවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය,
15 නුඹේ සහෝදරයන්ට එනම් නුඹේ
සහෝදරයන් වන නුඹේ නෑයන්ගේ
මනුෂ්‍යයින්ටද ඉශ්‍රායෙල් මුළු වංශයේ
සියල්ලන්ටද යෙරුසලම් වැසියෝ
කථාකොට—නුඹලා **ස්වාමීන්වහන්සේගෙන්**
ඈත්ව සිටපල්ලා; උරුමයක් කොට මේ
දේශය දී තිබෙන්නේ අපටයයි කීවෝය.
16 එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේකැයි කියාපන්න: මා
විසින් ජාතීන් අතරට ඔවුන් එළවා, දුර
දේශවල ඔවුන් විසිරෙවූ නුමුත්, ඔවුන්
පැමිණ සිටින දේශවලදී මම ස්වල්ප
කලකට ඔවුන්ට ශුද්ධස්ථානයක්
17 වන්නෙමියි කීසේක. එබැවින් ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේකැයි
කියාපන්න: මම ජනයන් අතුරෙන්
නුඹලා එකතුකර, නුඹලා විසිර සිටින
දේශවලින් නුඹලා රැස්කොට, ඉශ්‍රායෙල්
රට නුඹලාට දෙන්නෙමි. ඔවුන් එහි 18
පැමිණ, එහි සියලු අශික්ෂිත දේද එහි
සියලු පිළිකුල්කම්ද එතනින් පහකරනවා
ඇත. මම ඔවුන්ට එක සිතක් දෙන්නෙමි, 19
අලුත් ආත්මයක්ද නුඹලා තුළ
තබන්නෙමි. ඔවුන් මාගේ පනත් ප්‍රකාර
හැසිර, මාගේ නියෝග රක්ෂාකොට
පවත්වන පිණිස, ඔවුන්ගේ මාංසයෙන් 20
ගල් සිත පහකොට මාංසමයවූ සිතක්
ඔවුන්ට දෙන්නෙමි. මෙසේ ඔව්හු මාගේ
සෙනඟ වන්නෝය, මමද ඔවුන්ගේ
දෙවියන්වහන්සේ වන්නෙමි. නුමුත් 21
තමුන්ගේ අශික්ෂිතකම්ද තමුන්ගේ
පිළිකුල්කම්ද කෙරෙහි තිබෙන ආශාව
ලෙස සිත ඇදී යන්නාවූ අයගේ හිස් පිටට
ඔවුන්ගේ මාර්ගය පමුණුවන්නෙමියි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ කියනසේකැයි**
කීය. එකල කෙරුබ්වරු තමුන්ගේ 22
පියාපත් එසෙවුවෝය, රෝදත් ඔවුන්
එක්වම තිබුණේය; ඉශ්‍රායෙල්ගේ දෙවියන්-
වහන්සේගේ තේජස ඔවුන්ට උඩින්
තිබුණේය. **ස්වාමීන්වහන්සේගේ** තේජස 23
නුවර තුළෙන් නැගී ගොස් නුවරට
නැගෙනහිරින් තිබෙන කන්ද උඩ සිටියේය.
එවිට ආත්මය මා ඔසවා කල්දියාවෙහි 24
වහල්ව සිටියවුන් ළඟට දෙවියන්-
වහන්සේගේ ආත්මය කරණකොටගෙන
දර්ශනයෙන් මා පැමිණෙවුවේය. මෙසේ
මා දුටු දර්ශනයද මා වෙතින් නැගී
ගියේය. මමද **ස්වාමීන්වහන්සේ** මට 25
පෙන්වූ සියලු දේ වාල්කමේ සිටියවුන්ට
කීවෙමි.

## පලායාම හා සාගතය ගැන උපමා ලකුණු

12 **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය 2
පුත්‍රය, නුඹ වාසයකරන්නේ කැරළිකාර
වංශයක් අතරෙහිය, දකිමට ඔවුන්ට
ඇස් තිබෙන නුමුත් ඔවුන්ට පෙනෙන්නේ
නැත. ඇසීමට ඔවුන්ට කන් තිබෙන

තුමුත් ඔවුන්ට ඇසෙන්නේ නැත;
මක්නිසාද ඔව්හු කැරළිකාර වංශයක්ය.
3 ඒ නිසා, මනුෂ්‍ය පුත්‍රය, නුඹ මාර්ගෝප-
කරණ සූදානම්කරගෙන, දවාලෙහි ඔවුන්
බලාසිටියදී පිටත්වෙයන්න; ඔවුන්
බලාසිටියදී නුඹේ ඉඩමේ සිට වෙන
ඉඩමකට පිටත්ව පලයන්න. ඔවුන්
කැරළිකාර වංශයක් තුමුත් සමහරවිට
4 ඔවුන් ඒක සිතට ගන්නවා ඇත. නුඹේ
බඩු මාර්ගෝපකරණ මෙන් දවාලෙහි
ඔවුන් බලාසිටියදී පිටතට ගෙන, මිනිසුන්
වහල්කමට පිටත්ව යන්නාක්මෙන් සවස
5 ඔවුන් බලාසිටියදී පිටත්වෙයන්න. නුඹ
ඔවුන් බලාසිටියදී භිත්තිය හාරා, එයින්
6 බඩු පිටතට ගෙනියන්න. නුඹ ඔවුන්
බලාසිටියදී ඒවා කරට ගෙන, අඳුරුවූ
කල්හි පිටතට ගෙනියන්න; බිම නො-
පෙනෙන පිණිස නුඹේ මුහුණ වසා-
ගනින්න. මක්නිසාද මම ඉශ්‍රායෙල්
වංශයට ලකුණක් පිණිස නුඹ තැබීමියි
7 කීයේය. මමද මට අණකළ ලෙසම
කෙළෙමි. මාගේ බඩු මාර්ගෝපකරණ මෙන්
දවාලේ පිටතට ගෙන, සවස මාගේ
අතින් භිත්තිය හාරා, අඳුරුවූ කල්හි
ඔවුන් බලාසිටියදී ඒවා කරට ගෙන
8 පිටතට ගෙනාවෙමි. උදයේ **ස්වාමීන්-
වහන්සේගේ** වචනය මා වෙතට පැමිණ
9 කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, කැරළිකාර
වංශය වන ඉශ්‍රායෙල් වංශය—නුඹ
මක්කරනවාදැයි නුඹට කීවා නොවේද?
10 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ කියන-
සේකැයි ඔවුන්ට කියාපන්න: මේ දිව්‍ය
ප්‍රකාශනය යෙරුසලමේ අධිපතියා සහ
එහි තුළ සිටින මුළු ඉශ්‍රායෙල් වංශය
11 ගැනය. මෙසේ කියාපන්න—මම නුඹලාගේ
සලකුණය. මා කළ ලෙස ඔවුන්ට
සිද්ධවන්නේය. ඔව්හු පිටත්වී අන් රටකට
12 වාල්කමට යන්නෝය. ඔවුන් අතරේ
සිටින අධිපතියාද බඩු කරට ගෙන,
අඳුරුවූ කල්හි පිටතට එනවා ඇත.
පිටතට ගෙනෙන පිණිස ඔවුන් පවුර
හාරනවා ඇත. ඔහු තමාගේ ඇස්වලින්
බිම නොදකින පිණිස තමාගේ මුහුණ
13 වසාගන්නවා ඇත. මාගේ දැලද ඔහු
පිට හෙළන්නෙමි, ඔහු මාගේ මලපතට
අසුවන්නේය. මම කල්දිවරුන්ගේ දේශය-
වූ බබිලෝනියට ඔහු ගෙනෙන්නෙමි;
ඔහු එහිදීම නසින තුමුත් ඒක දකින්නේ
නැත. ඔහුට උපකාරකරන පිණිස ඔහු 14
වටකර සිටින සියල්ලන්ද ඔහුගේ සියලුම
සමූදවල්ද මම සියලු හුළං දෙසට
විසුරුවා ඔවුන් පසුපස්සේ කඩුව දිගු-
කරන්නෙමි. මා විසින් ඔවුන් ජාතීන් 15
අතරට පන්වා, දේශවල විසිරෙවූ කල්හි,
මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැන-
ගන්නවා ඇත. එහෙත් මම ඔවුන්ගෙන් 16
ස්වල්ප දෙනෙකු කඩුවෙන්ද සාගතයෙන්ද
වසංගතයෙන්ද ගළවා ඉතිරිකරන්නෙමි;
මෙසේ කරන්නේ ඔවුන් පැමිණෙන
දේශවල ජාතීන් අතරේදී ඔවුන් තමුන්ගේ
සියලු පිළිකුල්කම් ප්‍රකාශකරන පිණිසය;
මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැන-
ගන්නවා ඇතැයි කීවේය.
තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 17
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, 18
නුඹේ කෑම වෙව්ලුම ඇතුව කා,
චංචලකමද පිරිමැසීමද ඇතුව වතුර බී,
දේශයේ සෙනඟට මෙසේ කියාපන්න— 19
ඉශ්‍රායෙල් රටෙහි සිටින යෙරුසලමේ
වැසියන් ගැන ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: ඔව්හු තමුන්ගේ
කෑම පිරිමසාගෙන කා, තමුන්ගේ වතුර
කනස්සලුකමින් බොන්නෝය, මෙසේ
වන්නේ ඔවුන්ගේ දේශය එහි වැසි
සියල්ලන්ගේ බලාත්කාරකම නිසා එහි
තිබෙන සියල්ලෙන් පාළුවෙන පිණිසය.
වැසියන් ඇති නුවරවල්ද නාස්තිවී, 20
දේශය පාළුවක් වන්නේය; මෙසේ මා
**ස්වාමීන්වහන්සේ** බව නුඹලා දැන-
ගන්නහුයයි කීවේය.

## අනාගතවාක්‍යය හෙළාදැකීම ගැන තර්ජනකිරීම

තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 21
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, 22
දවස් පසුවන්නේය, දර්ශන සියල්ල
නැතිවන්නේය කියා ඉශ්‍රායෙල් රටෙහි
නුඹලා අතරේ ව්‍යවහාරවෙන උපමාකීම
කිමෙක්ද? එබැවින් ස්වාමිවූ **දෙවියන්-** 23

වහන්සේ මෙසේ කියනසේකැයි ඔවුන්ට
කියාපන්න: මම මේ උපමාකීම නවත්-
වන්නෙමි, එය උපමාකීම කොට ඉශ්‍රා-
යෙල්හි තවත් ව්‍යවහාර නොවන්නේය;
එසේය, ඒ දවස්ද සියලු දර්ශනවල
කාරණාද ළංවී තිබේයයි ඔවුන්ට කියා-
24 පන්න. මක්නිසාද තවත් කිසි නිෂ්ඵල
දර්ශනයක්වත් ඉච්චාකාර දිවැස්කීමක්වත්
ඉශ්‍රායෙල් වංශය අතරෙහි නොවන්නේය.
25 මක්නිසාද මම **ස්වාමීන්වහන්සේය**; මම
කියන දේ කියන්නෙමි, එය තවත් පමා
නොවී ඉෂ්ටවන්නේය. එසේය, එම්බා
කැරළිකාර වංශය, මම තුඹලාගේ
දවස්වලදීම වචනයක් කියා ඒක ඉෂ්ට-
කරන්නෙමියි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
කියනසේකැයි කීය.
26 නැවත **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
27 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය,
ඉශ්‍රායෙල් වංශය කථාකොට—ඔහු දකින
දර්ශනය ඉෂ්ටවෙන්ට බොහෝ දවස්
යන්නේය, ඔහු අනාගතවාක්‍ය කියන්නේ
28 දුර කාලවල් ගැනයයි කියති. එබැවින්
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ කියන-
සේකැයි ඔවුන්ට කියාපන්න: මාගේ කිසි
වචනයක් තවත් ප්‍රමාද නොවී, මා විසින්
කියන වචනයක් සිද්ධවන්නේමය කියා
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේකැයි
කීවේය.

## බොරු අනාගතවාක්‍ය කියන්නන්ට විරුද්ධව වාක්‍ය

13 නවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
මා වෙතට පැමිණ කියනුයේ:
2 මනුෂ්‍ය පුත්‍රය, අනාගතවාක්‍ය කියන්නාවූ
ඉශ්‍රායෙල්හි අනාගතවක්තෘවරුන්ට
විරුද්ධව තුඹ අනාගතවාක්‍ය කියමින්,
තමුන්ගේම සිතින් උපදවා අනාගතවාක්‍ය
කියන්නන්ට මෙසේ කියාපන්න: **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනය අසාපල්ලා;
3 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක—කිසිවක් නොදැක, තමුන්-
ගේම ආත්මය පස්සේ යන්නාවූ මෝඩවූ
4 අනාගතවක්තෘවරුන්ට දුක්වේ! අහෝ
ඉශ්‍රායෙල්, තුඹේ අනාගතවක්තෘවරු
පාළු තැන්වල සිටින සිවලුන් හා සමාන
වූය. තුඹලා කපලුවලට නැගුණේවත් 5
**ස්වාමීන්වහන්සේගේ** දවසේ සටනේදී
සවිව සිටීමට තුඹලා ඉශ්‍රායෙල් වංශය
වටකර තාප්පයක් ගොඩනැගුවේවත්
නැත. **ස්වාමීන්වහන්සේ** ඔවුන් නොඑවූ 6
නුමුත් ඔව්හු: **ස්වාමීන්වහන්සේ** කියන-
සේකැයි කියා නිෂ්ඵල කාරණා දැක,
බොරු පේන කියා, වචනය ස්ථිර කරන්ට
බලාපොරොත්තුවුණෝය. තුඹලා නිෂ්ඵල 7
දර්ශනයක් දකින්ටත් බොරු දිවැස්
කියන්ටත් යෙදුණා නොවේද? මා
කථානොකළ නුමුත්: **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි තුඹලා කියන්නහුය.
එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 8
මෙසේ කියනසේක: තුඹලා නිෂ්ඵල
දේ කියන්ටත් බොරු දර්ශන දකින්ටත්
යෙදුණු නිසා, මෙන්න, මම තුඹලාට
විරුද්ධව සිටිමියි ස්වාමිවූ **දෙවියන්-**
**වහන්සේ** කියනසේක. මාගේ අතද නිෂ්ඵල 9
දේ දකින්නාවූ බොරු දිවැස් කියන්නාවූ
අනාගතවක්තෘවරුන්ට විරුද්ධවන්නේය.
ඔව්හු මාගේ සෙනඟගේ සභාවේ
නොසිටින්නෝය. ඉශ්‍රායෙල් වංශයේ
ලේකම් පොතේ ලියනු නොලබන්නෝය,
ඉශ්‍රායෙල් රටට ඇතුල් නොවන්නෝය;
මෙසේ මා ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
බව තුඹලා දැනගන්නහුය. මක්නිසාද 10
සමාදානය නැති කල්හි සමාදානයයයි
කියා ඔව්හු මාගේ සෙනඟ මුළා-
කෙරෙවුවෝය; සෙනඟ තාප්පයක්
ගොඩනගන විට ඔව්හු එහි පදම්
නොකළ බදම ගාති. ඒක වැටෙන්නේ- 11
යයි පදම් නොකළ බදම ගාන අයට
කියාපන්න. ඉතා සැර වැස්සක් එන්නේය;
එම්බා මහත් ගල් වර්ෂාවෙනි, තුඹලා
වැටෙනවා ඇත; හුළං-කුණාටුවක් එය
ඉරාදමන්නේය. බලව, තාප්පය වැටුණු 12
කල: තුඹලා ගෑවාවූ ගෑම කොයිද්දැයි
මනුෂ්‍යයෝ තුඹලාට නොකියද්ද?
එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 13
මෙසේ කියනසේක; මාගේ කෝපයෙන්

හුළං-කුණාටුවක් කරණකොටගෙන ඒක
ඉරාදමන්නෙමි; ඒක විනාශකරන්ට
මාගේ උදහස නිසා සැර වැස්සක්ද
මාගේ කෝපය නිසා ගල් වර්ෂාද
14 වන්නේය. මෙසේ තුඹලා පදම් නොකළ
බදම ගෑවාවූ තාප්පය මම කඩාදමා,
එහි අත්තිවාරම පෙනෙන හැටියට එය
බිම හෙලන්නෙමි. ඒක වැටෙනවා ඇත,
තුඹලාද ඊට යටවී නාස්තිවෙනවා ඇත;
මෙසේ මා **ස්වාමීන්වහන්සේ** බව තුඹලා
15 දැනගන්නහුය. මෙසේ මාගේ කෝපය
තාප්පය පිටත් එහි පදම් නොකළ බදම
ගෑ අය පිටත් වගුරුවා: තාප්පය නැත,
එහි බදම ගෑවාවූ අයත් නැතැයි තුඹලාට
16 කියන්නෙමි. ඔව්හු නම් යෙරුසලම ගැන
අනාගතවාක්‍ය කියමින්, සමාදනය නැති
කල්හි ඈ උදෙසා සමාදන දර්ශන
දකින ඉශ්‍රායෙල් අනාගතවක්තෘවරුයයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේක.
17 තවද මනුෂ්‍ය පුත්‍රය, තමුන්ගේම සිතින්
උපදවා අනාගතවාක්‍ය කියන්නාවූ තුඹේ
සෙනඟගේ දූවරුන්ට විරුද්ධව තුඹේ
මුහුණ තබා, ඔවුන්ට විරුද්ධව අනා-
18 ගතවාක්‍ය කියමින්, මෙසේ කියාපන්න:
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක—ප්‍රාණ දඩයම් කිරීමට අත්වල
සියලු සන්ධිවලට වැසුම් මහන්නාවූ,
සියලු ප්‍රමාණවල හිස් වැසුම් සාදන්නාවූ
ස්ත්‍රීන්ට දුක්වේ! තුඹලා මාගේ සෙනඟගේ
ප්‍රාණ නාස්තිකරමින්, තුඹලාගේම ප්‍රාණ
ඉතුරුකරගන්ට තුඹලාට පුළුවන්වේද?
19 බොරු බස් අසන මාගේ සෙනඟට තුඹලා
විසින් බොරු කීමෙන්, මරණය විඳින්ට
සුදුසු නැති ප්‍රාණීන් මරමින්ද ජීවත්වීමට
සුදුසු නැති ප්‍රාණීන් ජීවත්කරමින්ද තුඹලා
යව අහුරුවලටත් රොටි කෑලිවලටත්
මාගේ සෙනඟ අතරේ මා කෙලසූහුය.
20 එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: මෙන්න, ප්‍රාණ
ඉගිලීයන හැටියට තුඹලා එහි ඒවා
දඩයම්කිරීමට පාවිච්චිකරන තුඹලාගේ
වැසුම්වලට විරුද්ධව සිටිමි, මම ඒවා
තුඹලාගේ හස්තවලින් ඉරාදමා, ප්‍රාණ
ඉගිලී යන හැටියට තුඹලා දඩයම්කරන
ඒ ප්‍රාණ නිදහස්කරන්නෙමි. තුඹලාගේ 21
වැසුම්ද මම ඉරාදමා, මාගේ සෙනඟ
තුඹලාගේ අතින් මුදන්නෙමි, දඩයම්
කිරීමට ඔවුන් නවත් තුඹලා අතට
අසුවෙන්නේ නැත; මෙසේ මා **ස්වාමීන්-
වහන්සේ** බව තුඹලා දැනගන්නහුය. මා 22
විසින් ධර්මිෂ්ඨයාගේ සිතට කනගාටු
නොකළ නුමුත් තුඹලා බොරුවෙන් එය
ශෝකකළ නිසාද දුෂ්ටයා ජීවත්වෙන
පිණිස ඔහු තමාගේ නපුරු මාර්ගයෙන්
නොහැරෙන හැටියට තුඹලා ඔහුගේ
අත් බලවත්කළ නිසාද, තුඹලා නවත් 23
නිෂ්ඵල දර්ශන නොදකින්නහුය, දිවස්-
කීම් නොකියන්නහුය. මමද මාගේ
සෙනඟ තුඹලාගේ අතින් මුදන්නෙමි;
මෙසේ මා **ස්වාමීන්වහන්සේ** බව තුඹලා
දැනගන්නහුයයි කීය.

## ස්වාමීන්වහන්සේගෙන් විහාග කරන වංක අයවලුත් ගැන

14

එකල්හි ඉශ්‍රායෙල් වැඩි-
මහල්ලන්ගෙන් සමහරු මා
ළඟට ඇවිත් මා ඉදිරියෙහි හිඳගත්තෝය.
එවිට **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 2
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය 3
මේ මනුෂ්‍යයෝ තමුන්ගේ දේවරූප
තමුන්ගේ සිත්වල පිහිටුවාගෙන, තමුන්-
ගේ අයුතුකම නැමති පැකිලීමේ ගල
තමුන්ගේ මුහුණු ඉදිරිපිට තබාගෙන
සිටිති. මාගෙන් විහාගකරන්ට ඔවුන්ට
කොහෙත්ම ඉඩදිය යුතුද? එබැවින් 4
ඔවුන් සමග කථාකර ඔවුන්ට මෙසේ
කියාපන්න—ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: ඉශ්‍රායෙල් වංශයෙන්
තමාගේ දේවරූප තමාගේ සිතේ
පිහිටුවාගෙන, තමාගේ අයුතුකම නැමති
පැකිලීමේ ගල තමාගේ මුහුණ ඉදිරිපිට
තබාගන්න එකිනෙකා අනාගතවක්තෘ
ළඟට ආ විට, **ස්වාමීන්වහන්සේ** වන
මම ඒ හැටියට එනම් ඔහුගේ දේවරූප
රාශියේ ප්‍රකාරයට ඔහුට උත්තර-

5 දෙන්නෙමි. මෙසේ කරන්නේ මුළු
ඉශ්‍රායෙල් වංශය තමුන්ගේ දේවරූප
කරණකොටගෙන මාගෙන් වෙන්ව ගිය
බැවින් ඔවුන්ගේ සිත් තුළෙහිම ඔවුන්
6 අසුකරන පිණිසය. එබැවින් ඉශ්‍රායෙල්
වංශයට මෙසේ කියාපන්න: ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක–
නුඹලා හැරී, නුඹලාගේ දේවරූප කෙරෙන්
සිත හරවා, නුඹලාගේ සියලු පිළිකුල්කම්-
වලින් නුඹලාගේ මුහුණු හරවාගනිල්ලා.
7 මක්නිසාද ඉශ්‍රායෙල් වංශයෙන් හෝ
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි පොරොත්තුව
සිටි අන්‍යයන්ගෙන් හෝ මාගෙන් වෙන්වී
තමාගේ දේවරූප තමාගේ සිතේ
තබාගෙන, තමාගේ අයුතුකම නැමති
පැකිළීමේ ගල තමාගේ මුහුණ ඉදිරිපිට
තබාගන්න එකිනෙකා, මා ගැන
අනාගතවක්තෘගෙන් විභාග කරන්ට ඔහු
ළඟට ආකල්හි **ස්වාමීන්වහන්සේ** වන
මම මා ගැන ඔහුට උත්තරදෙන්නෙමි.
8 මම ඒ මනුෂ්‍යයාට විරුද්ධව මාගේ
මුහුණ තබා, ලකුණක්ද උපමාවක්ද
පිණිස ඔහු නාස්තිකර, මාගේ සෙනඟ
අතරෙන් ඔහු සිඳදමන්නෙමි; මෙසේ
මා **ස්වාමීන්වහන්සේ** බව නුඹලා
9 දැනගන්නහුය. අනාගතවක්තෘ රැවටී
වචනයක් කියනවා නම්, **ස්වාමීන්-
වහන්සේ** වන මම ඒ අනාගතවක්තෘ
රැවටෙන්ට සැලැස්වීමි, මම ඔහුට
විරුද්ධව මාගේ අත දිගුකොට, මාගේ
සෙනඟවූ ඉශ්‍රායෙල් අතරෙන් ඔහු
10 නාස්තිකරන්නෙමි. ඔවුන් තමුන්ගේ
අයුතුකම දරනවා ඇත. අනාගත-
වක්තෘගේ අපරාධය ඔහුගෙන් විභාග
කරන්නාගේ අපරාධය මෙන් වන්නේය.
11 මෙසේ වන්නේ ඉශ්‍රායෙල් වංශය මා
වෙතින් තවත් මුළාව නොගොස්, තමුන්-
ගේ සියලු අපරාධවලින් තවත් කිලුටු
නොවී, මාගේ සෙනඟ වන පිණිසත්
මා ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන
පිණිසත්යයි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
කියනසේකැයි කීවේය.

## පාපිෂ්ඨයන් අතරේ ධර්මිෂ්ඨයන් සිටියත් ප්‍රයෝජනයක් නැති බව

තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 12
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, 13
යම් දේශයක් ද්‍රෝහිකම්කරමින් මට
විරුද්ධව පව්කරන නිසා මා ඊට
විරුද්ධව මාගේ අත දිගුකොට එහි
කෑම නමැති යෂ්ටිය නැතිකර, ඊට
විරුද්ධව සාගතය යවා, එතනින්
මනුෂ්‍යයන් සහ මෘගයන්ද සිඳදමන විට,
නෝවාද දනියෙල්ද යෝබ්ද යන මේ 14
මනුෂ්‍යයන් තුන්දෙනා එහි සිටියත්, ඔවුන්
තමුන්ගේ ධර්මිෂ්ඨකමින් තමුන්ගේම
ප්‍රාණ පමණක් ගළවාගන්නවා ඇතැයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේක.
චණ්ඩ මෘගයන් නිසා කිසිවෙකු 15
දේශයෙහි ගමන් නොකරන හැටියට
ඒක පාළුවක් වෙන ලෙස නාස්තිකරන
පිණිස මා විසින් මෘගයන් එහි යවන
විට, ඒ මනුෂ්‍යයන් තුන්දෙනා එහි 16
සිටියත්, මා ජීවමාන බව සැබෑවා සේම,
ඔවුන් පුත්‍රයන්වත් දූවරුන්වත් ගළවා-
ගන්නේ නැතුව ඔවුන් පමණක්ම ගැළ-
වෙනවා ඇත, දේශයද පාළුවක් වෙනවා
ඇතැයි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
කියනසේකැයි කීයේය. නොහොත් මා 17
විසින් කඩුවක් ඒ දේශයට විරුද්ධව
පමුණුවා: කඩුව, දේශය මුළුල්ලෙහි යවයි
කියා එතනින් මනුෂ්‍යයන් සහ මෘගයන්ද
සිඳදමන විට, ඒ මනුෂ්‍යයන් තුන්දෙනා 18
එහි සිටියත් මා ජීවමාන බව සැබෑවා
සේම, ඔවුන් පුත්‍රයන්ද දූවරුන්ද ගළවා-
ගන්නේ නැතුව ඔවුන් පමණක්
ගැළවෙනවා ඇතැයි ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** කියනසේක. නොහොත් මා 19
ඒ දේශයට වසංගතය යවා එතනින්
මනුෂ්‍යයන් සහ මෘගයන්ද සිඳදැමීමට
ලේ වැගිරවීමෙන් මාගේ කෝපය ඒක
කෙරෙහි වගුරුවන විට, නෝවාද 20
දනියෙල්ද යෝබ්ද එහි සිටියත්, මා
ජීවමාන බව සැබෑවා සේම, ඔවුන්
පුත්‍රයෙක්වත් දුවෙක්වත් ගළවාගන්නේ
නැත; ඔවුන් තමුන්ගේ ධර්මිෂ්ඨකමින්

ස්වකීය ප්‍රාණ පමණක් ගළවාගන්නවා
ඇතැයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
21 කියනසේක. තවද ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේක: යෙරුසල-
මෙන් මනුෂ්‍යයන් සහ මෘගයන් සිඳ-
දමන්ට මා විසින් ඊට මාගේ තද දඬුවම්
සතරවූ කඩුවද සාගතයද චණ්ඩ
මෘගයන්ද වසංගතයද යැවූ කල්හි කො-
පමණ වැඩියෙන් එසේ නොවන්නේද?
22 එහෙත් එහි පුත්‍රයන්ද දූවරුන්ද ස්වල්ප
දෙනෙක් ඉතිරිවී පිටතට පමුණුවනු
ලබන්නෝය. ඔව්හු තුඹලා ළඟට පිටත්ව
එන්නෝය, තුඹලා ඔවුන්ගේ මාර්ගයද
ඔවුන්ගේ ක්‍රියාද දැක, මා විසින්
යෙරුසලම පිටට පැමිණෙවූ විපත්තිය,
එනම් මා විසින් ඒ පිටට පැමිණෙවූ
23 සියල්ල ගැන සැනසෙනවා ඇත. තුඹලා
ඔවුන්ගේ මාර්ගයද ක්‍රියාද දුටු විට
ඔවුන් ගැන තුඹලා සැනසෙනවා ඇත.
මා එහි කළ සියල්ල නිෂ්කාරණයේ
නොකළ බව තුඹලා දැනගන්නවා ඇතැයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.

## මිදිවැලේ උපමාව

15 ස්වාමීන්වහන්සේගේ වචනය මා
2 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, වෙන යම් ලී ජාතියකට නොහොත්
වනයේ ගස්වලට වඩා මුද්‍රික අත්තේ
3 ඇති අගය මොකද? යම් වැඩක් කිරීමට
එයින් ලී ගන්නෝද? නොහොත් යම්
භාජනයක් එල්ලා තබන්ට එයින් ඇණ-
4 යක් සාදගන්නෝද? බලව, ඒක දර
පිණිස ගින්නට දමනු ලැබුවේය. එහි
කොන් දෙක ගින්නෙන් දලාගොස් මැදත්
පත්තුවී තිබේ; ඒක යම් වැඩකට සුදුසුද?
5 ඒක සම්පූර්ණව තිබියදීවත් කිසි වැඩකට
සුදුසු නොවීය. ඒක ගින්නට දලාගොස්
පත්තුවී තිබියදී සුදුසුවන්නේ කො-
හොමද? තවත් යම් වැඩකට ගනු
6 ලැබේද? එබැවින් ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේක: වනයේ ලී
අතරේ මුද්‍රික ලීත් මා විසින් ගින්නට
දර පිණිස දී තිබෙන්නාක්මෙන්
7 යෙරුසලමේ වැසියන් දෙන්නෙමි. මාගේ
මුහුණද ඔවුන්ට විරුද්ධව තබන්නෙමි;
ඔවුන් ගින්නෙන් නික්ම ගිය නුමුත් ගින්න
ඔවුන් නාස්තිකරනවා ඇත; මා විසින්
ඔවුන්ට විරුද්ධව මාගේ මුහුණ තබන
විට මා ස්වාමීන්වහන්සේ බව තුඹලා
දැනගන්නහුය. ඔවුන් ද්‍රෝහිකම්කළ නිසා 8
මම දේශය පාළුවක් කරන්නෙමියි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේකැයි
කීය.

## කරුණාවෙන් ඇතිකරගත් දරුවෙකු වැනි ඉශ්‍රායෙල් අවිශ්වාස භාර්යාවක් හා සමානවීම

16 නැවතත් ස්වාමීන්වහන්සේගේ
වචනය මා වෙතට පැමිණ කියනුයේ:
මනුෂ්‍ය පුත්‍රය, යෙරුසලමට ඇගේ 2
පිළිකුල්කම් දන්වමින්, මෙසේ කියාපන්න– 3
ස්වාමිවූ දෙවියන්වහන්සේ යෙරුසලමට
මෙසේ කියනසේක: තුඹේ පිළිසිඳීම සහ
තුඹේ ඉපදීමද කානානිවරුන්ගේ දේශ-
යේදී සිද්ධවිය; තුඹේ පියා අමෝරි-
යයාය, තුඹේ මවු හිත්තිය ස්ත්‍රියෙක්ය.
තුඹ උපන් දවසේදී, තුඹ උපන් කල 4
තුඹේ පෙකනිවැළ කැපුවේවත් පිරිසිදු-
කිරීමට තුඹ වතුරෙන් නැවුවේවත් තුඹට
ලුණු කොහෙත්ම ගැවේවත් රෙදි එතු-
වේවත් නැත. තුඹට අනුකම්පාකොට 5
මේවායින් එකක්වත් තුඹට කරන ලෙස
කිසි ඇසක් තුඹට දයා නොවීය; තුඹ
උපන් දවසේදී තුඹේ ප්‍රාණය පිළිකුල්
එකක් ලෙස සලකා තුඹ කෙතේ දමනු
ලැබුවෙහිය. මම තුඹ ළඟින් යන විට 6
තුඹ ලේවල වැතිර ඉන්නවා දැක: තුඹ
තුඹේ ලේවල වැතිර ඉන්දදී ජීවත්-
වෙයන්නැයි තුඹට කීවෙමි; එසේය,
ජීවත්වෙයන්නැයි තුඹේ ලේවල වැතිර
ඉන්දද්දී තුඹට කීවෙමි. කෙතේ දළුව 7
මෙන් තුඹ රාශි ගණන් වැඩිකෙළෙමි,
තුඹ වැඩී මහත්වී, ඉතා ලක්ෂණ ස්වභා-
වකට පැමිණියෙහිය; තුඹේ පියයුරු
සැදුණෝය, තුඹේ ඉසකේද වැඩුණෝය;
නුමුත් තුඹ නිර්වස්ත්‍රව නග්නව සිටියෙහිය.
මම තුඹ ළඟින් ගොස් බැලූ කල, තුඹේ 8

කාලය වන ප්‍රේමයේ කාලය පැමිණී
තිබෙන බව දැක, මාගේ වස්ත්‍රය තුඹ
පිට අතුරා, තුඹේ නිර්වස්ත්‍රකම වසා,
තුඹට දිවුරුම්දී, තුඹ සමග ගිවිසුමක්
කරගත්තෙමි. තුඹද මට අයිතිවූයෙහි-
යයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන-
9 සේක. තවද මම තුඹ වතුරෙන් නාවා,
තුඹෙන් හොඳකාරයෙන් ලේ සෝද හැර,
10 තෙලින් ආලේපකෙළෙමි. විසිතුරු වස්ත්‍ර
මම තුඹට හඳවා, තහඡ් හම්වලින්වූ
වහන් තුඹට දමා. සිහින් හණ රෙදි
පිළියෙන් කටිය බැඳ, පටරෙදිවලින් තුඹ
11 වැසුවෙමි. මම ආභරණවලින් තුඹ
සරසමින්, තුඹේ අත්වල වළලුද තුඹේ
12 බෙල්ලේ මාලයක්ද දැමුවෙමි. තුඹේ
නාසයේ ආභරණයක්ද තුඹේ කන්වල
කුණ්ඩලාභරණද තුඹේ හිසේ අලංකාර
13 ඔටුන්නක්ද තැබුවෙමි. මෙසේ තුඹ රන්
රිදීවලින් සැරසී සිටියෙහිය; තුඹේ වස්ත්‍රද
සිහින් හණ රෙදිත් පට සහ විසිතුරු
රෙදිත්ය; තුඹ සිහින් පිටිද මීපැණිද
තෙල්ද කෑවෙහිය. තුඹ අතිශයින්ම
ලක්ෂණවී, රාජ්‍යයක් වෙන හැටියට
14 වර්ධනයවූවෙහිය. තුඹේ ශෝභනකම
නිසා තුඹේ කීර්තිය ජාතීන් අතරේ
පැතිර ගියේය; මක්නිසාද මා විසින්
තුඹ කෙරෙහි තැබූ මාගේ තේජස නිසා
ඒක සම්පූර්ණව තිබුණේයයි ස්වාමිවූ
දෙවියන්වහන්සේ කියනසේක.
15 තුමුත් තුඹේ ශෝභනකම කෙරේ තුඹ
විශ්වාසකොට, තුඹේ කීර්තිය නිසා
වේශ්‍යාකම්කරමින්, ළඟින් යන එකි-
නෙකාටම තුඹේ වේශ්‍යාකම් වැගිරෙවු-
16 වෙහිය; එය ඔහුට වුණේය. තුඹේ
වස්ත්‍රවලින් සමහරක් තුඹ රැගෙන,
විසිතුරු වර්ණවත් උස් තැන් සාදගෙන,
පළමු සිදුවුණේවත් මතු සිදුවෙන්නේවත්
නැති ආකාරයකට ඒවා උඩ වේශ්‍යාකම්-
17 කෙළෙහිය. මා තුඹට දුන්නාවූ මාගේ
රන් රිදීවලින් සෑදූ තුඹේ ලක්ෂණ
ආභරණ රැගෙන පුරුෂයන්ගේ රූප
සාදගෙන, ඒවා සමග වේශ්‍යාකම්-
18 කෙළෙහිය; තුඹේ විසිතුරු වස්ත්‍රවලින්
තුඹ ඒවා වසා, මාගේ තෙල්ද මාගේ
සුගන්ධ ද්‍රව්‍යයද ඒවා ඉදිරියෙහි තැබූ-
වෙහිය. කන්ට මා විසින් තුඹට දුන්නාවූ 19
මාගේ කෑම වන සිහින් පිටිද තෙල්ද
මීපැණිද තුඹ මිහිරි සුවඳ පිණිස ඒවා
ඉදිරියෙහි තැබුවෙහිය. මෙසේ වුණායයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
තවද මා නිසා තුඹ වැදූ තුඹේ පුත්‍රයන්ද 20
තුඹේ දූවරුන්ද තුඹ රැගෙන විනාශ-
වීමට ඔවුන් ඒවාට පූජාකෙළෙහිය. තුඹ 21
මාගේ දරුවන් ගින්නට කැපකොට ඔවුන්
ඒවාට මරාදුන්නේ තුඹේ වේශ්‍යාකම්
සුළු කාරණයක්වූ නිසාද? තුඹේ සියලු 22
පිළිකුල්කම්වලදීද වේශ්‍යාකම්වලදීද තුඹ
නිර්වස්ත්‍රව, නග්නව, තුඹේ ලේවල වැතිර
උන්නාවූ තුඹේ බාල කාලය තුඹ සිහි
නොකෙළෙහිය. තවද තුඹට දුක්වේ! 23
දුක්වේයයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක. මක්නිසාද තුඹේ සියලු
දුෂ්ටකම්වලට පසු, තුඹ සියලු වීථිවල 24
[වේශ්‍යා] මහලක් තනාගෙන උස්තැනක්ද
සාදගත්තෙහිය. තුඹ සියලු මංසන්ධි- 25
වල තුඹේ උස්තැන් ගොඩනගා, තුඹේ
ශෝභනකම පිළිකුල්කමට පමුණුවා,
ළඟින් යන සියල්ලන්ට තුඹේ කකුල්
විදහා, තුඹේ වේශ්‍යාකම් වැඩිකරගත්-
තෙහිය. තවද ශරීරයෙන් තරව සිටින 26
තුඹේ අසල්වාසීන් වන මීසරයන් සමග
තුඹ වේශ්‍යාකම්කොට, මා කෝපකරවන
ලෙස තුඹේ වේශ්‍යාකම් වැඩිකරගත්තෙහිය.
එබැවින් මම මාගේ අත තුඹට විරුද්ධව 27
දිගුකොට, තුඹේ කෑම කොටස අඩුකර,
තුඹට වෛරවෙන්නන්වූ තුඹේ සල්ලාල
මාර්ගය ගැන ලජ්ජාවෙන් සිටින
පිලිස්තිවරුන්ගේ දූවරුන්ගේ කැමැත්තට
තුඹ භාරදුනිමි. තුඹේ ආශාව සංසිඳීමක් 28
නොවූ නිසා, තුඹ අෂූරියයන් සමගද
වේශ්‍යාකම්කෙළෙහිය: තුඹ ඔවුන්
සමග වේශ්‍යාකම්කළ තුමුත් සෑහීමට
නොපැමිණියෙහිය. තුඹ කානාන් 29
දේශයේදී කල්දියාව දක්වාත් තුඹේ
වේශ්‍යාකම් වැඩිකරගත්තෙහිය: එහෙත්
එයිනුත් සෑහීමට නොපැමිණියෙහිය.

30 නොහික්මෙන වේශ්‍යා ස්ත්‍රියෙකුගේ ක්‍රියා
වන මේ සියල්ල කරන්නාවූ නුඹේ සිත
කොපමණ දුර්වලව තිබෙනවා නොවේදැයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
31 එසේය, නුඹේ සියලු මාර්ග කොන්වල
නුඹේ (වේශ්‍යා) මහල ගොඩනගා, සියලු
වීථිවල නුඹේ උස්තැනක් සාදගත්තෙහිය;
පණයම් එපාකරන හෙයින් වේශ්‍යාවට
32 නුඹ සමාන නුණෙහිය. කාමමිථ්‍යාචාරය
කරන භාර්යාවක්ය! තමාගේ පුරුෂයා
වෙනුවට අන්‍යයන් ගන්න ස්ත්‍රියෙක්ය!
33 සියලු වේශ්‍යාවන්ට යම් තෑග්ගක් දෙනු
ලැබේ. නුමුත් නුඹ නුඹේ සියලු ප්‍රේම-
වන්තයන්ට නුඹේ තෑගි දී, නුඹ සමග
වේශ්‍යාකම්කිරීමට හැම අතින්ම නුඹ
ළඟට එන්ට ඔවුන්ට තෑගි දුන්නෙහිය.
34 නුඹේ වේශ්‍යාකම්වලදී නුඹේ අන්දම
අන් ස්ත්‍රීන්ට වෙනස්ය, මක්නිසාද
වේශ්‍යාකමට කිසිවෙක් නුඹ පස්සේ
එන්නේ නැත. නුඹ පණයම් දෙනවා
මිස නුඹට පණයම් දෙන්නේ නැත, මෙසේ
නුඹ වෙනස්ය.
35 එබැවින් වේශ්‍යාවිය, ස්වාමීන්-
36 වහන්සේගේ වචනය අසාපන්න. ස්වාමිවූ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේක:
නුඹේ ප්‍රේමවන්තයන් සමගද නුඹේ සියලු
පිළිකුල්වල රූප සමගද නුඹ කළ
වේශ්‍යාකම්වලිනුත් නුඹ ඒවාට දුන් නුඹේ
දරුවන්ගේ ලේවලිනුත් නුඹේ මුදල්
වියදම්වී නුඹේ නග්න භාවය පෙනුණු
37 බැවින්, නුඹ කෙරෙහි ආලයවුණ නුඹේ
සියලු ප්‍රේමවන්තයන්ද නුඹ ප්‍රේමවුණ
සියල්ලන්ද නුඹ වෛරකළ සියල්ලන්ද
රැස්කරමි; මම ඔවුන් නුඹට විරුද්ධව
වටේට රැස්කොට, ඔවුන් නුඹේ මුළු
නිර්වස්ත්‍රකම දකින පිණිස නුඹේ නිර්-
වස්ත්‍රකම ඔවුන්ට ප්‍රකාශකරන්නෙමි.
38 පතිව්‍රතාව කඩකරන්නාවූ ලේ වගුරුවන්නාවූ
තැනැත්තියන් විනිශ්චයකරන්නාක්මෙන්
මම නුඹ විනිශ්චයකොට, උදහස හා
ජ්වලිත ලේ නුඹ පිටට පමුණුවන්නෙමි.
39 තවද මම නුඹ ඔවුන් අතට දෙන්නෙමි,
ඔවුන් නුඹේ [වේශ්‍යා] මහල කඩාදමා,
නුඹේ උස්තැන් හෙළාදමා, නුඹේ වස්ත්‍ර
ලිහාදමා, නුඹේ අලංකාර ආභරණ
රැගෙන නුඹ නිර්වස්ත්‍ර කොට නග්න-
කරනවා ඇත. ඔවුන් නුඹට විරුද්ධව 40
සමූහයක් පමුණුවා, නුඹට ගල්ගසා,
තමුන්ගේ කඩුවලින් නුඹට අනිනවා ඇත.
ඔවුන් නුඹේ ගෙවල් ගිනිලා, බොහෝ 41
ස්ත්‍රීන් ඉදිරියෙදී විනිශ්චයන් නුඹ
කෙරෙහි ඉෂ්ටකරනවා ඇත; වේශ්‍යාකම්-
කිරීමෙන්ද නුඹ නවත්වන්නෙමි, පණයම්ද
නුඹ තවත් නොදෙන්නෙහිය. මෙසේ 42
මාගේ උදහස නුඹ කෙරෙන් නවත්වා,
පසුව මාගේ ජ්වලිතය නුඹෙන් පහකොට,
නිශ්චලව තවත් උදහස් නොවී සිටින්-
නෙමි. නුඹේ බාල කාලය නුඹ 43
සිහිනැතිකොට, ඒ සියල්ලෙන් මා
උදහස්කළ බැවින්, බලව, මමත් නුඹේ
මාර්ගය නුඹේ හිස පිටට පමුණුවන්-
නෙමි. නුඹද නුඹේ සියලු පිළිකුල්කම්වලට
වඩා නරකවූ මේ දූෂ්‍යකම නො-
කරන්නෙහියයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක.
උපමා කියන සියල්ලෝ: මවු යම්සේද 44
දූවත් එසේමය යන උපමාව නුඹ ගැන
කියනවා ඇත. නුඹ තම් පුරුෂයාටත් 45
දරුවන්ටත් පිළිකුල්කරන මවගේ දූවය;
නුඹ තමුන්ගේ පුරුෂයන්ටද දරුවන්ටද
පිළිකුල්කළ නුඹේ සහෝදරියන්ගේ
සහෝදරීය. නුඹලාගේ මවු හිත්තිය ස්ත්‍රි-
යෙක්ය, නුඹලාගේ පියා අමෝරියයෙක්ය.
නුඹේ වැඩිමල් සහෝදරී නුඹට වමින් 46
වාසයකරන සමාරිය සහ ඇගේ දූවරුය.
නුඹේ බාල සහෝදරී නුඹට දකුණෙන්
වාසයකරන සොදෝම සහ ඇගේ දූවරුය.
නුමුත් නුඹ ඔවුන්ගේ මාර්ගවලම නො- 47
ගොස්, ඔවුන්ගේ පිළිකුල්වල ප්‍රකාරයටම
නොකර, ඒවා මදියයි සිතා, ඔවුන්ටත්
වඩා නුඹේ සියලු මාර්ගවලින් නුඹ
දුෂ්ටකම්කෙළෙහිය. මා ජීවමාන බව 48
සැබැවා සේම නුඹ සහ නුඹේ දූවරුන්
කළ ලෙස නුඹේ සහෝදරීවූ සොදෝම
සහ ඇගේ දූවරුන් කළේම නැතැයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.

49 මෙන්න, නුඹේ සහෝදරීවූ සොදෙමේ
වරද මෙසේය; උඩඟුකමත් කෑම පූර්ණ-
කමත් නොසැලකිලි නිශ්චලකමත් ඈට
සහ ඈගේ දූවරුන්ටත් තිබුණේය; ඈ
අසරණයාගේද දිළින්දාගේද අත බලවත්
50 නොකළාය. ඔවුන් උඩඟුව සිට මා
ඉදිරියෙහි පිළිකුල්කම් කළ බැවින්, මට
හොඳව පෙනුණු ලෙස ඔවුන් පහකෙළෙමි.
51 සමාරිය නුඹේ පව්වලින් අර්ධයක්වත්
නොකළාය; නුඹ ඔවුන්ට වඩා නුඹේ
පිළිකුල් ක්‍රියා වැඩිකර, නුඹ කළ
නුඹේ සියලු පිළිකුල් ක්‍රියාවලින් නුඹේ
සහෝදරියන් ධර්මිෂ්ඨව පෙනෙන්ට
52 සැලැස්සුවෙහිය. නුඹේ සහෝදරියන්
විනිශ්චයකළ නුඹ නුඹේ ලජ්ජාව දරා-
ගනින්න; ඔවුන්ට වඩා පිළිකුල් ලෙස
නුඹ කළාවූ නුඹේ පාප නිසා ඔව්හු
නුඹට වඩා ධර්මිෂ්ඨය. මෙසේ නුඹ නුඹේ
සහෝදරියන් ධර්මිෂ්ඨව පෙනෙන්ට
සැලැස්සූ බැවින් නුඹත් ලජ්ජාවට
පැමිණ නුඹේ නින්දාව දරාගනින්න.
53 ඔවුන්ගේ වාල්කම එනම් සොදෙම සහ
ඈගේ දූවරුන්ගේ වාල්කමද සමාරිය
සහ ඈගේ දූවරුන්ගේ වාල්කමද ඔවුන්
අතරේ නුඹේ වාල්වූ අයගේ වාල්කමද
54 පහකරන්නෙමි. මෙසේ කරන්නේ ඔවුන්
නුඹෙන් සැනසෙන හැටියට නුඹ කළ
සියල්ල නිසා, නුඹේ ලජ්ජාව නුඹ දරා,
55 නින්දාවට පැමිණෙන පිණිසය. නුඹේ
සහෝදරියන් වන සොදෙම සහ ඈගේ
දූවරුන්ද තමුන්ගේ පළමු ස්වභාවට
පැමිණෙනවා ඇත, සමාරිය සහ ඈගේ
දූවරුන්ද තමුන්ගේ පළමු ස්වභාවට
පැමිණෙනවා ඇත, නුඹ සහ නුඹේ
දූවරුන්ද නුඹලාගේ පළමු ස්වභාවට
56 පැමිණෙනවා ඇත. සිරියේ දූවරුන්ද ඈ
වටකර සිටි සියල්ලන් එනම් නුඹව
සුළුකරන පිලිස්තිවරුන්ගේ දූවරුන්ද හැම
අතින්ම නුඹට නින්දාකළ කාලයේදී මෙන්,
නුඹේ දුෂ්ටකම එළිදරව්වෙන්ට පළමු-
57 වෙන්, නුඹේ උඩඟුකමේ දවසේදී නුඹේ
සහෝදරීවූ සොදෙම නුඹේ මුඛයෙන්
58 සඳහන්කළේවත් නැත. නුඹේ සල්ලාල-
කමද නුඹේ පිළිකුල්කම්ද නුඹම දරුවෙහි-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
මක්නිසාද ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 59
මෙසේ කියනසේක: ගිවිසුම කඩකරන
ලෙස දිවුරුම සුළු කළාවූ නුඹ කළ
හැටියටම මම නුඹට කරන්නෙමි. එහෙත් 60
මා විසින් නුඹේ බාල කාලයේදී නුඹ
සමග කළාවූ මාගේ ගිවිසුම සිහිකොට,
සදාකාල ගිවිසුමක් නුඹ සමග පිහිටු-
වන්නෙමි. නුඹේ වැඩිමහල්වූද බාලවූද 61
සහෝදරියන් නුඹ විසින් පිළිගන්න විට
නුඹ නුඹේ මාර්ග සිහිකොට ලජ්ජා-
වන්නෙහිය. ඔවුන් දූවරුන් කොට නුඹට
දෙන්නෙමි, නුමුත් එය නුඹේ ගිවිසුමකින්
නොවේය. නුඹ කළ සියල්ල ගැන මා 62
විසින් නුඹට කමාවෙන විට නුඹ
සිහිකොට, වියවුල්ව, ලජ්ජාවෙන් තවත්
කට නැර සිටින පිණිස, මාගේ ගිවිසුම 63
නුඹ සමග පිහිටුවන්නෙමි; එවිට මා
**ස්වාමීන්වහන්සේ** බව නුඹ දනගන්නෙහි-
යයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන-
සේකැයි කීය.

## රාජාලීන් හා මිදිවැලේ උපමාව

17 **ස්වාමීන්වහන්සේ**ගේ වචනය මා
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය 2
පුත්‍රය, නුඹ ඉශ්‍රායෙල් වංශයට තේර-
විල්ලක්ද උපමාවක්ද කියමින්—ස්වාමිවූ 3
දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි
කියාපන්න. මහත් පියාපත්ද දිග පිහාටුද
ඇත්තාවූ, පිහාටුවලින් ගැවසීගත්තාවූ,
විසිතුරුවූ මහ රාජාලියෙක් ලෙබනොන්ට
ඇවිත් කිහිරි ගහේ මුදුන කඩාගත්තේය.
ඔහු ඒකේ මුදුන් රිකිලි කඩා, වෙළඳමේ 4
දේශයකට එය ගෙනැවිත්, වෙළඳුන්ගේ
නුවරක එය සිටෙවුවේය. ඔහු දේශයේ 5
බීජයක්ද රැගෙන සාරවත් බිමක
සිටෙවුවේය; ඔහු එය බොහෝ දිය ළඟ
නළා ගසක් මෙන් එහි පිහිටෙවුවේය.
ඒක වැවී පැතිරෙන්නාවූ මිටිවූ මිදිවැලක් 6
විය; එහි අතු ඔහු දෙසට හැරී එහි මුල්
ඔහු යටින් ඇද්දේය. මෙසේ ඒක මිදි-
වැලක් වී අතු ලියලා රිකිලි දැමුවේය.

7 තවද මහත් පියාපත් සහ බොහෝ පිහාටු
ඇති තවත් මහත් රාජාලියෙක් විය.
එවිට ඒ මිදිවැල එහි මුල් ඔහු දෙසට
හරවා, ඔහු ඒකට වතුර වක්කරන පිණිස,
එය පිහිටුවා තිබුණු පාත්තිවලින් එහි
8 අතු ඔහු දෙසට දිගුකෙළේය. එය
උතුම් මිදිවැලක් වෙන හැටියට අතු ලියලා
ඵල දරන පිණිස එය හොඳ බිමක
බොහෝ වතුර ළඟ හිටවා තිබුණේය.
9 **ස්වාමිවූ දෙවියන්වහන්සේ** මෙසේ කියන-
සේකැයි කියාපන්න: එය සඵලවේද?
එය වියළී යන පිණිස ඔහු ඒකේ මුල්
උදුරා ඒකේ ඵල කපා නොදමන්නේද?
වැඩෙන්නාවූ ඒකේ [අමු] කොළ
සියල්ලම වියළී යනවා ඇත; ඒකේ මුල්
පිටින් එය උදුරාදමන්ට මහත් හස්ත-
යක්වත් බොහෝ සෙනඟවත් ඕනෑ නො-
10 වන්නේය. එය හිටවා තිබෙන නුමුත්
එය සඵලවේද? පෙරදිග සුළඟ ඊට වදින
විට එය සහමුලින්ම නොවියලෙන්නේද?
එය වැවුණු පාත්තිවලම එය වියළී
යනවා ඇතැයි කීය.

## ශෙදෙකියාගේ කැරළිගැසීම හා එහි ඵලය

11 තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
12 වෙතට පැමිණ කියනුයේ: මේ කාරණා
මොනවාද කියා නුඹලා දන්නේ නැද්දැයි
කැරළිකාර වංශයට කියාපන්න. තවත්
මෙසේ කියාපන්න: බබිලෝනියේ රජ
යෙරුසලමට ඇවිත් එහි රජු සහ
එහි අධිපතීන්ද රැගෙන තමා සමග
13 බබිලෝනියට ගෙනගියේය. ඔහු රාජ
වංශයේ කෙනෙක් ගෙන, ඔහු සමග
ගිවිසුමක් කොට, ඔහු දිවුරවා, දේශයේ
14 බලවන්තයන් ගෙනගියේය. මෙසේ කළේ
රාජ්‍යය පහත්ව තිබී ඔහුගේ ගිවිසුම
පැවැත්වීම කරණකොටගෙන එය
පවතිනවා මිස නැවත උසස් නොවන
15 පිණිසය. නුමුත් ඔහු අශ්වයන් සහ
බොහෝ සෙනඟ ලබාගන්ට තමාගේ
තානාපතියන් මිසරයට යැවීමෙන් ඔහුට
විරුද්ධව කැරළිගැසුවේය. ඔහු සඵලවේද?
මෙබඳු දේ කරන්නා ගැළවේද? ගිවිසුම
කඩකරලාත් ඔහු ගැළවෙනවා ඇද්ද?
මා ජීවමාන බව සැබෑවා සේම ඔහු 16
රජකමට පත්කළ රජුගේ දිවුරුම ඔහු
සුළුකොට ඔහුගේ ගිවිසුම කඩකළ
නිසා, ඔහු ඒ රජුගේ ස්ථානයවූ
බබිලෝනිය ඇතුළේදී ඒ රජු ළඟම
නසින්නේයයි **ස්වාමිවූ දෙවියන්වහන්සේ**
කියනසේක. ඔවුන් බොහෝ දෙනෙකු 17
සිඳදමන ලෙස ගොඩැලි සාද බලකොටු
ගොඩනගන කල, යුද්ධයෙහිදී ඵාරාවෝ
තමාගේ බලවත් සේනාවද මහත්
සමූහයද ඇතුව ඔහු උදෙසා කිසිවක්
කරන්නේ නැත. මක්නිසාද ඔහු ගිවිසුම 18
කඩකිරීමෙන් දිවුරුම සුළුකෙළේය; ඔහු
තමාගේ අත දී තිබුණ නුමුත් මේ සියල්ල
කෙළේය; ඔහු නොගැළවෙන්නේය.
එබැවින් **ස්වාමිවූ දෙවියන්වහන්සේ** 19
මෙසේ කියනසේක: මා ජීවමාන බව
සැබෑවා සේම ඔහු සුළුකළේ මාගේ
දිවුරුමය, ඔහු කඩකළේත් මාගේ
ගිවිසුමය, මමද ඔහුගේ හිස පිට්ට
ප්‍රතිඵල දෙන්නෙමි. මාගේ දැල ඔහු පිට 20
හෙළන්නෙමි, ඔහු මාගේ මලපතට
අසුවන්නේය, මම ඔහු බබිලෝනියට
පමුණුවා, මට විරුද්ධව කර තිබෙන
ඔහුගේ ද්‍රෝහිකම ගැන එහිදී ඔහු සමග
විනිශ්චයට පැමිණෙන්නෙමි. ඔහුගේ 21
සියලු සමූදවලින් පලායන සියල්ලන්
කඩුවෙන් වැටෙනවා ඇත, ඉතිරිවෙන
අය සියලු දිශාවලට විසුරුවනු ලබනවා
ඇත. නුඹලාද **ස්වාමීන්වහන්සේ** වන
මා එසේ කී බව දැනගන්නහුය.
**ස්වාමිවූ දෙවියන්වහන්සේ** මෙසේ 22
කියනසේක: මමත් උස්වූ කිහිරි ගසේ
මුදුනෙන් කැල්ලක් ගෙන හිටවන්නෙමි;
එහි මුදුන් රිකිලිවලින් ළපටි එකක්
කඩාගෙන උසස්ව තිබෙන උස්වූ කන්දක්
උඩ හිටවන්නෙමි. මම එය උස්වූ 23
ඉශ්‍රායෙල් කන්ද උඩ හිටවන්නෙමි. එයද
අතු ලියලා, ඵල හටගෙන, උතුම් කිහිරි
ගසක් වන්නේය. සියලු ආකාර පියාපත්
ඇති පක්ෂීහු ඒ යට ලගින්නෝය; එහි
අතුවල සෙවණේ උන් ලගින්නෝය. එවිට 24

ස්වාමීන්වහන්සේවූ මා විසින් උස් ගහ
පහත් කර, පහත් ගහ උසස්කළ බවත්
අමු ගහ වියළවා, වියළි ගහ සශ්‍රීකකර
තිබෙන බවත් කෙතේ සියලු ගස් දැන-
ගන්නවා ඇත. ස්වාමීන්වහන්සේ වන
මම කීවෙමි, එලෙසම කරමියි කීය.

## දෙවියන්වහන්සේ ඉදිරිපිට එක් එක්කෙනාගේ නිදහස හා වගකීම

18 ස්වාමීන්වහන්සේගේ වචනය
නැවත මා වෙතට පැමිණ කියනුයේ:
2 පියවරු ඇඹුල් මිදිඵල කන්නෝය,
දරුවන්ගේ දත් හිරිවැටෙන්නේය යන
උපමාව තුඹලා ඉශ්‍රායෙල් රට ගැන
3 කියන්නේ මක්නිසාද? මා ජීවමාන බව
සැබැවා සේම ඉශ්‍රායෙල්වරුන් අතරෙහි
මේ උපමාව තවත් කියන්ට තුඹලාට
නොලැබෙන්නේයයි ස්වාමිවූ දෙවියන්-
4 වහන්සේ කියනසේක. බලව, සියලුම
ප්‍රාණ මට අයිතිය; පියාගේ ප්‍රාණය
මෙන් පුත්‍රයාගේ ප්‍රාණයත් මට අයිතිය.
5 පව්කරන ප්‍රාණයම නසින්නේය. නුමුත්
යම් මනුෂ්‍යයෙක් ධර්මිෂ්ඨව සිට
යුක්තියද ධර්මිෂ්ඨකමද කෙරේ නම්,
6 කඳු පිට නොකා, ඉශ්‍රායෙල් වංශයේ
දේවරූපවලට තමාගේ ඇස් නොඑසෙ-
වුවේ නම්, අන් කෙනෙකුගේ භාර්යාව
අපවිත්‍ර නොකොට, ඔසප්වී සිටින
ස්ත්‍රියෙක් වෙතට නොපැමිණ සිටින්නේ
7 නම්, කිසිවෙකුට පීඩා නොකොට, ණය
ගැන ගත් උකස නැවත දුන්නේ නම්,
කිසිවෙකුගෙන් කොල්ල නොකා, බඩගිනි
ඇත්තාට තමාගේ කෑම දී, වස්ත්‍ර නැති
8 අයට වස්ත්‍ර ඇන්දෙවුවේ නම්, පොළියට
නොදී, ලාභත් නොගෙන, තමාගේ අත
අයුතුකමෙන් වලක්වාගත්තේ නම්,
එකිනෙකා අතරේ සැබෑවූ යුක්තිය
9 ඉෂ්ටකොට, මාගේ පනත් ප්‍රකාර හැසිර,
මාගේ විනිශ්චයන් පවත්වා, සැබෑලෙස
හැසිරේ නම්, ඔහු ධර්මිෂ්ඨය, ඔහු
සැබවින් ජීවත්වන්නේයයි ස්වාමිවූ
10 දෙවියන්වහන්සේ කියනසේක. නුමුත්
ඔහුට උපදින පුත්‍රයෙක් බලාත්කාර-
කරන්නෙක්ව, ලේ වගුරුවන්නෙක්ව,
මෙකී දේවලින් කොයි එකක් නුමුත්
කරන්නෙක්ව, ඒ කිසි යුතුකමක් 11
නොකරන්නෙක්ව සිටී නම්, කඳු පිට
කා, අන් කෙනෙකුගේ භාර්යාව
අපවිත්‍රකොට, අසරණයාටද දිළින්දටද 12
පීඩාකොට, කොල්ලකන්නෙක් වේ නම්,
උකස නැවත නොදී සිට, තමාගේ ඇස්
දේවරූපවලට ඔසවා, පිළිකුල්කම්කෙළේ 13
නම්, පොළියට දී, ලාභද ගත්තේ නම්,
ඒ පුත්‍රයා ජීවත්වන්නේද? ඔහු ජීවත්
නොවන්නේය; ඔහු මේ සියලු පිළිකුල්
ක්‍රියා කළ බැවින් ඔහු සැබවින්
නසින්නේය; ඔහුගේ ලේ ඔහු පිටම
වන්නේය. නුමුත් ඔහුට උපදින පුත්‍රයෙක් 14
තමාගේ පියා කළ සියලු පාප දැක,
භයවී, එලෙස නොකර සිටී නම්, කඳු 15
පිට නොකා, ඉශ්‍රායෙල් වංශයේ දේව-
රූපවලට තමාගේ ඇස් නොඔසවා, අන්
කෙනෙකුගේ භාර්යාව අපවිත්‍ර නොකොට
සිටී නම්, කිසිවෙකුට පීඩා නොකොට, 16
උකසක් නොගෙන, කිසිවෙකුගෙන්
කොල්ල නොකා, බඩගිනි ඇත්තාට
තමාගේ කෑම දී, වස්ත්‍ර නැති අයට
වස්ත්‍රයක් අන්දවා, තමාගේ අත 17
අසරණයා පිට නොහෙළා, පොළීවත්
ලාභවත් නොගෙන සිටී නම්, මාගේ
විනිශ්චයන් ඉෂ්ටකොට මාගේ පනත්
ප්‍රකාර හැසුරුණේ නම්; ඔහු තමාගේ
පියාගේ අයුතුකම නිසා නොනැසී
සැබවින්ම ජීවත්වන්නේය. ඔහුගේ පියා 18
වනාහි ක්‍රූරලෙස පීඩාකොට, තමාගේ
සහෝදරයාගෙන් කොල්ලකා, තමාගේ
සෙනඟ අතරේ හොඳ නැති දේ කළ
නිසා, බලව, ඔහු තමාගේ අයුතුකමෙහි
නසින්නේය. නුමුත්: ඒ කොහොමද? 19
පුත්‍රයා පියාගේ අයුතුකම නොදරන්නේ
මක්නිසාදැයි තුඹලා කියන්නහුය, පුත්‍රයා
යුක්තියද ධර්මිෂ්ඨකමද කොට, මාගේ
සියලු පනත් පවත්වා, ඒවා කර තිබේ
නම්, ඔහු සැබවින්ම ජීවත්වන්නේය.
පව්කරන ප්‍රාණයම නසිනවා ඇත. පුත්‍රයා 20

පියාගේ අයුතුකම නොදරන්නේය, පියාද
පුත්‍රයාගේ අයුතුකම නොදරන්නේය;
ධර්මිෂ්ඨයාගේ ධර්මිෂ්ඨකම ඔහු පිටටත්
දුෂ්ටයාගේ දුෂ්ටකම ඔහු පිටටත්
21 පැමිණෙන්නේය. නුමුත් දුෂ්ටයා තමා
කළ සියලු පාපවලින් හැරී, මාගේ
සියලු පනත් පවත්වමින්, යුක්තියද
ධර්මිෂ්ඨකමද කළොත්, ඔහු සැබවින්
22 නොනැසී ජීවත්වන්නේය. ඔහු කළ
ඔහුගේ සියලු වරද ඔහුට විරුද්ධව
සිහිකරනු නොලැබේ. ඔහු කළ ඔහුගේ
ධර්මිෂ්ඨකම නිසා ඔහු ජීවත්වන්නේය.
23 දුෂ්ටයා තමාගේ මාර්ගයෙන් හැරී
ජීවත්වෙනවාට මිස නසිනවාට කොයි
ප්‍රකාරයකින්වත් මාගේ ප්‍රසන්නයක්
ඇද්දැයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන-
24 සේක. නුමුත් ධර්මිෂ්ඨයෙක් තමාගේ
ධර්මිෂ්ඨකමෙන් හැරී, අධර්මිෂ්ඨකම්
කොට, දුෂ්ටයා කරන සියලුම පිළිකුල්
ක්‍රියාවල හැටියට කළොත් ඔහු ජීවත්වේද?
ඔහු කළ ඔහුගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලින්
කිසිවක් සිහිකරනු නොලැබේ. ඔහු කළ
ඔහුගේ ද්‍රෝහිකම නිසාත් ඔහු කළ
ඔහුගේ පාපය නිසාත් ඔහු නසින්නේය.
25 එහෙත්: ස්වාමීන්වහන්සේගේ මාර්ගය
සාධාරණ නැතැයි නුඹලා කියන්නහුය.
ඒම්බා ඉශ්‍රායෙල් වංශය, අසාපල්ලා.
මාගේ මාර්ගය සාධාරණ නොවේද?
සාධාරණ නැත්තේ නුඹලාගේ මාර්ගවල්
26 නොවේද? ධර්මිෂ්ඨයෙක් තමාගේ
ධර්මිෂ්ඨකමෙන් හැරී අධර්මිෂ්ඨකම්කරමින්
සිට නසින කල, ඔහු නසින්නේ තමා
කළ තමාගේ අධර්මිෂ්ඨකම නිසාය.
27 යළිත් දුෂ්ටයා තමා කළ දුෂ්ටකමෙන්
හැරී යුක්තියද ධර්මිෂ්ඨකමද කරන කල
ඔහු තමාගේ ජීවිතය රක්ෂාකරගන්නේය.
28 ඔහු කල්පනාකොට තමා කළ තමාගේ
සියලුම වරදවලින් හැරෙන නිසා ඔහු
29 නොනැසී ජීවත්වන්නේමය. එහෙත්:
ස්වාමීන්වහන්සේගේ මාර්ගය සාධාරණ
නැතැයි ඉශ්‍රායෙල් වංශය කියති. ඒම්බා
ඉශ්‍රායෙල් වංශය, මාගේ මාර්ග සාධාරණ
නොවේද? සාධාරණ නැත්තේ නුඹලාගේ
මාර්ග නොවේද? එබැවින්, ඒම්බා 30
ඉශ්‍රායෙල් වංශය, මම නුඹලා එක
එකා තම තමාගේ මාර්ගවල හැටියට
විනිශ්චය කරන්නෙමියි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක. නුඹලා
හැරී ඇවිත් නුඹලාගේ සියලුම වරද-
වලින් හැරියල්ලා; එවිට අයුතුකම
නුඹලාගේ පැකිළීමට කාරණයක්
නොවන්නේය. නුඹලා කළ නුඹලාගේ 31
සියලු වරද නුඹලා වෙතින් අහක
දමා, අලුත් සිතක්ද අලුත් ආත්මයක්ද
නුඹලාටම සාදගනිල්ලා. ඉශ්‍රායෙල්
වංශය නුඹලා නසින්නේ මක්නිසාද?
නසින්නාගේ මරණය ගැන මට කිසි 32
ප්‍රසන්නයක් නැත; එබැවින් හැරී ජීවත්-
වෙයල්ලායයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක.

## ඉශ්‍රායෙල් අධිපතීන් ගැන විලාපය

නුඹ වනාහි ඉශ්‍රායෙල් අධිපතීන් 19
ගැන විලාපයක් පවත්වමින් මෙසේ
කියාපන්න: නුඹේ මවු කවුද? සිංහ- 2
ධේනුවක්ය. ඈ සිංහයන් මැද ලැග්ගාය,
තරුණ සිංහයන් අතරෙහිද ඇගේ
පැටවුන් ඇතිකළාය. ඇගේ පැටවුන්ගෙන් 3
ඈ ඇතිකළ එකෙක් තරුණ සිංහයෙක්
වී, ගොදුරු අල්ලන්ට ඉගෙනගෙන,
මනුෂ්‍යයන් කෑයේය. ඌ ගැන ජාතීන්ටද 4
සැලවිය; ඌ ඔවුන්ගේ බොරු වළට
අසුවිය. ඔව්හු ඌට කොකු දමා මිසර
දේශයට ගෙන ගියෝය. ඈ බලා සිට 5
ඇගේ බලාපොරොත්තුව නැතිවී තිබෙන
බව දැක, තමාගේ පැටවුන්ගෙන් තවත්
එකෙකු ගෙන තරුණ සිංහයෙකු කළාය.
ඌද සිංහයන් අතරේ ගැවසී, තරුණ 6
සිංහයෙක් වී, ගොදුරු අල්ලන්ට
ඉගෙනගෙන, මනුෂ්‍යයන් කෑයේය. ඌ 7
ඔවුන්ගේ මාළිගා දැනගෙන, ඔවුන්ගේ
නුවර නාස්තිකෙළේය; දේශයද එහි
පූර්ණකමද ඌගේ නාදකිරීමේ ඝෝෂාවට
පාළුවුණේය. එවිට ජාතීහු රටවලින් 8
ඔහුට විරුද්ධව වටකරීන් ඇවිත්,

තමුන්ගේ දල උෟ පිට හෙළුවෝය; උෟද
9 ඔවුන්ගේ වළට අසුවිය. ඔව්හු උෟට
කොකු දමා කූඩුවක ලා, බබිලෝනියේ
රජු ළඟට ගෙනාවෝය; උගේ නාදය
ඉශ්‍රායෙල් කඳුවල තවත් නෑසෙන පිණිස
ඔව්හු උෟ බලකොටුවලට ගෙනාවෝය.
10 නුඹේ ලේ නුඹ පිට තිබියදී නුඹේ මව්
වතුර ළඟ සිටෙවූ මිදිවැලක් මෙන් වූවාය.
බොහෝ වතුර තිබුණ නිසා ඈ බොහෝ
එල දරුවාය, අතුවලින් ගැවසී ගත්තාය.
11 ආණ්ඩුකාරයන්ගේ ජයකොන්ත සෑදීම
පිණිස ඇට සවි ඇති දඬු තිබුණේය,
ඇගේ උස වලාකුල් අතරටම උස්වී
ගොස්, ඇගේ උසස්කමද ඇගේ බොහෝ
12 අතු සමග පෙනුණාය. නුමුත් ඈ කෝපය
කරණකොටගෙන උදුරනු ලැබ, බිමට
හෙළනු ලැබුවාය, ඇගේ එල නැගෙනහිර
සුළඟට වියළී ගියේය. ඇගේ සවි ඇති
දඬු කැඩී වියළී ගින්නෙන් දලාගියේය.
13 දැන් වනාහි ඈ කාන්තාරයෙහි දියසීරා
14 නැති වියළි භූමියක හිටවා තිබේ. ඇගේ
අතුවල දඬුවලින් ගිනි නික්ම ඇගේ එල
දවාදැමුවේය, එහෙයින් ආණ්ඩුකිරීමට
ජයකොන්තයක් පිණිස ඇට සවි ඇති
කිසි දණ්ඩක් නැත. මේක විලාපයක්ය,
විලාපයක් පිණිස වන්නේයයි කීය.

## දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ බව ඉශ්‍රායෙල්ගේ කථාන්තරයෙන් පෙන්වීම

20 තවද සත්වෙනි අවුරුද්දේ පස්වෙනි
මාසයේ දසවෙනිද ඉශ්‍රායෙල්
වැඩිමහල්ලන්ගෙන් සමහරෙක් ස්වාමීන්-
වහන්සේගෙන් විභාග කරන පිණිස
2 ඇවිත් මා ඉදිරියෙහි හිඳගත්තෝය. එවිට
ස්වාමීන්වහන්සේගේ වචනය මා වෙතට
3 පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, නුඹ
ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ට කථාකොට
ඔවුන්ට මෙසේ කියාපන්න: ස්වාමිවූ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේක--
නුඹලා ආවේ මාගෙන් විභාගකරන්ටද?
මා ජීවමාන බව සැබෑවා සේම නුඹලා-
ගේ විභාග කිරීමට මම ඇහුම්කන්
නොදෙන්නෙමියි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක. මනුෂ්‍ය පුත්‍රය, 4
නුඹ ඔවුන් විනිශ්චයකරනවාද? විනිශ්-
චයකරනවාද? ඔවුන්ගේ පියවරුන්ගේ
පිළිකුල්කම් ඔවුන්ට දන්වමින්, ඔවුන්ට 5
මෙසේ කියාපන්න: ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේක—මම
ඉශ්‍රායෙල් තෝරාගෙන, යාකොබ්ගේ
වංශයට මාගේ *අත ඔසවා, මිසර
දේශයේදී මා ඔවුන්ට ප්‍රකාශවූ
දවසේදී: මම නුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේය කියා මාගේ අත ඔවුන්ට
එසෙවුවෙමි. ඒ දවසේදී, මා විසින් ඔවුන් 6
උදෙසා තෝරාගත තිබුණාවූ, කිරිද
මීපැණිද ගලායන්නාවූ, සියලු දේශවලට
වඩා උතුම්වූ දේශයකට මිසර දේශයේ
සිට ඔවුන් පමුණුවයි කියා මම
ඔවුන්ට මාගේ අත ඔසවා—නුඹලා 7
එකිනෙකා තම තමාගේ ඇස්වලට ප්‍රියවූ
අශික්ෂිතකම් පහකරදමා, මිසරයේ
දේවරූපවලින් අපවිත්‍ර නොවී සිටපල්ලා;
මම නුඹලාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේයයි ඔවුන්ට කීමි. නුමුත් ඔව්හු 8
මට ඇහුම්කන් දෙන්ට කැමති නොවී,
මට විරුද්ධව කැරළිගැසුවෝය; ඔවුන්
තම තමුන්ගේ ඇස්වලට ප්‍රියවූ අශික්ෂිත-
කම් පහකර දැමුවේවත් මිසරයේ දේවරූප
අත්හැරියේවත් නැත. එවිට මම මිසර
දේශයේදී මාගේ කෝපය ඔවුන් පිටට
වගුරුවා, මාගේ උදහස ඔවුන් කෙරෙහි
ඉෂ්ටකරන්ට සිතුවෙමි. නුමුත් ඔවුන් 9
වටකර සිටි ජාතීන් ඉදිරියෙහි මාගේ
නාමය නොකෙලෙසෙන පිණිස එය
උදෙසා ක්‍රියාකෙළෙමි. මක්නිසාද ඔවුන්
මිසර දේශයෙන් පිටතට ගෙනෙන්ට ඒ
ජාතීන් ඉදිරියෙහි ඔවුන්ට ප්‍රකාශවුණෙමි.
එබැවින් මම ඔවුන් මිසර දේශයෙන් 10
පිටතට ගෙනැවිත් කාන්තාරයට
පැමිණෙවුවෙමි. මාගේ පනත් ඔවුන්ට 11
දී, මාගේ විනිශ්චයන් ඔවුන්ට දන්වීමි;
මනුෂ්‍යයෙක් ඒවා පවත්වන්නේ නම් ඔහු
එයින් ජීවත්වන්නේය. තවද මම ඔවුන් 12

*එනම්, දිවුරා.

විශුද්ධකරන **ස්වාමීන්වහන්සේ** බව ඔවුන්
දැනගන්න පිණිස, මා සහ ඔවුන් අතරේ
සලකුණක්ව තිබෙන්ට මාගේ සබත්
13 ඔවුන්ට දුනිමි. නුමුත් ඉශ්‍රායෙල් වංශය
කාන්තාරයේදී මට විරුද්ධව කැරළිගසා,
මාගේ පනත් ප්‍රකාර නොහැසිර, මාගේ
විනිශ්චයන් එපාකළෝය; මනුෂ්‍යයෙක්
ඒවා පවත්වන්නේ නම් ඔහු එයින්
ජීවත්වන්නේය; ඔව්හු මාගේ සබත්
බොහෝසෙයින් කෙලහුවෝය. එවිට
ඔවුන් නැතිකරදැමීමට කාන්තාරයේදී මාගේ
කෝපය ඔවුන් පිටට වගුරුවන්ට සිතු-
14 වෙමි. නුමුත් ජාතීන් ඉදිරියෙහි මා විසින්
ඔවුන් පිටතට ගෙනා බැවින්, ඒ ජාතීන්
ඉදිරියෙහි මාගේ නාමය නොකෙලහෙන
15 පිණිස එය උදෙසා ක්‍රියාකෙළෙමි. තවද
මා දුන්නාවූ, කිරිද මීපැණිද ගලායන්නාවූ,
සියලු දේශවලට වඩා උතුම්වූ දේශයට
ඔවුන් නොපමුණුවමියි කියා කාන්-
තාරයේදී ඔවුන්ට මාගේ අත එසෙවු-
16 වෙමි. මෙසේ කළේ ඔවුන් මාගේ
විනිශ්චයන් එපාකොට, මාගේ පනත්
ප්‍රකාර නොහැසිර, මාගේ සබත් කෙලහූ
නිසාය. මක්නිසාද ඔවුන්ගේ සිත් ඔවුන්ගේ
17 දේවරූප පස්සේ ගියෝය. එසේවී නුමුත්
ඔවුන් විනාශකර කාන්තාරයේදී ඔවුන්
තීන්දුවටම නැතිකර නොදමන ලෙස
18 මාගේ ඇස ඔවුන්ට දයාවුණේය. මම
කාන්තාරයේදී ඔවුන්ගේ දරුවන්ට
කථාකොට: නුඹලාගේ පියවරුන්ගේ
පනත් ප්‍රකාර නොහැසිර, ඔවුන්ගේ
විනිශ්චයන් නොපවත්වා, ඔවුන්ගේ
දේවරූපවලින් අපවිත්‍ර නොවී සිටපල්ලා.
19 මම නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය**;
මාගේ පනත් ප්‍රකාර හැසිර, මාගේ
විනිශ්චයන් පවත්වා, ඒවා කරපල්ලා.
20 මාගේ සබත් ශුද්ධ ලෙස පවත්වාපල්ලා;
එවිට මා නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්-**
**වහන්සේ** බව නුඹලා දැනගන්න පිණිස
ඒවා මා සහ නුඹලා අතරේ සලකුණක්
21 වන්නේයයි කීමි. නුමුත් දරුවෝ මට
විරුද්ධව කැරළිගසා, මාගේ පනත්
ප්‍රකාර නොහැසිර, මනුෂ්‍යයෙක් ජීවත්වෙන
පිණිස ඔහු විසින් පවත්වන්ට ඕනෑවූ
මාගේ විනිශ්චයන් ඉෂ්ටකරන ලෙස
ඒවා නොපවත්වා, මාගේ සබත්
කෙලහුවෝය. එවිට මම කාන්තාරයේදී
මාගේ කෝපය ඔවුන් පිටට වගුරුවා
මාගේ උදහස ඔවුන් කෙරෙහි ඉෂ්ට-
කරන්ට සිතුවෙමි. නුමුත් මම මාගේ 22
අත නවත්වාගෙන, ජාතීන් ඉදිරියෙහි
මා විසින් ඔවුන් පිටතට ගෙනා බැවින්
ඒ ජාතීන් ඉදිරියෙහි මාගේ නාමය
නොකෙලහෙන පිණිස, එය උදෙසා
ක්‍රියාකෙළෙමි. තවද: මම ඔවුන් ජාතීන් 23
අතරට පන්නා දේශවල විසුරුවමියි
කියා කාන්තාරයේදී ඔවුන්ට මාගේ අත
එසෙවුවෙමි; මක්නිසාද ඔව්හු මාගේ 24
විනිශ්චයන් ඉෂ්ට නොකර, මාගේ පනත්
එපාකොට, මාගේ සබත් කෙලහුවෝය,
ඔවුන්ගේ ඇස්ද තමුන්ගේ පියවරුන්ගේ
දේවරූප දෙස තිබුණේය. එබැවින් මමත් 25
යහපත් නුවූ පනත්ද ජීවනය දීමට සුදුසු
නොවන විනිශ්චයන්ද ඔවුන්ට දුනිමි.
තවද මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් 26
දැනගන්නා පිණිස, මම ඔවුන් අසරණ-
භාවයට පමුණුවන්ට, ගර්භයේ ප්‍රථම
ඵලවූ සියලු කුලුදුලන් ගිනි මැදින්
යැවීමෙන් ඔවුන් දුන් ඔවුන්ගේම පඬුරු-
වලදී ඔවුන් අපවිත්‍ර බව ප්‍රකාශකෙළෙමි.
එබැවින්, මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල් 27
වංශයට කථාකොට මෙසේ කියාපන්න:
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක—නුඹලාගේ පියවරු මට
විරුද්ධව ද්‍රෝහිකමක් කිරීමෙන් මෙසේ
මට තවත් අපහාසකළෝය. ඔවුන්ට දෙන 28
ලෙස මා විසින් මාගේ අත ඔසවා
දිවුරුම් දුන් දේශයට මා විසින් ඔවුන්
පැමිණෙවූ කල, ඔව්හු සියලු උස් හෙල්ද
අතු සනව තිබෙන සියලු ගස්ද දැක එහි
තමුන්ගේ පූජා ඔප්පුකළෝය, උදහස්
කරවන තමුන්ගේ පඬුරු එහි පිදුවෝය,
එහි ඔව්හු තමුන්ගේ සුගන්ධ ද්‍රව්‍ය සාද,
එහිම තමුන්ගේ පානපූජා වැගිරෙවුවෝය.
මමද කථාකොට: නුඹලා යන උස්තැන 29

කිමෙක්දැයි ඔවුන්ට කීමි. ඊට *බාමා
30 යන නම අද දවස දක්වා කියති. එබැවින්
ඉශ්‍රායෙල් වංශයට මෙසේ කියාපන්න:
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන-
සේක—තුඹලාගේ පියවරුන් කළාක්මෙන්
තුඹලා තමුන්ම අපවිත්‍රකරගන්නහුද?
ඔවුන්ගේ අශික්ෂිතකම් අනුව යමින්
31 වේශ්‍යාකම්කරන්නහුද? තුඹලාගේ
පුත්‍රයන් ගිනි මැදින් යැවීමෙන් තුඹලාගේ
පඬුරු ඔප්පුකරන කල, තුඹලා අද
දක්වා තුඹලාගේ සියලු දේවරූප කරණ-
කොටගෙන කිලුටුවන්නහුද? එබැවින්
ඉශ්‍රායෙල් වංශය, මම තුඹලා විසින්
විභාගකරනු ලබම්ද? මා ජීවමාන බව
සැබෑවා සේම මම තුඹලා විසින්
විභාගකරනු නොලබන්නෙමියි ස්වාමිවූ
32 දෙවියන්වහන්සේ කියනසේක. තුඹලාගේ
සිත්වල හටගන්න දේ එනම්: අපි ජාතීන්
වන දේශවල වංශ මෙන් ලීවලටත්
ගල්වලටත් සේවය කරන්නෙමුයයි
තුඹලා කියන එක සිද්ධවෙන්නේම නැත.

## ඉශ්‍රායෙල් කෙරෙහි පැමිණෙන විනිශ්චය

33 මා ජීවමාන බව සැබෑවා සේම
බලවත් අතකින්ද දිගුකළ හස්තයකින්ද
කෝපය වැගිරවීමෙන්ද තුඹලා කෙරෙහි
රජකම්කරන්නෙමියි ස්වාමිවූ දෙවියන්-
34 වහන්සේ කියනසේක. මම ජනයන්
අතරෙන් තුඹලා පිටතට පමුණුවා,
තුඹලා විසිරී සිටින දේශවලින් බලවත්
අතකින්ද දිගුකළ හස්තයකින්ද කෝපය
වැගිරවීමෙන්ද තුඹලා රැස්කරන්නෙමි.
35 ජනයන් නැමති කාන්තාරයට තුඹලා
ගෙනැවිත්, එහිදී මුහුණට මුහුණ ලා
තුඹලා සමග විනිශ්චයට පැමිණෙන්නෙමි.
36 මිසර දේශයේ කාන්තාරයේදී මම
තුඹලාගේ පියවරුන් සමග විනිශ්චයට
පැමුණුණාක්මෙන් තුඹලා සමගත්
විනිශ්චයට පැමිණෙන්නෙමියි ස්වාමිවූ
37 දෙවියන්වහන්සේ කියනසේක. මම

*එනම්, උස්වූ ස්ථානය.

තුඹලා දණ්ඩ යටින් යන්ට සලස්වා
ගිවිසුම් බැම්මට තුඹලා පමුණුවන්නෙමි.
තවද මට විරුද්ධව කැරළිගසන්නන්ද 38
ද්‍රෝහිකම්කරන්නන්ද මම තුඹලාගෙන්
වෙන්කොට ඔවුන් පොරොත්තුව සිටින
දේශයෙන් පිටකරන්නෙමි, නුමුත් ඔව්හු
ඉශ්‍රායෙල් රටට ඇතුල් නොවන්නෝය.
මෙසේ මා ස්වාමීන්වහන්සේ බව තුඹලා
දැනගන්නහුය. එම්බා ඉශ්‍රායෙල් වංශය, 39
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන-
සේක: තුඹලා වනාහි ගොස් එකිනෙකා
තම තමාගේ දේවරූපවලට සේවය-
කරපල්ලා, *තුඹලා මට ඇහුම්කන්-
දෙන්නේ නැත්නම් පසුත් එසේ කරපල්ලා.
නුමුත් තුඹලා මාගේ ශුද්ධ නාමය
තුඹලාගේ පඬුරුවලින්ද තුඹලාගේ දේව-
රූපවලින්ද තවත් කෙලසන්නේ නැත.
මක්නිසාද උස්වූ ඉශ්‍රායෙල් කන්ද වන 40
මාගේ ශුද්ධ කන්දේදී මුළු ඉශ්‍රායෙල්
වංශය වන දේශයෙහි සිටින ඔවුන්
සියල්ලෝම මට සේවයකරන්නෝයයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
එහිදී මම ඔවුන් පිළිගන්නෙමි, එහිදී
මම තුඹලාගේ පඬුරුද තුඹලා ඔප්පු-
කරන ප්‍රථම ඵලද තුඹලාගේ සියලු
ශුද්ධ දේත් ඇතුළුව මට දෙන්ට නියම-
කරන්නෙමි. මා විසින් ජනයන් අතරෙන් 41
තුඹලා පිටතට පමුණුවා, තුඹලා විසිරී
සිටින දේශවලින් රැස්කළ කල්හි, මිහිරි
සුවඳක් කොට තුඹලා පිළිගෙන, තුඹලා
කරණකොටගෙන ජාතීන් ඉදිරියෙහි මා
පිරිසිදු බව පෙන්වන්නෙමි. තුඹලාගේ 42
පියවරුන්ට දෙන හැටියට මා විසින්
මාගේ අත ඔසවා දිවුළ දේශය වන
ඉශ්‍රායෙල් රටට මා විසින් තුඹලා
පැමිණෙවූ කල්හි මා ස්වාමීන්වහන්සේ
බව තුඹලා දැනගන්නවා ඇත. එහිදී 43
තුඹලාගේ සියලු මාර්ගද තුඹලාම
අපවිත්‍රකරගත්තාවූ තුඹලාගේ සියලු
ක්‍රියාද තුඹලා සිහිකොට, තුඹලා කළාවූ

*නොහොත්—එහෙත් පසුව සැබෑවටම තුඹලා මට ඇහුම්කන්දී, මාගේ ශුද්ධ නාමය යනාදියි.

තුඹලාගේ සියලුම නපුරුකම් නිසා
44 තුඹලාටම පිළිකුල්කරන්නහුය. ඉශ්‍රායෙල්
වංශය, මා විසින් තුඹලාගේ නපුරු
මාර්ගවල හැටියටවත් තුඹලාගේ දූෂ්‍ය
ක්‍රියාවල හැටියටවත් නොව මාගේ
නාමය නිසා තුඹලා උදෙසා ක්‍රියාකළ
කල්හි මා **ස්වාමීන්වහන්සේ** බව තුඹලා
දැනගන්නහුයයි **ස්වාමිවූ දෙවියන්වහන්සේ**
කියනසේකැයි කීය.

## ස්වාමීන්වහන්සේගේ පළිගැනීමේ කඩුව

45 නැවත **ස්වාමීන්වහන්සේගේ** වචනය
46 මා වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, තුඹේ මුහුණ දකුණු දෙසට හරවා
තබාගන, තුඹේ වචනය දකුණු දෙසට
පිටෝත්තුකර, දකුණු පළාතේ වනයට
47 විරුද්ධව අනාගතවාක්‍ය කියා, දකුණු
දිශාවේ වනයට මෙසේ කියාපන්න—
**ස්වාමීන්වහන්සේගේ** වචනය අසාපන්න.
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක: බලව, මම තුඹ තුළ
ගින්නක් පත්තුකරමි, එයින් තුඹ තුළ
තිබෙන සියලු අමු ගස්ද සියලු වියළි
ගස්ද දැවීයන්නේය. ඒ ඇවිළෙන ගිනි-
මැලය නොනිවී, එයින් දකුණේ සිට
උතුර දක්වා සියලු මුහුණු දවෙන්නේය.
48 මාංසමයවූ සියල්ලෝද **ස්වාමීන්වහන්සේ**
වන මා විසින් එය දැල්වූ බව දකින්-
නෝය. එය නොනිවෙන්නේයයි කීය.
49 එවිට මම: අහෝ ස්වාමිවූ **දෙවියන්-
වහන්ස!** ඔහු උපමා කථාකරන කෙනෙක්
නොවේදැයි ඔව්හු මා ගැන කියතියි
කීයෙමි.

21 **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
2 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, තුඹේ මුහුණ යෙරුසලම දෙසට
හරවා තබාගන, ශුද්ධස්ථාන දෙසට
තුඹේ වචනය පිටෝත්තුකරමින්, ඉශ්‍රායෙල්
දේශයට විරුද්ධව අනාගතවාක්‍ය
3 කියාපන්න. ඉශ්‍රායෙල් දේශයට මෙසේ
කියාපන්න: **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක—මෙන්න, මම තුඹට
විරුද්ධය, මාගේ කඩුවද කොපුවෙන්
ඇද ධර්මිෂ්ඨයන් සහ දුෂ්ටයන් තුඹ
කෙරෙන් සිඳදමන්නෙමි. මා විසින් 4
මෙසේ ධර්මිෂ්ඨයන් සහ දුෂ්ටයන් තුඹ
කෙරෙන් සිඳදමන බැවින් මාංසමයවූ
සියල්ලන්ට විරුද්ධව දකුණේ සිට උතුර
දක්වා මාගේ කඩුව කොපුවෙන් පිටත්ව
යනවා ඇත. **ස්වාමීන්වහන්සේ** වන මා 5
විසින් මාගේ කඩුව කොපුවෙන් ඇදගත්
බව මාංසමයවූ සියල්ලන් දැනගන්නවා
ඇත; නැවත ඒක කොපුවට හැරී නො-
යන්නේය. එබැවින්, මනුෂ්‍ය පුත්‍රය, 6
තුඹ සුසුම්ලාපන්න; තුනටිය කැඩෙන
තරමට ශෝකයෙන් ඔවුන් ඉදිරියෙහි
කෙඳිරිගාපන්න. තුඹ සුසුම්ලන්නේ 7
මක්නිසාදැයි ඔවුන් තුඹෙන් අසන කල
මෙසේ කියාපන්න: ආරංචිය නිසාය,
මක්නිසාද එය පැමිණෙන්නේය. සියලු
සිත් දියවෙන්නේය, සියලු අත් හෙලා-
වැටෙන්නේය, සියලු ආත්ම ක්ලාන්ත-
වන්නේය, සියලු දණහිස් දිය මෙන්
බෙලහීනවන්නේය. බලව, එය පැමි-
ණෙන්නේය, එය සිද්ධවන්නේයයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේකැයි කීය.
**ස්වාමීන්වහන්සේගේ** වචනය මා 8
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, 9
අනාගතවාක්‍ය කියා, **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේකැයි කියාපන්න:
කඩුවක්ය, කඩුවක්ය, ඒක මුවහත්කර
මැදලාත් තිබේයයි කියාපන්න. ඒක 10
මුවහත්කර තිබෙන්නේ මරාදමන
පිණිසය; මැදලා තිබෙන්නේ විදුලිය මෙන්
දිලිහෙන පිණිසය. එසේ නම් අපට
ප්‍රීතිවෙන්ට යුතුද? මාගේ පුත්‍රයාගේ ජය-
කොන්තය සියලු ගස් සුළුකරන්නේය.
ඒක අතට ගන්න පිණිස මැදීමට දී 11
තිබේ. මරාදමන අයගේ අතට දෙන
පිණිස මේ කඩුව මුවහත්කර මැදලාත්
තිබේ. මනුෂ්‍ය පුත්‍රය, කෑගසා මොර- 12
ගසාපන්න. මක්නිසාද ඒක මාගේ
සෙනඟ පිටටත් සියලු ඉශ්‍රායෙල්
අධිපතීන් පිටටත් පැමුණුණේය. ඔව්හු
මාගේ සෙනඟ සමඟ කඩුවට පාවාදෙනු

ලැබුවෝය. එබැවින් කළවයට ගසා-
13 ගනින්න. මක්නිසාද තදබල විභාගයක්
ඇත්තේය; තවද සුළුකරන්නාවූ ජය-
කොන්තය පවා නැතුව ගියත් මොකදැයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේක.
14 එබැවින් මනුෂ්‍ය පුත්‍රය, නුඹ වනාහි
අනාගතවාක්‍ය කියමින්, අත් දෙක එකට
ගසාපන්න; කඩුව එනම් මරණීය තුවාල
ලැබූ අය මරාදමූ කඩුව නැවත තුන්වෙනි
වරට පැමිණේවා. එය නම් මරණීය
තුවාල ලැබූ උත්තමයා මරාදමූ කඩුවය,
එය ඔවුන්ගේ ඇතුල් ගෙවලට වදින්නේය.
15 සිත දියවී යන පිණිසත් පැකිලීම්
වැඩිවෙන පිණිසත් ඔවුන්ගේ සියලු
දොරටුවලට විරුද්ධව කඩුවේ භයානක-
කම මම නියමකෙළෙමි. අහෝ ඒක
විදුලිය මෙන් ඔප් නගා, මරාදැමීමට
16 තියුණුකර තිබේ. කඩුව, යොමුවෙයන්න,
දකුණට ගසාපන්න; සැදී සිටපන්න,
වමට ගසාපන්න; නුඹේ මුහුණත හැරී
තිබෙන කොයි අතට නුමුත් ගසාපන්න.
17 මමත් මාගේ අත් දෙක එකට ගසා,
මාගේ කෝපය සංසිඳුවාගන්නෙමි.
**ස්වාමින්වහන්සේ** වන මම කීවෙමියි කීය.
18 **ස්වාමින්වහන්සේගේ** වචනය නැවත
19 මා වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, බබිලෝනියේ රජුගේ කඩුව එන්ට
මාර්ග දෙකක් නියමකරගනින්න; ඒ
දෙකම එක දේශයකින් පැමිණෙන්නේය.
අත් ලකුණක් තබාපන්න, නුවරට
පැමිණෙන මාර්ග සන්ධියෙහි ඒක පිහි-
20 ටුවාපන්න. කඩුව අම්මොන් පුත්‍රයන්ගේ
නුවරවූ රබ්බාටත් යූදට සහ පවුරු ඇති
යෙරුසලමටත් පැමිණෙන්ට මාර්ගයක්
21 නියමකරපන්න. බබිලෝනියේ රජ
පේන අහන්ට මාර්ගය බෙදෙන තැන
දෙමංසන්ධියේ සිට, ඊගස් සොලවා,
තෙරාපීම් රූප කරණකොටගෙන විභාග-
22 කර, අක්මාව බැලුවේය. යුද්ධ යන්ත්‍ර
තබන්ටත් මරාදැමීමට මුඛය හැර ඝෝෂා
කිරීමෙන් ශබ්දනගන්ටත් දොරටුවලට
විරුද්ධව යුද්ධ යන්ත්‍ර තබන්ටත් ගොඩැලි
සාදන්ටත් කොටු ගොඩනගන්ටත්
යෙරුසලම ගැන ඔහුගේ දකුණතට
පේන-ඊගස වැටුණේය. ඔවුන් ඒ අයට 23
දිවුරුම් දී තිබෙන නුමුත් ඒක බොරු
පේනකීමක් වාගේ ඔවුන්ට පෙනේ. නුමුත්
ඔවුන් අසුවෙන පිණිස *ඔහු අයුතුකම
සිහිකරන්නේයයි කීය.
එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 24
මෙසේ කියනසේක: නුඹලාගේ සියලුම
ක්‍රියාවලින් නුඹලාගේ පාප පෙනීයාමට
නුඹලාගේ වරද එළිදරව්වෙන හැටියට
නුඹලාගේ අයුතුකම නුඹලා සිහිකෙරෙව්වූ
බැවින්ද නුඹලා ගැන මෙසේ සිහිවුණු
බැවින්ද නුඹලා ඔවුන් අතට අසුවෙනවා
ඇත. අනිනු ලැබුවාවූ, දුෂ්ටවූ ඉශ්‍රායෙල් 25
අධිපතිය, නුඹේ කාලය අන්තිම අයුතු-
කමේ කාලයෙහි පැමිණ තිබේ; ස්වාමිවූ 26
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
කිරීටය ගළවාදමාපන්න, ඔටුන්න අහක්-
කරපන්න. මෙය තිබුණ අන්දමටම
නොවන්නේය. පහත් දේ උසස්කරපන්න,
උසස් දේ පහත් කරපන්න. පෙරළාදමන්නෙමි, 27
පෙරළාදමන්නෙමි, පෙරළාදමන්නෙමි.
අයිතිවාසිය ඇති තැනැත්තා එන තුරු
ඒකත් තවත් නොවන්නේය; මම ඒක
ඔහුට දෙන්නෙමි.
මනුෂ්‍ය පුත්‍රය, නුඹ අනාගතවාක්‍ය 28
කියා, ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
අම්මොන් පුත්‍රයන් ගැනද ඔවුන්ගේ නින්ද
කිරීම ගැනද මෙසේ කියනසේකැයි
කියාපන්න: අන්තිම අයුතුකමේ 29
කාලයේදී සිටියාවූ මැරුම්කෑවාවූ
දුෂ්ටයන්ගේ කුළල් පිටට නුඹ හෙළනු
ලබන පිණිස ඔවුන් නුඹ උදෙසා නිෂ්ඵල
දේ දකිමින් නුඹට බොරු පේනකියන
අතර කඩුවක්–මරාදැමීමට කඩුවක්–ඇද
තිබේ, විදුලිය මෙන් දිලිහෙන පිණිස
පුළුවන් පමණ ඒක මැදලා තිබේ. නුඹේ 30
කඩුව කොපුවේ නැවත දමාපන්න. නුඹ
මවනු ලැබූ ස්ථානයෙහි නුඹේ උත්පත්ති
දේශයේදී නුඹ විනිශ්චයකරන්නෙමි.
මාගේ උදහස නුඹ පිටට වගුරුවා, මාගේ 31

*නොහොත්, උන්වහන්සේ.

කෝපය නැමති ගින්නෙන් නුඹට
පිඹ. රෞද්‍රවූ, විනාශ කිරීමට දක්ෂවූ
මනුෂ්‍යයන් අතට නුඹ පාවාදෙන්නෙමි.
32 නුඹ ගින්නට දර පිණිස වන්නෙහිය;
නුඹේ ලේ දේශය මැද වැගිරෙන්නේය;
නුඹ තවත් සිහිකරනු නොලබන්නෙහිය.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** වන මම
ඒක කීමියි කීය.

## යෙරුසලමේ අපරාධ සහ දඬුවම නැවත ගෙනහැරදක්වීම

**22** නවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
මා වෙතට පැමිණ කියනුයේ:
2 මනුෂ්‍ය පුත්‍රය, නුඹ විනිශ්චය කරන්-
නෙහිද? ලේ වගුරුවන නුවර විනිශ්චය-
කරන්නෙහිද? එසේවී නම් ඇගේ සෑම
පිළිකුල්කම් ඇට දන්වමින් මෙසේ
3 කියාපන්න: ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: ඒ වනාහි එහි කාලය
පැමිණෙන පිණිස එහි මැද ලේ වගුරු-
වන්නාවූද එය අපවිත්‍රවන පිණිස
තමාටම විරුද්ධව දේවරූප සාදගන්නාවූද
4 නුවරක්ය! නුඹ වැගිරෙවූ නුඹේ ලේවලින්
නුඹ වරදකාරයෙක්වී, නුඹ සෑදූ නුඹේ
රූපවලින් නුඹ අපවිත්‍රවී, මෙසේ නුඹේ
දවස් ළංවෙන්ට සලස්වා, නුඹේ අවුරුදු-
වලට නුඹ පැමිණෙහිය. එබැවින්
මම නුඹ ජාතීන්ට නින්දාවක්ද සියලුම
5 දේශවලට කවටකමක්ද කෙළෙමි. නුඹට
ළංව සිටින්නෝද දුරව සිටින්නෝද
අපකීර්තියත් බොහෝ කැලඹීමත් ඇතුව
සිටින කෙනෙක් කොට නුඹට කවටකම්-
6 කරන්නෝය. ඉශ්‍රායෙල් අධිපතීන් නුඹ
තුළ සිටියේ එක එකා තම තමාගේ
බලය ලෙස ලේ වගුරුවන පිණිසය.
7 නුඹ තුළ ඔව්හු පියාත් මවුත් සුළුකළෝය;
නුඹ ඇතුළෙහි විදේශියාට බලාත්-
කාරයෙන් ක්‍රියාකළෝය. නුඹ තුළ පියා
නැත්තාට සහ වැන්දඹුවටත් පීඩාකළෝය.
8 නුඹ මාගේ ශුද්ධ දේ හෙළාදැක, මාගේ
9 සබත් කෙලෙහුවෙහිය. ලේ වගුරුවන
පිණිස කේලාම්කියන මනුෂ්‍යයෝ නුඹ
තුළ සිටියෝය. නුඹ තුළ කඳු පිට
කෑවෝය. නුඹ ඇතුළෙහි සල්ලාලකම්-
කළෝය. නුඹ තුළ පියාගේ නග්නකම 10
ප්‍රකාශකළෝය. නුඹ තුළ ඔසප්ව සිටි
නැනැත්තීට අගෞරවකළෝය. එකෙක් 11
තමාගේ අසල්වාසියාගේ භාර්යාව සමග
පිළිකුල්කම්කෙළේය; අනිකෙක් තමාගේ
ලේලී සල්ලාලකමින් අපවිත්‍රකෙළේය;
නුඹ තුළ තවත් කෙනෙක් තම පියාගේ
දූවවූ තමාගේ සහෝදරියට අවනම්බු-
කෙළේය. ලේ වගුරුවන පිණිස ඔව්හු 12
නුඹ තුළ අල්ලස් ගත්තෝය; නුඹ පොළී
සහ ලාභ ගෙන, නුඹේ අසල්වාසීන්ගෙන්
අයුක්තියෙන් ලාභ උපදවාගෙන, මා
සිහිනැතිකෙළෙහියයි ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** කියනසේක. එබැවින් බලව, 13
නුඹ ලබාගත් අයුතු ලාභ ගැනත් නුඹ
ඇතුළෙහිවූ නුඹේ ලේ වැගිරීම් ගැනත්
මාගේ අත් එකට ගසාගනිමි. මා විසින් 14
නුඹ සමග ක්‍රියා කරන දවස්වලදී නුඹේ
සිත ස්ථිරව නොහොත් නුඹේ අත්
බලවත්ව තිබේද? **ස්වාමීන්වහන්සේ** වන
මම ඒ දේ කීමි, එලෙසම කරන්නෙමි.
මම නුඹ ජාතීන් අතරට පන්වා, නුඹ 15
දේශවල විසුරුවා, නුඹේ අපවිත්‍රකම
නුඹෙන් නැතිකරදමන්නෙමි. නුඹද ජාතීන් 16
ඉදිරියෙහි නුඹ කරණකොටගෙනම
කෙලෙසෙන්නෙහිය; මා **ස්වාමීන්වහන්සේ**
බව නුඹ දැනගන්නෙහියයි කීය.
තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා 17
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය,
ඉශ්‍රායෙල් වංශය මට බොර මෙන් වී 18
සිටිති. ඔවුන් සියල්ලෝ උදුන මැද
තිබෙන පිත්තලව බෙලෙක්ව යකඩව
ඊයම්ව සිටිති; ඔව්හු රිදී-බොරය.
එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 19
මෙසේ කියනසේක–බලව, නුඹලා
සියල්ලන්ම බොර වී සිටින නිසා නුඹලා
යෙරුසලම තුළට එකතුකරන්නෙමි. රිදීද 20
පිත්තලද යකඩද ඊයම්ද බෙලෙක්ද ගිනි
පිඹ උණුකරන පිණිස උදුන තුළට
එකතුකරන්නාක්මෙන් මම නුඹලා මාගේ
උදහසින්ද කෝපයෙන්ද එකතුකර තබා
උණුකරන්නෙමි. මම නුඹලා රැස්කර, 21

මාගේ උදහස් ගින්න තුඹලාට පිඹින්-
නෙමි. තුඹලා එහි තුළ උණුවන්නහුය.
22 උදුන තුළ රිදී උණුවෙන්නාක්-
මෙන් තුඹලා එහි තුළ උණුවන්නහුය:
**ස්වාමීන්වහන්සේ** වන මා විසින් මාගේ
කෝපය තුඹලා කෙරෙහි වැගිරෙවූ බව
තුඹලා දැනගන්නවා ඇතැයි කීය.
23 **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
24 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය.
ඇට මෙසේ කියාපන්න—නුඹ වනාහි
පවිත්‍ර නුණාවූ, උදහස් දවසේදී වැසි
25 නොලබන්නාවූ දේශයක්ය. ඇගේ
ප්‍රොපේතවරුන්ගේ ද්‍රෝහිකමක් ඈ තුළ
ඇත්තේය. ඔව්හු ගොදුර ඉරන්නාවූ
ගොරවන සිංහයෙකු මෙන් ප්‍රාණ
කාදමුවෝය. ඔව්හු වස්තු සහ අනර්ඝ
දේ ගනිති: ඔව්හු එහි තුළ වැන්දඹුවන්
26 වැඩිකළෝය. ඇගේ පූජකයෝ මාගේ
ව්‍යවස්ථාව කඩකොට මාගේ ශුද්ධවූ
දේ කෙලෙසුවෝය. ඔවුන් ශුද්ධ එකද
අශුද්ධ එකද අතරේ වෙනසක් කළේවත්
අපවිත්‍ර එකද පවිත්‍ර එකද අතරේ
තිබෙන වෙනස දන්නුවේවත් නැත. මාගේ
සබත්ද ඔව්හු නොසලකා ඇරියෝය.
මෙසේ ඔවුන් අතරෙහි මට අගෞරව
27 පැමුණුණේය. එහි තුළ සිටින ඇගේ
අධිපතීහු අයුතු ලාභ ලබාගන්නා පිණිස
ලේ වැගිරවීමටත් ප්‍රාණ නැතිකිරීමටත්
සිටින ගොදුර ඉරන්නාවූ වෘකයන්ට
28 සමානය. ඇගේ ප්‍රොපේතවරුද ප්‍රයෝග
දර්ශන දැක, ඔවුන්ට බොරු පේන කියා,
**ස්වාමීන්වහන්සේ** කථා නොකළ නුමුත්:
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේකැයි කියා පදම් නොකළ බදම
29 ගෑවෝය. දේශයේ සෙනඟ බලාත්කාර-
කම්කොට කොල්ලකෑවෝය: අසරණ-
යාටද දිළින්දටද පීඩාකොට, අයුතුලෙස
30 විදේශියාට බලාත්කාරකළෝය. මා
විසින් දේශය නාස්ති නොකරන පිණිස
පවුරක් ගොඩනගා දේශය උදෙසා මා
ඉදිරිපිට කඩුල්ලෙහි සිටීමට ඔවුන් අතරේ
මනුෂ්‍යයෙකු සෙවීමි. නුමුත් කිසිවෙක් මට
31 සම්බනුණේය. එබැවින් මාගේ කෝපය
ඔවුන් කෙරෙහි වගුරුවා. මාගේ උදහස්
ගින්නෙන් ඔවුන් නාස්තිකරදමා, ඔවුන්ගේ
මාර්ගය ඔවුන්ගේ හිස් පිටට පැමිණ-
වීමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන-
සේකැයි කීය.

## අනාචාර සහෝදරියෝ වන සමාරිය සහ යෙරුසලම

23 **ස්වාමීන්වහන්සේගේ** වචනය
නැවත මා වෙතට පැමිණ
කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය. එක මවෙකුගේ 2
දූවරුවූ ස්ත්‍රීන් දෙදෙනෙක් සිටියෝය.
ඔව්හු මිසරයේදී වේශ්‍යාකම්කළෝය: 3
ඔවුන්ගේ යෞවන වයසේදී වේශ්‍යාකම්-
කළෝය. ඔවුන්ගේ පියයුරු එහිදී
මිරිකනු ලැබීය. එහිදී ඔවුන්ගේ කන්‍යා
වයසේ තනපුඩු තැළුණේය. ඔවුන්ගේ 4
නාම වනාහි වැඩිමහල් තැනැත්තීවූ
*ඔහොලා සහ ඇගේ සහෝදරීවූ
†ඔහොලීබාය. ඔව්හු මා සන්තකවී
පුත්‍රයන්ද දූවරුන්ද වැදුවෝය. ඔවුන්ගේ
නම් මෙසේය: සමාරිය වනාහි
ඔහොලාය. යෙරුසලම ඔහොලීබාය.
ඔහොලා මා සන්තකව සිටියදී වේශ්‍යා- 5
කම්කළාය: ඇගේ ප්‍රේමවන්තයන් වන
අසල්වාසීන්වූ අෂූර්වරුන් කෙරෙහි ඈ
ආලයවූවාය. ඔවුන් සියල්ලෝම නීල 6
වස්ත්‍ර ඇන්දවූ ආණ්ඩුකාරයෝ වන
මුලාදැනියෝව, ප්‍රිය වඩන යෞවනයෝව.
අශ්වයන් පිට නැඟී යන අසරුවෝව
සිටි තැනැත්තෝය. ඈද අෂූර්හි උත්තම 7
පුත්‍රයන්වූ ඔවුන් සියල්ලන් සමග වේශ්‍යා-
කම්කළාය. ඈ ආලයවූ සියල්ලන්ගේ
සියලු රූපවලින්ද අපවිත්‍රවූවාය. ඈ 8
මිසරයේදී පටන්ගත් ඇගේ වේශ්‍යාකම්
අත්හැරියේ නැත; මක්නිසාද ඇගේ
යෞවන වයසේදී ඔව්හු ඈ සමග
සයනයකළෝය. මොව්හුද ඇගේ කන්‍යා
වයසේ තනපුඩු මිරිකා ඔවුන්ගේ
වේශ්‍යාකම ඈ පිට වැගිරෙවූවෝය.
එබැවින් ඇගේ ප්‍රේමවන්තයන් වන, ඈ 9

*එනම්, ඇගේම කූඩාරම
†එනම්, ඈ තුළ මාගේ කූඩාරම.

ආලයවුණාවූ අෂූර්වරුන් අතට ඈ
10 පාවාදුනිමි. මොව්හු ඇගේ නග්නකම
ප්‍රකාශකොට, ඇගේ පුත්‍රයන්ද දූවරුන්ද
අරගෙන ගොස්, ඈ කඩුවෙන් මැරුවෝය.
ඈ වනාහි ස්ත්‍රීන්ට නින්ද පාඨයක්
වුණාය; මෙසේ ඔව්හු ඈ කෙරෙහි
11 විනිශ්චය ඉෂ්ටකළෝය. ඇගේ සහෝ-
දරීවූ ඔහොලීබා මෙය දුටු නුමුත් ඈට
වඩා ඇගේ ආලයෙන්ද ඇගේ සහෝ-
දරීගේ වේශ්‍යාකම්වලට වඩා ඇගේ
වේශ්‍යාකම්වලින්ද දුෂ්ටලෙස හැසු-
12 රුණාය. ඈ අසල්වාසීවූ අලංකාර වස්ත්‍ර
ඇන්දවූ ආණ්ඩුකාරයෝව මූලාදෑනියෝව
අශ්වයන් පිට නැගී යන අසරුවෝව
සිටි අෂූර්වරුන් කෙරෙහි ආලයවුණාය,
ඔවුන් සියල්ලෝම ප්‍රිය වඩන යෞවන-
13 යෝය. ඈ අපවිත්‍රව සිටින බව දුටුමි;
ඔවුන් දෙදෙනාටම තිබුණේ එක
14 මාර්ගයය. නුමුත් ඈ ඇගේ වේශ්‍යාකම්
වැඩිකරගත්තාය; ඈ මනුෂ්‍යයන්ගේ රූප
හිත්තියේ සිතියම්කර තිබෙනවා, එනම්
කල්දිවරුන්ගේ ස්වරූප සාදිලිංගම්වලින්
15 සිතියම්කර තිබෙනවා දුටුවාය. ඔවුන්ගේ
ඉඟටිවල ඉඟපටි බැඳ, පාට ඇති දිග
රෙදි ඔවුන්ගේ හිස්වල දමා තිබුණේය.
ඔවුන් සියල්ලෝම තමුන් උපන්
දේශයවූ කල්දියාවේ බබිලෝනිවරුන්ගේ
ස්වරූපයේ හැටියට පෙනීමෙන් වංශාධි-
16 පතියෝව සිටියෝය. ඇගේ ඇස්වලින්
ඈ දුටු විටම ඔවුන් කෙරෙහි ආලයවී
කල්දියාවේ සිටිය ඔවුන් ළඟට පණිවිඩ-
17 කාරයන් යැවුවාය. බබිලෝනිවරුද ඈ
වෙතට ආදර යහනට එළඹ, තමුන්ගේ
වේශ්‍යාකමෙන් ඈ අපවිත්‍රකළෝය, ඈ
ඔවුන් කරණකොටගෙන අපවිත්‍රවී, පසුව
ඇගේ සිත ඔවුන් කෙරෙන් පහව ගියේය.
18 ඈ මෙසේ ඇගේ වේශ්‍යාකම්ද නග්න
භාවයද ප්‍රකාශකළ විට, මාගේ සිත
ඇගේ සහෝදරී කෙරෙන් පහව
ගියාක්මෙන් ඈ කෙරෙන්ද පහව ගියේය.
19 එහෙත් ඈ මිසර දේශයේදී වේශ්‍යාකම්-
කළාවූ ඇගේ යෞවන වයසේ දවස්
සිහිකරමින් ඇගේ වේශ්‍යාකම් වැඩිකළාය.

කොටළුවන්ගේ මාංස මෙන් මාංසද 20
අසුන්ගේ වැගිරීම මෙන් වැගිරීමක්ද ඇති
ඔවුන්ගේ ප්‍රේමවන්තයන් කෙරෙහි ඈ
ආලයවූවාය. මෙසේ නුඹේ යෞවන 21
පියයුරු නිසා මිසරවරුන් නුඹේ තනපුඩු
මිරිකන කල හටගත් නුඹේ යෞවන
සල්ලාලකමට නුඹ හැරුණෙහිය.
එබැවින්, එම්බා ඔහොලීබා, ස්වාමිවූ 22
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
මෙන්න, නුඹේ සිතෙන් නුඹ පහකළාවූ
නුඹේ ප්‍රේමවන්තයන් මම නුඹට විරුද්ධව
පොළඹවා, වටකරින් ඔවුන් නුඹට
විරුද්ධව පමුණුවන්නෙමි. ඔවුන් නම් 23
බබිලෝනිවරු සහ සියලුම කල්දිවරුද
පෙකොඩ්ද ෂෝවාද කෝවාද ඔවුන්
සමග අෂූර්වරුද යන මොව්හුය. ඔවුන්
සියල්ලෝම ප්‍රිය වඩන යෞවනයෝය.
ආණ්ඩුකාරයෝත් මූලාදෑනියෝත්ය, ඔවුන්
සියල්ලෝම අධිපතියෝය, අසුන් පිට
නැගී යන්නාවූ කීර්තිමත් තැනැත්තෝය.
ඔවුන් නුඹට විරුද්ධව ආයුධ සහ රථද 24
ගැල්ද ජන සමූහයක්ද ඇතුව ඇවිත්,
පලිහ සහ කුඩා පලිහද යුද්ධ තොප්පියද
ඇතුව නුඹට විරුද්ධව වටකරින් සිටිනවා
ඇත. ඔවුන් තමුන්ගේ විනිශ්චයවල
හැටියට නුඹ විනිශ්චයකරන පිණිස
මම ඔවුන්ට විනිශ්චය භාරදෙන්නෙමි.
මාගේ කෝපය නුඹ කෙරෙහි තබමි, 25
ඔවුන්ද නුඹ සමග උදහසින් ක්‍රියාකොට,
නුඹේ නාසයද නුඹේ කන්ද කපා
දමනවා ඇත; නුඹේ ඉතිරි අයද කඩුවෙන්
වැටෙනවා ඇත. ඔවුන් නුඹේ පුත්‍රයන්ද
නුඹේ දූවරුන්ද අරගන යනවා ඇත;
නුඹේ ඉතිරි අයද ගින්නෙන් නාස්ති-
වන්නෝය. ඔවුන් නුඹේ වස්ත්‍ර නුඹෙන් 26
ගළවාගෙන, නුඹේ අලංකාර ආභරණත්
ගන්නවා ඇත. මෙසේ නුඹේ සල්ලාල- 27
කමද නුඹ මිසර දේශයේදී පටන්ගත්
නුඹේ වේශ්‍යාකමද නුඹෙන් නවත්-
වන්නෙමි. නුඹ ඔවුන් දෙස නුඹේ ඇස්
නොඔසවන්නෙහිය, මිසරය තවත් සිහි
නොකරන්නෙහිය. මක්නිසාද ස්වාමිවූ 28
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, නුඹ වෛරවෙන්නාවූ, නුඹේ

සිතෙන් තුඹ පහකළාවූ අයගේ අතට
29 තුඹ පාවාදෙමි. ඔවුන් වෛරයෙන් තුඹ
සමග ක්‍රියාකොට. තුඹේ වැඩේ ඵල
සියල්ල හැරගෙන, තුඹ නග්නකොට
හිස්කර යනවා ඇත. තුඹේ වේශ්‍යා-
කම්වල නග්නකමද තුඹේ සල්ලාලකමද
30 වේශ්‍යාකම්ද ප්‍රකාශවන්නේය. මේවා
තුඹට කරන්ට යෙදෙන්නේ තුඹ ජාතීන්
සමග වේශ්‍යාකම්කොට ඔවුන්ගේ රූප-
31 වලින් අපවිත්‍රවූ නිසාය. තුඹේ සහෝදරී-
ගේ මාර්ගයෙහි තුඹ ගිය බැවින් ඇගේ
32 කුසලාන තුඹේ අතට දෙමි. ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
ගැඹුරුව පළල්ව තිබෙන තුඹේ සහෝ-
දරීගේ කුසලානෙන් තුඹ බොන්නෙහිය.
ඒක තුඹ ගැන සිනාසීමටත් කවටකම්-
කිරීමටත් පුළුවන් පමණ පිරී තිබේ.
33 තුඹ මත්කමෙන්ද ශෝකයෙන්ද එනම්
මවිතකමෙන් පාළුකමෙන් කුසලාන වන
තුඹේ සහෝදරීවූ සමාරියේ කුසලානෙන්
34 පූර්ණවන්නෙහිය. තුඹ ඒවා බී උරා,
ඒකේ කැබිලිති හපා, තුඹේ තන උදුරා-
දමන්නෙහිය. මක්නිසාද මම ඒක
කීයෙමියි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
35 කියනසේක. එබැවින් තුඹ මා සිහිනැති-
කර තුඹේ පිටිපස්සට මා දැමූ නිසා
තුඹද තුඹේ සල්ලාලකම සහ තුඹේ
වේශ්‍යාකම් දරාපන්නැයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේකැයි කීය.
36 **ස්වාමීන්වහන්සේ** මට තවත් කථා-
කොට: මනුෂ්‍ය පුත්‍රය. තුඹ ඔහොලා
සහ ඔහොලීබා විනිශ්චයකරන්නෙහිද?
එසේ නම් ඔවුන්ගේ පිළිකුල්කම් ඔවුන්ට
37 දන්වාපන්න. මක්නිසාද ඔව්හු කාම-
මිථ්‍යාචාරයකළෝය, ලේ ඔවුන්ගේ
අත්වල තිබේ, තමුන්ගේ පිළිම සමග
ඔව්හු කාමමිථ්‍යාචාරයකළෝය: ඔව්හු
මා නිසා වැදූ පුත්‍රයන්ද ගින්නෙහි
38 විනාශවෙන්ට ඒවාට කැපකළෝය. ඔව්හු
තව දුරටත් මට මෙසේ කළෝය: එම
දවසේ ඔව්හු මාගේ ශුද්ධස්ථානය
අපවිත්‍රකොට. මාගේ සබත් කෙලෙසුවෝය.
39 ඔව්හු තමුන්ගේ පිළිමවලට තමුන්ගේ
පුත්‍රයන් මරා දුන්නායින් පසු මාගේ
ශුද්ධස්ථානය කෙලෙසන ලෙස එම
දවසේම ඊට ඇතුල්වූවෝය. එසේය, මාගේ
ගෘහය මැද ඔව්හු මෙසේ කළෝය. තවද 40
තුඹලා දුරස්තරයෙහි සිටින මනුෂ්‍යයන්ට
අඬගසා ඇරියහුය. ඔවුන් ළඟට
පණිවිඩකාරයෙක් අරිනලද්දේය. ඔව්හුද
ආවෝය; තුඹ ඔවුන් නිසා නාගන,
තුඹේ ඇස්වල අඳුන් ගා ආභරණ පැළඳ-
ගෙන, අලංකාර ඇඳක ඉඳගත්තෙහිය,
ඒක ඉදිරිපිට පිළියෙළකරනලද මේසයක් 41
උඩ තුඹ මාගේ සුවඳ ද්‍රව්‍යද මාගේ
තෙල්ද තැබුවෙහිය. එවිට පහසුගෙන 42
නොසැලකිලිකමින් සිටින සමූහයක හඬ
ඈ තුළ නැගුණේය. සාමාන්‍ය උදවිය-
ගෙන් මිනිසුන් හා සමග බේබද්දෝද
කාන්තාරයෙන් ගෙනෙනු ලැබුවෝය:
ඔව්හු ඒ අයගේ අත්වල වළලු දමා.
ඔවුන්ගේ ඉස් පිට අලංකාර ඔටුනු
තැබුවෝය. එවිට මම කාමමිථ්‍යාචාර- 43
කම්වලින් ක්ෂයවී සිටින ඈ වැනි
තැනැත්තියක් සමග ඔවුන් දැන් වේශ්‍යා-
කම් කරනවා ඇද්දැයි ඈ ගැන කීවෙමි.
එසේය, වේශ්‍යාවක් වෙතට මෙන් ඔව්හු 44
ඈ වෙතට පැමුණුණෝය. එසේ ඒ
සල්ලාල ස්ත්‍රීන්වූ ඔහොලා සහ
ඔහොලීබා වෙතට ඔව්හු පැමුණුණෝය.
එබැවින් කාමමිථ්‍යාචාරික ස්ත්‍රීන් 45
විනිශ්චයකරන ප්‍රකාරයටත් ලේ වගුරු-
වන ස්ත්‍රීන් විනිශ්චයකරන ප්‍රකාරයටත්
ධර්මිෂ්ඨ මනුෂ්‍යයෝ ඔවුන් විනිශ්චය-
කරන්නෝය. මක්නිසාද ඔව්හු කාම-
මිථ්‍යාචාරික ස්ත්‍රියෝය, ලේ ඔවුන්ගේ
අත්වල ඇත්තේය. එසේය. ස්වාමිවූ 46
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
මම ඔවුන්ට විරුද්ධව සමූදවක් පමුණුවා.
පීඩාවිඳීමටත් කොල්ලකනු ලැබීමටත්
ඔවුන් පාවාදෙන්නෙමි. ඒ සමූදව ඔවුන්ට 47
ගල්ගසා, තමුන්ගේ කඩුවලින් ඔවුන්
කපාදමා. ඔවුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද
මරාදමා. ඔවුන්ගේ ගෙවල් ගින්නෙන්
දවාදමන්නෝය. මෙසේ සල්ලාලකම 48
දේශයෙන් පහකරන්නෙමි, සියලු ස්ත්‍රීන්ද

දැනමුතුවී, නුඹලාගේ සල්ලාලකමේ
49 හැටියට නොකර සිටිනවා ඇත. ඔවුන්
නුඹලාගේ සල්ලාලකමේ එල නුඹලා
පිටට පමුණුවනවා ඇත, නුඹලාගේ පිළි-
මවල පාපද නුඹලා දරා, මා ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** බව දැනගන්නවා
ඇතැයි කීසේක.

## අපවිත්‍රකමින් පිරුණු හැළියේ උපමාව

**24** නවවෙනි අවුරුද්දේ දසවෙනි
මාසයේ දසවෙනිද **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනය මා වෙතට පැමිණ
2 කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, දවසේ, එනම්
මේ අද දවසේම නම ලියාගනින්න.
බබිලෝනියේ රජ මේ අද දවසේදීම
3 යෙරුසලමට ළංවී සිටියේය. කැරළිකාර
වංශයට උපමාවක් කියමින්: ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේකැයි
ඔවුන්ට කියාපන්න—හැළිය ලිපේ
තබාපන්න; ඒක තබා වතුරත් එහි
4 වත්කරපන්න. ඊට අයිති කැලි වන සියලු
හොඳ කැලි පස්සා ගාතයද ඉස්සරහ
ගාතයද ඇතුව එහි එකතුකර, ඉතා
හොඳ ඇට ඇති ඒවායෙන් පුරවාපන්න.
5 එළු බැටළු රැළෙන් හොඳ එවුන් ගනින්න,
ඒක යට ඇට ගොඩක් තබාපන්න. ඒක
හොඳට උතුරවා, එහි තුළ තිබෙන ඇටත්
තම්බාපල්ලා.
6 එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: ලේ වගුරුවන
නුවරට දුක්වේ! ඒක මලකඩ ඇති
හැළියක්ය, ඒකේ මලකඩ ඒකෙන් ඇරීලා
නැත; ඒකේ සෑම කැලි පිටින්ම එය ඇර
දමාපන්න. ඊට කිසි පසඇටයක් වැටුණේ
7 නැත. මක්නිසාද ඇගේ ලේ ඈ ඇතුළෙහි
ඇත්තේය; ඈ ඒවා පස්වලින් වැසීයන්ට
පොළොව පිට වගුරුවන්නේ නැතුව පස්
8 නැති පර්වතය උඩ තැබුවාය. ඇගේ ලේ
වැසී නොයන හැටියට, පළිගන්න පිණිස
කෝපය ඇවිස්සවීමට, මම ඒවා පස්
9 නැති පර්වතය උඩ තැබීමි. එබැවින්
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ කියන-
සේක: ලේ වගුරුවන නුවරට දුක්වේ!
මමත් දර සෑය මහත්කරන්නෙමි.
බොහෝ දර දමා, ගින්දර අවුළුවා, 10
මස් තම්බාදමා, කලවමක් කර, ඇටත්
පුලුස්සා දමාපන්න. එවිට ඒකේ පිත්තල 11
රත්වී ගිනියම්වී, ඒකේ අපවිත්‍රකම ඒක
ඇතුළෙහි උණුවී, ඒකේ මලකඩ නැතිවී
යන පිණිස, ඒක ගිනිඅඟුරු පිට හිස්ව
තබාපන්න. ඈ වීර්යකිරීමෙන් වෙහෙසුණු 12
නුමුත්, ඇගේ බොහෝ මලකඩ ඇගෙන්
පහව නොයයි; ඇගේ මලකඩ ගින්නෙන්
පවා පහව නොයයි. නුඹේ අපවිත්‍රකම 13
දූෂිතය. මක්නිසාද මා විසින් නුඹ
පිරිසිදුකරමින් සිටි නුමුත් නුඹේ අපවිත්‍ර-
කමෙන් නුඹ පිරිසිදුවුණේ නැත; මාගේ
කෝපය නුඹ කෙරෙහි සංසිඳුවා ගන්න
තුරු නුඹ නවත් පිරිසිදුකරනු නො-
ලබන්නෙහිය. **ස්වාමීන්වහන්සේ** වන මම 14
ඒක කීයෙමි. ඒක සිදුවන්නේය, මම ඒක
කරන්නෙමි; මා පසුබටවෙන්නේවත්
දයාවෙන්නේවත් තැවෙන්නේවත් නැත;
නුඹේ මාර්ගවලද ක්‍රියාවලද හැටියට
ඔව්හු නුඹ විනිශ්චයකරන්නෝයයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේකැයි
කීය.

## එසකියෙල්ගේ ශෝකය සහ ලකුණක් වශයෙන් මහු නිශ්ශබ්දවීම

**ස්වාමීන්වහන්සේගේ** වචනය මා වෙතට 15
පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, මෙන්න, 16
නුඹේ ඇස්වලට ප්‍රියවූ දේ එක පහරකින්
නුඹෙන් ගනිමි. එහෙත් නුඹ විලාප
නොකිය යුතුය, නොහැඬිය යුතුය, නුඹේ
කඳුළුත් නොවැගිරිය යුතුය. නිශ්ශබ්දව 17
සුසුම්ලා, මළවුන් ගැන වැලපීමක්
නොකර, නුඹේ තොප්පිය හිසේ බැඳගන;
නුඹේ වහන් පාදවල දමාගනින්න, තොල්
වසා නොගෙන, මිනිසුන්ගේ රොටිද
නොකා සිටපන්නැයි කීය. එබැවින් මම 18
උදයේ සෙනඟට කථාකෙළෙමි; සවස
මාගේ භාර්යාව මළාය. මට අණකළ
ලෙස උදයේදී කෙළෙමි. සෙනඟද: නුඹ 19
කරන මේ දේ අපට අදාළවෙන හැටි
නුඹ අපට නොකියන්නෙහිදැයි මාගෙන්
ඇසුවෝය. එවිට මම ඔවුන්ට කථාකොට: 20
**ස්වාමීන්වහන්සේගේ** වචනය මා වෙතට

පැමිණ මෙසේ කීයේය—ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේකැයි
21 ඉශ්‍රායෙල් වංශයට කියාපන්න. බලව,
මම තුඹලාගේ බලයේ පාරට්ටුවවූ,
තුඹලාගේ ඇස්වලට ප්‍රියව තිබෙන්නාවූ,
තුඹලාගේ ආත්ම ආශාවෙන්නාවූ මාගේ
ශුද්ධස්ථානය කෙලහන්නෙමි; තුඹලා
විසින් අත්හැර ආවාවූ තුඹලාගේ
පුත්‍රයෝද තුඹලාගේ දූවරුද කඩුවෙන්
22 වැටෙන්නෝය. මා කළාක්මෙන් තුඹලාත්
කරනවා ඇත. තුඹලා තොල්වසා
නොගෙන, මිනිසුන්ගේ රොටිද නොකා
23 සිටිනවා ඇත. තුඹලාගේ තොප්පි
තුඹලාගේ හිස්වලද තුඹලාගේ වහන්
තුඹලාගේ පාදවලද වන්නේය. තුඹලා
විලාප කියන්නේවත් අඬන්නේවත් නැත;
තුඹලාගේ අයුතුකම්වලින් තුඹලා ක්ෂයවී
ගොස්, එකිනෙකා දෙස බලා සුසුම්-
24 ලනවා ඇත. මෙසේ එසකියෙල් තුඹලාට
සලකුණක් වන්නේය; ඔහු කළ සියල්ල
ලෙස තුඹලා කරනවා ඇත. මේක පැමිණි
කල මා ස්වාමිවූ **දෙවියන්වහන්සේ** බව
තුඹලා දැනගන්නවා ඇත.
25 ඉතින් මනුෂ්‍ය පුත්‍රය, ඔවුන්ගේ බලයද
ඔවුන්ගේ තේජසේ ප්‍රීතියද ඔවුන්ගේ
ඇස්වලට ප්‍රියව තිබෙන්නාවූ, ඔවුන්ගේ
ආත්ම ආශාවෙන්නාවූ දේද ඔවුන්ගේ
පුත්‍රයන්ද දූවරුන්ද මා විසින් ඔවුන්ගෙන්
26 පැහැරගන්න දවසේදී, මිදෙන තැනැත්තා
ඒ බව තුඹේ කන්වලට දන්වන පිණිස
27 තුඹ ළඟට එනවා නොවේද? ඒ දවසේදී
තුඹේ මුඛය මිදෙන තැනැත්තා කෙරෙහි
ඇරී, තුඹ තවත් ගොළුව නොසිට කථා-
කරන්නෙහිය. මෙසේ තුඹ ඔවුන්ට
සලකුණක් වන්නෙහිය; ඔවුන් මා
**ස්වාමීන්වහන්සේ** බව දැනගන්නවා
ඇතැයි කීය.

## අම්මොන්, මෝවබ්, ඒදෝම්, පිලිස්තිය යන මේ ජාතීන්ට විරුද්ධ අනාගතවාක්‍ය

25 ස්වාමීන්වහන්සේගේ වචනය මා
2 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, තුඹේ මුහුණ අම්මොන් පුත්‍රයන්
දෙසට හරවාගෙන, ඔවුන්ට විරුද්ධව
අනාගතවාක්‍ය කියමින්, මෙසේ කියා-
පන්න. ස්වාමිවූ **දෙවියන්වහන්සේගේ** 3
වචනය අසාපල්ලා; ස්වාමිවූ **දෙවියන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: මාගේ
ශුද්ධස්ථානය කෙලෙසුණු නිසා ඊට
විරුද්ධවද ඉශ්‍රායෙල් රට පාළුවී තිබෙන
නිසා ඊට විරුද්ධවද යූද වංශය වාල්-
කමට ගිය නිසා ඔවුන්ට විරුද්ධවද තුඹ
ඔහෝයයි කී බැවින්, මම නැගෙනහිර 4
දිශාවේ වැසියන්ට උරුමයක් කොට
තුඹ පාවාදෙන්නෙමි, ඔවුන් තුඹ තුළ
තමුන්ගේ කඳවුරු බැඳ, තමුන්ගේ
වාසස්ථාන තුඹ තුළ පිහිටුවාගන්නවා
ඇත; ඔවුන් තුඹේ ඵල කා, තුඹේ කිරි
බොනවා ඇත. රබ්බා ඔටුවන්ට තෘණ- 5
බිමක්ද අම්මොන් පුත්‍රයන්ගේ රට
බැටළුවන් ලගින ඉඩමක්ද කරන්නෙමි.
මෙසේ මා **ස්වාමීන්වහන්සේ** බව තුඹලා
දැනගන්නහුය. මක්නිසාද ස්වාමිවූ 6
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
තුඹ අත්පොළසන් දී, අඩිහපා, තුඹේ
මුළු උඩඟුකමින් ඉශ්‍රායෙල් දේශයට
විරුද්ධව සිතෙන් ප්‍රීතිවූ බැවින්, මාගේ 7
අත තුඹට විරුද්ධව දිගුකර, ජාතීන්ට
කොල්ලයක් කොට තුඹ පාවාදී, ජනයන්
අතරෙන් තුඹ සිඳදමා, දේශවලින් තුඹ
නැතිකොට විනාශකරන්නෙමි; තුඹ මා
**ස්වාමීන්වහන්සේ** බව දැනගන්නෙහිය.
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ 8
කියනසේක: යූද වංශය සියලු ජාතීන්
වාගේයයි මෝවබ් සහ සේයිර්ද කියන
නිසා, මෙන්න, මම මෝවබ්ගේ පැත්ත 9
ඔහුගේ සියලු නුවරවල සිට, එනම්
දේශයේ අලංකාරකම වන බෙත්-
යෙෂිමොත්ද බාල්-මෙයොන්ද පටන්
කිරියාතයිම් දක්වා, අම්මොන් පුත්‍රයන්ගේ 10
රටත් සමග නැගෙනහිර දිශාවේ
වැසියන්ට ඇරදී, ඒක උරුමයක් කොට
දෙන්නෙමි. මෙසේ කරන්නේ ජාතීන්
අතරෙහි අම්මොන් පුත්‍රයන් ගැන සිහි
නොවන පිණිසය. මම මෝවබ් කෙරෙහි 11
විනිශ්චයවල් ඉෂ්ටකරන්නෙමි; මෙසේ
මා **ස්වාමීන්වහන්සේ** බව ඔව්හු දැන-
ගන්නෝය.

12 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක: ඒදෝම් යුද්ධ වංශයෙන්
පළිගන්න ලෙස ක්‍රියාකොට බොහෝ
සෙයින් වරදකාරයන් වූ නිසාත්
13 ඔවුන්ගෙන් පළිගත් නිසාත්, ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
මම ඒදෝමට විරුද්ධව මාගේ අත දිගු
කොට, එතනින් මනුෂ්‍යයන්ද මෘගයන්ද
සිඳදමා, තේමාන් පටන් දෙදන් දක්වා
ඒක පාළුවක් කරන්නෙමි; ඔවුන් කඩුවෙන්
14 වැටෙනවා ඇත. මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල් ලවා ඒදෝම් පිටට මාගේ
පළිගැනීම පමුණුවන්නෙමි; ඔවුන් මාගේ
උදහසේද මාගේ කෝපයේද ප්‍රකාරයට
ඒදෝමට කරනවා ඇත. ඔවුන් මාගේ
පළිගැනීම දැනගන්නවා ඇතැයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක.
15 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක: පිලිස්තිවරුන් පළිගන්න
ලෙස ක්‍රියාකොට, පුරාණ සතුරුකමින්
විනාශකිරීමට සිතේ උඩඟුකමින් පළි-
16 ගත් බැවින්, මාගේ අත පිලිස්තිවරුන්ට
විරුද්ධව දිගුකොට, කෙරෙතිවරුන් සිඳ-
දමා, මුහුදුබඩ ඉතිරිව සිටින්නන් නැති-
17 කරන්නෙමි. කෝප සහිත තර්ජනවලින්
ඔවුන්ගෙන් බොහෝසෙයින් පළිගන්-
නෙමි; එසේ ඔවුන්ගෙන් පළිගන්න කල
මා **ස්වාමීන්වහන්සේ** බව ඔව්හු දැන-
ගන්නෝයයි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
කියනසේකැයි කීය.

## තීර්හි විනාශය ගැන අනාගත කීම්

26 එකොළොස්වෙනි අවුරුද්දේ
මාසයේ පළමුවෙනි දවසේදී
**ස්වාමීන්වහන්සේගේ** වචනය මා වෙතට
2 පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, තීර්
යෙරුසලමට විරුද්ධව කථාකොට—ඔහෝ,
ජනයන්ගේ දෙරටුව වන ඈ කඩා දමනු
ලැබුවාය; *එය මා දෙසට ඇරී තිබෙයි.
ඈ පාළුකරනු ලැබ සිටින නිසා
මට පූර්ණකම ඇතිවන්නේයයි කී
3 බැවින්, ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ

*හෙවත්, වෙළඳම් අවස්ථාව මා වෙතට හැරුණාය.

කියනසේක: ඊම්බා තීර්, මම නුඹට
විරුද්ධව සිටිමි, මුහුදේ රළ නැඟී
එන්නාක්මෙන් බොහෝ ජාතීන් නුඹට
විරුද්ධව පමුණුවන්නෙමි. ඔව්හු තීර්හි 4
පවුරු නාස්තිකොට එහි කොත් බිඳ-
දමන්නෝය. මම එහි ධූලි එතනින්
අතුගාදමා එය මුඩු පර්වතයක් කරන්-
නෙමි. එය මුහුද මැද දැල් අතුරන 5
ස්ථානයක් වන්නේය; මක්නිසාද මමම
ඒක කීයෙමියි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
කියනසේක. එය ජාතීන්ට කොල්ලයක්
වන්නේය. කෙතේ සිටින ඇගේ දූවරු 6
කඩුවෙන් මැරුම්කන්නෝය. මෙසේ මා
**ස්වාමීන්වහන්සේ** බව *ඔවුන් දැන-
ගන්නවා ඇත. මක්නිසාද ස්වාමිවූ 7
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
මෙන්න, මම රජවරුන්ගේ රජ වන
බබිලෝනියේ රජවූ නෙබුකද්රෙශර් අසුන්
සහ රථද අසරුවන් සහ සමූහයක්ද
බොහෝ සෙනඟද ඇතුව උතුරෙන් තීර්ට
විරුද්ධව පමුණුවන්නෙමි. කෙතේ සිටින 8
නුඹේ දූවරුන් ඔහු කඩුවෙන් මරා, නුඹට
විරුද්ධව කොටු බැඳ, නුඹට විරුද්ධව
ගොඩැල්ලක් සාදා, නුඹට විරුද්ධව පලිහ
ඔසවනවා ඇත. නුඹේ පවුරුවලට 9
විරුද්ධව තමාගේ යුද්ධ යන්ත්‍ර තබා,
තමාගේ පොරෝවලින් නුඹේ කොත්
කඩාදමනවා ඇත. ඔහුගේ අශ්වයන්ගේ 10
වැඩිකම නිසා උන්ගේ දූවිල්ලට නුඹ
වැසීයනවා ඇත. කපල්ලක් කර තිබෙන
නුවරකට මිනිසුන් ඇතුල්වෙන්නාක්මෙන්
ඔහු නුඹේ දෙරටුවලින් ඇතුල්වෙන කල,
අසරුවන්ගෙත් ගැල්වලත් රථවලත්
ශබ්දයට පවුරු සෙලවෙන්නේය. ඔහු 11
තමාගේ අශ්වයන්ගේ කුරවලින් නුඹේ
වීථි පාගා, නුඹේ සෙනඟ කඩුවෙන්
මරනවා ඇත, නුඹේ බලවත් කුළුනුද
බිමට වැටෙනවා ඇත. ඔවුන් නුඹේ වස්තු 12
කොල්ලකා, නුඹේ වෙළෙඳම් බඩු උදුරා-
ගන්නවා ඇත. නුඹේ පවුරු බිඳදමා,
නුඹේ ප්‍රිය ගෙවල් හෙළාදමා, නුඹේ ගල්ද
ලීද පස්ද ජල මැදට දමනවා ඇත. නුඹේ 13
ගීතිකාවල ඝෝෂාව නවත්වන්නෙමි;
නුඹේ වීණාවල ශබ්දයද නවත්

*එනම්, මිනිස්සු.

14 තොඇසෙන්නේය. මම තුඹ මුඩු
පර්වතයක් කරන්නෙමි. තුඹ වනාහි දැල්
ඇතිරීම පිණිස ස්ථානයක් වන්නෙහිය;
තුඹ තවත් ගොඩනගනු නොලබන්නෙහිය.
මක්නිසාද ස්වාමීන්වහන්සේ වන මම
ඒක කීයෙමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක.
15 ස්වාමිවූ දෙවියන්වහන්සේ තීර්ට මෙසේ
කියනසේක: තුඹේ වැටීමේ ශබ්දයටත්
තුඹ තුළෙහි තුවාලවූවන්ගේ කෙඳිරි-
ගෑමටත් මිනිසුන් මරා දැමීමටත්
16 ද්වීපයෝ නොසෙල්වන්නෝද? එකල
මුහුදේ සියලුම අධිපතීහුද තමුන්ගේ
සිංහාසනවලින් බැස, තමුන්ගේ සළු
අහක තබා, තමුන්ගේ විසිතුරු වස්ත්‍ර
ගළවාදමා, වෙව්ලුම් [නැමති වස්ත්‍ර]
ඇඳ බිම හිඳගෙන, මොහොතින් මො-
හොත වෙව්ලමින්, තුඹ ගැන විස්මපත්
17 වන්නෝය. ඔව්හු තුඹ ගැන විලාපයක්
කියමින්: මුහුදේ යාත්‍රාකරන්නන් විසූවාවූ
ප්‍රශංසා ලැබූ නුවරව, මුහුදෙහි බලවත්ව
සිටියාවූ තුඹ විනාශවූ හැටි! ඈ සහ
එහි වැසියෝ තමුන්ගේ භයානකකම
එහි විසූ සියල්ලන් කෙරෙහි තැබුවෝය.
18 දැන් ද්වීපයෝ තුඹේ වැටීමේ දවසේදී
වෙව්ලන්නෝය; එසේය, මුහුදේ පිහිටි
ද්වීපයෝ තුඹේ තුරන්වීමට තැතිගන්නෝ-
19 යයි තුඹ ගැන කියනවා ඇත. මක්නිසාද
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක: වැසියන් නැති නුවරවල්
මෙන් මා විසින් තුඹ පාළු නුවරක් කර,
මහත් ජලවලින් තුඹ වැසී යන ලෙස
20 ගැඹුර තුඹ පිටට පමුණුවන කල, මිනී-
වළට බැස්ස පුරාණ සෙනග ළඟට
බසින්ට මම තුඹට සලස්වන්නෙමි, තුඹ
තුළ වැසියන් නොසිටින පිණිසද ජීවත්ව
සිටින්නන්ගේ දේශයෙහි මා විසින්
මහිමය තබන පිණිසද මිනීවළට බසින
අය සමග පොළොවේ පහත් තැන්වල
එනම් පුරාතන සිට පාළුවූ තැන්හි තුඹ
21 වාසයකරවන්නෙමි. මම තුඹ භීතියක්
කරන්නෙමි, තුඹ තවත් නොසිටින්නෙහිය.
තුඹව සොයා ආවත් කිසි කලක තුඹ
සම්බවෙන්නේ නැතැයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේකැයි කීය.

## තීර් වැටීම ගැන විලාපය

27 ස්වාමීන්වහන්සේගේ වචනය
නැවත මා වෙතට පැමිණ
කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, තුඹ තීර් ගැන 2
විලාපයක් පවත්වමින්, තීර්ට මෙසේ 3
කියාපන්න: මුහුදට ඇතුල්වෙන තැන්හි
වාසයකරන්නාවූ, ජනයන්ගේ වෙළෙන්-
දියක්ව බොහෝ ද්වීපවලට යන්නාවූ
තැනැත්තිය, ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක: එම්බා තීර්—මම
අලංකාරකමෙන් සම්පූර්ණව සිටිමියි තුඹ
කීයෙහිය. තුඹේ පළාත් මුහුදු මැද 4
ඇත්තේය, තුඹව සෑදූ අය තුඹේ
අලංකාරකම සම්පූර්ණකර තිබේ. ඔව්හු 5
තුඹේ තට්පු සියල්ල සෙනීර්හි දේවදර
ලීවලින් සෑදුවෝය. තුඹට කුඹගසක්
සාදන්ට ඔව්හු ලෙබනොන්හි කිහිරි ගස්
ගත්තෝය. බාෂාන්හි අලෝන ලීවලින් 6
තුඹේ හබල් සෑදුවෝය; තුඹේ ආසන
කිත්තිවරුන්ගේ ද්වීපවලින් ගෙනා තසූර්
ලීවලින් සාද ඇත්දත් ගිල්ලෙවුවෝය.
තුඹට කොඩියක් කොට තුඹ විහිදෙවුවේ 7
මිසරයේ විසිතුරු සිහින් රෙදිය; තුඹේ
වියන එලීෂා නම් ද්වීපවලින් ගෙනා
නිල් සහ රත්නිල් රෙදිය. ශීදෝන්හි සහ 8
අර්වද්හි වැසියෝ තුඹේ හබල්කාරයෝව
සිටියෝය. එම්බා තීර්, තුඹ තුළ සිටි
තුඹේ ප්‍රඥවන්තයෝම තුඹේ නාවිකයෝව
සිටියෝය. ගෙබල්හි වැඩිමහල්ලෝද එහි 9
ප්‍රඥවන්තයෝද තුඹ තුළ තුඹේ කැඩුම්
හරිගස්සන්නෝව සිටියෝය. තුඹේ
වෙළඳාමේ යෙදී සිටීමට මුහුදේ සියලු
නැව්ද ඒවා යාත්‍රාකරන්නෝද තුඹ තුළ
සිටියෝය. පාර්සිවරුද ලූද්වරුද පූට්- 10
වරුද තුඹේ සේනාවෙහි සිටියෝය; ඔව්හු
තුඹේ යුද්ධකාරයෝය. ඔව්හු පලිස්ද
යුද්ධ තොප්පිද තුඹ තුළ එල්ලා, තුඹේ
ශෝභනකම දක්වාලූවෝය. අර්වද්හි 11
පුත්‍රයෝද තුඹේ සේනාවද තුඹේ පවුරු
පිට වටේට සිටියෝය, ගම්මද්හි
මනුෂ්‍යයෝ තුඹේ කොත්වල සිටියෝය.
ඔව්හු තමුන්ගේ පලිස් තුඹේ පවුරුවල
වටේට එල්ලා තැබුවෝය; ඔව්හු තුඹේ
රූව සම්පූර්ණකළෝය. සියලු සම්පත්වල 12

අධිකකම නිසා තර්ෂීෂ් නුඹේ වෙළෙන්-
දෙක්ව සිටියාය; ඔව්හු රිදීවලින්ද
යකඩවලින්ද බෙලෙක්වලින්ද ඊයම්වලින්ද
13 නුඹ සමග ගනුදෙනුකළෝය. යාවාන්ද
තුබල්ද මෙෂෙක්ද නුඹේ වෙළෙන්දෝව
සිට නුඹ සමග මනුෂ්‍ය ප්‍රාණද පිත්තල
14 බඩුද වෙළඳම්කළෝය. තොගර්මා
වංශයේ අය නුඹ සමග අශ්වයන්ද
සෙන්ධවයන්ද අශ්වතරයන්ද වෙළඳම්-
15 කළෝය. දෙදන්හි මනුෂ්‍යයෝ නුඹේ
වෙළෙන්දෝව සිටියෝය. බොහෝ
ද්වීපයෝ නුඹ යටතේ වෙළඳම්කළෝය;
ඔව්හු ඇතුන්ගේ දළ සහ කළුවර ලී
හුවමාරුවට නුඹ කරා ගෙනාවෝය.
16 නුඹේ බොහෝ කර්මාන්ත නිසා සිරිය
නුඹේ වෙළෙන්දෙක්ව සිටියාය. ඔව්හු
රතුකැටවලින්ද රත්නිල් රෙදිවලින්ද
විසිතුරු රෙදිවලින්ද සිහින් රෙදි-
වලින්ද පබළුවලින්ද ලෝහිතාංකවලින්ද
17 නුඹ සමග ගනුදෙනුකළෝය. යූදවරුද
ඉශ්‍රායෙල් දේශයේ මනුෂ්‍යයෝද නුඹේ
වෙළෙන්දෝව සිට නුඹ සමග මින්නිත්හි
තිරිඟු, පන්නග්, මීපැණි, තෙල්, ගුගුල්
18 යන මේවායින් ගනුදෙනුකළෝය. නුඹේ
බොහෝ කර්මාන්ත නිසාත් නුඹේ සියලු
සම්පත්වල අධිකකම නිසාත් දමස්කය
නුඹ සමග හෙල්බොන්හි මුද්‍රිකපානයද
19 සුදු ලොම්ද වෙළඳම් කළාය. වෙදන්ද
යාවාන්ද නුඹ සමග නූල් ගනුදෙනු-
කළෝය. තළාපු යකඩ සහ ගන්ධරසද
දඬුද නුඹේ වෙළඳම් බඩු අතරේ තිබු-
20 ණේය. පොරෝන්දු පිණිස අගේ ඇති
ඇතිරිලි ගැන දෙදන් නුඹේ වෙළෙන්දව
21 සිටියාය. අරාබිය සහ කේදර්හි සියලු
අධිපතීහු නුඹ යටතේ වෙළෙන්දෝව සිට
නුඹ සමග බැටළුපැටවුන්ද බැටළුවන්ද
22 එළුවන්ද වෙළඳම්කළෝය. ෂෙබා සහ
රාමාහි වෙළෙන්දෝ නුඹේ වෙළෙන්-
දෝව සිට නුඹ සමග සියලු ආකාර
උතුම් සුවඳ ද්‍රව්‍යද සියලු ආකාර අනර්ඝ
23 ගල්ද රන්ද ගනුදෙනුකළෝය. හාරාන්-
හිද කන්නෙහිද ඒදෙන්හිද මනුෂ්‍යයෝ
වන ෂෙබාහිත් අෂූර්හිත් කිල්මද්හිත්
වෙළෙන්දෝ නුඹේ වෙළෙන්දෝව සිටි-
24 යෝය. ඔව්හු නුඹ සමග ඉතා අලංකාර
වස්ත්‍රද නිල් සහ විසිතුරු සළුද
නොයෙක් පාට ඇති වස්ත්‍ර පිරෙවුවාවූ,
ලනුවලින් බැන්දවූ කිහිරි ලී පෙට්ටිද
නුඹේ වෙළඳම්පළෙහි වෙළඳම්කළෝය.
නුඹේ වෙළඳම් බඩු ගෙනගියේ තර්ෂීෂ්හි 25
නැව්වලින්ය. නුඹ පිරී, මුහුද මැද ඉතා
කීර්තිමත්ව සිටියෙහිය. නුඹේ හබල්- 26
කාරයෝ නුඹ මහත් ජලවලට පැමි-
ණෙවුවෝය. පෙරදිග සුළඟින් මුහුද මැදදී
නුඹ බිඳුණාය. නුඹේ සම්පත්ද නුඹේ 27
බඩුද නුඹේ වෙළඳම්ද නුඹේ යාත්‍රා-
කාරයෝද නුඹේ නාවිකයෝද නුඹේ
කැඩුම් හරිගස්සන්නෝද නුඹේ වෙළඳමේ
යෙදී සිටින්නෝද නුඹ තුළ සිටින නුඹේ
සියලු යුද්ධකාරයෝද නුඹ ඇතුළෙහි
සිටින නුඹේ මුළු සමූහයා සමග නුඹේ
වැටීමේ දවසේදී මුහුද මැද වැටෙන්නෝය.
නුඹේ නාවිකයන්ගේ කෑගැසීමේ ශබ්දයට 28
අසල ස්ථාන සෙලවෙන්නේය. හබල 29
අල්ලන සියල්ලෝද යාත්‍රාකාරයෝද
මුහුදේ සියලුම නාවිකයෝද තමුන්ගේ
නැව්වලින් බැස ගොඩ සිටගෙන, නුඹ 30
ගැන තමුන්ගේ හඬ පවත්වා, ශෝකයෙන්
මොරගසා, තමුන්ගේ හිස් පිට ධූලි
හෙළාගෙන, අළුවල පෙරළී සිටින්නෝය.
ඔව්හු නුඹ නිසා හිස් මුඩුකර, ගෝණි 31
රෙදි ඇඳගෙන, ආත්මයේ ශෝකයෙන්
තද විලාපයක් ඇතුව නුඹ ගැන
අඬන්නෝය. ඔවුන්ගේ ළතෝනියේදී 32
ඔවුන් නුඹ ගැන විලාපයක් පවත්වා,
නුඹ ගැන මෙසේ විලාප කියනවා ඇත:
මුහුද මැදදී නිශ්ශබ්දභාවයට පත්වූ තීර්ට
සමාන කවුද? නුඹේ බඩු මුහුදුවලින් 33
පිටත්ව ගිය කල නුඹ බොහෝ ජනයන්
තෘප්තියට පැමිණෙවුවෙහිය; නුඹේ
සම්පත්වලද වෙළඳම්වලද අධිකකමින්
නුඹ පොළොවේ රජුන් පොහොසත්-
කෙළෙහිය. දැන් නුඹ ගැඹුරු ජලවලදී 34
මුහුදුවලින් බිඳුණු බැවින් නුඹේ වෙළඳමද
නුඹ ඇතුළෙහි සිටි නුඹේ මුළු සමූහයාද
වැටුණෝය. ද්වීපවල සියලුම වැසියෝ 35
නුඹ ගැන විස්මපත්වෙති, ඔවුන්ගේ
රජවරුද අතිශයින් භයව කැලඹුණු
මුහුණු ඇතිව සිටිති. ජනයන් අතරේ 36
සිටින වෙළෙන්දෝ නුඹට කවටකම්කරති;
නුඹ භීතියක් වී තිබේ, තවත් කිසි කලක
නුඹ නොසිටින්නෙහියයි කීය.

## තීර්හි රජුගේ වැටීම

28 ස්වාමීන්වහන්සේගේ වචනය
නැවත මා වෙතට පැමිණ කියනු-
2 යේ: මනුෂ්‍ය පුත්‍රය, ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේකැයි තීර්හි
අධිපතියාට කියාපන්න: තුඹ දෙවි-
කෙනෙක් නොව මනුෂ්‍යයෙක් තුමුත්
තුඹේ සිත උඩඟුවී—මම දෙවිකෙනෙක්මි;
මුහුද මැද මම දෙවිකෙනෙකුගේ ආසනයේ
වැඩහිඳිමියි තුඹ කියමින්, තුඹේ සිත
දෙවිකෙනෙකුගේ සිත මෙන් සැලකූ-
3 වෙහිය. ඔන්න, තුඹ දනියෙල්ට වඩා
ප්‍රඥාවන්තය; තුඹෙන් කිසි රහසක් සඟ-
4 වන්ට බැරිය. තුඹේ ප්‍රඥාවෙන්ද තුඹේ
නුවණින්ද තුඹ සම්පත් උපදවාගෙන,
රන්ද රිදීද ලබා තුඹේ ගබඩාවල තබා-
5 ගත්තෙහිය. තුඹේ ප්‍රඥාවේ මහත්කමින්
තුඹේ වෙළඳාම කරණකොටගෙන තුඹේ
සම්පත් තුඹ වැඩිකරගෙන සිටින බැවින්,
තුඹේ සම්පත්වලින් තුඹේ සිත උඩඟු-
6 වී තිබේ. එබැවින් ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේක: තුඹේ සිත
දෙවිකෙනෙකුගේ සිත මෙන් තුඹ සලකන
7 බැවින්, බලව, මම ජාතීන් අතරෙන්
ඉතා භයානක විදේශීන් තුඹට විරුද්ධව
පමුණුවන්නෙමි. ඔව්හු තුඹේ ප්‍රඥාවේ
ලක්ෂණකමට විරුද්ධව තමුන්ගේ කඩු
ඇද, තුඹේ දීප්තිය කිලුටුකරන්නෝය.
8 ඔව්හු තුඹ මිනීවළට පමුණුවන්නෝය;
මැරුම්කන අය විඳින මරණවලින් තුඹ
9 මුහුද මැදදී මැරෙනවා ඇත. තුඹ
දෙවිකෙනෙක් නොව තුඹට තුවාල-
කරන්නාගේ අතේ මනුෂ්‍යයෙක්ව සිටින
තුමුත්—මම දෙවිකෙනෙක්යයි තුඹව
මරාදමන්නා ඉදිරියෙහි ඇත්තටම තුඹ
10 කියන්නෙහිද? අචර්මඡේදිතයන් විඳින
මරණවලින් තුඹ විදේශීන් අතින් මැරුම්-
කන්නෙහිය. මක්නිසාද මම එසේ
කීයෙමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේකැයි කීය.
11 තවද ස්වාමීන්වහන්සේගේ වචනය මා
12 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය,
තීර්හි රජු ගැන විලාපයක් පවත්වමින්—
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේකැයි ඔහුට කියාපන්න. තුඹ
සම්පූර්ණකම මුද්‍රාකරන්නාව ප්‍රඥාවෙන්
පිරී, අලංකාරකමෙන් සම්පූර්ණව සිටි-
නෙහිය. තුඹ දෙවියන්වහන්සේගේ උයන 13
වන ඒදන්හි සිටියෙහිය; සියලු අනර්ඝ
ගල් වන ලෝහිතංකද පුෂ්පරාගද වජ්‍රද
රත්කාන්තිද නබමාණික්‍යද සූර්යකාන්-
තිද නීලමාණික්‍යද රතු කැටද මරකතද
රන්ද තුඹේ වැස්මව තිබුණේය. තුඹේ
රබන්වලද තුඹේ නළාවලද මෙහෙවර
තුඹ තුළෙහි විය; තුඹ මවනු ලැබූ
දවසේදී ඒවා සූදානම් කරනලද්දේය. තුඹ 14
පියාපත් විදහාගෙන සිටින අභිෂේකලත්
කෙරුබයෙක් වූයෙහිය. මම තුඹ
දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කන්දෙහි
සිටෙවුවෙමි; තුඹ ගිනි ඇවිළෙන ගල්
අතරෙහි ඇවිද්දෙහිය. තුඹ මවනු ලැබූ 15
ද පටන් තුඹ තුළ අධර්මිෂ්ඨකම
සම්බවෙන තුරු තුඹේ මාර්ගවල තුඹ
සම්පූර්ණව සිටියෙහිය. තුඹේ වෙළඳාමේ 16
මහත්කමින් මනුෂ්‍යයෝ තුඹ මැද
බලාත්කාරකම් පිරෙවුවෝය, තුඹ පව්-
කෙළෙහිය. එබැවින් තුඹ කෙලෙහුණු
දෙයක් මෙන් දෙවියන්වහන්සේගේ
කන්දෙන් අහක්කර දැමුවෙමි; එබැවින්
පියාපත් විදහාගන සිටින කෙරුබ්නි,
මම තුඹ ගිනි ඇවිළෙන ගල් අතරෙන්
නැතිකෙළෙමි. තුඹේ රුව නිසා තුඹේ 17
සිත උඩඟුවී තිබේ, තුඹේ දීප්තිමත්කම
නිසා තුඹේ ප්‍රඥාව නරක්කරගත්තෙහිය.
මම තුඹ පොළොවට හෙළා, රජවරුන්
විසින් තුඹ දකින පිණිස තුඹ ඔවුන්
ඉදිරියෙහි තැබුවෙමි. තුඹේ වෙළඳාමේ 18
අධර්මිෂ්ඨකමෙන් කළ තුඹේ අපරාධ
රාශියෙන් තුඹ තුඹේ ශුද්ධස්ථාන
කෙලෙහුවෙහිය; එහෙයින් මම තුඹ
ඇතුළෙන් ගින්නක් නික්මවීමි, එය තුඹ
නාස්තිකෙළේය, තුඹ දකින සියල්ලන්ගේ
ඇස් ඉදිරියෙහි පොළොව පිට තුඹ
අලුකෙළෙමි. ජනයන් අතරෙහි තුඹව 19
අඳුනන සියල්ලෝ තුඹ ගැන විස්මපත්-
වන්නෝය. තුඹ භීතියක් වී සිටිනෙහිය,
තවත් කවදාවත් තුඹ නොවන්නෙහියයි
කීය.
ස්වාමීන්වහන්සේගේ වචනය මා වෙතට 20
පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, තුඹේ 21
මුහුණ සීදොන් දෙසට හරවා ඊට විරුද්ධව
අනාගතවාක්‍ය පවසමින් මෙසේ

22 කියාපන්න: ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක–එම්බා ශීදෙන්, මම
තුඹට විරුද්ධයෙමි; තුඹ ඇතුළෙහි
ගෞරව ලබන්නෙමි. මා ඈ කෙරෙහි
විනිශ්චයන් ඉෂ්ටකොට, මා පිරිසිදු බව
ඇය කරණකොටගෙන පෙන්නූ කල්හි,
මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැන-
23 ගන්නවා ඇත. එසේය, මම ඈ තුළට
වසංගතයත් ඇගේ වීථි තුළට ලේත්
අරින්නෙමි; වටකරින් ඈ පිටට පැමි-
ණෙන කඩුවෙන් ඈ තුළ මනුෂ්‍යයෝ
මැරුම්කා වැටෙන්නෝය; මෙසේ මා
**ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැනගන්නවා
24 ඇත. එවිට ඉශ්‍රායෙල් වංශයට ඇනෙන
කටුවක්වත් රිදවන උලක්වත් ඔවුන්ව
සුළුකළාවූ ඔවුන් අවට සිටින සියල්ලන්-
ගෙන් තවත් නොපැමිණෙන්නේය; මෙසේ
මා ස්වාමිවූ දෙවියන්වහන්සේ බව ඔවුන්
දැනගන්නවා ඇත.
25 ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක: ඉශ්‍රායෙල් වංශය විසිරී
සිටින ජනයන් අතරෙන් ඔවුන් මා විසින්
රැස්කර, මා පිරිසිදු බව ඔවුන් කරණ-
කොටගෙන ජාතීන්ගේ ඇස් හමුයෙහි
පෙන්නූ කල්හි, මාගේ මෙහෙකරුවාවූ
යාකොබ්ට මා විසින් දුන් රටෙහි ඔවුන්
26 වාසයකරනවා ඇත. ඔව්හු එහි සුවසේ
වාසයකොට, ගෙවල් ගොඩනගන්නෝය,
මිදිවතු වවන්නෝය; ඔවුන් අවට සිටින්-
නාවූ, ඔවුන්ව සුළුකළාවූ සියල්ලන්
කෙරෙහි මා විසින් විනිශ්චයන් ඉෂ්ට-
කළ කල්හි ඔවුන් එසේ සුවසේ වාසය-
කරනවා ඇත; මෙසේ මා ඔවුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** බව ඔව්හු
දැනගන්නෝයයි කීය.

## ඵාරාවෝටත් ඔහුගේ සෙනඟටත් විරුද්ධව අනාගතකීම්

29 දසවෙනි අවුරුද්දේ දසවෙනි
මාසයේ දොළොස්වෙනිද **ස්වාමීන්-
වහන්සේගේ** වචනය මා වෙතට පැමිණ
2 කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, මිසරයේ රජවූ
ඵාරාවෝට විරුද්ධව තුඹේ මුහුණ
හරවා, ඔහුටත් මුළු මිසරයටත් විරුද්ධව
3 අනාගතවාක්‍ය කියාපන්න. තුඹ කථා-
කොට මෙසේ කියාපන්න: ස්වාමිවූ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේක–
තමාගේ ගංගාවල් මැද ලගින්නාවූ,
මාගේ ගංගාව මාගේමය කියාත් මම්ම
ඒක සාදගත්තෙමියි කියාත් කියන්නාවූ
මහ කිඹුලා වන මිසරයේ ඵාරාවෝ
රජුනි, මෙන්න, මම තුඹට විරුද්ධයෙමි.
මම තුඹේ හකුවල කොකු දමා, තුඹේ 4
ගංගාවල මත්ස්‍යයන් තුඹේ කොරපොතු-
වල වද්දවා, එසේ තුඹේ කොරපොතුවල
වැදී ඉන්දද්දී තුඹේ ගංගාවල සියලු
මත්ස්‍යයන් ඇතුළුව තුඹව තුඹේ ගංගා-
වල් ඇතුළෙන් ගොඩට අදින්නෙමි. මම 5
තුඹ සහ තුඹේ ගංගාවල සියලු
මත්ස්‍යයන්ද කාන්තාරයෙහි හෙළා-
දමන්නෙමි. තුඹ පොළොව මතුපිට වැටී
ඇහිදිනු නොලබන්නෙහිය. තුඹ පො-
ළොවේ මෘගයන්ටද ආකාශයේ පක්ෂීන්-
ටද කෑම පිණිස දුනිමි. මිසරයේ සියලු 6
වැසියෝද මා **ස්වාමීන්වහන්සේ** බව,
ඔවුන් ඉශ්‍රායෙල් වංශයට බට සැරයටි-
යක්ව සිටි කාරණයෙන් දැනගන්නෝය.
අතින් ඔවුන් තුඹව ඇල්ලූ විට තුඹ 7
බිඳී, ඔවුන්ගේ සියලු උරහිස් ඉරුණේය.
ඔවුන් තුඹට බරවෙන විට තුඹ පොඩිවී,
ඔවුන්ගේ සියලු ඉඟටි ඇදී හිටින්ට
තුඹ සැලැස්සුවෙහිය. එබැවින්, ස්වාමිවූ 8
දෙවියන්වහන්සේ මෙසේ කියනසේක:
බලව, මම තුඹට විරුද්ධව කඩුවක්
පමුණුවා, තුඹෙන් මනුෂ්‍යයන්ද මෘගයන්ද
සිඳදමන්නෙමි. මිසර දේශය නාස්තියක්ද 9
පාළුවක්ද වන්නේය; මෙසේ මා **ස්වාමීන්-
වහන්සේ** බව ඔව්හු දැනගන්නෝය.
මක්නිසාද: ගංගාව මාගේය, මම ඒක
සාදගතිමියි ඔහු කීවේය. එබැවින්, 10
බලව, මම තුඹටත් තුඹේ ගංගාවලටත්
විරුද්ධයෙමි, මිග්දෝල් පටන් සෙවේනේ
කොටුව දක්වාත් කුෂ්හි සීමාව දක්වාත්
මිසර දේශය මුළුමනින්ම පාළුවක්ද
නාස්තියක්ද කරන්නෙමි. මනුෂ්‍ය පාදය 11
එහි ගමන් නොකරන්නේය, මෘග පාදයද
එහි නොයන්නේය, එය සතළිස්
අවුරුද්දක් වැසියන් නැතුව තිබෙන්නේය.
පාළුවී තිබෙන රටවල් මැද මම මිසර 12

දේශය පාළුවක් කරන්නෙමි, එහි
නුවරවල්ද නටබුන්වී තිබෙන නුවරවල්
අතරේ සතළිස් අවුරුද්දක් පාළුවක්ව
තිබෙනවා ඇත. මම මිසරවරුන් ජාතීන්
අතරට එළවා, දේශවල ඔවුන් විසුරු-
13 වන්නෙමි. එහෙත් ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** මෙසේ කියනසේක: සතළිස්
අවුරුද්දකට පසු, මිසරවරුන් විසිරීගිය
ජනයන් අතරෙන් ඔවුන් රැස්කරන්-
14 නෙමි. මම මිසරවරුන්ගේ වාල්කම
පහකර, ඔවුන්ගේ ජන්ම දේශයවූ පත්‍රොස්
දේශයට ඔවුන් නැවත පමුණුවන්නෙමි;
ඔවුන් වනාහි එහි පහත් රාජ්‍යයක්ව
15 සිටිනවා ඇත. ඒක අනික් රාජ්‍යවලට
වඩා පහත්ව ජාතීන් කෙරෙහි තවත්
උසස් නොවී තිබෙන්නේය. ඔවුන් ජාතීන්
කෙරෙහි ආණ්ඩු නොකරන හැටියට
16 මම ඔවුන් අඩුකරන්නෙමි. ඔවුන් දෙසට
හැරීමෙන්, ඉශ්‍රායෙල් වංශයේ අපරාධය
සිහිකරවන හැටියට, තවත් ඔව්හු මො-
වුන්ගේ විශ්වාසයට හේතු නොවන්නෝය.
මා ස්වාමිවූ **දෙවියන්වහන්සේ** බව ඔව්හු
දැනගන්නෝයයි කීය.
17 තවද විසිහත්වෙනි අවුරුද්දේ පළමුවෙනි
මාසයේ පළමුවෙනිද **ස්වාමීන්වහන්සේගේ**
වචනය මා වෙතට පැමිණ කියනුයේ:
18 මනුෂ්‍ය පුත්‍රය, බබිලෝනියේ රජවූ නෙබු-
කද්රෙශර් තීර්ට විරුද්ධව තමාගේ
සේනාව ලවා මහත් වැඩක් කෙරෙවුවේය.
සියලු හිස් මුඩුවිය, සියලු උරහිස් හම-
ගියේය. එහෙත් ඔහු තීර්ට විරුද්ධව
කළ වැඩය නිසා ඔහුටත් ඔහුගේ සේනා-
වටත් තීර්ගෙන් කුලී ලැබුණේ නැත.
19 එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: බලව, මම බබි-
ලෝනියේ රජවූ නෙබුකද්රෙශර්ට මිසර
දේශය පාවාදෙන්නෙමි; ඔහු එහි සමූහයා
අල්ලාගෙන, එහි තිබෙන කොල්ලය
රැගෙන, එහි තිබෙන සම්පත් කොල්ල-
කාගන යනවා ඇත; ඒවා ඔහුගේ සේනා-
20 වට කුලී වන්නේය. ලබාගැනීමට ඔහු
වැඩකළාවූ ඔහුගේ විපාකය කොට
මිසර දේශය මම ඔහුට දුනිමි. මක්නිසාද
ඔව්හු ඒ වැඩ මා උදෙසා කළෝයයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේක.
ඒ දවසේදී මම ඉශ්‍රායෙල් වංශයට 21
අඟක් ලියලවන්නෙමි, තුඹේ මුඛයද
ඔවුන් අතරෙහි අරවන්නෙමි; මෙසේ
මා **ස්වාමීන්වහන්සේ** බව ඔව්හු
දැනගන්නෝයයි කීය.

## මිසර දේශයට විරුද්ධව තවත් අනාගතකීම්

**ස්වාමීන්වහන්සේගේ** වචනය මා **30**
වෙතට නැවත පැමිණ කියනුයේ:
මනුෂ්‍ය පුත්‍රය, අනාගතවාක්‍ය කියමින් 2
මෙසේ කියාපන්න–ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** මෙසේ කියනසේක: කෑමොර-
ගසාපල්ලා, අහෝ කාලයේ හැටි!
මක්නිසාද දවස ළඟය, **ස්වාමීන්-** 3
**වහන්සේගේ** දවස ළඟය, එය වලාපටල
දවසක්ව, ජාතීන්ගේ කාලයව තිබේ.
කඩුවක් මිසරය පිටට පැමිණෙන්නේය, 4
මිසරයෙහි මනුෂ්‍යයන් මැරුම්කා
වැටෙන්ටත් එහි සමූහයා අල්ලා-
ගනයන්ටත් එහි අත්තිවාරම් පෙරළා-
දමන්ටත් යෙදෙන කල කූෂ්හි වේදනා
හටගන්නවා ඇත. කූෂ්වරුද පූට්වරුද 5
ලූද්වරුද මුළු මිශ්‍ර සේනාවද කූබ්වරුද
ගිවිසුමට බැඳුණු දේශයේ පුත්‍රයෝද
ඔවුන් සමග කඩුවෙන් වැටෙන්නෝය.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 6
මිසරයට ආධාරකරන අය වැටෙන්නෝය,
ඇගේ බලයේ උඩඟුකම පහත්වන්නේය.
මිග්දෙල් පටන් සෙවේනේ කොටුව දක්වා
මනුෂ්‍යයෝ එහි කඩුවෙන් වැටෙන්නෝ-
යයි ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියන-
සේක. පාළුවී තිබෙන දේශවල් අතරෙහි 7
ඔව්හු පාළුවන්නෝය, ඔවුන්ගේ නුවරවල්
නටබුන්වී තිබෙන නුවරවල් අතරෙහි
වන්නෝය. මා විසින් මිසරයෙහි ගින්නක් 8
අවුළුවා ඇගේ සියලු උදව්කාරයන්
බිඳීගිය කල, මා **ස්වාමීන්වහන්සේ** බව
ඔවුන් දැනගන්නවා ඇත. ඒ දවසේදී 9
නොසැලකිලි කූෂ්වරුන් භයගන්වන්ට
මා ඉදිරියෙන් පණිවිඩකාරයෝ නැව්-
වලින් පිටත්ව යන්නෝය; එවිට
මිසරයේ දවසේදී මෙන් වේදනාව ඔවුන්
අතරෙහි හටගන්නවා ඇත; මක්නිසාද
එය පැමිණෙන්නේමය.

10 ස්වාමිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: මම බබිලෝනියේ රජවූ
නෙබුකද්රෙශර් අතින් මිසරයේ සමූහයා
11 නැතිකරවන්නෙමි. ජාතීන්ගෙන් ඉතා
භයානක අය වන ඔහුත් ඔහු සමග
ඔහුගේ සෙනඟත් දේශය නාස්තිකරන්ට
ගෙන්වනු ලැබ, මිසරයට විරුද්ධව
තමුන්ගේ කඩු ඇද, මැරුම්කන අයගෙන්
12 ඔව්හු දේශය පුරවන්නෝය. මම ගංගා
හින්දවා, දේශය දුෂ්ටයන්ගේ අතට
විකුණා, දේශයද එහි පූර්ණකමද විදේශීන්
ලවා පාළුකරවන්නෙමි.
13 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ
කියනසේක: මම දේවරූපද නැතිකොට,
නොප් වෙතින් පිළිම පහකරන්නෙමි;
අධිපතියෙක් මිසර දේශයෙන් තවත්
නොනික්මෙන්නේය. තවද මම මිසර
14 දේශයෙහි භයක් හටගන්වන්නෙමි. මම
පත්‍රොස් පාළුකොට, සොවන්හි ගින්නක්
අවුළුවා, නෝයෙහි විනිශ්චයවල් ඉෂ්ට-
15 කරන්නෙමි. මම මිසරයේ බලකොටුව
වන සීන් පිටට මාගේ කෝපය වගුරුවා
16 නෝයේ සමූහයා සිඳදමන්නෙමි. ගින්-
නක්ද මිසරයෙහි අවුළුවන්නෙමි: සීන්
මහත් වේදනා විඳින්ටත් නෝය බිඳදමනු
ලබන්ටත් නොප්හි දවල් කාලයේ සතුරන්
17 සිටින්ටත් යෙදෙන්නේය. ආවෙන්හිද
පී-බෙසෙත්හිද යෞවනයෝ කඩුවෙන්
වැටෙන්නෝය; එහි වැසියෝ වාල්කමට
18 යන්නෝය. මම මිසරයේ වියගස්
තෙහප්නෙහේස්හිදී බිඳින කලද ඇගේ
බලයේ උඩඟුකම ඇගෙන් පහවන කලද
එහි දවාල අඳුරුවන්නේය. ඈ
වලාපටලයකින් වැසෙන්නේය. ඇගේ
19 දූවරු වාල්කමට යන්නෝය. මෙසේ මම
මිසරයෙහි විනිශ්චයන් ඉෂ්ටකරන්නෙමි.
එවිට මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන්
දැනගන්නවා ඇතැයි කීය.
20 තවද එකොළොස්වෙනි අවුරුද්දේ
පළමුවෙනි මාසයේ සත්වෙනිද **ස්වාමීන්-
වහන්සේගේ** වචනය මා වෙතට පැමිණ
21 කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, මිසරයේ රජවූ
ඵාරාවෝගේ හස්තය මම බින්දෙමි; කඩුව
අල්ලන්ට ඒක සවිවෙන පිණිස සුවකරන
ඖෂධ දමා, ඒක බැඳීමට පටියක් දමා,
ඒක බැන්දේ නැත. එබැවින් ස්වාමිවූ 22
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, මම මිසරයේ රජවූ ඵාරාවෝට
විරුද්ධව සිටිමි. මම ඔහුගේ බාහු වන
සවිවූ එකද බිඳුණු එකද බිඳ, ඔහුගේ
අතින් කඩුව වැටෙන්ට සලස්වා, මිසර- 23
වරුන් ජාතීන් අතරට එළවා, ඔවුන්
දේශවල විසුරුවන්නෙමි. මම බබි- 24
ලෝනියේ රජුගේ බාහු බලවත්කොට,
මාගේ කඩුව ඔහු අතට දෙන්නෙමි.
ඵාරාවෝගේ බාහු බිඳින්නෙමි. ඔහු
මරණීය තුවාල ලත් කෙනෙකුගේ
කෙඳිරිගැම්වලින් ඒ අය ඉදිරියෙහි
කෙඳිරිගානවා ඇත. මම බබිලෝනියේ 25
රජුගේ බාහු උසුලන්නෙමි. ඵාරාවෝගේ
බාහු වැටෙන්නේය; මෙසේ මා විසින්
බබිලෝනියේ රජුගේ අතට මාගේ කඩුව
දී, ඔහු ඒක මිසර දේශයට විරුද්ධව
දිගුකරන කල්හි, මා **ස්වාමීන්වහන්සේ**
බව ඔවුන් දැනගන්නවා ඇත. මම මිසර- 26
වරුන් ජාතීන් අතරට එළවා, ඔවුන්
දේශවල විසුරුවන්නෙමි; එවිට මා
**ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැනගන්නවා
ඇතැයි කීය.

## මහත් කිහිරි රුකක් මෙන් ඵාරාවෝ කපාදමනු ලැබීම

31 තවද එකොළොස්වෙනි අවු-
රුද්දේ තුන්වෙනි මාසයේ පළමු-
වෙනිද **ස්වාමීන්වහන්සේගේ** වචනය මා
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය. 2
මිසරයේ රජවූ ඵාරාවෝටත් ඔහුගේ
සමූහයාටත් මෙසේ කියාපන්න—නුඹේ
මහත්කමෙන් නුඹ කාට සමානද?
මෙන්න, අෂූරියයා ශෝභන අතුද ඝන 3
සෙවණක්ද ඇත්තාවූ. ඉතා උස්වූ.
ලෙබනොන්හි කිහිරි ගසක්ය; එහි මුදුන
වලාකුල් අතරෙහි වූයේය. ජලවලින් ඒක 4
මහත්වී, ගැඹුරෙන්ද උස්වුණේය. ගැඹුරේ
ගංගා එහි පාත්ති වටකර ගලා, එහි
ඇළවල් වනයේ සියලු ගස් ළඟට
පමුණුවනු ලැබීය. ඒ නිසා එහි උස 5
වනයේ සියලු ගස්වලට වඩා වැඩිවිය;
දළුලන විට බොහෝ වතුර ලැබුණු
නිසා එහි අතු වැඩිවී, එහි රිකිලිද
දික්වුණේය. ආකාශයේ සියලු පක්ෂීහු 6

එහි අතුවල කුඩු සාදගත්තෝය, එහි
රිකිලි යට වනයේ සියලු මෘගයෝ පැටවු
ගැහුවෝය, එහි සෙවණෙහි සියලු මහත්
7 ජාතීහුද වාසයකළෝය. එහි මහත්කමෙන්
සහ එහි අතුවල දීර්ඝකමෙන් ඒක
අලංකාරව තිබුණේය. මක්නිසාද එහි
මුල බොහෝ ජලයන් ළඟ තිබුණේය.
8 දෙවියන්වහන්සේගේ උයනේ කිහිරි
ගස්වලට ඒක සැඟවී නොතිබුණේය.
දේවදාර ගස් එහි අතුවලට සමාන නො-
වීය, අර්මොන් ගස් එහි රිකිලිවලට
සමව නොතිබුණේය; දෙවියන්වහන්සේ-
ගේ උයනෙහි කිසි ගසක් අලංකාර-
9 කමෙන් ඊට සමාන නොවීය. ඒකේ අතු
රාශියෙන් මම එය අලංකාරකෙළෙමි.
එබැවින් දෙවියන්වහන්සේගේ උයනවූ
ඒදන්හි සියලුම ගස්ද ඊර්ෂ්‍යාවුණෝය.
10 එබැවින් ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක: ඔහු උසින් උසස්වී,
ඔහුගේ මුදුන වලාකුල් අතරට ඇර,
ඔහුගේ උසස්කමින් ඔහුගේ සිත උඩඟුවූ
11 බැවින්, ජාතීන්ගේ බලවන්තයා කැමති
හැටියට ඔහුට කරන පිණිස ඒ අය
අතට ඔහු පාවාදෙන්නෙමි. ඔහුගේ
12 දුෂ්ටකම නිසා ඔහු එළවාදැමීමි. ජාතීන්-
ගෙන් ඉතා භයානක විදේශියෝ ඔහු
කපාදමා හැරගියෝය. ඔහුගේ අතු
කඳු පිටත් සියලු මිටියාවත්වලත්
වැටුණේය, ඔහුගේ රිකිලි දේශයේ සියලු
දෙණිවල කඩණු ලැබුවේය; පොළොවේ
සියලු ජනයෝද ඔහුගේ සෙවණෙන්
13 අහක්වී, ඔහු අත්හැර ගියෝය. ඔහුගේ
වැටුණු කඳ පිට ආකාශයේ සියලු පක්ෂීහු
ලගින්නෝය, ඔහුගේ අතු උඩ වනයේ
14 සියලු මෘගයෝ හිඳින්නෝය. මෙසේ
වන්නේ වතුර ලැබෙන සියලු ගස් ඒවා-
යේ උස නිසා උඩඟුවෙන්ටත් ඒවායේ
මුදුන් වලාකුල් අතරට අරින්ටත් වතුර
බීගන්න ඒ සියල්ල ඒවායේ උස්කම
නිසා තනියම සිටින්ටත් නොයෙ-
දෙන පිණිසය. මක්නිසාද ඒ සියල්ලෝම
පොළොවේ පහත් තැන්වල මිනී-
වළට බසිනවුන් ළඟට යන්ට මනුෂ්‍ය
පුත්‍රයන් අතරෙහිම මරණයට පාවාදෙනු
ලැබුවෝය.

ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ 15
කියනසේක: ඔහු *පාතාලයට බැස්ස
දවසේදී වැලපීමක් කෙළෙමි. ඔහු ගැන
ගැඹුර වසා ඒකේ ගැලීම නැවැත්වීමි,
මහත් ජලවල්ද නැවතුණේය. ලෙබනොන්
ඔහු ගැන වැලපෙන්ට සැලැස්වීමි, බැද්-
දේ සියලු ගස්ද ඔහු ගැන මැලවුණේය.
මිනීවළට බසින්නන් සමග මා විසින් 16
ඔහු *පාතාලයට බැස්සෙවූ කල ඔහුගේ
වැටීමේ ශබ්දයට ජාතීන් වෙවුලෙවූවෙමි.
එවිට ඒදන්හි සියලු ගස්ද ලෙබනොන්හි
ඉතා හොඳ වටිනා ගස්ද, එනම් වතුර
බීගන්න සියල්ලම, පොළොවේ පහත්
තැනදී සැනසුණෝය. ජාතීන් අතරේ 17
ඔහුගේ සෙවණෙහි වාසයකළාවූ, ඔහුගේ
හස්තයව සිටියාවූ තැනැත්තෝද කඩු-
වෙන් මැරුම්කෑ අය ළඟට ඔහු සමග
*පාතාලයට බැස්සෝය.
තුඹ එසේ මහිමයෙන්ද උතුම්කමෙන්ද 18
ඒදන්හි ගස්වලින් කොයි එකට සමානව
සිටිනෙහිද? තුඹත් ඒදන්හි ගස් සමග
පොළොවේ පහත් තැන්වලට බැස,
කඩුවෙන් මැරුම්කෑ අය සමග අචර්ම-
ඡේදිතයන් අතරෙහි වැටී ඉන්නවා ඇත.
ඵාරාවෝට සහ ඔහුගේ මුළු සමූහයා-
ටත් එයාකාර වේය කියා ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේකැයි කීය.

## ඵාරාවෝ සහ මිසරය ගැන විලාප

**32** තවද දෙළොස්වෙනි අවුරුද්දේ
දෙළොස්වෙනි මාසයේ පළමුවෙනිද
**ස්වාමීන්වහන්සේගේ** වචනය මා වෙතට
පැමිණ කියනුයේ: මනුෂ්‍ය පුත්‍රය, 2
මිසරයේ රජවූ ඵාරාවෝ ගැන විලාපයක්
පවත්වමින් ඔහුට මෙසේ කියාපන්න—තුඹ
ජාතීන් අතරෙහි තරුණ සිංහයෙකුට
සමානකරනු ලැබුවෙහිය. තුඹ ජලවල
ඉන්න කිඹුලෙක් වැනිය; තුඹේ ගංගාවල
තුඹ පැන පැන ගොස්, තුඹේ පාදවලින්
වතුර කලඹා, ඔවුන්ගේ ගංගාවල් කිලුටු-
කෙළෙහිය. ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 3
මෙසේ කියනසේක: බොහෝ ජනයන්
රැස්ව සිටියදී මාගේ දැල තුඹ පිට
හෙළන්නෙමි; ඔවුන් මාගේ දැලෙන් තුඹ

*හෙබ්‍රෙව්: ෂෙයෝල්ට.

4 ගොඩට අදිනවා ඇත. එවිට මම නුඹ
බිම දමා, පොළෝතලය මතුපිට හෙළා,
ආකාශයේ සියලු පක්ෂීන් නුඹ පිට
ලගින්ටත් මුළු පොළොවේ සත්ත්වයන්
නුඹෙන් තෘප්තියට පැමිණෙන්ටත්
5 සලස්වන්නෙමි. මම නුඹේ මස් කඳු පිට
දමා, නුඹේ මළකඳෙන් මිටියාවත්
6 පුරවන්නෙමි. නුඹ පීනන දේශය කඳු
දක්වා නුඹේ ලෙයෙන් පොහවන්නෙමි;
7 දෙණිද නුඹෙන් පිරෙනවා ඇත. මා
විසින් නුඹ නිවන කල, අහස වසා, එහි
තාරකා අඳුරුකර, වලාකුළකින් ඉර
වසන්නෙමි, සඳත් එහි එළිය නො-
8 දෙන්නේය. අහසේ බබළන සියලු
ආලෝකවල් නුඹ නිසා මම අඳුරුකොට,
නුඹේ දේශය කෙරෙහි අන්ධකාරය
පමුණුවන්නෙමියි ස්වාමිවූ දෙවියන්-
9 වහන්සේ කියනසේක. නුඹ නොදත්
රටවලට, ජාතීන් අතරට, නුඹේ විනාශය
මා විසින් පමුණුවන කල, බොහෝ
ජනයන්ගේ සිත් ශෝකකරවන්නෙමි.
10 එසේය, මම නුඹ ගැන බොහෝ ජනයන්
විස්මයට පමුණුවන්නෙමි, ඔවුන් ඉදිරිපිට
මාගේ කඩුව ලෙළවන කල ඔවුන්ගේ
රජවරුත් නුඹ නිසා ඉතා භයවන්නෝය;
නුඹේ වැටීමේ දවසේදී ඔවුන් එක එකා
තම තමාගේ ප්‍රාණය ගැන මොහොතෙන්
11 මොහොත වෙවුලන්නේය. මක්නිසාද
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන-
සේක: බබිලෝනියේ රජුගේ කඩුව නුඹ
12 පිටට පැමිණෙන්නේය. නුඹේ සමූහයා
බලවන්තයන්ගේ කඩුවලින් වැටෙන්ට
සලස්වන්නෙමි; ඔවුන් සියල්ලෝම
ජාතීන්ගෙන් ඉතා භයානක අයය. ඔවුන්
මිසරයේ මහිමය නැතිකරනවා ඇත.
13 එහි මුළු සමූහයාද නාස්තිවේ. මම
එහි සියලු මෘගයන් මහත් ජලවල්
ළඟින් නැතිකරන්නෙමි; මනුෂ්‍යයන්ගේ
පාදයට ඒවා නවත් නොකැලඹෙන්නේය,
මෘගයන්ගේ කුරවලටත් ඒවා නො-
14 කැලඹෙන්නේය. ඔවුන්ගේ ජලවල්
බැසයන්ටත් ඔවුන්ගේ ගංගා තෙල් මෙන්
15 ගලායන්ටත් සලස්වන්නෙමි. මා විසින්
මිසර දේශය පාළුකර, නාස්තියක් කොට,
දේශය ඒකේ පූර්ණකමෙන් හිස්වෙන්ට
සලස්වන කලද එහි සියලු වැසියන්ට
මා පහරදෙන කලද මා **ස්වාමීන්වහන්සේ**
බව ඔව්හු දැනගන්නෝයයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක. මිනිසුන් 16
විසින් කියන්නාවූ විලාපය මේය; ජාතීන්-
ගේ දූවරුන් එයින් විලාප කියනවා
ඇත. මිසරය ගැනත් එහි මුළු සමූහයා
ගැනත් ඔවුන් එයින් විලාප කියනවා
ඇතැයි ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියන-
සේකැයි කීය.

තවද දොළොස්වෙනි අවුරුද්දේ මාසයේ 17
පහළොස්වෙනිද **ස්වාමීන්වහන්සේගේ**
වචනය මා වෙතට පැමිණ කියනුයේ:
මනුෂ්‍ය පුත්‍රය, නුඹ මිසරයේ සමූහයා 18
ගැන විලාපයක් කියා, ඔවුන් සහ බලවත්
ජාතීන්ගේ දූවරුන්ද මිනීවළට බසින්නන්
සමග පොළොවේ පහත් තැන්වලට
හෙළාපන්න. නුඹ කාට වඩා රූපසම්- 19
පන්න වන්නෙහිද? නුඹ බැස ගොස්
අචර්මඡේදිතයන් සමග වැටී හිඳින්න.
කඩුවෙන් මැරුම්කන අය අතරෙහි ඔවුන් 20
වැටෙනවා ඇත. ඈ කඩුවට භාරදී තිබේ.
ඈ සහ ඇගේ සියලු සමූහයන් අහකට
ඇදගනිල්ලා. බලවතුන්ගේ උත්තම- 21
යෝ ඔහුගේ උපකාරකාරයන් සමග
*පාතාලය මැද සිට ඔහුට කථා-
කරන්නෝය. අචර්මඡේදිතවූ, කඩුවෙන්
මැරුම්කෑවාවූ අය බැසගොස් වැටී සිටිති.
අෂූර් සහ ඇගේ මුළු සමූහයත් එහිය: 22
ඔහුගේ මිනීවළවල් ඔහු අවටින් ඇත්තේය.
ඔවුන් සියල්ලෝම කඩුවෙන් වැටී
මැරුම්කෑවෝය. ඔවුන්ගේ මිනීවළවල් වළේ 23
ඉතා දුර තැන්වල සාදා තිබේ, ඇගේ
සමූහය ඇගේ මිනීවළ වටකර සිටිති.
ජීවත්ව සිටින්නන්ගේ දේශයෙහි භීතිය
ඉපදෙවූ ඔවුන් සියල්ලෝම කඩුවෙන්
වැටී මැරුම්කෑවෝය. එහි ඒලාම් සහ 24
ඇගේ මිනීවළ වටකර ඇගේ මුළු
සමූහයාද සිටිති. ඔවුන් සියල්ලෝම
කඩුවෙන් වැටී මැරුම්කෑවෝය, ජීවත්ව
සිටින්නන්ගේ දේශයෙහි භීතිය ඉපදෙවූ
ඔව්හු අචර්මඡේදිතව පොළොවේ පහත්
තැන්වලට බැස ගියෝය; ඔව්හුද මිනී-
වළට බසින්නන් සමග තමුන්ගේ නින්දව

*හෙබ්‍රෙව්: ෂෙයෝල.

25 දරා සිටිති. මැරුම්කෑ අයින් අතරෙහි
ඇගේ මුළු සමූහයා ඇතුළුව ඈට යහනක්
තබා තිබේ; ඇගේ මිනීවළවල් ඈ වටකර
තිබේ. ඔවුන් සියල්ලෝම අචර්මඡේදිතව
කඩුවෙන් මැරුම්කෑවෝය. මක්නිසාද
ජීවත්ව සිටින්නන්ගේ දේශයෙහි ඔව්හු
භීතිය ඉපදෙවූවෝය; ඔව්හු මිනීවළට
බසින්නන් හා සමග තමුන්ගේ නින්දාව
ඉසුලුවෝය. මරනු ලැබූවන් අතරේ ඔහු
26 තබනු ලැබීය. එහි මෙෂෙක්ද තුබල්ද
ඇගේ මුළු සමූහයාද සිටිති; ඇගේ
මිනීවළවල් ඈ වටකර ඇත්තේය. ඔවුන්
සියල්ලෝම අචර්මඡේදිතව කඩුවෙන්
මැරුම්කෑවෝය; මක්නිසාද ජීවත්ව
සිටින්නන්ගේ දේශයෙහි ඔව්හු භීතිය
27 ඉපදෙවූවෝය. වැටී තමුන්ගේ යුද්ධායුධ
පිටින් *පාතාලයට බැස ගියාවූද තමුන්-
ගේ කඩු තමුන්ගේ හිස යට තබා-
ගත්තාවූද තමුන්ගේ අපරාධ තමුන්ගේ
ඇට පිට ඇත්තාවූද අචර්මඡේදිත බලව-
තුන් සමග ඔව්හු වැටී නොසිටින්නෝය;
මක්නිසාද ජීවත්ව සිටින්නන්ගේ
දේශයෙහි ඔව්හු බලවතුන්ට භීතියක්ව
28 සිටියෝය. තුඹත් අචර්මඡේදිතයන්
අතරෙහි පොඩිවී කඩුවෙන් මැරුම්කෑ
29 අය සමග වැටී ඉන්නෙහිය. එහි ඒදෙම්
සහ ඇගේ රජවරුද ඇගේ සියලුම
අධිපතීහුද සිටිති; ඔව්හු බලවන්තයෝව
සිටි නුමුත් කඩුවෙන් මැරුම්කෑ අය
සමග තබනු ලැබුවෝය. ඔවුන්
අචර්මඡේදිතයන්ද මිනීවළට බසින්නන්ද
30 සමග වැටී ඉන්නවා ඇත. එහි උතුරු
දිශාවේ සියලු උත්තමයෝද සියලු
ශීදෝන්වරුද සිටිති; ඔව්හු මැරුම්කෑ අය
සමග බැසගියෝය; ඔව්හු තමුන්ගේ
බලවන්තකමෙන් ඉපදෙවූ භීතිය ගැන
ලජ්ජාවී, කඩුවෙන් මැරුම්කෑ අය සමග
වැටී ඉඳ, මිනීවළට බසින්නන් සමග
31 තමුන්ගේ නින්දාව දරති. ඵාරාවෝ සහ
මුළු සේනාවද කඩුවෙන් මැරුම්කෑ විට,
ඵාරාවෝ අනික් අයින් දැක, තමාගේ
මුළු සමූහයා ගැන සැනසෙන්නේයයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
32 මක්නිසාද ඔහුගේ භීතිය ජීවතුන්ගේ

*හෙබ්‍රෙව්: ෂෙයෝල.

දේශයෙහි ඉපදෙවූවෙමි. ඵාරාවෝද
ඔහුගේ මුළු සමූහයාද කඩුවෙන්
මැරුම්කෑ අයින් සමග අචර්මඡේදිතයන්
අතරෙහි වැටී ඉන්නෝයයි ස්වාමිවූ
දෙවියන්වහන්සේ කියනසේකැයි කීය.

## මුරකාරයෙකු මෙන් ප්‍රොපේත කෙනෙකුගේ වග කීම

33 ස්වාමීන්වහන්සේගේ වචනයද මා
වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය 2
පුත්‍රය, නුඹේ සෙනඟගේ පුත්‍රයන්ට
කථාකොට මෙසේ කියාපන්න–මා
විසින් යම් දේශයකට කඩුව පමුණුවන
විට ඒ දේශයේ සෙනඟ තමුන් අතරෙන්
මනුෂ්‍යයෙකු ගෙන තමුන්ට මුරකාරයා
කොට තැබුවොත්, දේශය පිටට කඩුව 3
පැමිණෙනවා ඔහු දැක හොරණෑව පිඹ
සෙනඟට දන්වූ කල්හි, හොරණෑ ශබ්දය 4
අසා ඒක නොසලකා සිටින යම්
කෙනෙකු කඩුව පැමිණ පහකළොත්,
ඔහුගේ ලේ තමාගේම හිස පිට වන්නේය.
ඔහු හොරණෑ ශබ්දය අසා නොසලකා 5
සිටියේය; ඔහුගේ ලේ තමා පිට වන්නේය.
නුමුත් ඔහු සැලකුවේ නම් තමාගේ
ප්‍රාණය ගළවාගන්නවා ඇත. නුමුත් 6
මුරකාරයා කඩුව පැමිණෙනවා දැක
සෙනඟට දන්වන ලෙස හොරණෑව
නොපිඹ සිටියොත්, කඩුව පැමිණ
ඔවුන්ගෙන් යමෙකු පහකරන්ට යෙදු-
ණොත්, ඔහු තමාගේ අයුතුකම නිසා
පහකරනු ලැබේ, නුමුත් ඔහුගේ ලේ
මුරකාරයාගේ අතින් අයකරන්නෙමියි
කියාපන්න. එසේම, මනුෂ්‍ය පුත්‍රය, මම 7
නුඹ ඉශ්‍රායෙල් වංශයට මුරකාරයෙකු
කෙළෙමි; නුඹද මාගේ මුඛයෙන් වචනය
අසා, මාගේ නාමයෙන් ඔවුන්ට
අවවාදකරපන්න. එම්බා දුෂ්ටය, නුඹ 8
නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට
කී කල්හි, තමාගේ මාර්ගයෙන් හැරෙන
ලෙස දුෂ්ටයාට අවවාදකිරීමට නුඹ
කථා නොකර සිටියොත්, දුෂ්ටවූ ඔහු
තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත,
එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය-
කරන්නෙමි. එසේවී නුමුත් තමාගේ 9
මාර්ගයෙන් හැරෙන ලෙස නුඹ ඒ ගැන

දුෂ්ටයාට අවවාදකළ කල්හි ඔහු තමාගේ
මාර්ගයෙන් නොහැරුණොත්, ඔහු තමා-
ගේ අයුතුකම නිසා නසිනවා ඇත, නුඹ
නුඹේ ප්‍රාණය ගළවාගත්තෙහිය.
10 තවද මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල් වංශයට
මෙසේ කියාපන්න: නුඹලා කථාකොට—
අපේ වරද සහ අපේ පාපද අප කෙරෙහි
තිබී අප එයින් ක්ෂයවී යද්දී අප
ජීවත්වන්නේ කොහොමදැයි කියා නුඹලා
11 කියන එක හරිය. මා ජීවමාන බව
සැබෑවා සේම, දුෂ්ටයා තමාගේ මාර්ග-
යෙන් හැරී ජීවත්වෙනවාට මිස, දුෂ්ටයා
නසිනවාට මම ප්‍රසන්න නොවෙමියි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
ඉශ්‍රායෙල් වංශය හැරියල්ලා, නුඹලාගේ
නපුරු මාර්ගවලින් හැරියල්ලා; නුඹලා
නසින්නේ මක්නිසාදැයි ඔවුන්ට කියා-
12 පන්න. එබැවින්, මනුෂ්‍ය පුත්‍රය, නුඹේ
සෙනඟගේ පුත්‍රයන්ට මෙසේ කියාපන්න:
ධර්මිෂ්ඨයා වරද කරන දවසේදී ස්වකීය
ධර්මිෂ්ඨකම නිසා ඔහු නොගැළවෙන්නේය;
දුෂ්ටයාද තමාගේ දුෂ්ටකමෙන් හැරෙන
දවසේදී තමාගේ දුෂ්ටකම නිසා වැටී
නොයන්නේය. ධර්මිෂ්ඨයා පව්කරන
දවසේදී ධර්මිෂ්ඨකම නිසා ජීවත්වෙන්ට
13 ඔහුට පුළුවන්වෙන්නෙත් නැත. නුඹ
සැබවින් ජීවත්වන්නෙහියයි මා විසින්
ධර්මිෂ්ඨයාට කීවාම ඔහු තමාගේ
ධර්මිෂ්ඨකම කෙරෙහි විශ්වාසකරමින්
අයුතුකම්කළොත්, ඔහුගේ සියලු ධර්-
මිෂ්ඨකම් සිහිකරනු නොලබන්නේය; ඔහු
කළාවූ ස්වකීය අයුතුකම නිසා ඔහු
14 නසිනවා ඇත. නුඹ නසිනවාම ඇතැයි
මා විසින් දුෂ්ටයාට කී විට ඔහු තමාගේ
පාපයෙන් හැරී යුක්තියද ධර්මිෂ්ඨකමද
15 කළොත්, උකස නැවත දී කොල්ලකා
ගත් දේ ආපසු දුන්නොත්, අධර්මිෂ්ඨකම්
නොකර ජීවන-පනත් ප්‍රකාර හැසුරුණොත්,
16 ඔහු නොනැසී ජීවත්වන්නේමය. ඔහු
කළාවූ ඔහුගේ කිසිම පාපයක් ඔහුට
විරුද්ධව සිහිකරනු නොලබන්නේය. ඔහු
යුක්තියද ධර්මිෂ්ඨකමද කෙළේය; ඔහු
17 සැබවින්ම ජීවත්වන්නේය. එහෙත්:
ස්වාමීන්වහන්සේගේ මාර්ගය සාධාරණ
නැතැයි නුඹේ සෙනඟගේ පුත්‍රයෝ කියති.
නුමුත් සාධාරණ නැත්තේ ඔවුන්ගේ
මාර්ගයය. ධර්මිෂ්ඨයා තමාගේ ධර්- 18
මිෂ්ඨකමෙන් හැරී අයුතුකම්කළොත්, ඔහු
ඒ නිසා නසින්නේය. දුෂ්ටයාද තමාගේ 19
දුෂ්ටකමෙන් හැරී යුක්තියද ධර්මිෂ්ඨකමද
කළොත්, ඔහු ඒ නිසා ජීවත්වන්නේය.
එහෙත්: ස්වාමීන්වහන්සේගේ මාර්ගය 20
සාධාරණ නැතැයි නුඹලා කියන්නහුය.
එම්බා ඉශ්‍රායෙල් වංශය, මම නුඹලා
එකිනෙකා තම තමාගේ මාර්ග ලෙස
විනිශ්චයකරන්නෙමියි කීය.

## අසන නුමුත් කීකරු නොවන අයට අවවාදය

අපේ වාල්කමේ දොළොස්වෙනි අවුරුද්දේ 21
දසවෙනි මාසයේ පස්වෙනිද යෙරුසලමෙන්
ගැළවුණු කෙනෙක් මා ළඟට ඇවිත්:
නුවර අසුවුණායයි කීය. ගැළවුණු 22
තැනැත්තා එන්ට ඉස්සරින්ද සවස
ස්වාමීන්වහන්සේගේ අත මා පිටට
පැමිණ තිබුණේය. තවද ඒ අය පසුවද
උදේ මා වෙතට එන තුරු උන්වහන්සේ
මාගේ මුඛය ඇර තිබුණේය; මාගේ
මුඛය ඇරී, මම තවත් ගොළුව නො-
සිටියෙමි. ස්වාමීන්වහන්සේගේ වචනයද 23
මා වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය 24
පුත්‍රය, ඉශ්‍රායෙල් දේශයෙහි තිබෙන ඒ
පාළු ඉඩම්වල වසන්නෝ කථාකොට—
ආබ්‍රහම් එක්කෙනෙක්ව සිටි නුමුත් ඔහුට
දේශය උරුමවිය. අපි වනාහි බොහෝ
දෙනෙක්ය; දේශයද උරුමයක් කොට
අපට දී තිබේයයි කියති. එබැවින් 25
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේකැයි ඔවුන්ට කියාපන්න. ලේ
පිටින් කන්නාවූ, නුඹලාගේ ඇස් නුඹලා-
ගේ රූපවලට ඔසවන්නාවූ, ලේ වගුරු-
වන්නාවූ නුඹලාට දේශය භුක්තිවිඳින්ට
ලැබේද? නුඹලාගේ කඩුව කෙරෙහි 26
පිහිටා සිටින්නාවූ, පිළිකුල්කම්කරන්නාවූ,
තම තමාගේ අසල්වාසියාගේ භාර්යාව
අපවිත්‍රකරන්නාවූ නුඹලාට දේශය
භුක්තිවිඳින්ට ලැබේද? ස්වාමිවූ දෙවියන්- 27
වහන්සේ මෙසේ කියනසේකැයි ඔවුන්ට
කියාපන්න: මා ජීවමාන බව සැබෑවා
සේම, පාළු ඉඩම්වල සිටින්නෝ කඩුවෙන්

වැටෙන්නෝය, කෙතේ පිටත සිටින අය
මෘගයන්ට කෑම පිණිස දෙන්නෙමි,
බලකොටුවලද ගුහාවලද සිටින්නෝ
28 වසංගතයෙන් නසින්නෝය. මම දේශය
පාළුවක්ද නාස්තියක්ද කරන්නෙමි,
ඇගේ බලයේ උඩඟුකමද පහවන්නේය;
ඉශ්‍රායෙල් කඳුවල කිසිවෙකු නොයන
29 ලෙස ඒවා පාළුවන්නේය. ඔවුන් කළ
සියලු පිළිකුල්කම් නිසා මා විසින්
දේශය පාළුවක්ද නාස්තියක්ද කළාම
මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැන-
30 ගන්නවා ඇත. තවද, මනුෂ්‍ය පුත්‍රය,
තුඹේ සෙනඟගේ පුත්‍රයෝ පවුරු
ළඟදීද ගෙවල්වල දොරකඩවලදීද තුඹ
ගැන කථාකොට: වරෙල්ලා, **ස්වාමීන්-
වහන්සේගෙන්** පැමිණෙන වචනය
මොකද කියා අසාපල්ලායයි එකිනෙකා
31 තම තමාගේ සහෝදරයාට කියති. එසේ
ඔව්හු සෙනඟක් එන්නාක්මෙන් තුඹ
ළඟට ඇවිත්, මාගේ සෙනඟ මෙන් තුඹ
ඉදිරියෙහි හිඳගෙන, තුඹේ වචන අසති,
නුමුත් ඔව්හු ඒවා නොපවත්වති. මක්-
නිසාද තමුන්ගේ කටින් ඔව්හු බොහෝ
ආදරය පෙන්වති, නුමුත් ඔවුන්ගේ සිත
32 ඔවුන්ගේ ලාභය පස්සේ යන්නේය. තුඹ
වනාහි මිහිරි හඬක් ඇත්තාවූ හොඳට
ගායනා කරන කෙනෙකුගේ ප්‍රේම ගීයක්
මෙන් ඔවුන්ට සිටියි. මක්නිසාද ඔව්හු
තුඹේ වචන අසති, නුමුත් ඒවා නො-
33 පවත්වා සිටිති. මේ කාරණය සිද්ධවන්-
නේමය. එය සිද්ධවන කල තමුන් අතරෙහි
අනාගතවක්තෘ කෙනෙක් සිටි බව ඔවුන්
දැනගන්නවා ඇතැයි කීය.

## ඉශ්‍රායෙල්ගේ යහපත් එඬේරාණෝ

34 තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
මා වෙතට පැමිණ කියනුයේ:
2 මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල්ගේ එඬේරුන්ට
විරුද්ධව අනාගතවාක්‍ය කියාපන්න.
අනාගතවාක්‍ය කියමින්: ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේකැයි
ඔවුන්ට, එනම් එඬේරුන්ට කියාපන්න.
තමුන්ම පෝෂ්‍යකරගන්න ඉශ්‍රායෙල්
එඬේරුන්ට දුක්වේ! එඬේරුන් විසින්
බැටළුවන් පෝෂ්‍ය කළ යුතු නොවේද?
තුඹලා තෙල කති, ලෝම ඇඳගනිති, තර 3
එවුන් මරති; එහෙත් තුඹලා බැටළුවන්
පෝෂ්‍ය කරන්නේ නැත. දුර්වල එවුන් 4
තුඹලා විසින් ශක්තිමත්කළේවත්, ලෙඩවූ
එකාට සුවකළේවත්, පොඩිවූ එකාගේ
තුවාල බැන්දේවත්, පන්නාදමනු ලැබූ එකා
නැවත ගෙනාවේවත්, නැතිවුණු එකා
සෙවුවේවත් නැත; බලාත්කාරකමින්ද
සැරකමින්ද තුඹලා උන් ආණ්ඩුකළහුය.
එඬේරෙක් නැතුව උන් විසිර ගොස් 5
වනයේ සියලු සත්ත්වයන්ට ගොදුරු
වූවෝය, උන් විසිරගියෝය. මාගේ 6
බැටළුවෝ සියලු කඳුවලද උස්වූ සියලු
හෙල් පිටද මුළාවගියෝය. එසේය, මුළු
පොළෝතලයෙහි මාගේ බැටළුවෝ
විසිරගියෝය; උන් සොයන්ට හෝ
බලන්ට හෝ කිසිවෙක් නොවීය. එබැවින් 7
එඬේරුනි, **ස්වාමීන්වහන්සේගේ** වචනය
අසාපල්ලා. ස්වාමිවූ **දෙවියන්වහන්සේ** 8
මෙසේ කියනසේක: මා ජීවමාන බව
සැබෑවා සේම, එඬේරෙක් නැතුව මාගේ
බැටළුවන් ගොදුරු වෙන්ටත් බැද්දේ
සියලු මෘගයන්ට මාගේ බැටළුවන් කෑම
වෙන්ටත් යෙදුණු නිසාද මාගේ එඬේ-
රුන් මාගේ බැටළුවන් ගැන විභාග-
කරන්නේවත් මාගේ බැටළුවන් පෝෂ්‍ය-
කරන්නේවත් නැතුව තමුන්ම පෝෂ්‍ය-
කරගත් නිසාද, එඬේරුනි, **ස්වාමීන්-** 9
**වහන්සේගේ** වචනය අසාපල්ලා; ස්වාමිවූ 10
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, මම එඬේරුන්ට විරුද්ධව සිට,
මාගේ බැටළුවන් ඔවුන් අතින් අයකර,
බැටළුවන් පෝෂ්‍යකිරීමෙන් ඔවුන් නවත්-
වන්නෙමි; තවත් තමුන්ම පෝෂ්‍ය-
කරගන්ට එඬේරුන්ට නොලැබෙන්නේය;
මාගේ බැටළුවන් ඔවුන්ට ගොදුරු නො-
වන ලෙස මම ඔවුන්ගේ කටින් උන්
ගළවාගන්නෙමි. මක්නිසාද ස්වාමිවූ 11
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, මමම මාගේ බැටළුවන් ගැන
විභාගකර, උන් බලාගන්නෙමි. එඬේරෙක් 12
වනාහි විසිරගිය තමාගේ බැටළුවන්
අතරේ සිටින දවසකදී තමාගේ රැළ
සොයා යන්නාක්මෙන් මමත් මාගේ

බැටළුවන් සොයා ගොස්, වලාකුල් සහ
අන්ධකාරය ඇති දවසේදී උන් විසිරගිය
සෑම තැන්වලින් උන් ගළවාගන්නෙමි.
13 මම ජනයන් අතරෙන් උන් පිටතට පමු-
ණුවා, දේශවලින් උන් රැස්කර, උන්ගේම
රටට උන් ගෙනවුත්, ඉශ්‍රායෙල් කඳුවලද
දෙණිවලද දේශයේ සියලු වාසස්ථානවලද
14 උන් පෝෂ්‍යකරන්නෙමි. හොඳ තෘණවලින්
උන් පෝෂ්‍යකරන්නෙමි, ඉශ්‍රායෙල් කඳුවල
උස්තැන්හි උන්ගේ තෘණබිම් වන්නේය.
එහි හොඳ තෘණබිම්වල උන් ලගිනවා
ඇත, ඉශ්‍රායෙල් කඳුවල උන් සාරවත්
15 තෘණ කනවා ඇත. මමම මාගේ
බැටළුවන් පෝෂ්‍යකර, මමම උන්
ලග්ගවන්නෙමියි ස්වාමිවූ දෙවියන්-
16 වහන්සේ කියනසේක. මම නැතිවූ එකා
සොයන්නෙමි, පන්නාදමනු ලැබූ එකා
දෙවනු ගෙනෙන්නෙමි, පොඩිවූ එකාගේ
තුවාල බඳින්නෙමි, ලෙඩවූ එකා ශක්ති-
මත්කරන්නෙමි. නුමුත් මම තරවූ එවුන්ද
ශක්තිමත් එවුන්ද නැතිකර, විනිශ්චයෙන්
17 උන් පෝෂ්‍යකරන්නෙමි. මාගේ බැටළු-
වෙනි, නුඹලාට ස්වාමිවූ දෙවියන්-
වහන්සේ මෙසේ කියනසේක: මම
සිවිපාවුන් සහ සිවිපාවුන්ද එනම්
බැටළුවන් සහ එළුවන්ද අතරේ විනිශ්චය
18 කරමි. *නුඹලා හොඳ තෘණ කා, නුඹලා-
ගේ තෘණවලින් ඉතුරු ඒවා නුඹලාගේ
පාදවලින් පාගාදමන එකත් පැහැදුණු
වතුර බී ඉතුරු ඒවා නුඹලාගේ පාදවලින්
කිලුටුකරන එකත් නුඹලාට සුළු දෙයක්ව
19 පෙනේද? මාගේ බැටළුවෝ නුඹලාගේ
පාදවලින් පෑගුවාවූ ඒවා කති, නුඹලාගේ
පාදවලින් කිලුටු කළ ඒවා බොති.

## අලුත් එඬේරා සහ අලුත් ගිවිසුම

20 එබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ
ඔවුන්ට මෙසේ කියනසේක: බලව, මමම
තර සිවිපාවුන් සහ කෙට්ටු සිවිපාවුන්
21 අතරේ විනිශ්චයකරන්නෙමි. දුර්වලවූ
සියල්ලන් පිටතට පන්නාදමන තුරු
නුඹලා ඇලපතෙන්ද උරෙන්ද තල්ලුකර,
නුඹලාගේ අංවලින් උන්ට අනින බැවින්,
මාගේ බැටළුවන් තවත් ගොදුරු නොවන 22
ලෙස මම උන් ගළවා, සිවිපාවුන් සහ
සිවිපාවුන් අතරේ විනිශ්චයකරන්නෙමි;
ඔවුන් පෝෂ්‍යකිරීමට එකම එඬේරෙක් 23
වන මාගේ සේවකයාවූ දවිත් නැගුටුවා
ඔවුන් කෙරෙහි පත්කරන්නෙමි; හෙතෙම
ඔවුන් පෝෂ්‍යකොට ඔවුන්ගේ එඬේරා
වන්නේය. **ස්වාමීන්වහන්සේ** වන මම 24
ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි,
මාගේ සේවකයාවූ දවිත්ද ඔවුන් අතරේ
අධිපතියා වන්නේය; **ස්වාමීන්වහන්සේ**
වන මම ඒක කීමි. මම ඔවුන් සමග 25
සමාදාන ගිවිසුමක් කරන්නෙමි; ඔවුන්ට
සුවසේ කාන්තාරයෙහි වසන්ටත්
කැලෑවල නිදාගන්ටත් පුළුවන්වන ලෙස
මම චණ්ඩ මෘගයන් දේශයෙන්
පහකරන්නෙමි. මම ඔවුන් සහ මාගේ 26
කන්ද වටකර ඉඩම් ආශීර්වාදයක්
කරන්නෙමි; වැස්ස නියම කාලයට
වස්වන්නෙමි; ආශීර්වාද වර්ෂා පැමි-
ණෙනවා ඇත. කෙතේ ගස්වල එල 27
හටගන්නේය, දේශය ඒකේ අස්වැන්න
දෙන්නේය, ඔව්හු උපද්‍රව රහිතව තමුන්ගේ
රටෙහි සිටින්නෝය; ඔව්හු මා විසින්
ඔවුන්ගේ වියගස් කඩා, ඔවුන් වාල්-
කරගත් අයගේ අත්වලින් ඔවුන් ගළවා-
ගත්තාම, මා **ස්වාමීන්වහන්සේ** බව
ඔවුන් දැනගන්නවා ඇත. ජාතීන්ට තවත් 28
ඔව්හු කොල්ලයක් නොවන්නෝය,
පොළොවේ මෘගයෝ උන් නොකන්නෝය;
කිසිවෙක් ඔවුන් භයගන්වන්නේ නැතුව,
ඔව්හු සුවසේ වාසයකරන්නෝය.
කීර්තිය පිණිස මම ඔවුන්ට ගස් 29
පන්තියක් උපදවන්නෙමි, ඔව්හු තවත්
දේශයෙහි සාගතයෙන් විනාශ
නොවන්නෝය, ජාතීන්ගේ නින්දාකිරීම
තවත් නොදරන්නෝය. මෙසේ ඔවුන්ගේ 30
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** වන මා
ඔවුන් සමග සිටින බවද ඉශ්‍රායෙල්
වංශයවූ ඔවුන් මාගේ සෙනඟ
බවද ඔව්හු දැනගන්නෝයයි ස්වාමිවූ
දෙවියන්වහන්සේ කියනසේක. මාගේ 31
බැටළුවෝ වන මාගේ ගොදුරු බිමේ
බැටළුවෝවූ නුඹලා වනාහි මනුෂ්‍යයෝය,
මම නුඹලාගේ දෙවියන්වහන්සේයයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේකැයි
කීය.

*එනම්, ශක්තිමත් සිවිපාවුන්.

## ඒදෙම්ට විරුද්ධව අනාගත වාක්‍ය කීම

35 තවද ස්වාමීන්වහන්සේගේ වචනය
මා වෙතට පැමිණ කියනුයේ:
2 මනුෂ්‍ය පුත්‍රය, නුඹේ මුහුණ සේයිර් කන්ද
දෙසට හරවාගන, ඊට විරුද්ධව අනා-
3 ගතවාක්‍ය කියමින්, මෙසේ කියාපන්න–
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක: එම්බා සේයිර් කන්ද, බලව,
මම නුඹට විරුද්ධව සිට, මාගේ අත
නුඹට විරුද්ධව දිගුකොට, නුඹ පාළුවක්ද
4 නාස්තියක්ද කරන්නෙමි. මම නුඹේ
නුවරවල් පාළුවක් කරන්නෙමි, නුඹ
නාස්තියක් වී, මා ස්වාමීන්වහන්සේ
5 බව දැනගන්නෙහිය. නුඹ නිරන්තරයෙන්
සතුරුකම පවත්වමින් සිට අන්තිමයේ
අයුතුකමේ කාලයට පැමුණුණු ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ විපත්ති කාලයේදී ඔවුන්
6 කඩුවේ බලයට පාවාදුන් බැවින්, මා
ජීවමාන බව සැබෑවා සේම මෙසේ
කියමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක: මම නුඹ ලෙයට සූදනම්-
කරන්නෙමි, ලේද නුඹ පස්සේ එළවා-
ගෙන එනවා ඇත. නුඹ ලේ වැගිරවීමට
ද්වේෂ නොකළ බැවින්, ලේ එළවාගෙන
7 එනවා ඇත. මම සේයිර් කන්ද පාළුවක්ද
නාස්තියක්ද කොට, එහි යන එන කෙ-
නෙක් නැතුව තිබෙන්ට සලස්වන්නෙමි.
8 මැරුම්කන ඔහුගේ අයගෙන් ඔහුගේ කඳු
පුරවන්නෙමි. නුඹේ හෙල්වලද නුඹේ
මිටියාවත්වලද නුඹේ සියලු දෙණිවලද
කඩුවෙන් මැරුම්කන අය වැටෙනවා
9 ඇත. මම නුඹ සදහටම පාළුවක්
කරන්නෙමි, නුඹේ නුවරවලද වැසියෝ
නොසිටින්නාහුය. මෙසේ මා ස්වාමීන්-
වහන්සේ බව නුඹලා දැනගන්නවා ඇත.
10 ස්වාමීන්වහන්සේ මෙහි සිටියදීත් නුඹ:
මේ ජාති දෙකද මේ රටවල් දෙකද මට
අයිතිවන්නේය කියාත් අපි එය හිමි-
11 කරගන්නෙමුය කියාත් කී බැවින්–මා
ජීවමාන බව සැබෑවා සේම මෙසේ
කියමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක. ඔවුන් කෙරෙහි තිබෙන
නුඹේ වෛරයෙන් නුඹ පැවාවූ නුඹේ
උදහසේ හැටියටත් නුඹේ ඊර්ෂ්‍යාවේ
හැටියටත් මම නුඹට කරන්නෙමි; මා
නුඹ විනිශ්චයකරන කල ඔවුන් අතරෙහි
ප්‍රකාශවන්නෙමි. ඒවා පාළුවී අපේ 12
භුක්තියට දී තිබේය කියා නුඹ ඉශ්‍රායෙල්
කඳුවලට විරුද්ධව කීවාවූ නුඹේ සියලුම
අපහාස කථා ස්වාමීන්වහන්සේ වන
මා ඇසූ බව නුඹ දැනගන්නෙහිය.
නුඹලාගේ මුඛයෙන් නුඹලා මට විරුද්ධව 13
ගරුකම් කියා මට විරුද්ධව නුඹලාගේ
වචන වැඩිකළහුය. මම ඒක ඇසීමි.
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන- 14
සේක: මුළු පොළොව ප්‍රීතිවන අතර
නුඹ පාළුවක් කරවන්නෙමි. ඉශ්‍රායෙල් 15
වංශයේ උරුමය පාළුවක් වුණ බැවින්
නුඹ ඊට ප්‍රීති වුණාක්මෙන් මම නුඹට
එසේම කරන්නෙමි. එම්බා සේයිර් කන්ද,
නුඹ සහ මුළු ඒදෙම් මුළුමනින්ම පාළුවක්
වන්නේය. මෙසේ මා ස්වාමීන්වහන්සේ
බව ඔවුන් දැනගන්නවා ඇත.

## ඉශ්‍රායෙල් නැවත පිහිටුවන බව කඳුවලට ප්‍රකාශකිරීම

36 තවද මනුෂ්‍ය පුත්‍රය, නුඹ ඉශ්‍රා-
යෙල් කඳුවලට අනාගතවාක්‍ය
කියමින් මෙසේ කියාපන්න: ඉශ්‍රායෙල්
කඳු, ස්වාමීන්වහන්සේගේ වචනය අසා-
පල්ලා. ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ 2
කියනසේක–සතුරා නුඹලා ගැන
කථාකොට: ඔහෝ, පුරාණ උසස්ථාන
අපට උරුමයක් වී තිබේයයි කියන
බැවින්, නුඹ අනාගතවාක්‍ය කියමින්: 3
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේකැයි කියාපන්න. ඉතුරු ජාතීන්ට
නුඹලා උරුමයක් වෙන පිණිස ඔවුන්
නුඹලා පාළුකළ බැවින්ද නුඹලා වටකර
හතිදමමින්ද ඉවඅල්ලන බැවින්ද නුඹලා
තොල්වල දෙඩීමක්ව සෙනඟ අතරේ
නින්දවක්ව සිටින බැවින්ද, ඉශ්‍රායෙල් 4
කඳු, ස්වාමිවූ දෙවියන්වහන්සේගේ
වචනය අසාපල්ලා. කඳුවලටත් හෙල්-
වලටත් දෙණිවලටත් මිටියාවත්වලටත්
අවට ඉතිරිව සිටින ජාතීන්ට කොල්ල-
යක්ව කවටකමක්ව තිබෙන්නාවූ පාළුවූ
නාස්ති ඉඩම්වලටත් අත්හැරී තිබෙන
නුවරවලටත් ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක. එසේවූ බැවින් 5
ස්වාමිවූ දෙවියන්න්වහන්සේ මෙසේ
කියනසේක: මාගේ දේශය කොල්ලයක්
කොට උදුරාගන්න පිණිස මුළු සිතේ

සන්තෝෂයෙන්ද ආත්මයේ උඩඟු-
කමින්ද ඒක තමුන්ට උරුමයක් කොට
නියමකරගත් ඉතුරු ජාතීන්ටත් මුළු
ඒදෙම්ටත් විරුද්ධව සැබෑවටම මාගේ
*ජ්වලිත ගින්නෙන් මම කථාකෙළෙමි.
6 එබැවින් ඉශ්‍රායෙල් රට ගැන අනාගත-
වාක්‍ය කියමින්, කඳුවලටත් හෙල්වලටත්
දෙණිවලටත් මිටියාවත්වලටත්: ස්වාමිවූ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි
කියාපන්න-බලව, නුඹලා ජාතීන්ගේ
නින්දව දරූ නිසා මාගේ *ජ්වලිතයෙන්ද
මාගේ උදහසින්ද මම කථාකෙළෙමි.
7 එබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක: නුඹලා අවට සිටින
ජාතීන්ම තමුන්ගේ නින්දව දරනවා ඇත
කියා දිවිරීමට මමම මාගේ අත එසෙවු-
8 වෙමි. නුමුත්, එම්බා ඉශ්‍රායෙල් කඳු,
නුඹලා විනාහි නුඹලාගේ අතු ලියලවා,
මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට නුඹලාගේ
ඵල දරාදෙනවා ඇත; ඔවුන් එන්ට ළඟය.
9 මක්නිසාද මම නුඹලා උදෙසාය, නුඹලා
වෙතට හැරෙන්නෙමි, නුඹලාද අස්වද්ද,
10 වපුරනු ලබන්නහුය. මම නුඹලා පිට
මනුෂ්‍යයන්, එනම් මුළු ඉශ්‍රායෙල් වංශයම,
වැඩිකරන්නෙමි. නුවරවල් ජනගහනය
වෙනවා ඇත, පාළු තැන්ද ගොඩනගනු
11 ලබනවා ඇත. මම නුඹලා පිට මනුෂ්‍ය-
යන්ද තිරිසනුන්ද වැඩිකරන්නෙමි; ඔව්හු
වැඩිවී බෝවන්නෝය. නුඹලාගේ ප්‍රථම
කාලවලදී මෙන් නුඹලා පිට මිනිසුන්
වාසයකරවා, නුඹලාගේ මුල් කාල-
වලට වඩා මම නුඹලාට යහපත
කරන්නෙමි. නුඹලාද මා ස්වාමීන්වහන්සේ
12 බව දැනගන්නවා ඇත. එසේය, නුඹලා
පිට මනුෂ්‍යයන්ට, එනම් මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්ට ඇවිදින්ට සලස්වන්නෙමි;
ඔවුන් නුඹව හිමිකරගන්නවා ඇත, නුඹද
ඔවුන්ට උරුමයක් වන්නෙහිය, ඔවුන්ගේ
දරුවන් නුඹ තවත් නැතිකර නො-
13 දමන්නෙහිය. ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක: දේශය, නුඹ
මනුෂ්‍යයන් කාදමා, නුඹේ සෙනඟ

*එනම්, කෝප ගින්නෙන්-කෝපයෙන්.

නැතිකළායයි නුඹට කියන බැවින්, නුඹ 14
තවත් මනුෂ්‍යයන් කාදමන්නේවත් නුඹේ
සෙනඟ තවත් නැතිකරන්නේවත් නැතැයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
නුඹට විරුද්ධව ජාතීන්ගේ අපහාස කථා 15
අසන්ට මම තවත් ඉඩ නොදෙන්නෙමි,
ජනයන්ගේ නින්දව නුඹ තවත් දරන්-
නේවත් නුඹ තවත් නුඹේ ජාතිය පැකිල-
වන්නේවත් නැතැයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේකැයි කීය.

## මෙය කරන්නේ ඉශ්‍රායෙල් නිසා නොව ස්වාමීන්වහන්සේගේ නාමය නිසාම බව

තවද ස්වාමීන්වහන්සේගේ වචනය 16
මා වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය 17
පුත්‍රය, ඉශ්‍රායෙල් වංශය තමුන්ගේ
රටෙහි වාසයකරද්දී ඔව්හු තමුන්ගේ
මාර්ගයෙන්ද තමුන්ගේ ක්‍රියාවලින්ද ඒක
අපවිත්‍රකළෝය. ඔවුන්ගේ මාර්ගය කිළිටි
ස්ත්‍රියෙකුගේ අපවිත්‍රකම මෙන් මා ඉදිරි-
යෙහි වූයේය. මමද ඔවුන් දේශය පිට 18
වැගිරෙවූ ලේ නිසාත් ඔවුන් තමුන්ගේ
රූපවලින් ඒක අපවිත්‍රකළ නිසාත් මාගේ
කෝපය ඔවුන් කෙරෙහි වගුරුවා,
ජාතීන් අතරට ඔවුන් පන්නා දැමීමි, 19
ඔව්හු දේශවල විසුරුවනු ලැබුවෝය.
ඔවුන්ගේ මාර්ගයේද ඔවුන්ගේ ක්‍රියාවලද
ප්‍රකාරයට ඔවුන් විනිශ්චයකෙළෙමි.
ඔවුන් පැමිණි තැන්වල ජාතීන් ළඟට 20
ඔවුන් ගිය කල: මොව්හු ස්වාමීන්-
වහන්සේගේ සෙනඟය, උන්වහන්සේගේ
දේශයෙන් පිටවුණෝයයි මිනිසුන් ඔවුන්
ගැන කී නිසා ඔව්හු මාගේ ශුද්ධ නාමය
කෙලෙසුවෝය. නුමුත් ඉශ්‍රායෙල් වංශය 21
පැමිණි තැන්වල ජාතීන් අතරෙහි ඔවුන්
කෙලෙසුවාවූ මාගේ ශුද්ධ නාමය කෙරෙහි
අනුකම්පා ඇතිවීමි. එබැවින්: ස්වාමිවූ 22
දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි
ඉශ්‍රායෙල් වංශයට කියාපන්න-එම්බා
ඉශ්‍රායෙල් වංශය, නුඹලා නිසා නොව
නුඹලා පැමිණි තැන්වල ජාතීන් අතරෙහි
නුඹලා විසින් කෙලෙසූ මාගේ ශුද්ධ
නාමය උදෙසා ක්‍රියාකරමි. ජාතීන් 23

අතරෙහි කෙලෙසී තිබෙන්නාවූ, තුඹලා
විසින් ඔවුන් අතරෙහි කෙලෙසුවාවූ මාගේ
මහත් නාමය විශුද්ධකරන්නෙමි; මා
විශුද්ධ බව තුඹලා කරණකොටගෙන
ජාතීන්ගේ ඇස් හමුයෙහි පෙනෙන කල,
මා **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැන-
ගන්නවා ඇතැයි ස්වාමිවූ **දෙවියන්-**
24 **වහන්සේ** කියනසේක. එසේය, මම ජාතීන්
අතරෙන් තුඹලා රැගෙන, සියලු දේශ-
වලින් තුඹලා රැස්කර, තුඹලාගේම රටට
25 ගෙනෙන්නෙමි. තුඹලා පිරිසිදුවන ලෙස
මම තුඹලා කෙරෙහි පිරිසිදු දිය
ඉසින්නෙමි. තුඹලාගේ සියලු අපවිත්‍ර-
කම්වලින්ද තුඹලාගේ සියලු දේවරූප-
26 වලින්ද තුඹලා පිරිසිදුකරන්නෙමි. මම
අලුත් සිතක් තුඹලාට දී, අලුත් ආත්මයක්
තුඹලා තුළ තබා, තුඹලාගේ මාංසයෙන්
ගල් සිත පහකොට, මාංසමයවූ සිතක්
27 තුඹලාට දෙන්නෙමි. මාගේ ආත්මය
තුඹලා තුළ තබා, තුඹලා මාගේ පනත්
ප්‍රකාර හැසිර මාගේ විනිශ්චයන් පවත්-
28 වමින් ඒවා කරන්ට සලස්වන්නෙමි. මා
විසින් තුඹලාගේ පියවරුන්ට දුන්
දේශයෙහි තුඹලා වාසයකොට මාගේ
සෙනඟව සිටිනවා ඇත, මමද තුඹලා-
29 ගේ දෙවියන්වහන්සේ වන්නෙමි. මම
තුඹලාගේ සියලු අපවිත්‍රකම්වලින් තුඹලා
ගළවන්නෙමි. තුඹලා පිටට සාගතය
නොපමුණුවා, ධාන්‍ය උපදවාදී, ඒවා
30 වැඩිකරන්නෙමි. තුඹලා ජාතීන් අතරෙහි
සාගතයේ නින්දාව තවත් නොලබන
පිණිස මම ගස්වල ඵලද කෙත්වල
31 අස්වැන්නද වැඩිකරන්නෙමි. තුඹලාද
තුඹලාගේ නපුරු මාර්ග සහ තුඹලාගේ
අයහපත් ක්‍රියා සිහිකොට, තුඹලාගේ
අයුතුකම්ද තුඹලාගේ පිළිකුල්කම්ද නිසා
32 තුඹලාටම පිළිකුල්කරන්නහුය. මා
මෙසේ ක්‍රියාකරන්නේ තුඹලා නිසා
නොවන බව දැනගනිල්ලායයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක. එම්බා
ඉශ්‍රායෙල් වංශය, තුඹලාගේ මාර්ග
33 නිසා ලජ්ජාවී කැලඹියල්ලා. ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
තුඹලාගේ සියලු අපරාධවලින් මා විසින්
තුඹලා පිරිසිදුකරන දවසේදී මම නුවරවල
මිනිසුන් වාසයකරවන්නෙමි, පාළු ඉඩම්ද
ගොඩනගනු ලබන්නේය. මග යන 34
සියල්ලන්ට දේශය පාළුවක්ව පෙනුණු
නුමුත් එය අස්වද්දනු ලබන්නේය.
මිනිස්සුද කථාකොට: පාළුවී තිබුණු 35
මේ දේශය ඒදන් උයන මෙන් වී තිබේ;
නාස්තිව පාළුව ජරාවාසව තිබුණාවූ
නුවරවල් බලකොටුවී වැසියන් ඇතුව
තිබේයයි කියන්නෝය. තුඹලා වටකර 36
ඉතිරිවෙන ජාතීන්ද **ස්වාමීන්වහන්සේ** වන
මා විසින් ජරාවාසවූ තැන් ගොඩ-
නගන්ටත් පාළුවූ ඉඩම් වවන්ටත් යෙදුණු
බව දැනගන්නහුය. **ස්වාමීන්වහන්සේ** වන
මම ඒක කීයෙමි, ඒක කරන්නෙමි.
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ 37
කියනසේක: මෙය ඉශ්‍රායෙල් වංශයට
කරන ලෙස මම ඔවුන්ගේ ඉල්ලීමට
තව දුරටත් ඇහුම්කන්දෙන්නෙමි; රැළක්
මෙන් ඔවුන්ගේ ගණන වැඩිකරන්නෙමි.
පූජාකිරීමට කැපකළ බැටළු රැළ මෙන්, 38
යෙරුසලමේ මංගල්‍යවලදී එහි සිටින
බැටළු රැළ මෙන්, පාළු නුවරවල් මනුෂ්‍ය
රැළවලින් පිරෙනවා ඇත. ඔවුන්ද මා
**ස්වාමීන්වහන්සේ** බව දැනගන්නවා
ඇතැයි කීය.

## ඉශ්‍රායෙල් නැවත ප්‍රාණවත් කර එක රජෙකු යටතේ එක්සත්කිරීම

**37** **ස්වාමීන්වහන්සේගේ** අත මා
පිටට පැමිණ, **ස්වාමීන්වහන්සේගේ**
ආත්මයෙන් මා පිටතට පමුණුවා,
සමභූමිය මැද සිටෙවුවේය; ඒක ඇට-
වලින් පිරී තිබුණේය; උන්වහන්සේ ඒවා 2
අතරේ වටකර එහා මෙහා යන්ට මට
සැලැස්සූසේක. එවිට සමභූමිය මතුපිට
ඒවා බහුලව තිබෙනවා දුටිමි; ඒවා
හොඳටම වියළී තිබුණේය. එවිට උන්- 3
වහන්සේ: මනුෂ්‍ය පුත්‍රය, මේ ඇට
ජීවත්වේදැයි මාගෙන් ඇසූසේක. මමද:
ස්වාමිවූ **දෙවියන්වහන්ස**, එය දන්නේ
ඔබයයි උත්තරදුනිමි. උන්වහන්සේ නැවත 4
මට කථාකොට: තුඹ මේ ඇට කෙරෙහි
අනාගතවාක්‍ය කියමින් ඒවාට මෙසේ

කියාපන්න–වියළි ඇට, ස්වාමීන්-
5 වහන්සේගේ වචනය අසාපල්ලා. මේ
ඇටවලට ස්වාමිවූ දෙවියන්වහන්සේ
මෙසේ කියනසේක: මෙන්න, නුඹලා
ජීවත්වන ලෙස මම නුඹලා තුළට
6 ආත්මය පමුණුවන්නෙමි. මම නුඹලා
පිට නහර තබා, නුඹලා කෙරෙහි මාංස
හටගන්වා, නුඹලා සමින් වසා, නුඹලා
ජීවත්වන ලෙස නුඹලා තුළ ආත්මය
තබන්නෙමි; නුඹලා මා ස්වාමීන්වහන්සේ
බව දනගන්නවා ඇත කියා කියාපන්නැයි
7 කීය. එවිට මට අණකළ ලෙස මම
අනාගතවාක්‍ය කීමි. මා අනාගතවාක්‍ය
කියද්දී ශබ්දයක්ද භූමිකම්පාවක්ද විය,
එක එක ඇටය ස්වකීය ඇටවලට ළංවිය.
8 මම බැලූවිට නහර ඒවා පිට තිබෙනවා
දුටිමි, මාංසය හටගැනී, ඒ උඩ සමින්
වැසුණේය. නුමුත් ඒවා තුළ ආත්මයක්
9 නොවීය. එවිට උන්වහන්සේ මට
කථාකොට: නුඹ *සුළඟට අනාගත-
වාක්‍ය කියාපන්න, මනුෂ්‍ය පුත්‍රය, නුඹ
අනාගතවාක්‍ය කියමින් සුළඟට කථා-
කොට–ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක: එම්බා ආත්මය, නුඹ සතර
දිග සුළංවලින් ඇවිත් මැරුම්කැවාවූ
මොවුන් ජීවත්වන ලෙස මොවුන් තුළට
හුස්ම හෙළාපන්න කියා කියාපන්නැයි
10 මට කීය. මමද උන්වහන්සේ මට අණකළ
ලෙස අනාගතවාක්‍ය කීමි, ආත්මයද
ඔවුන් තුළට පැමිණ, ඔව්හු ජීවත්වී
නැගිට, ඉතා මහත් සේනාවක්ව සිට-
11 ගත්තෝය. එවිට උන්වහන්සේ මට
කථාකොට: මනුෂ්‍ය පුත්‍රය, මේ ඇට
නම් මුළු ඉශ්‍රායෙල් වංශයය. අපේ
ඇට වියළී අපේ බලාපොරොත්තුව
නැතිවී තිබේ; අපි සහමුලින්ම සිඳදමනු
12 ලැබීමුයයි ඔව්හු කියති. එබැවින්
නුඹ අනාගතවාක්‍ය කියමින්: ස්වාමිවූ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි
කියාපන්න–මාගේ සෙනඟෙනි, මම
නුඹලාගේ සොහොන් විවරකොට,
නුඹලාගේ සොහොන්වලින් නුඹලා
නැගුවුවා, නුඹලා ඉශ්‍රායෙල් රටට
13 පමුණුවන්නෙමි. එම්බා මාගේ සෙනඟෙනි,

*එනම්, ආත්මයට

මා විසින් නුඹලාගේ සොහොන්
විවරකොට නුඹලාගේ සොහොන්වලින්
නුඹලා නැගිටෙවුවාම, මා ස්වාමීන්-
වහන්සේ බව නුඹලා දනගන්නවා ඇත.
නුඹලා ජීවත්වන ලෙස මා විසින් නුඹලා 14
තුළ මාගේ ආත්මය තබා, නුඹලාගේ
රටෙහි නුඹලා පිහිටුවන්නෙමි. මෙසේ
ස්වාමීන්වහන්සේ වන මා ඒක කියා
ඉෂ්ටකළ බව නුඹලා දනගන්නහුයයි
ස්වාමීන්වහන්සේ කියනසේකැයි මට කීය.
නැවත ස්වාමීන්වහන්සේගේ වචනය 15
මා වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, නුඹ එක ලීයක් රැගෙන–යූදටත් 16
ඔහුගේ සමාගම්කාරයන් වන ඉශ්‍රායෙල්
පුත්‍රයන්ටත්ය කියා ඒක පිට ලියා,
තව ලීයක් රැගෙන–යෝසෙප්ට අයිති
එප්‍රායිම්ගේද ඔහුගේ සමාගම්කාරයන්
වන මුළු ඉශ්‍රායෙල් වංශයේද ලීයය
කියා ඒක පිට ලියා, ඒවා නුඹේ අතේ 17
එකක් වෙන පිණිස එක ලීයක් කොට
එකිනෙකට ළංකරගනින්න. නුඹේ 18
සෙනඟගේ පුත්‍රයන් නුඹට කථාකොට:
මේවායින් නුඹ හඟවන්නේ කිමෙක්ද
කියා නුඹ අපට නොදන්වන්නෙහිදැයි
නුඹෙන් ඇසුවාම, නුඹ ඔවුන්ට කථා- 19
කොට: ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක–මෙන්න, එප්‍රායිම්ගේ අතේ
තිබෙන යෝසෙප්ගේ ලීයද ඔහුගේ
සමාගම්කාරයන් වන ඉශ්‍රායෙල් ගෝත්‍රද
මා විසින් රැගෙන, ඒවා ඒකට, එනම්
යූදගේ ලීයට තබා, ඒවා මාගේ අතේ
එකක් වෙන ලෙස ඒවා එක ලීයක්
කරන්නෙමියි කියාපන්න. නුඹ විසින් 20
ලිවීමක් කරන ලී ඔවුන් ඉදිරියෙහි නුඹේ
අතේ තිබෙද්දී: ස්වාමිවූ දෙවියන්වහන්සේ 21
මෙසේ කියනසේකැයි ඔවුන්ට කියාපන්න.
ඉශ්‍රායෙල් පුත්‍රයන් ගොස් සිටින තැන්වල
ජාතීන් අතරෙන් මම ඔවුන් රැගෙන,
වටකරින් ඔවුන් රැස්කොට, ඔවුන්ගේ
රටට ඔවුන් පමුණුවා, දේශයෙහි 22
ඉශ්‍රායෙල් කඳු පිට ඔවුන් එක ජාතියක්
කරන්නෙමි; එක රජෙක්ද ඔවුන්
සියල්ලන්ටම රජ වන්නේය. ඔව්හු තවත්
ජාති දෙකක් නොවන්නෝය, තවත්
රාජ්‍ය දෙකකට නොබෙදෙන්නෝය.

23 ඔව්හු තමුන්ගේ දේවරූපවලින්වත් තමුන්-
ගේ අශික්ෂිතකම්වලින්වත් තමුන්ගේ
සියලුම වරදවලින්වත් තමුන් කිලුටුකර
නොගන්නෝය. ඔවුන් පව්කළාවූ තමුන්-
ගේ සියලුම වාසස්ථානවලින් මම ඔවුන්
ගළවා ඔවුන් පිරිසිදුකරන්නෙමි. මෙසේ
ඔව්හු මාගේ සෙනඟ වන්නෝය, මමද
ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි.
24 මාගේ සේවකයාවූ දාවිත් ඔවුන් කෙරෙහි
රජ වන්නේය; ඔවුන් සියල්ලන්ටම එක
එඬේරෙක් වන්නේය. ඔව්හු මාගේ
විනිශ්චයන් ලෙස හැසිර, මාගේ පනත්
25 පවත්වා, ඒවා කරන්නෝය. මාගේ
සේවකයාවූ යාකොබ්ට මා දුන්නාවූ,
තුඹලාගේ පියවරුන් වාසයකළාවූ දේශ-
යෙහි ඔවුන් වාසයකරනවා ඇත; එසේ
ඔවුන් සහ ඔවුන්ගේ දරුවෝද ඔවුන්ගේ
දරුවන්ගේ දරුවෝද සදාකාලේටම එහි
වාසයකරන්නෝය. මාගේ සේවකයාවූ
දාවිත්ද සදාකාලේටම ඔවුන්ට අධිපතියා
26 වන්නේය. තවද මම සමාදාන ගිවිසුමක්
ඔවුන් සමග කරන්නෙමි. එය ඔවුන්
සමග සදාකාල ගිවිසුමක් වන්නේය. මම
ඔවුන් පිහිටුවා, ඔවුන් වැඩිකොට, මාගේ
ශුද්ධස්ථානය ඔවුන් අතරෙහි සදා-
27 කාලේටම පිහිටුවන්නෙමි. මාගේ මණ්ඩ-
පයද ඔවුන් වෙත වන්නේය; මම ඔවුන්ගේ
දෙවියන්වහන්සේ වන්නෙමි, ඔව්හු මාගේ
28 සෙනඟ වන්නෝය. මාගේ ශුද්ධස්ථානය
හැම කල්හිම ඔවුන් අතරෙහි තිබීමෙන්
මා ඉශ්‍රායෙල් විශුද්ධකරන **ස්වාමීන්-
වහන්සේ** බව ජාතීන් දැනගන්නවා ඇත
කියා කියාපන්නැයි කීය.

## ගොග් සහ අනික් ජාතීන් ඉශ්‍රායෙල්ට විරුද්ධවීම ස්වාමීන්වහන්සේ විසින් ඔවුන් ආරක්ෂාකරගැනීම

38 ස්වාමීන්වහන්සේගේ වචනය මා
2 වෙතට පැමිණ කියනුයේ: මනුෂ්‍ය
පුත්‍රය, රොෂ්හිද මෙෂෙක්හිද තුබල්හිද
අධිපතියා වන මාගොග් දේශයේ ගොග්ට
විරුද්ධව නුඹේ මුහුණ හරවාගෙන, ඔහුට
3 විරුද්ධව අනාගතවාක්‍ය කියමින්: ස්වාමිවූ
දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි
කියාපන්න—බලව, රොෂ්හිද මෙෂෙක්හිද
තුබල්හිද අධිපතියා වන ගොග්, මම
නුඹට විරුද්ධයෙමි. මම නුඹ පස්සට 4
හරවා, නුඹේ හකුවල කොකු දමා, නුඹ
සහ නුඹේ මුළු සේනාව අසුන්ද අසුරුවන්ද
ඇතුළුව පිටතට ගෙනයන්නෙමි; ඔවුන්
සියල්ලෝම අලංකාර වස්ත්‍ර ඇඳගෙන,
පලිස්ද කුඩා පලිස්ද ඇති මහත් සමූහ-
යක්ව, සියල්ලෝම කඩු පාවිච්චි කරන්-
නෝව සිටිති. ඔවුන් සමග පාර්සිවරුද 5
කූෂ්වරුද පූට්වරුද සිටිති; ඔවුන් සියල්-
ලන්ට පලිස්ද යුද්ධ තොප්පිද තිබේ.
ගොමෙර් සහ ඔහුගේ සියලු සමූහවල්ද 6
උතුරේ දුරස්ථානවල තොගර්මා වංශය
සහ ඔහුගේ සියලු සමූහවල්ද යන
බොහෝ ජනයෝ නුඹ සමග සිටිති.
නුඹ සූදානම්වී, එසේය, නුඹ වෙතට 7
රැස්ව සිටින නුඹේ සියලු සමූහයන් සමග
(සියල්ල) සූදානම්කරගෙන, ඔවුන්ගේ
ප්‍රධානියා වෙයන්න. බොහෝ දවස් ගිය 8
පසු නුඹ ප්‍රධානකමට පත්වී, කඩුවෙන්
මිදී තිබෙන දේශයකට මතු අවුරුදුවලදී
එනවා ඇත. එහි වැසියෝ බොහෝ
ජනයන් අතරෙන් ඉශ්‍රායෙල් කඳුවලට
රැස්කරනු ලැබුවෝය. ඒවා නිතරම
පාළුවක්ව තිබෙන නුමුත්, ඔවුන් ජනයන්
අතරෙන් ගෙන්වනු ලැබ, සියල්ලෝම
නිසැකව (එහි) වාසය කරති. එවිට 9
නුඹ නැගී ඇවිත්, කුණාටුවක් මෙන්
පැමිණෙනවා ඇත, නුඹ සහ නුඹ සමග
නුඹේ සියලු සමූහවන්ද බොහෝ
ජනයන්ද දේශය වසාගැනීමට වලාකුළක්
මෙන් සිටිනවා ඇත. ස්වාමිවූ **දෙවියන්- 10
වහන්සේ** මෙසේ කියනසේක: ඒ
කාලයෙහි නුඹේ සිතට කාරණා පහළව,
නුඹ නපුරු යෝජනාවක් කරගෙන
කථාකොට—මම පවුරු රහිත ගම් ඇති 11
දේශයට විරුද්ධව නැගී ගොස්, නිශ්චල-
කමින් සිට නිසැකව වාසයකරන අය
ළඟට පැමිණෙන්නෙමි; ඔවුන් සියල්ලෝම
පවුරු නැතුව වාසයකරති, ඔවුන්ට
අගුල්ද දොරවල්ද නැතැයි කියනවා ඇත.
නුඹ එසේ පැමිණෙන්නේ කොල්ල- 12
කෑමටත් සම්පත් උදුරාගැනීමටත් මනුෂ්‍ය-
යන් වාසයකරන්නාවූ පාළුව තිබුණු
ස්ථානවලටද ජාතීන් අතරෙන් රැස්වී
සිටින්නාවූ, සිව්පාවුන් සහ සම්පත්

ලබාගෙන පොළොවේ මැද ස්ථානයෙහි
වසන්නාවූ සෙනඟටද විරුද්ධව නුඹේ
13 අත හැරවීමටත්ය. ෂෙබාවරු සහ දෙදන්-
වරුද තර්ෂීෂ්හි වෙළෙන්දෝද එහි සියලු
තරුණ සිංහයෝද නුඹට කථාකොට:
නුඹ කොල්ලකන්ට ආයෙහිද? නුඹේ
සේනාව නුඹ රැස්කරගත්තේ සම්පත්
උදුරාගනිමින්, රන් රිදී රැගෙන, සිව්-
පාවුන්ද සම්පත්ද අල්ලා, බොහෝ
කොල්ල ලබාගන යන පිණිසදැයි අසන්-
නාහුය.
14 එබැවින්, මනුෂ්‍ය පුත්‍රය, නුඹ අනා-
ගතවාක්‍ය කියමින්: ස්වාමිවූ **දෙවියන්-
වහන්සේ** මෙසේ කියනසේකැයි ගොග්ට
කියාපන්න: මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්
නිසැකව වාසයකරන කාලයේදී නුඹ
15 ඒක දැනගන්නේ නැද්ද? උතුරේ දුර-
ස්ථානවල තිබෙන නුඹේ ස්ථානයේ සිට
නුඹ සහ නුඹ සමග බොහෝ ජනයන්
අසුන් පිට සියල්ලන්ම නැගී, මහත්
සමූහයක්ව, බලවත් සේනාවක්ව එනවා
16 ඇත. නුඹ දේශය වසාගැනීමට වලා-
කුළක් මෙන් මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට
විරුද්ධව නැගී එනවා ඇත; එය මතු
දවස්වලදී සිදුවන්නේය. එම්බා ගොග්,
මා ශුද්ධ බව නුඹ කරණකොටගෙන
ජාතීන්ගේ ඇස්වලට පෙනෙන කල, ඔවුන්
මා ඇඳිනගන්න පිණිස මම නුඹ මාගේ
දේශයට විරුද්ධව පමුණුවන්නෙමි.
17 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ කියන-
සේක: ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව නුඹ
පමුණුවන්නෙමියි කියා පුරාණ කාලයේ
අවුරුදුවල අනාගතවාක්‍ය කීවාවූ මාගේ
දසයන්වූ ඉශ්‍රායෙල් අනාගතවක්තෘවරුන්
ලවා මා ඒ දවස්වල කියෙවුවේ නුඹ
18 ගැන නොවේද? ගොග් ඉශ්‍රායෙල් රටට
විරුද්ධව එන ඒ කාලයේදී මාගේ උදහස
මාගේ මුහුණෙහි ඇවිළෙනවා ඇතැයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේක.
19 මක්නිසාද මාගේ *කෝපයෙන්ද මාගේ
උදහස් ගින්නෙන්ද මෙසේ කියමි:
සැබවින්ම ඒ කාලයේදී ඉශ්‍රායෙල් රටෙහි
20 මහත් කම්පාවක් වන්නේය; මුහුදේ
මත්ස්‍යයෝද ආකාශයේ පක්ෂිහුද වනයේ
මෘගයෝද භූමියෙහි බඩගායන සියලුම
සත්ත්වයෝද භූමිය මතුපිට සිටින සියලු
මනුෂ්‍යයෝද මා ඉදිරියෙහි වෙවුලන්-
නෝය, කඳු හෙළාදමනු ලබන්ටත් උස්-
තැන් වැටෙන්ටත් සියලු පවුරු බිම
වැටෙන්ටත් යෙදෙනවා ඇත. මාගේ සියලු 21
කඳු පිට ඔහුට විරුද්ධව පැමිණෙන්ට
කඩුවට අඬගසන්නෙමියි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක. එක එක
මනුෂ්‍යයාගේ කඩුව ඔහුගේ සහෝදරයාට
විරුද්ධව වන්නේය. මම වසංගතයෙන්ද 22
ලෙයින්ද ඔහු සමග විනිශ්චයට පැමිණ,
ඔහු සහ ඔහුගේ සමූහවන්ද ඔහු සමග
සිටින බොහෝ ජනයන්ද පිටට ජල-
ධාරාවන් සහ මහත් ගල් වර්ෂාවක්ද
ගින්ද ගෙන්දගම්ද වස්වන්නෙමි. මෙසේ 23
මා උතුම්ව ශුද්ධව සිටින බව පෙන්වා,
මා **ස්වාමීන්වහන්සේ** බව බොහෝ ජාතීන්
දැනගන්න පිණිස ඔවුන් ඉදිරියෙහි
ප්‍රකාශවන්නෙමි.

# 39

තවද මනුෂ්‍ය පුත්‍රය, නුඹ
ගොග්ට විරුද්ධව අනාගතවාක්‍ය
කියමින්: ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේකැයි කියාපන්න. බලව,
රොෂ්හිද මෙෂෙක්හිද තුබල්හිද අධිපතියා
වන ගොග්, මම නුඹට විරුද්ධවෙමි. මම 2
නුඹ හරවා, නුඹ ඇද, උතුරේ දුරස්ථාන-
වලින් නුඹ ගෙනැවිත්, ඉශ්‍රායෙල් කඳු 3
පිටට නුඹ පමුණුවා, නුඹේ දුන්න නුඹේ
වමතෙන් ගසාදමා නුඹේ ඊගස් නුඹේ
දකුණතින් වැටෙන්ට සලස්වන්නෙමි.
ඉශ්‍රායෙල් කඳුවල නුඹ සහ නුඹේ සියලු 4
සමූහවල්ද නුඹ සමග සිටින ජනයන්ද
වැටෙනවා ඇත. සියලු ආකාර ගිජු
පක්ෂීන්ටත් වනයේ මෘගයන්ටත් නුඹ
ගොදුරු පිණිස දෙන්නෙමි. නුඹ පො- 5
ළොව මතුපිට වැටෙනවා ඇත. මක්-
නිසාද මම එය කීයෙමියි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක. මම 6
මාගොග් පිටටත් ද්වීපවල නිසැකව
වාසයකරන්නන් පිටටත් ගින්නක් යවන්-
නෙමි. මෙසේ මා **ස්වාමීන්වහන්සේ** බව
ඔවුන් දැනගන්නවා ඇත. මාගේ ශුද්ධවූ 7
නාමය තවත් කෙලෙසන්ට ඉඩනැර, මම
මාගේ ශුද්ධවූ නාමය මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි දන්වන්-
නෙමි. ජාතීන්ද **ස්වාමීන්වහන්සේ** වන මා

*හෙවත්, ජ්වලිතයෙන්ද.

ඉශ්‍රායෙල්වරුන් අතරෙහි ශුද්ධව සිටින
8 බව දැනගන්නවා ඇත. බලව, එය
පැමිණෙයි, එය සිද්ධවේයයි ස්වාමිවූ
දෙවියන්වහන්සේ කියනසේක; ඒ වනාහි
9 මා විසින් කී දවසය. එවිට ඉශ්‍රායෙල්
නුවරවල වැසියෝ පිටතට ගොස්, ගිනි
පත්තුකර, ආයුධ වන පලිස්ද මහ පලිස්ද
දුනුද ඊගස්ද මුගුරුද සෙල්ලද දවන්-
නෝය, සත් අවුරුද්දක් ඒවායින් ගිනි
10 පත්තුකරනවා ඇත. ඔවුන් වනයෙන් දර
ගෙනෙන්නේවත් මූකළාන්වලින් ඒවා
කපාගන්නේවත් නැත; මක්නිසාද ඔව්හු
ආයුධවලින් ගිනි පත්තුකරන්නෝය.
තමුන්ගෙන් කොල්ලකෑ අයින්ගෙන්
කොල්ලකන්නෝය, තමුන්ගෙන් සම්පත්
උදුරාගත් අයින්ගෙන් සම්පත් උදුරා-
ගන්නෝයයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක.
11 තවද ඒ කාලයේදී මම එහි ඉඩමක්
වන මිනීවළක් ඉශ්‍රායෙල් දේශයෙහි
ගොග්ට දෙන්නෙමි; එය මුහුදට නැගෙන-
හිරෙන් තිබෙන ගමන්යන්නන්ගේ
මිටියාවතය. එය ඒ ගමන්යන්නන්
නවත්වනවා ඇත. එහි ගොග් සහ ඔහුගේ
මුළු සමූහයාද වළලා, ඊට *හාමොන්-
12 ගොග්යයි නම් තබන්නෝය. ඉශ්‍රායෙල්
වංශයද දේශය පිරිසිදුකරන පිණිස සත්
මසක් ඔවුන් වළලමින් සිටින්නෝය.
13 එසේය, දේශයේ මුළු සෙනඟ ඔවුන්
වළලන්නෝය; එය වනාහි මා ගෞරවයට
පැමිණෙන කාලයේදී ඔවුන්ට කීර්තියක්
වන්නේයයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
14 කියනසේක. තවද ඔව්හු දේශය පිරිසිදු-
කිරීමට එය මුළුල්ලෙහි ඇවිදිමින්, දේශය
මතු පිට ඉතුරුවෙන ඒ ගමන්යන්නන්
වැළලීමෙහි නිතරම යෙදී සිටීමට
මනුෂ්‍යයන් තෝරාගන්නෝය. ඔව්හු සත්
මසකට පසු එසේ සොයා ඇවිදින්නෝය.
15 දේශයෙහි ඇවිදින්නන්ගෙන් යමෙක්
මිනී ඇටයක් දුටුවාම වළලන්නෝ
ඒක හාමොන්-ගොග්හි වළලන තෙක්
ඒ ළඟ කණුවක් ගොඩනගන්නෝය.
16 තවද නුවරක නමත් †හාමොනා
වන්නේය. මෙසේ ඔවුන් දේශය පිරිසිදු
කරනවා ඇත.

*හෙවත්, ගොග්-සමූහ-මිටියාවත.
†එනම්, සමූහය.

මනුෂ්‍ය පුත්‍රය, ස්වාමිවූ දෙවියන්වහන්සේ 17
මෙසේ කියනසේක: නුඹ වනාහි සියලු
ආකාර පක්ෂීන්ටද වනයේ සියලු
මෘගයන්ටද කථාකොට-තෙපි රැස්වී
වරෙව්; මා විසින් ඉශ්‍රායෙල් කඳුපිට
තොප උදෙසා ඔප්පුකරන මහත් පූජාවක්
වන මාගේ පූජාවට වටකරින් එකතුවී
මස් කා ලේ බොව්. තෙපි බලවතුන්ගේ 18
මාංස කන්නහුය, පොළොවේ අධිපතීන්-
ගේද බැටළුවන්ගේද බැටළුපැටවුන්ගේද
එළුවන්ගේද ගවයන්ගේද ලේ බොන්-
නහුය, උන් සියල්ලෝම බාෂාන්හි තර
සත්තුය. මා විසින් තොප උදෙසා 19
ඔප්පුකර තිබෙන මාගේ පූජාවෙන්
තෙපි තෘප්තිමත්ලෙස තෙල කන්නහුය,
මත්වෙන තුරු ලේද බොන්නහුය. තෙපි 20
අශ්වයන්ගෙන්ද අසරුවන්ගෙන්ද බලව-
තුන්ගෙන්ද සියලු යුද්ධකාරයන්-
ගෙන්ද මාගේ මේසය ළඟ තෘප්තියට
පැමිණෙන්නහුයයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක. මමද මාගේ තේජස 21
ජාතීන් අතරෙහි පෙන්වන්නෙමි, සියලු
ජාතීහු මා ඉෂ්ටකළ විනිශ්චය සහ මා
ඔවුන් කෙරෙහි තැබූ මාගේ හස්තය
දකින්නෝය. ඉශ්‍රායෙල් වංශයද මා 22
ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ බව
ඒ දවසේ පටන් මත්තට දැනගන
සිටින්නෝය. තවද ඉශ්‍රායෙල් වංශය 23
වාලට ගියේ ඔවුන්ගේ අයුතුකම නිසා
බව ජාතීන් දැනගන්නවා ඇත; මක්නිසාද
ඔව්හු මට විරුද්ධව ද්‍රෝහිකම්කළෝය,
මමද මාගේ මුහුණ ඔවුන්ගෙන් සඟවා-
ගෙන, ඔවුන්ගේ එදිරිකාරයන්ගේ අතට
ඔවුන් පාවාදුන්නෙමි, ඔවුන් සියල්ලෝ
කඩුවෙන් වැටුණෝය. ඔවුන්ගේ අපවිත්‍ර- 24
කමේ සහ ඔවුන්ගේ වරදවල හැටියට
මම ඔවුන්ට කර, මාගේ මුහුණ ඔවුන්-
ගෙන් සඟවා ගතිමි.
එබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ 25
මෙසේ කියනසේක: දැන් මම යාකොබ්ගේ
වාල්කම පහකොට, මුළු ඉශ්‍රායෙල්
වංශයට අනුකම්පාකර, මාගේ ශුද්ධවූ
නාමය ගැන *සලකන්නෙමි. මා ජනයන් 26
අතරෙන් ඔවුන් නැවත ගෙනැවිත්,
ඔවුන්ගේ සතුරන්ගේ දේශවලින් ඔවුන්

*හෙවත්, ජ්වලිතවන්නෙමි.

රැස්කොට, මා ශුද්ධ බව ඔවුන්
කරණකොටගෙන බොහෝ ජාතීන්
27 ඉදිරියෙහි පෙන්වනු ලැබුවාම, ඔවුන්
කිසිවෙකුගෙන් භයක් නොලැබ, තමුන්ගේ
රටෙහි සුවසේ වාසයකරන විට, ඔවුන්
තමුන්ගේ ලජ්ජාවත් ඔවුන් මට විරුද්ධව
කළාවූ තමුන්ගේ සියලු ද්‍රෝහිකමුත්
28 සිහිනැතිකරනවා ඇත. ඔවුන් ජාතීන්
අතරට ගෙනගියාවූ මා විසින් ඔවුන්ගෙන්
කිසිවෙකු තවත් එහි අත්නැර ඔවුන්ගේ
රටට ඔවුන් රැස්කරන විට, මා ඔවුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** බව ඔවුන් දැන-
29 ගන්නවා ඇත. මා විසින් මාගේ ආත්මය
ඉශ්‍රායෙල් වංශය කෙරෙහි වැගිරෙවුවාම
මාගේ මුහුණ තවත් ඔවුන්ගෙන් සඟවා
නොගන්නෙමියි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේකැයි කීය.

## අලුත් දේවමාළිගාව සහ එහි කොටස් සම්බන්ධ දර්ශනය

(පරි: 40–42)

40 අපේ වාල්කමේ විසිපස්වෙනි
අවුරුද්ද වන නුවර අසුවීමෙන්
පසු දහහතරවෙනි අවුරුද්දේ පටන්-
ගැන්මේදී මාසයේ දසවෙනිද **ස්වාමීන්-
වහන්සේගේ** හස්තය මා පිටට පැමිණ
උන්වහන්සේ එතනට මා ගෙනාසේක.
2 දෙවියන්වහන්සේගේ දර්ශනවලින් උන්-
වහන්සේ ඉශ්‍රායෙල් දේශයට මා පමුණුවා,
ඉතා උස්වූ කන්දක් උඩ මා සිටෙවුසේක;
ඒක පිට නුවරක නිර්මාණය වැනි දෙයක්
3 දකුණෙන් තිබුණේය. උන්වහන්සේ මා
එතනට පැමිණෙවූ විට පිත්තලවල පෙනීම
වැනි පෙනීමක් ඇති මනුෂ්‍යයෙක් තමාගේ
අතේ හණ ලණුවක්ද මනින දණ්ඩක්ද
4 ඇතුව දොරටුවෙහි සිටිනවා දුටිමි. ඒ
මනුෂ්‍යයා මට කථාකොට: මනුෂ්‍ය පුත්‍රය,
නුඹේ ඇස්වලින් බලා, නුඹේ කන්වලින්
අසා, මා නුඹට පෙන්වන සියල්ලට නුඹේ
සිත යොමුකරපන්න; මක්නිසාද නුඹ
මෙහි පැමිණෙවුවේ ඒවා නුඹට පෙන්වන
පිණිසය. නුඹ දකින සියල්ල ඉශ්‍රායෙල්
වංශයට දන්වාපන්නැයි කීවේය.

ගෘහයට පිටතින් වටකරම තාප්පයක් 5
තිබුණේය, ඒ මනුෂ්‍යයාගේ අතේ හරිය-
නක් දිග ඇති දණ්ඩක් විය, එහි රියනක
දිග රියනකුත් අල්ලක්ය. එවිට ඔහු
ගොඩනැගිල්ලේ පළල මැන්නේය, ඒක
එක දණ්ඩක්ය; උසත් එක දණ්ඩක්ය.
එවිට ඔහු නැගෙනහිර දෙසට තිබෙන 6
දොරටුවට ඇවිත් ඒකේ පඩිවලින් නැගී
එළිපත්ත මැන්නේය, ඒකේ පළල එක
දණ්ඩක්ය. එක එළිපත්තක පළල එක
දණ්ඩක්ය. එක එක කාමරයේ දිග එක 7
දණ්ඩක්ය, පළලත් දණ්ඩක්ය; කාමර
අතරේ පස්රියනක් තිබුණේය; ගෘහය
දෙස දොරටුවේ ශාලාව ළඟ තිබුණු
දොරටුවේ එළිපත්ත එක දණ්ඩක්ය. ඔහු 8
ගෘහය දෙස තිබුණු දොරටුවේ ශාලාව
මැන්නේය, ඒක එක දණ්ඩක්ය. ඔහු 9
දොරටුවේ ශාලාව මැන්නේය, ඒක අට
රියනක්ය; ඒකේ කණු රියන් දෙකක්ය;
දොරටුවේ ශාලාව ගෘහය දෙසට
තිබුණේය. නැගෙනහිරට තිබුණු දොරටු- 10
වේ එක පැත්තක කුඩා මුර-ගෙවල්
තුනක්ද අනික් පැත්තෙහි තුනක්ද
තිබුණේය; ඒ තුනටම තිබුණේ එක
මිම්මය. එක එක පැත්තේ කණුවලටත්
තිබුණේ එක මිම්මය. ඔහු දොරකඩ පළලත් 11
මැන්නේය, ඒක දස රියනක්ය; දොරටුවේ
දිග දහතුන් රියනක්ය. මුර-ගෙවල් 12
ඉදිරිපිට එක රියනක ඉමක් තිබුණේය,
අනික් පැත්තෙහි එක රියනක ඉමක්
තිබුණේය; කාමරයකට එක පැත්තකින්
රියන් හයක්ද අනික් පැත්තෙන් රියන්
හයක්ද තිබුණේය. ඔහු එක කාමරයක 13
පියස්සේ සිට තවත් එකක පියස්ස දක්වා
දොරටුව මැන්නේය; දොරකඩකට ඉදිරිපිට
දොරකඩක් වශයෙන් පළල විසිපස්
රියනක්ය. ඔහු මැන කණු හැට 14
රියනක් දක්වා තිබෙන බව දැනගත්තේය;
කණුවලට ඇතුළෙහි දොරටුව වටකර
මළුව තිබුණේය. ඇතුල්වෙන දොරටුවේ 15
ඉස්සරහ පැත්තේ සිට ඇතුල් දොරටුවේ
ශාලාවේ ඉස්සරහ පැත්ත දක්වා
පනස් රියනක්ය. ඒ කුඩා මුර-ගෙවලටත් 16
ඒවායේ කණුවලටත් ශාලාවලටත්

දෙරටුවට ඇතුළෙන් වටකරින් පටු
කවුළු තිබුණේය. ඇතුළතිනුත් වටකරම
කවුළු තිබුණේය. කණුවලද තල්ගස්
(කැටයම්කර) තිබුණේය.
17 එවිට ඔහු පිට-මළුවට මා ගෙනාවේය,
ඒ මළුවට කාමර සාද වටකර ගල්
අල්ලා තිබුණේය. ඒ ගල්-බිම පිට කාමර
18 තිහක් තිබුණේය. දෙරටු පැත්තට තිබුණු
දෙරටුවල දිග ගල්-බිම ප්‍රමාණයට
19 තිබුණේය, ඒක පහළ ගල්-බිමය. ඔහුද
පහළ දෙරටුවේ ඉස්සරහ පැත්තේ සිට
ඇතුල් මළුවේ ඉස්සරහ පැත්ත දක්වා
පිටතින් පළල මැන්නේය, නැගෙනහිරටත්
උතුරටත් රියන් සියයක් තිබුණේය.
20 උතුරට තිබුණු පිට-මළුවේ දෙරටුවේ
21 දිගත් පළලත් ඔහු මැන්නේය. ඒකේ එක
පැත්තක මුර-ගෙවල් තුනක්ද අනික්
පැත්තෙහි තුනක්ද තිබුණේය; ඒකේ කණුද
ඒකේ ශාලාද පළමුවෙනි දෙරටුවේ
මිම්මේ ප්‍රකාරයට තිබුණේය. ඒකේ දිග
පනස් රියනක්ය, ඒකේ පළල විසිපස්
22 රියනක්ය. ඒකේ කවුළුද ඒකේ ශාලාද
තල්ගස්ද නැගෙනහිරට තිබුණු දෙරටුවේ
මිම්මේ ප්‍රකාරයට තිබුණේය; පඩි
සතකින් ඒකට නැංගෝය; ඒකේ ශාලාද
23 ඒවා ඉදිරිපිට තිබුණේය. උතුරු දෙරටුවට
ඉදිරිපිටින් ඇතුල් මළුවට දෙරටුවක්
තිබුණේය, නැගෙනහිරටත් එසේමය; ඔහු
දෙරටුවෙන් දෙරටුවට මැන්නේය, එය
24 රියන් සියයක් විය. ඔහු දකුණු පැත්තටත්
මා ගෙනගියේය, දකුණු දෙසටත්
දෙරටුවක් තිබුණේය. ඔහු ඒකේ කණුද
ඒකේ ශාලාද ඒ මිම්වල ප්‍රකාරයට
25 මැන්නේය. ඒ කවුළු වාගේ වටකරම
මේකටත් මේකේ ශාලාවලටත් කවුළු
තිබුණේය. දිග පනස් රියනක්ය, පළල
26 විසිපස් රියනක්ය. ඒකට නැගීමට පඩි
සතක් තිබුණේය, ඒකේ ශාලාද ඒවා
ඉදිරිපිට තිබුණේය. ඒකට තල්ගස් එක
පැත්තක එකක්ද අනික් පැත්තෙහි එකක්ද
බැගින් ඒකේ කණුවල (කැටයම්කර)
27 තිබුණේය. ඇතුල් මළුවටත් දකුණු දෙසට
දෙරටුවක් තිබුණේය. ඔහු දකුණු දෙසට
දෙරටුවෙන් දෙරටුවට මැන්නේය, එය
රියන් සියයක් විය.

ඔහු දකුණු දෙරටුවෙන් ඇතුල් මළුවට 28
මා පමුණුවා, දකුණු දෙරටුව ඒ මිම්වල
ප්‍රකාරයට මැන්නේය; ඒකේ මුර-ගෙවල්ද 29
ඒකේ කණුද ඒකේ ශාලාද ඒ මිම්වල
ප්‍රකාරයට තිබුණේය. වටකරම ඒකටත්
ඒකේ ශාලාවලටත් කවුළු තිබුණේය.
දිග පනස් රියනක්ය, පළල විසිපස්
රියනක්ය. වටකරම ශාලා තිබුණේය, 30
දිග විසිපස් රියනක්ය, පළල පස්
රියනක්ය. ඒකේ ශාලා පිට-මළුව දෙසට 31
තිබුණේය; ඒකේ කණුවලට තල්ගස්ද
ඒකට නගින්ට පඩි අටක්ද තිබුණේය.
එවිට නැගෙනහිර මාර්ගයෙන් ඔහු 32
ඇතුල් මළුවට මා පමුණුවා, ඒ මිම්වල
ප්‍රකාරයට දෙරටුව මැන්නේය; එකේ මුර- 33
ගෙවල්ද ඒකේ කණුද ඒකේ ශාලාද ඒ
මිම්වල ප්‍රකාරයට තිබුණේය. වටකරම
ඒකටත් ඒකේ ශාලාවලටත් කවුළු
තිබුණේය. දිග පනස් රියනක්ය, පළල
විසිපස් රියනක්ය. ඒකේ ශාලා පිට- 34
මළුව දෙසට තිබුණේය; ඒකේ කණුවල
දෙපැත්තෙහි තල්ගස්ද ඒකට නගින්ට
පඩි අටක්ද තිබුණේය. ඔහු උතුරු 35
දෙරටුවට මා පමුණුවා, ඒ මිම්වල
ප්‍රකාරයට, ඒක සහ ඒකේ මුර-ගෙවල්ද 36
ඒකේ කණුද ඒකේ ශාලාද මැන්නේය;
වටකරම ඊට කවුළු තිබුණේය. දිග පනස්
රියනක්ය, පළල විසිපස් රියනක්ය. ඒකේ 37
ශාලා පිට-මළුව දෙසට තිබුණේය; ඒකේ
කණුවල දෙපැත්තෙහි තල්ගස්ද ඒකට
නගින්ට පඩි අටක්ද තිබුණේය.
දෙරටුවල කණු ළඟ කාමරයක්ද ඒකේ 38
දෙරකඩක්ද තිබුණේය; එය තිබුණේ එහි
දවන පූජාව සෝදන පිණිසය. දෙරටුවේ 39
ශාලාවේ එක පැත්තක මේස දෙකක්ද
අනික් පැත්තෙහි මේස දෙකක්ද තිබුණේය;
ඒවා තිබුණේ ඒ උඩ දවන පූජාවද
පාප පූජාවද අපරාධ පූජාවද මරන
පිණිසය. උතුරු දෙරකඩට නගින තැන, 40
පිට පැත්තෙහි මේස දෙකක්ද දෙරටුවේ
ශාලාවේ අනික් පැත්තෙහි මේස දෙකක්ද
තිබුණේය. දෙරටුවේ එක පැත්තක මේස 41
හතරක්ද අනික් පැත්තෙහි මේස හතරක්ද
බැගින් මේස අටක් තිබුණේය; ඒවා
තිබුණේ ඒ උඩ සතුන් මරන පිණිසය.

42 රියන් එකහමාරක් දිගද රියන් එක-
හමාරක් පළලද රියනක් උසද ඇති
කැපූ ගල් මේස හතරකුත් තිබුණේය;
ඒවා තිබුණේ ඒ උඩ දවන පූජාවල්ද
වෙනත් පූජාවල්ද මරන්ට පාවිච්චිකරන
43 ආවුද තැබීමටය. අල්ලක පළල ඇති
කොකු ගේ ඇතුළේ වටේට සවිකර
තිබුණේය. මේස පිට පූජාවේ මාංස
44 තබනලදී. ඇතුල් දොරටුවට පිටතින් උතුරු
දිග දොර ළඟ ඇතුල් මළුවේ *ගී කියන්-
නන්ගේ කාමර තිබුණේය; ඒවා දකුණු
දෙසට තිබුණේය. පෙරදිග දොර ළඟ
45 එකක් උතුරු දිගට තිබුණේය. ඔහුද:
ඉස්සරහ පැත්ත දකුණු දෙසට තිබෙන
මේ කාමරය ගෘහයේ සේවය පවත්වන
46 පූජකයන්ටත්, ඉස්සරහ පැත්ත උතුරු
දෙසට තිබෙන කාමරය පූජාසනයේ
සේවය පවත්වන පූජකයන්ටත්ය. ඔව්හු
වනාහි ස්වාමීන්වහන්සේට සේවය
කරන්ට උන්වහන්සේ ළඟට පැමිණෙන
ලෙවීගේ පුත්‍රයන්ගෙන්වූ ශාදොක්ගේ
47 පුත්‍රයෝයයි මට කීවේය. එවිට ඔහු
මළුව මැන්නේය, දිග රියන් සියයක්ය,
පළල රියන් සියයක්ය, ඒක සතරැස්ව
තිබුණේය; පූජාසනය ගෘහයට ඉදිරිපිටින්
තිබුණේය.
48 ඔහු ගෘහයේ ශාලාවට මා පමුණුවා,
ශාලාවේ කණු එක එක මැන්නේය,
එක පැත්තක රියන් පහක්ය, අනික්
පැත්තෙහි රියන් පහක්ය. දොරටුවේ පළල
එක පැත්තක රියන් තුනක්ය, අනික්
49 පැත්තෙහි රියන් තුනක්ය. ශාලාවේ දිග
විසි රියනක්ය, පළල එකොළොස්
රියනක්ය; පඩි දසයකින් ඒකට නගින්-
නෝය. කුළුනුවලට කණු එක පැත්තක
එකක්ද අනික් පැත්තෙහි එකක්ද බැගින්
තිබුණේය.

41 එවිට ඔහු මාළිගාවට මා ගෙනවුත්
එහි කණු මැන්නේය, ඒවා එක
පැත්තක හරියනක් පළලටද අනික්
පැත්තෙහි හරියනක් පළලටද තිබුණේය,
2 එය කූඩාරමේ පළලය. දොරකඩ පළල
රියන් දසයක්ය; දොරකඩ එක පැත්තක්
රියන් පහක්ය, අනික් පැත්තත් රියන්
පහක්ය. ඔහු මාළිගාව මැන්නේය, ඒකේ
දිග රියන් සතළිසක්ය, පළල රියන්
විස්සක්ය. එවිට ඔහු ඇතුළට ගොස් 3
දොරකඩ එක එක කණුව මැන්නේය,
එය රියන් දෙකක්ය. දොරකඩ රියන්
හයක්ය; දොරකඩ පළල රියන් සතක්ය.
ඔහු මාළිගාවට ඉදිරිපිටින් ඒකේ දිගට 4
රියන් විස්සක්ද පළලට රියන් විස්සක්ද
මැන: මෙය අති ශුද්ධස්ථානයයයි මට
කීවේය. ඔහු ගෘහයේ හිත්තියත් මැන්නේය, 5
ඒක රියන් හයක්ය; වටකරම ගෘහයට
තිබුණු කාමරවල පළල රියන් සතරක්ය.
ඒ කාමර, කාමරයක් පිට කාමරයක් 6
වශයෙන් තුනක්ද පේළියට තිහක්ද
බැගින් තිබුණේය; කාමර වනාහි ගෘහයේ
හිත්තියට අල්ලන්නේ නැතුව, ඒවා අල්ලා
තිබීම පිණිස වටකරම ගෘහයට තිබුණු
හිත්තියට වැදී තිබුණේය. කාමරවලට 7
නැගී යන්ට යන්ට වටකරින්ම ඒවා වඩ
වඩා පළල්ව තිබුණේය; මක්නිසාද
ගෘහය වටකරම ඉහළින් ඉහළට ගෘහය
කාමරවලින් වටවී තිබුණේය. එබැවින්
ගෘහයේ පළල ඉහළින් වැඩිව තිබුණේය;
එසේ යට තට්ටුවේ සිට මැද එක මැදින්
ඉහළ එකට නගිති. වටකරින් ගෘහයේ 8
උස දුටිමි; කාමරවල අත්තිවාරම මුළු
දණ්ඩක්වූ සම්පූර්ණ රියන් හයක්ය.
පිට පැත්ත දක්වා කාමරවලට තිබුණු 9
හිත්තියේ පළල පස් රියනක්ය. ගෘහයට
තිබුණු කාමර පේළි ඇතුළේ හිස් ඉඩමක්
තිබුණේය. ඒවාටත් මළුවේ කාමරවලටත් 10
අතරේ ගෘහය වටකරින්ම විසි රියනක්
පළල ඇති ඉඩමක් තිබුණේය. කාමරවල 11
දොරකඩ හිස් ඉඩම දෙසට තිබුණේය,
එක දොරකඩක් උතුරු දෙසටත් එක
දොරකඩක් දකුණු දෙසටත් තිබුණේය.
හිස් ඉඩමේ පළල වටකරම පස්
රියනක්ය, බස්නාහිර පැත්තෙහි වෙන්වූ 12
මළුවට ඉදිරිපිට තිබුණු ගොඩනැගිල්ලේ
පළල රියන් සැත්තෑවක්ය; ඒ ගොඩ-
නැගිල්ලේ හිත්තියේ පළල වටකරම රියන්
පහක්ය, ඒකේ දිග රියන් අනූවක්ය. ඔහු 13
ගෘහයත් මැන්නේය, එහි දිග රියන්
සියයක්ය; වෙන්වූ මළුවේද එහි තිබුණු
ගොඩනැගිල්ලේද ඒකේ හිත්තිවලද දිග
රියන් සියයක්ය; නැගෙනහිරට තිබුණු 14
ගෙයි ඉස්සරහ පැත්තේද වෙන්වූ මළුවේද
පළල රියන් සියයක්ය.

*නොහොත්, කාමර දෙකක් තිබුණේය,

15 වෙන්වූ මළුවට ඉදිරිපිටින් ඊට පිටි-
පස්සෙන් තිබුණු ගොඩනැගිල්ලේ දිගද
දෙපැත්තෙහි තිබුණු ඒකේ පිට-ශාලාද
16 මැන්නේය, ඒවා රියන් සියයක්ය; ඇතුල්
මාළිගාවද මිදුලේ ශාලාද එළිපත්ද පටු
කවුළුද මහල් තුනටම එළිපත්ත
ඉස්සරහ වටකර තිබුණු පිට-ශාලාද
තුනී ලෑලිවලින් වසා තිබුණේය, බිම
සිට කවුළු දක්වාත් එසේම තිබුණේය;
17 කවුළුත් වසා තිබුණේය; දෙරකඩට
ඉහළින්ද ඇතුල් ගෘහය දක්වාද පිටතින්ද
වටකරම ඇතුළ සහ පිට මුළු හිත්තියද
18 මැන්නේය. කෙරුබ්ද තල් ගස්ද සාද
තිබුණේය; කෙරුබ් දෙකකට අතරේ
තල්ගසක් බැගින් තිබුණේය, කෙරුබ්
19 එකකට මුහුණු දෙකක් තිබුණේය. එනම්
එක පැත්තක තල්ගහ දෙසට මනුෂ්‍ය
මුහුණක්ද අනික් පැත්තෙහි තල්ගහ
දෙසට තරුණ සිංහ මුහුණක්ද තිබුණේය.
වටකරම මුළු ගෘහයෙහි එසේ සාද
20 තිබුණේය. බිම සිට දෙරකඩ ඉහළ
දක්වා කෙරුබ් සහ තල්ගස්ද මාළිගාවේ
21 හිත්තියෙහි සාද තිබුණේය. මාළිගාවේ
උළුවහු කණු සතරැස්ව තිබුණේය;
ශුද්ධස්ථානයේ ඉස්සරහ පැත්තේ
පෙනීමද මාළිගාවේ පෙනීම වාගේය.
22 පූජාසනය ලී පූජාසනයක්ය, උස රියන්
තුනක්ය, ඒකේ දිග දෙරියනක්ය; ඒකේ
කොන්ද ඒකේ අඩියද ඒකේ පැතිද
ලීවලින්ය. එවිට ඔහු: මෙය **ස්වාමීන්-
වහන්සේ** ඉදිරියෙහි තිබෙන මේසයයයි
23 මට කීය. මාළිගාවටත් ශුද්ධස්ථානයටත්
24 දෙරවල් දෙකක් තිබුණේය. දෙරවලට
දෙපියන් එනම් හැරෙන පියන් දෙකක්
තිබුණේය; එක දෙරකට පියන් දෙකක්ද
අනික් එකට පියන් දෙකක්ද තිබුණේය.
25 හිත්තිවල සාද තිබුණාක්මෙන් මාළිගාවේ
දෙරවල් පිටත් කෙරුබ් සහ තල්ගස්
සාද තිබුණේය; පිටතින් ශාලාව ඉස්සරහ
26 ඝනවූ ලී පඩි කදන් තිබුණේය. පටු
කවුළු සහ තල්ගස් ශාලාවේ දෙපැත්-
තෙහිද කාමරවලද තිබුණේය, ඝනවූ
(ලී) පඩි කදන්ද තිබුණේය.

42 තවද ඔහු උතුරු දෙසට පිට
මළුවට මා ගෙනගොස්, වෙන්වූ
මළුවටත් උතුරු දෙසට තිබුණු ගොඩ-
නැගිල්ලටත් ඉදිරිපිට තිබුණු කාමරයට
මා පැමිණෙවුවේය. උතුරු දෙරකඩ රියන් 2
සියයක් දිග ඉස්සරහ පිට තිබුණේය,
පළලද රියන් පනහක්ය. ඇතුල් මළුවේ 3
විසි රියනට ඉදිරිපිටත් පිට-මළුවේ ගල්-
බිම ඉදිරිපිටත් පිට-ශාලාවක් ඉස්සරහ
පිට-ශාලාවක් වශයෙන් මහල් තුනක්
තිබුණේය. කාමර ඉස්සරහ රියන් දහයක් 4
පළල ඇති මාර්ගයක්ද ඇතුළට යාමට
එක රියනක් පළල ඇති පාරක්ද
තිබුණේය. ඒවායේ දෙරකඩවල් උතුරු
දෙසට තිබුණේය. ඉහළ කාමර කොටව
තිබුණේය. මක්නිසාද ඒ ගොඩනැගිල්ලේ 5
පහළ සහ මැද කොටස්වලින් ඉඩ අසු-
වුණාට වඩා ඒවායෙන් පිට-ශාලාවලට
ඉඩ අසුවිය. මෙසේ වුණේ ඒවා මහල් 6
තුනක්ව තිබුණු නුමුත් මළුවල කුළුනු
වාගේ ඒවාට කුළුනු නොතිබුණු නිසාය.
එබැවින් පහළ ඒවාටත් මැද ඒවාටත්
වඩා ඒවා බිම සිට ඉහළට යන්ට
යන්ට පටුව තිබුණේය. කාමර දිගට 7
පිට-මළුව දෙසට කාමරවලට ඉදිරිපිට
පිටතින් තිබුණු තාප්පයේ දිග රියන්
පනහක්ය. මක්නිසාද පිට-මළුවේ 8
කාමරවල දිග රියන් පනහක්ය. නුමුත්
මාළිගාව ඉදිරිපිට තිබුණු ඒවායේ දිග
රියන් සියයක්ය. පිට-මළුවෙන් මේ 9
කාමරවලට පැමිණෙන්ට නැගෙනහිර
පැත්තෙන් ඇතුල්වෙන තැන ඒවාට යටින්
තිබුණේය. නැගෙනහිර දෙසට තිබුණු 10
මළුවේ තාප්පයේ පළලටම වෙන්වූ
මළුවටත් ගොඩනැගිල්ලටත් ඉදිරිපිට
කාමර තිබුණේය. මේවා ඉස්සරහ පිට 11
උතුරු පැත්තේ කාමරවල අන්දමටම
පාරක් තිබුණේය; ඒවායේ දිගද පළලද
ඒවාට ඇතුල්වෙන සියලු තැන්ද ඒවායේ
විධිද ඒවායේ දෙරකඩවල්ද වාගේ
මේවාටත් තිබුණේය. දකුණු පැත්තේ 12
කාමරවල දෙරකඩවල් වාගේ ඇතුල්වෙන
තැන නැගෙනහිර දෙසට තාප්පය
ඉදිරිපිටම තිබුණු මාර්ගයේ මුල
දෙරකඩක් තිබුණේය. එවිට ඔහු මට 13
කථාකොට: වෙන්වූ මළුවට ඉදිරිපිට
තිබෙන උතුරු කාමරද දකුණු කාමරද
ශුද්ධ කාමර වෙත්, එහි **ස්වාමීන්වහන්සේ**

ළඟට පැමිණෙන පූජකයෝ අති ශුද්ධ
දේවල් කන්නෝය. එහි ඔව්හු අති ශුද්ධ
දේවල්ද ආහාර පූජාවද පාප පූජාවද
අපරාධ පූජාවද තබන්නෝය; මක්නිසාද
14 ඒ ස්ථානය ශුද්ධය. පූජකයන් එහි ඇතුල්-
වුණාම ඔව්හු ශුද්ධස්ථානයෙන් පිට-
මළුවට නොයන්නෝය, සේවය කිරීමට
ඔවුන් අඳින වස්ත්‍රද එහි තබන්නෝය;
මක්නිසාද ඒවා ශුද්ධය. ඔව්හු වෙන
වස්ත්‍ර හැඳගෙන සෙනඟගේ කාරණා-
වලට පැමිණෙන්නෝයයි කීවේය.
15 ඔහු ඇතුල් ගෘහය මැන තීන්දුකළ
විට නැගෙනහිර දෙසට තිබෙන දොරටුවේ
මාර්ගයෙන් මා පිටතට ගෙනගොස්
16 වටේටම ඒක මැන්නේය. මනින දණ්ඩෙන්
ඔහු නැගෙනහිර පැත්ත මැන්නේය, ඒක
මනින දණ්ඩෙන් වටේට පන්සියයක්ව
17 තිබුණේය. ඔහු උතුරු පැත්ත මැන්නේය,
ඒක මනින දණ්ඩෙන් වටේට පන්-
18 සියයක්ව තිබුණේය. ඔහු දකුණු පැත්ත
මැන්නේය, ඒක මනින දණ්ඩෙන් පන්-
19 සියයක්ව තිබුණේය. ඔහු බස්නාහිර
පැත්තට හැරී ගොස් මැන්නේය, ඒක
මනින දණ්ඩෙන් පන්සියයක්ව තිබුණේය.
20 ඔහු ඒකේ සතර පැත්තම මැන්නේය.
ශුද්ධස්ථානය පොදු ස්ථානයෙන් වෙන්-
කරන පිණිස දඬු පන්සියයක් දිග අතටත්
පන්සියයක් පළල අතටත් ඇති පවුරක්
ඒක වටකරින්ම තිබුණේය.

## දෙවියන්වහන්සේ දේවමාළිගාවට පැමිණීම. එහි දේව නමස්කාරය අමුතුවෙන් පිහිටුවීම

**43** තවද ඔහු නැගෙනහිර දෙසට
තිබුණු දොරටුව ළඟට මා ගෙන-
2 ගියේය. එවිට ඉශ්‍රායෙල්ගේ දෙවියන්-
වහන්සේගේ තේජස නැගෙනහිර දිශා-
වෙන් එනවා දුටුවෙමි. උන්වහන්සේගේ
ශබ්දය බොහෝ ජල ඝෝෂාවක ශබ්දය
මෙන් විය. පොළොවද උන්වහන්සේගේ
3 තේජසින් බැබළුණේය. මා දුටු පෙනීම
නම් නුවර විනාශකරන්ට මා එද්දී මා
විසින් දුටු දර්ශනයේ පෙනීම මෙන්ය; ඒ
දර්ශනද කෙබාර් ගංගාව ළඟදී මා දුටු
දර්ශනය මෙන්ය. එවිට මම මුහුණින්
වැටුණෙමි. ස්වාමීන්වහන්සේගේ තේජස 4
නැගෙනහිර දෙසට තිබුණු දොරටුවේ
මාර්ගයෙන් ගෘහයට ඇතුල්විය. එවිට 5
ආත්මය මා ඔසවාගෙන ඇතුල් මළුවට
මා පැමිණෙවුවේය; ගෘහය ස්වාමීන්-
වහන්සේගේ තේජසින් පිරී තිබෙන බව
දුටුවෙමි. කෙනෙක් ගෘහයේ සිට මට 6
කථාකරනවා මට ඇසුණේය; මනුෂ්‍ය-
යෙක්ද මා ළඟ සිටියේය. උන්වහන්සේ 7
මට කථාකොට: මනුෂ්‍ය පුත්‍රය, මෙය
මාගේ සිංහාසනයේ ස්ථානය සහ මාගේ
පාද පතුල්වල ස්ථානයත්ය, මම මෙහි
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි සදාකාලේටම
වාසයකරන්නෙමි. ඉශ්‍රායෙල් වංශයවත්
ඔවුන්ගේ රජවරුන්වත් තමුන්ගේ
වේශ්‍යාකම්වලින්ද තමුන්ගේ රජවරුන්ගේ
මළකඳන් වැනි ඔවුන්ගේ උසස්ථානවලින්ද
මාගේ ශුද්ධවූ නාමය තවත් අපවිත්‍ර
නොකරන්නෝය; ඔව්හු තමුන්ගේ එළි- 8
පත්ත මාගේ එළිපත්ත ළඟද තමුන්ගේ
උළුවහු කණු මාගේ උළුවහු කණු ළඟද
තැබුවෝය, මා සහ ඔවුන් අතරේ තිබුණේ
භිත්තිය පමණක්ය; එසේ ඔවුන් කළාවූ
තමුන්ගේ පිළිකුල්කම්වලින් ඔව්හු මාගේ
ශුද්ධ නාමය අපවිත්‍රකළෝය. මමද
මාගේ උදහසින් ඔවුන් විනාශකෙළෙමි.
දැන් ඔව්හු තමුන්ගේ වේශ්‍යාකම්ද තමුන්- 9
ගේ රජවරුන්ගේ මළකඳන්ද මා වෙතින්
පහකරත්වා, එවිට මම ඔවුන් අතරෙහි
සදාකාලේටම වාසයකරන්නෙමි.
මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙල් වංශය තමුන්- 10
ගේ අපරාධ ගැන ලජ්ජාවෙන පිණිසත්
ගෘහයේ ආදර්ශ සිතියම මනින පිණිසත්
ගෘහය ඔවුන්ට පෙන්වාපන්න. ඔව්හු 11
තමුන් කළ සියල්ල ගැන ලජ්ජාවී සිටිත්
නම්, ගෘහයේ ආකාරයද එහි පිළිවෙළද
ඇතුළට පිටතට යන එන තැන්ද එහි
මුළු ආකාරයද එහි සියලුම නියෝගද
එහි මුළු ආකාරයද එහි මුළු ව්‍යවස්ථාවද
ඔවුන්ට දන්වා, ඔවුන් එහි මුළු ආකාරයද
එහි සියලුම නියෝගද පවත්වා ඒවා
කරන පිණිස ඔවුන් ඉදිරියේදී ඒවා
ලියාපන්න. ගෘහයේ නියමය මෙසේය: 12
කන්ද මුදුනෙහි වටකරම එහි මුළු සීමාව
ඉතා ශුද්ධය. ගෘහයේ ව්‍යවස්ථාව ඒකය.

13 රියන් වශයෙන් පූජාසනයේ මිමි
මේවාය: (ඒ රියනට රියනකුත් අල්ලක්ය.)
ඒකේ අඩියේ උස රියනක්ය, පළලත්
රියනක්ය, වටකර ඒකේ ගැටිය අද්දර
දක්වා එක වියතක්ය. මේක පූජාසනයේ
14 අඩියය. බිමේ පටන් පහළ පිළට දෙරි-
යනක්ය, පළල එක රියනක්ය; කුඩා
පිළ පටන් ලොකු පිළට රියන් සතරක්ය,
15 පළලද රියනක්ය. පූජාසනයේ උඩ
කොට්ඨාසය රියන් සතරක්ය; උඩ
කොට්ඨාසයේ සිට ඉහළට අං සතරක්
16 ඇත්තේය. උඩ කොට්ඨාසයේ දිග රියන්
දෙළොසක්ය, පළලත් දෙළොසක්ය, හතර
17 පැත්ත හතරැස්ය. එහි සතර පැත්තේ
පිළේ දිග රියන් දහහතරක්ය, එහි පළලත්
දහහතරක්ය; එය වටකර තිබෙන ගැටිය
රියන් භාගයක්ය; එය වටකර තිබෙන
අඩිය රියනක්ය; ඒකේ පඩිය නැගෙනහිර
දෙසටයයි කීසේක.
18 තවද උන්වහන්සේ මට කථාකොට:
මනුෂ්‍ය පුත්‍රය, ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
මෙසේ කියනසේක—පූජාසනය පිට දවන
පූජා ඔප්පුකරන්ටත් ඒක පිට ලේ
ඉසින්ටත් එය සාදන කල ඒකේ නියෝග
19 මේවාය. මට සේවයකරන්ට මා ළඟට
පැමිණෙන්නාවූ, ශාදෝක්ගේ වංශයේ
ලෙවීවරුවූ පූජකයන්ට පාප පූජාවක්
පිණිස තරුණ ගොනෙක් දීපන්නැයි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** කියනසේක.
20 නුඹ උගේ ලේවලින් ස්වල්පයක් රැගෙන
ඒකේ අං සතරේද පිළේ කොන් සතරේද
වටකර ගැටියේද ගා, එසේ ඒකේ දෝෂ
පහකොට, ඒක උදෙසා සමගිකමක්
21 කරපන්න. තවද පාප පූජාවේ ගොනා
රැගෙන ශුද්ධස්ථානයට පිටතින් ගෘහයේ
22 නියම තැන ඌ පුලුස්සාපන්න. දෙවෙනි
දවසේ පාප පූජාවක් පිණිස එළුවන්ගෙන්
කැලලක් නැති පිරිමි සතෙක් ගෙනෙන්න;
ගොනාගෙන් පූජාසනය පවිත්‍රකළාක්-
23 මෙන් එයින් ඒක පවිත්‍ර කරත්වා. නුඹ
ඒක පවිත්‍රකර තීන්දුවූණාම, කැලලක්
නැති තරුණ ගොනෙක්ද රැළෙන් කැල-
24 ලක් නැති බැටළුවෙක්ද ගෙනැවිත්, උන්
**ස්වාමීන්වහන්සේ** ඉදිරියට පමුණුවාපන්න.
එවිට පූජකයෝ උන් පිට ලුණු දමා,
දවන පූජාවක් කොට **ස්වාමීන්වහන්සේට**
ඔප්පුකරත්වා. සත් දවසක් දවස්පතාම 25
පාප පූජාවක් කොට එළුවෙක් පූජා-
කරපන්න. එසේම කැලලක් නැති තරුණ
ගොනෙක්ද රැළෙන් බැටළුවෙක්ද ඔව්හු
පූජාකරත්වා. සත් දවසක් ඔව්හු පූජා- 26
සනය උදෙසා සමගිකමක් කොට, ඒක
පිරිසිදුකර, ඒක කැපකරත්වා. ඒ දවස් 27
තීන්දුවූණාම අටවෙනි දවසෙත් මතුත්
පූජකයෝ නුඹලාගේ දවන පූජාද නුඹලා-
ගේ ශාන්ති පූජාද පූජාසනය පිට ඔප්පු-
කරත්වා; මමද නුඹලා පිළිගන්නෙමියි
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** වදාරනසේකැයි
කීසේක.

## දේවගෘහයෙහි සේවයකරන්ට සිටින්නාවූ පූජකයන් සහ ලෙවීවරු

44 එවිට ඔහු නැගෙනහිරට තිබෙන
ශුද්ධස්ථානයේ දොරටුව දෙසට යන
මාර්ගයෙන් මා නැවත ගෙනගියේය;
නුමුත් ඒක වසා තිබුණේය. **ස්වාමීන්-** 2
**වහන්සේ** මට කථාකොට: මේ දොරටුව
නැර වසා තිබිය යුතුය, කිසිවෙක් එයින්
ඇතුල් නොවන්නේය, මක්නිසාද ඉශ්‍රා-
යෙල්ගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ** එයින්
ඇතුල්වූසේක; එබැවින් එය වසා තැබිය
යුතුය. අධිපතියාට නම් ඔහු අධිපතියා 3
බැවින් එහි හිඳගෙන **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙහි කෑම කන්ට ලැබෙනවා ඇත;
ඔහු දොරටුවේ ශාලාවේ මාර්ගයෙන්
ඇතුල්වෙනවා ඇත, ඒකේ මාර්ගයෙන්ම
පිටතට යනවා ඇතැයි කීසේක. එවිට 4
ඔහු උතුරු දොරටුවේ මාර්ගයෙන් ගෘහයේ
ඉස්සරහ පැත්තට මා පැමිණෙවුවේය;
මම බැලූ විට **ස්වාමීන්වහන්සේගේ** ගෘහය
**ස්වාමීන්වහන්සේගේ** තේජසින් පිරී තිබෙන
බව දැක මුහුණින් වැටුණෙමි. **ස්වාමීන්-** 5
**වහන්සේ** මට කියනසේක්: මනුෂ්‍ය
පුත්‍රය, **ස්වාමීන්වහන්සේගේ** ගෘහයේ
සියලු නියෝග ගැනද එහි සියලු
ව්‍යවස්ථා ගැනද මා විසින් නුඹට කියන
සියල්ලම නුඹ සිතට ගෙන, නුඹේ ඇස්-
වලින් බලා, නුඹේ කන්වලින් අසා-
පන්න; ගෘහයට ඇතුල්වෙන තැනටත්
ශුද්ධස්ථානයෙන් පිටතට යන සියලු

තැන්වලටත් තුඹේ සිත යොමුකරපන්න.
6 කැරළිකාර ඉශ්‍රායෙල් වංශයට ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේකැයි
කියාපන්න: එම්බා ඉශ්‍රායෙල් වංශය,
තුඹලාගේ සියලු පිළිකුල්කම් තුඹලාට
7 ඉතින් ඇත. තුඹලා මාගේ ආහාර වන
තෙලද ලේද ඔප්පුකරන විට, මාගේ
ගෘහය කෙලහන හැටියට මාගේ ශුද්ධ-
ස්ථානයෙහි සිටීමට අචර්මඡේදිත සිත්ද
අචර්මඡේදිත මාංසද ඇති විදේශීන්
ඒක ඇතුළට ගෙනාවහුය; තුඹලාගේ
සියලු පිළිකුල්කම් මදිවාට ඔව්හු මාගේ
8 ගිවිසුමත් කඩකළෝය. තුඹලා මාගේ
ශුද්ධවූ සේවය නොපවත්වා, තුඹලා
වෙනුවට මාගේ ශුද්ධස්ථානයෙහි මාගේ
9 සේවය පවත්වන්නන් පත්කළහුය. ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** මෙසේ කියනසේක:
ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙහි සිටින
විදේශීන්ගෙන් අචර්මඡේදිත සිතක්ද
අචර්මඡේදිත මාංසද ඇති කිසි විදේශි-
යෙක් මාගේ ශුද්ධස්ථානයට ඇතුල්
10 නොවේවා. තමුන්ගේ දේවරූප පස්සේ
මුළාව ගිය ඉශ්‍රායෙල්වරුන් මුළාව ගිය
කල මා වෙතින් අහක්ව ගියාවූ ලෙවීවරු
11 ස්වකීය අයුතුකම දරන්නෝය. එහෙත්
ඔව්හු මාගේ ශුද්ධස්ථානයෙහි සේවක-
යෝව ගෘහයේ දොරටුවල රැකවල්ලුව
ගෘහයේ සේවකයෝව සිටින්නාහුය.
ඔවුන් විනාහි දවන පූජාව සහ යාගය
සෙනඟට මරාදෙනවා ඇත. ඔවුන්ට
සේවයකිරීමටද ඔවුන් ඉදිරියෙහි සිටිනවා
12 ඇත. ඔවුන්ගේ දේවරූප ඉදිරියෙහි
ඔවුන්ට මොවුන් සේවයකොට ඉශ්‍රායෙල්
වංශය පැකිලවන අපරාධකමේ ගලක්
වූ බැවින්, මාගේ අත මොවුන්ට විරුද්ධව
එසෙවුවෙමියි ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
කියනසේක, ඔවුන් තමුන්ගේ අයුතුකම
13 දරනවා ඇත. මට පූජකකම් කරමින්
මාගේ සියලු ශුද්ධ දේවල් වන අති
ශුද්ධ දේවලින් යමක් ළඟටවත් මා
ළඟටවත් ඔවුන් නොපැමිණිය යුතුය.
ඔවුන් තමුන්ගේ ලජ්ජාව සහ තමුන්
කළ තමුන්ගේ පිළිකුල්කමුත් දරනවා
14 ඇත. එසේ ගෘහයේ මුළු මෙහෙයටත්
එහි කෙරෙන සියල්ලටත් ඔවුන් ගෘහය
බලාගන්න රැකවලුන් කරන්නෙමි.

නුමුත් ඉශ්‍රායෙල් පුත්‍රයන් මා වෙතින් 15
මුළාව ගිය විට මාගේ ශුද්ධස්ථානයේ
සේවය පැවැත්තුවාවූ ලෙවීවරුන්වූ පූජ-
කයන් වන ශාදෝක්ගේ පුත්‍රයන්ට නම්
මට සේවයකිරීමට මා ළඟට පැමිණෙන්ටත්
තෙල සහ ලේ මට ඔප්පු කිරීමට මා
ඉදිරියෙහි සිටින්ටත් පුළුවනැයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක. ඔවුන්ට 16
නම් මාගේ ශුද්ධස්ථානයට ඇතුල්-
වෙන්ටත් මට සේවයකිරීමට මාගේ
මේසය ළඟට පැමිණෙන්ටත් මාගේ
සේවය පවත්වන්ටත් පුළුවන. ඔවුන් ඇතුල් 17
මළුවේ දොරටුවලට ඇතුල්වෙන කල හණ
වස්ත්‍ර ඇඳ සිටිය යුතුය; ඇතුල් මළුවේ
දොරටුවලට ඇතුළතින්ද ගෘහයෙහිද
සේවයකරන අතර ඔව්හු ලෝම රෙදි
නැඳ සිටිත්වා. ඔවුන්ගේ හිස් පිට හණ 18
තොප්පිද ඔවුන්ගේ ඉඟටිවල හණ වැසුම්ද
තිබේවා; ඩහදිය හටගන්වන දෙයක්
පෙරවා නොගනිත්වා. ඔවුන් පිට-මළුවට 19
එනම් පිට-මළුවේ සෙනඟ ළඟට යන
කල, ඔවුන් සේවයකරන්ට අඳින තමුන්ගේ
වස්ත්‍ර ගළවා, ඒවා ශුද්ධස්ථානයේ
කාමරවල තබා, තමුන්ගේ වස්ත්‍රවලින්
සෙනඟ විශුද්ධ නොකරන පිණිස වෙන
වස්ත්‍ර ඇඳගනිත්වා. ඔව්හු තමුන්ගේ 20
ඉස් බූගාන්නේවත් ඉසකේ දික්වීමට
අරින්නේවත් නැතුව, තමුන්ගේ ඉසකේ
කපත්වා. ඇතුල් මළුවට ඇතුල්වෙන කල 21
කිසි පූජකයෙක් මුද්‍රිකපානය නොබී
සිටීවා. ඔව්හු වැන්දඹුවක්වත් අත්හරිනු 22
ලැබූ ස්ත්‍රියෙක්වත් නොව ඉශ්‍රායෙල්
වංශයේ කන්‍යාවන් සරණපාවා ගනිත්වා;
නුමුත් පූජකයෙකුගේ වැන්දඹුවක්ව සිටින
ස්ත්‍රියෙක් පාවාගන්ට ඔවුන්ට පුළුවන.
ශුද්ධවූ එක සහ ශුද්ධ නැති එක අතරේ 23
තිබෙන වෙනස ඔවුන් මාගේ සෙනඟට
පෙන්වා, අපවිත්‍ර එක සහ පවිත්‍ර
එක අතරෙත් තිබෙන වෙනස ඔවුන්ට
දන්වත්වා. පැමිණිල්ලක් ගැන නම් 24
ඔව්හුම විනිශ්චයකිරීමට සිට, මාගේ
විනිශ්චයවල හැටියට ඒක විනිශ්චය-
කරත්වා. මාගේ ව්‍යවස්ථාද මාගේ

නියෝගද ඔව්හු මාගේ සියලු සභාවලදී
රක්ෂාකරත්වා; මාගේ සබත් දවස්ද
25 ශුද්ධකොට පවත්වත්වා. ඔව්හු මළ කෙ-
නෙකු ළඟට පැමිණ අපවිත්‍ර නොවෙත්වා.
නුමුත් පියා නිසාවත් මවු නිසාවත්
පුත්‍රයෙකු නිසාවත් දුවෙකු නිසාවත්
සහෝදරයෙකු නිසාවත් පුරුෂයෙකු
ඇතුව නොසිටිය සහෝදරියෙකු නිසාවත්
ඔවුන්ට අපවිත්‍ර වෙන්ට අවසර තිබේ.
26 ඔහු පිරිසිදුවූ පසු ඔහුට සත් දවසක්
27 නියමකරන්ට යෙදේවා. ඔහු ශුද්ධස්-
ථානයෙහි සේවයකරන්ට ශුද්ධස්ථානයේ
ඇතුල් මළුවට ඇතුල්වෙන දවසේ ඔහු
තමාගේ පාප පූජාව ගෙනෙන්ට යෙ-
දේවයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන-
28 සේක. ඔවුන්ට ලැබෙන උරුමය මෙසේය;
ඔවුන්ගේ උරුමය මමය. නුඹලා ඔවුන්ට
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි කොටසක්
නොදිය යුතුය; ඔවුන්ගේ කොටස මමය.
29 ඔවුන්ට ආහාර පූජාවද පාප පූජාවද
අපරාධ පූජාවද කන්ට පුළුවන; ඉශ්‍රායෙල්
අතරෙහි කැපවූ සියල්ලම ඔවුන්ට
30 වන්නේය. සියලුම දේවල සියලුම ප්‍රථම
ඵලවලින් පළමු ඒවාද නුඹලාගේ සියලු
ආකාර දේවල එසවීමේ පූජා සියල්ලද
පූජකයන්ට වන්නේය. නුඹේ ගෙය
මතුයෙහි ආශීර්වාදයක් පවතින පිණිස
නුඹලාගේ අනාපු පිටියෙන් පළමු
31 කොටස පූජකයාට දීපල්ලා. ඉබේම
මැරුණු නොහොත් මෘගයන් විසින්
ඉරාදැමූ කිසි පක්ෂියෙක්වත් මෘගයෙක්වත්
පූජකයන් විසින් නොකෑ යුතුය.

## දේශය පූජකාදීන්ට බෙදදීම. අධිපතියාට භාර යුතුකම්

45 තවද නුඹලා දේශය උරුම-
කරගැනීමට පසඅට දමන කල,
උපහාරයක් කොට දේශයෙන් ශුද්ධ
කොටසක් ස්වාමීන්වහන්සේට ඔප්පු-
කරපල්ලා. ඒකේ දිග දඬු විසිපන්දහසක්ද
පළල දඬු දසදහසක්ද වන්නේය. වටකර
ඒකේ සියලු සීමා තුළ ඒක ශුද්ධය.
2 එයින් පන්සියයක් දිගද පන්සියයක්
පළලද ඇති වටකරින් සතරැස්වූ පංගුවක්
ශුද්ධස්ථානයට වේවා; ඊට පිට-බිමක්
පිණිස රියන් පනසකුත් වටේට තිබේවා.
ඒ මිම්මෙන් විසිපන්දහසක් දිගද 3
දසදහසක් පළලද ඇති ඉඩමක් මැන-
පන්න. ඒක තුළ ශුද්ධස්ථානය වන අති
ශුද්ධස්ථානය වන්නේය. ඒක දේශයෙන් 4
ශුද්ධ කොටසක්ය; ඒක ස්වාමීන්-
වහන්සේට සේවයකරන්ට පැමිණෙන්-
නාවූ ශුද්ධස්ථානයේ සේවකයන්වූ
පූජකයන්ට වන්නේය; ඒක ඔවුන්ගේ
ගෙවල්වලට ඉඩමක්ද ශුද්ධස්ථානයට
ශුද්ධවූ තැනක්ද වන්නේය. විසිපන්දහසක් 5
දිගද දසදහසක් පළලද ඇති ඉඩමක්
ගෘහයේ සේවකයන්වූ ලෙවීවරුන්ට
උරුමයක් පිණිස කාමර විස්සක් ඇතුළුව
වේවා. නුවර කොටස පිණිස පන්දහසක් 6
පළලද විසිපන්දහසක් දිගද ඇති ඉඩමක්
උපහාරයවූ ශුද්ධ කොටස ළඟ නියම-
කරපල්ලා. ඒක මුළු ඉශ්‍රායෙල් වංශයට
වන්නේය. පඬුරවූ ශුද්ධ කොටසටත් 7
නුවර කොටසටත් දෙපැත්තෙහි, එනම්
උපහාරයවූ ශුද්ධ කොටසටත් නුවර
කොටසටත් යාව දිගටම බස්නාහිර
පැත්තෙහි සහ නැගෙනහිර පැත්තෙහි,
අධිපතියාට කොටස් වේවා. ඒවායේ
දිග බස්නාහිර සීමාවේ සිට නැගෙනහිර
සීමාවට (ගෝත්‍ර) කොටස්වලින් එකක
හරියේ තිබේවා. දේශයෙහි ඒවා ඉශ්‍රා- 8
යෙල්වරුන් අතරෙහි ඔහුට කොටසක්
වන්නේය. එසේ මාගේ අධිපතීන් මාගේ
සෙනඟට තවත් පීඩා නොකර, දේශය
ඉශ්‍රායෙල් වංශයට ඔවුන්ගේ ගෝත්‍ර
ප්‍රකාරයට දෙනවා ඇත.
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ 9
කියනසේක: එම්බා ඉශ්‍රායෙල් අධිපති-
වරුනි, ඉතින් නුඹලාට ඇත. බලාත්-
කාරය සහ කොල්ලකෑමද පහකොට,
යුක්තිය සහ ධර්මිෂ්ඨකමද කර, මාගේ
සෙනඟට බලාත්කාරකිරීමෙන් වැලකි-
යල්ලායයි ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක. හරි තරාදිද හරි *ඒඵාවක්ද 10
හරි †බාත් මිම්මක්ද නුඹලාට තිබේවා.
බාතට ‡හෝමෙරෙන් දසයෙන් කො- 11
ටසක්ද ඒඵාවට හෝමෙරෙන් දසයෙන්

*ඒඵාවක් නම් බුසලකින් $^{1}/_{5}$ යි.
†බාත නම් ගැලොම් 7 $^{1}/_{2}$ පමණවූ මිම්මකි.
‡හෝමෙර නම් බුසල් 8 යි.

කොටසක්ද අල්ලන පිණිස ඒඵාව හා
බාත එක ප්‍රමාණය වන්නේය. ඒවායේ
ප්‍රමාණය හෝමෙරට හරිව තිබේවා.
12 ෂෙකෙලට ගේරා විස්සක්ය. තුඹලාගේ
*මානෙය ෂෙකෙල් විස්සක්ව, ෂෙකෙල්
විසිපහක්ව, ෂෙකෙල් පහළොහක්ව,
13 තිබෙන්නේය. තුඹලා ඔප්පු කළ යුතුවූ
එසවීම් පූජාව නම් තිරිඟු හෝමෙරකින්
ඒඵාවෙන් හයෙන් කොටසක්ය. යව
හෝමෙරකිනුත් ඒඵාවෙන් හයෙන් කො-
14 ටසක් දිය යුතුය. තෙල් සම්බන්ධ නියමය
නම්: බාත් දසයක් අඩංගුවූ හෝමෙර
වන කෝරකින් බාතෙන් දසයෙන්
පංගුවක් දිය යුතුය: හෝමෙරට බාත්
15 දසයක් වේ. ඉශ්‍රායෙල්වරුන් උදෙසා
සමගිකමක් කිරීමට ආහාර පූජාවටත්
දවන පූජාවටත් ශාන්ති පූජාවලටත්
ඔවුන්ගේ සාරවත් බිම්වල එළු බැටළු
රැළවලින් දෙසියයකින් එක සතෙකු
බැගින් දෙන්ට යෙදේවයි ස්වාමිවූ
16 දෙවියන්වහන්සේ කියනසේක. දේශයේ
මුළු සෙනඟ ඒ එසවීම් පූජාව ඉශ්‍රායෙල්
17 අධිපතියාට දිය යුතුය. අධිපතියාගේ
යුතුකම නම් ඉශ්‍රායෙල් වංශයේ සියලු
නියම කාලවල මංගල්‍යවලදීත් අමාවක්-
වලදීත් සබත් දවස්වලදීත් දවන පූජාද
ආහාර පූජාද පාන පූජාද සපයා-
දීමය. ඉශ්‍රායෙල් වංශය උදෙසා සමගි-
කමක් කරන්ට පාප පූජාවද ආහාර
පූජාවද දවන පූජාවද ශාන්ති පූජාද ඔහු
විසින් පිළියෙළකළ යුතුය.

## මංගල්‍යවලදී සහ වෙනත් නියම කළ කාලවලදී පැවැත්විය යුතු පූජා

18 ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක: පළමුවෙනි මාසයේ පළමු-
වෙනිද කැලලක් නැති තරුණ ගොනෙක්
රැගෙන ශුද්ධස්ථානයේ දෝෂ පහ-
19 කරපන්න. පූජකයාද පාප පූජාවේ ලේ-
වලින් ස්වල්පයක් රැගෙන ගෘහයේ
උළුවස්සේ කණුවලත් පූජාසනයේ පිළේ
කොන් සතරේත් ඇතුල් මළුවේ දොරටුවේ
උළුවස්සේ කණුවලත් ගාන්නේය.
මාසයේ සත්වෙනි දවසේදීත් එසේම 20
කොට, මුළාවෙන අය නිසාත් අනුවණ
තැනැත්තා නිසාත් ගෘහය උදෙසා
සමගිකමක් කරපල්ලා. පළමුවෙනි 21
මාසයේදී දහහතරවෙනිද පටන් පාස්කු
මංගල්‍යය සත් දවසක් පවත්වමින්, මුහුන්
නැති රොටි කාපල්ලා. ඒ දවසේදී 22
අධිපතියා තමා උදෙසාත් දේශයේ මුළු
සෙනඟ උදෙසාත් තරුණ ගොනෙක් පාප
පූජාවක් කොට පිළියෙළකරන්නේය. ඔහු 23
මංගල්‍යයේ දවස් සතේ ස්වාමීන්වහන්සේට
දවන පූජාවක් කොට සත් දවසෙන්
එක එක දවසට කැලලක් නැති ගොන්
සත්දෙනෙකුත් බැටළුවන් සත්දෙනෙකුත්
පාප පූජාවක් කොට දවසට එළුවෙකුත්
පිළියෙළකරන්නේය. ඔහු ආහාර පූජාවක් 24
කොට ගොනෙකුට පිටි ඒඵාවක්ද
බැටළුවෙකුට ඒඵාවක්ද ඒඵාවකට තෙල්
හිනක්ද බැගින් පිළියෙළකරන්නේය.
සත්වෙනි මාසයේ පහළොස්වෙනිද 25
මංගල්‍යයේදී ඔහු එසේම සත් දවසක් ඒ
පාප පූජාවද දවන පූජාවද ආහාර පූජා-
වද තෙල්ද සඳහා පිළියෙළකරන්නේය.

46 ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
කියනසේක: නැගෙනහිර දෙස
තිබෙන ඇතුල් මළුවේ දොරටුව වැඩකරන
දවස් හයේ වසා තිබිය යුතුය; නුමුත්
සබත් දවසේද අමාවක දවසේද ඇර
තිබෙන්නේය. අධිපතියාද දොරටුවේ 2
ශාලාවේ මාර්ගයෙන් පිටතින් ඇතුල්වී,
දොරටුවේ කණුව ළඟ සිටින්නේය.
පූජකයෝ ඔහුගේ දවන පූජාවද ඔහුගේ
ශාන්ති පූජාවද පිළියෙළකරන්නෝය.
ඔහු දොරටුවේ එළිපත්ත ළඟ නමස්-
කාරකොට පිටතට යන්නේය. නුමුත්
සවස්වෙන තුරු දොරටුව නොවසා තිබිය
යුතුය. දේශයේ සෙනඟද එම දොරකඩ 3
ළඟ සබත් දවස්වලද අමාවක් දවස්වලද
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි නමස්-
කාරකරන්නෝය. අධිපතියා සබත් 4
දවසේදී ස්වාමීන්වහන්සේට ඔප්පුකළ
යුතු දවන පූජාව නම් කැලලක් නැති
බැටළුපැටියන් හදෙනෙකුත් කැලලක්
නැති බැටළුවෙකුත්ය: ආහාර පූජාව නම් 5

*මානෙය තලෙන්තයකින් $^1/_{60}$ යි.

බැටළුවාට පිටි ඒඵාවකුත් බැටළු-
පැටවුන්ට ඔහු දෙන පමණකුත් පිටි
6 ඒඵාවට තෙල් හිනකුත්ය. අමාවක
දවසේදී කැලලක් නැති තරුණ ගො-
නෙකුත් බැටළුපැටවුන් හදෙනෙකුත්
බැටළුවෙකුත් ඔප්පු කරන්නේය; උන්
7 කැලලක් නැති එවුන් විය යුතුය. ගොනාට
ඒඵාවකුත් බැටළුවාට ඒඵාවකුත් බැටළු-
පැටවුන්ට තමාගේ පුළුවන්කමේ හැටිය-
ටත් ඒඵාවට තෙල් හිනකුත් පිළියෙළ-
8 කරන්නේය. අධිපතියා ඇතුල්වෙන කල
ඔහු දොරටුවේ ශාලාවේ මාර්ගයෙන්
ඇතුල්විය යුතුය, ඒ මාර්ගයෙන්ම පිටතට
9 යා යුතුය. තුමූත් දේශයේ සෙනඟ නියම
කාලවලදී ස්වාමීන්වහන්සේ ඉදිරියට
ඇතුල්වෙන කල නමස්කාරකරන්ට උතුරු
දොරටුවේ මාර්ගයෙන් ඇතුල්වෙන අය
දකුණු දොරටුවේ මාර්ගයෙන් පිටතට
යා යුතුය; දකුණු දොරටුවේ මාර්ගයෙන්
ඇතුල්වෙන අය උතුරු දොරටුවේ මාර්ග-
යෙන් පිටතට යා යුතුය. කවුරු තුමූත්
ඇතුල්වෙන දොරටුවේ මාර්ගයෙන් හැරී
නොගොස් ඊට ඉදිරිපිටින් පිටතට යා
10 යුතුය. ඔවුන් ඇතුල්වෙන කල අධිපතියාත්
ඔවුන් අතරේ ඇතුල්වන්නේය; ඔවුන්
පිටතට යන කල ඔහුත් පිටතට යන්-
11 නේය. මංගල්‍යවලදීද නියම කාලවලදීද
ඔප්පුකරන ආහාර පූජාව ගොනෙකුට
ඒඵාවකුත් බැටළුවෙකුට ඒඵාවකුත්
බැටළුපැටවුන්ට ඔහු දෙන පමණකුත්
ඒඵාවට තෙල් හිනකුත් වන්නේය.
12 අධිපතියා ස්වේච්ඡා දවන පූජාවක්වත්
ස්වේච්ඡා ශාන්ති පූජාවක්වත් **ස්වාමීන්-
වහන්සේට** පිළියෙළකරන්ට එන කල,
නැගෙනහිරට තිබෙන දොර ඔහුට ඇරදිය
යුතුය, ඔහු සබත් දවසේදී කරන
ප්‍රකාරයට තමාගේ දවන පූජාවද ශාන්ති
පූජාවද පිළියෙළකර පිටතට යන්නේය;
ඔහු ගියායින් පසු දොරටුව වසනු ලබන්-
13 නේය. තවද කැලලක් නැති අවුරුද්දක
බැටළුපැටවෙක් දවන පූජාවක් කොට
දවස්පතාම **ස්වාමීන්වහන්සේට** පිළියෙළ-
කරපන්න. උදයෙන් උදය එසේ පිළියෙළ-
14 කරපන්න. ඌ සමග උදයෙන් උදය
ආහාර පූජාවක් වන ඒඵාවකින් හයෙන්
කොටසක්ද සිහින් පිටි තෙමන්ට තෙල්
හිනකින් තුනෙන් කොටසක්ද **ස්වාමීන්-
වහන්සේට** ආහාර පූජාවක් කොට
පිළියෙළකරපන්න; ඒක නිරන්තරවූ
සදාකාල නියෝගයක්ය. එසේ නිරන්තර 15
දවන පූජාවක් කොට බැටළුපැටවාද
ආහාර පූජාවද තෙල්ද උදයෙන් උදය
පිළියෙළකළ යුතුය.

ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මෙසේ 16
කියනසේක: අධිපතියා තමාගේ පුත්‍රයන්-
ගෙන් යමෙකුට තෑග්ගක් දුන්නොත්, එය
ඔහුගේ උරුමයය, එය ඔහුගේ පුත්‍රයන්ට
අයිතිවන්නේය; උරුමවීමෙන් එය ඔවුන්ගේ
කොටසය. තුමූත් තමාගේ උරුමයෙන් 17
තෑග්ගක් තමාගේ සේවකයන්ගෙන්
යමෙකුට දුන්නොත්, එය නිදහස්වීමේ
අවුරුද්ද දක්වා ඔහුට වන්නේය; එකල
එය අධිපතියාට නැවත වන්නේය; ඔහුගේ
උරුමය ඔහුගේ පුත්‍රයන්ට පමණක්
වන්නේය. සෙනඟ ඔවුන්ගේ කොටස්වලින් 18
අහක්කරන හැටියට අධිපතියා ඔවුන්ගේ
උරුමයෙන් කිසිවක් නොගනීවා; මාගේ
සෙනඟ තම තමුන්ගේ කොටස්වලින්
පන්නාදමනු නොලබන පිණිස තමා-
ගේම කොටසෙන් තමාගේම පුත්‍රයන්ට
උරුමයෙන් දේවයි කීවේය.

එවිට ඔහු දොරටුවේ පැත්තක ඇතුල්වීමට 19
තිබුණු මගින් උතුරු දෙසට පූජකයන්ට
තිබුණු ශුද්ධවූ කාමරවලට මා
පැමිණෙවුවේය. එහි පිටිපස්ස පැත්තෙහි
බස්නාහිර දෙසට ඉඩමක් තිබුණේය.
ඔහුද: මේක පූජකයන් අපරාධ පූජාව 20
සහ පාප පූජාව තම්බන්ටත් ආහාර
පූජාව බදින්ටත් ඕනෑවූ ඉඩමය; එසේ
කරන්නේ සෙනඟ ශුද්ධකරන පිණිස
ඒවා පිට-මළුවට නොගෙනියන පිණිස-
යයි මට කීවේය. එවිට ඔහු පිට-මළුවට 21
මා පමුණුවා, මළුවේ මුලු හතර ළඟින්
මා ගෙනගියේය; එවිට මළුවේ එක එක
මුල්ලෙහි මළුවක් තිබෙන බව දුටිමි.
මළුවේ මුලු හතරේ මළු සෙවිලිකර, 22
සතළිස් රියනක් දිගට තිස් රියනක් පළල්ව
තිබුණේය. ඒ සතරම එක මිම්මට
තිබුණේය. ඒ සතරම වටේට ඒවා 23

ඇතුළෙහි බැම්මක් බැගින් තිබුණේය,
වටකරින් බැම් යට ලිප් සාදා තිබුණේය.
24 එවිට ඔහු: මේවා ගෘහයේ සේවකයන්
විසින් සෙනඟගේ පූජා තම්බන්ට ඕනෑවූ
ගෙවල්යයි මට කීවේය.

## දේවමාළිගාවෙන් නික්මෙන ජීවන ගඟ

47 පසුව ඔහු මා ගෘහයේ දොරකඩ
ළඟට නැවත පැමිණෙවුවේය; එවිට
ගෘහයේ එළිපත්තට යටින් නැගෙනහිර
දෙසට වතුර ගලායන බව දුටිමි,
මක්නිසාද ගෘහයේ ඉස්සරහ පැත්ත
නැගෙනහිර දෙසට තිබුණේය. ඒ වතුර
ගෘහයට දකුණු පැත්තෙන් පූජාසනයට
2 දකුණෙන් පහළින් ගලා ආවේය. එකල
ඔහු මා උතුරු දොරටුවේ මාර්ගයෙන්
පිටතට ගෙනගොස්, නැගෙනහිරට තිබුණු
පිටත මාර්ගයෙන් පිටත දොරටුව ළඟට
වටකරින් මා පැමිණෙවුවේය; එවිට වතුර
3 දකුණු පැත්තෙන් වැගිරෙනවා දුටිමි. ඒ
මනුෂ්‍යයා තමාගේ අතින් ලනුව රැගෙන
නැගෙනහිර දෙසට යමින් රියන් දහසක්
මැන්නේය, එවිට ඔහු වතුර මැදින්
එගොඩට මා ඇරියේය, වතුර වළලුකර
4 දක්වා තිබුණේය. ඔහු තව දහසක් මැන
වතුර මැදින් මා ඇරියේය, වතුර දණහිස්
දක්වා තිබුණේය. ඔහු තව දහසක් මැන
වතුර මැදින් මා ඇරියේය, වතුර ඉඟටිය
5 දක්වා තිබුණේය. ඔහු තව දහසක්
මැන්නේය; එවිට ඒවා මට බැසයන්ට
බැරි ගඟක්ව තිබුණේය. මක්නිසාද
බැසයන්ට බැරි ගඟක්ව පීනන්ට උවමනා
6 තරමට වතුර උස්වී තිබුණේය. එවිට
ඔහු: මනුෂ්‍ය පුත්‍රය, නුඹ මෙය දුටුවෙහිදැයි
මාගෙන් අසා, මා කැඳවාගන නැවත
7 ගඟබඩට මා පැමිණෙවුවේය. මම හැරී
ගිය කල, ගඟබඩ දෙපැත්තෙන්ම බොහෝ
8 ගස් තිබෙනවා දුටිමි. ඔහුද: මේ වතුර
නැගෙනහිර දිසාව දෙසට ගලාගොස්,
අරබා සමභූමියට බැස, එහි මුහුදට
ඇතුල්වන්නේය; මුහුදට ගලායන ඒවා-
9 යෙන් එහි වතුර හොඳවන්නේය. මේ
ගංගා පැමිණෙන සෑම තැනම රාශි
ගණන් පණ ඇති සියලුම සත්ත්වයෝ
ජීවත්වන්නෝය; එසේ මත්ස්‍යයන් මහත්
ගණනක් හටගන්නවා ඇත. මක්නිසාද
මේ වතුර එහි පැමුණුණාම අනික් ඒවා
හොඳවන්නේය, ගංගාව ගලන කො-
තැනක නුමුත් ඉන්න සියල්ලන් ජීවත්ව
සිටිනවා ඇත. මසුන් අල්ලන්නන් ඒක 10
අද්දර සිටිනවා ඇත. ඒන්-ගෙදියේ සිට
ඒන්-එග්ලයිම් දක්වා දැල් අතුරන ස්ථාන
වන්නේය; එහි මත්ස්‍යයෝ මහ මුහුදේ
මත්ස්‍යයන් මෙන් එක එක වර්ගයේ
හැටියට මහත් ගණනක් ඉන්නෝය. නුමුත් 11
ඒකේ හැල්පත් සහ පොකුණුද හොඳ
නොවී, ලුණු ගන්නා පිණිස හරිනු
ලබන්නේය. ගඟ ළඟ දෙපැත්තේම එහි 12
අද්දර සියලු ආකාර ඵල-ගස් වැවෙන්-
නේය; ඒවායේ කොළ වේලෙන්නේවත්
ඒවායේ ඵල වරන්නේවත් නැතුව, හැම
මාසයේම අලුත් ඵල දරන්නේය, මක්-
නිසාද ඒවායේ වතුර ශුද්ධස්ථාන-
යෙන්ම නික්ම එන්නේය. ඒවායේ ඵල
ආහාර පිණිසත් ඒවායේ කොළ සුව-
කිරීම පිණිසත් වන්නේය.

## අලුත් ශුද්ධ දේශයේ සීමා

ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ 13
කියනසේක: ඉශ්‍රායෙල් ගෝත්‍ර දොළසට
නුඹලා දේශය බෙදා දිය යුතු මේ සීමාවේ
හැටියටය—යෝසෙප්ට කොටස් දෙකක්
ලැබෙන්නේය. නුඹලාගෙන් එක්කෙ- 14
නෙකුට මෙන් තවත් කෙනෙකුට ඒක
උරුමවන්නේය; මක්නිසාද නුඹලාගේ
පියවරුන්ට ඒක දෙන හැටියට මාගේ
අත එසෙවුවෙමි. එසේ මේ දේශය
උරුමයක් පිණිස නුඹලාට ලැබෙන්නේය.
දේශයේ සීමාව මෙසේය: උතුරු දිශාවේ 15
මහ මුහුදේ සිට ශෙදද්ට පැමිණෙන
හෙත්ලොන් මාර්ගයේ තිබෙන හමාත්ද
බේරෝතාද දමස්කයේ සීමාවටත් 16
හමාත්හි සීමාවටත් අතරේ තිබෙන
සිබ්‍රායිම්ද හවුරාන්හි සීමාවේ තිබෙන
මධ්‍ය හාශෙර්ද යන ඒවාය. මෙසේ 17
මුහුදේ සිට සීමාව හශර්-ඒනොන් සහ
දමස්කයේ සීමාවත්ය, උතුරු දිශාවේ
උතුරට හමාත්හි සීමාවත්ය. උතුරු
පැත්ත ඒකය. නැගෙනහිර පැත්ත වනාහි 18
හවුරාන්ටත් දමස්කයටත් ගිලියද්ටත්
ඉශ්‍රායෙල් දේශයටත් අතරේ යොර්දන

වන්නේය; උතුරු සීමාවේ පටන්
නැගෙනහිර මුහුද දක්වා මැනපල්ලා.
19 ඒක නැගෙනහිර පැත්තය. දකුණු දිශාවේ
පැත්ත නම් තාමාර් පටන් මෙරීබොත්-
කාදෙෂ්හි ජලයත් මිසර ඔයත් මහ
මුහුදත් දක්වා තිබේ. දකුණු දිශාවේ
20 දකුණු පැත්ත ඒකය. බස්නාහිර පැත්ත
නම් සීමාවේ පටන් හමාත් ඉදිරිපිටට
පැමිණෙන තුරු මහ මුහුදය. බස්නාහිර
21 පැත්ත ඒකය. මේ දේශයද ඉශ්‍රායෙල්
ගෝත්‍ර ප්‍රකාරයට තුඹලා අතරේ බෙදා-
22 ගනිල්ලා. තුඹලාටත් තුඹලා අතරේ
වාසයකරන්නාවූ, තුඹලා අතරෙහි
දරුවන් ඉපදී සිටින විදේශීන්ටත්
උරුමයක් පිණිස පසඇට දමා බෙදා-
ගනිල්ලා; ඔව්හු ඉශ්‍රායෙල් පුත්‍රයන්
අතරෙහි ස්වදේශීන් මෙන් තුඹලා සමග
සිටිත්වා; තුඹලා සමග ඉශ්‍රායෙල් ගෝත්‍ර
අතරෙහි පසඇට දමීමෙන් ඔවුන්ට
23 උරුමයක් වන්නේය. විදේශියා වාසය-
කරන ගෝත්‍රය අතරේම ඔහුගේ උරුමය
ඔහුට දීපල්ලායයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක.

## දේශය ගෝත්‍ර වශයෙන් බෙදීම

**48** ගෝත්‍රවල නාමවල් මේවාය:
හමාත්ට පැමිණෙන හෙත්ලොන්හි
මාර්ගයද හශර්-ඒනාන්ද උතුරෙහි
හමාත්ට ළංවූ දමස්කයේ සීමාවද ළඟ
තිබෙන උතුරු කෙළවරේ සිට නැගෙන-
හිර පැත්තේ පටන් බස්නාහිර දක්වා
2 දන්ට *එකක්ය. දන්ගේ සීමාව ළඟ
නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර
පැත්ත දක්වා ආෂෙර්ට *එකක්ය.
3 ආෂෙර්ගේ සීමාව ළඟ නැගෙනහිර
පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා
4 නප්තලීට *එකක්ය. නප්තලීගේ සීමාව
ළඟ නැගෙනහිර පැත්තේ පටන්
බස්නාහිර පැත්ත දක්වා මනස්සේට
5 *එකක්ය. මනස්සේගේ සීමාව ළඟ
නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර
පැත්ත දක්වා එප්‍රායිම්ට *එකක්ය.
6 එප්‍රායිම්ගේ සීමාව ළඟ නැගෙනහිර
පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා

*එනම්, එක කොටසක්ය.

රූබෙන්ට *එකක්ය. රූබෙන්ගේ සීමාව 7
ළඟ නැගෙනහිර පැත්තේ පටන් බස්-
නාහිර පැත්ත දක්වා යූදට *එකක්ය.
යූදගේ සීමාව ළඟ නැගෙනහිර පැත්තේ 8
පටන් බස්නාහිර පැත්ත දක්වා තුඹලා
ඔප්පුකළ යුතු උපහාර කොටස
වන්නේය, එහි පළල දඬු විසිපන් දහසක්ද
එහි දිග අනික් කොටස්වලින් එකක්
වාගේ නැගෙනහිර පැත්තේ පටන්
බස්නාහිර පැත්ත දක්වාද වන්නේය;
ශුද්ධස්ථානය එහි මැද වන්නේය. තුඹලා 9
එයින් ස්වාමින්වහන්සේට ඔප්පුකළ යුතුවූ
උපහාර කොටස විසිපන් දහසක් දිගද
දස දහසක් පළලද ඇතුව තිබිය යුතුය.
ශුද්ධවූ උපහාරය මොවුන්ට වන්නේය, 10
එනම්, පූජකයන්ට, උතුරට විසිපන්
දහසක් දිගද බස්නාහිරට දස දහසක්
පළලද නැගෙනහිරට දස දහසක් පළලද
දකුණ දෙසට විසිපන් දහසක් දිගද
ඇති කොටසක් වන්නේය. ඒක මැද
ස්වාමින්වහන්සේගේ ශුද්ධස්ථානය වන්-
නේය. එය ඉශ්‍රායෙල් පුත්‍රයන් මුළාව 11
ගිය කල ලෙවීවරු මුළාව ගියාක්මෙන්
මුළාව නොගොස් මාගේ සේවය පැවැත්-
තුවාවූ, ශාදෙක්ගේ පුත්‍රයන්වූ පවිත්‍රකරනු
ලැබූ පූජකයන්ට වන්නේය. එය දේශයේ 12
උපහාරයෙන් ලෙවීවරුන්ගේ සීමාව ළඟ
ඔවුන්ට අති ශුද්ධ උපහාර කොටසක්
වන්නේය. පූජකයන්ගේ සීමාවට යාව 13
විසිපන් දහසක් දිගද දස දහසක් පළලද
ඇති කොටසක් ලෙවීවරුන්ට වන්නේය.
මුළු දිග විසිපන් දහසක්ද පළල දස
දහසක්ද විය යුතුය. ඔවුන් විසින් එයින් 14
කිසිවක් විකුණන්ටවත් මාරුකරන්ටවත්
භූමියේ ප්‍රථම ඵල අහිමිකරන්ටවත්
නොයෙදේවා. මක්නිසාද එය ස්වාමින්-
වහන්සේට ශුද්ධය. විසිපන් දහසට යාව 15
පළලෙන් ඉතුරුව තිබෙන පන් දහස
වාසයකිරීමට නුවර සහ පිට-බිම් පිණිස
පොදුවූ කොටසක් වන්නේය. නුවර
වනාහි ඒක මැද වන්නේය. ඒකේ මිම්
මෙසේය: උතුරු පැත්ත හාරදස් පන්- 16
සියයක්ය, දකුණු පැත්ත හාරදස් පන්-
සියයක්ය, නැගෙනහිර පැත්ත හාරදස්

*එනම්, එක කොටසක්ය.

පන්සියයක්ය, බස්නාහිර පැත්ත හාරදස්
17 පන්සියයක්ය. නුවරට පිට-බිම් තිබිය
යුතුය; උතුරට දඹු දෙසිය පනහක්ව,
දකුණට දෙසිය පනහක්ව, නැගෙනහිරට
දෙසිය පනහක්ව, බස්නාහිරට දෙසිය
18 පනහක්ව තිබිය යුතුය. ශුද්ධවූ
උපහාරයට යාව දිගින් ඉතිරිවෙන්නේ
නැගෙනහිරට දස දහසක්ය; බස්නාහිරට
දස දහසක්ය. එය ශුද්ධවූ උපහාරය
ළඟ වන්නේය; ඒ කොට්ඨාසවල
අස්වැත්ත නුවර වැඩ කරන්නන්ට කෑම
19 පිණිස වන්නේය; සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රවලින් නුවර වැඩකරන්නෝ එය
20 අස්වද්දවත්වා. මුළු උපහාරය විසිපන්
දහසක් දිගව, විසිපන් දහසක් පළලව,
තිබිය යුතුය. එසේ ශුද්ධවූ උපහාරය
නුවර කොටස ඇතුළුව සතරැස් එකක්
කොට ඔප්පු කරපල්ලා.
21 ශුද්ධවූ උපහාරයටත් නුවර කොටසටත්
දෙපැත්තෙන් එනම් උපහාරයේ විසිපන්
දහස ළඟ සිට නැගෙනහිර සීමාව
දක්වාද බස්නාහිර දෙසට විසිපන් දහස
ළඟ සිට බස්නාහිර සීමාව දක්වාද
[ගෝත්‍ර] කොටස් ළඟ ඉතිරිවෙන පංගු
අධිපතියාට වන්නේය. ශුද්ධවූ උපහාරයද
ගෘහයේ ශුද්ධස්ථානයද එහි මැද
22 වන්නේය. එසේ අධිපතියාට අයිති ඒවාට
අතරේ තිබෙන ලෙවීවරුන්ගේ කොටසේ
සිටද නුවර කොටසේ සිටද යූදගේ
සීමාවටත් බෙන්යමින්ගේ සීමාවටත්
අතරේ තිබෙන කොටස් අධිපතියාට
වන්නේය.
23 ඉතිරි ගෝත්‍රවලින් නම් නැගෙනහිර
පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා
24 බෙන්යමින්ට *එකක්ය. බෙන්යමින්ගේ
සීමාව ළඟ නැගෙනහිර පැත්තේ පටන්
බස්නාහිර පැත්ත දක්වා සිමියොන්ට
25 *එකක්ය. සිමියොන්ගේ සීමාව ළඟ
නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර

*එනම්, එක කොටසක්ය.

පැත්ත දක්වා ඉස්සාකර්ට *එකක්ය.
ඉස්සාකර්ගේ සීමාව ළඟ නැගෙනහිර 26
පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා
සාබුලොන්ට *එකක්ය. සාබුලොන්ගේ 27
සීමාව ළඟ නැගෙනහිර පැත්තේ පටන්
බස්නාහිර පැත්ත දක්වා ගාද්ට *එකක්ය.
ගාද්ගේ සීමාව ළඟ දකුණු දිශාවට 28
දකුණු පැත්තේ සීමාව නම් තාමාර් පටන්
මෙරීබත්-කාදෙෂ්හි ජලයත් මිසර ඔයත්
මහ මුහුදත් දක්වා තිබෙන්නේය. ඉශ්‍රා- 29
යෙල් ගෝත්‍රවලට උරුමයක් පිණිස නුඹලා
පසඇට දමා බෙදිය යුතුවූ දේශය ඒකය,
ඔවුන්ගේ කොටස් ඒවායයි ස්වාමිවූ
දෙවියන්වහන්සේ කියනසේක.

## නුවර දෙරටු සහ නාමය

නුවරින් පිටතට යන තැන් මෙසේය: 30
දඹු මිම්මෙන් හාරදස් පන්සියයක් දිග
ඇති උතුරු පැත්තෙහි ඉශ්‍රායෙල් ගෝත්‍රවල 31
නාම ප්‍රකාරයට නම් ඇතුව, නුවර දෙරටු-
වලින් දෙරටු තුනක් උතුරට වන්නේය.
රූබෙන්ගේ දෙරටුව එකක්ය; යූදගේ
දෙරටුව එකක්ය; ලෙවීගේ දෙරටුව එකක්ය.
හාරදස් පන්සියයක් දිග ඇති නැගෙනහිර 32
පැත්තෙහි දෙරටු තුනක් වන්නේය.
යෝසෙප්ගේ දෙරටුව එකක්ය; බෙන්-
යමින්ගේ දෙරටුව එකක්ය; දන්ගේ දෙරටුව
එකක්ය. මිම්මෙන් හාරදස් පන්සියයක් 33
දිග ඇති දකුණු පැත්තෙහි දෙරටු තුනක්
වන්නේය. සිමියොන්ගේ දෙරටුව එකක්ය;
ඉස්සාකර්ගේ දෙරටුව එකක්ය; සාබු-
ලොන්ගේ දෙරටුව එකක්ය. හාරදස් 34
පන්සියයක් දිග ඇති බස්නාහිර පැත්තෙහි
දෙරටු තුනක් වන්නේය. ගාද්ගේ දෙරටුව
එකක්ය; ආෂේර්ගේ දෙරටුව එකක්ය;
නප්තලීගේ දෙරටුව එකක්ය. වටකර 35
දහඅට දහසක්ය. ඒ දවසේ පටන් නුවර
නාමය †යෝහෝවා-ෂාමා වන්නේයයි
කීසේක.

*එනම්, එක කොටසක්ය.
†එනම්: ස්වාමීන්වහන්සේ එහිය.

# අනාගතවක්තෘවූ දනියෙල්ගේ පොත

## දනියෙල් සහ මිත්‍රයන් තුන්දෙනා බබිලෝනියේ රජු වෙත සිටීම. සැප කෑම බීමෙන් වැලකීම

1 යූදහි රජවූ යෙහෝයාකීම්ගේ
රජකම්කිරීමේ තුන්වෙනි අවුරුද්දේදී
බබිලෝනියේ රජවූ නෙබුකද්නෙශර් රජ
යෙරුසලමට ඇවිත් ඒක වටලා
2 ගත්තේය. ස්වාමීන්වහන්සේද යූදහි රජවූ
යෙහෝයාකීම් සහ දෙවියන්වහන්සේගේ
ගෘහයේ බඩුවලින් කොටසක් ඔහු අතට
දුන්සේක; ඔහු ඒවා ෂීනාර් දේශයේ
තමාගේ දෙවියන්ගේ ගෘහයට ගෙනැවිත්,
ඒ බඩු තමාගේ දෙවියන්ගේ භාණ්ඩා-
3 ගාරයෙහි තැබුයේය. රජ තමාගේ
නපුංසකයන්ගේ ප්‍රධානියාවූ අෂ්පෙනස්ට
කථාකොට, ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරෙන්
රාජ වංශයෙන්ද උත්තමයන්ගෙන්ද
4 කැලලක් නැත්තාවූ, ශෝභමානවූ, සකල
ශාස්ත්‍ර දැනුම් ඇත්තාවූ, දැනගැන්මද
ඥනයද ඇත්තාවූ, රජුගේ මාළිගාවෙහි
සිටින්ට පුළුවන්කම ඇත්තාවූ යෞවනයන්
ගෙන්වාගන, කල්දිවරුන්ගේ අකුරුත්
5 භාෂාවත් උගන්වන්ට කීවේය. රජතෙමේ
ඔවුන්ට තමාගේ භෝජනවලින්ද තමා
බොන මුද්‍රිකපානයෙන්ද දවස්පතා
කොටසක් නියමකොට, ඊට පසු ඔවුන්
රජු ඉදිරියෙහි සිටින පිණිස තුන්
අවුරුද්දක් ඔවුන් පෝෂ්‍යකරන්ට අණ-
6 කෙළේය. ඔවුන් අතරේ යූද පුත්‍රයන්ගෙන්
දනියෙල්ද හනනියාද මීෂායෙල්ද අසරි-
7 යාද වූවෝය. නපුංසකයන්ගේ අධිපතියා
ඔවුන්ට නම් තැබුවේය; ඔහු දනියෙල්ට
බේල්ටෙෂශර්ද හනනියාට ෂද්‍රක්ද
මීෂායෙල්ට මේෂක්ද අසරියාට අබේද්-
8 නෙගෝද යන නම් තැබුවේය. එහෙත්
දනියෙල් රජුගේ භෝජනයෙන්වත් ඔහු
බොන මුද්‍රිකපානයෙන්වත් අපවිත්‍ර
නොවී සිටීමට තමාගේ සිතින්
නියමකරගෙන, එසේ අපවිත්‍ර නොවී
සිටින්ට නපුංසකයන්ගේ අධිපතියාගෙන්
අවසර ඉල්លුවේය. දෙවියන්වහන්සේ 9
දනියෙල්ට නපුංසකයන්ගේ අධිපති-
යාගෙන් කරුණාවත් අනුකම්පාවත්
ලැබෙන්ට සැලැස්වූසේක. නපුංසකයන්- 10
ගේ අධිපතියා දනියෙල්ට කථාකොට:
නුඹලාගේ කෑමද බීමද නියමකළ
මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට භයවෙමි.
නුඹලාගේ වයසේ යෞවනයන්ට වඩා
නුඹලාගේ මුහුණු මලානිකව තිබෙනවා
ඔහු දකින්නේ මක්නිසාද? එසේ නුඹලා
නිසා මාගේ හිස රජු ඉදිරියෙහි උපද්‍රවයට
පැමිණේයයි කීවේය. එකල දනියෙල්ද 11
හනනියාද මීෂායෙල්ද අසරියාද කෙරෙහි
නපුංසකයන්ගේ අධිපතියා විසින් පත්කළ
*ගබඩාකාරයාට දනියෙල් කථාකොට:
නුඹේ මෙහෙකරුවන් දස දවසක් 12
පරීක්ෂාකර බලන ලෙස ඉල්ලමි; කන්ට
එළවළුද බොන්ට වතුරද අපට ලැබේවා.
පසුව අපේ පෙනීමද රජුගේ භෝජන 13
කන්නාවූ යෞවනයන්ගේ පෙනීමද නුඹ
බලා, නුඹට පෙනෙන හැටියට නුඹේ
මෙහෙකරුවන්ට කළ මැනවියි කීවේය.
ඒ කාරණය ගැන ඔහු ඔවුන්ට 14
ඇහුම්කන්දී, දස දවසක් ඔවුන්
පරීක්ෂාකර බැලුවේය. දස දවසකට පසු 15
රජුගේ භෝජනයෙන් කෑවාවූ සියලු
යෞවනයන්ට වඩා ඔව්හු පෙනීමෙන්
හොඳව, මාංසයෙන් තරව සිටියෝය.
එවිට ගබඩාකාරයා ඔවුන්ගේ නියම 16
භෝජනද ඔවුන්ට බොන්ට තිබුණු

*හෙබ්‍රෙව්: හම්මෙල්සර්.

මුද්‍රිකපානයද අහක්කර, එලවලු ඔවුන්ට
17 දුන්නේය. මේ යෞවනයන් සතරදෙනාට
නම් දෙවියන්වහන්සේ සියලු ආකාර
ලියවිලි ගැනත් ශාස්ත්‍ර ගැනත් දැනගැන්මද
ඥානයද දුන්සේක. දනියෙල්ට සියලු
දර්ශනද ස්වප්නද සම්බන්ධ තේරුම
18 තිබුණේය. ඔවුන් කැඳවාගෙන එන්ට
රජු නියමකළ කාලය පැමිණුණු විට,
නපුංසකයන්ගේ අධිපතියා නෙබුකද්-
නෙශර් ඉදිරියට ඔවුන් කැඳවාගෙන
19 ආවේය. රජ ඔවුන් සමග කථාකෙළේය.
ඔවුන් සියල්ලන් අතරේ දනියෙල්ටත්
හනනියාටත් මීෂායෙල්ටත් අසරියාටත්
සමානවූ කිසිවෙක් සම්බ නොවීය. ඔව්හු
20 රජු ඉදිරියෙහි සිටියෝය. රජු විසින්
ශාස්ත්‍රයත් නුවණත් සම්බන්ධ මොන
කාරණයක් ඔවුන්ගෙන් විභාගකළත්,
තමාගේ මුළු රාජ්‍යයෙහි සිටි සියලු
මන්ත්‍රකාරයන්ටත් අනවිනකාරයන්ටත්
වඩා ඔවුන් දස ගුණයක් සමර්ථ බව
21 ඔහුට පෙනී ගියේය. දනියෙල් වනාහි
කෝරෙෂ් රජුගේ පළමුවෙනි අවුරුද්ද
දක්වා සිටියේය.

## නෙබුකද්නෙශර් රජ ස්වප්නයෙන් දුටු නානාවිධවූ රූපය සහ දනියෙල්ගේ විස්තරය

2 නෙබුකද්නෙශර්ගේ රජකම්කිරීමේ
දෙවෙනි අවුරුද්දේදී නෙබුකද්නෙශර්
ස්වප්න දුටුවේය; එයින් ඔහුගේ ආත්මය
කැලඹී, ඔහුගේ නින්ද ඔහුගෙන් පහව
2 ගියේය. එවිට රජුගේ ස්වප්න රජුට
දන්වන පිණිස මන්ත්‍රකාරයන්ටත්
අනවිනකාරයන්ටත් මායාකාරයන්ටත්
කල්දිවරුන්ටත් අඬගසන්ට රජ
අණකෙළේය. ඔව්හු ඇවිත් රජු ඉදිරියෙහි
3 සිටියෝය. රජද: මා ස්වප්නයක් දැක, ඒ
ස්වප්නය දැනගන්ට මාගේ ආත්මය
4 කැලඹී තිබේයයි ඔවුන්ට කීය. කල්දිවරු
අරාමි භාෂාවෙන් රජුට කථාකර:
රජ්ජුරුවෝ සදාකාලේටම ජීවත් වේවා.
ඔබගේ මෙහෙකරුවන්ට ස්වප්නය කිව
මැනවි, එවිට අපි අර්ථය තෝරා-
දෙන්නෙමුයයි කීවෝය. රජතෙමේ 5
කල්දිවරුන්ට උත්තරදෙමින්: කාරණය
මාගෙන් පහව ගියේය. ස්වප්නයද එහි
අර්ථයද නුඹලා මට නොදන්නුවොත්,
නුඹලා කැබලිකොට, නුඹලාගේ ගෙවල්
කසළගොඩක් කරනු ලබන්නේය. එහෙත් 6
ස්වප්නයද එහි අර්ථයද නුඹලා
පෙන්වාදෙන්නහු නම්, නුඹලාට තෑගි
හා විපාකද බොහෝ ගෞරවයද
මාගෙන් ලැබෙනවා ඇත. එබැවින්
ස්වප්නයද එහි අර්ථයද මට පෙන්වා-
පල්ලායයි කීවේය. ඔව්හු දෙවෙනි වර 7
උත්තරදෙමින්: රජ්ජුරුවෝ තමාගේ
මෙහෙකරුවන්ට ස්වප්නය කියත්වා,
එවිට අපි අර්ථය පෙන්වන්නෙමුයයි
කීවෝය. රජ උත්තරදෙමින්: කාරණය 8
මාගෙන් පහව ගිය බව නුඹලාට
පෙනෙන හෙයින් නුඹලා කල් ගන්ට
කැමති බව සත්තකලෙසම දනිමි. නුඹලා 9
ස්වප්නය මට නොදන්නුවොත්, නුඹලාට
ඇත්තේ එක නියමයක්ය. කාලය
වෙනස්වෙන තුරු, නුඹලා මා ඉදිරියෙහි
කියන්ට බොරුවූ ප්‍රයෝග වචන
යොදගෙන හිඳිනහුය. එබැවින් ස්වප්නය
මට කියාපල්ලා, එවිට නුඹලාට එහි
අර්ථය පෙන්වන්ට පුළුවන් බව මට
දැනෙනවා ඇතැයි කීවේය. කල්දිවරු 10
රජු ඉදිරියෙහි උත්තරදෙමින්: රජුගේ
කාරණය පෙන්වන්ට පුළුවන් මනුෂ්‍ය-
යෙක් පොළොව මතුපිට ඇත්තේ නැත.
කිසිම රජෙක් හෝ අධිපතියෙක්
හෝ ආණ්ඩුකාරයෙක් හෝ මෙවැනි
කාරණයක් මන්ත්‍රකාරයෙකුගෙන්වත්
අනවිනකාරයෙකුගෙන්වත් කල්දිය-
යෙකුගෙන්වත් විචාරා නැත. රජ්ජුරුවන් 11
විචාරන දේ ඉතා අමාරු එකකි,
මනුෂ්‍යයන් සමග වාසය නොකරන
දෙවිවරුන්ට මිස රජු ඉදිරියෙහි ඒක
පෙන්වන්ට පුළුවන් වෙන කිසිවෙක්
නැතැයි කීවෝය. එබැවින් රජ කිපී 12
ඉතා උදහස්වී, බබිලෝනියේ සියලු
ශාස්ත්‍රවන්තයන් නැතිකරදමන්ට
අණකෙළේය. මෙසේ ශාස්ත්‍රවන්තයන් 13
මරන ලෙස නියෝග නිකුත්විය; එහෙයින්
ඔව්හු දනියෙල් සහ ඔහුගේ සමාගම්කාරයන්

14 මරන්ට සෙවුවෝය. එකල දනියෙල්
බබිලෝනියේ ශාස්ත්‍රවන්තයන් මරන
පිණිස පිටත්ව ආ රජුගේ මුරකාරයන්ගේ
ප්‍රධානියාවූ අරියෝක්ට නුවණින්ද
15 සිහියෙන්ද උත්තරදුන්නේය; ඔහු රජුගේ
ඇමතියාවූ අරියෝක්ට කථාකොට:
මෙතරම් තද නියෝගයක් රජු වෙතින්
පැමුණුණේ මක්නිසාදැයි ඇසුවේය. එකල
අරියෝක් ඒ කාරණය දනියෙල්ට
16 දන්විය. දනියෙල් ඇතුළට ගොස්, අර්ථය
රජුට පෙන්වාදෙන පිණිස තමාට
කල් දෙන හැටියට රජුගෙන් ඉල්ලුවේය.
17 එකල දනියෙල් තමාගේ ගෙදරට
ගොස්, තමාගේ සමාගම්කාරයන්වූ
හනනියාටත් මීෂායෙල්ටත් අසරියාටත්
18 ඒ කාරණය දන්වා, තමා සහ තමාගේ
සමාගම්කාරයන් බබිලෝනියේ අනික්
ශාස්ත්‍රවන්තයන් සමග විනාශ නොවන
පිණිස, ඒ රහස ගැන ස්වර්ගයේ
දෙවියන්වහන්සේගෙන් අනුකම්පාව
19 ඉල්ලන්ට කීවේය. එවිට රාත්‍රියේ
දර්ශනයකින් ඒ රහස දනියෙල්ට
එළිදරව්විය. දනියෙල් ස්වර්ගයේ
දෙවියන්වහන්සේට ප්‍රශංසා කෙළේය.
20 දනියෙල් කථාකොට: දෙවියන්වහන්සේගේ
නාමයට සදකාලයෙන් සදකාලයටම
ප්‍රශංසාවේවා; මක්නිසාද ප්‍රඥවත් බලයත්
21 අයිති උන්වහන්සේටය. කාලවල්ද
ප්‍රස්තාවල්ද වෙනස්කරන්නෙත් රජවරුන්
පහකරන්නෙත් රජවරුන් පත්කරන්නෙත්
ප්‍රඥවන්තයන්ට ප්‍රඥවද නුවණ ඇත්තන්ට
22 දැනුමද දෙන්නෙත් උන්වහන්සේය. ගැඹුරුවූ
රහස්වූ කාරණා එළිදරව්කරන්නෙත්
අන්ධකාරයෙහි තිබෙන දේවල් දන්නෙත්
උන්වහන්සේය, ආලෝකයද උන්වහන්සේ
23 සමග වාසයකරන්නේය. මාගේ පිය-
වරුන්ගේ දෙවියන්වහන්ස, ඔබ මට
ප්‍රඥවත් බලයත්දී, අප ඔබගෙන් විචාළ
කාරණය දැන් මට දන්වාදුන් බැවින්
ඔබට ස්තුතිකරමි, ප්‍රශංසාකරමි. මක්නිසාද
ඔබවහන්සේ රජුගේ කාරණය අපට
24 දන්වූසේකැයි කීවේය. ඒ නිසා
දනියෙල් බබිලෝනියේ ශාස්ත්‍රවන්තයන්
නැතිකරදමන්ට රජු විසින් පත්කරනු

ලැබූ අරියෝක් ළඟට ගොස් ඇතුල්වී,
ඔහුට කථාකොට: බබිලෝනියේ
ශාස්ත්‍රවන්තයන් නැතිකර නොදමා, රජු
ඉදිරියට මා පමුණුවන්න, ඒ අර්ථය
රජුට පෙන්වමියි කීවේය.
එකල අරියෝක් තෙමේ දනියෙල් රජු 25
ඉදිරියට ඉක්මනින් කැඳවාගෙන ගොස්,
රජුට කථාකොට: යූද රටෙන් අල්ලාගත
ආ තැනැත්තන් අතරෙහි රජුට අර්ථය
දන්වන මනුෂ්‍යයෙක් මට සම්බවීයයි
කීවේය. රජ තෙමේ බේල්ටෙෂශර් නම්වූ 26
දනියෙල්ට කථාකොට: මා විසින් දුටු
ස්වප්නයත් එහි අර්ථයත් මට දන්වන්ට
තුඹට පුළුවන්දැයි ඇසුවේය. දනියෙල් 27
රජු ඉදිරියේ උත්තරදෙමින්: රජු
විචාළ රහස රජුට පෙන්වන්ට ශාස්ත්‍ර-
වන්තයන්ටවත් අනවිනකාරයන්ටවත්
මන්ත්‍රකාරයන්ටවත් ජේනකියන්නන්ටවත්
නුපුළුවන; නුමුත් රහස් එළිදරව්කරන 28
දෙවිකෙනෙක් ස්වර්ගයෙහි සිටිනසේක,
උන්වහන්සේ මතු දවස්වල සිද්ධවෙන්ට
තිබෙන කාරණා නෙබුකද්නෙශර් රජුට
දන්වා තිබේ. ඔබගේ ස්වප්නයද ඔබගේ
යහනේදී පැමුණුණ ඔබගේ හිසේ
දර්ශනද මෙසේය: රජ්ජුරුවෙනි, ඔබට 29
වූකලී, මින්මතු සිද්ධවෙන්ට තිබෙන
කාරණා ගැන ඔබගේ යහනේදී සිතිවිලි
හටගත්තේය. රහස් එළිදරව්කරන
තැනන්වහන්සේ සිද්ධවෙන්ට තිබෙන
කාරණා ඔබට දන්වා තිබේ. මටත් මේ 30
රහස එළිදරව්වුණේ ජීවත්ව සිටින
සියල්ලන්ට වඩා මට ප්‍රඥව තිබෙන
නිසා නොව, අර්ථය රජුට දන්වනු
සඳහාත් ඔබගේ සිතේ සිතිවිලි ඔබ
දැනගන්නා පිණිසත්ය. රජ්ජුරුවෙනි, ඔබ 31
මහත් රූපයක් දුටුවෙහිය. ඒ රූපය
මහත්ව ඉතා දීප්තිමත්ව තිබුණේය, ඒක
ඔබ ඉදිරියෙහි සිටියේය; ඒකේ පෙනීමද
භයංකරය. ඒ රූපයේ හිස අනර්ඝ 32
රත්රන්ව, ඒකේ ළය සහ අත් රිදීව,
ඒකේ බඩ සහ කළවා පිත්තලව, ඒකේ 33
කෙණ්ඩා යකඩව, ඒකේ පාදවලින්
කොටසක් යකඩව කොටසක් මැටිව
තිබුණේය. අතින් නොකැපූ ගලක් ගැළවී 34

ඇවිත් රූපයේ යකඩ සහ මැටිවූ පාදවලට
ගසා ඒ පොඩිකරන තුරු, ඔබ බලා
35 සිටියෙහිය. එකල යකඩද මැටිද පිත්තලද
රිදීද රත්රන්ද එකවිටම පොඩිවී, ග්‍රීෂ්ම
කාලයේ පාවරවල බොල් මෙන් වී,
ඒවා කිසිම ස්ථානයක් නොතිබෙන ලෙස
සුළඟට ගසාගනගියේය. රූපයට ගැසූ
ගලද මහත් කන්දක් වී, මුළු පොළොව
36 එයින් පිරුණේය. ස්වප්නය ඒකය; එහි
අර්ථය රජු ඉදිරියේ කියන්නෙමුව.
37 රජ්ජුරුවෙනි, ඔබ රජවරුන්ගේ රජය,
මක්නිසාද ස්වර්ගයේ දෙවියන්වහන්සේ
රජකමද බලයද පරාක්‍රමයද ඓශ්-
38 වර්යයද ඔබට දී තිබේ. මනුෂ්‍ය පුත්‍රයන්
වසන සෑම තැන්වලම සිටින වන
මෘගයන්ද ආකාශ පක්ෂීන්ද ඔබ අතට
දී, ඔවුන් සියල්ලන් කෙරෙහි ඔබ
ආණ්ඩුකාරයා කළසේක. රත්රන් හිස
39 නම් ඔබය. ඔබට පසුව ඔබට වඩා
පහත්වූ වෙන රාජ්‍යයක්ද ඉන්පසු මුළු
පොළොව කෙරෙහි ආණ්ඩුකරන්නාවූ
පිත්තල වැනිවූ තුන්වෙනි රාජ්‍යයක්ද නැගී
40 එන්නාහ. සතරවෙනි රාජ්‍යය යකඩ
මෙන් බලවත්වන්නේය. මක්නිසාද යකඩ
සියල්ල පොඩිකර සුණුකරයි. යකඩෙන්
සුණුකරන්නාක්මෙන් ඒ රාජ්‍යය ඒ
සියල්ල පොඩිකර සුණුකරනවා ඇත.
41 පාදවලින්ද පාද ඇඟිලිවලින්ද කොටසක්
කුම්භකාරයාගේ මැටිත් කොටසක්
යකඩත් බව ඔබ දුටු හෙයින්, ඒ රාජ්‍යය
බෙදී තිබෙනවා ඇත; නුමුත් යකඩ මැටි
සමග මිශ්‍රව තිබෙනවා ඔබ දුටු හෙයින්,
යකඩවල සවිය ඒක තුළ වන්නේය.
42 පාදවල ඇඟිලිවලින් කොටසක් යකඩව
කොටසක් මැටිව තිබුණාක්මෙන්, ඒ
රාජ්‍යයෙන් කොටසක් සවිවන්නේය,
43 කොටසක් බිඳී යන්නේය. යකඩ මැටි
සමග මිශ්‍රව තිබෙනවා ඔබ දුටු හෙයින්,
ඔව්හු මනුෂ්‍ය ජාතීන් සමග මිශ්‍රවන්-
නෝය; එහෙත් යකඩ මැටි සමග මිශ්‍ර
නොවන්නාක්මෙන් ඔව්හු එකිනෙකාට
44 ඇලී නොසිටින්නෝය. ඒ රජුන්ගේ
දවස්වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ
කිසිකලක නැති නොවන්නාවූ රාජ්‍යයක්
පිහිටුවනසේක, ඒකේ ආණ්ඩුව අන්
සෙනඟකට අත්හරිනු නොලබන්නේය;
අතින් නොකැපූ ගලක් කන්දෙන් ගැළවී 45
ඇවිත් යකඩද පිත්තලද මැටිද රිදීද
රත්රන්ද පොඩිකරනවා ඔබ දුටු හෙයින්,
ඒක ඒ සියලු රාජ්‍යවල් පොඩිකර
නැතිකරන්නේය, එයද සදාකාලේටම
පවතින්නේය. මහෝත්තම දෙවියන්-
වහන්සේ මතු සිද්ධවෙන්ට තිබෙන
කාරණා රජුට දන්වා තිබේ. ස්වප්නය
සැබෑය, එහි අර්ථයද සත්තකයයි
කීවේය. එකල නෙබුකද්නෙශර් රජ 46
මුහුණින් වැටී, දනියෙල්ට වැඳ, ආහාර
පූජාවක්ද සුවඳ ද්‍රව්‍යද ඔහුට පූජාකරන්ට
අණකෙළේය. රජ දනියෙල්ට කථාකොට: 47
සැබවින්ම නුඹලාගේ දෙවියන්වහන්සේ
දෙවිවරුන්ගේ දෙවියන්වහන්සේය, රජ-
වරුන්ගේ ස්වාමීන්වහන්සේය, රහස්
එළිදරව්කරන තැනන්වහන්සේය, මක්-
නිසාද මේ රහස එළිදරව්කරන්ට නුඹට
පුළුවන්වීයයි කීවේය. එකල රජ දනියෙල් 48
උතුම්කොට, මහත්වූ බොහෝ තෑගි
ඔහුට දී, ඔහු මුළු බබිලෝනි පළාත
කෙරෙහි ආණ්ඩුකාරයාද බබිලෝනියේ
සියලු ශාස්ත්‍රවන්තයන් කෙරෙහි ප්‍රධාන
අධිපතියාද කෙළේය. දනියෙල්ගේ ඉල්ලීම 49
පිට රජ බබිලෝනි පළාතේ කාරණා
කෙරෙහි ෂද්‍රක්ද මේෂක්ද අබේද්-නෙගෝද
පත්කෙළේය. දනියෙල් වනාහි රජ-
වාසලෙහි සිටියේය.

## රන් රූපයට නමස්කාර නොකළාවූ යුදෙව්වන් තුන්දෙනා ගිනි උදුනෙන් මුදනු ලැබීම

3 නෙබුකද්නෙශර් රජ රියන් හැටක්
උසද රියන් හයක් පළලද ඇති රන්
රූපයක් සාදා, බබිලෝනි පළාතේ දූරා
සමභූමියෙහි පිහිටෙවුවේය. තවද නෙබු- 2
කද්නෙශර් රජ තමා විසින් පිහිටෙවූ
රූපය කැපකිරීමට එන හැටියට කියා
ඇර, දිසාපතීන්ද අධිපතීන්ද ආණ්ඩු-
කාරයන්ද විනිශ්චයකාරයන්ද භාණ්ඩා-
ගාරිකයන්ද මන්ත්‍රීවරුන්ද නීතිඥයන්ද
පළාත්වල සියලු මූලාදෑනියෝද රැස්-
කෙරෙවුවේය. එවිට දිසාපතීහුද 3

අධිපතියෝද ආණ්ඩුකාරයෝද විනිශ්-
චයකාරයෝද භාණ්ඩාගාරිකයෝද
මන්ත්‍රීවරුද නීතිඥයෝද පළාත්වල
සියලු මූලාදෑනියෝද නෙබුකද්නෙශර්
රජු පිහිටෙවූ රූපය කැපකිරීමට රැස්වී,
නෙබුකද්නෙශර් රජු පිහිටෙවූ රූපය
4 ඉදිරියෙහි සිටියෝය. එකල ප්‍රකාශ-
කයා කෑමොරගසා: ජනයෙනි, ජාතීනි,
5 භාෂාවෙනි, හොරණෑවේද නළාවේද
වීණාවේද මහ වීණාවේද කුඩා
වීණාවේද මිහිරි නළාවේද සියලු
ආකාර තූර්යභාණ්ඩවලද ශබ්දය
තුඹලාට ඇසෙන විට බිම වැටී, නෙබු-
කද්නෙශර් රජ පිහිටුවා තිබෙන රන්
රූපයට නමස්කාරකරන්ට තුඹලාට
6 අණකරනලද්දේය. බිම වැටී නමස්කාර
නොකරන කවුරුනුමුත් එවේලෙහිම
ඇවිළෙන ගිනි උදුනක් මැදට හෙළනු
7 ලබන්නේයයි කීවේය. එබැවින් සියලු
ජනයන්ට හොරණෑවේද නළාවේද
වීණාවේද මහ වීණාවේද කුඩා වීණාවේද
සියලු ආකාර තූර්යභාණ්ඩවලද ශබ්දය
ඇසුණු වේලාවේ සියලු ජනයෝද
ජාතීහුද භාෂාවෝද බිම වැටී,
නෙබුකද්නෙශර් රජු පිහිටෙවූ රන්
8 රූපයට නමස්කාර කළෝය. එබැවින්
ඒ කාලයේ සමහර කල්දි මනුෂ්‍යයෝ
ළංවී යුදෙව්වරුන්ට වරද තැබුවෝය.
9 ඔව්හු නෙබුකද්නෙශර් රජුට කථාකොට:
රජ්ජුරුවෝ සදාකාලේටම ජීවත්වේවා.
10 රජ්ජුරුවෙනි, හොරණෑවේද නළාවේද
වීණාවේද මහ වීණාවේද කුඩා
වීණාවේද මිහිරි නළාවේද සියලු
ආකාර තූර්යභාණ්ඩවලද ශබ්දය
ඇසෙන සියල්ලන් බිම වැටී රන් රූපයට
11 නමස්කාරකරන හැටියටද, බිම වැටී
නමස්කාර නොකරන කවුරු නුමුත්
ඇවිළෙන ගිනි උදුනක් මැදට හෙළනු
ලබන හැටියටද ඔබ අණක් පනවා
12 තිබේ. නුමුත් බබිලෝනි පළාතේ කාරණා
කෙරෙහි ඔබ විසින් පත්කළ යුදෙව්
මනුෂ්‍යයන් වන ෂද්‍රක්ද මේෂක්ද අබේද්-
නෙගෝද ඔබ නොසලකති. ඔවුන්
ඔබගේ දෙවිවරුන්ට සේවය කරන්නේවත්
ඔබ විසින් පිහිටුවා තිබෙන රන් රූපයට
නමස්කාරකරන්නේවත් නැතැයි කීවෝය.
එකල නෙබුකද්නෙශර් උදහසිනුත් 13
කෝපයෙනුත් යුක්තව, ෂද්‍රක්ද මේෂක්ද
අබේද්-නෙගෝද ගෙනෙන්ට අණ-
කෙළේය. එවිට ඔව්හු ඒ මනුෂ්‍යයන්
රජු ඉදිරියට ගෙනාවෝය. නෙබුකද්- 14
නෙශර් ඔවුන්ට කථාකොට: එම්බා
ෂද්‍රක්, මේෂක්, අබේද්-නෙගෝ, තුඹලා
මාගේ දෙවිවරුන්ට සේවය නොකොට,
මා විසින් පිහිටුවා තිබෙන රන් රූපයට
නමස්කාර නොකර සිටින්නේ අදහසක්
පිටද? ඉතින් තුඹලා සූදානම්ව සිට, 15
හොරණෑවේද නළාවේද වීණාවේද
මහ වීණාවේද කුඩා වීණාවේද මිහිරි
නළාවේද සියලු ආකාර තූර්ය-
භාණ්ඩවලද ශබ්දය තුඹලාට ඇසෙන
විට, බිම වැටී මා විසින් සාදා තිබෙන
රූපයට නමස්කාරකළොත්, යහපති.
නුමුත් තුඹලා නමස්කාර නොකළොත්,
එකෙණෙහිම තුඹලා ඇවිළෙන ගිනි
උදුනක් මැදට හෙළනු ලබනවා ඇත;
එවිට මාගේ අත්වලින් තුඹලා ගළවන
දෙවියෝ කවුදැයි කීවේය. ෂද්‍රක්ද මේෂක්ද 16
අබේද්-නෙගෝද නෙබුකද්නෙශර් රජුට
උත්තරදෙමින්: මේ ගැන ඔබට කිසි
උත්තරයක් දෙන්ට අපට ඕනෑ නැත.
ඇවිළෙන ගිනි උදුනෙන් ගළවන්ට නම් 17
අප සේවයකරන අපේ දෙවියන්වහන්සේට
පුළුවන; රජ්ජුරුවෙනි, උන්වහන්සේ
ඔබගේ අතින් අප ගළවනසේක. එසේ 18
නොකළත්, රජ්ජුරුවෙනි, ඔබගේ
දෙවිවරුන්ට අප සේවයකරන්නේවත්
ඔබ පිහිටුවා තිබෙන රන් රූපයට
නමස්කාරකරන්නේවත් නැති බව ඔබ
දනගත මැනවයි කීවෝය. එකල 19
නෙබුකද්නෙශර් කෝපයෙන් පිරුණේය,
ෂද්‍රක්ටද මේෂක්ටද අබේද්-නෙගෝටද
විරුද්ධව ඔහුගේ මුහුණේ පෙනුම
වෙනස්විය. ඔහු කථාකොට, පුරුදු
ප්‍රමාණයට වඩා සත්ගුණයක් උදුන
රත්කරන්ට අණකෙළේය. තවද ෂද්‍රක්ද 20
මේෂක්ද අබේද්-නෙගෝද බැඳ, ඇවිළෙන
ගිනි උදුනට හෙළන්ට ඔහු තමාගේ

සේනාවේ බලවත් මනුෂ්‍යයන්ට අණකෙළේය.
21 එකල ඔව්හු ඒ මනුෂ්‍යයන් ඔවුන්ගේ
පොරෝනද සැට්ටද සළුද වෙනත්
වස්ත්‍රද පිටින් බැඳ, ඇවිළෙන ගිනි උදුන
22 මැදට හෙළූහ. එවිට රජුගේ ආඥාව
තද නිසා උදුන ඉතා රත්ව තිබුණු
බැවින්, ෂද්‍රක්ද මේෂක්ද අබේද්-නෙගෝද
එසවූ මනුෂ්‍යයෝ ගිනි දළුවෙන් මළෝය.
23 ඒ මනුෂ්‍යයන් තුන්දෙනා වන ෂද්‍රක්ද
මේෂක්ද අබේද්-නෙගෝද ඇවිළෙන ගිනි
උදුන මැදට බැමි පිටින් වැටුණෝය.
24 එකල නෙබුකද්නෙශර් රජ විස්මපත්වී,
ඉක්මනින් නැගිට, තමාගේ මන්ත්‍රීවරුන්ට
කථාකොට: අප විසින් මනුෂ්‍යයන්
තුන්දෙනකු බැඳ ගින්නට හෙළුවා
නොවේදැයි කීවේය. එසේය, රජ්ජුරුවෙනියි
25 ඔව්හු රජුට උත්තරදෙමින් කීවෝය. ඔහු
උත්තරදෙමින්: අන්න, මනුෂ්‍යයන් සතර
දෙනෙක් නිදහස්ව, කිසි උපද්‍රවයක්
නැතුව, ගින්න මැද ඇවිදිනවා මට
පෙනෙයි; සතරවෙනියාගේ පෙනීම
වනාහි දෙවියන්ගේ පුත්‍රයෙකුට
26 සමානයයි කීවෝය. එවිට නෙබුකද්නෙශර්
ඇවිළෙන ගිනි උදුනේ දෙරකඩට ළංවී:
මහෝත්තම දෙවියන්වහන්සේගේ
මෙහෙකරුවන් වන ෂද්‍රක්, මේෂක්, අබේද්-
නෙගෝ, පිටතට වරෙල්ලායයි කීවේය.
එවිට ෂද්‍රක්ද මේෂක්ද අබේද්-නෙගෝද
ගින්න මැද සිට පිටතට ආවෝය.
27 දිසාපතීහුද අධිපතියෝද ආණ්ඩු-
කාරයෝද රජුගේ මන්ත්‍රීවරුද රැස්ව, ඒ
මනුෂ්‍යයන්ගේ ශරීර කෙරෙහි ගින්න
බල නොපැවැත්වූ බවත් ඔවුන්ගේ
ඉසකේවත් නොදෑ බවත් ඔවුන්ගේ
පොරෝන වෙනස්වෙලාවත් ගිනිගඳ
ඔවුන්ට වැදීලාවත් නැති බවත් දුටුවෝය.
28 නෙබුකද්නෙශර් කථාකොට: ෂද්‍රක්-
ගේද මේෂක්ගේද අබේද්-නෙගෝගේද
දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා;
මක්නිසාද උන්වහන්සේ ස්වකීය දූතයා
එවා, තමන්වහන්සේ කෙරෙහි විශ්වාස-
කළාවූ, තමුන්ගේම දෙවියන්වහන්සේ-
ට මිස වෙන කිසි දෙවිකෙනෙකුට
සේවයකරන්ටවත් නමස්කාරකරන්ටවත්
නොයෙදෙන පිණිස, රජුගේ වචනය
කඩකර තමුන්ගේ ශරීර භාරදුන්නාවූ,
ස්වකීය මෙහෙකරුවන් ගැළවූසේක.
එබැවින් ෂද්‍රක්ගේද මේෂක්ගේද අබේද්- 29
නෙගෝගේද දෙවියන්වහන්සේට විරුද්ධව
දෝෂ කියන සියලු සෙනඟද ජාතීන්ද
භාෂාවන්ද කැබෙලිකොට, ඔවුන්ගේ
ගෙවල් කසළගොඩක් කරන හැටියට
නියමයක් කරමි. මක්නිසාද මේ
ආකාරයෙන් ගළවාගන්ට පුළුවන්වූ වෙන
දෙවිකෙනෙක් නැතැයි කීවේය. එකල 30
රජ ෂද්‍රක්ද මේෂක්ද අබේද්-නෙගෝද
බබිලෝනි පළාතෙහි උත්තමයන් කෙළේය.

## රජුගේ වැටීම ගැන දුටු ස්වප්නය. දනියෙල්ගේ විස්තරය ලෙස එය සම්පූර්ණවීම

4 නෙබුකද්නෙශර් රජු විසින් මුළු
පොළොවේ වාසයකරන සකල
ජනයන්ටත් ජාතීන්ටත් භාෂාවන්ටත්
ලියා එවන වගනම්: තුඹලාට සමාදානය
වැඩිවේවා. මහෝත්තම දෙවියන්වහන්සේ 2
මා උදෙසා කළ ලකුණු සහ ආශ්චර්යයන්
දන්වන්ට ප්‍රසන්නව සිටිමි. උන්වහන්සේගේ 3
ලකුණු කොපමණ මහත්ද! උන්වහන්සේගේ
ආශ්චර්යයෝ කොපමණ බලවත්ද!
උන්වහන්සේගේ රාජ්‍යය සදාකාල
රාජ්‍යයක්ය, උන්වහන්සේගේ ආණ්ඩුව
පරම්පරාවෙන් පරම්පරාවට පවත්නේය.
නෙබුකද්නෙශර් වන මම මාගේ 4
නිවසෙහි සුවසේද මාගේ මාළිගාවෙහි
සැපතින්ද සිටියදී, මට භය ඉපදෙවූ 5
ස්වප්නයක් දුටුවෙමි; මාගේ යහනේදී
පැමුණුණු මාගේ සිතිවිලිද මාගේ
හිසේ දර්ශනද මා කැලඹුවේය. එවිට 6
ස්වප්නයේ අර්ථය මට දන්වන පිණිස
බබිලෝනියේ සියලු ශාස්ත්‍රවන්තයන්
මා ඉදිරියට පමුණුවන්ට ආඥාකෙළෙමි.
එකල මන්ත්‍රකාරයෝද අනවිනකාරයෝද 7
කල්දිවරුද පේනකියන්නෝද ආවෝය.
මම ඔවුන් ඉදිරියෙහි ස්වප්නය කීවෙමි;
එහෙත් එහි අර්ථය ඔවුන් මට
පෙන්වාදුන්නේ නැත. අන්තිමේදී මාගේ 8
දෙවියන්ගේ නාමය ලෙස බේල්ටෙෂශර්
නම්වූ, ශුද්ධ දෙවිවරුන්ගේ ආත්මය

ඇත්තාවූ දනියෙල් මා ඉදිරියට ආයේය.
මම ඔහු ඉදිරියෙහි ස්වප්නය මෙසේ
9 කීවෙමි: මායාකාරයන්ගේ ප්‍රධානියාවූ
බේල්ටෙෂශර්, ශුද්ධ දෙවිවරුන්ගේ
ආත්මය තුඹට තිබෙන බවත් කිසි
රහසක් විසඳීම තුඹට අමාරු නොවන
බවත් දනිමි, එබැවින් මා දුටු ස්වප්නයේ
දර්ශනද එහි අර්ථයද මට කියාපන්න.
10 මාගේ යහනේදී පැමිණි මාගේ හිසේ
දර්ශන මෙසේය–බොහෝ උස ඇති
ගහක් පොළොව මැද තිබෙනවා දුටිමි.
11 ඒ ගස වැඩී, ශක්තිමත්ව තිබුණේය, ඒකේ
උස අහස දක්වා විය, ඒක මුළු
12 පොළොවේ කෙළවරට පෙනුණේය. එහි
කොළ ශෝභනව, එහි ඵල බොහෝව
තිබුණේය, එය තුළ සියල්ලන්ට ආහාර
තිබුණේය. ඒක යට වනයේ මෘගයන්ට
සෙවණ තිබුණේය, ඒකේ අතුවල ආකාශ
පක්ෂියෝ ලැග්ගෝය, සියලු සත්ත්වයන්ට
13 එයින් කෑම ලැබුණේය. මාගේ යහනේදී
පැමිණි මාගේ හිසේ දර්ශනවලදී මා
බලාඉන්න අතර, ශුද්ධවූ රැකවලෙක්
14 අහසෙන් බැස්සේය. ඔහු මොරගා
කෑගසමින්: ගහ කපාදමාපල්ලා, ඒකේ
අතුත් කපාදමා, ඒකේ කොළ සොලවා-
දමා, ඒකේ ඵල විසුරුවාපල්ලා. මෘගයෝ
ඒක යටින්ද පක්ෂීහු ඒකේ අතුවලින්ද
15 අහක්ව යත්වා. එහෙත් ඒකේ මුලේ කඳට
යකඩ සහ පිත්තල බැම්මක් දමා,
පොළොවෙහි වනයේ තෘණ අතරේ
තිබෙන්ට ඇරපල්ලා; ඒක අහසේ
පිනිවලින් තෙමේවා, ඔහුගේ කොටස
මෘගයන් සමග පොළොවේ තණකොළ
16 අතරේ වේවා. ඔහුගේ සිත මනුෂ්‍ය සිතක්
නොවන හැටියට වෙනස්වී, මෘග සිතක්
ඔහුට ලැබී, එසේ ඔහු කාලවල් සතක්
17 පසුකෙරේවා. මනුෂ්‍යයන්ගේ රාජ්‍යය
කෙරෙහි මහෝත්තමයාණන්වහන්සේ
බලය පවත්වා, තමන් කැමති කෙනෙකුට
ඒක දී, මනුෂ්‍යයන්ගෙන් නීචයෙකු තුමූත්
එය කෙරෙහි පත්කරන බව ජීවත්ව සිටින
අය දැනගන්න පිණිස, මේ තීන්දුව
රැකවලුන්ගේ නියමයෙන්ද මේ ආඥාව
ශුද්ධ තැනත්තන්ගේ වචනයෙන්ද වන්නේ-
යයි කීවේය. මේ ස්වප්නය නෙබුකද්නෙශර් 18
රජ වන මම දුටිමි. බේල්ටෙෂශර්, තුඹ
අර්ථය කියාපන්න, මක්නිසාද මට
අර්ථය දන්වන්ට මාගේ රාජ්‍යයේ සියලු
ශාස්ත්‍රවන්තයන්ට බැරිය; තුඹුත් ශුද්ධ
දෙවිවරුන්ගේ ආත්මය තුඹට තිබෙන
නිසා තුඹට නම් පුළුවන.
එකල බේල්ටෙෂශර් නම්වූ දනියෙල් 19
මොහොතක් පමණ විස්මපත්ව හිඳ,
තමාගේ සිතිවිලි නිසා කැලඹුණේය.
රජ කථාකොට: බේල්ටෙෂශර්, තුඹ
ස්වප්නය ගැනවත් එහි අර්ථය ගැනවත්
නොකැලඹෙන්නැයි කීවේය. බේල්ටෙෂශර්
උත්තරදෙමින්: මාගේ ස්වාමිනි, ඒ
ස්වප්නය ඔබට වෛරවෙන්නන්ටත් එහි
අර්ථය ඔබගේ සතුරන්ටත් වේවා.
රජ්ජුරුවෙනි, ඔබ දුටුවාවූ, වැඩී ශක්ති- 20
මත්වී අහස දක්වා උස්ව තිබුණාවූ,
මුළු පොළොවට පෙනුණාවූ, ශෝභන 21
කොළද බොහෝ ඵලද සියල්ලන්ට
කෑමද තිබුණාවූ, වනයේ මෘගයන්
වාසයකළාවූ, ආකාශ පක්ෂීන් ලැග්ගාවූ 22
ගස නම්, මහත්ව බලවත්ව සිටින ඔබමය.
ඔබගේ මහත්කමද වැඩී තිබේ, එය අහස
දක්වාත් ඔබගේ ආණ්ඩුව පොළොවේ
කෙළවර දක්වාත් ඇත්තේය. තවද ශුද්ධවූ 23
රැකවලෙක් අහසෙන් බැස කථාකොට:
ගහ කපාදමා විනාශකරපල්ලා; එහෙත්
ඒකේ මුලේ කඳට යකඩ සහ පිත්තල
බැම්මක් දමා, පොළොවෙහි වනයේ
තෘණ අතරේ තිබෙන්ට ඇරපල්ලා; ඒක
අහසේ පිනිවලින් තෙමේවා, ඔහු කාලවල්
සතක් පසුකරන තුරු ඔහුගේ කොටස
වනයේ මෘගයන් සමග වේවායි කියනවා
රජ දුටු බැවින්, රජ්ජුරුවෙනි, අර්ථය 24
මෙසේය, මාගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට
පැමිණී තිබෙන මහෝත්තමයාණන්ගේ
නියමයද මෙසේය: ඔබ මනුෂ්‍යයන් 25
වෙතින් පන්වනු ලබන්නෙහිය, ඔබගේ
වාසය වනයේ මෘගයන් සමග වන්නේය,
ගවයන්ට මෙන් ඔබට තෘණ කවනු
ලබන්නේය, ඔබ අහසේ පිනිනෙන්
තෙමෙන්නෙහිය; මෙසේ මනුෂ්‍යයන්ගේ
රාජ්‍යය කෙරෙහි මහෝත්තමයාණන්-
වහන්සේ බලය පවත්වා, කැමති කෙනෙකුට

ඒක දෙන බව ඔබ දැනගන්න තුරු, ඔබ
26 කාලවල් සතක් පසුකරනවා ඇත. ඇරත්
ගසේ මුල්වල කොටස ඉතිරිකරන්ට
අණකළ බැවින්, ස්වර්ගය විසින් බලය
පවත්වන බව ඔබ දැනගත් පසු, ඔබගේ
27 රාජ්‍යය ඔබට ස්ථිරවන්නේය. එබැවින්,
රජ්ජුරුවෙනි, මාගේ දැනමුතුකමට
ප්‍රසන්නවී, ධර්මිෂ්ඨකම් කිරීමෙන් ඔබගේ
පාපද දිළිඳුන්ට කරුණාකිරීමෙන් ඔබගේ
අපරාධද පහකළ මැනව; එසේ කිරීමෙන්
සමහරවිට ඔබගේ සමාදානය පවතින්ට
28 පුළුවනැයි කීවේය. මේ සියල්ල
29 නෙබුකද්නෙශර් රජුට සිදුවිය. දොළොස්
මසක් ගතවූ පසු ඔහු බබිලෝනියේ
රාජමාළිගාව උඩ සක්මන්කරමින්
30 සිටියේය. තවද රජ කථාකොට: මේ
වනාහි රාජ ගෘහයක් කොටද මාගේ
මහිමශ්‍රීයේ ගෞරවය උදෙසාද මාගේ
බලපරාක්‍රමයෙන් මා විසින් ගොඩනැගූ
මහත් බබිලෝනිය නොවේදැයි කීවේය.
31 ඒ වචනය රජුගේ මුඛයෙහි තිබෙද්දීම
අහසෙන් හඬක් පැමිණ: එම්බා
නෙබුකද්නෙශර් රජ, රාජ්‍යය තුඹෙන්
32 පහවිය. තුඹ මනුෂ්‍යයන් වෙතින් පන්වනු
ලබන්නෙහිය, තුඹේ වාසය වනයේ
මෘගයන් සමග වන්නේය; ගවයන්ට
මෙන් තුඹට තෘණ කවනු ලබන්නේය;
මෙසේ මනුෂ්‍යයන්ගේ රාජ්‍යය කෙරෙහි
මහෝත්තමයාණන්වහන්සේ බලය
පවත්වා, තමන් කැමති කෙනෙකුට ඒක
දෙන බව තුඹ දැනගන්න තුරු, තුඹ
කාලවල් සතක් පසුකරනවා ඇතැයි
33 තුඹට කියනලද්දේයයි කීවේය. එකෙ-
ණෙහිම මේ කාරණය නෙබුකද්නෙශර්
කෙරෙහි සම්පූර්ණ විය. ඔහු මනුෂ්‍යයන්
වෙතින් පන්වනු ලැබ, ගොනුන්
මෙන් තෘණ කෑයේය, ඔහුගේ ඉසකේ
රාජාලීන්ගේ පිහාටු මෙන්ද ඔහුගේ
නියපොතු පක්ෂීන්ගේ නියපොතු මෙන්ද
වැඩෙන තුරු, ඔහුගේ ශරීරය අහසේ
34 පින්නෙන් තෙමුණේය. ඒ දවස්වලට
පසු නෙබුකද්නෙශර් වන මම මාගේ
ඇස් ස්වර්ගය දෙසට එසවීමි, මාගේ
සිහිය නැවත මට පැමුණුණේය, මම
මහෝත්තමයාණන්වහන්සේට ප්‍රශංසා-
කොට, සදාකාලේටම ජීවත්වන්නාවූ
සදාකාල ආණ්ඩුවක්ද පරම්පරාවෙන්
පරම්පරාවට පවතින රාජ්‍යයක්ද ඇත්තාවූ
තැනන්වහන්සේ වර්ණනාකොට ගෞරව
දුනිමි. පොළොවේ සියලු වැසියෝ කිසිත් 35
නොවන්නාක් මෙන් සලකනු ලබන්නෝය.
උන්වහන්සේ ස්වර්ගයේ සේනාව සහ
පොළොවේ වැසියන් අතර තමන් කැමති
ලෙස කරනසේක. උන්වහන්සේගේ අත
නවත්වන්ටවත්: ඔබ කුමක් කරන-
සේක්දැයි උන්වහන්සේට කියන්ටවත්
පුළුවන්වූ කිසිවෙක් නැත. ඒ කාලයේදී 36
මාගේ සිහිය නැවත මට පැමිණියේය;
මාගේ රාජ්‍යයේ ගෞරවය උදෙසා මාගේ
මහිමතාවත් ඓශ්වර්යයත් මට නැවත
පැමිණියේය; මාගේ මන්ත්‍රීහුද මාගේ
උත්තමයෝද මා ළඟට ආවෝය; මම වනාහි
මාගේ රාජ්‍යයෙහි පිහිටුවනු ලැබීමි,
මාගේ උතුම්කමත් බොහෝසෙයින්ම මට
ලැබුණේය. දැන් නෙබුකද්නෙශර් වන 37
මම ස්වර්ගයේ රජ්ජුරුවන්වහන්සේට
වර්ණනාද ප්‍රශංසාද ගෞරවද කරමි;
මක්නිසාද උන්වහන්සේගේ සියලුම
ක්‍රියාවල් සැබෑය, උන්වහන්සේගේ
මාර්ගද ධර්මිෂ්ඨය. උඩඟුකමින් හැසි-
රෙන්නන් පහත්කරන්ට උන්වහන්සේට
පුළුවන යනුය.

## බෙල්ෂශර් රජුගේ මංගල්‍යය. හිත්තියේ ලිපිය

5 බෙල්ෂශර් රජ තමාගේ උත්තමයන්
දහසකට මහත් මංගල්‍යයක්
පිළියෙළකොට, ඒ දහස ඉදිරියෙහි
මුද්‍රිකපානය බීවේය. බෙල්ෂශර් මුද්‍රික- 2
පානය බොන අතර, යෙරුසලමේ
තිබුණු මාළිගාවෙන් තමාගේ පියවූ
නෙබුකද්නෙශර් විසින් ගත්තාවූ රන්
රිදී භාජනවලින් රජද තමාගේ
උත්තමයන්ද තමාගේ භාර්යාවරුන්ද
උපභාර්යාවරුන්ද විසින් බොන පිණිස
ඒවා ගෙනෙන්ට අණකෙළේය. එවිට ඔව්හු 3
යෙරුසලමේ තිබුණ දෙවියන්වහන්සේගේ

ගෘහයේ මාළිගාවෙන් ගත් රන් භාජන
ගෙනාවෝය; රජද ඔහුගේ උත්තමයෝද
භාර්යාවරුද උපභාර්යාවරුද එයින්
4 බීවෝය. ඔව්හු මුද්‍රිකපානය බී, රන්ද
රිදීද පිත්තලද යකඩද ලීද ගල්ද වූ
5 දෙවිවරුන් වර්ණනාකළෝය. එකෙ-
ණෙහිම මනුෂ්‍ය අතක ඇඟිලි පෙනී,
පහන්රුක ඉදිරිපිට රාජ මාළිගාවේ
භිත්තියේ බදාම පිට ලිවීය. රජතෙමේ
6 ලියන අතේ කොටස දුටුවේය. එකල
රජුගේ මුහුණේ පාට වෙනස්විය, ඔහු
තමාගේ සිතිවිලිවලින් කැලඹුණේය;
ඔහුගේ කටිසන්ධි බුරුල්වී, ඔහුගේ
7 දණහිස් එකිනෙකට වැදුණේය. එවිට
රජ අනවිනකාරයන්ද කල්දිවරුන්ද
පේනකියන්නන්ද කැඳවාගන එන ලෙස
මොරගසා කීය. රජතෙමේ බබිලෝනියේ
ශාස්ත්‍රවන්තයන්ට කථාකොට: මේ
ලියවිල්ල කියවා, එහි අර්ථය මට
පෙන්වාදෙන කවුරුනුමුත්, රත්නිල්
වස්ත්‍රයක් හඳවනු ලැබ, බෙල්ලේ
රන්මාලයක් දමනු ලැබ, රාජ්‍යයේ
තුන්වෙනි ආණ්ඩුකාරයා වන්නේයයි
8 කීවේය. එකල රජුගේ සියලු ශාස්ත්‍ර-
වන්තයෝ ඇතුල්වූහ. නුමුත් ඒ ලියවිල්ල
කියවන්ටවත් එහි අර්ථය රජුට
දන්වන්ටවත් ඔවුන්ට පුළුවන් නොවීය.
9 එකල බෙල්ෂසර් රජ ඉතා කැලඹී,
ඔහුගේ මුහුණේ පාට වෙනස්වුණේය,
10 ඔහුගේ උත්තමයෝත් වියවුල්වූහ. රජුගේද
ඔහුගේ උත්තමයන්ගේද වචන නිසා
බිසව භෝජන ශාලාවට ඇතුල්වී
කථාකොට: රජ්ජුරුවෝ සදාකාලේටම
ජීවත්වේවා; ඔබගේ සිතිවිලි ඔබ
නොකලඹාවා, ඔබගේ මුහුණේ පාටද
11 වෙනස් නොවේවා. ශුද්ධ දෙවිවරුන්ගේ
ආත්මය ඇති මනුෂ්‍යයෙක් ඔබගේ
රාජ්‍යයෙහි සිටියි; ඔබගේ පියාණන්ගේ
දවස්වලදී ආලෝකයද නුවණද දෙවි-
වරුන්ගේ ප්‍රඥාවට සමාන ප්‍රඥාවද ඔහු
තුළ සම්බවිය. ඔබගේ පියවූ නෙබුකද්-
නෙශර් රජ—ඔබගේ පිය රජ්ජුරුවෝ—
ඔහු මන්ත්‍රකාරයන්ටද අනවිනකාරයන්-
ටද කල්දිවරුන්ටද පේනකියන්නන්ටද
ප්‍රධානියා කළේය; මක්නිසාද උතුම් 12
ආත්මයක්ද දැනගැන්මද ස්වප්න තේරුම්-
කරදීමෙත් තේරවිලි විසඳීමෙත් ගැටපද
පහදදීමෙත් ඥානයද රජු විසින් බෙල්-
ටෙෂශර්යයි නම් තැබූ ඒ දනියෙල් තුළ
සම්බවිය. දැන් දනියෙල් කැඳෙවුවොත්
ඔහු අර්ථය පෙන්වාදෙනවා ඇතැයි කීවාය.
එකල දනියෙල් රජු ඉදිරියට 13
පමුණුවනලද්දේය. රජතෙමේ දනියෙල්ට
කථාකොට: මාගේ පිය රජ්ජුරුවන් යූද
රටින් අල්ලාගන ආ යුදෙව්වන්ගෙන්
එක්කෙනෙක්වූ දනියෙල් නුඹද? දෙවි- 14
වරුන්ගේ ආත්මය නුඹ තුළ තිබෙන
බවද ආලෝකයත් නුවණත් උතුම්
ප්‍රඥාවත් නුඹ තුළ තිබෙන බවද නුඹ
ගැන ඇසීමි. මේ ලියවිල්ල කියවා 15
එහි අර්ථය මට දන්වන පිණිස
ශාස්ත්‍රවන්තයෝද අනවිනකාරයෝද මා
ඉදිරියට පමුණුවනු ලැබුවෝය. නුමුත්
කාරණාවේ අර්ථය පෙන්වන්ට ඔවුන්ට
බැරිවිය. නුඹට නම් අර්ථ කියාදෙන්ටත් 16
ගැටපද පහදදෙන්ටත් පුළුවන් බව නුඹ
ගැන ඇසුවෙමි. ඉතින් ලියවිල්ල කියවා,
එහි අර්ථය මට දන්වන්ට නුඹට
පුළුවන්වුණොත්, නුඹට රත්නිල් වස්ත්‍රයක්
හඳවා, බෙල්ලේ රන් මාලයක් දමා,
නුඹ රාජ්‍යයේ තුන්වෙනි ආණ්ඩුකාරයා
කරනු ලබන්නෙහියයි කීවේය. එවිට 17
දනියෙල් රජු ඉදිරියෙහි උත්තරදෙමින්
කියනුයේ: ඔබගේ දීමනා ඔබටම
වේවා, ඔබගේ තෑගිද වෙන කෙනෙකුට
දෙනු ලැබේවා; එහෙත් මම ලියවිල්ල
රජ්ජුරුවන්ට කියවාදී, අර්ථය ඔබට
පෙන්වමි. රජ්ජුරුවෙනි, මහෝත්තම 18
දෙවියන්වහන්සේ රජකමද මහත්තත්ත්වයද
ගෞරවයද මහිමයද ඔබගේ පියවූ
නෙබුකද්නෙශර්ට දුන්සේක. උන්වහන්සේ 19
ඔහුට දුන් මහත්තත්ත්වය නිසා සියලු
ජනයෝද ජාතීහුද භාෂාවෝද ඔහු
ඉදිරියෙහි වෙව්ලා භයවූවෝය. ඔහු,
කැමති කෙනෙකු මැරීය, කැමති කෙනෙකු
ඉතුරුකෙළේය; ඔහු කැමති කෙනෙකු
උසස්කෙළේය, කැමති කෙනෙකු පහත්-
කෙළේය. එහෙත් ඔහුගේ සිත උසස්වී, 20

උඩඟුකම්කරන ලෙස ඔහුගේ ආත්මය
දඩිවූ කල, ඔහු තමාගේ රාජාසනයෙන්
පහත්කරනු ලැබුවේය, ඔහුගේ මහිමයද
21 ඔහුගෙන් පහකරනු ලැබීය. මහෝත්තම
දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ රාජ්‍යය
කෙරෙහි බල පවත්වා, උන්වහන්සේ කැමති
කෙනෙකු එය කෙරෙහි පත්කරන බව
ඔහු දැනගන්න තුරු, මනුෂ්‍ය පුත්‍රයන්
වෙතින් පන්වනු ලැබ, ඔහුගේ සිත මෘග
සිතකට සමානව, ඔහුගේ වාසය
වල්කොටළුවන් සමග වූයේය; ගොනුන්ට
මෙන් ඔහුට තෘණ කවනු ලැබ, ඔහුගේ
ශරීරයද අහසේ පින්නෙන් තෙමුණේය.
22 ඔහුගේ පුත්‍රවූ බෙල්ෂශර් වන ඔබ මේ
සියල්ල දැනගෙන සිටි නුමුත් ඔබගේ
23 සිත යටත්කර නොගෙන, ස්වර්ගයේ
ස්වාමීන්වහන්සේට විරුද්ධව උසස්වී,
උන්වහන්සේගේ ගෘහයේ භාජන ඔබ
ඉදිරියට ගෙන්වාගෙන, ඔබද ඔබගේ
උත්තමයෝද භාර්යාවරුද උපභාර්යා-
වරුද එයින් මුද්‍රිකපානය බීවෝය; තවද
කිසි පෙනීමක්වත් ඇසීමක්වත් දැනුමක්වත්
නැත්තාවූ, රන් රිදී පිත්තල යකඩ ලී
සහ ගල්ද වූ දෙවිවරුන්ට ඔබ ප්‍රශංසා-
කෙළෙහිය. නුමුත් ඔබගේ හුස්ම තමන්
හස්තයෙහි ඇත්තාවූ, ඔබගේ සියලු
මාර්ග අයිතිවූ දෙවියන්වහන්සේට ඔබ
24 ගෞරවකළේ නැත. එවිට අතේ කොටස
උන්වහන්සේ වෙතින් එවනු ලැබීය, මේ
25 ලියවිල්ලද ලියනලද්දේය. ලියන ලද
ලියවිල්ල නම්: *මෙනේ, මෙනේ, තෙකේල්,
26 උපාර්සීන් යනුය. ඒකේ අර්ථය මෙසේය:
මෙනේ යනු දෙවියන්වහන්සේ ඔබගේ
රජකමේ කාලය ගණන්කර කෙළවර-
27 කළසේක යනුය. තෙකේල් යනු ඔබ
තරාදියේ කිරනු ලැබ, අඩු බව පෙනුණේය
28 යනුය. †පෙරෙස් යනු ඔබගේ රාජ්‍යය
බෙද, මේදවරුන්ටත් පර්සිවරුන්ටත්
29 දෙනලද්දේය යනුයයි කීවේය. එකල
බෙල්ෂශර්ගේ ආඥාව පිට දනියෙල්ට
රත්නිල් වස්ත්‍රයක් හඳවා, ඔහුගේ බෙල්ලේ
රන් මාලයක් දමා, ඔහු රාජ්‍යයේ
තුන්වෙනි ආණ්ඩුකාරයාය කියා ඔහු
ගැන ප්‍රසිද්ධියක් කරනලද්දේය. එම 30
රාත්‍රියේ කල්දිවරුන්ගේ රජවූ බෙල්ෂශර්
මරනලද්දේය. අවුරුදු හැටදෙකක් පමණ 31
වයස්ව සිට මේදිය දරියුස් තෙම රාජ්‍යය
ලැබුවේය.

## දනියෙල් සිංහ ගුහාවේ සිටීම

6 මුළු රාජ්‍යයෙහි සිටීම පිණිස
රාජ්‍යය කෙරෙහි දිසාපතීන් එකසිය
විසිදෙනෙක්ද, රජුට අලාභ නොපැමිණෙන 2
පිණිස ඒ දිසාපතීන්ගෙන් ගණන්ගැනීමට
ඔවුන් කෙරෙහි අමාත්‍යයන් තුන්දෙනෙක්ද
පත්කිරීමට දරියුස් සතුටුවිය; ඒ
තුන්දෙනාගෙන් දනියෙල් එක්කෙනෙක්ය.
එකල මෙම දනියෙල් තුළෙහි උතුම් 3
ආත්මයක් තිබුණු නිසා, ඔහු අමාත්‍ය-
යන්ටත් දිසාපතීන්ටත් වඩා උතුම්විය;
රජතෙමේ මුළු රාජ්‍යය කෙරෙහි ඔහු
පත්කරන්ට සිතුවේය. එකල අමාත්‍ය- 4
යෝද දිසාපතීහුද රාජ්‍යය ගැන
දනියෙල්ට විරුද්ධව කාරණයක් අල්ලා-
ගන්ට සෙවුවෝය; නුමුත් කාරණයක්-
වත් දෝෂයක්වත් අල්ලාගන්ට ඔවුන්ට
නොහැකිවිය; මක්නිසාද ඔහු විශ්වාසව
සිටියේය, ඔහුගේ කිසි වරදක්වත්
දෝෂයක්වත් සම්බ නොවීය. එවිට 5
ඒ මනුෂ්‍යයෝ: ඒ දනියෙල්ගේ
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ගැන
ඔහුට විරුද්ධව කාරණයක් අල්ලා-
ගත්තොත් මිස නැත්නම් ඔහුට
විරුද්ධව කාරණයක් අපට සම්බ
නොවන්නේයයි කීවෝය. එකල ඒ 6
අමාත්‍යයෝද දිසාපතීහුද රජු වෙතට
රැස්ව ඔහුට කථාකොට: දරියුස්
රජ්ජුරුවෝ සදාකාලයටම ජීවත්වේවා.
රජ්ජුරුවෙනි, කවුරුනුමුත් තිස් දවසක් 7
යන තුරු ඔබගෙන් මිස යම් දෙවි-
කෙනෙකුගෙන්වත් මනුෂ්‍යයෙකුගෙන්වත්
කිසියම් අයදුමක් කළොත්, ඔහු සිංහ
ගුහාවේ දමනු ලැබේය කියා රාජ
පනතක් පනවා, ස්ථිර තහනමක්

*එනම්: ගණන්කරනලදී, ගණන්කරන ලදී, කිරනලදී, බෙදීම්.
†එනම්: බෙදනලදී.

පිහිටුවන්ට රාජ්‍යයේ සියලු අමාත්‍යයෝද
අධිපතිවරුද දිසාපතීහුද මන්ත්‍රීවරුද
ආණ්ඩුකාරයෝද මන්ත්‍රණයකරගත්තෝය.
8 ඉතින් රජ්ජුරුවෙනි වෙනස් නොවන්නාවූ
මේදවරුන්ගේද පර්සිවරුන්ගේද ව්‍යවස්-
ථාව ප්‍රකාරයට තහනම වෙනස් නොවී
තිබෙන පිණිස, එය ස්ථිරකොට පත්‍රය
9 අත්සන්කළ මැනවැයි කීවෝය. ඒ නිසා
දරියුස් රජ පත්‍රය හා නියමය අත්සන්-
10 කෙළේය. ඒ පත්‍රය අත්සන් කළ බව
දනියෙල් දැනගත් විට, තමාගේ ගෙදරට
ගොස්, තමාගේ උඩුමහලේ කවුළු
යෙරුසලම දෙසට ඇරී තිබියදී, තමා
ඊට පළමු කළාක්මෙන් දවසට තුන්වරක්
දණින් හිඳ තමාගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි යාච්ඤාකොට ස්තුතිකෙළේය.
11 එකල ඒ මනුෂ්‍යයෝ ඇතුළට වැද,
දනියෙල් තමාගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි යාච්ඤා හා කන්නලව්කරනවා
12 දුටුවෝය, එවිට ඔව්හු රජු ඉදිරියට
ළංවී රාජ තහනම ගැන කථාකොට:
රජ්ජුරුවෙනි, කොයි මනුෂ්‍යයෙක්
නුමුත් තිස් දවසක් යන තුරු ඔබ-
ගෙන් මිස යම් දෙවිකෙනෙකුගෙන්වත්
මනුෂ්‍යයෙකුගෙන්වත් යම් ඉල්ලීමක්
ඉල්ලුවොත්, ඔහු සිංහ ගුහාවේ දමනු
ලැබේය කියා ඔබ තහනම් පත්‍රයක් කොට
අත්සන්කළා නොවේදැයි ඇසුවෝය. රජද
උත්තරදෙමින්: වෙනස් නොවන්නාවූ
මේදවරුන්ගේද පර්සිවරුන්ගේද පනතේ
හැටියට කාරණය සැබෑයයි කීවේය.
13 එවිට ඔව්හු රජු ඉදිරියේ උත්තරදෙමින්;
රජ්ජුරුවෙනි, යූද රටෙන් අල්ලාගත ආ
තැනැත්තන්ගෙන් එක්කෙනෙක්වූ දනියෙල්
ඔබ සහ ඔබ විසින් අත්සන්කළ තහනම
නොසලකා, දවසට තුන් වරක් තමාගේ
යාච්ඤාව ඔප්පුකරන්නේයයි කීවෝය.
14 රජ මේ වචන ඇසූ කල ඉතා අමනාපවී,
දනියෙල් ගළවන්ට තමාගේ සිත ඔහු
කෙරෙහි තබා, ඔහු නිදහස්කරන්ට ඉර
15 බසින තුරු උත්සාහකෙළේය. එකල ඒ
මනුෂ්‍යයෝ රජු වෙතට වැද: රජ්ජුරුවෙනි,
රජු විසින් නියමකරන කිසි තහනමක්වත්
නියෝගයක්වත් වෙනස් නොකරන
හැටියට මේදවරුන්ගේද පර්සිවරුන්ගේද
පනතක් තිබෙන බව දැනගත මැනවැයි
රජුට කීවෝය. එවිට රජුගේ ආඥාව 16
පිට දනියෙල් ගෙනැවිත්, සිංහ ගුහාවේ
දැමුවෝය. රජ දනියෙල්ට කථාකොට:
නුඹ නොකඩවම සේවය කරන නුඹේ
දෙවියන්වහන්සේ නුඹ ගළවනසේක්වයි
කීවේය. තවද ගලක් ගෙනැවිත් ගුහාවේ 17
කටේ තබනලද්දේය; දනියෙල් ගැන
නියමය වෙනස් නොවන පිණිස රජ
තමාගේ මුද්‍රයෙන්ද තමාගේ උත්තමයන්ගේ
මුද්‍රයෙන්ද ඒක මුද්‍රකෙළේය. එකල රජ 18
තමාගේ මාළිගාවට ගොස්, නිරාහාරයෙන්
රාත්‍රිය පසුකෙළේය. තූර්යභාණ්ඩ ඔහු
ඉදිරියට නොගෙනාවෝය. ඔහුගේ
නින්දත් ඔහුගෙන් පහවගියේය. රජ අති 19
උදය නැගිට, සිංහ ගුහාව ළඟට
ඉක්මන්කර ගියේය. ඔහු ගුහාවට 20
ළංවෙන කොටම, ශෝක හඬකින්
දනියෙල්ට මොරගැසුවේය. රජතෙමේ
දනියෙල්ට කථාකොට: ජීවමාන
දෙවියන්වහන්සේගේ මෙහෙකරුවාවූ
දනියෙල්, නුඹ නොකඩවම සේවයකරන
නුඹේ දෙවියන්වහන්සේට සිංහයන්ගෙන්
නුඹ ගළවන්ට පුළුවන්වීදැයි ඇසුවේය.
එවිට දනියෙල් රජුට කථාකොට: 21
රජ්ජුරුවෙනි, ඔබ සදාකාලයටම
ජීවත්වේවා. මාගේ දෙවියන්වහන්සේ 22
තමන්ගේ දූතයා එවා, සිංහයන් මට
අනතුරු නොකරන හැටියට උන්ගේ
කටවල් පියෙවූසේක. මක්නිසාද
උන්වහන්සේ ඉදිරියෙහි මා තුළ
නිදෙස්කම තිබුණේය; ඇරත් රජ්ජුරුවෙනි,
ඔබ ඉදිරියේද මම කිසි වරදක්
නොකෙළෙමියි කීවේය. එකල රජ ඉතා 23
සන්තෝෂවී, දනියෙල් ගුහාවෙන්
ගොඩගන්ට අණකෙළේය. එසේ දනියෙල්
ගුහාවෙන් ගොඩගන්නාලද්දේය, කිසි
අනතුරක්ද ඔහුට සිද්ධ නොවී තිබුණේය,
මක්නිසාද ඔහු තමාගේ දෙවියන්වහන්සේ
කෙරේ විශ්වාසකෙළේය. එවිට දනියෙල් 24
කෙරෙහි වරද තැබූ ඒ මනුෂ්‍යයන්
රජුගේ ආඥාව පිට ගෙනවුත්, ඔවුන්
සහ ඔවුන්ගේ දරුවන්ද භාර්යාවන්ද

සිංහ ගුහාවේ දැමුවෝය; ඔවුන් ගුහාවේ
අඩියට පැමිණෙන්ටත් පළමුවෙන් සිංහ-
යෝ ඔවුන්ගෙන් ජයගෙන, ඔවුන්ගේ ඇට
සියල්ල කැබලි කළෝය.
25 එකල දරියුස් රජ මුළු පොළොවෙහි
වසන සියලු ජනයන්ටත් ජාතීන්ටත්
භාෂාවන්ටත් ලියා යවනුයේ: නුඹලාට
26 සමාදනය වැඩිවේවා. මාගේ රාජ්‍යයේ
ආණ්ඩුව පවතින සැමතැනම මනුෂ්‍යයන්
දනියෙල්ගේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි
වෙවුලා භයවෙන හැටියට අණකරමි.
මක්නිසාද උන්වහන්සේ ජීවමානවූ
සදකාලයටම සිටින්නාවූ දෙවියන්-
වහන්සේය, උන්වහන්සේගේ රාජ්‍යය නැති
නොවී, උන්වහන්සේගේ ආණ්ඩුව
27 කෙළවර දක්වා පවත්නේය. උන්වහන්සේ
ගළවා නිදහස්කරනසේක, අහසෙහිද
පොළොවෙහිද ලකුණු සහ ආශ්චර්යයන්
කරනසේක; උන්වහන්සේ සිංහයන්ගේ
බලයෙන් දනියෙල් ගැළවූසේකැයි ලියා
28 යැවීය. මේ දනියෙල් දරියුස්ගේ රජකමේද
පර්සිය කෝරෙෂ්ගේ රජකමේද කාලයෙහි
උසස්ව සිටියේය.

## මෘගයන් සතර දෙනෙකු පිළිබඳ දනියෙල්ගේ දර්ශනය

7 බබිලෝනියේ රජවූ බේල්ෂශර්ගේ
පළමුවෙනි අවුරුද්දේ දනියෙල්
තමාගේ යහනේදී ස්වප්නයක්ද තමාගේ
හිසේ දර්ශන වගයක්ද දුටුවේය. ඔහු
ස්වප්නය ලියා කාරණා සියල්ලම
2 කීවේය. දනියෙල් කථාකොට කියනුයේ:
රාත්‍රියේ මාගේ දර්ශනයේදී මෙසේ
දුටිමි—ආකාශයේ හුළං සතර මහා
3 මුහුදට සැරෙන් ගැසුවේය. එකිනෙකාට
වෙනස්වූ මහා මෘගයන් සතරදෙනෙක්
4 මුහුදෙන් නැගී ආවෝය. පළමුවෙනියා
සිංහයෙකු මෙන්ය, ඌට රාජාලි පියාපත්
තිබුණේය. මා බලාසිටින අතර උගේ
පියාපත් උදුරාදමා, ඌ පොළොවෙන්
ඔසවා, මනුෂ්‍යයෙකු මෙන් පාද දෙකකින්
සිටවනු ලැබීය, මනුෂ්‍ය සිතක්ද ඌට
5 දෙනලද්දේය. තව මෘගයෙක් වන දෙවෙනියා
වලසෙකුට සමානය, ඌ එක ඇළයකින්
පහළින්වී උන්නේය, ඉළඇට තුනක්ද
උගේ කටෙහි උගේ දත් අතරේ තිබුණේය.
නැගිට බොහෝ මස් කවයි ඌට
කියනලද්දේය. ඉන්පසු තවත් එකෙකු 6
දුටිමි; ඌ කොටියෙකු මෙන්ය, පක්ෂි
පියාපත් සතරක් උගේ පිටේ තිබුණේය;
ඒ මෘගයාට හිස් සතරකුත් තිබුණේය;
ආණ්ඩු බලයද ඌට දෙනලද්දේය.
ඉන්පසු රාත්‍රියේ දර්ශනවලදී සතරවෙනි 7
මෘගයෙකු දුටිමි; ඌ භයානකව බලවත්ව
ඉතාම ශක්තිමත්ව සිටියේය; මහත් යකඩ
දත් ඌට තිබුණේය. ඌ කාදමා
පොඩිකර, ඉතිරි ඒවා උගේ පාදවලින්
පෑගුවේය. ඌට පළමුවෙන් සිටි සියලු
මෘගයන්ට ඌ වෙනස්ය; අං දසයක්
ඌට තිබුණේය. ඒ අං දෙස මා 8
බලාසිටිද්දී, ඒවා අතරේ තවත් කුඩා
අඟක් හටගත්තේය, ඒක ඉදිරියෙහි පළමු
අංවලින් තුනක් උදුරා දමනු ලැබීය.
බලව, මේ අඟට මනුෂ්‍ය ඇස් වැනි
ඇස්ද උඩඟුලෙස කථාකරන මුඛයක්ද
තිබුණේය. මා බලාසිටින අතර 9
සිංහාසන පිහිටුවා, පුරාතන කෙනෙක්
වාඩිවුණේය. උන්වහන්සේගේ වස්ත්‍ර හිම
මෙන් සුදුව තිබුණේය, උන්වහන්සේගේ
හිසකේ පිරිසිදු ලොම් මෙන්ය; උන්-
වහන්සේගේ සිංහාසනය ගිනිදළුවක්ය,
ඒකේ චක්‍ර ඇළෙන ගිනිය. ගිනිමය 10
ගංගාවක් උන්වහන්සේ ඉදිරියෙන්
ගලාගන ගියේය. දහසක් වර දහස්
දෙනෙක් උන්වහන්සේට සේවයකළෝය,
දස දහසක් වර දස දහස් දෙනෙක්ද
උන්වහන්සේ ඉදිරියේ සිටියෝය.
විනිශ්චයකාර සභාව හිඳගත්තාය,
පොත්ද දිග අරිනලද්දේය. එකල ඒ අඟ 11
කථාකරන උඩඟු වචනවල ශබ්දය නිසා
බලාසිටියෙමි; මා බලාසිටින අතර
මෘගයා මරනු ලැබ, උගේ ශරීරය
නාස්තිකර, ඌ ඇවිළෙන ගින්නෙහි
දමනලද්දේය. අනික් මෘගයන්ගේ ආණ්ඩු 12
බලය උන්ගෙන් පහකරන ලද්දේය.
එහෙත් උන්ගේ ජීවිතවල ප්‍රමාණය
කාලයකටත් අවස්ථාවකටත් දීර්ඝකරන

13 ලද්දේය. මම රාත්‍රි දර්ශනවලදී දුටිමි:
බලව, අහසේ වලාකුල් සහිත මනුෂ්‍ය
පුත්‍රයෙකුට සමාන කෙනෙක් ඇවිත්
පුරාතන තැනන්වහන්සේ වෙතට
පැමිණියේය, ඒ තැනන්වහන්සේ ඉදිරියට
14 උන්වහන්සේ පමුණුවනු ලැබුසේක. සියලු
ජනයන්ද ජාතීන්ද භාෂාවන්ද උන්-
වහන්සේට සේවයකරන පිණිස ආණ්ඩු
බලයද ගෞරවයද රාජ්‍යයක්ද උන්-
වහන්සේට දෙනලද්දේය. උන්වහන්සේ-
ගේ ආණ්ඩුව පහ නොවන සදාකාල
ආණ්ඩුවක්ය, උන්වහන්සේගේ රාජ්‍යයද
නැති නොවන්නේය.
15 දනියෙල් වන මා තුළ මාගේ ආත්මය
දුක්වුණේය, මාගේ හිසේ දර්ශනවලින්
16 මම කැලඹුණෙමි. එහි සිටි තැනැත්තන්ගෙන්
එක්කෙනෙකු ළඟට මම ළංවී, ඒ සියල්ලේ
අර්ථය මට කියන මෙන් ඔහුගෙන්
ඉල්លුවෙමි. ඔහු මට කථාකොට,
කාරණාවල තේරුම මට දන්නුවේය.
17 ඒ මහා මෘගයන් සතරදෙනා නම්
රජවරු සතර දෙනෙක්ය, ඔව්හු
පොළොවෙන් නැගිට එන්නෝය.
18 නුමුත් මහෝත්තමයාණන්වහන්සේගේ
ශුද්ධවන්තයෝ රාජ්‍යය ලැබ, සෑම
කලටම, සදාකාලයටම රාජ්‍යය භුක්ති-
19 විඳින්නෝයයි කීවේය. එකල අනික්
සියලු මෘගයන්ට වෙනස්වූ, ඉතාමත්
භයානකවූ, යකඩ දත් සහ පිත්තල
නියපොතු ඇත්තාවූ, කාදමා පොඩිකර
ඉතිරි ඒවා පයින් පෑගුවාවූ සතරවෙනි
20 මෘගයා ගැනද, උගේ හිසේ තිබුණු අං
දසය ගැනද, යම් අඟක් හටගෙන අං
තුනක් හෙළාදැමුවේද ඒ අඟ ගැනද,
එනම් ඇස් සහ උඩඟුලෙස කථාකරන
මුඛයක් ඇත්තාවූ, අනික් ඒවාට වඩා
මහත්ව පෙනුණාවූ අඟ ගැනද අර්ථය
21 දැනගන්ට කැමතිව සිටියෙමි. ඒ
පුරාතන තැනන්වහන්සේ ඇවිත්,
මහෝත්තමයාණන්ගේ ශුද්ධවන්තයන්ට
යුක්තිය කරන තුරුද ශුද්ධවන්තයන්
රාජ්‍යය භුක්තිවිඳින කාලය පැමිණෙන
22 තුරුද, ඒ අඟ ශුද්ධවන්තයන්ට විරුද්ධව
යුද්ධකර ඔවුන්ගෙන් ජයගන්න බව

දුටුවෙමි. ඔහු මෙසේ කීවේය: සතර- 23
වෙනි මෘගයා නම් සියලු රාජ්‍යවලට
වෙනස්වූ, මුළු පොළොව නාස්තිකොට
පාගාදමා පොඩිකරන සතරවෙනි
රාජ්‍යයක්ය. අං දසය නම් මේ රාජ්‍යයෙන් 24
නැගිටින රජවරු දස දෙනෙක්ය. ඔවුන්ට
පසුව තවත් එක්කෙනෙක් නැගිටින්නේය;
ඔහු පළමු තැනැත්තන්ට වෙනස්ව
සිටින්නේය, ඔහු රජවරුන් තුන්
දෙනෙක් පහත්කරදමන්නේය. ඔහු 25
මහෝත්තමයාණන්ට විරුද්ධව කාරණා
කියන්නේය, මහෝත්තමයාණන්ගේ
ශුද්ධවන්තයන්ට පීඩාකරන්නේය. ඔහු
කාලවල්ද ව්‍යවස්ථාවද වෙනස්කරන්ට
සිතන්නේය; කාලයකටද කාලවලටද
කාල භාගයකටද ඔව්හු ඔහු අතට
භාරදෙනු ලබන්නෝය. එහෙත් 26
විනිශ්චයකාර සභාව හිඳගන්නවා ඇත,
එවිට ඔවුන් ඔහුගේ ආණ්ඩුව නාස්ති-
කිරීමටත් ඒක තීන්දුවටම නැතිකරදැමී-
මටත් ඒක පහකරනවා ඇත. මුළු 27
අහස යට තිබෙන රාජ්‍යවල රජකමද
ආණ්ඩුවද මහත්කමද මහෝත්ත-
මයාණන්ගේ ශුද්ධවන්තයන් වන
සෙනඟට දෙනවා ඇත. උන්වහන්සේගේ
රාජ්‍යය සදාකාල රාජ්‍යයක්ය, සියලුම
ආණ්ඩුද උන්වහන්සේට සේවයකර
කීකරුවෙනවා ඇතැයි කීවේය.
කාරණාවේ තීන්දුව මෙහිය. දනියෙල් 28
වන මම මාගේ සිතිවිලිවලින් බොහෝ-
සෙයින් කැලඹුණෙමි, මා කෙරෙහි
මාගේ මුහුණේ පාටද වෙනස්විය. නුමුත්
කාරණය මාගේ සිතේ තබාගන
උන්නෙමි.

## බැටළුවා සහ රළු එළුවා සම්බන්ධ දර්ශනය

8
දනියෙල් වන මට මුලදී පෙනුණු
දර්ශනයට පසුව බේල්ෂෙශර් රජුගේ
රජකම්කිරීමේ තුන්වෙනි අවුරුද්දේදී තවත්
දර්ශනයක් මට පෙනුණේය. දර්ශනයෙන් 2
මෙසේ දුටුවෙමි; දකින විට මම ඒලාම්
පළාතෙහි තිබෙන ෂූසන් මාළිගාවෙහි

සිටියෙමි; උලයි ගංගාව ළඟ මා සිටින
3 බව දර්ශනයෙන් දුටිමි. එවිට මම ඇස්
ඔසවා බලා, ගංගාව ඉදිරියෙහි අං දෙකක්
ඇති බැටළුවෙක් සිටිනවා දුටුවෙමි. අං
දෙක උස්ව තිබුණේය; නුමුත් එකක්
අනික් එකට වඩා උස්ව තිබුණේය, වඩා
උස ඇති එක අන්තිමයට හටගත්තේය.
4 ඒ බැටළුවා බස්නාහිරද උතුරද දකුණද
දෙසට අනිනවා දුටිමි; කිසි මෘගයෙකුට
ඌට විරුද්ධව සිටින්ට බැරිවිය, ඌගේ
අතින් ගළවන්ට කිසිවෙක් සිටියෙත් නැත;
ඌ තමාගේ කැමැත්ත ලෙස කරමින්
5 බලවත්වුණේය. මා කල්පනාකරමින්
සිටියදී, බලව, එළුවෙක් බස්නාහිරින්
මුළු පොළොව මතු පිට බිම අඩි
තබන්නේ නැතුව ආවේය. එළුවාට ඌගේ
ඇස් අතරේ මහත් අඟක් තිබුණේය.
6 ගංගාව ඉදිරියෙහි සිටිනවා මා දුටුවාවූ,
අං දෙක ඇති බැටළුවා දෙසට ඌ
ඇවිත්, තමාගේ බලවත් කෝපයෙන් ඌ
7 ළඟට දිවුවේය. ඌ බැටළුවා වෙතට
ළංවෙනවා දුටිමි, ඌ බැටළුවා කෙරෙහි
ක්‍රෝධවී, ඌට ඇන, ඌගේ අං දෙක
බිඳදැමීය; ඌට විරුද්ධව සිටින්ට
බැටළුවාට කිසි බලයක් නොතිබුණේය.
ඌ බැටළුවා බිම දමා පෑගුවේය; ඌගේ
අතින් බැටළුවා ගළවන්ට කිසිවෙක්
8 නොසිටියේය. එළුවා ඉතා උඩඟුලෙස
හැසුරුණේය. නුමුත් ඌ ශක්තිමත්වූ කල
මහ අඟ බිඳුණේය; ඒ වෙනුවට මහත්
අං සතරක් අහසේ සතර හුළං දෙසට
9 හටගත්තේය. එයින් එකකින් කුඩා අඟක්
නික්මී, දකුණත් නැගෙනහිරත් අලංකාර
10 දේශයත් දෙසට ඉතා මහත්විය. ඒක
අහසේ සේනාව දක්වාත් මහත්වී,
සේනාවෙන්ද තාරකාවලින්ද සමහරක්
පොළොවට හෙළා, ඒවා පෑගුවේය.
11 ඒක සේනාවේ අධිපතියාටත් විරුද්-
ධව උසස්වුණේය; උන්වහන්සේගෙන්
දවස්පතා පූජාවද පහකරනු ලැබීය,
උන්වහන්සේගේ ශුද්ධස්ථානයද හෙළනු
12 ලැබීය. දවස්පතා පූජාව ඇතුළුව
සේනාව අපරාධය නිසා පාවාදෙනු
ලැබීය; *එය වනාහි සත්‍යය බිම
හෙළුවේය, එසේ කරලාත් සඵලවුණේය.
එවිට ශුද්ධවන්තයෙක් කථාකරනවා 13
ඇසීමි; තවත් ශුද්ධවන්තයෙක් කථාකළ
තැනැත්තාට කියනුයේ: දවස්පතා පූජාවත්
නාස්ති කරන අපරාධයත් ගැන පෙනුණු
දර්ශනයේ හැටියට ශුද්ධස්ථානය සහ
සේනාවත් පාගාදැමීමට කොපමණ කල්
යනවා ඇද්දැයි ඇසුවේය. ඔහුද: රෑ දවල් 14
දෙදස් තුන්සියයක් පසුවන තුරුය; එකල
ශුද්ධස්ථානය පවිත්‍රකරනු ලබන්නේයයි
මට කීවේය.

තවද දනියෙල් වන මම දර්ශනය දුටු 15
විට එහි තේරුම සෙවීමි; එවිට මනුෂ්‍ය
පෙනීමක් ඇති කෙනෙක් මා ඉදිරියෙහි
සිටියේය. තවද: ගාබ්‍රියෙල්, මොහුට 16
දර්ශනය තේරුම්කරදීපන්නැයි කියා
මොරගසන මනුෂ්‍ය හඬක් උලයි ගඟේ
ඉවුරු අතරෙන් මට ඇසුණේය. ඔහු මා 17
සිටි තැනටම ආවේය; ඔහු ආවිට මම
භයපත්වී මුහුණින් වැටුණෙමි. නුමුත්
ඔහු: මනුෂ්‍ය පුත්‍රය, කල්පනා කරපන්න;
මක්නිසාද දර්ශනය අදාළවන්නේ අන්තිම
කාලයටයයි මට කීවේය. ඔහු මා සමග 18
කථාකරද්දී මම මූර්ඡාවී මුහුණින් බිම
වැටී උන්නෙමි. ඔහු මට තට්ටුකර මා
කෙළින් සිටෙව්වේය. ඔහු කථාකොට: 19
බලව, උදහසේ කෙළවරදී සිද්ධවෙන
දේ නුඹට දන්වමි. මක්නිසාද දර්ශනය
අදාළවන්නේ අන්තිම කාලයටය. නුඹ 20
විසින් දුටුවාවූ, අං දෙක ඇති බැටළුවා
නම් මේදියාවේද පර්සියාවේද රජවරුය.
රළු එළුවා ග්‍රීසියේ රජය. ඌගේ ඇස් 21
අතරේ තිබෙන ලොකු අඟ පළමුවෙනි
රජය. ඒක බිඳුණු විට ඒක වෙනුවට 22
සතරක් අටගත්තාක්මෙන් ඒ ජාතියෙන්
රාජ්‍යවල් සතරක් හටගන්නවා ඇත,
නුමුත් ඔහු වාගේ බලය ඇතුව නොවේ.
ඔවුන්ගේ රජකම් කිරීමේ අන්තිමේදී 23
අපරාධකාරයන්ගේ පාප මිම්ම සම්පූර්ණ-
වූ කල, රෞද්‍ර මුහුණක් ඇත්තාවූ,
වංචාවට සමර්ථවූ රජෙක් නැගිටින්නේය.
ඔහුගේ බලය සවිව තිබෙන්නේය, නුමුත් 24
ඔහුගේම බලයෙන් නොවේ; ඔහු අද්භූත-
ලෙස නාස්තිකරන්නේය, සඵලවෙමින්

*එනම්: අඟ.

කැමතිලෙස ක්‍රියාකරන්නේය. ඔහු
බලවතුන්ද ශුද්ධ සෙනඟද විනාශ-
25 කරන්නේය. ඔහු තමාගේ නුවණින්
තමාගේ අතේ උපාය සඵලකරගන්නේය;
ඔහු තමාගේ සිතින් උසස්වී, බොහෝ
දෙනෙක් නොදනුවත්ව සිටිද්දී ඔවුන්
නැතිකරන්නේය. ඔහු අධිපතීන්ගේ
අධිපතියාට විරුද්ධවද නැගිටිනවා ඇත;
නුමුත් අතක බලය නැතුව ඔහු
26 කඩාදමනු ලබන්නේය. මෙසේ කියනලද
සවසෙත් උදයෙත් දර්ශනය සැබෑය.
එහෙත් තුඹ දර්ශනය වසා තබාපන්න;
මක්නිසාද ඊට බොහෝ දවස් යනවා
27 ඇතැයි කීවේය. එවිට දනියෙල් වන මම
ක්ලාන්තවී, දවස් ගණනක් ලෙඩින්
උන්නෙමි; පසුව මම නැගිට රජුගේ
මෙහෙවර කෙළෙමි. මම දර්ශනය ගැන
විස්මපත්ව සිටියෙමි, නුමුත් කිසිවෙක්
ඒක තේරුම් නොගත්තේය.

## සැත්තෑ සතිය පිළිබඳ දර්ශනය

9 කල්දිවරුන්ගේ රාජ්‍යය කෙරෙහි
රජකමට පත්කරනු ලැබුවාවූ, මේද-
වරුන්ගේ වංශයේ අහෂ්වේරොෂ්ගේ
පුත්‍රවූ දරියුස්ගේ පළමුවෙනි අවුරුද්දේදී,
2 එනම් ඔහුගේ රජකම්කිරීමේ පළමුවෙනි
අවුරුද්දේදී, යෙරුසලම පාළුව තිබීමේ
සම්පූර්ණත්වයයයි ස්වාමීන්වහන්සේ
අනාගතවක්තෘවූ යෙරෙමියා ලවා
කියෙවූ අවුරුදු ගණන සැත්තෑ අවුරුද්දක්
බව දනියෙල් වන මම පොත්වලින්
3 තේරුම්ගත්තෙමි. එවිට මම නිරාහාරව,
ගෝණි රෙදිද අලුද ඇතුව, යාච්ඤාවෙනුත්
කන්නලව්වලිනුත් ස්වාමිවූ දෙවියන්-
වහන්සේ සොයන පිණිස මාගේ මුහුණ
4 උන්වහන්සේ දෙසට හරවා, මාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට යාච්ඤාකොට
පව් කියාදෙමින්, මෙසේ කීමි: අහෝ
ස්වාමීන්වහන්ස, ඔබට ප්‍රේමකොට
ඔබගේ ආඥා රක්ෂාකරන්නන්ට ගිවිසුමත්
කරුණාවත් පවත්වන්නාවූ මහත්වූ
5 භයංකරවූ දෙවියන්වහන්ස, අපි පව්-
කොට, අයුතුකම්කොට, දුෂ්ටකම්කොට,
කැරළිගසා, ඔබගේ ශික්ෂාවලින්ද
ඔබගේ විනිශ්චයවලින්ද ඉවත්ව ගියෙමුව.
ඔබවහන්සේගේ නාමයෙන් අපේ රජ- 6
වරුන්ටත් අපේ අධිපතීන්ටත් අපේ
පියවරුන්ටත් දේශයේ වැසියන්වූ සියල්-
ලන්ටත් කථාකළ අනාගතවක්තෘන්වූ
ඔබගේ මෙහෙකරුවන්ට අපි ඇහුම්කන්
නුදුන්නෙමුව. අහෝ ස්වාමීන්වහන්ස, 7
ඔබට ධර්මිෂ්ඨකම අයිතිය, නුමුත් අද
දවසේ තිබෙන්නාක්මෙන් මුහුණු-ලජ්ජාව
අපට අයිතිය, එනම් යූදාහි මනුෂ්‍යයන්ටත්
යෙරුසලමේ වැසියන්ටත් ඔබට විරුද්ධව
කළ ද්‍රෝහිකම නිසා ඔබ විසින්
පන්නාදමනු ලැබ, සියලු රටවල ළඟ
සිටින්නාවූද දුර සිටින්නාවූද සියලු
ඉශ්‍රායෙල්වරුන්ටත්ය. ස්වාමීන්වහන්ස, 8
අප විසින් ඔබට විරුද්ධව පව්කළ
නිසා අපට, එනම්, අපේ රජවරුන්ටත්
අපේ අධිපතීන්ටත් අපේ පියවරුන්ටත්
මුහුණු-ලජ්ජාව අයිතිය. අපේ දෙවිවූ 9
ස්වාමීන්වහන්සේ වෙත අනුකම්පාවත්
කමාවත් තිබේ; මක්නිසාද අපි
උන්වහන්සේට විරුද්ධව කැරළිගැසීමුව.
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ ප්‍රොපේත- 10
වරුන් වන තමන් මෙහෙකරුවන් ලවා
අප ඉදිරියෙහි තැබූ උන්වහන්සේගේ
ව්‍යවස්ථාවල ප්‍රකාරයට හැසිරෙන ලෙස
අපි උන්වහන්සේගේ හඬට කීකරු
නොවීමුව. එසේය, සියලු ඉශ්‍රායෙල්වරු 11
ඔබගේ ව්‍යවස්ථාව කඩකොට ඔබගේ
හඬට කීකරු නොවන ලෙස අහක්ව
ගියෝය. මෙසේ අප උන්වහන්සේට
විරුද්ධව පව්කළ බැවින්, දෙවියන්-
වහන්සේගේ මෙහෙකරුවාවූ මෝසෙස්ගේ
ව්‍යවස්ථාවේ ලියා තිබෙන ශාපයද
දිවුරුමද අප කෙරෙහි වගුරුවා තිබේ.
එසේ යෙරුසලමට සිද්ධවුණු හැටියට 12
මුළු අහස යට සිද්ධ නුණු ආකාර
මහත් විපතක් අප කෙරෙහි පැමිණවීමෙන්
උන්වහන්සේ අපටත් අප විනිශ්චයකළ
අපේ විරුද්ධකාරයන්ටත් විරුද්ධව කී
වචන ඉෂ්ටකළසේක. මෝසෙස්ගේ 13
ව්‍යවස්ථාවේ ලියා තිබෙන ලෙස මේ
මුළු විපත්තිය අප පිටට පැමුණුණේය.

එහෙත් අපේ අයුතුකම්වලින් හැරී ඔබගේ
සැබෑකම තේරුම්ගන්නා පිණිස අපේ
දෙවිවූ ස්වාමීන්වහන්සේට අපි කන්නලව්
14 නොකෙළෙමුව. එබැවින් ස්වාමීන්-
වහන්සේ විපත්තිය ගැන පිබිද සිට, ඒක
අප පිටට පැමිණෙවූසේක. මක්නිසාද
අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තමන්
කරන තමන්ගේ සියලු ක්‍රියාවල් ගැන
ධර්මිෂ්ඨව සිටිනසේක, අපි උන්-
වහන්සේගේ හඬට කීකරු නොවීමුව.
15 ඉතින් ඔබගේ සෙනඟ බලවත් හස්-
තයකින් මිසර දේශයෙන් පිටතට ගෙ-
නැවිත්, අද දවසේ තිබෙන ලෙස ඔබට
නාමයක් උපදවාගත්තාවූ අපේ දෙවිවූ
ස්වාමීන්වහන්ස, අපි පව්කෙළෙමුව,
16 දුෂ්ටකම්කෙළෙමුව. ස්වාමීනි, අනේ
ඔබගේ සියලු ධර්මිෂ්ඨකම් ලෙස ඔබගේ
උදහසත් කෝපයත් ඔබගේ ශුද්ධවූ
කන්ද වන ඔබගේ නුවරවූ යෙරුසලමෙන්
පහවේවා, මක්නිසාද අපේ පාප සහ
අපේ පියවරුන්ගේ අපරාධ නිසා
යෙරුසලම සහ ඔබගේ සෙනඟ අප
වටකර සිටින සියල්ලන්ට නින්දවක් වී
17 තිබේ. ඒ නිසා, අපේ දෙවියන්වහන්ස,
ඔබගේ මෙහෙකරුවාගේ යාච්ඤාවද
ඔහුගේ කන්නලව්ද අසා, පාළුව තිබෙන
ඔබගේ ශුද්ධස්ථානය කෙරෙහි ඔබගේ
මුහුණ ස්වාමීන්වහන්සේ නිසා බැබළෙ-
18 වුව මැනව. මාගේ දෙවියන්වහන්ස,
ඔබගේ කන් නමා අසුව මැනව; ඔබගේ
ඇස් හැර අපේ අසරණකමද ඔබගේ
නාමය දරන නුවරද බැලුව මැනව.
මක්නිසාද අපේ කන්නලව් අප විසින්
ඔබ ඉදිරියෙහි ඔප්පුකරන්නේ අපේ
ධර්මිෂ්ඨකම නිසා නොව ඔබගේ මහත්
19 අනුකම්පාවල් නිසාය. ස්වාමීන්වහන්ස,
ඇසුව මැනව; ස්වාමීන්වහන්ස, කමාවුව
මැනව, ස්වාමීන්වහන්ස, ඇහුම්කන්දුන
මැනව; මාගේ දෙවියන්වහන්ස, ප්‍රමාද
නොවී, ඔබ නිසාම එය ඉෂ්ටකළ මැනව;
මක්නිසාද ඔබගේ නුවරත් ඔබගේ
සෙනඟත් ඔබගේ නාමය දරන්නෝයයි
කීවෙමි.
20 මා කථාකර යාච්ඤාකරමින්ද, මාගේ
පාපය සහ මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්-
වරුන්ගේ පාපයත් කියාදෙමින්ද, මාගේ
දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කන්ද
උදෙසා මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
ඉදිරියෙහි මාගේ කන්නලව්ව ඔප්පු-
කරමින්ද සිටින අතර, එසේය, මා 21
යාච්ඤාවෙන් කථාකරද්දීම පළමු මා
දර්ශනයෙන් දුටු මනුෂ්‍යයාවූ ගාබ්‍රියෙල්
යුහුව ගමන්කොට, සවස් පූජාවේ
වේලාවට පමණ මා ළඟට පැමිණියේය.
ඔහු මට උගන්වා මා සමග කථාකොට: 22
එම්බා දනියෙල්, තේරුම්ගැනීමේ දක්ෂකම
නුඹට දෙන්ට දැන් පිටත්ව ආවෙමි. නුඹේ 23
කන්නලව්වේ පටන්ගැන්මේදී ආඥවක්
ලැබ මම නුඹට දන්වන්ට ආවෙමි; මක්-
නිසාද නුඹ බොහෝ ප්‍රේම ලද්දෙක්ය.
ඒ නිසා කාරණය කල්පනා කොට,
දර්ශනය තේරුම්ගනින්න. වරද තීන්දු- 24
කරන්ටත් පව් කෙළවර කරන්ටත්
අපරාධය උදෙසා සමගිකමක් කරන්ටත්
සදාකාල ධර්මිෂ්ඨකම පමුණුවන්ටත්
දර්ශනය සහ අනාගතවාක්‍යය මුද්‍රකර
තබන්ටත් අති ශුද්ධස්ථානය ආලේප-
කරන්ටත් නුඹේ සෙනඟත් නුඹේ
ශුද්ධවූ නුවරත් ගැන සති සැත්තෑවක්
නියමකර තිබේ. එබැවින් නුඹ මෙසේ 25
දැනගන තේරුම්ගනින්න, එනම් යෙරු-
සලම නැවත පිහිටුවා ගොඩනගන්ට
ආඥවක් ලැබෙන තැන් පටන් අධිපති-
යාවූ ආලේපලත් තැනැත්තා දක්වා සති
සතක්ද සති සැටදෙකක්ද තිබෙන බවය.
කැලඹීම් සහිත කාලවලදී වුවත් වීථියත්
අගළත් නැවත ගොඩනගනු ලබනවා
ඇත. සති සැටදෙකකට පසු ආලේපලත් 26
තැනැත්තා සිඳදමනු ලැබේ, කිසිවෙක්ද
ඔහුට නොවන්නේය. පැමිණෙන අධිපති-
යාගේ සෙනඟ නුවර සහ ශුද්ධස්ථානය
විනාශකරන්නෝය; එහි කෙළවර
ජලගැල්මකින් මෙන් වන්නේය, කෙළවර
දක්වාම යුද්ධ පවතින්නේය; පාළු-
කිරීම්ද නියමකර තිබේ. ඔහු සතියකට 27
බොහෝ දෙනෙකු සමග ගිවිසුමක්
ස්ථිරකොට, සතිය මැද්දී යාගයත්
ආහාර පූජාවත් නවත්වන්නේය;

පාළුකරන්නෙක් *පිළිකුල්වල මුදුන පිට
එන්නේය; †පාළුකරන දේ පිටට නියමවූ
තීන්දුව දක්වාම උදහස වගුරුවනු
ලබන්නේයයි කීවේය.

## දීප්තිමත් දේවදූතයෙකු දක කථාකිරීම

10 පර්සියාවේ රජවූ කෝරෙෂ්ගේ
තුන්වෙනි අවුරුද්දේ බේල්ටෙෂශර්
නම්වූ දනියෙල්ට කාරණයක් එළිදරව්විය;
ඒ කාරණය සැබෑය, එනම් මහත්
යුද්ධයක් ගැනය. ඔහු කාරණය
කල්පනාකර, දර්ශනය තේරුම්ගත්තේය.
2 ඒ දවස්වලදී දනියෙල් වන මම සති
තුනක් මුළුල්ලේම වැලපෙමින් සිටියෙමි.
3 සති තුනක්ම පසුවෙන තුරු මා රස
ආහාර කෑවේවත් මස් හෝ මුද්‍රික
පානය මාගේ කටට ගත්තේවත් තෙල්
4 ගාගත්තේවත් නැත. පළමුවෙනි මාසයේ
විසිහතරවෙනිද ‡හිද්දෙකෙල් යන මහත්
5 ගංගාව අසබඩ සිටියදී, මාගේ ඇස්
ඔසවා බලා, මනුෂ්‍යයෙක් සිහින් හණ
රෙදි ඇඳ, ඌපාස්හි පිරිසිදු රනින් ඉහටිය
6 බැඳගන සිටිනවා දුටිමි. ඔහුගේ ශරීරය
රන්කාන්තියක් මෙන්ය, ඔහුගේ මුහුණ
විදුලියේ පෙනීම මෙන්ය, ඔහුගේ ඇස්
ගිනි පහන් මෙන්ය, ඔහුගේ හස්ත සහ
පාද ඔප් නැගූ පිත්තල මෙන්ය, ඔහුගේ
වචනවල හඬ සමූහයක හඬ මෙන්ය.
7 දනියෙල් වන මම පමණක් දර්ශනය
දුටිමි. මා සමග සිටි මනුෂ්‍යයන්
දර්ශනය දුටුවේ නැත; එහෙත් මහත්
භීතියක් ඔවුන් පිටට පැමිණ, ඔව්හු
8 සැඟවෙන පිණිස පලාගියෝය. මම
පමණක් ඉතිරිව සිට, ඒ මහත් දර්ශනය
දුටුවෙමි, කිසි ශක්තියක් මා තුළ ඉතිරි
නොවීය. මා කෙරෙහි මාගේ ශෝභනකමද
අජීවකමට හැරුණේය, කිසි ශක්තියක්ද
9 මා තුළ නොපැවතුණේය. එහෙත් ඔහුගේ
වචනවල හඬ මට ඇසුණේය. ඔහුගේ
වචනවල හඬ මට ඇසුණු කල මූර්ඡාවී
මුහුණින් බිම වැටුණෙමි. එවිට අතක් 10
මට ස්පර්ශවී, මාගේ දණහිස්ද අතුල්ද
බිම ගසා ඉන්ට මට සැලැස්වීය. ඔහු 11
මට කථාකොට: බොහෝ ප්‍රේමලත්
මනුෂ්‍යයාවූ දනියෙල්, මා විසින් නුඹට
කියන වචන කල්පනාකර, නැගිට
කෙළින් සිටපන්න; මක්නිසාද මම දැන්
නුඹ ළඟට එවනලද්දෙමියි කීවේය. ඔහු
ඒ වචනය මට කී විට මම වෙවුලමින්
සිටියෙමි. ඔහු මට කථාකොට: දනියෙල්, 12
භය නොවන්න; මක්නිසාද නුඹ
තේරුම්ගන්ටත් නුඹේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි යටත්වෙන්ටත් නුඹේ සිත
යොමුකරගත් පළමුවෙනිද සිට නුඹේ
වචන අසනු ලැබීය. මමද නුඹේ වචන
නිසා ආවෙමි. පර්සියා රාජ්‍යයේ 13
අධිපතියා විසිඑක් දවසක් මට විරුද්ධව
සිටියේය; නුමුත් ප්‍රධාන අධිපතීන්ගෙන්
එක්කෙනෙක් වන මීකායෙල් තෙම මට
උපකාරකරන්ට ආයේය. එසේ මම
පර්සියාවේ රජවරුන් වෙත එහි ප්‍රමාද
වුණෙමි. මතු දවස්වල නුඹේ සෙනඟට 14
සිද්ධවෙන්ට තිබෙන කාරණා නුඹට
තේරුම්කරදෙන්ට ආවෙමි. මක්නිසාද
දර්ශනය [ඉෂ්ටවෙන්ට] තව බොහෝ
දවස් ඇත්තේයයි කීවේය. ඔහු මෙබඳු 15
වචන මට කී විට, මාගේ මුහුණ බිමට
නමා ගොළුව උන්නෙමි. එකල මනුෂ්‍ය 16
පුත්‍රයන්ට සමානවූ කෙනෙක් මාගේ
තොල් ස්පර්ශකෙළේය. මම වනාහි
මාගේ කට ඇර, මා ඉදිරියෙහි සිටි
තැනැත්තාට කථාකරමින්: මාගේ
ස්වාමිනි, දර්ශනය නිසා මට රුජාවක්
අල්ලා, මා තුළ කිසි ශක්තියක් ඉතිරි
නොවීය. මේ මාගේ ස්වාමිහුගේ 17
මෙහෙකරුවාට මේ මාගේ ස්වාමීන්
සමග කථාකරන්ට පුළුවන් කොහොමද?
මෙතැන් පටන් මා තුළ නම් කිසි
ශක්තියක් නොතිබුණේය, හුස්මද මා
තුළ ඉතිරි නොවීයයි කීවෙමි. එවිට 18
නැවත මනුෂ්‍ය පෙනීම ඇති කෙනෙක්
මට තට්ටුකර මා සවිකෙළේය. ඔහු 19
මට කථාකොට: බොහෝ ප්‍රේමලත්

*නොහොත්, පිළිකුල් නමැති පියාපතින්
†නොහොත්, පාළුකරන්නා පිටට.
‡එනම්, ටීග්‍රිස්.

මනුෂ්‍යය, භය නොවන්න. තුඹට සමාදනය
වේවා, සවිවෙයන්න, සවිවෙයන්නැයි
කීවේය. ඔහු මට කථාකළ විට මම
සවිවී: ස්වාමීන්වහන්සේ කථාකරන-
සේක්වා, ඔබ මා සවිකළසේකැයි
20 කීවෙමි. එවිට ඔහු: මම තුඹ ළඟට
කුමකට ආයෙම්දැයි දන්නෙහිද? මම
දැන් පර්සියාවේ අධිපතියා සමඟ
යුද්ධකරන්ට හැරී යන්නෙමි. මා පිටත්ව
ගිය කල ග්‍රීසියේ අධිපතියා එන්නේය.
21 එහෙත් සැබෑකමේ ලියවිල්ලෙහි ලියා
තිබෙන දේ තුඹට දන්වන්නෙමි. ඔවුන්ට
විරුද්ධව තුඹලාගේ අධිපතියාවූ
මීකායෙල් මිස මට උපකාරකරන වෙන
11 කිසිවෙක් නැත්තේය. මම මේදියවූ
දරියුස්ගේ පළමුවෙනි අවුරුද්දේදී
ඔහුට උපකාරයක්ද ආරක්ෂාවක්ද
පිණිස සිටියෙමි.

## පර්සියාව, ග්‍රීසිය, සිරියාව, මිසරය යන රටවල රජුන්ගේ ප්‍රවෘත්ති

ඉතින් මම තුඹට සැබෑව දන්වන්නෙමි.
2 තව රජවරු තුන්දෙනෙක් පර්සියාවෙහි
නැගිටින්නෝය; සතරවෙනියා සියල්ලන්ට
වඩා මහත් වස්තු සපයාගන තමාගේ
වස්තුවෙන් බලවත්වූ කල්හි ග්‍රීක් රාජ්‍යයට
විරුද්ධව සියල්ලන් පොලඹවන්නේය.
3 නුමුත් බලවත්ත රජෙක් නැගිට මහත්
පරාක්‍රමයෙන් ආණ්ඩුකරමින් තමා
4 කැමති පරිද්දෙන් කරන්නේය. ඔහු
සිටගත්තායින් පසු ඔහුගේ රාජ්‍යය බිඳී,
අහසේ සතර හුළඟට බෙදෙන්නේය;
නුමුත් එසේ වෙන්නේ ඔහුගෙන්
පැවත එන්නන්ටවත් ඔහු ආණ්ඩුකළ
පරාක්‍රමයේ හැටියටවත් නොවේ;
මක්නිසාද ඔහුගේ රාජ්‍යය උදුරාදමන්ට
යෙදී, මොවුන්ට පමණක් නොව
5 අන්‍යයන්ටත් ලැබෙන්නේය. දකුණු
දිශාවේ රජ නම් බලවත්වන්නේය; ඔහුගේ
අධිපතීන්ගෙන් එක්කෙනෙක් ඔහුට වඩා
බලවත්වී, ආණ්ඩු කරන්නේය; ඔහුගේ
ආණ්ඩුව මහත් ආණ්ඩුවක් වන්නේය.
6 අවුරුදු ගණනක් ගියායින් පසු ඔව්හු
එකතුවන්නෝය; දකුණු දිශාවේ රජුගේ
දුව ගිවිසුමක් කරන්ට උතුරු දිශාවේ
රජු ළඟට පැමිණෙන්නීය. එහෙත් ඇගේ
හස්තයේ බලය පවතින්නේ නැත; ඔහුවත්
ඔහුගේ හස්තයවත් නොපවත්නේය;
ඇද ඇය ගෙන්වූ අයද ඇය ඉපදවූ
තැනැත්තාද ඒ කාලවල ඇට උපකාරකළ
තැනැත්තාද පාවාදෙනු ලබන්නෝය.
එහෙත් ඇගේ මුල්වල පැළයක්වූ කෙනෙක් 7
ඔහුගේ ස්ථානයෙහි නැගිට, සේනාවට
විරුද්ධව පැමිණ, උතුරු දිශාවේ රජුගේ
බලකොටුවට ඇතුල්වී, ඔවුන්ට විරුද්ධව
ක්‍රියාකොට ජයගන්නේය. හෙතෙම 8
ඔවුන්ගේ දෙවිවරුන්ද ඔවුන්ගේ වාත්තු
පිළිමද ඔවුන්ගේ අනර්ඝ රිදී රත්රන්
බඩුද අල්ලා මිසරයට ගෙනයන්නේය.
තවද ඔහු උතුරු දිශාවේ රජුගෙන් අවුරුදු
ගණනක් වැලකෙනවා ඇත. ඔහු වනාහි 9
දකුණු දිශාවේ රජුගේ රාජ්‍යයට
විරුද්ධව පැමිණ, පසුව තමාගේ රටට
හැරී යන්නේය. නුමුත් ඔහුගේ පුත්‍රයන් 10
යුද්ධකරනවා ඇත, ඔවුන් මහත්
සේනාවල් රාශියක් රැස්කරනවා ඇත.
ඔහු ඉදිරියටම ඇවිත්, ජලය මෙන් ගලා
යටකරගන්ටද හැරී ඇවිත්, ඒ අයගේ
බලකොටුව දක්වාත් යුද්ධකරනවා ඇත.
දකුණු දිශාවේ රජද කෝපයෙන් උමතුව 11
පිටත්ව ඇවිත් ඔහු සමඟ, එනම් උතුරු
දිශාවේ රජු සමඟ, යුද්ධකරන්නේය. ඔහු
මහත් සමූහයක් සූදනම්කරගන්න නුමුත්,
ඒ සමූහයා ඒ අය අතට පාවාදෙනු
ලබන්නේය. ඒ සමූහයා අල්වාගත්තාම 12
ඔහුගේ සිත උසස්වන්නේය. මෙසේ ඔහු
දස දහස් ගණන් අය හෙළාදමන නුමුත්
ජය නොගන්නේය. උතුරු දිශාවේ 13
රජතෙමේ හැරී පළමු සමූහයාට වඩා
මහත් සමූහයක් නැගුපුවාගෙන, අවුරුදු
ගණනකට පසු මහත් සේනාවක් සහ
බොහෝ සම්පත්ද ඇතුව එනවා ඇත.
ඒ කාලවලදී බොහෝ දෙනෙක් දකුණු 14
දිශාවේ රජුට විරුද්ධව නැගිටින්නෝය.
තුඹේ සෙනඟගේ බලාත්කාරකම්කරන්-
නොත් දර්ශනය ඉෂ්ටකරන්ට නැගිට,
වැටියන්නෝය. උතුරු දිශාවේ රජද ඇවිත් 15

ගොඩැල්ලක් නගා, පවුරු ඇති නුවරවල්
අල්ලාගන්නේය. දකුණු දිශාවේ රජුගේ
සේනාවල්වත් ඔහුගේ තෝරාගත්
සමුදුවවත් විරුද්ධව නොසිටින්නෝය,
16 විරුද්ධව සිටින්ට ශක්තිය නැත. එහෙත්
ඔහුට විරුද්ධව එන තැනැත්තා තමාගේ
කැමැත්ත ලෙස කරන්නේය, කිසිවෙකුට
ඔහු ඉදිරියේ හිටින්ට බැරිවන්නේය. ඔහු
අලංකාර දේශයේ සිටින්නේය, එය
17 මුළුමනින්ම ඔහු අතට අසුවන්නේය. ඔහු
තමාගේ මුළු රාජ්‍යයේ බලය ඇතුව
ඇතුල්වෙන්ට තමාගේ මුහුණ යොමු-
කරන්නේය; එහෙත් ඔහු ඒ අය සමග
සමාදනයක් කරගෙන, පසුව ඒක
නැතිකරන පිණිස ස්ත්‍රීන්ගෙන් දුවෙක්
ඔහුට දෙන්නේය; නුමුත් එය ඉෂ්ට-
වෙන්නේවත් ඔහුට හරියන්නේවත් නැත.
18 තවද ඔහු තමාගේ මුහුණ ද්වීප දෙසට
හරවා, බොහෝ ද්වීප අල්වාගන්නේය.
නුමුත් අධිපතියෙක් ඔහු විසින් කරන
නින්දාව නවත්වනවාත් ඇර, ඔහු කළ
19 නින්දාව ඔහු පිටට හරවන්නේය. ඔහුද
තමාගේ මුහුණ තමාගේම දේශයේ
බලකොටු දෙසට හරවා, පැකිල වැටී
20 නැතිවන්නේය. එකල ඔහුගේ ස්ථානයෙහි
රාජ්‍යයේ අලංකාර දේශයෙහි ආදයම්
අයකරන්නෙකු ඇවිදින්ට සලස්වන
කෙනෙක් නැගිට, කෝපයවත් යුද්ධයවත්
නැතුව ස්වල්ප දවසකින් විනාශ
21 වන්නේය. ඔහුගේ ස්ථානයෙහි නීචයෙක්
නැගිටින්නේය; ඔහුට රජකමේ ගෞරවය
නුදුන් නුමුත් ඔහු හදිසියෙන් පැමිණ,
ඉච්චාවලින් රාජ්‍යය ලබාගන්නේය.
22 ජලගැල්මක් සමාන සේනාවෝ ගිවිසුමක්
කරගත් අධිපතියාත් ඇතුව ඔහු
ඉදිරියෙන් දියපහරකින් මෙන් බිඳී
23 යන්නෝය. ඔහු සමග බැඳුණායින් පසු
ඔහු වංචාවෙන් ක්‍රියාකොට, ගොස්
ස්වල්ප සෙනඟක් කරණකොටගෙන
24 බලවත්වන්නේය. ඔහු හදිසියෙන් දේශයේ
සාරවත් තැන්වලට පැමිණ, තමාගේ
පියවරුන්වත් තමාගේ පියවරුන්ගේ
පියවරුන්වත් නොකළ දේ කරන්නේය;
ඔහු කොල්ලයත් උදුරාගත් දේත්
සම්පතුත් ඔවුන්ට බෙදදෙන්නේය.
කාලයක් යන තුරු බලකොටුවලට
විරුද්ධව තමාගේ යෝජනාද යොදන්නේය.
ඔහු දකුණු දිශාවේ රජුට විරුද්ධව 25
මහත් සේනාවක් ඇතුව, තමාගේ බලයත්
වීර්යයත් පොලඹවාගන්නේය; දකුණු
දිශාවේ රජද ඉතා මහත්වූ බලවත්වූ
සේනාවක් ඇතුව යුද්ධයට නැගිටින්නේය.
නුමුත් ඔහුට හිටින්ට බැරිවන්නේය,
මක්නිසාද ඔව්හු ඔහුට විරුද්ධව උපා
යොදන්නෝය. එසේය, ඔහුගේ භෝජනයෙන් 26
කන අය ඔහු නැතිකරන්නෝය, ඔහුගේ
යුද්ධ සේනාව විසිරයනවා ඇත. බොහෝ
දෙනෙක්ම මැරුම්කා වැටෙනවාද ඇත.
ඒ රජුන් දෙදෙනාගේ සිත් වනාහි නපුර 27
කිරීමට යෙදී, එක මේසයේ හිඳගෙන
ඔව්හු බොරු කියන්නෝය. නුමුත්
ඉෂ්ටවෙන්නේ නැත; මක්නිසාද නියම
කාලය දක්වා තීන්දුව තව ප්‍රමාද
වන්නේය. එකල ඔහු බොහෝ සම්පත් 28
ඇතුව තමාගේ දේශයට හැරියනවා ඇත;
ඔහු තමාගේ සිත ශුද්ධ ගිවිසුමට
විරුද්ධව තබා, තමාගේ කැමැත්ත ඉෂ්ට
කොට, තමාගේ දේශයට හැරියන්නේය.
නියම කාලයේදී ඔහු නැවත දකුණු 29
දිශාවට එන්නේය; නුමුත් අන්තිම ගමන
පළමුවෙනි ගමන මෙන් නොවන්නේය.
මක්නිසාද කිත්තීම් නැව් ඔහුට විරුද්ධව 30
එන්නේය; ඔහුද කලකිරී, හැරී ගොස්,
ශුද්ධ ගිවිසුමට විරුද්ධව කෝපවී,
තමාගේ කැමැත්ත ඉෂ්ටකොට, ශුද්ධ
ගිවිසුම අත්හරින්නන් නැවත සලකනවා
ඇත. ඔහු විසින් නැගුටුවන සේනා 31
පැමිණ, බලකොටුව වන ශුද්ධස්ථානය
කෙලෙසා, දවස්පතා පූජාව පහකොට,
පාළුකරන පිළිකුල පිහිටුවනවා ඇත.
ගිවිසුමට ද්‍රෝහිකාරව සිටින්නන් ඔහු 32
ඉච්චාවලින් ඇදගන්නේය. නුමුත්
තමුන්ගේ දෙවියන්වහන්සේ හඳුනන්නෝ
වන සෙනඟ බලවත්වී, සමර්ථකම්
කරන්නෝය. සෙනඟ අතරෙන් නුවණ 33
ඇත්තන් විසින් බොහෝ දෙනෙකු
ඥනයට පමුණුවනවා ඇත. නුමුත්
දවස් ගණනක් කඩුවෙන්ද ගින්නෙන්ද

දුසකමෙන්ද කොල්ලකෑමෙන්ද ඔවුන්
34 වැටෙනවා ඇත. ඔවුන් වැටෙන කල
ස්වල්ප වශයෙන් ඔවුන්ට උපකාර ලැබේ.
බොහෝ දෙනෙක්ද ඉච්ඡාවලින් ඔවුන්ට
35 එකතුවෙනවා ඇත. තීන්දුවේ කාලය
දක්වා ඔවුන් පිරිසිදුකර ශුද්ධපවිත්‍රකරන්ට
ඔවුන්ගෙන් නුවණ ඇති සමහරු
වැටෙන්නෝය. මක්නිසාද නියම කාලය
36 තව ප්‍රමාදවන්නේය. රජද තමාගේ
කැමැත්තේ හැටියට කර, සියලු දෙවිවරුන්ට
විරුද්ධව උසස්වී, උඩඟුවී, දෙවිවරුන්ගේ
දෙවියන්වහන්සේටත් විරුද්ධව අපූරු
දේ කථාකරනවා ඇත. උදහස තීන්දුවෙන
තුරුද ඔහු සඵලවෙනවා ඇත; මක්නිසාද
37 නියමය ඉෂ්ටවන්නේය. ඔහු තමාගේ
පියවරුන්ගේ දෙවිවරුන් සලකන්නේවත්
*ස්ත්‍රීන්ගේ ආශාව හෝ වෙන කිසි
දෙවිකෙනෙකු හෝ සලකන්නේවත් නැතුව
සියල්ලන්ට විරුද්ධව උඩඟුවන්නේය.
38 එහෙත් †බලකොටු දෙවියාට නම් ඔහුගේ
ස්ථානයේදී ඔහු ගෞරව දෙමින්, තමාගේ
පියවරුන් ඇඳින නොගත් දෙවියෙකුට
රත් රිදීවලින්ද මැණික්වලින්ද අගේ ඇති
39 දේවලින්ද ගෞරව දෙන්නේය. ඉතා
සවිඇති බලකොටුවලට අන්‍ය දෙවියෙකු
ඇතුව ඔහු මෙසේ කරනවා ඇත; ඔහු
පිළිගන්න අයින්ට ඔහු බොහෝ ගෞරව
දී, බොහෝ දෙනෙකු කෙරෙහි ඔවුන්
ආණ්ඩුකාරයන් කර, මුදලට රට
40 බෙදදෙනවා ඇත. තීන්දුවේ කාලයේදී
දකුණු දිශාවේ රජ ඔහුට විරුද්ධව
පැමිණෙන්නේය. නුමුත් උතුරු දිශාවේ
රජ කුණාටුවක් මෙන් රථද අසරුවන්ද
බොහෝ නැව්ද ඇතුව ඔහුට විරුද්ධව
ඇවිත්, දේශවලට වැද, ජලය මෙන්
41 ගලාගන සැරෙන් පැමිණෙන්නේය. ඔහු
අලංකාර දේශයටත් ඇතුල්වන්නේය,
බොහෝ රටවල්ද වැටෙනවා ඇත.
එහෙත් ඒදෝමද මෝවබ්ද අම්මොන්
පුත්‍රයන්ගේ ප්‍රධාන කොටියාසයද ඔහුගේ
42 අතින් ගැළවෙනවා ඇත. ඔහු තමාගේ
අත් රටවල් කෙරෙහි දිගුකරන්නේය.
මිසර දේශයද නොගැළවෙන්නේය.
ඔහු මිසරයේ රත් රිදී නිධානද සියලු 43
අගේ ඇති දේවල්ද කෙරෙහි බලය
පවත්වන්නේය. ලූබිවරුද කූෂ්වරුද
ඔහුගේ අඩිපාරේ යන්නෝය. නුමුත් 44
නැගෙනහිරෙන්ද උතුරෙන්ද පැමිණෙන
ආරංචිවලට ඔහු කැලඹී, බොහෝ
දෙනෙක් නාස්තිකරන්ටත් සිඳදමන්ටත්
මහත් කෝපයෙන් පිටත්වන්නේය. ඔහු 45
මාළිගා වැනිවූ තමාගේ කූඩාරම් මුහුදටත්
අලංකාරවූ කන්දටත් අතරෙහි පිහිටුවා,
පසුව තමාගේ අන්තිමයට පැමිණෙන්නේය,
කිසිවෙක්ද ඔහුට උපකාර නොකරන්නේය.

12
ඒ කාලයේදී නුඹේ සෙනඟගේ
පුත්‍රයන් උදෙසා සිටින උතුම්
අධිපතියාවූ මීකායෙල් නැගිටින්නේය.
ඒ වනාහි මනුෂ්‍ය ජාතියක් පැවති තැන්
සිට ඒ කාලය දක්වා නොවූ ආකාර
විපත්ති කාලයක් වන්නේය. ඒ කාලයේදී
නුඹේ සෙනඟගෙන් පොතේ නම් ලියා
තිබෙන සියල්ලෝ ගැළවෙන්නෝය.
පොළොවේ ධූලියෙහි සැතපෙන්නන්ගෙන් 2
බොහෝ දෙනෙක්, සමහරෙක් සදාකාල
ජීවනයටත් සමහරෙක් නින්දාව සහ
සදාකාල නීචකමටත්, පිබිද එන්නෝය.
නුවණ ඇත්තෝ ආකාශයේ දීප්තිය 3
මෙන්ද බොහෝ දෙනෙකු ධර්මිෂ්ඨකමට
හරවාගන්නෝ තාරකාවන් මෙන්ද
සදාකාලේටම බැබළෙන්නෝය. නුමුත්, 4
දනියෙල්, නුඹ මේ වචන වසා, අන්තිම
කාලය දක්වා පොත මුද්‍රකර තබාපන්න.
බොහෝ දෙනෙක් එය කියවා බලනවා
ඇත, දැනගැන්මද වැඩිවන්නේයයි
කීවේය.

## දර්ශනයේ අන්තිම පණිවිඩය

එකල දනියෙල් වන මම බලා, තවත් 5
දෙදෙනෙක්, එක්කෙනෙක් ගඟ මෙගොඩද
එක්කෙනෙක් ගඟ එගොඩද, සිටිනවා
දුටිමි. එවිට සිහින් හණ රෙදි ඇඳගත 6
ගංගාවේ වතුරට උඩින් සිටි මනුෂ්‍යයාට
එක්කෙනෙක් කථාකොට: මේ අපූරු

*මේ තැමශ් නම් දෙවියා විය හැකිය.
†එනම්: ජුපිටර් (වෘහස්පති) දෙවියාය.

දේවල් තීන්දුවීමට කොපමණ කල්
7 ගතවෙනවා ඇද්දැයි ඇසුවේය. එවිට හණ
රෙදි ඇඳගත ගංගාවේ වතුරට උඩින්
සිටි මනුෂ්‍යයා තමාගේ දකුණතද
වමතද අහස දෙසට ඔසවා, සදාකාලයටම
ජීවත්වන තැනන්වහන්සේ ගැන දිවුරා:
කාලයකටත් කාලවලටත් කාල භාගය-
කටත් එය පවතිනවා ඇත; ශුද්ධවන්ත
සෙනඟගේ බලය විසිරවීම තීන්දුකළාම
මේ සියල්ල තීන්දුවන්නේයයි කියනවා
8 ඇසීමි. මම ඇසුවෙමි. නුමුත් තේරුම්
නොගතිමි. එවිට මම: මාගේ ස්වාමීනි,
මේ දේවල තීන්දුව කිමෙක්දැයි ඇසීමි.
9 ඔහුද: දනියෙල්, නුඹ පලයන්න. මක්නිසාද
අන්තිම කාලය දක්වා මේ වචන වසා
මුද්‍රකොට තිබේ. බොහෝ දෙනෙක් 10
තමුන්ම ශුද්ධ පවිත්‍රකරගෙන පිරිසිදු-
වන්නෝය; දුෂ්ටයෝ දුෂ්ටකම්-
කරන්නෝය; දුෂ්ටයන්ගෙන් කිසිවෙක්
තේරුම් නොගන්නෝය. නුමුත් නුවණ
ඇත්තෝ තේරුම්ගනිති. දවස්පතා පූජාව 11
පහකර පාළුකරන පිළිකුල පිහිටුවන
කාලය පටන් එක්දස් දෙසිය අනූ දවසක්
වන්නේය. එක්දස් තුන්සිය තිස්පස් දවස 12
දක්වා බලාසිට, ඒ කාලයට පැමිණෙන
තැනැත්තේ වාසනාවන්තයෙක්ය. නුඹ 13
ගොස් අන්තිමය වන තුරු සිටපන්න.
නුඹ සැතපී දවස්වල අන්තිමයේදී නුඹේ
කොටස [භුක්තිවිඳීමට] නැගිටින්නෙහි-
යයි කීවේය.

---

# අනාගතවක්තෘවූ හොෂෙයාගේ පොත

## හොෂෙයාගේ විවාහවීම සහ එයින් ගුරුකම්

1 යූදාහි රජවරුවූ උස්සියාගේද
යෝතාම්ගේද ආහාස්ගේද හෙසකියා-
ගේද දවස්වල සහ යෝවාෂ්ගේ පුත්‍රවූ
ඉශ්‍රායෙල් රජවූ යෙරොබෝවම්ගේ
දවස්වලත් බෙයේරීගේ පුත්‍රවූ හොෂෙයාට
පැමිණි **ස්වාමීන්වහන්සේගේ** වචනයය.
2 හොෂෙයා ලවා **ස්වාමීන්වහන්සේ**
කියෙවූ කාරණාවල පටන්ගැන්මය.
**ස්වාමීන්වහන්සේ** හොෂෙයාට කථාකොට:
නුඹ ගොස් වේශ්‍යා භාර්යාවක්ද
වේශ්‍යා දරුවන්ද අරගනින්න. මක්නිසාද
දේශය **ස්වාමීන්වහන්සේගෙන්** අහක්වී
බොහෝසේ වේශ්‍යාකම්කෙරේයයි
3 කීසේක. එවිට ඔහු ගොස්, දිබ්ලයිම්-
ගේ දූවූ ගොමෙර් පාවාගත්තේය; ඈ
ගර්භිණීව ඔහු නිසා පුත්‍රයෙකු වැදුවාය.
4 **ස්වාමීන්වහන්සේද**: ඔහුට *යෙස්‍රෙයෙල්
යන නම තබාපන්න; මක්නිසාද තව
ස්වල්ප කාලයකින් යෙස්‍රෙයෙල්හි ලේ
ගැන යේහුගේ වංශයට දඬුවම්කොට,
ඉශ්‍රායෙල් වංශයේ රාජ්‍යය නැතිකරන්නෙමි.
5 ඒ දවසේ යෙස්‍රෙයෙල් මිටියාවතේදී
ඉශ්‍රායෙල්වරුන්ගේ දුන්න බිඳින්නෙමියි
6 කීසේක. ඈ නැවත ගර්භිණීව දුවෙකු
වැදුවාය. **ස්වාමීන්වහන්සේද**: ඈට †ලෝ-
රුහාමා යන නම තබාපන්න. මක්නිසාද
මම ඉශ්‍රායෙල් වංශයට කමාවන ලෙස
ඔවුන්ට නැවත තවත් අනුකම්පා
7 නොකරන්නෙමි. නුමුත් මම යූද වංශයට
අනුකම්පාකොට, ඔවුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** කරණකොටගෙන
ඔවුන් ගළවන්නෙමි, දුන්නවත් කඩුවවත්
යුද්ධයවත් අශ්වයන්වත් අසරුවන්වත්
කරණකොටගෙන මම ඔවුන් නොගළ-
වන්නෙමියි ඔහුට කීසේක. ලෝ-රුහාමා 8
කිරිවැරෙවූවායින් පසු ඈ ගර්භිණීව
පුත්‍රයෙකු වැදුවාය. **ස්වාමීන්වහන්සේ** 9
මෙසේ කීසේක: ඔහුට *ලෝ-අම්මී
යන නම තබාපන්න. මක්නිසාද
නුඹලා මාගේ සෙනග නොවේය,
මමත් නුඹලාගේ දෙවියන්වහන්සේව
නොසිටින්නෙමි.
එහෙත් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ ගණන 10
මනින්ටවත් ගණින්ටවත් බැරිවූ මුහුදේ
වැලි මෙන් වන්නේය. තවද: නුඹලා
මාගේ සෙනග නොවේයයි ඔවුන්ට
කියන ස්ථානයේදීම—ජීවමාන දෙවියන්-
වහන්සේගේ පුත්‍රයෝයයි ඔවුන්ට කියනු
ලැබේ. යූද පුත්‍රයෝද ඉශ්‍රායෙල් පුත්‍රයෝද 11
එක්ව රැස්වී, තමුන්ට එක ප්‍රධානියෙකු
පත්කරගෙන, (වාල්කමේ) දේශයේ
සිට නැගී එන්නෝය. මක්නිසාද
යෙස්‍රෙයෙල්හි දවස මහත් වන්නේය.
2
නුඹලාගේ සහෝදරයන්ට †අම්මී
කියාද නුඹලාගේ සහෝදරියන්ට
‡රුහාමා කියාද කියාපල්ලා.

## අවිශ්වාස භාර්යාවට උපමාවූ ඉශ්‍රායෙල්ගේ දඬුවම හා දිනාගනු ලැබීම

නුඹලාගේ මවිට විරුද්ධව 2
පැමිණිලිකරපල්ලා, පැමිණිලිකරපල්ලා;

*දෙවියන්වහන්සේ විසුරුවනවා ඇත හෝ වපුරනවා ඇත යන අර්ථය.
†එනම්, අනුකම්පා නොලත්තී.

*එනම්, මාගේ සෙනග නොවේ.
†මාගේ සෙනග.
‡අනුකම්පාලත්තී.

මක්නිසාද, ඈ මාගේ භාර්යාව නොවේ,
මමද ඇගේ පුරුෂයා නොවෙමි. එබැවින්
ඈ ඇගේ වේශ්‍යාකම් ඇගේ මුහුණෙන්ද
ඇගේ කාමමිථ්‍යාචාරකම් ඇගේ පියයුරු
3 අතරෙන්ද පහකරාවා; නැත්නම් මම ඈ
නග්නකොට, ඈ උපන් දවසේදී මෙන්
ඈ සිටුවා, කාන්තාරයක් මෙන් කර,
වියළි දේශයක් මෙන් තබා, ඈ
4 පිපාසායෙන් නසන්නෙමි; එසේය, ඇගේ
දරුවන්ටද අනුකම්පා නොකරන්නෙමි;
මක්නිසාද ඔව්හු වේශ්‍යා දරුවෝය.
5 ඔවුන්ගේ මව් වේශ්‍යාකම්ද ඔවුන් වැදූ
තැනැත්තී නින්දිතකම්ද කර තිබේ.
මක්නිසාද ඈ කථාකොට: මට කෑමද
වතුරද ලොම්ද හණද තෙල්ද බීමද
දෙන්නාවූ මාගේ ප්‍රේමවන්තයන් පස්සේ
6 යන්නෙමියි කීවාය. එබැවින් තුඹේ
මාර්ගය කටුවලින් අහුරන්නෙමි, ඇගේ
මාවත් ඈට සොයාගන්ට බැරිවන ලෙස
7 තාප්පයක් ගොඩනගන්නෙමි. ඈද ඇගේ
ප්‍රේමවන්තියන් පස්සේ දුවන නුමුත් ඔවුන්
කරා නොපැමිණෙන්නීය; ඈ ඔවුන්
සොයන නුමුත් ඔව්හු ඈට සම්බ
නොවන්නෝය. එවිට ඈ කථාකොට:
මාගේ පළමු පුරුෂයා ළඟට
හැරීයන්නෙමි; මක්නිසාද දැනට වඩා ඒ
කාලය මට යහපත්ව තිබුණේයයි
8 කියන්නීය. නුමුත් ධාන්‍යද මිදියුසද
තෙල්ද ඈට දුන්නෙත් ඔවුන් විසින් බාල්
රූප සෑදීමට ගත් රිදීද රන්ද ඈට
වැඩිකළෙත් මා බව ඈ නොදැන
9 සිටියාය. එබැවින් මම නියම කාලයට
මාගේ ධාන්‍යද නියම සෘතුවට මාගේ
මිදියුසද අහක්කරන්නෙමි, ඇගේ
නග්නභාවය වසන්ට තිබුණු මාගේ
ලොම්ද මාගේ හණද උදුරාගන්නෙමි.
10 දැන් ඇගේ ප්‍රේමවන්තයන්ගේ ඇස්වලට
ඇගේ සල්ලාලකම පෙන්වන්නෙමි,
කිසිවෙක් මාගේ අතින් ඈ නො-
11 ගළවන්නේය. ඇගේ සියලු ප්‍රීතියද
ඇගේ මංගල්‍යයන්ද ඇගේ අමාවක්ද
ඇගේ සබත් දවස්ද ඇගේ සියලු නියම
12 රැස්වීම්ද පහකරන්නෙමි. මේවා මාගේ
ප්‍රේමවන්තයන් මට දුන් පණ්ඩියම්යයි ඈ
කියන්නාවූ ඇගේ මිදිවැල් සහ
අත්තික්කා ගස් මම නාස්තිකර කැලෑවක්
කරන්නෙමි, වන මෘගයෝ ඒවා
කන්නෝය. ඈ ඇගේ මුදුද ආභරණද 13
පැළඳගෙන, ඇගේ ප්‍රේමවන්තයන් පස්සේ
ගොස්, මා සිහිනැතිකොට, ඈ විසින්
සුවඳදුම් ඔප්පුකරන්ට යෙදුණාවූ බාල්
දේවතාවුන්ගේ දවස් නිසා ඈට දඬුවම්
කරන්නෙමියි ස්වාමීන්වහන්සේ කියන-
සේක. එබැවින් මම ඈ කැමතිකරවාගෙන, 14
ඈ කාන්තාරයට පමුණුවා, ඈට
කරුණාවෙන් කථාකරන්නෙමි. එතැන් 15
පටන් ඇගේ මිදිවතුද පැතීමේ දොරක්
පිණිස ආකෝර් මිටියාවතද ඈට
දෙන්නෙමි. එහි ඇගේ යෞවන දවස්වලදී
මෙන්ද ඈ මිසර දේශයේ සිට ආ
කාලයේදී මෙන්ද ඈ උත්තරදෙනවා
ඇත. ඒ කාලයේදී *බාලී කියා තුඹ 16
නවත් මට නොකියා, †ඉෂීයයි කියනවා
ඇතැයි ස්වාමීන්වහන්සේ කියනසේක.
මක්නිසාද මම බාල් දේවතාවුන්ගේ නාම 17
ඇගේ කටින් පහකර දමන්නෙමි, ඒ
දේවතාවෝ ඔවුන්ගේ නාමයෙන් නවත්
කියනු නොලබන්නෝය. ඒ කාලයේදී 18
මම ඔවුන් උදෙසා වනයේ මෘගයන්ද
ආකාශයේ පක්ෂීන්ද භූමියේ බඩගායන
සතුන්ද සමග ගිවිසුමක් කරන්නෙමි.
දුන්නද කඩුවද යුද්ධයද දේශයෙන්
නැතිකරදමා, ඔවුන් සුවසේ සැතපෙන්ට
සලස්වන්නෙමි. මම තුඹ සදාකාලේටම 19
පාවාගන්නෙමි; එසේය, ධර්මිෂ්ඨකමද
විනිශ්චයද කරුණාවද අනුකම්පාවද
ඇතුව තුඹ පාවාගන්නෙමි. විශ්වාසකමින් 20
තුඹ පාවාගන්නෙමි. තුඹ **ස්වාමීන්-**
**වහන්සේ** ඇඳිනගන්නෙහිය. ඒ කාලයේදී 21
මම උත්තරදෙන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. අහසට උත්තරදෙන්නෙමි,
අහස පොළොවට උත්තරදෙන්නේය;
පොළොව ධාන්‍යවලටත් මිදියුසයටත් 22
තෙල්වලටත් උත්තරදෙනවා ඇත; ඒවාද
යෙස්‍රෙයෙල්ට උත්තරදෙනවා ඇත. මම 23

*එනම්, මාගේ ස්වාමියාය.
†එනම්, මාගේ පුරුෂයාය.

ඈ දේශයෙහි මට වපුරාගන, *කරුණාව
නොලත් ඈත්තීට අනුකම්පාකරන්නෙමි;
†මාගේ සෙනඟ නොවූවන්ට: නුඹ මාගේ
සෙනඟයයි කියන්නෙමි; ඒ අයද: ඔබ
මාගේ දෙවියන්වහන්සේයයි කියනවා
ඇත.

## වරදකාර ස්ත්‍රිය හරවාගැනීමට උත්සාහය

3 තවද ස්වාමීන්වහන්සේ මට
කථාකොට: ඉශ්‍රායෙල් පුත්‍රයන් අන්
දෙවිවරුන් වෙතට හැරී [ඔවුන්ට
පිළිගන්වන] මුද්‍රිකඵල කැවිලිවලට ඇලුම්
වෙන නුමුත් ස්වාමීන්වහන්සේ ඔවුන්ට
ප්‍රේමකරන්නාක්මෙන්ම නුඹ නැවත
ගොස්, මිත්‍රයෙකුගේ ප්‍රේමවන්තියක් වී
‡කාමමිථ්‍යාචාරිණියක්ව සිටින ස්ත්‍රියෙකුට
2 ප්‍රේමවෙයන්නැයි කීසේක. මමද රිදී
පහළොහකටත් යව හෝමෙර්
3 එකහමාරකටත් ඈ මිලයට ගෙන: නුඹ
වේශ්‍යාකම් නොකර, පුරුෂයෙකුට
නොබැඳී, බොහෝ දවස් මා ගැන
බලාසිටපන්න. මමත් නුඹ ගැන එසේම
බලාසිටින්නෙමියි ඈට කීවෙමි.
4 මක්නිසාද ඉශ්‍රායෙල් පුත්‍රයෝ බොහෝ
දවස් රජෙක්වත් අධිපතියෙක්වත්
පූජාවක්වත් රූපස්තම්භයක්වත් පූජක
සැට්ටයක්වත් තෙරපීම් රූපවත් නැතුව
5 සිටින්නෝය. පසුව ඉශ්‍රායෙල් පුත්‍රයෝ
හැරී තමුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේද
තමුන්ගේ රජවූ දාවිත්ද සොයා, මතු
දවස්වලදී භයින් යුක්තව ස්වාමීන්-
වහන්සේ වෙතටත් උන්වහන්සේගේ
යහපත්කමටත් පැමිණෙන්නෝය.

## සෙනඟගේ දූෂ්‍යවීම. පූජකයින් විසින් එය දියුණුකිරීම

4 ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, ස්වාමීන්-
වහන්සේගේ වචනය අසාපල්ලා.
මක්නිසාද සැබෑකමවත් කරුණාවවත්
දෙවියන්වහන්සේ ඇඳිනගැනීමවත්
දේශයෙහි නැති හෙයින් දේශයේ වැසියන්
සමග ස්වාමීන්වහන්සේට පැමිණිල්ලක්
තිබේ. දෙස් තිබීමද බොරු කීමද 2
මිනීමැරීමද සොරකම්කිරීමද කාම-
මිථ්‍යාචාරයද මිස වෙන කිසිවක් නැත; ලේ
වැගිරවීම පිට ලේ වැගිරවීම වෙයි.
එබැවින් දේශය වැලපෙනවා ඇත, එහි 3
වසන සියල්ලෝ වනයේ මෘගයන්
හා ආකාශයේ පක්ෂීන්ද ඇතුළුව
මලානිකවන්නෝය; මුහුදු මත්ස්‍යයෝ
පවා පහකරනු ලබන්නෝය. එහෙත් 4
කිසිවෙක් පැමිණිලි නොකෙරේවා,
කිසිවෙක් අවවාද නොකෙරේවා;
මක්නිසාද නුඹේ සෙනඟ පූජකයා සමග
පැමිණිලිකරන අය වාගේය. එබැවින් 5
නුඹ දවාලේ වැටෙනවා ඇත,
අනාගතවක්තෘද නුඹ සමග රාත්‍රියේදී
වැටෙනවා ඇත; නුඹේ මෑණියන්ද
නාස්තිකරන්නෙමි. මාගේ සෙනඟ 6
දැනගැන්ම නැතිකමෙන් නාස්තිවී
සිටිති. නුඹ දැනගැන්ම එපාකළ
නිසා මට පූජකකම්කිරීමෙන් මමත්
නුඹ එපාකරන්නෙමි. නුඹ නුඹේ
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මතක
නැතිකළ නිසා මමත් නුඹේ දරුවන්
මතකනැතිකරන්නෙමි. ඔව්හු බෝවෙන්ට 7
බෝවෙන්ට මට විරුද්ධව වඩ වඩා
පව්කළෝය. ඔවුන්ගේ ගෞරවය
ලජ්ජාවට හරවන්නෙමි. ඔව්හු මාගේ 8
සෙනඟගේ පාපයෙන් පෝෂ්‍යවෙති, ඔවුන්
වරදකරනවාටත් ආශාවෙති. එබැවින් 9
සෙනඟට මෙන්ම පූජකයාටත් සිද්ධවෙයි.
මම ඔවුන්ගේ මාර්ගවල හැටියට
ඔවුන්ට දඬුවම්කර, ඔවුන්ගේ ක්‍රියා නිසා
ඔවුන්ට ප්‍රතිඵල දෙන්නෙමි. ඔව්හුද කන 10
නුමුත් තෘප්තියට නොපැමිණෙන්නෝය;
ඔව්හු වේශ්‍යාකම්කරන නුමුත් වැඩි
නොවන්නෝය. මක්නිසාද ඔව්හු
ස්වාමීන්වහන්සේ සැලකීම අත්හැරියෝය.
වේශ්‍යාකමද මුද්‍රිකපානයද මිදියුසද 11
නිසා සිහිය පහවයන්නේය. මාගේ 12
සෙනඟ තමුන්ගේ දණ්ඩෙන් විභාගකරති,
ඔවුන්ගේ සැරයටියද ඔවුන්ට දන්-
වන්නේය. මක්නිසාද වේශ්‍යා ආත්මය
ඔවුන් මුළාකෙරෙවුවේය, ඔව්හු තමුන්ගේ

*හෙබ්‍රෙව්: ලෝ-රුහාමා.
†හෙබ්‍රෙව්: අම්මී.
‡එනම්, එසේ වුණ නුඹේ භාර්යාවට.

දෙවියන්වහන්සේ කෙරෙන් වෙන්ව ගොස්
13 වේශ්‍යාකම් කළෝය. ඔව්හු කඳු මුදුන්වල
යාග කරති, හෙල් උඩ අලෝනද
ලිබ්නාද ඒලාද යන ගස්වල සෙවණ
හොඳ නිසා ඒවා යට සුවඳ
දුම්ද ඔප්පුකරති. එබැවින් තුඹලාගේ
දූවරු වේශ්‍යාකම් කරති, තුඹලාගේ
යෙහෙළියෝද කාමමිථ්‍යාචාරයකරති.
14 තුඹලාගේ දූවරුන් වේශ්‍යාකම්කරන
නිසාත් තුඹලාගේ යෙහෙළියන්
කාමමිථ්‍යාචාරයකරන නිසාත් මම
ඔවුන්ට දඬුවම් නොකරන්නෙමි;
මක්නිසාද ඔව්හුම වේශ්‍යාවන් සමග
අහක්ව යති, දේවාල වේශ්‍යාවන් සමග
යාගකරති. තේරුම් නැති සෙනඟද
15 හෙළාදමනු ලබන්නෝය. එම්බා
ඉශ්‍රායෙල්, තුඹ වේශ්‍යාකම්කරන නුමුත්
යූද වරද නොකෙරේවා. ගිල්ගල්ට
නොපැමිණෙල්ලා, බෙතාවෙන්ට
නොයල්ලා, ස්වාමීන්වහන්සේ ජීවමාන
බව සැබෑවා සේම කියා නොදිවුරල්ලා.
16 මක්නිසාද ඉශ්‍රායෙල් මුරණ්ඩු එළ-
දෙනෙක් මෙන් මුරණ්ඩුවූවාය. දැන්
ස්වාමීන්වහන්සේ ඔවුන් බැටළුපැටවෙකු
මෙන් විශාල ඉඩමක පෝෂ්‍යාකරනවා
17 ඇත. එප්‍රායිම් දේවරූපවලට බැඳී
18 සිටියි; ඔහු නිකම් සිටියාවේ. ඔව්හු
බීලා තීන්දුවුණාම වේශ්‍යාකම්කරති;
ඇගේ ප්‍රධානියෝ නින්දිතකමට
19 ඇලුම්වන්නෝමය. හුළඟ ඒකේ
පියාපත්වලින් ඇ අසුකරගන ගියේය;
එසේ ඔව්හු තමුන්ගේ පූජාවල් ගැන
ලජ්ජාවන්නෝය.

## ඔවුන්ගේ වරදකාරකම හා දඬුවම ප්‍රකාශකිරීම

5 පූජකයෙනි, මෙය අසාපල්ලා,
ඉශ්‍රායෙල් වංශය, ඇහුම්කන්දියල්ලා,
රාජ වංශය තුඹලාත් කන්යොමුකරපල්ලා;
කුමක් හෙයින්ද තුඹලා මිශ්පායෙහි
මලපතක්ව තාබෝර් උඩ අතුරාපු දැලක්ව
සිටින නිසා මේ විනිශ්චය තුඹලාට
2 විරුද්ධය. විපක්ෂවාදීහු භයානක ලෙස
මරණ සිද්ධකළෝය; නුමුත් මම ඔවුන්
සියල්ලන්ට දඬුවම්කරමි. මම එප්‍රායිම් 3
අඳුනමි, ඉශ්‍රායෙල්ද මාගෙන් සැඟවී
නැත. මක්නිසාද, එප්‍රායිම්, තුඹ දැන්
වේශ්‍යාකම්කර තිබේ, ඉශ්‍රායෙල් අපවිත්‍රවී
සිටියි. තමුන්ගේ දෙවියන්වහන්සේ වෙතට 4
හැරීඑන්ට ඔවුන්ගේ ක්‍රියාවලින් අවකාශ
නොලැබේ. මක්නිසාද වේශ්‍යා ආත්මය
ඔවුන් තුළ තිබේ, ඔව්හු ස්වාමීන්වහන්සේ
නැඳින සිටිති. ඉශ්‍රායෙල්ගේ අහංකාරකම 5
[වූ දේවරූප] ඔහුගේ මුහුණ ඉදිරියෙහිම
සාක්ෂිදෙයි. ඒ නිසා ඉශ්‍රායෙල් සහ
එප්‍රායිම් තමුන්ගේ අයුතුකමෙන් පැකිල
වැටෙන්නෝය; යූදත් ඔවුන් සමග
වැටෙනවා ඇත. ඔව්හු තමුන්ගේ බැටළුවන් 6
සහ ගවයන්ද ඇතුව ස්වාමීන්වහන්සේ
සොයායන්නෝය; නුමුත් උන්වහන්සේ
ඔවුන්ට සම්බවන්නේ නැත. උන්වහන්සේ
ඔවුන්ගෙන් පහව සිටිනසේක. ඔව්හු 7
ස්වාමීන්වහන්සේට විරුද්ධව ද්‍රෝහිකම්-
කළෝය; මක්නිසාද අවජාත දරුවෝ
ඔවුන්ට ඉපදී සිටිති. ඉතින් මාසයකින්
ඔවුන්ද ඔවුන්ගේ කොටස්ද නාස්ති-
වෙනවා ඇත.

ගිබියාහි හොරණෑවක්ද රාමාහි 8
නළාවක්ද පිඹපල්ලා. බෙත්-ආවෙන්හි
ඝෝෂාකරපල්ලා; අහෝ බෙන්යමීන්,
[සතුරා] තුඹ පස්සෙන්ය. දඬුවම්කිරීමේ 9
දවසේදී එප්‍රායිම් පාළුවක් වන්නේය.
සැබවින්ම පැමිණෙන දේ මා විසින්
ඉශ්‍රායෙල් ගෝත්‍ර අතරෙහි දන්වා තිබේ.
යූදහි අධිපතීන් මායිම් කණු වෙනස් 10
කරන්නන් වැනිය. ඔවුන් කෙරෙහි මාගේ
කෝපය ජලය මෙන් වගුරුවන්නෙමි.
එප්‍රායිම් කැමැත්තෙන්ම *හිස්කම පස්සේ 11
ගිය බැවින් ඔහු විනිශ්චයට යටවී
පොඩිවන්නේය. මමද එප්‍රායිම්ට කාවෙකු 12
මෙන්ද යූද වංශයට දිරුම මෙන්ද වෙමි.
එප්‍රායිම් තමාගේ රෝගාතුරකමද යූද 13
තමාගේ තුවාලයද දුටු කල එප්‍රායිම් අෂූර්
ළඟට ගියේය, [යූදද] විරුද්ධකාර රජු
ළඟට පණිවුඩ ඇරියේය. නුමුත් තුඹලාට
සුවකරන්ට ඔහුට බැරිය, ඔහු තුඹලාගේ

*එනම්, දේවරූප

තුවාලය සනීපකරන්නෙත් නැත.
14 මක්නිසාද මම එප්‍රායිම්ට සිංහයෙකු
මෙන්ද, යූද වංශයට තරුණ සිංහයෙකු
මෙන්ය. මම, මමම, ඉරාදමා යන්නෙමි;
ගළවන්ට කිසිවෙකුට ඉඩ නොතබා
15 අල්ලාගන යන්නෙමි. ඔවුන් දඬුවම් විඳ
මාගේ මුහුණ සොයන තුරු, මම මාගේ
ස්ථානයට හැරීයන්නෙමි. ඔවුන්ට විපත
පැමිණෙන විට ඔවුන් ඕනෑකමින් මා
වෙතට එනවා ඇත.

## මතුපිටින්වූ පශ්චාත්තාපය සහ එහි නිෂ්ඵලකම

6 වරෙල්ලා, අපි ස්වාමීන්වහන්සේ
වෙතට හැරීයමු. මක්නිසාද
ඉරාදැමුවේ උන්වහන්සේය, උන්වහන්සේ
අප සුවකරනවා ඇත; පහරදෙන
උන්වහන්සේ අපේ තුවාල බඳිනවා ඇත.
2 දෙදවසකට පසු උන්වහන්සේ අප
ජීවත්කර, අප උන්වහන්සේ ඉදිරියෙහි
ජීවත්වෙන පිණිස තුන්වෙනිද අප
3 නැගුටුවනවා ඇත. එබැවින් ස්වාමීන්-
වහන්සේ ඇඳිනගනිමු, ඇඳිනගන්ට
වීර්යකරමු; උන්වහන්සේගේ උදවීම
පහන්වීම මෙන් ඒකාන්තමය.
උන්වහන්සේ වර්ෂාව මෙන්ද පොළොව
තෙමන අන්තිම වර්ෂාව මෙන්ද අප
ළඟට එනවා ඇත.
4 අහෝ එප්‍රායිම්, මම නුඹට කුමක්
කරම්ද? අහෝ යූද, මම නුඹට කුමක්
කරම්ද? නුඹලාගේ යහපත්කම උදයේ
වලාකුළද ඉක්මනින් පහව යන පිනිද
5 මෙන්ය. එබැවින් ප්‍රොපේතවරුන් ලවා
මම ඔවුන් කැප්පෙවුවෙමි; මාගේ
මුඛයේ වචනවලින් ඔවුන් මරාදැමුවෙමි.
ඔබවහන්සේගේ විනිශ්චයෝද පැතිරෙන
6 එළිය මෙන්ය. මම පූජාවට නොව
කරුණාවටත් දවන පූජාවලට වඩා
දෙවියන්වහන්සේ ඇඳිනගැන්මටත්
7 කැමැත්තෙමි. නුමුත් ඔව්හු *ආදම් මෙන්
ගිවිසුම කඩකළෝය. එහි ඔවුන් මට
8 විරුද්ධව ද්‍රෝහිකම්කළෝය. ගිලියද්
අපරාධකාරයන්ගේ නුවරක්ය, ලේමය
අඩිවලින් එය පිරී තිබේ. කොල්ලකාර 9
සමූදවල් මනුෂ්‍යයෙකු ගැන රැක-
සිටින්නාක්මෙන් පූජක සභාව ෂෙකෙම්ට
යන මාර්ගයෙහි මිනී මරති. එසේය,
ඔවුන් සල්ලාලකම් කර තිබේ. ඉශ්‍රායෙල් 10
වංශය අතරෙහි භයංකර දෙයක් මා
විසින් දක තිබේ. එහි එප්‍රායිම්ගේ
වේශ්‍යාකම ඇත්තේය, ඉශ්‍රායෙල්
අපවිත්‍රවී සිටින්නේය. මම මාගේ 11
සෙනඟගේ වාල්කම පහකරන විට,
එම්බා යූද, නුඹටත් ගොයම් කැපීමක්
පැමිණෙන්ට නියමකර තිබේ.

## ජන ප්‍රධානයන්ගේ දූෂ්‍යවීම. ඔවුන් දෙවියන්වහන්සේ අත්හැර අන්‍යයන්ගේ උපකාර සෙවීම

මා විසින් ඉශ්‍රායෙල්ට සුවකරන්ට 7
කැමතිවූ කල එප්‍රායිම්ගේ අයුතුකමද
සමාරියේ දුෂ්ටකම්ද එළිදරව්වී තිබේ;
මක්නිසාද ඔව්හු බොරුවෙන් ක්‍රියාකරති.
සොරාද ඇතුල්වෙයි, කොල්ලකාර
සමූදව පිටත කොල්ලකති. ඔවුන්ගේ සියලු 2
දුෂ්ටකම් මට මතක තිබෙන බව ඔව්හු
තමුන්ගේ සිත්වලින් කල්පනා නොකරති.
දැන් ඔව්හු තමුන්ගේ ක්‍රියාවලින් වටවී
සිටිති; ඒවා මාගේ මුහුණ ඉදිරිපිට තිබේ.
ඔව්හු තමුන්ගේ දුෂ්ටකමෙන් රජුද 3
තමුන්ගේ බොරුවලින් අධිපතීන්ද
ප්‍රසන්නකරති. ඔවුන් සියල්ලෝම 4
කාමමිථ්‍යාචාරිකයෝය; ඔවුන් රොටි
සාදන්නා විසින් රත්කළ උදුනක් මෙන්ය;
ඔහු එය රත්කිරීමෙන් නවතින්නේ පිටි
ඇනීමේ පටන් ඒවා පිපෙන තුරු
(පමණක්) ය. අපේ රජුගේ දවසේදී 5
අධිපතීහු මුද්‍රිකපානයේ උෂ්ණයෙන්
ලෙඩවූවෝය; ඔහු තමාගේ අත
නින්දකරන්නන් සමග දිගුකෙළේය.
මක්නිසාද ඔව්හු උදුනක් සමාන සිත් 6
ඇතුව තමුන්ගේ ප්‍රයෝගය ඉෂ්ටකිරීමට
ආවෝය. ඔවුන්ගේ රොටි-සාදන්නා මුළු
රාත්‍රියෙහි නිදන්නේය; උදය ගිනිදැලක්
මෙන් ඇවිළෙන්නේය. ඔවුන් සියල්ලෝම 7
උදුනක් මෙන් රත්වී, තමුන්ගේ
විනිශ්චයකාරයන් නාස්තිකරති; ඔවුන්ගේ

*හෙවත්, අද්මාහි මෙන්,

සියලු රජවරු වැටුණෝය. මට අඬ-
ගසන කෙනෙක් ඔවුන් අතරෙහි නැත.
8 එප්‍රායිම් ජනයන් අතරෙහි මිශ්‍රවන්නේය;
එප්‍රායිම් නොපෙරළා පිළිස්සූ රොටියක්ය.
9 විදේශියෝ ඔහුගේ සවිය නාස්තිකළෝය,
නුමුත් ඔහු එය නොදන්නේය. පැසුණු
ඉසකේ ඔහු මතුයෙහි තැනින් තැන තිබේ,
10 නුමුත් ඔහු නොදන්නේය. ඉශ්‍රායෙල්ගේ
පාරට්ටුවවූ දේවරූප ඔහුගේ මුහුණටම
සාක්ෂිදෙයි. මේ සියල්ල මෙසේව තිබෙන
නුමුත්, ඔව්හු තමුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ දෙසට හැරී උන්වහන්සේ
11 නොසෙවුවෝය. එප්‍රායිම් අනුවණ
පරෙවියෙකු මෙන් සිතක් නැතුව
සිටින්නේය. ඔව්හු මිසරයට අඬගසති,
12 අෂූර්ට යති, ඔවුන් යන කල මාගේ දල
ඔවුන් පිට හෙළන්නෙමි; ආකාශ පක්ෂීන්
මෙන් ඔවුන් පහළට අදින්නෙමි. ඔවුන්ගේ
සභාවට දන්වා තිබෙන හැටියට ඔවුන්ට
13 දඬුවම්කරන්නෙමි. ඔවුන් මාගෙන්
පලාගිය නිසා ඔවුන්ට දුක්වේ! ඔවුන්
මට විරුද්ධව කැරළිගැසූ නිසා ඔවුන්ට
විනාශය පැමිණෙන්නේය! මම ඔවුන්
මුදගන්ට කැමතිවීමි, නුමුත් ඔව්හු මට
14 විරුද්ධව බොරු කීවෝය. ඔව්හු
තමුන්ගේ යහන්වලදී කෑගසන විට
තමුන්ගේ සිත්වලින් මට මොර
නොගැසුවෝය. ඔව්හු ධාන්‍යයද මිදියුසද
ගැන රැස්වී, මට විරුද්ධව කැරළිගසති.
15 මමම දනමුතුකම් දී ඔවුන්ගේ හස්තයන්
සවිකළ නුමුත්, ඔව්හු මට විරුද්ධව
16 නපුර යෝජනා කරති. ඔවුන් හැරෙන
නුමුත් මහෝත්තමයාණන් වෙතට
නොවේය; ඔවුන් හොර දුන්නක් මෙන්ය.
ඔවුන්ගේ අධිපතීහු තමුන්ගේ දිව්-
වල අහංකාරකම නිසා කඩුවෙන්
වැටෙන්නෝය. මිසර දේශයේදී මේක
ඔවුන්ට නින්දවක් වන්නේය.

## බොරු රජවරුන් හා බොරු දෙවිවරු

8 හොරණෑව නුඹේ මුඛයට තබාපන්න.
රාජාලියා මෙන් ස්වාමීන්වහන්සේගේ
ගෘහයට විරුද්ධව [සතුරා] එන්නේය.
මක්නිසාද ඔව්හු මාගේ ගිවිසුම
කඩකොට මාගේ ව්‍යවස්ථාවට විරුද්ධව
කැරළිගැසුවෝය. මාගේ දෙවියන්වහන්ස, 2
ඉශ්‍රායෙල් වන අපි ඔබ අඳුනමුව කියා
ඔවුන් මට මොරගසනවා ඇත. ඉශ්‍රායෙල් 3
වනාහි යහපත එපාකෙළේය. සතුරා
ඔහු පස්සේ එළවාගනයනවා ඇත. ඔව්හු 4
මාගේ කැමැත්ත නැතුව රජවරුන්ද
මා විසින් පිළි නොගත් අධිපතීන්ද
පත්කරගත්තෝය. ඔව්හු සිඳදමනු ලබන
ලෙස තමුන්ගේ රන් රිදීවලින් දේවරූප
සාදගත්තෝය. එම්බා සමාරිය, නුඹේ 5
වස්සා මට පිළිකුලක්ය; මාගේ උදහස
ඔවුන්ට විරුද්ධව ඇවිළී තිබේ. ඔවුන්
නිදෙස් බවට පැමිණෙන්ට කොපමණ
කල් යනවා ඇද්ද? මක්නිසාද මේකත් 6
ඉශ්‍රායෙල්වරුන්ගෙන්ය; ඒක සෑදුවේ
කම්කරුවෙක්ය, ඒක දෙවියන්වහන්සේ
නොවේ. එසේය, සමාරියේ වස්සා
කැබෙලිකරනු ලබන්නේය. ඔව්හු හුළඟ 7
වපුරා, සුළිහුළඟ කපාගන්නෝය. ඔවුන්ට
ගොයම් නැත; කොළවල කරල් නැත;
තිබුණත්, අන්‍ය දේශීන් ඒවා ගිලගන්නවා
ඇත. ඉශ්‍රායෙල් ගිලිනු ලැබීය. දන් ඔව්හු 8
ජාතීන් අතරෙහි අප්‍රියවූ භාජනයකට
සමානව සිටිති. මක්නිසාද ඔව්හු තනියම 9
සිටින වල් කොටළුවෙකු මෙන් අෂූර්ට
ගියෝය. එප්‍රායිම් ප්‍රේමවන්තයන් කුලියට
ගත්තේය. එසේය, ඔවුන් ජාතීන් අතරෙන් 10
ඔවුන් කුලියට ගන්න නුමුත්, මමත් *ඔවුන්
රැස්කරන්නෙමි; එවිට †ඔව්හු රජුගේද
අධිපතීන්ගේද බර නිසා පිරිහෙන්ට
පටන්ගනිති. පව් කිරීම පිණිස එප්‍රායිම් 11
පූජාසන වැඩිකරගත් බැවින් පූජාසන
ඔහුට පව්කරන පිණිස විය. මා විසින් 12
මාගේ ව්‍යවස්ථාවේ කාරණා ඔහු උදෙසා
දසදහස් ගණනකින් ලියනත්, ඒවා අන්‍ය
කාරණයක් කොට සලකනු ලබන්නේය.
මට ඔප්පු කරන පූජාවල් ලෙස ඔව්හු 13
මස් පූජා කොට කති; එහෙත් ස්වාමීන්-
වහන්සේ ඔවුන් පිළි නොගන්නාසේක.
උන්වහන්සේ දන් ඔවුන්ගේ අයුතුකම
සිහිකොට, ඔවුන්ගේ පාපවලට දඬුවම්කරන-

*එනම්, ජාතීන්.
†එනම්, ඉශ්‍රායෙල්වරු.

සේක; ඔවුන් මිසරයට හැරීයනවා ඇත.
14 තවද ඉශ්‍රායෙල් තමාගේ මැවුම්කාරයා
මතකනැතිකොට, මාළිගා ගොඩනගාගන
සිටී; යූදද බලකොටු නුවරවල්
වැඩිකරගන සිටී. නුමුත් මම ඔහුගේ
නුවරවලට ගින්නක් යවන්නෙමි, එයින්
එහි මාළිගා දලායනවා ඇත.

## පැමිණෙන්ට තිබෙන පිටවහල්වීමේ එල

9 එම්බා ඉශ්‍රායෙල්, ජාතීන් මෙන්
අධිකලෙස ප්‍රීති නොවන්න; මක්-
නිසාද නුඹේ දෙවියන්වහන්සේගෙන්
නුඹ වේශ්‍යාලෙස අහක්වුණෙහිය, නුඹ
සියලු කමත්වල පණයම් ලබන්ට
2 ආශාවූයෙහිය. පාවරෙන්වත් මිදි
පැසෙන්වත් ඔව්හු පෝෂ්‍ය නොවන්නෝය,
3 මිදියුසද එහි නොවන්නේය. ඔවුන්ට
**ස්වාමීන්වහන්සේගේ** දේශයෙහි වසන්ට
නොලැබේ; එප්‍රායිම් මිසරයට හැරී
යන්නේය, අෂූර්හිත් ඔවුන් අපවිත්‍ර ආහාර
4 කනවා ඇත. ඔවුන් මුද්‍රිකපානය **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි වගුරුවන්නේවත්
ඔවුන්ගේ පූජාවලට උන්වහන්සේ
ප්‍රසන්නවන්නේවත් නැත. ඒවා ඔවුන්ට
ශෝකයේ ආහාර මෙන් වන්නේය; ඒවා
කන සියල්ලෝම අපවිත්‍රවන්නෝය.
මක්නිසාද ඔවුන්ගේ කෑම ඔවුන්ගේ
බඩගින්න නිසා පමණක්ය; ඒවා **ස්වාමීන්-**
**වහන්සේගේ** ගෘහයට නොපැමිණෙන්නේය.
5 නියම රැස්වීමේ දවසේදීත් **ස්වාමීන්-**
**වහන්සේගේ** මංගල්‍ය දවසේදීත් නුඹලා
6 මක්කරනවාද? මක්නිසාද ඔව්හු
විනාශය වෙතින් ඉවත්ව ගියෝය, නුමුත්
මිසරය ඔවුන් එකතුකරගන්නේය,
මෙම්පිස්හි ඔව්හු වළලනු ලබන්නෝය.
ඔවුන්ගේ ප්‍රියවූ රිදී බඩු කහඹිලියාවලට
හිමිවන්නේය. ගොකටුද ඔවුන්ගේ
7 කූඩාරම්වල හැදෙන්නේය. දඬුවම්කිරීමේ
දවස් පැමිණ තිබේ, ප්‍රතිඵල දීමේ දවස්
පැමිණ තිබේ; ඉශ්‍රායෙල් ඒක දැනගන්නවා
ඇත. ප්‍රොපේත තෙම අඥනයෙක්ය,
ආත්මය ඇති මනුෂ්‍යයා උමතු කෙනෙක්ය.
(මෙසේ වන්නේ) නුඹේ අයුතුකමේ
මහත්කමද එදිරිකාරකමේ අධිකකමද
නිසාය. එප්‍රායිම් මාගේ දෙවියන්වහන්සේ 8
වෙත රැකවලෙක් විය. ප්‍රොපේත තෙම
තමාගේ සියලු මාර්ගවල පක්ෂි වැද්දගේ
මලපතක්ව, තමාගේ දෙවියන්වහන්සේගේ
ගෘහයෙහි එදිරිකාරකමක්ව සිටින්නේය.
ගිබියාහි දවස්වලදී මෙන් ඔව්හු 9
අධිකලෙස තමුන්ම දූෂ්‍යකරගත්තෝය.
උන්වහන්සේ ඔවුන්ගේ අයුතුකම සිහිකර,
ඔවුන්ගේ පාපවලට දඬුවම්කරනසේක.

## සෙනග දූෂ්‍යවීමෙන් වන්නාවූ විනාශය

කාන්තාරයෙහි මුද්‍රිකඵල මෙන් 10
ඉශ්‍රායෙල් මට සම්බවිය; අත්තික්කා
ගසේ පළමු සෘතුවේ නාඹුල් එල මෙන්
නුඹලාගේ පියවරුන් දුටිමි. නුමුත් ඔව්හු
බාල්-පෙයෝර්ට අවුත්, *නින්දිතයාට
කැපවී, තමුන්ගේ ඒ ප්‍රේමවන්තයා
මෙන් පිළිකුල්වූවෝය. ඉපදීමක්වත් 11
ගැබ්ගැනීමක්වත් පිළිසිඳීමක්වත් නොවන
හැටියට එප්‍රායිම්ගේ තේජස කුරුල්ලෙකු
මෙන් ඉගිලීයන්නේය. ඔවුන් දරුවන් 12
ඇතිකරතත් මනුෂ්‍යයෙක් නොසිටින
හැටියට ඔවුන් තුරන්කරන්නෙමි. එසේය,
මා විසින් ඔවුන් අත්හැර යන කල
ඔවුන්ට දුක්වේ! මා දුටු ලෙස තීර් මෙන් 13
එප්‍රායිම් ප්‍රසන්න තැනක පිහිටා තිබේ.
එහෙත් එප්‍රායිම් තමාගේ දරුවන්
මිනීමරන්නා ළඟට පිටතට ගෙනෙන්නේය.
**ස්වාමීන්වහන්ස**, ඔවුන්ට [ප්‍රතිඵල] 14
දුන මැනව. ඔබ කුමක් දෙනසේක්ද?
ගස්සාවන ගර්භයක්ද කිරි නැති තනද
ඔවුන්ට දුන මැනව. ඔවුන්ගේ සියලු 15
දුෂ්ටකම් ගිල්ගල්හි ඇත්තේය; මම ඔවුන්ට
එහිදී ද්වේෂකෙළෙමි. ඔවුන්ගේ ක්‍රියාවල
දුෂ්ටකම නිසා මාගේ ගෘහයෙන් ඔවුන්
පන්නාදමන්නෙමි. ඔවුන්ට තවත් ප්‍රේම
නොකරන්නෙමි; ඔවුන්ගේ සියලු අධිපතීහු
කැරළිකාරයෝය. එප්‍රායිම් පහර ලැබ 16
සිටින්නේය, ඔවුන්ගේ මුල වියළී ගියේය,

*එනම්, බාල් දේවතාවාට.

ඔව්හු ඵල නොදරන්නෝය. එසේය, ඔවුන්
වැදුවත් මම ඔවුන්ගේ ගර්භයේ ප්‍රිය
17 ඵල නසන්නෙමි. ඔවුන් මාගේ දෙවියන්-
වහන්සේට කීකරු නුණ නිසා
උන්වහන්සේ ඔවුන් පහකරදමනසේක.
ඔවුන් අන්‍ය ජාතීන් අතරෙහි මුළාවූ
අය වන්නෝය.

## ඉශ්‍රායෙල්ගේ ඵල නැතිකම, බොරුකාරකම සහ දුෂ්ටභාවය. ඒවාට දඬුවම

10 ඉශ්‍රායෙල් විහිදීයන්නාවූ, ඵල
දරන මිදිවැලක්ය. තමාගේ ඵල
වැඩිවූ පමණට ඔහු පූජාසන වැඩි
කෙළේය: ඔහුගේ දේශයේ සාර භාවය
හැටියට ඔව්හු අලංකාරවූ රූපස්තම්භ
2 සෑදුවෝය. ඔවුන්ගේ සිත බෙදී තිබේ:
දැන් ඔවුන් අච්චුවිදිනවා ඇත.
උන්වහන්සේම ඔවුන්ගේ පූජාසන
පෙරළාදමා, ඔවුන්ගේ රූපස්තම්භ
3 නාස්තිකරනසේක. සැබවින් ඔව්හු දැන්
කථාකොට: අපට රජෙක් නැත.
මක්නිසාද අපි **ස්වාමීන්වහන්සේ**
කෙරෙහි භය නැත්තෙමුව: රජු අපට
4 මක්කරනවා ඇද්දැයි කියන්නෝය. ඔව්හු
බොරුවට දිවුරා ගිවිසුමක් කරමින්.
නිෂ්ඵල වචන කියති. එබැවින් විනිශ්චයද
කෙතේ හීවිටිවල හටගන්න කොසඹ
5 මෙන් හටගනියි. සමාරියේ වැසියෝ
බෙත්-ආවෙන්හි වස්සන් නිසා භයින්
සිටින්නෝය. මක්නිසාද උගේ සෙනඟ
ඌ ගැන වැළපෙන්නෝය, උගේ තේජස
උගෙන් පහවගිය බැවින් උගේ
6 කපුවෝ ඌ ගැන වෙවුලන්නෝය. ඌද
විරුද්ධකාර රජුට තෑග්ගක් පිණිස
අෂූර්ට ගෙනයනු ලබන්නේය. එප්‍රායිම්
ලජ්ජාවට අසුවන්නේය, ඉශ්‍රායෙල්ද
තමාගේ මන්ත්‍රණය ගැන ලජ්ජාවන්නේය.
7 සමාරියේ රජ වනාහි සිඳිනලද්දේය, ඔහු
ජලය මතුපිට තිබෙන පතුරක් මෙන්ය.
8 ඉශ්‍රායෙල්ගේ පාපය වන ආවෙන්හි
උස්තැන්ද නාස්තිවෙයි. කටු සහ ගොකටු
ඔවුන්ගේ පූජාසනවල හටගන්නවා ඇත.
ඔවුන්: අප වසාගනිල්ලායයි කඳුවලටත්.
අප පිටට වැටියල්ලායයි හෙල්වලටත්
කියනවා ඇත. අහෝ ඉශ්‍රායෙල්, නුඹ 9
ගිබියාහි දවස්වල පටන් පව්කෙළෙහිය.
එහි ඔව්හු නැවතී සිටිති; දුෂ්ටකමේ
පුත්‍රයන්ට විරුද්ධව පැමිණෙන යුද්ධයට
ඔව්හු ගිබියාහිදී අසුනොවන්නෝද?
ඔවුන්ට අච්චුකරන්ට මාගේ කැමැත්තක් 10
තිබේ; ඔවුන් තමුන්ගේ අපරාධ දෙකට
බැඳී සිටින කල ජනයෝ ඔවුන්ට
විරුද්ධව රැස්කරනු ලබන්නෝය. එප්‍රායිම් 11
පුරුදුවූ. මැඩීමට කැමතිවූ එළනැම්-
බියක්ය: එහෙත් මමම ඇගේ ශෝභන
බෙල්ල පිටට පැමිණ සිටිමි. එප්‍රායිම්
පිට දක්කන්නෙකු හිඳුවන්නෙමි: යූද
හාන්නේය, යාකොබ් බිම
සමතලාකරන්නේය. ධර්මිෂ්ඨකම පිණිස 12
වපුරාගන, කරුණාවේ හැටියට
කපාගනිල්ලා: පුරන් බිම කොටාගනිල්ලා.
**ස්වාමීන්වහන්සේ** ඇවිත් නුඹලාට
ධර්මිෂ්ඨකම වස්වන තුරු, දැන් උන්-
වහන්සේ සොයන්ට කාලයය. නුඹලා 13
දුෂ්ටකම හෑවහුය, අයුතුකම කපාගත්තහුය;
බොරුවල ප්‍රතිඵල කෑවහුය. මක්නිසාද
නුඹ නුඹේ මාර්ගයත් නුඹේ බලවතුන්
රාශියත් කෙරෙහි විශ්වාස කෙළෙහිය.
එබැවින් නුඹේ සෙනඟ අතර ඝෝෂාවක් 14
හටගන්නවා ඇත. මෑණියන් ඇගේ
දරුවන් සමග පොඩිකරනු ලැබූ යුද්ධ
දවසේදී ෂල්මාන් විසින් බෙත්-අර්බේල්
නාස්තිකළ ලෙස නුඹේ සියලු බලකොටු
නාස්තිකරනු ලබනවා ඇත. නුඹලාගේ 15
මහත් නපුරුකම නිසා බෙතෙල් නුඹලාට
එසේ කරන්නේය. අලුයම් වේලෙහි
ඉශ්‍රායෙල් රජ සහමුලින්ම සිඳිනු
ලබන්නේය.

## දෙවියන්වහන්සේගේ පියකම හා දයාබරකම

11 ඉශ්‍රායෙල් බාලව සිටි කල මම
ඔහුට ප්‍රේමකොට. මාගේ පුත්‍රයාවූ
ඔහු මිසරයෙන් කැඳවාගතිමි. *ඔවුන් 2
කැඳවූ පමණටම ඔව්හු ඔවුන් වෙතින්

*එනම්–අනාගතවක්තෘවරුන් ආදිවූ දේව සේවකයෝ.

ඉවත්ව ගියෝය. ඔව්හු බාල් දේවතාවුන්ට
යාගකළෝය, කැපූරූපවලට සුවඳ දුම්
3 ඔප්පුකළෝය. එහෙත් මම එප්‍රායිම්ට
ඇවිදින්ට ඉගැන්වීමි; මාගේ අත්වලින්
ඔවුන් වඩාගතිමි; එහෙත් ඔවුන්ට
සුවකළේ මා බව ඔව්හු නොදැන
4 සිටියෝය. මනුෂ්‍ය ලනුවලින්ද ප්‍රේමයේ
බැඳුම්වලින්ද ඔවුන් ඇදගතිමි; ඔවුන්ගේ
කම්මුල් පිට තිබුණු වියගහ උස්සන්නන්
මෙන් මම ඔවුන් උදෙසා සිට, ඔවුන්
5 ඉදිරියෙහි කෑම තැබීමි. ඔහු මිසර
දේශයට හැරී නොයන්නේය; එහෙත්
ඔවුන් හැරීඑන්ට අකමැතිවූ නිසා අෂූරියයා
6 ඔහුගේ රජ වන්නේය. ඔවුන්ගේ මන්ත්‍රණ
නිසා කඩුව ඔහුගේ නුවරවල් පිටට
පැමිණ, ඔහුගේ පොලු විනාශකොට,
7 ඔවුන් නාස්තිකරන්නේය. මාගේ සෙනඟ
මා කෙරෙන් පසුබටවීමට ඇලුම්ව සිටිති.
උසස් තැන්හි වසන තැනන්වහන්සේ
වෙතට එන්ට ඔවුන් කැඳවන නුමුත්,
කිසිවෙක් උන්වහන්සේව උසස්
8 නොකරන්නේය. එප්‍රායිම්, මම කෙසේ
නුඹ අත්හරින්නෙම්ද? ඉශ්‍රායෙල්, නුඹ
කෙසේ පාවාදෙන්නෙම්ද? කෙසේ අද්මාට
මෙන් නුඹට කරන්නෙම්ද? කෙසේ නුඹව
ශෙබොයිම්ට සමකරන්නෙම්ද? මාගේ
සිත මා තුළ හැරී, මාගේ අනුකම්පාව
9 මුළුමනින්ම ඇවිළී තිබේ. මාගේ බලවත්
උදහස ඉෂ්ට නොකරන්නෙමි, එප්‍රායිම්
නැවත විනාශ නොකරන්නෙමි.
මක්නිසාද මම මනුෂ්‍යයෙක් නොව
දෙවියන්වහන්සේය; නුඹලා අතරෙහි
10 සිටින ශුද්ධ තැනන්වහන්සේය. මම
නුවරට ඇතුල් නොවන්නෙමි. **ස්වාමීන්-
වහන්සේ** සිංහයෙකු මෙන් ගොරවන
කල, ඔව්හු උන්වහන්සේ පස්සේ
යන්නෝය. මක්නිසාද උන්වහන්සේ
ගොරවනසේක, දරුවෝද වෙවුලමින්
11 බස්නාහිර සිට එන්නෝය. ඔව්හු ගේ
කුරුල්ලෙකු මෙන් මිසරයෙන්ද
පරෙවියෙකු මෙන් අෂූර් දේශයෙන්ද
වෙවුලමින් එන්නෝය. මම ඔවුන්ගේ
ගෙවල්වල ඔවුන් වාසයකරවන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## ජාතියේ වංක භාවය හා වෙළඳ ප්‍රයෝග

එප්‍රායිම් බොරුවද ඉශ්‍රායෙල් වංශය 12
වංචාවද ඇතුව මා වටකරගන සිටිති;
එහෙත් යූද දෙවියන්වහන්සේ එනම්
විශ්වාසවූ ශුද්ධ තැනන්වහන්සේ කෙරෙහි
තවම අස්ථිරව සිටියි. එප්‍රායිම් සුළං
12
කන්නේය, පෙරදිග සුළං පස්සේද
එළවාගන යන්නේය. ඔහු බොරු සහ
බලාත්කාරකම නිරතුරුම වැඩිකරන්නේය;
ඔව්හු අෂූර් සමග ගිවිසුමක් කරති,
මිසරයට තෙල් ගෙන යති. ඒ නිසා 2
යූදට විරුද්ධව **ස්වාමීන්වහන්සේට**
පැමිණිල්ලක් ඇත්තේය, උන්වහන්සේ
යාකොබ්ට ඔහුගේ මාර්ගවල හැටියට
දඬුවම්කරනසේක; ඔහුගේ ක්‍රියාවල
හැටියට ඔහුට විපාක දෙනසේක.
ගර්භයේදී ඔහු තමාගේ සහෝදරයාගේ 3
විලුඹ අල්වාගත්තේය; පුරුෂ වයසේදී
ඔහු දෙවියන්වහන්සේ වෙත බලපෑවේය.
එසේය, ඔහු දේව දූතයා කෙරෙහි 4
බලපාමින් ජයගත්තේය. ඔහු අඬා
උන්වහන්සේට කන්නලව්කෙළේය.
බෙතෙල්හිදී උන්වහන්සේ ඔහුට සම්බවිය.
එහිදී උන්වහන්සේ එනම්, **යෙහෝවා** 5
යන ස්මෘති නාමය ඇති සේනාවල
දෙවිවූ **ස්වාමීන්වහන්සේ**, අප සමග
කථාකළසේක. එබැවින් නුඹ නුඹේ 6
දෙවියන්වහන්සේ වෙතට හැරී,
කරුණාවද විනිශ්චයද පවත්වා, නුඹේ
දෙවියන්වහන්සේ ගැන නිතරම
බලාසිටපන්න.
වෙළෙන්දෙක් වන ඔහුගේ අතේ හොර 7
තරාදි තිබේ. ඔහු ප්‍රයෝගකරන්ට
කැමතිය. නුමුත් එප්‍රායිම් කථාකොට: 8
සැබවින් මම පොහොසත්වී සිටිමි,
සම්පත් ලබාගන සිටිමි. මාගේ සියලු
වැඩ අතරේ පාපයවූ අයුතුකමක් මට
තිබෙන බව ඔවුන්ට සම්බ නොවන්නේ-
යයි කීය. එහෙත් මිසර දේශයේ පටන් 9
මම නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේය**;
මංගල්‍ය දවස්වලදී මෙන් මත්තටත් නුඹ
කූඩාරම්වල වාසයකරවන්නෙමි. ඇරත් 10

මම ප්‍රොපේතවරුන්ට කථාකොට, මමම
බොහෝ දර්ශන පෙන්වා, ප්‍රොපේතවරුන්
කරණකොටගෙන උපමා භාවිතා-
11 කෙළෙමි. *ගිලියද් අයුතුකමද? ඔව්හු
සහමුලින්ම නිෂ්ඵලකමය; ඔව්හු
ගිල්ගල්හිදී ගොනුන් පූජාකරති. එසේය,
ඔවුන්ගේ පූජාසනද කෙතේ හීව්ටි
පිට තිබෙන ගල්ගොඩවල් මෙන්ය.
12 යාකොබ් අරාම් රටට පලාගියේය,
ඉශ්‍රායෙල්ද භාර්යාවක් සඳහා වැඩකර,
භාර්යාවක් සඳහා බැටළුවන් බලාගත්තේය.
13 ප්‍රොපේතවරයෙකු ලවා **ස්වාමීන්-**
**වහන්සේ** ඉශ්‍රායෙල් මිසරයෙන් ගෙන්වූ-
සේක, ප්‍රොපේතවරයෙකු ලවා ඔව්හු
14 ආරක්ෂාකරනු ලැබුවෝය. එප්‍රායිම්
විසින් තද ලෙසම කෝප උපදවා තිබේ.
එබැවින් ඔහුගේ **ස්වාමීන්වහන්සේ**
ඔහුගේ ලේ ඔහු පිටට පැමිණෙන්ට ඉඩ
ඇර, ඔහුගේ නින්දිතකම ඔහු පිටට
පමුණුවනවා ඇත.

## ඉශ්‍රායෙල් කෙරෙහි වූ අන්තිම විනිශ්චය

**13** එප්‍රායිම් කථාකළ විට වෙවුලුමක්
විය; ඔහු ඉශ්‍රායෙල් අතරෙහි
උසස්වුණේය. නුමුත් ඔහු බාල්
කරණකොටගෙන වරදකර නැසුණේය.
2 දැන් ඔවුන් තව තව පව්කරමින්, පිළිම
වන දේවරූප තමුන්ගේ ඥානයේ හැටියට
තමුන්ගේ රිදීවලින් සාදගන තිබේ, ඒ
සියල්ල කම්කරුවාගේ වැඩය. පූජා කරන
මනුෂ්‍යයෝ වස්සන් සිඹගනිත්වයි ඔව්හු
3 ඒවා ගැන කියති. එබැවින් ඔව්හු උදයේ
වලාකුළ මෙන්ද ඉක්මනින් පහවයන
පිනි මෙන්ද සුළිහුළඟ කරණකොටගෙන
කමතෙන් ගසාගෙනයන බොල් මෙන්ද
දුම් කවුළුවෙන් යන දුම මෙන්ද
4 වන්නෝය. නුමුත් මම මිසර දේශයේ
පටන් නුඹේ දෙවිවූ **ස්වාමීන්වහන්සේව**
සිටිමි; මා ඇර අන්‍ය දෙවිකෙනෙකු
ඇඳින නොගනින්න, මා ඇර වෙන
ගැළවුම්කාරයෙක් නැත. මම වනාහි 5
නිරුදක දේශයක් වන කාන්තාරයේදී
නුඹ ඇඳින්නෙමි. ඔවුන්ගේ ගොදුරු-බිම් 6
ප්‍රකාරයට ඔව්හු තෘප්තියට පැමිණියෝය;
තෘප්තියට පැමිණි විට ඔවුන්ගේ සිත
උඩඟුවිය. එබැවින් ඔව්හු මා මතක-
නැතිකළෝය. මමද ඔවුන්ට සිංහයෙකු 7
මෙන් වෙමි. මඟ අසල දිවියෙකු
මෙන් බලාසිටිමි. පැටවුන් නැතිවුණු 8
වැලහින්නියක් මෙන් මම ඔවුන්ට
විරුද්ධව පැමිණ, ඔවුන්ගේ හෘදයේ
අතුණුවැටිය ඉරන්නෙමි. එහිදී සිංහයෙකු
මෙන් ඔවුන් නාස්තිකරන්නෙමි; වල්
මෘගයා ඔවුන් ඉරාදමන්නේය. අනේ 9
ඉශ්‍රායෙල්, නුඹ විනාශයට පැමිණ
සිටින්නේ නුඹේ ආධාරකාරයා වන මට
විරුද්ධව සිටීමෙන්ය. ඉතින් නුඹේ රජ 10
කොතනද? ඔහු නුඹේ සියලු නුවරවලදී
නුඹ ගළවාවා. නුඹේ විනිශ්චයකාරයෝ
(කොතනද)? මක්නිසාද: මට රජෙකු
සහ අධිපතීන් දුන මැනවයි නුඹ
කීයෙහිය. මාගේ උදහසින් නුඹට රජෙකු 11
දුන්නෙමි, මාගේ කෝපයෙන් ඔහු
පහකෙළෙමි. එප්‍රායිම්ගේ අපරාධය බැඳ 12
තබා තිබේ; ඔහුගේ පාපය නිදන්කර
තිබේ. වදන ස්ත්‍රියෙකුගේ රුජා ඔහුට 13
පැමිණෙනවා ඇත. ඔහු ප්‍රඥව නැති
පුත්‍රයෙක්ය: මක්නිසාද ඔහු ගර්භාග්‍රයෙහි
නොසිටීමෙන් බිහිවන්ට ප්‍රමාදවන්නේය.
මම ඔවුන් මිනීවළේ බලයෙන් 14
නිදහස්කරන්නෙමි; ඔවුන් මරණයෙන්
මුදගන්නෙමි. එම්බා මරණය, නුඹේ
වසංගත කොතැනද? එම්බා මිනීවළ,
නුඹේ විනාශය කොතැනද? පසුතැවිල්ල
මාගේ ඇස්වලින් සැඟවී තිබෙයි. ඔහු 15
සහෝදරයින් අතරේ සඵලව සිටින නුමුත්,
පෙරදිග හුළඟක් වන **ස්වාමීන්වහන්සේගේ**
හුස්ම කාන්තාරයෙන් නැඟී ඇවිත්, ඔහුගේ
උල්පත හිඳීයන්නේය, ඔහුගේ ළිඳද
වියළීයනවා ඇත. ඒ අය සියලු ප්‍රිය
භාජන වන වස්තු කොල්ලකනවා ඇත.
සමාරිය ස්වකීය දෙවියන්වහන්සේට 16
විරුද්ධව කැරළිගැසූ නිසා අව්වූ

*නොහොත්, ගිලියද්හි ඔවුන් අයුතුකම් කර තිබේ.

ලබන්නීය. ඔව්හු කඩුවෙන් වැටෙන්නෝය;
ඔවුන්ගේ ළදරුවෝ බිම ගසා මරනු
ලබන්නෝය, ඔවුන්ගේ ගර්භිණීන්ද
ඉරාදමනු ලබනවා ඇත.

## පශ්චාත්තාපවීමට ආරාධනාව. සම්පූර්ණ මිදීම ගැන දයාවත් පොරොන්දුව

14 ඉශ්‍රායෙල්, නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ වෙතට හැරී වරෙන්න;
මක්නිසාද නුඹේ අයුතුකම නිසා නුඹ
2 වැටී ඉන්නෙහිය. නුඹලා වචන රැගෙන
ස්වාමීන්වහන්සේ වෙතට හැරී ඇවිත්,
උන්වහන්සේට කථාකොට: අපේ සියලුම
අපරාධවලට කමාවී, කරුණාවෙන් අප
පිළිගත මැනව. එවිට අපේ තොල්වල
පූජා ගොනුන් පූජාකරන්නාක්මෙන් ඔප්පු
3 කරන්නෙමුව. අෂූර් අප නොගළවන්නේය;
අපි අසුන් පිට නැගී නොයන්නෙමුව.
නුඹලා අපේ දෙවිවරුයයි අපේ අතින්
සෑදූ දේට අපි තවත් නොකියන්නෙමුව.
මක්නිසාද පියා නැත්තාට ඔබගෙන්
4 අනුකම්පාව ලැබේයයි කියාපල්ලා. මම
ඔවුන්ගේ පසුබටවීම සුවකර, සිය
කැමැත්තෙන්ම ඔවුන්ට ආදරේවන්නෙමි.
මක්නිසාද මාගේ උදහස ඔවුන්
කෙරෙන් පහවගියේය. මම ඉශ්‍රායෙල්ට 5
පිනි මෙන් වන්නෙමි. ඔහු මානෙල් මෙන්
මල් දරන්නේය, ලෙබනොන් මෙන් මුල්
අදින්නේය. ඔහුගේ අතු පැතිරී ගොස්, 6
ඔහුගේ අලංකාරය ඔලීව ගස මෙන්ද
ඔහුගේ සුවඳ ලෙබනොන් මෙන්ද
වන්නේය. ඔහුගේ සෙවණෙහි වසන්නෝ 7
හැරීඑන්නෝය; ඔව්හු ගොයම මෙන්
නැවත ප්‍රාණවත්වී, මුද්‍රිකවැල මෙන්
දළුදමන්නෝය. එහි සුවඳ ලෙබනොන්හි
මුද්‍රිකපානය මෙන් වන්නේය. එප්‍රායිම්ද: 8
දේවරූපවලින් මට තවත් කම් මොකදැයි
කියනවා ඇත. මමම ඔහුට
උත්තරදුනිමි, ඔහු සලකන්නෙමි. මම
වනාහි කොළ නොවේලෙන දේවදර
ගසක් මෙන්ය: නුඹේ එල ලැබී තිබෙන්නේ
මාගෙන්ය. මේවා තේරුම්ගැනීමට 9
ප්‍රඥාවන්තව, මේවා දැනගැනීමට
බුද්ධිමත්ව සිටින්නේ කවුද? මක්නිසාද
ස්වාමීන්වහන්සේගේ මාර්ග හරිය,
ධර්මිෂ්ඨයෝ එහි ඇවිදින්නෝය; නුමුත්
අපරාධකාරයෝ එහිදී වැටෙන්නාහුය.

# අනාගතවක්තෘවූ යෝවෙල්ගේ පොත

## පළඟැටියන්ගෙන් වූ නාස්තිය. පසුතැවිලිවීමට කැඳවීම

1 පෙතුයෙල්ගේ පුත්‍රවූ යෝවෙල්
වෙතට පැමිණි **ස්වාමීන්වහන්සේගේ**
වචනයය.
2 මහල්ලෙනි, මේක අසාපල්ලා, දේශයේ
සියලුම වැසියෙනි, කන් යොමුකරපල්ලා.
තුඹලාගේ දවස්වල හෝ තුඹලාගේ
පියවරුන්ගේ දවස්වල හෝ මෙබඳු
3 දෙයක් සිද්ධවීද? තුඹලාගේ දරුවන්ට
ඒ ගැන කියාදීපල්ලා, තුඹලාගේ දරුවෝ
තමුන්ගේ දරුවන්ටත් ඔවුන්ගේ දරුවෝ
තවත් පරම්පරාවකටත් කියාදෙත්වා.
4 පළඟැටි පණුවන් ඉතිරිකළ ඒවා පළ-
ඟැටියෝ කෑවෝය; පළඟැටියන් ඉතිරිකළ
ඒවා කෙඳි-පළඟැටියෝ කෑවෝය; කෙඳි-
පළඟැටියන් ඉතිරිකළ ඒවා කපන-
5 පළඟැටියෝ කෑවෝය. සුරාසොඬුනි,
පිබිද අඬාපල්ලා; මුද්‍රිකපානය බොන
සියල්ලෙනි, මිදියුස තුඹලාගේ මුඛවලින්
පහවුණු නිසා ඒ ගැන කෑමොර-
6 ගසාපල්ලා. මක්නිසාද බලවත්වූ
ගණනාවක් නැති ජාතියක් මාගේ
දේශයට නැගී ආවෝය; උන්ගේ දත්
සිංහ දත්ය, සිංහ ධේනුවෙකුගේ දළ
7 දත්ද උන්ට තිබේ. උන් මාගේ මිදිවැල
පාළුකොට, මාගේ අත්තික්කා ගහ
කඩාදමා, එහි පොතු ගළවා හෙළා-
දමුවෝය; එහි අතුද සුදුවී තිබේ.
8 තරුණ වයසේ පුරුෂයා නිසා ගෝණි
රෙදි ඇඳ සිටින කන්‍යාවක් මෙන්
9 වැලපියන්න. ආහාර පූජාවද පාන
පූජාවද **ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙන්
පහවගියේය; **ස්වාමීන්වහන්සේගේ**
මෙහෙකරුවූ පූජකයෝ වැලපෙන්නෝය.
කෙත් නාස්තිවී තිබේ, දේශය වැලපෙයි; 10
මක්නිසාද ගොයම් නාස්තිවී, මිදියුස
සිඳී, තෙල් හීනවී තිබේ. ගොවියෙනි, 11
තිරිඟු සහ යව ගැන ලජ්ජාවෙයල්ලා,
මිදිවතුකාරයෙනි, කෑමොරගසාපල්ලා;
මක්නිසාද කෙතේ අස්වැන්න නාස්තිවිය.
මිදිවැල වියළී, අත්තික්කා ගස මැලවී, 12
දෙළුම් ගසද තල් ගසද ජම්බු ගසද
යනාදිවූ කෙතේ සියලුම ගස් වියළී
තිබේ. මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයන්ගෙන්
ප්‍රීතිය පහවගියේය. පූජකයෙනි, ගෝණි 13
රෙදි ඔතාගෙන විලාප කියාපල්ලා;
පූජාසනයේ සේවකයෙනි, කෑමොර-
ගසාපල්ලා; මාගේ දෙවියන්වහන්සේගේ
සේවකයෙනි, ඇවිත් ගෝණි රෙදි
පෙරවාගෙන මුළු රාත්‍රියෙහි වැතිර ඉඳිල්ලා.
මක්නිසාද ආහාර පූජාවද පාන
පූජාවද තුඹලාගේ දෙවියන්වහන්සේගේ
ගෘහයට නොපැමිණෙන්නේය. ශුද්ධවූ 14
උපවාසයක්ද රැස්වීමක්ද ප්‍රසිද්ධකර,
තුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයට වැඩිමහල්ලන්ද දේශයේ සියලුම
වැසියන්ද රැස්කර, **ස්වාමීන්වහන්සේට**
මොරගසාපල්ලා. අහෝ ඒ දවසේ හැටි! 15
මක්නිසාද **ස්වාමීන්වහන්සේගේ** දවස
ළංව තිබේ, ඒක සර්වපරාක්‍රමයාණන්-
වහන්සේ එවන විනාශයක් මෙන්
පැමිණෙන්නේය. අපේ ඇස් ඉදිරියෙහිම 16
කෑමත් අපේ දෙවියන්වහන්සේගේ
ගෘහයෙන් ප්‍රීති සන්තෝෂයත් පහවගියා
නොවේද? බීජ ඒවායේ පිඩලි යට 17
දිරායයි; අටු පාළුවී, ගබඩා කඩා-
වැටී තිබේ; මක්නිසාද ගොයම් වියළී
තිබේ. සිව්පාවුන් කෙඳිරිගාන හැටි! ගව 18

රැළවලට තෘණ නැති නිසා උන් කැලඹී
ඇවිදිති; එසේය, බැටළු රැළවලුත්
19 නාස්තිවුණෝය. ස්වාමීන්වහන්ස, ඔබට
යාච්ඤාකරමි. මක්නිසාද කාන්තාරයේ
ගොදුරු-බිම් ගින්නෙන් නාස්තිවී ගියේය,
කෙතේ සියලු ගස්ද ගිනිදැල්ලට දැගියේය.
20 වනයේ මෘගයෝ පවා ඔබවහන්සේ දෙස
බලා හතිදමති. මක්නිසාද වතුර ඔයවල්
හිඳීගියේය, කාන්තාරයේ පිට්ටනිද
ගින්නෙන් නාස්තිවිය.

## භයානක පළඟැටි සමූහය

2 සියොන්හි හොරණෑව පිඹ, මාගේ
ශුද්ධවූ කන්දෙහි මහත් ශබ්දයක්
පවත්වාපල්ලා; දේශයේ සියලු වැසියෝ
වෙවුලත්වා. මක්නිසාද ස්වාමීන්-
වහන්සේගේ දවස පැමිණෙයි, ඒක ළංව
2 තිබේ; ඒක අඳුරුවූ කළුවරවූ දවසක්ය,
වලාකුල්ද තද අන්ධකාරයද ඇති
දවසක්ය; කඳු පිට අලුයම් එළිය පැතිර
යන්නාක්මෙන් මහත්වූ බලවත්වූ
සෙනඟක් එන්නේය; ඒ ආකාර සෙනඟක්
කවදාවත් සිටියේ නැත, ඉන්පසු බොහෝ
පරම්පරාවල අවුරුදු දක්වාම එසේ
3 සිටින්නෙත් නැත. උන්ට පෙරටුවෙන්
ගින්නක් නාස්තිකරන්නේය; උන්ට
පස්සෙන් ගිනිදැල්ලක් ඇවිළෙන්නේය.
උන්ට පෙරටුවෙන් දේශය ඒදන් උයන
මෙන් තිබී, උන්ට පස්සෙන් පාළු
කාන්තාරයක් වන්නේය; උන්ගෙන්
4 කිසිවක් නොගැළවුණේය. උන්ගේ පෙනීම
අශ්වයන්ගේ පෙනීම මෙන්ය; උන් අසරුවන්
5 මෙන් දුවති. කඳු මුදුන් පිට යන්නාවූ
රථ ශබ්දය මෙන්ද ඉපනැලි දවන
ගිනිදැල්ලේ ශබ්දය මෙන්ද යුද්ධ පිළි-
වෙළට සිටින බලවත් සෙනඟක් මෙන්ද
6 උන් පනින්නෝය. උන් ඉදිරියෙහි ජනයෝ
වෙවුලති. සියලු මුහුණු සුදුමැලිවී තිබේ.
7 උන් බලවතුන් මෙන් දුවති; යුද්ධකාරයන්
මෙන් පවුරට නගිති; උන් තමුන්ගේ
මාවත්වලින් අහක් නොවී, එක එකා
තම තමාගේ මාර්ගයෙන්ම යන්නෝය.
8 උන් එකිනෙකාට නොහැපී, තම තමාගේ
පාරවලම යන්නෝය. උන් යුද්ධායුධ
අතරේ වැටුණත් තුවාලවන්නේ නැත.
9 උන් නුවර එහා මෙහා දුවති; පවුර පිට
නැගීයති; ගෙවල්වලට නගිති; සොරෙකු
මෙන් කවුළුවලින් ඇතුල්වෙති. උන් 10
ඉදිරියෙහි පොළොව වෙවුලන්නේය; අහස
සෙලවෙන්නේය. ඉර හඳ අඳුරුවන්නේය,
තාරකාවල දීප්තිමද නවතින්නේය.
ස්වාමීන්වහන්සේ තමන්ගේ සේනාවට 11
පෙරටුවෙන් ස්වකීය හඬ පවත්වනසේක;
මක්නිසාද උන්වහන්සේගේ සමූහය ඉතා
මහත්ය; උන්වහන්සේ තමන් වචන ඉෂ්ට-
කරමින් බලවත්ව සිටිනසේක. එසේය,
ස්වාමීන්වහන්සේගේ දවස මහත්ව ඉතා
භයංකරව තිබේ; එය දරන්ට කාට
පුළුවන්ද?

## පසුතැවිලිව යටත්වීමට ආරාධනාව

එහෙත් දැන්වත් තුඹලාගේ මුළු සිතින්ද 12
නිරාහාරව සිටීමෙන්ද ඇඬීමෙන්ද
වැලපීමෙන්ද මා වෙතට හැරීවරෙල්ලා-
යයි ස්වාමීන්වහන්සේ කියනසේක.
එසේය, තුඹලාගේ වස්ත්‍ර නොව 13
තුඹලාගේ සිත් ඉරාගෙන, තුඹලාගේ
දෙවිවූ ස්වාමීන්වහන්සේ වෙතට
හැරියල්ලා. මක්නිසාද උන්වහන්සේ
දයාවන්තවූ, අනුකම්පාවෙන් පූර්ණවූ,
ඉවසිලිවන්තවූ, ඉතා කරුණාවන්තවූ
කෙනෙක්ය; උන්වහන්සේ විපත්තිය ගැන
තැවෙනසේක. සමහරවිට උන්වහන්සේ 14
හැරී ඇවිත් තැවී, තුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට ඔප්පුකිරීමට ආහාර
පූජාවක්ද පාන පූජාවක්ද අඩංගුවූ
ආශීර්වාදයක් දීලා යනවා ඇද්දෝයි
දන්නේ කවුද?
සියොන්හි හොරණෑව පිඹ, ශුද්ධවූ 15
උපවාසයක්ද රැස්වීමක්ද ප්‍රසිද්ධකර-
පල්ලා. සෙනඟ රැස්කර, ශුද්ධවූ සභාවක් 16
පවත්වාපල්ලා, මහල්ලන් එකතුකර,
ළමයින්ද කිරිදරුවන්ද එක්කාසුකරපල්ලා.
මනමාලයා තමාගේ ගෙයින්ද මනමාලී
ඇගේ ඇතුල් ගෙයින්ද පිටතට එත්වා.
ස්වාමීන්වහන්සේගේ සේවකවූ පූජකයෝ 17

ද්වාරමණ්ඩපය සහ පූජාසනය අතරෙහි
සිට අඩමින්: **ස්වාමීන්වහන්ස**, ඔබගේ
සෙනඟට කරුණාකළ මැනව, ඔවුන්
කෙරෙහි ජාතීන් විසින් ආණ්ඩු කරන
හැටියට ඔබගේ උරුමය නින්දවට පාවා
නුදුන මැනව. ඔවුන්ගේ දෙවියන්වහන්සේ
කොතනදැයි ජනයන් අතරේ මක්නිසා
කියනු ලබන්නේදැයි කියත්වා.

## ප්‍රීතිදායක සමෘද්ධියක් හා පුදුම දේවාත්ම වැගිරවීමක් පොරොන්දුවීම

18 එකල **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
දේශය ගැන ජ්වලිතවී, තමන්ගේ සෙනඟට
19 අනුකම්පාකළසේක. **ස්වාමීන්වහන්සේ**
තමන් සෙනඟට උත්තර දෙමින්: මෙන්න,
නුඹලා තෘප්තියට පැමිණෙන ලෙස
ධාන්‍යද මිදියුසද තෙල්ද නුඹලා වෙත
එවමි. මම ජාතීන් අතරෙහි නුඹලා තවත්
20 නින්දවක් නොකරන්නෙමි. මම උතුරු
සමුද්‍රව නුඹලා වෙතින් ඈත්කර, ඔවුන්
නිසරු පාළු දේශයකටත්, ඔවුන්ගේ
ඉස්සරහ කොටස නැගෙනහිර මුහුදටත්,
පසු කොටස බස්නාහිර මුහුදටත්
පන්නාදමන්නෙමි; මෙසේ ඔවුන්
උඩඟුකම්කළ බැවින්, ඔවුන් ගඳගසා,
ඔවුන්ගේ දුර්ගන්ධය නගින්නේයයි
21 කියනවා ඇත. එම්බා දේශය, භය නොවී,
ප්‍රීතිසන්තෝෂවෙයන්න; මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** මහත් දේ කළසේක.
22 වනයේ මෘගයෙනි, භය නොවව්;
මක්නිසාද කාන්තාරයේ ගොදුරු-
බිම්වල තෘණ අටගනියි, ගස්ද එලදෙයි,
අත්තික්කා ගසද මිදි වැලද ඒවායේ
23 ස්වරසය දෙති. ඉතින් සියොන් පුත්‍රයෙනි,
නුඹලාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේ**
කෙරෙහි ප්‍රීතිසන්තෝෂවෙයල්ලා.
මක්නිසාද උන්වහන්සේ නුඹලාට
පළමුවෙනි වර්ෂාව නිසි තරමට දුන්සේක,
තද වැස්ස වන පළමුවෙනි වර්ෂාවද
පළමුවෙනි මාසයේ අන්තිම වර්ෂාවද
උන්වහන්සේ නුඹලා උදෙසා වස්වනවා
ඇත. එවිට කමත් ධාන්‍යවලින් පිරෙනවා 24
ඇත, මිදියුසද තෙල්ද පැස්වලින්
ඉතිරෙනවා ඇත. මා විසින් නුඹලා 25
අතරට එවූවාවූ මාගේ මහත් සමූදව
වන පළඟැටියන්ද කෙඳි-පළඟැටියන්ද
කපන-පළඟැටියන්ද පළඟැටි පණුවන්ද
නාස්තිකළාවූ අවුරුදු මම නුඹලාට
නැවත දෙන්නෙමි. නුඹලා වනාහි 26
කෑම කා තෘප්තියට පැමිණ, නුඹලා
ගැන පුදුමලෙස ක්‍රියාකළාවූ නුඹලාගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** නාමය
වර්ණනාකරන්නහුය. මාගේ සෙනඟ
කිසි කලෙකත් ලජ්ජාවට පත් නො-
වන්නෝය. මා ඉශ්‍රායෙල්වරුන් අතරේ 27
සිටින බවත් මා නුඹලාගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** බවත් වෙන කෙනෙක්
නැති බවත් නුඹලා දැනගන්නවා ඇත.
මාගේ සෙනඟ කිසි කලෙකත් ලජ්ජාවට
නොපැමිණෙන්නෝය.

ඉන්පසු මාංසමයවූ සියල්ලන් කෙරෙහි 28
මාගේ ආත්මය වගුරුවන්නෙමි; නුඹලා-
ගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍ය
කියන්නෝය, නුඹලාගේ මහල්ලෝ
ස්වප්න දකින්නෝය, නුඹලාගේ යෞවන-
යන්ට දර්ශන පෙනෙනවා ඇත. ඒ 29
දවස්වලදී දාසයන් සහ දාසීන් කෙරෙහි
පවා මාගේ ආත්මය වගුරුවන්නෙමි.
තවද අහසෙහිත් පොළොවෙහිත් පුදුම 30
එනම් ලේද ගින්ද දුම්-කණුද පෙන්-
වන්නෙමි. **ස්වාමීන්වහන්සේගේ** මහත්වූ 31
භයානකවූ දවස පැමිණෙන්ට පළමුවෙන්
ඉර අඳුරුවන්නේය, හඳ ලේ වන්නේය.
තවද **ස්වාමීන්වහන්සේගේ** නම කියා 32
යාච්ඤාකරන කවුරු නුමුත් ගැළවෙනවා
ඇත. මක්නිසාද **ස්වාමීන්වහන්සේ** කී
ලෙස, ගැළවෙන අයද ඉතිරි අය අතරේ
**ස්වාමීන්වහන්සේ** කැඳවන අයද සියොන්
කන්දෙහිත් යෙරුසලමෙහිත් සිටිනවා
ඇත.

## ඉශ්‍රායෙල්ට අනතුරු කළ ජාතීන් කෙරෙහි විනිශ්චය. ඉශ්‍රායෙල්ගේ මතු තේජස

3 එසේය, මා විසින් යූදගේද
යෙරුසලමේද වාල්කම පහකරන ඒ
2 දවස්වලදීත් ඒ කාලයෙහිදීත්, මම සියලු
ජාතීන් රැස්කොට, *යෙහෝෂාපාත්
මිටියාවතට පමුණුවා, එහි මාගේ
සෙනඟද මාගේ උරුමයවූ ඉශ්‍රායෙල්ද
ගැන ඔවුන් සමග විනිශ්චයට
පැමිණෙන්නෙමි. මක්නිසාද ඔව්හු මොවුන්
ජාතීන් අතරට විසුරුවා, මාගේ දේශය
3 බෙදගත්තෝය. ඔව්හු මාගේ සෙනඟ
ගැන පසඇට දමා, පිරිමි ළමයෙකු
වේශ්‍යාවක් නිසා දුන්නෝය, ගැනු
ළමයෙකු මුද්‍රිකපානය බොන පිණිස
4 වික්කෝය. ඇරත් තීර් සහ ශීදෝන්ද
පිලිස්තියේ සියලු පළාත්ද යන නුඹලා
මට මොකක්ද? නුඹලා මා පිටට ප්‍රතිඵල
පමුණුවන්නහුද? එසේ මා පිටට
පැමිණෙවුවොත් කඩිනමින්ම නුඹලාගේ
ප්‍රතිඵල නුඹලාගේ හිස් පිටට වහාම
5 හරවන්නෙමි. නුඹලා මාගේ රන් රිදී
අරගත ගොස්, මාගේ හොඳවූ ප්‍රියවූ
දේවල් නුඹලාගේ මාළිගාවල තැබුවහුය.
6 තවද නුඹලා යූද දරුවන්ද යෙරුසලමේ
දරුවන්ද නුඹලාගේ සීමාවෙන් ඈත්කරන
පිණිස ඔවුන් ග්‍රීක්වරුන්ගේ පුත්‍රයන්ට
7 වික්කහුය. ඉතින් නුඹලා ඔවුන් විකුණ
ඇරිය ස්ථානයෙන් මම ඔවුන් නැගුට්ටුවා,
නුඹලාගේ ක්‍රියාව නුඹලාගේ හිස් පිටට
8 හරවා, නුඹලාගේ පුත්‍රයන්ද දූවරුන්ද
යූද පුත්‍රයන් අතට විකුණන්නෙමි, ඔවුන්
වනාහි දුරස්තර ජාතියක් වන
ෂෙබාවරුන්ට ඔවුන් විකුණනවා ඇත.
මක්නිසාද **ස්වාමීන්වහන්සේ** එසේ
කීසේක.
9 ජාතීන් අතරේ මේක ප්‍රකාශකරපල්ලා;
යුද්ධයට පේවී, බලවතුන් නැගුට්ටුවාපල්ලා;
සියලු යුද්ධකාරයෝ ළංවී නැගී එත්වා.
10 නුඹලාගේ හීවැල්වලින් කඩුද නුඹලාගේ
දෑකැතිවලින් හෙල්ලද තළාගනිල්ලා. මම
බලවන්තයෙක්මියි බෙලහීනයා කියාවා.
වටකර සිටින සියලු ජාතීනි, ඉක්මන්කර 11
වරෙල්ලා, එසේ ඔව්හු රැස්වෙත්වා.
**ස්වාමීන්වහන්ස**, ඔබගේ බලවතුන් එහි
පැමිණෙවුව මැනව. ජාතීහු නැගිට 12
යෙහෝෂාපාත් මිටියාවතට නැගී එත්වා.
මක්නිසාද වටකර සිටින සියලු ජාතීන්
විනිශ්චයකරන්ට එහි හිඳගන්නෙමි. ගොයම් 13
පැසුණු නිසා දෑකැත්ත පොවාපල්ලා.
මුද්‍රික යන්ත්‍රය පිරී තිබෙන බැවින් ඇවිත්
බැහැපල්ලා; මිදි යන්ත්‍රය පිරී තිබේ,
පැස් ඉතිරීයන්නේය; මක්නිසාද ඔවුන්ගේ
දුෂ්ටකම මහත්ය. රාශි ගණන් සමූහයෝ 14
තීන්දුකිරීමේ මිටියාවතෙහි සිටින්නෝය.
මක්නිසාද තීන්දු කිරීමේ මිටියාවතෙහි
**ස්වාමීන්වහන්සේගේ** දවස ළංව තිබේ.
ඉර හඳ අඳුරුවී තිබේ, තාරකාවල 15
දිලිහීමද පහවෙයි. **ස්වාමීන්වහන්සේ** 16
සියොන්හි සිට ගර්ජනාකොට,
යෙරුසලමේ සිට තමන්ගේ හඬ පවත්වන-
සේක; අහසද පොළොවද සෙලවෙනවා
ඇත. එහෙත් **ස්වාමීන්වහන්සේ** තමන්ගේ
සෙනඟට රක්ෂාස්ථානයක්ව, ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට බලකොටුවක්ව සිටිනසේක.
මෙසේ **ස්වාමීන්වහන්සේ** වන මා මාගේ 17
ශුද්ධ කන්ද වන සියොන්හි වසන
නුඹලාගේ දෙවියන්වහන්සේ බව නුඹලා
දනගන්නහුය. එකල යෙරුසලම ශුද්ධව
තිබෙන්නේය, විදේශියෝ එහි මැදින්
තවත් නොයන්නෝය. ඒ කාලයෙහි 18
කඳුවලින් මිදි පැන් වැගිරෙනවා ඇත,
හෙල්වලින් කිරි ගලනවා ඇත, යූදහි
සියලු ඔයවල වතුර ගලා යනවා ඇත;
**ස්වාමීන්වහන්සේගේ** ගෘහයෙන් උල්පතක්
නික්ම ෂිට්ටීම් මිටියාවතට වතුර දෙනවා
ඇත. යූද දරුවන්ගේ දේශයෙහි නිදෙස් 19
ලේ වගුරුවා ඔවුන්ට කළ බලාත්-
කාරකම නිසා මිසරය පාළුවක්ද ඒදෝම්
පාළු කාන්තාරයක්ද වන්නේය. නුමුත් 20
යූද සදාකාලේටත් යෙරුසලම පරම්-
පරාවෙන් පරම්පරාවටත් පවතිනවා ඇත.
මා විසින් නිදෙස් නොකළ ඔවුන්ගේ 21
ලේ නිදෙස්කරන්නෙමි; **ස්වාමීන්වහන්සේද**
සියොන්හි වාසය කරනවා ඇත.

*යෙහෝවාගේ විනිශ්චයේ මිටියාවතට යනුයි.

# අනාගතවක්තෘවූ ආමොස්ගේ පොත

## අවට ජාතීන් හා යූදා කෙරෙහි විනිශ්චය ප්‍රකාශකිරීම

1 තෙකෝවාහි එඬේරුන් අතරේ සිටි
ආමොස් යූදාහි රජවූ උස්සියාගේ
දවස්වලද යෝවාෂ්ගේ පුත්‍රවූ ඉශ්‍රායෙල්
රජවූ යෙරොබෝවම්ගේ දවස්වලද
පොළෝකම්පාවට දෑවුරුද්දකට පළමුවෙන්
ඉශ්‍රායෙල් ගැන දුටු කාරණය.
2 ඔහු මෙසේ කීවේය: **ස්වාමීන්වහන්සේ**
සියොන්හි සිට ගර්ජනාකොට, යෙරූ-
සලමේ සිට තමන්ගේ හඬ පවත්වනවා
ඇත; එවිට එඬේරුන්ගේ ගොදුරුබිම්
වැලපෙනවා ඇත, කර්මෙල් මුදුනද වියළී
යන්නේය.
3 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
දමස්කයේ වරද තුනක්ද, එසේය,
හතරක්ද නිසා මම එහි දඬුවම
පහ නොකරන්නෙමි; මක්නිසාද මඩින
යකඩ යන්ත්‍රවලින් ඔවුන් විසින් ගිලියද්
4 දේශය මඩිනලද්දේය. ඒ නිසා මම
බෙන්-හදද්ගේ මාළිගා නාස්තිකරන
ගින්නක් හසායෙල්ගේ ගෙදරට
5 අරින්නෙමි. මම දමස්කයේ අගුල බිඳ,
වැසියා ආවෙන්හි මිටියාවතෙන්ද,
ජයකොන්තය අල්ලන්නා ඒදන්
වංශයෙන්ද සිඳදමන්නෙමි. අරාම්හි
වැසියෝ වහල්කමට කීර්ට යන්නෝයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
6 **ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
ගාසාහි වරද තුනක්ද, එසේය, හතරක්ද
නිසා මම එහි දඬුවම පහ නොකරන්නෙමි;
මක්නිසාද ඔව්හු ඒදෙම්ට පාවාදෙන
පිණිස මුළු සෙනඟ වහල්කමට
7 ගෙනගියෝය. ඒ නිසා මම ගාසාහි
මාළිගා නාස්තිකරන ගින්නක් එහි
පවුර පිටට අරින්නෙමි. මම අෂ්දොද් 8
කෙරෙන් වැසියාද අෂ්කෙලොන් කෙරෙන්
ජයකොන්තය අල්ලන්නාද සිඳදමා,
මාගේ අත එක්‍රොන්ට විරුද්ධව
හරවන්නෙමි, පිලිස්තිවරුන්ගෙන් ඉතිරි
කොටසද විනාශවන්නේයයි ස්වාමිවූ
**දෙවියන්වහන්සේ** කියනසේක.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 9
මම තීර්හි වරද තුනක්ද, එසේය, හතරක්ද
නිසා එහි දඬුවම පහ නොකරන්නෙමි;
මක්නිසාද ඔව්හු සහෝදර ගිවිසුම සිහි
නොකර, මුළු සෙනඟ අල්ලා ඒදෙම්ට
පාවාදුන්නෝය. ඒ නිසා මම තීර්හි 10
මාළිගා විනාශකරන ගින්නක් එහි පවුර
පිටට අරින්නෙමි.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 11
ඒදෙම්හි වරද තුනක්ද, එසේය, හතරක්ද
නිසා මම එහි දඬුවම පහ නොකරන්නෙමි;
මක්නිසාද ඔහු කඩුව ඇතුව තමාගේ
සහෝදරයා පස්සේ එළවාගනගොස්,
තමාගේ අනුකම්පාව සහමුලින්ම
පහකොට, තමාගේ උදහසින් නිතරම
ඉරාදමා, තමාගේ කෝපය සෑමකල්හිම
තබාගත්තේය. ඒ නිසා මම බොශ්රාහි 12
මාළිගා විනාශකරන ගින්නක් තේමාන්ට
අරින්නෙමි.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 13
අම්මොන් පුත්‍රයන්ගේ වරද තුනක්ද,
එසේය, හතරක්ද නිසා ඔවුන්ගේ දඬුවම
පහ නොකරන්නෙමි; මක්නිසාද ඔව්හු
තමුන්ගේ සීමාව විශාල කරගන්න පිණිස
ගිලියද්හි ගර්භිණීන් ඉරාදැම්මෝය. ඒ 14
නිසා යුද්ධ දවසේ ඝෝෂාවද සුළිහුළං
දවසේ කුණාටුවද ඇතුව, රබ්බාහි
මාළිගා විනාශකරන ගින්නක් එහි පවුර

15 පිට අවුළුවන්නෙමි. ඔවුන්ගේ රජද ඔහුගේ
අධිපතීහුද එක්ව වහල්කමට යන්නෝ-
යයි ස්වාමීන්වහන්සේ කියනසේක.

2 ස්වාමීන්වහන්සේ මෙසේ කියන-
සේක: මෝවබ්ගේ වරද තුනක්ද,
එසේය, හතරක්ද නිසා මම එහි දඬුවම
පහ නොකරන්නෙමි; මක්නිසාද ඔහු
ඒදෙම් රජුගේ ඇට දවා හුනු සෑදුවේය.
2 ඒ නිසා මම කෙරියොත් විනාශකරන
ගින්නක් මෝවබ්ට අරින්නෙමි;
මෝවබ්වරු කෝලාහලද සෝෂාවද
හොරණෑ ශබ්දයද ඇතුව මැරෙන්නෝය.
3 මම එය තුළෙන් විනිශ්චයකාරයා
සිඳදමා, එහි සියලු අධිපතීන් ඔහු
සමග මරාදමන්නෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේක.
4 ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
යූදගේ වරද තුනක්ද, එසේය, හතරක්ද
නිසා මම එහි දඬුවම පහ නොකරන්නෙමි;
මක්නිසාද ඔව්හු ස්වාමීන්වහන්සේගේ
ව්‍යවස්ථාව එපාකොට, උන්වහන්සේගේ
පනත් නොපවත්වා, ඔවුන්ගේ පියවරුන්
ඇදහූ බොරු කරණකොටගෙන
5 මුළාවූවෝය. ඒ නිසා මම යෙරුසලමේ
මාළිගා නාස්තිකරන ගින්නක් යූදට
එවන්නෙමි.

## ඉශ්‍රායෙල්ගේ පාප. කෙළෙහිගුණ නොසැලකීම

6 ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
ඉශ්‍රායෙල්ගේ වරද තුනක්ද, එසේය,
හතරක්ද නිසා මම එහි දඬුවම පහ
නොකරන්නෙමි; මක්නිසාද ඔව්හු
ධර්මිෂ්ඨයා රිදීවලටත් දිළින්ද වහන්
7 සහළකටත් වික්කෝය. දුප්පතාගේ හිසේ
පොළොවේ ධූලි තිබෙනවා දකින්ට
ඔව්හු ආශාවෙති, යටහත් අයගේ
මාර්ගය පෙරළති. මාගේ ශුද්ධවූ නාමය
කෙලහෙන ලෙස පුරුෂයෙක්ද ඔහුගේ
පියාද එම තරුණිය කරා එළඹෙති.
8 ඔවුන් උකසට ගත් වස්ත්‍ර සියලු පූජාසන
ළඟ එළාගන ඉඳිති, දඬගැසූම් කෑ අයගේ
මුද්‍රිකපානයද තමුන්ගේ දෙවිවරුන්ගේ
9 ගෘහයේදී බොති. එහෙත් කිහිරි ගස්වල
උස හා සමාන උස ඇත්තාවූ, අලෝන
ගස් මෙන් ශක්තිමත්වූ අමෝරීවරුන් ඔවුන්
ඉදිරියෙන් විනාශකරදැමුවේ මමය;
ඉහළින් ඔවුන්ගේ ඵලද පහළින් ඔවුන්ගේ
මුල්ද නාස්තිකෙළෙමි. අමෝරීවරුන්ගේ 10
දේශය හිමිකරගැනීමට තුඹලා මිසර
දේශයෙන් ගෙන්වා, සතළිස් අවුරුද්දක්
තුඹලා කාන්තාරයෙහි ගෙනගියෙත්
මමය. තුඹලාගේ පුත්‍රයන්ගෙන් 11
අනාගතවක්තෘවරුන්ද තුඹලාගේ
තරුණයන්ගෙන් *නසරියයන්ද නැගි-
ටෙවුවෙමි. ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, එසේ
නොවේදැයි ස්වාමීන්වහන්සේ කියන-
සේක. එහෙත් තුඹලා *නසරියයන්ට 12
මුද්‍රිකපානය බොන්ට දුන්නහුය;
අනාගතවාක්‍ය නොකියල්ලායයි අනාගත-
වක්තෘවරුන්ට අණකළහුය. ගොයම් මිටි 13
පිරෙවූ ගැළක් නැමෙන්නාක්මෙන් මම
තුඹලා බිමට තමන්නෙමි. එබැවින් 14
පලායාම ශීඝ්‍ර අයගෙන් නැතිවන්නේය,
බලවත් අයද තමාගේ ශක්තිය
වැඩිකරගන්නේවත් බලවතා තමාගේ
ප්‍රාණය ගළවාගන්නේවත් නැත. දුනුවායා 15
සිටින්නේවත් ශීඝ්‍ර පාද ඇත්තා ගැළවී
යන්නේවත් අශ්වයා පිට නැඟීයන්නා
තමාගේ ප්‍රාණය ගළවාගන්නේවත් නැත.
බලවතුන් අතරෙහි ධෛර්ය සිතක් ඇති 16
අයද ඒ දවසේ නිර්වස්ත්‍රව පලායන්නේ-
යයි ස්වාමීන්වහන්සේ කියනසේක.

## ප්‍රොපේත තැනගේ මුල් ප්‍රතිපත්තිය

3 ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, තුඹලාට
විරුද්ධව, එනම් මිසර දේශයෙන්
මා විසින් ගෙනාවාවූ මුළු වංශයට
විරුද්ධව, ස්වාමීන්වහන්සේ කීවාවූ මේ
වචනය අසාපල්ලා: පොළොවේ සියලු 2
වංශවලින් තුඹලා පමණක් ඇඳිනගත්තෙමි.
එබැවින් තුඹලාගේ සියලු අයුතුකම් නිසා
තුඹලාට දඬුවම්කරන්නෙමි.

---

*එනම්, කැපවූ අයින්.

## ප්‍රොපේත තැන පොලඹවන බලය

3 දෙදෙනෙක් එකඟවුණොත් මිස නැත්නම්
4 එක්ව යනවා ඇද්ද? සිංහයෙකුට ගොදුරු
නැතිවිට ඌ කැලෑවේ ගොරවනවා
ඇද්ද? ගොදුරක් අල්වා නොගෙන සිටිද්දී
තරුණ සිංහයා උගේ ගුහාවේ සිට
5 නාදකරනවා ඇද්ද? මලපතක් නැති විට
කුරුල්ලෙක් බිමේ උගුලකට අසුවේද?
උගුලක් බිමෙන් ගැස්සුණාම යමක් අසු
6 නොවී තිබේද? යම් නුවරක හොරණෑව
පිඹිබාම සෙනඟ භය නොවන්නෝද?
ස්වාමීන්වහන්සේ නොපැමිණෙවූ
7 විපත්තියක් නුවරක ඇත්තේද? සැබවින්
ස්වාමිවූ දෙවියන්වහන්සේ තමන්ගේ
රහස තමන් මෙහෙකරුවන්වූ අනා-
ගතවක්තෘවරුන්ට එළිදරව් නොකර
8 කිසිවක් නොකරනසේක. සිංහයා
ගර්ජනාකෙළේය, භය නොවෙන්නේ කවුද?
ස්වාමිවූ දෙවියන්වහන්සේ කථාකළ-
සේක, ප්‍රොපේත වාක්‍ය නොකියන්නේ
කවුද?

## ඉශ්‍රායෙල්ගේ විනාශය දන්වීම

9 සමාරියේ කඳු උඩ තුඹලා රැස්වී, එය
තුළ තිබෙන මහත් කෝලාහලද එය
මැද තිබෙන පීඩාද බලාපල්ලාය
කියමින් අෂ්දෝද්හි මාළිගාද මිසර
දේශයේ මාළිගාද උඩ සිට
10 ප්‍රකාශකරපල්ලා. මක්නිසාද බලාත්-
කාරකමේ ප්‍රයෝජනද කොල්ලයද
තමුන්ගේ මාළිගාවල රැස්කරගන්න
තැනැත්තෝ යුතුකම් කරන්ට නොදනිතියි
11 ස්වාමීන්වහන්සේ කියනසේක. එබැවින්
ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන-
සේක: දේශය වටකරම එදිරිකාරයෙක්
සිට තුඹේ බලය තුඹෙන් පහකරන්නේය,
තුඹේ මාළිගාද කොල්ලකනු ලබන්නේය.
12 ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
එඬේරා සිංහයාගේ කටින් කකුල්
දෙකක්වත් කන් කෑල්ලක්වත්
ගළවාගන්නාක්මෙන් සමාරියෙහි යහන්
කොනකද ඇඳක පට මෙත්ත පිටද හිඳින
ඉශ්‍රායෙල් පුත්‍රයන් ගැළවෙනවා ඇත.
තුඹලා අසා යාකොබ්ගේ වංශයට 13
විරුද්ධව සාක්ෂි දීපල්ලායයි සේනාවල
දෙවියන්වහන්සේ වන ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක. මක්නිසාද මා 14
විසින් ඉශ්‍රායෙල්ගේ වරද නිසා ඔවුන්ට
දඬුවම්කරන දවසේදී බෙතෙල්හි
පූජාසනවලටත් දඬුවම් කරන්නෙමි,
පූජාසනයේ අංද කපාදමනු ලැබ බිමට
වැටෙන්නෝය. මම ශීත ඍතු නිවාසයටත් 15
ග්‍රීෂ්ම ඍතු නිවාසයටත් පහරදෙන්නෙමි.
ඇත්දත් ගෙවල් විනාශවෙනවා ඇත,
මහත් ගෙවල්ද පහවෙනවා ඇතැයි
ස්වාමීන්වහන්සේ කියනසේක.

## ධනවත් කෲර ස්ත්‍රීන්ට පැමිණෙන අවවාදය

4 සමාරියේ කඳුකරයෙහි සිටින
බාෂාන්හි එළදෙන්නුනි, මේ වචනය
අසාපල්ලා; තුඹලා දුප්පතුන්ට පීඩාකර
දිළිඳුන්ට බලාත්කාරකරන්නහුය; අපට
බොන්ට ගෙනෙල්ලායයි තුඹලාගේ
ස්වාමිවරුන්ට කියන්නහුය. ස්වාමිවූ 2
දෙවියන්වහන්සේ තමන්ගේ ශුද්ධකම ගැන
මෙසේ දිවුරා තිබේ: තුඹලාව
කොකුවලින්ද තුඹලාගෙන් පැවත
එන්නන් බිලිකටුවලින්ද අහකට ගෙනයන
දවස් තුඹලා පිටට පැමිණෙන්නේය.
තුඹලා කපොලුවලින් එක එකා තම 3
තමා ඉදිරිපිටින් පිටත්ව යන්නහුය; තුඹලා
හාර්මොන්ට විසිකරනු ලබන්නහුයයි
ස්වාමීන්වහන්සේ කියනසේක.

## ඉශ්‍රායෙල් ගැන දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම නිෂ්ඵලවූ බව

බෙතෙල්ට ඇවිත් වරදකරපල්ලා; 4
ගිල්ගාල්හි බොහෝසෙයින් වරදකොට,
හැම උදයම තුඹලාගේ පූජාද තුන්
දවසකට වරක් තුඹලාගේ ඕතුද
ගෙනෙල්ලා; මුහුන් මිශ්‍රවූ ස්තුති පූජාවකුත් 5
ඔප්පුකර, ස්වේච්ඡා පූජා ගැනත්
මොරගසා ප්‍රකාශකරපල්ලා. මක්නිසාද

ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, තුඹලා ඊට
ප්‍රියයයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන-
6 සේක. තවද මා විසින් තුඹලාගේ සියලුම
නුවරවල *දත් ශුද්ධකමද තුඹලාගේ
සියලු ස්ථානවල කෑම හිඟකමද දුන්
නුමුත්, තුඹලා මා වෙතට හැරී නාවහු-
7 යයි ස්වාමීන්වහන්සේ කියනසේක. තවද
කපන කාලයට තුන් මසක් තිබෙද්දී
මම වැස්ස තුඹලාගෙන් වළක්වාගතිමි.
එක නුවරකට වහින්ට සලස්වද්දී තවත්
නුවරකට වැස්ස නොදී ඇරියෙමි. එක
බිම් කොටසකට වැස්සේය, වැස්ස
8 නොලැබූ කොටස වියළී ගියේය. ඒ
නිසා නුවරවල් දෙකක් තුනක් වතුර
බීමට වෙන නුවරකට ගමන්කළෝය,
නුමුත් සෑහීමට නොපැමුණුණෝය.
එහෙත් තුඹලා මා වෙතට හැරී නාවහු-
9 යයි ස්වාමීන්වහන්සේ කියනසේක. මම
ගොයම් වියළීමෙන්ද ගොයම්
රෝගයෙන්ද තුඹලාට පහරදුනිමි.
තුඹලාගේ බොහෝවූ වතුද මිදිවතුද
තුඹලාගේ අත්තික්කා ගස්ද ඔලීව ගස්ද
පළහැටි පණුවෝ කෑවෝය. එහෙත්
තුඹලා මා වෙතට හැරී නාවහුයයි
10 ස්වාමීන්වහන්සේ කියනසේක. මිසරයට
ඇරියාක්මෙන් තුඹලා අතරට වසංගතය
එවීමි. තුඹලාගේ තරුණයන් කඩුවෙන්
මරාදැමීමි, තුඹලාගේ අශ්වයන්ද
අල්ලාගනගියෙමි; තුඹලාගේ කඳවුරේ
සේනාවල දුර්ගන්ධය තුඹලාගේ
නාස්වලට වදින්ටත් සැලැස්වීමි. එහෙත්
තුඹලා මා වෙතට හැරී නාවහුයයි
11 ස්වාමීන්වහන්සේ කියනසේක. දෙවියන්-
වහන්සේ සොදොම සහ ගොමෝරාව
පෙරළාදැමුවාක්මෙන් තුඹලා අතරෙන්
සමහරෙකු පෙරළා දැමුවෙමි, තුඹලා
ගින්නෙන් ඇදගත් පෙනෙල්ලක්
මෙන් වූවහුය. එහෙත් තුඹලා මා වෙතට
හැරී නාවහුයයි ස්වාමීන්වහන්සේ
12 කියනසේක. එබැවින්, ඉශ්‍රායෙල්, මෙසේ
තුඹට කරන්නෙමි. මා තුඹට මෙසේ
කරන්ට යන බැවින්, එම්බා ඉශ්‍රායෙල්,
තුඹේ දෙවියන්වහන්සේ සම්මුඛවෙන්ට
සූදානම්වෙයන්න. මක්නිසාද උන්වහන්සේ 13
කඳු සාදන්නාවූ, හුළඟ මවන්නාවූ,
මනුෂ්‍යයාට තමාගේ කල්පනාව මොකද
කියා දන්වන්නාවූ, පහන් වේලාව
අන්ධකාරකරන්නාවූ, පොළොවේ උස්තැන්
පිට යන්නාවූ තැනන්වහන්සේය;
උන්වහන්සේගේ නාමය සේනාවල දෙවිවූ
ස්වාමීන්වහන්සේය.

## පසුතැවිලිවීමට තද ඉල්ලීමක්

5
එම්බා ඉශ්‍රායෙල් වංශය, මා
විසින් තුඹලා ගැන පවත්වන
විලාපය වන මේ වචනය අසාපල්ලා.
ඉශ්‍රායෙල් කන්‍යාව වැටුණාය; ඈ තවත් 2
නොනැගිටින්නීය. ඈ නැගුටුවන්ට
කිසිවෙක් නැතුව ඈගේ භූමිය පිට
ඈ වැටී ඉන්නවාය. මක්නිසාද; යම් 3
නුවරකින් දහසක් පිටත්ව ගියෝද
ඔවුන්ගෙන් සිය දෙනෙක්ද, යම් නුවරකින්
සියයක් පිටත්ව ගියෝද ඔවුන්ගෙන්
දසදෙනෙක්ද ඉශ්‍රායෙල් වංශයට
ඉතුරුවන්නෝයයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක. එසේය, ස්වාමීන්- 4
වහන්සේ ඉශ්‍රායෙල් වංශයට මෙසේ
කියනසේක: මා සොයාපල්ලා, එවිට 5
තුඹලා ජීවත්වන්නහුය. නුමුත් බෙතෙල්
නොසොයල්ලා, ගිල්ගාල්ට ඇතුල්
නොවෙල්ලා, බෙයෙර්-ෂෙබාට නො-
යල්ලා. මක්නිසාද ගිල්ගාල් සැබවින්
වහල්කමට යනවා ඇත, බෙතෙල්ද
නිස්කමට පැමිණෙනවා ඇත. යුක්තිය 6
කොසඹවලට හරවන්නාවූ, ධර්මිෂ්ඨකම
බිම හෙළන්නාවූ තැනැත්තෙනි, ස්වාමීන් - 7
වහන්සේ සොයාපල්ලා, එවිට තුඹලා
ජීවත්වන්නහුය; නැත්නම් උන්වහන්සේ
ගින්නක් මෙන් යෝසෙප් වංශය පිටට
පැමිණෙනවා ඇත, බෙතෙල්හි නිවන්ට
කෙනෙක් නැතුව එය ඇවිළෙනවා ඇත.
උන්වහන්සේ නම් හත්දින්නද මුවසිරසද 8
සෑදුවාවූ, මරණ සෙවණ උදයේ එළියට

*එනම්: සාගින්න.

හරවන්නාවූ, දවාල රාත්‍රිය මෙන්
අන්ධකාරකරන්නාවූ, මුහුදේ ජලයට
අඬගසා ඒවා පොළෝ තලයෙහි
වත්කරන්නාවූ, යෙහෝවා යන නාමය
9 ඇත්තාවූ තැනන්වහන්සේය. උන්වහන්සේ
බලය ඇත්තා පිටට විනාශය හදිසියෙන්
පමුණුවනසේක, විනාශය බලකොටුව
10 පිටට පැමිණෙනවා ඇත. දෙරටුවෙහි
අවවාදකරන්නාට ඔව්හු වෛරවෙති,
අවංකලෙස කථාකරන්නාටද පිළිකුල්-
11 කරති. එබැවින් තුඹලා දුප්පතා පාගා,
ඔහුගෙන් ධාන්‍ය-ඕතු ගන්න නිසා, තුඹලා
කැපූ ගල්වලින් ගෙවල් ගොඩනගාගන
සිටින නුමුත් තුඹලා ඒවායේ වාසය
නොකරන්නහුය; තුඹලා ප්‍රියවූ මිදිවතු
වවාගන සිටින නුමුත් එයින් මුද්‍රිකපානය
12 නොබොන්නහුය. මක්නිසාද තුඹලාගේ
වරදවල් කොපමණ වැඩිව, තුඹලාගේ
පාපවල් කොපමණ තදබලව තිබෙනවාද
කියා දනිමි; තුඹලා ධර්මිෂ්ඨයාට
පීඩාකරන්නහුය, අල්ලසක් ගෙන,
යුක්තිය නොකොට දිළිඳුන් දෙරටුවෙහි
13 අහක්කරන්නහුය. එබැවින් ඒ කාලය
නපුරු නිසා නුවණ ඇත්තා ඒ කාලයෙහි
14 නිශ්ශබ්දව සිටින්නේය. තුඹලා
ජීවත්වන පිණිස නපුර නොව යහපත
සොයාපල්ලා. එවිට සේනාවල දෙවිවූ
ස්වාමීන්වහන්සේ තුඹලා කියන ලෙස
15 තුඹලා සමග සිටිනසේක. නපුරට
ද්වේෂකර, යහපතට ප්‍රේමවී, දෙරටුවෙහි
යුක්තිය පිහිටුවාපල්ලා. සමහරවිට
සේනාවල දෙවිවූ ස්වාමීන්වහන්සේ
යෝසෙප්ගේ ඉතිරි අයට දයාවෙනවා
ඇත.

## ස්වාමීන්වහන්සේගේ දවස

16 එබැවින් ස්වාමිවූ සේනාවල දෙවිවූ
ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක:
සියලු පළල් මාවත්වල වැලපීම වන්නේය;
සියලු වීථිවල ඔව්හු—අනේ, අනේයයි
කියන්නෝය; වැලපෙන පිණිස
ගොවියාටත් විලාප කියන පිණිස
ළතෝනි කීමෙහි දක්ෂ අයටත්
අඬගසන්නෝය. සියලු මිදිවතුවලත් 17
වැලපීම වන්නේය. මක්නිසාද තුඹ මැදින්
යන්නෙමියි ස්වාමීන්වහන්සේ කියන-
සේක. ස්වාමීන්වහන්සේගේ දවසට 18
ආශාවන්නෙනි, තුඹලාට දුක්වේ!
ස්වාමීන්වහන්සේගේ දවස තුඹලාට
ඕනෑ කරන්නේ මක්නිසාද? එය
ආලෝකය නොව අන්ධකාරයය. එය 19
සිංහයෙකු ඉදිරියෙන් මනුෂ්‍යයෙක් පලා-
යද්දී වලසෙකුට අසුවෙන්නාක්මෙන්ය;
නොහොත් ගෙට ඇතුල්වී තමාගේ අත
භිත්තියේ තබන විට සර්පයෙක් ඔහුට
දෂ්ටකරන්නාක්මෙන්ය. ස්වාමීන්- 20
වහන්සේගේ දවස එළිය නොව අඳුර
නොවන්නේද? දීප්තියක් නැතිව ඉතා
කළුවරව නොතිබෙන්නේද?

## ධර්මිෂ්ඨකම නැති නමස්කාරය ස්වාමීන්වහන්සේට පිළිකුල් බව

තුඹලාගේ මංගල්‍යවලට ද්වේෂකර 21
ඒවා සුළුකොට සිතමි, තුඹලාගේ
මංගල්‍ය රැස්වීම්වලටද මම ප්‍රසන්න
නොවෙමි. තුඹලා දවන පූජාද තුඹලාගේ 22
ආහාර පූජාද මට ඔප්පුකරන නුමුත්
ඒවා පිළි නොගන්නෙමි. තුඹලාගේ තර
සතුන්ගෙන් ඔප්පුකරන ශාන්ති පූජාවන්ද
නොසලකන්නෙමි. තුඹේ ගීතිකා ඝෝෂාව 23
මා වෙතින් අහක්කරගනින්න; තුඹේ
වීණා නාදයත් නාසන්නෙමි. නුමුත් 24
යුක්තිය ජලය මෙන්ද ධර්මිෂ්ඨකම
බලවත් දියපාරක් මෙන්ද ගලායාවා.
එම්බා ඉශ්‍රායෙල් වංශය, තුඹලා යාගද 25
ආහාර පූජාද කාන්තාරයේදී සතළිස්
අවුරුද්දක් මට ඔප්පුකළහුද? එසේය, 26
තුඹලාගේ රජුගේ මණ්ඩපයත් තුඹලා
සාදගත්තාවූ තුඹලාගේ දේවරූපවූ කීයුන්
වන තුඹලාගේ දෙවියන්ගේ තාරකා-
වත් තුඹලා ගෙන ගියහුය. ඒ නිසා 27
දමස්කයෙන් එපිටට වහල්කමට තුඹලා
යවන්නෙමියි සේනාවල දෙවියන්වහන්සේ
නම්වූ ස්වාමීන්වහන්සේ කියනසේක.

## අධර්මිෂ්ඨකම්කරන සැපපහසු ඇති සෙනඟට දුක් වේ

6 සියොන්හි පහසුගෙන නොසැල-
කිල්ලෙන් සිටින්නන්ටද සමාරියේ
කන්දේ අප්‍රවේසම්ව සිටින්නන්ටද දුක්වේ!
ඔව්හු ජාතීන්ගෙන් ප්‍රධාන ජාතියේ
උත්තමයෝය, ඉශ්‍රායෙල් වංශයද ඔවුන්
2 ළඟට එන්නෝය. කල්නේට ගමන්කර
ගොස් බලාපල්ලා; එතැනින් මහ හමාත්ට
පලයල්ලා. පිලිස්තිවරුන්ගේ ගාත්ටද
පලයල්ලා. ඒවා මේ රාජ්‍යවලට වඩා
හොඳද? නොහොත් තුඹලාගේ සීමාවට
වඩා ඔවුන්ගේ සීමාව විශාලද?
3 විපත්තියේ දවස ඈත්කරන්නාවූ,
බලාත්කාරකමේ ආසනය ළංකරන්නාවූ,
4 ඇත්දත් ඇඳන්වල සැතපෙන්නාවූ,
තමුන්ගේ යහන්වල දිගාවී ඉන්නාවූ,
රැළෙන් බැටළුපැටියන්ද ගාලෙන්
5 වස්සන්ද කන්නාවූ, වීණා ශබ්දයට
නිෂ්ඵල ලෙස ගී කියන්නාවූ, දාවිත් මෙන්
6 තූර්යභාණ්ඩ උපදවාගන්නාවූ, මුද්‍රිකපාන
පාත්‍රාවලින් බොන්නාවූ, ඉතා හොඳ තෙල්
ආලේපකරගන්නාවූ, යෝසෙප්ගේ පීඩාව
ගැන ශෝක නොවී සිටින්නාවූ අයට
7 දුක්වේ. එබැවින් ඔවුන් වාලට යන්නන්
අතරෙහි පෙරටුවෙන් යනවා ඇත, දිගාවී
ඉන්නන්ගේ ශෝභාවද පහවයන්නේය.
8 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** තමන් ගැනම
දිවුරමින් සේනාවල දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක: මම
යාකොබ්ගේ තේජසට පිළිකුල්කොට,
ඔහුගේ මාළිගාවලට ද්වේෂකරමි.
එබැවින් මම නුවර සහ එහි සියල්ලද
9 පාවාදෙන්නෙමි. යම් ගෙයක මනුෂ්‍යයන්
දස දෙනෙක් ඉතිරි වුණත් ඔවුන්
10 මැරෙනවා ඇත. යමෙකුගේ ඇට ගෙයින්
පිටතට ගෙනයන්ට ඔහුගේ මාමාද ඔහු
පුලුස්සන්නාද ඔහු උස්සන විට, ගෙය
ඇතුළේ ඉන්න අයට කථාකරමින්: තුඹ
සමග තවත් යමෙක් ඇද්දැයි අසන්නේය;
ඔහු: නැතැයි කියනවා ඇත. එවිට ඔහු:
නිශ්ශබ්දව ඉඳින්න; **ස්වාමීන්වහන්සේගේ**
නාමය අප විසින් සඳහන්කරන්ට හොඳ
නැතැයි කියනවා ඇත. මක්නිසාද 11
**ස්වාමීන්වහන්සේ** නියමකර තිබෙන
හැටියට ලොකු ගෘහය කැඩුම් ඇතිවන
ලෙසත් කුඩා ගෘහය පැළුම්
ඇතිවන ලෙසත් ඒවාට පහරදෙනු
ලබන්නේය. නොවටිනා දෙයක් ගැන 12
සන්තෝෂවෙන්නාවූ, අපේම බලයෙන්
අපි අං ලබා නොගතිමුදැයි කියන්නාවූ
තැනැත්තෙනි, අශ්වයන් පර්වත පිට 13
දුවන්ටවත් එහි ගොනුන්ගෙන්
හාන්ටවත් පුළුවන්ද? එහෙත් තුඹලා
යුක්තිය තික්තකමටත් ධර්මිෂ්ඨකමේ ඵල
කොසඹවලටත් හරවා තිබේ. නුමුත්, 14
ඉශ්‍රායෙල් වංශය, මම තුඹලාට
විරුද්ධව ජාතියක් නැගුටුවන්නෙමි;
හමාත්ට ඇතුල්වන තැන් පටන් අරබා
සමභූමියේ ඔය දක්වා ඔව්හු තුඹලාට
පීඩාකරන්නෝයයි සේනාවල දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## පළඟැටියන්ද ගිනි සහ ලඹකැටයද ගැන දර්ශන

7 ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මට
මෙසේ පෙන්නූසේක: බලව, රජුගේ
කපාගැනීමට පසුව වැවුණු තෘණ වන
දෙවෙනි ඒවා හටගන්ට පටන්ගන්න විට
උන්වහන්සේ පළඟැටියන් හටගැන්වූ-
සේක. තවද උන් දේශයේ පලාජාති කා 2
තීන්දුකළ විට මම කථාකොට: ස්වාමිවූ
**දෙවියන්වහන්ස**, කමාවුව මැනව.
යාකොබ් කුඩා නිසා ඔහු පවතින්නේ
කෙසේදැයි කීවෙමි. **ස්වාමීන්වහන්සේ** ඒ 3
ගැන තැවුණුසේක. ඒක නොවන්නේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක.
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** මට මෙසේ 4
පෙන්නූසේක: බලව, ගින්නෙන්
ප්‍රතිඵලදීමට ස්වාමිවූ **දෙවියන්වහන්සේ**
අඩගැසූසේක. ඊට මහත් ගැඹුර සහ
භූමි කොටසක් දගියේය. එකල මම: 5
ස්වාමිවූ **දෙවියන්වහන්ස**, නැවතුණ
මැනව. යාකොබ් කුඩා නිසා ඔහු
පවතින්නේ කෙසේදැයි කීවෙමි. **ස්වාමීන්-** 6
**වහන්සේ** මේ ගැන තැවුණුසේක. මේකත්

නොවන්නේයයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක.
7 උන්වහන්සේ මෙසේ මට පෙන්නූසේක:
බලව, ස්වාමීන්වහන්සේ ලඹයට හරිලෙස
සෑදූ පවුරක් උඩ තමන් අතේ ලඹයක්
8 ඇතුව සිටිසේක. ස්වාමීන්වහන්සේ:
ආමොස්, නුඹට පෙනෙන්නේ කුමක්-
දැයි මාගෙන් ඇසූසේක. ලඹයක්යයි
මම කීවෙමි. එකල ස්වාමීන්වහන්සේ
කථාකොට: බලව, මම නැවත තවත්
මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට අව්වු
නොකර නොසිට, ඔවුන් මැද ලඹයක්
9 අල්ලන්නෙමි. ඊසාක්ගේ උස්තැන්
නාස්තිවන්නේය, ඉශ්‍රායෙල්ගේ ශුද්ධ-
ස්ථාන පාළුවන්නේය; මම යෙරොබෝ-
වම්ගේ වංශයට විරුද්ධව කඩුවක් ඇතුව
නැගිටින්නෙමියි කීසේක.

## ආමොස් සහ පූජකවූ අමශියාගේ විවාදය

10 එකල බෙතෙල්හි පූජකවූ අමශියා
ඉශ්‍රායෙල්හි රජවූ යෙරොබෝවම්ට කියා
යවනුයේ: ආමොස් ඔබට විරුද්ධව
ඉශ්‍රායෙල් වංශය අතරෙහි කුමන්ත්‍රණය-
කර තිබේ. ඔහුගේ සියලු වචන
11 දරන්ට දේශයට බැරිය. මක්නිසාද—
යෙරොබෝවම් කඩුවෙන් මැරෙන්නේය,
ඉශ්‍රායෙල්වරුන් තමුන්ගේ රටෙන් වාලට
යනවාම ඇත කියා ආමොස් කීවේයයි
12 කීය. තවද අමශියා ආමොස්ට
කථාකොට: එම්බා දර්ශනකාරය, නුඹ
යූදා දේශයට පලාගොස්, එහි කෑම
කා, එහි අනාගතවාක්‍ය කියාපන්න.
13 බෙතෙල්හි නම් නැවත තවත්
අනාගතවාක්‍ය නොකියන්න. මක්නිසාද
එය රජුගේ ශුද්ධස්ථානයය, එය රාජ
14 ගෘහයයයි කීවේය. ආමොස් උත්තරදෙමින්:
මම අනාගතවක්තෘ කෙනෙක්වත්
අනාගතවක්තෘ කෙනෙකුගේ පුත්‍රයෙක්වත්
නොව එඬේරෙක්ව අත්තික්කා ගස්
15 වවන්නෙක්ව සිටියෙමි. නුමුත් බැටළු
රැළ පස්සේ යාමෙන් ස්වාමීන්වහන්සේ
මා රැගෙන: නුඹ ගොස් මාගේ
සෙනඟවූ ඉශ්‍රායෙල්ට අනාගතවාක්‍ය
කියාපන්නැයි මට කීසේක. එබැවින් දැන් 16
ස්වාමීන්වහන්සේගේ වචනය අසාපන්න:
ඉශ්‍රායෙල්ට විරුද්ධව අනාගතවාක්‍ය
කියන්ටවත් ඊසාක්ගේ වංශයට විරුද්ධව
වචනයක් කියන්ටවත් එපායයි නුඹ
කියන්නෙහිය. එබැවින් ස්වාමීන්වහන්සේ 17
මෙසේ කියනසේක: නුඹේ භාර්යාව
නුවරදී වේශ්‍යාවක් වන්නීය, නුඹේ
පුත්‍රයෝද දූවරුද කඩුවෙන් වැටෙන්-
නෝය, නුඹේ භූමිය ලනුවෙන් බෙදනු
ලබන්නේය; නුඹම අපිරිසිදු රටකදී
මැරෙන්නෙහිය, ඉශ්‍රායෙල්ද සැබවින්ම
තමුන්ගේ දේශයෙන් වාලට යනවාම
ඇතැයි අමශියාට කීවේය.

## ඉදුණු ඵල දර්ශනය

**8** ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ
මට පෙන්නූසේක: බලව, ඉදුණු
ඵල පෙට්ටියක් විය. උන්වහන්සේ: 2
ආමොස්, නුඹට පෙනෙන්නේ කුමක්දැයි
මාගෙන් ඇසූසේක. මමද: ඉදුණු
ඵල පෙට්ටියක්යයි කීවෙමි. එකල
ස්වාමීන්වහන්සේ: මාගේ සෙනඟවූ
ඉශ්‍රායෙල්ට අන්තිමය පැමිණ තිබේ; මම
නැවත තවත් ඔවුන්ට අව්වු නොකර
නොසිටින්නෙමි. මාළිගාවේ ගීතිකා ඒ 3
දවසේදී දුකෙන් කෑගැසීම් වන්නේයයි
ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක.
බොහෝ මළකඳන් තිබෙනවා ඇත; ඔවුන්
සෑම තැනම ඒවා නිශ්ශබ්දලෙස පිටත
දමනවා ඇතැයි මට කීසේක.

## වංචාකාර වෙළෙන්දන් ගැන

දිළින්ද ගිලදමීමටත් දේශයේ යටහත් 4
අය නැතිකිරීමටත් හතිදමාගන යමින්,
ඒඵාව කුඩාකර, ෂෙකෙල මහත් කර, 5
හොර තරාදිවලින් වංචාකම්කරන්නාවූ,
දුප්පතුන් රිදීවලටද දිළින්ද වහන්-
සහළකටද ගන්ටත් බොල් ධාන්‍ය
විකුණන්ටත් ලැබෙන හැටියට, අප විසින් 6
භෝග විකුණන පිණිස අමාවකද, ධාන්‍ය
කඩ අරින පිණිස සබත් දවසද
පසුවෙන්නේ කොයි වේලාවේදැයි කියන්නාවූ
තැනැත්තෙනි, මෙය අසාපල්ලා.

### මහත් විනාශවීම් ගැන දැන්වීම

7 ඔවුන්ගේ සියලු ක්‍රියාවල් කවදාවත්
මතකනැති නොකරන්නෙමියි ස්වාමීන්-
වහන්සේ යාකොබ්ගේ තේජස ගැන දිවුරා
8 තිබේ. ඒ ගැන දේශය නොවෙවුලන්නේද?
එහි වසන සියල්ලෝම නොවැලපෙන්නෝද?
එසේය, ඒක ගංගාව මෙන් මුළුමනින්ම
ගලා, කැලඹී, මිසරයේ ගංගාව මෙන්
9 බැසයනවා ඇත. තවද මම ඒ කාලයේ
ඉර මුදුන් වේලාවට ඉර බසින්ට සලස්වා,
එළිය ඇති දවසේදී දේශය අන්ධ-
10 කාරකරන්නෙමි. තුඹලාගේ මංගල්‍යවල්
වැලපීමටත් තුඹලාගේ සියලු ගීතිකා
විලාපයටත් හරවා, සියලුම ඉඟටිවලට
ගෝණි රෙදිද සියලුම හිස්වලට මුඩුකමද
පමුණුවා, ඒක එකම පුත්‍රයෙකු නිසා
වැලපීම මෙන්ද එහි අන්තිමය තික්තවූ
දවසක් මෙන්ද කරන්නෙමියි ස්වාමිවූ
11 දෙවියන්වහන්සේ කියනසේක. බලව,
හානියක්, එනම් කෑම හානියක්වත්
වතුර පිපාසායක්වත් නොව ස්වාමීන්-
වහන්සේගේ වචන ඇසීමේ හානියක්,
මා විසින් දේශයට එවන දවස්
12 පැමිණෙන්නේය. එවිට මනුෂ්‍යයෝ ස්වාමීන්-
වහන්සේගේ වචනය සොයන පිණිස
මුහුදෙන් මුහුදට ගමන්කරන්නෝය,
උතුරේ සිට නැගෙනහිරටද ඔබ
මොබ දුවනවා ඇත, නුමුත් ඔවුන්ට
13 සම්බවෙන්නේ නැත. සමාරියේ අපරාධය
ගැන දිවුරන්නාවූ, දාන්, තුඹේ දෙවියන්
ජීවමාන බව සැබෑවා සේම කියාත්
බෙයෙර්-ෂෙබාහි මාර්ගය ජීවමාන බව
සැබෑවා සේම කියාත් කියන්නාවූ,
14 ශෝභන කන්‍යාවෝද තරුණයෝද ඒ
කාලයේදී පිපාසායෙන් ක්ලාන්තවී,
නැවත නොනැගිටින හැටියට
වැටෙන්නෝයයි ස්වාමිවූ දෙවියන්-
වහන්සේ කියනසේක.

### විසිරයාම ගැන අවසාන වාක්‍ය

9 ස්වාමීන්වහන්සේ පූජාසනය ළඟ
සිටිනවා දුටිමි. උන්වහන්සේ
කථාකොට: උළුවහු සෙලවෙන හැටියට
පේකඩවලට ගසා, ඒවා ඔවුන්
සියල්ලන්ගේ හිස් පිට කඩාදමාපන්න;
ඔවුන්ගෙන් ඉතිරිවෙන්නන් කඩුවෙන්
මරන්නෙමි. ඔවුන්ගෙන් කිසිවෙක් පලා
නොයන්නේය, ඔවුන්ගෙන් කිසිවෙක්
නොගැළවෙන්නේය. ඔවුන් *පාතාලය 2
දක්වා හාරාගන ගියත් එතැනින් මාගේ
අත ඔවුන් අරගන්නවා ඇත; ඔවුන්
අහසට නැඟුණත් එතැනින් මම ඔවුන්
පහතට හෙළන්නෙමි. ඔවුන් කර්මෙල් 3
මුදුනෙහි සැඟවී සිටියත්, මම එතැනින්
ඔවුන් සොයාගන්නෙමි; ඔවුන් මාගේ
ඇස් ඉදිරියෙන් මුහුදුපල්ලෙහි සැඟවුණත්,
එහිදී ඔවුන්ට දෂ්ටකරන හැටියට මම
සර්පයාට අණකරන්නෙමි. ඔවුන් 4
තමුන්ගේ සතුරන් ඉදිරියෙහි වාලට ගියත්,
එහිදී ඔවුන් මරන හැටියට කඩුවට
අණකරන්නෙමි. යහපත පිණිස නොව
විපත්තිය පිණිස මාගේ ඇස් ඔවුන් දෙස
යොමුකරන්නෙමි. මක්නිසාද පොළොව 5
දියවෙන හැටියටත් එහි සියලු වැසියන්
වැලපෙන හැටියටත් එය ගංගාව මෙන්
මුළුමනින්ම ගලා මිසරයේ ගංගාව
මෙන් බැසයන හැටියටත් ඊට අතගසන්නේ
සේනාවල දෙවිවූ ස්වාමීන්වහන්සේය.
උන්වහන්සේ තමන්ගේ උඩුමහල් අහස 6
පිට ගොඩනගා, තමන්ගේ අහස් කුහරය
පොළොව පිට පිහිටුවා තිබෙන්නාවූ,
මුහුදේ ජලයට අඬගසා ඒවා
පොළෝතලයෙහි වත්කරන්නාවූ,
යෙහෝවා යන නාමය ඇත්තාවූ
තැනන්වහන්සේය. ඉශ්‍රායෙල් පුත්‍රයෙනි, 7
තුඹලා මා ඉදිරියෙහි කූෂ්වරුන්ගේ
පුත්‍රයින්ට සමාන නොවෙත්දැයි
ස්වාමීන්වහන්සේ කියනසේක. මා විසින්
ඉශ්‍රායෙල්වරුන් මිසර දේශයෙන්ද
පිලිස්තිවරුන් කප්තෝර් සිටද අරාම්වරුන්
කීර් කෙරෙන්ද ගෙනාවා නොවේද?
බලව, ස්වාමිවූ දෙවියන්වහන්සේගේ 8
ඇස් පාපිෂ්ඨවූ රාජ්‍යය දෙසට යොමා
තිබේ, මම එය භූමිය මතුපිටින්
විනාශකරන්නෙමි; එහෙත් යාකොබ්
වංශය සහමුලින්ම විනාශ

*හෙබ්‍රෙව්: ෂෙයෝල්.

නොකරන්නෙමියි ස්වාමීන්වහන්සේ
9 කියනසේක. කිසි ඇටයක් බිම නොවැටෙන
හැටියට පෙනේරෙන් හලන්නාක්මෙන්
මම අණකර, ඉශ්‍රායෙල් වංශය සියලු
10 ජාතීන් අතරෙහි හලන්නෙමි. ඒ විපත්තිය
ළංවී අප පිටට නොපැමිණෙන්නේයයි
කියන්නාවූ, මාගේ සෙනඟගෙන්
පව්කාරයෝව සිටින්නාවූ සියල්ලෝ
කඩුවෙන් මැරෙන්නෝය.

## ඉශ්‍රායෙල් සෙනඟ නැවත පිහිටුවනු ලබන බව

11 ඒදෙමෙන් ඉතිරිවූ කොට්ඨාසයද මාගේ
නාමය දරන සියලු ජාතීන්ද ඔවුන්
12 විසින් හිමිකරගන්න පිණිස, වැටී තිබෙන
දාවිත්ගේ මණ්ඩපය මම ඒ කාලයේදී
පිහිටුවා, එහි කපොලු අහුරා, කඩාදමා
තිබෙන දේද පිහිටුවා, පුරාණයේ
දවස්වල මෙන් ඒක ගොඩනගන්නෙමියි
මෙය කරන ස්වාමීන්වහන්සේ කියන-
සේක. හීහාන්නා ගොයම් කපන්නාටත් 13
මුද්‍රිකපල මඩින්නා බීජ වපුරන්නාටත්
කිට්ටුවෙන දවස් පැමිණෙන්නේය; කඳු
මිහිරි මිදිපැන් වස්වන්නේය, සෑම හෙල්
දියවන්නේයයි ස්වාමීන්වහන්සේ කියන-
සේක. මම මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ගේ 14
වහල්කම පහකරන්නෙමි, ඔවුන් විනාශවී
තිබෙන නුවරවල් ගොඩනගා එහි වාසය
කරනවා ඇත; මිදිවතු වවා ඒවායේ
මුද්‍රිකපානය බොනවා ඇත; වතුද වවා
ඒවායේ ඵල කනවා ඇත. මම ඔවුන්ගේ 15
රටෙහි ඔවුන් පිහිටුවන්නෙමි, මා විසින්
ඔවුන්ට දී තිබෙන රටෙන් ඔවුන් තවත්
උදුරනු ලබන්නේ නැතැයි නුඹේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ කියනසේක.

# අනාගතවක්තෘවූ ඔබදියාගේ පොත

## ඒදොම් යටත්කරනු ලැබීම

1 ඔබදියාගේ දර්ශනයය.
ස්වාමිවූ දෙවියන්වහන්සේ ඒදොම් ගැන
මෙසේ කියනසේක: නැගිටපල්ලා, අපි
ඈට විරුද්ධව යුද්ධයට නැගිට යමුයයි
කියන්ට ජාතීන් අතරට පණිවිඩ-
කාරයෙක් අරිනු ලැබුවේය යන ආරංචිය
2 ස්වාමීන්වහන්සේ වෙතින් ලැබීමුව. බලව,
මම නුඹ ජාතීන් අතරෙහි කුඩා-
කෙළෙමි. නුඹ ඉතා සුළුකොට සලකනු
3 ලබයි. පර්වත විවරවල වසන්නාවූ, උස්වූ
වාසස්ථානයක් ඇත්තාවූ, මා බිම
හෙළන්නේ කවුදැයි තමාගේ සිතින්
සිතාගන්නාවූ නුඹ නුඹේ සිතේ
4 උඩඟුකමට රැවටුණෙහිය. නුඹ රාජාලියා
මෙන් නුඹේ කූඩුව ඉහළින් සාද තාරකා
අතරෙහි තැබුවත්, එතනින් නුඹ පහළට
හෙළන්නෙමියි ස්වාමීන්වහන්සේ කියන-
5 සේක. අහෝ නුඹ සිඳිනු ලැබූ හැටි!
සොරුවත් රාත්‍රියේ කොල්ලකාරයෝවත්
නුඹ ළඟට ආවෝ නම් තමුන්ට සෑහෙන
පමණ සොරකම්කර නොගන්නෝද?
මිදිඵල නෙළන්නෝ නුඹ ළඟට ආවෝ
නම් ඔවුන් ස්වල්පයක්වත් ඉතුරු
6 කරන්නේ නැද්ද? අනේ ඒසව්ගේ දේවල්
සොයාගනු ලැබූ හැටි! ඔහුගේ සඟවනලද
7 වස්තු සෝදිසිකරනු ලැබූ හැටි! නුඹේ
ගිවිසුමේ සියලු මනුෂ්‍යයෝ සීමාව දක්වා
නුඹ පන්නා හැරියෝය. නුඹ සමග
සමාදානයෙන් සිටි මනුෂ්‍යයෝ නුඹ රවටා
පරාජයකළෝය; නුඹේ කෑම කන අයද
නුඹ යට මලපතක් තබති. ඔහුට කිසි
8 තේරුමක් නැත. ඒ කාලයේදී මම
ඒදොමෙන් ප්‍රඥාවන්තයන්ද ඒසව්ගේ
කඳුකරයෙන් ඥානයද නැති නො-
කරන්නෙම්දැයි ස්වාමීන්වහන්සේ කියන-
සේක. ඒසව්ගේ කඳුකරයෙන් හැමදෙනාම 9
මරා සිඳදමනු ලබන පිණිස, එම්බා
තේමාන්, නුඹේ බලවන්තයෝ කැල-
ඹෙන්නෝය.

## ඒදොමේගේ පාපය, එනම්, ඉශ්‍රායෙල්ට කෲරකම් පෑම

නුඹේ සහෝදරවූ යාකොබ්ට කළ 10
බලාත්කාරය නිසා නුඹ ලජ්ජාවෙන්
වැසෙනවා ඇත, සදාකාලේටම සිඳදමනු
ලබනවා ඇත. නුඹ අහකට වී සිටිය 11
දවසේදීද, විදේශීන් ඔහුගේ දේපළ
ගෙනගියාවූ, පරදේශීන් ඔහුගේ දොරටුවලට
ඇතුල්වී යෙරුසලම ගැන දාදුදැමූවාවූ
දවසේදීද, නුඹත් ඔවුන්ගෙන් එක්-
කෙනෙක් මෙන් වූවෙහිය. නුඹේ සහෝ- 12
දරයාගේ දවස වන ඔහුගේ විපත්ති
දවස නොබලන්න, යූද පුත්‍රයන්ගේ
විනාශවීමේ දවසේදී ඔවුන් ගැන ප්‍රීති
නොවන්න; ඔවුන්ගේ විපත්ති දවසේදී
උඩඟුකමෙන් කථා නොකරන්න. මාගේ 13
සෙනඟගේ නාස්තිවීමේ දවසේදී ඔවුන්ගේ
දොරටුවලට ඇතුල් නොවන්න; එසේය,
ඔවුන්ගේ නාස්තිවීමේ දවසේදී ඔවුන්ගේ
විපත්තිය නොබලන්න, ඔවුන්ගේ නාස්-
තිවීමේ දවසේදී ඔවුන්ගේ සම්පත්වලට
අත නොපොවන්න. ඔවුන්ගෙන් පලා- 14
යන්නන් සිඳදමන්ට මංසන්ධියෙහි නො-
සිටින්න; විපත්ති දවසේදී ඔවුන්ගෙන්
ඉතිරිවූණ අය පාවා නොදෙන්න. මක්- 15
නිසාද සියලු ජාතීන්ට විරුද්ධව තිබෙන
ස්වාමීන්වහන්සේගේ දවස ළංව තිබේ.
නුඹ කළ හැටියටම නුඹට කරනවා
ඇත; නුඹේ ක්‍රියාව නුඹේම හිස පිටට
හැරී එනවා ඇත. එසේය, මාගේ ශුද්ධවූ 16

කන්දෙහි සිටින නුඹලා බීවාක් මෙන්
සියලු ජාතීන් නිතරම බොනවා ඇත,
එසේය, ඔවුන් බී, ගිලගන, ඔවුන් නො-
17 සිටියාක්මෙන් වෙනවා ඇත. නුමුත්
සියොන් කන්දෙහි සමහරෙක් මිදී
සිටිනවා ඇත, එයද ශුද්ධව තිබෙන්-
නේය; යාකොබ්ගේ වංශය තමුන්ගේ
උරුමවල් උරුමකරගන්නවා ඇත.
18 තවද යාකොබ්ගේ වංශය ගින්නක්ද
යෝසෙප්ගේ වංශය ගිනිදල්ලක්ද ඒසව්ගේ
වංශය ඉපනැලිද වන්නේය. එසේ ඔවුන්
ඒසව්ගේ වංශයෙන් කිසිවෙකු ඉතුරු
නොවන හැටියට ඔවුන් පත්තුකර දවා
දමනවා ඇත; මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේ** ඒක කීසේක. තවද දකුණු 19
දිශාවේ අය ඒසව්ගේ කඳුකරයත් පාත
රටේ අය පිලිස්තිවරුන්ගේ රටත් හිමි-
කරගන්නවා ඇත. ඔවුන් ඒප්‍රායිම් කෙත්
හා සමාරියේ කෙත්ද බෙන්යමින්වරුන්
ගිලියද්ද හිමිකරගන්නවා ඇත. කානාන්- 20
වරුන් අතරේ වාල්වී සිටින ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගෙන් මේ සමූදව ශාරෙපත්
දක්වාම හිමිකරගන්නෝය; සෙපාරද්හි
වාල්වී සිටින යෙරුසලමේ අය දකුණු
දිශාවේ නුවරවල්ද හිමිකර ගන්නෝය.
තවද ඒසව්ගේ කඳුකරය විනිශ්චයකරන්ට 21
ගැළවුම්කාරයෝ සියොන් කන්දෙහි
නැගිටින්නෝය; රාජ්‍යයද **ස්වාමීන්-**
**වහන්සේගේ** වන්නේය.

# අනාගතවක්තෘවූ යෝනාගේ පොත

---

### යෝනා දේව අණට අකීකරුවීම. මහත් කුණාටුවක් පැමිණීම. මත්ස්‍යයා විසින් ගිලිනු ලැබීම

1 ස්වාමීන්වහන්සේගේ වචනය
අමිත්තයිගේ පුත්‍රවූ යෝනා වෙතට
2 පැමිණ: නුඹ නැගිට නිනිවය නම් මහත්
නුවරට ගොස් ඊට විරුද්ධව මොර-
ගසාපන්න; මක්නිසාද ඔවුන්ගේ දුෂ්ටකම
මා ඉදිරියට පැමිණ තිබේයයි කීසේක.
3 එහෙත් යෝනා **ස්වාමීන්වහන්සේ**
ඉදිරියෙන් තර්ෂීෂ්ට පලා යන පිණිස
නැගිට, යොප්පාවට බැසගොස්, තර්ෂීෂ්ට
යන නැවක් එහි සම්බවී, ඊට ගාස්තුව
ගෙවා, **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙන් ඔවුන්
සමග තර්ෂීෂ්ට යන පිණිස ඒකට
4 නැගුණේය. නුමුත් **ස්වාමීන්වහන්සේ** තද
හුළඟක් මුහුද පිටට පැමිණෙවූසේක,
එයින් මුහුදේ මහත් කුණාටුවක් වී
5 නැව බිඳෙන්ට ළංවිය. එකල නැවි-
කාරයෝ භයව, එක එකා තම තමාගේ
දෙවියන්ට මොරගසා, නැව සැහැල්ලු-
කරගැනීමට එහි තිබුණු බඩු මුහුදේ
දැමුවෝය. එහෙත් යෝනා නැවේ ඇතුළට
බැස හාන්සිවී තද නින්දට පැමිණ
6 හුන්නේය. එවිට නැවේ ප්‍රධානියා ඔහු
ළඟට ඇවිත්: නුඹ නිදගන ඉන්නේ
මක්නිසාද? නැගිට නුඹේ දෙවියන්-
වහන්සේගෙන් පිහිට ඉල්ලාපන්න,
සමහරවිට අප විනාශ නොවන ලෙස
දෙවියන්වහන්සේ අප ගැන කල්පනා-
7 කරනවා ඇතැයි ඔහුට කීවේය. ඔව්හු:
මේ විපත්තිය අපට පැමුණුණේ කා
නිසාදැයි දැනගන්නා පිණිස පසඇට
දමමුයයි ඔවුනොවුන් කථාකරගත්තෝය.
එසේ ඔවුන් පසඇට දැමූ විට පසඇටය
යෝනාට වැටුණේය. එවිට ඔව්හු: මේ 8
විපත්තිය අපට පැමුණුණේ මක්නිසාද
කියා අපට කියාපන්න; නුඹේ රක්ෂාව
මොකද? නුඹ කොතන සිට ආවාද?
නුඹේ රට කිමෙක්ද? නුඹ මොන ජාතියේ
කෙනෙක්දැයි ඔහුගෙන් ඇසුවෝය. ඔහුද: 9
මම හෙබ්‍රෙව්වෙක්ය; මම වනාහි මුහුදත්
ගොඩබිමත් මැවුවාවූ ස්වර්ගයේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** අදහමියි ඔවුන්ට කීය.
එකල ඒ මනුෂ්‍යයෝ ඉතා භයපත්ව: 10
නුඹ කළ මේ දේ කිමෙක්දැයි ඔහුට
කීවෝය. එසේ කීවේ තමා **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙන් පලායන බව ඔහු
ඒ මනුෂ්‍යයන්ට කියා තිබී, ඔවුන් එය
දැනගන සිටි නිසාය. එකල ඔව්හු: 11
මුහුද අපට නිශ්චලවෙන පිණිස අප
විසින් නුඹට කරන්ට ඕනෑ මොකදැයි
ඔහුගෙන් ඇසුවෝය: මක්නිසාද මුහුද
වඩ වඩා වේගවත් විය. මා අරන් මුහුදේ 12
දමාපල්ලා; එවිට මුහුද නුඹලාට
නිශ්චලවන්නේය. කුමක්හෙයින්ද මේ
මහත් කුණාටුව නුඹලා පිටට පැමිණ
තිබෙන්නේ මා නිසා බව දනිමියි ඔහු
ඔවුන්ට කීවේය. එහෙත් ඒ මනුෂ්‍යයෝ 13
ගොඩට හැරීඑන පිණිස තදින් පැද්දෝය;
නුමුත් මුහුද ඔවුන්ට විරුද්ධව වඩ වඩා
සැරවූ බැවින් ඔවුන්ට බැරිවිය. එවිට 14
ඔව්හු **ස්වාමීන්වහන්සේට** හඬගසා:
අහෝ **ස්වාමීන්වහන්ස**, මේ මනුෂ්‍යයාගේ
ප්‍රාණය නිසා අප පිට විනාශයක්
නොවේවා, නිදෙස් ලේද අප පිට
නොතැබුව මැනව. මක්නිසාද, **ස්වාමීන්-**
**වහන්ස**, ඔබ කැමති ලෙසම කළසේකැයි
කීවෝය. එවිට ඔව්හු යෝනා අරන් 15
මුහුදේ දැමූහ. මුහුදේ වේගයද නැවතුණේය.

16 එකල ඒ මනුෂ්‍යයෝ ස්වාමීන්වහන්සේ
කෙරේ අතිශයින් භයව, ස්වාමීන්-
වහන්සේට පූජාවක් ඔප්පුකොට, බාරවල්
17 වුණෝය. තවද ස්වාමීන්වහන්සේ යෝනා
ගිලින්ට මහා මත්ස්‍යයෙකු පත්කළසේක;
යෝනා වනාහි දවල් තුනක්ද රෑ තුනක්ද
මත්ස්‍යයාගේ බඩේ සිටියේය.

## යෝනාගේ යාච්ඤාව සහ ස්තුති ප්‍රශංසාව

2 එකල යෝනා මත්ස්‍යයාගේ බඩේ
සිට තමාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට යාච්ඤාකරමින් මෙසේ
කීවේය:–

2 මාගේ පීඩාව නිසා ස්වාමීන්වහන්සේට
හඬගැසීමි,
උන්වහන්සේද මට උත්තරදුන්සේක;
*පාතාල ගැබේ සිට කෑගැසීමි,
ඔබ මාගේ හඬ ඇසූසේක.
3 ඔබ මුහුදු මධ්‍යයේ ගැඹුරට මා
හෙළූසේක,
ජලධාරාවද මා වටකර තිබුණේය;
ඔබගේ රැළ හා ඔබගේ ජලකඳු
සියල්ල මට උඩින් ගලාගියේය.
4 එවිට මම: ඔබගේ ඇස් හමුයෙන්
පහකරනු ලැබීමි;
එහෙත් ඔබගේ ශුද්ධ මාළිගාව දෙස
නැවත බලන්නෙමියි කීමි.
5 ජලයෝ ප්‍රාණ හානිය දක්වා මා වට
කරගත්තෝය;
ගැඹුර මා වටේට පැමිණියේය;
මුහුදු පන් මාගේ ඉස වටේ එතුණේය.
6 කඳුවල පතුලට බැස්සෙමි;
පොළොව ස්වකීය අගුල්වලින්
සදාකාලේටම මා හිරකරගත්තේය.
එහෙත්, මාගේ දෙවිවූ ස්වාමීන්වහන්ස,
ඔබ මාගේ ප්‍රාණය වළෙන් ගොඩට
ගත්සේක.
7 මා තුළ මාගේ ආත්මය ක්ලාන්තවූ
විට, මම ස්වාමීන්වහන්සේ සිහි
කෙළෙමි.
මාගේ යාච්ඤාව ඔබ වෙතට, ඔබගේ
ශුද්ධ මාළිගාවට, පැමිණියේය.

*හෙබ්‍රෙව්: ෂෙයෝල්.

බොරු නිරර්ථක දේවල් සලකන්නෝ 8
තමුන්ගේම රක්ෂස්ථානය හැර දමති.
එහෙත් මම ස්තුති හඬකින් ඔබට පූජා 9
ඔප්පුකරන්නෙමි;
බාරවූ දේ ගෙවන්නෙමි.
ගැළවීම අයිති ස්වාමීන්වහන්සේට
යයි කීවේය.
ස්වාමීන්වහන්සේ මත්ස්‍යයාට කථා 10
කළසේක, එවිට ඌ යෝනා ගොඩට
වමාරාලූයේය.

## යෝනා නිනිවයේ දේශනාකිරීම. සෙනග පසුතැවිලිව කමාව ලැබීම

3 ස්වාමීන්වහන්සේගේ වචනය
යෝනා වෙතට දෙවෙනි වර
පැමිණ: නුඹ නැගිට නිනිවය නම් මහත් 2
නුවරට ගොස්, මා විසින් නුඹට කියන
කාරණා එහි ප්‍රකාශකරපන්නැයි කී-
සේක. එවිට යෝනා නැගිට ස්වාමීන්- 3
වහන්සේගේ වචනයේ හැටියට නිනිවයට
ගියේය. නිනිවය වනාහි තුන් දවසක
ගමන් ප්‍රමාණවූ ඉතා මහත් නුවරක්ය.
යෝනා නුවරට ඇතුල්වෙන්ට පටන්ගෙන 4
දවසක ගමන් යමින්: තව සතළිස්
දවසකින් නිනිවය පෙරළාදමනු ලැබේයයි
කියා ප්‍රකාශකෙළේය. එවිට නිනිවයෙහි 5
මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේ කෙරෙහි
විශ්වාසකොට, උපවාසයක් ප්‍රසිද්ධකර,
ලොකු අය පටන් කුඩා අය දක්වා
ගෝණිරෙදි ඇඳගත්තෝය. ඒ ආරංචිය 6
නිනිවයේ රජු වෙතට පැමුණුණු විට,
හෙතෙම තමාගේ සිංහාසනයෙන් බැස,
තමාගේ සළුව අහක තබා, ගෝණිරෙදි
පෙරවාගෙන, අළු පිට හිඳගත්තේය. තවද 7
රජු සහ ඔහුගේ උත්තමයන්ගේ ආඥාව
පිට: මනුෂ්‍යයෙක්වත් මෘගයෙක්වත්
ගවයෙක්වත් බැටළුවෙක්වත් කිසිවක් රස
නොබලත්වා. කිසි කෑමක් නොකත්වා,
වතුර නොබොත්වා. මනුෂ්‍යයාද 8
මෘගයාද ගෝණිරෙදි පෙරවාගෙන,
දෙවියන්වහන්සේට බලවත්ලෙස මොර-
ගසත්වා. එසේය, ඔවුන් එකිනෙකා තම
තමාගේ නපුරු මාර්ගයෙන්ද තමුන්ගේ

9 අත්වල බලාත්කාරයෙන්ද හැරේවා. අප
විනාශ නොවන ලෙස සමහරවිට
දෙවියන්වහන්සේ හැරී, තැවී, තමන්ගේ
බලවත් උදහසෙන් නොහැරෙනසේක්ද
කියා දන්නේ කවුද්දයි නිනිවයෙහි
10 ප්‍රකාශකරන ලද්දේය. එවිට ඔවුන්ගේ
ක්‍රියා–එනම් තමුන්ගේ නපුරු මාර්ගයෙන්
ඔවුන් හැරුණු බව–දෙවියන්වහන්සේ
දැක, ඔවුන්ට කරමියි කීවාවූ විපත්තිය
ගැන තැවී, ඒක නොකළසේක.

## යෝනාගේ නොසතුටුභාවය. ස්වාමීන්වහන්සේගේ අනුකම්පාව

4 නුමුත් යෝනා ඊට අතිශයින්
2 අප්‍රසන්නව, කෝපවිය. ඔහු **ස්වාමීන්-
වහන්සේට** යාච්ඤාකරමින්: අනේ
**ස්වාමීන්වහන්ස**, මාගේ රටේ සිටියදීම
මා කීවේ මෙය නොවේද? එබැවින්
මම තර්ෂීෂ්ට පලායන්ට ඉක්මන්
කෙළෙමි. මක්නිසාද ඔබ දයාවන්තවූ,
අනුකම්පා ඇත්තාවූ, ඉවසිලිවන්තවූ,
ඉතා කරුණාවන්තවූ, විපත්තිය ගැන
තැවෙන්නාවූ දෙවිකෙනෙකු බව දැනගෙන
3 සිටියෙමි. ඉතින්, **ස්වාමීන්වහන්ස**, මාගේ
ප්‍රාණය මාගෙන් තුරන්කරගන මැනව;
ජීවත්වීමට වඩා නැසීයාම මට හොඳයයි
4 කීවේය. නුමුත් **ස්වාමීන්වහන්සේ**:
කෝපවෙන්ට නුඹට යුතුදැයි කීසේක.
5 යෝනා නුවරින් පිටතට ගොස්, නුවරට
නැගෙනහිරෙන් ඉඳගත්තේය, ඔහු එහි
පැලක් සාදගෙන, නුවරට මක්වේද කියා
බලන පිණිස ඒක යට සෙවණෙහි
හිඳගත්තේය. දෙවිවූ **ස්වාමීන්වහන්සේ** 6
ලබු වැලක් නියමකර, යෝනා ඔහුගේ
දුකින් මුදන්ට ඔහුගේ හිසට උඩින්
සෙවණක් වීමට ඒක ඔහුට උඩින් යන්ට
සැලැස්සූසේක. යෝනා ලබුවැල ගැන
ඉතා ප්‍රීතිවුණේය. එහෙත් පසුවද පහන්වූ 7
විට දෙවියන්වහන්සේ පණුවෙකු
නියමකළසේක, ඌ ලබුවැල කෑ විට
ඒක වියළී ගියේය. තවද ඉර උදාවූ කල 8
දෙවියන්වහන්සේ ග්‍රීෂ්මය ඇති පෙරදිග
හුළඟක් නියමකළසේක; අව්ව යෝනාගේ
ඉසට වැදී, ඔහු ක්ලාන්තවී, තමාගේ
ප්‍රාණය හානිවෙන ලෙස ඉල්ලා:
ජීවත්වීමට වඩා නැසීයාම මට හොඳයයි
කීවේය. ලබුවැල ගැන කෝපවෙන්ට 9
නුඹට යුතුදැයි දෙවියන්වහන්සේ
යෝනාට කීසේක. මැරෙන තරම්
කෝපවෙන්ට මට යුතුයයි ඔහු
කීවේය. එවිට **ස්වාමීන්වහන්සේ**: නුඹේ 10
මාන්සිවීමක්වත් වැවීමක්වත් නැතුව
රාත්‍රියකින් හටගෙන රාත්‍රියකින්
නැතිවීගිය ලබුවැල කෙරෙහි නුඹ
අනුකම්පාකෙළෙහිය. එසේ නම්, තමුන්ගේ 11
දකුණතවත් වමතවත් නොදන්න
එක්ලක්ෂ විසිදහසකට වඩා මනුෂ්‍යයන්ද
බොහෝ මෘගයන්ද සිටින්නාවූ නිනිවය
නම්වූ ඒ මහත් නුවර කෙරෙහි මාත්
අනුකම්පාකළ යුතු නොවේදැයි කීසේක.

# අනාගතවක්තෘවූ මීකාගේ පොත

## යූද සහ ඉශ්‍රායෙල් කෙරෙහි විනිශ්චය

1 යෝතාම්ද ආහාස්ද හෙසකියාද
යන යූදහි රජවරුන්ගේ දවස්වලදී
මොරෂ්තිය මීකා වෙතට පැමිණුනාවූ,
සමාරිය සහ යෙරුසලම ගැන ඔහු
දුටුවාවූ **ස්වාමීන්වහන්සේගේ** වචනයය.
2 ජනයෙනි, නුඹලා සියල්ලෝ අසා-
පල්ලා; පොළොව සහ එහි ඇති සියල්ල,
ඇහුම්කන්දියල්ලා. ස්වාමීන්වහන්සේ වන
ස්වාමිවූ **දෙවියන්වහන්සේ** තමන්ගේ
ශුද්ධවූ මාළිගාවේ සිට නුඹලාට
විරුද්ධව සාක්ෂිකාර වනසේක්වා.
3 මක්නිසාද **ස්වාමීන්වහන්සේ** තමන්
ස්ථානයෙන් පිටත්වී බැස ඇවිත්,
පොළොවේ උසස්ථාන පිට ඇවිදින-
4 සේක. උන්වහන්සේ යට කඳු දියවන්නේය,
ගින්න ඉදිරියෙහි ඉටි මෙන්ද පල්ලමක
වගුරුවන වතුර මෙන්ද මිටියාවත්
5 පැළෙන්නේය. මේ සියල්ල වන්නේ
යාකොබ්ගේ වරද සහ ඉශ්‍රායෙල් වංශයේ
පාපවල් නිසාය. යාකොබ්ගේ වරද
මොකද? සමාරිය නොවේද? යූදහි
උස්තැන් මොනවාද? යෙරුසලම
6 නොවේද? එබැවින් මම සමාරිය කෙතේ
ගොඩක්ද මිදිවතුද කරන්නෙමි. එහි ගල්
මිටියාවතට වගුරුවා, එහි අත්තිවාරම්
7 ප්‍රකාශකරන්නෙමි. එහි කැපූ රූප සියල්ල
පොඩිකරනු ලබනවා ඇත, එහි පඬියම්
සියල්ලම ගින්නෙන් දවනු ලබනවා ඇත,
එහි දේවරූප සියල්ලද නාස්තිකරන්-
නෙමි. මක්නිසාද ඈ වේශ්‍යාවෙකුගේ
පඬියම්වලින් ඒවා එක්කරගත්තාය; ඒවා
වනාහි වේශ්‍යාවෙකුගේ පඬියම්වලට
හැරෙනවා ඇත.

## මේ සම්බන්ධ විලාපය

ඉන්නිසා මම වැලපී කෑගසන්නෙමි, 8
වස්ත්‍ර ගළවා නිර්වස්ත්‍රව යන්නෙමි.
සිවලුන් මෙන් විලාපයක් කරන්නෙමි,
පැස්බරුන් මෙන් වැලපෙන්නෙමි.
මක්නිසාද ඇගේ තුවාල අසාධ්‍යව තිබේ. 9
එය යූද දක්වාත් පැමුණුණේය; මාගේ
සෙනඟගේ දොරටුව දක්වාම යෙරුසලම
ළඟටම ආයේය. ගාත්හි එය නොදන්වව්, 10
අක්කොවෙහි නාඬව්. බෙත්-ලෙ-අප්‍රාහි
දූවිල්ලේ පෙරළී ඉඳින්න. ෂාපීර්හි 11
වාසයකරන්නිය, නිර්වස්ත්‍රව, ලජ්ජා
ඇතිව පලයන්න. ශයනාන්හි වසන්නී
පිටතට ආවේ නැත; බෙත්-ඒශෙල්හි
වැලපීම නිසා එහි පිහිට නුඹලාගෙන්
පහවන්නේය. මාරෝත්හි වාසයකරන්නී 12
යහපත ගැන ආශාවෙන් බලාසිටියි.
මක්නිසාද විපත්තිය **ස්වාමීන්වහන්සේ**
වෙතින් යෙරුසලමේ දොරටුව ළඟට බැස
තිබේ. අහෝ ලාකීෂ්හි වාසයකරන්නිය, 13
ශීඝ්‍ර අශ්වයා රථයේ බැඳපන්න. ඈ
වනාහි සියොන් දූවට පාපයේ
පටන්ගැන්මය; මක්නිසාද ඉශ්‍රායෙල්ගේ
වරද නුඹ තුළ සම්බවිය. එබැවින් නුඹ 14
මෝරෙෂෙත්-ගාත්ට අත්ඇරීම් පත්‍රයක්
දෙනවා ඇත. අක්සීබ් වංශ ඉශ්‍රායෙල්
රජුන්ට රැවටිල්ලක් වන්නේය. එම්බා 15
මරේෂාහි වාසයකරන්නිය, නුඹ හිමි-
කරගන්නා නැවත නුඹ ළඟට
පමුණුවන්නෙමි. ඉශ්‍රායෙල්ගේ තේජස
අදුල්ලාම්ට පවා පැමිණෙන්නේය. නුඹේ 16
හිස බූගා, නුඹේ ප්‍රිය දරුවන් නිසා හිස
මුඩුකොට, නුඹේ මුඩුකම රාජාලියා
මෙන් පළල්කරගනින්න; මක්නිසාද ඔව්හු
නුඹ වෙතින් වාලට ගියෝය.

## දේශයේ පොහොසතුන්ගේ තණ්හාව හා පීඩාකිරීම

**2** තමුන්ගේ යහන්වලදී අපරාධ යොද
නපුර පිළියෙළකරන්නන්ට දුක්වේ!
පසුවද එළිවෙන කොට ඔවුන්ගේ අතට
බලය ලැබෙන නිසා ඔව්හු ඒක
2 ඉෂ්ටකරති. ඔව්හු කෙත්වලට ආශාවී,
ඒවා අල්ලාගනිති; ගෙවල්වලටත් ආශාවී,
ඒවා පැහැරගනිති. ඔව්හු පුරුෂයෙකුට
සහ ඔහුගේ ගෙදරටත්, එසේය,
පුරුෂයෙකුට සහ ඔහුගේ උරුමයටත්
3 බලාත්කාරකම් කරති. එබැවින්
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
බලව, මම මේ වංශයට විරුද්ධව
විපත්තියක් යොදමි, එයින් තුඹලාගේ
කුළල් අහකට ගන්ටවත් උඩඟුලෙස
ඇවිදින්ටවත් තුඹලාට බැරිවන්නේය;
4 මක්නිසාද ඒක විපත්ති කාලයක්ය. ඒ
කාලයේදී ඔවුන් තුඹලා ගැන උපමාවක්
කියමින්ද දුක්මුසුවූ ළතෝනියකින්
ළතෝනි කියමින්ද: අපි සහමුලින්ම
නාස්තිවුණෙමුව. උන්වහන්සේ මාගේ
සෙනහගේ කොටස මාරුකරනසේක.
ඒක මාගෙන් පහකරන හැටි!
කැරළිකාරයන්ට උන්වහන්සේ අපේ කෙත්
5 බෙදදෙනසේකැයි කියනවා ඇත. එබැවින්
**ස්වාමීන්වහන්සේගේ** සභාවෙහි පසඇට
දමීමෙන් ලතුවක් අදින කෙනෙක් තුඹට
6 නොසිටින්නේය. අනාගතවාක්‍ය නො-
පවසල්ලායයි ඔව්හු අනාගතවාක්‍ය
කියති. තින්දවල් පහව නොයන්නේයයි
7 ඔව්හු කියති. යාකොබ් වංශයේ
තැනැත්තෙනි, **ස්වාමීන්වහන්සේගේ**
ආත්මය අඩුවෙලාද? මේවා උන්වහන්සේගේ
ක්‍රියාද? අවංකලෙස හැසිරෙන්නාට
මාගේ වචනවලින් යහපත සිද්ධවෙනවා
8 නොවේද? එහෙත් පුරාණයේ සිට මාගේ
සෙනහ සතුරෙකු මෙන් නැගුටුණාය.
යුද්ධයෙන් හැරීඑන අය මෙන් භය නැතුව
යන්නන්ගෙන් තුඹලා සළුව ඇතුළුව
9 පොරෝණයත් ගළවාගන්නහුය. තුඹලා
මාගේ සෙනහගේ ස්ත්‍රීන් තමුන්ගේ ප්‍රිය
ගෙවල්වලින් පන්නා දමන්නහුය; ඔවුන්ගේ
බාල දරුවන්ගෙන්ද මාගේ මහිමය
සදකාලේටම පහකරන්නහුය. මේක 10
තුඹලාගේ නිවාසය නොවන නිසා
නැගිට පලයල්ලා. අපවිත්‍රකම නිසා
බලවත් විනාශයකින් ඒක තුඹලාව
විනාශකරනවා ඇත. සුළඟද වංචාවද 11
ඇතුව ඇවිදින මනුෂ්‍යයෙක්: මම
මුද්‍රිකපානයත් සුරාපානයත් ගැන තුඹට
අනාගතවාක්‍ය පවසන්නෙමියි කියා
බොරු කියන්නේ නම්, ඔහු මේ
සෙනහගේ අනාගතවක්තෘ වන්නේය.
එම්බා යාකොබ්, මම සැබවින් තුඹලා 12
සියල්ලන් රැස්කර, ඉතුරු ඉශ්‍රායෙල්වරුන්
එකතුකර, බොශ්රාහි බැටළුවන් මෙන්
ඔවුන් එක්කාසුකරන්නෙමි. ගොදුරු බිම
මැද සතුන් රැළක් මෙන් මිනිසුන් රාශිය
නිසා ඝෝෂාවක් වන්නේය. කඩාදමන්නා 13
ඔවුන්ට පෙරටුව නැගී ගියේය. ඔව්හු
බිඳගෙන දොරටුව පසුකර, එයින් පිටතට
ගියෝය. ඔවුන්ගේ රජ ඔවුන්ට ඉස්සරින්
ගියේය, **ස්වාමීන්වහන්සේ** ඔවුන්ට පෙරටුව
ගියසේක.

## ප්‍රධානීන්ගේ දුෂ්ටකම සහ එහි විපාකය

තවද මම මෙසේ කීවෙමි: **3**
යාකොබ්ගේ ප්‍රධානියෙනි, ඉශ්‍රායෙල්
වංශයේ ආණ්ඩුකාරයෙනි, අසාපල්ලා.
විනිශ්චය දැනගැනීම තුඹලාගේ
යුතුකමක් නොවේද? තුඹලා යහපතට 2
ද්වේෂකොට නපුරට ප්‍රේමවන්නහුය;
තුඹලා ඔවුන්ගෙන් ඔවුන්ගේ හමද
ඔවුන්ගේ ඇටවලින් ඔවුන්ගේ මාංසද
ගළවන්නහුය. එසේ ඒ අය මාගේ 3
සෙනහගේ මාංස කන්නෝය; ඔවුන්ගේ
හම ඔවුන්ගෙන් ගළවන්නෝය, ඔවුන්ගේ
ඇටද පොඩිකර, ඇතිලියේ දමීමට
මෙන්ද කටාරමේ මාංසය මෙන්ද කැලි
කරන්නෝය. එකල ඔව්හු **ස්වාමීන්-** 4
**වහන්සේට** මොරගසන්නෝය, නුමුත්
උන්වහන්සේ ඔවුන්ට උත්තර නොදී,
ඔවුන් නපුරු ක්‍රියාවල් කළ හෙයින් ඒ
කාලයේදී තමන්ගේ මුහුණ ඔවුන්ගෙන්
සඟවාගන්නාසේක. මාගේ සෙනහ 5

මුළාකරවන්නාවූ, තමුන්ගේ දත්වලින්
හපාකන අතර: සමාදානයයයි මොර-
ගසන්නාවූ, තමුන්ගේ කටට කෑම
නොදෙන අයට විරුද්ධව යුද්ධයට
පේවෙන්නාවූ අනාගතවක්තෘවරුන් ගැන
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
6 තුඹලා එසේ කරන බැවින්
දර්ශනයක් නැතුව තුඹලාට රෑවෙනවා
ඇත; පේනකීමක් නැතුව තුඹලාට
අන්ධකාරවෙනවා ඇත; අනාගත-
වක්තෘවරුන්ට ඉර බසිනවා ඇත,
දවාලද ඔවුන්ට උඩින් කළුවරවෙනවා
7 ඇත. දර්ශනකාරයන් ලජ්ජාවටත්
පේනකියන්නන් වියවුල්කමටත් පැමිණ,
දෙවියන්වහන්සේගෙන් උත්තරයක් නැති
නිසා ඔවුන් සැමදෙනාම තමුන්ගේ තොල්
8 වසාගන්නවා ඇත. එහෙත් මම වනාහි
යාකොබ්ට ඔහුගේ වරදත් ඉශ්‍රායෙල්ට
ඔහුගේ පාපයත් දන්වන්ට **ස්වාමීන්-
වහන්සේගේ** ආත්මය ඇතුව, බලයෙන්ද
යුක්තියෙන්ද ධෛර්යයෙන්ද පූර්ණව
9 සිටිමි. යුක්තියට පිළිකුල්කොට, සියලු
යුතුකම් පෙරළා, සියොන් ලේවලින්ද
යෙරුසලම අධර්මිෂ්ඨකමෙන්ද ගොඩ-
10 නගන්නාවූ, යාකොබ්ගේ වංශයේ
ප්‍රධානියෙනි, ඉශ්‍රායෙල් වංශයේ
11 ආණ්ඩුකාරයෙනි, මේක අසාපල්ලා. එහි
ප්‍රධානියෝ තෑග්ගක් නිසා විනිශ්චය
කරති, පූජකයෝ කුලියට උගන්වති, එහි
අනාගතවක්තෘවරුද මිලේට පේනකියති.
එහෙත් ඔව්හු **ස්වාමීන්වහන්සේ** කෙරෙහි
පිහිටා සිට: **ස්වාමීන්වහන්සේ** අප
අතරෙහි සිටිනවා නොවේද? අප පිටට
විපත්තියක් නොපැමිණෙන්නේයයි කියති.
12 එබැවින් තුඹලා නිසා සියොන් කෙතක්
මෙන් හානු ලබන්නේය, යෙරුසලම
ගොඩවල්ද ගෘහයේ කන්ද කැලෑ මුදුන්ද
වෙනවා ඇත.

## මතු පැමිණෙන සියොන් රාජ්‍යයේ තේජස

4 නුමුත් මතු දවස්වලදී **ස්වාමීන්-
වහන්සේගේ** ගෘහයේ පිහිටි කන්ද
කඳුවල මුදුනේ පිහිටුවනු ලබන්නේය,
හෙල්වලට වඩා උසස්වන්නේය; ජනයෝ
එය කරා ගලාගන එන්නෝය. බොහෝ 2
ජාතීන්ද ගොස් කථාකොට: වරෙල්ලා,
**ස්වාමීන්වහන්සේගේ** කන්දටත්
යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ
ගෘහයටත් යමු; උන්වහන්සේ තමන්ගේ
මාර්ග ගැන අපට උගන්වනවා ඇත,
අපිද උන්වහන්සේගේ මාවත්වල
යන්නෙමුයයි කියනවා ඇත. මක්නිසාද
ශික්ෂාව සියොන් කෙරෙන්ද **ස්වාමීන්-
වහන්සේගේ** වචනය යෙරුසලමෙන්ද
නිකුත්වන්නේය. උන්වහන්සේ බොහෝ 3
ජනයන් අතරේ විනිශ්චයකොට, දුරින්
සිටින බලවත් ජාතීන්ට තීන්දුව
කියනසේක; ඔවුන් තමුන්ගේ කඩුවලින්
නීවැල්ද හෙල්ලවලින් දෑකැතිද
තළාගන්නෝය. ජාතියක් ජාතියකට
විරුද්ධව කඩුව ඔසවන්නේවත් ඔවුන්
තවත් යුද්ධය ඉගෙනගන්නේවත් නැත.
තවද ඔව්හු කිසිවෙකුගෙන් භයක් 4
නොලැබ, එකිනෙකා තම තමාගේ
මිදිවැල යටද අත්තික්කා ගස යටද
වාසයකරනවා ඇත. මක්නිසාද
සේනාවල **ස්වාමීන්වහන්සේගේ** මුඛය එය
වදළේය. එසේය, සියලු ජනයෝ තම 5
තමුන්ගේ දෙවිවරුන්ගේ නාමයෙන්
හැසිරෙන්නෝය, අපිද අපේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** නාමයෙන්
සදාකාලයටම හැසිරෙන්නෙමුව.
ඒ කාලයේදී මම කොරගසගසා 6
යන්නන් රැස්කර, පන්නාදමනු ලැබුවන්ද
මා විසින් විපත්තියට පැමිණුවූ අයද
එකතුකරන්නෙමි; මම කොරගසගසා 7
යන්නන් ඉතුරුවෙන්ට සලස්වා, ඈත්
කරනු ලැබූ අය බලවත් ජාතියක්
කරන්නෙමි. **ස්වාමීන්වහන්සේ** සියොන්
කන්දේ ඔවුන් කෙරෙහි මෙතැන් පටන්
සදාකාලයටම රජකම්කරනසේක. එම්බා 8
රැළේ කොත, සියොන් දුවගේ හෙල,
තුඹ වෙතට පළමු ආණ්ඩුව එන්නේය,
එසේය, යෙරුසලම් දුවගේ රාජ්‍යය
එන්නේයයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
ඉතින් තුඹ සෝෂාකරන්නේ මන්ද? තුඹ 9
තුළ රජෙක් නැද්ද? තුඹේ මන්ත්‍රීවරු
නැතිවූද? මක්නිසාද වදන ස්ත්‍රියෙකුට

මෙන් වේදනාව තුඹට අල්ලා තිබේ.
10 සියොන් දුව, වදන ස්ත්‍රියෙකු මෙන්
වේදනා විඳ වදපන්න. මක්නිසාද තුඹ
දැන් නගරයෙන් පිටතට ගොස් එළියේ
වාසයකොට, බබිලෝනියට පැමිණෙන්නීය;
එහිදී තුඹ නිදහස් කරනු ලබන්නීය;
එහිදී **ස්වාමීන්වහන්සේ** තුඹේ සතුරන්ගේ
11 අතින් තුඹ මුදගන්නසේක. දැන් වනාහි
බොහෝ ජාතීන් තුඹට විරුද්ධව රැස්ව
සිට: ඈ කිලුටුකරනු ලබාවා, සියොන්
කෙරෙහි අපේ ඇසේ ආශාව
12 ඉෂ්ටවේවායි කියති. තුමුත් ඔව්හු
**ස්වාමීන්වහන්සේගේ** අදහස් නොදනිති,
උන්වහන්සේගේ මන්ත්‍රණය, එනම්
උන්වහන්සේ පාවරෙහි ගොයම් මිටි
මෙන් ඔවුන් එකතුකරගත් බව ඔව්හු
13 තේරුම් නොගනිති. සියොන් දුව නැගිට
මැඩපන්න. මක්නිසාද මම තුඹේ අඟ
යකඩ කරන්නෙමි, තුඹේ කුර පිත්තල
කරන්නෙමි. තුඹ බොහෝ ජනයන්
පොඩිකර, ඔවුන්ගෙන් ගන්න කොල්ලය
**ස්වාමීන්වහන්සේටත්** ඔවුන්ගේ සම්පත්
මුළු පොළොවේ ස්වාමීන්වහන්සේටත්
**5** කැපකරන්නෙහිය. ඉතින් සමූදවල
දියණියනි, සමූද වශයෙන්
රැස්වෙයන්න. ඔහු අපට විරුද්ධව
බලකොටු බැඳ තිබේ. ඔව්හු ඉශ්‍රායෙල්ගේ
විනිශ්වයකාරයාගේ කම්මුලට දණ්ඩකින්
පහරදෙන්නෝය.

## පොරොන්දුවූ මෙසියස්වහන්සේ සහ උන්වහන්සේගේ රාජ්‍යය

2 තුමුත් බෙත්-ලෙහෙම් එප්‍රාතා, යූදගේ
දහස් ගණන් අතරෙහි සිටීමට කුඩාව
සිටින තුඹෙන්, ඉශ්‍රායෙල් කෙරෙහි
ආණ්ඩුකාරයා වීමට මා වෙතට
කෙනෙක් නික්ම එන්නේය; උන්-
වහන්සේගේ නික්මීම පුරාණයේ පටන්ද
3 සදකාලයේ සිටද වූයේය. එබැවින් වදන
තැනැත්තියගේ ප්‍රසූත කාලය දක්වා
උන්වහන්සේ ඔවුන් පාවාදෙනවා ඇත.
උන්වහන්සේගේ සහෝදරයන්ගෙන් ඉතිරි
අයද ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙතට හැරීඑනවා
4 ඇත. උන්වහන්සේ සිටගෙන **ස්වාමීන්-
වහන්සේගේ** බලයෙන් සහ තමුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේගේ** නාමයේ
මහිමයෙන්ද තමන් රැළ පෝෂ්‍යයකරනවා
ඇත. ඔව්හු පවතින්නෝය; මක්නිසාද
උන්වහන්සේ එකල පොළෝ සීමා දක්වා
උතුම්ව සිටිනවා ඇත. මේ මනුෂ්‍යයා 5
අපේ සමාදනය වන්නේය. අෂූරියයා
අපේ දේශයට එන කලත් අපේ
මාළිගාවලට ඇතුල්වන කලත් අපි ඔහුට
විරුද්ධව එඬේරුන් සත්දෙනෙකුත්
ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් අටදෙනෙකුත්
නැගුටුවන්නෙමුව. ඔව්හු කඩුවෙන් අෂූර් 6
දේශයද ඇතුල්වෙන තැන්වල නිම්රොද්
දේශයද පාලනයකරනවා ඇත. මෙසේ
අෂූරියයා අපේ දේශයට එන කලත්
අපේ සීමාවලට පය තබන කලත්
උන්වහන්සේ ඔහුගෙන් අප ගළවනසේක.
යාකොබ්ගේ ඉතිරිවූ අය බොහෝ 7
ජනයන් අතරෙහි **ස්වාමීන්වහන්සේගෙන්**
පැමිණෙන පිනි මෙන්ද මනුෂ්‍යයා ගැන
ප්‍රමාද නොවී, මනුෂ්‍ය පුත්‍රයන් ගැන
පමා නොවී, පලා ජාති පිටට බසින
වැහිබින්දු මෙන්ද සිටිනවා ඇත. තවද 8
යාකොබ්ගේ ඉතිරි අය ජාතීන් අතරෙහිද
බොහෝ ජනයන් මැදද කැලෑවේ
මෘගයන් අතරෙහි සිටින සිංහයෙකු
මෙන්ද බැටළු රැළවල් අතරට වන කල්හි
ගළවන්ට කිසිවෙකු නැතුව උන් පාගා
ඉරාදමන තරුණ සිංහයෙකු මෙන්ද
සිටිනවා ඇත. ඔබගේ අතද ඔබගේ 9
එදිරිකාරයන්ට වඩා උසස් වේවා, ඔබගේ
සියලු සතුරෝද සිඳදමනු ලබත්වා.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 10
ඒ කාලයෙහි මම තුඹ වෙතින්
තුඹේ අශ්වයන් සිඳදමා, තුඹේ රථ
විනාශකරන්නෙමි. තුඹේ දේශයේ 11
නුවරවල් සිඳදමා, තුඹේ සියලු බලකොටු
බිඳදමන්නෙමි. මම තුඹේ අතින් මායම් 12
සිඳදමන්නෙමි; පේනකියන්නෝ තවත්
තුඹට නොසිටින්නෝය. තුඹේ දේව 13
රූපද තුඹේ රූපස්තම්භද තුඹ වෙතින්
සිඳදමන්නෙමි; තුඹද තුඹේ අත්වල
වැඩයට තවත් නමස්කාර නොකරන්නෙහිය.
මම තුඹේ අෂේරා කණු තුඹ වෙතින් 14

උදුරාදමා, නුඹේ නුවරවල් විනාශ-
15 කරන්නෙමි. ඇහුම්කන් නුදුන්නාවූ ජාතීන්
පිටට උදහසෙනුත් කෝපයෙනුත් ප්‍රතිඵල
දෙන්නෙමි.

## දෙවියන්වහන්සේ තමන් සෙනඟ හා සමග විවාදකිරීම

6 ඉතින් ස්වාමීන්වහන්සේ කියන දේ
අසාපල්ලා. නැගිට කඳු ඉදිරියෙහි
පැමිණිලිකරපන්න, හෙල්ද නුඹේ හඬ
2 අසාවා. එම්බා කඳු සහ පොළොවේ
සවි අත්තිවාරම්, ස්වාමීන්වහන්සේගේ
නඩුව අසාපල්ලා. මක්නිසාද ස්වාමීන්-
වහන්සේට තමන්ගේ සෙනඟ සමග
නඩුවක් තිබේ, උන්වහන්සේ ඉශ්‍රායෙල්
3 සමග විවාදකරනසේක. මාගේ
සෙනඟෙනි, මම නුඹලාට කුමක්
කෙළෙම්ද? කුමකින් නුඹ වෙහෙසුවෙම්ද?
4 මට විරුද්ධව සාක්ෂි දීපන්න. මම නුඹ
මිසර දේශයෙන් ගෙනායෙමි, වහල්කමේ
ගෙයින් නුඹ මුදා, නුඹට පෙරටුවෙන්
මෝසෙස්ද ආරොන්ද මිරියාම්ද
5 ඇරියෙමි. මාගේ සෙනඟෙනි, මෝවබ්හි
රජවූ බාලාක් මන්ත්‍රණයකළේ කුමක්ද
කියාත් බෙයෝර්ගේ පුත්‍රවූ බාලාම් ඔහුට
දුන් උත්තර මොනවාද කියාත් ෂිට්ටීම්හි
සිට ගිල්ගාල් දක්වා සිද්ධවූණේ
මොනවාද කියාත් ස්වාමීන්වහන්සේගේ
ධර්මිෂ්ඨකම් දැනගන්න පිණිස
6 සිහිකරපන්න. මම ස්වාමීන්වහන්සේ
ඉදිරියට කුමක් රැගෙන ඇවිත් උසස්වූ
දෙවියන්වහන්සේට වඳිම්ද? මම දවන
පූජාද අවුරුද්දක්වූ එළවස්සන්ද රැගෙන
7 උන්වහන්සේ ඉදිරියට පැමිණෙම්ද? දහස්
ගණන් බැටළුවන්ටවත් දස දහස් ගණන්
තෙල් ගංගාවලටවත් ස්වාමීන්වහන්සේ
ප්‍රසන්නවනසේක්ද? මාගේ වරද නිසා
මාගේ කුලුඳුලාත් මාගේ ආත්මයේ
පාපය නිසා මාගේ ශරීරයේ ඵලයත්
8 දෙම්ද? එම්බා මනුෂ්‍යය, යහපත මොකද
කියා උන්වහන්සේ නුඹට පෙන්වා තිබේ;
ධර්මිෂ්ඨකම් කිරීමත් කරුණාවට
ප්‍රේමවීමත් නුඹේ දෙවියන්වහන්සේ වෙත
යටහත්ලෙස හැසිරීමත් මිස ස්වාමීන්-
වහන්සේ නුඹෙන් ඉල්ලන්නේ වෙන
කුමක්ද?

## සෙනඟගේ අපරාධ නිසා දෙවියන්වහන්සේගේ උදහස සහිත තර්ජනය

ස්වාමීන්වහන්සේගේ හඬ නුවරට 9
මොරගසන්නේය, ඥානවන්තයා ඔබගේ
නාමය දකිනවා ඇත. දණ්ඩටත් ඒක
නියමකළ තැනන්වහන්සේටත් යටත්-
වෙයල්ලා. දුෂ්ටයාගේ ගෙයි දුෂ්ටකමේ 10
වස්තූද පිළිකුල්වූ අඩු ඒඵාවද තවම
තිබෙනවාද? දුෂ්ටකමේ තරාදි සහ 11
හොර කළත් පඩි මල්ලකුත් තබාගෙන
සිටිද්දී මට නිදෙස්කමක් ඇද්ද?
මක්නිසාද එහි වස්තුකාරයෝ බලාත්- 12
කාරකමෙන් පිරී සිටිති, එහි වැසියෝ
බොරු කියති, ඔවුන්ගේ දිව ඔවුන්ගේ
මුඛවල වංචාකාරව තිබේ. එබැවින් මමත් 13
නුඹට තදලෙස පහරදී, නුඹේ පාප නිසා
පාළුකෙළෙමි. නුඹ කන නුමුත් තෘප්තියට 14
නොපැමිණ, නුඹේ ඇතුළත හිස්ව තිබෙයි.
නුඹ අහකට ගෙනයන නුමුත් ගළවා
නොගන්නෙහිය; නුඹ ගළවාගන්න දේත්
මම කඩුවට පාවාදෙන්නෙමි. නුඹ වපුරන 15
නුමුත් කපාගන්ට නොලැබේ. නුඹ ඔලීව
ඵල මඩින නුමුත් තෙල් ගාගන්ට
නොලැබේ; නුඹ මිදියුස මිරිකන නුමුත්
මුද්‍රිකපානය බොන්ට නොලැබේ.
මක්නිසාද ඔම්රිගේ නියෝගද ආහබ්ගේ 16
වංශයේ සියලු ක්‍රියාද පවත්වනු ලැබේ;
එසේ මා විසින් නුඹලා පුදුමයක්ද
එහි වැසියන් කවටකමක්ද කරන
හැටියට නුඹලා ඔවුන්ගේ මන්ත්‍රණවල
ප්‍රකාරයට යන්නහුය; මාගේ සෙනඟගේ
නින්දකිරීමද නුඹලා ඉවසනවා ඇත.

## දූෂ්‍යවූ සෙනඟ නිසා විලාපකීම

7 අනේ, මාගේ දුකේ හැටි! මක්නිසාද
ඵල නෙළාගන්ටත් මුද්‍රිකවලු
තීන්දුවටම කපාගන්ටත් යෙදුණාට පසු
මෙන් සිටිමි. කන්ට කිසි වල්ලක්වත්
මාගේ ආත්මය ආශාවන ප්‍රථම
අත්තික්කා ඵලවත් නැත. භක්තිවන්තයා 2

දේශයෙන් නැතිවී ගියේය, මනුෂ්‍යයන්
අතරේ අවංක කෙනෙක් නැත. ඔවුන්
සියල්ලෝම ලේ වගුරුවන පිණිස රැක
සිටිති; එක එකා තම තමාගේ
සහෝදරයා දැලකින් අසුකරගන්ට යති.
3 නපුර වීර්යයෙන් කරන්ට දෑත පොවා
තිබේ; අධිපතියාද විනිශ්චයකාරයාද
තෑග්ගක් ඉල්ලති; උත්තමයාද තමාගේ
සිතේ නපුරු ආශාව කියයි. එසේ ඔව්හු
4 ඒක යොදගනිති. ඔවුන්ගෙන් වඩා හොඳ
අය කටුගසක් වාගේය. වඩා අවංක
අයද කටු වැටකට වඩා නරකය. තුඹේ
මුරකාරයන් විසින් කීවාවූ තුඹේ දඬුවමේ
දවස පැමිණ තිබේ; දැන් ඔවුන්ගේ
5 වියවුල්කම වන්නේය. මිත්‍රයෙකු විශ්වාස
නොකරල්ලා, හිතේසි මිත්‍රයෙකු කෙරෙහි
විශ්වාසය නොතබල්ලා. තුඹේ ළයෙහි
සැතපෙන්නියගෙන් තුඹේ මුඛයේ දොරවල්
6 රැකගනින්න. මක්නිසාද පුත්‍රයා පියාට
අගෞරව කරයි, දුව ඇගේ මවට
විරුද්ධවද යෙහෙළී ඇගේ නැන්දට
විරුද්ධවද නැගිටියි. මනුෂ්‍යයෙකුගේ
සතුරෝ නම් තමාගේම පවුලේ අයවල්ය.

## පසුතැවිලිවීම හා පව්කියාදීම නිසා බලාපොරොත්තුව ඇතිවීම

7 මම වනාහි **ස්වාමීන්වහන්සේ** දෙස
බලා සිට, මාගේ ගැළවීමේ දෙවියන්-
වහන්සේ කෙරෙහි බලාපොරොත්තු-
වන්නෙමි. මාගේ දෙවියන්වහන්සේ මාගේ
8 වචන අසනවා ඇත. එම්බා මාගේ
සැතිරිය, මට විරුද්ධව ප්‍රීති නොවන්න.
මම වැටුණු විට නැගිටින්නෙමි. මා
අඳුරෙහි හිඳින කල **ස්වාමීන්වහන්සේ**
9 මට එළියක්ව සිටිනසේක. **ස්වාමීන්-
වහන්සේ** මාගේ විපත්තිය කියා මාගේ
විනිශ්චය ඉෂ්ටකරන තුරු, මා
උන්වහන්සේට විරුද්ධව පව්කළ බැවින්
උන්වහන්සේගේ උදහස ඉවසන්නෙමි.
උන්වහන්සේ මා ආලෝකයට පමුණුවනවා
ඇත, මමද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
10 දකින්නෙමි. තුඹේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** කොතැනදැයි මට කී මාගේ
සැතිරීත් ඒ දැක ලජ්ජාවෙන් වැසීයනවා
ඇත; මාගේ ඇස් ඇගේ දඬුවම දකිනවා
ඇත; දැන් ඈ වීථිවල මඩ මෙන්
පාගාදමනු ලබන්නීය. තුඹේ 11
පවුරු ගොඩනගන්ට කාලයක්
පැමිණෙන්නේය. ඒ කාලයෙහි නියෝගයක්
දුරට පතළවී යනවා ඇත. ඒ කාලයෙහි 12
අෂූර් කෙරෙන්ද මිසරයේ නුවරවලින්ද
මිසරයේ පටන් ගංගාව දක්වාද මුහුදෙන්
මුහුදටද කන්දෙන් කන්දටද තිබෙන
පළාත්වලින් මිනිසුන් තුඹ ළඟට එනවා
ඇත. තුමූත් දේශය එහි වැසියන් නිසා 13
එනම් ඔවුන්ගේ ක්‍රියාවල ඵල නිසා
පාළුවන්නේය.
කර්මෙල් තුළ වනයෙහි වෙන්ව 14
වසන්නාවූ ඔබගේ සෙනඟ වන ඔබගේ
උරුමයවූ බැටළු රැළ ඔබගේ
සැරයටියෙන් පාලනයකළ මැනව.
බාෂාන්හිද ගිලියද්හිද පුරාණයේ දවස්වල
මෙන් ඔව්හු පෝෂ්‍යවෙත්වා. තුඹ මිසර 15
දේශයෙන් පිටතට ආ දවස්වල මෙන්
මම ඔවුන්ට ආශ්චර්යමත් දේ
පෙන්වන්නෙමි. ජාතීන් දැක තමුන්ගේ 16
මුළු බලවත්තකම ගැන ලජ්ජාවට පත්ව,
අතින් කට වසාගන්නවා ඇත, ඔවුන්ගේ
කන් බිහිරිවෙනවා ඇත. ඔව්හු සර්පයෙකු 17
මෙන් දූවිල්ල ලෙවකන්නෝය;
පොළොවේ බඩගායන සතුන් මෙන්
ඔව්හු තමුන්ගේ බලකොටුවල සිට
වෙවුලමින් නික්ම එන්නෝය. ඔව්හු අපේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** වෙතට භයෙන්
යුක්තව පැමිණෙන්නෝය, තුඹ නිසාද
භයවෙනවා ඇත. අපරාධය කමාකරන්නාවූ, 18
ස්වකීය උරුමයේ ඉතිරි අයින්ගේ වරදට
දඬුවම් නොකර අරින්නාවූ ඔබවහන්සේ
සමාන දෙවිකෙනෙක් කවුද? උන්-
වහන්සේ කරුණාවට ප්‍රියවන නිසා
ස්වකීය උදහස සැම කල්හිම තබා-
නොගන්නසේක. උන්වහන්සේ නැවත 19
අපට අනුකම්පාකරනසේක; අපේ
අපරාධ පාගාදමනසේක. ඔබවහන්සේ
ඔවුන්ගේ සියලුම පාප මුහුදේ ගැඹුරට
හෙළනසේක. පුරාණයේ දවස්වල පටන් 20
ඔබවහන්සේ අපේ පියවරුන්ට දිවුළාවූ
සැබෑකම යාකොබ්ටත් කරුණාව
ආබ්‍රහම්ටත් ඔබ ඉෂ්ටකරනසේක.

# අනාගතවක්තෘවූ නාහූම්ගේ පොත

## ස්වාමීන්වහන්සේගේ ශුද්ධකම හා උදහස

1 නිනිවය පිළිබඳ දිව්‍ය ප්‍රකාශනයය.
එල්කොෂියවූ නාහූම්ගේ දර්ශනයේ
පොතය.
2 **ස්වාමීන්වහන්සේ** *ස්වකීය ගෞරවය
රක්ෂාකරන්නාවූ පළිගන්න දෙවිකෙනෙක්ය;
**ස්වාමීන්වහන්සේ** පළිගන්නාවූ, උදහසින්
පූර්ණවූ කෙනෙක්ය; **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ එදිරිකාරයන්ගෙන් පළිගන්නා-
සේක, තමන්ගේ සතුරන්ට උදහස
3 තබාගන සිටිනසේක. **ස්වාමීන්වහන්සේ**
ඉවසිලිවන්තව බලයෙන් මහත්ව සිටින-
සේක, වරදකාරයන් කොයි ප්‍රකාරය-
කින්වත් නිදෙස් නොකරනසේක.
**ස්වාමීන්වහන්සේගේ** මාර්ගය සුළි-
හුළඟෙහිද කුණාටුවෙහිද ඇත්තේය,
වලාකුල් උන්වහන්සේගේ පාදවල ධූලිය.
4 උන්වහන්සේ මුහුදට තරවටුකොට,
හින්දවා, සියලු ගංගාද හින්දවනසේක.
බාෂාන්ද කර්මෙල්ද මැලවෙති,
5 ලෙබනොන්හි දළුත් මැලවෙති. කඳු
උන්වහන්සේට භයින් වෙව්ලති, හෙල්ද
දියවෙති; උන්වහන්සේ ඉදිරියෙහි
පොළොවද ලෝකය සහ එහි
වාසයකරන සියල්ලෝද කම්පාවෙති.
6 උන්වහන්සේගේ කෝපය ඉදිරියෙහි
සිටින්ට පුළුවන් කාටද? උන්වහන්සේගේ
බලවත් උදහසේදී පවතින්නේ කවුද?
උන්වහන්සේගේ කෝපය ගිනි මෙන්
වැගිරෙන්නේය, පර්වතද උන්වහන්සේ
ඉදිරියෙහි කඩාවැටෙන්නේය.

*හෙවත්, අන්‍ය භක්ති නොඉවසන්නාවූ.

## සතුරන් ගැන උන්වහන්සේගේ පළිගැනීම

**ස්වාමීන්වහන්සේ** යහපත්ය, විපත්ති 7
දවසේදී බලකොටුවක්ය; උන්වහන්සේ
තමන් කෙරේ විශ්වාසය තබන්නන්
දන්නාසේක. නුමුත් ගලායන ජල- 8
ගැල්මකින් උන්වහන්සේ තමන්ගේ
එදිරිකාරයන් සහමුලින්ම විනාශකරන-
සේක, තමන්ගේ සතුරන්ද අන්ධකාරයට
පන්නාදමනසේක. [අෂූර්වරුනි,] නුඹලා 9
**ස්වාමීන්වහන්සේට** විරුද්ධව කුමක්
යෝජනාකරන්නහුද? උන්වහන්සේ
මුළුමනින්ම නිමාවක් කරනසේක.
විපත්තිය දෙවරක් නොපැමිණෙන්නේය.
මක්නිසාද ඔව්හු කටුගස් වාගේ පටලැවී, 10
තමුන්ගේ සුරාපානයෙන් පෙඟී සිටියත්,
හොඳට වේළී තිබෙන ඉපනැලි මෙන්
දලායන්නෝය. **ස්වාමීන්වහන්සේට** 11
විරුද්ධව නපුර යෝජනාකරන්නාවූ,
දුෂ්ටකම් ගැන මන්ත්‍රණයකරන්නාවූ
කෙනෙක් *නුඹෙන් නික්ම ආයේය.
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: 12
ඔවුන් සම්පූර්ණව එපමණ වැඩිව සිටින
නුමුත් ඔවුන් එසේ කපාදමනු ලැබ,
ඔහුද පහවීයන්නේය. [යූද,] මම නුඹට
පීඩාකළ නුමුත් තවත් නුඹට පීඩා නො-
කරන්නෙමි. දැන් මම ඔහුගේ වියගහ 13
නුඹ කෙරෙන් බිඳදමා, නුඹේ බැඳුම්
කඩාදමන්නෙමි. [අෂූරියයා,] නුඹ ගැන 14
**ස්වාමීන්වහන්සේ** මෙසේ අණකළසේක:
නුඹේ නාමය තවත් පැවත නොඑන්නේය.
මම නුඹේ දෙවිවරුන්ගේ ගෘහයෙන්
කැපූ රූපයත් වාත්තු රූපයත් සිඳදමා,

*එනම්, නිනිවයෙන්.

තුඹ නීච නිසා තුඹේ මිනීවළ පිළියෙළ-
15 කරන්නෙමි. අන්න, ශුභාරංචි දන්-
වන්නාවූ, සමාදනය ප්‍රකාශකරන්නාවූ
අයගේ පාද කඳු පිට එති! ඒම්බා යූදා,
තුඹේ මංගල්‍යවල් පවත්වා තුඹේ බාරවල්
ඉෂ්ටකරපන්න. මක්නිසාද දුෂ්ටයා තුඹ
මැදින් තවත් නොඑන්නේය; ඔහු
සහමුලින්ම සිඳදමනු ලැබීය.

## නිනිවය වටලෑම සහ නාස්තිකර දැමීම

2 කැබෙලිකොට කඩන්නා තුඹේ
මුහුණට විරුද්ධව නැඟී ආයේය.
බලකොටුව රැකවල්කර, මාර්ගය මුරකර,
ඉඟටි බලවත්කර, තුඹේ ශක්තිය ඉතා
2 බලවත්කරගනින්න. එසේය, **ස්වාමීන්-
වහන්සේ** ඉශ්‍රායෙල්ගේ තේජස මෙන්
යාකොබ්ගේ තේජසත් නැවත පිහිටුවන-
සේක. මක්නිසාද හිස්කරනෝ ඒවා
හිස්කර, ඒවායේ රිකිලි නාස්තිකළෝය.
3 ඔහුගේ බලවතුන්ගේ පලිස්වලට රතු
සායම් පොවා තිබේ, යුද්ධකාර
මනුෂ්‍යයෝ රතු වස්ත්‍ර ඇඳගන සිටිති.
ඔහුගේ සූදනම්වීමේ දවසේදී රථ
වානෙන් දිලිහෙති, දේවදාර හෙල්ලද
4 සොලවන්නේය. රථ වීථිවල වේගයෙන්
යති, පළල් මාර්ගවල එහා මෙහා දුවති.
ඒවායේ පෙනීම පන්දම් මෙන්ය, ඒවා
5 විදුලි මෙන් දුවති. ඔහු තමාගේ
උත්තමයන් සිහිකරයි. ඔව්හු යනකොට
පැකිලෙමින් එහි පවුරට ඉක්මනින් යති,
මුවාවද පිළියෙළකරනු ලබන්නේය.
6 ගංගාවල දොරටු අරිනු ලැබ, මාළිගාව
7 දියවී තිබේ. †හුශබ් නිර්වස්ත්‍රව ගෙනයනු
ලබන්නීය, ඇගේ මෙහෙකාරියෝද
තමුන්ගේ ළයට ගසාගනිමින්,
පරෙවියන්ගේ හඩින් මෙන් සුසුම්ලති.
8 නිනිවය පුරාණයේ සිට වතුර පොකුණක්
මෙන් (මිනිසුන්ගෙන්) පිරී තිබුණේය.
තුමූත් ඔව්හු පලායති; හිටපල්ලා,
හිටපල්ලාය කියන නුමුත් කිසිවෙක් හැරී
9 නොබලයි. රිදී කොල්ලකාගනිල්ලා, රන්
කොල්ලකාගනිල්ලා. වස්තුද නිමක් නැත,

†බිසොව.

අනර්ඝවූ සියලු ආකාර බඩු රාශියක්
ඇත්තේය. ඈ හිස්ව ශූන්‍යව පාළුව සිටියි. 10
සිත දියවීමද දණහිස් වෙවුලීමද සියලු
තුනටිවල රුජාවද තිබේ, ඔවුන්
සියල්ලන්ගේ මුහුණුද සුදුමැලිව තිබේ.
සිංහයන්ගේ ගුහාවත් තරුණ සිංහයන්ගේ 11
ගොදුරු ඉඩමත් කොයිද? එහි කිසි-
වෙකුගෙන් භයක් නොලැබ සිංහයාත්
සිංහධේනුවත් සිංහපැටවාත් ඇවිද්දෝය.
සිංහයා උගේ පැටවුන්ට සෑහෙන පමණ 12
ගොදුරු ඉරාදී, උගේ සිංහධේනුන්ට සතුන්
මරාදී, උගේ ලෙනවල් ගොදුරෙන්ද උගේ
ගුහාවල් ගොදුරුවලින්ද පිරෙවුවේය.
බලව, මම තුඹට විරුද්ධයයි සේනාවල 13
**ස්වාමීන්වහන්සේ** කියනසේක; ඇගේ
රථ දවා දුම් කරන්නෙමි, කඩුවද තුඹේ
තරුණ සිංහයන් කාදමන්නේය. මම
තුඹේ ගොදුර පොළෝතලයෙන් සිඳ-
දමන්නෙමි, තුඹේ පණිවිඩකාරයන්ගේ
හඬ තවත් නෑසෙන්නේය.

## නිනිවය පිළිබඳ තවත් තර්ජනයක් හා දුක්විමක්

3 ලේ වගුරුවන නුවරට දුක්වේ!
ඒක මුළුල්ලම වංචාවෙන්ද
බලාත්කාරයෙන්ද පිරී තිබේ; කොල්ල-
කෑම නොනවතියි. කස ශබ්දයත් 2
චක්‍රකරකැවෙන ශබ්දයත් ඇත්තේය;
අශ්වයෝ වේගයෙන් දුවති, රථද
පැනයති; අසරුවෝ නගිති, කඩුව 3
දිලිහෙන්නේය, හෙල්ලයද බැබළෙන්නේය;
සමූහයක් මැරුම්කන්නේය, මළකඳන්
ගොඩගැසී තිබේ. මළකඳන් නිමක් නැත;
ඔවුන්ගේ මළකඳන්වල හැපී ඔව්හු
පැකිලෙති. මෙසේ වෙන්නේ මන්ත්‍රකාරීවූ 4
ඉතා ශෝභමාන වේශ්‍යාවීගේ
වේශ්‍යාකම් රාශිය නිසාය; ඇගේ
වේශ්‍යාකම්වලින් ඈ ජාතීන්ද ඇගේ
මන්ත්‍රවලින් පවුල්ද විකුණන්නීය. බලව, 5
මම තුඹට විරුද්ධයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක; මම
තුඹේ කඩ තුඹේ මුහුණ පිට හෙළා,
ජාතීන්ට තුඹේ නග්නකමද රාජ්‍යවලට

6 තුඹේ ලජ්ජාවද පෙන්වන්නෙමි. පිළිකුල්
දේවල් තුඹ පිට හෙළා, තුඹට අගෞරව
කර, තුඹ කෝලමක් කරන්නෙමි.
7 තුඹව දකින සියල්ලෝද තුඹ වෙතින්
පලාගොස් කථාකොට: නිනිවය
නාස්තිවිය. ඇට අනුකම්පාව පෙන්-
වන්නේ කවුද? සනසන්නන් මම
කොතනින් තුඹට සොයාදෙන්නෙම්දැයි
8 කියන්නෝය. තුඹ නෝ-ආමොන්ට වඩා
හොඳද? ඈ ගංගා අතරේ පිහිටා, ඈ
වටකරින් ජල ඇතුව තිබුණාය; ඇගේ
අගළ *මුහුද විය, ඇගේ ප්‍රාකාරය *මුහුදේ
9 පිහිටුවා තිබුණේය. කුෂ් සහ මිසරය
ඇගේ බලයය, නිමක්ද නැත; පූට් සහ
ලූබිවරු තුඹේ උපකාරකාරයෝ වූවෝය.
10 තුමුත් ඈ පවා අසුවී වාලට ගියාය.
ඇගේ දරුවෝද සියලු වීථි සන්ධිවල
බිමගසා මරනු ලැබුවෝය. ඇගේ
නම්බුකාරයන් ගැන පසඇට දැමුවෝය.
ඇගේ සියලු උත්තමයෝ දම්වැල්-
11 වලින් බඳිනු ලැබුවෝය. තුඹත් මත්වී
සැඟවෙන්නෙහිය; තුඹත් සතුරාගෙන්
ගැළවෙන්ට රක්ෂාස්ථානයක් සොයන්-
12 නෙහිය. තුඹේ සියලු බලකොටු ප්‍රථම
ඵල ඇති අත්තික්කා ගස් වාගේය. ඒවා
සෙලවුවොත් කන්නාගේ කටට
13 වැටෙනවා ඇත. තුඹ තුළ සිටින තුඹේ
සෙනඟ ගැහැනුය; තුඹේ දේශයේ දොරවල්

*එනම්, නයිල් ගංගාව.

තුඹේ සතුරන්ට සම්පූර්ණයෙන් ඇරලා
තිබේ. තුඹේ අගුල් ගින්නෙන් දලාගියේය.
වටලෑම නිසා වතුර ඇද තබාගනින්න, 14
තුඹේ බලකොටු සවිකරපන්න. මැටි
පිටට පෑමිණ, බදම පාගා, ගඩොල්
වැඩ සවිකරපන්න. එහි ගින්න තුඹ 15
දවාදමන්නේය; කඩුවද තුඹව සිඳ-
දමන්නේය, කෙඳි-පළඟැටියන් වාගේ
එය තුඹ කාදමන්නේය. කෙඳි-පළඟැටියන්
මෙන් වැඩිවෙයන්න, පළඟැටියන් මෙන්
වැඩිවෙයන්න. තුඹ තුඹේ වෙළඳුන් අහසේ 16
තාරකාවලට වඩා වැඩිකරගත්තෙහිය.
කෙඳි-පළඟැටියෝ පැතිර ඉගිලීගියෝය.
තුඹේ උත්තමයෝ පළඟැටියන් මෙන්ය, 17
තුඹේ සේනාපතියෝ පළඟැටි රාශියක්
මෙන්ය, උන් ශීතල දවසේදී තාප්පවල
රැස්වී ඉඳ, ඉර පායන කල පලායති.
උන් ඉන්න ඉඩමද කිසිවෙක් දන්නේ
නැත. අෂූර් රජ්ජුරුවෙනි, තුඹේ එඬේරු 18
නිදහිඳිති. තුඹේ උත්තමයෝ සැතපෙති.
තුඹේ සෙනඟ කඳුවල විසිරී ගියෝය,
ඔවුන් එකතුකරන්ට කිසිවෙක්ද නැත.
තුඹේ තුවාලයට සහනයක් නැත; තුඹට 19
වැදුණු පහර තදය. තුඹේ ප්‍රවෘත්තිය
අසන සියල්ලෝ තුඹට විරුද්ධව
අත්පොළසන්දෙති; මක්නිසාද තුඹේ
දුෂ්ටකම නිතරම නොපැමුණුණේ කා
පිටටද?

# අනාගතවක්තෘවූ හබක්කුක්ගේ පොත

## උපකාරකිරීමට ස්වාමීන්-වහන්සේගේ ප්‍රමාදය ගැන පැමිණිල්ල

1 අනාගතවක්තෘවූ හබක්කුක් දුටු දිව්‍ය
ප්‍රකාශනයය.
2 **ස්වාමීන්වහන්ස**, මම කොපමණ කල්
මොරගසම්ද? එහෙත් ඔබ නොඅසන-
සේක; බලාත්කාරය ගැන ඔබට
කෑගසමි, එහෙත් ඔබ නොගළවනසේක.
3 ඔබවහන්සේ අධර්මිෂ්ඨකම දකින්ට
මට ඉඩහැර, හිතුවක්කාර හිංසාව
බලාසිටින්නේ මක්නිසාද? නාස්තිකිරීමද
බලාත්කාරයද මා ඉදිරිපිට තිබේ. භේද
4 තිබේ, තරහයද හටගනියි. එබැවින්
ව්‍යවස්ථාව බෙලහීනවී, විනිශ්චය
කවදවත් නොනික්මෙයි. මක්නිසාද
දුෂ්ටයෝ ධර්මිෂ්ඨයා වටකරති; ඒ නිසා
විපරීත විනිශ්චයක් සැලසේ.

## කල්දිවරුන් එවන බව ප්‍රකාශකිරීම

5 ජාතීන් අතරෙහි බලා, කල්පනාකර,
ඉතා විස්මපත්වෙයල්ලා. මක්නිසාද
නුඹලාට කීවත් නුඹලා විශ්වාස
නොකරන ක්‍රියාවක් නුඹලාගේ දවස්-
6 වලදී කරමි. එසේය, රෞද්‍රවූ කඩිසරවූ
ජාතියක් වන කල්දිවරුන් නැගුටුවමි;
ඔව්හු තමුන්ට අයිති නැති වාසස්ථාන
හිමිකරගන්ට පොළොවේ දුරස්තර තැන්
7 දක්වාම යති. ඔව්හු භයානකව භයංකරව
සිටිති. ඔවුන්ගේ විනිශ්චයද උසස්කමද
8 ඔවුන්ගෙන්ම පැමිණේ. ඔවුන්ගේ
අශ්වයෝ දිවියන්ට වඩා ශීඝ්‍රය, සැන්දෑ
වෘකයන්ට වඩා සැරය; ඔවුන්ගේ
අසරුවෝ විසිරයති. එසේය, ඔවුන්ගේ
අසරුවෝ දුර සිට එති; ගොදුරු කරා
වේගයෙන් යන රාජාලියෙකු මෙන්
පියාඹති. ඔවුන් සියල්ලෝම බලාත්කාරය 9
පිණිස එති; ඔවුන්ගේ මුහුණු නැගෙනහිර
දෙසට යොමුකර තිබේ; ඔව්හු වැලි
මෙන් වහලුන් රැස්කරගනිති. එසේය, 10
ඔව්හු රජුන්ට නින්ද කරති, අධිපතීහුද
ඔවුන්ට කවටකමක්ය. ඔව්හු සියලු
බලකොටුවලට සිනාසී, පස් ගොඩකර,
ඒවා අල්ලාගනිති. එකල තමුන්ගේ බලය 11
ස්වකීය දෙවියන් කොට ගත් ඔව්හු
හුළඟක් මෙන් ගහගන ගොස්
පහවන්නෝය, වරදකාරද වන්නෝය.

## කල්දිවරුන්ගේ කෲරතරකම ගැන කියාපෑම

මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්ස**, මාගේ 12
ශුද්ධ තැනන්වහන්ස, ඔබ පුරාණයේ
සිට නොසිටිනසේක්ද? අපි නොනසින්-
නෙමුව. අහෝ **ස්වාමීන්වහන්ස**, ඔබ ඔහු
විනිශ්චය පිණිස නියමකර තිබේ; අහෝ
පර්වතයාණෙනි, ඔබ ඔහු දඬුවම පිණිස
පිහිටුවා තිබේ. නපුර බලන්ට බැරි තරම් 13
පවිත්‍ර ඇස් ඇත්තාවූ, හිංසාව බලාසිටින්ට
නොහැකිවූ ඔබවහන්සේ ද්‍රෝහීන් දෙස
බලාසිටින්නෙත්, දුෂ්ටයා තමාට වඩා
ධර්මිෂ්ඨ තැනැත්තා නාස්තිකරන කල
ඔබ නිශ්ශබ්දව සිටින්නෙත්, මුහුදේ 14
මත්ස්‍යයන් මෙන්ද තමුන් කෙරෙහි
ආණ්ඩුකාරයෙකු නැති බඩගායන සතුන්
මෙන්ද වෙන්ට මනුෂ්‍යයන්ට සලස්වන්නෙත්
මක්නිසාද? ඔහු බිළිකටුවෙන් සියල්ලන් 15
අල්ලාගන්නේය, තමාගේ දැලෙන් ඔවුන්

ඈදගන, තමාගේ අතංගුවෙන් ඔවුන්
එකතුකරගන්නේය. ඉන්නිසා ඔහු ප්‍රීතිව
16 සන්තෝෂවන්නේය. එබැවින් ඔහු තමාගේ
දැලට පූජා ඔප්පුකොට, තමාගේ අතංගුවට
සුවඳ දුම් දමන්නේය; මක්නිසාද ඒවායින්ම
ඔහුගේ කොටස තරවී, ඔහුගේ ආහාර
17 පුෂ්ටිමත්ව තිබේ. ඒ පිණිස ඔහු තමාගේ
දැල හිස්කොට ජාතීන් නිතරම මරා
දැමීමෙන් නොවැලකෙන්නේද?

## මුරපළේ සිටින්නා උත්තරයක් බලාඉඳීම

2 මම මාගේ මුරපළ උඩට පැමිණ,
බලකොටුව උඩ සිටගන, උන්-
වහන්සේ මට කියන්නේ මොකද කියාත්
මාගේ පැමිණිල්ල ගැන මා විසින් මොන
උත්තරයක් දිය යුතුද කියාත් දැනගන්ට
2 බලාසිටින්නෙමි. ස්වාමීන්වහන්සේ මට
උත්තරදෙමින්: දර්ශනය කියවන්නා
ඉක්මනින් කියවන්ට පුළුවන් වන පිණිස
එය ලෑලිවල පැහැදිලිලෙස ලියාපන්න.
3 මක්නිසාද දර්ශනය නියම කාලය දක්වා
තව ප්‍රමාදවේ, එහෙත් එය බොරු නොවී
ඉක්මනින් තීන්දුවට පැමිණෙන්නේය. එය
ප්‍රමාදවෙතත් ඒ ගැන බලාසිටපන්න;
මක්නිසාද එය පසු නොබැස පැමි-
4 ණෙනවාම ඇත. බලව, ඔහුගේ සිත
උඩඟුය, එය ඔහු තුළ අවංක නැත.
ධර්මිෂ්ඨයා තමාගේ *විශ්වාසකමෙන්
ජීවත්වන්නේයයි කීසේක.

## කල්දිවරුන්ට දුක පැතීම. එය පස් වරක් කීම

5 ඇරත් මුද්‍රිකපානය ද්‍රෝහියෙක්ය,
අහංකාරවූ, ගෙදර නැවතී නොසිට
තමාගේ ආශාව පාතාලය මෙන්
විශාලකරගන, මරණය මෙන් තෘප්තියට
නොපැමිණ, තමා වෙතට සියලු ජාතීන්
රැස්කරගන්නාවූ, තමා වෙතට සියලු
ජනයන් එකතුකරගන්නාවූ මනුෂ්‍යයෙක්ය.

*එනම්–දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසකමෙන්.

ඔවුන් සියල්ලෝම ඔහුට විරුද්ධව 6
උපමාවක් සහ නින්දකරන උපහැරණයක්
නොකියද්ද? එනම්: තමාට අයිති නැති
දේ වැඩිකරගන්නාවූ, උකස් බඩු තමා
පිට පටවාගන්නාවූ අයට දුක්වේ!
කොපමණ කල්ද? තුඹ *හපාකෑමට 7
මනුෂ්‍යයෝ හදිසියෙන් නොනැගිටින්නෝද?
තුඹට හිරිහැරකිරීමට නොපිබිදෙන්නෝද?
තුඹ වනාහි ඔවුන්ට කොල්ලයක්
වන්නෙහිය. තුඹ බොහෝ ජාතීන්ගෙන් 8
කොල්ලකෑ බැවින්, මනුෂ්‍යයන්ගේ ලේ
නිසාද දේශයටත් නගරයටත් එහි සියලු
වැසියන්ටත් කළ බලාත්කාරය නිසාද
ඉතිරිවූ සියලුම ජනයන් තුඹෙන්
කොල්ලකනවා ඇත.
තමාගේ කූඩුව ඉහළින් සාදන පිණිසද, 9
විපත්තියේ බලයෙන් මිදෙන පිණිසද
අධර්මයෙන් ගත් දෙයක් තමාගේ ගෙට
ගෙනෙන්නාට දුක්වේ! බොහෝ ජනයන් 10
සිඳදැමීමෙන් තුඹේ වංශයට ලජ්ජාව
පැමිණෙන ලෙස තුඹ මන්ත්‍රණය කොට
තුඹේම ප්‍රාණයට විරුද්ධව පව්
කෙළෙහිය. මක්නිසාද භිත්තිය කෙරෙන් 11
ගල මොරගසන්නේය, ලී වැඩය කෙරෙන්
බාල්කය ඊට උත්තරදෙන්නේය.
ලේවලින් නුවරක් ගොඩනගන්නාවූ, 12
අධර්මිෂ්ඨකමෙන් නගරයක් පිහිටුවන්නාවූ
අයට දුක්වේ! බලව, ජනයන් ගින්න 13
පිණිස වැඩකිරීමත් ජාතීන් හිස්කමට
වෙහෙසීමත් සේනාවල ස්වාමීන්-
වහන්සේගෙන් නොවේද? මක්නිසාද 14
ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක් මෙන්
ස්වාමීන්වහන්සේගේ තේජස දැනගැන්මෙන්
පොළොව පිරීයන්නේය.
අසල්වාසීන්ගේ නග්නභාවය පෙනෙන 15
ලෙස, තුඹේ කෝප විෂය යොදා, ඔවුන්ට
බොන්ට දී මත්කරවන්නාවූ අයට දුක්වේ!
තුඹ ගෞරවය වෙනුවට ලජ්ජාවෙන් 16
පිරී සිටින්නෙහිය. තුඹත් බී අචර්මඡේදිත
බව පෙන්වාපන්න. ස්වාමීන්වහන්සේගේ
දකුණතේ පාත්‍රය තුඹ වෙතටත්
කැත නින්දිතකම තුඹේ මහිමය
පිටටත් පැමිණෙනවා ඇත. මක්නිසාද 17

*හෙවත්, පොළිය ගැනීමට.

මනුෂ්‍යයන්ගේ ලේ නිසාත් දේශයටද
නගරයටද එහි සියලු වාසීන්ටද කළ
බලාත්කාරය නිසාත් ලෙබනොන්ට කළ
බලාත්කාරය සහ මෘගයන් භයගැන්වූ
උන්ගේ විනාශය තුඹ වසාගන්නේය.
18 කැපූ රූපය සාදන්නා විසින් ඒක කැපූ
නිසා රූපයෙන්වත්, ගොළු රූප සාදන්නා
ඒවා සාදමින් තමාගේ වැඩ කෙරෙහි
විශ්වාසකරන නිසා වාත්තු පිළිමයෙන්වත්,
බොරු උගන්වන්නාගෙන්වත් ඇති
19 ප්‍රයෝජනය මොකද? ලීයට: පිබිදියන්න
කියාත් ගොළු ගලට: නැගිටින්න කියාත්
කියන්නාට දුක්වේ! ඒක උගන්වනවා
ඇද්ද? අන්න, ඒක රනිනුත් රිදීයෙනුත්
වසා තිබේ. කිසි හුස්මක් ඒක තුළ
20 ඇත්තෙම නැත. **ස්වාමීන්වහන්සේ** තමන්-
ගේ ශුද්ධ මාළිගාවෙහි සිටිනසේක.
මුළු පොළොව උන්වහන්සේ ඉදිරියෙහි
නිශ්ශබ්ද වේවා.

## **තේජසේ දෙවියන්වහන්සේ විනිශ්චයට පැමිණීම** (පද 1–16) **සහ උන්වහන්සේ තුළ ප්‍රීතිවීම** (පද 17–19) **ගැන යාච්ඤාවක්**

3 අනාගතවක්තෘවූ හබක්කුක් විසින්
ෂිගියොනොත් වෘත්තයට ලියනලද
යාච්ඤාවක්ය.
2 **ස්වාමීන්වහන්ස**, මම ඔබගේ ප්‍රවෘත්තිය
අසා භයවීමි.
**ස්වාමීන්වහන්ස**, අවුරුදු අතරතුරේ
ඔබගේ ක්‍රියාකිරීම ප්‍රාණවත්කළ
මැනව.
අවුරුදු අතරතුරේ දන්වුව මැනව;
උදහසේදී අනුකම්පාව සිහිකළ මැනව.
3 දෙවියන්වහන්සේ තේමාන් සිටද
ශුද්ධ තැනන්වහන්සේ පාරාන් කන්දේ
සිටද එනසේක.
උන්වහන්සේගේ මහිමය ස්වර්ගය වසා
ගත්තේය,
පොළොවද උන්වහන්සේගේ
ප්‍රශංසාවෙන් පිරුණේය.
4 උන්වහන්සේගේ දීප්තිය එළිය මෙන්
විය;
උන්වහන්සේගේ හස්තයෙන් රශ්මි
නික්මුණේය.
උන්වහන්සේගේ පරාක්‍රමයද එහි සැඟවී
තිබුණේය.
උන්වහන්සේට පෙරටුවෙන් වසංගතය 5
ගියේය,
උන්වහන්සේගේ පාදවලින් ගිනි අඟුරු
නික්මුණේය.
උන්වහන්සේ සිට, පොළොව 6
සෙලෙවූසේක;
උන්වහන්සේ බලා, ජාතීන්
වෙවුලෙවූසේක.
සදාකාල කඳු විසිරුණේය,
පුරාණ හෙල්ද නැමුණේය;
උන්වහන්සේගේ ගමන් පුරාණෙහි
මෙන් විය.
කූෂාන්හි කූඩාරම් විපත්තියට යටවී 7
තිබෙනවා දුටිමි.
මිදියන් දේශයේ තිර වෙවුලුවේය.
**ස්වාමීන්වහන්ස**, ඔබගේ උදහස 8
ගංගාවලට විරුද්ධව ඇවිළුණේද?
එය ගංගාවලට විරුද්ධව තිබුණේද?
ඔබගේ අසුන් පිටද
ගැළවීම නැමති ඔබගේ රථවලද
ඔබ නැගී ගියේ ඔබගේ කෝපය
මුහුදට විරුද්ධව තිබුණු නිසාද?
ගෝත්‍රවලට දුන් දිවුරුම් වචනය 9
ප්‍රකාරයට,
ඔබගේ දුන්නේ වැස්ම ඇරලාම
තිබුණේය.
ගංගා සෑදෙන ලෙස ඔබ පොළොව
පැළුසේක.
කඳු ඔබ දැක භයවූය; 10
ජලධාරාව වැගුරුණේය.
ගැඹුර සිය හඬ පවත්වා,
සිය අත් ඉහළ එසවීය.
විහිදුණාවූ ඔබගේ ඊගස්වල එළියටත් 11
ඔබගේ දිලිහෙන සෙල්ලයේ
දීප්තිමත්කමටත්
ඉර සඳ ඒවායේ විමානවල නැවතී
සිටියෝය.
ඔබවහන්සේ කෝපයෙන් දේශයෙහි 12
ගමන්කළසේක,
උදහසින් ජාතීන් මැඩලූසේක.

13 ඔබගේ සෙනඟගේ ගැළවීම පිණිසත්
ඔබගේ අභිෂේකලත් තැනැත්තා
ගැළවීමටත් ඔබ පිටත්ව ගොස්,
දුෂ්ටයාගේ වංශයේ ප්‍රධානියා
පොඩිකර,
බෙල්ල දක්වාම අත්තිවාරම
ඇරියසේක.
14 ඔබ ඔහුගේ අධිපතීන්ගේ ප්‍රධානියාට
ඔහුගේම හෙල්ලවලින්
ඇන්නසේක.
ඔව්හු මා විසුරුවාදමන්ට සුළිහුළඟක්
මෙන් ආවෝය.
ඔවුන්ගේ ප්‍රීතිමත්කම අසරණයන්
රහසින් නාස්තිකිරීමටය.
15 මුහුද එනම් මහත් ජලස්කන්ධ පිට
ඔබගේ අසුන් ඇතුව ඔබ
පාගාගියසේක.
16 මා ඇසූ විට මාගේ බඩ කැලඹුණේය,
ඒ හඬට මාගේ තොල් වෙවුලුවේය;
මාගේ ඇටවලට දිරීම පැමිණ, මාගේ
දණඉස් වැනුණේය.
එහෙත් අපට විරුද්ධව යුද්ධකරන
සෙනඟ නැගීඑන
විපත්ති දවසේදී මට නිශ්චලය ලැබෙයි.
මක්නිසාද අත්තික්කා ගස දළු 17
නොලෑවත්,
මුද්‍රිකවැල්වල පලදාවක් නොතිබුණත්;
ඔලීව ගසේ එල හට නොගත්තත්,
කෙත්වලින් භෝජන නොලැබුණත්;
ගාලෙන් එළු බැටළු රැළ සිඳදමනු
ලැබුවත්,
පට්ටිවල ගවයන් නැතුව ගියත්;
මම වනාහි ස්වාමීන්වහන්සේ කෙරෙහි 18
සන්තෝෂවන්නෙමි,
මාගේ ගැළවීමේ දෙවියන්වහන්සේ
කෙරෙහි ප්‍රීතිමත්වන්නෙමි.
ස්වාමිවූ යෙහෝවඃවහන්සේ මාගේ 19
බලයය,
උන්වහන්සේ මාගේ පාද මුවදෙනුන්ගේ
පාදවලට සමානකොට,
මාගේ උසස්ථාන පිට යන්ට
සලස්වනසේක.
[නායක ගායනාකරුවටය, මාගේ
වීණා ඇතුව ගීතිකාකිරීමටය.]

# අනාගතවක්තෘවූ ශෙපනියාගේ පොත

## ස්වාමීන්වහන්සේගේ දවස අපරාධකාර යූදා කෙරෙහි විනිශ්චය දවසක් බව

1 ආමොන්ගේ පුත්‍රවූ යූදාහි රජවූ
යොෂියාගේ දවස්වලදී හෙසකියාගේ
පුත්‍රවූ අමරියාගේ පුත්‍රයා වන ගෙදලියාගේ
පුත්‍රවූ කූෂීගේ පුත්‍රයා වන ශෙපනියා
වෙතට පැමිණි **ස්වාමීන්වහන්සේගේ**
වචනයය.
2 මම භූමිය මතුපිටින් සියලු දේ
සහමුලින් නැතිකරන්නෙමියි **ස්වාමීන්-**
3 **වහන්සේ**, කියනසේක. මනුෂ්‍යයා සහ
මෘගයා නැතිකරන්නෙමි; ආකාශයේ
පක්ෂීන්ද මුහුදේ මත්ස්‍යයන්ද දුෂ්ටයන්
ඇතුළුව පැකිලවන දේවල්ද නැති-
කරන්නෙමි; භූමිය මතුපිටින් මනුෂ්‍යයා
සිඳදමන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
4 සේක. තවද මම යූදාටත් යෙරුසලමේ
සියලු වැසියන්ටත් විරුද්ධව මාගේ අත
දිගුකරන්නෙමි; බාල්ගේ ඉතිරි පංගුවද,
පූජකයන් සමග කපුවන්ගේ නාමද,
5 ගෙවල් මුදුනේ සිට අහස් සේනාවට
නමස්කාරකරන්නන්ද, **ස්වාමීන්-**
**වහන්සේට** දිවුරා මල්කාම් නමිනුත්
6 දිවුරා නමස්කාරකරන්නන්ද, **ස්වාමීන්-**
**වහන්සේ** වෙතින් පසුබටවූවන්ද,
**ස්වාමීන්වහන්සේ** නොසෙවුවාවූ, උන්-
වහන්සේගෙන් විභාග නොකළාවූ අයද
මේ ස්ථානයෙන් සිඳදමන්නෙමි.
7 **ස්වාමිවූ දෙවියන්වහන්සේ** ඉදිරියෙහි
නිශ්ශබ්දව සිටපන්න. මක්නිසාද **ස්වාමීන්-**
**වහන්සේගේ** දවස ළංව තිබේ. **ස්වාමීන්-**
**වහන්සේ** පූජාවක් පිළියෙළකොට, තමන්
විසින් කැඳෙවූ අය කැපකර තිබේ.
එසේ **ස්වාමීන්වහන්සේගේ** පූජාවේ දවසේදී 8
අධිපතීන්ටද රජුගේ පුත්‍රයන්ටද විදේශි
ඇඳුම් අඳින සියල්ලන්ටද දඬුවම්-
කරන්නෙමි. ඒ දවසේම එළිපත්ත උඩින් 9
පැන තමුන්ගේ ස්වාමිවරුන්ගේ ගෙවල්
බලාත්කාරයෙන්ද ප්‍රයෝගයෙන්ද පුරවන
සියල්ලන්ටත් දඬුවම්කරන්නෙමි. එම 10
දවසේම මත්ස්‍ය දොරටුවෙන් ඝෝෂාවක්ද
දෙවෙනි කොටසෙන් කෑමොරගෑසීමක්ද
හෙල්වලින් බිඳීමේ ශබ්දයක්ද වන්නේ-
යයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
*මක්තේෂ්හි වැසියෙනි, කෑමොරගසා- 11
පල්ලා, මක්නිසාද කානාන්හි සියලු
සෙනඟ නාස්තිවී ගියාය. මුදල් රැස්-
කරගත් සියල්ලෝ සිඳදමනු ලැබුවෝය.
ඒ කාලයේදී මම පහන් දල්වා යෙරු- 12
සලම සෝදිසිකරන්නෙමි; තවද තමුන්ගේ
මඩ්ඩි පිට තදවී සිටින්නාවූ, **ස්වාමීන්-**
**වහන්සේ** යහපතවත් නපුරවත් කරන්නේ
නැතැයි තමුන්ගේ සිත් තුළ සිතාගන්නාවූ
මනුෂ්‍යයන්ට දඬුවම්කරන්නෙමි. ඔවුන්ගේ 13
සම්පත් කොල්ලයක්ද ඔවුන්ගේ ගෙවල්
පාළුවක්ද වන්නේය. එසේය, ඔවුන්
ගෙවල් ගොඩනගන නුමුත් ඒවායේ
වාසයකරන්නේවත් මිදිවතු වවන නුමුත්
එයින් මුද්‍රිකපානය බොන්නේවත් නැත.
**ස්වාමීන්වහන්සේගේ** මහත් දවස ළංව 14
තිබේ, ඒක, එනම් **ස්වාමීන්වහන්සේගේ**
දවසේ ශබ්දය, ළංව ඉතා ඉක්මනට
එන්නේය; එකල බලවතා තදලෙස
කෑගසන්නේය. ඒ දවස වනාහි උදහස් 15
දවසක්ය, දුක්ඛිතවූ විපත්ති දවසක්ය,
නාස්තිවීමේ හා සුනත්වීමේ දවසක්ය,

*එනම්, වන්ගෙඩියේ.

අන්ධකාරවූ කළුවරවූ දවසක්ය,
වලාපටලද ඝනාන්ධකාරයද ඇති
16 දවසක්ය, පවුරු ඇති නුවරවලටත් උස්වූ
කොත්වලටත් විරුද්ධව හොරණෑ
පිඹීමේද ඝෝෂාකිරීමේද දවසක්ය.
17 **ස්වාමීන්වහන්සේට** විරුද්ධව පව්කළ
බැවින් ඒ මනුෂ්‍යයන් අන්ධයන් මෙන්
ඇවිදින හැටියට මම ඔවුන් පිට විපත්ති
පමුණුවන්නෙමි. ඔවුන්ගේ ලේ ධූලි මෙන්ද
ඔවුන්ගේ මාංසය කසළ මෙන්ද වගුරනු
18 ලබන්නේය. **ස්වාමීන්වහන්සේගේ** උදහස්
දවසේදී ඔවුන්ගේ රිදී නිසාවත් ඔවුන්ගේ
රන් නිසාවත් ඔවුන්ට ගැළවෙන්ට
නුපුළුවන; උන්වහන්සේගේ *ජ්වලිත
ගින්නට මුළු දේශය විනාශවන්නේය.
මක්නිසාද උන්වහන්සේ දේශයේ වසන
සියල්ලන් පිටට අන්තිමයක්, එනම්
භයානක අන්තිමයක්, පමුණුවනසේක.

## අන්‍යජාතීන් කෙරෙහි ස්වාමීන්-වහන්සේගේ විනිශ්චයේ දවස පැමිණීම

**2** එම්බා ලජ්ජා නැති ජාතිය, නියමය
ඉෂ්ටවෙන්ට පළමුවෙන්ද, දවස බොල්
මෙන් පහව් ගොස් **ස්වාමීන්වහන්සේගේ**
බලවත් උදහස නුඹලා පිටට පැමිණෙන්ට
2 පළමුවෙන්ද, **ස්වාමීන්වහන්සේගේ** උදහස්
දවස නුඹලා පිටට පැමිණෙන්ට පළමු-
3 වෙන්ද, නැමී යටත්වෙයල්ලා. **ස්වාමීන්-
වහන්සේගේ** විනිශ්චය ඉෂ්ටකළාවූ
දේශයේ මොළොක් ගුණ ඇති සියල්-
ලෙනි, උන්වහන්සේ සොයාපල්ලා;
ධර්මිෂ්ඨකම සොයාපල්ලා, මොළොක්
ගුණය සොයාපල්ලා. සමහරවිට නුඹලා
**ස්වාමීන්වහන්සේගේ** උදහස් දවසේදී
4 සඟවනු ලබනවා ඇත. මක්නිසාද ගාසා
අත්හරිනු ලබන්නේය, අෂ්කෙලොන්
පාළුවක් වන්නේය. ඔව්හු මද්දහන්
වේලාවේ අෂ්දෝද්වරුන් එළවා දමන්-
නෝය, එක්‍රොන්ද උදුරනු ලබන්නේය.
5 මුහුදුබඩ වැසියන් වන කෙරේතිය

*හෙවත්, කෝප ගින්නට.

ජාතියට දුක්වේ! එම්බා පිලිස්තිවරුන්ගේ
දේශය වන කානාන්, **ස්වාමීන්වහන්සේගේ**
වචනය නුඹට විරුද්ධව තිබේ. වැසියෙක්
නොසිටින ලෙස නුඹ විනාශකරන්නෙමි.
මුහුදුබඩ වනාහි එඬේරුන්ට පැල්ද බැටළු 6
ගාල්ද ඇති පිට්ටනි වන්නේය. තවද 7
මුහුදුබඩ පළාත යූද වංශයේ ඉතිරි අයට
ලැබී, ඔවුන් එහි මෑග රැළවල් පෝෂ්‍ය-
කරනවා ඇත. සවස ඔව්හු අෂ්-
කෙලොන්හි ගෙවල්වල නිදාගන්නෝය;
මක්නිසාද ඔවුන්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේ** ඔවුන් දෙස බලා ඔවුන්ගේ
වාල්කම පහකරනසේක. මාගේ සෙනඟට 8
නින්දකළාවූ, ඔවුන්ගේ සීමාවට විරුද්ධව
උඩඟුවුණාවූ මෝවබ්ගේ නින්දකිරීමත්
අම්මොන් පුත්‍රයන්ගේ අපහාස වචනත්
ඇසීමි. එබැවින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ 9
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: මා ජීවත්ව සිටින බව
සැබැවා සේම මෝවබ් සොදෙම මෙනුත්
අම්මොන් පුත්‍රයෝ ගොමෝරාව මෙනුත්
කහඹිලියා බිමක්ද ලුණු වළවල්ද
නිරන්තර පාළුවක්ද වන්නෝය. මාගේ
සෙනඟගෙන් ඉතිරි අය ඔවුන්ගෙන්
කොල්ලකන්නෝය; මාගේ ජාතියෙන්
ඉතිරි තැනැත්තෝ ඔවුන්ගේ රට
උරුමකරගන්නෝය. මේක ඔවුන්ට 10
පැමිණෙන්නේ ඔවුන් නින්දකර, සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** සෙනඟට විරුද්ධව
උඩඟුවී පෙන්නූ උදුරම්කම නිසාය. ඔවුන් 11
කෙරෙහි **ස්වාමීන්වහන්සේ** භයංකරව
සිටිනසේක. මක්නිසාද උන්වහන්සේ
පොළොවේ සියලුම දෙවිවරුන්
ක්ෂයකරනසේක; ජාතීන්ගේ සියලුම
ද්වීපවල වැසියෝද තම තමුන්ගේ
ස්ථානවල සිට උන්වහන්සේට නමස්-
කාරකරන්නෝය. එම්බා කූෂ්වරුනි, නුඹ- 12
ලාත් මාගේ කඩුවෙන් මැරුම්කන්නහුය.
උන්වහන්සේ තමන් අත උතුරු දිගට 13
විරුද්ධව දිගුකර, අෂූර් විනාශ කොට,
නිනිවය කාන්තාරය මෙන් දියසීරා නැති
පාළුවක් කරනවා ඇත. එහි තුළ මෑග 14

රැළවල් වන සියලු වර්ගවල සත්ත්වයෝ
ලගින්නෝය. කරවැල් කොකාද
ඉත්තෑවාද එහි පේකඩවල රැය පසු-
කරන්නෝය. උන්ගේ හඬ කවුළුවල
ඇසෙන්නේය; එළිපතුවල පාළුකම
ඇතිවන්නේය. මක්නිසාද උන්වහන්සේ
කිහිරි ලී කර්මාන්තය බිඳහෙළා තිබේ.
15 ප්‍රීතිමත්ව අප්‍රවේසමෙන් වාසය කරමින්:
තවත් කෙනෙක් නැතුව මමම සිටිමියි
සිත තුළ සිතාගත්තාවූ නුවර මේය. ඒක
පාළුවක්ද මෘගයන් ලගින තැනක්ද වූ
හැටි! ඒ ළඟින් යන හැම දෙනම
කවටකම්කර අත සොලවනවා ඇත.

## යෙරුසලම කෙරෙහි විනිශ්චය. එය අන්තිමට පවිත්‍රකරනු ලැබීම

**3** කැරළිකාරවූ, අපවිත්‍රවූ, පීඩා-
2 කරන්නාවූ නුවරට දුක්වේ! ඈ හඬට
කීකරු නුවූවාය; අවවාදය පිළි
නොගත්තාය; **ස්වාමීන්වහන්සේ** කෙරෙහි
විශ්වාස නොකළාය; ඇගේ දෙවියන්-
3 වහන්සේට ළංවුණේ නැත. ඈ තුළ සිටින
ඇගේ අධිපතීහු ගොරවන සිංහයෝය;
ඇගේ විනිශ්වයකාරයෝ සැන්දෑ
වෘකයෝය; ඔව්හු පසුවදට කිසිවක් ඉතිරි
4 නොකරති. ඇගේ ප්‍රොපේතවරු අහංකාර
ද්‍රෝහි මනුෂ්‍යයෝය. ඇගේ පූජකයෝ
ශුද්ධ දේ කෙලහුවෝය, ව්‍යවස්ථාව
5 පෙරළුවෝය. ඈ තුළ **ස්වාමීන්වහන්සේ**
ධර්මිෂ්ඨව සිටිනසේක; උන්වහන්සේ
අධර්මිෂ්ඨකම නොකරනසේක; නො-
වරදවා උදයක් පාසා උන්වහන්සේ
තමන්ගේ විනිශ්චය එළියට ගෙනෙන-
සේක; නුමුත් අධර්මිෂ්ඨයාට ලජ්ජාව
6 නොදනෙයි. මම ජාතීන් සිඳදැමීමි, ඔවුන්ගේ
පවුරු මුදුන් පාළුවී තිබේ; ඔවුන්ගේ
වීථිවල කිසිවෙක් නොයන හැටියට
ඒවා පාළුකෙළෙමි. ඔවුන්ගේ නුවරවල
මනුෂ්‍යයෙක්වත් වැසියෙක්වත් නොසිටින
7 ලෙස ඒවා නටබුන්වී තිබේ. මා විසින්
ඈ ගැන නියමකළ සියල්ල ලෙස ඇගේ
වාසස්ථානය සිඳදමනු නොලබන පිණිස:
නුඹ මා කෙරෙහිම භයවී අවවාදය
පිළිගන්නෙහියයි කීවෙමි. එහෙත් ඔව්හු
අලුයම නැගිට තමුන්ගේ සියලු ක්‍රියාවල්
දූෂ්‍යකළෝය. එබැවින් කොල්ල ගැනීමට 8
මා නැගිටින දවස දක්වා මා ගැන
බලාසිටපල්ලායයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද මාගේ නියමය
නම් ජාතීන් රැස්කොට, රාජ්‍යවල්
එකතුකොට, මාගේ කෝපය වන මාගේ
මුළු බලවත් උදහස ඔවුන් කෙරෙහි
වැගිරවීමය; එසේය, මාගේ *ජ්වලිත
ගින්නෙන් මුළු පොළොව විනාශවන්නේය.
එකල සියලු ජනයන් **ස්වාමීන්වහන්සේගේ** 9
නාමයට යාච්ඤාකොට, එක්සිත්ව
උන්වහන්සේට සේවයකරන පිණිස,
ඔවුන්ට පවිත්‍ර භාෂාවක් දෙන්නෙමි.
විසිරගිය මාගේ සෙනඟ වන මට 10
කන්නලව්කරන්නෝ කූෂ් ගංගාවලට
එගොඩින් මාගේ පඬුර ගෙනෙන්නෝය.
නුඹ මට විරුද්ධව කළාවූ නුඹේ සියලු 11
අපරාධ ක්‍රියා නිසා ඒ කාලයේදී
නුඹ ලජ්ජාවට නොපැමිණෙන්නෙහිය.
මක්නිසාද මම එකල නුඹේ උඩඟුවූ
ප්‍රීතිමත්වන්නන් නුඹ තුළෙන් පහ-
කරන්නෙමි, නුඹද මාගේ ශුද්ධවූ කන්දෙහි
තවත් උද්දරම් නොවන්නෙහිය. මම නුඹ 12
තුළ යටහත්වූ දිළිඳුවූ සෙනඟක් ඉතිරි-
කරන්නෙමි, ඔව්හු **ස්වාමීන්වහන්සේගේ**
නාමය කෙරෙහි විශ්වාසය තබන්නෝය.
ඉශ්‍රායෙල්ගෙන් ඉතිරි අය අයුතුකමක් 13
නොකරන්නෝය, බොරු නොකියන්-
නෝය; වංචා දිවක් ඔවුන්ගේ මුඛවල
සම්බ නොවන්නේය. මක්නිසාද ඔව්හු
කිසිවෙකු විසින් භයගන්වනු නොලැබ,
කෑම කා නිදාගන්නෝය. සියොන් 14
දියණියෙනි, ගී කියාපන්න; ඉශ්‍රායෙල්,
ඝෝෂාකරපන්න; යෙරුසලම් දියණියෙනි,
මුළු සිතින් සන්තෝෂවී ප්‍රීතිමත්වෙයන්න.
**ස්වාමීන්වහන්සේ** නුඹේ විනිශ්චයන් 15
පහකළසේක, නුඹේ සතුරන් පිටත
හෙළූසේක. ඉශ්‍රායෙල් රජවූ **ස්වාමීන්-
වහන්සේ** නුඹ තුළ සිටිනසේක, නුඹ

*හෙවත්, කෝප ගින්නෙන්.

තවත් විපත්තියට භය නොවන්නෙහිය.
16 ඒ කාලයේදී යෙරුසලමට කියනුයේ:
භය නොවන්න. සියොන්, නුඹේ අත්
17 හෙළාවැටී නොතිබේවා. නුඹේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** නුඹ තුළ සිටිනසේක,
උන්වහන්සේ ගළවන්ට බලවත්වූ තැනන්-
වහන්සේය. උන්වහන්සේ සන්තෝෂයෙන්
නුඹ කෙරෙහි ප්‍රීතිවී, තමන්ගේ ප්‍රේමයෙහි
නිශ්චලව සිටිනසේක, ප්‍රීති ඝෝෂාවෙන්
18 නුඹ කෙරෙහි ප්‍රීතිමත්වනසේක. මංගල්‍ය
රැස්වීම ගැන ශෝකවන්තන් රැස්කරන්-
නෙමි, ඔව්හු නුඹට අයිතිව සිටියෝය.
19 එහි නින්දව ඔවුන්ට බරක් විය. ඒ
කාලයේදී නුඹට පීඩාකරන සියල්ලන්ට
මම ප්‍රතිඵල දෙන්නෙමි. කොරගසගසා
යන්නන් ගළවා, පන්නාදැමූවන් රැස්-
කොට, ඔවුන් ලජ්ජාව වින්දවූ සියලුම
දේශවල ඔවුන් ප්‍රශංසාවක්ද නාමයක්ද
වෙන්ට සලස්වන්නෙමි. මා විසින් නුඹලා 20
රැස්කරන ඒ කාලයෙහිම නුඹලා ඇතුළට
ගෙනෙන්නෙමි. මක්නිසාද මම නුඹලා-
ගේ ඇස් හමුයෙහි නුඹලාගේ වාල්කම
පහකරන විට, පොළොවේ සියලු ජනයන්
අතරෙහි නුඹලා නාමයක්ද ප්‍රශංසාවක්ද
කරන්නෙමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක.

# අනාගතවක්තෘවූ හග්ගයිගේ පොත

## දේවමාළිගාව ගොඩනගන්ට පටන්ගැනීමට ආරාධනාවක්

1 දරියුස් රජුගේ දෙවෙනි අවුරුද්දේ
හවෙනි මාසයේ පළමුවෙනිද
**ස්වාමීන්වහන්සේගේ** වචනය අනා-
ගතවක්තෘවූ හග්ගයි කරණකොටගෙන
ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ, යූදහි ආණ්ඩු-
කාරයාවූ සෙරුබ්බාබෙල් වෙතටත්
උත්තම පූජකවූ යෙහෝශාදක්ගේ පුත්‍රවූ
යෝෂුවා වෙතටත් පැමිණ මෙසේ කීය.
2 සේනාවල **ස්වාමීන්වහන්සේ** කථාකොට:
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය ගොඩ-
නගන්ට නිසි කාලය පැමුණුණේ නැතැයි
3 මේ සෙනඟ කියතියි කීසේක. එකල
**ස්වාමීන්වහන්සේගේ** වචනය අනා-
ගතවක්තෘවූ හග්ගයි කරණකොටගෙන
4 පැමිණ කියනුයේ: මේ ගෘහය පාළුව
තිබෙද්දීම ඇතුළත ලෑලිවලින් වසා
තිබෙන නුඹලාගේ ගෙවල්වල වාසය-
කිරීමට නුඹලාට මෙය නිසි කාලයද?
5 එබැවින් සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: නුඹලාගේ මාර්ග
6 සිතට ගනිල්ලා. නුඹලා බොහෝම
වැපුරූ නුමුත් එකතුකරගත්තේ
ස්වල්පයක්ය; නුඹලා කන නුමුත්
තෘප්තියට නොපැමිණෙන්නහුය; බොන
නුමුත් සෑහීමට නොපැමිණෙන්නහුය;
අඳින නුමුත් උණුහුම් නොවන්නහුය;
කුලී ලබාගන්නාද එය ලබාගන්නේ හිල්
7 ඇති පසුම්බියකට (දමන්ට)ය. සේනාවල
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක:
8 නුඹලාගේ මාර්ග සිතට ගනිල්ලා. මා
විසින් ගෘහය කෙරෙහි ප්‍රසන්නවී ගෞරව
ලබන පිණිස, නුඹලා කඳු රටට නැගී
ගොස් ලී ගෙනවුත් ඒක ගොඩ-
නගාපල්ලායයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. නුඹලා බොහොමයක් ගැන 9
බලාසිටියහුය, නුමුත් ඒවා ස්වල්ප විය;
නුඹලා ඒවා ගෙදර ගෙනා කල මම
ඒවා පිඹදැමුවෙමි. ඒ මක්නිසාදැයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** අසනසේක.
මාගේ ගෘහය පාළුව තිබෙද්දී නුඹලා
එකිනෙකා තම තමාගේම ගෙදරට දුවන
නිසාය. එබැවින් නුඹලා නිසා ආකා- 10
ශයෙන් පිනි නැවතී තිබේ, පොළොවෙන්
එහි ඵල වැලකී තිබේ. මම දේශය 11
හා කඳුද ගොයමද මිදියුසද තෙල්ද
භූමියෙන් අටගන්න දේවල්ද මනුෂ්‍යයන්ද
සිව්පාවුන්ද සියලු හස්තකර්මද පිටට
නියඟයක් එන්ට අණකෙළෙමියි කීවේය.
එකල ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ 12
සෙරුබ්බාබෙල්ද යෙහෝශාදක්ගේ පුත්‍රවූ
උත්තම පූජකයාවූ යෝෂුවාද සෙනඟගෙන්
අනික් සියල්ලෝද තමුන්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේගේ** හඬටත් තමුන්ගේ
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** විසින් එවූ
අනාගතවක්තෘවූ හග්ගයිගේ වචනවලටත්
කීකරුවූවෝය; එසේ සෙනඟ **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි භයවූවෝය. එකල 13
**ස්වාමීන්වහන්සේගේ** පණිවිඩකාරයාවූ
හග්ගයි **ස්වාමීන්වහන්සේගේ** පණිවිඩයේ
හැටියට සෙනඟට කථාකොට: මම
නුඹලා සමග සිටිමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කීවේය. තවද **ස්වාමීන්-** 14
**වහන්සේ** ෂෙයල්තියෙල්ගේ පුත්‍රවූ යූදහි
ආණ්ඩුකාරයාවූ සෙරුබ්බාබෙල්ගේ
ආත්මයද යෙහෝශාදක්ගේ පුත්‍රවූ
උත්තම පූජකයාවූ යෝෂුවාගේ ආත්මයද

සෙනඟගෙන් අනික් සියල්ලන්ගේ ආත්මද
15 පුබුදුකළසේක. ඔව්හු දරියුස් රජුගේ
දෙවෙනි අවුරුද්දේ හවෙනි මාසයේ
විසිහතරවෙනිද ඇවිත් තමුන්ගේ
දෙවිවූ සේනාවල **ස්වාමීන්වහන්සේගේ**
ගෘහයෙහි වැඩය කළෝය.

## පළමුවෙනි දෙවෙනි මාළිගා දෙක

2 හත්වෙනි මාසයේ විසිඑක්වෙනිද
**ස්වාමීන්වහන්සේගේ** වචනය අනා-
ගතවක්තෘවූ හග්ගයි කරණකොටගෙන
2 පැමිණ කියනුයේ: ෂෙයල්තියෙල්ගේ
පුත්‍රවූ යූදහි ආණ්ඩුකාරයාවූ සෙරුබ්-
බාබෙල්ටත් යෙහෝශාදක්ගේ පුත්‍රවූ
උත්තම පූජකයාවූ යෝෂුවාටත් සෙනඟ-
ගෙන් අනික් අයටත් කථාකොට මෙසේ
3 කියාපන්න: මේ ගෘහය එහි පළමු තේජස
ඇතුව තිබෙද්දී එය දුටු අයගෙන්
තුඹලා අතරේ ඉතිරිව සිටින්නේ කවුද?
මේක දැන් තුඹලාට පෙනෙන්නේ
කොහොමද? මේක කිසිත් නැත්තාක්-
මෙන් තුඹලාගේ ඇස්වලට පෙනෙනවා
4 නොවේද? එහෙත්, සෙරුබ්බාබෙල්,
දැන් බලවත්ව සිටපන්නැයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක; යෙහෝශාදක්ගේ
පුත්‍රවූ උත්තම පූජකයාවූ යෝෂුවා, තුඹත්
බලවත්ව සිටපන්න; දේශයේ සෙනඟ
සියල්ලෙනි, තුඹලාත් බලවත්ව සිට
වැඩකරපල්ලායයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද මම තුඹලා සමග
සිටිමියි සේනාවල **ස්වාමීන්වහන්සේ**
5 කියනසේක. තුඹලා මිසරයෙන් පිටත්ව
ආකල මා විසින් තුඹලා සමග ගිවිසගත්
වචනයත් මාගේ ආත්මයත් තුඹලා
අතරෙහි පවතින්නේය. භය නොවෙල්ලා.
6 මක්නිසාද සේනාවල **ස්වාමීන්වහන්සේ**
මෙසේ කියනසේක: මම ටික කලකින්
තව වරක් අහස සහ පොළොවත් මුහුද
7 සහ ගොඩත් සොලවන්නෙමි; සියලු
ජාතීන් සොලවන්නෙමි, සියලු ජාතීන්
ආශාවෙන දේද පැමිණෙන්නේය, මේ
ගෘහය තේජසින් පුරවන්නෙමියි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. රිදී 8
මාගේය, රන්ද මාගේයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. මේ 9
ගෘහයේ අන්තිම තේජස පළමු එකේ
තේජසට වඩා මහත්වන්නේයයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක.
මේ ස්ථානයෙහිදී මම සමාදනය
දෙන්නෙමියි සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කීය.

## පූජකයින්ගේ අපිරිසිදුකම සහ සෙනඟගේ පමාවීම ගැන ස්වාමීන්වහන්සේගේ දඬුවම

දරියුස්ගේ දෙවෙනි අවුරුද්දේ නවවෙනි 10
මාසයේ විසිහතරවෙනිද **ස්වාමීන්-
වහන්සේගේ** වචනය අනාගතවක්තෘවූ
හග්ගයි කරණකොටගෙන පැමිණ
කියනුයේ: සේනාවල **ස්වාමීන්වහන්සේ** 11
කථාකොට—යමෙක් තමාගේ වස්ත්‍ර 12
කෙළවරින් ශුද්ධ මාංසය ගෙනයන විට
ඒ වස්ත්‍ර කෙළවර රොටිවල හෝ
හොදිවල හෝ මුද්‍රිකපානයෙහි හෝ
තෙල්වල හෝ වෙන යම් කෑමක හෝ
තැවරුණොත් ඒවා ශුද්ධවන්නේද
කියා ව්‍යවස්ථාව ගැන පූජකයන්ගෙන්
අසාපන්නැයි කියනසේක. පූජකයෝ
උත්තරදෙමින්: නැතැයි කීවෝය. එවිට 13
හග්ගයි: මළකඳකින් අපවිත්‍රවී සිටින
කෙනෙක් ඒවායෙන් යමකට තැවරු-
ණොත් එය අපවිත්‍රවේදැයි ඇසුවේය.
පූජකයෝ උත්තරදෙමින්: අපවිත්‍රවේ-
යයි කීවෝය. එවිට හග්ගයි උත්තර- 14
දෙමින් මෙසේ කීවේය: මා ඉදිරියෙහි
මේ සෙනඟ එසේමය, මේ ජාතියද
එසේමයයි **ස්වාමීන්වහන්සේ** කියන-
සේක; ඔවුන්ගේ අත්වල සියලු වැඩත්
එසේමය; ඔවුන් එහි ඔප්පුකරන දේත්
අපවිත්‍රය. එබැවින් අද දවසේ පටන් 15
මත්තට සිතට ගනිල්ලා, **ස්වාමීන්-
වහන්සේගේ** මාළිගාවෙහි ගලක් පිට

ගලක් තබන්ට පළමුවෙන් තිබුණු
16 දවස්වල නම්, යමෙක් මිම් විස්සක් තිබුණු
ගොඩක් ළඟට ආකල තිබුණේ මිම්
දහයක්ය; යමෙක් පුරා මිම් පනහක්
අරගන්ට මුද්‍රික පැස ළඟට ආකල
17 තිබුණේ විස්සක්ය. ගොයම් වියළී-
යාමෙන්ද ගොයම් රෝගයෙන්ද ගල්
වර්ෂාවෙන්ද තුඹලාගේ අත්වල සියලු
වැඩවලදී තුඹලාට පහරදුනිමි; එහෙත්
තුඹලා මා වෙතට හැරුණේ නැතැයි
18 **ස්වාමීන්වහන්සේ** කියනසේක. අද දවස
වන නවවෙනි මාසයේ විසිහතරවෙනිද
පටන් මත්තට සිතට ගනිල්ලා, එසේය,
**ස්වාමීන්වහන්සේගේ** මාළිගාවේ අත්-
තිවාරම තැබූ දවසේ පටන් සිතට
19 ගනිල්ලා. බීජ තවම අටුවෙහිද? එසේම
මිදිවැලත් අත්තික්කා ගසත් දෙළුම් ගසත්
ඔලීව ගසත් තවම ඵල දුන්නේ නැත;
අද පටන් මම තුඹලාට ආශිර්වාද-
කරන්නෙමියි කීසේක.

## රාජ්‍යවල් නැතිකරදැමීමට පොරොන්දුව

තවද මාසයේ විසිහතරවෙනිද 20
**ස්වාමීන්වහන්සේගේ** වචනය දෙවෙනි
වර හග්ගයි වෙතට පැමිණ මෙසේ කීය.
යූදහි ආණ්ඩුකාරයාවූ සෙරුබ්බාබෙල්ට 21
කථාකොට මෙසේ කියාපන්න: මම අහස
සහ පොළොවත් සොලවන්නෙමි. මම 22
රාජ්‍යවල සිංහාසනය පෙරළාදමා,
ජාතීන්ගේ රාජ්‍යවල බලය නැතිකොට,
රථ සහ එහි නැගීයන්නන්ද පෙරළා-
දමන්නෙමි, අශ්වයෝද උන් පිට නැගී
යන්නෝද එකිනෙකාගේ කඩුවෙන්
වැටෙන්නෝය. සේනාවල **ස්වාමීන්-** 23
**වහන්සේ** කථාකොට: ෂෙයල්තියෙල්ගේ
පුත්‍රවූ මාගේ මෙහෙකරුවාවූ සෙරුබ්බාබෙල්,
මම ඒ දවසේදී තුඹ රැගෙන පේරස්මුද්දක්
කොට තබාගන්නෙමියි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. මක්නිසාද තුඹ තෝරා-
ගතිමියි සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කීවේය.

# අනාගතවක්තෘවූ සෙකරියාගේ පොත

## ආරම්භය. පසුතැවිලිවීමට ආරාධනාව

1 දරියුස්ගේ දෙවෙනි අවුරුද්දේ අටවෙනි
මාසයේදී **ස්වාමීන්වහන්සේගේ** වචනය
ඉද්දෝගේ පුත්‍රයා වන බෙරෙකියාගේ
පුත්‍රවූ අනාගතවක්තෘවූ සෙකරියා වෙතට
2 පැමිණ කියනුයේ: **ස්වාමීන්වහන්සේ**
තුඹලාගේ පියවරුන් කෙරෙහි ඉතා
3 අප්‍රසන්නවූසේක. එබැවින්: සේනාවල
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේකැයි
ඔවුන්ට කියාපන්න—මා වෙතට
හැරීවරෙල්ලායයි සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක, එවිට මම
තුඹලා වෙතට හැරීඑන්නෙමියි සේනාවල
4 **ස්වාමීන්වහන්සේ** කියනසේක. තුඹලාගේ
පියවරුන්ට සමාන නොවෙල්ලා, පළමු
අනාගතවක්තෘවරුන්: තුඹලාගේ නපුරු
මාර්ගවලින්ද නපුරු ක්‍රියාවලින්ද
හැරියල්ලායයි සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක කියා ඔවුන්ට
මොරගැසූ නුමුත්, ඔවුන් ඇසුවේවත් මට
ඇහුම්කන්දුන්නේවත් නැතැයි **ස්වාමීන්-**
5 **වහන්සේ** කියනසේක. තුඹලාගේ පියවරු
කොයිද? අනාගතවක්තෘවරු සැමකල්ම
6 ජීවත්වෙද්ද? නුමුත් මාගේ මෙහෙ-
කරුවන්වූ අනාගතවක්තෘවරුන්ට මා
විසින් අණකළ මාගේ වචනත් මාගේ
නියෝගත් තුඹලාගේ පියවරුන් කරා
පැමුණුණා නොවේද? එවිට ඔව්හු හැරී:
සේනාවල **ස්වාමීන්වහන්සේ** අපට
කරන්ට අදහස්කළ ප්‍රකාරයට අපේ
මාර්ග සහ අපේ ක්‍රියාවල හැටියට
උන්වහන්සේ අපට කළසේකැයි කීවෝ-
යයි කීය.

## රතු අශ්වයෙකු පිට නැගී ඉන්නෙක් නම්වූ දර්ශනය

දරියුස්ගේ දෙවෙනි අවුරුද්දේ ෂෙබාට් 7
නම්වූ එකොළොස්වෙනි මාසයේ
විසිහතරවෙනිද ඉද්දෝගේ පුත්‍රයා වන
බෙරෙකියාගේ පුත්‍රවූ අනාගතවක්තෘවූ
සෙකරියා වෙතට **ස්වාමීන්වහන්සේගේ**
වචනය පැමිණ මෙසේ කීයේය: මම 8
රාත්‍රියේදී බලා මනුෂ්‍යයෙක් රතු
අශ්වයෙකු පිට නැගී ඉන්නවා දුටිමි,
ඔහු පහළ තිබුණු රටමරඳ ගස් අතරේ
සිටියේය; ඔහුට පිටිපස්සේ රතුවූ දුඹුරුවූ
සුදුවූ අශ්වයෝ සිටියෝය. එවිට මම: 9
මාගේ ස්වාමිනි, මොව්හු කවුරුදැයි
ඇසුවෙමි. මා සමග කථාකළ දූතයාද:
මොව්හු කවුරුද කියා මම තුඹට
පෙන්වන්නෙමියි කීවේය. එවිට රටමරඳ 10
ගස් අතරේ සිටි මනුෂ්‍යයා උත්තරදෙමින්:
මොව්හු වනාහි පොළොවෙහි ඇවිදින්ට
**ස්වාමීන්වහන්සේ** විසින් ඇරිය තැනැත්-
තෝයයි කීවේය. ඔව්හු රටමරඳ ගස් 11
අතරේ සිටි **ස්වාමීන්වහන්සේගේ** දූතයාට
උත්තරදෙමින්: අපි පොළොවෙහි
ඇවිද්දෙමුව, මුළු පොළොව නිස්කලංකව
නිශ්චලව තිබේයයි කීවෝය. එවිට 12
**ස්වාමීන්වහන්සේගේ** දූතයා උත්තර-
දෙමින්: සේනාවල **ස්වාමීන්වහන්ස**, ඔබ
විසින් දැනට සැත්තෑ අවුරුද්දක් උදහස
දක්වූ යෙරුසලමටත් යූදහි නුවරවලටත්
කොපමණ කල් අනුකම්පා නොකර
සිටිනසේක්දැයි කීවේය. **ස්වාමීන්වහන්සේ** 13
මා සමග කථාකළ දූතයාට යහපත්වූ
සැනසිලිදායක වචනවලින් උත්තරදුන්-
සේක. මා සමග කථාකළ දූතයාද: 14
තුඹ මොරගසා මෙසේ කියාපන්න—
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ
කියනසේක: මම යෙරුසලම සහ

සියොන් ගැන මහත් ජ්වලිතයකින් ජ්වලිතව
15 සිටිමි. නොසැලකිලි ජාතීන් කෙරෙහි
මහත් අප්‍රසන්නකමකින් අප්‍රසන්නව
සිටිමි. මක්නිසාද මා ස්වල්ප වශයෙන්
අප්‍රසන්නව සිටි විට ඔව්හු පීඩාව
16 වැඩිකළෝය. එබැවින් ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක: මම අනුකම්පා ඇතුව
යෙරුසලම වෙතට හැරී සිටිමි; මාගේ
ගෘහය එහි ගොඩනගනු ලැබේයයි
සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක,
ලනුවක්ද යෙරුසලම උඩ අදිනු
17 ලබන්නේය. නැවත මොරගසා මෙසේ
කියාපන්න: සේනාවල ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක. නැවත මාගේ
නුවරවලින් යසස ඉතිරියන්ටත් ස්වාමීන්-
වහන්සේ විසින් සියොන් නැවත සනසා
යෙරුසලම නැවත තෝරාගන්ටත්
යෙදේයයි කීය.

## අං සතර සහ ආචාරියන් සතර දෙනා නම්වූ දර්ශනය

18 තවද මාගේ ඇස් ඔසවා බැලූ විට
19 අං සතරක් දුටිමි. එවිට මම: මේවා
මොනවාදැයි මා සමග කථාකළ
දූතයාගෙන් ඇසීමි. මේවා යූද සහ
ඉශ්‍රායෙල්ද යෙරුසලමද විසිරෙවූ අංයයි
20 ඔහු මට කීවේය. ස්වාමීන්වහන්සේද
ආචාරියන් සතරදෙනෙකු මට පෙන්වූ-
21 සේක. එවිට මම: මොවුන් මක්කරන්ට
එනවාදැයි ඇසීමි. උන්වහන්සේ
කථාකොට: මේවා වනාහි කිසිවෙකු
විසින් තමාගේ හිස නොඔසවන තරම්
යූද විසුරුවාදැමූ අංය. මොවුන් එන්නේ
ඒවා භයගන්වා, යූද දේශය
විසුරුවාදමන්ට අහ සෙවූ ජාතීන්ගේ
අං හෙළාදමන්ටයයි කීසේක.

## මනින ලනුව ඇති මනුෂ්‍යයා නම්වූ දර්ශනය

2 තවද මා ඇස් ඔසවා බැලූ විට
මනුෂ්‍යයෙක් මනින ලනුවක් තමාගේ
2 අතේ ඇතුව ඉන්නවා දුටිමි. එවිට මම:
නුඹ කොතනට යනවාදැයි ඇසීමි.
යෙරුසලමේ පළල කොපමණද කියාත්
දිග කොපමණද කියාත් මැන බලන
පිණිසයයි මට කීවේය. එවිට මා 3
සමග කථාකළ දූතයා පිටත්ව ගියේය,
වෙන දූතයෙක් ඔහුගේ පෙරමගට ඇවිත්
ඔහුට කථාකොට: නුඹ දුව ගොස් අර 4
තරුණයාට කථාකර—යෙරුසලම තුළ
මනුෂ්‍යයන්ගේද සිව්පාවුන්ගේද වැඩිකම
නිසා පවුරු නැති ගම්වල මෙන් මිනිස්සු
එහි වාසයකරන්නෝය. මක්නිසාද මම්ම 5
ඒක අවට ගිනි පවුරක්ව ඒක තුළ
තේජසව සිටින්නෙමියි කියා ස්වාමීන්-
වහන්සේ කියනසේකැයි කියාපන්නැයි
කීය. හෝ, හෝ, උතුරු දේශයේ සිට 6
පලා වරෙල්ලායයි ස්වාමීන්වහන්සේ
කියනසේක. මක්නිසාද මම ආකාශයේ
සතර දිග හුළං මෙන් නුඹලා
විසිරෙවූවෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේක. මෙන්න, බබිලෝන් දුව වෙත 7
වසන සියොන්, මිදී වරෙන්න.
මක්නිසාද සේනාවල ස්වාමීන්වහන්සේ 8
මෙසේ කියනසේක: ගෞරවය
පැමුණුණායින් පසු උන්වහන්සේ
නුඹලාගෙන් කොල්ලකෑ ජාතීන් ළඟට
මා ඇරියසේක. මක්නිසාද නුඹලාට
අතගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු
ඉංගිරියාවට අතගසන්නේය. එසේය, 9
මම ඔවුන්ට විරුද්ධව මාගේ අත
සොලවන්නෙමි, ඔව්හු තමුන්ට
මෙහෙකළවුන්ට කොල්ලයක් වන්නේය.
සේනාවල ස්වාමීන්වහන්සේ මා යැවූ
බව නුඹලා දැනගන්නවා ඇත. සියොන් 10
දුවණියෙනි, ගී කියා ප්‍රීතිවෙයන්න.
මක්නිසාද මම ඇවිත් නුඹ තුළෙහි
වාසයකරන්නෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේක. ඒ කාලයෙහි බොහෝ 11
ජාතීහු ස්වාමීන්වහන්සේට එකතුවී මාගේ
සෙනඟ වන්නෝය. මම නුඹ තුළෙහි
වාසයකරන්නෙමි, නුඹද සේනාවල
ස්වාමීන්වහන්සේ මා නුඹ ළඟට එවූ
බව දැනගන්නෙහිය. ස්වාමීන්වහන්සේද 12
ශුද්ධවූ දේශයෙහි තමන්ගේ කොටස

ලෙස යූද උරුමකරගන, යෙරුසලම
13 නැවත තෝරාගන්නසේක. මාංසමයවූ
සියල්ලෙනි, **ස්වාමීන්වහන්සේ** ඉදිරියෙහි
නිශ්ශබ්දවෙයල්ලා. මක්නිසාද උන්-
වහන්සේ ස්වකීය ශුද්ධ වාසස්ථානයෙන්
නැගුටුණුසේක.

## උත්තම පූජකයාවූ යෝෂුවා නම්වූ දර්ශනය

3 තවද උත්තම පූජකයාවූ යෝෂුවා
**ස්වාමීන්වහන්සේගේ** දූතයා
ඉදිරියෙහිද, ඔහුගේ එදිරිකාරයා
වන පිණිස සාතන් ඔහුගේ දකුණු
පැත්තෙහිද සිටිනවා ඔහු මට පෙන්නුවේය.
2 **ස්වාමීන්වහන්සේ** සාතන්ට කථාකොට:
සාතන්, **ස්වාමීන්වහන්සේ** තුඹට
තරවටුකරනසේක්වා; එසේය, යෙරුසලම
තෝරාගත් **ස්වාමීන්වහන්සේ** තුඹට
තරවටුකරනසේක්වා. මොහු ගින්නෙන්
ඇදලාගත් පෙනෙල්ලක් නොවේදැයි
3 කීසේක. යෝෂුවා වනාහි කිලුටු වස්ත්‍ර
ඇඳගන දූතයා ඉදිරියෙහි සිටියේය.
4 දූතයා තමා ඉදිරියෙහි සිටිය
තැනැත්තන්ට කථාකොට: කිලුටු වස්ත්‍ර
ඔහුගෙන් ගළවාදමාපල්ලායයි කීය.
තවද ඔහුට කථාකොට: මෙන්න තුඹේ
අපරාධකම තුඹෙන් පහකෙළෙමි,
මංගල්‍ය වස්ත්‍ර තුඹට පළඳවමියි කියා—
5 මොහුගේ හිසේ ශෝභන මකුටයක්
තබත්වයි කීය. එසේ ඔව්හු ශෝභන
මකුටයක් ඔහුගේ හිසේ තබා ඔහුට
වස්ත්‍ර පැළඳවූවෝය; **ස්වාමීන්වහන්සේගේ**
6 දූතයාද නැගිට එහි සිටියේය. එවිට
**ස්වාමීන්වහන්සේගේ** දූතයා යෝෂුවාට
7 අනුශාසනාකරමින්: සේනාවල **ස්වාමීන්-
වහන්සේ** මෙසේ කියනසේක—තුඹ මාගේ
මාර්ගවල හැසිර, මාගේ භාරය රක්ෂා-
කරන්නෙහි නම්, තුඹට මාගේ ගෘහය
විනිශ්චයකරන්ටත් මාගේ මණ්ඩප
බලාගන්ටත් ලැබෙයි, මෙහි සිටින
මොවුන් අතරේ ළඟාවිය හැකි ස්ථානයක්
8 තුඹට දෙන්නෙමි. ඉතින් උත්තම
පූජකයාවූ යෝෂුවා, තුඹ අසාපන්න,
තුඹ ඉදිරියෙහි ඉඳගන්නාවූ තුඹේ
සහායකාරයන්ද සලකුණක් පිණිස වූ
මනුෂ්‍යයන් බැවින් ඔව්හුද අසත්වා.
මක්නිසාද මාගේ මෙහෙකරුවාවූ
පැළෑටිය පැමිණෙන්ට සලස්වන්-
නෙමි. මෙන්න, යෝෂුවා ඉදිරියේ මා 9
විසින් තබා තිබෙන ගල වූ ඒ එක ගල
පිට ඇස් සතක් ඇත්තේය. මම්ම එහි
කැටයම්කරන්නෙමියි සේනාවල **ස්වාමීන්-
වහන්සේ** කියනසේක, ඒ දේශයේ
අපරාධය එක දවසකින් පහකරන්නෙමි.
ඒ කාලයෙහි තුඹලා එකිනෙකා තම 10
තමාගේ මිත්‍රයා මුද්‍රිකවැල යටටත්
අත්තික්කා ගස යටටත් කැඳවාගන
යනවා ඇතැයි සේනාවල **ස්වාමීන්-
වහන්සේ** කියනසේකැයි කීය.

## රන් පහන් රුක සහ ඔලීව අතු දෙක නම්වූ දර්ශනය

4 මා සමග කථාකළ දූතයා නැවත
ඇවිත් නින්දෙන් පුබුදුවනු ලබන්නාවූ
මනුෂ්‍යයෙකු මෙන් මා පුබුදුවා: තුඹට 2
පෙනෙන්නේ මොකද්දැයි මාගෙන්
ඇසුවේය. මමද: මුළුමනින්ම රන්මයවූ
පහන් රුකක් මට පෙනෙයි; ඒකේ මුදුනේ
ඒකේ භාජනයත් ඒක උඩ ඒකේ පහන්
සතකුත්, ඒක උඩ තිබෙන පහන්වලට
නළ සතකුත්, ඒක ළඟ පාත්‍රයට 3
දකුණෙන් එකක්ද වමෙන් එකක්ද බැගින්
ඔලීව ගස් දෙකකුත් තිබේයයි කීවෙමි.
තවද මා සමග කථාකළ දූතයාට මම 4
උත්තරදෙමින්: මාගේ ස්වාමීනි, මේවා
මොනවාදැයි ඇසුවෙමි. මා සමග 5
කථාකළ දූතයා මට උත්තරදෙමින්:
මේවා මොනවාද කියා තුඹ දන්නේ
නැද්දැයි මට කීවේය. මාගේ ස්වාමීනි,
නැතැයි මම කීවෙමි. එකල ඔහු මට 6
උත්තරදෙමින්: සෙරුබ්බාබෙල්ට **ස්වාමීන්-
වහන්සේගේ** වචනය මේය. එනම්,
බලයෙන්වත් ශක්තියෙන්වත් නොව
මාගේ ආත්මයෙන්යයි සේනාවල

7 ස්වාමීන්වහන්සේ කියනසේක. එම්බා
මහත් කන්ද, තුඹ කවුද? සෙරුබ්බාබෙල්
ඉදිරියෙහි තුඹ සමභූමියක් වන්නෙහිය.
ඔහුද: ඊට කරුණාව ලැබේවා,
කරුණාව ලැබේවයි මොරගසමින්
ප්‍රධාන ගල පිටතට ගෙනෙනවා ඇතැයි
8 කීය. තවද ස්වාමීන්වහන්සේගේ වචනය
මා වෙතට පැමිණ කියනුයේ:
9 සෙරුබ්බාබෙල්ගේ අත්වලින් මේ ගෘහයේ
අත්තිවාරම තැබුවාක්මෙන් ඔහුගේ
අත්වලින් ඒක තීන්දුකරනවා ඇත; එසේ
සේනාවල ස්වාමීන්වහන්සේ තුඹලා ළඟට
මා එවූ බව තුඹ දැනගන්නවා ඇත.
10 මක්නිසාද කුඩා දේවල දවස
හෙළාදැක්කේ කවුද? මේ සත වන
ස්වාමීන්වහන්සේගේ ඇස් තුමූ
සෙරුබ්බාබෙල්ගේ අතේ ලඹකැටය
තිබෙනවා දැක ප්‍රීතිවන්නෝය; ඒවා
පොළොව මුළුල්ලෙහි ඔබ මොබ දුවතියි
11 කීය. මම තවත් කථාකොට: පහන්රුකට
දකුණෙනුත් වමෙනුත් තිබෙන මේ ඔලීව
ගස් දෙක මොනවාදැයි ඔහුගෙන් අසා,
12 නැවත කථාකොට: රන් නළ දෙකෙන්
රන් වැනි තෙල් වත්කරදෙන ඔලීව අතු
දෙක මොනවාදැයි ඔහුගෙන් ඇසුවෙමි.
13 ඔහු මට උත්තරදෙමින්: මේවා
මොනවාද කියා තුඹ දන්නේ නැද්දැයි
ඇසුවේය. මාගේ ස්වාමිනි, නැතැයි
14 මම කීමි. මොව්හු මුළු පොළොවේ
ස්වාමීන්වහන්සේ වෙත සිටින ආලේපලත්
දෙදෙනායයි ඔහු කීය.

## ඉගිලෙන අකුළාපු පොත නම්වූ දර්ශනය

5 නැවත මම මාගේ ඇස් ඔසවා
බැලීමි, එවිට අකුළන පොතක්
2 ඉගිලයනවා දුටිමි. තුඹට පෙනෙන්නේ
කුමක්දැයි ඔහු මාගෙන් ඇසුවේය. මමද:
අකුළන පොතක් ඉගිලයනවා මට
පෙනෙයි; එහි දිග රියන් විස්සක්ය, පළල
3 රියන් දසයක්යයි කීමි. එවිට ඔහු මට
කථාකොට: මේක දේශය මුළුල්ලෙහි
පිටත්ව යන ශාපයය. මක්නිසාද එහි
මේ පැත්තේ ලියා තිබෙන හැටියට,
සොරකම්කරන සියල්ලෝ පහකරනු
ලබන්නෝය; එහි අනිත් පැත්තේ ලියා
තිබෙන හැටියට බොරුවට දිවුරන
සියල්ලෝද පහකරනු ලබන්නෝයයි කීය.
ඒක සොරාගේ ගෙටත් මාගේ නාමයෙන් 4
බොරුවට දිවුරන අයගේ ගෙටත් වැද,
ඔහුගේ ගෙය තුළ නැවතී, එහි දඬුත්
ගලුත් ඇතුළුව නැතිකරන පිණිස
පිටත්කර හරින්නෙමියි සේනාවල
ස්වාමීන්වහන්සේ කියනසේකැයි කීවේය.
එවිට මා සමග කථාකළ දූතයා 5
පිටතට ඇවිත් මට කථාකොට: මේ
පිටතට එන්නේ මොකද කියා තුඹේ
ඇස් ඔසවා බලාපන්නැයි කීවේය. ඒක 6
මොකක්දැයි ඇසීමි. එය නම් පිටතට
එන ඒඵාවයයි ඔහු කීවේය. තවද මුළු
දේශයෙහි ඔවුන්ගේ පෙනීම මේ ආකාර-
යයි කීවේය. (බලව, ඊයම් තලෙන්තයක් 7
උස්සනු ලැබුවේය.) එක් ස්ත්‍රියක් ඒඵාව
තුළ ඉඳගෙන උන්නාය. ඔහු: මෑ නම් 8
දුෂ්ටකමයයි කියා, ඇය ඒඵාව ඇතුළට
හෙළා, එහි කටට ඊයම් බර තැබුවේය.
එවිට මම මාගේ ඇස් ඔසවා බලා, 9
ස්ත්‍රීන් දෙදෙනෙක් එනවා දුටිමි, ඔවුන්ගේ
පියාපත්වල හුළඟ තිබුණෝය;
කතකොකාගේ පියාපත් වැනි පියාපත්
ඔවුන්ට තිබුණේය. ඔව්හු අහසටත්
පොළොවටත් අතරේ ඒඵාව උස්සාගෙන
ගියෝය. එවිට මම: ඒඵාව ඔවුන් 10
කොතනට ගෙනයනවාදැයි මා සමග
කථාකළ දූතයාගෙන් ඇසීමි. ෂීනාර් 11
දේශයේ ඇට ගෙයක් ගොඩනගන්ටය.
ඒක පිහිටෙවූ කල්හි ඇ එහි ඇගේම
ඉඩමෙහි සිටුවනු ලබන්නීයයි ඔහු මට
කීය.

## රථ සතර නම්වූ දර්ශනය

6 නැවත මම මාගේ ඇස් ඔසවා
බැලූ විට රථ සතරක් කඳු දෙකකට
අතරෙන් පිටත්ව එනවා දුටිමි; ඒ කඳු
වනාහි පිත්තල කඳුය. පළමුවෙනි රථයට 2

රතු අශ්වයෝද දෙවෙනි රථයට කළු
3 අශ්වයෝද, තුන්වෙනි රථයට සුදු
අශ්වයෝද හතරවෙනි රථයට ලප
ඇත්තාවූ දුඹුරුපාට අශ්වයෝද යොදා
4 සිටියෝය. එකල මම මා සමග කථාකළ
දූතයාට කථාකොට: මාගේ ස්වාමිනි,
5 මේ මොකදැයි ඇසුවෙමි. දූතයා මට
උත්තරදෙමින්: මොව්හු මුළු පොළොවේ
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සිට පිටත්ව
යන්නාවූ *ආකාශයේ හුළං සතරයයි
6 කීවේය. එහි කළු අශ්වයන් බැඳ සිටින
රථය උතුරු දේශයට පිටත්ව යයි; සුදු
අශ්වයෝ එවුන් පස්සේ ගියෝය; ලප
ඇති එවුවෝ දකුණු දේශයට ගියෝය.
7 දුඹුරුපාට එවුවෝ පිටත්ව දේශයෙහි
ඇවිදීමට යන්ට වෑයම්කළෝය. ගොස්
දේශයෙහි ඇවිදපල්ලායයි උන්වහන්සේ
කීසේක. එවිට උන් දේශයෙහි ඇවිද්-
8 දෝය. එකල උන්වහන්සේ මට අඬගසා
මට කථාකොට: උතුරු දේශයට පිටත්ව
ගිය එවුවෝ උතුරු දේශය කෙරෙහි
†මාගේ ආත්මය සංසිදෙවුවෝයයි
කීසේක.

## උත්තම පූජකයාට ඔටුනු පැළඳීම නම්වූ දර්ශනය

9 තවද ස්වාමීන්වහන්සේගේ වචනය මා
10 වෙතට පැමිණ කියනුයේ: වාලට ගිය
අයගෙන්, එනම් බබිලෝනියේ සිට
ආවාවූ හෙල්දයිගෙන්ද ටෝබියාගෙන්ද
යෙදයාගෙන්ද නුඹ රන් රිදී ලබාගන,
ඒ දවසේදී ශෙපනියාගේ පුත්‍රවූ
යොෂියාගේ ගෙදරට පැමිණ ඇතුල්වී,
11 ඔටුනු සාද, යෙහෝශාදක්ගේ පුත්‍රවූ
උත්තම පූජකයාවූ යෝෂුවාගේ ඉසේ
12 තබා, ඔහුට මෙසේ කියාපන්න--
සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ
කියනසේක: මෙන්න, පැළැටිය නම්වූ
මනුෂ්‍යයා තමන්ගේ ස්ථානයෙන් පැළවී
ඇවිත් ස්වාමීන්වහන්සේගේ මාළිගාව
13 ගොඩනගනවා ඇත. උන්වහන්සේම
ස්වාමීන්වහන්සේගේ මාළිගාව ගො-
ඩනගා, උන්වහන්සේම මහිමය දරමින්,
තමන් සිංහාසනයෙහි වැඩහිඳ ආණ්ඩු
කරනසේක; තමන් සිංහාසනයෙහිම
පූජකයෙක්වද සිටිනසේක. ඒ දෙදෙනා
අතරේද සමාදාන මන්ත්‍රණය තිබෙයි. ඒ 14
ඔටුනු වනාහි හේලෙම්ද ටෝබියාද
යෙදයාද ශෙපනියාගේ පුත්‍රවූ හේන්ද
උදෙසා සිහිවීමක් පිණිස ස්වාමීන්-
වහන්සේගේ මාළිගාවෙහි තිබෙයි. තවද 15
දුර සිටින්නෝ ඇවිත් ස්වාමීන්වහන්සේගේ
මාළිගාව ගොඩනැගීමට උදව්වන්නෝය,
සේනාවල ස්වාමීන්වහන්සේ මා නුඹලා
ළඟට එවූ බව නුඹලා දැනගන්නහුය.
නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ
හඬට නුඹලා ඇත්තටම කීකරුවුණොත්
මෙසේ සිදුවේයයි කීයේය.

## නිරාහාරව ඉඳීම ගැන ප්‍රශ්නය. ඊට ස්වාමීන්වහන්සේගේ උත්තරය

7
දරියුස් රජුගේ සතරවෙනි අවුරුද්දේ
කිස්ලෙව් වන නවවෙනි මාසයේ
සතරවෙනිද ස්වාමීන්වහන්සේගේ වචනය
සෙකරියා වෙතට පැමිණියේය.
මක්නිසාද: මෙපමණ අවුරුදුවල 2
කළාක්මෙන් අප පස්වෙනි මාසයේ
සැපතින් වැලකී සිට අඬන්ට ඕනෑදැයි
කියා සේනාවල ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි සිටින පූජකයන්ගෙනුත්
අනාගතවක්තෘවරුන්ගෙනුත් අසා,
ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි කන්නලව්- 3
කරන්ට බෙතෙල්හි වැසියෝ ෂරෙශෙර්ද
රෙගෙම්-මෙලෙක්ද ඔවුන්ගේ මිනිසුන්ද
ඇරියෝය. එවිට සේනාවල ස්වාමීන්- 4
වහන්සේගේ වචනය මා වෙතට පැමිණ
කියනුයේ: නුඹ දේශයේ මුළු සෙනඟටත් 5
පූජකයන්ටත් කථාකරමින්--නුඹලා දැන්
සැත්තෑ අවුරුද්දක් පස්වෙනි සහ
හත්වෙනි මාසවල නිරාහාරව සිට
විලාපකියද්දී නුඹලා නිරාහාරව සිටියේ
මාම උදෙසාද? නුඹලා කන විටත් 6

*හෙවත්, ස්වර්ගයේ ආත්ම සතරක්ය.
†එනම්, මාගේ උදහස.

බොන විටත් කන්නෙත් බොන්නෙත්
තුඹලාම උදෙසා නොවේද?
7 යෙරුසලමෙහිත් ඒ වටකර ඒකේ
නුවරවලත් වැසියන් සුවසේ සිටිද්දීද
දකුණු දිශාවෙහි සහ පාත රටෙහිත්
වැසියන් සිටිද්දීද පළමු අනාගතවක්තෘ-
වරුන් අතින් **ස්වාමීන්වහන්සේ** ප්‍රකාශ-
කළ වචන *මේවා නොවේද කියා
කියාපන්නැයි කීය.
8 තවද **ස්වාමීන්වහන්සේගේ** වචනය
සෙකරියා වෙතට පැමිණ කියනුයේ:
9 සේනාවල **ස්වාමීන්වහන්සේ** කථාකොට:
සැබෑලෙස විනිශ්චයකරපල්ලා, එකි-
නෙකාට කරුණාවද අනුකම්පාවද
10 පෙන්වාපල්ලා. වැන්දඹුවට සහ පියා
නැත්තාටත් විදේශියාට සහ
අසරණයාටත් පීඩා නොකරල්ලා;
තුඹලාගේ සිත්වලින් එකිනෙකාට
විරුද්ධව නපුර යෝජනා නොකරල්ලා-
11 යයි කීසේක. එහෙත් ඔව්හු ඇහුම්-
කන්දෙන්ට අකමැතිව, කර ඇරියෝය,
නොඅසන පිණිස තමුන්ගේ කන්
12 වසාගත්තෝය. එසේය, ඔව්හු
ව්‍යවස්ථාවත් සේනාවල **ස්වාමීන්-
වහන්සේ** තමන් ආත්මයෙන් පළමු
අනාගතවක්තෘවරුන් අතින් එවූ වචනත්
නාසන ලෙස තමුන්ගේ සිත් වජ්‍රයක්
මෙන් කරගත්තෝය. එබැවින් මහත්
කෝපයක් සේනාවල **ස්වාමීන්-
13 වහන්සේගෙන්** පැමුණුණේය. එසේ
උන්වහන්සේ අඬගැසූ කල ඔවුන් නාසා
සිටියාක්මෙන් ඔවුන් අඬගසන කල
14 මමත් නාසා සිට, ඔවුන් නොදන්නාවූ
සියලු ජාතීන් අතරට සුළිහුළඟකින්
ඔවුන් විසුරුවාදමන්නෙමි. මෙසේ ඔවුන්
ගියායින් පසු දේශය මැදින් යන එන
කෙනෙක් නැතුව ඒක පාළුවෙන
හැටියට ඔව්හු ප්‍රියවූ දේශය පාළුවක්
කළෝයයි සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේකැයි කීයේය.

*නොහොත්, තුඹලා විසින් අසන්ට යුතු
නොවේද?

## සෙනඟ අවංකව කීකරුව සිටියොත් ස්වාමීන්වහන්සේ ආශීර්වාදකරන බව

8 තවද සේනාවල **ස්වාමීන්-
වහන්සේගේ** වචනය මා වෙතට
පැමිණ කියනුයේ: මම සියොන් උදෙසා 2
මහත් ජ්වලිතයෙන් ජ්වලිතවී, මහත්
කෝපයෙන් ඈ ගැන ජ්වලිතව සිටිමියි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක.
මම සියොන්ට හැරී ආවෙමි, යෙරුසලම 3
තුළද වාසයකරන්නෙමි. යෙරුසලමට
සැබෑකමේ නුවරය කියාද සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** කන්ද වන ශුද්ධවූ
කන්දය කියාද නම් තබන්ට යෙදේයයි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. නැවත 4
මහල්ලෝද මහලු ස්ත්‍රීහුද එකිනෙකා
වයස් වැඩිකම නිසා තමාගේ සැරයටිය
අතේ තබාගත යෙරුසලමේ වීථිවල
ඉඳගන ඉන්නවා ඇත. එහි වීථිවල 5
සෙල්ලම්කරන පිරිමි ළමයින්ගෙන් හා
ගෑනු ළමයින්ගෙන් නුවර වීථි පිරී
තිබෙන්නේයයි සේනාවල **ස්වාමීන්-
වහන්සේ** කියනසේක. සේනාවල 6
**ස්වාමීන්වහන්සේ** මෙසේ කියනසේක: මේ
සෙනඟගෙන් ඉතිරි අයට ඒ දවස්වලදී
ඒක පුදුමයක්ව පෙනුණත් මටත්
පුදුමයක්ව පෙනේදැයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. බලව, මම 7
මාගේ සෙනඟ නැගෙනහිර දේශයෙන්ද
බස්නාහිර දේශයෙන්ද මුදා, ඔවුන්
යෙරුසලම තුළ වාසයකරන පිණිස
ඔවුන් ගෙනෙන්නෙමි; ඔව්හු 8
සැබෑකමෙනුත් ධර්මිෂ්ඨකමෙනුත්
මාගේ සෙනඟ වන්නෝය, මමත්
එසේම ඔවුන්ගේ දෙවියන්වහන්සේ
වන්නෙමියි සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේක. සේනාවල **ස්වාමීන්වහන්සේ** 9
මෙසේ කියනසේක: සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** ගෘහය වන
මාළිගාව ගොඩනැගීමට එහි අත්තිවාරම
තැබූ දවසේදී අනාගතවක්තෘවරුන්ගේ
මුඛයෙන් ලැබුණ මේ වචන මේ දවස්වලදී

අසත්නාවූ තුඹලාගේ අත් බලවත් වේවා.
10 මක්නිසාද මේ දවස්වලට පළමුවෙන්
මනුෂ්‍යයාට කුලියක් ලැබුණේවත්
මෘගයාට කුලියක් තිබුණේවත් නැත;
පිටතට යන අයටත් ඇතුළට එන
අයටත් එදිරිකාරයා නිසා සමාදානය
තිබුණේත් නැත. එසේය, මම සියලු
මනුෂ්‍යයන් එකිනෙකාට විරුද්ධකෙළෙමි.
11 නුමුත් දැන් මේ සෙනඟගෙන් ඉතිරි අයට
මම පළමු දවස්වල මෙන් නොකරන්නෙමියි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක.
12 මක්නිසාද සමාදාන බීජ තිබෙයි;
මුද්‍රිකවැල එහි ඵලද භූමිය එහි
අස්වැන්නද ආකාශය එහි පිනිද දෙනවා
ඇත; මේ සෙනඟගෙන් ඉතිරි අයට මේ
13 සියල්ල උරුමකරදෙන්නෙමි. එම්බා යූද
වංශය, එම්බා ඉශ්‍රායෙල් වංශය, තුඹලා
ජාතීන් අතරෙහි ශාපයක්ව සිටියාක්මෙන්
තුඹලා ආශීර්වාදයක් වෙන හැටියට
මම තුඹලා ගළවන්නෙමි. භය
නොවෙල්ලා, තුඹලාගේ අත් බලවත්
14 වේවා. මක්නිසාද සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** මෙසේ කියනසේක: තුඹලාගේ
පියවරුන් මා උදහස්කෙරෙවූ විට තුඹලා
විපත්තියට පමුණුවන්ට අදහස් කොට
15 මා නොතැවී සිටියාක්මෙන්ම, මේ
දවස්වලදී යෙරුසලමටත් යූද වංශයටත්
යහපත කරන්ට මම නැවත
අදහස්කරගත සිටිමි. භය නොවෙල්ලා-
යයි සේනාවල **ස්වාමීන්වහන්සේ** කියන-
16 සේක. තුඹලා විසින් කටයුතු දේ
මේවාය—එකිනෙකා තම තමුන්ගේ
අසල්වාසියා සමග සැබෑව කථාකරපල්ලා;
තුඹලාගේ දොරටුවල සැබෑලෙසත්
සමාදානය පිණිසත් විනිශ්චයකරපල්ලා.
17 තුඹලාගේ සිත්වලින් එකිනෙකාට
විරුද්ධව නපුරු යෝජනා නොකරල්ලා;
බොරු දිවිරීමට ප්‍රිය නොවෙල්ලා.
මක්නිසාද මේ සියල්ලටම මම
ද්වේෂකරමියි **ස්වාමීන්වහන්සේ** කියන-
සේකැයි කීය.
18 තවද සේනාවල **ස්වාමීන්වහන්සේගේ**
වචනය මා වෙතට පැමිණ කියනුයේ:
19 හතරවෙනි මාසයේ උපවාසයත් පස්වෙනි
මාසයේ උපවාසයත් සත්වෙනි මාසයේ
උපවාසයත් දසවෙනි මාසයේ
උපවාසයත් යූද වංශයට ප්‍රීති සන්තෝෂ
ප්‍රස්තාවල්ද ප්‍රසන්නවූ මංගල්‍යවල්ද
වන්නේය; එබැවින් සැබෑකමටත්
සමාදානයටත් ප්‍රේමවෙයල්ලායයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක.
සේනාවල **ස්වාමීන්වහන්සේ** මෙසේ 20
කියනසේක: මනුෂ්‍ය වර්ගයෝද බොහෝ
නුවරවල වැසියෝද මින්මතු එන්නෝය.
එක් නුවරක වැසියෝ තවත් නුවර- 21
කට ගොස්—අපි **ස්වාමීන්වහන්සේට**
කන්නලව්කරන්ටත් සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** සොයන්ටත් ඉක්මනින් පිටත්ව
යමු, මමත් යමියි කියන්නෝය. එසේය, 22
බොහෝ සෙනඟද බලවත් ජාතීහුද
සේනාවල **ස්වාමීන්වහන්සේ** යෙරුසලමෙහි
සොයන්ටත් **ස්වාමීන්වහන්සේගෙන්**
කරුණාව ඉල්ලන්ටත් එන්නෝය. ඒ 23
දවස්වලදී සියලු භාෂා ඇති ජාතීන්ගෙන්
මනුෂ්‍යයන් දසදෙනෙක්, වස්ත්‍ර කොන
අල්ලාගෙන, එසේය, යුදෙව් ජාතියේ
මනුෂ්‍යයෙකුගේ වස්ත්‍ර කොන
අල්ලාගෙන—අපි තුඹලා සමග
යන්නෙමුව, මක්නිසාද දෙවියන්වහන්සේ
තුඹලා සමග සිටින බව අප විසින්
අසා තිබේයයි කියනවා ඇතැයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියන-
සේකැයි කීය.

## ඉශ්‍රායෙල්ගේ සතුරන්ට දඬුවම්කිරීම

9 හද්‍රාක් දේශය කෙරෙහි **ස්වාමීන්-**
**වහන්සේගේ** වචනයේ දිව්‍ය
ප්‍රකාශනයය, එය පිහිටෙන තැන
දමස්කයය. මක්නිසාද මනුෂ්‍යයන්ගෙත්
සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලත් ඇස්
**ස්වාමීන්වහන්සේ** දෙසටය. ඊට යාව 2
තිබෙන හමාතටත් ඉතා ප්‍රඥාවන්ත
තීර්ටත් සීදොන්ටත් ඒක විරුද්ධය. තීර් 3
වනාහි බලකොටුවක් ගොඩනගාගෙන,
දූවිලි මෙන් රිදීද වීථිවල මඩ
මෙන් රන්ද රැස්කරගත්තාය. බලව, 4

ස්වාමීන්වහන්සේ එය අල්ලාගෙන එහි
පවුර මුහුදේ හෙළාදමනවා ඇත; එය
5 ගින්නෙන් විනාශවන්නේය. අෂ්කෙලොන්
ඒ දැක භයවෙනවා ඇත; ගාසාත් ඒ දැක
තද වේදනා විඳින්නීය; එක්‍රොන්ටද
එසේම සිදුවේ, මක්නිසාද එහි
බලාපොරොත්තුව ලජ්ජාවට පැමි-
ණෙන්නේය. ගාසායෙන් රජ නැතිවී-
යන්නේය, අෂ්කෙලොන්හිද වැසියෝ
6 නොසිටින්නෝය. අෂ්දෝද්හි අවජාත
සෙනඟක් වසන්නෝය, පිලිස්තිවරුන්ගේ
7 පාරට්ටුවද සිඳදමන්නෙමි. ඔහුගේ ලේ
ඔහුගේ කටින්ද ඔහුගේ පිළිකුල්කම්
ඔහුගේ දත් අතරෙන්ද පහකරන්නෙමි;
ඔහු අපේ දෙවියන්වහන්සේ උදෙසා
ඉතිරිවී, යූදාහි අධිපතියෙකු මෙන්
සිටිනවා ඇත, එක්‍රොන් යෙබූසියයෙකු
8 මෙන් වන්නේය. මම සේනාව නිසා
කිසිවෙකුට යන්ටවත් එන්ටවත්
නොලැබෙන ලෙස මාගේ ගෘහය
අවටින් අන්දයම් බැඳගන සිටින්නෙමි.
පීඩා කරන්නෙක් තවත් ඔවුන් මැදින්
නොයන්නේය. මක්නිසාද දැන් මාගේ
ඇසින්ම දුටිමි.

## සමාදානයේ කුමාරයාගේ පැමිණීම

9 සියොන් දියණියෙනි, බොහෝසෙයින්
ප්‍රීතිමත්වෙයන්න; යෙරුසලම් දියණියෙනි,
ශබ්ද පවත්වාපන්න. බලව, නුඹේ රජ
නුඹ වෙතට එනසේක. උන්වහන්සේ
ධර්මිෂ්ඨය, ගැළවීම ඇත්තාය; උන්-
වහන්සේ යටහත්ය, කොටළුවෙකු එනම්
කොටළුදෙනෙකුගේ පැටියෙකු පිට නැඟී
10 එනසේක. මම එප්‍රායිම් කෙරෙන් රථයද
යෙරුසලමෙන් අශ්වයාද සිඳදමන්නෙමි,
යුද්ධ දුන්නද සිඳිනු ලබන්නේය;
උන්වහන්සේද ජාතීන්ට සමාදානය
ප්‍රකාශකරනසේක. උන්වහන්සේගේ
ආණ්ඩුව මුහුදෙන් මුහුදටත් ගංගාවේ
පටන් පොළොවේ සීමා දක්වාත්
11 වන්නේය. නුඹ ගැන වනාහි නුඹේ
ගිවිසුමේ ලේ නිසා නුඹේ හිරකාරයන්
වතුර නැති වළෙන් පිටත යැවීමි.
බලාපොරොත්තු ඇති හිරකාරයෙනි, 12
බලකොටුවට හැරී වරෙල්ලා. මම නුඹට
දෙගුණයක් දෙන්නෙමියි අදම
ප්‍රකාශකරමි. මක්නිසාද මම යූදා දුන්නක් 13
කොට තැත්කවා, එප්‍රායිම් ඊගහක් කොට
තබාගතිමි; එම්බා සියොන්, මම නුඹේ
පුත්‍රයන් ග්‍රීසියේ පුත්‍රයන්ට විරුද්ධව
පොලඹවා, නුඹ බලවන්තයෙකුගේ
කඩුවක් මෙන් කරන්නෙමි. ස්වාමීන්- 14
වහන්සේ ඔවුන්ට ඉහළින් පෙනෙනසේක.
උන්වහන්සේගේ ඊගහද විදුලිය මෙන්
විහිදෙන්නේය. ස්වාමිවූ දෙවියන්වහන්සේ
හොරණෑව පිඹ, දකුණු දිශාවේ
කුණාටුව ඇතුව යනවා ඇත. සේනාවල 15
ස්වාමීන්වහන්සේ ඔවුන් ආරක්ෂාකරන-
සේක; ඔව්හුද කාදමා ගල්පටියේ ගල්
පාගාදමන්නෝය; ඔව්හු බී මුද්‍රිකපානය
බීවාක්මෙන් ඝෝෂාකරන්නෝය. පාත්‍රාද
පූජාසනයේ කොන්ද මෙන් ඔව්හු පුරවනු
ලබන්නෝය. ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්- 16
වහන්සේ තමන් සෙනඟවූ රැළ මෙන් ඒ
දවසේ ඔවුන් ගළවනසේක. මක්නිසාද
ඔව්හු උන්වහන්සේගේ දේශය කෙරෙහි
එසවී තිබෙන ඔටුන්නක මැණික් මෙන්
වන්නෝය. එසේය, උන්වහන්සේගේ 17
යහපත්කම කොපමණ මහත්ද!
උන්වහන්සේගේ අලංකාරකම කොපමණ
මහත්ද! ධාන්‍යයෙන් තරුණයෝද අලුත්
මිදිරසින් තරුණියෝද සමෘද්ධවන්නෝය.

## දෙවියන්වහන්සේගේ සෙනඟ ආපසු සියරටට ප්‍රීතියෙන් පැමිණවීම

10 අන්තිම වර්ෂා කාලයට
ස්වාමීන්වහන්සේගෙන්, එනම් විදුලි
කොටවන ස්වාමීන්වහන්සේගෙන් වර්ෂාව
ඉල්ලාපල්ලා; උන්වහන්සේද ඔවුන්ට තද
වර්ෂාවත් එකිනෙකාට පිට්ටනියෙහි
තෘණත් දෙනවා ඇත. තෙරපීම් රූප 2
නිෂ්ඵල දේ කථාකළෝය, පේනකියන්නෝ
බොරු දේ දුටුවෝය; නිරර්ථක ස්වප්න
කියාදුන්නෝය, ඔව්හු නිෂ්ඵලයේ

සනසති. එබැවින් ඔව්හු බැටළුවන් මෙන්
ගමන්කරමින් එඬේරෙක් නැති නිසා දුකට
3 පැමිණෙති. මාගේ උදහස එඬේරුන්ට
විරුද්ධව ඇවිළී තිබේ, මම එළුවන්ගෙන්
පිරිමි සතුන්ට දඬුවම්කරන්නෙමි.
මක්නිසාද සේනාවල **ස්වාමීන්වහන්සේ**
තමන්ගේ රැළවූ යූද වංශය බලා,
යුද්ධයේදී ඔවුන් තමන්ගේ ශෝභන
සෙන්ධවයා මෙන් කරනසේක.
4 ඔහුගෙන්ම කොනේ ගලත් ඔහුගෙන්ම
ඇණයත් ඔහුගෙන්ම යුද්ධ දුන්නත්
ඔහුගෙන්ම එක එක ආඥාකාරයාත්
5 එක්ව පැමිණෙනවා ඇත. ඔවුන්
බලවතුන්ව, යුද්ධයේදී සතුරන් වීථිවල
මඩේ පාගා දමා, **ස්වාමීන්වහන්සේ** ඔවුන්
සමග සිටින නිසා සටන්කර, අශ්වයන්
පිට නැගීයන්නන් ලජ්ජාවට පමුණුවනවා
6 ඇත. මම යූද වංශය බලවත්කර,
යෝසෙප් වංශය ගළවා, ඔවුන් නැවත
ගෙනෙන්නෙමි, මක්නිසාද මම ඔවුන්ට
අනුකම්පාකරමි; ඔව්හුද මා විසින් ඔවුන්
අහක නොදැමුවාක්මෙන් සිටින්නෝය.
මක්නිසාද මම ඔවුන්ගේ දෙවිවූ **ස්වාමීන්-
වහන්සේය**, මම ඔවුන්ගේ බස් අසන්නෙමි.
7 එප්‍රායිම්වරු බලවන්තයෙකු මෙන්
වන්නෝය, ඔවුන්ගේ සිත්ද මුද්‍රිකපානයෙන්
මෙන් ප්‍රීතිවන්නේය. එසේය, ඔවුන්ගේ
දරුවෝත් ඒ දැක ප්‍රීතිවන්නෝය;
ඔවුන්ගේ සිත් **ස්වාමීන්වහන්සේ** තුළ
8 සන්තෝෂවන්නේය. මම ඔවුන් කැඳවා
රැස්කරන්නෙමි; මක්නිසාද මම
ඔවුන් මුදගත්තෙමි. ඔව්හු වැඩිවී
9 සිටින්නාක්මෙන්ම වැඩිවන්නෝය. මම
ඔවුන් ජනයන් අතරෙහි වපුරන්නෙමි;
ඔවුන් දුර රටවලදී මා සිහිකොට,
තමුන්ගේ දරුවන් සමග ජීවත්ව සිට
10 හැරී එනවා ඇත. මම ඔවුන් මිසර
දේශයෙන් නැවත ගෙනෙන්නෙමි, අෂූර්
දේශයෙන් ඔවුන් රැස්කර, ගිලියද් දේශයටත්
ලෙබනොන්ටත් පමුණුවන්නෙමි; ඒත්
11 ඔවුන්ට ඉඩ මදිවන්නේය. විපත්තිය
නැමති මුහුද මැදින් එන විට උන්වහන්සේ
මුහුදේ රැළවලට ගසනවා ඇත, නයිල්
ගංගාවේ සියලු ගැඹුරු තැන්ද හිඳීයනවා
ඇත. අෂූර්හි උඩඟුකම පහත්වී, මිසරයේ
ජයකොන්තයද පහවෙනවා ඇත.
මම ඔවුන් **ස්වාමීන්වහන්සේ** තුළ 12
බලවත්කරන්නෙමි; ඔව්හු උන්වහන්සේගේ
නාමයෙන් හැසිරෙන්නෝයයි **ස්වාමීන්-
වහන්සේ** කියනසේක.

## එඬේරුන් සම්බන්ධ උපමාව

11

ලෙබනොන්, තුඹේ කිහිරි ගස්
ගින්නෙන් දලායන පිණිස තුඹේ
දෙරවල් ඇරපන්න. එම්බා දේවදර 2
වෘක්ෂය, කැමොරගසාපන්න, මක්නිසාද
කිහිරි ගස වැටුණේය, උත්තමයෝ
නාස්තිවුණෝය. බාෂාන්හි අලෝන
වෘක්ෂ, කැමොරගසාපල්ලා, මක්නිසාද
දුර්ග වනය හෙළාදමනු ලැබුවේය.
එඬේරුන්ගේ ඓශ්වර්යය නාස්තිවූ බැවින් 3
ඔවුන්ගේ කැමොරගැසීමේ හඬ
ඇසෙන්නේය. යෝර්දනේ මහිමය
නාස්තිවූ බැවින් තරුණ සිංහයන්ගේ
ගෙරවීමේ හඬ ඇසෙන්නේය. මාගේ 4
දෙවිවූ **ස්වාමීන්වහන්සේ** මෙසේ කීසේක:
මරනු ලබන්ට සිටින බැටළු රැළ
පෝෂ්‍යකරපන්න; ඔවුන් මිලේට ගන්න 5
අය ඔවුන් මරන නුමුත් වරදට පත්
නොවී සිටිති; උන් විකුණන්නෝද
කථාකොට—**ස්වාමීන්වහන්සේට** ස්තුති-
වේවා, මම පොහොසත්යයි කියති.
ඔවුන්ගේ එඬේරුද උන්ට කරුණා
නොකරති. මක්නිසාද මම දේශයේ 6
වැසියන්ට තවත් කරුණා නොකර, ඒ
මනුෂ්‍යයන් එකිනෙකා තම තමාගේ
අසල්වැසියා අතටත් තම තමාගේ රජු
අතටත් අසුකරදෙන්නෙමි. ඔවුන් දේශය
නටබුන්කර දමනවා ඇත, මම ඔවුන්ගේ
අතින් ඔවුන් මුද නොගන්නෙමියි
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එසේ 7
මරන්ට සිටි බැටළු රැළ පෝෂණයකෙළෙමි,
ඔව්හු සැබෑවටම අසරණ රැළක්ය. මම
සැරයටි දෙකක් රැගෙන එකකට
**ප්‍රසන්නකමය** කියාද අනිකට බැඳුම්ය

කියාද නම් තබා, බැටළු රැළ
8 පෝෂණයකෙළෙමි. එක මාසයකදී
එඬේරුන් තුන්දෙනා සිඳදැමීමි; මක්නිසාද
මාගේ ආත්මය ඔවුන් ගැන වෙහෙසට
පත්විය, ඔවුන්ගේ ආත්මයද මට
9 පිළිකුල්කෙළේය. එවිට මම කථාකොට:
නුඹලා පෝෂණය නොකරන්නෙමි.
නසින අය නසීවා; සිඳදමනු ලබන අය
සිඳදමනු ලැබේවා; ඉතිරි අයද
10 එකිනෙකාගේ මාංස කත්වයි කීමි. එවිට
මම සියලු ජනයන් සමග කළාවූ මාගේ
ගිවිසුම වලංගුකරන පිණිස ප්‍රසන්නකම
නම්වූ මාගේ සැරයටිය රැගෙන
11 කඩාදැමුවෙමි. එසේ ඒ දවසේදී එය
අවලංගුවීමෙන්, මා සැලකුවාවූ අසරණ
බැටළු රැළ එය ස්වාමීන්වහන්සේගේ
12 වචනය බව දැනගත්තෝය. මමද:
නුඹලාට හොඳව පෙනේනම් මාගේ කුලිය
දියල්ලා; නැත්නම් නොදී සිටපල්ලායයි
ඔවුන්ට කීවෙමි. ඔව්හු මාගේ කුලිය
13 වන රිදී තිහක් කිරාදුන්නෝය. ඔවුන්
විසින් මා මිලකළ වටිනා අගය වන
ඒවා *කුම්භකාරයාට හෙළාපන්නැයි
ස්වාමීන්වහන්සේ මට කීසේක. මමද
රිදී තිහ රැගෙන ස්වාමීන්වහන්සේගේ
14 ගෘහයෙහි කුම්භකාරයාට හෙළීමි. තවද
යූද සහ ඉශ්‍රායෙල් අතරේ තිබුණු
සහෝදරකම බඳින පිණිස බැඳුම් නම්වූ
මාගේ අනික් සැරයටිය කඩාදැමුවෙමි.
15 ස්වාමීන්වහන්සේ මට කථාකොට: නුඹ
නැවත අඥාන එඬේරෙකුගේ ආයුධ
16 අරගනින්න. මක්නිසාද එඬේරෙකු
දේශයෙහි නැගුටුවමි, ඔහු සිඳිනු
ලබන්නන් බලාගන්නේවත් විසුරුවනු
ලබන්නන් සොයන්නේවත් තුවාලවෙන
එකාට සුවකරන්නේවත් නවතින එකාට
කෑම ගෙනදෙන්නේවත් නැතුව, තරවූ
එකාගේ මස් කමින් උන්ගේ කුර
17 කඩාදමන්නේය. රැළ අත්හරින්නාවූ
නොවටිනා එඬේරාට දුක් වන්නේය!
ඔහුගේ හස්තයටත් දකුණු ඇසටත්
විරුද්ධව කඩුවක් පැමිණෙන්නේය.
ඔහුගේ හස්තය වේළීයන්නේය, ඔහුගේ
දකුණැසද අන්ධවන්නේයයි කීසේක.

*නොහොත්, භාණ්ඩාගාරයට.

## ස්වාමීන්වහන්සේ තමන් සෙනග ආරක්ෂාකිරීම

12

ඉශ්‍රායෙල් ගැන තිබෙන
ස්වාමීන්වහන්සේගේ වචනයේ
දිව්‍ය ප්‍රකාශනයය.
අහස දිගහරින්නාවූ, පොළොවේ
අත්තිවාරම තබන්නාවූ, මනුෂ්‍යයා තුළ
ඔහුගේ ආත්මය උපදවන්නාවූ ස්වාමීන්-
වහන්සේ මෙසේ කියනසේක: බලව, 2
අවටින් සිටින සියලුම ජනයන්ට
යෙරුසලම වැතීමේ පාත්‍රයක් කරන්නෙමි,
යෙරුසලම වටලෑමේදී යූදට එසේම
වන්නේය. ඒ කාලයේදී මම සියලු 3
ජනයන්ට යෙරුසලම බරවූ ගලක්
කරන්නෙමි; එය උස්සාගන්න සියල්ලෝ
බොහෝසේ තුවාල ලබන්නෝය;
පොළොවේ සියලු ජාතීහුද ඊට විරුද්ධව
රැස්වන්නෝය. ඒ කාලයෙහි මම සියලු 4
අශ්වයන්ට කුල්මත්කමද අසරුවන්ට
උමතුකමද පැමිණවීමෙන් පහරදෙන්නෙමි.
නුමුත් යූද වංශය කෙරේ මාගේ ඇස්
ඇරගන ඉඳ, ජනයන්ගේ සියලු අශ්වයන්ට
අන්ධකමෙන් පහරදෙන්නෙමියි ස්වාමීන්-
වහන්සේ කියනසේක. යෙරුසලමේ 5
වැසියෝ ඔවුන්ගේ දෙවිවූ සේනාවල
ස්වාමීන්වහන්සේ කරණකොටගෙන
මාගේ බලය වන්නෝයයි යූදහි ප්‍රධානීහු
තමුන්ගේ සිතින් කියාගන්නෝය. ඒ 6
කාලයෙහි වටකර සිටින සියලුම ජනයන්
දකුණෙන්ද වමෙන්ද දලායන හැටියට
යූදහි ප්‍රධානීන් දර අතරෙහි තිබෙන
ගිනි භාජනයක් මෙන්ද ගොයම් මිටියක්
තුළ තිබෙන ගිනි පෙනෙල්ලක් මෙන්ද
කරන්නෙමි. යෙරුසලමේ වැසියන්ද
තමුන්ගේ ස්ථානය වන යෙරුසලමෙහි
නැවත වාසයකරනවා ඇත. දාවිත්ගේ 7
වංශයේ මහිමයද යෙරුසලමේ වැසියන්ගේ
මහිමයද යූදට වඩා උසස් නොවෙන

පිණිස **ස්වාමීන්වහන්සේ** පළමුකොට
8 යූදගි කූඩාරම් ගළවනවා ඇත. ඒ
කාලයෙහි **ස්වාමීන්වහන්සේ** යෙරුසලමේ
වැසියන් ආරක්ෂාකරනසේක; ඔවුන්
අතරෙහි සිටින දුර්වලයා පවා ඒ
කාලයෙහි දාවිත් මෙන් වන්නේය; දාවිත්ගේ
වංශයද දෙවියන්වහන්සේ මෙන්, එනම්
ඔවුන්ට පෙරටුව යන්නාවූ **ස්වාමීන්-**
9 **වහන්සේගේ** දූතයා මෙන් වන්නේය. තවද
ඒ කාලයේදී යෙරුසලමට විරුද්ධව
එන සියලු ජාතීන් විනාශකරන්ට
සොයන්නෙමි.

## තමුන්ගේ පාප ගැන සෙනඟ වැලපීම

10 දාවිත්ගේ වංශය කෙරෙහිද යෙරුසලමේ
වැසියන් කෙරෙහිද කරුණාවේ හා
කන්නලව්කිරීමේ ආත්මය වගුරුවන්නෙමි;
ඔවුන් තමුන් විසින් ඇන්නාවූ තැනැත්තා
වන මා දෙස බලාසිට, එකම පුත්‍රයෙකු
ගැන වැලපෙන්නාක් මෙන් උන්වහන්සේ
ගැන වැලපෙනවා ඇත, කුලුඳුලා ගැන
ශෝකවෙන්නාක් මෙන් උන්වහන්සේ
11 ගැන ශෝකවෙනවා ඇත. ඒ
කාලයේ මෙගිද්දෙන් සමභූමියෙහිදී වූ
හදද්රිම්මොන්හි වැලපීම මෙන්
යෙරුසලමෙහි මහත් වැලපීමක් වන්නේය.
12 එසේ දේශයේ පෙළපත් වෙන් වෙන්
වශයෙන් විලාපකියනවා ඇත; දාවිත්ගේ
වංශ පෙළපත වෙනම සහ ඔවුන්ගේ
භාර්යාවෝ වෙනමද, නාතාන්ගේ වංශ
පෙළපත වෙනම සහ ඔවුන්ගේ
13 භාර්යාවෝ වෙනමද, ලෙවීගේ වංශ
පෙළපත වෙනම සහ ඔවුන්ගේ
භාර්යාවෝ වෙනමද, ෂිමෙයි පෙළපත
වෙනම සහ ඔවුන්ගේ භාර්යාවෝ
14 වෙනමද, ඉතිරිව සිටින සියලු පෙළපත්
වෙන් වෙන් වශයෙන් සහ ඔවුන්ගේ
භාර්යාවෝ වෙනමද විලාපකියන්නෝය.

## පීඩා කරණකොටගෙන යෙරුසලම පවිත්‍රකරනු ලැබීම

13 ඒ කාලයෙහි පාපය සහ
අපවිත්‍රකම සඳහා දාවිත්ගේ
වංශයටද යෙරුසලමේ වැසියන්ටද
උල්පතක් ඇරී තිබෙන්නේය. තවද ඒ 2
කාලයේදී දේවරූපවල නාමවල් තවත්
සිහි නොවෙන හැටියට ඒවා දේශයෙන්
සිඳදමන්නෙමි. මම අනාගතවක්තෘවරුන්ද
අපවිත්‍රකමේ ආත්මයද දේශයෙන්
පහකරන්නෙමියි සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. තුමුත් යමෙක් 3
නැවත අනාගතවාක්‍ය කීවොත් ඔහුගේ
පියාත් ඔහුගේ මවුත් වන ඔහු ඉපදෙවූ
අයම: තුඹ **ස්වාමීන්වහන්සේගේ**
නාමයෙන් බොරුවූ දේ කථාකරන බැවින්
තුඹට ජීවත්වෙන්ට නොලැබේයයි ඔහුට
කියා, ඔහු අනාගතවාක්‍ය කියන විට
ඔහුගේ පියාත් ඔහුගේ මවුත් වන ඔහු
ඉපදෙවූ අයම ඔහුට ඇන මරනවා ඇත.
ඒ කාලයේදී අනාගතවක්තෘවරුන් 4
අනාගතවාක්‍ය කියන විට එකිනෙකා
තම තමාගේ දර්ශනය ගැන ලජ්ජාවෙනවා
ඇත; රවටන පිණිස ඔවුන් රෝමමය
සළුවක් අඳින්නෙත් නැත. එකිනෙකාද: 5
මම අනාගතවක්තෘ කෙනෙක් නොව
ගොවියෙක්ය; මක්නිසාද මාගේ බාල
වයසේ පටන් දාසකමෙහි සිටියෙමියි
කියන්නේය. එවිට: තුඹේ අත්වල තිබෙන 6
ඔය තුවාල මොනවාදැයි කෙනෙක්
ඔහුගෙන් අසන්නේය. මාගේ ප්‍රේමවන්-
තයන්ගේ ගෙදරදී මා ලැබූ තුවාලයයි
ඔහු කියන්නේය.
එම්බා කඩුව, මාගේ එඬේරාටත් මාගේ 7
සහායකාරවූ මනුෂ්‍යයාටත් විරුද්ධව
පිබිදියන්නැයි සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේක. එඬේරාට පහරදීපන්න,
එවිට බැටළුවන් විසිරී යනවා ඇත;
තුමුත් කුඩා තැනැත්තන් පිටට මාගේ
අත හරවන්නෙමි. තවද මුළු දේශයෙහි 8
තුනෙන් දෙකොටසක් සිඳදමනු ලැබ
මැරෙනවා ඇත; තුමුත් තුන්වෙනි කොටස
එහි ඉතිරිවේයයි **ස්වාමීන්වහන්සේ**
කියනසේක. තුන්වෙනි කොටස මම 9
ගින්නට පමුණුවා, රිදී පවිත්‍රකරන්-
නාක්මෙන් ඔවුන් පවිත්‍රකරන්නෙමි, රන්
පරීක්ෂාකරන්නාක්මෙන් ඔවුන් පරීක්ෂා-
කරන්නෙමි. ඔව්හු මාගේ නාමය කියා

යාච්ඤාකරන්නෝය, මම ඔවුන්ට
උත්තරදෙන්නෙමි. ඔව්හු මාගේ සෙනඟ-
යයි කියන්නෙමි; ඔවුන්ද: **ස්වාමීන්-
වහන්සේ** මාගේ දෙවියන්වහන්සේයයි
කියනවා ඇත.

## අන්‍යජාතීන් කෙරෙහි විනිශ්චය. යෙරුසලම උසස්කරනු ලැබීම

14 බලව, **ස්වාමීන්වහන්සේගේ** දවසක්
පැමිණෙන්නේය, එකල නුඹේ
කොල්ලය නුඹ තුළ බෙදනු ලැබේ.
2 එසේය, මම යෙරුසලමට විරුද්ධව
සියලු ජාතීන් යුද්ධයට රැස්කරන්නෙමි;
නුවරද අසුවී, ගෙවල් කොල්ලකනු
ලබන්නේය, ස්ත්‍රීහු බලාත්කාර කරනු
ලබන්නෝය. නුවරුන්ගෙන් දෙකෙන්
කොටසක් වාලට යනවා ඇත,
සෙනඟගෙන් ඉතිරි කොටස නුවරින්
3 සිඳදමනු නොලැබේ. තවද **ස්වාමීන්-
වහන්සේ** පිටත්වී උන්වහන්සේ යුද්ධ කළ
සටනේ දවසේදී මෙන් ඒ ජාතීන්ට
4 විරුද්ධව යුද්ධකරනවා ඇත. ඒ
කාලයේදී උන්වහන්සේගේ පාද
යෙරුසලමට ඉදිරිපිටින් නැගෙනහිරට
තිබෙන ඔලීව කන්ද පිට සිටිනවා ඇත,
එවිට ඔලීව කන්ද නැගෙනහිර දෙසටත්
බස්නාහිර දෙසටත් මැදින් පැළී, ඉතා
මහත් මිටියාවතක් වන්නේය; කන්දෙන්
භාගයක් උතුරු දෙසටත් අනික් භාගය
දකුණු දෙසටත් අහක්ව යනවා ඇත.
5 නුඹලාද මාගේ කඳුවල මිටියාවතින්
පලායනවා ඇත; මක්නිසාද කඳුවල
මිටියාවත ආශෙල් දක්වා වන්නේය.
එසේ යූදාහි රජවූ උස්සියාගේ දවස්වලදී
නුඹලා පොළෝකම්පාව ඉදිරියෙන්
පලාගියාක්මෙන් නුඹලා පලායනවා
ඇත. මාගේ දෙවිවූ **ස්වාමීන්වහන්සේද**
ඔබ සමග සියලු ශුද්ධවන්තයන්ද එනවා
6 ඇත. ඒ කාලයේදී එළිය දීප්තිමත්
7 නොවන්නේය, කළුවරද තිබෙයි. එහෙත්
දවල් සහ රෑ නොවී, සවස් වේලාවට
එළිය ඇත්තාවූ, **ස්වාමීන්වහන්සේ**
දන්නාවූ එක්තරා දවසක් පැමිණෙන්නේය.
ඒ කාලයෙහි ජීවමාන වතුර 8
යෙරුසලමෙන් නික්ම, එයින් කොටසක්
නැගෙනහිර මුහුදටත් කොටසක්
බස්නාහිර මුහුදටත් ගලායනවා ඇත.
ග්‍රීෂ්ම කාලයෙත් ශීත කාලයෙත් එසේ
වන්නේය. **ස්වාමීන්වහන්සේ** මුළු 9
පොළොව කෙරෙහි රජව සිටිනවා ඇත.
ඒ කාලයෙහි **ස්වාමීන්වහන්සේ** පමණක්ම
දෙවිව සිටිනවා ඇත, උන්වහන්සේගේ
නාමය පමණක්ම ඇතිවන්නේය. මුළු 10
දේශයද ගෙබා පටන් යෙරුසලමට
දකුණෙන් රිම්මොන් දක්වා තිබෙන අරබා
සමභූමියට සමානවන්නේය; නුවරද
උස්සනු ලැබ, ඒකේ ස්ථානයෙහිම
බෙන්යමින් දොරටුවේ පටන් පළමු
දොරටුවේ ඉඩම දක්වාත් කොන්වල
දොරටුව දක්වාත් හනනේල්ගේ කොතේ
පටන් රජුගේ මුද්‍රික තටාකය දක්වාත්
පිහිටා තිබෙයි. මනුෂ්‍යයෝ එහි
වසන්නෝය; සිඳදැමීමේ ශාපයක්ද 11
නොපැමිණ යෙරුසලම සුවසේ
පවතින්නේය. යෙරුසලමට විරුද්ධව 12
යුද්ධයට ආවාවූ සියලුම ජනයන්ට
**ස්වාමීන්වහන්සේ** පමුණුවන්නාවූ පීඩාව
මේය: ඔවුන් හිටගෙන සිටිද්දීම ඔවුන්ගේ
මාංසය ක්ෂයවන්නේය, ඔවුන්ගේ ඇස්
ඒවායේ සිදුරුවලම ක්ෂයවන්නේය;
ඔවුන්ගේ දිවද ඔවුන්ගේ කටේම
ක්ෂයවන්නේය. ඒ කාලයෙහි මහත් 13
වියවුල්කමක් **ස්වාමීන්වහන්සේගෙන්**
ඔවුන් අතරට පැමිණ, ඔවුන් එකිනෙකාගේ
අත අල්ලනවා ඇත, එක්කෙනෙකුගේ
අත තවත් කෙනෙකුගේ අතට විරුද්ධව
ඔසවනවා ඇත. යූදා යෙරුසලමට 14
විරුද්ධව යුද්ධකරන්නේය; අවට සියලු
ජාතීන්ගේ සම්පත් වන රන් රිදීද
වස්ත්‍රද මහත් රාශියක් එකතුකරනු
ලබන්නේය. මේ පීඩාව මෙන් 15
අශ්වයන්ටත් අශ්වතරයන්ටත් ඔටුවන්ටත්
කොටළුවන්ටත් ඒ අන්දයම්වල සිටින
සියලුම මෘගයන්ටත් පීඩාවක් වන්නේය.
තවද යෙරුසලමට විරුද්ධව ආවාවූ 16

සියලු ජාතීන්ගෙන් ඉතුරු වෙන
සියල්ලෝම රජවූ සේනාවල ස්වාමීන්-
වහන්සේට නමස්කාරකරන්ටත් කූඩාරම්
මංගල්‍යය පවත්වන්ටත් අවුරුද්දෙන්
17 අවුරුද්ද නැගීඑන්නෝය. රජවූ සේනාවල
ස්වාමීන්වහන්සේට නමස්කාරකරන
පිණිස පොළොවේ වර්ගයන්ගෙන්
යෙරුසලමට නේන අයට වැසිවසින්නේ
18 නැත. මිසර වර්ගය නැගීඑන්නේ නැත්නම්
ඔවුන්ටත් වැසිවසින්නේ නැත; කූඩාරම්
මංගල්‍යය පවත්වන්ට නේන ජාතීන්ට
ස්වාමීන්වහන්සේ පමුණුවන පීඩාව
19 ඔවුන්ටත් වන්නේය. මිසරයේ දඬුවමත්
කූඩාරම් මංගල්‍යය පවත්වන්ට නේන
සියලු ජාතීන්ගේ දඬුවමත් ඒකය. ඒ 20
කාලයෙහි අශ්වයන්ගේ මිණිගෙඩිවල:
ස්වාමීන්වහන්සේට ශුද්ධය කියා ලියා
තිබෙනවා ඇත; ස්වාමීන්වහන්සේගේ
ගෘහයේ සැළිද පූජාසනය ඉදිරියෙහි
තිබෙන පාත්‍රා මෙන් වන්නේය.
යෙරුසලමෙහිද යූදහිද තිබෙන සැළි 21
සියල්ලත් සේනාවල ස්වාමීන්වහන්සේට
ශුද්ධව තිබෙනවා ඇත. පූජාකරන
සියල්ලෝ ඇවිත් ඒවායින් කැමති ඒවා
රැගෙන, ඒවායේ උයන්නෝය. ඒ
කාලයේදී සේනාවල ස්වාමීන්වහන්සේගේ
ගෘහයෙහි කානානියයෙක් තවත් නො-
සිටින්නේය.

# අනාගතවක්තෘවූ මලාකීගේ පොත

### ස්වාමීන්වහන්සේගේ ප්‍රේමය. උන්වහන්සේගේ සෙනඟගේ කෙළෙහිගුණ නොසැලකීම

1 මලාකී කරණකොටගෙන ඉශ්‍රායෙල්
වෙතට පැමිණි ස්වාමීන්වහන්සේගේ
වචනයේ දිව්‍ය ප්‍රකාශනයය.
2 මම නුඹලාට ප්‍රේමකෙළෙමියි ස්වාමීන්-
වහන්සේ කියනසේක. එහෙත්: ඔබ-
වහන්සේ අපට ප්‍රේමකළේ කුමකින්දැයි
නුඹලා අසන්නහුය. ඒසව් යාකොබ්ගේ
සහෝදරයා නොවේද? එහෙත් මම
3 යාකොබ්ට ප්‍රේමකොට, ඒසව්ට අප්‍රියවී,
ඔහුගේ කඳු පාළුවක් කෙළෙමි, ඔහුගේ
උරුමයද කාන්තාරයේ සිවලුන්ට
දුනිමියි ස්වාමීන්වහන්සේ කියනසේක.
4 අප නටබුන්වී සිටින නුමුත් නාස්ති ඉඩම්
නැවත ගොඩනගන්නෙමුයයි ඒදොම් කියන
බැවින් සේනාවල ස්වාමීන්වහන්සේ
මෙසේ කියනසේක: ඔවුන් ගොඩනගන
නුමුත් මම කඩාදමන්නෙමි. ඔවුන්ට:
දුෂ්ටකමේ පළාතය කියාද ස්වාමීන්-
වහන්සේගේ උදහස සෑම කල්ම දරන
සෙනඟය කියාද මනුෂ්‍යයෝ කියත්-
5 තෝය. එය නුඹලාගේ ඇස්වලට
පෙනෙනවා ඇත, නුඹලාද: ඉශ්‍රායෙල්
පළාතෙන් එපිටත් ස්වාමීන්වහන්සේ
උසස්වනසේක්වයි කියන්නහුය.
6 පුත්‍රයා තමාගේ පියාටත් මෙහෙකරුවා
තමාගේ ස්වාමියාටත් ගෞරවකරති.
එබැවින් මාගේ නාමය සුළුකරන
පූජකයෙනි, මම පියෙක් නම් මාගේ
ගෞරවය කොයිද? මම ස්වාමියෙක්
නම් මා කෙරෙහි ඇති භය කොයිදැයි
සේනාවල ස්වාමීන්වහන්සේ නුඹලාගෙන්
අසනසේක. එහෙත්: අපි ඔබවහන්සේගේ
නාමය කුමකින් සුළුකෙළෙමුදැයි නුඹලා
අසන්නහුය. මාගේ පූජාසනය පිට අපවිත්‍ර 7
ආහාර ඔප්පුකිරීමෙන්ය. එහෙත්: අපි
කුමකින් ඔබ අපවිත්‍රකෙළෙමුදැයි නුඹලා
අසන්නහුය. ස්වාමීන්වහන්සේගේ මේසය
සුළුයයි නුඹලා විසින් කීමෙන්ය. නුඹලා 8
පූජාවක් කොට අන්ධවූ සතෙකු
ඔප්පුකරන එකත් නපුරක් නොවේද?
කොර එකෙක්ද ලෙඩ එකෙක්ද නුඹලා
ඔප්පුකරන එකත් නපුරක් නොවේද?
එය නුඹේ ආණ්ඩුකාරයාට ඔප්පුකර-
පන්න; ඔහු නුඹ කෙරෙහි ප්‍රසන්නවේද?
නොහොත් නුඹව පිළිගන්නවා ඇද්දැයි
සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක.
එබැවින් දෙවියන්වහන්සේ අපට දයාවන 9
පිණිස දන් උන්වහන්සේට කන්නලව්
කරපල්ලා. මේක වූණේ නුඹලා කරණ-
කොටගෙනය. උන්වහන්සේ නුඹලාගෙන්
කිසිවෙකුවත් පිළිගන්නවා ඇද්දැයි
සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක.
අනේ නුඹලා මාගේ පූජාසනය පිට 10
නිෂ්ඵලලෙස ගිනි නොදල්වන පිණිස
දොරවල් වසාතබන කෙනෙක් නුඹලා
අතරේ ඇත්නම් හොඳය! නුඹලා කෙරේ
මට ප්‍රසන්නයක් නැත, නුඹලාගේ අත්-
වලින් පූජාවක් මා විසින් පිළිගන්නෙත්
නැතැයි සේනාවල ස්වාමීන්වහන්සේ
කියනසේක. මක්නිසාද ඉර උදවන තැන් 11
පටන් බස්නා තැන දක්වා මාගේ
නාමය ජාතීන් අතරේ උතුම්ය; සියලුම
ස්ථානවල සුවඳ දුම්ද පිරිසිදු පූජාවක්ද
මාගේ නාමයට ඔප්පුකරනු ලබන්නේය.
එසේය, මාගේ නාමය ජාතීන් අතරේ

උතුම්යයි සේනාවල **ස්වාමීන්වහන්සේ**
12 කියනසේක. නුමුත් නුඹලා: **ස්වාමීන්-**
**වහන්සේගේ** මේසය පිළිකුල්ය, එහි ඵල
එනම් එහි ආහාර නීචයයි කීමෙන් ඒ
13 නාමය කෙලහන්නහුය. තවද: මෙය
කොපමණ මහත් වෙහෙසක්දැයි කියා
නුඹලා එය සුළුකළහුයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක; තවද
කොල්ලකාගත්තාවූද කොරවූද ලෙඩවූද
සතුන් නුඹලා ගෙනාවහුය; මෙසේ
නුඹලා ගෙනැවිත් ඔප්පුකරන්නහුය. මම
නුඹලාගේ අත්වලින් එය පිළිගනිම්දැයි
14 **ස්වාමීන්වහන්සේ** කියනසේක. එසේ
නොව බාරයක්වී තමාගේ රැළේ පිරිමි
සතෙකු සිටිද්දී නරක්වූ සතෙකු ස්වාමීන්-
වහන්සේට ඔප්පුකරන ප්‍රයෝගකාරයාට
ශාපවේවා. මක්නිසාද මම මහත්
රජෙක්ය, මාගේ නාමය ජාතීන් අතරෙහි
භයානකව තිබේයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## පූජකයින්ගේ දූෂ්‍යභාවය

**2** ඉතින් පූජකයෙනි, මේ ආඥාව
2 නුඹලාටය. මාගේ නාමයට ගෞරව
දෙන හැටියට නුඹලා අසා සිතට
නොගන්නහුනම් මම නුඹලා අතරට
ශාපය එවා, නුඹලාගේ ආශීර්වාදවලට
ශාපකරන්නෙමියි සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. එසේය, නුඹලා
සිතට නොගන්න නිසා මම ඒවාට ශාපම
3 කෙළෙමි. බලව, මම නුඹලා නිසා බීජ
වලක්වමි, නුඹලාගේ මුහුණු පිට කසළ,
එනම් නුඹලාගේ මංගල්‍ය පූජාවල කසළ
ඉසිමි; ඒවා සමග නුඹලා අහකට
4 ගෙනයනු ලබනවා ඇත. එවිට මාගේ
ගිවිසුම ලෙවී සමග පවතින පිණිස මේ
ආඥාව මා විසින් නුඹලාට එවූ බව
නුඹලා දැනගන්නවා ඇතැයි සේනාවල
5 **ස්වාමීන්වහන්සේ** කියනසේක. ජීවනයද
සමාදානයද ඇති මාගේ ගිවිසුම ඔහු
සමග විය; භය ඇතුව සිටින පිණිස
ඒවා ඔහුට දුනිමි, එසේ ඔහු භයව,
මාගේ නාමය කෙරෙහි භයාදූකමින්
6 සිටියේය. සැබෑකමේ ව්‍යවස්ථාව ඔහුගේ
මුඛයෙහි තිබුණේය, අධර්මිෂ්ඨකමක්
ඔහුගේ තොල්වල සම්බ නොවීය. ඔහු
සමාදානයෙන්ද අවංකකමෙන්ද මා සමග
හැසිර, බොහෝ දෙනෙකු අපරාධයෙන්
හරවාගත්තේය. මක්නිසාද පූජකයා 7
විසින් තමාගේ තොල්වල දැනගැන්ම
තබාගැනීම යුතුය, මිනිසුන් වනාහි
ව්‍යවස්ථාවද ඔහුගේ මුඛයෙන් දැනගත
යුතුය. කුමක්හෙයින්ද ඔහු සේනාවල
**ස්වාමීන්වහන්සේගේ** පණිවිඩකාරයෙක්ය.
එහෙත් නුඹලා මාර්ගයෙන් ඉවත්ව 8
ගොස්, ව්‍යවස්ථාව ගැන බොහෝ
දෙනෙකු පැකිලෙන්ට සැලැස්වූහුය;
නුඹලා ලෙවීගේ ගිවිසුම බිඳදැමූවහුයයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියන-
සේක. එබැවින් නුඹලා මාගේ මාර්ගයන් 9
රක්ෂා නොකොට, ව්‍යවස්ථාව ගැන
තරාතිරම් බලන ප්‍රකාරයටම, මමත්
නුඹලා මුළු සෙනඟ ඉදිරියෙහි නීචවූ
පහත්වූ අය කෙළෙමි.

## අන්‍යජාති ස්ත්‍රීන් විවාහකර ගැනීම සහ අයුතු දික්කසාදයන් ගැන දෙස් තැබීම

අප සියල්ලන්ට ඇත්තේ එක පියා 10
නොවේද? අප මැවූවේ එක දෙවියන්-
වහන්සේ නොවේද? අපේ පියවරුන්ගේ
ගිවිසුම කෙලහන හැටියට අපි එකි-
නෙකාට විරුද්ධව මක්නිසා ද්‍රෝහිකම්-
කරමුද? යූදවරු ද්‍රෝහිලෙස ක්‍රියා 11
කළෝය, ඉශ්‍රායෙල්හිද යෙරුසලමෙහිද
පිළිකුලක් කෙරී තිබේ; මක්නිසාද
**ස්වාමීන්වහන්සේ** ප්‍රේමකළාවූ උන්-
වහන්සේගේ *ශුද්ධකම යූද කෙලහා,
අන්‍ය දෙවියෙකුගේ දුව සරණපාවාගත්තේය.
මෙසේ කරන මනුෂ්‍යයාගෙන් රැකවළා 12
සහ උත්තරදෙන අයත් සේනාවල
**ස්වාමීන්වහන්සේට** පූජාවක් ඔප්පු-
කරන්නාත් **ස්වාමීන්වහන්සේ** යාකොබ්ගේ
කූඩාරම්වලින් සිඳදමනසේක. නුඹලා 13
මේ කාරණය දෙවෙනිවරත් කර,

*නොහොත්, ශුද්ධ ස්ථානය.

**ස්වාමීන්වහන්සේගේ** පූජාසනය කඳුළු-
වලින්ද ඇඬීමෙන්ද සුසුම්ලෑමෙන්ද
වසන්නහුය. එබැවින් උන්වහන්සේ පූජාව
තවත් නොසලකනසේක, නුඹලාගේ
අත්වලින් සතුටු සිතින් එය පිළි-
14 නොගන්නාසේක. එහෙත් නුඹලා: ඒ
මක්නිසාදැයි අසන්නහුය. **ස්වාමීන්වහන්සේ**
නුඹ සහ නුඹේ තරුණ වයසේ භාර්-
යාවත් අතරේ සාක්ෂිව සිටි නිසාය; ඈ
නුඹේ පංගුකාරීව, නුඹේ ගිවිසුමේ
භාර්යාවව සිටින නුමුත්, නුඹම ඈට
15 විරුද්ධව ද්‍රෝහිකම්කළෙහිය. ආත්මයේ
ඉතිරි කොටස උන්වහන්සේට තිබුණු
නුමුත් උන්වහන්සේ එකෙකු නොසෑදූ-
සේක්ද? එකෙකු සෑදුවේ මක්නිසාද?
උන්වහන්සේ භක්තිවන්ත වංශයක් සෙවූ
නිසාය. එබැවින් නුඹලාගේ ආත්මය
ගැන ප්‍රවේසම්වෙයල්ලා, කිසිවෙක්
තමාගේ තරුණ වයසේ භාර්යාවට
විරුද්ධව ද්‍රෝහිලෙස ක්‍රියා නොකෙරේවා.
16 මක්නිසාද [භාර්යාවන්] අත්හැරදැමීමට
මම ද්වේෂකරමියි ඉශ්‍රායෙල්ගේ දෙවිවූ
**ස්වාමීන්වහන්සේ** කියනසේක; තමාගේ
වස්ත්‍රය බලාත්කාරයෙන් වසන්නාටත්
මම ද්වේෂකරමියි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එබැවින්
නුඹලාගේ ආත්ම ගැන ප්‍රවේසම්වී,
ද්‍රෝහිකම් නොකර සිටපල්ලා.
17 නුඹලාගේ වචනවලින් නුඹලා
**ස්වාමීන්වහන්සේ** වෙහෙසූහුය. එහෙත්:
අපි කුමකින් උන්වහන්සේ වෙහෙසූ-
යෙමුදැයි නුඹලා අසන්නහුය. නපුර කරන
සියල්ලෝම **ස්වාමීන්වහන්සේ** ඉදිරියේ
යහපත්ය, උන්වහන්සේ ඔවුන් කෙරෙහි
ප්‍රසන්නය; නැතහොත් යුක්තියේ
දෙවියන්වහන්සේ කොතැනදැයි නුඹලා
විසින් කීමෙන්ය.

## දේව අභක්තිකම ගැන තර්ජනය කිරීම

3 මෙන්න, මාගේ දූතයා එවමි, ඔහු
මට පෙරටුව මාර්ගය පහදන්නේය.
එවිට නුඹලා සොයන ස්වාමීන්වහන්සේ
හදිසියෙන් තමන් මාළිගාවට එනසේක;
එසේය, නුඹලා ආශාවන ගිවිසුමේ දූතයා
එන්නේයයි සේනාවල **ස්වාමීන්වහන්සේ**
කියනසේක. නුමුත් උන්වහන්සේගේ ඊමේ 2
දවස දරන්ට පුළුවන් කාටද? උන්වහන්සේ
පෙනෙන කල සිටින්ට පුළුවන් කාටද?
මක්නිසාද උන්වහන්සේ රන්කරුවෙකුගේ
ගින්නද අපුල්ලන්නන්ගේ සබන්ද මෙන්ය.
උන්වහන්සේ රිදී උණුකර පිරිසිදුකරන 3
කෙනෙක් මෙන් සිට, ලෙවී පුත්‍රයන්
ධර්මිෂ්ඨකමෙන් **ස්වාමීන්වහන්සේට** පූජා
ඔප්පුකරන්නන්ව සිටින පිණිස ඔවුන්
පිරිසිදුකර, රන් රිදී මෙන් ඔවුන් පවිත්‍ර-
කරනසේක. එකල යූදාහිද යෙරුසලමේද 4
පූජාව පුරාණ දවස්වලදීත් පළමු
අවුරුදුවලදීත් මෙන් **ස්වාමීන්වහන්සේට**
ප්‍රසන්නව තිබෙන්නේය. තවද මම 5
විනිශ්චය පිණිස නුඹලා ළඟට ඇවිත්,
මන්ත්‍රකාරයන්ටද කාමමිථ්‍යාචාරික-
යන්ටද බොරු දිවුරන්නන්ටද මට භය
නොවී කුලී ගැන කුලීකාරයාටත්
වැන්දඹුවටත් පියා නැත්තාටත් ප්‍රයෝග
කරන්නන්ටද විදේශියාගේ යුක්තිය
පෙරළන්නන්ටද විරුද්ධව ශීඝ්‍ර සාක්ෂි-
කාරයෙක් වන්නෙමියි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. මක්නිසාද 6
**ස්වාමීන්වහන්සේ** වන මම වෙනස් නො-
වෙමි; එබැවින් යාකොබ්ගේ පුත්‍රයෝවූ
නුඹලා විනාශ නොවී සිටින්නහුය.

## වරදවා පුදකිරීම ගැන තරවටුකිරීම

නුඹලාගේ පියවරුන්ගේ දවස්වල 7
පටන්ම නුඹලා මාගේ නියෝග
නොපවත්වා, එයින් අභක්ව ගියහුය.
මා වෙතට හැරී වරෙල්ලා, මමත් නුඹලා
වෙතට හැරී එන්නෙමියි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. එහෙත්
අපි කෙසේ හැරී එන්නෙමුදැයි නුඹලා
අසන්නහුය. මනුෂ්‍යයෙක් දෙවියන්- 8
වහන්සේගෙන් කොල්ලකනවා ඇද්ද?
නුඹලා නම් මාගෙන් කොල්ලකන්නහුය.
එහෙත්: අපි කෙසේ ඔබවහන්සේගෙන්
කොල්ලකෑවෙමුදැයි නුඹලා අසන්නහුය.
ඔතුවලින් සහ එසවීම් පූජාවලිනුත්ය.
ශාපය නුඹලා පිටට පැමිණ තිබේ; 9
මක්නිසාද නුඹලා, එනම් මේ මුළු ජාතිය,

10 මාගෙන් කොල්ලකන්නහුය. මාගේ
ගෘහයෙහි භෝජන තිබෙන පිණිස
නුඹලා ගබඩාගෙට ඔතු සියල්ල
ගෙනවුත්, මා විසින් නුඹලාට අහසේ
කවුළු ඇර ඉඩම් මදිවෙන තරම්
නුඹලාට ආශීර්වාදයක් වගුරුවා
දෙන්නේ නැද්ද කියා එයින් මා සෝදිසි-
කර බලාපල්ලායයි සේනාවල **ස්වාමීන්-**
11 **වහන්සේ** කියනසේක. නුඹලාගේ භූමියේ
ඵල නාස්ති නොකරන ලෙස, ඒවා
කාදමන්නාට නුඹලා උදෙසා තර්ජන-
කරන්නෙමි; කෙතේ නුඹලාගේ මිදිවැලත්
අකාලයේ එහි ඵල නොහෙළන්නේයයි
සේනාවල **ස්වාමීන්වහන්සේ** කියනසේක.
12 නුඹලා වාසනාවන්තයෝයයි සියලු
ජාතීන් කියනවා ඇත. මක්නිසාද නුඹලා
ප්‍රියකරු දේශයක් වන්නහුයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ විනිශ්චය

13 නුඹලාගේ වචන මට විරුද්ධව තදව
තිබේයයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.
එහෙත්: අපි ඔබවහන්සේට විරුද්ධව
කුමක් කීවෙමුදැයි නුඹලා අසන්නහුය.
14 නුඹලා කථාකොට: දෙවියන්වහන්සේට
සේවයකිරීම නිෂ්ඵලය. අපි උන්වහන්සේගේ
නියමය පවත්වා, සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** ඉදිරියෙහි ශෝකලෙස
හැසුරුණායින් ඇති වාසිය මොකද?
15 එබැවින් උඩඟු තැනැත්තෝ වාසනා-
වන්තයෝයයි අපි දන් කියමුව; එසේය,
දුෂ්ටකම්කරන්නෝ දියුණුවෙති; ඔව්හු
දෙවියන්වහන්සේ පරීක්ෂාකළ නුමුත්
16 ගළවනු ලබතියි කියන්නහුය. එකල
**ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය ඇත්තෝ
එකිනෙකා සමග කථාකරගත්තෝය.
**ස්වාමීන්වහන්සේද** කන්දී ඇසූසේක,
එවිට **ස්වාමීන්වහන්සේ** කෙරෙහි භය
ඇත්තාවූ, උන්වහන්සේගේ නාමය
සැලකුවාවූ අය ගැන උන්වහන්සේ
ඉදිරියෙහි සිහිවීමේ පොතක් ලියන-
ලද්දේය. ඔව්හු වනාහි මා විසින් 17
පමුණුවන දවසේදී මාගේම සම්පතක්
වන්නෝය; මමද මනුෂ්‍යයෙක් තමාට
සේවයකරන තමාගේ පුත්‍රයාට කරුණා-
කරන්නාක්මෙන් ඔවුන්ට කරුණා-
කරන්නෙමියි සේනාවල **ස්වාමීන්-**
**වහන්සේ** කියනසේක. එකල ධර්මිෂ්ඨයා 18
සහ දුෂ්ටයා අතරේද දෙවියන්වහන්සේට
සේවයකරන්නා සහ උන්වහන්සේට
සේවය නොකරන්නා අතරේද ඇති
වෙනස නුඹලා නැවත දකිනවා ඇත.

4

මක්නිසාද උදුනක් මෙන් ඇවිළෙන
දවස පැමිණෙන්නේය; එවිට සියලු
උඩඟු අයද දුෂ්ටකම්කරන සියල්ලන්ද
ඉපනැලි වී, ඔවුන්ට මුලක්වත් අත්තක්වත්
ඉතුරු නොවෙන හැටියට, පැමිණෙන ඒ
දවසේදී දලා යනවා ඇතැයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක. නුමුත් 2
මාගේ නාමය කෙරෙහි භය ඇත්තාවූ
නුඹලාට ධර්මිෂ්ඨකමේ සූර්යයා ස්වකීය
පියාපත්වල සුවකිරීම ඇතුව උදවන්නේය;
නුඹලා නික්ම ගොස් ගාලේ වස්සන්
මෙන් පනින්නහුය. නුඹලා දුෂ්ටයන් 3
පාගාදමන්නහුය; මක්නිසාද මා විසින්
පමුණුවන දවසේදී ඔව්හු නුඹලාගේ
පතුල් යට අලු වන්නෝයයි සේනාවල
**ස්වාමීන්වහන්සේ** කියනසේක.

## අන්තිම අවවාදය. එලියා එන්ට සිටින බව

මා විසින් සියලු ඉශ්‍රායෙල්වරුන් උදෙසා 4
හොරෙබ්හිදී මාගේ මෙහෙකරුවාවූ
මෝසෙස්ට අණකළ ව්‍යවස්ථාව වන
නියෝග සහ විනිශ්චයන් සිහිකරපල්ලා.
බලව, **ස්වාමීන්වහන්සේගේ** මහත්වූ 5
භයානකවූ දවස පැමිණෙන්ට පළමුවෙන්
ප්‍රොපේතවූ එලියා නුඹලා වෙතට
එවන්නෙමි. මා ඇවිත් ශාපයකින් 6
දේශයට පහර නොදෙන පිණිස, ඔහු
පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත්
දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත්
හරවන්නේය.

# ශුද්ධවූ මතෙව් විසින් ලියනලද
# ශුභාරංචිය

## යේසුස්වහන්සේගේ පෙළපත

1 ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දවිත්ගේ
පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
පරම්පරාවේ පොතය.
2 ආබ්‍රහම්ට දව ඊසාක් උපන්නේය;
ඊසාක්ට දව යාකොබ් උපන්නේය;
යාකොබ්ට දව යූදද ඔහුගේ
3 සහෝදරයෝද උපන්නෝය; යූදට දව
තාමාර්ගෙන් පෙරෙශ්ද ශෙරාද
උපන්නෝය; පෙරෙශ්ට දව හෙශ්‍රොන්
උපන්නේය; හෙශ්‍රොන්ට දව රාම්
4 උපන්නේය; රාම්ට දව අමිනාදබ්
උපන්නේය; අමිනාදබ්ට දව නාෂොන්
උපන්නේය; නාෂොන්ට දව සල්මොන්
5 උපන්නේය; සල්මොන්ට දව රාහබ්ගෙන්
බෝවාස් උපන්නේය; බෝවාස්ට දව
රූත්ගෙන් ඕබෙද් උපන්නේය; ඕබෙද්ට
6 දව යෙස්සේ උපන්නේය; යෙස්සේට දව
දවිත් රජ උපන්නේය.
දවිත් රජුට දව උරියාට භාර්යාව වී
සිටිය ස්ත්‍රියගෙන් සාලමොන් උපන්නේය;
7 සාලමොන්ට දව රෙහොබොවම්
උපන්නේය; රෙහොබොවම්ට දව අබියා
උපන්නේය; අබියාට දව ආසා
8 උපන්නේය; ආසාට දව යෙහෝෂාපාත්
උපන්නේය; යෙහෝෂාපාත්ට දව යෝරාම්
උපන්නේය; යෝරාම්ට දව උස්සියා
9 උපන්නේය; උස්සියාට දව යෝතාම්
උපන්නේය; යෝතාම්ට දව ආහාස්
10 උපන්නේය; ආහාස්ට දව හෙසකියා
උපන්නේය; හෙසකියාට දව මනස්සේ
උපන්නේය; මනස්සේට දව ආමොන්
උපන්නේය; ආමොන්ට දව යොෂියා
11 උපන්නේය; බබිලෝනියට ගෙනයාමේ
කාලයෙහිදී, යොෂියාට දව යෙකොනියාද
ඔහුගේ සහෝදරයෝද උපන්නෝය.
බබිලෝනියට ගෙනයාමට පසු, 12
යෙකොනියාට දව ෂෙයල්තියෙල්
උපන්නේය; ෂෙයල්තියෙල්ට දව
සෙරුබාබෙල් උපන්නේය; සෙරුබාබෙල්ට 13
දව අබියුද් උපන්නේය; අබියුද්ට දව
එලියාකීම් උපන්නේය; එලියාකීම්ට දව
ආශොර් උපන්නේය; ආශොර්ට දව 14
සාදෙක් උපන්නේය; සාදෙක්ට දව ආකීම්
උපන්නේය; ආකීම්ට දව එලියුද්
උපන්නේය; එලියුද්ට දව එලෙයාසර් 15
උපන්නේය; එලෙයාසර්ට දව මත්තාන්
උපන්නේය; මත්තාන්ට දව යාකොබ්
උපන්නේය; යාකොබ්ට දව මරියාගේ 16
පුරුෂයාවූ යෝසෙප් උපන්නේය;
මරියාගෙන් ක්‍රිස්තුස් නම්වූ
යේසුස්වහන්සේ උපන්සේක.
මෙසේ ආබ්‍රහම් පටන් දවිත් දක්වා 17
සියලු පරම්පරා දසසතරක්ය; දවිත්
පටන් බබිලෝනියට ගෙනයාම දක්වා
පරම්පරා දසසතරක්ය; බබිලෝනියට
ගෙනයාමේ පටන් ක්‍රිස්තුස්වහන්සේ
දක්වා පරම්පරා දසසතරක්ය.

## යේසුස්වහන්සේගේ උප්පැන්නය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය 18
මෙසේ විය. උන්වහන්සේගේ මවුවූ මරියා
යෝසෙප්ට විවාහබස් දී සිටියදී, ඔවුන්
එක්වෙන්ට පළමුවෙන්, ශුද්ධාත්මයාණන්
කරණකොටගෙන ඈ ගර්භිණීවූ බව
දැනගන්නාලදී. ධර්මිෂ්ඨයෙක්ව සිටි ඇගේ 19
පුරුෂයාවූ යෝසෙප් ඈ නින්දාවට
පමුණුවන්ට නොකැමතිව, රහසින් ඈ
අත්හරින්ට සිතුවේය. නුමුත් ඔහු මේ 20
කාරණා කල්පනාකරමින් සිටියදී,

බලව, ස්වාමීන්වහන්සේගේ දූතයෙක්
ස්වප්නයකින් ඔහුට පෙනී: දාවිත්ගේ පුත්‍රවූ
යෝසෙප්, නුඹේ භාර්යාවවූ මරියා
පාවාගන්ට භය නොවන්න. මක්නිසාද
ඈ තුළ පිළිසිඳුණාවූ යමක් ඇද්ද එය
ශුද්ධාත්මයාණන් කරණකොටගෙනය.
21 ඈ පුත්‍රයෙකු වදන්නීය; උන්වහන්සේට
යේසුස් යන නාමය තබාපන්න;
මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ
පාපවලින් ගළවන්නේ උන්වහන්සේයයි
22 කීවේය. මේ සියල්ල සිද්ධවූයේ–
බලව, කන්‍යාව ගර්භිණීව පුත්‍රයෙකු
වදන්නීය;
උන්වහන්සේට එම්මානුවෙල් යන
නාමය තබනවා ඇත
23 කියා ස්වාමීන්වහන්සේ අනාගතවක්තෘ
ලවා කියෙවූ කීම සම්පූර්ණවන පිණිසය.
ඒ නාමයේ අර්ථය නම් දෙවියන්වහන්සේ
24 අප සමගය යනුයි. එවිට යෝසෙප්
නින්දෙන් පිබිද, ස්වාමීන්වහන්සේගේ
දූතයා ඔහුට අණකළ ලෙස කරනුයේ,
25 තමාගේ භාර්යාව පාවාගත්තේය; නුමුත්
ඈ පුත්‍රයෙකු වදන තුරු ඔහු ඈ
නොහැඳින්නේය. ඔහු උන්වහන්සේට
යේසුස් යන නාමය තැබීය.

## ශාස්ත්‍රවන්තයන්ගේ ඊම

2 තවද හෙරොද් රජුගේ දවස්වල
යුදයේ බෙත්ලෙහෙම්හි යේසුස්වහන්සේ
උපන් කල, පූර්වදිශාවෙන් ශාස්ත්‍රවන්තයෝ
2 යෙරුසලමට ඇවිත්: යුදෙව්වරුන්ට රජව
උපන් තැනන්වහන්සේ කොතැන්හිද?
මක්නිසාද අපි උන්වහන්සේගේ තාරකාව
පූර්වදිශාවෙහිදී දැක, උන්වහන්සේට
නමස්කාර කරන පිණිස ආවෙමුයයි
3 කීවෝය. හෙරොද් රජ ඒ ඇසූ කල්හි
ඔහුද ඔහු සමග මුළු යෙරුසලමද
4 කැලඹුණෝය. එකල ඔහු සියලු නායක
පූජකයන්ද සෙනඟගේ ලියන්නන්ද
රැස්කරවා, ක්‍රිස්තුස්වහන්සේ කොතැන්හි
උපදිනසේක්දැයි ඔවුන්ගෙන් විචාළේය.
5 ඔව්හු කථාකොට: යුදයේ බෙත්ලෙහෙම්හිය,
කුමක් හෙයින්ද–
6 එම්බා බෙත්ලෙහෙම, යූද දේශය,
තී යූදගේ අධිපතීන් අතරෙහි කොයි
ලෙසකින්වත් ඉතා කුඩා නොවන්නීය.
මක්නිසාද මාගේ ඉශ්‍රායෙල් සෙනඟ
පාලනයකරන්නාවූ
ආණ්ඩුකාරයෙක් තී කෙරෙන්
නික්මෙන්නේයයි
අනාගතවක්තෘ විසින් ලියා තිබේයයි
ඔහුට කීවෝය. එකල හෙරොද් 7
ශාස්ත්‍රවන්තයන් රහසින් කැඳවා, තාරකාව
කොයි කාලයෙහි පෙනුණේදැයි
හරියාකාරයෙන් ඔවුන්ගෙන් දැනගෙන:
නුඹලා ගොස් ඒ ළදරුවා ගැන 8
හරියාකාරයෙන් විභාගකරපල්ලා;
නුඹලාට සම්බවූ කල, මාත් ගොස්
උන්වහන්සේට නමස්කාරකරන පිණිස
මට දන්වාපල්ලාය කියා, ඔවුන්
බෙත්ලෙහෙමට යැවීය. ඔව්හු රජුගේ 9
බස් අසා පිටත්ව ගියෝය; බලව,
පූර්වදිශාවෙහිදී ඔවුන් දුටු තාරකාව
ළදරුවා උන් තැන මුදුනට පැමිණ
නවතින තුරු ඔවුන්ට පෙරටුව ගියේය.
ඔව්හු තාරකාව දැක ඉතා මහත් 10
ප්‍රීතියකින් ප්‍රීතිවූවෝය. ඔව්හු ගෙට වැද, 11
ළදරුවා ස්වකීය. මවුවූ මරියා සමග
සිටිනවා දැක, බිම වැටී උන්වහන්සේට
නමස්කාරකොට, තමුන්ගේ කරඬු හැර,
රත්ද කට්ටකුමංචල්ද සුවඳ ලාටුද යන
පඬුරු උන්වහන්සේට පිදූවෝය. තවද 12
හෙරොද් වෙතට නැවත නොයන ලෙස
දෙවියන්වහන්සේ විසින් ස්වප්නයකින්
දන්වනු ලැබ, ඔව්හු අන් මගකින්
තමුන්ගේ රටට ගියෝය.

## මිසරයට පලායාම

ඔවුන් ගිය කල්හි ස්වාමීන්වහන්සේගේ 13
දූතයෙක් ස්වප්නයකින් යෝසෙප්ට පෙනී:
නැගිට ළදරුවාද උන්වහන්සේගේ
මෑණියන්ද රැගෙන මිසරයට පලාගොස්,
මා නුඹට කියන තුරු එහි සිටපන්න.
මක්නිසාද හෙරොද් ළදරුවා
විනාශකරන්ට සොයනවා ඇතැයි
කීවේය. ඔහු නැගිට රාත්‍රියෙහි ළදරුවාද 14
උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන
මිසරයට ගොස්, හෙරොද්ගේ මරණය 15
දක්වා එහි සිටියේය. මෙසේ වූයේ:
මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවා-
ගතිමියි කියා ස්වාමීන්වහන්සේ විසින්
අනාගතවක්තෘ කරණකොටගෙන කියන
ලද කීම සම්පූර්ණවන පිණිසය.

## හෙරොද් රජ බෙත්ලෙහෙමේ කුඩා දරුවන් මැරවීම

16 එකල හෙරොද් ශාස්ත්‍රවන්තයන් විසින්
තමා රවටනු ලැබූ බව දැක, ඉතා
උදහස්ව, ඔවුන්ගෙන් හරියාකාර දැනගත්
කාලයේ හැටියට, මනුෂ්‍යයන් යවා,
බෙත්ලෙහෙම්හිද එහි සියලු සීමාවලද
සිටි දෑවුරුදු වයස්වූද ඊට බාලවූද සියලු
17 පිරිමි දරුවන් මැරෙවුවේය. එකල:
හැඬීමේද බොහෝ වැලපීමේද
හඬක් රාමාහි ඇසුණේය;
රාබෙල් ඇගේ දරුවන් ගැන අඬමින්,
ඔවුන් නැති නිසා සැනසෙන්ට
නොකැමතිවූවායයි
18 අනාගතවක්තෘවූ යෙරෙමියා කරණ-
කොටගෙන කියනලද කාරණාව
සම්පූර්ණ විය.

## මිසරයෙන් හැරී ඊම

19 නුමුත් හෙරොද් මැරුණායින් පසු,
බලව, ස්වාමීන්වහන්සේගේ දූතයෙක්
මිසරයෙහිදී ස්වප්නයකින් යෝසෙප්ට
20 පෙනී: නැගිට ළදරුවාද උන්වහන්සේගේ
මෑණියන්ද රැගෙන ඉශ්‍රායෙල් දේශයට
පලයන්න. මක්නිසාද ළදරුවාගේ ජීවිතය
නසන්ට සෙවූ අය මළෝයයි කීවේය.
21 එවිට ඔහු නැගිට ළදරුවාද
උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන
22 ඉශ්‍රායෙල් දේශයට ආවේය. එහෙත්
අර්කෙලාවුස් තමාගේ පියවූ හෙරොද්
වෙනුවට යුදය කෙරෙහි රජකම්කරන
බව ඔහු අසා, එහි යන්ට භයව,
දෙවියන්වහන්සේ විසින් ස්වප්නයකින්
දන්වනු ලැබ, ගලීලයේ පළාත්වලට
23 ගොස්, නාසරෙත් නම් නුවරට පැමිණ,
එහි වාසයකෙළේය. මෙසේ වූයේ:
උන්වහන්සේ නාසරීයයෙක්යයි කියනු
ලබනසේකැයි අනාගතවක්තෘවරුන්
කරණකොටගෙන කියනලද කාරණාව
සම්පූර්ණවන පිණිසය.

## යොහන් බව්තීස්ත හා ඔහුගේ පණිවිඩය

3 ඒ දවස්වලදී *යොහන් බව්තීස්ත
ඇවිත් යුදයේ වනයෙහි දේශනා
කරමින්: පසුතැවිලිවෙයල්ලා; මක්නිසාද 2
ස්වර්ගරාජ්‍යය ළඟයයි කීවේය. කුමක් 3
හෙයින්ද—
ස්වාමීන්වහන්සේගේ මාර්ගය පිළියෙළ
කර
උන්වහන්සේගේ මාවත් සමතලා
කරපල්ලාය කියා
වනාන්තරයෙහි හඬගසන්නෙකුගේ
ශබ්දයයයි
අනාගතවක්තෘවූ යෙසායා කරණ-
කොටගෙන කියනලද්දේ මොහු ගැනය.
මෙම යොහන් ඔටුරෝම වස්ත්‍ර හැඳ, 4
ඉඟටියේ හම්පටියක් බැඳ සිටියේය;
ඔහුගේ කෑම වූයේ පළඟැටියන් හා
වනමීය. එකල යෙරුසලමේද මුළු 5
යුදයේද යොර්දන අවට මුළු පළාතේද
වැසියෝ ඔහු වෙතට පැමිණ, තමුන්ගේ 6
පව් කියාදෙමින්, යොර්දන් ගංගාවෙහි
ඔහුගෙන් †බව්තීස්මය ලැබුවෝය. නුමුත් 7
ඔහු තමාගෙන් †බව්තීස්මය ලබන
පිණිස ඵරිසිවරුන්ගෙන්ද සද්දූසිවරුන්-
ගෙන්ද බොහෝ දෙනෙකු එනවා දැක,
ඔවුන්ට කථාකොට: පොළොංවංශය,
පැමිණෙන උදහසින් පලායන්ට
නුඹලාට අවවාදකළේ කවුද? එබැවින් 8
අබ්‍රහම් අපගේ පියාණෝයයි කියාගන්ට
නොසිතා, පසුතැවිල්ලට සුදුසු ඵල
උපදවාපල්ලා. මක්නිසාද මේ ගල්වලින් 9
ආබ්‍රහම්ට දරුවන් උපදවා දෙන්ට
දෙවියන්වහන්සේට පුළුවනැයි නුඹලාට
කියමි. තවද දැනටම පොරොව ගස් මුලට 10
තබා තිබේ. එබැවින් හොඳ ඵල නොදරන
සියලු ගස් කපනු ලැබ ගින්නෙහි දමනු
ලැබේ. මම වනාහි පසුතැවිල්ල පිණිස 11

---

*අවගාහක යොහන්.
†අවගාහනය.

තුඹලා *වතුරෙන් බව්තීස්මකරමි. තුමුත්
මට පසුව එන තැනැත්තේ මට වඩා
බලවත්ය, මම උන්වහන්සේගේ වහන්
ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ
†ශුද්ධාත්මයාණන්ගෙන්ද ගින්නෙන්ද
12 තුඹලා ‡බව්තීස්මකරනසේක. උන්-
වහන්සේගේ කුල්ල තමන්වහන්සේගේ
අතේය, උන්වහන්සේ තමන් කමත හොඳ
හැටි පවිත්‍රකරනසේක; තමන් ධාන්‍ය
අටුවට රැස්කොට, බොල් නොනිවෙන
ගින්නෙන් දවනසේකැයි කීවේය.

## යේසුස්වහන්සේගේ ‡බව්තීස්මය

13 එකල යේසුස්වහන්සේ යොහන්ගෙන්
‡බව්තීස්මය ලබන පිණිස ගලීලයේ
14 සිට යොර්දනට ආසේක. තුමුත්
යොහන් උන්වහන්සේ වලක්වමින්:
ඔබගෙන් ‡බව්තීස්මය ලබන්ට මට යුතුව
තිබියදී ඔබ මා වෙතට එනසේක්දැයි
15 කීවේය. යේසුස්වහන්සේ ඔහුට
උත්තරදෙමින්: දැනට ඉඩහරින්න.
මක්නිසාද මෙසේ සියලු ධර්මිෂ්ඨකම්
සම්පූර්ණකරන්ට අපට සුදුසුයයි කීසේක.
එවිට ඔහු උන්වහන්සේට ඉඩහැරියේය.
16 යේසුස්වහන්සේ ‡බව්තීස්ම ලැබ
එකෙණෙහිම දියෙන් ගොඩනැගුණු-
සේක. බලව, අහස උන්වහන්සේට
විවරවිය, දෙවියන්වහන්සේගේ
ආත්මයාණන් පරෙවියෙකු මෙන්
බසිනවාද තමන් පිටට පැමිණෙනවාද
17 උන්වහන්සේ දුටුසේක; තවද: මොහු
මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු
කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන්
හඬක් විය.

## යේසුස්වහන්සේ වනාන්තරයෙහි පරීක්ෂාකරනු ලැබීම

4 එකල යේසුස්වහන්සේ යක්ෂයා
විසින් පරීක්ෂාකරනු ලබන
පිණිස ආත්මයාණන්වහන්සේ විසින්
වනාන්තරයට පමුණුවනු ලැබුසේක.
2 උන්වහන්සේ දවල් සතළිසක්ද රෑ
සතළිසක්ද නිරාහාරව හුන් පසු,
උන්වහන්සේට බඩගිනිවිය. එවිට 3
පරීක්ෂකයා උන්වහන්සේ වෙතට ඇවිත්:
ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම්
මේ ගල් රොටි වෙන්ට අණකරපන්නැයි
කීවේය. උන්වහන්සේ උත්තරදෙමින්: 4
මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන්
නික්මෙන සියලු වචනවලින්
ජීවත්වෙනවා මිස, රොටි පමණකින්
ජීවත් නොවන්නේය කියා ලියා තිබේයයි
කීසේක. එවිට යක්ෂයා උන්වහන්සේ 5
ශුද්ධ නුවරට පමුණුවා දේවමාළිගාව
මුදුනෙහි සිටුවා: ඔබ දෙවියන්වහන්සේගේ 6
පුත්‍රයා නම් පහතට පනින්න. කුමක්
හෙයින්ද–

උන්වහන්සේ තමන් දූතයන්ට තුඹ
ගැන අණදෙනසේක.
තුඹේ පය යම් හෙයකින් ගලක
නොවදින පිණිස
ඔව්හු තමුන්ගේ අත්පිට තුඹ උසුලා
ගන්නෝය

කියා ලියා තිබේයයි උන්වහන්සේට
කීවේය. යේසුස්වහන්සේද: තාගේ දෙවිවූ 7
ස්වාමීන්වහන්සේ පරීක්ෂා නොකරව
කියාත් ලියා තිබේයයි ඔහුට කීසේක.
නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා 8
උස් කන්දකට පමුණුවා, ලෝකයේ
සියලු රාජ්‍යයන්ද එහි ඓශ්වර්යයද
උන්වහන්සේට පෙන්වා: ඔබ බිම වැටී 9
මට නමස්කාරකරන්නෙහි නම් මේ
සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට
කීවේය. එවිට යේසුස්වහන්සේ: සාතන් 10
අහක්ව යව. මක්නිසාද–තාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට නමස්කාරකරව,
උන්වහන්සේට පමණක් සේවයකරවයි
ලියා තිබේයයි ඔහුට කීසේක. එකල 11
යක්ෂයා උන්වහන්සේ අත්හැර ගියේය;
බලව, දේවදූතයෝ ඇවිත් උන්වහන්සේට
උපස්ථානකළෝය.

## යේසුස්වහන්සේ ගලීලයේ කපර්ණවුමෙහි විසීම

යොහන් පාවාදෙනු ලැබූ බව 12
උන්වහන්සේ අසා අහක්ව ගලීලයට
ගියසේක. උන්වහන්සේ නාසරෙත් නුවර 13

---

*වතුරෙහි අවගාහනයකරමි.
†ශුද්ධාත්මයෙහිද ගින්නෙහිද.
‡අවගාහනය.

හැර, සාබුලොන් සහ නප්තලීයේ
සීමාවල මුහුදුබඩ තිබෙන කපර්ණවුමට
14 පැමිණ, එහි වාසයකළසේක. මෙසේ
කළේ–

යොර්දන් එගොඩ මුහුද අසබඩ
සාබුලොන් රටද නප්තලී රටද වන
අන්‍ය ජාතීන්ගේ ගලීලයෙහි,
15 අන්ධකාරයෙහි හුන් සෙනඟ
මහත් ආලෝකයක් දුටුවෝය,
මරහුගේ දේශයෙහිද සෙවණෙහිද
හුන්නවුන්ට
ආලෝකය උදවූයේයයි
16 අනාගතවක්තෘවූ යෙසායා කරණකොට-
ගෙන කියනලද කාරණාව සම්පූර්ණ-
වන පිණිසය.

## යේසුස්වහන්සේ දේශනාකරන්ට පටන්ගැනීම

17 එතැන් පටන් යේසුස්වහන්සේ:
පසුතැවිලිවෙයල්ලා; මක්නිසාද ස්වර්ග
රාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට
පටන්ගත්සේක.

## උන්වහන්සේගේ මුල් ගෝලයන් කැඳවීම

18 උන්වහන්සේ ගලීලයේ මුහුදුබඩ
ඇවිදිනසේක්, මසුන් අල්ලන්නන්ව
සිටියාවූ සහෝදරයන් දෙදෙනෙක් වන
පේත්‍රුස් නම්ලත් සීමොන්ද ඔහුගේ
සහෝදරවූ අන්ද්‍රෑද මුහුදේ දැලක්
19 හෙළනවා දැක: මා පස්සේ වරෙල්ලා,
මම තුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන්
කරන්නෙමියි ඔවුන්ට කීසේක.
20 එකෙණෙහිම ඔව්හු දැල් අත්හැර
21 උන්වහන්සේ අනුව ගියෝය. උන්වහන්සේ
එතැනින් ගොස් තවත් සහෝදරයන්
දෙදෙනෙක් වන සෙබදීගේ පුත්‍රවූ
යාකොබ්ද ඔහුගේ සහෝදරවූ යොහන්ද
තමුන්ගේ පියවූ සෙබදී සමග ඔරුවේ
හිඳ දැල් හරිගස්සනවා දැක, ඔවුන්ට
අඬගැසූසේක. එකෙණෙහිම ඔව්හු ඔරුවද 22
තමුන්ගේ පියාද අත්හැර උන්වහන්සේ
අනුව ගියෝය.

## උන්වහන්සේ ගලීලයේ හැසිර තමන් මෙහෙය ඉෂ්ටකිරීම

තවද යේසුස්වහන්සේ ඔවුන්ගේ 23
සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ
ශුභාරංචිය දේශනාකරමින්ද සෙනඟ
අතරෙහි සියලු ආකාර ලෙඩ හා සියලු
ආකාර රෝග සුවකරමින්ද ගලීලය
මුළුල්ලෙහි ඇවිද්දසේක. උන්වහන්සේගේ 24
කීර්තිය සිරියා රට මුළුල්ලෙහි පතළව
ගියාය. නොයෙක් රෝගපීඩාවලින්
පීඩිතවූ සියලු රෝගීහුද යක්ෂාවේශවූවෝද
මීමස්මර රෝගීහුද අංශභාග රෝගීහුද
උන්වහන්සේ වෙතට ගෙනෙනලද්දෝය;
උන්වහන්සේ ඔවුන් සුවපත්කළ-
සේක. ගලීලයෙන්ද දෙකපොලිසෙන්ද 25
යෙරුසලමෙන්ද යුදයෙන්ද යොර්දන්
එගොඩින්ද බොහෝ සමූහයෝ
උන්වහන්සේ අනුව ගියෝය.

## කන්ද උඩ දේශනාව

(පරි: 5-7)

5 උන්වහන්සේ සමූහයන් දැක කන්දට
නැගුණසේක. උන්වහන්සේ හිඳගත්
කල්හි උන්වහන්සේගේ ගෝලයෝ
උන්වහන්සේ වෙතට ආවෝය. එවිට 2
උන්වහන්සේ මුඛය හැර ඔවුන්ට
උගන්වමින් මෙසේ කීසේක–

## ආශීර්වාද වාක්‍ය ("වාසනාවන්තයෝ")

සිතින් දිළින්දෝ *ආශීර්වාදලද්දෝය; 3
මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය.
ශෝකවන්තයෝ *ආශීර්වාදලද්දෝය; 4
මක්නිසාද ඔව්හු සනසනු ලබන්නෝය.
මොළොක් ගුණ ඇත්තෝ 5
*ආශීර්වාදලද්දෝය; මක්නිසාද ඔව්හු
පොළොව උරුමකරගන්නෝය.

*හෙවත්, වාසනාවන්තයෝ.

6 ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ
*ආශීර්වාදලද්දෝය; මක්නිසාද ඔව්හු
තෘප්තියට පැමිණෙන්නෝය.
7 දයාවන්තයෝ *ආශීර්වාදලද්දෝය;
මක්නිසාද ඔව්හු දයාව ලබන්නෝය.
8 සිතින් පවිත්‍රව සිටින්නෝ *ආශීර්වාද-
ලද්දෝය; මක්නිසාද ඔව්හු දෙවියන්-
වහන්සේ දකින්නෝය.
9 සමාදනයකරන්නෝ *ආශීර්වාදලද්දෝය;
මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ
පුත්‍රයෝයයි කියනු ලබන්නෝය.
10 ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද
තැනැත්තෝ *ආශීර්වාදලද්දෝය;
මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය.
11 මනුෂ්‍යයන් මා නිසා තුඹලාට නින්ද
පීඩාකොට තුඹලාට විරුද්ධව සියලු
ආකාර අගුණ බොරුවෙන් කියන කල
12 තුඹලා *ආශීර්වාදලද්දෝය. ප්‍රීතිවෙයල්ලා,
ඉතා සන්තෝෂවෙයල්ලා; මක්නිසාද
ස්වර්ගයෙහි තුඹලාගේ විපාකය
මහත්ය. තුඹලාට පළමුවෙන් සිටි
අනාගතවක්තෘවරුන්ටත් ඔව්හු එලෙසම
පීඩාකළෝය.

## ලුණු සහ ආලෝකය

13 තුඹලා පොළොවේ ලුණුය. නුමුත්
ලුණුවල රස නැතිවුණොත් ඒවා කුමකින්
රසකරනු ලබන්නේද? එතැන් පටන් ඒවා
පිටත දමනු ලබන්ටද මනුෂ්‍යයන්ගේ
පයින් පාගනු ලබන්ටද මිස අන්
14 කිසිවකට නොවටනේය. තුඹලා
ලෝකයේ ආලෝකයය. කන්දක්
මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්ට
15 නොහැකිය. මනුෂ්‍යයෝ පහනක් දල්වා
කුරුණිය යට නොව පහන්රුක උඩ
තබති; එවිට එයින් ගෙයි සිටින
සියල්ලන් කෙරෙහි ආලෝකය බබළයි.
16 එසේම මනුෂ්‍යයන් විසින් තුඹලාගේ
යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින
තුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව
කරන පිණිස තුඹලාගේ ආලෝකය
ඔවුන් ඉදිරියේ බබළාවා.

*හෙවත්, වාසනාවන්තයෝ.

## පරණ ව්‍යවස්ථාව හා යේසුස්වහන්සේගේ ව්‍යවස්ථාව

ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ 17
අවලංගුකරන පිණිස මම ආවෙමියි
නොසිතල්ලා. සම්පූර්ණකරන්ට මිස
අවලංගුකරන්ට නාවෙමි. සැබවක් 18
තුඹලාට කියමි: අහසත් පොළොවත්
පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු,
ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත්
බින්දුවක්වත් කිසිසේත් පහව
නොයන්නේය. එබැවින් මේ ආඥවලින් 19
ඉතා සුළු එකක්වත් කඩකරන්නාවූ,
කඩකරන ලෙස මනුෂ්‍යයන්ට
උගන්වන්නාවූ කවරෙක් නුමුත්
ස්වර්ගරාජ්‍යයෙහි ඉතා සුළුයයි කියනු
ලබන්නේය. නුමුත් ඒවා පවත්වන්නාවූ,
උගන්වන්නාවූ කවරෙක් නුමුත්
ස්වර්ගරාජ්‍යයෙහි උතුම්යයි කියනු
ලබන්නේය. මක්නිසාද තුඹලාගේ 20
ධර්මිෂ්ඨකම ලියන්නන්ගේද ඵරිසි-
වරුන්ගේද ධර්මිෂ්ඨකමට වැඩි
නොවීනම්, තුඹලා කිසිසේත්
ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුයයි
තුඹලාට කියමි.

## කෝපය සහ මිනීමැරීම

මිනී නොමරව, මිනීමරන කවරෙක් 21
නුමුත් විනිශ්චයට සුදුස්සෙකැයි
පුරාතනයන්ට කී බව තුඹලා අසා තිබේ.
නුමුත් මම තුඹලාට කියමි: තමාගේ 22
සහෝදරයාට කෝපවෙන කවරෙක්
නුමුත් විනිශ්චයට සුදුස්සෙක් වන්නේය.
තමාගේ සහෝදරයාට *රකායයි කියන
කවරෙක් නුමුත් මන්ත්‍රණ සභාවෙන්
දඬුවම් ලබන්ට සුදුස්සෙක් වන්නේය,
තෝ ජඩයායයි කියන කවරෙක් නුමුත්
නිරාගින්නට සුදුස්සෙක් වන්නේය.
එබැවින් තුඹේ පඬුර පූජාසනය ළඟ 23
පුදන කල්හි, තුඹේ සහෝදරයා තුඹ
කෙරෙහි යම් විරුද්ධයක් ඇති බව එහිදී
තුඹට සිහිවී නම්, තුඹේ පඬුර පූජාසනය 24
ඉදිරියෙහි තබා ගොස්, පළමුකොට
තුඹේ සහෝදරයා හා සමගිවී, පසුව

*එනම්, මෝඩයා.

25 ඇවිත් නුඹේ පඩුර පුදපන්න. නුඹේ
විරුද්ධකාරයා සමග පාරේ යන
කල්හිම ඉක්මනින් ඔහු හා සමගි-
වෙයන්න; නැත්නම් විරුද්ධකාරයා නුඹ
විනිශ්චයකාරයාට භාරදෙන්නේය,
විනිශ්චයකාරයා නුඹ සේවකයාට
භාරදෙන්නේය, නුඹද හිරගෙයි දමනු
26 ලබන්නෙහිය. සැබවක් නුඹට කියමි:
අන්තිම සල්ලිය ගෙවනතුරු නුඹ
කිසිසේත් එයින් පිටවී නොඑන්නෙහිය.

## කිලුටුකම

27 කාමමිථ්‍යාචාරය නොකරවයි කී බව
28 නුඹලා අසා තිබේ. නුමුත් මම නුඹලාට
කියමි: ස්ත්‍රියෙකු දෙස රාගයෙන් බලන
කවරෙක් නුමුත් එවේලේම ඇ සමග
29 සිතින් කාමමිථ්‍යාචාරය කෙළේය. නුඹේ
දකුණු ඇස නුඹට බාධාකෙරේ නම්,
ඒක උගුළා අහකට දමාපන්න.
මක්නිසාද නුඹේ මුළු ශරීරය නිරයෙහි
හෙළනු ලැබීමට වඩා, නුඹේ අවයවවලින්
30 එකක් නැතිවීම නුඹට යහපත. නුඹේ
දකුණු අත නුඹට බාධාකෙරේ නම්,
ඒක කපා අහකදමාපන්න. මක්නිසාද
නුඹේ මුළු ශරීරය නිරයට යාමට වඩා,
නුඹේ අවයවවලින් එකක් නැතිවීම නුඹට
31 යහපත. ඇරත්, තමාගේ භාර්යාව
අත්හරින කවරෙක් නුමුත් ඇට අත්හැරීම්
32 පත්‍රයක් දේවයි කියා තිබුණේය. මම
නුඹලාට කියමි: වේශ්‍යාකමට මිස
වෙන කාරණයකට තමාගේ භාර්යාව
අත්හරින කවරෙක් නුමුත් ඇය
කාමමිථ්‍යාචාරයට පමුණුවන්නේය.
යමෙක් අත්හරිනු ලැබූ ඇය
විවාහකරගන්නේ නම් ඔහුත්
කාමමිථ්‍යාචාරය කරන්නේය.

## දිවිරීම සහ සත්‍යවාදිකම

33 බොරුවට නොදිවුරව, ස්වාමීන්-
වහන්සේට නුඹේ දිවුරුම් ඉෂ්ටකරවයි
පුරාතනයන්ට කී බවත් නුඹලා අසා
34 තිබේ. නුමුත් මම නුඹලාට කියමි:
කිසිසේත් නොදිවුරල්ලා; ස්වර්ගය
දෙවියන්වහන්සේගේ සිංහාසනය බැවින්
ඒක ගැනවත්, පොළොව දෙවියන්- 35
වහන්සේගේ පාපුටුව බැවින් ඒක
ගැනවත්, යෙරුසලම මහරජහුගේ නුවර
බැවින් ඒක ගැනවත් නොදිවුරල්ලා. එක 36
හිසකෙසක් සුදුකරන්ටවත් කළුකරන්ටවත්
නුඹට නොහැකි බැවින් හිස ගැනත්
නොදිවුරන්න. නුඹලාගේ වචනය: 37
එසේය, එසේය කියාද; නැත, නැත කියාද
වේවා. මීට වැඩිවූ යමක් ඇද්ද එය
නපුරාගෙන් වේ.

## පළිගැනීම

ඇසකට ඇසක්ය, දතකට දතක්යයි 38
කී බව නුඹලා අසා තිබේ. නුමුත් මම 39
නුඹලාට කියමි: නපුරු අය සමග
පොරට නොසිටිල්ලා. යමෙක් නුඹේ
දකුණු කම්මුලට ගැසී නම් ඔහුට අනික්
කම්මුලද හරවාපන්න. යමෙක් නඩු කියා 40
නුඹේ අඳනය ගන්ට කැමතිවීනම්, ඔහුට
නුඹේ උතුරු සළුවත් ගන්ට ඉඩඇරපන්න.
යමෙක් එක හැතැප්මක් යන්ට නුඹට 41
බලාත්කාරකෙරේද, ඔහු සමග හැතැප්ම
දෙකක් පලයන්න. නුඹෙන් ඉල්ලන්නාට 42
දීපන්න, නුඹෙන් ණය ගන්ට කැමති
තැනැත්තාට පිටුනොපාන්න.

## ප්‍රේමය සහ නිර්මල චරිතය

තාගේ අසල්වාසියාට ප්‍රේමකරව, 43
තාගේ සතුරාට වෛරකරවයි කී බව
නුඹලා අසා තිබේ. නුමුත් මම 44
නුඹලාට කියමි: නුඹලාගේ සතුරන්ට
ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩාකරන්නන්
උදෙසා යාච්ඤාකරපල්ලා; මෙසේ 45
නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ
පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය.
මක්නිසාද උන්වහන්සේ නපුරන්ටත්
යහපතුන්ටත් තමන් ඉර උදාකරවනසේක,
ධර්මිෂ්ඨයන්ටත් අධර්මිෂ්ඨයන්ටත් වැසි
වස්වනසේක. නුඹලාට ප්‍රේමකරන්නන්ටම 46
නුඹලා ප්‍රේමකරනවා නම්, නුඹලාට
කවර විපාකයක්ද? සුංගම් අයකරන්නෝ
පවා එසේ නොකරද්ද? නුඹලාගේ 47
සහෝදරයන්ට පමණක් ආචාරකරනවා
නම් නුඹලා අනුන්ට වඩා කුමක්

කරන්නහුද? අන්‍ය ජාතීහු පවා
48 එසේ නොකරද්ද? එබැවින් නුඹලාගේ
ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව
සිටින්නාක්මෙන් නුඹලාත් සම්පූර්ණව
සිටපල්ලා.

6 මනුෂ්‍යයන්ට පෙනෙන පිණිස ඔවුන්
ඉදිරියෙහිදී නුඹලාගේ ධර්මිෂ්ඨ ක්‍රියා
නොකරන්ට බලාගනිල්ලා. නැතහොත්
ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්-
වහන්සේ වෙත නුඹලාට විපාකයක්
ඇත්තේ නැත.

## රහසින් දන්දීම

2 එබැවින් නුඹ දන්දෙන කල්හි
මනුෂ්‍යයන්ගෙන් ප්‍රශංසා ලබන පිණිස
සිනගෝගවලදීත් වීථිවලදීත් වංචාකාරයන්
කරන්නාක්මෙන් නුඹට පෙරටුවෙන්
හොරණෑවක් නොපිඹින්න. සැබවක්
නුඹලාට කියමි: ඔවුන්ගේ විපාකය
3 ඔවුන්ට ලැබී තිබේ. නුමුත් නුඹ දන්දෙන
කල්හි, නුඹේ දනය රහස්ව තිබෙන
පිණිස, නුඹේ දකුණත කරන දෙය වමත
4 නොදනීවා. එවිට රහසින් දකින නුඹේ
පියාණන්වහන්සේ නුඹට විපාක දෙන-
සේක.

## රහසින් යාච්ඤාකිරීම

5 තවද නුඹලා යාච්ඤාකරන
කල්හි වංචාකාරයන් කරන්නාක්මෙන්
නොකරල්ලා. මක්නිසාද මනුෂ්‍යයන්ට
පෙනෙන පිණිස ඔව්හු සිනගෝගවලත්
මංසන්ධිවලත් සිටගෙන යාච්ඤාකිරීමට
සතුටුවෙති. සැබවක් නුඹලාට කියමි:
ඔවුන්ගේ විපාකය ඔවුන්ට ලැබී තිබේ.
6 නුමුත් නුඹ යාච්ඤාකරන කල්හි නුඹේ
ඇතුල් ගෙට වැද, දොර වසා, රහසිගතව
වසන නුඹේ පියාණන්වහන්සේට
යාච්ඤාකරපන්න, එවිට රහසින් දකින
නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක
7 දෙනසේක. තවද යාච්ඤාකිරීමේදී අන්‍ය
ජාතීන් මෙන් නිරර්ථකවූ වචන කියාගන
කියාගන නොයල්ලා. ඔව්හු තමුන්ගේ
වචන රාශිය නිසා අසනු ලබන්නෝයයි
8 සිතති. එබැවින් ඔවුන්ට සමාන
නොවෙල්ලා. මක්නිසාද නුඹලාගේ
පියාණන්වහන්සේගෙන් නුඹලා යමක්
ඉල්ලන්ට පළමුවෙන් නුඹලාට වුවමනා
දේ කුමක්දැයි උන්වහන්සේ දන්නාසේක.
එහෙයින් නුඹලා මෙසේ යාච්ඤාකරපල්ලා:– 9

## ස්වාමීන්ගේ යාච්ඤාව

ස්වර්ගයෙහි වැඩසිටින අපගේ
පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව
වේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ 10
කැමැත්ත ස්වර්ගයෙහි මෙන්
පොළොවෙහිද කරනු ලැබේවා. අපේ 11
දවස්පතා භෝජනය අපට අද දුන
මැනව. අපේ ණයකාරයන්ට අප 12
කමාකළාක්මෙන් අපේ ණයත් අපට
කමාකළ මැනව. අප පරීක්ෂාවට 13
නොපමුණුවා, නපුරාගෙන් අප ගැළවුව
මැනව. මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට 14
ඔවුන්ගේ වරද කමාකරන්නහු නම්,
නුඹලාගේ ස්වර්ගීයවූ පියාණන්වහන්සේ
නුඹලාටත් කමාකරනසේක. නුමුත් 15
නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද
කමා නොකරන්නහු නම්, නුඹලාගේ
පියාණන්වහන්සෙත් නුඹලාගේ වරද
කමා නොකරනසේක.

## නිරාහාරව සිටීම

තවද නුඹලා නිරාහාරයෙන් ඉන්න 16
කල්හි වංචාකාරයන් මෙන් දුක්ඛිත
මුහුණක් ඇතුව නොසිටිල්ලා. ඔව්හු
නිරාහාරයෙන් ඉන්න බව මනුෂ්‍යයන්ට
පෙනෙන පිණිස තමුන්ගේ මුහුණු විරූප
කරගනිති. සැබවක් නුඹලාට කියමි:
ඔවුන්ගේ විපාකය ඔවුන්ට ලැබී තිබේ.
නුමුත් නුඹ නිරාහාරයෙන් ඉන්න කල්හි 17
රහසිගතව වසන නුඹේ පියාණන්-
වහන්සේට මිස නුඹ නිරාහාරයෙන්
ඉන්න බව මනුෂ්‍යයන්ට නොපෙනෙන
පිණිස, නුඹේ හිසේ තෙල් ගා, මුහුණ 18
සෝද ගනින්න; එවිට රහසින් දකින
නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක
දෙනසේක.

## පරම වස්තුව

19 පොළොවෙහි නුඹලාට වස්තු රැස්කර
නොතබල්ලා; එහිදී කාවෝද මළකඩද
ඒවා නාස්තිකරති, සොරුද උමංකැන
20 සොරාගනිති. නුමුත් ස්වර්ගයෙහි
නුඹලාට වස්තු රැස්කර තබාගනිල්ලා;
එහිදී කාවෝවත් මලකඩවත් ඒවා
නාස්ති නොකරති, සොරු උමංකැන
21 සොරා නොගනිති. මක්නිසාද නුඹේ
වස්තුව යම් තැනෙක්හිද නුඹේ සිතත්
එතැන්හිම වන්නේය.

## ආලෝකය සහ අන්ධකාරය

22 ශරීරයේ පහන නම් ඇසය. එහෙයින්
නුඹේ ඇස පැහැදිලි නම්, නුඹේ මුළු
23 ශරීරය එළිය වන්නේය. නුඹේ ඇස නපුරු
නම්, නුඹේ මුළු ශරීරය අඳුරු වන්නේය.
එබැවින් නුඹ තුළ තිබෙන එළිය අඳුරු
නම් ඒ අඳුර කොපමණ මහත්ද!
24 ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවයකරන්ට
කිසිවෙකුට නුපුළුවන. මක්නිසාද ඔහු
එක්කෙනෙකුට වෛරවී අනික් අයට
ප්‍රියවන්නේය; නොහොත් එක්කෙනෙකුට
ඇලුම්වී අනික් අය හෙළාදකින්නේය.
දෙවියන්වහන්සේට සහ වස්තුවටත්
සේවයකරන්ට නුඹලාට නුපුළුවන.

## කනගාටු සිතීම. දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය

25 එහෙයින් නුඹලාට කියමි: කුමක් කමුද
කුමක් බොමුද කියා ජීවිතය ගැනවත්,
කුමක් අඳිමුද කියා ශරීරය ගැනවත්
කනස්සලු නොවෙල්ලා. කෑමට වඩා
ජීවිතයද ඇඳුමට වඩා ශරීරයද උතුම්
26 නොවේද? ආකාශයේ පක්ෂීන් බලාපල්ලා,
උන් වපුරන්නේවත් කපාගන්නේවත්
අටුවල රැස්කරගන්නේවත් නැත;
නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේද
උන් පෝෂණය කරනසේක. නුඹලා උන්ට
වඩා බොහෝ වටිනවා නොවේද?
27 කනස්සලුවීමෙන් තමාගේ උසට එක
රියනක් එක්කරගන්ට නුඹලා අතරෙන්
28 කවරෙකුට පුළුවන්ද? නුඹලා ඇඳුම් ගැන
කුමක් නිසා කනස්සලුවන්නහුද? කෙතේ
මානෙල් වැඩෙන හැටි කල්පනා
කරපල්ලා; ඒවා වෙහෙසෙන්නේවත් නූල්
කටින්නේවත් නැත. එහෙත් සාලමොන් 29
පවා ස්වකීය සියලු ඓශ්වර්යයෙහිදී
ඒවායින් එකක් ලෙස පැළඳී නොසිටියේ-
යයි නුඹලාට කියමි. මද ඇදහිල්ල 30
ඇත්තෙනි, අද තිබී හෙට උදුනෙහි
දමනු ලබන්නාවූ කෙතේ තෘණ
දෙවියන්වහන්සේ මෙසේ පළඳවනසේක්
නම්, ඊට වඩා කොපමණ වැඩියෙන්
නුඹලා නොපළඳවනසේක්ද? එහෙයින් 31
කුමක් කමුද කුමක් බොමුද කුමක් අඳිමුද
කියමින් කනස්සලු නොවෙල්ලා.
මක්නිසාද මේ සියල්ල අන්‍ය ජාතීහු 32
සොයති; මේ සියල්ල නුඹලාට ඕනෑ
බව නුඹලාගේ ස්වර්ගීය පියාණන්-
වහන්සේ දන්නාසේක. නුමුත් 33
පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද
උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයා-
පල්ලා; මේ සියල්ලත් නුඹලාට දෙනු
ලබන්නේය. එබැවින් හෙට දවස ගැන 34
කනස්සලු නොවෙල්ලා. හෙට දවස ඒ
ගැනම කරදරවන්නේය. දවසේ කරදරය
ඒ දවසට සෑහෙයි.

## අනුන් විනිශ්චයකිරීම

7 නුඹලා විනිශ්චයකරනු නොලබන
පිණිස විනිශ්චය නොකරල්ලා.
මක්නිසාද නුඹලා යම් විනිශ්චයකින් 2
විනිශ්චයකරන්නහුද එයින්ම නුඹලාත්
විනිශ්චයකරනු ලබන්නහුය. යම්
මිම්මකින් නුඹලා මැනදෙන්නහුද එයින්ම
නුඹලාටත් මැනදෙනු ලබන්නේය. නුඹේ 3
ඇසේ තිබෙන දූවය නොසලකා, නුඹේ
සහෝදරයාගේ ඇසේ තිබෙන රොඩ්ඩ
කුමකට බලන්නෙහිද? නොහොත් නුඹේම 4
ඇසේ දූවය තිබියදී, සහෝදරයාට
කථාකොට: නුඹේ ඇසේ තිබෙන
රොඩ්ඩ පහකරන්ට අවසර දියන්නැයි
ඔහුට කෙසේ කියන්නෙහිද?
වංචාකාරය, පළමුකොට නුඹේ ඇසෙන් 5
දූවය පහකරපන්න; එවිට නුඹේ
සහෝදරයාගේ ඇසෙන් රොඩ්ඩ
පහකරන්ට නුඹට හොඳ හැටි
පෙනෙන්නේය.

6 ශුද්ධ දේ බල්ලන්ට නොදෙල්ලා,
තුඹලාගේ මුතු ඌරන් ඉදිරියෙහි
නොදමල්ලා, සමහරවිට උන් ඒවා පයින්
පාගා හැරී තුඹලා ඉරාදමන්ට පුළුවන.

## යාච්ඤා කිරීමට ධෛර්යය දීම

7 ඉල්ලාපල්ලා, එවිට තුඹලාට දෙනු
ලැබේ; සොයාපල්ලා, එවිට තුඹලාට
සම්බවේ; තට්ටුකරපල්ලා, එවිට තුඹලාට
8 දෙර හරිනු ලැබේ. මක්නිසාද
ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ;
සොයන්නාට සම්බවේ; තට්ටුකරන්නාට
9 දෙර හරිනු ලැබේ. තුඹලා අතරෙන් කවර
මනුෂ්‍යයෙක් තමාගේ පුත්‍රයා රොටියක්
ඉල්ලන්නේ නම්, ඔහුට ගලක් දේද?
10 නොහොත් ඔහු මත්ස්‍යයෙකු ඉල්ලන්නේ
11 නම්, ඔහුට සර්පයෙකු දේද? මෙසේ
නපුරුවූ තුඹලා තුඹලාගේ දරුවන්ට
යහපත් දේ දෙන්ට දන්නහු නම්,
කොපමණ වැඩියෙන් ස්වර්ගයෙහි
සිටින තුඹලාගේ පියාණන්වහන්සේ
තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට යහපත්
දේ නොදෙනසේක්ද?

## රන් අණ

12 එබැවින් මනුෂ්‍යයන් විසින් තුඹලාට
යමක් යමක් කරනවාට තුඹලා කැමතිද
තුඹලාත් එසේම ඔවුන්ට කරපල්ලා.
ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් මේය.

## මාර්ග දෙක

13 පටු දෙරටුවෙන් ඇතුල්වෙයල්ලා.
මක්නිසාද විනාශයට යන දෙරටුව
විශාලය, පාරත් පළලය, එයින්
14 ඇතුල්වන්නෝද බොහෝය. මක්නිසාද
ජීවනයට යන දෙරටුව පටුය, පාර
අවහිරය, ඒක සම්බවන්නේ ස්වල්ප
දෙනෙකුටය.

## බොරු ගුරුවරු සහ සැබෑ ගුරුවරු

15 බොරු අනාගතවක්තෘවරුන්ගෙන්
ප්‍රවේසම්වෙයල්ලා. ඔව්හු බැටළු
වේශයෙන් තුඹලා ළඟට එති, නුමුත්
ඇතුළතින් ඔව්හු කෲරවූ වෘකයෝය.
ඔවුන්ගේ ඵලවලින් තුඹලා ඔවුන් 16
ඇඳිනගන්නහුය. මනුෂ්‍යයෝ කටුගස්වලින්
මුදිරික ඵලවත් ගොකටුවලින් අත්තික්කා
ඵලවත් නෙළාගනිද්ද? එසේම සියලු 17
හොඳ ගස් හොඳ ඵල දරයි; නුමුත්
නරක ගහ නරක ඵල දරයි. හොඳ 18
ගහක නරක ඵලවත් නරක ගහක හොඳ
ඵලවත් හටගන්ට බැරිය. හොඳ ඵල 19
නොදරන සියලු ගස් කපනු ලැබ,
ගින්නෙහි දමනු ලැබේ. එබැවින් ඔවුන්ගේ 20
ඵලවලින් තුඹලා ඔවුන් ඇඳිනගන්නහුය.

## කීම සහ කිරීම

ස්වර්ගයෙහි සිටින මාගේ 21
පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා
මිස මට: ස්වාමිනි, ස්වාමිනියි කියන
සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල්
නොවන්නෝය. ඒ දවසේදී බොහෝ 22
දෙනෙක්: ස්වාමිනි, ස්වාමිනි, ඔබගේ
නාමයෙන් අනාගත වචන නොකියෙමුද?
ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු
නොකෙළෙමුද? ඔබගේ නාමයෙන්
නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමුදැයි
මට කියනවා ඇත. එවිට මම: 23
කිසිකලෙකත් තුඹලා නොහැඳින්නෙමි.
අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන්
අහක්ව පලයල්ලායයි ඔවුන්ට
කියන්නෙමි.

## අත්තිවාරම් දෙක

එහෙයින් යමෙක් මාගේ මේ වචන 24
අසා ඒවා පිළිපදීද, ඔහු පර්වතය පිට
තමාගේ ගෙය සාදගත් නුවණ ඇති
මනුෂ්‍යයෙකුට සමානකරනු ලබන්නේය.
වැසි වැස, ජලය ගලා, හුළඟ හමා, ඒ 25
ගෙට ගැසුවේය; එය පර්වතය පිට පිහිටා
තිබුණු බැවින් නොවැටුණේය. යමෙක් 26
මාගේ මේ වචන අසා, ඒවා පිළි නොපදීද,
ඔහු වැලි මත්තෙහි තමාගේ ගෙය සාදගත්
නුවණ නැති මනුෂ්‍යයෙකුට සමානකරනු
ලබන්නේය. වැසි වැස, ජලය ගලා, හුළඟ 27
හමා, ඒ ගෙට ගැසුවේය; ඒක වැටුණේය.
එහි වැටීමද බලවත්විය.

28 යේසුස්වහන්සේ මේ වචන කියා
නිමකළ කල්හි, සමූහයෝ උන්-
වහන්සේගේ ඉගැන්වීම ගැන විස්මයට
29 පත්වූවෝය. මක්නිසාද උන්වහන්සේ
ඔවුන්ගේ ලියන්නන් මෙන් නොව, බලය
ඇති කෙනෙකු මෙන් ඔවුන්ට ඉගැන්වූ-
සේක.

## කුෂ්ඨරෝගකාරයෙකු සුවකිරීම

8 උන්වහන්සේ කන්දෙන් බැස්ස කල
බොහෝ සමූහයෝ උන්වහන්සේ
2 අනුව ගියෝය. බලව, කුෂ්ඨරෝගියෙක්
උන්වහන්සේ ළඟට ඇවිත් උන්වහන්සේට
වැඳ: ස්වාමිනි, ඔබ කැමතිසේක් නම් මා
පවිත්‍රකරන්ට ඔබට පුළුවනැයි කීවේය.
3 උන්වහන්සේ අත දිගුකොට ඔහු පිට
තබා: මම කැමැත්තෙමි; පවිත්‍රවෙයන්නැයි
කීසේක. එකෙණෙහිම ඔහු කුෂ්ඨයෙන්
4 පවිත්‍ර විය. යේසුස්වහන්සේ කථාකොට:
කාටවත් නොකියන්ට බලාගනින්න;
නුමුත් ඔවුන්ට සාක්ෂි පිණිස ගොස්
පූජකයාට පෙනී, මෝසෙස් විසින්
අණකළ පඬුර ඔප්පුකරපන්නැයි ඔහුට
කීසේක.

## ශතාධිපතියාගේ දසයා සුවකිරීම

5 උන්වහන්සේ කපර්ණවුමට ඇතුල්වූ
කල්හි, සියයකට මුලාදෑනියෙක්
උන්වහන්සේ ළඟට ඇවිත්, උන්වහන්සේට
6 කන්නලව්කරමින්: ස්වාමිනි, මාගේ
මෙහෙකරුවා අංශභාග රෝගීව
බලවත්ලෙස වේදනා විඳිමින් ගෙයි
7 ඔත්පළව ඉඳීයයි කීවේය. මම ඇවිත්
ඔහු සුවපත්කරමියි උන්වහන්සේ ඔහුට
8 කීසේක. සියයකට මුලාදෑනියා
උත්තරදෙමින්: ස්වාමිනි, මාගේ පියස්ස
යටට ඔබගේ ඊමට මම නොවටිමි.
වචන මාත්‍රයක් කිව මැනව, එවිට මාගේ
9 මෙහෙකරුවාට සුවවන්නේය. මක්නිසාද
මමත් ආණ්ඩු බලයට යටත්
මනුෂ්‍යයෙක්ය, මා යටතෙහිද භේවායෝ
සිටිති. එක්කෙනෙකුට: යවයි මා කී
කල, ඔහු යන්නේය; තව කෙනෙකුට:
එවයි කී කල, ඔහු එන්නේය; මාගේ
දසයාට: මේක කරවයි කී කල, ඔහු ඒක
කරන්නේයයි කීවේය. යේසුස්වහන්සේ 10
ඒ අසා, මවිතව, තමන් අනුව එන්නන්ට
කථාකොට: සැබවක් නුඹලාට කියමි,
ඉශ්‍රායෙල්හිවත් මෙබඳු මහත් ඇදහිල්ලක්
නුදුටිමි. තවද නුඹලාට කියමි: 11
නැගෙනහිරින්ද බස්නාහිරින්ද බොහෝ
දෙනෙක් ඇවිත්, ආබ්‍රහම්ද ඊසාක්ද
යාකොබ්ද සමග ස්වර්ගරාජ්‍යයෙහි
හිඳගන්නෝය. එහෙත් රාජ්‍යයේ පුත්‍රයෝ 12
පිටත අඳුරෙහි දමනු ලබන්නෝය. එහි
හැඬීමද දත්මිටිකෑමද වන්නේයයි කීසේක.
යේසුස්වහන්සේ සියයකට මුලාදෑනියාට 13
කථාකොට: පලයන්න; නුඹ අදහාගත්
ලෙසම නුඹට වේවයි කීසේක. ඒ පැයේදීම
මෙහෙකරුවා සුවපත්විය.

## සීමොන්ගේ භාර්යාවගේ මව සහ වෙනත් බොහෝ දෙනෙකු සුවකිරීම

යේසුස්වහන්සේ පේත්‍රුස්ගේ ගෙට 14
ඇතුල්වූ කල ඔහුගේ භාර්යාවගේ මවු
උණ රෝගයෙන් ඔත්පළව ඉන්නවා දැක,
ඇගේ අත ඇල්ලූසේක, එවිට උණ 15
රෝගය ඇගෙන් පහව ගියේය; ඈ නැගිට
උන්වහන්සේට උපස්ථාන කළාය. සවස්වූ 16
කල යක්ෂාවේශවූ බොහෝ දෙනෙක්
උන්වහන්සේ වෙතට ගෙනෙනලද්දෝය.
උන්වහන්සේ වචන මාත්‍රයකින්
ආත්මයන් දුරුකළසේක, රෝගාතුරවූ
සියල්ලන් සුවපත් කළසේක. මෙසේ 17
වූයේ: උන්වහන්සේම අපේ දුර්වලකම්
ගත්සේක, අපේ රෝග උසුලාගත්සේකැයි
අනාගතවක්තෘවූ යෙසායා කරණ-
කොටගෙන කියනලද කාරණාව
සම්පූර්ණවන පිණිසය.

## ගෝලයන් වන්ට කැමතිවූවන් සෝදිසිකිරීම

යේසුස්වහන්සේ බොහෝ සමූහයන් 18
තමන් පිරිවරා සිටින බව දැක, එගොඩට
යන්ට අණදුන්සේක. එවිට ලියන්නෙක් 19
ඇවිත්: ආචාරීන්වහන්ස, ඔබ යන

කොතැනට නුමුත් ඔබ අනුව එන්නෙමියි
20 උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේද:
සිවලුන්ට බිල්ද ආකාශයේ පක්ෂීන්ට
කූඩුද තිබේ; නුමුත් මනුෂ්‍ය පුත්‍රයාට
හිස තබන්ට තැනක් නැතැයි ඔහුට
21 කීසේක. ගෝලයන්ගෙන් තවත් කෙනෙක්:
ස්වාමිනි, පළමුකොට ගොස් මාගේ
පියාණන් භූමදනකරන්ට මට ඉඩ දුන
22 මැනවයි කීවේය. යේසුස්වහන්සේද: මා
අනුව වරෙන්න; මළාහු තමුන්ගේ මළවුන්
භූමදනකරත්වයි ඔහුට කීසේක.

## කුණාටුව සන්සිඳවීම

23 උන්වහන්සේ ඔරුවකට නැගුණු කල
ගෝලයෝ උන්වහන්සේ අනුව ගියෝය.
24 බලව, ඔරුව රැළවලින් වැසී යන තරම්
මුහුදේ මහත් කුණාටුවක් විය.
25 උන්වහන්සේ නිද හුන්සේක. එවිට ඔව්හු
උන්වහන්සේ ළඟට ඇවිත් උන්වහන්සේ
පුබුදුවා: ස්වාමිනි, අප ගැළවුව
මැනව; අපි විනාශවෙමුයයි කීවෝය.
26 උන්වහන්සේද: මඳ ඇදහිල්ල ඇත්තෙනි,
කුමක් නිසා භයපත්වව්දැයි ඔවුන්ට කියා,
නැගිට හුළඟටත් මුහුදටත් සැරකළසේක;
27 එවිට මහත් නිශ්චලයක් විය. ඒ
මනුෂ්‍යයෝ මවිතව: මුන්වහන්සේ
කෙබඳු කෙනෙක්ද? හුළඟ හා මුහුද
පවා මුන්වහන්සේට කීකරුවෙනවායයි
කීවෝය.

## ගදරීන රටේ යකුන් වැහී සිටි අය

28 උන්වහන්සේ එගොඩව ගදරීනයන්ගේ
රටට පැමිණි කල යක්ෂාවේශවූ
දෙදෙනෙක් සොහොන් ගෙවල්වලින්
පිටත්ව උන්වහන්සේගේ පෙරමගට එනවා
උන්වහන්සේට සම්බවිය. ඔවුන් ඉතා
රෞද්‍ර නිසා ඒ පාරෙන් කිසිවෙකුට
29 යන්ට නුපුළුවන් විය. බලව, ඔව්හු
මොරගසමින්: දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණෙනි, ඔබට අපෙන් කම මොකද?
කාලයට ප්‍රථමයෙන් අපට වදදෙන්ට
30 ඔබ මෙහි ආසේක්දැයි කීවෝය. ඔවුන්ට
දුරින් මහත් ඌරු රැළක් ගොදුරු කමින්
සිටියේය. යක්ෂයෝද: ඔබ අප 31
දුරුකරනසේක්නම්, ඌරු රැළට වැහෙන්ට
අප හැරිය මැනවයි උන්වහන්සේගෙන්
ඉල්ලුවෝය. පලයව්යයි උන්වහන්සේ 32
ඔවුන්ට කීසේක. එවිට ඔව්හු පිටවී
ගොස් ඌරන්ට වැහුණෝය. බලව, ඒ
මුළු රැළ ප්‍රපාතය දිගේ මුහුදට වේගයෙන්
දිවගොස්, ජලයෙහි වැටී මළෝය. ඌරු 33
රැකවල්ලු පලාගොස් නුවරට පැමිණ ඒ
සියල්ලත් යක්ෂාවේශවූවන්ට සිදුවූ දේත්
කීවෝය. එකල ඒ මුළු නුවර වැසියෝ 34
යේසුස්වහන්සේ සම්මුඛවීමට ඇවිත්,
උන්වහන්සේ දැක, ඔවුන්ගේ සීමාවලින්
අහක්ව යන ලෙස උන්වහන්සේගෙන්
ඉල්ලුවෝය.

## අංශභාග රෝගකාරයෙකු සුවකිරීම

9 එකල උන්වහන්සේ ඔරුවකට
නැගී එගොඩවී තමන්ගේම නුවරට
පැමිණිසේක. එවිට, ඔව්හු ඇඳක 2
ඔත්පළව හුන් අංශභාග රෝගියෙකු
උන්වහන්සේ ළඟට ගෙනාවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල දැක:
පුත්‍රය, ධෛර්යවත්වෙයන්න; නුඹේ පව්
කමාකරනලද්දේයයි අංශභාග රෝගියාට
කීසේක. එකල ලියන්නන්ගෙන් 3
සමහරෙක්: මොහු දෙවියන්වහන්සේට
අපහාසකරන්නේයයි තමුන් තුළ
කියාගත්තෝය. යේසුස්වහන්සේ ඔවුන්ගේ 4
සිතිවිලි දැන: කුමක් නිසා නුඹලා
නුඹලාගේ සිත්වලින් නපුරු දේ
සිතන්නහුද? වඩා පහසු කොයි එකද? 5
නුඹේ පව් නුඹට කමාකරනලදැයි කීමද?
නොහොත්: නැගිට ඇවිදපන්නැයි කීමද?
නුමුත් පොළොවෙහිදී පව්කමා කරන්ට 6
මනුෂ්‍ය පුත්‍රයාට බලය තිබෙන බව
නුඹලා විසින් දැනගන්නා පිණිසයයි
කියා: නැගිට නුඹේ ඇඳ අරගෙන නුඹේ
ගෙදරට පලයන්නැයි අංශභාග
රෝගියාට කීසේක. එවිට ඔහු නැගිට 7
තමාගේ ගෙදරට ගියේය. නුමුත් 8
සමූහයෝ ඒ දැක භයවී, මෙබඳු බලය
මනුෂ්‍යයන්ට දුන් දෙවියන්වහන්සේට
ගෞරවකළෝය.

## මතෙව් කැඳවනු ලැබීම

9 යේසුස්වහන්සේ එතැනින් යන අතර
මතෙව් නම් මනුෂ්‍යයෙක් සුංගම් අය
කරන තැන වාඩිවී ඉන්නවා දැක: මා
අනුව වරෙන්නැයි ඔහුට කීසේක. ඔහු
නැගිට උන්වහන්සේ අනුව ගියේය.
10 තවද යේසුස්වහන්සේ ගෙයි කෑමට හුන්
කල්හි බොහෝ සුංගම් අයකරන්නෝද
පව්කාරයෝද ඇවිත් උන්වහන්සේ සහ
උන්වහන්සේගේ ගෝලයන් සමග
11 හිඳගත්තෝය. ඵරිසිවරු ඒ දැක: නුඹලාගේ
ආචාරීන්වහන්සේ සුංගම් අයකරන්නන්ද
පව්කාරයන්ද සමග කන්නේ මක්නිසාදැයි
උන්වහන්සේගේ ගෝලයන්ට කීවෝය.
12 උන්වහන්සේ ඒ අසා ඔවුන්ට කියනසේක්:
රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදගෙන්
13 කම් නැත. නුමුත්—මම පූජාවට නොව
දයාවට කැමැත්තෙමියි යන කීමේ අර්ථය
නුඹලා ගොස් ඉගෙනගනිල්ලා.
මක්නිසාද මම පව්කාරයන් මිස
ධර්මිෂ්ඨයන් කැඳවන්ට නාවෙමියි
කීසේක.

## නිරාහාරය පිළිබඳ ප්‍රශ්නය

14 එකල යොහන්ගේ ගෝලයෝ
උන්වහන්සේ ළඟට ඇවිත්: ඵරිසිවරුත්
අපිත් නොයෙක්වර නිරාහාරව සිටිමුව,
නුමුත් ඔබගේ ගෝලයන් නිරාහාරව
නොසිටින්නේ මක්නිසාදැයි කීවෝය.
15 යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට:
මගුල් ගෙදර අය සමග මනමාලයා
සිටින තුරු ඔවුන්ට ශෝකවන්ට
පුළුවන්ද? නුමුත් මනමාලයා ඔවුන්ගෙන්
අහක්කරනු ලබන දවස් පැමිණෙන්නේය,
එකල ඔවුන් නිරාහාරව සිටිනවා ඇත.
16 කිසිවෙක් තාන් රෙදිකෑල්ලක් පරණ
වස්ත්‍රයකට මහන්නේ නැත; මක්නිසාද
එසේ කළොත් අණ්ඩයට ගත් රෙදි
කැබෙල්ල වස්ත්‍රයෙන් ඇදී, වඩා ලොකු
17 ඉරුමක් වේ. අලුත් මුද්‍රිකපානය
පරණ සම්භාජනවල වත් නොකරති.
වත්කළොත් භාජන පැළී, මුද්‍රිකපානය
වැගිරී ගොස්, භාජනත් නාස්තිවන්නේය.
නුමුත් අලුත් මුද්‍රිකපානය අලුත්
සම්භාජනවල වත්කරති; එවිට දෙවගේම
ආරක්ෂාවෙයියි කීසේක.

## යායිරස්ගේ දුව. මාර්ගයේදී ස්ත්‍රියෙක් සුවපත් කිරීම

උන්වහන්සේ ඔවුන්ට මේ කාරණා 18
කියමින් සිටියදී එක්තරා මූලාදෑනියෙක්
ඇවිත් උන්වහන්සේට වැඳ: මාගේ දුව
මේ දැන් මළාය. එහෙත් ඔබවහන්සේ
ඇවිත් ඈ පිට අත තැබුව මැනව, එවිට
ඈ ජීවත්වේයයි කීවේය. යේසුස්වහන්සේ 19
නැගිට ඔහු අනුව ගියසේක,
උන්වහන්සේගේ ගෝලයෝද එසේම
කළෝය. එවිට දොළොස් අවුරුද්දක් 20
මහලේ රෝගයෙන් පෙළුණාවූ ස්ත්‍රියෙක්
උන්වහන්සේ පස්සේ ඇවිත්,
උන්වහන්සේගේ සළුවේ දවල්ලට
අතගෑසුවාය. මක්නිසාද: උන්වහන්සේගේ 21
සළුවට පමණවත් අතගෑසුවොත් මට
සුවවන්නේයයි ඈ සිතින් කියාගත්තාය.
යේසුස්වහන්සේ හැරී ඈ දැක: දියණියෙනි, 22
ධෛර්යවත්වෙයන්න; නුඹේ ඇදහිල්ල
නුඹ සුවකළේයයි කීසේක. ඒ ස්ත්‍රී
ඒ පැයේ පටන් සුවපත්වූවාය.
යේසුස්වහන්සේ මූලාදෑනියාගේ ගෙට 23
ඇතුල්ව, නළාකාරයන්ද ඝෝෂාකරමින්
සිටි සමූහයාද දැක: අහක්වෙයල්ලා. 24
යෞවනී මැරිලා නොව නිදන්නීයයි
කීසේක. එවිට ඔව්හු උන්වහන්සේට
සිනාසුණෝය. නුමුත් සමූහයා පිටකරනු 25
ලැබූ විට උන්වහන්සේ ඇතුල්වී, ඈගේ
අත ඇල්ලූසේක; යෞවනී නැගිට්ටාය. 26
එහි කීර්තිය ඒ රට මුළුල්ලෙහි පතළවිය.

## අන්ධයෝ දෙදෙනා

යේසුස්වහන්සේ එතැනින් යන කල 27
අන්ධයෝ දෙදෙනෙක්: දාවිත්ගේ
පුත්‍රයාණෙනි, අපට කරුණාකළ මැනව
කියා මොරගසමින් උන්වහන්සේ පස්සේ
ගියෝය. උන්වහන්සේ ගෙට පැමිණි කල 28
ඒ අන්ධයෝ උන්වහන්සේ ළඟට
ආවෝය. මට මේක කරන්ට පුළුවන
කියා නුඹලා විශ්වාසකරනවාදැයි
යේසුස්වහන්සේ ඔවුන්ගෙන් ඇසූසේක.
එසේය, ස්වාමිනියි ඔව්හු කීවෝය. එවිට 29
උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අතගා:

නුඹලාගේ විශ්වාසයේ ප්‍රකාරයට
30 නුඹලාට වේවයි කීසේක. ඔවුන්ගේ ඇස්
පැහැදුණේය. කිසිවෙකු ඒ බව දැන-
නොගන්නා හැටියට බලාගනිල්ලායයි
යේසුස්වහන්සේ ඔවුන්ට තදින් අණ-
31 කළසේක. එහෙත් ඔව්හු පිටත්ව ගොස්
උන්වහන්සේගේ කීර්තිය ඒ රට මුළුල්ලෙහි
පතළකළෝය.

## යක්ෂාවේශ ගොළුවා

32 ඔවුන් පිටත්ව යන අතර යක්ෂාවේශවූ
ගොළුවෙක් උන්වහන්සේ වෙතට
33 ගෙනෙනලද්දේය. යක්ෂයා දුරුකරනු
ලැබූ විට ගොළුවා කථාකළේය.
එකල සමූහයෝ මවිතව: මෙබන්දක්
ඉශ්‍රායෙල්හි කිසිකලෙක දකින්ට ලැබුණේ
34 නැතැයි කීවෝය. නුමුත් ඵරිසිවරු: මොහු
යක්ෂයන් දුරුකරන්නේ යක්ෂාධිපතියා
කරණකොටගෙනයයි කීවෝය.
35 යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල
උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය
දේශනාකරමින්ද සියලු ආකාර ලෙඩ
හා සියලු ආකාර රෝග සුවකරමින්ද
සියලු නුවරවලද ගම්වලද ඇවිද්දසේක.

## මිනිසුන් කෙරෙහි ස්වාමීන්-වහන්සේගේ අනුකම්පාව

36 උන්වහන්සේ සමූහයන් දැක, ඔවුන්
එඬේරෙකු නැති බැටළුවන් ලෙස හිරිහැර
විඳිමින් විසිර ගොස් සිටිය බැවින් ඔවුන්
37 කෙරෙහි අනුකම්පාකළසේක. එවිට
උන්වහන්සේ තමන් ගෝලයන්ට
කථාකොට: ගොයම නම් බොහෝය,
නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය.
38 එබැවින් තමන් ගොයම් කැපීමට
ගොවියන් එවන ලෙස ගොයමේ
ස්වාමියාට යාච්ඤාකරපල්ලායයි කීසේක.

## ප්‍රේරිතයන් දෙළොස්දෙනා. ඔවුන්ගේ ධර්මදූත මෙහෙය

10 තවද උන්වහන්සේ තමන්
ගෝලයන් දෙළොස්දෙනා තමන්
ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට
ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ
සහ සියලු ආකාර රෝග සුවකිරීමටද
ඔවුන්ට බලය දුන්සේක.
ප්‍රේරිතයන් දෙළොස්දෙනාගේ නාමවල් 2
මේය: පළමුවෙනුව පේත්‍රුස් නම් ලත්
සීමොන් සහ ඔහුගේ සහෝදරවූ අන්ද්‍රෑය;
සෙබදීගේ පුත්‍රවූ යාකොබ් සහ ඔහුගේ
සහෝදරවූ යොහන්ය; පිලිප් සහ
බර්තොලොමෙව්ය; තෝමස් සහ සුංගම් 3
අයකරන්නා වන මතෙව්ය; අල්පෙවුස්ගේ
පුත්‍රවූ යාකොබ් සහ තද්දියස්ය;
කානානිය සීමොන් සහ උන්වහන්සේව 4
පාවාදුන් යුදස් ඉස්කාරියෝත්ය.
යේසුස්වහන්සේ මේ දෙළොස්දෙනා 5
යවමින් ඔවුන්ට මෙසේ අණකළසේක:
කෙසේද?
අන්‍ය ජාතීන්ගේ කිසි මාවතකට
නොගොස්, සමාරියයන්ගේ කිසි
නුවරකට ඇතුල් නොවී, ඉශ්‍රායෙල් 6
වංශයේ නැතිවූ බැටළුවන් වෙතට
පලයල්ලා. නුඹලා යමින්–ස්වර්ගරාජ්‍යය 7
ළංවී තිබේය කියා දේශනාකරපල්ලා.
රෝගීන් සුවකරපල්ලා, මළවුන් 8
නැඟුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන්
පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා.
නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ
දීපල්ලා. නුඹලාගේ පසුම්බිවල රන්වත් 9
රිදීවත් පිත්තලවත් නොගනිල්ලා. ගමනට 10
මල්ලක්වත් කබා දෙකක්වත් වහන්වත්
සැරයටියක්වත් සපයා නොගනිල්ලා.
මක්නිසාද වැඩකරුවාට තමාගේ කෑම
ලැබෙන්ට යුතුය. නුඹලා කොයි 11
නුවරකට නුමුත් ගමකට නුමුත් ඇතුල්වූ
කල එහි සුදුස්සා කවුදැයි විභාගකොට,
පිටත්ව යන තුරු එහිම නැවතී
සිටපල්ලා. ගෙදරට ඇතුල්වන විට ඊට 12
ආචාරකරපල්ලා. ගෙයි වැසියන් සුදුසු 13
නම්, නුඹලාගේ සමාදනය ඒ පිටට
පැමිණේවා. නුමුත් නුසුදුසු නම් නුඹලාගේ
සමාදනය නැවත නුඹලා කරා
පැමිණේවා. කවරෙක් නුමුත් නුඹලා 14
පිළිගන්නේවත් නුඹලාගේ වචන
අසන්නේවත් නැත්නම්, ඒ ගෙදරින් හෝ
නුවරින් හෝ පිටත්ව යන කල නුඹලාගේ

පාදවල ධූලි ගසාදමාපල්ලා. සැබවක්
15 තුඹලාට කියමි: විනිශ්චය දවසේදී ඒ
නුවරට වඩා සොදෙම් සහ ගොමෝරා
රටට ඉවසීම පහසුවන්නේය.
16 වෘකයන් මැදට බැටළුවන් මෙන් මම
තුඹලා යවමි. එහෙයින් සර්පයන් මෙන්
නුවණ ඇතිව, පරෙවියන් මෙන්
17 අහිංසකව සිටපල්ලා. නුමුත් මනුෂ්‍යයන්-
ගෙන් ප්‍රවේසම්වෙයල්ලා. මක්නිසාද
ඔවුන් තුඹලා මන්ත්‍රණසභාවලට පාවාදී,
ඔවුන්ගේ සිනගෝගවලදී තුඹලාට
18 තළනවා ඇත; ඔවුන්ටද අන්‍ය ජාතීන්ටද
සාක්ෂියක් පිණිස තුඹලා මා නිසා
ආණ්ඩුකාරයන්ද රජුන්ද ඉදිරියට
19 ගෙනයනු ලබනවා ඇත. නුමුත් ඔවුන්
තුඹලා පාවාදෙන කල, තුඹලා කථා-
කරන්නේ කෙසේද, කුමක්දැයි සිතා
20 කනගාටු නොවෙල්ලා. මක්නිසාද තුඹලා
විසින් කිය යුතු දේ ඒ පැයේදී
තුඹලාට දෙනු ලබන්නේය. මක්නිසාද
කථාකරන්නේ තුඹලා නොව තුඹලා
තුළ කථාකරන තුඹලාගේ පියාණන්ගේ
21 ආත්මයාණෝය. තවද සහෝදරයා
සහෝදරයාද පියා තමාගේ දරුවාද
මරණයට පාවාදෙන්නෝය. දරුවෝද
මවුපියන්ට විරුද්ධව නැගිට ඔවුන්
22 මරණයට පත්කරවන්නෝය. තුඹලා
මාගේ නාමය නිසා සියල්ලන් විසින්
වෛරකරනු ලබන්නහුය. නුමුත් අන්තිම
දක්වා ස්ථිරව සිටින්නාම ගැළවෙන්නේය.
23 ඔවුන් එක් නුවරකදී තුඹලාට පීඩාකරන
කල ඊළඟ නුවරට දුවපල්ලා. මක්නිසාද
සැබවක් තුඹලාට කියමි: මනුෂ්‍ය පුත්‍රයා
එනතෙක් තුඹලා ඉශ්‍රායෙල්ගේ
සියලු නුවරවල ඇවිද කෙළවර
නොකරන්නහුය.

## ගෝලකමට වුවමනා කාරණා

24 ගෝලයෙක් තමාගේ ගුරුවරයාටවත්
දසයෙක් තමාගේ ස්වාමියාටවත් උතුම්
25 නැත. ගෝලයා තමාගේ ගුරුවරයා
මෙන්ද දසයා තමාගේ ස්වාමියා මෙන්ද
වුණොත් ඔවුන්ට ඇත. ඔව්හු ගෙයි
ස්වාමියාට බෙල්සෙබුබ්යයි කීවෝ නම්
ඔහුගේ ගෙයි වැසියන්ට කොපමණ
26 වැඩියෙන් නොකියත්ද! එබැවින් ඔවුන්ට
භය නොවෙල්ලා. මක්නිසාද ප්‍රකාශ
නොවන්නාවූ වැසී තිබෙන දෙයක්වත්
දැනගනු නොලබන්නාවූ සැඟවී
තිබෙන දෙයක්වත් නැත. මා විසින් 27
තුඹලාට අඳුරේදී කියන දේ තුඹලා
එළියේදී කියාපල්ලා. තුඹලාගේ කනට
රහසේ ඇසෙන දේ ගෙවල් උඩදී
ප්‍රකාශකරපල්ලා. ශරීරය නසන නුමුත් 28
ආත්මය නසන්ට නුපුළුවන්වූ අයවලුන්ට
භය නොවෙල්ලා. එහෙත් ආත්මයද
ශරීරයද නිරයෙහි විනාශකරන්ට පුළුවන්
තැනන්වහන්සේටම භයවෙයල්ලා.
ගේකුරුල්ලන් දෙදෙනෙකු ශතයකට 29
නොවිකුණද්ද? එහෙත් උන්ගෙන්
එකෙක්වත් තුඹලාගේ පියාණන්වහන්සේ
නොදැනුවත්ව බිම වැටෙන්නේ නැත.
තුඹලාගේ සියලු හිසකේ පවා ගණන්- 30
කර තිබේ. එබැවින් භයනොවෙල්ලා; 31
තුඹලා බොහෝ ගේකුරුල්ලන්ට වඩා
වටින්නහුය. එබැවින් මනුෂ්‍යයන් 32
ඉදිරියෙහිදී: ඔහු අඳුනමියි මා ගැන
කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින
මාගේ පියාණන්වහන්සේ ඉදිරියෙහිදී
මමත්: ඔහු අඳුනමියි කියන්නෙමි. නුමුත් 33
මනුෂ්‍යයන් ඉදිරියෙහිදී: ඔහු නාඳුනමියි
මා ගැන කියන යමෙක් ඇද්ද,
ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්-
වහන්සේ ඉදිරියෙහිදී මමත්: ඔහු
නාඳුනමියි කියන්නෙමි.
පොළොවෙහි සමාදනය දෙන්ට මම 34
ආවෙමියි නොසිතල්ලා. සමාදනය නොව
කඩුවක් දෙන්ට ආවෙමි. මක්නිසාද 35
මනුෂ්‍යයෙකු තමාගේ පියා සමගද දුව
ඇගේ මවු සමගද යෙහෙළී ඇගේ නැන්ද
සමගද භේදකරවන පිණිස ආවෙමි.
මනුෂ්‍යයෙකුගේ සතුරෝ නම් ඔහුගේම 36
ගෙයි වැසියෝය. මට වඩා පියාටවත් 37
මවුටවත් ප්‍රේමකරන්නා මට සුදුසු
නොවේ; මට වඩා පුතාටවත් දුවටවත්
ප්‍රේමකරන්නා මට සුදුසු නොවේ.
තමාගේ කුරුසිය රැගෙන මා අනුව 38
නොඑන තැනැත්තා මට සුදුසු නොවේ.
තමාගේ *ජීවිතය ආරක්ෂා කරගන්නාට 39
ඒක නැතිවේ; මා නිසා තමාගේ *ජීවිතය
නැතිකරගන්නාට ඒක සම්බවේ.

*හෙවත්, ප්‍රාණය

40 තුඹලා පිළිගන්නා මා පිළිගන්නේය,
මා පිළිගන්නා මා එවූ තැනන්වහන්සේ
41 පිළිගන්නේය. අනාගතවක්තෘ කෙනෙක්
නිසාම අනාගතවක්තෘ කෙනෙකු
පිළිගන්නාට අනාගතවක්තෘ කෙනෙකුගේ
විපාකය ලැබේ; ධර්මිෂ්ඨයෙක්
නිසාම ධර්මිෂ්ඨයෙකු පිළිගන්නාට
42 ධර්මිෂ්ඨයෙකුගේ විපාකය ලැබේ. යමෙක්
ගෝලයෙකු නිසා මේ කුඩා අයවලුන්ගෙන්
එක්කෙනෙකුට ඇල්වතුර කෝප්පයක්
පමණවත් බොන්ට දෙන්නේ නම් ඔහුගේ
විපාකය කිසිසේත් නැති නොවන්නේයයි
සැබවින් තුඹලාට කියමියි කීසේක.

11 යේසුස්වහන්සේ තමන් ගෝලයන්
දෙළොස්දෙනාට අණකොට නිමකළ
පසු එතැනින් පිටත්ව, ඔවුන්ගේ නුවරවල
උගන්වන්ටද දේශනාකරන්ටද ගියසේක.

## *යොහන් බව්තීස්ත

2 යොහන් ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියා
ගැන හිරගෙයිදී අසා: එන්නාවූ තැනැත්තේ
3 ඔබද? නොහොත් අපි වෙන කෙනෙකු
බලා සිටිමුදැයි තමාගේ ගෝලයන්
යවා උන්වහන්සේගෙන් විචාළේය.
4 යේසුස්වහන්සේ උත්තරදෙමින්: තුඹලා
අසන දකින දේ තුඹලා ගොස් යොහන්ට
5 දන්වාපල්ලා. අන්ධයෝ පෙනීම ලබති,
කොරු ඇවිදිති, කුෂ්ඨ රෝගීහු පවිත්‍ර
කරනු ලබති, බිහිරන්ට ඇසෙයි, මළාහු
නැගුටුවනු ලබති, දිළිඳුන්ට ශුභාරංචිය
6 ප්‍රකාශකරනු ලැබේ. මා ගැන පැකිළීමේ
හේතුවක් යමෙකුට නොවන්නේද ඔහු
ආශීර්වාදලද්දෙකැයි ඔවුන්ට කීසේක.
7 ඔවුන් යද්දී යේසුස්වහන්සේ යොහන්
ගැන සමූහයන්ට කථාකරන්ට
පටන්ගෙන: තුඹලා කුමක් බලන්ට
වනයට ගියහුද? සුළඟින් සෙලවෙන බට
8 ගසක්ද? තුමූත් කුමක් බලන්ට ගියහුද?
සිහින් වස්ත්‍ර පැළඳගත් මනුෂ්‍යයෙක්ද?
බලව, සිහින් වස්ත්‍ර අඳින්නෝ රජගෙවල
9 සිටිති. තුමූත් කුමකට පිටත්ව ගියහුද?
අනාගතවක්තෘ කෙනෙකු බලන්ටද?
එසේය, තුඹලාට කියමි: අනාගතවක්තෘ
කෙනෙකුටත් වඩා බොහෝ උතුම්
10 කෙනෙක්ය. මක්නිසාද—

මෙන්න, මම මාගේ දූතයා තුඹට
පෙරටුව යවමි,
ඔහු තුඹ ඉදිරියෙහි තුඹේ මාර්ගය
සාදන්නේයයි

ලියා තිබෙන්නේ මොහු ගැනය. සැබවක් 11
තුඹලාට කියමි: ස්ත්‍රීන්ගෙන් උපන්නවුන්
අතරෙන් *යොහන් බව්තීස්තට වඩා උතුම්
කෙනෙක් නොනැගුටුණේය. තුමූත්
ස්වර්ගරාජ්‍යයෙහි කුඩා තැනැත්තේ ඔහුට
වඩා උතුම්ය. යොහන් බව්තීස්තගේ 12
දවස්වල පටන් මේ දක්වා ස්වර්ග-
රාජ්‍යය බලාත්කාරයෙන් ගනු
ලැබේ, බලාත්කාරකරන්නෝ ඒක
බලයෙන් අල්ලාගනිති. මක්නිසාද සියලු 13
අනාගතවක්තෘවරුද ව්‍යවස්ථාවද
යොහන් දක්වා අනාගතවාක්‍ය
කීවෝය. තුඹලා පිළිගන්ට කැමති නම් 14
එන්ට සිටින එලියා මොහුය. ඇසීමට 15
කන් ඇත්තේ අසාවා. තුමූත් මේ 16
පරම්පරාව කුමකට සමානකරම්ද? අපි
තුඹලාට නළා පිම්බෙමුව, තුඹලා
නැටුවේ නැත; තුඹලාට විලාපකීමුව, 17
තුඹලා ඇඬුවේ නැතැයි වෙළඳම්පළවල
හිඳ තමුන්ගේ යහළුවන්ට හඬගසා
කියන්නාවූ ළමයින්ට සමානය.
මක්නිසාද යොහන් කමින් බොමින් 18
නාවේය, එබැවින් ඔහු යක්ෂාවේශවූ
කෙනෙකැයි ඔව්හු කියති. මනුෂ්‍ය පුත්‍රයා 19
කමින් බොමින් ආවේය, බලව,
කෑදර මනුෂ්‍යයෙක්ය, මුද්‍රිකපානය
බොන්නෙක්ය, සුංගම් අයකරන්නන්ගෙත්
පව්කාරයන්ගෙත් මිත්‍රයෙක්යයි ඔව්හු
කියති. එහෙත් ප්‍රඥව නිදෙස් බව ඈගේ
ක්‍රියාවලින් ඔප්පුවී තිබේයයි කීසේක.

## පශ්චාත්තාප නුවූ නගරවල් ගැන තර්ජන ප්‍රකාශය

එකල උන්වහන්සේගේ බලවත් 20
ක්‍රියාවලින් බොහොමයක් කරන්ට
යෙදුණු නුවරවල් පසුතැවිලි නුවූ බැවින්
ඒවාට වරද තබන්ට පටන්ගෙන:
කොරාශීන්, තිට දුක්වේ! බෙත්සයිද, තිට 21
දුක්වේ! තොප ඇතුළේ කරනලද

*හෙවත්, අවගාහක යොහන්.

*අවගාහක යොහන්ට.

ආශ්චර්ය ක්‍රියා තීර් හා සීදෙන් ඇතුළේ
කරනලද්දේ නම්, ඒ නුවරවල් බොහෝ
ඉහතදී ගෝණි රෙදි ඇඳ අලුයෙහි ඉඳ
22 පසුතැවිල්ලට පැමිණෙනවා ඇත. එසේවී
නුමුත් විනිශ්චය දවසේදී තොපට වඩා
තීර්ට සහ සීදෙන්ට ඉවසන්ට පහසු-
23 වන්නේයයි කියමි. එම්බා කපර්ණවුම,
තී ස්වර්ගය දක්වා උසස්කරනු ලබන්නීද?
තී *පාතාලය දක්වා පහළට හෙළනු
ලබන්නීය. තී ඇතුළේ කරනලද ආශ්චර්ය
ක්‍රියා සොදෙම් ඇතුළේ කරන ලද්දේ
නම්, අද දක්වා ඒක පවතිනවා ඇත.
24 එසේවීනුමුත් විනිශ්චය දවසේදී තිට
වඩා සොදෙම් රටට ඉවසන්ට පහසු-
වන්නේයයි කියමියි කීසේක.

## ළදරු ගතිය

25 ඒ ප්‍රස්තාවේදී යේසුස්වහන්සේ
උත්තරදෙමින් කියනසේක්: ස්වර්ගයටත්
පොළොවටත් ස්වාමිවූ පියාණෙනි,
ඔබවහන්සේ ප්‍රඥවන්තයන්ගෙන්ද තේරුම්
ඇත්තන්ගෙන්ද මේ කාරණා සඟවා
ළදරුවන්ට එළිදරව්කළ බැවින් ඔබට
26 ස්තුතිකරමි. එසේය, පියාණෙනි,
මක්නිසාද එය ඔබගේ ඇස් හමුයෙහි
ප්‍රසන්නදයක විය.

## යේසුස්වහන්සේගේ විශේෂ මෙහෙය

27 මාගේ පියාණන්වහන්සේ විසින් සියල්ල
මට භාරදෙනලද්දේය. පියාණන්වහන්සේ
මිස අන් කිසිවෙක් පුත්‍රයා හඳුනන්නේ
නැත; පුත්‍රයාත් පුත්‍රයා විසින් යමෙකුට
පියාණන්වහන්සේ එළිදරව්කරන්ට
සතුටුවන්නේද ඔහුත් හැර අන් කිසිවෙක්
පියාණන්වහන්සේ හඳුනන්නේ නැත.
28 වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ
සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම
29 නුඹලාට සහනය දෙමි. මම සිතින්
මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ
වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන්

*ග්‍රීක්: හේදීස.

ඉගෙනගනිල්ලා. එවිට නුඹලාගේ
ආත්මවලට සහනය ලැබෙන්නේය.
මක්නිසාද මාගේ වියගහ පහසුය, මාගේ 30
බරද සැහැල්ලුයයි කීසේක.

## සබත් දින ගැන විවාදය

12 එසමයෙහිදී යේසුස්වහන්සේ සබත්
දවසේදී ගොයම් කෙත් මැදින්
ගියසේක; උන්වහන්සේගේ ගෝලයෝ
බඩගිනිව කරල් කඩා කන්ට
පටන්ගත්තෝය. ඵරිසිවරු ඒ දැක: බැලුව 2
මැනව, සබත් දවසේදී කරන්ට යුතු නැති
දෙයක් ඔබගේ ගෝලයෝ කරතියි
කීවෝය. උන්වහන්සේ කථාකොට: දාවිත් 3
තමාටද තමා සමග සිටියවුන්ටද
බඩගිනිවූ කල්හි කළ දේ, එනම්, 4
දෙවියන්වහන්සේගේ ගෘහයට ඇතුල්ව,
පූජකයන්ට පමණක් මිස තමාටවත්
තමා සමග සිටියවුන්ටවත් කන්ට යුතු
නැති පිදීමේ රොටි කෑ බව නුඹලා
කියෙවුවේ නැද්ද? නොහොත් දේව- 5
මාළිගාවෙහි පූජකයන් සබත් දවසේදී
සබත් කඩකොට නිවැරදිව සිටින බව
ව්‍යවස්ථාවෙහි නුඹලා කියවා නැද්ද?
නුමුත් නුඹලාට කියමි: දේවමාළිගාවට 6
වඩා උතුම්වූ කෙනෙක් මෙහි සිටියි.
නුමුත්: මම පූජාවට නොව කරුණාවට 7
කැමැත්තෙමියි යන කීමේ අර්ථය නුඹලා
දැනගෙන සිටියා නම් නිවැරදිකාරයන්
පිට වරද තබන්නේ නැත. මක්නිසාද 8
මනුෂ්‍ය පුත්‍රයා සබත් දවසේ ස්වාමියා-
යයි ඔවුන්ට කීසේක.

## වියළි අතක් ඇති මනුෂ්‍යයෙකුට සුවකිරීම

උන්වහන්සේ එතැනින් පිටත්ව ගොස් 9
ඔවුන්ගේ සිනගෝගයට ඇතුල්වූසේක.
එහි වියළුණු අතක් ඇති මනුෂ්‍යයෙක් 10
සිටියේය. එවිට ඔව්හු උන්වහන්සේට
වරද තබන පිණිස: සබත් දවසේදී
සුවකරන්ට යුතුදැයි උන්වහන්සේගෙන්
ඇසුවෝය. උන්වහන්සේ ඔවුන්ට 11
කථාකොට: නුඹලා අතරෙන් එක

බැටළුවෙක් ඇති කොයි මනුෂ්‍යයෙක්
නුමුත්, ඒකා සබත් දවසේදී වළක
වැටුණොත්, ඌ අල්ලා ගොඩගන්නේ
12 නැද්ද? එසේවී නම් බැටළුවෙකුට වඩා
මනුෂ්‍යයෙක් කොපමණ උතුම්ද? එබැවින්
සබත් දවසේදී යහපත්කම් කරන්ට
13 යුතුයයි ඔවුන්ට කියා–තුඹේ අත
දිගුකරපන්නැයි ඒ මනුෂ්‍යයාට කීසේක.
ඔහු එය දිගු කෙළේය; එවිට ඒක අනික්
අත මෙන් සුවවිය.

## යේසුස්වහන්සේ නසන්ට කුමන්ත්‍රණයක්

14 එවිට ඵරිසිවරු පිටත්ව ගොස්,
උන්වහන්සේ නසන්නේ කෙසේදැයි
උන්වහන්සේට විරුද්ධව මන්ත්‍රණය
15 කළෝය. නුමුත් යේසුස්වහන්සේ ඒ දැන
එතැනින් අහක්ව ගියසේක. බොහෝ
සමූහයෝද උන්වහන්සේ අනුව ගියෝය;
උන්වහන්සේ සියල්ලන්ට සුවකොට,
16 තමන්වහන්සේ ප්‍රසිද්ධ නොකරන
17 ලෙස ඔවුන්ට අණකළසේක. මෙසේ
වූයේ: අනාගතවක්තෘවූ යෙසායා කරණ-
කොටගෙන කියනලද:
18 බලව, මා විසින් තෝරාගත් මාගේ
මෙහෙකරුවූ,
මාගේ ආත්මයට ප්‍රසන්නවූ මාගේ
ප්‍රේමවන්තයා මේය.
මාගේ ආත්මය ඔහු කෙරෙහි
තබන්නෙමි,
ඔහු අන්‍ය ජාතීන්ට විනිශ්චය ප්‍රකාශ
කරන්නේය.
19 ඔහු ඩබරකරන්නේවත්
මොරගසන්නේවත් නැත;
ඔහුගේ හඬද වීථිවල කිසිවෙකුට
නොඇසෙන්නේය.
20 ඔහු විනිශ්චය ජයට පමුණුවන තුරු,
තැළුණු බටලීයක් බිඳින්නේවත්
දුම්නගින පහන් තිරයක් නිවන්නේවත්
නැත.
21 ඔහුගේ නාමය කෙරෙහි අන්‍ය ජාතීහු
බලාපොරොත්තුවන්නෝය
යන කීම සම්පූර්ණ වන පිණිසය.

## යේසුස්වහන්සේ තමන් සාතන්ගේ ආධාරයෙන් ක්‍රියාකරන්නේය යන අපහාසයට පිළිතුරු දීම

එවිට යක්ෂාවේශවූ අන්ධ ගොළුවෙක් 22
උන්වහන්සේ වෙතට ගෙනෙනලද්දේය.
උන්වහන්සේ ඔහුට සුවකළසේක,
එහෙයින් ඒ ගොළුවාට කථාකරන්ටද
දකින්ටද පුළුවන්විය. සියලු සමූහයෝ 23
විස්මපත්වී: මූන්වහන්සේ දාවිත්ගේ
පුත්‍රයාණෝද්දැයි ඇසුවෝය. නුමුත් 24
ඵරිසිවරු ඒ අසා: මොහු යක්ෂාධිපතිවූ
බෙල්සෙබුබ් කරණකොටගෙන මිස වෙන
හැටියකින් යක්ෂයන් දුරු නොකෙරේ-
යයි කීවෝය. උන්වහන්සේ ඔවුන්ගේ 25
සිතිවිලි දැන ඔවුන්ට කථාකොට:
තමාටම විරුද්ධව භේදවුණාවූ හැම
රාජ්‍යයම පාළුවන්නේය; තමාටම
විරුද්ධව භේදවුණාවූ හැම නුවර හෝ
ගෙය නොපවතින්නේය. සාතන් විසින්ම 26
සාතන් දුරුකරයි නම් ඔහු තමාටම
විරුද්ධව භේදව සිටියි; එසේවී නම්
ඔහුගේ රාජ්‍යය පවතින්නේ කොහොමද?
තවද මම බෙල්සෙබුබ් කරණකොටගෙන 27
යක්ෂයන් දුරුකරම් නම්, තුඹලාගේ
පුත්‍රයෝ කවරෙකු කරණකොටගෙන උන්
දුරුකරද්ද? එබැවින් ඔව්හු තුඹලාගේ
විනිශ්චයකාරයෝ වන්නෝය. නුමුත් 28
මම දෙවියන්වහන්සේගේ ආත්මයාණන්
කරණකොටගෙන යක්ෂයන් දුරුකරම්
නම්, සැබවින්ම දෙවියන්වහන්සේගේ
රාජ්‍යය තුඹලා කරා පැමිණ තිබේ.
නොහොත් බලවන්තයා පළමුකොට 29
නොබැඳ, යමෙකුට ඔහුගේ ගෙට වැද
ඔහුගේ වස්තු කොල්ලකන්ට කෙසේ
හැකි වේද? බැඳලාම ඔහුගේ ගෙය
කොල්ලකන්නේය. මාගේ පක්ෂයට 30
නොසිටින්නා මට විරුද්ධය; මා සමග
රැස් නොකරන්නා විසුරුවයි. එබැවින් 31
මම තුඹලාට කියමි: හැම පාපයද දේව
අපහාසයද මනුෂ්‍යයන්ට කමාකරනු
ලබන්නේය; නුමුත් ශුද්ධාත්මයාණන්ට
විරුද්ධවූ අපහාසය කමාකරනු
නොලබන්නේය. යමෙක් මනුෂ්‍ය පුත්‍රයාට 32

විරුද්ධව වචනයක් කියන්නේද, ඒක
ඔහුට කමාකරනු ලබන්නේය; නුමුත්
යමෙක් ශුද්ධාත්මයාණන්ට විරුද්ධව
කථාකරන්නේද, ඒක ඔහුට මේ
ලෝකයේදීවත් මතු පැමිණෙන
ලෝකයේදීවත් කමාකරනු නොලබන්නේය.
33 ගහත් ඒකේ ඵලත් යහපත්යයි පිළි-
ගනිල්ලා; නොහොත් ගහත් ඒකේ ඵලත්
නරකයයි පිළිගනිල්ලා. මක්නිසාද ගහ
ඒකේ ඵලවලින් ඇඳිනගනු ලැබේ.
34 පොළොං වංශය, නපුරුව සිටින නුඹලා
යහපත් දේ කෙසේ කියවුද? මක්නිසාද
සිතේ පූර්ණකමෙන් මුඛය කථාකරයි.
35 යහපත් මනුෂ්‍යයා තමාගේ යහපත්
සම්පතින් යහපත් දේ පිටතට
ගෙනෙන්නේය. නපුරු මනුෂ්‍යයා තමාගේ
නපුරු සම්පතින් නපුරු දේ පිටතට
36 ගෙනෙන්නේය. තවද මනුෂ්‍යයන්
කියන්නාවූ සියලු නිෂ්ඵල වචන ගැන
විනිශ්චය දවසේදී උත්තරදෙන්ට
37 වෙන්නේයයි නුඹලාට කියමි. මක්නිසාද
නුඹේ වචනවලින් නුඹ නිදෙස්කරනු
ලබන්නෙහිය, නුඹේ වචනවලින් නුඹ
වරදට පත්කරනු ලබන්නෙහියයි කීසේක.

## ලකුණක් දක්වන්ට බැරිය කීම

38 එවිට ලියන්නන්ගෙන්ද එරිසි-
වරුන්ගෙන්ද සමහරෙක් උත්තරදෙමින්:
ආචාරීනි, ඔබගෙන් ලකුණක් දකින්ට
39 කැමැත්තෙමුයයි කීවෝය. උන්වහන්සේ
ඔවුන්ට උත්තරදෙමින්: නපුරුවූ
කාමමිථ්‍යාචාරිකවූ පරම්පරාවක් ලකුණක්
සොයයි; නුමුත් අනාගතවක්තෘවූ
යෝනාගේ ලකුණ හැර වෙන ලකුණක්
40 ඔවුන්ට දෙනු නොලබන්නේය. මක්නිසාද
යෝනා මහා මත්ස්‍යයාගේ බඩේ දවහල්
තුනක්ද රෑ තුනක්ද සිටියාක්මෙන් මනුෂ්‍ය
පුත්‍රයාද පොළෝ ගැබේ දවහල් තුනක්ද
41 රෑ තුනක්ද සිටින්නේය. නිනිවයේ
මනුෂ්‍යයෝ මේ පරම්පරාවට විරුද්ධව
විනිශ්චයේදී නැගිට එය වරදට
පත්කරන්නෝය. මක්නිසාද යෝනාගේ
දේශනාකිරීමෙන් ඔව්හු පසුතැවිලිවූවෝය;
බලව, යෝනාට වඩා උතුම් කෙනෙක්
මෙහි සිටියි. දකුණු දික්හි බිසව මේ 42
පරම්පරාවට විරුද්ධව විනිශ්චයේදී
නැගිට එය වරදට පත්කරන්නීය.
මක්නිසාද ඈ සාලමොන්ගේ ප්‍රඥව
අසන පිණිස පොළොවේ සීමාවලින්
ආවාය; බලව, සාලමොන්ට වඩා උතුම්
කෙනෙක් මෙහි සිටියි.

## හරි වෙනස්වීමක් සිදු නොවීමේ අන්තරාය

අපිරිසිදු ආත්මය මනුෂ්‍යයෙකුගෙන් 43
දුරුව ගිය කල්හි, ඔහු දිය නැති තැන්වල
ඇවිදිමින් විශ්‍රාම සොයා නොලැබ: මම 44
පිටත්ව ආ මාගේ ගෙට හැරීයමියි කියයි;
ඔහු එහි පැමිණි කල, ඒ ගෙය හිස්ව,
අතුගා, සරහා තිබෙන බව දකියි. එවිට 45
ඔහු ගොස් තමාට වඩා දුෂ්ටවූ වෙන
ආත්මයන් සත්දෙනෙකු තමා කැටුව
ගෙන එන්නේය, ඔව්හු ඇතුල්ව එහි
වාසයකරති. එසේ ඒ මනුෂ්‍යයාගේ පළමු
ස්වභාවට වඩා අන්තිම ස්වභාව
නපුරුවන්නේය. මේ නපුරු පරම්පරාවටද
එසේම වන්නේයයි කීසේක.

## යේසුස්වහන්සේගේ සැබෑ නෑයෝ

උන්වහන්සේ සමූහයන්ට කථාකරමින් 46
සිටියදීම උන්වහන්සේගේ මෑණියෝද
සහෝදරයෝද උන්වහන්සේ සමග
කථාකරන්ට සොයමින් පිටත සිටියෝය.
එවිට එක්කෙනෙක් උන්වහන්සේට 47
කථාකොට: බැලුව මැනව, ඔබගේ
මෑණියෝද සහෝදරයෝද ඔබ සමග
කථාකරන්ට සොයමින් පිටත සිටිතියි
උන්වහන්සේට කීවේය. එහෙත් 48
උන්වහන්සේ තමන්ට කථාකළ
තැනැත්තාට උත්තරදෙමින්: මාගේ
මෑණියෝ කවුද? මාගේ සහෝදරයෝ
කවුරුදැයි කියා, තමන් ගෝලයන් දෙසට 49
අත දිගුකොට: මෙන්න, මාගේ
මෑණියෝ සහ මාගේ සහෝදරයෝ!

50 මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ
පියාණන්වහන්සේගේ කැමැත්ත කරන
කවුරු නුමුත් මාගේ සහෝදරයාත්
සහෝදරීත් මෑණියොත්යයි කීසේක.

## වපුරන්නාගේ උපමාව

13 ඒ දවසෙහි යේසුස්වහන්සේ
ගෙදරින් පිටත්ව ගොස් මුහුද ළඟ
2 හිඳගත්සේක. බොහෝ සමූහයන්
උන්වහන්සේ වෙතට රැස්වූ බැවින්
උන්වහන්සේ ඔරුවකට නැගී හිඳ-
ගත්සේක; මුළු සමූහයා වෙරළෙහි
3 සිටියෝය. උන්වහන්සේ ඔවුන්ට බොහෝ
කාරණා උපමාවලින් කියනසේක්: බලව,
4 වපුරන්නා වපුරන්ට ගියේය; ඔහු වපුරන
කල්හි සමහර බීජ මග අසල
වැටුණේය, පක්ෂීහු ඇවිත් ඒවා අවුලා
5 කෑවෝය. සමහරක් වඩා පස් නැති ගල්
බිම්වල වැටී, පස් ඝනව නොතිබුණු
6 බැවින් ඒවා වහාම පැළවිය. නුමුත් ඉර
උදවූ කල අව්වෙන් දලා, මුල් නැති
7 බැවින් වියළී ගියේය. අන් සමහරක්
කටු අතරෙහි වැටුණේය; කටු ගස් වැවී
8 ඒවා යටකර දැම්මේය. තවත් සමහරක්
සරු බිමෙහි වැටී, එකෙන් සියයක්ද
එකෙන් සැටක්ද එකෙන් තිහක්ද බැගින්
9 එල දුන්නේය. ඇසීමට කන් ඇත්තේ
අසාවයි කීසේක.

## උපමා කථාවලින් ඉගැන්වීම

10 එවිට ගෝලයෝ ඇවිත්: ඔබවහන්සේ
ඔවුන්ට උපමාවලින් කථාකරන්නේ
11 මක්නිසාදැයි ඇසුවෝය. උන්වහන්සේ
ඔවුන්ට උත්තරදෙමින්: ස්වර්ගරාජ්‍යයේ
රහස් දැනගැනීම තුඹලාට දී තිබේ, නුමුත්
12 ඔවුන්ට දීලා නැත. මක්නිසාද යමෙකුට
ඇත්තේද ඔහුට දෙනු ලැබෙන්නේය,
ඔහුට බොහෝ වන්නේය. නුමුත්
යමෙකුට නැත්තේද ඔහුට ඇති දේත්
13 ඔහුගෙන් ගනු ලබන්නේය. එහෙයින්
ඔවුන් දකිමින්ම නොදක්නා නිසාද
අසමින්ම නොඅසන නිසාද තේරුම්
නොගන්නා නිසාද ඔවුන්ට උපමාවලින්
කථාකරමි. තවද යෙසායාගේ අනාගත 14
වචනය ඔවුන් කෙරෙහි සම්පූර්ණවේ,
එනම්:
ඇසීමෙන් තුඹලා අසන නුමුත්
කිසිසේත් තේරුම් නොගන්නහුය;
බලමින්ම සිටින නුමුත් තුඹලා
කිසිසේත් නොපැහැදෙන්නහුය.
මක්නිසාද යම් හෙයකින් තමුන්ගේ 15
ඇස්වලින් නොදැක,
කන්වලින් නොඅසා,
සිතින් තේරුම් නොගෙන,
නොහැරී,
මා විසින් ඔවුන්ට සුව නොකරන
පිණිස,
මේ සෙනඟගේ සිත් දැඩිව තිබේ,
ඔවුන්ගේ කන් හොඳට නෑසී,
ඔවුන්ගේ ඇස් පියාගන සිටිතියි
යනුයි.
නුමුත් පෙනෙන නිසා තුඹලාගේ 16
ඇස්ද ඇසෙන නිසා තුඹලාගේ
කන්ද වාසනාවන්තය. මක්නිසාද 17
සැබවක් තුඹලාට කියමි: බොහෝ
අනාගතවක්තෘවරුන්ද ධර්මිෂ්ඨයන්ද
තුඹලා දකින දේ දකින්ටත් තුඹලා
අසන දේ අසන්ටත් ආශාවූ නුමුත් ඒවා
දුටුවේවත් ඇසුවේවත් නැත.

## වපුරන්නාගේ උපමාව තෝරාදීම

එබැවින් වපුරන්නාගේ උපමාව 18
අසාපල්ලා. යමෙක් රාජ්‍යයේ වචනය 19
අසා තේරුම් නොගන්නේද, ඔහුගේ සිතේ
වපුළ දේ නපුරා ඇවිත් උදුරාගන්නේය.
මග අසල වපුරනලද්දේ නම් මොහුය.
ගල් බිම්වල වපුරනලද්දේ නම්, වචනය 20
අසා එකෙණෙහිම සන්තෝෂයෙන්
පිළිගන්න තැනැත්තාය; එහෙත් තමා 21
තුළ මුල් නැති බැවින්, ඔහු මඳ කලක්
පැවත, වචනය නිසා හිංසාවක් හෝ
පීඩාවක් හෝ පැමිණි කෙණෙහිම
බාධාවන්නේය. කටු අතරෙහි 22
වපුරන ලද්දේ නම්, වචනය අසා,
ලෝකය ගැන වෙහෙසීමෙන්ද වස්තුවේ

රැවට්ටිලිකාරකමෙන්ද වචනය යටවීමෙන්
23 ඵල නොදරන තැනැත්තාය. සරු බිමෙහි
වපුරනලද්දේ නම්, වචනය අසා
තේරුම්ගෙන, ඵලද දරන තැනැත්තාය;
එක්කෙනෙක් සියයක්ද එක්කෙනෙක්
සැටක්ද එක්කෙනෙක් තිහක්ද බැගින්
ඵල දෙන්නේයයි කීසේක.

## කිරිදි ගැන උපමාව

24 උන්වහන්සේ තවත් උපමාවක් ඔවුන්
ඉදිරියෙහි දක්වමින්: තමාගේ කෙතෙහි
හොඳ බීජ වපුළ මනුෂ්‍යයෙකුට
ස්වර්ගරාජ්‍යය සමානකරනු ලැබේ.
25 මනුෂ්‍යයන් නිදසිටියදී ඔහුගේ සතුරා
ඇවිත් තිරිඟු අතරේ කිරිදි වපුරා ගියේය.
26 කොළ වැඩී කරල් හටගත් කල කිරිදිත්
27 පෙනුණේය. එවිට ගෙදර ස්වාමියාගේ
දසයෝ ඇවිත්: ස්වාමිනි, ඔබගේ කෙතෙහි
ඔබ හොඳ බීජ වපුළා නොවේද? එසේවී
නම් කිරිදි කොයින්දැයි ඔහුට කීවෝය.
28 සතුරෙක් මේක කරලා තිබේයයි ඔහු
කීවේය. එවිට දසයෝ කථාකොට:
එසේවී නම් අප ගොස් ඒවා
උදුරාදමනවාට ඔබ කැමතිදැයි
29 ඔහුගෙන් ඇසුවෝය. එහෙත් ඔහු
උත්තරදෙමින්: එසේ නොකරල්ලා;
නුඹලා කිරිදි උදුරන කල තිරිඟුත් ඒ
30 සමග ඉදිරෙන්ට පුළුවන. කපන කාලය
දක්වා දෙවගේම එකට වැඩෙන්ට
ඇරපල්ලා. කපන කාලයේදී–පළමුකොට
කිරිදි එකතුකර දවන පිණිස මිටි
බැඳපල්ලා. තුමුත් තිරිඟු මාගේ
අටුවෙහි රැස්කරපල්ලායයි කපන්නන්ට
කියන්නෙමියි කීවේයයි කීසේක.

## අබ ඇටයේ උපමාව සහ මුහුන් උපමාව

31 උන්වහන්සේ තවත් උපමාවක් ඔවුන්
ඉදිරියේ දක්වමින්: මනුෂ්‍යයෙකු විසින්
අරගෙන තමාගේ කෙතෙහි වපුළ අබ
32 ඇටයකට ස්වර්ගරාජ්‍යය සමානය. ඒක
සියලුම බීජවලට වඩා කුඩා නුමුත්
වැඩුණු කල පළාගස්වලට වඩා මහත්ව,
ආකාශ පක්ෂීන් ඇවිත් එහි අතුවල
ලගින තරම් ගසක් වන්නේයයි කීසේක.
උන්වහන්සේ තවත් උපමාවක් කියන- 33
සේක්: ස්ත්‍රියෙකු විසින් පිටි නැළි තුනක්
සහමුලින්ම පිපෙන තුරු එහි දමා තිබූ
මුහුන්වලට ස්වර්ගරාජ්‍යය සමානයයි
කීසේක.
යේසුස්වහන්සේ මේ සියල්ල සමූහයන්ට 34
උපමාවලින් කථාකළසේක; උපමාවක්
නැතුව කිසිවක් ඔවුන්ට කථානොකළ-
සේක. මෙසේ වූයේ– 35
උපමාවලින් මාගේ මුඛය අරින්නෙමි;
ලෝකයේ පටන්ගැන්මේ සිට සැඟවී
තිබුණු කාරණා ප්‍රකාශකරන්නෙමියි
අනාගතවක්තෘහු කරණකොටගෙන
කියනලද කාරණා සම්පූර්ණ වන පිණිසය.

## කිරිදි උපමාව තෝරාදීම

එවිට උන්වහන්සේ සමූහයන් යන්ට 36
හැර ගෙට ගියසේක. ගෝලයෝ
උන්වහන්සේ ළඟට ඇවිත්: කෙතේ
කිරිදිවල උපමාව අපට තෝරාදුන
මැනවයි කීවෝය. උන්වහන්සේ 37
උත්තරදෙමින්: හොඳ බීජ වපුරන
තැනැත්තේ නම් මනුෂ්‍ය පුත්‍රයාය; කෙත 38
නම් ලෝකයය; හොඳ බීජ නම් රාජ්‍යයේ
පුත්‍රයෝය; කිරිදි නම් නපුරාගේ පුත්‍රයෝය;
ඒවා වපුළ සතුරා නම් යක්ෂයාය. කපන 39
කාලය නම් ලෝකාන්තිමයය; කපන්නෝ
නම් දේවදූතයෝය. එබැවින් කිරිදි 40
එක්කොට ගින්නෙන් දවන්නාක් මෙන්
ලෝකාන්තිමයේදී වන්නේය. මනුෂ්‍ය 41
පුත්‍රයා තමන් දූතයන් එවනසේක, ඔව්හු
බාධා උපදවන සියල්ලද අයුතුකම්
කරන්නන්ද උන්වහන්සේගේ රාජ්‍යයෙන්
එක්කොට, ගිනි උදුනෙහි හෙළන්නෝය. 42
එහිදී හැඬීමද දත්මිටිකෑමද වන්නේය.
එකල ධර්මිෂ්ඨයෝ තමුන්ගේ 43
පියාණන්ගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන්
බබළන්නෝය. ඇසීමට කන් ඇත්තේ
අසාවා.

## නිධානයේද මුතුඇටයේද දැලේද උපමා

44 කෙතෙහි සඟවා තිබුණු වස්තුවකට
ස්වර්ගරාජ්‍යය සමානය; මනුෂ්‍යයෙකුට
ඒක සම්බවිය; ඔහු ඒක සඟවාතබා, ඒ
ගැන සන්තෝෂයෙන් ගොස්, තමා
සන්තක සියල්ල විකුණා ඒ කෙත මිලදී
ගන්නේය.
45 තවද හොඳ මුතු සොයන්නාවූ
වෙළෙන්දෙකුට ස්වර්ගරාජ්‍යය සමානය.
46 ඉතා අනර්ඝවූ එක මුතු ඇටයක් ඔහුට
සම්බවී, ඔහු ගොස් තමා සන්තක සියල්ල
විකුණා ඒක මිලදී ගත්තේය.
47 තවද මුහුදේ හෙළුවාවූද සියලු වර්ගවල
මසුන් අසුවුණාවූද දැලකට ස්වර්ග
48 රාජ්‍යය සමානය. ඒ දැල පිරුණු
කල ඔව්හු එය වෙරළට ඇද
හිඳගෙන, හොඳවුන් භාජනවල
එකතුකොට, නරකවුන් අහකදැමුවෝය.
49 ලෝකාන්තිමයේදී එසේම වන්නේය.
දේවදූතයෝ නික්ම ඇවිත්, ධර්මිෂ්ඨයන්
50 කෙරෙන් දුෂ්ටයන් වෙන්කොට, ගිනි
උදුනෙහි හෙළන්නෝය. එහි හැඬීමද
දත්මිටිකෑමද වන්නේය.
51 තුඹලා මේ සියල්ල තේරුම්ගත්තහු-
දැයි ඇසූසේක. එසේයයි ඔව්හු උන්-
52 වහන්සේට කීවෝය. එවිට උන්වහන්සේ
ඔවුන්ට කථාකොට: එහෙයින් ස්වර්ග
රාජ්‍යය සඳහා ගෝලයෙක් වී සිටින
යම් ලියන්නෙක් ඇද්ද, ඔහු තමාගේ
ගබඩාවෙන් අලුත් දේත් පරණ
දේත් පිටතට ගෙනෙන්නාවූ ගෙදර
ස්වාමියෙකුට සමානයයි කීසේක.

## නාසරෙත්හිදී යේසුස්වහන්සේ සුළුකරනු ලැබීම

53 තවද යේසුස්වහන්සේ මේ උපමා කියා
නිමකළායින් පසු එතැනින් පිටත්ව
54 ගියසේක. උන්වහන්සේ තමන්ගේ රටට
පැමිණ, ඔවුන්ගේ සිනගෝගයෙහිදී
ඔවුන්ට ඉගැන්වූසේක. ඔව්හු විස්මපත්ව:
මොහුට මේ ප්‍රඥාව සහ බලවත් ක්‍රියා
55 කොයින්ද? මොහු වඩුවාගේ පුත්‍රයා
නොවේද? මොහුගේ මවුගේ නම මරියා
නොවේද? මොහුගේ සහෝදරයෝ
යාකොබ්, යෝසෙප්, සීමොන් සහ
යූදස් නොවෙද්ද? මොහුගේ සියලු 56
සහෝදරියෝත් අප අතරෙහි නොවෙද්ද?
එසේවී නම් මේ සියල්ල මොහුට
කොයින්ද කියා, උන්වහන්සේ ගැන 57
බාධාවූවෝය. නුමුත් යේසුස්වහන්සේ
කථාකොට: අනාගතවක්තෘ කෙනෙක්
තමාගේම රටේදීත් තමාගේම ගෙදරදීත්
හැර ගෞරව නැතුව නොසිටින්නේයයි
ඔවුන්ට කීසේක. ඔවුන්ගේ ඇදහිලි 58
නැතිකම නිසා උන්වහන්සේ එහිදී
බොහෝ ආශ්චර්යයන් නොකළසේක.

## *යොහන් බව්තීස්තගේ මරණය

14 එසමයෙහිදී දේශාධිපතිවූ
හෙරොද් යේසුස්වහන්සේගේ
කීර්තිය ගැන අසා: මොහු †යොහන්
බව්තීස්තය; ඔහු මළවුන්ගෙන් නැගිට 2
සිටියි. ඒ නිසා ඔහු තුළ මේ
බලපරාක්‍රම ක්‍රියාකරන්නේයයි තමාගේ
මෙහෙකරුවන්ට කීවේය. මක්නිසාද 3
හෙරොද් තමාගේ සහෝදරයා වන
පිලිප්ගේ භාර්යාවවූ හෙරෝදියස් නිසා
යොහන් අල්වා බැඳ හිරගෙයි දමා
තිබුණේය. මෙසේ කළේ: ඈ තබාගැන්ම 4
තුඹට යුතු නැතැයි යොහන් ඔහුට කී
නිසාය. ඔහු යොහන් මරන්ට 5
කැමතිව සිටි නුමුත්, යොහන්
අනාගතවක්තෘ කෙනෙකු කොට සෙනඟ
සැලකූ නිසා ඔවුන්ට භයව සිටියේය.
නුමුත් හෙරොද්ගේ උපන් දවස පැමිණි 6
කල හෙරෝදියස්ගේ දුව පිරිස මැද
නටා හෙරොද් ප්‍රසන්නකළාය. එහෙයින් 7
ඈ ඉල්ලන මොන දෙයක් නුමුත් ඈට
දෙන්ට දිවුරුමකින් ඔහු පොරොන්දු-
වූයේය. ඈද තමාගේ මවු විසින් 8
පොළඹවනු ලැබ: *යොහන් බව්තීස්තගේ
හිස තැටියක ලා මෙහිදී මට දුන
මැනවැයි කීවාය. එවිට රජ ශෝකවූයේය;

*අවගාහක යොහන්ගේ.
†අවගාහක යොහන්ය.

9 එහෙත් තමාගේ දිවුරුම් නිසාත්, තමා
සමග කමින් උන්නවුන් නිසාත්, ඔහු
10 ඒක දෙන්ට ආඥකොට, කෙනෙකු
යවා හිරගෙයිදී යොහන්ගේ හිස
11 කැප්පෙවුවේය. ඔහුගේ හිස තැටියක
ලා ගෙනවුත් තරුණියට දෙනලද්දේය.
ඈද ඒක ඈගේ මවු ළඟට ගෙනගියාය.
12 ඔහුගේ ගෝලයෝ ඇවිත් මිනිය රැගෙන,
ඔහු තැන්පත් කොට, පසුව ගොස්
යේසුස්වහන්සේට දැන්වූහ.

## පන්දහසකට කන්ට දීම

13 යේසුස්වහන්සේ ඒ අසා එයින් පිටත්ව,
ඔරුවකින් කාන්තාර ස්ථානයකට
වෙන්ව ගියසේක. සමූහයෝ ඒ අසා
නුවරවලින් පිටත්ව ඇවිත් උන්වහන්සේ
14 පස්සේ පයින් ගියෝය. උන්වහන්සේ
නික්මවිත්, මහත් සමූහයක් දැක, ඔවුන්
කෙරෙහි අනුකම්පාවී, ඔවුන්ගේ රෝගීන්
15 සුවකළසේක. සවස්වූ කල ගෝලයෝ
උන්වහන්සේ ළඟට ඇවිත්: මේක
කාන්තාර ස්ථානයක්ය, දැන් වේලාවද
ඉක්මගොස් තිබේ; සමූහයා ගම්වලට
ගොස් තමුන්ට කෑම මිලදී ගන්නා පිණිස
ඔවුන් යන්ට හැරිය මැනවයි කීවෝය.
16 ඔවුන් යන්ට කමක් නැත; තුඹලා ඔවුන්ට
කන්ට දීපල්ලායයි යේසුස්වහන්සේ
17 ඔවුන්ට කීසේක. ඔව්හුද: අපට මෙහි
තිබෙන්නේ රොටි පහකුත් මසුන්
දෙදෙනෙකුත් පමණක්යයි උන්වහන්සේට
18 කීවෝය. ඒවා මෙහි මා වෙතට
ගෙනෙල්ලායයි උන්වහන්සේ කීසේක.
19 උන්වහන්සේ සමූහයාට තණකොළ පිට
හිඳගන්ට අණකොට, රොටි පහත් මසුන්
දෙදෙනත් රැගෙන, ස්වර්ගය දෙස
බලා ආශීර්වාදකොට, රොටි කඩා
ගෝලයන්ට දුන්සේක, ගෝලයෝද
20 සමූහයන්ට දුන්නෝය. සියල්ලෝම කා
තෘප්තියට පැමිණියෝය. ඔව්හු කෑඩූ
කැබෙලිවලින් ඉතිරි ඒවා එක්කොට පැස්
21 දෙළොසක් පුරවාගත්තෝය. ස්ත්‍රීන්ද
දරුවන්ද හැර කෑවාවූ පුරුෂයෝ
පන්දහසක් පමණ වූහ.

## මුහුද පිට පයින් යෑම

එකෙණෙහිම උන්වහන්සේ සමූහයන් 22
අරින තෙක්, ඔරුවට නැගී තමන්ට
පළමුවෙන් එගොඩට යන්ට ගෝලයන්ට
බලකළසේක. උන්වහන්සේ සමූහයන් 23
යැවූ පසු, යාච්ඤකරන පිණිස වෙන්ව
කන්දට ගියසේක. සවස් වූ කල්හි
උන්වහන්සේ එහි තනියම සිටිසේක.
එහෙත් හුළඟ ඉදිරියට ගැසූ බැවින්, 24
ඔරුව එවේලෙහි රැළවලින් සෙලවී
සෙලවී මුහුද මැද තිබුණේය. රෑ 25
සතරවෙනි යාමයේදී උන්වහන්සේ ඔවුන්
වෙතට මුහුද පිට පයින් ආසේක.
ගෝලයෝ උන්වහන්සේ මුහුද පිට පයින් 26
එනවා දැක, කැලඹී: ඒ අවතාරයක්යයි
කියා භයින් මොරගැසුවෝය. එහෙත් 27
යේසුස්වහන්සේ එකෙණෙහිම ඔවුන්ට
කථාකොට: ධෛර්යවත් වෙයල්ලා;
මමය; භය නොවෙල්ලායයි කීසේක.
පේත්‍රුස් උන්වහන්සේට උත්තරදෙමින්: 28
ස්වාමිනි, ඒ ඔබවහන්සේ නම්, වතුර
පිට ඔබ වෙතට එන්ට මට අණකළ
මැනවයි කීවේය. වරෙන්නැයි උන්වහන්සේ 29
කීසේක. එවිට පේත්‍රුස් ඔරුවෙන් බැස,
යේසුස්වහන්සේ වෙතට යන පිණිස
වතුරු පිට පයින් ගියේය. නුමුත් ඔහු 30
හුළඟ දැක භයවී, ගිලෙන්ට පටන්ගෙන:
ස්වාමිනි, මා ගැළෙවුව මැනවයි
මොරගැසුවේය. එකෙණෙහිම යේසුස්- 31
වහන්සේ අත දිගුකොට ඔහු අල්ලාගෙන:
ඇදහිලි මඳ තැනැත්ත, කුමක් නිසා
සැකවූයෙහිදැයි කීසේක. ඔවුන් ඔරුවට 32
නැගුණු කල හුළඟ නැවතුණේය. එවිට 33
ඔරුවේ සිටි අය: ඒකාන්තයෙන්ම ඔබ
දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය කියා
උන්වහන්සේට නමස්කාරකළෝය.
ඔව්හු එගොඩවී, ගෙන්නෙසරෙත් නම් 34
රටට පැමිණියෝය. ඒ රටේ මනුෂ්‍යයෝ 35
උන්වහන්සේ ඇඳින, එහි වටකර මුළු
රටට කියා ඇර, සියලු රෝගීන්
උන්වහන්සේ වෙතට ගෙන්වා,
උන්වහන්සේගේ සළුවේ දවල්ලටවත් 36
අතගසන්ට ඔවුන්ට ඉඩ දෙන හැටියට
උන්වහන්සේගෙන් ඉල්ලුවෝය. අතගැසූ
සියල්ලෝම සුවපත්වූවෝය.

## චාරිත්‍ර හා මුඛ පාඨ පිළිබඳ ප්‍රශ්න විසඳීමක්

15 එකල ඵරිසිවරුද ලියන්නෝද
යෙරුසලමෙන් යේසුස්වහන්සේ
2 ළඟට ඇවිත්: ඔබගේ ගෝලයෝ
වැඩිමහල්ලන්ගේ පරම්පරාගත නියෝග
කඩකරන්නේ මක්නිසාද? ඔව්හු කෑම
කන විට අත් නොසෝද කතියි කීවෝය.
3 උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
තුඹලාත් තුඹලාගේ පරම්පරාගත
නියෝග නිසා දෙවියන්වහන්සේගේ
4 ආඥාව කඩකරන්නේ මක්නිසාද? තාගේ
පියාටත් මවුටත් ගෞරවකරව; පියා
ගැන හෝ මවු ගැන හෝ අගුණ
කියන්නා මැරුම්කෑ යුතුමයයි
5 දෙවියන්වහන්සේ කීසේක. එහෙත්:
කවරෙක් නුමුත් පියාට හෝ මවුට හෝ
කථාකොට—මාගෙන් තුඹට ප්‍රයෝජන
වෙන්ට පුළුවන්ව තිබුණු දේ
දෙවියන්වහන්සේට දෙනලද්දයි ඔවුන්ට
6 කියන්නේ නම්, ඔහු විසින් පියාට ගෞරව
නොකර සිටිය යුතුයයි තුඹලා
කියන්නෝය. මෙසේ තුඹලා තුඹලාගේ
පරම්පරාගත නියෝග නිසා දෙවියන්-
වහන්සේගේ වචනය අවලංගුකළහුය.
7 වංචාකාරයෙනි, යෙසායා තුඹලා ගැන
කථාකොට:
8 මේ සෙනඟ තොල්වලින් මට ගෞරව
කරති;
නුමුත් ඔවුන්ගේ සිත මා කෙරෙන්
දුරුව තිබේ.
9 මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් ගුරුකම්
කොට උගන්වමින්,
ඔවුන් මට නමස්කාරකරන්නේ
නිරර්ථකයේයයි
අනාගත වචන මනාකොට කීයේයයි
10 කීසේක. එවිට උන්වහන්සේ සමූහයා
කැඳවා ඔවුන්ට කථාකොට: තුඹලා
11 අසා තේරුම්ගනිල්ලා. කටට ඇතුල්වෙන
දෙයින් මනුෂ්‍යයා අපවිත්‍රවෙනවා නොව,
මනුෂ්‍යයා අපවිත්‍ර වෙන්නේ කටින්
12 පිටවෙන දෙයින්යයි කීසේක. එවිට
ගෝලයෝ ඇවිත්: ඵරිසිවරුන් ඒ වචනය
අසා බාධාවූ බව දන්නාසේක්දැයි
උන්වහන්සේගෙන් ඇසුවෝය. උන්-
වහන්සේ උත්තරදෙමින්: මාගේ 13
ස්වර්ගීය පියාණන්වහන්සේ විසින්
නොඉන්දූ සියලුම පැළෑටි උදුරනු
ලබන්නේය. ඔව්හු තිකම් සිටිත්වා. ඔව්හු 14
මග පෙන්වන අන්ධයෝය. අන්ධයෙක්
අන්ධයෙකුට මග පෙන්වමින් යනොත්
දෙදෙනාම වළක වැටෙනවා ඇතැයි
කීසේක. එවිට පේත්‍රුස් උත්තරදෙමින්: 15
මේ උපමාව අපට තෝරාදුන මැනවයි
උන්වහන්සේට කීවේය. උන්වහන්සේ 16
කියනසේක්: තුඹලාත් තවම තේරුම්
නැතුව සිටින්නහුද? කටට ඇතුල්වෙන 17
සියල්ල බඩට පැමිණ වැසිකිළියට යන
බව තුඹලාට තේරෙන්නේ නැද්ද? නුමුත් 18
කටින් පිටවෙන දේ නික්මෙන්නේ
සිතින්ය; මනුෂ්‍යයා අපවිත්‍රවෙන්නේ
එයින්ය. මක්නිසාද නපුරු සිතිවිලි, මිනී- 19
මැරුම්, කාමමිථ්‍යාචාරකම්, වේශ්‍යාකම්,
සොරකම්, බොරු සාක්ෂිකීම් සහ
අපහාසකිරීම් සිතින් නික්මෙන්නේය.
මනුෂ්‍යයා අපවිත්‍ර වෙන්නේ මේ 20
දේවලින්ය. නුමුත් නොසේදූ අත්වලින්
කෑවාට මනුෂ්‍යයා අපවිත්‍රවෙන්නේ
නැතැයි කීසේක.

## අන්‍යජාතික ගෑනු ළමයෙකුට සුවකිරීම

යේසුස්වහන්සේ එයින් පිටත්ව තීර් හා 21
සීදෝන්හි පළාත්වලට ගියසේක. බලව, 22
කානානිය ස්ත්‍රියෙක් එහි සීමාවල සිට
පිටත්ව ඇවිත්: දවිත්ගේ පුත්‍රවූ ස්වාමිනි,
මට කරුණාකළ මැනව; මාගේ දුව
බලවත්ලෙස යක්ෂාවේශව සිටින්නීයයි
කීවාය. නුමුත් උන්වහන්සේ ඈට 23
වචනයකින්වත් උත්තරයක් දුන්නේ නැත.
උන්වහන්සේගේ ගෝලයෝ ඇවිත්: මෑ
අප පස්සේ මොරගසන බැවින්
යන්ට හරිය මැනවයි උන්වහන්සේ-
ගෙන් ඉල්ලුවෝය. නුමුත් උන්වහන්සේ 24
උත්තරදෙමින්: ඉශ්‍රායෙල් වංශයේ
නැතිවුණු බැටළුවන් වෙතට මිස අන්‍යයන්
වෙතට මම එවනු නොලද්දෙමියි
කීසේක. නුමුත් ඈ ඇවිත් උන්වහන්සේට 25

නමස්කාරකොට: ස්වාමිනි, මට පිහිටවුව
26 මැනවයි කීවාය. උන්වහන්සේ උත්තර-
දෙමින්: දරුවන්ගේ රොටි රැගෙන
බල්ලන්ට දැමීම නුසුදුසුයයි කීසේක.
27 තුමුත් ඈ කථාකොට: එසේය, ස්වාමිනි,
බල්ලෝ පවා උන්ගේ ස්වාමිවරුන්ගේ
මේසයෙන් වැටෙන කැබෙලි කතියි කීවාය.
28 එවිට යේසුස්වහන්සේ ඈට උත්තර-
දෙමින්: ස්ත්‍රිය, තුඹේ ඇදහිල්ල මහත්ය.
තුඹේ කැමැත්ත ලෙසම තුඹට වේවයි
කීසේක. ඒ පැයේ පටන් ඈගේ දුව
සුවපත්වූවාය.

## බොහෝ දෙනෙකු සුවපත් කිරීම

29 යේසුස්වහන්සේ එයින් පිටත්ව ගලීලයේ
මුහුද ළඟට ගොස් කන්දට නැගී එහි
30 වැඩහුන්සේක. බොහෝ සමූහයෝ
කොරුන්, අන්ධයන්, ගොළුවන්,
අබ්බාගාතයන් හා වෙනත් බොහෝ
දෙනා රැගෙන යේසුස්වහන්සේ ළඟට
ඇවිත්, උන්වහන්සේගේ පාමුල ඔවුන්
තැබුවෝය; උන්වහන්සේ ඔවුන්ට සුවකළ-
31 සේක. ඒ නිසා ගොළුවන් කථාකරන
බවත් අබ්බාගාතයන් සුවවී ඉන්න බවත්
කොරුන් ඇවිදින බවත් අන්ධයන්ට ඇස්
පෙනෙන බවත් සමූහයෝ දැක,
පුදුමව, ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේට
ප්‍රශංසාකළෝය.

## හාරදහසකට කන්ට දීම

32 යේසුස්වහන්සේ ගෝලයන් තමන්
වෙතට කැඳවා කියනසේක්: මම සමූහයා
කෙරෙහි අනුකම්පා ඇත්තෙමි, මක්නිසාද
ඔව්හු දැනට තුන් දවසක් මා ළඟ සිටිති;
ඔවුන්ට කන්ට කිසිත් නැත. ඔවුන්
බඩගින්නෙන් හරින්ට නොකැමැත්තෙමි,
හැරියෙම් නම් මාර්ගයේදී ඔවුන්
ක්ලාන්තවෙන්ට පුළුවනැයි කීසේක.
33 ගෝලයෝ උන්වහන්සේට කථාකොට:
මෙපමණ මහත් සමූහයක් තෘප්තියට
පමුණුවන්ට වනාන්තරයක අපට රොටි
34 කොයින්දැයි කීවෝය. යේසුස්වහන්සේ
කථාකොට: තුඹලා ළඟ රොටි කීයක්
තිබේදැයි ඇසූසේක. රොටි සතකුත් කුඩා
මසුන් ස්වල්පයකුත්යයි ඔව්හු කීවෝය.
උන්වහන්සේ සමූහයන්ට බිම හිඳගන්ට 35
අණදී, රොටි සතද මසුන්ද රැගෙන 36
ස්තුතිකොට කඩා, ගෝලයන්ට දුන්සේක,
ගෝලයෝද සමූහයන්ට දුන්නෝය.
සියල්ලෝම කා තෘප්තියට පැමුණුණෝය. 37
ඉතිරිවූ කැබෙලි එක්කොට කුඩා සතක්
පුරවා ගත්තෝය. ස්ත්‍රීන්ද දරුවන්ද 38
හැර, කෑවාවූ පුරුෂයෝ හාරදහසක්ය.
උන්වහන්සේ සමූහයන් යන්ට හැර, 39
ඔරුවට නැගී, මගදන් සීමාවලට
පැමිණිසේක.

## ලකුණක් දෙන ලෙස කළාවූ ඉල්ලීම ප්‍රතික්ෂේපකිරීම

16
එරිසිවරුද සද්දුසිවරුද ඇවිත්
උන්වහන්සේ පරීක්ෂාකරමින්,
තමුන්ට අහසෙන් ලකුණක් පෙන්වන්ට
උන්වහන්සේගෙන් ඉල්ලුවෝය.
උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: සවස් 2
වේලෙහි අහස රතුපාට නිසා හොඳ
කාලයක් වන්නේය කියාත්, උදය අහස 3
රතුපාටව, අඳුරුව තිබෙන නිසා අද
කුණාටු දවසක් වන්නේය කියාත් තුඹලා
කියවූය. තුඹලා අහස්තලය විමසන්ට
දන්නහුය; එහෙත් කාලයන්ගේ
ලකුණු විමසා දැනගන්ට තුඹලාට
බැරිය. නපුරුවූ කාමමිථ්‍යාචාරීකවූ 4
පරම්පරාවක් ලකුණක් සොයයි; තුමුත්
අනාගතවක්තෘවූ යෝනාගේ ලකුණ
හැර ඔවුන්ට වෙන ලකුණක් දෙනු
නොලැබෙන්නේයයි කීසේක. උන්වහන්සේ
ඔවුන් අත්හැර පිටත්ව ගියසේක.

## ගෝලයන්ගේ අන්ධකම ගැන තරවටුකිරීම

ගෝලයෝ එගොඩට පැමිණියෝය; 5
රොටි ගෙනයන්ට ඔවුන්ට මතකනැති
වුණේය. යේසුස්වහන්සේ ඔවුන්ට 6
කථාකොට: එරිසිවරුන්ගේද සද්දුසි-
වරුන්ගේද මුහුන්වලින් ප්‍රවේසම්වෙන්ට
බලාගනිල්ලායයි ඔවුන්ට කීසේක. ඔව්හු: 7

අපි රොටි නොගෙනාමුයයි තම තමුන්
8 අතරේ කථාකරගත්තෝය. යේසුස්-
වහන්සේ ඒ බව දැන: මඳ ඇදහිල්ල
ඇත්තෙනි, තුඹලාට රොටි නැති නිසා
කුමකට තුඹලා අතරෙහි කථාකර-
9 ගන්නහුද? තුඹලාට තවම තේරෙන්නේ
නැද්ද? පන්දහසකට දුන් රොටි පහ
ගැනත්, පැස් කීයක් පුරවාගත්තහුද
10 කියාත්, සාරදහසකට දුන් රොටි සත
ගැනත්, කූඩා කීයක් පුරවාගත්තහුද
11 කියාත් මතක නැද්ද? රොටි ගැන මා
විසින් තුඹලාට නොකී බව තුඹලාට
තේරුම් නැත්තේ කොහොමද? තුමූත්
ඵරිසිවරුන්ගේද සද්දුසිවරුන්ගේද මුහුන්-
වලින් ප්‍රවේසම්වෙයල්ලායයි කීසේක.
12 එවිට උන්වහන්සේ ඵරිසිවරුන්ගේද
සද්දුසිවරුන්ගේද ඉගැන්වීමෙන් මිස
රොටිවල මුහුන්වලින් ප්‍රවේසම්වෙන්ට
නොකී බව ඔව්හු තේරුම්ගත්තෝය.

## යේසුස්වහන්සේ ක්‍රිස්තුස් බව පේත්‍රුස් කියා සිටීම

13 යේසුස්වහන්සේ පිලිප්පිකායිසාරියේ
පළාත්වලට පැමිණි කල: මනුෂ්‍ය පුත්‍රයා
කවරෙක්ය කියා මනුෂ්‍යයෝ කියද්දැයි
තමන්ගේ ගෝලයන්ගෙන් ඇසූසේක.
14 ඔව්හු කථාකොට–සමහරෙක්: *යොහන්
බව්තීස්තය කියාද, අන් සමහරෙක්:
එලියාය කියාද, තවත් අය: යෙරෙමියා
නොහොත් අනාගතවක්තෘන්ගෙන් එක්-
කෙනෙක්ය කියාද කියතියි කීවෝය.
15 තුමූත් තුඹලා මා කවුරුය කියා
කියනවාදැයි ඔවුන්ගෙන් ඇසූසේක.
16 සීමොන් පේත්‍රුස් උත්තරදෙමින්:
ඔබ ක්‍රිස්තුස්වහන්සේය, ජීවමාන
දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි
17 කීවේය. යේසුස්වහන්සේ උත්තරදෙමින්:
සීමොන් බර්-යෝනා, තුඹ ආශීර්වාද-
ලද්දෙක්ය. මක්නිසාද ස්වර්ගයෙහි සිටින
මාගේ පියාණන්වහන්සේ මිස මාංසය
හා රුධිරය මේක තුඹට එළිදරව්
18 නොකෙළේය. මම තුඹට කියමි: තුඹ

*අවගාහක යොහන්ය.

*පේත්‍රුස්ය, තවද මේ පර්වතය පිට මාගේ
සභාව ගොඩනගන්නෙමි; †පාතාලයේ
දොරටු ඒක පරාජය නොකරන්නේය.
ස්වර්ගරාජ්‍යයේ යතුරු තුඹට දෙන්නෙමි. 19
තුඹ පොළොවෙහිදී යමක් බඳින්නෙහිද
ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය.
තුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද
ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි
ඔහුට කීසේක. එවිට තමන් ක්‍රිස්තුස්- 20
වහන්සේ බව කිසිවෙකුට නොකියන
ලෙස උන්වහන්සේ ගෝලයන්ට
අණකළසේක.

## යේසුස්වහන්සේ තමන්ගේ මරණය හා මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන කලින් කීම

එවක් පටන් යේසුස්වහන්සේ, තමන් 21
යෙරුසලමට ගොස් වැඩිමහල්ලන්ගෙන්ද
නායක පූජකයන්ගෙන්ද ලියන්නන්ගෙන්ද
බොහෝ දේ විඳින්ටත් මරනු ලබන්ටත්
තුන්වෙනිද නැගුටුවනු ලබන්ටත් ඕනෑ
බව ගෝලයන්ට දන්වන්ට පටන්ගත්-
සේක. එවිට පේත්‍රුස් උන්වහන්සේ කැඳවා 22
තරවටුකරන්ට පටන්ගෙන: ස්වාමිනි,
එය ඔබ කෙරෙන් දුරුවේවා. ඔබට
කිසිකලකත් එසේ සිද්ධ නොවන්නේයයි
කීවේය. තුමූත් උන්වහන්සේ හැරී 23
පේත්‍රුස්ට කථාකොට: සාතන් මා
පස්සට යව, තුඹ මට බාධාවක්ය.
මක්නිසාද තුඹ මනුෂ්‍යයන්ගේ කාරණා
මිස දෙවියන්වහන්සේගේ කාරණා
කල්පනාකරන්නේ නැතැයි කීසේක.

## තමාගේම කැමැත්ත අත්හැරීමට ආරාධනාව

එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට 24
කථාකොට: යමෙක් මා පස්සේ එන්ට
කැමති නම් ඔහු තමාම නොසලකා,
තමාගේ කුරුසිය රැගෙන, මා අනුව
ඒවා. මක්නිසාද යමෙක් තමාගේ ජීවිතය 25
ගළවාගන්ට කැමතිවේද, ඒක ඔහුට
නැතිවන්නේය. මා නිසා තමාගේ ජීවිතය
නැතිවෙන අයට ඒක සම්බවන්නේය.

*හෙවත්, ගලය. †හේදීසයේ.

26 යම් මනුෂ්‍යයෙක් මුළු ලෝකය ලබා-
ගත්තත් තමාගේ ජීවිතය නැතිවුණොත්
ඔහුට මොන ලාභයක්ද? නොහොත්
මනුෂ්‍යයෙක් තමාගේ ජීවිතය වෙනුවට
27 දෙන්නේ කුමක්ද? මක්නිසාද මනුෂ්‍ය
පුත්‍රයා තමන් පියාණන්වහන්සේගේ
තේජසින් යුක්තව තමන් දූතයන් සමග
එන්නේය; එකල උන්වහන්සේ
එකිනෙකාට තම තමාගේ ක්‍රියා ලෙස
28 විපාක දෙනසේක. සැබවක් තුඹලාට
කියමි: මනුෂ්‍ය පුත්‍රයා ස්වකීය
රාජ්‍යයෙන් යුක්තව එනවා දකින තෙක්
මෙහි සිටින්නන්ගෙන් සමහරෙක්
කිසිසේත් මරණ රසය නොවිඳින්නෝයයි
කීසේක.

## අන්වෙසක්වීම

17 සදවසකට පසු යේසුස්වහන්සේ
පේත්‍රුස්ද යාකොබ්ද ඔහුගේ
සහෝදරවූ යොහන්ද පමණක්
කැඳවාගෙන උස්වූ කන්දකට වෙන්වගිය-
2 සේක. උන්වහන්සේ ඔවුන් ඉදිරියෙහි
අන්වෙසක්වූසේක. උන්වහන්සේගේ
මුහුණ සූර්යයා මෙන් බැබළුවේය,
උන්වහන්සේගේ වස්ත්‍රද ආලෝකය මෙන්
3 සුදුවූයේය. බලව, මෝසෙස්ද එලියාද
උන්වහන්සේ සමග කථාකරමින්
4 සිටිනවා ඔවුන්ට පෙනුණේය. පේත්‍රුස්
උත්තරදෙමින් යේසුස්වහන්සේට කථා-
කොට: ස්වාමිනි, අපට මෙහි සිටීම
යහපත; ඔබ කැමතිසේක්නම්, ඔබට
එකක්ද මෝසෙස්ට එකක්ද එලියාට
එකක්ද බැගින් මෙහි මණ්ඩප තුනක්
5 සාදන්නෙමියි කීවේය. ඔහු කථාකරද්දීම
දීප්තිමත් වලාපටලයක් ඔවුන් මත්තෙහි
පැතිර තිබුණේය. බලව, මේ මාගේ
ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි
ඉතා ප්‍රසන්නව සිටිමි; මොහුට
ඇහුම්කන්දෙව්යයි වලාපටලයෙන් හඬක්
6 විය. ගෝලයෝ ඒ අසා, මුහුණින් වැටී,
7 අතිශයින් භයපත්වූවෝය. යේසුස්වහන්සේ
ඇවිත් ඔවුන්ට අතගසා: නැගිටිල්ලා,
8 භයනොවෙල්ලායයි කීසේක. ඔව්හු ඇස්
ඔසවා බලා, යේසුස්වහන්සේ හැර වෙන
කිසිවෙකු නුදුටුවෝය.

ඔවුන් කන්දෙන් බසින කල 9
යේසුස්වහන්සේ ඔවුන්ට අණකරමින්:
මනුෂ්‍ය පුත්‍රයා මළවුන්ගෙන් නැගිටින
තුරු මේ දර්ශනය කාටවත් නොකියල්ලා-
යයි කීසේක. උන්වහන්සේගේ ගෝලයෝ 10
කථාකොට: එසේවී නම් එලියා
පළමුවෙන් එන්ට ඕනැයයි ලියන්නෝ
කුමක් නිසා කියන්නෝදැයි උන්-
වහන්සේගෙන් ඇසුවෝය. උන්වහන්සේ 11
උත්තරදෙමින්: එලියා එන්නේමය, ඇවිත්
සියල්ල නැවත පිහිටුවන්නේය. නුමුත් 12
තුඹලාට කියමි—එලියා ආවේය, ඔව්හු
ඔහු නැඳින, යමක් යමක් කරන්ට
කැමතිවූවෝද ඒ ඒ දේ ඔහුට කළෝය.
එසේම මනුෂ්‍ය පුත්‍රයාත් ඔවුන්ගෙන්
පීඩා විඳින්නේයයි ඔවුන්ට කීසේක.
උන්වහන්සේ *යොහන් බව්තීස්ත ගැන 13
තමුන්ට කථාකළ බව එකල ගෝලයෝ
තේරුම්ගත්තෝය.

## අපස්මාර රෝගීවූ ළමයාට සුවකිරීම

ඔවුන් සමූහයා ළඟට ආ කල 14
මනුෂ්‍යයෙක් උන්වහන්සේ වෙතට ඇවිත්
උන්වහන්සේ ඉදිරියේ දණින් හිඳ:
ස්වාමිනි, මාගේ පුත්‍රයාට කරුණාකළ 15
මැනව; මක්නිසාද ඔහු අපස්මාර රෝගීව
බොහෝ වේදනා විඳියි. නොයෙක් විට
ගින්නෙහිද නොයෙක්විට වතුරෙහිද
වැටෙයි. ඔබවහන්සේගේ ගෝලයන් ළඟට 16
මම ඔහු ගෙනාවෙමි, ඔහු සුවපත්කරන්ට
ඔවුන්ට නුපුළුවන්වියයි කීවේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: අහෝ 17
ඇදහිලි නැති හිතුවක්කාර පරම්පරාව,
මම තුඹලා සමග කොපමණ කල්
සිටිම්ද? කොපමණ කල් තුඹලා ගැන
ඉවසම්ද? මෙහි මා ළඟට ඔහු ගෙනෙල්ලා-
යයි කීසේක. යේසුස්වහන්සේ ඔහුට 18
තරවටුකළසේක; එවිට යක්ෂයා ඔහුගෙන්
දුරුව ගියේය. ඒ පැයේ පටන් ළමයා
සුවපත් විය. එවිට ගෝලයෝ තනිව 19
යේසුස්වහන්සේ ළඟට ඇවිත්: ඔහු
දුරුකරන්ට අපට බැරිවුණේ මක්නිසාදැයි

*අවගාහක යොහන්.

20 ඇසුවෝය. උන්වහන්සේ කියනසේක්:
තුඹලාගේ ඇදහිල්ලේ මදිකම නිසාය.
සැබවක් තුඹලාට කියමි–අබ ඇටයක්
පමණ ඇදහිල්ල තුඹලාට ඇත්නම්, මේ
කන්දට කථාකොට: මෙතැනින් අහක්ව,
එතැනට යවයි කීවත් ඒක යන්නේය;
21 කිසිවක් තුඹලාට බැරිනොවන්නේයයි
කීසේක.

## යේසුස්වහන්සේ තමන්ගේ මරණය ගැන නැවත කීම

22 ඔවුන් ගලීලයේ නැවතී සිටින අතර
යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට:
මනුෂ්‍ය පුත්‍රයා මනුෂ්‍යයන්ගේ අත්වලට
23 පාවාදෙනු ලබන්නේය; ඔව්හුද ඔහු
මරන්නෝය, තුමුත් තුන්වෙනිද ඔහු
නැගුටුවනු ලබන්නේයයි කීසේක. එවිට
ඔව්හු අතිශයෙන් ශෝකවූවෝය.

## මාළිගා බද්ද ගෙවීම

24 ඔවුන් කපර්ණවුමට ආ කල *ෂෙකෙල්
භාගය අයකරන්නෝ පේත්‍රුස් ළඟට
ඇවිත්: තුඹලාගේ ආචාරීන්වහන්සේ
*ෂෙකෙල් භාගය නොගෙවනසේක්දැයි
25 කීවෝය. ගෙවනසේකැයි ඔහු කීවේය.
ඔහු ගෙට ආ කල යේසුස්වහන්සේ
පළමුවෙන් ඔහුට කථාකොට: සීමොන්,
තුඹ හිතන්නේ මොකද? පොළොවේ
රජවරුන් සුංගම් නොහොත් ආදායම්
ගන්නේ කාගෙන්ද? තමුන්ගේ
පුත්‍රයන්ගෙන්ද නොහොත් අන්‍යයන්-
26 ගෙන්දැයි කීසේක. අන්‍යයන්ගෙන්යයි ඔහු
කී කල යේසුස්වහන්සේ කථාකොට:
27 එසේ නම් පුත්‍රයෝ නිදහස්ය. තුමුත් අප
විසින් ඔවුන්ට බාධා නොකරන පිණිස,
තුඹ මුහුදට ගොස් බිළියක් බා, පළමු-
කොට අසුවෙන මත්ස්‍යයා ගනින්න;
උගේ කට හැරිය කල ෂෙකෙලයක්
සම්බවන්නේය. ඒක ගෙන මා සහ තුඹ
උදෙසා ඔවුන්ට දීපන්නැයි කීසේක.

*දේවමාළිගාවට ඔප්පුකළ මිලයකි.

## යටත්කම ගැන ගුරුකමක් දීම

18

ඒ පැයේදී ගෝලයෝ යේසුස්-
වහන්සේ ළඟට ඇවිත්: ඉදින්
ස්වර්ගරාජ්‍යයෙහි ඉතා උතුම් වන්නේ
කවුදැයි ඇසුවෝය. උන්වහන්සේ කුඩා 2
දරුවෙකු තමන් ළඟට කැඳවා ඔවුන්
මැද සිටුවා: සැබවක් තුඹලාට 3
කියමි–තුඹලා හැරී කුඩා දරුවන්
මෙන් නූණොත්, කිසිසේත් ස්වර්ග-
රාජ්‍යයට ඇතුල් නොවන්නාහුය. එබැවින් 4
මේ කුඩා දරුවා මෙන් යටත්වන කවුරු
තුමුත් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා උතුම්
තැනැත්තාය. තවද යමෙක් මාගේ 5
නමින් මෙබඳු කුඩා දරුවෙකු
පිළිගන්නේද ඔහු මා පිළිගන්නේය.

## අනුන්ට බාධාකිරීම ගැන අවවාදය

තුමුත් මා කෙරෙහි අදහන මේ 6
බාලයන්ගෙන් එක්කෙනෙකුටවත් බාධා-
කරන යමෙක් ඇද්ද ඔහුගේ බෙල්ලේ
මහත් ඇඹරුම් ගලක් එල්ලා මුහුදේ
ගැඹුරෙහි ගිල්වීම ඔහුට යහපත. බාධා 7
නිසා ලොවට දුක්වේ! මක්නිසාද බාධා
පැමිණෙන්ට ඕනෑය; තුමුත් යමෙකු
කරණකොටගෙන බාධාව පැමිණේද
ඒ තැනැත්තාට දුක්වේ! තුඹේ අත හෝ 8
පය හෝ තුඹට බාධාකෙරේ නම් ඒක
කපා අහක දමාපන්න. දෑත හෝ දෙපය
හෝ ඇතුව සදාකාල ගින්නට හෙළනු
ලැබීමට වඩා අබ්බාගාතව නොහොත්
කොරව ජීවනයට පැමිණීම තුඹට
යහපත. තුඹේ ඇස තුඹට බාධා කෙරේ 9
නම් ඒක උගුළා අහක දමාපන්න. ඇස්
දෙකක් ඇතුව නිරාගින්නට හෙළනු
ලැබීමට වඩා එක ඇසක් ඇතුව
ජීවනයට පැමිණීම තුඹට යහපත.
මේ බාලයන්ගෙන් එකෙකුටවත් හෙළා 10
නොදක්නා ලෙස බලාගනිල්ලා.
මක්නිසාද ස්වර්ගයේදී ඔවුන්ගේ දූතයෝ
ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්-
වහන්සේගේ මුහුණ නිතරම දකිතියි
තුඹලාට කියමි.*

*සමහර පුරාණ පිටපත්වල 11 වෙනි පදයක් ඇතුළත්කර තිබේ. ඒ මෙසේය: මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ ගළවාගන්ට ආයේය යනුය.

## නැතිවූ බැටළුවා ගැන උපමාව

12 නුඹලා සිතන්නේ මොකද? යම්
මනුෂ්‍යයෙකුට බැටළුවන් සියයක්
ඇත්නම්, උන්ගෙන් එකෙක් මුළාව
ගියොත්, ඔහු ඉතිරි අනූනවදෙනා
අත්හැර, කඳුවලට ගොස්, මුළාව
13 ගිය එකා සොයන්නේ නැද්ද? ඌ
සම්බවුණොත් මුළාව නොගිය අනූ-
නවදෙනා ගැන සන්තෝෂවෙනවාට
වඩා ඌ ගැන සන්තෝෂවන්නේයයි
14 ඒකාන්තයෙන් නුඹලාට කියමි. එසේම
මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත්
විනාශවෙනවාට ස්වර්ගයෙහි සිටින
නුඹලාගේ පියාණන්වහන්සේ කැමති
නොවනසේක.

## වරදකළ අයින්ට ක්‍රියාකළ යුතු අන්දම

15 තවද නුඹේ සහෝදරයා නුඹට
විරුද්ධව වරදකළොත්, ගොස්, ඔහු සමග
තනිව සිට ඔහුගේ වරද පෙන්වාදීපන්න.
නුඹ කී දේ ඔහු ඇසුවොත් නුඹ නුඹේ
16 සහෝදරයා දිනාගත්තෙහිය. නෑසුවොත්
සාක්ෂිකාරයන් දෙදෙනෙකුගේ හෝ
තුන්දෙනෙකුගේ හෝ මුඛයෙන් සියලු
වචන ස්ථිරවන පිණිස නුඹ සමග තවත්
එක්කෙනෙකු නොහොත් දෙදෙනෙකු
17 කැඳවාගන පලයන්න. ඔහු ඔවුන්
කී දේත් පිළිනොගත්තොත්, සභාවට
කියාපන්න. සභාව කී දේත් පිළි
නොගත්තොත්, ඔහු නුඹට අන්‍යජාතියෙක්
මෙන්ද සුංගම් අයකරන්නෙක් මෙන්ද
18 වේවා. සැබවක් නුඹලාට කියමි: නුඹලා
පොළොවේදී යමක් යමක් බඳිනවාද,
ඒක ස්වර්ගයේදී බඳිනු ලබන්නේය.
පොළොවේදී යමක් යමක් මුදනවාද,
ඒක ස්වර්ගයේදී මුදනු ලබන්නේය.

## එක්සත් යාච්ඤාව

19 නැවතත් නුඹලාට කියමි: පොළොවේදී
නුඹලාගෙන් දෙදෙනෙක් තමුන් ඉල්ලන
යමක් ගැන එක්සිත්වන්නෝ නම්,
ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්-
වහන්සේගෙන් ඒ දේ ඔවුන්ට
20 ලැබෙන්නේය. මක්නිසාද දෙදෙනෙක්
හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන්
යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන
ඔවුන් මැද සිටිමියි කීසේක.

## එකිනෙකාට කමාවීම. අකරුණාවන්ත දසයා ගැන උපමාව

එකල පේත්‍රුස් උන්වහන්සේ ළඟට 21
ඇවිත්: ස්වාමීනි, මට වරදකරන මාගේ
සහෝදරයාට කීවරක් කමාවෙන්ටද?
සත්වරක් දක්වාදැයි උන්වහන්සේගෙන්
ඇසුවේය. යේසුස්වහන්සේ ඔහුට කථා- 22
කොට: සත්වරක් නොව සැත්තෑවර
සත්වරක්යයි කියමි. එබැවින් තමාගේ 23
දසයන් සමග ගණන් බලන්ට කැමතිවූ
රජෙකුට ස්වර්ගරාජ්‍යය උපමා කරනු
ලැබේ. ඔහු ගණන් බලන්ට පටන්ගත් 24
කල, *තලෙන්ත දස දහසක් ණයවූ
එක්කෙනෙක් ඔහු ළඟට ගෙනෙනලද්දේය.
ණය ගෙවන්ට ඔහුට කිසිවක් නොතිබුණු 25
බැවින්, ඔහුගේ ස්වාමියා ඔහුද ඔහුගේ
භාර්යාවද දරුවන්ද ඔහු සන්තක
සියල්ලද විකුණා ණය ගෙවන්ට
ආඥකෙළේය. එවිට ඒ දසයා බිම වැටී 26
වැඳ: ස්වාමීනි, මා ගැන ඉවසුව මැනවි,
නුඹවහන්සේට සියල්ලම ගෙවන්නෙමියි
කීවේය. ඒ දසයාගේ ස්වාමියා 27
අනුකම්පාකොට, ඔහු මුදහැර, ඒ ණය
ඔහුට කමාකෙළේය. එහෙත් ඒ දසයා 28
පිටත්ව ගොස්, තමාගේ සහකාර
දසයන්ගෙන් තමාට මසු සියයක් ණයවූ
එක්කෙනෙකු දැක, ඔහු අල්වා, ඔහුගේ
බෙල්ල මිරිකාගෙන: ණය ගෙවාපන්නැයි
කීවේය. එවිට ඔහුගේ සහකාර දසයා 29
බිම වැටී: මා ගැන ඉවසුව මැනවි,
නුඹට ගෙවන්නෙමියි කන්නලව්කෙළේය.
නුමුත් ඔහු නොකමැතිව, ගොස් ණය 30
ගෙවන තුරු ඔහු හිරගෙයි දැම්මේය.
ඔහුගේ සහකාර දසයෝ සිද්ධවූ දේ 31
දැක, ඉතා ශෝකව, ඇවිත් සිදුවූ සියල්ල
තමුන්ගේ ස්වාමියාට කීවෝය. එවිට 32
ඔහුගේ ස්වාමියා ඔහු කැඳවා
කථාකොට: නපුරු දසය, නුඹ මාගෙන්
ඉල්ලූ නිසා ඒ ණය සියල්ල නුඹට

*තලෙන්තයක් පවුම් 240 ක් පමණ වේ.

33 කමාකෙළෙමි. මා විසින් නුඹට
කරුණාකළා සේම නුඹ විසිනුත් නුඹේ
සහකාර දසයාට කරුණාකරන්ට යුතුව
34 තිබුණා නොවේදැයි කීවේය. ඔහුගේ
ස්වාමියා කෝපව, තමාට ණයව තිබුණු
සියල්ල ඔහු විසින් ගෙවන තුරු ඔහු
35 වධකයන්ට භාරදුන්නේය. නුඹලාත්
එකිනෙකා තම තමාගේ සහෝදරයාට
සිතින් කමා නොකරනවා නම්
ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්-
වහන්සේද නුඹලාට එසේම කරනවා
ඇතැයි කීසේක.

## දික්කසාදය ගැන ප්‍රශ්නයක්

19 තවද යේසුස්වහන්සේ මේ වචන
කියා නිමවූ පසු ගලීලයෙන් පිටත්ව
යොර්දනින් එගොඩ යුදයේ සීමාවලට
2 පැමිණිසේක; බොහෝ සමූහයෝ
උන්වහන්සේ අනුව ගියෝය; උන්වහන්සේ
එහිදී ඔවුන්ට සුවකළසේක.
3 එරිසිවරු උන්වහන්සේ ළඟට පැමිණ
උන්වහන්සේ පරීක්ෂාකරමින්: යමෙකු
විසින් කොයියම් කාරණයක් නිසාවත්
තමාගේ භාර්යාව අත්හැරිය
යුතුදැයි උන්වහන්සේගෙන් ඇසුවෝය.
4 උන්වහන්සේ උත්තරදෙමින්: පටන්ගැන්මේ
සිට ඔවුන් මැවූ තැනන්වහන්සේ
පුරුෂයෙක්ද ස්ත්‍රියෙක්ද වශයෙන් ඔවුන්
5 මැවූ බවත්. ඒ නිසා මනුෂ්‍යයෙක් තමාගේ
පියා සහ මවු අත්හැර තමාගේ
භාර්යාවට ඇලුම්වන්නේය කියාද ඒ
දෙදෙන එක මාංසය වන්නෝය කියාද
කී බවත් නුඹලා කියෙවුවේ නැද්ද?
6 මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනෙක්
නොව එකම මාංසය වෙති. එබැවින්
දෙවියන්වහන්සේ එක්කළ දෙය
මනුෂ්‍යයා වෙන් නොකෙරේවයි කීසේක.
7 ඔව්හු කථාකොට: එසේවී නම් ඇත්හැරීම්
පත්‍රයක්දී ඈ අත්හරින්ට මෝසෙස්
අණකළේ මක්නිසාදැයි උන්වහන්සේට
8 කීවෝය. උන්වහන්සේද: නුඹලාගේ සිත්
දැඩිකම නිසා මෝසෙස් නුඹලාගේ
භාර්යාවන් අත්හරින්ට ඉඩදුන්නේය.
නුමුත් පටන්ගැන්මේ සිට එසේ
9 නොවූයේයයි ඔවුන්ට කීසේක. තවද මම
නුඹලාට කියමි—වේශ්‍යාකම නිසා මිස
තමාගේ භාර්යාව අත්හැර වෙන
ස්ත්‍රියෙකු සරණපාවාගන්න කවරෙක්
නුමුත් කාමමිථ්‍යාචාරය කරන්නේය:
අත්හරිනලද ඒ ස්ත්‍රිය සරණපාවාගන්නාද
කාමමිථ්‍යාචාරය කරන්නේයයි ඔවුන්ට
කීසේක. ගෝලයෝ උන්වහන්සේට 10
කථාකොට: ස්ත්‍රීත් පුරුෂයාත් අතරේ
කාරණය මෙසේ නම් සරණපාවා
නොගැන්ම වඩා හොඳයයි කීවෝය.
එහෙත් උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: 11
පුළුවන්කම ලැබූ අය මිස හැම දෙනාටම
මේ කීම පිළිගන්ට බැරිය. මක්නිසාද 12
මවු කුසින් නපුංසකව උපන් තැනැත්තෝ
ඇත්තාහ. මනුෂ්‍යයන් විසින් නපුංසකයන්
කරනලද නපුංසකයෝද ඇත්තාහ.
ස්වර්ගරාජ්‍යය නිසා තමුන්ම
නපුංසකයන් කරගන්නාවූ නපුංසකයෝද
ඇත්තාහ. ඒක පිළිගන්ට පුළුවන්
තැනැත්තේ පිළිගත්තාවේයයි කීසේක.

## යේසුස්වහන්සේ සහ පුංචි ළමයි

එකල උන්වහන්සේ විසින් දරුවන් පිට 13
අත් තබා යාච්ඤාකරන පිණිස ඔව්හු
උන්වහන්සේ වෙතට ගෙනෙනලද්දෝය.
ගෝලයෝ ඔවුන්ට සැරකළෝය. එහෙත් 14
යේසුස්වහන්සේ කථාකොට: දරුවන්
නොවලක්වා මා ළඟට එන්ට ඉඩ-
හැරපල්ලා. මක්නිසාද ස්වර්ගරාජ්‍යය
මෙබඳුවන්ගේයයි කීසේක. උන්වහන්සේ 15
ඔවුන් පිට අත් තබා එතැනින් පිටත්ව
ගියසේක.

## පොහොසත් යෞවනයා

බලව, එක්තරා කෙනෙක් උන්වහන්සේ 16
ළඟට ඇවිත්: ආචාරීන්වහන්ස, සදාකාල
ජීවනය ලබාගන්න පිණිස මොන
යහපත් දෙයක් කරම්දැයි උන්වහන්සේ-
ගෙන් ඇසුවේය. උන්වහන්සේද: නුඹ 17
යහපත ගැන මාගෙන් විචාරන්නේ
මක්නිසාද? යහපත්ව සිටින්නේ එක්-
කෙනෙක්මය. නුමුත් නුඹ ජීවනයට
ඇතුල්වෙන්ට කැමැත්තෙහි නම් ආඥාවන්
පවත්වාපන්නැයි ඔහුට කීසේක. ඒ 18
කොයි ඒවාදැයි ඔහු උන්වහන්සේගෙන්

ඇසුවේය. යේසුස්වහන්සේ කියනසේක්:
මිනී නොමරව, කාමමිථ්‍යාචාරය
නොකරව, සොරකම් නොකරව, බොරු
19 සාක්ෂි නොකියව, තාගේ පියාටත්
මවුටත් ගෞරවකරව; තමාට මෙන්
තමාගේ අසල්වාසියාට ප්‍රේමකරව යන
20 මේවායයි කීසේක. යෞවනයාද: මේ
සියල්ල රක්ෂාකෙළෙමි. තව මට අඩු
කිමෙක්දැයි උන්වහන්සේගෙන් ඇසුවේය.
21 යේසුස්වහන්සේද: නුඹ සම්පූර්ණවෙන්ට
කැමති නම් ගොස් නුඹ සන්තක දේ
විකුණා දිළිඳුන්ට දීපන්න, එවිට
ස්වර්ගයෙහිදී නුඹට වස්තු ලැබෙන්නේය.
නුඹ මා අනුව යන්ට වරෙන්නැයි ඔහුට
22 කීසේක. නුමුත් යෞවනයා ඒ කීම අසා,
තමා බොහෝ සම්පත් ඇති කෙනෙක්ව
සිටි බැවින්, ශෝකයෙන් යන්ට ගියේය.

## වස්තුව අන්තරා සහිත බව

23 එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට
කථාකොට: සැබවක් නුඹලාට
කියමි–ධනවන්තයෙකුට ස්වර්ගරාජ්‍යයට
24 ඇතුල්වීම අමාරුය. නැවතත්
නුඹලාට කියමි–ධනවන්තයෙක් දෙවියන්-
වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙනවාට
වඩා ඔටුවෙකුට ඉඳිකටුවක සිදුරෙන්
25 යන්ට පහසුයයි කීසේක. ගෝලයෝ ඒ
අසා ඉතා විස්මපත්ව: එසේවී නම්
ගැළවෙන්ට පුළුවන් කාටදැයි කීවෝය.
26 යේසුස්වහන්සේ ඔවුන් දෙස බලමින්:
ඒක මනුෂ්‍යයන්ට නම් නුපුළුවන; නුමුත්
දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි
27 කීසේක. එවිට පේත්‍රුස් උන්වහන්සේට
උත්තරදෙමින්: අපි සියල්ල අත්හැර
ඔබවහන්සේ අනුව ආවෙමුව; එබැවින්
අපට ලැබෙන්නේ කුමක්දැයි උන්-
28 වහන්සේට කීවේය. යේසුස්වහන්සේ
ඔවුන්ට කථාකොට: සැබවක් නුඹලාට
කියමි–අලුත් උත්පාදයේදී මනුෂ්‍ය පුත්‍රයා
තමන්ගේ තේජසේ සිංහාසනය පිට
වැඩහිඳින කල, මා අනුව ආවාවූ
නුඹලාත් ඉශ්‍රායෙල්ගේ ගෝත්‍රයන්
දොළොස විනිශ්චයකරමින් සිංහාසන
29 දොළොසක් පිට හිඳින්නහුය. ඇරත් මාගේ
නාමය නිසා ගෙවල් හෝ සහෝදරයන්
හෝ සහෝදරියන් හෝ පියා හෝ මවු
හෝ දරුවන් හෝ ගම්බිම් හෝ
අත්හැරියාවූ යමෙක් ඇද්ද, ඔහු සියක්
ගුණයක් ලබන්නේය, සදකාල ජීවනයටත්
උරුමක්කාරයා වන්නේය. නුමුත් 30
ප්‍රථමයෝ බොහෝ දෙනෙක්
අන්තිමයෝද අන්තිමයෝ ප්‍රථමයෝද
වන්නෝයයි කීසේක.

## මිදිවත්තේ වැඩකාරයන් ගැන උපමාව

20 මක්නිසාද තමාගේ මිදිවත්තට
වැඩකාරයන් කුලියට ගන්නා
පිණිස අලුයම පිටත්ව ගිය ගෙදර
ස්වාමියෙකුට ස්වර්ගරාජ්‍යය සමානය.
ඔහු දවසකට මස්සක් බැගින් දෙන 2
ලෙස වැඩකාරයන් සමග පොරොන්දුව,
තමාගේ මිදිවත්තට ඔවුන් යැවීය. ඔහු 3
තුන්වෙනි පැය පමණේදීත් පිටත්ව ගොස්,
වෙළඳම්පළේ නිකම් සිටින තවත් අය
දැක: නුඹලාත් මිදිවත්තට පලයල්ලා, 4
ලැබිය යුතු කුලිය නුඹලාට දෙමියි
කීවේය. ඔව්හුද ගියෝය. නැවත ඔහු 5
හවෙනි සහ නවවෙනි පැය පමණේදීත්
පිටත්ව ගොස් එසේම කෙළේය.
එකොළොස්වෙනි පැය පමණේදීත් 6
පිටත්ව ගොස්, එහි තවත් අය සිටිනවා
දැක: නුඹලා මෙතැන දවස මුළුල්ලේ
නිකම් සිටින්නේ මක්නිසාදැයි ඔවුන්ගෙන්
ඇසුවේය. කිසිවෙකු විසින් අප කුලියට 7
නොගත් නිසායයි ඔව්හු කීවෝය. එවිට
ඔහු: නුඹලාත් මිදිවත්තට පලයල්ලායයි
ඔවුන්ට කීවේය. සවස්වූ කල මිදි- 8
වත්තේ ස්වාමියා තමාගේ ගබඩා-
කාරයාට කථාකොට: වැඩකාරයන්
කැඳවා අන්තිමයන්ගෙන් පටන්ගෙන
පළමුවෙනියන් දක්වා ඔවුන්ට කුලිය
දීපන්නැයි කීවේය. එවිට එකොළොස්- 9
වෙනි පැය පමණේදී කුලියට ගන්නාලද
අය ඇවිත් එක එකා මස්සක් බැගින්
ලැබුවෝය. පළමුවෙනියෝ ඇවිත්, 10
තමුන්ට වැඩියෙන් ලැබේයයි සිතුවෝය;
නුමුත් ඔව්හුද එක එකා මස්සක් බැගින්ම
ලැබුවෝය. එය ලැබූ කල ඔව්හු ගෙදර 11
ස්වාමියාට විරුද්ධව කොඳුරමින්: මේ 12

අන්තිමයෝ එක පැයක් පමණ
වැඩකළෝය, නුමුත් ඔබ දවසේ බරත්
අව්රස්නයත් දරුවාවූ අපට ඔවුන්
13 සමානකෙළෙහියයි කීවෝය. එහෙත් ඔහු
ඔවුන්ගෙන් එක්කෙනෙකුට උත්තරදෙමින්:
යහළුව, මා නුඹට අයුක්තක් කරනවා
නොවේ. නුඹ මා සමග මස්සකට
14 පොරොන්දුවුණා නොවේද? නුඹ සන්තක
දේ රැගෙන පලයන්න; නුඹට දුන්
හැටියටම මේ අන්තිමයාටත් දෙන්ට
15 කැමැත්තෙමි. මා සන්තක දෙයින් මාගේ
කැමැත්ත කිරීම යුතු නැද්ද? මා යහපත්
නිසා නුඹේ ඇස නපුරුදැයි කීවේය.
16 මෙසේ අන්තිමයෝ ප්‍රථමයෝද ප්‍රථමයෝ
අන්තිමයෝද වන්නෝයයි කීසේක.

## යේසුස්වහන්සේ තුන්වෙනි වර තමන් මරණය ගැන කලින් කීම

17 යේසුස්වහන්සේ යෙරුසලමට යන කල
ගෝලයන් දෙළොස්දෙනා වෙන්කොටගෙන
18 මගදී ඔවුන්ට කථාකොට: අපි
යෙරුසලමට යමුව; මනුෂ්‍ය පුත්‍රයා
නායක පූජකයන්ටත් ලියන්නන්ටත්
පාවාදෙනු ලබන්නේය; ඔව්හුද ඔහු
19 මරණයට නියමකොට, කවටකම්කිරීමටත්
තැළීමටත් කුරුසියෙහි ඇණගැසීමටත්
අන්‍යජාතීන්ට පාවාදෙන්නෝය. නුමුත්
තුන්වෙනිද ඔහු නැගුටුවනු ලබන්නේයයි
කීසේක.

## ලෞකික ගරුබුහුමන් පිළිබඳ ඉල්ලීමක්

20 එකල සෙබදීගේ පුත්‍රයන්ගේ මවු ඇගේ
පුත්‍රයන් සමග උන්වහන්සේ ළඟට ඇවිත්,
නමස්කාරකොට, වරයක් ඉල්ලුවාය.
21 උන්වහන්සේ: නුඹට ඕනෑ කුමක්දැයි
ඇගෙන් ඇසූසේක. ඈද: ඔබගේ
රාජ්‍යයෙහිදී මේ මාගේ පුත්‍රයන්
දෙදෙනාගෙන් එක්කෙනෙක් ඔබගේ
දකුණු පැත්තේද එක්කෙනෙක් වම්
පැත්තේද හිඳින්ට නියමකළ මැනවයි
22 කීවාය. නුමුත් යේසුස්වහන්සේ උත්තර
දෙමින්: නුඹලා ඉල්ලන්නේ කුමක්දැයි
නුඹලා දන්නේ නැත. මා බොන්ට යන
කුසලානෙන් බොන්ට නුඹලාට පුළුවන්දැයි
ඇසූසේක. අපට පුළුවනැයි ඔව්හු
උන්වහන්සේට කීවෝය. උන්වහන්සේ 23
ඔවුන්ට කථාකොට: ඒකාන්තයෙන්
නුඹලා මාගේ කුසලානෙන් බොන්නහුය.
නුමුත් මාගේ දකුණු පැත්තේද වම්
පැත්තේද ඉන්ට දීම මට අයිති නැත,
එහෙත් මාගේ පියාණන් විසින් ඒවා
යමෙකුට නියමකරනලද්දේද ඔවුන්ටයයි
කීසේක. එවිට දසදෙන ඒ අසා ඒ 24
සහෝදරයන් දෙදෙනා ගැන කිපුණෝය.

## සැබෑ උතුම්කම

නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් 25
ළඟට කැඳවා: අන්‍යජාතීන්ගේ ආණ්ඩු-
කාරයින් ඔවුන් කෙරේ අධිපතිකම් කරන
බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන්
කෙරේ බලය පවත්වන බවත් නුඹලා
දනිහුය. නුඹලා අතරේ එසේ නො- 26
වන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම්
වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ
සේවකයා වන්නේය. නුඹලා අතරේ 27
යමෙක් ප්‍රධානයා වෙන්ට කැමති නම්
ඔහු නුඹලාගේ දසයා වන්නේය. එසේම 28
මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව
සේවයකරන්ටද බොහෝ දෙනෙක්
උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ
ජීවිතය දෙන්ටද ආවේයයි කීසේක.

## අන්ධයන් දෙදෙනෙකුගේ ඇස් පෑදවීම

ඔවුන් යෙරිකෝවෙන් පිටත්ව යන අතර 29
මහත් සමූහයක් උන්වහන්සේ අනුව
ගියෝය. පාර අද්දර ඉඳගනහුන් 30
අන්ධයන් දෙදෙනෙක් යේසුස්වහන්සේ
ඒ ළඟින් යන බව අසා: ස්වාමිනි,
දවිත්ගේ පුත්‍රය, අපට කරුණාකළ
මැනවයි මොරගැසුවෝය. ඔවුන් 31
නිශ්ශබ්දවන පිණිස සමූහයා ඔවුන්ට
සැරකළෝය. නුමුත් ඔව්හු: ස්වාමිනි,
දවිත්ගේ පුත්‍රය, අපට කරුණාකළ
මැනවයි වඩ වඩා මොරගැසුවෝය.
යේසුස්වහන්සේ නැවතී ඔවුන් කැඳවා: 32
මා විසින් නුඹලාට කුමක් කරනවාට
කැමතිදැයි ඇසූසේක. ස්වාමිනි, අපේ ඇස් 33
පහදනු ලැබීමටයයි ඔව්හු උන්වහන්සේට

34 කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට
අනුකම්පාකරමින්, ඔවුන්ගේ ඇස්
අතගෑසේක. එවලේම ඔව්හු පෙනීම ලැබ
උන්වහන්සේ අනුව ගියෝය.

## යේසුස්වහන්සේ රජෙකු සේ යෙරුසලමට ඇතුල්වීම

21 ඔවුන් යෙරුසලමට ළංව ඔලීව
කන්දට සමීපවූ බෙත්පාගයට
පැමිණි කල, යේසුස්වහන්සේ ගෝලයන්
2 දෙදෙනෙකු යවමින්: නුඹලා ඉදිරිපිට
තිබෙන ගමට පලයල්ලා, ගියකෙණෙහිම
එහි කොටළුදෙනක්ද ඈ සමග
පැටවෙක්ද බැඳ සිටිනවා නුඹලාට
සම්බවෙයි. උන් ලිහා මා ළඟට
3 ගෙනෙල්ලා. යමෙක් නුඹලාට කිසිවක්
කීවොත්: ස්වාමීන්වහන්සේට උන්
ඕනෑකෙරේයයි කියාපල්ලා; එවිට ඔහු
එවලේම උන් එවන්නේයයි ඔවුන්ට
කීසේක.
4 මෙසේ වූයේ,
බලව, තිගේ රජ කොටළුවෙකු පිටද,
කොටළුවෙකුගේ පැටවාවූ වස්සෙකු
පිටද නැගී,
මොළොක් ගුණයෙන් යුක්තව
තී වෙතට එනසේකැයි
සියොන්ගේ දූවට කියාපල්ලායයි
5 අනාගතවක්තෘහු කරණකොටගෙන
කියනලද කාරණාව සම්පූර්ණවන
6 පිණිසය. ගෝලයෝ ගොස් යේසුස්-
වහන්සේ නියමකළ ලෙස කර,
7 කොටළුදෙනත් පැටියත් ගෙනවුත්
තමුන්ගේ වස්ත්‍ර උන් පිට එළුවෝය;
උන්වහන්සේ ඒ පිට හිඳගත්සේක.
8 සමූහයාගෙන් වැඩිදෙනා තමුන්ගේ වස්ත්‍ර
මග අතුළෝය; තවත් සමහරු ගස්-
9 වලින් අතු කපා මග අතුළෝය. පෙර
පසුව ගිය සමූහයෝ: දාවිත්ගේ
පුත්‍රයාට හෝසන්නාය කියාත්,
ස්වාමීන්වහන්සේගේ නාමයෙන් එන
තැනැත්තේ ආශීර්වාදලද්දේය කියාත්,
ඉතා උස්තැන්හි හෝසන්නාය
10 කියාත් මොරගැසුවෝය. උන්වහන්සේ
යෙරුසලමට ඇතුල්වූ කල මුළු නුවර
11 කැලඹී: මේ කවුදැයි කීවෝය. සමූහයෝද:
මූන්වහන්සේ ගලීලයේ නාසරෙත් නුවර
අනාගතවක්තෘවූ යේසුස්වහන්සේයයි
කීවෝය.

## දේවමාළිගාව පවිත්‍රකිරීම

යේසුස්වහන්සේ දේවමාළිගාවට 12
ඇතුල්ව, මාළිගාවෙහි විකුණමින්ද
මිලේට ගනිමින්ද සිටි සියලු දෙන පිටතට
එළවා, මිල මාරුකරන්නන්ගේ මේසද
පරෙවියන් විකුණන්නන්ගේ ආසනද
පෙරළාදමා: මාගේ ගෘහය යාච්ඤා 13
ගෘහයක්ය කියනු ලබන්නේයයි ලියා
තිබේ. නුමුත් නුඹලා ඒක සොරුන්ගේ
ගුහාවක් කරතියි ඔවුන්ට කීසේක.
අන්ධයෝද කොරුද දේවමාළිගාවෙහි 14
උන්වහන්සේ වෙතට ආවෝය.
උන්වහන්සේ ඔවුන්ට සුවකළසේක.
එහෙත් නායක පූජකයොත් ලියන්නොත් 15
උන්වහන්සේ කළ පුදුම දේවල්ද දාවිත්ගේ
පුත්‍රයාට හෝසන්නාය කිය කියා දේව
මාළිගාවේ මොරගසන දරුවන්ද දැක,
කිපී: මොවුන් කියන දේ ඔබට 16
ඇසෙනවාදැයි උන්වහන්සේට කීවෝය.
යේසුස්වහන්සේද: එසේය, බාලයන්ගේද
කිරි බොන දරුවන්ගේද මුඛයෙන් ඔබ
ප්‍රශංසාව සම්පූර්ණකර තිබේය යන්න
නුඹලා කිසිකලක කියෙවුවේ නැද්දැයි
ඔවුන්ට කීසේක. උන්වහන්සේ ඔවුන් 17
අත්හැර නුවරින් පිටත්ව බෙතානියට
ගොස්, එහි සිටිසේක.

## එලනැති අත්තික්කා ගහ

අලුයම නුවරට නැවත යන අතර 18
උන්වහන්සේට බඩගිනිවිය. උන්වහන්සේ 19
පාර අද්දර තිබෙන අත්තික්කා ගහක්
දැක ළඟට ගොස්, එහි කොළ මිස
වෙන කිසිවක් නොදැක: මෙතැන් පටන්
කිසිකලක තාගෙන් එල හට නොගනීවයි
ඒ ගහට කීසේක. අත්තික්කා ගහ
වහාම වියළුණේය. ගෝලයෝ ඒ දැක: 20
අත්තික්කා ගහ වහාම වියළුණේ
කෙසේද කියා මවිතවූවෝය. යේසුස්-
වහන්සේ උත්තරදෙමින්: සැබවක් 21
නුඹලාට කියමි—නුඹලා සැක නොකොට,

ඇදහිල්ල ඇතුව සිටිනවානම්, අත්තික්කා
ගහට කළ දේ තුඹලා කරනවා පමණක්
නොව: ඉදිරී මුහුදේ වැටෙවයි මේ කන්දට
22 කීවත් එය සිද්ධවන්නේය. තවද තුඹලා
ඇදහිල්ල ඇතුව යාච්ඤාවෙන් ඉල්ලන
කොයි දෙයක් නුමුත්, ඒ සියල්ල තුඹලාට
ලැබේයයි ඔවුන්ට කීසේක.

## යේසුස්වහන්සේගේ බලය ගැන ප්‍රශ්නකිරීම

23 උන්වහන්සේ දේවමාළිගාවට ඇතුල්ව
උගන්වමින් සිටියදී නායක පූජකයෝද
සෙනඟගේ වැඩිමහල්ලෝද උන්වහන්සේ
ළඟට ඇවිත්: තුඹ මේ දේ කරන්නේ
මොන බලයකින්ද? මේ බලය තුඹට
24 දුන්නේ කවුද්දයි ඇසුවෝය. යේසුස්-
වහන්සේ උත්තරදෙමින්: මමත්
තුඹලාගෙන් එක ප්‍රශ්නයක් අසමි–තුඹලා
ඒක මට කියන්නහුනම් මමද මේ
කාරණා අසවල් බලයෙන් කරමියි
25 තුඹලාට එසේම කියන්නෙමි. යොහන්ගේ
*බව්තීස්මය වූයේ කොතැනින්ද? ස්වර්ග-
යෙන්ද? නොහොත් මනුෂ්‍යයන්ගෙන්දැයි
ඇසූසේක. ඔව්හු තම තමුන් අතරේ
කථාකරගෙන: ස්වර්ගයෙනැයි කියමු
නම්, ඔහුව අදහා නොගත්තේ
මක්නිසාදැයි අපෙන් අසනවා ඇත.
26 මනුෂ්‍යයන්ගෙනැයි කියමු නම්, යොහන්
අනාගතවක්තෘ කෙනෙකු කොට
සියල්ලන් විසින් සලකන හෙයින් අපි
27 සමූහයාට භයයයි කියා: අපි නොදනිමු-
යයි යේසුස්වහන්සේට උත්තරදුන්නෝය.
උන්වහන්සේද: මේ දේවල් අසවල්
බලයෙන් කරමියි මමත් තුඹලාට
නොකියමියි ඔවුන්ට කීසේක.

## පුත්‍රයන් දෙදෙනා ගැන උපමාව

28 නුමුත් තුඹලා සිතන්නේ කුමක්ද? එක්
මනුෂ්‍යයෙකුට පුත්‍රයන් දෙදෙනෙක්
සිටියෝය; ඔහු පළමුවෙනියා ළඟට
ඇවිත්: පුත්‍රය, ගොස් අද මිදිවත්තේ
29 වැඩකරපන්නැයි කීවේය. ඔහු උත්තරදෙමින්:
30 නොයමියි කීවේය; නුමුත් පසුව
පසුතැවිලිවී ගියේය. ඔහු දෙවෙනියා
ළඟට ඇවිත් එසේම කීවේය. ඔහු
උත්තරදෙමින්: ස්වාමිනි, යමියි කීවේය;
නුමුත් ගියේ නැත. ඒ දෙදෙනාගෙන් 31
පියාගේ කැමැත්ත කළේ කවුද්දයි ඇසූ-
සේක. පළමුවෙනියායයි ඔව්හු කීවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට කියන-
සේක්: සැබවක් තුඹලාට කියමි,
සුංගම් අයකරන්නොත් වේශ්‍යාවොත්
තුඹලාට පළමුවෙන් දෙවියන්වහන්සේගේ
රාජ්‍යයට ඇතුල්වෙති. මක්නිසාද යොහන් 32
ධර්මිෂ්ඨකම නැමති මාර්ගයෙන් තුඹලා
ළඟට ආවේය, එහෙත් තුඹලා ඔහු
අදහා නොගත්තහුය. නුමුත් සුංගම්
අයකරන්නොත් වේශ්‍යාවොත් ඔහු
අදහාගත්තෝය. තුඹලා ඒ දැකත්
ඔහු අදහාගන්න පිණිස පසුවවත්
පසුතැවිලිවූණේ නැත.

## මිදිවත්ත ගැන උපමාව

තවත් උපමාවක් අසාපල්ලා: එක් 33
ගෙදර ස්වාමියෙක් මිදිවත්තක් වවා,
වටේට වැට බැඳ, එහි මුද්‍රික යන්ත්‍රයක්
හාරා තබා, කොතක් බැඳ ගොවීන්ට
බදුදී, වෙන රටකට ගියේය. එල නෙළන 34
කාලය ළංවූ කල තමාට අයිති එල
ලබාගන්නා පිණිස ඔහු තමාගේ දසයන්
ගොවීන් වෙතට යැවීය. එවිට ගොවියෝ 35
ඔහුගේ දසයන් අල්ලා, එකෙකුට
ගැසුවෝය, එකෙකු මැරුවෝය, තවත්
කෙනෙකුට ගල් ගැසුවෝය. නැවතත් 36
ඔහු පළමුවෙනි අයට වඩා වැඩි ගණනක්
වෙන දසයන් යැවීය. ඔව්හු ඔවුන්ටත්
එසේම කළෝය. පසුව ඔහු: මාගේ 37
පුත්‍රයාට ඔවුන් ගෞරවකරනවා ඇත
කියා, තමාගේ පුත්‍රයා ඔවුන් ළඟට
යැවීය. නුමුත් ගොවියෝ පුත්‍රයා දැක: 38
මොහු උරුමක්කාරයාය; වරෙල්ලා,
මොහු මරා මොහුගේ උරුමය ගනිමුයයි
ඔවුනොවුන් කථාකොට, ඔහු අල්ලා 39
මිදිවත්තෙන් පිටතට දමා මැරුවෝය.
එබැවින් මිදි වත්තේ ස්වාමියා ආ කල 40
ඒ ගොවීන්ට කුමක් කරන්නේදැයි
ඇසූසේක. ඔව්හු කථාකොට: ඔහු 41
ඒ නපුරු මනුෂ්‍යයන් භයානකලෙස
විනාශකොට, නියම කාලවලදී තමාගේ
එල කොටස දෙන්නාවූ වෙන ගොවීන්ට

*අවගාහනය.

තමාගේ මිදිවත්ත භාරදෙන්නේයයි
42 කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට
කියනසේක්:

ගෙවල් සාදන්නන් විසින් එපාකළ
ගලම
කොනෙහි ප්‍රධාන ගල කරනු ලැබීය.
මෙය ස්වාමීන්වහන්සේ කෙරෙන් විය.
අපේ ඇස්වලට ඒක ආශ්චර්යයක්ය

යනු ශුද්ධ ලියවිලිවල නුඹලා කිසිකලක
43 කියෙවුවේ නැද්ද? එබැවින් නුඹලාට
මම කියමි–දෙවියන්වහන්සේගේ රාජ්‍යය
නුඹලාගෙන් අහක්කොට එහි ඵල
උපදවන ජාතියකට දෙනු ලබන්නේය.
44 මේ ගල පිට වැටෙන්නා පොඩිවී
යන්නේය. නුමුත් ඒක යමෙකු පිට
වැටුණොත්, ඒක ඔහු ධූලි මෙන් සුනුකර
45 දමන්නේයයි කීසේක. නායක පූජකයෝත්
ඵරිසිවරුත් උන්වහන්සේගේ උපමා
අසා, ඒවා තමුන් ගැන කී බව දැන,
46 උන්වහන්සේ අල්ලන්ට සෙවුවෝය. නුමුත්
උන්වහන්සේ අනාගතවක්තෘ කෙනෙකැයි
සමූහයා සැලකූ නිසා ඔවුන්ට
හයවූවෝය.

## සරණ මංගල්‍යය පිළිබඳ උපමා කථාව

22 යේසුස්වහන්සේ උත්තරදෙමින්
නැවතත් උපමාවලින් කථාකොට:
2 තමාගේ පුත්‍රයාට සරණ මංගල්‍යයක්
පිළියෙළකළ එක්තරා රජෙකුට ස්වර්ග-
3 රාජ්‍යය සමානකරනු ලැබේ. ඔහු සරණ
මංගල්‍යයට ආමන්ත්‍රණය ලැබූවන්
කැඳවන පිණිස තමාගේ දසයන් යැවූවේය.
නුමුත් ඔව්හු එන්ට අකමැතිවූවෝය.
4 නැවතත් ඔහු වෙන දසයන් යවමින්:
මෙන්න, මාගේ කෑම පිළියෙළකර
තිබේ. මාගේ ගොන්නුද තර සත්තුද
මරනලද්දෝය, සියල්ල සූදානම්ව
තිබේ. මංගල්‍යයට වරෙල්ලාය කියා
ආමන්ත්‍රණය ලැබූ අයට කියාපල්ලා-
5 යයි කීවේය. නුමුත් ඔව්හු ඒ
නොසලකා, එක්කෙනෙක් තමාගේම
කෙතටත්, අන් කෙනෙක් තමාගේ
6 වෙළඳාමටත් ගියෝය. සෙස්සෝ ඔහුගේ
දසයන් අල්ලා, නිග්‍රහකොට, මැරුවෝය.
රජ්ජුරුවෝ උදහස්වී, තමාගේ යුද්ධ- 7
සේනාවන් යවා ඒ මිනීමරුවන්
විනාශකොට, ඔවුන්ගේ නුවර ගිනි-
ලැවූවේය. එවිට ඔහු තමාගේ දසයන්ට 8
කථාකොට: මංගල්‍යය සූදානම්කර තිබේ;
නුමුත් ආමන්ත්‍රණය ලැබූවෝ සුදුස්සෝ
නොවෙති. ඒ නිසා නුඹලා මංසන්ධිවලට 9
ගොස් සම්බවෙන සියල්ලන් මංගල්‍යයට
කැඳවා ගෙනෙල්ලායයි කීවේය. ඒ 10
දසයෝ මහ මාවත්වලට ගොස් තමුන්ට
සම්බවූ යහපත් අයහපත් සියල්ලන්
රැස්කළෝය. අමුත්තන්ගෙන් මංගල්‍ය
ශාලාව පිරුණේය. එහෙත් රජ්ජුරුවෝ 11
අමුත්තන් දකින්ට පැමිණි කල, එහි
මංගල්‍ය වස්ත්‍රයක් නැඳ සිටි මනුෂ්‍යයෙකු
දැක: යහළුව, මංගල්‍ය වස්ත්‍රයක් නැතුව 12
නුඹ කෙසේ මෙතැනට ආයෙහිදැයි ඔහුට
කීහ. ඔහු වාක්රහිත විය. එවිට 13
රජ්ජුරුවෝ කථාකොට: මොහුගේ අත්පා
බැඳ, මොහු පිටත අන්ධකාරයෙහි
දමාපල්ලා; එහිදී හැඬීමත් දත්මිටිකෑමත්
වන්නේයයි සේවකයන්ට කීවේය.
මක්නිසාද කැඳවනු ලැබූවෝ බොහෝය, 14
තෝරාගනු ලැබූවෝ ස්වල්පයයි කීසේක.

## ආදයම් සම්බන්ධ ප්‍රශ්නයක්

එවිට ඵරිසිවරු ගොස්, කථාවෙන් 15
උන්වහන්සේ කෙසේ අසුකරගනිමුදැයි
මන්ත්‍රණයකළෝය. ඔව්හු හෙරෝදිවරුන් 16
සමග තමුන්ගේ ගෝලයන් උන්වහන්සේ
ළඟට යැවූවෝය. ඔව්හුද: ආචාරීන්-
වහන්ස, ඔබ සැබෑ කෙනෙක් බවත්,
දෙවියන්වහන්සේගේ මාර්ගය සැබෑලෙස
උගන්වන බවත්, මනුෂ්‍යයන්ගේ තරාතිරම්
නොබලන බැවින් කිසිවෙකු නොසලකන
බවත් දනිමු. එබැවින් ඔබ සිතන්නේ 17
කුමක්ද? කායිසර්ට ආදයම් දීම යුතුද
අයුතුද කියා අපට කිව මැනවයි
කීවෝය. නුමුත් යේසුස්වහන්සේ ඔවුන්ගේ 18
දුෂ්ටකම දැන: වංචාකාරයෙනි, නුඹලා
මා පරීක්ෂාකරන්නේ මක්නිසාද? ආදයම් 19

බිලය මට පෙන්වාපල්ලායයි කීසේක.
ඔව්හු මස්සක් උන්වහන්සේ ළඟට
20 ගෙනාවෝය. මේ රූපයත් සටහනත්
කාගේදැයි උන්වහන්සේ ඔවුන්ගෙන්
21 ඇසූසේක. කායිසර්ගේයයි ඔව්හු කීවෝය.
එවිට උන්වහන්සේ: එබැවින් කායිසර්ගේ
දේ කායිසර්ටත් දෙවියන්වහන්සේගේ
දේ දෙවියන්වහන්සේටත් දීපල්ලායයි
22 ඔවුන්ට කීසේක. ඔව්හු ඒ අසා මවිතව,
උන්වහන්සේ අත්හැර ගියෝය.

## නැවත-නැගිටීම ගැන ප්‍රශ්නයක්

23 නැවත-නැගිටීමක් නැතැයි කියන
සද්දුසිවරු එදා උන්වහන්සේ වෙතට
24 ඇවිත්: ආචාරීන්වහන්ස, යමෙකු දරුවන්
නොලැබ මළොත්, ඔහුගේ සහෝදරයා
විසින් ඔහුගේ භාර්යාව සරණපාවාගෙන,
සහෝදරයා නමට දරුවන් උපදවන්ට
ඕනැයයි මෝසෙස් විසින් කියා තිබේ.
25 අප අතරේ සහෝදරයෝ සත්දෙනෙක්
සිටියෝය. පළමුවෙනියා භාර්යාවකු
සරණපාවාගෙන දරුවන් නොලැබ
මැරුණු බැවින් ඔහුගේ භාර්යාව
26 සහෝදරයාට වූවාය. දෙවෙනි තුන්වෙනි
සත්වෙනි තැනැත්තා දක්වාත් එසේම
27 වූයේය. සියල්ලන්ට පසු ස්ත්‍රීද නැසුණාය.
28 සියල්ලන්ම ඈ සරණපාවාගත් හෙයින්,
නැවත-නැගිටීමේදී ඈ ඒ සත්දෙනාගෙන්
කාගේ භාර්යාව වන්නීදැයි ඇසුවෝය.
29 යේසුස්වහන්සේ උත්තරදෙමින්: තුඹලා
ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ
බලයවත් නොදැන, වරද්දගනිහුය.
30 මක්නිසාද නැවත-නැගිටීමේදී ඔවුන්
සරණපාවාගන්නෝවත් සරණපාවා
දෙන්නෝවත් නැත, එහෙත් ස්වර්ගයෙහි
31 දේවදූතයන් හා සමාන වෙති. තුමුත්
මළවුන්ගේ නැගිටීම සම්බන්ධව නම්:
මම ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේය,
ඊසාක්ගේ දෙවියන්වහන්සේය, යාකොබ්ගේ
දෙවියන්වහන්සේයයි දෙවියන්වහන්සේ
තුඹලාට කී බව තුඹලා කියෙවුවේ
32 නැද්ද? දෙවියන්වහන්සේ මළවුන්ගේ
නොව ජීවතුන්ගේ දෙවියන්වහන්සේයයි
33 කීසේක. සමූහයෝ ඒ අසා, උන්-
වහන්සේගේ ඉගැන්වීම ගැන විස්ම-
පත්වූවෝය.

## ඉතා උතුම් ආඥාව ගැන ප්‍රශ්නයක්

උන්වහන්සේ සද්දුසිවරුන් නිශ්ශබ්ද 34
කළ බව ඵරිසිවරු අසා, එකට
රැස්වූවෝය. ඔවුන් අතරෙන් ව්‍යවස්ථාව 35
උගන්වන්නෙක් උන්වහන්සේ පරීක්ෂා
කරමින්: ආචාරීනි, ව්‍යවස්ථාවෙහි ඉතා 36
උතුම් ආඥාව කොයි එකදැයි ඇසුවේය.
උන්වහන්සේ ඔහුට කථාකොට: තාගේ 37
මුළු හෘදයෙන්ද තාගේ මුළු ආත්මයෙන්ද
තාගේ මුළු බුද්ධියෙන්ද තාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේට ප්‍රේමකරව. මේක 38
උතුම්වූ පළමුවෙනිවූ ආඥාවය. මෙය හා 39
සමාන දෙවෙනි එකක් තිබේ, එනම්,
තට මෙන් තාගේ අසල්වාසියාට
ප්‍රේමකරව යනුය. මේ ආඥා දෙක පිට 40
මුළු ව්‍යවස්ථාවත් අනාගතවාක්‍යයත්
පිහිටා තිබේයයි කීසේක.

## මෙසියස්වහන්සේ ගැන ප්‍රශ්න විචාරීමක්

ඵරිසිවරු රැස්ව සිටියදී යේසුස්වහන්සේ 41
කථාකොට: ක්‍රිස්තුස් ගැන තුඹලා කුමක් 42
සිතවුද? උන්වහන්සේ කාගේ පුත්‍රයාදැයි
ඇසූසේක. දවිත්ගේ පුත්‍රයායයි
ඔව්හු කීවෝය. උන්වහන්සේ ඔවුන්ට 43
කියනසේක්: එසේවී නම් ආත්මයාණන්
කරණකොටගෙන දවිත් කථාකරමින්:
මා විසින් තුඹේ සතුරන් තුඹේ පාද 44
යට දමන තෙක්
මාගේ දකුණු පැත්තෙහි හිඳගනින්නැයි
ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්-
වහන්සේට කීසේකැයි
කියමින්, උන්වහන්සේට ස්වාමීන්-
වහන්සේයයි කියන්නේ කෙලෙසද?
මෙසේ දවිත් උන්වහන්සේට ස්වාමීන්- 45
වහන්සේයයි කියන්නේ නම්, උන්වහන්සේ
ඔහුගේ පුත්‍රයා වන්නේ කෙසේදැයි ඇසූ-
සේක. උන්වහන්සේට වචනයක්වත් කියා 46
උත්තරදෙන්ට කිසිවෙකුට නුපුළුවන්විය,
එදා පටන් උන්වහන්සේගෙන් තවත් ප්‍රශ්න
අසන්ට කිසිවෙකුට ධෛර්යය තිබුණේත්
නැත.

## ලියන්නන්ටත් ඵරිසිවරුන්ටත් දුක්වේයයි කීම

23 එකල යේසුස්වහන්සේ සමූහ-
යන්ටත් තමන් ගෝලයන්ටත්
2 කථාකොට: ලියන්නෝද ඵරිසිවරුද
3 මෝසෙස්ගේ ආසනයෙහි හිඳිති. එබැවින්
ඔවුන් නුඹලාට අණකරන සියල්ල
ඉෂ්ටකර පවත්වාපල්ලා. නුමුත් ඔවුන්ගේ
ක්‍රියා ලෙස නොකරල්ලා; මක්නිසාද
ඔවුන් කියනවා මිස කරන්නේ නැත.
4 එසේය, ඔව්හු උසුලන්ට අමාරු මහත්
බර බැඳ මනුෂ්‍යයන්ගේ කරේ තබති;
නුමුත් තමුන්ගේ ඇඟිල්ලවත් ඒවාට
5 තබන්ට කැමති නොවෙති. ඔවුන් කරන
සියල්ලම කරන්නේ මනුෂ්‍යයන්ට
පෙනෙන පිණිසය. ඔව්හු තමුන්ගේ
පිලාක්තරී පළල්කර (තමුන්ගේ වස්ත්‍රවල)
6 දවුලු මහත් කරති, මංගල්‍යවලදී ප්‍රධාන
ස්ථානයටද සිනගෝගවලදී ප්‍රධාන
7 ආසනවලටද, වෙළඳම්පළවලදී ආචාර
ලැබීමටද මනුෂ්‍යයන් විසින් රබ්බියි
8 කියනු ලැබීමටද කැමතිවෙති. නුමුත්
නුඹලා රබ්බියි කියවා නොගනිල්ලා.
මක්නිසාද නුඹලාගේ ආචාරීන්වහන්සේ
එක්කෙනෙක්මය, නුඹලා සියල්ලෝම
9 සහෝදරයෝය. පොළොවෙහි කාටවත්
පියාණෝයයි නොකියල්ලා. මක්නිසාද
නුඹලාගේ පියාණෝ එක්කෙනෙක්මය,
එනම් ස්වර්ගයෙහි සිටින උන්වහන්-
10 සේමය. නුඹලා නායකයෝයයි කියවා
නොගනිල්ලා. මක්නිසාද නුඹලාගේ
නායකයාණෝ එක්කෙනෙක්මය, එනම්
11 ක්‍රිස්තුස්වහන්සේය. නුමුත් නුඹලා
අතරෙන් ඉතා උත්තමයා නුඹලාගේ
12 සේවකයා වන්නේය. තමාම
උසස්කරගන්න කවරෙක් නුමුත්
පහත්කරනු ලබන්නේය; තමාම
පහත්කරගන්න කවරෙක් නුමුත්
උසස්කරනු ලබන්නේය.
13 ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ
නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා
මනුෂ්‍යයන්ට එන්ට නොදී ස්වර්ගරාජ්‍යය
වසා, නුඹලාම ඇතුල්වෙන්නේවත්
ඇතුල්වෙමින් සිටින්නන්ට ඇතුල්වෙන්ට
ඉඩදෙන්නේවත් නැත.*

ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ 15
නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා
එක්කෙනෙකු හරවාගන්න පිණිස මුහුදත්
ගොඩත් හැමතැනම ඇවිදින්නහුය;
හරවාගත්තාම, නුඹලාටත් වඩා
දෙගුණයක් ඔහු නිරයේ පුත්‍රයෙකු
කරන්නහුය.
අන්ධවූ මග පෙන්වන්නෙනි, නුඹලාට 16
දුක්වේ! මක්නිසාද: යමෙක් දේවමාළිගාව
ගැන දිවුවොත් එයින් කාරියක් නැත
කියාද යමෙක් දේවමාළිගාවේ රන් ගැන
දිවුවොත් ඔහු බැඳී සිටීය කියාද නුඹලා
කියන්නෝය. අඥනයෙනි, අන්ධයෙනි, 17
වඩා උතුම් කොයි එකද? රන්ද? රන්
විශුද්ධකළ දේවමාළිගාවද? තවද: 18
යමෙක් පූජාසනය ගැන දිවුවොත් එයින්
කාරියක් නැත කියාද යමෙක් ඒ පිට
තිබෙන පඬුර ගැන දිවුවොත් ඔහු බැඳී
සිටීය කියාද නුඹලා කියන්නෝය.
අන්ධයෙනි, වඩා උතුම් කොයි එකද? 19
පඬුරද? පඬුර විශුද්ධකරන පූජාසනයද?
එබැවින් පූජාසනය ගැන දිවුරන්නා ඒ 20
ගැනද ඒ පිට තිබෙන සියල්ල ගැනද
දිවුරන්නේය. දේවමාළිගාව ගැන 21
දිවුරන්නා ඒ ගැනද එහි වසන
තැනන්වහන්සේ ගැනද දිවුරන්නේය.
ස්වර්ගය ගැන දිවුරන්නාද දෙවියන්- 22
වහන්සේගේ සිංහාසනය ගැනත් එහි
වැඩහිඳින තැනන්වහන්සේ ගැනත්
දිවුරන්නේය.
ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ 23
නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා
සුවඳතලාය, ශතපුෂ්පය, සුදුදුරුය යන
මෙයින් දසයෙන් කොටසක් දෙන්නහුය,
නුමුත් යුක්තියත් දයාවත් විශ්වාසකමත්
යන ව්‍යවස්ථාවේ වඩා වැදගත් කාරණා
නුඹලා විසින් අත්හැර තිබේ. ඒ දේවලුත්
නෑර මේවාත් කටයුතුව තිබුණේය.
අන්ධවූ මගපෙන්වන්නෙනි, නුඹලා 24
මදුරුවා බේරාදමා ඔටුවා ගිලගන්නහුය.
ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ 25
නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා
කුසලානද තැටියද පිටින් පවිත්‍ර-
කරන්නහුය, නුමුත් ඇතුළේ ඒවා
කොල්ලකෑමෙනුත් තෘෂ්ණාධිකකමෙනුත්
පිරී තිබේ. අන්ධවූ ඵරිසිය, කුසලානත් 26

*14 වෙනි පදය මාර්ක් 12.40, ලූක් 20.47 යන තැන්වලට පමණක් අයිතිය.

තැටියත් පිටින් පවිත්‍රවන පිණිස
පළමුකොට ඒවායේ ඇතුළ පවිත්‍ර-
කරපන්න.
27 ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ
තුඹලාට දුක්වේ! මක්නිසාද තුඹලා
සුදුකළ සොහොන් ගෙවලට සමානය,
ඒවා පිටින් ලක්ෂණව පෙනෙන
නුමුත් ඇතුළේ මිනීඇටවලින්ද සියලු
28 අපවිත්‍රකමෙන්ද පිරී තිබේ. එසේම
තුඹලාත් පිටතින් මනුෂ්‍යයන්ට
ධර්මිෂ්ඨව පෙනෙන්නහුය, නුමුත්
ඇතුළතින් වංචාවෙන්ද අයුතුකමෙන්ද
පිරී සිටින්නහුය.
29 ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ
තුඹලාට දුක්වේ! මක්නිසාද තුඹලා
අනාගතවක්තෘවරුන්ගේ සොහොන්
ගෙවල් සාද, ධර්මිෂ්ඨයන්ගේ සොහොන්
30 කොත් සරසා: අපේ පියවරුන්ගේ
කාලයේදී අපි සිටියෙමු නම්
අනාගතවක්තෘවරුන්ගේ ලේ වැගිරීමට
ඔවුන් සමග හවුල්කාරයෝ
31 නොවන්නෙමුයයි කියන්නහුය. මෙසේ
තුඹලා අනාගතවක්තෘවරුන් මැරුවන්ගේ
පුත්‍රයෝයයි තුඹලාම සාක්ෂිදෙන්නහුය.
32 තුඹලාත් තුඹලාගේ පියවරුන්ගේ මිම්ම
33 පූර්ණකරපල්ලා. සර්පයෙනි, පොළොං
වංශයෙනි, තුඹලා නිරයේ දඬුවමින්
34 කෙසේ ගැළවෙන්නහුද? එබැවින් මම
අනාගතවක්තෘවරුන්ද ප්‍රඥාවන්තයන්ද
ලියන්නන්ද තුඹලා ළඟට එවමි.
තුඹලා ඔවුන්ගෙන් සමහරෙකු
මරන්නහුය, කුරුසියෙහි ඇණගසන්නහුය;
සමහරෙකුට තුඹලාගේ සිනගෝගවලදී
තළා, ඔවුන් නුවරින් නුවරට එළවමින්
35 පීඩාකරන්නහුය. මෙසේ ධර්මිෂ්ඨවූ
ආබෙල්ගේ ලේ පටන් ශුද්ධස්ථානයටත්
පූජාසනයටත් අතරේ තුඹලා විසින්
මරනලද බරාකියාගේ පුත්‍රවූ සකරියාගේ
ලේ දක්වා පොළොවේදී වගුරුවනලද
සියලු ධර්මිෂ්ඨයන්ගේ ලේ තුඹලා පිටට
36 පැමිණෙන්නේය. සැබවක් තුඹලාට
කියමි—මේ සියල්ල මේ පරම්පරාව පිටට
පැමිණෙන්නේය.

## යෙරුසලම සඳහා දුක්වීම

37 අනේ අනාගතවක්තෘවරුන් මරන්නාවූ,
තී ළඟට එවූවන්ට ගල්ගසන්නාවූ
යෙරුසලම, යෙරුසලම, කිකිළී
ඇගේ පැටවුන් පියාපත් යටට
එකතුකරගන්නාක්මෙන් තිගේ දරුවන්
එකතුකරගන්ට මම කී වරක්
කැමතිවුණෙම්ද? එහෙත් තුඹලා 38
කැමතිවුණේ නැත. බලව, තුඹලාගේ
ගෘහය තුඹලාට පාළුකොට අත්හරිනු
ලැබේ. මක්නිසාද තුඹලාට කියමි: 39
ස්වාමීන්වහන්සේගේ නාමයෙන් එන
තැනැත්තා ආශීර්වාදලද්දේයයි තුඹලා
කියන තෙක් මෙතැන් පටන් තුඹලා මා
දකින්නේ නැතැයි කීසේක.

## දේවමාළිගාවේ විනාශය හා ලෝකාන්තිමය පිළිබඳ අනාගත කීම

24 යේසුස්වහන්සේ දේවමාළිගාවෙන්
නික්ම යන කල මාළිගාවේ
ගොඩනැගිලි උන්වහන්සේට පෙන්වන
පිණිස ගෝලයෝ උන්වහන්සේ ළඟට
ආවෝය. නුමුත් උන්වහන්සේ ඔවුන්ට 2
උත්තරදෙමින්: මේ සියල්ල තුඹලාට
පෙනෙනවා නොවේද? සැබවක් තුඹලාට
කියමි—කඩාදමනු නොලැබ ගලක් පිට
ගලක් මෙහි ඉතුරු නොවන්නේයයි
කීසේක.
උන්වහන්සේ ඔලීව කන්දේ වැඩහුන් 3
කල ගෝලයෝ තනිව උන්වහන්සේ ළඟට
ඇවිත්: ඒ දේ කොයි කලෙක
සිද්ධවන්නේද? ඔබවහන්සේගේ ඊමටත්
ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක්දැයි
අපට කිව මැනවයි කීවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: 4
කිසිවෙක් තුඹලා මුළා නොකරන ලෙස
බලාගනිල්ලා. මක්නිසාද බොහෝ 5
දෙනෙක්: මම ක්‍රිස්තුස්ය කියා මාගේ
නමින් ඇවිත් බොහෝ දෙනෙකු
මුළාකරන්නෝය. යුද්ධ සහ යුද්ධ 6
ප්‍රවෘත්ති ගැන තුඹලා අසනවා
ඇත. නොකැලඹෙන්ට බලාගනිල්ලා.
මක්නිසාද මේ සියල්ල සිදුවන්ට ඕනෑය;
නුමුත් ඒ වන තුරුත් අන්තිමය
නොපැමිණෙන්නේය. මක්නිසාද ජාතියක් 7
ජාතියකටද රාජ්‍යයක් රාජ්‍යයකටද

විරුද්ධව නැගිටිනවා ඇත. නොයෙක්
තැන්වල සාගතද පොළෝකම්පාද
8 සිදුවෙනවා ඇත. මේ සියල්ල වනාහි
9 ගාවිනාවල පටන්ගැන්මය. එකල ඔව්හු
තුඹලා පීඩා විඳීමට පාවාදී මරන්නෝය.
තුඹලා මාගේ නාමය නිසා සියලු
ජාතීන් විසින් වෛරකරනු ලබන්නහුය.
10 එකල බොහෝ දෙනෙක් බාධාවට
පැමිණ ඔවුනොවුන් පාවාදෙන්නෝය,
11 ඔවුනොවුන්ට වෛරවන්නෝය. නොයෙක්
බොරු අනාගතවක්තෘවරු නැගිට
බොහෝ දෙනෙකු මුළාකරන්නෝය.
12 අධර්මිෂ්ඨකම බෝවන බැවින් බොහෝ
13 දෙනාගේ ප්‍රේමය හීනවන්නේය. නුමුත්
අන්තිමය දක්වා ස්ථිරව සිටින්නාම
14 ගැළවෙන්නේය. රාජ්‍යයේ මේ ශුභාරංචිය
සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව
මුළුල්ලේ ප්‍රකාශකරනු ලබන්නේය; එවිට
අන්තිමය පැමිණෙන්නේය.
15 එබැවින් අනාගතවක්තෘවූ දනියෙල්
විසින් කියනලද පාළුකරන පිළිකුල
ශුද්ධස්ථානයෙහි තිබෙනවා තුඹලා
යම් කලෙක දක්නහුද (කියවන්නා
16 තේරුම්ගනීවා), එකල යුදයේ සිටින්නෝ
17 කඳුවලට පලායෙත්වා. ගේ උඩ සිටින්නා
තමාගේ ගෙයි තිබෙන දේ ගන්ට
18 නොබසීවා. කෙතෙහි සිටින්නාද තමාගේ
වස්ත්‍රය ගන්ට ආපසු හැරී නොඒවා.
19 නුමුත් ඒ දවස්වල ගර්භිණීන්ටත් කිරිදෙන
20 ස්ත්‍රීන්ටත් දුක්වේ. තුඹලාගේ පලායාම
ශීත කාලයේවත් සබත් දවසකවත්
නොවන ලෙස යාච්ඤාකරපල්ලා.
21 මක්නිසාද ලෝකයේ පටන්ගැන්මේ සිට
මේ දක්වා නූණාවූ, මතු කොයි-
කලෙකවත් නොවන්නාවූ මහත් පීඩාවක්
22 ඒ කාලයෙහි වන්නේය. ඒ දවස් ලුහුඬු
නොකරනලද්දේවීනම් කිසි කෙනෙක්
නොගැළවෙන්නේය. නුමුත් තෝරාගනු
ලැබූවන් උදෙසා ඒ දවස් ලුහුඬුකරනු
23 ලබන්නේය. එකල යමෙක් කථාකොට:
බලව, ක්‍රිස්තුස්වහන්සේ මෙතනය
නොහොත් එතනයයි තුඹලාට කියන්නේ
24 නම් විශ්වාස නොකරල්ලා. මක්නිසාද
බොරු ක්‍රිස්තුස්වරුද බොරු
අනාගතවක්තෘවරුද නැගිට පුළුවන්නම්
තෝරාගනු ලැබූවන් පවා මුළාකරන
ලෙස මහත් ලකුණුද පුදුමද
දක්වන්නෝය. බලව, මම තුඹලාට කලින් 25
කීවෙමි. එබැවින් ඔව්හු තුඹලාට 26
කථාකොට: අන්න, උන්වහන්සේ
වනාන්තරයෙහි සිටිනසේකැයි කියත් නම්,
පිටත්ව නොයල්ලා. උන්වහන්සේ ඇතුල්
ගෙවල සිටිනසේකැයි කියත් නම්,
විශ්වාස නොකරල්ලා. මක්නිසාද යම්සේ 27
විදුලිය පෙරදිගින් නික්ම අපරදිග දක්වා
පෙනේද, මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එසේම
වන්නේය. යම් තැනක මළකුණ ඇත්තේද 28
එතැන ගිජුලිහිණියෝ රැස්වන්නෝය.
තවද ඒ දවස්වල පීඩා පසුවූ 29
කෙනෙහිම, ඉර අඳුරුවන්නේය, සඳ
එහි එළිය නොදෙන්නේය, තාරකාවෝ
අහසෙන් වැටෙන්නෝය, අහසේ
බලපරාක්‍රමද සෙලවෙන්නෝය. එකල 30
මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ අහසේ
පෙනෙන්නේය. එවිට පොළොවේ සියලු
ගෝත්‍රයෝ වැලපෙන්නෝය, ඔව්හු
මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද මහත්
තේජසින්ද අහසේ වලාකුල් පිට එනවා
දකින්නෝය. උන්වහන්සේ මහත් 31
හොරණෑ ශබ්දයක් ඇතුව තමන් දූතයන්
එවනසේක, ඔව්හු අහසේ එක් කෙළවරක
සිට අනික් කෙළවර දක්වා සතර
දිගින්ම උන්වහන්සේගේ තෝරාගත්තවුන්
රැස්කරන්නෝය.

## අවදිව සූදානම්ව සිටිය යුතු බව

අත්තික්කා ගහේ උපමාව ඉගෙන- 32
ගනිල්ලා. එහි අතු මෘදුව කොළ
හටගන්න කල ග්‍රීෂ්ම කාලය ළඟ බව
තුඹලා දන්නහුය. එසේම තුඹලා මේ 33
සියල්ල දකින කල, උන්වහන්සේ දොරටු
සමීපයෙහිම බවත් දැනගනිල්ලා. සැබවක් 34
තුඹලාට කියමි—මේ සියල්ල සිදුවන
තුරු මේ පරම්පරාව පහව නොයන්නේය.
අහසත් පොළොවත් පහවන්නේය, නුමුත් 35
මාගේ වචන පහ නොවන්නේය. නුමුත් 36
ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ
මිස දන්නා කෙනෙක් නැත; ස්වර්ගයෙහි
දේවදූතයන්වත් පුත්‍රයාවත් දන්නේ නැත.

37 නෝවාගේ දවස් මෙන් මනුෂ්‍ය පුත්‍රයාගේ
38 ඊමත් වන්නේය. මක්නිසාද ජලගැලීමට
පළමු දවස්වලදී, නෝවා නැවට ඇතුල්වූ
දවස දක්වා, ඔව්හු කමින් බොමින්,
සරණපාවාගනිමින්, සරණපාවාදෙමින්
39 සිටියෝය. ජලගැල්ම පැමිණ සියල්ලන්ම
ගසාගෙනයන තුරු ඔව්හු නොදැන
සිටියෝය; මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත්
40 එලෙසම වන්නේය. එකල මනුෂ්‍යයන්
දෙදෙනෙක් කෙතෙහි සිටිනවා ඇත;
එක්කෙනෙක් ගනු ලබන්නේය,
එක්කෙනෙක් අත්හරිනු ලබන්නේය.
41 ස්ත්‍රියන් දෙදෙනෙක් ඇඹරුම්ගලේ
අඹරමින් සිටිනවා ඇත; එක්
තැනැත්තියක් ගනු ලබන්නීය, එක්
තැනැත්තියක් අත්හරිනු ලබන්නීය.
42 එබැවින් අවදිව සිටපල්ලා. මක්නිසාද
තුඹලාගේ ස්වාමියා කොයි දවසේ එන-
43 සේක්දැයි තුඹලා දන්නේ නැත. නුමුත්
සොරා කොයි යාමයේ එන්නේදැයි ගෙයි
ස්වාමියා දැනගන සිටියේ නම්, ඔහු
අවදිව සිටිමින් තමාගේ ගෙය උමං
කණින්ට නොදෙන බව දැනගනිල්ලා.
44 එබැවින් තුඹලාත් සෑදී සිටපල්ලා.
මක්නිසාද තුඹලා නොසිතන පැයකදී
මනුෂ්‍ය පුත්‍රයා එනසේක.

## යහපත් දසයන් සහ අයහපත් දසයන්ගේ උපමා කථාව

45 ඉඳින් ස්වාමියා විසින් තමාගේ ගෙයි
වැසියන්ට නියම වේලාවට කෑම දෙන්ට
ඔවුන් කෙරෙහි පත්කළ විශ්වාසවූ නුවණ
46 ඇති දසයා කවුද? ස්වාමියා එන කල
යම් දසයෙකු එසේ කරනවා දක්නේද,
47 ඒ දසයා ආශීර්වාදලද්දෙක්ය. සැබවක්
තුඹලාට කියමි–ඒ ස්වාමියා තමා
සන්තක සියල්ල කෙරෙහි ඔහු අධිපති
48 කරන්නේය. නුමුත් ඒ නපුරු දසයා:
මාගේ ස්වාමියා ප්‍රමාදවන්නේයයි
49 තමාගේ සිතින් සිතාගන, තමාගේ
සහකාර දසයන්ට තළන්ට පටන්ගෙන,
බේබද්දන් සමග කමින් බොමින්
50 සිටිනවා නම්, ඒ දසයාගේ ස්වාමියා
ඔහු බලා නොසිටින දවසක නොදන්නා
පැයක ඇවිත්, ඔහුට තදබලලෙස 51
අච්චුකොට, වංචාකාරයන් සමග ඔහුගේ
කොටස නියමකරන්නේය; එහිදී හැඬීමත්
දත්මිටිකෑමත් වන්නේය.

## කන්‍යාවන් දසදෙනාගේ උපමාව

25 එකල තමුන්ගේ පහන් රැගෙන
මනමාලයාගේ පෙරමගට ගිය
කන්‍යාවන් දස දෙනෙකුට ස්වර්ගරාජ්‍යය
සමානකරනු ලැබේ. ඔවුන්ගෙන් 2
පස්දෙනෙක් නුවණ නැත්තියෝය,
පස්දෙනෙක් නුවණ ඇත්තියෝය.
මක්නිසාද නුවණ නැත්තියෝ තමුන්ගේ 3
පහන් ගෙනයද්දී තමුන් සමග තෙල්
නොගෙනගියෝය. නුමුත් නුවණ 4
ඇත්තියෝ තමුන්ගේ පහන් සමග
තමුන්ගේ භාජනවල තෙල් ගෙනගියෝය.
මනමාලයාගේ ඊම ප්‍රමාදවූ කල ඒ 5
සියල්ලෝම නිදිබරව නිදගත්තෝය.
මධ්‍යම රාත්‍රියේ: අන්න, මනමාලයා 6
එනවා! ඔහුගේ පෙරමගට වරෙල්ලායයි
හඬක් වූයේය. එවිට ඒ සියලු කන්‍යාවෝ 7
නැගිට තමුන්ගේ පහන් හරිගැස්සුවෝය.
එකල නුවණ නැත්තියෝ: අපේ පහන් 8
නිවීගන යන නිසා තුඹලාගේ තෙලින්
අපටත් දියල්ලායයි නුවණ ඇත්තියන්ට
කීවෝය. නුමුත් නුවණ ඇත්තියෝ 9
උත්තරදෙමින්: සමහරවිට අපටත්
තුඹලාටත් මදිවෙයි. එසේ නොව
විකුණන්නන් ළඟට ගොස්, තුඹලාටම
මිලේට ගනිල්ලායයි කීවෝය. මිලේට 10
ගන්ට ඔවුන් ගිය අතර මනමාලයා
ආවේය; සෑදී සිටියෝ ඔහු සමග
සරණමංගල්‍යයට ඇතුල්වූවෝය. දොරද
වසනලද්දේය. පසුව අනික් කන්‍යාවෝත් 11
ඇවිත්: ස්වාමිනි, ස්වාමිනි, අපට දොර
හැරිය මැනවයි කීවෝය. නුමුත් ඔහු 12
උත්තරදෙමින්: සැබවක් තුඹලාට කියමි,
මම තුඹලා නාඳුනමියි කීවේය. එබැවින් 13
දවසවත් පැයවත් තුඹලා නොදන්න නිසා
අවදිව සිටපල්ලා.

## තලෙන්ත උපමාව

කුමක්හෙයින්ද එය වනාහි අන් රටකට 14
යන මනුෂ්‍යයෙක් තමාගේ දසයන් කැඳවා,

ඔවුන්ට තමා සන්තක දේ භාරදෙන්නාක්-
15 මෙන්ය. ඔහු එක්කෙනෙකුට තලෙන්ත
පහක්ද එක්කෙනෙකුට දෙකක්ද
එක්කෙනෙකුට එකක්ද බැගින්
එකිනෙකාගේ පුළුවන්කමේ හැටියට දී
16 තමාගේ ගමන ගියේය. තලෙන්ත පහ
ලැබූ තැනැත්තේ එවලේම ගොස් එයින්
වෙළඳම්කොට තවත් තලෙන්ත පහක්
17 ඉපදවූයේය. එසේම දෙක ලැබූ
තැනැත්තේද තවත් දෙකක් උපදවා-
18 ගත්තේය. නුමුත් එක ලැබූ තැනැත්තේ
ඉවත්ව ගොස් පොළොව හාරා, තමාගේ
ස්වාමියාගේ මිල සඟවා තැබුවේය.
19 බොහෝ කලකට පසු ඒ දසයන්ගේ
ස්වාමියා ඇවිත් ඔවුන් සමග ගණන්
20 බැලුවේය. එවිට තලෙන්ත පහ ලැබූ
තැනැත්තේ තවත් තලෙන්ත පහක්
ගෙනැවිත්: ස්වාමිනි, ඔබ මට තලෙන්ත
පහක් භාරදුන්නෙහිය. මෙන්න, තවත්
තලෙන්ත පහක් උපදවාගතිමියි කීවේය.
21 ඔහුගේ ස්වාමියා ඔහුට කථාකොට:
යහපත්වූ විශ්වාසවූ දසය, ඒ යහපත.
ස්වල්ප දේ ගැන නුඹ විශ්වාසවූවෙහිය,
බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති
කරමි. නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට
ඇතුල්වෙයන්නැයි ඔහුට කීවේය.
22 තලෙන්ත දෙක ලැබූ තැනැත්තේද ඇවිත්:
ස්වාමිනි, ඔබ මට තලෙන්ත දෙකක්
භාරදුන්නෙහිය. මෙන්න, තවත් තලෙන්ත
23 දෙකක් උපදවාගතිමියි කීවේය. ඔහුගේ
ස්වාමියා ඔහුට කථාකොට: යහපත්වූ
විශ්වාසවූ දසය, ඒ යහපත; ස්වල්ප දේ
ගැන නුඹ විශ්වාසවූවෙහිය, බොහෝ
දේ කෙරෙහි නුඹ අධිපති කරමි. නුඹේ
ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙයන්නැයි
24 ඔහුට කීවේය. එක තලෙන්තය ලැබූ
තැනැත්තේද ඇවිත්: ස්වාමිනි, ඔබ
නොවපුළ තැනින් කපාගන්නාවූ,
නොඉස්ස තැනින් රැස්කරන්නාවූ, කර්කශ
25 මනුෂ්‍යයෙකු බව දැනගතිමි. එබැවින් මම
භයව ගොස්, ඔබගේ තලෙන්තය
පොළොවේ සඟවා තැබීමි. මෙන්න,
26 ඔබ සන්තකදේයයි කීවේය. ඔහුගේ
ස්වාමියා ඔහුට උත්තරදෙමින්: දුෂ්ටවූ
අලසවූ දසය, මා නොවපුළ තැනින්
කපාගන්න බවත් නොඉස්ස තැනින්
රැස්කරගන්න බවත් නුඹ දැනගෙන
සිටියෙහිද! එසේ නම් මාගේ මුදල මිල 27
ගනුදෙනුකරන්නන්ට නුඹ විසින් දිය
යුතුව තිබුණේය, එවිට මා ආ කල මට
අයිති දේ පොළියත් සමග ලබන්ට
තිබුණේය. එබැවින් ඔහුගෙන් තලෙන්තය 28
හැරගෙන තලෙන්ත දසය ඇත්තාට
දීපල්ලා. මක්නිසාද ඇති තැනැත්තාට 29
දෙනු ලබන්නේය, ඔහුට බොහෝ
වන්නේය. නුමුත් නැති තැනැත්තාගෙන්
ඔහුට ඇති දේත් පහකරනු ලබන්නේය.
ඒ නිෂ්ප්‍රයෝජන දසයා පිටත 30
අන්ධකාරයෙහි දමාපල්ලා. එහිදී
හැඬීමත් දත්මිටිකෑමත් වන්නේයයි
කීවේය.

## විනිශ්චය දවස

මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමග 31
තමන්ගේ තේජසින් එන කල, ස්වකීය
තේජසේ සිංහාසනයෙහි වැඩහිඳිනසේක.
එවිට සියලු ජාතීහු උන්වහන්සේ ඉදිරියට 32
රැස්කරනු ලබන්නෝය. උන්වහන්සේ
එඬේරෙකු විසින් එළුවන් කෙරෙන්
බැටළුවන් වෙන්කරන්නාක්මෙන් ඔවුන්
වෙන්කොට, බැටළුවන් තමන්ගේ දකුණු 33
පැත්තේද එළුවන් වම් පැත්තේද
සිටුවනසේක. එවිට රජ්ජුරුවෝ තමන්ගේ 34
දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක්:
මාගේ පියාණන්ගෙන් ආශීර්වාදලත්තෙනි,
වරෙල්ලා, ලෝකය පටන්ගැන්මේ සිට
නුඹලාට සූදානම්කර තිබෙන රාජ්‍යය
උරුමකරගනිල්ලා. මක්නිසාද මම 35
බඩගිනිව සිටියෙමි, නුඹලා මට කන්ට
දුන්නහුය. පිපාසිතව සිටියෙමි, නුඹලා
මට බොන්ට දුන්නහුය. ආගන්තුකව
සිටියෙමි, නුඹලා මා පිළිගත්තහුය; වස්ත්‍ර 36
නැතුව සිටියෙමි, නුඹලා මට ඇඳුම්
දුන්නහුය. රෝගාතුරව සිටියෙමි, නුඹලා
මා බලන්ට ආවහුය. හිරගෙයි සිටියෙමි,
නුඹලා මා වෙතට ආවහුයයි කියන-
සේක. එකල ධර්මිෂ්ඨයන් උත්තරදෙමින්: 37
ස්වාමිනි, කොයි කලෙක ඔබවහන්සේ
බඩගිනිව සිටිනවා දැක කෑම දුනිමුද?

නොහොත් පිපාසිතව සිටිනවා දැක
38 බොන්ට දුනිමුද? කොයි කලෙක
ඔබවහන්සේ ආගන්තුකව සිටිනවා දැක
පිළිගතිමුද? නොහොත් වස්ත්‍ර නැතුව
39 සිටිනවා දැක ඇඳුම් දුනිමුද? කොයි
කලෙක ඔබ රෝගාතුරවවත් හිරගෙයිවත්
සිටිනවා දැක ඔබ ළඟට ආවෙමුදැයි
40 කියනවා ඇත. එවිට රජ්ජුරුවෝ
උත්තරදෙමින්: සැබවක් තුඹලාට
කියමි–මාගේ මේ සහෝදරයන්ගෙන්
ඉතා කුඩා කෙනෙකුට තුමුත් තුඹලා
ඒක කළහුද ඒක කළේ මටයයි
41 කියනසේක. එවිට උන්වහන්සේ වම්
පැත්තේ සිටින්නන්ට කියනසේක්:
ශාපලත්තෙනි. මා කෙරෙන් පහව
යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත්
සූදනම්කර තිබෙන සදාකාල ගින්නට
42 පලයල්ලා. මක්නිසාද මම බඩගිනිව
සිටියෙමි, තුඹලා මට කන්ට නුදුන්නහුය.
පිපාසිතව සිටියෙමි, තුඹලා මට බොන්ට
43 නුදුන්නහුය. ආගන්තුකව සිටියෙමි,
තුඹලා මා පිළිනොගත්තහුය: වස්ත්‍ර
නැතුව සිටියෙමි. තුඹලා මට ඇඳුම්
නුදුන්නහුය: රෝගාතුරවද හිරගෙයිද
සිටියෙමි, තුඹලා මා බලන්ට නාවහුයයි
44 කියනසේක. එවිට ඔවුනුත් උත්තරදෙමින්:
ස්වාමිනි. අපි කොයි කලෙක ඔබ
බඩගිනිව හෝ පිපාසිතව හෝ
ආගන්තුකව හෝ වස්ත්‍ර නැතුව හෝ
රෝගාතුරව හෝ හිරගෙයි හෝ
සිටිනවා දැක ඔබවහන්සේට උපස්ථාන
45 නොකෙළෙමුදැයි කියනවා ඇත. එවිට
උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
සැබවක් තුඹලාට කියමි–මොවුන්ගෙන්
ඉතා කුඩා කෙනෙකුටවත් එසේ නොකර
සිටියහුද ඒක නොකළේ මටයයි
46 කියනසේක. මොව්හු සදාකාල දඬුවමටත්
ධර්මිෂ්ඨයෝ සදාකාල ජීවනයටත්
යන්නෝයයි කීසේක.

## යේසුස්වහන්සේ නසන්ට කුමන්ත්‍රණය

26 තවද යේසුස්වහන්සේ මේ සියලු
වචන කියා නිමවා තමන්ගේ
2 ගෝලයන්ට කථාකොට: තව
දෙදවසකට පසු පාස්කුව පැමිණෙන
බව තුඹලා දන්නහුය, මනුෂ්‍ය පුත්‍රයා
කුරුසියෙහි ඇණගැසීමට පාවාදෙනු
ලැබේයයි කීසේක. එකල නායක 3
පූජකයෝද සෙනගගේ වැඩිමහල්ලෝද
කායාඵස් නම් උත්තම පූජකයාගේ
ශාලාවට එකතුව, යේසුස්වහන්සේ 4
ප්‍රයෝගයෙන් අල්ලා මරන්ට
මන්ත්‍රණයකළෝය. නුමුත්: සෙනග 5
අතරේ කෝලාහලයක් හට නොගන්නා
පිණිස මංගල්‍යයේදී නොකරමුයයි
කීවෝය.

## බෙතානියේදී යේසුස්වහන්සේ ආලේපකරනු ලැබීම

යේසුස්වහන්සේ බෙතානියෙහි කුෂ්ඨ 6
රෝගීවූ සීමොන්ගේ ගෙදර සිටියදී
ස්ත්‍රියෙක් ඉතා අනර්ඝවූ සුවඳ තෙලින් 7
පිරවූ සුදු ගල් කරඬුවක් ගෙන
උන්වහන්සේ ළඟට ඇවිත්. කෑමට
හිඳගත හුන් උන්වහන්සේගේ හිසේ
වත්කළාය. නුමුත් ගෝලයෝ ඒ දැක 8
කිපී: මේ නාස්තිය කළේ කුමටද?
මක්නිසාද මේ තෙල ලොකු ගණනකට 9
විකුණා දිළිඳුන්ට දෙන්ට පුළුවන්ව
තිබුණේයයි කීවෝය. නුමුත් යේසුස්- 10
වහන්සේ ඒක දැන: කුමට තුඹලා මේ
ස්ත්‍රීට කරදරකරනවාද? ඈ මට
යහපත් ක්‍රියාවක් කළාය. මක්නිසාදයත් 11
දිළින්දෝ තුඹලා සමග නිතරම සිටිති;
නුමුත් මම තුඹලා සමග නිතරම
නොසිටිමි. ඈ මේ තෙල මාගේ ශරීරයේ 12
වත්කළේ මා තැන්පත්කිරීමට සූදනම්-
කරන පිණිසය. සැබෑවක් තුඹලාට 13
කියමි–මේ ශුභාරංචිය ලොව මුළුල්ලේ
යම් තැනක ප්‍රකාශකරනු ලබන්නේද
එතැනදී මේ ස්ත්‍රිය විසින් කළ මේ
ක්‍රියාවත් ඈ සිහිකිරීමක් පිණිස කියනු
ලබන්නේයයි කීසේක.

## යූදස්ගේ ද්‍රෝහිකාරකම

එවිට යූදස් ඉස්කාරියෝත් නම් 14
දෙළොස්දෙනාගෙන් එක්කෙනෙක් නායක
පූජකයන් ළඟට ගොස්: ඔහු තුඹලාට 15
පාවාදෙන්ට තුඹලා මට දෙන්ට කැමති

මොනවාදැයි ඇසුවේය. ඔව්හු රිදී මිල
16 තිහක් ඔහුට කිරා දුන්නෝය. එතැන්
පටන් ඔහු උන්වහන්සේ පාවාදෙන්ට
ප්‍රස්තාවක් සෙවීය.

## අන්තිම රාත්‍රි කෑම

17 මුහුන් නොදැමූ රොටි කන පළමුවෙනි
දවසේ ගෝලයෝ යේසුස්වහන්සේ ළඟට
ඇවිත්: ඔබ පාස්කුව කන පිණිස අප
විසින් කොතැන පිළියෙළකරනවාට
18 කැමතිසේක්දැයි ඇසුවෝය. උන්වහන්සේ:
නුවර අසවලා ළඟට ගොස් ඔහුට
කථාකොට—මාගේ කාලය ආසන්නය;
මාගේ ගෝලයන් සමග නුඹේ ගෙදරදී
පාස්කුව පවත්වමියි ආචාරීන්වහන්සේ
කියනසේකැයි ඔහුට කියාපල්ලායයි
19 කීසේක. ගෝලයෝ යේසුස්වහන්සේ
ඔවුන්ට අණකළ ලෙස කොට, පාස්කුව
20 පිළියෙළකළෝය. සවස්වූ කල්හි උන්-
වහන්සේ ගෝලයන් දෙළොස්දෙනා
21 සමග කෑමට වාඩිව හුන්සේක; ඔවුන්
කමින් සිටියදී උන්වහන්සේ කථාකොට:
සැබවක් නුඹලාට කියමි—නුඹලාගෙන්
එක්කෙනෙක් මා පාවාදෙන්නේයයි
22 කීසේක. ඔව්හු අතිශයෙන් ශෝකව
එකිනෙකා: ස්වාමිනි, මමද මමදැයි
23 අසන්ට පටන්ගත්තෝය. උන්වහන්සේ
උත්තරදෙමින්: මා සමග තලියේ අත
ලෑ තැනැත්තේම මා පාවා දෙන්නේය.
24 මනුෂ්‍ය පුත්‍රයා ගැන ලියා තිබෙන
හැටියට ඔහු යන්නේය. නුමුත් මනුෂ්‍ය
පුත්‍රයා පාවාදෙන ඒ මනුෂ්‍යයාට දුක්වේ!
ඒ මනුෂ්‍යයා නූපන්නා නම් ඔහුට
25 යහපතැයි කීසේක. උන්වහන්සේ පාවාදුන්
යූදස්ද උත්තරදෙමින්: රබ්බී, ඒ මමදැයි
ඇසුවේය. නුඹ කීවෙහියයි උන්වහන්සේ
26 ඔහුට කීසේක. ඔවුන් කමින් සිටියදී
යේසුස්වහන්සේ රොටි ගෙන ආශීර්වාද-
කොට කඩා ගෝලයන්ට දී: රැගෙන
කාපල්ලා; මේක මාගේ ශරීරයයයි
27 කීසේක. උන්වහන්සේ *කුසලානක් ගෙන
ස්තුතිකොට ඔවුන්ට දී: නුඹලා
28 සියල්ලෝම මෙයින් බීපල්ලා; මේක පව්

කමාව පිණිස බොහෝ දෙනා උදෙසා
වගුරුවන අලුත් ගිවිසුමේ මාගේ ලේය.
එහෙත් මාගේ පියාණන්ගේ රාජ්‍යයෙහිදී 29
මා නුඹලා සමග අලුත් මුද්‍රිකපානය
බොන දවස දක්වා මෙතැන් පටන් මේ
මිදිඵල යුෂ නොබොන්නෙමියි නුඹලාට
කියමියි කීසේක.
ඔව්හු ගීතිකාවක් කළායින් පසු ඔලීව 30
කන්දට පිටත්ව ගියෝය.

## ගෝලයන් උන්වහන්සේ හැර දමා යන බව කලින් කීම

එවිට යේසුස්වහන්සේ ඔවුන්ට කියන- 31
සේක්: නුඹලා සියල්ලෝම අද රාත්‍රියේ
මා ගැන බාධාවන්නහුය. මක්නිසාද
මම එඬේරාට පහරදෙන්නෙමි, එකල
රැළේ බැටළුවෝ විසිරවනු ලබන්නෝයයි
ලියා තිබේ. නුමුත් මා නැගුටුවනු ලැබූ 32
පසු නුඹලාට පළමුවෙන් ගලීලයට
යන්නෙමියි කීසේක. පේත්‍රුස් උන්- 33
වහන්සේට උත්තරදෙමින්: සියල්ලන්ම
ඔබ ගැන බාධාවෙතත් මමනම්
කවදාවත් බාධා නොවන්නෙමියි කීවේය.
යේසුස්වහන්සේද: සැබවක් නුඹට 34
කියමි—අද රාත්‍රියේ කුකුළා හඬලන්ට
පළමුවෙන් නුඹ මා අඳුනන්නේ නැත
කියා තුන් වරක් කියන්නෙහියි ඔහුට
කීසේක. පේත්‍රුස්ද: ඔබ සමග නසින්ට 35
පවා මට සිද්ධවුණත්—ඔබ නාඳුනමියි
කියන්නේ නැතැයි උන්වහන්සේට කීවේය.
ගෝලයන් සියල්ලෝද එලෙසම කීවෝය.

## ගෙත්සෙමනේ උයනෙහි

එකල යේසුස්වහන්සේ ඔවුන් සමග 36
ගෙත්සෙමනය කියන ස්ථානයට
පැමිණ: මා අතනට ගොස් යාච්ඥාකරන
අතර නුඹලා මෙහි ඉඳිල්ලායයි තමන්
ගෝලයන්ට කීසේක. උන්වහන්සේ 37
පේත්‍රුස්ද සෙබදීගේ පුත්‍රයන් දෙදෙනාද
කැඳවාගෙන ගොස්, ශෝකවෙන්ටත්
අතිශයින් කැලඹෙන්ටත් පටන්ගත්සේක.
එකල උන්වහන්සේ ඔවුන්ට කථාකොට: 38
මැරෙන තරම් මාගේ ආත්මය ඉතා
ශෝක සහිතය. නුඹලා මෙහි නැවතී

*සමහර පුරාණ පිටපත්වල, කුසලාන.

මා සමග අවදිව සිටපල්ලායයි කීසේක.
39 උන්වහන්සේ මඳක් ඉස්සරහට ගොස්
මුහුණින් වැටී: අහෝ මාගේ පියාණෙනි,
මේ කුසලාන මා කෙරෙන් පහවෙන්ට
පුළුවන් නම් එසේ වේවා. එසේවී නුමුත්
මා කැමතිලෙස නොව ඔබ කැමති
ලෙස වේවයි කියා යාච්ඤාකළසේක.
40 උන්වහන්සේ ගෝලයන් ළඟට ඇවිත්
ඔවුන් නිදඉන්නවා දැක, පේත්‍රුස්ට
කථාකොට: කිමෙක්ද? මා සමග එක
පැයක්වත් අවදිව ඉන්ට නුඹලාට
41 බැරිවුණාද? නුඹලා පරීක්ෂාවට
නොපැමිණෙන පිණිස අවදිව ඉඳ
යාච්ඤාකරපල්ලා. ආත්මය නම් කැමතිය,
නුමුත් මාංසය බෙලහීනයයි කීසේක.
42 උන්වහන්සේ නැවත දෙවෙනි වරත්
අහක්ව ගොස්: අහෝ මාගේ පියාණෙනි,
මේක මා විසින් නොබී පහවෙන්ට බැරි
නම්, ඔබගේ කැමැත්ත වේවයි කියා
43 යාච්ඤාකළසේක. උන්වහන්සේ නැවත
ඇවිත් ඔවුන් නිදඉන්නවා දුටුසේක,
මක්නිසාද ඔවුන්ගේ ඇස් නිදිබරව
44 තිබුණේය. නැවතත් උන්වහන්සේ ඔවුන්
අත්හැර ගොස්, තුන්වෙනි වරත් ආයෙත්
45 එම වචන කියා යාච්ඤාකළසේක. එකල
උන්වහන්සේ ගෝලයන් ළඟට ඇවිත්:
ඉතින් නිදගෙන තිවාඩු ගනිල්ලා.
මෙන්න, පැය ළඟය, මනුෂ්‍ය පුත්‍රයා
පව්කාරයන්ගේ අත්වලට පාවාදෙනු
46 ලබයි. නැඟිටිල්ලා, අපි යමු. අන්න, මා
පාවාදෙන්නා ළඟයයි කීසේක.

## යේසුස්වහන්සේ අල්ලාගැනීම

47 උන්වහන්සේ කථාකරද්දීම, බලව,
දෙළොස්දෙනාගෙන් එක්කෙනෙක්වූ
යූදස්ද ඔහු සමග නායක පූජකයන් හා
සෙනඟගේ වැඩිමහල්ලන් කෙරෙන් කඩු
මුගුරු ගත් මහත්වූ සමූහයක්ද ආවෝය.
48 උන්වහන්සේ පාවාදෙන්නා: මම යමෙකු
සිඹගනිම්ද ඒ උන්වහන්සේය.
උන්වහන්සේ අල්ලාගනිල්ලාය කියා
ඔවුන්ට ලකුණක් දී තිබුණේය.
49 එකෙණෙහිම ඔහු යේසුස්වහන්සේ ළඟට
ඇවිත්: රබ්බී, ශුභසිද්ධවේවා කියා
උන්වහන්සේ සිඹගත්තේය. යේසුස්- 50
වහන්සේද: මිත්‍රය, නුඹ කරන්ට ආ දෙය
කරපන්නැයි ඔහුට කීසේක. එවිට ඔව්හු
ඇවිත් යේසුස්වහන්සේ පිට අත් තබා
උන්වහන්සේ අල්ලාගත්තෝය. යේසුස්- 51
වහන්සේ සමග සිටියවුන්ගෙන් එක්-
කෙනෙක් තමාගේ අත දිගුකොට කඩුව
ඇද, උත්තම පූජකයාගේ දාසයාට
ගසා ඔහුගේ කන කපාදැමීය. එවිට 52
යේසුස්වහන්සේ: නුඹේ කඩුව කොපුවේ
දමාපන්න. මක්නිසාද කඩු ගන්න
සියල්ලෝ කඩුවෙන්ම විනාශවන්නෝය.
දේවදූතයන් ලෙගියොන් දෙළොසකට 53
වඩා මා ළඟට මේ දැන් එවන ලෙස
මාගේ පියාණන්ගෙන් ඉල්ලන්ට මට
බැරියයි නුඹ සිතනවාද? එසේ 54
ඉල්ලුවොත්, මේ ආකාර වෙන්ට ඕනැයයි
කියන ලියවිලි සම්පූර්ණවෙන්නේ
කොහොමදැයි ඔහුට කීසේක. ඒ පැයේදී 55
යේසුස්වහන්සේ සමූහයන්ට කථාකොට:
නුඹලා සොරෙකුට විරුද්ධව මෙන් කඩු
මුගුරු රැගෙන මා අල්ලන්ට ආවහුද?
මා දේවමාළිගාවේ උගන්වමින්
දවස්පතා හිඳිද්දී නුඹලා මා ඇල්ලුවේ
නැත. නුමුත් මේ සියල්ල සිද්ධවූයේ 56
අනාගතවක්තෘවරුන්ගේ ලියවිලි
සම්පූර්ණවන පිණිසයයි කීසේක. එවිට
ගෝලයන් සියල්ලෝම උන්වහන්සේ
අත්හැර පලාගියෝය.

## උත්තම පූජකයා ඉදිරියෙහි විනිශ්චය

යේසුස්වහන්සේ ඇල්ලූ අය උත්තම 57
පූජකයාවූ කායාඵස් ළඟට උන්වහන්සේ
ගෙනගියෝය, ලියන්නොත් වැඩිමහල්ලොත්
එතැන්හි රැස්ව සිටියෝය. නුමුත් පේත්‍රුස් 58
උත්තම පූජකයාගේ ශාලාව දක්වා
උන්වහන්සේ අනුව දුරින් ගොස්, ඇතුල්ව,
තීන්දුව දකින පිණිස සේවකයන්
සමග හිඳගත්තේය. නායක පූජකයෝද 59
මුළු මන්ත්‍රණසභාවද යේසුස්වහන්සේ
මරණයට පත්කරන පිණිස උන්-
වහන්සේට විරුද්ධව බොරු සාක්ෂි
සෙවුවෝය. බොහෝ බොරු සාක්ෂිකාරයන් 60

ආ නුමුත් කිසිවක් සම්බවුණේ නැත.
නුමුත් පසුව දෙදෙනෙක් ඇවිත්:
61 දේවමාළිගාව කඩාදමා ඒක තුන්
දවසකින් ගොඩනගන්ට මට පුළුවනැයි
62 මොහු කීයේයයි කීවෝය. එවිට උත්තම
පූජකයා නැගිට සිට: නුඹ කිසි
උත්තරයක් දෙන්නේ නැද්ද? මොවුන්
නුඹට විරුද්ධව කියන මේ සාක්ෂිය
63 මොකදැයි උන්වහන්සේට කීවේය. නුමුත්
යේසුස්වහන්සේ කථා නොකර සිටි-
සේක. එවිට උත්තම පූජකයා: නුඹ
දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්ද
කියා අපට කියන ලෙස ජීවමාන
දෙවියන්වහන්සේගේ නාමයෙන් මම
නුඹ දිවුරවමියි උන්වහන්සේට කීවේය.
64 යේසුස්වහන්සේද: නුඹ කීවෙහිය. තවද
නුඹලාට කියමි, මෙතැන් පටන් මනුෂ්‍ය
පුත්‍රයා පරාක්‍රමයේ දකුණු පැත්තේ වාඩිව
හිඳිනවාත් අහසේ වලාකුල් පිට එනවාත්
නුඹලා දකින්නහුයයි ඔහුට කීසේක.
65 එවිට උත්තම පූජකයා තමාගේ වස්ත්‍ර
ඉරාගෙන: මොහු දෙවියන්වහන්සේට
අපහාසකෙළේය. සාක්ෂිකාරයන්ගෙන්
අපට තවත් කම මොකද? මොහුගේ
දේවඅපහාසය දැන් නුඹලාට ඇසුණේය.
66 නුඹලා කුමක් සිතවුදැයි කීවේය.
ඔව්හු උත්තරදෙමින්: මොහු මරණයට
67 සුදුස්සෙකැයි කීවෝය. එවිට ඔව්හු
උන්වහන්සේගේ මුහුණට කෙළගසා,
උන්වහන්සේට ගුටි ඇන්නෝය.
68 සමහරෙක් අතුල් පහර ගසා: ක්‍රිස්තුස්නි,
නුඹට ගැසුවේ කවුදැයි දිවැසින් අපට
කියාපන්නැයි කීවෝය.

## පේත්‍රුස් විසින් අඳුනන්නේ නැතැයි කීම

69 පේත්‍රුස් පිටත මළුවෙහි හිඳගෙන
උන්නේය. යෞවනියක් ඔහු ළඟට ඇවිත්:
නුඹත් ගලීලයාවූ යේසුස් සමග
70 සිටියෙහියයි කීවාය. නැත, නුඹ කියන
දේ නොදනිමියි ඔහු සියල්ලන් ඉදිරියේ
71 කීවේය. ඔහු පිටතට දොරටුව ළඟට ගිය
කල, තව තැනැත්තියක් ඔහු දැක: මොහුත්
නාසරිය යේසුස් සමග සිටියේයයි එතන
සිටියවුන්ට කීවාය. ඔහු නැවතත්: මා ඒ 72
මනුෂ්‍යයා අඳුනන්නේ නැතැයි දිවුරමින්
කීවේය. ස්වල්ප වේලාවකට පසු එතැන 73
සිටි අය ඇවිත්: සැබෑවටම නුඹත්
ඔවුන්ගෙන් එක්කෙනෙක්ය; ඒ බව
නුඹේ කථාවෙන්ම ප්‍රකාශයයි පේත්‍රුස්ට
කීවෝය. එවිට ඔහු: ඒ මනුෂ්‍යයා 74
නාඳුනමියි කියා දෙස්තිබාගන්ටද
දිවුරන්ටද පටන්ගත්තේය. එකෙණෙහිම
කුකුළා හඬලීය. කුකුළා හඬලන්ට 75
පළමුවෙන් නුඹ මා අඳුනන්නේ නැත
කියා තුන්වරක් කියනවා ඇතැයි
යේසුස්වහන්සේ කී වචනය පේත්‍රුස්
සිහිකොට, පිටතට ගොස් බලවත් දුකින්
හැඬුවේය.

27 පහන්වූ කල සියලු නායක
පූජකයොත් සෙනගගේ වැඩි-
මහල්ලොත් යේසුස්වහන්සේ මරණයට
පත්කරන පිණිස උන්වහන්සේට විරුද්ධව
මන්ත්‍රණයකළෝය. ඔව්හු උන්වහන්සේ 2
බැඳගෙන ගොස් ආණ්ඩුකාරයාවූ
පිලාත්ට බාරදුන්නෝය.

## යූදස්ගේ මනස්ථාපය

එවිට උන්වහන්සේ පාවාදුන් යූදස් 3
උන්වහන්සේ වරදට පත්කරනු ලැබූ බව
දැක, පසුතැවිලිව, රිදී මිල තිහ නායක
පූජකයන්ද වැඩිමහල්ලන්ද ළඟට නැවත
ගෙනවුත්: නිදෙස් ලේ පාවාදීමෙන් මම 4
පව්කෙළෙමියි කීවේය. නුමුත් ඔව්හු:
එයින් අපට කම මොකද? නුඹම
බලාගනින්නැයි කීවෝය. එවිට ඔහු ඒ 5
රිදී මිල ශුද්ධස්ථානයෙහි දමා ගියේය;
ඔහු අහක්ව ගොස් එල්ලී මැරුණේය.
නායක පූජකයෝ ඒ රිදී මිල රැගෙන: 6
මේවා ලේවල මිල බැවින් දේවගබඩාවේ
දමන්ට යුතු නැතැයි කීවෝය. එවිට 7
ඔව්හු මන්ත්‍රණයකොට විදේශීන් වළලන
පිණිස එයින් කුම්භකාරයාගේ පිට්ටනිය
ගත්තෝය. එහෙයින් අද දක්වා ඒ 8
පිට්ටනියට ලේ පිට්ටනියයි කියති.
එවිට: ඔව්හු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් 9
සමහරුන් විසින් මිල කරනලද
තැනැත්තාගේ වටිනාකමවූ රිදී මිල තිහ

10 රැගෙන, ස්වාමීන්වහන්සේ මට නියමකළ
ලෙස කුම්භකාරයාගේ පිට්ටනියට ඒවා
දුන්නෝය යන අනාගතවක්තෘවූ
යෙරෙමියා විසින් කියන ලද කාරණාව
සම්පූර්ණවිය.

## පිලාත් නම් රෝම ආණ්ඩුකාරයා ඉදිරිපිට සිටීම

11 යේසුස්වහන්සේ ආණ්ඩුකාරයා
ඉදිරියෙහි සිටිසේක. නුඹ යුදෙව්වරුන්ගේ
රජද්දැයි ආණ්ඩුකාරයා උන්වහන්සේගෙන්
ඇසුවේය. එසේයයි යේසුස්වහන්සේ
12 කීසේක. නායක පූජකයන්ද
වැඩිමහල්ලන්ද උන්වහන්සේට වරද තැබූ
විට උන්වහන්සේ කිසි උත්තරයක් දුන්නේ
13 නැත. එවිට පිලාත් කථාකොට: මොව්හු
නුඹට විරුද්ධව කොපමණ කාරණා
ගැන සාක්ෂි කියන්නෝද කියා
14 ඇසෙන්නේ නැද්දැයි කීවේය. නුමුත්
උන්වහන්සේ එක වචනයකටවත් උත්තර
නුදුන්සේක. එහෙයින් ආණ්ඩුකාරයා
15 බොහෝසෙයින් මවිතවූයේය. මංගල්‍ය-
යෙහිදී සමූහයා ඉල්ලන එක
හිරකාරයෙකු ආණ්ඩුකාරයා විසින්
නිදහස්කර දෙන සිරිතක් තිබුණේය.
16 එකල්හි බරබ්බස් නම් ප්‍රසිද්ධ
17 හිරකාරයෙක් සිටියේය. එහෙයින් ඔවුන්
රැස්වූ විට පිලාත් ඔවුන්ට කථාකොට:
මා විසින් නුඹලාට කවරෙකු
නිදහස්කරදෙනවාට නුඹලා කැමතිද?
බරබ්බස්ද? නොහොත් ක්‍රිස්තුස්ය කියන
18 යේසුස්දැයි ඇසුවේය. මක්නිසාද ඔවුන්
ඊර්ෂ්‍යාවෙන් උන්වහන්සේ පාවාදුන් බව
19 ඔහු දැනගෙන සිටියේය. තවද ඔහු
විනිශ්චයාසනයෙහි හිඳිද්දී ඔහුගේ
භාර්යාව: ඒ ධර්මිෂ්ඨයාට කිසිවක්
නොකරන්න. අද ඔහු නිසා ස්වප්නයකින්
බොහෝ දුක් වින්දෙමියි ඔහුට කියා
20 ඇරියාය. එහෙත් නායක පූජකයෝද
වැඩිමහල්ලෝද බරබ්බස් ඉල්ලන්ටත්
යේසුස්වහන්සේ නසන්ටත් සමූහයන්
21 කැමතිකරවාගත්තෝය. ආණ්ඩුකාරයා
ඔවුන්ට උත්තරදෙමින්: මේ දෙදෙනාගෙන්
කවරෙකු මා විසින් නුඹලාට නිදහස්කර-
දෙනවාට කැමතිදැයි ඔවුන්ගෙන් ඇසුවේය.
බරබ්බස්යයි ඔව්හු කීවෝය. එසේවී නම් 22
ක්‍රිස්තුස්ය කියන යේසුස්ට මා විසින්
කුමක් කරන්ටදැයි පිලාත් ඔවුන්ගෙන්
ඇසුවේය. ඔහු කුරුසියෙහි ඇණගසනු
ලබාවයි සියල්ලෝම කීවෝය. එවිට 23
ඔහු: මන්ද, මොහු මොන නපුරක්
කෙළේදැයි ඇසුවේය. නුමුත්: ඔහු
කුරුසියෙහි ඇණගසනු ලබාවයි ඔව්හු
අතිශයෙන් මොරගැසුවෝය. මෙසේ 24
කෝලාහලයක් හටගන්නවා මිස තමාගේ
උත්සාහයෙන් කිසි පලක් නැති බව
පිලාත් දැක, වතුර ගෙන සමූහයා ඉදිරියේ
අත් සෝදමින්: මේ ධර්මිෂ්ඨයාගේ ලේ
ගැන මම නිදෙස්වෙමි. නුඹලාම
බලාගනිල්ලායයි කීවේය. මුළු සෙනඟ 25
උත්තරදෙමින්: ඔහුගේ ලේ අප පිටද
අපගේ දරුවන් පිටද වේවයි කීවෝය.
එකල ඔහු බරබ්බස් ඔවුන්ට 26
නිදහස්කරදුන්නේය. නුමුත් ඔහු
යේසුස්වහන්සේට තළවා, උන්වහන්සේ
කුරුසියෙහි ඇණ ගසනු ලබන්ට
භාරදුන්නේය.

## යේසුස්වහන්සේ කුරුසියේ ඇණගසනු ලැබීම

එකල ආණ්ඩුකාරයාගේ භේවායෝ 27
යේසුස්වහන්සේ *ප්‍රේතෝරියම් ශාලාවට
ගෙනගොස් මුළු භේවා කණ්ඩායම
උන්වහන්සේ වෙතට රැස්කළෝය. ඔව්හු 28
උන්වහන්සේගේ ඇඳුම් ගළවා, රතු
සළුවක් උන්වහන්සේට හැඳෙව්වෝය.
ඔව්හු කටු ඔටුන්නක් ගොතා 29
උන්වහන්සේගේ හිසෙහි තබා, බට-
දණ්ඩක් දකුණතට දී, උන්වහන්සේ
ඉදිරියෙහි දණ නමා: යුදෙව්වරුන්ගේ
රජ්ජුරුවෙනි, ශුභසිද්ධවේවයි කියා
උන්වහන්සේට කවටකම්කළෝය. ඔව්හු 30
උන්වහන්සේට කෙළගසා, බටදණ්ඩ
ගෙන උන්වහන්සේගේ හිසට ගැසුවෝය.
උන්වහන්සේට කවටකම්කළ පසු ඔව්හු 31
රතු සළුව ගළවා උන්වහන්සේගේම
ඇඳුම් හඳවා, කුරුසියෙහි ඇණගසන
පිණිස ගෙනගියෝය.

*හෙවත්, රජගෙදරට.

32 ඔව්හු නික්ම යද්දී සීමොන් නම්
කිරේනියේ මනුෂ්‍යයෙකු සම්බවී,
උන්වහන්සේගේ කුරුසිය උසුලාගෙන
33 යන්ට ඔහුට බලකළෝය. ඔව්හු
ඉස්කබල ස්ථානය යන අර්ථ ඇති
ගොල්ගොතා නම් ස්ථානයකට
34 පැමිණ, තිත්ත මිශ්‍රකළ මුද්‍රිකපානය
උන්වහන්සේට බොන්ට දුන්නෝය.
උන්වහන්සේ රස බලා බොන්ට
35 නොකැමතිවූසේක. උන්වහන්සේ
කුරුසියෙහි ඇණගැසූ පසු ඔව්හු
උන්වහන්සේගේ ඇඳුම් දාදුදමා
36 බෙදාගත්තෝය. ඔව්හු එහි හිඳගෙන
37 උන්වහන්සේ රැකවල්කළෝය. තවද:
මොහු යුදෙව්වරුන්ගේ රජවූ යේසුස්ය
කියා උන්වහන්සේගේ වරද ලියා
උන්වහන්සේගේ හිසට උඩින් තැබුවෝය.
38 එවිට සොරු දෙදෙනෙක්, එක්කෙනෙක්
දකුණු පැත්තෙහිද එක්කෙනෙක් වම්
පැත්තෙහිද, උන්වහන්සේ සමග
39 කුරුසියෙහි ඇණගසනු ලැබුවෝය. මග
යන්නෝ තමුන්ගේ හිස් වන
40 වනා උන්වහන්සේට නින්දකරමින්:
දේවමාළිගාව කඩාදමා තුන් දවසකින්
ගොඩනගන්නාවූ තුඹ තුඹම ගළවා-
ගනින්න. තුඹ දෙවියන්වහන්සේගේ
පුත්‍රයා නම් කුරුසියෙන් බැසපන්නැයි
41 කීවෝය. ඒ ආකාරයෙන්ම නායක
පූජකයෝත් ලියන්නන් හා වැඩිමහල්ලන්
සමග උන්වහන්සේට කවටකම් කොට:
42 ඔහු අනුන් ගැළවුවේය; තමාම ගළවා-
ගන්ට නුපුළුවන. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ
රජය; ඔහු දැන් කුරුසියෙන් බසීවා,
43 එවිට අපි ඔහු අදහාගන්නෙමුව. ඔහු
දෙවියන්වහන්සේ කෙරේ විශ්වාස
කරන්නේය; උන්වහන්සේ ඔහුට ප්‍රිය
වනසේක්නම් දැන් ඔහු මුදහරිනසේක්වා.
මක්නිසාද–මම දෙවියන්වහන්සේගේ
පුත්‍රයෙමියි ඔහු කීවේයයි කීවෝය.
44 උන්වහන්සේ සමග කුරුසියෙහි
ඇණගසනලද්දවූ සොරුද එසේම
උන්වහන්සේට නින්දකළෝය.

## යේසුස්වහන්සේගේ මරණය

සවෙනි පැය පටන් නවවෙනි පැය 45
දක්වා දේශය මුළුල්ලෙහි අන්ධකාරයක්
විය. නවවෙනි පැය පමණේදී 46
යේසුස්වහන්සේ: ඒලී, ඒලී, ලාමා
සබක්තානි කියා මහත් ශබ්දයකින්
මොරගැසූසේක. එහි අර්ථය නම්, මාගේ
දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා
අත්හැරියේ මක්නිසාද යනුයි. එහි 47
සිටියවුන්ගෙන් සමහරෙක් ඒ අසා: මොහු
එලියාට අඬගසන්නේයයි කීවෝය.
එකෙණෙහිම ඔවුන්ගෙන් එක්කෙනෙක් 48
දිව ගොස්, මුදුහත්තක් ගෙන
කාඩියෙන් පොහවා බටදණ්ඩක ගසා,
උන්වහන්සේට බොන්ට දුන්නේය.
සෙස්සෝ කථාකොට: නිකම් සිටපන්න; 49
මොහු ගළවන්ට එලියා එන්නේද කියා
බලමුයයි කීවෝය. යේසුස්වහන්සේ 50
නැවතත් මහත් ශබ්දයකින් හඬනගා
ආත්මය හළසේක. බලව, දේවමාළිගාවේ 51
තිරය ඉහළ පටන් පහළට දෙකඩව
ඉරුණේය; පොළොව කම්පාවූවාය;
පර්වත පැළුණේය; සොහොන් ගෙවල්ද 52
ඇරුණේය; සැතපී හුන්නාවූ නොයෙක්
ශුද්ධවරයන්ගේ ශරීර නැඟුටුවනලදුව,
ඔව්හු උන්වහන්සේ නැඟුටුණු පසු 53
සොහොන් ගෙවලින් නික්ම ශුද්ධ නුවරට
ඇතුල්ව, බොහෝ දෙනෙකුට පෙනුණෝය.
සියයකට මුලාදෑනියාද ඔහු සමග 54
යේසුස්වහන්සේ රැකවල්කරමින් සිටි අයද
පොළෝකම්පාවත් සිදුවූ දේත් දැක
ඉතා භයපත්ව: සැබවින්ම මුන්වහන්සේ
දෙවියන්වහන්සේගේ පුත්‍රයායයි කීවෝය.
යේසුස්වහන්සේට උපස්ථාන කරමින් 55
ගලීලයේ සිට උන්වහන්සේ කැටුව ආවාවූ
බොහෝ ස්ත්‍රීවරුත් එහි දුරින් බලා
සිටියෝය. ඔවුන් අතරෙහි මග්දලායේ 56
මරියාද යාකොබ් සහ යෝසෙස්ගේ
මවුවූ මරියාද සෙබදීගේ පුත්‍රයන්ගේ
මෑණියෝද සිටියෝය.

## යේසුස්වහන්සේගේ භූමදනය

සවස්වූ කල යේසුස්වහන්සේගේ 57
ගෝලයෙක්ව සිටිය යෝසෙප් නම්
වස්තුකාර මනුෂ්‍යයෙක් අරිමාතියේ සිට

ඇවිත්, පිලාත් ළඟට ගොස්,
58 යේසුස්වහන්සේගේ මිනිය ඉල්ලුවේය.
එවිට පිලාත් එය භාරදෙන්ට
59 අණකෙළේය. යෝසෙප් මිනිය ගෙන
60 පිරිසිදු හණ රෙද්දකින් වෙළා, තමා
විසින් පර්වතයෙහි කප්පවා තිබුණ
තමාගේම අලුත් සොහොන්ගෙයි තබා,
එහි දෙරකඩට මහත් ගලක් පෙරළා
61 තබා ගියේය. මග්දලායේ මරියාද අනික්
මරියාද එතැන සොහොන් ගෙය ඉදිරිපිට
ඉඳගෙන උන්නෝය.
62 පසුවද, එනම් සූදනම්කිරීමේ දවසට
පසුවද, නායක පූජකයෝද ඵරිසිවරුද
63 පිලාත් ළඟට රැස්ව ඇවිත්: ස්වාමිනි, ඒ
වංචාකාරයා ජීවත්ව සිටියදී–මම
තුන්දවසකට පසු නැගිටින්නෙමියි කී
64 බව අපට මතකය. එහෙයින් තුන්වෙනි
දවස දක්වා සොහොන් ගෙය ආරක්ෂා
කරන්ට අණකළ මැනවි, නැතහොත්
සමහරවිට ඔහුගේ ගෝලයන් ඇවිත්
ඔහු සොරාගෙන ගොස්–ඔහු මළවුන්-
ගෙන් නැගුටුණේයයි සෙනඟට කියනවා
ඇත. මෙසේ පළමු මුළාවට වඩා
අන්තිම මුළාව මහත්වන්නේයයි කීවෝය.
65 තුඹලාට රැකවල්ලු සිටිති. තුඹලා ගොස්
තුඹලාට පුළුවන් පමණ එය සුරක්ෂිත
කොට තබාපල්ලායයි පිලාත් ඔවුන්ට
66 කීවේය. ඔව්හු ගොස් ගල මුද්‍රකර,
රැකවලුන් ඇතුව, සොහොන්ගෙය
සුරක්ෂිත කළෝය.

## යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම

28 සබත් දවස නිමවන්ට ළංව සතියේ
පළමුවෙනි දවසට එළිවෙන
වේලේහි, මග්දලායේ මරියාද අනික්
මරියාද සොහොන්ගෙය බලන්ට
2 ගියෝය. එවිට මහත් පොළෝකම්පාවක්
විය; මක්නිසාද ස්වාමීන්වහන්සේගේ
දූතයෙක් ස්වර්ගයෙන් බැස ඇවිත්, ගල
අහකට පෙරළා, ඒ පිට ඉඳගත්තේය.
3 ඔහුගේ පෙනීම විදුලිය මෙන් වූය, ඔහුගේ
වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුණේය.
4 රැකවල්ලු ඔහුට භයින් වෙවුලා මළවුන්
සේ වූහ. දේවදූතයා ඒ ස්ත්‍රීන්ට 5
කථාකරමින්: භය නොවෙල්ලා;
මක්නිසාද කුරුසියෙහි ඇණ ගසනලද
යේසුස්වහන්සේව තුඹලා සොයන බව
දනිමි. උන්වහන්සේ මෙහි නැත; 6
උන්වහන්සේ කී ලෙසම නැගුටුණු-
සේක. වරෙල්ලා, ස්වාමීන්වහන්සේ උන්
ස්ථානය බලා ඉක්මනින් ගොස්,
උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණුසේක 7
කියා උන්වහන්සේගේ ගෝලයන්ට
කියාපල්ලා; උන්වහන්සේ තුඹලාට පළමු
ගලීලයට යනසේක; එහිදී තුඹලා
උන්වහන්සේ දකින්නහුය. බලාපල්ලා,
තුඹලාට කීයෙමියි කීවේය. එවිට ඔව්හු 8
භයින්ද මහත් ප්‍රීතියෙන්ද සොහොන්
ගෙයින් ඉක්මනින් නික්ම ගොස්,
උන්වහන්සේගේ ගෝලයන්ට දන්වන
පිණිස දිවුවෝය. එකල යේසුස්වහන්සේ 9
ඔවුන්ට සම්මුඛවී: ශුභසිද්ධවේවයි
කීසේක. ඔව්හු ළඟට ඇවිත්
උන්වහන්සේගේ පාද වැළඳගෙන,
උන්වහන්සේට නමස්කාරකළෝය. එකල 10
යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට:
භය නොවෙල්ලා. මාගේ සහෝදරයන්
ළඟට ගොස්, ගලීලයට පිටත්ව යන්ට
ඔවුන්ට කියාපල්ලා, එහිදී ඔවුන් මා
දකිනවා ඇතැයි කීසේක.
ඔවුන් යන කල රැකවලුන්ගෙන් 11
සමහරෙක් නුවරට ඇවිත් සිදුවූ සියල්ල
නායක පූජකයන්ට දන්නුවෝය. එවිට 12
ඔව්හු වැඩිමහල්ලන් සමග රැස්ව
මන්ත්‍රණයකොට, භේවායන්ට බොහෝ
මිලදී: අප නිදඉන්දදී ඔහුගේ ගෝලයෝ 13
රෑ ඇවිත් ඔහු සොරාගෙන ගියෝයයි
කියාපල්ලා. මේක ආණ්ඩුකාරයාට 14
ආරංචිවුණොත්, අපි ඔහු සතුටුකොට
තුඹලා බේරාගන්නෙමුයයි කීවෝය.
ඔව්හු මිල රැගෙන තමුන්ට ඉගැන්නු 15
ලෙස කළෝය. මෙසේ ඒ කීම
යුදෙව්වරුන් අතරේ ප්‍රසිද්ධව, අද දක්වා
පවත්නේය.

## ගලීලයේදී ප්‍රේරිතයන්ට දර්ශනය වීම

ගෝලයෝ එකොළොස්දෙනා යේසුස්- 16
වහන්සේ තමුන්ට නියමකළ ගලීලයේ

17 කන්දට ගියෝය. ඔව්හු උන්වහන්සේ
දැක උන්වහන්සේට නමස්කාරකළෝය.
නුමුත් සමහරෙක් සැකකළෝය.
18 යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත්
කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද
19 සියලු බලය මට දී තිබේ. එබැවින්
නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන්
කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත්
ශුද්ධාත්මයාණන්ගේත් *නාමයට ඔවුන්
†බව්තීස්මකරපල්ලා. මා විසින් නුඹලාට 20
අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට
උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය
දක්වා සෑම කල්හිම නුඹලා සමග
සිටිමියි කීසේක.

*නාමය තුළට.
†අවගාහනයකරපල්ලා.

# ශුද්ධවූ මාර්ක් විසින් ලියනලද ශුභාරංචිය

## *යොහන් බව්තීස්ත සහ මහුගේ පණිවුඩය

1 දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියේ
පටන්ගැන්මය.

2 බලව, මම මාගේ දූතයා නුඹට
පෙරටුව යවමි,
හෙතෙම නුඹේ මාර්ගය සාදන්නේය;
3 ස්වාමීන්වහන්සේගේ මාර්ගය පිළියෙළ
කරව්,
උන්වහන්සේගේ මාවත් සමතලා
කරවියයි
වනාන්තරයේ හඬගසන්නෙකුගේ
ශබ්දයය කියා

අනාගතවක්තෘවූ යෙසායාගේ පොතේ
4 ලියා තිබෙන ප්‍රකාරයට, යොහන්
ආවේය. ඔහු වනාන්තරයෙහිදී
†බව්තීස්මකරමින් පව්කමාව පිණිස
පසුතැවිල්ලේ †බව්තීස්මය ප්‍රකාශකෙළේය.
5 එවිට මුළු යූද රටවාසීහුද යෙරුසලමේ
සියල්ලෝද ඔහු වෙතට පැමිණ තමුන්ගේ
පව් කියාදෙමින් ඔහුගෙන් යොර්දන්
6 ගඟෙහි †බව්තීස්මය ලැබුවෝය. යොහන්
ඔටුරෝම වස්ත්‍ර හැඳ ඉඟටියේ සම්පටියක්
බැඳ සිටියේය, ඔහු පළඟැටියන්ද වන
7 මීද කෑවේය. ඔහු දේශනාකරමින්: මට
වඩා බලවත් කෙනෙක් මට පසුව
එනසේක, මම නැමී උන්වහන්සේගේ
වහන්වල පටිය මුදන්ටවත් නොවටිමි.
8 මම නුඹලා ‡වතුරෙන් †බව්තීස්ම
කෙළෙමි, නුමුත් උන්වහන්සේ නුඹලා
//ශුද්ධාත්මයාණන්ගෙන් †බව්තීස්ම
කරනසේකැයි කීය.

---

*අවගාහක යොහන්. †අවගාහනය.
‡වතුරෙහි. //ශුද්ධාත්මයාණන් තුළ.

## යේසුස්වහන්සේ †බව්තීස්මය ලැබීම

ඒ දවස්වලදී යේසුස්වහන්සේ ගලීලයේ 9
නාසරෙත් සිට ඇවිත් යොහන්ගෙන්
යොර්දනෙහි *බව්තීස්මය ලැබූසේක.
උන්වහන්සේ දියෙන් ගොඩනැගුණු 10
කෙණෙහිම අහස විවරවී, ආත්මයාණන්-
වහන්සේ පරෙවියෙකු මෙන් තමන් පිටට
බැස එනවා දුටුසේක. තවද: නුඹ මාගේ 11
ප්‍රේමවන්ත පුත්‍රයාය, නුඹ කෙරෙහි ඉතා
ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක්
නික්මුණේය.

## යේසුස්වහන්සේ පරීක්ෂාකරනු ලැබීම

එකෙණෙහිම ආත්මයාණන්වහන්සේ 12
උන්වහන්සේ වනාන්තරයට පැමිණෙවූ-
සේක. උන්වහන්සේ සාතන් විසින් 13
පරීක්ෂාකරනු ලබමින් සතළිස් දවසක්
වනාන්තරයේ සිටිසේක; උන්වහන්සේ
වන මෘගයන් අතරේ සිටිසේක; දේව
දූතයෝ උන්වහන්සේට උපස්ථාන
කළෝය.

## යේසුස්වහන්සේගේ මෙහෙය ආරම්භකිරීම

යොහන් පාවාදෙනු ලැබුවායින් පසු 14
යේසුස්වහන්සේ ගලීලයට පැමිණ
දෙවියන්වහන්සේගේ ශුභාරංචිය
දේශනාකරමින්: කාලය සම්පූර්ණවිය, 15
දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය.
පසුතැවිලිවී ශුභාරංචිය අදහාගනිල්ලායයි
කීසේක.

---

*අවගාහනය.

## මුල් ගෝලයන් කැඳවීම

16 උන්වහන්සේ ගලීලයේ මුහුද අද්දර
යද්දී, මසුන් අල්ලන්නන්වූ සීමොන්ද
සීමොන්ගේ සහෝදරවූ අන්ද්‍රෑද මුහුදේ
17 දලක් හෙළනවා දැක: මා අනුව
වරෙල්ලා, මම තුඹලා මනුෂ්‍යයන්
අල්ලන්නන් වෙන්ට සලස්වන්නෙමියි
18 ඔවුන්ට කීසේක. එකෙණෙහිම ඔව්හු
දැල් අත්හැර උන්වහන්සේ අනුව ගියෝය.
19 උන්වහන්සේ එතැනින් මදක් දුර ගොස්,
සෙබදීගේ පුත්‍රවූ යාකොබ්ද ඔහුගේ
සහෝදරවූ යොහන්ද ඔරුවේ හිඳ දැල්
20 අලුත්කරනවා දැක, එකෙණෙහිම ඔවුන්ට
අඬගැසූසේක. ඔව්හුද තමුන්ගේ පියවූ
සෙබදී වැඩකාරයන් සමග ඔරුවේ
ඉන්ට හැර උන්වහන්සේ පස්සේ ගියෝය.

## කපර්ණවුමේදී කිලිටි ආත්මයක් ආවේශවූවෙකුට සුවකිරීම

21 ඔව්හු කපර්ණවුමට පැමිණියෝය;
එකෙණෙහිම සබත් දවසේ උන්වහන්සේ
සිනගෝගයට ඇතුල්වී ඉගැන්වූසේක.
22 උන්වහන්සේගේ ඉගැන්වීම ගැන ඔව්හු
විස්මිතවූවෝය. මක්නිසාද උන්වහන්සේ
ලියන්නන් මෙන් නොව බලය ඇති
කෙනෙකු මෙන් ඉගැන්වූසේක.
23 එකෙණෙහිම ඔවුන්ගේ සිනගෝගයේ
අශුද්ධාත්මයක් ආවේශවූ මනුෂ්‍යයෙක්
24 සිටියේය. ඔහු මොරගසමින්: නාසරිය
යේසුස්වහන්ස, ඔබට අපෙන් කම
මොකද? අප විනාශකරන්ට ආසේක්ද?
ඔබවහන්සේ කවුද කියා දනිමි,
ඔබ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ
25 තැනන්වහන්සේයයි කීය. යේසුස්වහන්සේ
ඔහුට තරවටුකරමින්: කථා නොකරව,
26 මොහුගෙන් පිටවෙවයි කීසේක. එවිට
අශුද්ධාත්මය ඔහු තදින් වෙවුලවා,
මහත් හඬින් මොරගසමින්, ඔහුගෙන්
27 පිටවූයේය. එකල ඔවුන්ගේ පුදුමය
කෙතරම් වීදයත්, සියල්ලෝම: මේ
කිමෙක්ද? අලුත් ඉගැන්වීමක්ය.
මුන්වහන්සේ බලයෙන් යුක්තව
අශුද්ධාත්මයන්ට පවා අණකරනසේක.
ඔව්හු උන්වහන්සේට කීකරුවෙතියි
ඔවුනොවුන් අතරේ කථාකරගත්තෝය.
එකෙණෙහිම උන්වහන්සේ ගැන 28
ප්‍රවෘත්තිය මුළු ගලීල පළාතේ අවට
සෑමතැනම පතළවිය.

## පේත්‍රුස්ගේ භාර්යාවගේ මවුටත් තවත් බොහෝ දෙනෙකුටත් සුවකිරීම

ඔව්හු සිනගෝගයෙන් පිටත්ව ආ 29
කෙණෙහිම යාකොබ් සහ යොහන්
සමග සීමොන්ගේද අන්ද්‍රෑගේද ගෙදරට
පැමිණියෝය. සීමොන්ගේ භාර්යාවගේ 30
මවු උණෙන් ඔත්පළව සිටියාය.
එකෙණෙහිම ඔව්හු ඈ ගැන
උන්වහන්සේට කීවෝය. උන්වහන්සේ 31
ඇවිත් ඇගේ අත අල්ලා ඈ නැගිටෙවූ-
සේක; එවිට උණරෝගය ඈ කෙරෙන්
පහව ගියේය, ඈ ඔවුන්ට උපස්ථානකළාය.
සවස්වී ඉර බැස්ස කල ඔව්හු 32
රෝගාතුරවූ සියල්ලන්ද යක්ෂාවේශවූවන්ද
උන්වහන්සේ ළඟට ගෙනාවෝය. මුළු 33
නුවර වැසියෝ දොර ළඟ රැස්ව සිටියෝය.
උන්වහන්සේ අනේකාකාර රෝගවලින් 34
පීඩිතවූ බොහෝ දෙනෙකු සුවකළසේක,
බොහෝ යක්ෂයන්ද දුරුකළසේක; ඒ
යක්ෂයන් උන්වහන්සේ හැඳින්න බැවින්
කථාකරන්ට උන්වහන්සේ ඔවුන්ට
අවසර නුදුන්සේක.

## යේසුස්වහන්සේ යාච්ඤාව සඳහා යෑම. කපර්ණවුමෙන් පිටත්වීම

උදය පහන්වෙන්ට බොහෝ ප්‍රථමයෙන් 35
උන්වහන්සේ නැගිට වනාන්තර
ස්ථානයකට පිටත්ව ගොස්, එහිදී
යාච්ඤාකළසේක. සීමොන් සහ ඔහු 36
සමග සිටි අයද උන්වහන්සේ පස්සේ
ගොස්, උන්වහන්සේ සම්බවූ කල: 37
සියල්ලෝම ඔබ සොයතියි උන්වහන්සේට
කීවෝය. එවිට උන්වහන්සේ: වෙන 38
තැන්වලත් මා විසින් දේශනා කරන
පිණිස අසල නුවරවලට යමු; ඒ සඳහාම
පිටත්ව ආවෙමියි ඔවුන්ට කීසේක.

39 උන්වහන්සේ දේශනාකරමින්ද යක්ෂයන්
දුරුකරමින්ද ගලීලය මුළුල්ලෙහි ඔවුන්ගේ
සිනගෝගවලට ගියසේක.

## කුෂ්ඨරෝගියෙකුට සුවකිරීම

40 එවිට කුෂ්ඨරෝගියෙක් උන්වහන්සේ
ළඟට ඇවිත් දණින් හිඳ: ඔබවහන්සේ
කැමතිසේක් නම් මා පවිත්‍රකරන්ට ඔබට
පුළුවනැයි කියා අයැද සිටියේය.
41 උන්වහන්සේ අනුකම්පාවෙන් යුක්තව අත
දිගුකොට ඔහු පිට තබා: කැමැත්තෙමි,
පවිත්‍රවෙයන්නැයි ඔහුට කීසේක.
42 එකෙණෙහිම කුෂ්ඨය ඔහුගෙන් පහවී,
43 ඔහු පවිත්‍රකරනු ලැබීය. උන්වහන්සේ:
කිසිවෙකුට කිසිවක් නොකියන්ට
බලාගනිත්තැයි ඔහුට තදින් අණකොට--
44 නුඹ ගොස් ඔවුන්ට සාක්ෂි පිණිස
පූජකයාට පෙනී, නුඹේ පවිත්‍රවීම ගැන
මෝසෙස් විසින් අණකළ දේවල්
පූජාකරපන්න කියා එකෙණෙහිම ඔහු
45 යැවූසේක. නුමුත් ඔහු පිටත්ව
ගොස් ඒ කාරණය බොහෝසෙයින්
ප්‍රසිද්ධකරන්ටත් පතළකරන්ටත් පටන්-
ගත්තේය. ඒ නිසා යේසුස්වහන්සේ
ප්‍රසිද්ධයෙන් නුවරකට තවත් ඇතුල්වන්ට
නොහැකිව, වනාන්තර ස්ථානවල පිටත
සිටිසේක. මනුෂ්‍යයෝ සියලු දිශාවලින්
උන්වහන්සේ වෙතට ආවෝය.

## අංශභාග රෝගියෙකුට සුවකිරීම

2 උන්වහන්සේ දවස් ගණනකට පසු
කපර්ණවුමට නැවත ඇතුල්වූ කල,
උන්වහන්සේ ගෙයි සිටින බව ආරංචිවිය.
2 එවිට දෙරකඩ ළඟවත් ඉඩ නැති
තරමට බොහෝ දෙනෙක් රැස්වූවෝය.
උන්වහන්සේ ඔවුන්ට වචනය කීසේක.
3 එකල සතරදෙනෙකු විසින් උසුලනලද
අංශභාග රෝගියෙකු රැගෙන ඔව්හු
4 උන්වහන්සේ වෙතට ආවෝය. සමූහයා
නිසා උන්වහන්සේ ළඟට එන්ට
නොහැකිව, ඔව්හු උන්වහන්සේ සිටි තැන
සෙවිල්ල හැර, පියස්ස කඩා, අංශභාග
රෝගියා ඔත්යහන බැස්සෙවූවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල දැක: 5
පුත්‍රය, නුඹේ පව් කමාකරනලදැයි
අංශභාග රෝගියාට කීසේක. එහෙත් 6
එතැන ඉඳගෙන උන් ලියන්නන්ගෙන්
සමහරෙක්: මොහු මෙසේ කථාකරන්නේ 7
මක්නිසාද? මොහු දෙවියන්වහන්සේට
අපහාසකරයි. එක්කෙනෙකුට එනම්
දෙවියන්වහන්සේට මිස පව් කමාකරන්ට
කාට පුළුවන්දැයි තමුන්ගේ සිත්වලින්
කල්පනාකරගත්තෝය. ඔවුන් තමුන් තුළ 8
මෙසේ කල්පනාකළ බව යේසුස්වහන්සේ
තමන්ගේ ආත්මයෙන් එකෙණෙහිම දැන,
ඔවුන්ට කියනසේක්: නුඹලා කුමක් නිසා
මේ කාරණා සිතින් කල්පනාකරව්ද?
අංශභාග රෝගියාට—නුඹේ පව් කමා- 9
කරනලදැයි කීමෙනුත්—නැගිට නුඹේ යහන
රැගෙන පලයන්නැයි කීමෙනුත් වඩා
පහසු කෝකද? නුමුත් පොළොවේදී පව් 10
කමාකරන්ට මනුෂ්‍ය පුත්‍රයාට බලය
ඇති බව නුඹලා විසින් දැනගන්නා
පිණිසය කියා උන්වහන්සේ අංශභාග
රෝගියාට කථාකොට: නැගිට නුඹේ 11
යහන රැගෙන ගෙදර පලයන්නැයි නුඹට
කියමියි කීසේක. ඔහු නැගිට 12
එකෙණෙහිම යහන රැගෙන සියල්ලන්
ඉදිරියෙහි පිටත්ව ගියේය; ඒ නිසා
සියල්ලෝම විස්මපත්වී: මෙබඳු දෙයක්
කවදාවත් නුදුටිමුව කියා දෙවියන්වහන්සේට
ප්‍රශංසා කළෝය.

## ලෙවී කැඳවීම

නැවත උන්වහන්සේ පිටත්ව මුහුද 13
අයිනේ ගියසේක; මුළු සමූහයා
උන්වහන්සේ වෙතට ආවෝය,
උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූසේක.
උන්වහන්සේ මග යන අතර, 14
අල්පෙවුස්ගේ පුත්‍රවූ ලෙවී සුංගම්පළේ
වාඩිවී ඉඳිනු දැක: මා අනුව වරෙන්නැයි
ඔහුට කීසේක. ඔහු නැගිට උන්වහන්සේ
අනුව ගියේය. තවද උන්වහන්සේ ඔහුගේ 15
ගෙයි කෑමට හුන් කල, බොහෝ
සුංගම් අයකරන්නෝද පව්කාරයෝද
උන්වහන්සේ සහ උන්වහන්සේගේ

ගෝලයන් සමග ඉඳගත්තෝය. මක්නිසාද
බොහෝ දෙනෙක් සිටියෝය, ඔව්හු
16 උන්වහන්සේ අනුව ගියෝය. උන්වහන්සේ
සුංගම් අයකරන්නන් හා පව්කාරයන්
සමග කනවා එරිසිවරුන්ගේ ලියන්නෝ
දැක උන්වහන්සේ සුංගම් අයකරන්නන්ද
පව්කාරයන්ද සමග කනබොනසේකැයි
උන්වහන්සේගේ ගෝලයන්ට කීවෝය.
17 යේසුස්වහන්සේ ඒ අසා: රෝගීන්ට මිස
නිරෝගීන්ට වෛද්‍යගෙන් කම් නැත. මම
පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්ට
නාවෙමියි ඔවුන්ට කීසේක.

## නිරාහාරය ගැන වාදය

18 යොහන්ගේ ගෝලයෝද එරිසිවරුද
නිරාහාරව සිටියෝය. ඔව්හු ඇවිත්:
යොහන්ගේ ගෝලයන්ද එරිසිවරුන්ගේ
ගෝලයන්ද නිරාහාරයෙන් සිටිද්දී
ඔබගේ ගෝලයන් නිරාහාරයෙන්
නොසිටින්නේ මක්නිසාදැයි උන්වහන්සේ-
19 ගෙන් ඇසුවෝය. යේසුස්වහන්සේ
ඔවුන්ට කථාකොට: මගුල් ගෙදර
අය සමග මනමාලයා සිටියදී
ඔවුන්ට නිරාහාරව සිටින්ට පුළුවන්ද?
මනමාලයා ඔවුන් සමග සිටින
තෙක් නිරාහාරව සිටින්ට ඔවුන්ට
20 බැරිය. නුමුත් මනමාලයා ඔවුන්ගෙන්
අහක්කරනු ලබන දවස් පැමිණෙන්නේය,
එවිට ඒ දවසේ ඔව්හු නිරාහාරව
21 සිටින්නෝය. කිසිවෙක් තාන් රෙදි
කැබෙල්ලක් පරණ වස්ත්‍රයකට මහන්නේ
නැත; මැහුවොත් අලුත් රෙදි කැල්ලට
පරණ රෙද්ද ඇදී, වඩා ලොකු ඉරුමක්
22 වේ. තවද කිසිවෙක් අලුත් මුද්‍රිකපානය
පරණ සම්භාජනවල වත් නොකරයි;
වත්කළොත් මුද්‍රිකපානයෙන් සම්භාජන
පැළී, මුද්‍රිකපානයත් භාජනත් නාස්ති-
වන්නේය. නුමුත් අලුත් මුද්‍රිකපානය අලුත්
සම්භාජනවල වත්කරතියි කීසේක.

## සබත් පැවැත්වීම පිළිබඳ ප්‍රශ්නය

23 තවද උන්වහන්සේ සබත් දවසේදී
ගොයම් කෙත් මැදින් ගියසේක; උන්-
වහන්සේගේ ගෝලයෝ යමින්ම කරල්
කඩන්ට පටන්ගත්තෝය. එවිට එරිසිවරු 24
කථාකොට: මෙන්න, සබත් දවසේදී
නොකටයුතු දේ මොවුන් කරන්නේ
මක්නිසාදැයි උන්වහන්සේට කීවෝය.
උන්වහන්සේ ඔවුන්ට කථාකොට: දාවිත් 25
තමාටද තමා සමග සිටියවුන්ටද
හිඟයක් වී බඩගිනිවූ කල්හි කළ දේ,
එනම් උත්තම පූජකයාවූ අබියාතර්ගේ 26
කාලයේදී දෙවියන්වහන්සේගේ ගෘහයට
ඇතුල්ව, පූජකයන්ට විනා වෙන කාටවත්
කන්ට යුතු නැති පිදීමේ රොටි කා,
තමා සමග සිටියවුන්ටත් දුන් බව
නුඹලා කවදාවත් කියෙවුවේ නැද්දැයි
කීසේක. උන්වහන්සේ ඔවුන්ට 27
කියනසේක්: මනුෂ්‍යයා සබත් දවස
උදෙසා නොව සබත් දවස මනුෂ්‍යයා
උදෙසා නියමකරනලද්දේය. එබැවින්
මනුෂ්‍ය පුත්‍රයා සබත් දවසේ පවා 28
ස්වාමීයයි කීසේක.

## වියළි අතක් ඇති මනුෂ්‍යයෙකුට සුවකිරීම

3 උන්වහන්සේ නැවත සිනගෝගයට
ඇතුල්වූසේක; වියළුණු අතක් ඇති
මනුෂ්‍යයෙක් එහි සිටියේය. එවිට ඔව්හු 2
උන්වහන්සේට වරදනබන පිණිස
උන්වහන්සේ සබත් දවසේදී ඔහු
සුවකරනසේක්දෝ කියා බල බලා
සිටියෝය. උන්වහන්සේ: නැගිට ඉදිරියට 3
වරෙන්නැයි වියළුණු අත ඇති
මනුෂ්‍යයාට කියා, ඔවුන්ට කථාකොට- 4
සබත් දවසේදී සුදුසුවන්නේ යහපත
කිරීමද නොහොත් නපුර කිරීමද?
ප්‍රාණයක් ගැළවීමද නොහොත්
නාස්තිකිරීමදැයි ඔවුන්ගෙන් ඇසූසේක.
නුමුත් ඔව්හු කථා නොකර සිටියෝය.
උන්වහන්සේ ඔවුන්ගේ සිත් දැඩිකම නිසා 5
දුක්වී, උදහසින් ඔවුන් වටකර බලා:
නුඹේ අත දිගුකරපන්නැයි ඒ මනුෂ්‍යයාට
කීසේක. ඔහු එය දිගුකෙළේය.
එවිට ඔහුගේ අත සුවවිය. එරිසිවරු 6
පිටත්ව ගොස් උන්වහන්සේ නසන්නේ
කෙසේද කියා උන්වහන්සේට විරුද්ධව
හෙරෝදිවරුන් සමග එකෙණෙහිම
මන්ත්‍රණයකළෝය.

## විවිධ රෝගීන් සුවකිරීම

7 යේසුස්වහන්සේ එයින් අහක්ව තමන්
ගෝලයන් සමග මුහුද ළඟට ගියසේක.
ගලීලයෙන් මහත් සමූහයක්ද
උන්වහන්සේ අනුව ගියෝය. යුදයෙන්ද
8 යෙරුසලමෙන්ද ඉදුමයෙන්ද යෝර්දන්
එගොඩින්ද තීර් සහ සීදෝන්
අවටින්ද මහත් සමූහයක් උන්වහන්සේ
විසින් කරනලද මහත් ක්‍රියා ගැන
අසා උන්වහන්සේ ළඟට ආවෝය.
9 සමූහයාගෙන් උන්වහන්සේ නොතෙරපෙන
පිණිස තමන්ට කුඩා ඔරුවක් සූදානම්ව
තිබිය යුතුයයි උන්වහන්සේ ගෝලයන්ට
10 කීසේක. මක්නිසාද උන්වහන්සේ බොහෝ
දෙනෙකු සුවකළ හෙයින් රෝගවලින්
පීඩිතවූ සියල්ලෝම උන්වහන්සේගේ
ඇඟේ අත් තබන්ට උන්වහන්සේට
11 තෙරපීගන ආවෝය. අශුද්ධාත්මයෝද
උන්වහන්සේ දුටු කල උන්වහන්සේ
ඉදිරියෙහි වැටී: ඔබ දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණෝයයි මොරගසා කීවෝය.
12 තමන් ප්‍රසිද්ධ නොකරන ලෙස
උන්වහන්සේ බොහෝසේ ඔවුන්ට
අණකළසේක.

## ප්‍රේරිතයන් දොළොස්දෙනා තෝරාගැනීම

13 උන්වහන්සේ කන්දට නැඟී
තමන්වහන්සේ කැමතිවූවන් තමන් ළඟට
කැඳෙවූසේක. ඔව්හු උන්වහන්සේ ළඟට
14 ආවෝය. උන්වහන්සේද තමන් සමග
සිටින පිණිසත්, දේශනාකරන්ට පිටත්කර
15 අරින පිණිසත්, යක්ෂයන් දුරු කිරීමේ
බලය දරන පිණිසත්, දොළොස්දෙනෙකු
16 නියමකළසේක. (ඔව්හු කවුරුද යත්:)
උන්වහන්සේ විසින් පේත්‍රුස්යයි නම්කළ
17 සීමොන්ද, ගර්ජනාවේ පුත්‍රයෝය
යන අර්ථය ඇති බොවනර්ගස්යයි
උන්වහන්සේ විසින් නම් තබනලද
සෙබදීගේ පුත්‍රවූ යාකොබ් සහ ඔහුගේ
18 සහෝදරවූ යොහන්ද, අන්ද්‍රෑ සහ පිලිප්ද,
බර්තොලොමෙව් සහ මතෙව්ද, තෝමස්
සහ අල්පෙවුස්ගේ පුත්‍රවූ යාකොබ්ද,
තද්දියුස් සහ කානානියවූ සීමොන්ද,
උන්වහන්සේ පාවාදුන් යූදස් 19
ඉස්කාරියෝත්ද යන මොව්හුය.

## යේසුස්වහන්සේ සාතන් හා සම්බන්ධව ක්‍රියාකරන්නේය යන කීමට උත්තරදීම

උන්වහන්සේ ගෙදරකට පැමිණිසේක.
ඔවුන්ට කෑම කන්ට පමණවත් අවකාශ 20
නැතිවන තරමට සමූහයා නැවත
රැස්වුණෝය. උන්වහන්සේගේ නෑයෝ 21
ඒ අසා, උන්වහන්සේට ඔල්මාදයයි
කියා උන්වහන්සේ අල්ලන්ට ගියෝය.
යෙරුසලමෙන් ආවාවූ ලියන්නෝ: 22
මොහුට බෙල්සෙබුබ් ඇත්තේය කියාත්
යක්ෂාධිපතියාගේ බලයෙන් මොහු
යක්ෂයන් දුරුකරයිය කියාත් කීවෝය.
එවිට උන්වහන්සේ ඔවුන් තමන් වෙතට 23
කැඳවා උපමාවලින් කථාකරමින්:
සාතන් දුරුකරන්ට සාතන්ට පුළුවන්
කොහොමද? යම් රාජ්‍යයක් ඒකටම 24
විරුද්ධව භේද වුණොත් ඒ රාජ්‍යය
පවතින්ට නොහැකිය. යම් ගෙයක් 25
ඒකටම විරුද්ධව භේද වුණොත් ඒ
ගෙය පවතින්ට නොහැකි වන්නේය.
සාතන් තමාටම විරුද්ධව නැඟිට භේදවේ 26
නම් ඔහු පවතින්ට නොහැකිව
කෙළවරවෙයි. නුමුත් බලවන්තයා 27
පළමුකොට බැඳලා මිස ඔහුගේ ගෙට
වැද ඔහුගේ බඩු කොල්ලකන්ට කාටවත්
නුපුළුවන; බැඳලාම ඔහුගේ ගෙය
කොල්ලකන්නේය. සැබවක් නුඹලාට 28
කියම්–මනුෂ්‍ය පුත්‍රයන්ට ඔවුන්ගේ සියලු
පව්ද ඔවුන් දෙවියන්වහන්සේට කරන
සියලු ආකාර අපහාසද කමාකරනු
ලබන්නේය. නුමුත් ශුද්ධාත්මයාණන්- 29
වහන්සේට අපහාස කරන කෙනෙකුට
කොයි කලකවත් කමාව නොලැබෙන්නේය,
ඔහු සදාකාලික පාපයක් ගැන
වරදකාරයෙකැයි කීසේක. මෙසේ 30
කීවේ උන්වහන්සේට අශුද්ධාත්මයක්
ඇත්තේයයි ඔවුන් කී බැවින්ය.

## යේසුස්වහන්සේගේ සැබෑ නෑයෝ

31 එවිට උන්වහන්සේගේ මෑණියෝද
සහෝදරයෝද ඇවිත් පිටත සිට
උන්වහන්සේ කැඳවන්ට යැවූවෝය.
32 සමූහයක් උන්වහන්සේ අවට වාඩිවී
උන්නේය. බැලුව මැනව, ඔබවහන්සේගේ
මෑණියොත් සහෝදරයොත් පිටත සිට
ඔබ සොයතියි ඔව්හු උන්වහන්සේට
33 කීවෝය. උන්වහන්සේ ඔවුන්ට
උත්තරදෙමින්: මාගේ මෑණියොත් මාගේ
34 සහෝදරයොත් කවුරුදැයි කියා, තමන්
අවට වාඩිවී උන්නවුන් දෙස වටේට
බලා: මෙන්න, මාගේ මෑණියොත් මාගේ
35 සහෝදරයොත්! මක්නිසාද දෙවියන්-
වහන්සේගේ කැමැත්ත කරන කවරෙක්
තුමුත් මාගේ සහෝදරයාත් සහෝදරීත්
මෑණියොත්යයි වදාළසේක.

## වපුරන්නා ගැන උපමා කථාව

4 නැවතත් උන්වහන්සේ මුහුද අද්දර
උගන්වන්ට පටන්ගත්සේක. එකල
ඉතා මහත් සමූහයක් උන්වහන්සේ
වෙතට රැස්වූ බැවින් උන්වහන්සේ මුහුදේ
ඔරුවකට නැගී වැඩහුන්සේක; මුළු
සමූහයාද මුහුද ළඟ ගොඩ සිටියෝය.
2 උන්වහන්සේ බොහෝ කාරණා
උපමාවලින් ඔවුන්ට ඉගැන්වූසේක.
උන්වහන්සේ තමන් ඉගැන්වීමේදී ඔවුන්ට
3 කියනසේක්: අසාපල්ලා—වපුරන්නා
4 වපුරන්ට ගියේය. ඔහු වපුරන කල මෙසේ
සිද්ධවිය: සමහර බීජ මග අසල
වැටුණේය, පක්ෂීහු ඇවිත් ඒවා අවුලා
5 කෑවෝය. සමහරක් වඩා පස් නැති ගල්
බිමේ වැටී, පස් ඝන නොවූ නිසා වහාම
6 පැළවී, ඉර උදාවූ කල අව්වෙන් දලා,
7 මුල් නැති බැවින් වියළී ගියේය. අන්
සමහරක් කටු අතරේ වැටුණේය, කටු
වැවී ඒවා යටකළ බැවින් ඒවා එල
8 නුදුන්නේය. තවත් සමහරක් සරුබිමේ
වැටුණේය; ඒවා පැළවී වැඩී, එලදෙමින්,
එකෙන් තිහක්ද එකෙන් හැටක්ද එකෙන්
සියයක්ද බැගින් අස්වැන්න ඉපදවිය.
9 ඇසීමට කන් ඇත්තේ අසාවයි කීසේක.
උන්වහන්සේ තනියම සිටියදී 10
දොළොස්දෙනා සමග උන්වහන්සේ
පිරිවරා සිටි අය උපමා ගැන
උන්වහන්සේගෙන් ඇසුවෝය. එවිට 11
උන්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්-
වහන්සේගේ රාජ්‍යයේ රහස තුඹලාට
දී තිබේ. තුමුත් පිටත සිටින්නන්ට
සියල්ලම උපමාවලින් කියනු ලැබේ.
මක්නිසාදයත්: යම් හෙයකින් ඔවුන් හැරී 12
කමාව නොලබන ලෙස දක දකත්
නොදක්නා පිණිසය, අස අසාත් තේරුම්
නොගන්නා පිණිසයයි කීසේක. තවද 13
උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: මේ
උපමාව තුඹලා නොදනිවුද? එසේ
නම් තුඹලා සියලු උපමා කෙලෙස
දැනගන්නහුද? වපුරන්නා වචනය වපුරයි. 14
වචනය ඇසූ කල තමුන්ගේ සිත් තුළ 15
වපුළ වචනය සාතන් එකෙණෙහිම
ඇවිත් පැහැරගනීද, වචනය වපුරන ලද
මග අසල වූවෝ නම් ඔව්හුය. එසේම 16
ගල් බිම්වල වපුරනලද්දෝ නම්, වචනය
ඇසූ කෙණෙහිම ප්‍රීතියෙන් පිළිගන්න
තුමුත්, තමුන් තුළ මුල් නැති බැවින් මඳ 17
කලක් පැවත, වචනය නිසා හිංසාවක්
හෝ පීඩාවක් හෝ පැමිණි කල්හි,
එකෙණෙහිම බාධාවන්නෝවෙත්. කටු 18
අතරේ වපුරනලද අනික් අයවල් නම්,
වචනය ඇසූ තුමුත්, මේ ලෝකය 19
සම්බන්ධ කරදරද වස්තු මායාවද
අනිකුත් දේවලට තෘෂ්ණාවද පැමිණීම
කරණකොටගෙන වචනය යටකරනු
ලැබ එල නොදෙන්නෝ වෙති. සරුබිමේ 20
වපුරනලද්දෝ නම්, වචනය අසා,
පිළිගෙන, තිස් ගුණයක්ද සැට ගුණයක්ද
සියක් ගුණයක්ද බැගින් එල
දරන්නෝයයි කීසේක.

## පහනකින් සහ බීජවලින් ගුරුකම්

තවද උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: 21
පහන ගෙනෙන්නේ කුරුණිය යට හෝ
ඇඳ යට හෝ තබන පිණිසද? පහන්
රුක උඩ තැබීමට නොවේද? මක්නිසාද 22
මතු එළිදරව් නොවන සඟවනලද

දෙයක්වත්, මතු ප්‍රසිද්ධකරනු නොලබන
රහසේ තැබූ කිසි දෙයක්වත් නැත්තේය.
23 යමෙකුට ඇසීමට කන් ඇත්තේද ඔහු
24 අසාවයි කීසේක. තවද උන්වහන්සේ
ඔවුන්ට කියනසේක්: නුඹලා අසන
කාරණා ගැන බලාගනිල්ලා. නුඹලා
යම් මිම්මකින් මැනදෙන්නහුද, එයින්ම
නුඹලාටත් මැනදෙනු ලැබේ. නුඹලාට
25 තව වැඩියෙන් දෙනු ලැබේ. මක්නිසාද
යමෙකුට ඇත්තේද ඔහුට දෙනු ලැබේ
යමෙකුට නැත්තේද ඔහුට ඇති දේ පවා
ඔහුගෙන් ගනු ලැබේයයි කීසේක.
26 තවද උන්වහන්සේ කියනසේක්:
දෙවියන්වහන්සේගේ රාජ්‍යය වනාහි
මනුෂ්‍යයෙකු විසින් පොළොවෙහි බීජ
27 වැපිරීමට සමානය. ඔහු රාත්‍රියේ
නිදන්නේය, දහවල් නැගිට සිටින්නේය,
ඔහු නොදන්නා ප්‍රකාරයකින් ඒ බීජ
28 පැළවී වැඩෙන්නේය. පොළොවෙන්ම ඵල
හටගන්නේය; පළමුව කොළද දෙවනුව
කරල්ද ඉන්පසු කරළේ සම්පූර්ණ
29 ධාන්‍යයද හටගන්නේය. ගොයම් පැසුණු
කල, කපන කාලය පැමුණුණ බැවින්,
ඔහු වහාම දෑකැත්ත යොදන්නේයයි
කීසේක.
30 තවද උන්වහන්සේ කියනසේක්:
දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට
සමානකරමුද? නොහොත් කවර
31 උපමාවකින් එය දක්වාදෙමුද? එය අබ
ඇටයකට සමානය. එය පොළොවෙහි
වපුරන කල පොළොවෙහි තිබෙන සියලු
32 බීජවලට වඩා කුඩා නුමුත්, වපුළායින්
පසු එය වැඩී, සියලුම පලා ගස්වලට
වඩා ලොකුවී, ඒකේ සෙවණෙහි
ආකාශයේ පක්ෂීන්ට ලගින්ට පුළුවන්
තරමට මහත් අතු විහිදන්නේයයි
කීසේක.
33 ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට
මෙබඳු බොහෝ උපමාවලින්
උන්වහන්සේ වචනය ඔවුන්ට කීසේක.
34 උපමාවක් නැතුව උන්වහන්සේ ඔවුන්ට
කථානොකළසේක. නුමුත් උන්වහන්සේ
තමන්ගේම ගෝලයන්ට සියල්ල රහසේ
තෝරාදුන්සේක.

## කුණාටුවක් නිශ්චලකිරීම

එද සවස්වූ කල: අපි එගොඩට යමුයයි 35
උන්වහන්සේ ඔවුන්ට කීසේක. ඔව්හු 36
සමූහයා අත්හැර, උන්වහන්සේ සිටි
ලෙසම ඔරුවේ තමුන් සමග උන්වහන්සේ
ගෙනගියෝය. ඒ සමග වෙනත් ඔරුද
තිබුණේය. එවිට සැඩ සුළඟක් හමා, 37
ඔරුව පිරෙන තරමට ඒ තුළට රළ
ගැසුවේය. උන්වහන්සේ ඔරුවේ අවරේ 38
මෙත්තය පිට නිදාහුන්සේක. ඔව්හු
උන්වහන්සේ පුබුදුවා: ආචාරීනි, අප
විනාශවන බව ඔබ සලකන්නේ නැද්දැයි
උන්වහන්සේට කීවෝය. උන්වහන්සේ 39
නැගිට සුළඟට තරවටුකොට:
නිශ්ශබ්දවෙව, නිශ්චලවෙවයි මුහුදට
කීසේක. එවිට හුළඟ නැවතී, මහත්
නිශ්චලයක් විය. උන්වහන්සේද: නුඹලා 40
භයව සිටින්නේ මන්ද? තවම නුඹලාට
ඇදහිල්ල නැද්දැයි කීසේක. ඔව්හු ඉතා 41
භයපත්වී: හුළඟ සහ මුහුද පවා
මූන්වහන්සේට කීකරුවීමට මූන්වහන්සේ
කවරෙක්දැයි එකිනෙකා කථාකර
ගත්තෝය.

## ගෙරසේනයේ යක්ෂාවේශවූවෙකුට සුවකිරීම

5 ඔව්හු මුහුදෙන් එතර ගෙරසේන-
යන්ගේ රටට පැමිණියෝය.
උන්වහන්සේ ඔරුවෙන් බැස්ස 2
කෙණෙහිම අශුද්ධාත්මයක් ආවේශවූ
මනුෂ්‍යයෙක් සොහොන් ගෙවලින් පිටත්ව
එනවා උන්වහන්සේට සම්බවිය. ඔහු 3
සොහොන් ගෙවල වාසයකෙළේය.
දම්වැළකින් පවා ඔහු තවත් නවත්වන්ට
කිසිවෙකුට නුපුළුවන්විය. මක්නිසාද 4
විලංගුවලින්ද දම්වැල්වලින්ද බොහෝවර
බඳිනු ලැබූ නුමුත් ඔහු දම්වැල් කඩාදමා
විලංගු බිඳදැම්මේය. ඔහු දමනයකරන්ට
කිසිවෙකුට ශක්තිය නොවිය. ඔහු 5
නිතරම රෑ දවල් මොරගසමින්ද
ගල්වලින් කපාගනිමින්ද සොහොන්
ගෙවල්හිත් කඳුවලත් සිටියේය. ඔහු 6
යේසුස්වහන්සේ දුරදීම දැක දුවගෙන ඇවිත්

7 උන්වහන්සේට වැඳ: මහෝත්තම
දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්ස,
ඔබවහන්සේට මාගෙන් කම මොකද?
මට වද නොදෙන මෙන් දෙවියන්-
වහන්සේගේ නාමයෙන් උදක්ම ඉල්ලමියි
මහත් හඬින් මොරගසා කීවේය.
8 එසේ කීවේ: අශුද්ධාත්මය, මොහුගෙන්
දුරුවෙවයි උන්වහන්සේ ඔහුට කී නිසාය.
9 නුඹේ නම මොකදැයි උන්වහන්සේ
ඔහුගෙන් ඇසූසේක. මගේ නම
ලෙගියොන්ය; මක්නිසාද අපි බොහෝ
10 දෙනෙක් වමුයයි ඔහු කීය. රටෙන්
තමුන් දුරු නොකරන හැටියට ඔහු
බොහෝසෙයින් උන්වහන්සේගෙන්
11 ඉල්ලුවේය. එතැන කන්ද අයිනේ මහත්
ඌරු රැළක් ගොදුරු කමින් සිටියේය.
12 ඔව්හුද: ඌරන්ට වැහෙන පිණිස අප
හැරිය මැනවයි උන්වහන්සේගෙන්
13 ඉල්ලුවෝය. උන්වහන්සේ ඔවුන්ට
අවසරදුන්සේක. අශුද්ධාත්මයන් නික්ම
ගොස් ඌරන්ට වැහුණු කල, දෙදහසක්
පමණවූ ඒ ඌරු රැළ ප්‍රපාතය පහළට
වේගයෙන් දුව ගොස් මුහුදේ වැටී ගිලී
14 මළෝය. ඌරු රැකවල්ලු පලාගොස්
නුවරත් ගම්වලත් එපවත් දන්නුවෝය.
එවිට සිදුවූ දේ කුමක්දැයි බලන පිණිස
15 මනුෂ්‍යයෝ පිටත්ව ඇවිත්, යේසුස්-
වහන්සේ ළඟට පැමිණ, ලෙගියොන් නම්
යක්ෂාවේශවූ මනුෂ්‍යයා වස්ත්‍ර හැඳ සිහි
ඇතුව වාඩිවී ඉන්නවා දැක, භයවූවෝය.
16 ඒ දුටු අය යක්ෂාවේශවූ මනුෂ්‍යයාට
සිදුවුණු හැටිත් ඌරන් ගැනත් ඔවුන්ට
17 දන්නුවෝය. ඔව්හු වනාහි තමුන්ගේ
සීමාවලින් අහක්ව යන මෙන්
උන්වහන්සේගෙන් ඉල්ලන්ට පටන්-
18 ගත්තෝය. උන්වහන්සේ ඔරුවට නගිද්දී,
යක්ෂාවේශව සිටි මනුෂ්‍යයා උන්වහන්සේ
සමග සිටින ලෙස උදක්ම ඉල්ලා
19 සිටියේය. නුමුත් උන්වහන්සේ ඔහුට
අවසර නොදී: නුඹ ගෙදර නුඹේ නෑ
මිතුරන් ළඟට ගොස්, ස්වාමීන්වහන්සේ
නුඹට කොපමණ මහත් දේවල්
කළසේක්ද කියාත් උන්වහන්සේ නුඹට
කරුණාකළ හැටිත් ඔවුන්ට දන්වාපන්නැයි
ඔහුට කීසේක. ඔහු පිටත්ව ගොස්, 20
යේසුස්වහන්සේ තමාට කොපමණ මහත්
දේවල් කළසේක්ද කියා දෙකපොලිසෙහි
ප්‍රකාශ කරන්ට පටන්ගත්තේය. සියල්ලෝ
මවිතවූවෝය.

## යායිරස්ගේ දුව මළවුන්ගෙන් නැගිටවීම. රෝගීවූ ස්ත්‍රියක් සුවය ලැබීම

යේසුස්වහන්සේ නැවත ඔරුවෙන් 21
එගොඩවූ කල මහත් සමූහයක්
උන්වහන්සේ ළඟට රැස්වූවෝය.
උන්වහන්සේද මුහුද ළඟ සිටිසේක. එකල 22
සිනගෝගයේ මුලාදෑනීන්ගෙන් කෙනෙක්වූ
යායිරස් නැමැත්තෙක් ඇවිත් උන්-
වහන්සේ දැක, උන්වහන්සේගේ පාමුල
වැටී: මාගේ කුඩා දුව මරණාසන්නව 23
සිටින්නීය. ඈ සුවවී ජීවත්වන පිණිස
ඔබ ඇවිත් ඈ පිට අත් තැබුව මැනවයි
උන්වහන්සේගෙන් බොහෝසෙයින්
ඉල්ලුවේය. උන්වහන්සේ ඔහු සමග වැඩිය- 24
සේක; මහත් සමූහයක්ද උන්වහන්සේට
තෙරපෙමින් උන්වහන්සේ අනුව ගියෝය.
දොළොස් අවුරුද්දක් මහලේ රෝගය 25
ඇතුව සිටි ස්ත්‍රියෙක් නොයෙක් 26
වෙදුන්ගෙන් බොහෝ දේ විඳ, තමා
සතු සියල්ල වියදම්කළ නුමුත් කිසි
පලක් නොලැබ, වඩා අමාරුවට
පැමිණ සිටියාය. ඈ යේසුස්වහන්සේ 27
ගැන අසා, සමූහයා අතරෙන් පස්සෙන්
ඇවිත්, උන්වහන්සේගේ සළුවට
අතගැසුවාය. මක්නිසාද: උන්වහන්සේගේ 28
වස්ත්‍රවලට පමණවත් අතගැසුවොත් මට
සුවය ලැබේයයි ඈ කීවාය. එකෙණෙහිම 29
ඇගේ ලේ ධාරාව වියළී ගොස්, ඒ
පීඩාවෙන් ඈට සුවය ලැබුණු බව ඇගේ
ශරීරය තුළෙහි ඈට දැනුණේය.
එකෙණෙහිම යේසුස්වහන්සේ තමන් 30
කෙරෙන් නිකුත් වන ආනුභාව පිටවී
ගිය බව දැන, සමූහයා මැද හැරී: මාගේ
වස්ත්‍රවලට අතගැසුවේ කවුදැයි ඇසූසේක.
උන්වහන්සේගේ ගෝලයෝ: ඔබට 31
තෙරපීගන සිටින්නාවූ සමූහයා දැක

දකත්–මට අතගැහුවේ කවුද කියා
32 අසනසේක්දැයි කීවෝය. ඒ දේ කළ ස්ත්‍රිය
දකින පිණිස උන්වහන්සේ අවට
33 බැලූසේක. නුමුත් ස්ත්‍රී තමාට සිදුවූ දේ
දන භයවී වෙවුලමින්, ඇවිත් උන්වහන්සේ
ඉදිරියෙහි වැටී, සම්පූර්ණ ඇත්ත
34 උන්වහන්සේට කීවාය. උන්වහන්සේද:
දියණියනි, නුඹේ ඇදහිල්ල නුඹ
සුවකළේය; සමාදනයෙන් ගොස්, නුඹේ
පීඩාවෙන් සුවපත්ව සිටපන්නැයි ඇට
කීසේක.
35 උන්වහන්සේ කථාකරද්දීම සින-
ගෝගයේ මුලාදෑනියාගේ ගෙදරින්
සමහරු ඇවිත්: නුඹේ දුව මැරුණාය;
ආචාරීන්වහන්සේට තවත් කුමට
36 වෙහෙසකරන්නෙහිදැයි කීවෝය. නුමුත්
යේසුස්වහන්සේ ඒ කීම නොසලකා,
සිනගෝගයේ මුලාදෑනියාට කථාකොට:
භයනොවී ඇදහිල්ලෙන්ම සිටපන්නැයි
37 ඔහුට කීසේක. උන්වහන්සේ පේත්‍රුස්ද
යාකොබ්ද යාකොබ්ගේ සහෝදරවූ
යොහන්ද හැර වෙන කාටවත් තමන්
38 සමග එන්ට නොදී, සිනගෝගයේ
මුලාදෑනියාගේ ගෙට ආසේක. එවිට
උන්වහන්සේ කෝලාහලයක්ද බොහෝ-
39 සේ හඬාවැලපෙන්නවුන්ද බලා, ගෙට
ඇතුල්ව: නුඹලා සෝෂාකරන්නෙත්
හඬන්නෙත් මක්නිසාද? දරුවා මැරීලා
නොවේ, නිදන්නීයයි ඔවුන්ට කීසේක.
40 එවිට ඔව්හු උන්වහන්සේට සිනා-
සුණෝය. නුමුත් උන්වහන්සේ සියල්ලන්
බැහැරකොට, දරුවාගේ පියාද මවුද
තමන්වහන්සේ සමග සිටියවුන්ද කැඳවා-
ගෙන, දරුවා හුන් තැනට ගොස්,
41 ඇගේ අත අල්ලා: තලීතාකුම් කියා
ඇට කීසේක; එහි අර්ථය–යෞවනිය,
නැගිටපන්නැයි නුඹට කියමි යනුය.
42 දෙළොස් අවුරුදු වයස්වූ ඒ යෞවනී
එකෙණෙහිම නැගිට ඇවිද්දය.
එකෙණෙහිම ඔව්හු මහත් විස්මයකින්
43 විස්මිත වූවෝය. උන්වහන්සේ මෙය
කිසිවෙකු දන නොගන්නා ලෙස ඔවුන්ට
තදින් අණකොට, ඇට කෑම දෙන්ට
කීසේක.

## නාසරෙත්හිදී යේසුස්වහන්සේ සුළුකරනු ලැබීම

6 උන්වහන්සේ එතැනින් පිටත්ව
ගොස් තමන්ගේම රටට පැමිණි-
සේක; ගෝලයෝ උන්වහන්සේ කැටුව
ගියෝය. සබත් දවස පැමිණි කල 2
උන්වහන්සේ සිනගෝගයෙහි උගන්වන්ට
පටන්ගත්සේක. බොහෝ දෙනෙක් ඒ
අසා මවිතව: මොහුට මේ දේවල්
කොයින්ද? මොහුට දී තිබෙන මේ ප්‍රඥව
කිමෙක්ද? මොහුගේ අතින් කරනලද
බලවත් ක්‍රියාවලින් හැඟෙන්නේ කිමෙක්ද?
මොහු මරියාගේ පුත්‍රවූද යාකොබ්, 3
යෝසෙස්, යූදස් සහ සීමොන්ගේ
සහෝදරවූද වඩුවා නොවේද? මොහුගේ
සහෝදරියෝ මෙහි අප අතරේ සිටිනවා
නොවේද කියා උන්වහන්සේ ගැන
බාධාවූහ. එවිට යේසුස්වහන්සේ 4
කථාකොට: අනාගතවක්තෘ කෙනෙක්
තමාගේම රටේදීත් තමාගේම නෑයන්
අතරේදීත් තමාගේම ගෙදරදීත් මිස
ගෞරව නැතුව නොසිටීයයි කීසේක.
එහිදී රෝගීන් ස්වල්පදෙනෙකු පිට 5
අත් තබා සුවකළා මිස වෙන කිසි
බලවත් ක්‍රියාවක් කරන්ට උන්වහන්සේට
නොහැකිවූයේය. ඔවුන්ගේ විශ්වාසය 6
නැතිකම ගැන උන්වහන්සේ මවිතවූසේක.
උන්වහන්සේ උගන්වමින් අවට ගම්වල
ඇවිද්දසේක.

## දෙළොස්දෙනාගේ මෙහෙය

එකල උන්වහන්සේ දෙළොස්දෙනා 7
තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන
දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන,
අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලයදී,
ගමනට සැරයටියක් පමණක් මිස 8
රොටිවත් මල්ලක්වත් පසුම්බිවල මුදල්වත්
යන කිසි දෙයක් නොගෙන, වහන් පය 9
ලා, ඇඳුම් දෙකක් නොහැඳ යන
ලෙස ඔවුන්ට අණකළසේක. තවද 10
උන්වහන්සේ ඔවුන්ට කියනසේක්:
නුඹලා යම් තැනකදී ගෙදරකට ඇතුල්වූ
කල, එයින් පිටත්ව යන තෙක් එහිම

11 සිටපල්ලා. යම් තැනකදී ඔවුන් නුඹලා
පිළිගන්නේවත් නුඹලාගේ වචන
අසන්නේවත් නැත්නම්, එතැනින් පිටත්ව
යන කල ඔවුන්ට සාක්ෂියක් පිණිස
නුඹලාගේ පාද යට තිබෙන ධූලි
12 ගසාදමාපල්ලායයි කීසේක. ඔව්හු
පිටත්ව ගොස්: පසුතැවිලිවෙයල්ලායයි
13 දේශනාකළෝය. ඔව්හු බොහෝ
යක්ෂයන්ද දුරුකොට, බොහෝ ලෙඩුන්
තෙලින් ආලේපකොට, සුවකළෝය.

## *යොහන් බව්තීස්තගේ මරණය

14 එකල උන්වහන්සේගේ නාමය ප්‍රසිද්ධවූ
බැවින්, හෙරොද් රජ ඒ අසා: †යොහන්
බව්තීස්ත මළවුන්ගෙන් නැගුටුණේය,
එබැවින් මේ ආශ්චර්ය බලය ඔහු
15 තුළ ක්‍රියාකරන්නේයයි කීවේය. නුමුත්
සමහරෙක්: ඔහු එලියායයි කීවෝය.
අන් සමහරෙක්: අනාගතවක්තෘ-
වරුන්ගෙන් එක්කෙනෙකු මෙන් ඔහු
අනාගතවක්තෘ කෙනෙක්යයි කීවෝය.
16 නුමුත් හෙරොද් ඒ ඇසූකල: මේ වනාහි
මා විසින් හිස කප්පවන ලද යොහන්ය,
ඔහු (මළවුන්ගෙන්) නැගිට සිටින්නේයයි
17 කීයේය. මක්නිසාද හෙරොද් තමා
සරණපාවාගත්, තමාගේ සහෝදරයා
වන පිලිප්ගේ භාර්යාවවූ හෙරෝදියස්
නිසා මිනිසුන් යවා යොහන් අල්ලා
18 හිරඅඩස්සි කෙළේය. මෙසේ කළේ: නුඹේ
සහෝදරයාගේ භාර්යාව තබාගැනීම
නුඹට යුතු නැතැයි යොහන් හෙරොද්ට
19 කී නිසාය. එබැවින් හෙරෝදියස් ඔහුට
වෛරබැඳ, ඔහු මරන්ට කැමතිවූවාය;
20 නුමුත් ඇට නොහැකිවිය; මක්නිසාදයත්
යොහන් ධර්මිෂ්ඨවූ ශුද්ධවූ මනුෂ්‍යයෙකු
බව හෙරොද් දැන, ඔහුට භයව, ඔහු
ආරක්ෂාකෙළේය. තවද ඔහුගේ බස් අසා
හෙරොද් බොහෝසේ වියවුල් විය; නුමුත්
සන්තෝෂයෙන් ඔහුට ඇහුම්කන්දුන්නේය.
21 තවද පහසු දිනක් පැමිණියෙන්, හෙරොද්
තමා උපන් දවසේදී තමාගේ උත්තමයන්ටද
ප්‍රධාන සේනාධිපතීන්ටද ගලීලයේ
ප්‍රධානීන්ටද මංගල්‍යකෑමක් දුන්නේය.
එවිට හෙරෝදියස්ගේ දුව එහි පැමිණ 22
නටා, හෙරොද් සහ ඔහු සමග කෑමට
වාඩිව හුන් අය ප්‍රසන්නකළාය; එකල
රජතෙම තරුණියට කථාකොට: නුඹ
කැමති මොන දෙයක් නුමුත් මාගෙන්
ඉල්ලාපන්න, ඒක නුඹට දෙමියි කීය.
ඔහුද: නුඹ මාගෙන් ඉල්ලන කොයිදෙයක් 23
වුවත්, මාගේ රාජ්‍යයෙන් දෙකෙන්
කොටසක් වුවත්, නුඹට දෙමියි කියා
ඇට දිවුරුම් දුන්නේය. ඈ පිටතට ගොස්: 24
මා කුමක් ඉල්ලන්ටදැයි ඇගේ මව්ගෙන්
ඇසුවාය. *යොහන් බව්තීස්තගේ හිසයයි
ඈ කීවාය. එකෙණෙහිම ඈ ඉක්මනින් 25
රජු වෙතට පැමිණ: ඔබ විසින් *යොහන්
බව්තීස්තගේ හිස තැටියක ලා දැන්ම
මට දෙනවාට කැමැත්තෙමියි කියා
ඉල්ලුවාය. රජතෙමේ අතිශයින් 26
ශෝකවිය; නුමුත් ඔහුගේ දිවුරුම් නිසාත්,
ඔහු සමග කෑමට වාඩිව සිටි
අයවල් නිසාත්, බැරියයි ඇට කියන්ට
නොකැමතිවිය. එකෙණෙහිම රජ 27
මුරකාර භේවායෙකු යවා, යොහන්ගේ
හිස ගෙනෙන්ට අණ කෙළේය. ඔහු
ගොස් හිරගෙයිදී ඔහුගේ හිස කපා,
තැටියක ලා ගෙනවුත් යෞවනියට 28
දුන්නේය; යෞවනීද ඒක ඇගේ මවුට
දුන්නාය. ඔහුගේ ගෝලයෝ ඒ අසා 29
ඇවිත්, ඔහුගේ මළකඳ ගෙනගොස්
සොහොන් ගෙයක තැබුවෝය.

## ප්‍රේරිතයන් හැරී ඊම

ප්‍රේරිතයෝ යේසුස්වහන්සේ වෙතට 30
රැස්ව තමුන් විසින් කළාවූද
ඉගැන්නුවාවූද සියල්ල උන්වහන්සේට
දන්නුවෝය. එවිට උන්වහන්සේ: නුඹලා 31
පමණක් වනාන්තර ස්ථානයකට ඇවිත්
ටිකක් පහසු ගනිල්ලායයි ඔවුන්ට
කීසේක. මක්නිසාදයත් ඔවුන්ට කෑම
කන්ටවත් අවකාශ නැති තරමට එන්නෝ
යන්නෝ බොහෝ වූවෝය. එවිට ඔව්හු 32
පමණක් ඔරුවෙන් වනාන්තර ස්ථානයකට

---

*අවගාහක යොහන්ගේ.
†අවගාහක යොහන්.

*අවගාහක යොහන්ගේ

33 ගියෝය. සෙනඟ ඔවුන් යනවා දැක,
බොහෝ දෙනෙක් ඔවුන් හැඳින, සියලු
නුවරවලින් එක්ව පයින් දුවගොස්,
ඔවුන්ට පළමුවෙන් එහි පැමිණියෝය.
34 උන්වහන්සේ ගොඩබැස්ස කල මහත්
සමූහයක් දැක, ඔවුන් එඬේරෙකු නැති
බැටළුවන් මෙන් සිටිය බැවින් ඔවුන්
කෙරෙහි අනුකම්පාකොට, ඔවුන්ට
බොහෝ කාරණා උගන්වන්ට
පටන්ගත්සේක.

## පන්දහසකට කන්ට දීම

35 දවාල බොහෝසේ ගෙවුණු කල
උන්වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේ
වෙතට ඇවිත්: මේ වනාහි වනාන්තර
ස්ථානයක්ය, දවාල බොහෝසේ ගෙවී
36 තිබේ. ඔවුන් අවට තිබෙන ජනපදයට
හා ගම්වලට ගොස් තමුන්ට යම් දෙයක්
කන්ට මිලදී ගැනීම පිණිස ඔවුන් හැරිය
37 මැනවයි කීවෝය. නුමුත් උන්වහන්සේ
උත්තරදෙමින්: නුඹලා ඔවුන්ට කන්ට
දීපල්ලායයි කීසේක. එවිට ඔව්හු:
අප ගොස් මසු දෙසියයක රොටි
මිලේටගෙන ඔවුන්ට කන්ට දෙන්ටදැයි
38 උන්වහන්සේගෙන් ඇසුවෝය. නුඹලා
ළඟ රොටි කීයක් තිබේද කියා ගොස්
බලාපල්ලායයි උන්වහන්සේ ඔවුන්ට
කීසේක. ඔව්හු දැනගත් කල: රොටි
පහකුත් මසුන් දෙන්නෙකුත්යයි කීවෝය.
39 උන්වහන්සේ ඔවුන් සියල්ලන් කණ්ඩායම්
වශයෙන් නිල් තණකොළ පිට හිඳුවන්ට
40 ඔවුන්ට අණකළසේක. ඔව්හු පේළි
වශයෙන් සියය බැගින්ද පණහ බැගින්ද
41 ඉඳගත්තෝය. උන්වහන්සේ රොටි පහද
මසුන් දෙදෙනද අරගෙන, ස්වර්ගය දෙස
බලා ස්තුතිකොට, රොටි කඩා, ඔවුන්
ඉදිරියෙහි තබන්ට ගෝලයන්ට දී, මසුන්
දෙදෙනත් ඔවුන් සියල්ලන්ට බෙද-
42 දුන්සේක. සියල්ලෝම කාලා තෘප්තියට
43 පැමිණියෝය. ඉතිරි කැබලිවලින්ද මසුන්-
ගෙන්ද පැස් දොළොසක් පුරවා-
44 ගත්තෝය. රොටි කෑවාවූ පුරුෂයෝ
පන්දහසක්ය.

## මූද පිට පයින් යාම

එකෙණෙහිම උන්වහන්සේ සමූහයා 45
යවන අතර, තමන්ට පළමුවෙන් ඔරුවට
නැගී බෙත්සයිදවට එගොඩට යන්ට
තමන්ගේ ගෝලයන්ට සැලැස්වූසේක.
උන්වහන්සේ ඔවුන්ගෙන් වෙන්වූ පසු, 46
යාච්ඤාකරන පිණිස කන්දට ගියසේක.
සවස්වූ කල ඔරුව මුහුද මැද තිබුණේය, 47
උන්වහන්සේ වනාහි තනියම ගොඩ
සිටිසේක. හුළඟ ඔවුන්ට විරුද්ධව තිබුණු 48
බැවින් ඔවුන් ඔරුව පැදීමෙන් හිරිහැර
විඳිනවා උන්වහන්සේ දැක, රෑ සතරවෙනි
යාමය පමණේදී ඔවුන් වෙතට මුහුද
පිට පයින් යමින්, ඔවුන් පසුකර යන්ට
හැදූසේක. ඔව්හු උන්වහන්සේ මුහුද 49
පිට පයින් යනවා දැක, අවතාරයකැයි
සිතා මොරගැසූහ. මක්නිසාද 50
සියල්ලෝම උන්වහන්සේ දැක
කැලඹුණෝය. නුමුත් උන්වහන්සේ
එකෙණෙහිම ඔවුන් සමඟ කථාකොට:
ධෛර්යවත්ව සිටපල්ලා. මමය; භය
නොවෙල්ලායයි කියා, ඔවුන් වෙතට 51
ගොස් ඔරුවට නැගුණුසේක; එකල
හුළඟ නැවතුණේය. ඔව්හු තමුන් තුළ
අතිශයින් විස්මපත්වූවෝය; මක්නිසාද 52
ඔවුන්ගේ සිත් දැඩිව තිබුණු බැවින්
රොටි පිළිබඳ කාරණය ඔව්හු තේරුම්
නොගත්තෝය.

## ගෙන්නෙසරෙත්හිදී සුවකිරීම

ඔව්හු එගොඩ ගෙන්නෙසරෙත් රටට 53
පැමිණ ඔරුව වෙරළේ බැන්දෝය. ඔවුන් 54
ඔරුවෙන් බැස්ස කෙණෙහිම මිනිස්සු
උන්වහන්සේ හැඳින, එහි වටකර රට 55
මුළුල්ලේ දුවගොස්, උන්වහන්සේ සිටින
බව ඇසූ ඇසූ තැන්වලට රෝගාතුරයන්
යහන් පිටින් උසුලා ගෙනෙන්ට
පටන්ගත්තෝය. යම්කිසි ගමකට හෝ 56
නුවරකට හෝ ජනපදයකට හෝ
උන්වහන්සේ ඇතුල්වූසේක්ද, එතැන්හි
ඔව්හු රෝගාතුරයන් කඩපිල්වල තබා,
ඔවුන්ට උන්වහන්සේගේ සළුවේ දවල්ලට
පමණවත් අතගසන්ට ඉඩදෙන ලෙස

උන්වහන්සේගෙන් ඉල්ලුවෝය. අතගැසූ
සියල්ලන්ටම සුවය ලැබුණේය.

## බාහිර චාරිත්‍ර නොපැවැත්වීම පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරුදීම

7 යෙරුසලමෙන් ආවාවූ ඵරිසිවරුද
ලියන්නන්ගෙන් සමහරෙක්ද උන්-
2 වහන්සේ වෙතට රැස්ව, උන්වහන්සේගේ
ගෝලයන්ගෙන් සමහරුන් අපවිත්‍රවූ
එනම් නොසේදූ අත්වලින් කෑම කනවා
3 දුටුවෝය. මක්නිසාද ඵරිසිවරුත් සියලු
යුදෙව්වරුත් වැඩිමහල්ලන්ගේ පරම්-
පරාගත නියෝග රක්ෂා කරන බැවින්
හොඳට අත් සෝදගත මිස කන්නේ
4 නැත. කඩේ සිට ආවාම තමුන්ම
සෝදගත මිස ඔව්හු කෑම නොකති.
ඔවුන් විසින් රක්ෂාකරන්ට පිළිගෙන
තිබෙන වෙනත් බොහෝ දේ ඇත,
එනම් කුසලාන් කළගෙඩි සහ
5 පිත්තල භාජන සේදීමය. ඵරිසිවරුද
ලියන්නෝද උන්වහන්සේට කථාකොට:
ඔබගේ ගෝලයන් වැඩිමහල්ලන්ගේ
නියෝග ලෙස නොහැසිර, අපවිත්‍රවූ
අත්වලින් කෑම කන්නේ මක්නිසාදැයි
6 ඇසුවෝය. උන්වහන්සේ ඔවුන්ට කියන-
සේක්:

මේ සෙනඟ ඔවුන්ගේ තොල්වලින්
මට ගෞරවකරති,
එහෙත් ඔවුන්ගේ සිත මාගෙන් දුරය.
7 මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් ගුරුකම්
කොට උගන්වමින්,
නිරර්ථකයේ මට නමස්කාරකරතියි

ලියා තිබෙන ලෙස වංචාකාරවූ තුඹලා
ගැන යෙසායා මනාලෙස අනාගත-
8 වාක්‍යයෙන් කීයේය. තුඹලා දෙවියන්-
වහන්සේගේ ආඥාව හැරදමා මනුෂ්‍යයන්ගේ
නියෝග රක්ෂාකරන්නහුයයි කීසේක.
9 උන්වහන්සේ ඔවුන්ට තවත් කථා-
කොට: තුඹලාගේ නියෝග පවත්වන
පිණිස තුඹලා දෙවියන්වහන්සේගේ
ආඥාව එපාකරන හැටි කදිමයි.
10 මක්නිසාද—තුඹේ පියාටත් තුඹේ මවුටත්
ගෞරවකරපන්න; පියා ගැන හෝ මවු
ගැන හෝ අගුණ කියන්නා මරනු
ලබන්ටම ඕනෑයයි මෝසෙස් කීවේය.
එහෙත්—මාගෙන් තුඹට ප්‍රයෝජනවෙන්ට 11
පුළුවන්ව තිබුණු දේ කොර්බාන්, එනම්
පඬුරක්යයි යම් මනුෂ්‍යයෙක් පියාටවත්
මවුටවත් කීවොත්, එතැන් පටන් ඔහුගේ 12
පියාටවත් මවුටවත් උපකාරකරන්ට
තුඹලා ඔහුට ඉඩදෙන්නේ නැත. මෙසේ 13
තුඹලා භාරදී තිබෙන තුඹලාගේ
නියෝගවලින් තුඹලා දෙවියන්-
වහන්සේගේ වචනය අවලංගුකරන්නහුය.
තුඹලා තවත් එබඳු බොහෝ දේ
කරන්නහුයයි කීසේක. උන්වහන්සේ 14
සමූහයා තමන් ළඟට නැවත කැඳවා
කියනසේක්: තුඹලා සියල්ලෝම මාගේ
වචනය අසා තේරුම්ගනිල්ලා. පිටතින් 15
මනුෂ්‍යයා තුළට වැද ඔහු අපවිත්‍රකරන්ට
පුළුවන්වූ කිසි දෙයක් නැත. මනුෂ්‍යයා 16
අපවිත්‍රවෙන්නේ ඔහු තුළින් නික්මෙන
දේවලින්යයි කීසේක. උන්වහන්සේ 17
සමූහයාගෙන් වෙන්ව ගෙට ඇතුල්වූ
කල ගෝලයෝ ඒ උපමාව ගැන
උන්වහන්සේගෙන් ඇසුවෝය. උන්- 18
වහන්සේ ඔවුන්ට කියනසේක්: තුඹලාත්
එසේම තේරුම් නැතුව සිටින්නහුද?
පිටතින් මනුෂ්‍යයා තුළට පැමිණෙන කිසි
දෙයක්වත් ඔහු අපවිත්‍රකරන්ට නොහැකි
බව තුඹලාට තේරෙන්නේ නැද්ද?
මක්නිසාද එය ඔහුගේ සිතට නොව 19
බඩට ඇතුල්ව වැසිකිළියට යන්නේයයි
කීසේක. මෙසේ සියලු ආකාර කෑම
පවිත්‍රයයි උන්වහන්සේ ප්‍රකාශකළ-
සේක. නැවතද උන්වහන්සේ: තුමූත් 20
මනුෂ්‍යයා අපවිත්‍රවෙන්නේ ඔහුගෙන්
පිටවන දෙයින්මය. මක්නිසාද ඇතුළතින් 21
එනම් මනුෂ්‍යයන්ගේ සිතින් නපුරු
සිතිවිලි, වේශ්‍යාකම්, සොරකම්,
මිනීමැරීම්, කාමමිථ්‍යාචාරකම්, තණ්හා, 22
දුෂ්ටකම්, වංචාව, සල්ලාලකම,
*ඊර්ෂ්‍යාව, අපහාසකිරීම, උඩඟුකම
සහ මෝඩකම නික්මෙයි. මේ 23
සියලු නපුරු දේ ඇතුළතින්
නික්මී මනුෂ්‍යයා අපවිත්‍රකෙරේයයි
කීසේක.

*එනම්, නපුරු ඇස.

## අන්‍ය ජාතික යෞවනියකට සුවකිරීම

24 උන්වහන්සේ එතැනින් නැගිට තීර් සහ
සීදෙන්හි සීමාවලට පිටත්ව ගොස්
ගෙයකට ඇතුල්ව, ඒ බව කිසිවෙකු දැන
නොගන්නවාට කැමතිවූසේක. නුමුත්
උන්වහන්සේට සැඟවී සිටින්ට බැරිවිය.
25 එකෙණෙහිම අශුද්ධාත්මයක් ආවේශවූ
කුඩා දුවෙක් ඇති ස්ත්‍රියෙක් උන්වහන්සේ
ගැන අසා ඇවිත් උන්වහන්සේගේ පාමුල
26 වැටුණාය. ඈ වනාහි සිරෝපිනිසි
ජාතියේ ග්‍රීක් ස්ත්‍රියෙක්ය. ඇගේ
දුවගෙන් යක්ෂයා දුරුකරන ලෙස ඈ
උන්වහන්සේගෙන් උදක්ම ඉල්ලුවාය.
27 උන්වහන්සේ කථාකොට: පළමුකොට
දරුවෝ තෘප්තියට පැමිණෙත්වා.
මක්නිසාද දරුවන්ගේ රොටි ගෙන
බල්ලන්ට දැමීම නුසුදුසුයයි ඇට කීසේක.
28 එහෙත් ඈ උත්තරදෙමින්: එසේය,
ස්වාමිනි. මේසේ යට සිටින බල්ලෝ
පවා දරුවන්ගේ කෑම කැබෙලිවලින්
ගෙන කතියි උන්වහන්සේට කීවාය.
29 උන්වහන්සේද: මේ කීම නිසා පලයන්න;
යක්ෂයා නුඹේ දුවගෙන් දුරුව ගියේයයි
30 ඇට කීසේක. ඈ ගෙදර ගිය කල ඇගේ
දුව ඇඳේ සැතපී ඉන්න බවද යක්ෂයා
දුරුවී සිටින බවද දුටුවාය.

## ගොළු බිහිරෙකුට සුවකිරීම

31 නැවතත් උන්වහන්සේ තීර් සීමාවලින්
පිටත්ව, සීදෙන් මැදින් ගොස්,
දෙකපොලිසේ සීමා මැදින් ගලීලයේ
32 මුහුද ළඟට පැමුණුණුසේක. එකල
ඔව්හු වික්කල් බිහිරෙකු උන්වහන්සේ
වෙතට ගෙනැවිත්, ඔහු පිට අත
තබන ලෙස උන්වහන්සේගෙන් උදක්ම
33 ඉල්ලුවෝය. උන්වහන්සේ රහසින් ඔහු
සමූහයා කෙරෙන් අහකට ගෙන ගොස්,
ඔහුගේ කන්වල තමන්ගේ ඇඟිලි බහා,
කෙළගසා, ඔහුගේ දිව ස්පර්ශකොට,
34 ස්වර්ගය දෙස බලා, සුසුම්ලා: එප්ඵාතා,
35 එනම් ඇරේවයි ඔහුට කීසේක. එවිට
ඔහුගේ කන් ඇරී, දිවේ බැඳුම් මිදී, ඔහු
පැහැදිලි ලෙස කථාකෙළේය. ඒ බව 36
කාටවත් නොකියන්ට උන්වහන්සේ
ඔවුන්ට අණදුන්සේක. නුමුත් උන්-
වහන්සේ යම් පමණ අණකළසේක්ද
ඔව්හු එපමණටත් වඩා බොහෝසෙයින්
එය ප්‍රසිද්ධ කළෝය. තවද ඔව්හු 37
අප්‍රමාණලෙස මවිතව: උන්වහන්සේ
සියල්ල යහපත්ලෙස කළසේක.
උන්වහන්සේ බිහිරන්ට පවා ඇසෙන්ටත්
ගොළුවන්ට කථාකරන්ටත් සලස්වන-
සේකැයි කීවෝය.

## හාරදහසකට කන්ට දීම

8
ඒ දවස්වලදී නැවත ඉතා මහත්
සමූහයක් රැස්වූ කල, ඔවුන්ට කන්ට
කිසිවක් නොතිබුණු බැවින් උන්වහන්සේ
තමන් ගෝලයන් කැඳවා: සමූහයා 2
කෙරෙහි අනුකම්පා ඇත්තෙමි, මක්නිසාද
ඔව්හු දැනට තුන් දවසක් මා ළඟ සිටිති,
ඔවුන්ට කන්ට කිසිවක් නැත. ඔවුන් 3
තමුන්ගේ ගෙවලට නිරාහාරයෙන් යන්ට
හැරියෙම් නම් ඔවුන් මාර්ගයේදී
ක්ලාන්තවෙනවා ඇත; ඔවුන්ගෙන්
සමහරෙක් දුර සිට ඇවිත් සිටිතියි
කීසේක. උන්වහන්සේගේ ගෝලයෝ 4
උත්තරදෙමින්: මෙහි වනාන්තර
ස්ථානයකදී මොවුන් කෑමෙන්
තෘප්තිමත්කරන්ට කාට පුළුවන්දැයි
උන්වහන්සේට කීවෝය. නුඹලා ළඟ 5
රොටි කීයක් තිබේදැයි උන්වහන්සේ
ඔවුන්ගෙන් ඇසූසේක. සතකැයි ඔව්හු
කීවෝය. එවිට උන්වහන්සේ සමූහයාට 6
බිම ඉඳගන්ට අණදී, රොටි සත
රැගෙන ස්තුතිකොට කඩා, ඔවුන්
ඉදිරියෙහි තබන පිණිස තමන්
ගෝලයන්ට දුන්සේක; ඔව්හුද සමූහයා
ඉදිරියෙහි ඒවා තැබුවෝය. ඔවුන් ළඟ 7
කුඩා මසුන් ස්වල්පයක්ද තිබුණේය.
උන්වහන්සේ ඒවාට ආශිර්වාද කොට,
ඒවාත් ඔවුන් ඉදිරියෙහි තබන්ට
අණකළසේක. ඔව්හු වනාහි කාලා 8
තෘප්තියට පැමිණියෝය. ඉතිරිවූ කැබෙලි
එක්කොට කුඩා සතක් පුරවා ගත්තෝය.
කෑවාවූ අය සාරදහසක් පමණ වූහ. 9

උන්වහන්සේ ඔවුන් යන්ටහැරියසේක.
10 එකෙණෙහිම උන්වහන්සේ තමන්
ගෝලයන් සමග ඔරුවට නැගී
දල්මනූතයේ පළාත්වලට පැමිණිසේක.

## ගෝලයන්ගේ අන්ධකම ගැන තරවටුකිරීම

11 එකල ඵරිසිවරු ඇවිත් උන්වහන්සේ
පරීක්ෂාකරමින්, අහසෙන් ලකුණක්
උන්වහන්සේගෙන් ඉල්ලමින්, උන්වහන්සේ
සමග විවාදකරන්ට පටන්ගත්තෝය.
12 උන්වහන්සේ තමන් ආත්මයෙන්
බලවත්ලෙස සුසුම්ලා: මේ පරම්පරාව
ලකුණක් සොයන්නේ මක්නිසාද?
සැබවක් තුඹලාට කියමි—මේ පරම්පරාව
ලකුණක් දෙනු නොලබන්නේයයි කියා,
13 ඔවුන් අත්හැර නැවත ඔරුවට නැගී
එගොඩට ගියසේක.
14 රොටි ගෙනයන්ට ඔවුන්ට මතක
නැතිවිය; ඔරුවේ ඔවුන් ළඟ එක
රොටියකට වඩා නොතිබුණෝය.
15 උන්වහන්සේ: ඵරිසිවරුන්ගේ මුහුන්-
වලිනුත් හෙරොද්ගේ මුහුන්වලිනුත්
ප්‍රවේසම්වෙන්ට බලාගනිල්ලායයි
16 ඔවුන්ට අණකළසේක. අපට රොටි
නැති නිසාය කියා ඔව්හු තම තමුන්
17 අතරේ කථාකරගත්තෝය. යේසුස්-
වහන්සේ ඒ දැන: තුඹලාට රොටි නැති
නිසා තුඹලා අතරේ කථාකරගන්නේ
මක්නිසාද? තුඹලාට තවම දැනෙන්නේ
නැද්ද? තේරෙන්නේ නැද්ද? තුඹලාගේ
18 සිත දැඩිව තිබේද? ඇස් ඇති කොට
තුඹලාට පෙනෙන්නේ නැද්ද? කන් ඇති
කොට තුඹලාට ඇසෙන්නේ නැද්ද?
19 තුඹලාට මතක නැද්ද? මා විසින් රොටි
පහ කඩා පන්දහසකට දුන් විට ඉතුරු
කැබෙලිවලින් පැස් කීයක් තුඹලා
පුරවාගත්තහුදැයි ඇසූසේක. දොළොසකැයි
20 ඔව්හු උන්වහන්සේට කීවෝය. රොටි
සත සාර දහස අතරේ බෙදදුන්
විට කැබෙලිවලින් කුඩා කීයක්
පුරවාගත්තහුදැයි ඇසූසේක. සතකැයි
21 ඔව්හු උන්වහන්සේට කීවෝය. තුඹලාට
තවම තේරෙන්නේ නැද්දැයි උන්වහන්සේ
ඔවුන්ට කීසේක.

## බෙත්සයිදවේදී අන්ධයෙකුට සුවකිරීම

ඔව්හු බෙත්සයිදවට පැමිණියෝය. 22
එවිට ඔව්හු උන්වහන්සේ වෙතට
අන්ධයෙකු ගෙනැවිත් ඔහු පිට අත්
තබන මෙන් උන්වහන්සේගෙන් උදක්ම
ඉල්ලුවෝය. උන්වහන්සේ අන්ධයා අතින් 23
අල්ලා, ගමෙන් පිටතට ගෙනැවිත්, ඔහුගේ
ඇස්වලට කෙළගසා, ඔහු පිට අත් තබා:
තුඹට යමක් පෙනේදැයි ඔහුගෙන්
ඇසූසේක. ඔහු ඇස් ඔසවා කියනුයේ: 24
මට මනුෂ්‍යයන් පෙනේ; මක්නිසාද ගස්
වාගේ (ඔවුන්) ඇවිදිනවා මට පෙනේයයි
කීවේය. එවිට උන්වහන්සේ ඔහුගේ ඇස් 25
පිට නැවත අත් තැබූසේක; ඔහු ස්ථිරලෙස
බලා, සුවය ලැබ, සියල්ල පැහැදිලි-
ලෙස දුටුවේය. උන්වහන්සේද: ගමට 26
ඇතුල්වෙන්ටවත් එපා කියා ඔහුගේ
ගෙදරට ඔහු හැරියසේක.

## යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේය කියා පේත්‍රුස් විසින් කියාදීම

යේසුස්වහන්සේද තමන් ගෝලයෝද 27
පිලිප්පි කායිසාරියේ ගම්වලට පිටත්ව
ගියෝය. මගදී උන්වහන්සේ: මා කවරෙකු
කියා මනුෂ්‍යයෝ කියද්දැයි ගෝලයන්ගෙන්
ඇසූසේක. ඔව්හු උත්තරදෙමින්, *යොහන් 28
බව්තීස්තය කියාත් සමහරෙක් එලියාය
කියාත් සමහරෙක් අනාගතවක්තෘ-
වරුන්ගෙන් එක්කෙනෙක්ය කියාත්
කියතියි කීවෝය. නුමුත් තුඹලා 29
මා කවරෙකු කියා කියන්නහුදැයි
උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූසේක.
පේත්‍රුස් උත්තරදෙමින්: ඔබ ක්‍රිස්තුස්-
වහන්සේයයි උන්වහන්සේට කීවේය.
උන්වහන්සේද තමන් ගැන කාටවත් 30
නොකියන්ට ඔවුන්ට අණකළසේක.

*අවගාහක යොහන්.

## යේසුස්වහන්සේ තමන් මරණය ගැනද නැවත නැඟිටීම ගැනද කලින් කීම

31 එවිට උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයා
බොහෝ දේ විඳින්ටත්, ප්‍රධානීන්ද නායක
පූජකයන්ද ලියන්නන්ද විසින් එපාකරනු
ලබන්ටත්, මරනු ලබන්ටත්, තුන් දවසකට
පසු නැවත නැඟිටින්ටත් ඕනෑ බව ඔවුන්ට
32 උගන්වන්ට පටන්ගත්සේක. උන්වහන්සේ
ඒ කීම ප්‍රසිද්ධයෙන් කීසේක. එකල
පේත්‍රුස් උන්වහන්සේව කැඳවාගෙන,
උන්වහන්සේට තරවටුකරන්ට පටන්-
33 ගත්තේය. නුමුත් උන්වහන්සේ හැරී, තමන්
ගෝලයන් දැක, පේත්‍රුස්ට සැර
කරමින්: සාතන් මා පස්සට යව.
මක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා
මිස දෙවියන්වහන්සේගේ කාරණා
කල්පනාවට ගන්නේ නැතැයි කීසේක.

## සිය කැමැත්ත අත්හැරීමට අනුශාසනාව

34 එවිට උන්වහන්සේ සමූහයා තමන්
ගෝලයන් සමග ළඟට කැඳවා ඔවුන්ට
කියනසේක්: කවරෙක් නුමුත් මා පස්සේ
එන්ට කැමති නම්, ඔහු තමාගේ කැමැත්ත
අත්හැර, තමාගේ කුරුසිය රැගෙන, මා
35 අනුව ඒවා. මක්නිසාද තමාගේ ජීවිතය
ගළවාගන්ට කැමති කවරෙකුට නුමුත්
ඒක නැතිවන්නේය; මා නිසාද ශුභාරංචිය
නිසාද තමාගේ ජීවිතය නැතිකරගන්න
කවරෙක් නුමුත් ඒක ගළවාගන්නේය.
36 මක්නිසාද යම් මනුෂ්‍යයෙක් මුළු
ලෝකය ලබාගත්තත් තමාගේ *ජීවිතය
නැතිවී ගියොත් ඔහුට ඇති ප්‍රයෝජනය
37 මොකද? නොහොත් මනුෂ්‍යයෙකුට
තමාගේ ජීවිතය හිලව්වට මොකක්
38 දෙන්ට පුළුවන්ද? එසේ හෙයින්
මේ කාමමිථ්‍යාචාරිකවූ පාපිෂ්ඨවූ
පරම්පරාවේදී යමෙක් මා ගැනත් මාගේ
වචන ගැනත් ලජ්ජාවන්නේද, මනුෂ්‍ය
පුත්‍රයා තමන් පියාණන්ගේ තේජසින්
ශුද්ධ දේවදූතයන් සමග එන කල,
උන්වහන්සේ ඔහු ගැනත් ලජ්ජාවෙනවා
ඇතැයි කීසේක. තවද උන්වහන්සේ 9
ඔවුන්ට කථාකොට: සැබවක්
තුඹලාට කියමි–මෙහි සිටින්නන්ගෙන්
සමහරෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය
බලයෙන් යුක්තව පැමිණ තිබෙන බව
දකින තෙක් කිසිසේත් මරණ රසය
නොවිඳින්නෝයයි කීසේක.

## යේසුස්වහන්සේ අන්වෙසක් වීම

සදවසකට පසු යේසුස්වහන්සේ 2
පේත්‍රුස්ද යාකොබ්ද යොහන්ද පමණක්
වෙන්කොට, ඔවුන් තමන් සමග උස්
කන්දකට ගෙනගියසේක. උන්වහන්සේ
ඔවුන් ඉදිරියෙහි අන්වෙසක් වූසේක.
උන්වහන්සේගේ වස්ත්‍ර පොළොවෙහි 3
කවර අපුල්ලන්නෙකුටවත් සුදුකරන්ට
බැරි තරම් ඉතා සුදුවී දීප්තිමත්විය.
එවිට එලියා මෝසෙස් සමග ඔවුන්ට 4
පෙනුණේය. ඔව්හු යේසුස්වහන්සේ
සමග කථාකරමින් සිටියෝය. පේත්‍රුස් 5
යේසුස්වහන්සේට කථාකොට: රබ්බි,
මෙහි සිටීම අපට හොඳය. ඔබට එකක්ද
මෝසෙස්ට එකක්ද එලියාට එකක්ද
බැගින් මණ්ඩප තුනක් සාදමුයයි කීවේය.
මක්නිසාද ඔවුන් ඉතා භයපත්වූ බැවින්, 6
කිය යුතු දේ කුමක්දැයි ඔහු නොදැන
සිටියේය. තවද වලාපටලයක් පැමිණ 7
ඔවුන් මත්තෙහි පැතිර තිබුණේය. එවිට:
මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහුට
ඇහුම්කන්දීපල්ලායයි වලාකුළෙන් හඬක්
නික්මුණේය. ඔව්හු හදිසියෙන් වටකර 8
බලා, තමුන් සමග යේසුස්වහන්සේම
මිස අන් කිසිවෙකු තවත් නුදුටුවෝය.
ඔවුන් කන්දෙන් බසින කල, මනුෂ්‍ය 9
පුත්‍රයා මළවුන්ගෙන් නැඟිටින තුරු ඔවුන්
දුටුදේ කාටවත් නොකියන ලෙස
උන්වහන්සේ ඔවුන්ට අණකළසේක.
මළවුන්ගෙන් නැඟිටීම නම් කුමක්දැයි 10
ඔව්හු ඔවුනොවුන් විචාරමින් ඒ කීම
ධාරණයකරගත්තෝය. තවද ඔව්හු 11
කථාකොට: එලියා පළමුවෙන් එන්ට
ඕනෑයයි ලියන්නෝ මක්නිසා
කියද්දැයි උන්වහන්සේගෙන් ඇසුවෝය.

*හෙවත්–ප්‍රාණය.

12 උන්වහන්සේ කථාකොට: එලියා
පළමුවෙන් ඇවිත් සියල්ල නැවත
පිහිටුවන්නේමය. මනුෂ්‍ය පුත්‍රයා බොහෝ
දේ විඳින්ටත් සුළුකරනු ලබන්ටත්
ඕනෑයයි ඔහු ගැනත් ලියා තිබෙන්නේ
13 කෙලෙසද? නුමුත් තුඹලාට කියමි–
එලියා ආවේමය, ඔහු ගැන ලියා තිබෙන
ලෙසම ඔව්හු තමුන් කැමති දේ ඔහුට
කළෝයයි කීසේක.

## මීමස්මර රෝගකාර ළමයා සුවපත්කිරීම

14 ඔව්හු ගෝලයන් ළඟට ආ කල ඔවුන්
අවට මහත් සමූහයක් සිටිනවාත්
ලියන්නන් ඔවුන් සමග විවාදකරනවාත්
15 දුටුවෝය. එකෙණෙහිම මුළු සමූහයා
උන්වහන්සේ දුටු කල ඉතා විස්මිතව,
ඉදිරියට දුවගොස් උන්වහන්සේට
16 ආචාරකළෝය. තුඹලා ඔවුන් සමග
කුමක් ගැන විවාදකරනවාදැයි උන්-
වහන්සේ ඔවුන්ගෙන් ඇසූසේක.
17 සමූහයාගෙන් එක්කෙනෙක් උන්වහන්සේට
උත්තරදෙමින්: ආචාරීන්වහන්ස, ගොළු
ආත්මයක් ආවේශවූ මාගේ පුත්‍රයා
18 ඔබවහන්සේ ළඟට ගෙනාවෙමි. ඒ
ආත්මය, ඔහුට ආවේශවන කොතැනකදී
නුමුත්, ඔහු බිම හෙළන්නේය. එවිට
ඔහු පෙණදමා, දත්මිටිකා, දුර්වලවේගන
යන්නේය. ඒ ආත්මය දුරුකරන ලෙස
මම ඔබවහන්සේගේ ගෝලයන්ට කීයෙමි;
නුමුත් ඔවුන්ට බැරිවීයයි කීවේය.
19 උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
අහෝ ඇදහිලි නැති පරම්පරාව,
කොපමණ කල් තුඹලා සමග සිටිම්ද?
කොපමණ කල් තුඹලා ගැන ඉවසම්ද?
ඔහු මා ළඟට ගෙනෙල්ලායයි කීසේක.
20 එවිට ඔව්හු උන්වහන්සේ ළඟට ඔහු
ගෙනාවෝය. ඔහු උන්වහන්සේ දුටු
කෙණෙහිම ආත්මය ඔහු තදින් වෙවු-
ලෙවුවේය; ඔහු බිම වැටී, පෙණදමමින්,
21 පෙරළී පෙරළී හුන්නේය. මේක මොහුට
පැමිණ කොපමණ කල්දැයි උන්වහන්සේ
පියාගෙන් ඇසූසේක. ඔහු උත්තරදෙමින්:
ළදරු කාලේ පටන්ය. තවද ඒ ආත්මය 22
නොයෙක්වර ඔහු විනාශකරන පිණිස
ගින්නෙහිද වතුරෙහිද හෙළීය. ඔබට
යමක් කරන්ට පුළුවන් නම්, අපට
අනුකම්පාකර පිහිටවුව මැනවයි කීවේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: ඔබට 23
පුළුවන් නම්! විශ්වාසකරන්නාට
සියල්ල පුළුවනැයි කීසේක. එකෙණෙහිම 24
දරුවාගේ පියා: මම විශ්වාසකරමි;
මාගේ විශ්වාසය මදිකමට පිහිටවුව
මැනවයි මොරගසා කීවේය. සමූහයක් 25
දුවඑමින් රැස්වෙන බව යේසුස්වහන්සේ
දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට
තරවටුකර: ගොළු බිහිරි ආත්මය, මොහු
කෙරෙන් පහව යව, තවත් මොහුට
ආවේශ නොවන්ට තට අණකරමියි
කීසේක. එවිට ආත්මය මොරගසා, 26
බොහෝසේ ඔහු වෙවුලවමින්, පිටතට
ආවේය. ඔහු මළ කෙනෙකු මෙන් විය;
එබැවින් ඔහු මැරුණේයයි වැඩිදෙනා
කීවෝය. නුමුත් යේසුස්වහන්සේ ඔහුගේ 27
අත අල්ලා නැගිටෙවුසේක; එවිට ඔහු
නැගිට සිටියේය. උන්වහන්සේ ගෙට 28
පැමිණි කල උන්වහන්සේගේ ගෝලයෝ
කථාකොට: ඒ ආත්මය දුරුකරන්ට
අපට බැරිවුණේ මක්නිසාදැයි
රහසින් උන්වහන්සේගෙන් විචාළෝය.
උන්වහන්සේද *යාච්ඤාවෙන් මිස වෙන 29
ආකාරයකින් මේ ජාතිය දුරුකරන්ට
නුපුළුවනැයි ඔවුන්ට කීසේක.
ඔව්හු එතැනින් පිටත්ව ගලීලය මැදින් 30
ගියෝය; ඒ බව කිසිවෙක් දැනගන්නවාට
උන්වහන්සේ කැමති නොවූසේක.

## යේසුස්වහන්සේ තමන් මරණය ගැන නැවත කීම

මක්නිසාද උන්වහන්සේ තමන් 31
ගෝලයන්ට උගන්වමින්: මනුෂ්‍ය පුත්‍රයා
මනුෂ්‍යයන්ගේ අත්වලට පාවාදෙනු
ලැබේ, ඔව්හුද ඔහු මරන්නෝය; මරනු
ලැබූ පසු, තුන් දවසකින් ඔහු නැවත

*පුරාණ පිටපත් කීපයක: යාච්ඤාවෙන් සහ නිරාහාරව ඉඳීමෙන් කියා පෙනේ.

32 නැගිටින්නේයයි ඔවුන්ට කීසේක. නුමුත්
ඒ කීම ඔවුන්ට තේරුණේ නැත,
උන්වහන්සේගෙන් අසන්ටද ඔව්හු භය
වූවෝය.

## යටත්කම ගැන ඉගැන්වීම

33 ඔව්හු කපර්ණවුමට ආවෝය.
උන්වහන්සේ ගෙයි සිටි කල: නුඹලා
මාර්ගයේදී කුමක් ගැන විවාදකළහුදැයි
34 ඔවුන්ගෙන් ඇසූසේක. නුමුත්: වඩා
උතුම් තැනැත්තා කවුදැයි කියා ඔවුන්
මාර්ගයේදී තමුන් අතරේ විවාදකළ
බැවින් ඔව්හු කථා නොකර සිටියෝය.
35 එකල උන්වහන්සේ වාඩිවී, දොළොස්දෙනා
කැඳවා: යමෙක් පළමුවෙනියා වෙන්ට
කැමති නම් ඔහු සියල්ලන්ට අන්තිමයාත්
සියල්ලන්ගේ සේවකයාත් වේවයි ඔවුන්ට
36 කීසේක. උන්වහන්සේ කුඩා දරුවෙකු
ගෙන ඔවුන් මැද සිටුවා, ඔහු වඩාගෙන:
37 මෙබඳු කුඩා දරුවන්ගෙන් එක්කෙනෙකු
මාගේ නාමයෙන් පිළිගන්නාවූ කවරෙක්
නුමුත් මා පිළිගන්නේය. මා පිළිගන්න
කවරෙක් නුමුත් මා පිළිගන්නවා නොව
මා එවූ තැනන්වහන්සේ පිළිගන්නේයයි
ඔවුන්ට කීසේක.

## අන්‍ය පක්ෂවලට අභයදීම ගැනයි

38 යොහන් උන්වහන්සේට කථාකොට:
ආචාරිනි, ඔබගේ නාමයෙන් කෙනෙක්
යක්ෂයන් දුරුකරනවා දුටිමුව. ඔහු
අප අනුව නේන නිසා අපි ඔහුට
39 තහනම් කෙළෙමුයයි කීවේය. නුමුත්
යේසුස්වහන්සේ කියනසේක්: ඔහුට
තහනම් නොකරල්ලා. මක්නිසාද මාගේ
නාමයෙන් බලවත් ක්‍රියාවක් කරන
කිසිවෙකුට මා ගැන ඉක්මනින්ම නපුර
40 කථාකරන්ට නොහැකිවේ. අපට විරුද්ධ
නැති තැනැත්තේ අපගේ පක්ෂයටය.
41 නුඹලා ක්‍රිස්තුස්වහන්සේට අයිතිය කියා
යමෙක් ඒ නාමයෙන් නුඹලාට බොන්ට
වතුර කෝප්පයක් දෙන්නේද, ඔහුගේ
විපාකය කිසිසේත් නැති නොවන්නේයයි
සැබවින් නුඹලාට කියමි.

## බාධා ගැන පරෙස්සම්වීම

තවද මා කෙරේ අදහන මේ බාලයන්ගෙන් 42
එකෙකුටවත් බාධාකරන්නෙක් ඇද්ද
ඔහුගේ බෙල්ලේ මහත් ඇඹරුම් ගලක්
එල්ලා මුහුදේ හෙළනු ලැබීම ඔහුට
හොඳය. නුඹේ අත නුඹට බාධාකෙරේ 43
නම්, ඒක කපාදමාපන්න. අත්දෙක ඇතුව
නිරයට එනම් නොනිවෙන ගින්නට
පැමිණීමට වඩා අබ්බාගාතව ජීවනයට
ඇතුල්වීම නුඹට හොඳය. *නුඹේ පය 45
නුඹට බාධාකෙරේ නම් ඒක
කපාදමාපන්න. දෙපය ඇතුව නිරයෙහි
හෙළනු ලැබීමට වඩා කොරව ජීවනයට
ඇතුල්වීම නුඹට හොඳය. *නුඹේ 47
ඇස නුඹට බාධාකෙරේ නම් ඒක
උගුලාදමාපන්න. ඇස් දෙක ඇතුව නිරයේ
හෙළනු ලැබීමට වඩා එක ඇසක් ඇතුව
දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම
නුඹට හොඳය. නිරයේදී ඔවුන්ගේ 48
පණුවා නසින්නේවත් ගින්න
නිවෙන්නේවත් නැත. සියල්ලෝම 49
ගින්නෙන් ලුණුලනු ලබන්නෝය. ලුණු 50
හොඳය. නුමුත් ඒවායේ ලුණු ගතිය
නැතිවුණොත් ඒවා රස කරන්නේ
කුමකින්ද? නුඹලා තුළ ලුණු ඇතුව
සිටපල්ලා, එකිනෙකා සමග සමාදානයෙන්
සිටපල්ලායයි කීසේක.

## දික්කසාදය ගැන ප්‍රශ්නයක්

10 උන්වහන්සේ එතැනින් නැගිට
යුදයේ සීමාවලටත් යොර්දානෙන්
එගොඩ පළාතටත් පැමිණිසේක.
සමූහයෝ උන්වහන්සේ වෙතට නැවත
රැස්වූවෝය; උන්වහන්සේද තමන් පුරුද්ද
ලෙස නැවත ඔවුන්ට ඉගැන්නූසේක.
ඵරිසිවරු උන්වහන්සේ වෙතට ඇවිත් 2
උන්වහන්සේ පරීක්ෂා කරමින්: පුරුෂ-
යෙකු විසින් තමාගේ භාර්යාව අත්-
හැරිය යුතුදැයි උන්වහන්සේගෙන්
ඇසුවෝය. උන්වහන්සේ උත්තරදෙමින්: 3

*48 වෙනි පදයට සමානව තිබෙන 44 සහ 46 වෙනි පද දෙක හොඳ පරණ පිටපත්වල නැත.

මෝසෙස් තුඹලාට අණකළේ කුමක්දැයි
4 ඔවුන්ගෙන් ඇසූසේක. අත්හැරීම් පත්‍රයක්
ලියා ඈ අත්හරින්ට මෝසෙස් අවසර
5 දුන්නේයයි ඔව්හු කීවෝය. නුමුත්
යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට:
තුඹලාගේ සිත් දැඩිකම නිසා ඔහු මේ
6 ආඥාව තුඹලාට ලියා දුන්නේය. නුමුත්
මැවීමේ පටන්ගැන්මේ සිට උන්වහන්සේ
පුරුෂයෙකු හා ස්ත්‍රියෙකු වශයෙන් ඔවුන්
7 මැවූසේක. එබැවින් මනුෂ්‍යයෙක්
තමාගේ පියාද මවුද අත්හැර තමාගේ
8 භාර්යාවට ඇලුම්වන්නේය; ඒ දෙදෙනාද
එක මාංසය වන්නෝය. මෙසේ ඔව්හු
එතැන් පටන් දෙදෙනෙක් නොව එක
9 මාංසය වෙති. එබැවින් දෙවියන්වහන්සේ
එක්කළ දෙය මනුෂ්‍යයා වෙන්
10 නොකෙරේවයි කීසේක. ගෝලයෝ
ගෙයිදී මේ කාරණය ගැන නැවතත්
11 උන්වහන්සේගෙන් ඇසුවෝය. උන්වහන්සේ
ඔවුන්ට කියනසේක්: තමාගේ භාර්යාව
අත්හැර වෙන ස්ත්‍රියෙකු පාවාගන්න
කවරෙක් නුමුත් ඈට විරුද්ධව
12 කාමමිථ්‍යාචාරය කෙරේ. ඒ ස්ත්‍රී
ඈගේ පුරුෂයා අත්හැර වෙන
කෙනෙකු සරණපාවාගන්නී නම්, ඈද
කාමමිථ්‍යාචාරය කරන්නීයයි කීසේක.

## යේසුස්වහන්සේ සහ කුඩා ළමයි

13 ඔව්හු ළදරුවන් පිට උන්වහන්සේගේ
අත තබවාගන්න පිණිස ඔවුන්
උන්වහන්සේ ළඟට ගෙනාවෝය. නුමුත්
ගෝලයෝ ඔවුන්ට සැරකළෝය.
14 යේසුස්වහන්සේ ඒ දැක ඉතා අමනාපවී:
ළදරුවන් මා ළඟට එන්ට හැරපල්ලා;
ඔවුන් වලක්වන්ට එපා. මක්නිසාද
දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳු-
15 වන්ගේය. සැබවක් තුඹලාට
කියමි—යමෙක් දෙවියන්වහන්සේගේ
රාජ්‍යය ළදරුවෙකු මෙන් පිළි
නොගත්තොත් ඔහු කිසිසේත් එහි ඇතුල්
නොවන්නේයයි ඔවුන්ට කීසේක.
16 උන්වහන්සේ ඔවුන් වඩාගෙන, ඔවුන්
පිට අත් තබා, ඔවුන්ට ආශිර්වාදකළසේක.

## පොහොසත් තරුණයෙක් සදාකාල ජීවනය සෙවීම

උන්වහන්සේ මාර්ගයට යද්දී එක්තරා 17
කෙනෙක් දුවගෙන ඇවිත් උන්වහන්සේ
ඉදිරියෙහි දණින් හිඳ: යහපත් ආචාරීන්
වහන්ස, සදාකාල ජීවනය උරුමකර
ගන්නා පිණිස මා විසින් කුමක්
කරන්ටදැයි උන්වහන්සේගෙන් ඇසුවේය.
යේසුස්වහන්සේ ඔහුට කියනසේක්: මා 18
යහපත්යයි තුඹ මට කියන්නේ මන්ද?
එක්කෙනෙක් එනම් දෙවියන්වහන්සේ
මිස වෙන කිසිවෙක් යහපත් නොවේ.
මිනී නොමරව, කාමමිථ්‍යාචාරය නොකරව, 19
සොරකම් නොකරව, බොරුසාක්ෂි
නොකියව, වංචාකම් නොකරව, තාගේ
පියාටත් මවුටත් ගෞරවකරව යන මේ
ආඥා තුඹ දන්නෙහියයි කීසේක.
ඔහුද: ආචාරීන්වහන්ස, මේ සියල්ල 20
මාගේ යෞවන අවස්ථාවේ පටන්
රක්ෂාකෙළෙමියි උන්වහන්සේට කීවේය.
යේසුස්වහන්සේ ඔහු දෙස බලා, ඔහුට 21
ප්‍රේමකොට: තුඹට එකක් අඩුය. ගොස්
තුඹ සන්තක සියල්ල විකුණා දිළිඳුන්ට
දීපන්න, ස්වර්ගයෙහි තුඹට වස්තු
ඇතිවන්නේය. තුඹ මා අනුව වරෙන්නැයි
ඔහුට කීසේක. එහෙත් ඔහුට බොහෝ 22
සම්පත් තිබුණු බැවින් ඔහු ඒ කීම නිසා
මුහුණ මැලවී, ශෝකයෙන් යන්ට ගියේය.

## වස්තුව පිළිබඳව අවවාදකිරීම

එවිට යේසුස්වහන්සේ අවට බලා: 23
ධනවත්තයන්ට දෙවියන්වහන්සේගේ
රාජ්‍යයට ඇතුල්වීම කොපමණ අමාරුදැයි
ගෝලයන්ට කීසේක. ගෝලයෝ 24
උන්වහන්සේගේ වචනවලට විස්මපත්
වූවෝය. නුමුත් යේසුස්වහන්සේ නැවතත්
උත්තරදෙමින්: දරුවෙනි, වස්තුව කෙරෙහි
විශ්වාසකරන්නන්ට දෙවියන්වහන්සේගේ
රාජ්‍යයට ඇතුල්වීම කොපමණ අමාරුද!
ධනවත්තයෙකු ස්වර්ගරාජ්‍යයට ඇතුල්- 25
වීමට වඩා ඉඳිකටු සිදුරෙන්
ඔටුවෙකුට යන්ට පහසුයයි කීසේක.
ඔව්හු අතිශයින් මවිතවී: එසේ නම් 26

ගැළවෙන්ට පුළුවන් කාටදැයි උන්-
27 වහන්සේට කීවෝය. යේසුස්වහන්සේ
ඔවුන් දෙස බලා: මනුෂ්‍යයන්ට නම්
නුපුළුවන, නුමුත් දෙවියන්වහන්සේට එසේ
නොවේය. මක්නිසාද දෙවියන්වහන්සේට
28 සියල්ලම පුළුවනැයි කීසේක. පේත්‍රුස්
උන්වහන්සේට කථාකරන්ට පටන්ගෙන:
මෙන්න, අපි සියල්ල අත්හැර
ඔබවහන්සේ අනුව ආවෙමුයයි කීය.
29 යේසුස්වහන්සේද: සැබවක් නුඹලාට
කියමි—මා නිසාද ශුභාරංචිය නිසාද
ගෙය හෝ සහෝදරයන් හෝ
සහෝදරියන් හෝ මවු හෝ පියා හෝ
දරුවන් හෝ ගම්බිම් හෝ අත්හැරිය
30 කවරෙක් නුමුත්, දැන් මේ කාලයේදී
ගෙවල්ද සහෝදරයන්ද සහෝදරියන්ද
මවුවරුන්ද දරුවන්ද ගම්බිම්ද පීඩාත්
සහිතව සියක් ගුණයක් හා, අනාගත
ලෝකයේදී සදාකාල ජීවනයද නොලබා
31 නොසිටින්නේය. නුමුත් ප්‍රථමයෝ
බොහෝ දෙනෙක් අන්තිමයෝද
අන්තිමයෝ ප්‍රථමයෝද වන්නෝයයි
කීසේක.

## යේසුස්වහන්සේ තමන් මරණය ගැන තුන්වෙනි වරට කලින් කීම

32 ඔවුන් යෙරුසලමට යන කල මගදී
යේසුස්වහන්සේ ඔවුන්ට පෙරටුව
ගියසේක. ඔව්හු විස්මපත්වූවෝය;
පස්සෙන් ගිය අය භයවූවෝය.
උන්වහන්සේ දොළොස්දෙනා නැවත
කැඳවා, තමන්වහන්සේට සිදුවෙන්ට
33 තිබෙන දේ කියන්ට පටන්ගෙන: බලව,
අපි යෙරුසලමට යමුව; මනුෂ්‍ය පුත්‍රයා
නායක පූජකයන්ටත් ලියන්නන්ටත්
පාවාදෙනු ලබන්නේය; ඔව්හු වනාහි
ඔහු මරණයට නියමකොට අන්‍ය
34 ජාතීන්ට පාවාදෙන්නෝය. ඔව්හු ඔහුට
නින්දකොට, කෙළගසා, තළා, ඔහු
මරන්නෝය; නුමුත් තුන් දවසකට පසු
ඔහු නැවත නැගිටින්නේයයි කීසේක.

## යාකොබ් සහ යොහන් කළ ඉල්ලීම

සෙබදීගේ පුත්‍රයෝවූ යාකොබ්ද 35
යොහන්ද උන්වහන්සේ ළඟට ඇවිත්:
ආචාරීනි, අප ඉල්ලන්නාවූ කොයිදෙයක්
නුමුත් ඔබ අපට කරදෙනවාට අපි
කැමැත්තෙමුයයි කීවෝය. මා විසින් 36
නුඹලාට කුමක් කරදෙනවාට නුඹලා
කැමැත්තහුදැයි උන්වහන්සේ ඔවුන්ගෙන්
ඇසූසේක. ඔබගේ තේජසේදී එක්කෙනෙක් 37
ඔබගේ දකුණු පැත්තේද එක්කෙනෙක්
වම් පැත්තේද හිඳගන්ට අපට වරදුන
මැනවයි ඔව්හු උන්වහන්සේට කීවෝය.
නුමුත් යේසුස්වහන්සේ: නුඹලා 38
ඉල්ලන්නේ කුමක්දැයි නුඹලා
නොදන්නහුය. මා බොන කුසලානෙන්
බොන්ට හෝ මා ලබන *බව්තීස්මයෙන්
බව්තීස්මකරනු ලබන්ට හෝ නුඹලාට
පුළුවන්දැයි ඔවුන්ට කීසේක. අපට 39
පුළුවනැයි ඔව්හු උන්වහන්සේට
කීවෝය. යේසුස්වහන්සේද: මා බොන
කුසලානෙන් නුඹලා බොන්නහුය; මා
ලබන *බව්තීස්මයෙන් බව්තීස්මකරනු
ලබන්නහුය. නුමුත් මාගේ දකුණු 40
පැත්තේද වම් පැත්තේද හිඳගන්ට
දීම මාගේ නොවේය. යමෙකුට එය
සූදනම්කර තිබේද ඔවුන්ටයයි කීසේක.
එවිට දසදෙනා ඒ අසා යාකොබ් 41
සහ යොහන් කෙරේ කෝපවෙන්ට
පටන්ගත්තෝය.

## සැබෑ උතුම්කම

යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට 42
කැඳවා කියනසේක්: අන්‍ය ජාතීන් අතරේ
ආණ්ඩුකාරයෝයයි සලකනු ලබන්නන්
ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත්
ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය
පවත්වන බවත් නුඹලා දන්නහුය. නුමුත් 43
නුඹලා අතරේ එසේ නොවේය. නුඹලා
අතරේ උතුම්වෙන්ට කැමති කවරෙක්
නුමුත් නුඹලාගේ සේවකයා වන්නේය.
නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති 44

*අවගාහනයෙන් අවගාහනය.

කවරෙක් නුමුත් සියල්ලන්ගේ දසයා
45 වන්නේය. මක්නිසාද සැබවින් මනුෂ්‍ය
පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය
කරන්ටද බොහෝ දෙනෙකු උදෙසා
මිදීමේ මිලයක් කොට තමාගේ ජීවිතය
දෙන්ටද ආයේයයි කීසේක.

## බර්තිමේයුස්ට පෙනීම දීම

46 ඔව්හු යෙරිකෝවට පැමිණියෝය.
උන්වහන්සේ තමන් ගෝලයන් හා මහත්
සමූහයක් සමග යෙරිකෝවෙන් පිටත්ව
යන කල තිමේයුස්ගේ පුත්‍රවූ බර්තිමේයුස්
නම් අන්ධවූ හිඟන්නෙක් පාර
47 අයිනේ ඉඳගෙන උන්නේය. ඒ නාසරීය
යේසුස්වහන්සේ බව ඔහු අසා: දවිත්ගේ
පුත්‍රවූ යේසුස්වහන්ස, මට කරුණාකළ
මැනවයි මොරගසන්ට පටන්ගත්තේය.
48 එවිට ඔහු නිශ්ශබ්ද වන ලෙස බොහෝ
දෙනෙක් ඔහුට සැරකළෝය. නුමුත් ඔහු:
දවිත්ගේ පුත්‍රය, මට කරුණාකළ මැනවයි
49 වඩ වඩා මොරගැසුවේය. යේසුස්වහන්සේ
නැවතී සිට: ඔහුට අඬගසාපල්ලායයි
කීසේක. ඔව්හු අන්ධයාට අඬගසා:
ධෛර්යවත්වෙයන්න. නැගිටපන්න,
උන්වහන්සේ නුඹට අඬගසනසේකැයි
50 කීවෝය. ඔහු තමාගේ සළුව ඉවත දමා,
පැනනැගී යේසුස්වහන්සේ ළඟට ආයේය.
51 යේසුස්වහන්සේ ඔහුට කථාකොට: මා
විසින් නුඹට මක්කරනවාට නුඹ
කැමතිදැයි ඔහුගෙන් ඇසූසේක.
රබ්බෝනි, පෙනීම ලබාගන්ටයයි
අන්ධයා උන්වහන්සේට කීයේය.
52 යේසුස්වහන්සේද: පලයන්න, නුඹේ
ඇදහිල්ල නුඹට සුවකළේයයි ඔහුට
කීසේක. එවේලේම ඔහු පෙනීම ලැබ,
මාර්ගයෙහි උන්වහන්සේ අනුව ගියේය.

## යේසුස්වහන්සේ රජකෙනෙකු සේ යෙරුසලමට ඇතුල්වීම

11 ඔවුන් යෙරුසලමට ළංව, ඔලීව
කන්දට නුදුරුවූ බෙත්පාගයටද
බෙතානියටද පැමිණි කල, උන්වහන්සේ
තමන්ගේ ගෝලයන්ගෙන් දෙදෙනෙකු
යවමින්: නුඹලා ඉදිරිපිට තිබෙන ගමට 2
පලයල්ලා. එහි ඇතුල්වූ කෙණෙහිම,
කිසි මනුෂ්‍යයෙක් නොනැගුණු කොටළු
වස්සෙකු බැඳ සිටිනවා නුඹලාට
සම්බවන්නේය; ඌ ලිහා ගෙනෙල්ලා.
නුඹලා මේක කරන්නේ මක්නිසාදැයි 3
යමෙක් නුඹලාට කියන්නේ නම්,
ස්වාමීන්වහන්සේට උගෙන් ඕනෑකමක්
තිබේ; උන්වහන්සේ වහාම ඌ ආපසු
මෙහි එවනසේකැයි ඔහුට කියාපල්ලායයි
ඔවුන්ට කීසේක. ඔව්හු ගොස්, දෙර ළඟ 4
පිටත මාවත අසල බැඳ සිටි කොටළු
වස්සෙකු දැක ඌ ලිහුවෝය. එහි 5
සිටියවුන්ගෙන් සමහරෙක් කථාකොට:
කොටළු වස්සා ලිහන්නේ මක්නිසාදැයි
ඔවුන්ගෙන් ඇසුවෝය. යේසුස්වහන්සේ 6
කී ලෙසම ඔව්හු ඔවුන්ට කීවෝය. එවිට
ඔව්හු ඔවුන්ට යන්ට හැරියෝය. ඔව්හු 7
කොටළු වස්සා යේසුස්වහන්සේ ළඟට
ගෙනැවිත්, තමුන්ගේ වස්ත්‍ර ඌ පිට
ලූවෝය; උන්වහන්සේ ඌ පිට හිඳගත්-
සේක. එවිට බොහෝ දෙනෙක් තමුන්ගේ 8
වස්ත්‍රද තවත් අය කෙත්වලින් කපාගත්
අතුද මග අතුළෝය. පෙරටුවෙන්ද 9
පස්සෙන්ද ගිය අය: හෝසන්නා;
ස්වාමීන්වහන්සේගේ නාමයෙන් එන
තැනැත්තේ ආශීර්වාද ලද්දේය කියාත්,
පැමිණෙන්නාවූ අපේ පියවූ දවිත්ගේ 10
රාජ්‍යය ආශීර්වාද ලද්දේය කියාත්, ඉතා
උසස්තැන්හි හෝසන්නාය කියාත්
මොරගැසුවෝය.
උන්වහන්සේද යෙරුසලමට පැමිණ, 11
දේවමාළිගාවට ඇතුල්ව, අවට සියල්ල
බලා, සවස්වී තිබුණු බැවින්
දොළොස්දෙනා සමග බෙතානියට
පිටත්ව ගියසේක.

## එල නැති අත්තික්කා ගහ

පසුවද ඔවුන් බෙතානියෙන් පිටත්ව 12
එද්දී, උන්වහන්සේට බඩගිනිවිය. කොළ 13
ඇති අත්තික්කා ගහක් උන්වහන්සේ දුරින්
දැක, එයින් යමක් ලැබේදෝ කියා ළඟට
ගියසේක. ගස ළඟට පැමිණි කල,
කොළ මිස වෙන කිසිවක් සම්බ

නොවීය; මක්නිසාද ඒ වනාහි අත්තික්කා
14 වාරය නොවීය. උන්වහන්සේ කථා-
කොට: මෙතැන් පටන් කිසිකලක
කිසිවෙක් තාගෙන් ඵල නොකාවයි ගසට
කීසේක. ඒ කීම උන්වහන්සේගේ
ගෝලයන්ට ඇසුණේය.

## දේවමාළිගාව පවිත්‍රකිරීම

15 ඔව්හු යෙරුසලමට පැමිණියෝය.
උන්වහන්සේ දේවමාළිගාවට ඇතුල්ව,
එහි විකුණමින්ද මිලේට ගනිමින්ද සිටි
අය පිටතට පන්නාහරින්ට පටන්ගෙන,
මිලමාරුකරන්නන්ගේ මේසද පරෙවියන්
විකුණන්නන්ගේ ආසනද පෙරළාදමා,
16 දේවමාළිගාව මැදින් කිසි භාජනයක්
ගෙනයන්ට කිසිවෙකුට ඉඩ නුදුන්සේක.
17 උන්වහන්සේ උගන්වමින් ඔවුන්ට
කියනසේක්: මාගේ ගෘහය සියලු ජාතීන්ට
යාච්ඤා ගෘහයකැයි කියනු ලබන්නේයයි
ලියා තිබෙනවා නොවේද? නුමුත් නුඹලා
ඒක සොරුන්ගේ ගුහාවක් කළහුයයි
18 කීසේක. නායක පූජකයෝද ලියන්නෝද
ඒ අසා, උන්වහන්සේ නසන්නේ කෙසේදැයි
සෙවුවෝය. මක්නිසාද උන්වහන්සේගේ
ඉගැන්වීම ගැන මුළු සමූහයා විස්මයට
පත්වූ බැවින්, ඔව්හු උන්වහන්සේට
භයවූවෝය.
19 සවස්වූ කල්හි උන්වහන්සේ නුවරින්
පිටත්ව ගියසේක.

## ඇදහිල්ලේ බලය

20 ඔව්හු පසුවද උදේ යන කල
අත්තික්කා ගහ මුල පටන් වියළී
21 තිබෙනවා දුටුවෝය. පේත්‍රුස්ද
සිහිකොට: රබ්බී, බැලුව මැනව, ඔබ
ශාපකළ අත්තික්කා ගහ වියළී තිබේයයි
22 කීවේය. යේසුස්වහන්සේ ඔවුන්ට
උත්තරදෙමින්: දෙවියන්වහන්සේ කෙරෙහි
23 ඇදහිල්ල ඇතුව සිටපල්ලා. සැබවක්
නුඹලාට කියමි–කවරෙක් නුමුත් මේ
කන්දට කථාකොට: ඉදිරී මුහුදේ
වැටියන්නැයි කියා, තමාගේ සිතින් සැක
නොකොට, තමා කියන දේ සිදුවේයයි
අදහන්නේ නම්, ඒක ඔහුට සිදුවන්නේය.
එබැවින් නුඹලාට කියමි–නුඹලා 24
යාච්ඤාකොට ඉල්ලන මොන දෙයක්
වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේයයි
අදහාපල්ලා, ඒවා නුඹලාට ලැබෙන්නේය.
නුඹලා යාච්ඤාකරමින් සිටින කල 25
ස්වර්ගයෙහි සිටින නුඹලාගේ
පියාණන්වහන්සේ නුඹලාගේ වරද
නුඹලාට කමාවන පිණිස යමෙකුට
විරුද්ධව යමක් නුඹලාට ඇත්නම්
නුඹලාත් කමාවෙයල්ලා.*

## යේසුස්වහන්සේගේ බලය ගැන ප්‍රශ්නකිරීම

ඔව්හු නැවත යෙරුසලමට ආවෝය. 27
උන්වහන්සේ දේවමාළිගාවේ සක්මන්
කරන කල නායක පූජකයෝද
ලියන්නෝද වැඩිමහල්ලෝද උන්වහන්සේ
වෙතට ඇවිත්: නුඹ කවර බලයක් පිට 28
මේ දේ කරන්නෙහිද? නොහොත් මේ
දේවල් කරන්ට මේ බලය නුඹට දුන්නේ
කවුදැයි උන්වහන්සේගෙන් ඇසුවෝය.
යේසුස්වහන්සේද ඔවුන්ට කියනසේක්: 29
නුඹලාගෙන් එක් ප්‍රශ්නයක් අසමි, මට
උත්තරදියල්ලා, එවිට මම මේ දේවල්
කරන්නේ මොන බලයක් පිටදැයි
නුඹලාට කියන්නෙමි. යොහන්ගේ 30
†බව්තීස්මය වූයේ ස්වර්ගයෙන්ද
නොහොත් මනුෂ්‍යයන්ගෙන්ද? මට
උත්තරදියල්ලායයි ඔවුන්ට කීසේක.
ඔව්හු ඔවුනොවුන් අතරේ කථාකොට: 31
ස්වර්ගයෙන්යයි කියමු නම්–ඔහු අදහා
නොගත්තේ මක්නිසාදැයි අපට කියනවා
ඇත. නුමුත් මනුෂ්‍යයන්ගෙන්යයි කියමු 32
නම්–යොහන් සැබැවටම අනාගතවක්තෘ
කෙනෙකැයි සියල්ලන් සැලකූ බැවින්
සෙනඟට භයවී: අපි නොදනිමුයයි 33

*පුරාණ පිටපත් කීපයක 26 වෙනි පදයක් මෙයාකාර තිබේ: නුමුත් නුඹලා කමා-නොවෙනවා නම් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ නුඹලාගේ වරදවලටත් කමා නොවෙනසේක.

†අවගාහනය.

යේසුස්වහන්සේට උත්තරදුන්නෝය.
යේසුස්වහන්සේද: මා විසින් මේ දේවල්
කරන්නේ මොන බලයක් පිටද කියා
මමත් තුඹලාට නොකියමියි ඔවුන්ට
කීසේක.

## මිදිවත්ත ගැන උපමාව

12 උන්වහන්සේ උපමාවලින් ඔවුන්ට
කථාකරන්ට පටන්ගෙන:
මනුෂ්‍යයෙක් මිදිවත්තක් වවා, වටේට
වැට බැඳ, මිදියන්ත්‍රය සඳහා වළක් හාරා,
කොතක් ගොඩනගා, ගොවීන්ට බදුදී,
2 අන් රටකට ගියේය. ඔහු මිදිවත්තේ
ඵල කොටස ගොවීන්ගෙන් ලබාගන්න
පිණිස ඵල වාරයේදී ගොවීන් ළඟට
3 දසයෙකු යැවීය. ඔව්හු ඔහු අල්ලා, ඔහුට
4 තළා, හිස් අතින් හැරියෝය. නැවත ඔහු
වෙන දසයෙකු ඔවුන් වෙතට හැරියේය;
ඔව්හු ඔහුගේ හිස තුවාලකොට ඔහුට
5 නිග්‍රහකළෝය. ඔහු තවත් කෙනෙකු
යැවීය; ඔව්හු ඔහු මැරුවෝය. තවත්
බොහෝ දෙනෙකුගෙන් සමහරෙකුට
6 තැළුවෝය, සමහරෙකු මැරුවෝය. ඔහුට
තව එක්කෙනෙක් එනම් ප්‍රේමවන්ත
පුත්‍රයෙක් සිටියේය. ඔවුන් මාගේ පුත්‍රයාට
ගෞරව කරනවා ඇත කියා අන්තිමේදී
7 ඔහුත් ඔවුන් වෙතට යැවීය. නුමුත් ඒ
ගොවියෝ තමුන් අතරේ කථාකොට:
මොහු උරුමක්කාරයාය; වරෙල්ලා, ඔහු
8 මරමු, එවිට උරුමය අපට වන්නේය
කියා, ඔහු අල්ලා, මරා, මිදිවත්තෙන්
9 පිටතට දැමුවෝය. එබැවින් මිදිවත්තේ
ස්වාමියා කුමක් කරන්නේද? ඔහු ඇවිත්
ඒ ගොවීන් විනාශකොට මිදිවත්ත
අන්‍යයන්ට දෙන්නේය.
10 ගෙවල් සාදන්නන් විසින් එපාකළ
ගලම
කොනේ ප්‍රධාන ගල කරනු ලැබීය.
11 මෙය ස්වාමීන්වහන්සේ කෙරෙන්
වූයේය,
ඒ වනාහි අපගේ ඇස්වලට පුදුමයක්ය
යන මේ ලියවිල්ලවත් තුඹලා කියෙවුවේ
12 නැද්දැයි කීසේක. උන්වහන්සේ මේ උපමාව
තමුන්ට විරුද්ධව කී බව ඔව්හු
දැන උන්වහන්සේ අල්ලන්ට සෙවුවෝය.
නුමුත් ඔව්හු සමූහයාට භයව සිටියෝය.
ඔව්හු වනාහි උන්වහන්සේ අත්හැර
ගියෝය.

## කායිසර්ට ආදායම් දීම ගැන ප්‍රශ්නය

ඔව්හු කථාවෙන් උන්වහන්සේ 13
අසුකරගන්න පිණිස ඵරිසිවරුන්ගෙන්ද
හෙරෝදිවරුන්ගෙන්ද සමහරෙකු
උන්වහන්සේ වෙතට යැවුවෝය. ඔව්හු 14
ඇවිත්: ආචාරීනි, ඔබ සැබෑවූ කෙනෙකු
බවත්, මනුෂ්‍යයන්ගේ තරාතිරම්
නොබලන බැවින් කිසිවෙකුට භය නොවී
දෙවියන්වහන්සේගේ මාර්ගය සැබෑ ලෙස
උගන්වන බවත් දනිමුව. කායිසර්ට
අයබද්ද දීම යුතුද අයුතුද? දෙමුද 15
නොදෙමුදැයි උන්වහන්සේට කීවෝය.
නුමුත් උන්වහන්සේ ඔවුන්ගේ වංකකම
දැන: තුඹලා මා පරීක්ෂාකරන්නේ
මක්නිසාද? මට බලන්ට මස්සක්
ගෙනෙල්ලායයි ඔවුන්ට කීසේක. ඔව්හු 16
ගෙනාවෝය. උන්වහන්සේද: මේ රූපයත්
සටහනත් කාගේදැයි ඔවුන්ගෙන් ඇසූ-
සේක. කායිසර්ගේයයි ඔව්හු කීවෝය.
එවිට යේසුස්වහන්සේ: කායිසර්ගේ දේ 17
කායිසර්ටද දෙවියන්වහන්සේගේ දේ
දෙවියන්වහන්සේටද දීපල්ලායයි ඔවුන්ට
කීසේක. ඔව්හු උන්වහන්සේ ගැන
බොහෝසෙයින් පුදුමවූවෝය.

## නැවත-නැගිටීම ගැන ප්‍රශ්න කිරීම

නැවත-නැගිටීමක් නැතැයි කියන 18
සද්දුසිවරු උන්වහන්සේ ළඟට ඇවිත්
කථාකොට: ආචාරීනි, යමෙකුගේ 19
සහෝදරයෙක් දරුවෙකු නොලැබ
තමාගේ භාර්යාව සිටියදී මළොත්
ඔහුගේ සහෝදරයා ඔහුගේ භාර්යාව
පාවාගෙන තමාගේ සහෝදරයා නමට
දරුවන් ඉපදවිය යුතුයයි මෝසෙස් විසින්
අපට ලියාදී තිබේ. සහෝදරයෝ 20
සත්දෙනෙක් සිටියෝය. පළමුවෙනියා
භාර්යාවක් පාවාගෙන දරුවන් නොලැබ

21 මැරුණේය; දෙවෙනියාත් ඈ පාවාගෙන
දරුවන් නොලැබ මැරුණේය; තුන්-
22 වෙනියාත් එසේමය. සත්දෙනාම
දරුවන් නොලැබ මැරුණෝය.
සියල්ලන්ට පසු ස්ත්‍රීත් මළාය.
23 සත්දෙනාම ඈ භාර්යාව කොට
පාවාගත් බැවින් නැවත-නැගිටීමේදී
ඈ ඔවුන්ගෙන් කාගේ භාර්යාව
වන්නීදැයි උන්වහන්සේගෙන් ඇසුවෝය.
24 යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට:
තුඹලා වරද්දගන්නේ ශුද්ධලියවිලිවත්
දෙවියන්වහන්සේගේ බලයවත් නොදන්න
25 නිසා නොවේද? මක්නිසාද ඔව්හු
මළවුන්ගෙන් නැගිටින කල සරණපාවා-
ගන්නේවත් සරණපාවාදෙන්නේවත්
නැතුව ස්වර්ගයේ දේවදූතයන් මෙන්
26 වෙති. තවද මළවුන් නැගිටින බව
ගැන නම්, දෙවියන්වහන්සේ කථා-
කොට: මම ආබ්‍රහම්ගේ දෙවියන්-
වහන්සේය, ඊසාක්ගේ දෙවියන්-
වහන්සේය, යාකොබ්ගේ දෙවියන්-
වහන්සේයයි මෝසෙස්ට කී බව ඔහුගේ
පොතේ පඳුර ගැන සඳහන්වූ තැන
27 තුඹලා කියෙවුවේ නැද්ද? උන්වහන්සේ
මළවුන්ගේ නොව ජීවත්වන්නන්ගේ
දෙවියන්වහන්සේය. තුඹලා බොහෝසේ
වරද්දගන්නහුයයි කීසේක.

## ඉතා මහත් ආඥාව ගැන ප්‍රශ්නය

28 එවිට ලියන්නන්ගෙන් එක්කෙනෙක්
ඇවිත් ඔවුන් එකතුව ප්‍රශ්න විචාරනවා
අසා, උන්වහන්සේ මනාසේ ඔවුන්ට
පිළිතුරු දුන් බව දැන: සියලු ආඥාවලින්
කොයි එක ප්‍රධානදැයි උන්වහන්සේගෙන්
29 ඇසුවේය. යේසුස්වහන්සේ උත්තරදෙමින්:
ප්‍රධාන එක නම්—අහෝ ඉශ්‍රායෙල්,
අසාපන්න; අපේ දෙවියන්වහන්සේ
ස්වාමීන්වහන්සේය උන්වහන්සේ එකම
30 (දෙවියන්වහන්සේ)ය. තුඹේ මුළු
හෘදයෙන්ද තුඹේ මුළු ආත්මයෙන්ද
තුඹේ මුළු බුද්ධියෙන්ද තුඹේ මුළු
ශක්තියෙන්ද තුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට ප්‍රේමකරපන්න යන එකය.
31 දෙවෙනි එක නම්: තුඹට මෙන් තුඹේ
අසල්වාසියාට ප්‍රේමකරපන්න යනුය.
මේවාට වඩා උතුම්වූ අන්කිසි ආඥාවක්
නැතැයි කීසේක. එවිට ලියන්නා: 32
ආචාරීන්වහන්ස, සැබවින් උන්වහන්සේ
එකම තැනන්වහන්සේයයි ඔබ හරිලෙස
කීයෙහිය; උන්වහන්සේ හැර වෙන කිසි
දෙවිකෙනෙක් නැත. මුළු හෘදයෙන්ද 33
මුළු ඥානයෙන්ද මුළු ශක්තියෙන්ද
උන්වහන්සේට ප්‍රේමකිරීමත් තමාට මෙන්
තමාගේ අසල්වාසියාට ප්‍රේමකිරීමත්
සියලු මුළු දවන පූජාවලට හා
යාගවලටත් වඩා උතුම්යයි කීය. ඔහු 34
නුවණින් උත්තරදුන් බව යේසුස්වහන්සේ
දැක: තුඹ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට
නුදුරුව සිටින්නෙහියයි ඔහුට කීසේක.
ඉන්පසු උන්වහන්සේගෙන් කිසි ප්‍රශ්නයක්
අසන්ට කිසිවෙකුට ධෛර්ය නොතිබුණේය.

## දවිත්ගේ පුත්‍රයාවූ ක්‍රිස්තුස්වහන්සේ

යේසුස්වහන්සේ දේවමාළිගාවේ 35
උගන්වද්දී උත්තරදෙමින්: ක්‍රිස්තුස්-
වහන්සේ දවිත්ගේ පුත්‍රයායයි ලියන්නෝ
කෙසේ කියද්ද? දවිත්ම ශුද්ධාත්මයාණන් 36
කරණකොට කථාකරමින්:

මා විසින් තුඹේ සතුරන් තුඹේ පා
පුටුව කොට තබන තෙක්
මාගේ දකුණු පැත්තේ හිඳගනින්නැයි
ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්-
වහන්සේට කීසේකැයි

කීය. දවිත්ම උන්වහන්සේට ස්වාමීන්- 37
වහන්සේයයි කියයි; එසේ නම්
උන්වහන්සේ ඔහුගේ පුත්‍රයා වන්නේ
කෙසේද්දැයි ඇසුසේක. සාමාන්‍ය
ජනයා උන්වහන්සේට සන්තෝෂයෙන්
ඇහුම්කන්දුන්නෝය.

## ලියන්නන්ගෙන් පරෙස්සම්වීමට අවවාදයක්

උන්වහන්සේ තමන් ඉගැන්වීමේදී 38
කියනසේක්: උතුරු සළු ඇඳ ඇවිදීමටත්
කඩපිල්වලදී ආචාර ලැබීමටත්
සිනගෝගවලදී ප්‍රධාන ආසනවලටත් 39
මංගල්‍යවලදී ප්‍රධාන ස්ථානවලටත්

40 කැමතිවන්නාවූද, වැන්දඹුවන්ගේ ගෙවල්
කොල්ලකන්නාවූද, වංචාවට දීර්ඝ
යාච්ඤාකරන්නාවූද ලියන්නන්ගෙන්
ප්‍රවේසම්වෙයල්ලා; ඔව්හු වඩා බරපතළ
දඬුවමක් ලබන්නෝයයි කීසේක.

## කනවැන්දුම්ගේ දීමනාව

41 උන්වහන්සේ මුදල් ගබඩාව ඉදිරියෙහි
වැඩහිඳ සෙනඟ ගබඩාවට මුදල් දමන
හැටි බලාහුන්සේක. වස්තුකාරයෝ
42 බොහෝ දෙනෙක් හුඟක් දැමුවෝය. දිළිඳු
වැන්දඹුවක් ඇවිත් ශතයක් වටිනා සල්ලි
43 දෙකක් දැමුවාය. උන්වහන්සේ ගෝලයන්
තමන් වෙතට කැඳවා: සැබවක් නුඹලාට
කියමි–ගබඩාවේ මුදල් දමන සියල්ලන්ට
වඩා මේ දිළිඳු වැන්දඹුව දැමුවාය.
44 මක්නිසාද ඒ සියල්ලෝ තමුන්ගේ
වැඩිමනත් දෙයින් දැමුවෝය. නුමුත් මැ
වනාහි තමාගේ හිඟකමෙන් තමාගේ
රක්ෂාවීමට තිබුණු සියල්ලම දැමුවායයි
කීසේක.

## දේවමාළිගාවේ විනාශයද ස්වාමීන්වහන්සේගේ නැවත ඊමද ගැන කලින් කීම

13 උන්වහන්සේ දේවමාළිගාවෙන්
පිටත්ව යද්දී උන්වහන්සේගේ
ගෝලයන්ගෙන් එක්කෙනෙක්: ආචාරීනි,
බැලුව මැනව, කොයි ආකාර ගල්ද,
කොයි ආකාර ගොඩනැගිලිද! කියා
2 උන්වහන්සේට කීයේය. යේසුස්වහන්සේ
ඔහුට කථාකොට: නුඹ මේ මහත්
ගොඩනැගිලි දකින්නෙහිද? ගලක් පිට
ගලක් ඉතුරු නොවන ලෙස ඒවා
කඩාදමනු ලබන්නේයයි කීසේක.
3 උන්වහන්සේ දේවමාළිගාව ඉදිරියෙහි
ඔලීව කන්දේ වැඩහුන් කල පේතෘස්ද
යාකොබ්ද යොහන්ද අන්දෘද රහසින්
4 උන්වහන්සේට කථාකොට: ඒ දේ කොයි
කලක සිද්ධවන්නේද? ඒ සියල්ල
සිද්ධවන්ට යන කල ඊට ලකුණ කිමෙක්ද
කියා අපට කිව මැනවයි කීවෝය.
5 යේසුස්වහන්සේ ඔවුන්ට කථාකරන්ට
පටන්ගෙන: කිසිවෙකු විසින් නුඹලා මුළා
නොකරන හැටියට බලාගනිල්ලා.
බොහෝ දෙනෙක් මාගේ නාමයෙන් 6
ඇවිත්–මම ඒ තැනන්වහන්සේය කියා
බොහෝ දෙනෙක් මුළාකරන්නෝය.
යුද්ධ සහ යුද්ධ කථා ගැන නුඹලා 7
අසන කල නොකැලඹෙල්ලා. මේ දේවල්
සිදුවෙන්ට ඕනෑය; නුමුත් අන්තිමය 8
එවකට නොවෙයි. මක්නිසාද ජාතියක්
ජාතියකටද රාජ්‍යයක් රාජ්‍යයකටද
විරුද්ධව නැගිටිනවා ඇත. නොයෙක්
තැන්වල පොළෝකම්පාවන්නේය; සාගත
වන්නේය. මේවා ගාවිනාවල
පටන්ගැනීමය.
එහෙත් නුඹලා ප්‍රවේසම්වෙයල්ලා. 9
මක්නිසාද ඔව්හු මන්ත්‍රණ සභාවලට
නුඹලා පාවාදෙන්නෝය; සිනගෝගවලදී
නුඹලා තළනු ලබන්නහුය; අධිපතීන්ද
රජුන්ද ඉදිරියේ නුඹලා මා නිසා ඔවුන්ට
සාක්ෂියක් පිණිස සිටිනවා ඇත. තවද 10
ශුභාරංචිය පළමුකොට සියලු ජාතීන්ට
ප්‍රකාශකරනු ලබන්ට ඕනෑය. ඔවුන් 11
නුඹලා පාවාදෙන්ට ගෙනයන කල
කුමක් කියන්නෙමුදැයි කලින් කනස්සලු
නොවෙල්ලා. එහෙත් ඒ පැයේදී නුඹලාට
යමක් දෙනු ලැබේද ඒක කියාපල්ලා.
මක්නිසාද කථාකරන්නේ නුඹලා නොව
ශුද්ධාත්මයාණන්වහන්සේය. තවද 12
සහෝදරයා සහෝදරයාද පියා දරුවාද
මරණයට පාවාදෙන්නෝය. දරුවෝද
මවුපියන්ට විරුද්ධව නැගිට ඔවුන්
මරණයට පත්කරවන්නෝය; මාගේ 13
නාමය නිසා සියල්ලෝම නුඹලාට
වෛරකරන්නෝය. නුමුත් අන්තිමය
දක්වාම ස්ථිරව සිටින්නා ගළවනු
ලබන්නේය.
තවද පාළුකරන පිළිකුල නුසුදුසු 14
ස්ථානයේ සිටිනවා නුඹලා යම් කලක
දකින්නහුද (කියවන්නා තේරුම්ගනීවා),
එකල යුදයෙහි සිටින්නෝ කඳුවලට
පලායෙත්වා. ගෙය උඩ සිටින්නා 15
බසින්ටවත් තමාගේ ගෙයින් කිසිවක්
ගන්නා පිණිස එහි ඇතුල්වෙන්ටවත්
නොයෙදේවා. කෙතෙහි සිටින්නාද 16

තමාගේ වස්ත්‍ර ගන්ට හැරී ආපසු
17 නොයේවා. නුමුත් ඒ දවස්වලදී
ගර්භිණීන්ටත් කිරිදෙන ස්ත්‍රීන්ටත් දුක්වේ!
18 ශීත කාලයේදී මේවා සිද්ධ නොවෙන
19 පිණිස යාච්ඤාකරපල්ලා. මක්නිසාද
දෙවියන්වහන්සේ මැවූ මැවිල්ලේ
පටන්ගැන්මේ සිට මේ දක්වා නූණාවූ
මතු සිදු නොවන්නාවූ ආකාර පීඩා ඒ
20 දවස්වලදී පැමිණෙන්නේය. ස්වාමීන්-
වහන්සේ ඒ දවස් ලුහුඬු නොකළසේක්
නම් කිසිකෙනෙක් ගැළවෙන්නේ
නැත. නුමුත් උන්වහන්සේ තමන්
තෝරාගත්තවුන් උදෙසා ඒ දවස්
21 ලුහුඬුකළසේක. එකල: මෙන්න
ක්‍රිස්තුස්වහන්සේ මෙහිය; නොහොත්:
අන්න එහියයි යමෙක් නුඹලාට කීවොත්
22 විශ්වාස නොකරල්ලා. මක්නිසාද බොරු
ක්‍රිස්තුස්වරුද බොරු අනාගතවක්තෘවරුද
නැගිට, පුළුවන්නම් තෝරාගත්තවුන්
මුළාකරන පිණිස ලකුණුද පුදුමද
23 දක්වන්නෝය. නුමුත් නුඹලා
ප්‍රවේසම්වෙයල්ලා. ඔන්න, කල් ඇතුව
නුඹලාට සියල්ල කීයෙමි.
24 ඒ දවස්වලදී ඒ පීඩාවෙන් පසු ඉර
අඳුරුවන්නේය, සඳ එළිය නොදෙන්නේය,
25 තාරකාවෝ අහසෙන් වැටෙන්නෝය,
අහසේ ඇති බලපරාක්‍රමයෝද සොලවනු
26 ලබන්නෝය. එකල මනුෂ්‍ය පුත්‍රයා
මහත් බලයෙන්ද තේජසින්ද යුක්තව
වලාකුල්වල එනවා ඔව්හු දකින්නෝය.
27 එවිට උන්වහන්සේ තමන් දූතයන්
යවා, පොළොවේ කෙළවර පටන්
අහසේ කෙළවර දක්වා සතරදිගින්
තමන්වහන්සේගේ තෝරාගත්තවුන්
රැස්කරවනවා ඇත.

## කාලය නොදන්න නිසා අවදිව සිටිය යුතු බව

28 අත්තික්කා ගහේ උපමාව
ඉගෙනගනිල්ලා. එහි අත්ත මෑදුව කොළ
හටගන්න කල ග්‍රීෂ්ම කාලය ළඟ බව
29 නුඹලා දන්නහුය. එසේම මේ දේ
සිද්ධවෙනවා නුඹලා දකින කල
උන්වහන්සේ දෙරටුව ළඟම බව
දැනගනිල්ලා. සැබවක් නුඹලාට කියමි– 30
මේ සියල්ල සිදුවන තෙක් මේ පරම්පරාව
පහවනොයන්නේය. අහසත් පොළොවත් 31
පහවන්නේය. නුමුත් මාගේ වචන
පහනොවන්නේය. නුමුත් ඒ දවසවත් ඒ 32
පැයවත් පියාණන්වහන්සේ මිස අන්
කිසිවෙක් දන්නේ නැත, ස්වර්ගයෙහි සිටින
දූතයෝවත් පුත්‍රයාවත් නොදනිති. ඒ 33
කාලය කවද වේදැයි නුඹලා නොදන්න
බැවින් ප්‍රවේසම්වී, අවදිව ඉඳ
යාච්ඤාකරපල්ලා. ඒ වනාහි තමාගේ 34
දසයන්ට බලයද එකිනෙකාට තම
තමාගේ වැඩද දී, අවදිව සිටින්නැයි
දෙරටුපාලයාට අණ දී, තමාගේ ගෙදරින්
පිටත්ව ගොස් අන් රටක නැවතී සිටින
මනුෂ්‍යයෙකුට සමානය. එබැවින් ගෙදර 35
ස්වාමියා හදිසියෙන් ඇවිත් නුඹලා
නිදඉන්නවා නොදක්නා පිණිස අවදිව
සිටපල්ලා. මක්නිසාද ඔහු එන්නේ 36
කොයි වේලේද එනම් සවසද මධ්‍යම
රාත්‍රියේද කුකුළා හඬලන වේලේද
අලුයමදැයි නුඹලා නොදන්නහුය. මම 37
නුඹලාට කියන දේ සියල්ලන්ටම
කියමි–අවදිව සිටපල්ලායයි කීසේක.

## යේසුස්වහන්සේ නැසීමට කුමන්ත්‍රණය

14

පාස්කුවද මුහුන් නොදමූ රොටි
කන මංගල්‍යයද දෙදවසකට පසු
පැමිණෙන්ට තිබුණේය. නායක
පූජකයෝද ලියන්නෝද උන්වහන්සේ
ප්‍රයෝගයෙන් අල්ලා මරන්නේ කෙසේද
කියා සොයමින් සිටියෝය. මක්නිසාද: 2
සෙනඟ අතරේ කෝලාහලයක් නොවන
පිණිස මංගල්‍යයෙහිදී නොකරමුයයි
ඔව්හු කීවෝය.

## බෙතානියේදී කළ ආලේපය

උන්වහන්සේ බෙතානියෙහි කුෂ්ඨ 3
රෝගීවූ සීමොන්ගේ ගෙයි කෑමට
ඉඳගෙන ඉන්දදී ස්ත්‍රියෙක් ඉතා අනර්ඝවූ
ජටාමාංස තෙලින් පිරූ සුදුගල්
කරඬුවක් ගෙනැවිත්, ඒ කරඬුව බිඳ,

4 උන්වහන්සේගේ හිසේ වත්කළාය. තුමුත්
එහි සිටි සමහරෙක් තම තමුන් අතරේ
කිපී: මේ තෙල නාස්තිකළේ කුමක්
5 නිසාද? මේ තෙල මසු තුන්සියයකට
වැඩියෙන් විකුණා දිළිඳුන්ට දෙන්ට
පුළුවන්ව තිබුණේය කියා ඇට විරුද්ධව
6 කොඳුළෝය. තුමුත් යේසුස්වහන්සේ
කියනසේක්: ඇ නිකම් උන්නාවේ; තුඹලා
ඇට කරදරකරන්නේ මක්නිසාද? ඇ
7 මට කළේ යහපත් ක්‍රියාවක්ය. මක්නිසාද
දිළින්දෝ තුඹලා සමග නිතරම සිටිති,
තුඹලා කැමති කලක ඔවුන්ට යහපත
කරන්ට තුඹලාට පුළුවන. තුමුත් මම
8 තුඹලා සමග නිතරම නොසිටිමි. ඇට
පුළුවන් දේ ඇ කළාය. භූමදනය පිණිස
ඇ කල් ඇතුව මාගේ ශරීරය
9 ආලේපකළාය. සැබවක් තුඹලාට
කියමි–ලොව මුළුල්ලේ ශුභාරංචිය
ප්‍රකාශකරනු ලබන සෑම තැන්වලදීම
මේ ස්ත්‍රිය කළ ක්‍රියාවත් ඇ ගැන
සිහිවීමක් කොට කියනු ලබන්නේයයි
කීසේක.

## යූදස්ගේ ද්‍රෝහිකම

10 දෙළොස්දෙනාගෙන් එක්කෙනෙක්වූ
යූදස් ඉස්කාරියෝත් උන්වහන්සේ නායක
පූජකයන්ට පාවාදෙන පිණිස ඔවුන්
11 වෙතට ගියේය. ඔව්හු ඒ අසා සතුටුව
ඔහුට මිල දෙන්ට පොරොන්දුවූවෝය.
එවිට ඔහු උන්වහන්සේ පාවාදීමට පහසු
ප්‍රස්තාවක් සෙව්ය.

## අන්තිම රාත්‍රි කෑම

12 පාස්කුව පූජාකරන මුහුන් නුමුසු රොටි
කන පළමුවෙනි දවසේ උන්වහන්සේගේ
ගෝලයෝ: ඔබ පාස්කුව කන පිණිස
අප ගොස් කොතැන පිළියෙළ කරනවාට
කැමතිසේක්දැයි උන්වහන්සේගෙන්
13 ඇසුවෝය. එවිට උන්වහන්සේ තමන්
ගෝලයන්ගෙන් දෙදෙනෙකු යවමින්
ඔවුන්ට කියනසේක්: නුවරට පලයල්ලා,
එකල වතුර කළයක් ගෙනයන
මනුෂ්‍යයෙක් තුඹලාට සම්බවන්නේය.
ඔහු පස්සේ ගොස්, ඔහු යම් ගෙදරකට 14
ඇතුල්වන්නේද එහි ස්වාමියාට
කථාකොට–මාගේ ගෝලයන් සමග මා
විසින් පාස්කුව කන මාගේ ආගන්තුක
ශාලාව කොතැන්හිදැයි ආචාරීන්වහන්සේ
අසනසේකැයි කියාපල්ලා. එවිට 15
සූදනම්ව පිළියෙළකර තිබෙන
මහත් උඩුමහලක් ඔහුම තුඹලාට
පෙන්වන්නේය. එහි අපට පිළියෙළ
කරපල්ලායයි කීසේක. ගෝලයෝ ගොස්, 16
නුවරට පැමිණ, උන්වහන්සේ ඔවුන්ට
කී ලෙසම සම්බව, පාස්කුව පිළියෙළ-
කළෝය.
සවස්වූ කල උන්වහන්සේ 17
දෙළොස්දෙනා සමග ආසේක. ඔවුන් 18
හාන්සිවී කමින් සිටියදී යේසුස්වහන්සේ
කථාකොට: සැබවක් තුඹලාට කියමි–
මා සමග කන්නාවූ කෙනෙක් වන
තුඹලාගෙන් එක්කෙනෙක් මා
පාවාදෙන්නේයයි කීසේක. ඔව්හු 19
ශෝකවන්ටත් එක්කෙනෙක් එක්කෙනෙක්
පාසා: මමද මමදැයි උන්වහන්සේගෙන්
අසන්ටත් පටන්ගත්තෝය. උන්වහන්සේද: 20
දෙළොස්දෙනාගෙන් එක්කෙනෙක්වූ මා
සමග තළියේ අත ලන තැනැත්තේය.
මක්නිසාද තමා ගැන ලියා තිබෙන 21
හැටියටම මනුෂ්‍ය පුත්‍රයා යන්නේය. තුමුත්
මනුෂ්‍ය පුත්‍රයා පාවාදෙන මනුෂ්‍යයාට
දුක්වේ! ඒ මනුෂ්‍යයා නූපන්නා නම්
ඔහුට හොඳයයි කීසේක.
ඔවුන් කමින් සිටියදී උන්වහන්සේ රොටි 22
ගෙන ආශිර්වාදකොට කඩා ඔවුන්ටදී:
ගනිල්ලා. මේක මාගේ ශරීරයයි
කීසේක. උන්වහන්සේ කුසලානක්ද ගෙන 23
ස්තුතිකොට ඔවුන්ට දුන්සේක. ඔවුන්
සියල්ලෝ එයින් බීවෝය. තවද 24
උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: මේක
බොහෝ දෙනෙකු උදෙසා මා විසින්
වගුරුවන ගිවිසුමේ මාගේ ලේය. සැබවක් 25
තුඹලාට කියමි–දෙවියන්වහන්සේගේ
රාජ්‍යයේදී මුද්‍රිකඵල අලුතෙන් බොන
දවස දක්වා එය තවත් නොබොන්නෙමියි
කීසේක.

26 ඔව්හු ගීතිකාවක් කළායින් පසු ඔලිව
කන්දට පිටත්ව ගියෝය.

## ගෝලයන් විසින් ස්වාමීන්වහන්සේ අත්හැරයාම ගැන කලින් කීම

27 එවිට යේසුස්වහන්සේ ඔවුන්ට
කියනසේක්: තුඹලා සියල්ලෝම
බාධාවන්නහුය. මක්නිසාද–මම එඬේරාට
පහරදෙන්නෙමි, එවිට බැටළුවෝ
විසුරුවනු ලබන්නෝයයි ලියා තිබේ.
28 එසේ වී නුමුත් මම නැඟුටුවනු ලැබූ පසු
තුඹලාට පෙරටුව ගලීලයට යන්නෙමියි
29 ඔවුන්ට කීසේක. එහෙත් පේත්‍රුස්
කථාකොට: සියලුදෙනාම බාධා-
වෙතත් මම නම් බාධා නොවෙමියි
30 උන්වහන්සේට කීය. යේසුස්වහන්සේද:
සැබවක් තුඹට කියමි–අද, මේ රාත්‍රියේම
කුකුළා දෙවරක් හඬලන්ට පළමුවෙන්
තුඹ මා අඳුනන්නේ නැත කියා තුන්වරක්
31 කියන්නෙහියයි ඔහුට කීසේක. නුමුත්
ඔහු: මට ඔබවහන්සේ සමග නසින්ට
වෙතත්, ඔබ නාඳුනමියි කියන්නේ නම්
නැතැයි ඉතා තදලෙස කීවේය. ඔවුන්
සියල්ලෝද එසේම කීවෝය.

## යේසුස්වහන්සේ ගෙත්සෙමනේහි සිටීම

32 ඔව්හු ගෙත්සෙමනේ නම්වූ ස්ථානයකට
පැමුණුණෝය. උන්වහන්සේද: මා
යාච්ඤාකරන අතර තුඹලා මෙහි
ඉඳිල්ලායයි ගෝලයන්ට කීසේක.
33 උන්වහන්සේ පේත්‍රුස්ද යාකොබ්ද
යොහන්ද තමන් සමග කැඳවාගෙන
ගොස්, බොහෝසෙයින් විස්මපත්වෙන්ටත්
අතිශයින් කැලඹෙන්ටත් පටන්ගත්සේක.
34 උන්වහන්සේ ඔවුන්ට කථාකොට:
මැරෙන තරම් මාගේ *සිත ඉතා
ශෝකවෙයි. තුඹලා මෙහි නැවතී අවදිව
35 සිටපල්ලාය කියා, මඳක් ඉස්සරහට
ගොස්, බිම වැටී, පුළුවන් නම් ඒ පැය
තමන් කෙරෙන් පහව යන ලෙස
යාච්ඤාකරමින්: අබ්බා පියාණෙනි, ඔබට 36
සියල්ලම පුළුවන; මේ කුසලාන මාගෙන්
පහකළ මැනව. එසේ වී නුමුත් මා
කැමති දේ නොව ඔබ කැමති දේ වේවයි
කීසේක. උන්වහන්සේ ඇවිත් ඔවුන් 37
නිදාඉන්නවා දැක, පේත්‍රුස්ට කථාකොට:
සීමොන්, තුඹ නිදාඉන්නවාද? තුඹට එක
පැයක් අවදිව ඉන්ට බැරිවුණාද? තුඹලා 38
පරීක්ෂාවට නොපැමිණෙන පිණිස
අවදිව හිඳ යාච්ඤාකරපල්ලා. ආත්මය
නම් කැමතිය, නුමුත් මාංසය දුර්වලයයි
කීසේක. උන්වහන්සේ නැවතත් ගොස් 39
එම වචනම කියා යාච්ඤාකළසේක.
උන්වහන්සේ නැවත හැරී ඇවිත්, ඔවුන් 40
නිදාඉන්නවා දුටුසේක, මක්නිසාද
ඔවුන්ගේ ඇස් ඉතා නිදිබරව තිබුණේය;
උන්වහන්සේට මොන උත්තරයක්
දෙන්ටදැයි ඔව්හු නොදැන සිටියෝය.
උන්වහන්සේ තුන්වෙනි වර ඇවිත් 41
ඔවුන්ට කියනසේක්: දැන් නිදාගන නිවාඩු
ගනිල්ලා; ඉතින් ඇත; පැය පැමිණ තිබේ;
මෙන්න, මනුෂ්‍ය පුත්‍රයා පව්කාරයන්ගේ
අත්වලට පාවාදෙනු ලබයි. නැඟිටියල්ලා, 42
අපි යමු. මෙන්න, මා පාවාදෙන්නා
ළඟයයි කීසේක.

## යේසුස්වහන්සේ අල්ලාගැනීම

එකෙණෙහිම, උන්වහන්සේ කථා- 43
කරද්දීම, දොළොස්දෙනාගෙන් එක්-
කෙනෙක්වූ යූදස්ද ඔහු සමග නායක
පූජකයන් ලියන්නන් හා වැඩිමහල්ලන්
කෙරෙන් සමූහයක්ද කඩු මුගුරු රැගෙන
ආවෝය. උන්වහන්සේ පාවාදෙන්නා 44
කථාකොට: මම යමෙකු සිඹගනිම්ද ඒ
ඔහුය; ඔහු අල්ලා ප්‍රවේසමෙන් අරගන
පලයල්ලායයි ලකුණක් ඔවුන්ට දී
තිබුණේය. ඔහු ආ කෙණෙහිම 45
උන්වහන්සේ ළඟට පැමිණ: රබ්බි කියා
උන්වහන්සේ සිඹගත්තේය. ඔව්හුද 46
උන්වහන්සේ පිට අත්හෙළා උන්වහන්සේ
අල්ලාගත්තෝය. ළඟ සිටියවුන්ගෙන් 47
එක්කෙනෙක් කඩුව ඇද උත්තම
පූජකයාගේ දාසයාට ගසා ඔහුගේ කන

*ප්‍රාණය.

48 කපාදමීය. යේසුස්වහන්සේ ඔවුන්ට
උත්තරදෙමින්: නුඹලා සොරෙකුට
විරුද්ධව මෙන් කඩු මුගුරු රැගෙන මා
49 අල්ලන්ට ආවහුද? මම දේවමාළිගාවේ
උගන්වමින් දවස්පතා නුඹලා සමග
සිටියෙමි, නුඹලා මා ඇල්ලුවේ නැත.
නුමුත් ලියවිලි සම්පූර්ණ වෙන පිණිස
50 මෙසේ සිදුවීයයි කීසේක. එවිට
සියල්ලෝම උන්වහන්සේ අත්හැර
පලාගියෝය.
51 තමාගේ නග්න ශරීරයෙහි හණ රෙද්දක්
පොරවාගත් එක්තරා තරුණයෙක්
උන්වහන්සේ පස්සේ ගියේය. ඔව්හු ඔහු
52 ඇල්ලුවෝය; නුමුත් ඔහු හණ රෙද්ද
අත්හැර, නග්නව පලාගියේය.

## උත්තම පූජකයා ඉදිරිපිට සිටීම

53 ඔව්හු යේසුස්වහන්සේ උත්තම පූජකයා
වෙතට ගෙනගියෝය. සියලු නායක
පූජකයෝද වැඩිමහල්ලෝද ලියන්නෝද
54 ඔහු සමග රැස්වුණෝය. පේත්‍රුස් දුරින්
උන්වහන්සේ පස්සේ උත්තම පූජකයාගේ
මළුව දක්වා ගොස්, එහි ඇතුළේ
සේවකයන් සමග ඉඳගන ගිනිතපිමින්
55 හුන්නේය. නායක පූජකයෝද මුළු
මන්ත්‍රණ සභාවද යේසුස්වහන්සේ
මරණයට පත්කරන පිණිස උන්වහන්සේට
විරුද්ධව සාක්ෂි සෙවුවෝය; නුමුත්
56 සම්බවුණේ නැත. මක්නිසාද බොහෝ
දෙනෙක් උන්වහන්සේට විරුද්ධව බොරු
සාක්ෂි කී නුමුත් ඔවුන්ගේ සාක්ෂි
57 එකඟවුණේ නැත. එවිට සමහරු නැගිට
සිට උන්වහන්සේට විරුද්ධව බොරු
58 සාක්ෂි කියමින්: අතින් සාදනලද මේ
දේවමාළිගාව මම කඩාදමා, අතින්
නොසාදනලද අනිකක් තුන් දවසකින්
ගොඩනගමියි ඔහු කියනවා අපි
59 ඇසුවෙමුයයි කීවෝය. නුමුත් මේ
ආකාරයෙන්වත් ඔවුන්ගේ සාක්ෂි එකඟ
60 නොවීය. උත්තම පූජකයා නැගිට මැද
සිට: නුඹ කිසි උත්තරයක් දෙන්නේ
නැද්ද? මොවුන් නුඹට විරුද්ධව කියන
සාක්ෂි කිමෙක්දැයි යේසුස්වහන්සේගෙන්
ඇසුවේය. නුමුත් උන්වහන්සේ කථා 61
නොකර, කිසි උත්තරයක් නොදී
සිටිසේක. නැවත උත්තම පූජකයා
කථාකොට: නුඹ ආශීර්වාදලත්
තැනන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්-
වහන්සේදැයි උන්වහන්සේගෙන් ඇසුවේය.
යේසුස්වහන්සේද: එසේය. තවද මනුෂ්‍ය 62
පුත්‍රයා පරාක්‍රමයේ දකුණු පැත්තේ
වැඩහුන්නවාත් අහසේ වලාකුල්
පිරිවරාගන එනවාත් නුඹලා
දකින්නහුයයි කීසේක. එවිට උත්තම 63
පූජකයා තමාගේ වස්ත්‍ර ඉරාගෙන:
සාක්ෂිකාරයන්ගෙන් තවත් අපට කම
මොකද? දේව අපහාසය නුඹලාට 64
ඇසුණේය. නුඹලා සිතන්නේ මොකදැයි
ඇසුවේය. ඔවුන් සියල්ලෝ උන්වහන්සේ
මරණයට සුදුස්සෙක්යයි තීන්දුකොට
කීවෝය. එකල සමහරෙක් උන්වහන්සේට 65
කෙළගසන්ටත් උන්වහන්සේගේ මුහුණ
වසා උන්වහන්සේට ගුටි ඇන: දිවස්
කියාපන්නැයි උන්වහන්සේට කියන්ටත්
පටන්ගත්තෝය. සේවකයෝද අතුල්පහර
දී උන්වහන්සේ භාරගත්තෝය.

## යේසුස්වහන්සේ නාඳුනමියි පේත්‍රුස් කීම

පේත්‍රුස් මළුවෙහි පහළ සිටියදී උත්තම 66
පූජකයාගේ මෙහෙකාර තරුණියන්ගෙන්
එක්කෙනෙක් ඇවිත් පේත්‍රුස් ගිනිතපිනවා 67
දැක, ඔහු දෙස බලා: නුඹත් නාසරීය
යේසුස් සමග සිටියෙහියයි කීවාය. නුමුත් 68
ඔහු: නැත, නුඹ කියන දේ මා දන්නේවත්
මට තේරෙන්නේවත් නැතැයි කියා පිට
ශාලාවට ගියේය; එවිට කුකුළා හඬලීය.
ඒ තරුණී ඔහු දැක: මොහු ඔවුන්ගෙන් 69
එක්කෙනෙක්යයි ළඟ සිටියවුන්ට නැවතත්
කියන්ට පටන්ගත්තාය. නුමුත් ඔහු 70
නැවතත්: නැතැයි කීවේය. ස්වල්ප
වේලාවකට පසු නැවත ළඟ සිටිය
අය: සැබෑවටම නුඹ ඔවුන්ගෙන්
එක්කෙනෙක්ය; මක්නිසාද නුඹ
ගලීලයෙක්යයි පේත්‍රුස්ට කීවෝය. නුමුත් 71
ඔහු: නුඹලා කියන ඒ මනුෂ්‍යයා

නාඳුනමියි කියා දෙස් තිබාගන්වද
72 දිවුරන්ටද පටන්ගත්තේය. එකෙණෙහිම
කුකුළා දෙවෙනි වර හඬලීය. කුකුළා
දෙවරක් හඬලන්ට පළමුවෙන් නුඹ මා
අඳුනන්නේ නැත කියා තුන්වරක්
කියන්නෙහියයි යේසුස්වහන්සේ තමාට
කී වචනය පේත්‍රුස් සිහිකොට, ඒ ගැන
සිත සිතා හැඬුවේය.

## පිලාත් නම් රෝම ආණ්ඩුකාරයා ඉදිරිපිට සිටීම

15 පහන්වූ කෙණෙහිම නායක
පූජකයෝ වැඩිමහල්ලන්ද ලියන්නන්ද
මුළු මන්ත්‍රණ සභාවද සමග මන්ත්‍රණයක්
පවත්වා, යේසුස්වහන්සේ බැඳගෙන
2 ගොස් පිලාත්ට භාරදුන්නෝය. නුඹ
යුදෙව්වරුන්ගේ රජදැයි පිලාත් උන්-
වහන්සේගෙන් ඇසුවේය. උන්වහන්සේ
උත්තරදෙමින්: නුඹ කියන්නෙහියයි ඔහුට
3 කීසේක. නායක පූජකයෝ බොහෝ
දේ ගැන උන්වහන්සේට වරද තැබුවෝය.
පිලාත් නැවත කථාකොට: නුඹ කිසි
4 උත්තරයක් දෙන්නේ නැද්ද? මොවුන්
නුඹට කොපමණ වරද තබනවාද කියා
බලාපන්නැයි උන්වහන්සේට කීයේය.
5 නුමුත් යේසුස්වහන්සේ තවත් කිසි
උත්තරයක් නුදුන්සේක; එහෙයින් පිලාත්
මවිතවිය.
6 මංගල්‍යයේදී ඔවුන් ඉල්ලන
හිරකාරයෙකු ඔහු විසින් ඔවුන්ට
7 මුදදෙන සිරිතක් තිබුණේය. කැරළිගසා,
ඒ කැරළි ගැසීමේදී මිනීමැරූ මිනිසුන්
සමග බඳිනු ලැබූ බරබ්බස් නම් කෙනෙක්
8 විය. සමූහයා නැගීගොස් ඔහු තමුන්ට
කළ සිරිතේ හැටියට කරදෙන ලෙස
ඔහුගෙන් ඉල්ලන්ට පටන්ගත්තෝය.
9 පිලාත් උත්තරදෙමින්: මා විසින්
යුදෙව්වරුන්ගේ රජ නුඹලාට
නිදහස්කරදෙනවාට නුඹලා කැමතිදැයි
10 ඔවුන්ගෙන් ඇසුයේය. මක්නිසාද නායක
පූජකයන් විසින් ඊර්ෂ්‍යාවෙන්
උන්වහන්සේ පාවා දුන් බව ඔහු දැනගන
11 සිටියේය. නුමුත් එසේ නොව ඔහු විසින්
බරබ්බස් ඔවුන්ට මුදා දෙන
පිණිස නායක පූජකයෝ සමූහයා
පෙලඹෙවුවෝය. පිලාත් නැවත ඔවුන්ට 12
උත්තරදෙමින්: එසේනම් යුදෙව්වරුන්ගේ
රජයයි නුඹලා කියන්නාවූ මොහුට
කුමක් කරම්දැයි කීය. ඔහු කුරුසියෙහි 13
ඇණගැසුව මැනවැයි නැවතත් ඔව්හු
මොරගැසුවෝය. එකල පිලාත්: ඒ මන්ද? 14
මොහු මොන නපුරක් කෙළේදැයි
ඔවුන්ගෙන් ඇසුවේය. නුමුත් ඔව්හු: ඔහු
කුරුසියෙහි ඇණගැසුව මැනවැයි
අතිශයින් මොරගැසුවෝය. පිලාත් 15
සමූහයා සතුටුකරන්ට කැමතිව, බරබ්බස්
ඔවුන්ට මුදාදී, යේසුස්වහන්සේට තළවා,
උන්වහන්සේ කුරුසියෙහි ඇණගසන්ට
භාරදුන්නේය.

## හේවායන්ගේ කවටකම්කිරීම

හේවායෝ උන්වහන්සේ *ප්‍රේතෝරියම් 16
නම් ශාලාව ඇතුළට ගෙනගොස්, මුළු
හේවා සමූදව රැස්කළෝය. ඔව්හු 17
උන්වහන්සේට රත්තිල් වස්ත්‍රයක් අඳවා,
කටු ඔටුන්නක් ගොතා උන්වහන්සේගේ
හිසෙහි තබා: යුදෙව්වරුන්ගේ රජ්ජුරුවෙනි, 18
ඔබට ශුභසිද්ධවේවයි කියා, උන්වහන්සේට
ආචාරකරන්ට පටන්ගත්තෝය. ඔව්හු 19
බට දණ්ඩකින් උන්වහන්සේගේ හිසට
ගසා, උන්වහන්සේට කෙළගසා, දණ
නමා උන්වහන්සේට නමස්කාරකළෝය.
ඔව්හු උන්වහන්සේට සරදම්කළ පසු, 20
රත්තිල් වස්ත්‍රය මුදා උන්වහන්සේගේම
වස්ත්‍ර අඳවා, කුරුසියෙහි ඇණගසන
පිණිස උන්වහන්සේ පිටතට ගෙනගියෝය.

## යේසුස්වහන්සේ ඇණගසනු ලැබීම

ඔව්හු අලෙක්සන්දර්ගෙත් රූපස්ගෙත් 21
පියවූ, පිටිසරින් ඇවිත් ඒ මග ගියාවූ
කිරේනියේ සීමොන් නම් කෙනෙකුට
උන්වහන්සේගේ කුරුසිය උසුලාගන යන
පිණිස ඔවුන් සමග යන්ට බලකළෝය.
ඔව්හු ඉස්කබලස්ථානය යන අර්ථ ඇති 22

*හෙවත්, රජගෙදර.

ගොල්ගොතා නම්වූ ඉඩමට උන්වහන්සේ
23 ගෙනගොස්, ගන්ධරස මිශ්‍රවූ මුද්‍රිකපානය
උන්වහන්සේට දුන්නෝය. නුමුත්
24 උන්වහන්සේ ඒ පිළිනොගත්සේක. ඔව්හු
උන්වහන්සේ කුරුසියෙහි ඇණගසා,
උන්වහන්සේගේ වස්ත්‍ර බෙදගනිමින්, එක
එකාට කුමක් ලැබේදෝ කියා ඒවා
25 ගැන දදු දමුවෝය. එය තුන්වෙනි පැය
විය, ඔව්හු උන්වහන්සේ කුරුසියෙහි ඇණ
26 ගැසුවෝය. යුදෙව්වරුන්ගේ රජය කියා
උන්වහන්සේගේ වරද පත්‍රය ලියා උඩින්
27 තබා තිබුණේය. ඔව්හු සොරු දෙදෙනෙකු,
එක්කෙනෙකු උන්වහන්සේගේ දකුණු
පැත්තෙහිද එක්කෙනෙකු වම් පැත්තෙහිද
උන්වහන්සේ සමග කුරුසියෙහි
29 ඇණගැසුවෝය. *මග යන්නෝ තමුන්ගේ
හිස් වන වනා උන්වහන්සේට
අපහාසකරමින්: ඔහෝ! දේවමාළිගාව
කඩාදමා තුන් දවසකින් ගොඩනගන්නාවූ
30 නුඹ, නුඹම ගැළවී කුරුසියෙන්
31 බැසපන්නැයි කීවෝය. නායක
පූජකයොත් ලියන්නන් සමග ඒ
ආකාරයෙන්ම තමුන් අතරේ
උන්වහන්සේට කවටකම්කරමින්: ඔහු
අනුන් ගැළවුවේය; තමාම ගළවාගන්ට
32 බැරිය. අප විසින් දැක අදහන පිණිස
ඉශ්‍රායෙල්ගේ රජවූ ක්‍රිස්තුස් දැන්
කුරුසියෙන් බසීවයි කීවෝය. උන්වහන්සේ
සමග කුරුසියෙහි ඇණගසනු ලැබූ අයද
උන්වහන්සේට නින්දකළෝය.

## යේසුස්වහන්සේගේ මරණය

33 හයවෙනි පැය පැමුණුණවිට, නවවෙනි
පැය දක්වා රට මුළුල්ලේ අන්ධකාරයක්
34 විය. නවවෙනි පැයේදී යේසුස්වහන්සේ:
එලොයි, එලොයි, ලාමා සබක්තානි
කියා මහත් හඬින් මොරගැසූසේක. එහි
අර්ථය නම්, මාගේ දෙවියනි, මාගේ
දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාද
යනුය. ළඟ සිටියවුන්ගෙන් සමහරෙක් 35
ඒ අසා: අන්න, ඔහු එලියාට
හඬගසනවායයි කීවෝය. කෙනෙක් 36
දිවගොස් මුදුහත්තක් කාඩියෙන් පොහවා
බට දණ්ඩක ගසා උන්වහන්සේට
බොන්ට දී: නිකම් සිටපල්ලා; මොහු
බස්වාගන්ට එලියා එන්නේදැයි බලමුයයි
කීවෝය. යේසුස්වහන්සේ මහත් හඬක් 37
නගා ආත්මය හළසේක. එවිට 38
දේවමාළිගාවේ තිරය ඉහළ පටන් පහළ
දක්වා දෙකඩව ඉරුණේය. උන්වහන්සේ 39
ඉදිරියෙහි සිටි සියයකට මුලාදැනියා
උන්වහන්සේ මෙසේ ආත්මය හළ බව
දුටු කල: සැබෑවටම මේ මනුෂ්‍යයා
දෙවියන්වහන්සේගේ පුත්‍රයායයි කීය.
ස්ත්‍රීවරුද දුරින් බලාසිටියෝය. ඔවුන් 40
අතරේ උන්වහන්සේ ගලීලයේ සිටි කල්හි
උන්වහන්සේ කැටුව ගියාවූ, උන්වහන්සේට 41
උපස්ථානකළාවූ මග්දලායේ මරියාත්
කුඩා යාකොබ්ගේද යෝසෙස්ගේද මවුවූ
මරියාත් සලෝමිත් උන්වහන්සේ සමග
යෙරුසලමට ආවාවූ වෙන බොහෝ
ස්ත්‍රීවරුත් සිටියෝය.

## භූමදානය

ඒ දවස සූදානම්කිරීමේ දවස වන සබත් 42
දවසට ප්‍රථම දවස බැවින්, සවස්වූ කල,
ගරුතර මන්ත්‍රීයෙක්වූ, දෙවියන්වහන්සේගේ 43
රාජ්‍යය ගැන බලා සිටියාවූ අරිමාතියේ
යෝසෙප් ඇවිත්, ධෛර්ය ගෙන පිලාත්
ළඟට ගොස්, යේසුස්වහන්සේගේ මිනිය
ඉල්ලුවේය. පිලාත් උන්වහන්සේ එපමණ 44
ඉක්මනට නැසුණු බවට පුදුමවී, සියයකට
මුලාදැනියා කැඳවා, උන්වහන්සේ මැරී
බොහෝ වේලා ගියේදැයි ඇසුයේය. ඒ 45
බව හෙතෙම සියයකට මුලාදැනියාගෙන්
දැනගෙන, යෝසෙප්ට මිනිය
භාරදුන්නේය. ඔහු හණ රෙද්දක් 46
මිලේට ගෙන, උන්වහන්සේ බාගෙන ඒ
රෙද්දෙහි ඔතා, පර්වතයක කපනලද
සොහොන් ගෙයක තබා, එහි දොරකඩට
ගලක් පෙරළා තැබුවේය. මග්දලායේ 47
මරියාද යෝසෙස්ගේ මවුවූ මරියාද
උන්වහන්සේ තැබූ ස්ථානය දුටුවෝය.

*නොයෙක් පුරාණ පිටපත්වල 28 වෙනි පදයක් ඇතුළත්කර තිබේ: මෙසේ උන්වහන්සේ වරදකාරයන් සමග ගණන්ගනු ලැබූසේක යන ශුද්ධ ලියවිල්ල සම්පූර්ණවිය.

## යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම

16 සබත් දවස පසුවූ කල මග්දලායේ
මරියාද යාකොබ්ගේ මවුවූ මරියාද
සලෝමිද ඇවිත් උන්වහන්සේ ආලේප-
කරන පිණිස සුවඳ ද්‍රව්‍ය මිලේට ගෙන,
2 සතියේ පළමුවෙනිද ඉතා උදය ඉර පෑවූ
කල සොහොන් ගේ ළඟට ආවෝය.
3 ඔව්හු: අපට සොහොන් ගෙයි දෙරකඩින්
ගල අහකට පෙරළා දෙන්නේ කවුදැයි
ඔවුනොවුන් අතරේ කථාකළෝය.
4 මක්නිසාද ඒක ඉතා මහත්ව තිබුණේය.
ඔව්හු ඇස් ඔසවා බැලූ කල ගල අහකට
5 පෙරළා තිබුණු බව දුටුවෝය. එකල
ඔව්හු සොහොන් ගෙට ඇතුල්ව, සුදු
සළුවක් පැළඳගත් තරුණයෙක් දකුණු
පැත්තේ ඉඳගන ඉන්නවා දැක, භීතවූහ.
6 ඔහු ඔවුන්ට කථාකොට: භීත
නොවෙල්ලා. තුඹලා වනාහි කුරුසියෙහි
ඇණගසනලද නාසරීය යේසුස්වහන්සේ
සොයන්නහුය. උන්වහන්සේ නැගුටුණු-
සේක; උන්වහන්සේ මෙහි නැත. මෙන්න,
7 ඔවුන් උන්වහන්සේ තැබූ ස්ථානය! නුමුත්
තුඹලා ගොස්: උන්වහන්සේ තුඹලාට
පළමුවෙන් ගලීලයට යනසේකැයි
කියාත් උන්වහන්සේ තුඹලාට කී ලෙස
එහිදී තුඹලා උන්වහන්සේ දකිනවා ඇත
කියාත් උන්වහන්සේගේ ගෝලයන්ටද
8 පේත්‍රුස්ටද කියාපල්ලායයි කීවේය. ඔව්හු
පිටතට ඇවිත්, සොහොන් ගෙයින් පලා-
ගියෝය; මක්නිසාද වෙවුලුම සහ
විස්මයත් ඔවුන් කෙරෙහි පැමිණ
තිබුණේය. ඔව්හු භයව සිටි බැවින්,
කිසිවෙකුට කිසිවක් නොකීවෝය.

## යේසුස්වහන්සේගේ ප්‍රකාශවීම් හා ස්වර්ගයට නැගීම

9 උන්වහන්සේ සතියේ පළමුවෙනිද
අලුයම් වේලේ නැගිටි කල පළමුකොට
මග්දලායේ මරියාට පෙනුණුසේක. ඈ
වනාහි උන්වහන්සේ විසින් යක්ෂයන්
සත්දෙනෙකු දුරුකරනු ලැබූ තැනැත්තීය.
10 ඈ ගොස් උන්වහන්සේ සමග සිටි අය
අඩමින් වැලපෙමින් සිටිද්දී ඔවුන්ට
දන්නුවාය. උන්වහන්සේ ජීවත්ව සිටින 11
බවද ඈ විසින් දක්නාලද බවද ඇසූ
විට ඔව්හු අවිශ්වාසකළෝය.
ඉන්පසු ඔවුන්ගෙන් දෙදෙනෙක් පිටිසරට 12
යන කල උන්වහන්සේ අන්‍යාකාරයකින්
ඔවුන්ට ප්‍රකාශවූසේක. ඔව්හු ගොස් 13
අනික් අයට දන්නුවෝය. ඔව්හු ඔවුන්වත්
විශ්වාස නොකළෝය.
පසුව උන්වහන්සේ එකොළොස් දෙන 14
කෑමට හාන්සිවී සිටියදී ඔවුන්ට පෙනී,
නැගුටුණායින් පසු තමන්වහන්සේව දුටු
අයව ඔවුන් විශ්වාස නොකළ නිසා,
ඔවුන්ගේ විශ්වාසය නැතිකමටත් සිත්
දැඩිකමටත් ඔවුන්ට දෙස්තැබූසේක.
උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: 15
තුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල
ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරපල්ලා.
අදහාගන්නාවූ *බව්තීස්මය ලබන්නාවූ 16
තැනැත්තේ ගළවනු ලබන්නේය; නුමුත්
අදහා නොගන්නා තැනැත්තේ වරදට
පත්කරනු ලබන්නේය. අදහන්නන්ට 17
ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ
නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය;
අන් භාෂාවලින් කථාකරන්නෝය;
සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය 18
වස ජාතියක් බීවත් එයින් කිසිසේත්
ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන්
රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු
සුවය ලබන්නෝයයි කීසේක.
මෙසේ ස්වාමිවූ යේසුස්වහන්සේ ඔවුන්ට 19
කථාකළ පසු, ස්වර්ගයට ඔසවාගනු
ලැබ, දෙවියන්වහන්සේගේ දකුණු
පැත්තෙහි වාඩිවූසේක. ඔව්හු පිටත්ව 20
ගොස්, සියලු තැන්වලම දේශනා-
කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමග
ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ
ලකුණුවලින් වචනය ස්ථිරකළසේක.
ආමෙන්.

---

*අවගාහනය.

# ශුද්ධවූ ලූක් විසින් ලියනලද ශුභාරංචිය

## ප්‍රාරම්භය

1 අති උත්තමවූ තියෝපිලස්නි,
පටන්ගැන්මේ සිට ඇසින් දුටුවාවුන්
හා වචනයේ සේවකයන්ව සිටි අය විසින්
2 අපට දන්වා දුන් ප්‍රකාරයට, අප අතරෙහි
ඉෂ්ටවී තිබෙන කාරණා ගැන
කථාවස්තුවක් රචනාකරන්ට බොහෝ
දෙනෙකු විසින් පටන්ගෙන තිබෙන
3 බැවින්, ඔබ යමක් ගැන ඉගනීම ලැබූයෙහිද
ඒ කාරණාවල සත්‍යකම ඔබ විසින්
4 දැනගන්නා පිණිස, මමත් මුල පටන්
ක්‍රමයට සියලු කාරණා හරියාකාර
විමසා බලා, ඒ දේ පිළිවෙළින් ඔබට
ලියා එවීම සුදුසුයයි සිතුවෙමි.

## *යොහන් බව්තීස්තගේ උප්පැත්තය කලින් දන්වීම

5 යුදයේ රජවූ හෙරොද්ගේ කාලයේදී
අබියාගේ පන්තියෙහි සෙකරියස් නම්
එක්තරා පූජකයෙක් සිටියේය. ඔහුට
ආරොන්ගේ දූවරුන්ගෙන් භාර්යාවක්
6 වූවාය, ඇගේ නම එලිසබෙත්ය. ඔවුන්
දෙදෙනාම ස්වාමීන්වහන්සේගේ සියලු
ආඥා හා නියෝගවල නිර්දෝෂව
හැසිරෙමින්, දෙවියන්වහන්සේ ඉදිරියෙහි
7 ධර්මිෂ්ඨව සිටියෝය. එලිසබෙත් වඳ
බැවින් ඔවුන්ට දරුවෙක් නොවීය, ඔවුන්
දෙදෙනාම වයස්ගතව සිටියෝය.
8 තවද ඔහු තමාගේ පන්තියේ ක්‍රමය
ලෙස දෙවියන්වහන්සේ ඉදිරියෙහි පූජක
9 මෙහෙය කරන කල, ස්වාමීන්වහන්සේගේ
ශුද්ධස්ථානයට ඇතුල්ව සුවඳ දුම්
ඔප්පුකිරීමට වාරය පූජකයාගේ නිලයේ
සිරිත ලෙස පසඇට දැමීමෙන් ඔහුට
වැටුණේය. සුවඳ දුම් ඔප්පුකරන වේලාවේ 10
මුළු සමූහයා යාච්ඤාකරමින් පිටත
සිටියෝය. එවිට දුම් පූජාසනයට දකුණු 11
පැත්තේ ස්වාමීන්වහන්සේගේ දූතයෙකු
සිටිනවා ඔහුට පෙනුණේය. සෙකරියස් 12
ඔහු දැක කැලඹී භයපත්වූයේය. නුමුත් 13
දේවදූතයා ඔහුට කථාකොට: සෙකරියස්,
භය නොවන්න. මක්නිසාද තුඹේ
කන්නලව්ව අසනලද්දේය, තුඹේ
භාර්යාවවූ එලිසබෙත් තුඹ නිසා
පුත්‍රයෙකු වදන්නීය, ඔහුට යොහන්
යන නම තබාපන්න. තුඹට ප්‍රීතියත් 14
සන්තෝෂයත් වන්නේය; බොහෝ
දෙනෙක් ඔහුගේ ඉපදීමට ප්‍රීතිවන්නෝය.
මක්නිසාද ඔහු ස්වාමීන්වහන්සේ 15
ඉදිරියෙහි උත්තමයෙක් වන්නේය,
ඔහු මුද්‍රිකපානයවත් මද්‍යපානයවත්
නොබොන්නේය; මවු කුස පටන්ම ඔහු
ශුද්ධාත්මයෙන් පූර්ණව සිටින්නේය.
ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් බොහෝ 16
දෙනෙකු ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ වෙතට හරවන්නේය. ඔහු 17
පියවරුන්ගේ සිත් දරුවන් දෙසටත්
අකීකරුවන් ධර්මිෂ්ඨයන්ගේ ඥානයෙහි
හැසිරීමටත් හරවන පිණිසද, සූදානම්වූ
සෙනඟක් ස්වාමීන්වහන්සේට පිළියෙළ
කරන පිණිසද, එලියාගේ ආත්මයෙන්ද
බලයෙන්ද උන්වහන්සේට පෙරටුව
යන්නේයයි කීවේය. සෙකරියස්ද: මම 18
මේක කුමකින් දැනගනිම්ද? මක්නිසාද
මම මහල්ලෙක්ය, මාගේ භාර්යාවත්
වයස්ගතයයි දේවදූතයාට කීවේය.
දේවදූතයා උත්තරදෙමින්: මම දෙවියන්- 19
වහන්සේ ඉදිරියෙහි සිටින්නාවූ
ගාබ්‍රියෙල්ය; තුඹ සමග කථාකරන්ටත්
මේ යහපත් ආරංචිය තුඹ වෙත

*අවගාහක යොහන්ගේ

20 ගෙනෙන්ටත් එවනලද්දෙමි. බලව. නියම
කාලයට සම්පූර්ණවන්නාවූ මාගේ වචන
නුඹ විශ්වාස නොකළ බැවින්.
මේ කාරණා සිද්ධවන දවස දක්වා.
නුඹ කථාකරන්ට නොහැකිව
21 නිශ්ශබ්දවන්නෙහියයි කීවේය. සෙකරියස්
එන තෙක් බලා සිටි සෙනඟ
දේවමාළිගාවේ ඔහුගේ පමාවීම ගැන
22 මවිතවූවෝය. ඔහු පිටත ආ කල ඔවුන්ට
කථාකරන්ට ඔහුට බැරිවිය. ඔහු
දේවමාළිගාවේදී දර්ශනයක් දුටු බව
ඔව්හු දැනගත්තෝය: ඔහු ගොළුව ඔවුන්ට
23 සංඥකරමින් සිටියේය. තවද තමාගේ
මෙහෙකිරීමේ දවස් සම්පූර්ණවූ කල ඔහු
ස්වකීය ගෙදරට ගියේය.
24 ඒ දවස්වලට පසු ඔහුගේ භාර්යාවූ
25 එලිසබෙත් ගර්භිණීව: මනුෂ්‍යයන් අතරේ
වූ මාගේ නින්දාව පහකරන පිණිස
ස්වාමීන්වහන්සේ මා දෙස බැලූ
දවස්වලදී මට මෙසේ කරුණාකළසේකැයි
කියා. පස් මසක් සැඟවී සිටියාය.

## යේසුස්වහන්සේගේ උප්පත්තිය කලින් දන්වීම

26 සවෙනි මාසයේදී. ගලීලයේ නාසරෙත්
නම් නුවරක විසූ. දාවිත්ගේ වංශයෙහිවූ
යෝසෙප් නම් මනුෂ්‍යයෙකුට විවාහබස්
27 දී සිටි කන්‍යාවකු වෙතට දෙවියන්-
වහන්සේ වෙතින් ගාබ්‍රියෙල් නම් දූතයා
යවනලද්දේය: ඒ කන්‍යාවගේ නාමය
28 මරියාය. ඔහු ඈ සිටි තැනට පැමිණ:
බොහෝ කරුණාව ලැබූ තැනැත්තිය.
ශුභසිද්ධවේවා. ස්වාමීන්වහන්සේ නුඹ
29 සමග සිටිනසේකැයි කීවේය. නුමුත් ඈ
ඔහුගේ කීමට බොහෝසේ කැලඹී.
මේ කෙබඳුවූ ආචාරයක්ද කියා
30 කල්පනාකරමින් සිටියාය. දේවදූතයා
ඈට කථාකොට: මරියා. භය නොවන්න.
මක්නිසාද නුඹට දෙවියන්වහන්සේගෙන්
31 කරුණාව ලැබුණේය. බලව, නුඹ
ගර්භිණීව පුත්‍රයෙකු වදන්නීය.
උන්වහන්සේට යේසුස් යන නාමය
32 තබාපන්න. උන්වහන්සේ උතුම්වූ
මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝයයි
කියනු ලබනසේක. උන්වහන්සේගේ
පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිවූ
ස්වාමීන්වහන්සේ උන්වහන්සේට දෙන-
සේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය 33
කෙරෙහි සදාකාලේටම රජකම්කරන-
සේක: උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර
නොවන්නේයයි කීයේය. එවිට මරියා 34
දේවදූතයාට කථාකොට: මා පුරුෂයෙකු
නැඳින සිටින බැවින්. මේක වෙන්නේ
කෙසේදැයි කීවාය. දේවදූතයා ඈට 35
උත්තරදෙමින්: ශුද්ධාත්මයාණන්වහන්සේ
නුඹ කෙරෙහි පැමිණෙනසේක.
මහෝත්තමයාණන්ගේ ආනුභාවද නුඹ
වසාගන්නේය. ඒ නිසා උපදින්ට සිටින
තැනැත්තේ ශුද්ධය. දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණෝයයි කියනු ලබනසේක.
බලව. නුඹට නෑවූ එලිසබෙත් ඈගේ 36
මහලු වයසේදී පුත්‍රයෙකු පිළිසිඳ ඉන්නීය.
වඳීයයි කියන ලද ඈට දැනට
සවෙනි මාසයය. මක්නිසාද දෙවියන්- 37
වහන්සේගෙන් වූ කිසි වචනයක් බල
රහිත නොවන්නේයයි කීවේය. මරියාද: 38
බැලුව මැනව. ස්වාමීන්වහන්සේගේ දාසිය;
ඔබගේ වචනය ලෙස මට වේවයි කීවාය.
එවිට දේවදූතයා ඈ කෙරෙන් ගියේය.

## මරියා එලිසබෙත් බලන්ට යෑම. මරියාගේ ප්‍රශංසා ගීය

ඒ දවස්වලදී මරියා නැඟිට කඳු රට 39
කරා. යූදයේ නුවරකට. වහාම ගොස්.
සෙකරියස්ගේ ගෙට ඇතුල්ව. එලිසබෙත්ට 40
ආචාරකළාය. එලිසබෙත් මරියාගේ 41
ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි
දරුවා පැන නැංගේය. එවිට එලිසබෙත්
ශුද්ධාත්මයෙන් පූර්ණව. මහත් 42
ශබ්දයකින් හඬනගා කියන්නී: නුඹ
ස්ත්‍රීන් අතරෙහි ආශීර්වාදලද්දීය, නුඹේ
ගර්භයේ ඵලයද ආශීර්වාදලද්දේය.
මාගේ ස්වාමීන්වහන්සේගේ මෑණියන් 43
මා ළඟට පැමිණීම කෙසේ සිද්ධවීද?
මක්නිසාද නුඹේ ආචාර ශබ්දය මාගේ 44
කන්වල වැටුණු කෙණෙහිම. මාගේ
කුසෙහි දරුවා ප්‍රීතියෙන් පැන නැංගේය.
විශ්වාසකළ තැනැත්තී ආශීර්වාදලද්දීය: 45
මක්නිසාද ස්වාමීන්වහන්සේ කෙරෙන්
ඈට කියනලද දේ සම්පූර්ණවන්නේයයි

46 කීවාය. එවිට මරියා කියන්නී:
මාගේ සිත ස්වාමීන්වහන්සේ වර්ණනා
කෙරෙයි,
47 මාගේ ආත්මයද මාගේ ගැළවුම්කාර
දෙවියන්වහන්සේ කෙරෙහි
ප්‍රීතිමත්විය.
48 මක්නිසාද උන්වහන්සේ ස්වකීය
දසියගේ පහත්කම බැලූසේක.
බලව, මෙතැන් පටන් සියලු
පරම්පරාවෝ මට ආශීර්වාදලද්දීයයි
කියන්නෝය.
49 මක්නිසාද බලවත්වූ තැනන්වහන්සේ
මට මහත් දේ කළසේක;
උන්වහන්සේගේ නාමය ශුද්ධය.
50 උන්වහන්සේගේ කරුණාව
උන්වහන්සේට භයවන්නන් කෙරෙහි
පරම්පරාවෙන් පරම්පරාවට පවතියි.
51 උන්වහන්සේ ස්වකීය බාහුවෙන් බලය
පෑසේක;
තමුන්ගේ සිත්වල කල්පනාවෙන්
අහංකාරීවූ අය විසිරෙවූසේක.
52 උන්වහන්සේ අධිපතීන් සිංහාසනවලින්
හෙළා,
පහත් අය උසස්කළසේක.
53 බඩගිනිවූවන් යහපත් දෙයින් තෘප්තියට
පමුණුවා,
වස්තුකාරයන් හිස් අතින් හැරියසේක.
54 උන්වහන්සේ අපේ පියවරුන්ට කී ලෙස,
ආබ්‍රහම්ටද ඔහුගේ වංශයටද
55 සදකල්ම ස්වකීය කරුණාව සිහිකරන
අදහසින්,
තමන් මෙහෙකරුවූ ඉශ්‍රායෙල්ට
පිහිටවූසේකැයි කීවාය.

## *යොහන් බව්තීස්තගේ උප්පැන්තය. සෙකරියස්ගේ ගීය

56 මරියා ඈ සමග තුන් මසක් පමණ
වාසයකොට, තමාගේම ගෙදරට හැරී
ගියාය.
57 එලිසබෙත්ගේ වදන කාලය සම්පූර්ණවූ
58 කල ඈ පුත්‍රයෙකු වැදුවාය. ඇගේ
අසල්වාසියෝද නෑයෝද ස්වාමීන්වහන්සේ
ඈ කෙරෙහි ස්වකීය කරුණාව
විශාලකළ බව අසා, ඈ සමග
ප්‍රීතිවූවෝය. තවද අටවෙනිද දරුවා 59
චර්මඡේදනයකරන පිණිස ඔව්හු ඇවිත්,
ඔහුගේ පියාගේ නාමය ලෙස ඔහුට
සෙකරියස්යයි නම් තබන්ට හැදුවෝය.
නුමුත් ඔහුගේ මවු උත්තරදෙමින්: එසේ 60
නොවේ; ඔහුට යොහන් යන නාමය
තබන්ට ඕනෑයයි කීවාය. නුඹේ නෑයන් 61
අතරේ මේ නාමය ඇති කෙනෙක් නැතැයි
ඔව්හු ඈට කීවෝය. ඔහුගේ පියා ඔහුට 62
මොන නමක් තබන්ට කැමැත්තේද
කියා දනගන්නා පිණිස ඔව්හු ඔහුට
සංඥකළෝය. ඔහු ලියන ලෑල්ලක් 63
ඉල්ලාගෙන: ඔහුගේ නම යොහන්යයි
ලියුවේය. සියල්ලෝද මවිතවූවෝය.
එකෙණෙහිම ඔහුගේ මුඛය ඇරී, දිවද 64
ලිහී, ඔහු දෙවියන්වහන්සේට
ප්‍රශංසාකරමින්, කථාකෙළේය. ඔවුන් 65
අවට විසූ සියල්ලන් කෙරෙහි භය
පැමිණියේය. මේ සියලු කීම් යුදයෙහි
මුළු කඳු රටේ පතළවී ගියේය. ඒ ඇසූ 66
සියල්ලෝ ඒ දේ තමුන්ගේ සිත්වල
තබාගෙන: එසේ නම් මේ දරුවා කෙබඳු
කෙනෙක් වන්නේදැයි කීවෝය. මක්නිසාද
ස්වාමීන්වහන්සේගේ හස්තය ඔහු සමග
වූයේය.
ඔහුගේ පියවූ සෙකරියස් 67
ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව
අනාගතවචන කියමින්:
ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්- 68
වහන්සේට ප්‍රශංසාවේවා;
මක්නිසාද උන්වහන්සේ ස්වකීය
සෙනඟ බලා, ඔවුන්ට මිදීම
සාදදුන්සේක.
ලෝකයේ පටන්ගැන්මෙහි සිට විසූ 69
ස්වකීය ශුද්ධවූ අනාගතවක්තෘ-
වරුන්ගේ මුඛයෙන් කියෙවූ ලෙස
අපේ සතුරන්ගෙන්ද අප කෙරේ 70
වෛර බැඳගත් සියල්ලන් අතින්ද
අප ගළවන්නාවූ අහක් 71
තමන් දසවූ දාවිත්ගේ වංශයෙන්
අපට නැඟුටුවාදුන්සේක.
මෙසේ උන්වහන්සේ අපේ සතුරන්ගේ 72
අත්වලින් අප ගළවා,

*අවගාහක යොහන්ගේ.

අපේ සියලු දවස්වල භයක් නැතුව
උන්වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින්ද
ධර්මිෂ්ඨකමින්ද
73 උන්වහන්සේට සේවයකරන්ට වර
දෙන පිණිස,
74 අපේ පියවූ ආබ්‍රහම්ට දිවුළ දිවිරීම
වන
75 තමන්ගේ ශුද්ධවූ ගිවිසුම සිහිකොට,
අපේ පියවරුන්ට කරුණාව
පෙන්වනසේක.
76 එසේය, දරුව, තුඹ
මහෝත්තමයාණන්ගේ
අනාගතවක්තෘයයි කියනු
ලබන්නෙහිය.
මක්නිසාද තුඹ ස්වාමීන්වහන්සේගේ
මාර්ග පිළියෙළකරන්ට,
77 එනම් අපේ දෙවියන්වහන්සේගේ
දයාබරකම කරණකොටගෙන
උන්වහන්සේගේ සෙනඟට පව්
කමාවීමෙන් ලැබෙන ගැළවීම දන්වන්ට,
78 උන්වහන්සේට පෙරටුව යන්නෙහිය.
ඒ දයාබරකමෙන් අඳුරෙහිද මරණ
සෙවණෙහිද සිටින්නන්ට එළිය දෙන
පිණිසත්,
79 අපේ පාද සමාදාන මාර්ගයට
පමුණුවන පිණිසත්,
ඉහළින් අරුණාලෝකය අප කරා
පහළවන්නේයයි කීයේය.
80 දරුවා වැඩී, ආත්මයෙන් ශක්තිමත්ව,
ඉශ්‍රායෙල්ට තමා ප්‍රකාශවන දවස දක්වා
වනාන්තර ස්ථානවල සිටියේය.

## යේසුස්වහන්සේගේ උත්පත්තිය

2 තවද ඒ දවස්වලදී මුළු ලෝකයාගේ
ලේඛනයක් සෑදීමට කායිසර්
අගොස්තුස් කෙරෙන් නියෝගයක්
2 නිකුත්ව ගියේය. මේ වනාහි කිරේනියස්
සිරියාවේ ආණ්ඩුකාරයාව සිටියදී කළ
3 පළමුවෙනි ලේඛනයයි. සියල්ලෝ
ලියවෙන්ට තම තමුන්ගේ නුවරවලට
4 ගියෝය. යෝසෙප්ද දාවිත්ගේ වංශයටත්
5 පෙළපතටත් අයිති බැවින්, තමාට
විවාහබස් දුන් ගර්භිණීව සිටි මරියා
සමග ලියවෙන්ට, ගලීලයෙහිවූ නාසරෙත්
නුවරින් පිටත්ව යූදයේ බෙත්ලෙහෙම්
නම් දාවිත්ගේ නුවරට ගියේය. තවද ඔවුන් 6
එහි සිටියදී ඇගේ වදන කාලය
සම්පූර්ණවිය. ඈ කුලුදුල් පුත්‍රයා වදා, 7
රෙදිවලින් ඔතා, තවාතැන් ගෙයි ඔවුන්ට
ඉඩ නොතිබුණු බැවින් ගවයන් කන
ඔරුවක බැවුවාය.
තවද එම රටෙහි එඬේරු රෑ යාමයෙන් 8
යාමට තමුන්ගේ බැටළු රැළ ප්‍රවේසම්-
කරමින් පිට්ටනියෙහි සිටියෝය.
එවිට ස්වාමීන්වහන්සේගේ දූතයෙක් 9
ඔවුන් ළඟ සිටියේය, ස්වාමීන්වහන්සේගේ
තේජස ඔවුන් අවට බැබළුණේය. ඔව්හු
අතිශයින් භයපත්වූහ. දේවදූතයා ඔවුන්ට 10
කථාකොට: භයනොවෙල්ලා; බලව, මුළු
සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත්
ආරංචි තුඹලාට ගෙනෙමි. මක්නිසාද 11
ස්වාමිවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක්
තුඹලාට දාවිත්ගේ නුවර අද උපන්සේක.
රෙදිවලින් ඔතා ගවයන් කන ඔරුවක 12
බාවා ඉන්න ළදරුවෙක් තුඹලාට
සම්බවන්නේය; මේක තුඹලාට ලකුණයයි
කීවේය. එකෙණෙහිම ඒ දේවදූතයා සමග 13
මහත් ස්වර්ගීය සේනා සමූහයක්
දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින්:
ඉතා උසස්තැන්හි දෙවියන්වහන්සේට 14
මහිමයද
පොළොවෙහි උන්වහන්සේට ප්‍රියවූ
මනුෂ්‍යයන් අතරෙහි සමාදානයද
වේවයි
කීවෝය.
තවද දේවදූතයන් ඔවුන් කෙරෙන් 15
ස්වර්ගයට ගිය කල එඬේරු ඔවුනොවුන්
කථාකොට: දැන්ම බෙත්ලෙහෙමට
ගොස් ස්වාමීන්වහන්සේ විසින් අපට
දන්වනලද සිද්ධවූ මේ දෙය බලමුව
කියා, වහාම ගොස්, මරියාද යෝසෙප්ද 16
ගවයන් කන ඔරුවේ බාවා උන්
ළදරුවාද දුටුවෝය. ඔව්හු ඒ දැක, මේ 17
ළදරුවා ගැන තමුන්ට කී දේ දන්වූවෝය.
ඒ ඇසූ සියල්ලෝ තමුන්ට එඬේරුන් 18
විසින් කියනලද දේවලට පුදුමවූවෝය.
නුමුත් මරියා ඒ සියලු කීම් 19
සිතේ තබාගෙන මෙනෙහිකළාය. එඬේරු 20
වනාහි තමුන්ට කී ලෙසම ඇසූ දුටු
සියල්ල ගැන දෙවියන්වහන්සේට

ගෞරවකරමින්ද ප්‍රශංසාකරමින්ද හැරී
ගියෝය.
21 උන්වහන්සේ චර්මඡේදනයකිරීමට අට
දවස සම්පූර්ණවූ කල, උන්වහන්සේ
කුසෙහි පිළිසිඳෙන්ට පළමුවෙන් දේව-
දූතයා විසින් කියනලද යේසුස් යන
නාමය උන්වහන්සේට තබනලද්දේය.

## යේසුස්වහන්සේ දේවමාළිගාවෙහි ඔප්පුකරනු ලැබීම

22 මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ප්‍රකාරයට
ඔවුන්ගේ පවිත්‍රවීමේ දවස් සම්පූර්ණවූ
කල: කුලුඳුල්වූ සියලු පිරිමි ස්වාමීන්-
වහන්සේට කැපයයි කියනු ලබන්නෝයයි
23 ස්වාමීන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ලියා
තිබෙන ලෙස, උන්වහන්සේ ස්වාමීන්-
24 වහන්සේට ඔප්පුකරන පිණිසද, ස්වාමීන්-
වහන්සේගේ ව්‍යවස්ථාවෙහි කියා
තිබෙන හැටියට කොබෙයියන් දෙදෙනෙකු
හෝ පරෙවි පැටවුන් දෙදෙනෙකු හෝ
පූජාකරන පිණිසද, ඔව්හු උන්වහන්සේ
යෙරුසලමට ගෙනාවෝය.

## සිමියොන් සහ ආනා

25 බලව, යෙරුසලමෙහි සිමියොන් නම්
මනුෂ්‍යයෙක් සිටියේය; මේ මනුෂ්‍යයා
ඉශ්‍රායෙල්ගේ සැනසීම බලා සිටියාවූ
ධර්මිෂ්ඨවූ භක්තිවන්තවූ කෙනෙක්ය.
ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහු කෙරෙහි
26 වූසේක. ස්වාමීන්වහන්සේගේ ක්‍රිස්තුස්-
වහන්සේ දකින්ට පළමුවෙන් ඔහු
මරණය නොදක්නේය කියා ශුද්ධාත්ම-
යාණන්වහන්සේ විසින් ඔහුට එළිදරව්-
27 කර තිබුණේය. ඔහු ආත්මයාණන්
කරණකොටගෙන දේවමාළිගාවට
ආවේය. ළදරු යේසුස්වහන්සේට
ව්‍යවස්ථාවේ සිරිත ලෙස කරන පිණිස
මවුපියන් විසින් උන්වහන්සේ ගෙනා
28 විට, ඔහු උන්වහන්සේ දෑතින් වඩා-
ගෙන දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින්
කියනුයේ:
29 ස්වාමීන්වහන්ස, දැන් ඔබගේ වචනය
ලෙස
ඔබගේ දසයා සමාදනයෙන් යන්ට
හරිනසේක;
මක්නිසාද අන්‍යජාතීන්ට එළිදරව් 30
කිරීමට ආලෝකයක්ද
ඔබගේ ඉශ්‍රායෙල් සෙනඟගේ තේජසදවූ
සියලු මනුෂ්‍යයන් ඉදිරියෙහි ඔබ 31
විසින් පිළියෙළකළාවූ
ගැළවීම මාගේ ඇස්වලින් දුටිමියි 32
කීවේය. උන්වහන්සේ ගැන කී 33
කාරණාවලට උන්වහන්සේගේ පියාද
මෑණියෝද මවිතවෙමින් සිටියෝය.
සිමියොන් ඔවුන්ට ආශීර්වාදකර, 34
උන්වහන්සේගේ මවුවූ මරියාට
කථාකොට: බලව, මේ ළදරුවා
ඉශ්‍රායෙල්හි බොහෝ දෙනෙකුගේ වැටීම
පිණිසත් නැගිටීම පිණිසත් විරුද්ධව
කථාකරනු ලබන ලකුණක් පිණිසත්
නියමවී සිටියි; එසේය, නුඹේම ආත්මයට 35
කඩුවකින් අනිනු ලැබේ; මෙසේ වන්නේ
බොහෝ දෙනෙකුගේ සිත්හි කල්පනා
එළිදරව්වන පිණිසයයි කීවේය. තවද 36
ආෂේර්ගේ ගෝත්‍රයේ ඵානුයෙල්ගේ දූවූ,
ඉතා වයස්ගතවූ, ආනා නම්
අනාගතවක්ත්‍රියක් සිටියාය. ඈ
කන්‍යාවස්ථාවෙහි සිට සත් අවුරුද්දක්
ස්වාමි පුරුෂයෙකු සමග වාසයකළාය,
අවුරුදු අසූහතරක්ම ඈ වැන්දඹුවක්ව 37
සිටියාය; ඈ දේවමාළිගාවෙන් අහක්ව
නොගොස්, රෑ දවල් දෙක්හි නිරාහාරයෙන්
ඉඳ යාච්ඤාකරමින් නමස්කාරකළාය.
ඈද ඒ පැයෙහිම ඇවිත් දෙවියන්- 38
වහන්සේට ස්තුතිකොට, යෙරුසලමේ
මිදීම ගැන බලාසිටි සියලුදෙනාට
උන්වහන්සේ ගැන කථාකළාය.

## යේසුස්වහන්සේගේ ළමා කාලය

ඔව්හු ස්වාමීන්වහන්සේගේ ව්‍යවස්ථාවේ 39
ප්‍රකාරයට සියල්ල ඉෂ්ටකළ පසු,
ගලීලයෙහිවූ නාසරෙත් නම් තමුන්ගේම
නුවරට හැරී ගියෝය.
ළදරුවා වැඩී, ශක්තිමත්ව, ප්‍රඥාවෙන් 40
පූර්ණවූසේක. දෙවියන්වහන්සේගේ
කරුණාවද උන්වහන්සේ කෙරෙහි විය.
උන්වහන්සේගේ මවුපියෝ අවුරුදු පතා 41
පාස්කු මංගල්‍යය පිණිස යෙරුසලමට
ගියෝය. උන්වහන්සේට දොළොස් අවුරුදු 42
වයස්වූ කල ඔව්හු මංගල්‍ය සිරිත් ලෙස

43 ගියෝය. ඔවුන් නියම දවස් ගතකොට
හැරී එද්දී, යේසුස් නම් ළමයා
යෙරුසලමෙහි නැවතී සිටිසේක; නුමුත්
උන්වහන්සේගේ මවුපියෝ ඒ බව නොදැන,
44 උන්වහන්සේ ගමන් යන අය සමගයයි
සිතා, දවසක ගමන් ගොස්, නෑයන්ද
අඳුනන්නවුන්ද අතරෙහි උන්වහන්සේ
45 සෙවුවෝය. උන්වහන්සේ සම්බ නුවූ
බැවින්, ඔව්හු උන්වහන්සේ සොයමින්
46 යෙරුසලමට ආපසු ගියෝය. තවද
තුන් දවසකට පසු, උන්වහන්සේ
දේවමාළිගාවෙහි පණ්ඩිතයන් මැද
වාඩිවී, ඔවුන් කියන දේ අසමින්ද
ඔවුන්ගෙන් ප්‍රශ්න විචාරමින්ද ඉන්නවා
47 ඔව්හු දුටුවෝය. උන්වහන්සේගේ බස්
ඇසූ සියල්ලෝම උන්වහන්සේගේ නුවණ
හා උත්තර ගැන විස්මිත වූහ.
48 ඔව්හු උන්වහන්සේ දැක මවිතවූවෝය.
උන්වහන්සේගේ මෑණියෝ: පුත්‍රය, කුමක්
නිසා අපට මෙසේ කෙළෙහිද? බලව,
නුඹේ පියාද මමද සෝකවෙමින් නුඹ
49 සෙවුවෙමුයයි කීවාය. එවිට උන්වහන්සේ:
නුඹලා මා සෙවුවේ මක්නිසාද? *මාගේ
පියාණන්වහන්සේගේ ගෘහයෙහි මා
සිටින්ට ඕනෑ බව නුඹලා දැන සිටියේ
50 නැද්දැයි ඔවුන්ට කීසේක. නුමුත්
උන්වහන්සේ ඔවුන්ට කී කීම ඔවුන්
51 තේරුම්ගත්තේ නැත. උන්වහන්සේ ඔවුන්
සමග ගොස් නාසරෙත්ට පැමිණ,
ඔවුන්ට යටත්ව සිටිසේක. උන්වහන්සේගේ
මෑණියෝ මේ සියලු කීම් සිතේ
තබාගත්තාය.
52 යේසුස්වහන්සේ ප්‍රඥාවෙන් හා
උස මහතින්ද දෙවියන්වහන්සේගෙන්
මනුෂ්‍යයන්ගෙන් කරුණාවෙහිද වැඩුණු-
සේක.

## †යොහන් බව්තීස්තගේ මෙහෙය

3 පොන්තියුස් පිලාත් යුදයේ
ආණ්ඩුකාරයාවද, හෙරොද් ගලීලයට
අධිපතියාවද, ඔහුගේ සහෝදරවූ පිලිප්
ඉතුරයටත් ත්‍රකොනිතිස් නම්ලත්
පළාතටත් අධිපතියාවද, ලූසානියස්
අබිලේනියට අධිපතියාවද, අන්නස් සහ
කායාඵස් උත්තම පූජකයෝවද සිටි
කාලයෙහි, තිබේරියස් කායිසර් රාජ්‍යයට 2
පැමිණි පසළොස්වෙනි අවුරුද්දෙහි,
දෙවියන්වහන්සේගේ වචනය වනයෙහිදී
සෙකරියස්ගේ පුත්‍රවූ යොහන් වෙතට
පැමිණියේය.

ස්වාමීන්වහන්සේගේ මාර්ගය පිළියෙළ 3
කරව්,
උන්වහන්සේගේ මාවත් සමතලා
කරව්.
සෑම මිටිතැන් පුරවනු ලබන්නේය, 4
සෑම කඳු සහ හෙල් පහත්කරනු
ලබන්නේය;
ඇද තැන් ඇද හරිනු ලැබ,
රළු මාවත් සමතලාවන්නේය;
සියලු මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේගේ 5
ගැළවීම දකින්නෝයයි

වනයෙහි හඬගසන්නෙකුගේ ශබ්දයය
කියා අනාගතවක්තෘවූ යෙසායාගේ
වචන සඳහන්වූ පොතෙහි ලියා
තිබෙන ලෙස, යොහන් පව්කමාව 6
පිණිස පසුතැවිල්ලේ *බව්තීස්මය
දේශනාකරමින්, යොර්දන් වටකර මුළු
පළාතට ආවේය.

එකල ඔහු තමාගෙන් *බව්තීස්මය 7
ලබන්ට ආවාවූ සමූහයන්ට කථාකොට:
පොළොං වංශය, පැමිණෙන උදහසින්
පලායන්ට නුඹලාට අවවාද කළේ කවුද?
එබැවින්–ආබ්‍රහම් අපගේ පියාණෝයයි 8
සිතින් කියන්ට පටන් නොගෙන පසු-
තැවිල්ලට සුදුසු ඵල උපදවාපල්ලා.
මක්නිසාද මේ ගල්වලින් ආබ්‍රහම්ට
දරුවන් උපදවාදෙන්ට දෙවියන්වහන්සේට
පුළුවනැයි නුඹලාට කියමි. තවද දැනටම 9
පොරොව ගස් මුලට තබා තිබේ.
එබැවින් හොඳ ඵල නොදරන සියලු
ගස් කපනු ලැබ ගින්නෙහි දමනු
ලැබේයයි කීවේය. එවිට සමූහයෝ: 10
එසේවී නම් අප විසින් කුමක් කරන්ට
ඕනෑදැයි ඔහුගෙන් ඇසුවෝය. ඔහු 11
උත්තරදෙමින්: අඳනා දෙකක් ඇති අය
නැති අයට දේවා; කෑම ඇති අයද
එසේම කෙරේවයි ඔවුන්ට කීවේය. සුංගම් 12

*හෙවත්: මාගේ පියාණන්වහන්සේගේ කටයුතුවල යෙදී සිටින්ට ඕනෑ බව.

†අවගාහක යොහන්ගේ.

*අවගාහනය.

අයකරන්නෝද *බව්තීස්මය ලබන්ට
ඇවිත්: ආචාරිනි, අප විසින් කුමක්
කරන්ට ඕනෑදැයි ඔහුගෙන් ඇසුවෝය.
13 තුඹලාට නියමකර තිබෙන පමණට
වඩා අයකර නොගනිල්ලායයි ඔහු
14 ඔවුන්ට කීයේය. භේවායෝද: ඉතින් අප
විසින් කරන්ට ඕනෑ මොකක්දැයි
ඇසුවෝය. කාටවත් බලාත්කාර
නොකරල්ලා, අයුත්තෙන් යමක්
අයකරනොගනිල්ලා; තුඹලාගේ කුලී
පමණින් සතුටුවෙයල්ලායයි ඔහු ඔවුන්ට
කීවේය.
15 සෙනඟ බලාපොරොත්තුවෙන් සිටි
අතරද සියල්ලන් යොහන් ගැන, ඔහු
ක්‍රිස්තුස්වහන්සේ දෝහෝයි සිතින්
කල්පනාකරමින් සිටි අතරද යොහන්
16 සියල්ලන්ට උත්තරදෙමින්: මම වනාහි
†වතුරෙන් බව්තීස්මකරමි; නුමුත් මට වඩා
බලවත්තයා එනසේක, උන්වහන්සේගේ
වහන්වල පටිය මුදන්ටවත් මම නොවටිමි.
උන්වහන්සේ ‡ශුද්ධාත්මයාණන්ගෙන්ද
§ගින්නෙන්ද තුඹලා *බව්තීස්මකරන-
17 සේක. කමත හොඳහැටි පවිත්‍රකරන්ටත්
ධාන්‍ය තමන් අටුවට රැස්කරන්ටත්
උන්වහන්සේගේ කුල්ල උන්වහන්සේගේ
අතේය; නුමුත් බොල් නොනිවෙන
ගින්නෙන් දවනසේකැයි කීවේය.
18 මෙසේ වෙනත් බොහෝ අනුශාසනා-
වලින් ඔහු සෙනඟට ශුභාරංචිය දේශනා
19 කෙළේය; නුමුත් දේශාධිපතිවූ හෙරොද්
තමාගේ සහෝදරයාගේ භාර්යාවවූ
හෙරෝදියස් නිසාද තමා කළ සියලු
නපුරු දේ නිසාද යොහන්ගෙන් තරවටු
20 ලැබ, යොහන් හිරගෙයි දමීමෙන් ඒ
සියල්ලට වැඩි නපුරක් කෙළේය.

## යේසුස්වහන්සේගේ *බව්තීස්මය

21 තවද සියලු සෙනඟ *බව්තීස්මය ලැබූ
විට යේසුස්වහන්සෙත් *බව්තීස්මය ලැබ,
යාච්ඤාකරන කල, අහස විවරවී,
22 ශුද්ධාත්මයාණන්වහන්සේ රූපාකාරයෙන්
පරෙවියෙකු මෙන් උන්වහන්සේ පිටට
බැස්සසේක. එවිට: තුඹ මාගේ ප්‍රේමවන්ත
පුත්‍රයාය; තුඹ කෙරෙහි ඉතා ප්‍රසන්නව
සිටිමියි අහසෙන් හඬක් නික්ම ආයේය.

## යේසුස්වහන්සේගේ පෙළපත

යේසුස්වහන්සේ උගන්වන්ට පටන්ගත් 23
කල අවුරුදු තිහක් පමණ වයස්ව
සිටිසේක; උන්වහන්සේ යෝසෙප්ගේ
පුත්‍රයායයි මනුෂ්‍යයෝ සිතුවෝය.
යෝසෙප් හේලීගේ පුත්‍රයාය, ඔහු 24
මත්තාත්ගේ පුත්‍රයාය, ඔහු ලෙවීගේ
පුත්‍රයාය, ඔහු මෙල්කීගේ පුත්‍රයාය, ඔහු
යන්නයිගේ පුත්‍රයාය, ඔහු යෝසෙප්ගේ
පුත්‍රයාය, ඔහු මත්තාතියස්ගේ පුත්‍රයාය, 25
ඔහු ආමොස්ගේ පුත්‍රයාය, ඔහු නාහූම්ගේ
පුත්‍රයාය, ඔහු එස්ලීගේ පුත්‍රයාය, ඔහු
නග්ගයිගේ පුත්‍රයාය, ඔහු මායත්ගේ 26
පුත්‍රයාය, ඔහු මත්තාතියස්ගේ පුත්‍රයාය,
ඔහු සෙමෙයින්ගේ පුත්‍රයාය, ඔහු
යෝසෙක්ගේ පුත්‍රයාය, ඔහු යෝදගේ
පුත්‍රයාය, ඔහු යොවානන්ගේ පුත්‍රයාය, 27
ඔහු රෙසාගේ පුත්‍රයාය, ඔහු
සෙරුබ්බාබෙල්ගේ පුත්‍රයාය, ඔහු
ෂෙයල්තියෙල්ගේ පුත්‍රයාය, ඔහු නේරීගේ
පුත්‍රයාය, ඔහු මෙල්කීගේ පුත්‍රයාය, ඔහු 28
අද්දීගේ පුත්‍රයාය, ඔහු කෝසම්ගේ
පුත්‍රයාය, ඔහු එල්මාදම්ගේ පුත්‍රයාය,
ඔහු ඒර්ගේ පුත්‍රයාය, ඔහු යේසුස්ගේ 29
පුත්‍රයාය, ඔහු එලියේශෙර්ගේ පුත්‍රයාය,
ඔහු යෝරිම්ගේ පුත්‍රයාය, ඔහු මත්තාත්ගේ
පුත්‍රයාය, ඔහු ලෙවීගේ පුත්‍රයාය, ඔහු 30
සිමියොන්ගේ පුත්‍රයාය, ඔහු යූදස්ගේ
පුත්‍රයාය, ඔහු යෝසෙප්ගේ පුත්‍රයාය,
ඔහු යෝනාම්ගේ පුත්‍රයාය, ඔහු
එලියාකීම්ගේ පුත්‍රයාය, ඔහු මෙලෙයාගේ 31
පුත්‍රයාය, ඔහු මෙන්නාගේ පුත්‍රයාය, ඔහු
මත්තතාගේ පුත්‍රයාය, ඔහු නාතන්ගේ
පුත්‍රයාය, ඔහු දවිත්ගේ පුත්‍රයාය, ඔහු 32
යෙස්සේගේ පුත්‍රයාය, ඔහු ඕබෙද්ගේ
පුත්‍රයාය, ඔහු බෝවාශ්ගේ පුත්‍රයාය,
ඔහු සල්මොන්ගේ පුත්‍රයාය, ඔහු
නාෂොන්ගේ පුත්‍රයාය, ඔහු අම්නාදබ්ගේ 33
පුත්‍රයාය, ඔහු අර්නීගේ පුත්‍රයාය, ඔහු
හෙශ්‍රොන්ගේ පුත්‍රයාය, ඔහු පෙරෙශ්ගේ

*අවගාහනය.
†වතුරෙහි අවගාහනය.
‡ශුද්ධාත්මයෙහිද.
§ගින්නෙහිද.

34 පුත්‍රයාය, ඔහු යූදගේ පුත්‍රයාය, ඔහු
යාකොබ්ගේ පුත්‍රයාය, ඔහු ඊසාක්ගේ
පුත්‍රයාය, ඔහු ආබ්‍රහම්ගේ පුත්‍රයාය, ඔහු
තේරාගේ පුත්‍රයාය, ඔහු නාහෝර්ගේ
35 පුත්‍රයාය, ඔහු සෙරූග්ගේ පුත්‍රයාය, ඔහු
රෙව්ගේ පුත්‍රයාය, ඔහු පෙලෙග්ගේ
පුත්‍රයාය, ඔහු ඒබෙර්ගේ පුත්‍රයාය, ඔහු
36 ෂෙලාගේ පුත්‍රයාය, ඔහු කායිනන්ගේ
පුත්‍රයාය, ඔහු ආර්පක්සද්ගේ පුත්‍රයාය,
ඔහු ෂෙම්ගේ පුත්‍රයාය, ඔහු නෝවාගේ
37 පුත්‍රයාය, ඔහු ලාමෙක්ගේ පුත්‍රයාය, ඔහු
මෙතුසෙලාගේ පුත්‍රයාය, ඔහු ඒනොක්ගේ
පුත්‍රයාය, ඔහු යාරෙද්ගේ පුත්‍රයාය, ඔහු
මහලලේල්ගේ පුත්‍රයාය, ඔහු කායිනන්ගේ
38 පුත්‍රයාය, ඔහු ඒනොස්ගේ පුත්‍රයාය, ඔහු
සෙත්ගේ පුත්‍රයාය, ඔහු ආදම්ගේ
පුත්‍රයාය, ඔහු දෙවියන්වහන්සේගේ
පුත්‍රයාය.

## යේසුස්වහන්සේ පරීක්ෂාකරනු ලැබීම

4 යේසුස්වහන්සේ ශුද්ධාත්මයා-
ණන්ගෙන් පූර්ණව, යොර්දනෙන් හැරී
ඇවිත්, යක්ෂයා විසින් පරීක්ෂා
2 කරනු ලබමින්, ආත්මයාණන්වහන්සේ
කරණකොටගෙන සතළිස් දවසක්
වනයෙහි ගෙනයනු ලැබූසේක. ඒ
දවස්වලදී උන්වහන්සේ කිසිවක් නොකා
සිටිසේක. ඒ දවස් නිමවූ පසු
3 උන්වහන්සේට බඩගිනිවිය. එකල
යක්ෂයා උන්වහන්සේට කථාකොට: ඔබ
දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් මේ
ගල රොටි වෙන්ට අණකළ මැනවයි
4 කීවේය. යේසුස්වහන්සේ ඔහුට
උත්තරදෙමින්: මනුෂ්‍යයා රොටි
පමණකින් ජීවත් නොවන්නේය කියා
5 ලියා තිබේයයි කීසේක. එවිට ඔහු
උන්වහන්සේ උස් ඉඩමකට ගෙනගොස්,
ක්ෂණයකින් ලෝකයේ සියලු රාජ්‍යයන්
6 උන්වහන්සේට පෙන්වා, උන්වහන්සේට
කථාකොට: මේ මුළු බලයද එහි
ඓශ්වර්යයද ඔබට දෙන්නෙමි. මක්නිසාද
ඒවා මට භාරදී තිබේ; මම කැමති
7 කෙනෙකුට ඒවා දෙමි. එබැවින් ඔබ මා
ඉදිරියෙහි නමස්කාරකරන්නෙහි නම් ඒ
සියල්ලම ඔබට වන්නේයයි උන්වහන්සේට
කීවේය. යේසුස්වහන්සේ ඔහුට 8
උත්තරදෙමින්: තාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේට නමස්කාරකරව, උන්වහන්සේට
පමණක් සේවයකරවයි ලියා තිබේයයි
කීසේක. එවිට ඔහු උන්වහන්සේ 9
යෙරුසලමට ගෙනගොස්, දේවමාළිගාව
මුදුනේ සිටුවා: ඔබ දෙවියන්වහන්සේගේ
පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න;
මක්නිසාද, 10

ඔබ ආරක්ෂාකරන පිණිස
උන්වහන්සේ තමන්ගේ දූතයන්ට ඔබ
ගැන අණදෙනසේක

කියාත්,

ඔබගේ පය යම් හෙයකින් ගලක 11
නොවදින පිණිස
ඔව්හු අත් පිට ඔබ උසුලාගන්නෝය

කියාත් ලියා තිබේයයි උන්වහන්සේට
කීවේය. යේසුස්වහන්සේ ඔහුට 12
උත්තරදෙමින්: තාගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ පරීක්ෂා නොකරවයි කියා
තිබේයයි කීසේක.
යක්ෂයා පරීක්ෂා සියල්ල නිමවා, 13
කලකට උන්වහන්සේගෙන් ඉවත්ව ගියේය.

## යේසුස්වහන්සේ නාසරෙත්හි සිටීම

එවිට යේසුස්වහන්සේ ආත්මයාණන්- 14
වහන්සේගේ බලයෙන් යුක්තව ගලීලයට
හැරී ආසේක. උන්වහන්සේ ගැන
කීර්තියක්ද අවට මුළු පළාතෙහි පතළව
ගියේය. උන්වහන්සේ ඔවුන්ගේ 15
සිනගෝගවලදී උගන්වමින්, සියල්ලන්-
ගෙන් ප්‍රශංසා ලැබූසේක.
උන්වහන්සේ තමන් වැඩුණු නුවරවූ 16
නාසරෙත්ට පැමිණ, තමන්ගේ පුරුද්ද
ලෙස සබත් දවසෙහි සිනගෝගයට
ඇතුල්ව, කියවන පිණිස නැගිටුණුසේක.
එවිට අනාගතවක්තෘවූ යෙසායාගේ 17
පොත උන්වහන්සේට දෙනලද්දේය.
උන්වහන්සේ පොත දිගහැර:

ස්වාමීන්වහන්සේගේ ආත්මය මා 18
කෙරෙහිය;
මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය
දේශනාකරන්ට උන්වහන්සේ මා

ආලේපකළසේක;
වහලුන්ට මිදීම සහ
අන්ධයන්ට පෙනීම ලැබෙන බව
ප්‍රකාශකරන්ටද
මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද
19 ස්වාමීන්වහන්සේගේ පිළිගත යුතු
අවුරුද්ද ප්‍රකාශකරන්ටද
උන්වහන්සේ මා එවූසේකැයි
ලියා තිබෙන ස්ථානය සොයාගෙන,
20 පොත අකුළා සේවකයාට දී, වැඩහුන්-
සේක. එකල සිනගෝගයෙහි සිටි
සියල්ලෝ උන්වහන්සේ කෙරෙහි ඇස්
21 හෙළාගෙන සිටියෝය. උන්වහන්සේ
ඔවුන්ට කථාකරන්ට පටන්ගෙන: අද
තුඹලා අසා සිටියදී මේ ලියවිල්ල
22 සම්පූර්ණවීයයි කීසේක. සියල්ලෝ
උන්වහන්සේට සාක්ෂිදෙමින්, උන්-
වහන්සේගේ මුඛයෙන් නික්මුණු
කරුණාවේ වචන ගැන පුදුමව: මොහු
යෝසෙප්ගේ පුත්‍රයා නොවේදැයි කීවෝය.
23 එවිට උන්වහන්සේ ඔවුන්ට කියනසේක්:
වෙදණෙනි, තමාම සුවකරගනින්න යන
මේ උපහැරණ කීම මට කියා, තුඹ
කපර්ණවුමෙහිදී කළාය කියා අප විසින්
ඇසූ දේම තුඹේ රටවූ මෙහිදීත්
කරපන්නැයි නිසැකින්ම මට කියනවා
24 ඇත. සැබවක් තුඹලාට කියමි—කිසි
අනාගතවක්තෘ කෙනෙක් තමාගේම
රටෙහිදී පිළිගනු නොලබන්නේය.
25 සැබවක් තුඹලාට කියමි—එලියාගේ
දවස්වලදී තුන් අවුරුදු සමසක් අහස
පියවී, රට මුළුල්ලෙහි මහත් සාගතයක්
පැවති කල, ඉශ්‍රායෙල්හි බොහෝ
26 වැන්දඹුවන් සිටිය නුමුත්, සීදෙන්
දේශයෙහි සරෙප්තාවේ වැන්දඹු ස්ත්‍රියෙක්
වෙතට මිස ඔවුන්ගෙන් කිසිවෙකු
වෙතට එලියා යවනු නොලැබුයේය.
27 අනාගතවක්තෘවූ එලිෂාගේ කාලයේදී
ඉශ්‍රායෙල්හි බොහෝ කුෂ්ඨරෝගීන් සිටිය
නුමුත්, සිරියවූ නාමන් මිස ඔවුන්ගෙන්
කිසිවෙක් පවිත්‍රකරනු නොලැබුයේයයි
28 කීසේක. සියල්ලෝ ඒ අසා,
29 සිනගෝගයෙහිදී ක්‍රෝධයෙන් පිරී, නැගිට,
උන්වහන්සේ නුවරින් පිටත දමා,
උන්වහන්සේ පහතට හෙළන පිණිස
තමුන්ගේ නුවර ගොඩනගනලද කන්ද
අද්දරට ගෙනගියෝය. නුමුත් උන්වහන්සේ 30
ඔවුන් මැදින් ගොස් යන්ට ගියසේක.

## යක්ෂාවේශවූවෙකුට සුවකිරීම

උන්වහන්සේ ගලීලයේ නුවරක්වූ 31
කපර්ණවුමට පැමිණ, සබත් දවසේදී
ඔවුන්ට උගන්වමින් සිටිසේක.
උන්වහන්සේගේ වචනය බලයෙන් 32
යුක්තවූ බැවින් උන්වහන්සේගේ
ඉගැන්වීමට ඔව්හු විස්මිතවූවෝය.
අශුද්ධ යක්ෂ ආත්මයක් ආවේශවූ 33
මනුෂ්‍යයෙක් සිනගෝගයෙහි සිටියේය;
ඔහු මහත් හඬින් මොරගසමින්: අහෝ! 34
නාසරිය යේසුස්වහන්ස, ඔබට අපෙන්
කම මොකද? ඔබ අප විනාශකරන්ට
ආසේක්ද? ඔබ කවුද කියා දනිමි,
ඔබ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ
තැනන්වහන්සේයයි කීවේය. යේසුස්- 35
වහන්සේ ඔහුට තරවටුකරමින්: කථා
නොකර මොහුගෙන් පිටවෙවයි කීසේක.
එවිට යක්ෂයා සමූහයා මැද ඔහු බිම
හෙළා, ඔහුට හිංසාවක් නොකොට,
ඔහුගෙන් පිටතට ආයේය. සියල්ලෝ 36
විස්මිතව: මේ වචනය කිමෙක්ද?
මක්නිසාද උන්වහන්සේ බලයෙන්ද
ආනුභාවයෙන්ද අශුද්ධාත්මයන්ට
අණදෙනසේක, ඔව්හු පිටවෙතියි
ඔවුනොවුන් අතරෙහි කථාකරගත්තෝය.
තවද වටකර පළාතේ සැමතැන්හි 37
උන්වහන්සේ ගැන ආරංචියක් පතළවිය.

## පේත්‍රුස්ගේ භාර්යාවගේ මවු සහ වෙනත් අය සුවපත්කිරීම

උන්වහන්සේ සිනගෝගයෙන් නැගිට 38
ගොස් සීමොන්ගේ ගෙදරට ඇතුල්වූ-
සේක. සීමොන්ගේ භාර්යාවගේ මවුට
බලවත් උණරෝගයක් වැළඳී තිබුණේය;
ඔව්හු ඈ උදෙසා උන්වහන්සේට
කන්නලව්කළෝය. උන්වහන්සේ ඈ ළඟ 39
සිට උණට සැරකළසේක; උණරෝගය
ඇගෙන් පහව ගියේය. එකෙණෙහිම ඈ
නැගිට ඔවුන්ට උපස්ථානකළාය.

40 ඉර බසින කල අනේකාකාර රෝගවලින්
පීඩිතවූ රෝගකාරයන් ඇති සියල්ලෝම
උන්වහන්සේ වෙතට ඔවුන් ගෙනාවෝය;
උන්වහන්සේ ඔවුන් එකිනෙකා පිට අත්
41 තබා, ඔවුන් සුවපත් කළසේක. යක්ෂයෝද:
ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය
කියා මහත් ශබ්ද පවත්වමින්, බොහෝ
දෙනෙකුගෙන් දුරුවුණෝය. උන්වහන්සේ
ක්‍රිස්තුස්වහන්සේයයි ඔවුන් දැනගෙන සිටි
නිසා උන්වහන්සේ ඔවුන්ට සැරකරමින්
කථාකරන්ට ඉඩ නුදුන්සේක.
42 පහන්වූ කල උන්වහන්සේ පිටත්ව
වනාන්තර ස්ථානයකට ගියසේක.
සමූහයෝ උන්වහන්සේ සොයමින්
උන්වහන්සේ ළඟට පැමිණ, ඔවුන්
කෙරෙන් නොයන ලෙස උන්වහන්සේ
43 නවත්වාගන්ට උත්සාහකළෝය. නුමුත්
උන්වහන්සේ: මා විසින් අනික්
නුවරවලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ
යහපත් ආරංචිය දේශනාකරන්ට ඕනෑය.
මක්නිසාද ඒ පිණිස එවනලද්දෙමියි
ඔවුන්ට කීසේක.
44 උන්වහන්සේ ගලීලයේ සිනගෝගවලදී
දේශනාකරමින් සිටිසේක.

## මුල් ගෝලයන් කැඳවීම

5 තවද උන්වහන්සේ ගෙන්නෙසරෙත්-
නම් විල ළඟ සිටියදී සමූහයෝ
දෙවියන්වහන්සේගේ වචනය අසමින්
2 උන්වහන්සේට තෙරපීගෙන සිටියෝය. විල
ළඟ ඔරු දෙකක් තිබෙනවා උන්වහන්සේ
දුටුසේක. මසුන් අල්ලන්නෝ ඒවායින්
බැස තමුන්ගේ දැල් සෝදමින් සිටියෝය.
3 උන්වහන්සේ ඒ ඔරුවලින් එකක් වන
සීමොන්ගේ ඔරුවට නැඟී, ගොඩින් ටිකක්
ඈත්කරන්ට ඔහුගෙන් ඉල්ලා, ඔරුවෙහි
වැඩහිඳගන සමූහයන්ට ඉගැන්වූසේක.
4 උන්වහන්සේ කථාකොට නිමවූ කල:
ගැඹුරට ගොස් මසුන් අල්ලන්ට දැල්
හෙළාපල්ලායයි සීමොන්ට කීසේක.
5 සීමොන් උත්තරදෙමින්: ස්වාමිනි, අපි
මුළු රාත්‍රියෙහිම වෙහෙසවීමුව, නුමුත්
මොකවත් ඇල්ලුවේ නැත. එහෙත් ඔබගේ
වචනය නිසා දැල් හෙළමියි කීවේය.
6 ඔවුන් එසේ කළ විට මසුන් මහත්
රාශියක් අසුවිය; ඔවුන්ගේ දැල් ඉරෙන්ට
පටන්ගත්තේය; ඇවිත් තමුන්ට 7
උපකාරකරන්ට අනික් ඔරුවෙහි සිටි
හවුල්කාරයන්ට ඔව්හු සංඥා කළෝය.
ඔව්හු ආ කල්හි, ගිලෙන තරමට ඔරු
දෙකම පුරවාගත්තෝය. සීමොන් පේත්‍රුස් 8
ඒ දැක, යේසුස්වහන්සේගේ දණ ළඟ
වැටී: ස්වාමිනි, මා වෙතින් ගිය මැනව;
මම පව්කාර මනුෂ්‍යයෙකැයි කීවේය.
මක්නිසාද ඔහු සහ ඔහු සමග සිටි 9
සියල්ලෝ තමුන් ඇල්ලූ මසුන්
රාශිය දැක විස්මිතවූවෝය. සීමොන්ගේ 10
හවුල්කාරයෝවූ සෙබදීගේ පුත්‍රවූ
යාකොබ්ද යොහන්ද එසේම
විස්මිතවූවෝය. යේසුස්වහන්සේ: භය
නොවන්න, මෙතැන් පටන් නුඹ
මනුෂ්‍යයන් අල්ලනවා ඇතැයි සීමොන්ට
කීසේක. ඔව්හු තමුන්ගේ ඔරු ගොඩට 11
ඇද, සියල්ල අත්හැර, උන්වහන්සේ අනුව
ගියෝය.

## කුෂ්ඨ රෝගියෙකුට සහ අංශභාග රෝගියෙකුට සුවකිරීම

තවද උන්වහන්සේ එක් නුවරක සිටියදී 12
කුෂ්ඨයෙන් පිරුණු මනුෂ්‍යයෙක් එහි
සිටියේය. ඔහු යේසුස්වහන්සේ දැක
මුහුණින් වැටී: ස්වාමිනි, ඔබ කැමති-
සේක් නම් මා පවිත්‍රකරන්ට ඔබට
පුළුවනැයි කියා උන්වහන්සේට කන්නලව්
කෙළේය. උන්වහන්සේ අත දිගුකොට 13
ඔහු පිට තබා: මම කැමැත්තෙමි;
පවිත්‍රවෙයන්නැයි ඔහුට කීසේක.
එකෙණෙහිම කුෂ්ඨය ඔහුගෙන් පහව
ගියේය. කාටවත් එය නොකියන්ට 14
උන්වහන්සේ ඔහුට අණකොට: නුඹ
ගොස් පූජකයාට පෙනී, මෝසෙස් විසින්
අණකළ දේවල් ඔවුන්ට සාක්ෂි පිණිස
නුඹේ පවිත්‍රවීම සඳහා ඔප්පුකරපන්නැයි
කීසේක. එහෙත් උන්වහන්සේ ගැන 15
ප්‍රවෘත්තිය වඩ වඩා පතළවිය. බොහෝ
සමූහයෝ වචනය අසන්ටත් තමුන්ගේ
රෝග සුවකරවාගන්ටත් රැස්වූහ. නුමුත් 16
උන්වහන්සේ වනාන්තර ස්ථානවලට
අහක්ව ගොස් යාච්ඤාකළසේක.

17 ඒ දවස්වලින් එකකදී උන්වහන්සේ
උගන්වන කල, ගලීලයේ හා යුදයේ
සෑම ගම්වලින්ද යෙරුසලමෙන්ද ආවාවූ
ඵරිසිවරුත් ව්‍යවස්ථාව උගන්වන්නොත්
එහි හිඳගෙන උන්නෝය. සුවකරන
පිණිස ස්වාමීන්වහන්සේගේ ආනුභාවය
18 උන්වහන්සේ සමග වූයේය. එවිට
මිනිස්සු අංශභාග රෝගියෙකු ඇඳක
තබා ගෙනාවෝය. ඔහු ඇතුළට
ගෙනැවිත් උන්වහන්සේ ඉදිරියෙහි
19 තබන්ට ඔව්හු සෙවුවෝය. නුමුත් සමූහයා
නිසා ඇතුළට ගෙනයන්ට අන්දමක්
නොදැක, වහලට නැගී සෙවිල්ල ඇර,
යේසුස්වහන්සේ ඉදිරියෙහි ඇඳත් සමග
20 ඔහු මැදට බැස්සෙවුවෝය. උන්වහන්සේ
ඔවුන්ගේ ඇදහිල්ල දැක: මනුෂ්‍යය, නුඹේ
පව් නුඹට කමාකරන ලදැයි කීසේක.
21 එවිට ලියන්නෝද ඵරිසිවරුද: දෙවියන්-
වහන්සේට අපහාස වචන කියන මොහු
කවුද? පව් කමාකරන්ට දෙවියන්-
වහන්සේට මිස වෙන කාට පුළුවන්-
දැයි කල්පනාකරන්ට පටන්ගත්තෝය.
22 යේසුස්වහන්සේ ඔවුන්ගේ කල්පනා දැන
ඔවුන්ට උත්තරදෙමින්: නුඹලාගේ
සිත්වලින් නුඹලා කල්පනාකරගන්නේ
23 කිමෙක්ද? වඩා පහසු කොයි එකද?
නුඹේ පව් නුඹට කමාකර තිබේයයි
කීමද? නොහොත්–නැගිට ඇවිදපන්නැයි
24 කීමද? නුමුත් පොළොවෙහිදී පව්
කමාකරන්ට මනුෂ්‍ය පුත්‍රයාට බලය
තිබෙන බව නුඹලා දැනගන්නා පිණිසය
කියා, උන්වහන්සේ අංශභාග රෝගියාට
කථාකොට: නැගිට ඇඳ රැගෙන නුඹේ
ගෙදරට පලයන්නැයි නුඹට කියමියි
25 කීසේක. එකෙණෙහිම ඔහු ඔවුන්
ඉදිරියෙහි නැගිට, තමා ඔත් ඇඳ රැගෙන,
දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින්,
26 තමාගේ ගෙදරට ගියේය. සියල්ලෝ
විස්මපත්වී, දෙවියන්වහන්සේට
ප්‍රශංසාකරමින්: අද පුදුම දේ දුටිමුව
කියා භයෙන් පිරුණෝය.

## ලෙවී සහ ආදයම් අයකරන්නෝ

27 මින්පසු උන්වහන්සේ පිටත්ව ගොස්
ලෙවී නම් සුංගම් අයකරන්නෙක් සුංගම්
පළේ ඉඳගන ඉන්නවා දැක: මා අනුව
වරෙන්නැයි ඔහුට කීසේක. ඔහු සියල්ල 28
අත්හැර නැගිට උන්වහන්සේ අනුව
ගියේය. ලෙවී තමාගේ ගෙයි 29
උන්වහන්සේට මහත් මංගල්‍ය කෑමක්
සාදා දුන්නේය. සුංගම් අයකරන්නන්ගෙන්
හා අන්‍යයන්ගෙන් මහත් සමූහයක්
ඔවුන් සමග කෑමට වාඩිවී
සිටියෝය. එකල ඵරිසිවරුද ඔවුන්ගේ 30
ලියන්නෝද උන්වහන්සේගේ ගෝලයන්ට
විරුද්ධව කොඳුරමින්: නුඹලා සුංගම්
අයකරන්නන්ද පව්කාරයන්ද සමග
කන්නෙත් බොන්නෙත් මක්නිසාදැයි
කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට 31
උත්තරදෙමින්: රෝගීන්ට මිස නිරෝගීන්ට
වෙදගෙන් ඕනෑකමක් නැත. පව්කාරයන් 32
මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලිවීමට
කැඳවන්ට මම නාවෙමියි කීසේක.

## නිරාහාරව ඉඳීම ගැන වාදය

එවිට ඔව්හු උන්වහන්සේට 33
කථාකොට: යොහන්ගේ ගෝලයෝ
නොයෙක්වර නිරාහාරව සිට යාච්ඤා
ඔප්පු කරති; ඵරිසිවරුන්ගේ ගෝලයොත්
එසේමය; නුමුත් ඔබගේ ගෝලයෝ
කමින් බොමින් සිටිතියි කීවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට: 34
මඟුල් ගෙදර අය සමග මනමාලයා
සිටියදී ඔවුන් නිරාහාරයෙන් සිටුවන්ට
නුඹලාට පුළුවන්ද? නුමුත් මනමාලයා 35
ඔවුන්ගෙන් අහක්කරනු ලබන දවස්
පැමිණෙන්නේය; එකල ඒ දවස්වලදී ඔවුන්
නිරාහාරව සිටිනවා ඇතැයි කීසේක.
උන්වහන්සේ ඔවුන්ට උපමාවක්ද 36
කියමින්: කිසිවෙක් අලුත් වස්ත්‍රයකින්
කැබෙල්ලක් ඉරාගෙන පරණ වස්ත්‍රයකට
මහන්නේ නැත; මැහුවොත් අලුත් එක
ඉරෙනවාත් ඇර අලුත් එකෙන් ගත්
කැබෙල්ල පරණ එකට සම නොවන්නේය.
කිසිවෙක් අලුත් මුද්‍රිකපානය පරණ 37
සම්භාජනවල වත් නොකරයි; වත්කළොත්
අලුත් මුද්‍රිකපානයෙන් සම්භාජන පැළී,
මුද්‍රිකපානය වැගිරී ගොස්, සම්භාජනත්
නාස්තිවන්නේය. නුමුත් අලුත් මුද්‍රිකපානය 38
අලුත් සම්භාජනවල වත්කළ යුතුය. තවද 39
පරණ මුද්‍රිකපානය බීවාවූ කිසිවෙක්

අලුත් ඒවාට කැමති නොවෙයි.
මක්නිසාද: පරණ ඒවා හොඳය කියා
ඔහු කියන්නේයයි කීසේක.

## සබත් පැවැත්වීම

6 තවද එක් සබත් දවසක උන්වහන්සේ
ගොයම් කෙත් මැදින් යමින් සිටිසේක;
උන්වහන්සේගේ ගෝලයෝ කරල් කඩා
2 අතින් පොඩිකර කැවෝය. එවිට
ඵරිසිවරුන්ගෙන් සමහරෙක්: සබත්
දවසේදී නොකටයුතු දෙයක් තුඹලා
කරන්නේ මක්නිසාදැයි කීවෝය.
3 යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
දාවිත් තමාටද තමා සමග සිටිය අයටද
4 බඩගිනිවූ කල්හි කළ දේ, එනම්
දෙවියන්වහන්සේගේ ගෘහයට ඇතුල්ව,
පූජකයන්ට මිස වෙන කාටවත් කන්ට
යුතු නැති පිදීමේ රොටි රැගෙන කා,
තමා සමග සිටි අයටත් දුන්
කාරණයවත් තුඹලා කියවා නැද්දැයි
5 කීසේක. තවද: මනුෂ්‍ය පුත්‍රයා සබත්
දවසේ ස්වාමියායයි උන්වහන්සේ ඔවුන්ට
කීසේක.
6 තවත් සබත් දවසක උන්වහන්සේ
සිනගෝගයට ඇතුල්ව ඉගැන්වූසේක. එහි
දකුණත වියළී තිබුණු මනුෂ්‍යයෙක්
7 සිටියේය. එවිට ලියන්නෝද ඵරිසිවරුද
උන්වහන්සේට වරද තබන්ට මාර්ගයක්
සොයාගන්නා පිණිස උන්වහන්සේ සබත්
දවසේදී සුවකරනවා ඇද්ද කියා බලා
8 සිටියෝය. නුමුත් උන්වහන්සේ ඔවුන්ගේ
සිතිවිලි දැන: නැගිට මැද සිටපන්නැයි
වියළි අත ඇති මනුෂ්‍යයාට කීසේක.
9 ඔහු නැගිට මැද සිටියේය. එවිට
යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට:
සබත් දවසේදී යුතුවන්නේ යහපතක්
කිරීමද? නොහොත් නපුරක් කිරීමද?
ප්‍රාණයක් ගැළවීමද? නොහොත් නැති-
කිරීමදැයි තුඹලාගෙන් අසමියි කීසේක.
10 තවද උන්වහන්සේ ඔවුන් සියල්ලන්
දෙස වටකර බලා, ඔහුට කථාකොට:
තුඹේ අත දිගුකරපන්නැයි කීසේක. ඔහු
11 එසේ කෙළේය. එවිට ඔහුගේ අත
සුවවිය. නුමුත් ඔව්හු උමතුවෙන් පිරී:
යේසුස්වහන්සේට කුමක් කරමුදැයි
එකිනෙකා අතරේ කථාකරගත්තෝය.

## ප්‍රේරිතයන් දෙළොස්දෙනා

තවද ඒ දවස්වලදී උන්වහන්සේ 12
යාච්ඤාකරන පිණිස කන්දකට ගොස්
දෙවියන්වහන්සේට යාච්ඤාකරමින් මුළු
රාත්‍රිය ගතකළසේක. පහන්වූ කල 13
උන්වහන්සේ තමන්ගේ ගෝලයන් කැඳවා
ඔවුන්ගෙන් දෙළොස් දෙනෙකු
තෝරාගෙන, ඔවුන්ට ප්‍රේරිතයෝයයි නම්
තැබූසේක. ඔව්හු කවුරුදයත්- 14
උන්වහන්සේ විසින් පේත්‍රුස්ය කියා
නම්කළ සීමොන් සහ ඔහුගේ සහෝදරවූ
අන්ද්‍රෑද, යාකොබ් සහ යොහන්ද, පිලිප්
සහ බර්තොලොමෙව්ද, මතෙව් සහ 15
තෝමස්ද, අල්පෙවුස්ගේ පුත්‍රවූ යාකොබ්
සහ ජ්වලිතයාය කියනලද සීමොන්ද,
යාකොබ්ගේ පුත්‍රවූ යූදස් සහ ද්‍රෝහියාවූ 16
යූදස් ඉස්කාරියොත්ද යන මොව්හුය.
උන්වහන්සේ ඔවුන් සමග බැස 17
ඇවිත් සමභූමියක නැවතී සිටිසේක.
උන්වහන්සේගේ ගෝලයන්ගෙන් මහත්
සමූහයක්ද උන්වහන්සේගේ වචන
අසන්ටත් තමුන්ගේ රෝග සුවකරවා-
ගන්ටත් මුළු යුදය හා යෙරුසලමෙනුත්
තීර් හා සීදෝන්හි මුහුදුකරෙනුත්
ආවාවූ බොහෝ දෙනෙක්ද සිටියෝය;
අශුද්ධාත්මයන්ගෙන් පීඩිතවූවෝ සුව 18
කරනු ලැබුවෝය. උන්වහන්සේගෙන් 19
ආනුභාවය නික්මවිත් ඔවුන් සියල්ලන්
සුවකළ බැවින්, මුළු සමූහයා උන්-
වහන්සේට අතගසන්ට උත්සාහ-
කළෝය.

## ආශීර්වාද සහ ශාප වාක්‍ය

එවිට උන්වහන්සේ තමන් ගෝලයන් 20
දෙසට ඇස් ඔසවා කියනසේක්: දිළිඳුවූ
තුඹලා ආශීර්වාදලද්දෝය. මක්නිසාද
දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුඹලාගේය.
දැන් බඩගිනි ඇති තුඹලා ආශීර්වාද- 21
ලද්දෝය. මක්නිසාද තුඹලා තෘප්තියට
පැමිණෙන්නහුය. දැන් හඩන්නාවූ තුඹලා
ආශීර්වාදලද්දෝය. මක්නිසාද තුඹලා
සිනාසෙන්නහුය. මනුෂ්‍ය පුත්‍රයා නිසා 22
මනුෂ්‍යයන් තුඹලාට වෛර කරන කලද
තමුන්ගේ සමාගමෙන් තුඹලා වෙන්කර,

තුඹලාට නින්දකර, තුඹලාගේ නාමය
නපුරුයයි පහකරන කලද තුඹලා
23 ආශීර්වාදලද්දෝය. ඒ දවසේදී
ප්‍රීතිවෙයල්ලා, ප්‍රීතියෙන් නටාපල්ලා.
මක්නිසාද ස්වර්ගයෙහි තුඹලාගේ
විපාකය මහත්ය. ඔවුන්ගේ පියවරු
අනාගතවක්තෘවරුන්ටත් එසේම
24 කළෝය. නුමුත් ධනවන්තවූ තුඹලාට
දුක්වේ! මක්නිසාද තුඹලාගේ සැනසීම
25 තුඹලාට ලැබී තිබේ. දැන් තෘප්තියට
පැමිණ සිටින තුඹලාට දුක්වේ!
මක්නිසාද තුඹලා බඩගිනිවීමට
පැමිණෙන්නහුය. දැන් සිනාසෙන්නාවූ
තුඹලාට දුක්වේ! මක්නිසාද තුඹලා
26 ශෝකව අඩන්නහුය. සියලු මනුෂ්‍යයන්
තුඹලා ගැන හොඳ කියන කල තුඹලාට
දුක්වේ! මක්නිසාද ඔවුන්ගේ පියවරු
බොරු අනාගතවක්තෘන්ටත් එසේම
කළෝය.

## සතුරන්ට ප්‍රේමකිරීම

27 නුමුත් අසන්නාවූ තුඹලාට මම කියමි:
තුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා,
තුඹලාට වෛරකරන්නන්ට යහපත
28 කරපල්ලා, තුඹලාට ශාපකරන්නන්ට
ආශීර්වාදකරපල්ලා, තුඹලාට නින්ද-
29 කරන්නන් උදෙසා යාච්ඤාකරපල්ලා. නුඹේ
එක කම්මුලකට ගසන්නාට අනිකත්
හරවාපන්න; නුඹේ උතුරුසළුව
උදුරාගන්නාගෙන් අඳනා රෙද්දත්
30 වලක්වා නොගන්න. නුඹෙන් ඉල්ලන
සියල්ලන්ට දීපන්න; නුඹේ දේපළ
පැහැරගන්නාගෙන් නැවත ඒවා
31 නොඉල්ලන්න. මනුෂ්‍යයන් විසින්
තුඹලාට යම්සේ ක්‍රියාකරනවාට
තුඹලා කැමතිද, තුඹලාත් ඔවුන්ට
32 එසේම කරපල්ලා. තවද තුඹලාට
ප්‍රේමකරන්නන්ටම තුඹලාත් ප්‍රේමකරනවා
නම් තුඹලාට කවර ස්තුතියක්ද?
මක්නිසාද පව්කාරයෝ පවා තමුන්ට
33 ප්‍රේමකරන්නන්ට ප්‍රේම කරති. තුඹලාට
යහපත කරන්නන්ටම තුඹලාත් යහපත
කරනවානම් තුඹලාට කවර ස්තුතියක්ද?
මක්නිසාද පව්කාරයෝ පවා එසේම
34 කරති. තුඹලා නැවත ලබන්ට
බලාපොරොත්තුවෙන් ණයට දෙන්නහු
නම් තුඹලාට කවර ස්තුතියක්ද?
පව්කාරයෝ පවා දුන් පමණ නැවත
ලබන පිණිස පව්කාරයන්ට ණයට
දෙති. නුමුත් තුඹලාගේ සතුරන්ට 35
ප්‍රේමකරපල්ලා, යහපතකරපල්ලා, සැක
නොසිතා ණයට දීපල්ලා; එවිට
තුඹලාගේ විපාකය මහත්වන්නේය;
තුඹලා මහෝත්තමයාණන්ගේ පුත්‍රයෝ
වන්නහුය. මක්නිසාද කෘතෝපකාර
නොසලකන්නන්ටද දුෂ්ටයන්ටද
උන්වහන්සේ කරුණාවන්තව සිටින-
සේක. තුඹලාගේ පියාණන්වහන්සේ 36
දයාවන්තව සිටින්නාක්මෙන් තුඹලාත්
දයාවන්තව සිටපල්ලා.

## අනුන් විනිශ්චයකිරීම

විනිශ්චය නොකරල්ලා, එවිට තුඹලාත් 37
විනිශ්චයකරනු නොලබන්නහුය. වරදට
පත් නොකරල්ලා; එවිට තුඹලාත් වරදට
පත්කරනු නොලබන්නහුය. මුදහැරපල්ලා,
එවිට තුඹලාත් මුදහරිනු ලබන්නහුය.
දීපල්ලා, එවිට තුඹලාටත් දෙනු 38
ලැබෙන්නේය; ඔබ්බු ඔබමින්
සොලවමින් උතුරුවමින් තුඹලාගේ
ඔඩොක්කුවලට හොඳකාර මැනදෙන්නෝය.
මක්නිසාද තුඹලා යම් මිම්මකින්
මැනදෙන්නහුද එයින්ම නැවත
තුඹලාටත් මැනදෙනු ලැබෙන්නේයයි
කීසේක.

## අන්ධ මගපෙන්වන්නෝ

තවද උන්වහන්සේ ඔවුන්ට උපමාවක් 39
කියමින්: අන්ධයෙකුට මගපෙන්වන්ට
අන්ධයෙකුට පුළුවන්ද? ඔවුන් දෙදෙනම
වළක නොවැටෙන්නෝද? ගෝලයා 40
ගුරුවරයාට වඩා උතුම් නැත. නුමුත්
සම්පූර්ණත්වයට පැමිණි සැමදෙනම
තමුන්ගේ ගුරුවරයා මෙන් වන්නෝය.
නුඹේම ඇසේ තිබෙන දඬුව නොබලා, 41
නුඹේ සහෝදරයාගේ ඇසේ තිබෙන
රොඩ්ඩ බලන්නේ මක්නිසාද? නොහොත් 42
නුඹේම ඇසේ තිබෙන දඬුව නොබලා:
සහෝදරය, නුඹේ ඇසේ තිබෙන

රොඩ්ඩ අරන්දමන්ට ඉඩදියන්නැයි
සහෝදරයාට කියන්ට නුඹට කෙසේ
හැකිවේද? වංචාකාරය, පළමුකොට
නුඹේම ඇසෙන් දවය අරන්දමාපන්න,
එවිට නුඹේ සහෝදරයාගේ ඇසේ
තිබෙන රොඩ්ඩ අරන්දමන්ට නුඹට
43 හොඳහැටි පෙනෙනවා ඇත. මක්නිසාද
නරක එල දරන හොඳ ගහක්වත් හොඳ
එල දරන නරක ගහක්වත් ඇත්තේ නැත.
44 මක්නිසාද එක එක ගහ එහිම එලයෙන්
දැනගනු ලැබේ. මනුෂ්‍යයෝ කටුගස්වලින්
අත්තික්කා එල නෙළා නොගනිති,
ගොකටු පඳුරකින් මුද්‍රික එල කඩා
45 නොගනිති. යහපත් මනුෂ්‍යයා තමාගේ
සිතෙහිවූ යහපත් සම්පතෙන් යහපත් දේද
නපුරු මනුෂ්‍යයා නපුරු සම්පතෙන් නපුරු
දේද පිටතට ගෙනෙන්නේය. මක්නිසාද
මුඛය කථාකරන්නේ සිතේ පූර්ණකමෙන්ය.

## ඇසීම සහ කිරීම

46 මා කියන දේ නොකර: ස්වාමිනි,
ස්වාමිනියි මට කියන්නේ මක්නිසාද?
47 මා ළඟට ඇවිත්, මාගේ වචන අසා,
ඒවා පවත්වන අය කාට සමානදැයි
48 නුඹලාට පෙන්වමි: ඔහු ගැඹුරට හාරා,
පර්වතයක් පිට අත්තිවාරම ලා, ගෙයක්
සාදගත් මනුෂ්‍යයෙකුට සමානය. ජල
ගැල්මක් පැමිණ සැඩපාර ඒ ගෙට ගැසූ
නුමුත්, ඒක හොඳින් ගොඩනගා තිබුණු
49 බැවින් සොලවන්ට බැරිවිය. නුමුත් අසා,
නොකරන අය අත්තිවාරමක් නැතුව
පොළොව පිට ගෙයක් සාදගත්
මනුෂ්‍යයෙකුට සමානය; සැඩපාර ඒ
ගෙට ගැසුවේය, එවලේම ඒක වැටුණේය;
ඒ ගෙයි විනාශයද මහත්වියයි කීසේක.

## සියයකට මුලාදෑනියාගේ දසයාට සුවකිරීම

7 උන්වහන්සේ සෙනඟ අසමින් සිටියදී
තමන්ගේ සියලු වචන කියා
නිමකළායින් පසු, උන්වහන්සේ
කපර්ණවුමට ඇතුල්වූසේක.
2 එක්තරා සියයකට මුලාදෑනියෙකුගේ
ප්‍රියවූ දසයෙක් රෝගීව මරණාසන්නව
සිටියේය. ඔහු යේසුස්වහන්සේ ගැන අසා, 3
උන්වහන්සේ ඇවිත් තමාගේ දසයා
සුවපත්කරන ලෙස උන්වහන්සේගෙන්
ඉල්ලන පිණිස යුදෙව්වරුන්ගේ
වැඩිමහල්ලන් උන්වහන්සේ වෙතට
යැවීය. ඔව්හු යේසුස්වහන්සේ ළඟට 4
පැමිණ: ඔහු ඔබගෙන් ඒක ලබන්ට
සුදුස්සෙක්ය. ඔහු අපේ ජාතියට 5
ප්‍රේමවන්තේය, ඔහුම අපේ සිනගෝගය
අපට සාදදුන්නේය කියා බොහෝසෙයින්
ඉල්ලුවෝය. එවිට යේසුස්වහන්සේ ඔවුන් 6
සමඟ ගියසේක. උන්වහන්සේ ගෙට
නුදුරුව සිටිද්දී සියයකට මුලාදෑනියා
උන්වහන්සේ ළඟට මිත්‍රයන් යවා:
ස්වාමිනි, වෙහෙස නුව මැනව. ඔබ මාගේ
පියස්ස යටට එන්ට මම නොවටිමි.
එහෙයින් ඔබ ළඟට එන්ටත් මම 7
වටින්නෙක්යයි නොසිතුවෙමි. නුමුත්
වචනයකින් කිව මැනව, එවිට මාගේ
මෙහෙකරුවා සුවපත්වේ. මක්නිසාද 8
මමත් ආණ්ඩුබලයට යටත් මනුෂ්‍ය-
යෙක්මි, මා යටතෙහිද භේවායෝ සිටිති.
එක්කෙනෙකුට–යවයි මා කී කල ඔහු
යන්නේය; තවත් කෙනෙකුට එවයි කී
කල ඔහු එන්නේය; මාගේ දසයාට–
මේක කරවයි කී කල ඔහු ඒක
කරන්නේයයි උන්වහන්සේට කියා යැවීය.
යේසුස්වහන්සේ ඒ අසා, ඔහු ගැන 9
මවිතව, හැරී තමන් අනුව ආ සමූහයාට
කථාකොට: ඉශ්‍රායෙල්වරුන් අතරේවත්
මෙබඳු මහත් ඇදහිල්ලක් මට සම්බවුණේ
නැතැයි නුඹලාට කියමියි කීසේක.
යවනලද්දෝ ගෙට හැරී ගිය කල දසයා 10
සුවපත්ව සිටිනවා දුටුවෝය.

## නායින් නුවර කනවැන්දුම්යගේ පුතා ජීවත්කරනු ලැබීම

ඉන්පසු උන්වහන්සේ නායින් නම් 11
නුවරකට ගියසේක; උන්වහන්සේගේ
ගෝලයෝද මහත් සමූහයක්ද
උන්වහන්සේ සමඟ ගියෝය. උන්වහන්සේ 12
නුවර දොරටුවට ළංවූ කල, බලව, මළාවූ
කෙනෙක් පිටතට ගෙනයනලද්දේය. ඔහු
තමාගේ මවුගේ එකම පුත්‍රයාය, ඈ
වැන්දඹුවක්ය. ඒ නුවර බොහෝ සෙනඟක්

13 ඈ සමග ආවෝය. ස්වාමීන්වහන්සේ
ඈ දුටු කල ඈ කෙරෙහි අනුකම්පාකොට:
අඬන්ට එපායයි ඈට කීසේක.
14 උන්වහන්සේ ළඟට ගොස් දෙනයට
අතගැසූසේක. එවිට උසුලාගෙනයන්නෝ
නැවතුණෝය. උන්වහන්සේ: යෞවනය,
නැගිටපන්නැයි නුඹට කියමියි කීසේක.
15 එවිට මළාවූ ඔහු නැගිට හිඳ කථාකරන්ට
පටන්ගත්තේය. උන්වහන්සේ ඔහුගේ
16 මෑණියන්ට ඔහු භාරදුන්සේක. එකල
සියල්ලෝම භයපත්ව: උතුම්වූ
අනාගතවක්තෘ කෙනෙක් අප අතරෙහි
නැගුටුණුසේක, දෙවියන්වහන්සේ
තමන්ගේ සෙනඟ දෙස බැලූසේක කියා
දෙවියන්වහන්සේට ප්‍රශංසාකළෝය.
17 උන්වහන්සේ ගැන මේ ප්‍රවෘත්තිය මුළු
යුදයෙහිද වටකර රට මුළුල්ලෙහිද
පතළවිය.

## *යොහන් බව්තීස්තගේ ප්‍රශ්නය. ඔහු ගැන ස්වාමීන්වහන්සේගේ සාක්ෂිය

18 යොහන්ගේ ගෝලයෝ ඔහුට මේ
19 සියල්ල දන්වූවෝය. එවිට යොහන්
තමාගේ ගෝලයන්ගෙන් දෙදෙනෙකු
කැඳවා: එන්නාවූ තැනැත්තේ ඔබද?
නොහොත් වෙන කෙනෙකු බලා සිටිය
යුතුද කියා අසන්ට ස්වාමීන්වහන්සේ
20 වෙතට ඔවුන් යැවීය. ඒ මනුෂ්‍යයෝ
උන්වහන්සේ ළඟට ඇවිත්: එන්නාවූ
තැනැත්තේ ඔබද? නොහොත් වෙන
කෙනෙකු බලා සිටිය යුතුදැයි අහන
පිණිස †යොහන් බව්තීස්ත අප ඔබ
21 වෙතට එවුවේයයි කීවෝය. ඒ පැයේදී
උන්වහන්සේ බොහෝ දෙනෙකුගේ රෝගද
ව්‍යාධිද සුවකර, දුෂ්ටාත්ම පහකර,
නොයෙක් අන්ධයන්ට පෙනීම දුන්සේක.
22 උන්වහන්සේ උත්තරදෙමින්: නුඹලා ඇසූ
දුටු දේ ගොස් යොහන්ට දන්වාපල්ලා;
බිහිරන්ට ඇසෙයි, මළාහු නැගුටුවනු
ලබති, අන්ධයෝ පෙනීම ලබති, කොරු
ඇවිදිති, කුෂ්ඨ රෝගීහු පවිත්‍රකරනු ලබති,
දිළිඳුන්ට ශුභාරංචිය ප්‍රකාශකරනු ලැබේ.
23 යමෙකුට මම පැකිලීමේ හේතුවක්

*අවගාහක යොහන්ගේ.
†අවගාහක යොහන්.

නොවන්නේද ඔහු ආශීර්වාදලද්දෙකැයි
ඔවුන්ට කීසේක.
යොහන්ගේ දූතයන් නික්ම ගිය විට 24
උන්වහන්සේ යොහන් ගැන සමූහයන්ට
කථාකරන්ට පටන්ගෙන: නුඹලා කුමක්
බලන්ට වනයට ගියහුද? සුළඟින්
සෙලවෙන බටගසක්ද? නුමුත් කුමක් 25
බලන්ට ගියහුද? සිහින් වස්ත්‍ර පැළඳගත්
මනුෂ්‍යයෙක්ද? බලව, අලංකාර වස්ත්‍ර
හැඳ සැපජීවිකාවෙන් සිටින්නෝ
රාජමාළිගාවල සිටිති. නුමුත් කුමක් 26
බලන්ට ගියහුද? අනාගතවක්තෘ
කෙනෙක්ද? එසේය, නුඹලාට කියමි,
අනාගතවක්තෘ කෙනෙකුටත් වඩා
බොහෝ උතුම් කෙනෙක්ය.
බලව, මාගේ දූතයා නුඹට පෙරටුව 27
යවමි,
ඔහු නුඹ ඉදිරියෙහි නුඹේ මාර්ගය
සාදන්නේය
කියා ලියා තිබෙන්නේ මොහු ගැනය.
ස්ත්‍රීන්ගෙන් උපන්නවුන් අතුරෙන් 28
යොහන්ට වඩා උත්තමයෙක් ඇත්තේ
නැතැයි නුඹලාට කියමි. එහෙත්
දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි කුඩා
තැනැත්තේ ඔහුට වඩා උතුම්ය—මුළු 29
සෙනඟද සුංගම් අයකරන්නෝද ඒ අසා,
ඔවුන් යොහන්ගේ *බව්තීස්මයෙන්
බව්තීස්මය ලැබ සිටි නිසා,
දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ බව
ඒත්තුගත්තෝය. නුමුත් ඵරිසිවරුද 30
ව්‍යවස්ථාව උගන්වන්නෝද ඔහුගෙන්
†බව්තීස්මය නොලැබ, දෙවියන්-
වහන්සේගේ අදහස තමූන්ටම
එපාකළෝය.—මේ පරම්පරාවේ මනුෂ්‍යයන් 31
කුමකට සමානකරම්ද? මොන දෙයකට
ඔවුන් සමානද? අපි නුඹලාට නළා 32
පිම්බෙමුව, නුඹලා නැටුවේ නැත;
නුඹලාට විලාපකීමුව, නුඹලා ඇඬුවේ
නැතැයි වෙළඳම්පළේ හිඳ ඔවු-
නොවුන්ට හඬගසා කියන්නාවූ
දරුවන් හා සමාන වෙති. මක්නිසාද 33
‡යොහන් බව්තීස්ත ඇවිත් රොටි නොකා

*අවගාහනයෙන් අවගාහනය.
†අවගාහනය.
‡අවගාහක යොහන්.

මුද්‍රිකපානය නොබී සිටියි; එබැවින්
ඔහු යක්ෂාවේශ කෙනෙකැයි තුඹලා
34 කියන්නහුය. මනුෂ්‍ය පුත්‍රයා ඇවිත්
කමින් බොමින් සිටියි; තුඹලා
කථාකොට: බලව, ගිජු මනුෂ්‍යයෙක්ය,
මුද්‍රිකපානය බොන්නෙක්ය, සුංගම්
අයකරන්නන්ගෙත් පව්කාරයන්ගෙත්
35 මිත්‍රයෙක්යයි තුඹලා කියන්නහුය. එහෙත්
ප්‍රඥාව නිදෙස් බව ඇගේ සියලු දරුවන්
කරණකොටගෙන ඔප්පුවී තිබේයයි
කීසේක.

## යේසුස්වහන්සේගේ පාද ආලේපකිරීම. ණයකාරයන් දෙදෙනා ගැන උපමාව

36 ඵරිසිවරුන්ගෙන් එක්කෙනෙක් තමා
සමග කෑමට එන මෙන් උන්වහන්සේගෙන්
ඉල්ලුවේය. උන්වහන්සේ ඵරිසියාගේ ගෙට
37 ඇතුල්ව කෑමට හිඳගත්සේක. ඒ නුවර
සිටි පව්කාර ස්ත්‍රියෙක් උන්වහන්සේ
ඵරිසියාගේ ගෙයි කෑමට ඉඳගන හුන්
බව දැන, සුවඳ තෙලින් පිරූ සුදුගල්
38 කරඬුවක් ගෙනැවිත්, උන්වහන්සේගේ පාද
ළඟ පිටිපසින් හඬ හඬා සිට,
උන්වහන්සේගේ පාද කඳුළෙන් තෙමන්ට
පටන්ගෙන, ඒවා ඇගේ හිසකේවලින්
පිසදමා, උන්වහන්සේගේ පාද සිඹ සිඹ,
39 ඒ සුවඳ තෙල් ගෑවාය. උන්වහන්සේව
කැඳවාගත් ඵරිසියා ඒ දැක: මුන්වහන්සේ
අනාගතවක්තෘ කෙනෙක් නම් තමාට
අතගසන මේ ස්ත්‍රිය කවුද කියාත්
කොහොම කෙනෙක්ද කියාත්
දැනගන්නවා ඇත, මක්නිසාද ඈ
පව්කාරියෙකැයි තමාගේ සිත
40 තුළ සිතාගත්තේය. යේසුස්වහන්සේ
උත්තරදෙමින්: සීමොන්, තුඹට
කාරණයක් කියන්ට මට තිබේයයි ඔහුට
කීසේක. ආචාරීනි, කිව මැනවයි
41 ඔහු කීවේය. එක්තරා ණයහිමියෙකුට
ණයකාරයෝ දෙදෙනෙක් සිටියෝය.
එක්කෙනෙක් මසු පන්සියයක්ද අනික්
තැනැත්තා පණසක්ද ණයව සිටියෝය.
42 ණය ගෙවන්ට ඔවුන්ට කිසිවක් නැති
හෙයින් ඔහු ඒ දෙදෙනාටම කමාවූයේය.
එබැවින් ඔවුන්ගෙන් කොයි තැනැත්තා
ඔහුට වැඩිව ප්‍රේමකරනවා ඇද්දැයි
කීසේක. සීමොන් උත්තරදෙමින්: යමෙකුට 43
ඔහු වැඩියෙන් කමාවූයේද ඔහුය කියා
මම සිතමියි කීවේය. එවිට උන්වහන්සේ:
තුඹේ විනිශ්චය හරියයි ඔහුට කියා,
ස්ත්‍රිය දෙසට හැරී, සීමොන්ට කථාකොට: 44
මේ ස්ත්‍රිය තුඹට පෙනෙනවාද? මම
තුඹේ ගෙදරට ඇතුල්වුණෙමි, තුඹ මාගේ
පාද සෝදන්ට වතුර දුන්නේ නැත. තුමුත්
මෑ තමාගේ කඳුළෙන් මාගේ පාද තෙමා,
ඇගේ හිසකේවලින් ඒවා පිසදැමුවාය.
තුඹ මා සිම්බේ නැත. තුමුත් මෑ මා ආ 45
වේලේ පටන් මාගේ පාද සිඹීමෙන්
නැවතුණේ නැත. තුඹ මාගේ හිසේ තෙල් 46
ගෑවේ නැත. තුමුත් මෑ මාගේ පාදවල
සුවඳ තෙල් ගෑවාය. එබැවින් තුඹට 47
කියමි–බොහෝවූ ඇගේ පව් ඈට
කමාකරනලද්දේය; මක්නිසාද ඈ
බොහෝකොට ප්‍රේමකළාය. තුමුත්
යමෙකුට ස්වල්පයක් කමාකරනලද්දේද
ඔහු ස්වල්ප කොට ප්‍රේමකෙරේයයි
කීසේක. එවිට උන්වහන්සේ: තුඹේ පව් 48
තුඹට කමාකරනලදැයි ඈට කීසේක.
උන්වහන්සේ සමග කෑමට හිඳගත උන් 49
අය: පව්කමාව පවා දෙන මොහු කවුදැයි
තමුන් තුළ කියාගන්ට පටන්ගත්තෝය.
තුමුත් උන්වහන්සේ: තුඹේ ඇදහිල්ල 50
තුඹ ගැළෙවුවේය, සමාදනයෙන්
පලයන්නැයි ඒ ස්ත්‍රීට කීසේක.

## සේවක ස්ත්‍රීවරු

8 ඉන්පසු උන්වහන්සේ දේශනා
කරමින්, දෙවියන්වහන්සේගේ
රාජ්‍යයේ ශුභාරංචිය ප්‍රකාශකරමින්,
නුවරවලත් ගම්වලත් සංචාරණයකළ-
සේක; උන්වහන්සේ සමග ගෝලයෝ
දෙළොස්දෙනාද, දුෂ්ටාත්මවලින් හා 2
දුර්වලකම්වලින් සුවවුණාවූ සමහර
ස්ත්‍රියෝද තමා කෙරෙන් යකුන්
සත්දෙනෙක් දුරුව ගියාවූ මග්දලේනා
නම් මරියාද, හෙරොද්ගේ ගබඩාකාරවූ 3
කූසාගේ භාර්යාවූ යොවන්නාද සූසානාද
තමුන්ගේ වස්තුවෙන් උන්වහන්සේට
උපස්ථානකළ වෙනත් බොහෝ ස්ත්‍රියෝද
සිටියෝය.

## වපුරන්නා ගැන උපමාව

4 මහත් සමූහයක් රැස්වූ කලද ඒ ඒ
නුවරින් මනුෂ්‍යයන් උන්වහන්සේ වෙත
පැමිණි කලද උන්වහන්සේ උපමාවකින්
5 කථාකරනසේක්: වපුරන්නා බීජ
වපුරන්ට ගියේය. ඔහු වපුරන කල්හි
සමහරක් මග අසල වැටුණේය; ඒවා
පයින් පාගනලද්දේය, ආකාශ පක්ෂීහු
6 ඒවා අවුලා කෑවෝය. තවත් ඒවා ගල
පිට වැටී, පැළවූ කෙණෙහිම, දියසීරාව
7 නැති බැවින් වියළී ගියේය. තවත් ඒවා
කටු අතරේ වැටුණේය; කටුද ඒවා සමග
8 වැවී, ඒවා යටකරදැම්මේය. තවත් ඒවා
සරුබිමේ වැටී, පැළවී, එකෙන් සියයක්
ඵල දුන්නෝයයි කීසේක. උන්වහන්සේ
මේ දේවල් කියා: අසන්ට කන් ඇත්තේ
අසාවයි ශබ්දනගා කීසේක.
9 උන්වහන්සේගේ ගෝලයෝ මේ උපමාව
කිමෙක්දැයි උන්වහන්සේගෙන් ඇසුවෝය.
10 උන්වහන්සේ ඔවුන්ට කියනසේක්:
දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ රහස්
දැනගැනීම නුඹලාට දී තිබේ. නුමුත්
දකිමින්ම නොදක්නා පිණිසත් අසමින්ම
තේරුම් නොගන්නා පිණිසත් සෙස්සන්ට
11 උපමාවලින් කියනු ලැබේ. ඉදින් උපමාව
මෙසේය. බීජ නම් දෙවියන්වහන්සේගේ
12 වචනයය. මග අසල ඒවා නම් වචනය
ඇසූ අයය; එකල ඔවුන් අදහා
නොගැළවෙන පිණිස යක්ෂයා ඇවිත්
ඔවුන්ගේ සිත්වලින් වචනය
13 උදුරාගන්නේය. ගලපිට ඒවා නම් වචනය
අසා සන්තෝෂයෙන් පිළිගන්න නුමුත්,
මුල් නැති බැවින්, කලකට පමණක්
අදහා, පරීක්ෂා කාලයෙහි වැටියන්නෝය.
14 කටු අතරේ වැටුණ ඒවා නම් වචනය
අසා, තමුන්ගේ ජීවිත ගමනේදී
එහි වෙහෙසීම්වලින්ද වස්තුවෙන්ද
සැපජීවිකාවෙන්ද වචනය යටව,
15 සම්පූර්ණ ඵල නොදරන්නෝය. සරුබිමේ
ඒවා නම් අවංකවූ යහපත් සිතින් වචනය
අසා, තදින් අල්ලාගෙන, ඉවසීමෙන්
ඵලදරන්නෝය.

## පහනකින් ගුරුකම් ලබාදීම

කිසිවෙක් පහනක් දල්වා භාජනයකින් 16
නොවසයි; ඇඳක් යටද නොතබයි; නුමුත්
ඇතුල්වන්නන්ට එළිය පෙනෙන පිණිස
පහන්රුක උඩ තබයි. මක්නිසාද 17
එළිදරව්කරනු නොලබන සඟවනලද
දෙයක් නැත; නොහොත් දැනගනු
නොලබන්නාවූ එළිදරව් නොවන්නාවූ
කිසි රහසක්ද නැත. එබැවින් නුඹලා 18
අසන්නේ කෙසේද කියා බලාගනිල්ලා.
මක්නිසාද යමෙකුට ඇත්තේද ඔහුට
දෙනු ලබන්නේය; යමෙකුට නැත්තේද
ඔහුට ඇතැයි සිතන දේත් ඔහුගෙන්
පැහැරගනු ලබන්නේයයි කීසේක.

## ක්‍රිස්තුස්වහන්සේගේ මවු සහ සහෝදරයෝ

උන්වහන්සේගේ මෑණියෝද සහෝදර- 19
යෝද උන්වහන්සේ වෙතට ආවෝය,
නුමුත් සමූහයා නිසා උන්වහන්සේ
ළඟට එන්ට නුපුළුවන්විය. එවිට: ඔබගේ 20
මෑණියෝද සහෝදරයෝද ඔබ දකිනු
කැමතිව පිටත සිටිතියි උන්වහන්සේට
කියනලද්දේය. එහෙත් උන්වහන්සේ 21
ඔවුන්ට උත්තරදෙමින්: මාගේ
මෑණියොත් මාගේ සහෝදරයොත් නම්
දෙවියන්වහන්සේගේ වචනය අසා
පිළිපදින්නාවූ මොව්හුයයි වදාළසේක.

## යේසුස්වහන්සේ කුණාටුවක් සන්සිඳවීම

තවද ඒ දවස්වලින් එකකදී උන්වහන්සේ 22
තමන් ගෝලයන් සමග ඔරුවකට නැගී:
අපි විලෙන් එගොඩ යමුයයි ඔවුන්ට
කීසේක. එවිට ඔව්හු ඔරුව දියත්-
කළෝය. ඔවුන් යාත්‍රාකරද්දී උන්- 23
වහන්සේ නිදගත්සේක. එකල මහත්
කුණාටු හුළඟක් විලට පහත්වී ඒ පිට
හැමුවේය; ඔරුවට වතුර පිරෙමින්
ඔව්හු අන්තරායට පැමිණියෝය. ඔව්හු 24
උන්වහන්සේ ළඟට ඇවිත් උන්-
වහන්සේ පුබුදුවා: ආචාරිනි, ආචාරිනි,
අපි විනාශවෙනවායයි කීවෝය. උන්-
වහන්සේ පිබිද, හුළඟටත් රැළගැසීමටත්

සැරකළසේක. එකල ඒවා නැවතී
25 නිශ්චලයක් විය. නුඹලාගේ ඇදහිල්ල
කොයිදැයි උන්වහන්සේ ඔවුන්ට කීසේක.
ඔව්හු භයව විස්මපත්වෙමින්:
මුන්වහන්සේ කවුද? හුළඟටත් වතුරටත්
අණකරන විට ඒවා පවා උන්වහන්සේට
කීකරුවෙතියි කියා ඔවුනොවුන්
කථාකළෝය.

## යක්ෂාත්ම සහ ඌරු රැළ

26 ඔව්හු ගලීලය ඉදිරියෙහි තිබෙන
ගෙරසේනයන්ගේ රටට පැමිණියෝය.
27 උන්වහන්සේ ගොඩබැස්ස කල, නුවරින්
පිටවූ යක්ෂාවේශවූ මනුෂ්‍යයෙක්
උන්වහන්සේට සම්බවුණේය; ඔහු
බොහෝ කලක සිට ඇඳුම් නොහැඳ
සිටියේය, ගෙයක නොව සොහොන්
28 ගෙවල්හි විසුවේය. ඔහු යේසුස්වහන්සේ
දැක මොරගසා, උන්වහන්සේ ඉදිරියෙහි
වැටී: මහෝත්තම දෙවියන්වහන්සේගේ
පුත්‍රවූ යේසුස්වහන්ස, ඔබට මාගෙන්
කම මොකද? මට වධ නොදෙන
මෙන් ඉල්ලමියි මහත් හඬින් කීවේය.
29 මක්නිසාද ඒ මනුෂ්‍යයාගෙන් දුරුවෙන්ට
උන්වහන්සේ අශුද්ධාත්මයට අණකළ-
සේක. අශුද්ධාත්මය වනාහි නොයෙක්
වර ඔහු අල්ලාගත් බැවින්, දම්වැල්-
වලින්ද විලංගුවලින්ද බැඳ ඔහු
රැකවල්කරනලද්දේය; ඔහු වනාහි
බැඳුම් කඩාදැමුවේය, යක්ෂයා විසින්
වනාන්තරවලට ඔහු එලවනලද්දේය.
30 තාගේ නම කිමෙක්දැයි යේසුස්වහන්සේ
ඔහුගෙන් ඇසූසේක. ඔහුට බොහෝ
යක්ෂයන් ආවේශව සිටි නිසා, ඔහු
31 *ලෙගියොන්යයි කීවේය. එවිට පාතාලයට
යන්ට තමුන්ට අණනොකරන ලෙස
ඔව්හු උන්වහන්සේගෙන් ඉල්ලුවෝය.
32 එතැන කන්දේ මහත්වූ ඌරු රැළක්
ගොදුරු කමින් සිටියෝය. උන්ට
වැහෙන්ට යක්ෂයෝ උන්වහන්සේගෙන්
අවසර ඉල්ලුවෝය. උන්වහන්සේ ඔවුන්ට
33 අවසර දුන්සේක. යක්ෂයෝ ඒ
මනුෂ්‍යයාගෙන් දුරුවී ගොස් ඌරන්ට
වැහුණෝය. එකල ඌරු රැළ ප්‍රපාතය
දිගේ වේගයෙන් විලට දිවගොස් ගිලී
මළෝය. ඌරු රැකවල්ලු සිදුවූ දේ දැක, 34
පලාගොස්, නුවරත් ගම්වලත් එපවත්
දැන්වූවෝය. සිදුවූ දේ බලන පිණිස 35
මනුෂ්‍යයෝ පිටත්ව ගොස් යේසුස්වහන්සේ
වෙතට පැමිණ, යක්ෂයන් දුරුවූණු
මනුෂ්‍යයා වස්ත්‍ර ඇඳ සිහි ඇතුව
යේසුස්වහන්සේගේ පාමුල ඉඳගන
ඉන්නවා දැක, භයවූවෝය. එය දුටු අය 36
යක්ෂයන් වැහී සිටි මනුෂ්‍යයා සුවකරනු
ලැබූ හැටි ඔවුන්ට කීවෝය. එවිට වටකර 37
සිටි ගෙරසේනයන්ගේ රටේ මුළු සෙනඟ
මහත් භයට පැමිණ, ඔවුන් කෙරෙන්
අහක්ව යන්ට උන්වහන්සේගෙන්
ඉල්ලුවෝය. උන්වහන්සේ ඔරුවකට නැඟී
හැරී ගියසේක. යක්ෂයන් දුරුවුණු 38
මනුෂ්‍යයා උන්වහන්සේ සමග සිටින්ට
උන්වහන්සේගෙන් ඉල්ලුවේය. නුමුත්
උන්වහන්සේ ඔහු යවමින්: නුඹේ ගෙදරට 39
හැරී ගොස්, දෙවියන්වහන්සේ නුඹට
කොපමණ මහත් දේවල් කළසේක්ද
කියා ප්‍රකාශකරපන්නැයි කීසේක. ඔහු
ගොස්, යේසුස්වහන්සේ තමාට
කොපමණ මහත් දේවල් කළසේක්ද
කියා නුවර මුළුල්ලේ ප්‍රසිද්ධකෙළේය.

## යායිරස්ගේ දුව මළවුන්ගෙන් නැගිටවීම. ස්ත්‍රියෙක් සුවපත්කිරීම

යේසුස්වහන්සේ හැරී ආ කල සමූහයා 40
උන්වහන්සේ පිළිගත්තෝය. මක්නිසාද
සියල්ලෝම උන්වහන්සේ එනවා බලා
සිටියෝය. බලව, සිනගෝගයේ 41
මුලාදෑනියෙක්වූ යායිරස් නම්
මනුෂ්‍යයෙක් ඇවිත් යේසුස්වහන්සේගේ
පාමුල වැටී, තමාගේ ගෙදරට එන ලෙස
උන්වහන්සේගෙන් ඉල්ලුවේය; මක්නිසාද 42
දෙළොස් අවුරුද්දක් පමණ වයස් ඇති
ඔහුගේ එකම දුව මරණාසන්නව
සිටියාය. උන්වහන්සේ යන කල
සමූහයෝ උන්වහන්සේට තෙරපෙමින්
සිටියෝය.
දෙළොස් අවුරුද්දක් මහලේ රෝගය 43
ඇතුව, වෙදුන්ට තමාගේ සියලු සම්පත්
වියදම්කොටත් කිසිවෙකුගෙන් සුවයක්

*එනම්-රංචුව.

ලබන්ට බැරිවූවාවූ ස්ත්‍රියෙක් පස්සෙන්
44 ඇවිත්, උන්වහන්සේගේ සළුවේ දවල්ලට
අතගැසුවාය. එකෙණෙහිම ඇගේ ලේ
45 ධාරාව නැවතුණේය. එවිට යේසුස්-
වහන්සේ: මට අතගැසුවේ කවුද්දැයි
ඇසූසේක. අප නොවෙයි සියල්ලන් කී
කල්හි පේතෘස්ද ඔහු සමග සිටියෝද
කථාකොට: ආචාරීනි, සමූහයා ඔබට
හැපෙමින් තෙරපෙමින් සිටිතියි කීවෝය.
46 එහෙත් යේසුස්වහන්සේ: කවුරු නුමුත්
මට අතගැසුවේය. මක්නිසාද මාගෙන්
ආනුභාවය නිකුත්වූ බව මට දැනුණේයයි
47 කීසේක. ඒ ස්ත්‍රී තමා අප්‍රකාශව නොසිටි
බව දැක, වෙව්ලමින් ඇවිත් උන්වහන්සේ
ඉදිරියෙහි වැටී, තමා විසින් උන්වහන්සේට
අතගැසුවේ මක්නිසාද කියාත්
එකෙණෙහිම තමා සුවවුණ හැටිත්
මුළු සෙනඟ ඉදිරියේ ප්‍රකාශකළාය.
48 උන්වහන්සේද: දියණියනි, නුඹේ ඇදහිල්ල
නුඹ සුවකෙළේය; සමාදානයෙන්
පලයන්නැයි ඈට කීසේක.
49 උන්වහන්සේ කථාකරද්දීම සිනාගෝගයේ
මුලාදෑනියාගේ ගෙදරින් කෙනෙක් ඇවිත්:
නුඹේ දූව මැරුණාය; ආචාරීන්වහන්සේට
කරදර නොකරන්නැයි කීවේය.
50 යේසුස්වහන්සේ ඒ අසා: භය නොවන්න.
ඇදහිල්ලෙන්ම සිටපන්න, එවිට
ඈට සුවවන්නේයයි උත්තරදුන්සේක.
51 උන්වහන්සේ ගෙදරට ආ කල, පේතෘස්ද
යොහන්ද යාකොබ්ද යෞවනියගේ පියාද
මවුද හැර වෙන කාටවත් තමන් සමග
ඇතුල්වෙන්ට අවසර නුදුන්සේක.
52 සියල්ලෝම ඈ ගැන අඬමින්ද
වැලපෙමින්ද සිටියෝය. එහෙත්
උන්වහන්සේ කථාකොට: අඬන්ට එපා;
ඈ මැරිලා නොවේ, නිදන්නීයයි කීසේක.
53 ඔව්හු ඈ මළ බව දැන, උන්වහන්සේට
54 නින්ද වශයෙන් සිනාසුණෝය. නුමුත්
උන්වහන්සේ ඇගේ අත අල්ලා: යෞවනිය,
55 නැගිටපන්නැයි ශබ්දනගා කීසේක. එවිට
ඇගේ ආත්මය හැරී ඇවිත්, ඈ
එකෙණෙහිම නැගුටුණාය. ඈට කන්ට
දෙන ලෙස උන්වහන්සේ අණදුන්සේක.
56 ඇගේ මවුපියෝ විස්මිත වූවෝය. නුමුත්
සිදුවූ දේ කාටවත් නොකියන්ට
උන්වහන්සේ ඔවුන්ට අණකළසේක.

## දෙළොස්දෙනා පිටත්කර යැවීම

9 එකල උන්වහන්සේ දෙළොස්දෙනා
කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද
රෝග සුවකරන්ටද බලය සහ වරය
ඔවුන්ට දී, දෙවියන්වහන්සේගේ රාජ්‍යය 2
ප්‍රකාශකරන්ටත් රෝගීන් සුවකරන්ටත්
ඔවුන් යැවූසේක. තවද උන්වහන්සේ 3
ඔවුන්ට කථාකොට: ගමනට කිසිවක්
එනම් සැරයටියක්වත් මල්ලක්වත්
රොටිවත් මුදල්වත් කබා දෙකක්වත්
නොගනිල්ලා. නුඹලා ඇතුල්වන්නේ යම් 4
ගෙදරකටද එහි වාසයකොට, එතැනින්
පිටත්ව පලයල්ලා. නුඹලා පිළි 5
නොගන්න යම් පමණ දෙනෙක් ඇද්ද
නුඹලා ඒ නුවරින් පිටත්ව යන
කල ඔවුන්ට විරුද්ධව සාක්ෂි
පිණිස නුඹලාගේ පාදවල ධූලි
ගසාදමාපල්ලායයි කීසේක. ඔව්හු 6
පිටත්ව හැම තැන්හිම ශුභාරංචිය
දේශනාකරමින්ද රෝග සුවකරමින්ද
ගමින් ගමට ගියෝය.

## හෙරොද්ගේ වික්ෂිප්තය

සිද්ධවූ සියල්ල ගැන දේශාධිපතිවූ 7
හෙරොද් අසා බොහෝ වියවුල්වුණේය.
මක්නිසාද සමහරෙක්: යොහන්
මළවුන්ගෙන් නැගුට්ටුණේය කියාත්,
සමහරෙක්: එලියා පහළවුණේය කියාත්, 8
අන් සමහරෙක්: පෙර සිටි
අනාගතවක්තෘවරුන්ගෙන් එක්කෙනෙක්
නැගුට්ටුණේය කියාත් කීවෝය. එවිට 9
හෙරොද් කථාකොට: මම යොහන්ගේ
හිස කැප්පෙවීමි. නුමුත් මා අසන මෙබඳු
දේ කරන තැනැත්තා කවුදැයි කීවේය.
ඔහු උන්වහන්සේ දකින්ට සෙවීය.

## පන්දහසකට කන්ට දීම

ප්‍රේරිතයෝ හැරී ඇවිත් තමුන් කළ 10
දේවල් උන්වහන්සේට ප්‍රකාශකළෝය.
එවිට උන්වහන්සේ ඔවුන් වෙන්කොට
කැඳවාගෙන බෙත්සයිද නම් නුවරකට
ගියසේක. එහෙත් සමූහයෝ එය 11
දැනගෙන උන්වහන්සේ අනුව ගියෝය.
උන්වහන්සේ ඔවුන් පිළිගෙන,

දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන
ඔවුන්ට කථාකොට, සුවය ඕනෑ අයට
12 සුවකළසේක. සවස්වෙන්ට පටන්ගත් කල
දෙළොස්දෙනා උන්වහන්සේ ළඟට ඇවිත්
කථාකොට: මෙහි වනාන්තර ස්ථානයක
අප සිටින බැවින් වටකර තිබෙන ගම්
හා නියම්ගම්වලට ගොස් නවාතැන්ද
කෑමද සපයාගන්ට සමූහයා හැරිය
13 මැනවයි කීවෝය. එහෙත් උන්වහන්සේ:
තුඹලා ඔවුන්ට කන්ට දීපල්ලායයි
කීසේක. අප ගොස් මේ මුළු සෙනඟට
කෑම මිලදී ගත්තොත් මිස අප ළඟ
රොටි පහකටත් මසුන් දෙදෙනෙකුටත්
14 වඩා නැතැයි ඔව්හු කීවෝය. මක්නිසාද
පුරුෂයෝම පන්දහසක් පමණ සිටියෝය.
එවිට උන්වහන්සේ: ඔවුන් පණස්
දෙනා බැගින් කණ්ඩායම් වශයෙන්
හිඳුවාපල්ලායයි ගෝලයන්ට කීසේක.
15 ඔව්හු එසේ කොට සැම දෙනාම
16 හිඳගන්ට සැලැස්සුවෝය. එකල
උන්වහන්සේ රොටි පහත් මසුන්
දෙදෙනත් රැගෙන, ස්වර්ගය දෙස බලා
ඒවාට ආශීර්වාදකොට, කඩා, සමූහයා
ඉදිරියෙහි තබන පිණිස ගෝලයන්ට
17 දුන්සේක. සියල්ලෝම කාලා තෘප්තියට
පැමිණියෝය. ඔවුන් නොකා ඉතිරිවූ
කැබලිවලින් කූඩා දෙළොසක්
එකතුකරගන්නාලද්දේය.

## යේසුස්වහන්සේ ක්‍රිස්තුස්ය කියා පේත්‍රුස් කියා සිටීම

18 ඉන්පසු උන්වහන්සේ තනියම
යාච්ඤාකරද්දී ගෝලයෝ උන්වහන්සේ
සමග සිටියෝය. එවිට උන්වහන්සේ:
මා කවුරුය කියා මනුෂ්‍යයෝ කියද්දැයි
19 ඔවුන්ගෙන් ඇසූසේක. ඔව්හු උත්තර
දෙමින්: *යොහන් බව්තීස්තය; එහෙත්
සමහරෙක් එලියාය; අන් සමහරෙක්,
පුරාණ අනාගතවක්තෘවරුන්ගෙන්
එක්කෙනෙක් නැවත නැගිට සිටීය කියා
20 කියතියි කීවෝය. නුමුත් තුඹලා මා
කවුරුය කියනවාදැයි උන්වහන්සේ
ඔවුන්ගෙන් ඇසූසේක. පේත්‍රුස්
උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ
21 ක්‍රිස්තුස්යයි කීවේය. උන්වහන්සේද මෙය
කාටවත් නොකියන ලෙස ඔවුන්ට තදින්
අණකොට: මනුෂ්‍ය පුත්‍රයා බොහෝ 22
වධවිඳින්ටත් වැඩිමහල්ලන් විසින්ද
නායක පූජකයන් විසින්ද ලියන්නන්
විසින්ද එපාකරනු ලබන්ටත් මරනු
ලබන්ටත් තුන්වෙනිද නැගිටින්ටත්
ඕනෑයයි කීසේක.

## කුරුසිය උසුලාගෙන ක්‍රිස්තුස්වහන්සේ අනුගමනයකිරීම

උන්වහන්සේ සියල්ලන්ට කථාකොට: 23
යමෙක් මා පස්සේ එන්ට කැමති නම්,
ඔහු තමාගේම ආශා වලකාගෙන,
දවස්පතා තමාගේ කුරුසිය රැගෙන, මා
අනුව ඒවා. මක්නිසාද තමාගේ ජීවිතය 24
ගළවාගන්ට කැමති අයට එය නැතිවේ;
නුමුත් මා නිසා තමාගේ ජීවිතය
නැතිකරගන්න අය එය ගළවාගන්නේය.
මනුෂ්‍යයෙක් මුළු ලෝකය ලබාගත්තත් 25
තමාම නැතිකරගත්තොත් නොහොත්
විනාශකරගත්තොත් ඔහුට මොන
ලාභයක්ද? මක්නිසාද යමෙක් මා ගැනත් 26
මාගේ වචන ගැනත් ලජ්ජාවන්නේද,
මනුෂ්‍ය පුත්‍රයා තමන්ගේද පියාණන්ගේද
ශුද්ධවූ දේවදූතයන්ගේද තේජසින් යුක්තව
එන කල උන්වහන්සේ ඔහු
ගැනත් ලජ්ජාවනසේක. එහෙත් මෙහි 27
සිටින්නන්ගෙන් සමහරෙක් දෙවියන්-
වහන්සේගේ රාජ්‍යය දකින තුරු කිසිසේත්
මරණ රසය නොවිඳින්නෝයයි සැබවින්
තුඹලාට කියමියි කීසේක.

## යේසුස්වහන්සේ අන්වෙසක් වීම

තවද මේ වචන කියා අට දවසකට 28
පමණ පසු උන්වහන්සේ පේත්‍රුස්ද
යොහන්ද යාකොබ්ද කැඳවාගෙන
යාච්ඤාකරන පිණිස කන්දට නැගුණු-
සේක. උන්වහන්සේ යාච්ඤාකරද්දී 29
උන්වහන්සේගේ මුහුණේ ආකාරය
වෙනස්විය, උන්වහන්සේගේ වස්ත්‍ර
සුදුව බැබළුණේය. එවිට මනුෂ්‍යයෝ 30
දෙදෙනෙක් උන්වහන්සේ සමග
කථාකළෝය, ඔව්හු නම් මෝසෙස් සහ
එලියාය. ඔව්හු තේජසින් යුක්තව පෙනී, 31

*අවගාහක යොහන්ය.

උන්වහන්සේ යෙරුසලමේදී සිදුකරන්ට
තිබුණු උන්වහන්සේගේ ඉකුත්වීම ගැන
32 කථාකරමින් සිටියෝය. පේත්‍රුස්ද ඔහු
සමග සිටියෝද නිදිබරව උන්නෝය.
ඔව්හු හොඳටම පිබිද, උන්වහන්සේගේ
තේජසද උන්වහන්සේ සමග සිටි
33 මනුෂ්‍යයන් දෙදෙනාද දුටුවෝය. තවද
ඔවුන් උන්වහන්සේ වෙතින් වෙන්ව යද්දී,
පේත්‍රුස් තමා කියන්නේ කුමක්දැයි
නොදන්නේ: ආචාරීනි, අපට මෙහි සිටීම
යහපත. එබැවින් කුඩාරම් තුනක් සාදමු;
ඔබට එකක්ය, මෝසෙස්ට එකක්ය,
එලියාට එකක්යයි උන්වහන්සේට
34 කීවේය. ඔහු මේ කාරණා කියද්දීම
වලාපටලයක් පැමිණ, ඔවුන් මත්තෙහි
පැතිර තිබුණේය. වලාකුළට ඇතුල්වූ
35 කල ඔව්හු භයවූවෝය. එවිට: මේ මාගේ
පුත්‍රයාණෝය, මාගේ තෝරාගත්
තැනැත්තේය. මොහුට ඇහුම්කන්-
දීපල්ලායයි වලාකුළෙන් හඬක්
36 නික්මුණේය. ඒ හඬ පැමිණි කල
යේසුස්වහන්සේ තනියම සිටිනවා
පෙනුණේය. ඔව්හු නිශ්ශබ්දව සිට, තමුන්
දුටු දේවලින් කිසිවක් ඒ දවස්වලදී
කාටවත් නොකීවෝය.

## මීමස්මර රෝගකාර ළමයා සුවපත්කිරීම

37 තවද පසුවද ඔවුන් කන්දෙන් බැස්ස
කල මහත් සමූහයක් උන්වහන්සේට
38 සම්මුඛවූවෝය. සමූහයා අතරෙන්
එක්කෙනෙක් මොරගසමින් කියනුයේ:
ආචාරීනි, මාගේ පුත්‍රයා දෙස බලන
මෙන් ඔබගෙන් ඉල්ලමි; මක්නිසාද ඔහු
39 මාගේ එකම දරුවාය. ආත්මයක් ඔහුට
ආවේශවේ, ඔහුද හදිසියෙන් මොරගසයි;
ඒ ආත්මය ඔහුට පීඩාකොට, වෙවුලවා,
පෙණදම්මවා, බොහෝ තුවාලකොට,
40 අමාරුවෙන් ඔහුගෙන් අහක්ව යයි. ඔහු
දුරුකරන මෙන් ඔබවහන්සේගේ
ගෝලයන්ගෙන් ඉල්ලුවෙමි; නුමුත් ඔවුන්ට
41 නුපුළුවන්වීයයි කීවේය. යේසුස්වහන්සේ
උත්තරදෙමින්: අහෝ ඇදහිලි නැත්තාවූ
හිතුවක්කාර පරම්පරාව, මම කොපමණ
කල් නුඹලා සමග සිට නුඹලා ගැන
ඉවසම්ද? නුඹේ පුත්‍රයා මෙහි
ගෙනෙන්නැයි කීසේක. ඔහු එද්දීම 42
යක්ෂයා ඔහු බිම හෙළා, ඔහුට
බොහෝසේ පීඩාකෙළේය. නුමුත්
යේසුස්වහන්සේ අශුද්ධාත්මයට
තරවටුකොට, ළමයා සුවකර, ඔහු පියාට
නැවත භාරදුන්සේක. ඔවුන් සියල්ලෝම 43
දෙවියන්වහන්සේගේ මහත්තත්වය ගැන
විස්මයට පත්වූවෝය.

## යේසුස්වහන්සේගේ මරණය ගැන කලින් කීම

උන්වහන්සේ විසින් කළ සියලු දේ
ගැන සියල්ලන්ම පුදුමව සිටියදී,
උන්වහන්සේ තමන් ගෝලයන්ට
කථාකොට: මේ වචන නුඹලාගේ 44
කන්වල බහාගනිල්ලා. මක්නිසාද මනුෂ්‍ය
පුත්‍රයා මනුෂ්‍යයන්ගේ අත්වලට
පාවාදෙනු ලබන්නේයයි කීසේක. නුමුත් 45
ඔවුන්ට ඒ කීම තේරුණේ නැත. ඒක
ඔවුන්ට නොහැඟෙන ලෙස සැඟවී
තිබුණේය. ඔව්හු ඒ කීම ගැන
උන්වහන්සේගෙන් අසන්ට භයවූවෝය.

## සැබෑ උතුම්කම සහ පක්ෂපාතකම

තමුන්ගෙන් වඩා උතුම් තැනැත්තා කවුද 46
කියා ඔවුන් අතරේ විවාදයක්
හටගත්තේය. යේසුස්වහන්සේ ඔවුන්ගේ 47
සිතේ කල්පනාව දැන, කුඩා ළමයෙකු
ගෙන තමන් ළඟ සිටුවා: යමෙක් මාගේ 48
නාමයෙන් මේ කුඩා ළමයා පිළිගන්නේද
ඔහු මා පිළිගන්නේය. යමෙක්
මා පිළිගන්නේද ඔහු මා එවූ
තැනන්වහන්සේ පිළිගන්නේය. කුමක්
හෙයින්ද නුඹලා සියල්ලන් අතරෙහි ඉතා
කුඩා අයම උතුම්යයි ඔවුන්ට කීසේක.
යොහන් උත්තරදෙමින්: ආචාරීනි, 49
එක්කෙනෙකු ඔබගේ නාමයෙන් යක්ෂයන්
දුරුකරනවා දුටිමුව; ඔහු අප අනුව
නේන නිසා ඔහුට තහනම්කෙළෙමුයයි
කීවේය. නුමුත් යේසුස්වහන්සේ: 50
තහනම්කරන්ට එපා. මක්නිසාද නුඹලාට

විරුද්ධ නැති තැනැත්තේ නුඹලාගේ
පක්ෂයටයයි ඔහුට කීසේක.

### යේසුස්වහන්සේ යෙරුසලමට පිටත්ව යාම. සමාරියයන් විසින් උන්වහන්සේ එපාකිරීම

51 තවද උන්වහන්සේ ඔසවාගනු ලබන
දවස් ආසන්නවූ කල, උන්වහන්සේ
යෙරුසලමට යන පිණිස ස්ථිරලෙසින්
තමන් මුහුණ යොමුකොට, තමන්ට
52 පෙරටුව දූතයන් ඇරියසේක. ඔව්හු
ගොස් උන්වහන්සේට උවමනා දේ
පිළියෙළකරන පිණිස සමාරිවරුන්ගේ
53 ගමකට ඇතුල්වූවෝය. නුමුත්
උන්වහන්සේ යෙරුසලම දෙසම බලා
යන්නාක්මෙන් පෙනුණු නිසා ඔව්හු
උන්වහන්සේ පිළි නොගත්තෝය.
54 උන්වහන්සේගේ ගෝලයෝවූ යාකොබ්ද
යොහන්ද ඒ දැක: ස්වාමිනි, ඔවුන් නාස්ති
කරන පිණිස අහසින් ගිනි බසින්ට
අප අණකරනවාට ඔබ කැමතිසේක්දැයි
55 ඇසුවෝය. නුමුත් උන්වහන්සේ හැරී
56 ඔවුන්ට තරවටුකළසේක. එවිට ඔව්හු
වෙන ගමකට ගියෝය.

### චපල ගෝලයන් තුන්දෙනෙක්

57 ඔවුන් මාර්ගයේ යද්දී එක්තරා
මනුෂ්‍යයෙක්: ඔබවහන්සේ යන
කොතැනට නුමුත් මමත් ඔබ අනුව
58 එන්නෙමියි කීවේය. යේසුස්වහන්සේද:
සිවලුන්ට බෙනත් ආකාශයේ පක්ෂීන්ට
කූඩුත් තිබේ; නුමුත් මනුෂ්‍ය පුත්‍රයාට
හිස තබන්ට තැනක් නැතැයි ඔහුට
59 කීසේක. උන්වහන්සේ තවත් කෙනෙකුට:
මා අනුව වරෙන්නැයි කීසේක. නුමුත්
ඔහු: ස්වාමිනි, පළමුකොට ගොස් මාගේ
පියාණන් භූමදනකරන්ට මට අවසර
60 දුන මැනවයි කීවේය. උන්වහන්සේද:
මළාවූ අය තමුන්ගේ මළවුන්
තැන්පත්කරත්වා; නුඹ ගොස් දෙවියන්-
වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශකරපන්නැයි
61 ඔහුට කීසේක. තවත් කෙනෙක්ද:
ස්වාමිනි, ඔබ අනුව එන්නෙමි; නුමුත්
පළමුකොට මාගේ ගෙදර සිටින්නන්ගෙන්
අවසර ගෙන එන්ට මට ඉඩදුන මැනවයි
කීවේය. එහෙත් යේසුස්වහන්සේ: නගුලේ 62
අත තබා ආපසු බලන කිසිවෙක්
දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සුදුසු
නැතැයි ඔහුට කීසේක.

### සැත්තෑදෙනා යවනු ලැබ හැරී ඊම

10 ඉන්පසු ස්වාමීන්වහන්සේ තවත්
සැත්තෑ දෙනෙකු නියමකොට
තමන් යන්ට සිටිය සියලු නුවරවලටත්
ස්ථානවලටත් ඔවුන් දෙදෙනා බැගින්
තමන්ට පෙරටුව යැවූසේක. උන්වහන්සේ 2
ඔවුන්ට කථාකොට: ගොයම බොහෝය,
මෙහෙකරුවෝ ස්වල්ප දෙනෙක්ය. ඒ
නිසා තමන්ගේ ගොයම් කැපීමට
මෙහෙකරුවන් එවන ලෙස ගොයමේ
ස්වාමීන්වහන්සේට යාච්ඤා කරපල්ලා.
නුඹලා පලයල්ලා. බලව, වෘකයන් මැදට 3
බැටළු පැටවුන් මෙන් නුඹලා යවමි.
පසුම්බියක්වත් මල්ලක්වත් වහන්වත් 4
ගෙන නොයල්ලා. මාර්ගයේදී කාටවත්
ආචාර නොකරල්ලා. නුඹලා යම් 5
ගෙයකට ඇතුල්වූ කල: මේ ගෙට
සමාදනය වේවයි පළමුකොට
කියාපල්ලා. සමාදනයේ පුත්‍රයෙක් එහි 6
සිටී නම් නුඹලාගේ සමාදනය ඔහු
කෙරෙහි රඳන්නේය. නැතහොත් එය
නුඹලා කරා පැමිණෙන්නේය. ඔවුන් 7
දෙන දෙයක් කමින් බොමින් එම ගෙයිම
නැවතී සිටපල්ලා. මක්නිසාද වැඩකාරයා
තමාගේ කුලිය ලබන්ට සුදුසුය. ගෙයින්
ගෙට නොයල්ලා. නුඹලා යම් නුවරකට 8
ඇතුල්වූ කල ඔව්හු නුඹලා පිළිගන්නෝ
නම්, නුඹලා ඉදිරියෙහි තබන දේ
කාපල්ලා. එහි ඉන්න රෝගීන් 9
සුවකරපල්ලා, දෙවියන්වහන්සේගේ
රාජ්‍යය නුඹලා ළඟට පැමුණුණේයයි
ඔවුන්ට කියාපල්ලා. නුමුත් යම් නුවරකට 10
නුඹලා ඇතුල්වූ කල ඔව්හු නුඹලා පිළි
නොගන්නෝ නම් ඒ නුවර වීථිවලට
ගොස්: අපේ පාදවල ඇලෙන නුඹලාගේ 11
නුවර ධූලි පවා නුඹලාට විරුද්ධව
අපි ගසාදමමුව. එසේවී නුමුත්

දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළංවී තිබෙන
12 බව දැනගනිල්ලායයි කියාපල්ලා. නුඹලාට
කියමි–ඒ දවසෙහි ඒ නුවරට වඩා
සොදොමට ඉවසිය හැකි වන්නේය.
13 කොරාශීන්, තිට දුක්වේ! බෙත්සයිද, තිට
දුක්වේ! තොප ඇතුළේ කළ බලවත්
ක්‍රියා තීර් හා සීදොන්හි කළා නම්, ඔව්හු
මීට ප්‍රථම ගෝනිරෙදි ඇඳ, අලුයෙහි
ඉඳ, පසුතැවිල්ලට පැමුණුණෝ වෙති.
14 එසේවී නුමුත් විනිශ්වයෙහිදී තොපට
වඩා තීර් හා සීදොන්ට ඉවසිය
15 හැකිවන්නේය. එම්බා කපර්ණවුම, තී
ස්වර්ගය දක්වා උසස්කරනු ලබන්නීද?
පාතාලය දක්වා පහතට හෙළනු
16 ලබන්නීය. නුඹලාගේ වචන අසන්නා
මාගේ වචන අසයි; නුඹලා එපාකරන්නා
මා එපාකරයි; මා එපාකරන්නා මා
එවූ තැනන්වහන්සේ එපාකරන්නේයයි
කීසේක.
17 ඉන්පසු සැත්තෑදෙනා ප්‍රීතියෙන් හැරී
ඇවිත්: ස්වාමිනි, ඔබගේ නාමය නිසා
යක්ෂයෝ පවා අපට යටත්වෙතියි
18 කීවෝය. උන්වහන්සේ ඔවුන්ට කියන-
සේක්: සාතන් විදුලිය මෙන් අහසෙන්
19 වැටුණා දුටිමි. බලව, සර්පයන්ද
ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු
ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින්
නුඹලාට බලය දී තිබේ. කොයි
දෙයකින්වත් නුඹලාට අන්තරායක්
20 නොවන්නේය. එසේවුවත් ආත්මයන්
නුඹලාට යටත්වන නිසා නොව
නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා
තිබෙන නිසා ප්‍රීතිවෙයල්ලායයි කීසේක.

## යේසුස්වහන්සේගේ ස්තුති වාක්‍යය

21 ඒ පැයේදීම උන්වහන්සේ
ශුද්ධාත්මයෙන් ප්‍රීතිමත්ව කියනසේක්:
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමිවූ
පියාණෙනි, ඔබවහන්සේ ප්‍රඥවන්තයන්ටත්
නුවණ ඇත්තන්ටත් මේ කාරණා සඟවා
බාලයන්ට එළිදරව්කළ බැවින් ඔබට
ස්තුතිකරමි. එසේය, පියාණෙනි; මක්නිසාද
22 ඔබගේ කැමැත්ත එසේ විය. මාගේ
පියාණන්වහන්සේ විසින් සියල්ල මට
භාරදී තිබේ. පියාණන්වහන්සේ මිස
අන් කිසිවෙක් පුත්‍රයා කවුද කියා
නොදනියි; පුත්‍රයාත් පුත්‍රයා
විසින් යමෙකුට පියාණන්වහන්සේ
එළිදරව්කරන්ට කැමතිද ඔහුත් හැර අන්
කිසිවෙක් පියාණන්වහන්සේ කවුද කියා
දන්නේ නැතැයි කීසේක. එවිට 23
උන්වහන්සේ ගෝලයන් දෙසට හැරී
අප්‍රසිද්ධයෙන් කියනසේක්: නුඹලා දකින
දේ දකින ඇස් වාසනාවන්තය.
මක්නිසාද නුඹලාට කියමි–නුඹලා 24
දකින දේ දකින්ටත් අසන දේ අසන්ටත්
බොහෝ අනාගතවක්තෘවරුද රජවරුද
ආශාවෙන් සිටියෝය; නුමුත් දුටුවේවත්
ඇසුවේවත් නැතැයි කීසේක.

## සදාකාල ජීවනය ලබාගන්න අන්දම

බලව, ව්‍යවස්ථාව උගන්වන්නෙක් 25
නැගිට උන්වහන්සේ පරීක්ෂාකරමින්:
ආචාරීනි, සදාකාල ජීවනය උරුමකර
ගන්න පිණිස මා විසින් කුමක්
කටයුතුදැයි ඇසුවේය. උන්වහන්සේද: 26
ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන්නේ
කිමෙක්ද? නුඹ කියවන්නේ කෙසේදැයි
ඇසූසේක. ඔහු උත්තරදෙමින්: නුඹේ මුළු 27
හෘදයෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද
නුඹේ මුළු ශක්තියෙන්ද නුඹේ මුළු
බුද්ධියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේටත් නුඹට මෙන් නුඹේ
අසල්වාසියාටත් ප්‍රේමකරව යනුයයි
කීවේය. උන්වහන්සේ: නුඹ උත්තරදුන්නා 28
හරිය. එසේ කරපන්න, එවිට නුඹ
ජීවත්වන්නෙහියයි ඔහුට කීසේක. නුමුත්
ඔහු නිදෙස්වෙන්ට කැමතිව: මාගේ 29
අසල්වාසියා කවුදැයි යේසුස්වහන්සේගෙන්
ඇසුවේය.

## යහපත් සමාරියයා ගැන උපමා කථාව

යේසුස්වහන්සේ උත්තරදෙමින් 30
කියනසේක්: එක්තරා මනුෂ්‍යයෙක්
යෙරුසලමෙන් යෙරිකෝවට යන කල
සොරුන්ට අසුවිය; සොරු ඔහුගේ වස්ත්‍ර

පැහැරගෙන, ඔහුට පහරදී, ඔහු අඩපණකර
31 ගියෝය. එක්තරා පූජකයෙක් අහම්බෙන්
ඒ මාර්ගයෙන් යනුයේ ඔහු දැක අනික්
32 පැත්තෙන් ගියේය. එසේම ලෙවීයයෙක්ද
එතැනට පැමිණ ඔහු දැක අනික් පැත්තෙන්
33 ගියේය. නුමුත් එක්තරා සමාරියයෙක්
ගමන් යන අතර ඔහු සිටි තැනට ඇවිත්,
34 ඔහු දැක අනුකම්පාකොට, ළඟට ගොස්,
ඔහුගේ තුවාලවලට තෙල්ද මුද්‍රිකපානයද
වත්කොට තුවාල බැඳ, තමාගේම
මෘගයා පිට හිඳුවාගෙන, තානායමකට
35 ගෙන ගොස්, ඔහු බලාගත්තේය. පසුවද
ඔහු මසු දෙකක් රැගෙන තානායම්කාරයාට
දී: මොහු බලාගනින්න; මීට වැඩියෙන්
නුඹ වියදම්කරන දෙයක් මම නැවත
ආ කල නුඹට ගෙවන්නෙමියි කීවේය.
36 ඉඳින් සොරුන් අතට අසුවූ තැනැත්තාට
මොවුන් තුන්දෙනාගෙන් අසල්වාසියා
වූණේ කවරෙක කියා නුඹ සිතන්නෙහිදැයි
37 ඇසූසේක. ඔහුට කරුණාකළ
තැනැත්තේයයි ඔහු කීවේය. නුඹත් ගොස්
එලෙසම කරපන්නැයි යේසුස්වහන්සේ
ඔහුට කීසේක.

## මාර්තා සහ මරියා

38 තවද ඔවුන් යද්දී උන්වහන්සේ එක්තරා
ගමකට ඇතුල්වූසේක. එවිට මාර්තා
නම් එක්තරා ස්ත්‍රියෙක් තමාගේ ගෙදරට
39 උන්වහන්සේ පිළිගත්තාය. ඈට මරියා
නම් සහෝදරියෙක් සිටියාය; ඈ ස්වාමීන්-
වහන්සේගේ පාද මූලයෙහි හිඳ
40 උන්වහන්සේගේ වචන ඇසුවාය. නුමුත්
මාර්තා බොහෝ උපස්ථානකිරීමෙන්
කරදරව සිටියාය; ඈ උන්වහන්සේ
වෙතට ඇවිත්: ස්වාමීනි, මාගේ සහෝදරී
තනියම උපස්ථානකරන්ට මා හැරිය
බව ඔබ සලකන්නේ නැද්ද? එබැවින්
මට උපකාරකරන ලෙස ඈට කිව
41 මැනවයි කීවාය. නුමුත් ස්වාමීන්වහන්සේ
උත්තරදෙමින්: මාර්තා, මාර්තා, නුඹ
බොහෝ දේවල් ගැන තලංගුවී
42 කැලඹෙන්නෙහිය. නුමුත් ඕනෑකරන්නේ
එක දෙයක්ය. මරියා වනාහි ඈ කෙරෙන්
බැහැර ගනු නොලබන්නාවූ යහපත්
කොටස තෝරාගත්තායයි කීසේක.

## ස්වාමීන්ගේ යාච්ඤාව

11
තවද උන්වහන්සේ එක් තැනක
යාච්ඤාකරමින් සිට නිමවූ පසු,
උන්වහන්සේගේ ගෝලයන්ගෙන්
එක්කෙනෙක් කථාකොට: ස්වාමීනි,
යොහන් තමාගේ ගෝලයන්ට
ඉගැන්නුවාක්මෙන් අපටත් යාච්ඤාකරන්ට
ඉගැන්නුව මැනවයි කීවේය. උන්වහන්සේද 2
ඔවුන්ට කියනසේක්: නුඹලා යාච්ඤාකරන
කල-පියාණෙනි, ඔබගේ නාමයට
ගෞරවවේවා. ඔබගේ රාජ්‍යය ඒවා.
*අපේ දවස්පතා භෝජනය අපට දවසින් 3
දවස දුන මැනව. අපේ පව් අපට 4
කමාකළ මැනව; මක්නිසාද අපට ණයව
සිටින සියල්ලන්ට අපිත් කමාවෙමුව. අප
පරීක්ෂාවට †නොපැමිණෙවුව මැනවයි
කියාපල්ලායයි කීසේක.

## නොකඩව යාච්ඤාකිරීම. රාත්‍රියේ පැමිණි මිත්‍රයා ගැන කථාව

තවද උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: 5
නුඹලා අතරෙහි මිත්‍රයෙක් ඇති කෙනෙක්
මධ්‍යම රාත්‍රියෙහි ඔහු ළඟට ගොස්:
මිත්‍රය, රොටි තුනක් මට ණයට දියන්න;
මක්නිසාද ගමනක් යන මාගේ මිත්‍රයෙක් 6
මා ළඟට ඇවිත් සිටියි, ඔහු ඉදිරියෙහි
තබන්ට කිසිවක් මා ළඟ නැතැයි
කියන්නේ නම්, ඔහු ඇතුළේ සිට 7
උත්තරදෙමින්: මට වෙහෙස නොකරන්න.
දැන් දොර වසා තිබේ, මාගේ දරුවෝ
මා සමග නිදාගෙන සිටිති; නැගිට නුඹට
දෙන්ට බැරියයි කියයිද? නුඹලාට 8
කියම්-ඔහු තමාගේ මිත්‍රයෙකු නිසා
නැගිට ඔහුට නොදෙතත්, ඔහුගේ
කන්නලව්ව නිසා නැගිට ඔහුට ඕනෑ

*නොයෙක් පුරාණ පිටපත්වලට මෙය එකතුකර තිබේ: ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. ශු. මතෙව් 6. 10 බලනු.

†නොයෙක් පුරාණ පිටපත්වලට මෙය එකතුකර තිබේ: නොපමුණුවා නපුරාගෙන් (නොහොත් නපුරෙන්) අප ගැළවුව මැනව. ශු. මතෙව් 6. 13 බලනු.

9 පමණ දෙන්නේයයි කීසේක. මමද
තුඹලාට කියමි: ඉල්ලාපල්ලා, එවිට
තුඹලාට දෙනු ලැබේ; සොයාපල්ලා,
එවිට තුඹලාට සම්බවේ; තට්ටුකරපල්ලා;
එවිට තුඹලාට දෙර හරිනු ලැබේ.
10 මක්නිසාද ඉල්ලන සියල්ලන්ට ලැබේ;
සොයන්නාට සම්බවේ; තට්ටු කරන්නාට
11 දෙර හරිනු ලැබේ. තුඹලා අතරෙන්
කොයි පියෙක් තමාගේ පුත්‍රයා රොටියක්
ඉල්ලුවාම ඔහුට ගලක් දෙයිද?
නොහොත් මත්ස්‍යයෙකු ඉල්ලුවාම
මත්ස්‍යයා වෙනුවට ඔහුට සර්පයෙකු
12 දෙයිද? නොහොත් බිත්තරයක් ඉල්ලුවාම
13 ඔහුට ගෝනුස්සෙකු දෙයිද? මෙසේ
නපුරුවූ තුඹලා තුඹලාගේ දරුවන්ට
යහපත් දේ දෙන්ට දනිවූ නම්, කොපමණ
වැඩියෙන් තුඹලාගේ ස්වර්ගීය
පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන්
ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙන-
සේක්දැයි කීසේක.

## යක්ෂාධිපති බෙල්සෙබුබ් යේසුස්-වහන්සේ හා සම්බන්ධකර අපහාස කිරීම

14 උන්වහන්සේ ගොළු යක්ෂයෙකු
දුරුකරමින් සිටිසේක. තවද යක්ෂයා
දුරුවූ කල ගොළුවා කථාකෙළේය;
15 සමූහයෝ පුදුමවූවෝය. නුමුත් ඔවුන්ගෙන්
සමහරෙක් කථාකොට: ඔහු යක්ෂයන්
දුරුකරන්නේ යක්ෂාධිපතිවූ බෙල්සෙබුබ්
16 කරණකොටගෙනයයි කීවෝය. අන්
සමහරු උන්වහන්සේ පරීක්ෂාකරමින්,
අහසෙන් ලකුණක් උන්වහන්සේගෙන්
17 ඉල්ලුවෝය. නුමුත් උන්වහන්සේ ඔවුන්ගේ
සිතිවිලි දැන ඔවුන්ට කියනසේක්: තමාටම
විරුද්ධව භේදවූ යම් රාජ්‍යයක් ඇද්ද
ඒක පාළුවන්නේය; ගෙදරකට භේදවූ
18 ගෙදරක් වැටියන්නේය. ඉදින් සාතන්
තමාටම විරුද්ධව භේදව සිටී නම් ඔහුගේ
රාජ්‍යය පවතින්නේ කෙසේද? මක්නිසාද
මා යක්ෂයන් දුරුකරන්නේ බෙල්සෙබුබ්
කරණකොටගෙනයයි තුඹලා කියන්නහුය.
19 නුමුත් මම බෙල්සෙබුබ් කරණකොටගෙන
යක්ෂයන් දුරුකරමි නම්, තුඹලාගේ
පුත්‍රයෝ කවරෙකු කරණකොටගෙන
ඔවුන් දුරුකරද්ද? එහෙයින් ඔව්හු
තුඹලාගේ විනිශ්චයකාරයෝ වන්නෝය.
නුමුත් මම දෙවියන්වහන්සේගේ 20
ඇඟිල්ලෙන් යක්ෂයන් දුරුකරම් නම්,
සැබවින් දෙවියන්වහන්සේගේ රාජ්‍යය
තුඹලා කෙරෙහි පැමිණ තිබේ.
යුද්ධායුධවලින් සැරසුණාවූ බලවන්තයා 21
තමාගේ ගෙය රක්ෂාකරන කල, ඔහුගේ
දේපළ සුරක්ෂිතව තිබේ. නුමුත් ඔහුට 22
වඩා බලවන්තයෙක් ඔහු කරා පැමිණි
කල, ඔහු පරාජයකොට, ඔහු විශ්වාසකළ
ඔහුගේ සියලු යුද්ධායුධ උදුරාගෙන,
කොල්ලකාගත් දේ බෙදදෙන්නේය.
මාගේ පක්ෂයට නොසිටින්නා මට 23
විරුද්ධය; මා සමග රැස් නොකරන්නා
විසුරුවන්නේය. අශුද්ධාත්මය 24
මනුෂ්‍යයාගෙන් දුරුව ගිය කල, නිවාඩු
සොයමින්, දිය නැති තැන්වල ඇවිද,
එය නොලැබුණු බැවින්, ඔහු කථාකොට:
මම පිටත්ව ආ මාගේ ගෙට හැරී
යමියි කියයි. ඔහු එහි පැමිණි කල, එය 25
අතුගා සරහා තිබෙනවා සම්බවේ. එවිට 26
ඔහු ගොස් තමාට වඩා නපුරුවූ වෙන
ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව
ගෙන එන්නේය; ඔව්හු ඇතුල්ව එහි
වාසයකරති. එවිට ඒ මනුෂ්‍යයාගේ පළමු
ස්වභාවට වඩා අන්තිම ස්වභාව නපුරු
වන්නේයයි කීසේක.
තවද උන්වහන්සේ මේ වචන කියද්දී 27
සමූහයා අතරෙන් එක්තරා ස්ත්‍රියෙක්
ශබ්දනගා: ඔබවහන්සේ දරූ කුසයද
ඔබවහන්සේට කිරිදුන් තනද
වාසනාවන්තයයි උන්වහන්සේට කීවාය.
උන්වහන්සේද කථාකොට: එසේය, ඊට 28
වඩා දෙවියන්වහන්සේගේ වචනය
අසා එය පවත්වන්නෝ සැබවින්ම
වාසනාවන්තයෝයයි කීසේක.

## ලකුණු සෙවීම ගැන

සමූහයන් උන්වහන්සේ වෙත රැස්ව 29
එන කල්හි උන්වහන්සේ කථාකරන්ට
පටන්ගෙන: මේ පරම්පරාව නපුරු
පරම්පරාවක්ය. ඔව්හු ලකුණක් සොයති;

නුමුත් යෝනාගේ ලකුණ මිස වෙන
ලකුණක් ඔවුන්ට දෙනු නොලබන්නේය.
30 මක්නිසාද යෝනා නිනිවයේ වැසියන්ට
යම්සේ ලකුණක් වීද, එසේම මනුෂ්‍ය
පුත්‍රයා මේ පරම්පරාවට ලකුණක්
31 වන්නේය. දකුණු දික්හි බිසව මේ
පරම්පරාවේ මනුෂ්‍යයන් සමග විනිශ්චයේදී
නැගිට ඔවුන් වරදට පත්කරන්නීය.
මක්නිසාද ඈ සාලමොන්ගේ ප්‍රඥව
අසන පිණිස පොළොවේ සීමාවල සිට
ආවාය. බලව, සාලමොන්ට වඩා උතුම්
32 කෙනෙක් මෙහි සිටියි. නිනිවයේ
මනුෂ්‍යයෝ මේ පරම්පරාව සමග
විනිශ්චයේදී නැගිට ඔවුන් වරදට
පත්කරන්නෝය. මක්නිසාද යෝනාගේ
දේශනාවෙන් ඔව්හු පසුතැවිලි වූවෝය.
බලව, යෝනාට වඩා උතුම් කෙනෙක්
මෙහි සිටියි.

## පහන සහ එහි එළිය

33 කිසිවෙක් පහනක් දල්වා, ඇතුල්වන්නන්ට
එළිය ලැබෙන පිණිස පහන්රුක උඩ
තබනවා මිස, යට ගබඩාවකවත්
34 කුරුණියක් යටවත් නොතබයි. ශරීරයේ
පහන නම් නුඹේ ඇසය. නුඹේ ඇස
පැහැදිලිව තිබෙන විට නුඹේ මුළු
ශරීරයත් එළියවන්නේය; නුමුත් එය
නරකව තිබෙන විට නුඹේ ශරීරයත්
35 අඳුරුවන්නේය. එබැවින් නුඹ තුළ තිබෙන
එළිය අඳුරු නොවන ලෙස බලාගනින්න.
36 ඒ නිසා නුඹේ මුළු ශරීරය එහි අඳුරු
තැනක් නැතුව එළියෙන් පිරී තිබේ නම්,
පහන දීප්තිමත්ව බැබළීමෙන් නුඹට එළිය
දෙන ලෙසම, ඒක සම්පූර්ණයෙන්ම
එළියවන්නේයයි කීසේක.

## ඵරිසිවරුන්ට සහ ව්‍යවස්ථාව උගන්වන්නන්ට තරවටු ප්‍රකාශය

37 උන්වහන්සේ කථාකරද්දී ඵරිසියෙක්
තමා සමග කෑම කන මෙන්
උන්වහන්සේගෙන් ඉල්ලුවේය. උන්වහන්සේ
38 ඇතුල්ව කෑමට වැඩහුන්සේක. ඵරිසියා
ඒ දැක උන්වහන්සේ කෑමට පළමුවෙන්
අත් නොසේදූ නිසා පුදුමවුණේය.
ස්වාමීන්වහන්සේ ඔහුට කියනසේක්: 39
ඵරිසිවරුවූ නුඹලා කුසලානේද තලියේද
පිට පැත්ත පවිත්‍රකරන්නෝය; නුමුත්
නුඹලාගේ ඇතුල් පැත්ත කොල්ලකෑමෙන්ද
දුෂ්ටකමෙන්ද පිරී තිබේ. අඥානයෙනි, 40
පිට පැත්ත සෑදූ තැනන්වහන්සේ ඇතුල්
පැත්තත් නොසෑදූසේක්ද? එසේවී නුමුත් 41
ඇතුළේ තිබෙන ඒ දෙයින් දන් දීපල්ලා;
එවිට සියල්ලම නුඹලාට පවිත්‍රවේ.
ඵරිසිවරුනි, නුඹලාට දුක්වේ! 42
මක්නිසාද නුඹලා පුවඳ තළාවලින්ද
දුරුවලින්ද සියලු පලා වර්ගවලින්ද
දශයෙන් එකක් දෙන නුමුත් යුක්තියද
දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රේමයද
අත්හරින්නහුය. එහෙත් නුඹලා විසින් ඒ
දේත් නැර මේ දේත් කටයුතුව තිබුණේය.
ඵරිසිවරුනි, නුඹලාට දුක්වේ! මක්නිසාද 43
නුඹලා සිනගෝගවලදී ප්‍රධාන
ආසනවලටද වෙළඳම්පළවලදී ආචාර
ලැබීමටද කැමතිවන්නහුය. නුඹලාට 44
දුක්වේ! මක්නිසාද නුඹලා නොපෙනෙන
සොහොන් ගෙවලට සමානය, ඒවා උඩ
ඇවිදින මිනිස්සු ඒවා නොදනිතියි
කීසේක.
ව්‍යවස්ථාව උගන්වන්නන්ගෙන් 45
එක්කෙනෙක් උත්තරදෙමින්: ආචාරීනි,
ඔබ මෙසේ කීමෙන් අපටත් දෝෂා-
රෝපණයකරනසේකැයි කීවේය.
උන්වහන්සේ කියනසේක්: ව්‍යවස්ථාව 46
උගන්වන්නෙනි, නුඹලාටත් දුක්වේ!
මක්නිසාද උසුලන්ට අමාරු බර නුඹලා
මනුෂ්‍යයන් පිට තබන්නහුය, නුමුත්
නුඹලාගේ එක ඇඟිල්ලක්වත් ඒ බරවලට
තබන්නේ නැත. නුඹලාට දුක්වේ! 47
මක්නිසාද නුඹලාගේ පියවරුන්
විසින් මැරූ අනාගතවක්තෘවරුන්ගේ
සොහොන්කොත් නුඹලා ගොඩනගන්නහුය.
මෙසේ නුඹලා නුඹලාගේ පියවරුන්ගේ 48
ක්‍රියාවලට සාක්ෂිකාරයෝව, ඊට
එකඟවන්නහුය. මක්නිසාද ඔව්හු
ඔවුන් මැරුවෝය, නුඹලා ඔවුන්ගේ
සොහොන්කොත් ගොඩනගන්නහුය.
එහෙයින් දෙවියන්වහන්සේගේ ප්‍රඥව 49
තොමෝ කියන්නී: අනාගතවක්තෘන්ද
ප්‍රේරිතයන්ද ඔවුන් ළඟට යවන්නෙමි;

ඔව්හු ඔවුන්ගෙන් සමහරෙකු මරා
50 සමහරෙකුට පීඩාකරන්නෝය; මෙසේ
ආබෙල්ගේ ලේ පටන් පූජාසනයටත්
ශුද්ධස්ථානයටත් අතරෙහි මරන
51 ලද සෙකරියාගේ ලේ දක්වා, ලෝකය
මැවීමේ පටන් වගුරුවනලද සියලු
ප්‍රොපේතවරුන්ගේ ලේ මේ පරම්පරාවෙන්
අයකරනු ලබන්නේයයි කීසේක. එසේය,
මේ පරම්පරාවෙන් අයකරනු
52 ලබන්නේයයි නුඹලාට කියමි. ව්‍යවස්ථාව
උගන්වන්නෙනි, නුඹලාට දුක්වේ! නුඹලා
දැනගැනීමේ යතුර රැගෙන ගියහුය.
නුඹලාම ඇතුල්වුණේ නැත,
ඇතුල්වන්නන්ද වැළැක්වූවහුයයි කීසේක.
53 උන්වහන්සේ එතැනින් පිටත්ව ආ කල්හි
ලියන්නෝද ඵරිසිවරුද උන්වහන්සේ ගැන
රැක සිට, උන්වහන්සේගේ මුඛයෙන් යමක්
අසුකරගන්න පිණිස උන්වහන්සේ
54 තදලෙස පොළඹවා, උන්වහන්සේ ලවා
බොහෝ දේ ගැන කථාකරවන්ටත්
පටන්ගත්තෝය.

12 ඒ අතරතුරේදී, ඔවුනොවුන්
පෑගෙන තරම් සමූහයාගෙන් දහස්
ගණන් රැස්ව සිටියදී, උන්වහන්සේ
පළමුකොට තමන් ගෝලයන්ට
කථාකරන්ට පටන්ගෙන: නුඹලා
ඵරිසිවරුන්ගේ වංචා නැමති මුහුන්වලින්
2 ප්‍රවේසම්වෙයල්ලා. මක්නිසාද එළිදරව්
නොවන වසනලද දෙයක්වත් දැනගන්ට
නොලැබෙන සඟවනලද දෙයක්වත්
3 නැත. එබැවින් නුඹලා අඳුරෙහිදී කී දේ
එළියෙහිදී අසනු ලබන්නේය; ඇතුල්
ගෙවලදී නුඹලා කනට කී දේත් ගෙවල්
මුදුන්වලදී ප්‍රසිද්ධ කරනු ලබන්නේය.

## ගෝලයන් ධෛර්යකිරීම

4 මාගේ මිත්‍රයෙනි, ශරීරය නසා එයින්
පසු වෙන කිසිවක් කරන්ට බැරි අයින්ට
භය නොවෙල්ලායයි නුඹලාට කියමි.
5 නුමුත් නුඹලා භයවිය යුතු කාටදැයි
නුඹලාට පෙන්වමි. නැසුවායින් පසු
නිරයෙහි හෙළන්ට බලය ඇත්තාවූ
තැනන්වහන්සේට භයවෙයල්ලා; එසේය,
උන්වහන්සේටම භයවෙයල්ලායයි
6 නුඹලාට කියමි. ගේ කුරුල්ලන් පස් දෙනෙක්

ශත දෙකකට නොවිකුණද්ද? උන්ගෙන්
එකෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි
මතකනැති නොවන්නේය. නුඹලාගේ 7
සියලු හිසකේ පවා ගණන්කර තිබේ.
භයනොවෙල්ලා. නුඹලා බොහෝ ගේ
කුරුල්ලන්ට වඩා අගේය. තවද යමෙක් 8
මනුෂ්‍යයන් ඉදිරියේදී මා පිළිගන්නේද,
මනුෂ්‍ය පුත්‍රයාත් දෙවියන්වහන්සේගේ
දූතයන් ඉදිරියේදී ඔහු පිළිගන්නේය. නුමුත් 9
මනුෂ්‍යයන් ඉදිරියේදී මා එපාකළ
තැනැත්තේ දෙවියන්වහන්සේගේ දූතයන්
ඉදිරියේදී එපාකරනු ලබන්නේයයි නුඹලාට
කියමි. මනුෂ්‍ය පුත්‍රයාට විරුද්ධව 10
වචනයක් කියන කවරෙකුට නුමුත්
කමාව ලැබෙන්නේය. නුමුත්
ශුද්ධාත්මයාණන්ට විරුද්ධව අපහාස-
කරන්නාට කමාව නොලැබෙන්නේය.
ඔවුන් සිනගෝගවලටද ප්‍රධානීන් හා 11
ආණ්ඩුකාරයන් ඉදිරියටද නුඹලා
ගෙනයන කල, උත්තර දෙන්නේ කෙසේද
කියාවත් කියන්නේ කුමක්ද කියාවත්
සිතා කනගාටු නොවෙල්ලා. මක්නිසාද 12
නුඹලා විසින් කියයුතු දේ ඒ පැයේදීම
ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලාට
උගන්වනවා ඇතැයි කීසේක.

## තණ්හාව ගැන.
## පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව

සමූහයාගෙන් එක්කෙනෙක් කථා- 13
කොට: ආචාරීන්වහන්ස, මා සමග
උරුමය බෙදගන්ට මාගේ සහෝදරයාට
කිව මැනවයි උන්වහන්සේට කීවේය.
නුමුත් උන්වහන්සේ කථාකොට: 14
මනුෂ්‍යය, නුඹලා කෙරෙහි විනිශ්චය-
කාරයෙකු නොහොත් බෙදන්නෙකු
කොට මා පත්කළේ කවුද්දැයි ඔහුට
කීසේක. තවද උන්වහන්සේ කථා- 15
කොට: සියලු ආකාර ලෝභකමෙන්
ප්‍රවේසම්වෙන්ට බලාගනිල්ලා. මක්නිසාද
මනුෂ්‍යයෙකුට කොපමණ දේපළ
තිබුණත් ඔහුගේ ජීවිතය එහි පිහිටා
නැතැයි ඔවුන්ට කීසේක. උන්වහන්සේ 16
ඔවුන්ට උපමාවක් කියනසේක්: එක්
වස්තුකාරයෙකුගේ බිමෙහි බොහෝ

17 හෝග හටගත්තේය. එවිට ඔහු තමාගේ
සිත තුළ කල්පනාකරනුයේ: කුමක්
කරම්ද? මාගේ හෝග රැස්කර තබන්ට
18 ඉඩ නැත. මම මෙසේ කරමි: මාගේ
ගබඩා කඩාදමා. වඩා ලොකු ඒවා
ගොඩනගා. එහි මාගේ සියලු ධාන්‍යද
19 බඩුද රැස්කර තබා–ප්‍රාණය, නුඹට
බොහෝ අවුරුදු ගණනකට හොඳවූ
බොහෝ දේ රැස්කර තිබේ. පහසුගෙන.
කා බී. ප්‍රීතියෙන් සිටපන්නැයි මාගේ
20 ප්‍රාණයට කියම්යි කීවේය. නුමුත්
දෙවියන්වහන්සේ ඔහුට කථාකොට:
අඥානය. අද රාත්‍රියේදී නුඹේ ප්‍රාණය
නුඹෙන් අයකරනු ලැබේ: එවිට නුඹ
සූදනම්කරගත් දේ කාට වන්නේදැයි
21 කීසේක. දෙවියන්වහන්සේ කෙරෙහි
පොහොසත් නොවී තමාටම වස්තු
රැස්කරගන්න අය එයාකාරයයි කීසේක.

## පුද්ගලික ඕනෑකම් ගැන කනගාටු නොසිතිය යුතු බව

22 තවද උන්වහන්සේ තමන් ගෝලයන්ට
කියනසේක්: එහෙයින් නුඹලාට කියම්–
කුමක් කමුද කියා ජීවිතය
ගැනවත්–කුමක් අඳිමුද කියා ශරීරය
ගැනවත් කනස්සලු නොවෙල්ලා.
23 මක්නිසාද කෑමට වඩා ජීවිතයද ඇඳීමට
24 වඩා ශරීරයද උතුම්ය. කපුටුවන්
ගැන කල්පනාකර බලාපල්ලා: උන්
වපුරන්නේවත් කපන්නේවත් නැත: උන්ට
අටුවක්වත් ගබඩාවක්වත් නැත: නුමුත්
දෙවියන්වහන්සේ උන් පෝෂණයකරන-
සේක. නුඹලා පක්ෂීන්ට වඩා කොපමණ
25 වටින්නහුද! කනස්සලුවීමෙන් තමාගේ
උසට එක රියනක්වත් වැඩිකරගන්ට
නුඹලා අතරෙන් කවරෙකුට පුළුවන්ද?
26 ඉදින් සුළු දෙයක්වත් කරගන්ට නුඹලාට
බැරි නම්. නුඹලා අනික් කාරණා ගැන
27 කනස්සලුවන්නේ මක්නිසාද? මානෙල්
වැඩෙන හැටි කල්පනාකරපල්ලා. ඒවා
වෙහෙසෙන්නේවත් නූල් කටින්නේවත්
නැත: එහෙත් තමාගේ මුළු ඉසුරුමත්කමේදී
සාලමොන්වත් මේවායින් එකක් ලෙස
පැළඳි සිටියේ නැතැයි නුඹලාට කියමි.
28 විශ්වාසය මදි තැනැත්තෙනි. අද තිබී
හෙට උදුනෙහි දමනු ලබන්නාවූ කෙතෙහි
තෘණ දෙවියන්වහන්සේ මෙසේ පළඳවන-
සේක් නම්. ඊට කොපමණ වැඩියෙන්
නුඹලා නොපළඳවනසේක්ද? එබැවින් 29
නුඹලා කන්නේ මොනවාද බොන්නේ
මොනවාදැයි නොසොයල්ලා. සැක
නොසිතල්ලා. මක්නිසාද මේ සියල්ල 30
ලෝකයේ ජාතීහු සොයති. මේ දේවල්
නුඹලාට වුවමනා බව නුඹලාගේ
පියාණන්වහන්සේ දන්නාසේක. එහෙත් 31
උන්වහන්සේගේ රාජ්‍යයම සොයාපල්ලා,
එවිට මේ දේවලුත් නුඹලාට දෙනු
ලබන්නේය. කුඩා රැළ. භය නොවෙල්ලා: 32
මක්නිසාද නුඹලාට රාජ්‍යය දෙන්ට
නුඹලාගේ පියාණන්වහන්සේ ප්‍රසන්නව
සිටිනසේක. නුඹලා සන්තක දේ විකුණා 33
දන් දීපල්ලා: පරණ නොවන පසුම්බිද
නැති නොවන වස්තුවක්ද ස්වර්ගයෙහි
නුඹලාට සපයාගනිල්ලා: එහි සොරෙක්
ළංවන්නේවත් කාවෙක් කන්නේවත් නැත.
මක්නිසාද නුඹලාගේ වස්තුව තිබෙන්නේ 34
යම් තැනකද නුඹලාගේ සිතත් එහිම
තිබෙන්නේය.

## නිතර සූදනම්ව සිටිය යුතු බව. විශ්වාස ගබඩාකාරකම වුවමනා බව

නුඹලාගේ ඉඟටි බැඳ නුඹලාගේ පහන්ද 35
දල්වා තිබේවා. නුඹලාද තමුන්ගේ 36
ස්වාමියා සරණ මංගල්‍යයෙන් හැරී
ඇවිත් තට්ටුකරන වහාම ඔහුට දෙර
අරින පිණිස ඔහුගේ ඊම බලා සිටින
මනුෂ්‍යයන්ට සමානවෙයල්ලා. ස්වාමියා 37
එන කල දසයන් අවදිව සිටිනවා ඔහු
දුටුවොත්, ඔව්හු වාසනාවන්තයෝය.
සැබවක් නුඹලාට කියමි–ඔහු තමාගේ
ඉඟටිය බැඳගෙන. ඔවුන් කෑමට හිඳුවා.
ඇවිත් ඔවුන්ට උපස්ථානකරන්නේය.
ඔහු දෙවෙනි යාමයේදීවත් තුන්වෙනි 38
යාමයේදීවත් ඇවිත් එසේම දකින්නේ
නම්, ඒ දසයෝ වාසනාවන්තයෝය.
නුමුත් සොරා කොයි පැයේදී එන්නේදැයි 39
ගෙයි ස්වාමියා දනගත සිටියේ
නම්. ඔහු අවදිව සිට තමාගේ
ගෙය උමංකණින්ට නොදෙන බව
දනගනිල්ලා. එබැවින් නුඹලාත් සූදනම්ව 40
සිටපල්ලා. මක්නිසාද නුඹලා නොසිතන

පැයකදී මනුෂ්‍ය පුත්‍රයා එන්නේයයි
කීසේක.
41 එවිට පේත්‍රුස්: ස්වාමීනි, ඔබ මේ
උපමාව කියන්නේ අපටද නොහොත්
සියල්ලන්ටදැයි උන්වහන්සේගෙන්
42 ඇසූවේය. එකල ස්වාමීන්වහන්සේ
කියනසේක්: ඉදින් ස්වාමියා විසින්
තමාගේ ගෙයි වැසියන්ට නියම
වේලාවට කෑම කොටස දෙන්ට ඔවුන්
කෙරේ පත්කරන විශ්වාසවූ නුවණ ඇති
43 ගබඩාකාරයා කවුද? ස්වාමියා ආවාම
යම් දාසයෙක් එසේ කරනවා ඔහු
දුටුවොත්, ඒ දාසයා වාසනාවන්තයෙක්ය.
44 තමා සන්තක සියල්ල කෙරෙහි ඒ
ස්වාමියා ඔහු පත්කරන්නේයයි සැබවින්
45 තුඹලාට කියමි. නුමුත් ඒ දාසයා: මාගේ
ස්වාමියාගේ ඊම ප්‍රමාදවන්නේය කියා
සිතින් සිතාගෙන, දාසිදාසුන්ට ගහන්ටත්
කන්ටත් බොන්ටත් මත්වෙන්ටත්
46 පටන්ගත්තොත්, ඔහු බලා නොසිටින
දවසකදීද නොදන්නා පැයකදීද ඒ
දාසයාගේ ස්වාමියා ඇවිත් ඔහුට
තදබලලෙස දඩුවම්කර, අවිශ්වාසයන්
සමග ඔහුගේ කොටස නියමකරන්නේය.
47 තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගනත්
සූදානම් නොකළාවූ, ඔහුගේ කැමැත්ත
ලෙස නොකළාවූ දාසයා බොහෝ පහර
48 ලබන්නේය. නුමුත් නොදැන, පහර
ලැබීමට සුදුසු දේ කළාවූ අය පහර
ස්වල්පයක් ලබන්නේය. යමෙකුට
බොහෝ දේ දෙනලද්දේද, ඔහුගෙන්
බොහෝ දේ අයකරනු ලබන්නේය.
යමෙකුට බොහෝ දේ භාරදෙනලද්දේද,
ඔහුගෙන් වඩා ඉල්ලනු ලබන්නේය.

## මතු පැමිණෙන විපත්ති කාලයේ ලකුණු

49 පොළොව මතුයෙහි ගිනිලන්ට ආවෙමි;
එය දැනටම ඇවිළ තිබේ නම් මම
50 කොපමණ කැමතිවෙම්ද? නුමුත් මට
*බව්තීස්මයක් ලබන්ට තිබේ; ඒක
ඉෂ්ටවෙන තුරු කොපමණ ගාවිනාවෙන්
51 යුක්තවෙම්ද? පොළොවට සමාදානය
දෙන පිණිස මම ආවෙමියි තුඹලා
සිතවුද? එසේ නොව, භේද උපදවන
පිණිසයයි තුඹලාට කියමි. මක්නිසාද 52
මෙවක් පටන් එක ගෙයක සිටින
පස්දෙනෙකුගෙන් දෙදෙනෙකුට විරුද්ධව
තුන්දෙනෙක්ද තුන්දෙනෙකුට විරුද්ධව
දෙදෙනෙක්ද භේදව සිටින්නෝය. පියා 53
පුත්‍රයාටත් පුත්‍රයා පියාටත් මවු දුවටත්
දුව මවුටත් නැන්ද යෙහෙළීටත් යෙහෙළී
නැන්දටත් විරුද්ධව භේද වන්නෝයයි
කීසේක.
තවද උන්වහන්සේ සමූහයන්ට 54
කථාකර: බස්නාහිරින් වලාකුළක්
නගිනවා තුඹලා දකින විට-වර්ෂාවක්
එන්නේයයි තුඹලා එවලේම කියන්නහුය;
එසේම වන්නේය. දකුණෙන් හුළඟ 55
ගසන කල-ග්‍රීෂ්මය වන්නේයයි
තුඹලා කියන්නහුය; එසේම වන්නේය.
වංචාකාරයෙනි, පොළෝතලයත් අහස්- 56
තලයත් විසඳන්ට තුඹලා දනිහුය; නුමුත්
මේ කාලය විසඳන්ට නොදැන සිටින්නේ
කොහොමද? යුතු දේ තුඹලාම විනිශ්වය 57
නොකරන්නේ මක්නිසාද? ඉදින් තුඹේ 58
එදිරිකාරයා සමග නඩුකාරයා ඉදිරියට
යන විට පාරේදීම ඔහුගෙන් බේරෙන්ට
උත්සාහකරපන්න; නැත්නම් සමහරවිට
ඔහු විනිශ්වයකාරයා ළඟට තුඹ ඇදගන
යන්නේය, විනිශ්වයකාරයාද තුඹ
සේවකයාට භාරදෙන්නේය; සේවකයා
තුඹ හිරගෙයි දමන්නේය, අන්තිම 59
සල්ලිය ගෙවන තුරු තුඹ එතනින් පිටවී
නොඑන්නෙහියයි තුඹට කියමියි කීසේක.

## පසුතැවිලිවීමට අනුශාසනා

13
තවද ඒ ප්‍රස්තාවේදීම එහි සිටි
සමහරෙක් කථාකොට: පිලාත්
විසින් ගලීලයන්ගේ ලේ ඔවුන්ගේ යාග
සමග මිශ්‍රකරනලදැයි උන්වහන්සේට
දන්නුවෝය. උන්වහන්සේ ඔවුන්ට 2
උත්තරදෙමින්: ඒ ගලීලයෝ ඒ දේ වින්ද
බැවින් සියලු ගලීලයන්ට වඩා
පව්කාරයෝව සිටියෝයයි සිතවුද? එසේ 3
නොවේයයි තුඹලාට කියමි. පසුතැවිලි
නුණොත් තුඹලා සියල්ලෝම එසේම
විනාශවන්නෝය. නොහොත් සිලෝවම් 4

*අවගාහනයක්.

කොටුව වැටී යටවී මැරුණු දසඅටදෙන
යෙරුසලමේ වාසයකරන සියලු
මනුෂ්‍යයන්ට වඩා වැරදිකාරයෝව
5 සිටියෝයයි නුඹලා සිතවුද? එසේ
නොවේයයි නුඹලාට කියමි. නුඹලා
පසුතැවිලි නුණොත්, නුඹලා සියල්ලෝම
එසේම විනාශවන්නෝයයි කීසේක.

## ඵලනැති දිඹුල්ගහේ උපමාව

6 උන්වහන්සේ මේ උපමාව කියනසේක්:
එක් මනුෂ්‍යයෙකුගේ මිදිවත්තෙහි
අත්තික්කා ගහක් හිටවා තිබුණේය. ඔහු
ඒ ගහේ ගෙඩි සොයමින් ආවේය, නුමුත්
7 කිසිවක් සම්බවුණේ නැත. එවිට ඔහු
මිදිවත්ත බලන්නාට කථාකොට: බලව,
මේ තුන් අවුරුද්දේම මේ අත්තික්කා
ගහේ ගෙඩි සොයා ආ නුමුත් කිසිවක්
සම්බවුණේ නැත. ඒක කපාදමාපන්න;
පොළොවට බරව තිබෙන්නෙත්
8 මක්නිසාදැයි කීවේය. ඔහු උත්තරදෙමින්:
ස්වාමීනි, ඒක වටකර හාරා, පෝර
දමන තුරු, මේ අවුරුද්දෙත් තිබුණාවේ.
9 ඉන්පසු ඵල දරුවොත් යහපත; නැත්නම්
ඒක කපාදමන්ට පුළුවනැයි ඔහුට
කීවේයයි කීසේක.

## සබත් දවසේදී කුදු ස්ත්‍රියෙක් සුවපත්කිරීම

10 උන්වහන්සේ සබත් දවසෙහි එක්
සිනගෝගයක උගන්වමින් සිටිසේක.
11 බලව, දසඅට අවුරුද්දක් දුර්වලකමේ
ආත්මයක් ඇතිවූ කොයි ප්‍රකාරයකින්වත්
කෙලින් වෙන්ට බැරි ස්ත්‍රියෙක් එහි
12 සිටියාය. යේසුස්වහන්සේ ඈ දැක
අඬගසා: ස්ත්‍රිය, නුඹේ දුර්වලකමින්
13 නුඹ මිදුණාය කියා, ඈ පිට අත්
තැබූසේක. එකෙණෙහිම ඈ කෙලින්වී,
දෙවියන්වහන්සේට ප්‍රශංසාකළාය.
14 යේසුස්වහන්සේ සබත් දවසේදී සුවකළ
බැවින් සිනගෝගයේ මුලාදෑනියා
කෝපව, සමූහයාට උත්තරදෙමින්:
වැඩකළ යුතුවූ සදවසක් ඇත. ඒ නිසා
සබත් දවසේ නොව ඒ දවස්වල ඇවිත්
සුවය ලබාගනිල්ලායයි කීවේය. නුමුත් 15
ස්වාමීන්වහන්සේ ඔහුට උත්තරදෙමින්:
වංචාකාරයෙනි, නුඹලාගෙන් එකිනෙකා
සබත් දවසේදී තම තමාගේ ගොනා
හෝ කොටළුවා හෝ ගාලෙන් ලිහා
වතුර පොවන්ට ගෙන නොයන්නේද?
එසේ නම්, දසඅට අවුරුද්දක් මුළුල්ලෙහි 16
සාතන් විසින් බැඳ සිටි, ආබ්‍රහම්ගේ
දුවෙක්වූ මේ ස්ත්‍රිය ඒ බැම්මෙන් සබත්
දවසේදී මුදන්ට යුතුව තිබුණා නොවේදැයි
කීසේක. උන්වහන්සේ මෙසේ කී කල්හි 17
උන්වහන්සේගේ සියලු විරුද්ධකාරයෝ
ලජ්ජාවට පැමිණියෝය. මුළු සමූහයාද
උන්වහන්සේ විසින් කළ සියලු තේජවන්ත
දේවල් ගැන ප්‍රීති වුණෝය.

## අබ ඇටය සහ මුහුන් ගැන උපමා

එබැවින් උන්වහන්සේ කියනසේක්: 18
දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට
සමානද? ඒක කුමකට සමානකරම්ද?
එක් මනුෂ්‍යයෙකු විසින් අරගෙන තමාගේ 19
වත්තේ දැමූ අබ ඇටයකට සමානය;
ඒක වැඩී ගසක් විය; ආකාශයේ පක්ෂීහු
එහි අතුවල ලැග්ගෝයයි කීසේක.
නැවතත් උන්වහන්සේ කියනසේක්: 20
දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට
සමානකරම්ද? ස්ත්‍රියෙකු විසින් පිටිනැළි 21
තුනක් සහමුලින්ම පිපෙන තෙක් එහි
දමා තිබූ මුහුන්වලට එය සමානයයි
කීසේක.

## ජීවනයට ඇතුල්වෙන පටු දොරකඩ

උන්වහන්සේ යෙරුසලමට ගමන්කරද්දී 22
උගන්වමින් නුවරවල් සහ ගම් මැදින්
ගියසේක. එක් කෙනෙක් කථාකොට: 23
ස්වාමීනි, ගැළවීම ලබන්නෝ ස්වල්ප
දෙනෙක්දැයි උන්වහන්සේගෙන් ඇසුවේය.
උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: පටු 24
දොරකඩින් ඇතුල්වෙන්ට වීර්යයකරපල්ලා.

මක්නිසාද බොහෝ දෙනෙක්
ඇතුල්වෙන්ට සොයන නුමුත්
25 බැරිවන්නේයයි තුඹලාට කියමි. ගෙයි
ස්වාමියා නැගිට දෙර වැසුවායින් පසු,
තුඹලා පිටත සිට දෙරට තට්ටුකරන්ට
පටන්ගෙන: ස්වාමිනි, අපට දෙර ඇරිය
මැනවයි කියන කල, උන්වහන්සේ
උත්තරදෙමින්: තුඹලා කොතැනින්
ආවාද කියා නොදනිමියි තුඹලාට
26 කියන්නේය. එවිට තුඹලා: අපි ඔබ
ඉදිරියෙහි කැවෙමුව, බීවෙමුව, ඔබ අපේ
වීථිවල ඉගැන්වූසේකැයි කියන්ට
27 පටන්ගන්නහුය. නුමුත් උන්වහන්සේ
කථාකොට: තුඹලා කොතැනින් ආවාද
කියා නොදනිමි; අයුතුකම් කරන
සියල්ලෙනි, මා වෙතින් පලයල්ලායයි
28 කියන්නේය. ආබ්‍රහම්ද ඊසාක්ද
යාකොබ්ද සියලු අනාගතවක්තෘවරුන්ද
දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි සිටිනවාත්
තුඹලාම පිටත දමනු ලබනවාත් තුඹලා
දකින කල, එහි හැඬීමද දත්මිටිකෑමද
29 වන්නේය. තවද මනුෂ්‍යයෝ
නැගෙනහිරින්ද බස්නාහිරින්ද උතුරෙන්ද
දකුණෙන්ද ඇවිත් දෙවියන්වහන්සේගේ
30 රාජ්‍යයෙහි හිඳගන්නෝය. බලව, දැන්
අන්තිමයෝව සිටින්නාවූ සමහරෙක්
ප්‍රථමයෝද දැන් ප්‍රථමයෝව සිටින්නාවූ
සමහරෙක් අන්තිමයෝද වන්නෝයයි
කීසේක.

## හෙරොද් රජුගේ සතුරුකම

31 ඒ පැයේදීම ඵරිසිවරුන්ගෙන් සමහරෙක්
ඇවිත්: මෙයින් අහක්ව ගිය මැනව.
මක්නිසාද හෙරොද් ඔබ මරන්ට
කැමතිව සිටින්නේයයි උන්වහන්සේට
32 කීවෝය. උන්වහන්සේ ඔවුන්ට කියන-
සේක්: මා අදත් හෙටත් යක්ෂයන්
දුරුකර, රෝග සුවකර, තුන්වෙනිද
සම්පූර්ණවීමට පැමිණෙන බව තුඹලා
33 ගොස් ඒ හිවලාට කියාපල්ලා. එසේ
වුවත්, අදත් හෙටත් අනිද්දත් මා විසින්
ගමන්කරන්ට ඕනෑය. කුමක්හෙයින්ද
යෙරුසලමෙන් පිටදී අනාගතවක්තෘ
කෙනෙකුගේ විනාශය නොවන්නේය.

## යෙරුසලම ගැන ශෝක ප්‍රකාශය

අනේ! අනාගතවක්තෘවරුන් මරන්නාවූ, 34
තී ළඟට එවූවන්ට ගල් ගසන්නාවූ
යෙරුසලම, යෙරුසලම, කිකිළී
ඇගේ පැටවුන් පියාපත් යටට
එකතුකරගන්නාක්මෙන් තිගේ දරුවන්
එකතුකරගන්ට මම කී වරක්
කැමතිවීම්ද! නුමුත් තුඹලා කැමතිවූණේ
නැත. මෙන්න, තුඹලාගේ ගෘහය (පාළුව) 35
තුඹලාට අත්හරිනු ලබන්නේය. තවද:
ස්වාමීන්වහන්සේගේ නාමයෙන් එන
තැනැත්තා ආශිර්වාදලත්තෙකැයි තුඹලා
කියන තුරු තුඹලා මා නොදක්නහුයයි
තුඹලාට කියමියි කීසේක.

## දියඋදර රෝගියෙකුට සබත් දවසේදී සුවකිරීම

14 තවද උන්වහන්සේ සබත් දවසකදී
කෑම කන පිණිස ඵරිසිවරුන්ගෙන්
ප්‍රධානියෙකුගේ ගෙදරට පැමිණි කල
ඔව්හු උන්වහන්සේ ගැන රැක බලා
සිටියෝය. බලව, උන්වහන්සේ ඉදිරියෙහි 2
දියඋදර රෝගීවූ මනුෂ්‍යයෙක් සිටියේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: සබත් 3
දවසේදී සුවකරන්ට යුතුද නැද්දැයි
ව්‍යවස්ථාව උගන්වන්නන්ගෙන්ද
ඵරිසිවරුන්ගෙන්ද ඇසූසේක. නුමුත් ඔව්හු 4
කථා නොකර සිටියෝය. උන්වහන්සේ
ඔහු අතින් අල්ලා, සුවකොට ඇරිය-
සේක. උන්වහන්සේ ඔවුන්ට කථා- 5
කරමින්: තුඹලාගෙන් කවරෙකුගේවත්
*කොටළුවෙකු හෝ ගොනෙකු හෝ
සබත් දවසේදී ළිඳක වැටුණොත්
එකෙණෙහිම ඌ ගොඩට ඇදගන්නේ
නැද්දැයි ඇසූසේක. ඊට උත්තරදෙන්ට 6
ඔවුන්ට බැරිවූණේය.

## යටත්කම සහ ආගන්තුක සත්කාරය ගැන උපමා කථා

කැඳවනු ලැබූවන් ප්‍රධාන ආසන 7
තෝරාගන්න බව උන්වහන්සේ දැක,
ඔවුන්ට උපමාවක් කියනසේක්: යමෙක් 8

*නොහොත් - පුත්‍රයෙකු.

විසින් සරණ මංගල්‍යයකට තුඹ කැඳවනු
ලැබූ කල්හි ප්‍රධානාසනයෙහි ඉඳ
නොගනින්න. සමහරවිට තුඹට වඩා
උතුම් කෙනෙක් කැඳවනු ලැබුවේ නම්,
9 තුඹත් ඔහුත් කැඳවූ තැනැත්තා ඇවිත්–
මොහුට ඉඩදීපන්නැයි තුඹට කීවොත්,
තුඹ ලජ්ජාවෙන් පහත් ස්ථානයට යන්ට
10 පටන්ගන්නෙහිය. නුමුත් තුඹ කැඳවනු
ලැබූ කල, ගොස් පහත් ස්ථානයෙහි
ඉඳගනින්න; එවිට තුඹ කැඳවූ තැනැත්තේ
ඇවිත්: යහළුව, ඉහළ ඉඩමකට
වරෙන්නැයි තුඹට කීවොත්, තුඹ සමග
කෑමට හිඳින සියල්ලන් ඉදිරියෙහි තුඹ
11 ගෞරව ලබන්නෙහිය. මක්නිසාද තමුන්ම
උසස්කරගන්න හැමදෙනාම පහත්කරනු
ලබන්නෝය; තමාම යටත්කරගන්නා
උසස්කරනු ලබන්නේයයි කීසේක.
12 උන්වහන්සේ තමන් කැඳවූ
තැනැත්තාටත් කථාකොට: තුඹ දවල්
කෑමක් හෝ රාත්‍රි කෑමක් හෝ
පිළියෙළකරන කල, තුඹේ යහළුවන්වත්
සහෝදරයන්වත් නෑයන්වත් පොහොසත්
අසල්වාසීන්වත් නොකැඳවන්න;
සමහරවිට ඔව්හු නැවත තුඹ
කැඳවන්නෝය, එවිට තුඹට ප්‍රතිඵලයක්
13 ලැබෙන්නේය. නුමුත් තුඹ කෑමක්
පිළියෙළකරන කල, දිළිඳුන්ද
අබ්බාගාතයන්ද කොරුන්ද අන්ධයන්ද
14 කැඳවාපන්න. තුඹට ප්‍රතිඵලදෙන්ට
ඔවුන්ට නුපුළුවන් බැවින් තුඹට
ආශිර්වාද ලැබෙන්නේය. මක්නිසාද
ධර්මිෂ්ඨයන්ගේ නැවත-නැගිටීමේදී තුඹට
ප්‍රතිඵල ලැබෙන්නේයයි කීසේක.

## මහත් රාත්‍රි කෑම ගැන උපමාව

15 උන්වහන්සේ සමග කෑමට
හිඳගත්තවුන්ගෙන් එක්කෙනෙක් ඒ දේ
අසා: දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහිදී
කෑම කන තැනැත්තේ වාසනාවන්තයෙකැයි
16 උන්වහන්සේට කීවේය. නුමුත්
උන්වහන්සේ ඔහුට කියනසේක්: එක්තරා
මනුෂ්‍යයෙක් මහත් රාත්‍රි කෑමක්
පිළියෙළකොට බොහෝ දෙනෙකු
17 කැඳෙවුවේය. කෑම වේලාව පැමිණි කල:
වරෙල්ලා, සියල්ලම දැන් සූදනම්යයි
කැඳවනු ලැබූවන්ට කියන පිණිස ඔහු
තමාගේ දාසයා යැවීය. නුමුත් ඔවුන් 18
සියල්ලෝම නැවිත් සිටීමට එකලෙස
කාරණා කියන්ට පටන්ගත්තෝය.
පළමුවෙනියා: මම කෙතක් මිලේට ගතිමි,
ඒක බලන්ට යන්ටම ඕනෑය. මට
කමාවෙන මෙන් තුඹෙන් ඉල්ලමියි ඔහුට
කීවේය. තවත් කෙනෙක්: මම ගොන් 19
පස්බානක් මිලේට ගතිමි, උන් හොඳද
කියා බලන්ට යමි. මට කමාවෙන මෙන්
තුඹෙන් ඉල්ලමියි ඔහුට කීවේය. තවත් 20
කෙනෙක්ද? මම භාර්යාවකු සරණපාවා
ගතිමි, එබැවින් එන්ට බැරියයි කීවේය.
ඒ දාසයා ඇවිත් තමාගේ ස්වාමියාට 21
මේ කාරණා දැන්නුවේය. එවිට ගෙදර
ස්වාමියා කෝපවී: තුඹ නුවර
වීථිවලටද අතුරු පාරවලටද වහාම
ගොස්, දිළිඳුන්ද අබ්බාගාතයන්ද
අන්ධයන්ද කොරුන්ද මෙහි
ගෙනෙන්නැයි තමාගේ දාසයාට කීවේය.
දාසයාද: ස්වාමිනි, ඔබ අණකළ ලෙස 22
කරනලද්දේය, නුමුත් තව ඉඩ තිබේයයි
කීවේය. එවිට ස්වාමියා දාසයාට 23
කථාකොට: තුඹ මහමාවත්වලටද
වැටවල් දිගටද ගොස්, මාගේ ගෙය
පිරෙන පිණිස මනුෂ්‍යයන්ට එන්ට
බලකරපන්නැයි කීවේය. මක්නිසාද 24
තුඹලාට කියමි–කැඳවනු ලැබූවන්ගෙන්
එක්කෙනෙක්වත් මාගේ රාත්‍රි කෑමෙහි
රස නොබලන්නේයයි කීයේය.

## ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියල්ල අත්හැරීම සහ වියදම් ගණන් බැලීම

තවද බොහෝ සමූහයෝ උන්වහන්සේ 25
සමග ගියෝය. උන්වහන්සේ ආපසු හැරී
ඔවුන්ට කියනසේක්: මා ළඟට එන 26
තැනැත්තේ තමාගේ පියාටත් මවුටත්
භාර්යාවටත් දරුවන්ටත් සහෝදරයන්ටත්
සහෝදරියන්ටත්, එසේය, තමාගේම
ජීවිතයටත් ද්වේෂ නොකරන්නේ නම්
ඔහුට මාගේ ගෝලයා වෙන්ට බැරිය.
තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ 27
නොඑන තැනැත්තාට මාගේ ගෝලයා
වෙන්ට බැරිය. මක්නිසාද කොතක් 28

ගොඩනගන්ට කැමතිවූ තුඹලාගෙන්
යමෙක් ඒක නිමකරන්ට තමාට
පුළුවන්දැයි පළමුකොට හිඳ වියදම
29 ගණන් බලන්නේ නැද්ද? එසේ
නොකළොත්, අත්තිවාරමක් දමා
නිමකරන්ට බැරිවූ විට ඒ දකින
30 සියල්ලෝ: මේ මනුෂ්‍යයා ගොඩනගන්ට
පටන්ගත් නුමුත් නිමකරන්ට ඔහුට
බැරිවීයයි කියා ඔහුට සරදම්කරන්ට
31 පටන්ගන්නෝය. නොහොත් වෙන
රජෙකුට විරුද්ධව යුද්ධයට යන කවර
රජෙක් තමාට විරුද්ධව විසිදහසක්
ගෙනඑන්නාවූ ඔහු ඉදිරියට දසදහසක්
සමග යන්ට පුළුවන්දෝ කියා පළමුකොට
32 හිඳ මන්ත්‍රණය නොකරන්නේද? බැරිනම්
ඒ රජ දුර සිටියදීම ඔහු පණිවිඩයක්
යවා, සමාදාන ගිවිසුම් ඉල්ලා සිටියි.
33 එසේම තුඹලා අතරෙහි තමා සන්තක
සියල්ලම අත්නොරින කවරෙකුටවත්
මාගේ ගෝලයා වෙන්ට බැරිය. ඉදින්
34 ලුණු හොඳය. නුමුත් ලුණෙහි පවා ලුණු
ගතිය නැතිවුණොත්, ඒවා රසකරන්නේ
35 කුමකින්ද? පොළොවටවත් කසළ
ගොඩටවත් ඒවා සුදුසු නැත. ඒවා අහක
දමති. අසන්ට කන් ඇත්තේ අසාවයි
කීසේක.

## නැතිවුණ බැටළුවා සහ නැතිවුණ මිලය

15 තවද සියලු සුංගම් අයකරන්නෝද
පව්කාරයෝද උන්වහන්සේගේ
වචන අසන පිණිස උන්වහන්සේට
2 ළංවෙවී ආවෝය. ඵරිසිවරුද ලියන්නෝද
කථාකොට: මොහු පව්කාරයන්
පිළිගෙන ඔවුන් සමග කන්නේය කියා
කොඳුළෝය.
3 උන්වහන්සේ මේ උපමාව ඔවුන්ට
4 කියනසේක්: තුඹලා අතරෙන් බැටළුවන්
සියයක් ඇති කවර මනුෂ්‍යයෙක් නුමුත්
උන්ගෙන් එකෙක් නැතිවුණොත්,
එකුන්සියය වනයේ හැර, නැතිවූ එකා
පස්සේ ගොස්, ඌ සම්බවෙන තුරු
5 නොසොයන්නේද? ඌ සම්බවූ විට ඔහු
ප්‍රීතිවෙමින්, ඌ තමාගේ කරේ තබාගෙන,
6 ගෙදර ඇවිත් මිත්‍රයන්ද අසල්වාසීන්ද
කැඳවා: මා සමග ප්‍රීතිවෙයල්ලා,
මක්නිසාද මාගේ නැතිවූ බැටළුවා
සම්බවීයයි ඔවුන්ට කියයි. එලෙසම 7
පශ්චාත්තාපය ඕනෑ නැති ධර්මිෂ්ඨයන්
එකුන්සියයකට වඩා පශ්චාත්තාපවන්නාවූ
එක පව්කාරයෙකු ගැන ස්වර්ගයෙහි
ප්‍රීතිය වන්නේයයි තුඹලාට කියමි.
නොහොත් රිදී මිල දසයක් ඇති කවර 8
ස්ත්‍රියෙක් එයින් එකක් නැතිවුණොත්
පහනක් දල්වා, ගෙය අතුගා, ඒක
සම්බවෙන තුරු උත්සාහයෙන්
නොසොයන්නීද? ඒක සම්බවූ විට ඈ 9
මිත්‍රයන්ද අසල්වාසීන්ද කැඳවා: මා සමග
ප්‍රීතිවෙයල්ලා, මක්නිසාද මාගේ නැතිවූ
රිදී මිලය සම්බවීයයි ඔවුන්ට කියන්නීය.
එලෙසම පශ්චාත්තාපවන්නාවූ එක 10
පව්කාරයෙකු ගැන දෙවියන්වහන්සේගේ
දූතයන් ඉදිරියෙහි ප්‍රීතිය ඇත්තේයයි
තුඹලාට කියමියි කීසේක.

## අකීකරු පුත්‍රයා

තවද උන්වහන්සේ කියනසේක්: 11
එක්තරා මනුෂ්‍යයෙකුට පුත්‍රයෝ
දෙදෙනෙක් සිටියෝය. ඔවුන්ගෙන් 12
බාලයා: පියාණෙනි, ඔබගේ වස්තුවෙන්
මට එන කොටස දෙන්නැයි පියාට
කීවේය. එවිට ඔහු තමාගේ සම්පත්
ඔවුන්ට බෙදදුන්නේය. නොබෝ දවසකට 13
පසු බාල පුත්‍රයා සියල්ල එකතුකරගෙන,
දුර රටකට ගොස්, එහිදී අවකල්
ක්‍රියාවෙන් ජීවත්වෙමින්, තමාගේ වස්තුව
නාස්තිකෙළේය. ඔහු සියල්ල වියදම්කළ 14
පසු, ඒ රටේ මහත් සාගතයක් හටගැනී,
ඔහුට හිඟවෙන්ට පටන්ගත්තේය. එවිට 15
ඔහු ගොස් ඒ රටේ වැසියෙකුට
බැඳුණේය; හෙතෙම ඌරන්ට ගොදුරු
කවන පිණිස තමාගේ කෙත්වලට ඔහු
යැවීය. ඔහු ඌරන් කෑ කරල්වලින් 16
තමාගේ බඩ පුරවාගන්ට කැමතිවූයේය;
කිසිවෙක්ද ඔහුට කිසිවක් දුන්නේ නැත.
එහෙත් ඔහු සිහිඋපදවා කථාකොට: 17
මාගේ පියාණන්ගේ කුලීකාරයන් එපමණ
දෙනෙකුට ඕනෑවාට වඩා කෑම තිබෙද්දී
මම මෙහි බඩගින්නේ නසිමි! මම නැගිට 18
මාගේ පියාණන් ළඟට ගොස්:

පියාණෙනි, ස්වර්ගයට විරුද්ධවද ඔබ
19 ඉදිරියෙහිද පව්කෙළෙමි. තවත් ඔබගේ
පුත්‍රයායයි කියනු ලබන්ට නොවටිමි.
ඔබගේ කුලීකාරයන්ගෙන් එක්කෙනෙකු
මෙන් මා තබාගත මැනවයි ඔහුට
20 කියන්නෙමියි කියා, නැගිට තමාගේ පියා
ළඟට ගියේය. ඔහු දුර සිටියදීම ඔහුගේ
පියා ඔහු දැක, අනුකම්පාවී, දුවගන
ගොස්, ඔහුගේ බෙල්ල වැළඳගෙන, ඔහු
21 සිඹගත්තේය. එවිට පුත්‍රයා ඔහුට
කථාකොට: පියාණෙනි, ස්වර්ගයට
විරුද්ධවද ඔබ ඉදිරියෙහිද පව්කෙළෙමි.
තවත් ඔබගේ පුත්‍රයායයි කියනු ලබන්ට
22 නොවටිමියි කීවේය. නුමුත් පියා තමාගේ
දාසයන්ට කථාකොට: ඉතා හොඳ සළුව
වහාම ගෙනැවිත් මොහුට හඳවාපල්ලා;
මොහුගේ ඇඟිල්ලේ මුද්දුවක්ද පාදවල
23 වහන්ද දමාපල්ලා. තරකළ වස්සා
ගෙනැවිත් මරාපල්ලා, අපි කමින්
24 ප්‍රීතිවෙමු. මක්නිසාද මේ මාගේ පුත්‍රයා
නැසී, නැවත ජීවත්ව සිටියි; ඔහු නැතිවී,
සම්බවීයයි කීවේය. එවිට ඔව්හු
25 ප්‍රීතිවෙන්ට පටන්ගත්තෝය. ඔහුගේ
වැඩිමහල් පුත්‍රයා කෙතෙහි සිටියේය.
ඔහු ඇවිත් ගෙදරට ළංවූ කල,
26 තූර්යනාදයත් නැටීමත් ඇසී, දාසයන්ගෙන්
එක්කෙනෙකුට හඬගසා: මේ මොකදැයි
27 විචාළේය. ඔහුද: ඔබගේ සහෝදරයා
ආවේය; ඔබගේ පියාණෝ ඔහු සුවසේ
පිළිගත් බැවින්, තරකළාවූ වස්සා
28 මැරෙව්වේයයි කීවේය. එවිට ඔහු කිපී,
ගෙට ඇතුල්වෙන්ට නොකැමති වූයේය.
එබැවින් ඔහුගේ පියා පිටතට ඇවිත්,
29 එන මෙන් ඔහුගෙන් ඉල්ලුවේය. නුමුත්
ඔහු උත්තරදෙමින්: මෙපමණ අවුරුදු
ගණනක් ඔබට සේවයකරමින් සිටිමි,
කවදාවත් ඔබගේ ආඥාවක් කඩ
නොකෙළෙමි. එසේවී නුමුත් මාගේ
මිත්‍රයන් සමග ප්‍රීතිවෙන්ට ඔබ
එළු පැටවෙකුවත් කිසිකලක මට
30 නුදුන්නෙහිය. නුමුත් ඔබගේ සම්පත
වේශ්‍යාවන් සමග නාස්තිකළාවූ මේ
ඔබගේ පුත්‍රයා ආ වේලේ, ඔහු නිසා
තරකළ වස්සා මැරුවෙහියයි පියාට
31 කීවේය. ඔහුද: පුත්‍රය, නුඹ නිතරම මා
සමග සිටිනෙහිය, මා සන්තක සියල්ලද
නුඹේය. නුමුත් අප විසින් ප්‍රීති 32
සන්තෝෂවෙන්ට යුතුව තිබුණේය.
මක්නිසාද මේ නුඹේ සහෝදරයා නැසී
නැවත ජීවත්ව සිටියි; නැතිවී සම්බවීයයි
කීයේයයි කීසේක.

## අධර්මිෂ්ඨ ගබඩාකාරයා

16
තවද උන්වහන්සේ ගෝලයන්ට
කියනසේක්: එක්තරා ධනවන්ත-
යෙකුට ගබඩාකාරයෙක් සිටියේය; ඒ
ගබඩාකාරයා ඔහුගේ වස්තුව
නාස්තිකෙරේයයි ඔහුට දන්වනලද්දේය.
එවිට ඔහු ගබඩාකාරයාට අඬගසා: 2
නුඹ ගැන මා අසන මේ කාරණය
කිමෙක්ද? නුඹේ ගබඩාකාරකමේ ගණන
දියන්න; මක්නිසාද නුඹට තවත්
ගබඩාකාරයාව සිටින්ට නුපුළුවනැයි
කීවේය. ගබඩාකාරයාද: මාගේ 3
ස්වාමියා ගබඩාකාර තනතුර මාගෙන්
පැහැරගන්න නිසා කුමක් කරම්ද? බිම
කොටන්ට මට ශක්තිය නැත; සිඟන්ට
ලජ්ජාවෙමි. ගබඩාකාර තනතුරෙන් මා 4
අහක්කළ කල්හි, ඔවුන්ගේ ගෙවලට මා
පිළිගන්නා පිණිස, මා විසින් කුමක්
කටයුතුදැයි නියමකරගෙන සිටිමියි තමා
තුළම කියාගත්තේය. මෙසේ ඔහු තමාගේ 5
ස්වාමියාගේ ණයකාරයන් එක එකා
බැගින් අඬගස්වා, පළමුවෙනියාට
කථාකොට: මාගේ ස්වාමියාට නුඹ
කොපමණ ණයදැයි ඇසුවේය. තෙල් *බාත් 6
සියයකැයි ඔහු කීවේය. ඔහු කථාකොට:
නුඹේ ගණන් පත්‍රය රැගෙන වහාම
ඉඳගෙන, පණසකැයි ලියාපන්නැයි ඔහුට
කීවේය. තවත් කෙනෙකුට: නුඹ 7
කොපමණ ණයදැයි ඇසුවේය. ගෝධුම
†අමුණු සියයකැයි ඔහු කීවේය. නුඹේ
ගණන් පත්‍රය රැගෙන අසූවකැයි
ලියාපන්නැයි ඔහුට කීවේය. අධර්මිෂ්ඨ 8
ගබඩාකාරයා නුවණින් ක්‍රියාකළ නිසා
ඔහුගේ ස්වාමියා ඔහුට ප්‍රශංසාකළේය.
මක්නිසාද ආලෝකයේ පුත්‍රයන්ට වඩා

*බාත් එකක් නැළි තිහක් පමණ වේ.
†අමුණක් බුසල් $14^1/_2$ ක් පමණය.

මේ ලෝකයේ පුත්‍රයෝ තමුන්ගේම
පරම්පරාව ගැන නුවණැත්තෝය.

## වස්තුව හරිලෙස පාවිච්චිකිරීම

9 මමත් නුඹලාට කියමි: අධර්මිෂ්ඨකමේ
වස්තුවෙන් මිත්‍රයන් සපයාගනිල්ලා; එවිට
එය පහවයන කල ඔව්හු නුඹලා සදකාල
කුඩාරම්වලට පිළිගන්නවා ඇත.
10 ස්වල්පයක් ගැන විශ්වාසව සිටින්නා
බොහෝ දේ ගැනත් විශ්වාසව සිටියි.
ස්වල්පයක් ගැන අධර්මිෂ්ඨව සිටින්නා
බොහෝ දේ ගැනත් අධර්මිෂ්ඨව සිටියි.
11 එබැවින් නුඹලා අධාර්මික වස්තුව ගැන
විශ්වාසව නොසිටියා නම්, සැබෑවූ
වස්තුව නුඹලාට භාරදෙන්නේ කවුද?
12 අනිකෙකුගේ දේ ගැන නුඹලා විශ්වාසව
නොසිටියා නම්, නුඹලාගේම දේ
13 නුඹලාට දෙන්නේ කවුද? ස්වාමිවරුන්
දෙදෙනෙකුට සේවයකරන්ට කිසි
වැඩකාරයෙකුට නුපුළුවන. මක්නිසාද
ඔහු එක්කෙනෙකුට වෛරවන්නේය,
අනික් අයට ප්‍රේමවන්නේය; නොහොත්
එක්කෙනෙකුට ඇලුම්වන්නේය, අනික්
අය හෙළාදක්නේය. දෙවියන්වහන්සේටත්
වස්තුවටත් සේවය කරන්ට නුඹලාට
බැරියයි කීසේක.

## එරිසිවරුන්ට තරවටුකිරීම. පොහොසතා සහ ලාසරුස්

14 එරිසිවරු මුදලට ආශා ඇත්තෝ
බැවින් මේ සියල්ල අසා උන්වහන්සේට
15 කවටකම්කළෝය. උන්වහන්සේ ඔවුන්ට
කියනසේක්: නුඹලා නම් මනුෂ්‍යයන්
ඉදිරියෙහි තමුන් ධර්මිෂ්ඨකරගන්න
අයය; නුමුත් දෙවියන්වහන්සේ නුඹලාගේ
සිත් දන්නාසේක. මක්නිසාද මනුෂ්‍යයන්
අතරේ උතුම්කොට සලකන දෙය
දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිළිකුලක්ය.
16 ව්‍යවස්ථාවද අනාගතවක්තෘහුද යොහන්
දක්වා පැවතුණෝය. එතැන් පටන්
දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචිය
දේශනා කරනු ලැබේ, සියල්ලෝද බලෙන්
17 ඊට ඇතුල්වෙති. එහෙත් ව්‍යවස්ථාවෙන්
එක බින්දුවක් පහවීමට වඩා අහසත්
පොළොවත් පහවයාම පහසුය. තමාගේ 18
භාර්යාව අත්හැර වෙන ස්ත්‍රියෙකු
සරණපාවාගන්න කවරෙක් නුමුත්
කාමමිථ්‍යාචාරයකරයි. පුරුෂයෙකු විසින්
අත්හරිනලද ස්ත්‍රිය සරණපාවාගන්න
තැනැත්තේද කාමමිථ්‍යාචාරය කරයි.
රත්නිල් වස්ත්‍ර සහ සිහින් රෙදි ඇන්දවූ, 19
දවස් පතා සැපජීවිකාවෙන් කාලය
ගතකළාවූ එක්තරා ධනවතෙක් සිටියේය.
වණවලින් ගැවසීගත් ලාසරුස් නම් 20
එක්තරා හිඟන්නෙක් ධනවතාගේ දොරටුව
ළඟ තබනලද්දේය. ඔහු ධනවතාගේ 21
මේසයෙන් වැටුණු කැබෙලි කන්ට
කැමතිවූයේය; එසේය, බල්ලෝ පවා
ඇවිත් ඔහුගේ වණ ලෙවූවෝය. තවද 22
හිඟන්නා නැසී, දේවදූතයන් විසින්
ආබ්‍රහම්ගේ ළැපැත්තට ගෙනයනලද්දේය.
ධනවතාත් නැසී, තැන්පත්කරනලද්දේය.
ඔහු *හේදිසියෙහි වධවිඳිමින්, ඇස් ඔසවා 23
ආබ්‍රහම් සහ ඔහුගේ ළැපැත්තේ හුන්
ලාසරුස්ද දුර සිට දැක, මොරගසා: 24
පියවූ ආබ්‍රහම්. මට කරුණාකොට.
තමාගේ ඇඟිල්ලේ අග දියේ ගලා, මාගේ
දිව සිසිල්කරන්ට ලාසරුස් එවුව මැනව;
මක්නිසාද මම මේ ගිනිදැලෙහි වේදනා
විඳිමියි කීවේය. නුමුත් ආබ්‍රහම් කියනුයේ: 25
පුත්‍රය, නුඹේ ජීවිතයේදී නුඹේ යහපත්
දේ නුඹට ලැබුණු බවත් එලෙසම
ලාසරුස්ට අයහපත් දේ ලැබුණු බවත්
සිහිකරපන්න. නුමුත් දැන් ඔහු මෙහි
සැනසී ඉඳියි, නුඹ වේදනා විඳිනෙහිය.
මේ සියල්ල ඇර, මෙහෙන් නුඹලා ළඟට 26
යන්ටත් ඔහෙන් අප ළඟට එන්ටත්
කැමතිවූවන්ට බැරි වන ලෙස අපටත්
නුඹලාටත් අතරෙහි මහත් කුහරයක්
පිහිටා තිබේයයි කීවේය. ඔහුද: එසේ 27
නම්. පියාණෙනි, මට සහෝදරයන්
පස්දෙනෙක් සිටිති; ඔවුන්ද මේ වේදනා 28
ඇති ස්ථානයට නොපැමිණෙන පිණිස,
ඔවුන්ට සාක්ෂි දෙන්ට ඔහු මාගේ
පියාගේ ගෙදරට අරින ලෙස ඉල්ලමියි
කීවේය. නුමුත් ආබ්‍රහම්: මෝසෙස් සහ 29
අනාගතවක්තෘවරු ඔවුන්ට සිටිති; ඔව්හු
ඔවුන්ගේ වචන අසත්වයි කීවේය. ඔහු 30

*හෙවත්–පාතාලයෙහි

කථාකොට: එසේ නොවේ, පියවූ
ආබ්‍රහම්. මළවුන්ගෙන් යමෙක් ඔවුන්
වෙතට ගියොත් ඔවුන් පසුතැවිලිවෙනවා
31 ඇතැයි කීවේය. ආබ්‍රහම්ද: මෝසෙස්ගෙත්
අනාගතවක්තෘවරුන්ගෙත් වචන ඔව්හු
නොඅසත් නම්, යමෙක් මළවුන්ගෙන්
නැගුටුණත් ඔවුන් විශ්වාස කරන්නේ
නැත කියා ඔහුට කීවේයයි කීසේක.

## යේසුස්වහන්සේගේ කීම් සමහරක්

17 උන්වහන්සේ තමන් ගෝලයන්ට
කියනසේක්: බාධා නොපැමිණී
තිබෙන්ට බැරිය. නුමුත් යමෙකු
කරණකොටගෙන ඒවා පැමිණේද ඔහුට
2 දුක්වේ. යමෙක් මේ කුඩා අයගෙන්
එක්කෙනෙකුට බාධාකරනවාට වඩා,
එසේ කරන්නාගේ බෙල්ලේ ඇඹරුම්
ගලක් එල්ලා, ඔහු මුහුදේ දැමීම ඔහුට
3 යහපත. නුඹලා ප්‍රවේසම්වෙයල්ලා. නුඹේ
සහෝදරයා පව්කළොත් ඔහුට
තරවටුකරපන්න; ඔහු පසුතැවිලිවේ නම්
4 ඔහුට කමාවෙයන්න. ඔහු දවසකට
සත්වරක් නුඹට විරුද්ධව පව්කොට,
සත්වරක් නුඹ වෙතට හැරී: මම
පසුතැවිලිවෙමියි කීවොත්, ඔහුට
කමාවෙයන්නැයි කීසේක.
5 එවිට ප්‍රේරිතයෝ කථාකොට: අපේ
ඇදහිල්ල වැඩිකළ මැනවයි ස්වාමීන්-
6 වහන්සේට කීවෝය. ස්වාමීන්වහන්සේ
කියනසේක්: අබ ඇටයක ප්‍රමාණ
ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ ඇඹිල්ල
ගහට කථාකොට: ඉදිරී මුහුදේ
සිටවෙවයි කියන්නහු නම් ඒක නුඹලාට
7 කීකරුවෙනවා ඇත. නුමුත් නුඹලා
අතරෙහි යමෙක් හාන්නාවූ නොහොත්
බැටළුවන් පාලනයකරන්නාවූ තමාගේ
දසයා කෙතේ සිට ආ කල: වහාම
ඇවිත් කන්ට ඉඳගනින්නැයි ඔහුට
8 කියන්නේද? එසේ නොව: මට කෑම
බීම පිළියෙළකොට, ඉහටිය බැඳ,
මා විසින් කනබොන තුරු මට
උපස්ථානකරපන්න, ඉන්පසු කාපන්න
9 බීපන්නැයි කියන්නේ නැද්ද? ඒ දසයා
තමාට අණකළ දේ කළ බැවින්
ස්වාමියා ඔහුට ස්තුතිකරයිද? එසේම 10
නුඹලාත් නුඹලාට අණකළ සියල්ල කළ
පසු: අපි නිෂ්ප්‍රයෝජන දසයෝය; අප
විසින් කටයුතුව තිබුණු දේ කළෙමුයයි
කියාපල්ලායයි කීසේක.

## කුෂ්ඨරෝගීන් දසදෙනා සුවපත්කිරීම

තවද ඔවුන් යෙරුසලමට යද්දී උන්- 11
වහන්සේ සමාරියද ගලීලයද මැදින්
ගියසේක. උන්වහන්සේ එක්තරා ගමකට 12
ඇතුල්වන කල, කුෂ්ඨරෝගීන් දසදෙනෙක්
උන්වහන්සේට සම්මුඛවූවෝය; ඔව්හු 13
දුරින් සිට: යේසුස්වහන්ස, ආචාරීන්වහන්ස,
අපට කරුණාකළ මැනවයි ශබ්දනගා
කීවෝය. උන්වහන්සේ ඔවුන් දැක: නුඹලා 14
ගොස් පූජකයන්ට පෙනියල්ලායයි
කීසේක. තවද ඔව්හු යද්දී පවිත්‍රවූවෝය. 15
ඔවුන්ගෙන් එක්කෙනෙක් තමාට සුවවූ
බව දැක, මහත් ශබ්දයකින් දෙවියන්-
වහන්සේට ගෞරවකරමින් හැරී ඇවිත්,
උන්වහන්සේගේ පාමුල මුහුණින් 16
වැටී උන්වහන්සේට ස්තුතිකළේය.
ඔහු සමාරියයෙක්ය. යේසුස්වහන්සේ 17
උත්තරදෙමින්: දසදෙනාම පවිත්‍රවුණා
නොවේද? නුමුත් නවදෙනා කොයිද?
මේ විදේශිකයා හැර දෙවියන්වහන්සේට 18
ගෞරවකරන්ට වෙන කිසිවෙක් හැරී
නායේද කියා, ඔහුට කථාකොට: නැගිට 19
පලයන්න. නුඹේ ඇදහිල්ල නුඹ
සුවකළේයයි කීසේක.
දෙවියන්වහන්සේගේ රාජ්‍යය කොයි 20
කලක එන්නේදැයි ඵරිසිවරුන් විසින්
ඇසූ බැවින් උන්වහන්සේ ඔවුන්ට
උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ
රාජ්‍යය පෙරහැර සහිතව නොඑන්නේය.
බලව, ඒක මෙතැනය! එතැනයයි 21
නොකියන්නෝය; මක්නිසාද දෙවියන්-
වහන්සේගේ රාජ්‍යය නුඹලා *ඇතුළේයයි
කීසේක.

*හෙවත්, අතරෙහි.

## දෙවියන්වහන්සේගේ රාජ්‍යය හදිසියෙන් පැමිණීම

22 උන්වහන්සේ ගෝලයන්ට කියනසේක්:
නුඹලා මනුෂ්‍ය පුත්‍රයාගේ දවස්වලින්
එකක් දකින්ට ආශාවන නුමුත් එය
දකින්ට නුඹලාට නොලැබෙන කාලයක්
23 පැමිණෙන්නේය. බලව, එතැනය! බලව,
මෙතැනයයි ඔවුන් නුඹලාට කියන කල්හි
පිටත්ව නොයල්ලා. ඔවුන් පස්සේ
24 නොයල්ලා. මක්නිසාද ආකාශයේ එක්
දිසාවකින් නික්මෙන විදුලිය ආකාශයේ
අනික් දිසාව දක්වා බැබළෙන්නාක්මෙන්
මනුෂ්‍ය පුත්‍රයා තමන් දවසේදී වන්නේය.
25 නුමුත් පළමුකොට ඔහු බොහෝ දුක්විඳ
මේ පරම්පරාව විසින් එපාකරනු ලබන්ට
26 ඕනෑය. තවද නෝවාගේ දවස්වලදී
වූවාක්මෙන්ම මනුෂ්‍ය පුත්‍රයාගේ
27 දවස්වලදීත් වන්නේය. නෝවා නැවට
ඇතුල්වූ දවස දක්වා මනුෂ්‍යයෝ කමින්,
බොමින්, සරණපාවාගනිමින්, සරණ-
පාවාදෙමින් සිටියෝය. ජලගැල්ම
පැමිණ ඔවුන් සියල්ලන්ම විනාශකළේය.
28 ලොත්ගේ දවස්වලදීත් එසේම වූයේය;
ඔව්හු කමින්, බොමින් මිලේට ගනිමින්,
විකුණමින්, වවමින්, ගොඩනගමින්
29 සිටියෝය; නුමුත් ලොත් සොදොම්හි සිට
පිටත්ව ගිය දවසේ අහසෙන් ගිනි සහ
ගෙන්දගම් වැස, සියල්ලන් විනාශ
30 කළේය. මනුෂ්‍ය පුත්‍රයා ප්‍රකාශවන
31 දවසේදීත් ඒ ආකාරම වන්නේය. ඒ
දවසේ ගේ උඩ සිටින්නා ගෙයි තිබෙන
තමාගේ බඩු ගෙනයන්ට නොබසීවා.
එසේම කෙතේ සිටින්නා ආපසු නොඒවා.
32 ලොත්ගේ භාර්යාව සිහිකරපල්ලා.
තමාගේ ජීවිතය ලබාගන්ට සොයන්නා
33 ඒක නැතිකරගන්නේය. තමාගේ ජීවිතය
නැතිකරගන්නා ඒක ආරක්ෂා කර-
34 ගන්නේය. නුඹලාට කියමි—ඒ රාත්‍රියේ
මනුෂ්‍යයෝ දෙදෙනෙක් එක යහනක
වන්නෝය; එක්කෙනෙක් ගනු ලබන්නේය,
අනික් එක්කෙනා අත්හරිනු ලබන්නේය.
35 ස්ත්‍රියෝ දෙදෙනෙක් එකට අඹරමින්
සිටින්නෝය; එක තැනැත්තියක් ගනු
ලබන්නීය, අනික් තැනැත්තී අත්හරිනු
36 ලබන්නීයයි කීසේක. එවිට ඔව්හු
උත්තරදෙමින්: ස්වාමිනි, කොතැන්හිදැයි
උන්වහන්සේට කීවෝය. උන්වහන්සේ
ඔවුන්ට කියනසේක්: යම් තැනක 37
මළකඳ ඇද්ද, එතැනට ගිජුලිහිණියොත්
රැස්වන්නෝයයි කීසේක.

## අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා

18 තවද ඔවුන් විසින් නොමැළිව
නිතර යාච්ඤාකරන්ට ඕනෑ බව
දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට
උපමාවක් කියනසේක්: දෙවියන්- 2
වහන්සේට භය නැත්තාවූ, මනුෂ්‍යයන්ට
ගරු නොකළාවූ විනිශ්චයකාරයෙක් එක්
නුවරක සිටියේය. ඒ නුවර වැන්දඹුවක්ද 3
සිටියාය; ඈ නොයෙක්වර ඔහු ළඟට
ගොස්: මාගේ විරුද්ධකාරයා ගැන මට
යුක්තිය කළමැනවයි කීවාය. ඔහු කලක් 4
නොකැමැත්තිවිය. පසුව ඔහු තමා තුළ
කථාකොට: මම දෙවියන්වහන්සේට
භය නොවෙමි නුමුත්, මනුෂ්‍යයන්ට ගරු
නොකරමි නුමුත්, මේ වැන්දඹුව මට 5
කරදරකරන හෙයින්, ඈ නිතර ඊමෙන්
මා නොපෙළෙන පිණිස, ඈට යුක්තිය
කරන්නෙමියි කීයේයයි කීසේක. එවිට 6
ස්වාමීන්වහන්සේ කියනසේක්: මේ
අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා කියන දේ
අසාපල්ලා. දෙවියන්වහන්සෙත් තමන්ට 7
රෑ දවල් හඬගසන්නාවූ තමන්
තෝරාගත්තවුන් ගැන යුක්තිය ඉෂ්ට
නොකරනසේක්ද? උන්වහන්සේ ඔවුන්
කෙරෙහි බොහෝ ඉවසිල්ලෙන්
සිටිනසේක. උන්වහන්සේ ඔවුන්ට වහාම 8
යුක්තිය ඉෂ්ටකරනසේකැයි නුඹලාට
කියමි. එසේවී නුමුත් මනුෂ්‍ය පුත්‍රයා
එන කල්හි පොළොවේ ඇදහිල්ල
සම්බවේදැයි කීසේක.

## එරිසියා සහ ආදයම් අයකරන්නා

තවද තුමූම ධර්මිෂ්ඨයෝයයි විශ්වාස 9
කොට, අනික් සියල්ලන් සුළුකළාවූ
සමහරෙකුට උන්වහන්සේ මේ උපමාවද
කියනසේක්: මනුෂ්‍යයෝ දෙදෙනෙක් 10
යාච්ඤාකරන පිණිස දේවමාළිගාවට
නැගී ගියෝය; එක්කෙනෙක් එරිසියෙක්ය,

අනික් තැනැත්තා සුංගම් අයකරන්නෙක්ය.
11 එරිසියා සිටගෙන තමා තුළ
යාච්ඤාකරමින්: දෙවියන්වහන්ස, මම
කොල්ලකාරවූ අධර්මිෂ්ඨවූ කාම-
මිථ්‍යාචාරිකවූ අනික් මනුෂ්‍යයන් මෙන්
කෙනෙක්වත් මේ සුංගම් අය-
කරන්නාමෙන් කෙනෙක්වත් නොවන
බැවින් ඔබවහන්සේට ස්තුතිකරමි.
12 සතියකට දෙවරක් නිරාහාරයෙන් සිටිමි;
මට ලැබෙන සියල්ලෙන් දසයෙන්
13 කොටස දෙමියි කීවේය. නුමුත් සුංගම්
අයකරන්නා දුරින් සිට, ස්වර්ගය දෙසට
ඇස් ඔසවා බලන්ටවත් නොසිතා,
තමාගේ ළැපැත්තට ගසාගනිමින්:
දෙවියන්වහන්ස, පව්කාරයෙක්වූ මට
14 කරුණාකළ මැනවයි කීවේය. නුඹලාට
කියමි–අනික් තැනැත්තා නොව මොහු
ධර්මිෂ්ඨකොට ගණන්ගනු ලැබ තමාගේ
ගෙදරට ගියේය. මක්නිසාද තමුන්ම
උසස් කරගන්න හැමදෙනා යටත්කරනු
ලබන්නෝය; තමාම යටත්කරගන්නා
උසස්කරනු ලබන්නේයයි කීසේක.

## යේසුස්වහන්සේ කුඩා දරුවන්ට ආශීර්වාදකිරීම

15 ඔව්හු තමුන්ගේ ළදරුවන් පිට උන්-
වහන්සේගේ අත් තබවාගන්න පිණිස
ඔවුන් උන්වහන්සේ ළඟට ගෙනාවෝය.
ගෝලයෝ ඒ දැක ඔවුන්ට තරවටුකළෝය.
16 නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන්
ළඟට කැඳවා: ළදරුවන් නොවලක්වා
මා ළඟට එන්ට ඉඩහැරපල්ලා;
මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය
17 මෙබඳුවන්ගේය. සැබවක් නුඹලාට
කියමි–යමෙක් දෙවියන්වහන්සේගේ
රාජ්‍යය ළදරුවෙකු මෙන් පිළි
නොගන්නේද, ඔහු කිසිසේත් එහි ඇතුල්
නොවන්නේයයි කීසේක.

## වස්තුව සදකාල ජීවනය ලැබීමට බාධාවක් වීම

18 එවිට එක්තරා මූලාදෑනියෙක්
උන්වහන්සේට කථාකොට: යහපත්
ආචාරීනි, සදකාල ජීවනය උරුම-
කරගන්නා පිණිස මම කුමක්
කරම්දැයි ඇසුවේය. යේසුස්වහන්සේද: 19
මට යහපත්යයි නුඹ කියන්නේ
මක්නිසාද? එක්කෙනෙක්, එනම්,
දෙවියන්වහන්සේ මිස වෙන කිසිවෙක්
යහපත් නොවේ. කාමමිථ්‍යාචාරය 20
නොකරව, මිනී නොමරව, සොරකම්
නොකරව, බොරු සාක්ෂි නොකියව,
තාගේ පියාටත් මවුටත් ගෞරව කරව
යන මේ ආඥා නුඹ දන්නවායයි ඔහුට
කීසේක. මේ සියල්ල මාගේ යෞවන 21
අවස්ථාවේ පටන් රක්ෂාකෙළෙමියි ඔහු
කීවේය. යේසුස්වහන්සේ ඒ අසා: නුඹට 22
තවම එක දෙයක් අඩුය. නුඹ සන්තක
සියල්ල විකුණා, දිළිඳුන්ට බෙදීපන්න,
එවිට ස්වර්ගයෙහි නුඹට වස්තුව
ලැබෙන්නේය. මා අනුවයන්ට
වරෙන්නැයි ඔහුට කීසේක. නුමුත් ඔහු 23
ඒ අසා, බොහෝ ධනවත්ව සිටි බැවින්,
අතිශයින් ශෝකවූයේය. යේසුස්වහන්සේ 24
ඔහු දෙස බලා කියනසේක්: වස්තු ඇති
අය දෙවියන්වහන්සේගේ රාජ්‍යයට
ඇතුල්වෙන්නේ කොපමණ අමාරු-
වෙන්ද! ධනවතෙකු දෙවියන්වහන්සේගේ 25
රාජ්‍යයට ඇතුල්වීමට වඩා ඉඳිකටුවක
සිදුරෙන් ඔටුවෙකුගේ ගමන පහසුයයි
කීසේක. ඒ ඇසූ අය: එසේවී නම් 26
ගැළවෙන්ට පුළුවන් කාටදැයි කීවෝය.
උන්වහන්සේද: මනුෂ්‍යයන්ට නුපුළුවන් 27
දේ දෙවියන්වහන්සේට පුළුවනැයි
කීසේක. එවිට පේත්‍රුස් කථාකොට: අපි 28
වනාහි අප සන්තක දේ අත්හැර
ඔබවහන්සේ අනුව ආවෙමුයයි කීවේය.
උන්වහන්සේ: සැබවක් නුඹලාට කියමි– 29
දෙවියන්වහන්සේගේ රාජ්‍යය නිසා ගෙය
හෝ භාර්යාව හෝ සහෝදරයන් හෝ
දෙමවුපියන් හෝ දරුවන් හෝ අත්හැරිය
කවරෙක් නුමුත්, මේ කාලයේදී ඊට 30
බොහෝ වැඩියෙන්ද පරලොවදී සදකාල
ජීවනයද නොලැබ නොසිටින්නේයයි
කීසේක.

## යේසුස්වහන්සේගේ මරණය සහ නැවත-නැගිටීම ගැන තුන්වෙනි වරට කලින් කීම

31 උන්වහන්සේ දෙළොස්දෙනා තමන්
ළඟට කැඳවා ඔවුන්ට කියනසේක්: බලව,
අපි යෙරුසලමට යමුව, මනුෂ්‍ය පුත්‍රයා
ගැන අනාගතවක්තෘවරුන් විසින් ලියා
තිබෙන සියල්ල සම්පූර්ණ වන්නේය.
32 මක්නිසාද ඔහු අන්‍යජාතීන්ට පාවාදෙනු
ලැබ, කවටකම් සහ නින්දද කෙළගැසීම්ද
33 ලබන්නේය. ඔව්හු ඔහුට තළා ඔහු
මරන්නෝය. නුමුත් තුන්වෙනිද ඔහු නැවත
34 නැගිටින්නේයයි කීසේක. මේ දේවලින්
කිසිවක් ඔව්හු තේරුම් නොගත්තෝය.
කී දේ ඔවුන්ට නොතේරී, මේ කීම
ඔවුන්ගෙන් සැඟවී තිබුණේය.

## අන්ධයෙකුට පෙනීම දීම

35 තවද උන්වහන්සේ යෙරිකෝව ළඟට
පැමිණි කල, එක්තරා අන්ධයෙක්
සිඟමින් පාර අයිනේ ඉඳගෙන උන්නේය.
36 සමූහයක් ඒ ළඟින් යනවා ඔහුට ඇසී,
37 ඒ කුමක්දැයි ඇසුවේය. එවිට ඔව්හු
නාසරීය යේසුස්වහන්සේ ඒ ළඟින් යන
38 බව ඔහුට කීවෝය. ඔහුද: යේසුස්වහන්ස,
දවිත්ගේ පුත්‍රය, මට කරුණාකළ මැනවයි
39 මොරගැසුවේය. පෙරටුවෙන් ගිය අය
ඔහු නිශ්ශබ්ද වෙන පිණිස ඔහුට
තරවටුකළෝය. නුමුත් ඔහු ශබ්ද නගා:
දවිත්ගේ පුත්‍රය, මට කරුණාකළ මැනවයි
තව වඩ වඩා මොරගැසුවේය.
40 යේසුස්වහන්සේ නැවතී සිට ඔහු තමන්
ළඟට ගෙනෙන්ට අණකළසේක. ඔහු
41 ළඟට ආ කල: මා විසින් තුඹට කුමක්
කරනවාට තුඹ කැමැත්තෙහිදැයි ඔහුගෙන්
ඇසූසේක. ස්වාමිනි, මට පෙනීම
42 ලැබේවයි ඔහු කීවේය. යේසුස්වහන්සේ:
පෙනීම ලබාපන්න. තුඹේ ඇදහිල්ල තුඹ
43 සුවකළේයයි ඔහුට කීසේක. එකෙණෙහිම
ඔහු පෙනීම ලැබ, දෙවියන්වහන්සේ
වර්ණනාකරමින්, උන්වහන්සේ අනුව
ගියේය. මුළු සෙනඟද ඒ දැක
දෙවියන්වහන්සේට ප්‍රශංසාකළෝය.

## සාකෙවුස්

19 උන්වහන්සේ යෙරිකෝවට ඇතුල්ව
ඒ මැදින් යද්දී, සුංගම් 2
අයකරන්නන්ගේ ප්‍රධානියෙක්වූ සාකෙවුස්
නම්ලත් පොහොසත් මනුෂ්‍යයෙක්,
යේසුස්වහන්සේ කවුද කියා බලන්ට 3
සෙවීය; නුමුත් ඔහු මිටි බැවින් සමූහයා
නිසා නොහැකිවිය. උන්වහන්සේ ඒ 4
මාර්ගයේ යන්ට සිටි බැවින්, ඔහු පෙරටුව
දුවගොස් උන්වහන්සේ දකින පිණිස
අත්තික්කා ගහකට නැගුණේය.
යේසුස්වහන්සේ ඒ ස්ථානයට පැමිණ, 5
උඩ බලා ඔහුට කථාකොට: සාකෙවුස්,
වහාම බැසපන්න, මක්නිසාද අද තුඹේ
ගෙදර මා නවතින්ට ඕනෑයයි ඔහුට
කීසේක. ඔහු වහාම බැස ඇවිත්, 6
ප්‍රීතියෙන් උන්වහන්සේ පිළිගත්තේය. ඔවුන් 7
ඒ දැක: උන්වහන්සේ පව්කාර මනුෂ්‍යයෙකු
සමග නවාතැන් ගන්ට ගියසේකැයි
කියමින් සියල්ලෝම කොඳුළෝය.
සාකෙවුස් නැගිට සිට: ස්වාමිනි, මා 8
සන්තක දෙයින් දෙකෙන් කොටසක්
දිළිඳුන්ට දෙමි; යමෙකුගෙන් අයුත්තේ
යමක් ගෙන තිබේ නම්, ඔහුට
සතරගුණයක් නැවත දෙමියි ස්වාමීන්-
වහන්සේට කීවේය. යේසුස්වහන්සේ ඔහුට 9
කියනසේක්: ගැළවීම අද මේ ගෙදරට
පැමිණියේය, කුමක්හෙයින්ද මොහුත්
ආබ්‍රහම්ගේ පුත්‍රයෙක්ය. මක්නිසාද 10
මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ සොයන්ටද
ගළවාගන්ටද ආයේයයි කීසේක.

## වෙළඳම්කිරීමට මුදල් භාරදීම ගැන උපමාව

මෙසේ කාරණා ඔවුන් ඇසූ කල, 11
උන්වහන්සේ යෙරුසලමට සමීපව සිටි
බැවින්ද, දෙවියන්වහන්සේගේ රාජ්‍යය
වහාම එළිදරව්වේයයි ඔවුන් සිතූ
බැවින්ද, උන්වහන්සේ තව දුරටත්
උපමාවක් කීසේක. එබැවින් උන්වහන්සේ 12
කථාකොට: එක්තරා වංශවත්
මනුෂ්‍යයෙක් තමාටම රාජ්‍යයක්
ලබාගෙන නැවත එන පිණිස දුර රටකට
ගියේය. ඔහු තමාගේ දසයන් දසදෙනෙකුට 13
අඬගසා, ඔවුන්ට *පවුම් දසයක් දී: මා

*මෙහි පවුමක් රුපියල් 50 ක් පමණය.

එන තෙක් මෙයින් වෙළඳම්කරපල්ලායයි
14 කීවේය. එහෙත් ඔහුගේ නුවර
වැසියෝ ඔහුට වෛරවී: මේ මනුෂ්‍යයා
අප කෙරෙහි රජකම්කරනවාට
නොකැමැත්තෙමුයයි ඔහු පස්සේ
15 පණිවිඩයක් ඇරියෝය. තවද ඔහු
රාජ්‍යය ලබාගෙන ඇවිත්, තමා විසින්
මිල දුන් දසයෝ වෙළඳමෙන් කොපමණ
උපදවාගත්තෝදැයි දැනගන්නා පිණිස
ඔවුන් තමා ළඟට කැඳවන්ට අණකළේය.
16 එවිට පළමුවෙනියා ඔහු ඉදිරියට ඇවිත්:
ස්වාමිනි, ඔබගේ *පවුමෙන් පවුම් දසයක්
17 ඉපදවීමියි කීවේය. ඔහුද: ඉතා හොඳය,
යහපත්වූ දසය. නුඹ ඉතා ස්වල්පයක්
ගැන විශ්වාසවූ බැවින් නුවරවල් දසයක්
කෙරෙහි අධිපතිවෙයන්නැයි ඔහුට
18 කීවේය. දෙවෙනියාද ඇවිත්: ස්වාමිනි,
ඔබගේ පවුමෙන් පවුම් පහක් ඉපදවීමියි
19 කීවේය. එවිට ඔහු: නුඹත් නුවරවල්
පහක් කෙරෙහි අධිපතිවෙයන්නැයි ඔහුට
20 කීවේය. තවත් එක්කෙනෙක් ඇවිත්:
ස්වාමිනි, මෙන්න, ඔබගේ පවුම! එය
21 රෙදිකඩක ඔතා තැබීමි. මක්නිසාද ඔබ
නොතිබූ දේ ගන්නාවූ, නොවපුළ දේ
කපන්නාවූ, කර්කශ කෙනෙකු බැවින්,
22 ඔබට භයවූයෙමියි කීවේය. එවිට ඔහු
කථාකොට: දුෂ්ටවූ දසය, නුඹේම කටින්
නුඹ විනිශ්චයකරමි. මා නොතිබූ දේ
ගන්නාවූ, නොවපුළ දේ කපන්නාවූ,
කර්කශ කෙනෙක් බව නුඹ දැනගෙන
23 සිටියෙහිය; එසේ නම් මා ආ කල්හි
පොළිත් සමග අයකරගන්න පිණිස
මාගේ මුදල බැංකුවට නුදුන්නේ
24 මක්නිසාද කියා, ළඟ සිටියවුන්ට
කථාකොට: පවුම ඔහුගෙන් රැගෙන
පවුම් දසය ඇත්තාට දීපල්ලායයි කීවේය.
25 එවිට ඔව්හු: ස්වාමිනි, ඔහුට පවුම්
26 දසයක් ඇත්තේයයි කීවෝය. ඇත්තාවූ
සියල්ලන්ට දෙනු ලැබේ; නැති අයගෙන්
ඔහුට ඇති දේත් පැහැරගනු ලැබේයයි
27 නුඹලාට කියමි. එසේ වුවත් මා තමුන්
කෙරේ රජකම්කරනවාට කැමති නුණාවූ
මේ මාගේ සතුරන් මෙහි ගෙනැවිත්, මා
ඉදිරියෙහි මරාපල්ලායයි කීවේයයි
කීසේක.

*මෙහි පවුමක් රුපියල් 50 ක් පමණය.

## යේසුස්වහන්සේ ජයාන්විතව යෙරුසලමට ඇතුල්වීම

උන්වහන්සේ මෙසේ කියා යෙරුසලමට 28
යන පිණිස ඔවුන්ට පෙරටුව ගියසේක.
තවද උන්වහන්සේ ඔලීව නම්වූ කන්ද 29
ළඟ බෙත්පාගයටද බෙතානියටද
සමීපවූ කල, තමන්ගේ ගෝලයන්ගෙන්
දෙදෙනෙකු යවමින්: නුඹලා ඉදිරිපිට 30
තිබෙන ගමට පලයල්ලා; එහි
ඇතුල්වූවිට, කිසි කලෙක මනුෂ්‍යයෙකු
නොනැගුණාවූ කොටළු පැටවෙකු එහි
බැඳ සිටිනවා නුඹලාට සම්බවන්නේය.
ඌ ලිහා ගෙනෙල්ලා. ඌ ලිහන්නේ 31
මක්නිසාදැයි යමෙක් නුඹලාගෙන්
ඇසුවොත්, ස්වාමීන්වහන්සේට ඌ
ඕනෑයයි කියාපල්ලායයි කීසේක. යවනු 32
ලැබූවෝ ගොස්, උන්වහන්සේ ඔවුන්ට
කී ලෙසම දුටුවෝය. ඔවුන් කොටළු 33
පැටවා ලිහන කල ඌ අයිතිකාරයෝ:
නුඹලා කොටළු පැටවා ලිහන්නේ
මක්නිසාදැයි ඔවුන්ට කීවෝය. ස්වාමීන්- 34
වහන්සේට ඌ ඕනෑයයි ඔව්හු කීවෝය.
ඔව්හු කොටළු පැටවා උන්වහන්සේ ළඟට 35
ගෙනැවිත්, තමුන්ගේ වස්ත්‍ර ඌ පිට අතුරා,
යේසුස්වහන්සේ ඒ පිට හිඳෙවුවෝය.
උන්වහන්සේ යද්දී ඔව්හු තමුන්ගේ වස්ත්‍ර 36
මග අතුළෝය. උන්වහන්සේ ඔලීව කන්දේ 37
බැස්ම ළඟට පැමිණි කල්හි, මුළු ගෝල
සමූහයා ප්‍රීතිවෙන්ටත් තමුන් දුටු සියලු
බලවත් ක්‍රියා ගැන මහත් ශබ්දයකින්
දෙවියන්වහන්සේට ප්‍රශංසාකරන්ටත්
පටන්ගෙන: ස්වාමීන්වහන්සේගේ 38
නාමයෙන් එන්නාවූ රජ ආශිර්වාද-
ලත්තෙක්ය. ස්වර්ගයෙහි සමාදානයද ඉතා
උසස්තැන්හි මහිමයද වේවයි කීවෝය.
එවිට සමූහයා අතරෙන් සමහර 39
ඵරිසිවරු: ආචාරිනි, ඔබගේ ගෝලයන්ට
තරවටුකළ මැනවයි උන්වහන්සේට
කීවෝය. උන්වහන්සේ උත්තරදෙමින්: 40
ඔවුන් නිශ්ශබ්දවුණොත්, ගල්
මොරගසන්නේයයි නුඹලාට කියමියි
කීසේක.

## නුවර ගැන දුක්වීම

41 උන්වහන්සේ ළංවී, නුවර දැක, ඒ ගැන
42 හඬමින්; අහෝ තිගේ සමාදානයට අයිති
කාරණා මේ දවසේදීවත් තීම දැනගෙන
සිටියා නම් යහපත! එහෙත් දැන් ඒවා
43 තීගේ ඇස්වලින් සැඟවී තිබේ. තී විමසා
බලන කාලය තී නොදැන සිටි බැවින්,
තිගේ සතුරන් විසින් තී වටේට
පස්වැටියක් නගා, තී වටකොට, සියලු
44 දිසාවෙන්ම තී කොටුකරගෙන, තී සහ
තී තුළ සිටින තිගේ දරුවන්ද පොළොවේ
ගසා, තී තුළේ ගලක් පිට ගලක් තිබෙන්ට
නාරින දවස් පැමිණෙන්නේයයි කීසේක.

## දේවමාළිගාව පවිත්‍රකිරීම

45 උන්වහන්සේ දේවමාළිගාවට ඇතුල්ව,
විකුණන්නන් බැහැරකරන්ට පටන්ගෙන:
46 මාගේ ගෘහය යාච්ඤා ගෘහයක්
වන්නේයයි ලියා තිබේ. නුමුත් නුඹලා
ඒක සොරුන්ගේ ගුහාවක් කර තිබේයයි
ඔවුන්ට කීසේක.
47 උන්වහන්සේ දවස්පතා දේවමාළිගාවේ
ඉගැන්වූසේක. නුමුත් නායක පූජකයෝද
ලියන්නෝද සෙනඟගේ ප්‍රධානීහුද
උන්වහන්සේ නසන්ට සෙවුවෝය.
48 මුළු සෙනඟ උන්වහන්සේගේ වචන
ඇලුම්කමින් ඇසූ බැවින්, උන්වහන්සේට
කිසිවක් කරන්ට ඔවුන්ට නොලැබුණේය.

## යේසුස්වහන්සේගේ බලය ගැන ප්‍රශ්නකිරීම

20 නවද උන්වහන්සේ ඒ දවස්වලින්
එකකදී දේවමාළිගාවේ සෙනඟට
උගන්වමින්, ශුභාරංචිය දේශනාකරමින්
සිටියදී, නායක පූජකයෝද ලියන්නෝද
වැඩිමහල්ලන් සමග උන්වහන්සේ ළඟට
2 පැමිණ කථාකොට: නුඹ මේ දේ
කරන්නේ මොන බලයකින්ද? නොහොත්
මේ බලය නුඹට දුන්නේ කවුදැයි අපට
කියන්නැයි උන්වහන්සේට කීවෝය.
3 උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
මමත් නුඹලාගෙන් ප්‍රශ්නයක් අසමි;
4 ඒක මට කියාපල්ලා: යොහන්ගේ
*බව්තීස්මය වුණේ ස්වර්ගයෙන්ද?
නොහොත් මනුෂ්‍යයන්ගෙන්දැයි ඇසූ-
සේක. එවිට ඔව්හු තමුන් අතරේ 5
කථාකොට: ස්වර්ගයෙන්යයි කීවොත්,
ඔහු අදහා නොගත්තේ මක්නිසාදැයි
කියනවා ඇත. මනුෂ්‍යයන්ගෙන්යයි 6
කීවොත්, යොහන් අනාගතවක්තෘ
කෙනෙක් කොට මුළු සෙනඟ
විශ්වාසකරන බැවින්, ඔවුන් අපට
ගල්ගසනවා ඇතැයි කියා, කොතැනින් 7
වුණේදැයි නොදනිමුයයි උත්තරදුන්නෝය.
එවිට යේසුස්වහන්සේ: මමත් මොන 8
බලයකින් මේ දේ කරම්දැයි නුඹලාට
නොකියමියි ඔවුන්ට කීසේක.

## නපුරු ගොවීන් ගැන උපමාව

උන්වහන්සේ සෙනඟට මේ උපමාව 9
කියන්ට පටන්ගෙන: මනුෂ්‍යයෙක්
මිදිවත්තක් වවා, ගොවීන්ට බදුදී,
බොහෝ කලකට වෙන රටකට ගියේය.
එල අවස්ථාවේදී ගොවියන් විසින් මිදි 10
වත්තේ එල කොටස ඔහුට දෙන පිණිස
ඔහු ඔවුන් ළඟට දසයෙකු යැවීය. නුමුත්
ගොවීහු ඔහුට තළා, ඔහු හිස් අතින්
ඇරියෝය. පසුව ඔහු වෙන දසයෙකු 11
යැවීය. ගොවියෝ ඔහුටත් තළා,
නිග්‍රහකොට, ඔහු හිස් අතින් ඇරියෝය.
නැවතද ඔහු තුන්වෙනියෙකු යැවීය. ඔව්හු 12
ඔහුටත් තුවාලකොට පිටතට දැම්මෝය.
එවිට මිදිවත්තේ ස්වාමියා කථාකොට: 13
මම මක්කරම්ද? මාගේ ප්‍රේමවන්ත
පුත්‍රයා යවමි. සමහරවිට ඔවුන් ඔහුට
ගෞරවකරනවා ඇතැයි කීවේය. නුමුත් 14
ගොවීහු ඔහු දැක, ඔවුනොවුන්
කථාකොට: මොහු උරුමක්කාරයාය.
උරුමය අපට වෙන පිණිස මොහු මරමුව
කියා, ඔහු මිදිවත්තෙන් පිටත දමා 15
මැරුවෝය. එහෙයින් මිදිවත්තේ
ස්වාමියා ඔවුන්ට කුමක් කරනවා ඇද්ද?
ඔහු ඇවිත් ඒ ගොවීන් විනාශකොට, 16
මිදිවත්ත අන්‍යයන්ට දෙන්නේයයි කීසේක.
ඔව්හු ඒ අසා: එසේ නොවේවයි කීවෝය.
නුමුත් උන්වහන්සේ ඔවුන් දෙස බලා: 17
එසේවී නම්,

*අවගාහනය.

ගෙවල් සාදන්නන් විසින් එපාකළ
ගලම කොණෙහි ප්‍රධාන ගල කරනු
ලැබීය
18 යන ලියවිල්ලේ අර්ථය මොකද? ඒ
ගල පිට වැටෙන කවුරු නුමුත්
කැබලිකරනු ලබන්නේය; ඒ ගල යමෙකු
පිට වැටෙන්නේද, එයින් ඔහු සුණුවිසුණු
කරනු ලබන්නේයයි කීසේක.

## ආදයම් මිලය සහ නැවත-නැගිටීම ගැන ප්‍රශ්න

19 නායක පූජකයෝද ලියන්නෝද මේ
උපමාව ඔවුන්ට විරුද්ධව උන්වහන්සේ
කී බව දැන, ඒ පැයේදීම උන්වහන්සේ
අල්ලන්ට සෙවුවෝය; නුමුත් සෙනඟට
20 භයවූවෝය. ඔව්හු උන්වහන්සේගේ වචන
අල්ලාගෙන, උන්වහන්සේ ආණ්ඩුවටද
ආණ්ඩුකාරයාගේ බලයටද භාරදෙන
පිණිස බලාසිට, තුමූ ධර්මිෂ්ඨයෝයයි
හඟවන්නාවූ ඔත්තුකාරයන් යැවූවෝය.
21 ඔව්හු: ආචාරීන්වහන්ස, ඔබ යුතුලෙස
කථාකරන බවත් උගන්වන බවත්,
මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලා,
සැබෑලෙස දෙවියන්වහන්සේගේ මාර්ගය
22 උගන්වන බවත් දනිමුව. කායිසර්ට
ආදයම් දීම අපට යුතුද අයුතුදැයි
23 උන්වහන්සේගෙන් ඇසුවෝය. එහෙත්
උන්වහන්සේ ඔවුන්ගේ ප්‍රයෝගය දැන:
24 මට මස්සක් පෙන්වාපල්ලා. එහි තිබෙන
රූපයත් සටහනත් කාගේදැයි ඔවුන්ගෙන්
ඇසුසේක. කායිසර්ගේයයි ඔව්හු කීවෝය.
25 එසේවී නම් කායිසර්ගේ දේ කායිසර්ටත්
දෙවියන්වහන්සේගේ දේ දෙවියන්-
වහන්සේටත් දීපල්ලායයි උන්වහන්සේ
26 ඔවුන්ට කීසේක. සෙනඟ ඉදිරියෙහිදී
උන්වහන්සේගේ කීම අල්ලාගන්ට බැරි
විය. ඔව්හු උන්වහන්සේගේ උත්තරයට
පුදුමව, නිශ්ශබ්දව සිටියෝය.
27 නැවත-නැගිටීමක් නැතැයි කියන්නාවූ
සද්දූසිවරුන්ගෙන් සමහරෙක්
28 උන්වහන්සේ ළඟට ඇවිත්: ආචාරීනි,
යමෙකුගේ සහෝදරයෙක් භාර්යාවක්
ඇතුව සිට දරුවෙකු නොලැබ මළොත්,
ඔහුගේ සහෝදරයා විසින් ඒ භාර්යාව
පාවාගෙන, තමාගේ සහෝදරයාගේ
නමට දරුවන් උපදවන්ට යුතුයයි
මෝසෙස් විසින් අපට ලියාදී තිබේ.
ඉදින් සහෝදරයන් සත්දෙනෙක් 29
සිටියෝය. පළමුවෙනියා භාර්යාවකු
සරණපාවාගෙන දරුවන් නොලැබ
මැරුණේය. දෙවෙනියාත් තුන්වෙනියාත් 30,31
ඈ පාවාගත්තෝය; සත්දෙනාම එසේම
දරුවන් නොලැබ මැරුණෝය. පසුව 32
ස්ත්‍රීත් මළාය. සත්දෙනාම ඈ 33
සරණපාවාගත් බැවින්, නැවත-නැගිටීමේදී
ඈ ඔවුන්ගෙන් කාගේ භාර්යාව වන්නීදැයි
ඇසුවෝය. යේසුස්වහන්සේද: මේ 34
ලෝකයේ දරුවෝ සරණපාවාගනිති,
සරණපාවාදෙනු ලබති. නුමුත් 35
ඒ ලෝකයටත් නැවත-නැගිටීමටත්
පැමිණෙන්ට සුදුස්සෝයයි ගණන්ගනු
ලබන අය සරණපාවාගන්නේවත්
සරණපාවාදෙනු ලබන්නේවත් නැත.
මක්නිසාද ඔවුන්ට තවත් මැරෙන්ට 36
නුපුළුවන. ඔව්හු දේව දූතයන් හා
සමානවෙති; නැවත-නැගිටීමේ පුත්‍රයන්
බැවින් ඔව්හු දෙවියන්වහන්සේගේ
පුත්‍රයෝය. නුමුත් මළවුන් නැඟුටුවනු 37
ලබන බව මෝසෙස් පාවා පඳුර
සම්බන්ධ කාණ්ඩයෙහි: ස්වාමීන්වහන්සේ
ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේය, ඊසාක්ගේ
දෙවියන්වහන්සේය, යාකොබ්ගේ දෙවියන්-
වහන්සේයයි කීමෙන් පෙන්වාදී තිබේ.
උන්වහන්සේ මළවුන්ගේ නොව ජීවතුන්ගේ 38
දෙවියන්වහන්සේය. මක්නිසාද සියල්ලෝම
උන්වහන්සේ උදෙසා ජීවත්ව සිටිතියි
කීසේක. එවිට ලියන්නන්ගෙන් 39
සමහරෙක් උත්තරදෙමින්: ආචාරීනි, ඔබ
කීවා යහපතැයි කීවෝය. මක්නිසාද 40
උන්වහන්සේගෙන් කිසි ප්‍රශ්නයක් අසන්ට
ඔවුන්ට තවත් ධෛර්ය නොතිබුණේය.

## ක්‍රිස්තුස්වහන්සේ දාවිත්ගේ පුත්‍රයාණෝද?

උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: 41
ක්‍රිස්තුස් වනාහි දාවිත්ගේ පුත්‍රයායයි
ඔවුන් කියන්නේ කෙසේද? මක්නිසාද: 42
මා විසින් නුඹේ සතුරන් නුඹේ පාපුටුව

කරන තෙක්
මාගේ දකුණු පැත්තේ හිඳගනින්නැයි
43 ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්-
වහන්සේට කීසේකැයි
දවිත්ම ගීතිකා පොතේ කියා තිබේ.
44 මෙසේ දවිත් උන්වහන්සේට: ස්වාමීන්-
වහන්සේයයි කියයි, ඉඳින් උන්වහන්සේ
ඔහුගේ පුත්‍ර වන්නේ කෙසේදැයි කීසේක.

## ලියන්නන් ගැනයි

45 මුළු සෙනඟ අසමින් සිටියදී
උන්වහන්සේ තමන් ගෝලයන්ට කියන-
46 සේක්: දිග උතුරු සළු ඇඳ ඇවිදීමට
කැමතිවූ, වෙළඳම්පළවලදී ආචාරවලටද
සිනගෝගවලදී ප්‍රධාන ආසනවලටද
මංගල්‍යවලදී ප්‍රධාන ස්ථානවලටද
47 ආශා ඇති, වැන්දඹුවන්ගේ ගෙවල්
කොල්ලකමින්, වංචා පිණිස දීර්ඝ
යාච්ඤාකරන්නාවූ ලියන්නන්ගෙන්
ප්‍රවේසම්වෙයල්ලා. ඔව්හු වඩා බරපතළ
දඬුවමට පත්කරනු ලබන්නෝයයි
කීසේක.

## වැන්දඹු ස්ත්‍රියගේ පඬුර

21 උන්වහන්සේ ඇස් ඔසවා,
ධනවතුන් තමුන්ගේ පඬුරු
2 ගබඩාවට දමනවා දුටුසේක. එක්තරා
දිළිඳු වැන්දඹුවක් කුඩා මිල දෙකක්
3 එහි දමනවාත් උන්වහන්සේ දැක: සැබවක්
තුඹලාට කියමි—මේ දිළිඳු වැන්දඹුව
4 සියල්ලන්ට වඩා දැමුවාය. මක්නිසාද
මොවුන් සියල්ලෝම තමුන්ගේ වැඩිමනත්
දෙයින් ගබඩාවට පඬුරු දැමුවෝය. නුමුත්
මැ තමාගේ හිඟකමින්, තමාට ජීවිකාවට
තිබුණු සියල්ලම දැමුවායයි කීසේක.

## දේවමාළිගාවේ විනාශය සහ මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ ඊම කලින් කීම

5 සමහරු දේවමාළිගාව ගැන කථාකොට,
ඒක ශෝභමාන ගල්වලින්ද කැපකළ
දේවලින්ද සරසා තිබෙන හැටි කී කල්හි,
6 උන්වහන්සේ කථාකොට: තුඹලා බලන
මේ දේවල් වනාහි ගලක් පිට ගලක්
ඉතුරු නොවන හැටියට කඩා දමනු
ලබන දවස් පැමිණෙන්නේයයි කීසේක.
ආචාරීනි, ඒ දේ කොයි කලක වන්නේද? 7
ඒවා සිදුවෙන්ට එන කල ලකුණ
කිමෙක්දැයි ඔව්හු උන්වහන්සේගෙන්
ඇසුවෝය. උන්වහන්සේ කියනසේක්: 8
මුළා නොවෙන්ට බලාගනිල්ලා.
මක්නිසාද මාගේ නාමයෙන් බොහෝ
දෙනෙක් ඇවිත්—ඒ මමය කියාත් කාලය
ළඟය කියාත් කියන්නෝය. ඔවුන් පස්සේ
නොයල්ලා. යුද්ධ සහ කෝලාහල ගැන 9
අසන කල, ත්‍රස්ත නොවෙල්ලා.
මක්නිසාද මේ දේවල් පළමුකොට
සිදුවෙන්ට ඕනෑය; නුමුත් කෙළවර
එකෙණෙහිම නොපැමිණෙන්නේයයි
කීසේක.
එවිට උන්වහන්සේ ඔවුන්ට 10
කියනසේක්: ජාතියක් ජාතියකටද
රාජ්‍යයක් රාජ්‍යයකටද විරුද්ධව
නැගිටිනවා ඇත. මහත් භූමිකම්පාද 11
නොයෙක් තැන්වල සාගත හා වසංගතද
වන්නේය; භයංකර පෙනීම්ද අහසින්
මහත් ලකුණුද වන්නේය. නුමුත් ඒ 12
සියල්ලට පළමුවෙන් මාගේ නාමය නිසා
ඔව්හු තුඹලා පිට අත්හෙළා,
සිනගෝගවලටත් හිරගෙවලටත් තුඹලා
පාවාදෙමින්, තුඹලාට පීඩාකරන්නෝය,
තුඹලා රජුන් හා ආණ්ඩුකාරයන්
ඉදිරියට ගෙනයන්නෝය. ඒක තුඹලාට 13
සාක්ෂියක් පිණිස වන්නේය. එබැවින් 14
උත්තරදිය යුතු කෙසේදැයි කලින්
කල්පනා නොකරන්ට තුඹලාගේ සිත්හි
නියමකරගනිල්ලා. මක්නිසාද තුඹලාගේ 15
සියලු එදිරිකාරයින් විසින් විරුද්ධව
සිටින්ටවත් බොරු කරන්ටවත් බැරිවූ
මුඛයක්ද ප්‍රඥාවද මම තුඹලාට දෙන්නෙමි.
එහෙත් මවුපිය සහෝදර නෑ මිත්‍රයන් 16
විසින්ම තුඹලා භාරදෙනු ලබන්නහුය;
ඔව්හු තුඹලාගෙන් සමහරෙකු මරණයට
පත්කරවන්නෝය. මාගේ නාමය නිසා 17
සියල්ලෝම තුඹලාට වෛරවන්නෝය.
නුමුත් තුඹලාගේ හිසකෙසක්වත් 18
නැති නොවන්නේය. තුඹලා ක්ෂාන්ති 19

ගුණයෙන් සිටීමෙන් තුඹලාගේ *ආත්ම
දිනාගන්නහුය.
20 එහෙත් යම් කලක සේනාවන් විසින්
යෙරුසලම වටලා සිටිනවා තුඹලා
දකින්නහුද, එකල එහි විනාශය ආසන්න
21 බව දැනගනිල්ලා. එකල යුදයෙහි
සිටින්නෝ කඳුවලට පලායත්වා; එහි
තුළ සිටින්නෝ පිටතට යත්වා; ගම්බද
සිටින්නෝ එහි ඇතුල් නොවෙත්වා.
22 මක්නිසාද ලියනලද සියල්ල
සම්පූර්ණවන පිණිස ඒ දවස් පළිගැනීමේ
23 දවස් වන්නේය. ඒ දවස්වලදී
ගර්භිණීන්ටත් කිරිදෙන ස්ත්‍රීන්ටත් දුක්වේ!
මක්නිසාද දේශය පිට මහත් දුක්
වේදනාද මේ සෙනඟ කෙරෙහි උදහසද
24 වන්නේය. ඔව්හු කඩුමුවහතින්
වැටෙන්නෝය, සියලු ජාතීන් අතරට
වහලුන් මෙන් ගෙනයනු ලබන්නෝය.
අන්‍යජාතීන්ගේ කාලවල් සම්පූර්ණ වන
තෙක් යෙරුසලම අන්‍යජාතීන් විසින්
25 මඩිනු ලබන්නීය. ඉර සඳ හා තාරකාවන්
කෙරේ ලකුණු හා මුහුදෙත් රළ ගැසීමෙත්
ඝෝෂාව නිසා වන වියවුලින් පොළොවේ
ජාතීන්ට දුක්වේදනාද වන්නේය.
26 මක්නිසාද ආකාශයේ පරාක්‍රමධාරීන්
සොලවනු ලබන බැවින් භයෙනුත්
ලෝකයට පැමිණෙන්නාවූ දේ
බලාපොරොත්තුව සිටීමෙනුත්
මනුෂ්‍යයන්ගේ සිත් ක්ලාන්තවන්නේය.
27 එකල මනුෂ්‍ය පුත්‍රයා බලයෙන් සහ
මහත් තේජසින් යුක්තව වලාකුළකින්
28 එනවා ඔව්හු දකින්නෝය. මේ දේ
සිදුවෙන්ට පටන්ගන්න කල, තුඹලාගේ
මිදීම ළංවූ බැවින්, ඉහළ බලා, හිස්
ඔසවාපල්ලායයි කීසේක.

## අත්තික්කා ගහේ උපමාව. අවදිව සිටීමට අවවාද

29 තවද උන්වහන්සේ ඔවුන්ට උපමාවක්
කියනසේක්: අත්තික්කා ගසද සියලු ගස්ද
30 බලාපල්ලා. ඒවා දළුලන විට, ඒ දැක
ග්‍රීෂ්ම කාලය දැනටම ළඟ බව තුඹලාම
31 දැනගන්නහුය. එලෙසම මේ දේ
සිදුවෙනවා තුඹලා දකින කල,
දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළඟ බවත්
දැනගනිල්ලා. සැබවක් තුඹලාට කියමි- 32
සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව
පහව නොයන්නේය. අහසත් පොළොවත් 33
පහව යන්නේය. තුමූත් මාගේ වචන
පහව නොයන්නේය.
එහෙත් ඒ දවස මලපතක් මෙන් 34
හදිසියෙන් තුඹලා කෙරේ නොපැමිණෙන
පිණිස, අධික කෑමෙන්ද බීමත්කමින්ද
මේ ජීවිතයේ වෙහෙසින්ද තුඹලාගේ සිත්
බර නොවන හැටියට බලාගනිල්ලා.
මක්නිසාද ඒක මුළු පොළෝතලය පිට 35
වසන්නාවූ සියල්ලන් කෙරෙහි එසේ
පැමිණෙන්නේය. එබැවින් ඒ සිදුවන 36
සියල්ලෙන් ජයගෙන ගැළවෙන පිණිසද
මනුෂ්‍ය පුත්‍රයා ඉදිරියෙහි සිටින පිණිසද
කන්නලව්කරමින්, සැම කාලයේදීම
අවදිව හිඳිල්ලායයි කීසේක.
උන්වහන්සේ දවාලේ දේවමාළිගාවෙහි 37
උගන්වමින් සිට, රාත්‍රියේ පිටත්ව ගොස්,
ඔලීව නම් කන්දේ නැවතී සිටිසේක. මුළු 38
සෙනඟද උන්වහන්සේගේ වචන අසන
පිණිස දේවමාළිගාවේ සිටි උන්වහන්සේ
වෙතට උදයේම ආවෝය.

## යූදස්ගේ ද්‍රෝහිකාරකම

22 පාස්කුව නම්වූ මුහුන් නොදැමූ
රොටි කන මංගල්‍යය ළං විය.
නායක පූජකයෝද ලියන්නෝද 2
උන්වහන්සේ නසන්නේ කෙසේදැයි
සෙවුවෝය; මක්නිසාද ඔව්හු සෙනඟට
භයව සිටියෝය.
එවිට දෙළොස්දෙනාගෙන් එක්කෙනෙක්වූ 3
ඉස්කාරියෝත් නම් යූදස්ට සාතන්
ආවේශවිය. ඔහු ගොස්, නායක 4
පූජකයන්ට සහ අධිපතීන්ටත්
උන්වහන්සේ පාවාදෙන්නේ කෙසේද කියා
ඔවුන් සමග කථාකරගත්තේය. ඔව්හු 5
සතුටුව ඔහුට මිල දෙන්ට ගිවිස්සෝය.
ඔහු ඊට එකඟවී, සමූහයා ළඟ නැති 6
විටක උන්වහන්සේ ඔවුන්ට පාවාදෙන්ට
ප්‍රස්තාවක් සෙවීය.

*හෙවත් ප්‍රාණ ගළවාගන්නහුය.

## අන්තිම පාස්කු මංගල්‍යය පිළියෙළකිරීම

7 තවද පාස්කුව පූජාකළ යුතුවූ මුහුන්
නොදැමූ රොටි කන දවස පැමුණුණේය.
8 එවිට උන්වහන්සේ පේතෘස්ද යොහන්ද
යවමින්: තුඹලා ගොස් අප විසින්
පාස්කුව කන පිණිස පිළියෙළකරපල්ලායයි
9 කීසේක. කොතැන පිළියෙළ කරනවාට
ඔබ කැමතිසේක්දැයි ඔව්හු උන්වහන්සේගෙන්
10 ඇසුවෝය. උන්වහන්සේ ඔවුන්ට
කථාකොට: බලව, තුඹලා නුවරට
ඇතුල්වූ විට, මනුෂ්‍යයෙක් පැන් කළයක්
ගෙනයනවා තුඹලාට සම්බවන්නේය;
ඔහු යන ගෙදරට ඔහු පස්සේ ගොස්,
11 ගෙයි ස්වාමියාට කථාකොට: මා විසින්
මාගේ ගෝලයන් සමග පාස්කුව කන්ට
හැකිවූ ආගන්තුක ශාලාව කොතනද
කියා ආචාරීන් අසනවායයි කියාපල්ලා.
12 සූදනම්කර තිබෙන මහත් උඩුමහලක්
ඔහු තුඹලාට පෙන්වනවා ඇත. එහි
13 පිළියෙළකරපල්ලායයි කීසේක. ඔව්හු
ගොස්, උන්වහන්සේ කී ලෙස සම්බව,
පාස්කුව පිළියෙළකළෝය.

## අන්තිම රාත්‍රි කෑම

14 පැය පැමිණි කල උන්වහන්සේද
උන්වහන්සේ සමග ප්‍රේරිතයෝද
15 හිඳගත්තෝය. උන්වහන්සේ ඔවුන්ට
කථාකොට: වධවිඳීමට පළමුවෙන් මම
මේ පාස්කුව තුඹලා සමග කන්ට
16 අතිශයෙන් ආශාවුණෙමි. මක්නිසාද
තුඹලාට කියමි–දෙවියන්වහන්සේගේ
රාජ්‍යයෙහිදී ඒක සම්පූර්ණවන තුරු
මම ඒක නොකන්නෙමියි කීසේක.
17 උන්වහන්සේ කුසලානක් ලැබ,
ස්තුතිකොට: මේක ගෙන තුඹලා අතරේ
18 බෙදගනිල්ලා. මක්නිසාද තුඹලාට
කියමි–දෙවියන්වහන්සේගේ රාජ්‍යය
පැමිණෙන තුරු, මෙතැන් පටන් මම
මිදිවැලේ ඵලයෙන් නොබොන්නෙමියි
19 කීසේක. උන්වහන්සේ රොටි ගෙන ස්තුති
කොට කඩා, ඔවුන්ට දී: මේක තුඹලා
උදෙසා දෙනලද මාගේ ශරීරයය; මා
සිහිකිරීම පිණිස මේක කරපල්ලායයි
කීසේක. එලෙසම රාත්‍රි කෑමට පසු 20
කුසලාන දී: මේ කුසලාන තුඹලා උදෙසා
වගුරුවන මාගේ ලෙයෙහි අලුත් ගිවිසුමය.
එහෙත් මා පාවාදෙන්නාගේ අත මා සමග 21
මේසයෙහි තිබේ. මක්නිසාද මනුෂ්‍ය 22
පුත්‍රයා නියමකර තිබෙන හැටියට
යන්නේමය. නුමුත් ඔහු පාවාදෙන ඒ
මනුෂ්‍යයාට දුක්වේයයි කීසේක. එවිට, 23
ඒක කරන්ට යන්නේ ඔවුන්ගෙන්
කවරෙක්දැයි ඔව්හු තමුන් අතරේම
විචාරන්ට පටන්ගත්තෝය.

## වඩා උතුම් තැනැත්තා කවුද යන වාදය

ඔවුන්ගෙන් ඉතා උතුම්කොට ගණන්ගනු 24
ලබන්නේ කවරෙක්දැයි ඔවුන් අතරේ
විවාදයක්ද හටගත්තේය. උන්වහන්සේ 25
ඔවුන්ට කියනසේක්: අන්‍ය ජාතීන්ගේ
රජවරු ඔවුන් කෙරෙහි අධිපතිකම්
පවත්වති; ඔවුන් කෙරෙහි බලය
පවත්වන්නෝ වනාහි උපකාරකාරයෝයයි
කියනු ලබති. නුමුත් තුඹලා එසේ නොව, 26
තුඹලා අතරෙන් වඩා උත්තමයා බාලයා
මෙන් වේවා; ප්‍රධානයා උපස්ථානකරන්නා
මෙන් වේවා. වඩා උතුම් කවුද?
කෑමට හිඳින තැනැත්තාද? නොහොත් 27
උපස්ථානකරන්නාද? කෑමට හිඳින
තැනැත්තේ නොවේද? නුමුත් මම වනාහි
තුඹලා මධ්‍යයෙහි උපස්ථානකරන්නා
මෙන් වෙමි. මාගේ පරීක්ෂාවලදී මා 28
සමගම සිටි අය නම් තුඹලාය. එබැවින් 29
මාගේ පියාණන්වහන්සේ මට රාජ්‍යයක්
නියමකළාක්මෙන්ම, මාගේ රාජ්‍යයෙහිදී 30
මාගේ මේසයේ කන්ටද බොන්ටද
තුඹලාට රාජ්‍යයක් නියමකරමි; තුඹලා
ඉශ්‍රායෙල්ගේ ගෝත්‍ර දෙළොස විනිශ්චය
කරමින් සිංහාසනවල හිඳින්නහුය.

## පේතෘස්ට සහ අනික් ගෝලයන්ට කලින් අවවාදකිරීම

සීමොන්, සීමොන්, බලව, තුඹලා 31
ගෝධූම මෙන් පොළන්ට සාතන්

32 ඉල්ලුවේය. නුමුත් තුඹේ ඇදහිල්ල නැති
නොවන පිණිස තුඹ උදෙසා මම
යාච්ඤාකෙළෙමි. තුඹ නැවත
හැරුණායින් පසු තුඹේ සහෝදරයන්
33 ස්ථිරකරපන්නැයි කීසේක. ඔහුද:
ස්වාමිනි, ඔබ සමග හිරගෙටත්
මරණයටත් යන්ට සූදනම්ව සිටිමියි
34 උන්වහන්සේට කීවේය. උන්වහන්සේද:
පේත්‍රුස්, තුඹට කියමි–තුඹ මා
අඳුනන්නේ නැත කියා තුන්වරක් කියන
තුරු, අද කුකුළා අඬලන්නේ නැතැයි
කීසේක.
35 උන්වහන්සේ ඔවුන්ට කථාකොට:
පසුම්බියක්වත් මල්ලක්වත් වහන්වත්
නැතුව මා තුඹලා යැවූ කල තුඹලාට
කිසිවක් හිඟවීදැයි ඔවුන්ගෙන් ඇසූසේක.
36 නැතැයි ඔව්හු කීවෝය. උන්වහන්සේ
ඔවුන්ට කියනසේක්: නුමුත් දැන්
පසුම්බියක් ඇත්තෙක් ඒක ගනීවා,
එසේම මල්ලකුත් ගනීවා. කඩුවක්
නැත්තා තමාගේ සළුව විකුණා, කඩුවක්
37 මිලේට ගනීවා. මක්නිසාද තුඹලාට
කියමි–උන්වහන්සේ අපරාධකාරයන්
සමග ගණන්ගනු ලැබූසේකැයි ලියා
තිබෙන මේ දේ මා කෙරෙහි
සම්පූර්ණවිය යුතුය; මක්නිසාද මා ගැන
ලියා තිබෙන දේ සම්පූර්ණවන්නේයයි
38 කීසේක. ඔව්හු: ස්වාමිනි, බැලුව මැනව,
කඩු දෙකක් මෙහි තිබේයයි කීවෝය.
උන්වහන්සේද: ඇතැයි ඔවුන්ට කීසේක.

## ගෙත්සෙමන

39 එවිට උන්වහන්සේ පිටත්ව, තමන්ගේ
පුරුද්ද ලෙස ඔලීව කන්දට ගියසේක;
ගෝලයෝත් උන්වහන්සේ අනුව ගියෝය.
40 උන්වහන්සේ ඒ ස්ථානයට පැමිණ
සිටියදී කථාකොට: තුඹලා පරීක්ෂාවට
නොපැමිණෙන ලෙස යාච්ඤා
41 කරපල්ලායයි ඔවුන්ට කීසේක. ගලක්
ගසන දුර පමණ උන්වහන්සේ
ඔවුන්ගෙන් වෙන්වී, දණින් හිඳ යාච්ඤා
42 කරමින්: පියාණෙනි, ඔබ කැමතිසේක්
නම්, මේ කුසලාන මාගෙන් පහකළ
මැනව. එසේවී නුමුත් මාගේ කැමැත්ත
නොව ඔබගේ කැමැත්ත වේවයි කීසේක.

එකල ස්වර්ගයෙන් දේවදූතයෙක් 43
උන්වහන්සේට පෙනී, උන්වහන්සේ
ශක්තිමත්කළේය. උන්වහන්සේ මහත් 44
වේදනා වින්දසේක් වඩා ඕනෑකමින්
යාච්ඤාකළසේක. උන්වහන්සේගේ
ඩාදියද මහත් ලේ බින්දු මෙන් බිම
වැටුණේය. උන්වහන්සේ යාච්ඤාවෙන් 45
නැගිට, ගෝලයන් ළඟට ඇවිත්, ඔවුන්
ශෝකයෙන් නිද ඉන්නවා දැක: තුඹලා 46
නිද ඉන්නේ මක්නිසාද? පරීක්ෂාවට
නොපැමිණෙන පිණිස නැගිට
යාච්ඤාකරපල්ලායයි ඔවුන්ට කීසේක.

## යේසුස්වහන්සේ අල්ලාගනු ලැබීම

උන්වහන්සේ කථාකරද්දීම, බලව, 47
සමූහයක් ආවෝය; දොළොස්දෙනාගෙන්
එක්කෙනෙක්වූ යූදස් කියන අයද ඔවුන්ට
පෙරටුව ඇවිත් යේසුස්වහන්සේ සිඹින
පිණිස උන්වහන්සේට ළංවුණේය.
යේසුස්වහන්සේද: යූදස්, තුඹ සිඹීමකින් 48
මනුෂ්‍ය පුත්‍රයා පාවා දෙනවාදැයි ඔහුට
කීසේක. උන්වහන්සේ අවට සිටි අය 49
පැමිණෙන්ට තිබෙන දේ දැක: ස්වාමිනි,
කඩුවෙන් ගසමුදැයි උන්වහන්සේගෙන්
ඇසුවෝය. ඔවුන්ගෙන් එක්තරා කෙනෙක් 50
උත්තම පූජකයාගේ දසයාට ගසා,
ඔහුගේ දකුණු කන කපාදැමීය.
නුමුත් යේසුස්වහන්සේ උත්තරදෙමින්: 51
මෙපමණකට ඉඩදියල්ලාය කියා,
ඔහුගේ කන අතගා සුවකළසේක.
යේසුස්වහන්සේ තමන්ට විරුද්ධව ආවාවූ 52
නායක පූජකයන්ටද දේවමාළිගාවේ
අධිපතීන්ටද වැඩිමහල්ලන්ටද කථාකොට:
තුඹලා සොරෙකුට විරුද්ධව මෙන්
කඩුමුගුරු රැගෙන ආවහුද? දවස්පතා 53
මා දේවමාළිගාවෙහි තුඹලා සමග
සිටියදී තුඹලා මට විරුද්ධව අත්
දිගුකළේ නැත. නුමුත් මෙය තුඹලාගේ
පැයත් අන්ධකාරයේ බලයත්යයි කීසේක.

## පේත්‍රුස් විසින්: නාඳුනමියි කීම

ඔව්හු උන්වහන්සේ අල්ලාගෙන 54
යන්නාහු, උත්තම පූජකයාගේ ගෙදරට

55 ගෙනගියෝය. එහෙත් පේත්‍රුස් ඈතින්
පස්සේ ගියේය. ඔවුන් ශාලාව මැද ගිනි
පත්තුකොට, එකතුව හිඳගෙනඋන් කල,
56 පේත්‍රුස් ඔවුන් මැද හිඳගත්තේය. එවිට
එක් යෞවනියෙක් ඔහු ගිනි ළඟ
ඉන්නවා දැක, ඔහු දෙස හොඳට බලා:
මොහුත් ඔහු සමග සිටියේයයි කීවාය.
57 නැත, ස්ත්‍රිය, මම ඔහු නාඳුනම්යි ඔහු
58 කීවේය. ස්වල්ප වේලාවකට පසු වෙන
කෙනෙක් ඔහු දැක: නුඹත් ඔවුන්ගෙන්
එක්කෙනෙක්යයි කීවේය. පේත්‍රුස්ද:
මනුෂ්‍යය, මම එසේ නොවෙමියි කීවේය.
59 පැයකට පමණ පසු තවත් එක්කෙනෙක්
කථාකොට: සැබෑවටම මොහුත් ඔහු
සමග සිටියේය. මක්නිසාද මොහු
ගලීලයෙකැයි සැක නොකොට
60 ස්ථිරලෙස කීවේය. පේත්‍රුස්ද: මනුෂ්‍යය,
නුඹ කියන දේ නොදනිමියි කීවේය.
එකෙණෙහිම, ඔහු කථාකරද්දීම, කුකුළා
61 හඬලීය. ස්වාමීන්වහන්සේ හැරී පේත්‍රුස්
දෙස බැලූසේක. පේත්‍රුස්ද: අද කුකුළා
හඬලන්ට පළමුවෙන් ඔහු නාඳුනම්යි
තුන් වරක් නුඹ මා ගැන කියන්නෙහියයි
ස්වාමීන්වහන්සේ ඔහුට කී වචනය
62 සිහිකොට, පිටතට ගොස්, බලවත් දුකින්
හැඬුවේය.
63 එකල යේසුස්වහන්සේ අල්ලාගෙන
සිටි මනුෂ්‍යයෝ උන්වහන්සේට
64 කවටකම්කරමින්, පහර දුන්නෝය. ඔව්හු
උන්වහන්සේගේ ඇස් බැඳ: නුඹට ගැසුවේ
කවුදැයි දිවැසින් කියාපන්නැයි
65 උන්වහන්සේට කීවෝය. ඔව්හු තවත්
බොහෝ දේ උන්වහන්සේට විරුද්ධව
කියමින්, උන්වහන්සේට අපහාසකළෝය.

## යේසුස්වහන්සේ යුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරිපිට සිටීම

66 පහන්වූ කෙණෙහිම සෙනඟගේ
වැඩිමහල්ලන්ගේ සභාව වන නායක
පූජකයෝද ලියන්නෝද රැස්ව, තමුන්ගේ
මන්ත්‍රණසභාව අභිමුඛයට උන්වහන්සේ
67 ගෙනගොස්: නුඹ ක්‍රිස්තුස් නම් අපට
කියාපන්නැයි කීවෝය. උන්වහන්සේද:
මා නුඹලාට කීවත් නුඹලා විශ්වාසකරන්නේ
නැත; මා නුඹලාගෙන් ඇසුවත් නුඹලා 68
උත්තරදෙන්නේ නැත. නුමුත් මෙතැන් 69
පටන් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්-
වහන්සේගේ පරාක්‍රමයේ දකුණු පැත්තේ
වැඩහිඳිනවා ඇතැයි ඔවුන්ට කීසේක.
ඔවුන් සියල්ලෝ: එසේ නම් 70
නුඹ දෙවියන්වහන්සේගේ පුත්‍රයාදැයි
ඇසුවෝය. උන්වහන්සේද: ඒ මම බැවින්
නුඹලා කියන්නහුයයි ඔවුන්ට කීසේක.
ඔව්හුද: තවත් සාක්ෂි අපට කුමටද?
මක්නිසාද ඔහුගේම කටින් කියනවා 71
අපිම ඇසීමුයයි කීවෝය.

## පිලාත් සහ හෙරොද් ඉදිරිපිට සිටීම

23
එවිට ඔවුන්ගේ මුළු සමූහයා
නැගිට, උන්වහන්සේ පිලාත්
ඉදිරිපිටට ගෙනගියෝය. ඔව්හු 2
උන්වහන්සේට වරද තබන්ට පටන්ගෙන:
මොහු අපගේ ජාතිය මුළාකරන බවද,
කායිසර්ට ආදායම් දීම තහනම්කරන
බවද, තමාම ක්‍රිස්තුස් රජයයි කියන
බවද අපි දැනගතිමුයයි කීවෝය.
පිලාත්ද: නුඹ යුදෙව්වරුන්ගේ රජදැයි 3
උන්වහන්සේගෙන් ඇසුවේය. උන්වහන්සේ
ඔහුට උත්තරදෙමින්: එසේයයි කීසේක.
එවිට පිලාත් නායක පූජකයන්ටද 4
සමූහයන්ටද කථාකොට: මේ මනුෂ්‍යයා
අත කිසි වරදක් මට පෙනෙන්නේ නැතැයි
කීවේය. නුමුත් ඔව්හු: මොහු ගලීලයේ 5
පටන් මෙතැන දක්වා යුදය මුළුල්ලෙහි
උගන්වමින්, සෙනඟ කලඹනවායයි වඩා
තදින් කීවෝය. පිලාත් ඒ අසා, මේ 6
මනුෂ්‍යයා ගලීලයෙක්දැයි විචාළේය.
එවිට පිලාත් උන්වහන්සේ හෙරොද්ගේ 7
නඩුකාර පළාතට අයිති බව දැන,
හෙරොද් ඒ දවස්වලදී යෙරුසලමේ සිටි
බැවින් ඔහු වෙතට උන්වහන්සේව යැවීය.
හෙරොද් යේසුස්වහන්සේ දැක, ඉතා 8
සන්තෝෂවූයේය. මක්නිසාද ඔහු
උන්වහන්සේ ගැන අසා තිබුණු බැවින්,
බොහෝ කලක සිට උන්වහන්සේ
දකින්ට කැමතිව සිටියේය, උන්වහන්සේ
යම් ආශ්චර්යයක් කරනවා දකින්ටද

9 ඔහු බලාපොරොත්තුවූයේය. ඔහු
බොහෝ වචනවලින් උන්වහන්සේගෙන්
ප්‍රශ්න ඇසූ නුමුත්, උන්වහන්සේ කිසි
10 උත්තරයක් ඔහුට නුදුන්සේක. නායක
පූජකයෝද ලියන්නෝද නැගිට සිට,
තදලෙස උන්වහන්සේට වරද තැබුවෝය.
11 හෙරොද් තමාගේ භේවායන් සමග
උන්වහන්සේ සුළුකොට, උන්වහන්සේට
සරදම්කොට, දිලිසෙන්නාවූ වස්ත්‍රයක්
හඳවා, පිලාත් ළඟට උන්වහන්සේ ආපසු
12 යැවීය. හෙරොද්ද පිලාත්ද ඒ දවසේදීම
මිත්‍රවූවෝය. මක්නිසාද ඔව්හු පළමු
එදිරිව සිටියෝය.

## පිලාත්, බරබ්බස්, යේසුස්-වහන්සේ

13 පිලාත් නායක පූජකයන්ද මුලාදෑනීන්ද
14 සෙනඟද රැස්කරවා, ඔවුන්ට කියනුයේ:
නුඹලා මේ මනුෂ්‍යයා සෙනඟ
මුළාකරන්නෙක කියා මා ළඟට
ගෙනාවහුය. බලව, නුඹලා ඉදිරියෙහිම
මා විසින් ඔහු විභාගකළ විට, නුඹලා
විසින් මොහු කෙරෙහි තබන ලද ඒ
වරදවලින් කිසිවක් ඔහු අත මට සම්බ
15 නුණේය. හෙරොද්ටත් සම්බවුණේ නැත.
මක්නිසාද ඔහු අප ළඟට මොහු නැවත
එවීය; බලව, මරණයට සුදුසු කිසිවක්
16 ඔහු විසින් නොකරනලද්දේය. එබැවින්
මම ඔහුට තළා, නිදහස්කොට හරිමියි
17 කීයේය. *මක්නිසාද ඒ මංගල්‍යයේදී
එක්කෙනෙකු ඔහු විසින් ඔවුන්ට
18 නිදහස්කර දියයුතුව තිබුණේය. නුමුත්
ඔවුන් සියල්ලෝම: මොහු පහකොට
බරබ්බස් අපට නිදහස්කර දුනමැනවයි
19 එක්ව මොරගැසුවෝය. බරබ්බස් වනාහි
නුවරදී කළ කැරළිගැසීමක්ද
මිනීමැරීමක්ද නිසා හිරගෙයි දමනලද
20 කෙනෙක්ය. පිලාත් යේසුස්වහන්සේ
මුදහරින්ට කැමතිව, නැවතත් ඔවුන්ට
21 කථාකෙළේය; නුමුත් ඔව්හු: මොහු
කුරුසියෙහි ඇණගැසුව මැනව,
කුරුසියෙහි ඇණගැසුව මැනව, කියා
මොරගැසුවෝය. ඔහු තුන්වෙනි වර 22
කථාකොට: කිමෙක්ද? මොහු කවර
නපුරක් කෙළේද? මරණයට සුදුසු
කිසිදෙයක් මොහු අත මට සම්බ නුණේය.
එබැවින් මොහුට තළා මුදහරිමියි ඔවුන්ට
කීවේය. නුමුත් උන්වහන්සේ කුරුසියෙහි 23
ඇණගසන ලෙසම ඔව්හු වඩ වඩා
ශබ්දනගා ඉල්ලා සිටියෝය. තවද
ඔවුන්ගේ මොරගැසීමට ජය ලැබුණේය.
පිලාත් ඔවුන් ඉල්ලූ දේ ඉෂ්ට වෙන 24
ලෙස තීන්දුව දුන්නේය. තවද ඔහු 25
කැරළිගැසීමත් මිනීමැරීමත් නිසා හිරගෙයි
ලා සිටියාවූ, ඔවුන් ඉල්ලූවාවූ තැනැත්තා
ඔවුන්ට මුදහැර, යේසුස්වහන්සේ ඔවුන්ගේ
කැමැත්තට භාරදුන්නේය.
ඔව්හු උන්වහන්සේ ගෙනයන කල, 26
පිටිසරින් එන කිරේනියේ සීමොන් නම්
මනුෂ්‍යයෙකු අල්ලා, යේසුස්වහන්සේ
පස්සෙන් කුරුසිය උසුලාගෙන යන්ට
ඒක ඔහු පිට තැබුවෝය.

## ස්ත්‍රීන්ට සැනසීමේ වචන. කුරුසියේ ඇණගසනු ලැබීම. පසුතැවිලිවූ හොරා

සෙනඟගෙන්ද උන්වහන්සේ නිසා හඬා 27
වැලපෙන්නාවූ ස්ත්‍රීන්ගෙන්ද යුක්තවූ
මහත් සමූහයක් උන්වහන්සේ අනුව
ගියෝය. යේසුස්වහන්සේ ඔවුන් දෙසට 28
හැරී: යෙරුසලමේ දූවරුනි, මා නිසා
නොහඬා, නුඹලා සහ නුඹලාගේ දරුවන්
නිසාත් හඬාපල්ලා. මක්නිසාද වඳ ස්ත්‍රීහුද 29
දරුවන් නොවැදූ කුසද කිසිකලෙක කිරි
නුදුන් තනද වාසනාවන්තයයි කියන
දවස් පැමිණෙන්නේය. ඒ කාලයේදී ඔව්හු 30
කඳුවලට කථාකොට: අප පිට වැටියල්ලා;
හෙල්වලට: අප වසාගනිල්ලායයි
කියන්ට පටන්ගන්නෝය. මක්නිසාද අමු 31
ගසට මේ දේ කරත් නම්, වියළි ගසට
කුමක් කරනු ලබන්නේදැයි කීසේක.
මරනු ලබන පිණිස වරදකාරයන්වූ 32
තවත් දෙදෙනෙක්ද උන්වහන්සේ සමග
ගෙනයනලද්දෝය.
ඔව්හු ඉස්කබල නම් ස්ථානයට 33
පැමිණ එහිදී උන්වහන්සේද වරදකාරයන්ද

*17 වෙනි පදය සමහර ග්‍රීක් පිටත්වල නොපෙනේ.

කුරුසියෙහි ඇණගසන්නාහු, එක්කෙනෙකු
උන්වහන්සේගේ දකුණු පැත්තෙහිද අනික්
එක්කෙනා වම් පැත්තෙහිද ඇණගැසුවෝය.
34 යේසුස්වහන්සේ කථාකොට: පියාණෙනි,
ඔවුන්ට කමාවුව මැනව; මක්නිසාද
ඔවුන් කරන්නේ මොකද කියා
ඔව්හු නොදනිතියි කීසේක. ඔව්හු
උන්වහන්සේගේ වස්ත්‍ර දදුදමා, තමුන්
35 අතරේ බෙදගත්තෝය. සෙනඟද බල බලා
සිටියෝය. මූලාදෑනීහු උන්වහන්සේට
ගැරහුම්කරමින්: මොහු අනුන් ගැළවිය;
මොහු දෙවියන්වහන්සේගේ තෝරාගත්
ක්‍රිස්තුස් නම් තමාම ගළවාගනීවයි
36 කීවෝය. භේවායෝද උන්වහන්සේ ළඟට
ඇවිත් උන්වහන්සේට කාඩි ළංකොට:
37 තුඹ යුදෙව්වරුන්ගේ රජ නම් තුඹම
ගළවාගනින්න කියා සරදම්කළෝය.
38 යුදෙව්වරුන්ගේ රජ මොහුය කියා
ලියවිල්ලක් උන්වහන්සේට උඩින් තබා
තිබුණේය.
39 එල්ලා සිටි වරදකාරයන්ගෙන්
එක්කෙනෙක් උන්වහන්සේට අපහාස
කරමින්: තුඹ ක්‍රිස්තුස් නොවේද? තුඹත්
40 අපත් ගළවාගනින්නැයි කීවේය. අනික්
අය ඔහුට තරවටුකරමින්: එම දඬුවමට
පැමිණ සිටින තුඹ දෙවියන්වහන්සේටවත්
41 භය නැද්ද? අප දඬුවම් ලබන්නේ
සාධාරණලෙසය; මක්නිසාද අපේ
ක්‍රියාවලට සුදුසු විපාක ලබමුව. තුමුත්
මුන්වහන්සේ කිසි වරදක් නොකළසේක
42 කියා උත්තරදුන්නේය. තවද ඔහු:
යේසුස්වහන්ස, ඔබගේ රාජ්‍යයෙන්
යුක්තව ඔබ එන කල මා සිහිකළ
43 මැනවයි කීවේය. උන්වහන්සේද: සැබවක්
තුඹට කියම්—අදම තුඹ මා සමග
පරාදීසයෙහි සිටින්නෙහියයි කීසේක.

## යේසුස්වහන්සේගේ මරණය සහ භූමදනය

44 ඒ වේලාව සවෙනි පැය පමණ විය,
ඉර එළිය නැතිවී, නවවෙනි පැය දක්වා
දේශය මුළුල්ලෙහි අන්ධකාරයක් විය.
45 දේවමාළිගාවේ තිරයද මැදින් ඉරුණේය.
46 යේසුස්වහන්සේ මහත් ශබ්දයකින්
මොරගසා: පියාණෙනි, ඔබගේ අතට
මාගේ ආත්මය භාරදෙමියි කීසේක.
මෙසේ කියා උන්වහන්සේ ආත්මය හළ-
සේක. එවිට සියයකට මූලාදෑනියා 47
සිද්ධවූ දේ දැක දෙවියන්වහන්සේට
ප්‍රශංසා කරමින්: සැබවින් මේ මනුෂ්‍යයා
ධර්මිෂ්ඨයෙකැයි කීවේය. මේ කාරණය 48
බලන්ට ආ සමූහයා සිද්ධවූ දේ දැක,
ළය අත්ගසා ගනිමින් ආපසු ගියෝය.
උන්වහන්සේ අඳුනන සියල්ලෝද 49
ගලීලයේ සිට උන්වහන්සේ අනුව ආ
ස්ත්‍රීහුද ඒ දේවල් බල බලා දුරින්
සිටියෝය.

බලව, මන්ත්‍රියෙක්ව, දෙවියන්වහන්සේගේ 50
රාජ්‍යය ගැන බලාසිටියාවූ, ඔවුන්ගේ 51
මන්ත්‍රණයටද ක්‍රියාවටද එකඟ නුණාවූ,
සත්පුරුෂවූ, ධර්මිෂ්ඨවූ, යුදෙව්වරුන්ගේ
නුවරක් වන අරිමාතියේවූ යෝසෙප් නම්
මනුෂ්‍යයෙක්, පිලාත් ළඟට ගොස් 52
යේසුස්වහන්සේගේ මිනිය ඉල්ලුවේය. ඔහු 53
ඒක බාගෙන, සිහින් හණ රෙද්දකින්
වෙළා, ඒ දක්වා කිසිවෙකු නොතැබුවාවූ
ගලක කපනලද සොහොන් ගෙයක
උන්වහන්සේ තැබුවේය. ඒ දවස 54
සූදනම්වීමේ දවසය, සබත් දවසද
ආසන්නවිය. ගලීලයේ සිට උන්වහන්සේ 55
සමග ආවාවූ ස්ත්‍රීහු ගොස්, සොහොන්
ගෙයද උන්වහන්සේගේ මිනිය තැබූ
අන්දමද බලා සිටියෝය. ඔව්හු හැරී 56
ඇවිත් සුගන්ධ ද්‍රව්‍යද සුවඳ තෙල්ද
සූදනම්කළෝය.

ඔව්හු ආඥාව ලෙස සබත් දවසේ
නිවාඩු ගත්තෝය.

## හිස්වූ සොහොන

24 තුමුත් සතියේ පළමුවෙනිද ඉතා
අලුයම තමුන් විසින් සූදනම්කළ
සුවඳ ද්‍රව්‍ය රැගෙන ඔව්හු සොහොන්
ගෙය ළඟට ගොස්, ගල සොහොන් 2
ගෙයින් අහකට පෙරළා තිබෙනවා
දුටුවෝය. ඔව්හු ඇතුල්වූ කල ස්වාමිවූ 3
යේසුස්වහන්සේගේ ශරීරය නුදුටුවෝය.
තවද ඔවුන් ඒ ගැන වියවුල්ව සිටියදී, 4
බලව, දිලියෙන වස්ත්‍ර ඇන්දවූ මනුෂ්‍යයෝ

5 දෙදෙනෙක් ඔවුන් ළඟ සිටියෝය. ඔවුන්
භයපත්ව තමුන්ගේ මුහුණු බිමට නමාගත්
කල ඒ මනුෂ්‍යයෝ කථාකොට: ජීවත්ව
සිටින තැනැත්තා මළවුන් අතරේ තුඹලා
6 සොයන්නේ මක්නිසාද? උන්වහන්සේ
මෙහි නැත, උන්වහන්සේ නැගිටුණුසේක.
7 මනුෂ්‍ය පුත්‍රයා පව්කාර මිනිසුන්ගේ
අත්වලට පාවාදෙනු ලබන්ටත්
කුරුසියෙහි ඇණගසනු ලබන්ටත්
තුන්වෙනිද නැවත නැගිටින්ටත් ඕනැය
කියා උන්වහන්සේ ගලීලයේ සිටියදී
කථාකළ හැටි සිහිකරපල්ලායයි ඔවුන්ට
8 කීවෝය. එකල ඔව්හු උන්වහන්සේගේ
වචන සිහිකොට සොහොන් ගෙයින්
9 හැරී ඇවිත්, මේ සියල්ල එකොළොස්
දෙනාටද අනික් සියල්ලන්ටද දන්වූවෝය.
10 ඒ ස්ත්‍රීහු නම් මග්දලායේ මරියාත්
යොවන්නාත් යකොබ්ගේ මවූවූ
මරියාත්ය. ඔවුන් සමග අනික් ස්ත්‍රීහුද
11 ප්‍රේරිතයන්ට මේ දේ කීවෝය. මේ වචන
ඔවුන්ට නිරර්ථක කථාවක් මෙන් පෙනී,
12 ඔව්හු ඔවුන් අවිශ්වාසකළෝය. නුමුත්
පේත්‍රුස් නැගිට සොහොන් ගෙය ළඟට
දුවගන ගොස්, නැමී බලා, හණ රෙදි
පමණක් තිබෙන බව දැක, සිද්ධවූ
කාරණාව ගැන පුදුමවෙමින් සිය
නිවෙසට ගියේය.

## එම්මාවුස්හි ගෝලයන් දෙන්නාට ප්‍රකාශවීම

13 බලව, ඔවුන්ගෙන් දෙදෙනෙක් ඒ
දවසේම යෙරුසලමේ සිට දෙගව්වක්
පමණ දුරවූ එම්මාවුස් නම් ගමකට
14 යද්දී, සිද්ධවූ ඒ සියල්ල ගැන
15 කථාකළෝය. තවද ඔවුන් කථාකරමින්
විචාරමින් සිටියදී යේසුස්වහන්සේම
ඔවුන් ළඟට පැමිණ ඔවුන් සමග
16 ගියසේක. නුමුත් ඔවුන් උන්වහන්සේ
නාඳුනන ලෙස ඔවුන්ගේ ඇස්
17 බැඳී තිබුණේය. උන්වහන්සේ ඔවුන්ට
කථාකොට: තුඹලා කථාකරකර යන්නාවූ
මේ කාරණා මොනවාදැයි ඔවුන්ගෙන්
ඇසූසේක. ඔව්හු දුක්ඛිත මුහුණුවලින්
18 යුක්තව නැවතුණෝය. ඔවුන්ගෙන්
ක්ලෙයෝපස් නම් එක්කෙනෙක්
උන්වහන්සේට උත්තරදෙමින්: මේ
දවස්වලදී යෙරුසලමෙහි විදේශීව
සිටිමින්, එහි සිදුවූ කාරණා නොදන්නේ
තුඹ පමණක්දැයි උන්වහන්සේට කීවේය.
මොන කාරණාදැයි උන්වහන්සේ 19
ඔවුන්ගෙන් ඇසූසේක. ඔව්හු
උන්වහන්සේට කථාකොට: නාසරීය
යේසුස්වහන්සේ ගැන කාරණාය.
උන්වහන්සේ දෙවියන්වහන්සේද මුළු
සෙනඟද ඉදිරියෙහි ක්‍රියාවෙහිත්
කථාවෙහිත් බලවත්වූ අනාගතවක්තෘ
කෙනෙක්ව සිටිසේක. නායක පූජකයෝද 20
අපගේ මූලාදෑනීහුද උන්වහන්සේ
මරණයට පාවාදී කුරුසියෙහි
ඇණගැසුවෝය. නුමුත් ඉශ්‍රායෙල් 21
මුදගන්ට සිටි තැනන්වහන්සේ
උන්වහන්සේයයි අපි බලාපොරොත්තු
වුණෙමුව. එපමණකුත් නොව මේ දේ
සිද්ධවී අදට තුන්වෙනි දවසය. තවද 22
අපේ සමාගම්කාරවූ සමහර ස්ත්‍රීහු
අලුයම සොහොන් ගෙය ළඟට ගොස්,
උන්වහන්සේගේ ශරීරය නොදැක 23
ඇවිත්, ඔවුන්ට දර්ශනයවූ දේවදූතයන්
උන්වහන්සේ ජීවත්ව සිටිනසේකැයි කී
බව කියා අප විස්මිතකළෝය. අප සමග 24
සිටියවුන්ගෙන් සමහරෙක් සොහොන්ගෙය
ළඟට ගොස් ඒ ස්ත්‍රීන් කී ලෙසම
දුටුවෝය. නුමුත් ඔව්හු උන්වහන්සේ
නුදුටුවෝයයි කීවෝය. එවිට උන්වහන්සේ 25
ඔවුන්ට කියනසේක්: අඥානයෙනි,
අනාගතවක්තෘවරුන් විසින් කියනලද
සියල්ල විශ්වාසකරන්ට ප්‍රමාද සිත්
ඇත්තෙනි, ක්‍රිස්තුස්වහන්සේ ඒ දේ 26
විඳලාම ස්වකීය මහිමයට පැමිණෙන්ට
යුතුව තිබුණා නොවේද කියා,
මෝසෙස්ගෙන්ද සියලු අනාගතවක්තෘ- 27
වරුන්ගෙන්ද පටන්ගෙන, සියලු ලියවිලි-
වල තමන් ගැන තිබුණු කාරණා ඔවුන්ට
තෝරාදුන්සේක. ඔව්හු යන්ට ගිය ගමට 28
ළංවූවෝය. උන්වහන්සේ වනාහි වඩා
දුර යන්නාක්මෙන් දක්වූසේක. නුමුත් 29
ඔව්හු: දවස බොහෝ ගතවී, සවස්වේගන
එන බැවින්, අප සමග නැවතුණ මැනව

කියා උන්වහන්සේට උදක්ම
පෙරැත්තකළෝය. උන්වහන්සේ ඔවුන්
30 සමග නවතින්ට ඇතුළට ගියසේක. තවද
උන්වහන්සේ ඔවුන් සමග කෑමට වාඩිවූ
කල්හි, රොටි රැගෙන ආශිර්වාදකොට
31 කඩා ඔවුන්ට දුන්සේක. එකල ඔවුන්ගේ
ඇස් ඇරී ඔව්හු උන්වහන්සේ
ඇඳිනගත්තෝය; එවිට උන්වහන්සේ
32 ඔවුන්ට නොපෙනී ගියසේක. එකල ඔව්හු:
උන්වහන්සේ අප සමග මගදී කථාකළ
කල්හිත් ලියවිලි අපට තේරාදුන්
කල්හිත් අපේ සිත් දැවා නොවේදැයි
33 එකිනෙකා කථා කරගත්තෝය. ඔව්හු
එම පැයේදීම නැගිට යෙරුසලමට හැරී
ඇවිත්, එකොළොස් දෙනාද ඔවුන් සමග
34 සිටියවුන්ද රැස්ව: ස්වාමීන්වහන්සේ
සැබවින්ම නැගුටුණුසේක, සීමොන්ට
පෙනුණුසේකැයි කියමින් සිටිනවා
35 දුටුවෝය. එවිට ඔව්හු මගදී සිද්ධවූ
කාරණාද රොටි කැඩීමේදී ඔවුන්
උන්වහන්සේ ඇඳිනගත් හැටිද කීවෝය.

## එකොළොස් දෙනාට ප්‍රකාශවීම

36 ඔවුන් මෙසේ කථාකරමින් සිටියදී
උන්වහන්සේ ඔවුන් මැද සිට: තුඹලාට
37 සමාදානය වේවයි ඔවුන්ට කීසේක. නුමුත්
ඔව්හු ත්‍රස්තව, භයපත්ව, ආත්මයක්
38 පෙනුණේයයි සිතුවෝය. උන්වහන්සේ
ඔවුන්ට කථාකොට: තුඹලා
කැලඹෙන්නේ මක්නිසාද? තුඹලාගේ
සිත්වල ශංකා හටගන්නේ මක්නිසාද?
39 මාගේ අත් පා බලා, ඒ මමම බව
දැනගනිල්ලා. මා අතගා බලාපල්ලා.
මක්නිසාද මස් හා ඇට මට තිබෙනවා
තුඹලාට පෙනෙන ලෙස ආත්මයකට
40 නැතැයි කීසේක. උන්වහන්සේ මෙසේ
කියා, තමන් අත් පා ඔවුන්ට පෙන්වූසේක.
41 ඔවුන් ප්‍රීතිය නිසා විශ්වාස නොකර
පුදුමව සිටියදී, උන්වහන්සේ ඔවුන්ට
කථාකොට: කන්ට යමක් මෙහි තුඹලා
ළඟ තිබේදැයි ඇසූසේක. ඔව්හු බැදපු 42
මාලු කෑල්ලක් උන්වහන්සේට දුන්නෝය.
උන්වහන්සේ එය රැගෙන ඔවුන් 43
ඉදිරියෙහි කෑසේක.
උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: මා 44
ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද
අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලද
ගීතිකාවලද ලියනලද සියල්ල සම්පූර්ණ
විය යුතුයයි මා තුඹලා සමග සිටියදීම
තුඹලාට කී වචන මේයයි කීසේක. එවිට 45
උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන
පිණිස ඔවුන්ගේ සිත් පහදවා, ඔවුන්ට
කියනසේක්: මෙසේ ක්‍රිස්තුස්වහන්සේ 46
වධවිඳින්ටත්, තුන්වෙනිද මළවුන්ගෙන්
නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු 47
ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද
උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු
ලබන්ටත් යුතුයයි ලියා තිබේ. තුඹලා 48
මේ දේවලට සාක්ෂිකාරයෝය. බලව, 49
මම මාගේ පියාණන්වහන්සේගේ
පොරොන්දුව තුඹලා වෙතට එවමි. නුමුත්
ඉහළින් තුඹලා බලයෙන් සරසනු ලබන
තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක.

## ස්වර්ගයට නැගීම

උන්වහන්සේ ඔවුන් බෙතානිය දක්වා 50
කැඳවාගෙන ගොස්, තමන්ගේ අත් ඔසවා
ඔවුන්ට ආශිර්වාදකළසේක. තවද 51
උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරද්දී
ඔවුන් කෙරෙන් වෙන්ව, ස්වර්ගයට
ඔසවාගනු ලැබූසේක. ඔව්හු 52
උන්වහන්සේට නමස්කාරකොට, මහත්
ප්‍රීතියෙන් යෙරුසලමට හැරී ඇවිත්,
නිතරම දේවමාළිගාවෙහි දෙවියන්- 53
වහන්සේට ප්‍රශංසාකරමින් සිටියෝය.

# ශුද්ධවූ යොහන් විසින් ලියනලද ශුභාරංචිය

## දිව්‍ය වාක්‍යයාණෝ

1 පටන්ගැන්මෙහිදී වාක්‍යයාණෝ
සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන්-
වහන්සේ හා සමග සිටිසේක,
වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව
2 සිටිසේක. උන්වහන්සේ පටන්ගැන්මෙහිදී
දෙවියන්වහන්සේ සමග සිටිසේක.
3 උන්වහන්සේ කරණකොටගෙන සියල්ල
සාදනලද්දේය; සාදනලද කිසිවක්
උන්වහන්සේ නැතුව සාදනු නොලද්දේය.
4 උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය; ඒ
ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය
5 වූයේය. ආලෝකය අන්ධකාරයෙහි
බබළයි; අන්ධකාරයද එය ග්‍රහණය
6 නොකෙළේය. දෙවියන්වහන්සේ වෙතින්
එවනලද යොහන් නම් මනුෂ්‍යයෙක්
7 ආවේය. ඔහු කරණකොටගෙන
සියල්ලන් විසින් අදහන පිණිස
ආලෝකය ගැන සාක්ෂිදෙන්ට ඔහු
8 සාක්ෂි පිණිස ආවේය. ඔහු ඒ ආලෝකය
නොව ඒ ආලෝකය ගැන සාක්ෂිදෙන
9 පිණිස ආ තැනැත්තේය. ලෝකයට
එන්නාවූ සියලු මනුෂ්‍යයන්
ආලෝකකරන්නාවූ ආලෝකය සත්‍යවූ
10 ආලෝකයය. උන්වහන්සේ ලෝකයෙහි
සිටිසේක, ලෝකයද උන්වහන්සේ
කරණකොටගෙන සාදනලද්දේය, නුමුත්
ලෝකයා උන්වහන්සේ ඇඳින ගත්තේ
11 නැත. උන්වහන්සේ ස්වකීය ස්ථානවලට
ආසේක, ස්වකීයයෝ උන්වහන්සේ පිළි
12 නොගත්තෝය. නුමුත් යම් පමණ
දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද,
එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි
අදහාගත්තෝද, ඔවුන්ට දෙවියන්-
වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ
13 බලය දුන්සේක. ඔව්හු ලෙයෙන්වත්
මාංසයේ කැමැත්තෙන්වත් මනුෂ්‍යයාගේ
කැමැත්තෙන්වත් නොව දෙවියන්-
වහන්සේගෙන් උපන්නෝය. තවද 14
වාක්‍යයාණෝ මාංසවත්වී, කරුණාවෙන්ද
සත්‍යයෙන්ද පූර්ණව, අප අතරෙහි
වාසයකළසේක. පියාණන්වහන්සේ
වෙතින් වූ ඒකජාතක පුත්‍රයාණන්-
වහන්සේගේ මහිමය වැනි
උන්වහන්සේගේ මහිමය දුටිමුව. යොහන් 15
උන්වහන්සේ ගැන සාක්ෂි දෙමින්: මට
පසුව එන්නාවූ තැනන්වහන්සේ මට
පළමුවෙන් සිටි බැවින් මට වඩා උතුම්වී
සිටිනසේකැයි මා කීවේ යම් කෙනෙකු
ගැනද ඒ මූන්වහන්සේමයයි මොරගසා
කීයේය. කුමක්හෙයින්ද උන්වහන්සේගේ 16
පූර්ණකමෙන් අපි සියල්ලෝම අනුග්‍රහය
ලැබීමුව. මක්නිසාද ව්‍යවස්ථාව 17
මෝසෙස් කරණකොටගෙන දෙනලද්දේය;
අනුග්‍රහයද සත්‍යයද පැමුණුණේ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙනය.
කිසිවෙක් කිසිකලක දෙවියන්වහන්සේ 18
දුටුවේ නැත; පියාණන්වහන්සේගේ ළයේ
ඉන්නාවූ ඒකජාතක පුත්‍රයාණන්-
වහන්සේම උන්වහන්සේ ප්‍රකාශකළසේක.

## *යොහන් බව්තීස්තගේ සාක්ෂිය

නුඹ කවරෙක්දැයි යොහන්ගෙන් අසන 19
පිණිස යුදෙව්වරුන් විසින් යෙරුසලමේ
සිට පූජකයන්ද ලෙවීයයන්ද යැවූ කල
ඔහු දුන් සාක්ෂිය මේය. ඔහු නොසඟවා 20
ඇත්ත කියමින්: මම ක්‍රිස්තුස්වහන්සේ
නොවෙමියි කීවේය. ඔව්හුද: එසේ නම් 21

*අවගාහක යොහන්ගේ.

මොකද? නුඹ එලියාදැයි ඔහුගෙන්
ඇසුවෝය. එසේ නොවේයයි ඔහු කීය.
නුඹ අනාගතවක්තෘදැයි ඇසූ කල,
22 නැතැයි ඔහු උත්තරදුන්නේය. එබැවින්
ඔව්හු කථාකොට: අප එවූවන්ට
උත්තරදෙන පිණිස, නුඹ කවරෙක්ද?
නුඹ ගැනම නුඹ කියන්නේ කිමෙක්දැයි
23 ඔහුගෙන් ඇසුවෝය. ඔහුද: මම
වනාහි අනාගතවක්තෘවූ යෙසායා කී
හැටියට—ස්වාමීන්වහන්සේගේ මාර්ගය
සමතලාකරපල්ලාය කියා වනයෙහි
හඬගසන්නෙකුගේ ශබ්දය වෙමියි කීවේය.
24 ඔවුන් එවනු ලැබුවේ ඵරිසිවරුන්
25 කෙරෙන්ය. එවිට ඔව්හු කථාකොට:
ඉදින් නුඹ ක්‍රිස්තුස්වත් එලියාවත්
අනාගතවක්තෘවත් නොවේ නම්
*බව්තීස්ම කරන්නේ මක්නිසාදැයි
26 ඔහුගෙන් ඇසුවෝය. යොහන් ඔවුන්ට
උත්තරදෙමින්: මම †වතුරෙන්
බව්තීස්මකරමි. නුඹලා නාඳුනන
27 කෙනෙක් නුඹලා මැද සිටිනසේක, එනම්
මට පසුව එන තැනන්වහන්සේය,
උන්වහන්සේගේ වහන්සහලේ පටිය
මුදන්ටවත් මම නොවටිමියි කීවේය.
28 මේ කාරණා සිද්ධවුණේ යොහන්
*බව්තීස්මකරමින් සිටි යොර්දනෙන්
එගොඩ බෙතානියේදීය.
29 පසුවද ඔහු තමා ළඟට යේසුස්වහන්සේ
එනවා දැක කථාකොට: අන්න, ලෝකයේ
පාපය දුරුකරන දෙවියන්වහන්සේගේ
30 බැටළු පැටියාණෝ! මට වඩා උතුම්වී
සිටින මනුෂ්‍යයෙක් මට පසුව එන්නේයයි
මා කීවේ මුන්වහන්සේ ගැනය. මක්නිසාද
උන්වහන්සේ මට පළමුවෙන් සිටිසේක.
31 මම උන්වහන්සේ නැඳින සිටියෙමි; නුමුත්
මා †වතුරෙන් බව්තීස්මකරමින් ආවේ
උන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට ප්‍රකාශවන
32 පිණිසයයි කීවේය. තවද යොහන්
සාක්ෂිදෙමින්: ආත්මයාණන් පරෙවියෙකු
මෙන් අහසින් බසිනවා දුටිමි; එය
33 උන්වහන්සේ පිට නැවතුණේය. මම
උන්වහන්සේ නැඳින සිටියෙමි. නුමුත්
†වතුරෙන් බව්තීස්මකරන්ට මා එවූ
තැනන්වහන්සේම මට කථාකොට:

*අවගාහනය.
†වතුරෙහි අවගාහනය.

ආත්මයාණන් යමෙකු පිට බැස
නවතිනවා නුඹ දකින්නෙහිද
*ශුද්ධාත්මයෙන් බව්තීස්මකරන්නේ
උන්වහන්සේයයි මට කීසේක. මමද ඒ 34
දැක: මුන්වහන්සේ දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණෝයයි සාක්ෂිදුනිමියි කීවේය.

## යොහන්ගේ ගෝලයෝ සහ යේසුස්වහන්සේගේ ගෝලයෝ

නැවත පසුවද යොහන් තමාගේ 35
ගෝලයන් දෙදෙනෙකු සමග සිටියදී;
යේසුස්වහන්සේ යනවා දැක: අන්න! 36
දෙවියන්වහන්සේගේ බැටළු පැටියාණෝයයි
කීවේය. ඒ ගෝලයන් දෙදෙනා ඔහුගේ 37
කීම අසා යේසුස්වහන්සේ පස්සේ
ගියෝය. යේසුස්වහන්සේ හැරී ඔවුන් 38
තමන් පස්සෙන් එනවා දැක: නුඹලා
සොයන්නේ කුමක්දැයි ඔවුන්ගෙන්
ඇසූසේක. ඔව්හුද: රබ්බී, ඔබ නැවතී
සිටින්නේ කොතැනදැයි කීවෝය. (රබ්බී
යනු ආචාරීනි යන අර්ථයි.) ඇවිත් 39
බලාපල්ලායයි උන්වහන්සේ ඔවුන්ට
කීසේක. එසේ ඔව්හු ගොස් උන්වහන්සේ
සිටින ස්ථානය දැක, එදින උන්වහන්සේ
සමග නැවතුණෝය. ඒ වේලාව දසවෙනි
පැය පමණ විය. යොහන්ගේ කීම 40
අසා උන්වහන්සේ පස්සේ ගියාවූ
දෙදෙනාගෙන් එක්කෙනෙක් නම් සීමොන්
පේත්‍රුස්ගේ සහෝදරවූ අන්ද්‍රෑය. ඔහු 41
පළමුකොට තමාගේම සහෝදරවූ
සීමොන් දැක: අපට මෙසියස්වහන්සේ
සම්බවූසේකැයි ඔහුට කීවේය.
(මෙසියස් යන්නෙහි අර්ථය ක්‍රිස්තුස්-
වහන්සේ යනුය.) ඔහු යේසුස්වහන්සේ 42
ළඟට සීමොන් කැඳවාගෙන ආවේය.
යේසුස්වහන්සේ ඔහු දෙස බලා: නුඹ
යොහන්ගේ පුත්‍රවූ සීමොන්ය. නුඹට
කේපස්ය කියනු ලබන්නේයයි කීසේක.
(එහි අර්ථය නම් †පේත්‍රුස්ය.)
පසුවද උන්වහන්සේ ගලීලයට පිටත්ව 43
යන්ට අදහස්කොට පිලිප් දැක: මා අනුව

*ශුද්ධාත්මයෙහි අවගාහනය.
†එනම්—පර්වතය.

44 වරෙන්නැයි ඔහුට කීසේක. පිලිප් වනාහි
අන්ද්‍රෑ සහ පේත්‍රුස් විසූ බෙත්සයිද නුවර
45 වැසියෙක්ය. පිලිප් නතානියෙල් දැක: යම්
කෙනෙකු ගැන මෝසෙස් විසින්
ව්‍යවස්ථාවෙහිත් අනාගතවක්තෘවරුන්
විසිනුත් ලියන ලද්දේද උන්වහන්සේ අපට
සම්බවූසේක. උන්වහන්සේ යෝසෙප්ගේ
පුත්‍රවූ නාසරිය යේසුස්යයි ඔහුට කීවේය.
46 නතානියෙල්ද: නාසරෙත් නුවරින් යම්
යහපතක් එන්ට පුළුවන්දැයි ඔහුට
කීවේය. ඇවිත් බලාපන්නැයි පිලිප් ඔහුට
47 කීවේය. යේසුස්වහන්සේ නතානියෙල්
තමන් වෙතට එනවා දැක: මෙන්න,
සැබවින්ම ඉශ්‍රායෙලිතයෙක්! මොහු තුළ
කිසි වංචාවක් නැතැයි ඔහු ගැන කීසේක.
48 ඔබ මා අඳුනන්නේ කොහොමදැයි
නතානියෙල් උන්වහන්සේට කීවේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: පිලිප් නුඹ
කැඳවන්ට පළමුවෙන්, අත්තික්කා ගස යට
නුඹ සිටියදී නුඹ දුටිමියි කීසේක.
49 නතානියෙල් උන්වහන්සේට උත්තර-
දෙමින්: රබ්බී, ඔබ දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණෝය; ඔබ ඉශ්‍රායෙල්වරුන්ගේ
50 රජ්ජුරුවෝයයි කීවේය. යේසුස්වහන්සේ
ඔහුට උත්තරදෙමින්: නුඹ අත්තික්කා
ගස යට සිටිනවා දුටිමියි මා නුඹට කී
බැවින් විශ්වාසකරනවාද? මීට වඩා
මහත් දේ නුඹ දකිනවා ඇතැයි කීසේක.
51 තවද උන්වහන්සේ: සැබවක් සැබවක්
නුඹලාට කියමි—ස්වර්ගය විවරව,
දෙවියන්වහන්සේගේ දූතයන් මනුෂ්‍ය
පුත්‍රයා කෙරෙහි නගිනවා සහ බසිනවා
නුඹලා දකිනවා ඇතැයි කීසේක.

## කානාහි සරණ මංගල්‍යය

2 තුන්වෙනිද ගලීලයේ කානාහි සරණ
මංගල්‍යයක් විය; යේසුස්වහන්සේගේ
2 මෑණියෝද එහි සිටියාය. යේසුස්වහන්සේත්
උන්වහන්සේගේ ගෝලයොත් සරණ
මංගල්‍යයට කැඳවනු ලැබුවෝය.
3 මුද්‍රිකපානය ඉවරවූ කල: ඔවුන්ට
මුද්‍රිකපානය නැතැයි යේසුස්වහන්සේගේ
මෑණියෝ උන්වහන්සේට කීවාය.
4 යේසුස්වහන්සේද: ස්ත්‍රිය, නුඹෙන් මට
කම මොකද? මාගේ වේලාව තවම
පැමුණුණේ නැතැයි ඇට කීසේක.
උන්වහන්සේගේ මෑණියෝ: උන්වහන්සේ 5
නුඹලාට කියන කොයි දෙයක් නුමුත්
කරපල්ලායයි මෙහෙකරුවන්ට කීවාය.
යුදෙව්වරුන්ගේ පවිත්‍රවීමේ ප්‍රකාරයට 6
එක එකේ *මෙත්‍රෙ දෙකක් තුනක් පමණ
වතුර අල්ලන්නාවූ ගල් භාජන හයක්
එහි තබා තිබුණේය. භාජනවල වතුර 7
පුරවාපල්ලායයි යේසුස්වහන්සේ ඔවුන්ට
කීසේක. ඔව්හු ඒවා කට දක්වා
පිරෙවූවෝය. උන්වහන්සේද: ඉතින් එයින් 8
අරන් මංගල්‍යයේ ප්‍රධානියා ළඟට
ගෙනියාපල්ලායයි ඔවුන්ට කීසේක. ඔව්හු
ගෙනගියෝය. මංගල්‍යයේ ප්‍රධානියා 9
මුද්‍රිකපානයවූ වතුර රස බලා, ඒවා
කොතැනින් වීදැයි වතුර ගෙනා
මෙහෙකරුවන් දන්න නුමුත් ඔහු නොදැන,
මනමාලයාට අඬගසා: කවුරුත් 10
පළමුකොට හොඳ මුද්‍රිකපානයද
මිනිසුන් හොඳටම බීවායින් පසු බාල
මුද්‍රිකපානයද දෙති. නුඹ මේ වන
තුරු හොඳ මුද්‍රිකපානය තබාගෙන
සිටියෙහියයි ඔහුට කීවේය. යේසුස්- 11
වහන්සේ ගලීලයේ කානාහිදී තමන්
ලකුණුවලින් මේ පළමුවෙනි එක
කර, ස්වකීය මහිමය ප්‍රකාශකළසේක;
උන්වහන්සේගේ ගෝලයෝද උන්වහන්සේ
කෙරෙහි අදහාගත්තෝය.
ඉන්පසු උන්වහන්සේද උන්වහන්සේගේ 12
මෑණියෝද සහෝදරයෝද ගෝලයෝද
කපර්ණවූමට ගියෝය. නුමුත් ඔවුන්
බොහෝ දවස් එහි නැවතුණේ නැත.

## දේව මාළිගාව පවිත්‍රකිරීම

යුදෙව්වරුන්ගේ පාස්කුව ළංව 13
තිබුණේය, යේසුස්වහන්සේද යෙරුසලමට
ගියසේක. එවිට දේවමාළිගාවෙහි 14
ගවයන් බැටළුවන් හා පරෙවියන්
විකුණන්නන්ද මිල මාරුකරන්නන්ද
වාඩිව ඉන්නවා දැක, ලනුවලින් කසයක් 15
සාදා, බැටළුවන්ද ගවයන්ද මාළිගාවෙන්
පිටතට එළවා, මිල මාරුකරන්නන්ගේ

*මෙත්‍රෙ එකක් ගැලොම් 8 3/4 පමණ වේ.

මිල විසුරුවා මේස පෙරළාදමූ-
16 සේක. තවද උන්වහන්සේ පරෙවියන්
විකුණන්නන්ට කථාකොට: මේ දේවල්
මෙතැනින් අරන් පලයල්ලා; මාගේ
පියාණන්ගේ ගෘහය වෙළඳම් ගෙයක්
17 නොකරල්ලායයි කීසේක. ඔබගේ ගෘහය
ගැන ඇති ජ්වලිතය මා දවන්නේයයි
ලියා තිබෙන බව උන්වහන්සේගේ
18 ගෝලයන්ට මතක්විය. එකල යුදෙව්වරු:
තුඹ මේ දේවල් කරන බැවින් මොන
ලකුණක් අපට පෙන්වන්නෙහිදැයි
19 උන්වහන්සේගෙන් ඇසුවෝය. යේසුස්-
වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: මේ
මාළිගාව කඩාදමාපල්ලා, එවිට තුන්
දවසකින් එය නැඟුටුවන්නෙමියි කීසේක.
20 යුදෙව්වරු කථාකොට: මේ මාළිගාව
ගොඩනැඟීමට සතළිස් සාවුරුද්දක්
ගතවිය, තුඹ ඒක තුන් දවසකින්
21 නැඟුටුවන්නෙහිදැයි කීවෝය. නුමුත්
උන්වහන්සේ කථාකළේ තමන්ගේ ශරීරය
22 නැමති මාළිගාව ගැනය. එබැවින් උන්-
වහන්සේ මේක කී බව යේසුස්වහන්සේ
මළවුන්ගෙන් නැඟිටි පසු උන්-
වහන්සේගේ ගෝලයෝ සිහිකර,
ලියවිල්ලද උන්වහන්සේ කී වචනයද
විශ්වාසකළෝය.
23 උන්වහන්සේ පාස්කු මංගල්‍යයේදී
යෙරුසලමෙහි සිටි කල්හි බොහෝ
දෙනෙක් උන්වහන්සේ කළ ලකුණු දැක,
උන්වහන්සේගේ නාමය කෙරෙහි
24 අදහාගත්තෝය. නුමුත් යේසුස්වහන්සේ
සියල්ලන් දන්නා බැවින්ද මනුෂ්‍යයා
තුළ තිබෙන්නේ කුමක්දැයි දන්න නිසා,
25 මනුෂ්‍යයා ගැන යමෙකුගේ සාක්ෂියෙන්
උන්වහන්සේට ඕනෑකමක් නැති බැවින්ද
තමන්ම ඔවුන්ට භාරනුවූසේක.

## නිකොදේමුස් සමග කථාව

3 යුදෙව්වරුන්ගේ ප්‍රධානියෙක්වූ
නිකොදේමුස් නම් ඵරිසියෙක්
2 සිටියේය. හෙතෙම රාත්‍රියේ උන්වහන්සේ
ළඟට ඇවිත්: රබ්බි, ඔබ දෙවියන්-
වහන්සේ කෙරෙන් ආවාවූ ගුරුවරයෙකැයි
අපි දනිමුව. මක්නිසාද තමා සමග
දෙවියන්වහන්සේ නැත්නම් ඔබ
කරන්නාවූ මේ හාස්කම් කරන්ට
කිසිවෙකුට නුපුළුවනැයි කීවේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් 3
සැබවක් තුඹට කියමි–යමෙක් අලුතෙන්
නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ
රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට
කීසේක. නිකොදේමුස් උන්වහන්සේට 4
කථාකොට: මනුෂ්‍යයෙක් මහලුව සිටියදී
උපදින්ට පුළුවන් කොහොමද? දෙවෙනි
වර මවුකුසට ඇතුල්ව උපදින්ට
පුළුවන්දැයි උන්වහන්සේට කීවේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් 5
සැබවක් තුඹට කියමි–යමෙක් වතුරෙන්ද
ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට
දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්-
වෙන්ට බැරිය. මාංසයෙන් උපදින දේ 6
මාංසයය; ආත්මයාණන්ගෙන් උපදින
දේ ආත්මයය. තුඹලා අලුතෙන් උපදින්ට 7
ඕනෑයයි මා කීවාට පුදුම නොවන්න.
හුළඟ කැමති කැමති තැනට ගසයි, 8
එහි ශබ්දය තුඹට ඇසෙයි, නුමුත්
කොතැනින් එන්නේද කියාවත් කොතැනට
යන්නේද කියාවත් තුඹ දන්නේ
නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින
සියල්ලෝම එසේමයයි කීසේක.
නිකොදේමුස් උත්තරදෙමින්: මේ දේ 9
වෙන්ට පුළුවන් කොහොමදැයි උන්-
වහන්සේට කීවේය. යේසුස්වහන්සේ ඔහුට 10
උත්තරදෙමින්: තුඹ ඉශ්‍රායෙල්හි
ගුරුවරයාව සිටියදීත් මේ දේවල්
දන්නේ නැද්ද? සැබවක් සැබවක් තුඹට 11
කියමි–අපි දන්නා දේ කියමුව, දුටු දේට
සාක්ෂිදෙමුව; නුමුත් තුඹලා අපේ සාක්ෂිය
පිළිගන්නේ නැත. මා තුඹලාට 12
පොළොවේ දේ කී කල්හි තුඹලා විශ්වාස
නොකරනවා නම් ස්වර්ගීක දේ කීවොත්
විශ්වාස කරන්නේ කෙසේද? ස්වර්ගයෙන් 13
බැස්සාවූ, ස්වර්ගයෙහි සිටින්නාවූ මනුෂ්‍ය
පුත්‍රයා මිස වෙන කිසිවෙක් ස්වර්ගයට
නොනැංගේය. මෝසෙස් කාන්තාරයේදී 14
සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද
උන්වහන්සේ කෙරෙහි අදහාගන්න
සෑමදෙනම, සදාකාල ජීවනය ලබන 15
පිණිස ඔසවනු ලබන්ට ඕනෑයයි කීසේක.
මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය 16
ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම්
ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ

උන්වහන්සේ කෙරෙහි අදහාගන්න
සැමදෙනම විනාශ නොවී සදාකාල
17 ජීවනය ලබන පිණිසය. මක්නිසාද
දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට
එවූවේ ලෝකයා විනිශ්චය කරන
පිණිස නොව ලෝකයා උන්වහන්සේ
කරණකොටගෙන ගළවනු ලබන
18 පිණිසය. උන්වහන්සේ කෙරෙහි
අදහාගන්නා විනිශ්චයකරනු නොලැබේ.
අදහා නොගන්නා දෙවියන්වහන්සේගේ
ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය
කෙරෙහි අදහා නොගෙන සිටින බැවින්
දැනටම විනිශ්චය කරනු ලැබ සිටියි.
19 විනිශ්චය නම් මේය–ලෝකයට
ආලෝකය පැමිණ තිබෙන නුමුත්,
මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන්
ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම්වූ
20 බවය. නපුරුකම් කරන සැමදෙනම
ආලෝකයට වෛරවී, තමුන්ගේ ක්‍රියා
වැරදි බව ඔප්පු නොවන පිණිස
21 ආලෝකයට නොඑති. නුමුත් සැබෑව
කරන්නා තමාගේ ක්‍රියා දෙවියන්වහන්සේ
තුළ කළ බව ප්‍රකාශවෙන පිණිස
ආලෝකයට එන්නේයයි කීසේක.

## *යොහන් බව්තීස්ත තවත් සාක්ෂිදීම

22 ඉන්පසු යේසුස්වහන්සේද උන්වහන්සේගේ
ගෝලයෝද යූද දේශයට පැමිණියෝය;
එහිදී උන්වහන්සේ ඔවුන් සමග නැවතී
23 සිට, †බව්තීස්මකළසේක. යොහන්ද
සාලිම් ළඟවූ ඒනොන් යන ස්ථානයෙහි
බොහෝ වතුර තිබුණු බැවින් එහි
†බව්තීස්මකරමින් සිටියේය. මනුෂ්‍යයෝ
ඇවිත් †බව්තීස්ම කරනු ලැබුවෝය.
24 මක්නිසාද යොහන් ඒ වන තුරු ම
25 හිරගෙයි දමනු නොලැබුවේය. එකල
යොහන්ගේ ගෝලයන් හා යුදෙව්වෙකු
අතරේ පවිත්‍රවීම ගැන වාදයක්
26 හටගත්තේය. එවිට ඔව්හු යොහන් ළඟට
ඇවිත්: රබ්බි, යොර්දනෙන් එගොඩ ඔබ
සමග සිටියාවූද ඔබගෙන් සාක්ෂි
ලැබුවාවූද තැනැත්තේම †බව්තීස්මකරන-
සේක, සියල්ලෝද උන්වහන්සේ වෙතට

*අවගාහක යොහන්. †අවගාහනය.

පැමිණෙතියි ඔහුට කීවෝය. යොහන් 27
උත්තරදෙමින් මෙසේ කීවේය:
මනුෂ්‍යයෙකුට ස්වර්ගයෙන් දෙනලද
දෙයක් මිස වෙන කිසිවක් ලබන්ට බැරිය.
මම ක්‍රිස්තුස් නොවෙමි, නුමුත් 28
උන්වහන්සේට පළමුවෙන් එවන-
ලද්දෙමියි මා කී බවට නුඹලාම
සාක්ෂිකාරයෝය. මනමාලී ඇත්තා 29
මනමාලයාය. නුමුත් මනමාලයා ළඟ
සිට ඔහුගේ වචන අසන ඔහුගේ
මිත්‍රයා මනමාලයාගේ හඬට බොහෝ
සෙයින් ප්‍රීතිවෙයි. එබැවින් මාගේ මේ
ප්‍රීතිය සම්පූර්ණවී තිබේ. උන්වහන්සේ 30
වර්ධනවෙන්ටත් මා අඩුවෙන්ටත් ඕනෑය.
ඉහළින් එන්නාවූ තැනන්වහන්සේ 31
සියල්ලන්ට වඩා උතුම්ය. භූමියෙන් වූ
තැනැත්තේ භූමිකව, භූමික දේ ගැන
කථාකරන්නේය. ස්වර්ගයෙන් එන්නාවූ
තැනන්වහන්සේ සියල්ලන්ටම වඩා
උතුම්ය. උන්වහන්සේ දුටුවාවූ ඇසුවාවූ 32
දේ ගැන සාක්ෂිදෙනසේක; එහෙත්
කවරෙක්වත් උන්වහන්සේගේ සාක්ෂිය
පිළිගන්නේ නැත. උන්වහන්සේගේ 33
සාක්ෂිය පිළිගත් තැනැත්තේ දෙවියන්-
වහන්සේ සැබෑවන්ත බවට මුද්‍රාව තබා
තිබේ. මක්නිසාද දෙවියන්වහන්සේ විසින් 34
එවනලද තැනන්වහන්සේ දෙවියන්-
වහන්සේගේ වචන කථාකරනසේක.
කුමක්හෙයින්ද දෙවියන්වහන්සේ මිම්මක්
සහිතව ආත්මයාණන් නොදෙනසේක.
පියාණන්වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම- 35
කරනසේක, සියල්ල උන්වහන්සේ අතට
භාරදී තිබේ. පුත්‍රයාණන් කෙරෙහි 36
අදහන්නාට සදාකාල ජීවනය ඇත; නුමුත්
පුත්‍රයාණන්ට කීකරු නොවන්නා ජීවනය
නොදක්නේය, දෙවියන්වහන්සේගේ උදහස
ඔහු කෙරෙහි පවතියි.

## යේසුස්වහන්සේ සහ සමාරියේ ස්ත්‍රිය

4 එබැවින් (යේසුස්වහන්සේගේ
ගෝලයන් මිස උන්වහන්සේම
*බව්තීස්ම නොකළ නුමුත්) උන්වහන්සේ 2
යොහන්ට වඩා ගෝලයන් සාදගෙන
*බව්තීස්මකරනසේකැයි ඵරිසිවරුන්ට

*අවගාහනය.

ආරංචිවූ බව ස්වාමීන්වහන්සේ දැනගත්
3 කල, යුදය අත්හැර නැවත ගලීලයට
4 ගියසේක. උන්වහන්සේ සමාරිය මැදින්
5 යන්ට ඕනෑ බැවින්, යාකොබ් තමාගේ
පුත්‍රවූ යෝසෙප්ට දුන් බිම් කොටස ළඟ
තිබෙන සිඛාර් නම් සමාරියේ නුවරකට
6 පැමිණිසේක. එහි යාකොබ්ගේ ළිඳ
තිබුණේය. යේසුස්වහන්සේ ගමනින්
වෙහෙසව සිටිසේක්, ඒ ආකාරයෙන්ම
ළිඳ ළඟ හිඳගත්සේක. ඒ හවෙනි පැය
7 පමණ විය. සමාරියේ ස්ත්‍රියෙක් වතුර
අදින්ට ආවාය. මට බොන්ට දියන්නැයි
8 යේසුස්වහන්සේ ඇට කීසේක. මක්නිසාද
උන්වහන්සේගේ ගෝලයෝ කෑම මිලේට
9 ගන්ට නුවරට ගොස් සිටියෝය. එවිට
සමාරිය ස්ත්‍රී උන්වහන්සේට කථාකොට:
යුදෙව් කෙනෙක්වූ ඔබ සමාරිය
ස්ත්‍රියෙක්වූ මාගෙන් බොන්ට ඉල්ලන්නේ
කොහොමදැයි කීවාය. (මක්නිසාද
සමාරියයන් සමග යුදෙව්වන්ගේ
10 ගනුදෙනුවක් නැත.) යේසුස්වහන්සේ
ඇට උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ
දීමනාවත්, මට බොන්ට දියන්නැයි
නුඹට කීවේ කවුද කියාත් නුඹ දැනගෙන
සිටියා නම්, නුඹ ඔහුගෙන් ඉල්ලනවා
ඇත, එවිට ඔහු නුඹට ජීවනදායක
11 වතුර දෙනවා ඇතැයි කීසේක. ස්ත්‍රීද:
ස්වාමිනි, වතුර අදින්ට භාජනයක් ඔබට
නැත, ළිඳත් ගැඹුරුය. එබැවින් ඒ
12 ජීවනදායක වතුර ඔබට කොයින්ද? ළිඳ
අපට දුන් අපේ පියවූ යාකොබ්ට වඩා
ඔබ උතුම්ද? ඔහුද ඔහුගේ පුත්‍රයෝද
ඔහුගේ සිවුපාවෝද මෙයින් බීවෝයයි
13 උන්වහන්සේට කීවාය. යේසුස්වහන්සේ
උත්තරදෙමින්: මේ වතුර බොන
හැමදෙනාට නැවත පිපාසාවන්නේය.
14 නුමුත් මා දෙන වතුරෙන් බොන
කවරෙකුට නුමුත් කිසිකලෙක පිපාසා
නොවන්නේය; මා ඔහුට දෙන වතුර
ඔහු තුළෙහි සදාකාල ජීවනය
නික්මවන්නාවූ වතුර උල්පතක්
15 වන්නේයයි කීසේක. ස්ත්‍රීද: ස්වාමිනි,
මට පිපාසා නොවන පිණිසත් වතුර
අදින්ට මෙපමණ දුර නොඑන පිණිසත්
ඒ වතුර මට දුන මැනවයි කීවාය. ගොස් 16
නුඹේ පුරුෂයා කැඳවාගෙන මෙහි
වරෙන්නැයි යේසුස්වහන්සේ ඇට කීසේක.
ස්ත්‍රීද උන්වහන්සේට උත්තරදෙමින්: මට 17
පුරුෂයෙක් නැතැයි කීවාය. යේසුස්-
වහන්සේ ඇට කියනසේක්: මට
පුරුෂයෙක් නැතැයි නුඹ කීවා හරිය.
මක්නිසාද නුඹට පුරුෂයන් පස්දෙනෙක් 18
සිටියෝය; නුඹට දැන් සිටින තැනැත්තා
නුඹේ පුරුෂයා නොවේ. එය නුඹ
සැබෑලෙස කීවෙහියයි කීසේක. ස්ත්‍රී 19
උන්වහන්සේට කියන්නී: ස්වාමිනි, ඔබ
අනාගතවක්තෘ කෙනෙකු බව මට පෙනේ.
අපගේ පියවරු මේ කන්දේදී නමස්කාර- 20
කළෝය; නුමුත් මනුෂ්‍යයන් විසින්
නමස්කාරකරන්ට යුතු ස්ථානය
යෙරුසලමේයයි නුඹවහන්සේලා
කියන්නහුයයි කීවාය. යේසුස්වහන්සේ 21
ඇට කියනසේක්: ස්ත්‍රිය, මා
විශ්වාසකරපන්න, මේ කන්දේදීවත්
යෙරුසලමේදීවත් නුඹලා පියාණන්-
වහන්සේට නමස්කාර නොකරන කාලය
පැමිණෙන්නේය. නුඹලා නමස්කාර 22
කරන්නේ නොදන්නා දේටය. අපි දන්නා
දේට නමස්කාරකරමුව. මක්නිසාද
ගැළවීම යුදෙව්වරුන්ගෙන්ය. නුමුත් 23
සැබෑ නමස්කාරකරන්නන් විසින්
ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්-
වහන්සේට නමස්කාරකරන කාලය
පැමිණෙන්නේය, දැනටම පැමිණ තිබේ.
මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට
නමස්කාරකරන්නන් වන පිණිස එබඳු
වූවන් සොයනසේක. දෙවියන්වහන්සේ 24
ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර-
කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑ-
කමෙන්ද නමස්කාරකළ යුතුයයි කීසේක.
ස්ත්‍රී උන්වහන්සේට කථාකොට: 25
(ක්‍රිස්තුස්යයි කියන) මෙසියස්වහන්සේ
එන බව දනිමි. උන්වහන්සේ ආවාම
සියල්ල අපට දන්වනසේකැයි කීවාය.
නුඹ සමග කථාකරන්නාවූ මම 26
උන්වහන්සේයයි යේසුස්වහන්සේ ඇට
කීසේක.

27 එවිට උන්වහන්සේගේ ගෝලයෝ
ඇවිත්, උන්වහන්සේ ස්ත්‍රියෙක් සමග
කථාකරමින් සිටියාට මවිතවූවෝය;
එහෙත් ඔබ කුමක් සොයනසේක්ද?
නොහොත් ඈ සමග කථාකරන්නේ
මක්නිසාදැයි කිසිවෙක් ඇසුවේ නැත.
28 එකල ස්ත්‍රී තමාගේ කළය තබා නුවරට
29 ගොස්: මා කළ සියල්ල මට කීවාවූ
මනුෂ්‍යයෙකු බලන්ට වරෙල්ලා. ඒ
ක්‍රිස්තුස්වහන්සේදෝහෝයි මනුෂ්‍යයන්ට
30 කීවාය. එවිට ඔව්හු නුවරින් පිටත්ව
31 උන්වහන්සේ වෙතට ආවෝය. ඒ අතර
ගෝලයෝ කථාකොට: රබ්බි, කෑව
මැනවයි උන්වහන්සේගෙන් ඉල්ලා
32 සිටියෝය. නුමුත් උන්වහන්සේ: තුඹලා
නොදන්නා කෑමක් කන්නට මට
33 තිබේයයි ඔවුන්ට කීසේක. එබැවින්:
කවුරුවත් උන්වහන්සේට කෑම
ගෙනාවාදෝ කියා ගෝලයෝ
34 එකිනෙකා කථාකරගත්තෝය. යේසුස්-
වහන්සේද: මාගේ කෑම නම් මා එවූ
තැනන්වහන්සේගේ කැමැත්ත කොට
35 උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. තව
සාරමසක් ගිය කල ගොයම් කපන
කාලය පැමිණෙන්නේයයි තුඹලා
කියනවා නොවේද? මම තුඹලාට
කියමි—තුඹලාගේ ඇස් ඔසවා කුඹුරු
දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට
36 පැහී තිබෙන බව බලාපල්ලා. වපුරන්නාත්
කපන්නාත් එක්ව සන්තෝෂවන පිණිස,
කපන්නා කුලී ලැබ සදාකාල ජීවනයට
37 අස්වැන්න එකතුකරගන්නේය. මක්නිසාද:
එක්කෙනෙක් වපුරන්නේය, වෙන කෙනෙක්
කපන්නේය යන කීම මෙයින් සැබෑවේ.
38 තුඹලා විසින් වැඩ නොකළ ගොයම්
කපන්ට මම තුඹලා යැවීමි. අන්‍යයෝ
වැඩකළෝය, තුඹලා ඔවුන්ගේ වැඩට
පැමින්නෝයයි කීසේක.
39 මා කළ සියල්ල උන්වහන්සේ මට
කීසේකැයි සාක්ෂිදුන් ස්ත්‍රියගේ වචන
නිසා ඒ නුවර සමාරියයන්ගෙන්
බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි
40 අදහාගත්තෝය. එවිට සමාරියවරු
උන්වහන්සේ ළඟට ඇවිත්, තමුන්
සමග නවතින ලෙස උන්වහන්සේගෙන්
ඉල්ලුවෝය. උන්වහන්සේ දෙදවසක් එහි
නැවතුණුසේක. වෙනත් බොහෝ දෙනෙක් 41
උන්වහන්සේගේ වචන නිසා අදහා,
ස්ත්‍රියට කථාකොට: අප දැන් 42
අදහන්නේ තුඹේ කීම නිසා
නොවේ. මක්නිසාද අපිම අසා,
සැබෑවටම මුන්වහන්සේ ලෝකයාගේ
ගැළවුම්කාරයාණන් බව දනිමුයයි
කීවෝය.

## ගලීලයේ රාජ සේවකයෙකුගේ පුත්‍රයාට සුවකිරීම

ඒ දෙදවසට පසු උන්වහන්සේ එතැනින් 43
පිටත්ව ගලීලයට ගියසේක. මක්නිසාද 44
අනාගතවක්තෘ කෙනෙකුට තමාගේම
රටේදී ගෞරව නැතැයි යේසුස්වහන්සේම
සාක්ෂිදුන්සේක. මෙසේ උන්වහන්සේ 45
ගලීලයට පැමිණි කල, ගලීලයෝ
මංගල්‍යයේදී උන්වහන්සේ විසින්
යෙරුසලමෙහි කළ සියල්ල දැක
උන්වහන්සේ පිළිගත්තෝය. මක්නිසාද
ඔව්හුද මංගල්‍යයට පැමිණියෝය.
එවිට උන්වහන්සේ තමන් විසින් 46
වතුරෙන් මුද්‍රිකපානය සෑදුවාවූ ගලීලයේ
කානා නුවරට නැවත පැමිණිසේක.
කපර්ණවුමෙහි රෝගීවූ පුත්‍රයෙකු ඇති
එක්තරා ඇමතියෙක් සිටියේය. ඔහු 47
යේසුස්වහන්සේ යුදයේ සිට ගලීලයට
ඇවිත් සිටින බව අසා, උන්වහන්සේ
ළඟට ගොස්, ඇවිත් තමාගේ පුත්‍රයා
සුවකරන ලෙස උන්වහන්සේගෙන්
ඉල්ලුවේය; මක්නිසාද ඔහු මරණාසන්නව
සිටියේය. යේසුස්වහන්සේ ඔහුට 48
කථාකොට: තුඹලා ලකුණුද පුදුමද
නුදුටුවොත් කිසිසේත් විශ්වාස කරන්නේ
නැතැයි ඔහුට කීසේක. ස්වාමිනි, මාගේ 49
දරුවා නසින්ට පළමුවෙන් අව මැනවයි
ඇමතියා කීවේය. යේසුස්වහන්සේද: 50
පලයන්න, තුඹේ පුත්‍රයා ජීවත්ව සිටීයයි
ඔහුට කීසේක. ඒ මනුෂ්‍යයා
තමාට යේසුස්වහන්සේ කී වචනය
විශ්වාසකරගෙන ගියේය. ඔහු යන කල 51
ඔහුගේ දාසයෝ ඔහු පෙරමගට ඇවිත්
ඔහුගේ පුත්‍රයා ජීවත්ව සිටීයයි ඔහුට
කීවෝය. එවිට ඔහුට සුවවෙන්ට 52

පටන්ගත්තේ කොයි පැයේදීදැයි ඔහු
ඔවුන්ගෙන් විචාළේය. ඊයේ සත්වෙනි
පැයේදී උණ බැස්සේයයි ඔව්හු ඔහුට
53 කීවෝය. නුඹේ පුත්‍රයා ජීවත්ව සිටීයයි
යේසුස්වහන්සේ තමාට කී පැය එයමයයි
පියා දත, ඔහුද ඔහුගේ ගෙයි
54 සියල්ලෝද අදහාගත්තෝය. මේ වනාහි
යේසුස්වහන්සේ යුදයේ සිට ගලීලයට
පැමිණ පසු කළාවූ දෙවෙනි හාස්කමය.

## බෙතෙස්දවේ කොරාට සුවකිරීම

5 ඉන්පසු යුදෙව්වරුන්ගේ මංගල්‍යයක්
විය; යේසුස්වහන්සේද යෙරුසලමට
ගියසේක.
2 යෙරුසලමෙහි බැටළුදෙර ළඟ හෙබ්‍රෙව්
භාෂාවෙන් බෙතෙස්ද නම්වූ මණ්ඩප
3 පහක් ඇති පොකුණක් තිබේ. ඒවායේ
අන්ධයෝය, කොරුය, වියළි අවයව
ඇත්තෝය යන රෝගීන් සමූහයක්
5 ඔත්පළම උන්නෝය.* තිස්අට අවුරුද්දක්
දුර්වලකමෙන් පීඩිතවූ එක්තරා
6 මනුෂ්‍යයෙක් එහි සිටියේය. ඔහු ඔත්පළම
ඉන්නවා යේසුස්වහන්සේ දැක, ඔහු දැනට
බොහෝ කලක සිට ඒ ආකාරව
සිටි බව දැන: නුඹ සුවය ලබන්ට
කැමැත්තෙහිදැයි ඔහුගෙන් ඇසූසේක.
7 රෝගියා උන්වහන්සේට උත්තර
දෙමින්: ස්වාමිනි, වතුර කැලඹෙන කල
මා පොකුණට බස්වන්ට කිසිවෙක් මට
නැත. මා යන කල වෙන කෙනෙක් මට
8 පළමුවෙන් බසින්නේයයි කීවේය. නැගිට
නුඹේ යහන රැගෙන පලයන්නැයි
යේසුස්වහන්සේ ඔහුට කීසේක.
9 එකෙණෙහිම ඒ මනුෂ්‍යයා සුවපත්ව,
තමාගේ යහන රැගෙන ගියේය.
10 ඒ දවස සබත් දවසය. එහෙයින්
යුදෙව්වරු: අද සබත් දවසය, යහන
රැගෙන යන්ට යුතු නැතැයි සුවකරනු
11 ලැබූ මනුෂ්‍යයාට කීවෝය. නුමුත් ඔහු
ඔවුන්ට උත්තරදෙමින්: මා සුවකළ
තැනැත්තේම—නුඹේ යහන රැගෙන
පලයන්නැයි මට කීසේකැයි කීවේය. නුඹේ 12
යහන රැගෙන පලයන්නැයි නුඹට කී
මනුෂ්‍යයා කවුදැයි ඔව්හු ඔහුගෙන්
ඇසුවෝය. ඒ ස්ථානයේ සමූහයක් සිටි 13
බැවින් යේසුස්වහන්සේ අහක්ව ගොස්
සිටිසේක; එබැවින් සුවකරනු ලැබූ
මනුෂ්‍යයා උන්වහන්සේ කවුද කියා දැන
නොගත්තේය. ඉන්පසු යේසුස්වහන්සේ 14
දේවමාළිගාවේදී ඔහු දැක: බලාපන්න,
නුඹ සුවය ලැබුවෙහිය. නුඹට මීට වඩා
නරකක් සිදු නොවන පිණිස, තවත් පව්
නොකරන්නැයි ඔහුට කීසේක. ඒ 15
මනුෂ්‍යයා ගොස් යේසුස්වහන්සේ විසින්
තමාට සුවකළ බව යුදෙව්වරුන්ට
දැන්විය. යේසුස්වහන්සේ මේ දේ සබත් 16
දවසේදී කළ නිසා යුදෙව්වරු
උන්වහන්සේට පීඩාකළෝය. නුමුත් 17
යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
මාගේ පියාණන්වහන්සේ මේ දක්වාම
ක්‍රියාකරනසේක, මමත් ක්‍රියාකරමියි
කීසේක. එබැවින් උන්වහන්සේ සබත් 18
කඩකළා පමණක් නොව, දෙවියන්-
වහන්සේ තමන්ගේම පියාණෝයයි
කියමින්, තමන් දෙවියන්වහන්සේ හා
සමාන කරගත් නිසා, යුදෙව්වරු
උන්වහන්සේ මරන්ට වඩ වඩා
සෙවූවෝය.

## යේසුස්වහන්සේ පියාණන්වහන්සේ හා තමන් අතරේ වූ සම්බන්ධකම දැක්වීම

එබැවින් යේසුස්වහන්සේ උත්තර 19
දෙමින්:
සැබවක් සැබවක් නුඹලාට කියමි—
පියාණන්වහන්සේ යමක් කරනවා පුත්‍රයා
දක්නේද ඒ දේ මිස තනියම කිසිවක්
කරන්ට ඔහුට බැරිය. මක්නිසාද
උන්වහන්සේ යමක් කරනසේක්ද පුත්‍රයාත්
ඒ දේ එසේම කරන්නේය. කුමක් හෙයින්ද 20
පියාණන්වහන්සේ පුත්‍රයාට ප්‍රේමකරන-
සේක, තමන්වහන්සේ කරන්නාවූ සියල්ල
ඔහුට පෙන්වනසේක. නුඹලා මවිතවන
පිණිස මීට වඩා මහත් ක්‍රියාවලුත්
ඔහුට පෙන්වනසේක. මක්නිසාද 21

*දේවදූතයෙක් බැස පොකුණේ වතුර කැළඹීමක් ගැන 4 වෙනි පදයක් පුරාණ පිටපත් කීපයක පෙනේ.

පියාණන්වහන්සේ මළවුන් නැගුටුවා
ජීවත්කරන්නාක්මෙන් පුත්‍රයාත් තමන්
22 කැමතිවූවන් ජීවත්කරන්නේය. තවද
සියල්ලන් විසින් පියාණන්වහන්සේට
ගෞරව කරන්නාක් මෙන්ම පුත්‍රයාටත්
23 ගෞරවකරන පිණිස, පියාණන්වහන්සේ
කවරෙකුවත් විනිශ්චය නොකොට
සියලු විනිශ්චයම පුත්‍රයාට දී තිබේ.
පුත්‍රයාට ගෞරව නොකරන්නා ඔහු
එවූ පියාණන්වහන්සේටත් ගෞරව
24 නොකරයි. සැබවක් සැබවක් තුඹලාට
කියමි—මාගේ වචනය අසා, මා එවූ
තැනන්වහන්සේ අදහන්නාට සදාකාල
ජීවනය තිබේ, ඔහු විනිශ්චයට පත්
නොව, මරණය කෙරෙන් ජීවනයට
25 පැමිණ සිටියි. සැබවක් සැබවක්
තුඹලාට කියමි—දෙවියන්වහන්සේගේ
පුත්‍රයාගේ හඬ මළවුන්ට ඇසෙන පැය
පැමිණෙන්නේය, දැනුත් පැමිණ තිබේ;
26 අසන අය ජීවත්වන්නෝය. මක්නිසාද
පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය
ඇතුව සිටින්නාක්මෙන් පුත්‍රයාටත් තමන්
තුළම ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ
27 වරය දුන්සේක. ඔහු *මනුෂ්‍ය පුත්‍රයා
බැවින් විනිශ්චයකරන්ටද බලය දුන්සේක.
28 මේ ගැන මවිත නොවෙල්ලා. මක්නිසාද
සොහොන් ගෙවල්හි සිටින සියල්ලන්ට
ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ,
29 යහපත්කම් කළාහු ජීවනයේ නැවත-
නැගිටීමටත් නපුරුකම් කළාහු විනිශ්චයේ
නැවත-නැගිටීමටත් පිටත්ව එන්නෝය.

## යේසුස්වහන්සේ පුත්‍රයාණන් බවට දිව්‍ය සාක්ෂි දැක්වීම

30 මට තනියම කිසිවක් කරන්ට නුපුළුවන.
මම අසන පරිද්දෙන්ම විනිශ්චය
කරමි. මාගේ විනිශ්චය ධර්මිෂ්ඨය;
මක්නිසාද මාගේම කැමැත්ත නොව
මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත
31 සොයමි. මම මා ගැනම සාක්ෂිදෙම්
නම්, මාගේ සාක්ෂිය සැබෑ නොවේ.
32 මා ගැන සාක්ෂිදෙන්නේ වෙන කෙනෙක්ය;
උන්වහන්සේ විසින් මා ගැන දෙන
සාක්ෂිය සැබෑ බව දනිමි. තුඹලා 33
යොහන් ළඟට මනුෂ්‍යයන් යැවූහුය, ඔහු
සත්‍යතාව ගැන සාක්ෂිදුන්නේය. එහෙත් 34
මා ලබන සාක්ෂිය මනුෂ්‍යයන්ගෙන්
නොවේ. එසේ වුවත් තුඹලා ගැළවෙන
පිණිස මේ දේ කියමි. ඔහු ඇවිළෙන්නාවූ 35
බබළන්නාවූ පහනව සිටියේය. තුඹලාද
කාලයක් ඔහුගේ එළියෙහි ප්‍රීතිමත්වන්ට
කැමැතිව සිටියහුය. නුමුත් මට ඇත්තාවූ 36
සාක්ෂිය යොහන්ගේ සාක්ෂියට වඩා
උතුම්ය. මක්නිසාද මා විසින් ඉෂ්ටකරන
පිණිස පියාණන්වහන්සේ මට
භාරදුන්නාවූ මා කරන්නාවූ වැඩම,
පියාණන්වහන්සේ මා එවූ බවට මා
ගැන සාක්ෂිදෙයි. තවද මා එවූ 37
පියාණන්වහන්සේම මා ගැන සාක්ෂිදුන්-
සේක. තුඹලා කිසිකලක උන්වහන්සේගේ
හඬ ඇසුවේවත් උන්වහන්සේගේ
රූපාකාරය දුටුවේවත් නැත.
උන්වහන්සේගේ වචනය තුඹලා තුළ 38
පවතින්නෙත් නැත. මක්නිසාද
උන්වහන්සේ විසින් එවන ලද තැනැත්තා
තුඹලා විශ්වාස කරන්නේ නැත. ලියවිලිවල 39
සදාකාල ජීවනය ඇත්තේයයි තුඹලා
සිතන බැවින් තුඹලා ඒවා සොයන්නහුය;
ඒවා මා ගැන සාක්ෂිදෙයි; නුමුත් තුඹලා 40
ජීවනය ලබන පිණිස මා ළඟට එන්ට
කැමති නැත. මම මනුෂ්‍යයන්ගෙන් 41
ගෞරවය නොලබමි. නුමුත් තුඹලා 42
අඳුනමි, දෙවියන්වහන්සේ කෙරෙහි
ප්‍රේමය තුඹලා තුළ නැති බව දනිමි.
මම මාගේ පියාණන්වහන්සේගේ 43
නාමයෙන් ඇවිත් සිටිමි, නුමුත් තුඹලා
මා පිළිගන්නේ නැත. වෙන කෙනෙක්
තමාගේම නාමයෙන් එන්නේ නම්, තුඹලා
ඔහු පිළිගන්නවා ඇත. එකම 44
දෙවියන්වහන්සේ කෙරෙන් පැමිණෙන
ගෞරවය නොසොයා, එකිනෙකාගෙන්
ගෞරවය ලබන්නාවූ තුඹලාට
විශ්වාසකරන්ට පුළුවන් කොහොමද?
පියාණන්වහන්සේ ඉදිරියෙහි මම 45
තුඹලාට වරද තබන්නෙමියි නොසිතල්ලා.
තුඹලාට වරද තබන කෙනෙක්
ඇත, එනම් මෝසෙස්ය. තුඹලාගේ

*හෙවත්, මනුෂ්‍ය පුත්‍රයෙක්.

බලාපොරොත්තුව තබා තිබෙන්නේ ඔහු
46 කෙරෙහිය. මක්නිසාද නුඹලා මෝසෙස්
විශ්වාසකරනවා නම් මාත් විශ්වාස
කරනවා ඇත; කුමක් හෙයින්ද ඔහු මා
47 ගැන ලියුවේය. නුමුත් නුඹලා ඔහුගේ
ලියවිලි විශ්වාස නොකරනවා නම්,
මාගේ වචන විශ්වාසකරන්නේ
කොහොමදැයි කීසේක.

## පන් දහසකට කන්ට දීම

6 ඉන්පසු යේසුස්වහන්සේ ගලීලයේ
මුහුද වන තිබේරියස් මුහුදෙන්
2 එගොඩට ගියසේක. මහත් සමූහයක්
උන්වහන්සේ අනුව ගියෝය, මක්නිසාද
රෝගීන් කෙරෙහි උන්වහන්සේ විසින්
දක්වූ ලකුණු ඔව්හු දුටුවෝය.
3 යේසුස්වහන්සේ කන්දට නැගී තමන්
ගෝලයන් සමග එහි වැඩහුන්සේක.
4 යුදෙව්වරුන්ගේ මංගල්‍යයවූ පාස්කුව ළංව
5 තිබුණේය. යේසුස්වහන්සේ ඇස් ඔසවා
තමන් ළඟට මහත් සමූහයක් එන බව
දැක: මොවුන්ට කන්ට දෙන්ට අපි
කොතැනින් රොටි මිලේට ගනිමුදැයි
6 පිලිප්ගෙන් ඇසූසේක. තමන් කරන්ට
යන්නේ කිමෙක්ද කියා තමන්ම දැනගෙන,
ඔහු සෝදිසිකරන පිණිස මෙසේ
7 කීසේක. පිලිප් උන්වහන්සේට
උත්තරදෙමින්: එකිනෙකාට ටික ටිකවත්
ලැබෙන පිණිස මසු දෙසියයක රොටිත්
8 ඔවුන්ට මදියයි කීවේය. උන්වහන්සේගේ
ගෝලයන්ගෙන් එක්කෙනෙක්වූ සීමොන්
පේත්‍රෘස්ගේ සහෝදරවූ අන්ද්‍රෑ
9 උන්වහන්සේට කථාකොට: යව රොටි
පහක්ද කුඩා මසුන් දෙදෙනෙක්ද ඇති
ළමයෙක් මෙහි සිටියි. නුමුත්
මෙපමණ දෙනෙකුට ඒවා මොකක්දැයි
10 කීවේය. මනුෂ්‍යයන් හිඳුවාපල්ලායයි
යේසුස්වහන්සේ කීසේක. එතැන්හි
බොහෝ තණකොළ තිබුණේය. මෙසේ
ගණන් වශයෙන් පන්දහසක් පමණ
11 පුරුෂයෝ හිඳගත්තෝය. එවිට
යේසුස්වහන්සේ රොටි ගෙන, ස්තුතිකොට,
ඉඳගෙන උන්නවුන්ට බෙදදුන්සේක;
එසේම මසුන්ගෙන්ද ඔවුන්ට කැමති
12 පමණ දුන්සේක. ඔවුන් තෘප්තියට
පැමිණි කල: කිසිවක් නැති නොවන
පිණිස ඉතිරිවූ කැබෙලි එකතු
කරපල්ලායයි උන්වහන්සේ තමන්
ගෝලයන්ට කීසේක. මෙසේ මනුෂ්‍යයන් 13
කාලා යව රොටි පහෙන් ඉතිරිවූ
කැබෙලි එකතුකොට පැස් දොළොසක්
පුරවාගත්තෝය. එබැවින් ඒ මනුෂ්‍යයෝ 14
උන්වහන්සේ විසින් කළාවූ මේ හාස්කම
දැක: සැබෑවටම මුන්වහන්සේ ලෝකයට
එන්නාවූ අනාගතවක්තෘමයයි කීවෝය.

## විවේකව සිටීමට යාම. මුහුද පිට පයින් ගමන

එබැවින් රජකමට පත්කරගන්නා 15
පිණිස තමන්වහන්සේ බලාත්කාරයෙන්
අල්ලාගන්ට ඔවුන් එන බව යේසුස්-
වහන්සේ දැන, නැවත තනියම කන්දට
ගියසේක.
සවස්වූ කල උන්වහන්සේගේ ගෝලයෝ 16
මුහුද ළඟට ගියෝය; ඔව්හු ඔරුවකට 17
නැගී මුහුදෙන් එගොඩව කපර්ණවුමට
යන පිණිස ගියෝය. එවිට අන්ධකාරවී
තිබුණේය, ඒතාක්ම යේසුස්වහන්සේ
ඔවුන් ළඟට ඇවිත් සිටියේ නැත. තද 18
හුළඟක් ගැසූ බැවින් මුහුද කැලඹී කැලඹී
තිබුණේය. ඔව්හු ගවුවක් පමණ 19
පැදගෙන ගිය කල, යේසුස්වහන්සේ
ඔරුව ළඟට මුහුද පිට පයින් එනවා
දැක භයවූවෝය. මමය, භය නොවෙල්ලායයි 20
උන්වහන්සේ කීසේක. එබැවින් ඔව්හු 21
උන්වහන්සේ ඔරුවට ගන්ට කැමති-
වූවෝය. ඔරුව ඔවුන් යන්ට සිටි තැනට
එකෙණෙහිම පැමුණුණේය.

## මිනිසුන් ලකුණක් සෙවීම

පසුවද මුහුද එගොඩ සිටි සමූහයා 22
එහි එකම ඔරුවක් මිස වෙන එකක්
නොතිබුණු බවද යේසුස්වහන්සේ තමන්
ගෝලයන් සමග එහි නොනැගුණු බවද
උන්වහන්සේගේ ගෝලයන් පමණක් ගිය
බවද දුටුවෝය. (එසේ වුවත් ස්වාමීන්- 23
වහන්සේ ස්තුතිකළායින් පසු ඔවුන් රොටි
කෑවාවූ ස්ථානය සමීපයට තිබේරියස්හි
සිට ඔරු වගයක් ආවෝය.) එහෙයින් 24

සමූහයෝ යේසුස්වහන්සේවත් උන්-
වහන්සේගේ ගෝලයන්වත් එහි නැති
බව දැනගත් කල, තුමූත් ඔරුවලට නැගී
යේසුස්වහන්සේ සොයමින් කපර්ණවුමට
25 ආවෝය. ඔව්හු මුහුදෙන් එගොඩදී
උන්වහන්සේ දැක: රබ්බි, ඔබ කොයි
වේලේ මෙතැනට ආසේක්දැයි ඇසුවෝය.

## ජීවනයේ කෑම

26 යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක්
සැබවක් තුඹලාට කියමි–තුඹලා මා
සොයන්නේ ලකුණු දුටු නිසා නොව
රොටි කා තෘප්තියට පැමිණි නිසාය.
27 නැතිවී යන කෑම පිණිස නොව සදකාල
ජීවනයට පවතින්නාවූ කෑම පිණිස
වැඩකරපල්ලා, එය මනුෂ්‍ය පුත්‍රයා
තුඹලාට දෙනසේක. මක්නිසාද
පියාණන්වහන්සේ, එනම්, දෙවියන්-
වහන්සේ විසින් ඔහු මුද්‍රාකොට තිබේයයි
28 කීසේක. එබැවින් ඔව්හු කථාකොට:
දෙවියන්වහන්සේගේ වැඩ ඉෂ්ටකරන
පිණිස අප විසින් කුමක්කටයුතුදැයි
29 උන්වහන්සේගෙන් ඇසුවෝය. යේසුස්-
වහන්සේ උත්තරදෙමින්: දෙවියන්-
වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ
විසින් එවූ තැනැත්තා කෙරෙහි තුඹලා
30 විසින් අදහාගැන්මයයි කීසේක. එබැවින්
ඔව්හු: එසේවී නම් අප විසින් දැක ඔබ
විශ්වාසකරන පිණිස ලකුණක් වශයෙන්
ඔබ කුමක් කරනසේක්ද? ඔබ මොන
31 වැඩක් කරනසේක්ද? ඔවුන්ට කන පිණිස
ස්වර්ගයෙන් කෑම දුන්නේයයි ලියා
තිබෙන ලෙස අපේ පියවරු වනයේදී
මන්නා කෑවෝයයි උන්වහන්සේට
32 කීවෝය. එහෙයින් යේසුස්වහන්සේ
ඔවුන්ට කියනසේක්: සැබවක් සැබවක්
තුඹලාට කියමි–ස්වර්ගයෙන්වූ කෑම
තුඹලාට දුන්නේ මෝසෙස් නොවේ;
තුමූත් ස්වර්ගයෙන් පැමිණෙන සැබෑවූ
කෑම මාගේ පියාණන්වහන්සේ තුඹලාට
33 දෙනසේක. මක්නිසාද දෙවියන්වහන්සේ
දෙන කෑම නම් ස්වර්ගයෙන් බැස
ලෝකයාට ජීවනය දෙන කෑමයයි
34 කීසේක. එබැවින් ඔව්හු: ස්වාමිනි, ඒ
කෑම නිතරම අපට දුන මැනවයි

කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට 35
කියනසේක්: ජීවනදායක කෑම නම් මමය.
මා ළඟට එන්නාට බඩගිනි නොවන්නේය,
මා කෙරෙහි අදහන්නාට කිසිකලකත්
පිපාසා නොවන්නේය. තුමූත් තුඹලා 36
මා දැකත් අදහන්නේ නැතැයි මම
තුඹලාට කීමි. පියාණන්වහන්සේ මට 37
දෙන සියල්ලෝම මා වෙතට එන්නෝය;
මා ළඟට එන තැනැත්තා මා විසින්
කිසිසේත් අහක දමන්නේ නැත.
මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ 38
මාගේ කැමැත්ත නොව මා එවූ
තැනන්වහන්සේගේ කැමැත්ත කරන
පිණිසය. මා එවූ තැනන්වහන්සේගේ 39
කැමැත්ත නම් උන්වහන්සේ මට දුන්
සියල්ලෙන් කිසිවක් නැතිවෙන්ට නැර
මා විසින් අන්තිම දවසේදී එය
නැගුටුවීමය. මක්නිසාද මාගේ 40
පියාණන්වහන්සේගේ කැමැත්ත නම්,
පුත්‍රයාණන් බලා, ඔහු කෙරෙහි
අදහන්නාවූ සෑමදෙනම සදකාල ජීවනය
ලැබීමය; මමද අන්තිම දවසේදී ඔහු
නැගුටුවන්නෙමියි කීසේක.
එබැවින්: ස්වර්ගයෙන් බැස්සාවූ කෑම 41
මමයයි උන්වහන්සේ කී නිසා යුදෙව්වරු
උන්වහන්සේ ගැන කොඳුරමින්–මොහු 42
යෝසෙප්ගේ පුත්‍රවූ යේසුස් නොවේද?
අපි මොහුගේ මවුපියන් අඳුනමුව; මම
ස්වර්ගයෙන් බැස්සෙමියි මොහු දැන්
කියන්නේ කොහොමදැයි කීවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: 43
තුඹලා අතරෙහි නොකොඳුරල්ලා. මා 44
එවූ පියාණන්වහන්සේ විසින් අදිනු ලැබූ
කෙනෙකුට මිස වෙන කිසිවෙකුට මා
ළඟට එන්ට බැරිය. මම අන්තිම
දවසේදී ඔහු නැගුටුවන්නෙමි. සියල්ලෝම 45
දෙවියන්වහන්සේ විසින් උගන්වනු
ලබන්නෝයයි අනාගතවක්තෘවරුන්ගේ
ලියවිලිවල ලියා තිබේ. පියාණන්-
වහන්සේගෙන් අසා ඉගෙනගත්
සියල්ලෝම මා ළඟට එති. එසේවී තුමූත් 46
දෙවියන්වහන්සේ වෙතින් ආ තැනැත්තා
මිස අන් කිසිවෙක් පියාණන්වහන්සේ
තුදුටුවේය, ඔහු වනාහි පියාණන්වහන්සේ
දුටුවේය. සැබවක් සැබවක් තුඹලාට 47

කියමි–අදහන්නාට සදකාල ජීවනය
48 ඇත්තේය. ජීවනදායක කෑම මමය.
49 නුඹලාගේ පියවරු වනයේදී මන්නා
50 කෑවෝය, නුමුත් ඔව්හු මළෝය. මේ
කෑම නම්, එයින් කන කවුරු නුමුත්
නොමැරෙනු පිණිස ස්වර්ගයෙන් බැස
51 එන්නාවූ කෑමය. ස්වර්ගයෙන් බැස
ආවාවූ ජීවනදායක කෑම මමය. යමෙක්
මේ කෑමෙන් කෑවොත් ඔහු සදකල්
ජීවත්වන්නේය. එසේය, ලෝකයාගේ
ජීවනය පිණිස මා විසින් දෙන්නාවූ
කෑම නම් මාගේ මාංසයයයි කීසේක.
52 එබැවින් යුදෙව්වරු ඔවුනොවුන් අතරේ
වාදකරමින්: කන පිණිස තමාගේ
මාංසය අපට දෙන්ට මොහුට පුළුවන්
53 කොහොමදැයි කීවෝය. ඒ නිසා
යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්:
සැබවක් සැබවක් නුඹලාට කියමි–නුඹලා
මනුෂ්‍ය පුත්‍රයාගේ මාංස නොකනවා
නම්, ඔහුගේ ලේ නොබොනවා නම්,
54 නුඹලා තුළම ජීවනය නැත. මාගේ
මාංසය කන්නාවූ මාගේ ලේ බොන්නාවූ
අයට සදකාල ජීවනය ඇත; මම අන්තිම
55 දවසේදී ඔහු නැගුටුවන්නෙමි. මක්නිසාද
මාගේ මාංසය සැබෑවූ කෑමය, මාගේ
56 ලේ සැබෑවූ බීමය. මාගේ මාංසය
කන්නාවූ මාගේ ලේ බොන්නාවූ
තැනැත්තේ මා තුළෙහි පවතියි, මමද ඔහු
57 තුළෙහි පවතිමි. ජීවමාන පියාණන්වහන්සේ
මා එවූවාක්මෙන්ද මා පියාණන්වහන්සේ
නිසා ජීවත්වන්නාක්මෙන්ද මා කන
තැනැත්තේ මා නිසා ජීවත්වන්නේය.
58 ස්වර්ගයෙන් බැස ආවාවූ කෑම මේය.
පියවරුන් කාලා මැරුණාක්මෙන් නොව,
මේ කෑම කන තැනැත්තේ සදකල්
59 ජීවත්වන්නේයයි කීසේක. උන්වහන්සේ
කපර්ණවූමේ උගන්වමින් සිටිසේක්, මේ
කාරණා සිනගෝගයේදී කීසේක.

## ගෝලයන්ගේ පසුබටවීම

60 එබැවින් උන්වහන්සේගේ ගෝලයන්ගෙන්
බොහෝ දෙනෙක් ඒ අසා: මේක තද
කීමක්ය; ඒක අසන්ට පුළුවන් කාටදැයි
61 කීවෝය. ගෝලයන් ඒ ගැන කොඳුරන
බව යේසුස්වහන්සේ තමන් තුළ දැන,
ඔවුන්ට කියනසේක්: මේක නුඹලාට 62
බාධාවක්ද? එසේ නම් මනුෂ්‍ය පුත්‍රයා
පෙර සිටිය තැනට නගිනවා නුඹලා
දුටුවොත් කිමෙක්ද? ජීවත්කරන්නේ 63
ආත්මයය; මාංසයෙන් කිසි ප්‍රයෝජනයක්
නැත. මා නුඹලාට කී වචන ආත්මයද
ජීවනයද වෙයි. නුමුත් විශ්වාස නොකරන 64
සමහරෙක් නුඹලා අතරෙහි සිටිතියි
කීසේක. මක්නිසාද විශ්වාස
නොකරන්නෝ කවුරුද කියාත්
තමන්වහන්සේ පාවාදෙන්ට සිටියේ
කවුද කියාත් යේසුස්වහන්සේ මුල
පටන් දැනගෙන සිටිසේක. එහෙයින් 65
උන්වහන්සේ කියනසේක්: මාගේ
පියාණන්වහන්සේගෙන් බලය ලැබූ
කෙනෙකුට මිස අන් කිසිවෙකුට මා
වෙතට එන්ට බැරි බව නුඹලාට
කීවෙමියි කීසේක.
මේ නිසා එවක් පටන් උන්වහන්සේගේ 66
ගෝලයන්ගෙන් බොහෝ දෙනෙක්
පසුබටවී, උන්වහන්සේ සමග තවත්
නොහැසුරුණෝය.

## යේසුස්වහන්සේ ක්‍රිස්තුස්ය කියා පේත්‍රුස් කියාසිටීම

නුඹලාත් අහක්ව යන්ට කැමතිදැයි 67
යේසුස්වහන්සේ දෙළොසගෙන් ඇසූ-
සේක. සීමොන් පේත්‍රුස් උන්වහන්සේට 68
උත්තරදෙමින්: ස්වාමිනි, අපි කා ළඟට
යමුද? සදකාල ජීවනයේ වචන
ඔබවහන්සේට ඇත්තේය. අපිද ඔබ 69
දෙවියන්වහන්සේගේ ශුද්ධ තැනන්-
වහන්සේ බව විශ්වාසකරගෙන දැනගෙන
සිටිමුයයි කීවේය. යේසුස්වහන්සේ 70
ඔවුන්ට උත්තරදෙමින්: මා විසින් නුඹලා
දෙළොස්දෙනා තෝරාගත්තා නොවේද?
නුමුත් නුඹලාගෙන් එක්කෙනෙක්
යක්ෂයෙක්යයි කීසේක. මෙසේ කීවේ 71
සීමොන් ඉස්කාරියෝත්ගේ පුත්‍රවූ යූදස්
ගැනය, මක්නිසාද දෙළොස්දෙනාගෙන්
එක්කෙනෙක්වූ ඔහු උන්වහන්සේ
පාවාදෙන්ට සිටියේය.

## යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සහෝදරයෝ

7 ඉන්පසු යේසුස්වහන්සේ ගලීලයෙහි
සංචාරණයකළසේක. මක්නිසාද
යුදෙව්වරු උන්වහන්සේ මරන්ට සෙවූ
බැවින් උන්වහන්සේ යුදයෙහි
සංචාරණයකරන්ට නොකැමැතිවූසේක.
2 එකල යුදෙව්වරුන්ගේ කුඩාරම්
3 මංගල්‍යය ළංව තිබුණේය. ඒ
නිසා උන්වහන්සේගේ සහෝදරයෝ
කථාකොට: තුඹ කරන ක්‍රියා තුඹේ
ගෝලයන් විසින්ද දකින පිණිස මෙයින්
4 පිටත්ව යුදයට පලයන්න. මක්නිසාද
ප්‍රසිද්ධවෙන්ට කැමති කිසිවෙක් කිසිදෙයක්
රහසින් කරන්නේ නැත. තුඹ මේ දේ
කරනවා නම් තුඹ ලෝකයාට
5 ප්‍රකාශවෙයන්නැයි කීවෝය. මක්නිසාද
උන්වහන්සේගේ සහෝදරයන් පවා
උන්වහන්සේ කෙරෙහි අදහාගත්තේ නැත.
6 එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට කියන-
සේක්: මාගේ කාලය තවම පැමුණුණේ
නැත; තුඹලාගේ කාලය නිතර සූදනම්ව
7 තිබේ. තුඹලාට වෛරකරන්ට
ලෝකයාට බැරිය; නුමුත් ඔවුන්ගේ ක්‍රියා
නපුරු බවට මා විසින් සාක්ෂිදෙන
8 බැවින් ඔව්හු මට වෛරකරති. තුඹලා
මංගල්‍යයට පලයල්ලා. මාගේ කාලය
තවම සම්පූර්ණ නුවූ හෙයින් මේ
මංගල්‍යයට දැන්ම නොයමියි කීසේක.
9 උන්වහන්සේ මෙසේ ඔවුන්ට කියා,
ගලීලයේ නැවතී සිටිසේක.
10 නුමුත් තමන් සහෝදරයන් මංගල්‍යයට
ගියායින් පසු උන්වහන්සේද ප්‍රසිද්ධයෙන්
නොව රහසින් මෙන් මංගල්‍යයට
11 ගියසේක. එකල යුදෙව්වරු මංගල්‍යයේදී
උන්වහන්සේ සොයමින්: ඔහු
12 කොතැන්හිදැයි ඇසුවෝය. සමූහයන්
අතරේ උන්වහන්සේ ගැන මහත්
කෙඳිරීමක් විය. සමහරෙක්: ඔහු
සත්පුරුෂයෙකැයි කීවෝය; සමහරෙක්:
එසේ නොවේ, ඔහු සමූහයා
13 මුළාකරන්නේයයි කීවෝය. එසේ වුවත්
යුදෙව්වරුන්ට හය නිසා කිසිවෙක්
උන්වහන්සේ ගැන ප්‍රසිද්ධයෙන්
කථාකළේ නැත.

## තමන් දෙවියන්වහන්සේ කෙරෙන් ආ බව යේසුස්වහන්සේ යෙරුසලමේදී කියාදීම

නුමුත් මංගල්‍යය මැදදී යේසුස්වහන්සේ 14
දේවමාළිගාවට ගොස් ඉගැන්වූසේක.
එබැවින් යුදෙව්වරු මවිතව: කිසිකලක 15
ඉගෙන නොගත්තාවූ මොහු ලියවිලි
දන්නේ කොහොමදැයි කීවෝය. එහෙයින් 16
යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
මාගේ ඉගැන්වීම මාගේ නොව මා
එවූ තැනන්වහන්සේගේය. යමෙක් 17
උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති
නම්, ඔහු ඒ ඉගැන්වීම දෙවියන්-
වහන්සේගෙන් වූ ඉගැන්වීමක්ද
නොහොත් මා විසින් උපදවා
කියනවාදැයි දැනගන්නේය. තමාම 18
උපදවන දේ කියන්නා තමාගේම
ගෞරවය සොයයි. නුමුත් තමා
එවූ තැනන්වහන්සේගේ ගෞරවය
සොයන්නා සැබෑවූ කෙනෙක්ය, ඔහු
තුළ අධර්මිෂ්ඨකමක් නැත. මෝසෙස් 19
තුඹලාට ව්‍යවස්ථාව දුන්නා නොවේද?
එහෙත් තුඹලාගෙන් කිසිවෙක් ව්‍යවස්ථාව
නොපවත්වයි. මා මරන්ට සොයන්නේ
මක්නිසාදැයි කීසේක. සමූහයා 20
උත්තරදෙමින්: තුඹට යක්ෂයෙක්
ආවේශව සිටී. තුඹ මරන්ට සොයන්නේ
කවුදැයි කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට 21
උත්තරදෙමින්: එක් ක්‍රියාවක් කෙළෙමි,
ඊට තුඹලා සියල්ලෝම මවිතව සිටිති.
මෝසෙස් චර්මඡේදනය තුඹලාට දී 22
තිබේ; (නුමුත් ඒක මෝසෙස්ගෙන්
නොව පියවරුන්ගෙන්ය.) තුඹලා සබත්
දවසේදී මනුෂ්‍යයෙකු චර්මඡේදනයකරති.
මෝසෙස්ගේ ව්‍යවස්ථාව කඩ නොවන 23
පිණිස මනුෂ්‍යයෙක් සබත් දවසේදී
චර්මඡේදනය ලබන්නේ නම්, සබත්
දවසේදී මනුෂ්‍යයෙකු සම්පූර්ණයෙන් සුව
කළාට තුඹලා මා කෙරේ කෝපවවුද?
පෙනීමේ හැටියට විනිශ්චය නොකරල්ලා, 24
ධාර්මික විනිශ්චයෙන් විනිශ්චය
කරපල්ලායයි කීසේක.
එබැවින් යෙරුසලම් වාසීන්ගෙන් 25
සමහරු කියන්නෝ: ඔවුන් මරන්ට
සොයන්නේ මොහු නොවේද? එහෙත් 26

ඔහු ප්‍රසිද්ධයෙන් කථාකරයි, ඔව්හු කිසි
දෙයක් ඔහුට නොකියති. මොහු
ක්‍රිස්තුස්වහන්සේ බව මූලාදෑනීහු
27 සැබෑවටම දැනගෙන සිටිනවාදෝ? එසේ
වුවත් මොහු ආවේ කොතැනින්දැයි අපි
දනිමුව. නුමුත් ක්‍රිස්තුස්වහන්සේ එන කල
උන්වහන්සේ කොතැනින්දැයි කිසිවෙක්
28 දන්නේ නැතැයි කීවෝය. ඒ නිසා
යේසුස්වහන්සේ දේවමාළිගාවෙහි
උගන්වමින් ශබ්දනගා: තුඹලා මා කවුද
කියාත් මම කොතැනින් ආවෙම්ද කියාත්
දන්නහුය; මම මාගේ කැමැත්තෙන්
නායෙම්, නුමුත් මා එවූ තැනන්වහන්සේ
සැබෑ කෙනෙක්ය; තුඹලා උන්වහන්සේ
29 අඳුනන්නේ නැත. මම උන්වහන්සේ
අඳුනමි; කුමක්හෙයින්ද මම
උන්වහන්සේ කෙරෙන් ආයෙමි,
උන්වහන්සේද මා එවූසේකැයි කීසේක.
30 එබැවින් ඔව්හු උන්වහන්සේ අල්ලන්ට
හැදුවෝය. නුමුත් උන්වහන්සේගේ වේලාව
ඒතාක් පැමුණුණේ නැති බැවින් කිසිවෙක්
උන්වහන්සේ පිට අත් නොතැබුවෝය.
31 නුමුත් සමූහයාගෙන් බොහෝ දෙනෙක්
උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය.
තවද ඔව්හු: ක්‍රිස්තුස්වහන්සේ ආ කල
මූන්වහන්සේ කළ ලකුණුවලට වඩා
උන්වහන්සේ කරනසේක්දැයි කීවෝය.
32 සමූහයා උන්වහන්සේ ගැන මේ දේවල්
කියමින් කොඳුරනවා ඵරිසිවරුන්ට
ඇසී, නායක පූජකයෝද ඵරිසිවරුද
උන්වහන්සේ අල්ලන්ට සේවකයන්
33 යැවුවෝය. එබැවින් යේසුස්වහන්සේ
කියනසේක්: තව ටික කලක් මම තුඹලා
සමග සිටිමි, ඉන්පසු මා එවූ
34 තැනන්වහන්සේ ළඟට යමි. තුඹලා මා
සොයනවා ඇත, නුමුත් තුඹලාට මා
සම්බවෙන්නේ නැත. මා සිටින තැනට
එන්ට තුඹලාට නුපුළුවනැයි කීසේක.
35 එබැවින් යුදෙව්වරු ඔවුනොවුන් අතරේ
කථාකරමින්: මොහු අපට සම්බ
නොවෙන්ට කොතැනට යන්නේද?
ග්‍රීකයන් අතරෙහි විසිර සිටින්නන් වෙතට
ගොස් ග්‍රීකයන්ට උගන්වනවා ඇද්ද?
36 තුඹලා මා සොයනවා ඇත, නුමුත්
තුඹලාට මා සම්බවෙන්නේ නැත; මා
සිටින තැනට එන්ට තුඹලාට නුපුළුවන
කියා ඔහු කී වචනය කිමෙක්දැයි කීවෝය.

## ජීවමාන වතුර

මංගල්‍යයේ මහත් දවසවූ අන්තිම 37
දවසේ යේසුස්වහන්සේ නැගිට සිට ශබ්ද
පවත්වමින්: යමෙකුට පිපාසා ඇත්නම්
ඔහු මා ළඟට ඇවිත් බීවාවේ. මා 38
කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි
කියා තිබෙන හැටියට ජීවනදායක වතුර
ඇති ගංගා ගලන්නේයයි කීසේක.
උන්වහන්සේ මෙසේ කීවේ තමන් 39
අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය
ආත්මයාණන් ගැනය. මක්නිසාද
යේසුස්වහන්සේ ඒතාක්ම මහිමයට
නොපැමිණි බැවින් ඒතාක්ම
ආත්මයාණන් නොදෙනලද්දේය. එබැවින් 40
සමූහයාගෙන් සමහරෙක් මේ වචන
අසා: සැබෑවටම මූන්වහන්සේ
අනාගතවක්තෘමයයි කීවෝය. අන් 41
සමහරෙක්: මූන්වහන්සේ ක්‍රිස්තුස්-
වහන්සේයයි කීවෝය. එහෙත්
සමහරෙක්: කිමෙක්ද, ක්‍රිස්තුස්වහන්සේ
ගලීලයෙන් එනසේක්ද? ක්‍රිස්තුස්වහන්සේ 42
දාවිත්ගේ වංශයෙන්ද දාවිත් විසූ ගම
වන බෙත්ලෙහෙමෙන්ද එනසේකැයි
ශුද්ධලියවිල්ලෙහි කියා තිබෙනවා
නොවේදැයි කීවෝය. මෙසේ උන්වහන්සේ 43
නිසා සමූහයා අතරෙහි භේදයක්
හටගත්තේය. ඔවුන්ගෙන් සමහරෙක් 44
උන්වහන්සේ අල්ලන්ට කැමතිවූවෝය;
නුමුත් කිසිවෙක් උන්වහන්සේ පිට අත්
තැබුවේ නැත.

ඉක්බිති සේවකයෝ නායක පූජකයන් 45
සහ ඵරිසිවරුන් ළඟට ආවෝය. තුඹලා
ඔහු නොගෙනාවේ මක්නිසාදැයි ඔව්හු
ඔවුන්ගෙන් ඇසුවෝය. සේවකයෝ 46
උත්තරදෙමින්: මනුෂ්‍යයෙක් කිසිකලක
මෙසේ කථාකළේ නැතැයි කීවෝය.
එබැවින් ඵරිසිවරු ඔවුන්ට 47
උත්තරදෙමින්: තුඹලාත් මුළාවෙලාද?
මූලාදෑනීන්ගෙන්වත් ඵරිසිවරුන්ගෙන්වත් 48
යමෙක් ඔහු කෙරෙහි අදහා ගත්තේද?
නුමුත් ව්‍යවස්ථාව නොදන්නාවූ මේ 49
සමූහයා ශාපලද්දෝයයි කීවෝය.

50 ඔවුන්ගෙන් එක්කෙනෙක්වූ (ඊට ප්‍රථම
උන්වහන්සේ ළඟට ගියාවූ) නිකොදේමුස්
51 ඔවුන්ට කථාකොට: යම් මනුෂ්‍යයෙකුගෙන්
පළමුකොට නොඅසා, ඔහු කරන්නේ
කිමෙක්දැයි ඔහුගෙන්ම නොදැන, අපගේ
ව්‍යවස්ථාව ඔහු විනිශ්චයකෙරේදැයි
52 ඔවුන්ට කීවේය. ඔව්හු උත්තරදෙමින්:
තුඹත් ගලීලයෙන්ද? ගලීලයෙන්
අනාගතවක්තෘ කෙනෙක් නොනැගිටින
බව සොයා බලාපන්නැයි ඔහුට කීවෝය.

## අනාචාර ස්ත්‍රියක් යේසුස්වහන්සේ වෙතට ගෙනෙනු ලැබීම

53 8 *[එවිට සියල්ලෝම තම තමුන්ගේ
ගෙවලට ගියෝය. යේසුස්වහන්සේ
2 ඔලීව කන්දට ගියසේක. උන්වහන්සේ
අලුයම දේවමාළිගාවට නැවත ආසේක,
මුළු සෙනඟ උන්වහන්සේ ළඟට
පැමිණියෝය; උන්වහන්සේ වැඩහිඳ
3 ඔවුන්ට ඉගැන්වූසේක. එවිට කාම-
මිථ්‍යාචාරය කරද්දී අසුවූ ස්ත්‍රියෙක්
ලියන්නන් හා ඵරිසිවරුන් විසින්
4 ගෙනැවිත් මැද සිටුවා, උන්වහන්සේට
කථාකොට: ආචාරීනි, මේ ස්ත්‍රී කාම-
මිථ්‍යාචාරය කරද්දීම අල්ලනලද්දීය.
5 මෙබඳු අය ගල්ගසා මරන්ට මෝසෙස්
විසින් ව්‍යවස්ථාවෙහි අපට අණකර
තිබේ. තුමුත් ඔබ මෑ ගැන කියන්නේ
කුමක්දැයි ඔව්හු උන්වහන්සේගෙන්
6 ඇසුවෝය. ඔවුන් මෙසේ ඇසුවේ
උන්වහන්සේ පරීක්ෂාකරමින් උන්-
වහන්සේට වරද තබන්ට කාරණයක්
ලබන පිණිසය. තුමුත් යේසුස්වහන්සේ
7 නැමී ඇඟිල්ලෙන් බිම ලිව්වසේක. ඔවුන්
උන්වහන්සේගෙන් අස අසා සිටියදී
උන්වහන්සේ කෙලින්වී ඔවුන්ට
කථාකොට: තුඹලා අතරෙන් පව්
නැත්තා ඈට පළමුකොට ගලක් ගසාවයි
8 කියා, නැවතත් නැමී ඇඟිල්ලෙන් බිම
9 ලිව්වසේක. ඔව්හු ඒ අසා වැඩිමහල්ලා
පටන් බාලයා දක්වා එකිනෙකා පිටතට
ගියෝය. යේසුස්වහන්සේ පමණක් එහි
සිටිසේක, ස්ත්‍රීද සිටි තැනම මැද සිටියාය.
යේසුස්වහන්සේ කෙලින් වී, ස්ත්‍රියට 10
කථාකොට: ඔව්හු කොහේද? කිසිවෙක්
තුඹ වරදට පත්කළේ නැද්දැයි ඇසූසේක.
ස්වාමිනි, නැතැයි ඈ කීවාය. එවිට 11
යේසුස්වහන්සේ: මමත් තුඹ වරදට පත්
නොකරමි. පලයන්න, මෙතැන් පටන්
තවත් පව් නොකරන්නැයි ඈට කීසේක.]

## ලෝකයේ ආලෝකය

එබැවින් යේසුස්වහන්සේ නැවත 12
ඔවුන්ට කථාකරමින්: මම ලෝකයේ
ආලෝකයය. මා අනුව එන්නා
අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ
ආලෝකය ලබන්නේයයි කීසේක.
එබැවින් ඵරිසිවරු: තුඹ තුඹ ගැනම 13
සාක්ෂිදෙන්නෙහිය; තුඹේ සාක්ෂිය සැබෑ
නැතැයි උන්වහන්සේට කීවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: 14
මා ගැනම මා සාක්ෂිදෙතත් මාගේ
සාක්ෂිය සැබෑය; මක්නිසාද මම
කොතැනින් ආයෙම්ද කොතැනට යම්දැයි
දනිමි; එහෙත් මා එන්නේ කොතැනින්ද
යන්නේ කොතැනටදැයි තුඹලා දන්නේ
නැත. තුඹලා මාංසාකාරයෙන් 15
විනිශ්චයකරහුය; මම කිසිවෙකු විනිශ්චය
නොකරමි. තුමුත් මම විනිශ්චයකරම් 16
නම් මා තනියම නොව මා සහ මා
එවූ පියාණන්වහන්සෙත් සිටින බැවින්
මාගේ විනිශ්චය සැබෑය. එසේය, 17
මනුෂ්‍යයන් දෙදෙනෙකුගේ සාක්ෂිය
සැබෑයයි තුඹලාගේ ව්‍යවස්ථාවෙහි ලියා
තිබේ. මා ගැන සාක්ෂිදෙන්නේ මමය, 18
මා එවූ පියාණන්වහන්සේද මා ගැන
සාක්ෂිදෙනසේකැයි කීසේක. එබැවින් 19
ඔව්හු: තුඹේ පියාණන් කොතැන්හිදැයි
උන්වහන්සේගෙන් ඇසුවෝය. යේසුස්-
වහන්සේ උත්තරදෙමින්: තුඹලා මාවත්
මාගේ පියාණන්වහන්සේවත් අඳුනන්නේ
නැත. තුඹලා මා ඇඳින්නහු නම් මාගේ
පියාණන්වහන්සෙත් අඳුනනවා ඇතැයි
කීසේක. උන්වහන්සේ දේවමාළිගාවේ 20
උගන්වමින් මුදල් ගබඩාවේදී මේ වචන

*7.53 පටන් 8.11 දක්වා කොටස නොයෙක් පුරාණ පිටපත්වල නොපෙනේ.

කීසේක. උන්වහන්සේගේ වේලාව ඒතාක්
නොපැමිණි බැවින් කිසිවෙක්
උන්වහන්සේ ඇල්ලුවේ නැත.

## පැමිණෙන්නාවූ විපත කලින් දැන්වීම

21 එබැවින් උන්වහන්සේ නැවත ඔවුන්ට
කථාකොට මම අහක්ව යමි, තුඹලා
මා සොයනවා ඇත, නුමුත් තුඹලාගේ
පාපයෙහි තුඹලා මැරෙනවා ඇත. මා
යන ස්ථානයට තුඹලාට එන්ට
22 නුපුළුවනැයි කීසේක. එබැවින් යුදෙව්වරු:
මා යන ස්ථානයට තුඹලාට එන්ට
නුපුළුවනැයි මොහු කියන්නේ තමා
නසාගන්ට යනවාදැයි කීවෝය.
23 උන්වහන්සේද: තුඹලා පහළින් වන්නහුය;
මම ඉහළින් වෙමි. තුඹලා මේ
ලෝකයෙන් වන්නහුය; මම මේ
24 ලෝකයෙන් නොවෙමි. එහෙයින්,
තුඹලාගේ පාපවල තුඹලා මැරෙනවා
ඇතැයි තුඹලාට කීයෙමි. මක්නිසාද ඒ
මමයයි තුඹලා විශ්වාසකළොත් මිස
නැත්නම් තුඹලාගේ පාපවල තුඹලා
25 මැරෙන්නහුයයි කීසේක. එබැවින්
ඔව්හු උන්වහන්සේට කථාකොට: තුඹ
කවුදැයි උන්වහන්සේගෙන් ඇසුවෝය.
යේසුස්වහන්සේ: මුල පටන් මා විසින්
26 තුඹලාට කථාකළ එකමය. තුඹලා
ගැන කථාකරන්ටත් විනිශ්වයකරන්ටත්
බොහෝ කාරණා මට ඇත්තේය. එසේ
වුවත් මා එවූ තැනන්වහන්සේ සත්‍යවාදී
කෙනෙක්ය; උන්වහන්සේගෙන් ඇසූ දේම
මම ලෝකයාට කියමියි කීසේක.
27 උන්වහන්සේ පියාණන්වහන්සේ ගැන
ඔවුන්ට කථාකළ බව ඔවුන්ට තේරුණේ
28 නැත. එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට
කියනසේක්: තුඹලා මනුෂ්‍ය පුත්‍රයා
එසවූ කල, මා ඔහුම බවත් මාගේම
කැමැත්තෙන් මා කිසිවක් නොකර
මාගේ පියාණන්වහන්සේ මට ඉගැන්වූ
ලෙස මේ දේවල් කියන බවත්
29 තුඹලා දැනගන්නවා ඇත. මා එවූ
තැනන්වහන්සේ මා සමග සිටිනසේක;
උන්වහන්සේ මා තනියම සිටින්ට
නැරියසේක; මක්නිසාද උන්වහන්සේට
ප්‍රසන්නවූ දේවල් මම නිතරම කරමියි
කීසේක. උන්වහන්සේ මේ කාරණා 30
කියද්දී බොහෝ දෙනෙක් උන්වහන්සේ
කෙරෙහි අදහාගත්තෝය.

## යුදෙව්වන් සමග විවාදය

එබැවින් යේසුස්වහන්සේ තමන්ව 31
අදහාගත් යුදෙව්වරුන්ට කියනසේක්:
තුඹලා මාගේ වචනයෙහි පවතිනවා
නම්, සැබෑවට තුඹලා මාගේ ගෝලයෝය;
තුඹලා සැබෑව දැනගන්නවා ඇත, සැබෑවද 32
තුඹලා නිදහස්කරන්නේයයි කීසේක.
ඔව්හු උන්වහන්සේට උත්තරදෙමින්: අපි 33
ආබ්‍රහම්ගේ වංශයය, කිසි කලක අපි
කිසිවෙකුට වහල් නූණෙමුව. තුඹලා
නිදහස්වන්නහුයයි තුඹ කියන්නේ
කොහොමදැයි කීවෝය. යේසුස්වහන්සේ 34
ඔවුන්ට උත්තරදෙමින්: සැබවක්
සැබවක් තුඹලාට කියමි–පව්කරන
සියල්ලෝම පාපයාගේ වහල්ලුය. වාලා 35
නිතරම ගෙදර නැවතී නොසිටියි. පුත්‍රයා
නිතරම නැවතී සිටියි. එහෙයින් පුත්‍රයා 36
තුඹලා නිදහස්කරන්නේ නම් සැබවින්
තුඹලා නිදහස්වන්නහුය. තුඹලා 37
ආබ්‍රහම්ගේ වංශය බව දනිමි; එහෙත්
තුඹලා තුළ නිදහස්ලෙස ක්‍රියාකරන්ට
මාගේ වචනයට ඉඩ නැති බැවින්, මා
මරන්ට සොයහුය. මාගේ පියාණන්- 38
වහන්සේ ළඟදී දුටු දේ මම කියමි.
එසේම තුඹලාත් තුඹලාගේ පියාගෙන්
ඇසූ දේ කරහුයයි කීසේක. ඔව්හු 39
උත්තරදෙමින්: අපගේ පියාණෝ
ආබ්‍රහම්යයි උන්වහන්සේට කීවෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්:
තුඹලා ආබ්‍රහම්ගේ දරුවෝ නම්
ආබ්‍රහම්ගේ ක්‍රියා කරන්නහුය. නුමුත් 40
දෙවියන්වහන්සේගෙන් ඇසූ සැබෑව
තුඹලාට කීවාවූ මනුෂ්‍යයෙක් වන මා
මරන්ට දැන් තුඹලා සොයහුය. ආබ්‍රහම්
එසේ නොකළේය. තුඹලා තුඹලාගේ 41
පියාගේ ක්‍රියා කරහුයයි කීසේක. එවිට
ඔව්හු: අපි වේශ්‍යාකමින් උපන්නෝ
නොවෙමුව; අපට ඇත්තේ එකම
පියාණෝය, ඒ දෙවියන්වහන්සේයයි

42 කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට කියන-
සේක්: දෙවියන්වහන්සේ තුඹලාගේ
පියාණෝ නම් තුඹලා මට ප්‍රේම-
කරන්නහුය. මක්නිසාද මම දෙවියන්-
වහන්සේ කෙරෙන් නික්ම ඇවිත්
සිටිමි; මාගේම කැමැත්තෙන් මා ආවා
නොව උන්වහන්සේ මා එවූසේක.
43 මාගේ කථාව තුඹලාට නොතේරෙන්නේ
මක්නිසාද? මාගේ වචනය තුඹලාට
44 අසන්ට බැරි නිසාමය. තුඹලා තුඹලාගේ
පියවූ යක්ෂයාගෙන්ය, තුඹලා තුඹලාගේ
පියාගේ තෘෂ්ණාවන් ඉෂ්ටකරන්ට
කැමතිය. ඔහු පටන්ගැන්මේ සිට
මිනීමරන්නෙක්ය, ඔහු තුළ සැබෑකම
නැති හෙයින් ඔහු සැබෑවෙහි
නොපැවතුණේය. ඔහු බොරුවක් කියන
කල තමාගේම දේ කියයි. මක්නිසාද
ඔහු බොරුකාරයෙක්ය, බොරුවේ
45 පියාය. මා තුඹලාට සැබෑව කියන
හෙයින් තුඹලා මා අදහාගන්නේ නැත.
46 මට පාපය ඇතැයි තුඹලාගෙන් කවරෙක්
ඔප්පුකෙරේද? මම සැබෑව කියම්
නම් තුඹලා මා අදහා නොගන්නේ
47 මක්නිසාද? දෙවියන්වහන්සේගෙන් වූ
තැනැත්තේ දෙවියන්වහන්සේගේ වචන
අසයි. තුඹලා දෙවියන්වහන්සේගෙන්
නොවන බැවින් ඒවා අසන්නේ නැතැයි
48 කීසේක. යුදෙව්වරු උත්තරදෙමින්:
තුඹ සමාරියයෙක්ය, තුඹට යක්ෂයෙක්
ආවේශවෙලාය කියා අප කියනවා හරි
නොවේදැයි උන්වහන්සේට කීවෝය.
49 යේසුස්වහන්සේ උත්තරදෙමින්: මට
යක්ෂයෙක් ආවේශවෙලා නොව මම
මාගේ පියාණන්වහන්සේට ගෞරවකරමි,
50 තුඹලා මට අගෞරවකරහුය. තුමුත්
මම මාගේම ගෞරවය නොසොයමි.
එය සොයන්නාවූ විනිශ්චයකරන්නාවූ
51 කෙනෙක් සිටිනසේක. සැබවක් සැබවක්
තුඹලාට කියමි–යමෙක් මාගේ වචනය
රක්ෂාකරන්නේ නම් ඔහු කිසිකලක
මරණය දකින්නේ නැතැයි කීසේක.
52 යුදෙව්වරු උන්වහන්සේට කථාකොට:
තුඹට යක්ෂයෙක් ආවේශවී සිටින බව
දැන් අපි දනිමුව. ආබ්‍රහම්ද අනාගත-
වක්තෘහුද මළෝය; යමෙක් මාගේ වචනය
රක්ෂාකරන්නේ නම් ඔහු කිසිකලක
මරණයේ රස නොවිඳින්නේමයයි තුඹ
කියයි. තුඹ අපගේ පියවූ ආබ්‍රහම්ට 53
වඩා උතුම් කෙනෙක්ද? ඔහු මළේය;
අනාගතවක්තෘවරුද මළෝය. තුඹ
කවරෙක කියා කියාගන්නෙහිදැයි
කීවෝය. යේසුස්වහන්සේ උත්තරදෙමින්: 54
මම මටම ගෞරව කරම් නම් මාගේ
ගෞරවය හිස්ය. මට ගෞරවකරන්නේ
මාගේ පියාණන්වහන්සේය; උන්වහන්සේ
තුඹලාගේ දෙවියන්වහන්සේයයි තුඹලා
කියහුය; තුඹලා උන්වහන්සේ ඇඳින-
ගත්තේ නැත. තුමුත් මම උන්වහන්සේ 55
අඳුනමි; උන්වහන්සේ නාඳුනමියි කීවොත්
මමත් තුඹලා හා සමාන බොරුකාරයෙක්
වන්නෙමි. තුමුත් මම උන්වහන්සේ
අඳුනමි, උන්වහන්සේගේ වචනයද
රක්ෂාකරමි. තුඹලාගේ පියවූ ආබ්‍රහම් 56
මාගේ දවස දකින්ට ප්‍රීතියෙන් සිටියේය;
ඔහු ඒ දැක සන්තෝෂවීයයි කීසේක.
එබැවින් යුදෙව්වරු: තුඹ තවම 57
අවුරුදු පණහක් වයස නැතුව,
ආබ්‍රහම් දුටුවෙහිදැයි උන්වහන්සේට
කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට 58
කථාකොට: සැබවක් සැබවක් තුඹලාට
කියමි–ආබ්‍රහම් උපදින්ට පළමුවෙන්
මම සිටිමියි කීසේක. එබැවින් ඔව්හු 59
උන්වහන්සේට ගසන පිණිස ගල් අතට
ගත්තෝය. තුමුත් යේසුස්වහන්සේ සැඟවී
දේවමාළිගාවෙන් පිටවී ගියසේක.

## ජාත්‍යාන්ධයෙකු සුවපත්කිරීම

9 උන්වහන්සේ යද්දී, උපන්ද පටන්
අන්ධවූ මනුෂ්‍යයෙකු දුටුසේක.
උන්වහන්සේගේ ගෝලයෝ: රබ්බී, මොහු 2
අන්ධව ඉපදීමට පව්කළේ කවුද? මොහුද?
මොහුගේ මවුපියෝද්දයි ඇසුවෝය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්- 3
වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි
ප්‍රකාශවන පිණිස මිස මොහුවත්
මොහුගේ මවුපියන්වත් පව්කළ නිසා
නොවේ. දවහල්ව තිබියදී මා එවූ 4
තැනන්වහන්සේගේ වැඩ අප විසින්
කටයුතුය. රාත්‍රිය පැමිණෙයි, එවිට
කිසිවෙකුට වැඩකරන්ට නුපුළුවන. මා 5

ලෝකයෙහි සිටින කල මම ලෝකයේ
ආලෝකයව සිටිමියි කීසේක.
6 උන්වහන්සේ මෙසේ කියා බිමට කෙළ
ගසා, එයින් මඩ සාදා ඒවා ඔහුගේ
7 ඇස්වල ගා: නුඹ ගොස් සිලෝවම්
පොකුණෙන් සෝදගනින්නැයි ඔහුට
කීසේක. (සිලෝවම් යන වචනයේ අර්ථය
එවනලද්දේය යනුයි.) එවිට ඔහු
ගොස් සෝදගෙන පෙනීම ලැබ
8 ආවේය. එබැවින් අසල්වාසියෝද ඔහු
සිඟන්නෙක්ව සිටි බව පෙර දුටු අයද
කථාකොට: ඉඳගෙන සිඟමන් ඉල්ලූ
තැනැත්තා මොහු නොවේදැයි කීවෝය.
9 සමහරෙක්: මේ ඔහුයයි කීවෝය. තවත්
අය: නැත, නුමුත් මොහු ඔහු වාගේයයි
10 කීවෝය. ඒ මමයයි ඔහු කීවේය. එසේ
නම් නුඹේ ඇස් පෑදුණේ කොහොමදැයි
11 ඔව්හු ඔහුගෙන් ඇසුවෝය. ඔහු
උත්තරදෙමින්: යේසුස් නම් මනුෂ්‍යයා
මඩ සාදා මාගේ ඇස්වල ගා–නුඹ
සිලෝවම්ට ගොස් සෝදගනින්නැයි මට
කීවේය. මම ගොස් සෝදගෙන පෙනීම
12 ලැබීමියි කීවේය. ඔහු කොතැන්හිදැයි
ඔව්හු ඇසුවෝය. මම නොදනිමියි ඔහු
කීවේය.
13 පළමු අන්ධව සිටි තැනැත්තා ඔව්හු
ඵරිසිවරුන් ළඟට ගෙනගියෝය.
14 යේසුස්වහන්සේ මඩ සාදා ඔහුගේ ඇස්
15 පෑදූ දවස වනාහි සබත් දවසය. එබැවින්
ඵරිසිවරු ඔහුට පෙනීම ලැබුණේ
කොහොමදැයි ඔහුගෙන් නැවත
ඇසුවෝය. ඔහුද: උන්වහන්සේ මාගේ
ඇස්වල මඩ ගෑසේක, මම සෝදගෙන
පෙනීම ලැබ සිටිමියි ඔවුන්ට කීවේය.
16 එබැවින් ඵරිසිවරුන්ගෙන් සමහරෙක්:
ඒ මනුෂ්‍යයා සබත් දවස නොපවත්වන
බැවින් ඔහු දෙවියන්වහන්සේ වෙතින්
ආ කෙනෙක් නොවේයයි කීවෝය. නුමුත්
අන් සමහරෙක්: පව්කාරවූ මනුෂ්‍යයෙකුට
මෙබඳු හාස්කම් කරන්ට පුළුවන්
කොහොමදැයි කීවෝය. මෙසේ ඔවුන්
17 අතරේ භේදයක් විය. එබැවින් ඔව්හු
නැවත අන්ධයාට කථාකොට: ඔහු නුඹේ
ඇස් පෑදූ නිසා, ඔහු ගැන නුඹ කියන්නේ
කුමක්දැයි ඇසුවෝය. උන්වහන්සේ
අනාගතවක්තෘ කෙනෙකැයි ඔහු කීවේය.
එබැවින් යුදෙව්වරු පෙනීම ලැබූ ඒ අයගේ 18
මවුපියන් කැඳවන තුරු ඔහු අන්ධව
සිට පෙනීම ලැබූ බව විශ්වාස
නොකොට: අන්ධව උපන්නේයයි නුඹලා 19
කියන නුඹලාගේ පුත්‍රයා මොහුද? එසේවී
නම් දැන් ඔහුට පෙනෙන්නේ කොහොමදැයි
ඔවුන්ගෙන් ඇසුවෝය. ඔහුගේ මවුපියෝ 20
ඔවුන්ට උත්තරදෙමින්: මොහු අපගේ
පුත්‍රයා බවද අන්ධව උපන් බවද අපි
දනිමුව. නුමුත් දැන් ඔහුට පෙනෙන්නේ 21
කොහොමදැයි නොදනිමුව; ඔහුගේ ඇස්
පෑදුවේ කවුද කියාත් අපි නොදනිමුව.
ඔහුගෙන් අසාපල්ලා; ඔහුට වයස්
ඇත්තේය; ඔහුම තමා ගැන කියනවා
ඇතැයි කීවෝය. ඔහුගේ මවුපියන් මෙසේ 22
කීවේ යුදෙව්වරුන්ට භයව සිටි
නිසාය. මක්නිසාද යමෙක් උන්වහන්සේ
ක්‍රිස්තුස්වහන්සේයයි ඒත්තුගත්තොත් ඔහු
සිනගෝගයෙන් අහක්කරනු ලබන්නේයයි
යුදෙව්වරුන් නියමකරගෙන තිබුණේය.
ඒ නිසා ඔහුගේ මවුපියෝ: ඔහුට වයස් 23
ඇත්තේය, ඔහුගෙන් අසාපල්ලායයි
කීවෝය. එවිට ඔව්හු අන්ධව සිටි 24
මනුෂ්‍යයා දෙවෙනි වර කැඳවා:
දෙවියන්වහන්සේට ගෞරව දීපන්න. මේ
මනුෂ්‍යයා පව්කාරයෙක් බව අපි
දනිමුයයි ඔහුට කීවෝය. එබැවින් 25
ඔහු උත්තරදෙමින්: උන්වහන්සේ
පව්කාරයෙක්ද නැද්දැයි මම නොදනිමි.
එකක් දනිමි–මම අන්ධව සිටියෙමි, දැන්
මට පෙනීම ඇත්තේයයි කීවේය. එබැවින් 26
ඔව්හු: ඔහු නුඹට කුමක් කෙළේද? නුඹේ
ඇස් පෑදුවේ කොහොමදැයි ඔහුගෙන්
ඇසුවෝය. ඔහු ඔවුන්ට උත්තරදෙමින්: 27
මම මේ දැන් නුඹලාට කීමි, නුමුත්
නුඹලා ඇසුවේ නැත. නුඹලා නැවත
අසන්ට කැමති මක්නිසාද? නුඹලාත්
උන්වහන්සේගේ ගෝලයන් වෙන්ට
කැමතිදැයි කීවේය. ඔව්හු ඔහුට නින්දා 28
කොට: නුඹ ඔහුගේ ගෝලයාය;
අපි නම් මෝසෙස්ගේ ගෝලයෝය.
දෙවියන්වහන්සේ මෝසෙස්ට කථාකර 29
තිබෙන බව අපි දනිමුව. නුමුත් මේ
මනුෂ්‍යයා ගැන නම් ඔහු කොතැනින්දැයි

30 අපි නොදනිමුයයි කීවෝය. ඒ මනුෂ්‍යයා
ඔවුන්ට උත්තරදෙමින්: ඇයි, මේක
පුදුමයක්ය, උන්වහන්සේ මාගේ ඇස්
පාද තිබියදීත් උන්වහන්සේ කොතැනින්
ආසේක්ද කියා තුඹලා නොදන්නහුය.
31 දෙවියන්වහන්සේ පව්කාරයන්ගේ බස්
නොඅසන බවත් යමෙක් දෙවියන්-
වහන්සේට නමස්කාරකරන්නෙක්ව
උන්වහන්සේගේ කැමැත්ත කරන්නේ නම්
ඒ අයගේ බස් අසන බවත් අපි දනිමුව.
32 කිසිවෙක් අන්ධව උපන් කෙනෙකුගේ
ඇස් පෑදූ බව ලෝකයේ පටන්ගැන්මේ
33 සිට කවදාවත් නෑසූ දෙයක්ය. මූන්වහන්සේ
දෙවියන්වහන්සේ කෙරෙන් නාසේක් නම්
කිසි දෙයක් කරන්ට උන්වහන්සේට
34 නුපුළුවනැයි කීවේය. ඔව්හු උත්තරදෙමින්:
සියලු ආකාරයෙන් පාපවල උපන්
තුඹ අපට උගන්වනවාදැයි කියා ඔහු
අහක්කළෝය.
35 ඔවුන් ඔහු අහක්කළ බව යේසුස්-
වහන්සේට ආරංචිවිය; උන්වහන්සේට
ඔහු සම්බව: තුඹ දෙවියන්වහන්සේගේ
පුත්‍රයා කෙරෙහි අදහනවාදැයි ඇසූසේක.
36 ඔහු උත්තරදෙමින්: ස්වාමිනි, උන්වහන්සේ
කෙරෙහි මා අදහන පිණිස උන්වහන්සේ
37 කවුදැයි ඇසීය. යේසුස්වහන්සේ ඔහුට
කියනසේක්: තුඹ උන්වහන්සේ
දුටුවෙහිය, තුඹ සමග කථාකරන්නෙත්
38 උන්වහන්සේයයි කීසේක. ස්වාමිනි, මම
අදහමියි කියා ඔහු උන්වහන්සේට
39 නමස්කාරකෙළේය. යේසුස්වහන්සේ
කථාකොට: ඇස් නොපෙනෙනවුන්ට
පෙනෙන පිණිසද ඇස් පෙනෙනවුන්
අන්ධවෙන පිණිසද විනිශ්චය සඳහා
මේ ලෝකයට ආවෙමියි කීසේක.
40 උන්වහන්සේ සමග සිටියාවූ ඵරිසි-
වරුන්ගෙන් සමහරෙක් ඒ අසා:
අපිත් අන්ධයෝදැයි උන්වහන්සේගෙන්
41 ඇසුවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට
කියනසේක්: තුඹලා අන්ධයෝ නම්
තුඹලාට පාපයක් නැත; නුමුත්
දැන්-අපට පෙනේයයි තුඹලා කියන නිසා
තුඹලාගේ පාපය පවතින්නේයයි ඔවුන්ට
කීසේක.

## යහපත් බැටළු එඬේරා

10
සැබවක් සැබවක් තුඹලාට
කියමි-දොරකඩින් බැටළුගාලට
ඇතුල් නොවී වෙන මගකින් නැගී එන්නා
සොරෙක්ද කොල්ලකන්නෙක්ද වේ.
නුමුත් දොරකඩින් ඇතුල්වෙන්නා 2
බැටළුවන්ගේ එඬේරාය. ඔහුට 3
දොරටුපාලයා දොර හරියි; බැටළුවෝ
ඔහුගේ හඬ අසති. ඔහු තමාගේම
බැටළුවන්ගේ නම් කියා අඬගසා උන්
පිටතට ගෙනයයි. ඔහු තමාගේම සියලු 4
බැටළුවන් පිටතට හැරියාම ඔහු උන්ට
පෙරටුව යයි, බැටළුවෝද ඔහුගේ හඬ
අඳුනන බැවින් ඔහු පස්සේ යති. උන් 5
අන්‍යයන්ගේ හඬ නාඳුනන බැවින්
අන්‍යයෙකු පස්සේ නොගොස් ඔහු
වෙතින් පලායන්නේයයි කීසේක.
යේසුස්වහන්සේ මේ උපහැරණය ඔවුන්ට 6
කී නුමුත් උන්වහන්සේ විසින් කියන
ලද කාරණා කිමෙක්දැයි ඔවුන් තේරුම්
ගත්තේ නැත.
ඒ නිසා යේසුස්වහන්සේ නැවත ඔවුන්ට 7
කියනසේක්: සැබවක් සැබවක් තුඹලාට
කියමි-බැටළුවන්ගේ දොරකඩ මමය. මට 8
පළමු ආ සියල්ලෝම සොරු සහ
කොල්ලකන්නෝත්ය. නුමුත් බැටළුවෝ
ඔවුන්ට ඇහුම්කන් නුදුන්නෝය. දොරකඩ 9
නම් මමය. යමෙක් මා කරණකොට-
ගෙන ඇතුල්වේද, ඔහු ආරක්ෂාකරනු
ලැබ ඇතුළට සහ පිටතට ගොස් ගොදුරු
ලබන්නේය. සොරා එන්නේ සොරකම්- 10
කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත්
පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය
ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන
පිණිසත්ය. මම යහපත් බැටළු එඬේරාය. 11
යහපත් බැටළු එඬේරා තමාගේ ජීවිතය
බැටළුවන් උදෙසා දෙන්නේය. එඬේරෙක් 12
නොවූ, බැටළුවන්ගේ අයිතිකාරයා
නොවන්නාවූ කුලීකාරයා වෘකයා
එනවා දැක බැටළුවන් අත්හැර පලා-
යන්නේය, වෘකයා උන් අල්ලමින්
විසුරුවාදමන්නේය. ඔහු පලායන්නේ 13
ඔහු කුලීකාරයෙකු නිසාත් බැටළුවන්
ගැන නොසලකන නිසාත්ය. මම යහපත් 14

බැටළු එඬේරාය; පියාණන්වහන්සේ මා
අඳුනන්නාක්මෙන්ද, මා පියාණන්වහන්සේ
15 අඳුනන්නාක්මෙන්ද, මම මාගේ බැටළුවන්
අඳුනමි. මාගේ බැටළුවෝද මා අඳුනති;
බැටළුවන් උදෙසා මාගේ ප්‍රාණය දෙමි.
16 තවද මේ ගාලට අයිති නොවූ වෙනත්
බැටළුවෝ මට ඇත්තාහ. ඔවුන්ද මා
විසින් ගෙනෙන්ට ඕනෑය, ඔව්හු මාගේ
හඬ අසන්නෝය; එසේ එක රැළක්ද
17 එක එඬේරෙක්ද වන්නාහ. මා විසින්
නැවත ගන්නා පිණිස මාගේ ප්‍රාණය
දෙන බැවින් මාගේ පියාණන්වහන්සේ
18 මට ප්‍රේමකරනසේක. කිසිවෙක් ඒක
මාගෙන් උදුරාගන්නවා නොව මමම
ඒක දෙමි. ඒක දෙන්ට මට බලය තිබේ,
නැවත ගන්ටද මට බලය තිබේ. මේ
ආඥාව මාගේ පියාණන්වහන්සේගෙන්
ලදිමියි කීසේක.
19 මේ වචන නිසා යුදෙව්වරුන් අතරේ
20 නැවත භේදයක් හටගත්තේය. ඔවුන්ගෙන්
බොහෝ දෙනෙක්: ඔහු යක්ෂාවේශව
උමතුව සිටියි; ඔහුට ඇහුම්කන්දෙන්නේ
21 මක්නිසාදයි කීවෝය. අන් සමහරෙක්:
මේවා යක්ෂාවේශවූ කෙනෙකුගේ කීම්
නොවෙයි. අන්ධයන්ගේ ඇස් පහදන්ට
යක්ෂයෙකුට පුළුවන්දැයි කීවෝය.

## යේසුස්වහන්සේගේ දෙව්කම ඔප්පුකිරීම

22 කැපකිරීමේ මංගල්‍යය යෙරුසලමේ විය.
23 ඒ කාලය ශීත සෘතුවය; යේසුස්වහන්සේ
දේවමාළිගාවේ සාලමොන්ගේ ද්වාර-
මණ්ඩපයේ සක්මන්කරමින් සිටිසේක.
24 එබැවින් යුදෙව්වරු ඇවිත් උන්වහන්සේ
අවටින් සිට: ඔබ කොපමණ කල් අප
ශංකා පිට තබනසේක්ද? ඔබ ක්‍රිස්තුස්
නම් පැහැදිලිලෙස අපට කිව මැනවයි
25 උන්වහන්සේට කීවෝය. යේසුස්වහන්සේ
ඔවුන්ට උත්තරදෙමින්: මම තුඹලාට
කීමි, නුමුත් තුඹලා විශ්වාසකරන්නේ
නැත. මාගේ පියාණන්වහන්සේගේ
නාමයෙන් මා කරන ක්‍රියාම මා ගැන
26 සාක්ෂිදෙති. තුඹලා මාගේ බැටළුවන්
නොවන බැවින් විශ්වාසකරන්නේ නැත.
27 මාගේ බැටළුවෝ මාගේ හඬ අසති,
මමද ඔවුන් අඳුනමි, ඔව්හු මා පස්සේ
එති. මම ඔවුන්ට සදාකාල ජීවනය 28
දෙමි; ඔව්හු කිසිකලකත් විනාශ
නොවන්නෝය, කිසිවෙක් මාගේ අතින්
ඔවුන් උදුරා නොගන්නේය. ඔවුන් මට 29
දුන්නාවූ මාගේ පියාණන්වහන්සේ
සියල්ලන්ටම වඩා උතුම්ය; පියාණන්-
වහන්සේගේ අතින් ඔවුන් උදුරාගන්ට
කාටවත් බැරිය. මමද පියාණන්වහන්සේද 30
එකතැනැත්තායයි කීසේක.

## යුදෙව්වන්ගේ සතුරුකම

යුදෙව්වරු උන්වහන්සේට ගසන්ට 31
නැවතත් ගල් අතට ගත්තෝය.
යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: 32
පියාණන්වහන්සේගෙන් බොහෝ යහපත්
ක්‍රියා තුඹලාට දක්වීමි; එයින් කොයි
ක්‍රියාව නිසා මට ගල්ගසන්නහුදැයි
ඇසූසේක. යුදෙව්වරු උන්වහන්සේට 33
උත්තරදෙමින්: අප තුඹට ගල් ගසන්නේ
යහපත් ක්‍රියාවක් නිසා නොව දේව
අපහාසය නිසාය; මනුෂ්‍යයෙක්වූ තුඹ
දෙවියන්වහන්සේ වෙන්ට සාදන
නිසායයි කීවෝය. යේසුස්වහන්සේ 34
ඔවුන්ට උත්තරදෙමින්: තුඹලා
දෙව්වරුයයි මම කීමියි තුඹලාගේ
ව්‍යවස්ථාවෙහි ලියා තිබෙනවා
නොවේද? (ලියවිල්ල කඩවෙන්ට බැරිය.)
දෙවියන්වහන්සේගේ වචනය ලැබූවන්ට 35
දෙව්වරුයයි උන්වහන්සේ කීසේක් නම්,
මම දෙවියන්වහන්සේගේ පුත්‍රයෙමියි 36
මා කී නිසා පියාණන්වහන්සේ
විසින් කැපකොට ලෝකයට එවනලද
තැනැත්තා ගැන—තුඹ දෙවියන්වහන්සේට
අපහාසකරන්නෙහියයි තුඹලා කියවුද?
මම මාගේ පියාණන්වහන්සේගේ ක්‍රියා 37
නොකරමි නම්, මා විශ්වාස නොකරල්ලා.
නුමුත් ඒවා කරමි නම්, තුඹලා මා 38
විශ්වාස නොකරතත් පියාණන්වහන්සේ
මා තුළෙහිද මා පියාණන්වහන්සේ
තුළෙහිද සිටින බව දැන තේරුම්ගන්නා
පිණිස ක්‍රියා විශ්වාසකරපල්ලායයි
කීසේක. ඔව්හු නැවතත් උන්වහන්සේ 39

අල්ලන්ට හැදුවෝය; නුමුත් උන්වහන්සේ
ඔවුන් අතින් ගැළවී ගියසේක.
40 උන්වහන්සේ යොර්දනෙන් එගොඩ
යොහන් පළමුවෙන් *බව්තීස්මකරමින්
සිටි ස්ථානයට ආයෙත් ගොස් එහි
41 නැවතී සිටිසේක. බොහෝ දෙනෙක්
උන්වහන්සේ ළඟට ඇවිත්: සැබවින්
යොහන් කිසි ආශ්චර්යයක් කළේ නැත.
නුමුත් මුන්වහන්සේ ගැන යොහන් කී
42 සියල්ලම සැබෑයයි කීවෝය. එහිදී
බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි
අදහාගත්තෝය.

## ලාසරුස් මළවුන්ගෙන් නැගිටවීම

11 මරියාගේද ඇගේ සහෝදරිවූ
මාර්තාගේද ගමවූ බෙතානියෙහි
ලාසරුස් නම් එක්තරා මනුෂ්‍යයෙක්
2 රෝගීව සිටියේය. ඒ මරියා නම් ස්වාමීන්-
වහන්සේට සුවඳ තෙල් ආලේප කොට
ඇගේ හිසකේවලින් උන්වහන්සේගේ පාද
පිසදැමූ තැනැත්තීය, රෝගීව සිටි ලාසරුස්
3 ඇගේ සහෝදරයාය. එබැවින් ඔහුගේ
සහෝදරියෝ: ස්වාමිනි, ඔබවහන්සේ
ආදරේව සිටින තැනැත්තා රෝගීව
සිටීයයි උන්වහන්සේට කියා යැවූවෝය.
4 නුමුත් යේසුස්වහන්සේ ඒ අසා: ඒ
රෝගය මරණය පිණිස නොව එයින්
දෙවියන්වහන්සේගේ පුත්‍රයා මහිමයට
පමුණුවනු ලබන පිණිස දෙවියන්-
වහන්සේගේ ගෞරවය සඳහායයි කීසේක.
5 යේසුස්වහන්සේ මාර්තාටද ඇගේ
සහෝදරීටද ලාසරුස්ටද ප්‍රේමකළසේක.
6 ඔහු රෝගීව සිටින බව උන්වහන්සේ
ඇසූ කල්හි, තමන් සිටි ස්ථානයේම තව
7 දෙදවසක් නැවතුණුසේක. ඉන්පසු
උන්වහන්සේ: යුදයට නැවත යමුයයි
8 ගෝලයන්ට කීසේක. ගෝලයෝද: රබ්බී,
මේ ළඟදී යුදෙව්වරු ඔබට ගල්ගසන්ට
සෙවූවෝය; එතැනට ඔබ නැවත
යනසේක්දැයි උන්වහන්සේට කීවෝය.
9 යේසුස්වහන්සේ උත්තරදෙමින්: දවාලට
දෙළොස් පැයක් තිබෙනවා නොවේද?
යමෙක් දහවල් ඇවිදින්නේ නම්, මේ
ලෝකයේ එළිය ඔහුට පෙනෙන බැවින්
ඔහු නොපැකිලෙයි. නුමුත් යමෙක් 10
රාත්‍රියෙහි ඇවිදින්නේ නම්, ඔහු තුළ
එළිය නැති නිසා ඔහු පැකිලේයයි
කීසේක. උන්වහන්සේ මෙසේ කියා, පසුව: 11
අපගේ මිත්‍රවූ ලාසරුස් සැතපී ඉන්නේය;
ඔහු පුබුදුවන පිණිස යමියි ඔවුන්ට
කීසේක. එබැවින් ගෝලයෝ උන්වහන්සේට 12
කථාකොට: ස්වාමිනි, ඔහු සැතපී
සිටී නම් ඔහුට සුවවේයයි කීවෝය.
යේසුස්වහන්සේ කීවේ ඔහුගේ මරණය 13
ගැනය. ඔව්හු, නින්දේ පහදුගැනීම ගැන
උන්වහන්සේ කීසේකැයි සිතුවෝය.
එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට 14
පැහැදිලිලෙස කථාකොට: ලාසරුස්
මැරිලාය. නුඹලා විශ්වාසකරන පිණිස 15
මා එහි නොසිටියාට නුඹලා නිසා
සතුටුවෙමි; එසේවී නුමුත් ඔහු ළඟට
යමුයයි කීසේක. එහෙයින් දිදිමුස් නම්වූ 16
තෝමස්: අපිත් මුන්වහන්සේ සමඟ නසින
පිණිස යමුයයි සහකාර ගෝලයන්ට
කීවේය.
එසේ යේසුස්වහන්සේ ආ කල ඔහු 17
සොහොන්ගෙයි තබා එවකට සතර
දිනක් වූ බව දැනගත්සේක. බෙතානිය 18
යෙරුසලමට කිට්ටුව හැතැප්ම දෙකක්
පමණ දුරව තිබුණේය; යුදෙව්වරුන්ගෙන් 19
බොහෝ දෙනෙක්ද මාර්තා සහ මරියා
ඔවුන්ගේ සහෝදරයා ගැන සනසන
පිණිස ඇවිත් සිටියෝය. එබැවින් මාර්තා 20
යේසුස්වහන්සේ එන බව ඇසූ විට
උන්වහන්සේ සම්මුඛවන්ට ගියාය. නුමුත්
මරියා ගෙයි ඉඳගෙන උන්නාය. එසේ 21
හෙයින් මාර්තා යේසුස්වහන්සේට
කියන්නී: ස්වාමිනි, ඔබ මෙහි සිටිසේක්
නම් මාගේ සහෝදරයා නොමැරෙයි.
දැනුත් ඔබ දෙවියන්වහන්සේගෙන් යමක් 22
ඉල්ලනසේක් නම්, ඒක දෙවියන්වහන්සේ
ඔබට දෙන බව දනිමියි කීවාය. නුඹේ 23
සහෝදරයා නැවත නැගිටින්නේයයි
යේසුස්වහන්සේ ඇට කීසේක. අන්තිම 24
දවසේ නැවත-නැගිටීමේදී ඔහු නැවත
නැගිටින බව දනිමියි මාර්තා
උන්වහන්සේට කීවාය. යේසුස්වහන්සේ: 25

*අවගාහනය.

නැවත-නැගිටීමද ජීවනයද මමය. මා
කෙරෙහි අදහාගන්නා මළ නුමුත්
26 ජීවත්වන්නේය. ජීවත්ව සිටින කවුරු
නුමුත් මා කෙරෙහි අදහන්නේද, ඔහු
කිසිකලකත් නොනසින්නේය. මේක
27 විශ්වාසකරනවාදැයි ඈට කීසේක. ඈ:
එසේය, ස්වාමිනි ඔබ දෙවියන්-
වහන්සේගේ පුත්‍රවූ ලෝකයට එන
තැනන්වහන්සේවූ ක්‍රිස්තුස් බව
විශ්වාසකරගන සිටිමියි උන්වහන්සේට
28 කීවාය. ඈ මෙසේ කියා ගොස් ඇගේ
සහෝදරීවූ මරියා රහසින් කැඳවා:
ආචාරීන්වහන්සේ ඇවිත් තුඹට
29 අඬගසනසේකැයි කීවාය. ඈ ඒ අසා
වහාම නැගිට උන්වහන්සේ ළඟට ගියාය.
30 (ඒ වන තුරු යේසුස්වහන්සේ ගමට
නොපැමිණ මාර්තා උන්වහන්සේට
31 සම්මුඛවූ ස්ථානයේම සිටිසේක.) එවිට
මරියා සනසමින් ඈ සමග ගෙයි
සිටියාවූ යුදෙව්වරු, ඈ වහාම නැගිට
පිටතට යන බව දැක, සොහොන්ගේ
ළඟදී අඬන පිණිස එහි යන්නීයයි සිතා,
32 ඈ පස්සේ ගියෝය. එබැවින් මරියා
යේසුස්වහන්සේ සිටි තැනට ඇවිත්,
උන්වහන්සේ දැක, උන්වහන්සේගේ පාමුල
වැටී: ස්වාමිනි, ඔබ මෙහි සිටිසේක් නම්,
මාගේ සහෝදරයා මැරෙන්නේ නැතැයි
33 උන්වහන්සේට කීවාය. යේසුස්වහන්සේ
ඈ අඬනවාත් ඈ සමග ආ යුදෙව්වරුන්
අඬනවාත් දැක, ආත්මයෙන් සුසුම්ලා,
34 කැලඹී: ඔහු කොතැන තැබුවහුදැයි
ඇසූසේක. ස්වාමිනි, ඇවිත් බැලුව
මැනවයි ඔව්හු උන්වහන්සේට කීවෝය.
35,36 යේසුස්වහන්සේ ඇඬූසේක. එහෙයින්
යුදෙව්වරු කථාකොට: මූන්වහන්සේ
මොහුට කොපමණ ආදරේවූසේක්දැයි
37 බලාපල්ලායයි කීවෝය. නුමුත්
ඔවුන්ගෙන් සමහරෙක්: අන්ධයාගේ ඇස්
පැහැදුවාවූ මූන්වහන්සේට මේ තැනැත්තා
නොමැරී සිටින්ට සලස්වන්ට බැරිවුණාදැයි
38 කීවෝය. එවිට යේසුස්වහන්සේ නැවතත්
තමන් තුළ සුසුම්ලමින් සොහොන්ගේ
ළඟට පැමිණිසේක. ඒක වනාහි
ගුහාවක්ය, ඊට ගලක් හේත්තුකර
39 තිබුණේය. ගල අහක්කරපල්ලායයි
යේසුස්වහන්සේ කීසේක. මළ
තැනැත්තාගේ සහෝදරීවූ මාර්තා:
ස්වාමිනි, ඔහු මැරී සතර දවසක් වන
බැවින් දුන් ගඳ ඇතැයි කීවාය.
යේසුස්වහන්සේ: තුඹ විශ්වාසකළොත් 40
දෙවියන්වහන්සේගේ මහිමය දකින්නෙහිය
කියා මා කීවා නොවේදැයි ඈට කීසේක.
එවිට ඔව්හු ගල අහක්කළෝය. 41
යේසුස්වහන්සේ ඇස් ඔසවා: පියාණෙනි,
ඔබ මාගේ වචන ඇසූ නිසා ඔබට
ස්තුති කරමි. ඔබ නිතරම මාගේ වචන 42
අසන බව දැනගෙන සිටියෙමි. නුමුත්
මා එසේ කීවේ ඔබ විසින් මා එවූ බව
අවට සිටින්නාවූ සමූහයා විශ්වාසකරන
පිණිස ඔවුන් නිසායයි කීසේක.
උන්වහන්සේ මෙසේ කියා: ලාසරුස් 43
පිටතට වරෙන්නැයි මහත් ශබ්දයකින්
කීසේක. මැරී සිටි තැනැත්තේ පිටතට 44
ආවේය; ඔහුගේ අත්පා වස්ත්‍රවලින් බැඳ
මුහුණද රෙදිකඩකින් ඔතා තිබුණේය.
මොහු මුදා යන්ට හැරපල්ලායයි
යේසුස්වහන්සේ ඔවුන්ට කීසේක.
එබැවින් මරියා වෙතට ආවාවූ 45
යුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක්
යේසුස්වහන්සේ කළ දෙය දැක
උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය.
නුමුත් ඔවුන්ගෙන් සමහරෙක් ඵරිසිවරුන් 46
ළඟට ගොස් යේසුස්වහන්සේ කළ දේවල්
ඔවුන්ට කීවෝය.

## යේසුස්වහන්සේ මරන්ට නායක පූජකයන් මන්ත්‍රණයකිරීම

එබැවින් නායක පූජකයෝද ඵරිසිවරුද 47
මන්ත්‍රණ සභාවක් රැස්කරවා: අපි කුමක්
කරමුද? මේ මනුෂ්‍යයා බොහෝ
හාස්කම් කරයි. අපි ඔහුට මෙසේ 48
ඉඩහැරියෙමු නම් සියල්ලන් ඔහු කෙරෙහි
අදහාගන්නවා ඇත. එවිට රෝමවරුන්
ඇවිත් අපේ ස්ථානයත් අපේ ජාතියත්
පැහැරගන්නවා ඇතැයි කීවෝය. එවිට 49
ඔවුන්ගෙන් එක්කෙනෙක්වූ ඒ අවුරුද්දට
උත්තම පූජකවූ කායාඵස් ඔවුන්ට
කියනුයේ: තුඹලා කිසිවක්ම දන්නේ නැත,
මුළු ජාතිය විනාශ නොවන පිණිස 50
සෙනඟ උදෙසා එක මනුෂ්‍යයෙකුගේ

මරණය නුඹලාට ප්‍රයෝජන ඇති බව
නුඹලා කල්පනාකරන්නේ නැතැයි කීවේය.
51 ඔහු ඒ කීම තමා විසින්ම උපදවා කීවා
නොවේය. ඔහු ඒ අවුරුද්දට උත්තම
පූජකයාව සිටි බැවින්, යේසුස්වහන්සේ
52 ඒ ජාතිය උදෙසා මැරෙන බවත්,
ඒ ජාතිය උදෙසා පමණක් නොව
දෙවියන්වහන්සේගේ විසිරගියාවූ දරුවන්
එකට රැස්කරන පිණිස මැරෙන බවත්
53 අනාගතවාක්‍යයෙන් කීවේය. මෙසේ එදා
පටන් ඔව්හු උන්වහන්සේ මරන්ට
මන්ත්‍රණයකළෝය.
54 එහෙයින් යේසුස්වහන්සේ යුදෙව්වරුන්
අතරෙහි තවත් ප්‍රසිද්ධයෙන් නොහැසිර,
එයින් පිටත්ව වනාන්තරයට සමීප
පළාතට පැමිණ, එප්‍රායිම් නම් නුවරකට
ගොස් ගෝලයන් සමග එහි නැවතී
55 සිටිසේක. එකල යුදෙව්වරුන්ගේ පාස්කු
මංගල්‍යය ළංව තිබුණේය. බොහෝ
දෙනෙක් තමුන්ම පවිත්‍රකර ගන්නා
පිණිස පාස්කු මංගල්‍යයට පළමුවෙන්
පිට පළාත්වලින් නික්ම යෙරුසලමට
56 ගියෝය. එවිට ඔව්හු යේසුස්වහන්සේ
සොයමින්: නුඹලා කුමක් සිතනවාද?
ඔහු මංගල්‍යයට නේනවාදෝ කියමින්,
දේවමාළිගාවේ සිට ඔවුනොවුන්
57 කථාකළෝය. උන්වහන්සේ සිටින තැන
යමෙක් දනිතොත් උන්වහන්සේ
අල්ලාගන්න පිණිස ඒ බව කියන්ට
නායක පූජකයන් හා ඵරිසිවරුන් විසින්
අණ දී තිබුණේය.

## බෙතානියේදී මරියා විසින් යේසුස්වහන්සේ ආලේපකරනු ලැබීම

12 යේසුස්වහන්සේ පාස්කු
මංගල්‍යයට සදවසකට පළමුවෙන්
බෙතානියට ආසේක. යේසුස්වහන්සේ
විසින් මළවුන්ගෙන් නැගිටෙවුවාවූ
2 ලාසරුස් එහි සිටියේය. එබැවින් ඔව්හු
උන්වහන්සේට එහි කෑමක් පිළියෙළ
කළෝය. මාර්තා උපස්ථානකළාය;
එහෙත් ලාසරුස් උන්වහන්සේ සමග
කෑමට හිඳගත්තවුන්ගෙන් එක්කෙනෙක්
3 වූයේය. එවිට මරියා ඉතා අනර්ඝ
ජටාමාංස තෙල් රාත්තලක් රැගෙන
යේසුස්වහන්සේගේ පාද ආලේපකොට,
ඇගේ හිසකේවලින් උන්වහන්සේගේ පාද
පිසදැම්මාය. තෙලේ සුවඳින් ගේ පිරුණේය.
එහෙත් උන්වහන්සේගේ ගෝලයන්ගෙන් 4
එක්කෙනෙක්වූ උන්වහන්සේ පාවාදෙන්ට
සිටිය යූදස් ඉස්කාරියෝත් කථාකොට:
මේ තෙල මසු තුන්සියයකට විකුණා 5
දිළිඳුන්ට නුදුන්නේ මක්නිසාදැයි කීවේය.
ඔහු මේක කීවේ දිළිඳුන් සැලකූ නිසා 6
නොව ඔහු සොරෙකු බැවිනුත් මුදල්
පසුම්බිය භාරව එහි දැමූ දේ රැගෙනගිය
බැවිනුත්ය. එබැවින් යේසුස්වහන්සේ 7
කියනසේක්: මා තැන්පත්කරන දවසට
මේ තෙල තිබාගන්ට ඇට ඉඩ හැරපන්න.
මක්නිසාද දිළින්දෝ නුඹලා සමග 8
නිතරම සිටිති; නුමුත් මම නුඹලා සමග
නිතරම නොසිටිමියි කීසේක.
එකල යුදෙව්වරුන්ගෙන් මහත් 9
සමූහයක් උන්වහන්සේ එහි සිටිනසේකැයි
දැන, යේසුස්වහන්සේ නිසා පමණක්
නොව උන්වහන්සේ විසින් මළවුන්ගෙන්
නැගුටුවනලද ලාසරුස් දකින පිණිස
ආවෝය. නුමුත් නායක පූජකයෝ 10
ලාසරුස්වත් මරන්ට මන්ත්‍රණය කළෝය.
මක්නිසාද ඔහු නිසා යුදෙව්වරුන්ගෙන් 11
බොහෝ දෙනෙක් අහක්ව ගොස්
යේසුස්වහන්සේ කෙරෙහි අදහා
ගත්තෝය.

## යෙරුසලමට පෙරහරින් ඇතුල්වීම

පසුවදා මංගල්‍යයට ඇවිත් සිටිය මහත් 12
සමූහයක් යේසුස්වහන්සේ යෙරුසලමට
එනසේකැයි අසා, තල් අතු රැගෙන 13
උන්වහන්සේගේ පෙරමගට පිටත්ව
ගොස්: හෝසන්නා! ස්වාමීන්වහන්සේගේ
නාමයෙන් එන්නාවූ තැනැත්තේ, එනම්,
ඉශ්‍රායෙල්ගේ රජ ආශිර්වාදලද්දෙකැයි
මොරගසා කීවෝය. සියොන් 14
දියණියෙනි, භය නොවව. බලව, නුඹේ
රජ කොටළු පැටවෙකු පිට නැගී 15
එනසේකැයි ලියා තිබෙන හැටියට
යේසුස්වහන්සේ කොටළු තරයෙකු ලැබ

16 උඹ පිට හිඳගත්සේක. උන්වහන්සේගේ
ගෝලයෝ ඒ කාරණා පළමුවෙන් තේරුම්
නොගත්තෝය. නුමුත් යේසුස්වහන්සේ
මහිමයට පැමිණි කල උන්වහන්සේ ගැන
මෙසේ ලියා තිබුණු බවද ඔවුන්
උන්වහන්සේට එසේ කළ බවද ඔව්හු
17 සිහිකළෝය. එබැවින් උන්වහන්සේ
ලාසරුස් සොහොන්ගෙයින් පිටතට
කැඳවා මළවුන්ගෙන් නැගිටෙවූ කල
උන්වහන්සේ සමග සිටියාවූ සමූහයා
18 සාක්ෂි දරුවෝය. මේ ලකුණ
උන්වහන්සේ දැක්වූසේකැයි සමූහයාට
ආරංචිවූ බැවින් ඔව්හු උන්වහන්සේගේ
19 පෙරමගට ගියෝය. එහෙයින් ඵරිසිවරු
ඔවුනොවුන් කථාකරමින්: නුඹලාට කිසි
ජයක් නැති හැටි බලාපල්ලා. අන්න,
ලෝකයා ඔහු පස්සේ ගියෝයයි කීවෝය.

## ග්‍රීක්වරුන්ගේ ඉල්ලීම

20 මංගල්‍යයේදී නමස්කාරකරන පිණිස
පැමිණියවුන් අතරේ සමහර ග්‍රීකයෝ
21 සිටියෝය. එවිට ඔව්හු ගලීලයේ
බෙත්සයිදවේ පිලිප් වෙතට පැමිණ:
මහතාණෙනි, අපි යේසුස්වහන්සේ
22 දකින්ට කැමැත්තෙමුයයි කීවෝය. පිලිප්
ඇවිත් අන්ද්‍රෑට කීවේය. අන්ද්‍රෑද පිලිප්ද
ඇවිත් යේසුස්වහන්සේට කීවෝය.
23 යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
මනුෂ්‍ය පුත්‍රයා මහිමයට පමුණුවනු
24 ලබන පැය පැමිණ තිබේ. සැබවක්
සැබවක් නුඹලාට කියමි—ගෝධුම බීජය
පොළොවෙහි වැටී නොමළොත් තනිව
තිබෙයි; නුමුත් මළොත් බොහෝ ඵල
25 දෙයි. තමාගේ ජීවිතයට ප්‍රියවන්නාට
ඒක නැතිවන්නේය; මේ ලෝකයෙහි
තමාගේ ජීවිතයට වෛර කරන්නා
සදාකාල ජීවනයට ඒක ආරක්ෂාකර-
26 ගන්නේය. යමෙක් මට සේවයකෙරේ
නම් ඔහු මා අනුව ඒවා; මම යම්
තැනක සිටිම්ද එතැන මාගේ සේවකයාද
සිටින්නේය. යමෙක් මට සේවයකෙරේ
නම් ඔහුට මාගේ පියාණෝ
27 ගෞරවකරනසේක. දැන් මාගේ සිත
කැලඹෙයි; ඉදින් කුමක් කියම්ද?
පියාණෙනි, මේ පැයෙන් මා ගැළෙවුව
මැනව. නුමුත් මේ පිණිසම මේ පැයට
පැමුණුණෙමි. පියාණෙනි, ඔබගේ නාමය 28
මහිමයට පැමිණෙවූව මැනවයි කීසේක.
එවිට: මම එය මහිමයට පැමිණෙවීමි,
නැවතත් මහිමයට පමුණුවන්නෙමියි
අහසෙන් හඬක් නික්මුණේය. එබැවින් 29
ළඟ සිටියාවූ ඒ ඇසූ සමූහයා: අහස
ගෙරෙවුවේයයි කීවෝය. තවත්
සමහරෙක්: දේවදූතයෙක් උන්වහන්සේට
කථාකළේයයි කීවෝය. යේසුස්වහන්සේ 30
උත්තරදෙමින්: මේ හඬ මා නිසා නොව
නුඹලා නිසා පැමිණියේය. මේ ලෝකයේ 31
විනිශ්වය දැන්ය. මේ ලෝකයේ අධිපතියා
දැන් පිටත දමනු ලබන්නේය. මම වනාහි 32
භූමියෙන් ඔසවනු ලැබුවොත් සියල්ලන්
මා වෙතට ඇදගන්නෙමියි කීසේක.
උන්වහන්සේ මෙසේ කීවේ තමන්වහන්සේ 33
කොයි ආකාර මරණයකින් මැරෙන්ට
සිටිසේක්දැයි හඟවන පිණිසය. එබැවින් 34
සමූහයා උන්වහන්සේට උත්තරදෙමින්:
ක්‍රිස්තුස්වහන්සේ සදාකල් සිටිනසේකැයි
අපි ව්‍යවස්ථාවෙන් ඇසීමුව. එසේවී
නම්—මනුෂ්‍ය පුත්‍රයා ඔසවනු ලැබිය
යුතුයයි ඔබ කියන්නේ කොහොමද? මේ
මනුෂ්‍ය පුත්‍රයා කවුදැයි කීවෝය. එබැවින් 35
යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්:
තව ස්වල්ප කලක් ආලෝකය නුඹලා
අතරේ තිබේ. අන්ධකාරය නුඹලා කරා
වහාම නොපැමිණෙන පිණිස නුඹලාට
ආලෝකය තිබෙන කල ඇවිදපල්ලා.
අන්ධකාරයේ ඇවිදින තැනැත්තේ තමා
කොතැනට යන්නේදැයි නොදනියි. නුඹලා 36
ආලෝකයේ පුත්‍රයන් වන පිණිස
ආලෝකය නුඹලාට තිබෙද්දී ආලෝකය
කෙරෙහි අදහාගනිල්ලායයි කීසේක.
යේසුස්වහන්සේ මෙසේ කියා පිටත්ව
ගොස් ඔවුන් කෙරෙන් සැඟවුණුසේක.

## යුදෙව්වන්ගේ අවිශ්වාසය. සමහරෙක් රහසින් ගෝලයන් වීම

උන්වහන්සේ ඔවුන් ඉදිරියෙහි මෙපමණ 37
ලකුණු දැක්වූ නුමුත් ඔව්හු උන්වහන්සේ
කෙරෙහි අදහා නොගත්තෝය. මෙසේ 38
සිද්ධවුණේ,

ස්වාමීන්වහන්සේ, අපේ ප්‍රවෘත්තිය
විශ්වාසකළේ කවුද?
ස්වාමීන්වහන්සේගේ බාහුව කාට
ප්‍රකාශකරනලද්දේදැයි
අනාගතවක්තෘවූ යෙසායා කී වචනය
39 සම්පූර්ණ වන පිණිසය. මේ නිසා ඔවුන්ට
අදහාගන්ට නුපුළුවන්විය, මක්නිසාද
යෙසායා නැවතත් කථාකොට:
40 ඔවුන් තමුන්ගේ ඇස්වලින් නොදකින
පිණිසත් හිතෙන් තේරුම්
නොගන්නා පිණිසත්
හරවනු නොලබන පිණිසත්
මා විසින් සුවකරනු නොලබන
පිණිසත්
උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අන්ධ
කළසේක, ඔවුන්ගේ හිත්
දැඩිකළසේකැයි
41 කීය. යෙසායා උන්වහන්සේ ගැන
කථාකරමින් මේ කාරණා කීවේ
උන්වහන්සේගේ මහිමය දුටු නිසාය.
42 එසේවී නුමුත් මූලාදෑනීන්ගෙන් පවා
බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි
අදහාගත්තෝය; නුමුත් සිනගෝගයෙන්
අහක්කරනු නොලබන පිණිස ඵරිසිවරුන්
නිසා ඒ බව ප්‍රකාශ නොකළෝය.
43 මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගෙන්
ලැබෙන ගෞරවයට වඩා මනුෂ්‍යයන්ගෙන්
ලැබෙන ගෞරවයට ප්‍රියවූවෝය.

## යේසුස්වහන්සේගේ ඉගැන්වීම සංක්ෂේපයෙන් සංග්‍රහකිරීමක්

44 යේසුස්වහන්සේ ශබ්ද පවත්වමින්
කියනසේක්: මා කෙරෙහි අදහන
තැනැත්තේ මා කෙරෙහි නොව මා එවූ
තැනන්වහන්සේ කෙරෙහි අදහාගනියි.
45 මා දකින්නාද මා එවූ තැනන්වහන්සේ
46 දකියි. මා කෙරෙහි අදහාගන්න කවරෙක්
නුමුත් අන්ධකාරයෙහි නොසිටින පිණිස
මම ලෝකයට ආලෝකයක්ව ආවෙමි.
47 තවද යමෙක් මාගේ වචන අසා ඒවා
නොපවත්වන්නේ නම්, මම ඔහු විනිශ්චය
නොකරමි. මක්නිසාද මා ආවේ ලෝකය
ගළවන්ට මිස විනිශ්චයකරන්ට
48 නොවේය. මා එපාකොට මාගේ වචන
පිළි නොගන්නා විනිශ්චයකරන්නෙක්
සිටිනසේක. මා කී වචනයම අන්තිම
දවසේදී ඔහු විනිශ්චයකරන්නේය.
මක්නිසාද මම මාගෙන්ම උපදවා කථා 49
නොකෙළෙමි; නුමුත් මා එවූ මාගේ
පියාණන්වහන්සේම මා විසින් කිය යුතු
දේ ගැනත් කථාකළ යුතු දේ ගැනත්
මට අණක් දී තිබේ. උන්වහන්සේගේ 50
අණ සදකාල ජීවනය බවද දනිමි.
එබැවින් මා කථාකරන දේ පියාණන්-
වහන්සේ මට කියා දුන් ලෙසම
කථාකරමියි කීසේක.

## ගෝලයන්ගේ පාද සේදීම

13 පාස්කු මංගල්‍යයට පළමුවෙන්,
යේසුස්වහන්සේ මේ ලෝකයෙන්
පිටත්ව පියාණන්වහන්සේ ළඟට යන
තමන්ගේ පැය පැමිණ තිබෙන බව දැන,
ලෝකයෙහි සිටියාවූ ස්වකීය සෙනඟට
ප්‍රේමයෙන් සිට, අන්තිම දක්වා
ඔවුන්ට ප්‍රේමකළසේක. යේසුස්වහන්සේ 2
පාවාදෙන්ට සීමොන්ගේ පුත්‍රවූ යූදස්
ඉස්කාරියෝත්ගේ සිත යක්ෂයා විසින්
පොළඹවා තිබුණෙන්, රාත්‍රිකෑම කද්දී, 3
උන්වහන්සේ පියාණන්වහන්සේ විසින්
තමන්ගේ අත්වලට සියල්ල දී තිබෙන
බවද තමන් දෙවියන්වහන්සේ වෙතින්
ආ බවද දෙවියන්වහන්සේ ළඟට යන
බවද දැන, රාත්‍රිකෑමෙන් නැඟිට, උඩ 4
ඇඳුම ගළවා තබා, රෙදිකඩක් රැගෙන
ඉහටියෙහි බැඳගත්සේක. ඉන්පසු 5
උන්වහන්සේ භාජනයට වතුර වත්කොට
ගෝලයන්ගේ පාද සෝදන්ටත් තමන්
ඉහටියේ බැඳගත් රෙදිකඩින් පිසදමන්ටත්
පටන්ගත්සේක. උන්වහන්සේ සීමොන් 6
පේත්‍රුස් ළඟට ආසේක. ඔහු: ස්වාමිනි,
ඔබ මාගේ පාද සෝදනසේක්දැයි
කීවේය. යේසුස්වහන්සේ උත්තරදෙමින්: 7
මම කුමක් කරම්දැයි දැන් නුඹ දන්නේ
නැත; නුමුත් පසුව නුඹට තේරෙනවා
ඇතැයි ඔහුට කීසේක. ඔබවහන්සේට 8
කිසිකලක මාගේ පාද සෝදන්ට
නොදෙමියි පේත්‍රුස් උන්වහන්සේට
කීවේය. යේසුස්වහන්සේ උත්තරදෙමින්:

මම නුඹ නොසේදුවොත් මා හා සමග
පංගුකාරකමක් නුඹට නැතැයි ඔහුට
9 කීසේක. සීමොන් පේත්‍රුස්: ස්වාමිනි,
මාගේ පාද පමණක් නොව අත්ද හිසද
(සේදුව මැනවයි) උන්වහන්සේට කීවේය.
10 යේසුස්වහන්සේද: නෑවාවූ තැනැත්තේ
මුළුමනින්ම පවිත්‍ර බැවින් ඔහුට
ඕනෑකරන්නේ පාද සේදීම පමණක්ය.
නුඹලා පවිත්‍රය, නුමුත් සියල්ලෝම
11 නොවේයයි ඔහුට කීසේක. නුඹලා
සියල්ලෝම පවිත්‍ර නැතැයි කීවේ
උන්වහන්සේ තමන් පාවාදෙන්නා
දැනගෙන සිටි හෙයිනි.
12 මෙසේ උන්වහන්සේ ඔවුන්ගේ පාද
සෝද තමන් ඇඳුම් ඇඳ නැවත
හිඳගත්කල ඔවුන්ට කියනසේක්: මා
නුඹලාට කළ දේ කිමෙක්දැයි නුඹලා
13 දන්නහුද? ආචාරීනි, ස්වාමිනි කියා
නුඹලා මට කියහුය. නුඹලා කියනවා
14 හරිය; මක්නිසාද මම එසේ වෙමි. ඉදින්
ස්වාමිද ආචාර්යද වූ මම නුඹලාගේ
පාද සේදීම් නම් නුඹලා විසිනුත්
එකිනෙකාගේ පාද සේදිය යුතුය.
15 මක්නිසාද මා නුඹලාට කළ ලෙස
නුඹලාත් කරන පිණිස නුඹලාට
16 ආදර්ශයක් දුනිමි. සැබවක් සැබවක්
නුඹලාට කියමි—දසයෙක් තමාගේ
ස්වාමියාට වඩා උතුම් නැත;
පණිවුඩකාරයෙක්ද තමා යැවූ
17 තැනැත්තාට වඩා උතුම් නැත. ඉදින් මේ
දේවල් දන්නාවූ නුඹලා ඒවා කරනවා
18 නම් නුඹලා ආශිර්වාදලද්දෝය. මා
කථාකරන්නේ නුඹලා සියල්ලත් ගැන
නොවේය. මා විසින් තෝරාගත්තවුන්
මම දනිමි. නුමුත් මාගේ භෝජනය
කන තැනැත්තා මට විරුද්ධව විලුඹ
එසවූයේයයි ලියා තිබෙන ලියවිල්ල
19 සම්පූර්ණවිය යුතුය. ඒක සිද්ධවුණාම
මම උන්වහන්සේමයයි නුඹලා විශ්වාස
කරන පිණිස ඒක පැමිණෙන්ට පළමුවෙන්
20 මෙවක් පටන් නුඹලාට කියමි. සැබවක්
සැබවක් නුඹලාට කියමි—මා විසින්
එවනලද කවරෙකු නුමුත් පිළිගන්නා
මා පිළිගන්නේය; මා පිළිගන්නා මා
එවූ තැනන්වහන්සේව පිළිගන්නේයයි
කීසේක.

## යේසුස්වහන්සේ තමන් පාවා දෙන්නා කවුදැයි දැනුම්දීම

යේසුස්වහන්සේ මෙසේ කියා 21
ආත්මයෙන් කැලඹී සාක්ෂිදෙමින්:
සැබවක් සැබවක් නුඹලාට කියමි—
නුඹලාගෙන් එක්කෙනෙක් මා පාවා-
දෙන්නේයයි කීසේක. ගෝලයෝ 22
උන්වහන්සේ කවරෙකු ගැන කීසේක්දෝ
කියා සැකකොට ඔවුනොවුන්
දෙස බැලුවෝය. යේසුස්වහන්සේගේ 23
ගෝලයන්ගෙන් කෙනෙක්වූ උන්වහන්සේ
ප්‍රේමකළ තැනැත්තා මේසයෙහි
උන්වහන්සේගේ ළයට හාන්සිවී උන්නේය.
එබැවින් සීමොන් පේත්‍රුස් ඔහුට සංඥ 24
කොට: උන්වහන්සේ කා ගැන කථාකරන-
සේක්දැයි (අපට) කියන්නැයි ඔහුට
කීවේය. ඔහු යේසුස්වහන්සේගේ ළයට 25
හාන්සිව හිඳිමින්ම: ස්වාමිනි, ඒ
කවුදැයි උන්වහන්සේට කීවේය. එවිට 26
යේසුස්වහන්සේ උත්තරදෙමින්: මම
කැබෙල්ල පොඟවා යමෙකුට දෙම්ද ඒ
ඔහුමයයි කීසේක, මෙසේ උන්වහන්සේ
කැබෙල්ල පොඟවා සීමොන්ගේ පුත්‍රවූ
යූදස් ඉස්කාරියොත්ට දුන්සේක.
කැබෙල්ල ගත් පසු සාතන් ඔහුට 27
ආවේශවිය. එබැවින් යේසුස්වහන්සේ
ඔහුට කථාකොට: නුඹ කරන දේ
ඉක්මනට කරපන්නැයි ඔහුට කීසේක.
මෙය කුමක් නිසා ඔහුට කීසේක්දැයි 28
කෑමට හිඳගත්තවුන්ගෙන් කිසිවෙක්
දැනගත්තේ නැත. මක්නිසාද යූදස් මුදල් 29
පසුම්බිය දැරූ බැවින්, මංගල්‍යයට ඕනෑ
දේ මිලේට ගනින්න, නොහොත් දිළිඳුන්ට
යමක් දීපන්න කියා යේසුස්වහන්සේ
ඔහුට කීසේකැයි සමහරු සිතුවෝය.
එවිට ඔහු කැබෙල්ල ගෙන එකෙණෙහිම 30
පිටතට ගියේය. රාත්‍රියද විය.

## ප්‍රේමය නමැති අලුත් ආඥව

ඔහු පිටතට ගිය කල යේසුස්වහන්සේ 31
කියනසේක්: දැන් මනුෂ්‍ය පුත්‍රයා මහිමයට
පැමුණුණේය, දෙවියන්වහන්සේද ඔහු
තුළ මහිමයට පැමිණිසේක; දෙවියන්- 32
වහන්සේ තමන් තුළම ඔහුව මහිමයට

පමුණුවනසේක, උන්වහන්සේ ඔහුව
වහාම මහිමයට පමුණුවනසේක.
33 දරුවෙනි, මා තුඹලා සමග සිටින්නේ
තව ස්වල්ප වේලාවක්ය. තුඹලා මා
සොයනවා ඇත. මා යන තැනට එන්ට
තුඹලාට බැරියයි යුදෙව්වරුන්ට කී
34 ලෙසම දැන් තුඹලාටත් කියමි. මා
තුඹලාට ප්‍රේමකළාක්මෙන් තුඹලාත්
එකිනෙකාට ප්‍රේමකරන ලෙස,
එකිනෙකාට ප්‍රේමකරපල්ලාය කියා
අලුත් ආඥුවක් මම තුඹලාට දෙමි.
35 තුඹලා එකිනෙකාට ප්‍රේමකරනවා නම්,
තුඹලා මාගේ ගෝලයෝ බව එයින්
සියල්ලන් දැනගන්නවා ඇතැයි කීසේක.

## පේත්‍රුස් විසින් 'නාදුනමි'යි කියන බව කලින් ප්‍රකාශකිරීම

36 සීමොන් පේත්‍රුස් උන්වහන්සේට
කථාකොට: ස්වාමිනි, ඔබ කොතැනට
යනසේක්දැයි ඇසුවේය. යේසුස්වහන්සේ
උත්තරදෙමින්: මා යන තැනට දැන් මා
අනුව එන්ට තුඹට බැරිය; තුමුත් පසුව
37 එන්නෙහියයි කීසේක. පේත්‍රුස්
උන්වහන්සේට කථාකොට: ස්වාමිනි,
දැන්ම ඔබ අනුව මට එන්ට බැරි
මක්නිසාද? ඔබ නිසා මාගේ ජීවිතය
38 දෙමියි කීවේය. යේසුස්වහන්සේ
උත්තරදෙමින්: තුඹ මා නිසා තුඹේ
ජීවිතය දෙන්නෙහිද? සැබවක් සැබවක්
තුඹට කියමි–තුඹ මා නාදුනමියි
තුන්වරක් කියන තෙක් කුකුළා හඬලන්නේ
නැතැයි කීසේක.

## පියාණන්වහන්සේ වෙත පැමිණීමේ මාර්ගය

14 තුඹලාගේ සිත් නොකැලඹේවා.
දෙවියන්වහන්සේ කෙරේ විශ්වාස-
කරපල්ලා; මා කෙරේත් විශ්වාසකරපල්ලා.
2 මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි
බොහෝ වාසස්ථාන ඇත්තේය; එසේ
නොවූයේ නම් මා විසින් තුඹලාට
කියනවා ඇත; මක්නිසාද තුඹලාට
ස්ථානයක් පිළියෙළකරන පිණිස යමි.
3 මම ගොස් තුඹලාට ස්ථානයක්
පිළියෙළකරම් නම්, මා සිටින තැන
තුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත්
තුඹලා මා ළඟට ගන්නෙමි. මා යන 4
ස්ථානයට මාර්ගය තුඹලා දන්නහුයයි
කීසේක. තෝමස්ද: ස්වාමිනි, ඔබ 5
කොතැනට යනසේක්දැයි අපි නොදනිමුව;
මාර්ගය දන්නේ කොහොමදැයි
උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේ 6
ඔහුට කියනසේක්: මාර්ගයද සැබෑවද
ජීවනයද මමය. මා කරණකොටගෙන
මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට
පැමිණෙන්නේ නැත, තුඹලා මා 7
ඇඳිනගත්තා නම් මාගේ පියාණන්-
වහන්සෙත් අඳුනනවා ඇත. මෙතැන්
පටන් තුඹලා උන්වහන්සේව අඳුනති,
දැකලාත් තිබේයයි කීසේක. පිලිප්ද: 8
ස්වාමිනි, පියාණන්වහන්සේ අපට
පෙන්නුව මැනව, ඒ අපට ඇතැයි
උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේ 9
ඔහුට කියනසේක්: පිලිප්, මා මෙපමණ
කල් තුඹලා සමග සිටලාත් මා
අඳුනන්නේ නැද්ද? මා දුටු තැනැත්තේ
පියාණන්වහන්සේ දුටුවේය; එසේවී
නම්–පියාණන්වහන්සේ අපට පෙන්නුව
මැනවයි තුඹ කියන්නේ කෙසේද? මා 10
පියාණන්වහන්සේ තුළෙහිත් පියාණන්-
වහන්සේ මා තුළෙහිත් සිටින බව
විශ්වාසකරන්නේ නැද්ද? මා තුඹලාට
කියන වචන මමම උපදවා කථානොකරමි;
තුමුත් පියාණන්වහන්සේ මා තුළෙහි
වසමින් ස්වකීය ක්‍රියා කරනසේක. මම 11
පියාණන්වහන්සේ තුළෙහිත් පියාණන්-
වහන්සේ මා තුළෙහිත් සිටිනසේක යන
මාගේ කීම විශ්වාසකරපල්ලා. එසේ
නැත්නම් මාගේ ක්‍රියා නිසාම
විශ්වාසකරපල්ලා. සැබවක් සැබවක් 12
තුඹලාට කියමි–මා කෙරෙහි අදහන්නා
මා කරන ක්‍රියාත් කරන්නේය; මා
පියාණන්වහන්සේ ළඟට යන නිසා
මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය.
තුඹලා මාගේ නාමයෙන් ඉල්ලන 13
කොයි දෙයක් වුවත්, පුත්‍රයා තුළ
පියාණන්වහන්සේ මහිමය ලබන පිණිස
මම ඒක ඉෂ්ටකරන්නෙමි. තුඹලා විසින් 14
මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත්,
මම ඒක ඉෂ්ටකරන්නෙමි.

## ශුද්ධාත්මයාණන් එවීම ගැන පොරොන්දුව

15 තුඹලා මට ප්‍රේමකරනවා නම්
16 මාගේ ආඥ රක්ෂාකරන්නහුය. මම
පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි,
එවිට උන්වහන්සේ තුඹලා සමග
සදකල්ම සිටින පිණිස වෙන
සැනසිලිකාරයෙකු තුඹලාට දෙනසේක.
17 ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ
ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව
පිළිගන්ට ලෝකයාට බැරිය; මක්නිසාද
ලෝකයා උන්වහන්සේව දකින්නේවත්
අඳුනන්නේවත් නැත. තුඹලා
උන්වහන්සේව අඳුනන්නහුය; මක්නිසාද
උන්වහන්සේ තුඹලා සමග නැවතී
සිටිනසේක, තුඹලා තුළෙහි සිටිනසේක.
18 තුඹලා අනාථව නාරින්නෙමි. තුඹලා
19 වෙතට එමි. තව ස්වල්ප වේලාවකින්
ලෝකයා මා තවත් නොදකිති; තුමුත්
තුඹලා මා දකින්නහුය. මා ජීවත්වන
20 බැවින් තුඹලාත් ජීවත්වන්නහුය. ඒ
දවසේදී මා පියාණන්වහන්සේ තුළෙහිද
තුඹලා මා තුළෙහිද මා තුඹලා තුළෙහිද
21 සිටින බව තුඹලා දැනගන්නහුය. යමෙක්
මාගේ ආඥ පිළිගෙන රක්ෂාකෙරේද,
මට ප්‍රේමකරන්නේ ඔහුය. මට
ප්‍රේමකරන්නා මාගේ පියාණන් විසින්
ප්‍රේමකරනු ලබන්නේය, මමද ඔහුට ප්‍රේම
කොට ඔහුට ප්‍රකාශවන්නෙමියි කීසේක.
22 ඉස්කාරියෝත් නොවන යූදස්
උන්වහන්සේට කථාකොට: ස්වාමිනි,
ඔබ ලෝකයාට ප්‍රකාශ නොවී අපට
ප්‍රකාශවන්නේ කුමක් නිසාදැයි
23 උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේ
ඔහුට උත්තරදෙමින්: යමෙක් මට
ප්‍රේමකරන්නේ නම්, ඔහු මාගේ වචනය
රක්ෂාකරන්නේය. මාගේ පියාණන්-
වහන්සේද ඔහුට ප්‍රේමකරනසේක, අපි
ඔහු ළඟට ඇවිත් ඔහු සමග වාසය
24 කරමුව. මට ප්‍රේම නොකරන්නා මාගේ
වචන රක්ෂා නොකරයි. තුඹලා අසන
වචනය මාගේ නොව මා එවූ පියාණන්-
වහන්සේගේය.

මම තුඹලා සමග සිටියදීම මේ දේවල් 25
තුඹලාට කීවෙමි. තුමුත් මාගේ 26
නාමයෙන් පියාණන්වහන්සේ එවන
සැනසිලිකාරයාණන්වහන්සේ, එනම්
ශුද්ධාත්මයාණන්වහන්සේ, තුඹලාට
සියල්ල උගන්වමින්, මා විසින් තුඹලාට
කියනලද සියල්ල තුඹලාට සිහිකරවන-
සේක. තුඹලා වෙත සමාදනය තබා 27
යමි; මාගේ සමාදනය තුඹලාට දෙමි.
මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන්
නොවේ. තුඹලාගේ සිත් කැලඹෙන්ටවත්
භයවෙන්ටවත් නොදෙල්ලා. මම අහක්ව 28
ගොස් තුඹලා ළඟට නැවත එමියි මා
තුඹලාට කී බව තුඹලා ඇසුවහුය.
තුඹලා මට ප්‍රේමකළහු නම්, පියාණන්-
වහන්සේ ළඟට මා යන බැවින්
තුඹලා සන්තෝෂවන්නහුය. මක්නිසාද
පියාණන්වහන්සේ මට වඩා උතුම්ය. ඒ 29
දේ සිද්ධවූ කල තුඹලා විශ්වාසකරන
පිණිස දැන් සිද්ධවෙන්ට පළමුවෙන්
තුඹලාට කීවෙමි. තවත් තුඹලා 30
සමග බොහෝකොට කථා නොකරමි,
මක්නිසාද ලෝකයේ අධිපතියා එන්නේය.
තුමුත් ඔහුට මා තුළ කිසිවක් නැත;
එහෙත් මේ දේ සිද්ධවෙන්නේ මා 31
පියාණන්වහන්සේට ප්‍රේමකරන බවත්
පියාණන්වහන්සේ මට අණකළ ලෙසම
මා කරන බවත් ලෝකයා දැනගන්නා
පිණිසය. නැගිට මෙතැනින් යමුයයි
කීසේක.

## මුද්‍රික වැලට අතු මෙන් යේසුස්වහන්සේට ප්‍රේමයෙන් පැහී සිටීම

15
මම සැබෑවූ මිදිවැලය, මාගේ
පියාණන්වහන්සේ ගොවියාය. මා 2
තුළෙහි තිබී එල නොදරන සියලු අතු
උන්වහන්සේ පහකරනසේක. එල දරන
සියලු අතු වඩා එල දරන පිණිස
උන්වහන්සේ පවිත්‍රකරනසේක. මා විසින් 3
තුඹලාට කී වචනය කරණකොටගෙන
තුඹලා දැන් පවිත්‍රය. මා තුළ පැවතියල්ලා, 4
මමත් තුඹලා තුළ පවතින්නෙමි. අත්ත
මිදිවැලෙහි නොපවතී නම් තනියම එල

දරන්ට බැරුවාක්මෙන්, නුඹලා මා
තුළෙහි නොපවතිවු නම් ඵල දරන්ට
5 නුඹලාට බැරිය. මිදිවැල මමය, නුඹලා
අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද,
මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ
බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන්
වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය.
6 යමෙක් මා තුළෙහි නොපවතී නම්, ඔහු
අත්තක් මෙන් පිටත දමනු ලැබ
වියළීයයි; ඒවා එක්කොට ගින්නට දමනු
7 ලැබේ, ඒවා දලායන්නේය. නුඹලා මා
තුළෙහි පවතින්නෝ නම්, මාගේ වචනය
නුඹලා තුළෙහි පවතී නම්, නුඹලා කැමති
දෙයක් ඉල්ලාපල්ලා, එවිට නුඹලාට
8 ලැබේ. මාගේ පියාණන්වහන්සේට
ගෞරව ලැබෙන්නේ නුඹලා විසින්
බොහෝ ඵල දරීමෙන්ය; මෙසේ නුඹලා
මාගේ ගෝලයෝ වන්නෝය.
9 පියාණන්වහන්සේ මට ප්‍රේමකළාක්මෙන්ම
මමත් නුඹලාට ප්‍රේමකෙළෙම්. මාගේ
10 ප්‍රේමයෙහි පැවතියල්ලා. මම මාගේ
පියාණන්වහන්සේගේ ආඥා රක්ෂාකොට
උන්වහන්සේගේ ප්‍රේමයෙහි යම්සේ
පවතිම්ද, එසේම නුඹලාත් මාගේ ආඥා
රක්ෂාකරවුනම් මාගේ ප්‍රේමයෙහි
11 පවතින්නහුය. මාගේ ප්‍රීතිය නුඹලා
තුළෙහි පවතින පිණිසද නුඹලාගේ ප්‍රීතිය
සම්පූර්ණවන පිණිසද මේ දේවල්
12 නුඹලාට කීවෙමි. මාගේ ආඥාව නම්
මා නුඹලාට ප්‍රේමකළාක්මෙන් නුඹලාත්
එකිනෙකාට ප්‍රේමකරපල්ලාය යනුය.
13 යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ
ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක්
14 කිසිවෙකුට නැත. මා නුඹලාට ආඥා
කරන දේ නුඹලා කරනවානම්, නුඹලා
15 මාගේ මිත්‍රයෝය. දසයා තමාගේ ස්වාමියා
කරන්නේ කුමක්දැයි නොදන්නා
බැවින් තවත් නුඹලාට දසයෝයයි
නොකියමි; මක්නිසාද මාගේ
පියාණන්වහන්සේගෙන් මා ඇසූ සියල්ල
නුඹලාට දන්වූ බැවින් නුඹලා
16 මිත්‍රයෝයයි කීමි. නුඹලා මා
තෝරාගත්තා නොව මම නුඹලා
තෝරාගෙන පත්කෙළෙමි. එසේ කළේ
නුඹලා ගොස් ඵල දරන පිණිසත්
නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ
නාමයෙන් පියාණන්වහන්සේගෙන්
නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත්
උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය.

## ලෝකය සහ සත්‍යතාවේ ආත්මයාණෝ

මේ දේවල් මා නුඹලාට අණ- 17
කරන්නේ නුඹලා එක් එක්කෙනාට
ප්‍රේමකරන පිණිසය. ලෝකයා නුඹලාට 18
වෛරවෙනවා නම්, නුඹලාට පළමුවෙන්
මට වෛරවුණ බව නුඹලා දනිහුය.
නුඹලා ලෝකයට අයිති නම්, ලෝකයා 19
තමුන්ගේම අයට ආදරේවන්නෝය.
නුමුත් නුඹලා ලෝකයාගෙන් නොවන
නිසාත් මා විසින් ලෝකයෙන් නුඹලා
තෝරාගත් නිසාත් ලෝකයා නුඹලාට
වෛරවෙති. දසයෙක් තමාගේ ස්වාමියාට 20
වඩා උතුම් නොවේයයි නුඹලාට මා කී
වචනය සිහිකරපල්ලා. ඔව්හු මට
පීඩාකළෝනම් නුඹලාටත් පීඩා
කරන්නෝය; මාගේ වචනය රක්ෂා
කළෝ නම් නුඹලාගේ වචනයත් රක්ෂා
කරන්නෝය. නුමුත් ඔවුන් මා එවූ 21
තැනන්වහන්සේව නාඳුනන බැවින් මාගේ
නාමය නිසා මේ සියල්ල නුඹලාට
කරනවා ඇත. මම ඇවිත් ඔවුන්ට කථා 22
නොකෙළෙම් නම්, ඔවුන්ට පාපයක් නැත.
නුමුත් දැන් ඔවුන්ගේ පාපය ගැන
ඔව්හු නිරුත්තරව සිටිති. මට වෛර- 23
වෙන්නා මාගේ පියාණන්වහන්සේටත්
වෛරවන්නේය. වෙන කිසිවෙකු විසින් 24
නොකළ ක්‍රියා මම ඔවුන් අතරෙහි
නොකෙළෙම් නම්, ඔවුන්ට පාපයක් නැත.
නුමුත් දැන් ඔව්හු මාද මාගේ
පියාණන්වහන්සේද දැක වෛරවූවෝය.
(මෙසේ වූණේ) ඔව්හු නිස්කාරණයේ 25
මට වෛරවූණෝයයි ඔවුන්ගේ
ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන වචනය
සම්පූර්ණවන පිණිසය. නුමුත් 26
පියාණන්වහන්සේ කෙරෙන් මා විසින්
නුඹලාට එවන සැනසිලිකාරයාණන්-
වහන්සේ එනම් පියාණන්වහන්සේ
වෙතින් නික්මෙන්නාවූ සත්‍යතාවේ

ආත්මයාණන්වහන්සේ ආ කල, උන්-
වහන්සේ මා ගැන සාක්ෂිදෙනසේක.
27 පටන්ගැන්මේ සිට තුඹලා මා සමග
සිටි බැවින් තුඹලාත් සාක්ෂිදෙන්නහුය.
16 තුඹලා බාධා නොවන පිණිස
2 මේ දේවල් තුඹලාට කීවෙමි. ඔව්හු
සිනගෝගවලින් තුඹලා අහක්කරන්නෝය.
එසේය, තුඹලා මරන්නාවූ කවරෙක්
තුමුත් එය තමුන් විසින් දෙවියන්-
වහන්සේට කරන මෙහෙයක්යයි සිතන
3 කාලය පැමිණෙන්නේය. ඔවුන්
පියාණන්වහන්සෙත් මාත් නාදුනන
4 බැවින් මේ දේවල් කරනවා ඇත. තවද
මා විසින් මේ දේවල් තුඹලාට කීවේ
ඒවායේ කාලය පැමිණි කල මා ඒවා
කී බව තුඹලාට මතක්වෙන පිණිසය.
මේ දේවල් පටන්ගැන්මේ සිට තුඹලාට
නොකීවේ මා තුඹලා සමග සිටි නිසාය.
5 තුමුත් දැන් මා එවූ තැනන්වහන්සේ
ළඟට යමි; කොතැනට යනසේක්දැයි
තුඹලාගෙන් කිසිවෙක් මාගෙන් අසන්නේ
6 නැත. තුමුත් මා මේ දේවල් තුඹලාට කී
බැවින් තුඹලාගේ සිත් දුකින් පිරී තිබේ.
7 එසේවී තුමුත් මම තුඹලාට සැබෑව
කියමි: මාගේ අහක්ව යෑම තුඹලාට
ප්‍රයෝජනවත්ය. මක්නිසාද මා අහක්ව
නොගියොත්, සැනසිලිකාරයාණන්-
වහන්සේ තුඹලා ළඟට එන්නේ නැත;
තුමුත් ගියොත්, උන්වහන්සේ තුඹලා
8 වෙතට එවන්නෙමි. උන්වහන්සේ ආ කල,
පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද
විනිශ්චය ගැනද ලෝකයාට අභවාදෙන-
9 සේක. පාපය ගැනයයි කීවේ ඔවුන්
මා කෙරෙහි නොඅදහන නිසාය;
10 ධර්මිෂ්ඨකම ගැනයයි කීවේ මාගේ
පියාණන්වහන්සේ ළඟට යන බැවින්
තවත් තුඹලා මා නොදක්නා නිසාය;
11 විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ
අධිපතියා විනිශ්චයකරනු ලැබ සිටින
12 නිසාය. තුඹලාට කියන්ට තව බොහෝ
දේවල් මට ඇත්තේය, තුමුත් දැන් ඒවා
13 දරන්ට තුඹලාට බැරිය. එසේවී
තුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ
ආත්මයාණන්වහන්සේ ආ කල,
උන්වහන්සේ මුළු සත්‍යය කරා
තුඹලාට මගපෙන්වනසේක. මක්නිසාද
උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා
නොකර, උන්වහන්සේ අසන දේ කියා,
පැමිණෙන්ට තිබෙන දේ තුඹලාට
ප්‍රකාශකරනසේක. උන්වහන්සේ මා 14
ගෞරවයට පමුණුවනසේක. මක්නිසාද
උන්වහන්සේ මා සන්තක දෙයින්
රැගෙන තුඹලාට ප්‍රකාශකරනසේක.
පියාණන්වහන්සේ සන්තක සියල්ල 15
මාගේය. එහෙයින්: උන්වහන්සේ මා
සන්තක දෙයින් රැගෙන තුඹලාට
ප්‍රකාශකරනසේකැයි කීවෙමි.

## අවසාන අනුශාසනා වාක්‍ය

ස්වල්ප වේලාවකින් තුඹලා මා තවත් 16
දකින්නේ නැත; නැවත ස්වල්ප
වේලාවකින් තුඹලා මා දකිනවා ඇතැයි
කීසේක. එබැවින් උන්වහන්සේගේ 17
ගෝලයන්ගෙන් සමහරෙක් ඔවුනොවුන්
කථාකොට: ස්වල්ප වේලාවකින් තුඹලා
මා දකින්නේ නැත කියාත්, තව ස්වල්ප
වේලාවකින් තුඹලා මා දකිනවා ඇත
කියාත්, මා පියාණන්වහන්සේ ළඟට
යන නිසාය කියාත් මුන්වහන්සේ අපට
කියන මේ දේ කිමෙක්දැයි කීවෝය.
එබැවින් ඔව්හු කථාකොට: ස්වල්ප 18
වේලාවකැයි උන්වහන්සේ කියන මේක
මොකක්ද? උන්වහන්සේ කියන්නේ
කුමක්ද කියා අපි නොදනිමුයයි කීවෝය.
තමන්ගෙන් අසන්ට ඔවුන් කැමති බව 19
යේසුස්වහන්සේ දැන, ඔවුන්ට කියන-
සේක්: ස්වල්ප වේලාවකින් තුඹලා
මා නොදක්නහුය, නැවත ස්වල්ප
වේලාවකින් තුඹලා මා දකින්නහුයයි
මා කී කාරණය ගැන තුඹලා එකිනෙකා
විචාරවුද? සැබවක් සැබවක් තුඹලාට 20
කියමි—තුඹලා හඬා වැලපෙන්නහුය,
තුමුත් ලෝකයා ප්‍රීතිවන්නෝය. තුඹලා
ශෝකවන්නහුය, තුමුත් තුඹලාගේ
ශෝකය ප්‍රීතියට හැරෙන්නේය. ස්ත්‍රියෙක් 21
වදන වේදනාවෙන් සිටින කල, ඇගේ
වේලාව පැමිණි නිසා ඇට ශෝකය
තිබේ. තුමුත් ඈ දරුවා වැදූ පසු,

ලෝකයට මනුෂ්‍යයෙක් උපන්නේය යන
ප්‍රීතිය නිසා, වේදනාව තවත් සිහි
22 නොකරන්නීය. එසේ තුඹලාට දැන්
ශෝකය තිබේ. නුමුත් නැවත තුඹලා
දකින්නෙමි, එවිට තුඹලාගේ සිත
ප්‍රීතිවන්නේය, තුඹලාගේ ප්‍රීතිය කිසිවෙක්
23 තුඹලාගෙන් පැහැර නොගන්නේය. ඒ
දවසේදී තුඹලා මාගෙන් කිසිවක්
අසන්නේ නැත. සැබවක් සැබවක්
තුඹලාට කියමි—පියාණන්වහන්සේගෙන්
තුඹලා යමක් ඉල්ලුවොත්, උන්වහන්සේ
මාගේ නාමයෙන් ඒ දේ තුඹලාට
24 දෙනසේක. මේ දක්වා මාගේ නාමයෙන්
තුඹලා කිසිවක් ඉල්ලුවේ නැත. තුඹලාගේ
ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ඉල්ලාපල්ලා,
එවිට තුඹලාට ලැබෙන්නේය.
25 මේ දේ උපමාවලින් තුඹලාට
කථාකෙළෙමි. නුමුත් උපමාවලින් තවත්
තුඹලාට කථා නොකොට පැහැදිලි
ලෙස පියාණන්වහන්සේ ගැන තුඹලාට
දන්වන්නාවූ කාලය පැමිණෙන්නේය.
26 ඒ දවසේදී මාගේ නාමයෙන් තුඹලා
ඉල්ලන්නහුය. තුඹලා උදෙසා
පියාණන්වහන්සේට යාච්ඤාකරන්නෙමියි
27 නොකියමි; මක්නිසාද තුඹලා මට
ප්‍රේමවූ බැවින්ද මා දෙවියන්වහන්සේ
වෙතින් ආ බව විශ්වාසකළ බැවින්ද
පියාණන්වහන්සේම තුඹලාට ප්‍රේමවන-
28 සේක. මම පියාණන්වහන්සේ වෙතින්
පිටත්ව ලෝකයට ඇවිත් සිටිමි. නැවත
මම ලෝකය අත්හැර පියාණන්වහන්සේ
29 වෙතට යමියි කීසේක. උන්වහන්සේගේ
ගෝලයෝ කථාකොට: දැන් ඔබ උපමා
නැතුව පැහැදිලිලෙස කථාකරනසේක.
30 ඔබ සියල්ල දන්නා බවද කිසිවෙකු
විසින් ඔබගෙන් විචාරන්ට ඕනෑ
නැති බවද දැන් අපි දනිමුව. ඔබ
දෙවියන්වහන්සේ වෙතින් ආ බව අපි
මෙයින් විශ්වාසකරමුයයි කීවෝය.
31 යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්:
32 තුඹලා දැන් විශ්වාසකරවුද? බලව,
තුඹලා එකිනෙකා තම තමාගේ
ස්ථානයට විසිර ගොස්, මා තනියම
අත්හැර දමන පැය පැමිණෙන්නේය;
එසේය, දැනටම පැමිණ තිබේ. එසේවී
නුමුත් පියාණන්වහන්සේ මා සමග
සිටින බැවින් මම තනියම නොවෙමි.
මා තුළ තුඹලාට සමාදානය තිබෙන 33
පිණිස මේ දේවල් තුඹලාට කීවෙමි.
ලෝකයෙහි තුඹලාට පීඩා තිබේ. නුමුත්
ධෛර්යවත් වෙයල්ලා; මම ලෝකයෙන්
ජයගතිමියි කීසේක.

## යේසුස්වහන්සේගේ යාච්ඤාව

17 යේසුස්වහන්සේ මේ දේවල් කියා,
ස්වර්ගය දෙසට ඇස් ඔසවා
කියනසේක්: පියාණෙනි, පැය පැමිණ
තිබේ; ඔබගේ පුත්‍රයාට ඔබ දුන් 2
සියල්ලන්ට ඔහු විසින් සදාකාල ජීවනය
දෙන පිණිස ඔබ සියලු මනුෂ්‍යයන්
කෙරෙහි ඔහුට බලය දුන් ලෙස, පුත්‍රයා
ඔබ ගෞරවයට පමුණුවන පිණිස ඔබ
පුත්‍රයා ගෞරවයට පැමිණෙවුව මැනව.
සදාකාල ජීවනය නම් මේය—එකම සැබෑවූ 3
දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ
විසින් එවනලද තැනැත්තා වන යේසුස්
ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳිනගැනීමය.
ඔබ මට කරන්ට දුන් වැඩ මම තීන්දුකර 4
පොළොවේදී ඔබ ගෞරවයට පැමිණෙවීමි.
දැන් පියාණෙනි, ලෝකය තිබෙන්ට 5
පළමුවෙන් ඔබ වෙත මට තිබුණු
මහිමයෙන් ඔබ වෙත මා ගෞරවයට
පැමිණෙවුව මැනව. ඔබ ලෝකයෙන් 6
මට දුන් මනුෂ්‍යයන්ට ඔබගේ නාමය
ප්‍රකාශකෙළෙමි. ඔව්හු ඔබ සන්තක-
වූවෝය, ඔබ ඔවුන් මට දුන්සේක; ඔව්හු
ඔබගේ වචනය රක්ෂා කළෝය. ඔබ 7
මට දුන් සියල්ලම ඔබගෙන් පැමුණුණ
බව ඔව්හු දැන් දනිති. මක්නිසාද ඔබ 8
මට දුන් වචන මම ඔවුන්ට දුනිමි;
ඔව්හු ඒවා පිළිගෙන, මා ඔබ වෙතින්
ආ බව සැබවින් දැන, ඔබ මා එවූ බව
විශ්වාසකළෝය. මම ඔවුන් ගැන 9
යාච්ඤාකරමි. ලෝකයා ගැන යාච්ඤා
නොකරමි, නුමුත් ඔබ මට දුන් ඔවුන්
ගැන යාච්ඤාකරමි; මක්නිසාද ඔව්හු
ඔබගේය. මා සන්තක සියල්ල ඔබගේය, 10
ඔබ සන්තක සියල්ල මාගේය. මමද
ඔවුන් තුළ ගෞරවයට පැමිණ සිටිමි.
මම ලෝකයෙහි තවත් නොසිටිමි, ඔව්හු 11
ලෝකයෙහි සිටිති, මමද ඔබ ළඟට

එමි. ශුද්ධවූ පියාණෙනි, අප ඒකත්වයක්ව
සිටින්නාක්මෙන්ම ඔවුන්ද ඒකත්වයක්
වන පිණිස, ඔබ මට දුන් ඔවුන් ඔබගේ
12 නාමයෙන් ආරක්ෂාකළ මැනව. මම
ඔවුන් සමග සිටියදී ඔබ මට දුන් ඔබගේ
නාමයෙන් ඔවුන් ආරක්ෂාකෙළෙමි. මම
ඔවුන් ප්‍රවේසම්කෙළෙමි, ලියවිල්ල
සම්පූර්ණ වන පිණිස විනාශයේ පුත්‍රයා
හැර ඔවුන්ගෙන් කිසිවෙක් විනාශ
13 නූණේය. නුමුත් දැන් ඔබ ළඟට එමි; මා
ලෝකයෙහිදී මේ දේවල් කථාකරන්නේ
ඔවුන් මාගේ ප්‍රීතිය තමුන් තුළ සම්පූර්ණ-
14 ලෙස ලබන පිණිසය. මම ඔවුන්ට
ඔබගේ වචනය දුනිමි; මා ලෝකයාට
අයිති නැති ලෙසම ඔවුනුත් ලෝකයාට
අයිති නැති නිසා ලෝකයා ඔවුන්ට
15 වෛර වුණෝය. ඔබ ලෝකයෙන් ඔවුන්
අහක්කරන පිණිස නොව, නපුරාගෙන්
ඔවුන් ආරක්ෂාකරන පිණිස යාච්ඤා
16 කරමි. මා ලෝකයෙන් නොවන්නාක්
මෙන්ම ඔව්හුද ලෝකයෙන් නොවෙති.
17 සත්‍යතාවෙන් ඔවුන් පවිත්‍රකළ මැනව.
18 ඔබගේ වචනය සත්‍යතාවය. ඔබ මා
ලෝකයට එවූවාක්මෙන්ම මමද ඔවුන්
19 ලෝකයට යැවීමි. සත්‍යතාවෙන් ඔවුන්ද
පවිත්‍රවන පිණිස ඔවුන් උදෙසා මා
20 කැපකරගනිමි. මොවුන් ගැන පමණක්
නොව, මොවුන්ගේ වචනය කරණ-
කොටගෙන මා කෙරෙහි විශ්වාස-
21 කරන්නවුන් ගැනත්, ඔවුන් සියල්ලන්
ඒකත්වයක් වන පිණිස, පියවූ ඔබ මා
තුළෙහිද මා ඔබ තුළෙහිද සිටින්නාක්
මෙන්ම ඔබ මා එවූ බව ලෝකයා
විශ්වාසකරන පිණිසත්, අප තුළ ඔවුන්
ඒකත්වයක් වන පිණිසත් යාච්ඤාකරමි.
22 අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත්
ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන්
23 මහිමය ඔවුන්ට දුනිමි. මෙසේ කෙළේ
මා ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද
සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණලෙස
පැමිණෙන පිණිසත් ඔබ මා එවූ බවද
මට ප්‍රේමකළාක්මෙන් ඔවුන්ටත් ප්‍රේමකළ
බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය.
24 පියාණෙනි, ඔබ මට දුන් මහිමය ඔබ
මට දුන්නාවුන් විසිනුත් දක්නා පිණිස
මා සිටින තැන ඔවුනුත් මා සමග
සිටිනවාට කැමැත්තෙමි. මක්නිසාද
ලෝකය මැවීමට පළමුවෙන් ඔබ මට
ප්‍රේමකළසේක. ධර්මිෂ්ඨ පියාණෙනි, 25
ලෝකයා ඔබ හැඳින්නේ නැත, නුමුත්
මම ඔබ හැඳින්නෙමි; මොව්හුද ඔබ
විසින් මා එවූ බව දැනගත්තෝය. ඔබ 26
මා කෙරෙහි ඇතුව සිටි ප්‍රේමය ඔවුන්
තුළෙහිද මාත් ඔවුන් තුළෙහිද වන පිණිස
ඔබගේ නාමය ඔවුන්ට දැන්වීමි, තවත්
දන්වන්නෙමියි කීසේක.

## යේසුස්වහන්සේ අල්ලාගනු ලැබීම

18
යේසුස්වහන්සේ මේ වචන කියා
නිමවූ කල තමන් ගෝලයන් සමග
කිද්‍රොන් නම් ඔයෙන් එගොඩට ගියසේක;
එහි තිබුණු උයනකට උන්වහන්සේ
තමන් ගෝලයන් සමග ඇතුල්වූසේක.
යේසුස්වහන්සේ තමන් ගෝලයන් සමග 2
නොයෙක් වර එහි ගිය බැවින්,
උන්වහන්සේ පාවාදුන් යූදස් ඒ ස්ථානය
දැනගෙන සිටියේය. එබැවින් යූදස් නායක 3
පූජකයන්ගෙන්ද ඵරිසිවරුන්ගෙන්ද හේවා
කණ්ඩායම සහ සේවකයන් ලබාගෙන,
පහන්ද පන්දම්ද ආයුධද ඇතුව එතැනට
ආවේය. යේසුස්වහන්සේ තමන් කෙරේ 4
පැමිණෙන්නාවූ සියලු දේ දැන,
ඉදිරියට ගොස්: තුඹලා කවරෙකු
සොයවුද්දයි ඔවුන්ගෙන් ඇසූසේක. ඔව්හු 5
උන්වහන්සේට උත්තරදෙමින්: නාසරිය
යේසුස්යයි කීවෝය. ඒ මමයයි 6
යේසුස්වහන්සේ ඔවුන්ට කීසේක.
උන්වහන්සේ පාවාදුන් යූදස්ද ඔවුන්
සමග සිටියේය. ඒ මමයයි යේසුස්-
වහන්සේ ඔවුනට කී කල්හි, ඔව්හු
පස්සෙන් පස්සට ගොස් බිම වැටුණෝය.
එබැවින් නැවතත් උන්වහන්සේ: තුඹලා 7
කවරෙකු සොයවුද්දයි ඔවුන්ගෙන්
ඇසූසේක. නාසරිය යේසුස්යයි ඔව්හු
කීවෝය. යේසුස්වහන්සේ උත්තරදෙමින්: 8
ඒ මමයයි තුඹලාට කීවෙමි. එබැවින්,
තුඹලා මා සොයවු නම්, මොවුන් යන්ට

9 හැරපල්ලායයි කීසේක. මෙසේ වුණේ:
ඔබ මට දුන්නවුන්ගෙන් එක්කෙනෙක්වත්
නැතිවුණේ නැතැයි උන්වහන්සේ විසින්
කියනලද වචනය සම්පූර්ණවන පිණිසය.
10 එවිට සීමොන් පේත්‍රුස්ට කඩුවක්
තිබුණෙන්, ඔහු ඒක ඇද, උත්තම
පූජකයාගේ දසයාට ගසා, ඔහුගේ දකුණු
කන කපාදැමීය. ඒ දසයාගේ නම
11 මල්කස්ය. එබැවින් යේසුස්වහන්සේ
පේත්‍රුස්ට කියනසේක්: කඩුව කොපුවේ
දමාපන්න. පියාණන්වහන්සේ මට දී
තිබෙන කුසලාන නොබොම්දැයි කීසේක.
12 එකල හේවාකණ්ඩායමද ප්‍රධාන
සේනාපතියාද යුදෙව්වරුන්ගේ සේවක-
යෝද යේසුස්වහන්සේ අල්ලා බැඳ,
13 පළමුකොට අන්නස් ළඟට ගෙනගියෝය;
මක්නිසාද ඔහු ඒ අවුරුද්දට උත්තම
පූජකයාවූ කායාඵස්ගේ මාමාව සිටියේය.
14 ඒ කායාඵස් වනාහි එක් මනුෂ්‍යයෙකු
විසින් සෙනඟ උදෙසා මරණය විඳීම
ප්‍රයෝජන ඇතැයි යුදෙව්වරුන්ට උපදෙස්
දුන් තැනැත්තේය.

## පේත්‍රුස් යේසුස්වහන්සේ අඳුනන්නේ නැත කියා කීම

15 සීමොන් පේත්‍රුස්ද තව ගෝලයෙක්ද
යේසුස්වහන්සේ පස්සේ ගියෝය. උත්තම
පූජකයා ඒ ගෝලයා අඳුනන බැවින්,
ඔහු යේසුස්වහන්සේ සමග උත්තම
16 පූජකයාගේ ශාලාවට ඇතුල් විය; නුමුත්
පේත්‍රුස් දෙර ළඟ පිටත සිටියේය. එවිට
උත්තම පූජකයා අඳුනන ඒ අනික්
ගෝලයා පිටතට ගොස් දෙරටුපාලීට
කථාකොට, පේත්‍රුස් ඇතුළට ගෙනාවේය.
17 එවිට දෙරටුපාලීවූ තරුණී: නුඹත්
ඒ මනුෂ්‍යයාගේ ගෝලයන්ගෙන් එක්-
කෙනෙක්දැයි පේත්‍රුස්ගෙන් ඇසුවාය.
18 නැතැයි ඔහු කීවේය. එකල ශීත බැවින්
දසයෝද සේවකයෝද අඟුරු දල්වා ගිනි
තපිමින් සිටියෝය. පේත්‍රුස්ද ඔවුන් සමග
ගිනි තපිමින් සිටියේය.
19 එකල උත්තම පූජකයා යේසුස්-
වහන්සේගේ ගෝලයන් ගැනද ඉගැන්වීම
ගැනද උන්වහන්සේගෙන් ඇසුවේය.
යේසුස්වහන්සේ ඔහුට උත්තරදෙමින්: 20
මම ප්‍රසිද්ධයෙන් ලෝකයාට කථා-
කෙළෙමි; සියලු යුදෙව්වරුන් රැස්-
වන්නාවූ සිනගෝගවලදීත් දේව-
මාළිගාවේදීත් නිතර ඉගැන්වීමි; රහසින්
කිසිවක් කථානොකෙළෙමි. මාගෙන් 21
විචාරන්නේ මක්නිසාද? මාගේ වචන
ඇසූවන්ගෙන් මා ඔවුන්ට කීවේ කුමක්දැයි
අසන්න. මෙන්න, මොව්හු මා කී දේ
දනිතියි කීසේක. උන්වහන්සේ මේක 22
කී කල, ළඟ සිටියාවූ සේවකයන්ගෙන්
එක්කෙනෙක්: නුඹ උත්තම පූජකයාට
මෙසේ උත්තරදෙනවාද කියා, යේසුස්-
වහන්සේට අතුල්පහරක් ගැසීය.
යේසුස්වහන්සේ ඔහුට උත්තරදෙමින්: 23
මම අයුතුලෙස කථාකෙළෙම් නම්, ඒ
අයුතුකම ගැන සාක්ෂිදීපන්න. යුතුලෙස
කථාකෙළෙම් නම්, මට පහරදෙන්නේ
මක්නිසාදැයි කීසේක. එවිට බැඳසිටි 24
උන්වහන්සේ අන්නස් විසින් උත්තම
පූජකයාවූ කායාඵස් ළඟට යැවුවේය.
සීමොන් පේත්‍රුස් ගිනිතපිමින් සිටියේය. 25
ඔව්හු: නුඹත් ඔහුගේ ගෝලයන්ගෙන්
එක්කෙනෙක්දැයි ඔහුගෙන් ඇසුවෝය.
නැත, එසේ නොවේයයි ඔහු කීය. උත්තම 26
පූජකයාගේ දසයන්ගෙන් එක්කෙනෙක්වූ,
පේත්‍රුස් විසින් කන කැපූ තැනැත්තාගේ
නෑයෙක් කථාකොට: නුඹ ඔහු සමග
උයනේ සිටිනවා මම නුදුටිම්දැයි කීය.
එවිට පේත්‍රුස් නැවතත්: නැතැයි කීවේය. 27
එකෙණෙහිම කුකුළා හඬලීය.

## යේසුස්වහන්සේ රෝම ආණ්ඩු-කාරයාවූ පිලාත් ඉදිරිපිට සිටීම

එවිට ඔව්හු යේසුස්වහන්සේ කායාඵස් 28
කෙරෙන් *ප්‍රේතෝරියම් ශාලාවට
ගෙනගියෝය. එය අලුයම් වේලාවය;
ඔව්හු, අපවිත්‍ර නොවී පාස්කුව කන්ට
හැකිවන පිණිස, *ප්‍රේතෝරියම් ශාලාවට
ඇතුල් නූණෝය. එබැවින් පිලාත් ඔවුන් 29
වෙතට පිටතට ගොස්: මේ මනුෂ්‍යයාට
විරුද්ධව මොන වරදක් තබවුදැයි

*හෙවත්, රජගෙදර.

30 ඇසුවේය. ඔව්හු උත්තරදෙමින්: මොහු
වරදකාරයෙක් නොවේ නම්, අප විසින්
ඔහු ඔබට භාරදෙන්නේ නැතැයි කීවෝය.
31 එබැවින් පිලාත්: තුඹලාම ඔහු ගෙන-
ගොස්, තුඹලාගේ ව්‍යවස්ථාව ලෙස
විනිශ්චයකරපල්ලායයි ඔවුන්ට කීවේය.
යුදෙව්වරු ඔහුට කථාකොට: කිසිවෙකු
මරණයට පත්කරන්ට අපට බලය
32 නැතැයි කීවෝය. මෙසේ වුණේ, තමන්-
වහන්සේ කොයි ආකාර මරණයකින්
මැරෙනසේක්ද කියා හඟවාදෙමින්
යේසුස්වහන්සේ කී වචනය සම්පූර්ණවන
පිණිසය.
33 එබැවින් පිලාත් නැවත *ප්‍රේතෝරියම්
ශාලාවට ඇතුල්ව, යේසුස්වහන්සේ
කැඳවා: තුඹ යුදෙව්වරුන්ගේ රජද‍යි
34 උන්වහන්සේගෙන් ඇසුවේය. යේසුස්-
වහන්සේ උත්තරදෙමින්: තුඹම මේක
කියනවාද? නොහොත් වෙන අය මා
ගැන තුඹට මේක කීවෝද‍යි ඇසුසේක.
35 පිලාත් උත්තරදෙමින්: මම යුදෙව්වෙක්ද?
තුඹේම ජාතියද නායක පූජකයෝද තුඹ
මට භාරදුන්නෝය. තුඹ කළේ
36 මොකද‍යි ඇසුවේය. යේසුස්වහන්සේ
උත්තරදෙමින් මාගේ රාජ්‍යය මේ
ලෝකය සම්බන්ධව නොවේ. මාගේ
රාජ්‍යය මේ ලෝකය සම්බන්ධවී නම්,
යුදෙව්වරුන්ට මා භාරදෙනු නොලබන
පිණිස මාගේ සේවකයන් සටන්කරනවා
ඇත, තුමුත් දන් මාගේ රාජ්‍යය
මෙලොවින් නොවේයයි කීසේක.
37 එබැවින් පිලාත්: එසේවී නම්, තුඹ
රජෙක්ද‍යි උන්වහන්සේගෙන් ඇසුවේය.
යේසුස්වහන්සේ උත්තරදෙමින්: මම
රජෙක්යයි තුඹ කියනවා හරිය. ඒ පිණිස
මම ඉපද සිටිමි, මා ලෝකයට ඇවිත්
සිටින්නේ සත්‍යයට සාක්ෂිදෙන පිණිසය.
සත්‍යයෙන්වූ සියල්ලෝ මාගේ හඬ
38 අසතියි කීසේක. පිලාත් තෙමේ: සත්‍යය
නම් කිමෙක්ද‍යි උන්වහන්සේගෙන්
ඇසුවේය.
ඔහු මෙසේ කියා නැවත යුදෙව්වරුන්
වෙතට පිටතට ගොස්: මොහු අත
39 කිසි වරදක් මට නොපෙනෙයි. තුමුත්

*හෙවත්, රජගෙදර.

පාස්කුවේදී මා විසින් තුඹලාට එක්-
කෙනෙකු නිදහස්කර හරින සිරිතක්
තුඹලාට තිබේ. එහෙයින් යුදෙව්වරුන්ගේ
රජ මා විසින් තුඹලාට නිදහස්කර
හරිනවාට තුඹලා කැමතිහුද‍යි ඔවුන්-
ගෙන් ඇසුවේය. එවිට ඔව්හු නැවත 40
මොරගසමින්: මොහු නොව බරබ්බස්යයි
කීවෝය. බරබ්බස් වනාහි සොරෙක්
විය.

## පිලාත් යුදෙව්වන්ගේ කැමැත්තට ඉඩදීම

19

එවිට පිලාත් යේසුස්වහන්සේට
තැළෙව්වේය. හේවායෝද කටු 2
ඔටුන්නක් ගොතා, උන්වහන්සේගේ හිසේ
තබා, රත්නිල් වස්ත්‍රයක් උන්වහන්සේට
පළඳවා, උන්වහන්සේ ළඟට ඇවිත්:
යුදෙව්වරුන්ගේ රජ්ජුරුවෙනි, ශුභ 3
සිද්ධවේවා! කියා උන්වහන්සේට
අතුල්පහර ගැසුවෝය. පිලාත් නැවත 4
පිටතට ගොස්: මොහු අත කිසි
වරදක් මට නොපෙනෙන බව තුඹලා
දැනගන්නා පිණිස, මෙන්න, මොහු තුඹලා
ළඟට ගෙනෙමියි ඔවුන්ට කීවේය. එකල 5
යේසුස්වහන්සේ කටු ඔටුන්නද රත්නිල්
වස්ත්‍රයද ඇතුව පිටතට ආසේක. පිලාත්ද:
මෙන්න, ඒ මනුෂ්‍යයා! කියා ඔවුන්ට
කීවේය. එවිට නායක පූජකයෝද 6
සේවකයෝද උන්වහන්සේ දුටු කල:
කුරුසියෙහි ඇණ ගැසුව මැනව,
ඇණගැසුව මැනව කියා මොරගැසුවෝය.
පිලාත්ද: තුඹලාම මොහු රැගෙන ගොස්
කුරුසියෙහි ඇණ ගසාපල්ලා. මක්නිසාද
මොහු අත කිසි වරදක් ඇති බව මට
නොපෙනේයයි කීවේය. යුදෙව්වරු ඔහුට 7
උත්තරදෙමින්: අපට ව්‍යවස්ථාවක් තිබේ,
තමාම දෙවියන්වහන්සේගේ පුත්‍රයායයි
ඔහු කී බැවින්, ඒ ව්‍යවස්ථාවේ හැටියට
ඔහු මරනු ලැබිය යුතුයයි කීවෝය.
එබැවින් පිලාත් ඒ කීම අසා, 8
වඩාත් භයවූයේ, නැවත *ප්‍රේතෝරියම් 9
ශාලාවට ඇතුල්ව: තුඹ කොතැනින්ද‍යි
යේසුස්වහන්සේගෙන් ඇසුවේය. තුමුත්

*හෙවත්, රජගෙදර.

යේසුස්වහන්සේ ඔහුට කිසි උත්තරයක්
10 නුදුන්සේක. නුඹ මට කථාකරන්නේ
නැද්ද? නුඹ මුදහරින්ට බලයද නුඹ
කුරුසියෙහි ඇණගසන්ට බලයද මට
ඇති බව නුඹ දන්නේ නැද්දැයි පිලාත්
11 උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේ
ඔහුට උත්තරදෙමින්: ඉහළින් එය නුඹට
නොදෙනලද්දේ නම්, මට විරුද්ධව නුඹට
කිසි බලයක් නැත. එහෙයින් මා නුඹට
පාවාදුන් තැනැත්තාගේ පාපය වඩා
12 මහත්යයි කීසේක. ඒ කීම නිසා පිලාත්
උන්වහන්සේ නිදහස්කරන්ට සෙව්ය.
නුමුත් යුදෙව්වරු මොරගසමින්: ඔබ
මොහු නිදහස්කර හැරියොත්, කායිසර්ගේ
මිත්‍රයෙක් නොවේය. තමාම රජෙකු
කරගන්න කවුරු නුමුත් කායිසර්ට
විරුද්ධව කථාකෙරේයයි කීවෝය.
13 එබැවින් පිලාත් ඒ බස් අසා,
යේසුස්වහන්සේ පිටතට ගෙනැවිත්,
හෙබ්‍රෙව් භාෂාවෙන් ගබ්බතායයි කියන
ගල් අතුළ ස්ථානයෙහි නඩු ආසනයේ
14 හිඳගත්තේය. ඒ වනාහි පාස්කුව
සූදානම්කිරීමේ දවසේ හවෙනි පැය පමණ
විය. ඔහු: මෙන්න, නුඹලාගේ රජ! යයි
15 යුදෙව්වරුන්ට කීවේය. එබැවින් ඔව්හු:
ඔහු පහකළ මැනව, පහකළ මැනව!
කුරුසියෙහි ඇණ ගැසුව මැනව කියා
මොරගැසුවෝය. නුඹලාගේ රජ්ජුරුවන්
කුරුසියෙහි ඇණගසම්දැයි පිලාත්
ඔවුන්ගෙන් ඇසුවේය. නායක පූජකයෝ
උත්තරදෙමින්: කායිසර් මිස අපට
16 රජෙක් නැතැයි කීවෝය. එකල ඔහු
උන්වහන්සේ කුරුසියෙහි ඇණගසනු
ලබන පිණිස ඔවුන්ට භාරදුන්නේය.
එබැවින් ඔව්හු යේසුස්වහන්සේව
ගෙනගියෝය.

## කුරුසියේ ඇණගසනු ලැබීම

17 උන්වහන්සේම කුරුසිය උසුලාගෙන,
හෙබ්‍රෙව් භාෂාවෙන් ගොල්ගොතායයි
කියනලද ඉස්කබල ස්ථානයට පිටත්ව
18 ගියසේක. එහිදී ඔව්හු උන්වහන්සේව
කුරුසියෙහි ඇණගැසුවෝය; මැද්දේ
උන්වහන්සේද උන්වහන්සේ සමග
දෙපැත්තේ තවත් දෙදෙනෙක්ද කුරුසිවල
ඇණගැසුවෝය. තවද පිලාත් නාම 19
පත්‍රයක්ද ලියා කුරුසිය මත්තෙහි තැබීය.
යුදෙව්වරුන්ගේ රජවූ නාසරිය යේසුස්
කියා එහි ලියා තිබුණේය. යේසුස්- 20
වහන්සේ කුරුසියෙහි ඇණගසනු ලැබූ
ස්ථානය නුවරට සමීපවූ බැවින්,
යුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක් එය
කියෙවුවෝය. හෙබ්‍රෙව් ලතින් ග්‍රීක් යන
භාෂාවලින් එය ලියා තිබුණේය. එබැවින් 21
යුදෙව්වරුන්ගේ නායක පූජකයෝ
පිලාත්ට කථාකොට: යුදෙව්වරුන්ගේ
රජය කියා නොලියා, මම යුදෙව්-
වරුන්ගේ රජයයි ඔහු කීවේය කියා ලිව
මැනවයි කීවෝය. පිලාත් උත්තරදෙමින්: 22
මා ලියූ දේ ලියූවාමයයි කීවේය.
හේවායෝ යේසුස්වහන්සේ කුරුසියෙහි 23
ඇණගැසුවායින් පසු, උන්වහන්සේගේ
වස්ත්‍ර රැගෙන, එක හේවායෙකුට එක
කොටස බැගින් සතර කොටසක්
කළෝය; උන්වහන්සේගේ සළුවද
ගත්තෝය. ඒ සළුව වනාහි නොමහා
උඩ පටන් මුළුල්ලම වියලා තිබුණේය.
එබැවින් ඔව්හු එකිනෙකා කථාකොට: 24
මේක නොඉරා, කාට වේදෝයි
දැනගන්නා පිණිස දාදු දමමුයයි කීවෝය.
මෙසේ වුණේ,

මාගේ වස්ත්‍ර ඔවුන් අතරේ බෙදාගෙන,
මාගේ සළුව පිණිස දාදු දැමුවෝය

යන ලියවිල්ල සම්පූර්ණවන පිණිසය.
එහෙයින් හේවායෝ මේ දේ කළෝය.
යේසුස්වහන්සේගේ මෑණියෝද මෑණි- 25
යන්ගේ සහෝදරිවූ ක්ලෝපාස්ගේ
භාර්යාවවූ මරියාද මග්දලායේ මරියාද
උන්වහන්සේගේ කුරුසිය ළඟ සිටියෝය.
එකල යේසුස්වහන්සේ තමන්ගේ මෑණි- 26
යන්ද ළඟ සිටියාවූ තමන් විසින්
ප්‍රේමකළාවූ ගෝලයාද දැක: ස්ත්‍රිය,
මෙන්න, නුඹේ පුත්‍රයා! යයි තමන්
මෑණියන්ට කීසේක. එවිට උන්වහන්සේ 27
ගෝලයාට කථාකොට: මෙන්න, නුඹේ
මෑණියෝ! යයි කීසේක. ඒ පැයේ පටන්
ඒ ගෝලයා තමාගේ ගෙදරට ඇය
පිළිගත්තේය.

28 ඉන්පසු යේසුස්වහන්සේ සියල්ල නින්දුවී
තිබෙන බව දැන: මට පිපාසයයි කීසේක.
29 එහි කාඩියෙන් පිරුණු භාජනයක් තබා
තිබුණේය. එබැවින් ඔව්හු කාඩි පොවාපු
මුදුහත්තක් හිසොප් දණ්ඩක ගසා,
උන්වහන්සේගේ මුඛයට ළංකළෝය.
30 යේසුස්වහන්සේ කාඩි ගත් පසු:
නින්දුවුණේය කියා හිස නමා, තමන්
ආත්මය භාරදුන්සේක.

## හෙල්ලයකින් ඇනීම. වළලනු ලැබීම

31 ඒ දවස සූදනම්වීමේ දවස බැවින්,
සබත් දවසේදී ශරීර කුරුසියෙහිම
නොතිබෙන පිණිස, ඔවුන්ගේ කෙණ්ඩා
බිඳුවා, ඔවුන් පහකරන්ට යුදෙව්වරු
පිලාත්ගෙන් ඉල්ලුවෝය. මක්නිසාද ඒ
32 සබත් දවස මහත් දවසක්ය. එබැවින්
භේවායෝ ඇවිත්, පළමුවෙනියාගෙත් ඔහු
සමග කුරුසියෙහි ඇණගසනලද අනික්
33 අයගෙත් කෙණ්ඩා බින්දෝය. නුමුත්
ඔව්හු යේසුස්වහන්සේ ළඟට ආ කල,
උන්වහන්සේ මැරී සිටි බව දැක, උන්-
වහන්සේගේ කෙණ්ඩා නොබින්දෝය.
34 එසේ වුවත්, භේවායින්ගෙන් එක්කෙනෙක්
හෙල්ලයකින් උන්වහන්සේගේ ඇළයට
ඇන්නේය, එකෙණෙහිම ලේත් වතුරත්
35 නික්මුණේය. ඒ දුටු තැනැත්තේ සාක්ෂිදී
තිබේ, ඔහුගේ සාක්ෂිය සැබෑය. නුඹලාත්
විශ්වාස කරන පිණිස තමා සැබෑව
36 කියන බව ඔහු දන්නේය. මක්නිසාද
මේ දේවල් සිද්ධවුණේ: උන්වහන්සේගේ
ඇටයක්වත් බිඳිණු නොලැබෙන්නේයයි
ලියා තිබුණු ලියවිල්ල සම්පූර්ණවන
37 පිණිසය. නැවතත්: ඔවුන් විසින් අනින-
ලද තැනන්වහන්සේ දෙස ඔව්හු
බලන්නෝයයි වෙන ලියවිල්ලක කියා
තිබේ.
38 ඉන්පසු යුදෙව්වරුන්ට භය නිසා
රහසින් යේසුස්වහන්සේගේ ගෝලයෙක්ව
සිටියාවූ අරිමාතියේ යෝසෙප්
යේසුස්වහන්සේගේ මිනිය ගෙනයන
පිණිස පිලාත්ගෙන් ඉල්ලුවේය, පිලාත්
අවසර දුන්නේය. එහෙයින් ඔහු ඇවිත්
යේසුස්වහන්සේගේ මිනිය ගෙනගියේය.
පළමුවෙන් රාත්‍රියෙහි උන්වහන්සේ ළඟට 39
ආවාවූ නිකොදේමුස්ද ගන්ධරස මිශ්‍රවූ
අගිලි රාත්තල් සියයක් පමණ රැගෙන
ආවේය. ඔව්හු යේසුස්වහන්සේගේ ශරීරය 40
රැගෙන, යුදෙව්වරුන් තැන්පත් කරන
සිරිත ලෙස, සුවඳ බඩු සමග සිහින්
හණරෙදිවලින් එය වෙළුහ. උන්වහන්සේ 41
කුරුසියෙහි ඇණ ගසනු ලැබූ
ස්ථානයෙහි උයනක් තිබුණේය; ඒ
උයනෙහි ඒතාක් කිසිකලෙක කිසිවෙකු
නොතැබුවාවූ අලුත් සොහොන්ගෙයක්
තිබුණේය. ඒ සොහොන්ගෙය ළඟ තිබුණු 42
බැවින්, යුදෙව්වරුන්ගේ සූදනම්වීමේ දවස
නිසා, ඔව්හු යේසුස්වහන්සේව එහි
තැබුවෝය.

## හිස්වූ සොහොන

20 සතියේ පළමුවෙනිද අලුයම්
වේලේ, අඳුර තිබියදීම, මග්දලායේ
මරියා සොහොන්ගේ ළඟට ගොස්,
සොහොන්ගෙයින් ගල අහක්කොට
තිබෙන බව දුටුවාය. එහෙයින් ඈ 2
සීමොන් පේත්‍රුස් ළඟටද යේසුස්වහන්සේ
ප්‍රේමකළ අනික් ගෝලයා ළඟටද
දුවගොස්: ඔවුන් ස්වාමීන්වහන්සේව
සොහොන්ගෙයින් අහක්කොට ගෙනගොස්
තිබේ, උන්වහන්සේව කොතැන තැබුවාද
කියා අපි නොදනිමුයයි ඔවුන්ට කීවාය.
එබැවින් පේත්‍රුස්ද අනික් ගෝලයාද 3
පිටත්ව සොහොන්ගේ දෙසට ගියෝය.
ඔවුන් දෙදෙන එක්ව දිවුවෝය. අනික් 4
ගෝලයා පේත්‍රුස් පසුකර දුවගොස්,
පළමුකොට සොහොන්ගෙය ළඟට
පැමිණ, නැමී බලා, සිහින් හණරෙදි 5
එහි තිබෙනවා දුටුවේය; නුමුත් ඇතුළට
ගියේ නැත. සීමොන් පේත්‍රුස් ඔහුට 6
පසුව පැමිණ, සොහොන්ගේ ඇතුළට
ගොස්, හණරෙදි තිබෙන බවත්, 7
උන්වහන්සේගේ හිසේ තිබුණු රෙදිකඩ
හණරෙදි සමග නැතුව වෙනම එක්
තැනක අකුළා තබා තිබෙන
බවත් දුටුවේය. එකල පළමුකොට 8
සොහොන්ගේ ළඟට ආවාවූ ඒ අනික්

ගෝලයාද ඇතුළට ගොස්, දැක
9 විශ්වාසකෙළේය. මක්නිසාද උන්වහන්සේ
මළවුන්ගෙන් නැගිටින්ට ඕනෑයයි
ලියනලද ලියවිල්ල ඒතාක්කල් ඔව්හු
10 නොදැන සිටියෝය. එවිට ගෝලයෝ
නැවත තමුන්ගේම ගෙවලට ගියෝය.

## යේසුස්වහන්සේ මග්දලායේ මරියාට පෙනීම

11 නුමුත් මරියා සොහොන්ගෙය ළඟ
පිටත හඬමින් සිටියාය. මෙසේ ඈ
හඬන්නී, නැමී සොහොන්ගේ ඇතුළ
12 බැලුවාය. එවිට යේසුස්වහන්සේගේ
ශරීරය තබනලද ස්ථානයෙහි සුදු වස්ත්‍ර
හඳනාලද දේවදූතයන් දෙදෙනෙක්
එක්කෙනෙක් හිස ළඟද එක්කෙනෙක්
පාද ළඟද ඉඳගෙන ඉන්නවා දුටුවාය.
13 එකල ඔව්හු: ස්ත්‍රිය, මක්නිසා හඬනවාදැයි
ඇගෙන් ඇසුවෝය. ඈ ඔවුන්ට
කථාකොට: මාගේ ස්වාමීන්වහන්සේව
අහක්කොට ගෙනගොස් කොතැන
තබනලද්දේදැයි මා නොදන්නා නිසායයි
14 කීවාය. ඈ මෙසේ කියා, ආපසු හැරී,
යේසුස්වහන්සේ සිටිනවා දුටුවාය, නුමුත්
ඒ යේසුස්වහන්සේ බව ඈ නොදත්තීය.
15 යේසුස්වහන්සේ: ස්ත්‍රිය, නුඹ මක්නිසා
හඬනවාද? කවරෙකු සොයනවාදැයි
ඇගෙන් ඇසූසේක. ඈ උන්වහන්සේ
උයන්ගොව්වායයි සිතා: ස්වාමීනි,
නුඹ උන්වහන්සේව ගෙනගියානම්,
උන්වහන්සේ කොතැන තැබූවාද කියා
මට කිව මැනව, මම උන්වහන්සේ
ඉවත්කොට ගෙන යමියි කීවාය.
16 යේසුස්වහන්සේ: මරියා කියා ඇට
කීසේක. ඈ හැරී හෙබ්‍රෙව් භාෂාවෙන්:
රබ්බෝනියි උන්වහන්සේට කීවාය; එහි
17 අර්ථය ආචාරීනි යනුයි. යේසුස්වහන්සේ:
මට අත නොගසන්න; මක්නිසාද
මම තවම පියාණන්වහන්සේ වෙතට
නොනැංගෙමි. නුමුත් මාගේ සහෝදරයන්
ළඟට ගොස්–මම මාගේ පියාණන්-
වහන්සේ හා නුඹලාගේ පියාණන්-
වහන්සේද මාගේ දෙවියන්වහන්සේ හා
නුඹලාගේ දෙවියන්වහන්සේද වෙතට
නගිමියි ඔවුන්ට කියාපන්නැයි ඇට
කීසේක. මග්දලායේ මරියා ඇවිත්, ඈ 18
ස්වාමීන්වහන්සේව දුටු බවද උන්වහන්සේ
ඒ දේවල් ඇට කී බවද ගෝලයන්ට
දැන්නුවාය.

## යේසුස්වහන්සේ අපෝස්තුලු-වරුන්ට ප්‍රකාශවීම

සතියේ පළමුවෙනිවූ ඒ දවසේ සවස්වූ 19
කල, යුදෙව්වරුන්ට භයින් දොරවල් වසා
තිබෙද්දී, ගෝලයන් එක්ව සිටිතැන්හි
යේසුස්වහන්සේ ඇවිත් මැද සිට:
නුඹලාට සමාදනය වේවා කියා ඔවුන්ට
කීසේක. උන්වහන්සේ මෙසේ කියා, 20
තමන්ගේ අත්ද ඇළයද ඔවුන්ට
දැක්වූසේක. එවිට ගෝලයෝ ස්වාමීන්-
වහන්සේ දැක සන්තෝෂවූහ. යේසුස්- 21
වහන්සේ: නුඹලාට සමාදනය වේවයි
නැවතත් ඔවුන්ට කියා–පියාණන්වහන්සේ
මා එවූවාක්මෙන්ම මමත් නුඹලා
යවමියි කීසේක. උන්වහන්සේ මෙසේ 22
කියා, ඔවුන් දෙසට හුස්ම හෙළා:
ශුද්ධාත්මයාණන් පිළිගනිල්ලා. යමෙකුගේ 23
පව් නුඹලා කමාකරවුද ඒවා ඔවුන්ට
කමාකරනු ලැබේ; යමෙකුගේ පව් නුඹලා
කමා නොකරවුද ඒවා කමාකරනු
නොලැබේයයි ඔවුන්ට කීසේක.

## තෝමස්ට ප්‍රකාශවීම

යේසුස්වහන්සේ ආ කල, දොළොස් 24
දෙනාගෙන් එක්කෙනෙක්වූ දිදිමුස් නම්
තෝමස් ඔවුන් සමග නොසිටියේය.
එහෙයින් අනික් ගෝලයෝ: අපි 25
ස්වාමීන්වහන්සේ දුටිමුයයි ඔහුට
කීවෝය. නුමුත් ඔහු ඔවුන්ට කථාකොට:
උන්වහන්සේගේ අත්වල ඇණ ලකුණු
දැක, ඒ ලකුණුවල මාගේ ඇඟිල්ල තබා,
උන්වහන්සේගේ ඇළයෙහි මාගේ අත
තබා බැලුවොත් මිස, නැත්නම් විශ්වාස
නොකරමියි කීවේය.

26 අට දවසකට පසු උන්වහන්සේගේ
ගෝලයෝ නැවතත් ගේ ඇතුළෙහි
සිටියෝය, තෝමස්ද ඔවුන් සමග
සිටියේය. දොරවල් වසා තිබියදී
යේසුස්වහන්සේ ඇවිත් මැද සිට:
නුඹලාට සමාදානය වේවයි කීසේක.
27 එකල උන්වහන්සේ තෝමස්ට
කථාකොට: නුඹේ ඇඟිල්ල මෙහි
දිගුකොට, මාගේ අත් බලාපන්න; නුඹේ
අත දිගුකොට, මාගේ ඇළයෙහි
බහාපන්න. අවිශ්වාස නොකොට,
28 විශ්වාසකරපන්නැයි කීසේක. තෝමස්
උත්තරදෙමින්: මාගේ ස්වාමිනි, මාගේ
29 දෙවියනියි උන්වහන්සේට කීවේය. නුඹ
මා දුටු බැවින් විශ්වාසකෙළෙහිය.
නුදුටු නුමුත් විශ්වාසකළාවූ අය
ආශිර්වාදලද්දෝයයි යේසුස්වහන්සේ
කීසේක.

## මේ පොත ලිවීමේ අදහස

30 මේ පොතෙහි ලියා නැති වෙනත්
බොහෝ හාස්කම් යේසුස්වහන්සේ
31 ගෝලයන් ඉදිරියෙහි කළසේක. නුමුත්
මේවා ලියනලද්දේ යේසුස්වහන්සේ
දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්-
වහන්සේ බව නුඹලා විශ්වාසකරන
පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ
නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය.

## ගලීලයේ මුහුද ළඟදී ප්‍රකාශවීම

21 ඉන්පසු යේසුස්වහන්සේ
තිබේරියස් නම් මුහුද ළඟදී
ගෝලයන්ට නැවත ප්‍රකාශවූසේක;
උන්වහන්සේ ප්‍රකාශවූණේ මේ
2 ආකාරයෙන්ය. සීමොන් පේත්‍රුස්ද දිදිමුස්
නම් තෝමස්ද ගලීලයේ කානා නුවර
නතානියෙල්ද සෙබදීගේ පුත්‍රයෝද
උන්වහන්සේගේ ගෝලයන්ගෙන් තවත්
3 දෙදෙනෙක්ද එක්ව සිටියෝය. සීමොන්
පේත්‍රුස්: මසුන් අල්ලන්ට යමියි ඔවුන්ට
කීවේය. අපිත් නුඹ සමග එමුයයි ඔව්හු
ඔහුට කීවෝය. ඔව්හු පිටත්ව ගොස්
ඔරුවට නැගුණෝය; නුමුත් ඒ රාත්‍රියේ
4 ඔවුන් කිසිවක් ඇල්ලුවේ නැත. පහන්වන
කල්හි යේසුස්වහන්සේ වෙරළෙහි
සිටිසේක. එසේ වුවත් ඒ යේසුස්වහන්සේ
බව ගෝලයෝ දැන නොගත්තෝය. එවිට 5
යේසුස්වහන්සේ: දරුවෙනි, නුඹලා ළඟ
කන්ට යමක් ඇද්දැයි ඔවුන්ගෙන් ඇසුසේක.
ඔව්හු උන්වහන්සේට උත්තරදෙමින්:
නැතැයි කීවෝය. ඔරුවේ දකුණු 6
පැත්තෙන් දැල දමාපල්ලා, එවිට
සම්බවේයයි උන්වහන්සේ ඔවුන්ට
කීසේක. එසේ දැමූ කල, මසුන් රාශිය
නිසා දැල ඇදගන්ට ඔවුන්ට බැරිවිය.
එබැවින් යේසුස්වහන්සේ ප්‍රේමකළ 7
ගෝලයා පේත්‍රුස්ට කථාකොට: ඒ
ස්වාමීන්වහන්සේයයි කීවේය. එවිට
සීමොන් පේත්‍රුස් ඒ ස්වාමීන්වහන්සේ
බව අසා, තමා ඇඳුම් නැතුව සිටි බැවින්,
වස්ත්‍රයක් ඉණේ බැඳගෙන, මුහුදට
පැන්නේය. එහෙත් අනික් ගෝලයෝ 8
මසුන්ගෙන් පිරුණු දැල ඇදගෙන කුඩා
ඔරුවෙන් ආවෝය; මක්නිසාද ඔව්හු
වෙරළට නුදුරුව රියන් දෙසියයක් පමණ
ඈත සිටියෝය. මෙසේ ගොඩබැස්ස 9
විට ඔව්හු එහි ගිනි අඟුරුද ඒ පිට
මාලු තිබෙන බවද රොටිද දුටුවෝය.
නුඹලා දැන් ඇල්ලූ මසුන්ගෙන් 10
ගෙනෙල්ලායයි යේසුස්වහන්සේ ඔවුන්ට
කීසේක. එබැවින් සීමොන් පේත්‍රුස් 11
ඔරුවට නැගී, ලොකු මසුන් එකසිය
පණස් තුන් දෙනෙකුගෙන් පිරුණු දැල
ගොඩට ඇද්දේය. එපමණ තිබුණු නුමුත්
දැල ඉරුණේ නැත. යේසුස්වහන්සේ 12
කථාකොට: ඇවිත් කාපල්ලායයි ඔවුන්ට
කීසේක. ඒ ස්වාමීන්වහන්සේ බව දැන:
ඔබ කවුදැයි උන්වහන්සේගෙන් අසන්ට
ගෝලයන්ගෙන් කිසිවෙකුට ධෛර්ය
නොතිබුණේය. යේසුස්වහන්සේ ඇවිත් 13
රොටි අරන් ඔවුන්ට දුන්සේක, එසේම
මාලුත් දුන්සේක. මේ වනාහි 14
යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට පසු
ගෝලයන්ට ප්‍රකාශවූ තුන්වෙනි වතාවය.

## පේත්‍රුස්ට දෙනලද තුන් ප්‍රකාර නියමය

මෙසේ ඔවුන් කෑ පසු යේසුස්වහන්සේ 15
සීමොන් පේත්‍රුස්ට කථාකොට:

යොහන්ගේ පුත්‍රවූ සීමොන්, මොවුන්ට
වඩා නුඹ මට ප්‍රේමකරනවාදැයි ඇසූ-
සේක. ඔහු: එසේය, ස්වාමිනි, මා ඔබට
ආදරේ ඇති බව ඔබ දන්නාසේකැයි
උන්වහන්සේට කීවේය. උන්වහන්සේ:
මාගේ බැටළුපැටවුන් පෝෂණය-
16 කරපන්නැයි ඔහුට කීසේක. නැවතත්
දෙවෙනි වරක්: යොහන්ගේ පුත්‍රවූ
සීමොන්, නුඹ මට ප්‍රේමකරනවාදැයි
ඔහුගෙන් ඇසුසේක. ඔහු: එසේය,
ස්වාමිනි, මා ඔබට ආදරේ ඇති බව
ඔබ දන්නාසේකැයි උන්වහන්සේට
කීවේය. උන්වහන්සේද: මාගේ බැටළුවන්
පාලනයකරපන්නැයි ඔහුට කීසේක.
17 උන්වහන්සේ තුන්වෙනි වර ඔහුට
කථාකොට: යොහන්ගේ පුත්‍රවූ සීමොන්,
නුඹ මට ආදරේදැයි ඔහුගෙන් ඇසුසේක.
තුන්වෙනි වර: මට ආදරේදැයි යේසුස්-
වහන්සේ තමාගෙන් ඇසූ බැවින් පේතෘස්
දුකට පැමිණ—ස්වාමිනි, ඔබ සියල්ල
දන්නාසේක; මා ඔබට ආදරේ ඇති
බව ඔබ දන්නාසේකැයි උන්වහන්සේට
කීවේය. යේසුස්වහන්සේ ඔහුට කථා-
කොට: මාගේ බැටළුවන් පෝෂණය-
18 කරපන්න. සැබවක් සැබවක් නුඹට
කියමි—නුඹේ යෞවන කාලයේ නුඹේ
ඉහටිය බැඳගෙන කැමති තැන්වල
ඇවිද්දෙහිය. නුමුත් නුඹ මහලුවූ කල
නුඹේ අත් දිගු කරන්නෙහිය, වෙන
කෙනෙක් නුඹේ ඉහටිය බැඳ, නුඹ කැමති
නැති තැනකට ගෙනයනවා ඇතැයි
කීසේක. ඔහු කොයි ආකාර 19
මරණයකින් දෙවියන්වහන්සේව
ගෞරවයට පමුණුවනවා ඇද්දැයි
හඟවාදෙමින් උන්වහන්සේ මෙසේ
කීසේක. මේ වචන කියා: මා අනුව
වරෙන්නැයි ඔහුට කීසේක. පේතෘස් 20
හැරී, යේසුස්වහන්සේ ප්‍රේම කළාවූද
රාත්‍රිකෑමේදී උන්වහන්සේගේ ළපැත්තේ
හාන්සිව සිට: ස්වාමිනි, ඔබ
පාවාදෙන්නා කවුදැයි ඇසුවාවූද
ගෝලයා පස්සෙන් එනවා දුටුවේය.
පේතෘස් ඔහු දැක: ස්වාමිනි, මොහු 21
ගැන කිමෙක්දැයි යේසුස්වහන්සේගෙන්
ඇසුවේය. යේසුස්වහන්සේද: මා එන 22
තුරු ඔහු සිටිනවාට මා කැමති නම්
නුඹට මොකද? නුඹ මා අනුව
වරෙන්නැයි ඔහුට කීසේක. එහෙයින් ඒ 23
ගෝලයා මැරෙන්නේ නැත යන මේ
කීම සහෝදරයන් අතරේ පතළවිය.
එසේවී නුමුත් යේසුස්වහන්සේ: මා එන
තුරු ඔහු සිටිනවාට මා කැමති නම්
නුඹට මොකදැයි කීවා මිස ඔහු
මැරෙන්නේ නැතැයි නොකීසේක.

## අවසානය

මේ දේ ගැන සාක්ෂිදෙන්නාවූ, මේ දේ 24
ලියූවාවූ ගෝලයා මොහුය. මොහුගේ
සාක්ෂිය සැබෑ බව අපි දනිමුව.
යේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ 25
දේවල්ද ඇත්තේය, ඒවා එකින් එක
ලියනලද්දේ නම්, ලියනු ලබන පොත්
දරන්ට ලෝකයත් මදියයි සිතමි.

# ප්‍රේරිතයන්ගේ ක්‍රියා

## ප්‍රාරම්භය

1 එම්බා තෙයෝපිලස්නි. යේසුස්-
වහන්සේ තමන් විසින් තෝරාගත්
ප්‍රේරිතයන්ට ශුද්ධාත්මය කරණකොට-
2 ගෙන අණදුන් පසු, ඔසවාගනු ලැබූ
දවස දක්වා. උන්වහන්සේ විසින්
කරන්ටත් උගන්වන්ටත් පටන්ගත් සියල්ල
ගැන ප්‍රථම පොත සම්පාදනයකෙළෙමි.
3 උන්වහන්සේ වධ වින්ද පසු සතළිස්
දවසක් අතරතුරේ ඔවුන්ට පෙනෙමින්ද
දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන
කාරණා කියමින්ද බොහෝ ඔප්පු
සාක්ෂිවලින් තමන්ම ජීවමානව ඔවුන්ට
4 ප්‍රකාශවූසේක. උන්වහන්සේ ඔවුන්
සමග රැස්ව ඔවුන්ට ආඥකරමින්:
යෙරුසලමෙන් අහක්ව නොගොස්
නුඹලා මාගෙන් ඇසූ පියාණන්-
වහන්සේගේ පොරොන්දුව බලා
5 සිටපල්ලා. මක්නිසාද යොහන් *වතුරෙන්
බව්තීස්මකෙළේය: නුමුත් නුඹලා මෙයින්
නොබෝ දවසක් ගිය පසු †ශුද්ධාත්මයෙන්
බව්තීස්මකරනු ලබන්නහුයයි කීසේක.

## යේසුස්වහන්සේ ස්වර්ගයට නැඟීම

6 එහෙයින් ඔව්හු රැස්වූ විට: ස්වාමිනි,
මේ කාලයේදී ඔබ ඉශ්‍රායෙල්ට
රාජ්‍යය නැවත පිහිටුවාදෙනසේක්දැයි
උන්වහන්සේගෙන් ඇසුවෝය.
7 උන්වහන්සේ ඔවුන්ට කියනසේක්:
පියාණන්වහන්සේ තමන්ගේම බලය
යටතේ තබාගත් කාලයන්ද ප්‍රස්තාවන්ද
දැනගැනීම නුඹලාට අයිති නැත.
8 නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා
කෙරෙහි පැමිණි කල නුඹලා බලය
ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද
මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ
සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ
වන්නහුයයි කීසේක. උන්වහන්සේ මේ 9
කාරණා කී කල්හි. ඔවුන් බලා සිටියදීම
ඔසවාගනු ලැබ. වලාකුළකින් වැසී.
ඔවුන්ට නොපෙනී ගියසේක. උන්- 10
වහන්සේ යන කල. ඔවුන් ස්වර්ගය
දෙස ඕනෑකමින් බලා සිටියදී, සුදු වස්ත්‍ර
ඇන්දවූ මනුෂ්‍යයන් දෙදෙනෙක් ඔවුන්
ළඟ සිට: ගලීලයේ මනුෂ්‍යයෙනි. නුඹලා 11
ස්වර්ගය දෙස බල බලා සිටින්නේ
මක්නිසාද? නුඹලා කෙරෙන් ස්වර්ගයට
ඔසවාගනු ලැබූ මේ යේසුස්වහන්සේ
ස්වර්ගයට යනවා නුඹලා දුටු
ආකාරයෙන්ම එනවා ඇතැයි ඔවුන්ට
කීවෝය.

## ගෝලයන් යාච්ඤාවෙහි යෙදී සිටීම. මත්තියස් තෝරාගැනීම

එකල ඔව්හු යෙරුසලමට සම්පවූ, 12
සබත් දවසක ගමන් දුරවූ ඔලීව නම්
ලත් කන්දේ සිට යෙරුසලමට හැරී
ගියෝය. ඔව්හු ඇවිත් තමුන් නැවතී 13
සිටි උඩුමහලට නැඟුණෝය. ඔව්හු නම්:
පේත්‍රුස්ද යොහන්ද යාකොබ්ද අන්ද්‍රෑද
පිලිප් සහ තෝමස්ද බර්තොලොමෙව්
සහ මතෙව්ද අල්පෙවුස්ගේ පුත්‍රවූ
යාකොබ්ද ජ්වලිතයාවූ සීමොන්ද
යාකොබ්ගේ පුත්‍රවූ යූදස්ද යනුය. මේ 14
සියල්ලෝම ස්ත්‍රීන්ද යේසුස්වහන්සේගේ
මවුවූ මරියාද උන්වහන්සේගේ
සහෝදරයන්ද සමග එක්සිත්ව
නොකඩවම යාච්ඤාකරමින් සිටියෝය.

*වතුරෙහි අවගාහනය.
†ශුද්ධාත්මයෙහි අවගාහනය.

15 මේ දවස්වලදී එකසිය විසිදෙනෙක්
පමණ සෙනඟ රැස්ව සිටි කල පේත්‍රුස්
සහෝදරයන් මැද නැගිට සිට කියනුයේ:
16 සහෝදරයෙනි, යේසුස්වහන්සේ ඇල්ලූ
අයට මගපෙන්නුවාවූ යූදස් ගැන
ශුද්ධාත්මයාණන්වහන්සේ දවිත්ගේ
මුඛයෙන් පෙර කීවාවූ වාක්‍යය
සම්පූර්ණවෙන්ට ඕනෑව තිබුණේය.
17 මක්නිසාද ඔහු අප සමග ගණන්ගනු
ලැබ, මේ මෙහෙයේ තමාගේ කොටස
18 ලැබුවේය. (මේ මනුෂ්‍යයා තමාගේ
අයුතුකමේ කුලියෙන් බිමක් මිලේට ගෙන,
මුහුණින් වැටී, මැදින් පැළුණේය, ඔහුගේ
බඩවැල් සියල්ලම පිටත විසිවුණේය.
19 එය යෙරුසලම් වාසි සියල්ලන්ට
සැලවිය; එහෙයින් ඒ බිමට ඔවුන්ගේ
භාෂාවෙන් අකෙල්දමයයි කියනලදී,
20 එනම් ලේබිමය.) කුමක්හෙයින්ද:
ඔහුගේ වාසස්ථානය පාළුවේවා,
කිසිවෙක් එහි වාසය නොකෙරේවා
කියාද
ඔහුගේ තනතුර වෙන කෙනෙක් ගනීවා
කියාද ගීතිකා පොතෙහි ලියා තිබේ.
21 එහෙයින් යොහන්ගේ *බව්තීස්මය පටන්
ස්වාමිවූ යේසුස්වහන්සේ අප කෙරෙන්
ඔසවාගනු ලැබූ දවස දක්වා,
22 උන්වහන්සේ අප අතරෙහි ආ ගිය මුළු
කාලයෙහි නිතරම අප සමග
සිටියාවූ මනුෂ්‍යයන්ගෙන් එක්කෙනෙක්
උන්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම
ගැන අප සමග සාක්ෂිකාරයෙක් විය
23 යුතුයයි කීවේය. එවිට ඔව්හු යුස්තස්
කියනලද බර්සබ්බස් නම් යෝසෙප්ද
මත්තියස්ද යන දෙදෙනෙක් ඉදිරිපිට
24 සිටෙවුවෝය. තවද ඔව්හු යාච්ඤාකරමින්:
සියල්ලන්ගේ සිත් දන්නාවූ ස්වාමීන්-
වහන්ස, තමාගේම ස්ථානයට යන පිණිස
යම් මෙහෙයකින්ද ප්‍රේරිතකමකින්ද යූදස්
25 වැටී ගියේද, ඒ මෙහෙයත් ප්‍රේරිතකමේ
ස්ථානයත් ලැබීමට මොවුන්
දෙන්නාගෙන් ඔබ විසින් තෝරාගත්
තැනැත්තා පෙන්නුව මැනවයි කියා,
26 ඔවුන් ගැන පසඇට දැමුවෝය; එවිට
පසඇටය මත්තියස්ට වැටුණේය; ඔහු
ප්‍රේරිතයන් එකොළොස්දෙනා සමග
ගණන්ගන්නාලද්දේය.

*අවගාහනය.

## ශුද්ධාත්මයාණන් ප්‍රදානය

2 තවද පෙන්තකොස්ත දවස පැමිණි
කල ඔවුන් සියල්ලෝ එක තැනක
රැස්ව සිටියෝය. තද හුළඟක් 2
හමන්නාක්මෙන් ශබ්දයක් අහසෙන්
හදිසියෙන් පැමිණ, එයින් ඔවුන් හිඳගෙන
උන්නාවූ මුළු ගෙය පිරුණේය. ගිනි 3
වැනිවූ දිව් බෙදී යනවා ඔවුන්ට
පෙනුණේය; එය ඔවුන් එක්එක්කෙනා
කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ 4
ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන්
ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන්
ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට
පටන්ගත්තෝය.
එකල අහසින් යට තිබෙන සියලු 5
දේශවලින් ආවාවූ භක්තිවන්ත යුදෙව්වරු
යෙරුසලමේ වාසයකරමින් සිටියෝය.
මේ ශබ්දය ඇසුණු කල සමූහයා එකතුව 6
ඇවිත් වියවුල්විය, මක්නිසාද එකිනෙකා
තම තමාගේ භාෂාවෙන් ඔවුන්
කථාකරනවා ඇසුවේය. ඔවුන් සියල්ලෝ 7
විස්මිතව පුදුමවී: බලව, මේ කථාකරන
සියල්ලෝ ගලීලයෝ නොවෙද්ද? අප 8
උපන් දේශවල අප එකිනෙකාගේම
භාෂාවෙන් ඔවුන් කථාකරනවා කෙසේ 9
අසමුද? පාර්තිවරුද මේදවරුද ඒලාමි-
වරුද මෙසොපොතාමියෙහිත් යූදය සහ
කපදෝකියෙහිත් පොන්තසය සහ
ආසියාවෙහිත්, පිරිගිය සහ පම්පිලියෙහිත් 10
මිසරය සහ කිරේනිය වටකර ලිබියේ
ප්‍රදේශවලත් යන මෙකී දේශවාසීහුද
රෝමයෙන් ආ විදේශීහුද යුදෙව්වරුන්
සහ ඔවුන්ගේ ආගමට හැරුණු අයද,
ක්‍රීත්වරු සහ අරාබිවරුද යන අපි අපගේ 11
භාෂාවලින් දෙවියන්වහන්සේගේ බලවත්
ක්‍රියා ගැන ඔවුන් කථාකරනවා
අසමුයයි කීවෝය. ඔවුන් සියල්ලෝ 12
විස්මිතව වියවුල්ව: මේ කිමෙක්දයි
ඔවුනොවුන් කථාකරගත්තෝය. නුමුත් 13
සමහරෙක් සරදම් කරමින්: මොවුන්
අලුත් මුද්‍රිකපානයෙන් පිරීලායයි කීවෝය.

## පෙන්තකොස්ත දින පේත්‍රුස්ගේ දේශනාව

14 නුමුත් පේත්‍රුස් එකොළොස්දෙනා සමග
නැගිට ශබ්දනගා ඔවුන්ට කියනුයේ:
යුදයේ මනුෂ්‍යයෙනි, යෙරුසලමේ වසන
සියල්ලෙනි, මේක දනගනිල්ලා. මාගේ
15 වචනවලට කන්දියල්ලා. මක්නිසාද දනට
දවල් තුන්වෙනි පැය පමණක් බැවින්
නුඹලා සිතන්නා සේ මොවුන් මත්වෙලා
16 නොවේ. නුමුත් මේ වනාහි අනාගත-
වක්තෘවූ යෝවෙල් කරණකොටගෙන
කියනලද කාරණයය. කෙසේදයත්:

17 අන්තිම දවස්වලදී
මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට
වගුරුවන්නෙමි.
නුඹලාගේ පුත්‍රයෝද දූවරුද
අනාගතවාක්‍ය කියන්නෝය,
නුඹලාගේ තරුණයෝද දර්ශන
දකින්නෝය,
නුඹලාගේ මහල්ලන්ද ස්වප්න දකිනවා
ඇත.
18 එසේය, ඒ දවස්වලදී මාගේ දසදසීන්
කෙරෙහි
මාගේ ආත්මය වගුරුවන්නෙමි; ඔව්හු
අනාගතවාක්‍ය කියන්නෝය.
19 තවද උඩ අහසෙහි පුදුමද
පාත පොළොවෙහි ලකුණුද වන
ලේ සහ ගිනිත් දුම් වලාපටලත්
දක්වන්නෙමි.
20 ස්වාමීන්වහන්සේගේ මහත්වූ තේජවත්වූ
ඒ දවස එන්ට පළමුවෙන්
ඉර අඳුරුවන්නේය,
හඳ ලේ වන්නේය.
21 ස්වාමීන්වහන්සේගේ නාමයෙන්
යාච්ඤාකරන කවරේත් ගළවනු
ලබන්නේයයි දෙවියන්වහන්සේ
කියනසේක
22 යනුයි. ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි, මේ වචන
අසාපල්ලා—නුඹලාම දන්නා ලෙස
නුඹලා අතරේ දෙවියන්වහන්සේ විසින්
නාසරිය යේසුස්වහන්සේ ලවා
කරවනලද බලවත් ක්‍රියාවලින්ද පුදුම-
වලින්ද ලකුණුවලින්ද දෙවියන්වහන්සේ
විසින් ඒත්තුගනු ලැබූ මනුෂ්‍යයෙක්වූ එම
යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ 23
නියමවූ මන්ත්‍රණය සහ පෙරදැනගැන්ම
ලෙස භාරදෙනලදුව, නුඹලා ව්‍යවස්ථාව
නොසලකන අය ලවා කුරුසියෙහි
ඇණගස්වා මැරවුවහුය. නුමුත් 24
දෙවියන්වහන්සේ මරණ වේදනාවෙන්
උන්වහන්සේ මුදා නැගිටෙවූසේක.
කුමක්හෙයින්ද උන්වහන්සේ නවතාගන
සිටින්ට මරණයට නුපුළුවන් විය.
මක්නිසාද දාවිත් උන්වහන්සේ ගැන 25
කථාකරමින්:

ස්වාමීන්වහන්සේ නිතරම මා ඉදිරියෙහි
සිටිනවා දුටිමි;
මා සොලවනු නොලබන පිණිස
උන්වහන්සේ මාගේ දකුණු පැත්තෙහි
සිටිනසේක.
එහෙයින් මාගේ සිත සන්තෝෂවිය, 26
මාගේ දිව ප්‍රීතිවිය;
තවද මාගේ මාංසය
බලාපොරොත්තුවෙන් වසන්නේය.
මක්නිසාද ඔබවහන්සේ මාගේ 27
ආත්මය *පාතාලයේ නවතින්නටවත්
ඔබගේ ශුද්ධ තැනන්වහන්සේ
කුණුවෙන්ටවත් ඉඩ නොදෙනසේක.
ඔබ ජීවනයේ මාර්ගයන් මට 28
දන්වූසේක;
ඔබගේ මුහුණෙන් ඔබ මා
සන්තෝෂයෙන් පූර්ණ කරනසේකැයි
කීය. සහෝදරයෙනි, කුලජ්‍යෙෂ්ඨවූ දාවිත් 29
මැරී තැන්පත්කරනු ලැබූ බව භය නැතුව
කියන්ට පුළුවන, ඔහුගේ සොහොන්ගෙය
අද දක්වා අප අතරේ තිබේ. එහෙයින් 30
ඔහු අනාගතවක්තෘ කෙනෙක්ව, ඔහුගේ
වංශයෙන් කෙනෙකු ඔහුගේ සිංහාසනය
පිට හිඳුවනසේකැයි දෙවියන්වහන්සේ
දිවුරුමකින් ඔහුට දිවුළ බව දනගත්තේය.
ඔහු මෙය කලින් දැක ක්‍රිස්තුස්වහන්සේගේ 31
මළවුන්ගෙන් නැගිටීම ගැන කථාකරමින්:

---

*ග්‍රීක්: හේදීස.

උන්වහන්සේ *පාතාලයේ නවතින්ට
හරිනු නොලැබූ බවත් උන්වහන්සේගේ
මාංසය කුණු නොවූ බවත් කීවේය.
32 මෙම යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ
විසින් නැගිටෙවුසේක, ඊට අපි සියල්ලෝ
33 සාක්ෂිකාරයෝය. එහෙයින් උන්වහන්සේ
දෙවියන්වහන්සේගේ දකුණතින් උසස්
කරනු ලැබ, පොරොන්දුවූ ශුද්ධාත්මයා-
ණන්වහන්සේ පියාණන්වහන්සේගෙන්
ලබා, නුඹලා අසන දකින මේ දේ
34 වැගිරෙවුසේක. මක්නිසාද දාවිත්
ස්වර්ගයට නැගුණේ නැත. නුමුත් ඔහු
කථාකොට:
මා විසින් නුඹේ සතුරන් නුඹේ
පාපුටුව කරන තෙක්
35 මාගේ දකුණු පැත්තේ හිඳගනින්නැයි
ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්-
වහන්සේට කීසේකැයි
36 ඔහුම කියයි. එබැවින් නුඹලා විසින්
කුරුසියෙහි ඇණගැසුවාවූ මෙම
යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ විසින්
ස්වාමීන්වහන්සේද ක්‍රිස්තුස්වහන්සේද
කරනු ලැබූ බව ඉශ්‍රායෙල්ගේ මුළු වංශය
නිසැකව දැනගනීවයි කීවේය.

## දේශනාවේ ඵල. සභාව පිහිටුවීම

37 ඔව්හු ඒ අසා අනිනලද සිත් ඇතුව:
සහෝදරයෙනි, අප විසින් මක්කරන්ට
ඕනෑදැයි පේත්‍රුස්ගෙන්ද අනික්
38 ප්‍රේරිතයන්ගෙන්ද ඇසුවෝය. පේත්‍රුස්:
නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්
කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
නාමයෙන් †බව්තීස්මය ලබාපල්ලා; එවිට
ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය.
39 මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත්
නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ
දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු
උන්වහන්සේ වෙතට කැඳවනසේක්ද දුර
සිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා,
40 වෙනත් බොහෝ වචනවලින් සාක්ෂිදී:
මේ වංක පරම්පරාවෙන් ගැළවියල්ලාය
41 කියමින් අවවාද කෙළේය. එකල ඔහුගේ
වචනය පිළිගත් අය *බව්තීස්මකරනු
ලැබුවෝය. ඒ දවසේදී තුන්දහසක් පමණ
මනුෂ්‍යයෝ ඔවුන්ට එකතුකරනලද්දෝය.

## ක්‍රිස්තියානි සමාගමේ ලක්ෂණ

තවද ඔව්හු ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහිද 42
සහභාගිකමෙහිද රොටි කැඩීමෙහිද
යාච්ඤාවලද ස්ථිරලෙස පැවතුණාහ.
එවිට සියලුදෙනා කෙරෙහි භය 43
පැමුණුණේය. බොහෝ පුදුමද හාස්කම්ද
ප්‍රේරිතයන් කරණකොටගෙන කරන
ලද්දේය. අදහාගත් සියල්ලෝ එක්ව සිට 44
සියලු දේ පොදුවේ තබාගත්තෝය; ඔව්හු 45
තමුන්ගේ ගම් බිම් සහ දේපළ විකුණා,
එකිනෙකාට වුවමනාව තිබුණු හැටියට
සියල්ලන්ට බෙදුදුන්නෝය. තවද ඔව්හු 46
දවසින් දවස නොකඩවම එක්සිත්ව
දේවමාළිගාවේ සිටිමින්, ගෙදරදී රොටි
කඩමින්, ප්‍රීතියෙනුත් අවංක සිතිනුත්
කෑම කමින්, දෙවියන්වහන්සේට ස්තුති
ප්‍රශංසාකරමින්, සෙනඟට ප්‍රිය උපදින 47
ලෙස ක්‍රියාකරමින් පසුවුණෝය.
ස්වාමීන්වහන්සේ වනාහි ගැළවෙන්නාවූ
අය දවස්පතා ඔවුන්ට එක්කළසේක.

## කොරෙකු සුවපත්කිරීම

3 පේත්‍රුස්ද යොහන්ද යාච්ඤා
වේලාවවූ නවවෙනි පැයේ
දේවමාළිගාවට යද්දී, මවුකුස පටන් 2
කොරව සිටි එක්තරා මනුෂ්‍යයෙක්
ගෙනයනු ලැබුවේය. ඔහු මාළිගාවට
ඇතුල් වෙන්නන්ගෙන් සිඟමන් ඉල්ලන
පිණිස සුඳර්ශන දෙරටුවයයි කියන
මාළිගාවේ දෙරටුව ළඟ දවස්පතා
තබනලද්දේය. ඔහු පේත්‍රුස්ද යොහන්ද 3
දේවමාළිගාවට ඇතුල්වෙන්ට යනවා දැක,
සිඟමන් ඉල්ලුවේය. පේත්‍රුස් යොහන් 4
සමග ඔහු දෙස ඇස් හෙළා: අප දෙස
බලාපන්නැයි කීවේය. ඔහු ඔවුන්ගෙන් 5
යමක් ලබන බලාපොරොත්තුවෙන්
ඔවුන් දෙස බලා සිටියේය. පේත්‍රුස්ද: 6
රන් රිදී මට නැත; නුමුත් මට ඇති දේ
නුඹට දෙමි. නාසරීය යේසුස්වහන්සේගේ
නාමයෙන්, ඇවිදපන්නැයි කියා, ඔහුගේ 7
දකුණත අල්ලා ඔහු නැගිටෙවුවේය.

*ග්‍රීක්: හේදීස. †අවගාහනය.

*අවගාහනය.

එකෙණෙහිම ඔහුගේ පාද සහ ඇස්වට
8 සවිවිය. ඔහු පැනනැගී කෙලින් සිට,
ඇවිදින්ට පටන්ගත්තේය; ඇවිදිමින්ද
පැනනගිමින්ද දෙවියන්වහන්සේට
ප්‍රශංසාකරමින්ද ඔහු ඔවුන් සමග
9 දේවමාළිගාවට ඇතුල්වුණේය. මුළු
සෙනඟ ඔහු ඇවිදිනවාත් දෙවියන්-
වහන්සේට ප්‍රශංසාකරනවාත් දැක,
10 දේවමාළිගාවේ සුදර්ශන දොරටුව ළඟ
සිඟමින් ඉඳගත උන් තැනැත්තා ඔහු
බව දැන, ඔහුට සිද්ධවූ කාරණය ගැන
පුදුමයෙන්ද විස්මයෙන්ද පිරුණෝය.
11 ඔහු පේත්‍රුස් සහ යොහන් අල්ලාගෙන
සිටියදී, මුළු සෙනඟ ඉතා
පුදුමව සාලමොන්ගේයයි කියන ද්වාර-
මණ්ඩපයේ සිටි ඔවුන් වෙතට එක්ව
දිවුවෝය.

## දේවමාළිගාවේදී පේත්‍රුස්ගේ කථාව

12 පේත්‍රුස් ඒ දැක සෙනඟට උත්තරදෙමින්:
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි, මේ මනුෂ්‍යයා
ගැන තුඹලා පුදුමවන්නේ මක්නිසාද?
නොහොත් අපගේම බලයෙන්වත්
භක්තිවන්තකමින්වත් අප විසින් මොහු
ඇවිදින්ට සැලැස්සුවාක්මෙන් අප දෙස
ඇස් හෙළා සිටින්නේ මක්නිසාද?
13 ආබ්‍රහම්ගේද ඊසාක්ගේද යාකොබ්ගේද
දෙවිවූ අපගේ පියවරුන්ගේ දෙවියන්-
වහන්සේ තමන් මෙහෙකරුවූ යේසුස්-
වහන්සේ ගෞරවයට පැමිණෙවුසේක.
තුඹලා උන්වහන්සේ පාවාදී, පිලාත්
උන්වහන්සේ නිදහස්කරන්ට තීන්දුකරගන
සිටි කල, ඔහු ඉදිරියෙහිදී උන්වහන්සේව
14 එපාකළහුය. මෙසේ තුඹලා ශුද්ධවූ
ධර්මිෂ්ඨවූ තැනන්වහන්සේව එපාකොට,
මිනීමරුවෙකු තුඹලාට දෙන පිණිස
15 ඉල්ලා, ජීවනයේ අධිපතියාව මැරුවහුය;
දෙවියන්වහන්සේ උන්වහන්සේව
මළවුන්ගෙන් නැගිටෙවුසේක; අපි ඊට
16 සාක්ෂිකාරයෝය. උන්වහන්සේගේ
නාමය කෙරෙහි ඇදහිල්ල කරණකොට-
ගෙන උන්වහන්සේගේ නාමයම තුඹලා
දකින්නාවූ අඳුනන්නාවූ මේ මනුෂ්‍යයා
සවිකෙළේය. එසේය, උන්වහන්සේ
කරණකොටගෙන ඇත්තාවූ ඇදහිල්ල
තුඹලා සියල්ලන් ඉදිරියෙහි මොහුට
මේ සම්පූර්ණ සුවය දුන්නේය. ඉතින්, 17
සහෝදරයෙනි, තුඹලාගේ මූලාදෑනීන්
කළාක්මෙන්ම තුඹලාත් නොදත්කමින්
ඒක කළ බව මම දනිමි. නුමුත් 18
ස්වකීය ක්‍රිස්තුස්වහන්සේ විඳිනසේකැයි
දෙවියන්වහන්සේ සියලු අනාගතවක්තෘ-
වරුන්ගේ මුඛයෙන් පෙර දන්නෙවූවාවූ
දේවල් මෙසේ සම්පූර්ණකළසේක.
එබැවින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් 19
සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද,
තුඹලා උදෙසා නියමකරනලද්දවූ 20
ක්‍රිස්තුස්වහන්සේ, එනම් යේසුස්වහන්සේ,
එවන පිණිසද, තුඹලාගේ පාපයත්
මකාදමනු ලබන පිණිසද, පශ්චාත්තාපව
හැරියල්ලා. දෙවියන්වහන්සේ ලෝකයේ 21
පටන්ගැන්මේ සිට තමන්ගේ ශුද්ධවූ
අනාගතවක්තෘවරුන්ගේ මුඛයෙන්
කියෙවුවාවූ, සියලු දේ නැවත
පිහිටුවන්නාවූ කාලවල් දක්වා
උන්වහන්සේ ස්වර්ගයෙහි සිටින්ට ඕනෑය.
මෝසෙස් කථාකොට: තුඹලාගේ 22
ස්වාමිවූ දෙවියන්වහන්සේ මා සමාන
අනාගතවක්තෘකෙනෙකු තුඹලාගේ
සහෝදරයන් අතරෙන් තුඹලාට
නැඟුටුවාදෙනසේක; ඔහු තුඹලාට
කථාකරන සියල්ල ගැන ඔහුට
ඇහුම්කන්දීපල්ලා. ඒ අනාගතවක්තෘට 23
ඇහුම්කන් නොදෙන්නාවූ සෑමදෙනම
සෙනඟ අතරෙන් මුළුමනින්ම
විනාශකරනු ලබන්නෝයයි කීවේය.
එසේය, සාමුවෙල් පටන් ඊට පසු 24
පැමිණි යම් පමණ අනාගතවක්තෘහු
කථාකළෝද, ඒ සියල්ලෝම මේ
දවස් ගැන කථාකළෝය. තුඹලා 25
අනාගතවක්තෘවරුන්ගේද, නුඹේ වංශය
කරණකොටගෙන පොළොවේ සියලු
වර්ගයෝ ආශීර්වාද ලබන්නෝයයි
ආබ්‍රහම්ට කියමින් දෙවියන්වහන්සේ
විසින් තුඹලාගේ පියවරුන් සමග කළ
ගිවිසුමේද පුත්‍රයෝය. දෙවියන්වහන්සේ 26
ස්වකීය සේවකයා නැඟුටුවාදී,
තුඹලාගෙන් එකිනෙකා තම තමාගේ
අයුතුකම්වලින් හැරවීමෙන් තුඹලාට
ආශීර්වාදකරන පිණිස, පළමුකොට
තුඹලා වෙතට උන්වහන්සේව එවූසේකැයි
කීවේය.

## පේත්‍රුස් සහ යොහන් මන්ත්‍රණ සභාව ඉදිරියේ සිටීම

4 ඔවුන් සෙනඟට කථාකරද්දී
පූජකයෝද දේවමාළිගාවේ සේනා-
පතියාද සද්දුසිවරුද සෙනඟට ඔවුන්
2 ඉගැන්වූ බැවිනුත්, යේසුස්වහන්සේ
කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටීම
ප්‍රකාශකළ බැවිනුත් අතිශයෙන් කැලඹී,
3 ඔවුන් කරා පැමිණ, ඔවුන් පිට අත්
හෙළා, සවස්වූ බැවින් පසුවද වන තුරු
4 හිරගෙයි තැබුවෝය. නුමුත් වචනය
ඇසූවන්ගෙන් බොහෝ දෙනෙක්
අදහාගත්තෝය; ඒ මනුෂ්‍යයන්ගේ ගණන
පන්දහසක් පමණ විය.
5 තවද පසුවද ඔවුන්ගේ මූලාදෑනියෝද
6 වැඩිමහල්ලෝද ලියන්නෝද, උත්තම
පූජකයාවූ අන්නස්ද කායාඵස්ද
යොහන්ද අලෙක්ෂන්දර්ද උත්තම
පූජකයාගේ සියලු නෑයෝද
යෙරුසලමෙහි රැස්වී ඔවුන් මැද සිටුවා:
7 නුඹලා මේක කළේ මොන බලයෙන්ද
නොහොත් මොන නාමයෙන්දැයි
8 විචාළෝය. එවිට පේත්‍රුස් ශුද්ධාත්මයෙන්
පූර්ණව, ඔවුන්ට කියනුයේ: සෙනඟගේ
9 මූලාදෑනියෙනි, වැඩිමහල්ලෙනි, දුර්වල
මනුෂ්‍යයෙකුට කළාවූ යහපත් ක්‍රියාවක්
ගැන, ඔහු සුවකරනු ලැබුවේ කොයි
විධියෙන්දැයි අද අපි විභාගකරනු ලබමු
10 නම්, නුඹලා විසින් කුරුසියෙහි
ඇණගසනලද්දවූද දෙවියන්වහන්සේ
විසින් මළවුන්ගෙන් නැගුටුවනලද්දවූද
නාසරීය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
නාමයෙන්ම මේ මනුෂ්‍යයා නුඹලා
ඉදිරියෙහි සුවපත්ව සිටීයයි නුඹලා
සියල්ලෝද සියලුම ඉශ්‍රායෙල් සෙනඟද
11 දැනගනිත්වා. උන්වහන්සේ වනාහි ගෙවල්
සාදන්නන් වන නුඹලා විසින් සුළුකරනු
ලැබුවාවූද කොනේ ප්‍රධාන ගල කරනු
12 ලැබුවාවූද ගලය. වෙන කිසිවෙකු තුළ
ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ
ගැළවීමට අවශ්‍යවූ, මනුෂ්‍යයන් අතරේ
දෙනලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන්
යට නැත්තේයයි කීවේය.

එවිට ඔව්හු පේත්‍රුස්ගේද යොහන්ගේද 13
නිර්භීතකම දැක, ඔවුන් අපණ්ඩිතවූ නූගත්
මනුෂ්‍යයන් බව දැන මවිතවූවෝය; ඔවුන්
යේසුස්වහන්සේ සමග සිටි බව ඔව්හු
ඇඳින්නෝය. සුවකරනු ලැබූ මනුෂ්‍යයා 14
ඔවුන් සමග සිටිනවා දැක, ඊට විරුද්ධව
කිසිවක් කියන්ට ඔවුන්ට නොහැකි විය.
නුමුත් මන්ත්‍රණ සභාවෙන් පිටතට යන්ට 15
ඔවුන්ට ආඥකොට, තම තමුන් අතරේ
කථාකරගනිමින්: මේ මනුෂ්‍යයන්ට
මක්කරමුද? මක්නිසාද විශිෂ්ටවූ 16
ආශ්චර්යයක් ඔවුන් කරණකොටගෙන
කරනලද බව යෙරුසලමෙහි වසන්නාවූ
සියල්ලන්ට ප්‍රකාශව තිබේ; ඒක නැතැයි
කියන්ට අපට නුපුළුවන. නුමුත් සෙනඟ 17
අතරේ එය තවත් දුරට පතළ නොවන
පිණිස, මින්මතු කාටවත් මේ නාමයෙන්
කථා නොකරන්ට ඔවුන්ට තර්ජනය-
කරමුයයි කීවෝය. තවද ඔව්හු ඔවුන් 18
ගෙන්වා, යේසුස්වහන්සේගේ නාමයෙන්
කොහෙත්ම කථා නොකරන ලෙසද
නූගන්වන ලෙසද ඔවුන්ට ආඥකළෝය.
නුමුත් පේත්‍රුස්ද යොහන්ද ඔවුන්ට 19
උත්තරදෙමින්: දෙවියන්වහන්සේට
ඇහුම්කන්දීමට වඩා නුඹලාට
ඇහුම්කන්දීම දෙවියන්වහන්සේ ඉදිරියෙහි
හරිද කියා නුඹලාම විනිශ්චයකරපල්ලා.
මක්නිසාද අප ඇසූ දුටු දේ ගැන 20
කථානොකර සිටින්ට අපට නුපුළුවනැයි
කීවෝය. සිද්ධවුණු දේ ගැන සියල්ලන් 21
දෙවියන්වහන්සේට ප්‍රශංසාකළ බැවින්,
සෙනඟ නිසා ඔවුන්ට දඬුවම්කරන්ට
අන්දමක් නොදැක, ඔව්හු ඔවුන්ට තව-
දුරටත් තර්ජනයකොට යන්ට හැරියෝය.
මක්නිසාද මේ ආශ්චර්යයෙන් සුවකරනු 22
ලැබූ මනුෂ්‍යයා සතළිස් අවුරුද්දකට
වඩා වයස්ව සිටියේය.

## ඔවුන් නිදහස්වී හැරී ආවාට පසු සභාව යාච්ඤකිරීම

ඔව්හු නිදහස්කරනු ලැබ, තමුන්ගේම 23
සමාගමට ඇවිත්, නායක පූජකයන් හා
වැඩිමහල්ලන් විසින් තමුන්ට කියන ලද
සියල්ල දන්වූවෝය. ඔව්හු ඒ අසා 24
එක්සිත්ව දෙවියන්වහන්සේට හඬනඟා:

අහසත් පොළොවත් මුහුදත් එහි ඇති
25 සියල්ලත් මැවූ ස්වාමිනි, ඔබගේ
මෙහෙකරුවූ අපගේ පියවූ දාවිත්ගේ
මුඛයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ
කරණකොටගෙන ඔබ කථාකොට:
අන්‍යජාතීහු කුමට කෝලාහල
කළෝද?
ජනයෝ කුමට නිෂ්ඵල දේ සිතත්ද?
26 ස්වාමීන්වහන්සේටද උන්වහන්සේගේ
ක්‍රිස්තුස්වහන්සේටද විරුද්ධව
පොළොවේ රජවරු සැරසී සිටියෝය,
ආණ්ඩුකාරයෝ එක්ව රැස්වූවෝයයි
27 කීසේක. කුමක්හෙයින්ද ඔබගේ අතින්ද
ඔබගේ මන්ත්‍රණයෙන්ද සිද්ධවන්ට
නියමකළ කොයි දෙයක් තුමූත්
28 ඉෂ්ටකරන පිණිස, ඔබ ආලේපකළ
ඔබගේ ශුද්ධ සේවකවූ යේසුස්-
වහන්සේට විරුද්ධව සැබවින් හෙරොද්ද
පොන්තියුස් පිලාත්ද අන්‍ය ජාතීන් හා
ඉශ්‍රායෙල් සෙනඟ සමග මේ නුවර
29 රැස්වූවෝය. දැනුදු ස්වාමිනි, ඔවුන්ගේ
තර්ජන බලා සුවකිරීමට ඔබගේ අත
30 දිගුකරන කල, ඔබගේ වචනය
නිර්භීතකමින් කථාකරන්ටත් ඔබගේ
ශුද්ධ සේවකයාවූ යේසුස්වහන්සේගේ
නාමය කරණකොටගෙන හාස්කම්ද
පුදුමද කරන්ටත් ඔබගේ දාසයන්ට වර
31 දුන මැනවයි කීවෝය. ඔවුන් යාච්ඤාකළ
පසු, ඔවුන් රැස්ව සිටි ස්ථානය
කම්පාවිය; ඔවුන් සියල්ලෝද
ශුද්ධාත්මයෙන් පූර්ණව, දෙවියන්-
වහන්සේගේ වචනය නිර්භීත ලෙස
කථාකළෝය.

## සභාවේ එක්සත්කම. පොදු අරමුදල

32 අදහාගත් සමූහයා එක සිතකින් හා
එක ආත්මයකින් යුක්තවූහ. කිසිවෙක්
තමාට අයිති දේවලින් කිසිවක්
තමාගේමයයි නොකීවේය; සියල්ල
33 ඔවුන්ට පොදුවේ තිබුණේය. ස්වාමිවූ
යේසුස්වහන්සේගේ නැවත-නැගිටීම ගැන
ප්‍රේරිතයෝ මහත් බලයෙන් සාක්ෂි-
දුන්නෝය. මහත් අනුග්‍රහය ඔවුන්
සියල්ලන් කෙරෙහි තිබුණේය. හිඟ ඇති 34
කිසිවෙක් ඔවුන් අතරෙහි නොවීය.
මක්නිසාද බිම් හෝ ගෙවල් හෝ ඇති
සියල්ලෝ ඒවා විකුණා, විකුණනලද
දේවල මිල ගෙනත්, ප්‍රේරිතයන්ගේ 35
පාමුල තැබුවෝය. එකල එකිනෙකාගේ
වුවමනාවේ හැටියට බෙදදෙන ලද්දේය.
කුප්‍රස් දේශිකයෙක් වන ලෙවියයෙක්වූ 36
(අනුශාසනාවේ පුත්‍ර යන අර්ථ ඇති)
බාර්ණබස් යන නාමය ප්‍රේරිතයන්ගෙන්
ලැබුවාවූ යෝසෙප් වනාහි, තමාට
තිබුණු බිමක් විකුණා, මිල ගෙනැවිත් 37
ප්‍රේරිතයන්ගේ පාමුල තැබුවේය.

## අනනියස් සහ සප්පිරා. සභාව වර්ධනයවීම

5
නුමුත් අනනියස් නම් එක්තරා
මනුෂ්‍යයෙක් සප්පිරා නම් තමාගේ
භාර්යාව සමග, ඉඩමක් විකුණා, තමාගේ 2
භාර්යාවත් දැනුවත්ව මිලෙන් කොටසක්
තබාගෙන, එක්තරා කොටසක් ගෙනැවිත්
ප්‍රේරිතයන්ගේ පාමුල තැබුවේය. නුමුත් 3
පේතෘස් කථාකොට: අනනියස්නි,
ශුද්ධාත්මයාණන්වහන්සේ රවටා බිමේ
මිලෙන් කොටසක් තබාගන්ට සාතන්
තුඹේ සිත පිරෙවුවේ මක්නිසාද? ඒක 4
තිබියදී තුඹටම අයිතිව තිබුණා
නොවේද? වික්කායින් පසුත් මිල
තුඹේ කැමැත්ත යටතේ තිබුණා
නොවේද? තුඹේ සිතින් මෙබඳු
දෙයක් යෝජනාකරගන්ට යෙදුණේ
කොහොමද? තුඹ බොරු කීවේ
මනුෂ්‍යයන්ට නොව දෙවියන්-
වහන්සේටයයි කීවේය. අනනියස් ඒ 5
වචන අසා වැටී මළේය. ඒ ඇසූ
සියල්ලන්ට මහත් භයක් පැමුණුණේය.
තරුණයෝ නැගිට ඔහු ඔතා, පිටතට 6
ගෙනගොස් වැළලුවෝය.
ඊට තුන් පැයකට පමණ පසු ඔහුගේ 7
භාර්යාව සිද්ධවූ දේ නොදැන එහි
පැමුණුණාය. එවිට පේතෘස් ඈට 8
උත්තරදෙමින්: තුඹලා බිම වික්කේ
මෙපමණටදැයි මට කියාපන්නැයි
කීවේය. එසේය, එපමණටයයි ඈ කීවාය.
එවිට පේතෘස් ඈට කථාකොට: 9
ස්වාමීන්වහන්සේගේ ආත්මයාණන්

පරීක්ෂාකරන්ට නුඹලා එකඟවෙන්ට
යෙදුණේ කොහොමද? අන්න, නුඹේ
පුරුෂයා වැළලූ අයගේ පාද දොර ළඟය,
ඔව්හු නුඹද පිටතට ගෙනයන්නෝයයි
10 ඈට කීවේය. එකෙණෙහිම ඈ ඔහුගේ
පාමුල වැටී මළාය. තරුණයෝ ඇතුල්වී
ඈ මැරී සිටිනවා දැක, ඈ පිටතට
ගෙනගොස් ඇගේ පුරුෂයා ළඟ
11 වැළලුවෝය. මුළු සභාවටද මේ දේ
ඇසූ සියල්ලන්ටද මහත් භයක්
පැමිණියේය.

## ප්‍රේරිතයන්ගේ ලකුණු හා සුව කිරීම

12 තවද ප්‍රේරිතයන්ගේ අත්වලින් බොහෝ
හාස්කම්ද පුදුමද සෙනඟ අතරේ
කරනලද්දේය; ඔවුන් සියල්ලෝ එක්-
සිත්ව සාලමොන්ගේ ද්වාරමණ්ඩපයෙහි
13 සිටියෝය. අනික් අයගෙන් කිසිවෙකුට
ඔවුන් සමග එකතුවෙන්ට ධෛර්ය
නොතිබුණේය. එසේවී නුමුත් සෙනඟ
14 ඔවුන් වර්ණනාකළෝය; අදහාගන්නන්
වන පුරුෂයන්ගෙන්ද ස්ත්‍රීන්ගෙන්ද මහත්
සමූහයක් වැඩි වැඩිව ස්වාමීන්වහන්සේට
15 එක්කරනලද්දෝය. එහෙයින් පේත්‍රුස් එන
විට ඔහුගේ සෙවණැල්ල පමණවත් යම්
රෝගියෙකු පිට වැටෙන පිණිස ඔව්හු
ඔවුන් පිටත වීථිවලට ගෙනැවිත්
ඇඳන්වලද යහන්වලද තැබුවෝය.
16 යෙරුසලම අවට නුවරවලින් සමූහයෝ
රෝගීන්ද අශුද්ධාත්මවලින් පීඩිතවූවන්ද
ගෙන රැස්වූවෝය. ඔවුන් සියල්ලෝද
සුවකරනු ලැබුවෝය.

## ප්‍රේරිතයන් දෙවෙනි වර හිර කරනු ලැබීම. මන්ත්‍රණ සභාව ඉදිරිපිට සිටීම

17 නුමුත් උත්තම පූජකයාද සද්දුසිවරුන්ගේ
ලබ්ධියෙහිවූ ඔහු සමග සිටි සියල්ලෝද
18 නැගිට, ඊර්ෂ්‍යාවෙන් පිරී, ප්‍රේරිතයන්
19 අල්ලා ප්‍රසිද්ධ හිරගෙයි දැමුවෝය. නුමුත්
ස්වාමීන්වහන්සේගේ දූතයෙක් රාත්‍රියේ
හිරගෙයි දොරවල් ඇර ඔවුන් පිටතට
20 ගෙනැවිත්: නුඹලා ගොස් දේව
මාළිගාවේ සිට මේ ජීවනය සම්බන්ධ
සියලු වචන සෙනඟට කථාකරපල්ලායයි
කීවේය. ඔව්හු ඒ අසා, අලුයම් වේලෙහි 21
දේවමාළිගාවට ඇතුල්වී ඉගැන්නුවෝය.
නුමුත් උත්තම පූජකයාද ඔහු සමග
සිටියෝද ඇවිත් මන්ත්‍රණ සභාව හා
ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු වැඩිමහල්ලන්
රැස්කරවා, ඔවුන් ගෙනෙන පිණිස
හිරගෙට මනුෂ්‍යයන් යැවුවෝය. නුමුත් 22
ගියාවූ සේවකයෝ හිරගෙයි ඔවුන්
නොදැක ආපසු ඇවිත්: හිරගේ ඉතා 23
ප්‍රවේසමෙන් වසා තිබුණු බවත් රැකවලුන්
දොරකඩ ඉදිරියෙහි සිටි බවත් දුටිමුව.
නුමුත් දොර ඇරිය කල ඇතුළෙහි කිසි
මනුෂ්‍යයෙක් සම්බ නුණේයයි දන්නුවෝය.
දේවමාළිගාවේ අධිපතියාද නායක 24
පූජකයෝද මේ වචන අසා, මෙයින්
කුමක් වන්නේදෝ කියා බොහෝ වියවුල්-
වූහ. නුමුත් එක්කෙනෙක් ඇවිත්: අන්න, 25
නුඹලා හිරගෙයි දැමූ මනුෂ්‍යයෝ
දේවමාළිගාවෙහි සෙනඟට උගන්වමින්
සිටිතියි ඔවුන්ට කීවේය. එවිට අධිපතියා 26
සේවකයන් සමග ගොස්, බලාත්කාර
නොකොට ඔවුන් ගෙනාවෝය;
මක්නිසාද සෙනඟ ගල් ගසතියි කියා
ඔව්හු භයවූවෝය. ඔව්හු ඔවුන් ගෙනැවිත් 27
සභාව ඉදිරියෙහි සිටෙවුවෝය. උත්තම
පූජකයා කථාකොට: මේ නාමයෙන් 28
නුගන්වන්ට නුඹලාට තදින්
ආඥකෙළෙමුව. එහෙත් නුඹලා
නුඹලාගේ ඉගැන්වීමෙන් යෙරුසලම
පුරවා, ඒ මනුෂ්‍යයාගේ ලේ අප පිට
පමුණුවන්ට සාදන්නහුයයි ඔවුන්ට
කීවේය. පේතෘස්ද ප්‍රේරිතයෝද 29
උත්තරදෙමින්: මනුෂ්‍යයන්ට වඩා
දෙවියන්වහන්සේට අප විසින් කීකරු
විය යුතුය. නුඹලා විසින් ගසක එල්ලා 30
මැරුවාවූ යේසුස්වහන්සේව අපගේ
පියවරුන්ගේ දෙවියන්වහන්සේ නැගිටෙවු-
සේක. ඉශ්‍රායෙල්ට පශ්චාත්තාපයත් 31
පව් කමාවත් දෙන අධිපතියෙක්ද
ගැළවුම්කාරයෙක්ද වන පිණිස
දෙවියන්වහන්සේ තමන්ගේ දකුණතින්
උන්වහන්සේව උසස්කළසේක. අපි මේ 32
කාරණාවලට සාක්ෂිකාරයෝය; එසේම
දෙවියන්වහන්සේ විසින් තමන්ට

කීකරුවෙන්නන්ට දුන් ශුද්ධාත්මයාණන්-
වහන්සෙත් සාක්ෂිකාරයෙකැයි කීවෝය.
33 ඔව්හු ඒ අසා, අතිශයෙන් කෝපවී,
34 ඔවුන් මරන්ට අදහස්කළෝය. තුමුත්
ව්‍යවස්ථාචාර්යයෙක්වූ සියලු මනුෂ්‍යයන්
විසින් ගරුකරනලද්දවූ ගමාලියෙල් නම්
එක් ඵරිසියෙක් සභාවෙහි නැගිට
සිට, ඒ මනුෂ්‍යයන් ස්වල්ප වේලාවකට
පිටතට ගෙනයන්ට අණකොට,
35 කියනුයේ: ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි,
තුඹලා මේ මනුෂ්‍යයන්ට කරන්ට යන
කාරණය ගැන ප්‍රවේසම්වෙයල්ලා.
36 මක්නිසාද මේ දවස්වලට පළමුවෙන්
තුදස් තෙමේ තමාත් වැදගත් කෙනෙක්ය
කියා නැගිට්ටේය; ගණනින් හාරසියයක්
පමණ මනුෂ්‍යයෝ ඔහුට එකතු වූණෝය.
ඔහු මරනලද්දේය; ඔහුට යම් පමණ
දෙනෙක් කීකරුවූවෝද ඒ සියල්ලෝම
37 විසුරුවනු ලැබ නැතිවී ගියෝය. ඔහුට
පසුව ලේඛනය කරන දවස්වලදී
ගලීලයේ යූදස් නැගිට සෙනඟගෙන්
සමහරෙක් තමා වෙතට ඇදගත්තේය.
ඔහුත් විනාශ විය; ඔහුට යම් පමණ
දෙනෙක් කීකරු වූවෝද ඔව්හුත් විසුරුවනු
38 ලැබුවෝය. ඉදින් මා තුඹලාට කියන්නේ
නම්, මේ මනුෂ්‍යයන්ගෙන් වැලකී ඔවුන්ට
කිසිවක් නොකරන ලෙසය. මක්නිසාද
මේ මන්ත්‍රණය හෝ මේ ක්‍රියාව
මනුෂ්‍යයන්ගෙන් වී නම්, ඒක පෙරළාදමනු
39 ලබන්නේය. තුමුත් ඒක දෙවියන්-
වහන්සේගෙන් වී නම්, ඔවුන් පරාජය
කරන්ට තුඹලාට බැරිය; එසේ
උත්සාහ කළොත් සමහරවිට තුඹලා
දෙවියන්වහන්සේට විරුද්ධව පවා
යුද්ධකරන්නනුවන්ට පුළුවනැයි කීවේය.
40 ඔව්හු ඔහුගේ වචනයට එකඟවී,
ප්‍රේරිතයන් තමුන් වෙතට ගෙන්වා, ඔවුන්ට
තළා, යේසුස්වහන්සේගේ නාමයෙන්
කථා නොකරන්ට අණකොට යන්ට
41 හැරියෝය. එහෙයින් ඔව්හු ඒ නාමය
නිසා නින්ද විඳින්ට තුමූ වටින්නෝයයි
ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව,
සභාව ඉදිරියෙන් පිටත්ව ගොස්,
42 දවස්පතාම දේව මාළිගාවේදීත් ගෙදරදීත්
ඉගැන්වීමෙන්ද යේසුස්වහන්සේ ක්‍රිස්තුස්-
වහන්සේයයි දේශනාකිරීමෙන්ද
නොනැවතුණෝය.

## උපස්ථායකයන් සත්දෙනා තෝරාගනු ලැබීම

6 ඒ දවස්වලදී ගෝලයන්ගේ ගණන
වැඩිවෙන කල, දවස්පතා කෙරුණු
උපස්ථානයේදී හෙල්ලීන යුදෙව්වරුන්ගේ
වැන්දඹුවන් නොසලකනු ලැබූ නිසා
හෙබ්‍රෙව්වරුන්ට විරුද්ධව කෙඳිරීමක් විය.
එවිට දෙළොස්දෙනා ගෝල සමූහයා 2
කැඳවා ඔවුන්ට කථාකොට: අප විසින්
දෙවියන්වහන්සේගේ වචනය හැරදමා
මේසවල සේවයකිරීම සුදුසු නැත.
එහෙයින්, සහෝදරයෙනි, මේ වැඩට අප 3
විසින් පත්කරන පිණිස යහපත්යයි
ප්‍රසිද්ධවූ, ආත්මයෙන්ද ප්‍රඥාවෙන්ද
පූර්ණවූ මනුෂ්‍යයන් සත්දෙනෙකු තුඹලා
අතරෙන් සොයාගනිල්ලා. අපි වනාහි 4
යාච්ඥාවෙහිද වචනයේ මෙහෙකිරීමෙහිද
ස්ථිරලෙස යෙදී සිටින්නෙමුයයි කීවෝය.
ඒ කීම මුළු සමූහයාට ප්‍රියවිය. එවිට 5
ඔව්හු ඇදහිල්ලෙන්ද ශුද්ධාත්මයෙන්ද
පූර්ණවූ මනුෂ්‍යයෙක් වන ස්තේපන්ද
පිලිප්ද ප්‍රොකොරස්ද නිකනෝර්ද
තීමොන්ද පර්මෙනස්ද යුදෙව් ආගමට
හැරුණු අන්තියෝකියේ නිකොලස්ද
තෝරාගෙන, ඔවුන් ප්‍රේරිතයන් ඉදිරියෙහි 6
සිටෙවුවෝය. ඔව්හු යාච්ඥාකොට ඔවුන්
පිට අත් තැබුවෝය.
තවද දෙවියන්වහන්සේගේ වචනය 7
පතළවී ගියේය; ගෝලයන්ගේ ගණන
යෙරුසලමේ අතිශයින්ම වැඩිවිය;
පූජකයන්ගෙන් මහත් සමූහයක්ද
ඇදහිල්ලට කීකරුවූවෝය.

## ස්තේපන්ට විරුද්ධවීම

ස්තේපන් අනුග්‍රහයෙන්ද බලයෙන්ද 8
පූර්ණව, පුදුමද හාස්කම්ද සෙනඟ අතරේ
සිදුකෙළේය. එහෙත් ලිබර්තීනයන්ගේ 9
සිනගෝගය කියන සිනගෝගයට
අයිතිවූවන්ගෙන්ද කිරේනියයන්ගෙන්ද
අලෙක්සන්ද්‍රියයන්ගෙන්ද කිලිකිය සහ
ආසියාවේ වැසියන්ගෙන්ද සමහරෙක්

නැගිට ස්තේපන් සමග විවාදකළෝය.
10 ඔහු ප්‍රඥාවෙන්ද ආත්මයාණන්
කරණකොටගෙනද කළ කථාවේ
බලයට විරුද්ධව සිටින්ට ඔවුන්ට
11 නොහැකිවිය. එවිට ඔහු මෝසෙස්ටත්
දෙවියන්වහන්සේටත් විරුද්ධව අපහාස
වචන කියනවා ඇසුවෙමුයයි කියන්ට
12 ඔව්හු මනුෂ්‍යයන් පෙළඹවූවෝය. තවද
ඔව්හු සෙනඟද වැඩිමහල්ලන්ද
ලියන්නන්ද කලඹා, ඔහුට විරුද්ධව
ඇවිත් ඔහු අල්ලා මන්ත්‍රණ සභාවට
13 ගෙනැවිත්: මේ මනුෂ්‍යයා මේ
ශුද්ධස්ථානයටත් ව්‍යවස්ථාවටත්
විරුද්ධව කථාකිරීම නොනවත්වයි.
14 කුමක්හෙයින්ද මේ නාසරීය යේසුස් මේ
ස්ථානය කඩාදමා, මෝසෙස් විසින්
අපට භාරදුන් නියෝග වෙනස්කරනවා
ඇතැයි ඔහු කියනවා ඇසීමුයයි
කියන්නාවූ බොරු සාක්ෂිකාරයන්
15 පැමිණෙවූවෝය. මන්ත්‍රණ සභාවේ ඉඳගන
උන් සියල්ලෝම ඔහු දෙස ඇස් හෙළා
සිටියදී, ඔහුගේ මුහුණ දේවදූතයෙකුගේ
මුහුණ මෙන් ඔවුන්ට පෙනුණේය.

## ස්තේපන්ගේ පිළිතුරු කථාව

7 එවිට උත්තම පූජකයා: මේ දේවල්
2 මෙසේදැයි ඇසුයේය. ස්තේපන්
කථාකොට කියනුයේ:
සහෝදරයෙනි, පියවරුනි, ඇහුම්-
කන්දියල්ලා. අපගේ පියවූ ආබ්‍රහම්
හාරන්හි විසීමට පළමුවෙන්
මෙසොපොතාමියෙහි සිටි කාලයෙහි
මහිමාන්විත දෙවියන්වහන්සේ ඔහුට
3 පෙනී: නුඹේ දේශයෙන්ද නෑයන්
කෙරෙන්ද තුරන්ව, මා නුඹට පෙන්වන
4 දේශයට එවයි කීසේක. එකල ඔහු
කල්දියයන්ගේ දේශයෙන් පිටත්ව
හාරන්හි විසුවේය. ඔහුගේ පියා මළ
කල්හි, දෙවියන්වහන්සේ ඔහු එතැනින්
නුඹලා දැන් වසන්නාවූ මේ දේශයට
5 ගෙනාසේක. එහි එක පියවරක් තබන්ට
පමණවත් ඔහුට උරුමයක් නොදී ඔහු
දරුවෙකු නොලැබ සිටියදී, මේ දේශය
ඔහුටද ඔහුගෙන් පසු ඔහුගේ වංශයටද
උරුම කොට දෙන්ට පොරොන්දුවූසේක.

තවද දෙවියන්වහන්සේ මෙසේ කීසේක, 6
කෙසේද: ඔහුගේ වංශය අන්‍ය දේශයක
විදේශීව සිටිනවා ඇත, ඒ දේශවාසීන්
ඔවුන් වහල්කමට ගෙන, අවුරුදු
හාරසියයක් මුළුල්ලෙහි ඔවුන්ට
පීඩාකරනවා ඇත. දෙවියන්වහන්සේ 7
කථාකොට—ඔව්හු යම් ජාතියකට
වහල්වන්නෝද ඒ ජාතිය විනිශ්චය-
කරන්නෙමි. ඉන්පසු ඔව්හු පිටත්ව ඇවිත්
මේ ස්ථානයෙහි මට මෙහෙකරන්නෝයයි
කීසේක. උන්වහන්සේ චර්මඡේද්‍ය ගිවිසුම 8
ඔහුට දුන්සේක. මෙසේ ආබ්‍රහම්ට දාව
ඊසාක් උපන්නේය, ආබ්‍රහම් අටවෙනිදා
ඔහු චර්මඡේද්‍යකෙළේය; ඊසාක්ට
දාව යාකොබ්ද යාකොබ්ට දාව කුල-
ජ්‍යෙෂ්ඨයන් දෙළොස්දෙනාද උපන්නෝය.
කුලජ්‍යෙෂ්ඨයෝ යෝසෙප්ට ඊර්ෂ්‍යා- 9
කොට ඔහු මිසරයට වික්කෝය. නුමුත් 10
දෙවියන්වහන්සේ ඔහු සමග සිට,
ඔහුගේ සියලු දුක්වලින් ඔහු මුදා,
මිසරයේ රජවූ ඵාරාවෝ ඉදිරියෙහි
කරුණාවත් ප්‍රඥාවත් ඔහුට දුන්සේක; ඒ
රජ මිසරයටද තමාගේ මුළු ගෙටද
ඔහු ආණ්ඩුකාරයා කොට පත්කෙළේය.
එකල මුළු මිසර දේශයෙහිද කානාන්හිද 11
සාගතයක් හා මහත් විපත්තියක් විය.
අපේ පියවරුන්ට කිසි ආහාරයක්
නොලැබුණේය. නුමුත් මිසරයෙහි ධාන්‍ය 12
ඇති බව යාකොබ් අසා, පළමු වාරයේ
අපේ පියවරුන් යැවුවේය. දෙවෙනි 13
වාරයේදී යෝසෙප් තමාගේ සහෝදර-
යන්ට අඳුන්වාදෙනලද්දේය; යෝසෙප්ගේ
ගෝත්‍රය ඵාරාවෝ දැනගත්තේය. එකල 14
යෝසෙප් හැත්තෑ පස්දෙනෙක් වන
ස්වකීය පියවූ යාකොබ්ද තමාගේ සියලු
නෑයන්ද තමා වෙතට කැඳවා හැරියේය.
යාකොබ් මිසරයට ගියේය; ඔහුද අපගේ 15
පියවරුද මළෝය; ඔව්හු ෂෙකෙම් නුවරට 16
ගෙනයනලදුව, ආබ්‍රහම් විසින් ෂෙකෙම්හි
හාමොර්ගේ පුත්‍රයන්ගෙන් රිදීමිල
ගණනකට ගත් සොහොන්ගෙයි තබන
ලද්දෝය. නුමුත් දෙවියන්වහන්සේ 17
ආබ්‍රහම්ට දුන් පොරොන්දුවේ කාලය
ළංවී, යෝසෙප් නොහඳුනන අන් රජෙක් 18

මිසරය කෙරෙහි පැමිණෙන තුරු සෙනඟ
මිසරයෙහි වැඩී බොහෝ වූවෝය.
19 හෙතෙම අපේ ජාතියට විරුද්ධව උපා
යොදා තමුන්ගේ ළදරුවන් ජීවත් නොවන
පිණිස ඔවුන් අහක දමන ලෙස අපගේ
20 පියවරුන්ට පීඩා කෙළේය. ඒ කාලයේදී
මෝසෙස් උපන්නේය. ඔහු අතිශයින්
ශෝභනව සිටියේය: ඔහු ස්වකීය පියාගේ
ගෙයි තුන් මසක් පෝෂණයකරනු
ලැබුවේය. ඔහු පිටතට දමනු ලැබූ කල.
21 ඵාරාවෝගේ දූව ඔහු රැගෙන. තමාගේම
පුත්‍රයා කොට ඇතිකරගත්තාය.
22 මෝසෙස් තෙම මිසරයන්ගේ සකල
ශාස්ත්‍රයන්හි පුහුණුකරනු ලැබ. තමාගේ
වචනවලින්ද ක්‍රියාවලින්ද බලවත්ව
23 සිටියේය. ඔහු සතළිස් අවුරුදු වයසට
ළංවූ කල ඉශ්‍රායෙල් පුත්‍රයන් වන
තමාගේ සහෝදරයන් බලන්ට යන ලෙස
ඔහුගේ සිතෙහි අදහසක් හටගත්තේය.
24 එකල ඔහු කෙනෙකුට අයුක්තියක්
සිදුවෙනවා දැක. ඔහුට උදව්වී.
මිසරයාට පහරදෙමින්. පීඩා වින්ද අයට
25 යුක්තිය කෙළේය. මක්නිසාද දෙවියන්-
වහන්සේ ඔහු කරණකොටගෙන ඔවුන්ට
ගැළවීම දෙන බව තමාගේ සහෝදරයන්
දන්නවායයි ඔහු සිතුවේය: නුමුත් ඔව්හු
26 තේරුම් නොගත්තෝය. පසුවදා ඔවුන්
ඩබරකරන විට ඔහු ඔවුන්ට පෙනී:
මනුෂ්‍යයෙනි, නුඹලා සහෝදරයෝය:
කුමක් නිසා එකිනෙකාට අයුතුකම්
කරවුද්දයි කියමින් සමාදනකරන්ට
27 ගියේය. නුමුත් තමාගේ අසල්වාසියාට
අයුක්තිය කළ අය ඔහු නෙරපා: අප
කෙරෙහි නුඹ අධිපතියෙක් හා
විනිශ්චයකාරයෙක්ද කොට පත්කළේ
28 කවුද? නුඹ ඊයේ මිසරයා මැරූ ලෙස
29 මාත් මරන්ට හදනවාදැයි කීවේය. ඒ
කීම නිසා මෝසෙස් පලාගොස්,
මිදියන් දේශයෙහි විදේශිව විසුවේය,
එහිදී ඔහුට දූ පුත්‍රයන් දෙදෙනෙක්
30 උපන්නෝය. සතළිස් අවුරුද්දක්
සම්පූර්ණවූ කල, දේවදූතයෙක් සීනයි
කන්දේ වනයෙහි පඳුරක ගිනි
31 ජාලාවෙක්හි ඔහුට පෙනුණේය. මෝසෙස්
ඒ දැක, දර්ශනයට පුදුමව, බලන පිණිස
ළඟට ගිය කල: මම නුඹේ පියවරුන්ගේ 32
දෙවියන්වහන්සේ වන ආබ්‍රහම්ගේද
ඊසාක්ගේද යාකොබ්ගේද දෙවියන්-
වහන්සේය කියා ස්වාමීන්වහන්සේගේ
හඬක් විය. මෝසෙස් වෙවුලමින්. බලන්ට
හයවූයේය. ස්වාමීන්වහන්සේ ඔහුට 33
කියනසේක්: නුඹේ පාදවලින් වහන් මුදව:
මක්නිසාද නුඹ සිටින ස්ථානය ශුද්ධ
භූමියක්ය. මිසරයෙහි වසන මාගේ 34
සෙනඟගේ පීඩාව සැබවින් දුටිමි,
ඔවුන්ගේ සුසුම්ලෑම අසා. ඔවුන් ගළවන
පිණිස බැස්සෙමි. ඉතින් වරෙන්න. නුඹ
මිසරයට යවන්නෙමියි කීසේක. නුඹ 35
අධිපතියෙක් හා විනිශ්චයකාරයෙක්
කොට පත්කරනලද්දේ කවරෙකු විසින්ද
කියා ඔවුන් එපාකළාවූ මෙම මෝසෙස්
ප්‍රධානියෙක්ද ගැළවුම්කාරයෙක්ද වන
පිණිස. දෙවියන්වහන්සේ පඳුරේදී ඔහුට
පෙනුණු දූතයාගේ හස්තය ඇතුව යැවූ-
සේක. මිසරයෙහිදීත් රතු මුහුදේදීත් 36
සතළිස් අවුරුද්දක් මුළුල්ලෙහි කාන්තාර-
යේදීත් පුදුමද හාස්කම්ද කොට මේ
මනුෂ්‍යයා ඔවුන් පිටතට ගෙනගියේය.
දෙවියන්වහන්සේ මා හා සමාන 37
අනාගතවක්තෘ කෙනෙකු නුඹලාගේ
සහෝදරයන් අතරෙන් නුඹලාට
නැගුටුවාදෙනසේකැයි ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට කීවාවූ මෝසෙස් මේය. සීනයි 38
කන්දේදී තමාට කථාකළ දේවදූතයා
සමගද අපගේ පියවරුන් සමගද
කාන්තාරයේ සභාවෙහි සිටියේත්.
අපට දෙන පිණිස ජීවන වාක්‍යයන්
ලැබුවෙත් මොහුය. අපේ පියවරු ඔහුට 39
කීකරුවෙන්ට නොකැමැතිව. ඔහු නෙරපා,
තමුන්ගේ සිත්වලින් මිසරය දෙසට හැරී.
ආරොන්ට කථාකරමින්: අපට පෙරටුව 40
යන පිණිස දෙවිවරුන් සාදුව මැනවි.
කුමක්හෙයින්ද මිසර දේශයෙන් අප
ගෙනාවාවූ ඒ මෝසෙස්ට කුමක් වුණාද
කියා නොදනිමුයයි කීවෝය. ඔව්හු 41
ඒ දවස්වලදී වස්සෙකු සාදා. ඒ
රූපයට පූජාවක් ගෙනැවිත්, තමුන්ගේ
හස්තකර්ම ගැන ප්‍රීතිවුණෝය. එවිට 42
දෙවියන්වහන්සේ ඔවුන් වෙතින් හැරී.
අහස් සේනාවට මෙහෙකරන්ට ඔවුන්

අත්හැර දැමූසේක; අනාගතවක්තෘ-
වරුන්ගේ පොතේ ඒ ගැන මෙසේ ලියා
තිබේ, කෙසේද:
එම්බා ඉශ්‍රායෙල් වංශය, මැරුවාවූ
මෘගයන් හා යාග
තුඹලා වනයෙහිදී සතළිස් අවුරුද්දක්
මට පූජාකළහුද?
43 නමස්කාරකරන පිණිස තුඹලා විසින්
සාදනලද රූප
එනම් මොලොක්ගේ කූඩාරමද
රෙපාන් දෙවියාගේ තාරකාවද
ඔසවාගෙනගියහුය.
එබැවින් තුඹලා බබිලෝනියෙන්
එපිටට ගෙනයන්නෙමි
44 යනුයි. තමා දුටුවාවූ ආදර්ශය මෙන්
සාක්ෂියේ කූඩාරම සාදන්ට මෝසෙස්ට
කී තැනන්වහන්සේ නියමකළ ලෙස
අපගේ පියවරුන්ට ඒක වනයෙහි
45 තිබුණේය. අපේ පියවරු ඒක භාරගෙන,
දෙවියන්වහන්සේ විසින් අපේ පියවරුන්
ඉදිරියෙන් පන්නාදැමූ ජාතීන්ගේ දේශය
අයිතිකරගන්න විට යෝෂුවා සමග
ඇතුළට ගෙනැත්, දාවිත්ගේ දවස් දක්වා
46 තබාගත්තෝය. ඔහු දෙවියන්වහන්සේගේ
ඇස් හමුයෙහි කරුණාව ලැබ,
යාකොබ්ගේ දෙවියන්වහන්සේට
වාසස්ථානයක් සාදන්ට ඉල්ලුවේය.
47 නුමුත් උන්වහන්සේට ගෘහයක්
48 ගොඩනැගුවේ සාලමොන්ය. එසේද
වුවත් අතින් සෑදුවාවූ ගෘහවල
මහෝත්තමයාණන්වහන්සේ වාසය
නොකරනසේක; අනාගතවක්තෘහු කියන
හැටියට:-
49 ස්වර්ගය මාගේ සිංහාසනයය,
පොළොව මාගේ පාපුටුවය.
කෙබඳු ගෘහයක් තුඹලා මට
ගොඩනගවුද?
නොහොත් මාගේ විශ්‍රාමස්ථානය
කිමෙක්ද?
50 මේ සියල්ල මාගේ අතින් නොසාදන
ලද්දේදැයි ස්වාමීන්වහන්සේ
කියනසේක.
51 තදවූ කුලල් ඇත්තෙනි, සිතින්ද
කන්වලින්ද අචර්මඡේදිතයෙනි, තුඹලා
නිතරම ශුද්ධාත්මයාණන්ට විරුද්ධව
සිටිහුය. තුඹලාගේ පියවරුන් කළාක්
මෙන් තුඹලාත් කරහුය. තුඹලාගේ 52
පියවරුන් පීඩා නොකළේ ප්‍රොපේත-
වරුන්ගෙන් කොයි තැනැත්තාටද? ඔව්හු
ධර්මිෂ්ඨයාණන්ගේ ඊම පළමුවෙන්
දන්වූවන් මැරුවෝය; තුඹලා දැන්
උන්වහන්සේව පාවාදෙන්නන්ද
මරන්නන්ද වී සිටිති; තුඹලා දේවදූතයන් 53
කරණකොටගෙන නියමකරන ලද
ආකාරයෙන් ව්‍යවස්ථාව ලැබත්, එය
රක්ෂා නොකළහුය යනුයි.

## ස්තේපන් වේදසාක්ෂිකාරයෙකු සේ මැරුම් කෑම

ඔව්හු ඒ දේ ඇසූ විට, අතිනලද සිත් 54
ඇතුව, ඔහුට විරුද්ධව දත්මිටිකෑවෝය.
නුමුත් ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණව, 55
ස්වර්ගය දෙස බලා, දෙවියන්වහන්සේගේ
මහිමයත් දෙවියන්වහන්සේගේ දකුණු
පැත්තේ යේසුස්වහන්සේ නැගිට
සිටිනවාත් දැක: බලව, ස්වර්ගය විවරවී 56
තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්-
වහන්සේගේ දකුණු පැත්තේ නැගිට
සිටිනවාත් මට පෙනේයයි කීවේය. නුමුත් 57
ඔව්හු මහත් ශබ්දයෙන් මොරගසා,
තමුන්ගේ කන් වසාගෙන, එක්සිත්ව ඔහු
කරා වේගයෙන් දිව ගොස්, ඔහු නුවරින් 58
පිටත ලා ඔහුට ගල්ගැසූවෝය.
සාක්ෂිකාරයෝ වනාහි තමුන්ගේ වස්ත්‍ර
සාවුල් නම් යෞවනයෙකුගේ පාමුල
තැබුවෝය. ස්වාමිවූ යේසුස්වහන්ස, 59
මාගේ ආත්මය පිළිගත මැනව කියා
ස්තේපන් යාච්ඤාකරද්දී ඔව්හු ඔහුට
ගල්ගැසුවෝය. ඔහු දණින් වැටී: 60
ස්වාමීන්වහන්ස, මේ පාපය ඔවුන් පිට
නොතැබුව මැනවයි මහත් හඬින්
මොරගසා කීවේය. ඔහු මෙසේ කියා
සැතපුණේය.

## ක්‍රිස්තියානිකාරයන් පීඩාකරනු ලැබීම සහ විසිරයෑම

ඔහු මරාදැමීම ගැන සාවුල්ද 8
එකඟව සිටියේය.
ඒ දවසේදී යෙරුසලමෙහිවූ සභාවට

විරුද්ධව මහත් පීඩාවක් අටගත්තේය;
එවිට ප්‍රේරිතයන් හැර ඔවුන් සියල්ලෝ
යුදයේද සමාරියේද පළාත්වල විසුරුවනු
2 ලැබුවෝය. භක්තිවන්ත මනුෂ්‍යයෝ
ස්තේපන් භූමදානකොට, ඔහු ගැන
3 බොහෝසෙයින් වැලපුණාහ. නුමුත් සාවුල්
සියලු ගෙවලට වැද, පුරුෂයන්ද ස්ත්‍රීන්ද
ඇදගෙන ගොස් හිර ගෙට භාරදෙමින්,
සභාව නාස්තිකෙළේය.

## පිලිප් සමාරියට යෑම

4 එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය
ගිය ස්ථානවල වචනය ප්‍රකාශකළෝය.
5 පිලිප් සමාරිය නුවරට ගොස්
එහි සිටියවුන්ට ක්‍රිස්තුස්වහන්සේව
6 ප්‍රකාශකෙළේය. සමූහයෝ ඇහුම්කන්දී,
පිලිප් කළ ආශ්වර්යයන් දුටු කල, ඔහු
7 කී කරුණු එක්සිත්ව සැලකුවෝය. කුමක්
හෙයින්ද අශුද්ධාත්මයන් වැහී සිටි
බොහෝ දෙනෙකුගෙන් ඒ ආත්මයෝ
මහත් හඬින් මොරගසමින් අහක්ව
ගියෝය. බොහෝ අංශභාග රෝගීහුද
8 කොරුද සුවකරනු ලැබුවෝය. ඒ නුවර
මහත් ප්‍රීතියක් වූයේය.

## මායාකාර සීමොන්

9 නුමුත් ඒ නුවර ප්‍රථමයෙන් මායා
අභ්‍යාසකළාවූ, තමා උත්තමයෙකැයි
ප්‍රකාශකරමින් සමාරිය වැසියන් විස්මිත
කළාවූ සීමොන් නම් මනුෂ්‍යයෙක්
10 සිටියේය. මේ තෙමේ ශ්‍රේෂ්ඨයයි කියන
දෙවියන්ගේ බලයයයි කියමින්, කුඩා
අය පටන් ලොකු අය දක්වා හැම
11 දෙනා ඔහුට ඇහුම්කන්දුන්නෝය. ඔවුන්
විසින් ඔහු එසේ සලකනලදදේ ඔහුගේ
මායාවලින් බොහෝ කලක පටන් ඔවුන්
12 විස්මිතකළ නිසාය. නුමුත් ඔව්හු
දෙවියන්වහන්සේගේ රාජ්‍යයද යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ නාමයද ගැන
ශුභාරංචිය දේශනාකළාවූ පිලිප්
විශ්වාසකොට, පුරුෂයෝද ස්ත්‍රීහුද
*බව්තීස්මකරනු ලැබුවෝය. එකල 13
සීමොන්ද විශ්වාසකොට, *බව්තීස්ම
කරනු ලැබ, පිලිප් සමග නිතර සිට,
ඔහු කළ හාස්කම්ද මහත් ආශ්වර්යයන්ද
දැක විස්මිතවූයේය.

## පේත්‍රුස් සහ යොහන් සමාරියට පැමිණීම

සමාරියයන් දෙවියන්වහන්සේගේ 14
වචනය පිළිගත් බව යෙරුසලමේ සිටියාවූ
ප්‍රේරිතයෝ අසා, පේත්‍රුස් සහ යොහන්
ඔවුන් ළඟට යැවුවෝය. ඔව්හු එහි ගොස් 15
ඔවුන්ට ශුද්ධාත්මය ලැබෙන ලෙස ඔවුන්
උදෙසා යාච්ඤාකළෝය. මක්නිසාද 16
ඔවුන් ස්වාමිවූ යේසුස්වහන්සේගේ
†නාමයට බව්තීස්මකරනු ලැබුවා මිස,
ශුද්ධාත්මය ඒ වන තුරු ඔවුන්ගෙන්
කිසිවෙකු කෙරෙහි පැමිණ තිබුණේ නැත.
ප්‍රේරිතයන් ඔවුන් කෙරෙහි අත් තැබූ 17
කල, ඔවුන්ට ශුද්ධාත්මය ලැබුණේය.
සීමොන්ද ප්‍රේරිතයන්ගේ අත් තැබීම 18
කරණකොටගෙන ශුද්ධාත්මය ලැබෙන
බව දැක, ඔවුන් වෙතට මුදල් ගෙනැවිත්: 19
යමෙකු පිට මම අත් තබම්ද, ඔහුට
ශුද්ධාත්මය ලැබෙන පිණිස මේ
බලය මටත් දියල්ලායයි කීවේය.
නුමුත් පේත්‍රුස් ඔහුට කථාකොට: 20
දෙවියන්වහන්සේගේ දීමනාව මුදලට
ගන්ට නුඹ සිතූ බැවින් නුඹේ මිල නුඹ
සමග විනාශවේවා. මේ කාරණයෙහි 21
කොටසක්වත් පංගුකාරකමක්වත් නුඹට
නැත. මක්නිසාද දෙවියන්වහන්සේ
ඉදිරියෙහි නුඹේ සිත හරි නැත. ඒ නිසා 22
නුඹේ සිතේ කල්පනාව නුඹට කමාකරනු
ලැබේදෝ කියා බලන පිණිස, නුඹේ
මේ දුෂ්ටකම ගැන පශ්චාත්තාපව,
ස්වාමීන්වහන්සේට යාච්ඤාකරපන්න.
මක්නිසාද නුඹ තිත්තකමේ පිතේද 23
අයුතුකම නැමති බැම්මේද සිටින බව
මට පෙනේයයි කීවේය. සීමොන් 24
උත්තරදෙමින්: නුඹලා කීවාවූ දෙයින්
කිසිවක් මා කරා නොපැමිණෙන පිණිස,
මා උදෙසා ස්වාමීන්වහන්සේට යාච්ඤා-
කරපල්ලායයි කීවේය.

*අවගාහනය.
†නාමය තුළට අවගාහනය.

25 එබැවින් ඔව්හු සාක්ෂිදී දෙවියන්-
වහන්සේගේ වචනය කියාදුන්නායින් පසු,
යෙරුසලමට හැරී යද්දී සමාරියයන්ගේ
බොහෝ ගම්වල ශුභාරංචිය ප්‍රකාශ
කළෝය.

## එතියෝපිය නපුංසකයා

26 එහෙත් ස්වාමීන්වහන්සේගේ දූතයෙක්
පිලිප්ට කථාකොට: නැගිට දකුණු දෙස
යෙරුසලමේ සිට ගාසාට බහින පාරට
පලයන්නැයි කීවේය. එය කාන්තාර
27 පාරක්ය. ඔහු නැගිට ගියේය. එකල
එතියෝපිය රට වැසියන්ගේ කන්දකී
නම් බිසව යටතේ බොහෝ
බලය ඇත්තාවූද, ඇගේ මුළු
වස්තුවේ භාණ්ඩාගාරිකවූද, නපුංසකවූ
එතියෝපියයෙක් නමස්කාරකරන පිණිස
යෙරුසලමට ගොස් ආපසු යන්නේ,
28 තමාගේ රථයේ හිඳ, අනාගතවක්තෘවූ
යෙසායාගේ පොත කියවමින් උන්නේය.
29 එවිට ආත්මයාණන්වහන්සේ පිලිප්ට
කථාකොට: නුඹ මේ රථය ළඟට ගොස්
30 එක්වෙයන්නැයි කීසේක. පිලිප් ඔහු ළඟට
දිව ගොස්, අනාගතවක්තෘවූ යෙසායාගේ
පොත ඔහු කියනවා අසා: නුඹ කියවන
දේ නුඹට තේරෙනවාදැයි ඇසුවේය.
31 යමෙක් මගපෙන්නුවොත් මිස නැත්නම්
මට තේරුම්ගන්ට පුළුවන් කොහොමදැයි
කියා, රථයට නැගී තමා සමග ඉඳගන්ට
32 ඔහු පිලිප්ගෙන් උදක්ම ඉල්ලුවේය. ඔහු
කියවමින් සිටි ශුද්ධලියවිලි කොට්ඨාසය
නම්:

උන්වහන්සේ බැටළුවෙකු මෙන්
මරණයට ගෙනයනු ලැබ,
බැටළු පැටවෙක් උගේ ලෝම
කපන්නා ඉදිරිපිට ගොළුව
සිටින්නාක්මෙන්
තමන් මුඛය නාරිනසේක.
33 උන්වහන්සේගේ පහත්වීමේදී
උන්වහන්සේ විනිශ්චය බැහැර
කරනලද්දේය.
උන්වහන්සේගේ පරම්පරාව ප්‍රකාශ
කරන්නේ කවුද?
මක්නිසාද උන්වහන්සේගේ ජීවිතය
භූමියෙන් පහකරනලද්දේය

යනුයි. නපුංසකයා පිලිප්ගෙන් විචාරමින්: 34
අනාගතවක්තෘ මේක කියන්නේ කා
ගැනද? තමාම ගැනද නොහොත් වෙන
කෙනෙකු ගැනදැයි කියන ලෙස නුඹෙන්
ඉල්ලමියි කීවේය. එවිට පිලිප් මුඛය 35
හැර, ඒ ලියවිල්ලෙන් පටන්ගෙන,
යේසුස්වහන්සේ ගැන ඔහුට දේශනා
කෙළේය. ඔව්හු මාර්ගයේ යද්දී, 36
වතුර තිබෙන තැනකට පැමුණුණාහ;
නපුංසකයා කථාකොට: මෙන්න, වතුර
තිබේ; *බව්තීස්මකරනු ලබන්ට මට
කවර බාධාවක් තිබේදැයි† කියා,
රථය නවත්වන්ට අණකෙළේය. එවිට 38
පිලිප්ද නපුංසකයාද දෙදෙනම වතුරට
බැස්සෝය; පිලිප් ඔහුව *බව්තීස්ම-
කෙළේය. ඔවුන් වතුරෙන් ගොඩනැගුණු 39
කල ස්වාමීන්වහන්සේගේ ආත්මයාණෝ
පිලිප් රැගෙන ගියසේක; නපුංසකයා
තවත් ඔහුව නුදුටුයේය, මක්නිසාද ඔහු
ප්‍රීතිවෙමින් තමාගේ ගමන ගියේය. නුමුත් 40
පිලිප් අසෝතසේදී දක්නාලද්දේය. ඔහු
කායිසාරියට එන තෙක් සියලු නුවරවල්
මැදින් යමින් ශුභාරංචිය ප්‍රකාශකෙළේය.

## තාර්සස්හි සාවුල්ගේ හැරීම

9 නුමුත් සාවුල් තව දුරටත් ස්වාමීන්-
වහන්සේගේ ගෝලයන්ට විරුද්ධව
තර්ජනයකරමින්ද, ඔවුන් මරමියි
කියමින්ද, උත්තම පූජකයා වෙතට ගොස්,
ඒ ලබ්ධි මාර්ගයට අයිති අයවලුන්ගෙන් 2
පුරුෂයන් හෝ ස්ත්‍රීන් හෝ සම්බවුණොත්
ඔවුන් බැඳ යෙරුසලමට ගෙන එන
පිණිස දමස්කයේ සිනගෝගවලට
ඔහුගෙන් ලියුම් ඉල්ලාගත්තේය. තවද 3
ඔහු ගමන්කොට දමස්කයට ළංවූ කල,
හදිසියෙන් අහසින් ආලෝකයක් ඔහු

*අවගාහනය.

†සමහර පුරාණ පිටපත්වල 37 වෙනි පදයක් සම්පූර්ණයෙන්ම නොහොත් අර්ධ වශයෙන් තිබේ, ඒ මෙසේය: පිලිප් කථාකොට—නුඹ නුඹේ මුළු සිතින් අදහන්නෙහි නම් එසේ පුළුවනැයි කීය. ඔහු උත්තරදෙමින්—යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව මම අදහමියි කීයේය.

4 අවට බැබළුණේය. ඔහු බිම වැටුණේය,
එවිට: සාවුල්, සාවුල්, තුඹ මට
පීඩාකරන්නේ මක්නිසාදැයි තමාට
කියන හඬක් ඔහුට ඇසුණේය. ස්වාමිනි,
5 ඔබ කවුදැයි ඔහු ඇසීය. උන්වහන්සේද:
මම වනාහි තුඹ පීඩාකරන යේසුස්ය.
6 නුමුත් නැගිට නුවරට ඇතුල්වෙයන්න,
තුඹ විසින් කටයුතු දේ තුඹට කියනු
7 ලබන්නේයයි කීසේක. ඔහු සමග
ගමන්කළ මනුෂ්‍යයන්ට ඒ හඬ ඇසුණ
නුමුත්, ඔව්හු කිසිවෙකු නොදැක,
කථාකරන්ට නොහැකිව සිටියෝය.
8 සාවුල් බිමෙන් නැගිට තමාගේ ඇස්
ඇරිය කල, ඔහුට කිසිවක් පෙනුණේ
නැත; ඔව්හු ඔහුගේ අත අල්ලා
9 දමස්කයට ගෙනගියෝය. ඔහු තුන්දවසක්
ඇස් නොපෙනී, නොකා නොබී සිටියේය.

## සාවුල් දමස්කයෙහි සිටීම

10 දමස්කයෙහි අනනියස් නම් එක්තරා
ගෝලයෙක් සිටියේය; ස්වාමීන්වහන්සේ
දර්ශනයකින්: අනනියස්නි කියා ඔහුට
කීසේක. ස්වාමිනි, මම මෙහියයි
11 ඔහු කීවේය. ස්වාමීන්වහන්සේ ඔහුට
කථාකොට: නැගිට සෘජු නම්වූ වීථියට
ගොස්, තාර්සස්හි මනුෂ්‍යයෙක්වූ සාවුල්
නම් කෙනෙකු ගැන යූදස්ගේ ගෙයි
12 විභාගකරපන්න. මක්නිසාද ඔහු
යාච්ඤාකරමින් සිටිනුයේ, තමාට පෙනීම
ලැබෙන පිණිස අනනියස් නම්
මනුෂ්‍යයෙක් පැමිණ තමා පිට අත්
13 තබනවා දුටුවේයයි කීසේක. එහෙත්
අනනියස් උත්තරදෙමින්: ස්වාමිනි, මේ
මනුෂ්‍යයා යෙරුසලමේදී ඔබගේ
ශුද්ධවන්තයන්ට කොපමණ නපුරුකම්
කළේදැයි බොහෝ දෙනෙකුගෙන් ඇසීමි.
14 මෙහිදීත්, ඔබගේ නාමයට යාච්ඤා කරන
සියල්ලන් බඳින්ට නායක පූජකයන්ගෙන්
15 බලය ලැබ සිටීයයි කීවේය. නුමුත්
ස්වාමීන්වහන්සේ ඔහුට කථාකොට:
පලයන්න, මක්නිසාද ඔහු මාගේ නාමය
අන්‍යජාතීන්ද රජුන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ද
ඉදිරියට ගෙනයන්ට මා විසින්
16 තෝරාගන්නාලද භාජනයක්ය. ඔහු
මාගේ නාමය නිසා කොපමණ දේ විඳින්ට
ඕනෑද කියා ඔහුට දක්වන්නෙමියි
කීසේක. අනනියස් පිටත්ව ගොස්, ගෙට 17
ඇතුල්වී, ඔහු පිට අත් තබා: සහෝදරවූ
සාවුල්, තුඹ පෙනීම ලබන පිණිසද
ශුද්ධාත්මයෙන් පූර්ණකරනු ලබන
පිණිසද ස්වාමීන්වහන්සේ, එනම් තුඹ
ආවාවූ මාර්ගයෙහිදී තුඹට පෙනුණාවූ
යේසුස්වහන්සේ, මා එවූසේකැයි
කීවේය. එකෙණෙහිම ඔහුගේ ඇස්වලින් 18
කොරපොතු වැන්නක් වැටී, ඔහු පෙනීම
ලැබුවේය; ඔහු නැගිට *බව්තීස්ම කරනු 19
ලැබ, කෑම කා ශක්තිමත්විය.
ඔහු දමස්කයෙහි වූ ගෝලයන් සමග
කීප දවසක් සිටියේය. ඔහු අප්‍රමාදවම: 20
යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ
පුත්‍රයාය කියා සිනගෝගවලදී
උන්වහන්සේව ප්‍රකාශකළේය. ඒ 21
ඇසූ සියල්ලෝ විස්මිතව: මෙම
නාමයට යාච්ඤාකරන්නන් යෙරුසලමේදී
නාස්තිකළ තැනැත්තේ මොහු නොවේද?
මොහු මෙහි ආවේත් ඔවුන් බැඳගෙන
නායක පූජකයන් ඉදිරිපිටට ගෙන යන
අදහස පිටයයි කීවෝය. නුමුත් සාවුල් 22
වඩ වඩා බලවත්ව, මුන්වහන්සේ
ක්‍රිස්තුස්වහන්සේයයි ඔප්පුදෙමින්,
දමස්කයෙහි විසූ යුදෙව්වරුන් වියවුල්
කෙළේය.
බොහෝ දවස් ගිය කල, යුදෙව්වරු 23
ඔහු මරන්ට මන්ත්‍රණයකළෝය. නුමුත් 24
ඔවුන්ගේ උපාය සාවුල්ට දැනගන්ට
ලැබුණේය. ඔහු මරන පිණිස ඔව්හු රෑ
දවල් දොරටුවල රැකසිටියෝය. නුමුත් 25
ඔහුගේ ගෝලයෝ රාත්‍රියේ ඔහු රැගෙන,
කූඩයක බාමින් ඔහු පවුරෙන්
බැස්සෙවුවෝය.

## සාවුල් දමස්කයෙහි සහ යෙරුසලමෙහි ශුභාරංචිය ප්‍රකාශකිරීම

ඔහු යෙරුසලමට පැමිණියේ, 26
ගෝලයන්ට එක්වෙන්ට උත්සාහකළේය.
නුමුත් ඔහු ගෝලයෙකු බව විශ්වාස
නොකොට ඔවුන් සියල්ලෝ ඔහු ගැන

*අවගාහනය.

27 හයවූහ. නුමුත් බාර්ණබස් ඔහු ගෙන
ප්‍රේරිතයන් ළඟට කැඳවාගෙන ගොස්,
මාර්ගයෙහිදී ඔහු ස්වාමීන්වහන්සේව
දුටු හැටිත්, උන්වහන්සේ ඔහුට කථාකළ
බවත්, දමස්කයෙහිදී යේසුස්වහන්සේගේ
නාමයෙන් ඔහු නිර්භීතලෙස දේශනාකළ
28 හැටිත් ඔවුන්ට කියාදුන්නේය. ඔහුද ඔවුන්
සමග සිට යෙරුසලමෙහි හැසිරෙමින්,
29 ස්වාමීන්වහන්සේගේ නාමයෙන් භය
නැතුව කථාකෙළේය. ඔහු ග්‍රීක්
යුදෙව්වරුන් සමග කථාකරමින්
වාදකෙළේය; නුමුත් ඔව්හු ඔහු මරන්ට
30 සෙවුවෝය. සහෝදරයෝ ඒ දැන, ඔහු
කායිසාරීයට ගෙන ගොස්, තාර්සස්ට
යැවුවෝය.
31 මෙසේ මුළු යුදයෙහිද ගලීලයෙහිද
සමාරියෙහිද සභාව දියුණුවී, සමාදනය
ලැබ, ස්වාමීන්වහන්සේ කෙරෙහි භය
ඇතුව හැසිරෙමින්, ශුද්ධාත්මයාණන්ගේ
පිහිටවීමෙන් වර්ධනයවූවාය.

## ලිද්දයෙහි පේත්‍රුස්ගේ සුවකිරීම

32 තවද පේත්‍රුස් සියලු පළාත්වල ගමන්
කරන්නේ, ලිද්දයෙහි විසූ ශුද්ධවන්තයන්
33 වෙතටද ආවේය. එහි අට අවුරුද්දක්
අංශභාග රෝගියෙක්ව ඔත්පළව හුන්
අයිනෙයස් නම් එක්තරා මනුෂ්‍යයෙක්
34 ඔහුට සම්බවුණේය. පේත්‍රුස් ඔහුට
කථාකොට: අයිනෙයස්, යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ නුඹ සුවකරනසේක.
නැගිට, නුඹේ ඇඳ සකස්කරපන්නැයි
කීවේය. එකෙණෙහිම ඔහු නැගිට්ටේය.
35 ලිද්දයෙහිද ෂාරෝනෙහිද විසූ සියල්ලෝ
ඔහු දැක, ස්වාමීන්වහන්සේ වෙතට
හැරුණෝය.

## දෙර්කස්

36 *දෙර්කස් යන අර්ථ ඇති තබීතා නම්
එක්තරා ගෝල ස්ත්‍රියෙක් යොප්පාවෙහි
සිටියාය. මේ ස්ත්‍රී බොහෝ යහපත්
ක්‍රියාවලද දන දීමෙහිද යෙදී සිටියාය.
37 තවද ඒ දවස්වල ඇ රෝගීව මළාය.
ඔව්හු ඇ නාවා, උඩුමහලක තැබුවෝය.
ලිද්දව යොප්පාවට සමීප බැවින්, පේත්‍රුස් 38
එහි සිටින බව ගෝලයෝ අසා: ප්‍රමාද
නොවී අප වෙතට අව මැනවයි ඉල්ලමින්
මනුෂ්‍යයන් දෙදෙනෙකු ඔහු වෙතට
යැවූවෝය. එවිට පේත්‍රුස් නැගිට ඔවුන් 39
සමග ගියේය. ඔහු ආ කල, ඔව්හු
උඩුමහලට ඔහු කැඳවාගන ගියෝය.
සියලු වැන්දඹුවෝ ඔහු ළඟ සිට හඬ
හඬා, දෙර්කස් තමුන් සමග සිටියදී
මහපු ඇඳුම් සහ වස්ත්‍ර පෙන්නුවෝය.
නුමුත් පේත්‍රුස් ඔවුන් සියල්ලන් 40
බැහැරකොට, දණින් හිඳ, යාච්ඤාකර,
පසුව මිනිය දෙසට හැරී: තබීතා,
නැගිටින්නැයි කීවේය. එවිට ඇ ඇස්
ඇර, පේත්‍රුස් දැක හිඳගත්තාය. ඔහු ඇට 41
අත දී, නැගුටුවා, ශුද්ධවන්තයන්ද
වැන්දඹුවන්ද කැඳවා, ජීවත්වූ ඇ ඔවුන්ට
භාරදුන්නේය. එය යොප්පාව මුළුල්ලෙහි 42
ප්‍රකාශවිය. බොහෝ දෙනෙක් ස්වාමීන්-
වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. තවද 43
ඔහු සීමොන් නම් සම්කරුවෙකු වෙත
යොප්පාවෙහි බොහෝ දවසක් නැවතී
සිටියේය.

## පේත්‍රුස් සහ කොර්නේලියස්

10 ඉතාලික කණ්ඩායමයයි කියන
හේවා කණ්ඩායමේ සියයකට
මුලාදෑනියෙක්වූ කොර්නේලියස් නම්
එක්තරා මනුෂ්‍යයෙක් කායිසාරීයෙහි
සිටියේය. ඔහු භක්තිවන්තවූ, තමාගේ 2
ගෙදර සියල්ලන් සමග දෙවියන්වහන්සේ
කෙරෙහි භය ඇතුව සිටියාවූ, සෙනඟට
බොහෝ දන් දුන්නාවූ, නිතරම
දෙවියන්වහන්සේට යාච්ඤා කළාවූ
කෙනෙක්ය. ඔහු දහවල් නවවෙනි පැය 3
පමණේදී දෙවියන්වහන්සේගේ දූතයෙකු
තමා ළඟට එනවා සහ: කොර්නේ-
ලියස්යයි තමාට කියනවාත් දර්ශනයකින්
පැහැදිලිලෙස දැක, ඔහු දෙස ඇස් යොමා 4
බලා, භයපත්ව: ස්වාමිනි, කිමෙක්දැයි
ඇසීය. ඔහු කථාකොට: නුඹේ යාච්ඤාද
දනද සිහිවීමක් කොට දෙවියන්වහන්සේ
ඉදිරියට පැමුණුණේය. ඉදින් යොප්පාවට 5
මනුෂ්‍යයන් යවා, පේත්‍රුස් නම් සීමොන්

*මුවදෙන යන අර්ථයි.

6 කැඳවාගන්න. ඔහු මුහුද අද්දර
සීමොන් නම් සම්කරුවෙකුගේ ගෙදර
7 නවාතැන්ගෙන සිටීයයි කීවේය. ඔහු
සමග කථාකළ දේවදූතයා ගිය කල,
ඔහු තමාගේ ගෙදර වැඩකාරයන්ගෙන්
දෙදෙනෙකුත් තමාට නිතර මෙහෙකළ-
වුන්ගෙන් භක්තිවන්ත භේවායෙකුත්
8 කැඳවා, ඔවුන්ට සියල්ල දන්වා,
යොප්පාවට ඔවුන් යැවීය.
9 පසුවද ඔවුන් ගමන්කොට ඒ නුවරට
ළංවනකල, පේත්‍රුස් සවෙනි පැය පමණේදී
10 යාච්ඤාකරන්ට ගේ උඩට ගියේය. ඔහු
බඩගිනිව, කෑම කන්ට කැමති වූයේය.
නුමුත් ඔවුන් එය පිළියෙළ කරද්දී ඔහු
11 මූර්ඡාවිය. එවිට අහස විවරව, සතර
කොනින් මහත් ඇතිරිල්ලක් වැනිවූ
එක්තරා භාජනයක් පොළොවට බැස
12 එනවා ඔහු දුටුවේය. පොළොවේ සියලු
ආකාර සිවුපාවෝද බඩගාන ජාතීහුද
ආකාශයේ පක්ෂීහුද එහි සිටියෝය.
13 පේත්‍රුස්, නැගිට, මරා කාපන්න යන
14 හඬක් ඔහු වෙතට පැමුණුණේය. නුමුත්
පේත්‍රුස්: ස්වාමිනි, එසේ නොවේවා;
මක්නිසාද අකැපවූ අපවිත්‍රවූ දෙයක් කිසි
15 කලෙකත් නොකෑවෙමියි කීවේය. නැවත:
දෙවියන්වහන්සේ පවිත්‍රකළ දේ අකැපයයි
නුඹ නොකියන්නැයි දෙවෙනි වර හඬක්
16 ඔහු වෙත පැමිණියේය. මෙය තුන්වරක්
කරනලද්දේය. එකෙණෙහිම ඒ භාජනය
අහසට ඔසවාගනු ලැබීය.
17 තවද, තමා දුටු දර්ශනයේ අර්ථය
කුමක් විය හැකිදැයි සිතා පේත්‍රුස්
වියවුල්ව සිටියදී, කෝර්නේලියස් විසින්
එවනලද මනුෂ්‍යයෝ සීමොන්ගේ ගෙදර
කොහේදැයි විභාගකර, දොරටුව ඉදිරියෙහි
18 සිට: පේත්‍රුස් නම්ලත් සීමොන් මෙහි
නවාතැන්ගෙන සිටීදැයි හඬගසා ඇසූහ.
19 පේත්‍රුස් වනාහි දර්ශනය ගැන
කල්පනාකරමින් සිටියදී, ආත්මයාණන්-
වහන්සේ කථාකොට: බලව, මනුෂ්‍යයෝ
20 තුන්දෙනෙක් නුඹ සොයති. එබැවින්
නැගිට, බැස, කිසිසේත් සැක නොකොට,
ඔවුන් සමග පලයන්න. මක්නිසාද මම
21 ඔවුන් එවීමියි කීසේක. එවිට පේත්‍රුස්
ඒ මනුෂ්‍යයන් වෙතට බැස: නුඹලා
සොයන තැනැත්තා මමය. නුඹලා ආ
කාරණය කිමෙක්දැයි ඇසුවේය. ඔව්හු 22
කථාකොට: ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්වූ,
දෙවියන්වහන්සේ කෙරෙහි භය
ඇත්තෙක්වූ, යුදෙව්වරුන්ගේ මුළු ජාතිය
විසින් යහපතැයි ප්‍රකාශකරනලද්දවූ,
සියයකට මුලාදෑනියෙක්වූ කෝර්නේලියස්
තමාගේ ගෙදරට නුඹ කැඳවා, නුඹෙන්
වචන අසන පිණිස දෙවියන්වහන්සේ
විසින් ශුද්ධවූ දේවදූතයෙකු ලවා
අණදෙනු ලැබුවේයයි කීවෝය. එකල 23
ඔහු ඔවුන් ඇතුළට කැඳවා නවාතැන්
දුන්නේය.
පසුවද ඔහු නැගිට ඔවුන් සමග පිටත්ව
ගියේය, යොප්පාවේ සහෝදරයන්ගෙන්
සමහරෙක්ද ඔහු කැටුව ගියෝය. ඊට 24
පසුවද ඔව්හු කායිසාරියට පැමිණියෝය.
කෝර්නේලියස් තමාගේ නෑයන්ද හිතේෂි
මිත්‍රයන්ද කැඳවාගෙන ඔවුන්ගේ ඊම බලා
සිටියේය. තවද පේත්‍රුස් ගෙට ඇතුල්වන 25
කල, කෝර්නේලියස් ඔහු ඉදිරියට ගොස්,
ඔහුගේ පාමුල වැටී නමස්කාර කෙළේය.
නුමුත් පේත්‍රුස්: නැගිටින්න, මමත් 26
මනුෂ්‍යයෙකැයි කියා ඔහු නැගිටෙව්වේය.
පේත්‍රුස් ඔහු සමග කථාකරමින්, ගේ 27
ඇතුළට ගොස්, බොහෝ දෙනෙකු
රැස්ව සිටිනු දැක, ඔවුන්ට කියනුයේ: 28
යුදෙව් මනුෂ්‍යයෙකුට අන්‍යජාති කෙනෙකු
හා සමාගම්වීමවත් ඔහු ළඟට
ඊමවත් අයුතු බව නුඹලාම දන්නහුය;
නුමුත් කොයි මනුෂ්‍යයෙක්වත් අකැපය
නොහොත් අපවිත්‍රයයි නොකියන්ට
දෙවියන්වහන්සේ මට දන්වූසේක.
එබැවින් මා කැඳවා යැවූ කල මම 29
අකමැති නොවී ආවෙමි. මොන අදහසක්
පිණිස නුඹලා මා කැඳෙවුවාද කියා
අසමියි කීවේය. එවිට කෝර්නේලියස් 30
කියනුයේ: සතර දවසකට පළමුවෙන්
මේ පැය දක්වා, නවවෙනි පැයේදී මාගේ
ගෙදර යාච්ඤාකරමින් සිටියෙමි; එවිට
දිලියෙන වස්ත්‍ර ඇන්දවූ මනුෂ්‍යයෙක් මා
ඉදිරියෙහි සිට: කෝර්නේලියස්, නුඹේ 31
යාච්ඤාව අසනලද්දේය, නුඹේ දනද
දෙවියන්වහන්සේගේ ඇස් හමුයෙහි
සිහිකරන ලද්දේය. එබැවින් යොප්පාවට 32

මනුෂ්‍යයන් යවා, පේතෘස් නම්ලත්
සීමොන් මෙතැනට කැඳවාගනින්න; ඔහු
මුහුද ළඟ සම්කරු සීමොන්ගේ ගෙයි
33 නවාතැන්ගෙන සිටීයයි කීවේය. එහෙයින්
එකෙණෙහිම නුඹට කියා යැවීමි;
නුඹද ආ එක යහපත්ය. දැනුදු අපි
සියල්ලෝ ස්වාමීන්වහන්සේ විසින් නුඹට
අණකරනලද සියල්ල අසන පිණිස
මෙහි දෙවියන්වහන්සේගේ ඇස් හමුයෙහි
සිටිමුයයි කීවේය.

## පේතෘස්ගේ කථාව

34 එවිට පේතෘස් තමාගේ මුඛය හැර
කථාකොට:
සැබවින් දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ
35 තරාතිරම් නොබලන කෙනෙක්ය. සියලු
ජාතීන් අතරේ උන්වහන්සේ කෙරෙහි
භය ඇතිව ධර්මිෂ්ඨකම් කරන තැනැත්තේ
උන්වහන්සේට ප්‍රසන්න බව සැබවින්ම
36 මට පෙනේ. උන්වහන්සේ සියල්ලන්ගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
කරණකොටගෙන සමාදානයේ යහපත්
ආරංචිය ප්‍රකාශකරවමින් ඉශ්‍රායෙල්
පුත්‍රයන්ට එවනලද වචනය නුඹලා
37 දන්නහුය; එනම් ගලීලය පටන් යුදය
මුළුල්ලෙහි පතළාවූ වචනය වන, යොහන්
විසින් ප්‍රකාශකරනලද *බව්තීස්මයට
38 පසු, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද
බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ
ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ
උන්වහන්සේ සමග සිටි බැවින්
උන්වහන්සේ යහපත්කම් කරමින්ද
යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන්
සුවකරමින්ද හැසුරුණු බවත්ය.
39 උන්වහන්සේ විසින් යුදෙව්වරුන්ගේ
රටෙහිද යෙරුසලමෙහිද කරනලද
සියල්ලට අපි සාක්ෂිකාරයෝය; ඔව්හු
උන්වහන්සේව ගසක එල්ලා
40 මැරුවෝය. දෙවියන්වහන්සේ තුන්වෙනිද
උන්වහන්සේව නැගුටුවා ප්‍රකාශවෙන්ට
41 සැලැස්සූසේක; නුමුත් මුළු සෙනඟට
නොව, දෙවියන්වහන්සේ විසින් කලින්
තෝරාගන්නාලද සාක්ෂිකාරයන් වන,

*අවගාහනයට.

උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණු පසු
උන්වහන්සේ සමග කෑවාවූ බීවාවූ
අපටමය. ජීවත්වන්නන්ටද මළවුන්ටද 42
විනිශ්චයකාරයා වන පිණිස
දෙවියන්වහන්සේ විසින් නියමකරනලද
තැනැත්තේ මුන්වහන්සේ බව සෙනඟට
ප්‍රකාශකරන්ටත් සාක්ෂිදෙන්ටත්
උන්වහන්සේ අපට අණකළසේක.
උන්වහන්සේ කෙරෙහි අදහන සියල්ලන්ට 43
උන්වහන්සේගේ නාමය කරණකොට-
ගෙන පාප කමාව ලැබෙන බවට සියලු
අනාගතවක්තෘවරු උන්වහන්සේ ගැන
සාක්ෂිදෙතියි කීවේය.

## අන්‍යජාතිකයන්ට ශුද්ධාත්මය ලැබීම

පේතෘස් මේ වචන කථාකරද්දීම 44
වචනය ඇසූ සියල්ලන් කෙරෙහි
ශුද්ධාත්මයාණන්වහන්සේ පහළවූසේක.
පේතෘස් සමග ආවාවූ චර්මඡේදිත 45
ඇදහිලිවන්තයෝ අන්‍යජාතීන් කෙරෙහිත්
ශුද්ධාත්ම දීමනාව වගුරුවනු ලැබූ බැවින්
විස්මිතවූවෝය. මක්නිසාද ඔවුන් අන්‍ය 46
භාෂාවලින් කථාකරනවාත් දෙවියන්-
වහන්සේ වර්ණනාකරනවාත් ඔවුන්ට
ඇසුණේය. එවිට පේතෘස් උත්තරදෙමින්:
අපට ලැබුණාක්මෙන් ශුද්ධාත්මයාණන්- 47
වහන්සේ ලැබූ මොවුන් *බව්තීස්මකරනු
නොලබන පිණිස වතුර තහනම්කරන්ට
කාට පුළුවන්දැයි කීවේය. ඔහු යේසුස් 48
ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔවුන්
*බව්තීස්ම කරනු ලබන්ට අණකෙළේය.
එවිට ඔව්හු දවස් ගණනක් තමුන් සමග
නැවතී සිටින්ට ඔහුගෙන් ඉල්ලුවෝය.

## පේතෘස්ට දෙස්තැබීම හා ඔහුගේ උත්තරදීම

11 අන්‍යජාතීන් විසින්ද දෙවියන්-
වහන්සේගේ වචනය පිළිගත් බව
යුදයෙහි සිටියාවූ ප්‍රේරිතයන්ටත්
සහෝදරයන්ටත් ආරංචිවිය. පේතෘස් 2
යෙරුසලමට ආ කල චර්මඡේදිතයෝ
ඔහු සමග වාදකරමින්: නුඹ 3

*අවගාහනයට.

අචර්මඡේදිත මනුෂ්‍යයන් ළඟට ගොස්
4 ඔවුන් සමග කෑයෙහියයි කීවෝය. නුමුත්
පේත්‍රුස් ඒ කාරණය මුල පටන් ක්‍රමයෙන්
5 ඔවුන්ට කියාදෙන්ට පටන්ගෙන: මම
යොප්පා නුවර යාච්ඤාකරමින් සිටි කල
මූර්ඡාවූයෙමි, සතර කොනෙන් අහසෙන්
බස්වනලද මහත් ඇතිරිල්ලක් වැනිවූ
එක්තරා භාජනයක් බැස එනවා
දර්ශනයෙන් දුටිමි; ඒක මා ළඟටම
6 පැමිණියේය. ඒ දෙස මාගේ ඇස්
යොමා කල්පනාකළ විට, පොළොවේ
සිවුපාවුන්ද වන මෘගයන්ද බඩගාන
7 ජාතීන්ද ආකාශ පක්ෂීන්ද දුටිමි. පේත්‍රුස්,
නැගිට මරා කාපන්නැයි මට කියන
8 ශබ්දයකුත් ඇසීමි. මමද: ස්වාමිනි, එසේ
නොවේවා. මක්නිසාද අකැපවූ අපවිත්‍රවූ
දෙයක් කිසි කලෙකත් මාගේ කටට
9 ඇතුල් නොවීයයි කීවෙමි. නුමුත්
ශබ්දයක් දෙවෙනි වාරයෙහි අහසෙන්
මට උත්තරදෙමින්: දෙවියන්වහන්සේ
පවිත්‍රකළ දේ නුඹ අකැපයයි
10 නොකියන්නැයි කීය. තුන්වරක්ම මෙය
කරනලද්දේය. නැවත සියල්ල අහසට
11 ඇදගන්නාලද්දේය. තවද එවේලේම
කායිසාරියෙන් මා ළඟට එවනලද
මනුෂ්‍යයෝ තුන්දෙනෙක් අප උන් ගෙය
12 ඉදිරියෙහි සිටියෝය. ආත්මයාණන්-
වහන්සේද, ප්‍රභේදයක් නොකොට ඔවුන්
සමග යන ලෙස මට අණකළසේක.
මේ සහෝදරයන් සදෙනාත් මා සමග
ගියෝය; අපි ඒ මනුෂ්‍යයාගේ ගෙට
13 ඇතුල්වුණෙමුව. එවිට ඔහු තමාගේ ගෙයි
දේව දූතයා සිටිනවා දුටු හැටිත්,
යොප්පාවට මනුෂ්‍යයන් යවා පේත්‍රුස්
14 නම්ලත් සීමොන් කැඳවාපන්න, ඔහු
වනාහි නුඹ සහ නුඹේ ගෙයි වැසි
සියල්ලන්ද ගැළවීමට පමුණුවන්නාවූ
වචන නුඹට කියන්නේයයි තමාට කී
15 බවත් අපට දැන්වූයේය. මා කථාකරන්ට
පටන්ගත් කල, ශුද්ධාත්මයාණන්-
වහන්සේ මුලදී අප කෙරෙහි මෙන්ම
16 ඔවුන් කෙරෙහිත් පහළවූසේක. එකල:
යොහන් *වතුරෙන් බව්තීස්මකෙළේය,
නුඹලා †ශුද්ධාත්මයෙන් බව්තීස්ම

*වතුරෙහි අවගාහනය.
†ශුද්ධාත්මයෙහි අවගාහනය.

ලබන්නහුයයි ස්වාමීන්වහන්සේ කී
වචනය මට මතක්විය. එහෙයින් යේසුස් 17
ක්‍රිස්තුස්වහන්සේව අදහාගත් කල්හි
අපට දුන්නාක්මෙන්ම දෙවියන්වහන්සේ
ඔවුන්ටත් එම දීමනාව දුන් බැවින්,
දෙවියන්වහන්සේට විරුද්ධව සිටින්ට
මම කවරෙක්දැයි කීවේය. ඔව්හු ඒ 18
අසා, නිශ්ශබ්දවී, දෙවියන්වහන්සේට
ප්‍රශංසාකරමින්: එසේවී නම් දෙවියන්-
වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස
වූ පශ්චාත්තාපය දුන්සේකැයි කීවෝය.

## අන්තියෝකියේ අන්‍යජාතිකයන්ගේ සභාව

ස්තේපන් නිසා හටගත් පීඩාව 19
කරණකොටගෙන විසුරුවනු ලැබුවාවූ
අය යුදෙව්වරුන්ට මිස වෙන කාටවත්
වචනය නොකියා, පෙනිකියද කුප්‍රසද
අන්තියෝකියද දක්වා ගමන්කළෝය.
නුමුත් කුප්‍රසේද කිරේනියේද මනුෂ්‍යයෝවූ 20
ඔවුන්ගෙන් සමහරෙක් අන්තියෝකියට
පැමිණ ග්‍රීකයන්ටත් කථාකරමින්, ස්වාමිවූ
යේසුස්වහන්සේ ගැන දේශනාකළෝය.
ස්වාමීන්වහන්සේගේ හස්තය ඔවුන් සමග 21
වූයේය. විශ්වාසකළාවූ විශාල ගණනක්
ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය.
ඔවුන් ගැන ප්‍රවෘත්තිය යෙරුසලමෙහි 22
සභාවට සැලවිය. ඔව්හුද; අන්තියෝකිය
දක්වා යන්ට බාර්ණබස් යැවූවෝය.
ඔහු ඇවිත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය 23
දැක, සන්තෝෂවී, ස්වාමීන්වහන්සේ
කෙරෙහි ස්ථිර සිතින් ඇලුම්ව සිටින්ට
ඔවුන් සියල්ලන්ට අවවාදකෙළේය.
මක්නිසාද ඔහු යහපත්වූ ශුද්ධාත්මයෙන්ද 24
ඇදහිල්ලෙන්ද පූර්ණවූ මනුෂ්‍යයෙක්ය.
මහත් සමූහයක්ද ස්වාමීන්වහන්සේට
එක්කරනලද්දෝය. ඔහු සාවුල් සොයන්ට 25
තාර්සසට ගොස්, ඔහු සම්බව, 26
අන්තියෝකියට කැඳවාගන ආවේය.
තවද ඔව්හු අවුරුද්දක් මුළුල්ලෙහිම
සභාව සමග රැස්ව, මහත් සමූහයකට
ඉගැන්නුවෝය; ගෝලයෝ ක්‍රිස්තියානි-
කාරයෝයයි පළමුකොට කියනු ලැබුවේ
අන්තියෝකියේදීය.

## බාර්ණබස් සහ සාවුල් යෙරුසලමට යවනු ලැබීම

27 ඒ දවස්වලදී යෙරුසලමෙන්
ප්‍රොපේතවරු අන්තියෝකියට ආවෝය.
28 ඔවුන්ගෙන් අගබස් නම් කෙනෙක් නැගිට,
මුළු ලෝකයෙහි මහත් සාගතයක්
වන්නේයයි ආත්මයාණන්වහන්සේ
කරණකොටගෙන දන්වූයේය. ඒ වනාහි
29 ක්ලෞදියස්ගේ දවස්වලදී සිද්ධවිය. එවිට
ගෝලයෝ එකිනෙකා තම තමාගේ
පුළුවන්කමේ හැටියට යුදයෙහි විසූ
සහෝදරයන්ට ආධාරෝපකාර යවන්ට
30 නියමකරගත්තෝය. ඔව්හු එසේ
කරමින්, බාර්ණබස් සහ සාවුල් අත
වැඩිමහල්ලන්ට ඒවා හැරියෝය.

## හෙරොද්ගේ පීඩාකිරීම. පේත්‍රැස් හිරගෙයින් ගැළවීයාම

12 ඒ කාලය පමණේදී හෙරොද් රජ
සභාවේ සමහරුන්ට පීඩා කරන්ට
2 අත දිගුකෙළේය. ඔහු යොහන්ගේ
සහෝදරවූ යාකොබ් කඩුවෙන්
3 මැරුවේය. ඊට යුදෙව්වරුන් ප්‍රසන්නවූ
බව දැක, ඔහු පේත්‍රැසුත් ඇල්ලුවේය. ඒ
කාලය මුහුන් නුමුසු රොටි කන දවස්ය.
4 ඔහු අල්ලා හිරගෙයි තබා, පාස්කු
මංගල්‍යයෙන් පසු සෙනඟ ඉදිරියට පිටත
ගෙනෙන්ට සිතා, හේවායින් සතර
දෙනෙකු බැගින් ඇති කාණ්ඩ සතරකට
ඔහු රැකවල්කරන්ට භාරදුන්නේය.
5 එබැවින් පේත්‍රැස් හිරගෙයි රැකවල්-
කරනලද්දේය. නුමුත් සභාව ඔහු
උදෙසා දෙවියන්වහන්සේට උදක්ම
6 යාච්ඤාකළාය. හෙරොද් ඔහු පිටතට
ගෙනෙන්ට සිටිය දට ප්‍රථම රාත්‍රියේ
පේත්‍රැස් දම්වැල් දෙකකින් බඳිනු ලැබ
හේවායන් දෙදෙනෙකු මැද නිදාගත්තේය.
රැකවල්ලු දෙර ඉදිරියෙහි හිරගෙය රැක
7 සිටියෝය. එවිට ස්වාමීන්වහන්සේගේ
දූතයෙක් ඔහු ළඟ සිටියේය. ආලෝකයක්
කාමරයෙහි බැබළුණේය. ඔහු පේත්‍රැස්ගේ
ඇළයට ගසා, ඔහු පුබුදුවමින්: ඉක්මනින්
නැගිටින්නැයි කීය. ඔහුගේ දම්වැල්
8 අත්වලින් ගැළවී වැටුණේය. දූතයා ඔහුට
කථාකොට: ඉඟටිය බැඳ, වහන්
දමාගනින්නැයි කීවේය. ඔහු එසේ
කෙළේය. නුඹේ සළුව ඇඟලාගෙන මා
පස්සේ වරෙන්නැයි ඔහුට කීවේය. ඔහු
පිටත්ව ඔහු පස්සෙන් ගියේය; දූතයා 9
විසින් කරනලද දේ ඇත්තක් බව ඔහු
නොදැන, තමා දර්ශනයක් දකින්නේයයි
සිතුවේය. ඔවුන් පළමුවෙනි දෙවෙනි 10
මුරපළවල් පසුකොට, නුවරට යන යකඩ
දෙරටුව ළඟට ගිය කල, ඒක ඔවුන්ට
ඉබේම ඇරුණේය. ඔවුන් පිටතට ගොස්
එක වීථියක් පසුකළ කෙණෙහිම දේව
දූතයා ඔහු කෙරෙන් අහක්ව ගියේය.
පේත්‍රැස් සිහි ලැබ කථාකොට: ස්වාමීන්- 11
වහන්සේ තමන් දූතයා එවා හෙරොද්ගේ
අතින්ද යුදෙව් සෙනඟගේ මුළු
බලාපොරොත්තුවෙන්ද මා මිදූ බව දැන්
සැබවින් දනිමියි කීවේය. ඔහු ඒ 12
ගැන කල්පනාකොට මාර්ක් නම්ලත්
යොහන්ගේ මවුවූ මරියාගේ ගෙදරට
පැමිණියේය: එහි බොහෝ දෙනෙක්
රැස්ව යාච්ඤාකරමින් සිටියෝය. ඔහු 13
පිට-දෙරට තට්ටුකළ විට, රොදනම්
තරුණියෙක් බලන්ට ආවාය. ඈ 14
පේත්‍රැස්ගේ කටහඬ හැඳින, ප්‍රීතිය නිසා
දෙර නැර, ඇතුළට දිවගොස්, පේත්‍රැස්
දෙරටුව ළඟ සිටින බව කීවාය. නුඹට 15
ඔල්මාදයයි ඔව්හු කීවෝය. නුමුත් ඈ:
ඒ ඔහුමයයි සහතිකකොට කීවාය. ඒ
ඔහුගේ දූතයායයි ඔව්හු කීවෝය. නුමුත් 16
පේත්‍රැස් තට්ටුකරමින් සිටියේය. ඔව්හු
දෙර හැරිය කල ඔහු දැක, විස්මිතවූහ.
නුමුත් ඔහු ඔවුන්ට නිශ්ශබ්දවෙන්ට අතින් 17
සංඥාකොට, ස්වාමීන්වහන්සේ තමා
හිරගෙයින් පිටතට ගෙනා හැටි ඔවුන්ට
ප්‍රකාශකොට: යාකොබ්ටද සහෝදරයන්ටද
මේ කාරණා දන්වාපල්ලායයි කියා,
පිටත්ව වෙන තැනකට ගියේය. පහන්වූ 18
කල, පේත්‍රැස්ට කුමක් සිද්ධවීදැයි හේවායින්
අතරේ මහත් කැලඹීමක් විය. හෙරොද් 19
ඔහු සොයා, සම්බ නොවූ කල, රැක-
වලුන්ගෙන් විචාරා, ඔවුන් මරන්ට
අණකොට, යුදයෙන් කායිසාරියට ගොස්,
එහි නැවතී සිටියේය.

## හෙරොද් රජුගේ මරණය

20 ඔහු තීර් සහ සීදෝන් වැසියන්ට ඉතා
කෝපව සිටියේය. ඔව්හු තමුන්ගේ රට
රජුගේ රටෙන් පෝෂණයකරනු ලැබූ
බැවින්, එක්සිත්ව ඔහු ළඟට ඇවිත්,
රජුගේ ගෙයි ඇමතියා වන බ්ලාස්තුස්
මිත්‍රකරගෙන, සමාදානය ඉල්ලුවෝය.
21 නියම දවසක හෙරොද් රාජාභරණ
පැළඳ සිංහාසනය පිට හිඳ, ඔවුන්ට
22 ප්‍රසිද්ධ කථාවක් කෙළේය. සෙනඟ
හඬනගා කථාකොට: මෙය මනුෂ්‍යයෙකුගේ
හඬ නොව දෙවිකෙනෙකුගේ හඬයයි
23 කීවෝය. ඔහු ඒ ගෞරවය දෙවියන්-
වහන්සේට නුදුන් බැවින්, ස්වාමීන්-
වහන්සේගේ දූතයෙක් එකෙණෙහිම ඔහුට
පහරදුන්නේය. ඔහු පණුවන් විසින්
කනලදුව මැරුණේය.
24 නුමුත් දෙවියන්වහන්සේගේ වචනය
පතළවී දියුණුවිය.
25 බාර්ණබස්ද සාවුල්ද තමුන්ගේ උප
ස්ථානය සම්පූර්ණකොට, මාර්ක් නම්
ලත් යොහන් කැඳවාගෙන, යෙරුසලමෙන්
හැරී ආවෝය.

## අන්තියෝකියේ සභාව

13 අන්තියෝකියේ පිහිටි සභාවෙහි
ප්‍රොපේතවරු සහ ගුරුවරු
සිටියෝය; එනම්, බාර්ණබස් සහ නීගර්
නම් සිමියොන්ද කිරේනියේ ලූකියස්ද
දේශාධිපතිවූ හෙරොද් සමග ඇතිදැඩි
වුණාවූ මානායින්ද සාවුල්ද යන
2 අයවල්ය. ඔවුන් ස්වාමීන්වහන්සේට
මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල,
ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට:
මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ
වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායයි
3 කීසේක. එවිට ඔව්හු නිරාහාරයෙන් හිඳ
යාච්ඤාකොට ඔවුන් පිට අත් තබා,
ඔවුන් පිටත්කර හැරියෝය.

## බාර්ණබස් සහ සාවුල් කුප්‍රසට ගොස් වැඩකිරීම

4 මෙසේ ඔව්හු ශුද්ධාත්මයාණන් විසින්
යවනලදුව සිලූකියට බැසගොස්, එහිදී
නැව් නැඟී කුප්‍රසට ගියෝය. ඔව්හු 5
සලමීයට පැමිණි කල, යුදෙව්වරුන්ගේ
සිනගෝගවලදී දෙවියන්වහන්සේගේ
වචනය ප්‍රකාශකළෝය. යොහන්
ඔවුන්ගේ සේවකයාව සිටියේය. ඔව්හු 6
මුළු දිවයින මැදින් පාපස් දක්වා ගිය
කල, එක්තරා මායාකාරයෙක් වන
බොරු අනාගතවක්තෘ කෙනෙක්වූ බාර්-
යේසුස් නම් යුදෙව් මනුෂ්‍යයෙකු
දුටුවෝය. ඔහු බුද්ධිමත් මනුෂ්‍යයෙක්වූ 7
සර්ගියස් පාවුලස් නම් අධිපතියා සමග
සිටියේය. ඒ අධිපති තෙමේ බාර්ණබස්
සහ සාවුල් කැඳවාගෙන, දෙවියන්-
වහන්සේගේ වචනය අහන්ට ආශාවුණේය.
නුමුත් මායාකාර යන අර්ථ ඇති එලිමස් 8
නම් තැනැත්තේ අධිපතියා ඇදහීමෙන්
ඉවතට හරවාගන්ට අදහස්කරමින්,
ඔවුන්ට විරුද්ධව සිටියේය. නුමුත් පාවුල් 9
යන නමක්ද ඇති සාවුල් ශුද්ධාත්මයෙන්
පූර්ණව, ඔහු දෙස ඇස් යොමා: සියලු 10
වංචාවෙන් හා සියලු දුෂ්ටකමින් පූර්ණවූ
තැනැත්ත, යක්ෂයාගේ පුත්‍රය, සියලු
ධර්මිෂ්ඨකමට සතුරුවූ නුඹ ස්වාමීන්-
වහන්සේගේ හරි මාර්ගයන් පෙරළීමෙන්
නවතින්නේ නැද්ද? ඉදින්, මෙන්න, 11
ස්වාමීන්වහන්සේගේ හස්තය නුඹ පිට
තිබේ, නුඹ අන්ධවී කලකට ඉර
නොදක්නෙහියයි කීවේය. එකෙණෙහිම
දුමාරයක්ද අඳුරක්ද ඔහු පිටට
පැමුණුණේය; ඔහුද තමාගේ අත
අල්ලාගෙන යන්ට මිනිසුන් සොයමින්
ඇවිද්දේය. එකල අධිපති තෙමේ සිද්ධවූ 12
දේ දැක, ස්වාමීන්වහන්සේගේ ඉගැන්වීමට
විස්මපත්ව, අදහාගත්තේය.

## පිසිදියේ අන්තියෝකියෙහි යුදෙව්වන්ට පාවුල්ගේ දේශනාව

පාවුල්ද ඔහු සමග සිටියෝද පාපස් 13
කෙරෙන් නැව් නැඟී ගොස්, පම්පිලියේ
පර්ගායට පැමුණුණෝය. එවිට යොහන්
ඔවුන් කෙරෙන් අහක්වී යෙරුසලමට
හැරී ගියේය. නුමුත් ඔව්හු පර්ගායෙන් 14
පිටත්ව ගමන්කොට, පිසිදියේ
අන්තියෝකියට ඇවිත්, සබත් දවසේදී

සිනගෝගයට ඇතුල්වී හිඳගත්තෝය.
15 ව්‍යවස්ථාවද අනාගතවාක්‍යයද කියවූ
පසු සිනගෝගයේ මූලාදෑනීහු:
සහෝදරයෙනි, සෙනඟට අවවාද
වචනයක් තුඹලාට ඇත්නම්
කියාපල්ලායයි ඔවුන්ට කියා යැවුවෝය.
16 එවිට පාවුල් නැගිට සිට අතින්
සංඥකොට:
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි, දෙවියන්-
වහන්සේ කෙරෙහි භය ඇත්තෙනි,
17 ඇහුම්කන්දියල්ලා. මේ ඉශ්‍රායෙල්
සෙනඟගේ දෙවියන්වහන්සේ අපේ
පියවරුන් තෝරාගෙන, මිසර දේශයෙහි
විදේශීව සිටියදී සෙනඟ උසස්කොට,
බලවත් බාහුවකින් ඔවුන් එයින් පිටතට
18 ගෙනාසේක. උන්වහන්සේ සතළිස්
අවුරුද්දක් පමණ කාලයක් වනයෙහිදී
ඔවුන්ගේ හැසිරීම ගැන ඉවසිල්ලෙන්
19 සිටිසේක. උන්වහන්සේ කානාන් දේශයේ
ජාතීන් හතක් විනාශ කොට, අවුරුදු
හාරසිය පනහක් පමණ කාලයකට ඒ
ජාතීන්ගේ දේශය උරුමයක් කොට ඔවුන්ට
20 දුන්සේක. එයින් පසු අනාගතවක්තෘවූ
සාමුවෙල් දක්වා උන්වහන්සේ ඔවුන්ට
21 විනිශ්චයකාරයන් දුන්සේක. ඉන්පසු
ඔව්හු රජෙකු ඉල්ලුවෝය. දෙවියන්වහන්සේ
බෙන්යමින්ගේ ගෝත්‍රයේ මනුෂ්‍යයෙක්වූ
කීෂ්ගේ පුත්‍රවූ සාවුල් සතළිස් අවුරුද්දකට
22 ඔවුන්ට දුන්සේක. උන්වහන්සේ ඔහු
අහක්කොට, දවිත් ඔවුන්ගේ රජ වන
පිණිස නැගිටෙවූසේක. උන්වහන්සේ
ඔහු ගැන සාක්ෂිදෙමින්: යෙස්සේගේ
පුත්‍රවූ, මාගේ සිතට එකඟ මනුෂ්‍යයෙක්වූ,
මාගේ මුළු කැමැත්ත කරන්නාවූ දවිත්
23 මට සම්බවීයයි කීසේක. ඔහුගේ
වංශයෙන් දෙවියන්වහන්සේ පොරොන්දුවූ
ලෙස ඉශ්‍රායෙල්ට යේසුස් නම්
ගැළවුම්කාරයෙකු පමුණුවා දුන්සේක.
24 උන්වහන්සේගේ ඊමට පෙර යොහන්
ඉශ්‍රායෙල්ගේ මුළු සෙනඟට
පශ්චාත්තාපයේ *බව්තීස්මය ප්‍රකාශ-
25 කෙළේය. තවද යොහන් තමාගේ
මෙහෙය ඉෂ්ටකරමින් සිටියදී: මම
කවුරුය කියා තුඹලා සිතවුද? මම
උන්වහන්සේ නොවෙමි. බලව, මට පසුව
කෙනෙක් එනසේක, උන්වහන්සේගේ
පාදවල වහන් මුදන්ටවත් මම නොවටිමියි
කීවේය. සහෝදරයෙනි, ආබ්‍රහම්ගේ 26
වංශයේ පුත්‍රයෙනි, තුඹලා අතරේ
දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇත්තෙනි,
මේ ගැළවීමේ වචනය එවනලද්දේ
අපටය. මක්නිසාද යෙරුසලමෙහි 27
වසන්නෝද ඔවුන්ගේ මූලාදෑනිවරුද
උන්වහන්සේවත් සියලු සබත් දවස්වල
කියවෙන අනාගතවක්තෘවරුන්ගේ
හඬවත් නොදැන, උන්වහන්සේ වරදට
පත්කිරීමෙන් ඒවා සම්පූර්ණකළෝය.
උන්වහන්සේ කෙරෙහි මරණයට 28
සුදුසු කිසිවක් සම්බ නූණ නුමුත්,
උන්වහන්සේව මරන ලෙස ඔව්හු
පිලාත්ගෙන් ඉල්ලුවෝය. උන්වහන්සේ 29
ගැන ලියා තිබුණු සියල්ල ඔවුන්
සම්පූර්ණකළ විට, ගසෙන් උන්වහන්සේව
බාගෙන, සොහොන්ගෙයක තැබුවෝය.
නුමුත් දෙවියන්වහන්සේ උන්වහන්සේව 30
මළවුන්ගෙන් නැගිටෙවූසේක. උන්- 31
වහන්සේ තමන්වහන්සේ සමග
ගලීලයෙන් යෙරුසලමට ගියවුන්ට
බොහෝ දවසක් පෙනී පෙනී සිටිසේක.
ඔව්හු දැන් සෙනඟට උන්වහන්සේගේ
සාක්ෂිකාරයෝය. එබැවින් දෙවියන්- 32
වහන්සේ පියවරුන්ට දුන් පොරොන්දුව
යේසුස්වහන්සේව නැගිටවීමෙන් අපේ
දරුවන්ට සම්පූර්ණයෙන් ඉෂ්ටකළ-
සේකැයි යන යහපත් ආරංචි තුඹලාට
ගෙනෙමුව. එසේම: තුඹ මාගේ පුත්‍රයාය, 33
අද තුඹ ජනිතකෙළෙමියි දෙවෙනි
ගීතිකාවේ ලියා තිබේ. තවත් කුණුවීමට 34
නොහැරෙන ලෙස දෙවියන්වහන්සේ
විසින් උන්වහන්සේ මළවුන්ගෙන්
නැගිටෙවූ බවට මෙයාකාරයෙන් කීසේක,
එනම්: දවිත්ගේ ශුද්ධවූ ස්ථිරවූ ආශීර්වාද
තුඹලාට දෙන්නෙමියි යනුයි. ඇරත් වෙන 35
ගීතිකාවකද: ඔබගේ ශුද්ධ තැනැත්තා
කුණුවීමට පැමිණෙන්ට ඉඩ නොදෙන-
සේකැයි කීසේක. කුමක්හෙයින්ද දවිත් 36
දෙවියන්වහන්සේගේ මන්ත්‍රණය ලෙස
තම පරම්පරාවේදී මෙහෙකළ පසු
සැතපී, තමාගේ පියවරුන් ළඟ තබනලදුව,
කුණුවීමට පැමුණුණේය. නුමුත් දෙවියන්- 37

*අවගාහනය.

වහන්සේ විසින් නැගුටුවනලද
තැනන්වහන්සේ කුණුවීමට නොපැමිණි-
38 සේක. එහෙයින්, සහෝදරයෙනි,
උන්වහන්සේ කරණකොටගෙන පව්
කමා කිරීම තුඹලාට ප්‍රකාශකරනු
39 ලබන බව දනගනිල්ලා. අදහාගන්නාවූ
සියල්ලෝ උන්වහන්සේ කරණකොට-
ගෙන සියලු දේවල් පිළිබඳව නිර්දෝෂ-
කරනු ලබති. එසේ තුඹලාට
මෝසෙස්ගේ ව්‍යවස්ථාව කරණකොට-
ගෙන නිර්දෝෂ කරනු ලබන්ට
නුපුළුවන්විය.
40 එබැවින්:
හෙළාදකින්නෙනි, බලව්, පුදුමවව්,
විනාශවව්;
මක්නිසාද තුඹලාගේ දවස්වලදී
ක්‍රියාවක් කරමි.
ඒ ක්‍රියාව ගැන යමෙක් තුඹලාට
ප්‍රකාශකළත් තුඹලා කිසිසේත්
එය විශ්වාස නොකරන්නහුයයි
41 අනාගතවක්තෘවරුන්ගේ පොත්වල කියා
තිබෙන කාරණා තුඹලා පිටට
නොපැමිණෙන ලෙස බලාගනිල්ලායයි
කීවේය.
42 ඔවුන් නික්ම යද්දී එම වචන ඊළඟ
සබත් දවසෙහිත් තමුන්ට ප්‍රකාශකරන
43 ලෙස ඔව්හු ඉල්ලුවෝය. සමූහයා විසිර
ගියායින් පසු යුදෙව්වරුන්ගෙන්ද යුදෙව්
ආගමට හැරුණ භක්තිවන්තයන්ගෙන්ද
බොහෝ දෙනෙක් පාවුල් සහ බාර්ණබස්
අනුව ගියෝය. ඔව්හු ඔවුන්ට කථාකරමින්,
දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙහි
පවතින්ට ඔවුන්ට අවවාද කළෝය.

## ප්‍රේරිතවරුන් අන්‍යජාතීන් වෙතට හැරියාම

44 ඊළඟ සබත් දවසේ දෙවියන්වහන්සේගේ
වචනය අසන පිණිස නුවර වැසි
45 සියල්ලෝම වාගේ රැස්වුණෝය. නුමුත්
යුදෙව්වරු සමූහයන් දක, ඊර්ෂ්‍යාවෙන්
පිරී, පාවුල් විසින් කියනලද කාරණාවලට
විරුද්ධව කථාකරමින් අපහාසකළෝය.
46 එවිට පාවුල්ද බාර්ණබස්ද භය නැතුව
කථාකරමින්: දෙවියන්වහන්සේගේ
වචනය පළමුකොට තුඹලාට කියන්ට
යුතුව තිබුණේය. තුඹලා ඒක පහකොට,
සදාකාල ජීවනයට තමුන් නුසුදුස්සන්
බව තුඹලාම විනිශ්චයකරගන්න හෙයින්,
මෙන්න, අපි අන්‍යජාතීන් අතට හැරී
යමුව. මක්නිසාද ස්වාමීන්වහන්සේ අපට 47
මෙසේ අණකළසේක, කෙසේදයත්:
තුඹ පොළොවේ සීමා දක්වා ගැළවීම
වන පිණිස
අන්‍යජාතීන්ට තුඹ එළියක් කොට
තැබුවෙමියි
කියා තිබේයයි කීවෝය. අන්‍යජාතීහු ඒ 48
අසා සන්තෝෂව, දෙවියන්වහන්සේගේ
වචනයට ගෞරවකළෝය. සදාකාල
ජීවනය ලැබීමට නියම කරනලද
සියල්ලෝම අදහාගත්තෝය. ස්වාමීන්- 49
වහන්සේගේ වචනය ඒ පළාත මුළුල්ලෙහි
පතළව ගියේය. නුමුත් යුදෙව්වරු 50
භක්තිවන්ත කුල ස්ත්‍රීන්ද නුවර
ප්‍රධානීන්ද පොලඹවා, පාවුල් සහ
බාර්ණබස්ට විරුද්ධව පීඩාවක් උපදවා,
තමුන්ගේ සීමාවලින් ඔවුන් පිටතට
ලූවෝය. එහෙත් ඔව්හු තමුන්ගේ පාදවල 51
ධූලි ඔවුන්ට විරුද්ධව ගසා දමා,
ඉකෝනියට පැමිණියෝය. ගෝලයෝ 52
වනාහි ප්‍රීතියෙන්ද ශුද්ධාත්මයෙන්ද
පූර්ණවූහ.

## පාවුල් සහ බාර්ණබස් ඉකෝනියෙහි සහ ලුස්ත්‍රාවෙහි දේශනාකිරීම සහ පීඩා ලැබීම

14 තවද ඉකෝනියේදී ඔව්හු එක්ව
යුදෙව්වරුන්ගේ සිනගෝගයට
ඇතුල්වී, යුදෙව්වරුන්ගෙන්ද ග්‍රීක්වරුන්-
ගෙන්ද මහත් සමූහයක් අදහාගන්නා
පරිද්දෙන් කථාකළෝය. නුමුත් අකීකරුවූ 2
යුදෙව්වරු අන්‍ය ජාතීන්ගේ සිත්
කලඹා, ඔවුන් සහෝදරයන්ට විරුද්ධව
එදිරිකෙරෙවුවෝය. එහෙයින් ඔව්හු 3
ස්වාමීන්වහන්සේ තුළ නිර්භීතලෙස
කථාකරමින් බොහෝ කලක් නැවතී
සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ
අත්වලින් හාස්කම්ද පුදුමද කරවමින්,
ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි
දුරුසේක. නුමුත් නුවර සමූහයෝ භේදව, 4
සමහරෙක් යුදෙව්වරුන්ගේ පක්ෂයටද

අන් සමහරෙක් ප්‍රේරිතයන්ගේ පක්ෂයටද
5 සිටියෝය. අන්‍යජාතීන්ද යුදෙව්වරුන්ද
තමුන්ගේ ප්‍රධානීන් සමග ඔවුන්ට
නිග්‍රහකරන්ටත් ගල්ගසන්ටත්
6 යෝජනාවක් කළ කල්හි, ඔව්හු ඒ දැන,
ලුකෝනියේ නුවරවල්වූ ලුස්ත්‍රාවටද
දර්බයටද අවට පළාතටද පලාගොස්,
7 එහිදී ශුභාරංචිය දේශනාකළෝය.
8 මවුකුස පටන් කොරවූ, පාද
දුර්වලවූ කිසිකලකත් නැවිද්දවූ එක්තරා
මනුෂ්‍යයෙක් ලුස්ත්‍රාවෙහි ඉඳගන
9 උන්නේය. ඔහු පාවුල් කථාකරනවා
ඇසුවේය. පාවුල් ඔහු දෙස ඇස් යොමා,
සුවය ලබන්ට ඇදහිල්ල ඔහුට තිබෙන
10 බව දැක: නැගිට තුඹේ පාදවලින් කෙලින්
සිටපන්නැයි මහත් හඬින් කීවේය.
එවිට ඔහු පැන නැගී ඇවිද්දේය.
11 එකල සමූහයෝ පාවුල් කළ දේ දැක
ශබ්දනගා: දෙවිවරු මනුෂ්‍ය වේශයෙන්
අප ළඟට බැස සිටිතියි ලුකෝනියේ
12 භාෂාවෙන් කීවෝය. ඔව්හු බාර්ණබස්ට
සියුස්ය කියාද පාවුල් ප්‍රධාන
කථාකාරයා බැවින් ඔහුට හෙර්මීස්ය
13 කියාද නම් තැබුහ. නුවර ඉදිරියෙහි
පිහිටියාවූ සියුස්ගේ දේවාලයේ පූජක
තෙමේ ගොන්ද මල්මාලාද දොරටුව
ළඟට ගෙනැවිත්, සමූහයන් සමග
14 යාගකරන්ට හැදුවේය. එහෙත් ප්‍රේරිතවූ
බාර්ණබස්ද පාවුල්ද ඒ ගැන අසා,
තමුන්ගේ වස්ත්‍ර ඉරාගෙන, සමූහයා
15 අතරට දුව ගොස්, මොරගසා:
මනුෂ්‍යයෙනි, තුඹලා මේ දේවල් කරන්නේ
මක්නිසාද? අපිත් තුඹලා සමාන ගති
ගුණ ඇති මනුෂ්‍යයෝය, තුඹලා මේ
නිෂ්ඵල දේවලින් දුරුව, අහසත්
පොළොවත් මුහුදත් එහි ඇති සියල්ලත්
මැවූ ජීවමානවූ දෙවියන්වහන්සේ වෙතට
හැරෙන පිණිස ශුභාරංචිය තුඹලාට
16 ගෙනෙමුව. උන්වහන්සේ පසුගිය
පරම්පරාවලදී සියලු ජාතීන්ට තම
තමුන්ගේ මාර්ගවල හැසිරෙන්ට ඉඩ
17 හැරියසේක. එහෙත් උන්වහන්සේ
අහසෙන් වර්ෂාව සහ සාරවත් කාලවල්
තුඹලාට දී, කෑමෙන්ද සන්තෝෂයෙන්ද
තුඹලාගේ සිත් පුරවමින්, යහපත්කම්
කළ බැවින්, තමන්වහන්සේ ගැන සාක්ෂි
නොදී නොසිටියසේකැයි කීවෝය. ඔව්හු 18
මෙසේ කීමෙන්, තමුන්ට පූජා ඔප්පු
නොකරන ලෙස සමූහයන් අමාරුවෙන්
වැලැක්වූවෝය.
නුමුත් අන්තියෝකියෙන්ද ඉකෝනි- 19
යෙන්ද යුදෙව්වරු ඇවිත් සමූහයන්
පොලඹවාගෙන, පාවුල්ට ගල්ගසා, ඔහු
නැසුණේයයි සිතා නුවරින් පිටතට
ඇද්දෝය. නුමුත් ගෝලයන් ඔහු අවට 20
රැස්ව සිටි කල, ඔහු නැගිට නුවරට
ඇතුල්වී, පසුවද බාර්ණබස් සමග
දර්බයට ගියේය.

## ඔවුන් අන්තියෝකියට හැරී ඒම

ඔව්හු ඒ නුවර ශුභාරංචිය දේශනා 21
කොට, බොහෝ දෙනෙක් ගෝලයන්
කර, ලුස්ත්‍රාවටද, ඉකෝනියටද
අන්තියෝකියටද හැරී ඇවිත්: අප විසින් 22
දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ
දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා
ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ
පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. ඔව්හු 23
සභාවක් සභාවක් පාසා ඔවුන්ට
වැඩිමහල්ලන් පත්කොට, නිරාහාරයෙන්
ඉඳ යාච්ඤා කොට, තමුන් අදහාගත්
ස්වාමීන්වහන්සේට ඔවුන් භාරදී, පිසිදිය 24
මැදින් ගමන්කොට, පම්පිලියට ආවෝය.
ඔව්හු පර්ගායේදී වචනය කියාදී, 25
අත්තාලියට බැස, එයින් නැව් නැගී, 26
යම් වැඩක් කරන පිණිස දෙවියන්-
වහන්සේගේ අනුග්‍රහයට අන්තියෝකියේදී
ඔවුන් භාරදෙනලදද, ඒ වැඩ සම්පූර්ණ-
කොට, එම අන්තියෝකියට ආවෝය.
ඔව්හු ආ කල, සභාව රැස්කරවා, 27
දෙවියන්වහන්සේ තමුන් ලවා කෙරෙවූ
සියල්ලද අන්‍යජාතීන්ට උන්වහන්සේ
ඇදහිල්ලේ දොරක් ඇරදුන් බවද
දැන්වූවෝය. තවද ඔව්හු ගෝලයන් සමග 28
එහි බොහෝ කලක් සිටියෝය.

## අන්‍යජාතික ක්‍රිස්තියානිකාරයන් සහ මෝසෙස්ගේ ව්‍යවස්ථාව

15
යුදයෙන් සමහර දෙනෙක් ඇවිත්:
මෝසෙස්ගේ නියෝගය ලෙස
තුඹලා චර්මඡේදනයකරනු නොලැබුවොත්

නුඹලාට ගැළවෙන්ට නුපුළුවනැයි
2 සහෝදරයන්ට ඉගැන්නුවෝය. එහෙයින්
පාවුල්ද බාර්ණබස්ද ඔවුන් සමග මහත්
භේදයක් සහ වාදයක් ඇතිවූ කල්හි,
පාවුල් සහ බාර්ණබස්ද ඔවුන්ගෙන්
තවත් සමහරෙක්ද මේ ප්‍රශ්නය ගැන
ප්‍රේරිතයන් සහ වැඩිමහල්ලන්ගෙන්
විචාරන පිණිස යෙරුසලමට යන්ට
3 නියමකරනු ලැබුවෝය. එබැවින් ඔව්හු
සභාව විසින් ඇරලන ලදුව, පෙනීකියද
සමාරියද මැදින් ගොස්, අන්‍යජාතීන්ගේ
හැරීම ප්‍රකාශ කරමින්, සියලු
සහෝදරයන්ට මහත් ප්‍රීතියක්
4 ඉපදෙවුවෝය. ඔව්හු යෙරුසලමට
පැමිණි කල, සභාව විසින්ද ප්‍රේරිතයන්
සහ වැඩිමහල්ලන් විසින්ද පිළිගන්නා-
ලදුව, දෙවියන්වහන්සේ තමුන් ලවා
5 කෙරෙවූ සියලු දේ දන්වූවෝය. නුමුත්
අදහාගත්තාවූ, ඵරිසිවරුන්ගේ ලබ්ධියට
අයිතිවූ සමහරෙක් නැගිට, චර්මඡේද්‍යය-
කරන්ටත් මෝසෙස්ගේ ව්‍යවස්ථාව
රක්ෂාකරන ලෙස ඔවුන්ට අණකරන්ටත්
ඕනැයයි කීවෝය.

## යෙරුසලමෙහි පැවැත්වූ මන්ත්‍රණ සභාව

6 ප්‍රේරිතයෝද වැඩිමහල්ලෝද මේ
කාරණාව ගැන කල්පනාකර බලන
7 පිණිස රැස්වූහ. බොහෝ වාද හටගත්
පසු පේත්‍රුස් නැගිට ඔවුන්ට කියනුයේ:
සහෝදරයෙනි, අන්‍යජාතීන් මාගේ
මුඛයෙන් ශුභාරංචිය අසා අදහන පිණිස,
බොහෝ කලකට පළමුවෙන් දෙවියන්-
වහන්සේ නුඹලා අතරෙන් මා තෝරාගත්
8 බව නුඹලා දන්නහුය. සිත් දන්නාවූ
දෙවියන්වහන්සේ අපට මෙන්ම ඔවුන්ටත්
ශුද්ධාත්මය දී, ඔවුන් ගැන සාක්ෂිදුන්-
9 සේක; උන්වහන්සේ ඔවුන් සහ අප අතරේ
කිසි වෙනසක් නොකොට, ඇදහිල්ල
කරණකොටගෙන ඔවුන්ගේ සිත්
10 පවිත්‍රකළසේක. එබැවින් අපගේ
පියවරුන්ටවත් අපටවත් දරන්ට
නොහැකිවුණු වියගහක් ගෝලයන්ගේ
කරේ තැබීමෙන් නුඹලා කුමක් නිසා
දෙවියන්වහන්සේව පරීක්ෂා කරවුද?
11 එසේ නොව ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන
ඔවුන් මෙන් අපත් ගළවනු ලබන බව
විශ්වාසකරමුයයි කීවේය.
එවිට මුළු සමූහයා නිශ්ශබ්දව 12
සිටියෝය; තවද පාවුල් සහ බාර්ණබස්
තමුන් ලවා දෙවියන්වහන්සේ අන්‍ය
ජාතීන් අතරේ කොපමණ මහත් ලකුණු
සහ පුදුම කෙරෙවූසේක්දැයි කියනවා
ඔව්හු අසාගෙන සිටියෝය. ඔවුන් 13
නිශ්ශබ්දවූ ඉක්බිති යාකොබ් උත්තර
දෙමින් කියනුයේ:
සහෝදරයෙනි, මට ඇහුම්කන්දියල්ලා. 14
දෙවියන්වහන්සේ තමන්ගේ නාමයට
අන්‍යජාතීන්ගෙන් සෙනගක් ගන්නා
පිණිස පළමුවෙන් ඔවුන් දෙස
බැලූ හැටි සිමියොන් කියාදුන්නේය.
අනාගතවක්තෘවරුන්ගේ වචන ඊට 15
එකඟය; කෙසේදයත්:
ඉතිරිවූ මනුෂ්‍යයන්ද 16
මාගේ නාමය දරන සියලු අන්‍ය
ජාතීන්ද විසින් ස්වාමීන්වහන්සේව
සොයන පිණිස
මෙයින් පසු මම හැරී ඇවිත්, 17
දාවිත්ගේ වැටුණාවූ මණ්ඩපය නැවත
ගොඩනගා,
එහි නටබුන් තැන් නැවත ගොඩනගා,
ඒක පිහිටුවන්නෙමියි
ලෝකයේ පටන්ගැන්මේ සිට මේ 18
සියල්ල දන්වන්නාවූ ස්වාමීන්වහන්සේ
කියනසේකැයි
ලියනලද්දේය. එබැවින් අන්‍යජාතීන් 19
අතරෙන් දෙවියන්වහන්සේ වෙතට
හැරෙන්නන් චංචල නොකර, රූප සම්බන්ධ 20
දූෂ්‍යකම්වලින්ද වේශ්‍යාකමින්ද බොටුව
මිරිකා මැරූ සතුන්ගෙන්ද ලෙයින්ද
වලකින ලෙස ඔවුන්ට ලියා ඇරීම යුතුය
යනු මාගේ තීරණය වේ. මක්නිසාද 21
ආදි පරම්පරාවල සිට මෝසෙස්ගේ
ව්‍යවස්ථාව ප්‍රකාශකරන්නෝ සියලු
නුවරවල සිටිති, ඔව්හු සියලු සබත්
දවස්වල එය සිනගෝගවලදී කියවතියි
කීවේය.

## අන්‍යජාතික ක්‍රිස්තියානිකාරයන්ට යැවූ ලියුම

22 එකල තමුන්ගේ සමාගමෙන්
මනුෂ්‍යයන් තෝරාගන පාවුල් හා
බාර්ණබස් සමග අන්තියෝකියට යැවීම
යහපතැයි ප්‍රේරිතයන්ටද වැඩිමහල්ලන්ටද
මුළු සභාවටද පෙනීගියේය; තෝරාගනු
ලැබුවෝ නම් සහෝදරයන් අතරේ
ප්‍රධානවූ අය වන බර්සබ්බස් නම්ලත්
23 යූදස් සහ සීලස්ය. ඔවුන් අත මෙසේ
ලියා යැවූවෝය: ප්‍රේරිතයන්ද සහෝදරවූ
වැඩිමහල්ලන්ද අන්තියෝකියෙහිත්
සිරියාවෙහිත් කිලිකියෙහිත් වසන
අන්‍යජාතිවූ සහෝදරයන්ට ශුභසිද්ධවන
24 ලෙස ලියා එවන වගනම්–අපෙන් අණ
නොලැබුවාවූ සමහරෙක් අප අතරෙන්
පිටත්ව ගොස්, වචනවලින් තුඹලා
කලඹමින්, තුඹලාගේ සිත පෙරළූ බව
25 ඇසූ හෙයින්, අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා
තමුන්ගේ ජීවිත උපද්‍රවයට පැමිණවූ,
26 අපගේ ප්‍රේමණීය බාර්ණබස්ද පාවුල්ද
සමග මනුෂ්‍යයන් තෝරාගන තුඹලා
ළඟට එවීම යහපතැයි එක්සිත්ව රැස්වූ
27 අපට පෙනීගියේය. එහෙයින් යූදස්ද
සීලස්ද එවීමුව, ඔවුනුත් එම කාරණා
28 තුඹලාට කටින් කියනවා ඇත. එනම්
රූපවලට පූජාකළ දේවලින්ද ලෙයින්ද
බොටුව මිරිකා මැරූ සතුන්ගෙන්ද
වේශ්‍යාකමින්ද තුඹලා වලකින්ට ඕනෑවා
මිස, වෙන කිසි බරක් තුඹලා
පිට නොතබන්ට ශුද්ධාත්මයාණන්ටත්
29 අපටත් යහපතැයි පෙනීගියේය. මේවායින්
තුඹලා වලකින්නහුනම් තුඹලාට යහපත
වන්නේය. තුඹලාට ශුභසිද්ධවේවා යනුයි.
30 මෙසේ ඔව්හු යවනු ලැබ,
අන්තියෝකියට පැමිණ, සමූහයා
31 එකතුකරවා, ලියුම් භාරදුන්නෝය. ඔව්හු
එය කියවා, ඒ සැනසිල්ල ගැන
32 ප්‍රීතිවූවෝය. යූදස් සහ සීලස්,
තුමූ ප්‍රොපේතවරු බැවින්, බොහෝ
වචනවලින් සහෝදරයන්ට අවවාදකර,
33 ඔවුන් ස්ථිරකළෝය. ඔව්හු කලක් එහි
සිටි පසු, ඔවුන් එවූ අය වෙතට
සමාදානයෙන් සහෝදරයන් වෙතින්
යවනලද්දෝය.* තුමුත් පාවුල්ද 35
බාර්ණබස්ද වෙනත් බොහෝ
දෙනෙකු සමග ස්වාමීන්වහන්සේගේ
වචන උගන්වමින්ද ප්‍රකාශකරමින්ද
අන්තියෝකියෙහි නැවතී සිටියෝය.

## පාවුල් සහ බාර්ණබස් එකිනෙකාගෙන් වෙන්වීම

කීප දවසකට පසු පාවුල් බාර්ණබස්ට 36
කථාකොට: අප විසින් ස්වාමීන්-
වහන්සේගේ වචනය ප්‍රකාශකළාවූ සියලු
නුවරවල වසන සහෝදරයෝ කෙලෙස
සිටිත්දැයි අපි නැවත ගොස් බලමුයයි
කීවේය. බාර්ණබස්ද මාර්ක් නම්ලත් 37
යොහන්ද තමුන් සමග කැඳවාගන යන්ට
කැමතිවූයේය. නුමුත් පාවුල්, ඒ වැඩේට 38
නොගොස් පම්පිලියේදී තමුන්ගෙන්
අහක්ව ගියාවූ තැනැත්තා තමුන් සමග
කැඳවාගන යාම නුසුදුසුයයි සිතුවේය.
ඒ ගැන සැර විවාදයක් හටගත් බැවින් 39
ඔව්හු එකිනෙකාගෙන් වෙන්ව ගියෝය,
බාර්ණබස් මාර්ක් කැඳවාගෙන, කුප්‍රසට
නැවෙන් ගියේය: නුමුත් පාවුල් 40
සීලස් තෝරාගෙන, සහෝදරයන්
විසින් ස්වාමීන්වහන්සේගේ අනුග්‍රහයට
භාරදෙනලදුව පිටත්වී, සභාවන් 41
ස්ථිරකරමින්, සිරියාව සහ කිලිකියාව
මැදින් ගමන්කළේය.

## ලුස්ත්‍රාවේදී තිමෝතියස් පාවුල්ට එක්වීම

16 තවද ඔහු දර්බයටත් ලුස්ත්‍රාවටත්
ආවේය. ඇදහිලිවන්ත යුදෙව්
ස්ත්‍රියෙකුගේ පුත්‍රවූ තිමෝතියස් නම්
ගෝලයෙක් එහි සිටියේය; ඔහුගේ 2
පියා ග්‍රීකයෙක්ය. ඔහු ලුස්ත්‍රාවෙහිද
ඉකෝනියෙහිද සිටි සහෝදරයන් අතරේ
යහපත්යයි ප්‍රසිද්ධවූ කෙනෙක්ය. තමා 3
සමග ඔහු යනවාට පාවුල් කැමතිව, ඒ
පළාත්වල සිටි යුදෙව්වරුන් නිසා ඔහු
කැඳවා චර්මඡේද්‍යකෙළේය. මක්නිසාද

*සමහර පුරාණ පිටපත්වල 34 වෙනි පදයක් මෙලෙස ඇතුල්වී තිබේ: නුමුත් එහි නැවතීම හොඳයයි සීලස්ට පෙනුණේය.

ඔහුගේ පියා ග්‍රීකයෙක් බව ඒ සියල්ලෝ
4 දැනගෙන සිටියෝය. ඔව්හු නුවරින් නුවරට
ගමන්කරද්දී යෙරුසලමේ සිට ප්‍රේරිතයන්
විසින්ද වැඩිමහල්ලන් විසින්ද පනවනලද
නියෝග පවත්වන්ට ඔවුන්ට භාර-
5 දුන්නෝය. මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි
ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ.

## කුඩා ආසියාව මැදින් පාවුල්ගේ ගමන

6 ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට
ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු
ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින්
7 ගියෝය; ඔව්හු මිසිය ඉදිරියට ඇවිත්,
බිතිනියට යන්ට උත්සාහ කළෝය;
නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ
8 ඔවුන්ට ඉඩ නුදුන්සේක. එවිට ඔව්හු
මිසිය පසුකර ත්‍රෝවසට බැස
9 ආවෝය. පාවුල්ට රාත්‍රියෙහි දර්ශනයක්
පෙනුණේය; එනම්: මකිදෝනියට ඇවිත්
අපට උපකාරකරන්නැයි කියමින්
මකිදෝනියේ මනුෂ්‍යයෙක් නැගිට සිට
10 ඔහුගෙන් අයැද සිටියේය. ඔහු දර්ශනය
දුටු කල, ඔවුන්ට ශුභාරංචිය දේශනා-
කරන්ට දෙවියන්වහන්සේ අඬගැසූ බව
තේරුම්ගෙන, එකෙණෙහිම මකිදෝනියට
යන්ට අපි උත්සාහකෙළෙමුව.

## පාවුල් නැව්නැගී ගොස් මකිදෝනියේ පිලිප්පියට පැමිණීම

11 එහෙයින් අපි ත්‍රෝවසෙන් නැව් නැගී,
කෙලින්ම සමොත්‍රාකියටද පසුවද
12 නෙයාපොලිසටද යාත්‍රාකර, එයින්
මකිදෝනියේ නුවරක්වූ, ඒ දිශාවේ ප්‍රධාන
නුවර හා රෝමයන්ගේ වාසයක්වූ
පිලිප්පියට ඇවිත්, ඒ නුවර කීප දවසක්
13 නැවතී සිටියෙමුව. සබත් දවසේදී අපි
පිටත්වී නුවර දොරටුවෙන් පිට යාච්ඤා
ස්ථානයක් ඇතැයි අපට කල්පනාවුණ
ගංගාවක් අද්දරට ගොස් හිඳ, රැස්ව සිටි
14 ස්ත්‍රීන්ට කථාකෙළෙමුව. තියාතිරා නුවර
විසූ රත්තිල් පිළි විකුණන්නාවූ ලිදියා
නම් දේවභක්ති ස්ත්‍රියෙක් අපේ වචන
අසාගෙන සිටියාය. පාවුල් විසින් කියනලද
කාරණා සලකන ලෙස ස්වාමීන්වහන්සේ
15 ඇගේ සිත විවරකළසේක. ඈද ඇගේ
ගෙයි වැසියන්ද *බව්තීස්මකරනු
ලැබුවායින් පසු, ඈ කථාකොට: මා
ස්වාමීන්වහන්සේට විශ්වාසව සිටින
කෙනෙකැයි නුඹලා ඒත්තුගෙන සිටිහු
නම්, මාගේ ගෙට ඇවිත් එහි
නැවතුණ මැනවියි අපෙන් ඉල්ලා, අප
නවත්වාගත්තාය.
අප යාච්ඤකරන තැනට යද්දී, ශාස්ත්‍ර 16
කියන ආත්මයක් ඇත්තාවූ, පේනකීමෙන්
ස්වකීය ස්වාමිවරුන්ට බොහෝ ලාභ
ඉපදෙවුවාවූ එක්තරා තරුණියක් අපට
සම්බවූවාය. ඈ පාවුල් සහ අප පස්සේ 17
එමින්: මේ මනුෂ්‍යයෝ ගැළවීමේ
මාර්ගය නුඹලාට ප්‍රකාශ කරන්නාවූ,
මහෝත්තම දෙවියන්වහන්සේගේ
දසයෝයයි මොරගසා කීවාය. ඈ 18
බොහෝ දවසක්ම මෙසේ කළාය. එවිට
පාවුල් අතිශයෙන් අප්‍රසන්නවී, හැරී
ආත්මයට කථාකොට: යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඇගෙන්
අහක්වී යන්ට නුඹට අණකරමියි කීවේය.
ඒ පැයේදීම ආත්මය අහක්ව ගියේය.

## පාවුල් සහ සීලස් සිරකරනු ලැබීම හා හිරෙන් නිදහස්වීම

නුමුත් ඇගේ ස්වාමිවරු තමුන්ගේ ලාභ 19
ලැබීමේ බලාපොරොත්තුව නැතිවූ බව
දැක, පාවුල් සහ සීලස් අල්ලා
වෙළඳම්පළට ඇදගෙන ගොස්, මුලාදෑනීන් 20
ඉදිරියෙහි සිටෙවුවෝය, නඩුකාරයන්
ළඟටද ඔවුන් ගෙනගොස්: යුදෙව්වරුවූ
මේ මනුෂ්‍යයෝ අපගේ නුවර අතිශයින්
කළඹමින්, රෝමයන්වූ අප විසින් 21
පිළිගන්ටවත් පවත්වන්ටවත් නුසුදුසුවූ
චාරිත්‍ර උගන්වතියි කීවෝය. එවිට 22
සමූහයා ඔවුන්ට විරුද්ධව එක්ව
නැගුටුණෝය. නඩුකාරයෝද ඔවුන්ගේ
වස්ත්‍ර ඉරාදමා, ඔවුන්ට කෝටුවලින්
තළන්ට අණකළෝය. ඔව්හු ඔවුන්ට 23
බොහෝ පහර දුන්නායින් පසු හිරගෙයි
දමා, ඔවුන් ප්‍රවේසමෙන් රැකවල්කරන්ට
හිරගෙයි මුලාදෑනියාට අණකළෝය. ඔහු 24
එවැනි අණක් ලැබූ බැවින් ඔවුන් ඇතුල්

*අවගාහනය.

හිරගෙයි දමා, ඔවුන්ගේ පාද සවිලෙස
25 දඬුගැසුවේය. නුමුත් මධ්‍යම රාත්‍රිය
පමණේදී පාවුල්ද සීලස්ද යාච්ඤාකරමින්
දෙවියන්වහන්සේට ගී කීවෝය.
හිරකාරයෝද ඔවුන්ට ඇහුම්කන්දීගන
26 සිටියෝය: හදිසියෙන් මහත් පොළෝ-
කම්පාවක් විය. එයින් හිරගෙයි
අත්තිවාරම් සෙලවුණේය. එකෙණෙහිම
සියලු දෙරවල් ඇරුණේය; සියල්ලන්ගේ
27 බැඳුම්ද මිදුණේය. එකල හිරගෙයි
මුලාදෑනියා නින්දෙන් පිබිද, හිරගෙයි
දෙරවල් ඇරී තිබෙනවා දැක, හිරකාරයෝ
පැනලා ගියෝයයි සිතා, කඩුව ඇදගන
28 තමාම මරාගන්ට හැදුවේය. නුමුත් පාවුල්
කථාකොට: නුඹට කිසි අනතුරක් කර
නොගනින්න. මක්නිසාද අපි සියල්ලෝ
මෙහියයි මහත් හඬින් මොරගසා කීවේය.
29 එකල ඔහු එළි ඉල්ලාගන ඇතුළට පැන,
හයින් වෙවුලමින්, පාවුල් සහ සීලස්
30 ඉදිරියෙහි වැටී, ඔවුන් පිටතට කැඳවා
කථාකොට: ස්වාමිවරුනි, ගැළවෙන
පිණිස මා විසින් කුමක් කටයුතුදැයි
31 ඇසුවේය. ඔව්හු කථාකොට:
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
කෙරෙහි අදහාගනින්න, එවිට නුඹ
ගැළවෙන්නෙහිය, නුඹද නුඹේ ගෙයි
32 වැසියෝද එසේමයයි කීවෝය. තවද
ඔව්හු ඔහුගේ ගෙදර වැසි සියල්ලන්
ඇතුළුව ඔහුට ස්වාමීන්වහන්සේගේ
33 වචනය කියාදුන්නෝය. ඔහු රාත්‍රියේ ඒ
පැයේදීම ඔවුන් රැගෙන, ඔවුන්ගේ තුවාල
සේදුවේය; ඔහුද ඔහුගේ ගෙයි වැසි
සියල්ලෝද එකෙණෙහිම *බව්තීස්මකරනු
34 ලැබුවෝය. ඔහු ඉහළ තමාගේ ගෙට
ඔවුන් කැඳවාගන ගොස්, ඔවුන් ඉදිරියෙහි
කෑම මේසයක් තබා, තමාගේ ගෙයි
වැසි සියල්ලන් සමග දෙවියන්වහන්සේ
අදහමින් බොහෝසේ ප්‍රීතිවූයේය.
35 පහන්වූ කල නඩුකාරයෝ: ඒ
මනුෂ්‍යයන් යන්ට හැරපන්නැයි
36 සේවකයන් අත කියා යැවුවෝය. එවිට
හිරගෙයි මුලාදෑනියා ඒ වචන පාවුල්ට
දන්වා: නුඹලා මුදහරින්ට නඩුකාරයෝ
කියා එවුවෝය. එබැවින් පිටතට ඇවිත්
සමාදානයෙන් ගිය මැනවියි කීවේය. නුමුත් 37
පාවුල් ඔවුන්ට කථාකොට: ඔව්හු
රෝමයන්වූ අප විනිශ්චය නොකොට
ප්‍රසිද්ධයෙන් අපට තළා, හිරගෙයි
දැමුවෝය; දැන් ඔවුන් රහසින් අප
අරිනවාද? එසේ නොව, ඔව්හුම ඇවිත්
අප පිටතට ගෙනයත්වයි ඔවුන්ට කීවේය.
සේවකයෝ ඒ බස් නඩුකාරයන්ට 38
දැන්නුවෝය. ඔවුන් රෝමයන් බව ඇසූ
විට ඔව්හු හයවී, ඇවිත් ඔවුන්ට 39
කන්නලව්කර, ඔවුන් පිටතට කැඳවා,
නුවරින් පිටත්ව යන ලෙස ඉල්ලා
සිටියෝය. එකල ඔව්හු හිරගෙයින් 40
පිටත්ව ගොස් ලිදියාගේ ගෙට
පැමිණියෝය. එහිදී සහෝදරයන් දැක,
ඔවුන් ධෛර්ය කොට පිටත්ව ගියෝය.

## ප්‍රේරිතයන් තෙසලෝනිකයට සහ බෙරියයට පැමිණීම

17 ඔව්හු අම්පිපොලිස හා
අපොලෝනිය මැදින් ගොස්
තෙසලෝනිකයට ආවෝය. එහි
යුදෙව්වරුන්ගේ සිනගෝගයක් තිබුණේය.
පාවුල් තමාගේ පුරුද්ද ලෙස ඔවුන් 2
ළඟට ගොස්, සබත් දවස් තුනක්
ඔවුන්ට කථාකර, ලියවිලි තෝරා-
දෙමින්, ක්‍රිස්තුස්වහන්සේ දුක් විඳින්ටත් 3
මළවුන්ගෙන් නැගිටින්ටත් ඕනෑය කියාද,
නුඹලාට මා විසින් ප්‍රකාශකරන මේ
යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේය
කියාද පෙන්වා ප්‍රකාශකෙළේය.
ඔවුන්ගෙන් සමහරෙක්ද භක්තිවන්තවූ 4
ග්‍රීක්වරුන්ගෙන් මහත් සමූහයක්ද ප්‍රධාන
ස්ත්‍රීන්ගෙන් කීප දෙනෙක්ද ඇදහීමට
පමුණුවනු ලැබ, පාවුල් හා සීලස් සමග
සමාගම් වූවෝය. නුමුත් යුදෙව්වරු 5
ඊර්ෂ්‍යාවෙන් පිරී, අධමයන් අතරෙන්
සමහර අසත්පුරුෂයන් කැඳවාගන,
සමූහයක් රැස්කරවා, නුවර කලඹා
යාසොන්ගේ ගේ ළඟට පැමිණ, සමූහයා
වෙතට ඔවුන් පිටතට ගෙනෙන්ට
තැත්කළෝය. නුමුත් ඔව්හු ඔවුන් සොයා 6
නොදැක, යාසොන් සහ සමහර
සහෝදරයන්ද නුවර මුලාදෑනීන් ළඟට
ඇදගන ගොස්: ලෝකය පෙරළවාවූ
මොව්හු මෙහිත් ඇවිත් සිටිති; යාසොන් 7

*අවගාහනය.

ඔවුන් පිළිගත්තේය. මොවුන් සියල්ලෝද
යේසුස් නම් අන් රජෙක් ඇතැයි කියා
කායිසර්ගේ නියෝගවලට විරුද්ධව
8 ක්‍රියාකරතියි මොරගසා කියමින්, මේ
කාරණා ඇසූ සමූහයාද නුවර
9 මුලාදෑනීන්ද කැලඹවූවෝය. ඔව්හු
යාසොන්ගෙන්ද අනික් අයවලුන්ගෙන්ද
ඇප ගෙන ඔවුන් යන්ට ඇරියෝය.
10 එවේලේම සහෝදරයෝ රාත්‍රියේ පාවුල්
හා සීලස් බෙරීයයට ඇරියෝය.
ඔව්හු එහි පැමිණ යුදෙව්වරුන්ගේ
11 සිනගෝගයට ඇතුල්වූවෝය. ඔව්හු
තෙසලෝනිකයෙහි අයවලුන්ට වඩා
උතුම් වූවෝය. මක්නිසාද ඔව්හු මේ
කාරණා මෙසේදැයි දැනගන්නා පිණිස
දවස්පතා ලියවිලි සොයමින්, සිතේ මුළු
කැමැත්තෙන් වචනය පිළිගත්තෝය.
12 එහෙයින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ද
ග්‍රීක් කුල ස්ත්‍රීන් හා පුරුෂයන්ගෙන්
13 කීපදෙනෙක්ද අදහාගත්තෝය. නුමුත්
පාවුල් විසින් බෙරීයයෙහිදීත් දෙවියන්-
වහන්සේගේ වචනය ප්‍රකාශ කළ බව
තෙසලෝනිකයේ යුදෙව්වරු දැන,
එතැනටත් පැමිණ, සමූහයා පොලඹා
14 කැලඹවූවෝය. එවිට සහෝදරයෝ
පාවුල් මුහුද දක්වා යන්ට එවේලේම
ඔහු පිටත්කර ඇරියෝය. සීලස්ද
තිමෝතියස්ද එහිම නැවතී සිටියෝය.
15 පාවුල් කැඳවාගන ගිය අය අතීනසය
දක්වා ඔහු ගෙනගොස්, ඔහු ළඟට
පුළුවන් ඉක්මනින් එන්ට කියා සීලස්ටද
තිමෝතියස්ටද කියන ලෙස අණ ලැබ,
පිටත්ව ගියෝය.

## පාවුල් අතීනසයේ දේශනාකිරීම

16 පාවුල් අතීනසයේදී ඔවුන්ගේ ඊම බලා
සිටි කල නුවර දේවරූපවලින් පිරී
තිබෙන බව දැක ඔහුගේ ආත්මය ඔහු
17 තුළ චංචලවූයේය. එබැවින් ඔහු
සිනගෝගයේදී යුදෙව්වරුන් හා
භක්තිවන්තයන් සමගද දවස්පතා
වෙළඳම් පළේදී සම්බවූවන් සමගද
18 වාදකෙළේය. එපිකූරීය සහ ස්තෝයික
පණ්ඩිතයන්ගෙන් සමහරෙක්ද ඔහුට
මුණගැසුණෝය. සමහරෙක්ද: මේ
වාචාලයා මක්කියන්ට හදනවාදැයි
කීවෝය. තව සමහරෙක්: ඔහු අන්
දේවතාවන් ප්‍රකාශකරන්නෙකු මෙන්
පෙනේයයි කීවෝය. මෙසේ කීවේ
ඔහු යේසුස්වහන්සේ හා මළවුන්ගෙන්
නැගිටීම ප්‍රකාශකළ බැවින්ය. එබැවින් 19
ඔව්හු අරියෝපගයට ඔහු ගෙනගොස්:
නුඹ කියන මේ අලුත්වූ ඉගැන්වීම
කිමෙක්දැයි අපට දැනගන්ට පුළුවන්ද?
මක්නිසාද සමහර අමුතු කාරණා නුඹ 20
අපේ කන්වල හෙළන්නෙහිය. එහෙයින්
මේ කාරණාවල අර්ථය කිමෙක්ද කියා
දැනගන්ට කැමැත්තෙමුයයි කීවෝය.
(මක්නිසාද සියලු අතීනසයෝද එහි 21
පොරොත්තුව සිටියාවූ විදේශීහුද අමුතු
කාරණයක් කීමෙන් නොහොත්
ඇසීමෙන් මිස වෙන හැටියකින් කාලය
ගත නොකළෝය.) එවිට පාවුල් 22
ඇරියෝපගය මැද සිට කියනුයේ:
අතීනසයේ මනුෂ්‍යයෙනි, දෙවිවරුන්
ඇදහීමට නුඹලා ලැදිව සිටින බව සියලු
කාරණාවලදී මට පෙනේ. මක්නිසාද 23
මා නුඹලාගේ නමස්කාරයට අඩංගු
දේවල් බලමින් යන අතර: නාඳුනන
දෙවිකෙනෙකුටය යන ලියවිල්ල ඇති
පූජාසනයකුත් දුටිමි. එබැවින් නුඹලා
නොදන්නාකමින් නමස්කාරකරන ඒ
දෙය මම නුඹලාට ප්‍රකාශකරමි.
ලෝකයද එහි ඇති සියල්ලද 24
මැවූ දෙවියන්වහන්සේ ස්වර්ගයටත්
පොළොවටත් ස්වාමිව සිටිනසේක්, අතින්
සාදනලද මාළිගාවල නොවසනසේක;
උන්වහන්සේ යම් දෙයකින් අඩුකමක් 25
ඇති කෙනෙකු මෙන් මනුෂ්‍යයන්ගේ
අත්වලින් උපස්ථාන නොලැබ
උන්වහන්සේම සියල්ලන්ට ජීවිතයද
හුස්මද සියලු දේවල්ද දෙනසේක.
උන්වහන්සේ පිළියෙළකළ කාලවල්ද 26
සියලු මනුෂ්‍ය ජාතීන්ගේ වාසස්ථානවල
සීමාද නියමකොට, මුළු පොළෝතලයෙහි
වාසය කරන පිණිස එක්කෙනෙකුගෙන්
ඔවුන් මැවූසේක. මෙසේ කළේ අතගා 27
යමින්වත් යම් අන්දමකින් දෙවියන්-
වහන්සේව සම්බවන ලෙස ඔවුන්
තමන්වහන්සේව සොයන පිණිසය;
එහෙත් උන්වහන්සේ අප එකිනෙකාට
නුදුරුව සිටිනසේක. මක්නිසාද අපි 28
උන්වහන්සේ තුළ ජීවත්වමුව,
හැසිරෙමුව, සිටිමුව. තවද: අපි

උන්වහන්සේගේ දරුවෝයයි තුඹලාගේ
කාව්‍යක්කාරයන්ගෙන් සමහරෙක් පවා
29 කියා තිබේ. එහෙයින් දෙවියන්-
වහන්සේගේ දරුවන්වූ අප විසින්
දේවත්වය වනාහි මනුෂ්‍ය ශිල්පයෙන්
හා සමර්ථකමින් කැපූ රනටවත්
රිදීයටවත් ගලටවත් සමානයයි
30 නොසිතිය යුතුය. ඉතින් මේ
නොදන්නාකමේ කාලවල් දෙවියන්-
වහන්සේ නොබලා හැරිය නුමුත් සියලු
මනුෂ්‍යයන්ට හැම තැන්හි පසුතැවිලි-
31 වෙන්ට දූන් අණකරනසේක. මක්නිසාද
තමන්වහන්සේ විසින් පත්කළ මනුෂ්‍යයා
ලවා ලෝකයා ධර්මිෂ්ඨකමින්
විනිශ්චයකරවන්ට එක් දවසක් නියමකර
තිබේ; උන්වහන්සේ ඒ මනුෂ්‍යයා
මළවුන්ගෙන් නැගිටවීමෙන් සියල්ලන්ට
ඒ ගැන සහතිකයක් දී තිබේයයි කීවේය.
32 මළවුන්ගෙන් නැගිටීම ගැන ඔවුන් ඇසූ
කල, සමහරු සරදම්කළෝය; සමහරෙක්:
මේ ගැන අපි නැවතත් නුඹ කියන දේ
33 අසන්නෙමුයයි කීවෝය. එවිට පාවුල්
34 ඔවුන් අතරෙන් අහක්ව ගියේය. නුමුත්
සමහර මනුෂ්‍යයෝ ඔහුට එකතුවී
අදහාගත්තෝය. ඔවුන් අතරෙහි
අරියෝපගිය දියොනිසියස්ද දමරිස් නම්
ස්ත්‍රියෙක්ද ඔවුන් සමග වෙනත් අයද
වූවෝය.

## කොරින්තියේ මෙහෙය

18 මෙයින් පසු පාවුල් අතීනසයෙන්
පිටත්ව, කොරින්තියට ආවේය.
2 ක්ලෞදියස් සියලු යුදෙව්වරුන්ට
රෝමයෙන් අහක්ව යන්ට අණකර
තිබුණු බැවින්, ඉතාලියෙන් අලුත ආවාවූ
පන්තස්හි උපන් මනුෂ්‍යයෙක්වූ අකිලා-
නම් එක්තරා යුදෙව්වෙක් ප්‍රිස්කිලා නම්
ඔහුගේ භාර්යාව සමග පාවුල්ට සම්බවී,
3 ඔහු ඔවුන් වෙතට ගොස්, දෙගොල්ලම
එම කර්මාන්තය කරන්නෝ බැවින්,
ඔවුන් සමග නැවතී සිට වැඩකළේය;
ඔවුන්ගේ කර්මාන්තය කූඩාරම් සෑදීමය.
4 ඔහු සියලු සබත් දවස්වල සිනගෝගයෙහිදී
තර්කකර, යුදෙව්වරුන්ද ග්‍රීක්වරුන්ද
ඇදහිල්ලට පමුණුවාගන්ට උත්සාහකළේය.
5 නුමුත් සීලස්ද තිමෝතියස්ද
මකිදෝනියෙන් ආ කල, යේසුස්වහන්සේ
ක්‍රිස්තුස්මයයි පාවුල් යුදෙව්වරුන්ට
සාක්ෂිදෙමින්, වචනය දේශනාකිරීමේ
වැඩේම යෙදී සිටියේය. එහෙත් ඔවුන් 6
විරුද්ධව සිට අපහාසකළ කල්හි, ඔහු
තමාගේ වස්ත්‍ර ගසාදමා, ඔවුන්ට
කථාකොට: නුඹලාගේ ලේ නුඹලාගේම
හිස් පිට වේවා; මම නිදෙස්වෙමි. මෙතැන්
පටන් අන්‍යජාතීන් ළඟට යමියි කීවේය.
ඔහු එතැනින් අහක්ව ගොස්, 7
දෙවියන්වහන්සේට නමස්කාරකළාවූ
තීතස් යුස්තස් නම් මනුෂ්‍යයෙකුගේ
ගෙදරට ගියේය; ඔහුගේ ගේ
සිනගෝගයට යාව තිබුණේය.
සිනගෝගයේ මුලාදෑනියාවූ ක්‍රිස්පස් 8
තමාගේ ගෙයි වැසි සියල්ලන් සමග
ස්වාමීන්වහන්සේ කෙරෙහි අදහාගත්තේය;
කොරින්තිවරුන්ගෙන් බොහෝ දෙනෙක්ද
අසා අදහාගෙන *බව්තීස්මකරනු
ලැබුවෝය. ස්වාමීන්වහන්සේ රාත්‍රියෙහි 9
දර්ශනයකින් පාවුල්ට කථාකොට: නුඹ
භයනොවී, නිශ්ශබ්දව නොසිට,
කථාකරපන්න. මක්නිසාද මම නුඹ 10
සමග සිටිමි, කිසිවෙක් නුඹට
අනතුරුකරන ලෙස නුඹට විරුද්ධව
නොඑන්නේය. මට මේ නුවර බොහෝ
සෙනඟ සිටිතියි කීසේක. ඔහු 11
දෙවියන්වහන්සේගේ වචනය ඔවුන්
අතරේ උගන්වමින් එක් අවුරුදු සමසක්
එහි වාසයකෙළේය.

## ගලියෝ සහ පාවුල්

එහෙත් ගලියෝ අකායේ අධිපතියාව 12
සිටියදී යුදෙව්වරු එක්සිත්ව පාවුල්ට
විරුද්ධව නැගිට, ඔහු විනිශ්චයාසනය
ඉදිරියට ගෙනැවිත්: මොහු ව්‍යවස්ථාවට 13
වෙනස්ලෙස දෙවියන්වහන්සේට
නමස්කාරකරන්ට මනුෂ්‍යයන් පොලඹ-
වන්නේයයි කීවෝය. පාවුල් මුඛය අරින්ට 14
හදන කල ගලියෝ යුදෙව්වරුන්ට
කථාකොට: එම්බා යුදෙව්වරුනි, මේ
කාරණය අපරාධයක්වත් නපුරු
දුෂ්ටකමක්වත් වී නම්, නුඹලා ගැන මා
විසින් ඉවසිය යුතුය. නුමුත් මේවා 15
වනාහි වචනවල්ද නාමවල්ද නුඹලාගේම

*අවගාහනය.

ව්‍යවස්ථාවද ගැන වාදවල් නම්, නුඹලාම
බලාගනිල්ලා; මේ දේවල් ගැන
මම විනිශ්චයකාරයෙක් නොවන්නෙමියි
16 කියා, ඔවුන් නඩු ආසනය
17 වෙතින් එලෙවුවේය. එවිට ඒ
සියල්ලෝ සිනගෝගයේ මුලාදෑනියාවූ
සොස්තෙනේස් අල්ලා නඩු ආසනය
ඉදිරියේදී ඔහුට තැළුවෝය. ගලියෝ මේ
දේවලින් කිසිවක් ගැන සැලකුවේ නැත.

## සිරියාවට හැරී ඒම

18 මෙයින් පසු පාවුල් බොහෝ දවස්
එහි නැවතී සිට, සහෝදරයන්ට
ආයුබෝවන් කියා, තමා බාරයක් වී
සිටි බැවින් කෙන්ක්‍රෙයායේදී හිසකේ
බූගා, සිරියාවට යන්ට නැව් නැගුණේය,
ප්‍රිස්කිලාද අකිලාද ඔහු සමග ගියෝය.
19 ඔවුන් එපීසයට පැමිණ, ඔහු ඔවුන් එහි
සිටින්ට හැර, තමාම සිනගෝගයට
ගොස් යුදෙව්වරුන් සමග තර්කකෙළේය.
20 තවත් කලක් නැවතී සිටින ලෙස ඔවුන්
ඔහුගෙන් ඉල්ලූ කල්හි ඔහු එකඟ නොවී,
21 ඔවුන්ට ආචාරකොට: දෙවියන්වහන්සේ
කැමතිසේක් නම් නුඹලා ළඟට නැවත
එන්නෙමියි කියා එපීසයෙන් නැව්
22 නැගුණේය. ඔහු කායිසාරියට ගොඩ-
බැස, ගොස්, සභාවට ආචාරකොට,
23 අන්තියෝකියට බැස ගියේය. ඔහු එහි
කලක් පසුකොට පිටත්ව පිළිවෙළින්
ගලාතියේ සහ පිරිගියේ පළාත මැදින්
ගොස් සියලු ගෝලයන් ස්ථිරකෙළේය.

## අපොල්ලොස් එපීසයේ සහ අකායේ සිටීම

24 අලෙක්ෂන්ද්‍රියෙහි උපන්නාවූ, උගතෙක්වූ,
අපොල්ලොස් නම් එක්තරා යුදෙව්වෙක්
එපීසයට ආවේය; ඔහු වනාහි ලියවිලි
25 ගැන බලවත්ව සිටියේය. මේ මනුෂ්‍යයා
ස්වාමීන්වහන්සේගේ මාර්ගය ගැන
උගන්වනු ලැබ ආත්මයෙන් ජ්වලිතව
සිට, යේසුස්වහන්සේගේ කාරණා ගැන
හරි ආකාර කථාකර ඉගැන්නුවේය.
එහෙත් ඔහු යොහන්ගේ *බව්තීස්මය
පමණක් දැනගෙන සිටියේය. ඔහු 26
සිනගෝගයේදී නිර්භීතව කථාකරන්ට
පටන්ගත්තේය. ප්‍රිස්කිලාද අකිලාද ඔහුගේ
බස් අසා, ඔහු තමුන් ළඟට කැඳවාගෙන,
දෙවියන්වහන්සේගේ මාර්ගය වඩා
හරිලෙස ඔහුට තෝරාදුන්නෝය. තවද 27
ඔහු අකායට යන්ට සිතූ කල්හි,
සහෝදරයෝ ඔහු ධෛර්යකොට, ඔහු
පිළිගන්නා ලෙස ගෝලයන්ට ලියා
ඇරියෝය. ඔහු එහි පැමිණි කල,
අනුග්‍රහය කරණකොටගෙන අදහාගත
සිටි අයට බොහෝ උපකාරකෙළේය.
මක්නිසාද ඔහු යේසුස්වහන්සේ ක්‍රිස්තුස් 28
බව ලියවිලිවලින් පෙන්වා, ප්‍රසිද්ධයෙන්
බලවත් ලෙස යුදෙව්වරුන් පරාජයකෙළේය.

*අවගාහනය.

## එපීසයේ සිටි *යොහන් බව්තීස්තගේ ගෝලයෝ

19 තවද අපොල්ලොස් කොරින්තියෙහි
සිටියදී පාවුල් ඉහළ පළාත් මැදින්
ගොස්, එපීසයට ඇවිත්, සමහර 2
ගෝලයන් සම්බව: නුඹලා අදහාගත්
කල ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුවහු-
දැයි ඔවුන්ගෙන් ඇසුවේය. ඔව්හු: නැත,
ශුද්ධාත්මයාණන්වහන්සේ ඇති බවවත්
නොඇසීමුයයි කීවෝය. එසේවී නම් 3
නුඹලා මොන †බව්තීස්මයක් ලැබුවහුදැයි
ඔහු ඇසුවේය. යොහන්ගේ †බව්තීස්මයයයි
ඔව්හු කීවෝය. පාවුල් කථාකොට: 4
යොහන් පසුතැවිල්ලේ ‡බව්තීස්මයෙන්
†බව්තීස්මකොට සෙනහට කථාකරමින්,
තමාට පසුව එන තැනන්වහන්සේ
කෙරෙහි, එනම් යේසුස්වහන්සේ කෙරෙහි,
අදහාගන්න ලෙස සෙනහට කීවේයයි
කීය. ඔව්හු ඒ අසා ස්වාමිවූ යේසුස්- 5
වහන්සේගේ §නාමයට බව්තීස්මකරනු
ලැබුවෝය. පාවුල් ඔවුන් පිට අත් තැබූ 6
කල ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්
කෙරෙහි පැමිණිසේක; ඔව්හු අන්‍ය

*අවගාහක යොහන්ගේ.
†අවගාහනය.
‡අවගාහනයෙන්.
§නාමය තුළට අවගාහනය.

භාෂාවලින් කථාකරමින් අනාගතවාක්‍ය
7 කීවෝය. ඒ මනුෂ්‍යයන් සියල්ලෝම
දොළොස් දෙනෙක් පමණ වූවෝය.

## පාවුල් එපීසයේ නැවතීම

8 ඔහු සිනගෝගයට ඇතුල්වී දෙවියන්-
වහන්සේගේ රාජ්‍යය සම්බන්ධ කාරණා
ගැන තර්කකරමින්ද උගන්වමින්ද
තුන්මසක් අතරතුරේ භය නැතුව
9 කථාකෙළේය. නුමුත් සමහරු මුරණ්ඩුව,
අකීකරුව, සමූහයා ඉදිරියෙහි ඒ ලබ්ධි
මාර්ගය ගැන දෙස් කී කල්හි ඔහු ඔවුන්
ළඟින් අහක්ව, ගෝලයන් වෙන්කරගන,
තුරානස්ගේ ශිල්ප ශාලාවෙහි දවස්පතා
10 තර්කකරමින් සිටියේය. මෙය දෑවුරුද්දක්
කෙරීගන ගියේය; මෙසේ ආසියාවේ විසූ
සියල්ලෝ වන යුදෙව්වරුද ග්‍රීක්වරුද
ස්වාමීන්වහන්සේගේ වචනය ඇසූහ.
11 දෙවියන්වහන්සේ පාවුල්ගේ අත්වලින්
අපූරුවූ ආශ්චර්යයන් කෙරෙවූසේක.
12 ඔහුගේ ශරීරයෙන් පිස්නාකඩවත්
රෙදිකඩවත් ලෙඩුන් ළඟට ගෙනගිය
පමණින් රෝග ඔවුන්ගෙන් පහවිය,
13 නපුරු ආත්මයෝද දුරුව ගියෝය. නුමුත්
තැනින් තැන සංචාරණය කරන යකදුරුවූ
යුදෙව්වරුන්ගෙන් සමහරුත් නපුරු ආත්ම
වැහී සිටි අයයින් කෙරෙහි ස්වාමිවූ
යේසුස්වහන්සේගේ නාමය කියන්ට
පටන්ගෙන: පාවුල් දේශනාකරන්නාවූ
යේසුස්වහන්සේගේ නාමයෙන් නුඹලාට
14 අණකරමියි කීවෝය. ප්‍රධාන පූජකයෙක්වූ
ස්කෙවා නම් යුදෙව්වෙකුගේ පුත්‍රයන්
15 සත් දෙනෙක් මෙසේ කළෝය. නුමුත්
නපුරු ආත්මය උත්තරදෙමින්:
යේසුස්වහන්සේ අඳුනමි, පාවුල්ද දනිමි;
නුමුත් නුඹලා කවුරුද්දැයි ඔවුන්ට කීවේය.
16 නපුරු ආත්මය වැහී සිටි මනුෂ්‍යයා
ඔවුන් පිටට පැනනැගී දෙදෙනාම
දමනයකොට, ඔවුන් පරදවාදම්මේය,
මෙසේ ඔව්හු නිර්වස්ත්‍රව, තුවාලවී, ඒ
17 ගෙයින් පලා ගියෝය. මෙය එපීසයෙහි
විසූ සියලු යුදෙව්වරුන්ටද ග්‍රීක්වරුන්ටද
දැනගන්ට ලැබුණේය; ඔවුන් සියල්ලන්
කෙරෙහි භයක් පැමුණුණේය, ස්වාමිවූ
යේසුස්වහන්සේගේ නාමයටද ගෞරව
පැමුණුණේය. අදහාගත්තවුන්ගෙන් 18
බොහෝ දෙනෙක්ද ඇවිත් තමුන්ගේ
ක්‍රියාවන් ප්‍රකාශකරමින් ඒවා කියා-
දුන්නෝය. යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාසකළ 19
බොහෝ දෙනෙක්ද තමුන්ගේ පොත්
එක්කොට ගෙනැවිත් සියල්ලන් ඉදිරියෙහි
පුළුස්සාදැමුවෝය. ඒවායේ මිල ගණන්
බලා, රිදීමිල පනස් දහසක් බව
දැනගත්තෝය. එපමණ බලගතු ලෙස 20
ස්වාමීන්වහන්සේගේ වචනය වර්ධනයවී,
බලවත්වුණේය.
මේ දේවල් නිමවූ කල, පාවුල්: මා 21
යෙරුසලමට ගියායින් පසු රෝමයද
දකින්ට ඕනෑය කියා, මකිදෝනිය සහ
අකාය මැදින් ගොස්, යෙරුසලමට
යන්ට ආත්මයෙන් නියමකරගත්තේය.
ඔහු තමාට සේවයකළ අයගෙන් 22
දෙදෙනෙකු වන තිමෝතියස්ද එරස්තස්ද
මකිදෝනියට යවා, තමාම කලක්
ආසියාවෙහි නැවතී සිටියේය.

## ප්‍රේරිත තැනගේ වැඩ පිළිවෙළ. එපීසයේ කෝලාහලය

ඒ කාලය පමණේදී ඒ ලබ්ධි මාර්ගය 23
ගැන මහත් කැලඹීමක් හටගත්තේය.
මක්නිසාද අර්තේමිස්ගේ දේවාලයේ රිදී 24
රූප සාදන්නාවූ දෙමේත්‍රියස් නම්
රිදීකරුවෙක් කර්මාන්තකාරයන්ට
බොහෝ ලාභ උපදවාදුන්නේය. ඔහු 25
ඔවුන්ද එබඳුවූ කර්මාන්තකාරයන්ද
රැස්කරවා: මහත්වරුනි, අපට වස්තුව
ලැබෙන්නේ මේ කර්මාන්තයෙන් බව
නුඹලා දන්නාහුය. මේ පාවුල් වනාහි 26
අත්වලින් කරන ලද දෙවිවරු දෙවිවරු
නොවෙතියි කියමින් එපීසයෙහි පමණක්
නොව මුළු ආසියාවේ සෑම තැනම
වාගේ බොහෝ සෙනඟ උගන්වා
හරවාගත් බව නුඹලාට දකින්ටද
අසන්ටද ලැබී තිබේ. එහෙයින් අපගේ 27
මේ කර්මාන්තය සුළු බවට පැමිණෙන්ට
පුළුවන්වා පමණක් නොව, මුළු
ආසියාවත් ලෝකයත් නමස්කාර-
කරන්නාවූ මහත් දේවතාවිවූ අර්තේමිස්ගේ
මාළිගාව අගෞරවයට පත්වීමද ඇගේ

මහත්තත්ත්වය පවා පහවීයාමද වෙන්ට
28 පුළුවනැයි කීවෝය. ඔව්හු ඒ අසා
කෝපයෙන් පිරී: එපීසයන්ගේ අර්තේමිස්
උත්තමීයයි මොරගසමින් කීවෝය.
29 එවිට නුවර වියවුලෙන් පිරුණාය. ඔව්හු,
පාවුල් සමග ගමන්කළාවූ ඔහුගේ
සමාගම්කාර මකිදෝනියේ මනුෂ්‍යයන්වූ
ගායස්ද අරිස්තාර්කස්ද අල්ලාගෙන
එක්සිත්ව නෘත්‍ය ශාලාවට වේගයෙන්
30 දිවුවෝය. පාවුල් සෙනඟ මැදට යන්ට
සිතූ කළ ගෝලයෝ ඔහුට ඉඩ
31 නොහැරියෝය. ඔහුට මිත්‍රව සිටිය
ආසියාවේ අධිපතීන්ගෙන් සමහරෙක්ද
නෘත්‍ය ශාලාවට කොයි ආකාරයකින්වත්
ඇතුල් නොවන ලෙස ඉල්ලා ඔහුට
32 කියා ඇරියෝය. සභාව වියවුල්වූ බැවින්,
සමහරෙක් එකක්ද අන් සමහරෙක් වෙන
එකක්ද කියමින් මොරගැසුවෝය;
ඔවුන්ගෙන් වැඩි කොටස තුමූ මොන
කාරණාවක් නිසා එකතුවූණෝදැයි
33 නොදන සිටියෝය. යුදෙව්වරුන් විසින්
ඉදිරිපත් කරනලද අලෙක්ෂන්දර් ඔව්හු
සමූහයා අතරෙන් ගෙනාවෝය.
අලෙක්ෂන්දර්ද අතින් සංඥකොට,
සමූහයාට උත්තරදෙන්ට කැමතිවිය.
34 නුමුත් ඔහු යුදෙව්වෙක් බව ඔව්හු දැනගත්
විට: එපීසයන්ගේ අර්තෙමිස් උත්තමීය
කියා දෙපැයක් පමණ සියල්ලෝම එක
35 හඬින් මොරගැසූහ. නුවර ලේකම්
තැන සමූහයා සන්සිඳුවා: එපීසයේ
මනුෂ්‍යයෙනි, එපීසවරුන්ගේ නුවර
වනාහි අර්තෙමිස්ගේ මාළිගාවේද සියුස්
ළඟින් වැටුණාවූ රූපයේද රැකවලී බව
36 නොදන්න මනුෂ්‍යයා කවුද? මෙසේ මේ
දේවලට විරුද්ධව යමක් කියන්ට බැරි
හෙයින් නුඹලා ඉක්මනින් කිසිවක්
නොකොට නිශ්චලව සිටින්ට යුතුය.
37 මක්නිසාද නුඹලා මෙහි ගෙනාවාවූ
මේ මනුෂ්‍යයෝ දේවාලවලින් සොරකම්-
කරන්නෝවත් අපේ දේවතාවීට අපහාස-
38 කරන්නෝවත් නොවෙති. එහෙයින්
යමෙකුට විරුද්ධව දෙමේත්‍රියස්ගේද ඔහු
සමග සිටින කර්මාන්තකාරයන්ගේද
පැමිණිල්ලක් ඇත්නම්, නඩු දවස් තිබේ,
අධිපතියෝද සිටිති. ඔව්හු එකිනෙකාට
විරුද්ධව පැමිණිලිකරත්වා. නුමුත් 39
නුඹලා වෙන කාරණා ගැන විචාරවූ
නම්, එය නියම සභාවේදී නිශ්චයකරනු
ලැබේ. මක්නිසාද මේ කෝලාහල 40
රැස්වීම ඇතිවීම ගැන අපට උත්තර-
දෙන්ට පුළුවන්වන ලෙස ඊට කිසි
කාරණාවක් නැති බැවින්, අද දවසේ
කැරැල්ල ගැන අප කෙරෙහිත් දෝෂා-
රෝපණයක් පැමිණෙන්ට පුළුවනැයි
කීවේය. ඔහු මෙසේ කියා සභාව යන්ට 41
ඇරියේය.

## මකිදෝනිය, ග්‍රීසිය, ත්‍රෝවස යන තැන්හි සිටීම

20 කෝලාහලය නැවතුණු පසු පාවුල්
ගෝලයන් කැඳවා අවවාදකොට,
ඔවුන්ට ආයුබෝවන් කියා, මකිදෝනියට
යන්ට පිටත්වුණේය. ඔහු ඒ පළාත් මැදින් 2
ගොස්, ඔවුනට බොහෝ අවවාද දී,
ග්‍රීසියට ආවේය. එහි ඔහු තුන් මාසයක් 3
ගතකොට, නැවෙන් සිරියාවට යන්ට
සූදානම්ව සිටියදී, ඔහුට විරුද්ධව
යුදෙව්වරුන් උපායක් යෙදූ කල,
මකිදෝනිය මැදින් හැරී යන්ට
නියමකරගත්තේය. පුරස්ගේ පුත්‍රවූ 4
බෙරීයයේ සෝපතර්ද තෙසලෝනික-
වරුන්ගෙන් අරිස්තාර්කස් සහ
සෙකුන්දස්ද දර්බයේ ගායස් සහ
තිමෝතියස්ද ආසියාවේ තුඛීකස් සහ
ත්‍රොපිමස්ද ඔහු සමග ආසියාව දක්වා
ගියෝය. මොව්හු ඉස්සරව ගොස්, 5
ත්‍රෝවසේදී අපගේ ඊම බලා සිටියෝය.
මුහුන් නොදමූ රොටි කන දවස්වලට 6
පසු අපි පිලිප්පියෙන් නැව් නැගී, පස්
දවසකින් ත්‍රෝවසෙහි සිටියාවූ ඔවුන්
ළඟට ඇවිත්, එහි සත් දවසක් නැවතී
සිටියෙමුව.
සතියේ පළමුවෙනිද අපි රොටි කඩන්ට 7
රැස්වූ කල, පාවුල් පසුවද යන්ට
අදහස්කරගෙන, ඔවුන්ට අනුශාසනා-
කෙළේය; ඔහුගේ කථාව මධ්‍යම රාත්‍රිය
දක්වා පැවතුණේය. අප රැස්ව සිටි 8
උඩුමහලේ බොහෝ පහන් තිබුණේය.

## යූතිකස්

9 යූතිකස් නම් එක් තරුණයෙක් බොහෝ
නිදිබරව කවුළුව උඩ ඉඳගෙන උන්නේය;
පාවුල් තව දුරට අනුශාසනාකරද්දී
යූතිකස් නින්දේ තදකම නිසා තුන්වෙනි
මහලින් පහළට වැටුණේය, ඔහු
10 ඔසවාගත් කල මැරී සිටියේය. එවිට
පාවුල් බැස, ඔහු පිට වැටී, ඔහු වැළඳගන:
සෝෂා නොකරල්ලා; මක්නිසාද
මොහුගේ ප්‍රාණය මොහු තුළ තිබේයයි
11 කීවේය. ඔහු නැවත උඩට ගොස්, රොටි
කඩා කා, ඔවුන් සමග බොහෝ
වේලාවක් එනම් පහන්වන තුරු කථාකර,
12 පසුව පිටත්ව ගියේය. ඔව්හු ඒ ළමයා
පණපිටින් ගෙනැවිත්, බොහෝසේ
සැනසුණෝය.

## මිලේතසට ගමන

13 එහෙත් අපි අසොස්හිදී පාවුල් නංවා-
ගන්ට අදහස්කරගන, පෙරටුව නැව
ළඟට ගොස්, එහි යන්ට නැගුණෙමුව.
මක්නිසාද ගොඩින් යන්ට අදහස්කළ
ඔහු, එසේ යන්ට අපට නියමකර
14 තිබුණේය. අසොස්හිදී ඔහු අපට සම්බවූ
කල ඔහු නංවාගන මිතුලේනට ආවෙමුව.
15 අපි එතැනින් යාත්‍රාකොට, පසුවද
කියොස් ඉදිරියට පැමිණ, ඊට පසුවද
සාමොස්ට ළඟාවී, ඊළඟ දවසේ
16 මිලේතසට පැමිණියෙමුව. එසේ කළේ,
හැකිවී නම් පෙන්තකොස්ත දවසේ
යෙරුසලමේ සිටින්ට පාවුල් ඉක්මන්කළ
බැවින්, ආසියාවෙහි කල්ගතකරන්ට
නොවෙන පිණිස නැවෙන් එපීසය
පසුකරයන්ට ඔහු නියමකරගන සිටි
නිසාය.

## එපීසයේ සභාවේ වැඩිමහල්ලන්ට අන්තිමට කළ කථාව

17 ඔහු මිලේතසෙන් එපීසයට පණිවිඩ
යවා, සභාවේ වැඩිමහල්ලන් කැඳවූයේය.
18 ඔවුන් ඔහු ළඟට ආ කල ඔහු ඔවුන්ට
කථාකොට:
මා ආසියාවට ආ පළමුවෙනිද පටන්
මුළු කාලය නුඹලා සමග ගතකළ හැටි
නුඹලා දන්නාහුය. මම සිතේ සියලු 19
ආකාර යටත්කමින්ද කඳුළුවලින්ද
යුදෙව්වරුන්ගේ උපා නිසා පැමිණි
අමාරුකම්වලින්ද යුක්තව, ස්වාමීන්-
වහන්සේට සේවයකෙළෙමි. ප්‍රයෝජනවත්වූ 20
කිසි දෙයක් ප්‍රකාශකිරීමෙන් නොවැලකී,
ප්‍රසිද්ධයෙන්ද ගෙයින් ගෙටද නුඹලාට
උගන්වමින්, දෙවියන්වහන්සේ කෙරෙහි 21
පසුතැවිල්ලත් අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලත්
ගැන යුදෙව්වරුන්ට හා ග්‍රීක්වරුන්ට
සාක්ෂිදුනිමි. දැන් ඉතින් ආත්මයෙන් බඳිනු 22
ලැබ, මම යෙරුසලමට යමි, එහිදී මට
මක්වේද කියා නොදනිමි. නුමුත් බැඳුම්ද 23
දුක්ද මට පැමිණේයයි ශුද්ධාත්මයාණන්-
වහන්සේ සියලු නුවරවලදී සාක්ෂි-
දෙනසේක. නුමුත් මාගේ දිවිමද 24
දෙවියන්වහන්සේගේ කරුණාවේ
ශුභාරංචියට සාක්ෂිදෙන පිණිස ස්වාමිවූ
යේසුස්වහන්සේගෙන් මට ලැබුණු
මෙහෙයද සම්පූර්ණකිරීම පමණ මාගේ
ජීවිතය වැදගත්ය නොහොත් මටම
අගේය කියා මම කිසිසේත් නොසලකමි.
ඉතින් රාජ්‍යය ගැන දේශනාකරමින් 25
නුඹලා අතරෙහි ඇවිද්දවූ මාගේ මුහුණ
නුඹලා සියල්ලන් තවත් නොදකින බව
දනිමි. එහෙයින් මම සියල්ලන්ගේ ලෙයින් 26
නිදෙස්වෙමියි අද දවසේ නුඹලාට
සාක්ෂිදෙමි. මක්නිසාද දෙවියන්- 27
වහන්සේගේ මුළු අභිප්‍රාය නුඹලාට
ප්‍රකාශකිරීමෙන් නොවැලකුණෙමි.
දෙවියන්වහන්සේ විසින් තමන්ගේම 28
රුධිරයෙන් මිලේට ගත් තමන්ගේ සභාව
පෝෂණයකරන්ට ශුද්ධාත්මයාණන්-
වහන්සේ යම් රැළෙක්හි නුඹලා
නායකයන් කොට නියමකළසේක්ද, ඒ
මුළු රැළ ගැනත් නුඹලාම ගැනත්
ප්‍රවේසම්වෙයල්ලා. මාගේ පිටත්ව 29
යාමෙන් පසු රැළට අනුකම්පා නොකරන
රෞද්‍රවූ වෘකයන් නුඹලා අතරට
පැමිණෙන බව දනිමි; නුඹලා අතරෙන්ම 30
මනුෂ්‍යයන් නැගිට, තමුන් පස්සේ යන්ට
ගෝලයන් ඇදගන්නා පිණිස කාරණා
පෙරළා කථාකරනවා ඇත. එබැවින් 31

මා තුන් අවුරුද්දක් මුළුල්ලෙහි රෑ දවල්
දෙකේ කඳුළුවලින් යුක්තව සියල්ලන්ට
නිරතුරු අවවාද දුන් බව සිහිකොට,
32 අවදිව සිටපල්ලා. දැන් දෙවියන්-
වහන්සේටද, නුඹලා ඉදිකරන්ටත්
පිරිසිදුකරනලද සියල්ලන් අතරෙහි
නුඹලාට උරුමයක් දෙන්ටත් හැකිවූ
උන්වහන්සේගේ අනුග්‍රහයේ වචනයටද
33 නුඹලා භාරදෙමි. කිසිවෙකුගේ රිදීයටවත්
රනටවත් ඇඳුම්වලටවත් ආශා නොවීමි.
34 මටත් මා සමග සිටියවුන්ටත් වුවමනාවූ
දේ සපයාගැනීමට මේ අත්වලින් වැඩකළ
35 බව නුඹලාම දන්නහුය. මෙසේ
වැඩකරමින් නුඹලා දුර්වලයන්ට
උපකාර කටයුතු බවද: ගැනීමට වඩා
දීම ආශීර්වාදයකැයි ස්වාමිවූ යේසුස්-
වහන්සේම කී වචන සිහිකටයුතු බවද
පෙන්වා සියල්ලේදී නුඹලාට ආදර්ශයක්
වූයෙමියි කීවේය.
36 ඔහු මෙසේ කියා දණින් හිඳ ඔවුන්
37 සියල්ලන් සමග යාච්ඤාකෙළේය. ඔවුන්
සියල්ලෝ, තවත් තමාගේ මුහුණ ඔව්හු
නොදක්නෝයයි පාවුල් කී වචනය ගැන
සියල්ලට වඩා කනගාටුවෙමින්,
38 අතිශයෙන් හඬා, ඔහුගේ බෙල්ල
වැළඳගන ඔහු සිඹගත්තෝය. ඔව්හු නැව
ළඟට ඔහු සමග ගියෝය.

## මිලේතසේ සිට තීර්ට ගමන

21 අපි ඔවුන්ගෙන් වෙන්ව නැවෙන්
පිටත්වී කෙලින්ම ගොස්, කෝස්ටද
පසුවද රෝදස්ටද, එතැනින් පතරටද
2 ආවෙමුව. එහිදී පෙනීකියට යන්නාවූ
නැවක් සම්බව එහි නැගී පිටත්වුණෙමුව.
3 අපට කුප්‍රස පෙනුණු විට ඒක වමට
හැර සිරියාවට ගොස්, තීර්හිදී
ගොඩබැස්සෙමුව. මක්නිසාද එහි බඩු
4 ගොඩබාන්ට තිබුණේය. ගෝලයන්
සොයාගෙන එහි සත් දවසක් සිටියෙමුව.
යෙරුසලමට යන්ට එපායයි ඔව්හු
ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන
5 පාවුල්ට කීවේය. නුමුත් ඒ දවස් ගතවූ
විට පිටත්ව අපේ ගමන ගියෙමුව; අප
නුවරින් පිටවන තුරු ඔව්හු සියල්ලෝ
තමුන්ගේ භාර්යාවන් හා දරුවන් සමග
අප කැටුව ආවෝය. අපි වෙරළෙහි
දණින් හිඳ යාච්ඤාකොට, එකිනෙකාට 6
ශුභාචාරකොට, නැවට නැගුණෙමුව,
නුමුත් ඔව්හු තමුන්ගේ නිවාසවලට හැරී
ගියෝය.

## කායිසාරියට ගමන

අපි තීර් සිට වින් අපේ මුහුදු ගමන 7
නිමකොට තොලිමයිසට පැමිණියෙමුව;
එහිදී සහෝදරයන්ට ආචාරකොට ඔවුන්
සමග දවසක් නැවතී සිටියෙමුව.
පසුවද අපි පිටත්ව කායිසාරියට 8
ඇවිත්, සත්දෙනාගෙන් එක්කෙනෙක්වූ
එවැන්ජලිස්ත පිලිප්ගේ ගෙට පැමිණ
ඔහු සමග නැවතී සිටියෙමුව. ප්‍රොපේත 9
වාක්‍ය කියන්නාවූ කන්‍යා දූවරු
සතරදෙනෙක් ඔහුට සිටියෝය. බොහෝ 10
දවස් අප එහි නැවතුණු අතර, අගබස්
නම් එක් අනාගතවක්තෘ කෙනෙක්
යුදයෙන් ඇවිත්, අප වෙතට පැමිණ 11
පාවුල්ගේ ඉඟපටිය රැගෙන තමාගේම
අත්පා බැඳගන: යුදෙව්වරු මේ ඉඟපටිය
අයිතිවූ මනුෂ්‍යයා යෙරුසලමේදී මේ
ආකාරයෙන් බැඳ අන්‍යජාතීන්ගේ
අත්වලට පාවාදෙන්නෝයයි ශුද්ධාත්ම-
යාණන්වහන්සේ කියනසේකැයි කීවේය.
අප මේ දේ ඇසූ කල, අප සහ ඒ 12
ස්ථානයේ වැසියෝ, යෙරුලමට නොයන
ලෙස ඔහුගෙන් උදක්ම ඉල්ලුවෝය. එවිට 13
පාවුල් උත්තරදෙමින්: නුඹලා කුමක්
කරනවාද? අඬා මාගේ හිත පළන්නේ
මක්නිසාද? මම යෙරුසලමේදී ස්වාමිවූ
යේසුස්වහන්සේගේ නාමය නිසා බඳිනු
ලබන්ට පමණක් නොව මැරෙන්ටත්
සූදානම්ව සිටිමියි කීවේය. ඔහු එකඟ 14
නුවූකල: ස්වාමීන්වහන්සේගේ කැමැත්ත
වේවයි කියමින් අපි නැවතුණෙමුව.

## යෙරුසලමට පැමිණීම

ඒ දවස්වලට පසු අපි බඩු- 15
බාහිරාදිය රැගෙන යෙරුසලමට ගියෙමුව.
ගෝලයන්ගෙන් සමහරෙක්ද කායිසාරී- 16
යෙන් අප සමග ඇවිත්, බොහෝ

කලක පටන් ගෝලයෙක්ව සිටියාවූ
මිනාසොන් නම්වූ කුප්‍රසේ කෙනෙකු
වෙත නවාතැන්ගන්ට අප කැඳවාගෙන
ගියෝය.

## සභාවේ වැඩිමහල්ලන් විසින් පිළිගැනීම. ඔවුන්ගේ අවවාදය පිට ප්‍රේරිත තැන බාරයක් වීම

17 අප යෙරුසලමට ආ කල
සහෝදරයෝ සන්තෝෂයෙන් අප
18 පිළිගත්තෝය. පසුවද පාවුල් අප සමග
යාකොබ් වෙතට ගියේය; සියලු
19 වැඩිමහල්ලෝද එහි සිටියෝය. ඔහු
ඔවුන්ට ආචාරකොට, තමාගේ
මෙහෙයෙන් දෙවියන්වහන්සේ
අන්‍යජාතීන් අතරෙහි කෙරෙවූවාවූ
කාරණා එකක් එකක් පාසා
20 කියාදුන්නේය. ඔව්හු ඒ අසා
දෙවියන්වහන්සේට ප්‍රශංසාකළෝය;
තවද ඔව්හු ඔහුට කථාකොට:
සහෝදරය, අදහාගත්තවුන් අතරේ
යුදෙව්වරු කොපමණ දහස් ගණන්
සිටිත්ද කියා තුඹට පෙනෙන්නේය; ඔවුන්
සියල්ලෝ ව්‍යවස්ථාව ගැන ජ්වලිතව
21 සිටිති. තුඹ අන්‍යජාතීන් අතරේ සියලු
යුදෙව්වරුන්ට, තමුන්ගේ දරුවන්
චර්මඡේද්‍යකරන්ටවත් නියෝග පවත්-
වන්ටවත් එපාය කියමින් මෝසෙස්
අත්හරින්ට උගන්වනවායයි තුඹ ගැන
22 ඔවුන්ට දැනුම්දී තිබේ. එහෙයින් කුමක්
කටයුතුද? තුඹ ඇවිත් සිටින බව
නිසැකවම ඔවුන් දැනගන්නවා ඇත.
23 එබැවින් අප විසින් තුඹට කියන දේ
කරපන්න. බාරයක් වූණාවූ මනුෂ්‍යයෝ
24 සතරදෙනෙක් අප අතරේ සිටිති; ඔවුන්
රැගෙන තුඹද ඔවුන් සමග පවිත්‍රව,
ඔවුන්ගේ හිස් මුඩුකරන්ට වියදම
දරාපන්න. එවිට තුඹ ගැන තමුන්ට
ආරංචිවූ කාරණාවලින් එකක්වත් සැබෑ
නොවන බවත් තුඹම ව්‍යවස්ථාව
රක්ෂාකරමින් හැසිරෙන බවත්
25 සියල්ලන්ම දැනගන්නවා ඇත. තුමුත්
අදහාගෙන සිටින අන්‍යජාතීන් ගැන නම්,
ඔවුන් රූපවලට පුදනලද දෙයින්ද
ලෙයින්ද බොටුව මිරිකා මැරූ
සතුන්ගෙන්ද වේශ්‍යාකමින්ද වැලකී
සිටින ලෙස අපිම නියම කර ලියා
ඇරියෙමුයයි කීවෝය. එවිට පාවුල් ඒ 26
මනුෂ්‍යයන් රැගෙන, පසුවද ඔවුන් සමග
පවිත්‍රවී දේවමාළිගාවට පැමිණ, ඔවුන්
එකිනෙකා උදෙසා පූජාවක් ඔප්පුකරන
තුරු පවිත්‍රවීමේ දවස් සම්පූර්ණකරන
බව දන්නුවේය.

## මාළිගාවේ කෝලාහලය. පාවුල් අල්ලාගනු ලැබීම

ඒ දවස් සත සම්පූර්ණවෙන්ට ළංවූ 27
කල ආසියාවෙන් ආවාවූ යුදෙව්වරු
දේවමාළිගාවේදී ඔහු දැක, මුළු සමූහයා
කලඹා, ඔහු පිට අත් හෙළා:
ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි, උපකාර-
කරපල්ලා. සෙනඟටද ව්‍යවස්ථාවටද මේ 28
ස්ථානයටද විරුද්ධව සියලු තැන්වල
සියල්ලන්ට උගන්වන්නාවූ මනුෂ්‍යයා
මොහුය. එපමණකුත් නොව ග්‍රීක්වරුන්ද
දේවමාළිගාවට කැඳවාගෙනවිත්, ඔහු
මේ ශුද්ධස්ථානය අපවිත්‍රකෙළේයයි
මොරගසා කීවෝය. මක්නිසාද එපීසියවූ 29
ත්‍රොපිමස් ඔහු සමග නුවර සිටිනවා
ඔවුන් පළමුවෙන් දැක තිබුණු බැවින්,
පාවුල් ඔහු දේවමාළිගාවට කැඳවාගෙන
ගියේයයි ඔව්හු සිතුවෝය. එවිට මුළු 30
නුවර කැලඹී සෙනඟ එකට දුවගන
ඇවිත් පාවුල් අල්ලාගෙන මාළිගාවෙන්
පිටතට ඇද්දෝය. එකෙණෙහිම දොරවල්
වසනලද්දේය. ඔවුන් ඔහු මරන්ට 31
උත්සාහකරමින් සිටින අතර මුළු
යෙරුසලම වියවුල්වියයි හේවා සමූදවේ
අධිපතියාට දන්වනලද්දේය. ඔහු 32
එවේලේම හේවායන්ද සියයකට
මුලාදෑනීන්ද රැගෙන ඔවුන් වෙතට
දිවුවේය. ඔව්හු අධිපතියා සහ හේවායන්
දැක, පාවුල්ට තැළීමෙන් නැවතුණෝය.
එවිට අධිපතියා ළංවී ඔහු අල්ලා, 33
දම්වැල් දෙකකින් බඳින්ට අණකොට:
මොහු කවුද? කුමක් කෙළේදැයි
විචාළේය. එවිට සමූහයා අතරේ 34
සමහරෙක් එකක්ද සමහරෙක් අනිකක්ද

මොරගසා කීවෝය. ඒ කෝලාහලය
නිසා ඇත්ත දැනගන්ට ඔහුට බැරිවී,
ඔහු කොටුවට ගෙනයන්ට අණකෙළේය.
35 පාවුල් එහි තිබුණු පඩිපෙළ පිටට
පැමිණි කල, සමූහයාගේ බලාත්කාරය
නිසා හේවායන් විසින් ඔහු
36 උසුලාගෙනයන්ට සිදුවිය. මක්නිසාද:
ඔහු නැතිකරපන්නැයි ජන සමූහයා
මොරගසමින් පස්සෙන් ගියෝය.
37 පාවුල් කොටුව ඇතුළට ගෙනයනු
ලබද්දී: ඔබට වචනයක් කියන්ට මට
අවසර ඇද්දැයි ඔහු අධිපතියාගෙන්
ඇසුවේය. එවිට ඔහු: නුඹට ග්‍රීක් භාෂාව
38 පුළුවන්ද? එසේ නම් මේ දවස්වලට
පළමුවෙන් කැරලිගස්වා මිනීමරන්නන්
සාරදහසක් වනයට ගෙන ගියාවූ
මිසරයා නුඹ නොවේදැයි ඇසුවේය.
39 නුමුත් පාවුල්: මම නම් කීර්තිමත් නුවරක්
වන කිලිකියේ තාර්සස්හි යුදෙව්වෙක්ය.
සෙනඟට කථාකරන්ට මට අවසරදෙන
40 මෙන් ඔබගෙන් ඉල්ලමියි කීවේය. ඔහු
අවසරදුන් කල, පාවුල් පඩිපෙළ මත්තේ
සිට සෙනඟට අතින් සංඥකෙළේය; මහත්
නිශ්ශබ්දයක්වූ කල ඔහු හෙබ්‍රෙව්
භාෂාවෙන් කථාකරමින්–

## යුදෙව්වන්ට ප්‍රේරිතතැනගේ උත්තරදීමේ කථාව

22 සහෝදරයෙනි, පියවරුනි, මා දැන්
නුඹලාට කියන්නාවූ මාගේ විත්තිය
අසාපල්ලායයි කීවේය.
2 ඔහු හෙබ්‍රෙව් භාෂාවෙන් තමුන්ට
කථාකරන බව ඇසූ විට ඔව්හු වඩාම
නිශ්ශබ්දව සිටියෝය. ඔහු කථාකොට:
3 මම කිලිකියේ තාර්සස්හි උපන්
යුදෙව්වෙක්ය, නුමුත් මේ නුවර වැඩී,
පියවරුන්ගේ ව්‍යවස්ථාවේ නියම
පිළිවෙළේ හැටියට ගමාලියෙල්ගේ පාද
මූලයෙහි උගන්වනු ලැබ, අද නුඹලා
සියල්ලන් සිටින්නාක්මෙන් මමත්
දෙවියන්වහන්සේ ගැන ජ්වලිතව
4 සිටියෙමි. පුරුෂයන්ද ස්ත්‍රීන්ද බැඳ
හිරගෙවලට භාරදෙමින්, මරණය දක්වා
5 මේ ලබ්ධි මාර්ගයට පීඩාකෙළෙමි. ඒ
ගැන උත්තම පූජකයාද වැඩිමහල්ලන්ගේ
මුළු සභාවද මට සාක්ෂි දරති.
ඔවුන්ගෙනුත් සහෝදරයන්ට ලියුම්
ලබාගෙන, දමස්කයේ සිටි අයටත්
දඬුවම්කරන පිණිස ඔවුන් බැඳ
යෙරුසලමට ගෙනෙන්ට එතැනට
ගමන්කෙළෙමි. තවද මා ගමන්කරමින් 6
දමස්කයට ළංවූ කල, ඉරමුදුන් වේලාව
පමණේදී හදිසියෙන් අහසින් මහත්
ආලෝකයක් මා වටකර බැබළුණේය.
මම බිම වැටුණෙමි. එවිට: සාවුල්, සාවුල්, 7
නුඹ මට පීඩාකරන්නේ මක්නිසාදැයි
මට කියන හඬක් ඇසුණේය. මම 8
උත්තරදෙමින්: ස්වාමීනි, ඔබ කවුදැයි
ඇසුවෙමි. උන්වහන්සේද: මම නම් නුඹ
පීඩාකරන්නාවූ නාසරීය යේසුස්යයි මට
කීසේක. මා සමග සිටි අය ආලෝකය 9
දුටුවෝය, නුමුත් මට කථාකළ තැනන්-
වහන්සේගේ හඬ ඔවුන්ට ඇසුණේ නැත.
මමද: ස්වාමීනි, මම මක්කරම්දැයි ඇසුවෙමි. 10
ස්වාමීන්වහන්සේ මට කථාකොට:
නැගිට දමස්කයට පලයන්න; නුඹ විසින්
කරන්ට නියමකර තිබෙන සියල්ල එහිදී
නුඹට කියනු ලැබේයයි කීසේක. ඒ 11
ආලෝකයේ තේජස නිසා මාගේ ඇස්
නොපෙනී ගිය කල, මා සමග සිටියවුන්
විසින් මාගේ අත අල්ලා ගෙනයනු ලැබ,
දමස්කයට පැමිණියෙමි. එවිට ව්‍යවස්ථාව 12
ප්‍රකාරයට භක්තිවන්තවූ, එහි වසන සියලු
යුදෙව්වරුන් විසින් යහපත් කෙනෙකැයි
කියනලද්දවූ අනනියස් නම් මනුෂ්‍යයෙක් 13
මා වෙත ඇවිත් මා ළඟ සිට: සහෝදරවූ
සාවුල්, පෙනීම ලබාපන්නැයි මට කීවේය.
මමද ඒ පැයේදීම ඔහු දෙස බැලීමි. ඔහු 14
කථාකොට: අපේ පියවරුන්ගේ දෙවියන්-
වහන්සේ, තමන්වහන්සේගේ කැමැත්ත
දැනගන්ටත් ධර්මිෂ්ඨ තැනන්වහන්සේව
දකින්ටත් උන්වහන්සේගේ මුඛයෙන්
හඬක් අසන්ටත් නුඹව නියමකළසේක.
මක්නිසාද නුඹ ඇසූ දුටු දේ ගැන සියලු 15
මනුෂ්‍යයන්ට නුඹ උන්වහන්සේ උදෙසා
සාක්ෂිකාරයෙක් වන්නෙහිය. ඉදින් 16
ප්‍රමාදවෙන්නේ මක්නිසාද? නැගිට
උන්වහන්සේගේ නාමයට යාච්ඤකරමින්,

*බව්තීස්මය ලැබ, නුඹේ පව් සෝද
17 දමාපන්නැයි කීවේය. තවද මම
යෙරුසලමට නැවත ඇවිත් දේව-
මාළිගාවෙහි යාච්ඤාකරමින් සිටියදී
18 මූර්ඡා වුණෙමි. එවිට උන්වහන්සේ මට
දර්ශනයවී: නුඹ ප්‍රමාද නොවී ඉක්මනින්
යෙරුසලමෙන් පලයන්න. මක්නිසාද මා
ගැන නුඹේ සාක්ෂිය ඔව්හු පිළි
19 නොගන්නෝයයි මට කීසේක. එකල
මම කථාකොට: ස්වාමිනි, ඔබ කෙරෙහි
ඇදහූවන් මා විසින් හිරගෙවල දමා,
සියලු සිනගෝගවලදී ඔවුන්ට තැළූ බව
20 ඔව්හුම දනිති. ඔබගේ සාක්ෂිකාරවූ
ස්තේපන්ගේ ලේ වැගිරෙවූ කල මමත්
ළඟ සිට, ඊට එකඟවෙමින්, ඔහු
මැරූවන්ගේ වස්ත්‍ර ප්‍රවේසම්කෙළෙමියි
21 කීවෙමි. එවිට උන්වහන්සේ මට කථා-
කොට: පිටත්වෙයන්න. මක්නිසාද මම
නුඹ මෙයින් බොහෝ ඈතට අන්‍ය-
ජාතීන් වෙතට යවන්නෙමියි කීසේකැයි
කීවේය.

## රෝම නාගරිකයෙකු වීමේ වාසිය කියා සිටීම

22 ඔව්හු මේ වචනය දක්වා ඔහුට
ඇහුම්කන්දුන්නෝය; එවිට ඔව්හු
ශබ්දනගා: මෙබඳු මනුෂ්‍යයා
පොළොවෙන් අහක්කරන්න. මක්නිසාද
මොහු ජීවත්වෙන්ට යුතු නැතැයි කීවෝය.
23 ඔවුන් මොරගසමින්, තමුන්ගේ උතුරුසළු
24 ගළවා වීසිකරමින්, ධූලි ඉහළට
දමමින් සිටි බැවින්, අධිපතියා ඔහු
කොටුවට ගෙනයන්ට අණ කොට
මොන කාරණයක් නිසා ඔව්හු ඔහුට
විරුද්ධව එසේ මොරගැසුවෝදැයි
දනගන්නා පිණිස ඔහුට කසෙන් තළා
25 විභාගකරන්ට නියමකෙළේය. නුමුත්
ඔවුන් පටිවලින් ඔහුව බැන්ද විට පාවුල්
කථාකොට: රෝමයෙක්වූ මනුෂ්‍යයෙකු
විනිශ්චය නොකොට ඔහුට කසෙන්
තළන්ට නුඹලාට අවසර තිබේදැයි ළඟ
සිටියාවූ සියයකට මූලාදැනියාට කීවේය.
26 සියයකට මූලාදැනියා ඒ අසා අධිපතියා
ළඟට ගොස්: ඔබ මක්කරන්ට යනවාද?
මේ මනුෂ්‍යයා රෝමයෙකැයි කීවේය.
එවිට අධිපතියා ඇවිත්: නුඹ 27
රෝමයෙක්ද කියා මට කියාපන්නැයි
ඔහුට කීවේය. එසේයයි ඔහු කීවේය. 28
අධිපතියා උත්තරදෙමින්: මම බොහෝ
මිල දී මේ නාගරිකත්වය ලබාගතිමියි
කීවේය; පාවුල්ද: මම රෝමයෙක්ව
උපන්නෙමියි කීවේය. එබැවින් ඔහු 29
විභාගකරන්ට සිටි අය එවලේම ඔහු
වෙතින් අහක්ව ගියෝය. ඔහු රෝමයෙක්
බව දනගත් කල ඔහු බැන්ද බැවින්
අධිපතියාද භයවූයේය.

## යුදෙව් මන්ත්‍රී සභාව ඉදිරිපිට සිටීම

පසුවද, හෙතෙම යුදෙව්වරු මොන 30
කාරණයක් ගැන ඔහුට වැරදි තබත්-
දැයි හරියාකාර දනගන්ට කැමතිව, ඔහු
මුද, නායක පූජකයන්ට සහ මුළු
මන්ත්‍රණ සභාවට රැස්වෙන්ට අණකොට,
පාවුල් ගෙනැවිත් ඔවුන් ඉදිරියෙහි
සිටෙවුවේය.

23 පාවුල් ඉතා ඕනෑකමින් සභාව
දෙස ඇස් හෙළා: සහෝදරයෙනි,
මම අද දක්වා දෙවියන්වහන්සේ
ඉදිරියෙහි සියලු ආකාර යහපත්
හෘදයසාක්ෂියක් ඇතුව හැසුරුණෙමියි
කීවේය. එවිට උත්තම පූජකවූ අනනියස් 2
ඔහුගේ කටට ගසන ලෙස ළඟ
සිටියවුන්ට අණකෙළේය. එවිට පාවුල්: 3
සුදුකළ බිත්තියක් බඳුවූ නුඹට
දෙවියන්වහන්සේ ගසනසේක. ව්‍යවස්ථාව
ලෙස මා විනිශ්චයකරන්ට ඉඳගතම
ව්‍යවස්ථාවට විරුද්ධව මට ගසන්ට
අණකෙරෙහිදැයි කීවේය. එවිට ළඟ සිටි 4
අය: නුඹ දෙවියන්වහන්සේගේ උත්තම
පූජකයාට නින්දකරනවාදැයි කීවෝය.
පාවුල්ද: සහෝදරයෙනි, ඔහු උත්තම 5
පූජකයා බව මම නොදන සිටියෙමි.
මක්නිසාද—නුඹේ සෙනඟගේ අධිපතියෙකු
ගැන අගුණ නොකියන්නැයි ලියා
තිබේයයි කීවේය. එහෙත් පාවුල් 6
සෙනඟගෙන් එක් කොටසක් සද්දුසිවරුද

*අවගාහනය.

අනික් කොටස එරිසිවරුද බව දැක
සභාවෙහි මොරගසා: සහෝදරයෙනි,
මම එරිසියෙක්මි, එරිසිවරුන්ගේ
පුත්‍රයෙක්මි. මළවුන්ගේ බලාපොරොත්තු-
වද නැවත–නැගිටීමද ගැන විචාරනු
7 ලබම්යි කීවේය. ඔහු මෙසේ කී කල
එරිසිවරුන් හා සද්දුසිවරුන් අතරේ
භේදයක් හටගත්තේය. රැස්වූ අය
8 බෙදුණෝය. මක්නිසාද සද්දුසිවරු
නැවත-නැගිටීමක්වත් දේවදූතයෙක්වත්
ආත්මයක්වත් නැතැයි කියති. නුමුත්
9 එරිසිවරු දෙකම ඇතැයි කියති. එකල
මහත් මොරගැසීමක් විය. එරිසිවරුන්ගේ
පක්ෂයේ ලියන්නන්ගෙන් සමහරෙක්
නැගිට විවාදකොට: මේ මනුෂ්‍යයා අත
කිසි නපුරක් අපට නොපෙනේ. ඉදින්
ආත්මයක්වත් දේවදූතයෙක්වත් මොහුට
කථාකෙළේනම් කිමෙක්දැයි කීවෝය.
10 නුමුත් මහත් භේදයක් හටගත් කල ඔවුන්
විසින් පාවුල් කැබෙලිකොට ඉරාදමනවා
ඇත කියා අධිපතියා භයව, භේවායන්ට
කථාකොට, ඔවුන්ගෙන් ඔහුව පැහැර-
ගෙන කොටුවට ගෙනයන්ට අණ-
කෙළේය.
11 එදා රාත්‍රියේ ස්වාමීන්වහන්සේ ඔහු ළඟ
සිට: ධෛර්ය ඇතුව සිටපන්න. නුඹ
විසින් යෙරුසලමේදී මා ගැන සාක්ෂිදුන්
සේම රෝමයේදීත් සාක්ෂි දෙන්ට
ඕනැයයි කීසේක.

## ප්‍රේරිත නැනට විරුද්ධව කළ යුදෙව් කුමන්ත්‍රණය නිෂ්ඵලවීම

12 පහන්වූ කල යුදෙව්වරු සමාගමක් වී
පාවුල් මරන තුරු කන්නේවත්
බොන්නේවත් නැත කියා දිවුරුමකින්
13 බැඳුණෝය. මේ කුමන්ත්‍රණය කළාවූ
අය සතළිස් දෙනෙකුට වැඩිව සිටියෝය.
14 ඔව්හු නායක පූජකයන්ද වැඩිමහල්ලන්ද
ළඟට ගොස්: පාවුල් මරන තුරු අපි
කිසි කෑමක රස නොබලන්ට මහත්
15 දිවිරිල්ලකින් අපම බැඳගතිමුව. එබැවින්,
නුඹලා ඔහුගේ කාරණා ගැන වඩා
හරිලෙස විභාගකරන්ට යනවා වාගේ,
හෙට නුඹලා ළඟට ඔහු ගෙනෙන ලෙස
සභාව සමග අධිපතියාට දන්වා
ඇරපල්ලා. ඔහු මෙහාට ළංවෙන්ට
පළමුවෙන් අපි ඔහු මරන්ට සූදානම්ව
සිටිමුයයි කීවෝය. ඒ ඔවුන්ගේ රැකසිටීම 16
ගැන පාවුල්ගේ සහෝදරීගේ පුත්‍රයා අසා
ඇවිත්, කොටුවට ඇතුල්වී, පාවුල්ට
දැනුම්දුන්නේය. එවිට පාවුල් සියයකට 17
මුලාදෑනීන්ගෙන් එක්කෙනෙකු කැඳවා:
මේ යෞවනයා ප්‍රධාන සේනාපතියා
ළඟට ගෙනියාපන්න. ඔහුට කාරණයක්
දන්වන්ට තිබේයයි කීවේය. එසේ ඔහු 18
අධිපතියා ළඟට ඔහුව ගෙනගොස්:
හිරකාරවූ පාවුල් මා කැඳවා, ඔබට
දන්වන්ට කාරණයක් ඇත්තාවූ මේ
යෞවනයා ඔබ වෙතට ගෙනෙන්ට
මාගෙන් ඉල්ලුවේයයි කීවේය. එකල 19
අධිපතියා ඔහුගේ අත අල්ලා අහකට
ගෙන ගොස්: මට දන්වන්ට නුඹට
තිබෙන කාරණය මොකදැයි ඇසුවේය.
ඔහු කථාකොට: පාවුල් ගැන ඔබ වඩා 20
හරි ලෙස විභාගකරන්ට යනවා වාගේ
ඔහු හෙට සභාවට ගෙනෙන ලෙස
යුදෙව්වරු ඔබගෙන් ඉල්ලන්ට නියමකර
ගත්තෝය. නුමුත් ඔවුන්ගේ කැමැත්තට 21
ඉඩ නුදුන මැනවි. මක්නිසාද ඔවුන්ගෙන්
හතළිහකට වැඩි දෙනෙක් ඔහු මරන
තුරු කන්නේවත් බොන්නේවත් නැත
කියා දිවිරිල්ලකින් තමුන්ම බැඳගෙන
රැකසිටිති. දැන් ඔව්හු සූදානම්ව ඔබගේ
පොරොන්දුව බලා සිටිතියි කීවේය.
එවිට අධිපතියා: නුඹ මේ දේවල් මට 22
දැන්නූ බව කාටවත් කියන්ට එපායයි
අණකොට යෞවනයා යන්ට හැරියේය.

## මුර ඇතුව කායිසාරියට යවනු ලැබීම

එවිට ඔහු සියයකට මුලාදෑනීන් 23
දෙදෙනෙකුට අඬගසා: කායිසාරීය දක්වා
යන පිණිස භේවායන් දෙසියයක්ද
අසරුවන් සැත්තෑවක්ද හෙල්ල දරන්නන්
දෙසියයක්ද රාත්‍රියේ තුන්වෙනි පැයට
සූදානම්කරපල්ලායයි කීවේය. පීලික්ස් නම් 24
ආණ්ඩුකාරයා ළඟට ප්‍රවේසමෙන් පාවුල්
නංවාගන යන පිණිස මෘගයන් සපයා
තබන්ටද අණකෙළේය. තවද ඔහු මෙසේ 25
ලියුමක් ලියුවේය:

26 ක්ලෞදියස් ලිසියස් විසින් අතිඋත්තමවූ
පීලික්ස් නම් ආණ්ඩුකාරයාණන්ට
ශුභසිද්ධවේවයි ලියා එවන වග නම්–
27 යුදෙව්වරුන් විසින් මේ මනුෂ්‍යයා අල්ලා
මරන්ට සාදන කල, ඔහු රෝමයෙකු
බව මම දැනගෙන, භේවායන් සමග ගොස්
28 ඔහු ගළවාගතිමි. ඔවුන් ඔහුට තබන
වරද මම දැනගන්ට කැමතිව, ඔවුන්ගේ
29 සභාවට ඔහු ගෙනගියෙමි. එවිට ඔවුන්ගේ
ව්‍යවස්ථාවේ ප්‍රශ්න ගැන ඔහුට
වැරදි තබන බව මිස මරණයටවත්
බැඳුම්වලටවත් සුදුසු යම් දෝෂයක් ඔහු
30 පිට නොතබන බව දැනගතිමි. නුමුත් ඒ
මනුෂ්‍යයාට විරුද්ධව උපායක් යොදන්ට
යන බව මට දන්වන්ට යෙදුණු බැවින්
එවේලේම ඔහු ඔබ වෙතට එවා, ඔහුට
විරුද්ධව තිබෙන දේවල් ඔබ ඉදිරියේ
කියන්ට වරද තබන්නන්ට අණකෙළෙම්
යනුයි.
31 මෙසේ භේවායන්ට අණකළ ප්‍රකාරයට
ඔව්හු පාවුල් රැගෙන රාත්‍රියෙහි
32 අන්තිපත්‍රිසට ගියෝය. පසුවද අසරුවන්
ඔහු සමග යන්ට හැර, ඔව්හු කොටුවට
33 හැරී ආවෝය. අසරුවෝ කායිසාරියට
ඇවිත් ආණ්ඩුකාරයාට ලියුම භාරදී
පාවුල්ද ඔහු ඉදිරියෙහි සිටෙවුවෝය.
34 එවිට ඔහු ඒ ලියුම කියවා, ඔහු කොයි
පළාතේ කෙනෙක්ද කියා අසා, කිලිකියේ
කෙනෙකු බව දැනගත් විට: තුඹට වැරදි
තබන්නන් ආවාම තුඹේ මුළු කාරණය
විභාගකරන්නෙමියි කියා, හෙරොද්ගේ
මාළිගාවෙහි ඔහු රැකවල් කරන්ට
අණකෙළේය.

## ප්‍රේරිත තැන අධිපතිවූ පීලික්ස් ඉදිරියේදී උත්තරදීම

24 පස් දවසකට පසු උත්තම පූජකවූ
අනනියස් සමහර වැඩිමහල්ලන්ද
තෙර්තුලස් නම් එක්තරා ව්‍යක්තයෙක්ද
සමග බැස ඇවිත් පාවුල්ට විරුද්ධව
2 ආණ්ඩුකාරයාට පැමිණිලි කෙළේය. ඔහු
කැඳවනු ලැබූ කල, තෙර්තුලස් ඔහුට
වරද තබන්ට පටන්ගෙන කථාකරමින්:
අති උත්තමවූ පීලික්ස්නි, ඔබ
කරණකොටගෙන අප බොහෝ
සමාදනය භුක්තිවිඳින බවද, ඔබගේ
පාලනයෙන් මේ ජාතිය උදෙසා
දුර්භාග්‍ය දේවල් පහකරන්ට යෙදුණ
බවද, සැම විටම සැම තැන්වලදීම 3
සියලු ආකාර ස්තුතිවන්තකමෙන් අපි
ඒත්තුගනිමුව. නුමුත් මම වඩා ඔබට 4
වෙහෙස නොකරන පිණිස ලුහුඬෙන්
අප කියන දේ ඔබගේ කරුණාවෙන්
අසන ලෙස අයැදිමි. මක්නිසාද මේ 5
මනුෂ්‍යයා දුර්ජනයෙක් බවද ලෝකයේ
සියලු යුදෙව්වරුන් අතරෙහි කැරලි
උපදවන්නෙක් බවද නාසරීයයන්ගේ
ලබ්ධියේ මූලිකයෙක් බවද දැනගතිමුව,
මොහු දේවමාළිගාව අපවිත්‍ර කරන්ටත් 6
හැදුවේය. අපි ඔහු අල්ලාගතිමුව.* යමක් 8
ගැන අපි මොහුට වරද තබමුද ඒ
සියල්ල මොහුගෙන්ම විචාරා දැනගන්ට
ඔබට පුළුවනැයි කීවේය. යුදෙව්වරුද 9
ඒ කාරණා එසේමයයි කියමින්
පැමිණිල්ලට එකඟවූවෝය.
පාවුල්ට කථාකරන්ට ආණ්ඩුකාරයා 10
සංඥාකළ කල්හි ඔහු උත්තරදෙමින්:
ඔබ බොහෝ අවුරුදු ගණනක් මේ
ජාතියට විනිශ්චයකාරයෙක්ව සිටින බව
මම දන්න නිසා සතුටින් මාගේ
කාරණය ගැන උත්තරදෙමි. නමස්කාර 11
කරන පිණිස මා යෙරුසලමට ගොස්
දැනට දෙළොස් දවසකට වඩා නැති
බව ඔබට දැනගන්ට පුළුවන.
දේවමාළිගාවේදීවත් සිනගෝගවලදීවත් 12
නුවරදීවත් කිසිකෙනෙකු සමග මා
වාදකරනවා හෝ සමූහයන් කළඹනවා
ඔව්හු නුදුටුවෝය. ඔවුන් දැන් මා 13
කෙරෙහි තබන වරද ඔබට

*සමහර පුරාණ පිටපත්වල වැඩිදුර
මෙසේ පෙනේ: අප විසින් අපේ
ව්‍යවස්ථාව පරිද්දෙන් ඔහු විනිශ්චය
කරන්ට කැමතිවුණ නුමුත්, අධිපතියාවූ 7
ලිසියස් ඇවිත් මහත් බලාත්කාරයෙන්
අපේ අත්වලින් ඔහු උදුරාගන ගොස්, 8
ඔහුට වරද තබන්නන්ට ඔබ වෙතට
එන්ට අණකෙළේය.

14 ඔප්පුකරන්ටත් ඔවුන්ට බැරිය. නුමුත්
මේක ඔබ ඉදිරියෙහි ඒත්තුගනිමි: එනම්,
ලබ්ධියක්යයි කියා ඔවුන් කියන්නාවූ
මාර්ගය ලෙස මම අපේ පියවරුන්ගේ
දෙවියන්වහන්සේට සේවයකරමි.
ව්‍යවස්ථාවේද අනාගතවාක්‍යවලද ලියා
තිබෙන සියල්ලත් විශ්වාස කරමි.
15 ධර්මිෂ්ඨයන්ගේද අධර්මිෂ්ඨයන්ගේද
නැවත-නැගිටීමක් වන්නේයයි මොවුන්
බලා සිටින්නාක්මෙන් මමත් දෙවියන්-
වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙන්
16 යුක්තව සිටිමි. ඒ නිසා මම දෙවියන්-
වහන්සේ කෙරෙහිත් මනුෂ්‍යයන්
කෙරෙහිත් නිදෙස් හෘදයසාක්ෂියක්
ඇතුව සිටින්ටද නිතරම උත්සාහකරමි.
17 ඉතින් අවුරුදු කීපයකට පසු මාගේ
ජාතියට දනවල්ද පූජාද දෙන පිණිස
18 ආවෙමි. ඒ අතරේදී සමූහයක්වත්
කෝලාහලයක්වත් නැතුව, මා දේව-
මාළිගාවෙහි පවිත්‍රකරනු ලැබ සිටිනවා
ඔවුන්ට සම්බවිය. එහෙත් ආසියාවේ
සිට ආවාවූ සමහර යුදෙව්වරු එහි
19 සිටියෝය. මට විරුද්ධව යමක් ඔවුන්ට
තිබුණේ නම්, මට දෝෂාරෝපණයකරන
පිණිස මෙහි ඔබ ඉදිරියට එන්ට ඔවුන්ට
20 යුතුව තිබුණේය. නැතහොත්, මම
මොවුන් අතරේ සිට: අද නුඹලා
ඉදිරියේදී මා විචාරනු ලබන්නේ
මළවුන්ගෙන් නැගිටීම ගැනයයි
21 මොරගසා කී එකම කීම මිස, මා
සභාව ඉදිරියෙහි සිටි කල මා අත
මොන අපරාධයක් මොවුන්ට සම්බ-
වුණාද කියා මොව්හුම කියත්වයි
කීවේය.

## පීලික්ස් නඩුව කල් දැමීම

22 නුමුත් පීලික්ස් ඒ මාර්ගය ගැන කාරණා
වඩා හරිලෙස දන සිටියේ, අධිපතිවූ
ලිසියස් ආ කල නුඹලාගේ කාරණය
තීන්දුකරන්නෙමියි කියා ඔවුන්
23 නැවැත්තුවේය. තවද ඔහු රැකවල්
කරන්ටත් ඔහුට නිදහස දෙන්ටත් ඔහුගේ
මිත්‍රයන්ගෙන් කිසිවෙකු විසින් ඔහුට
උපස්ථානකිරීම තහනම් නොකරන්ටත්
සියයකට මුලාදැනියාට ඔහු අණ-
කෙළේය.
කීප දවසකට පසු පීලික්ස් යුදෙව් 24
ස්ත්‍රියෙක්වූ තමාගේ භාර්යාව වන
දෘසිල්ලා සමග ඇවිත් පාවුල් ගෙන්වා,
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි
ඇත්තාවූ ඇදහිල්ල ගැන ඔහු කථාකරනවා
ඇසුවේය. ඔහු ධර්මිෂ්ඨකමද පමණ 25
දන ක්‍රියාකිරීමද පැමිණෙන්නාවූ
විනිශ්චයද ගැන කථාකරද්දී පීලික්ස්
භයපත්ව: දනට පලයන්න; මට ප්‍රස්තාවක්
ලැබුණාම නුඹට අඩගස්වන්නෙමියි
කීවේය. ඒ ඇර තමාට පාවුල් මුදල් 26
දෙනවා ඇතැයි ඔහු බලාපොරොත්තු
වුණේය. එබැවින් නැවත නැවත ඔහු
කැඳවා ඔහු සමග කථාකෙළේය. නුමුත් 27
දැවුරුද්දක් සම්පූර්ණවූ කල පීලික්ස්ගේ
නිලයට පෝර්කියුස් පෙස්තුස්
පත්කරනලද්දේය; පීලික්ස් වනාහි
යුදෙව්වරුන් සතුටුකරනු කැමතිව පාවුල්
නිදහස් නොකර ගියේය.

## පාවුල් ප්‍රේරිතතැන පෙස්තුස් ඉදිරිපිට සිටීම සහ කායිසර් අගරජුගේ විනිශ්චය ඉල්ලාසිටීම

25
මෙසේ පෙස්තුස් තෙමේ ඒ පළාතට
පැමිණි කල තුන් දවසකට පසු
කායිසාරියේ සිට යෙරුසලමට ගියේය.
නායක පූජකයෝද යුදෙව්වරුන්ගේ 2
ප්‍රධානීහුද පාවුල්ට විරුද්ධව පෙස්තුස්ට
දනුම්දී, ඔවුන්ට කරුණාවක් වශයෙන් 3
ඔහු යෙරුසලමට යවන ලෙස
පෙස්තුස්ගෙන් ඉල්ලුවෝය. එසේ කළේ
ඔවුන් මාර්ගයේ රැකසිට ඔහුව මරන
පිණිසය. නුමුත් පෙස්තුස් උත්තරදෙමින්: 4
පාවුල් කායිසාරියෙහි හිරබාරේ සිටින
බවත් තමාද ඉක්මනින් එහි යන්ට ඉන්න
බවත් කීවේය. එහෙයින් නුඹලා අතරෙහි 5
වැදගත් අය මා සමග ගොස් ඒ මනුෂ්‍යයා
අත යම් දෝෂයක් ඇත්නම් ඔහුට වරද
තබත්වයි කීවේය.
ඔහු ඔවුන් අතරෙහි දවස් අටකට 6
නොහොත් දහයකට වඩා ප්‍රමාද
නොවී කායිසාරියට ගොස්, පසුවද

විනිශ්චයාසනයෙහි හිඳ පාවුල්
7 ගෙනෙන්ට අණකෙළේය. ඔහු ආ කල,
යෙරුසලමෙන් ඇවිත් සිටි යුදෙව්වරු
පාවුල් වටකර සිට ඔහුට විරුද්ධව
ඔප්පුකළ නොහැකිවූ බරපතළවූ
8 බොහෝ පැමිණිලි කළෝය. පාවුල්
තමාගේ නිදහසට උත්තරදෙමින්: මම
යුදෙව්වරුන්ගේ ව්‍යවස්ථාවටවත් දේව-
මාළිගාවටවත් කායිසර්ටවත් විරුද්ධව
කිසි වරදක් නොකෙළෙමියි කීවේය.
9 නුමුත් පෙස්තුස් යුදෙව්වරුන්
සතුටුකරනු කැමතිව පාවුල්ට උත්තර-
දෙමින්: නුඹ යෙරුසලමට ගොස් එහිදී
මේ කාරණා ගැන මා ඉදිරියෙහි
විනිශ්චයකරනු ලබන්ට කැමැත්තෙහිදැයි
10 ඇසුවේය. නුමුත් පාවුල්: මම කායිසර්ගේ
විනිශ්චයාසනය ඉදිරියෙහි සිටිමි; මෙහිදී
මා විනිශ්චයකරන්ට යුතුය. යුදෙව්-
වරුන්ට මා විසින් කිසි වරදක් කළේ
නැත, ඒ බව ඔබටත් හොඳකාර
11 පෙනියන්නේය. ඉදින් මම වරදකාරයෙක්
නම්, මරණයට සුදුසු කිසිවක් කෙළෙම්
නම්, මරණය නොලබන ලෙසට
නොඉල්ලමි. නුමුත් මොවුන් මට තබන
වරදවලින් එකක්වත් සැබෑ නොවේ නම්,
මා ඔවුන්ට පාවාදෙන්ට කිසිවෙකුට
බැරිය. මම කායිසර්ගේ විනිශ්චය
12 ඉල්ලමියි කීවේය. එවිට පෙස්තුස්
මන්ත්‍රණ සභාව සමග කථාකොට: නුඹ
කායිසර්ගේ විනිශ්චය ඉල්ලුවෙහිය.
කායිසර් ළඟට යන්නෙහියයි උත්තර-
දුන්නේය.

## අග්‍රිපා සහ බර්නීකි

13 කීප දවසකට පසු අග්‍රිපා රජද
බර්නීකිද කායිසාරියට ඇවිත් පෙස්තුස්ට
14 ආචාරකළෝය. ඔවුන් බොහෝ දවස්
එහි නැවතී සිටියදී පෙස්තුස් පාවුල්ගේ
කාරණය රජුට දන්වමින්: පීලික්ස්
නිදහස් නොකර ගිය එක් හිරකාරයෙක්
15 සිටියි. මා යෙරුසලමට ගිය විට
නායක පූජකයෝද යුදෙව්වරුන්ගේ
වැඩිමහල්ලෝද ඔහු ගැන මට දන්වමින්,
ඔහුට විරුද්ධව විනිශ්චය ඉල්ලුවෝය.
16 මම ඔවුන්ට උත්තරදෙමින්: යම් වරද
තබනු ලැබුවෙකු ඉදිරියට වරද තබන්නන්
ගෙන්වා වරද ගැන උත්තරදීමට ඔහුට
ඉඩදෙන්ට පළමුවෙන් ඔහු පාවාදීම
රෝමයන්ගේ සිරිතක් නොවේයයි කීවෙමි.
එහෙයින් ඔවුන් මෙහි රැස්වූ කල, 17
මම ප්‍රමාදයක් නොකොට පසුවද
විනිශ්චයාසනයෙහි හිඳ ඒ මනුෂ්‍යයා
ගෙනෙන්ට අණකෙළෙමි. වරද තබන්නන් 18
නැඟිට සිටි විට මා සිතූ දේවල් ගැන
කිසි වරදක් නොතබා, තමුන්ගේ ආගම 19
ගැනද ජීවත්ව සිටිනසේකැයි පාවුල් කියා
සිටි යේසුස් නම් මළාවූ කෙනෙකු ගැනද
ඔහුට විරුද්ධව සමහර වාද කාරණා
ඔවුන්ට තිබුණේය. මේ දේවල් ගැන 20
විභාගකරන්නේ කෙසේදැයි වියවුල්වූ මම
එනාහි, ඔහු යෙරුසලමට ගොස් එහිදී
මේ කාරණා ගැන විනිශ්චයකරනු
ලබන්ට කැමතිදැයි ඔහුගෙන් ඇසුවෙමි.
නුමුත් අධිරාජතුමාගේ තීරණයට නඩුව 21
නවත්වාගන්න මෙන් පාවුල් ඉල්ලූ කල,
ඔහු කායිසර් ළඟට යවන තුරු
රැකවල්කර තබන්ට මම අණකෙළෙමියි
කීවේය. එවිට අග්‍රිපා: මමත් ඒ මනුෂ්‍යයා 22
කථාකරනවා අසන්ට කැමැත්තෙමියි
පෙස්තුස්ට කීවේය. හෙට ඔබට අසන්ට
ලැබේයයි ඔහු කීවේය.
එසේ පසුවද අග්‍රිපාද බර්නීකිද මහත් 23
පෙරහැරකින් ඇවිත් ප්‍රධාන සේනාපතීන්
සහ නුවර ප්‍රධාන මනුෂ්‍යයන් සමග
නඩුශාලාවට පැමිණි කල, පෙස්තුස්ගේ
ආඥාවෙන් පාවුල් ගෙන්වන ලද්දේය.
පෙස්තුස් කථාකොට: අග්‍රිපා රජ්ජුරුවනි, 24
මෙහි අප සමග සිටින සියලු
මනුෂ්‍යයෙනි, මොහු තවත් ජීවත්ව සිටින්ට
නොවටනේයයි මොරගසමින් මුළු යුදෙව්
සමූහයා යමෙකු ගැන යෙරුසලමේදීත්
මෙහිදීත් මට පැමිණිලිකළෝද ඒ මනුෂ්‍යයා
මෙහි දක්නහුය. නුමුත් මරණයට සුදුසු 25
කිසිවක් මොහු නොකළ බව මට
පෙනුණේය. ඇරත් මොහුම අධිරාජතුමාගේ
විනිශ්චය ඉල්ලූ බැවින් ඔහු යවන්ට
නියමකෙළෙමි. ඔහු ගැන මාගේ 26
ස්වාමීන්ට ලියා ඇරීමට සත්තකවූ යමක්
මට නැත. එබැවින් මේ විභාගය
කළායින් පසු ලියා ඇරීමට යමක් මට
ලැබෙන පිණිස නුඹලා ඉදිරියටද
ප්‍රධානකොට, අග්‍රිපා රජ්ජුරුවනි, ඔබ

27 ඉදිරියටද ඔහු ගෙනාවෙමි. මක්නිසාද
හිරකාරයාට විරුද්ධව ගෙනා පැමිණිලි
නොදන්වා ඔහු යැවීම අනුචිත දෙයක්
බව මට පෙනේයයි කීවේය.

## අග්‍රිපා රජු ඉදිරිපිටදී ප්‍රේරිත තැන කළ උත්තරදීමේ කථාව

26 එවිට අග්‍රිපා තෙමේ: නුඹ ගැන
උත්තරදෙන්ට නුඹට අවසර
තිබේයයි පාවුල්ට කීවේය. එකල පාවුල්
අත දිගුකොට තමා ගැන මෙසේ
උත්තරදුන්නේය—
2 අග්‍රිපා රජ්ජුරුවනි, යුදෙව්වරුන් විසින්
මට තබන සියලු වැරදි ගැන අද ඔබ
ඉදිරියෙහි උත්තරදෙන්ට මා සිටින
බැවින් මම වාසනාවන්තයෙකැයි සිතමි.
3 ප්‍රධානකොටම එසේ සිතන්නේ
යුදෙව්වරුන් අතරේ පවතින සියලු සිරිත්ද
වාදද ඔබට හොඳකාර තේරෙන නිසාය.
එහෙයින් මාගේ වචන ඉවසිල්ලෙන්
4 අසන ලෙස ඉල්ලමි. යෞවන අවස්ථාවේ
පටන් මාගේ ජාතීන් අතරෙහිද
යෙරුසලමෙහිද මාගේ හැසිරීම මුල
5 පටන් සියලු යුදෙව්වරු දනිති. ඔවුන්
සාක්ෂිදෙන්ට කැමති නම් අපේ ආගමේ
ඉතා දෘඪතර ලබ්ධිය අනුව මා
ඵරිසියෙක්ව ජීවත්වූ බව මුල පටන් මා
6 අඳුනන ඔව්හු දනිති. දෙවියන්වහන්සේ
විසින් අපේ පියවරුන්ට දෙනලද
පොරොන්දුව බලා සිටීම ගැන මම දැන්
7 විනිශ්චයකරනු ලබන්ට සිටිමි. අපගේ
දොළොස් ගෝත්‍රයෝ රෑ දවල් උනන්දුකමින්
දෙවියන්වහන්සේට සේවයකරමින්, ඒ
පොරොන්දුවට පැමිණෙන්ට බලා-
පොරොත්තුව සිටිති. රජ්ජුරුවනි,
යුදෙව්වරුන් මට වරද තබන්නේ මේ
8 බලාපොරොත්තුව ගැනයි. දෙවියන්-
වහන්සේ මළවුන් නැගුටුවනසේක් නම්
එය විශ්වාසකරන්ට බැරි දෙයක්යයි
9 මක්නිසා කල්පනාකරන්නහුද? නාසරීය
යේසුස්වහන්සේගේ නාමයට විරුද්ධව
බොහෝ දේ මා විසින් කටයුතුයයි
10 මමත් සිතුවෙමි. එලෙසම යෙරුසලමේදීත්
කෙළෙමි. නායක පූජකයන්ගෙන් බලය
ලැබ, ශුද්ධවන්තයන්ගෙන් බොහෝ
දෙනෙකු හිරගෙවල දැමුවෙමි, ඔවුන්
මරණයට පත්කරන කල්හි ඊට
කැමැත්තද දුනිමි. තවද සියලු 11
සිනගොගවලදී නොයෙක්විට ඔවුන්ට
දඬුවම්කරමින්, ඔවුන් ලවා අපහාස-
කරවන්ට උත්සාහකෙළෙමි; මම ඔවුන්
ගැන අතිශයෙන් උමතුව සිට, අන්
නුවරවල් දක්වාත් ඔවුන්ට පීඩාකෙළෙමි.
ඒ ගැන නායක පූජකයන්ගෙන් බලයද 12
අවසරද ලැබ, දමස්කයට මා ගමන්-
කරද්දී, රජ්ජුරුවනි, මාර්ගයෙහිදී 13
ඉරමුදුන් වේලෙහි, මාද මා සමග
යන්නාවුන්ද වටකර සූර්ය තේජසට වැඩිවූ
එළියක් බබළනවා දුටිමි. අප සියල්ලෝම 14
බිම වැටුණු කල: සාවුල්, සාවුල්, නුඹ
මට පීඩාකරන්නේ මක්නිසාද? කෙවිටට
පයින් ගැසීම නුඹට අන්තරාදයකයයි
හෙබ්‍රෙව් භාෂාවෙන් මට කියන්නාවූ
ශබ්දයක් ඇසීමි. මමද: ස්වාමිනි, ඔබ 15
කවුදැයි ඇසුවෙමි. ස්වාමීන්වහන්සේද:
මම නම් නුඹ පීඩාකරන යේසුස්ය. නුමුත් 16
නැගිට කෙලින් සිටපන්න. මක්නිසාද
යම් යම් දේ සඳහා නුඹ මා දුටුයෙහිද,
නුඹට ප්‍රකාශවන්නෙමිද, ඒ දේවල් ගැන
නුඹ සේවකයෙක්ද සාක්ෂිකාරයෙක්ද
කොට නියමකරන පිණිස මම නුඹට
පෙනුණෙමි. සෙනඟගෙන්ද අන්‍යජාතීන්- 17
ගෙන්ද නුඹ ගළවන්නෙමි; මා කෙරෙහි
ඇදහීමෙන් ඔවුන් පව්-කමාවද පිරිසිදු
කරනු ලැබූ අයවලුන් අතරෙහි
උරුමයක්ද ලබන පිණිස, ඔවුන් 18
අන්ධකාරයෙන් ආලෝකයටද සාතන්ගේ
බලයෙන් දෙවියන්වහන්සේ වෙතටද
හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්ට
ඔවුන් වෙතට නුඹ යවමියි කීසේක.
එසේහෙයින්, අග්‍රිපා රජ්ජුරුවනි, මම 19
ස්වර්ගීය දර්ශනයට අකීකරු නොවී,
පළමුකොට දමස්කයේද පසුව 20
යෙරුසලමේද යුදා රට මුළුල්ලෙහිද
වසන්නන්ටත්, අන්‍යජාතීන්ටත්, පසු-
තැවිලිව දෙවියන්වහන්සේ වෙතට හැරී,
පසුතැවිල්ලට සුදුසු ක්‍රියාවන් කරන්ට
කියා ප්‍රකාශකෙළෙමි. මේ කාරණය නිසා 21
යුදෙව්වරු දේවමාළිගාවේදී මා අල්ලා
මරන්ට හැදුවෝය. එසේවී නුමුත් 22
දෙවියන්වහන්සේගෙන් වන පිහිට ලැබ,

ලොකු කුඩා අයට සාක්ෂිදෙමින්,
ක්‍රිස්තුස්වහන්සේ දුක්විඳින්ට ඕනෑ බව
සහ පළමුකොට මළවුන්ගෙන් නැගිටීම
කරණකොටගෙන උන්වහන්සේ
සෙනඟටද අන්‍යජාතීන්ටද එළිය ප්‍රකාශ
23 කරනසේකැයි යන අනාගතවක්තෘවරුන්
විසින්ද මෝසෙස් විසින්ද මතු
සිද්ධවන්නේයයි කියනලද කාරණා ගැන
මිස වෙන කිසිවක් නොකියා අද දක්වා
සිටිමියි කීයේය.
24 ඔහු මෙසේ තමා ගැන උත්තරදෙද්දී:
පාවුල්, නුඹට ඔල්මාදය; බොහෝ
උගත්කමෙන් නුඹ ඔල්මාදවී සිටින්-
නෙහියයි පෙස්තුස් මහත් හඬින් කීවේය.
25 නුමුත් පාවුල්: උත්තම පෙස්තුස්නි, මට
ඔල්මාද නැත; මම සත්‍යවූ සිහියට හුරුවූ
26 වචන කියමි. මේ දේවල් රජ්ජුරුවන්ට
තේරෙන්නේය, එබැවින් එතුමාට නිදහස්-
ලෙස කථාකරමි. මක්නිසාද මෙය
මුල්ලකදී නොකළ බැවින් මේ දේවලින්
කිසිවක් එතුමාට සැඟවී නැතැයි
27 විශ්වාසකරමි. අග්‍රිපා රජ්ජුරුවෙනි,
ඔබ අනාගතවක්තෘවරුන් විශ්වාස-
කරන්නෙහිද? විශ්වාසකරන බව මම
28 දනිමියි කීවේය. එවිට අග්‍රිපා කථාකොට:
වැඩි පෙළඹීමක් නැතුවම නුඹ මා
ක්‍රිස්තියානිකාරයෙක් කරන්ට සිතනවායයි
29 පාවුල්ට කීවේය. පාවුල් කථාකොට:
ඔබ පමණක් නොව අද මාගේ වචන
අසන සියල්ලන්ද, වැඩියෙන් හෝ
අඩුවෙන් හෝ, මේ බැඳුම් හැර මා
වාගේ වෙන ලෙස දෙවියන්වහන්සේට
යාච්ඤාකරමියි කීවේය.
30 එවිට රජද ආණ්ඩුකාරයාද බර්නීකිද
ඔවුන් සමග උන් තැනැත්තෝද නැගිට,
31 ඉවතට ගොස්: මේ මනුෂ්‍යයා
මරණයටවත් බැඳුම්වලටවත් සුදුසු
කිසිදෙයක් කරනවා නොවේයයි
32 ඔවුනොවුන් කථාකරගත්තෝය. අග්‍රිපා
පෙස්තුස්ට කථාකොට: මේ මනුෂ්‍යයා
කායිසර්ගේ විනිශ්චය නොඉල්ලුවා නම්
ඔහුව මුදහරින්ට පුළුවන්ව තිබුණේයයි
කීවේය.

## රෝමයට නැවෙන් ගමන්ගැනීම

27
ඉතාලියට නැව් නැගී යන්ට අපට
නියමකරනු ලැබූ කල්හි පාවුල්ද
වෙනත් සමහර හිරකාරයෝද
අගොස්තීනු කණ්ඩායමට අයිතිවූ
ජූලියස් නම් සියයකට මුලාදෑනියෙකුට
භාරදෙනලද්දෝය. අපි ආසියාවේ 2
මුහුදුබඩ ස්ථානවලට යාත්‍රාකරන්ට
තිබුණු අද්‍රාමුත්තියේ නැවකට නැගී
පිටත්වුණෙමුව; තෙසලෝනිකයේ
මකිදෝනියයෙක්වූ අරිස්තාර්කස් අප
සමග සිටියේය. පසුවද සීදොන්ට 3
පැමිණියෙමුව. ජූලියස් පාවුල්ට මිත්‍රකම්
පෙන්වමින්, ඔහුගේ මිත්‍රයන් ළඟට යන්ටද
පහසු ලබන්ටද ඔහුට ඉඩ ඇරියේය.
එතැනින් පිටත්වී, හුළඟ විරුද්ධව තිබුණු 4
බැවින් කුප්‍රසේ මුවාවෙන් යාත්‍රාකර
ගියෙමුව. කිලිකිය සහ පම්පිලිය ළඟ 5
මුහුද මැදින් යාත්‍රාකර, මුරා නම්
ලුකියේ නුවරකට පැමිණියෙමුව. එහිදී 6
සියයකට මුලාදෑනියා ඉතාලියට යන
අලෙක්සන්ද්‍රියාවේ නැවක් දැක අප එහි
නැංගෙවුවේය. හුළඟ අප වැලකූ බැවින් 7
බොහෝ දවසක්ම හෙමින් යාත්‍රාකර,
කනීදස ඉදිරියට අමාරුවෙන් පැමිණ,
ක්‍රීතයේ මුවාවෙන් සල්මොන ඉදිරියට
ඇවිත්, අමාරුවෙන් ඒක පසුකොට 8
ලසේය නුවරට සමීපවූ සුන්දර වරාය
නම් ස්ථානයකට පැමිණියෙමුව.

## මෙලීතය. කුණාටුව සහ නැව බිඳීයාම

බොහෝ කල් ගතවී උපවාසය පසුවූ 9
බැවින් මුහුදේ ගමන අන්තරාය සහිත
වූයෙන්, පාවුල් ඔවුන්ට දැනමුතුකම්
දෙමින්: මනුෂ්‍යයෙනි, මේ ගමන බඩුවලට 10
සහ නැවට පමණක් නොව අපේ
ජීවිතවලටත් අන්තරාය සහ බොහෝ
අලාභත් පමුණුවන එකක් බව මට
පෙනේයයි කීවේය. නුමුත් සියයකට 11
මුලාදෑනියා පාවුල් කී දේවලට වඩා
නැව්පතියාගේද නැව අයිතිකාරයාගේද
කීම සැලකුවේය. ශීත කාලයේ නැවතී 12
සිටීමට ඒ වරාය හොඳ නැති බැවින්,

එතැනින් පිටත්වී පුළුවන් නම් ඊශානටත්
ගිනිකොණටත් ඉදිරියෙහි තිබෙන්නාවූ
ක්‍රීතයේ වරායක්වූ පෙනීකියට පැමිණ
එහි ශීත කාලය ගතකරන්ට යන ලෙස
13 වැඩිදෙනා දැනමුතුකම් දුන්නෝය. දකුණු
හුළඟ හීන්සැරේ ගැසූ කල, ඔව්හු,
තමුන්ගේ අදහස ඉෂ්ටවුණේයයි සිතා,
නැංගුරම් ඔසවා ක්‍රීතයේ වෙරළ අසලින්ම
14 ගියෝය. නුමුත් මඳ වේලාවකින්
එව්රකුලොන් නම් කුණාටු-හුළඟක්
15 එතැනින් හැමුවේය. නැව ඊට අසුවී හුළඟ
ඉදිරියට යන්ට බැරිවූ බැවින්, හුළඟට
16 ගහගන යන්ට ඉඩ හැරියෙමුව. තවද
ක්ලෞද කියන සුළු දිවයිනක මුවාවට
දුවගොස් අමාරුවෙන් ඔරුව ගත්තෙමුව.
17 ඔව්හු ඒක ඔසවාගත් විට ආධාර කඹ
නැව යටින් දමා බැන්දෝය; සොරවැල්ලේ
වැටේය යන භයින් ඔව්හු කුඹ දව
18 බා, එසේ ගෙනයනු ලැබුවෝය. තද
කුණාටුවට අසුවී සිටි බැවින් පසුවද
ඔව්හු නැව සැහැල්ලුකරන්ට පටන්-
19 ගත්තෝය; තුන්වෙනිද තමුන්ගේම
අත්වලින් නැවේ උපකරන වීසිකළෝය.
20 බොහෝ දවස් ඉරවත් තාරකාවත්
නොපෙනුණ බැවින්ද තද කුණාටුවක්
පැවතුණු බැවින්ද අපේ ගැළවිල්ල ගැන
තිබුණු සියලු බලාපොරොත්තු එතැන්
21 පටන් නැතිවී ගියේය. කෑමෙන් අප
බොහෝසෙයින් වැලකී සිටියාට පසු
පාවුල් ඔවුන් මැද සිට: මනුෂ්‍යයෙනි,
මේ අන්තරාය සහ අලාභයත්
නොපැමිණෙන පිණිස ක්‍රීතයෙන්
පිටත් නොවන්ට මා කී වචනයට
22 ඇහුම්කන්දෙන්ට යුතුව තිබුණේය. දැන්
ඉතින් ධෛර්යවත්ව සිටින ලෙස
නුඹලාට අවවාදකරමි. මක්නිසාද නැව
මිසක් නුඹලා අතරේ ජීවිත නැතිවීමක්
23 නොවන්නේය. කුමක්හෙයින්ද මා අයිතිවූ,
මා සේවයකරන්නාවූ දෙවියන්-
වහන්සේගේ දූතයෙක් මේ රාත්‍රියේ මා
24 ළඟ සිට: පාවුල් භය නොවන්න; නුඹ
කායිසර් ඉදිරියෙහි සිටින්ට ඕනැය.
බලව, නුඹ සමග නැවෙන් යන්නාවූ
සියල්ලන්ද දෙවියන්වහන්සේ නුඹට
25 දුන්සේකැයි කීවේය. එබැවින්,
මනුෂ්‍යයෙනි, ධෛර්ය ඇතුව සිටපල්ලා.

මක්නිසාද මම දෙවියන්වහන්සේව
විශ්වාසකරමි, මට කියන්ට යෙදුණු
ප්‍රකාරයටම සිද්ධවන්නේයයි විශ්වාස-
කරමි. එසේ වුවත් අප එක් දිවයිනකට 26
වැටෙන්ට ඕනැයයි කීවේය.
දසසතරවෙනි රාත්‍රිය පැමිණ අප අද්‍රිය 27
මුහුදේ ඔබ මොබ ගෙනයනු ලබන
කල, මධ්‍යම රාත්‍රිය පමණේදී
නැව්කාරයෝ, අප ගොඩකට
ළංවෙනවායයි සිතා, ගැඹුර බලා විසි 28
බඹයක් බව දැනගත්තෝය. තව ටිකක්
ඈතට ගොස් නැවතත් ගැඹුර බලා,
පසළොස් බඹයක් බව දැනගත්තෝය.
එකල අප ගල් ඉඩම්වල වැටේය යන 29
භයින් ඔව්හු අවරෙන් නැංගුරම් හතරක්
දමා, පහන්වෙනවා ආශාවෙන් බලා
සිටියෝය. නැව්කාරයන් නැවෙන් 30
පලායන්ට සොයමින් ඇණියෙන්
නැංගුරම් දමන්ට යන්නාක්මෙන් ඔරුව
මුහුදට බැස්සෙවු කල, පාවුල් කථාකොට: 31
මොවුන් නැවේ සිටියොත් මිස නැත්නම්
නුඹලාට ගැළවෙන්ට නුපුළුවනැයි
සියයකට මුලාදෑනියාටද හේවායන්ටද
කීවේය. එකල හේවායෝ ඔරුවේ යොත් 32
කපා ඒක යන්ට ඇරියෝය. පහන්වේගන 33
එන කල්හි පාවුල් ඔවුන් සියල්ලන්ට
කෑම කන්ට අවවාදකරමින්: නුඹලා
බලාසිටිමින්, කිසිත් නොකා නිරාහාරව
සිට අදට දසසතරවෙනි දවසය. එබැවින් 34
කෑම කන මෙන් නුඹලාට අවවාදකරමි.
මක්නිසාද එය නුඹලාගේ ආරක්ෂාව
පිණිස ඕනැකෙරේ. නුඹලාගෙන්
කිසිවෙකුගේ ඉසකේ ගහක්වත් නැති
නොවන්නේයයි කීවේය. ඔහු මෙසේ කියා 35
රොටි රැගෙන සියල්ලන් ඉදිරියෙහි
දෙවියන්වහන්සේට ස්තුති කොට කඩා
කන්ට පටන්ගත්තේය. එවිට ඔවුන් 36
සියල්ලොත් ධෛර්ය ලැබ, තුමූද කෑම
කෑවෝය. නැවේ සිටි අපි සියල්ලෝම, 37
දෙසිය සැත්තෑ සදෙනෙක්ය. කෑම කා 38
තෘප්තියට පැමුණුණ විට ඔව්හු ධාන්‍ය
මුහුදට දමා නැව සැහැල්ලුකළෝය.
පහන්වූ කල ඔව්හු ඒ දේශය කිමෙක්දැයි 39
නොහැඳින්නෝය. නුමුත් වෙරළක් ඇති
බොකු වරායක් දැක, එහි නැව

පමුණුවන්ට පුළුවන්වේදෝ කියා
40 කථාකරගත්තෝය. නැංගුරම් පහකරදමා
මුහුදේ තිබෙන්ට හැර, ඒ එක්කම
සුක්කානම්වල බැඳුම් මුදා, ඉස්සරහ රුවල
හුළඟට නගා වෙරළ බලා ගියෝය.
41 නුමුත් මුහුදු දෙකක් යාවෙන තැනකට
පැමිණ නැව බිමට වැද්දෙවුවෝය; එවිට
ඇණිය එරී තදවුණේය, රැළවල වේගය
නිසා අවරය බිඳෙන්ට පටන්ගත්තේය.
42 තවද හිරකාරයන්ගෙන් කිසිවෙක් පීනා
ගැළවී නොයන පිණිස ඔවුන් මැරීමට
43 හේවායන්ගේ අදහසක් වූයේය. නුමුත්
සියයකට මුලාදෑනියා පාවුල් ආරක්ෂා
කරනු කැමතිව ඒ අදහසින් ඔවුන්
වලක්වා, පීනන්ට පුළුවන් අයට
පළමුකොට මුහුදට පැන ගොඩට
44 යන්ටත්, සෙස්සන්ට සමහරු ලෑලිවලින්ද
සමහරු නැවේ කෑලිවලින්ද ගොඩට
යන්ටත් අණකෙළේය. මෙසේ සියල්ලෝම
ගැළවී ගොඩට පැමිත්තෝය.

## මෙලීතයේදී සිදුවූ කරුණු

28 මෙසේ ගැළවුණු කල ඒ ද්වීපයට
මෙලීතයයි කියන බව දැනගතිමුව.
2 එහි සිටි ම්ලේච්ඡයෝ අපට බොහෝ
මිත්‍රකම් පෙන්නුවෝය. මක්නිසාද
පැවතුණාවූ වර්ෂාව නිසාද ශීතලය නිසාද
ඔව්හු ගිනි පත්තුකරදී අප සියල්ලන්
3 පිළිගත්තෝය. පාවුල් දරමිටියක්
එක්කොට ගින්නෙහි ලූ කල ගිනි උෂ්ණය
නිසා සර්පයෙක් පිටවී ඇවිත් ඔහුගේ
4 අතේ එල්ලුණේය. ඒ සතා ඔහුගේ අතේ
එල්ලී ඉන්නවා ම්ලේච්ඡයෝ දැක:
ඒකාන්තයෙන් මේ මනුෂ්‍යයා මිනී-
මරුවෙක්ය, ඔහු මුහුදෙන් ගැළවුණ
නුමුත් ඔහුට ජීවත්වෙන්ට යුක්තිය
නෙමේ ඉඩ නොහරින්නේය කියා
5 කථාකරගත්තෝය. නුමුත් ඔහු ඒ සතා
ගින්නට ගසාදමා කිසි උපද්‍රවයකට
6 නොපැමිණ සිටියේය. ඔහු ඉදිමෙන්නේය
නොහොත් හදිසියෙන් මැරී වැටෙන්නේය
කියා ඔව්හු බලා සිටියෝය. නුමුත්
බොහෝ වේලා බලා සිට, ඔහුට කිසි
අනතුරක් නොවන බව ඔව්හු දුටු කල,
තමුන්ගේ කල්පනාව වෙනස්කොට, ඔහු
දෙවිකෙනෙකැයි කීවෝය.

ඒ දිවයිනට ප්‍රධානියාවූ පබ්ලියස් හට 7
අයිති ඉඩම් ඒ අසල තිබුණේය. ඔහු
අප පිළිගෙන, තුන් දවසක් ආදරයෙන්
අපට ආගන්තුක සත්කාරකෙළේය. තවද 8
පබ්ලියස්ගේ පියා උණෙන් සහ
රක්තාතිසාරයෙන් පීඩිතව ඔත්පළම
උන්නේය. පාවුල් ඔහු උන් තැනට ගොස්
යාච්ඤාකොට, ඔහු පිට අත් තබා, ඔහු
සුවකෙළේය. මෙය සිදුවූ කල දිවයිනේ 9
ලෙඩ ඇති අනික් අයද පැමිණ සුවකරනු
ලැබුවෝය. ඔව්හු අපට බොහෝ 10
ගරුනම්බුකොට, අප පිටත්ව යන කල
අපට වුවමනාදේ නැවේ පැටෙවුවෝය.

## රෝමයට යන්ට නැවත නැව් නැගීම

තුන් මාසයකට පසු ශීත කාලය ඒ 11
දිවයිනේ ගතකළාවූ තිඹුල් සොහොයුරු
යන සටහන ඇති අලෙක්ෂන්ද්‍රියාවේ
නැවකට නැගී පිටත්වුණෙමුව. අපි 12
සිරාකූසට පැමිණ එහි තුන් දවසක්
සිටියෙමුව. එතනින් පිටත්ව වටකර ගොස්, 13
රෙගියනට පැමිණ, එක දවසකට පසු
දකුණු හුළඟ ගැසූ බැවින්, දෙවෙනිද
පොතියොලට ආවෙමුව. එහිදී අපට 14
සහෝදරයන් සම්බවී, තමුන් සමග සත්
දවසක් නැවතී සිටින්ට ඔව්හු අපගෙන්
ඉල්ලුවෝය. මෙසේ අපි රෝමයට
පැමිණියෙමුව. සහෝදරයෝ අප ගැන 15
අසා, එතැනින් අපියුස්ගේ වෙළඳම්පළද
තානායම් තුනද දක්වා අප පෙරමගට
ආවෝය. පාවුල් ඔවුන් දැක, දෙවියන්-
වහන්සේට ස්තුතිකොට, ධෛර්යය
ලැබුවේය.
අප රෝමයට ඇතුල්වුණ කල* පාවුල්ට 16
තමා මුරකළ හේවායා සමග තනියම
සිටින්ට අවසර ලැබුණේය.

## ප්‍රේරිත තැන රෝමයේදී යුදෙව්වන් සම්මුඛවී කථාකිරීම

තුන් දවසකට පසු පාවුල් යුදෙව්වරුන්ගේ 17
ප්‍රධානීන් කැඳෙවුවේය. ඔවුන් රැස්වූ කල

*සමහර පුරාණ පිටපත්වල වැඩිදුර මෙසේ පෙනේ: සියයකට මුලාදෑනියා හිරකාරයන් සේනාධිපතියාට භාර-දුන්නේය; නුමුත්

ඔහු ඔවුන්ට කථාකොට: සහෝදරයෙනි,
මම සෙනඟටවත් අපේ පියවරුන්ගේ
නියෝගවලටවත් විරුද්ධව කිසිදෙයක්
නොකෙළෙමි. නුමුත් හිරකාරයෙක්ව
යෙරුසලමෙන් රෝමයන්ගේ අත්වලට
18 භාරදෙනු ලැබීමි. ඔව්හු මා ගැන
විභාගකර, මරණයට සුදුසුවූ කිසි
දෙයක් මා අත නොතිබුණු බැවින් මා
19 නිදහස්කරන්ට කැමතිවූවෝය. නුමුත්
යුදෙව්වරුන් විසින් ඊට විරුද්ධව
කථාකළ කල්හි, කායිසර්ගේ විනිශ්චය
ඉල්ලන්ට මට ඕනෑවිය. එහෙත් එසේ
කළේ මාගේ ජාතියට කිසි දෝෂයක්
20 තබන අදහසින් නොවේ. මේ කාරණය
නිසා නුඹලා දකින්ටද නුඹලා සමග
කථාකරන්ටද නුඹලා කැඳෙවුවෙමි.
කුමක් හෙයින්ද මා මේ දම්වැළෙන්
බඳිනු ලැබ සිටින්නේ ඉශ්‍රායෙල්ගේ
බලාපොරොත්තුව නිසායයි කීවේය.
21 එවිට ඔව්හු කථාකොට: යුදයෙන් නුඹ
ගැන අපට ලියුම් ලැබුණේවත් ආවාවූ
සහෝදරයන්ගෙන් කවුරුවත් නුඹ ගැන
22 කිසි දෝෂයක් දන්නුවේවත් නැත. නුමුත්
මේ ලබ්ධිය ගැන සියලු තැන්හි විරුද්ධව
කථාකරන බව අපි දනිමුව. එබැවින්
නුඹ සිතන්නේ මොකද කියා නුඹෙන්
අසන්ට කැමැත්තෙමුයයි කීවෝය.
23 තවද ඔව්හු ඔහුට දවසක් නියමකොට,
බොහෝ දෙනෙක් ඔහු ළඟට, ඔහුගේ
නවාතැනට, ආවෝය; ඔහු උදය පටන්
සවස දක්වා දෙවියන්වහන්සේගේ
රාජ්‍යය ගැන ඔවුන්ට සාක්ෂිදෙමින්,
යේසුස්වහන්සේ ගැන ඔවුන් පහදන
පිණිස මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙන් හා
අනාගතවක්තෘවරුන්ගේ පොත්වලින්
24 කාරණා තේරුම්කරදුන්නේය. කියන ලද
දේ සමහරු විශ්වාසකළෝය, සමහරු
25 අවිශ්වාසකළෝය. ඔව්හු ඔවුනොවුන්
එකඟ නොවී පාවුල් එක කාරණයක්
කී පසු, අහක්ව ගියෝය. එනම්: 26
නුඹ මේ සෙනඟ ළඟට ගොස්
කථාකොට–
ඇසීමෙන් නුඹලා අසන නුමුත්
කිසිසේත් තේරුම් නොගන්නහුය;
දකීමෙන් දකින නුමුත් කිසිසේත්
නොපැහැදෙන්නහුය.
මක්නිසාද යම් හෙයකින් තමුන්ගේ 27
ඇස්වලින් නොදක්නා පිණිසද,
කන්වලින් නොඅසන පිණිසද,
සිතින් තේරුම්ගෙන
නොහැරෙන පිණිසද,
මා විසින් ඔවුන් සුව නොකරන
පිණිසද,
මේ සෙනඟගේ සිත් දැඩිව තිබේ,
ඔවුන්ගේ කන් හොඳට නෑසී,
ඔව්හු තමුන්ගේ ඇස් පියාගන සිටිතියි
අනාගතවක්තෘවූ යෙසායා කරණකොට-
ගෙන ශුද්ධාත්මයාණන්වහන්සේ අපේ
පියවරුන්ට මනාකොට කියෙවු
වාක්‍යයය. එහෙයින් දෙවියන්වහන්සේගේ 28
මේ ගැළවීම අන්‍යජාතීන්ට යවනලද
බව නුඹලාට දනේවා. ඔවුන්ද ඒක
අසනවා ඇතැයි කීවේය.*

## අවසානය

ඔහු තමා විසින් කුලියට ගත් ගෙයි 30
දැවුරුද්දක්ම වාසයකොට, තමා වෙත
පැමිණි සියල්ලන් පිළිගෙන, කිසිම 31
භයක්වත් තහනමක්වත් නැතුව,
දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනා-
කරමින්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය.

*සමහර පුරාණ පිටපත්වල 29 වෙනි පදයක් තිබේ. ඒ මෙසේය: ඔහු මෙසේ කී පසු යුදෙව්වරු තමුන් අතරෙහි බොහෝ විවාදකරමින් අහක්ව ගියෝය.

# ප්‍රේරිතවූ පාවුල් විසින් රෝමවාසීන්ට ලියනලද පත්‍රය

### පාවුල් ප්‍රේරිත තැනගේ ආචාරය

1 යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
දසයෙක්වූ, ප්‍රේරිතයෙක් වෙන්ට කැඳවනු
2 ලැබුවාවූ, දෙවියන්වහන්සේ තමන්ගේ
පුත්‍රයා වන අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ ගැන අනාගතවක්තෘ-
වරුන් ලවා ශුද්ධ ලියවිලිවල පූර්වයෙහි
පොරොන්දුකෙරෙවූ උන්වහන්සේගේ
ශුභාරංචියට වෙන්කරනු ලැබුවාවූ
3 පාවුල්, දෙවියන්වහන්සේට ප්‍රියවූ,
ශුද්ධවන්තයන්ව සිටින්ට කැඳවනු
ලැබුවාවූ, රෝමයෙහි සිටින සියල්ලන්ට
4 ලියා එවන වගනම්: අපගේ පියවූ
දෙවියන්වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගෙන්ද අනුග්‍රහයත්
5 සමාදනයත් නුඹලාට වේවා. ඒ
පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන්
දාවිත්ගේ වංශයෙන් ඉපිද, ශුද්ධකමේ
ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන්
හැටියට මළවුන්ගෙන් නැගිටීම
කරණකොටගෙන බලයෙන් යුක්තව
6 ප්‍රකාශ කරනු ලැබූසේක. උන්වහන්සේගේ
නාමය නිසා සියලු ජාතීන් අතරෙහි
ඇදහීමේ කීකරුකමට පැමිණවීම
පිණිස උන්වහන්සේගෙන් අනුග්‍රහයත්
7 ප්‍රේරිතකමත් ලැබීමුව. ඔවුන් අතරෙහි
නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
සන්තකවන පිණිස කැඳවනු ලැබුවහුය.

### රෝමයේ සභාව වෙත පැමිණීමට ඇති ආශාව

8 පළමුකොට, නුඹලාගේ ඇදහිල්ල මුළු
ලෝකයෙහි ප්‍රසිද්ධව තිබෙන නිසා නුඹලා
සියල්ලන් ගැන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
කරණකොටගෙන මාගේ දෙවියන්-
වහන්සේට ස්තුතිකරමි. මාගේ 9
යාච්ඥාවලදී කඩ නැතුව නුඹලා
සඳහන්කරමින්, දැන්වත් යම් අන්දමකින්
නුඹලා වෙතට එන්ට දෙවියන්වහන්සේගේ
කැමැත්තෙන් මාර්ගයක් සැලසෙන ලෙස
නිතරම ඉල්ලන බවට, තමන් 10
පුත්‍රයාණන්ගේ ශුභාරංචියෙහි මාගේ
ආත්මයෙන් මා විසින් සේවය කරන
දෙවියන්වහන්සේ මට සාක්ෂිය. මක්නිසාද 11
නුඹලා ස්ථිරවන හැටියට නුඹලාට යම්
කිසි ආත්මික දීමනාවක් දෙන පිණිස
නුඹලා දක්නට ආශාවෙමි. මෙසේ 12
කියන්නේ නුඹලාගෙත් මාගෙත්
අන්‍යෝන්‍ය ඇදහිල්ල කරණකොටගෙන
නුඹලා සමග මටත් සැනසිල්ල ලැබෙන
පිණිසය. සහෝදරයෙනි, වෙන 13
අන්‍යජාතීන් අතරෙහි මෙන් නුඹලා
අතරෙහිද මට යම් ඵලයක් ලැබෙන
පිණිස මම නුඹලා වෙතට එන්ට
නොයෙක් වර අභිප්‍රායකළ බවත් මේ
වන තෙක්ම වලකනු ලැබූ බවත් නුඹලා
නොදන සිටිනවාට නොකැමැත්තෙමි.
මම ග්‍රීක්වරුන් හා ම්ලේච්ඡයන්ටත් 14
ඥානවන්තයන් හා අඥානයන්ටත්
ණයකාරයෙක්ව සිටිමි. එසේ රෝමයෙහි 15
සිටින්නාවූ නුඹලාටත් මට පුළුවන්
ප්‍රමාණයට ශුභාරංචිය දේශනාකරන්ට
මම සැදී සිටිමි.

### ශුභාරංචිය කෙබන්දක්ද යන්න

මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා 16
නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම,

එනම් පළමුකොට යුදෙව්වාටද එසේම
ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය
දෙවියන්වහන්සේගේ බලයව තිබෙන
17 නිසාය. කුමක්හෙයින්ද ධර්මිෂ්ඨයා
ඇදහිල්ලෙන් ජීවත්වේයයි ලියා තිබෙන
ලෙස, ඇදහීමෙන් පැමිණෙන
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඇදහීම
පිණිස එහි එළිදරව්වී තිබේ.

## අන්‍යජාති ලෝකයාගේ පාපිෂ්ඨ ස්වභාව

18 මක්නිසාද සත්‍යය අධර්මිෂ්ඨකමින්
වලක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියලු
අභක්තියටද අධර්මිෂ්ඨකමටද විරුද්ධව
දෙවියන්වහන්සේගේ උදහස ස්වර්ගයෙන්
19 එළිදරව්වී තිබේ; මක්නිසාද
දෙවියන්වහන්සේ ගැන දැනගන්ට පුළුවන්
දේ ඔවුන් තුළ ප්‍රකාශව තිබේ;
කුමක්හෙයින්ද දෙවියන්වහන්සේ එය
20 ඔවුන්ට ප්‍රකාශකළසේක. මක්නිසාද
ලෝකය මැවූ තැන් පටන් දෙවියන්-
වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන
උන්වහන්සේගේ සදාකාලිකවූ බලය හා
දේවිකම මවනලද දේවලින් තේරුම්
ගොස් පැහැදිලිලෙස පෙනීයන්නේය;
එබැවින් ඔව්හු නිරුත්තරව සිටිති.
21 මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේ
ඇඳිනගතත් උන්වහන්සේට දෙවියන්-
වහන්සේ මෙන් ගෞරවයවත් ස්තුතිවත්
නොකොට, තමුන්ගේ විතර්කවලින්
නිරර්ථක බවට පැමුණුණෝය, ඔවුන්ගේ
22 අඥාන සිත්ද අඳුරුවිය. තුමූම
ප්‍රඥාවන්තයෝයයි කියමින් ඔව්හු
23 අඥානයෝව, ජරාවට නොපැමිණෙන්නාවූ
දෙවියන්වහන්සේගේ මහිමය ජරාවට
පැමිණෙන්නාවූ මනුෂ්‍යයාගේද පක්ෂීන්
හා සිව්පාවුන්ගේද බඩගායන ජාතීන්ගේද
රූපවලට සමානවෙන ලෙස මාරුකළෝය.
24 එබැවින් ඔවුන් තම තමුන්ගේ සිත්වල
තෘෂ්ණා කරණකොටගෙන තමුන්ගේ
ශරීරවලට අවමානනකරගන්න හැටියට
දෙවියන්වහන්සේ ඔවුන් අපවිත්‍රකමට
25 පාවාදුන්සේක. එසේ කළේ ඔවුන්
දෙවියන්වහන්සේගේ සත්‍යය බොරුවකට
මාරුකර, මැවුම්කාරයාණන්වහන්සේට
නොව මැවිල්ලට නමස්කාරකරමින්
මෙහෙකළ නිසාය. උන්වහන්සේ
සදාකල්හිම ප්‍රශංසනීයව සිටිනසේක.
ආමෙන්.
ඒ නිසා දෙවියන්වහන්සේ ඔවුන් නීච 26
තෘෂ්ණාවලට භාරදුන්සේක. ඔවුන්ගේ
ස්ත්‍රීහු ස්වාභාවික ව්‍යවහාරය ස්වභාවට
විරුද්ධවූ ව්‍යවහාරයට වෙනස්කළෝය.
එසේම පුරුෂයෝද ස්ත්‍රිය සම්බන්ධ 27
ස්වාභාවික ව්‍යවහාරය අත්හැර
ඔවුනොවුන් කෙරෙහි රාගයෙන් මත්ව,
පුරුෂයෝ පුරුෂයන් සමග අශෝභන
දේ කරමින්, තමුන්ගේ වරදවලට සුදුසු
ඵල තමුන් තුළම ලැබුවෝය.
තවද ඔවුන් දෙවියන්වහන්සේ දැනගන්ට 28
අකමැතිව සිටි බැවින්, නුසුදුසු දේ කරන
පිණිස දෙවියන්වහන්සේ ඔවුන් ජඩ
සිතකට පාවාදුන්සේක. ඔව්හු වනාහි 29
සියලු අධර්මිෂ්ඨකමින්ද දුෂ්ටකමින්ද
ලෝභකමින්ද නපුරුකමින්ද පූර්ණව,
ඊර්ෂ්‍යාවෙන්ද මිනීමැරීමෙන්ද ඩබරයෙන්ද
වංචාවෙන්ද ක්‍රෝධයෙන්ද පිරී සිටියෝය.
ඔව්හු කතට කොඳුරන්නෝව, කේලාම් 30
කියන්නෝව, දෙවියන්වහන්සේට
පිළිකුල්වූවෝව, නින්දකරන්නෝව,
උඩඟුවූවෝව, පාරට්ටුකරගන්නෝව,
නපුරු දේවල් උපදවන්නෝව, මවුපියන්ට
අකීකරුවෝව, අඥානයෝව, ගිවිසුම් 31
කඩකරන්නෝව, ජම්ම ස්නේහය
නැත්තෝව, දයා නැත්තෝව සිටියෝය.
මෙබඳු දේ කරන්නෝ මරණයට 32
සුදුස්සෝය යන දෙවියන්වහන්සේගේ
නියෝගය ඔව්හු දැනගනත් ඒ දේ කරති,
එපමණක් නොව ඒ දේ කරන්නන් සමග
එකඟ වෙති.

## යුදෙව්වරුත් දෝෂකාරයන් බව

2 එබැවින් විනිශ්චයකරන මනුෂ්‍යය,
නුඹ කවරෙක් වුවත් නිරුත්තරව
සිටිනෙහිය. මක්නිසාද යමක් ගැන නුඹ
අනිකෙකු විනිශ්චයකෙරෙහිද, නුඹම එම
දේවල් කරන නිසා නුඹටම වරද
තබාගන්නෙහිය. එබඳු දේ කරන්නන්ට 2
විරුද්ධව දෙවියන්වහන්සේගේ විනිශ්චය
සැබෑවේ ප්‍රකාරයට පවත්නා බව දනිමුව.

3 එබඳු දේ කරන්නන් විනිශ්චයකරමින්
එම දේ කරන මනුෂ්‍යය, නුඹ
දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන්
ගැළවෙන්නෙහියයි සිතන්නෙහිද?
4 නොහොත් නුඹ පසුතැවිල්ලට පමුණුවන
පිණිස දෙවියන්වහන්සේගේ යහපත්කම
පවතින බව නොදැන, උන්වහන්සේගේ
යහපත්කමේද ක්ෂාන්තියේද ඉවසීමේද
5 බහුලත්වය සුළු කොට සිතා, නුඹේ
සිතේ මුරණ්ඩුකමෙන්ද පසුතැවිලි
නොවන සිතින්ද දෙවියන්වහන්සේගේ
ධර්මිෂ්ඨවූ විනිශ්චය එළිදරව්වන
උදහසේ දවසට නුඹ උදහස
6 රැස්කරගන්නෙහිද? උන්වහන්සේ සියලු
මනුෂ්‍යයන්ට තම තමුන්ගේ ක්‍රියා ලෙස
7 විපාකදී, ඉවසීම ඇතුව යහපත්කම්
කිරීමෙන් මහිමයද ගෞරවයද
අමරණභාවයද සොයන්නන්ට සදාකාල
8 ජීවනය දෙනසේක; නුමුත් සැබෑකමට
අකීකරුවූ, අධර්මිෂ්ඨකමට කීකරුවූ
විරුද්ධවාදීන්ට උදහස හා තද
9 කෝපයත්, නපුරුකම් කරන සියලු
මනුෂ්‍ය ආත්මවලට, එනම් පළමුකොට
යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, පීඩාව
හා සිත් වේදනාවත් පැමිණෙන්නේය.
10 නුමුත් යහපත්කම් කරන්නාවූ සියලු
මනුෂ්‍යයන්ට, එනම් පළමුකොට
යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, මහිමයත්
ගෞරවයත් සමාදානයත් ලැබෙන්නේය.
11 මක්නිසාද දෙවියන්වහන්සේ තරාතිරම්
12 නොබලනසේක. එබැවින් මාගේ
ශුභාරංචියේ ප්‍රකාරයට දෙවියන්වහන්සේ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා
මනුෂ්‍යයන්ගේ රහස් විනිශ්චයකරවන
13 දවසේදී, ව්‍යවස්ථාවක් නැතුව පව්කළාවූ
සියල්ලෝ ව්‍යවස්ථාව නැතුව
විනාශවන්නෝය. ව්‍යවස්ථාවක් ඇතුව
පව්කළාවූ සියල්ලෝ ව්‍යවස්ථාව
කරණකොටගෙන විනිශ්චයකරනු
14 ලබන්නෝය. මක්නිසාද ව්‍යවස්ථාව
අසන්නන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි
ධර්මිෂ්ඨයන්ව සිටිනවා නොව,
ව්‍යවස්ථාව පවත්වන්නෝ ධර්මිෂ්ඨකොට
15 ගණන්ගනු ලබන්නෝය. මක්නිසාද
ව්‍යවස්ථාව නැත්තාවූ අන්‍යජාතීන්
ස්වභාවයෙන්ම ව්‍යවස්ථාවේ දේවල්
කරන කල, ඔව්හු ව්‍යවස්ථාව නැතුව
තමුන්ටම ව්‍යවස්ථාවක්ව සිටිති;
කෙසේද? ඔවුන්ගේ හෘදයසාක්ෂිය 16
සාක්ෂිදීමෙන්ද, ඔවුන්ගේ සිතිවිලි
ඔවුනොවුන්ට දෝෂාරෝපණය කිරීමෙන්
හෝ නිර්දෝෂකිරීමෙන්ද, ව්‍යවස්ථාවේ
ක්‍රියාව ඔවුන්ගේ සිත්වල ලියනලදැයි
ඔව්හු දක්වති.
එහෙත් නුඹ යුදෙව්වෙක්යයි කියනු ලැබ 17
ව්‍යවස්ථාවෙහි පිහිටා සිට දෙවියන්-
වහන්සේ ගැන පාරට්ටුකරගන්නෙහි නම්,
ව්‍යවස්ථාවෙන් උගන්වනු ලැබ, 18
උන්වහන්සේගේ කැමැත්ත දැන, වඩා
උතුම් කාරණා මොනවාදැයි විමසා
බලන්නෙහිනම්, නුඹ දැනගැනීමේද
සැබෑකමේද විලාසය ව්‍යවස්ථාවෙන්
ලැබ, නුඹම අන්ධයන්ට මගපෙන්වන්- 19
නෙක්ය, අඳුරෙහි සිටින්නන්ට එළියක්ය.
අඥානයන්ට ගුරුකෙනෙක්ය, බාලයන්ට 20
ඉගැන්නුම්කාරයෙක්ය කියා නිසැකව
විශ්වාසකෙරෙහිනම්, අනිකෙකුට 21
උගන්වන්නාවූ නුඹ නුඹටම උගන්වා
ගන්නේ නැද්ද? සොරකම් නොකළ
යුතුයයි දේශනාකරන්නාවූ නුඹ
සොරකම්කරනවාද? කාමමිථ්‍යාචාරය 22
නොකළ යුතුයයි කියන්නාවූ නුඹ
කාමමිථ්‍යාචාරය කරනවාද? දේවරූපවලට
පිළිකුල්කරන්නාවූ නුඹ දේවගෘහයන්
කොල්ලකනවාද? ව්‍යවස්ථාව ගැන 23
පාරට්ටුකරගන්නාවූ නුඹ ව්‍යවස්ථාව
කඩකිරීමෙන් දෙවියන්වහන්සේට
අගෞරවකරනවාද? මක්නිසාද ලියා 24
තිබෙන ප්‍රකාරයට නුඹලා කරණකොටගෙන
අන්‍යජාතීන් අතරෙහි දෙවියන්වහන්සේගේ
නාමය අපහාසකරනු ලබයි. මක්නිසාද 25
නුඹ ව්‍යවස්ථාව පවත්වන්නෙක් නම්
චර්මඡේදනයෙන් නුඹට ප්‍රයෝජන ඇත.
නුමුත් නුඹ ව්‍යවස්ථාව කඩකරන්නෙක්
නම් නුඹේ චර්මඡේදනය අචර්මඡේදනයක්
වී තිබේ. එබැවින් අචර්මඡේදිතයා 26
ව්‍යවස්ථාවේ නියෝගයන් පවත්වන්නේ
නම්, ඔහුගේ අචර්මඡේදනය චර්මඡේදනය
මෙන් ගණන්ගනු නොලබන්නේද? මෙසේ 27
ස්වභාවෙන් අචර්මඡේදිතව සිටින්නා

ව්‍යවස්ථාව සම්පූර්ණකරන්නේ නම්,
ලියවිල්ලත් චර්මඡේදනයත් ඇතුව
ව්‍යවස්ථාව කඩකරන්නාවූ නුඹව
28 විනිශ්චය නොකරන්නේද? මක්නිසාද
පිටාතර පෙනීමෙන් යුදෙව්වෙක්ව
සිටින්නා යුදෙව්වෙක් නොවේ; මාංසයේ
පිටාතර චර්මඡේදනය චර්මඡේදනයක්
29 නොවේ. නුමුත් ඇතුළතින් යුදෙව්වෙක්ව
සිටින්නා යුදෙව්වෙක් වේ; චර්මඡේදනය
නම් ලියවිල්ලේ හැටියට නොව ආත්මයේ
හැටියට සිතෙහි වූ එකය; එබඳු අයට
මනුෂ්‍යයන්ගෙන් නොව දෙවියන්-
වහන්සේගෙන් ප්‍රශංසාව ලැබේ.

## විරුද්ධ ප්‍රශ්නවලට උත්තර

3 එසේවී නම් යුදෙව්වාට ඇති වාසිය
මොකද? නොහොත් චර්මඡේදනයෙන්
2 ඇති ප්‍රයෝජනය මොකද? සියලු
ආකාරයෙන් බොහෝය. පළමුවෙන්ම,
දෙවියන්වහන්සේගේ වාක්‍ය ඔවුන්ට
3 භාරදෙනලද්දේය. ඉදින් සමහරෙක්
ඇදහිල්ල නැතුව සිටියොත් කිමෙක්ද?
ඔවුන්ගේ ඇදහිලි නැතිකමෙන්
දෙවියන්වහන්සේගේ විශ්වාසකම
4 හිස්වේද? එසේ නොවේවා.

ඔබවහන්සේගේ වචනවලින් ඔබ
සාධාරණව පෙනෙන පිණිසත්
ඔබ විනිශ්චයකරනු ලබන කල ජය
ගන්න පිණිසත්ය

කියා ලියා තිබෙන ලෙස, සියලු
මනුෂ්‍යයන් බොරුකාරයන් වුණත්
දෙවියන්වහන්සේ සැබෑ බව පෙනේවා.
5 එහෙත් (මම මනුෂ්‍ය ව්‍යවහාරය
ලෙස කථාකරමි) අපේ අධර්මිෂ්ඨකම
කරණකොටගෙන දෙවියන්වහන්සේගේ
ධර්මිෂ්ඨකම වර්ණනාකරනු ලැබේ නම්
කුමක් කියමුද? උදහස පාන්නාවූ
6 දෙවියන්වහන්සේ අධර්මිෂ්ඨද? එසේ
නොවේවා. එසේ වුවොත් දෙවියන්-
වහන්සේ ලෝකයා විනිශ්චයකරන්නේ
7 කොහොමද? නුමුත් මාගේ බොරුව
කරණකොටගෙන දෙවියන්වහන්සේගේ
මහිමය පිණිස උන්වහන්සේගේ සැබෑකම
වැඩිවූයේ නම් මමත් මක්නිසා
පව්කාරයෙකු මෙන් තවත් විනිශ්චයකරනු
ලබම්ද? ඒ හැටියට යහපත සිද්ධවීම 8
පිණිස නපුර කරමුයයි නොකියමුද?
(අපි එසේ කියමුයයි අපට අපහාස
වශයෙන් සමහරු අප ගැන කියති.)
ඔවුන්ගේ දඬුවම සාධාරණය.

## ලෝකවාසී සියලු දෙනා වරදකාරයන් බව

එසේවී නම් කිමෙක්ද? අපි ඔවුන්ට 9
වඩා අඩු තත්ත්වයකද? කිසිසේත් නැත.
මක්නිසාද යුදෙව්වරුද ග්‍රීක්වරුද යන
සියල්ලෝ පාපයට යටත්ව සිටිතියි කියා
අපි පළමු දෙස්තැබුවෙමුව. ඒ ගැන මෙසේ 10
ලියා තිබේ:

ධර්මිෂ්ඨ කෙනෙක් නැත, එසේය,
එක්කෙනෙක්වත් නැත;
තේරුම්ගන්නාවූ කිසිවෙක් නැත, 11
දෙවියන්වහන්සේ සොයන්නාවූ
කෙනෙක් නැත;
ඔවුන් සියල්ලෝ අහක්ව ගියෝය, 12
එක්ව නිෂ්ප්‍රයෝජනවූවෝය;
යහපත කරන්නෙක් නැත, එසේය,
එක්කෙනෙක් පමණවත් නැත.
ඔවුන්ගේ උගුර විවරවූ මිනීවළක්ය; 13
ඔව්හු තමුන්ගේ දිව්වලින් වංචාකම්
කළෝය.
ඔවුන්ගේ තොල් යට පොළොං විෂ
තිබේ.
ඔවුන්ගේ මුඛය ශාපයෙන්ද 14
තික්තකමෙන්ද පූර්ණය.
ඔවුන්ගේ පාද ලේ වැගිරීමට කඩිසරය; 15
ඔවුන්ගේ මාර්ගවල විනාශයත් 16
කාලකණ්ණිකමත් තිබේ;
ඔව්හු සමාදානයේ මාර්ගයද දැන 17
නොගත්තෝය.
ඔවුන්ගේ ඇස් හමුයෙහි දෙවියන්- 18
වහන්සේ කෙරෙහි භයක් නැත යනුයි.

ඉදින් ව්‍යවස්ථාවෙහි කියනලද 19
සියල්ලම ව්‍යවස්ථාව යටතෙහි
සිටින්නන්ට කියනලද බව අපි දනිමුව.
එසේ වන්නේ සියල්ලන්ගේ කටවල්
පියවනු ලබන පිණිසත්, මුළු ලෝකයා
දෙවියන්වහන්සේගේ විනිශ්චයට යටත්-
කරනු ලබන පිණිසත්ය. කුමක්හෙයින්ද 20
ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම

මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි
ධර්මිෂ්ඨකරනු නොලබන්නේය.
මක්නිසාද ව්‍යවස්ථාව කරණකොටගෙන
පාපය දැනගැනීම වේ.

## ක්‍රිස්තුස්වහන්සේ තුළ ධර්මිෂ්ඨකම සපයාදී තිබෙන බව

21 නුමුත් දැන් වනාහි ව්‍යවස්ථාව නැතුව,
ව්‍යවස්ථාව සහ අනාගතවක්තෘවරුන්ගෙන්
සාක්ෂි ලබමින්, දෙවියන්වහන්සේගේ
ධර්මිෂ්ඨකමක් ප්‍රකාශකරන ලද්දේය.
22 එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි
ඇදහිල්ල කරණකොටගෙන, අදහන්නාවූ
සියල්ලන්ට ලැබෙන ධර්මිෂ්ඨකමය;
23 ප්‍රභේදයකුත් නැත; මක්නිසාද සියල්ලෝම
පව්කොට *දෙවියන්වහන්සේගේ
24 මහිමයෙන් හීනව සිටිති. එබැවින්
ඔව්හු උන්වහන්සේගේ අනුග්‍රහයෙන්
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබෙන
මිදීම කරණකොටගෙන නොමිලයේ
25 ධර්මිෂ්ඨ කරනු ලබන්නෝ වෙති. ඇදහීම
කරණකොටගෙන උන්වහන්සේ ස්වකීය
ලෙයින් පව් නසන පූජාවක්
වෙන්ට දෙවියන්වහන්සේ නියමකළසේක.
කුමටද? දෙවියන්වහන්සේ තමන්
ඉවසිලිවන්තකම නිසා, පසුගිය පව්
ගණන් නොගෙනහැරීම කරණකොටගෙන,
තමන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පෙන්වන
26 පිණිසය. එනම් තමන්වහන්සේ
ධර්මිෂ්ඨවෙන හැටියටද, යේසුස්වහන්සේ
කෙරෙහි ඇදහිලි ඇත්තා ධර්මිෂ්ඨකරන්නා
හැටියටද, තමන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
27 මේ කාලයේදී දක්වන පිණිසය. එසේවී
නම් පාරට්ටුකර ගැනීම කොයිද?
එය බැහැරකරන ලද්දේය. කෙබඳු
ව්‍යවස්ථාවකින්ද? ක්‍රියාවල ව්‍යවස්ථාවෙන්ද?
නැත; ඇදහීමේ ව්‍යවස්ථාවකින්ය.
28 එහෙයින් මනුෂ්‍යයෙක් ව්‍යවස්ථාවේ ක්‍රියා
නැතුව ඇදහීමෙන් ධර්මිෂ්ඨකරනු
29 ලැබේයයි අපි ගණන්ගනිමුව. නැත්නම්
දෙවියන්වහන්සේ යුදෙව්වරුන්ගේ
දෙවියන්වහන්සේ පමණක්ද?
අන්‍යජාතීන්ගෙත් දෙවියන්වහන්සේ
නොවේද? එසේය, අන්‍යජාතීන්ගෙත්
දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ 30
එකම කෙනෙක්ව සිටිමින්, චර්මඡේදිතයන්
ඇදහිල්ලෙන්ද අචර්මඡේදිතයන් ඇදහිල්ල
කරණකොටගෙනද ධර්මිෂ්ඨකරනසේක.
එසේවී නම් අපි ඇදහිල්ල කරණකොට- 31
ගෙන ව්‍යවස්ථාව අවලංගුකරමුද? එසේ
නොවේවා. අපි ව්‍යවස්ථාව ස්ථිරකරමුව.

## ආබ්‍රහම්ගේ ඇදහීම ක්‍රිස්තියානිකාරයාගේ ඇදහීමට ආදර්ශයක් බව

4
එසේවී නම් මාංසාකාරයෙන්
අපේ මුල් පියවූ ආබ්‍රහම්ට කුමක්
ලැබුණේයයි කියමුද? මක්නිසාද ආබ්‍රහම් 2
ක්‍රියා කරණකොටගෙන ධර්මිෂ්ඨ
කරනලද්දේවී නම්, ඔහුට පාරට්ටුකර
ගැනීමට කාරණයක් ඇත: නුමුත්
දෙවියන්වහන්සේ ඉදිරියෙහි නොවේය.
මක්නිසාද ලියවිල්ලේ කුමක් කියා 3
තිබේද? ආබ්‍රහම් දෙවියන්වහන්සේව
විශ්වාසකෙළේය. එය ඔහුට ධර්මිෂ්ඨකම
කොට ගණන්ගන්නාලද්දේය කියාය.
ඉදින් වැඩකරන්නාට කුලිය ණයක් 4
වශයෙන් මිස කරුණාවක් වශයෙන්
ගණන්ගනු නොලැබේ. නුමුත් වැඩ 5
නොකරන්නාවූ, අභක්තිකයන් ධර්මිෂ්ඨ-
කොට ගණන්ගන්න තැනන්වහන්සේ
කෙරෙහි අදහන්නාවූ අයට ඔහුගේ ඒ
ඇදහිල්ල ධර්මිෂ්ඨකම කොට ගණන්ගනු
ලැබේ. එලෙසම දෙවියන්වහන්සේ 6
යමෙකුට ධර්මිෂ්ඨකම ක්‍රියා නැතුව
ගණන් තබනසේක්ද, ඔහුගේ
ආශීර්වාදලත්කම දාවිත් දක්වමින්:
තමුන්ගේ අයුතුකම්වලට කමාවත් 7
තමුන්ගේ පාපයට වැස්මත් ලැබූ
තැනැත්තෝ ආශීර්වාදලද්දෝය.
ස්වාමීන්වහන්සේ විසින් පාපය ගණන් 8
නොතබන්නාවූ මනුෂ්‍යයා ආශීර්වාද
ලද්දේයයි කියයි.
එසේවී නම් මේ ආශීර්වාදය 9
ප්‍රකාශකරන ලද්දේ චර්මඡේදිතයන්
කෙරෙහිද? නොහොත් අචර්මඡේදිතයන්

*හෙවත්, දෙවියන්වහන්සේගෙන් ලැබුවාවූ.

කෙරෙහිත්ද? මක්නිසාද: ආබ්‍රහම්ගේ
ඇදහිල්ල ඔහුට ධර්මිෂ්ඨකම කොට
10 ගණන්ගන්නාලදැයි අපි කියමුව. එසේවී
නම් ගණන්ගන්නාලද්දේ කෙසේද? ඔහු
චර්මඡේදිතව සිටිය කල්හිද? නොහොත්
අචර්මඡේදිතව සිටිය කල්හිද?
චර්මඡේදිතව සිටිය කල්හි නොව
11 අචර්මඡේදිතව සිටිය කල්හිමය. ඔහු
අචර්මඡේදිතව සිටියදී තමාට තිබුණාවූ
ඇදහිල්ලේ ධර්මිෂ්ඨකමේ මුද්‍රාවක් කොට
චර්මඡේද්‍යය නම් ලකුණ ලැබුවේය.
මෙසේ වූයේ අචර්මඡේදිතව සිටිය නුමුත්
ධර්මිෂ්ඨකම සඳහා ගණන්ගැනීම පිණිස
අදහන්නාවූ සියල්ලන්ගේ පියා වන
පිණිසත්, චර්මඡේදිතයෝව පමණක්
12 නොව, අපගේ පියවූ ආබ්‍රහම්
අචර්මඡේදිතව සිටිය කල්හි ඔහුට තිබුණු
ඇදහිල්ලේ අඩිපාරේ යන්නෝව
සිටින්නන්ට චර්මඡේද්‍යයේ පියා වන
13 පිණිසත්ය. මක්නිසාද ආබ්‍රහම්ට හෝ
ඔහුගේ වංශයට හෝ ලෝකය
උරුමවන්නේය යන පොරොන්දුව
ව්‍යවස්ථාව කරණකොටගෙන නොව
ඇදහිල්ලේ ධර්මිෂ්ඨකම කරණකොටගෙන
14 වූයේය. ව්‍යවස්ථාවෙහි වූවෝ
උරුමක්කාරයෝ නම් ඇදහිල්ල
අවලංගුවේ, පොරොන්දුවද නිෂ්ඵලවී
15 තිබේ. මක්නිසාද ව්‍යවස්ථාව උදහස
උපදවන්නීය; නුමුත් ව්‍යවස්ථාවක් නැති
16 තැන වරද කිරීමකුත් නැත. මේ නිසා
අනුග්‍රහය ප්‍රකාරයට සිද්ධවන පිණිස
එය ඇදහිල්ලෙන් වේ. කුමටද?
පොරොන්දුව මුළු වංශයට ස්ථිරවන
පිණිසය, එනම් ව්‍යවස්ථාවෙහි වූ වංශයට
පමණක් නොව ආබ්‍රහම්ගේ ඇදහීමෙන්
17 වූ වංශයටත්ය. (නුඹ බොහෝ ජාතීන්ට
පියෙකු කෙළෙමියි ලියා තිබෙන ලෙස)
ආබ්‍රහම් තමා විශ්වාසකළාවූ, මළවුන්
ජීවත්කරන්නාවූ, නැති දේ ඇති දේ මෙන්
සඳහන්කරන්නාවූ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි අප සියල්ලන්ගේ පියාණෝය.
18 නුඹේ වංශය මෙසේ වන්නේය කියා
තිබෙන ලෙස, ආබ්‍රහම්, බොහෝ
ජාතීන්ගේ පියා වන පිණිස,
බලාපොරොත්තුවීමට ඉඩ නැති තැන
බලාපොරොත්තුවෙන් විශ්වාසකෙළේය.
ඔහු (අවුරුදු සියයක් පමණ වයස්ගතව 19
සිටියදී,) ඇදහිල්ලෙන් දුර්වල නොවී,
තමාගේම ශරීරය මළ බව හා සාරාගේ
කුසය මළ බවත් සිතා ඇදහිලි නැතිකම
කරණකොටගෙන චංචල නොවී, එසේය, 20
දෙවියන්වහන්සේගේ පොරොන්දුව දෙස
බලා ඇදහිල්ලෙන් බලවත්ව,
දෙවියන්වහන්සේට ගෞරවකරමින්,
පොරොන්දුවූ දේ ඉෂ්ටකරන්ට 21
උන්වහන්සේට පුළුවන කියා නිසැකව
විශ්වාසකෙළේය. ඒ නිසා එය 22
ඔහුට ධර්මිෂ්ඨකම කොට ගණන්-
ගන්නාලද්දේය. ඉදින් ඔහුට එය 23
ගණන්ගන්නාලදැයි ලියනු ලැබුවේ ඔහු
නිසා පමණක් නොව අප නිසාත්ය.
මක්නිසාද අපේ ස්වාමිවූ යේසුස් 24
ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ
තැනන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ
අපටත් එය ගණන්ගනු ලබන්නේය.
උන්වහන්සේ වනාහි අපේ වරද නිසා 25
පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨ කොට
ගණන්ගනු ලැබීම සඳහා නැගුටුවනු
ලැබුසේක.

## ඇදහිල්ලේ ඵල

5

එබැවින් අපි ඇදහිල්ලෙන්
ධර්මිෂ්ඨකරනු ලැබ, අපේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට-
ගෙන දෙවියන්වහන්සේ හා සමග
*සමාදනය ඇතුව සිටිමු. අප පිහිටා 2
සිටින මේ අනුග්‍රහයට උන්වහන්සේ
කරණකොටගෙනම ඇදහිල්ලෙන් †ළඟාවී
සිටිමුව; තවද දෙවියන්වහන්සේගේ
මහිමයේ බලාපොරොත්තුවෙහි අපි
ප්‍රීතිමත්වෙමු. එපමණකුත් නොව, පීඩා 3
විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් 4
සහතිකකමද සහතිකකමෙන් බලා-
පොරොත්තුවීමද උපදින බව දැන,
අප විඳින පීඩාවලදීත් ප්‍රීතිමත්-
වෙමු. බලාපොරොත්තුව ලජ්ජාවට 5
නොපමුණුවන්නේය; මක්නිසාද අපට
දෙනලද ශුද්ධාත්මයාණන්වහන්සේ

*හෙවත්–අපට සමාදනය තිබේ.
†හෙවත්–ඇතුල්වීම ලැබුවෙමුව.

කරණකොටගෙන දෙවියන්වහන්සේගේ
ප්‍රේමය අපගේ හෘදවල වගුරුවනලද්දේය.

## ක්‍රිස්තුස්වහන්සේගේ මරණයෙන් ප්‍රකාශවූ දේව ප්‍රේමය

6 මක්නිසාද අප දුර්වලව සිටියදීම නියම
කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ අභක්තිකයන්
7 උදෙසා මළසේක. ධර්මිෂ්ඨයෙකු උදෙසා
යමෙකු මැරෙන්ට කැමතිවීම දුර්ලභය.
සමහරවිට සත්පුරුෂයා උදෙසා
මැරෙන්ට යමෙකු ධෛර්ය ඇතුව සිටින්ට
8 පුළුවන. නුමුත් දෙවියන්වහන්සේ අප
කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය
පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම
අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ
9 මරණය විඳීමෙන්ය. එබැවින් ඊටත්
වඩා ක්‍රිස්තුස්වහන්සේගේ ලේ
කරණකොටගෙන ධර්මිෂ්ඨකරනු ලැබූ
අපි උන්වහන්සේ කරණකොටගෙන
දෙවියන්වහන්සේගේ උදහසෙන් ගළවනු
10 ලබන්නෙමුව. මක්නිසාද අපි
සතුරන්ව සිටියදීම දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණන්ගේ මරණය කරණකොටගෙන
උන්වහන්සේ සමග අපි සමගි කරනු
ලැබුවෙමු නම්, සමගිවූණාවූ අපි
ඊටත් වඩා උන්වහන්සේගේ ජීවනය
කරණකොටගෙන ගළවනු ලබන්නෙමුව.
11 එපමණක් නොව, සමගිකිරීම අපට
ලබාදුන්නාවූ අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රීතිද වෙමුව.

## ආදම් කරණකොටගෙන මරණය. ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ජීවනය

12 එහෙයින් එක් මනුෂ්‍යයෙකු
කරණකොටගෙන පාපයත් පාපය
කරණකොටගෙන මරණයත් ලෝකයට
ඇතුල්වුණාක්මෙන්, සියලු මනුෂ්‍යයන්
පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි
13 මරණයද පැමුණුණේය. මක්නිසාද
ව්‍යවස්ථාව දෙන තෙක් පාපය
ලෝකයෙහි තිබුණේය. නුමුත්
ව්‍යවස්ථාවක් නැති කල්හි පාපය
ගණන්ගනු නොලැබේ. එසේවී නුමුත් 14
ආදම් පටන් මෝසෙස් දක්වා,
ආදම්ගේ වරදකිරීමේ ආකාරයෙන් පව්
නොකළවුන් කෙරෙහි පවා මරණය
රජකම්කෙළේය. ඒ ආදම් වනාහි
එන්නාවූ තැනන්වහන්සේගේ
ආදර්ශයක්ය. නුමුත් වරද යම්සේද 15
නොමිලයේ දීමනාව එසේ නොවේ.
මක්නිසාද එක්කෙනාගේ වරදෙන්
බොහෝදෙනා මළාහු නම්, ඊටත් වඩා
දෙවියන්වහන්සේගේ කරුණාවත් එකම
මනුෂ්‍යයාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
කරුණාවෙන් වූ දීමනාවත් බොහෝ
දෙනා සඳහා වැඩිවූයේය. ඇරත් දීමනාව 16
වනාහි පව්කළ එක්කෙනෙකු
කරණකොටගෙන මෙන් නොවේය.
මක්නිසාද විනිශ්චය දඬුවම උදෙසා
එක්කෙනෙකුගෙන් පැමුණුණේය, නුමුත්
දීමනාව වනාහි බොහෝ වරදවලින්
ධර්මිෂ්ඨකරනු ලැබීම සඳහාය.
මක්නිසාද එක්කෙනාගේ වරද නිසා ඒ 17
එක්කෙනා කරණකොටගෙන මරණය
රජකම්කළේවී නම්, කරුණාවේද
ධර්මිෂ්ඨකම නමැති දීමනාවේද
බහුලත්වය ලබන අය, එක්කෙනාවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
ඊට වඩා ජීවනයෙහි රජකම්කරන්නෝය.
එබැවින් එක වරදක් කරණකොටගෙන 18
දඬුවමට පත්කිරීම පිණිස විනිශ්චය
සියලුම මනුෂ්‍යයන් කෙරෙහි
පැමුණුණාක්මෙන්ම, එක ධර්මිෂ්ඨ
ක්‍රියාවක් කරණකොටගෙන ජීවනයේ
ධර්මිෂ්ඨකිරීම පිණිස දීමනාව සියලු
මනුෂ්‍යයන් කෙරෙහි වූයේය. මක්නිසාද 19
එක මනුෂ්‍යයාගේ අකීකරුකම
කරණකොටගෙන බොහෝදෙනා
පව්කාරයන් කරනු ලැබුවා සේම,
එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන
බොහෝදෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය.
ඒ ඇර ව්‍යවස්ථාව පැමුණුණේ වරද 20
බොහෝ වන පිණිසය; නුමුත් පාපය
මරණයෙහි රජකම්කළාක්මෙන්ම
අනුග්‍රහය සදාකල ජීවනය සඳහා අපේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
කරණකොටගෙන ධර්මිෂ්ඨකමෙන්

රජකම්කරන පිණිස. පාපය බොහෝ වූ
තැන අනුග්‍රහය ඊට වඩා අධික වූයේය.

## ක්‍රිස්තුස්වහන්සේ හා සම්බන්ධව සිටීම පිණිස පාපයෙන් වෙන්විය යුතුයි

6 එසේවී නම් කුමක් කියමුද? අනුග්‍රහය
බොහෝ වන පිණිස පාපයෙහි
2 පවතිමුද? එසේ නොවේවා. පාපයට
මළාවූ අපි තවත් එහි කෙසේ ජීවත්වමුද?
3 නොහොත් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ
තුළට *බව්තීස්ම ලැබුවාවූ අප සියල්ලන්
උන්වහන්සේගේ මරණයට *බව්තීස්ම
ලැබූ බව නුඹලා නොදැන සිටිනහුද?
4 එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්-
වහන්සේගේ මහිමය කරණකොටගෙන
මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවා සේම,
අපිත් ජීවනයේ අලුත්කමෙන් හැසිරෙන
පිණිස, මරණය තුළට *බව්තීස්මය
කරණකොටගෙන උන්වහන්සේ සමග
5 තැන්පත්කරනු ලැබුවෙමුව. මක්නිසාද
උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන්
අපි උන්වහන්සේට සම්බන්ධවී සිටිමු
නම්, උන්වහන්සේගේ නැගිටීමේ
සමානත්වයෙනුත් සම්බන්ධවන්නෙමුව.
6 මින්මතු අපි පාපයට සේවය නොකරන
ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ
පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමග
කුරුසියෙහි ඇණගසනලද බව දනිමුව.
7 මක්නිසාද මැරුණාවූ තැනැත්තේ පාපය
8 ගැන නිර්දෝෂකරනු ලැබ සිටියි. තවද
මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවාවූ
ක්‍රිස්තුස්වහන්සේ තවත් නොමැරෙන බවත්
මරණය උන්වහන්සේ කෙරෙහි තවත්
බලය නොපවත්වන බවත් අපි දන්නා
9 බැවින්, අපි උන්වහන්සේ සමග මැරුනෙමු
නම්, උන්වහන්සේ සමග ජීවත්වන්නෙමුයයි
10 විශ්වාසකරමුව. මක්නිසාද උන්වහන්සේ
මැරුණු මරණයෙන් එක වරක් පාපයට
මළසේක. නුමුත් ජීවත්වන ජීවිතයෙන්
දෙවියන්වහන්සේට ජීවත්වනසේක.
11 එලෙසම නුඹලාත් පාපයට මැරී
සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව
සිටින්නන් කොටද සිතාගනිල්ලා.

*අවගාහනය.

එබැවින් නුඹලා නුඹලාගේ මරණීයවූ 12
ශරීරයේ තෘෂ්ණාවලට කීකරුවන ලෙස
පාපය එහි අධිපතිකම් නොකෙරේවා.
නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ 13
ආයුධ කොට පාපයට භාර නොදී,
නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන්
මෙන් දෙවියන්වහන්සේට භාරවී,
නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ
ආයුධ කොට උන්වහන්සේට
භාරදීපල්ලා. කුමක්හෙයින්ද, නුඹලා 14
ව්‍යවස්ථාව යටතෙහි නොව අනුග්‍රහය
යටතෙහි සිටින බැවින්, පාපය නුඹලා
කෙරෙහි අධිපතිකම් නොකරන්නේය.

## පාපයට සේවයකිරීම සහ ධර්මිෂ්ඨකමට සේවයකිරීම

එසේවී නම් කිමෙක්ද? අපි ව්‍යවස්ථාව 15
යටතෙහි නොව කරුණාව යටතෙහි
සිටින නිසා පව්කරමුද? එසේ නොවේවා.
නුඹලා කීකරුකම පිණිස දසයන් කොට 16
යමකට නුඹලාම භාරදෙන්නහුද, එය
මරණයට පමුණුවන්නාවූ පාපය වේවා,
ධර්මිෂ්ඨකමට පමුණුවන්නාවූ කීකරුකම
වේවා, නුඹලා කීකරුවන එකට දසයන්
වන බව නොදනිවුද? එහෙත් නුඹලා 17
පාපයේ දසයන්ව සිටි නුමුත්, යම්
ඉගැන්වීම් ක්‍රමයකට නුඹලා
භාරදෙනලදද, ඊට සිතින්ම කීකරුවී,
පාපයෙන් නිදහස්කරන ලදුව, 18
ධර්මිෂ්ඨකමේ දසයන් වූ බැවින්,
දෙවියන්වහන්සේට ස්තුතිවේවා.
නුඹලාගේ මාංසයේ දුර්වලකම නිසා 19
මනුෂ්‍ය ව්‍යවහාරයෙන් කථාකරමි.
නුඹලා නුඹලාගේ අවයවයන්
අපවිත්‍රකමටත් අයුතුකම පිණිස
අයුතුකමටත් දසයන් කොට භාරදුන්
සේම, දැන් නුඹලාගේ අවයවයන්
ශුද්ධකම පිණිස ධර්මිෂ්ඨකමට දසයන්
කොට භාරදීපල්ලා. මක්නිසාද 20
නුඹලා පාපයාගේ දසයෝව සිටියදී
ධර්මිෂ්ඨකම සම්බන්ධව නිදහස්ව
සිටියහුය. ඉදින් නුඹලා දැන් යම් දෙයකට 21
ලැජ්ජාව සිටිවුද, එකල්හි ඒ දෙයින්
කුමන ඵලයක් ලැබුවහුද? මක්නිසාද ඒ
දේවල කෙළවර නම් මරණයය. නුමුත් 22

දන් නුඹලා පාපයෙන් නිදහස්කරනලදුව,
දෙවියන්වහන්සේගේ දසයෝ වී, ශුද්ධකම
සඳහා ඵල දරන්නහුය, එහි කෙළවරද
23 සදාකාල ජීවනයය. මක්නිසාද පාපයේ
කුලී නම් මරණයය; නුමුත් දෙවියන්-
වහන්සේගේ දීමනාව නම්, අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ
සදාකාල ජීවනයය.

## ව්‍යවස්ථාවේ බලයෙන් නිදහස්වීම. විවාහය ආදර්ශකොට ගැනීම

7 *නොහොත් සහෝදරයෙනි, මනුෂ්‍යයා
ජීවත්ව සිටින තෙක් ව්‍යවස්ථාව ඔහු
කෙරේ බලය පවත්වන බව නුඹලා
නොදන සිටිවුද? (මා කථාකරන්නේ
2 ව්‍යවස්ථාව දන්නන්ටය.) පුරුෂයෙකු ඇති
ස්ත්‍රී පුරුෂයා ජීවත්ව සිටින තෙක්
ව්‍යවස්ථාවෙන් ඔහුට බැඳී සිටින්නීය;
නුමුත් පුරුෂයා මැරුණොත්, පුරුෂයාට
බැඳී සිටි ව්‍යවස්ථාවෙන් ඈ මිදී සිටින්නීය.
3 පුරුෂයා ජීවත්ව සිටියදී ඈ
අන් පුරුෂයෙකුට බැඳුණොත්, ඈ
කාමමිථ්‍යාචාරිනීයයි කියනු ලබන්නීය.
නුමුත් පුරුෂයා මැරුණු පසු ඈ
අන් කෙනෙකුට බැඳුණත්, ඈ
කාමමිථ්‍යාචාරිනියක් නොවන ලෙස ඒ
ව්‍යවස්ථාවෙන් නිදහස්ව සිටින්නීය.
4 එබැවින්, මාගේ සහෝදරයෙනි, අප
විසින් දෙවියන්වහන්සේට ඵල උපදවන
පිණිස නුඹලාද අන් කෙනෙකුට එනම්
මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවාවූ
තැනන්වහන්සේට බැඳී, ක්‍රිස්තුස්-
වහන්සේගේ ශරීරය කරණකොටගෙන
ව්‍යවස්ථාවට මළ අය කරනු ලැබුවහුය.
5 මක්නිසාද අප මාංසයෙහි සිටියදී
ව්‍යවස්ථාවෙන්වූ පාප තෘෂ්ණා මරණයට
ඵල උපදවන පිණිස අපේ අවයව තුළ
6 ක්‍රියාකෙළේය. නුමුත් අපි යමකට බැඳී
සිටියෙමුද, ඊට නැසී, ව්‍යවස්ථාවෙන්
නිදහස් කරනලදුව, පදර්ථයේ පැරණි
ආකාරයෙන් නොව ආත්මයේ අලුත්
ආකාරයෙන් සේවයකරමුව.

*මෙය 6 වෙනි පරි: 14 පදය හා සම්බන්ධය.

## ව්‍යවස්ථාව සහ පාපය. මනුෂ්‍යයාගේ ප්‍රතිවිරෝධ ගතිදෙක

එසේවී නම් කුමක් කියමුද? ව්‍යවස්ථාව 7
පාපයද? එසේ නොවේවා. නුමුත්
ව්‍යවස්ථාවෙන් දන නොගත්තා නම්
පාපය කුමක්දැයි මා නොදන සිටිනවා
ඇත. මක්නිසාද: තණ්හා නොවෙන්නැයි
ව්‍යවස්ථාවෙහි කියා නොතිබුණා නම්
තණ්හාව කුමක්දැයි මා විසින් නොදන
සිටිනවා ඇත. නුමුත් පාපය අවකාශ 8
ලැබ, ආඥාව කරණකොටගෙන මා තුළ
සියලු ආකාර තණ්හා ඉපදෙවුවේය.
මක්නිසාද ව්‍යවස්ථාවෙන් වෙන්ව පාපය
නැසී තිබේ. මම වරක් ව්‍යවස්ථාව නැතුව 9
ජීවත්ව සිටියෙමි. නුමුත් ආඥාව පැමිණි
කල පාපය පණ ලැබුවේය, මමද
මැරුණෙමි. මෙසේ ජීවනය පිණිස වූ 10
ආඥාවෙන් මට මරණය පැමිණෙන බව
දනගතිමි. මක්නිසාද පාපය අවකාශ 11
ලැබ, ආඥාව කරණකොටගෙන මා
රවටා, එයින් මා මැරුවේය. එබැවින් 12
ව්‍යවස්ථාව ශුද්ධය, ආඥාවද ශුද්ධය,
ධර්මිෂ්ඨය, යහපත්ය. එසේවී නම් ඒ 13
යහපත් දේ මට මරණය වූයේද? එසේ
නොවේවා. නුමුත් මෙසේ වුණේ යහපත්වූ
එක කරණකොටගෙන මට මරණය
ඉපදවීමෙන් පාපය පාපය ලෙස
පෙනෙන පිණිසත්, ව්‍යවස්ථාව
කරණකොටගෙන පාපය ඉතා පාපිෂ්ඨව
පෙනෙන පිණිසත්ය. මක්නිසාද 14
ව්‍යවස්ථාව ආත්මික බව අපි දනිමුව.
නුමුත් මම මාංසිකව පාපයට විකුණනු
ලැබ සිටිමි. මක්නිසාද මා කරන දේ 15
මම නොදනිමි. මා කරන්නේ මා කැමති
දේ නොව මා ද්වේෂකරන දේය. ඉදින් 16
මම අකමැති එක කරම් නම්, ව්‍යවස්ථාව
යහපත් බව ඊත්තුගනිමි. එහෙයින් එය 17
කරන්නේ මා නොව මා තුළ වාසය
කරන පාපයය. මක්නිසාද මා තුළ 18
එනම් මාගේ මාංසය තුළ කිසි යහපතක්
වාසය නොකරන බව දනිමි. මක්නිසාද
කැමැත්ත මට ඇත්තේය, නුමුත් යහපත්
දෙය කිරීම මට නැත්තේය. මක්නිසාද 19
මම කැමති යහපත නොකර අකමැති

20 තපුර කරමි. ඉදින් මම කැමති නැති දේ
කරම් නම්, ඒක කරන්නේ මා නොව
21 මා තුළ වාසය කරන පාපයය. එබැවින්
යහපත කරන්ට කැමතිවූ මා හට නපුර
තිබීම යන ව්‍යවස්ථාව ඇති බව
22 මට පෙනේ. මක්නිසාද අභ්‍යන්තර
මනුෂ්‍යයාගේ ප්‍රකාරයට මම දෙවියන්-
23 වහන්සේගේ ව්‍යවස්ථාවට ප්‍රියවෙමි. නුමුත්
මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව
යුද්ධකරන්නාවූ, මාගේ අවයව තුළ
තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි
මා වහල්කමට පමුණුවන්නාවූ අන්‍ය
ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන
24 බව මට පෙනේ. අනේ, මම කාලකණ්ණි
මනුෂ්‍යයෙක්ය! මේ මරණයේ ශරීරයෙන්
25 මා මුදන්නේ කවුද? අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණ-
කොටගෙන දෙවියන්වහන්සේට ස්තුති
කරමි. මෙසේ මමම සිතින්
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට
සේවයකරමි; නුමුත් මාංසයෙන්
සේවයකරන්නේ පාපයාගේ ව්‍යවස්ථාවටය.

## ආත්මයාණන් තුළ ජීවත්වීම

8 එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ
තුළ සිටින්නන්ට දන් දඬුවමට
2 පත්කිරීමක් නැත. මක්නිසාද ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක
ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව
පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා
3 නිදහස්කළාය. මක්නිසාද දෙවියන්-
වහන්සේ තමන්වහන්සේගේම පුත්‍රයාණන්
පාප-මාංසයේ සමානකමෙන්ද පාපය
නිසාද එවා, මාංසයේ පාපය දඬුවමට
පත්කරමින්, මාංසය කරණකොටගෙන
දුර්වලවූ ව්‍යවස්ථාවට බැරිවූ දේ
4 ඉෂ්ටකළසේක. එසේ කළේ මාංසික ලෙස
නොව ආත්මිකලෙස හැසිරෙන්නාවූ
අප තුළ ව්‍යවස්ථාවේ නියෝගය
5 සම්පූර්ණවෙන පිණිසය. මක්නිසාද
මාංසිකලෙස සිටින්නෝ මාංසික
දේවලටද ආත්මිකලෙස සිටින්නෝ
6 ආත්මික දේවලටද ඇලුම්වෙති. මාංසයේ
ඇල්ම මරණයය; නුමුත් ආත්මයේ ඇල්ම
7 ජීවනය හා සමාදනයය. කුමක්හෙයින්ද,
මාංසයේ ඇල්ම දෙවියන්වහන්සේට
සතුරුකමය; ඒක දෙවියන්වහන්සේගේ
ව්‍යවස්ථාවට යටත් නැත, යටත් වෙන්ටත්
බැරිය. මෙසේ, මාංසයෙහි සිටින්නන්ට 8
දෙවියන්වහන්සේ සතුටු කරන්ට
නොහැකිය. නුමුත් නුඹලා තුළ 9
දෙවියන්වහන්සේගේ ආත්මයාණන්-
වහන්සේ වාසයකරනසේක් නම්,
නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි
සිටින්නෝය. ක්‍රිස්තුස්වහන්සේගේ
ආත්මයාණන්වහන්සේ යම් කෙනෙකුට
නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත.
ඉදින් ක්‍රිස්තුස්වහන්සේ නුඹලා තුළ 10
සිටිනසේක් නම්, පාපය නිසා ශරීරය
මැරී තිබෙන නුමුත් ධර්මිෂ්ඨකම නිසා
ආත්මය ජීවත්වෙයි. තවද යේසුස්- 11
වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ
තැනන්වහන්සේගේ ආත්මයාණන්-
වහන්සේ නුඹලා තුළ වාසයකරනසේක්
නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව
මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේ
නුඹලා තුළෙහි වසන තමන්ගේ
ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන
නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත්
කරනසේක.
එබැවින් සහෝදරයෙනි, අපි 12
ණයකාරයෝව සිටිමුව, නුමුත්
මාංසිකලෙස ජීවත්වෙන්ට මාංසයට
නොවේය. මක්නිසාද නුඹලා 13
මාංසිකලෙස ජීවත්වෙනවා නම් මැරෙන්ට
ඕනෑය, නුමුත් ආත්මයෙන් ශරීරයේ ක්‍රියා
නසනවා නම් ජීවත්වෙනවා ඇත.

## දේව පුත්‍රයෝ

මක්නිසාද දෙවියන්වහන්සේගේ 14
ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු
ලබන යම් පමණ දෙනෙක් ඇද්ද,
එපමණ දෙනා දෙවියන්වහන්සේගේ
පුත්‍රයෝය. මක්නිසාද නුඹලා භය 15
උපදවන දසකමේ ආත්මය නැවත
නොලබා, පුත්‍රකමේ ආත්මය ලබාගත්තහුය;
එයින් අපි: අබ්බා, පියාණෙනි, කියා
හඬගසමුව. අපි දෙවියන්වහන්සේගේ 16
දරුවෝයයි ආත්මයාණන්වහන්සේම
අපේ ආත්මය එක්ව සාක්ෂිදෙනසේක.

17 තවද දරුවෝ නම් උරුමක්කාරයෝය;
දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෝය,
ක්‍රිස්තුස්වහන්සේ හා සමග හවුල්
උරුමක්කාරයෝය. උන්වහන්සේ හා
සමග මහිමය ලබන පිණිස, උන්වහන්සේ
සමග දුක්විඳිමු නම්, මෙසේ වන්නේය.

## මතු ප්‍රකාශවෙන්ට තිබෙන මහිමතාව

18 මක්නිසාද මේ වර්තමාන කාලයේ
දුක් වනාහි අප කෙරෙහි එළිදරව් කරනු
ලබන්නාවූ මහිමයට සමාන කරනු
19 ලබන්ට නොවටීයයි සිතමි. මක්නිසාද
මැවිල්ල දෙවියන්වහන්සේගේ පුත්‍රයන්ගේ
එළිදරව්වීම උනන්දු ප්‍රාර්ථනාවෙන් බලා
20 සිටියි. මක්නිසාද මැවිල්ල නිෂ්ඵල
භාවයට යටත්කරන ලද්දේ ඒකේම
කැමැත්තෙන් නොව, ඒ මැවිල්ලම ජරාවේ
21 වහල්කමින් නිදහස්වී, දෙවියන්වහන්සේගේ
දරුවන්ගේ මහිමයේ නිදහස්කමට
පැමිණෙන්නේය යන බලාපොරොත්තුවෙන්
එය යටත්කළාවූ තැනන්වහන්සේ නිසාය.
22 මක්නිසාද මුළු මැවිල්ල මේ දක්වා එක්ව
කෙඳිරිගාමින් ගාවිනා විඳින බව දනිමුව.
23 එපමණක් නොව ආත්මයාණන්-
වහන්සේ නැමති ප්‍රථම ඵල ලැබූ අපිද
අපේ ශරීරයේ මිදීම, එනම් පුත්‍රකමට
පිළිගනු ලැබීම, බලා සිටිමින් අප
24 තුළෙහිම කෙඳිරිගාමුව. මක්නිසාද අප
ගළවනු ලැබුවේ බලාපොරොත්තුවෙන්ය.
නුමුත් පෙනෙන බලාපොරොත්තුවක්
බලාපොරොත්තුවක් නොවේය.
මක්නිසාද තමාට පෙනෙන
දෙයක් ගැන බලාපොරොත්තුවෙන්නේ
25 කවරෙක්ද? නුමුත් අපි නොපෙනෙන
දේ ගැන බලාපොරොත්තුවෙමු නම්
ඉවසිල්ලෙන් ඒ ගැන බලා සිටිමුව.
26 එලෙසම ආත්මයාණන්වහන්සෙත්
අපගේ දුර්වලකම්වලදී උපකාරකරන-
සේක. මක්නිසාද යුතුලෙස යාච්ඤා
කරන්ට අපි නොදනිමුව; නුමුත්
ආත්මයාණන්වහන්සේම කිය නොහැකි
කෙඳිරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම්
27 කරනසේක. ඒ ආත්මයාණන්වහන්සේ
දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස
ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන
බැවින්, සිත් විමසන තැනන්වහන්සේ
උන්වහන්සේගේ අදහස කුමක්දැයි
දන්නාසේක. තවද දෙවියන්වහන්සේට 28
ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ
අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු
දේම යහපත පිණිස එකට ක්‍රියාකරන
බව අපි දනිමුව. මක්නිසාද උන්වහන්සේ 29
පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්-
වහන්සේගේ පුත්‍රයා බොහෝ
සහෝදරයන් අතරේ කුලුඳුලා වන
පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට
සමානවෙන්ට පූර්වයෙන් නියමකළසේක.
පූර්වයෙන් නියමකළවුන් උන්වහන්සේ 30
කැඳවාගත්සේක. කැඳවාගත්තවුන්
උන්වහන්සේ ධර්මිෂ්ඨකළසේක.
ධර්මිෂ්ඨකළ අය උන්වහන්සේ මහිමයට
පැමිණෙවූසේක.

## දෙවියන්වහන්සේගේ අප්‍රමාණ ප්‍රේමය

එසේවී නම් මේ කාරණා ගැන කුමක් 31
කියමුද? දෙවියන්වහන්සේ අපේ පක්ෂයට
සිටිනසේක් නම්, අපට විරුද්ධවෙන්නේ
කවුද? තමන්වහන්සේගේම පුත්‍රයා 32
ඉතුරුකර නොගෙන අප සියල්ලන්
උදෙසා පාවාදුන්නාවූ තැනන්වහන්සේ
පුත්‍රයා ඇතුළුව අනිකුත් සියල්ල අපට
නොදෙන්නේ කෙසේද? දෙවියන්- 33
වහන්සේගේ තෝරාගනු ලැබූවන්ට වරද
තබන්නේ කවුද? ධර්මිෂ්ඨ කරන්නේ
දෙවියන්වහන්සේය; වරදට පත්කරන්නේ
කවුද? මැරුණෙත්, ඒ ඇර මළවුන්ගෙන් 34
නැඟුටුවනු ලැබුවෙත්, දෙවියන්වහන්සේගේ
දකුණු පැත්තෙහි සිට අප උදෙසා
මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය.
ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප 35
වෙන්කරන්නේ කවුද? විපතවත්, සිත්
වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්,
නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත්
අප වෙන්කරන්නේද? ඒ හැටියට, 36
දවස මුළුල්ලේ ඔබ නිසා අපි මරනු
ලබමුව;
මරණයට නියමකළ බැටළුවන් මෙන්
ගණන්ගනු ලැබුවෙමුයයි

37 ලියා තිබේ. නුමුත් අපට ප්‍රේමකළාවූ
තැනන්වහන්සේ කරණකොටගෙන අපි
මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝ
38 වමුව. මක්නිසාද මරණයටවත්,
ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්-
වලටවත්, දැන් පවතින දේවලටවත්, මතු
පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්,
39 උසටවත්, ගැඹුරටවත්, අන් කිසි
මැවිල්ලකටවත්, අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ
දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප
වෙන්කරන්ට නොහැකිවන්නේයයි
ඒකාන්තයෙන්ම දනිමි.

## ඉශ්‍රායෙල්ගේ නොඇදහිල්ල ගැන ප්‍රේරිත තැනගේ ශෝකය

9 මට බලවත් ශෝකයද හෘදයෙහි
නිරන්තර වේදනාවද තිබේයයි
බොරු නොකියා ක්‍රිස්තුස්වහන්සේ තුළ
2 සැබෑව කියමි. ඒ බවට ශුද්ධාත්මයාණන්-
වහන්සේ තුළ මාගේ හෘදයසාක්ෂිය මා
3 එක්ව සාක්ෂිදෙයි. මාංසාකාරයෙන්
මාගේ නෑයන්වූ මාගේ සහෝදරයන්
උදෙසා ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්වී
ශාපලද්දෙක් වෙන්ට පුළුවන්නම් ඊටත්
4 කැමතිවෙමි. ඔව්හු ඉශ්‍රායෙල්වරුය;
පුත්‍රකමත් මහිමයත් ගිවිසුමුත් ව්‍යවස්ථාව
දීමත් දේව සේවයත් පොරොන්දුත්
5 ඔවුන්ගේය; පියවරුද ඔවුන්ගේය,
මාංසාකාරයෙන් ක්‍රිස්තුස්වහන්සේ
පැමුණුණෙත් ඔවුන්ගෙන්ය; උන්වහන්සේ
සියල්ලන්ටම උතුම්වූ සදාකාල
ආශීර්වාදලත් දෙවියන්වහන්සේය.
ආමෙන්.

## දෙවියන්වහන්සේගේ පොරොන්දු නිරර්ථක නොවූ බව

6 එහෙත් දෙවියන්වහන්සේගේ වචනය
නිරර්ථකවුණා නොවේය. මක්නිසාද
ඉශ්‍රායෙල්ගෙන් වූ සියල්ලෝම
7 ඉශ්‍රායෙල්වරු නොවෙති. ඔවුන්
ආබ්‍රහම්ගේ වංශය නිසාම සියල්ලෝම
දරුවෝද නොවෙති. නුමුත්: නුඹේ වංශය
නම්කරනු ලබන්නේ ඊසාක් කෙරෙහියයි
(කියා තිබේ.) එනම්, මාංසයෙන් වූ 8
දරුවෝම දෙවියන්වහන්සේගේ දරුවෝ
නොවෙති. නුමුත් වංශයක් ලෙස
ගණන්ගනු ලබන්නේ පොරොන්දුවේ
දරුවෝය. මක්නිසාද: මේ කාලයේ 9
හැටියට මම එන්නෙමි, සාරාට පුතෙක්
ලැබෙන්නේය යන වචනය පොරොන්දුවේ
වචනයක්ය. එපමණක්ද නොවේය; 10
එක්කෙනෙකු නිසා එනම් අපේ පියවූ
ඊසාක් නිසා රෙබෙකා ගර්භිණීවූ කල්හිද,
ඒ තාක් දරුවන් නොඉපද, යහපතවත් 11
අයහපතවත් නොකර සිටි කල්හිද, ක්‍රියා
නිසා නොව කැඳවන තැනැන්වහන්සේ
නිසා, තෝරාගැනීමේ ප්‍රකාරයට
දෙවියන්වහන්සේගේ නියමය ස්ථිරවන
පිණිස: වැඩිමහල්ලා බාලයාට සේවය 12
කරන්නේයයි ඇට කියනලද්දේය. එසේම: 13
මම යාකොබ්ට ප්‍රේමකෙළෙමි, ඒසව්ට
අප්‍රියවීමියි ලියා තිබේ.

## දෙවියන්වහන්සේ අසාධාරණ නොවන බව

එසේවී නම් කුමක් කියමුද? 14
දෙවියන්වහන්සේ වෙත අධර්මිෂ්ඨකම
ඇද්ද? එසේ නොවේවා. මක්නිසාද: මම 15
දයාවෙන්ට කැමති තැනැත්තාට
දයාවන්නෙමි, අනුකම්පාකරන්ට කැමති
තැනැත්තාට අනුකම්පාකරන්නෙමියි
උන්වහන්සේ මෝසෙස්ට කීසේක. ඒ නිසා 16
එය කැමතිවන තැනැත්තාගෙන්වත් දුවන
තැනැත්තාගෙන්වත් නොව, දයාවෙන්නාවූ
දෙවියන්වහන්සේගෙන් වේ. මක්නිසාද: 17
නුඹ කෙරෙහි මාගේ බලය පෙන්වා
මාගේ නාමය මුළු පොළොවෙහි
ප්‍රකාශවන පිණිසම නුඹ නැගිටවීමියි
ලියවිල්ලේ ඵාරාවෝට කියා තිබේ.
මෙසේ උන්වහන්සේ කැමති කෙනෙකුට 18
දයාවනසේක, කැමති කෙනෙකු
දැඩිකරනසේක.

## දෙවියන්වහන්සේ මහෝත්තමයාණන්වහන්සේ බව

එසේවී නම් උන්වහන්සේ තවම දෙස් 19
තබන්නේ මක්නිසාද? උන්වහන්සේගේ

කැමැත්තට විරුද්ධව සිටින්නේ කවුද්දැයි
20 නුඹ මට කියනවා ඇත. නුමුත්, අහෝ
මනුෂ්‍යය, දෙවියන්වහන්සේට විරුද්ධව
උත්තරදෙන්නාවූ නුඹ කවුද? සාදන ලද
දේ එය සෑදූ අයට: නුඹ මා මේ
ආකාරයෙන් සෑදුවේ මක්නිසාදැයි
21 කියයිද? එක මැටි පිඩෙන් එක් භාජනයක්
ගෞරවය පිණිසත් අනිකක් අගෞරවය
පිණිසත් සාදන්ට කුම්භකාරයාට මැටි
22 කෙරෙහි බලය නැද්ද? දෙවියන්වහන්සේ
තමන්ගේ උදහස පෙන්වන්ටත් තමන්ගේ
බලය ප්‍රකාශකරන්ටත් කැමතිව,
විනාශයට සූදානම්කරන ලද උදහසේ
භාජන ගැන බොහෝ ක්ෂාන්තියෙන්
23 ඉවසා, මහිමය පිණිස පූර්වයෙන්
තමන්වහන්සේ විසින් සූදානම් කරනලද
24 දයාවේ භාජනවූ, යුදෙව්වරුන්ගෙන්
පමණක් නොව අන්‍යජාතීන්ගෙන්ද
කැඳවනලද අප කෙරෙහි, තමන්-
වහන්සේගේ මහිමයේ සම්පත
ප්‍රකාශකරන්ට කැමතිවූසේක් නම්
25 කිමෙක්ද? එසේම උන්වහන්සේ
හොෂෙයාගේ පොතෙහි:

මාගේ සෙනඟව නොසිටියවුන්ට
මාගේ සෙනඟය කියාත්
ප්‍රිය නොවූ තැනැත්තියට ප්‍රිය
තැනැත්තිය කියාත් කියන්නෙමියි
කියාද
26 නුඹලා මාගේ සෙනඟ නොවන්නහුයයි
ඔවුන්ට කියා තිබෙන තැන
නුඹලා ජීවමාන දෙවියන්වහන්සේගේ
පුත්‍රයෝය කියනු ලබන්නහුයයි
27 කියාද කීසේක. තවද යෙසායා
මොරගසා ඉශ්‍රායෙල් ගැන කියන්නේ:
ඉශ්‍රායෙල් දරුවන්ගේ ගණන මුහුදේ
වැලි මෙන් වන නුමුත්, ගැළවෙන්නේ
28 ස්වල්පදෙනෙක් පමණක්ය. මක්නිසාද
ස්වාමීන්වහන්සේ තමන් වචනය තීන්දු
කොට, එය අප්‍රමාදව පොළොව පිට
29 ඉෂ්ටකරනසේක කියාය. පළමුවෙනුත්
යෙසායා කියා තිබෙන ප්‍රකාරයට,

සේනාවල ස්වාමීන්වහන්සේ අපට
වංශයක් ඉතිරි නොකළසේක් නම්
අපි සොදෝම මෙන් වීමුව,
ගොමොරාවට සමාන කරනු ලැබීමුයයි
කියාය.

## ඉශ්‍රායෙල් එපාකරනු ලැබීමට හේතුව

එසේවී නම් කුමක් කියමුද? ධර්මිෂ්ඨකම 30
අනුව නොගියාවූ අන්‍යජාතීහු
ධර්මිෂ්ඨකමට එනම් ඇදහිල්ලෙන්වූ
ධර්මිෂ්ඨකමට පැමිණියෝය, ඉශ්‍රායෙල් 31
වනාහි ධර්මිෂ්ඨකමේ ව්‍යවස්ථාවක් අනුව
ගොස් ඒ ව්‍යවස්ථාවට නොපැමිණියේය
කියාය. ඒ මක්නිසාද? ඔවුන් එය 32
ඇදහිල්ලෙන් නොව ක්‍රියාවලින් මෙන්
සෙවූ නිසාය. ඔව්හු පැකිළීමේ ගලෙහි
පැකුලුණෝය. කෙසේදයත්: 33

පැකිළීමේ ගලක්ද බාධාවේ පර්වතයක්ද
සියොනෙහි තබමි.
උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා
ලජ්ජාවට නොපැමිණෙන්නේයයි

ලියා තිබෙන ලෙසය.

10 සහෝදරයෙනි, ඔවුන් උදෙසා
මාගේ සිතේ ආශාවත් දෙවියන්-
වහන්සේට කරන කන්නලව්වත් නම්
ඔවුන් ගැළවෙන පිණිසය. මක්නිසාද 2
ඔවුන්ට දෙවියන්වහන්සේ උදෙසා
ජ්වලිතකමක් ඇති බවට ඔවුන් ගැන
මම සාක්ෂිදෙමි. නුමුත් එය දැනගැම්ම
ඇතුව නොවේ. මක්නිසාද ඔව්හු 3
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
නොදැන, තමුන්ගේ ධර්මිෂ්ඨකම
ස්ථිරකරන්ට සොයමින්, දෙවියන්-
වහන්සේගේ ධර්මිෂ්ඨකමට යටත්
නූණෝය. මක්නිසාද අදහන සියලු 4
දෙනාටම ධර්මිෂ්ඨකම පිණිස
ක්‍රිස්තුස්වහන්සේ ව්‍යවස්ථාවේ සමාප්තිය
වනසේක.

## ධර්මිෂ්ඨකමේ අලුත් මාර්ගය සියල්ලන්ටම බව

මක්නිසාද ව්‍යවස්ථාවෙන් වූ ධර්මිෂ්ඨ- 5
කම ගැන නම්: මේ දේ කරන තැනැත්තා
එයින් ජීවත්වන්නේයයි මෝසෙස් ලියා
තිබේ. නුමුත් ඇදහිල්ලෙන් වූ 6
ධර්මිෂ්ඨකම කථාකොට,–ක්‍රිස්තුස්-
වහන්සේව බස්සවාගන්න පිණිස–
'ස්වර්ගයට නගින්නේ කවුද කියාවත්,–
ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් ගෙනෙන 7

පිණිස,– පාතාලයට බසින්නේ කවුද
කියාවත් නුඹේ සිතින් නොසිතන්නැයි
කියන්නේය. තවත් කුමක් කියන්නේද?
8 වාක්‍යය නුඹ ළඟය, නුඹේ මුඛයේද
නුඹේ සිතේද තිබේය කියාය. එනම් අප
විසින් ප්‍රකාශකරන ඇදහිල්ලේ වාක්‍යය.
9 කුමක්හෙයින්ද යේසුස්වහන්සේ ස්වාමීන්-
වහන්සේයයි නුඹේ මුඛයෙන්
ප්‍රකාශකරන්නෙහිනම්, දෙවියන්වහන්සේ
විසින් උන්වහන්සේව මළවුන්ගෙන්
නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්,
10 නුඹ ගළවනු ලබන්නෙහිය. මක්නිසාද
මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින්
අදහාගන්නේය; ගැළවීම පිණිස
11 මුඛයෙන් කියාදෙන්නේය. උන්වහන්සේ
කෙරෙහි අදහන කවරෙක්වත් ලජ්ජාවට
නොපැමිණෙන්නේයයි ලියවිල්ල
12 කියන්නේය. මක්නිසාද යුදෙව්වාද
ග්‍රීකයාද අතරේ ප්‍රභේදයක් නැත. එකම
ස්වාමීන්වහන්සේ සියල්ලන්ට ස්වාමිව,
උන්වහන්සේට යාච්ඤාකරන සියල්ලන්
උදෙසා පොහොසත්ව සිටිනසේක.
13 මක්නිසාද: ස්වාමීන්වහන්සේගේ
නාමයට යාච්ඤාකරන කවුරු නුමුත්
14 ගළවනු ලබන්නේය. එසේ නම් ඔවුන්
තමුන් විසින් අදහා නොගත්තාවූ
කෙනෙකුට යාච්ඤාකරන්නේ කොහොමද?
තමුන් නොඇසූවාවූ කෙනෙකු
කෙරෙහි අදහන්නේ කොහොමද?
දේශනාකරන්නෙක් නැතුව ඔවුන්
15 අසන්නේ කොහොමද? (සමහරු) යවනු
ලැබුවොත් මිස දේශනාකරන්නේ
කොහොමද? මේ සම්බන්ධව: යහපත්
දේ ගැන ශුභ ආරංචිය ගෙනෙන්නාවූ
තැනැත්තන්ගේ පාද කොපමණ
අලංකාරද! කියා ලියා තිබේ.
16 නුමුත් ඔවුන් සියල්ලන්ම ඒ යහපත්
ආරංචියට ඇහුම්කන්දුන්නේ නැත.
මක්නිසාද: ස්වාමිනි, අපේ දන්වීම
විශ්වාසකළේ කවුදැයි යෙසායා කියයි.
17 මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද ක්‍රිස්තුස්-
වහන්සේගේ වචනයෙන් ඇසීමද
18 පැමිණෙන්නේය. නුමුත් ඔව්හු
නොඇසුවෝදැයි මම අසමි. එසේය,
සැබවින්,

ඔවුන්ගේ ශබ්දය පොළොව මුළුල්ලේද
ඔවුන්ගේ වචන ලෝකයේ සීමා
දක්වාද ගියේය.
නුමුත් ඉශ්‍රායෙල් නොදැන සිටියේදැයි 19
අසමි:
ජාතියක් නොවන්නන් කරණකොටගෙන
නුඹලා ජ්වලිතකරවන්නෙමි,
තේරුම් නැත්තාවූ ජාතියක්
කරණකොටගෙන නුඹලා
කෝපකරවන්නෙමියි
පළමුකොට මෝසෙස් කියයි. ඇරත් 20
යෙසායා ඉතා නිර්භීතව කථාකරමින්:
මා නොසෙවූවන්ට සම්බවීමි;
මා ගැන විභාග නොකළවුන්ට
ප්‍රකාශවීමියි
කියයි. නුමුත් ඔහු ඉශ්‍රායෙල් ගැන 21
කථාකොට: අකීකරුවූ විරුද්ධවාදීවූ
සෙනඟකට දවස මුළුල්ලේම මාගේ අත්
විදහාගෙන සිටියෙමියි කියයි.

## යට සී එපාකරනු ලැබීම කලකට පමණක් බව

එසේවී නම් දෙවියන්වහන්සේ 11
තමන්ගේ සෙනඟ අත්හැරදැමූසේක්දැයි
අසමි. එසේ නොවේවා. මක්නිසාද මමත්
ආබ්‍රහම්ගේ වංශයේ, බෙන්යමින්ගේ
ගෝත්‍රයේ ඉශ්‍රායෙලිතයෙක්ය.
දෙවියන්වහන්සේ පෙර ඇඳිනගත් 2
තමන්ගේ සෙනඟ අත්හැර නොදැමූසේක.
නොහොත් ලියවිල්ල එලියා ගැන කුමක්
කියන්නේද කියා දන්නේ නැද්ද? ඔහු
ඉශ්‍රායෙල්ට විරුද්ධව දෙවියන්වහන්සේට
කාරණා කියමින්: ස්වාමිනි, ඔව්හු ඔබගේ 3
අනාගතවක්තෘවරුන් මැරුවෝය, ඔබගේ
පූජාසන බිඳහෙළුවෝය. මම පමණක්
ඉතුරුව සිටිමි, ඔව්හු මාගෙන් දිවි
නසන්ට සොයතියි කීවේය. නුමුත් 4
දෙවියන්වහන්සේගේ උත්තරය ඔහුට
කුමක් කියන්නේද? බාල්ට දණ නොනැමූ
සත් දහසක් මනුෂ්‍යයන් මටම
ඉතුරුකරගතිමියි යනුය. එසේම මේ 5
කාලයේදීත් අනුග්‍රහයේ තෝරාගැනීමේ
ප්‍රකාරයට ඉතිරිවූ කොටසක් සිටියි. ඉදින් 6
අනුග්‍රහයෙන් නම් තවත් ක්‍රියාවලින්

නොවේ. එසේ නොවේ නම් අනුග්‍රහය
තවත් අනුග්‍රහය නොවේ. එසේවී නම්
7 කිමෙක්ද? ඉශ්‍රායෙල් සොයන දේ ඔහු
ලබා නොගත්තේය; තෝරාගනු
ලැබූවන්ට එය ලැබුණේය. සෙස්සෝ
8 දැඩිකරනු ලැබුවෝය. කලින් ලියා තිබෙන
ලෙස දෙවියන්වහන්සේ අද දවස
දක්වාම ඔවුන්ට නිදිමතකමේ
ආත්මයක්ද නොපෙනෙන ඇස්ද
9 නොඇසෙන කන්ද දුන්සේක. තවද දාවිත්
කථාකොට:

ඔවුන්ගේ මේසය ඔවුන්ට මලපතක්
හා උගුලක්ද
බාධාවක් හා විපාකයක්ද කරනු
ලැබේවා.
10 නොපෙනෙන ලෙස ඔවුන්ගේ ඇස්
අඳුරුවේවා,
නිතරම ඔවුන්ගේ පිට නැමුව මැනවයි
11 කියයි. එසේවී නම් ඔවුන් පැකිළුණේ
වැටෙන පිණිසදැයි අසමි. එසේ
නොවේවා. එහෙත් ඔවුන් ජ්වලිතකරවන
පිණිස ඔවුන්ගේ වැටීම කරණකොටගෙන
අන්‍යජාතීන්ට ගැළවීම පැමිණ තිබේ.
12 ඉදින් ඔවුන්ගේ වැටීම ලෝකයාට
සම්පතද ඔවුන්ගේ අලාභය අන්‍ය-
ජාතීන්ට සම්පතද වේ නම්, ඔවුන්ගේ
සම්පූර්ණත්වය ඊට කොපමණ වැඩියෙන්
එසේ නොවන්නේද?

## අන්‍යජාතීන්ට ගැළවීම. පැස්සීමේ නිදර්ශනය

13 නුමුත් මම අන්‍යජාතීවූ නුඹලාට
කථාකරමි. මම අන්‍යජාතීන්ට
ප්‍රේරිතයෙක්ව සිටින බැවින් මාගේ
14 මෙහෙයට ගෞරවකරමි. කුමටද? යම්
හෙයකින් මාගේම මාංසය වූවන්ට
ජ්වලිතය උපදවා, ඔවුන්ගෙන් සමහරෙක්
15 ගළවාගන්න පිණිසය. මක්නිසාද ඔවුන්
අත්හැරදැමීම ලෝකයා සමගිකිරීම නම්,
ඔවුන් පිළිගැනීම මළවුන් කෙරෙන් ජීවනය
16 මිස වෙන කුමක්ද? තවද ප්‍රථම පිටි
ශුද්ධ නම් පිඬද එසේමය. මුල ශුද්ධ
17 නම් අතුද එසේමය. නුමුත් සමහර අතු
කඩාදමනලද්දේ වී නම්, වල් ඔලීව
ගසක්වූ නුඹ ඒවා අතරේ පාස්සනු ලැබ.
ඔලීව ගසේ සාරවත්කමේ මුලට
පංගුකාරයෙක් වූයෙහි නම්. අතුවලට 18
විරුද්ධව පාරට්ටුකර නොගනින්න. නුමුත්
පාරට්ටුකරගත්තෙහි නම්, නුඹ විසින්
මුල දරනවා නොව මුල නුඹව
දරන්නේය. එසේවී නම් මා පාස්සනු 19
ලබන පිණිස අතු කඩාදමනලදැයි නුඹ
කියන්නෙහිය. හොඳයි; අවිශ්වාසකම 20
නිසා ඒවා කඩාදමනලද්දේය, නුඹද
නුඹේ ඇදහිල්ලෙන් ස්ථිරව සිටින්නෙහිය.
උඩඟු නොවී, භයවෙයන්න. මක්නිසාද 21
දෙවියන්වහන්සේ ස්වාභාවික අතු ඉතුරු
නොකළසේක් නම්. නුඹවත් ඉතුරු
නොකරනසේක. එබැවින් දෙවියන්- 22
වහන්සේගේ යහපත්කමත් සැරකමත්
බලාපන්න. වැටුණුවුන් කෙරෙහි
සැරකමය; නුමුත් නුඹ උන්වහන්සේගේ
යහපත්කමෙහි පවතින්නෙහි නම්
නුඹ කෙරෙහි දෙවියන්වහන්සේගේ
යහපත්කමය. එසේ නොපවතින්නෙහි නම්
නුඹත් කපාදමනු ලබන්නෙහිය. ඔව්හුද 23
අවිශ්වාසකමෙහිව නොපවතිත් නම්
පාස්සනු ලබන්නෝය. මක්නිසාද ඔවුන්
නැවත පාස්සන්ට දෙවියන්වහන්සේට
පුළුවන. මක්නිසාද නුඹ ස්වභාවයෙන්ම 24
වල් ඔලීව ගසින් කපනු ලැබ, ස්වභාවයට
විරුද්ධව හොඳ ඔලීව ගසකට පාස්සන
ලද්දෙහි නම් ස්වාභාවික අතු වන
මොව්හු තමුන්ගේම ඔලීව ගසට
කොපමණ වැඩි වශයෙන් පාස්සනු
නොලබන්නෝද?

## දෙවියන්වහන්සේගේ අවසාන අදහස හැම දෙනාටම කරුණාව දක්වීම බව

මක්නිසාද සහෝදරයෙනි, නුඹලාම 25
ඥානවන්තයෝයයි නොසිතන පිණිස, මේ
අභිරහස නුඹලා නොදැන සිටිනවාට
නොකැමැත්තෙමි, එනම් අන්‍ය ජාතීන්ගේ
සම්පූර්ණත්වය පැමිණෙන තුරු
ඉශ්‍රායෙල්වරුන්ට තරමක් දුරට
දැඩිකමක් පැමිණ තිබෙන බවය. මේ 26
ආකාරයෙන් මුළු ඉශ්‍රායෙල් ගළවනු
ලබන්නේය. ඒ හැටියට.
සියොන්හි සිට ගැළවුම්කාරයාණෝ

එනසේක;
උන්වහන්සේ යාකොබ්ගෙන් අභක්තිය
දුරුකරනසේක.
27 මා ඔවුන්ගේ පාප දුරලන කල
ඔවුන් කෙරෙහි මාගේ ගිවිසුම මේයයි
28 ලියනලද්දේය. ශුභාරංචිය ගැන නම්
ඔව්හු නුඹලා නිසා සතුරෝය. නුමුත්
තෝරාගැනීම ගැන නම් ඔව්හු පියවරුන්
29 නිසා ප්‍රේමලද්දෝය. මක්නිසාද
දෙවියන්වහන්සේගේ දීමනාද කැඳවීමද
30 වෙනස් නොවන්නේය. මක්නිසාද පසුගිය
කාලයෙහිදී නුඹලා දෙවියන්වහන්සේට
අකීකරුව සිට, ඔවුන්ගේ අකීකරුකම
නිසා දැන් යම්සේ කරුණාව ලැබුවහුද,
31 එසේම නුඹලාට දක්වනලද කරුණාව
කරණකොටගෙන ඔවුනුත් දැන් කරුණාව
ලබන පිණිස ඔව්හුද දැන් අකීකරුව
32 සිටිති. මක්නිසාද දෙවියන්වහන්සේ
සියල්ලන්ටම කරුණාකරන පිණිස
සියල්ලන්ම අකීකරුකමෙහි වසා
තැබූසේක.
33 අහෝ, දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙත්
දැනගැන්මෙත් බහුලත්වය කොපමණ
ගැඹුරුද! උන්වහන්සේගේ විනිශ්චයන්
සොයා දැනගැන්මත් උන්වහන්සේගේ
මාර්ගයන් තේරුම්ගැනීමත් කොපමණ
34 අමාරුද! එසේය, ස්වාමීන්වහන්සේගේ
සිත දැනගත්තේ කවුද? නොහොත්
උන්වහන්සේට මන්ත්‍රියා වූණේ කවුද!
35 නොහොත් පළමුවෙන් උන්වහන්සේට
යමක් දුන්නේ කවුද? දුන්නා නම් ඔහුට
36 ප්‍රතිඵල ලැබේ. මක්නිසාද සියල්ල
උන්වහන්සේ කෙරෙන්ය, උන්වහන්සේ
කරණකොටගෙනය, උන්වහන්සේ
උදෙසාය. උන්වහන්සේට සදාකල්ම
මහිමය වේවා. ආමෙන්.

## අලුත් ජීවිතය

12 එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ
ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ,
දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ
යාගයක් කොට ඔප්පුකරන හැටියට
දෙවියන්වහන්සේගේ දයාවත් නිසා
නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගේ
*ආත්මික සේවය වේ. නුඹලා මේ 2
ලෝකයේ ආකාරයට සමාන නොවී,
දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම්
යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය
කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත
අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ
වෙයල්ලා.

## ආත්මික දීමනා සුදුසු ලෙස ව්‍යවහාරකළ යුතු බව

නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා 3
තම තමා ගැන උතුම්කොට නොසිතා,
දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදුදුන්
ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණදැන
සිතන හැටියට, මට දෙන ලද
අනුග්‍රහයෙන් නුඹලා අතරෙහි
එකිනෙකාට කියමි. මක්නිසාද යම්සේ 4
අපට එකම ශරීරයෙහි බොහෝ අවයව
තිබෙන නුමුත් ඒ සියලු අවයවයන්ට
එකම ක්‍රියාවක් නැතුවාක්මෙන්, බොහෝ 5
දෙනෙක්වූ අපිත් ක්‍රිස්තුස්වහන්සේ තුළ
එසේම එක ශරීරයක්ව, වෙන් වෙන්
වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ
වෙමුව. එහෙයින් අපට දෙනලද 6
අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා
ඇත්තාවූ අපට ලැබුණේ අනාගත කීම
නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට
අනාගත වචන කියමු. සේවය නම් අපගේ 7
සේවයෙහි යෙදී සිටිමු. උගන්වන්නා
තමාගේ ඉගැන්වීමටත්, උපදේශ දෙන්නා 8
තමාගේ උපදේශ දීමටත් භාරවේවා.
දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද
ආණ්ඩුකරන තැනැත්තේ උනන්දුකමෙන්ද
කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න
ලීලාවෙන්ද එසේ කෙරේවා.

## ක්‍රිස්තියානි ජීවිතයේ ප්‍රතිපත්ති

ප්‍රේමය වංචා රහිත වේවා. නපුරට 9
පිළිකුල්කොට යහපතට ඇලුම්වෙයල්ලා.
සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට 10
ස්නේහවෙයල්ලා; ගෞරවයෙන් තම
තමාට වඩා අනික් අය උතුම් කොට
සලකාපල්ලා; උත්සාහවන්තකමේදී මැළි 11

*හෙවත්, සිහියට හුරු හෝ ඥනානුසාර.

නොවෙල්ලා; ආත්මයෙන් ජ්වලිතවෙයල්ලා;
ස්වාමීන්වහන්සේට සේවයකරපල්ලා;
12 බලාපොරොත්තුවෙහි ප්‍රීතිවෙයල්ලා;
දුකේදී ඉවසිලිවන්තව සිටපල්ලා;
යාච්ඤාවෙහි නොකඩව පැවතියල්ලා;
13 ශුද්ධවන්තයන්ගේ ඕනෑකම්වලදී
උපකාරකරපල්ලා; ආගන්තුක
14 සත්කාරයට ලැදිව සිටපල්ලා. තුඹලාට
පීඩාකරන්නන්ට ආශීර්වාද කරපල්ලා;
ශාප නොකොට ආශීර්වාදම කරපල්ලා.
15 ප්‍රීතිවෙන්නන් සමග ප්‍රීතිවෙයල්ලා;
16 අඬන්නන් සමග අඬාපල්ලා. එකිනෙකා
සමග එක්සිත්වෙයල්ලා. උසස් දේවල්හි
සිත නොතබා, පහත් *දේවලට
සිත අවනතකරපල්ලා. තුඹලාම
ඥානවන්තයෝයයි නොසිතල්ලා.
17 කාටවත් නපුරට නපුර නොකරල්ලා.
සියලු මනුෂ්‍යයන් ඉදිරියේ ශෝභන දේ
18 කරන්ට සිතට ගනිල්ලා. පුළුවන් නම්,
තුඹලාගෙන් විය හැකි ප්‍රමාණයට, සියලු
මනුෂ්‍යයන් සමග සමාදානයෙන්
19 සිටපල්ලා. ප්‍රේමවන්තයෙනි, පළි
නොගෙන, උදහසට ඉඩහැරපල්ලා.
මක්නිසාද: පළිගැනීම මාගේය; මම
විපාක දෙමියි ස්වාමීන්වහන්සේ
20 කියනසේකැයි ලියා තිබේ. තුමුත් තුඹේ
සතුරාට බඩගිනිවුවොත් ඔහුට කන්ට
දීපන්න; පිපාසවුවොත් ඔහුට බොන්ට
දීපන්න. එසේ කිරීමෙන් තුඹ ඔහුගේ
හිස පිට ගිනිඅඟුරු ගොඩකරන්නෙහිය.
21 නපුරුකමෙන් පරාජය නොවී,
යහපත්කමෙන් නපුරුකම පරාජයකරපල්ලා.

## ආණ්ඩුවට යටත්වීම

13 හැමදෙනාම බලයත් මුලාදෑනීන්ට
යටත්වෙත්වා. මක්නිසාද දෙවියන්-
වහන්සේගෙන් මිස කිසි මුලාදෑනිකමක්
නැත්තේය; ඇත්තාවූ මුලාදෑනිකම්
දෙවියන්වහන්සේ විසින් නියමකර තිබේ.
2 එබැවින් මුලාදෑනිකමට විරුද්ධව සිටින්නා
දෙවියන්වහන්සේගේ නියෝගයට
විරුද්ධව සිටියි. විරුද්ධව සිටින්නෝ
තමුන් පිටට දඬුවම් පමුණුවා ගන්නෝය.

*හෙවත්, අයවලුන්ගේ තරමට බැසපල්ලා.

මක්නිසාද ආණ්ඩුකාරයෝ නපුරු 3
ක්‍රියාවට මිස යහපත් ක්‍රියාවට භය
උපදවන්නෝ නොවෙති. තුඹ
මුලාදෑනියාට භයක් නැතුව සිටින්ට
කැමැත්තෙහිද? යහපත් දේ කරපන්න,
එවිට ඔහුගෙන් තුඹට ප්‍රශංසාව ලැබේ.
මක්නිසාද තුඹට යහපත පිණිස 4
ඔහු දෙවියන්වහන්සේගේ සේවකයෙක්ය.
තුමුත් තුඹ නපුර කෙරෙහි නම්,
භයවෙයන්න; මක්නිසාද ඔහු
නිරර්ථකයේ කඩුව නොදරයි. ඔහු
දෙවියන්වහන්සේගේ සේවකයෙක්ව,
නපුර කරන්නා කෙරෙහි උදහස
පමුණුවන පිණිස පළිගන්නා කෙනෙක්ය.
එබැවින් උදහස නිසා පමණක් නොව 5
හෘදයසාක්ෂිය නිසාද යටත්වෙන්ට
ඕනෑය. එසේය, තුඹලා සුංගම් දෙන්නෙත් 6
මේ නිසාය; මක්නිසාද ඔව්හු මේ
කාරණයෙහිම නොකඩව යෙදීසිටින්නාවූ
දෙවියන්වහන්සේගේ සේවකයෝය.
එබැවින් සියල්ලන්ට දෙන්ට යුතු දේ 7
දීපල්ලා. සුංගම් දෙන්ට නිස්සාට සුංගම්ද
අයබදු දෙන්ට නිස්සාට අයබදුද
දීපල්ලා; භයවෙන්ට නිස්සාට
භයවෙයල්ලා; ගෞරව ලබන්ට නිස්සාට
ගෞරවකරපල්ලා.

## සහෝදර ප්‍රේමය

එකිනෙකාට ප්‍රේමවීම මිස, අන් කිසිවක් 8
ගැන කිසිවෙකුට ණයව නොසිටිල්ලා.
මක්නිසාද තමාගේ අසල්වාසියාට
ප්‍රේමකරන්නා ව්‍යවස්ථාව සම්පූර්ණකර
තිබේ. මක්නිසාද: කාමමිථ්‍යාචාරය 9
නොකරව, මිනී නොමරව, සොරකම්
නොකරව, ලෝභ නොවව යන ආඥද,
වෙන යම් ආඥවක් ඇත්නම් ඒ ආඥවද:
තුඹට මෙන් තුඹේ අසල්වාසියාට
ප්‍රේමකරව යන මේ කීමෙහි අන්තර්ගතය.
ප්‍රේමය අසල්වාසියාට නපුරක් කරන්නේ 10
නැත. එබැවින් ප්‍රේමය නම් ව්‍යවස්ථාව
සම්පූර්ණකිරීමය.

## ක්‍රිස්තුස්වහන්සේගේ දවස ළංවීම

තවද කාලය දැන, එනම් දැන් තුඹලා 11
නින්දෙන් පිබිද සිටින්ට හරි වේලාවයයි

දැන. එසේ කරපල්ලා. මක්නිසාද අප
අදහාගත් කාලයේදී තිබුණාට වඩා
12 දැන් ගැළවීම අපට ළංව තිබේ. රාත්‍රිය
බොහෝසේ ඉකුත්ව ගියේය. දවාල ළඟය.
එබැවින් අන්ධකාරයේ ක්‍රියා අහකදමා.
13 ආලෝකයේ ආයුධ පැළඳගනිමු. ක්‍රීඩා
ඝෝෂාව සහ බීමත්කමෙන් හෝ
සල්ලාලකම සහ අනාචාරයෙන් හෝ
ඩබර සහ ඊර්ෂ්‍යාවෙන් හෝ නොහැසිර.
දවාලෙහි මෙන් ඔබින ලෙස හැසිරෙමු.
14 නුමුත් තෘෂ්ණා පූර්ණකරන පිණිස
මාංසයට පංගාඩමක් නොකොට.
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
පැළඳගනිල්ලා.

## සිත්හි යම් අමාරුකම් ඇත්තන් ගැන ඉවසිල්ල දැක්වීම

14 ඇදහිල්ලෙන් දුර්වල තැනැත්තා
පිළිගනිල්ලා. එහෙත් සැක සහිතවූ
2 වාදකිරීමට නොවේය. සියලු දේ
කන්ට පුළුවනැයි එක්කෙනෙක්
විශ්වාසකරන්නේය: නුමුත් දුර්වල
තැනැත්තේ එළවළු පමණක් කන්නේය.
3 කන තැනැත්තා නොකන තැනැත්තා
සුළුකොට නොසිතාවා: නොකන
තැනැත්තාද කන තැනැත්තා විනිශ්චය
නොකෙරේවා. මක්නිසාද දෙවියන්වහන්සේ
4 ඔහු පිළිගත්සේක. අනිකෙකුගේ
වැඩකාරයා විනිශ්චයකරන්නාවූ නුඹ
කවුද? ඔහු සිටියත් වැටුණත් ඒක අයිති
තමාගේම ස්වාමියාටය. එසේය. ඔහු
සිටුවනු ලබන්නේය: කුමක් හෙයින්ද ඔහුව
සිටුවන්ට ස්වාමීන්වහන්සේට බලය
5 ඇත්තේය. එක්කෙනෙක් එක දවසකට
වඩා වෙන දවසක් උතුමැයි සිතන්නේය.
වෙන කෙනෙක් සියලු දවස්ම
එකාකාරයයි සිතන්නේය. එක් එක්කෙනා
තම තමාගේ සිතින් නිසැකව සිටීවා.
6 දවස සලකන්නා ස්වාමීන්වහන්සේ
උදෙසා ඒක සලකන්නේය. කන
තැනැත්තාද දෙවියන්වහන්සේට
ස්තුතිකරන බැවින් කන්නේ ස්වාමීන්-
වහන්සේ උදෙසාය. නොකන තැනැත්තාත්.
ස්වාමීන්වහන්සේ උදෙසා නොකා සිට
දෙවියන්වහන්සේට ස්තුතිකරන්නේය.
මක්නිසාද අපෙන් කිසිවෙක් තමාම 7
උදෙසා ජීවත්වෙන්නේ නැත. කිසිවෙක්
තමාම උදෙසා නසින්නෙත් නැත.
මක්නිසාද ජීවත්වෙමු නම් ස්වාමීන්- 8
වහන්සේ උදෙසා ජීවත්වෙමුව: නසිමු
නම් ස්වාමීන්වහන්සේ උදෙසා නසිමුව.
ඒ නිසා ජීවත්වෙතත් මැරෙතත් අපි
ස්වාමීන්වහන්සේගේය. මක්නිසාද 9
ක්‍රිස්තුස්වහන්සේ නැසුණෙත් නැවත ජීවත්-
වුණෙත් මළවුන්ගේද ජීවතුන්ගේද
ස්වාමීන්වහන්සේ වන පිණිසය. එසේ 10
නම් නුඹ නුඹේ සහෝදරයා විනිශ්චය
කරන්නේ මක්නිසාද? නොහොත් නුඹ
නුඹේ සහෝදරයා කුමක් පිණිස
සුළුකොට සිතන්නෙහිද? මක්නිසාද
අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ
විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී
සිටින්නෙමුව. මක්නිසාද: 11

මා ජීවත්ව සිටිනු සැබෑවා සේම සෑම
දණහිස් මට නමන්නේය.
සෑම දිවද දෙවියන්වහන්සේට
ප්‍රශංසාකරන්නේය කියා ස්වාමීන්-
වහන්සේ කියනසේකැයි

ලියා තිබේ. එහෙයින් අප එක් එක්කෙනා 12
තම තමා ගැන දෙවියන්වහන්සේට
ගණන්දෙනවා ඇත.

එබැවින් අපි තවත් එකිනෙකා විනිශ්චය 13
නොකරමු. නුමුත් අනික් අතට තමාගේ
සහෝදරයා ඉදිරියෙහි පැකිලීමට
හේතුවක්වත් බාධාවක්වත් නොතබන්ට
නිශ්චයකරගනිල්ලා. යමෙක් යම් දෙයක් 14
අපවිත්‍රයයි සිතන්නේ නම් එය ඔහුට
අපවිත්‍රවා මිස. ස්වභාවෙන්ම අපවිත්‍ර
දෙයක් නැතැයි ස්වාමිවූ යේසුස්වහන්සේ
කරණකොටගෙන ඒකාන්තයෙන්ම දනිමි.
කෑම නිසා නුඹේ සහෝදරයා දුකට 15
පැමිණේ නම්. නුඹ තවත් ප්‍රේමයෙන්
යුක්තව හැසිරෙන්නේ නැත. යමෙකු නිසා
ක්‍රිස්තුස්වහන්සේ මළසේක්ද ඔහු නුඹේ
කෑමෙන් විනාශ නොකරන්න. එබැවින් 16
නුඹලාට තිබෙන යහපත ගැන අගුණ
කියනු නොලබාවා. මක්නිසාද දෙවියන්- 17
වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත්
නොව. ධර්මිෂ්ඨකමද සමාදනයද

ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ.
18 කුමක්හෙයින්ද ඒ කාරණාවලින්
ක්‍රිස්තුස්වහන්සේට සේවයකරන අය
දෙවියන්වහන්සේට ප්‍රසන්නවූද
මනුෂ්‍යයන් විසින් යහපතැයි
19 ඒත්තුගන්නාවූද කෙනෙක්ය. එබැවින් අපි
සමාදනය උපදවන කාරණාද එකිනෙකා
වැඩිදියුණුකරන්ට පුළුවන් කාරණාද
20 අනුව යමු. කෑම නිසා දෙවියන්-
වහන්සේගේ වැඩේ නාස්ති නොකරන්න.
සියලු දේම පවිත්‍රය; නුමුත් බාධා
උපදවන ලෙස කන මනුෂ්‍යයාට නපුරය.
21 මස් කෑමෙන්වත් මුද්‍රිකපානය බීමෙන්වත්
වෙන යමකින්වත් තුඹේ සහෝදරයා
බාධාවට පැමිණේද, එය නොකර සිටීම
22 හොඳය. තුඹට තිබෙන ඇදහිල්ල
දෙවියන්වහන්සේ ඉදිරියෙහි තුඹටම
තබාගනින්න. තමා විසින් යහපත්ය කියා
පිළිගන්නාවූ කාරණය ගැන තමාට
දෝෂ පමුණුවා නොගන්නාවූ තැනැත්තා
23 වාසනාවන්තය. නුමුත් සැකකරමින් කන
තැනැත්තා, ඇදහිල්ලෙන් යුක්තව
නොකන බැවින්, වරදට පත්කරනු ලැබ
සිටියි; ඇදහිල්ලෙන් නොවූ සියල්ල
පාපයය.

15 ඉදින් බලවත්වූ අප විසින්
අපම සතුටුකර නොගෙන,
බෙලහීනයන්ගේ දුර්වලකම් ඉසිලිය යුතුය.
2 අපෙන් එකිනෙකා තම තමාගේ
අසල්වාසියාගේ වැඩිදියුණුව පිණිස
යහපත සඳහා ඔහු සතුටුකෙරේවා.
3 මක්නිසාද: ඔබට නින්දකළවුන්ගේ නින්ද
මා පිටට පැමිණියේයයි ලියා තිබෙන
ලෙස ක්‍රිස්තුස්වහන්සේද තමන්ම
4 සතුටුකර නොගත්සේක. මක්නිසාද
ඉවසිල්ල කරණකොටගෙනද ලියවිලිවලින්
හටගන්න සැනසිල්ල කරණකොටගෙනද
අප බලාපොරොත්තු ඇතුව සිටින පිණිස,
පූර්වයෙහි ලියනලද සියල්ල අපගේ
ඉගෙනගැනීම සඳහා ලියනලද්දේය.
5 තුඹලා එක සිතින්ද එක කටින්ද අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ
දෙවියන්වහන්සේට ගෞරවකරන පිණිස,
6 ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ ආදර්ශය
ලෙස තුඹලා එකිනෙකා සමග එක්සිත්ව
සිටින්ට, ඉවසිල්ලේද සැනසිල්ලේද
දෙවියන්වහන්සේ වර දෙනසේක්වා.
එහෙයින් දෙවියන්වහන්සේගේ ගෞරවය 7
පිණිස ක්‍රිස්තුස්වහන්සේ තුඹලා පිළිගත්
ලෙසම තුඹලාත් එකිනෙකා පිළිගනිල්ලා.
මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්- 8
වහන්සේගේ සත්‍යතාව උදෙසා
චර්මඡේදයයේ මෙහෙකරුවෙක් වූසේකැයි
කියමි. කුමටද, පියවරුන්ට දුන්
පොරොන්දු ස්ථිරකරන පිණිසත්,
අන්‍යජාතීන් විසින් දෙවියන්වහන්සේගේ 9
දයාව ගැන උන්වහන්සේට ගෞරවකරන
පිණිසත්ය. ඒ හැටියට:
එබැවින් අන්‍යජාතීන් අතරේ ඔබ
වර්ණනාකරන්නෙමි,
ඔබගේ නාමයට ගීතිකා කියන්නෙමියි
ලියා තිබේ. නැවතත්: 10
අන්‍යජාතීනි, උන්වහන්සේගේ සෙනඟ
සමග ප්‍රීතිවෙයල්ලායයි
කියා තිබේ. නැවතත්: 11
සියලු අන්‍යජාතීනි, ස්වාමීන්වහන්සේට
ප්‍රශංසාකරපල්ලා;
සියලු වර්ගයෝ උන්වහන්සේට
ප්‍රශංසා කරපල්ලායයි
කියා තිබේ. නැවතත් යෙසායා: 12
යෙස්සේගේ මුලවූද
අන්‍යජාතීන් කෙරෙහි රජකම්කරන්ට
නැගිටින්නාවූද තැනන්වහන්සේ
එනසේක;
උන්වහන්සේ කෙරෙහි අන්‍යජාතීහු
බලාපොරොත්තුවන්නෝයයි
කියයි. ඉදින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ 13
බලයෙන් තුඹලා අධික බලාපොරොත්තුවෙන්
යුක්තව සිටින පිණිස, බලාපොරොත්තුවේ
දෙවියන්වහන්සේ ඇදහිල්ලෙන් වූ සියලු
ප්‍රීතියෙන්ද සමාදනයෙන්ද තුඹලා
පූර්ණකරනසේක්වා.

## ප්‍රේරිත තැන තම අදහස් නොවලහා ලියා යැවීමට හේතුව

මාගේ සහෝදරයෙනි, තුඹලාම 14
යහපත්කමින් පිරී, සියලු දනගැන්මෙන්
පූර්ණව, එකිනෙකාට දනමුතුකම් දෙන්ට
පොහොසත්වූ අය බව මමම
ඒකාන්තයෙන්ම දනිමි. එහෙත් මා විසින් 15
තුඹලාට නැවත සිහිකරවන්ට මෙන් වඩා

නිර්භීතකමින් තරමක් දුරට ලියන්නේ,
අන්‍යජාතීන් නමැති පූජාව
ශුද්ධාත්මයාණන්වහන්සේ විසින්
ශුද්ධකරනලද්දුව පිළිගත යුතු වන පිණිස,
16 දෙවියන්වහන්සේගේ ශුභාරංචියේ සේවය
පවත්වමින්, අන්‍යජාතීන්ට ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගේ සේවකයෙකු වීමට
දෙවියන්වහන්සේ මට දී තිබෙන
17 කරුණාව නිසාය. එහෙයින් දෙවියන්-
වහන්සේට අදළ කාරණා ගැන
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මාගේ
18 පාරට්ටුකරගැනීමක් තිබේ. මක්නිසාද
අන්‍යජාතීන්ගේ කීකරුවීම පිණිස
වචනයෙන්ද ක්‍රියාවෙන්ද, ලකුණුවල සහ
පුදුමවලත් බලයෙන්ද, ශුද්ධාත්මයාණන්ගේ
19 බලයෙන්ද, ක්‍රිස්තුස්වහන්සේ විසින් මා
කරණකොටගෙන කරවන ලද කාරණා
ගැන මිස, අන් කිසිවක් ගැන
කථාකරන්ට සිතටවත් නොගනිමි.
එසේම යෙරුසලම පටන් ඉල්ලුරිකය
දක්වා අවට රටවල ක්‍රිස්තුස්වහන්සේගේ
ශුභාරංචිය සම්පූර්ණ වශයෙන්
20 දේශනාකෙළෙමි. එසේය, වෙන
කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩ
නොනගන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ
නාමය සඳහන්කරනු ලැබූ තැන්වල
නොව:
21 උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ
අය දකින්නෝය,
උන්වහන්සේ ගැන නෑසූ අය
තේරුම්ගන්නෝයයි
ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනා
කරන්ට අභිප්‍රායකෙළෙමි.

## ප්‍රේරිත තැනගේ යෝජනා පිළිවෙළ

22 නුඹලා ළඟට මාගේ ඊම කීප වරක්
23 වැලකුණේත් ඒ නිසාය. නුමුත් දැන් මේ
රටවල මට තවත් ඉඩක් නැති බැවින්ද,
බොහෝ අවුරුදු ගණනක පටන් නුඹලා
ළඟට එන්ට මහත් ආශාවක් මට
24 තිබෙන බැවින්ද, මම ස්පාඤ්ඤයට යන
කල එන්නෙමි. (මක්නිසාද ගමනේදී
නුඹලා දකින්ටත්, නුඹලා එක්ව
සමාගම්වීමෙන් තරමක් දුරට තෘප්තියට
පැමුණුණායින් පසු නුඹලා විසින්ම එහාට
ඇරලනු ලබන්ටත් බලාපොරොත්තුවෙමි.)
නුමුත් දැනට මම ශුද්ධවන්තයන්ට 25
උපස්ථාන කරන පිණිස යෙරුසලමට
යමි. මක්නිසාද යෙරුසලමෙහි සිටින 26
ශුද්ධවන්තයන් අතරෙහිවූ දිළිඳුන් උදෙසා
සම්මාදමක් කිරීමට මකිදෝනියෙත්
අකායෙත් සභාවෝ ප්‍රසන්නවූවෝය.
එසේය, එය ඔවුන්ගේ ප්‍රසන්නය වූයේය; 27
තවද ඔව්හු ඔවුන්ගේ ණයකාරයෝය.
මක්නිසාද අන්‍යජාතීහු ඔවුන්ගේ ආත්මික
දේවල පංගුකාරයෝ වූවෝ නම්, මාංසික
දේවලින් ඔවුන්ටත් සේවයකිරීමට ඔව්හු
ණයව සිටිති. එහෙයින් මම මෙය 28
ඉෂ්ටකර, මේ ඵලය ඔවුන්ට මුද්‍රාකොට
දුන් ඉක්බිති, නුඹලා ළඟින් ස්පාඤ්ඤයට
යන්නෙමි. මා නුඹලා ළඟට එන 29
කල ක්‍රිස්තුස්වහන්සේගේ ආශීර්වාදයේ
පූර්ණත්වය ඇතුව මා එන බව දනිමි.
සහෝදරයෙනි, යුදයෙහි සිටින 30
අකීකරුවන්ගෙන් මා ගළවනු ලබන
ලෙසත්, යෙරුසලම උදෙසා මා කරන
උපස්ථානය ශුද්ධවන්තයන්ට ප්‍රසන්න
වන ලෙසත්, දෙවියන්වහන්සේගේ 31
කැමැත්ත කරණකොටගෙන සතුටින්
නුඹලා ළඟට ඇවිත් නුඹලා සමග නිවාඩු
ලබන ලෙසත්, නුඹලා මා උදෙසා 32
දෙවියන්වහන්සේට කරන නුඹලාගේ
යාච්ඤාවලදී මා සමග බලවත්ලෙස
වීර්යකරන හැටියට අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසාද
ආත්මයාණන්වහන්සේගේ ප්‍රේමය නිසාද
නුඹලාගෙන් ඉල්ලමි. ඉදින් සමාදානයේ 33
දෙවියන්වහන්සේ නුඹලා සියල්ලන් සමග
සිටිනසේක්වා. ආමෙන්.

## ආචාරකිරීම. බොරු ගුරුවරුන්ගෙන් මුළා නොවීමට අවවාද

16 කෙංක්‍රියේ තිබෙන සභාවෙහි
මෙහෙකාරියෙක්වූ ෆේබී නම් අපගේ
සහෝදරී ශුද්ධවන්තයන්ට ඔබිනාලෙස
නුඹලා විසින් ස්වාමීන්වහන්සේ තුළ
පිළිගනු ලබන ලෙසත්, ඈට නුඹලාගෙන් 2
ඕනෑකරන කවර කාරණයකදී නුමුත්
උපකාරකරන ලෙසත්, නුඹලාට ඈ

හාරකරමි. මක්නිසාද ඈ බොහෝ
දෙනෙකුගේද මාගේද උපකාරකාරියෙක්ව
සිටියාය.
3 ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මාගේ
හවුල් වැඩකාරයන්වූ, මාගේ ජීවිතය
උදෙසා තමුන්ගේ බෙල්ල දුන්නාවූ
ප්‍රිස්කාටද අකිලාටද ආචාරකරපල්ලා.
4 මා පමණක් නොව අන්‍යජාතීන්ගේ
සියලු සභාවෝද ඔවුන්ට ස්තුතිකරති.
5 ඔවුන්ගේ ගෙදර තිබෙන සභාවටත්
ආචාරකරපල්ලා. ක්‍රිස්තුස්වහන්සේට
ආසියාවේ ප්‍රථම ඵලවූ මාගේ ප්‍රියවූ
6 එපීනතස්ට ආචාරකරපල්ලා. තුඹලා
නිසා බොහෝ වෙහෙස දරුවාවූ
7 මරියාට ආචාරකරපල්ලා. ප්‍රේරිතයන්
අතරෙහි ප්‍රසිද්ධවූ, මට පළමුවෙන්
ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටියාවූ, මාගේ
නෑයන්වූ, මාගේ හවුල් හිරකාරයන්වූ
අන්ද්‍රෝනිකස්ට හා යූනියස්ට
8 ආචාරකරපල්ලා. ස්වාමීන්වහන්සේ
තුළ මාගේ ප්‍රියවූ අම්ප්ලියාතුස්ට
9 ආචාරකරපල්ලා. ක්‍රිස්තුස්වහන්සේ තුළ
අපගේ හවුල් සේවකයෙක්වූ උර්බානස්ටද
මාගේ ප්‍රියවූ ස්තාකිස්ටද ආචාර-
10 කරපල්ලා. ක්‍රිස්තුස්වහන්සේ තුළ පිළිගනු
ලැබූ අපෙල්ලස්ට ආචාරකරපල්ලා.
අරිස්තොබුලස්ගේ ගෙට අයිතිවූවන්ට
11 ආචාරකරපල්ලා. මාගේ නෑයාවූ
හෙරෝදියෝන්ට ආචාරකරපල්ලා.
නාර්කිසස්ගේ ගෙට අයිතිවූවන්ගෙන්
ස්වාමීන්වහන්සේ තුළ සිටින්නන්ට
12 ආචාරකරපල්ලා. ස්වාමීන්වහන්සේ තුළ
වැඩකරන ත්‍රෆේනාටද ත්‍රෆෝසාටද
ආචාරකරපල්ලා. ස්වාමීන්වහන්සේ තුළ
බොහෝ වෙහෙස දරුවාවූ ප්‍රියවූ පර්සිස්ට
13 ආචාරකරපල්ලා. ස්වාමීන්වහන්සේ තුළ
තෝරාගනු ලැබූවාවූ රූපස්ටද
ඔහුගෙත් මාගෙත් මෑණියන්ටද ආචාර-
14 කරපල්ලා. අසින්ක්‍රිතස්ටද ප්ලෙගෝන්ටද
හෙර්මෙස්ටද පත්‍රොබස්ටද හෙර්මස්ටද
ඔවුන් සමග සිටින්නාවූ සහෝදරයන්ටද
15 ආචාරකරපල්ලා. පිලොලොගස්ටද
ජූලියාටද නේරියස්ටද ඔහුගේ
සහෝදරීටද ඔලිම්පස්ටද ඔවුන් සමග
සිටින්නාවූ සියලු ශුද්ධවන්තයන්ටද
ආචාරකරපල්ලා. ශුද්ධවූ සිඹීමකින් 16
එකිනෙකාට ආචාරකරපල්ලා. ක්‍රිස්තුස්-
වහන්සේගේ සියලු සභාවෝ තුඹලාට
ආචාරකරති.
සහෝදරයෙනි, තුඹලා ඉගෙනගත් 17
ධර්මයට විරුද්ධව භේදයන්ද බාධාවට
හේතුවූ දේවල්ද උපදවන්නන් බලා,
ඔවුන්ගෙන් අහක්වෙන මෙන් තුඹලාගෙන්
ඉල්ලමි. මක්නිසාද එබඳු අය අපගේ 18
ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේට නොව
තමුන්ගේම බඩට සේවයකරමින්,
තමුන්ගේ සෞම්‍ය ප්‍රිය වචනවලින් අවංක
අයවලුන්ගේ සිත් මුළාකරති. මක්නිසාද 19
තුඹලාගේ කීකරුකම සියල්ලන්ටම
ප්‍රකාශවී තිබේ. එබැවින් තුඹලා ගැන
ප්‍රීතිවෙමි. එසේවී තුමුත් තුඹලා යහපත
ගැන ප්‍රඥවන්තව, නපුර ගැන නිවටව
සිටිනවාට කැමැත්තෙමි. සමාදානයේ 20
දෙවියන්වහන්සේද නොබෝ කලකින්
සාතන් තුඹලාගේ පාද යට දමා
පොඩිකරනසේක.
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ අනුග්‍රහය තුඹලා සමග
වේවා.
මාගේ හවුල් සේවකයෙක්වූ 21
තිමෝතියස්ද මාගේ නෑයෝවූ ලූකියස්ද
යාසෝන්ද සෝසිපාතර්ද තුඹලාට
ආචාරකරති. මේ ලියුම ලියන තර්තියස් 22
නම් මම ස්වාමීන්වහන්සේ තුළ තුඹලාට
ආචාරකරමි. මටද මුළු සභාවටද 23
ආගන්තුක සත්කාරකරන්නා වන
ගායස් තුඹලාට ආචාරකරයි. නුවර
භාණ්ඩාගාරිකවූ එරස්තස්ද සහෝදරවූ
ක්වර්තස්ද තුඹලාට ආචාරකරති.*
ඉතින් සදාකාලය පටන් නිශ්ශබ්දව 25
තිබී, දැන් එළිදරව්වී තිබෙන, අනාගත-
වක්තෘවරුන්ගේ ලියවිලිවලින් ප්‍රකාශ
කරනලදුව, ඇදහිල්ලේ කීකරුකම පිණිස
සියලු ජාතීන්ට සදාකාලික දෙවියන්-

*ඇතැම් පුරාණ පිටපත්වල: අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය තුඹලා සමග වේවා. ආමෙන් කියා 24 වෙනි පදයක් පෙනේ. ඒ පිටපත්වල 20 වෙනි පදයට ඇතුළත් මීට සමාන කොටස අත්හැර තිබේ.

වහන්සේගේ ආඥාව ලෙස දන්වනු
26 ලැබුවාවූ, ඒ රහස එළිදරව්වීමේ හැටියටද,
මාගේ ශුභාරංචියේ සහ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ ගැන දේශනාකිරීමේ
හැටියටද, නුඹලා ස්ථිරකරන්ට සමර්ථවූ,
එකම ප්‍රඥාවන්තවූ දෙවියන්වහන්සේට 27
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
සදාකල්ම ගෞරවය වේවා. ආමෙන්.

# ප්‍රේරිතවූ පාවුල් විසින් කොරින්ති‍වරුන්ට ලියනලද පළමුවෙනි පත්‍රය

## ආචාරකිරීම සහ ස්තුති දීම

1 දෙවියන්වහන්සේගේ කැමැත්තෙන්
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිත-
යෙක්ව සිටීමට කැඳවනු ලැබුවාවූ පාවුල්
සහ අපේ සහෝදරවූ සොස්තෙනස්
2 විසින්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි
පිරිසිදුකරනලද්දවූ, ශුද්ධවන්තව සිටීමට
කැඳවනලද්දවූ කොරින්තියෙහි තිබෙන
දෙවියන්වහන්සේගේ සභාවටද
ඔවුන්ගෙන් අපගෙන් ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු
තැන්වල යාච්ඤා කරන්නාවූ සියල්ලන්ටද
3 ලියා එවන වගනම්: අපගේ පියවූ
දෙවියන්වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගෙන්ද අනුග්‍රහයත්
සමාදානයත් තුඹලාට වේවා.
4 ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තුඹලාට
දෙනලද දෙවියන්වහන්සේගේ අනුග්‍රහය
නිසා මම තුඹලා ගැන මාගේ
දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරමි.
5 මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිය
6 තුඹලා තුළ ස්ථිරවූ ලෙසම, තුඹලා
සියලු කථාවෙහිද සියලු දැනගැනීමෙහිද
උන්වහන්සේ තුළ පොහොසත්
7 කරනලද්දහුය. මෙසේ තුඹලා කිසි
දීමනාවකින් අඩු නොව අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීම
8 බලා සිටින්නහුය. අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ දවසේදී තුඹලා
දෝෂ රහිතව සිටින පිණිස උන්වහන්සේ
අන්තිම දක්වා තුඹලා ස්ථිර කරනසේක.
9 ස්වකීය පුත්‍රවූ අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ සහභාගිකමට
තුඹලා කැඳවාගත් දෙවියන්වහන්සේ
විශ්වාසව සිටිනසේක.

## සභාවේ ඇතිවූ පක්ෂභජනය

ඉතින්, සහෝදරයෙනි, තුඹලා සියල්ලන් 10
විසින් එකම දේ කථාකරන හැටියටද,
තුඹලා අතරෙහි භේද නැතුව එක සිතින්
හා එක කල්පනාවෙන් එකහව සම්පූර්ණව
සිටින හැටියටද අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්
තුඹලාගෙන් ඉල්ලමි. මක්නිසාද මාගේ 11
සහෝදරයෙනි, තුඹලා අතරෙහි විවාද
තිබෙන බව ක්ලොයිගේ පවුලේ අය
මට දන්නුවෝය. ඉදින් මාගේ තේරුම 12
නම්, තුඹලා එක් එක්කෙනා: මම
පාවුල්ගේය; මම අපොල්ලොස්ගේය; මම
කේපස්ගේය; මම ක්‍රිස්තුස්වහන්සේගේයයි
කියන බවය. ක්‍රිස්තුස්වහන්සේ බෙදී 13
සිටිනසේක්ද? පාවුල් තුඹලා උදෙසා
කුරුසියෙහි ඇණගසනු ලැබුවේද?
නොහොත් පාවුල්ගේ *නාමයට තුඹලා
බව්තීස්මකරනු ලැබුවහුද? මාගේ 14
*නාමයට තුඹලා බව්තීස්ම කරනලදැයි
කියන්ට කිසිවෙකුට පුළුවන් නොවන
ලෙස ක්‍රිස්පස්ද ගායස්ද ඇර තුඹලාගෙන් 15
වෙන කිසිවෙකු මා විසින් †බව්තීස්ම
නොකළ බැවින් දෙවියන්වහන්සේට
ස්තුතිකරමි. ස්තේපනස්ගේ ගෙයි වැසියන්ද 16
†බව්තීස්ම කෙළෙමි. ඒ ඇර මම
වෙන කිසිවෙකු †බව්තීස්මකෙළෙම්දැයි
නොදනිමි. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ 17
මා යැවූවේ †බව්තීස්මකරන්ට නොව
ශුභාරංචිය දේශනාකරන්ටය. තුමුන්
ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය නිෂ්ඵල
නොවන පිණිස, වචනවල ඥානවන්තකමින්
(දේශනාකරන්ට) නොවේය.

---

*නාමය තුළට අවගාහනය.
†ආවගාහනය.

## කුරුසියේ බලය

18 මක්නිසාද කුරුසියේ වචනය
විනාශවන්නන්ට මෝඩකමය; නුමුත්
ගැළවෙන්නාවූ අපට ඒක දෙවියන්-
19 වහන්සේගේ බලයය. ඒ හැටියට:
මම ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාව නැති
කරන්නෙමි,
බුද්ධිමත් අයගේ බුද්ධිය පහකරන්-
නෙමියි
20 ලියා තිබේ. ප්‍රඥාවන්තයා කොතැනද?
ව්‍යවස්ථාව උගන්වන්නා කොතැනද? මේ
ලෝකයේ වාදකරන්නා කොතැනද?
ලෝකයාගේ ප්‍රඥාව දෙවියන්වහන්සේ
21 විසින් මෝඩකළා නොවේද? මක්නිසාද
දෙවියන්වහන්සේගේ ප්‍රඥාවේ හැටියට
ලෝකයා ස්වකීය ප්‍රඥාවෙන්
දෙවියන්වහන්සේව ඇඳින නොගත්
බැවින්, "දේශනාකිරීමේ මෝඩකම"
කරණකොටගෙන අදහන්නන් ගළවන්ට
දෙවියන්වහන්සේ සතුටුවූසේක.
22 කෙසේදයත්, යුදෙව්වරු ලකුණු ඉල්ලති.
23 ග්‍රීක්වරු ප්‍රඥාව සොයති. නුමුත් අපි
කුරුසියෙහි ඇණගසනු ලැබූ ක්‍රිස්තුස්-
වහන්සේ දේශනාකරමුව. උන්වහන්සේ
යුදෙව්වරුන්ට පැකිලීමක්ය, අන්‍යජාතීන්ට
24 මෝඩකමය; නුමුත් කැඳවනු ලැබූ
යුදෙව්වරුන්ට සහ ග්‍රීක්වරුන්ටත්
දෙවියන්වහන්සේගේ බලය සහ දෙවියන්-
25 වහන්සේගේ ප්‍රඥාවන්ය. මක්නිසාද
දෙවියන්වහන්සේගේ මෝඩකම
මනුෂ්‍යයන්ට වඩා ප්‍රඥාවන්තය; දෙවියන්-
වහන්සේගේ දුර්වලකම මනුෂ්‍යයන්ට
වඩා බලවත්ය.
26 මක්නිසාද සහෝදරයෙනි, නුඹලාගේ
කැඳවීම, එනම් මාංසය ලෙස ප්‍රඥාවන්ත
බොහෝ දෙනෙක්වත් බලවත්ත බොහෝ
දෙනෙක්වත් වංශවත් බොහෝ
දෙනෙක්වත් කැඳවනු නොලැබූ බව
27 බලාපල්ලා. නුමුත් දෙවියන්වහන්සේ
ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස
ලෝකයේ මෝඩ දේවල් තෝරාගත්සේක;
දෙවියන්වහන්සේ ශක්තිමත් දේ ලජ්ජාවට
පමුණුවන පිණිස ලෝකයේ දුර්වල
28 දේවල් තෝරාගත්සේක; ඇත්තාවූ දේවල්
නැතිකරන පිණිස නැති දේවල් වැනි
ලෝකයේ පහත් දේවල්ද සුළුකොට
සිතනු ලබන දේවල්ද දෙවියන්වහන්සේ
තෝරාගත්සේක. එසේ කළේ කොයි 29
මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ
ඉදිරියෙහි පාරට්ටුකර නොගන්නා
පිණිසය. නුමුත් උන්වහන්සේ 30
කරණකොටගෙන නුඹලා ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ තුළ සිටින්නහුය. ඒ
තැනන්වහන්සේ දෙවියන්වහන්සේගෙන්
අපට ප්‍රඥාව එනම් ධර්මිෂ්ඨකමද
ශුද්ධකමද මිදීමද කරනු ලැබූසේක.
එහෙයින්, ලියා තිබෙන ලෙස, ගරුකම් 31
කියන්නා ස්වාමීන්වහන්සේ කෙරෙහි
ගරුකම් කියාවා.

## විද්‍යානුකූල ඥානය සහ සැබෑ ප්‍රඥාව

2

ඒ හැටියට, සහෝදරයෙනි, මා
නුඹලා වෙතට ආ කල්හි දෙවියන්-
වහන්සේගේ රහස නුඹලාට එළිදරව්
කරමින් ආවා මිස කථාවේවත් ප්‍රඥාවේවත්
උතුම්කමින් යුක්තව නාවෙමි. මක්නිසාද 2
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේ
කුරුසියෙහි ඇණගසනු ලැබූ බවත් මිස
වෙන කිසිවක් නුඹලා අතරෙහි
නොදන සිටින්ට නියම කරගතිමි. මම 3
දුර්වලකමින්ද භයින්ද බොහෝ
වෙව්ලුමෙන්ද නුඹලා සමග සිටියෙමි.
මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් 4
ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින්
නොව ආත්මයාණන්වහන්සේගේද
බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ 5
නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ
බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන්
නොපිහිටන පිණිසය.
එසේවී නුමුත් සම්පූර්ණ තැනැත්තන් 6
අතරෙහි අපි ප්‍රඥාව කථාකරමුව. එනම්,
මේ ලෝකයේ, නොහොත් මේ ලෝකයේ
නැතිවීයන මූලාදෑනීන්ගේ ප්‍රඥාවක් නොව,
අපගේ ගෞරවය පිණිස ලෝකවලට 7
ප්‍රථම දෙවියන්වහන්සේ විසින් කලින්
නියමකරනලද්දවූ, සඟවා තුබූ,
දෙවියන්වහන්සේගේ ප්‍රඥාව අභිරහසක්
ලෙස කථාකරමුව. ඒ ප්‍රඥාව මේ 8
ලෝකයේ මූලාදෑනීන්ගෙන් කිසිවෙක්

නොදනියි. දැනගෙන සිටියා නම්
ඔවුන් මහත්තත්ත්වයේ ස්වාමීන්වහන්සේව
කුරුසියෙහි ඇණගසන්නේ නැත.
9 නුමුත් ලියා තිබෙන ලෙස:
දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේම
කරන්නන්ට සූදනම්කළ යම් දෙයක්
ඇද්ද
ඒ දේ ඇසට නොපෙනුණේය; කනට
නොඇසුණේය,
මනුෂ්‍යයාගේ සිතට නොපැමිණියේය.
10 නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය
ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන
අපට ඒ දේ එළිදරව්කළසේක. මක්නිසාද
ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය,
දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල්
11 විමසනසේක. මනුෂ්‍යයෙකුගේ කාරණා
මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය
හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක්
දන්නේද? එසේම දෙවියන්වහන්සේගේ
කාරණා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්
12 මිස වෙන කිසිවෙක් නොදනියි. නුමුත්
දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද
දේ අප විසින් දැනගන්නා පිණිස
ලෝකයේ ආත්මය නොව දෙවියන්-
13 වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව. අප
විසින් ඒ දේවල් කථාකරන්නෙත් මනුෂ්‍ය
ප්‍රඥාව කරණකොටගෙන උගන්වනලද
වචනවලින් නොව *ආත්මික දේවල්
ආත්මික දේ සමග සමානකර බලමින්
ආත්මයාණන්වහන්සේ විසින් උගන්වනලද
14 වචනවලින්ය. නුමුත් ජම්මික මනුෂ්‍යයා
දෙවියන්වහන්සේගේ ආත්මයාණන්-
වහන්සේගේ කාරණා පිළි නොගනියි.
ඒවා ඔහුට මෝඩකමය; ඒවා ආත්මිකලෙස
විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට
15 බැරිය. නුමුත් ආත්මික තැනැත්තේ සියල්ල
විමසයි, නුමුත් ඔහුම කිසිවෙකු විසින්
16 විමසනු නොලබයි. මක්නිසාද ස්වාමීන්-
වහන්සේට උගන්වන පිණිස
උන්වහන්සේගේ සිත දැනගත්තේ කවුද?
නුමුත් අපට ක්‍රිස්තුස්වහන්සේගේ සිත
ඇත්තේය.

---

*නොහොත්, ආත්මිකයන්ට ආත්මික
දේවල් තේරුම්කරදෙමින්.

## පක්ෂභජනය මාංසික බව

3 සහෝදරයෙනි, ආත්මිකයන්ට
මෙන් තුඹලාට කථාකරන්ට
නොහැකිව, මාංසිකයන්ටත් ක්‍රිස්තුස්-
වහන්සේ තුළ බිළිඳුන්ටත් මෙන්
කථාකෙළෙමි. මම තුඹලා දඩි කෑමෙන් 2
නොව කිරෙන් පෝෂණයකෙළෙමි; එසේ
කළේ තුඹලා ඒවා දරන්ට බැරිව සිටි
නිසාය. එසේය, දැනුත් බැරිය; මක්නිසාද 3
තුඹලා තවම මාංසිකය. තුඹලා අතරෙහි
ඊර්ෂ්‍යාවද විවාදයද ඇති බැවින්, තුඹලා
මාංසිකව මනුෂ්‍ය ප්‍රකාරයෙන්
හැසිරෙනවා නොවේද? මක්නිසාද 4
එක්කෙනෙක්: මම පාවුල්ගේය; වෙන
කෙනෙක්: මම අපොල්ලොස්ගේයයි
කියන කල, තුඹලා මාංසිකයෝ
නොවෙත්ද? ඉදින් අපොල්ලොස් කවුද? 5
පාවුල් කවුද? ස්වාමීන්වහන්සේ
එකිනෙකාට දුන් ලෙස තුඹලා ඇදහීමට
පැමිණෙවූ සේවකයෝය. මම 6
හිටෙවූවෙමි, අපොල්ලොස් වතුර
වත්කෙළේය; නුමුත් වර්ධනය දුන්නේ
දෙවියන්වහන්සේය. එබැවින් වර්ධනය 7
දෙන දෙවියන්වහන්සේ මිස හිටවන
තැනැත්තේද වතුර වත්කරන තැනැත්තේද
කිසිත් නැත. හිටවන තැනැත්තෙත් වතුර 8
වත්කරන තැනැත්තෙත් එකය. එක්
එක්කෙනා තම තමාගේ වැඩේ හැටියට
තම තමාගේ විපාකය ලබන්නේය.
මක්නිසාද අපි දෙවියන්වහන්සේගේ 9
හවුල් වැඩකරන්නෝය. තුඹලා දෙවියන්-
වහන්සේගේ කෙතය, දෙවියන්වහන්සේගේ
ගොඩනැගිල්ලය.

## ගුරුවරුන් පිට පැවරී තිබෙන වගකීම

මට දෙනලද දෙවියන්වහන්සේගේ 10
අනුග්‍රහ පරිද්දෙන් ප්‍රඥාවන්ත ප්‍රධාන
ගෘහකාරයෙකු මෙන් මම අත්තිවාරමක්
දැමීමි; වෙන කෙනෙක් ඒ පිට ගොඩනගයි.
නුමුත් එකිනෙකා ඒ පිට ගොඩනගන්නේ
කෙසේදැයි බලාගනීවා. මක්නිසාද දමා 11
තිබෙන අත්තිවාරම ඇර වෙන
අත්තිවාරමක් දමන්ට කවරෙකුටවත්

තුපුළුවන, ඒ අත්තිවාරම නම් යේසුස්
12 ක්‍රිස්තුස්වහන්සේය. තුමුත් අත්තිවාරම
පිට යමෙක් රන්, රිදී අනර්ඝ ගල්, ලී,
තෘණ, පිදුරු ගොඩනගන්නේ නම්,
13 එක් එක්කෙනාගේ කර්මාන්තය
ප්‍රකාශවන්නේය. මක්නිසාද එය
ගින්නෙන් එළිදරව්වන නිසා ඒ දවස
තෙමේ එය ප්‍රකාශකරන්නේය; එක්
එක්කෙනාගේ කර්මාන්තය කොයි
ආකාරදැයි ගින්නෙන්ම ඔප්පුවන්නේය.
14 ඒ පිට ගොඩනැගුවාවූ යම් කෙනෙකුගේ
කර්මාන්තය පවතී නම්, ඔහු විපාකයක්
15 ලබන්නේය. යම් කෙනෙකුගේ කර්මාන්තය
දැවීයන්නේ නම්, ඔහුට අලාභවන්නේය.
තුමුත් ඔහුම ගැළවෙන්නේය; එහෙත් ගිනි
මැදින් ගැළවුණාක්මෙන්ය.
16 තුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව
බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්-
වහන්සේ තුඹලා තුළ වාසය කරන බවද
17 නොදනිවුද? යමෙක් දෙවියන්වහන්සේගේ
මාළිගාව නාස්ති කරන්නේ නම්,
දෙවියන්වහන්සේ ඔහුව නාස්ති-
කරනසේක; මක්නිසාද දෙවියන්-
වහන්සේගේ මාළිගාව ශුද්ධය, *ඒ
මාළිගාව තුඹලාය.
18 කිසිවෙක් තමාම රවටා නොගනීවා.
තුඹලා අතරෙහි යමෙක් මේ ලෝකයෙහි
ප්‍රඥාවන්තයෙකැයි සිතන්නේ නම්, ඔහු
ප්‍රඥාවන්ත වන පිණිස මෝඩයෙක් වේවා.
19 මක්නිසාද මේ ලෝකයේ ප්‍රඥාව දෙවියන්-
වහන්සේ ඉදිරියෙහි මෝඩකමය. මක්නිසාද:
උන්වහන්සේ ප්‍රඥාවන්තයන් ඔවුන්ගේ
උපායවලින් අසුකරගන්නාසේකැයි
20 ලියා තිබේ. නැවතද: ස්වාමීන්වහන්සේ
ප්‍රඥාවන්තයන්ගේ කල්පනා නිෂ්ඵලව
තිබෙන බව දන්නාසේකැයි ලියා තිබේ.
21 එහෙයින් කවරෙක්වත් මනුෂ්‍යයන් ගැන
පාරට්ටු නොකෙරේවා. මක්නිසාද සියල්ල
22 තුඹලාගේය; පාවුල් හෝ අපොල්ලොස්
හෝ කේපස් හෝ ලෝකය හෝ ජීවනය
හෝ මරණය හෝ දැන් තිබෙන දේ
හෝ මතු පැමිණෙන දේ හෝ සියල්ල
23 තුඹලාගේය; තුඹලා ක්‍රිස්තුස්වහන්සේගේය;
ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේය.

*නොහොත්, තුඹලා එයාකාරය.

## ප්‍රේරිතවරුන් දෙවියන්වහන්සේට වගකිය යුතු බව

4 මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ
සේවකයන් මෙන්ද දෙවියන්-
වහන්සේගේ රහස්වල ගබඩාකාරයන්
මෙන්ද ගණන්ගනිත්වා. ඇරත් මෙහිදී 2
ගබඩාකාරයන්ගෙන් ඕනෑකරන්නේ එක
එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය. තුමුත් 3
තුඹලා විසින්වත් මනුෂ්‍ය විනිශ්චයෙන්වත්
මා විනිශ්චයකරනු ලැබීම මට ඉතා
සුළු දෙයක්ය. එසේය, මමම මා විනිශ්චය
නොකරමි. මක්නිසාද මට විරුද්ධව 4
කිසිවක් ඇති බව නොදනිමි; තුමුත්
ඒ නිසාම නිදෙස් නොවෙමි. මා
විනිශ්චයකරන්නේ ස්වාමීන්වහන්සේය.
එහෙයින් ස්වාමීන්වහන්සේ එන තුරු 5
කාලයට පළමුවෙන් කිසිවක් විනිශ්චය
නොකරල්ලා. උන්වහන්සේ අන්ධකාරයේ
සැඟවුණු දේ එළිදරව්කොට, සිත්වල
අදහස් ප්‍රකාශ කරනසේක; එවිට
එකිනෙකාට තම තමාගේ ප්‍රශංසාව
දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නේය.
ඉතින්, සහෝදරයෙනි, තුඹලා උදෙසා 6
මේ දේ උපමාවකින් අපොල්ලොස්ටත්
මටත් අදාළකොට කීමි. එසේ කරන්නේ
ලියා තිබෙන දේ ඉක්මවා නොයන්ට
තුඹලා අපෙන් ඉගෙන ගන්නා පිණිසත්
තුඹලාගෙන් කවරෙක්වත් එක්කෙනෙකු
උදෙසා අනිකෙකුට විරුද්ධව උඩඟු
නොවන පිණිසත්ය. මක්නිසාද තුඹට 7
වෙනස් වෙන්ට සලස්වන්නේ කවුද?
තුඹට ලැබුණ දේ හැර තුඹට ඇත්තේ
කිමෙක්ද? ඉදින් එය ලැබුණානම්
නොලැබුණාක්මෙන් පාරට්ටුකරගන්නේ
මක්නිසාද? දැනටම තුඹලා පූර්ණව 8
සිටින්නහුය, දැනටම තුඹලා ධනවන්තව
සිටින්නහුය, අප නැතුව තුඹලා
රජකම්කළහුය. එසේය, තුඹලා සමග
අපත් රජකම්කරන පිණිස තුඹලා
රජකම්කරවු නම් කැමැත්තෙමි.
මක්නිසාද ප්‍රේරිත වූ අප මරණයට 9
නියමකරනලද්දන් මෙන් අන්තිමයන්
කොට දෙවියන්වහන්සේ දැක්වූසේකැයි
සිතමි. මක්නිසාද, අපි ලෝකයටත්
දේවදූතයන්ටත් මනුෂ්‍යයන්ටත් ප්‍රදර්ශනයක්

10 කරනු ලබමුව. අපි ක්‍රිස්තුස්වහන්සේ
උදෙසා මෝඩයෝය. නුමුත් නුඹලා
ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රඥවන්තයෝය:
අපි දුර්වලය. නුමුත් නුඹලා ශක්තිමත්ය:
නුඹලාට ගෞරවය ඇත්තේය. නුමුත්
11 අපට ඇත්තේ අගෞරවයය. මේ පැය
දක්වාම ක්ෂුධාවද පිපාසායද විඳ. වස්ත්‍ර
නැතුව. පහර ලැබ, නියම වාසස්ථානයක්
12 නැතුව සිටිමුව. අපේම අත්වලින් වැඩකරමින්
වෙහෙසෙමුව. නින්ද ලබන කල අපි
ආශීර්වාදකරමුව; පීඩා ලබන කල අපි
13 ඉවසමුව; අපකීර්තිය ලබන කල අපි
අවවාද දෙමුව. මේ දක්වාම ලෝකයේ
කුණු මෙන්ද සියලු දේවල කසළ මෙන්ද
වී සිටිමුව.

## පියෙකු සේ අවවාදකිරීම හා තරවටුකිරීම

14 මා විසින් මේ දේ ලියන්නේ නුඹලා
ලජ්ජාවට පමුණුවන පිණිස නොව.
මාගේ ප්‍රිය දරුවන්ට මෙන් නුඹලාට
15 අවවාදකරන පිණිසය. මක්නිසාද
ක්‍රිස්තුස්වහන්සේ තුළ නුඹලාට දසදහසක්
ගුරුවරු ඇතත් නුඹලාට බොහෝ
පියවරු නැත. මක්නිසාද ශුභාරංචිය
කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේ තුළ මම නුඹලා ජනිතකෙළෙමි.
16 එහෙයින් නුඹලා මා ආදර්ශයට ගන්නත්
17 වන ලෙස නුඹලාගෙන් ඉල්ලමි. මේ පිණිස.
ස්වාමීන්වහන්සේ තුළ මාගේ ප්‍රියවූ
විශ්වාස දරුවාවූ තිමෝතියස් නුඹලා
ළඟට එවීමි. මා සියලු තැන්වල සියලු
සභාවලදී උගන්වන ප්‍රකාරයට
ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ මාගේ
මාර්ගයන් ඔහු නුඹලාට සිහිකරවනවා
18 ඇත. නුමුත් මා නුඹලා ළඟට එන්නේ
19 නැත කියා සමහරු උඩඟුව සිටිති. නුමුත්
ස්වාමීන්වහන්සේ කැමතිසේක් නම්
මම නුඹලා ළඟට වහාම ඇවිත්.
උඩඟුවූවන්ගේ කථාව නොව ඔවුන්ගේ
20 බලය දැනගන්නෙමි. මක්නිසාද
දෙවියන්වහන්සේගේ රාජ්‍යය
(ප්‍රකාශවන්නේ) කථාවෙන් නොව
21 බලයෙන්ය. නුඹලා කැමති කොයි
එකටද? මා නුඹලා ළඟට ඉපලක්
රැගෙන එනවාටද? නැතහොත්
ප්‍රේමයෙනුත් මෘදුකමේ ආත්මයෙනුත්
යුක්තව එනවාටද?

## බරපතළ අනාචාරයෙහි හැසිරීමක්

5 මිථ්‍යාදෘෂ්ටීන් අතරෙහිවත් නැති
ආකාර වේශ්‍යාකමක් නුඹලා
අතරෙහි තිබෙන බව ඇත්තටම
ආරංචිය: එනම්. නුඹලාගෙන් කෙනෙක්
තමාගේ පියාගේ භාර්යාව තබාගෙන
ඉන්න බවය. මේ ක්‍රියාව කළ තැනැත්තා 2
නුඹලාගෙන් පහකරනු ලබන පිණිස
ශෝකවෙනවා වෙනුවට. නුඹලා උඩඟුව
සිටිවුය. සැබවින් මම ශරීරයෙන් දුරුව 3
සිටිමි නුමුත් ආත්මයෙන් ළංව සිට. ළඟ
සිටියාක්මෙන්ම මේ දේ මෙසේ කළ
තැනැත්තා විනිශ්චය කෙළෙමි. එනම්. 4
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ
නාමයෙන්, නුඹලා සහ මාගේ ආත්මය
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ බලය
ඇතුව රැස්වුණාම. ආත්මය ස්වාමිවූ 5
යේසුස්වහන්සේගේ දවසේදී ගැළවෙන
පිණිස මාංසය නාස්තිවීම පිණිස මෙබඳු
තැනැත්තා සාතන්ට භාරදීමටය.
නුඹලාගේ පාරට්ටුකරගැනීම හොඳ 6
නැත. මුහුන් ටිකකින් මුළු පිඩ පිපෙන
බව නොදනිවුද? මුහුන් නැත්තාවූ නුඹලා 7
අලුත් පිඩක් වන පිණිස. පරණ මුහුන්
පහකරපල්ලා. කුමක්හෙයින්ද. අපගේ
පාස්කුව. එනම් ක්‍රිස්තුස්වහන්සේ. යාග
කරනලද්දේය. එබැවින් පරණ මුහුන්- 8
වලින්වත් ඊර්ෂ්‍යාවද දුෂ්ටකමද නැමති
මුහුන්වලින්වත් නොව අවංකකමද
සැබෑකමද නැමති මුහුන් නුමුසු
රොටියෙන් මංගල්‍යය පවත්වමු.
වේශ්‍යාකම්කරන්නන් සමග සමාගම් 9
නොපවත්වන ලෙස මාගේ ලියමනෙහි
නුඹලාට ලියූවෙමි: නුමුත් මේ ලෝකයෙහි 10
වේශ්‍යාකම්කරන්නන්වත් ලෝභයින් හා
කොල්ලකාරයන්වත් රූපවඳින්නන්වත්
සමග කොහෙත්ම සමාගම් නොපවත්වන
හැටියට නොවේය: එසේ කරන්ට නම්
නුඹලා ලෝකයෙන් අහක්ව යන්ට
ඕනෑය. නුමුත් සහෝදරයෙකැයි කියනලද 11

කෙනෙක් වේශ්‍යාකම්කරන්නෙක්වත්
ලෝභයෙක්වත් රූපවඳින්නෙක්වත්
නින්දකරන්නෙක්වත් බේබද්දෙක්වත්
කොල්ලකාරයෙක්වත් වේ නම්, එබන්දෙකු
සමග සමාගම් නොපවත්වන්ටද කැමවත්
නොකන්ටද දන් තුඹලාට ලියමි.
12 මක්නිසාද පිටත සිටින්නවුන් විනිශ්චය
කරන්ට මට ඇති කම මොකද? තුඹලා
වනාහි ඇතුළත සිටින්නන් විනිශ්චය
13 කරනවා නොවේද? එහෙත් පිටත
සිටින්නන් දෙවියන්වහන්සේ විනිශ්චය
කරනසේක. ඒ දුෂ්ටයා තුඹලා අතරෙන්
පහකරපල්ලා.

## ක්‍රිස්තියානිකාරයන් අතරේ නඩුකීම

6 තුඹලාගෙන් යමෙකුට තමාගේ
අසල්වාසියාට විරුද්ධව කාරණයක්
ඇත්නම්, ඔහු ශුද්ධවන්තයන් ඉදිරියෙහි
නොව අධර්මිෂ්ඨයන් ඉදිරියෙහි නඩු
2 කියන්ට හය නැද්ද? නොහොත් ශුද්ධ-
වන්තයන් ලෝකයා විනිශ්චයකරන බව
නොදනිවුද? ඉදින් තුඹලා විසින්
ලෝකයා විනිශ්චයකරනු ලබන්නේ නම්,
ඉතා සුළු කාරණා විනිශ්චයකරන්ට
3 තුඹලා නොවටින්නෝද? අපි දේවදූතයන්
විනිශ්චයකරන්නෙමුයයි තුඹලා දන්නේ
නැද්ද? එසේ නම් මේ ජීවිතයට අයිති
4 දේම විනිශ්චයකරන්ට බැරිද? ඉදින් මේ
ජීවිතයට අයිති දේ විනිශ්චයකරන්ට
තුඹලාට තිබේ නම් එසේ
විනිශ්චයකිරීමට සභාව විසින් සුළු
කොට සිතන නැනැත්තන් පත්කරන්නහුද?
5 මා මෙසේ කියන්නේ තුඹලාට ලජ්ජා
උපදවන පිණිසය. මොකද? තමාගේ
සහෝදරයන් අතරේ විනිශ්චය කරන්ට
පුළුවන්වූ එක ඥානවන්තයෙක්වත් තුඹලා
6 අතරෙහි නැද්ද? නුමුත් සහෝදරයා
සහෝදරයා සමග නඩු කියන්නේය.
ඒකත් නොඇදහිලිකාරයන් ඉදිරියෙහිය.
7 ඉතින් එකිනෙකා සමග තුඹලාට නඩු
ඇතුව තිබීම දනටම මුළුමනින්ම තුඹලාට
පාඩුවක්ය. ඒ වෙනුවට තුඹලා අයුක්තිය
නොවිඳින්නේ මන්ද? ඒ වෙනුවට අලාභය
8 නොවිඳින්නේ මන්ද? නුමුත් තුඹලාම
අයුක්තියත් අලාභයත් කරති, ඒත්
තුඹලාගේ සහෝදරයන්ටය. නොහොත් 9
අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ
රාජ්‍යය උරුමකරගන්නේ නැති බව
තුඹලා දන්නේ නැද්ද? නොරැවටෙල්ලා.
වේශ්‍යාකම්කරන්නෝවත් රූප-
වඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත්
ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින්
සමග අනාචාරකරන්නෝවත්, සොරුවත් 10
ලෝභයෝවත් බේබද්දෝවත් නින්ද-
කරන්නෝවත් කොල්ලකන්නෝවත්
දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර
නොගන්නෝය. තුඹලාගෙන් සමහරු 11
එබන්දෝව සිටියෝය. නුමුත් ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්ද
අපගේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්
තුළද තුඹලා සෝදනු ලැබුවහුය.
ශුද්ධකරනු ලැබුවහුය. ධර්මිෂ්ඨකරනු
ලැබුවහුය.

## ක්‍රිස්තියානිකාරකම හා නොගැළපෙන අපිරිසිදුකම

සියලු දේ ගැන මට නිදහස තිබේ: 12
නුමුත් සියල්ල ප්‍රයෝජන නැත. සියලු
දේ ගැන මට නිදහස තිබේ: නුමුත් මම
කිසිවකට වශග නොවන්නෙමි. කෑම 13
බඩ උදෙසාය. බඩ කෑම උදෙසාය.
නුමුත් දෙවියන්වහන්සේ ඒකත් ඒවාත්
නැතිකරනසේක. එහෙත් ශරීරය
තිබෙන්නේ වේශ්‍යාකම පිණිස නොව
ස්වාමීන්වහන්සේ උදෙසාය: ස්වාමීන්-
වහන්සේද ශරීරය උදෙසාය. දෙවියන්- 14
වහන්සේ ස්වාමීන්වහන්සේව නැගිටෙවූ-
සේක. අපත් තමන්වහන්සේගේ බලයෙන්
නැඟුටුවනසේක. තුඹලාගේ ශරීර 15
ක්‍රිස්තුස්වහන්සේගේ අවයවයන් බව
දන්නේ නැද්ද? එසේවී නම් මම
ක්‍රිස්තුස්වහන්සේගේ අවයවයන්
පැහැරගෙන වේශ්‍යාවියෙකුගේ අවයවයන්
කරම්ද? එසේ නොවේවා. නොහොත් 16
වේශ්‍යාවියෙකුට එක්වූ නැනැත්තේ එකම
ශරීරය වන බව නොදනිවුද? මක්නිසාද:
දෙදෙනම එක මාංසය වන්නෝයයි
උන්වහන්සේ කියනසේක. නුමුත් 17

ස්වාමීන්වහන්සේට එක්වූ තැනැත්තේ එක
18 ආත්මයය. වේශ්‍යාකම කෙරෙන් පලා
දුවපල්ලා. මනුෂ්‍යයා කරන්නාවූ සියලු
පව් ශරීරයෙන් පිටතය; නුමුත්
වේශ්‍යාකම්කරන්නා තමාගේම ශරීරයට
19 විරුද්ධව පව්කරන්නේය. නොහොත්
තුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන්
ලැබූ, තුඹලා තුළ ඇත්තාවූ
ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව
20 බව නොදනිවුද? තුඹලා තුඹලාටම
අයිති නැත; මක්නිසාද තුඹලා
මිලේටගනු ලැබුවහුය. එබැවින්
තුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට
ගෞරවකරපල්ලා.

## විවාහය සම්බන්ධ ප්‍රශ්න. අවිවාහක භාවය හා දික්කසාද

7 ඉදින් තුඹලා විසින් ලියනලද
කාරණා ගැනය. ස්ත්‍රියෙක් ස්පර්ශ
2 නොකිරීම මනුෂ්‍යයෙකුට හොඳය. නුමුත්
වේශ්‍යාකම් නිසා එක එක පුරුෂයා
තම තමාගේම භාර්යාවද එක එක
ස්ත්‍රී තම තමාගේ පුරුෂයාද ඇතිව සිටීවා.
3 පුරුෂයා භාර්යාවට යුතු දේ කරදේවා.
එසේම භාර්යාවත් පුරුෂයාට කරදේවා.
4 භාර්යාවගේ ශරීරය කෙරෙහි බලය
ඇත්තේ ඇට නොව පුරුෂයාටය. එසේම
පුරුෂයාගේ ශරීරය කෙරෙහි බලය
ඇත්තේ ඔහුට නොව භාර්යාවටය.
5 යාච්ඤාවේ යෙදීසිටීම පිණිස, දෙදෙනාගේ
කැමැත්ත ඇතුව, කලකට වෙන්ව සිටිනවා
මිස, නැත්නම් වෙන්ව නොසිටිල්ලා. එසේ
කළොත් තුඹලාගේ කාම ආශාව
මැඩපවත්වාගන්ට බැරි නිසා, සාතන්
තුඹලා පරීක්ෂා නොකරන පිණිස නැවත
6 එක්වෙයල්ලා. නුමුත් මෙය ආඥාවක්
කොට නොව අවසරයක් කොට කියමි.
7 එහෙත් සියලු මනුෂ්‍යයෝ මා සිටින
ලෙසම සිටින්නම් කැමැත්තෙමි. එසේවී
නුමුත් එක් කෙනෙකුට මේ ප්‍රකාරයටද
වෙන කෙනෙකුට ඒ ප්‍රකාරයටද
දෙවියන්වහන්සේගෙන් එකිනෙකාට
නියමවූ දීමනාවක් ඇත්තේය.

නුමුත් අවිවාහකයන්ටද වැන්දඹුවන්ටද 8
මා කියන්නේ ඔවුන් මා ලෙසම පැවතී
සිටියොත් ඔවුන්ට හොඳය කියාය. නුමුත් 9
ඔවුන්ට කාම ආශාවෙන් වැලකී සිටින්ට
බැරි නම් විවාහ වෙත්වා. මක්නිසාද
කාමදහයට වඩා විවාහය හොඳය.
නුමුත් විවාහවූවන්ට මම ආඥාකරමි, 10
එහෙත් ආඥාකරන්නේ මා නොව
ස්වාමීන්වහන්සේය. එනම්, භාර්යාව
පුරුෂයාගෙන් අහක්ව නොයේවා, (නුමුත් 11
ඇ අහක්ව ගියොත් විවාහ නොවී
සිටීවා, නැතහොත් ඇගේ පුරුෂයා හා
සමගිවේවා); පුරුෂයාද තමාගේ
භාර්යාව අත් නොහරීවා. නුමුත් 12
සෙස්සන්ට ස්වාමීන්වහන්සේ නොව
මම කියමි. යම් සහෝදරයෙකුට
නොඇදහිලිකාර භාර්යාවක් ඇත්නම්,
ඇ ඔහු සමග වාසයකරන්ට කැමති
නම්, ඔහු ඇ අත් නොහරීවා. යම් 13
ස්ත්‍රියෙකුට නොඇදහිලිකාර පුරුෂයෙක්
ඇත්නම්, ඔහු ඇ සමග වාසයකරන්ට
කැමතිනම්, ඇ ඔහු අත් නොහරීවා.
මක්නිසාද නොඇදහිලිකාර පුරුෂයා 14
භාර්යාව නිසා ශුද්ධකරනු ලැබ සිටියි,
නොඇදහිලිකාර භාර්යාවද සහෝදරයා
නිසා ශුද්ධකරනු ලැබ සිටියි. නැතහොත්
තුඹලාගේ දරුවෝ අපවිත්‍රය. නුමුත් දැන් 15
ඔව්හු ශුද්ධය. නුමුත් නොඇදහිලිකාර
පක්ෂය අහක්ව යේනම් අහක්ව යේවා.
මෙබඳු කාරණාවලදී සහෝදරයා හෝ
සහෝදරී හෝ බැඳී නැත. නුමුත්
දෙවියන්වහන්සේ විසින් අප කැඳවා
තිබෙන්නේ සමාදානයෙහි පැවතීමටය.
මක්නිසාද, භාර්යාව, තුඹ තුඹේ පුරුෂයා 16
ගළවන්නීදෝ තුඹ දන්නේ කොහොමද?
නොහොත් පුරුෂය, තුඹ තුඹේ භාර්යාව
ගළවන්නේදෝ තුඹ දන්නේ කොහොමද?
නුමුත් ස්වාමීන්වහන්සේ එක් එක්කෙනාට 17
බෙදා දුන් ප්‍රකාරයටද එක් එක්කෙනාව
දෙවියන්වහන්සේ කැඳෙවූ ප්‍රකාරයටද
හැසිරේවා. සියලු සභාවලදී මෙසේ
නියමකරමි. යමෙක් චර්මඡේදිතව 18
කැඳවනලද්දේද? ඔහු අචර්මඡේදිත
නොවේවා. යමෙක් අචර්මඡේද්‍යයේදී
කැඳවනලද්දේද? ඔහු චර්මඡේදිත

19 නොවේවා. දෙවියන්වහන්සේගේ ආඥා
පැවැත්වීම මිස චර්මඡේදනය කිසිත් නැත,
20 අචර්මඡේදනයද කිසිත් නැත. යම්
පදවියක එක් එක්කෙනා කැඳවනු
21 ලැබුයේද එහිම ඔහු පවතීවා. තුඹ
වාලෙක්ව සිටියදී කැඳවනු ලැබුයෙහිද?
ඒ ගැන නොසලකන්න. නුඹුත්
නිදහස්වන්ට පුළුවන් නම් ඒ ප්‍රයෝජනය
22 ලබාගනින්න. මක්නිසාද වාලෙක්ව
සිටියදී ස්වාමීන්වහන්සේ තුළ කැඳවනු
ලැබූ තැනැත්තේ ස්වාමීන්වහන්සේගේ
නිර්දාසයාය. එසේම නිර්දාසව සිටියදී
කැඳවනු ලැබූ තැනැත්තේ ක්‍රිස්තුස්-
23 වහන්සේගේ වාලෙක්ය. තුඹලා මිලේට
ගන්නාලද්දහුය; මනුෂ්‍යයන්ගේ වාල්ලු
24 නොවෙල්ලා. සහෝදරයෙනි, යම්
පදවියක එක් එක්කෙනා කැඳවන ලද්දේද
එහිම ඔහු දෙවියන්වහන්සේ වෙත
පවතීවා.

25 කන්‍යාවන් ගැන ස්වාමීන්වහන්සේගෙන්
ආඥාවක් මට නැත. නුමුත් විශ්වාසව
සිටින්ට ස්වාමීන්වහන්සේගෙන් දයාව
ලද්දෙකු මෙන් මාගේ කල්පනාව කියමි.
26 මේ කාලයේ තිබෙන විපත්තිය නිසා
මේක යහපතැයි සිතමි, එනම්,
මනුෂ්‍යයෙකුට ඔහු සිටින ලෙසම සිටීම
27 හොඳය. තුඹ භාර්යාවකට බැඳී
සිටින්නෙහිද? නිදහස්වෙන්ට නො-
සොයන්න. භාර්යාවකුගෙන් නිදහස්ව
සිටිනෙහිද? භාර්යාවක් නොසොයන්න.
28 එහෙත් විවාහවුවත් එයින් තුඹට පාපයක්
නැත; කන්‍යාවක්ද විවාහවුවත් එයින්
ඇට පාපයක් නැත. එසේවී නුමුත්
එබන්දන්ට මාංසයෙහි දුක් ඇතිවන්නේය.
මම තුඹලා එයින් වලක්වන්ට
29 කැමැත්තෙමි. නුමුත් සහෝදරයෙනි, කාලය
ලුහුඬුකරනලද්දේය. මෙතැන් පටන්
භාර්යාවන් ඇත්තෝ භාර්යාවන්
30 නැත්තන් මෙන්ද; අඬන්නෝ නාඬන්නන්
මෙන්ද, ප්‍රීතිවන්නෝ ප්‍රීති නොවන්නන්
මෙන්ද, මිලේට ගන්නෝ අයිති නැත්තන්
31 මෙන්ද; මේ ලෝකය භුක්තිවිඳින්නෝ
අධිකලෙස භුක්ති නොවිඳින්නන් මෙන්ද
සිටිය යුත්තෝයයි කියමි. මක්නිසාද
මේ ලෝකයේ අන්දම පහවෙවී යන්නේය.
තුඹලාද කරදර නැතුව සිටිනවාට 32
කැමැත්තෙමි. විවාහ නොවූ තැනැත්තේ
ස්වාමීන්වහන්සේව සතුටු කරන්නේ
කෙසේද කියා ස්වාමීන්වහන්සේගේ
කාරණා ගැන සලකන්නේය. විවාහවූ 33
තැනැත්තේ භාර්යාව සතුටු කරන්නේ
කෙසේද කියා ලෝකයේ කාරණා ගැන
සලකන්නේය. එසේම භාර්යාව හා 34
කන්‍යාව අතරෙහිද වෙනසක් ඇත.
විවාහ නොවූ තැනැත්තී ශරීරයෙන්ද
ආත්මයෙන්ද ශුද්ධව සිටින පිණිස
ස්වාමීන්වහන්සේගේ කාරණා ගැන
සලකන්නීය. නුමුත් විවාහවී සිටින
තැනැත්තී පුරුෂයා සතුටුකරන්නේ
කෙසේද කියා ලෝකයේ කාරණා ගැන
සලකන්නීය. මා මෙසේ කියන්නේ 35
තුඹලාට මලපතක් තබන පිණිස නොව,
සුදුසු දේ සඳහාත්, තුඹලා වියවුල් නොවී
ස්වාමීන්වහන්සේ කෙරෙහි යෙදීසිටින
පිණිසත්, තුඹලාගේම ප්‍රයෝජනයටය.
නුමුත් යමෙක් තමාගේ *කන්‍යා දුව 36
ගැන තමා සුදුසු ලෙස ක්‍රියා නොකරන
බව සිතේ නම්, ඈ ඇගේ තරුණ කාලය
පසුකොට සිටී නම්, ඕනෑකමක්ම තිබේ
නම්, ඔහු කැමති දෙයක් කෙරේවා; ඔහු
පව් නොකරයි; ඔව්හු විවාහවෙත්වා.
එසේවී නුමුත් ස්ථිර සිතින් යුක්තව 37
සිටින්නාවූද, ඕනෑකමක් නැත්තාවූද,
තමාගේම කැමැත්ත ගැන බලය
ඇත්තාවූද, තමාගේ *කන්‍යා දුව
රක්ෂාකරන්ට තමාගේ සිතින්
නියමකරගත්තාවූද තැනැත්තේ යහපතක්
කරයි. මෙසේ තමාගේ කන්‍යා දුව 38
විවාහකරදෙන තැනැත්තේ යහපතක්
කරයි; විවාහකර නොදෙන තැනැත්තේ
වඩා යහපතක් කරයි. භාර්යාවක් 39
තමාගේ පුරුෂයා ජීවත්ව සිටින තුරු
බැඳී සිටින්නීය; නුමුත් පුරුෂයා මළොත්,
ඈ කැමති කෙනෙකු සමග විවාහවන්ට
නිදහස්ව සිටින්නීය; නුමුත් †ස්වාමීන්-
වහන්සේ තුළ පමණක්ය. නුමුත් ඈ 40

*හෙවත්, කන්‍යාව.
†එනම්, ක්‍රිස්තියානිකාරයෙක් විය යුතුය.

සිටින ලෙසම සිටින්නීනම්, මාගේ
විනිශ්චයේ හැටියට ඈ වඩා
වාසනාවන්තියක්ය. දෙවියන්වහන්සේගේ
ආත්මයාණන්වහන්සේ මටත් ඇතිසේකැයි
සිතමි.

## දේවතා පිදවිලි සම්බන්ධ ප්‍රශ්නය

8 දේවතාවන්ට පුදනලද දේවල් ගැනය.
අප සියල්ලන්ටම ඥනය ඇති බව
දනිමුව. ඥනය උඩඟුකම උපදවයි, නුමුත්
2 ප්‍රේමය වැඩ සිද්ධකරයි. යමෙක් තමා
යමක් දන්නේයයි සිතයි නම්, ඔහු
දනගන්ට ඕනෑ ලෙස තවම දනගෙන
3 නැත; නුමුත් යමෙක් දෙවියන්වහන්සේට
ප්‍රේමකෙරේ නම්, ඔහු උන්වහන්සේ විසින්
4 දන්නා ලද්දේය. ඉතින් දේවතාවන්ට
පුදන ලද කෑම ගැන වනාහි, දේවතාවෙක්
ලෝකයෙහි කිසිත් නැති බවත්, එකම
දෙවිකෙනෙක් මිස අන් දෙවිකෙනෙක්
5 නැති බවත් දනිමුව. මක්නිසාද බොහෝ
දෙවිවරුන්ද බොහෝ ස්වාමිවරුන්ද
ඇත්තාක්මෙන්, ස්වර්ගයෙහි හෝ
පොළොවෙහි හෝ දෙවිවරුය කියන
6 නැනැත්තන් සිටින නුමුත්, අපට ඇත්තේ
එක දෙවිකෙනෙක් වන පියාණන්-
වහන්සේය. සියල්ල පැමිණ තිබෙන්නේ
උන්වහන්සේගෙන්ය, අපිත් උන්වහන්සේ
උදෙසාය. තවද අපට ඇත්තේ එක
ස්වාමීන්වහන්සේය, එනම් යේසුස්
ක්‍රිස්තුස්වහන්සේය. සියල්ල උන්වහන්සේ
කරණකොටගෙනය, අපිත් උන්වහන්සේ
කරණකොටගෙනය.

## දුර්වල සහෝදරයාගේ හෘදය සාක්ෂිය ගැන සැලකිලි සහිත විය යුතු බව

7 එසේවී නුමුත් මේ දනගැන්ම සියලු
මනුෂ්‍යයන් තුළ නැත. සමහරු මේ දක්වා
දේවතාවා විද්‍යමාන කෙනෙක්යයි
සිතන්ට පුරුදුවූයෙන්, දේවතා පිදවිල්ලක්
කොට කති; දුර්වලව තිබෙන ඔවුන්ගේ
8 හෘදයසාක්ෂියද කිලුටුවේ. නුමුත් කෑම
නිසා දෙවියන්වහන්සේට අප වඩා ප්‍රිය
අය වෙන්නේ නැත. නොකෑවාට අප
පහත් වෙන්නේවත් කෑවාට අප උතුම්
වෙන්නේවත් නැත. නුමුත් නුඹලාගේ මේ 9
නිදහස යම් අන්දමකින් දුර්වලයන්ට
බාධා හේතුවක් නොවන ලෙස
බලාගනිල්ලා. මක්නිසාද දනුම ඇත්තාවූ 10
නුඹ දේවාලයක කන්ට හිඳගන ඉන්නවා
යමෙක් දුටුවොත්, ඔහු දුර්වල නම්,
දේවතාවන්ට පුදනලද දේ කන්ට ඔහුගේ
හෘදය සාක්ෂිය ධෛර්ය නොවන්නේද?
මෙසේ ඒ සහෝදරයා නිසා ක්‍රිස්තුස්- 11
වහන්සේ මළ නුමුත්, දුර්වලවූ ඔහු නුඹේ
දනගැන්මෙන් විනාශවෙයි. මෙසේ නුඹලා 12
සහෝදරයන්ට විරුද්ධව පව්කරමින්
ඔවුන්ගේ දුර්වලවූ හෘදයසාක්ෂිය තුවාල
කරන විට, ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධව
පව්කරන්නෝය. එබැවින් කෑම මාගේ 13
සහෝදරයාට බාධාවක් වේ නම්, මාගේ
සහෝදරයාට බාධා නොපැමිණෙන
පිණිස, කිසි කලක මාංස නොකන්නෙමි.

## ශුභාරංචියෙන් රක්ෂාවෙන්ට දේශනාකාරයන්ට ඇති අවසරය අත්හැරීමෙන් ප්‍රේරිතතුමා දක්වූ ආදර්ශය

9 මම නිදහස් කෙනෙක් නොවෙමිද?
මම ප්‍රේරිතයෙක් නොවෙමිද? මම
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ නුදුටිමිද?
ස්වාමීන්වහන්සේ තුළ නුඹලා මාගේ
කර්මාන්තය නොවවුද? මම අන්‍යයන්ට 2
ප්‍රේරිතයෙක් නොවෙනත් නුඹලාට නම්
ප්‍රේරිතයෙක්ය. මක්නිසාද ස්වාමීන්-
වහන්සේ තුළ මාගේ ප්‍රේරිතකමේ මුද්‍රාව
නම් නුඹලාය. මා විචාරන්නන්ට මාගේ 3
උත්තරය නම් මේකය. කන්ටත් බොන්ටත් 4
අපට අවසර නැද්ද? අනික් ප්‍රේරිතයන්ද 5
ස්වාමීන්වහන්සේගේ සහෝදරයන්ද
කේපස්ද කරන්නාක්මෙන් ඇදහිලිවන්ත
භාර්යාවක් කැඳවාගෙන හැසිරෙන්ට
අපටත් අවසර නැද්ද? නොහොත් වැඩ 6
නොකර සිටින්ට අවසර නැත්තේ මටත්
බාර්ණබස්ටත් පමණක්ද? කොයි 7
කලකවත් තමාගේම වියදමෙන්
සේවාකම්කරන්නේ කවුද? මිදිවත්තක්

වවා එහි ඵල නොකන්නේ කවුද?
නොහොත් ගව රැළක් පෝෂ්‍යකොට
උන්ගේ කිරිවලින් නොකන්නේ කවුද?
8 මා මේ කාරණා කියන්නේ මනුෂ්‍ය
ප්‍රකාරයෙන්ද? නොහොත් ව්‍යවස්ථාවත්
9 එසේම නොකියාද? මක්නිසාද: ගොනා
ගොයම් පාගන විට උගේ කට
නොබඳුවයි මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහි
ලියා තිබේ. දෙවියන්වහන්සේ සලකන්නේ
10 ගවයන් ගැනද? නොහොත් එය
මුළුමනින්ම අප නිසා කියනසේක්ද?
එසේය, අප නිසා එය ලියනලද්දේය.
හාන්නා බලාපොරොත්තුවෙන් හාන්ට
ඕනෑ නිසාද, පාගන්නා කොටස
බලාපොරොත්තුවෙන් පාගන්ට ඕනෑ
11 නිසාද එසේ ලියනලද්දේය. අපි තුඹලාට
ආත්මික දේ වපුළෙමු නම්, තුඹලාගේ
මාංසික දේ කැපීම මහත් දෙයක්ද?
12 අන්‍යයෝ තුඹලා කෙරෙහි මේ බලයට
හවුල්වෙත් නම් ඊට වඩා අපට යුතු
නොවේද? එසේවී නුමුත් අපි මේ බලය
නොපවත්වා, ක්‍රිස්තුස්වහන්සේගේ
ශුභාරංචියට කිසි බාධාවක් නොකරන
13 පිණිස සියල්ල දරාගනිමුව. ශුද්ධ දේ
සම්බන්ධයෙන් මෙහෙකරන්නන්
දේවමාළිගාව සන්තක දෙයින් කන බවද
පූජාසනයේ සේවයකරන්නන් පූජාසනයට
පංගුකාරයන් වන බවද තුඹලා
14 දන්නේ නැද්ද? එසේම ශුභාරංචිය
ප්‍රකාශකරන්නන් විසින් ශුභාරංචිය
කරණකොටගෙන ජීවිකාව ලබන්ට
ස්වාමීන්වහන්සේ නියෝගකළසේක.
15 නුමුත් මා මේ දේවලින් කිසිවක්
ව්‍යවහාරකළේ නැත. මේ කාරණා මා
ලියන්නේ මට එසේ ලබාගන්නා
අදහසින් නොවේ. යමෙකු විසින් මාගේ
පාරට්ටුව හිස්කිරීමට වඩා මරණය මට
16 හොඳය. මක්නිසාද මම ශුභාරංචිය
දේශනා කරම් නුමුත් පාරට්ටුකරගැනීමට
මට කිසිත් නැත; මක්නිසාද එසේ
කිරීමට බැඳී සිටිමි; ශුභාරංචිය දේශනා
17 නොකළොත් මට දුක්වේ. මක්නිසාද
මේක මාගේ කැමැත්තෙන්ම කරම් නම්,
මට විපාකයක් තිබේ. කැමැත්තක් නැතුව
කළත් ගබඩාකාරකමක් මට භාරදී
තිබේ. එසේවී නම් මාගේ විපාකය 18
කිමෙක්ද? ඒ විපාකය නම් ශුභාරංචිය
දේශනාකරන කල මට තිබෙන බලය
සම්පූර්ණයෙන්ම පාවිච්චි නොකොට
ශුභාරංචිය නොමිලයේ පිහිටුවීමය.

## ක්‍රිස්තුස්වහන්සේ වෙතට මනුෂ්‍යයන් දිනාගැනීමට ප්‍රේරිත තැනගේ තද ආශාව

මක්නිසාද මම සියල්ලන්ගෙන් 19
නිදහස්ව සිටියෙමි නුමුත් වැඩිදෙනෙකු
දිනාගන්නා පිණිස සියල්ලන්ට මා
දසයෙක් කරගතිමි. යුදෙව්වරුන් 20
දිනාගන්නා පිණිස යුදෙව්වරුන් අතරෙහි
යුදෙව්වෙකු මෙන්ද ව්‍යවස්ථාව යටතේ
නොසිටින මම ව්‍යවස්ථාවට යටත්වූවන්
දිනාගන්නා පිණිස, ව්‍යවස්ථාව යටතේ
සිටින්නන්ට ව්‍යවස්ථාව යටතේ සිටින
කෙනෙකු මෙන්ද වුණෙමි. මම 21
ව්‍යවස්ථාව නැත්තවුන් දිනාගන්නා
පිණිස, ව්‍යවස්ථාව නැත්තන්ට ව්‍යවස්ථාව
නැති කෙනෙකු මෙන් වුණෙමි. එහෙත්
දෙවියන්වහන්සේ කෙරෙහි ව්‍යවස්ථාවක්
නැතුව නොව ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි
ව්‍යවස්ථාවට යටත්ව සිටිමි. දුර්වලයන් 22
දිනාගන්නා පිණිස දුර්වලයන්ට
දුර්වලයෙක් වුණෙමි. සියලු ආකාරයෙන්ම
සමහරෙකු ගළවන පිණිස මම සියල්ලන්ට
සියල්ල වුණෙමි. තවද ශුභාරංචියේ 23
පංගුකාරයෙක් වෙන පිණිස ශුභාරංචිය
උදෙසා සියල්ල කරමි.

## ජයග්‍රහණය සඳහා වූවමනා උත්සාහය

දුවන ස්ථානයෙහි සියල්ලන්ම දුවන 24
නුමුත් තෑග්ග ලබන්නේ එක්කෙනෙක්ම
බව නොදනිවුද? එසේම තුඹලාත්
ලබාගන්නා පිණිස දුවපල්ලා. දිනන 25
පිණිස වීර්යකරන්නාවූ සියල්ලෝම
සියල්ලෙහි පමණ දැන හැසිරෙති. ඔවුන්
එසේ කරන්නේ දිරන්නාවූ ඔටුන්නක්
ලබාගන්න පිණිසය; අප වනාහි
නොදිරන එකක් ලබාගන්නා පිණිසය.

26 එබැවින් මා දුවන්නේ සැකයෙන් මෙන්
නොවේය; පහරදෙන්නේ හුළඟට
27 පහරදෙන්නාක්මෙන් නොවේය. නුමුත්
මාගේ ශරීරය දමනයකර වාල්කමට
පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට
දේශනාකළාට පසු කොයි ලෙසකින්වත්
මාම එපාකරනු නොලබන පිණිසය.

## ඉශ්‍රායෙල්වරුන්ගේ වැටීම අපගේ ප්‍රවේසම පිණිස ආදර්ශ බව

10 මක්නිසාද සහෝදරයෙනි, අපගේ
පියවරු සියල්ලන් වලාකුළ යට
සිටි බවත්, සියල්ලන්ම මුහුද මැදින්
2 ගිය බවත්, සියල්ලන්ම වලාකුළෙහිද
මුහුදෙහිද *මෝසෙස්ට බව්තීස්මකරනු
3 ලැබූ බවත්, සියල්ලන්ම එම ආත්මික
4 කෑම කෑ බවත්, සියල්ලන්ම එම ආත්මික
බීම බී බවත්, නුඹලා නොදන සිටිනවාට
නොකැමැත්තෙමි. මක්නිසාද ඔව්හු
තමුන් අනුව ගියාවූ ආත්මික
පර්වතයකින් බීවෝය. ඒ පර්වතය නම්
5 ක්‍රිස්තුස්වහන්සේය. එසේවී නුමුත්
ඔවුන්ගෙන් වැඩිදෙනාට දෙවියන්වහන්සේ
ප්‍රසන්න නොවූසේක. එබැවින් ඔව්හු
කාන්තාරයෙහි හෙළාදමනු ලැබුවෝය.
6 ඉදින් ඔවුන් නපුරු දේවලට
ආශාවුණාක්මෙන් අප විසිනුත් ආශා
නොවන පිණිස මේ කාරණා අපට
7 ආදර්ශ විය. සෙනඟ කන්ටද බොන්ටද
හිඳ, ක්‍රීඩාකරන්ට නැගුටුණෝයයි ලියා
තිබෙන ලෙස, ඔවුන්ගෙන් සමහරෙකු
මෙන් රූපවඳින්නෝ නොවෙල්ලා.
8 ඔවුන්ගෙන් සමහරෙක් වේශ්‍යාකම්-
කළාක්මෙන් අපි වේශ්‍යාකම් නොකරමු,
එයින් එක දවසෙහි විසිතුන්දහස් දෙනෙක්
9 විනාශවුණෝය. අපි ස්වාමීන්වහන්සේ
පරීක්ෂා නොකරමු, ඔවුන්ගෙන්
සමහරෙක් පරීක්ෂාකොට සර්පයන්ගෙන්
10 නාස්තිවුණෝය. නුඹලා නොකොඳුරල්ලා,
ඔවුන්ගෙන් සමහරෙක් කොඳුරා,
11 විනාශකයාගෙන් නාස්තිවුණෝය. ඒ
සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට
සිද්ධවුණේය; ඒවා ලියා තිබෙන්නේ
කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ
අපට අවවාද පිණිසය. එහෙයින් තමා 12
කෙලින් සිටින්නේයයි සිතන තැනැත්තේ
නොවැටෙන්ට බලාගනීවා. මනුෂ්‍යයා 13
විසින් ඉසිලිය හැකි පරීක්ෂාවක් මිස
අනිකක් නුඹලාට පැමුණුණේ නැත. නුමුත්
දෙවියන්වහන්සේ විශ්වාස කෙනෙක්ය.
උන්වහන්සේ නුඹලාගේ පුළුවන්කමට
වඩා නුඹලා පරීක්ෂාකරනු ලබන්ට ඉඩ
නොදී, නුඹලාට පරීක්ෂාව ඉවසිය
හැකිවන පිණිස ඒ සමග ගැළවෙන
මාර්ගයද සාදදෙනසේක.

## රූප ඇදහීමට අයත් ක්‍රියාවලින් වැලකී සිටිය යුතු බව

එහෙයින් මාගේ ප්‍රේමවන්තයෙනි, රූප 14
ඇදහීම කෙරෙන් පලා දුවපල්ලා.
ඥනවන්තයන්ට මෙන් කථාකරමි; මා 15
කියන දේ නුඹලාම විනිශ්වයකරපල්ලා.
අප විසින් ආශීර්වාදකරන ආශීර්වාද 16
කුසලාන වනාහි ක්‍රිස්තුස්වහන්සේගේ
ලෙයේ සහභාගිකමක් නොවේද? අප
විසින් කඩන රොටිය ක්‍රිස්තුස්වහන්සේගේ
ශරීරයේ සහභාගිකමක් නොවේද?
කුමක්හෙයින්ද බොහෝ දෙනෙක් වූ අපි 17
එක රොටියක්ය, එක ශරීරයක්ය.
මක්නිසාද අපි සියල්ලෝ එක රොටියේ
පංගුකාරයෝව සිටිමුව. මාංස ප්‍රකාරවූ 18
ඉශ්‍රායෙල් බලාපල්ලා. පූජාවන් කන
අය පූජාසනය සමග සහභාගිවන්නෝ
නොවෙද්ද? එසේවී නම් කුමක් කියම්ද? 19
දේවතා පිදවිල්ලක් යමක්ය කියාවත්
නොහොත් දේවතාවෙක් යමක්ය කියාවත්
කියම්ද? නුමුත් මිථ්‍යාදෘෂ්ටීන් පූජාකරන 20
දේ ඔවුන් පූජාකරන්නේ දෙවියන්-
වහන්සේට නොව යක්ෂයන්ටයයි කියමි.
නුඹලා යක්ෂයන් සමග සහභාගිව
සිටිනවාට නොකැමැත්තෙමි. නුඹලාට 21
ස්වාමීන්වහන්සේගේ කුසලානෙන්ද
යක්ෂයන්ගේ කුසලානෙන්ද බොන්ට
නුපුළුවන. ස්වාමීන්වහන්සේගේ
මේසයටද යක්ෂයන්ගේ මේසයටද
පංගුකාරයන් වන්ට නුඹලාට නුපුළුවන.

*මෝසෙස් තුළටම අවගාහනය.

22 නොහොත් අපි ස්වාමීන්වහන්සේ
උදහස්කරමුද? අපි උන්වහන්සේට වඩා
බලවත්ද?
23 සියලු දේ ගැන නිදහස තිබේ; නුමුත්
සියල්ල යෝග්‍ය නොවේ. සියල්ල ගැන
නිදහස තිබේ; නුමුත් සියල්ල වර්ධනය
24 නොකෙරේ. කිසිවෙක් තමාගේම කාරණා
නොසොයා, එකිනෙකා තම තමාගේ
අසල්වාසියාගේ යහපත සොයාවා.
25 මස්කඩේ විකුණන කොයි දෙයක්
නුමුත්, හෘදයසාක්ෂිය නිසා කිසිවක්
නොවිචාරා කාපල්ලා; මක්නිසාද
පොළොවත් එහි සම්පූර්ණකමත් ස්වාමීන්-
26 වහන්සේගේය. නොඅදහන්නන්ගෙන්
යමෙක් නුඹලා කෑමට කැඳෙවූ කල
27 නුඹලා යන්ට කැමති නම්, නුඹලා
ඉදිරියෙහි තබනලද කොයි දෙයක්
නුමුත්, හෘදයසාක්ෂිය නිසා කිසිවක්
28 නොවිචාරා, කාපල්ලා. නුමුත්: මේක
දේවතා පිදවිල්ලක්යයි යමෙක් නුඹලාට
කීවොත්, දන්වූ තැනැත්තා නිසාත්
හෘදයසාක්ෂිය නිසාත් නොකා සිටපන්න.
29 හෘදයසාක්ෂිය නිසායයි මා කියන්නේ
නුඹේම හෘදයසාක්ෂිය ගැන නොව
අනික් අයගේ හෘදයසාක්ෂිය ගැනය;
මාගේ නිදහස්කම අන් කෙනෙකුගේ
හෘදයසාක්ෂියේ හැටියට විනිශ්චයකරන්නේ
30 මන්ද? මම ස්තුති දීමෙන් කන්නෙම්
නම්, මා ස්තුති දෙන්නාවූ ඒ දේ
ගැන මක්නිසා අපහාසකරනු ලබම්ද?
31 එහෙයින් නුඹලා කනත් බොනත් වෙන
යමක් කරනත් සියල්ල දෙවියන්-
වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා.
32 මම මාගේම ප්‍රයෝජනය නොසොයා,
බොහෝ දෙනෙක් ගැළවෙන පිණිස
ඔවුන්ගේ ප්‍රයෝජනය සොයා, සියලු
දේවලදී යම්සේ සියල්ලන් ප්‍රසන්න
33 කරම්ද, එසේම නුඹලාත් යුදෙව්-
වරුන්ටවත් ග්‍රීක්වරුන්ටවත් දෙවියන්-
වහන්සේගේ සභාවටවත් බාධා
11 හේතු නොවී සිටපල්ලා. මා
ක්‍රිස්තුස්වහන්සේව ආදර්ශයට
ගන්නාක්මෙන් නුඹලා මා ආදර්ශයට
ගනිල්ලා.

ඉතින් නුඹලා සියල්ලෙහිදී මා සිහිකර, 2
මා විසින් නුඹලාට භාරදුන් නියෝග
භාරදුන් හැටියට පවත්වන නිසා නුඹලාට
ප්‍රශංසාකරමි. නුමුත් එක එක පුරුෂයාගේ 3
හිස ක්‍රිස්තුස්වහන්සේ බවද, ස්ත්‍රියගේ
හිස පුරුෂයා බවද, ක්‍රිස්තුස්වහන්සේගේ
හිස දෙවියන්වහන්සේ බවද නුඹලා
දැනගන්නවාට කැමැත්තෙමි. හිස 4
වසාගෙන යාච්ඤා කරන්නාවූ නොහොත්
ධර්මවාක්‍ය පවසන්නාවූ පුරුෂයා
තමාගේ හිසට අගෞරවකරයි. නුමුත් 5
හිස නොවසා යාච්ඤා කරන්නාවූ
නොහොත් ධර්මවාක්‍ය පවසන්නාවූ ස්ත්‍රී
තමාගේ හිසට අගෞරව කරන්නීය.
මක්නිසාද ඈ මුඩුකළ හිස ඇත්තියකට
සමානය. මක්නිසාද ස්ත්‍රියෙක් හිස වසා 6
නොගනිතොත් හිසකේ කපාගනීවා.
නුමුත් ස්ත්‍රියකට හිසකේ කැපීමවත්
මුඩුකිරීමවත් ලජ්ජාවක් නම් ඈ
හිස වැස්මක් ඇතුව සිටීවා. පුරුෂයා 7
දෙවියන්වහන්සේගේ රූපයද ගෞරවයද
බැවින් ඔහුට තම හිස වසන්ට කිසිසේත්
යුතු නැත. නුමුත් ස්ත්‍රිය පුරුෂයාගේ
ගෞරවයය. මක්නිසාද පුරුෂයා 8
ස්ත්‍රියගෙන් නොව, ස්ත්‍රිය පුරුෂයාගෙන්ය.
තවද පුරුෂයා ස්ත්‍රිය නිසා නොව ස්ත්‍රිය 9
පුරුෂයා නිසා මවනලද්දීය. එහෙයින් 10
දේවදූතයන් නිසා බලයට යටත්වීමේ
ලකුණක් හිසේ ඇතුව සිටින්ට ස්ත්‍රීට
යුතුය. ඒ කෙසේවී නුමුත් ස්වාමීන්- 11
වහන්සේ තුළ පුරුෂයා නැතුව ස්ත්‍රියවත්
ස්ත්‍රිය නැතුව පුරුෂයාවත් නැත.
මක්නිසාද ස්ත්‍රී පුරුෂයාගෙන් වුණාක්මෙන් 12
පුරුෂයාත් ස්ත්‍රිය කරණකොටගෙන
වන්නේය; නුමුත් සියල්ල දෙවියන්-
වහන්සේගෙන්ය. හිස නොවසා 13
දෙවියන්වහන්සේට යාච්ඤාකරන්ට
ස්ත්‍රියකට හොබනේද කියා නුඹලා
තුළම විනිශ්චයකරපල්ලා. පුරුෂයෙකුට 14
දික්වූ හිසකේ තිබේ නම් ඒක ඔහුට
අගෞරවයක් බව ස්වාභාවධර්මයෙන්ම
නුඹලා ඉගෙනගන්නවා නොවේද? නුමුත් 15
ස්ත්‍රියකට දික්වූ හිසකේ ඇත්නම් එය
ඈට ගෞරවයක්ය. මක්නිසාද ඈගේ

හිසකේ වැස්මක් කොට ඇට දී තිබේ.
16 එහෙත් යමෙක් (ඒ ගැන) වාදකරන්ට
කැමැත්තේ නම් අපටවත් දෙවියන්-
වහන්සේගේ සභාවලටවත් එයාකාර
සිරිතක් නැත.

## ස්වාමීන්ගේ රාත්‍රි භෝජනය නොනිසි ලෙස පැවැත්වීම

17 නුමුත් මම නුඹලාට මේ ආඥාව දීමේදී
යහපත නොව අයහපත සිද්ධවෙන
හැටියට නුඹලා රැස්වන නිසා නුඹලාට
18 ප්‍රශංසා නොකරමි. මක්නිසාද
පළමුකොට නුඹලා සභාවෙහි රැස්වන
කල, නුඹලා අතරෙහි භේද තිබෙන බව
මට ආරංචිය; එය තරමක් දුරට
19 විශ්වාසකරමි. මක්නිසාද නුඹලා
අතරෙහි විශ්වාසවූ අයවල් ප්‍රකාශවන
පිණිස ලබ්ධි භේදත් නුඹලා අතරෙහි
20 තිබෙන්ට ඕනෑය. ඉතින් නුඹලා එකට
රැස්වන කල්හි ස්වාමීන්වහන්සේගේ රාත්‍රි
21 භෝජනය කෑමක් නම් නැත. මක්නිසාද
නුඹලා කන විට, එකිනෙකා තම
තමාගේම කෑම අනික් කෙනෙකුට
ප්‍රථමයෙන් කන්නේය; මෙසේ
එක්කෙනෙක් බඩගිනිව ඉන්නේය, තවත්
22 කෙනෙක් මත්වන්නේය. කිමෙක්ද?
කන්ටත් බොන්ටත් නුඹලාට ගෙවල්
නැද්ද? නොහොත් නුඹලා දෙවියන්-
වහන්සේගේ සභාව සුළුකොට කිසිවක්
නැත්තන් ලජ්ජාවට පමුණුවවුද? නුඹලාට
මක්කියම්ද? මේ ගැන නුඹලාට
ප්‍රශංසා කරම්ද? ප්‍රශංසා නොකරමි.
23 මක්නිසාද මම නුඹලාට භාරදුන් දේ
ස්වාමීන්වහන්සේගෙන් ලැබීමි, එනම්
ස්වාමිවූ යේසුස්වහන්සේ පාවාදෙනු ලැබූ
රාත්‍රියේදී උන්වහන්සේ රොටි රැගෙන,
24 ස්තුතිකොට, කඩා: මේක නුඹලා උදෙසා
දෙන්නාවූ මාගේ ශරීරයය. මා සිහිකිරීම
පිණිස මේක කරපල්ලායයි කීසේක.
25 එලෙසම රාත්‍රි කෑමෙන් පසු කුසලානත්
දී: මේ කුසලාන මාගේ ලෙයින් පිහිටුවන
අලුත් ගිවිසුමය. යම් පමණ වර නුඹලා
මෙයින් බොන්නහුද, එපමණ වර මා
සිහිකිරීම පිණිස මේක කරපල්ලායයි
කීසේක. මක්නිසාද, නුඹලා යම් පමණ 26
වරක් මේ රොටි කන්නහුද කුසලානෙන්
බොන්නහුද එපමණ වරක් ස්වාමීන්-
වහන්සේ එන තුරු නුඹලා උන්වහන්සේගේ
මරණය ප්‍රකාශකරන්නහුය. එහෙයින් 27
නුසුදුසුලෙස මේ රොටි කන්නාවූ
නොහොත් ස්වාමීන්වහන්සේගේ
කුසලානෙන් බොන්නාවූ කවරෙකු නුමුත්,
ස්වාමීන්වහන්සේගේ ශරීරය ගැනත් ලේ
ගැනත් වරදකාරයෙක් වන්නේය. නුමුත් 28
එක් එක්කෙනා තම තමාම සෝදිසිකොට,
ඒ රොටි කැවාවේ, ඒ කුසලානෙන් 29
බීවාවේ. මක්නිසාද කන්නාවූ බොන්නාවූ
තැනැත්තේ ශරීරය නොවිමසනවා නම්,
ඔහු තමාටම දඬුවම් පැමිණෙන ලෙස
කන්නේය, බොන්නේය. ඉන්නිසා නුඹලා 30
අතරේ බොහෝ දෙනෙක් දුර්වලව
ලෙඩව සිටිති, බොහෝ දෙනෙක්ද
නින්දට පත්වෙති. අපි අපම විමසමු 31
නම්, අප විනිශ්චයකරනු ලබන්නේ නැත.
නුමුත් අප විනිශ්චයකරනු ලබන කල 32
ලෝකයා සමග වරදට පත් නොවන
පිණිස ස්වාමීන්වහන්සේගෙන් දඬුවම්
ලබමුව. එබැවින්, මාගේ සහෝදරයෙනි, 33
කන්ට නුඹලා රැස්වෙන කල එකිනෙකා
ගැන බලා සිටපල්ලා. යමෙකුට බඩගිනි 34
ඇත්නම් නුඹලාගේ රැස්වීම දඬුවමට
හේතු නොවන පිණිස ඔහු ගෙදරදී
කැවාවේ. මා ආ විටකදී අනික් කාරණා
හරිගස්සන්නෙමි.

## ආත්මයාණන්වහන්සේගේ දීමනාවන්ගේ නානාප්‍රකාරත්වය හා එකඟත්වය

12 සහෝදරයෙනි, ආත්මික දීමනා
ගැන නුඹලා නොදැන සිටිනවාට
නොකැමැත්තෙමි. නුඹලා අන්‍යාදෘෂ්ටිකව 2
සිටියදී යම්සේ ගෙනයනු ලැබුවහුද
එලෙසම නුඹලා ගොළු දේවතාරූප
වෙතට ගෙනයනු ලැබූ බව නුඹලා
දන්නහුය. එබැවින් දෙවියන්වහන්සේගේ 3
ආත්මයාණන් කරණකොටගෙන
කථාකරන්නාවූ කිසිවෙක්: යේසුස්-
වහන්සේ ශාපලත් කෙනෙකැයි නොකියන
බවත්, ශුද්ධාත්මයාණන්වහන්සේ

කරණකොටගෙන මිස: යේසුස්වහන්සේ
ස්වාමීන්වහන්සේයයි කියන්ට කිසිවෙකුට
නුපුළුවන් බවත් නුඹලාට දන්වමි.
4 ඉතින් නානාප්‍රකාර දීමනා ඇත්තේය,
නුමුත් එක ආත්මයාණන්වහන්සේය.
5 නානාප්‍රකාර සේවයකිරීම් ඇත්තේය,
නුමුත් එක ස්වාමීන්වහන්සේය.
6 නානාප්‍රකාර ක්‍රියාකිරීම් ඇත්තේය, නුමුත්
සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ
7 එක දෙවියන්වහන්සේය. නුමුත්
ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම
එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය
8 පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්-
වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට
ප්‍රඥවේ වචනයද, එම ආත්මයාණන්-
වහන්සේ කරණකොටගෙන තවත්
9 කෙනෙකුට දැනගැනීමේ වචනයද, එම
ආත්මයාණන්වහන්සේ තුළ වෙන
කෙනෙකුට ඇදහිල්ලද, එම
ආත්මයාණන්වහන්සේ තුළ තවත්
10 කෙනෙකුට සුව කිරීමේ දීමනාවද, තවත්
කෙනෙකුට ආශ්වර්ය කිරීමද, තවත්
කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, වෙන
කෙනෙකුට ආත්මවල් විමසීමද, තවත්
කෙනෙකුට නානා වර්ග භාෂාද, තවත්
කෙනෙකුට භාෂා තේරුම්කර දීමද
11 දෙනලද්දේය. නුමුත් ඒ එකමවූ
ආත්මයාණන්වහන්සේ තමන් කැමති
ලෙස එකිනෙකාට වෙන වෙනම බෙද
දෙමින්, මේ සියල්ල කරවනසේක.

## ශරීරයේ මෙන් සභාවේ අවයව එකට බැඳී ඇති බව

12 මක්නිසාද ශරීරය එකක්ව බොහෝ
අවයව ඇතුවාක්මෙන්ද, ශරීරයේ අවයව
සියල්ල බොහෝ වුවත් එක ශරීරයක්ව
තිබෙන්නාක්මෙන්ද, ක්‍රිස්තුස්වහන්සෙත්
13 එසේව සිටිනසේක. මක්නිසාද යුදෙව්වරු
නොහොත් ග්‍රීක්වරු වෙත්වා, දසයෝ
නොහොත් නිර්දසයෝ වෙත්වා, අපි
සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ
තුළ එකම *ශරීරයට බව්තීස්මකරනු ලැබ,
සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන්
පොවනු ලැබීමුව. මක්නිසාද ශරීරය එක 14
අවයවයක් නොව බොහෝ අවයවයෝය.
ඉදින් පාදය: මම අත නොවන බැවින් 15
ශරීරයට අයිති නොවෙමියි කීවත් ඒ
නිසා ශරීරයට අයිති නොවන්නේ
නොවේ. කන: මම ඇස නොවන බැවින් 16
ශරීරයට අයිති නොවෙමියි කීවත් ඒ
නිසා ශරීරයට අයිති නොවන්නේ
නොවේ. මුළු ශරීරය ඇසක් නම් ඇසීම 17
කොයිද? මුළු ශරීරය ඇසීම නම් ගඳදැනීම
කොයිද? නුමුත් දෙවියන්වහන්සේ 18
තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු
අවයවයන් වෙන වෙනම ශරීරයේ
තැබූසේක. ඒ සියල්ල එකම අවයවයක් 19
වීනම් ශරීරය කොයිද? නුමුත් දැන් 20
බොහෝ අවයවයන් ඇති නුමුත් එක
ශරීරයක්ය. නුඹ මට ඕනෑ නැතැයි අතට 21
කියන්ට ඇසටවත්, නුඹලා මට ඕනෑ
නැතැයි පාදවලට කියන්ට හිසටවත්
නුපුළුවන. එසේය, ශරීරයේ වඩා 22
ඕනෑකරන්නේ වඩා දුර්වලව පෙනෙන
අවයවයෝය. ශරීරයේ වඩා නම්බු 23
රහිතයයි අප සිතන කොටස්වලට වඩා
නම්බු දෙමුව; මෙසේ අපගේ අශෝභනවූ
කොටස්වලට වඩා ශෝභනකම ලැබේ.
නුමුත් අපගේ ශෝභනවූ කොටස්වලට 24
එසේ ඕනෑ නැත. නුමුත් ශරීරයෙහි කිසි
භේදයක් නොව අවයව එකිනෙක
ගැන එකාකාර සලකන පිණිස,
දෙවියන්වහන්සේ අඩුකම් ඇති කොටසට 25
වඩා නම්බු දී, ශරීරය සංයෝජනය-
කළසේක. මෙසේ එක අවයවයක් 26
වේදනා විඳී නම්, ඒ සමග සියලු
අවයවයෝම වේදනා විඳිති; නොහොත්
එක අවයවයක් නම්බු ලබයි නම්, ඒ
සමග සියලු අවයවයෝ ප්‍රීතිවෙති. ඉදින් 27
නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද
වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද
වෙති. මෙසේ දෙවියන්වහන්සේ 28
පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව
අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරු-
වරුන්ද ඊළඟට ආශ්වර්ය කරන්නන්ද
පසුව සුවකිරීමේ දීමනාද උපකාරද
ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි
පිහිටෙවුසේක. සියල්ලෝම ප්‍රේරිතයෝද? 29

*ශරීරය තුළට අවගාහනය.

සියල්ලෝම අනාගතවක්තෘවරුද?
30 සියල්ලෝම ගුරුවරුද? සියල්ලෝම
ආශ්චර්යකරන්නෝද? සුව කිරීමේ දීමනා
සියල්ලන්ටම ඇත්තේද? සියල්ලෝම
අන් භාෂාවලින් කථාකරන්නෝද?
සියල්ලෝම තේරුම්කර දෙන්නෝද?
31 නුඹුත් වඩා උතුම් දීමනාවලට
ආශාවෙයල්ලා. තවද ඊටත් වඩා උතුම්
මාර්ගයක් මම නුඹලාට පෙන්වමි.

## සියලු දීමනාවලට වඩා උතුම් දීමනාව ප්‍රේමයයි

13 මම මනුෂ්‍යයන්ගේද දේවදූතයන්ගේද
භාෂාවලින් කථාකරන්නෙම් නුමුත්
මට ප්‍රේමය නැත්නම්, හඬනගන පිත්තලට
නොහොත් ශබ්ද පවත්වන අත්තලකට
2 සමානවී සිටිමි. මට අනාගතවාක්‍යකීමේ
දීමනාව ඇතුව, සියලු රහස්ද සියලු
දනගැන්මද දනිම් නුමුත්, කඳු පහකරන
තරම් සියලු ඇදහිල්ල ඇතුව සිටිම් නුමුත්,
3 මට ප්‍රේමය නැත්නම් මම හිස්වෙමි. මා
සන්තක සියල්ල දිළිඳුන් පෝෂණය කරන
පිණිස දෙනත්, මාගේ ශරීරය දවන්ට
භාරදෙනත්, මට ප්‍රේමය නැත්නම්, මට
4 කිසි ප්‍රයෝජනයක් නැත. ප්‍රේමය බොහෝ
ඉවසිලිවන්තය, ගුණවන්තය; ප්‍රේමය
ඊර්ෂ්‍යාවෙන්නේ නැත; ප්‍රේමය
5 පාරට්ටුකරගන්නේ නැත, උඩඟුවෙන්නේ
නැත, අශෝභනලෙස හැසිරෙන්නේ නැත,
තමාගේම කාරණා සොයන්නේ නැත,
කෝපවෙන්නේ නැත, නපුර
6 ගණන්ගන්නේ නැත; අධර්මිෂ්ඨකමට ප්‍රීති
නොවී සැබෑව සමග ප්‍රීතිවන්නේය,
7 සියල්ල දරාගන්නේය, සියල්ල
විශ්වාසකරන්නේය, සියල්ල
බලාපොරොත්තුවන්නේය, සියල්ල
8 ඉවසන්නේය. ප්‍රේමය කිසිකලක
පහවන්නේ නැත. අනාගතවාක්‍යකීම්
වුවත්, නැතිවන්නේය; භාෂා වුවත්,
නවතින්නේය; දනගැන්ම වුවත්,
9 නැතිවන්නේය. මක්නිසාද අපේ දනගැන්ම
10 මඳය, .අනාගතවාක්‍යකීමත් මඳය. නුමුත්
සම්පූර්ණ එක පැමුණුණාම මඳක්ව
11 තිබෙන දේ නැතිවන්නේය. මම
බාලයෙක්ව සිටිය කල බාලයෙකු මෙන්
කථාකෙළෙමි, බාලයෙකු මෙන් සිතුවෙමි,
බාලයෙකු මෙන් කල්පනාකෙළෙමි. දන්
මම වැඩිවියසට පැමිණ සිටින බැවින්
බාලයාගේ දේවල් අත්හැර සිටිමි. එසේය, 12
දන් අපට කැඩපතකින් අඳුරුලෙස
පෙනෙන්නේය; නුමුත් මතු මුහුණට මුහුණ
පෙනෙනවා ඇත. දන් මාගේ දනගැන්ම
අඩුය; නුමුත් මා දනගනු ලැබූ ලෙසම
මතු මම දනගන්නෙමි. දන් පවතින්නේ 13
ඇදහිල්ල, බලාපොරොත්තුව, ප්‍රේමය යන
මේ තුනය; මෙයින් ඉතා උතුම් එක නම්
ප්‍රේමයය.

## ධර්මවාක්‍ය පැවසීම 'අන් භාෂා' නැමති දීමනාවට වඩා උතුම් බව

14 ප්‍රේමය අනුව පලයල්ලා; ආත්මික
දීමනාවලටද ආශාවෙයල්ලා,
ප්‍රධානකොට ධර්මවාක්‍ය කියන්ට
ආශාවෙයල්ලා. මක්නිසාද අන් 2
භාෂාවකින් කථාකරන්නා මනුෂ්‍යයන්ට
නොව දෙවියන්වහන්සේට කථාකරන්නේය;
ඔහු ආත්මයෙන් රහස් කථා කරන
නුමුත් කාටවත් තේරෙන්නේ නැත. නුමුත් 3
ධර්මවාක්‍ය පවසන්නා වර්ධනවීමද
දනමුතුකමද සැනසීමද පිණිස
මනුෂ්‍යයන්ට කථාකරන්නේය. අන් 4
භාෂාවකින් කථාකරන්නා තමාම
වර්ධනයකරගන්නේය, නුමුත් ධර්මවාක්‍ය
පවසන්නා සභාව වර්ධනයකරන්නේය.
නුඹලා සියල්ලන් අන් භාෂාවලින් 5
කථාකරනවාට කැමැත්තෙමි, නුමුත්
නුඹලා ධර්මවාක්‍ය කියනවාට ඊට
වඩා කැමැත්තෙමි. අන් භාෂාවලින්
කථාකරන්නා සභාවේ වර්ධනයවීම
පිණිස තේරුම්කර නොදෙනොත් ඔහුට
වඩා ධර්මවාක්‍ය කියන්නා උතුම්ය.
ඉතින්, සහෝදරයෙනි, මම නුඹලා 6
ළඟට ඇවිත් එළිදරව්කිරීමෙන්වත්
දනගැන්මෙන්වත් ධර්මවාක්‍ය
පැවසීමෙන්වත් ගුරුකම් දීමෙන්වත්
නුඹලාට කථා නොකොට, අන්
භාෂාවලින් කථාකළොත් නුඹලාට
මොන ප්‍රයෝජනයක්ද? එසේම 7

ශබ්දනගන්නාවූ පණ නැති දේවල්-
නළාව වුණත් වීණාව වුණත්-වෙනස්
ආකාර ශබ්ද නොකරන්නේ නම්,
පිඹින්නේ මොකක්ද, ගායනාකරන්නේ
මොකක්දැයි දැනගන්නේ කොහොමද?
8 එලෙසම හොරණෑව අනුමාන ශබ්දයක්
කරන්නේ නම්, යුද්ධයට සැරසෙන්නේ
9 කවුද? එසේම නුඹලාත් තේරුම්ගන්ට
පහසු වචන දිවෙන් කථා නොකළොත්,
කියන දේ දැනගන්නේ කොහොමද?
නුඹලා හුළඟට කථාකරන්නාක්මෙන්
10 වේ. යම් පමණ වෙනස්වූ භාෂාවල්
ලෝකයේ ඇද්ද, එයින් එකක්වත් අර්ථ
11 රහිත නැත. එබැවින් මම භාෂාවේ
තේරුම නොදනිම් නම්, කථාකරන්නාට
පරදේශියෙක් වෙමි, කථාකරන්නා මට
12 පරදේශියෙක් වේ. එසේම නුඹලාත්
ආත්මික දීමනා ගැන ජ්වලිතව සිටින
බැවින්, සභාවේ වර්ධනයවීම පිණිස
ඒවා බොහෝසෙයින් ඇතුව සිටින්ට
13 සොයාපල්ලා. එබැවින් අන් භාෂාවකින්
කථාකරන්නා තේරුම් කරදෙන්ට
පුළුවන්වන ලෙස යාච්ඤාකෙරේවා.
14 මක්නිසාද මම අන් භාෂාවකින්
යාච්ඤාකරම් නම්, මාගේ ආත්මය
යාච්ඤාකරන නුමුත් මාගේ
සිහිකල්පනාව ප්‍රයෝජන නැත.
15 එසේවී නම් කිමෙක්ද? ආත්මයෙන්
යාච්ඤාකරමි, සිහිකල්පනාවෙනුත්
යාච්ඤාකරමි. ආත්මයෙන් ගීතිකාකරමි,
සිහිකල්පනාවෙනුත් ගීතිකාකරමි.
16 නැත්නම්, නුඹ ආත්මයෙන් ස්තුතිකරන
කල, තේරුම් නැති තැනැත්තා නුඹ
කියන්නේ කිමෙක්දැයි නොදන්නා බැවින්
නුඹේ ස්තුතිකිරීමට ආමෙන්යයි
17 කියන්නේ කොහොමද? නුඹ නම්
හොඳකාරයෙන් ස්තුතිකෙරෙහිය, නුමුත්
18 අනික් අයට වැඩ සිද්ධ නොවේ. නුඹලා
සියල්ලන්ට වඩා මා අන් භාෂාවලින්
කථා කරන බැවින් දෙවියන්වහන්සේට
19 ස්තුතිකරමි. එසේවී නුමුත් සභාවේදී
අන් භාෂාවකින් දසදහසක් වචන කථා-
කරනවාට වඩා, අනුන්ටත් උගන්වන
පිණිස මාගේ සිහිකල්පනාවෙන් වචන
පහක් කථාකරන්ට කැමැත්තෙමි.

සහෝදරයෙනි, නුඹලා බුද්ධිය 20
සම්බන්ධයෙන් ළමයි නොවෙල්ලා; නපුර
සම්බන්ධයෙන් බිළින්දෝ වෙයල්ලා,
බුද්ධියෙන් පුරුෂයෝ වෙයල්ලා. අන් 21
භාෂාවලිනුත් අන්‍යයන්ගේ තොල්වලිනුත්
මම මේ සෙනඟට කථාකරන්නෙමි;
එසේවුවත් ඔව්හු මාගේ වචන
නොඅසන්නෝයයි ස්වාමීන්වහන්සේ
කියනසේකැයි ව්‍යවස්ථාවෙහි ලියා තිබේ.
මෙසේ අන් භාෂා වනාහි අදහන්නන්ට 22
නොව නොඅදහන්නන්ට ලකුණක්
පිණිස වේ. නුමුත් ධර්මවාක්‍ය කීම
තිබෙන්නේ නොඅදහන්නන් නොව
අදහන්නන් උදෙසාය. එබැවින් මුළු 23
සභාව එකට රැස්ව, සියල්ලෝම අන්
භාෂාවලින් කථාකරත් නම්, නූගත්
අයවත් නොඅදහන්නන්වත් එහි
පැමුණුණොත්, ඔවුන් නුඹලාට
ඔල්මාදයයි කියන්නේ නැද්ද? නුමුත් 24
සියල්ලෝ ධර්මවාක්‍ය කියත් නම්,
නොඅදහන්නෙක් හෝ නූගත් කෙනෙක්
හෝ පැමිණි කල, සියල්ලන් විසින්
ඔහුගේ වරද හඟවාදී, සියල්ලන් විසින්
ඔහු විනිශ්චය කරනු ලබන්නේය; ඔහුගේ 25
සිතේ රහස් එළිදරව්වන්නේය; මෙසේ
ඔහු සැබවින් දෙවියන්වහන්සේ නුඹලා
අතරෙහියයි ප්‍රකාශකරමින්, මුහුණින් වැටී
දෙවියන්වහන්සේට නමස්කාරකරන්නේය.

## ප්‍රසිද්ධ දේවමෙහෙය ඔබිනාලෙස තිබිය යුතු බව

එසේවී නම්, සහෝදරයෙනි, කිමෙක්ද? 26
නුඹලා රැස්වන කල එක් එක්කෙනාට
ගීතිකාවක්ද ගුරුකමක්ද එළිදරව්කිරීමක්ද
අන් භාෂාවක්ද තේරුම්කරදීමක්ද
ඇත්තේය. සියල්ල වර්ධනයවීම පිණිස
කරනු ලැබේවා. යමෙක් අන් භාෂාවකින් 27
කථාකෙරේ නම්, දෙදෙනෙක් නොහොත්
වැඩි වුණොත් තුන්දෙනෙක් පමණක්
එක්කෙනෙක් පාසා එක්කෙනෙක් එසේ
කෙරේවා; එක්කෙනෙක් තේරුම්කර දේවා.
තේරුම්කරදෙන කෙනෙක් නැත්නම්, ඔහු 28
සභාවේදී නිශ්ශබ්දවේවා; තමාටත්
දෙවියන්වහන්සේටත් කථාකෙරේවා.

29 ධර්මවාක්‍ය කියන්නෝ දෙදෙනෙක්
නොහොත් තුන්දෙනෙක් කථාකරත්වා.
30 අනික් අය විමසාබලත්වා. තුමුත් එහි
හිඳින අනිකෙකුට එළිදරව්කිරීමක්
පැමුණුණොත්. පළමුවෙනි තැනැත්තේ
31 නිශ්ශබ්දවේවා. මක්නිසාද සියල්ලන්
ඉගෙනගන්නා පිණිසත්. සියල්ලන්
ධෛර්යවෙන පිණිසත්. සියල්ලන්ට
එක්කෙනෙකු බැගින් ධර්මවාක්‍ය කියන්ට
32 පුළුවන: ධර්මවාක්‍ය කියන්නන්ගේ ආත්ම
ධර්මවාක්‍ය කියන්නන්ට යටත්ව තිබේ.
33 මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ
නොව සමාදනයේ දෙවියන්වහන්සේය:
ශුද්ධවන්තයන්ගේ සියලු සභාවන්හි
එසේමය.
34 ස්ත්‍රීහු සභාවලදී නිශ්ශබ්දව සිටිත්වා.
මක්නිසාද කථාකරන්ට ඔවුන්ට අවසර
නැත: ව්‍යවස්ථාවෙන් කියා තිබෙන ලෙස
35 ඔව්හු යටත්ව සිටිත්වා. ඔව්හු යමක්
දනගන්ට කැමති නම්. ගෙදරදී
තමුන්ගේම පුරුෂයන්ගෙන් විචාරත්වා.
මක්නිසාද සභාවේදී කථාකිරීම
36 ස්ත්‍රියකට ලජ්ජාවක්ය. මොකද?
දෙවියන්වහන්සේගේ වචනය නික්මගියේ
තුඹලා කෙරෙන්ද? නොහොත් ඒක
පැමුණුණේ තුඹලා වෙතට පමණක්ද?
37 යමෙක් තමාම ධර්මවාක්‍ය පවසන්නෙක්ය
කියා නොහොත් ආත්මික කෙනෙක්ය
කියා සිතනවා නම්. මා විසින් තුඹලාට
ලියන කාරණා ස්වාමීන්වහන්සේගේ
38 ආඥව බව ඔහු ඒත්තුගනීවා. යමෙක්
එය නොදන්නවා නම්. ඔහු නොදන
සිටීවා.
39 එබැවින්. මාගේ සහෝදරයෙනි.
ධර්මවාක්‍ය කියන්ට ආශාවෙයල්ලා. අන්
භාෂාවලින් කථාකිරීමත් තහනම්
40 නොකරල්ලා. තුමුත් සියල්ල ඔබිනාලෙසද
පිළිවෙළින්ද කරනු ලැබේවා.

### යේසුස්වහන්සේගේ නැවත-නැගිටීම. උන්වහන්සේ කරණකොටගෙන වූ මළවුන්ගේ නැගිටීම

15 තවද. සහෝදරයෙනි. මම තුඹලාට
දේශනාකළාවූ. තුඹලා පිළිගත්තාවූ.
තුඹලා පිහිටා සිටින්නාවූ. *තුඹලා 2
ගැළවීමට පැමිණෙවූවාවූ ශුභාරංචිය
තුඹලාට දන්වමි. මා තුඹලාට
ප්‍රකාශකළ කාරණා තුඹලා අල්ලාගෙන
සිටින්නහු නම්. කුමන වචනවලින් එය
තුඹලාට දේශනාකෙළෙම්දැයි දන්වමි.
නැත්නම් තුඹලා නිෂ්ඵලලෙස ඇදහුවහුය.
ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට 3
පළමුවෙන් තුඹලාට භාරදුනිමි. එනම්.
ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා
ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්.
උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්. 4
ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිද
උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්.
කේපස්ටද පසුව දෙළොස්දෙනාටද 5
පෙනුණු බවත්ය. ඉන්පසු උන්වහන්සේ 6
එකවිටම පන්සියයකට වඩා
සහෝදරයන්ට පෙනුණුසේක. ඔවුන්ගෙන්
වැඩිදෙනා මේ දක්වා සිටිති. සමහරු
සැතපුණෝය. ඉන්පසු උන්වහන්සේ 7
යාකොබ්ටද පසුව සියලු ප්‍රේරිතයන්ටද
පෙනුණුසේක. සියල්ලන්ට පසු. අකලට 8
උපන් තැනැත්තෙක් වැනිවූ මටත්
උන්වහන්සේ පෙනුණුසේක. මක්නිසාද 9
මම ප්‍රේරිතයන්ගෙන් ඉතා කුඩා
තැනැත්තාය. මම දෙවියන්වහන්සේගේ
සභාවට පීඩාකළ බැවින් ප්‍රේරිතයෙකැයි
කියනු ලබන්ට නොවටිමි. තුමුත් මම 10
යම් ස්වභාවකට පැමිණ සිටිම්ද
එසේ සිටින්නේ දෙවියන්වහන්සේගේ
අනුග්‍රහයෙන්ය. උන්වහන්සේ මට දුන්
අනුග්‍රහය නිෂ්ඵල නොවීය: මම ඔවුන්
සියල්ලන්ට වඩා බොහෝසෙයින්
වැඩකෙළෙමි. තුමුත් එසේ කළේ මා
නොව මා කෙරෙහි තිබුණාවූ
දෙවියන්වහන්සේගේ අනුග්‍රහයය. එබැවින් 11
මා වුණත් ඔවුන් වුණත් එසේ අපි

*නොහොත්. 2 වෙනි පදය මෙසේය: මා තුඹලාට ප්‍රකාශකළ කාරණා තුඹලා අල්ලාගෙන සිටින්නහු නම් තුඹලා ගැළවීමට පැමිණෙවූවාවූ ශුභාරංචිය තුඹලාට දන්වමි. කුමන වචනවලින්......

දේශනාකරමුව, එසේ තුඹලා
අදහාගත්තහුය.
12 ඉදින් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන්
නැගුටුවනු ලැබූසේකැයි දේශනාකරනු
ලැබේ නම්, මළවුන්ගේ නැගිටීමක්
නැතැයි තුඹලා අතරෙන් සමහරුන්
13 කියන්නේ කොහොමද? මළවුන්ගේ
නැගිටීමක් නැත්නම්, ක්‍රිස්තුස්වහන්සෙත්
14 නැගුටුවනු නොලැබූසේක. ඉදින්
ක්‍රිස්තුස්වහන්සේ නැගුටුවනු නොලැබූ-
සේක් නම්, අපගේ දේශනාකිරීම නිෂ්ඵලය,
තුඹලාගේ ඇදහීමත් නිෂ්ඵලය.
15 එසේය, මළාහු නැගුටුවනු නොලබත්
නම් දෙවියන්වහන්සේ විසින්
නොනැගිටෙවුවාවූ ක්‍රිස්තුස්වහන්සේව
උන්වහන්සේ නැගිටෙවුසේකැයිද අප
උන්වහන්සේ ගැන සාක්ෂි දුන් බැවින්,
අපත් දෙවියන්වහන්සේ ගැන බොරු
16 සාක්ෂිකාරයන් බව පෙනේ. මක්නිසාද
මළාහු නැගුටුවනු නොලබත් නම්,
ක්‍රිස්තුස්වහන්සෙත් නොනැගුටුණුසේක.
17 ඉදින් ක්‍රිස්තුස්වහන්සේ නොනැගුටුණු-
සේක් නම්, තුඹලාගේ ඇදහීම නිෂ්ඵලය;
තුඹලා මේ දක්වා තුඹලාගේ පාපවල
18 සිටින්නහුය. එපමණක් නොව,
ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි සැතපුණු අයද
19 විනාශවුණෝ වෙති. ක්‍රිස්තුස්වහන්සේ
තුළ අපට බලාපොරොත්තුව තිබෙන්නේ
මේ ජීවිතය ගැන පමණක් නම් අපි
සියලු මනුෂ්‍යයන්ට වඩා අනුකම්පා
ලැබිය යුත්තෝය.
20 තුමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන්
නැගිට සිටිනසේක්මය, උන්වහන්සේ
සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය.
21 මක්නිසාද මනුෂ්‍යයෙකු කරණකොටගෙන
මරණය පැමුණුණ බැවින් මනුෂ්‍යයෙකු
කරණකොටගෙන මළවුන්ගෙන්
22 නැගිටීමත් පැමුණුණේය. මක්නිසාද,
ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක්මෙන්ම,
ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම
23 ජීවත්කරනු ලබන්නෝය. තුමුත් එක්
එක් අය තම තමාගේම ක්‍රමයෙන්ය.
ක්‍රිස්තුස්වහන්සේ නාඹුල් ඵලයය; ඉන්පසු,
ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී, උන්වහන්සේ
සන්තකවූවෝ (නැගිටින්නෝ) ය. එවිට
කෙළවර පැමිණේ; උන්වහන්සේ සියලු 24
අධිපතිකම්ද බලයද පරාක්‍රමයද
නැතිකළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය
පියවූ දෙවියන්වහන්සේට භාරදෙනසේක.
මක්නිසාද උන්වහන්සේ සියලු සතුරන් 25
තමන්වහන්සේගේ පාද යට දමන
තුරු රජකම්කරන්ට ඕනැය. නැතිකරනු 26
ලබන්නාවූ අන්තිම සතුරා නම්
මරණයය. මක්නිසාද දෙවියන්වහන්සේ 27
උන්වහන්සේගේ පාදවලට සියල්ල
යටත්කළසේක. එහෙත්: සියල්ල
යටත්කරනු ලැබුවේයයි උන්වහන්සේ
කියන කල, සියල්ල උන්වහන්සේට
යටත්කළ තැනන්වහන්සේ අයත්
නැති බව පැහැදිලිය. තවද සියල්ල 28
උන්වහන්සේට යටත්කරනු ලැබුවාම,
දෙවියන්වහන්සේ සියල්ලන් තුළ සියල්ල
වන පිණිස පුත්‍රයාණන්වහන්සෙත් තමන්ට
සියල්ල යටත්කළ තැනන්වහන්සේට
යටත්වනසේක.
ඇරත් මළවුන් උදෙසා *බව්තීස්ම 29
කරනු ලැබූ අය කුමක් කරන්නෝද?
මළාහු කිසිසේත් නැගුටුවනු
නොලබන්නෝ නම්, කුමක්හෙයින්
ඔවුන් උදෙසා *බව්තීස්මකරනු
ලබන්නෝද? අපිත් කුමක්හෙයින් සැම 30
වේලේම අන්තරායෙහි සිටිමුද?
සහෝදරයෙනි, මම දවස්පතා නසිමියි 31
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
තුළ තුඹලා ගැන මට ඇත්තාවූ පාරට්ටුව
පිට කියමි. මම එපීසයේදී 32
මනුෂ්‍යාකාරයෙන් මෘගයින් සමග
පොරබැදීම් නම්, මට ඇති ප්‍රයෝජනය
කුමක්ද? මළාහු නොනැගිටිත් නම්,
හෙට මැරෙන බැවින් කමු, බොමු.
නොරැවටෙල්ලා. නපුරු සමාගමෙන් 33
හොඳ චරිත නරක්වන්නේය. ධාර්මිකලෙස 34
පිබිද, පව් නොකර සිටපල්ලා;
මක්නිසාද සමහරු දෙවියන්වහන්සේ
ගැන දැනුම නැතුව සිටිති. තුඹලා
ලජ්ජාවට පමුණුවන පිණිස මෙසේ
කියමි.

*අවගාහනය

35 නුමුත්: මළවුන් නැගිටින්නේ කෙසේද?
ඔව්හු කොයි ප්‍රකාර ශරීරයක් ඇතුව
36 එද්දයි යමෙක් අසනවා ඇත. අඥානය,
නුඹම වපුරන දේ මළොත් මිස නැත්නම්
37 පැළවෙන්නේ නැත. නුඹ වපුරන කල
වපුරන්නෙත් මතු අටගන්න කඳ නොව
තිරිඟු හෝ වෙන වර්ගයක බීජයක් හෝ
38 පමණය; නුමුත් දෙවියන්වහන්සේ තමන්
කැමතිවූ හැටියට ඊට කඳක්ද එක එක
39 බීජයට නියමවූ කඳක්ද දෙනසේක. සියලු
මාංස එකාකාර මාංස නොවේ.
මනුෂ්‍යයන්ගේ මාංසය එක් ආකාරයක,
මෘගයන්ගේ මාංසය වෙන ආකාරයක,
පක්ෂීන්ගේ මාංසය තවත් ආකාරයක,
මසුන්ගේ මාංසය වෙනත් ආකාරයක.
40 ස්වර්ගීක ශරීරද, භූමික ශරීරද ඇත්තාහ.
නුමුත් ස්වර්ගීකයන්ගේ තේජස එකක්ය,
භූමිකයන්ගේ තේජස අනිකක්ය.
41 සූර්යයාගේ තේජස එකක්ය, චන්ද්‍රයාගේ
තේජස අනිකක්ය, තාරකාවන්ගේ තේජස
තවත් එකක්ය; මක්නිසාද තේජසින්
තාරකාවක් තාරකාවකට වෙනස්ය.
42 මළවුන්ගෙන් නැගිටීමත් එසේමය.
ජරාවෙන් යුක්තව වපුරනු ලැබේ;
ජරාවෙන් වියුක්තව නැගුටුවනු ලැබේ.
43 අගෞරවයෙන් යුක්තව වපුරනු ලැබේ;
තේජසින් යුක්තව නැගුටුවනු ලැබේ.
දුර්වලකමෙන් යුක්තව වපුරනු ලැබේ;
බලයෙන් යුක්තව නැගුටුවනු ලැබේ.
44 ස්වාභාවික ශරීරයක්ව වපුරනු ලැබේ;
ආත්මික ශරීරයක්ව නැගුටුවනු ලැබේ.
ස්වාභාවික ශරීරයක් තිබේ නම් ආත්මික
45 ශරීරයක්ද තිබේ. එසේම: පළමුවෙනි
මනුෂ්‍යයාවූ ආදම් ජීවමාන ප්‍රාණයක්
වුණේයයි ලියා තිබේ. අන්තිම ආදම්
46 ජීවනදායක ආත්මයක් විය. එසේවී
නුමුත් ප්‍රථමවන්නේ ආත්මික එක නොව
ස්වාභාවික එකය; පසුව ආත්මික එක
47 විය. පළමුවෙනි මනුෂ්‍යයා භූමියෙන්ය,
භූමිකය. දෙවෙනි මනුෂ්‍යයා ස්වර්ගයෙන්ය.
48 භූමික තැනැත්තා යම්සේද භූමිකයෝත්
එසේමය. ස්වර්ගීක තැනැත්තා යම්සේද
ස්වර්ගීකයෝත් එසේමය. අපි භූමිකවූ 49
තැනැත්තාගේ රූපය දරුවා සේම
ස්වර්ගීක තැනැත්තාගේ රූපයද
දරන්නෙමුව.
ඉතින්, සහෝදරයෙනි, මාංසයට හා 50
රුධිරයට දෙවියන්වහන්සේගේ රාජ්‍යය
උරුමකරගන්ට බැරි බවත් දිරන
ස්වභාවට නොදිරන ස්වභාව උරුම-
කරගන්ට බැරි බවත් කියමි. මෙන්න, 51
නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම
නොසැතපෙන්නෙමුව, නුමුත් අන්තිම
හොරණෑව පිඹින කල මොහොතකින්,
ඇසිපිය හෙළන ක්ෂණයකින්, අපි 52
සියල්ලෝම වෙනස්කරනු ලබන්නෙමුව.
මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය,
එකල මළාහු නොදිරන ස්වභාවෙන්
යුක්තව නැගුටුවනු ලබන්නෝය, අපිද
වෙනස්කරනු ලබන්නෙමුව, මක්නිසාද 53
දිරන සුලුවූ මේක නොදිරන බවට
පැමිණෙන්ට ඕනෑය, මරණීයවූ මේක
අමරණ භාවයට පැමිණෙන්ට ඕනෑය.
දිරන සුලුවූ මේක නොදිරන භාවයටත් 54
මරණීයවූ මේක අමරණ භාවයටත්
පැමිණි කල්හි: මරණය ජයෙන්
ගිලිනාලද්දේයයි ලියා තිබෙන වචනය
සම්පූර්ණවේ. එම්බා මරණය, තාගේ
ජය කොයිද? එම්බා මරණය, තාගේ 55
කටුව කොයිද? මරණයේ කටුව 56
නම් පාපයය; පාපයේ බලය නම්
ව්‍යවස්ථාවය. නුමුත් අපගේ ස්වාමිවූ 57
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට-
ගෙන අපට ජය දෙන්නාවූ දෙවියන්-
වහන්සේට ස්තුතිවේවා. එහෙයින්, මාගේ 58
ප්‍රේමවන්ත සහෝදරයෙනි, ස්වාමීන්-
වහන්සේ කෙරෙහි නුඹලාගේ මෙහෙය
නිෂ්ඵල නොවන බව නුඹලා දන්නා
බැවින් ස්ථිරවව්, නිශ්චලවව්, නිතරම
ස්වාමීන්වහන්සේගේ මෙහෙයෙහි වඩ
වඩා පවතිව්.

## යෙරුසලමේ දිළිඳුන් උදෙසා සම්මාදම් එකතුකිරීම

16 ශුද්ධවන්තයන් උදෙසා
සම්මාදම්කිරීම ගැන, ගලාතියේ
සභාවලට මා නියමකළ ලෙස තුඹලාත්
2 කරපල්ලා. මා ආ කල සම්මාදම්
නොකරන පිණිස සතියේ පළමුවෙනිද
තුඹලාගෙන් එකිනෙකා තම තමාගේ
කාරණා සඵලවන ප්‍රකාරයට රැස්කොට
3 තම තමා ළඟ යමක් තබාගනීවා. මා
ආවාම තුඹලා දෙන දේ යෙරුසලමට
ගෙනයන පිණිස සුදුස්සෝයයි තුඹලා
සිතන තැනැත්තන් ලියුම් ඇතුව
4 යවන්නෙමි. මාත් යෑම යෝග්‍ය නම්
ඔවුන් කැඳවාගන යන්නෙමි.

## පුද්ගලික කාරණා. අවසාන ආචාරය

5 මම මකිදෝනිය මැදින් ගිය පසු
තුඹලා ළඟට එන්නෙමි; මක්නිසාද
6 මකිදෝනිය මැදින් යමි. මා යන කොයි
දිශාවට තුමුත් මාගේ ගමනෙහි තුඹලා
මා යවන පිණිස, තුඹලා සමග කලක්
නවතින්නෙමි. නොහොත් ශීත කාලය
7 ගතකරන්නෙමි. මා දැන් යන ගමනේදී
තුඹලා දකින්ට නොකැමැත්තෙමි;
මක්නිසාද ස්වාමීන්වහන්සේ අවසර
දෙනසේක් නම්, තුඹලා සමග කලක්
8 සිටින්ට බලාපොරොත්තුවෙමි. තුමුත්
පෙන්තකොස්තය වෙන තුරු එපීසයෙහි
9 නවතින්නෙමි; මක්නිසාද මහත්වූ
බලවත්වූ දෙරක් මට ඇර තිබේ, බොහෝ
විරුද්ධකාරයෝද සිටිති.
10 තිමෝතියස් ආවොත් ඔහු භය නැතුව
තුඹලා අතරෙහි සිටින හැටියට
බලාගනිල්ලා; මක්නිසාද මා වාගේම
ඔහුත් ස්වාමීන්වහන්සේගේ වැඩය
11 කරන්නේය. එබැවින් කිසිවෙක් ඔහු
සුළුකොට නොසිතාවා. තුමුත් ඔහු මා
ළඟට එන පිණිස සමාදනයෙන් ඔහුගේ
ගමනෙහි යවාපල්ලා. මක්නිසාද ඔහු
සහෝදරයන් සමග එනවා බලා සිටිමි.
සහෝදරවූ අපොල්ලොස් ගැන නම්, 12
සහෝදරයන් සමග තුඹලා ළඟට යන
ලෙස මම ඔහුගෙන් බොහෝකොට
ඉල්ලමි. තුමුත් දැන්ම යෑම කිසිසේත්
ඔහුගේ කැමැත්ත නොවේ; අවකාශ
ලැබුණු විටක ඔහු එනවා ඇත.
අවදිව සිටපල්ලා, ඇදහිල්ලේ ස්ථිරව 13
සිටපල්ලා, පුරුෂයන් මෙන් සිටපල්ලා,
ශක්තිමත් වෙයල්ලා. තුඹලා කරන 14
සියල්ලම ප්‍රේමයෙන් කරනු ලැබේවා.
සහෝදරයෙනි, ස්තේපනස්ගේ ගෙයි 15
වැසියන් අකායෙහි ප්‍රථම ඵල බවද
ඔවුන් ශුද්ධවන්තයන්ගේ සේවයට
භාරවුණ බවද තුඹලා දනිහුය. තුඹලාත් 16
එවැනි අයටද වැඩට හවුල්වෙමින්
වීර්යකරන්නාවූ සියල්ලන්ටද යටත්ව
සිටින ලෙස තුඹලාගෙන් ඉල්ලමි.
ස්තේපනස්ගේද පොර්තුනාතුස්ගේද 17
ආකායිකස්ගේද ඊම ගැන ප්‍රීතිවෙමි.
තුඹලා නැති පාඩුව ඔව්හු පිරිමැසුවෝය.
මක්නිසාද ඔව්හු මාගෙත් තුඹලාගෙත් 18
ආත්ම ප්‍රාණවත්කළෝය. එබැවින් එබඳු
අය සලකාපල්ලා.
ආසියාවේ සභාවෝ තුඹලාට ආචාර 19
කරති. අකිලාද ප්‍රිස්කාද ඔවුන්ගේ ගෙදර
තිබෙන සභාව සමග ස්වාමීන්වහන්සේ
තුළ තුඹලාට බොහෝසෙයින්
ආචාරකරති. සියලු සහෝදරයෝ 20
තුඹලාට ආචාරකරති. ශුද්ධවූ සිඹීමකින්
එකිනෙකාට ආචාරකරපල්ලා.
පාවුල් නම්වූ මාගේම අතින් ලියන 21
මාගේ ආචාරකිරීමය. යමෙක් ස්වාමීන්- 22
වහන්සේට ප්‍රේම නොකරන්නේ නම් ඔහු
ශාපලද්දෙක් වේවා. ස්වාමීන්වහන්සේ
එනසේක. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්- 23
වහන්සේගේ අනුග්‍රහය තුඹලා සමග
වේවා. මාගේ ප්‍රේමය ක්‍රිස්තුස් 24
යේසුස්වහන්සේ තුළ තුඹලා සියල්ලන්
සමග වේවා. ආමෙන්.

# ප්‍රේරිතවූ පාවුල් විසින් කොරින්තිවරුන්ට ලියනලද දෙවෙනි පත්‍රය

## ආචාරකිරීම, සැනසීම සහ සුවපත්වීම ගැන ස්තුතිකිරීම

1 දෙවියන්වහන්සේගේ කැමැත්ත
කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේගේ ප්‍රේරිතයෙක්වූ පාවුල්ද අපගේ
සහෝදරවූ තිමෝතියස්ද කොරින්තියෙහි
තිබෙන දෙවියන්වහන්සේගේ සභාවටත්
අකාය මුළුල්ලෙහි සිටින සියලු
ශුද්ධවන්තයන්ටත් ලියා එවන වග නම්:
2 අපේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද
කරුණාවත් සමාදානයත් තුඹලාට වේවා.
3 දයාබර කරුණාවල පියවූද සෑම
සැනසිල්ලේ දෙවිවූද අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ
4 දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා. අපි
දෙවියන්වහන්සේගෙන් යම් සැනසිල්ලක්
ලැබුවෙමුද, ඒ සැනසිල්ල කරණකොටගෙන
කොයි පීඩාවක් තුමුත් විඳින්නන්
සනසන්ට අපට පුළුවන්වන පිණිස
උන්වහන්සේ අපේ සියලු පීඩාවලදී අප
5 සනසනසේක. මක්නිසාද යම්සේ
ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විඳීම් අප
කෙරෙහි අධිකවන්නේද, එසේම
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
6 අපගේ සැනසිල්ලත් අධිකවන්නේය. අපි
පීඩා විඳිමු නම්, ඒ වනාහි තුඹලාගේ
සැනසිල්ලත් ගැළවීමත් පිණිසය; අපි
සැනසිල්ල ලබමු නම්, ඒ තුඹලාගේ
සැනසිල්ල පිණිසය; ඒවා ඉෂ්ටවෙන්නේ
අප විඳින දුක්ම තුඹලා විසිනුත්
7 ඉවසීමෙන්ය. තුඹලා ගැන තිබෙන අපේ
බලාපොරොත්තුව ස්ථිරව පවත්නේය;
මක්නිසාද තුඹලා දුක්වලට පංගුකාරව
සිටින ලෙසම සැනසීමටත් පංගුකාරවන
බව අපි දනිමුව. එබැවින්, සහෝදරයෙනි, 8
ආසියාවේදී අපට පැමිණි පීඩාව
ගැන තුඹලා නොදැන සිටිනවාට
නොකැමැත්තෙමුව. එනම් ජීවිතය ගැන
පවා අපට බලාපොරොත්තුවක් නැති
තරමට, උසුලන්ට බැරි පමණ, අප පිටට
බර පැමුණුණ බවය. එසේය, මළවුන් 9
නැඟුටුවන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි
මිස අප කෙරෙහිම විශ්වාස නොකරන
පිණිස මරණ-මුගිංචිය අප තුළේම
තිබුණේය. උන්වහන්සේ මෙබඳු මහත් 10
මරණයකින් අප ගැළෙවුසේක, මතුත්
ගළවනසේක. උන්වහන්සේ තව
දුරටත් අප ගළවනසේකැයි යන
බලාපොරොත්තුව අප විසින්
උන්වහන්සේ කෙරෙහි තබා තිබේ;
තුඹලාත් එක්ව තුඹලාගේ කන්නලව් 11
කරණකොටගෙන අප වෙනුවට උපකාර
කරන්නහුය. එසේ කරන්නේ බොහෝ
දෙනෙකු කරණකොටගෙන අපට
ලැබුණු දීමනාව නිසා අප වෙනුවට
බොහෝ දෙනෙක් ස්තුතිකරන පිණිසය.

## පාවුල් තුමාගේ පිරිසිදු අදහස්

මක්නිසාද අපේ පාරට්ටුව නම් අපි 12
වනාහි ලෝකයෙහිද විශේෂයෙන් තුඹලා
කෙරෙහිද දිව්‍යවූ ශුද්ධකමින් හා
අවංකකමින්, මාංසික ප්‍රඥාවෙන් නොව
දෙවියන්වහන්සේගේ කරුණාවෙන්,
හැසුරුණෙමුව යන අපේ හෘදයසාක්ෂියය.
එසේය, තුඹලා කියවන්නාවූද 13

ඒත්තුගන්නාවූද කාරණයන් හැර වෙන
කාරණයන් නුඹලාට නොලියමුව,
නුඹලා කෙළවර දක්වා ඒවා
ඒත්තුගන්නහුයයි බලාපොරොත්තුවෙමි.
14 අපි එසේ නුඹලාගේ පාරට්ටුවය කියා
නුඹලාගෙන් සමහර දෙනෙක් අප
ඒත්තුගත්තෝය; එමෙන්ම නුඹලාත්
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ
දවසේදී අපේ පාරට්ටුව වන්නහුය.

## ගමනක් කල්දැමීම

15 මේ විශ්වාසයෙන් නුඹලාට දෙවනුත්
අනුග්‍රහයක් ලැබෙන පිණිස පළමුවෙන්
16 නුඹලා ළඟට ඇවිත්, නුඹලා වෙතින්
මකිදෝනියට යන්ටද නැවත
මකිදෝනියෙන් නුඹලා ළඟට ඇවිත්
යුදයට යන ගමනේදී නුඹලා විසින්
17 ඇරලනු ලබන්ටද සිතට ගතිමි. ඉදින්
මෙසේ සිතීමෙන් මම අස්ථිරලෙස
ක්‍රියාකළෙම්ද? නොහොත් එසේය එසේය
කියාත් නැත නැත කියාත් මා
කියන පිණිස, මා අදහස්කරන දේ
18 මාංසාකාරයෙන් අදහස් කරම්ද? නුමුත්
දෙවියන්වහන්සේ විශ්වාසව සිටින සේම
නුඹලා වෙතට පැමිණෙන අපේ වචනය
එසේය කියාද නැත කියාද නොවේ.
19 මක්නිසාද අප කරණකොටගෙන, එනම්
මාද සිල්වානස්ද තිමෝතියස්ද යන අප
විසින්, නුඹලා අතරෙහි දේශනාකරනු
ලැබූ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ එසේය කියාත් නැත
කියාත් වූවා නොව උන්වහන්සේ තුළ
20 එසේය කියා වේ. මක්නිසාද දෙවියන්-
වහන්සේගේ පොරොන්දු කොපමණ
වුණත් උන්වහන්සේ තුළ එසේය
කියා වේ. එහෙයින් අප කරණකොටගෙන
දෙවියන්වහන්සේට ගෞරවය පැමිණෙන
පිණිස, උන්වහන්සේ කරණකොටගෙන
21 ආමෙන්ය කියාත් වේ. ඉදින් නුඹලා
සමග අප ක්‍රිස්තුස්වහන්සේ තුළ
ස්ථිරකරන්නෙත් අප ආලේපකළෙත්
22 දෙවියන්වහන්සේය. උන්වහන්සේ අප
මුද්‍රාකොට අපේ සිත් තුළ ආත්මයාණන්-
වහන්සේ නැමති අත්තිකාරම අපට
දුන්සේක.

මම කොරින්තියට නාවේ නුඹලා 23
කෙරෙහි අනුකම්පාවෙන් බවට මාගේ
ප්‍රාණය පිට දෙවියන්වහන්සේ සාක්ෂියක්
කොට ගනිමි. එහෙත් නුඹලාගේ 24
ඇදහිල්ල කෙරෙහි අපි බලය පවත්වනවා
නොව නුඹලාගේ ප්‍රීතියට
ආධාරකාරයෝව සිටිමුව. මක්නිසාද
නුඹලා පිහිටා සිටින්නේ ඇදහිල්ල
කරණකොටගෙනය.

2

ශෝකයෙන්
යුක්තව නුඹලා ළඟට නැවත
නොඑන්ට මම මාගේ සිතින් නියම-
කරගතිමි. මක්නිසාද මම නුඹලා 2
ශෝකයට පත්කරම් නම්, මා විසින්
ශෝකයට පත්කරන අයම මිස මා
සන්තෝෂකරන්නේ වෙන කවුද? මේ 3
කාරණය මා ලියා එවුවේ මාගේ ප්‍රීතිය
නුඹලා සියල්ලන්ගේ ප්‍රීතියයයි නුඹලා
සියල්ලන් ගැන විශ්වාසකරමින්, මා
ආවාම මා ප්‍රීතිකරන්ට ඕනෑ අයවලුන්-
ගෙන් මට ශෝකය නොපැමිණෙන
පිණිසය. මක්නිසාද බොහෝ දුක්වලින්ද 4
හෘදය වේදනාවෙන්ද බොහෝ කඳුළෙන්ද
යුක්තව නුඹලාට ලිවීමි. එසේ කළේ
නුඹලා ශෝකයට පත්කරන්ට නොව
නුඹලා කෙරෙහි ඇත්තාවූ මාගේ ඉතා
මහත් ප්‍රේමය නුඹලා විසින් දැනගන්නා
පිණිසය.

## වරද ගැන පශ්චාත්තාපවූ තැනැත්තා නැවත පිළිගැනීම

එහෙත් යමෙක් ශෝක ඉපදෙවුවේ නම් 5
ඔහු මට නොව, පමණක් දුරට නුඹලා
සියල්ලන්ටම ශෝක ඉපදෙවුවේය. මෙසේ
කියන්නේ පමණට වඩා බර නොකරන
පිණිසය. බොහෝ දෙනා විසින් 6
පමුණුවනලද මේ දඬුවම එබඳු
තැනැත්තාට ඇත. අනික් අතට එබඳු 7
තැනැත්තා යම් විධියකින් ඔහුගේ අධික
ශෝකයෙහි ගිලී නැති නොවන පිණිස
ඔහුට කමාවෙන්ටද ඔහු සනසන්ටද
ඊට වඩා නුඹලාට යුතුය. එබැවින් ඔහු 8
කෙරෙහි තිබෙන නුඹලාගේ ප්‍රේමය
ස්ථිරකරන මෙන් නුඹලාගෙන් ඉල්ලමි.
තවද මේ නිසා මා ලියුවෙත් සියල්ලෙහිදී 9

තුඹලා කීකරුව සිටිනවාද කියා
10 සෝදිසිකර දැනගන්නා පිණිසය. තුඹලා
යමෙකුට යමක් ගැන කමාවෙනවා නම්
මමත් කමාවෙමි. මම යමක් ගැන
කමාවීම් නම්, එසේ කමාවී තිබෙන්නේ
සාතන් අප කෙරෙහි වාසි නොලබන
11 පිණිස, ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි
තුඹලා උදෙසාය. මක්නිසාද ඔහුගේ
උපායවල් අප විසින් නොදැන සිටිනවා
නොවේ.

## ශුභාරංචිය සම්බන්ධ පීඩා සහ ජයගැනීම්

12 නවද ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය
ප්‍රකාශකරන්ට මා ත්‍රෝවසට පැමිණි
කල ස්වාමීන්වහන්සේ තුළ මට දොරක්
13 ඇර තිබෙද්දීත්, මාගේ සහෝදරවූ තීතස්
සම්බ නුවූ බැවින් මාගේ ආත්මයට
කිසි පහසුවක් නොලැබ, ඔවුන්ගෙන්
අවසරගෙන මම මකිදෝනියට පිටත්ව
14 ගියෙමි. නවද ක්‍රිස්තුස්වහන්සේ තුළ
නිතරම අප *ජයට පමුණුවන්නාවූ,
සියලු තැන්වල අප ලවා උන්වහන්සේව
දැනගැනීම නැමති සුවඳ පතුරුවන්නාවූ
දෙවියන්වහන්සේට ස්තුතිවේවා.
15 මක්නිසාද ගැළවෙන්නවුන් කෙරෙහිද
විනාශවන්නන් කෙරෙහිද අපි
දෙවියන්වහන්සේට ක්‍රිස්තුස්වහන්සේගේ
16 මිහිරි සුවඳක්ව සිටිමුව; එක පක්ෂයකට
මරණය පිණිස මරණයේ සුවඳක්ය;
අනික් පක්ෂයට ජීවනය පිණිස ජීවනයේ
සුවඳක්ය. ඉතින් මේ දේවලට සමර්ථ
17 කවුද? මක්නිසාද අපි දෙවියන්-
වහන්සේගේ වචනය බොහෝදෙනා මෙන්
නරක් නොකර, අවංකකමින්ද දෙවියන්-
වහන්සේගෙන් ලැබුණු ලෙසද දෙවියන්-
වහන්සේ ඉදිරියෙහි ක්‍රිස්තුස්වහන්සේ තුළ
කථාකරමුව.

## ප්‍රේරිත තැනගේ මෙහෙයේ දිව්‍ය සාක්ෂිපත්‍ර

3 අපි නැවත අප ගැනම සාක්ෂි දෙන්ට
පටන්ගනිමුද? නොහොත් සාක්ෂිපත්‍ර
තුඹලාට දෙන්ට හෝ තුඹලාගෙන් ගන්ට
හෝ සමහරුන්ට මෙන් අපට
ඕනෑකරනවාද? අපගේ පත්‍රය නම් 2
තුඹලාය; එය අපේ සිත්වල ලියා තිබේ,
සියලු මනුෂ්‍යයෝද එය දැනගෙන කියවති.
මක්නිසාද තුඹලා අපේ සේවය 3
කරණකොටගෙන තීන්තවලින් නොව
ජීවමාන දෙවියන්වහන්සේගේ
ආත්මයෙන්ද ගල්ලෑලිවල නොව මාංසවූ
සිත් නැමති ලෑලිවලද ලියා තිබෙන
ක්‍රිස්තුස්වහන්සේගේ පත්‍රයක් බව ප්‍රකාශව
තිබේ. එබඳු විශ්වාසයක් ක්‍රිස්තුස්- 4
වහන්සේ කරණකොටගෙන දෙවියන්-
වහන්සේ කෙරෙහි අපට ඇත්තේය.
එහෙත් අපෙන්ම වූණාක්මෙන් අප 5
තුළෙන්ම යමක් යෝජනාකරන්ට අපගේ
සමර්ථකමක් නැත; අපගේ සමර්ථකම
දෙවියන්වහන්සේගෙන්ය. නවද 6
උන්වහන්සේ අලුත් ගිවිසුමක සේවකයින්
කොට අප සමර්ථකළසේක; එනම්
වචනාර්ථයේ හැටියට නොව
පරමාර්ථයේ හැටියටය. මක්නිසාද
වචනාර්ථය නසන්නේය, පරමාර්ථය
ජීවත්කරන්නේය.

## ශුභාරංචියේ සේවය ව්‍යවස්ථාවට වඩා තේජවත්ව තිබෙන බව

ඉදින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෝසෙස්ගේ 7
මුහුණේ තිබුණු නැතිවීයන්නාවූ තේජස
නිසා ඔහුගේ මුහුණ දෙස ඇස් හෙළා
සිටින්ට බැරි ලෙස ගල්වල ලියා
කොටනලද මරණයාගේ සේවය
තේජසින් යුක්තව පැමිණියේ නම්,
ආත්මයේ සේවය ඊට වඩා කොපමණ 8
තේජසින් යුක්තව නොතිබේද? මක්නිසාද 9
වරදට පත්කිරීමේ සේවය තේජස නම්
ධර්මිෂ්ඨකමේ සේවයේ තේජස ඊට වඩා
බොහෝසෙයින් වැඩිව තිබේ. එසේය, 10
තේජස ඇතුව තිබුණු එක පවා ඉතා
වැඩිව තිබෙන තේජස නිසා මේ
කාරණයෙන් තේජස නැතුව තිබේ.
මක්නිසාද නැතිවී යන්නාවූ එක තේජසින් 11
යුක්තවී නම්, පවතින්නාවූ එක ඊට වඩා
බොහෝසෙයින් තේජසින් යුක්තව තිබේ.

*හෙවත්–ජය පෙරහැරින් ගෙනයන්නාවූ.

12 එහෙයින් මෙබඳුවූ බලාපොරොත්තුවක්
ඇතුව අපි ඉතා පැහැදිලිලෙස කථාකරමුව.
13 පහවීයන්නාවූ දෙයේ අවසානය දෙස
ඉශ්‍රායෙල් පුත්‍රයන් ඇස් හෙළාගෙන
නොසිටින පිණිස මෝසෙස් තමාගේ
මුහුණේ වැස්මක් දමාගත් ලෙස අපි
14 නොකරමුව. ඔවුන්ගේ සිත් දැඩිවුණේය.
එසේය, අද දක්වාම පරණ ගිවිසුම
කියවන කල එම වැස්ම පවතින්නේය.
ඒ වැස්ම ක්‍රිස්තුස්වහන්සේ තුළ
15 නැතිකරනලද්දේය. අද දක්වා
මෝසෙස්ගේ ලියවිලි කියවන කල
16 වැස්මක් ඔවුන්ගේ සිත් පිට තිබේ. එසේවී
නුමුත් ස්වාමීන්වහන්සේ වෙතට හැරෙන
17 කල ඒ වැස්ම අහක්කරනු ලැබේ. ඉදින්
ඒ ස්වාමීන්වහන්සේ ආත්මයාණන්-
වහන්සේය. ස්වාමීන්වහන්සේගේ
ආත්මයාණන්වහන්සේ ඇති තැන
18 නිදහස්කම ඇත්තේය. අපි සියල්ලෝද
මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්-
වහන්සේගේ තේජස කැඩපතකින් මෙන්
දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන
ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින්
තේජසට එම ස්වරූපයට වෙනස්කරනු
ලබමුව.

## ශුභාරංචිය ප්‍රකාශකිරීමේ ධෛර්යවත් අවංකකම

4 ඉත්නිසා අපට කරුණාව ලැබුණු
ලෙසම මේ සේවයත් ලැබී තිබෙන
බැවින්, අපි ක්ලාන්ත නොවී සිටිමුව.
2 ලජ්ජාවේ රහස් දේවල් එපාකළෙමුව.
ප්‍රයෝගයෙන් නොහැසිර, දෙවියන්-
වහන්සේගේ වචනය ගැන වංචා නොකර,
සැබෑව ප්‍රකාශකිරීමෙන්ම දෙවියන්-
වහන්සේ ඉදිරියෙහි සියලු මනුෂ්‍යයන්ගේ
හෘදයසාක්ෂියට එකඟවෙන ලෙස අපේ
3 ගුණ දක්වීමුව. නුමුත් අපේ ශුභාරංචිය
වැසී තිබේ නම්, එය වැසී තිබෙන්නේ
4 විනාශවෙන්නන්ටය. නොඇදහිලිකාරවූ
ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ
ස්වරූපයවූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ
ශුභාරංචි ආලෝකය නොබැබළෙන
පිණිස, මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ
සිත් අන්ධකළේය. මක්නිසාද අපි අප 5
ගැනම නොව, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ
ස්වාමීන්වහන්සේය කියාද යේසුස්-
වහන්සේ නිසා අපි තුඹලාගේ
දසයෝය කියාද ප්‍රකාශකරමුව. එසේය, 6
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුහුණෙහි
දෙවියන්වහන්සේගේ තේජස දැනගැන්ම
නැමති ආලෝකය බැබළෙන පිණිස,
අපගේ සිත්වල බැබළුවේ අන්ධකාරයෙන්
ආලෝකය බැබළෙන්ට කීවාවූ දෙවියන්-
වහන්සේය.

## ප්‍රේරිතවරුන්ගේ දුර්වලතාව සහ දෙවියන්වහන්සේගේ බලසම්පන්නකම

නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට 7
නොව දෙවියන්වහන්සේට අයිතිවන
පිණිස මේ වස්තුව අපි මැටි භාජනවල
දරමුව. අපි හැම අතින්ම මඩිනු ලබමුව. 8
එහෙත් හිර නොවී සිටිමුව; වියවුල්ව
සිටිමුව, එහෙත් බලාපොරොත්තුවක්
නැතුව නොවේය; ලුහුබඳිනු ලබමුව, 9
එහෙත් අත්හරිනු නොලබමුව; හෙළා
දමනු ලබමුව, එහෙත් විනාශ නොවී
සිටිමුව. යේසුස්වහන්සේගේ ජීවත්වීම අපේ 10
ශරීරයෙහි ප්‍රකාශවෙන පිණිස අපි
යේසුස්වහන්සේගේ මරනු ලැබීම අපේ
ශරීරයෙහි නිතරම දරාගෙන යමුව.
මක්නිසාද අපේ මරණීයවූ මාංසයෙහි 11
යේසුස්වහන්සේගේ ජීවනයත් ප්‍රකාශවෙන
පිණිස ජීවත්වන්නාවූ අපි යේසුස්වහන්සේ
උදෙසා නිතරම මරණයට පාවා දෙනු
ලබමුව. මෙසේ අප තුළ මරණයද තුඹලා 12
තුළ ජීවනයද ක්‍රියාකරන්නේය. නවද: 13
මම විශ්වාසකළෙමි, ඒ නිසා
කථාකළෙමියි ලියා තිබෙන ලෙස,
ඇදහිල්ලේ එම ආත්මය ඇත්නාවූ අපිත්
විශ්වාසකරමුව, එබැවින් කථාකරමුව.
මක්නිසාද ස්වාමිවූ යේසුස්වහන්සේව 14
නැගිටෙවූ තැනන්වහන්සේ යේසුස්-
වහන්සේ සමග අපත් නැගුටුවා, තුඹලා
සමග තමන්වහන්සේ ඉදිරියෙහි සිටවන
බව අපි දනිමුව. මක්නිසාද අනුග්‍රහය 15
වැඩිදෙනා කරණකොටගෙන අධිකවී,

ස්තුතිකිරීම දෙවියන්වහන්සේගේ තේජස
සඳහා අධික වන පිණිස ඒ සියල්ල
තුඹලා උදෙසා වන්නේය.

## කාලික දුක් පීඩා සහ සදාකාල තේජස

16 එහෙයින් අපි ක්ලාන්ත නොවමුව; අපේ
පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නුමුත්, අපේ
ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු
17 ලබන්නේය. මොහොතකට පවතින අපේ
සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව
නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට,
18 ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල
තේජස් භාරයක් සාදදෙන්නේය. මක්නිසාද
පෙනෙන දේ කාලිකය; නොපෙනෙන
දේ සදාකාලිකය.

## භූමික ශරීරයෙන් වෙන්වීම ගැන භයක් නැති බව

5 කූඩාරමක්වූ අපේ භූමික
ගෙය කඩාවැටුණත් දෙවියන්-
වහන්සේගෙන්වූ ගොඩනැගිල්ලක් වන
අතින් නොසෑදූවාවූ සදාකාලිකවූ ගෘහයක්
ස්වර්ගවල අපට ඇති බව දනිමුව.
2 මක්නිසාද මේකේදී අපි කෙඳිරිගාමින්
අපගේ ස්වර්ගීය වාසස්ථානය
3 පැළඳගන්ට ආශාවමුව. මෙසේ වූ කල්හි
අපි පළඳනලදුව, නග්නව සිටිනවා දකිනු
4 නොලබමුව. එසේය, මේ කූඩාරමේ
සිටින්නාවූ අපි බර උසුලමින්
කෙඳිරිගාමුව; මක්නිසාද පැළඳීම අහක
දමන්ට නොව මරණීයවූ එක ජීවනයෙන්
ගිලිනු ලබන පිණිස, අපි පළඳිනු ලබන්ට
5 කැමැත්තෙමුව. ඉදින් මේ පිණිසම
අප පිළියෙළකළේ දෙවියන්වහන්සේය,
උන්වහන්සේ ආත්මයාණන් නැමති
6 අත්තිකාරම අපට දුන්සේක. අපි ශරීරය
නැමති ගෙදර සිටින විට ස්වාමීන්-
වහන්සේගෙන් ඈත්ව සිටින බව දන
7 නිතරම ධෛර්යවත්ව සිටිමුව. (මක්නිසාද
අප හැසිරෙන්නේ පෙනීමෙන් නොව
8 ඇදහීමෙන්ය.) එසේය, අපි ධෛර්යවත්ව,
ශරීරයෙන් ඈත්ව ස්වාමීන්වහන්සේ
සමග සිටින්ට වඩා කැමතිවෙමුව.
එහෙයින් උන්වහන්සේ වෙත සිටින නුමුත් 9
ඈත්ව සිටින නුමුත් උන්වහන්සේට
ප්‍රසන්නවූ තැනැත්තන් වීම අපේ අභිප්‍රාය
කරගනිමුව. මක්නිසාද එකිනෙකා තම 10
තමාගේ ශරීරයේදී කළාවූ දේවල එල,
ඒ දේ යහපත් වුවත් අයහපත් වුවත්,
කළ දේවල හැටියට ලබන පිණිස,
අප සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේගේ
විනිශ්චයාසනය ඉදිරියෙහි ප්‍රකාශවෙන්ට
ඕනෑය.

## ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයේ බලය

එබැවින් ස්වාමීන්වහන්සේ කෙරෙහි 11
භයවීම කිමෙක්දැයි දන්නාවූ අපි
මනුෂ්‍යයන් පොලඹවමුව, නුමුත් අපි
දෙවියන්වහන්සේට ප්‍රකාශකරනු ලැබ
සිටිමුව; තුඹලාගේ හෘදයසාක්ෂිවලටද
අපි ප්‍රකාශව සිටිමුයයි විශ්වාසකරමි.
අපි නැවත අප ගැනම තුඹලාට සාක්ෂි 12
නොදෙමුව, නුමුත් හිතෙන් නොව
පෙනීමෙන් පාරට්ටුකරගන්නන්ට
උත්තරදෙන්ට තුඹලාට පුළුවන්වන
පිණිස අප ගැන පාරට්ටුකරන්ට අපි
තුඹලාට කාරණා දෙමුව. මක්නිසාද 13
අපට ඔල්මාද නම් ඒ දෙවියන්වහන්සේ
උදෙසාය. අපි සිහි ඇත්තෝ නම්
ඒ තුඹලා උදෙසාය. මක්නිසාද 14
ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි
බලපවත්වන්නේය; එසේය, එක් කෙනෙක්
සියල්ලන් වෙනුවට මැරුණේය කියාත්,
එබැවින් සියල්ලෝම මැරුණෝය කියාත්,
උන්වහන්සේ සියල්ලන් වෙනුවට 15
මැරුණේ, ජීවත්වන්නන් තවත් තමුන්
උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට
මැරී නැවත නැගිටුණාවූ තැනැත්වහන්සේ
උදෙසා ජීවත්වන පිණිසය කියාත්, අපි
නිශ්චයකොට කියමුව.

## ක්‍රිස්තුස්වහන්සේ තුළවූ අලුත් ජීවිතය

එහෙයින් මෙතැන් පටන් අපි මාංසා- 16
කාරයෙන් කිසිවෙකු දන නොගනිමුව.
මාංසාකාරයෙන් ක්‍රිස්තුස්වහන්සේ

දැනගෙන සිටිය නුමුත් අපි දැන්
තවත් එසේ දැන නොගනිමුව.
17 එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ
සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය.
පරණ දේ පහව ගියේය; මෙන්න,
18 සියල්ලම අලුත්වී තිබේ. සියල්ල
පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන්ය;
උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ කරණ-
කොටගෙන තමන්වහන්සේට අප
සමගිකරගෙන, සමගිකිරීමේ සේවය අපට
19 දුන්සේක. එනම්, දෙවියන්වහන්සේ
මනුෂ්‍යයන්ගේ වරදවල් ඔවුන්ගේ
ගණනට නොතබා, ක්‍රිස්තුස්වහන්සේ
කරණකොටගෙන ලෝකයා තමන්-
වහන්සේට සමගිකරගනිමින් සිටියසේක,
සමගිකිරීමේ වචනයද අපට
භාරදුන්සේක.

## සමගිකිරීමේ පණිවිඩය

20 එබැවින් දෙවියන්වහන්සේ අප ලවා
ඉල්වන්නාක්මෙන් අපි ක්‍රිස්තුස්වහන්සේ
වෙනුවෙන් තානාපතියෝව සිට:
දෙවියන්වහන්සේ හා සමගිවෙයල්ලායයි
ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් තුඹලාගෙන්
21 ඉල්ලමුව. අප උන්වහන්සේ තුළ
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන
පිණිස පාපයක් නොදත්තාවූ
උන්වහන්සේ අප වෙනුවට *පාපය වෙන්ට
[දෙවියන්වහන්සේ] සැලැස්සූසේක.
6 තවද අපි දෙවියන්වහන්සේ සමග
හවුල් වැඩකරන්නෝව, තුඹලා
උන්වහන්සේගේ අනුග්‍රහය නිෂ්ප්‍ර-
යෝජනයේ නොලබන ලෙස ඉල්ලා
2 සිටිමුව. මක්නිසාද—
පිළිගත යුතුවූ කාලයකදී තුඹට
ඇහුම්කන්දුනිමි,
ගැළවීමේ දවසකදී තුඹට පිහිට
වුණෙමියි
උන්වහන්සේ කියනසේක. මෙන්න, දැන්
පිළිගත යුතුවූ කාලයය; මෙන්න, දැන්
3 ගැළවීමේ දවසය. අපගේ සේවයට දෝෂ
නොපැමිණෙන පිණිස, කිසිවකින්
බාධාවට කිසි ප්‍රස්තාවක් නොදී,
බොහෝ ඉවසීමෙන්ද පීඩාවලින්ද 4
හිඟකම්වලින්ද විපත්තිවලින්ද, පහර- 5
කෑම්වලින්ද හිරඅඩස්සිවීම්වලින්ද
කෝලාහලවලින්ද වෙහෙසවලින්ද
නිදිමැරීම්වලින්ද නිරාහාරව සිටීම්-
වලින්ද; පිරිසිදුකමින්ද දැනගැන්මෙන්ද 6
ඉවසිලිවන්තකමින්ද ගුණවත්කමින්ද
ශුද්ධාත්මයෙන්ද අවංක ප්‍රේමයෙන්ද;
සත්‍යතාවේ වචනයෙන්ද දෙවියන්- 7
වහන්සේගේ බලයෙන්ද දකුණෙහිත්
වමෙහිත් ධර්මිෂ්ඨකම නමැති සන්නාහය
කරණකොටගෙනද; ගෞරවය සහ 8
අගෞරවය කරණකොටගෙනද, අපකීර්තිය
සහ කීර්තිය කරණකොටගෙනද,
වංචාකාරයන් මෙන් පෙනෙන නුමුත්
සත්‍යවාදී අය මෙන්ද; නාඳුනනු 9
ලබන්නන් මෙන් පෙනෙන නුමුත්
හොඳට අඳුනනු ලබන්නන් මෙන්ද,
මැරෙන්නාක්මෙන් පෙනෙන නුමුත්, බලව,
ජීවත්වෙන්නන් මෙන්ද, දඬුවම්
ලබන්නාක්මෙන් පෙනෙන නුමුත් මරනු
නොලබන්නන් මෙන්ද; ශෝකවෙන්නන් 10
මෙන් පෙනෙන නුමුත් නිතර ප්‍රීතිවෙන්නන්
මෙන්ද, දිළින්දන් මෙන් පෙනෙන නුමුත්
බොහෝ දෙනෙක් ධනවන්ත කරන්නන්
මෙන්ද, කිසිවක් නැත්තන් මෙන් පෙනෙන
නුමුත් සියල්ල ඇත්තවුන් මෙන්ද යන
මේ සියල්ලෙන් අපි දෙවියන්වහන්සේගේ
සේවකයන් මෙන් අපම පිළිගන්වමුව.

## අදහාගත් තැනැත්තන් විසින් ප්‍රේමය පෙන්වන ලෙස ඉල්ලීම

එම්බා කොරින්තිවරුනි, අපේ මුඛය 11
තුඹලාට කථාකරන පිණිස ඇරී තිබේ,
අපේ සිත විශාලවී තිබේ. තුඹලා හිරවී 12
සිටින්නේ අප තුළ නොවේ, තුඹලාගේම
සිත් තුළ තුඹලා හිරවී සිටිහුය. එබැවින් 13
එම ආකාර ප්‍රතිඵලයක් පිණිස තුඹලාත්
සිතින් විශාලවෙයල්ලා; දරුවන්ට මෙන්
මෙසේ කියමි.

## ක්‍රිස්තියානිකාරයා නොඇදහිලිකාරයන් සමග පංගුකාරකම නොපැවැත්විය යුතු බව

නොඇදහිලිකාරයන් සමග අසම ලෙස 14
සම්බන්ධ නොවෙල්ලා. ධර්මිෂ්ඨකමෙන්

*එනම්—පාපය තමන් පිටට ගන්ට.

අධර්මිෂ්ඨකමෙන් ඇති සහභාගිකම
මොකද? නොහොත් අන්ධකාරය සමග
ආලෝකයේ ඇති පංගුකාරකම මොකද?
15 බෙලියෙල් සමග ක්‍රිස්තුස්වහන්සේගේ
ඇති එකමුතුකම මොකද? නොහොත්
නොඅදහන කෙනෙකු සමග ඇදහිලි-
වන්තයෙකුගේ ඇති කොටස මොකද?
16 දේවතා රූප සමග දෙවියන්වහන්සේගේ
මාළිගාවට ඇති එකඟකම මොකද?
මක්නිසාද අපි ජීවමාන දෙවියන්-
වහන්සේගේ මාළිගාවය; එසේම
දෙවියන්වහන්සේ කථාකොට: මම ඔවුන්
අතරේ වාසයකරන්නෙමි, හැසිරෙන්නෙමි;
මම ඔවුන්ගේ දෙවියන්වහන්සේව
සිටින්නෙමි, ඔව්හුද මාගේ සෙනඟව
17 සිටින්නෝයයි කීසේක. එබැවින්–

තුඹලා ඔවුන් අතරෙන් පිටතට
ඇවිත්, වෙන්ව සිටපල්ලා,
අපවිත්‍ර දෙයකට අත නොගසා
සිටපල්ලායයි
ස්වාමීන්වහන්සේ කියනසේක.
එවිට මම තුඹලා පිළිගෙන,
18 තුඹලාට පියෙක් වන්නෙමි,
තුඹලාද මට පුත්‍රයොත් දූවරුත්
වන්නහුයයි
සර්වපරාක්‍රමවූ ස්වාමීන්වහන්සේ
කියනසේක.

7 එබැවින්, ප්‍රේමවන්තයෙනි, මේ
පොරොන්දු අපට තිබෙන නිසා,
මාංසයේද ආත්මයේද සියලු
කිලුටුකම්වලින් අපම පවිත්‍රකරගනිමින්,
දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව,
ශුද්ධකම සම්පූර්ණකරගනිමු.

## පසුබටවීම හැරදමූ කොරින්තිවරුන් ගැන ප්‍රේරිත තැනගේ සැනසිල්ල හා ප්‍රීතිය

2 තුඹලාගේ සිත් අපට විවරකරපල්ලා.
අපි කිසිවෙකුට අයුත්තක් නොකළෙමුව,
කිසිවෙකු නරක් නොකළෙමුව,
3 කිසිවෙකුගෙන් වාසි නොගතිමුව. මා
එසේ කියන්නේ තුඹලාට වරද තබන
පිණිස නොවේ. මක්නිසාද තුඹලා එක්ව
මැරෙන්ටත් එක්ව ජීවත්වෙන්ටත් තුඹලා
අපේ සිත්වල දරමුයයි පළමුවෙන්ම
කීවෙමි. තුඹලා කෙරෙහි තිබෙන මාගේ 4
විශ්වාසය මහත්ය, තුඹලා ගැන මාගේ
පාරට්ටුකිරීම මහත්ය. සැනසිල්ලෙන්
පූර්ණව සිටිමි, අපේ සියලු දුක්වලදී
ප්‍රීතියෙන් පිනමි.
මක්නිසාද අප මකිදෝනියට ආ කල 5
පවා අපේ මාංසයට කිසි පහසුවක්
නැතුව හැම අතින්ම දුක්වින්දෙමුව;
පිටතින් විරුද්ධකම්ද ඇතුළතින් භයද
විය. තුමුත් යටහතුන් සනසන්නාවූ 6
තැනන්වහන්සේ එනම් දෙවියන්වහන්සේ
තීතස්ගේ ඊමෙන් අප සැනසූසේක; ඔහුගේ 7
ඊමෙන් පමණක් නොව තුඹලා ගැන
ඔහු ලැබූ සැනසිල්ලත් කරණකොටගෙනය;
තුඹලාගේ මහත් ආශාවද තුඹලාගේ
වැලපීමද මා උදෙසා තුඹලාගේ
ජ්වලිතකමද ගැන ඔහු දන්වූ කල, මම
තව වඩා ප්‍රීතිවීමි. මෙසේ මම ඒ ලියුමෙන් 8
තුඹලා ශෝකයට පැමිණෙවූ නිසා
කනගාටුවූ තුමුත්, දැන් කනගාටු නොවෙමි;
කලකට පමණක් වුවත් ඒ ලියුම තුඹලා
ශෝකයට පැමිණෙවූ බව මට පෙනේ.
තුඹලා ශෝකයට පමුණුවනු ලැබූ නිසා 9
නොව පසුතැවිලිවීම සඳහා තුඹලා
ශෝකයට පමුණුවනු ලැබූ බැවින් දැන්
ප්‍රීතිවෙමි. එසේය, කොයි ප්‍රකාරයකින්වත්
තුඹලා අපෙන් අලාභ නොවිඳින පිණිස
දේව කැමැත්තේ හැටියට තුඹලා
ශෝකවුණහුය. මක්නිසාද දේවකැමැත්තට 10
එකඟවූ ශෝකයෙන්, තැවෙන්ට
කාරණයක් නොවන්නාවූ ගැළවීමට
පමුණුවන පසුතැවිලිවීම හටගන්නේය.
තුමුත් ලෞකික ශෝකය මරණය
උපදවන්නේය. එසේය, මෙන්න, 11
දේවකැමැත්තේ හැටියට ශෝකවීම යන
කාරණයෙන් තුඹලා තුළ කොපමණ
උනන්දුකමත් කොපමණ නිදෙස්කරගැනීමත්
කොපමණ අමනාපවීමත් කොපමණ
භයත් කොපමණ ආශාවත් කොපමණ
ජ්වලිතකමත් කොපමණ යුක්තිය
සිදුකිරීමේ අදහසත් හටගන්නා නොවේද!
මේ කාරණය සම්බන්ධව තුඹලා නිදෙස්
බව තුඹලා සියලු ආකාරයෙන්ම
ඔප්පුකළහුය. ඉතින් මා තුඹලාට ලියා 12
එවූ තුමුත් එසේ ලියුවේ අයුතුකම කළ
අය නිසාවත් අයුතුකම වින්ද අය

නිසාවත් නොව, අප ගැන තුඹලාගේ
ඇති මහත් සැලකිල්ල දෙවියන්වහන්සේ
ඉදිරියෙහි තුඹලාටම ප්‍රකාශවන පිණිසය.
13 එහෙයින් අපි සැනසීම ලබා සිටිමුව.
තුමුත් අපේ සැනසිල්ලේදී අප වඩාම
ප්‍රීතිවුණේ තීතස්ගේ ප්‍රීතිය නිසාය,
මක්නිසාද ඔහුගේ ආත්මයට තුඹලා
සියල්ලන්ගෙන් පහසුව ලැබී තිබේ.
14 එසේය, මම තුඹලා ගැන පාරට්ටුකර
ඔහුට යමක් කීවෙම් නම්, මම ලජ්ජාවට
පමුණුවනු නොලැබුවෙමි; එහෙත් අප
තුඹලාට සැබෑකමින් සියල්ල කී
හැටියටම තීතස් ඉදිරියෙහි අප විසින්
තුඹලා ගැන කළ පාරට්ටුවත්
15 සැබෑවුණේය. තවද තුඹලා සියල්ලන්ගේ
කීකරුකම, එනම් භයත් වෙවුලුමත් ඇතුව
ඔහුව පිළිගත් හැටි ඔහු සිහිකරන කල,
ඔහුගේ මෘදු ප්‍රේමය තුඹලා කෙරෙහි
16 වඩාත් අධිකවන්නේය. සියලු කාරණා-
වලදී මම තුඹලා ගැන නිසැකව සිටින
බැවින් ප්‍රීතිවෙමි.

## මකිදෝනියේ දිළිඳු ඇදහිලි-වන්තයන්ගේ තැගිවන්තකම

8 තවද, සහෝදරයෙනි, මකිදෝනියේ
සභාවලට දී තිබෙන දෙවියන්-
වහන්සේගේ අනුග්‍රහය අපි තුඹලාට
2 දන්වමුව. එනම්, බොහෝ දුක්විඳීම
නැමති පරීක්ෂාවකදී ඔවුන්ගේ ප්‍රීතිය
වැඩිවූ බවත්, ඔවුන්ගේ මහත් දිළිඳුකමේ
ප්‍රමාණයට ඔවුන් ඔවුන්ගේ
තැගිවන්තකම නැමති ධනයෙන් වැඩිවූ
3 බවත්ය. මක්නිසාද, තුමුන්ගේ
පුළුවන්කමේ ප්‍රකාරයටත්, එසේය, ඊට
වැඩියෙනුත්, ස්වකීය කැමැත්තෙන්ම ඔව්හු
4 දුන්නෝයයි සාක්ෂිදෙමි. ශුද්ධවන්තයන්ට
උපස්ථානකිරීමට පංගුකාරයන් වීමේ
ප්‍රසාදය බොහෝ කන්නලව් ඇතුව ඔව්හු
5 අපගෙන් ඉල්ලුවෝය. අප සිතූ ලෙස
නොව පළමුකොට තුමූම ස්වාමීන්-
වහන්සේටද දෙවියන්වහන්සේගේ
කැමැත්ත කරණකොටගෙන අපටද
6 භාරවුණෝය. එහෙයින් තීතස් පළමුවෙන්
පටන්ගත් ලෙසම මේ අනුග්‍රහයත් තුඹලා
අතරෙහි සම්පූර්ණකරන්ට අපි ඔහුට
7 අවවාදකළෙමුව. ඉදින් තුඹලා සියලු
දෙයින්, එනම් ඇදහිල්ලෙන්ද කථාවෙන්ද
ඥානයෙන්ද සියලු උත්සාහවලින්ද අප
කෙරෙහි තිබෙන තුඹලාගේ ප්‍රේමයෙන්ද
අධිකව සිටින්නාක්මෙන්ම මෙම
අනුග්‍රහයෙන්ද අධිකවන්ට බලාගනිල්ලා.
මේක මා කියන්නේ අණක් ලෙස නොව 8
වෙන අයවලුන්ගේ උත්සාහවන්තකමෙන්
තුඹලාගෙන් ප්‍රේමයේ සැබෑකම
විභාගකරන පිණිසය. මක්නිසාද අපගේ 9
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
කරුණාව, එනම්, උන්වහන්සේ ධනවන්තව
සිටිය තුමුත්, තමන්වහන්සේගේ දිළිඳුකම
කරණකොටගෙන තුඹලා ධනවන්ත වන
පිණිස, තුඹලා උදෙසා දිළිඳුවූ බව
තුඹලා දන්නහුය. මේ කාරණය ගැන 10
මාගේ කල්පනාව කියමි. මක්නිසාද
අවුරුද්දකට ප්‍රථම සිට ඒක කරන්ට
පමණක් නොව ඊට කැමතිවෙන්ටත්
පටන්ගත් තුඹලාට ඒක ප්‍රයෝජනවන්ය.
ඉතින් කැමතිවීමට සූදනම්ව 11
සිටියාක්මෙන්ම තුඹලාගේ පුළුවන්කමේ
හැටියට එහි තීන්දුවත් පැමිණෙන පිණිස
දන් කිරීමත් තීන්දුකරපල්ලා. මක්නිසාද 12
මනාපය තිබේ නම්, යමෙකුට නැති දේ
ප්‍රකාරයට නොව ඇති දේ ප්‍රකාරයට
පිළිගනු ලැබේ. මෙසේ කියන්නේ අනුන්ට 13
පහසුවත් තුඹලාට අමාරුවත් පැමිණෙන
පිණිස නොව සමකම පිණිසය; මේ 14
කාලයේ තුඹලාගේ වැඩිකම ඔවුන්ගේ
හීනකමට ආධාරයක් වූයෙන්, (මත්තට)
ඔවුන්ගේ වැඩිකමත් තුඹලාගේ හීනකමට
ආධාරයක් වීමෙන් සමකමක් වන
පිණිසය. එසේම: බොහෝ එකතුකළ 15
අයට වැඩිවුණේවත් ස්වල්පයක් එකතුකළ
අයට අඩුවුණේවත් නැතැයි ලියා තිබේ.

## සම්මාදම් සම්බන්ධව ප්‍රේරිත තැනගේ උදවුකාරයෝ

ඉතින් තුඹලා ගැන එම උනන්දුකම 16
තීතස්ගේ සිතට දුන් දෙවියන්වහන්සේට
ස්තුතිවේවා. මක්නිසාද ඔහු අපේ 17
අවවාදය සැබවින් පිළිගත්තේය; තුමුත්
තමාම ඉතා උනන්දුව සිටිය බැවින්,
ඔහු තමාගේම කැමැත්තෙන් තුඹලා
ළඟට ආයේය. තවද ශුභාරංචිය ගැන 18

සියලු සභාවලින් ප්‍රශංසාව ලබන
19 සහෝදරයා ඔහු සමග එව්වමු; එපමණක්
නොව අපේ සේවයෙන් ඉෂ්ටකරන්නාවූ
මේ ප්‍රසාදය ගැන අප සමග ගමන්
කිරීමට ස්වාමීන්වහන්සේගේ ගෞරවයද
අපගේ මනාපවීමද සඳහා ඔහුත් සභාවන්
20 විසින් නියමකරනලද්දේය. මෙසේ, අපේ
සේවයෙන් ඉෂ්ටකරන මේ දීමනාව ගැන
කිසිවෙක් අපට දෝෂාරෝපණය
නොකරන පිණිස ප්‍රවේසම්වෙමුව.
21 මක්නිසාද ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
පමණක් නොව මනුෂ්‍යයන් ඉදිරියෙහිත්
ගරුකටයුතු දේ කරන්ට සිතට ගනිමුව.
22 තවද නොයෙක්විට නොයෙක්
කාරණාවලදී උනන්දු කෙනෙක් බව
අපට ඔප්පුවුණාවූ, දැන් තුඹලා කෙරෙහි
ඇති මහත් විශ්වාසය නිසා ඊටත් වඩා
උනන්දුකම ඇත්තෙක්වූ අපේ සහෝදරයා
23 ඔවුන් සමග එව්වමු. තීතස් වනාහි මාගේ
පංගුකාරයෙක්ව, තුඹලා උදෙසා
මාගේ හවුල් සේවකයෙක්ව සිටින්නේය.
අපගේ සහෝදරයෝ වනාහි සභාවල
ප්‍රේරිතයෝව, ක්‍රිස්තුස්වහන්සේගේ
24 තේජසක්ව සිටිති. එහෙයින් තුඹලාගේ
ප්‍රේමයේද තුඹලා ගැන අපේ පාරට්ටුවේද
ඔප්පුව ඔවුන්ට සභාවන් ඉදිරියෙහිදී
පෙන්වාපල්ලා.

## සම්මාදම් එකතුකිරීමට තවත් අවවාද හා ධෛර්ය වචන

9 ශුද්ධවන්තයන්ට උපස්ථානකිරීම
ගැන මා විසින් තුඹලාට ලිවීම ඕනෑ
2 නැත. මක්නිසාද තුඹලාගේ මනාපකම
දනිමි, අකාය ගිය අවුරුද්දේ පටන්ම
සූදනම්ව සිටියායයි මකිදෝනිවරුන්ට
තුඹලා ගැන පාරට්ටුකරමි; තුඹලාගේ
ජ්වලිතකමින් ඔවුන්ගෙන් බොහෝ
3 දෙනෙක් පොලඹවනු ලැබුවෝය. එසේවී
නුමුත් මේ ගැන තුඹලා උදෙසා අපේ
පාරට්ටුව හිස් නොවන පිණිසද මා කී
හැටියට තුඹලා සූදනම්ව සිටින පිණිසද
4 සහෝදරයන් එව්වෙමි. නැත්නම් යම්
විධියකින් මකිදෝනිවරු මා සමග එන්ට
යෙදී තුඹලා සූදනම් නැති බව දුටුවොත්,
තුඹලා කොහොම නුමුත් අපි නම්
මේ විශ්වාසය නිසා ලජ්ජාවට
පැමිණෙන්නෙමුව. එබැවින් කලින් 5
පොරොන්දුවුණාවූ තුඹලාගේ දීමනාව
බලාත්කාරයෙන් ගැනීමක් මෙන් නොව
ත්‍යාගවත් දීමනාවක්ව තිබෙන පිණිස
කලින් තුඹලා වෙතට ඇවිත් එය පිළියෙළ
කරන ලෙස ඒ සහෝදරයන්ගෙන්
ඉල්ලන්ට යුතුයයි සිතුවෙමි.
නුමුත් මේක කියමි: මසුරුලෙස 6
වපුරන්නා මසුරුලෙස කපාගන්නේය;
නොමසුරුව වපුරන්නා නොමසුරුව
කපාගන්නේය. කනගාටුවෙන්වත් ඕනෑම 7
නිසාවත් නොව එක් එක්කෙනා තම
තමාගේ සිතින් නියමකරගත් ලෙස දේවා.
මක්නිසාද සතුටු සිතින් දෙන්නාට
දෙවියන්වහන්සේ ප්‍රේම කරනසේක. තවද 8
තුඹලා සියලු දේවලදී නිතරම පූර්ණකම
ලැබ සියලු යහපත් ක්‍රියා සඳහා පූර්ණව
සිටින පිණිස තුඹලාට සියලු අනුග්‍රහය
වැඩිකරදෙන්ට දෙවියන්වහන්සේට
පුළුවන. ඒ හැටියට– 9

ඔහු විසිරෙව්වේය, දිළිඳුන්ට දුන්නේය;
ඔහුගේ ධර්මිෂ්ඨකම සදකල්
පවතින්නේයයි

ලියා තිබේ. ඉතින් වපුරන්නාට බීජද 10
කෑමට රොටිද සපයාදෙන්නාවූ
තැනන්වහන්සේ තුඹලාට වැපිරීම
පිණිස බීජ සපයාදී, වැඩිකොට,
තුඹලාගේ ධර්මිෂ්ඨකමේ ඵල
වර්ධනයකරනසේක. මෙසේ තුඹලා සියලු 11
ත්‍යාගවන්තකමට සියලු ආකාරයෙන්
පොහොසත්වන්නහුය, එය අප
කරණකොටගෙන දෙවියන්වහන්සේට
ස්තුති උපදවන්නේය. මක්නිසාද 12
මේ උපස්ථානකිරීමේ සේවයෙන්
ශුද්ධවන්තයන්ගේ හිඟකම පිරිමැසෙනවා
පමණක් නොව දෙවියන්වහන්සේට
බොහෝ ස්තුතිදීම්ද උපදින්නේය. මේ 13
උපස්ථානයෙන් තුඹලා සෝදිසිකිරීම
කරණකොටගෙන ඔව්හු ක්‍රිස්තුස්-
වහන්සේගේ ශුභාරංචිය තුඹලා විසින්
පිළිගැනීමේ කීකරුකමද, ඔවුන්
සහ සියල්ලන් කෙරෙහි තුඹලාගේ
සම්මාදමේ ත්‍යාගවන්තකමද නිසා

දෙවියන්වහන්සේට ප්‍රශංසාකරනවාත්
14 හැර, තුඹලා උදෙසා කන්නලව්කරමින්,
තුඹලා කෙරෙහි ඇත්තාවූ දෙවියන්-
වහන්සේගේ ඉතා මහත් අනුග්‍රහය නිසා
තුමූම තුඹලා කෙරෙහි ඉතා ඇලුම්වෙති.
15 දෙවියන්වහන්සේගේ කියා නිමකළ
නොහැකි දීමනාව ගැන උන්වහන්සේට
ස්තුතිවේවා.

## ප්‍රේරිතතැන දුර්වල බයාදු කෙනෙකැයි චරද තැබූවන්ට උත්තරය

10 ඉදිරියෙහි සිටින කල තුඹලා
අතරෙහි යටහත්වූ, ඈත්ව සිටින
කල තුඹලා කෙරෙහි නිර්භීතවූ පාවුල්
නම් මම ක්‍රිස්තුස්වහන්සේගේ මෘදුකම
සහ මොළොක් ගුණය නිසා තුඹලාගෙන්
2 ඉල්ලීමක් කරමි. එසේය, අප
මාංසාකාරයෙන් හැසිරෙන්නන් කොට
ගණන්ගන්නා සමහරුන්ට විරුද්ධව
පාන්නට මා සිතන විශ්වාසයෙන්,
තුඹලා වෙත සිටින විට මට
නිර්භීතවෙන්ට නොසලස්වන මෙන්
3 තුඹලාගෙන් ඉල්ලමි. මක්නිසාද අපි
මාංසයෙහි හැසිරෙන තුමූත් මාංශයේ
4 හැටියට යුද්ධ නොකරමුව. (මක්නිසාද
අපේ යුද්ධායුධ මාංසික නොවේය,
එහෙත් ඒවා බලකොටු බිඳහෙළීමට
දෙවියන්වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය.)
5 අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන
දැනගැනීමට විරුද්ධව උසස්වන්නාවූ
සියලු උසස් දේවල්ද බිඳහෙළා, සියලු
සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට
6 වාල්කරදෙමුව. තුඹලාගේ කීකරුකම
සම්පූර්ණවූ කල සියලු අකීකරුකමට
දඬුවම්කිරීමටද අපි සූදානම්ව සිටිමුව.
7 තුඹලා පෙනීමේ හැටියට කාරණා
බලන්නහුද? යමෙක් තමා ක්‍රිස්තුස්-
වහන්සේට අයිතියයි සිතාගන සිටින්නේ
නම්, තමා ක්‍රිස්තුස්වහන්සේට අයිතිවා
සේම අපිත් අයිති බව තමාම
8 කල්පනාකරගනීවා. මක්නිසාද (තුඹලා
බිඳහෙළීම පිණිස නොව ගොඩනැඟීම
පිණිස ස්වාමීන්වහන්සේ අපට දුන්)
බලය ගැන මම ටිකක් වැඩිවශයෙන්
පාරට්ටුකරතත් ලජ්ජා නොවන්නෙමි.
[එසේ කියන්නේ] මම මාගේ ලියුම්වලින් 9
තුඹලා භයගන්වන්නාක් මෙන්
නොපෙනෙන පිණිසය. මක්නිසාද: 10
ඔහුගේ ලියුම් නම් බරපතළය, බලවත්ය;
තුමූත් ළඟ සිටින විට ශරීරාකාරය
දුර්වලය, කථාවද සුළුයයි ඔව්හු කියති.
මෙන්න, අපි ඈත්ව සිටින කල ලියුම්වල 11
වචනවලින් යම් ආකාරව සිටිමුද ළඟ
සිටින කල ක්‍රියාවෙනුත් එසේමයයි එබඳු
අය තේරුම්ගනීවා. මක්නිසාද තමුන් 12
ගැනම සාක්ෂිදෙන්නාවූ සමහරුන් සමග
අප ගණන්ගන්ට නොහොත් ඔවුන්ට
අපම සමානකරගන්ට අපට ධෛර්යය
නැත. තුමූත් තමුන්ගේම මිම්මෙන්
තමුන්ම මැනගන්නාවූ, තමුන්ටම තමුන්
සමානකර බලන්නාවූ ඔව්හු තේරුම්
නැතුව සිටිති. තුමූත් අපි ප්‍රමාණයට 13
වඩා නොව, තුඹලා ළඟට පවා
පැමිණෙන පිණිස, දෙවියන්වහන්සේ
විසින් අපට මැනදුන් මායිමේ ප්‍රමාණයේ
හැටියට පාරට්ටුකරගන්නෙමුව.
මක්නිසාද අප තුඹලා ළඟට 14
නොපැමුණුණාක්මෙන්, [අපේ මේ
කීමෙන්] අපේ මායිමෙන් එපිට යනවා
නොවේ. එසේය, තුඹලා දක්වාත්
ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ඇතුව
ආවෙමුව. අපේ පමණට වඩා, එනම් 15
අනුන්ගේ වැඩ ගැන, අපි පාරට්ටු
නොකරමුව. තුමූත් තුඹලාගේ ඇදහිල්ල 16
වැඩිවන විට, අපේ අත්වලට සූදානම්ව
තිබෙන අනුන්ගේ මායිමේ වැඩ ගැන
පාරට්ටු නොකොට, තුඹලාට එහායින්
තිබෙන පළාත්වලත් ශුභාරංචිය
දේශනාකරන පිණිස වර්ධනයවීමට
ඇත්තාවූ අපේ මායිමේ ප්‍රමාණය
ලෙස තුඹලා නිසා විශාලකමක්
ලබන්නෙමුයයි බලාපොරොත්තුවෙමුව.
තුමූත් පාරට්ටුකරගන්නා ස්වාමීන්- 17
වහන්සේ තුළ පාරට්ටුකරගනීවා.
මක්නිසාද ඔප්පු සාක්ෂි තිබෙන්නේ තමා 18
ගැනම සාක්ෂිදෙන අයට නොව ස්වාමීන්-
වහන්සේගෙන් සාක්ෂි ලබන අයටය.

## ප්‍රේරිතයෙක් හැටියට පාවුල් තුමාගේ අයිතිවාසිකම

11 ස්වල්ප අඥානකමකදී නුඹලා මා
ගැන ඉවසන්නහු නම් කැමැත්තෙමි.
2 එසේය, මා ගැන ඉවසාපල්ලා. මක්නිසාද
පිරිසිදු කන්‍යාවකු මෙන් නුඹලා
ක්‍රිස්තුස්වහන්සේ වන එක පුරුෂයෙකුට
පාවාදීම පිණිස මා විසින් විවාහබස්
දුන් බැවින් දිව්‍යවූ ජ්වලිතයකින් නුඹලා
3 ගැන මම ජ්වලිතව සිටිමි. නුමුත්
සර්පයා තමාගේ ප්‍රයෝගයෙන් ඒව
රැවටූවාක්මෙන් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි
පවතින අවංකකමෙන්ද පිරිසිදුකමෙන්ද
යම් විධියකින් නුඹලා වෙන්කොට
නුඹලාගේ සිත් දූෂ්‍යකරනු ලැබේදෝ
4 කියා භයවෙමි. මක්නිසාද එන්නාවූ
තැනැත්තේ අප දේශනා නොකළ වෙන
යේසුස් කෙනෙකු ගැන දේශනාකෙරේ
නම්, නොහොත් නුඹලා නොලැබූ වෙන
ආත්මයක්වත් නුඹලා පිළි නොගත් වෙන
ශුභාරංචියක්වත් නුඹලා ඔහුගෙන්
පිළිගන්නහු නම්, ඔහු ගැන ඉවසීම
5 හොඳය. නුමුත් ඔය උත්කෘෂ්ට
ප්‍රේරිතයන්ට වඩා මම කොයි
ආකාරයකින්වත් අඩු නැතැයි සිතමි.
6 මම කථාවට නිවට නුමුත් දැනගැන්මෙන්
නිවට නොවෙමි; එපමණක් නොව අපි
හැම දෙයින්ම සියල්ලන් අතරේ නුඹලා
උදෙසා ඒ බව ප්‍රකාශ කළෙමුව.
7 නොහොත් නුඹලා උසස්වෙන ලෙස
මා විසින් මාම පහත්කරගනිමින්,
දෙවියන්වහන්සේගේ ශුභාරංචිය නිකමට
දේශනාකළ නිසා පාපයක් කළෙම්ද?
8 නුඹලාට සේවයකරන පිණිස වෙන
සභාවලින් කුලී ගනිමින් ඔවුන්ට
9 අලාභකළෙමි. තවද මම නුඹලා ළඟ
සිටියදී හිඟවූ කල කිසිවෙකුට බරක්
නොවීමි; මක්නිසාද සහෝදරයෝ
මකිදෝනියෙන් ආ කල මාගේ හිඟකම
පිරිමැසූවෝය; සියලු කාරණාවලදී
නුඹලාට බරක් නොවී සිටියෙමි,
10 එසේම සිටින්නෙමි. ක්‍රිස්තුස්වහන්සේගේ
සත්‍යතාව මා තුළ තිබෙන ලෙස අකායේ
පළාත්වලදී මේ මාගේ පාරට්ටුකිරීම
නවත්වන්ට කිසිවෙකුට ඉඩ නාරින්නෙමි.
ඒ මක්නිසාද? මා නුඹලාට ප්‍රේම 11
නොකරන නිසාද? දෙවියන්වහන්සේ
දන්නාසේක. නුමුත් මා කරන දේ, 12
ප්‍රස්තාවක් සොයන්නවුන්ගේ ප්‍රස්තාව
සිඳදමන පිණිස, මතුත් කරන්නෙමි; එසේ
කරන්නේ ඔවුන් පාරට්ටුකරගන්නාවූ
කාරණයේදී ඔවුන් අප වාගේ පෙනෙන
පිණිසය. එබඳු මනුෂ්‍යයෝ බොරු 13
ප්‍රේරිතයෝය, ක්‍රිස්තුස්වහන්සේගේ
ප්‍රේරිතයන්ගේ වෙස් ගන්නාවූ වංචාකාර
සේවකයෝය. ඒක පුදුමයක් නොවේ;
මක්නිසාද සාතන් පවා ආලෝකයේ 14
දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ 15
සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ
වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ;
ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස
වන්නේය.

## උවමනාවී නම් අන්‍යයන්ට වඩා දුක් පීඩා ගැන පාරට්ටුකරගන්ට ප්‍රේරිත තැනට පුළුවන් බව

මා අඥානයෙක්ය කියා කිසිවෙක් 16
නොසිතාවයි මම නැවත කියමි; නුමුත්
නුඹලා එසේ සිතුවත් මාත් මඳක්
පාරට්ටුකරගන්න පිණිස අඥානයෙකු
හැටියට මා පිළිගනිල්ලා. පාරට්ටුකිරීමේ 17
විශ්වාසයෙන් යුක්තව මා කථාකරන
දේ ස්වාමීන්වහන්සේ අනුව නොව
අඥානකමින් මෙන් කථාකරමි.
මාංසාකාරයෙන් බොහෝ දෙනෙක් 18
පාරට්ටුකරගන්නා බැවින් මමත්
පාරට්ටුකරගනිමි. මක්නිසාද ඥානවන්තව 19
සිටින නුඹලා, අඥානයන් ගැන
සන්තෝෂයෙන් ඉවසන්නහුය. යමෙක් 20
නුඹලා වහල්කමට පමුණුවන්නේ නුමුත්,
යමෙක් නුඹලා කාදමන්නේ නුමුත්,
යමෙක් නුඹලා අසුකරගන්නේ නුමුත්,
යමෙක් තමා උසස්කරගන්නේ නුමුත්,
යමෙක් නුඹලාගේ මුහුණට පහරදෙන්නේ
නුමුත්, නුඹලා ඉවසන්නහුය. අපි නම් 21
දුර්වලව සිටියෙමුය කියා අවනම්බුවක්
වශයෙන් කියමි. එසේවී නුමුත් කොයි
කාරණයකදීවත් යමෙක් නිර්භීත නම්
මමත් නිර්භීතව සිටිමියි අඥානලෙසින්
කියමි. ඔව්හු හෙබ්‍රෙව්වරුද? මමත් 22

එසේමය. ඔව්හු ඉශ්‍රායෙලිතයෝද? මමත්
එසේමය. ඔව්හු ආබ්‍රහම්ගේ වංශයද?
23 මමත් එසේමය. ඔව්හු ක්‍රිස්තුස්වහන්සේගේ
සේවකයෝද? මම වැඩිවශයෙන් එසේයයි
සිහිමුළාවූ කෙනෙකු මෙන් කියමි.
එසේ වන්නේ බොහෝ වැඩවලිනුත්,
වැඩිවශයෙන් හිරගෙට යාමෙනුත්,
අප්‍රමාණලෙස පහරකෑමෙනුත්, බොහෝ
වර මරණ උපද්‍රවයෙනුත් යන
24 මේවායින්ය. යුදෙව්වරුන්ගෙන් පස්වරක්
25 එකුන් සතළිසක් පහරකෑවෙමි. තුන් වරක්
වේවැල්වලින් තැළුම්කෑවෙමි, එක වරක්
ගල්ගසනු ලැබීමි, තුන් වරක් නැව් බිඳී
උපද්‍රවයට පැමුණුණෙමි, රාත්‍රියකුත්
26 දවාලකුත් ගැඹුරේ සිටියෙමි. නවද
බොහෝ විට ගමන්වලටද, ගංගා
උපද්‍රවවලටද, සොර උපද්‍රවවලටද,
මාගේ රට වැසියන්ගෙන් පැමිණි
උපද්‍රවවලටද, අන්‍ය ජාතීන්ගෙන්
පැමිණි උපද්‍රවවලටද, නුවරෙහි
උපද්‍රවවලටද, වනයේ උපද්‍රවවලටද,
මුහුදේ උපද්‍රවවලටද, බොරු
සහෝදරයන්ගෙන් පැමිණි උපද්‍රවවලටද;
27 වැඩ සහ වෙහෙසීම්වලටද, නොයෙක්විට
නිදිමැරීමටද, ක්ෂුධාව සහ පිපාසයටද,
නොයෙක්විට නිරාහාරව සිටීමටද,
ශීතලයටද, නග්නභාවයටද පැමිණියෙමි.
28 බාහිරවූ ඒ දේ හැර සියලු සභාවන්
ගැන සිතේ බරක් දවස්පතා මට ඇත්තේය.
29 යමෙක් දුර්වල නම් මමත් දුර්වල
නොවෙම්ද? යමෙක් පැකිලීමට පමුණුවනු
30 ලබන්නේනම් මම නොදැවෙම්ද? මා විසින්
පාරට්ටුකරන්ට යුතු නම් මාගේ
දුර්වලකම සම්බන්ධ කාරණා ගැන
31 පාරට්ටුකරන්නෙමි. මා බොරු
නොකියන බව අපගේ ස්වාමිවූ
යේසුස්වහන්සේගේ පියවූ සදාකල්ම
ප්‍රශංසනීයවූ දෙවියන්වහන්සේ
32 දන්නාසේක. දමස්කයේදී අරේතස් රජු
යටතේවූ ආණ්ඩුකාරයා මා අල්ලන
පිණිස දමස්කවරුන්ගේ නුවර මුර සිටුවා
33 රැකසිටි විට, මම කුඩයක ලා කවුළුවක
සිට පවුරෙන් බස්වනු ලැබ, ඔහුගේ
අත්වලින් ගැළවුණෙමි.

## උසස් එළිදරව්කිරීම්. මනුෂ්‍ය දුර්වලකම

12 පාරට්ටුකිරීම ප්‍රයෝජන නැති
නුමුත් එය මට ඕනෑකෙරේ; නුමුත්
ස්වාමීන්වහන්සේගේ දර්ශනයන්ද
එළිදරව්කිරීම්ද කියන්නෙමි. ක්‍රිස්තුස්- 2
වහන්සේ තුළවූ මනුෂ්‍යයෙක් දනිමි, ඔහු
දසසතර අවුරුද්දකට ප්‍රථම තුන්වෙනි
ස්වර්ගයට පවා ඇදගන්නාලද්දේය.
එසේවුණේ ශරීරයෙන් යුක්තවද ශරීරයෙන්
වියුක්තවද කියා නොදනිමි; දෙවියන්-
වහන්සේ දන්නාසේක. එයාකාර 3
මනුෂ්‍යයෙක් පාරාදීසයට ඇදගනු ලැබ,
කියන්ට බැරිවූ, මනුෂ්‍යයෙකු විසින්
නොකිය යුතුවූ වචන ඇසූ බව දනිමි.
(මෙසේ වුණේ ශරීරයෙන් යුක්තවද 4
ශරීරයෙන් වියුක්තවද නොදනිමි;
දෙවියන්වහන්සේ දන්නාසේක.)
එබඳු තැනැත්තෙකු ගැන පාරට්ටුකරමි. 5
නුමුත් මාගේ දුර්වලකම් ගැන මිස මා
ගැනම පාරට්ටු නොකරමි. එහෙත් 6
මම පාරට්ටුකරගන්ට කැමතිවෙතත්
අඥනයෙක් නොවන්නෙමි. මක්නිසාද
මම ඇත්ත කියන්නෙමි. එසේවී නුමුත්
මා කෙරෙහි දකින දේට නොහොත්
මාගෙන් අසන දේට වඩා මම උතුමැයි
කිසිවෙකු නොසිතන පිණිස එයින්
වලකිමි. නවද ඒ එළිදරව්කිරීම්වල අතිශය 7
උතුම්කම කරණකොටගෙන පමණට
වඩා උසස් නොවන පිණිස මට
පහරදීමට සාතන්ගේ දූතයෙකු වැනිවූ
උලක් මාගේ මාංසයෙහි මට
දෙනලද්දේය, ඒ පමණට වඩා මා උසස්
නොවන පිණිසය. ඒක මා කෙරෙන් 8
පහවන පිණිස ඒ ගැන තුන්වරක්
ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලුවෙමි.
උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට 9
සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ
බලය සම්පූර්ණවෙන්නේයයි මට කීසේක.
එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය
මා කෙරෙහි පිහිටන පිණිස මාගේ
දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන්
පාරට්ටුකරන්නෙමි. එහෙයින් 10
ක්‍රිස්තුස්වහන්සේ උදෙසා පැමිණෙන

දුර්වලකම්වලටත් අන්තරායවලටත්
හිඟකම්වලටත් පීඩාවලටත් විපත්තිවලටත්
ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව
සිටින කලම ශක්තිමත්ව සිටිමි.

## ප්‍රේරිත තැනගේ ආශාව සභාවට ප්‍රයෝජනවත්ව සිටීම පමණක් බව

11 මම අඥානයෙක් වී සිටිමි. ඊට තුඹලා
මා සැලැස්සුවහුය. මා ගැන සාක්ෂි
දෙන්ට යුතුව තිබුණේ තුඹලා විසින්ය.
මක්නිසාද, මම කිසිත් නොවෙමි නුමුත්
ඔය උත්කෘෂ්ට ප්‍රේරිතයන්ට වඩා කොයි
12 ආකාරයකින්වත් අඩුනොවීමි. සැබවින්
ලකුණුවලින්ද පුදුමවලින්ද බලවත්
ක්‍රියාවලින්ද ප්‍රේරිතයෙකුගේ ලකුණු සියලු
ආකාර ඉවසීම ඇතුව තුඹලා අතරෙහි
13 කරනලද්දේය. මා තුඹලාට බරක්ව
නොසිටිය කාරණයෙන් මිස වෙන මොන
දෙයකින් තුඹලා අනික් සභාවලට අඩුව
සිටියහුද? ඒ වැරැද්දට මට කමාවෙයල්ලා.
14 මෙන්න, තුන්වෙනි වරට තුඹලා වෙතට
එන්ට සූදානම්ව සිටිමි. නුමුත් තුඹලා
මිස තුඹලාගේ දේපළ මා නොසොයන
නිසා මම තුඹලාට බරක් නොවන්නෙමි.
මක්නිසාද රැස්කර තබන්ට යුතුව
තිබෙන්නේ දරුවන් විසින් මවුපියන්ට
15 නොව මවුපියන් විසින් දරුවන්ටය. මම
ඉතා සන්තෝෂයෙන් තුඹලාගේ ආත්ම
ගැන මට ඇති දේ වියදම්කරන්නෙමි,
මම්ම ව්‍යාවෘතවන්නෙමි. මම වැඩියෙන්
තුඹලාට ප්‍රේමකරන තරමට අඩුවෙන්
16 ප්‍රේමකරනු ලබම්ද? එසේ වුණාවේ, මම්ම
තුඹලාට බරක් නුණෙමි; නුමුත්
ප්‍රයෝගකාරයෙක් වූයෙන්, මම
17 වංචාවෙන් තුඹලා අල්ලාගතිමි. මා
තුඹලා ළඟට එවූවන්ගෙන් යමෙකු ලවා
18 තුඹලාගෙන් වාසියක් ලබාගතිම්ද? මම
තීතස්ට අවවාදකොට, ඔහු සමග ඒ
සහෝදරයා එවීමි. තීතස් තුඹලාගෙන්
යම් වාසියක් ලබාගත්තේද? අප ගමන්
කළේ එම ආත්මයාණන්වහන්සේ
කරණකොටගෙන නොවේද? එක
අඩිපාරේ නොවේද?

අපිම තුඹලා ඉදිරියෙහි නිදෙස්වන්ට 19
උත්සාහකරමුයයි මෙපමණ කල් තුඹලා
සිතන්ට ඇත. අප කථාකරන්නේ
දෙවියන්වහන්සේ ඉදිරියෙහි ක්‍රිස්තුස්-
වහන්සේ තුළය. නුමුත්, ප්‍රේමවන්තයෙනි,
මේ සියල්ල තුඹලාගේ වර්ධනයවීම
පිණිසය. මක්නිසාද මා ආකල යම් 20
විධියකින් තුඹලා මා කැමති ආකාර
නොවන බවත්, මා තුඹලා කැමති
ආකාර නොවන බවත් පෙනේදෝ
කියාද, යම් විධියකින් විවාද, ඊර්ෂ්‍යා,
ක්‍රෝධ, පක්ෂවාදිකම්, කේලාම්, කනට
කෙඳිරීම්, උඩඟුකම්, කෝලාහල පවතිනවා
ඇද්දෝ කියාද, මා නැවත ආකල මාගේ 21
දෙවියන්වහන්සේ තුඹලා ඉදිරියෙහි මා
යටත්කරනසේකැයි කියාද, මේ දක්වා
පව්කොට තමුන් කළ අපිරිසිදුකමද
වේශ්‍යාකමද සල්ලාලකමද ගැන
පසුතැවිලි නුවූ බොහෝ දෙනා උදෙසා
මට වැලපෙන්ට වේදෝ කියාද හයවෙමි.

## ප්‍රේරිත තැන යන්ට සිටින ගමන සම්බන්ධව කල් ඇතුව කළ අවවාද දන්වීම

13 මේක මා තුඹලා ළඟට එන
තුන්වෙනි වතාවය. සාක්ෂිකාරයන්
දෙදෙනෙකුගේවත් තුන්දෙනෙකුගේවත්
මුඛයෙන් සියලු වචන ස්ථිර කරනු
ලැබේ. මම නැවත ආවොත් මේ දක්වා 2
පව්කළවුන්ටද අනික් සියල්ලන්ටද අව්වු
නොකර නාරින්නෙමියි කියා මම
දෙවෙනි වතාවේ ළඟ සිටියදී කලින් කී
ලෙස, දැන් ඈත්ව සිටියදීත් කලින් කියමි.
මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ මා තුළ 3
කථාකරන බවට තුඹලා ඔප්පුවක්
සොයන්නහුය; උන්වහන්සේ තුඹලා
කෙරෙහි දුර්වලව නොව තුඹලා අතරෙහි
බලවත්ව සිටිනසේක. මක්නිසාද 4
උන්වහන්සේ දුර්වලකමින් කුරුසියෙහි
ඇණගසනු ලැබූ නුමුත් දෙවියන්-
වහන්සේගේ බලයෙන් ජීවත්වනසේක.
එසේම අපිද උන්වහන්සේ තුළෙහි
දුර්වලව සිටින නුමුත් උන්වහන්සේ සමග
දෙවියන්වහන්සේගේ බලයෙන් තුඹලා
උදෙසා ජීවත්වන්නෙමුව. තුඹලා 5

ඇදහිල්ලෙහි සිටිනවාද කියා නුඹලාම
පරීක්ෂාකර බලාපල්ලා; නුඹලාවම
සෝදිසිකර බලාපල්ලා. නොහොත්,
නුඹලා එපාකරනලද නැනැත්තෝ
නොවෙත් නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
නුඹලා තුළෙහි වසන බව නුඹලාම
6 නොදනිව්දද? නුමුත් අප එපාකරනලද
නැනැත්තන් නොවන බව නුඹලා
දනගන්නවා ඇතැයි බලාපොරොත්තු-
7 වෙමි. නුමුත් නුඹලා කිසි නපුරක්
නොකරන ලෙස අපි දෙවියන්වහන්සේට
යාච්ඤාකරමුව. එසේ කරන්නේ අපි
ඒන්තුගත් නැනැත්තන් බව පෙනෙන පිණිස
නොව, අපි එපාකරනලද නැනැත්තන්
මෙන් වූ නුමුත්, නුඹලා විසින්
ගරුකටයුතු දේ කරන පිණිසය.
8 මක්නිසාද සැබෑව උදෙසා මිස සැබෑවට
විරුද්ධව කිසිවක් කරන්ට අපට බැරිය.
9 අප දුර්වලව නුඹලා බලවත්ව සිටින
කල අපි ප්‍රීතිවෙමුව. තවද නුඹලාගේ
සම්පූර්ණවීම සඳහා අපි යාච්ඤාද
10 කරමුව. මේ නිසා, බිඳහෙළීමට නොව
ගොඩනැගීම පිණිස ස්වාමීන්වහන්සේ
මට දුන් බලය ලෙස මා නුඹලා ළඟ
සිටින විට සැරකම පාවිච්චි නොකරන
පිණිස, ඈත්ව සිටින විට මේ දේවල්
ලියා එවමි.

## ආචාරකිරීම

ඉතින් සහෝදරයෙනි, සුවසේ 11
සිටපල්ලා. සම්පූර්ණවෙයල්ලා; සැනසී
සිටපල්ලා; එක්සිත්වෙයල්ලා;
සමාදනයෙන් සිටපල්ලා. එකල ප්‍රේමයේ
හා සමාදනයේ දෙවියන්වහන්සේ නුඹලා
සමග වනසේක. ශුද්ධවූ සිඹීමකින් 12
එකිනෙකාට ආචාරකරපල්ලා.
සියලු ශුද්ධවන්තයෝ නුඹලාට ආචාර 13
කරති.
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ 14
කරුණාවද දෙවියන්වහන්සේගේ
ප්‍රේමයද ශුද්ධාත්මයාණන්වහන්සේගේ
සහභාගිකමද නුඹලා සියල්ලන් හා
සමග වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් ගලාතිවරුන්ට ලියනලද පත්‍රය

## ආචාරය

1 මනුෂ්‍යයන් කෙරෙන්වත් මනුෂ්‍යයා
කරණකොටගෙනවත් නොව, යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේව
මළවුන්ගෙන් නැගිටෙවූ පියවූ
දෙවියන්වහන්සේ කරණකොටගෙන
ප්‍රේරිතයෙක් වන පාවුල් නම් මා විසින්ද,
2 මා සමග සිටින සියලු සහෝදරයන්
විසින්ද, ගලාතියේ සභාවලට ලියා එවන
3 වග නම්: පියවූ දෙවියන්වහන්සේගෙන්ද
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගෙන්ද තුඹලාට කරුණාවත්
4 සමාදානයත් වේවා. උන්වහන්සේ දැන්
තිබෙන නපුරු ලෝකයෙන් අප
ගළවන පිණිස අපගේ පියවූ දෙවියන්-
වහන්සේගේ කැමැත්ත ලෙස අපේ
පව් නිසා තමන්ම පාවාදුන්සේක.
5 උන්වහන්සේට සදාකාලයෙන් සදාකාලයට
ගෞරවය වේවා. ආමෙන්.

## ගලාතිවරු ශුභාරංචියෙන් පසුබටවීම

6 ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව
කරණකොටගෙන තුඹලා කැඳවූ
තැනන්වහන්සේ කෙරෙන් තුඹලා
මෙපමණ ඉක්මනින් අන්‍ය ශුභාරංචියකට
7 හැරී යනවාට මවිතවෙමි. සමහරු තුඹලා
කලඹා, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය
පෙරළන්ට කැමතිවා මිස, ඒක වෙන
8 ශුභාරංචියක් නොවේ. නුමුත් අප විසින්
තුඹලාට ප්‍රකාශකළ ශුභාරංචිය හැර
වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන්
දේවදූතයෙක්වත් තුඹලාට ප්‍රකාශකරතොත්
ඔහු ශාපලද්දෙක් වේවා. තුඹලා පිළිගත් 9
ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක්
යමෙක් තුඹලාට දේශනාකරතොත් ඔහු
ශාපලද්දෙක් වේවයි අප වරක් කී
හැටියටම මම දැන් නැවතත් කියමි. ඉතින් 10
මා විසින් සතුටුකරන්ට හදන්නේ
මනුෂ්‍යයන්ද? නොහොත් දෙවියන්-
වහන්සේද? නොහොත් මා මනුෂ්‍යයන්
ප්‍රසන්නකරන්ට සොයනවාද? මම
තවම මනුෂ්‍යයන් ප්‍රසන්නකරමි නම්
ක්‍රිස්තුස්වහන්සේගේ දාසයෙක් නොවෙමි.

## ප්‍රේරිත තැනගේ ශුභාරංචිය ස්වාමීන්වහන්සේගෙන්ම ලැබුණු බව

ඉතින්, සහෝදරයෙනි, මා දේශනාකළාවූ 11
ශුභාරංචිය වනාහි මනුෂ්‍ය ප්‍රකාරවූ
එකක් නොවන බව තුඹලාට දන්වමි.
මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ 12
එළිදරව්කිරීමෙන් මිස මා එය
මනුෂ්‍යයන්ගෙන් ලැබුවේවත් උගන්වනු
ලැබුවේවත් නැත. මක්නිසාද මා පසුගිය 13
කාලයේ යුදෙව්වරුන්ගේ ආගමෙහි
හැසුරුණු අන්දම, එනම් දෙවියන්-
වහන්සේගේ සභාවට අප්‍රමාණ ලෙස
පීඩාකොට එය නාස්තිකළ හැටි,
තුඹලා ඇසුවහුය. මාගේ පියවරුන්ගේ 14
පරම්පරාගත නියෝග ගැන අතිශයින්
ජ්වලිතව සිටීමෙන්, මාගේ රටවැසියන්
අතරේ මාගේ වයසේ බොහෝ
දෙනෙකුට වඩා යුදෙව්වරුන්ගේ ආගමේ
වර්ධනයවුණෙමි. නුමුත් මවුකුස පටන් 15
මා වෙන්කළාවූද තමන්ගේ කරුණාව

කරණකොටගෙන මා කැඳෙවූවාවූද
දෙවියන්වහන්සේ තමන්ගේ පුත්‍රයාණන්-
වහන්සේ ගැන අන්‍යජාතීන් අතරේ මා
16 විසින් දේශනාකරන පිණිස, උන්වහන්සේ
මා තුළෙහි ප්‍රකාශකරන්ට කැමතිවූ
කෙණෙහිම, මාංසය හා රුධිරය සමග
17 මන්ත්‍රණය නොකොට, මට පළමුවෙන්
ප්‍රේරිතව සිටියවුන් ළඟට යෙරුසලමට
නොගොස්, අරාබියට පිටත්ව ගොස්,
නැවත දමස්කයට හැරී ආවෙමි.
18 නවද තුන් අවුරුද්දකට පසු කේපස්
දකින පිණිස යෙරුසලමට ගොස්, ඔහු
සමග පසළොස් දවසක් නැවතී සිටියෙමි.
19 නුමුත් ස්වාමීන්වහන්සේගේ සහෝදරයා
වන යාකොබ් හැර අනික් ප්‍රේරිතයන්ගෙන්
20 වෙන කවරෙකුවත් නුදුටිමි. මා තුඹලාට
ලියා එවන මේ කාරණා සම්බන්ධව
මා බොරු නොකියන බව, මෙන්න,
දෙවියන්වහන්සේ ඉදිරිපිට කියාසිටිමි.
21 පසුව සිරිය, කිලිකිය යන පළාත්වලට
22 ආවෙමි. ක්‍රිස්තුස්වහන්සේ තුළවූ යුදයේ
සභාවෝ ඒනාක්ම මාගේ මුහුණ දැක
23 ඇඳිනගෙන නොසිටියෝය. වරක් අපට
පීඩාකළ තැනැත්තා තමා විසින්
වරක් නාස්තිකළාවූ ඇදහිල්ල දැන්
දේශනාකරන්නේය යන ප්‍රවෘත්තිය
24 පමණක් ඔවුන්ට ලැබුණේය. ඔව්හු මා
ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසාකළෝය.

## පාවුල් තුමාගේ දිව්‍ය කැඳවීම අනික් ප්‍රේරිතවරුන් විසින්ද ඒත්තුගත් බව

**2** නවද දසසතර අවුරුද්දකට පසු
තීතස්ද මා කැටුව ගෙන බාර්ණබස්
2 සමග යෙරුසලමට නැවත ගියෙමි. එහි
ගියේ එළිදරව්වීමක් නිසාය. එහි ගොස්
මම අන්‍යජාතීන් අතරෙහි ප්‍රකාශකරන
ශුභාරංචිය ඔවුන් ඉදිරියෙහි තැබුවෙමි.
නුමුත් මා දුවන්නාවූ නොහොත් දිවුවාවූ
දිවීම යම් හෙයකින් නිෂ්ඵල නොවන
පිණිස, ප්‍රධාන තැනැත්තන්ට එය දැන්නුවේ
3 රහසින්ය. එහෙත් මා සමග සිටියාවූ
ග්‍රීකයෙක් වන තීතස්ට නුමුත් රහසින්
ඇතුල්වුණු බොරු සහෝදරයන් නිසාවත්
චර්මඡේදන ලබන්ට බලකළේ නැත. ඔව්හු 4
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ අපට
ඇත්තාවූ නිදහස්කම ගැන ඔත්තු බලා,
අප වහල්කමට පමුණුවන පිණිස රහසින්
ඇතුල්වුණෝය. ශුභාරංචියේ සත්‍යතාව 5
තුඹලා අතරේ නොකඩව පවතින පිණිස,
යටත්වීමෙන් අපි පැයකටවත් ඔවුන්ට
ඉඩ නුදුනිමුව. නුමුත් ප්‍රධානයන්ය 6
කියා සිතනලද තැනැත්තන්ගෙන් මට
අමුතු කිසිවක් ලැබුණේ නැත. (ඔවුන්
කොහොම අයවල්ව සිටියත් මට කමක්
නැත; දෙවියන්වහන්සේ මනුෂ්‍යයෙකුගේ
තරාතිරම නොබලනසේක.) එසේය, ඒ
ප්‍රධානයන්ගෙන් මට අමුතු කිසිවක්
ලැබුණේ නැත. නුමුත් අනික් අතට 7
පේත්‍රුස්ට චර්මඡේද්‍යයේ ශුභාරංචිය
භාරදී තිබෙන්නාක්මෙන් මට
අචර්මඡේද්‍යයේ ශුභාරංචිය භාරදී
තිබෙන බව ඔව්හු දුටුවෝය. (මක්නිසාද 8
චර්මඡේද්‍යයේ ප්‍රේරිතකමට පේත්‍රුස්
තුළෙහි ක්‍රියාකළාවූ තැනන්වහන්සේම
අන්‍යජාතීන් උදෙසා මා තුළ ක්‍රියාකළ-
සේක.) එවිට කණු මෙන් සලකනු 9
ලැබූවාවූ යාකොබ්ද කේපස්ද යොහන්ද,
මට දෙනලද අනුග්‍රහය දැනගත් කල,
මටද බාර්ණබස්ටද පංගුකාරකමේ
දකුණත දුන්නෝය. එසේ කළේ අප
අන්‍යජාතීන් වෙතටද ඔවුන්
චර්මඡේදිතයන් වෙතටද යන පිණිසය.
අප විසින් දිළිඳුන් සිහිකරන ලෙස ඔවුන් 10
ඉල්ලුවා පමණක්ය; එම දේ කරන්ට
මමද ආශාවෙන් සිටියෙමි.

## ප්‍රේරිතවූ පේත්‍රුස්ට ප්‍රසිද්ධියේ තරවටුකිරීම

නවද කේපස් අන්තියෝකියට ආ කල, 11
ඔහු වරද කරලා සිටි බැවින් ඔහු
ඉදිරිපිටදීම ඔහුට විරුද්ධව සිටියෙමි.
මක්නිසාද යාකොබ් වෙතින් සමහරුන් 12
එන්ට පළමුවෙන් ඔහු අන්‍යජාතීන් සමග
කෑවේය. නුමුත් ඔවුන් ආ කල ඔහු
චර්මඡේද්‍යවූවන්ට භයව පසුබැස වෙන්ව
සිටියේය. අනික් යුදෙව්වරුද ඔහු සමග 13
එසේම වංකකම් කළෝය; එසේය,

බාර්ණබස් පවා ඔවුන්ගේ වංකකමට
14 ඇදී ගියේය. නුමුත් මම වනාහි
ඔවුන් ශුභාරංචියේ සැබෑවේ හැටියට
ඇදනැතිකමින් නොහැසුරුණු බව දැක,
සියල්ලන් ඉදිරියෙහි කේපස්ට කථාකරමින්:
නුඹ යුදෙව්වෙක්ව සිට, යුදෙව්වරුන් ලෙස
නොව අන්‍යජාතීන් ලෙස හැසිරෙනවා
නම්, අන්‍යජාතීන්ට යුදෙව්වරුන් මෙන්
හැසිරෙන්ට බලකරන්නේ කෙසේදැයි කීමි.

## ව්‍යවස්ථාවේ අසම්පූර්ණකම

15 නවද අන්‍යජාති පව්කාරයන් නොව
16 ස්වභාවෙන් යුදෙව්වරුන් වන අපි, යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
කරණකොටගෙන මිස ව්‍යවස්ථාවේ
ක්‍රියා කරණකොටගෙන මනුෂ්‍යයෙක්
ධර්මිෂ්ඨකරනු නොලබන බව දැන,
ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් නොව
ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
කරණකොටගෙන ධර්මිෂ්ඨකරනු ලබන
පිණිස, ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි
අදහාගතිමුව. මක්නිසාද ව්‍යවස්ථාවේ
ක්‍රියාවලින් කවර මනුෂ්‍යයෙක්වත්
17 ධර්මිෂ්ඨකරනු නොලබයි. නුමුත්
ක්‍රිස්තුස්වහන්සේ තුළ ධර්මිෂ්ඨකරනු
ලබන්ට සොයමින්ම අපිම පවා
පව්කාරයෝව පෙනෙමු නම්,
ක්‍රිස්තුස්වහන්සේ පාපයේ සේවකයෙක්
18 වනසේක්ද? එසේ නොවේවා. මක්නිසාද
මා විසින් කඩා දමනලද දේවල්ම මම
නැවත ගොඩනගන්නෙම් නම්, මා
වරදකාරයෙකු බව මමම ඔප්පුකරමි.
19 ඇරත් මම දෙවියන්වහන්සේ උදෙසා
ජීවත්වන පිණිස ව්‍යවස්ථාව
කරණකොටගෙන ව්‍යවස්ථාවට
20 මැරුණෙමි. මම ක්‍රිස්තුස්වහන්සේ සමග
කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි;
එසේවී නුමුත් මම ජීවත්වෙමි; නුමුත්
තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා
තුළ ජීවත්වනසේක. තවද මා දැන්
මාංසයෙහි ජීවත්වන ජීවිතය මට
ප්‍රේමකළාවූ, මා උදෙසා තමන්ම
පාවාදුන්නාවූ දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන්
ජීවත්වෙමි. දෙවියන්වහන්සේගේ කරුණාව 21
නිෂ්ඵල නොකරමි. මක්නිසාද
ධර්මිෂ්ඨකම ව්‍යවස්ථාව කරණකොටගෙන
වේ නම් ක්‍රිස්තුස්වහන්සේ නිකරුණේ
මළසේක.

## දෙවියන්වහන්සේ අප පිළිගන්නේ ව්‍යවස්ථාව නිසා නොව ඇදහිල්ල නිසා බව

3 අහෝ අඥාන ගලාතිවරුනි,
කුරුසියෙහි ඇණගසනලද යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ නුඹලාගේ ඇස්
ඉදිරියෙහි ප්‍රසිද්ධලෙස දක්වනු ලැබූ නුමුත්
නුඹලා මායාවකට ඇල්ලුවේ කවුද?
නුඹලාගෙන් මේක පමණක් දැනගන්ට 2
කැමැත්තෙමි: එනම්, නුඹලා
ආත්මයාණන්වහන්සේ ලැබුවේ
ව්‍යවස්ථාවේ ක්‍රියා කරණකොටගෙනද?
නොහොත් ඇදහිල්ලේ පණිවිඩය
කරණකොටගෙනද? නුඹලා මෙපමණ
අඥානද? ආත්මයාණන් තුළ පටන්ගත් 3
නුඹලා දැන් මාංසයෙහි සම්පූර්ණව
සිටිහුද? නුඹලා එපමණ දේ නිෂ්ඵලලෙස 4
වින්දහුද? ඇත්තටම එය නිෂ්ඵලද?
ඉදින් නුඹලාට ආත්මයාණන්වහන්සේ 5
දෙන්නාවූ, නුඹලා අතරෙහි ආශ්චර්යයන්
කරන්නාවූ තැනන්වහන්සේ එසේ
කරන්නේ ව්‍යවස්ථාවේ ක්‍රියාවලින්ද?
නොහොත් ඇදහිල්ලේ පණිවිඩය
කරණකොටගෙනද? මෙසේ ආබ්‍රහම් 6
දෙවියන්වහන්සේ විශ්වාසකළේය, එය
ඔහුට ධර්මිෂ්ඨකම කොට ගණින්ගනු
ලැබුවේය. එබැවින් ඇදහිල්ලෙහි 7
පිහිටෙන්නෝම ආබ්‍රහම්ගේ පුත්‍රයන් බව
දැනගනිල්ලා. තවද දෙවියන්වහන්සේ 8
ඇදහිල්ල කරණකොටගෙන අන්‍යජාතීන්
ධර්මිෂ්ඨකරන බව ලියවිල්ල
කල්මත්තෙන් දැක: නුඹ තුළ සියලු
ජාතීහු ආශීර්වාද ලබන්නෝය
කියා ශුභාරංචිය ආබ්‍රහම්ට කලින්
ප්‍රකාශකළේය. මෙසේ ඇදහිල්ලෙහි 9
පිහිටෙන්නෝ ඇදහිලිවන්තවූ ආබ්‍රහම්
සමග ආශීර්වාද ලබති. මක්නිසාද යම් 10
පමණ දෙනෙක් ව්‍යවස්ථාවේ ක්‍රියාවල

පිහිටෙන්නෝද, එපමණ දෙනා
ශාපයකට යටත්ව සිටිති. මක්නිසාද:
ව්‍යවස්ථාපොතෙහි ලියා තිබෙන සියලු
දේවල් කරන පිණිස එහි නොපවතින
සියල්ලෝ ශාපලද්දෝයයි ලියා තිබේ.
11 ඉදින් ව්‍යවස්ථාව කරණකොටගෙන
කිසිවෙක් දෙවියන්වහන්සේ ඉදිරිපිට
ධර්මිෂ්ඨකරනු නොලබන බව පැහැදිලිය.
මක්නිසාද ධර්මිෂ්ඨයා ඇදහිල්ල
කරණකොටගෙන ජීවත්වන්නේය.
12 ව්‍යවස්ථාව වනාහි ඇදහිල්ලෙන් නොවේ;
නුමුත්: ඒ දේ කරන තැනැත්තේ එයින්
13 ජීවත්වන්නේය. ගසක එල්ලෙන සියල්ලෝ
ශාපලද්දෝයයි ලියා තිබෙන ලෙස,
ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා ශාපයක්වී,
ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදගත්සේක.
14 මෙසේ කළේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ
තුළ ආබ්‍රහම්ගේ ආශීර්වාදය අන්‍යජාතීන්
කෙරෙහි පැමිණෙන පිණිසත්, ඇදහිල්ල
කරණකොටගෙන අප විසින්
ආත්මයාණන්වහන්සේ නැමති
පොරොන්දුව ලබාගන්නා පිණිසත්ය.
15 සහෝදරයෙනි, මම මනුෂ්‍යාකාරයෙන්
කථාකරමි. මනුෂ්‍යයෙකුගේ ගිවිසුම්පත්‍රයක්
වුවත් ස්ථිරවී නම්, කිසිවෙක් එය
අවලංගුකරන්නේවත් ඊට කිසිවක්
16 එකතුකරන්නේවත් නැත. ඉතින්
පොරොන්දු දෙනලද්දේ ආබ්‍රහම්ටත්
ඔහුගේ වංශයටත්ය. බොහෝ දෙනෙකුට
මෙන්: වංශයන්ටය නොකියා,
එක්කෙනෙකුට මෙන්: නුඹේ වංශයටයයි
17 උන්වහන්සේ කියනසේක. ඒ වංශය නම්
ක්‍රිස්තුස්වහන්සේය. ඉදින් මා කියන්නේ
නම්: දෙවියන්වහන්සේ විසින් කලින්
ස්ථිරකරනලද ගිවිසුමක්, ඊට හාරසිය
තිස් අවුරුද්දකට පසු පැමුණුණාවූ
ව්‍යවස්ථාවෙන්, පොරොන්දුව නිෂ්ඵලවන
ලෙස, අවලංගුකරන්ට නුපුළුවන් බවය.
18 මක්නිසාද උරුමය ව්‍යවස්ථාවෙන් වේ
නම් තවත් පොරොන්දුවෙන් නොවේ.
නුමුත් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට ඒක
දුන්නේ පොරොන්දුවෙන්ය.

## ව්‍යවස්ථාවේ අදහස

එසේවී නම් ව්‍යවස්ථාව කිමෙක්ද? ඒක 19
වනාහි පොරොන්දුව ලැබූ ඒ බීජය එන
තුරු දේවදූතයන් ලවා මැදහත්කාරයෙකුගේ
අතින් නියමකරවනු ලැබ, පසුව අපරාධ
නිසා එකතුකරන ලද්දේය. තවද 20
මැදහත්කාරයෙක් සිටින්නේ එක්කෙනෙකු
පිළිබඳව නොවේය; නුමුත් දෙවියන්-
වහන්සේ එක්කෙනෙක්ය. එසේවී නම් 21
ව්‍යවස්ථාව දෙවියන්වහන්සේගේ
පොරොන්දුවලට විරුද්ධද? එසේ
නොවේවා. මක්නිසාද ජීවත්කරන්ට
පුළුවන්වූ ව්‍යවස්ථාවක් දෙනලද්දේ නම්,
ධර්මිෂ්ඨකම සැබවින් ව්‍යවස්ථාවෙන්
වෙනවා ඇත. එසේවී නුමුත් අදහන්නන්ට 22
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ
ඇදහිල්ලෙන් වූ පොරොන්දුව දෙනු
ලබන පිණිස, ලියවිල්ල සියල්ලන්ම
පාපය යට වසා තැබුවේය.
නුමුත් එළිදරව්වෙන්ට තිබුණු ඇදහීම 23
පිණිස, ඒ ඇදහීම පැමිණෙන්ට
පළමුවෙන්, අපි හිරඅඩස්සිවී ව්‍යවස්ථාව
යටතේ ආරක්ෂාකරනු ලැබුවෙමුව.
මෙසේ අපි ඇදහිල්ල කරණකොටගෙන 24
ධර්මිෂ්ඨකරනු ලබන පිණිස, ව්‍යවස්ථාව
අප ක්‍රිස්තුස්වහන්සේ ළඟට පමුණුවන
අපේ ගුරුවරයෙක් වී තිබේ.

## ඇදහිල්ල කරණකොටගෙන සිදුවන දේ

නුමුත් දැන් ඇදහිල්ල පැමිණ තිබෙන 25
බැවින්, අපි තවත් ගුරුවරයෙකු යටතේ
නොවමුව. මක්නිසාද නුඹලා සියල්ලෝම 26
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල
කරණකොටගෙන දෙවියන්වහන්සේගේ
පුත්‍රයෝය. මක්නිසාද නුඹලාගෙන් 27
ක්‍රිස්තුස්වහන්සේ තුළට *බව්තීස්මකරනු
ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ
පැළඳගත්තෝය. නුඹලා සියල්ලන් 28
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
එක්කෙනෙක්ව සිටින නිසා, යුදෙව්වෙක්
හෝ ග්‍රීකයෙක් නැත්තේය, දසයෙක් හෝ
නිර්දසයෙක් නැත්තේය, පුරුෂයෙක් හා

*අවගාහනය.

29 ස්ත්‍රියෙක් නැත්නාහ. ඉදින් තුඹලා
ක්‍රිස්තුස්වහන්සේගේ නම්, තුඹලා
ආබ්‍රහම්ගේ වංශයද පොරොන්දුව ලෙස
උරුමක්කාරයෝද වන්නාහුය.

## ක්‍රිස්තුස්වහන්සේ කෙරේ ඇදහීම කරණකොටගෙන දේව දරුකම ලැබීම

4 උරුමක්කාරයා සියල්ලටම ස්වාමියා
තුමුත්, ඔහු බාලයෙක්ව සිටින තුරු
2 දසයෙකුට වඩා වෙනසක් නැතුව, පියා
විසින් නියමකළ කාලය දක්වා,
ප්‍රවේසම්කරන්නන් හා ගබඩාකාරයන්
3 යටතේ සිටින්නේයයි කියමි. එසේම අපිත්
බාලයන්ව සිටියදී, ලෝකයේ ගුරුකම්
4 යටතේ දසව සිටියෙමුව. තුමුත් කාලය
සම්පූර්ණවූ කල, දෙවියන්වහන්සේ
ස්ත්‍රියෙකුගෙන් උපන්නාවූද ව්‍යවස්ථාව
යටතේ උපන්නාවූද තමන් පුත්‍රයාණන්-
5 වහන්සේ එවූසේක. එසේ කළේ අප විසින්
පුත්‍රකම ලබන පිණිස උන්වහන්සේ විසින්
ව්‍යවස්ථාව යටතෙහි වූවන් මුදගැනීමටය.
6 තවද තුඹලා පුත්‍රයන්ව සිටින බැවින්:
අබ්බා, පියාණෙනි, කියා හඬගසන්නාවූ
තමන් පුත්‍රයාණන්ගේ ආත්මය
දෙවියන්වහන්සේ අපේ සිත්වලට
7 එවූසේක. මෙසේ තුඹ තවත් දසයෙක්
නොව පුත්‍රයෙක්ය; පුත්‍රයෙක් නම්
දෙවියන්වහන්සේ කරණකොටගෙන
උරුමක්කාරයෙක්ය.

## ආපසු හැරී නොයන ලෙස ප්‍රේරිත තුමාගේ අයැදීම

8 එසේවී තුමුත් තුඹලා ඒ කාලයේදී
දෙවියන්වහන්සේ නැඳින, ස්වභාවෙන්
දෙවිවරුන් නොවන්නන්ට වහල්ව
9 සිටියාහුය. තුමුත් දැන් තුඹලා
දෙවියන්වහන්සේ ඇඳිනගෙන සිටිද්දී
නොහොත් ඊට වඩා දෙවියන්වහන්සේ
විසින් අඳුනනු ලැබ සිටිද්දී, තුඹලා ඒ
දුර්වලවූ නිෂ්ඵලවූ ගුරුකම්වලට නැවතත්
වහල්ව සිටින්ට ආශා ඇතුව, ඒ දෙසට
10 නැවත හැරෙන්නේ කොහොමද? තුඹලා
දවස්ද මාසද කාලවල්ද අවුරුදුද
සලකන්නාහුය. සමහරවිට තුඹලා 11
උදෙසා මා දරූ වෙහෙස නිෂ්ඵලවේදෝ
කියා තුඹලා ගැන භයවෙමි.
සහෝදරයෙනි, මා තුඹලා මෙන් සිටින 12
බැවින්, තුඹලාත් මා ලෙස සිටින මෙන්
තුඹලාගෙන් ඉල්ලමි. තුඹලා මට කිසි
වැරැද්දක් කළේ නැත. මාංසයේ 13
දුර්වලකමක් නිසා පළමුකොට මා
තුඹලාට ශුභාරංචිය ප්‍රකාශකළ හැටි
තුඹලා දන්නාහුය. මාගේ මාංසය 14
සම්බන්ධයෙන් තුඹලාට පරීක්ෂාවක්ව
තිබුණු දේ තුඹලා සුළුකළේවත්
එපාකළේවත් නැතුව, දෙවියන්-
වහන්සේගේ දූතයෙකු මෙන්ද, එසේය,
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ මෙන්ද මා
පිළිගත් බව තුඹලා දන්නාහුය. එසේවී 15
නම් තුඹලාට තිබුණු ඒ ප්‍රීතිය කොයිද?
මක්නිසාද පුළුවන්නම් තුඹලාගේ ඇස්
උගුලා මට දෙන්ට පවා තුඹලා කැමතිව
සිටිය බවට තුඹලා ගැන සාක්ෂිදෙමි.
එසේවී නම් මම තුඹලාට සැබෑව කියන 16
බැවින් තුඹලාට සතුරෙක් වී සිටිම්ද?
ඔවුන් තුඹලා ගැන ජ්වලිතව සිටින්නේ 17
යහපත් ආකාරයෙන් නොවේය. තුමුත්
අනික් අතට තුඹලා ඔවුන් ගැන
ජ්වලිතවන පිණිස තුඹලා අපෙන්
වෙන්කරගන්ට ඔව්හු ආශාවෙති. තුමුත් 18
මා තුඹලා ළඟ සිටින කල පමණක්
නොව නිතරම, යහපත් කාරණයකදී,
ජ්වලිතලෙස සොයනු ලැබීම යහපත.
මාගේ දරුවෙනි, ක්‍රිස්තුස්වහන්සේ තුඹලා 19
තුළ සෑදෙන තුරු තුඹලා නිසා නැවත
ප්‍රසවවේදනා විඳිමි. එසේය, පුළුවන් නම් 20
දැන් තුඹලා ළඟ සිටින්ටද වෙන
ආකාරයකින් කථාකරන්ටද කැමැත්තෙමි;
මක්නිසාද තුඹලා ගැන වියවුල්ව සිටිමි.

## පරණ ගිවිසුමෙන් උදහරණයක්

ව්‍යවස්ථාව යටතේ සිටින්ට කැමැත්තෙනි, 21
තුඹලා ව්‍යවස්ථාව අසන්නේ නැද්දැයි
මට කියාපල්ලා. මක්නිසාද ආබ්‍රහම්ට 22
පුත්‍රයෝ දෙදෙනෙක් සිටියෝය,
එක්කෙනෙක් දාසියගෙන්ය, එක්කෙනෙක්

23 නිර්දසියගෙන්ය. නුමුත් දසියගේ පුත්‍රයා
මාංසිකලෙසද නිර්දසියගේ පුත්‍රයා
පොරොන්දුව කරණකොටගෙනද
24 උපන්නේයයි ලියා තිබේ. මේ දේවල
උපමාවක් අන්තර්ගතය. මක්නිසාද මේ
ස්ත්‍රීහු ගිවිසුම් දෙකක්ය; සීනා
පර්වතයෙන් දුන් ගිවිසුම තොමෝ
දසකමට දරුවන් උපදවන්නීය, ඒ
25 හාගර්ය. මේ හාගර් නම් අරාබියෙහි
සීනා පර්වතයය, ඒ දැන් තිබෙන
යෙරුසලමට අදළවේ. මක්නිසාද ඈ
තමාගේ දරුවන් සමග දසකමෙහි
26 සිටින්නීය. නුමුත් ඉහළ තිබෙන
යෙරුසලම නිදහස්ය, ඈ අපගේ මවුය.
27 මක්නිසාද:

දරුවන් නොවදන වඳ තැනැත්තිය,
ප්‍රීතිවෙව;
වදන වේදනා නොවිඳින තැනැත්තිය,
ශබ්දනගා මොරගසව.
මක්නිසාද පුරුෂයා ඇති තැනැත්තියට
වඩා අන්හරිනු ලැබූ තැනැත්තියට
දරුවෝ බොහෝයයි

28 ලියා තිබේ. ඉදින්, සහෝදරයෙනි, ඊසාක්
මෙන් අපිත් පොරොන්දුවේ දරුවෝය.
29 නුමුත් මාංසාකාරයෙන් උපන් තැනැත්තා
ආත්මයාණන් කරණකොටගෙන උපන්
තැනැත්තාට එකල්හි පීඩාකළා සේම
30 දැනුත් වන්නේය. එසේවී නුමුත් ලියවිල්ලේ
කුමක් කියා තිබේද? දසිය සහ ඇගේ
පුත්‍රයාත් පිටත දමාපන්න. මක්නිසාද
දසියගේ පුත්‍රයාට නිර්දසියගේ පුත්‍රයා
සමග උරුමය නොලැබෙන්නේය යනුයි.
31 එබැවින්, සහෝදරයෙනි, අපි දසියෙකුගේ
නොව නිර්දසියගේ දරුවෝය.

## ක්‍රිස්තුස්වහන්සේ හෝ ව්‍යවස්ථාව හෝ තෝරාගත යුතු බව

5 ක්‍රිස්තුස්වහන්සේ අප මුදගත්තේ
නිදහස්කම ඇතුව සිටීමටය. එබැවින්
දසකම නැමති වියගහකට නැවත අසු
නොවී ස්ථිරව සිටපල්ලා.
2 ඉදින් නුඹලා චර්මඡේදනය ලබන්නහු
නම්, ක්‍රිස්තුස්වහන්සේගෙන් නුඹලාට කිසි
ප්‍රයෝජනයක් නොලැබෙන බව පාවුල්
නම් මම නුඹලාට කියමි. එසේය, 3
චර්මඡේදනය ලබන සැමදෙනම මුළු
ව්‍යවස්ථාව පැවැත්වීමට ණයකාරයෝව
සිටින්නෝයයි නැවත සාක්ෂිදෙමි.
ව්‍යවස්ථාව කරණකොටගෙන 4
ධර්මිෂ්ඨකරනු ලබන්ට සතුටුවූ නුඹලා
ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්කරනලද්දහුය.
නුඹලා අනුග්‍රහයෙන් වැටී සිටින්නහුය.
මක්නිසාද අපි ආත්මයාණන්වහන්සේ 5
කරණකොටගෙන ඇදහිල්ලෙන්
ධර්මිෂ්ඨකමේ බලාපොරොත්තුව ගැන
බලාසිටිමුව. මක්නිසාද ක්‍රිස්තුස් 6
යේසුස්වහන්සේ තුළ ප්‍රේමය
කරණකොටගෙන ක්‍රියාකරන ඇදහිල්ලෙන්
මිස, චර්මඡේදනයෙන්වත් අචර්මඡේදන-
යෙන්වත් ප්‍රයෝජනයක් නැත. නුඹලා 7
හොඳකාර දුවමින් උන්නහුය; සත්‍යයට
කීකරු නොවන ලෙස නුඹලාට
බාධාකළේ කවුද? ඔය පෙලඹීම නුඹලා 8
කැඳවන තැනන්වහන්සේගෙන් නොවේය.
මුහුන් ටිකකින් මුළු පිටි පිඩ පිපෙන්නේය. 9
නුඹලා වෙන කල්පනාවකින් යුක්තව 10
සිටින්නේ නැත කියා ස්වාමීන්වහන්සේ
තුළ මම නුඹලා ගැන විශ්වාසකරමි.
නුමුත් නුඹලාව වියවුල්කරන තැනැත්තේ
කවරෙක් නුමුත් ඔහු තමාගේ දඬුවම
විඳිනවා ඇත. නුමුත් සහෝදරයෙනි, 11
මම තවම චර්මඡේදනය ප්‍රකාශකරම්
නම් මක්නිසා තවම පීඩාකරනු ලබම්ද?
එසේවී නම් කුරුසියේ බාධාව පහකරන
ලද්දේය. නුඹලාව වියවුල්කරන්නෝ 12
තමුන්ම සිඳගන්නෝ නම් කැමැත්තෙමි.

## නිදහස පැවැත්වීම ප්‍රේමයට යටත්ව තිබිය යුතු බව

මක්නිසාද, සහෝදරයෙනි, නුඹලා 13
නිදහස්කමට කැඳවනු ලැබුවහුය; එහෙත්
නුඹලාගේ නිදහස මාංසයට ප්‍රස්තාවක්
පිණිස ව්‍යවහාර නොකොට, ප්‍රේමයෙන්
එකිනෙකාට සේවයකරන්නෝ වෙයල්ලා.
මක්නිසාද: නුඹට මෙන් නුඹේ 14
අසල්වාසියාට ප්‍රේමකරපන්න යන
එක වාක්‍යයෙන්ම මුළු ව්‍යවස්ථාව
සම්පූර්ණවේ. නුමුත් නුඹලා එකිනෙකා 15

විකාකන්නහු නම්, තුඹලා එකිනෙකාගෙන්
විනාශ නොවන හැටියට බලාගනිල්ලා.

## ආත්මයාණන්වහන්සේගේ මග පෙන්වීම

16 තුමුන් ආත්මයාණන්වහන්සේ
කරණකොටගෙන හැසිරියල්ලා, එවිට
තුඹලා මාංසයේ තෘෂ්ණා
සම්පූර්ණකරන්නේ නැතැයි කියමි.
17 මක්නිසාද මාංසය ආත්මයාණන්-
වහන්සේට විරුද්ධවද ආත්මයාණන්-
වහන්සේ මාංසයට විරුද්ධවද
ආශාකරයි. තුඹලා කැමතිවන දේ
නොකරන ලෙස මොව්හු එකිනෙකාට
18 විරුද්ධවෙති. තුමුන් තුඹලා
ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු
ලබන්නහු නම්, තුඹලා ව්‍යවස්ථාව
19 යටතේ නොවන්නහුය. ඉදින් මාංසයේ
ක්‍රියා ප්‍රකාශව තිබේ; එනම්, වේශ්‍යාකම,
20 අපවිත්‍රකම, සල්ලාලකම; රූප වැඳීම,
මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා,
ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධි භේද;
21 වෛර, බීමත්කම, මංගල්‍ය සෝෂා සහ
තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ
කරන්නන්ට දෙවියන්වහන්සේගේ
රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම
තුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින්
22 තුඹලාට කියමි. තුමුන් ආත්මයාණන්-
වහන්සේගේ ඵල නම්—ප්‍රේමය,
ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම,
කරුණාවන්තකම, යහපත්කම,
23 විශ්වාසකම, මෘදුකම, පමණ දැන
ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට
24 විරුද්ධව ව්‍යවස්ථාවක් නැත. තවද
ක්‍රිස්තුස්වහන්සේට අයිති තැනැත්තෝ
මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමග
කුරුසියෙහි ඇණගැසුවෝය.
25 අපි ආත්මයාණන්වහන්සේ කරණ-
කොටගෙන ජීවත්වෙමු නම්,
ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන
හැසිරෙමු. නිෂ්ඵල පාරට්ටු නොකරමු.
එකිනෙකා කෝප නොකරමු.
එකිනෙකාට ඊර්ෂ්‍යා නොවෙමු.

## අනුශාසනා හා අවවාද

6 සහෝදරයෙනි, මනුෂ්‍යයෙක් යම්
වරදකට අසුවුණත්, ආත්මිකවූ
තුඹලා මෘදුකමේ ආත්මයෙන් යුක්තව
එබඳු කෙනෙකු හරවාගනිල්ලා. තුඹත්
පරීක්ෂාවට නොපැමිණෙන පිණිස
බලාගනින්න. එකිනෙකාගේ බර උසුලා, 2
එසේ ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව
සම්පූර්ණකරපල්ලා. මක්නිසාද කිසිත් 3
නොවන කෙනෙක් තමා වැදගත්
කෙනෙක්යයි සිතන්නේ නම්, ඔහු තමාම
රවටාගනියි. තුමුන් එකිනෙකා තම 4
තමාගේ වැඩය සෝදිසිකෙරේවා, එවිට
ඔහුට වෙන කෙනෙක් ගැන නොව තමා
ගැන පමණක්ම පාරට්ටුව තිබේ.
මක්නිසාද එකිනෙකා තම තමාගේ බර 5
උසුලන්නේය.
වාක්‍යය ඉගෙනගන්නා උගන්වන්නාට 6
සියලු යහපත් දෙයින් දේවා.
නොරැවටෙල්ලා; දෙවියන්වහන්සේට 7
සරදම්කරන්ට කාටවත් බැරිය. මක්නිසාද
මනුෂ්‍යයෙක් තමා වපුරන දේම
කපාගන්නේය. ඒ හැටියට තමාගේ 8
මාංසය සඳහා වපුරන්නා මාංසයෙන්
කුණුවීම කපාගන්නේය; ආත්මයාණන්-
වහන්සේ සඳහා වපුරන්නා
ආත්මයාණන්වහන්සේගෙන් සදාකාල
ජීවනය කපාගන්නේය. තවද 9
යහපත්කම්කිරීමට මැළිනොවෙමු;
මක්නිසාද අපි ක්ලාන්ත නොවෙමු නම්,
නියම කාලයේදී කපාගන්නෙමුව.
එබැවින් අපට ප්‍රස්තා ඇති හැටියට 10
සියල්ලන්ටම, ප්‍රධානකොට ඇදහිල්ලේ
පවුලට අයිතිවූවන්ට, යහපත්කම්කරමු.

## අවසානය

කොපමණ ලොකු අකුරුවලින් මාගේම 11
අතින් තුඹලාට ලිව්මිදැයි බලාපල්ලා.
මාංසාකාරයෙන් උතුම්ව පෙනෙන්ට 12
කැමති සියල්ලෝ චර්මඡේදනය ලබන්ට
තුඹලාට බලකරති. එසේ කරන්නේ
ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන පීඩා
නොලබන පිණිස පමණක්ය. මක්නිසාද 13
චර්මඡේදනය ලබන්නෝ පවා ව්‍යවස්ථාව

නොපවත්වති; නුමුත් තුඹලාගේ මාංසය
ගැන ඔවුන් පාරට්ටුකරන පිණිස තුඹලා
චර්මඡේද්‍යකරවාගන්ට කැමතිවෙති.
14 නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන
කිසි දෙයක් ගැන පාරට්ටුකරගන්ට
මට නම් සිද්ධ නොවේවා; ඒ
කරණකොටගෙන ලෝකය මටද මා
ලෝකයටද කුරුසියෙහි ඇණ
15 ගසනුලද්දේ විය. මක්නිසාද අලුත්
මැවිල්ල මිස, චර්මඡේද්‍යවත්
16 අචර්මඡේද්‍යයවත් කිසිවක් නොවේ. තවද
යම් පමණ දෙනෙක් මේ විධිය ප්‍රකාර
හැසිරෙන්නෝද, ඔවුන්ට, දෙවියන්-
වහන්සේගේ ඉශ්‍රායෙල්ට, සමාදනයත්
දයාවත් වේවා.
මින්මතු කිසිවෙක් මට කරදර 17
නොකෙරේවා. මක්නිසාද මම යේසුස්-
වහන්සේගේ නිවරණ මාගේ ශරීරයේ
දරමි.
සහෝදරයෙනි, අපගේ ස්වාමිවූ යේසුස් 18
ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව තුඹලාගේ
ආත්මයත් සමග වේවා. ආමෙන්.

# ප්‍රේරිතවූ පාවුල් විසින් එපීසවරුන්ට ලියනලද පත්‍රය

## ආචාරකිරීම

1 දෙවියන්වහන්සේගේ කැමැත්ත
කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේගේ ප්‍රේරිතයෙක්ව සිටින පාවුල්,
එපීසයෙහි සිටින ශුද්ධවන්තයන්ව,
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
ඇදහිලිවන්තයන්ව සිටින්නන්ට ලියා
2 එවන වග නම්: අපගේ පියවූ දෙවියන්-
වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගෙන්ද කරුණාවත් සමාදානයත්
නුඹලාට වේවා.

## මිදීමේ සදාකාල අදහස ගැන ස්තුතිදීම

3 අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට
ප්‍රශංසාවේවා. මක්නිසාද උන්වහන්සේ
ඉදිරිපිට ප්‍රේමයෙන් ශුද්ධව, නොකැළැල්ව
4 සිටින පිණිස, ලෝකය මැවීමට
ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප
තෝරාගත් ලෙසම, උන්වහන්සේ තුළ
ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික
ආශීර්වාදවලින් උන්වහන්සේ අපට
5 ආශීර්වාද කළසේක. උන්වහන්සේ විසින්
ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ අපට
නොමිලයේ දුන්නාවූ තමන්වහන්සේගේ
කරුණාවේ මහිමයේ ප්‍රශංසාව
6 සඳහා, තමන්වහන්සේගේ කැමැත්තේ
ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේ කරණකොටගෙන පුත්‍රයන්
වීමට අප පෙර නියමකළසේක.
7 ඒ ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ,
උන්වහන්සේගේ කරුණාවේ සම්පතේ
ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ
කරණකොටගෙන අපේ මිදීම වන අපේ
වරදවලට කමාව අපට ඇත්තේය. ඒ 8
කරුණාව සියලු ප්‍රඥාව හා නුවණැතිකමින්
අප කෙරෙහි බොහෝවන්ට සැලැස්සූසේක.
එසේ කළේ කාලවල සම්පූර්ණකමේ 9
නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද
පොළොවෙහි දේවල්ද යන සියල්ල
ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට,
තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ 10
ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ
කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය.
එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය 11
හැටියට සියල්ල සිද්ධකරන්නාවූ
තැනැත්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට,
අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්-
වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව.
එසේ වූණේ ක්‍රිස්තුස්වහන්සේ තුළ 12
පළමුවෙන් බලාපොරොත්තුවුණාවූ අප
උන්වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව
සඳහා සිටින පිණිසය. උන්වහන්සේ තුළ 13
නුඹලාත් නුඹලාගේ ගැළවීමේ ශුභාරංචිය
වන සැබෑවේ වචනය අසා, උන්වහන්සේ
කෙරෙහි අදහාගෙන, උන්වහන්සේගේ
මහිමයේ ප්‍රශංසාව සඳහා දෙවියන්-
වහන්සේට හිමිවූ වස්තුවේ මිදීම
පිණිස, අපේ උරුමයේ අත්තිකාරමවූ 14
පොරොන්දුවේ ශුද්ධාත්මයාණන්-
වහන්සේගෙන් නුඹලා උන්වහන්සේ තුළ
මුද්‍රාකරනු ලැබුවහුය.

## දිව්‍ය තේජසේ සම්පත දැනගැනීම සඳහා යාච්ඤාකිරීම

මේ නිසා මමත් ස්වාමිවූ යේසුස්- 15
වහන්සේ තුළ නුඹලා අතරේ ඇත්තාවූ,

තුඹලා සියලු ශුද්ධවන්තයන්ට
දක්වන්නාවූ ඇදහිල්ල ගැන අසා, තුඹලා
මාගේ යාච්ඤාවලදී සඳහන්කරමින්,
16 තුඹලා ගැන නොකඩව ස්තුතිකරමි.
17 එසේ කරන්නේ මහිමයේ පියාණන්
වන අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ දෙවියන්වහන්සේ,
උන්වහන්සේ ගැන දැනගැනීමට ප්‍රඥාවේද
එළිදරව්කිරීමේද ආත්මයක් තුඹලාට
18 දෙන ලෙසත්, උන්වහන්සේගේ කැඳවීමේ
බලාපොරොත්තුව කිමෙක්ද කියාත්,
ශුද්ධවන්තයන් තුළවූ උන්වහන්සේගේ
උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද
19 කියාත්, අදහන්නාවූ අප කෙරෙහි
උන්වහන්සේගේ බලයේ මහත්කම
කිමෙක්ද කියාත්, තුඹලා දැනගන්න
පිණිස තුඹලාගේ සිත් නැමති ඇස්
පහදන ලෙසත්ය.

## ක්‍රිස්තුස්වහන්සේගේ නැවත-නැගිටීමෙන් දෙවියන්වහන්සේගේ බලය දක්වනලද බව

20 උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ
ඉෂ්ටකළාවූ ස්වකීය පරාක්‍රමයේ
ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට
ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගුටුවා,
21 සියලු අධිපතිකමටත් බලයටත්
පරාක්‍රමයටත් ස්වාමිකමටත් මේ
ලෝකයෙහි පමණක් නොව
පරලෝකයෙහිත් සඳහන්කරනලද සියලු
නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය
ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා,
22 සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට
යටත්කොට, සභාව උදෙසා සියල්ලට
ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ
23 නියමකළසේක. ඒ සභාව නම්, සියල්ලන්
තුළ සියල්ල සම්පූර්ණකරන තැනන්-
වහන්සේගේ පූර්ණකම වන
උන්වහන්සේගේ ශරීරයය.

## අන්‍යජාතීන් කෙරෙහි ප්‍රකාශවූ දේව කරුණාව

2 තුඹලා තුඹලාගේ වරද සහ පාප
කරණකොටගෙන මැරී සිටි කල
උන්වහන්සේ තුඹලා ජීවත්කළසේක. පෙර 2
කාලයේ තුඹලා මේ ලෝකයේ
ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ
පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ
ආත්මය වන ආකාශයේ බලයේ
අධිපතියාගේ කැමැත්තේ හැටියටත්,
ඒවායෙහි හැසුරුණහුය. ඔවුන් අතරේ 3
අප සියල්ලෝද වරක් අපේ මාංසයේ
තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත්
සිතටත් කැමති දේ කරමින්, ස්වභාවෙන්
අනික් අය මෙන් උදහසේ දරුවෝව
සිටියෙමුව. නුමුත් දෙවියන්වහන්සේ 4
දයාවෙන් පොහොසත්ව සිටිනසේක්,
අපට ප්‍රේම කළාවූ තමන්වහන්සේගේ
මහත් ප්‍රේමයෙන්, අපගේ වරද 5
කරණකොටගෙන අප මැරී සිටි කල්හි
පවා, ක්‍රිස්තුස්වහන්සේ සමග අප
ජීවත්කර–තුඹලා ගැළවී සිටින්නේ
අනුග්‍රහයෙන්ය–උන්වහන්සේ සමග අප
නැගුටුවා, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ 6
ස්වර්ගීයවූ ස්ථානවල උන්වහන්සේ සමග
අප හිඳවූසේක. එසේ කළේ, ක්‍රිස්තුස්- 7
යේසුස්වහන්සේ තුළ අප කෙරෙහි
ඇත්තාවූ කරුණාවන්තකම නිසා
තමන්වහන්සේගේ අනුග්‍රහයේ ඉතා මහත්
සම්පත පැමිණෙන්නාවූ කාලවලදී
පෙන්වන පිණිසය. මක්නිසාද ඇදහිල්ල 8
කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන්
තුඹලා ගැළවී සිටින්නහුය. එය
තුඹලාගෙන්ම නොව දෙවියන්-
වහන්සේගේ දීමනාවය. කිසිවෙක් 9
පාරට්ටුකර නොගන්න පිණිස ඒක
ක්‍රියාවලින් නොවේ. මක්නිසාද අපි 10
වනාහි යහපත් ක්‍රියා කරන පිණිස
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු
ලැබ දෙවියන්වහන්සේගේ කර්මාන්තයව
සිටිමුව. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන
පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින්
සූදනම්කළසේක.

## අන්‍යජාතීන් හා යුදෙව්වන් සභාවෙහි එක්ව සිටින බව

එහෙයින් පෙර කාලයේදීම මාංසයෙන් 11
අන්‍යජාතිකයන්ව සිටියාවූ, අතින්

මාංසයෙහි කරනලද චර්මඡේදනය
ඇත්තන් විසින් අචර්මඡේදිතයෝයයි
12 කියනලද්දවූ තුඹලා, ඒ කාලයෙහි
ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්ව,
ඉශ්‍රායෙල්ගේ නාගරිකත්වයට අන්‍යයන්ව,
පොරොන්දුවේ ගිවිසුම්වලට විදේශීන්ව,
ලෝකයෙහි බලාපොරොත්තුවක් නැතුව,
දෙවියන්වහන්සෙත් නැතුව සිටිය බව
13 සිහිකරපල්ලා. තුමුන් වරක් දුර සිටියාවූ
තුඹලා දැන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ
තුළ උන්වහන්සේගේ ලේ
කරණකොටගෙන ළංකරනු ලැබුවහුය.
14 මක්නිසාද වෙන්කිරීමේ මැද හිත්තිය
බිඳදමා, ඒ සතුරුකම නමැති නියෝගවල
අන්තර්ගතවූ ආඥාවල ව්‍යවස්ථාව
තමන්ගේ මාංසයෙන් නැතිකොට,
15 දෙගොල්ල එක්කළ උන්වහන්සේම අපේ
සමාදානයව සිටිනසේක; එසේ කළේ
සමාදානකරමින් තමන් තුළ දෙගොල්ල
එක අලුත් මනුෂ්‍යයෙක් කොට මවන
16 පිණිසත්, කුරුසියෙන් සතුරුකම නැසූ
බැවින් දෙගොල්ලම එක ශරීරයක් කොට,
කුරුසිය කරණකොටගෙන දෙවියන්-
වහන්සේට සමගිකරදෙන පිණිසත්ය.
17 උන්වහන්සේ ඇවිත් දුර සිටියාවූ තුඹලාට
සමාදානයද, ළඟ සිටියවුන්ට සමාදානයද
18 දේශනාකළසේක. මක්නිසාද උන්වහන්සේ
කරණකොටගෙන අප දෙගොල්ලට එක
ආත්මයාණන්වහන්සේ තුළ පියාණන්-
වහන්සේ ළඟට පැමිණීමේ පුළුවන්කම
19 තිබේ. ඒ නිසා තුඹලා තවත්
විදේශියෝවත් ආගන්තුකයෝවත් නොව,
ශුද්ධවන්තයන් සමග එක නුවර
වැසියෝව දෙවියන්වහන්සේගේ පවුලේ
20 අයවල්ව සිටින්නහුය. තුඹලා
ප්‍රේරිතයන්ගෙත් ප්‍රොපේතවරුන්ගෙත්
අත්තිවාරම පිට ඉදිකරනු ලැබ
සිටින්නහුය. ක්‍රිස්තුස් යේසුස්වහන්සේම
එහි කොණේ ප්‍රධාන ගලව සිටිනසේක.
21 උන්වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල
හොඳ හැටියට එකතුකරනලදුව, ස්වාමීන්-
වහන්සේ තුළ ශුද්ධවූ මාළිගාවක්ව
22 සෑදීගනයන්නේය. උන්වහන්සේ තුළ
තුඹලාත් ආත්මයාණන්වහන්සේ
කරණකොටගෙන දෙවියන්වහන්සේගේ
වාසය පිණිස එකට ගොඩනගනලද්දහුය.

## ක්‍රිස්තුස්වහන්සේගේ රහස හෙවත් ශුභාරංචිය අන්‍යජාතීන්ටත් අයිති බව

3 මේ කාරණය නිසා අන්‍යජාතිකයන්වූ
තුඹලා උදෙසා ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේගේ හිරකාරවූ පාවුල් නම් මම
[යාච්ඤාකරමි]. තුඹලා උදෙසා මට 2
දෙනලද දෙවියන්වහන්සේගේ ඒ
කරුණාවේ ගබඩාකාරකම ගැන තුඹලා
අසන්ට ඇත; එනම්, මා විසින් ඉහත 3
ලුහුඬින් ලියා තිබෙන ලෙස එළිදරව්
කිරීම කරණකොටගෙන ඒ රහස මට
ප්‍රකාශවූ බවය. ඒ ප්‍රකාරයට තුඹලා 4
එය කියවන විට ක්‍රිස්තුස්වහන්සේගේ
රහස ගැන මට තිබෙන දැනගැන්ම
තුඹලාට තේරුම්ගන්ට පුළුවන; එය 5
උන්වහන්සේගේ ශුද්ධ ප්‍රේරිතයන්ටත්
ප්‍රොපේතවරුන්ටත් ආත්මයාණන්වහන්සේ
කරණකොටගෙන දැන් එළිදරව් කර
තිබෙන ලෙස වෙන පරම්පරාවලදී
මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වනු නොලැබුවේය;
එනම් ශුභාරංචිය කරණකොටගෙන 6
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ,
අන්‍යජාතීන් හවුල් උරුමක්කාරයන් බවත්,
ශරීරයේ හවුල් අවයවයන් බවත්,
පොරොන්දුවට හවුල්කාරයන් බවත්ය.
දෙවියන්වහන්සේගේ බලයේ ක්‍රියාකිරීමේ 7
ප්‍රකාරයට මට දෙනලද උන්වහන්සේගේ
ඒ කරුණාවේ දීමනාව හැටියට මම ඒ
ශුභාරංචියේ සේවකයෙක් කරනු
ලැබුවෙමි. සියලු ශුද්ධවන්තයන්ගෙන් 8
ඉතා කුඩා තැනැත්තාවූ මට මේ අනුග්‍රහය
දෙනලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ සොයා
දැනගත නොහැකි සම්පත ගැන
අන්‍යජාතීන්ට දේශනාකරන්ටත්, සියල්ල 9
මැවුවාවූ දෙවියන්වහන්සේ තුළ සියලු
කාලවල පටන් සැඟවී තිබුණාවූ රහසේ
නියමය කිමෙක්ද කියා සියල්ලන්ට
පෙන්වන පිණිසත්ය. එසේ කළේ අපගේ 10
ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
දෙවියන්වහන්සේ විසින් අභිප්‍රායකරනලද
සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගීය 11
ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත්

මේ කාලයෙහි සභාව කරණකොටගෙන
උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව
දැනගන්ට ලැබෙන පිණිසය.
12 ක්‍රිස්තුස්වහන්සේ තුළ අපේ ඇදහිල්ල
කරණකොටගෙන නිර්භීතකමත්, සැක
නැතුව ළංවන්ට පුළුවන්කමත්,
13 උන්වහන්සේ තුළ අපට තිබේ. එහෙයින්
තුඹලාගේ ගෞරවයට හේතුවූ, තුඹලා
නිසා මා විඳින්නාවූ දුක් ගැන ක්ලාන්ත
නොවෙන ලෙස ඉල්ලමි.

## මෙසා විශාල ප්‍රේමය සභාව විසින් තේරුම්ගන්නා ලෙස යාච්ඤාකිරීම

14 මේ නිසා ස්වර්ගයෙහිද පොළොවෙහිද,
15 ඒ ඒ ගෝත්‍රයට නම් දෙන්නාවූ
පියාණන්වහන්සේට මම මාගේ දණ
16 නමා, උන්වහන්සේගේ ආත්මයාණන්-
වහන්සේ කරණකොටගෙන තුඹලාගේ
අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ තුඹලා
බලයෙන් ශක්තිමත් වන පිණිසත්,
17 ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස්-
වහන්සේ තුඹලාගේ සිත් තුළ
වාසයකරන පිණිසත්, තුඹලා ප්‍රේමයෙහි
18 මුල් ඇද පිහිටා සිට, දෙවියන්-
වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණවන
පිණිස සියලු ශුද්ධවන්තයන් සමග
ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි
19 ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග, උස,
ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට
තුඹලාට පුළුවන්වන පිණිසත්,
උන්වහන්සේගේ මහිමයේ සම්පතේ
හැටියට තුඹලාට දෙන මෙන්
යාච්ඤාකරමි.
20 ඉතින් අප තුළ ක්‍රියාකරන්නාවූ බලයේ
හැටියට අපි ඉල්ලන නොහොත් සිතන
හැම දේට වඩා ඉතා අධිකලෙස කරන්ට
බලය ඇත්තාවූ තැනන්වහන්සේටම,
21 සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
සදාකාලයටම ගෞරවය වේවා. ආමෙන්.

## සභාව එක්සත්වීමට දෙවියන්වහන්සේගේ කැඳවීම

4 එබැවින් තුඹලා කැඳවනු ලැබූ
2 කැඳවීමට ඔබිනලෙස, සියලු ආකාර
යටහත්කමින්ද මොළොක් ගුණයෙන්ද
ඉවසිලිවන්තකමෙන්ද හැසිර, එකිනෙකා
ගැන ප්‍රේමයෙන් ඉවසා, සමාදානයේ 3
බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම
පවත්වාගන්ට උත්සාහ කරන මෙන්,
ස්වාමීන්වහන්සේ නිසා හිරකාරයෙක්ව
සිටින මම තුඹලාගෙන් ඉල්ලමි.
තුඹලාගේ කැඳවීමේ එක 4
බලාපොරොත්තුවට තුඹලා කැඳවනු
ලැබූ ලෙසම, ඇත්තේ එක ශරීරයත්,
එක ආත්මයාණන්වහන්සෙත්, එක 5
ස්වාමීන්වහන්සෙත්, එක ඇදහිල්ලත්, එක
*බව්තීස්මයත්, සියල්ලන් කෙරෙහිද 6
සියල්ලන් කරණකොටගෙනද සියල්ලන්
තුළද පවතින්නාවූ, සියල්ලන්ට එකම
පියවූ දෙවියන්වහන්සෙත්ය. නුමුත් අපෙන් 7
එක් එක්කෙනාට ක්‍රිස්තුස්වහන්සේගේ
දීමනාවේ ප්‍රමාණයේ හැටියට අනුග්‍රහය
දෙනලද්දේය. එහෙයින් උන්වහන්සේ 8
කථාකොට:

උන්වහන්සේ උසස්තැනට නැගුණු
කල්හි වහල්කමට ගත්තවුන්
වහල්කොට ගෙනගොස්,
මනුෂ්‍යයන්ට තෑගි දුන්සේකැයි

කියනසේක. (ඉතින්: නැගුණුසේකැයි 9
කී බැවින් උන්වහන්සේ පොළොවේ පහත්
තැන්වලට බැස්ස බවක් මිස වෙන කුමක්
හැඟේද? බැස්සාවූ උන්වහන්සේ නම් 10
සියල්ල පූර්ණකරන පිණිස සියලු
ස්වර්ගවලින් ඉහළට නැගුණාවූ
තැනන්වහන්සේමය.) උන්වහන්සේ 11
සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන්
අනාගතවක්තෘවරුන්ද සමහරුන්
ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන්
සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද
කොට දුන්සේක. එසේ දුන්නේ ඇදහීමේද 12
දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද
එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්,
ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස
මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන්
පැමිණෙන තෙක්, ශුද්ධවන්තයන්ගේ 13
සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ
වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ

*අවගාහනයත්.

14 ශරීරයේ වර්ධනයවීම පිණිසත්ය. තවද
අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද
ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත
උපාමාරුවෙන්ද හටගන්න සියලු ආකාර
ඉගැන්වීම් නමැති සුළඟින් ඇන මැන
වීසිවෙමින් ගෙනයනු ලබන්නාවූ
15 බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන්
යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින
ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී
16 වැඩෙන පිණිසත්ය. උන්වහන්සේගෙන්
මුළු ශරීරය එකට සන්ධිකරනු ලැබ
සවිවී, එක එක කොට්ඨාසයේ
ප්‍රමාණයේ ක්‍රියාකිරීමේ හැටියට
සහකාරවූ එක එක සන්ධිය
කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය
වන ලෙස ශරීරය වැඩෙන්නේය.

## ක්‍රිස්තුස්වහන්සේ තුළ අලුත් කරනු ලැබූ අයගේ හැසිරීම

17 එබැවින් අන්‍යජාතීන් තමුන්ගේ සිත්වල
නිෂ්ඵලකමින් හැසිරෙන්නාක්මෙන්,
තුඹලා තවත් නොහැසිරියල්ලායයි
ස්වාමීන්වහන්සේ තුළ සාක්ෂිදෙමින්
18 කියමි. ඔව්හු තමුන්ගේ තේරුම්ගැනීමෙන්
අඳුරුව, තමුන් තුළ ඇත්තාවූ අඥානකම
නිසාද තමුන්ගේ සිත් දැඩිවීම නිසාද
දෙවියන්වහන්සේ කෙරෙන්වූ ජීවනයට
19 විදේශීව සිටිති. ඔව්හු හැඟීමක් නැතුව
සියලු අපවිත්‍රකම් ගිජුලෙස කරන
පිණිස සල්ලාලකමට භාරවුණෝය.
20 තුමුත් තුඹලා ක්‍රිස්තුස්වහන්සේව එසේ
21 ඉගෙනගත්තේ නැත; එනම්, සැබෑව
යේසුස්වහන්සේ තුළ තිබෙන ප්‍රකාර
තුඹලා උන්වහන්සේගෙන්ම අසා,
උන්වහන්සේ තුළ උගන්වනු ලැබුවහුය.
22 [එසේ ඉගෙනගත්තේ] තුඹලාගේ
ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ
තෘෂ්ණාවල් අනුව දූෂ්‍යවන්නාවූ පරණ
23 මනුෂ්‍යයා පහකරදමා, තුඹලා
තුඹලාගේ චිත්තාත්මයෙන් අලුත්කරනු
24 ලැබ, සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද
ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව
මවනලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා
ලෙසය.

## දිනපතා ජීවිතය සඳහා උපදෙස්

එහෙයින් බොරුකීම අත්හැරදමා, එක් 25
එක්කෙනා තම තමාගේ අසල්වාසියා
සමග සැබෑව කථාකරපල්ලා. මක්නිසාද
අපි එකිනෙකාගේ අවයවයෝය.
කෝපවුණත් පව් නොකරල්ලා. ඉර බසින 26
තුරු තුඹලාගේ කෝපය පවතින්ට ඉඩ
නාරිල්ලා. යක්ෂයාට ඉඩ නොදෙල්ලා. 27
සොරකම්කළාවූ අය තවත් සොරකම් 28
නොකෙරේවා. ඒ වෙනුවට, හිඟ අයට
දෙන්ට පුළුවන්වන පිණිස, තමාගේ
අත්වලින් යහපත් වැඩක් කරමින්
වීර්යකෙරේවා. තුඹලාගේ මුඛයෙන් කිසි 29
දූෂ්‍ය කථාවක් නික්මෙන්ට ඉඩ නැර,
අසන්නන්ට ප්‍රයෝජන ලැබෙන පිණිස
ඕනෑකරන වර්ධනවීම සඳහා යහපත්
දේම කියාපල්ලා. දෙවියන්වහන්සේගේ 30
ශුද්ධාත්මයාණන්වහන්සේට දුක්
නොදෙල්ලා; මක්නිසාද උන්වහන්සේ
තුළ තුඹලා මිදීමේ දවසට මුද්‍රාකරනු
ලැබුවහුය. සියලු තික්තකමත් කෝපයත් 31
උදහසත් කෝලාහලත් අපහාසත් සියලු
ක්‍රෝධත් තුඹලා කෙරෙන් පහකරනු
ලැබේවා. තුඹලා එකිනෙකා කෙරෙහි 32
ගුණවත්තව අනුකම්පා ඇතුව සිට,
ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ
තුඹලාට කමාවූණ ලෙසම තුඹලාත්
එකිනෙකාට කමාවෙයල්ලා.

## දේව දරුවන්ගේ පිරිසිදු ජීවිතය

5
එබැවින් තුඹලා ප්‍රිය දරුවන්
මෙන් දෙවියන්වහන්සේ අනුව
යන්නෝ වෙයල්ලා. ක්‍රිස්තුස්වහන්සේ 2
තුඹලාට ප්‍රේමකොට, මිහිරි සුවඳක් පිණිස
දෙවියන්වහන්සේට පූජාවක්ද යාගයක්ද
කොට අප වෙනුවට තමන්ම
පාවාදුන්නාක්මෙන්ම, තුඹලාත්
ප්‍රේමයෙන් හැසිරියල්ලා. තුමුත් 3
වේශ්‍යාකමද සියලු ආකාර අපවිත්‍රකම
හෝ තණ්හාවද තුඹලා අතරේ
සඳහන් කරන්ට පමණවත් එපා; එය
ශුද්ධවන්තයන්ට නුසුදුසුය. කැතකම්ද 4
මෝඩ කථාද නීච කවටකම්ද යන
මේවාත් නුසුදුසුය. ඒවා නොව ස්තුතිකිරීම්

5 පවත්වාපල්ලා. මක්නිසාද වේශ්‍යාකම්
කරන්නෙකුටවත් අපවිත්‍ර තැනැත්තෙකුටවත්
රූපවඳින්නෙක්වූ ලෝභයෙකුටවත්
ක්‍රිස්තුස්වහන්සේගේද දෙවියන්-
වහන්සේගේද රාජ්‍යයෙහි උරුමයක්
නොලැබෙන බව තුඹලා සත්තකලෙස
6 දැන සිටින්නහුය. හිස් වචනවලින් තුඹලා
රවටන්ට කිසිවෙකුට ඉඩ නොදෙල්ලා.
මක්නිසාද මේ දේවල් නිසා දෙවියන්-
වහන්සේගේ උදහස අකීකරුකමේ පුත්‍රයන්
7 පිටට පැමිණෙන්නේය. එබැවින් ඔවුන්
සමග පංගුකාරයෝ නොවෙල්ලා.
8 මක්නිසාද වරක් තුඹලා අන්ධකාරව
සිටිය නුමුත්, දැන් ස්වාමීන්වහන්සේ තුළ
ආලෝකයව සිටින්නහුය. ආලෝකයේ
9 දරුවන් මෙන් හැසිරියල්ලා. ආලෝකයේ
එල නම්, සියලු ආකාර යහපත්කමත්
10 ධර්මිෂ්ඨකමත් සැබෑකමත්ය. ස්වාමීන්-
වහන්සේට ප්‍රසන්නව තිබෙන්නේ
කිමෙක්ද කියා විභාගකරපල්ලා.
11 අන්ධකාරයේ එල නැති ක්‍රියාවලට හවුල්
නොවී, ඒවාට දෙස් තබාපල්ලා:
12 මක්නිසාද ඔවුන් විසින් රහසින් කරන
දේ ගැන කථාකිරීම පවා ලජ්ජාවක්ය.
13 තුමුන් දෙස් තබනු ලබන සියලු
දේ ආලෝකය කරණකොටගෙන
ප්‍රකාශවන්නේය. මක්නිසාද ප්‍රකාශවන
14 සියල්ල ආලෝකයව තිබේ. එහෙයින්:
නිදන්නාවූ තුඹ පිබිද මළවුන්ගෙන්
නැගිටපන්න, එවිට ක්‍රිස්තුස්වහන්සේ තුඹ
කෙරෙහි උදුවනසේකැයි උන්වහන්සේ
කියනසේක.
15 ඒ නිසා තුඹලා ඥානය නැත්තන් මෙන්
නොව ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන්
16 හැසිරෙන්ට බලාගෙන, දවස් නපුරු
17 බැවින් *ප්‍රස්තාව අල්ලාගනිල්ලා. මේ
නිසා, තුඹලා අනුවණයෝ නොවී,
ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද
18 කියා තේරුම්ගනිල්ලා. මුද්‍රිකපානයෙන්
මත් නොවෙල්ලා. එයින් අනාචාරකම්
හටගන්නේය: තුමුන් ආත්මයාණන්ගෙන්
19 පූර්ණවී, ගීතිකාවලින්ද කවිවලින්ද
ආත්මික ගීවලින්ද එකිනෙකාට
කථාකොට, තුඹලාගේ සිත්වලින්
ස්වාමීන්වහන්සේට ගායනාද ගීතිකාද
කරමින්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්- 20
වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන
පියවූ දෙවියන්වහන්සේට නිතරම
ස්තුතිකරපල්ලා. ක්‍රිස්තුස්වහන්සේ 21
කෙරෙහි හය ඇතුව එකිනෙකාට
යටත්වෙයල්ලා.

## ක්‍රිස්තියානි පවුලක තිබිය යුතු හැසිරීම

භාර්යාවෙනි, ස්වාමීන්වහන්සේට මෙන් 22
තුඹලාගේ පුරුෂයන්ට යටත්ව
සිටපල්ලා. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ 23
සභාවේ හිසව සිටින්නා සේම පුරුෂයාත්
භාර්යාවගේ හිසව සිටියි. උන්වහන්සේ
වනාහි ශරීරයේ ගැළවුම්කාරයාය.
එබැවින් සභාව ක්‍රිස්තුස්වහන්සේට 24
යටත්වෙන්නාක්මෙන් භාර්යාවෝද
සියලු දේවලදී තමුන්ගේ පුරුෂයන්ට
යටත්වෙත්වා. පුරුෂයෙනි, ක්‍රිස්තුස්- 25
වහන්සේ සභාවට ප්‍රේමකොට, ඇ
උදෙසා තමන්ම පාවාදුන්නාක්මෙන්ම,
තුඹලාත් තුඹලාගේ භාර්යාවන්ට
ප්‍රේමකරපල්ලා. එසේ කළේ සභාව 26
ශුද්ධව, කැලලක් හෝ රැළි හෝ එබඳු
යමක් නැතුව, තේජවත් සභාවක් කොට 27
තමන්ට ඔප්පුකරගැනීම සඳහා වචනය
නමැති වතුරෙන් සේදීමෙන්, උන්වහන්සේ
එය පවිත්‍රකොට පිරිසිදුකරන පිණිසය.
එසේම පුරුෂයන් විසින්ද තමුන්ගේ 28
භාර්යාවන්ට තමුන්ගේම ශරීරවලට මෙන්
ප්‍රේමකටයුතුය. තමාගේ භාර්යාවට
ප්‍රේමකරන තැනැත්තේ තමාටම
ප්‍රේමකරන්නේය. කිසිවෙක් කිසිකලක 29
තමාගේම මාංසයට වෛරකළේ නැත.
ක්‍රිස්තුස්වහන්සේ සභාව ගැන
කරන්නාක්මෙන් එකිනෙකා තම
තමාගේ මාංසය පෝෂණයකොට
රක්ෂාකරගන්නේය. මක්නිසාද අපි 30
උන්වහන්සේගේ ශරීරයේ අවයවයෝය.
මේ නිසා මනුෂ්‍යයෙක් තමාගේ පියාද 31
මවුද අත්හැර, තමාගේ භාර්යාවට
ඇලුම්වන්නේය: ඔවුන් දෙදෙන එක
මාංසය වන්නෝය. මේ රහස මහත්ය. 32
තුමුත් මම ක්‍රිස්තුස්වහන්සේ ගැනත් සභාව

*එනම්–කාලය ඉතා හොඳට
පාවිච්චිකරපල්ලා.

33 ගැනත් කථාකරමි. එසේවී නුඹුත් නුඹලා
එක් එක්කෙනාත් තම තමාට මෙන්
තම තමාගේ භාර්යාවට ප්‍රේමකරපල්ලා;
භාර්යාවද පුරුෂයාට භයපක්ෂව
සිටින්ට බලාගනීවා.

## ක්‍රිස්තියානි පවුලක තිබිය යුතු තත්ත්වය

6 දරුවෙනි, නුඹලාගේ දෙමවුපියන්ට
ස්වාමීන්වහන්සේ තුළ කීකරුවෙයල්ලා.
2 මක්නිසාද එසේ කරන්ට යුතුය. නුඹට
වැඩසිද්ධවන පිණිසද නුඹ පොළොවෙහි
3 බොහෝ කල් ජීවත්වන පිණිසද, නුඹේ
පියාටත් මවුටත් ගෞරවකරපන්න. එය
පොරොන්දුවක් ඇති පළමුවෙනි ආඥාවය.
4 පියවරුනි, නුඹලාගේ දරුවන්ට
කෝප නූපදවා, ස්වාමීන්වහන්සේගේ
හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන්
ඇතිකරපල්ලා.
5 දසයෙනි, ක්‍රිස්තුස්වහන්සේට මෙන්
මාංසාකාරයෙන් නුඹලාගේ ස්වාමිවරුන්ව
සිටින්නන්ට භයෙනුත් වෙවුලුමෙනුත්
නුඹලාගේ සිත්වල ඒකාන්තකමින් කීකරු-
6 වෙයල්ලා; මනුෂ්‍යයන් සතුටුකරන්නන්
මෙන් පෙනීමට වැඩ නොකොට,
ක්‍රිස්තුස්වහන්සේගේ දසයන් මෙන්
සිතින් දෙවියන්වහන්සේගේ කැමැත්ත
7 කරපල්ලා. දසයෙක් වේවා, නිර්දසයෙක්
වේවා, එක් එක් අය කරන්නාවූ
යම් යහපතක් ඇද්ද, ඊට ස්වාමීන්-
වහන්සේගෙන් නැවත විපාක ලැබෙන
8 බව දැන, මනුෂ්‍යයන්ට නොව ස්වාමීන්-
වහන්සේට මෙන් කැමැත්තෙන් මෙහෙ-
9 කරපල්ලා. ස්වාමිවරුනි, නුඹලාගෙත්
ඔවුන්ගෙත් ස්වාමීන්වහන්සේ ස්වර්ගයෙහි
සිටින බවද උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ
තරාතිරම් නොබලන බවද දැන,
තර්ජනකිරීමෙන් වැලකී, ඔවුන්ට එම
දේවල් කරපල්ලා.

## ක්‍රිස්තියානිකාරයාගේ යුද්ධායුධ

10 ඉතින් ස්වාමීන්වහන්සේ තුළද
උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද
11 බලවත්වෙයල්ලා. යක්ෂයාගේ උපායවලට
විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන
පිණිස දෙවියන්වහන්සේගේ සියලු
යුද්ධායුධ පැළඳගනිල්ලා. මක්නිසාද 12
අපේ පොරබැදීම වනාහි මාංසයට
සහ රුධිරයට විරුද්ධව නොව,
අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ
අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත්
ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ
ආත්ම සේනාවන්ටත් විරුද්ධවය.
එබැවින් නපුරු දවසේදී විරුද්ධව 13
සිටින්ටත් සියල්ල සම්පූර්ණකරගන
ස්ථිරව සිටින්ටත් පුළුවන්වෙන පිණිස,
දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ
අරගනිල්ලා. එබැවින් නුඹලාගේ ඉහටි 14
සැබෑකම නැමති පටියෙන් බැඳගෙන,
ධර්මිෂ්ඨකම නැමති ළයවැස්ම
පැළඳගෙන, සමාදානයේ ශුභාරංචියේ 15
සූදානම නැමති වහන් පය ලා සිටපල්ලා.
ඒ සියල්ල ඇර, ඇදහිල්ල නමැති පලිහ 16
අරගනිල්ලා. එයින් නපුරාගේ සියලු
ගිනිහෙල්ල නිවන්ට නුඹලාට
පුළුවන්වන්නේය. ගැළවීම නමැති 17
ආරක්ෂාතොප්පියද දෙවියන්වහන්සේගේ
වචනය නැමති ආත්මයාණන්-
වහන්සේගේ කඩුවද ගනිල්ලා. සියලු 18
යාච්ඥාවලින්ද ඉල්ලීම්වලින්ද සියලු
කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන
යාච්ඥාකරපල්ලා. යම් ශුභාරංචියක් 19
නිසා මම තානාපතියෙක්ව බැඳුම ලැබ
සිටිම්ද, ඒ ශුභාරංචියේ රහස දන්වීමට
භය නැතුව මාගේ මුඛය අරින ලෙස
කථාවේ බලය මට ලැබෙන පිණිසත්,
මා විසින් කථාකරන්ට යුතුව තිබෙන 20
හැටියට ඒ ගැන භය නැතුව කථාකරන
පිණිසත්, සියලු ශුද්ධවන්තයන් ගැනද
මා උදෙසාද නොකඩවම සියලු
ඉල්ලීම්වලින් අවදිව සිටපල්ලා.

## අවසානය

නුඹුත් මාගේ කාරණාත් මා සිටින්නේ 21
කෙලෙසද කියාත් නුඹලා දැනගන්නා
පිණිස, ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්ත
සහෝදරයාද විශ්වාස සේවකයාද වූ
තුකීකස් සියල්ල නුඹලාට දන්වනවා
ඇත. මේ අදහස පිණිසම, එනම් නුඹලා 22

අපේ කාරණා දැනගන්න පිණිසත් ඔහු
තුඹලාගේ සිත් සනසන පිණිසත්, ඔහු
තුඹලා වෙතට එවීමි.
23 පියවූ දෙවියන්වහන්සේගෙන්ද ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද
සමාදානයත් ඇදහිල්ල සමග ප්‍රේමයත්
සහෝදරයන්ට වේවා. අපගේ ස්වාමිවූ 24
යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවංකකමින්
ප්‍රේමකරන්නාවූ සියල්ලන්ට අනුග්‍රහය
වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් පිලිප්පිවරුන්ට ලියනලද පත්‍රය

## ආචාරකිරීම, ස්තුතිදීම සහ යාච්ඤකිරීම

1 ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ දසයන්වූ
පාවුල්ද තිමෝතියස්ද ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ තුළ පිලිප්පියෙහි සිටින
සියලු ශුද්ධවන්තයන්ටත් නායකයන් හා
උපස්ථායකයන්ටත් ලියා එවන වග නම්:
2 අපගේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද
කරුණාවත් සමාදානයත් තුඹලාට වේවා.
3 තුඹලා මට සිහිවෙන හැම වේලේම
නිතරම මාගේ සියලු යාච්ඤවලදී
තුඹලා සියල්ලන් උදෙසා ප්‍රීතියෙන්
4 යාච්ඤව ඔප්පුකරමින්, පළමුවෙනි දවස
පටන් දැන් දක්වා ශුභාරංචියේ වර්ධනය
5 සඳහා තිබෙන, තුඹලාගේ පංගුකාරකම
ගැන මාගේ දෙවියන්වහන්සේට
6 ස්තුතිකරමි. තුඹලා තුළ යහපත් වැඩක්
පටන්ගත් උන්වහන්සේ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා ඒක
සම්පූර්ණකරනසේකැයි යන මේ
7 විශ්වාසය ඇතුව සිටිමි. තුඹලා සියල්ලන්
ගැන මෙසේ කල්පනාකරන්ට මට
යුතුය, මක්නිසාද මාගේ බැඳුම්වලදීද
ශුභාරංචිය ගැන උත්තරදීමේදීද ඒක
ස්ථිර කිරීමේදීද තුඹලා සියල්ලන් මා
සමග අනුග්‍රහයට පංගුකාරයන්ව සිටින
8 බැවින් තුඹලා මාගේ සිතේ දරමි. එසේය,
ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ ඇලුම්කමින්
මට තුඹලා සියල්ලන් කෙරෙහි
කොපමණ ආශා ඇත්තෙම්ද කියා
දෙවියන්වහන්සේ මට සාක්ෂි වනසේක.
9 යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
දෙවියන්වහන්සේට ගෞරවය හා ප්‍රශංසාව
සඳහා, තුඹලා ධර්මිෂ්ඨකමේ ඵලවලින්
පූර්ණව, උතුම්වූ දේවල් ඒත්තුගන්ට 10
තුඹලාට පුළුවන්වෙන්ටත්, ක්‍රිස්තුස්-
වහන්සේගේ දවස දක්වා අවංකව
නිදෙස්ව සිටින්ටත්, තුඹලාගේ ප්‍රේමය 11
දැනගැන්මෙන් හා සියලු ආකාර
විමසීමෙන් තව වඩ වඩා බොහෝ වන
පිණිස යාච්ඤකරමි.

## ප්‍රේරිත තැන හිරඅඩස්සිවී සිටීමෙන් ශුභාරංචිය පැතිරයාම

සහෝදරයෙනි, මට සිදුවූ කාරණා 12
වැඩි වශයෙන් ශුභාරංචියේ දියුණුවීමටම
හැරී තිබෙන බව තුඹලා දැනගන්නවාට
කැමැත්තෙමි. මෙසේ මාගේ බැඳුම් 13
ක්‍රිස්තුස්වහන්සේ නිසා පැමුණුණ බව
මුළු රජගෙදරද අනිකුත් සියල්ලන්ටද
ප්‍රකාශවී තිබේ. ස්වාමීන්වහන්සේ තුළවූ 14
සහෝදරයන්ගෙන් වැඩිදෙනාද මාගේ
බැඳුම් නිසා ධෛර්යය ලැබ, දෙවියන්-
වහන්සේගේ වචනය භය නැතුව
කියාදෙන්ට ඉතා වැඩිලෙස නිර්භීතවී
සිටිති. සමහරු ඊර්ෂ්‍යාවෙන්ද 15
විවාදයෙන්ද සමහරු හොඳ සිතින්ද
ක්‍රිස්තුස්වහන්සේ දේශනාකරති. එක 16
පක්ෂයක් මා ශුභාරංචිය ගැන
උත්තරදෙන්ට සිටින බව දැන ප්‍රේමයෙන්ද,
අනික් පක්ෂය මාගේ බැඳුම්වලදී මට 17
පීඩා උපදවන්ට සිතා පිරිසිදුලෙස නොව
පක්ෂවාදිකමෙන්ද, ක්‍රිස්තුස්වහන්සේව
ප්‍රකාශකරති.

## ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශකරනු ලැබීම ගැන ප්‍රේරිත තැනගේ ප්‍රීතිය

18 ඉතින් කිමෙක්ද? වංචාවෙන් වේවා,
සැබෑකමෙන් වේවා, ඒ කොහොම වෙතත්
සියලු ආකාරයෙන් ක්‍රිස්තුස්වහන්සේ
ප්‍රකාශකරනු ලබනසේක; ඊට ප්‍රීතිවෙමි,
19 එසේය, තවත් ප්‍රීතිවන්නෙමි. මක්නිසාද
මේ කාරණය නුඹලාගේ ඉල්ලීමෙන්ද
ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්
ලැබීමෙන්ද මාගේ ගැළවීමට හැරෙන
20 බව දනිමි. ඒ හැටියට මම කිසිවක්
ගැන ලජ්ජාවට නොපැමිණ, සියලු
ආකාරයෙන් නිර්භීතව සිටීමෙන්, මාගේ
ශරීරය කරණකොටගෙන, ජීවිතයෙන්
වේවා, මරණයෙන් වේවා, නිතරම වාගේ
දැනුත් ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට
පැමිණේයයි මාගේ තද බලාපොරොත්තු-
වක්ද ප්‍රාර්ථනාවක්ද ඇත්තේය.

## ජීවිතය නොහොත් මරණය, වඩා හොඳ කොයි එකද?

21 මක්නිසාද මාගේ ජීවත්වීම නම්
ක්‍රිස්තුස්වහන්සේ (උදෙසා) ය, මරණයද
22 මට ලාභයක්ය. නුමුත් මාංසයෙහි
ජීවත්වීම [මාගේ කොටස නම්], මාගේ
වැඩවලින් ප්‍රයෝජන ඇති නිසා කොයි
23 එක තෝරාගනිම්දැයි නොදනිමි. නුමුත්
මම මේ දෙක මැද හිරවී සිටිමි;
මාගේ ආශාව නම් තුරන්ව ගොස්
ක්‍රිස්තුස්වහන්සේ සමග විසීමටය;
මක්නිසාද ඒක බොහෝසෙයින් වඩා
24 හොඳය. නුමුත් මාංසයෙහි සිටීම නුඹලා
25 නිසා වඩා ඕනෑකෙරේ. මම මේක
විශ්වාස කරන බැවින්, මා ජීවත්වී,
ඇදහීමෙහි නුඹලාගේ දියුණුවීමද ප්‍රීතියද
සඳහා නුඹලා සියල්ලන් සමග සිටින්ට
26 යෙදෙන බව දනිමි. මෙසේ වන්නේ, මා
ගැන නුඹලාගේ පාරට්ටුකරගැන්ම නැවත
නුඹලා වෙතට මාගේ ඊමෙන් ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ තුළ වැඩි වෙන පිණිසය.

## ධෛර්යවත්වීමට අනුශාසනාව

27 මම ඇවිත් නුඹලා දක්නෙම් නුමුත්,
ඈත්ව සිටින්නෙම් නුමුත්, නුඹලා එකම
ආත්මයෙන් ස්ථිරව, එක සිතකින්
ශුභාරංචියේ ඇදහිල්ල ගැන වීර්යකරමින්,
විරුද්ධව සිටින්නන්ට කිසිවක් ගැන
භීත නොවී සිටින බව මට අසන්ට
පුළුවන්වන පිණිස, ක්‍රිස්තුස්වහන්සේගේ
ශුභාරංචියට ඔබිනලෙසම හැසිරියල්ලා.
ඒ [නිර්භීතකම] ඔවුන්ට විනාශයේද 28
නුඹලාට ගැළවීමේද ලකුණක්ව
තිබේ; එය දෙවියන්වහන්සේගෙන්ම
පැමිණෙන්නේය. මක්නිසාද ක්‍රිස්තුස්- 29
වහන්සේ කෙරෙහි අදහන්ට පමණක්
නොව, උන්වහන්සේ උදෙසා දුක්විඳින්ටත්
ක්‍රිස්තුස්වහන්සේ උදෙසා නුඹලාට
වරප්‍රසාදය දෙනලද්දේය. මා කෙරෙහි 30
තිබෙන බව නුඹලා දුටුවාවූ, දැන් මට
ඇතැයි නුඹලා අසන්නාවූ එම සටනම
නුඹලාටත් ඇත්තේය.

## එක්සත්වීමටත් යටහත්වීමටත් අනුශාසනාව

2 ඉතින් ක්‍රිස්තුස්වහන්සේ තුළ යම්
අස්වැසිල්ලක් ඇත්නම්, ප්‍රේමයේ
යම් සැනසිල්ලක් ඇත්නම්, ආත්මයාණන්-
වහන්සේගේ යම් පංගුකාරකමක් ඇත්නම්,
යම් ආදරයක් සහ දයාබරකමක්
ඇත්නම්, නුඹලා එක ප්‍රේමය ඇතුව, 2
එකභව සිට, එක කාරණයම
අභිප්‍රායකරගෙන එක්සිත්ව සිටීමෙන්,
මාගේ ප්‍රීතිය සම්පූර්ණකරපල්ලා.
පක්ෂවාදිකමෙන්වත් නිෂ්ඵල පාරට්ටු- 3
කාරකමෙන්වත් කිසි දෙයක් නොකොට,
එකිනෙකා තම තමාට වඩා වෙන
කෙනෙක් උතුම්යයි යටහත්කමින් සිතාවා.
නුඹලා එක් එක්කෙනා තම තමාගේම 4
කාරණා නොව අනුන්ගේ කාරණාත්
බලාපල්ලා.

## කුරුසිය දක්වා ක්‍රිස්තුස්වහන්සේගේ පහත්වීම ඇදහිලිවන්තයාගේ මහත් ආදර්ශය බව

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ 5
තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා.
උන්වහන්සේ දෙවියන්වහන්සේගේ 6

රූපාකාරය දරනසේක්, දෙවියන්-
වහන්සේට සමානව සිටීම තමන් විසින්
අල්ලාගනම සිටිය යුතුවූ වස්තුවකැයි
7 නොසිතා, එය ඉවත්කර, දසයෙකුගේ
ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ
8 සමානත්වයට පැමිණිසේක. මනුෂ්‍යා-
කාරයෙන් සිටිය කලත්, මරණය, එසේය,
කුරුසියේ මරණය දක්වා කීකරුවූසේක.
9 එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව
ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා
උසස් නාමය උන්වහන්සේට දුන්සේක.
10 එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද
පොළොව යටද සියල්ලන් යේසුස් යන
11 නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව
පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය
සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න
පිණිසත්ය.

## ගැළවීම වනාහි කල්ක්‍රියාවෙහි යෙදවිය යුතු බව

12 එබැවින්, මාගේ ප්‍රේමවන්තයෙනි,
නුඹලා නිතරම කීකරුව සිටියාක්මෙන්ම,
මා ළඟ සිටියදී පමණක් නොව දැන්
මා ඈත්ව සිටින විටද ඊට වඩා කීකරුව,
භයෙනුත් වෙව්ලුමෙනුත් නුඹලාගේම
13 ගැළවීම ඉෂ්ටකරගනිල්ලා; මක්නිසාද
තමන්වහන්සේගේ යහපත් කැමැත්ත
නිසා, කැමතිවෙන්ටත් වැඩකරන්ටත්
නුඹලා තුළ ක්‍රියාකරන්නේ දෙවියන්-
14 වහන්සේමය. වංකවූ හිතුවක්කාරවූ
පරම්පරාවක් අතරේ නුඹලා නිදොස්ව,
අහිංසකව, දෙවියන්වහන්සේගේ නිර්දෝෂ
දරුවන්ව සිටින පිණිස, කෙඳිරීම්ද විවාදද
15 නැතුව සියල්ල කරපල්ලා. ඔවුන් අතරේ
නුඹලා ජීවනයේ වචනය පාමින්
ආලෝකවල් මෙන් ලෝකයෙහි දක්නා
16 ලබන්නහුය. මෙසේ, මම නිෂ්ඵලලෙස
නොදිවීමි, නිෂ්ඵලලෙස වීර්ය
නොකෙළෙමියි කියා ක්‍රිස්තුස්වහන්සේගේ
දවසේදී මට පාරට්ටුවක් ඇතිවන්නේය.
17 එසේය, මා නුඹලාගේ ඇදහිල්ල නැමති
පූජාවත් මෙහෙයත් පිට පූජාකරනු ලබන
නුමුත් සන්තෝෂවෙමි, නුඹලා සියල්ලන්
සමග ප්‍රීතිවෙමි. එසේම නුඹලාත් 18
සන්තෝෂවෙයල්ලා, මා සමග
ප්‍රීතිවෙයල්ලා.

## සභා සේවක තිමෝතියස් සහ එපප්‍රොදිතස්

මමත් නුඹලාගේ කාරණා දැන හොඳ 19
සැනසිල්ල ලබන පිණිස නුඹලා
ළඟට තිමෝතියස් නොබෝ කලකින්
එවන්ට ස්වාමිවූ යේසුස්වහන්සේ
තුළ බලාපොරොත්තුවෙමි. මක්නිසාද 20
නුඹලාගේ කාරණා ගැන ඔහු වාගේ
සැබෑලෙස සලකන්නාවූ වෙන කෙනෙක්
මට නැත. මක්නිසාද සියල්ලෝ යේසුස් 21
ක්‍රිස්තුස්වහන්සේගේ කාරණා නොව තම
තමුන්ගේම කාරණා සොයන්නෝය.
ඔහු තම් දරුවෙක් පියෙකුට 22
සේවයකරන්නාක්මෙන් ශුභාරංචියේ
වර්ධනය සඳහා මා සමග සේවයකළේය
යන ඔහුගේ ඔප්පුව නුඹලා දනිහුය.
එබැවින් මාගේ කාරණා කොයි 23
ආකාරවේද කියා මම දුටු කෙණෙහිම,
ඔහු එවන්ට බලාපොරොත්තුවෙමි. මටත් 24
නොබෝ කලකින් එන්ට ලැබේය කියා
ස්වාමීන්වහන්සේ තුළ විශ්වාසය ඇතුව
සිටිමි. එහෙත් මාගේ සහෝදරයාවූ, හවුල් 25
සේවකයෙක්වූ, හවුල් හේවායෙක්වූ,
නුඹලාගේ ප්‍රේරිතයෙක්ද මාගේ
වුවමනාවලට උපස්ථානකරන්නාදවූ
එපප්‍රොදිතස් නුඹලා වෙතට එවන්ට
ඕනෑයයි සිතුවෙමි. මක්නිසාද ඔහු නුඹලා 26
හැමදෙනාම දකින්ට බොහෝ ආශාවක්
ඇතුව, තමා ලෙඩින් සිටිය බව නුඹලා
ඇසූ බැවින් ඉතා කනගාටුවෙන්
සිටියේය. එසේය, මරණාසන්නවෙන 27
තරමට ඔහු ලෙඩින් සිටියේය. නුමුත්
දෙවියන්වහන්සේ ඔහුට කරුණාකළසේක;
ඔහුට පමණක් නොව සෝකය පිට
සෝකය මට නොපැමිණෙන පිණිස
මටත් කරුණාකළසේක. එබැවින් නුඹලා 28
ඔහු නැවත දැක ප්‍රීතිවෙන පිණිසත් මාගේ
සෝකයද අඩුවෙන පිණිසත් ඔහු වඩා
ඉක්මන්කොට එවීමි. එබැවින් ස්වාමීන්- 29

වහන්සේ තුළ සියලු ආකාර ප්‍රීතියෙන්
ඔහු පිළිගනිල්ලා; එබඳු අය ගරුකොට
30 සලකාපල්ලා. මක්නිසාද මට කළාවූ
තුඹලාගේ සේවයෙහි අඩුපාඩුව
පිරිමසන්ට ඔහු තමාගේ ජීවිතය
නොසලකා ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය
නිසා මරණාසන්නවූණේය.

## ප්‍රේරිත තැනගේ ජාතික අයිති-වාසිකම් ක්‍රිස්තුස්වහන්සේ නිසා නොසලකා හැරීම

3 ඉතින්, මාගේ සහෝදරයෙනි,
ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතිවෙයල්ලා.
එම කාරණා තුඹලාට ලියා එවීම මට
වෙහෙස නැත, තුඹලාගේ ප්‍රවේසම
2 පිණිසත් ඒක හොඳය. බල්ලන්ගෙන්
ප්‍රවේසම්වෙයල්ලා, නපුරු ක්‍රියාකාරයන්ගෙන්
ප්‍රවේසම්වෙයල්ලා. ඡේදනකරන්නන්ගෙන්
3 ප්‍රවේසම්වෙයල්ලා. මක්නිසාද චර්ම-
ඡේදිතයෝ නම් දෙවියන්වහන්සේගේ
ආත්මයාණන් කරණකොටගෙන
නමස්කාරකරන්නාවූ, ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේ තුළ පාරට්ටුකරගන්නාවූ,
මාංසය තුළ විශ්වාසයක් නැත්තාවූ අපිය.
4 ඕනෑ නම් මට මාංසය කෙරෙහි පවා
විශ්වාසය තබන්ට පුළුවන. වෙන යමෙක්
මාංසය කෙරෙහි තමාට විශ්වාසය
තබන්ට පුළුවනැයි සිතන්නේ නම්,
5 මට ඊට වඩා පුළුවන. අටවෙනිද
චර්මඡේදිතවූයෙමි, ඉශ්‍රායෙල් වංශයේ,
බෙන්යමින්ගේ ගෝත්‍රයේ කෙනෙක්මි,
හෙබ්‍රෙව්වරුන්ගෙන් හෙබ්‍රෙව්වෙක්මි;
ව්‍යවස්ථාව ගැන නම්, ඵරිසියෙක්මි;
6 ජ්වලිතකම ගැන නම්, සභාවට
පීඩාකෙළෙමි; ව්‍යවස්ථාවෙන් පැමිණෙන
ධර්මිෂ්ඨකම ගැන නම්, නිර්දෝෂව
7 සිටියෙමි. එසේවී තුමුත් මට ලාභව
තිබුණු යම් යම් දේම ක්‍රිස්තුස්වහන්සේ
නිසා අලාභයයි සිතීමට පැමිණියෙමි.
8 එසේය, මාගේ ස්වාමිවූ ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ ඇඳිනගැනීමේ උතුම්කම
නිසා සියල්ල අලාභයයි සලකමි.
උන්වහන්සේ නිසා සියලු දේ මට නැතිවී
ගියා පමණක් නොව; ඒවා කුණුයයි
සලකමි. එසේ කරන්නේ මම
ක්‍රිස්තුස්වහන්සේ ලබාගන්නා පිණිසත්,
ව්‍යවස්ථාවෙන් පැමිණෙන මාගේම 9
ධර්මිෂ්ඨකම නොව, ක්‍රිස්තුස්වහන්සේ
කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන,
ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගෙන්
පැමිණෙන ධර්මිෂ්ඨකම ඇතුව
ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින පිණිසත්,
යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට 10
පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ 11
උන්වහන්සේගේ නැවත-නැගිටීමේ
බලයත් උන්වහන්සේගේ දුක්වල
පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය.

## පසු නොබැස ඉදිරියට යන්ටද ඒ පිණිස මාංසික තෘෂ්ණා වලක්වාගන්ටද ඕනෑ බව

මා දැනටම ලබාගෙන සිටිනවාවත් 12
දැනටම සම්පූර්ණවී සිටිනවාවත් නොවේ.
තුමුත් යමක් පිණිස ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ මා අල්ලාගත්සේක්ද,
ඒක අල්ලාගන්ට වීර්යකරමින් මමත්
දුවගන යමි. සහෝදරයෙනි, මම තවමත් 13
අල්ලාගත්තෙමියි නොසිතමි. තුමුත් එකක්
කරමි, එනම්, පස්සෙන් තිබෙන දේ
මතකනැතිකොට, ඉස්සරහට තිබෙන
ඒවා දෙසම බලාගන යමින්, ක්‍රිස්තුස් 14
යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ
උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ
කරා දුවමි. එබැවින් අපෙන් යම් පමණ 15
දෙනෙක් සම්පූර්ණව සිටිද්ද, ඔව්හු ඒ
ආකාරයෙන් කල්පනාකරත්වා. තුඹලා
යම් කාරණයක් ගැන වෙන අභිප්‍රායක්
ඇත්තාහු නම්, ඒකත් දෙවියන්වහන්සේ
තුඹලාට එළිදරව්කරනවා ඇත. තුමූත් 16
අපි යම් ස්වභාවකට පැමිණ සිටිමුද, ඒ
ප්‍රකාරයට හැසිරෙමු.
සහෝදරයෙනි, එක්ව මා අනුව 17
යන්නෝ වෙයල්ලා. අප තුඹලාට
ආදර්ශයක්ව සිටින්නේ යම් සේද, එසේ
හැසිරෙන්නන් බලාගනිල්ලා. මක්නිසාද, 18
මා තුඹලාට බොහෝ වර කී ලෙසත්,
දැනුත් අඩමින් කියන ලෙසත්,
බොහෝදෙනෙක් ක්‍රිස්තුස්වහන්සේගේ

19 කුරුසියට සතුරෝව හැසිරෙති. ඔවුන්ගේ
කෙළවර විනාශයය, ඔවුන්ගේ දෙවියෝ
බඩය, ඔවුන්ගේ පාරට්ටුව නම් තමුන්ගේ
ලජ්ජාව ගැනය. ඔවුන් සලකන්නේ ලෝක
20 දේවල්ය. නුමුත් අපේ නාගරිකත්වය
ස්වර්ගයෙහිය; එතැනින් ගැලවුම්කාරයෙක්
වන ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
21 එනවා අපි බලාසිටිමුව. සියලු දේ පවා
තමන්ට යටත්කරන්ට පුළුවන්වූ බලය
ලෙස, උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර
තමන්වහන්සේගේ තේජසේ ශරීරයට
සමානවන පිණිස ඒවා වෙනස්කරනවා
ඇත.

## එක්සත්කම, ප්‍රීතිවීම, උතුම් ගුණ මෙනෙහිකිරීම යන මේවා ගැන අවවාද

4 එහෙයින්, මාගේ ප්‍රේමවන්තවූ, මා
ඉතා ඇලුම්වෙන්නාවූ සහෝදරයෙනි,
මාගේ ප්‍රීතියත් ඔටුන්නත්වූ මාගේ
ප්‍රේමවන්තයෙනි, මෙසේ ස්වාමීන්වහන්සේ
තුළ ස්ථිරව සිටපල්ලා.
2 ස්වාමීන්වහන්සේ තුළ එක්සිත්වෙන
මෙන් එවෝදියාගෙන් ඉල්ලමි,
3 සින්තිකීගෙන්ද ඉල්ලමි. එසේය, මේ
ස්ත්‍රීන්ට උපකාරකරන ලෙස සැබෑ හවුල්
වැඩකරන්නෙක්වූ නුඹෙනුත් ඉල්ලමි. ඔව්හු
ක්ලෙමෙන්ත් සහ මාගේ අනික්
හවුල් සේවකයන් ඇතුළුව මා සමග
ශුභාරංචියෙහි වැඩකළෝය, ඔවුන්ගේ
නාම ජීවන-පොතෙහි තිබේ.
4 ස්වාමීන්වහන්සේ තුළ නිතරම
ප්‍රීතිවෙයල්ලා. ප්‍රීතිවෙයල්ලායයි නැවතත්
5 කියමි. නුඹලාගේ ඉවසිලිවන්තකම
සියලු මනුෂ්‍යයන්ට දැනගන්ට ලැබේවා.
ස්වාමීන්වහන්සේ ළංව සිටිනසේක.
6 නුඹලා කිසිවක් ගැන කනගාටු
නොසිතා, සියල්ලෙහිදී ස්තුතිදීම
සමග යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද
නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට
7 දන්වාපල්ලා. එවිට කිසි නුවණකින්
දැනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ
සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂාකරනවා
ඇත.

ඉතින්, සහෝදරයෙනි, යම් පමණ දේ 8
සැබෑද, යම් පමණ දේ ගරුකටයුතුද,
යම් පමණ දේ සාධාරණද, යම් පමණ
දේ පිරිසිදුද, යම් පමණ දේ ආදරණීයද,
යම් පමණ දේ යහපත් කීර්තියක් ඇතිව
තිබේද, යම් ගුණයක්, යම් ප්‍රශංසාවක්
ඇද්ද, ඒ දේවල් මෙනෙහිකරපල්ලා.
නුඹලා ඉගෙනගත්තාවූ, පිළිගත්තාවූ, මා 9
තුළ තිබෙන බව ඇසුවාවූ, දුටුවාවූ
දේවලුත් කරපල්ලා. එවිට සමාදානයේ
දෙවියන්වහන්සේ නුඹලා සමග සිටිනවා
ඇත.

## පිලිප්පිවරුන්ගේ තුති පඬුරු ගැන ප්‍රේරිත තැනගේ ස්තුතිවන්තකම

මෙපමණ කාලයකට පසු මා ගැන 10
කල්පනාකිරීමට නුඹලා නැවත පිබිදුණු
බැවින් ස්වාමීන්වහන්සේ තුළ බොහෝ-
සෙයින් ප්‍රීතිවෙමි. ඒ ගැන නුඹලා
ඇත්තටම කල්පනාකළහුය, නුමුත්
ප්‍රස්තාවක් ලැබුණේ නැත. හිඟකමක් 11
ගැන මෙසේ කියනවා නොවේ. මක්නිසාද
මම මොන ස්වභාවක සිටිම් නුමුත්, ඊට
සතුටුවෙන්ට මම ඉගෙනගෙන සිටිමි.
පහත්ව සිටින්ට දනිමි, පූර්ණව සිටින්ටත් 12
දනිමි. සෑම සියලු කාරණාවලදී
තෘප්තියට පැමිණ සිටින්ට සහ
ක්ෂුධාවෙන් සිටින්ටත්, පූර්ණව සිටින්ට
සහ හිඟව සිටින්ටත් පුළුවන් රහස
ඉගෙනගෙන සිටිමි. මා බලවත්කරන්නාවූ 13
තැනන්වහන්සේ තුළ මට සියලු දේ
කරන්ට පුළුවන. එසේවී නුමුත් නුඹලා 14
මාගේ පීඩාවට හවුල්වුණා හොඳය.
පිලිප්පිවරුනි, ශුභාරංචියේ පටන්ගැන්මේදී 15
මා මකිදෝනියෙන් ගිය කල, නුඹලා
මිස වෙන කිසි සභාවක් දීමත් ලැබීමත්
යන කාරණය ගැන මට හවුල්නුවූ
බව නුඹලාත් දනිහුය. මක්නිසාද 16
තෙසලෝනිකයට පවා නුඹලා මාගේ
ඕනෑකම් ගැන වරක් දෙවරක් මට දීලා
එව්වහුය. මා තෑග්ග සොයනවා නොව, 17
නුඹලාගේ ගණනට වැඩිවන්නාවූ එල

18 සොයමි. තුමුත් මට සියල්ල ලැබී, පූර්ණව
සිටිමි. තුඹලා විසින් එවන ලද දේවල්
එපප්‍රොදිතස්ගෙන් ලැබ පිරී සිටිමි. ඒවා
දෙවියන්වහන්සේට මිහිරි සුවඳක්ව, ප්‍රියවූ
19 ප්‍රසන්නවූ පූජාවක්ව තිබේ. මාගේ
දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේ තුළ තමන්ගේ තේජස් සම්පතේ
ප්‍රකාරයට තුඹලාගේ සියලු හිඟකම්
20 සම්පූර්ණකරනසේක. ඉතින් අපගේ පියවූ
දෙවියන්වහන්සේට සදාකාලයටම ගෞරවය
වේවා. ආමෙන්.

## අවසාන ආචාරය

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ 21
ශුද්ධවන්තයන් සැමදෙනාට ආචාර-
කරපල්ලා. මා සමග සිටින සහෝදරයෝ
තුඹලාට ආචාරකරති. සියලු ශුද්ධ- 22
වන්තයෝද ප්‍රධානකොට කායිසර්ගේ
ගෙදර සිටින ශුද්ධවන්තයෝද තුඹලාට
ආචාර කරති.
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ 23
කරුණාව තුඹලාගේ ආත්මය සමග
වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් කොලොස්සිවරුන්ට ලියනලද පත්‍රය

## ආචාරකිරීම

1 දෙවියන්වහන්සේගේ කැමැත්ත
කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේගේ ප්‍රේරිතයෙක් වන පාවුල්ද
සහෝදරයා වන තිමෝතියස්ද විසින්,
2 ක්‍රිස්තුස්වහන්සේ තුළ කොලොස්සේ සිටින
ශුද්ධවන්තයන්වූ විශ්වාස සහෝදරයන්ට
ලියා එවන වග නම්: අපගේ පියවූ
දෙවියන්වහන්සේගෙන් කරුණාවත්
සමාදනයත් නුඹලාට වේවා.

## ස්තුතිදීම සහ ආත්මික වර්ධනය සඳහා යාච්ඤාව

3 ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි
නුඹලාගේ ඇදහීමත් සියලු ශුද්ධවන්තයන්
කෙරෙහි පවත්නා නුඹලාගේ ප්‍රේමයත්
ගැන අප ඇසූ බැවින්, ස්වර්ගයෙහි
නුඹලාටත් තබා තිබෙන්නාවූ
4 බලාපොරොත්තුව නිසා, අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ
දෙවියන්වහන්සේට අපි ස්තුතිකර,
5 නිතරම නුඹලා ගැන යාච්ඤාකරමුව. ඒ
බලාපොරොත්තුව ගැන ශුභාරංචියේ
සැබෑවූ වචනයෙන් නුඹලා පළමු
6 ඇසුවහුය. ඒ ශුභාරංචිය මුළු ලෝකයට
මෙන් නුඹලා වෙතටත් පැමිණ තිබේ;
නුඹලා එය අසා දෙවියන්වහන්සේගේ
කරුණාව සැබෑවෙන් දනගත් ද පටන්
ඒ නුඹලා අතරේ මෙන් මුළු ලෝකයෙහිත්
7 එල දරමින් වර්ධනයවන්නේය. එසේ
*අප උදෙසා ක්‍රිස්තුස්වහන්සේගේ
විශ්වාස සේවකයෙක්ව සිටින අපේ
ප්‍රේමවන්ත හවුල් වැඩකාරවූ එපප්‍රස්ගෙන්
නුඹලා ඉගෙනගත්තහුය. ඔහු ආත්මයාණන්- 8
වහන්සේ තුළ තිබෙන නුඹලාගේ ප්‍රේමයත්
අපට දන්නුවේය.
එබැවින් අපිත් ඒ ඇසූ ද පටන් නුඹලා 9
උදෙසා නොකඩවම යාච්ඤාකරමින්,
නුඹලා සියලු ආකාර ප්‍රඥාවද ආත්මික
නුවණද ලබන ලෙස උන්වහන්සේගේ
කැමැත්ත දනගැනීමෙන් පූර්ණවී, සියලු 10
යහපත් ක්‍රියාවලින් එලදරමින්ද, දෙවියන්-
වහන්සේ දනගැනීමෙහි වර්ධනය
වෙමින්ද, ප්‍රීතිය ඇතුව සියලු ආකාර 11
ස්ථිරකමටත් ඉවසිලිවන්තකමටත්
උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ
හැටියට සියලු ආකාර බලයෙන්
ශක්තිමත් වෙමින්ද, ආලෝකයේ සිටින 12
ශුද්ධවන්තයන්ගේ උරුමයෙන්
කොටසකට අප සුදුස්සන් කළාවූ
පියාණන්වහන්සේට ස්තුතිකරමින්ද,
නුඹලා ස්වාමීන්වහන්සේට ඔබිනලෙස
සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන
ලෙස ඉල්ලමුව.

## මැවිල්ලෙහි හා සභාවෙහි පුත්‍රයාණන්වහන්සේගේ උත්කෘෂ්ටකම හා සමගිකිරීමේ මෙහෙය

පියාණන්වහන්සේ අන්ධකාරයේ 13
බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ
පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප
පමුණුවාගත්සේක. උන්වහන්සේ තුළ 14
අපගේ මිදීම වන, පව්වලට කමාව අපට

*හෙවත්–නුඹලා.

15 තිබේ. උන්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන්-
වහන්සේගේ ස්වරූපයය, මුළු මැවිල්ලේ
16 කුලුඳුලාණෝය; මක්නිසාද සිංහාසන
වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම්
වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල
සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ
දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන
සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය;
සියලු දේ උන්වහන්සේ කරණකොට-
ගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ;
17 උන්වහන්සේ සියල්ලටම පළමුවෙන්
සිටිනසේක, සියල්ලද උන්වහන්සේ තුළ
18 පවතින්නේය. උන්වහන්සේ සභාව නමැති
ශරීරයට හිසව සිටිනසේක. උන්වහන්සේ
පටන්ගැන්මව මළවුන්ගෙන් කුලුඳුලාව
සිටිනසේක. එසේව සිටින්නේ උන්-
වහන්සේම සියල්ලට ප්‍රධානව සිටින
19 පිණිසය. මක්නිසාද උන්වහන්සේ තුළ මුළු
පූර්ණකම පැවතීමටත්, උන්වහන්සේගේ
කුරුසියේ ලෙයින් සමාදානය උපදවා,
20 උන්වහන්සේ කරණකොටගෙන සියලු
දේ, එනම් පොළොවෙහි තිබෙන දේවල්
වුවත් ස්වර්ගවල තිබෙන දේවල් වුවත්,
උන්වහන්සේ කරණකොටගෙන තමන්ට
සමගිකරගැනීමටත් පියාණන්වහන්සේ
21 ප්‍රසන්නවූසේක. පසුගිය කාලයේදී
අන්‍යයන්ව, තුඹලාගේ නපුරු ක්‍රියාවලින්
22 සිතින් සතුරන්ව සිටියාවූ තුඹලා, ශුද්ධවූ
නොකැළැල්වූ නිදොස්වූ තැනැත්තන් කොට
තමන්වහන්සේ ඉදිරියෙහි ඔප්පුකරගන්න
පිණිස, උන්වහන්සේගේ මාංසමයවූ
ශරීරයෙහි මරණය කරණකොටගෙන
23 සමගිකරගත්සේක. තුඹලා ශුභාරංචියේ
බලාපොරොත්තුවෙන් අහක් නොවී,
ඇදහිල්ලේ පිහිට ස්ථිරව සිටින්නහු නම්,
එසේ වන්නේය. ඒ ශුභාරංචිය තුඹලා
ඇසුවහුය. එය අහසින් යට මුළු
මැවිල්ලෙහි ප්‍රකාශවුණේය. පාවුල් නම්
මම ඒකේ සේවකයෙක් කරනු ලැබීමි.

## ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය සම්බන්ධ ප්‍රේරිත තැනගේ දුක් විඳීම සහ සේවය

24 දැන් මම තුඹලා උදෙසා විඳින දුක්
ගැන ප්‍රීතිව, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය
වන සභාව උදෙසා, උන්වහන්සේගේ
දුක්වලින් අඩුව තිබෙන ඒවා මාගේ
මාංසයෙන් සම්පූර්ණකරමි. පූර්ව 25
කාලවලද පරම්පරාවලද පටන්
සැඟවී තිබී, දැන් දෙවියන්වහන්සේගේ
ශුද්ධවන්තයන්ට ප්‍රකාශවුණාවූ රහස වන,
දෙවියන්වහන්සේගේ වචනය සම්පූර්ණ 26
කිරීමට, තුඹලා උදෙසා මට දෙනලද
උන්වහන්සේගේ ගබඩාකාරකමේ
හැටියට, සභාවේ සේවකයෙක් කරනු
ලැබීමි. අන්‍යජාතීන් අතරේ තිබෙන මේ 27
රහසේ තේජස් සම්පත කිමෙක්ද කියා
දෙවියන්වහන්සේ ශුද්ධවන්තයන්ට
දන්වන්ට කැමතිවූසේක; ඒ වනාහි
තේජසේ බලාපොරොත්තුව වන තුඹලා
තුළ සිටින ක්‍රිස්තුස්වහන්සේය. අපි නම් 28
ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන්
සම්පූර්ණකොට ඔප්පුකරන පිණිස සියලු
මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද සියලු
මනුෂ්‍යයන්ට සියලු ආකාර ප්‍රඥාවෙන්
උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශකරමුව.
ඒ ඇර, මා තුළ බලවත් ලෙස කෙරෙන 29
උන්වහන්සේගේ ක්‍රියා කිරීමේ ප්‍රකාරයට
ඒ සඳහා මම පොරඅල්ලමින් වීර්යකරමි.

## රැවටිලි වචන, මනුෂ්‍යයන්ගේ නියෝග, දේවදූත නමස්කාරය යනාදි දේ ගැන පරෙස්සම්වීම

2

එසේය, තුඹලා උදෙසාත්
ලවොදිකයෙහි සිටින්නන් උදෙසාත්
මාංසාකාරයෙන් මාගේ මුහුණ නුදුටු
සියල්ලන් උදෙසාත් කොපමණ මහත්
පොරඇල්ලීමක් මට තිබේද කියා තුඹලා
දැනගන්නවාට කැමැත්තෙමි. ඒ වනාහි 2
ඔවුන් ප්‍රේමයෙහි සම්බන්ධවී, තේරුම්
ගැනීමේ සම්පූර්ණ සහතිකය නැමති
සියලු සම්පත භුක්තිවිඳිමින්, ඔවුන්ගේ
සිත් සනසනු ලබන පිණිසත්,
දෙවියන්වහන්සේගේ රහස වන ක්‍රිස්තුස්-
වහන්සේ දැනගන්නා පිණිසත්ය. ඒ 3
තැනන්වහන්සේ තුළ ප්‍රඥාවෙන්
දැනගැන්මෙත් සියලු වස්තු නිධානකර
ඇත්තේමය. මෙසේ මා කියන්නේ සිත් 4
ප්‍රසන්න කරන කථාවෙන් කිසිවෙකු

විසින් නුඹලා මුළා නොකරන පිණිසය.
5 මක්නිසාද මම මාංසාකාරයෙන් ඈත්ව
සිටින නුමුත්, ආත්මයෙන් නුඹලා සමග
සිට, නුඹලාගේ පිළිවෙළත් ක්‍රිස්තුස්-
වහන්සේ කෙරෙහි තිබෙන නුඹලාගේ
ඇදහිල්ලේ ස්ථිරකමත් බලමින් ප්‍රීතිවෙමි.
6 එබැවින් නුඹලා ස්වාමිවූ ක්‍රිස්තුස්
යේසුස්වහන්සේව පිළිගත් ලෙස,
උන්වහන්සේ තුළ මුල්ඇද ගොඩනගන
7 ලදුව, නුඹලාට ඉගැන්නූ ලෙසම
නුඹලාගේ ඇදහිල්ලෙහි පිහිටා, බොහෝ-
සෙයින් ස්තුතිදෙමින් උන්වහන්සේ තුළ
හැසිරියල්ලා.
8 ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ,
මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝගවලත්
ලෝකයේ ගුරුකම්වලත් ප්‍රකාරයට
තිබෙන පණ්ඩිතකමද හිස්වූ රැවටිලි-
කාරකමද කරණකොටගෙන නුඹලා
කොල්ලයක් කරගන්න කිසිවෙක්
නොසිටින හැටියට බලාගනිල්ලා.
9 මක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ
සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන්
10 වාසයකරන්නේය. සියලු අධිපතිකමේද
බලයේද හිස වන උන්වහන්සේ තුළ
11 නුඹලා පූර්ණව සිටින්නහුය. අතින්
නොකළ චර්මඡේද්‍යයක් වන මාංසයේ
ශරීරය පහකිරීම නැමති ක්‍රිස්තුස්-
වහන්සේගේ චර්මඡේද්‍යයෙන් උන්වහන්සේ
තුළ නුඹලා චර්මඡේද්‍ය කරනු ලැබුවහුය.
12 නුඹලා උන්වහන්සේ සමග *බව්තීස්-
මයෙහි තැන්පත්කරනු ලැබ, උන්වහන්සේ
මළවුන්ගෙන් නැගිටෙවූවාවූ දෙවියන්-
වහන්සේගේ ක්‍රියාකිරීම කෙරෙහි ඇදහීම
කරණකොටගෙන, උන්වහන්සේ සමග
13 නැගුටුවනු ලැබුවහුය. නුඹලාගේ
වරදවලද මාංසයේ අචර්මඡේද්‍යයෙහිද
මැරී සිටියාවූ නුඹලා, උන්වහන්සේ සමග
ජීවත්කරවූසේක. එසේය, උන්වහන්සේ
අපේ සියලු වරද අපට කමාකළසේක;
14 අපට විරුද්ධව, අපට එදිරිව තිබුණාවූ
නියෝගවල ලියවිල්ල මකාදමා, ඒක
කුරුසියෙහි ඇණගසා අහක්කළසේක.
15 උන්වහන්සේ නමන් කෙරෙන් අධිපතීන්ද
බලයලත්තන්ද පහකොට, ප්‍රසිද්ධයෙන්
ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන
ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශකළසේක.
එබැවින් කෑම ගැනවත් බීම ගැනවත් 16
මංගල්‍ය දවසක් ගැනවත් අමාවක
දවසක් ගැනවත් සබත් දවස් ගැනවත්
නුඹලා විනිශ්වයකරන්ට කිසිවෙකුට ඉඩ
නාරිල්ලා. ඒවා පැමිණෙන්ට තිබෙන 17
දේවල ඡායාවක්ය; නුමුත් සිරුර
ක්‍රිස්තුස්වහන්සේගේය. පහත්වීමටද 18
දේවදූතයන්ට නමස්කාරකිරීමටද
කැමතිවීමෙන් දිනුම නුඹලාගෙන්
පහකරන්ට කිසිවෙකුට ඉඩ නාරිල්ලා.
එබඳු තැනැත්තා තමා දුටු දේවල
හැසිරෙමින්, තමාගේ මාංසික බුද්ධියෙන්
නිරර්ථකලෙස උඩඟුවී, මුළු ශරීරයට 19
පුරුක් සහ නහර කරණකොටගෙන
උපකාර කොට, එය සම්බන්ධකර
දෙවියන්වහන්සේගේ වර්ධනයෙන්
වර්ධනයකරන්නාවූ හිසට නොබැඳී
සිටින්නේය.
නුඹලා ලෝකයේ ගුරුකම් කෙරෙන් 20
වෙන්ව ක්‍රිස්තුස්වහන්සේ සමග
මැරුණහුනම්, ලෝකයෙහි ජීවත්වන්නාක්
මෙන් මනුෂ්‍යයන්ගේ ශික්ෂා හා ධර්ම
අනුව: අල්ලන්ටවත් රසබලන්ටවත් 21
අතගසන්ටවත් එපාය යන නියෝගවලට
යටත්වන්නේ මක්නිසාද? මේ සියල්ල 22
පාවිච්චිකිරීමෙන් දිරායන්ට තිබේ. ඒ 23
දේවල් වනාහි කැමතිලෙස නමස්කාර
කිරීමෙන්ද පහත්වීමෙන්ද ශරීරයට
හිංසාකරගැනීමෙන්ද ඥානවන්තකමක්
මෙන් පෙනේ; නුමුත් මාංසයේ තෘෂ්ණා
වැලැක්වීම සඳහා ඒවායේ කිසි
වටිනාකමක් නැත.

## ක්‍රිස්තුස්වහන්සේ සමග නැගුටුවනු ලැබීමෙන්වූ අලුත් මනුෂ්‍යයාගේ ගතිගුණාංග

3 ඉදින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ
සමග නැගුටුවනලද්දහු නම් උසස්
තැන්හි තිබෙන දේවල් සොයාපල්ලා.
එහි ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ
දකුණු පැත්තේ වැඩහිඳිනසේක.

*අවගාහනයෙහි.

2 පොළොවේ තිබෙන දේ නොව
උසස්තැන්හි තිබෙන දේම සලකාපල්ලා.
3 මක්නිසාද තුඹලා මළහුය, තුඹලාගේ
ජීවනය ක්‍රිස්තුස්වහන්සේ සමග
4 දෙවියන්වහන්සේ තුළ සඟවා තිබේ. අපේ
ජීවනය වන ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශවන
කල, තුඹලාත් උන්වහන්සේ සමග
තේජසින් ප්‍රකාශවන්නහුය.
5 එබැවින් පොළොවේ තිබෙන තුඹලාගේ
අවයවයන්, එනම් වේශ්‍යාකමත්
අපිරිසිදුකමත් කාමරාගයත් නපුරු
තෘෂ්ණාවත් රූපවැඳීමවූ තණ්හාවත්
6 නසාපල්ලා. මේ දේවල් නිසා දෙවියන්-
වහන්සේගේ උදහස අකීකරුකමේ පුත්‍රයන්
7 පිටට පැමිණෙන්නේය. තුඹලාත් පසුගිය
කාලයෙහි ඒ දේවල ජීවත්වූ කල
8 ඒවායෙහි හැසුරුණහුය. නුමුත් දැන්
තුඹලා ඒ සියල්ල—කෝපය, උදහස,
ක්‍රෝධය, අපහාසය, නින්දකිරීම,
තුඹලාගේ මුඛයෙන් නික්මෙන කැත
9 කථාව—පහකරපල්ලා. එකිනෙකාට
බොරු නොකියල්ලා. මක්නිසාද තුඹලා
පරණ මනුෂ්‍යයා ඔහුගේ ක්‍රියා සමග
10 අහකදමා, අලුත් මනුෂ්‍යයාව මැවූ
තැනත්වහන්සේගේ රූපය ලෙස
සම්පූර්ණ දැනගැන්ම සඳහා අලුත්කරනු
ලබන ඒ අලුත් මනුෂ්‍යයාව පැළඳගත්තහුය.
11 එහි ග්‍රීකයෙක්වත් යුදෙව්වෙක්වත්
චර්මඡේද්‍යයෙක්වත් අචර්මඡේද්‍යයෙක්වත්
ම්ලේච්ඡයෙක්වත් ස්කිතියෙක්වත්
දසයෙක්වත් නිර්දසයෙක්වත් සිටිනවා
නොව, ක්‍රිස්තුස්වහන්සේ සියල්ලව,
සියල්ලත් තුළ සිටිනසේක.
12 එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ
ප්‍රේමවන්තවූ තෝරාගත්තවුන් මෙන්
දයාබර හිතක්ද ගුණවන්තකමක්ද
යටත්කමද මෘදුකමද ඉවසිලිවන්තකමද
13 පැළඳගෙන, එකිනෙකා ගැන ඉවසමින්,
යමෙකුට විරුද්ධව යමෙකුගේ
කාරණයක් ඇත්නම් එකිනෙකාට
කමාවෙයල්ලා; ස්වාමීන්වහන්සේ තුඹලාට
කමාවූණාක්මෙන් තුඹලාත් කරපල්ලා.
14 මේ සියල්ලට උඩින් ප්‍රේමය නැමති
සම්පූර්ණකමේ බැම්ම බැඳගනිල්ලා.
15 ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය තුඹලාගේ
සිත්වල ආණ්ඩුකෙරේවා. ඒ පිණිස
තුඹලා එක ශරීරයක්ව සිටීමට
කැඳවාගනු ලැබුවහුය; ස්තුතිවන්තවද
සිටපල්ලා. ක්‍රිස්තුස්වහන්සේගේ වචනය 16
තුඹලා තුළ සියලු ප්‍රඥාවෙන් සමෘද්ධව
වාසයකෙරේවා. තුඹලා ගීතිකාවලින්ද
කවිවලින්ද ආත්මික ගීවලින්ද එකිනෙකාට
උගන්වමින්, දැනමුතුකම් දෙමින්,
තුඹලාගේ සිත්වල අනුග්‍රහය ඇතුව
දෙවියන්වහන්සේට ගීතිකාකරපල්ලා.
තවද තුඹලා වචනයෙන් හෝ ක්‍රියාවෙන් 17
හෝ මොකක් කරනත්, සියල්ලම
ස්වාමිවූ යේසුස්වහන්සේගේ නාමයෙන්
කරමින්, උන්වහන්සේ කරණකොටගෙන
පියවූ දෙවියන්වහන්සේට ස්තුතිකරපල්ලා.

## ක්‍රිස්තියානි පවුලේ එකිනෙකාගේ යුතුකම

හාර්යාවෙනි. ස්වාමීන්වහන්සේ තුළ 18
සුදුසුව තිබෙන ලෙස, තුඹලාගේ
පුරුෂයන්ට යටත්ව සිටපල්ලා.
පුරුෂයෙනි, තුඹලාගේ හාර්යාවන් 19
කෙරෙහි කර්කශ නොවී ඔවුන්ට
ප්‍රේමකරපල්ලා. දරුවෙනි, සියලු 20
කාරණාවලදී මවුපියන්ට කීකරුවෙයල්ලා,
මක්නිසාද ඒක ස්වාමීන්වහන්සේට
ප්‍රසන්නය. පියවරුනි, තුඹලාගේ දරුවන් 21
කල නොකිරෙන පිණිස ඔවුන් කෝප
නොකරල්ලා. දසයෙනි, මනුෂ්‍යයන් 22
සතුටුකරන්නන් මෙන් පෙනීමට නොව
ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතුව
හිතේ අවංකකමෙන්, මාංසාකාරයෙන්
තුඹලාගේ ස්වාමිවරුන්ව සිටින්නන්ට
සියල්ලෙහිදී කීකරුවෙයල්ලා. තුඹලාට 23
තුඹලාගේ විපාකයවූ උරුමය ස්වාමීන්-
වහන්සේගෙන් ලැබෙන බව දැන, තුඹලා 24
කරන කොයි දෙයක් නුමුත් මනුෂ්‍යයන්ට
නොව ස්වාමීන්වහන්සේට මෙන් සිතෙන්
කරපල්ලා. තුඹලා සේවයකරන්නේ
ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේටය. මක්නිසාද 25
අයුක්තිය කරන්නා තමා කළාවූ
අයුක්තියේ එල ලබන්නේය. තරාතිරම්
බැලීමක් නැත්තේය. ස්වාමිවරුනි,
ස්වර්ගයෙහි තුඹලාටත් ස්වාමි 4

කෙනෙක් සිටින බව දැන, නුඹලාගේ
දසයන්ට ධර්මිෂ්ඨවූ සාධාරණවූ දේ
දීපල්ලා.

## යාච්ඤා කිරීම හා ඥානවන්තව ක්‍රියාකිරීම ගැන අවවාද

2 ස්තුතිදීමෙන් යුක්තව යාච්ඤාවෙහි
අවදිව සිට, නොකඩව එහි පැවතියල්ලා;
3 තවද මා විසින් කථාකළයුතුව තිබෙන
අන්දමට ක්‍රිස්තුස්වහන්සේගේ රහස
4 එළිදරව්කරන පිණිස, එය කියාදීමට
දෙවියන්වහන්සේ අපට වචනයේ දෙරක්
අරින ලෙස අප උදෙසාත් යාච්ඤාකරපල්ලා.
ඒ රහස නිසා මම බැඳුම් ලැබ සිටිමි.
5 නුඹලා *ප්‍රස්තාව අල්ලාගනිමින්,
පිටත සිටින්නන් කෙරෙහි ප්‍රඥාවෙන්
6 ක්‍රියාකරපල්ලා. නුඹලා එකිනෙකාට
උත්තරදිය යුතු කෙසේදැයි දැනගන්නා
පිණිස, නුඹලාගේ කථාව නිතරම
ලුණෙන් රසවත්ව, අනුග්‍රහයෙන් යුක්තව
තිබේවා.

## ප්‍රේරිත තැනගේ පණිවිඩකාරයෝ. ආචාරකිරීම හා අවසානය

7 ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්ත
සහෝදරයාද විශ්වාස සේවකයාද හවුල්
දසයාද වූ තුකීකස් මාගේ සියලු කාරණා
8 නුඹලාට දන්වනවා ඇත. ඒ පිණිසම
එනම් නුඹලා අපේ කාරණා දැනගන්න
පිණිසත්, ඔහු නුඹලාගේ සිත් සනසන
9 පිණිසත්, නුඹලාගෙන් එක්කෙනෙක් වන
විශ්වාස ප්‍රේමවන්ත සහෝදරයාවූ
ඕනේසිමස් සමග ඔහු නුඹලා ළඟට
එවමි. මෙහි සියලු කාරණා ඔවුන්
නුඹලාට දන්වනවා ඇත.

*එනම්—කාලය ඉතා හොඳට පාවිච්චි කරමින්.

මාගේ හවුල් හිරකාරයාවූ අරිස්තාර්කස්ද 10
බාර්ණබස්ගේ ඥාති සහෝදරයෙක්වූ
මාර්ක්ද යුස්තස් කියන යේසුස්ද
නුඹලාට ආචාරකරති. මාර්ක් ගැන
නුඹලා අණ ලැබුවහුය. ඔහු නුඹලා
වෙතට ආවොත් පිළිගනිල්ලා.
චර්මඡේදිතයන්ගෙන් මොව්හු පමණක් 11
මට සැනසිල්ලක් වූවෝය, මොව්හු
දෙවියන්වහන්සේගේ රාජ්‍යය උදෙසා
මාගේ හවුල් සේවකයෝවද සිටිති.
නුඹලාගෙන් එක්කෙනෙක්වූ, ක්‍රිස්තුස් 12
යේසුස්වහන්සේගේ දසයෙක්වූ එපප්‍රස්
නුඹලාට ආචාරකරන්නේය; නුඹලා
දෙවියන්වහන්සේගේ මුළු කැමැත්තෙහි
සම්පූර්ණව නිසැකව සිටින පිණිස ඔහු
යාච්ඤාවලින් නුඹලා ගැන නිතරම
වීර්යකරන්නේය. මක්නිසාද නුඹලා 13
උදෙසාත් ලවොදිකයෙහිද හියරපොලිසෙහිද
සිටින්නන් උදෙසාත් ඔහු බොහෝ
වෙහෙසෙන බවට මම සාක්ෂිදරමි. ලූක් 14
නම් ප්‍රේමවන්ත වෛද්‍යාචාරී තැනද
දේමස්ද නුඹලාට ආචාරකරති.
ලවොදිකයෙහි සිටින සහෝදරයන්ටත් 15
නිම්පස්ටත් ඔවුන්ගේ ගෙදර තිබෙන
සභාවටත් ආචාරකරපල්ලා. මේ ලියුම 16
නුඹලා අතරෙහි කියෙවූ පසු, මෙක
ලවොදිකයන්ගේ සභාවෙහිද කියවනු
ලබන්ට සලස්වාපල්ලා; ලවොදිකයෙන්
ලැබෙන ලියුම නුඹලාත් කියවන්ට
බලාගනිල්ලා. ස්වාමීන්වහන්සේ තුළ නුඹ 17
ලැබූ සේවය සම්පූර්ණකරන පිණිස ඒ
ගැන බලාගනින්නැයි අර්කිපස්ට
කියාපල්ලා.
පාවුල් නම්වූ මාගේම අතින් ලියන 18
ආචාරයය. මාගේ බැඳුම් සිහිකරපල්ලා.
අනුග්‍රහය නුඹලා සමග වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් තෙසලෝනිකවරුන්ට ලියනලද පළමුවෙනි පත්‍රය

### ආචාරය. ඔවුන්ගේ ඇදහිල්ල හා එහි ආනුභාවය ගැන ස්තුතිදීම

1 පාවුල්ද සිල්වානස්ද තිමෝතියස්ද
යන අප විසින් පියවූ දෙවියන්වහන්සේ
සහ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
තුළ තිබෙන තෙසලෝනිකවරුන්ගේ
සභාවට ලියා එවන වගනම්: තුඹලාට
අනුග්‍රහයත් සමාදානයත් වේවා.
2 අපගේ පියවූ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි තුඹලාගේ ඇදහිල්ලේ ක්‍රියාවද
ප්‍රේමයේ වීර්යයද අපේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබෙන
බලාපොරොත්තුවේ ඉවසීමද අපි
3 නොකඩව සිහිකරමින්, අපේ යාච්ඤාවලදී
තුඹලා ගැන මතක්කරමින්, තුඹලා
සියල්ලන් ගැන සැමවේලේම
4 දෙවියන්වහන්සේට ස්තුතිකරමුව. එසේය,
දෙවියන්වහන්සේ ප්‍රේමකරන්නාවූ
සහෝදරයෙනි, උන්වහන්සේ තුඹලා
5 තෝරාගත් බව අපි දනිමුව. මක්නිසාද
අපේ ශුභාරංචිය තුඹලා වෙතට
පැමුණුණේ වචනයෙන් පමණක් නොව
බලයත් ශුද්ධාත්මයත් බොහෝ
නිසැකකමත් ඇතුවය. එසේය, තුඹලා
නිසා අපි තුඹලා අතරෙහි කොයි
ආකාර අය වීමුදැයි තුඹලා දන්නහුය.
6 තුඹලාද බොහෝ පීඩාවෙන් යුක්තව
ශුද්ධාත්මයාණන්ගේ ප්‍රීතියෙන් වචනය
පිළිගැනීමෙන් අපද ස්වාමීන්වහන්සේද
7 අනුවයන්නෝ වූහ. මෙසේ තුඹලා
මකිදෝනියෙහි සහ අකායෙහි සිටින
සියලු ඇදහිලිවන්තයන්ට ආදර්ශවූණුහුය.
8 මක්නිසාද තුඹලා වෙතින් ස්වාමීන්-
වහන්සේගේ වචනයේ හඬ මකිදෝනියෙහිත්
අකායෙහිත් පැතිර ගියා පමණක් නොව
අප විසින් කිසිවක් කියන්ට ඕනෑ
නොකරන හැටියට දෙවියන්වහන්සේ
කෙරෙහි තිබෙන තුඹලාගේ ඇදහිල්ල
සෑම තැනම ප්‍රකාශවිය. එසේ තුඹලා 9
වෙතට අපේ පැමිණීම කොයි ආකාරව
තිබුණේද කියාත් තුඹලා ජීවමානවූ
සැබෑවූ දෙවියන්වහන්සේට මෙහෙකරන
පිණිසද, උන්වහන්සේ විසින් මළවුන්ගෙන්
නැඟුටුවනලද්දවූ, පැමිණෙන උදහසින් 10
අප ගළවන්නාවූ තමන්ගේ පුත්‍රවූ
යේසුස්වහන්සේ ස්වර්ගයෙන් එනවා
බලාසිටින පිණිසද, තුඹලා දේවතාරූප
කෙරෙන් දෙවියන්වහන්සේ වෙතට
හැරුණ හැටිත් ඔව්හුම දන්වති.

### ප්‍රේරිත තැන ඔවුන් අතර කල් යැවූ අන්දම. තමාගේ මෙහෙය ගැන කරුණු කියා පෑම

2 මක්නිසාද, සහෝදරයෙනි, තුඹලා
වෙතට අපේ පැමිණීම නිෂ්ඵලවී
නැති බව තුඹලාම දන්නහුය. තුඹලා 2
දන්න හැටියට අපි ප්‍රථමකොට
පිලිප්පියේදී දුක්ද නිග්‍රහද ලැබූ නුමුත්,
මහත් පොරඇල්ලීමක් ඇතුව දෙවියන්-
වහන්සේගේ ශුභාරංචිය තුඹලාට
කියාදෙන්ට අපගේ දෙවියන්වහන්සේ
තුළ නිර්භීතවූණෙමුව. මක්නිසාද 3
අපේ අනුශාසනාව මුළාවෙන්වත්
අපවිත්‍රකමින්වත් වංචාවෙන් යුක්තවවත්
නොවේය. නුමුත් ශුභාරංචිය භාරගැනීමට 4

අපි සුදුස්සෝයයි දෙවියන්වහන්සේ අප
ඒත්තුගත් ප්‍රකාරයටම, මනුෂ්‍යයන් නොව
අපේ සිත් විමසන දෙවියන්වහන්සේව
සතුටුකරන ලෙස කථාකරමුව.
5 මක්නිසාද තුඹලා දන්නා හැටියට අප
විසින් කිසිකලක ඉච්චා වචනවත්
තණ්හාවේ උපායක්වත් ව්‍යවහාරකළේ
6 නැත–දෙවියන්වහන්සේ සාක්ෂිය. අප
ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන් හැටියට
තුඹලාට බරක්වෙන්ට අපට පුළුවන්කම
තිබුණු නුමුත්, තුඹලාගෙන්වත්
අන්‍යයන්ගෙන්වත් මනුෂ්‍ය ගෞරවය
7 නොසෙවුවෙමුව. එසේ නොව, කිරිමවක්
ඇගේම දරුවන් පෝෂණයකරන්නාක්-
මෙන්, තුඹලා අතරෙහි අපි
8 මොළොක් ගුණයෙන් සිටියෙමුව. එලෙස
අපි තුඹලාට ප්‍රේමාන්විත ඇලුම්කමකින්
යුක්තව සිටිය බැවින්, දෙවියන්වහන්සේගේ
ශුභාරංචිය පමණක් නොව තුඹලා අපට
ඉතා ප්‍රියවූ නිසා අපේම ප්‍රාණත්
තුඹලාට දෙන්ට සතුටුව සිටියෙමුව.
9 මක්නිසාද, සහෝදරයෙනි, අපේ වීර්යයත්
වෙහෙසත් තුඹලාට මතක තිබේ. අපි
තුඹලාගෙන් කිසිවෙකුට බර නොවන
පිණිස රෑ දවල් වැඩකරමින්, දෙවියන්-
වහන්සේගේ ශුභාරංචිය තුඹලාට
10 දේශනාකෙළෙමුව. අදහන්නාවූ තුඹලා
අතරෙහි අපි කොපමණ ශුද්ධව
ධර්මිෂ්ඨව නිදෝස්ව හැසුරුණෙමුද
කියා තුඹලාත් දෙවියන්වහන්සේත්
11 සාක්ෂිකාරයෝය. එසේය, තමන්-
වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත්
තුඹලා කැඳවන දෙවියන්වහන්සේට
ඔබිනලෙස තුඹලා හැසිරෙන හැටියට,
12 පියෙකු තමාගේ දරුවන්ට මෙන්, අප
විසින් තුඹලාට අවවාදකරමින්,
ධෛර්යදෙමින්, අණදෙමින්, තුඹලා එක්
එක්කෙනාට ක්‍රියාකළ හැටි තුඹලා
දනිහුය.

## පීඩා විඳින්ට සිද්ධවීම

13 එසේහෙයින් තුඹලා පණිවිඩයේ
වචනය, එනම් දෙවියන්වහන්සේගේ
වචනය අපෙන් ලැබූ කල, තුඹලා
පිළිගත්තේ මනුෂ්‍යයන්ගේ වචනය නොව
ඇත්තෙන්ම දෙවියන්වහන්සේගේ
වචනයව තිබෙන්නාවූ, අදහන තුඹලා
තුළ ක්‍රියාද කරන්නාවූ වචනය බැවින්,
අපිත් නොකඩව දෙවියන්වහන්සේට
ස්තුතිකරමුව. මක්නිසාද, සහෝදරයෙනි, 14
තුඹලා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
යුදයෙහි තිබෙන දෙවියන්වහන්සේගේ
සභාවන් අනුවයන්නෝවී, ඔවුන්
යුදෙව්වරුන්ගෙන් වින්ද දේවල්ම
තුඹලාත් තුඹලාගේම රටවැසියන්ගෙන්
වින්දහුය. ඒ යුදෙව්වරු වනාහි ස්වාමිවූ 15
යේසුස්වහන්සේද අනාගතවක්තෘවරුන්ද
මැරුවෝය, අපත් පන්නාදැම්මෝය; ඔව්හු
දෙවියන්වහන්සේ ප්‍රසන්න නොකරති,
සියලු මනුෂ්‍යයන්ටද විරුද්ධව සිටිති;
අන්‍යජාතීන් ගැළවෙන පිණිස ඔවුන්ට 16
කථාකිරීම අපට තහනම්කරති. මෙසේ
ඔව්හු නිතරම තමුන්ගේ පව් සම්පූර්ණ
කරති. උදහස නීන්දුවටම ඔවුන් කෙරෙහි
පැමිණ තිබේ.

## ක්‍රිස්තියානි සහෝදරයන් ගැන ප්‍රේරිත තැනගේ ආශාව

නුමුත් සහෝදරයෙනි, අපි හිතෙන් 17
නොව පෙනීමෙන් තුඹලා වෙතින් ස්වල්ප
කාලයකට අහක්ව සිටිය කල, තුඹලාගේ
මුහුණ දකින්ට මහත් ආශාවෙන්
බොහෝ උත්සාහකළෙමුව. මක්නිසාද 18
අපි, එනම් පාවුල් යන මම, වරක්
දෙවරක් තුඹලා වෙතට එන්ට කැමතිව
සිටියෙමි; නුමුත් සාතන් අපට
බාධාකළේය. අපගේ බලාපොරොත්තුවත් 19
ප්‍රීතියත් පාරට්ටුවේ ඔටුන්නත් කිමෙක්ද?
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ ඊමේදී
උන්වහන්සේ ඉදිරියෙහි තුඹලාම
නොවේද? එසේය, තුඹලා අපේ 20
ගෞරවයත් අපේ ප්‍රීතියත්ය.

## තිමෝතියස් යැවීම. ඔහු ගෙනා යහපත් ආරංචි

3 එහෙයින්, අපට තවත් ඉවසාගන්ට
නොහැකිවූ කල, අතීනසෙහි තනියම
අත්හරිනු ලැබීමට අපි සතුටුවී, මේ 2
දුක්වලින් කිසිවෙක් චංචල නොවන
පිණිස, තුඹලා ස්ථිරකිරීමටත් තුඹලාගේ

ඇදහිල්ල ගැන අවවාද කිරීමටත්,
අපේ සහෝදරයාද ක්‍රිස්තුස්වහන්සේගේ
ශුභාරංචියෙහි දෙවියන්වහන්සේගේ
සේවකයාද වූ තිමෝතියස් එව්වෙමුව.
3 මක්නිසාද අප දුක් විඳීමට නියමව
4 තිබෙන බව නුඹලා දනිහුය. මක්නිසාද
අප දුක් විඳින්ට සිටින බව, නුඹලා
සමග සිටියදී කලින් නුඹලාට කීවෙමුව;
එලෙසම සිද්ධවුණු බව නුඹලා දන්නහුය.
5 මේ නිසා මටත් තවත් ඉවසාගන්ට
නොහැකිව, පරීක්ෂකයා යම් අන්දමකින්
නුඹලාව පරීක්ෂා කිරීමෙන් අපේ වීර්යය
හිස්වුණාදෝ කියා නුඹලාගේ ඇදහිල්ල
6 ගැන දනගන්නා පිණිස එව්මි. දැන්
තිමෝතියස් නුඹලා වෙතින් අප ළඟට
ඇවිත්, නුඹලාගේ ඇදහිල්ලත් ප්‍රේමයත්
නිතරම නුඹලා අප හොඳකාර
සිහිපත්කරමින්, අප නුඹලා දකින්ට
ආශාවෙන් සිටින්නාක්මෙන්ම අප
දකින්ට නුඹලාත් ආශාවෙන් සිටින බවත්
යන යහපත් ආරංචි අපට දන්වූ කල,
7 සහෝදරයෙනි, අපේ සියලු අමාරුවලදීත්
පීඩාවලදීත් නුඹලාගේ ඇදහිල්ල නිසා
නුඹලා සම්බන්ධව සැනසීම ලැබීමුව.
8 මක්නිසාද නුඹලා ස්වාමීන්වහන්සේ තුළ
ස්ථිරව සිටින්නහු නම් අපි ජීවත්වමුව.
9 මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි නුඹලා සඳහා ප්‍රීතිවන
සියලු ප්‍රීතිය නිසා නුඹලා ගැන
දෙවියන්වහන්සේට මොන ස්තුතියක්
10 දෙන්ට අපට පුළුවන්ද? නුඹලාගේ මුහුණ
දකින පිණිසද නුඹලාගේ ඇදහිල්ලේ
අඩුකම් සම්පූර්ණකරන පිණිසද අපි රෑ
දවල් ඉතා අධිකලෙස යාච්ඤාකරමුව.
11 ඉතින් අපගේ පියවූ දෙවියන්-
වහන්සේමද අපගේ ස්වාමිවූ යේසුස්-
වහන්සේද නුඹලා වෙතට එන්ට අපට
12 මාර්ගය සලස්වාදෙනසේක්වා. අප
නුඹලාට ප්‍රේමකරන්නාක්මෙන්ම ස්වාමීන්-
වහන්සේ නුඹලාගෙන් එකිනෙකා
කෙරෙහිත් අනික් සියල්ලන් කෙරෙහිත්
නුඹලාගේ ප්‍රේමය වැඩිකර, එයින් නුඹලා
13 පුරවා, මෙසේ අපගේ ස්වාමිවූ යේසුස්-
වහන්සේ තමන්ගේ සියලු ශුද්ධවන්තයන්
සමග එන කල නුඹලාගේ සිත් අපගේ
පියවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි
ශුද්ධකමින් නිදෙස්ව තිබෙන්ට ස්ථිර-
කරනසේක්වා.

## ජීවිතයේ පිරිසිදුකම, සහෝදර ප්‍රේමය සහ කඩිසරකම ගැන අවවාද

4 ඉතින්, සහෝදරයෙනි, නුඹලා
කොයි ආකාර හැසිර දෙවියන්-
වහන්සේ ප්‍රසන්නකරන්ට ඕනෑද කියා
නුඹලා අපෙන් දනගත් ලෙසද, නුඹලා
හැසිරෙන ලෙසද, වඩ වඩා කරන මෙන්
ස්වාමිවූ යේසුස්වහන්සේ තුළ අපි
නුඹලාගෙන් ඉල්ලමින් අවවාදකරමුව.
මක්නිසාද අපි ස්වාමිවූ යේසුස්- 2
වහන්සේගේ නාමයෙන් නුඹලාට මොන
ආඥා දුනිමුද කියා නුඹලා දන්නහුය.
දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, 3
නුඹලා ශුද්ධව සිටීමය—නුඹලා
වේශ්‍යාකමින් වැළකී, නුඹලාගෙන් 4
එකිනෙකා තම තමාගේ භාජනය,
දෙවියන්වහන්සේ නාඳුනන්නාවූ ජාතීන්
මෙන් කාමරාගයෙහි නොව,
ශුද්ධකමෙහිත් ගෞරවයෙහිත් තබාගන්ට 5
දනගන සිටීමත්, මේ කාරණය ගැන 6
කිසිවෙක් තමාගේ සහෝදරයා රවටා
වාසියක් නොගැනීමත්ය. මක්නිසාද අපි
පළමු නුඹලාට කියා සාක්ෂිදුන් ලෙස,
ස්වාමීන්වහන්සේ එබඳුවූ සියල්ල ගැන
පළිගන්න කෙනෙක්ය. දෙවියන්වහන්සේ 7
අප කැඳෙවුවේ අපවිත්‍රකමට නොව
ශුද්ධකමටය. එබැවින් එපාකරන්නා 8
මනුෂ්‍යයාව නොව තමන්ගේ
ශුද්ධාත්මයාණන් නුඹලාට දෙන්නාවූ
දෙවියන්වහන්සේව එපාකරන්නේය.
එහෙත් සහෝදර ප්‍රේමය ගැන නම් 9
නුඹලාට ලියන්ට වුවමනා නැත.
මක්නිසාද එකිනෙකාට ප්‍රේමකරන්ට
නුඹලාම දෙවියන්වහන්සේගෙන් ඉගෙන-
ගෙන සිටින්නහුය. සැබවින් නුඹලා 10
මකිදෝනිය මුළුල්ලෙහි සිටින සියලු
සහෝදරයන්ට එසේ ප්‍රේමකරන්නහුය.
එහෙත්, සහෝදරයෙනි, වඩ වඩා එසේ
කරන මෙන්ද, පිටත සිටින්නන් ගැන 11

ඔබිනලෙස හැසිරෙන පිණිසත් කිසි
12 හිගයක් නැතුව සිටින පිණිසත්, අප
නුඹලාට අණකළ ලෙස නිශ්චලව
සිටින්ට උත්සාහකරන මෙන්ද,
නුඹලාගේම කාරණා බලාගන්න මෙන්ද,
නුඹලාගේ අත්වලින් වැඩකරන මෙන්ද,
අපි නුඹලාට අවවාදකරමුව.

## මිය පරලොව ගියවුන් ගැනයි

13 තවද, සහෝදරයෙනි, බලාපොරොත්තුවක්
නැත්තාවූ අන් තැනැත්තන් මෙන් නුඹලා
සෝක නොවන පිණිස, සැතපෙන්නන්
ගැන නුඹලා නොදැන සිටිනවාට අපි
14 නොකැමැත්තෙමුව. මක්නිසාද යේසුස්-
වහන්සේ මැරී නැවත නැගිටුණුසේකැයි
අපි අදහමු නම්, එසේම දෙවියන්වහන්සේ
යේසුස්වහන්සේ කරණකොටගෙන,
සැතපී සිටින්නන් උන්වහන්සේ සමග
15 ගෙනෙනසේක. මක්නිසාද ස්වාමීන්-
වහන්සේගේ ඊම දක්වා ජීවත්ව
ඉතුරුවෙන අපි සැතපුණු තැනැත්තන්ට
කිසිසේත් ඉස්සර නොවන්නෙමුයයි
ස්වාමීන්වහන්සේගේ වචනයෙන් අපි
16 නුඹලාට කියමුව. මක්නිසාද ස්වාමීන්-
වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම
දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ
හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන්
බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ
17 අය පළමුකොට නැගිටින්නෝය. එවිට
ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම
ඔවුන් සමග ස්වාමීන්වහන්සේ සම්මුඛවන
පිණිස වලාකුල්වලින් අහසට ඇදගනු
ලබන්නෙමුව. මෙසේ අපි නිතරම
ස්වාමීන්වහන්සේ සමග සිටින්නෙමුව.
18 ඉන්නිසා මේ වචනවලින් එකිනෙකා
සනසාගනිල්ලා.

## ස්වාමීන්වහන්සේගේ දෙවෙනි ඊම. ඊට සූදානම්ව සිටිය යුතු බව

5 නුමුත් සහෝදරයෙනි, කාලවල්ද
ප්‍රස්තාවයන්ද ගැන නුඹලාට යමක්
2 ලියන්ට වුවමනා නැත. මක්නිසාද
රාත්‍රියෙහි සොරෙකු එන්නාක් මෙන්
ස්වාමීන්වහන්සේගේ දවස පැමිණෙන
බව නුඹලාම හොඳහැටි දනිහුය.
සමාදානයය, අනතුරක් නැත කියා 3
කියන විට ගර්භිණියට විලිරුජාව
පැමිණෙන්නාක්මෙන් හදිසියෙන් ඔවුන්
පිටට විනාශය පැමිණේ; ඔව්හුද
කිසිසේත් නොගැළවෙන්නෝය. නුමුත් 4
සහෝදරයෙනි, ඒ දවස සොරෙකු මෙන්
නුඹලා කෙරේ පැමිණෙන්ට නුඹලා
අන්ධකාරයෙහි සිටින්නෝ නොවෙති.
කුමක්හෙයින්ද නුඹලා සියල්ලෝ 5
ආලෝකයේද දවාලේද පුත්‍රයෝය. අපි
රාත්‍රියටවත් අන්ධකාරයටවත් අයිති
නොවමුව; එබැවින් වෙන තැනැත්තන් 6
මෙන් අපි නිඳ නොගෙන, *මත්
නොවී සිටිමු. මක්නිසාද නිඳගන්නෝ 7
රාත්‍රියෙහි නිඳගනිති; මත්වෙන්නෝ
රාත්‍රියෙහි මත්වෙති. නුමුත් දවාලට 8
අයිතිවූ අපි ඇදහිල්ල සහ ප්‍රේමය නැමති
ළයවැස්මත් ගැළවීමේ බලාපොරොත්තුව
නැමති ආරක්ෂා තොප්පියත් පැළඳගෙන
*මත් නොවී සිටිමු. මක්නිසාද 9
දෙවියන්වහන්සේ උදහසට නොව අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
කරණකොටගෙන ගැළවීම ලබාගැනීමට
අප නියමකළසේක. අප අවදිව සිටිනත් 10
නිදගනිතත් තමන්වහන්සේ සමග එක්ව
ජීවත්වන පිණිස ක්‍රිස්තුස්වහන්සේ අප
උදෙසා මළසේක. එබැවින් නුඹලා 11
කරන්නාක්මෙන් එකිනෙකාට අවවාද
කොට, එකිනෙකා වර්ධනයකරගනිල්ලා.

## නොයෙක් ක්‍රිස්තියානි යුතුකම් පිළිබඳ අවවාදනුශාසනා. අවසානය.

තවද, සහෝදරයෙනි, නුඹලා අතරෙහි 12
වෙහෙසගන්නාවූ, ස්වාමීන්වහන්සේ තුළ
නුඹලා කෙරෙහි ප්‍රධානකම් කරන්නාවූ,
නුඹලාට දැනමුතුකම් දෙන්නාවූ
තැනැත්තන් දැනගෙන, ඔවුන්ගේ වැඩේ 13
නිසා ප්‍රේමයෙන් ඔවුන් ඉතා උතුම්
කොට සලකන ලෙස අපි නුඹලාගෙන්
ඉල්ලමුව. තම තමුන් අතරේ සමාදානයෙන්

*හෙවත්–සිහි ඇතිව.

14 සිටපල්ලා. ඇරත්, සහෝදරයෙනි,
අනියම්ලෙස හැසිරෙන්නන්ට දැනමුතුකම්
දෙන මෙන්ද ක්ලාන්ත සිත් ඇත්තන්
ධෛර්යකරන මෙන්ද දුර්වලයන්ට
ආධාරවන මෙන්ද සියල්ලන් ගැන
ඉවසිලිවන්තව සිටින මෙන්ද අපි තුඹලාට
15 අවවාදකරමුව. කිසිවෙක් කාටවත්
නපුරට නපුර නොකරන්ට බලාගෙන,
එකිනෙකා ගැනත් සියල්ලන් ගැනත්
16 නිතරම යහපත්වූ දේ කරපල්ලා. නිතරම
17 ප්‍රීතිවෙයල්ලා; නොකඩව යාච්ඥාකර-
18 පල්ලා; සියල්ලේදී ස්තුතිකරපල්ලා.
මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
තුඹලා ගැන දෙවියන්වහන්සේගේ
19 කැමැත්ත මේය. ආත්මයාණන්වහන්සේ
20 නොනිවල්ලා; අනාගතවාක්‍යකීම් සුළු-
21 කොට නොසිතල්ලා; සියල්ල සෝදිසිකර
බලා, යහපත් දේ තදින් අල්ලාගනිල්ලා;
22 සියලු අන්දම්වල නපුරෙන් වැලකියල්ලා.

සමාදනයේ දෙවියන්වහන්සේම තුඹලා 23
සහමුලින්ම පවිත්‍රකරනසේක්වා; තුඹලාගේ
මුළු ආත්මයත් ප්‍රාණයත් ශරීරයත් අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
ඊමේදී නිදෙස්ව තිබෙන ලෙස
ආරක්ෂාකරනු ලැබේවා. තුඹලා 24
කැඳවන තැනන්වහන්සේ විශ්වාසව
සිටිනසේක, උන්වහන්සේ ඒක ඉෂ්ටද
කරනසේක.

සහෝදරයෙනි, අප උදෙසා යාච්ඥා- 25
කරපල්ලා.

සියලු සහෝදරයන්ට ශුද්ධවූ සිඹීමකින් 26
ආචාරකරපල්ලා. මේ ලියුම සියලු 27
සහෝදරයන්ට කියවාදෙන ලෙස
ස්වාමීන්වහන්සේගේ නමින් තුඹලාට
අණකරමි.

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්- 28
වහන්සේගේ කරුණාව තුඹලා සමග
වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් තෙසලෝනිකවරුන්ට ලියනලද දෙවෙනි පත්‍රය

## ආචාරය. ඔවුන්ගේ පීඩාවලදී විශ්වාසව සිටීම ගැන ස්තුතිදීම

1 පාවුල්ද සිල්වානස්ද යන අප විසින්
අපගේ පියවූ දෙවියන්වහන්සේ සහ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ
තිබෙන තෙසලෝනිකවරුන්ගේ සභාවට
2 ලියා එවන වග නම්: පියවූ දෙවියන්-
වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගෙන්ද කරුණාවත්
සමාදානයත් තුඹලාට වේවා.
3 සහෝදරයෙනි, තුඹලා ගැන දෙවියන්-
වහන්සේට නිතරම ස්තුතිකරන්ට අපි
බැඳී සිටිමුව. තුඹලාගේ ඇදහිල්ල
අතිශයින් වැඩිවන නිසාත්, එකිනෙකා
කෙරෙහි තිබෙන තුඹලා සියල්ලන්ගේ
ප්‍රේමය අධිකව තිබෙන නිසාත් එසේ
4 ස්තුතිකරන්ට යුතුය; එබැවින් තුඹලාගේ
සියලු පීඩාවලදීත් තුඹලා ඉවසන
දුක්වලදීත් ඇත්තාවූ තුඹලාගේ
ස්ථිරකමත් ඇදහිල්ලත් නිසා අපිම
තුඹලා ගැන දෙවියන්වහන්සේගේ
5 සභාවලදී පාරට්ටුකරමුව. ඒ ඉවසීම
වනාහි දෙවියන්වහන්සේගේ රාජ්‍යය
උදෙසා දුක්විඳින තුඹලා ඒ රාජ්‍යයට
සුදුස්සෝයයි ඒත්තුගනු ලැබීමට තිබෙන
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ විනිශ්චයේ
6 ඔප්පුවක්ය. කුමක්හෙයින්ද ස්වාමිවූ
යේසුස්වහන්සේ තමන්ගේ පරාක්‍රමයේ
දූතයන් සමග ඇවිළෙන්නාවූ ගින්නෙන්
යුක්තව ස්වර්ගයෙන් එළිදරව්වී,
7 දෙවියන්වහන්සේ නාඳුනන්නන්ටත්
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ
ශුභාරංචියට කීකරු නොවන්නන්ටත්
ප්‍රතිඵල දෙන කල, තුඹලාට දුක්දෙන්නන්ට 8
දුකද දුක්විඳින තුඹලාට අප සමග
සහනයද දීම දෙවියන්වහන්සේ ඉදිරියෙහි
ධර්මිෂ්ඨවූ කාරණයක්ය. ඒ දවසේදී 9
ස්වාමීන්වහන්සේ තමන් ශුද්ධවන්තයන්
තුළ මහිමය ලබන්ටත් අපේ සාක්ෂිය
අදහාගත් තුඹලා සමග අදහාගත්
සියල්ලන් තුළ මවිතලෙස පෙනෙන්ටත්
එන කල්හි, ඒ තැනැත්තෝ උන්වහන්සේ- 10
ගේ අභිමුඛයෙන්ද උන්වහන්සේගේ
බලයේ තේජස ඉදිරියෙන්ද සදාකාල
විනාශයේ දඬුවම විඳින්නෝය. එබැවින් 11
අපගේ දෙවියන්වහන්සේගෙන් ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් කරුණාව
ලෙස තුඹලා තුළ අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයද
උන්වහන්සේ තුළ තුඹලාද ගෞරවයට
පැමිණෙන පිණිස, තුඹලා තුඹලාගේ 12
කැඳවීමට සුදුස්සෝයයි අපගේ දෙවියන්-
වහන්සේ විසින් ඒත්තුගෙන, යහපත්කමේ
සියලු ආශාද ඇදහිල්ලේ සියලු ක්‍රියාද
ස්වකීය බලයෙන් සම්පූර්ණකරනමෙන්
අපි නිතරම තුඹලා ගැන යාච්ඥාකරමුව.

## ස්වාමීන්වහන්සේගේ ඊම ගැන වැරදි අදහස්

2 සහෝදරයෙනි, අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඊමද
උන්වහන්සේ වෙතට අපගේ රැස්වීමද
ගැන, ස්වාමීන්වහන්සේගේ දවස ළංවී 2
තිබේයයි ආත්මයෙන්වත් වචනයෙන්වත්
අපෙන් ලැබුණාක්මෙන් පෙන්වන
ලියුමකින්වත් ඉක්මනින් සිතින් චංචල

නොවන හැටියටද නොකැලඹෙන
හැටියටද අපි තුඹලාගෙන් උදක්ම
3 ඉල්ලමුව. කිසිවෙකුට කිසිසේත් තුඹලා
රවටන්ට ඉඩ නාරිල්ලා. මක්නිසාද
ඇදහිල්ලෙන් වැටීයාමත් විනාශයේ
පුත්‍රයා වන පාපයේ මනුෂ්‍යයා
එළිදරව්වීමත් පළමුවෙන් වුණොත් මිස
4 ඒක නොපැමිණෙන්නේය. ඔහු,
දෙවියන්වහන්සේයයි කියනු ලබන්නාවූ
නොහොත් නමස්කාරකරනු ලබන්නාවූ
සියල්ලන්ට විරුද්ධව සිට, ඒ සියල්ලන්ට
වඩා තමාම උසස්කරගෙන, දේව-
මාළිගාවෙහි වාඩිවී හිඳ, තමා දෙවිව
5 සිටින්නේයයි පෙන්වන්නේය. මා තුඹලා
සමග සිටියදීම මේ කාරණා තුඹලාට
6 කී බව තුඹලාට මතක නැද්ද? ඔහු
තමාගේම කාලයේදී එළිදරව්වෙන
පිණිස දැන් වලක්වන්නේ කිමෙක්ද
7 කියාත් තුඹලා දනිහුය. මක්නිසාද
නොපනත්කමේ අභිරහස දැනටම
ක්‍රියාකරන්නේය. තුමුන් තමා පහකරනු
ලබන තුරු දැන් වලක්වන්නාවූ කෙනෙක්
8 සිටී. එවිට නොපනත්කම් කරන්නා
එළිදරව්වන්නේය. ස්වාමිවූ යේසුස්-
වහන්සේ තමන්ගේ මුඛයේ හුස්මෙන්
ඔහු නසා, තමන්වහන්සේගේ ඊමේ
9 ප්‍රකාශවීමෙන් නාස්තිකරනසේක. ඔහුගේ
ඊම සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට
බොරුවූ සියලු ආකාර ආශ්චර්යවලින්ද
10 ලකුණුවලින්ද පුදුමවලින්ද, විනාශ-
වෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු
රැවටිලිවලින්ද යුක්තවේ; මක්නිසාද
ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට
11 ප්‍රේමවීම පිළි නොගත්තෝය. මේ නිසා
සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨ-
කමට ප්‍රසන්නවූ සියල්ලන්ම විනිශ්චය
12 කරනු ලබන පිණිස, බොරුව විශ්වාස
කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ
ක්‍රියාකිරීමක් ඔවුන්ට එවනසේක.

## දෙවතුත් ස්තුතිදීම සහ අවවාද කිරීම

13 තුමුන්, ස්වාමීන්වහන්සේ විසින්
ප්‍රේමකරනු ලබන සහෝදරයෙනි,
ආත්මයාණන්වහන්සේගේ පිරිසිදුකිරීමද
සැබෑව ඇදහීමද කරණකොටගෙන
තුඹලා ගැළවෙන පිණිස දෙවියන්-
වහන්සේ පටන්ගැන්මේ සිට තුඹලා
තෝරාගත් නිසා තුඹලා ගැන
දෙවියන්වහන්සේට නිතරම ස්තුතිකරන්ට
අපි බැඳී සිටිමුව. අපේ ස්වාමිවූ යේසුස් 14
ක්‍රිස්තුස්වහන්සේගේ තේජස ලබාගැනීම
පිණිස උන්වහන්සේ අපේ ශුභාරංචිය
කරණකොටගෙන තුඹලා ඊට කැඳෙවූ-
සේක. එබැවින්, සහෝදරයෙනි, තුඹලා 15
ස්ථිරව සිට අපගේ වචනයෙන් හෝ
ලියුමෙන් හෝ තුඹලාට ඉගැන්වූ ගුරුකම්
තදින් අල්ලාගෙනම සිටපල්ලා.
තවද අපගේ ස්වාමිවූ යේසුස් 16
ක්‍රිස්තුස්වහන්සේමද අපට ප්‍රේමකොට,
සදාකාල සැනසිල්ලත් යහපත්
බලාපොරොත්තුවකුත් අනුග්‍රහය
කරණකොටගෙන අපට දුන් අපගේ
පියවූ දෙවියන්වහන්සේද, තුඹලාගේ සිත් 17
සනසා, සියලු යහපත් ක්‍රියාවලද
වචනවලද තුඹලා ස්ථිරකරනසේක්වා.

## යාච්ඤා කරන මෙන් ඉල්ලීමක්. අනියම්ලෙස හැසිරීම ගැන

3 ඉතින්, සහෝදරයෙනි, තුඹලා
අතරෙහි සිද්ධවුණාක්මෙන් [වෙන
තැන්වලත්] ස්වාමීන්වහන්සේගේ වචනය
පතළවී ගොස් ගෞරවයට පැමිණෙන
පිණිසද, හිතුවක්කාර නපුරු 2
මනුෂ්‍යයන්ගෙන් අප ගළවනු ලබන
පිණිසද අප උදෙසා යාච්ඤාකරපල්ලා;
මක්නිසාද සියල්ලන්ටම ඇදහීම
නැත. තුමුන් ස්වාමීන්වහන්සේ 3
විශ්වාසව සිටිනසේක, උන්වහන්සේ
තුඹලා ස්ථිරකොට නපුරාගෙන්
ආරක්ෂාකරනසේක. තවද අප ආඥකරන 4
දේ තුඹලා කරනවාය කියාද මතුත්
කරනවා ඇත කියාද තුඹලා ගැන
ස්වාමීන්වහන්සේ තුළ විශ්වාසය ඇතුව
සිටිමුව. ස්වාමීන්වහන්සේද තුඹලාගේ 5
සිත් දෙවියන්වහන්සේගේ ප්‍රේමයටත්
ක්‍රිස්තුස්වහන්සේගේ ඉවසීමටත් පමුණු-
වනසේක්වා.
තවද, සහෝදරයෙනි, අපෙන් ලැබූ 6
නියෝග ප්‍රකාරයට නොව, අනියම් ලෙස

හැසිරෙන්නාවූ සියලු සහෝදරයන්ගෙන්
වෙන්ව සිටින මෙන් අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්
7 අපි තුඹලාට අණකරමුව. මක්නිසාද
අප අනුවයන්නෝ වෙන්ට ඕනෑ කෙසේද
කියා තුඹලාම දනිවුය. මක්නිසාද අපි
තුඹලා අතරෙහි අනියම් ලෙස
8 නොහැසිර, කාගෙන්වත් කෑම නිකමට
නොකා, තුඹලාගෙන් කාටවත් බරක්
නොවන පිණිස වීර්යය හා වෙහෙසින්
9 යුක්තව රෑ දවල් වැඩකළෙමුව. එසේ
කළේ බරක් වෙන්ට අපට අයිතිවාසිකම
නැති නිසා නොව, අපම තුඹලාට
ආදර්ශයක් වන පිණිසත් තුඹලා අප
10 අනුවයන්නත් වන පිණිසත්ය. මක්නිසාද
යමෙක් වැඩකරන්ට කැමති නැත්නම්
ඔහු කෑම නොකා සිටීවා කියා අපි
තුඹලා සමග සිටිද්දීම පවා තුඹලාට
11 අණකෙළෙමුව. තුඹලා අතරෙන් සමහරු
කිසි වැඩක් නොකර, අනුන්ගේ
කාරණාවලට මැදිවෙමින්, අනියම්ලෙස
12 හැසිරෙන බව අපි ඇසීමුව. ඉදින්
නිශ්චලකමින් වැඩකරමින්, තමුන්ම
ලබාගත් කෑම කන හැටියට අපි එබඳු
අයට ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
තුළ ආඥකොට අවවාදකරමුව. තුමුත්, 13
සහෝදරයෙනි, තුඹලා යහපත කිරීමට
මැළි නොවෙල්ලා. යමෙක් මේ ලියුමේ 14
අපේ වචනයට කීකරු නොවන්නේ නම්,
තුඹලා ඔහු බලාගෙන, ඔහු ලජ්ජාවන
පිණිස ඔහු සමග සමාගම් නොපවත්වා
සිටපල්ලා. තුමුත් ඔහු සතුරෙකු මෙන් 15
ගණන්නොගෙන, සහෝදරයෙකුට මෙන්
දැනමුතුකම් දීපල්ලා.

## අවසානය

සමාදානයේ ස්වාමීන්වහන්සේම 16
තුඹලාට නිතරම සියලු ආකාරයෙන්
සමාදානයදෙනසේක්වා. ස්වාමීන්-
වහන්සේ තුඹලා සියල්ලන් සමග
සිටිනසේක්වා.
පාවුල් යන මාගේම අතින් ලියන 17
ආචාරකිරීමය, ඒ වනාහි සියලු
ලියුම්වලට ලකුණය; එසේ ලියමි. අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
කරුණාව තුඹලා සියල්ලන් සමග වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් තිමෝතියස්ට ලියනලද පළමුවෙනි පත්‍රය

## ආචාරය. වැරදි ගුරුකම් පිළිබඳ අවවාද

1 අපගේ ගැළවුම්කාරයාණන් වන
දෙවියන්වහන්සේගේද අපගේ
බලාපොරොත්තුව වන ක්‍රිස්තුස් යේසුස්-
වහන්සේගේද ආඥාව ලෙස ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගේ ප්‍රේරිතයෙක්ව සිටින
2 පාවුල් නම් මා විසින්, ඇදහිල්ලෙහි
මාගේ සැබෑ දරුවාවූ තිමෝතියස්ට ලියා
එවන වග නම්: පියවූ දෙවියන්-
වහන්සේගෙන්ද අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගෙන්ද කරුණාවත්
දයාවත් සමාදනයත් වේවා.
3 අමුතු ධර්ම නූගන්වන හැටියටද,
ප්‍රබන්ධත් ඇදහිල්ලෙහිවූ දෙවියන්-
වහන්සේගේ මාර්ගය වර්ධනයකිරීම
4 වෙනුවට විවාද උපදවන, කෙළවරක්
නැති පෙළපත් කථාත් නොසලකන
හැටියටද, නුඹ විසින් සමහරුන්ට
ආඥාකරන පිණිස, එපීසයෙහි නැවතී
සිටින්ට කියා මා මකිදෝනියට යන
කල නුඹට අවවාද කෙළෙමි, දැනුත්
5 එසේ කරමි. ආඥාවේ අභිප්‍රාය නම් පිරිසිදු
සිතකිනුත් යහපත් හෘදයසාක්ෂියකිනුත්
සැබෑ අවංකවූ ඇදහිල්ලෙනුත් නික්මෙන
6 ප්‍රේමයය. ඒ දේවලින් සමහරු අහක්ව
7 නිෂ්ඵල කථාවට හැරී ගියෝය. තමුන්
කියන්නේ කිමෙක්ද කියාවත්
නිසැකකොට සහතිකකරන්නේ කුමන
දේ ගැනද කියාවත් තේරුම් නොගෙන
සිටින නුමුත්, ඔව්හු ව්‍යවස්ථාවේ ගුරුවරු
8 වෙන්ට කැමැත්තෝය. නුමුත් යමෙක්
ව්‍යවස්ථාව නියමලෙස භාවිතාකරන්නේ
නම්, ව්‍යවස්ථාව යහපත් බව අපි දනිමුව.
ඔහු මෙය දන්නවා ඇත: එනම්, 9
ව්‍යවස්ථාව වනාහි ධර්මිෂ්ඨයෙකු නිසා
නොව අධර්මිෂ්ඨයන් සහ අකීකරුවන්ද
අභක්තීන් සහ පව්කාරයන්ද අපිරිසිදුවන්
සහ දේව අපහාසිකයන්ද *පියවරුන්
මරන්නන් හා මවුවරුන් මරන්නන්ද
මිනීමරන්නන්ද, වේශ්‍යාකම්කරන්නන්ද 10
පුරුෂයන් සමග දූෂ්‍ය ක්‍රියාකරන්නන්ද
මිනිසුන් සොරකම්කරන්නන්ද බොරු-
කාරයන්ද බොරු දිවුරන්නන්ද නිසාත්,
මට භාරදෙන ලද ශුභාන්විත දෙවියන්- 11
වහන්සේගේ තේජවත්වූ ශුභාරංචියේ
හැටියට සාරවූ ඉගැන්වීමට විරුද්ධවූ
වෙන කිසිවක් ඇද්ද, ඒ නිසාත්
පිහිටුවනලද බවය.

## ප්‍රේරිත තැනට ලැබුණු දයාව සහ කරුණාව

මම විශ්වාසයෙකැයි ගණන්ගෙන 12
තමන්වහන්සේගේ සේවයට අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
මා පත්කළ බැවින් මට බලය
දුන්නාවූ උන්වහන්සේට ස්තුතිකරමි.
පළමුවෙන් මම අපහාසකරන්නෙක්ව, 13
පීඩාකරන්නෙක්ව, නින්දකරන්නෙක්ව
සිටියෙමි නුමුත්, නොදන්නාකමින් හා
ඇදහිලි නැතිකමින් එසේ කළ බැවින්,
දයාව ලැබුවෙමි. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ 14
තුළවූ ඇදහිල්ලද ප්‍රේමයද සමග අපගේ
ස්වාමීන්වහන්සේගේ කරුණාව ඉතා
අධිකවිය. පව්කාරයන් ගළවන්ට ක්‍රිස්තුස් 15

*හෙවත්–මවුපියන්ට ගහන්නන්ද.

යේසුස්වහන්සේ ලෝකයට ආසේක යන
කීම විශ්වාසවූ සර්ව ප්‍රකාරයෙන් පිළිගත
යුතුවූ කීමක්ය; ඔවුන් අතුරෙන් මම
16 ප්‍රධාන පව්කාරයාය. එසේ වී නුමුත්
මට කරුණාව ලැබුණේ මේ නිසාය.
එනම්, සදාකාල ජීවනය ලැබීම සඳහා
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි
අදහන්ට සිටින අයට ආදර්ශයක් කොට
උන්වහන්සේ විසින් ප්‍රධාන පව්කාරයාවූ
මා කෙරෙහි තමන්වහන්සේගේ මුළු
17 ඉවසිලිවන්තකම දක්වීම පිණිසය. ඉදින්
අමරණීයවූ, අදෘශ්‍යමානවූ, එකම
දෙවිවූ, සදාකාල රජ්ජුරුවන්වහන්සේට
ගෞරවයද තේජසද සදාකාලේටම වේවා.
ආමෙන්.
18 මාගේ පුත්‍රවූ තිමෝතියස්නි, නුඹ ගැන
කලින් කීවාවූ අනාගතවාක්‍ය ලෙස මේ
19 ආඥව නුඹට භාරදෙමි. එනම් නුඹ
ඇදහිල්ල සහ යහපත් හෘදයසාක්ෂියක්
ඇතුව සිට, ඒ වාක්‍යවලින් යහපත් යුද්ධය
කරන ලෙසය. සමහරු ඒ හෘදයසාක්ෂිය
අත්හැරදමා, ඇදහිල්ල නමැති නැව
20 බිඳගත්තෝය. හිමෙනියස්ද අලෙක්ෂන්දර්ද
එබඳු තැනැත්තෝය. අපහාස නොකරන්ට
දැනමුතුවෙන පිණිස ඔවුන් සාතන්ට
භාරදුනිමි.

## සියලු මනුෂ්‍යයන් උදෙසා යාච්ඥා කිරීම.

## ප්‍රසිද්ධ නමස්කාරය ගැන ගුරුකම්

2 ඉතින් අප විසින් සියලු ආකාර
භක්තියෙන් සහ සත්සුන්කමින්
සමාදානවූ නිශ්චල ජීවිතයක් ගත කරන
පිණිස, රජවරුන් හා උසස් තනතුරු
2 දරන සියල්ලන් ඇතුළුව, සියලු
මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඥද
මැදහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට
3 සියල්ලට පළමුවෙන් අවවාදකරමි. මෙය
සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව
දැනගැනීමට පැමිණෙනවාට කැමතිවූ,
4 අපගේ ගැළවුම්කාරයාණන් වන
දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ව
5 ප්‍රසන්නව තිබේ. මක්නිසාද ඇත්තේ එක
දෙවිකෙනෙක් සහ දෙවියන්වහන්සේටත්
මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර
කෙනෙකුත්ය. උන්වහන්සේ සියල්ලන් 6
උදෙසා මිදීමේ මිලයක් කොට
තමන්ම දුන්නාවූ, මනුෂ්‍යයාවූ ක්‍රිස්තුස්
යේසුස්වහන්සේය. ඊට සාක්ෂිය නියම
කාලවලදී ලැබේ. ඒ පිණිස මම 7
දේශනාකාරයෙක්ද ප්‍රේරිතයෙක්ද ඇදහිල්ල
සහ සත්‍යය ගැන අන්‍යජාතීන්ගේ
ගුරුවරයෙක්ද කොට පත්කරනු ලැබීමි.
ඒ ගැන මම බොරුවක් නොකියා සැබෑව
කියමි.
එබැවින් පුරුෂයන් සැමතැන්හිම 8
කෝපයත් විවාදයත් නැතුව, පිරිසිදු අත්
ඔසවා, යාච්ඥකරනවාට කැමැත්තෙමි.
එසේම ස්ත්‍රීන් ලජ්ජාවෙන් සහ විනීත 9
භාවයෙන් යුක්තව, ඔබින වස්ත්‍ර
ඇඳ, ඉසකේ ගෙතීමෙන්වත් රනින්වත්
මුතුවලින්වත් අනර්ඝ වස්ත්‍රවලින්වත්
නොව, දේවභක්ති නාමය දරන ස්ත්‍රීන්ට 10
සුදුසුලෙස යහපත් ක්‍රියාවලින්
සැරසෙනවාට කැමැත්තෙමි. ස්ත්‍රී 11
නිශ්චලව සියලු ආකාර යටත්කම ඇතුව
ඉගෙනගනීවා. උගන්වන්ටවත් පුරුෂයා 12
කෙරෙහි බලය පවත්වන්ටවත් ස්ත්‍රියෙකුට
ඉඩ නාරිමි, ඈ නිශ්ශබ්දව සිටීවා.
මක්නිසාද පළමුකොට ආදම්ද පසුව 13
ඒවද සාදනු ලැබීය; තවද ආදම් 14
රැවටුණේ නැත, නුමුත් ස්ත්‍රී රැවටී, වරදට
වැටී සිටින්නීය. නුමුත් ඔව්හු විනීත 15
භාවයෙන් යුක්තව, ඇදහිල්ලෙහිත්
ප්‍රේමයෙහිත් ශුද්ධකමෙහිත් පවතින්නෝ
නම්, දරුවන් *වැදීමේදී ගැළවෙනවා ඇත.

## සභාවේ නිලධාරීහු

3 යමෙක් සභාවේ නායක තනතුර
ලබන්ට ආශාවන්නේ නම් ඔහු
යහපත් වැඩකට ආශාවන්නේය යනු
විශ්වාසවූ කීමක්ය. එහෙයින් නායක 2
තෙමේ නිර්දෝෂවූ, එක භාර්යාවකට
පුරුෂයාවූ, පමණ දන හැසිරෙන්නාවූ,
සිහියද පිළිවෙළක්ද ඇත්තාවූ, ආගන්තුක
සත්කාරයට කැමතිවූ, උගන්වන්ට
සමර්ථවූ කෙනෙක්ව සිටින්ට ඕනෑය.

*හෙවත්–වැදීම කරණකොටගෙන.

3 ඔහු බේබද්දෙක් නොවූ, ගහගන්නෙක්
නොවූ, ඉවසිලිවන්තවූ, ඩබරකාරයෙක්
4 නොවූ, වස්තු තෘෂ්ණාව නැත්තාවූ, තමාගේම
පවුල හොඳින් හසුරුවාගනිමින්, සියලු
ආකාර සන්සුන්කම ඇතුව ස්වකීය
දරුවන් හික්මවාගන්නාවූ තැනැත්තෙක්ව
5 සිටිය යුතුය. (තුමුත් යමෙක් තමාගේම
පවුල හසුරුවාගන්ට නොදන්නේ නම්
ඔහු දෙවියන්වහන්සේගේ සභාව
6 ප්‍රවේසම්කරන්නේ කෙසේද?) ඔහු උඩඟුවී
යක්ෂයාට පැමිණි දඬුවමට නොවැටෙන
පිණිස අලුත් ගෝලයෙක් නොවිය යුතුය.
7 ඇරත් නින්දවටද යක්ෂයාගේ මලපතටද
නොවැටෙන පිණිස ඔහු පිටත
අයවලුන්ගෙන් යහපත් සාක්ෂි ඇතුව
8 සිටින්ට ඕනෑය. එසේම උපස්ථායකයන්
සන්සුන්වූ, දෙයාකාර කථා නැත්තාවූ,
බොහෝ මුද්‍රිකපානයට ඇලුම් නොවූ,
9 නින්දිත ලාභයට ගිජු නොවූ, ඇදහිල්ලේ
රහස පිරිසිදු හෘදයසාක්ෂියකින්
10 දරන්නාවූ අයවල්ව සිටින්ට යුතුය. තවද
ඔව්හුද පළමුකොට සෝදිසිකරනු ලැබ,
ඉන්පසු නිදෙස් නම්, උපස්ථායකයන්
11 මෙන් මෙහෙකරන්වා. එසේම ස්ත්‍රීවරුන්
සන්සුන්වූ, කේලාම් නොකියන්නාවූ,
පමණ දැන හැසිරෙන්නාවූ, සියල්ලේදී
විශ්වාසවූ අයව සිටින්ට ඕනෑය.
12 උපස්ථායකයෝ වනාහි එක එක
භාර්යාවකට පුරුෂයෝව, තමුන්ගේ
දරුවන්ද තමුන්ගේ ගෙදරවාසීන්ද
හොඳහැටි හසුරුවාගන්නෝව සිටින්වා.
13 මක්නිසාද උපස්ථායකයන්ව යහපත්-
ලෙස සේවයකළාවූ අය තමුන්ටම උසස්
තත්ත්වයක්ද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ
තුළ තිබෙන ඇදහිල්ලෙහි බොහෝ
නිසැකකමද ලබාගනිති.
14 තුඹට මේ කාරණා මා ලියා එවන්නේ,
ඉක්මනින් තුඹ ළඟට එන්ට
15 බලාපොරොත්තුවෙන තුමුත්, මා
ප්‍රමාදවුණොත් දෙවියන්වහන්සේගේ
ගෘහයෙහි මනුෂ්‍යයන් කෙසේ හැසිරිය
යුතුද කියා තුඹ දැනගන්නා පිණිසය.
එය ජීවමාන දෙවියන්වහන්සේගේ
සභාවත් සැබෑවේ කනුව සහ
16 අත්තිවාරමත්ය. දේව භක්තියේ රහසද
නිසැකවම මහත්ය; උන්වහන්සේ
මාංසයෙහි ප්‍රකාශවූසේක, ආත්මයෙහි
ධර්මිෂ්ඨව ඔප්පුවූසේක, දූතයන්ට
පෙනුණුසේක, අන්‍යජාතීන් අතරේ
ප්‍රකාශකරනු ලැබූසේක, ලෝකයෙහි
අදහනු ලැබූසේක, තේජසට ඔසවාගනු
ලැබූසේක.

## බොරු ගුරුවරුන් ගැනයි

4 එහෙත් පසු කාලවලදී සමහරු
මුළාකරවන ආත්මයන්ද යක්ෂයන්ගේ
ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව
යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ
පැහැදිලිලෙස කියනසේක. එසේ 2
වන්නේ බොරුකියන්නාවූ, තමුන්ගේම
හෘදයසාක්ෂියෙහි හංවඩු ලකුණු
ඇත්තාවූ, සරණපාවාගැනීම තහනම්-
කරන්නාවූ, සැබෑව දැනගෙන සිටින 3
ඇදහිලිවන්තයන් විසින් ස්තුතිදීමෙන්
පිළිගන්නා පිණිස දෙවියන්වහන්සේ මැවූ
කෑමවලින් වැලකීමට අණකරන්නාවූ
මිනිසුන්ගේ වංකකම කරණකොටගෙනය.
දෙවියන්වහන්සේ මැවූ සියල්ල යහපත්ය, 4
ස්තුතිදීමෙන් යුක්තව පිළිගන්නවා නම්
කොයි දෙයක්වත් එපාකරන්ට යුතු නැත.
මක්නිසාද එය දෙවියන්වහන්සේගේ 5
වචනයෙන්ද යාච්ඤාවෙන්ද පිරිසිදු කරනු
ලබන්නේය.
තුඹේ මේ දේවල් සහෝදරයන්ට 6
සිහිකරවන්නෙහි නම්, ඇදහිල්ලේද මේ
දක්වා තුඹ අනුව ගිය යහපත් ගුරුකමේද
වචනවලින් තුඹ පෝෂ්‍යවී, ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගේ යහපත් සේවකයෙක්
වන්නෙහිය. තුමුත් අපහාසිකවූ 7
මැහැලියන්ගේ ප්‍රබන්ධ එපාකොට,
භක්තිවන්තකම පිණිස ව්‍යායාම
පවත්වාපන්න. මක්නිසාද ශාරීරික 8
ව්‍යායාමයෙන් ප්‍රයෝජන ටිකය; තුමුත්
භක්තිවන්තකමට දැන් තිබෙන ජීවිතය
ගැනත් මතු ජීවිතය ගැනත් පොරොන්දු
තිබෙන බැවින් එය හැම දේටම
ප්‍රයෝජනවත්ය. මේක විශ්වාසවූ 9
සර්වප්‍රකාරයෙන් පිළිගත යුතුවූ කීමක්ය.
එසේය, ඒ පිණිස අපි වැඩකරමුව, 10

වීර්යකරමුව, මක්නිසාද සියලු
මනුෂ්‍යයන්ගේ, ප්‍රධානකොට ඇදහිලි-
වන්තයන්ගේ, ගැළවුම්කාරයාණන්වූ
ජීවමාන දෙවියන්වහන්සේ කෙරෙහි අපි
බලාපොරොත්තුවී සිටිමුව.

## යහපත් සේවකයාගේ හැසිරීම සහ ඉගැන්වීම

11 මේ දේවල් ආඥකොට උගන්වාපන්න.
12 තුඹේ යෞවනකම සුළුකරන්ට
කිසිවෙකුට ඉඩ නැර, කථාවෙනුත්
හැසිරීමෙනුත් ප්‍රේමයෙනුත් ඇදහිල්ලෙනුත්
පිරිසිදුකමෙනුත් අදහන්නන්ට තුඹම
13 ආදර්ශයක් වෙයන්න. මා එනතුරු
කියවීමෙහිද අවවාදකිරීමෙහිද ඉගැන්වී-
මෙහිද යෙදී සිටින්ට බලාගනින්න.
14 වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතුව
අනාගතවාක්‍යයෙන් තුඹට දෙනලද තුඹ
තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර
15 නොසිටින්න. තුඹේ දියුණුවීම සියල්ලන්ට
පෙනෙන පිණිස ඒ දේවල් කඩිසරලෙස
භාවිතාකරමින් එහිම යෙදී සිටපන්න.
16 තුඹ ගැනත් තුඹේ ඉගැන්වීම ගැනත්
ප්‍රවේසම්වෙයන්න. ඒවායේ පැවතියන්න;
මක්නිසාද තුඹ එසේ කිරීමෙන් තුඹද
තුඹේ වචන අසන්නන්ද ගළවා-
ගන්නෙහිය.

## සභාවේ වැන්දඹුවන් ගැන ක්‍රියා කළ යුතු අන්දම

5 මහලු කෙනෙකුට සැර නොකර,
පියෙකුට මෙන්ද, යෞවනයන්ට
2 සහෝදරයන්ට මෙන්ද, වැඩිමහල් ස්ත්‍රීන්ට
මවුවරුන්ට මෙන්ද, යෞවනියන්ට සියලු
ආකාර පිරිසිදුකමින් සහෝදරියන්ට
3 මෙන්ද අවවාදකරපන්න. ඇත්තටම
අසරණව සිටින වැන්දඹුවන්ට ගෞරව-
4 කරපන්න. නුමුත් යම් වැන්දඹු ස්ත්‍රියෙකුට
දරුවෝවත් මුණුබුරෝවත් සිටිත් නම්,
ඔව්හු පළමුකොට තමුන්ගේම පවුල
ගැන භක්තිවන්ත ලෙස හැසිරෙමින්
ස්වකීය මවුපියන්ට ප්‍රත්‍යුපකාරකරන්ට
ඉගෙනගනිත්වා. මක්නිසාද ඒක
දෙවියන්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්නව
තිබේ. ඇත්තටම අසරණව සිටින වැන්දඹු 5
තැනැත්තී දෙවියන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවෙමින් රෑ දවල්
කන්නලව්වලද යාච්ඤාවලද පවතින්නීය.
නුමුත් සැප සෙල්ලමින් පසුවෙන තැනැත්තී 6
ජීවත්ව සිටියදීම මැරී සිටින්නීය. ඔවුන් 7
නිදොස්ව සිටින පිණිස මේ දේත්
ආඥකරපන්න. යමෙක් තමාගේ අය, 8
ප්‍රධානකොටම තමාගේම පවුලේ අය,
රක්ෂා නොකරන්නේ නම්, ඔහු ඇදහිල්ල
එපාකළේය, ඔහු නොඇදහිලිකාරයෙකුට
වඩා නරකය. වැන්දඹුවන්ගේ ගණනට 9
ලියවෙන්ට යුතුව සිටින්නී නම්,
වයසින් හැටකට අඩු නැත්තාවූ, එකම
පුරුෂයෙකුට භාර්යාවව සිටියාවූ,
යහපත් ක්‍රියා ගැන ප්‍රසිද්ධවූ, දරුවන් 10
ඇතිකළාවූ, ආගන්තුක සත්කාරකළාවූ,
ශුද්ධවන්තයන්ගේ පාද සේදුවාවූ, පීඩා
විඳින්නන්ට උපකාරකළාවූ, සියලු
ආකාර යහපත් ක්‍රියාවල යෙදී සිටියාවූ
තැනැත්තියක්ය. නුමුත් යෞවන 11
වැන්දඹුවන් එපාකරපන්න. මක්නිසාද
ඔව්හු ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධවූ
තෘෂ්ණාවලින් පෙලඹුණාම සරණපාවා-
ගන්ට ආශාවෙති. මෙසේ ඔව්හු තමුන්ගේ 12
පළමු විශ්වාසය අත්හැරිය බැවින් වරදට
පැමිණෙති. ඇරත් ඔව්හු ගෙයින් ගෙට 13
ඇවිදිමින් කම්මැළිවෙන්ටත් ඉගෙන-
ගනිති; කම්මැළිවෙනවා පමණක් නොව
නුසුදුසු දේ කථාකරමින්, වාචාලියෝද
අනුන්ගේ කාරණා සොයන්නෝද වෙති.
එබැවින් යෞවන වැන්දඹුවන් විවාහවී 14
දරුවන් වදනවාටත් ගෙදර ආණ්ඩු-
කරනවාටත් නින්ද කිරීමට කිසි
අවකාශයක් විරුද්ධකාරයාට නොදෙන-
වාටත් මම කැමැත්තෙමි. මක්නිසාද 15
දැනටත් සමහරු අහක්ව සාතන් පස්සේ
ගොස් සිටිති. යම් ඇදහිලිවන්තියෙකුට 16
වැන්දඹු ස්ත්‍රීහු සිටිත් නම්, ඈ ඔවුන්ට
උපකාරකරාවා, සභාව විසින් ඇත්තටම
අසරණව සිටින වැන්දඹුවන්ට උපකාර-
කරන පිණිස අනික් අය ඒ සභාවට
බර නොවෙත්වා.

## සභාවේ වැඩිමහල්ලෝ

17 යහපත්ලෙස ප්‍රධානකම්කරන වැඩි-
මහල්ලෝ, ප්‍රධානකොට වචනයෙහිත්
ඉගැන්වීමෙහිත් වැඩකරන වැඩිමහල්ලෝ,
දෙගුණයක් ගෞරව ලබන්ට වටින්නෝ-
18 යයි ඒත්තුගනු ලබන්වා. මක්නිසාද:
ගවයෙක් ගොයම් පාගන විට උගේ
කට නොබඳින්න කියාද වැඩකරන්නාට
තමාගේ කුලිය ලැබෙන්ට යුතුය කියාද
19 ලියවිල්ලෙහි කියා තිබේ. සාක්ෂිකාරයන්
දෙදෙනෙකුගේ නොහොත් තුන්දෙනෙකුගේ
සාක්ෂිය පිට මිස නැත්නම් වැඩි-
මහල්ලෙකුට විරුද්ධව වරද නැඟීමක්
20 පිළි නොගනින්න. අනික් අය භයවෙන
පිණිස, පව්කරන්නන්ට සියල්ලන්
21 ඉදිරියෙහි තරවටුකරපන්න. කලින්
නිශ්චයකරගනවත් පක්ෂපාතකම්න්වත්
කිසිවක් නොකර, මේ සියල්ල
පවත්වන්ට දෙවියන්වහන්සේද ක්‍රිස්තුස්
යේසුස්වහන්සේද තෝරාගත් දේව-
දූතයන්ද ඉදිරියෙහි නුඹට අණකරමි.
22 ඉක්මන්ව් කිසිවෙකු කෙරෙහි අත්
නොතබන්න, අනුන්ගේ පාපවලට
23 පංගුකාරයෙක්ද නොවෙන්න. නුඹම
පිරිසිදුව සිටපන්න. මින් මතු වතුරම
බොන්නෙක් නොවී, නුඹේ ආමාශය
උදෙසාද නොයෙක්විට පැමිණෙන නුඹේ
දුර්වලකම් නිසාද, මුද්‍රිකපානය ටිකක්
24 භාවිතාකරපන්න. සමහර මනුෂ්‍යයන්ගේ
පාප ඉතා පැහැදිලිය, විනිශ්චයට
පළමුවෙන් ඒවා ප්‍රකාශය; සමහරුන්ගේ
25 පාප පසුව එළිදරව්වන්නේය. එසේම
පැහැදිලිව ප්‍රකාශවන්නාවූ යහපත් ක්‍රියාද
ඇත; එසේ නොවන ඒවාත් සැඟවී
තිබෙන්ට බැරිය.

## සභාවේ වාලුන් ගැනයි

6 වියගහට යටත්වූ යම් පමණ දසයෝ
ඇද්ද, දෙවියන්වහන්සේගේ නාමයටත්
ඉගැන්වීමටත් අපහාස නොපැමිණෙන
පිණිස ඔව්හු තමුන්ගේ ස්වාමිවරු සියලු
ආකාර ගෞරවය ලබන්ට වටින්නෝයයි
2 සිතත්වා. ඇදහිලිවන්ත ස්වාමිවරුන්
ඇත්තෝ වනාහි, ස්වාමිවරු සහෝදරයන්
නිසා ඔවුන් සුළු නොකර, ප්‍රයෝජන
ලබන්නෝ ඇදහිලිවන්තයන්ද ප්‍රේම-
වන්තයන්ද වන බැවින්, වඩා සතුටින්
ඔවුන්ට වැඩකරත්වා. මේ කාරණා
උගන්වා අවවාදකරපන්න.

## මිථ්‍යා ඉගැන්වීම

යමෙක් සාරවූ වචනවලට, එනම් අපගේ 3
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
වචනවලටත් භක්තිවන්තකමේ හැටියටවූ
ධර්මයටත් එකඟ නොවී, වෙනස්
ධර්මයක් උගන්වන්නේ නම්, ඔහු කිසිවක්
නොදන, වචන ගැන ප්‍රශ්නකිරීමෙන්ද 4
වාදකිරීමෙන්ද උමතුව අහංකාරව සිටියි;
එයින් ඊර්ෂ්‍යාවද විවාදයද අපහාසයද
නපුරුයයි සිතීම්ද දූෂ්‍යවූණ සිත් ඇත්තාවූ,
සැබෑවෙන් වෙන්ව සිටින්නාවූ 5
භක්තිවන්තකම ලාභයට මාර්ගයකැයි
සිතන්නාවූ මනුෂ්‍යයන්ගේ නිරන්තර
තරඟද උපදින්නේය.

## සැබෑ ධනවත්කම

ලත් පමණින් සතුටුවීම සමඟ 6
භක්තිවන්තකම මහත් ලාභයක්මය.
මක්නිසාද අප මේ ලෝකයට කිසිවක් 7
ගෙනාවේ නැත, එයින් අපට කිසිවක්
ගෙනයන්ටත් බැරිය. තවද කෑම ඇඳීම 8
අපට ඇත්නම් එයින් සතුටුවන්නෙමුව.
නුමුත් ධනවත්වන්ට ආශා ඇත්තෝ 9
පරීක්ෂාවකද මලපතකද මනුෂ්‍යයන්
නාස්තියෙත් විනාශයෙත් ගිල්වන්නාවූ,
අඥනවූ, අන්තරාය සහිත බොහෝ
තෘෂ්ණාවලද වැටෙන්නෝය. මක්නිසාද 10
වස්තු තෘෂ්ණාව සියලු ආකාර නපුරේ
මුලක්ය. සමහරු ඊට ආලයවී
ඇදහිල්ලෙන් මුළාව ගොස්, බොහෝ
වේදනාවලින් තමූම ඇනගත්තෝය.

## තිමෝතියස්ට අවවාද

නුමුත්, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යය, 11
නුඹ වනාහි මේවායින් පලාගොස්,
ධර්මිෂ්ඨකමද භක්තිවන්තකමද ඇදහිල්ලද
ප්‍රේමයද ස්ථිරකමද මොළොක්ගුණයද
පස්සේ පලයන්න. ඇදහිල්ලේ යහපත් 12

සටනෙන් සටන්කොට සදාකාල ජීවනය
අල්ලාගනින්න, ඊට නුඹ කැඳවනු ලැබ,
බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි
13 යහපත් ප්‍රකාශනය කර සිටියෙහිය. අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
ප්‍රකාශවීම දක්වා නුඹ මේ ආඥාව
කැලලක්ද දෝෂයක්ද නැතුව පවත්වන
14 ලෙස, සියල්ල ජීවත්කරන්නාවූ
දෙවියන්වහන්සේද පොන්තියුස්පිලාත්
ඉදිරියෙහි යහපත් ප්‍රකාශනය කළාවූ
ක්‍රිස්තුස් යේසුස්වහන්සේද ඉදිරියෙහි
15 නුඹට ආඥාකරමි. ශුභාන්විත එකම
අධිපතියාණන්වහන්සේ වන රජවරුන්ගේ
රජව, ස්වාමිවරුන්ගේ ස්වාමිව සිටින
16 එකම අමරණීයවූ, කිසිවෙකුට ළඟාවෙන්ට
බැරි ආලෝකයෙහි වසන්නාවූ, කිසි
මනුෂ්‍යයෙකු විසින් නුදුටුවාවූ, දකින්ටත්
බැරිවූ නැතන්වහන්සේ ඒ ප්‍රකාශවීම
නියම කාලවලදී පෙන්වනවා ඇත.
උන්වහන්සේට ගෞරවයත් සදාකාල
පරාක්‍රමයත් වේවා. ආමෙන්.

මේ ලෝකයේ ධනවතුන් උඩඟු 17
සිත්ඇත්තන් නොවී, වස්තුවේ
අස්ථිරකම කෙරෙහි නොව, සියල්ල
භුක්තිවිඳින පිණිස අපට බහුලලෙස
දෙන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවී සිටින්ටත්, යහපත
කරන්ටත්, උතුම් ක්‍රියාවලින් ධනවත් 18
වෙන්ටත්, ත්‍යාගිවන්නව, බෙදදීමට ලැදිව
සිටින්ටත්, සැබවින් ජීවනයවූ ඒ ජීවනය 19
අල්ලාගන්නා පිණිස මතු කාලයට
යහපත් අත්තිවාරමක් තබාගන්ටත්
ආඥාකරපන්න.

තිමෝතියස්නි, දූනගැන්මයයි බොරුවෙන් 20
කියන දූනගැන්මේ අපහාසිකවූ හිස්
දෙඩවිලිවලින්ද විරුද්ධකම්වලින්ද අහක්ව
සිට, නුඹට භාරදුන් දෙය
ආරක්ෂාකරපන්න; සමහරු ඒ දූනගැන්ම 21
තමුන්ට ඇත්තේය කියා ඇදහිල්ලෙන්
මුළාවුණෝය.

අනුග්‍රහය නුඹ සමග වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් තිමෝතියස්ට ලියනලද දෙවෙනි පත්‍රය

## තිමෝතියස් වෙත ප්‍රේම ආචාරය

1 ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබෙන
ජීවනයේ පොරොන්දුව ලෙස, දෙවියන්-
වහන්සේගේ කැමැත්ත කරණකොටගෙන
ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ ප්‍රේරිතයෙක්ව
2 සිටින පාවුල් නම් මා විසින්, මාගේ
ප්‍රේමවන්ත දරුවා වන තිමෝතියස්ට
ලියා එවන වග නම්: පියවූ දෙවියන්-
වහන්සේගෙන්ද අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගෙන්ද කරුණාවත්
දයාවත් සමාදනයත් වේවා.
3 මම රෑ දවල් කඩනැතුව මාගේ
යාච්ඤාවලදී තුඹ සිහිකරමින්,
මුතුන්මුත්තණුවන් පටන් පවිත්‍ර
හෘදයසාක්ෂියකින් මා සේවයකරන
4 දෙවියන්වහන්සේට ස්තුතිකරමි. එසේය,
තුඹේ කඳුළු සිහිකර, තුඹ තුළ තිබෙන
අවංක ඇදහිල්ල සිහියට ගෙන, මම
ප්‍රීතියෙන් පූර්ණවන පිණිස තුඹ දකින්ට
5 ආශාවෙමි. ඒ ඇදහිල්ල පළමුකොට
තුඹේ ආච්චිවූ ලොයිස් තුළද තුඹේ
මෑණියන්වූ එවුනීකී තුළද වාසයකළාය.
තුඹ තුළත් එය වාසයකරන බව
විශ්වාසකරගන සිටිමි.

## ජ්වලිතව ස්ථිරව සිටීමට අවවාදනුශාසනා

6 ඒ කාරණය නිසා මාගේ අත්තැබීම
කරණකොටගෙන තුඹ තුළ තිබෙන
දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදුකරන
7 හැටියට තුඹට සිහිකරවමි. මක්නිසාද
දෙවියන්වහන්සේ අපට දුන්නේ බියාදුකමේ
ආත්මයක් නොව බලයෙන් ප්‍රේමයෙන්
හික්මවීමෙන් ආත්මයක්ය. එබැවින් 8
අපගේ ස්වාමීන්වහන්සේගේ සාක්ෂිය
ගැනවත් උන්වහන්සේගේ හිරකාරයෙක්
වන මා ගැනවත් ලජ්ජා නොවී,
දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රකාරයට
ශුභාරංචිය නිසා මා සමග දුක් විඳපන්න.
උන්වහන්සේ අපේ ක්‍රියාවල ප්‍රකාරයට 9
නොව තමන්වහන්සේගේම අභිප්‍රායේද
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පූර්ව
කාලවලට ප්‍රථමයෙන් අපට දෙනලද
කරුණාවේද ප්‍රකාරයට අප ගළවා,
ශුද්ධවූ කැඳවීමකින් කැඳවාගත්සේක.
මරණය නැතිකර ජීවනයත් අමරණභාවයත් 10
ශුභාරංචිය කරණකොටගෙන එළිදරව්කළාවූ
අපගේ ගැළවුම්කාරවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශවීමෙන් ඒ
කරුණාව දැන් ප්‍රකාශවී තිබේ. ඒ 11
ශුභාරංචියට මම දේශනාකාරයෙක්ද
ප්‍රේරිතයෙක්ද ගුරුවරයෙක්ද කොට
පත්කරනු ලැබීමි. ඒ කාරණය නිසා මේ 12
දේවලුත් විඳිමි. එසේවී නුමුත් මම ලජ්ජා
නොවෙමි. මක්නිසාද මා විසින්
අදහාගත් තැනන්වහන්සේ කවුද කියා
මම දැනගෙන, මා උන්වහන්සේට භාරදී
තිබෙන දේ ඒ දවස දක්වා
ප්‍රවේසම්කරන්ට උන්වහන්සේ පොහොසත්
බව විශ්වාසකරගන සිටිමි. තුඹ මාගෙන් 13
ඇසූ සාරවූ වචනවල ආදෘශය ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ තුළ තිබෙන ඇදහිල්ල
සහ ප්‍රේමයෙන් යුක්තව අල්ලාගන
සිටපන්න. තුඹට භාරදුන් යහපත් දෙය 14
අප තුළ වසන ශුද්ධාත්මයාණන්වහන්සේ
කරණකොටගෙන ආරක්ෂාකරපන්න.

15 පිගෙලස්ද හර්මොගෙනිස්ද ඇතුළුව
ආසියාවේ සිටින සියල්ලන් මාගෙන්
අහක්ව ගිය බව තුඹ දන්නෙහිය.
16 ඔනේසිපොරස්ගේ පවුලට ස්වාමීන්-
වහන්සේ කරුණාකරනසේක්වා.
මක්නිසාද ඔහු නොයෙක් වර මා
ප්‍රාණවත්කළේය, මාගේ යදම් ගැනත්
17 ඔහු ලජ්ජා නූණේය; ඔහු රෝමයට ආ
කල බොහෝ උත්සාහයෙන් මා සොයා
18 මා සම්බවෙන්ට ආවේය. (ඒ දවසේදී
ඔහුට ස්වාමීන්වහන්සේගෙන් දයාව
ලැබෙන්ට ස්වාමීන්වහන්සේ සලස්වන-
සේක්වා.) ඔහු එපීසයෙහිදී කොපමණ
දේවලින් සේවයකළේද කියා තුඹ
හොඳහැටි දන්නෙහිය.

## ශුභාරංචි මෙහෙයේදී ඉවසිලි-වන්තව සිටීම සහ දුක් දරාගැනීම

2 එබැවින්, මාගේ දරුව, ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ තුළ තිබෙන
කරුණාවෙන් ශක්තිමත්වෙයන්න.
2 බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි තුඹ
මාගෙන් ඇසූ දේම වෙන අයටත්
උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ
3 මනුෂ්‍යයන්ට භාරදීපන්න. ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු
මෙන් දුක් විඳීමට පංගුකාරයෙක්
4 වෙයන්න. භේවාකම් කරන්නාවූ කිසිවෙක්,
ඔහු භේවායෙකු මෙන් ලියාගත් අය
සතුටු කරන පිණිස, මේ ජීවිතයේ
5 කාරණාවලට පටලැවෙන්නේ නැත. තවද
යමෙක් ක්‍රීඩාවන්හි පොරට යන්නේද,
ඔහු නියමලෙස නොයන්නේ නම් ඔටුන්න
6 පැළඳගන්ට ලැබෙන්නේ නැත. වැඩකරන
ගොවියාම පළමුකොට එල භුක්තිවිඳින්ට
7 ඕනෑය. මා කියන දේ කල්පනාකරපන්න;
මක්නිසාද ස්වාමීන්වහන්සේ සියල්ල ගැන
8 තුඹට දැනගැන්ම දෙනවා ඇත. මාගේ
ශුභාරංචියේ ප්‍රකාරයට දාවිත්ගේ
වංශයෙන් උපන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
මළවුන්ගෙන් නැගිට සිටින බව
9 සිහිකරපන්න. ඒ ශුභාරංචිය නිසා
වරදකාරයෙකු මෙන් බැඳුම් යන දුක
පවා විඳිමි; තුමුත් දෙවියන්වහන්සේගේ
වචනය බැඳලා නැත. එබැවින් තෝරාගත් 10
අයද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ
ඇත්තාවූ ගැළවීම සදාකාල තේජස සමග
ලබන පිණිස, ඔවුන් නිසා සියල්ල
ඉවසමි. මේක විශ්වාසවූ කීමක්ය: අපි 11
උන්වහන්සේ සමග මැරුණෙමු නම්
උන්වහන්සේ සමග ජීවත්වන්නෙමුව. අපි 12
ඉවසමු නම් උන්වහන්සේ සමග
රජකම්කරන්නෙමුව. අපි උන්වහන්සේ
නාඳුනමුය කියමු නම්, උන්වහන්සෙත්:
තුඹලා නාඳුනමියි කියනසේක. අප 13
අවිශ්වාසවුණත් උන්වහන්සේ විශ්වාසව
සිටිනසේක. මක්නිසාද තමන්වහන්සේගේ
වචනය බොරුකරන්ට උන්වහන්සේට
බැරිය.

## විවාදකිරීම මගහැරවිය යුතු බව

මේ දේවල් සිහිකරවමින්, කිසි 14
ප්‍රයෝජනයක් නැතුව, අසන්නන්ට හානිය
සිදුවන ලෙස වචන ගැන තරඟ
නොකරන්ට ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
ඔවුන්ට ආඥාකරපන්න. සැබෑවේ වචනය 15
හරි ආකාර පහදදෙන්නාවූ, ලජ්ජාවෙන්ට
ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක්ව,
දෙවියන්වහන්සේට ඒත්තුවුණාවූ
කෙනෙකු මෙන් පෙනෙන්ට
උත්සාහකරපන්න. තුමුත් අපහාසිකවූ 16
හිස් දෙඩවිලිවලින් අහක්ව සිටපන්න.
ඔවුන් අභක්තියේ තව දුරට
ගමන්කරනවා ඇත, ඔවුන්ගේ වචනයද 17
පිළිකාවක් මෙන් කාවදිනවා ඇත.
හිමෙනියස්ද පිලේතස්ද එබඳු අයවල්ය;
ඔව්හු මළවුන්ගෙන් නැගිටීම දැනටම 18
සිද්ධවෙලායයි කියමින් සැබෑකම ගැන
මුළාවී, සමහරුන්ගේ ඇදහිල්ල පෙරළති.
එසේද වුවත්: ස්වාමීන්වහන්සේ තමන්ගේ 19
අය දන්නාසේකැයිද ස්වාමීන්වහන්සේගේ
නාමය සඳහන්කරන සියල්ලෝ
අධර්මිෂ්ඨකමින් පහවෙන්වායිද යන
මුද්‍රාව ඇතුව දෙවියන්වහන්සේගේ ස්ථිර
අත්තිවාරම පවත්නේය. ඉදින් ලොකු 20
ගෙයක රන් රිදී භාජන පමණක් නොව
ලී මැටි භාජනත් ඇත්තේය; සමහරක්
ගෞරවය පිණිසය, සමහරක් අගෞරවය

21 පිණිසය. එබැවින් යමෙක් මේවා අත්ඇර
තමාම පවිත්‍රකරගනී නම්, ඔහු
පිරිසිදුකරනු ලැබුවාවූ, ස්වාමියාගේ
පාවිච්චියට සුදුසුවූ, සියලු යහපත්
වැඩවලට සූදනම්වූ, ගෞරවය පිණිසවූ
22 භාජනයක් වන්නේය. යෞවන වයසේ
තෘෂ්ණාවලින් දුරුව, පිරිසිදු සිතින්
ස්වාමීන්වහන්සේට යාච්ඤාකරන්නන්
සමග ධර්මිෂ්ඨකමත් ඇදහිල්ලත්
ප්‍රේමයත් සමාදානයත් අනුව පලයන්න.
23 නුඹුත් මෝඩවූ අඥානවූ විවාදවලින් ඩබර
උපදින බව දැන, ඒවා එපාකරපන්න.
24 ස්වාමීන්වහන්සේගේ දසයා ඩබර
නොකර, සියල්ලන් කෙරෙහි ගුණවන්තවූ,
උගන්වන්ට සමර්ථවූ, ඉවසිලිවන්තවූ
25 කෙනෙක්ව සිට, විරුද්ධව සිටින්නන්
විසින් සැබෑව දැනගන්නා පිණිසද,
යක්ෂයා තමාගේ කැමැත්ත කිරීමට
අඩුකරගත් ඔවුන් මත්කමෙන් පිබිද,
26 ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද,
දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල
දෙනසේක්දෝයි බලමින් මෘදුකමින්
ඔවුන්ට තරවටුකරන්ට ඕනෑය.

## ඇදහිල්ලෙන් වැටීමක් ගැන කලින් කියාදීම

3 නුඹුත් අන්තිම දවස්වලදී අන්තරා
සහිත කාලවල් පැමිණෙන බව
2 දැනගනින්න. මක්නිසාද මනුෂ්‍යයෝ
තමුන්ටම ප්‍රේමකරන්නෝව, මුදලට
ප්‍රේමකරන්නෝව, පාරට්ටුකරගන්නෝව,
උදරම්කාරයෝව, අපහාසකරන්නෝව,
මවුපියන්ට අකීකරුවන්නෝව, ස්තුතිවන්ත
3 නොවන්නෝව, අභක්තිකයෝව, ජන්ම
ස්නේහය නැත්තෝව, සමාදාන
නොවන්නෝව, කේලාම්කියන්නෝව,
තෘෂ්ණාව මැඩපවත්වා නොගන්නෝව,
කෲරයෝව, යහපතට ප්‍රේමනොකරන්නෝව,
4 ද්‍රෝහියෝව, හිතුවක්කාරයෝව,
අහංකාරයෝව, දෙවියන්වහන්සේට වඩා
සැපසෙල්ලමට ප්‍රේමකරන්නෝව,
5 දේවභක්තියේ වේසය දරන නුමුත්, එහි
බලය එපාකළ අයව සිටින්නෝය. එබඳු
6 අයගෙන් අහක්වෙයන්න. මක්නිසාද
මොවුන්ගෙන් සමහරු ගෙවල්වලට
ඇතුල්වී, පාපවලින් බරවූ, අනේකාකාර
තෘෂ්ණාවලින් ගෙනයනු ලබන්නාවූ,
නිතර ඉගෙනගන්න නුමුත් කිසිකලකත් 7
සත්‍යය දැනගැනීමට පැමිණෙන්ට බැරිවූ,
මෝඩ ස්ත්‍රීන් වහල්කරගන්නාවූ අය වෙති.
යන්නෙස් සහ යම්බ්‍රෙස් මෝසෙස්ට 8
විරුද්ධව සිටියාක්මෙන් මොව්හු සැබෑවට
විරුද්ධව සිටිති; මොව්හු දූෂ්‍ය
සිත් ඇත්තාවූ ඇදහිල්ල සම්බන්ධව
නිෂ්ප්‍රයෝජනවූ මනුෂ්‍යයෝය. නුමුත් 9
මොවුන්ට නවත් දුර යන්ට ලැබෙන්නේ
නැත. මක්නිසාද ඒ නැනැත්තන්ගේ
අනුවණකම ප්‍රකාශවුණාක්මෙන්ම
මොවුන්ගේ අනුවණකමත් සියල්ලන්ට
ප්‍රකාශවෙනවා ඇත.

## තිමෝතියස්ගේ පරෙස්සමට ගුරුකම්

නුමුත් නුඹ මාගේ ඉගැන්වීමද හැසිරීමද 10
අභිප්‍රායද ඇදහිල්ලද ඉවසිලිවන්තකමද
ප්‍රේමයද ක්ෂාන්තියද, අන්තියෝකියේදීත් 11
ඉකෝනියේදීත් ලුස්ත්‍රාවේදීත් මට
සිදුවුණාවූ මට පැමුණුණ පීඩාද
දුක්විඳීම්ද බලාගත්තෙහිය. එයාකාර
පීඩා වින්දෙමි, ඒ සියල්ලෙන්ද ස්වාමීන්-
වහන්සේ මා මිදූසේක. එසේය, ක්‍රිස්තුස් 12
යේසුස්වහන්සේ තුළ භක්තිවන්තලෙස
ජීවත්වන්ට කැමති සියල්ලෝම පීඩා
විඳින්නෝය. නුමුත් නපුරු මනුෂ්‍යයෝත් 13
රැවටිලිකාරයෝත් රවටමින්ද රැවටෙමින්ද
වඩ වඩා නරක්වන්නෝය. එහෙත් නුඹ 14
ඉගෙනගත්තාවූ, නුඹට සහතිකවූ
කාරණා කොයි නැනැත්තන්ගෙන්
ඉගෙනගත්තෙහිද කියාත්, ක්‍රිස්තුස් 15
යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
කරණකොටගෙන ගැළවීම පිණිස නුඹ
නැණවත්කරන්ට පුළුවන්වූ ශුද්ධලියවිලි
නුඹ බාල වයසේ පටන් දැනගෙන සිටින
බවත් දැන, ඒවායෙහි පිහිටා සිටපන්න.
දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා 16
සම්පූර්ණ ව, සියලු යහපත් ක්‍රියාවලට
සූදනම්ව සිටින පිණිස දේවානුභාවයෙන්
දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්

තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම
ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව
තිබේ.

## කාලය නපුරු බැවින් උනන්දුව සිටීම අවශ්‍ය බව. ප්‍රේරිත තැනගේ ඉකුත්වීම ළංව තිබෙන බව

4 දෙවියන්වහන්සේ ඉදිරියෙහිද, ජීවත්ව
සිටින්නන් සහ මළවුන්ද
විනිශ්චයකරන්ට සිටින ක්‍රිස්තුස්
යේසුස්වහන්සේ ඉදිරියෙහිද, උන්වහන්සේගේ
ප්‍රකාශවීම හා උන්වහන්සේගේ රාජ්‍යයේ
නාමයෙන් මා විසින් නුඹට අණකරන්නේ
2 නම්: වචනය දේශනාකරපන්න; කලටත්
අකලටත් වැඩේ යෙදී සිටපන්න; සියලු
ආකාර ඉවසිලිවන්තකමෙන් සහ
ඉගැන්වීමෙන් තරවටුකර, අවවාදකර,
3 අනුශාසනාකරපන්න කියාය. මක්නිසාද
ඔවුන් සාරවත් ඉගැන්වීම නොඉවසා,
කසන කන් ඇතුව, තමුන්ගේ ආශාවල්
ලෙස තමුන්ටම ගුරුවරුන් රැස්කරගෙන,
4 සත්‍යයට කන් නොදී, ප්‍රබන්ධවලට හැරී
5 යන කාලය පැමිණෙන්නේය. නුමුත් නුඹ
සියලු කාරණාවලදී සිහි ඇතුව
සිටපන්න, දුක් ඉවසාපන්න, ශුභාරංචිය
ප්‍රකාශකරන්නෙකුගේ වැඩේ කරපන්න,
නුඹේ සේවය සම්පූර්ණකරපන්න.
6 මක්නිසාද මම දන් *යාග කරනු
ලබමින් සිටිමි, මාගේ ඉකුත්වීමේ කාලයද
7 පැමිණ තිබේ. මම යහපත් යුද්ධයෙහි
යුද්ධකළෙමි, මම දිවීම කෙළවරකළෙමි,
8 මම ඇදහිල්ල රක්ෂාකළෙමි. මෙතැන්
පටන් ධර්මිෂ්ඨකමේ ඔටුන්න මට තබා
තිබේ, එය ධර්මිෂ්ඨ විනිශ්චයකාරවූ
ස්වාමීන්වහන්සේ ඒ දවසේදී මට දෙනවා
ඇත. මට පමණක් නොවේ,
උන්වහන්සේගේ ප්‍රකාශවීමට ආශාව
සිටින්නාවූ සියල්ලන්ටද දෙනවා ඇත.

## පුද්ගලික ඉල්ලීම්. අවසානය

9 මා ළඟට නොපමාව එන්ට වෑයම්
10 කරපන්න. මක්නිසාද දේමස් මේ ලෝකයට
ආලයවී, මා අත්හැර තෙසලෝනිකයට
ගියේය. ක්‍රෙස්කෙන්ස් ගලාතියටත් තීතස්
දල්මාතියටත් ගියෝය. ලූක් පමණක් 11
මා සමග සිටියි. මාර්ක් නුඹ කැටුව
කැඳවාගෙන වරෙන්න. මක්නිසාද සේවය
ගැන ඔහු මට ප්‍රයෝජනවත්ය. තුඛිකස් 12
එපීසයට යැවීමි. ත්‍රෝවසෙහි කාර්පස් 13
ළඟ මා තබා ආ සළුවද පොත්ද,
ප්‍රධානකොට සම්පොත්ද, නුඹ එන විට
ගෙනෙන්න. ලෝකරුවාවූ අලෙක්ෂන්දර් 14
මට බොහෝ නපුරුකම් පෑවේය. ස්වාමීන්-
වහන්සේ ඔහුගේ ක්‍රියාවල් ලෙස ඔහුට
විපාකදෙනවා ඇත. ඔහු අතිශයින් 15
අපගේ වචනවලට විරුද්ධව සිටිය නිසා
නුඹත් ඔහුගෙන් ප්‍රවේසම්වෙයන්න. මාගේ 16
පළමුවෙනි උත්තරදීමේදී කිසිවෙක් මා
සමග නොසිට සියල්ලෝම මා අත්හැර
ගියෝය. ඒක ඔවුන්ගේ ගණනට
තබන්ට නොයෙදේවා. නුමුත් මා 17
කරණකොටගෙන පණිවිඩය සම්පූර්ණ
ලෙස ප්‍රකාශවන පිණිසත් එය සියලු
අන්‍යජාතීන්ට අසන්ට ලැබෙන පිණිසත්
ස්වාමීන්වහන්සේ මා ළඟ සිට මා
ශක්තිමත්කළසේක. මම සිංහයාගේ
කටින් මුදනු ලැබීමි. ස්වාමීන්වහන්සේ 18
හැම නපුරු වැඩවලින් මා මුද
ආරක්ෂාකොට, තමන්වහන්සේගේ
ස්වර්ගීය රාජ්‍යයට මා පමුණුවනසේක.
උන්වහන්සේට සදාකාලයටම මහිමය
වේවා. ආමෙන්.

ප්‍රිස්කාටද අකිලාටද ඔනේසිපොරස්ගේ 19
පවුලටද ආචාරකරපන්න. එරස්තස් 20
කොරින්තියෙහි නැවතුණේය. නුමුත්
ත්‍රොපිමස් ලෙඩවූ බැවින් මිලේතසෙහි
නවත්වා ආවෙමි. ශීත කාලයට 21
පළමුවෙන් එන්ට වෑයම්කරපන්න.
යුබුලස්ද පුදෙන්ස්ද ලිනස්ද ක්ලෞදියාද
සියලු සහෝදරයෝද නුඹට ආචාර
කරති.

ස්වාමීන්වහන්සේ නුඹේ ආත්මය සමග 22
සිටිනසේක්වා. අනුග්‍රහය නුඹලා සමග
වේවා.

*එනම්—දියර පූජාවක් මෙන් වගුරුවනු ලබමි.

# ප්‍රේරිතවූ පාවුල් විසින් තීතස්ට ලියනලද පත්‍රය

## ආචාරය

1 බොරු නොකියන දෙවියන්වහන්සේ
පූර්ව කාලවලට ප්‍රථමයෙන්
2 පොරොන්දුවුණාවූ, අපේ ගැළවුම්කාරයා
වන දෙවියන්වහන්සේගේ ආඥාව
ලෙස මට භාරදෙනලද පණිවිඩයෙන්
තමන්වහන්සේගේ වචනය ප්‍රකාශකිරීමෙන්
නියම කාලවලදී එළිදරව්කළාවූ සදාකාල
ජීවනයේ බලාපොරොත්තුව සඳහා,
3 දෙවියන්වහන්සේගේ තෝරාගත්
අයවලුන්ගේ ඇදහිල්ලද දේවභක්තියේ
හැටියට තිබෙන සත්‍යය දැනගැන්මද
උදෙසා, දෙවියන්වහන්සේගේ දාසයෙක්ව
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයෙක්ව
4 සිටින පාවුල් නම් මා විසින්, පොදු
ඇදහිල්ලේ හැටියට මාගේ සැබෑ දරුවාවූ
තීතස්ට ලියා එවන වග නම්: පියවූ
දෙවියන්වහන්සේගෙන්ද අපගේ ගැළවුම්-
කාරයාවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේගෙන්ද
කරුණාවත් සමාදානයත් වේවා.

## වැඩිමහල්ලන් පත්කිරීම

5 මා එන විට තුඹ ක්‍රීතෙහි නැවැත්වූ
කාරණය නම්, අඩුව තිබුණු දේවල්
තුඹ විසින් පිළිවෙළට යොදන පිණිසත්
මා තුඹට ආඥාකළ ලෙස නුවරක් පාසා
වැඩිමහල්ලන් පත්කරන පිණිසත්ය;
6 පත්වෙන අය වනාහි නිදෙස්ව, එක
භාර්යාවකට පුරුෂයාව, අවකල් ක්‍රියාව
ගැන දෝෂාරෝපණය නොලත් කීකරුවූ
ඇදහිලිවන්ත දරුවන් ඇතුව සිටින්ට
7 ඕනෑය. මක්නිසාද නායකයා දෙවියන්-
වහන්සේගේ ගබඩාකාරයෙක් මෙන්
නිදෙස්වූ, හිතුවක්කාර නොවූ,
නොකිපෙන්නාවූ, බේබද්දෙක් නොවූ,
ගහගන්නෙක් නොවූ, නින්දිත ලාභයට
ගිජු නොවූ, ආගන්තුක සත්කාරයට 8
කැමතිවූ, යහපතට ප්‍රේමකරන්නාවූ,
සන්සුන් සිතක් ඇත්තාවූ, ධර්මිෂ්ඨවූ,
ශුද්ධවූ, පමණ දැන ක්‍රියාකරන්නාවූ
කෙනෙක්ව සිටින්ට ඕනෑය. තවද ඔහු 9
සාරවත් ගුරුකමින් අවවාදකරන්ටත්
විරුද්ධවාදීන් නිශ්ශබ්දකරන්ටත්
පුළුවන්වන පිණිස ඉගැන්වීමට එකඟවූ
විශ්වාස වචනය තදින් අල්ලාගෙන
සිටින්ට ඕනෑය.

## බොරු ගුරුවරු

මක්නිසාද මුරණ්ඩුවූ, නිෂ්ඵල 10
කථාකාරයෝවූ, රැවටිලිකාරවූ බොහෝ
දෙනෙක් සිටිති, ප්‍රධානකොට එසේව
සිටින්නේ චර්මඡේදිතයෝය. ඔවුන්ගේ 11
කට පියවන්ට ඕනෑය; ඔව්හු නීච ලාභය
නිසා යුතු නැති දේ උගන්වමින් මුළු
පවුල් පෙරළති. ක්‍රීත්වරු නිතරම 12
බොරුකාරයෝය, නපුරු මෘගයෝය,
කම්මැලි කෑදරයෝයයි ඔවුන්ගෙන්
එක්කෙනෙක්වූ ඔවුන්ගේම ප්‍රොපේත-
කෙනෙක් කියා තිබේ. මේ සාක්ෂිය 13
සැබෑය. මේ කාරණය නිසා ඔවුන් යුදෙව්
ප්‍රබන්ධද සැබෑකමෙන් අහක්ව යන
මනුෂ්‍යයන්ගේ ආඥාද නොසලකා,
ඇදහිල්ලෙහි හරිලෙස සිටින පිණිස 14
ඔවුන්ට තදින් තරවටුකරපන්න. පවිත්‍ර 15
අයට සියලු දේ පවිත්‍රය. නුමුත් කිලුටුවූ
නොඇදහිලිකාරවූ අයට කිසිවක් පවිත්‍ර

නැත; ඔවුන්ගේ සිහියත් හෘදයසාක්ෂියත්
16 කිලුටුව තිබේ. ඔව්හු දෙවියන්වහන්සේ
දනගත සිටින බව කියති; නුමුත් ඔව්හු
පිළිකුල්ව, අකීකරුව, සියලු යහපත් ක්‍රියා
ගැන නිෂ්ප්‍රයෝජනව සිටින බැවින්
තමුන්ගේ ක්‍රියාවලින් උන්වහන්සේව
නාඳුනන බව ප්‍රකාශකරති.

## ක්‍රිස්තියානි චරිතය ගැන අවවාද

2 නුමුත් නුඹ සාරවූ ගුරුකමට
2 හොබිනා දේ කථාකරපන්න. එනම්
මහලු පුරුෂයන් පමණ දන, සන්සුන්ව,
සිහියෙන් යුක්තව, ඇදහිල්ලෙහිත්
ප්‍රේමයෙහිත් ඉවසීමෙහිත් හරි ලෙස සිටිය
3 යුතුය. එසේම මහලු ස්ත්‍රීවරුත් ශුද්ධකමට
ඔබිනලෙස හැසිරෙන, කේලාම්
නොකියන, බොහෝ මුද්‍රිකපානයට
නොවහල්වූ, යහපත් දේ උගන්වන්නාවූ
4 තැනැත්තියන්ව සිටිය යුතුය. මෙසේ සිටිය
යුතු වන්නේ, දෙවියන්වහන්සේගේ
වචනයට අපහාස නොපැමිණෙන පිණිස
යෞවන ස්ත්‍රීන් තමුන්ගේ පුරුෂයන්ටත්
5 දරුවන්ටත් ප්‍රේමකරමින්, සිහියෙන්
යුක්තව, පිරිසිදුව, ගෙදර වැඩ
කරන්නියන්ව, කරුණාවන්තව, තමුන්ගේම
පුරුෂයන්ට යටත්ව සිටින්ට ඔවුන් විසින්
6 පුරුදුකරවන පිණිසය. එසේම
යෞවනයන්ට සිහියෙන් යුක්තව සිටින්ට
7 අවවාදකරපන්න. සියල්ලෙහිදී නුඹම
යහපත් ක්‍රියාවල ආදර්ශයක් වෙයන්න;
විරුද්ධකාරයාට අප ගැන කිසි නපුරක්
8 කියන්ට නැතුව, ලජ්ජාවන පිණිස නුඹේ
ගුරුකමෙන් පිරිසිදුකමත් සන්සුන්කමත්
නිවරදිවූ සාරවූ කථාවත් පෙන්වාපන්න.
9 දසයන් විසින්, අපේ ගැළවුම්කාරයාණන්
වන දෙවියන්වහන්සේගේ ධර්මය සියලු
කාරණාවලදී අලංකාර කරන පිණිස
තමුන්ගේ ස්වාමිවරුන්ට යටත්ව සිට,
සියලු කාරණාවලදී ඔවුන් ප්‍රසන්නකරන
10 හැටියටද, විරුද්ධවාදිව නොසිට,
සොරකම් නොකොට, සියලු ආකාර
හොඳ විශ්වාසකම පෙන්වන හැටියටද
ඔවුන්ට අවවාදකරපන්න.

## ක්‍රිස්තියානි යුතුකම් සඳහා පොලඹවන්නාවූ කාරණය

මක්නිසාද සියලු මනුෂ්‍යයන්ට 11
ගැළවීම ගෙනෙන්නාවූ දෙවියන්-
වහන්සේගේ කරුණාව ප්‍රකාශවී තිබේ.
අභක්තිකකමද ලෞකික තෘෂ්ණාද 12
එපාකර, ආශීර්වාදලත් බලාපොරොත්තුව
ගැනත් මහෝත්තම දෙවියන්වහන්සේගේද
අපගේ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේද තේජසේ ප්‍රකාශවීම ගැනත්
බලාසිටිමින්, සිහියෙන් යුක්තවද 13
ධර්මිෂ්ඨලෙසද භක්තිවන්තලෙසද මේ
ලෝකයෙහි ජීවත්වෙන පිණිස ඒ
කරුණාව අප දනුමැතිකරන්නේය.
උන්වහන්සේ සියලු අධර්මිෂ්ඨකම්වලින් 14
අප මුදා, යහපත් ක්‍රියා ගැන ජ්වලිතවූ
සෙනඟක් ස්වකීය සම්පතක් කොට
පවිත්‍රකරගන්න පිණිස, අප උදෙසා
තමන්ම දුන්සේක.
මේ දේවල් සියලු ආකාර බලය ඇතුව 15
කියා, අවවාදකොට, තරවටුකරපන්න.
කිසිවෙකුට නුඹ සුළුකොට සිතන්ට ඉඩ
නාරින්න.

## ක්‍රිස්තියානි යුතුකම. අපට පෙන්වනලද දේව කරුණාව

3 අධිපතීන්ටත් බලය ඇත්තන්ටත්
යටත්වෙන්ටද, කීකරුවෙන්ටද, සියලු
යහපත් වැඩවලට සූදනම්ව සිටින්ටද,
කිසිවෙකු ගැන අගුණ නොකියන්ටද, 2
ඩබරකාරයන් නොවී ඉවසිලිවන්තව සිට,
සියලු මනුෂ්‍යයන් ගැන සියලු ආකාර
මොළොක්ගුණය පෙන්වන්ටද ඔවුන්ට
සිහිකරවාපන්න. මක්නිසාද අපිත් වරක් 3
අඥනව, අකීකරුව, මුළාව, අනේකාකාර
තෘෂ්ණාවලටත් සැප සෙල්ලම්වලටත්
වාල්ව, ක්‍රෝධයෙන් හා ඊර්ෂ්‍යාවෙන්
හැසිරෙමින්, නුරුස්සනු ලබන්ට
නිස්සෝව, එකිනෙකාට වෛරකරමින්
සිටියෙමුව. නුමුත් අපගේ 4
ගැළවුම්කාරයාණන් වන දෙවියන්-
වහන්සේගේ ගුණවන්තකමද මනුෂ්‍යයන්
කෙරෙහි ඇති ප්‍රේමයද ප්‍රකාශවූ කල,

5 අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ
ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ
දයාව ලෙස නැවත ඉපදීම නැමති
සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ
අලුත්කිරීමෙන්ද උන්වහන්සේ අප
6 ගැළවූසේක. එසේය, උන්වහන්සේගේ
කරුණාවෙන් අප ධර්මිෂ්ඨකරනු ලැබ,
සදාකාල ජීවනයේ බලාපොරොත්තුවේ
හැටියට උරුමක්කාරයන් වන පිණිස,
7 උන්වහන්සේ අපගේ ගැළවුම්කාරයාණන්වූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට-
ගෙන ශුද්ධාත්මය අධිකලෙස අප
8 පිට වැගිරෙවූසේක. මේක විශ්වාසවූ
කීමක්ය. දෙවියන්වහන්සේ කෙරෙහි
අදහාගන සිටින්නන් යහපත් ක්‍රියාවල
යෙදී සිටින්ට බලාගන්නා පිණිස තුඹ
විසින් මේ දේවල් සහතිකලෙස කියනවාට
කැමැත්තෙමි. මේවා මනුෂ්‍යයන්ට
යහපත්වූ ප්‍රයෝජනවත්වූ දේවල්ය.

## පුද්ගලික කාරණා. ලබධිභේදකයන් එපාකිරීම

9 තුමූන් මෝඩ වාද, පෙළපත් කථා,
විවාද, ව්‍යවස්ථාව ගැන ඩබර යන
මේවායින් අහක්වෙයන්න; මක්නිසාද
ඒවා නිෂ්ඵලය, නිරර්ථකය. භේදකාර 10
මනුෂ්‍යයා පෙරළී ඉන්න බවත් දනගනම
පව්කරන බවත් තුඹ දන්න බැවින්,
පළමුවෙනි දෙවෙනි අවවාදයෙන් පසු 11
ඔහු එපාකරපන්න.

මම නිකපොලිසෙහි ශීත කාලයේ 12
සිටින්ට නියමකරගත් බැවින් අර්තිමස්
හෝ තුකීකස් හෝ තුඹ ළඟට එවූවාම
එහි මා ළඟට එන්ට උත්සාහකරපන්න.
නීතිඥයෙක්වූ සේනස්ටත් අපොල්ලොස්ටත් 13
කිසි අඩු පාඩුවක් නොවන පිණිස
ඔවුන්ගේ ගමනට කඩිසරලෙස
උපකාරකරපන්න. තවද අපේ අයවලුත් 14
ඵල නැතුව නොසිටින පිණිස
වුවමනාකරන දේවල් සඳහා යහපත්
වැඩවල යෙදී සිටින්ට ඉගෙනගනිත්වා.
මා සමග සිටින සියල්ලෝම තුඹට 15
ආචාරකරති. ඇදහිල්ලෙහි අපට ප්‍රේම
කරන්නන්ට ආචාරකරපන්න.

අනුග්‍රහය තුඹලා සියල්ලන් සමග
වේවා.

# ප්‍රේරිතවූ පාවුල් විසින් පිලෙමොන්ට ලියනලද පත්‍රය

## ප්‍රාරම්භ වචන

1 ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ
හිරකාරයෙක් වන පාවුල්ද සහෝදරවූ
තිමෝතියස්ද යන අප විසින් අපේ
ප්‍රේමවන්තවූ හවුල් සේවකයෙක්වූ
2 පිලෙමොන්ටද, අපේ සහෝදරීවූ අපියාටද
අපේ හවුල් භේවායෙක්වූ අර්කිපස්ටද
තුඹේ ගෙදර තිබෙන සභාවටද ලියා
3 එවන වග නම්: අපේ පියවූ දෙවියන්-
වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගෙන්ද කරුණාවත්
සමාදනයත් තුඹලාට වේවා.
4 ස්වාමිවූ යේසුස්වහන්සේ කෙරෙහිද
සියලු ශුද්ධවන්තයන් කෙරෙහිද තිබෙන
තුඹේ ප්‍රේමයත් ඇදහිල්ලත් ගැන මම
5 අසා, තුඹ තුළ පවතින සියලු යහපත්
දේ ගැන දනගැනීමෙන් තුඹේ ඇදහිල්ලේ
හවුල්කාරකම ක්‍රිස්තුස්වහන්සේ උදෙසා
6 බලවත්වන පිණිස, මාගේ යාච්ඤාවලදී
තුඹ ගැන මතක් කරමින් නිතරම
මාගේ දෙවියන්වහන්සේට ස්තුතිකරමි.
7 මක්නිසාද සහෝදරය, තුඹ
කරණකොටගෙන ශුද්ධවන්තයන්ගේ සිත්
ප්‍රාණවත්කරනු ලබන බැවින් තුඹේ
ප්‍රේමය නිසා බොහෝ සන්තෝෂයද
සැනසිල්ලද මට ලැබුණේය.

## සැඟවීගිය තුමූත් දත් ක්‍රිස්තියානිකාරයෙක් ව සිටින ඔනේසිමස් නම් දසයා ගැන අයැදීම

8 ඒ නිසා සුදුසුව තිබෙන දෙය තුඹට
ආඥකරන්ට ක්‍රිස්තුස්වහන්සේ තුළ මට
9 බොහෝ නිසැකකම තිබෙන තුමුත්, එසේ
නොකර, මහලුව, දනට ක්‍රිස්තුස්
යේසුස්වහන්සේගේ හිරකාරයෙක්ව සිටින
පාවුල් නම් මම, ප්‍රේමය නිසා ඉල්ලා
සිටිමි. එසේ මා තුඹෙන් උදක්ම 10
ඉල්ලන්නේ මා බැඳුම්වල සිටියදී
ජානකකළ මාගේ දරුවෙක්වූ ඔනේසිමස්
ගැනය. ඔහු වරක් තුඹට නිෂ්ප්‍රයෝජනව 11
සිටිය තුමුත් දන් තුඹටත් මටත්
ප්‍රයෝජනව සිටියි. මාගේම සිත වැනිවූ 12
ඔහු තුඹ වෙත නැවත එවීමි. ශුභාරංචිය 13
නිසාවූ බැඳුම්වලදී ඔහු තුඹ වෙනුවෙන්
මට උපස්ථාන කරන පිණිස මා වෙත
සිටුවාගන්ට කැමතිව සිටියෙමි. තුමුත් 14
තුඹේ යහපත්කම බලයෙන් වාගේ නොව
නිදහස් කැමැත්තෙන් වන පිණිස, තුඹේ
කැමැත්ත නැතුව කිසිත් කරන්ට
සතුටු නුණෙමි. මක්නිසාද සමහරවිට 15
ඔහු කලකට තුඹෙන් වෙන්වුණේ, මෙතැන්
පටන් දසයෙකු කොට නොව දසයෙකුට
වඩා ප්‍රේමවන්ත සහෝදරයෙකු කොට
සදකාලේටම ඔහු තුඹට ලැබෙන පිණිස
වෙන්ට පුළුවන. විශේෂ ලෙස මට 16
ප්‍රේමවන්ත සහෝදරයෙක්වූ ඔහු
කොපමණ වැඩියෙන් මාංසාකාරයෙන්
සහ ස්වාමීන්වහන්සේ තුළ තුඹටත්
එසේ නොවන්නේද. ඉදින් තුඹ මා 17
පංගුකාරයෙකු කොට සිතනවා නම්,
මා වාගේ ඔහු පිළිගනින්න. ඔහු තුඹට 18
අයුත්තක් කළා නම්, නොහොත් තුඹට
ණයව සිටිනවා නම්, ඒක මාගේ
ගණනට තබාපන්න. පාවුල් නම් මම 19
මාගේම අතින් මේක ලියමි: මම ඒක
ගෙවන්නෙමි. [මෙසේ කියන්නේ] තුඹම
මට ණයක්ව සිටින බව තුඹට

20 නොකියන පිණිසය. එසේය, සහෝදරය,
ස්වාමීන්වහන්සේ තුළ තුඹෙන් මට
*ප්‍රීතිය ලැබේවා. ක්‍රිස්තුස්වහන්සේ තුළ
21 මාගේ සිත ප්‍රාණවත්කරපන්න. මා තුඹට
ලියා එවන්නේ මා කියනවාටත් වඩා
තුඹ කරන බව මා දැන, තුඹේ කීකරුකම
22 විශ්වාසකරගනය. ඒ ඇර මට නවාතැනක්
සූදනම් කරපන්න. මක්නිසාද තුඹලාගේ
යාච්ඤා කරණකොටගෙන මා තුඹලාට
දෙනු ලැබේයයි බලාපොරොත්තුවෙමි.
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මාගේ 23
හවුල් හිරකාරයාවූ එපප්‍රස්ද මාගේ හවුල් 24
සේවකයන් වන මාර්ක්ද අරිස්තාර්කස්ද
දේමස්ද ලූක්ද තුඹට ආචාර කරති.
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්- 25
වහන්සේගේ කරුණාව තුඹලාගේ ආත්ම
සමග වේවා. ආමෙන්.

*නොහොත්, ප්‍රයෝජන.

# හෙබ්‍රෙව්වරුන්ට ලියනලද පත්‍රය

### පුත්‍රවූ තැනන්වහන්සේ ප්‍රොපේතවරුන්ටත් දේවදූතයන්ටත් වඩා උතුම් බව

1 දෙවියන්වහන්සේ ආදි කාලයෙහි
බොහෝ කොටස්වලින්ද බොහෝ
අන්දම්වලින්ද ප්‍රොපේතවරුන් ලවා
2 පියවරුන්ට කථාකරවා, මේ දවස්වල
කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන්
ලවා අපට කථාකෙරෙව්වූසේක.
උන්වහන්සේව සියල්ලට උරුමක්කාරයා
කළසේක, උන්වහන්සේ කරණකොටගෙන
3 ලෝකවල් සෑදූසේක. උන්වහන්සේ
දෙවියන්වහන්සේගේ මහත්තත්ත්වයේ
ප්‍රභාවයද උන්වහන්සේගේ දේවත්වයේ
ස්වරූපයද වනසේක්, තමන්ගේ
බලපරාක්‍රමයේ වචනයෙන් සියල්ල
දරමින්, පව් ගැන පවිත්‍රවීමක් කළ පසු,
උසස්ථානවල මහෝත්තමයාණන්-
වහන්සේගේ දකුණු පැත්තේ හිඳගත්සේක.
4 මෙසේ දේවදූතයන්ට වඩා උත්කෘෂ්ට
නාමයක් උන්වහන්සේට උරුමව තිබෙන
ලෙසම ඔවුන්ට වඩා එපමණ
5 උතුම්වූසේක. මක්නිසාද:

තුඹ මාගේ පුත්‍රයාය,
මම අද තුඹ ජනිතකෙළෙමියි

කියාත්,

මම ඔහුට පියෙක් වන්නෙමි,
ඔහු මට පුත්‍රයෙක් වන්නේය

කියාත්, දේවදූතයන්ගෙන් කවරෙකුට යම්
කලක උන්වහන්සේ කීසේක්ද?
6 උන්වහන්සේ තමන්ගේ කුලුඳුල් පුත්‍රයා
ලෝකයට නැවත ගෙනෙන කල:
දෙවියන්වහන්සේගේ සියලු දූතයෝ
උන්වහන්සේට නමස්කාරකරත්වයි
7 කියනසේක. දේවදූතයන් ගැන වනාහි:

උන්වහන්සේ ස්වකීය දූතයන් සුළංද
ස්වකීය සේවකයන් ගිනි දැලක්ද
කරනසේකැයි

කියනසේක. නුමුත් පුත්‍රයා ගැන 8
කථාකොට:

දෙවියන්වහන්ස, ඔබගේ සිංහාසනය
සදාකාලේටම පවත්නේය;
ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය
යුක්තියේ ජයකොන්තයක්ය.
ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රියව අධර්මිෂ්ඨ- 9
කමට ද්වේෂකළසේක;
එබැවින් දෙවියන්වහන්සේ, ඔබගේ
දෙවියන්වහන්සේ, ඔබගේ
සහකාරයන්ට වඩා
ප්‍රීතිය නමැති තෛලයෙන් ඔබ
ආලේපකළසේකැයි

කියනසේක.

නැවතද: 10

ස්වාමිනි, පටන්ගැන්මේදී ඔබ
පොළොවේ අත්තිවාරම දැමූසේක,
ස්වර්ගවල් ඔබගේ හස්තකර්ම වෙති.
ඒවා විනාශවන්නේය; නුමුත් ඔබ 11
පවතිනසේක.
ඒ සියල්ල වස්ත්‍රයක් මෙන්
පරණවන්නේය;
ඔබ ඒවා සළුවක් මෙන් අකුළනසේක, 12
වස්ත්‍රයක් මෙන් ඒවා මාරුවන්නේය.
නුමුත් ඔබ එකාකාරමය,
ඔබගේ අවුරුදු කීන්දු නොවන්නේයයි

කියනසේක.

නුමුත්: 13

මා විසින් තුඹේ සතුරන් තුඹේ පාපුටුව
කරන තෙක්
මාගේ දකුණු පැත්තේ හිඳගනින්නැයි

දේවදූතයන්ගෙන් කවරෙකුට කොයි
කලක උන්වහන්සේ කීසේක්ද? ඔවුන් 14

සියල්ලෝ ගැළවීම උරුමකරගන්ට
සිටින්නන් උදෙසා සේවයකරන පිණිස
එවනු ලබන සේවක ආත්මයෝ
නොවෙද්ද?

## ශුභාරංචිය සුළුකිරීමේ අන්තරාය

2 ඉන්නිසා අසන්ට ලැබූ දේවලින්
අප යම් අන්දමකින් අහක්ව නොයන
පිණිස ඒවා වඩා ඕනෑකමින් අප විසින්
2 සැලකිය යුතුය. මක්නිසාද දේවදූතයන්
කරණකොටගෙන කියනලද වචනය
ස්ථිරවී, සියලු වරද ක්‍රියාවලටත්
අකීකරුකම්වලටත් සාධාරණ
3 විපාකයක් ලැබුණේ වීනම්, පළමුවෙන්
ස්වාමීන්වහන්සේ කරණකොටගෙන
කියනලද්දවූ, ඇසූවන් විසින් අපට
ස්ථිරකරදුන්නාවූ මෙපමණ මහත් ගැළවීම
අපි නොසලකා සිටියොත් කොහොම
4 ගැළවෙමුද? දෙවියන්වහන්සෙත්
ලකුණුවලින්ද පුදුමවලින්ද අනේකාකාර
ආශ්චර්යවලින්ද ස්වකීය කැමැත්ත
ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගේ
දීමනාවලින්ද ඊට සාක්ෂිදුන්සේක.
5 මක්නිසාද අපි යම් ලෝකයක් ගැන
කථාකරමුද, පැමිණෙන්ට තිබෙන ඒ
ලෝකය උන්වහන්සේ යටත්කළේ
6 දේවදූතයන්ට නොවේය. තුමූන්
එක්කෙනෙක් එක් තැනක සාක්ෂිදෙමින්:
ඔබ විසින් මනුෂ්‍යයා සිහිකරන්ට
නොහොත්
මනුෂ්‍ය පුත්‍රයා දෙස බැලීමට ඔහු
කවරෙක්ද?
7 ඔබ දේවදූතයන්ට වඩා ඔහු මඳක්
පහත්කළසේක;
ඔබ තේජසද ගෞරවයද නමැති
ඔටුන්න ඔහුට පැළඳවූසේක,
ඔබගේ හස්තකර්ම කෙරෙහි ඔහු
ආණ්ඩුකාරයා කළසේක.
8 ඔබ සියල්ලම ඔහුගේ පාදවලට
යටත්කළසේකැයි
කීය. එසේය, උන්වහන්සේ සියල්ල ඔහුට
යටත්කළ බැවින් කිසිවක් යටත්
නොකොට හැරියේ නැත. එහෙත් දැන්
සියල්ල ඔහුට යටත්කර තිබෙන බව
නවම අපට නොපෙනේ. තුමූන් 9
දෙවියන්වහන්සේගේ කරුණාවෙන්
සියල්ලන් උදෙසා මරණය විඳින පිණිස
දේවදූතයන්ට වඩා මඳක් පහත්කරනු
ලැබුවාවූ උන්වහන්සේ, එනම්
යේසුස්වහන්සේ, මරණය වින්ද නිසා
තේජස හා ගෞරවය නමැති ඔටුන්න
පැළඳගන සිටින බව අපට පෙනේ.
කුමක්හෙයින්ද යමෙකු නිසාත් යමෙකු 10
කරණකොටගෙනත් සියල්ල පවත්නේද,
ඒ තැනන්වහන්සේ විසින් බොහෝ
පුත්‍රයන් තේජසට ගෙනයන කල ඔවුන්ගේ
ගැළවීමේ කර්තෘන්වහන්සේ දුක්විඳීම
කරණකොටගෙන සම්පූර්ණ කරන්ට
යුතුවූයේය. මක්නිසාද පිරිසිදුකරන්නාද 11
පිරිසිදුකරනු ලබන්නෝද යන සියල්ලෝම
එක්කෙනෙකුගෙන්ය. ඒ කාරණය නිසා
උන්වහන්සේ ඔවුන්ට සහෝදරයෝයයි
කියන්ට ලජ්ජානොවී:
මම මාගේ සහෝදරයන්ට ඔබගේ 12
නාමය ප්‍රකාශකරන්නෙමි,
සභාව මධ්‍යයෙහි ඔබට ප්‍රශංසා
ගීතිකාකරන්නෙමියි
කියනසේක. නැවතද: මම උන්වහන්සේ 13
කෙරෙහි විශ්වාසකරන්නෙමියි කියාද,
ආයෙත්: මෙන්න, මමත් දෙවියන්වහන්සේ
මට දුන් දරුවොත්ය කියාද කීසේක.
එහෙයින් දරුවන් ලේ හා මාංසයට 14
පංගුකාරයන්ව සිටින නිසා
උන්වහන්සෙත් එම ආකාරයෙන් ඒවාට
පංගුකාරයෙක් වූසේක. එසේ කළේ
මරණය කෙරෙහි බලය ඇත්තා වන
යක්ෂයාව මරණය කරණකොටගෙන
බල නැතිකොට, ජීවිතය මුළුල්ලෙහි 15
මරණයට භයින් වාල්කමට යටත්ව සිටි
සියල්ලන් නිදහස්කරන පිණිසය.
මක්නිසාද [පිහිටවීම සඳහා] සැබවින් 16
උන්වහන්සේ අල්ලාගන්නේ දේවදූතයන්
නොව ආබ්‍රහම්ගේ වංශයය. එබැවින් 17
සෙනඟගේ පව් උදෙසා ශාන්ති පූජාවක්
ඔප්පුකිරීමට දෙවියන්වහන්සේ පිළිබඳ
කාරණා ගැන දයාවන්තවූ විශ්වාසවූ
උත්තම පූජකයෙක් වෙන පිණිස, සියලු
දෙයින්ම තමන්ගේ සහෝදරයන්ට

සමානවෙන්ට උන්වහන්සේට යුතුවූයේය.
18 මක්නිසාද උන්වහන්සේම පරීක්ෂාකරනු
ලැබ දුක්වින්ද බැවින්, පරීක්ෂාකරනු
ලබන්නන්ට පිහිටවෙන්ට උන්වහන්සේට
පුළුවන.

## ක්‍රිස්තුස්වහන්සේ මෝසෙස්ට වඩා උතුම් බව

3 එහෙයින්, ස්වර්ගීය කැඳවීමකට
පංගුකාරවූ ශුද්ධවූ සහෝදරයෙනි,
අපේ ඇදහිල්ලේ ප්‍රේරිතයාණන් සහ
උත්තම පූජකයාණන්වූ යේසුස්වහන්සේ
2 කල්පනාකරපල්ලා. මෝසෙස්
දෙවියන්වහන්සේගේ මුළු ගෘහයෙහි
විශ්වාසව සිටි සේම මුන්වහන්සේද
තමන්ව පත්කළ තැනන්වහන්සේට
3 විශ්වාසව සිටිසේක. ගෘහයට වඩා
ගෘහය සෑදූ අයට ගෞරවය
තිබෙන්නාක්මෙන්ම, මුන්වහන්සේ
මෝසෙස්ට වඩා ගෞරවය ලබන්ට
වටිනසේකැයි ඒත්තුගන්නාලද්දේය.
4 මක්නිසාද සියලුම ගෘහයෝ යම් යම්
අය විසින් සාදනු ලබති; නුමුත් සියලු
දේවල් පිහිටෙවූ තැනන්වහන්සේ
5 දෙවියන්වහන්සේය. සැබවින් මෝසෙස්
මතු කියන්ට තිබුණු දේ ගැන සාක්ෂියක්
ලෙස උන්වහන්සේගේ මුළු ගෘහයේ
සේවකයෙකු මෙන් විශ්වාසව සිටියේය;
6 නුමුත් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ
ගෘහය කෙරෙහි පත්ව සිටින පුත්‍රයෙකු
මෙන් විශ්වාසව සිටිසේක. අපි අන්තිමය
දක්වා අපේ බලාපොරොත්තුවේ
නිසැකකමද පාරට්ටුවද ස්ථිරලෙස
අල්ලාගන සිටිමු නම්, උන්වහන්සේගේ
7 ගෘහය අපිය. එබැවින් ශුද්ධාත්මයාණන්-
වහන්සේ කථාකොට:
අද නුඹලා උන්වහන්සේගේ හඬ
අසන්නහු නම්,
8 කාන්තාරයේදී පරීක්ෂාකිරීමේ දවසේ
උදහස් ඉපදවීමේදී මෙන්
නුඹලාගේ සිත් දැඩිකර නොගනිල්ලා.
9 එහිදී නුඹලාගේ පියවරු මා සෝදිසි
කර බැලීමෙන් පරීක්ෂාකොට,
සතළිස් අවුරුද්දක් මාගේ ක්‍රියාවන්
දුටුවෝය.
එබැවින් මම ඒ පරම්පරාවට 10
අප්‍රසන්නවී:
ඔව්හු නිතරම සිතින් මුළාවෙති;
මාගේ මාර්ගයන්ද ඔව්හු දැන
නොගත්තෝය.
ඔව්හු මාගේ විශ්‍රාමස්ථානයට ඇතුල් 11
නොවන්නෝයයි
මාගේ උදහසින් දිවුළෙමියි
කියන ලෙස, සහෝදරයෙනි, ජීවමාන 12
දෙවියන්වහන්සේ කෙරෙන් අහක්ව
යන්නාවූ නොඇදහිලිකාර නපුරු සිතක්
නුඹලා අතරෙන් කිසිවෙකු තුළ
නොතිබෙන හැටියට බලාගනිල්ලා.

## කෙළවර දක්වා විශ්වාසවම සිටිය යුතු බව

නුඹලාගෙන් කිසිවෙක් පාපයේ 13
රැවටිලිකාරකමෙන් දැඩි නොවන පිණිස,
අදයයි කියන තෙක් දවස්පතාම
එකිනෙකාට අවවාදකරපල්ලා. මක්නිසාද: 14
අද නුඹලා උන්වහන්සේගේ හඬ
අසන්නහු නම්
උදහස් ඉපදවීමේදී මෙන් නුඹලාගේ
සිත් දැඩිකර නොගනිල්ලායයි
කියා තිබෙන හැටියට, අපගේ 15
විශ්වාසයේ පටන්ගැන්ම අන්තිම දක්වා
ස්ථිරලෙස අල්ලාගෙන සිටිමු නම්, අපි
ක්‍රිස්තුස්වහන්සේගේ පංගුකාරයෝ වී
සිටිමුව. එසේය, ඇසූ කල්හි උදහස් 16
ඉපදෙවූවෝ කවරහුද? මෝසෙස්
කරණකොටගෙන මිසරයෙන් පිටත්ව
ආවාවූ සියල්ලෝ නොවෙද්ද? තවද 17
උන්වහන්සේ සතළිස් අවුරුද්දක්
අප්‍රසන්නව සිටියේ කවුරුන් කෙරෙහිද?
පව්කළාවූ, තමුන්ගේ මළකඳන්
කාන්තාරයේ වැටුණාවූ තැනැත්තන්
කෙරෙහි නොවේද? තමන්වහන්සේගේ 18
විශ්‍රාමස්ථානයට ඔව්හු ඇතුල්
නොවන්නෝයයි උන්වහන්සේ දිවුරුවේ
අකීකරුවූ තැනැත්තන් ගැන නොවේද?
මෙසේ නොඇදහිලිකාරකම නිසා 19
ඔවුන්ට ඇතුල්වෙන්ට නුපුළුවන්වූ බව
අපට පෙනෙන්නේය.

## දෙවියන්වහන්සේගේ නිවාඩුව

4 එබැවින් උන්වහන්සේගේ
විශ්‍රාමස්ථානයට ඇතුල්වීමේ
පොරොන්දුවක් ඉතුරුව තිබෙද්දීත්
තුඹලාගෙන් යමෙකුට ඊට පැමිණෙන්ට
බැරිවූ බැව් පෙනේදෝ කියා භයවෙමු.
2 මක්නිසාද ඔවුන්ට මෙන් අපටත්
ශුභාරංචිය දේශනාකරනලද්දේය. නුමුත්
ඇසුවන් සමග ඔවුන් ඇදහිල්ලෙන්
එක්සත් නොවූ බැවින් ඇසූ වචනය
3 ඔවුන්ට ප්‍රයෝජනවත් නොවීය. මක්නිසාද
අදහාගත් අපි ඒ විශ්‍රාමස්ථානයට
ඇතුල්වෙමුව; ඒ ප්‍රකාරයට:
මාගේ උදහසින් දිවුළ ලෙස
ඔව්හු මාගේ විශ්‍රාමස්ථානයට ඇතුල්
නොවන්නෝයයි
උන්වහන්සේ කියා තිබේ. එසේවුවත්
ලෝකය මැවීමේ සිට වැඩ නිමවී
4 තිබුණේය. මක්නිසාද උන්වහන්සේ එක්
තැනක සත්වෙනි දවස ගැන කථාකොට:
දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ
සියලු වැඩවලින් සත්වෙනි දවසේදී
5 නිවාඩු ගත්සේකැයි කියා තිබේ. නැවත
මේ පදයෙහිත්:
ඔව්හු මාගේ විශ්‍රාමස්ථානයට ඇතුල්
නොවන්නෝයයි
6 කියා තිබේ. එබැවින් සමහරුන් ඊට
ඇතුල්වන්ට ඕනෑ බැවිනුත් ඒ ශුභාරංචිය
පළමුකොට ඇසූ අය අකීකරුකම නිසා
7 ඇතුල් නුණ බැවිනුත්, උන්වහන්සේ දවිත්
ලවා එපමණ කාලයකට පසු
කථාකරවමින්, ඉහත කීවාක්මෙන්:
අද තුඹලා උන්වහන්සේගේ හඬ
අසන්නහු නම්,
තුඹලාගේ සිත් දඩිකර නොගනිල්ලායයි,
අදය කියා, නැවත එක්තරා දවසක්
8 නියමකරනසේක. මක්නිසාද යෝෂුවා
ඔවුන්ට නිවාඩුව දුන්නේ නම් ඉන්පසු
වෙන දවසක් ගැන උන්වහන්සේ
9 කථාකරන්නේ නැත. එබැවින් දෙවියන්-
වහන්සේගේ සෙනඟට සබත් නිවාඩුවක්
10 ඉතුරුව තිබේ. මක්නිසාද දෙවියන්-
වහන්සේ තමන්ගේ වැඩවලින් නිවාඩු
ගත්තාක්මෙන්, උන්වහන්සේගේ
විශ්‍රාමස්ථානයට ඇතුල්වූ තැනැත්තාත්
තමාගේ වැඩවලින් නිවාඩු ගන්නේය.
එබැවින් ඒ අකීකරුකමේ ආදර්ශය 11
අනුව කිසිවෙකු නොවැටෙන පිණිස
ඒ විශ්‍රාමස්ථානයට ඇතුල්වෙන්ට
උත්සාහකරමු. මක්නිසාද දෙවියන්- 12
වහන්සේගේ වචනය ජීවමානය,
බලවත්ය, කොයිම දෙමුහත් කඩුවකටවත්
වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද
සන්ධි හා ඇටමිදුළුද වෙන්කරන තරමට
කාවදින්නේය, සිතේ සිතිවිලිද අදහස්ද
විමසන්නේය. උන්වහන්සේ ඉදිරියෙහි 13
ප්‍රකාශ නුවූ කිසි මැවිල්ලක් නැත.
උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි සියල්ල
වැස්මක් නැතුව ඇරී තිබේ, අපෙන්
ගණන්ගන්නේ උන්වහන්සේය.

## ආරොන්ට වඩා උසස්වූ උත්තම පූජකයාණෝ

එබැවින් අහස පසුකරගියාවූ දෙවියන්- 14
වහන්සේගේ පුත්‍රවූ යේසුස් නම් මහා
උත්තම පූජකයෙක් අපට සිටින නිසා,
අපේ ඇදහිල්ල තදින් අල්ලාගන සිටිමු.
මක්නිසාද අපට සිටින්නේ අපේ 15
දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන
උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක්
නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ
පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය.
එබැවින් අපට දයාව ලැබෙන පිණිසද 16
අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට
අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින්
කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු.
5 මක්නිසාද සියලු උත්තම පූජකයෝ
මනුෂ්‍යයන් අතරෙන් ගනු ලැබ
පඬුරුත් පව් උදෙසා පූජාවලුත්
ඔප්පුකරන පිණිස දෙවියන්වහන්සේට
අයිති කාරණා සම්බන්ධව මනුෂ්‍යයන්
උදෙසා පත්කරනු ලබන්නෝය. ඔවුහුත් 2
දුර්වලකමින් වටව සිටින බැවින්
අඥානයන්ද මුළාවෙන්නන්ද ගැන
මෘදුකමින් හැසිරෙන්ට ඔවුන්ට පුළුවන;
ඒ දුර්වලකම නිසා, සෙනඟ උදෙසා 3
වාගේම තමුන් උදෙසාත් පව් ගැන පූජා
ඔප්පුකරන්ට ඔවුන්ට ඕනෑව තිබේ. තවද 4
ආරොන් මෙන් දෙවියන්වහන්සේ විසින්
කැඳවාගන්න අය මිස වෙන කවුරුවත්
ඒ ගෞරවය තමාටම නොගන්නේය.

5 එසේම ක්‍රිස්තුස්වහන්සෙත් උත්තම
පූජකයෙක් වීමේ ගෞරවය තමන්වහන්-
සේම ගත්තේ නැත.
නුමුත්:
තුඹ මාගේ පුත්‍රයාය,
මම අද තුඹ ජනිතකළෙමියි
උන්වහන්සේට කී තැනන්වහන්සේ ඒ
6 ගෞරවය දුන්සේක; එලෙසම වෙන
තැනක:
තුඹ මෙල්කිසදෙක්ගේ පිළිවෙළ ප්‍රකාර
සදකල්ම පූජකයෙක්ව සිටින්නේයයි
7 උන්වහන්සේ කියනසේක. උන්වහන්සේ
මාංසවත්ව සිටි දවස්වලදී තමන්වහන්සේ
මරණයෙන් ගළවන්ට පුළුවන්වූ
තැනන්වහන්සේට බලවත් හැඬීමෙන් හා
කඳුළින් යුක්ත යාච්ඤා සහ කන්නලව්
ඔප්පුකර, තමන්ගේ දේව භය නිසා
8 උත්තර ලැබ, උන්වහන්සේ පුත්‍රයෙක්ව
සිටි නුමුත් තමන් වින්ද දේවලින්
9 කීකරුකම ඉගෙනගත්සේක. මෙසේ
උන්වහන්සේ සම්පූර්ණකරනු ලැබ,
මෙල්කිසදෙක්ගේ පිළිවෙළේ හැටියට
උත්තම පූජකයෙක්ය යන නම දෙවියන්-
10 වහන්සේගෙන් ලැබ, තමන්වහන්සේට
කීකරුවෙන්නාවූ සියල්ලන්ටම සදකාල
ගැළවීමේ කර්තෘවූසේක.

## ක්‍රිස්තියානි මාර්ගයෙහි වැඩි වර්ධනය විය යුතු බව

11 ඒ ගැන බොහෝ දේ කියන්ට අපට
ඇත්තේය, නුමුත් තුඹලා ඇසීමට මැළිව
සිටින බැවින් ඒවා තේරුම්කරදෙන්ට
12 අමාරුය. මක්නිසාද කාලය ප්‍රකාරයට
තුඹලා ගුරුවරයෝව සිටින්ට යුතුව
තිබියදීත්, දෙවියන්වහන්සේගේ වාක්‍යවල
මුල් ගුරුකම් නැවත යමෙකු විසින්
තුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ;
තුඹලා දැඩි ආහාර නොව කිරි
13 ඕනෑකරන අයව සිටින්නෝය. ඉතින්
කිරි බොන සෑමදෙනම ළදරුවන් බැවින්
ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන
14 අසමර්ථව සිටිති. නුමුත් දැඩි ආහාර
ඕනෑවන්නේ යහපත සහ අයහපත
විමසාබලන්ට ව්‍යවහාරයෙන් පුරුදු
පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති, සම්පූර්ණවූ
තැනැත්තන්ටය.

## ඉදිරියට යෑමේ අවශ්‍යතාව. පසුබටවී යෑමේ අන්තරාය

6 ඒ නිසා මළ ක්‍රියාවල් ගැන
පසුතැවිලිවීමද දෙවියන්වහන්සේ
කෙරෙහි ඇදහීමද *බව්තීස්මකිරීම්
ගැනත් අත්තැබීම ගැනත් මළවුන්ගේ
නැගිටීම ගැනත්, සදකාල විනිශ්චය 2
ගැනත් ඉගැන්වීමද නමැති අත්තිවාරමක්
නැවත නොතබා, ක්‍රිස්තුස්වහන්සේගේ
මුල් කාරණා පසුකර, සම්පූර්ණවීමට
පැමිණෙමු. දෙවියන්වහන්සේ ඉඩදෙන- 3
සේක් නම්, අපි එසේ කරන්නෙමුව.
මක්නිසාද වරක් ආලෝකකරනු 4
ලැබුවාවූ, ස්වර්ගීය දීමනාවේ රසය
වින්දවූ, ශුද්ධාත්මයාණන්වහන්සේට
පංගුකාරයන් වුණාවූ, දෙවියන්වහන්සේගේ 5
යහපත් වචනයේද මතු පැමිණෙන
කාලයේ බලවලද රසය බැලූවාවූ
තැනැත්තන්, වැටීගිය කල්හි ඔවුන් නැවත 6
පසුතැවිල්ලට පමුණුවන්ට නුපුළුවන;
මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ
පුත්‍රයා තමුන්ටම දෙවනු කුරුසියෙහි
ඇණගසා නින්දවට පමුණුවති. මෙසේ 7
නොයෙක් වර වහින වැස්ස උරාගනිමින්
වවන්නන්ට සුදුසු භෝග උපදවන
පොළොවට දෙවියන්වහන්සේගෙන්
ආශීර්වාද ලැබේ. නුමුත් කටුගස්ද 8
ගොකටුද දරනවා නම් එපාකරනු ලැබ,
ශාපයකට ළංව තිබේ; එහි කෙළවර
දවනු ලැබීමය.
එහෙත්, ප්‍රේමවන්තයෙනි, අපි මෙසේ 9
කථාකරන නුමුත් යහපත්වූ ගැළවීමට
අනුකූලවූ කොටසට තුඹලා අයිති බව
අපි නිසැකව විශ්වාසකරමුව. මක්නිසාද 10
තුඹලාගේ වැඩයද තුඹලා
ශුද්ධවන්තයන්ට කළාවූ, කරන්නාවූ
උපස්ථානයෙන් දෙවියන්වහන්සේගේ
නාමයට පෙන්නූ ප්‍රේමයද මතකනැතිකරන්ට
උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත. නුමුත් 11
තුඹලාගෙන් එකිනෙකා අන්තිම දක්වා
බලාපොරොත්තුවේ නිසැකකම සඳහා
එම උත්සාහවන්තකම පෙන්වනවාට අපි
ආශා ඇත්තෙමුව. ඒ වනාහි තුඹලා 12

*අවගාහනයකිරීම්.

අලස නොවී, ඇදහිල්ලද ඉවසිලිවන්තකමද
කරණකොටගෙන පොරොන්දු උරුම-
කරගත සිටින්නන්ගේ අඩිපාරේ යන්නන්
වෙන පිණිසය.

## දෙවියන්වහන්සේගේ පොරොන්දු-වලින් බලාපොරොත්තුව ප්‍රබෝධකරනු ලැබේ

13 මෙසේ දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට
පොරොන්දුව දුන් කල, තමන්ට වඩා
උතුම් කෙනෙක් ගැන දිවුරන්ට නැති
14 නිසා තමන්ම ගැන දිවුරමින්: සැබවින්ම
නුඹට බොහෝසෙයින් ආශීර්වාද
කරන්නෙමි, බොහෝසෙයින් නුඹ
15 වර්ධනයකරන්නෙමියි කීසේක. ඒ හැටියට
ඔහු ඉවසිල්ලෙන් සිට, පොරොන්දුව
16 ලබාගත්තේය. සැබවින්ම මනුෂ්‍යයෝ
වඩා උත්තමයා ගැන දිවුරති. ඔවුන්ගේ
සියලු විවාදවලදී ස්ථිරකිරීම පිණිස
17 කරන අන්තිම දේ නම් දිවිරීමය. ඒ
නිසා දෙවියන්වහන්සේ පොරොන්දුවේ
උරුමක්කාරයන්ට තමන්වහන්සේගේ
අභිප්‍රාය වෙනස් නොවන බව
බොහෝසෙයින්ම පෙන්වන්ට කැමතිව
18 දිවුරුමකින් මැදහත්වූසේක. මෙසේ කළේ
දෙවියන්වහන්සේ විසින් බොරුකියන්ට
බැරිවූ වෙනස් නොවන කාරණා දෙකක්
කරණකොටගෙන, අප ඉදිරියේ තබා
තිබෙන බලාපොරොත්තුව අල්ලාගැනීමට
ආරක්ෂාව පිණිස පලා ආවාවූ අපට
19 මහත් ධෛර්යයක් ලැබෙන පිණිසය. ඒ
බලාපොරොත්තුව ආත්මයේ සත්තකවූ,
ස්ථිරවූ, තිරයෙන් ඇතුළට යන්නාවූ
නැංගුරමක් මෙන් අපට ඇත්තේය.
20 යේසුස්වහන්සේ මෙල්කිසදෙක්ගේ
පිළිවෙළේ හැටියට සදාකාලේටම උත්තම
පූජකයෙක් වී, අප උදෙසා පෙරටුව
යන්නෙක් මෙන් එහි ඇතුල්වූසේක.

## මෙල්කිසදෙක්ගේ පූජක පිළිවෙළ

7 එසේය, සාලමේ රජවූ, මහෝත්තම
දෙවියන්වහන්සේගේ පූජකයෙක්වූ, මේ
මෙල්කිසදෙක් ආබ්‍රහම් රජුන් මැරීමෙන්
හැරී එද්දී සම්මුඛව ඔහුට
ආශීර්වාදකෙළේය. ආබ්‍රහම් සියල්ලෙන් 2
දසයෙන් කොටසක් ඔහුට දුන්නේය.
පළමුකොට ඔහුගේ නාමය, අර්ථයේ
හැටියට, ධර්මිෂ්ඨකමේ රජය, දෙවනුව
සමාදනයේ රජයයි අර්ථ ඇති සාලමේ
රජ්ජුරුවෝය. තවද පියෙක්වත් මවෙක්වත් 3
පෙළපතක්වත් දවස්වල පටන්ගැන්මක්වත්
ජීවිතයේ කෙළවරක්වත් නැත්තාවූ මේ
තෙමේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාට
සමානකරනු ලැබ නිතරම පූජකයෙක්ව
පවතින්නේය.
ඉතින් මොහු කොපමණ උතුම් 4
කෙනෙක්ව සිටියේදැයි කල්පනාකරපල්ලා.
පියවූ ආබ්‍රහම් පවා කොල්ලගත් දේවලින් 5
දසයෙන් කොටසක් ඔහුට දුන්නේය.
ලෙවීගේ පුත්‍රයන් අතරෙන් පූජක තනතුර
ලබන්නෝ ව්‍යවස්ථාව ලෙස සෙනඟගෙන්-
එනම්, ආබ්‍රහම්ගෙන් පැවත ආවාවූ
තමුන්ගේ සහෝදරයන්ගෙන් පවා-
දසයෙන් කොටසක් ගන්ට ආඥාවක්
ලැබ සිටිති. නුමුත් ඔවුන්ගේ පෙළපතට 6
ඇතුළත් නැත්තාවූ තැනැත්තා දසයෙන්
කොටසක් ආබ්‍රහම්ගෙන් ලබාගෙන,
පොරොන්දු ඇත්තාවූ ඔහුට
ආශීර්වාදකෙළේය. ආශීර්වාදකරන්නේ 7
උතුම් අය විසින් කුඩා අයට බව වාද
රහිතය. නුමුත් මෙහිදී දසයෙන් කොටස 8
ලබන්නෝ නසින්නාවූ මනුෂ්‍යයෝය;
නුමුත් එහිදී ලබන්නේ ජීවත්වන බවට
සාක්ෂි ලබන කෙනෙක්ය. ඇරත් දසයෙන් 9
කොටස ලබන්නාවූ ලෙවී පවා ආබ්‍රහම්
කරණකොටගෙන දසයෙන් කොටස
ගෙවුවේයයි කිය හැකිය. මක්නිසාද 10
මෙල්කිසදෙක් ආබ්‍රහම්ට සම්මුඛවූ විට,
ලෙවී තමාගේ පියාගේ කටියේ සිටියේය.

## ක්‍රිස්තුස්වහන්සේ මෙල්කිසදෙක්ගේ පිළිවෙළේ උත්තම පූජකයෙක්ව සිටි බව

ඉදින් ලෙවීගේ පූජකකමෙන් 11
සම්පූර්ණකම පැමිණෝ නම් (මක්නිසාද
ඒ සම්බන්ධව සෙනඟ ව්‍යවස්ථාව
ලැබුවෝය), ආරොන්ගේ පිළිවෙළේ

හැටියට කියනු නොලැබ, මෙල්කිසදෙක්ගේ
පිළිවෙළේ හැටියට වෙන පූජකයෙක්
නැගිටින්ට තවත් තිබුණු ඕනෑකම
12 මොකද? මක්නිසාද පූජකකම වෙනස්වූ
බැවින් ව්‍යවස්ථාවත් වෙනස්විය යුතුමය.
13 එසේය, යමෙකු ගැන මේ දේ
කියනලද්දේද, ඒ තැනන්වහන්සේ වෙන
ගෝත්‍රයකට අයිතිය, ඒ ගෝත්‍රයෙන්
කිසිවෙක් පූජාසනය ළඟ සේවයකළේ
14 නැත. මක්නිසාද අපගේ ස්වාමීන්-
වහන්සේ යූද ගෝත්‍රයෙන් නැගුටුණු බව
ඉතා පැහැදිලිය; ඒ ගෝත්‍රය ගැන
පූජකයන් සම්බන්ධවූ කිසිවක් මෝසෙස්
15 කීවේ නැත. ඇරත් මාංසයට අයිති
ආඥපනතේ හැටියට නොව පහ නොවන
ජීවිතයක හැටියට පත්කරනු ලැබූ,
16 අන් පූජකයෙක් මෙල්කිසදෙක්ගේ
සමානත්වයේ හැටියට නැගිටින්නේ නම්,
අප කියන දේ ඉතාමත්ම පැහැදිලිව
17 තිබේ. මක්නිසාද:

ඔබ මෙල්කිසදෙක්ගේ පිළිවෙළේ
හැටියට
සදකාලයටම පූජකයෙක්ව සිටින-
සේකැයි

18 උන්වහන්සේ ගැන සාක්ෂි දී තිබේ. මෙසේ
ව්‍යවස්ථාව කරණකොටගෙන කිසිවක්
සම්පූර්ණ නොවූ බැවින්, පළමු තිබුණු
ආඥවේ දුර්වලකම හා නිෂ්ප්‍රයෝජනකම
19 නිසා ඒක අවලංගුකිරීමද, වඩා යහපත්
බලාපොරොත්තුවක් පැමිණවීමද සිද්ධවේ.
ඒ බලාපොරොත්තුව කරණකොටගෙන
අපි දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙමුව.
20 ඉතින් ඔව්හු සැබවින් දිවුරුමක් නැතුව
21 පූජකයෝ වී සිටිති. නුමුත් උන්වහන්සේ
පූජකයෙක්ව සිටින්නේ:

ඔබ සදකාල පූජකයෙක්ය කියා
තමන්වහන්සේ නොතැවෙන ලෙස
ස්වාමීන්වහන්සේ දිවුළසේකැයි

උන්වහන්සේට කී තැනන්වහන්සේ
කරණකොටගෙන දිවුරුමක් ඇතුවය.
22 මෙසේ දිවුරුමක් නැතුව නොවන නිසා,
එපමණටම යේසුස්වහන්සේ වඩා උතුම්
ගිවිසුමක ඇපකාරයා වී සිටිනසේක.
23 තවද ඔවුන්ට මරණය නිසා පවතින්ට
බැරි බැවින් ඔව්හු ගණනින්
බොහෝ පූජකයෝව සිටිති. නුමුත් 24
උන්වහන්සේ, සදකාලේටම පවතින
හෙයින්, උන්වහන්සේගේ පූජකකම
පහවෙන්නේ නැත. එබැවින්, උන්වහන්සේ 25
කරණකොටගෙන දෙවියන්වහන්සේ
වෙතට ළඟාවෙන්නන් උදෙසා
මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ
නිරතුරුම ජීවත්වන හෙයින්, ඔවුන්
කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට
පුළුවන.

එබඳුවූ ශුද්ධවූ, නිවරදිවූ, නොකිලුටුවූ, 26
පව්කාරයන්ගෙන් වෙන්වූ, ස්වර්ගවලට
වඩා උසස්වී සිටින්නාවූ උත්තම
පූජකයෙක් අපට යෝග්‍යවූයේය. ඒ 27
උත්තම පූජකයන් මෙන් පළමුකොට
තමුන්ගේම පව් උදෙසාත් පසුව සෙනඟගේ
පව් උදෙසාත් දවස්පතා පූජාවල්
ඔප්පුකරන්ට උන්වහන්සේට වුවමනාවක්
නැත. මක්නිසාද උන්වහන්සේ තමන්ම
පූජාකිරීමෙන් එකවරක්ම ඒක කළසේක.
මක්නිසාද ව්‍යවස්ථාව දුර්වලකම් 28
ඇත්තාවූ මනුෂ්‍යයන් උත්තම පූජකයන්
කොට පත්කරන්නේය; නුමුත්
ව්‍යවස්ථාවට පසු පැමුණුණාවූ දිවුරුමේ
වචනය තෙම සදකාලේටම සම්පූර්ණව
සිටින පුත්‍රයාණන් පත්කරන්නේය.

## ක්‍රිස්තුස්වහන්සේගේ පූජකකම යුදෙව් පූජකකම්වලට වඩා උතුම් බව.
## උන්වහන්සේ අලුත් ගිවිසුමේ මැදහත්කාරයාව සිටින බව

8
ඉතින් අප කියන දේවලින්
ප්‍රධාන එක නම් ස්වර්ගවල
මහෝත්තමයාණන්වහන්සේගේ සිංහා-
සනයේ දකුණු පැත්තේ හිඳගත්තාවූ,
මනුෂ්‍යයා විසින් නොව ස්වාමීන්වහන්සේ 2
විසින් පිහිටුවනලද ශුද්ධස්ථානයේ හා
සැබෑවූ මණ්ඩපයේ සේවකයෙක් වූ
උත්තම පූජකයෙක් අපට සිටින බවය.
සියලු උත්තම පූජකයෝ පඩුරු සහ 3
පූජා ඔප්පුකරන පිණිස පත්කරනු ලබති.

එසේ හෙයින් පූජාකිරීමට මේ උත්තම
පූජකයාටත් යමක් තිබෙන්ට ඕනෑය.
4 එහෙත් ව්‍යවස්ථාව ප්‍රකාර පඬුරු ඔප්පු-
කරන්නන් සිටින බැවින් උන්වහන්සේ
[තවමත්] පොළොවේ සිටිසේක් නම්,
උන්වහන්සේට කිසිසේත් පූජකයෙක්ව
5 සිටින්ට නුපුළුවන. මෝසෙස් මණ්ඩපය
සාදන්ට යන කල: කන්දේදී නුඹට
පෙන්වන ලද ආදර්ශය ලෙස සියල්ල
සාදන්ට බලාගනින්නැයි දෙවියන්-
වහන්සේ ආඥා කළ හැටියට, ඒ
පූජකයෝ ස්වර්ගීයවූ දේවල සටහනක්ව
ඡායාවක්ව තිබෙන දෙයට සේවයකරති.
6 නුමුත් දැන් උන්වහන්සේ වඩා උතුම්
පොරොන්දු පිට පිහිටුවනලද්දවූ වඩා
හොඳ ගිවිසුමක මැදහත්කාර කෙනෙක්ව
සිටින්නාසේම උන්වහන්සේ වඩා උතුම්
7 සේවයක් ලැබූසේක. මක්නිසාද
පළමුවෙනි ගිවිසුම නිදෙස්ව තිබුණා
නම්, දෙවෙනි එකකට ඉඩ සොයන්නේ
8 නැත. එසේය, උන්වහන්සේ දෙස් තබමින්
ඔවුන්ට කථාකොට:

බලව, මා විසින් ඉශ්‍රායෙල් වංශය සහ
යූද වංශය සමග
අලුත් ගිවිසුමක් කරන දවස්
පැමිණෙන්නේයයි ස්වාමීන්වහන්සේ
කියනසේක.
9 ඒ වනාහි මිසර දේශයෙන් ඔවුන්ගේ
පියවරුන් ගෙනෙන පිණිස
මා විසින් ඔවුන්ගේ අත අල්ලාගත්
දවසේදී ඔවුන් සමග කළ ගිවිසුම
මෙන් නොවේය;
මක්නිසාද ඔව්හු මාගේ ගිවිසුමෙහි
නොපැවතුණෝය,
මමද ඔවුන් නොසැලකුවෙමියි
ස්වාමීන්වහන්සේ කියනසේක.
10 එසේය, ඒ දවස්වලට පසු
මා විසින් ඉශ්‍රායෙල් වංශය සමග
කරන ගිවිසුම නම්:
මාගේ ව්‍යවස්ථා ඔවුන්ගේ සිහියේ
තබමින්,
ඒවා ඔවුන්ගේ සිත්වලද ලියන්නෙමි.
මම ඔවුන්ගේ දෙවියන්වහන්සේ
වන්නෙමි,
ඔව්හුද මාගේ සෙනඟක් වන්නෝය.
ස්වාමීන්වහන්සේ ඇඳිනගනින්න 11
කියා
එකිනෙකා තම තමාගේ නුවර
වැසියාටත් සහෝදරයාටත්
නූගන්වන්නේය.
මක්නිසාද ඔවුන්ගෙන් කුඩා අය
පටන් ලොකු අය දක්වා
සියල්ලෝම මා ඇඳිනගන්නෝය.
එසේය, මම ඔවුන්ගේ අධර්මිෂ්ඨකම් 12
ගැන කරුණාකරන්නෙමි,
ඔවුන්ගේ පව්ද නවත් සිහි
නොකරන්නෙමියි ස්වාමීන්වහන්සේ
කියනසේකැයි

කියා තිබේ. අලුත් ගිවිසුමක්යයි කීමෙන් 13
පළමුවෙනි ගිවිසුම පරණකළසේක. ඉදින්
පරණවන්නාවූ මහලුවන්නාවූ දෙය
නොපෙනීයාමට ළඟය.

## පුරාණ මණ්ඩපය සහ එහි අසම්පූර්ණ මෙහෙයවල්

9 නවද පළමුවෙනි ගිවිසුමට පවා
දේවමෙහෙයේ නියෝගද භූමික
ශුද්ධස්ථානයද තිබුණේය. මක්නිසාද 2
ශුද්ධස්ථානයය කියන පළමුවෙනි
මණ්ඩපය සාදනලද්දේය, එහි පහන්රුකද
මේසයද පිදීමේ රොටිද තිබුණේය; ඊට
ශුද්ධස්ථානයයි කියනලදී. දෙවෙනි තිරය 3
ඇතුළෙන් අති ශුද්ධස්ථානයයයි
කියනලද මණ්ඩපය තිබුණේය. එහි රන් 4
දුම් භාජනයක්ද මුළුල්ලම රනින් වැසූ
ගිවිසුම්පෙට්ටියද තිබුණේය. ඒ පෙට්ටියේ
මන්නා දමූ රන් භාජනයක්ද දළු ලෑවාවූ
ආරොන්ගේ සැරයටියද ගිවිසුමේ
ගල්ලෑලිද තිබුණේය. ඒක උඩ තේජසේ 5
කෙරුබ්වරු කරුණාසනය වසාගන
සිටියෝය; දැන් මේවා ගැන වෙන්
වශයෙන් කථාකරන්ට අපට නුපුළුවන.
ඉදින් මේ දේවල් මෙසේ සූදානම්කොට 6
තිබෙද්දී, පූජකයෝ මෙහෙයන් ඉෂ්ටකරමින්
නිතරම පළමුවෙනි මණ්ඩපයට
ඇතුල්වෙති. නුමුත් දෙවෙනි මණ්ඩපයට 7
උත්තම පූජකයා පමණක් අවුරුද්දකට
එක වරක් ඇතුල්වේ, ඒත් ලේ නැතුව

නොවේය, ඒ ලේ ඔහු තමා උදෙසාත්
සෙනඟගේ වැරදි උදෙසාත් ඔප්පු-
8 කරන්නේය. මෙයින් ශුද්ධාත්මයාණන්-
වහන්සේ විසින් හඟවන්නේ ඒ පළමුවෙනි
මණ්ඩපය තිබෙන තුරු ශුද්ධස්ථානයට
පැමිණෙන මාර්ගය ප්‍රකාශවී නැති
9 බවය. ඒ මණ්ඩපය වර්තමාන කාලයට
උපහැරණයක්ය. ඒ ප්‍රකාරයට හෘදය-
සාක්ෂිය සම්බන්ධව සේවයකරන්නා
සම්පූර්ණකරන්ට නොහැකිවූ පඩුරු සහ
10 පූජා ඔප්පුකරනු ලබන්නේය. මේවා
(කෑමවලින්ද බීමවලින්ද නානාප්‍රකාර
*සේදීම්වලින්ද යුක්තවූ,) සකස්කිරීමේ
කාලය දක්වා පවතින්නාවූ, මාංසයට
අයිති නියෝගවා පමණක්ය.

## ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවෙහි අන්තර්ගත පිරිසිදුකිරීමේ බලය

11 නුමුත් ක්‍රිස්තුස්වහන්සේ මතු
පැමිණෙන්නාවූ යහපත් දේවල උත්තම
පූජකයෙක්ව පැමිණ, වඩා උතුම්වූ වඩා
සම්පූර්ණවූ අතින් නොසෑදුවාවූ, එනම්
මේ [භූමික] මැවිල්ලට අයිති
නොවන්නාවූ මණ්ඩපය මැදින්,
12 එළුවන්ගේත් වස්සන්ගේත් ලේ
කරණකොටගෙන නොව තමන්ගේම ලේ
කරණකොටගෙන, අප උදෙසා සදාකාල
මිදීම ලබාගෙන එකම වරක්
13 ශුද්ධස්ථානයට ඇතුල්වූසේක. මක්නිසාද
එළුවන්ගේත් ගොනුන්ගේත් ලේවලින්ද,
අශුද්ධවී සිටින්නන්ට එළනැම්බියෙකුගේ
අළු ඉසීමෙන්ද මාංසය පවිත්‍රවෙන
හැටියට පිරිසිදුකරනු ලබන්නේ නම්,
14 කැලලක් නැතුව සදාකාල ආත්මයාණන්
කරණකොටගෙන තමන්ම දෙවියන්-
වහන්සේට පූජාවුණාවූ ක්‍රිස්තුස්-
වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්-
වහන්සේට සේවයකරන පිණිස,
මළ ක්‍රියාවලින් තුඹලාගේ හෘදයසාක්ෂිය
කොපමණ වැඩියෙන් පිරිසිදුකරනු
15 නොලබන්නේද? මේ කාරණය නිසා
උන්වහන්සේ අලුත් ගිවිසුමක
මැදහත්කාරයාව සිටිනසේක. එසේ

*අවගාහනවලින්.

වන්නේ පළමුවෙනි ගිවිසුමේ කාලයේදී
කළ වරදවලින් මුදනු ලැබීම පිණිස
මරණයක් සිද්ධවූ බැවින්, කැඳවනු
ලැබුවාවූ තැනැත්තන්ට සදාකාල උරුමයේ
පොරොන්දුව ලැබෙන පිණිසය.
මක්නිසාද *ගිවිසුමක් තිබෙන තැන 16
ගිවිසුම කළාවූ අයගේ මරණයද
පෙන්විය යුතුය. එසේය, ගිවිසුමක් 17
ස්ථිරවෙන්නේ මරණය සිදුවුණායින්
පසුය. ගිවිසුම කළ තැනැත්තා ජීවත්ව
සිටින තුරු එය කිසිසේත් වලංගු නැත.
එහෙයින් පළමුවෙනි ගිවිසුමවත් ලේ 18
නැතුව පිහිටුවනු නොලැබුවේය. මක්නිසාද 19
මෝසෙස් ව්‍යවස්ථාවේ හැටියට මුළු
සෙනඟට සියලු ආඥා කියාදුන් පසු,
වස්සන්ගේත් එළුවන්ගේත් ලේ, වතුරද
රතු ලොම්ද හිසොප්ද සමග ගෙන:
මේවා දෙවියන්වහන්සේ විසින් තුඹලා 20
ගැන නියෝගකළ ගිවිසුමේ ලේයයි
කියමින් පොතටත් මුළු සෙනඟටත්
ඉස්සේය. එසේම මණ්ඩපයටත් සේවයේ 21
සියලු භාජනවලටත් ඔහු ලේ ඉස්සේය.
ව්‍යවස්ථාවේ ප්‍රකාරයට සියලු දේවල්ම 22
ලෙයින් පවිත්‍රකරනු ලැබේයයි කියන්ට
පුළුවන්වා වාගේ පෙනේ, ලේ වැගිරීමක්ද
නැතුව ක්ෂමාකිරීමකුත් නැත.

## ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවේ අසදෘශතාව

එබැවින් ස්වර්ගයේ තිබෙන දේවල 23
සටහන් මේවායින් පවිත්‍රකරන්ට ඕනෑව
තිබුණේය; නුමුත් ස්වර්ගීය දේවල්ම
මේවාට වඩා උතුම් පූජාවලින් පවිත්‍රකරනු
ලබන්ට යුතුය. මක්නිසාද ක්‍රිස්තුස්- 24
වහන්සේ සැබෑ ශුද්ධස්ථානයේ ආදර්ශ-
වන, අතින් සෑදූ ශුද්ධස්ථානයකට නොව
අප උදෙසා දෙවියන්වහන්සේගේ
අභිමුඛයෙහි දැන් පෙනී සිටින පිණිස
ස්වර්ගයටම ඇතුල්වූසේක. එහෙත් 25
උත්තම පූජකයා අන්‍ය ලේ රැගෙන
අවුරුදුපතා ශුද්ධස්ථානයට ඇතුල්-
වන්නාක්මෙන් උන්වහන්සේ බොහෝ

*මුල් වචනයෙන්–'අන්තිම කැමැත්ත' යන අර්ථයත් හැඟේ.

වර තමන්ම ඔප්පුකරන පිණිස
26 [ඇතුල්වුණා] නොවේය. එසේ
ඇතුල්වෙන්ට නම් උන්වහන්සේ ලෝකයේ
මැවීමේ පටන් නොයෙක්වර වධවිඳින්ට
ඕනෑව තිබුණේය. නුමුත් තමන්ම
පූජාකිරීම කරණකොටගෙන පාපය
පහකරන පිණිස උන්වහන්සේ
කාලයන්ගේ කෙළවරේදී එක වරක්
27 ප්‍රකාශවූසේක. තවද එක වරක් මරණයත්
ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව
28 තිබෙන්නාක්මෙන්ම, බොහෝ දෙනෙකුගේ
පව් උසුලන පිණිස එක වරක් පූජාවූ
ක්‍රිස්තුස්වහන්සෙත්, උන්වහන්සේගේ ඊම
බලාසිටින්නන්ට ගැළවීම පිණිස පාපය
නැතුව දෙවෙනි වර ප්‍රකාශවනසේක.

## ව්‍යවස්ථාවට අයත් පූජාවල අසම්පූර්ණකම සහ ක්‍රිස්තුස්-වහන්සේගේ පූජාවේ සම්පූර්ණකම

10 මක්නිසාද ව්‍යවස්ථාව මතු
පැමිණෙන යහපත් දේවල
ඡායාවක් මිස නියම රූපයම නොවන
බැවින්, ඔවුන් අවුරුදුපතා නිතර
ඔප්පුකරන ඒ පූජාවලින්, ළඟාවෙන්නන්
සම්පූර්ණකරන්ට කිසිකලක නුපුළුවන.
2 පුළුවන් නම්, නමස්කාරකරන්නන් වරක්
පවිත්‍ර කරනලදුව, පව් ගැන ඔවුන්ට
තවත් හැඟීමක් නැති බැවින්, ඒ පූජා
3 ඔප්පු කිරීම නවතින්නේ නැද්ද? නුමුත්
ඒ යාගවලින් අවුරුදුපතා පව් ගැන
4 සිහිකිරීමක් ඇත්තේය. මක්නිසාද
ගොනුන්ගෙන් එළුවන්ගෙන් ලෙයින් පව්
5 පහකරන්ට නුපුළුවන. එහෙයින්
උන්වහන්සේ ලෝකයට එන කල
කථාකර:
ඔබ පූජාවටත් පඬුරටත් කැමති නොවී,
ශරීරයක් මට සූදනම්කරදුන්සේක;
6 මුළු දවන පූජාවලටත් පාප
පූජාවලටත් ඔබ ප්‍රසන්න නුවූසේක.
7 එවිට මම කථාකොට:
දෙවියන්වහන්ස, මෙන්න,
(පොත් කාණ්ඩයේ මා ගැන ලියා
තිබෙන ලෙස)
ඔබගේ කැමැත්ත කරන්ට ඇවිත්
සිටිමියි

කීසේක. ව්‍යවස්ථාවේ හැටියට ඔප්පුකරන 8
පූජාවලටත් පඬුරුවලටත් මුළු දවන
පූජාවලටත් පාප පූජාවලටත් ඔබ
කැමතිවන්නේවත් සතුටුවන්නේවත් නැතැයි
ඉහත කී පසු: මෙන්න, ඔබගේ කැමැත්ත 9
කරන්ට මම ඇවිත් සිටිමියි උන්වහන්සේ
කීසේක. උන්වහන්සේ දෙවෙනි එක
පිහිටුවන පිණිස පළමුවෙනි එක
අහක්කරනසේක. ඒ කැමැත්ත පරිද්දෙන් 10
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය එකම
වරක් පූජාකිරීම කරණකොටගෙන අපි
පිරිසිදුකරනු ලැබ සිටිමුව. තවද සියලු 11
පූජකයෝ සිටගෙන, දවස්පතා සේවය
කරමින්, කිසි කලෙකත් පාපය
පහකරන්ට නොහැකිවූ එම පූජාවල්
බොහෝ වර ඔප්පුකරති. නුමුත් 12
මුන්වහන්සේ සැම කලටම පව් නිසා
එක පූජාවක් ඔප්පුකොට, දෙවියන්-
වහන්සේගේ දකුණු පැත්තේ හිඳගත්සේක.
එතැන් පටන් තමන්ගේ සතුරන් තමන්ගේ 13
පාපුටුව කරන තුරු උන්වහන්සේ
බලාසිටිනසේක. මක්නිසාද උන්වහන්සේ 14
පිරිසිදුකරනු ලබන්නන් එක පූජාවකින්
සැම කලටම සම්පූර්ණකළසේක.
ශුද්ධාත්මයාණන්වහන්සෙත් අපට 15
සාක්ෂිදෙමින්:
ඒ දවස්වලට පසුව මා විසින් ඔවුන් 16
සමග කරන ගිවිසුම නම්,
මාගේ ව්‍යවස්ථා ඔවුන්ගේ සිත්වල
තබා,
ඒවා ඔවුන්ගේ සිහියේ ලියන්නෙමියි
ස්වාමීන්වහන්සේ කියනසේකැයි
කී පසු,
උන්වහන්සේ කථාකොට:
ඔවුන්ගේ පාපවල් සහ අධර්මිෂ්ඨකම් 17
තවත් සිහි නොකරන්නෙමියි
කියනසේක. ඉදින් ඒවාට කමාව තිබෙන 18
තැන, පාපය ගැන පූජා ඔප්පුකිරීමක්
තවත් නැත.

## දෙවියන්වහන්සේගේ අභිමුඛයට ළඟාවීමේ අයිතිවාසිකම සහ පසුබටවී යාමේ මහත් වරද

එබැවින්, සහෝදරවරුනි, යේසුස්- 19
වහන්සේ ස්වකීය මාංසය නමැති තිරය

මැදින් *අප උදෙසා කැපකළාවූ මාර්ගය
වන අලුත්වූ ජීවමාන මාර්ගයකින්,
20 උන්වහන්සේගේ ලේ කරණකොටගෙන
ශුද්ධස්ථානයට ඇතුල්වීමට අපට
21 නිදහස්කම තිබෙන බැවින්ද, දෙවියන්-
වහන්සේගේ ගෘහය කෙරෙහි අපට උතුම්වූ
22 පූජකයෙක් සිටින බැවින්ද, නපුරු
හෘදයසාක්ෂියකින් පිරිසිදුවීම පිණිස
අපගේ සිත් ඉසිනු ලැබ, අපේ ශරීරය
පිරිසිදු වතුරෙන් සෝදනු ලැබ, සැබෑවූ
සිතක් ඇතුව ඇදහීමේ නිසැකකමින්
23 ළඟාවෙමු. අපේ බලාපොරොත්තුවේ
ප්‍රකාශකිරීම චංචල නොවන පිණිස එය
තදින් අල්ලාගෙන සිටිමු; මක්නිසාද
පොරොන්දුව දුන් තැනන්වහන්සේ
24 විශ්වාසව සිටිනසේක. තවද ප්‍රේමයටද
යහපත් ක්‍රියාවලටද පොලඹවන පිණිස
එකිනෙකා ගැන සිතේ තබාගනිමු.
25 සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම
රැස්වීම අත් නැර, ඒ දවස ළංවන බව
තුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩ වඩා
එකිනෙකාට අවවාදකරමු.
26 මක්නිසාද සැබෑව දැනගැනීම
ලැබුවායින් පසු අපි කැමැත්තෙන්ම පව්
27 කරමු නම්, විනිශ්චය ගැනත්
විරුද්ධකාරයන් දවාදමන්ට යන
උදහස්ගින්න ගැනත් භයානක
බලාසිටීමක් මිස පව් ගැන තවත් පූජාවක්
28 ඉතිරිව නැත. මෝසෙස්ගේ ව්‍යවස්ථාව
සුළුකළ අය දෙදෙනෙකුගේ නොහොත්
තුන්දෙනෙකුගේ සාක්ෂිය පිට කරුණාව
29 නොලැබ මරනු ලබන්නේය. තුඹලා
සිතන්නේ මොකද? දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණන් පාගාදමා, තමා පිරිසිදුකළ
ගිවිසුමේ ලේ අශුද්ධ දෙයක් කොට
සිතා, අනුග්‍රහයේ ආත්මයාණන්වහන්සේට
අපහාසකළ තැනැත්තා ඊට වඩා
කොපමණ මහත් දඬුවමකට සුදුස්සෙක්
කොට ගණන්ගනු නොලබන්නේද?
30 මක්නිසාද: පළිගැනීම මට අයිතිය,
මම්ම ප්‍රතිඵල දෙන්නෙමියි කියාද,
ස්වාමීන්වහන්සේ තමන්ගේ සෙනඟ
විනිශ්චයකරනසේක කියාද කී

*නොහොත්–අපට ඇරදුන්.

තැනන්වහන්සේ අපි දනිමුව. ජීවමානවූ 31
දෙවියන්වහන්සේගේ අත්වලට අසුවීම
භයානක දෙයක්ය.
තුමුත් තුඹලා ආලෝකකරනු ලැබුවාට 32
පසු තුඹලා දුක් නැමති මහත්
පොරබැදීමක් ඉවසුලුවාවූ පළමු දවස්
සිහිකරපල්ලා. එසේ වුණේ නින්ද සහ 33
පීඩා කරණකොටගෙන පරිහාස
හේතුවක් කරනු ලැබීමෙනුත්, එසේ කරනු
ලැබූවන්ට හවුල්කාරයන් වීමෙනුත්ය.
මක්නිසාද හිරකාරයන්ව සිටින්නන්ට 34
තුඹලා අනුකම්පාව දැක්වූවා පමණක්
නොව, වඩා උතුම්වූ පවතින්නාවූ වස්තුවක්
තුඹලාට ඇති බව දැනගෙන, තුඹලාගේ
දේපල කොල්ලකෑම ප්‍රීතියෙන් ඉවසුවහුය.
එබැවින් මහත් විපාකයක් ඇත්තාවූ 35
තුඹලාගේ නිසැකකම අත් නාරිල්ලා.
මක්නිසාද දෙවියන්වහන්සේගේ කැමැත්ත 36
කළ පසු පොරොන්දුව ලබන පිණිස
තුඹලාට ඉවසිල්ල ඕනෑය.
මක්නිසාද එන්නාවූ තැනන්වහන්සේ 37
ප්‍රමාද නොවී,
තව ඉතා ස්වල්ප කාලයකින් එනසේක.
ඉදින් මාගේ ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් 38
ජීවත්වේ.
තුමුත් ඔහු පසුබටවන්නේ නම්, මාගේ
ආත්මය ඔහු කෙරෙහි ප්‍රසන්න නැත.
තුමුත් අපි වනාහි විනාශවන ලෙස 39
පසුබටවීමට නොව ප්‍රාණය ගැළවෙන
ලෙස ඇදහීමට අයිතිවමුව.

## ශ්‍රේෂ්ඨ ඇදහිලිවන්තයෝ

11 ඇදහිල්ල නම් බලාපොරොත්තුවන
දේවල් ගැන සහතිකයය, නොදක්නා
දේවල් ගැන ඔප්පුවය. එයින්, 2
වැඩිමහල්ලන්ට සාක්ෂි ලැබුණේය.
දෙවියන්වහන්සේගේ වචනයෙන් 3
ලෝකවල් මවනු ලැබූ බවද, මෙසේ,
දකින දේවල් පෙනෙන දේවලින්
හටනොගත් බවද ඇදහිල්ලෙන්
තේරුම්ගනිමුව. ඇදහිල්ලෙන්, ආබෙල් 4
කායින්ට වඩා උතුම් පූජාවක්
දෙවියන්වහන්සේට ඔප්පුකෙළේය.
ඔහුගේ දීමනා ගැන දෙවියන්වහන්සේ

සාක්ෂිදුන් බැවින්, එයින් ඔහු
ධර්මිෂ්ඨයෙකු බවට සාක්ෂි ලැබුවේය.
ඔහු මළ නුමුත් ඒ ඇදහීමෙන් තවම
5 කථාකරන්නේය. ඇදහිල්ලෙන්, ඒනොක්
මරණය නොදකින ලෙස ගෙනයනු
ලැබුවේය; දෙවියන්වහන්සේ ඔහු
ගෙනගිය හෙයින් ඔහු සම්බ නොවීය.
ඔහුගේ ගෙනයාමට ප්‍රථම, ඔහු
දෙවියන්වහන්සේව ප්‍රසන්නකළ බවට
6 සාක්ෂි ලැබුවේය. නුමුත් ඇදහිල්ල නැතුව
උන්වහන්සේව ප්‍රසන්නකරන්ට නුපුළුවන.
මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට
ළඟාවෙන්නා විසින් උන්වහන්සේ
විද්‍යාමාන බවත්, උන්වහන්සේ
සොයන්නන්ට විපාකදෙන කෙනෙකු
බවත් විශ්වාසකරන්ට ඕනෑය.
7 ඇදහිල්ලෙන්, නෝවා ඒ වන තුරු නුදුටු
දේ ගැන දෙවියන්වහන්සේ විසින් දන්වනු
ලැබ, දේවභයින් පෙලඹී, තමාගේ පවුල
ගැළවීමට නැවක් සෑදුවේය; එයින් ඔහු
ලෝකයා වරදට පත්කොට, ඇදහිල්ලෙන්
පැමිණෙන ධර්මිෂ්ඨකමට උරුමක්කාරයෙක්
8 වූයේය. ඇදහිල්ලෙන්, ආබ්‍රහම් කැඳවනු
ලැබූ කල තමාට උරුමයක් පිණිස පසුව
ලැබෙන්ට තිබුණු ස්ථානයකට පිටත්ව
යන හැටියට කීකරුවී, තමා කොතැනට
යනවාදැයි නොදැන පිටත්ව ගියේය.
9 ඇදහිල්ලෙන්, ඔහු අන් දේශයක මෙන්
පොරොන්දුවේ දේශයෙහි පොරොන්තුවී,
එම පොරොන්දුවට උරුමක්කාරයන් වූ
ඊසාක් සහ යාකොබ් සමග කූඩාරම්වල
10 වාසයකළේය. මක්නිසාද අත්තිවාරම්
ඇත්තාවූ, දෙවියන්වහන්සේ විසින්
යෝජනාකර සෑදුවාවූ නුවර ගැන ඔහු
11 බලාසිටියේය. ඇදහිල්ලෙන්, සාරාත්
පොරොන්දුව දුන් තැනන්වහන්සේ
විශ්වාස කෙනෙකැයි පිළිගත් නිසා, නිසි
වයස පසුවෙලාත් ගර්භිණීවෙන්ට බලය
12 ලැබුවාය. එහෙයින් මළ කෙනෙකු වැනි
එක තැනැත්තෙකුගෙන් පවා ගණනින්
අහසේ තාරකා මෙන්ද ගණන්කළ
නොහැකි මුහුදු වෙරළේ වැලි මෙන්ද වූ
සමූහයක් හටගත්තේය.

මොවුන් සියල්ලෝ *පොරොන්දු 13
නොලැබ, දුරදී ඒවා දැක ප්‍රසන්නවී,
පොළොවෙහි තමන් විදේශීන්ද
ආගන්තුකයන්ද බව කියාදී, ඇදහිල්ල
ඇතුව මැරුණෝය. මක්නිසාද මෙබඳු 14
දේ කියන තැනැත්තෝ තමුන්ගේම රටක්
සොයන බව හොඳහැටි ප්‍රකාශ කරති.
තවද ඔව්හු තමුන් පිටත්ව ආවාවූ රට 15
සිහිකළෝ නම්, එහි හැරීයන්ට ඔවුන්ට
ඉඩප්‍රස්තා තිබුණේය. නුමුත් ඔව්හු දැන් 16
වඩා උතුම්වූ, එනම් ස්වර්ගීයවූ රටකට
ආශා ඇත්තෝය. එබැවින් දෙවියන්-
වහන්සේ ඔවුන්ගේ දෙවියන්වහන්සේයයි
කියනු ලබන්ට ලජ්ජා නොවනසේක.
මක්නිසාද උන්වහන්සේ ඔවුන්ට නුවරක්
සූදානම්කළසේක.

ආබ්‍රහම් පරීක්ෂාකරනු ලැබූ කල, 17
ඇදහිල්ලෙන් ඊසාක් පූජාකළේය. එසේය: 18
නුඹේ වංශය ප්‍රකාශවන්නේ ඊසාක්ගෙන්යයි
යමෙකුට කියනලද්දේද, ඒ පොරොන්දු
සන්තෝෂයෙන් පිළිගත් ඔහු තමාගේ
ඒකජාතක පුත්‍රයාව පූජාකරමින්
සිටියේය, මළවුන්ගෙන් පවා නැගුටුවන්ට 19
දෙවියන්වහන්සේට පුළුවනැයි ඔහු
කල්පනාකොට, උපහැරණ වශයෙන්
මරණයෙන් ඔහු නැවත ලබාගත්තේය.
ඇදහිල්ලෙන්, ඊසාක් මතු පැමිණෙන 20
දේ ගැන පවා යාකොබ්ට සහ ඒසව්ට
ආශීර්වාදකළේය. යාකොබ් නසින විට, 21
ඇදහිල්ලෙන් යෝසෙප්ගේ පුත්‍රයන්ගෙන්
එක් එක්කෙනාට ආශීර්වාදකොට,
තමාගේ සැරයටියේ මුදුනට හාත්සිව
නමස්කාරකළේය. යෝසෙප් තමාගේ 22
අන්තිමය ළංවූ කල, ඇදහිල්ලෙන්
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ පිටත්ව යෑම
සඳහන්කොට, තමාගේ ඇට ගැන
අණදුන්නේය. මෝසෙස් උපන් කල 23
ඔහුගේ මවුපියෝ ඔහු ශෝභමාන
ළමයෙකු බව දැක, රජුගේ ආඥාවට භය
නොවී, ඇදහිල්ලෙන් ඔහු තුන් මාසයක්
සඟවාගත්තෝය. මෝසෙස් වැඩුණායින් 24
පසු ඵාරාවෝගේ දුවගේ පුත්‍රයායයි

*දෙවියන්වහන්සේ පොරොන්දුවූ
දේවල්.

කියනු ලැබීම ඇදහීමෙන් එපාකර,
25 විපාකය දෙස බැලූ බැවින් මිසරයේ
වස්තුවලට වඩා ක්‍රිස්තුස්වහන්සේගේ
26 නින්දාව මහත් සම්පතක්යයි සිතා, කලකට
පාපයේ සැප භුක්තිවිඳීමට වඩා
දෙවියන්වහන්සේගේ සෙනඟ සමඟ
27 දුක්විඳීම තෝරාගත්තේය. ඇදහිල්ලෙන්,
ඔහු රජුගේ උදහසට භය
නොවී, මිසරය අත්හැර ගියේය.
මක්නිසාද අදෘශ්‍යමාන තැනන්වහන්සේ
දකින්නාක්මෙන් ඔහු ස්ථිරව සිටියේය.
28 කුලුඳුලන් විනාශකළ තැනැත්තා ඔවුන්ට
අත නොගසන පිණිස පාස්කුවද ලේ
ඉසීමද ඇදහිල්ලෙන් ඔහු පැවැත්තුවේය.
29 ඇදහිල්ලෙන්, ඔව්හු රතුමුහුද මැදින් වියළි
බිමින් මෙන් ගියෝය. මිසරවරු එසේ
කරන්ට උත්සාහකොට ගිලී මළෝය.
30 සත් දවසක් යෙරිකෝවේ පවුරු වටකර
ඇවිද්දයින් පසු, ඇදහිල්ලෙන් ඒවා
31 වැටුණේය. ඇදහිල්ලෙන්, වේශ්‍යාවවූ
රාහබ් ඔත්තුකාරයන් සමාදනයෙන්
පිළිගත් බැවින්, කීකරුනූණ තැනැත්තන්
32 සමඟ විනාශ නොවී සිටියාය. මම තව
මක්කියම්ද? ගිඩියොන්ද බාරක්ද
සම්සොන්ද යෙප්තාද දාවිත්ද සාමුවෙල්ද
ප්‍රොපේතවරුන්ද ගැන කියන්ට කල්
33 මදිය. ඔව්හු ඇදහිල්ලෙන් රාජ්‍යයන්
යටත්කළෝය, ධර්මිෂ්ඨකම් කළෝය,
පොරොන්දු ලබාගත්තෝය, සිංහයන්ගේ
34 මුඛ පියෙවුවෝය, ගින්නේ උෂ්ණය
නිවුවෝය, කඩුමුවහතින් ගැළවුණෝය,
දුර්වලව සිට ශක්තිමත්කරනු ලැබුවෝය,
යුද්ධයෙහි බලසම්පන්නවූවෝය, අන්‍ය
35 සේනාවන් පන්නාදමූවෝය. ස්ත්‍රීහු
නැවත-නැගිටීමකින් තමුන්ගේ මළවූන්
ලැබුවෝය. වෙන අය වඩා උතුම් නැවත-
නැගිටීමක් ලබන පිණිස, මිදීම පිළි
36 නොගෙන වධකරනු ලැබුවෝය. තවත්
අය සරදම්වලින්ද පහරවලින්ද, එසේය,
බැඳුම්වලින් සහ හිරගෙයි දමනු
ලැබීමෙන්ද පරීක්ෂාකරනු ලැබුවෝය.
37 ඔව්හු ගල්ගසනු ලැබුවෝය, කියතෙන්
ඉරනු ලැබුවෝය, පරීක්ෂා කරනු
ලැබුවෝය, කඩුවෙන් මරනු ලැබුවෝය.
ඔව්හු අසරණකමද පීඩාද නපුරුකමද
විඳිමින්, බැටළු හම්ද එළු හම්ද ඇඳගෙන,
ඔබ මොබ ගියෝය. ඔව්හු කාන්තාරවලද 38
කඳුවලද ගුහාවලද පොළොවේ
බෙනවලද ඇවිද්දෝය; ඔවුන්ගේ
විසීමට ලෝකය නොවටනේය. මොවුන් 39
සියල්ලෝ ස්වකීය ඇදහිල්ල
කරණකොටගෙන සාක්ෂිය ලැබත්,
*පොරොන්දුව නොලැබුවෝය. එසේ 40
වුණේ ඔවුන් අප නැතුව සම්පූර්ණ
නොවන පිණිස දෙවියන්වහන්සේ වඩා
උතුම් දෙයක් අප ගැන කලින්
පිළියෙළකර තිබුණු නිසාය.

## යේසුස්වහන්සේ ඇදහිල්ලේ ප්‍රධාන ආදර්ශය බව

12 එබැවින් මෙපමණ මහත්
සාක්ෂිකාර සේනාවකින් අප වටව
සිටින නිසා, සියලු බරද පහසුවෙන් අප
අසුකරන පාපයද අහක දමා, ඇදහිල්ලේ
කර්තෘවරයාද සම්පූර්ණකරන්නාදවූ
යේසුස්වහන්සේ දෙසම බලමින්, අප
ඉදිරියෙහි තබා තිබෙන දිවීම
†ඉවසිල්ලෙන් දුවමු. උන්වහන්සේ වනාහි 2
තමන් ඉදිරියෙහි තබා තිබුණු ප්‍රීතිය
නිසා ලජ්ජාව නොසලකා, කුරුසිය
දරාගන, පසුව දෙවියන්වහන්සේගේ
සිංහාසනයේ දකුණු පැත්තෙහි
වැඩහිඳගත්සේක. ඒ නිසා තුඹලා, 3
තුඹලාගේ සිත්වලින් ක්ලාන්තවී වෙහෙස
නොවන පිණිස, තමන්ට විරුද්ධව සිටිය
පව්කාරයන්ගෙන් එපමණ විරුද්ධකම්
ඉවසූ තැනන්වහන්සේ කල්පනාකර
බලාපල්ලා.

## පීඩා විඳීමෙන් ඇති ප්‍රීතිය සහ පුහුණුව

තුඹලා පාපයට විරුද්ධව පොරට සිට, 4
තවම ලේ වැගිරෙන තෙක් විරුද්ධව
සිටියේ නැත. ඇරත් පුත්‍රයන්ට මෙන් 5
තුඹලාට කියන අවවාද වචනය තුඹලා
මතකනැතිකළහුය, ඒ කවරද යත්:

*පොරොන්දුවී තිබුණු දෙය.
†නොහොත්, ස්ථිරකමෙන්.

මාගේ පුත්‍රය, ස්වාමීන්වහන්සේගේ
දඬුවම සුළු නොකරන්න,
උන්වහන්සේගෙන් තරවටු ලබන
කල ක්ලාන්ත නොවන්න;
6 මක්නිසාද ස්වාමීන්වහන්සේ ප්‍රේම
කරන අයට උන්වහන්සේ දඬුවම්
කරනසේක,
උන්වහන්සේ පිළිගන්න සියලු පුත්‍රයන්ට
තළනසේක
7 යනුයි. තුඹලා *ඉවසන්නේ දඬුවම්
පිණිසය; දෙවියන්වහන්සේ පුත්‍රයන්ට
මෙන් තුඹලා කෙරෙහි ක්‍රියාකරනසේක;
මක්නිසාද පියා දඬුවම් නොකරන පුත්‍රයා
8 කවුද? එහෙත් සියල්ලන් ලබන දඬුවමට
තුඹලා පංගුකාරයෝ නොවන්නහු නම්,
තුඹලා පුත්‍රයෝ නොව අවජාතකයෝය.
9 තවද අපට දඬුවම්කළාවූ මාංසයේ
පියවරු අපට සිටියෝය. අපි ඔවුන්ට
ගෞරවකළෙමුව. ඊට බොහෝ වැඩියෙන්
අප විසින් ආත්මවල පියාණන්වහන්සේට
යටත්ව ජීවත්වෙන්ට යුතු නොවේද?
10 මක්නිසාද ඔව්හු ඇත්තෙන්ම තමුන්ට
යහපත්ව පෙනුණු ලෙස ස්වල්ප දවසකට
දඬුවම්කළෝය; තුමුත් උන්වහන්සේ
තමන්ගේ ශුද්ධකමට අප පංගුකාරයන්
වන පිණිස අපේ ප්‍රයෝජනය සඳහා
11 දඬුවම්කරනසේක. කිසි දඬුවමක් ලබන
කල ඒක ශෝකයට මිස ප්‍රීතියට
කාරණාවක් මෙන් පෙනෙන්නේ නැත.
තුමුත් පසුව එයින් පෙළුණු නැනැත්තන්ට
ධර්මිෂ්ඨකමේ සමාදාන ඵල හටගන්නේය.
12 එබැවින් හෙළා තිබෙන අත්ද බෙලහීන
13 දණහිස්ද සවිකරගනිල්ලා. කොර කකුල්
අහක්කරනු නොලැබ, සුවවෙන පිණිස,
තුඹලාගේ පාදවලට සමතලා පාරවල්
සාදාගනිල්ලා.

## උපදෙස් හා අවවාද

14 සියල්ලන් සමග සමාදානයෙන්
සිටින්ටත්, ශුද්ධකම නැතුව කිසිවෙක්
ස්වාමීන්වහන්සේ නොදක්නා බැවින්
ශුද්ධකම අනුවයන්ටත් උත්සාහ-
15 කරපල්ලා. කිසිවෙක් දෙවියන්වහන්සේගේ
කරුණාවෙන් පසුබට නොවන පිණිසද,
තිත්තකමේ මුලක් හටගෙන එයින් තුඹලා
කලඹා බොහෝ දෙනෙක් කිලුටු නොවන
පිණිසද, වේශ්‍යාකම්කරන්නෙක්වත් කෑම 16
ටිකකට තමාගේ කුලුඳුල්කම වික්කාවූ
ඒසව් මෙන් දේව අභක්තිකයෙක්වත්
නොසිටින පිණිසද බලාගනිල්ලා.
මක්නිසාද පසුව ඔහු ආශීර්වාදය 17
උරුමකරගන්ට කැමතිවුණු තුමුත් ඔහු
එපාකරනු ලැබූ බව තුඹලා දනිහුය;
මක්නිසාද ඔහු කඳුළෙන් යුක්තව
ඕනෑකමින් එය සෙවූ නමුත්,
වෙනස්කිරීමට ඉඩක් ලැබුණේ නැත.

## පුරාණ ගිවිසුමේ භයංකරතාව සහ අලුත් ගිවිසුමේ තේජවන්තකම

තවද තුඹලා ළඟාවී සිටින්නේ 18
ස්පර්ශකරන්ට පුළුවන්වූ ගින්නෙන්
ඇවිළෙන්නාවූ කන්දකටත් කළුවර-
කමටත් අන්ධකාරයටත් කුණාටුවටත්,
හොරණෑවක ශබ්දයටත් වචනවල 19
හඬටත් නොවේය; ඒ හඬ ඇසූ අය
නවත් තමුන්ට කථානොකරන ලෙස
ඉල්ලා සිටියෝය. මක්නිසාද: 20
මෘගයෙක්වත් කන්දේ හැපුණොත් උං
ගල්ගසා මැරිය යුතුය කියා කළාවූ
අණ ඔවුන්ට දරන්ට බැරිවිය. ඒ දර්ශනය 21
එපමණ භයානකව තිබුණු බැවින්
මෝසෙස්ද කථාකොට: මම භයවෙමි,
වෙවුලමියි කීය. තුමුත් තුඹලා ළඟාවී 22
සිටින්නේ සියොන් කන්දටත්, ජීවමාන
දෙවියන්වහන්සේගේ නුවරවූ ස්වර්ගීය
යෙරුසලමටත්, ගණන් නැති දේවදූත
සේනා වෙතටත්, ස්වර්ගයෙහි නාම ලියා 23
තිබෙන කුලුඳුලන්ගේ මහ රැස්වීමට හා
සභාවටත්, සියල්ලන්ගේ විනිශ්චයකාරවූ
දෙවියන්වහන්සේද සම්පූර්ණකරනලද
ධර්මිෂ්ඨයන්ගේ ආත්මද, අලුත් ගිවිසුමේ 24
මැදහත්කාරවූ යේසුස්වහන්සේද
ආබෙල්ට වඩා උතුම්ලෙස කථාකරන
ඉසීමේ ලේද වෙතටත්ය. කථාකරන 25
තැනන්වහන්සේ එපා නොකරන්ට
බලාගනිල්ලා. මක්නිසාද පොළොවේදී
අවවාද කළ තැනන්වහන්සේ එපාකළ

*නොහොත්, දඬුවම පිණිස ඉවසාපල්ලා.

විට ඔව්හු නොගැළවුණෝ නම්,
ස්වර්ගයෙන් අවවාදකරන තැනන්වහන්සේ
කෙරෙන් අහක්ව ගියොත් අපි කොහොම
26 ගැළවෙමුද? උන්වහන්සේගේ ශබ්දයෙන්
ඒ කාලයේදී පොළොව සෙලවුණාය.
නුමුත් දැන් උන්වහන්සේ: මම පොළොව
පමණක් නොව ස්වර්ගයත් නව වරක්
කම්පාකරවන්නෙමියි කියා පොරොන්දුවී
27 තිබේ. නව වරක්ය කී වචනයෙන්
පෙන්වන්නේ නොසෙලවෙන්නාවූ දේවල්
පවතින පිණිස සෙලවෙන ඒවා සෑදූ
28 දේවල් මෙන් පහකරන බවය. එහෙයින්
සොලවන්ට බැරි රාජ්‍යයක් ලබන්නාවූ
අපි, ගෞරවයෙන්ද දේවභයින්ද දෙවියන්-
වහන්සේට ප්‍රසන්නවන ලෙස
සේවයකරන පිණිස, *අනුග්‍රහය ඇතුව
29 සිටිමු. මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ
විනාශකරන ගින්නක්ය.

## විශේෂ අනුශාසනා

13 සහෝදර ස්නේහය පවතීවා.
2 ආගන්තුක සත්කාරකිරීම මතකනැති
නොකරල්ලා. මක්නිසාද එසේ කිරීමෙන්
සමහරෙක් නොදැනම දේවදූතයන්ට
3 සත්කාරකළෝය. නුඹලාත් බැඳී
සිටින්නාක්මෙන් බැඳුම්වල සිටින්නන්ද,
නුඹලාත් ශරීරයෙහි සිටින බැවින්
4 දුක්විඳින්නන්ද සිහිකරපල්ලා. විවාහය
සියල්ලන් අතරෙහි ගෞරව ඇතුව,
යහන නොකිලුටුව තිබේවා; මක්නිසාද
වේශ්‍යාකම්කරන්නන්ද කාමමිථ්‍යා-
චාරිකයන්ද දෙවියන්වහන්සේ විනිශ්චය-
5 කරනසේක. නුඹලාට ඇතිදෙයින් සතුටුවී,
වස්තු තෘෂ්ණාවෙන් නොරව සිටපල්ලා.
මක්නිසාද: මම කිසිසේත් නුඹෙන්
අහක්ව නොයමි, කිසි අන්දමකින්වත්
නුඹ අත් නොහරිමියි උන්වහන්සේම
6 කියා තිබේ. මෙසේ:
ස්වාමීන්වහන්සේ මාගේ උපකාර-
කාරයාණෝය; මම භය
නොවන්නෙමි;
මනුෂ්‍යයා මට කරන්නේ කුමක්ද?
කියා මහත් ධෛර්යයෙන් යුක්තව
කියමුව.

*හෙවත්–ස්තුතිවන්තකම.

## සභාවේ ප්‍රධානීන්ට යටත්වීම

දෙවියන්වහන්සේගේ වචනය නුඹලාට 7
කියාදුන්නාවූ නුඹලාගේ ප්‍රධානීන්
සිහිකරපල්ලා; ඔවුන්ගේ හැසිරීමේ
කෙළවර බලමින් ඔවුන්ගේ ඇදහිල්ල
අනුවයන්නෝ වෙයල්ලා. යේසුස් 8
ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත්
සදාකාලයටත් එකාකාරමය. අනේකාකාරවූ 9
අමුතු ඉගැන්වීම් කරණකොටගෙන
අහකට ගෙනයනු නොලබල්ලා.
මක්නිසාද කෑම ගැන ව්‍යාවෘතවූවන්ට
ප්‍රයෝජනයක් වුණේ නැති නිසා
කෑමවලින් නොව, අනුග්‍රහයෙන් සිත
ස්ථිරවීම යහපත්ය. අපට පූජාසනයක් 10
ඇත්තේය, මණ්ඩපයට සේවයකරන්නන්ට
එයින් කන්ට අවසර නැත. මක්නිසාද 11
උත්තම පූජකයා විසින් පාපය නිසා
යම් යම් සතුන්ගේ ලේ ශුද්ධස්ථානයට
ගෙනයනු ලැබේද, ඒ සතුන්ගේ ශරීර
කඳවුරෙන් පිටතදී පුළුස්සාදමති.
එහෙයින් යේසුස්වහන්සෙත් තමන්ගේම 12
ලෙයින් සෙනඟ පිරිසිදුකරන පිණිස
දොරටුවෙන් පිටතදී වධවින්දසේක. ඉතින් 13
අපි උන්වහන්සේගේ නින්දාව දරාගනිමින්
කඳවුරෙන් පිටත උන්වහන්සේ වෙතට
යමු. මක්නිසාද පවතින නුවරක් මෙහි 14
අපට නැත, අප විසින් සොයන්නේ මතු
පැමිණෙන නුවරය. එබැවින් දෙවියන්- 15
වහන්සේගේ නාමයට ස්තුතිකරන
තොල්වල ඵල වන ප්‍රශංසාව නැමති
පූජාව උන්වහන්සේම කරණකොටගෙන
නිතරම දෙවියන්වහන්සේට ඔප්පුකරමු.
නුමුත් යහපත්කම්කරන්ටත් අනුන්ට 16
බෙදදෙන්ටත් මතකනැති නොකරල්ලා.
මක්නිසාද එයාකාර පූජාවලට
දෙවියන්වහන්සේ ප්‍රසන්නවනසේක.
නුඹලාගේ ප්‍රධානියෝ ගණන්දෙන්ට 17
සිටින්නන් මෙන් නුඹලාගේ ආත්ම ගැන
රැකබලා සිටිති. ඔවුන් සුසුම්ලමින් එසේ
කළොත් නුඹලාට අලාභ බැවින්,
සුසුම්ලමින් නොව ප්‍රීතියෙන් එසේ කරන
පිණිස ඔවුන්ට කීකරුව යටත්වෙයල්ලා.

## අවසාන වචන

18 අප ගැන යාච්ඤාකරපල්ලා. මක්නිසාද
අපි සියල්ලේදී යහපත්ලෙස හැසිරෙන්ට
ආශාවෙන්, යහපත් හෘදය සාක්ෂියක්
19 ඇතුව සිටින බව විශ්වාසකරමුව. වඩා
ඉක්මනින් මා තුඹලාට නැවත දෙනු
ලබන පිණිස, එසේ කරන්ට මම වඩා
ඕනෑකමින් තුඹලාට අනුශාසනාකරමි.
20 ඉතින් සදාකාල ගිවිසුමේ ලේ
කරණකොටගෙන බැටළුවන්ගේ මහත්
එඬේරා වන අපගේ ස්වාමිවූ
යේසුස්වහන්සේව මළවුන් කෙරෙන් නැවත
ගෙනාවාවූ සමාදානයේ දෙවියන්වහන්සේ,
21 තමන් ඉදිරියෙහි ප්‍රසන්නව තිබෙන දේ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට-
ගෙන *අප තුළ කරමින්, තුඹලා

*නොහොත්, තුඹලා තුළ

උන්වහන්සේගේ කැමැත්ත කරන පිණිස
සියලු යහපත් ක්‍රියාවලට තුඹලා
සම්පූර්ණකරනසේක්වා. උන්වහන්සේට
සදාකාලේටම ගෞරවය වේවා. ආමෙන්.
සහෝදරයෙනි, මේ අනුශාසනාවේ 22
වචනය ඉවසන හැටියට තුඹලාගෙන්
ඉල්ලමි. මක්නිසාද ලුහුඬින් මම
තුඹලාට ලියුවෙමි. අපේ සහෝදරවූ 23
තිමෝතියස් නිදහස්කරනු ලැබූ බව
දැනගනිල්ලා; ඔහු ඉක්මනින් ආවොත්,
ඔහු සමග තුඹලා බලන්ට එන්නෙමි.
තුඹලාගේ සියලු ප්‍රධානීන්ටත් සියලු 24
ශුද්ධවන්තයන්ටත් ආචාරකරපල්ලා.
ඉතාලියේ අය තුඹලාට ආචාරකරති.
අනුග්‍රහය තුඹලා සියල්ලන් සමග 25
වේවා. ආමෙන්.

# යාකොබ්ගේ සාමාන්‍ය පත්‍රය

### පරීක්ෂාවේදී ස්ථිරව සිටීම. පරීක්ෂාව දෙවියන්වහන්සේගෙන් නොවන බව

**1** දෙවියන්වහන්සේගේත් ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේත්
දසයෙක්වූ යාකොබ් විසින් විසිරී
සිටින්නාවූ ගෝත්‍ර දෙළොසට ශුභ
සිද්ධවන ලෙස ලියා එවන වග නම්:
2 මාගේ සහෝදරයෙනි. නුඹලාගේ
ඇදහිල්ල සෝදිසිකිරීමෙන් ක්ෂාන්තිගුණය
3 උපදින බව දැන, අනේකාකාර
පරීක්ෂාවලට වැටෙන කල, ඒ සියල්ල
4 ප්‍රීතියක්යයි සිතාපල්ලා. නුමුත් නුඹලා
කිසිවකින් අඩුව නොසිට සියලු
ආකාරයෙන්ම සම්පූර්ණව සිටින
පිණිස ක්ෂාන්තිගුණය සම්පූර්ණලෙස
ක්‍රියාකෙරේවා.
5 නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥව
අඩු නම්. වරද නොතබන්නාවූ,
බොහෝකොට සියල්ලන්ට දෙන්නාවූ
දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා;
6 එවිට ඔහුට එය දෙනු ලැබේ. නුමුත්
අනුමාන නොකරම ඇදහිල්ලෙන්
ඉල්ලාවා. මක්නිසාද අනුමානකරන්නා
සුළඟින් ගෙනයන්නාවූ. සෙලවෙන්නාවූ
7 මුහුදේ රැළට සමානය. එබැවින් එබඳු
මනුෂ්‍යයා තමාට ස්වාමීන්වහන්සේගෙන්
8 යමක් ලැබේයයි නොසිතාවා. ඔහු දෙසිත්
ඇති මනුෂ්‍යයෙක්ව. තමාගේ සියලු
මාර්ගවලදී අස්ථිරව සිටින්නේය.
9 නුමුත් පහත් අඩියක සිටින
සහෝදරයා තමාගේ උසස්වීම ගැනද.
10 ධනවතා තමාගේ පහත්වීම ගැනද
පාර්ට්ටුකෙරේවා. මක්නිසාද ඔහු තණ
11 මලක් මෙන් පහවයන්නේය. මක්නිසාද
සූර්යයා තද රස්නයෙන් යුක්තවූ සුළඟින්
උදාවී. තණකොළ වියළවයි: ඒවායේ මල්
වැටී පෙනීමේ අලංකාරය නැතිවී
යන්නේය. එසේම ධනවතා තමාගේ
මාර්ගවලදී මැළවී යන්නේය.
පරීක්ෂාව ඉවසන මනුෂ්‍යයා 12
වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු
ඒත්තුගනු ලැබූ කල. තමන්ට
ප්‍රේමකරන්නවුන්ට ස්වාමීන්වහන්සේ
විසින් පොරොන්දුවූණාවූ ජීවනය නම්
ඔටුන්න ලබන්නේය. යමෙක් පරීක්ෂාකරනු 13
ලබන කල: මම දෙවියන්වහන්සේගෙන්
පරීක්ෂාකරනු ලබමියි නොකියාවා.
මක්නිසාද දෙවියන්වහන්සේ නපුරෙන්
පරීක්ෂාකරනු ලබන්ට නුපුළුවන.
උන්වහන්සේම කිසිවෙකු පරීක්ෂා
නොකරනසේක. නුමුත් එක එක 14
මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන්
අදිනු ලබන කල්හිද පොලඹවනු ලබන
කල්හිද පරීක්ෂාකරනු ලබයි. එවිට 15
තෘෂ්ණාව පිළිසිඳගත් කල්හි පාපය
වදන්නීය. පාපයද සම්පූර්ණවූ කල්හි
මරණය උපදවයි. මාගේ ප්‍රේමවන්ත 16
සහෝදරයෙනි. නොරැවටෙල්ලා. සෑම 17
යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාවද
කිසි වෙනස්වීමක්වත් හැරීමේ
ඡායාවක්වත් නැත්ත වූ ආලෝකවල
පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් බැස
එන්නේය. අප උන්වහන්සේගේ මැවිලිවල 18
නාඹුල් ඵල විශේෂයක් වන පිණිස
තමන්ගේම කැමැත්ත ලෙස සත්‍යතාවේ
වචනයෙන් අප ඉපදවූසේක.

### සැබෑ ආගම ක්‍රියාවලින් ප්‍රකාශ වන බව

මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි. 19
නුඹලා මේක දන්නහුය. නුමුත් එක එක

මනුෂ්‍යයා ඇසීමට ඉක්මන්වේවා,
කථාකිරීමටත් උදහස්වීමටත් ප්‍රමාද
20 වේවා. මක්නිසාද මනුෂ්‍යයාගේ උදහසින්
දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඉෂ්ට
21 නොවන්නේය. එහෙයින් සියලු කිලුටුකමද
අධික දුෂ්ටකමද පහකොට, නුඹලාගේ
ප්‍රාණ ගළවන්ට පුළුවන්වූ, පිහිටුවනලද
වචනය මෘදුකමින් යුක්තව පිළිගනිල්ලා.
22 නුමුත් නුඹලාම රවටාගනිමින් වචනය
අසන්නෝ පමණක් නොවී එය
23 පිළිපදින්නෝ වෙයල්ලා. මක්නිසාද
යමෙක් වචනය අසන නුමුත් එය
පිළිපදින්නේ නැත්නම්, ඔහු කැඩපතකින්
තමාගේ ස්වාභාවික මුහුණ බලන
24 මනුෂ්‍යයෙකුට සමානය. මක්නිසාද ඔහු
තමාම බලාගනිමින් සිට අහක්ව ගිය
කල, තමා කෙබඳු මනුෂ්‍යයෙක්ව
සිටියේදැයි එවලේම මතක නැතිකරයි.
25 නුමුත් නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව
දෙස බලාගෙන, මතකනැතිකරන
අසන්නෙක් නොවී, ක්‍රියාකරන කෙනෙක්ව,
එසේ පවතින්නාවූ තැනැත්තේම තමාගේ
ක්‍රියාකිරීමෙහිදී ආශීර්වාද ලබන්නේය.
26 යමෙක් තමාගේ දිව යටත්කර නොගෙන,
තමාගේ සිත රවටාගනිමින්, තමා
භක්තිවන්තයෙකැයි සිතන්නේ නම්,
27 ඔහුගේ භක්තිය හිස්ය. අපගේ පියවූ
දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිරිසිදුවූ
නොකිලුටුවූ භක්තිය නම්, මවුපියන් නැති
දරුවන්ද වැන්දඹු ස්ත්‍රීන්ද ඔවුන්ගේ
විපත්තියේදී බලාගැනීමත්, ලෝකයෙන්
කිලුටු නොවන ලෙස තමාම
ආරක්ෂාකරගැනීමත්ය.

## සභාවෙහි තරාතිරම් බැලීම නොකටයුතු බව

2 මාගේ සහෝදරයෙනි, අපගේ
තේජවන්ත ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිල්ල
මනුෂ්‍යයන්ගේ තරාතිරම් සැලකීම ඇතුව
2 නොදරල්ලා. රන් මුද්දක්ද අලංකාර
වස්ත්‍රද පැළඳගෙන ඉන්න මනුෂ්‍යයෙකුත්
කිලුටු ඇඳුම් ඇඳගෙන ඉන්න දිළින්දෙකුත්
නුඹලාගේ සිනගෝගයට ආවොත්,
නුඹලා අලංකාර වස්ත්‍ර පැළඳගෙන ඉන්න 3
අය සලකා: මෙහි හොඳ තැනක
හිඳගන්ටය කියාද, දිළින්දාට: නුඹ ඔහේ
සිටපන්න, නොහොත් මාගේ පාපුටුව
ළඟ ඉඳගනින්නැයි කියාද, කියනවා නම්,
නුඹලා භේදවූ අදහස් ඇත්තෝව, නපුරු 4
සිතිවිලිවලින් යුක්ත විනිශ්චයකාරයෝ
නොවන්නෝද? මාගේ ප්‍රේමවන්ත 5
සහෝදරයෙනි, අසාපල්ලා; ඇදහිල්ලෙහි
ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට
ප්‍රේමකරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ
උරුමක්කාරයන් වන පිණිසත්,
දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන්
තෝරා නොගත්සේක්ද? නුමුත් නුඹලා
දිළින්දාට අගෞරවකළහුය. ධනවතුන් 6
නුඹලාට පීඩාකරනවා නොවේද?
නඩුශාලාවලට නුඹලා ඇදගෙන යනවා
නොවේද? නුඹලා දරන උතුම් නාමයට 7
අපහාසකරන්නේ ඔවුන් නොවේද? එසේ 8
වුවත්: නුඹට මෙන් නුඹේ අසල්වාසියාට
ප්‍රේමකරව යන රාජකීය ව්‍යවස්ථාව
ලියවිල්ලේ හැටියට පවත්වන්නහු නම්,
නුඹලා කරන එක යහපත්ය. නුමුත් 9
තරාතිරම් සලකන්නෝ නම්, නුඹලා
වරදකාරයන් බව ව්‍යවස්ථාවෙන්
ඔප්පුවෙන බැවින් නුඹලා කරන්නේ
පාපයය. මක්නිසාද යමෙක් මුළු 10
ව්‍යවස්ථාව රක්ෂාකොට, එක අණක්
කඩකළේ නම්, ඔහු සියල්ල ගැන
වරදකාරයෙක් වී සිටී. මක්නිසාද: 11
කාමමිථ්‍යාචාරය නොකරවයි කී
තැනන්වහන්සේ: මිනී නොමරව කියාත්
කීසේක. ඉදින් නුඹ කාමමිථ්‍යාචාරය
නොකරන නුමුත්, මිනී මරනවා
නම්, ව්‍යවස්ථාව කඩකරන්නෙක්ව
සිටිනෙහිය. නිදහස්කමේ ව්‍යවස්ථාවකින් 12
විනිශ්චයකරනු ලබන්ට සිටින
තැනැත්තන් මෙන් කථාකරපල්ලා,
ක්‍රියාකරපල්ලා. මක්නිසාද දයාව 13
නොපෙන්වූ තැනැත්තාට විනිශ්චය දයාව
නැතුව පැමිණෙන්නේය. දයාව වනාහි
විනිශ්චයට විරුද්ධව ජයනාදකරන්නේය.

## ක්‍රියාවල් නැති ඇදහිල්ල නිෂ්ඵල බව

14 මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල
ඇතැයි යමෙක් කියන නුමුත් ක්‍රියාවල්
නැත්නම් මොන ප්‍රයෝජනයක්ද? ඒ
ඇදහිල්ල නිසා ඔහුට ගැළවෙන්ට
15 පුළුවන්ද? සහෝදරයෙක් නොහොත්
සහෝදරියෙක් ඇඳුම් නැතුව, දවස්පතා
16 කෑම නැතුව සිටිද්දී, නුඹලාගෙන් යමෙක්:
සමාදානයෙන් පලයල්ලා, උණුහුම්වෙයල්ලා,
කෑම කා තෘප්තියට පැමිණියල්ලායයි
ඔවුන්ට කියනවා මිස ශරීරයට ඕනෑ
දේවල් නොදෙනවා නම්, මොන
17 ප්‍රයෝජනයක්ද? එසේම ඇදහිල්ල ක්‍රියා
නැතුව තනියම තිබේ නම් මැරිලාය.
18 එසේය, යමෙක් කථාකොට: නුඹට
ඇදහිල්ල තිබේ, මට ක්‍රියාවල් තිබේ.
ක්‍රියා නැතුව නුඹේ ඇදහිල්ල මට
පෙන්වාපන්න, මම මාගේ ක්‍රියාවලින්
මාගේ ඇදහිල්ල පෙන්වන්නෙමියි කියනවා
19 ඇත. ඇත්තේ එකම දෙවියන්වහන්සේ
බව නුඹ විශ්වාසකරන්නෙහිය; නුඹ
කරන එක හොඳය. යක්ෂයෝත්
20 විශ්වාසකර වෙවුලති. නුමුත්, හිස්වූ
මනුෂ්‍යය, ක්‍රියා නැති ඇදහිල්ල නිෂ්ඵල
21 බව නුඹ දැනගන්ට කැමතිද? අපේ පියවූ
ආබ්‍රහම් තමාගේ පුත්‍රවූ ඊසාක් පූජාසනය
පිට ඔප්පුකළ විට ක්‍රියාවලින්
ධර්මිෂ්ඨ කොට ගණන්ගනු ලැබුවා
22 නොවේද? ඇදහිල්ල ඔහුගේ ක්‍රියාවල්
සමග ක්‍රියාකළ බවත් ඇදහිල්ල
ක්‍රියාවලින් සම්පූර්ණවූ බවත් නුඹට
23 පෙනේ. මෙසේ: ආබ්‍රහම් දෙවියන්වහන්සේ
විශ්වාසකෙළේය, එය ධර්මිෂ්ඨකම
කොට ඔහුට ගණන්ගනු ලැබුවේය කියා
තිබෙන ලියවිල්ල සම්පූර්ණවුණේය; තවද
ඔහු දෙවියන්වහන්සේගේ මිත්‍රයායයි
24 කියනු ලැබුවේය. මනුෂ්‍යයෙක් ඇදහිල්ල
පමණකින් නොව ක්‍රියාවලිනුත්
ධර්මිෂ්ඨ කරනු ලබන බව නුඹලාට
25 පෙනෙන්නේය. එසේම වේශ්‍යාවවූ රාහබ්
පණිවිඩකාරයන් පිළිගෙන අන් මගකින්
පිටත්කර ඇරිය කල, ක්‍රියාවලින් ඈ
ධර්මිෂ්ඨකරනු ලැබුවා නොවේද?
26 මක්නිසාද ආත්මය නැති ශරීරය මැරී
තිබෙන්නාක්මෙන්ම ක්‍රියාවලින් වෙන්වූ
ඇදහිල්ලද මැරී තිබේ.

## දිව යටත්කරගැනීමේ උවමනාව

3 මාගේ සහෝදරයෙනි, (ගුරුවරු වන)
අපට, වඩා බරපතළ විනිශ්චය
පැමිණෙන බව දැන, බොහෝ දෙනෙක්
ගුරුවරු වෙන්ට නොසොයල්ලා.
මක්නිසාද බොහෝ වර අපි සියල්ලෝ 2
පැකිලෙමුව. යමෙක් වචනයෙන්
නොපැකිලේ නම්, ඔහු මුළු ශරීරය
දමනයකරගන්ට පුළුවන් සම්පූර්ණ
මනුෂ්‍යයෙක්ය. අශ්වයන් අපට 3
කීකරුකරගන්න පිණිස උන්ගේ කටවල
කටකලියා දමුවාම අපි උන්ගේ මුළු
ශරීරයත් හරවාගනිමුව. මෙන්න, නැව් 4
එපමණ මහත් නුමුත්, තද හුළංවලින්
ගෙනයනු ලබන නුමුත්, ඉතා කුඩා
සුක්කානමකින් එය අල්ලන්නා විසින්
කැමති අතට හරවනු ලබයි. එලෙසම 5
දිව කුඩා අවයවයක් නුමුත් ලොකුවට
පාරට්ටුකරයි. කුඩා ගින්නකින්
කොපමණ මහත් වනාන්තරයක්
පත්තුවෙනවා නොවේද! දිවද ගින්නක්ය.
එය අපේ අවයවයන් අතරේ 6
අධර්මිෂ්ඨකමේ ලෝකයක්ය. ඒක මුළු
ශරීරය කිලුටු කොට, සකල ලෝකයට
ගිනි අවුලවයි, ඒකට ගිනි ඇවිලෙන්නේ
නිරයෙන්ය. එසේය, සියලු ආකාර වන 7
මෘගයෝද පක්ෂීහුද බඩගායන ජාතීන්
හා මුහුදේ සත්ත්වයෝද මනුෂ්‍යයන්
විසින් දමනය කරනු ලබති, දමනයකරනු
ලැබුවෝය. නුමුත් දිව දමනයකරන්ට 8
කිසි මනුෂ්‍යයෙකුට නුපුළුවන. ඒක
කැරළිකාරවූ, මරණීය විෂයෙන් පූර්ණවූ,
නපුරු දෙයක්ය. එයින් ස්වාමිවූ 9
පියාණන්වහන්සේට අපි ප්‍රශංසාකරමුව;
එයින්ම දෙවියන්වහන්සේගේ සමානත්වය
ලෙස මවනලද මනුෂ්‍යයන්ට අපි
ශාපකරමුව. ප්‍රශංසාවත් ශාපයත් 10
එක මුඛයෙන් නික්මෙන්නේය. මාගේ
සහෝදරයෙනි, මේ කාරණා මෙසේ වීම
යුතු නැත. උල්පත එක සිදුරෙන් මිහිරි 11
දියත් තික්ත දියත් නිකුත්කරයිද? මාගේ 12
සහෝදරයෙනි, අත්තික්කා ගහේ ඔලීව
එලවත් මුද්‍රික වැලේ අත්තික්කා එලවත්
හටගන්ට පුළුවන්ද? කරදියෙන් මිරිදිය
නික්මෙන්ට නුපුළුවන.

## බොරු ප්‍රඥව සහ සැබෑ ප්‍රඥව

13 තුඹලා අතරෙහි ප්‍රඥවත්වූ තේරුම්
ඇත්තාවූ තැනැත්තා කවුද? ඔහු යහපත්
හැසිරීමෙන් තමාගේ ක්‍රියා ප්‍රඥවේ
14 මෑදුකම ඇතුව පෙන්වාවා. නුමුත්
තුඹලාගේ සිත්වල තික්ත ඊර්ෂ්‍යාවද
පක්ෂවාදිකමද තිබේ නම්, පාරට්ටුකරමින්
සත්‍යයට විරුද්ධව බොරු නොකියල්ලා.
15 ඒ ප්‍රඥව ඉහළින් පැමිණෙන එකක් නොව
භූමිකව මාංසිකව යක්ෂාකාරව තිබේ.
16 මක්නිසාද ඊර්ෂ්‍යාවත් පක්ෂවාදිකමත්
ඇති තැන, අවුල්කමත් සියලු නපුරු
17 ක්‍රියාවලුත් ඇත්තේය. නුමුත් ඉහළින්
පැමිණෙන ප්‍රඥව පළමුකොට පිරිසිදුව,
ඊළඟට සමාදනව, ඉවසිලිවන්තව,
යටහත්ව, දයාවෙනුත් යහපත් ඵලවලිනුත්
පූර්ණව, අපක්ෂවාදිව, අවංකව තිබේ.
18 තවද සමාදනකරන්නන් උදෙසා
ධර්මිෂ්ඨකමේ ඵලය සමාදනයෙන්
වපුරනු ලැබේ.

## ලෞකිකකමට සහ උඩඟුකමට විරුද්ධව තරවටුකිරීම

4 තුඹලා අතරෙහි යුද්ධත් ඩබරත්
කොයින්ද? ඒවා පැමිණෙන්නේ
තුඹලාගේ අවයවයන් තුළෙහි යුද්ධකරන
තුඹලාගේ තෘෂ්ණාවලින් නොවේද?
2 තුඹලා ආශාවන්නහුය. නුමුත්
නොලැබෙන්නේය. තුඹලා මිනීමරන්නහුය,
ඊර්ෂ්‍යාවන්නහුය. නුමුත් ලබාගන්ට
බැරිවන්නේය. තුඹලා ඩබරද යුද්ධද
කරන්නහුය: තුඹලා නොඉල්ලන බැවින්
3 තුඹලාට නොලැබෙන්නේය. තුඹලා
ඉල්ලන නුමුත් තුඹලාගේ තෘෂ්ණා ගැන
වියදම්කරන පිණිස වැරදිලෙස ඉල්ලන
4 බැවින් ලැබෙන්නේ නැත. කාමමිථ්‍යාචාරික
තැනැත්තියෙනි, ලෝකය සමග මිත්‍රකම
දෙවියන්වහන්සේට සතුරුකම බව
තුඹලා දන්නේ නැද්ද? එබැවින් කවරෙක්
නුමුත් ලෝකයට මිත්‍රවෙන්ට කැමැත්තේ
නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙක්
5 වන්නේය. නොහොත් දෙවියන්වහන්සේ
අප තුළ වාසයකෙරෙවුවාවූ ආත්මය
අප කෙරේ අතිශයින් ආශාවන්නේය
කියා ලියවිල්ල නිෂ්කාරණයේ
කථාකරන්නේයයි තුඹලා සිතන්නහුද?
6 නුමුත් උන්වහන්සේ වඩා කරුණාව
දෙනසේක. ඉන්නිසා: දෙවියන්වහන්සේ
උඩඟුවූවන්ට විරුද්ධව සිට, යටහතුන්ට
කරුණාව දෙනසේකැයි ලියවිල්ල
7 කියන්නේය. එබැවින් දෙවියන්වහන්සේට
යටත්ව සිටපල්ලා: නුමුත් යක්ෂයාට
විරුද්ධව සිටපල්ලා. එවිට ඔහු
තුඹලා වෙතින් පලායනවා ඇත.
8 දෙවියන්වහන්සේට ළංවෙයල්ලා, එවිට
උන්වහන්සේ තුඹලාට ළංවෙනසේක.
පව්කාරයෙනි, තුඹලාගේ අත්
පවිත්‍රකරගනිල්ලා: දෙසිත් ඇත්තෙනි,
තුඹලාගේ සිත් පිරිසිදුකරගනිල්ලා.
9 දුක්වෙමින් වැලපෙමින් හඬාපල්ලා.
තුඹලාගේ සිනාසීම ශෝකයටත්
තුඹලාගේ ප්‍රීතිය කනගාටුවටත්
10 හැරේවා. ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
පහත්වෙයල්ලා, එවිට උන්වහන්සේ
තුඹලා උසස්කරනසේක.
11 සහෝදරයෙනි, එකිනෙකාට විරුද්ධව
කථා නොකරල්ලා. සහෝදරයෙකුට
විරුද්ධව කථාකරන්නා නොහොත්
තමාගේ සහෝදරයා විනිශ්වයකරන්නා
ව්‍යවස්ථාවට විරුද්ධව කථාකරන්නේය,
ව්‍යවස්ථාව විනිශ්වයකරන්නේය. ඉදින්
තුඹ ව්‍යවස්ථාව විනිශ්වයකරන්නෙහි
නම්, තුඹ ව්‍යවස්ථාව පවත්වන්නෙක්
12 නොව විනිශ්වයකාරයෙක්ය. නීතිදයකයාද
විනිශ්වයකාරයාද එක්කෙනෙක්ය, එනම්
ගළවන්ටත් විනාශකරන්ටත් පුළුවන්
තැනන්වහන්සේය. නුමුත් තුඹේ
අසල්වාසියා විනිශ්වයකරන තුඹ කවුද?

## ධනවතුන්ගේ බැරෑරුම් අදහස්

13 මෙන්න: අදවත් හෙටවත් අපි අසවල්
නුවරට ගොස්, එහි අවුරුද්දක්
නැවතී සිට, වෙළඳම්කොට ලාභ
උපදවාගන්නෙමුයයි කියන්නාවූ
14 තැනැත්තෙනි, අසාපල්ලා. මක්නිසාද
හෙට මක්වේද කියා තුඹලා දන්නේ
නැත. තුඹලාගේ ජීවිතය මොකක්ද?
තුඹලා ස්වල්ප වේලාවක් පෙනී පසුව
15 නොපෙනී යන මීදුමක්ය. එබැවින්:
ස්වාමීන්වහන්සේ කැමතිසේක් නම්, අපි

ජීවත්ව මේකවත් ඒකවත් කරන්නෙමුයයි
16 තුඹලා විසින් කිය යුතුය. නුමුත් දැන්
තුඹලාගේ අහංකාර කථාවලින් තුඹලා
පාරට්ටුකරගන්නහුය. එබඳු සියලු
17 පාරට්ටුකිරීම් නපුරුය. එබැවින් යමෙක්
යහපත කරන්ට දැන එය නොකරන්නේ
නම්, ඔහුට ඒක පාපයය.

## ධනවතුන් කරන හිරිහැර ගැනයි

5 මෙන්න. ධනවතුනි, තුඹලා කෙරේ
පැමිණෙන්ට තිබෙන තුඹලාගේ
කාලකණ්ණිකම් නිසා මොරගසා
2 හඬාපල්ලා. තුඹලාගේ වස්තුව දිරා
ගියේය. තුඹලාගේ වස්ත්‍ර කාවෝ
3 කැවෝය. තුඹලාගේ රත්රිදී මලකඩ
කා තිබේ; ඒ මලකඩ තුඹලාට විරුද්ධව
සාක්ෂියක් වී, ගිනි මෙන් තුඹලාගේ
මාංස දවනවා ඇත. අන්තිම දවස්වලදී
4 තුඹලා වස්තු රැස්කොට තැබුවහුය. බලව,
තුඹලාගේ ගොයම් කැපූ වැඩකරුවන්ට
නොදී තබාගත් ඔවුන්ගේ කුලිය
කැගසන්නේය. ගොයම් කැපූ අයගේ
මොරගැසීමද සේනාවල ස්වාමීන්-
5 වහන්සේගේ කන්වල වැටුණේය. තුඹලා
පොළොවේදී සැපජීවිකාවෙන් වැස,
අලංකාරකමින් පසුවුණහුය; මැරුම්කන
දවසකදී තුඹලාගේ සිත් තුඹලා
6 පෝෂ්‍යකරගත්තහුය. තුඹලා ධර්මිෂ්ඨයා
වරදට පත්කොට මැරුවහුය; ඔහු
තුඹලාට විරුද්ධව සිටින්නේ නැත.

## ඉවසිල්ලෙන් සිටීමට අනුශාසනා

7 එබැවින්, සහෝදරයෙනි, ස්වාමීන්-
වහන්සේගේ ඊම දක්වා ඉවසාපල්ලා.
බලව, ප්‍රථම සහ අන්තිම වර්ෂාව
පැමිණෙන තුරු ඉවසමින් ගොවියා
පොළොවේ අනර්ඝ ඵල ගැන බලාසිටී.
8 තුඹලාත් ඉවසිල්ලෙන් සිටපල්ලා;
ස්වාමීන්වහන්සේගේ ඊම ළංව තිබෙන
බැවින් තුඹලාගේ සිත් ස්ථිරකරගනිල්ලා.
9 සහෝදරයෙනි. තුඹලා විනිශ්චයකරනු
නොලබන පිණිස එකිනෙකාට
විරුද්ධව නොකොඳුරල්ලා. බලව,
විනිශ්චයකාරයාණන්වහන්සේ දෙරකඩ
ඉදිරියෙහි සිටිනසේක. සහෝදරයෙනි. 10
ස්වාමීන්වහන්සේගේ නමින් කථාකළ
ප්‍රොපේතවරුන් පීඩාවිඳීමෙත් ඉවසීමෙත්
ආදර්ශයක් කොට ගනිල්ලා. ඉවසූ අය 11
ආශීර්වාද ලද්දෝයයි අපි කියමුව.
යෝබ්ගේ ඉවසීම ගැන තුඹලා අසා
තිබේ, ස්වාමීන්වහන්සේගේ තීරණයද
තුඹලා දුටුවහුය. ස්වාමීන්වහන්සේ
බොහෝ අනුකම්පාව ඇත්තාවූ
දයාවන්තවූ කෙනෙක්ය.
තුමුත්, මාගේ සහෝදරයෙනි. තුඹලා 12
වරදට පත් නොවන පිණිස. ස්වර්ගය
ගැනවත් පොළොව ගැනවත් වෙන
කිසිවක් ගැනවත් නොදිවුරල්ලායයි
ප්‍රධානකොට කියමි. තුඹලාගේ එසේය
කීම එසේය කියාද. නැත කීම නැත
කියාද වේවා.

## යාච්ඤාවේ බලවත්කම

තුඹලා අතරෙහි යමෙක් දුක්විඳින්නේද? 13
ඔහු යාච්ඤාකරාවා. යමෙක් ප්‍රීතියෙන්
සිටින්නේද? ඔහු ගී කියාවා. තුඹලා 14
අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද?
ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා:
ඔව්හු ස්වාමීන්වහන්සේගේ නාමයෙන්
ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා
යාච්ඤාකරත්වා. එවිට ඇදහිල්ලේ 15
යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය
ලැබේ, ස්වාමීන්වහන්සේ ඔහු
නැගුටුවනවා ඇත. ඔහු පාපයන් කර
තිබේ නම්, ඒවා ඔහුට කමාකරනු ලැබේ.
එබැවින් තුඹලාගේ වරද එකිනෙකාට 16
කියාදී, සුව ලබන පිණිස එකිනෙකා
උදෙසා යාච්ඤාකරපල්ලා. ධර්මිෂ්ඨ
මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව
කරණකොටගෙන මහත් දේ ඉෂ්ටවෙයි.
එලියා අප සමාන ගති ඇති 17
මනුෂ්‍යයෙක්ව සිටිය නුමුත් වැසි
නොවසින පිණිස ඔහු උනන්දුකමින්
යාච්ඤාකළේය: එවිට තුන් අවුරුදු
සමසක් රටට වැසි නොවැස්සේය. ඔහු 18
නැවත යාච්ඤාකළේය; එවිට අහසින්

වැසි වැස, පොළොවේ එල හටගත්තේය.
19 මාගේ සහෝදරයෙනි, නුඹලා අතරෙන්
යමෙක් සැබෑකමෙන් මුළාව ගියේද,
යමෙක් ඔහු හරවාගත්තේ නම්,
පව්කාරයෙකු තමාගේ මාර්ගයේ 20
මුළාවෙන් හරවාගත්ත තැනැත්තා
ප්‍රාණයක් මරණයෙන් ගළවා, පව්
රාශියක් වසන බව ඔහු දැනගනීවා.

# පේත්‍රුස්ගේ පළමුවෙනි සාමාන්‍ය පත්‍රය

## ආචාරය

1 යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
ප්‍රේරිතයෙක්වූ පේත්‍රුස් විසින්
පොන්තස්හිද ගලාතියෙහිද කප්පදෙකි-
යෙහිද ආසියාවෙහිද බිතිනියෙහිද
විසිර ගොස් විදේශීව සිටින්නාවූ,
2 ආත්මයාණන්වහන්සේගේ පිරිසිදු-
කිරීමෙන් කීකරුවීමටත්, යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ ලේ ඉසිනු ලැබීමටත්,
පියවූ දෙවියන්වහන්සේගේ පෙර
දැනගැන්මේ ප්‍රකාරයට තෝරාගනු
ලැබූවන්ට ලියා එවන වග නම්:
අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට
වැඩිවේවා.

## ක්‍රිස්තියානිකාරයාට ලැබෙන උරුමයේ අනර්ඝකම

3 අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට
ප්‍රශංසාවේවා. මක්නිසාද අන්තිම
කාලයෙහි එළිදරව්වෙන්ට සූදානම්ව
තිබෙන ගැළවීමට දෙවියන්වහන්සේගේ
බලයෙන් ඇදහිල්ල කරණකොටගෙන
4 ආරක්ෂා කරනු ලබන්නාවූ, නුඹලා
උදෙසා ස්වර්ගයෙහි තබා තිබෙන්නාවූ,
ජරාවට නොපැමිණෙන්නාවූ, නොකිලුටුවූ,
පහනොවන්නාවූ උරුමයක් ගැන,
5 ජීවත බලාපොරොත්තුවක් ලැබෙන
පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන
උන්වහන්සේ තමන්ගේ මහත් දයාව
ලෙස අප නැවත උත්පාදකළසේක.
6 ඕනෑව තිබෙන විට නුඹලා දැන් ස්වල්ප
කලක් අනේකාකාර පරීක්ෂාවලින්
ශෝකයට පත්වන නුමුත්, ඒ ගැළවීම
ගැන නුඹලා ඉතා ප්‍රීතිවන්නහුය. එසේ 7
ශෝකයට පත්වන්නේ නාස්තිවී යන්නාවූ,
එසේද වුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ
රනට වඩා අගේව තිබෙන නුඹලාගේ
ඇදහිල්ල පරීක්ෂාකිරීමෙන් යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී
ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත්
පැමිණෙන පිණිසය. නුඹලා උන්වහන්සේ 8
නුදුටු නුමුත් උන්වහන්සේට ප්‍රේම
කරන්නහුය; දැන් උන්වහන්සේ නොදකින
නුමුත් නුඹලා උන්වහන්සේ කෙරෙහි
අදහා, නුඹලාගේ ඇදහිල්ලේ තීන්දුව 9
වන නුඹලාගේ ආත්ම ගැළවීම
ලබමින්, කියා නිමකළ නොහැකිවූ,
තේජසින් පූර්ණවූ මහත් ප්‍රීතියකින්
ප්‍රීතිවන්නහුය. නුඹලාට පැමිණෙන්ට 10
තිබුණු අනුග්‍රහය ගැන අනාගතවාක්‍ය
කී අනාගතවක්තෘවරු ඒ ගැළවීම ගැන
බොහෝසෙයින් විභාගකොට සෙවුවෝය.
ඔවුන් තුළෙහිවූ ක්‍රිස්තුස්වහන්සේගේ 11
ආත්මයාණන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේට
නියමවූ වධවිඳීමද ඊට පසු පැමිණෙන
තේජසද ගැන කලින් සාක්ෂිදුන් විට,
කවර කාලයක් නොහොත් කොයි ප්‍රකාර
කාලයක් හැඟවූසේක්ද කියා ඔව්හු
සෙවූවෝය. ඔවුන් ඒ දේවල් ගැන 12
සේවයකරන්නේ තමුන්ට නොව නුඹලාට
බව ඔවුන්ට එළිදරව් කරනලද්දේය.
ස්වර්ගයෙන් එවනලද ශුද්ධාත්මයාණන්-
වහන්සේ කරණකොටගෙන ශුභාරංචිය
නුඹලාට ප්‍රකාශකළ තැනැත්තන් ලවා
දැන් ඒවා දන්වන ලද්දේය; ඒ දේවල්
බලා දැනගන්ට දේවදූතයෝ ආශාවෙති.

## ජීවිතයේ පිරිසිදුකම සහ සහෝදර ප්‍රේමය

13 ඉන්නිසා නුඹලාගේ සිත් නැමති
කටි බැඳගෙන සිහි ඇතුව සිට, යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී
නුඹලා වෙතට පමුණුවනු ලබන්ට තිබෙන
අනුග්‍රහය පිට නුඹලාගේ බලාපොරොත්තුව
14 සම්පූර්ණලෙස පිහිටුවාපල්ලා. නුඹලාගේ
නොදන්නාකමේ කාලයේ තිබුණු
තෘෂ්ණාවලට සමාන නොවී, කීකරුකමේ
15 දරුවන් මෙන්, නුඹලා කැඳවූ
තැනන්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන්
නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී
16 ශුද්ධව සිටපල්ලා. මක්නිසාද: මා ශුද්ධව
සිටින හෙයින් නුඹලාත් ශුද්ධව සිටිය
17 යුතුයයි ලියා තිබේ. තවද මනුෂ්‍යයන්ගේ
තරාතිරම් නොබලා එකිනෙකාගේ
ක්‍රියාවේ ප්‍රකාර විනිශ්චයකරන
තැනන්වහන්සේට පියාණෙනි'ය කියා
නුඹලා යාච්ඥාකරන්නහු නම්, නුඹලාගේ
විදේශීව සිටීමේ කාලය හයින් පසු-
18 කරපල්ලා. මක්නිසාද නුඹලාගේ පිය-
වරුන්ගෙන් ලැබූ නුඹලාගේ නිෂ්ඵල
හැසිරීමෙන් නුඹලා මුදනු ලැබුවේ
රන් රිදී වැනිවූ දිරායන දේවල්
19 කරණකොටගෙන නොව, කැලලක්වත්
පලුද්දක්වත් නැති බැටළු පැටවෙකුගේ
ලේ වැනිවූ ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ
ලෙය කරණකොටගෙන බව නුඹලා
20 දන්නහුය. ලෝකය මැවීමට පළමුවෙන්
නියමකරනු ලැබූ උන්වහන්සේව
මළවුන්ගෙන් නැගුටුවා, උන්වහන්සේට
මහිමය දුන්නාවූ දෙවියන්වහන්සේ
කෙරෙහි උන්වහන්සේ කරණකොටගෙන
21 අදහන්නාවූ නුඹලා උදෙසා, උන්වහන්සේ
කාලවල කෙළවරදී ප්‍රකාශකරනු
ලැබූසේක; මෙසේ නුඹලාගේ ඇදහිල්ල
සහ බලාපොරොත්තුව දෙවියන්වහන්සේ
22 කෙරෙහි ඇත්තේය. සහෝදරයන්ට
අවංකකමින් ප්‍රේමකරන පිණිස
සත්‍යතාවට කීකරුවීමෙන් නුඹලාගේ
ආත්ම පිරිසිදුකරගත් බැවින් සිතින්
එකිනෙකාට උනන්දුලෙස ප්‍රේමකරපල්ලා.
23 මක්නිසාද නුඹලා කුණුවෙන්නාවූ
බීජවලින් නොව දෙවියන්වහන්සේගේ
ජීවමානවූ පවතින්නාවූ වචනය
කරණකොටගෙන, කුණු නොවෙන්නාවූ
බීජවලින් නැවත උත්පාදකරනු ලැබුවහුය.
කුමක්හෙයින්ද: 24

මාංසමයවූ සියල්ලෝම තණකොළ
මෙන්ය,
ඔවුන්ගේ මුළු තේජස තණමල
මෙන්ය.
තණකොළ වියළීයයි, මල් වැටේ.
තුමුත් ස්වාමීන්වහන්සේගේ වචනය 25
සදාකාලේටම පවතින්නේය.

මේ වනාහි නුඹලාට දේශනාකරනලද
ශුභාරංචි වචනයය.

## කොනේ ප්‍රධාන ගල වන ක්‍රිස්තුස්වහන්සේ පිට ගොඩ-නගනු ලබන ආත්මික ගෘහය

2 එබැවින් සියලු ආකාර ක්‍රෝධද
සියලු ආකාර රැවටිල්ලද වංකකමද
ඊර්ෂ්‍යාද සියලු අගුණකීම්ද පහකරදමා,
ස්වාමීන්වහන්සේ යහපත් බව නුඹලා 2
රසබලා දැනගත්තහු නම්, ආත්මිකවූ 3
අමිශ්‍රවූ කිරිවලින්, නුඹලා ගැළවීම සඳහා
වර්ධනයවන පිණිස අලුත උපන් බිළිඳුන්
මෙන් එයට බොහෝ ආශාවෙයල්ලා.
මනුෂ්‍යයන් විසින් එපාකළ නුමුත් 4
දෙවියන්වහන්සේ විසින් තෝරාගත්තාවූ
අනර්ඝ ජීවමාන ගලක් වැනි උන්වහන්සේ
වෙතට පැමිණ, නුඹලාත් යේසුස් 5
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
දෙවියන්වහන්සේට ප්‍රසන්නවූ ආත්මික
පූජා ඔප්පුකරන පිණිස ශුද්ධ පූජක
සමූහයක් වීමට ආත්මික ගෘහයක්
කොට ජීවමාන ගල් මෙන් ගොඩනගනු
ලබන්නහුය. ඉන්නිසා: 6

බලව, තෝරාගත්, අනර්ඝ, කොනේ
ප්‍රධාන ගලක් සියොන්හි තබමි.
උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා
ලජ්ජාවට නොපැමිණෙන්නේයයි

ලියවිල්ලේ අන්තර්ගතව තිබේ. එබැවින් 7
අදහන්නාවූ නුඹලාට ඒ ගෞරවය
ඇත්තේය. නුමුත් නොඅදහන්නන්ට,
ගෙවල් සාදන්නන් විසින් එපාකළ

ගලම
කොනේ ප්‍රධාන ගල කරනලද්දේය.
8 තවද,
එය පැකිළීමේ ගලක්ද බාධාවේ
පර්වතයක්ද කරනලද්දේය.
මක්නිසාද ඔව්හු වචනයට අකීකරුව
සිට පැකිලෙති. ඊටද ඔව්හු නියම
9 කරනලද්දෝය. නුමුත් අන්ධකාරයෙන්
තමන්ගේ විස්මපත් ආලෝකයට
තුඹලා කැඳවාගත් තැනන්වහන්සේගේ
උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස තුඹලා
වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය
පූජකයෝද ශුද්ධවූ ජාතියක්ද දෙවියන්-
වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය.
10 වරක් තුඹලා සෙනඟක්ව සිටියේ නැත,
නුමුත් දැන් දෙවියන්වහන්සේගේ
සෙනඟව සිටින්නහුය; දයාව නොලැබ
සිටිය නුමුත් දැන් දයාව ලැබ
සිටින්නහුය.

## යහපත් හැසිරීම. අධිපතීන්ට යටත්වීම

11 ප්‍රේමවන්තයෙනි, තුඹලා ආගන්තුකයන්ද
විදේශීන්ද මෙන්, ආත්මයට විරුද්ධව
යුද්ධකරන මාංසික තෘෂ්ණාවලින්
වැලකී සිටින ලෙස තුඹලාගෙන් ඉල්ලමි.
12 තුඹලා නපුරකරන්නෝයයි අන්‍යජාතීන්
තුඹලාට විරුද්ධව කථාකරන නුමුත්,
ඔවුන් තුඹලාගේ යහපත් ක්‍රියා දැක,
විභාගකිරීමේ දවසේදී දෙවියන්වහන්සේට
ගෞරවකරන පිණිස, ඔවුන් අතරේ
තුඹලාගේ හැසිරීම ඔබිනලෙස
පවත්වාපල්ලා.
13 උත්තමයාව සිටින රජුට වේවා, නපුර
කරන්නන්ට දඬුවම පිණිසත් යහපත
කරන්නන්ට ප්‍රශංසාව පිණිසත් රජු විසින්
එවනලද්දවූ ආණ්ඩුකාරයන්ට වේවා,
14 සියලු මනුෂ්‍ය නියෝගවලට ස්වාමීන්-
වහන්සේ නිසා යටත්වෙයල්ලා.
15 මක්නිසාද මෙසේ තුඹලා යහපත
කිරීමෙන් අනුවණ මනුෂ්‍යයන්ගේ
අඥනකම නිශ්ශබ්දකිරීම දෙවියන්-
16 වහන්සේගේ කැමැත්තය. එසේය,
තුඹලා නිදහස් අය නුමුත්, ඒ
නිදහස නපුරට වැස්මක් කොට
නොව දෙවියන්වහන්සේගේ දසයන්
මෙන් ව්‍යවහාරකරපල්ලා. සියල්ලන්ටම
ගෞරවකරපල්ලා. සහෝදර සමාගමට 17
ප්‍රේමකරපල්ලා. දෙවියන්වහන්සේට භය-
වෙයල්ලා. රජ්ජුරුවන්ට ගෞරව-
කරපල්ලා.

## සේවයෙහි අදහස

වැඩකාරයෙනි, යහපත්වූ සෞම්‍යවූ 18
ස්වාමිවරුන්ට පමණක් නොව තුඹලාගේ
රළුවූ ස්වාමිවරුන්ටත් සියලු ආකාර
භයින් යටත්වෙයල්ලා. මක්නිසාද යමෙක් 19
දෙවියන්වහන්සේ කෙරෙහිවූ හෘදයසාක්ෂිය
නිසා අයුතුලෙස පීඩා විඳිමින් දුක්
ඉවසන්නේ වී නම්, ඒක ප්‍රශංසනීය
දෙයක්ය. මක්නිසාද තුඹලා වරදකොට 20
ඒ ගැන පහර ලබන කල්හි ඉවසන්නහු
නම්, එය මොන උතුම්කමක්ද? නුමුත්
යහපත්කම් කොට ඒ ගැන දුක්විඳින
කල්හි ඉවසන්නහු නම්, ඒක දෙවියන්-
වහන්සේ ඉදිරියෙහි ප්‍රශංසනීය දෙයක්ය.
එසේය, ඊට තුඹලා කැඳවනු ලැබුවහුය. 21
මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ තුඹලා නිසා
වධවිඳ, තුඹලා උන්වහන්සේගේ අඩි
පාරේ යන පිණිස තුඹලාට ආදර්ශයක්
දී ගියසේක. උන්වහන්සේ කිසි පාපයක් 22
නොකළසේක, උන්වහන්සේගේ මුඛයෙහි
වංචාවක්ද සම්බවුණේත් නැත,
උන්වහන්සේ නින්දකරනු ලැබූ කල නින්ද 23
නොකළසේක; වධවින්ද කල තර්ජන
නොකර, ධර්මිෂ්ඨලෙස විනිශ්චයකරන
තැනන්වහන්සේට කාරණය භාරදුන්සේක.
අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට 24
ජීවත්වන පිණිස, උන්වහන්සේම තමන්ගේ
ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන්
ඉසුලූසේක; උන්වහන්සේගේ තුවාලවලින්
තුඹලා සුවකරනු ලැබුවහුය. මක්නිසාද 25
තුඹලා බැටළුවන් මෙන් මුළාවයමින්
සිටියහුය; නුමුත් දැන් තුඹලාගේ
ආත්මවල එඬේරාද රැකවලාද වෙතට
හැරී ඇවිත් සිටින්නහුය.

## ස්ත්‍රී පුරුෂයන්ගේ හැසිරීම

3 එසේම, භාර්යාවරුනි, තුඹලාගේ
පුරුෂයන්ගෙන් සමහරෙක් වචනයට
2 අකීකරුව සිටිතත්, ඔවුන් තුඹලාගේ
පිරිසිදුවූ යටහත් හැසිරීම දුටුවාම,
වචනය නැතුව භාර්යාවන්ගේ හැසිරීම
කරණකොටගෙන දිනාගන්නා පිණිස,
3 ඔවුන්ට යටත්වෙයල්ලා. තුඹලාගේ
අලංකාරවීම හිසකේ ගෙතීමද
ස්වර්ණාභරණ පැළඳීමද නොහොත්
වස්ත්‍ර හැඳීමද යන පිටත අලංකාරය
4 නොව, දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා
අනර්ඝව තිබෙන මෘදුවූ නිශ්චලවූ
ගතියක් නමැති දිරා නොයන
සැරසීමෙන් යුක්තවූ සිතේ ඇතුල්
5 මනුෂ්‍යයා වේවා. මක්නිසාද පුරාණ
කාලයෙහි දෙවියන්වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවුණ ශුද්ධවූ ස්ත්‍රීවරු
තමුන්ගේ පුරුෂයන්ට යටත්ව මෙලෙස
6 අලංකාරවුණෝය. එලෙස සාරා
ආබ්‍රහම්ට ස්වාමියායයි කියමින්
කීකරුවුණාය. තුඹලාත් කිසි භීතියක්
කරණකොටගෙන භය නොවී යහපත
කරන්නහු නම්, ඇගේ දරුවෝව
සිටින්නහුය.
7 එසේම, පුරුෂයෙනි, තුඹලාගේ
යාච්ඤාවලට බාධා නොපැමිණෙන පිණිස,
වඩා දුර්වල භාජනවූ භාර්යාවන් සමග
දනගැන්මේ හැටියට වාසයකරමින්,
ඔවුන් ජීවනයේ අනුග්‍රහයට හවුල්
උරුමක්කාරියන්ද බැවින් ඔවුන්ට ගෞරව
දීපල්ලා.

## ක්‍රිස්තියානි දයානුකම්පාව

8 අවසානකොට, තුඹලා සියල්ලෝම
එක්සිත්ව, එකිනෙකා කෙරෙහි දයාවෙන්
යුක්තව, සහෝදර ස්නේහයද
අනුකම්පාවද යටහත්කමද ඇතුව
9 සිටපල්ලා. නපුරට නපුරවත් නින්දවට
නින්දවවත් නොකොට, තුඹලාට
ආශීර්වාදයක් උරුමවෙන පිණිස
කැඳවනු ලැබූ බැවින්, ආශීර්වාදම
10 කරපල්ලා. මක්නිසාද:

ජීවිතයට ඇලුම්වෙන්ටත්
යහපත් දවස් දකින්ටත් කැමති
තැනැත්තේ
තමාගේ දිව නපුරෙන්ද
තමාගේ තොල් වංචා කථාකිරීමෙන්ද
වලක්වාගනීවා.
නපුරෙන් ඉවත්ව යහපත කරාවා; 11
සාමාදනය සොයා, එය පස්සේ
දුවාවා;
මක්නිසාද ස්වාමීන්වහන්සේගේ 12
ඇස් ධර්මිෂ්ඨයන් කෙරෙහිත්
උන්වහන්සේගේ කන් ඔවුන්ගේ
කන්නලව්ව දෙසටත් යොමා තිබේ.
තුමුත් ස්වාමීන්වහන්සේගේ මුහුණ
නපුර කරන්නන්ට විරුද්ධව තිබේ.

## ධර්මිෂ්ඨකම නිසා දුක් විඳ දරාගැනීම. ඒ ගැන මහත් ආදර්ශය යේසුස්වහන්සේ බව

තවද තුඹලා යහපත් දෙය ගැන 13
ජ්වලිතව සිටිහු නම්, තුඹලාට අනතුරු
කරන්නේ කවුද? එහෙත් තුඹලා 14
ධර්මිෂ්ඨකම නිසා දුක්විඳින තුමුත්
ආශීර්වාදලද්දහුය. ඔවුන්ගේ භයගැන්වීමට
භයවෙන්ටවත් කැලඹෙන්ටවත් එපා;
තුමුත් තුඹලාගේ *සිත්වලින් ස්වාමීන්- 15
වහන්සේ කොට ක්‍රිස්තුස්වහන්සේට
ගෞරවකරපල්ලා. තුඹලා තුළ ඇත්තාවූ
බලාපොරොත්තුව ගැන තුඹලාගෙන්
අසන සියල්ලන්ට උත්තර දෙන්ට නිතර
සැදී සිටපල්ලා, තුමුත් මෘදුකමින්ද
යටහත්කමින්ද එසේ කළ යුතුය. තුඹලා 16
නපුර කරන්නහුයයි තුඹලාට විරුද්ධව
කථාකරන තුමුත්, ක්‍රිස්තුස්වහන්සේ තුළ
තිබෙන තුඹලාගේ යහපත් හැසිරීමට
දෙස්තබන්නන් ලජ්ජාවට පැමිණෙන
පිණිස, යහපත් හෘදයසාක්ෂියක් ඇතුව
සිටපල්ලා. මක්නිසාද තුඹලා යහපත 17
කර දුක්විඳීම දෙවියන්වහන්සේගේ
කැමැත්ත නම්, නපුර කර දුක්විඳීමට
වඩා ඒක හොඳය. මක්නිසාද 18
දෙවියන්වහන්සේ ළඟට අප පමුණුවන
පිණිස ධර්මිෂ්ඨවූ ක්‍රිස්තුස්වහන්සේ

*ග්‍රීක්: සිත් තුළ, සිත්හි.

අධර්මිෂ්ඨයන් උදෙසා පව් ගැන වරක්
වධවින්දසේක; උන්වහන්සේ මාංසය
සම්බන්ධයෙන් මරනු ලැබ, ආත්මය
සම්බන්ධයෙන් ජීවත්කරනු ලැබූසේක.
19 එම ආත්මයෙන් උන්වහන්සේ ගොස්
හිරගෙයි සිටි ආත්මවලට දේශනාකළසේක.
20 ඒ ආත්ම නෝවාගේ දවස්වලදී, නැව
සාදන අතර, දෙවියන්වහන්සේ
ඉවසිල්ලෙන් බලාසිටි කාලයෙහි
අකීකරුව සිටියෝය. ඒ නැවට ස්වල්ප
දෙනෙක් එනම් අටදෙනෙක් [ඇතුල්වී]
වතුර කරණකොටගෙන ගැළවුණෝය.
21 ඊට සමානව තිබෙන *බව්තීස්මයේ
වතුරෙන් එනම් මාංසයේ කිලිටුකම
පහකිරීමෙන් නොව, යහපත්
හෘදයසාක්ෂියකින් දෙවියන්වහන්සේ
සෙවීමෙන් දැන් තුඹලාත් යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම
කරණකොටගෙන ගැළවෙන්නහුය.
22 උන්වහන්සේ ස්වර්ගයට ගොස්
දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ
සිටිනසේක; දේවදූතයෝද බලයලත්තෝද
පරාක්‍රමධාරීහුද උන්වහන්සේට යටත්-
කරනලද්දෝ වෙති.

## පාපිෂ්ඨ දේ ප්‍රතික්ෂේපකිරීම

4 ඉතින් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන්
(අප උදෙසා) වධවින්ද බැවින්,
මාංසයේ ඉතිරිව තිබෙන කාලයෙහි තවත්
මනුෂ්‍යයන්ගේ තෘෂ්ණාලෙස නොව,
2 දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස
ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක්
කොට පැළඳගනිල්ලා. මක්නිසාද
මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන්
3 නිදහස්වී සිටියි. සල්ලාලකම්වලද
තෘෂ්ණාවලද බීමත්කම්වලද නපුරු
මංගල්‍යවලද මත්පැන්බීම්වලද පිළිකුල්වූ
රූපඇදහීම්වලද හැසිර, අන්‍යජාතීන්ගේ
කැමැත්ත කරමින් තුඹලා ගතකළාවූ
4 කාලය ඉතා ඇත. ඔවුන් සමග එම
අනාචාර බහුලත්වයට තුඹලා නොයන
බැවින් ඔව්හු ඊට පුදුමව තුඹලාට
5 අපහාසකරති. ඔවුන් විසින් ජීවතුන්ද
මළවුන්ද විනිශ්චයකරන්ට සූදානම්ව
සිටින තැනන්වහන්සේට ගණන්දෙන්ට
වෙනවා ඇත. මක්නිසාද මළවුන්ට පවා 6
ශුභාරංචිය ප්‍රකාශකරනු ලැබුවේ, ඔවුන්
මනුෂ්‍යාකාරයෙන් මාංසයෙන් විනිශ්චය
කරනු ලැබූ නුමුත්, දේවාකාරයෙන්
ආත්මයෙන් ජීවත්වෙන පිණිසය.

## අවදිව සිටීම සහ ප්‍රේමයෙන් එකිනෙකාට සේවයකිරීම

නුමුත් සියලු දේවල අන්තිමය ළංවී 7
තිබේ. එබැවින් තුඹලා සිහියෙන් යුක්තව
සිට, යාච්ඥාකිරීම පිණිස පිබිදසිටපල්ලා.
ඇරත් ප්‍රේමය පව් රාශියක් වසන බැවින්, 8
සියලු දේවලට වඩා එකිනෙකා කෙරෙහි
බලවත් ප්‍රේමයක් ඇතුව සිටපල්ලා.
කොඳුරන්නේ නැතුව එකිනෙකාට 9
ආගන්තුක සත්කාරකරපල්ලා. දෙවියන්- 10
වහන්සේගේ අනේකාකාර කරුණාවේ
යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට
ලැබුණු දීමනාවේ හැටියට එයින්
එකිනෙකාට සේවයකරපල්ලා. යමෙක් 11
කථාකෙරේ නම්, දෙවියන්වහන්සේගේ
වාක්‍ය වශයෙන් කථාකරාවා; යමෙක්
සේවයකෙරේ නම්, දෙවියන්වහන්සේ
සපයාදෙන ශක්තියේ ප්‍රකාර සේවය-
කරාවා. දෙවියන්වහන්සේට යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සියලු
කාරණාවලදී ගෞරව පැමිණෙන පිණිස
එසේකරන්ට ඕනෑය. මහිමයත් පරාක්‍රමයත්
සදාකාලේටම උන්වහන්සේගේය. ආමෙන්.

## ක්‍රිස්තියානිකාරයන් මෙන් දුක්විඳීමේ අයිතිවාසිය

ප්‍රේමවන්තයෙනි, තුඹලා සෝදිසිකිරීම 12
පිණිස පැමිණෙන තුඹලා අතරේ තිබෙන
ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක්
තුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම
නොවෙල්ලා. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ 13
තේජසේ එළිදරව්වීමේදීත් තුඹලා
ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස
උන්වහන්සේගේ දුක්විඳීමෙහි තුඹලා
පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීති-
වෙයල්ලා. ක්‍රිස්තුස්වහන්සේගේ නාමය 14

*අවගාහනයේ.

නිසා නින්දකරනු ලබන්නහු නම් නුඹලා
ආශීර්වාදලද්දහුය; මක්නිසාද මහිමයේ
ආත්මයාණන්වහන්සේ වන දෙවියන්-
වහන්සේගේ ආත්මයාණන්වහන්සේ
15 නුඹලා කෙරෙහි රඳනසේක. නුඹලාගෙන්
කිසිවෙක් මිනීමරන්නෙක්වත් සොරෙක්වත්
නපුර කරන්නෙක්වත් අනුන්ගේ
කාරණාවලට ම දිවන්නෙක්වත් මෙන්
16 දුක් නොවිඳීවා. නුමුත් යමෙක්
ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක්විඳී
නම්, ඔහු ලජ්ජා නොවී, ඒ නාමය
සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට
17 ගෞරවකරාවා. මක්නිසාද දෙවියන්-
වහන්සේගේ ගෘහයේ සිට විනිශ්චය
පටන්ගන්ට කාලය පැමිණ තිබේ. එය
පළමුකොට අප ළඟ සිට පටන්ගත්තොත්,
දෙවියන්වහන්සේගේ ශුභාරංචියට කීකරු
නොවන්නන්ගේ අන්තිමය කුමක්
18 වන්නේද? ධර්මිෂ්ඨයා අමාරුවෙන්
ගැළවෙන්නේ නම් අභක්තිකයාද
පව්කාරයාද කොතැන පෙනේද්ද?
19 එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත
ලෙස දුක් විඳින්නෝ යහපත කරමින්,
විශ්වාස මැවුම්කාරයාණන්ට තමුන්ගේ
ආත්ම භාරදෙත්වා.

## වැඩිමහල්ලන්ගේ විශ්වාස මෙහෙය ගැන

5 ඉතින් වැඩිමහල්ලෙක්ද ක්‍රිස්තුස්-
වහන්සේගේ දුක්විඳීමට සාක්ෂි-
කාරයෙක්ද එළිදරව්වෙන්ට තිබෙන
තේජසට පංගුකාරයෙක්ද වන මම,
නුඹලා අතරේ සිටින වැඩිමහල්ලන්ට
2 අනුශාසනාකරමි. නුඹලා අතරෙහි සිටින
දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්,
බලාත්කාරය නිසා නොව දේව කැමැත්ත
ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය
3 නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ
භාරයට දෙනලද්දවුන් කෙරෙහි
අධිපතිකම්කරන්නාක්මෙන් නොව
නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය
4 රැකබලාගනිල්ලා. එවිට ප්‍රධාන
එඬේරාණන් ප්‍රකාශවන කල්හි නුඹලා
තේජසේ නොමැළවෙන්නාවූ ඔටුන්න
5 ලබන්නහුය. එසේම, තරුණයෙනි,
වැඩිමහල්ලන්ට යටත්වෙයල්ලා. එසේය,
නුඹලා සියල්ලෝම එකිනෙකාට
මෙහෙකරන පිණිස යටත්කම
පැළඳගනිල්ලා. මක්නිසාද දෙවියන්-
වහන්සේ උඩඟු අයට විරුද්ධව සිට
යටහතුන්ට කරුණාව දෙනසේක.

## සාමාන්‍ය අවවාද

එබැවින් දෙවියන්වහන්සේ සුදුසු 6
කාලයේදී නුඹලා උසස්කරන පිණිස
උන්වහන්සේගේ බලවත් හස්තයට
යටත්වෙයල්ලා; උන්වහන්සේ නුඹලා ගැන 7
සලකන බැවින් නුඹලාගේ හැම කරදර
උන්වහන්සේ පිට තබාපල්ලා. සිහි ඇතිව, 8
අවදිව ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයාවූ
යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන්
කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ
මොබ ඇවිදින්නේය. ලෝකයෙහි සිටින 9
නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම
දුක්ම පැමිණෙන බව දැන, නුඹලාගේ
ඇදහිල්ලෙහි ස්ථිරව සිට, යක්ෂයාට
විරුද්ධව සිටපල්ලා. එවිට ක්‍රිස්තුස්- 10
වහන්සේ තුළ තමන්ගේ සදාකාල තේජසට
නුඹලා කැඳවාගත් සියලු කරුණාවේ
දෙවියන්වහන්සේම, නුඹලා ස්වල්ප
කලක් දුක්වින්ද පසු, නුඹලා
සම්පූර්ණකර, ස්ථිරකර, ශක්තිමත්කර
පිහිටුවනසේක. උන්වහන්සේට සදාකාලේටම 11
පරාක්‍රමය වේවා. ආමෙන්.

## අවසානය

මෙය දෙවියන්වහන්සේගේ සැබෑ 12
කරුණාව බවට මම සාක්ෂිදෙමින්ද
අනුශාසනාකරමින්ද අපේ විශ්වාස
සහෝදරයෙක්යයි මා සලකන
සිල්වානස් අත ලුහුඬින් නුඹලාට ලියා
එව්වෙමි. එහි ස්ථිරව පිහිටා සිටපල්ලා.
නුඹලා සමග තෝරාගනු ලැබූ 13
බබිලෝනියෙහි සිටින *තැනැත්තී නුඹලාට
ආචාරකරන්නීය; මාගේ පුත්‍රවූ මාර්ක්
එසේම නුඹලාට ආචාරකරයි. ප්‍රේමයේ 14
සිඹීමකින් එකිනෙකාට ආචාරකරපල්ලා.
ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින නුඹලා
සියල්ලන්ට සමාදානය වේවා.

*එනම්, සභාව නොහොත් සහෝදරී.

# පේත්‍රුස්ගේ දෙවෙනි සාමාන්‍ය පත්‍රය

## ආචාරය

1 යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ
දසයෙක්ද ප්‍රේරිතයෙක්ද්වූ, සීමොන්
පේත්‍රුස් නම් මා විසින්, අපේ දෙවිවූ
ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ ධර්මිෂ්ඨකමෙන් අප වාගේ
එක සමාන අනර්ඝ ඇදහිල්ල ලැබූවන්ට
2 ලියා එවන වග නම්: දෙවියන්වහන්සේද
අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේද
දැනගැනීමෙන් අනුග්‍රහයත් සමාදානයත්
නුඹලාට වැඩිවේවා.

## ක්‍රිස්තියානිකාරයන්ගේ චරිත ගුණ හා අභිවර්ධනය

3 මක්නිසාද තමන්වහන්සේගේ
මහිමයෙන් හා ගුණවත්තකමෙන් අප
කැඳවාගත් තැනන්වහන්සේ දැනගැනීම
කරණකොටගෙන, උන්වහන්සේගේ දිව්‍ය
බලයෙන් ජීවිතයටත් දේවභක්තියටත්
4 අදාළවූ සියලු දේ අපට දී තිබේ. ඒ
කරණකොටගෙන උන්වහන්සේ තමන්
අනර්ඝවූ ඉතා උතුම්වූ පොරොන්දු අපට
දී තිබේ; එසේ කළේ තෘෂ්ණාව නිසා
ලෝකයේ තිබෙන දූෂ්‍යකමෙන් නුඹලා
ගැළවී, ඒ පොරොන්දු කරණකොටගෙන
දේව ස්වභාවට පංගුකාරයන් වන
5 පිණිසය. එසේය, මේ කාරණය නිසාම
මුළු උත්සාහයෙන් නුඹලාගේ ඇදහිල්ල
සමග ගුණයද, ගුණය සමග දැනගැන්මද,
6 දැනගැන්ම සමග පමණ දැන ක්‍රියාකිරීමද,
පමණ දැන ක්‍රියාකිරීම සමග ඉවසිල්ලද,
ඉවසිල්ල සමග දේවභක්තියද,
7 දේවභක්තිය සමග සහෝදර ස්නේහයද,
සහෝදර ස්නේහය සමග ප්‍රේමයද
සපයාගනිල්ලා. මක්නිසාද මේවා 8
නුඹලාට තිබේ නම්, වැඩිවේ නම්, අපගේ
ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
දැනගැනීමෙහි කම්මැළි බවටවත් අඵල
බවටවත් පැමිණෙන්ට ඒවා නුඹලාට
ඉඩ නොදෙයි. නුමුත් මේවා නැති 9
තැනැත්තේ තමාගේ පරණ පව්වලින්
පවිත්‍රකරනු ලැබූ බව මතකනැතිකොට,
ළඟ තිබෙන දේ පමණක් බලමින්,
අන්ධව සිටියි. එබැවින්, සහෝදරයෙනි, 10
නුඹලාගේ කැඳවීමද තෝරාගැනීමද
ස්ථිරකරගන්න පිණිස වඩා කඩිසරව
ක්‍රියාකරපල්ලා. මක්නිසාද නුඹලා මේ
දේ කරනවා නම් කිසි කලකත්
පැකිලෙන්නේ නැත. මක්නිසාද මෙසේ 11
අපගේ ස්වාමිවූ ගැළවුම්කාරවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාල රාජ්‍යයට
ඇතුල්වීම නුඹලාට බොහෝසේ දෙනු ලැබේ.

## ප්‍රේරිත තැනගේ මරණය ළඟ බව දැනුම්දීම

එබැවින් නුඹලා මේ දේවල් දැන නුඹලාට 12
තිබෙන සත්‍යතාවෙහි පිහිටා සිටින
නුමුත් මම නුඹලාට මේ දේවල්
සිහිකරවන්ට නිතර සූදානම්ව සිටිමි.
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ 13
මට පෙන්වූ ලෙසම මාගේ කූඩාරම
පහකරදැමීමේ කාලය වහාම පැමිණෙන
බව දැන, මම මේ කූඩාරමෙහි සිටින 14
තුරු, නුඹලාට සිහිකරවීමෙන් නුඹලා
පුබුදුවන්ට යුතුයයි සිතමි. එසේය, මාගේ 15
ඇවෑමෙන් පසු නුඹලාට මේ දේවල්
හැම කල්හිම සිහිකරගන්ට පුළුවන්වන
පිණිස කඩිසරව ක්‍රියාකරන්නෙමි.

## පේතෘස් තුමාගේත් ප්‍රොපේත-වරුන්ගේත් සාක්ෂි

16 මක්නිසාද අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ බලයත් ඊමත් අප
තුඹලාට දන්වූ කල, උන්වහන්සේගේ
මහිමය ඇසින් දකලා මිස ප්‍රයෝගයෙන්
යොදනලද ප්‍රබන්ධ අනුව එසේ
17 නොකෙළෙමුව. මක්නිසාද: මොහු මාගේ
ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි
මම ප්‍රසන්නව සිටිමියි යන හඬක්
උත්කෘෂ්ඨ තේජසෙන් උන්වහන්සේ කරා
පහළවූ කල්හි, පියවූ දෙවියන්-
වහන්සේගෙන් ගෞරවයත් තේජසත්
18 උන්වහන්සේ ලැබූසේක. උන්වහන්සේ
සමග ශුද්ධවූ කන්දේ සිටියදී මේ හඬ
ස්වර්ගයෙන් එනවා අපිම ඇසීමුව. ඊට
වඩා ස්ථිරකරනලද්දවූ අනාගතවාක්‍යය
19 අපට තිබේ. ලියවිල්ලේ කිසි
අනාගතවාක්‍යයක් යමෙකුගේ අභිප්‍රා-
යෙන්ම හට නොගන්න බව පළමුකොට
20 දන, අලුයම පැමිණ පහන් තාරකාව
තුඹලාගේ සිත් තුළෙහි පායන තුරු
අඳුරු තැනක බබළන පහනක් මෙන්
එය සලකන්නහු නම් යහපත්ය.
21 මක්නිසාද කිසි අනාගතවාක්‍යයක්
මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක
නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ
ශුද්ධාත්මයාණන් විසින් පොලඹවනු
ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස
කථාකළෝය.

## බොරුවූ මාංසිකවූ අහංකාරවූ ගුරුවරුන් සම්බන්ධ තර්ජන

2 නුමුත් සෙනඟ අතරේ බොරු
ප්‍රොපේතවරුද සිටියෝය, එලෙසම
විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද
තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව
එපාකරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය
පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු
2 තුඹලා අතරෙත් වන්නෝය. ඔවුන්ගේ
සල්ලාලකම් අනුව බොහෝ දෙනෙක්
යනවා ඇත; ඔවුන් නිසා සත්‍යතාවේ
මාර්ගයට අපහාස පැමිණෙන්නේය.
3 තෘෂ්ණාව නිසා ඔවුන් වංචා වචනවලින්
තුඹලා වෙළඳමක් කරගන්නවා ඇත.
පුරාණයේ සිට පවතින ඔවුන්ගේ විනිශ්චය
ප්‍රමාද නොවන්නේය, ඔවුන්ගේ විනාශයද
නිද නොගනියි. මක්නිසාද දේවදූතයන් 4
පව්කළ විට දෙවියන්වහන්සේ ඔවුන්ට
දඬුවම් නොකර නැර, විනිශ්චය පිණිස
ඉතුරුකොට තැබීමට නිරයෙහි හෙළා
අන්ධකාරයේ ගුහාවලට භාරදුන්සේක්
නම්, උන්වහන්සේ අභක්තීන්ගේ ලෝකය 5
පිට ජලගැලීමක් පැමිණෙවූ කල, පුරාණ
ලෝකය ඉතිරි නොකොට ධර්මිෂ්ඨකමේ
දේශනාකාරයෙක්වූ නෝවා තවත්
සත්දෙනෙකුත් සමග ආරක්ෂාකළසේක්
නම්, සොදෙම හා ගොමෝරාව යන 6
නුවරවල් අළුකරමින් ඒවා පෙරළා
දමා විනාශයට නියමකොට, මතු
අභක්තිකලෙස හැසිරෙන්නන්ට ඒවා
ආදර්ශයක් කළසේක් නම්, දුෂ්ටයන්ගේ 7
සල්ලාල ජීවිතය කරණකොටගෙන තද
පීඩාවට පැමිණියාවූද, ඔවුන් අතරෙහි 8
වසමින් ඔවුන්ගේ අයුතු ක්‍රියාවන් දවසින්
දවස දකීමෙනුත් ඇසීමෙනුත් තමාගේ
ධර්මිෂ්ඨ ආත්මයට දඩි දුක්
පමුණුවාගත්තාවූද, ධර්මිෂ්ඨවූ ලොත්
ගැළවූසේක් නම්, භක්තිවන්තයන් 9
පරීක්ෂාවෙන් ගළවන්ටත් අධර්මිෂ්ඨයන්,
ප්‍රධානකොට කිලුටුකමේ තෘෂ්ණාවෙන්
මාංසය අනුව හැසිරෙන්නාවූ,
අධිපතිකමට අපහාසකරන්නාවූ අය,
දඬුවම යටතේ විනිශ්චය දවස දක්වා 10
තබන්ටත් ස්වාමීන්වහන්සේ දන්නාසේක.
භය නැත්තාවූ හිතුවක්කාරවූ මොව්හු
උත්තමයන්ට නින්දකරන්ට තැති
නොගනිති. එහෙත් දේවදූතයෝ 11
පරාක්‍රමයෙන්ද බලයෙන්ද වඩා උතුම්
නුමුත්, ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි
ඔවුන්ට විරුද්ධව නින්ද සහිත
විනිශ්චයක් නොපමුණුවති. නුමුත්, 12
අල්ලා විනාශකරනු ලබන්ට උපන්,
ජම්මයෙන් නුවණ නැත්තාවූ තිරිසනුන්
මෙන්, මොව්හු, නොදන්නා දේට
අපහාසකරමින්, අධර්මිෂ්ඨකමේ කුලිය
ලබමින්, තමුන්ගේම කිලුටුකමෙන්
සැබවින් විනාශවන්නෝය; ඔව්හු 13
දවාලෙහි ක්‍රීඩා සෝභාව ප්‍රීතියක්යයි

සලකති, ඔව්හු ලප හා කැලැල්ව සිටිති,
ඔව්හු තුඹලා සමග මංගල්‍ය පවත්වන
අතර තමුන්ගේ මංගල්‍යවලදී ක්‍රීඩාසෝභා
14 පවත්වති; ඔව්හු කාමමිථ්‍යාචාරයෙන්
පිරුණාවූ, පාපයෙන් වලකින්ට නුපුළුවන්
ඇස් ඇත්තෝය; ඔව්හු අස්ථිර ආත්ම
පොලඹවන්නෝය; තණ්හාවට පුරුදු
සිතක් ඇත්තෝය; ශාපයේ දරුවෝය;
15 ඔව්හු හරි මාර්ගය අත්හැර, අයුතුකමේ
කුලියට කැමතිවූ බෙයෝර්ගේ පුත්‍රවූ
බාලාම්ගේ මාර්ගය අනුව මුළාව
16 ගියෝය; නුමුත් ඕහු තමාගේම අපරාධය
ගැන තරවටු කරනු ලැබුවේය. ගොළු
කොටළුවෙක් මනුෂ්‍ය හඬින් කථාකොට
අනාගතවක්තෘගේ උමතුව වැලැක්වූයේය.
17 ඔව්හු වතුර නැති උල්පත්ය, තද
සුළඟින් ගසාගනයන මීදුම්ය; ඔවුන්ට
අන්ධකාරයේ කළුවරකම ඉතුරුකර තබා
18 තිබේ. මක්නිසාද ඔව්හු නිෂ්ඵලකමේ
මහත් ආඩම්බර වචන කථාකරමින්,
වරදෙහි වසන්නන් කෙරෙන් යන්තම්
ගැළවී යන්නන් මාංසයේ තෘෂ්ණාව වන
19 සල්ලාලකමෙන් ඇදගනිති; ඔව්හු තුමූම
දූෂ්‍යකමේ දසයන්ව සිටින අතර ඔවුන්ට
නිදහස දෙන්ට පොරොන්දුවෙති;
මක්නිසාද යමෙක් යමෙකුගෙන්
පරාජයවුණොත් ඕහු ඒ තැනැත්තාට
20 වාල්ව සිටියි. මක්නිසාද ස්වාමිවූ
ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව
දැනගැනීමෙන් ලෝකයේ කිලුටුකම්වලින්
මිදුණායින් පසු ඔවුන් නැවත ඒවාට
පටලැවී වහල්වුණොත්, ඔවුන්ගේ පළමු
ස්වභාවට වඩා අන්තිම ස්වභාව
21 නපුරුවන්නේය. මක්නිසාද ඔවුන්
ධර්මිෂ්ඨකමේ මාර්ගය දැනගත්තායින්
පසු, ඔවුන්ට භාරදුන් ශුද්ධවූ ආඥාවෙන්
හැරී යනවාට වඩා ඒ මාර්ගය දැන
නොගත්තා නම් ඔවුන්ට යහපත්ය.
22 බල්ලා නැවත උගේ වමනයටත්, නෑවාවූ
ඌරී මඩේ පෙරළීමටත් හැරී ගියෝය
යන සැබෑවූ උපමාවේ ප්‍රකාරයට ඔවුන්ට
සිදුවී තිබේ.

## ස්වාමීන්වහන්සේගේ ඊම ප්‍රමාද වන නුමුත් සත්තක බව

3 ප්‍රේමවන්තයෙනි, දැන් මේක මා
තුඹලාට ලියා එවන දෙවෙනි
ලියුමය. ශුද්ධවූ අනාගතවක්තෘවරුන් 2
විසින් පළමුවෙන් කියනලද වචනද
තුඹලාගේ ප්‍රේරිතයන් කරණකොටගෙන
කියෙවූ ස්වාමිවූ ගැළවුම්කාරයාණන්ගේ
ආඥාවද තුඹලාට මතක්වෙන
පිණිස, මතක්කරවීම කරණකොටගෙන
තුඹලාගේ අවංකවූ සිත් මේ ලියුම්
දෙකින්ම පුබුදුකරවමි. අන්තිම දවස්වලදී 3
තමුන්ගේ තෘෂ්ණා ලෙස හැසිරෙන්නාවූ:
පියවරුන් සැතපුණු පසු මැවීමේ 4
පටන්ගැන්මේ සිට සියලු දේ
තිබුණාක්මෙන් පවතින බැවින්,
උන්වහන්සේගේ ඊමේ පොරොන්දුව
කොතැන්හිදැයි සරදම්කරමින් කියන්නාවූ
කවටකම්කරන්නෝ පැමිණෙන්නෝයයි
පළමුකොට දැනගනිල්ලා. මක්නිසාද 5
දෙවියන්වහන්සේගේ වචනය කරණ-
කොටගෙන පුරාණයේ පටන් අහසක්ද
වතුරෙන් සම්බන්ධකරනලද්දවූ, වතුර
මධ්‍යයෙහිවූ පොළොවක්ද තිබුණු බවත්,
ඒ කරණකොටගෙන එකලට තිබුණු 6
ලෝකය ජලගැල්මට යටවී විනාශවූ
බවත් ඔව්හු කැමැත්තෙන්ම
මතකනැතිකරති. නුමුත් දැන් පවතින 7
අහසද පොළොවද එම වචනයෙන්
විනිශ්චයෙත් අභක්තිකයන්ගේ විනාශයෙත්
දවස දක්වා ඉතුරුකරනු ලැබ ගින්නෙන්
දැවීමට තබා තිබේ.
නුමුත්, ප්‍රේමවන්තයෙනි, ස්වාමීන්- 8
වහන්සේට එක දවසක් අවුරුදු දහසක්
මෙන්ය, අවුරුදු දහසක් එක දවසක්
මෙන්ය යන මේ එක කාරණය මතක
නැති නොකරල්ලා. ප්‍රමාදයයි සමහරුන් 9
සලකන හැටියට ස්වාමීන්වහන්සේ
තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද
නොවනසේක; නුමුත් සියල්ලන්ම
පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක්
විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව,
තුඹලා කෙරෙහි බොහෝ කල්
ඉවසනසේක. එහෙත් සොරෙකු මෙන් 10

ස්වාමීන්වහන්සේගේ දවස පැමිණෙන්නේය;
ඒ දවසේදී අහස මහත් ඝෝෂාවකින්
පහවයන්නේය, මහාභූතයෝද තද
උෂ්ණයෙන් නාස්තිවී යන්නෝය,
පොළොවද එහි තිබෙන කර්මාන්තද
දලායන්නේය.

## සූදානම්ව සිටීමේ උවමනාව

11 මේ සියල්ල මෙසේ නාස්තිවෙන්ට
තිබෙන බැවින්, නුඹලා දෙවියන්-
වහන්සේගේ දවස පැමිණීම බලාසිටිමින්ද
ඒ ගැන උනන්දුව ක්‍රියාකරමින්ද සියලු
ආකාර ශුද්ධවූ හැසිරීමෙහිත්
භක්තිවන්තකමෙහිත් කොයි ආකාර
12 අයවල්ව සිටින්ට ඕනෑද? ඒ නිසා
අහස ගිනි ඇවිලී නාස්තිවෙනවා ඇත,
මහාභූතයෝද දලා උණුවීයන්නෝය.
13 එහෙත් ධර්මිෂ්ඨකම වාසයකරන අලුත්
අහසක්ද අලුත් පොළොවක්ද උන්-
වහන්සේගේ පොරොන්දුවේ හැටියට අපි
බලාසිටිමුව.
14 ඉන්නිසා, ප්‍රේමවන්තයෙනි, නුඹලා මේ
දේවල් බලාසිටින බැවින්, උන්වහන්සේ
ඉදිරියෙහි කැලැල් රහිතව, නිදෙස්ව,
සමාදානයෙන් යුක්තව දකිනු ලබන පිණිස
උත්සාහකරපල්ලා. අපේ ප්‍රේමවන්ත 15
සහෝදරවූ පාවුල්ද තමාට දුන් ප්‍රඥාව
ලෙස නුඹලාට ලියා එවූවාක්
මෙන්, අපගේ ස්වාමීන්වහන්සේගේ
ඉවසිලිවන්තකම ගැළවීමයයි සලකා-
පල්ලා. එමෙන්ම සියලු ලියුම්වලත් ඔහු 16
මේ දේවල් ගැන කථාකර තිබේ; එහි
තේරුම්ගන්ට අමාරු සමහර දේ තිබේ,
නූගත් අස්ථිර තැනැත්තෝ අන් ලියවිලි
මෙන් තමුන්ගේම විනාශයට ඒවාත්
පෙරළති. එබැවින්, ප්‍රේමවන්තයෙනි, 17
නුඹලා මේ දේවල් කලින් දැනගත සිටින
බැවින්, දුෂ්ටයන්ගේ මුළාවෙන් ඇදීගොස්
නුඹලාගේම ස්ථිරභාවයෙන් නොවැටෙන
පිණිස පරෙස්සම්වෙයල්ලා. එහෙත් 18
අපගේ ස්වාමිවූ ගැළවුම්කාරවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවෙහිද උන්-
වහන්සේ දැනගැන්මෙහිද වර්ධනය-
වෙයල්ලා. දැනටත් සදාකාලයටත් උන්-
වහන්සේට ගෞරවය වේවා. ආමෙන්.

# යොහන්ගේ පළමුවෙනි සාමාන්‍ය පත්‍රය

## යේසුස්වහන්සේ තුළ ප්‍රකාශවූ සදාකාල ජීවනය

1 පටන්ගැන්මේ සිට තිබුණාවූ, අප විසින්
අසා තිබෙන්නාවූ, අපේ ඇස්වලින්
දැක තිබෙන්නාවූ, අප විසින් බැලුවාවූ,
අපේ අත්වලින් ඇල්ලුවාවූ දේ වන
2 ජීවනයේ වාක්‍යයාණන් ගැන, නුඹලාත්
අප සමග පංගුකාරකම ලබන පිණිස,
අප දුටුවාවූ ඇසුවාවූ ඒ දේ නුඹලාටත්
3 ප්‍රකාශකරමුව. (ඒ ජීවනය ප්‍රකාශකරනු
ලැබීය, අපි ඒ දැක සාක්ෂි දෙමින්,
පියාණන්වහන්සේ සමග තිබුණාවූ අපට
ප්‍රකාශකරනලද්දවූ ජීවනය, එනම්
සදාකාල ජීවනය නුඹලාට ප්‍රකාශකරමුව.)
එසේය, අපේ පංගුකාරකම පියාණන්-
වහන්සේද ස්වකීය පුත්‍රවූ යේසුස්
4 ක්‍රිස්තුස්වහන්සේද සමගය. මේ දේවල්
ලියා එවන්නේ *අපේ ප්‍රීතිය සම්පූර්ණවන
පිණිසය.

## දෙවියන්වහන්සේ සමග ආලෝකයෙහි හැසිරීම

5 අප විසින් උන්වහන්සේගෙන් අසා
තිබෙන්නාවූ, නුඹලාට දන්වන්නාවූ
පණිවිඩය නම්, දෙවියන්වහන්සේ
ආලෝකය බවත් උන්වහන්සේ තුළ කිසිම
6 අන්ධකාරයක් නැති බවත්ය. අපි
උන්වහන්සේ සමග පංගුකාරකම ඇතැයි
කියමින් අන්ධකාරයෙහි හැසිරෙමු නම්
අපි බොරු කියනවා මිස සැබෑව
7 නොකරමුව. නුමුත් උන්වහන්සේ
ආලෝකයෙහි සිටින්නා සේම අපිත්
ආලෝකයෙහි හැසිරෙමු නම්, අපට
එකිනෙකා සමග පංගුකාරකම ඇත්තේය,
උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේගේ
ලේද සියලු පාපවලින් අප පවිත්‍ර-
කරන්නේය. අපට පාපය නැතැයි කියමු 8
නම්, අපි අපම රවටාගනිමුව, සැබෑවද
අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු 9
නම්, අපේ පව් අපට කමාකරන්ටත්
සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර-
කරන්ටත් උන්වහන්සේ විශ්වාසව
ධර්මිෂ්ඨව සිටිනසේක. අපි පව්කළේ 10
නැතැයි කියමු නම්, අපි උන්වහන්සේ
බොරුකාරයෙක් කරමුව, උන්වහන්සේගේ
වචනද අප තුළ නැත.

## මැදහත්කාරවූ ක්‍රිස්තුස්වහන්සේගේ ආඥාවලට කීකරුවීම ගැන. ලෝකයට ප්‍රේමවීම නිෂ්ඵල බව

2 මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා
නුඹලාට ලියා එවන්නේ නුඹලා
පව් නොකරන පිණිසය. යමෙක් පව්
කළොත් ධර්මිෂ්ඨවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේ වන මැදහත්කාරයෙක්
පියාණන්වහන්සේ වෙත අපට සිටින-
සේක. උන්වහන්සේ අපේ පව් උදෙසා 2
ශාන්තිකර පූජාවය; අපේ පව් උදෙසා
පමණක් නොව මුළු ලෝකයාත්
උදෙසාය. අපි උන්වහන්සේගේ ආඥා 3
පවත්වමු නම්, අපි උන්වහන්සේ අඳුනන
බව එයින් දනිමුව. උන්වහන්සේ 4
අඳුනමියි කියා උන්වහන්සේගේ ආඥාවන්
නොපවත්වන තැනැත්තේ බොරු-
කාරයෙක්ය, සැබෑවද ඔහු තුළ නැත.
නුමුත් යමෙක් උන්වහන්සේගේ වචනය 5
පවත්වන්නේද, ඔහු තුළ සැබෑවටම
දෙවියන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණවී

*බොහෝ පුරාණ පිටපත්වල තිබෙන්නේ, නුඹලාගේ යනුය.

තිබේ. අපි උන්වහන්සේ තුළ සිටින
6 බව එයින් දනිමුව. උන්වහන්සේ තුළ
පවතිමියි කියන තැනැත්තා විසින්
උන්වහන්සේ හැසුරුණාක්මෙන් හැසිරිය
යුතුය.
7 ප්‍රේමවන්තයෙනි, මා නුඹලාට ලියා
එවන්නේ අලුත් ආඥවක් නොව
පටන්ගැන්මේ සිට නුඹලාට තිබුණු
පරණ ආඥවක්ය. ඒ පරණ ආඥව නම්
8 නුඹලා ඇසූ වචනය වේ. නැවතත් අලුත්
ආඥවක් නුඹලාට ලියා එවමි, එය
උන්වහන්සේ තුළද නුඹලා තුළද සැබෑය;
මක්නිසාද අන්ධකාරය පහවේගන යයි,
සැබෑවූ ආලෝකය දැනටම බබළයි.
9 ආලෝකයෙහි පවතිමියි කියමින් තමාගේ
සහෝදරයාට වෛරවෙන්නා මේතාක්
10 අඳුරෙහි සිටියි. තමාගේ සහෝදරයාට
ප්‍රේමවෙන්නා ආලෝකයෙහි පවතියි,
පැකිලීමට කාරණයක්ද ඔහු තුළ
11 නැත. නුමුත් තමාගේ සහෝදරයාට
වෛරවෙන්නා අන්ධකාරයෙහි සිටියි,
අන්ධකාරයෙහි හැසිරෙයි, අන්ධකාරය
ඔහුගේ ඇස් අන්ධකළ නිසා තමා
කොතැනට යන්නේදැයි ඔහු නොදනියි.
12 මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලාට ලියා
එවන්නේ, උන්වහන්සේගේ නාමය නිසා
නුඹලාගේ පව් කමාකරනු ලැබූ බැවින්ය.
13 පියවරුනි, මා නුඹලාට ලියා එවන්නේ,
නුඹලා පටන්ගැන්මේ සිට සිටින්නාවූ
තැනන්වහන්සේව අඳුනන බැවින්ය.
තරුණයෙනි, නුඹලාට ලියා එවන්නේ,
නුඹලා නපුරාගෙන් ජයගෙන සිටින
බැවින්ය. ප්‍රිය දරුවෙනි, නුඹලාට ලියා
එවූවේ, නුඹලා පියාණන්වහන්සේ
14 අඳුනන බැවින්ය. පියවරුනි, නුඹලාට
ලියා එවූවේ, නුඹලා පටන්ගැන්මේ සිට
සිටින්නාවූ තැනැන්වහන්සේව අඳුනන
බැවින්ය. තරුණයෙනි, නුඹලාට ලියා
එවූවේ, නුඹලා ශක්තිමත් බැවිනුත් නුඹලා
තුළ දෙවියන්වහන්සේගේ වචනය පවතින
බැවිනුත් නපුරාගෙන් නුඹලා ජයගත්
15 බැවිනුත්ය. ලෝකයටවත් ලෝකයෙහි
තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ලා.
යමෙක් ලෝකයට ප්‍රේමකෙරේ නම්,
පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු
තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන 16
සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත්
ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ
අහංකාරකමත් පියාණන්වහන්සේගෙන්
නොව ලෝකයෙන් වේ. ලෝකයත් 17
ලෝකයේ තෘෂ්ණාවත් පහවයන්නේය.
නුමුත් දෙවියන්වහන්සේගේ කැමැත්ත
කරන්නා සදාකාලේටම පවතින්නේය.

## විරුද්ධ ක්‍රිස්තුස්වරුන් ගැනයි. සැබෑවෙහි පැවතිය යුතු බව

ප්‍රිය දරුවෙනි, මේක අන්තිම කාලයය. 18
විරුද්ධ-ක්‍රිස්තුස් එන බව නුඹලා ඇසූ
ලෙසම දැනටම බොහෝ විරුද්ධ-
ක්‍රිස්තුස්වරු නැගිට සිටිති; මෙයින් මේක
අන්තිම කාලය බව අපි දනිමුව. ඔව්හු 19
අප කෙරෙන් ගියෝය, නුමුත් ඔවුන්
අපට අයිතිව සිටියේ නැත; ඔවුන් අපට
අයිතිව සිටියා නම් අප සමග පවතිනවා
ඇත. නුමුත් ඔවුන් සියල්ලන්ම අපට
අයිති නැති බව ප්‍රකාශවන පිණිස ඔව්හු
අපෙන් අහක්ව ගියෝය. නුඹලා ශුද්ධ 20
තැනන්වහන්සේගෙන් ආලේපයක් ලැබ
සියලු දේම දනිහුය. මා නුඹලාට ලියා 21
එවූවේ නුඹලා සැබෑව නොදන්නා බැවින්
නොව, නුඹලා සැබෑව දන්න නිසාත්
සැබෑවෙන් කිසි බොරුවක් හට
නොගන්න නිසාත්ය. යේසුස්වහන්සේ 22
ක්‍රිස්තුස්වහන්සේ නොවේයයි කියන
තැනැත්තා මිස බොරුකාරයා වෙන
කවුද? විරුද්ධ-ක්‍රිස්තුස් මේය, එනම්,
පියාණන්වහන්සේ සහ පුත්‍රයාණන්-
වහන්සේ එපාකරන තැනැත්තාමය.
යමෙක් පුත්‍රයාණන්වහන්සේව එපා- 23
කරන්නේද, ඔහුට පියාණන්වහන්සෙත්
නැත්තේය. යමෙක් පුත්‍රයාණන්වහන්සේව
පිළිගන්නේද, ඔහුට පියාණන්වහන්සෙත්
ඇත්තේය. නුඹලා පටන්ගැන්මේ සිට 24
ඇසූ දේම නුඹලා තුළ පවතීවා.
පටන්ගැන්මේ සිට නුඹලා ඇසූ දේ නුඹලා
තුළ පවතී නම්, නුඹලාත් පුත්‍රයාණන්-
වහන්සේද පියාණන්වහන්සේද තුළ
පවතින්නහුය. උන්වහන්සේ අපට 25
පොරොන්දුවූ පොරොන්දුව නම් සදාකාල

26 ජීවනයය. මා තුඹලාට මේ කාරණා
ලියුවේ තුඹලා මුළාකරන්ට හදන අය
27 ගැනය. තුඹලා ගැන වනාහි, තුඹලා
උන්වහන්සේගෙන් ලැබූ ආලේපය තුඹලා
තුළ පවතින්නේය, යමෙකු විසින්
තුඹලාට ඉගැන්වීම ඕනෑකරන්නේ නැත;
එම ආලේපය සියල්ල ගැන තුඹලාට
උගන්වන ලෙසද, එය බොරු නොව
සත්‍යව තිබෙන ලෙසද, එයින් තුඹලාට
ඉගැන්නූ ප්‍රකාරයටද උන්වහන්සේ තුළ
28 පැවතියල්ලා. ඉතින්, මාගේ ප්‍රිය දරුවෙනි,
උන්වහන්සේ තුළ පැවතියල්ලා; එසේ
කළ යුතුවන්නේ උන්වහන්සේ ප්‍රකාශ
වූණාම උන්වහන්සේගේ පැමිණීමේදී අප
උන්වහන්සේ ඉදිරිපිට ලජ්ජා නොවී
නිර්භීතකම ඇතුව සිටින පිණිසය.
29 උන්වහන්සේ ධර්මිෂ්ඨ බව තුඹලා දනිහු
නම්, ධර්මිෂ්ඨකම් කරන සියල්ලන්ද
උන්වහන්සේගෙන් ඉපදී සිටින බව
තුඹලා දනිහුය.

## දෙවියන්වහන්සේගේ දරුවෝ සහ යක්ෂයාගේ දරුවෝ

3 අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි
කියනු ලබන ලෙස පියාණන්වහන්සේ
කෙබඳු ප්‍රේමයක් අපට දී වදාළසේක්දැයි
බලාපල්ලා. අපි එබඳුවෝමය. මේ නිසා
ලෝකයා උන්වහන්සේව නැඳින්න බැවින්,
2 අපද අඳුනන්නේ නැත. ප්‍රේමවන්තයෙනි,
දැන් අපි දෙවියන්වහන්සේගේ දරුවෝය,
අපි කොයි ආකාර අය වන්නෙමුදැයි
තවම ප්‍රකාශවී නැත. උන්වහන්සේ
ප්‍රකාශවූණාම අපි උන්වහන්සේට
සමානවන බව දනිමුව; මක්නිසාද
උන්වහන්සේ සිටින ආකාරයටම අපි
3 උන්වහන්සේ දකින්නෙමුව. උන්වහන්සේ
කෙරෙහි මේ බලාපොරොත්තුව තබා
සිටින සැමදෙනම උන්වහන්සේ පිරිසිදුව
සිටින්නාක්මෙන් තමුන්ම පිරිසිදුකරගනිති.
4 පව්කරන සැමදෙනම නොපනත්කමද
5 කරති. පාපය නම් නොපනත්කමය. පව්
දුරුකරන පිණිස උන්වහන්සේ ප්‍රකාශ-
කරනු ලැබූ බව තුඹලා දනිහුය; කිසි
6 පාපයක්ද උන්වහන්සේ තුළ නැත. යමෙක්
උන්වහන්සේ තුළ පවතීද, ඔහු පව්-
කරන්නේ නැත. පව්කරන තැනැත්තේ
උන්වහන්සේ දුටුවේවත් උන්වහන්සේ
ඇඳිනගත්තේවත් නැත. මාගේ ප්‍රිය 7
දරුවෙනි, තුඹලා මුළාකරන්ට කිසිවෙකුට
ඉඩ නොදෙල්ලා. උන්වහන්සේ
ධර්මිෂ්ඨව සිටින්නාක්මෙන් ධර්මිෂ්ඨකම්
කරන්නා ධර්මිෂ්ඨව සිටියි. පව්කරන 8
තැනැත්තේ යක්ෂයාගෙන්ය; මක්නිසාද
යක්ෂයා පටන්ගැන්මේ සිට පව්කරන්නේය.
දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්
ප්‍රකාශකරනු ලැබුවේ මේ පිණිසය, එනම්
යක්ෂයාගේ ක්‍රියා විනාශකරන පිණිසය.
දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින 9
කිසිවෙක් පව්කරන්නේ නැත, මක්නිසාද
ඔහු තුළ උන්වහන්සේගේ බීජය
පවතින්නේය. දෙවියන්වහන්සේගෙන්
ඉපදී සිටින බැවින් පව්කරන්ට ඔහුට
නුපුළුවන. මෙයින් දෙවියන්වහන්සේගේ 10
දරුවෝද යක්ෂයාගේ දරුවෝද ප්‍රකාශව
සිටිති. ධර්මිෂ්ඨකම් නොකරන
කවරෙක්වත් තමාගේ සහෝදරයාට ප්‍රේම
නොකරන්නෙක්වත් දෙවියන්වහන්සේගෙන්
නොවෙයි. මක්නිසාද පටන්ගැන්මේ සිට 11
තුඹලා ඇසූ පණිවිඩය නම්, අප විසින්
එකිනෙකාට ප්‍රේමකළ යුතුය යන මේය.
තමාගේ සහෝදරයා මැරුවාවූද 12
නපුරාගෙන් වූද කායින් මෙන් නොවෙමු.
කුමක්හෙයින් ඔහුව මැරුවේද? තමාගේ
ක්‍රියා නපුරුව, තමාගේ සහෝදරයාගේ
ක්‍රියා ධර්මිෂ්ඨව තිබුණු නිසාය.

## සහෝදර ප්‍රේමය

සහෝදරයෙනි, ලෝකයා තුඹලාට 13
වෛරකරන්නේ නම් මවිත නොවෙල්ලා.
අප සහෝදරයන්ට ප්‍රේමකරන බැවින්, 14
අප මරණින් ජීවනයට පැමිණ සිටින
බව අපි දනිමුව. ප්‍රේම නොකරන
තැනැත්තේ මරණයෙහි පවතියි. තමාගේ 15
සහෝදරයාට වෛර කරන කවරෙක්
තුමුත් මිනීමරන්නෙක්ය. කිසි මිනී-
මරන්නෙකු තුළ සදාකාල ජීවනය
නොපවතින බව තුඹලා දනිහුය. අප 16
ප්‍රේමය දැනගන සිටින්නේ ඒ

තැනන්වහන්සේ තමන් ප්‍රාණය අප
උදෙසා දුන් හෙයින්ය. අප විසින්
සහෝදරයන් උදෙසා අපේ ජීවිත දෙන්ට
17 යුතුය. නුමුත් ලෝකයේ වස්තු ඇත්තා
තමාගේ සහෝදරයාගේ හිඟකම දැක
ඔහුට අනුකම්පා නොකළොත්,
දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔහු තුළ
18 පවතින්නේ කෙසේද? මාගේ ප්‍රිය
දරුවෙනි, වචනයෙන්වත් දිවෙන්වත්
නොව ක්‍රියාවෙනුත් සැබෑවෙනුත්
19 ප්‍රේමකරමු. මෙයින් අප සැබෑකමෙන්
වන බව දැනගෙන, අපේ සිත් අපට
දෝෂාරෝපණයකරන විට උන්වහන්සේ
ඉදිරියෙහි අපේ සිත් සහතිකකර-
20 ගන්නෙමුව; මක්නිසාද දෙවියන්වහන්සේ
අපේ සිතට වඩා උතුම්ව සියලු දේම
21 දන්න නිසාය. ප්‍රේමවන්තයෙනි, අපේ
සිත අපට දෝෂාරෝපණය නොකරනවා
නම්, දෙවියන්වහන්සේ ඉදිරියෙහි
22 නිර්භීතකම අපට ඇත්තේය; තවද අපි
උන්වහන්සේගේ ආඥ රක්ෂාකරමින්
උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දේ කරන
බැවින් අපි උන්වහන්සේගෙන් ඉල්ලන
23 සියල්ල ලබමුව. උන්වහන්සේගේ ආඥව
නම් උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ නාමය කෙරෙහි
ඇදහීමත් උන්වහන්සේ අපට ආඥකළ
ලෙස එකිනෙකාට ප්‍රේමකිරීමත්ය.
24 උන්වහන්සේගේ ආඥ පවත්වන්නා
උන්වහන්සේ තුළ පවතියි, උන්වහන්සේද
ඔහු තුළ පවතිනසේක. උන්වහන්සේ අප
තුළ සිටින බව අප දැනගන්නේ
උන්වහන්සේ අපට දුන් ආත්මයෙන්ය.

## බොරුවූ සහ සැබෑවූ ප්‍රොපේතවරුන් අතරේ වෙනස

4 ප්‍රේමවන්තයෙනි, බොහෝ බොරු
ප්‍රොපේතවරු ලෝකයට පැමිණ
සිටින බැවින් සියලු ආත්ම විශ්වාස
නොකොට ඒ ආත්ම දෙවියන්-
වහන්සේගෙන්දැයි පරීක්ෂාකරපල්ලා.
2 මෙයින් නුඹලා දෙවියන්වහන්සේගේ
ආත්මයාණන්වහන්සේ දැනගන්නහුය.
එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
මාංසයෙන් යුක්තව ආ බව ඊත්තු-
ගන්නාවූ සෑම ආත්මයෝ දෙවියන්-
වහන්සේගෙන්ය. යේසුස්වහන්සේ ඊත්තු 3
නොගන්නාවූ සියලු ආත්මයෝ
දෙවියන්වහන්සේගෙන් නොවෙති.
එන්නේයයි නුඹලා ඇසුවාවූ, දැනටම
ලෝකයෙහි සිටින්නාවූ විරුද්ධ-ක්‍රිස්තුස්ගේ
ආත්මය මේය. මාගේ ප්‍රිය දරුවෙනි, 4
නුඹලා දෙවියන්වහන්සේට අයිතිව,
ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා
නුඹලා තුළ සිටින තැනන්වහන්සේ උතුම්
බැවින්, නුඹලා ඔවුන්ගෙන් ජයගෙන
සිටින්නෝය. ඔව්හු ලෝකයෙන් වෙති.
එබැවින් ලෝකයෙන් වූවාක්මෙන් 5
කථාකරති, ලෝකයාද ඔවුන්ගේ වචන
අසති. අපි දෙවියන්වහන්සේගෙන් වෙමුව. 6
දෙවියන්වහන්සේව අඳුනන තැනැත්තේ
අපේ වචන අසන්නේය; දෙවියන්-
වහන්සේගෙන් නොවන තැනැත්තේ අපේ
වචන අසන්නේ නැත. මෙයින් සැබෑකමේ
ආත්මයත් මුළාවේ ආත්මයත් අපි
දැනගනිමුව.

## දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ ප්‍රේමයට උල්පත බව

ප්‍රේමවන්තයෙනි, අපි එකිනෙකාට 7
ප්‍රේමකරමු. මක්නිසාද ප්‍රේමය දෙවියන්-
වහන්සේගෙන්ය; ප්‍රේමකරන සෑමදෙනම
දෙවියන්වහන්සේගෙන් ඉපද සිටිති,
දෙවියන්වහන්සේව අඳුනති. ප්‍රේම 8
නොකරන්නා දෙවියන්වහන්සේව
නාඳුනයි; මක්නිසාද දෙවියන්වහන්සේ
ප්‍රේමයය. අප කෙරෙහි තිබෙන දෙවියන්- 9
වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු
ලැබුවේ දෙවියන්වහන්සේ ස්වකීය
ඒකජාතක පුත්‍රයාණන් කරණකොට-
ගෙන අප ජීවත්වන පිණිස උන්වහන්සේ
ලෝකයට එවූ කාරණයෙන්ය. ප්‍රේමය 10
මේය, එනම් අප දෙවියන්වහන්සේට ප්‍රේම-
කළා නොව උන්වහන්සේ අපට ප්‍රේම-
කොට, අපේ පව් උදෙසා ශාන්තිකර පූජාව
වන පිණිස තමන්ගේ පුත්‍රයා එවූ බවය.
ප්‍රේමවන්තයෙනි, දෙවියන්වහන්සේ අපට 11

මෙසේ ප්‍රේමකළසේක් නම්, අප විසිනුත්
12 එකිනෙකාට ප්‍රේමකළ යුතුය. කිසිවෙක්
කිසි කලක දෙවියන්වහන්සේව දුටුවේ
නැත. අපි එකිනෙකාට ප්‍රේමකරමු නම්,
දෙවියන්වහන්සේ අප තුළ සිටින-
සේක, උන්වහන්සේගේ ප්‍රේමයද අප තුළ
13 සම්පූර්ණවී තිබේ. අප උන්වහන්සේ තුළද
උන්වහන්සේ අප තුළද සිටින බව අප
විසින් දනගන්නේ උන්වහන්සේ තමන්ගේ
ආත්මයාණන් අපට දී තිබෙන නිසාය.
14 පියාණන්වහන්සේ විසින් පුත්‍රයාණන්
ලෝකයාගේ ගැළවුම්කාරයා කොට එවූ
බව අපි දුටිමුව, ඊට සාක්ෂිදෙමුව.
15 යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණන් බව යමෙක් ඒත්තුගන්නේද,
දෙවියන්වහන්සේ ඔහු තුළත් ඔහු
දෙවියන්වහන්සේ තුළත් ඇත්තේය.
16 දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති
ප්‍රේමය අපි දන විශ්වාසකරගෙන සිටිමුව.
දෙවියන්වහන්සේ ප්‍රේමයය; ප්‍රේමයෙහි
පවතින්නා දෙවියන්වහන්සේ තුළ
සිටී, දෙවියන්වහන්සේද ඔහු තුළ
17 සිටිනසේක. අප තුළ ප්‍රේමය සම්පූර්ණව
තිබීම නම්, ඒ තැනන්වහන්සේ සිටින
ආකාරයටම අපත් මේ ලෝකයෙහි
සිටින බැවින්, විනිශ්චය දවස ගැන
18 නිසැකකම ඇතුව සිටීමය. ප්‍රේමයෙහි භය
ඇත්තේ නැත. සම්පූර්ණ ප්‍රේමය භය
දුරුකරයි, මක්නිසාද භය දඬුවමින්
යුක්තය; භයවන තැනැත්තේ ප්‍රේමයෙහි
19 සම්පූර්ණ නොවී සිටියි. අප ප්‍රේමකරන්නේ
උන්වහන්සේ පළමුකොට අපට ප්‍රේමකළ
20 නිසාය. යමෙක්: දෙවියන්වහන්සේට
ප්‍රේම කරමියි කියා තමාගේ
සහෝදරයාට වෛරකෙරේ නම්, ඔහු
බොරුකාරයෙක්ය. මක්නිසාද තමා දුටු
සහෝදරයාට ප්‍රේම නොකරනවා නම්,
තමා නුදුටු දෙවියන්වහන්සේට ප්‍රේම-
21 කරන්ට ඔහුට *නුපුළුවන. දෙවියන්-
වහන්සේට ප්‍රේමකරන තැනැත්තේ
තමාගේ සහෝදරයාටත් ප්‍රේමකරාවා
යන මේ ආඥව අපි උන්වහන්සේගෙන්
ලැබීමුව.

*බොහෝ පුරාණ පිටපත්වල තිබෙන්නේ, පුළුවන් කොහොමද යනුය.

## ඇදහිල්ලේ ජය ගැන්ම හා සාක්ෂිය

5 යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ
බව විශ්වාසකරන සැමදෙනම
දෙවියන්වහන්සේගෙන් ඉපද සිටිති.
ඉපදෙවූ තැනන්වහන්සේට ප්‍රේමකරන
සැමදෙනම උන්වහන්සේගෙන් උපන්
තැනැත්තාටත් ප්‍රේමකරති. අප 2
දෙවියන්වහන්සේට ප්‍රේමකරමින්
උන්වහන්සේගේ ආඥ පවත්වන කල,
අපි දෙවියන්වහන්සේගේ දරුවන්ට
ප්‍රේමකරන බව අපි දනිමුව. මක්නිසාද 3
දෙවියන්වහන්සේට ප්‍රේමවීම නම් අප
විසින් උන්වහන්සේගේ ආඥ පැවැත්වීමය.
උන්වහන්සේගේ ආඥ බර නැත.
මක්නිසාද දෙවියන්වහන්සේගෙන් උපන් 4
යමක් ඇද්ද එය ලෝකයෙන් ජයගන්නේය.
ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ
ඇදහිල්ලය. යේසුස්වහන්සේ දෙවියන්- 5
වහන්සේගේ පුත්‍රයා බව විශ්වාසකරන
තැනැත්තා මිස ලෝකයෙන් ජයගන්නේ
වෙන කවුද? වතුර සහ ලේ 6
කරණකොටගෙන ආ තැනන්වහන්සේ
නම් මුන්වහන්සේය, එනම් යේසුස්
ක්‍රිස්තුස්වහන්සේය; වතුරෙන් පමණක්
නොව වතුරෙන් සහ ලෙයින්ය.
සාක්ෂිදෙන්නේ ආත්මයාණන්වහන්සේය. 7
මක්නිසාද ආත්මයාණන්වහන්සේ
සත්‍යතාවය. සාක්ෂිදරන තුන්දෙනෙක් 8
සිටිති: ආත්මයාණන්වහන්සේය, වතුරය,
ලේය. මේ තුන්දෙනම එකඟවෙති.
මනුෂ්‍යයන්ගේ සාක්ෂිය අපි පිළිගනිමු 9
නම්, දෙවියන්වහන්සේගේ සාක්ෂිය ඊට
වඩා උතුම්ය. මක්නිසාද දෙවියන්-
වහන්සේගේ සාක්ෂිය මේය, එනම් තමන්
පුත්‍රයාණන් ගැන උන්වහන්සේ සාක්ෂිදී
තිබෙන බවය. දෙවියන්වහන්සේගේ 10
පුත්‍රයා කෙරෙහි අදහන්නාට තමා තුළේම
සාක්ෂිය ඇත්තේය. දෙවියන්වහන්සේව
නොඅදහන්නා දෙවියන්වහන්සේ තමන්
පුත්‍රයාණන් ගැන දී තිබෙන සාක්ෂිය
කෙරෙහි විශ්වාස නොකළ නිසා
උන්වහන්සේව බොරුකාරයෙක් කෙළේය.
ඒ සාක්ෂිය නම් දෙවියන්වහන්සේ අපට 11

සදාකාල ජීවනය දුන් බවය, ඒ ජීවනයද
තමන් පුත්‍රයාණන් තුළ තිබේ.
12 පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනය
ඇත; දෙවියන්වහන්සේගේ පුත්‍රයා
නැත්තාට ඒ ජීවනය නැත.

## යාච්ඤාවෙහිදී නිසැකකම. අවසානය

13 දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ
නාමය කෙරෙහි අදහන්නාවූ තුඹලාට
මේ දේ මා ලියා එවුවේ තුඹලාට සදාකාල
ජීවනය ඇති බව තුඹලා දැනගන්නා
14 පිණිසය. උන්වහන්සේ ඉදිරියෙහි අපට
තිබෙන නිසැකකම නම්, අප
උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක්
ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම
15 අසන බවය. අප යම් දෙයක් ඉල්ලන
කල උන්වහන්සේ අසන බව අපි දනිමු
නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ
16 අපට ලැබෙන බව දනිමුව. යමෙක්
තමාගේ සහෝදරයා මරණයට
නොපමුණුවන පාපයක් කරන බව
දුටුවොත් ඔහු යාච්ඤාකරාවා, එවිට
ඔහුට, එනම් මරණයට නොපමුණුවන්නා
වූ පාපයක් කරන්නන්ට, *(දෙවියන්-
වහන්සේ) ජීවනය දෙනසේක. මරණයට
පමුණුවන්නාවූ පාපයක් ඇත්තේය. ඔහු
ඉල්ලිය යුතුය කියා මා කියන්නේ ඒ
ගැන නොවේ. සියලු අධර්මිෂ්ඨකම් 17
පාපයය. මරණයට නොපමුණුවන
පාපයක්ද ඇත්තේය.
දෙවියන්වහන්සේගෙන් ඉපිදී සිටින 18
කිසිවෙක් පව් නොකරන බව අපි දනිමුව;
එහෙත් දෙවියන්වහන්සේගෙන් උපන්
†තැනැත්තේ තමාම ආරක්ෂාකරගන්නේය,
නපුරා ඔහුට අතගසන්නේ නැත. අපි 19
දෙවියන්වහන්සේගෙන් වන බවද මුළු
ලෝකයා නපුරා තුළ බවද දනිමුව.
තවද දෙවියන්වහන්සේගේ පුත්‍රයා ඇවිත් 20
අප සැබෑවූ තැනන්වහන්සේව ඇඳිනගන්න
ලෙස අපට තේරුම දී තිබෙන බව
දනිමුව, සැබෑවූ තැනන්වහන්සේ තුළ,
එනම් උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ තුළ අපි සිටිමුව. සැබෑවූ
දෙවියන්වහන්සේද සදාකාලවූ ජීවනයද
මුන්වහන්සේමය. මාගේ ප්‍රිය දරුවෙනි, 21
දේවතා රූපවලින් දුරුව සිටපල්ලා.

*නොහොත්—ජීවනය දෙනවා ඇත.
†හෙවත්—තැනන්වහන්සේ ඔහු ආරක්ෂාකරනසේක.

# යොහන්ගේ දෙවෙනි පත්‍රය

## ආචාරය. ප්‍රේමයෙහි හැසිරීමට ධෛර්යදීම. බොරු ගුරුවරුන්ගෙන් පරෙස්සම්වීමට අවවාද

වැඩිමහල්ලා වන මා විසින්ද, අප
තුළ පවතින්නාවූ සදාකල්ම අප සමග
තිබෙන්නාවූ සැබෑව උදෙසා මා පමණක්
නොව සැබෑව දන්නාවූ සියල්ලන්
2 විසින්ද, සැබෑවෙහි ප්‍රේමකරන්නාවූ
තෝරාගත් ස්වාමිදුවටත් ඇගේ
3 දරුවන්ටත් ලියා එවන වග නම්: පියවූ
දෙවියන්වහන්සේගෙන්ද පියාණන්ගේ
පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද
කරුණාවත් දයාවත් සමාදානයත්
සත්‍යතාවෙහි හා ප්‍රේමයෙහි අප සමග
වන්නේය.

4 පියාණන්වහන්සේගෙන් අප ආඥා ලැබූ
ලෙසම නුඹේ දරුවන්ගෙන් සමහරුන්
සත්‍යතාවෙහි හැසිරෙනවා මට සම්බවුණ
5 බැවින් ඉතා ප්‍රීතිවෙමි. ඉදින්, ස්වාමි
දුවණියෙනි, පටන්ගැන්මේ සිට අපට
තිබුණු ආඥාව මිස අලුත් ආඥාවක්
ලියූවාක්මෙන් නොව, අප විසින්
එකිනෙකාට ප්‍රේමකරන ලෙස
6 නුඹෙන් ඉල්ලා සිටිමි. ප්‍රේමය නම්
උන්වහන්සේගේ ආඥා ලෙස හැසිරීමය.
ආඥාව නම් නුඹලා පටන්ගැන්මේ සිට
ඇසූ ලෙස ප්‍රේමයෙහි හැසිරීමය.
7 මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
මාංසයෙන් යුක්තව එන බව ඒත්තු
නොගන්නාවූ බොහෝ රැවටිලිකාරයෝ
ලෝකයට පැමිණ සිටිති. රවටන්නාද
විරුද්ධ-ක්‍රිස්තුස්ද මොහුය. අප විසින් 8
කළ දේ නුඹලාට නැති නොවන ලෙසත්
සම්පූර්ණවූ විපාකයක් නුඹලාට ලැබෙන
ලෙසත් නුඹලාම බලාගනිල්ලා.
ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීමෙහි 9
නොපැවතී ඉස්සරහට යන්නාවූ
කිසිවෙකුට දෙවියන්වහන්සේ නැත්තේය.
ඒ ඉගැන්වීමෙහි පවතින්නාටම
පියාණන්වහන්සේද පුත්‍රයාණන්වහන්සේද
සිටිනසේක. නුඹලා වෙතට එන යමෙක් 10
මේ ඉගැන්වීම නොගෙනෙනවා නම්,
ඔහු ගෙදරට පිළි නොගනිල්ලා, ඔහුට
ශුභසිද්ධවේවයි නොකියල්ලා. මක්නිසාද 11
ශුභසිද්ධවේවයි ඔහුට කියන්නා ඔහුගේ
නපුරු ක්‍රියාවලට පංගුකාරයෙක්
වන්නේය.

බොහෝ කාරණා නුඹලාට ලියා එවන්ට 12
මට තිබේ, නුමුත් කඩදාසියෙන් සහ
තීන්තෙන් එසේ කරන්ට නොකැමැත්තෙමි.
නුමුත් නුඹේ ප්‍රීතිය සම්පූර්ණවන පිණිස
නුඹ ළඟට එන්ටද මුහුණට මුහුණලා
කථාකරන්ටද බලාපොරොත්තුවෙමි.
නුඹේ තෝරාගත් සහෝදරීගේ දරුවෝ 13
නුඹට ආචාරකරති.

# යොහන්ගේ තුන්වෙනි පත්‍රය

**ගායස්ට ප්‍රශංසාකිරීම. ආගන්තුක සත්කාරකිරීමේ යුතුකම. විරුද්ධකාරවූ දියොත්‍රෙපස්. අවසානය**

වැඩිමහල්ලා වන මා විසින්
සත්‍යතාවෙහි ප්‍රේමකරන ප්‍රේමවන්ත
ගායස්ට ලියා එවන වග නම්:
2 ප්‍රේමවන්තය, තුඹේ ආත්මය සඵල-
වන්නාක්මෙන්ම තුඹ සියල්ලෙහි
සඵලවන ලෙසද සුවසේ සිටින ලෙසද
3 යාච්ඤාකරමි. තුඹ සැබෑවෙහි හැසිරෙන
ලෙසම තුඹ තුළ ඇති සැබෑව ගැන
සහෝදරයන් ඇවිත් සාක්ෂිදුන් කල මම
4 ඉතා ප්‍රීතිවුණෙමි. මාගේ දරුවන්
සත්‍යතාවෙහි හැසිරෙන බව ඇසීමට
වඩා මහත් ප්‍රීතියක් මට නැත.
5 ප්‍රේමවන්තය, තුඹ සහෝදරයන් හා
ආගන්තුකයන්ව සිටින්නන්ට කරන යමක්
ඇද්ද, තුඹ එයින් විශ්වාස ක්‍රියාවක්
6 කරන්නෙහිය; ඔව්හු තුඹේ ප්‍රේමය ගැන
සභාව ඉදිරිපිට සාක්ෂිදුන්නෝය.
දෙවියන්වහන්සේට ඔබිනලෙස තුඹ
ඔවුන්ගේ ගමනට උපකාරකිරීම
7 යහපත්ය. කෙසේදයත්, ඔවුන් අන්‍ය-
ජාතීන්ගෙන් කිසිත් නොගෙන,
උන්වහන්සේගේ නාමය නිසා පිටත්ව
8 ගිය බැවින්ය. අප සත්‍යතාවට හවුල්
වැඩකාරයන් වන පිණිස එබඳුවූවන්
ප්‍රීතියෙන් පිළිගත යුතුය.
මම සභාවට මඳක් ලියා එවූවෙමි. 9
නුමුත් ඔවුන් අතරෙහි ප්‍රධානකමට කැමති
දියොත්‍රෙපස් අප පිළිගන්නේ නැත.
ඉන්නිසා මම ආවොත් ඔහු අපට 10
විරුද්ධව දුෂ්ට වචන දෙඩමින් කරන
ක්‍රියාවන් සිහිකරවන්නෙමි. ඔහු එයිනුත්
තෘප්තියට නොපැමිණ සහෝදරයන් පිළි
නොගෙන, පිළිගන්ට කැමතිවූවන්
වලක්වා, සභාවෙන් ඔවුන් පහකරන්නේය.
ප්‍රේමවන්තය, නපුර නොව යහපත 11
ආදර්ශකොට ගනින්න. යහපත්කම්
කරන්නා දෙවියන්වහන්සේගෙන්ය. නපුර
කරන්නා දෙවියන්වහන්සේ දුටුවේ නැත.
දෙමේත්‍රියස්ට සියල්ලන්ගේද සැබෑකමේද 12
සාක්ෂිය ඇත්තේය. එසේය, අපිත්
සාක්ෂිදෙමුව; අපේ සාක්ෂිය සැබෑ බව
තුඹ දන්නෙහිය.
තුඹට බොහෝ දේ ලියා එවන්ට මට 13
තිබුණේය. නුමුත් තීන්තෙන් හා
පිහාටුවෙනුත් තුඹට ලියා එවන්ට
නොකැමැත්තෙමි. නුමුත් ඉක්මනින් තුඹ 14
දකින්ට බලාපොරොත්තුවෙමි, එවිට අපි
මුහුණට මුහුණලා කථාකරන්නෙමුව.
තුඹට සමාදානය වේවා. අපේ මිත්‍රයෝ
තුඹට ආචාරකරති. නම් වශයෙන්
මිත්‍රයන්ට ආචාරකරපන්න.

# යූදස් (යූද්) ගේ සාමාන්‍ය පත්‍රය

## ආචාරය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දසයෙක්ද
යාකොබ්ගේ සහෝදරයාදවූ යූදස් යන
මා විසින් පියවූ දෙවියන්වහන්සේ තුළ
ප්‍රියවූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා
ආරක්ෂාකරනු ලබන්නාවූ, කැඳවනු
2 ලැබුවන්ට ලියා එවන වග නම්: නුඹලාට
දයාවත් සමාදනයත් ප්‍රේමයත් වැඩිවේවා.

## බොරුගුරුවරු. දූෂ්‍යකම් පැහැර හැරීම

3 ප්‍රේමවන්තයෙනි, අපේ පොදු ගැළවීම
ගැන නුඹලාට ලියා එවන්ට මුළු
උත්සාහය දරන විට, එක වරක්ම
ශුද්ධවන්තයන්ට භාරදුන් ඇදහිල්ල
උදෙසා උනන්දු ආකාරයෙන්
පොරඅල්ලන ලෙස අවවාදකරමින්
නුඹලාට ලියා එවන්ට මට ඕනෑවිය.
4 මක්නිසාද පුරාණ කාලයේදී මේ
දඬුවමට නියම කොට තැබුවාවූද,
අභක්තිකවූද, අපගේ දෙවියන්වහන්සේගේ
කරුණාව සල්ලාලකමට හරවාගන්නාවූද,
අපගේ එකම අධිපතිවූ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේව එපාකරන්නාවූද
මනුෂ්‍යයන් වගයක් රහසින් ඇතුල්වී
සිටිති.
5 ඉදින් ස්වාමීන්වහන්සේ මිසරදේශයෙන්
සෙනඟක් ගළවා, ඉන්පසු විශ්වාස
නොකළවුන් විනාශකළසේක යන මේ
සියල්ල එක වරක්ම නුඹලා දනගන
සිටින නුමුත්, මම නුඹලාට එය
6 සිහිකරවන්ට කැමැත්තෙමි. තමුන්ගේම
අධිපතිකමෙහි නොපැවත ස්වකීය
වාසස්ථානය අත්හැරියාවූ දේවදූතයන්ද
උන්වහන්සේ මහත් දවසේ විනිශ්චය
පිණිස අන්ධකාරය යට සදකාල
බැඳුම්වලින් බැඳ තැබූසේක. එසේ 7
සොදෙම සහ ගොමොරාවද අවට
නුවරවල්ද මොවුන් සේම තුමූම
වේශ්‍යාකමට භාරවී, අන්‍ය මාංසය
පස්සේ ගොස්, සදකාල ගින්නේ දඬුවම
විඳිමින්, අවවාද ආදර්ශයක් කොට
දක්වනු ලැබ සිටිති. එහෙත් ඒ 8
ආකාරයෙන්ම මොව්හුත් තමුන්ගේ
නිස්සාර හීන දක්වීම්වලදී මාංසය
කිලුටුකරගනිති, අධිපතිකම සුළුකරති,
උත්තමයන්ට නින්දකරති. නුමුත් අග්‍ර 9
දේවදූතයාවූ මීකායෙල් යක්ෂයා සමග
පොරබදන අතර, මෝසෙස්ගේ මිනිය
ගැන විවාද කරද්දී, නින්දිතවූ විනිශ්චයක්
ඔහුට විරුද්ධව කරන්ට භයවී: ස්වාමීන්-
වහන්සේ නුඹට තරවටුකරනසේක්වයි
කීවේය. නුමුත් මොව්හු තමුන් නොදන්නා 10
කොයි දේටත් නින්දකරති. නුවණ නැති
තිරිසනුන් ලෙස ජම්ම ගතියෙන් ඔවුන්ට
තේරෙන මේ දේවලින් තුමූම විනාශකරනු
ලබන්නෝය. ඔවුන්ට දුක්වේ! මක්නිසාද 11
ඔව්හු කායින්ගේ මාර්ගයෙහි ගමන්-
කර; කුලී පිණිස බාලාම්ගේ මුළාවෙහි
වේගයෙන් දිවගොස්, කෝරාගේ විරුද්ධ-
කථාවේදී විනාශවූවෝය. මොව්හු නම් 12
නුඹලා සමග මංගල්‍ය කෑම කන විට
නුඹලාගේ ප්‍රේම-මංගල්‍යවල නොපෙනී
තිබෙන්නාවූ *පර්වතයෝය, නිර්භීතව
තමුන්ම පෝෂ්‍යකරගන්න එඬේරුය;
හුළඟින් ගහගෙනයන වතුර නැති
වලාකුල්ය; ඵල නැත්තාවූ, දෙවරක් මළාවූ,
මුලින් උදුරනලද්දවූ ශරත් කාලයේ ගස්ය.
ඔව්හු ස්වකීය ලජ්ජාව නැමති පෙණ 13

*නොහොත්, ලපය.

දමන මුහුදේ රෞද්‍ර තරංගයෝය;
මුළාවයන තාරකාවෝය, ඔවුන්ට
අන්ධකාරයේ කළුවරකම සදාකාලේටම
14 තබා තිබේ. ආදම් පටන් සත්වෙනියාවූ
ඒනොක් මොවුන් ගැනත් අනාගතවාක්‍ය
කියමින්: බලව, සියල්ලන් කෙරෙහි
යුක්තිය ඉෂ්ටකරන්ටද, සියලු අභක්තීන්
විසින් අභක්තිවන්තලෙස කළාවූ
ඔවුන්ගේ සියලු අභක්තික ක්‍රියා ගැනත්,
15 අභක්තික පව්කාරයන් විසින්
උන්වහන්සේට විරුද්ධව කථාකළාවූ
සියලු කර්කස දේ ගැනත් ඔවුන් වරදට
පත්කරන්ටද, ස්වාමීන්වහන්සේ ස්වකීය
දසදහස් ගණන් ශුද්ධවන්තයන් සමග
16 ආසේකැයි කීවේය. මොව්හු මැසිවිලි
කියන්නෝය, කොදුරන්නෝය, තමුන්ගේ
තෘෂ්ණාවල් අනුව හැසිරෙන්නෝය,
(ඔවුන්ගේ කටින් මහත් උඩඟු වචන
කියමින්,) ප්‍රයෝජනය පිණිස
මනුෂ්‍යයන්ගේ තරාතිරම් සලකන්නෝය.

## ස්ථිරව සිටීමට හා අනුකම්පා වීමට අවවාද

17 තුමුත් ප්‍රේමවන්තයෙනි, අපගේ ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන්
18 විසින් පළමු කියනලද වචන, එනම්:
අන්තිම කාලයෙහිදී තමුන්ගේ අභක්තික
තෘෂ්ණාවල හැටියට හැසිරෙන
සරදම්කරන්නන් සිටිනවා ඇතැයි ඔවුන්
තුඹලාට කී හැටි සිහිකරපල්ලා. මොව්හු 19
මාංසිකව, ආත්මයාණන්වහන්සේ නැතුව,
භේදකරන්නෝය. තුමුත් ප්‍රේමවන්තයෙනි, 20
තුඹලා වනාහි තුඹලාගේ ඉතා ශුද්ධ
ඇදහිල්ල පිට තුඹලාම ගොඩනගාගනිමින්,
ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ සිට
යාච්ඤාකරමින්, සදාකාල ජීවනය පිණිස 21
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-
වහන්සේගේ දයාව බලාසිටිමින්, දෙවියන්-
වහන්සේගේ ප්‍රේමයෙහි පැවතියල්ලා.
තවද මාංසය කරණකොටගෙන 22
කැලැල්වූ වස්ත්‍රයට පවා ද්වේෂකරමින්,
අනුමානයෙහි සිටින සමහරුන්ට දයාව 23
පෙන්වාපල්ලා; සමහරෙකුන් ගින්නෙන්
ඇදලා ගළවාපල්ලා; භයින් යුක්තව
සමහරුන්ට දයාව පෙන්වාපල්ලා.

## ප්‍රශංසා වාක්‍යය

ඉතින් තුඹලා නොපැකිලෙන ලෙස 24
ආරක්ෂාකරන්ටත් මහත් ප්‍රීතියෙන්
යුක්තව උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි
කැලැල් රහිතව තබන්ටත් සමර්ථවූ,
අපගේ ගැළවුම්කාරවූ එකම දෙවියන්- 25
වහන්සේට අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන
ගෞරවයද මහත්තත්ත්වයද පරාක්‍රමයද
බලයද සියලු කාලවලට ප්‍රථමයෙන්
සහ දැනටත් සදාකාලේටත් වේවා. ආමෙන්.

# දේවධර්මාචාර්ය ශුද්ධවූ යොහන්ගේ එළිදරව්කිරීමය

## ප්‍රාරම්භය සහ ආචාරය

1 ඉක්මනින් වෙන්ට ඕනෑ දේවල්,
එනම් දෙවියන්වහන්සේ තමන්ගේ
දසයන්ට දක්වන පිණිස යේසුස්
ක්‍රිස්තුස්වහන්සේට දුන්නාවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්කිරීමය.
උන්වහන්සේ තමන් දූතයා
කරණකොටගෙන තමන් මෙහෙකරුවූ
2 යොහන්ට එය දන්වා එවූසේක. ඔහු
දෙවියන්වහන්සේගේ වචනය ගැනත්
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිය
ගැනත්, එනම්, තමා දුටු සියලු දේ ගැන
3 සාක්ෂිදුන්නේය. මේ අනාගතවාක්‍යයේ
වචන කියන්නාද ඒවා අසන්නෝද එහි
ලියනලද කාරණා පවත්වන්නෝද
ආශීර්වාදලද්දෝය. මක්නිසාද කාලය
ළඟය.

4 යොහන් වන මා විසින් ආසියාවෙහි
තිබෙන සභා සතට ලියා එවන වග
නම්: සිටින්නාවූ, සිටියාවූ, මතු සිටින්නාවූ
තැනන්වහන්සේගෙන්ද, උන්වහන්සේගේ
සිංහාසනය ඉදිරිපිට සිටින ආත්මයාණන්
5 සත්දෙනාගෙන්ද, විශ්වාස සාක්ෂිකාරයාවූ,
මළවුන්ගෙන් නැගිටි කුලුඳුලාවූ,
පොළොවේ රජුන්ගේ අධිපතියාවූ
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද, නුඹලාට
කරුණාවත් සමාදනයත් වේවා. අපට
ප්‍රේමකරන්නාවූ, තමන්ගේ ලෙයින් අපේ
6 පාපවලින් අප මිදුවාවූ, අපව රාජ්‍යයක්ද
තමන් පියවූ දෙවියන්වහන්සේගේ
පූජකයන්ද කළාවූ තැනන්වහන්සේට
ගෞරවයද පරාක්‍රමයද සදකාලේටම
7 වේවා. ආමෙන්. බලාපල්ලා, උන්වහන්සේ
වලාකුල්වලින් එනසේක; සියලු ඇස්ද
උන්වහන්සේට ඇන්න අයද උන්වහන්සේව
දකින්නෝය; පොළොවේ සියලු ගෝත්‍රද
උන්වහන්සේ නිසා වැලපෙන්නෝය.
එසේය, ආමෙන්.

මම අල්ෆා සහ ඕමෙගාද වෙමියි 8
සිටින්නාවූ, සිටියාවූ, මතු සිටින්නාවූ,
සර්වපරාක්‍රමවූ, ස්වාමිවූ දෙවියන්වහන්සේ
කියනසේක.

## පත්මොස්හිදී මනුෂ්‍ය පුත්‍රයා සම්බන්ධ දර්ශනය

නුඹලාගේ සහෝදරයාද, යේසුස්- 9
වහන්සේ තුළ පීඩා විඳීමෙහිත්
රාජ්‍යයෙහිත් ඉවසීමෙහිත් පංගුකාරයාද
වූ යොහන් නම් මම, දෙවියන්වහන්සේගේ
වචනයද යේසුස්වහන්සේගේ සාක්ෂියද
නිසා පත්මොස් නම් දිවයිනෙහි සිටියෙමි.
මම ස්වාමීන්වහන්සේගේ දවසේදී 10
ආත්මයාණන්වහන්සේ තුළ සිටියෙමි.
එවිට: නුඹ දකින දේ පොතක ලියා, 11
එපීස, ස්මර්ණ, පර්ගමම්, තියාතිරා,
සර්දිස්, පිලදෙල්පියා, ලවොදික යන
මේ සභා හතට ඇරපන්නැයි කියන්නාවූ
හොරණෑවක මෙන් මහත් ශබ්දයක් මා
පස්සෙන් ඇසීමි. එකල මා සමග 12
කථාකළ ශබ්දය කිමෙක්දැයි බලන්ට
හැරුණෙමි. එසේ හැරුණු කල, රන්
පහන් රුක් සතක්ද, ඒ පහන් රුක් මැද 13
තමන්ගේ පාදය දක්වා වස්ත්‍රයක් පැළඳ
රන් පටියකින් ළය බැඳගෙන සිටි මනුෂ්‍ය
පුත්‍රයෙක් වැනිවූ කෙනෙක්ද දුටිමි.
උන්වහන්සේගේ හිසද හිසකේද සුදු 14

ලොම් සහ හිම මෙන් සුදුය;
උන්වහන්සේගේ ඇස් ගිනිදැල්ලක් හා
15 සමානය; උන්වහන්සේගේ පාද උදුනක
ගිනියම්කළ දිලිහෙන පිත්තල මෙන්ය;
උන්වහන්සේගේ ශබ්දය බොහෝ ජල
16 ඝෝෂාවක ශබ්දය මෙන්ය. උන්වහන්සේ
ස්වකීය දකුණතෙහි තාරකා සතක් ඇතුව
සිටිසේක. උන්වහන්සේගේ මුඛයෙන්
දෙමුවහත් තියුණු කඩුවක් නික්මුණේය.
උන්වහන්සේගේ මුහුණ තදින් බබළන
17 සූර්යයා මෙන්ය. මම උන්වහන්සේ දුටු
විට මළ කෙනෙකු මෙන් උන්වහන්සේගේ
පාමුල වැටුණෙමි. එවිට උන්වහන්සේ
තමන් දකුණත මා පිට තබා
කියනසේක්: භය නොවන්න; මම
පළමුවෙනියා සහ අන්තිමයාය, ජීවමානවූ
18 තැනැත්තාය; මම මැරුණෙමි, නුමුත්
බලව, මම දත් සදාකාලේටම ජීවත්ව
සිටිමි, මරණයේද *පාතාලයේද යතුරු
19 මට ඇත්තේය. එබැවින් තුඹ දුටු දේද
දැන් තිබෙන දේද මින්පසු සිදුවන්ට
20 තිබෙන දේද වන, මාගේ දකුණතෙහි
තුඹ දුටු තාරකා සතේ සහ රන් පහන්
රුක් සතේද රහස ලියාපන්න. තාරකා
සත නම් සභා සතේ දූතයෝය; පහන්
රුක් සත නම් සභා සතය.

## සභා සතට ලියුම්

(එපීසයට)

2 එපීසයෙහි සභාවේ දූතයාට මෙසේ
ලියාපන්න:
තමන් දකුණතෙහි තාරකා සත
දරන්නාවූද, රන් පහන් රුක් සත මැද
සක්මන්කරන්නාවූද තැනන්වහන්සේ මේ
2 කාරණා කියනසේක. එනම්, තුඹේ
ක්‍රියාවල්ද, තුඹේ වැඩ සහ ඉවසීමද,
තුඹ නපුරන් තුරුස්සන බවද, ප්‍රේරිතයන්
නොවන නුමුත් තුමූ ප්‍රේරිතයෝය
කියන්නන් තුඹ සෝදිසිකර බලා ඔවුන්
බොරුකාරයන්යයි තුඹ දැනගත් බවද,
3 ඉවසිල්ලෙන් යුක්තව මාගේ නාමය නිසා
දුක් උසුලා ක්ලාන්ත නොවූ බවද දනිමි.
4 නුමුත් තුඹේ පළමු ප්‍රේමය අත්හැරියෙහිය
යන කාරණය තුඹට විරුද්ධව මට
5 ඇත්තේය. එබැවින් තුඹ වැටී සිටින්නේ
කොතැනින්දැයි සිහිකොට, පශ්චාත්තාපව,
පළමු ක්‍රියාවන් කරපන්න; නැතහොත්
මම තුඹ ළඟට ඇවිත්, තුඹ පශ්චාත්තාප
නොවෙනවා නම්, තුඹේ පහන් රුක
ස්වකීය ස්ථානයෙන් අහක්කරන්නෙමි.
6 නුමුත් මේක තුඹට ඇත්තේය, එනම්, මා
ද්වේෂකරන නිකොලායිතයන්ගේ
ක්‍රියාවලට තුඹත් ද්වේෂකරන්නෙහිය.
7 ආත්මයාණන්වහන්සේ සභාවලට කියන
දේ කන් ඇත්තේ අසාවා. ජයගන්නාට
නම් දෙවියන්වහන්සේගේ පාරාදීසයෙහි
තිබෙන ජීවන වෘක්ෂයෙන් කන්ට
දෙන්නෙමි.

(ස්මර්ණයට)

8 තවද ස්මර්ණයෙහි සභාවේ දූතයාට
මෙසේ ලියාපන්න:
පළමුවෙනියාද අන්තිමයාද වන, මැරී
ජීවත්වුණාවූ තැනන්වහන්සේ මේ කාරණා
9 කියනසේක. එනම්, මම තුඹේ පීඩාවද
දිළිඳුකමද දනිමි (නුමුත් තුඹ ධනවත්ය),
යුදෙව්වන් නොවන නුමුත් තුමූ
යුදෙව්වෝයයි කියන සාතන්ගේ
සිනගෝගයක්ව සිටින්නන්ගේ
10 අපහාසයද දනිමි. තුඹ විඳින්ට යන
දේවලට භය නොවන්න. බලව, තුඹලා
විමසනු ලබන පිණිස යක්ෂයා
තුඹලාගෙන් සමහර දෙනෙකුන් හිරගෙයි
දමන්ට යන්නේය; තුඹලා දස දවසක්
පීඩා විඳින්නහුය. මරණය දක්වා
විශ්වාසව සිටපන්න, එවිට මම
ජීවනයේ ඔටුන්න තුඹට දෙන්නෙමි.
11 ආත්මයාණන්වහන්සේ සභාවලට කියන
දේ කන් ඇත්තේ අසාවා. ජයගන්නාට
නම් දෙවෙනි මරණයෙන් අනතුරු
නොවන්නේය.

(පර්ගමම්ට)

12 තවද පර්ගමම්හි සභාවේ දූතයාට
මෙසේ ලියාපන්න:
දෙමුවහත් තියුණු කඩුව ඇත්තාවූ
තැනන්වහන්සේ මේ කාරණා කියනසේක.

*ග්‍රීක්: හේදීසය.

13 එනම්, තුඹ වාසයකරන ස්ථානය දනිමි,
එනම් සාතන්ගේ සිංහාසනය තිබෙන
තැනය. තුඹ මාගේ නාමය තදින්
අල්ලාගන සිටින බවද සාතන්
වාසයකරන ස්ථානයෙහිදී තුඹලා
අතරෙහි මරනු ලැබූ මාගේ විශ්වාස
සාක්ෂිකාරවූ අන්තිපස්ගේ දවස්වලදීවත්
මා කෙරෙහි ඇදහීම අත් නොහැරිය
14 බවද දනිමි. එහෙත් දේවතා රූපවලට
පිදූ දේ කන්ටත් වේශ්‍යාකම්කරන්ටත්
ඉශ්‍රායෙල් පුත්‍රයන් ඉදිරියෙහි බාධාවක්
තැබීමට බාලාක්ට ඉගැන්වූ බාලාම්ගේ
ඉගැන්වීම දරන්නන් ඔතැන තුඹ ළඟ
සිටින බැවින් තුඹට විරුද්ධව කියන්ට
කරුණු ස්වල්පයක් මට තිබේ.
15 මෙසේ නිකොලායිතයන්ගේ ඉගැන්වීම
දරන්නොත් ඒ ආකාරයෙන්ම තුඹට
16 සිටිති. එබැවින් පශ්චාත්තාපවෙයන්න;
නැතහොත් මම ඉක්මනින් තුඹ ළඟට
ඇවිත්, මාගේ මුඛයේ කඩුවෙන් ඔවුන්ට
17 විරුද්ධව සටන්කරන්නෙමි. ආත්මයාණන්-
වහන්සේ සභාවලට කියන දේ කන්
ඇත්තේ අසාවා. ජයගන්නාට නම්
සැඟවී තිබෙන මන්නාවලින් දෙන්නෙමි,
ලබන්නා මිස වෙන කිසිවෙක් නොදන්න
අලුත් නාමයක් ලියා තිබෙන සුදු ගලක්ද
ඔහුට දෙන්නෙමි.

(තියාතිරාවට)

18 තවද තියාතිරාවෙහි සභාවේ දූතයාට
මෙසේ ලියාපන්න:
ගිනි දැල්ලක් වැනි ඇස්ද දිලිහෙන
පිත්තල වැනි පාදයන්ද ඇත්තාවූ
දෙවියන්වහන්සේගේ පුත්‍රයා මේ කාරණා
19 කියනසේක. එනම්, මම තුඹේ ක්‍රියාද
ප්‍රේමයද ඇදහිල්ලද සේවයද ඉවසිල්ලද
තුඹේ පළමු ක්‍රියාවලට වඩා අන්තිම
20 ක්‍රියා වැඩි බවද දනිමි. තුමුත් තුඹට
විරුද්ධව මේ කාරණය මට ඇත්තේය,
එනම්, තමාම අනාගතවක්ත්‍රියෙකැයි
කියාගන්නාවූ ස්ත්‍රී වන යෙසබෙල්ට තුඹ
අවකාශ දෙන්නෙහිය; ඈ වනාහි
වේශ්‍යාකම්කරන්ටද දේවතා රූපවලට
පූජාකළ දේ කන්ටද මාගේ මෙහෙකරුවන්ට
උගන්වා මුළාකරන්නීය. පශ්චාත්තාප- 21
වෙන්ට ඈට කල් දුනිමි; තුමුත් ඈ තමාගේ
වේශ්‍යාකම ගැන පශ්චාත්තාපවෙන්ට
නොකැමැත්තීය. බලව, ඈ යහනකට 22
හෙළමි, ඈ සමග කාමමිථ්‍යාචාරය
කරන්නෝ ඇගේ ක්‍රියා ගැන
පශ්චාත්තාප නොවෙත් නම්, ඔවුන්ද
මහත් පීඩාවකට හෙළමි. ඈගේ දරුවන්ද 23
වසංගතයෙන් නසන්නෙමි; මා වනාහි
අදහස්ද හෘදයන්ද විමසන තැනැත්තා
බව සියලු සභාවෝ දැනගන්නාහුය. මම
තුඹලා එක් එක්කෙනාට තුඹලාගේ ක්‍රියා
හැටියට දෙන්නෙමි. තුමුත් මේ ඉගැන්වීම 24
නැත්තාවූ, ගැඹුරුයයි ඔවුන් කියන
සාතන්ගේ ගැඹුරුවූ කාරණා
නොදන්නාවූ, තියාතිරාවෙහි ඉතිරිව
සිටින්නාවූ තුඹලා පිට මම වෙන කිසි
බරක් නොතබමියි තුඹලාට කියමි.
එසේවී තුමුත් තුඹලාට ඇති දේ මා 25
එන තුරු තදින් අල්ලාගන සිටපල්ලා.
ජයගන්නාවූ, කෙළවර දක්වා මාගේ 26
ක්‍රියා පවත්වන්නාවූ තැනැත්තාට නම්
මාගේ පියාණන්වහන්සේගෙන් මා ලැබූ
ලෙස ජාතීන් කෙරෙහි බලය දෙන්නෙමි.
කුම්භකාරයාගේ භාජන බිඳ සුණුකරනු 27
ලබන්නාක්මෙන් ඔහු ඔවුන් යදණ්ඩකින්
ආණ්ඩුකරන්නේය. ඔහුට පහන් තාරකාව 28
දෙන්නෙමි. ආත්මයාණන්වහන්සේ 29
සභාවලට කියන දේ කන් ඇත්තේ
අසාවා.

(සර්දිස්ට)

3 තවද සර්දිස්හි සභාවේ දූතයාට
මෙසේ ලියාපන්න:
දෙවියන්වහන්සේගේ ආත්මයාණන්
සත්දෙනාද තාරකා සතද ඇත්තාවූ
තැනන්වහන්සේ මේ කාරණා කියනසේක.
එනම්, තුඹේ ක්‍රියා දනිමි, තුඹ ජීවත්ව
සිටින බවට නාමයක් ඇතුව සිටින තුමුත්
තුඹ මැරිලාය. අවදිව සිට, ඉතිරිවූ, 2
නැසීයාමට ළංවූ දේ ස්ථිරකරපන්න.
මක්නිසාද මාගේ දෙවියන්වහන්සේ
ඉදිරියෙහි තුඹේ කිසි ක්‍රියාවක් සම්පූර්ණ
බව මට සම්බවුණේ නැත. එබැවින් 3

තුඹ ලැබුවේ කෙසේද, ඇසුවේ කෙසේදැයි
සිහිකර, ඒ දේ පවත්වා, පසුතැවිලිවෙයන්න.
මෙසේ තුඹ අවදිව නොසිටින්නෙහි නම්,
සොරෙකු මෙන් එන්නෙමි, මා තුඹ කරා
කොයි පැයේ එනවා ඇද්ද කියා තුඹ
4 නොදනම සිටිනවා ඇත. එහෙත්
තමුන්ගේ වස්ත්‍ර කිලුටුකර නොගත්
ස්වල්ප දෙනෙක් සර්දිස්හි තුඹට සිටිති.
ඔවුන් වටින්නන් නිසා සුදු ඇඳුමෙන්
5 මා සමග ඇවිදිනවා ඇත. ජයගන්නා
නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු
ලැබේ; ඔහුගේ නම ජීවන-පොතෙන්
කිසිසේත් මකා නොහැර, මාගේ
පියාණන්වහන්සේද උන්වහන්සේගේ
දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය
6 පිළිගන්නෙමි. ආත්මයාණන්වහන්සේ
සභාවලට කියන දේ කන් ඇත්තේ
අසාවා.

(පිලදෙල්පියාවට)

7 තවද පිලදෙල්පියාවෙහි සභාවේ
දූතයාට මෙසේ ලියාපන්න:
ශුද්ධවූ, සැබෑවූ, දාවිත්ගේ යතුර
ඇත්තාවූ, කිසිවෙක් නොපියන ලෙස
අරින්නාවූ, කිසිවෙක් නාරින ලෙස
පියන්නාවූ තැනන්වහන්සේ මේ කාරණා
8 කියනසේක. එනම්, මම තුඹේ ක්‍රියා
දනිමි, (මෙන්න, කිසිවෙකුට පියන්ට
බැරිවූ ඇරපු දොරක් තුඹ ඉදිරියෙහි මා
විසින් තබා තිබේ.) තුඹට ඇත්තේ ස්වල්ප
බලයක්ය, තුඹ මාගේ වචන
රක්ෂාකෙළෙහිය, මාගේ නාමය තුඹ
9 එපාකළේ නැත. බලව, යුදෙව්වරුව
නොසිට තුමූ යුදෙව්වරුයයි බොරුවෙන්
කියන්නාවූ, සාතන්ගේ සිනගෝගයේවූ
අය ඇවිත් තුඹේ පාද ඉදිරියෙහි
වැඳවැටෙන්ටත් මම තුඹට ප්‍රේමකළ බව
10 දනගන්ටත් සලස්වන්නෙමි. මාගේ
ඉවසීමේ වචනය තුඹ රක්ෂාකළ හෙයින්
පොළොවේ වසන්නන් පරීක්ෂාකිරීමට
මුළු ලෝකය පිටට පැමිණෙන්ට
තිබෙන්නාවූ පරීක්ෂාවේ පැයෙන් මමත්
තුඹ ආරක්ෂාකරන්නෙමි. ඉක්මනින් එමි.
කිසිවෙක් තුඹේ ඔටුන්න නොගන්නා 11
ලෙස තුඹට තිබෙන දේ තදින්
අල්ලාගනින්න. ජයගන්නා මාගේ 12
දෙවියන්වහන්සේගේ මාළිගාවෙහි කණුවක්
කරන්නෙමි, ඔහු තවත් එතැනින්
පිටතට නොයන්නේය. මාගේ දෙවියන්-
වහන්සේගේ නාමයද මාගේ දෙවියන්-
වහන්සේ කෙරෙන් ස්වර්ගයෙන් බසින
අලුත් යෙරුසලම වන මාගේ දෙවියන්-
වහන්සේගේ නුවරේ නාමයද මාගේම
අලුත් නාමයද ඔහු පිට ලියන්නෙමි.
ආත්මයාණන්වහන්සේ සභාවලට කියන 13
දේ කන් ඇත්තේ අසාවා.

(ලවොදිකයට)

තවද ලවොදිකයෙහි සභාවේ දූතයාට 14
මෙසේ ලියාපන්න:
ආමෙන් නමැත්තාවූ, විශ්වාස සැබෑ
සාක්ෂිකාරවූ, දෙවියන්වහන්සේගේ
මැවිල්ලේ මුලවූ තැනන්වහන්සේ මේ
කාරණා කියනසේක. එනම්, මම තුඹේ 15
ක්‍රියා දනිමි, තුඹ ශීතලව හෝ උෂ්ණව
හෝ නොසිටින බවද දනිමි. තුඹ ශීතලව
හෝ උෂ්ණව හෝ සිටිනවාට
කැමැත්තෙමි. තුඹ උෂ්ණව හෝ ශීතලව 16
හෝ නොසිට ඇල්මැරී සිටින බැවින්
මාගේ මුඛයෙන් තුඹ වමාරන්නෙමි.
කාලකණ්ණියාද දුක්ඛිතයාද දිළින්දද 17
අන්ධයාද නග්නව සිටින්නාද තුඹම
බව තුඹ නොදන: මම ධනවත්ය, මට
ධනය ඇත්තේය, කිසි දෙයකින් හිඟයක්
නැතැයි තුඹ කියන බැවින්, තුඹ 18
ධනවත්වන පිණිස ගින්නෙන් පවිත්‍ර
කරනලද රන්ද, තුඹේ නග්නභාවයේ
ලජ්ජාව ප්‍රකාශ නොවන පිණිස
හැඳගන්ට සුදු වස්ත්‍රද, තුඹේ ඇස්
පෙනෙන පිණිස ඇස්වල ගාගන්ට අඳුන්ද
මාගෙන් ලබාගන්ට තුඹට අවවාදකරමි.
මම ප්‍රේමකරන සියල්ලන්ට තරවටු 19
කොට දඬුවම්කරමි. එබැවින් තුඹ
ජ්වලිතව සිට පශ්චාත්තාපවෙයන්න.
මෙන්න, මම දොර ළඟ සිට තට්ටුකරමි, 20
යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත්,

ඔහු වෙතට ඇතුල්ව, ඔහු සමග කෑම
කන්නෙමි, ඔහුද මා සමග කන්නේය.
21 මම ජයගෙන මාගේ පියාණන්වහන්සේ
සමග උන්වහන්සේගේ සිංහාසනයෙහි
හිඳගත් සේම, ජයගන්නාටත් මාගේ
සිංහාසනයෙහි මා සමග ඉඳගන්ට
22 දෙන්නෙමි. ආත්මයාණන්වහන්සේ
සභාවලට කියන දේ කන් ඇත්තේ
අසාවා.

## සිංහාසනයෙහි වැඩ සිටින දෙවියන්වහන්සේ ගැන දර්ශනය

4 ඉන්පසු අහසේ දෙරක් ඇරී තිබෙනවා
මම දුටිමි, හොරණෑවක ශබ්දය මෙන්
මා සමග කථාකරනවා මා ඇසූ
පළමුවෙනි හඬද: මෙහි නැගී වරෙන්න,
මේ දේවලට පසුව වියයුතු දේවල් තුඹට
2 පෙන්වන්නෙමියි කීය. එකෙණෙහිම මම
ආත්මයාණන්වහන්සේ තුළ සිටියෙමි.
එවිට ස්වර්ගයෙහි සිංහාසනයක්
තිබුණේය, ඒ සිංහාසනයෙහි එක්-
3 කෙනෙක් වැඩහුන්සේක; එහි වැඩහුන්
තැනන්වහන්සේ පෙනීමෙන් සූර්යකාන්ති
සහ ලෝහිතංක මැණික්වලට සමානව
සිටිසේක. සිංහාසනය අවට මරකතයට
සමානව පෙනෙන දේදුන්නක් තිබුණේය.
4 ඒ සිංහාසනය වටේට සිංහාසන
විසිහතරක් තිබුණේය. ඒ සිංහාසන
මත්තෙහි වැඩිමහල්ලන් විසිහතර
දෙනෙක් සුදු වස්ත්‍ර පැළඳ, තමුන්ගේ
හිස් මතුයෙහි රන් ඔටුනු ඇතුව, වාඩිවී
5 හිඳිනවා දුටිමි. සිංහාසනයෙන් විදුලිද
ශබ්දද ගර්ජනාද නික්මුණේය.
සිංහාසනය ඉදිරියෙහි ගිනි පහන් සතක්
දල්වෙමින් තිබුණේය, ඒවා නම්
දෙවියන්වහන්සේගේ ආත්මයාණන්
6 සත්දෙනාය; සිංහාසනය ඉදිරියෙහි පළිඟු
හා සමානවූ වීදුරු සමුද්‍රයක් වැනි
පෙනීමක් විය; සිංහාසනය මධ්‍යයෙහිත්
සිංහාසනය අවටත් ඉස්සරහින්ද
පස්සෙන්ද ඇස්වලින් පිරුණාවූ ජීවමාන
සත්ත්වයන් සතර දෙනෙක් සිටියෝය.
7 පළමුවෙනි සත්ත්වයා සිංහයෙකුට
සමානය, දෙවෙනි සත්ත්වයා වස්සෙකුට
සමානය, තුන්වෙනි සත්ත්වයාට
මනුෂ්‍යයෙකුගේ මෙන් මුහුණක් තිබුණේය,
සතරවෙනි සත්ත්වයා පියාසරකරන
රාජාලියෙකුට සමානය. එක එකාට 8
පියාපත් සයක් බැගින් තිබුණාවූ ඒ
ජීවමාන සත්ත්වයන් සතරදෙනා අවටද
ඇතුළතද ඇස් පුරාම තිබුණේය. ඔව්හුද:
සිටියාවූ සිටින්නාවූ මතු සිටින්නාවූ
සර්වපරාක්‍රමවූ ස්වාමිවූ දෙවියන්-
වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධයයි රෑ
දවල් නොනැවතී කියති. ඒ ජීවමාන 9
සත්ත්වයන් සිංහාසනයෙහි වැඩහිඳින්නාවූ,
සදාකල්ම ජීවත්වන්නා වූ තැනන්-
වහන්සේට ප්‍රශංසාවද ගෞරවයද
ස්තුතියද දෙන කල, වැඩිමහල්ලන් 10
විසිහතරදෙනාද සිංහාසනයෙහි වැඩ-
සිටින තැනන්වහන්සේ ඉදිරියෙහි වැටී,
සදාකල්ම ජීවත්වන්නාවූ තැනන්වහන්සේට
නමස්කාරකර, තමුන්ගේ ඔටුනු
සිංහාසනය ඉදිරියෙහි හෙළා: අපගේ 11
ස්වාමීන්වහන්ස, අපගේ දෙවියන්වහන්ස,
ඔබ ප්‍රශංසාවත් ගෞරවයත් බලයත්
ලබන්ට වටින තැනන්වහන්සේය.
මක්නිසාද ඔබ සියලු දේ මැවූසේක,
ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුණේය,
ඒවා මවනලද්දේයයි කියති.

## බැටළුපැටියාණන් ගැන දර්ශනයක්

5 තවද ඇතුළත් පිටත් ලියනලද
මුද්‍රා සතකින් තදලෙස මුද්‍රාකරන
ලද පොතක් සිංහාසනයෙහි වැඩඋන්නාවූ
තැනන්වහන්සේගේ දකුණතෙහි දුටිමි. ඒ 2
පොත දිගඅරින්ටත් එහි මුද්‍රා කඩන්ටත්
වටින්නේ කවුදැයි කියා මහත් ශබ්දයකින්
බලවත් දේවදූතයෙක් හඬගසනවා දුටිමි.
නුමුත් ස්වර්ගයෙහි හෝ පොළොවෙහි 3
හෝ පොළොවෙන් යට හෝ පොත
දිගඅරින්ටවත් ඒක බලන්ටවත් පුළුවන්වූ
කිසිවෙක් නොසිටියේය. පොත 4
දිගඅරින්ටත් ඒක බලන්ටත් වටින්නාවූ
කිසිවෙක් සම්බ නුවූ බැවින් මම
බොහෝකොට හැඬුවෙමි. එවිට 5
වැඩිමහල්ලන්ගෙන් එක්කෙනෙක් මට

කථාකොට: නොහඬන්න. මෙන්න.
පොත සහ එහි මුද්‍රා සත දිගඅරින
ලෙස යූදගේ ගෝත්‍රයෙන්වූ සිංහයාද
දවිත්ගේ මුලදවූ තැනන්වහන්සේ
6 ජයගත්සේකැයි මට කීවේය. තවද අං
සතක්ද. පොළොව මුළුල්ලෙහි යවනු
ලැබූ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්
සත්දෙනා වන ඇස් සතක්ද ඇත්තාවූ.
මරනු ලැබුවාක්මෙන් පෙනුණාවූ බැටළු
පැටවෙක් සිංහාසනය සහ ජීවමාන
සත්ත්වයන් සතරදෙනා මධ්‍යයෙහිත්
වැඩිමහල්ලන් මධ්‍යයෙහිත් සිටිනවා
7 දුටිමි. ඒ බැටළු පැටවාණෝ ඇවිත්
සිංහාසනයෙහි වැඩඋන්නාවූ තැනන්-
වහන්සේගේ දකුණතින් පොත ගත්-
8 සේක. එසේ පොත ගත් කල. ජීවමාන
සත්ත්වයෝ සතරදෙනා සහ වැඩි-
මහල්ලෝ විසිහතරදෙනාත් එකිනෙකා
වීණාවක්ද ශුද්ධවන්තයන්ගේ යාච්ඤ
නමැති සුගන්ධ ද්‍රව්‍යයෙන් පිරුණු
රන් පාත්‍රාද රැගෙන. බැටළුපැටවාණන්
9 ඉදිරියෙහි වැඳ වැටුණෝය. ඔව්හු අලුත්
ගීතිකාවක් ගායනාකරමින්: ඔබ පොත
ගන්ටත් එහි මුද්‍රා කඩන්ටත් වටින
තැනන්වහන්සේය. මක්නිසාද ඔබ
මරනු ලැබ, සියලු ගෝත්‍රවලින්ද
භාෂාවන්ගෙන්ද සෙනඟගෙන්ද ජාතීන්-
ගෙන්ද මිනිසුන් ඔබගේ ලෙයින්
10 දෙවියන්වහන්සේට මිලේට ගෙන. ඔවුන්
අපගේ දෙවියන්වහන්සේට රාජ්‍යයක්ද
පූජකයන්ද කළසේක: ඔව්හු
11 පොළොවෙහි රජකම්කරතියි කීවෝය. තවද
මම බැලිමි. එවිට සිංහාසනයද ජීවමාන
සත්ත්වයන්ද වැඩිමහල්ලන්ද වටකර
බොහෝ දේවදූතයන් සිටිනවා දුටිමි,
ඔවුන්ගේ හඬද මට ඇසුණේය: ඔවුන්ගේ
ගණන දසදහසක් වර දසදහසක් සහ
12 දහස්වර දහස්ව තිබුණේය. ඔව්හු
කථාකොට: මරනු ලැබූ බැටළු-
පැටවාණෝ බලයත් ධනයත් ප්‍රඥවත්
පරාක්‍රමයත් ගෞරවයත් තේජසත්
ප්‍රශංසාවත් ලබන්ට වටින තැනන්-
වහන්සේයයි මහත් හඬකින් කීවෝය.
13 තවද ස්වර්ගයෙහිත් පොළොවෙහිත්
පොළොවෙන් යට සහ මුහුද පිටත්
ඇත්තාවූ සියලු මැවිලි වන එහි ඇති
සියල්ලෝ: සිංහාසනයෙහි වැඩඉන්න
තැනන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත්
ප්‍රශංසාවද ගෞරවයද මහිමයද
පරාක්‍රමයද සදාකාලේටම වේවයි
කියනවා ඇසීමි. ජීවමාන සත්ත්වයෝ 14
සතරදෙනාද: ආමෙන්යයි කීවෝය.
වැඩිමහල්ලෝ බිම වැටී නමස්කාර-
කළෝය.

## පොතේ මුද්‍රා කැඩීම

6 තවද බැටළුපැටවාණන් මුද්‍රා
සතෙන් එකක් කැඩූ කල. මම
බැලුවෙමි. ජීවමාන සත්ත්වයන් සතර-
දෙනාගෙන් එක්කෙනෙක් ගර්ජනා
ශබ්දයකින් මෙන් කථාකොට:
වරෙන්නැයි කියනවා ඇසීමි. එවිට සුදු 2
අශ්වයෙක් සිටිනවා දුටිමි. ඌ පිට හුන්
තැනැත්තාට දුන්නක් තිබුණේය:
ඔටුන්නක්ද ඔහුට දෙනලද්දේය. ඔහු
ජයගනිමින්ද ජයගන්න පිණිසද පිටත්ව
ආවේය.
උන්වහන්සේ දෙවෙනි මුද්‍රාව කැඩූ කල. 3
දෙවෙනි ජීවමාන සත්ත්වයා කථාකොට:
වරෙන්නැයි කියනවා ඇසීමි. තවත් 4
අශ්වයෙක්, එනම් රතු අශ්වයෙක් පිටත්ව
ආවේය. ඌ පිට හුන් තැනැත්තාට
මනුෂ්‍යයන් ඔවුනොවුන් මරන පිණිස
පොළොවෙන් සමාදනය දුරුකරන්ට
බලය දෙනලද්දේය. මහත්වූ කඩුවක්ද
ඔහුට දෙනලද්දේය.
උන්වහන්සේ තුන්වෙනි මුද්‍රාව කැඩූ 5
කල තුන්වෙනි ජීවමාන සත්ත්වයා
කථාකොට: වරෙන්නැයි කියනවා ඇසීමි.
එවිට කළු අශ්වයෙක් දුටිමි: ඌ
පිටහුන් තැනැත්තාගේ අතේ තරාදියක්
තිබුණේය. ජීවමාන සත්ත්වයන් සතර- 6
දෙනා මධ්‍යයෙහි: ධාන්‍ය නැළියක්
*මස්සය: යව නැළි තුනක් *මස්සය:
තෙල්වලටත් මුද්‍රිකපානයටත් අනතුර
නොකරන්නැයි කියන හඬක් මෙන් ඇසීමි.
උන්වහන්සේ සතරවෙනි මුද්‍රාව කැඩූ 7
කල. සතරවෙනි ජීවමාන සත්ත්වයා
කථාකොට: වරෙන්නැයි කියන හඬ

*මස්ස, පනම් හයක් පමණ වේ.

8 ඇසීමි. එවිට සුදුමැලි අශ්වයෙක් සිටිනවා
දුටිමි. ඌ පිට හුන් තැනැත්තාගේ නාමය
මරණයය; *පාතාලයද ඔහු අනුව ගියේය.
කඩුවෙනුත් සාගතයෙනුත් වසංගතයෙනුත්
පොළොවේ වනමෘගයන් ලවාත් මරන්ට
පොළොවෙන් සතරෙන් කොටසක්
කෙරෙහි ඔවුන්ට බලය දෙනලද්දේය.
9 උන්වහන්සේ පස්වෙනි මුද්‍රාව කැඩූ කල,
දෙවියන්වහන්සේගේ වචනය නිසාද
තමුන් දරූ සාක්ෂිය නිසාද මරනු
ලැබූවන්ගේ ආත්ම පූජාසනය යට
10 සිටිනවා දුටිමි. ඔව්හු: අහෝ, ස්වාමීනි,
ශුද්ධවූ සැබෑවූ තැනන්වහන්ස, ඔබ
පොළොවෙහි වසන්නන් විනිශ්චය
නොකොට, අපේ ලේ ගැන ඔවුන්ට
සුදුසු විපාක නොදී, කොපමණ කල්
ප්‍රමාද වනසේක්දැයි මහත් ශබ්දයකින්
11 මොරගසා කීවෝය. ඔවුන්ගෙන්
එකිනෙකාට සුදු සළුවක් දෙනලද්දේය.
ඔවුන් ලෙසම මරනු ලබන්ට සිටින්නාවූ
ඔවුන්ගේ හවුල් මෙහෙකරුවන්ගේද
සහෝදරයන්ගේද ගණන සම්පූර්ණවන
තුරු, තව ස්වල්ප කාලයක් නවතින්ට
කියා ඔවුන්ට කියනලද්දේය.
12 උන්වහන්සේ සවෙනි මුද්‍රාව කැඩූ කල,
මම දුටිමි, මහත්වූ භූමිකම්පාවක් විය;
සූර්යයා කේශකම්බලයක් මෙන් කළුවිය,
13 මුළු හඳද ලේ මෙන් විය; අත්තික්කා
ගසක් තද සුළඟකින් සෙලවී එහි අකාල
ඵල වැටෙන්නාක්මෙන් අහසේ තාරකා
14 පොළොව පිට වැටුණේය. අකුලනලද
පොතක් මෙන් අහස පහකරනලද්දේය;
සියලු කඳුද දිවයින්ද ස්වකීය
ස්ථානවලින් පහකරන ලද්දේය.
15 පොළොවේ රජවරුද උත්තමයෝද
සේනාපතියෝද ධනවත්තයෝද
බලවත්තයෝද සියලු දසයෝද
නිර්දසයෝද කඳුවල ගුහාවලත්
16 පර්වතවලත් සැඟවුණෝය; ඔව්හු
කඳුවලටත් පර්වතවලටත් කථාකොට:
අප පිට වැටී, සිංහාසනයෙහි වැඩඉන්න
තැනන්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත්
බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අප
සඟවාගනිල්ලා. මක්නිසාද උන්වහන්සේගේ 17
උදහසේ මහත් දවස පැමුණුණ බැවින්
සිටින්ට පුළුවන් කාටදැයි කීවෝය.

## දෙවියන්වහන්සේගේ සැබෑ සේවකයන් ආරක්ෂාකිරීම

7 ඉන්පසු ගොඩටවත් මුහුදටවත්
කිසි ගහකටවත් හුළඟ නොවදින
පිණිස දේවදූතයන් සතර දෙනෙක්
පොළොවේ සතරදිග හුළඟ අල්ලාගන
පොළොවේ සතර කොනේ සිටිනවා
දුටිමි. තවත් දේවදූතයෙක් ජීවමාන 2
දෙවියන්වහන්සේගේ මුද්‍රාව රැගෙන,
නැගෙනහිර දිසාවෙන් නගිනවා දුටිමි.
ඔහුද ගොඩටත් මුහුදටත් අනතුරු
කරන්ට බලය ලත් දේවදූතයන්
සතරදෙනාට මහත් ශබ්දයකින්
හඬගසා: අපේ දෙවියන්වහන්සේගේ 3
මෙහෙකරුවන්ගේ නළල්වල මුද්‍රා තබන
තුරු, ගොඩටවත් මුහුදටවත් ගස්වලටවත්
අනතුරු නොකරල්ලායයි කීය. තවද 4
මුද්‍රාකරනු ලැබූවන්ගේ ගණන ඇසීමි,
ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු ගෝත්‍රවලින්
මුද්‍රාකරනු ලැබූ අය එක්ලක්ෂ සතළිස්
සාරදහසක්ය.
යූදාගේ ගෝත්‍රයෙන් දොළොස් 5
දහසක් මුද්‍රාකරනු ලැබුවෝය.
රූබෙන්ගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක්ද,
ගාද්ගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක්ද,
ආෂෙර්ගේ ගෝත්‍රයෙන් දොළොස් 6
දහසක්ද,
නප්තලීගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක්ද,
මනස්සේගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක්ද,
සිමියොන්ගේ ගෝත්‍රයෙන් දොළොස් 7
දහසක්ද,
ලෙවීගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක්ද,
ඉස්සාකර්ගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක්ද,
සාබුලොන්ගේ ගෝත්‍රයෙන් දොළොස් 8

*ග්‍රීක්: හේදීසය.

දහසක්ද,
යෝසෙප්ගේ ගෝත්‍රයෙන් දෙළොස් දහසක්ද,
බෙන්යමින්ගේ ගෝත්‍රයෙන් දෙළොස් දහසක්ද මුද්‍රාකරනු ලැබුවෝය.

## දුක් පීඩා පසුකොට පවිත්‍රකරනු ලැබූවන් ගැන දර්ශනය

9 ඉන්පසු සියලු ජාතීන්ගෙනුත් ගෝත්‍ර-
වලිනුත් සෙනඟගෙනුත් භාෂාවන්ගෙනුත්
කිසිවෙකුට ගණන්කළ නොහැකි මහත්
සමූහයක් සුදු සළු පැළඳ, තමුන්ගේ
අත්වල තාලපත්‍ර ඇතුව, සිංහාසනය
ඉදිරියෙහිත් බැටළුපැටවාණන් ඉදිරියෙහිත්
10 සිටිනවා දුටිමි; ඔව්හු: සිංහාසනයෙහි
වැඩහිඳින අපේ දෙවියන්වහන්සේටත්
බැටළුපැටවාණන්ටත් ගැළවීම අයිතිය
කියා මහත් ශබ්දයකින් හඬගැසුවෝය.
11 සියලු දේවදූතයෝ සිංහාසනයද
වැඩිමහල්ලන්ද ජීවමාන සත්ත්වයන්
සතරදෙනාද වටකර සිට, සිංහාසනය
ඉදිරියෙහි මුහුණින් වැටී, දෙවියන්-
වහන්සේට නමස්කාරකරමින්: ආමෙන්.
12 ප්‍රශංසාවද තේජසද ප්‍රඥාවද ස්තුතියද
ගෞරවයද බලයද පරාක්‍රමයද
සදාකාලේටම අපේ දෙවියන්වහන්සේට
13 වේවා. ආමෙන්යයි කීවෝය. එවිට
වැඩිමහල්ලන්ගෙන් එක්කෙනෙක් මට
කථාකොට: සුදු සළු පැළඳ සිටින
මොව්හු කවුරුද? කොතැනින් ආවෝදැයි
14 මාගෙන් ඇසුවේය. මමද: මාගේ
ස්වාමිනි, ඔබ දන්නෙහියයි ඔහුට කීමි.
ඔහු කියනුයේ: මොව්හු මහත් පීඩා
මැදින් එන්නෝය, ඔව්හු තමුන්ගේ සළු
බැටළුපැටවාණන්ගේ ලෙයින් සෝද
15 සුදුකරගත්තෝය. එබැවින් ඔව්හු
දෙවියන්වහන්සේගේ සිංහාසනය
ඉදිරියෙහි සිටිති; උන්වහන්සේගේ
මාළිගාවේ රෑ දවල් උන්වහන්සේට
සේවයකරති. සිංහාසනයෙහි වැඩහිඳින
තැනන්වහන්සේ තමන්ගේ මණ්ඩපය
16 ඔවුන්ට උඩින් විදහනසේක. ඔවුන්ට
තවත් බඩගිනිවන්නේවත් පිපාසා
වන්නේවත් නැත; සූර්ය රශ්මියවත් කිසි
රස්නයක්වත් ඔවුන්ට පහරදෙන්නේ නැත.
මක්නිසාද සිංහාසනය මැද සිටින 17
බැටළුපැටවාණෝ ඔවුන්ගේ එඬේරාවී,
ජීවන-දිය-උල්පත්වලට ඔවුන් ගෙන-
යනසේක. දෙවියන්වහන්සේද ඔවුන්ගේ
ඇස්වලින් සියලු කඳුළු පිසදමනසේකැයි
කීවේය.

## හොරණෑ සත පිඹීම

8 උන්වහන්සේ සත්වෙනි මුද්‍රාව
කැඩූ කල පැය බාගයක් පමණ
ස්වර්ගයෙහි නිශ්ශබ්දයක් විය. තවද 2
දෙවියන්වහන්සේ ඉදිරියෙහි සිටින
දේවදූතයන් සත්දෙනා දුටිමි; ඔවුන්ට
හොරණෑ සතක් දෙනලද්දේය.
තවත් දේවදූතයෙක් රන් දුම් භාජනයක් 3
රැගෙන ඇවිත් පූජාසනය ඉදිරිපිට
සිටියේය; සිංහාසනය ඉදිරියෙහි තිබුණු
රන් පූජාසනය පිට සියලු
ශුද්ධවන්තයන්ගේ යාච්ඤා සමග
ඔප්පුකරන පිණිස බොහෝ සුගන්ධ
ද්‍රව්‍ය ඔහුට දෙනලද්දේය. සුගන්ධ 4
ද්‍රව්‍යයේ දුම ශුද්ධවන්තයන්ගේ යාච්ඤා
සමග දේවදූතයාගේ අතින්
දෙවියන්වහන්සේ ඉදිරියට නැංගේය.
දේවදූතයාද දුම් භාජනය රැගෙන 5
පූජාසනයේ ගින්නෙන් ඒක පුරවා,
පොළොවට හෙළුවේය. එවිට ගර්ජනාද
ශබ්දද විදුලිද පොළෝකම්පාවක්ද විය.
හොරණෑ සත ඇතුව සිටිය දේවදූතයන් 6
සත්දෙනාද පිඹින පිණිස සූදානම්
වුණෝය.
පළමුවෙනියා පිම්බේය, එවිට ලෙයින් 7
මිශ්‍රවූ ගල්වර්ෂාවක්ද ගිනිද හටගෙන
පොළොව පිට හෙළනු ලැබුවේය.
පොළොවෙන් තුනෙන් පංගුවක් දලා
ගියේය, ගස්වලින් තුනෙන් පංගුවක්
දලාගියේය, සියලු අමු තණකොළද
දලාගියේය.
දෙවෙනි දේවදූතයාද පිම්බේය, එවිට 8
ගින්නෙන් ඇවිලෙන මහත් කන්දක් වැනිවූ
දෙයක් මුහුදේ හෙළනු ලැබුවේය. මුහුදෙන්
තුනෙන් පංගුවක් ලේ වුණේය; මුහුදේ 9

සත්ත්වයන්ගෙන්, එනම් පණ ඇති
සතුන්ගෙන් තුනෙන් පංගුවක් මළෝය;
නැව්වලින්ද තුනෙන් පංගුවක් විනාශ-
වුණේය.
10 තුන්වෙනි දේවදූතයාද පිම්බේය, එවිට
මහත් තාරකාවක් පන්දමක් මෙන්
ඇවිලෙමින් අහසෙන් වැටුණේය; ඒක
ගංගාවලින් තුනෙන් පංගුවක් පිටද දිය
11 උල්පත් පිටද වැටුණේය; තාරකාවේ
නාමය තික්තකමයයි කියනලදී.
වතුරුවලින් තුනෙන් පංගුවක් තික්ත විය;
ඒවා තික්ත වී තිබුණු බැවින් බොහෝ
මනුෂ්‍යයෝ ඒ වතුරුවලින් මළෝය.
12 සතරවෙනි දේවදූතයාද පිම්බේය, එවිට
ඉරෙන් තුනෙන් පංගුවක්ද හඳෙන් තුනෙන්
පංගුවක්ද තාරකාවලින් තුනෙන්
පංගුවක්ද පහර ලැබුවේය; මෙසේ වුණේ
ඒවායින් තුනෙන් පංගුවක් අඳුරුවන
පිණිසත් දවාලෙන් තුනෙන් පංගුවක්
නොබැබළෙන පිණිසත්ය, රාත්‍රියත්
එසේමය.
13 තවද එක් රාජාලියෙක් අහස මැද
පියාසරකරනවා දුටිමි. පිඹින්ට සිටින
දේවදූතයන් තුන්දෙනාගේ ඉතුරු
හොරණෑ ශබ්ද නිසා පොළොවේ
වසන්නන්ට දුක්වේ, දුක්වේ, දුක්වේයයි
මහත් ශබ්දයකින් කියනවාත් ඇසීමි.

9 පස්වෙනි දේවදූතයාද හොරණෑව
පිම්බේය, එවිට අහසෙන් තාරකාවක්
පොළොවට වැටී තිබුණා දුටිමි. ඔහුට
පාතාලයේ වළේ යතුර දෙනලද්දේය.
2 ඔහු පාතාලයේ වළ විවෘත කළේය;
එවිට මහත් උදුනක දුම මෙන් දුමක්
වළෙන් නැඟී, ඉරත් අහසත් වළේ දුමෙන්
3 අඳුරු විය. ඒ දුමින් පළඟැටියෝ
පොළොව පිටට නික්ම ආවෝය;
පොළොවේ ගෝනුස්සන්ට බලය
තිබෙන්නාක්මෙන් උන්ට බලය
4 දෙනලද්දේය. තවද දෙවියන්වහන්සේගේ
මුද්‍රය තමුන්ගේ නළල්වල නැති මිනිසුන්ට
මිස පොළොවේ තණකොළවලටවත්
කිසි අමු දෙයකටවත් කිසි ගහකටවත්
අනතුරු නොකරන හැටියට උන්ට
5 කියනලද්දේය. උන්ට අවසර දුන්නේ
මිනිසුන් මරන පිණිස නොව ඔවුන් පස්
මසක් වදකරනු ලබන පිණිසය. ඔවුන්ගේ
වේදනාව මනුෂ්‍යයෙකුට ගෝනුස්සෙක්
ඇන්න කල හටගන්න වේදනාව මෙන්
වූයේය. ඒ දවස්වලදී මනුෂ්‍යයෝ මරණය 6
සොයන්නෝය, නුමුත් කිසිසේත්
එය සම්බනොවන්නේය; මැරෙන්ට
ආශාවන්නෝය, එහෙත් මරණය ඔවුන්
කෙරෙන් පලායන්නේය. පළඟැටියන්ගේ 7
ආකාරය යුද්ධයට සැරසී සිටින
අශ්වයන්ට සමානය; උන්ගේ ඉස් පිට
රන් වැනිවූ ඔටුනු තිබුණාක්මෙන් විය,
උන්ගේ මුහුණු මනුෂ්‍යයන්ගේ මුහුණු
වාගේය. ස්ත්‍රීන්ගේ හිසකේ මෙන් කේශ 8
උන්ට තිබුණේය, උන්ගේ දත් සිංහයන්ගේ
දත් වාගේය. යකඩ ළයවැසුම් මෙන් 9
ළයවැසුම් උන්ට තිබුණේය; උන්ගේ
පියාපත්වල ශබ්දය යුද්ධයට දුවන
බොහෝ අශ්ව රථවල ශබ්දය වාගේය.
ගෝනුස්සන්ට මෙන් වල්ගාද කටුද උන්ට 10
තිබේ; මනුෂ්‍යයන්ට පස් මසක්
අනතුරුකරන්ට උන්ගේ බලය තිබුණේ
උන්ගේ වල්ගාවලය. පාතාලයේ දූතයා 11
උන් කෙරෙහි රජ විය. ඔහුගේ නම
හෙබ්‍රෙව් භාෂාවෙන් අබද්දෝන්ය, ග්‍රීක්
භාෂාවෙන් *අපොල්ලියොන් යන නම
ඔහුට ඇත්තේය.
පළමුවෙනි දුක පසුවිය. මින්පසු තව 12
දුක් දෙකක් පැමිණෙන්නේය.
සවෙනි දේවදූතයාද පිම්බේය, එවිට: 13
එප්‍රාත් යන මහ ගංගාව ළඟ බඳිනලද
දූතයන් සතරදෙනා මුදපන්නැයි
හොරණෑව ඇතුව සිටිය සවෙනි
දේවදූතයාට, කෙනෙක් කියන ශබ්දයක් 14
දෙවියන්වහන්සේ ඉදිරියෙහි තිබෙන රන්
පූජාසනයේ අං සතර කෙරෙන් මට
ඇසුණේය. එවිට මනුෂ්‍යයන්ගෙන් තුනෙන් 15
පංගුවක් මරන පිණිස නියමෙ පැයටත්
දවසටත් මාසයටත් අවුරුද්දටත්
සූදනම්කරනු ලැබ සිටි ඒ දූතයන්
සතරදෙනා මුදනු ලැබුවෝය. අසරු 16
සේනාවල ගණන විසිකෝටියක්ය.
ඔවුන්ගේ ගණන කියනවා ඇසීමි. මෙසේ 17
අශ්වයන්ද උන් පිට හුන් අයද

*විනාශකයා යන අර්ථයි.

දර්ශනයෙන් දුටිමි, ගිනිද ගිනිගල්ද
ගෙන්දගම්ද ආකාරවූ ළයවැසුම් ඔවුන්ට
තිබුණේය. අශ්වයන්ගේ හිස් සිංහයන්ගේ
හිස් වාගේය; උන්ගේ කටවලින් ගිනිද
18 දුම්ද ගෙන්දගම්ද නික්මුණේය. උන්ගේ
කටවලින් නික්මුණු ගිනිද දුම්ද
ගෙන්දගම්ද යන මේ පීඩා තුනෙන්
මනුෂ්‍යයන්ගෙන් තුනෙන් කොටසක් මරනු
19 ලැබුවෝය. මක්නිසාද ඒ අශ්වයන්ගේ
බලය තිබෙන්නේ උන්ගේ කටවලත්
වල්ගාවලත්ය. එසේය, උන්ගේ වල්ගා
සර්පයන්ට සමානව ඉස්වලින් යුක්තවිය;
20 ඒවායින් උන් අනතුරුකරති. මේ
පීඩාවලින් මරනු නොලැබ ඉතිරිවූ
මනුෂ්‍යයෝද යක්ෂයන්ටත් දකින්ට
අසන්ට හෝ ඇවිදින්ට නුපුළුවන් රන්
රිදී පිත්තල ගල් ලී යන රූපවලටත්
නමස්කාර නොකරන ලෙස තමුන්ගේ
අත්වල වැඩ ගැන පශ්චාත්තාපවුණේ
21 නැත. ඔවුන්ගේ මිනීමැරීම්ද මායම්ද
වේශ්‍යාකමද සොරකම්ද ගැන ඔව්හු
පසුතැවිලි නුණෝය.

## බලවත් දේවදූතයා සහ කුඩා පොත

10 තවත් බලවත් දේවදූතයෙක්
වලාකුළක් පැළඳගෙන, තමාගේ
හිසේ දේදුන්නක් ඇතුව, ස්වර්ගයෙන්
බසිනවා දුටිමි; ඔහුගේ මුහුණ ඉර
මෙන්ද ඔහුගේ කකුල් ගිනි කණු මෙන්ද
2 විය; ඔහුගේ අතේ දිගහරින ලද කුඩා
පොතක් තිබුණේය. ඔහු තමාගේ දකුණු
පය මුහුද පිටද වම් පය ගොඩබිම පිටද
3 තබා, සිංහයෙකු ගොරවන්නාක්මෙන්
4 මහත් ශබ්දයකින් මොරගැසුවේය. ඔහු
මොරගැසූ කල ගර්ජනා සතද තමුන්ගේ
හඬ පැවැත්වූවෝය. ඒ ගර්ජනා සත
ශබ්ද පැවැත්වූ කල මම ලියන්ට හැදුවෙමි.
එවිට: ගර්ජනා සත ශබ්ද පවත්වා කී
දේ නොලියන්න, එය මුද්‍රාකරපන්නැයි
ස්වර්ගයෙන් කියන හඬක් මට
5 ඇසුණේය. මුහුද පිටත් ගොඩබිමෙහිත්
සිටිනවා මා විසින් දුටුවාවූ දේවදූතයා
ස්වර්ගය දෙසට තමාගේ දකුණත
ඔසවා: සදාකාලේටම ජීවත්වන්නාවූ, 6
ස්වර්ගයත් එහි තිබෙන දේත් පොළොවත්
එහි තිබෙන දේත්, මුහුදත් එහි තිබෙන
දේත් මැවූවාවූ තැනන්වහන්සේ ගැන
දිවුරනුයේ, තවත් කල් නැත කියාද,
සත්වෙනි දේවදූතයාගේ ශබ්දකිරීමේ 7
දවස්වලදී, ඔහු පිඹින්ට යන කල,
දෙවියන්වහන්සේ තමන්ගේ මෙහෙකරුවූ
ප්‍රොපේතවරුන්ට ප්‍රකාශකළ යහපත්
ආරංචිය ලෙස උන්වහන්සේගේ රහස
සම්පූර්ණවී තිබේය කියාද කීවේය.
ස්වර්ගයෙන් මට ඇසුණු හඬ නැවතත් 8
මා සමග කථාකරමින්: නුඹ ගොස්,
මුහුද පිටත් ගොඩබිමෙහිත් සිටින
දේවදූතයාගේ අතේ දිග ඇරලා තිබෙන
පොත අරගනින්නැයි මට කීවේය. මමද 9
දේවදූතයා වෙතට ගොස්: කුඩා පොත
මට දෙන්ට කීවෙමි. ඔහුද: ඒක
අරගන කාපන්න, ඒක නුඹේ බඩ
තිත්තකරන්නේය, එහෙත් ඒක නුඹේ කටේ
මීපැණි ලෙස මිහිරිවන්නේයයි මට
කීවේය. එවිට මම දේවදූතයා අතින් 10
කුඩා පොත රැගෙන කෑවෙමි; ඒක මාගේ
කටේ මීපැණි ලෙස මිහිරිව තිබුණේය.
ඒක කෑ පසු මාගේ බඩ තිත්ත විය.
තවද: නුඹ බොහෝ සෙනඟද ජාතීන්ද 11
භාෂාවන්ද රජුන්ද කෙරෙහි නැවතත්
අනාගතවාක්‍ය කියන්ට ඕනෑයයි මට
කියනලද්දේය.

## සාක්ෂිකාරයන් දෙදෙනා

11 සැරයටියක් වාගේ බටදණ්ඩක්
මට දෙනලද්දේය. එවිට කෙනෙක්
මට කථාකරමින්: නැගිට දෙවියන්-
වහන්සේගේ මාළිගාවද පූජාසනයද එහි
නමස්කාරකරන්නන්ද මැනපන්න.
මාළිගාවෙන් පිටත තිබෙන මළුව 2
අන්‍යජාතීන්ට දී තිබෙන බැවින් ඒක
නොමැන අත්හැරපන්න. ඔව්හු ශුද්ධවූ
නුවර සතළිස් දෙමාසයක් පයින්
පාගාදමන්නෝය. තවද මාගේ 3
සාක්ෂිකාරයන් දෙදෙනාට (බලය)
දෙන්නෙමි, ඔව්හු එක්දහස් දෙසිය සැට
දවසක් ගෝණිරෙදි හැඳ, අනාගත-
වාක්‍ය කියන්නෝයයි කීවේය. මොව්හු 4

පොළොවේ ස්වාමීන්වහන්සේ ඉදිරිපිට
සිටින ඔලීව ගස් දෙකද පහන් රුක්
5 දෙකද වෙති. යමෙක් ඔවුන්ට
අනතුරුකරන්ට කැමතිවේ නම්, ඔවුන්ගේ
කටින් ගිනි නික්ම ඔවුන්ගේ සතුරන්
විනාශකරයි. යමෙක් ඔවුන්ට අනතුරු
කරන්ට කැමතිවන්නේ නම් ඔහු මෙලෙස
6 මරනු ලබන්ට ඕනෑය. තමුන්ගේ
අනාගතවාක්‍යයේ දවස්වලදී වැසි
නොවසින ලෙස අහස්තලය පියන්ට
මොවුන්ට බලය තිබේ. වතුර කෙරෙහි
කැමති විටක වතුර ලේ කරන්ටත් සියලු
පීඩාවලින් පොළොවට පහර දෙන්ටත්
7 ඔවුන්ට බලය තිබේ. ඔවුන් තමුන්ගේ
සාක්ෂිය නිමකළ විට පාතාලයෙන් නැගී
එන මෘගයා ඔවුන්ට විරුද්ධව
යුද්ධකොට, ඔවුන්ගෙන් ජයගෙන ඔවුන්
8 මරන්නේය. ඔවුන්ගේ මළකඳන් වනාහි
සොදෙම සහ මිසරයත්‍යයි ආත්මික
අර්ථයෙන් කියනු ලබන, ඔවුන්ගේ
ස්වාමීන්වහන්සේ කුරුසියෙහි ඇණ-
ගසනලද මහත් නුවර වීථියේ
9 තිබෙනවා ඇත. සෙනඟගෙන්ද ගෝත්‍රයන්-
ගෙන්ද භාෂාවන්ගෙන්ද ජාතීන්ගෙන්ද
මනුෂ්‍යයෝ ඔවුන්ගේ මළකඳන් දෙස
දවස් තුනහමාරක් බලා සිටිමින්,
මළකඳන් සොහොනක තබන්ට ඉඩ
10 නොදෙති. මේ ප්‍රොපේතවරුන් දෙදෙන
පොළොවේ වසන්නන්ට වධ කළ නිසා,
පොළොවේ වසන්නෝ ඔවුන් ගැන ප්‍රීතිව
සන්තෝෂවෙමින් එකිනෙකාට තෑගි
11 යවන්නෝය. ඒ දවස් තුනහමාරට පසු
ජීවන හුස්ම දෙවියන්වහන්සේගෙන් ඔවුන්
තුළට පැමිණ, ඔව්හු නැගිට සිටියෝය;
ඔවුන් දුටුවන් කෙරෙහි මහත් භය
12 පැමුණුණේය. මෙහි නැගී වරෙල්ලායයි
ස්වර්ගයෙන් තමුන්ට කියන මහත් හඬක්
ඔවුන්ට ඇසුණේය. ඔව්හුද වලාකුළෙන්
ස්වර්ගයට නැගී ගියෝය; ඔවුන්ගේ
13 සතුරෝද ඔවුන් දුටුවෝය. එම පැයේදීම
මහත් භූමිකම්පාවක් වී, නුවරින් දසයෙන්
කොටසක් වැටුණේය; භූමිකම්පාවෙන්
මනුෂ්‍යයන් සත්දහසක් මැරුණෝය.
ඉතිරි අය භයපත්ව, ස්වර්ගයේ දෙවියන්-
වහන්සේට ගෞරව දුන්නෝය.
දෙවෙනි දුක පසුවිය. බලව, තුන්වෙනි 14
දුක ඉක්මනින් එන්නේය.

## සත්වෙනි හොරණෑව පිඹීම

සත්වෙනි දේවදූතයාද පිම්බේය; එවිට: 15
ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමීන්-
වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද
වූයේය. උන්වහන්සේ සදාකාලේටම
රජකම්කරනසේකැයි කියන මහත් ශබ්ද
ස්වර්ගයෙහි විය. දෙවියන්වහන්සේ 16
ඉදිරිපිට තමුන්ගේ සිංහාසනවල වාඩිව
ඉන්න වැඩිමහල්ලන් විසිහතරදෙනා
මුහුණින් වැටී, දෙවියන්වහන්සේට
නමස්කාරකොට, සිටින්නාවූ, සිටියාවූ, 17
සර්වපරාක්‍රමවූ, ස්වාමිවූ දෙවියන්වහන්ස,
ඔබගේ මහත් බලය රැගෙන ඔබ
රජකම්කළ බැවින් අපි ඔබට ස්තුති-
කරමුව. ජාතීහු උදහස්වූවෝය, ඔබගේ 18
උදහසද මළවුන් විනිශ්චය කරන
කාලයද ඔබ ස්වකීය මෙහෙකරුවූ
ප්‍රොපේතවරුන්ටත් ශුද්ධවන්තයන්ටත්
ඔබගේ නාමයට භයවන ලොකු කුඩා
තැනැත්තන්ටත් විපාක දෙන්නාවූ, පොළොව
විනාශකරන්නවුන් විනාශකරන්නාවූ
කාලයද පැමුණුණේයයි කීවෝය.
එවිට ස්වර්ගයෙහි තිබෙන දෙවියන්- 19
වහන්සේගේ මාළිගාව අරිනලද්දේය.
උන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටියද
උන්වහන්සේගේ මාළිගාවෙහි පෙනුණේය;
එවිට විදුලිද ශබ්දද ගර්ජනාද භූමි-
කම්පාවක්ද මහත් ගල්වර්ෂාවක්ද විය.

## ස්ත්‍රියෙක් හා මහත් සර්පයෙක්

12
තවද මහත් පුදුමයක් අහසෙහි
දක්නාලද්දේය. එනම් සූර්යයා
පැළඳගෙන, පාදයට චන්ද්‍රයාද හිස පිට
තාරකා දොළොසකින් යුක්ත ඔටුන්නක්ද
ඇති ස්ත්‍රියෙක්ය; ඈ ගර්භිණීව සිටියාය. 2
ඈ විළිරුජා විඳිමින් ප්‍රසව වේදනාවෙන්
යුක්තව මොරගසන්නීය. අහසෙහි තවත් 3
පුදුමයක්ද දක්නාලද්දේය; එනම් හිස්
සතක්ද අං දසයක්ද තමාගේ හිස් පිට
මකුට සතක්ද ඇති මහත් රතු සර්පයෙක්

4 විය. ඌ උගේ වල්ගයෙන් අහසේ
තාරකාවන්ගෙන් තුනෙන් කොටසක් ඇද
ඒවා පොළොවට හෙළුවේය. සර්පයාද
වදන්ට ආසන්නව සිටි ස්ත්‍රිය වැදූ
කෙණෙහිම, ඇගේ දරුවා කාදමන
5 පිණිස ඈ ඉදිරිපිට සිටියේය. ඈ සියලු
ජාතීන් යදණ්ඩකින් ආණ්ඩුකරන
පුත්‍රයෙකු, පිරිමි දරුවෙකු, වැදුවාය. ඇගේ
දරුවා දෙවියන්වහන්සේද උන්වහන්සේගේ
සිංහාසනයද වෙතට ඇදගනු ලැබුවේය.
6 ස්ත්‍රීද කාන්තාරයට පලාගියාය, එක්දහස්
දෙසිය සැට දවසක් ඈ පෝෂණය කරන
පිණිස දෙවියන්වහන්සේ විසින්
පිළියෙළකරනලද ස්ථානයක් ඈට එහි
තිබුණේය.

## යුද්ධයක් හටගැනීම

7 තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. ඒ
වනාහි මීකායෙල් සහ ඔහුගේ දූතයන්
මහ සර්පයාට විරුද්ධව යුද්ධයට යාමය.
මහ සර්පයාද තමාගේ දූතයෝද
8 සටන්කොට, ජය නොලැබුවෝය, ඔවුන්ට
ස්වර්ගයෙහි ස්ථානයක් නවත් නොවීය.
9 මුළු ලෝකයා රවටන්නා වන
යක්ෂයාය, සාතන්යයි කියනලද මහා
සර්පයා නමැති ඒ පුරාණ සර්පයා
පහතට හෙළනු ලැබුවේය; ඔහු
පොළොවට හෙළනු ලැබුවේය, ඔහුගේ
දූතයෝද ඔහු සමග හෙළනු ලැබුවෝය.
10 එවිට: අපගේ දෙවියන්වහන්සේගේ
ගැළවීමද බලයද රාජ්‍යයද තමන්
ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩුබලයද දැන්
පැමුණුණේය. මක්නිසාද අපගේ
දෙවියන්වහන්සේ ඉදිරිපිට රෑ දවල් අපේ
සහෝදරයන්ට වරදතබන්නාවූ, ඔවුන්ගේ
වරදතබන්නා පහත හෙළනු ලැබුවේය.
11 ඔව්හු බැටළුපැටවාණන්ගේ ලේ නිසාද
තමුන්ගේ සාක්ෂියේ වචනය නිසාද
ඔහුගෙන් ජයගත්තෝය; ඔව්හු මරණය
විඳින තරමට පවා තමුන්ගේ ජීවිතයට
12 ප්‍රේම නොකර සිටියෝය. එබැවින්
ස්වර්ගයෙනි, එහි වසන්නෙනි, ප්‍රීති-
වෙයල්ලා. ගොඩටත් මුහුදටත් දුක්වේ!
මක්නිසාද යක්ෂයා තමාට ඇත්තේ
ස්වල්ප කාලයක් බව දන්න බැවින්,
මහත් උදහසින් යුක්තව තුඹලා වෙතට
බැස ගියේයයි ස්වර්ගයෙහි කියන මහත්
හඬක් මට ඇසුණේය.
තමා පොළොවට හෙළනු ලැබූ බව 13
මහ සර්පයා දුටු කල, හෙතෙම පිරිමි
දරුවා වැදූ ස්ත්‍රීට පීඩාකෙළේය. සර්පයා 14
ඉදිරියෙන් වනයෙහි ඇගේ ස්ථානයට
ඉගිලී යන පිණිස මහත් රාජාලියෙකුගේ
පියාපත් දෙක ඈට දෙනලද්දේය; එහි
කාලයටත් කාලවලටත් කාල
භාගයකටත් ඈ පෝෂණයකරනු
ලබන්නීය. සර්පයාද ඒ ස්ත්‍රිය 15
සැඩපාරෙන් ගහගනයන්ට සලස්වන
පිණිස ඈ පස්සෙන් ගංගාවක් ලෙස
වතුර උගේ කටින් නික්මවා ඇරියේය.
නුමුත් පොළොව ස්ත්‍රීට පිහිටව, කට 16
හැර, මහ සර්පයා තමාගේ කටින්
නික්මවූ ගංගාව ගිල්ලාය. මහ සර්පයා
ස්ත්‍රී කෙරෙහි උදහස්වී, දෙවියන්-
වහන්සේගේ ආඥා පවත්වන්නාවූ,
යේසුස්වහන්සේගේ සාක්ෂිය දරන්නාවූ
ඇගේ වංශයේ ඉතිරි අයට විරුද්ධව
යුද්ධකරන්ට ගියේය.
ඌ මුහුදු වෙරළේ සිටියේය. 13

## මුහුදෙන් පැනනැගුණු මෘගයා

අං දසයක්ද ඉස් සතක්ද ඇත්තාවූ
මෘගයෙක් මුහුදෙන් මතුවෙනවා දුටිමි,
උගේ අං පිට මකුට දසයක්ද උගේ
ඉස්වල අපහාස නාමවල්ද තිබුණේය.
මා දුටු මෘගයා අඳුන්දිවියෙකුට 2
සමානය, උගේ පාද වළසෙකුගේ පාද
වැනිය, උගේ කට සිංහයෙකුගේ කට
වැනිය. මහ සර්පයා තමාගේ
පරාක්‍රමයත් තමාගේ සිංහාසනයත් මහත්
බලයත් ඌට දුන්නේය. මැරෙන තරමට 3
උගේ හිස්වලින් එකකට තුවාලවී
තිබෙන්නාක් මෙන් පෙනුණේය; නුමුත්
උගේ මරණීය තුවාලය සුවවිය. මුළු
ලෝකයා මෘගයා පස්සේ පුදුමව ගියෝය;
මහ සර්පයා මෘගයාට බලය දුන් නිසා 4
ඔව්හු මහ සර්පයාට නමස්කාරකළෝය;
ඔව්හු මෘගයාටත් නමස්කාරකොට:

මෘගයාට සමාන කවුද? ඌ හා
සමග යුද්ධ කරන්ට කවරෙකුට හැකිදැයි
5 කීවෝය. අහංකාර දේවල්ද දේව
අපහාසද කථාකරන මුඛයක් ඌට
දෙනලද්දේය. මාස සතළිස් දෙකක්
6 පවතින්ට ඌට බලය දෙනලද්දේය. එකල
ඌ දෙවියන්වහන්සේට විරුද්ධව
අපහාසකරන පිණිසද උන්වහන්සේගේ
නාමයට සහ උන්වහන්සේගේ
මණ්ඩපයටත්, එනම් ස්වර්ගයෙහි
වාසයකරන්නන්ටත් අපහාසකරන
7 පිණිසද මුඛය ඇරියේය. තවද
ශුද්ධවන්තයන්ට විරුද්ධව යුද්ධ
කරන්ටද ඔවුන්ගෙන් ජයගන්ටද ඌට
ඉඩ දෙනලද්දේය. සියලු ගෝත්‍රයන්ද
සෙනඟද භාෂාවන්ද ජාතීන්ද කෙරෙහි
8 ඌට බලය දෙනලද්දේය. ලෝකය
පටන්ගැන්මේ සිට මරනලද බැටළු
පැටවාණන්ගේ ජීවන-පොතෙහි නම්
ලියවී නොතිබුණු පොළොවෙහි වසන
සියල්ලෝ ඌට නමස්කාරකරන්නෝය.
9 යමෙකුට කන් ඇත්තේද ඔහු අසාවා.
10 යමෙක් වහල්කමට නියම නම්, ඔහු
වහල්කමට යන්නේය. යමෙක් කඩුවෙන්
මරන්නේ නම්, ඔහු කඩුවෙන් මරනු
ලබන්ට ඕනෑය. මෙහි ශුද්ධවන්තයන්ගේ
ඉවසීමත් ඇදහිල්ලත් ඇත්තේය.

### පොළොවෙන් මතුවුණු මෘගයා

11 තවත් මෘගයෙක් පොළොවෙන් නැඟී
එනවා දුටිමි; බැටළුපැටවෙකුට මෙන්
අං දෙකක් ඌට තිබුණේය, ඌ මහ
12 සර්පයෙකු මෙන් කථාකෙළේය. ඌ
පළමුවෙනි මෘගයාගේ මුළු බලය ඌ
ඉදිරියෙහි පවත්වමින්, තමාගේ මරණීයවූ
තුවාලයෙන් සුවවුණු පළමුවෙනි මෘගයාට
නමස්කාරකරන්ට පොළොවටද එහි
13 වැසියන්ටද සලස්වන්නේය. ඌ මනුෂ්‍යයන්
ඉදිරියෙහි අහසින් පොළොවට ගිනි
බස්වන තරමට මහත් හාස්කම්
14 කරන්නේය. කඩු පහර ලැබත් ජීවත්වූ
මෘගයාට රූපයක් සාදන්ට ඕනෑයයි
පොළොවේ වැසියන්ට කියමින්, මෘගයා
ඉදිරියෙහි කරන්ට ලැබුණු හාස්කම්
කරණකොටගෙන ඌ පොළොවේ
වැසියන් මුළාකරන්නේය. මෘගයාගේ 15
රූපය කථාකර, මෘගයාගේ රූපයට
නමස්කාර නොකරන සියල්ලන් මරනු
ලබන්ට සලස්වන පිණිස පවා මෘගයාගේ
රූපයට පණ දෙන්ට ඌට බලය
ලැබුණේය. තවද ලොකු කුඩා, 16
පොහොසත් දිළිඳු, දස නිර්දස යන
සියල්ලන්ට තමුන්ගේ දකුණතේ හෝ
නළලේ හෝ සලකුණක් ලබන්ටත්; ඒ 17
සලකුණ වන මෘගයාගේ නාමය හෝ
උගේ නාමයේ ගණන හෝ ඇත්තාට
මිස අන් කිසිවෙකුට මිලේටගන්ටවත්
විකුණන්ටවත් නුපුළුවන්වන හැටියටත්
සලස්වන්නේය. මෙහි ප්‍රඥාව ඇත්තේය. 18
නුවණ ඇත්තා මෘගයාගේ ගණන
ගණන්කරාවා; මක්නිසාද ඒක මනුෂ්‍ය-
යෙකුගේ ගණනක්ය. උගේ ගණනද හසිය
හැට හයක්ය.

### සියොන් කන්ද පිට සිටින බැටළුපැටියාණෝ

14 තවද බැටළුපැටවාණන්ද උන්-
වහන්සේ සමග එක්ලක්ෂ සතළිස්
සාරදහස් දෙනෙක්ද සියොන් කන්දේ
සිටිනවා දුටිමි, උන්වහන්සේගේ නාමයද
උන්වහන්සේගේ පියාණන්ගේ නාමයද
ඔවුන්ගේ නළල්වල ලියා තිබුණේය.
බොහෝ ජල ඝෝෂාව මෙන්ද මහත් 2
ගර්ජනාවක ශබ්දය මෙන්ද ස්වර්ගයෙන්
ශබ්දයක් මට ඇසුණේය. මට ඇසුණු
ශබ්දය වනාහි තමුන්ගේ වීණාවලින්
ගායනා කරන ගායනාකරන්නන්ගේ
ශබ්දය මෙන්ය. ඔව්හු සිංහාසනය 3
ඉදිරියෙහිද ජීවමාන සත්ත්වයන්
සතරදෙනා සහ වැඩිමහල්ලන්
ඉදිරියෙහිද අලුත් ගීතිකාවක් ගායනා-
කළෝය. ඒ ගීතිකාව එක්ලක්ෂ
සතළිස් සාර දහසට, එනම් පොළොවෙන්
මිලේටගනු ලැබුවාවූ අයින්ට මිස
අන් කිසිවෙකුට ඉගෙනගන්ට නොහැකි-
විය. ස්ත්‍රීන්ගෙන් කිලුටු නුවූවෝ 4
මොව්හුය; මක්නිසාද මොව්හු බ්‍රහ්ම-
චාරීහුය. බැටළුපැටවාණන් යන යන

තැනට උන්වහන්සේ අනුවයන්නෝ
මොව්හුය. මොව්හු දෙවියන්වහන්සේටත්
බැටළුපැටවාණන්ටත් නාඹුල් ඵල
වන පිණිස මනුෂ්‍යයන් අතරෙන්
5 මිලේටගන්නාලද්දෝය. ඔවුන්ගේ මුඛයේ
බොරුවක් සම්බනොවීය. ඔව්හු
නොකැලැල්ව සිටිති.

## අහසේ දේවදූතයන් හතරදෙනෙකුගේ දර්ශනය

6 පොළොවේ වසන්නන්ටත් සියලු
ජාතීන්ටත් ගෝත්‍රයන්ටත් භාෂාවන්ටත්
සෙනඟටත් ප්‍රකාශකරන පිණිස, සදාකාල
ශුභාරංචියක් ඇතුව සිටින තවත්
දේවදූතයෙක් අහස මැද පියාසරකරනවා
7 දුටිමි; ඔහු මහත් ශබ්දයකින් කථාකරමින්:
දෙවියන්වහන්සේට භයවී, උන්වහන්සේට
ගෞරව දීපල්ලා; මක්නිසාද උන්වහන්සේගේ
විනිශ්චයේ පැය පැමුණුණේය. අහසත්
පොළොවත් මුහුදත් ජල උල්පතුත් මැවූ
තැනන්වහන්සේට නමස්කාරකරපල්ලායයි
කීය.
8 තව දෙවෙනි දේවදූතයෙක්ද (ඔහු)
පස්සේ ගොස්: තමාගේ වේශ්‍යාකමේ
කෝපය නමැති මුද්‍රිකපානය සියලු
ජාතීන්ට පෙවූවාවූ මහත් බබිලෝනිය
වැටුණේය, වැටුණේයයි කීය.
9 තව තුන්වෙනි දේවදූතයෙක්ද ඔවුන්ට
පස්සේ ගොස්: යමෙක් මෘගයාටත් උගේ
රූපයටත් නමස්කාරකර, ඔහුගේ
නළලේවත් අතේවත් ලකුණක් ලබන්නේද,
10 ඔහුත් දෙවියන්වහන්සේගේ කෝපය
නැමති කුසලානට අමිශ්‍රව වත්කරනලද
උන්වහන්සේගේ උදහස නැමති මුද්‍රික-
පානය බොන්නේය; ඔහු ශුද්ධවූ දේව-
දූතයන් ඉදිරියෙහිද බැටළුපැටවාණන්
ඉදිරියෙහිද ගින්නෙනුත් ගෙන්දගම්වලිනුත්
11 වධකරනු ලබන්නේය. ඔවුන්ගේ වේදනාව
නැමති ධූමය සදාකාලේටම නගින්නේය;
මෘගයාටත් උගේ රූපයටත් නමස්කාර-
කරන්නෝද ඔහුගේ නාමයේ ලකුණ
ලබන්නාද දිවා රෑ දෙක්හි නිවාඩු
නොලබන්නෝයයි මහත් ශබ්දයකින්
12 කීය. මෙහි දෙවියන්වහන්සේගේ ආඥාද
යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලද
රක්ෂාකරන්නාවූ ශුද්ධවන්තයන්ගේ
ඉවසීම ඇත්තේය.

තවද: මෙතැන් පටන් ස්වාමීන්වහන්සේ 13
තුළ නසින්නාවූ මළවුන් වාසනාවන්තයෝය
කියා ලියාපන්නැයි ස්වර්ගයෙන් කියන
හඬක් මට ඇසුණේය. එසේය, ඔව්හු
තමුන්ගේ වෙහෙසීම්වලින් නිවාඩු ලබති;
ඔවුන්ගේ ක්‍රියාද ඔවුන් කැටුව යන්නේයයි
ආත්මයාණන්වහන්සේ කියනසේක.

## පොළොවේ ගොයම් කැපීම හා මිදිවලු එකතුකිරීම

තවද සුදු වලාකුළකුත්, ඒ වලාකුළ 14
පිට, තමාගේ හිසේ රන් ඔටුන්නක් සහ
තමාගේ අතේ මුවහත් දෑකැත්තක්ද
ඇත්තාවූ මනුෂ්‍ය පුත්‍රයෙක් වැනිවූ
කෙනෙක් වැඩහුන්නවාත් දුටිමි. වෙන 15
දේවදූතයෙක්ද දේවමාළිගාවෙන් නික්ම
ඇවිත්, වලාකුළ පිට වැඩහුන්
තැනන්වහන්සේට මහත් ශබ්දයකින්
මොරගසා: ඔබවහන්සේගේ දෑකැත්ත
යොමා කැපූවමැනව. මක්නිසාද
පොළොවේ ගොයම් පැසී තිබෙන බැවින්
කපන කාලය පැමිණ තිබේයයි කීය.
එවිට වලාකුළ පිට වැඩහුන් 16
තැනන්වහන්සේ දෑකැත්ත පොළොවට
හෙළූසේක; පොළොවේ ගොයම්ද කපනු
ලැබුවේය.
තවත් දේවදූතයෙක් ස්වර්ගයෙහි තිබෙන 17
දේවමාළිගාවෙන් පිටත්ව ආවේය, ඔහුටත්
මුවහත් දෑකැත්තක් තිබුණේය. ගින්න 18
කෙරෙහි බලය ඇත්තාවූ තවත්
දේවදූතයෙක් පූජාසනයෙන් පිටත්ව
ඇවිත්, මුවහත් දෑකැත්ත ඇතුව සිටිය
තැනැත්තාට මහත් හඬකින් මොරගසා:
නුඹේ මුවහත් දෑකැත්ත යොමුකොට
පොළොවේ මිදිවැලේ මිදිපොකුරු කපා
රැස්කරපන්න; මක්නිසාද මිදිපල හොඳට
ඉදී තිබේයයි කීය. එවිට දේවදූතයා 19
තමාගේ දෑකැත්ත පොළොවට හෙළා,
පොළොවේ මිදිපල රැස්කොට, දෙවියන්-
වහන්සේගේ උදහස නමැති මහත් මිදි-
පැසට හෙළුවේය. නුවරින් පිටත මිදි- 20
පැස පාගනලද්දේය, එවිට පර්ලොං එක්-
දහස් හසියයක් පමණ දුර අශ්වයන්ගේ
කටකලියා දක්වා මිදිපැසෙන් ලේ
පිටවුණේය.

## උදහසේ භාජන සත

15 ස්වර්ගයෙහි මහත්වූ විස්මපත්වූ
තවත් පුදුමයක් දුටිමි. එනම්
දේවදූතයන් සත්දෙනෙක් පීඩා සතක්
රැගෙන සිටියෝය. එයින් දෙවියන්-
වහන්සේගේ උදහස කෙළවරවන බැවින්
ඒවා අන්තිම පීඩාය.
2 ගින්නෙන් මිශ්‍රවූ වීදුරු සාගරයක් වැනි
දෙයක් සහ මෘගයාගෙනුත් උගේ
රූපයෙනුත් උගේ නමේ ගණනෙනුත්
ජයගෙන එන්නන් දෙවියන්වහන්සේගේ
වීණා රැගෙන වීදුරු සාගරය ළඟ
3 සිටිනවාත් මම දුටිමි. ඔව්හු දෙවියන්-
වහන්සේගේ මෙහෙකරුවාවූ මෝසෙස්ගේ
ගීතිකාවද බැටළුපැටවාණන්ගේ
ගීතිකාවද ගායනාකරමින්: සර්වපරාක්‍රමවූ
ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ
ක්‍රියා මහත්ය, විස්මපත්ය; ජාතීන්ගේ
රජ්ජුරුවෙනි, ඔබගේ මාර්ග ධර්මිෂ්ඨය,
4 සැබෑය. ස්වාමිනි, ඔබගේ නාමයට භය
නොවන්නෙත් ගෞරව නොකරන්නෙත්
කවුද? මක්නිසාද ඔබ පමණක් ශුද්ධය;
එබැවින් සියලු ජාතීන් පැමිණ ඔබ
ඉදිරියෙහි නමස්කාරකරනවා ඇත;
මක්නිසාද ඔබගේ ධර්මිෂ්ඨ ක්‍රියා
ප්‍රකාශකරනලද්දේයයි කීවෝය.
5 ඉන්පසු ස්වර්ගයෙහි තිබෙන සාක්ෂි
මණ්ඩපයේ දේවමාළිගාව ඇරී තිබෙන
6 බව දුටිමි. එවිට පීඩා සත ඇතුව සිටියාවූ
දේවදූතයන් සත්දෙනා පවිත්‍රවූ දීප්තිමත්වූ
වස්ත්‍ර පැළඳ, රන් පටිවලින් තමුන්ගේ
ළය බැඳගෙන, දේවමාළිගාවෙන් පිටත්ව
7 ආවෝය. ජීවමාන සත්ත්වයන් සතර-
දෙනාගෙන් එක්කෙනෙක් සදාකාලේටම
ජීවත්වන්නාවූ දෙවියන්වහන්සේගේ
උදහසින් පූර්ණවූ රන් පාත්‍රා සතක්
දේවදූතයන් සත්දෙනාට දුන්නේය.
8 දෙවියන්වහන්සේගේ තේජස සහ
බලයෙන් නිකුත්වූ ධූමයෙන්
දේවමාළිගාව පිරුණේය; දේවදූතයන්
සත්දෙනාගේ පීඩා සත කෙළවරවන
තුරු දේවමාළිගාවට ඇතුල්වෙන්ට
කිසිවෙකුට නුපුළුවන්විය.

## ඒ ඒ උදහසේ භාජනය වැගිරවීම සහ එහි ඵල

16 තවද: නුඹලා ගොස් දෙවියන්-
වහන්සේගේ උදහස නමැති පාත්‍රා
සත පොළොවේ වගුරුවාපල්ලායයි
දේවදූතයන් සත්දෙනාට කියන මහත්
හඬක් දේවමාළිගාවෙන් මට ඇසුණේය.
එකල පළමුවෙනියා ගොස් තමාගේ 2
පාත්‍රය භූමියෙහි වැගිරෙවුවේය; එවිට
මෘගයාගේ ලකුණ ඇත්තන්ද ඔහුගේ
රූපයට නමස්කාරකරන්නන්ද කෙරෙහි
වස අරිෂ්ට වණ හටගත්තේය.
දෙවෙනියා තමාගේ පාත්‍රය මුහුදේ 3
වැගිරෙවුවේය; එවිට මුහුද මළ
මිනිසෙකුගේ ලේ මෙන් ලේ වුණේය;
මුහුදේ පණ ඇති සියලු සත්ත්වයෝ
මැරුණෝය.
තුන්වෙනියා තමාගේ පාත්‍රය ගංගාවලද 4
දිය උල්පත්වලද වැගිරෙවුවේය; එවිට
ඒවා ලේ වුණේය. ජලය කෙරෙහි බලය 5
ඇති දේවදූතයා කථාකොට: සිටින්නාවූ,
සිටියාවූ, ශුද්ධවූ තැනන්වහන්ස, ඔබ
මෙසේ විනිශ්චයකළ බැවින් ඔබ
ධර්මිෂ්ඨය. ඔවුන් ශුද්ධවන්තයන්ගේද 6
අනාගතවක්තෘවරුන්ගේද ලේ වැගුරෙවූ
බැවින් ඔබ ඔවුන්ට බොන්ට ලේ
දුන්සේක. ඒක ඔවුන්ට සුදුසුයයි කියනවා
මට ඇසුණේය. එසේය, සර්වපරාක්‍රමවූ 7
ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ
විනිශ්චයෝ සැබෑය, ධර්මිෂ්ඨයයි
කියනවා පූජාසනයෙන් මට ඇසුණේය.
සතරවෙනියා තමාගේ පාත්‍රය සූර්යයා 8
පිට වැගිරෙවුවේය; එවිට ගින්නෙන්
මනුෂ්‍යයන් දවන්ට ඊට බලය දෙන
ලද්දේය. මහත් උෂ්ණයකින් මනුෂ්‍යයෝ 9
දවනු ලැබ, මේ පීඩා කෙරෙහි බලය
ඇති දෙවියන්වහන්සේගේ නාමයට
අපහාසකළෝය; උන්වහන්සේට ගෞරවය
දෙන ලෙස ඔව්හු පශ්චාත්තාප-
නුවුණෝය.
පස්වෙනියා තමාගේ පාත්‍රය මෘගයාගේ 10

සිංහාසනය පිට වැගිරෙවුවේය; ඔහුගේ
රාජ්‍යය අඳුරු විය; ඔව්හු වේදනා නිසා
11 තමුන්ගේ දිව් විකාගත්තෝය, ඔව්හු
තමුන්ගේ වේදනාද වණද නිසා
ස්වර්ගයේ දෙවියන්වහන්සේට අපහාස-
කළෝය; තමුන්ගේ ක්‍රියා ගැන
පශ්චාත්තාප නූණෝය.
12 සවෙනියා තමාගේ පාත්‍රය මහ ගඟෙහි,
එනම් එප්‍රාත් ගඟෙහි වැගිරෙවුවේය; එවිට
නැගෙනහිර දිසාවෙන් එන රජුන්ගේ
මාර්ගය සාදනු ලබන පිණිස එහි වතුර
13 සිඳීගියේය. තවද සර්පයාගේ කටිනුත්
මෘගයාගේ කටිනුත් බොරු අනාගත-
වක්තෘගේ කටිනුත් මැඩියන් වැනි වූ
අශුද්ධාත්මයන් තුන් දෙනෙක් නික්ම
14 එනවා දුටිමි. මක්නිසාද ඔව්හු
සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේගේ
මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ
රජුන් රැස්කරන පිණිස, ඔවුන් ළඟට
යන්නාවූ, හාස්කම් කරන්නාවූ
යක්ෂයින්ගේ ආත්මයෝය. (බලව, මම
15 සොරෙකු මෙන් එමි. නග්නව ඇවිද
තමාගේ ලජ්ජාව මනුෂ්‍යයන්ට
නොපෙනෙන පිණිස අවදිව සිට
තමාගේ වස්ත්‍ර ආරක්ෂාකරගන්නා
16 ආශීර්වාදලදදෙක්ය.) ඔව්හු හෙබ්‍රෙව්
භාෂාවෙන් හර්-මගෙදෙන් කියන
ස්ථානයට ඔවුන් රැස්කළෝය.
17 සත්වෙනියාද තමාගේ පාත්‍රය
ආකාශයේ වැගිරෙවුවේය; එවිට:
නිමවුණේයයි කියන මහත් හඬක්
දේවමාළිගාව තුළින් සිංහාසනයෙන්
18 නික්මුණේය. විදුලිද ශබ්දද ගර්ජනාද
විය; මහත් භූමිකම්පාවක්ද විය,
පොළොවේ මනුෂ්‍යයන් සිටි ද පටන්
එපමණ බලවත්වූ මහත්වූ භූමිකම්පාවක්
19 වුණේ නැත. ඒ මහත් නුවරද තුන්
කොටසකට බෙදනලද්දේය, ජාතීන්ගේ
නුවරවල් වැටුණේය. දෙවියන්වහන්සේගේ
උදහසේ සැරකම නැමති මුද්‍රිකපාන
කුසලාන මහත් බබිලෝනියට දෙන
පිණිස ඈ දෙවියන්වහන්සේ ඉදිරියෙහි
20 සිහිකරනු ලැබුවාය. සියලු ද්වීපයෝ
පලාගියෝය, කඳුද නොපෙනී ගියේය.
අහසෙන් මහත් ගල්වර්ෂාවක්ද 21
මනුෂ්‍යයන් පිටට වැස්සේය, එහි එක
එක ගල තලෙන්තයක් පමණ බරය.
මනුෂ්‍යයෝ ගල් වර්ෂාවේ පීඩාව නිසා
දෙවියන්වහන්සේට අපහාසකළෝය;
මක්නිසාද එහි පීඩාව ඉතා මහත්විය.

## වේශ්‍යාවවූ බබිලෝනිය සහ මෘගයා

17 පාත්‍රා සත දරූ දේවදූතයන්
සත්දෙනාගෙන් එක්කෙනෙක් ඇවිත්
මා සමග කථාකොට: මෙහි වරෙන්න,
බොහෝ ජල පිට හිඳින මහත්
වේශ්‍යාවගේ විනිශ්චය නුඹට
පෙන්වන්නෙමි; පොළොවේ රජවරු ඈ 2
සමග වේශ්‍යාකම්කළෝය, පොළොවේ
වැසියෝද ඇගේ වේශ්‍යාකම් නැමති
මුද්‍රිකපානයෙන් මත්වුණෝයයි කීවෝය.
ඔහු ආත්මයාණන්ගේ ආනුභාවයෙන් 3
කාන්තාරයකට මා ගෙනගියේය. එවිට
දේව අපහාස නාමවලින් පිරී සිටියාවූ
ඉස් සතක් හා අං දසයක් ඇත්තාවූ
රතුපාට මෘගයෙකු පිට ස්ත්‍රියෙක් වාඩිවී
ඉන්නවා දුටිමි. ඒ ස්ත්‍රී රත්නිල් සහ රතු 4
පාට වස්ත්‍ර පැළඳ, රනින්ද අනර්ඝ ගල්
සහ මුතුවලින්ද සැරසී සිටියාය,
පිළිකුල්කම්වලින්ද ඇගේ වේශ්‍යාකමේ
අපවිත්‍රකම්වලින්ද පූර්ණවූ රන්
කුසලානක් ඇගේ අතේ තිබුණේය,
ඇගේ නළල පිට: **රහසක්ය, මහා** 5
**බබිලෝනියය, පොළොවේ වේශ්‍යාවන්ගේද**
**පිළිකුල්කම්වලද මවුය** යන නාමයක්
ලියා තිබුණේය. ඒ ස්ත්‍රී ශුද්ධවන්තයන්ගේද 6
යේසුස්වහන්සේගේ වේදසාක්ෂිකයන්ගේද
ලෙයින් මත්වී සිටිනවා දුටිමි. මම ඈ
දුටු විට මහත් පුදුමයකින් පුදුමවුණෙමි.
දේවදූතයා මට කථාකොට: නුඹ 7
පුදුමවුණේ මක්නිසාද? ස්ත්‍රියගේද ඇව
උසුලාගෙන යන ඉස් සතකුත් අං
දසයකුත් ඇති මෘගයාගේද රහස නුඹට
කියමියි මට කීය. නුඹ දුටු මෘගයා 8
සිටියේය, දැන් නැත; ඌ පාතාලයෙන්
නැගී එන්ටද විනාශයට යන්ටද
සිටින්නේය. ලෝකයේ පටන්ගැන්මේ සිට

ජීවන-පොතෙහි නම් නොලියවුණු
පොළොවෙහි වාසය කරන්නෝ මෘගයා
සිටි හැටිත් දැන් නැති හැටිත් මතු එන
9 හැටිත් දැක පුදුමවන්නෝය. ප්‍රඥව ඇති
සිත මෙහිය. ඉස් සත නම් ස්ත්‍රිය වාඩිව
10 හිඳින කඳු සතය. ඒ (හිස්) රජවරු
සත්දෙනෙක්ය; පස්දෙනෙක් වැටී ගියෝය,
එක්කෙනෙක් දැන් සිටින්නේය, අනික්
තැනැත්තා තවම ආවේ නැත; ඔහු ආවාම
ස්වල්ප කාලයක් පවතින්ට ඕනෑය.
11 සිටියාවූ දැන් නැත්තාවූ මෘගයාම
අටවෙනියෙක්ව සත්දෙනාගෙන්
එක්කෙනෙක්ව සිටින්නේය; ඔහු
12 විනාශයට යන්නේය. තුඹ දුටු අං දසය
නම්, තවම කිසි රාජ්‍යයක් නොලැබූ
රජවරු දස දෙනෙක්ය; නුමුත් ඔව්හු
මෘගයා සමග එක පැයකට රජවරුන්
13 ලෙස ආණ්ඩුබලය ලබන්නෝය. මොව්හු
එක්සිත්ව තමුන්ගේ පරාක්‍රමයත්
14 බලයත් මෘගයාට දෙති. මොව්හු
බැටළුපැටවාණන්ට විරුද්ධව යුද්ධ-
කරන්නෝය, බැටළුපැටවාණෝ ඔවුන්
පරාජයකරනසේක, මක්නිසාද උන්-
වහන්සේ ස්වාමිවරුන්ගේ ස්වාමීන්-
වහන්සේය, රජවරුන්ගේ රජ්ජුරුවෝය;
උන්වහන්සේ සමග සිටින්නෝද
කැඳවාගත් තෝරාගත් විශ්වාස
15 තැනැත්තෝයයි කීවේය. ඔහු තවත් මට
කථාකොට: වේශ්‍යාව හිඳගන ඉන්න
තැන තුඹ දුටු ජලය නම් මනුෂ්‍ය
වර්ගයෝද සමූහයෝද ජාතීහුද
16 භාෂාවෝද වෙති. තුඹ දුටු අං දසයද
මෘගයාද වේශ්‍යාවට වෛරවී, ඈ පාළුද
නග්නද කර, ඇගේ මාංස කා, ඈ
සහමුලින් ගින්නෙන් දවන්නෝය.
17 මක්නිසාද දෙවියන්වහන්සේගේ වචන
සම්පූර්ණවන තුරු උන්වහන්සේගේ
කැමැත්ත කරන්ට එක්සිත්ව තමුන්ගේ
රාජ්‍යය මෘගයාට දෙන ලෙස
උන්වහන්සේ ඔවුන්ගේ සිත්
18 කැමතිකෙරෙවුසේක. තුඹ දුටු ස්ත්‍රී නම්
පොළොවේ රජුන් කෙරෙහි රජකම්කරන
මහත් නුවරයයි කීවේය.

## බබිලෝනිය වැටීම

18 ඉන්පසු මහත් බලය ඇතුව වෙන
දේවදූතයෙක් ස්වර්ගයෙන් බසිනවා
දුටිමි; ඔහුගේ තේජසින් පොළොව
ආලෝකවිය. ඔහු බලවත් හඬකින් 2
මොරගසා: මහා බබිලෝනිය
වැටුණාය, වැටුණාය, ඈ යක්ෂයන්ගේ
වාසස්ථානයක්ද සියලු අශුද්ධාත්මයන්ගේ
හිරගෙයක්ද සියලු අපවිත්‍රවූ පිළිකුල්වූ
පක්ෂීන්ගේ හිරගෙයක්ද වූවාය.
මක්නිසාද සියලු ජාතීහු ඇගේ 3
වේශ්‍යාකමේ උදහස නමැති මුද්‍රිකපානය
බී වැටුණෝය; පොළොවේ රජවරු ඈ
සමග වේශ්‍යාකම්කළෝය, පොළොවේ
වෙළෙන්දෝ ඇගේ සැපජීවිකාවේ
අධිකකමෙන් ධනවත් වූවෝයයි කීවේය.
තවද: මාගේ සෙනඟෙනි, ඇගේ 4
පාපවලට හවුල් නොවන පිණිසත්, ඇගේ
පීඩාවලට අසු නොවන පිණිසත්, ඇගෙන්
ඉවත්ව වරෙල්ලායයි කියන වෙන හඬක්
ස්වර්ගයෙන් මට ඇසුණේය. මක්නිසාද 5
ඇගේ පව් ස්වර්ගය දක්වා නැංගේය,
දෙවියන්වහන්සේද ඇගේ අපරාධ
සිහිකළසේක. ඈ දුන් ලෙස ඈට ප්‍රතිඵල 6
දී, ඇගේ ක්‍රියා හැටියට දෙගුණයක්
ඈට දීපල්ලා. ඈ මිශ්‍රකරදුන්
කුසලානෙහි දෙපංගුවක් මිශ්‍රකර ඈට
දීපල්ලා. ඈ යම් පමණක් තමාම 7
වර්ණනාකරගනිමින් සැපජීවිකාවෙන්
වැඩිවූවාද, එපමණටම ඈට ශෝකය
හා වධ දීපල්ලා. මක්නිසාද: මම
බිසවක්ව වැඩහිඳිමි, මම වැන්දඹුවක්
නොවෙමි, ශෝකයද කිසිසේත් නොදකිමියි
ඈ සිතින් කියාගන්නීය. එබැවින් 8
මරණයද ශෝකයද සාගතයද යන ඇගේ
පීඩා එක දවසේම පැමිණෙන්නේය; ඈ
සහමුලින් ගින්නෙන් දවනු ලබන්නීය;
මක්නිසාද ඈ විනිශ්චයකළ ස්වාමිවූ
දෙවියන්වහන්සේ බලවත්ව සිටිනසේක.
ඈ සමග වේශ්‍යාකම්කොට 9
සැපජීවිකාවෙන් විසූ පොළොවේ රජවරු
ඇගේ දැවීමේ දුම දකින කල, ඇගේ
වේදනාවට භයින් දුරින් සිට: අහෝ, 10

අහෝ, මහත් නුවර, බබිලෝනිය, බලවත්
නුවර! එක පැයකින් නුඹේ විනිශ්වය
පැමුණුණේයයි කියමින් ඈ ගැන අඬා
11 විලාපකියති. පොළොවේ වෙළෙන්දෝද
කිසිවෙක් ඔවුන්ගේ වෙළඳම් බඩු
නොගන්න බැවින් ඈ ගැන අඬා
12 ශෝකවෙති. ඒ බඩු නම්: රන් රිදී බඩුද
අනර්ඝ ගල්ද මුතුද සිහින් රෙදිද රත්නිල්
වස්ත්‍රද පටරෙදිද රක්ත වස්ත්‍රද; සියලු
ආකාර සුවඳ ලීද සියලු ඇත්දත් භාජනද
ඉතා අනර්ඝ ලීයෙන් පිත්තලෙන් යකඩින්
සහ කිරිගරුඬවලින් සෑදූ සියලු ආකාර
13 භාජනද; කුරුඳුද කුළු බඩුද සුගන්ධ
ද්‍රව්‍යද තෛලද කට්ටකුමංචල්ද
මුද්‍රිකපානයද තෙල්ද සිහින් පිටිද ධාන්‍යද
ගවයන්ද බැටළුවන්ද; අශ්වයන් සහ රථද
වහලුන්ද මනුෂ්‍යයන්ගේ ප්‍රාණද යන
14 මේවාය. තිගේ ආත්මය ආශාකළ ඵල
තී කෙරෙන් පහව ගියේය, ශෝභනවූ
ඉසුරුමත්වූ සියල්ල තී කෙරෙන්
විනාශවිය, මනුෂ්‍යයන්ට ඒවා තවත්
15 සම්බ නොවේ. ඈ කරණකොටගෙන
පොහොසත්වූ මේ බඩු වෙළෙන්දෝ ඈ
විඳින වධයට භයව, අඬමින් වැලපෙමින්,
16 දුරින් සිට: අහෝ, අහෝ, මහත් නුවර,
සිහින් රෙදිද රත්නිල් සහ රක්ත වස්ත්‍රද
පැළඳ රනින්ද අනර්ඝ මැණික් සහ
17 මුතුවලින්ද සැරසුණාවූ නුවර! එක
පැයකින් එපමණ මහත් ධනය
නැතිවී ගියේයයි කියති. සියලු
නැව් මුලාදෑනිවරුද යම් තැනකට
යාත්‍රාකරන්නෝද නාවිකයෝද මුහුදේ
වැඩපළ කරන සියල්ලෝද දුරින් සිට,
18 ඇගේ දැවීමේ දුම බලා: මේ මහත් නුවරට
සමාන නුවර කොයි එකදැයි කියමින්
19 මොරගැසුවෝය. ඔව්හු තමුන්ගේ හිස්
පිට ධූලි හෙළා, හඬමින් වැලපෙමින්:
අහෝ, අහෝ, ඒ මහත් නුවර! ඇගේ
වස්තුව හේතුකොටගෙන මුහුදේ නැව්
ඇත්තාවූ සියල්ලෝ ඇගෙන් ධනවත්
වූවෝය. එක පැයකින් ඈ පාළුවූණාය
20 කියමින් මොරගැසුවෝය. ස්වර්ගය
සහ ශුද්ධවන්තයෙනි, ප්‍රේරිතයෙනි,
ප්‍රොපේතවරුනි, ඈ ගැන ප්‍රීතිවෙයල්ලා;
මක්නිසාද ඈ නුඹලාට කළ
විනිශ්වයෙන්ම දෙවියන්වහන්සේ ඈ
විනිශ්වයකළසේක.
තවද බලවත්වූ දේවදූතයෙක් මහත් 21
ඇඹරුම් ගලක් වැනිවූ ගලක් ගෙන
මුහුදේ හෙළා: ඒ මහත් නුවරවූ
බබිලෝනිය මහත් වැටීමකින් මෙසේ
හෙළනු ලබන්නීය, තවත් කිසිසේත්
සම්බනොවන්නීය. වීණාකාරයන්ගේද 22
තූර්ය නාද පවත්වන්නන්ගේද
නළාකාරයන්ගේද හොරණෑකාරයන්ගේද
හඬ තී තුළ තවත් නොඇසෙන්නේය;
කොයි ආකාර කර්මාන්තකාරයෙක්වත්
තී තුළ තවත් සම්බ නොවන්නේය;
ඇඹරුම් ගලේ හඬ තී තුළ තවත්
නොඇසෙන්නේය; පහනක එළිය තී 23
තුළ තවත් නොබැබළෙන්නේය;
මනමාලයාගේවත් මනමාලීගේවත් හඬ
තී තුළ තවත් නොඇසෙන්නේය.
මක්නිසාද තිගේ වෙළෙන්දෝ පොළොවේ
උත්තමයෝව සිටියෝය; තිගේ
මායමින්ද සියලු ජාතීහු රැවටුණෝය;
ප්‍රොපේතවරුන්ගේද ශුද්ධවන්තයන්ගේද 24
පොළොවේ මරනලද සියල්ලන්ගේද ලේ
ඈ තුළ සම්බවුණේයයි කීවේය.

## ස්වර්ගයෙහි ජයග්‍රහණය හා බැටළු පැටියාණන්ගේ සරණමංගල්‍යය

19
මින්පසු ස්වර්ගයෙහි සිටින මහත්
සමූහයකුගේ හඬ මෙන් මහත්
හඬක් මට ඇසුණේය. ඔව්හු කථාකොට:
*හලෙලූයා! ගැළවීමද මහිමයද බලයද
අපගේ දෙවියන්වහන්සේට අයිතිය.
මක්නිසාද උන්වහන්සේගේ විනිශ්වයෝ 2
සැබෑය, ධර්මිෂ්ඨය; මක්නිසාද ඇගේ
වේශ්‍යාකමින් පොළොව කිලුටුකළ මහත්
වේශ්‍යාව උන්වහන්සේ විනිශ්වයකළසේක,
තමන්ගේ මෙහෙකරුවන්ගේ ලේ ගැන
ඇට විපාක දුන්සේකැයි කීවෝය.
දෙවෙනි වරක්ද ඔව්හු: *හලෙලූයා කියති. 3
ඇගේ දුම සදාකාලේටම නගින්නේය.
වැඩිමහල්ලන් විසිසතරදෙනාද ජීවමාන 4

*එනම්: ස්වාමීන්වහන්සේට වර්ණනා කරපල්ලා.

සත්ත්වයන් සතරදෙනාද වැටී: ආමෙන්;
*හලෙලූයා කියමින් සිංහාසනයේ
වැඩහිඳින දෙවියන්වහන්සේට නමස්කාර-
5 කළෝය. තවද: අපේ දෙවියන්වහන්සේගේ
සියලු මෙහෙකරුවෙනි, උන්වහන්සේට
භය ඇති ලොකු කුඩා සියල්ලෙනි,
උන්වහන්සේට ප්‍රශංසාකරපල්ලායයි
කියන ශබ්දයක් සිංහාසනයෙන්
6 නික්මුණේය. එවිට මහත් සමූහයකුගේ
හඬ මෙන්ද බොහෝ ජලඝෝෂාවක්
මෙන්ද බලවත් ගර්ජනාවල ශබ්දය
මෙන්ද හඬක් මට ඇසුණේය. එනම්:
සර්වපරාක්‍රමවූ අපගේ දෙවිවූ ස්වාමීන්-
වහන්සේ රජකම්කරන බැවින්,
7 *හලෙලූයා. අපි අතිශයෙන් ප්‍රීති
සන්තෝෂවෙමු, උන්වහන්සේට ගෞරවය
දෙමු. මක්නිසාද බැටළු පැටවාණන්ගේ
සරණමංගල්‍යය පැමිණියේය, උන්-
වහන්සේගේ භාර්යාවද සූදානම්ව
8 සිටින්නීය යනුයි. දීප්තිමත්වූ පවිත්‍රවූ සිහින්
වස්ත්‍රයෙන් පැළඳෙන්ට ඇට ලැබුණේය.
සිහින් වස්ත්‍ර නම් ශුද්ධවන්තයින්ගේ
9 ධර්මිෂ්ඨ ක්‍රියාය. තවද: බැටළු-
පැටවාණන්ගේ සරණමංගල්‍ය කෑමට
කැඳවනලද්දෝ වාසනාවන්තයෝය කියා
10 ලියාපන්නැයි ඔහු මට කීවේය. මේවා
දෙවියන්වහන්සේගේ සැබෑ වචනයයිද
ඔහු මට කීවේය. මම ඔහුට නමස්කාර
කරන පිණිස ඔහුගේ පාමුල
වැටුණෙමි. ඔහුද: එසේ නොකරන්ට
බලාගනින්න. මම තුඹේද යේසුස්-
වහන්සේගේ සාක්ෂිය දරන තුඹේ
සහෝදරයන්ගේද හවුල් මෙහෙකරුවෙක්ය.
දෙවියන්වහන්සේට නමස්කාරකරපන්න.
මක්නිසාද, යේසුස්වහන්සේගේ සාක්ෂිය
අනාගතවාක්‍යයේ ආත්මයයයි මට
කීවේය.

## ක්‍රිස්තුස්වහන්සේ ජයගැනීම

11 එවිට ස්වර්ගය ඇරී තිබෙනවා දුටුමි;
බලව, සුදු අශ්වයෙක් සිටියේය.
විශ්වාසය, සැබෑයයි කියනු ලැබූ
තැනන්වහන්සේ ඌ පිට වැඩහුන්සේක;
උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් විනිශ්චයත්

*එනම්: ස්වාමීන්වහන්සේට වර්ණනා කරපල්ලා.

යුද්ධයත් කරනසේක. උන්වහන්සේගේ 12
ඇස් ගිනිදැල්ලක්ය. උන්වහන්සේගේ හිසේ
බොහෝ මකුට තිබේ; උන්වහන්සේම
මිස අන් කිසිවෙක් නොදන්නාවූ නමක්
උන්වහන්සේට එහි ලියා තිබේ. තවද 13
උන්වහන්සේ ලේ ඉසිනු ලැබූ වස්ත්‍රයක්
පැළඳ සිටිසේක. උන්වහන්සේගේ නාමය
දෙවියන්වහන්සේගේ වාක්‍යයාණෝයයි
කියනු ලැබේ. ස්වර්ගයෙහි සිටින 14
සේනාවෝ සුදුවූ පවිත්‍ර සිහින් වස්ත්‍ර
හැඳ, සුදු අශ්වයන් පිටින් උන්වහන්සේ
පස්සේ ගියෝය. ජාතීන්ට පහරදෙන 15
පිණිස උන්වහන්සේගේ මුඛයෙන් තියුණු
කඩුවක් නික්මෙයි. උන්වහන්සේ
යදණ්ඩකින් ඔවුන් ආණ්ඩුකරනසේක.
උන්වහන්සේ සර්වපරාක්‍රම දෙවියන්-
වහන්සේගේ කෝපයේ උදහස නැමති
මුද්‍රිකපැස මඩිනසේක. උන්වහන්සේගේ 16
වස්ත්‍රයෙහිද කළවයෙහිද රජවරුන්ගේ
රජය, ස්වාමිවරුන්ගේ ස්වාමීන්-
වහන්සේය යන නාමය ලියා තිබේ.

## උන්වහන්සේගේ සතුරන්ගේ විනාශය

තවද සූර්යයා තුළ දේවදූතයෙක් 17
සිටිනවා දුටිමි; ඔහුද ආකාශ මධ්‍යයෙහි
පියාසරකරන සියලු පක්ෂීන්ට මහත්
හඬින් මොරගසා: තෙපි රජුන්ගේ 18
මස්ද සේනාපතීන්ගේ මස්ද බලවත්
මනුෂ්‍යයන්ගේ මස්ද අශ්වයන් සහ
උන්පිට හිඳිනවුන්ගේ මස්ද දස නිර්දස
ලොකු කුඩා සියලු මනුෂ්‍යයන්ගේ මස්ද
කන පිණිස, දෙවියන්වහන්සේගේ මහත්
රාත්‍රි කෑමට ඇවිත් රැස්වෙයව්යයි කීවේය.
අශ්වයා පිට වැඩහුන් තැනන්වහන්සේටත් 19
උන්වහන්සේගේ සේනාවටත් විරුද්ධව
යුද්ධකිරීමට මෘගයාද පොළොවේ
රජවරුන්ද ඔවුන්ගේ සේනාවන්ද රැස්ව
සිටිනවා දුටිමි. එකල මෘගයාද ඌ 20
ඉදිරියෙහි ඒ හාස්කම්කර උගේ සලකුණ
ලැබූවන් සහ උගේ රූපයට
නමස්කාරකළවුන් රැවටුවාවූ බොරු
අනාගතවක්තෘද අල්ලනු ලැබුවෝය.
ඔවුන් දෙදෙනාම ගෙන්දගමින් දවෙන

ගිනිවිලට පණපිටින් හෙළනු ලැබුවෝය.
21 අනික් අය අශ්වයා පිට වැඩහුන්
තැනන්වහන්සේගේ කඩුවෙන්, එනම්
උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු
කඩුවෙන්, මරනු ලැබුවෝය. ඔවුන්ගේ
මාංසවලින් සියලු පක්ෂීහු තෘප්තියට
පැමුණුණෝය.

## අවුරුදු දහසකට සාතන් බඳිනු ලැබීම

20 තවද පාතාලයේ යතුරුද අතේ
මහත් දම්වැලක්ද ඇතුව
දේවදූතයෙක් ස්වර්ගයෙන් බැස එනවා
2 දුටිමි. ඔහු යක්ෂයාද සාතන්දවූ පුරාණ
සර්පයා වන ඒ මහා සර්පයා අල්ලා
3 අවුරුදු දහසකට බැන්දේය, ඒ අවුරුදු
දහස කෙළවරවන තුරු ඔහු විසින්
ජාතීන් තවත් නොරවටන පිණිස ඔහු
පාතාලයට හෙළා, ඒක වසා, ඔහු
මතුයෙහි ඒක මුද්‍රාකෙළේය. මින්පසු
ස්වල්ප කලකට ඔහු මුදනු ලබන්ට
ඕනෑය.
4 තවද සිංහාසන දුටිමි, ඔව්හු එහි
හිඳගත්තෝය, විනිශ්වයද ඔවුන්ට දෙන
ලද්දේය. තවද යේසුස්වහන්සේගේ
සාක්ෂිය නිසාද දෙවියන්වහන්සේගේ
වචනය නිසාද හිස් කපාදමනු
ලැබූවන්ගේද, මෘගයාටවත් උගේ
රූපයටවත් නමස්කාර නොකළාවූ, උගේ
සලකුණ තමුන්ගේ නළල්වලත්
අත්වලත් නොලැබුවාවූ තැනත්තන්ගේද
ආත්මයන් දුටිමි; ඔව්හු ජීවත්ව
ක්‍රිස්තුස්වහන්සේ සමග අවුරුදු දහසක්
5 රජකම්කළෝය. මළාවූ අනික් අය
අවුරුදු දහස කෙළවරවන තුරු ජීවත්
නූණෝය. මේ වනාහි පළමුවෙනි නැවත-
6 නැගිටීමය. පළමුවෙනි නැවත-නැගිටීමට
පංගුකාරකම ඇති තැනැත්තා
වාසනාවන්තය, ශුද්ධය. ඔවුන්
කෙරෙහි දෙවෙනි මරණයට බලය
නැත්තේය; ඔව්හු දෙවියන්වහන්සේගේත්
ක්‍රිස්තුස්වහන්සේගේත් පූජකයෝව,
උන්වහන්සේ හා සමග අවුරුදු දහසක්
රජකම් කරන්නෝය.

## සාතන් නිදහස්කිරීම. අන්තිම සටන

අවුරුදු දහස කෙළවරවූ කල සාතන් 7
තමාගේ හිරගෙයින් මුදනු ලැබ,
පොළොවේ සතර කොනේ සිටින්නාවූ 8
ගොග් මාගොග් යන ජාතීන්
මුළාකරන්ටත් ඔවුන් යුද්ධයට
රැස්කරන්ටත් නික්ම එන්නේය. ඔවුන්ගේ
ගණන මුහුදේ වැලි මෙන්ය. ඔව්හු 9
පොළොවේ සෑම තැනටම ගොස්
ශුද්ධවන්තයන්ගේ අන්දයමද ප්‍රියවූ නුවරද
වටලා ගත්තෝය. එවිට [දෙවියන්වහන්සේ
වෙතින්] ස්වර්ගයෙන් ගිනි බැස ඔවුන්
විනාශකෙළේය. ඔවුන් මුළාකළ 10
යක්ෂයා වනාහි, මෘගයාද බොරු
අනාගතවක්තෘද වසන, ගින්නෙන්ද
ගෙන්දගම්න්ද යුත් විලට හෙළනු
ලැබුවේය; ඔව්හු සදාකාලේටම දිවා රෑ
දෙක්හි වධකරනු ලබති.

## සාමාන්‍ය මළවුන්ගෙන් නැගිටීම සහ අන්තිම විනිශ්වය

තවද මහත් සුදු සිංහාසනයක්ද එහි 11
වැඩහුන් තැනන්වහන්සේද දුටිමි,
උන්වහන්සේගේ අභිමුඛයෙන් අහසත්
පොළොවත් පලාගියේය; ඒවාට
ස්ථානයක් සම්බ නූණේය. මළාවූ ලොකු 12
අයද කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි
සිටිනවා දුටිමි; පොත්ද දිගහරිනු
ලැබුවේය. ජීවන-පොත වන තවත්
පොතක් දිගහරිනු ලැබීය. මළාහු
තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියනලද
දේවලින් විනිශ්වයකරනු ලැබුවෝය.
සමුද්‍රය එහි උන් මළවුන් පාවාදුන්නේය. 13
මරණයත් *පාතාලයත් එහි උන් මළවුන්
පාවාදුන්නෝය. ඔව්හු එකිනෙකා තම
තමාගේ ක්‍රියා ලෙස විනිශ්වයකරනු
ලැබුවෝය. මරණයත් *පාතාලයත් 14
ගිනිවිලට හෙළනලද්දේය. මෙය දෙවෙනි
මරණයය, එනම් ගිනිවිලය. යමෙකුගේ 15
නම ජීවන-පොතෙහි ලියා නැති බව
සම්බවීද, ඔහු ගිනිවිලට හෙළනු
ලැබුවේය.

*ග්‍රීක්: හේදිසය.

## අලුත් අහස සහ අලුත් පොළොව

21 අලුත් අහසක්ද අලුත් පොළොවක්ද
දුටිමි. මක්නිසාද පළමු අහසත්
පළමු පොළොවත් පහව ගියේය; මුහුදද
2 තවත් නොවීය. තවද තමාගේ පුරුෂයාට
සරසනලද මනමාලියෙකු මෙන්
සූදනම්කරනු ලැබූ ශුද්ධ නුවර, එනම්
අලුත් යෙරුසලම, දෙවියන්වහන්සේ
3 වෙතින් ස්වර්ගයෙන් බසිනවා දුටිමි. තවද:
මෙන්න, දෙවියන්වහන්සේගේ මණ්ඩපය
මනුෂ්‍යයන් සමගය, උන්වහන්සේ ඔවුන්
සමග වාසයකරනසේක, ඔව්හු
උන්වහන්සේගේ සෙනඟ වන්නෝය,
දෙවියන්වහන්සේම ඔවුන් සමග සිට
ඔවුන්ගේ දෙවියන්වහන්සේ වනසේක.
4 උන්වහන්සේ ඔවුන්ගේ ඇස්වලින් සියලු
කඳුළු පිසදමනසේක; මරණය තවත්
නොවන්නේය; වැලපීමත් හැඬීමත්
වේදනාවත් තවත් නොවන්නේය.
මක්නිසාද පළමු දේවල් පහව ගියේයයි
සිංහාසනයෙන් කියන මහත් හඬක් මට
5 ඇසුණේය. සිංහාසනය පිට වැඩහුන්
තැනන්වහන්සේ කථාකොට: බලව,
සියල්ල අලුත්කරමියි කීසේක. තවද
උන්වහන්සේ කථාකොට: ලියාපන්න.
මක්නිසාද මේ වචන විශ්වාසය,
6 සැබෑයයි කීසේක. උන්වහන්සේ මට
කථාකොට: ඒවා ඉෂ්ටවුණේය. මම
අල්ෆා සහ ඕමෙගාය, පටන්ගැන්ම හා
අන්තිමය. පිපාසාය ඇත්තාට මම
ජීවන-වතුර-උල්පතෙන් නොමිලයේ
7 බොන්ට දෙන්නෙමි. ජයගන්නා මේ
දේවල් උරුමකරගන්නේය; මම ඔහුගේ
දෙවියන්වහන්සේ වන්නෙමි, ඔහු මාගේ
8 පුත්‍රයා වන්නේය. නුමුත් භය ඇත්තන්ටත්
අවිශ්වාස කරන්නන්ටත් පිළිකුල්ව
සිටින්නන්ටත් මිනීමරන්නන්ටත් වේශ්‍යා-
කම්කරන්නන්ටත් මායාකාරයන්ටත්
රූපවඳින්නන්ටත් සියලු බොරුකාරයන්ටත්
ගින්නෙනුත් ගෙන්දගම්තුත් දැවෙන විලෙහි
තමුන්ගේ කොටස වන්නේය; එය
දෙවෙනි මරණයයි මට කීසේක.

## ස්වර්ගය යෙරුසලම

අන්තිම පීඩා සත සහ පාත්‍රා සත 9
දරූ දේවදූතයන් සත්දෙනාගෙන්
එක්කෙනෙක් ඇවිත් මා සමග
කථාකොට: මෙහි වරෙන්න,
බැටළුපැටවාණන්ගේ භාර්යාව වන
මනමාලී නුඹට පෙන්වන්නෙමියි කීවේය.
ඔහු මහත්වූ උස්වූ කන්දකට 10
ආත්මයාණන්ගේ ආනුභාවයෙන් මා
ගෙනගොස්, ශුද්ධ නුවරවූ යෙරුසලම
දෙවියන්වහන්සේගේ තේජස ඇතුව
දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන්
බසිනවා මට පෙන්නුවේය. ඇගේ 11
ආලෝකය ඉතා අනර්ඝවූ මාණික්‍ය-
යකට සමානය; එනම් පළිඟු මෙන්
පැහැදිලිවූ සූර්යකාන්ති ගලක්
වාගේය. මහත්වූ උස්වූ පවුරක්ද දොරටු 12
දොළොසක්ද ඊට තිබුණේය, දොරටු ළඟ
දේවදූතයෝ දොළොස්දෙනෙක් සිටියෝය;
ඒ පිට නාම ලියා තිබුණේය, ඒ නාම
වනාහි ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ දොළොස්
ගෝත්‍රයන්ගේ නාමවල්ය. නැගෙනහිරින් 13
දොරටු තුනක්ද, උතුරෙන් දොරටු තුනක්ද,
දකුණෙන් දොරටු තුනක්ද, බස්නාහිරින්
දොරටු තුනක්ද තිබුණේය. නුවර පවුරට 14
අත්තිවාරම් දොළොසක් තිබුණේය, ඒවා
පිට බැටළු පැටවාණන්ගේ ප්‍රේරිතයන්
දොළොස්දෙනාගේ නාම දොළොස ලියා
තිබුණේය. මා සමග කථාකළ 15
තැනැත්තාට නුවරද එහි දොරටුද එහි
පවුරද මනින පිණිස මිම්මක් කොට රන්
දණ්ඩක් තිබුණේය. නුවර සතරැස්ව 16
පිහිටා තිබේ, එහි දිගද පළලේ ප්‍රමාණයට
තිබේ. ඔහු දණ්ඩෙන් නුවර මැන්නේය.
එය පර්ලොං දොළොස් දහසක්ය. එහි
දිගත් පළලත් උසත් එක සමානය. ඔහු 17
එහි පවුර මැන්නේය, ඒක මිනිහෙකුගේ
එනම් දේවදූතයෙකුගේ මිම්මෙන් එකසිය
හතළිස්හතර රියනක්ය. එහි පවුර 18
සූර්යකාන්තිවලින් ගොඩනගා තිබුණේය.
නුවරද පවිත්‍ර වීදුරුවලට සමානවූ පවිත්‍ර
රන්ය. නුවර පවුරේ අත්තිවාරම් සියලු 19
ආකාර අනර්ඝ ගල්වලින් සරසා
තිබුණේය. පළමුවෙනි අත්තිවාරම
සූර්යකාන්තියය; දෙවෙනි එක
නීලකාන්තියය; තුන්වෙනි එක
වර්ණකාන්තියය; සතරවෙනි එක

20 මරකතයය; පස්වෙනි එක නාබ-
මාණික්‍යය; සවෙනි එක ලෝහිතංකයය;
සත්වෙනි එක රත්කාන්තියය; අටවෙනි
එක වෛදූර්යය; නවවෙනි එක පුෂ්ප-
රාගයය; දසවෙනි එක ගෝමේදයය;
එකළොස්වෙනි එක පද්මරාගයය;
21 දෙළොස්වෙනි එක අඹතෙස්ය. දෙරටු
දෙළොස මුතු දෙළොසක්ය; එක එක
දෙරටුව එක එක මුතු ඇටයකින් සාද
තිබුණේය. නුවර වීථිය විනිවිද පෙනෙන
22 වීදුරු මෙන් පවිත්‍ර රන්ය. මම එහි
දේවමාළිගාවක් නුදුටිමි. මක්නිසාද
සර්වපරාක්‍රමවූ ස්වාමිවූ දෙවියන්-
වහන්සේද බැටළුපැටවාණෝද එහි
23 දේවමාළිගාවය. දෙවියන්වහන්සේගේ
තේජසින් නුවර ආලෝකවූ බැවින්ද
බැටළුපැටවාණන් එහි පහන වන බැවින්ද
එහි බැබළීමට සූර්යයාවත් චන්ද්‍රයාවත්
24 ඕනෑ නැත. ජාතීහු එහි එළියෙහි ඇවිදිති.
පොළොවේ රජවරු තමුන්ගේ තේජස
25 ඊට ගෙනෙති. එහි දෙරටු දවාලේ
කිසිසේත් වසනු නොලබන්නේය.
මක්නිසාද එහි රාත්‍රියක් නොවන්නේය.
26 ඔව්හු ජාතීන්ගේ තේජසත් ගෞරවයත්
27 ඊට ගෙනෙනවා ඇත. බැටළුපැටවා-
ණන්ගේ ජීවන-පොතෙහි ලියනලද්දවුන්
මිස අපවිත්‍ර දෙයක්වත් පිළිකුල්වූ බොරුවූ
දෙයක් කරන්නෙක්වත් කිසිසේත් එහි
ඇතුල් නොවන්නේය.

## ජීවන-වෘක්ෂය සහ නුවර ආලෝකය

**22** තවද දෙවියන්වහන්සේගේද
බැටළුපැටවාණන්ගේද සිංහාසනයෙන්
නික්ම එන්නාවූ පළිඟු මෙන් දීප්තිමත්වූ
2 ජීවනදායක වතුර ඇති ගංගාවක්, එහි
වීථිය මැද ඔහු මට පෙන්වීය. ගඟේ
මේ පැත්තේද ඒ පැත්තේද දෙළොස්
ආකාරයක එල දරන, මාස්පතා එල
දෙන, ජීවන-වෘක්ෂය තිබුණේය. ඒ
වෘක්ෂයේ කොළ ජාතීන්ගේ සුවවීම
3 පිණිසය. කිසි ශාපයක් තවත්
නොවන්නේය. එහි දෙවියන්වහන්සේ-
ගේද බැටළුපැටවාණන්ගේද සිංහාසනය
වන්නේය. උන්වහන්සේගේ මෙහෙකරුවෝ
උන්වහන්සේට මෙහෙකරන්නෝය; ඔව්හු 4
උන්වහන්සේගේ මුහුණ දකින්නෝය;
උන්වහන්සේගේ නාමයද ඔවුන්ගේ
නළල්වල තිබෙන්නේය. එහි රාත්‍රියක් 5
තවත් නොවන්නේය. පහන් ආලෝකයවත්
සූර්යාලෝකයවත් ඔවුන්ට ඕනෑ නැත;
මක්නිසාද ස්වාමිවූ දෙවියන්වහන්සේ
ඔවුන්ට ආලෝකය දෙනසේක.
ඔව්හු සදාකාලේටම රජකම්කරන්නෝය.

## අවසානය

තවද ඔහු මට කථාකොට: මේ වචන 6
විශ්වාසය, සැබෑයයි කීයේය. ටික
කලකින් සිදුවෙන්ට ඕනෑ දේ තමන්ගේ
මෙහෙකරුවන්ට පෙන්වන පිණිස
අනාගතවක්තෘවරුන්ගේ ආත්මවල
දෙවිවූ ස්වාමීන්වහන්සේ තමන් දූතයා
එවූසේකැයි මට කීයේය. මෙන්න, 7
ඉක්මනින් එමි. මේ පොතේ අනාගත-
වාක්‍යයේ වචන රක්ෂාකරන්නා
ආශීර්වාද ලද්දෙකැයි කීයේය.
මේ දේ ඇසුවාවූ දුටුවාවූ තැනැත්තා 8
යොහන් නම් මමය. මම ඇසූ දුටු කල
මේ දේ මට පෙන්වූ දේවදූතයාට
නමස්කාරකරන්ට ඔහුගේ පාමුල
වැටුණෙමි. ඔහු මට කථාකොට: එසේ 9
නොකරන්ට බලාගනින්න. මම නුඹේද
නුඹේ සහෝදරවූ ප්‍රොපේතවරුන්ගේද
මේ පොතේ වචන රක්ෂාකරන්නන්ගේද
හවුල් මෙහෙකරුවෙක්ය. දෙවියන්-
වහන්සේට නමස්කාරකරපන්නැයි කීවේය.
තවද ඔහු මට කථාකොට: මේ පොතේ 10
අනාගතවාක්‍යයේ වචන මුද්‍රා
නොකරන්න; මක්නිසාද කාලය
ආසන්නය. අධර්මිෂ්ඨ තැනැත්තා මතුත් 11
අධර්මිෂ්ඨකම් කරාවා. අපවිත්‍ර තැනැත්තා
මතුත් අපවිත්‍රකරනු ලබාවා. ධර්මිෂ්ඨ
තැනැත්තා මතුත් ධර්මිෂ්ඨකම් කරාවා.
ශුද්ධ තැනැත්තා මතුත් ශුද්ධකරනු
ලබාවා. මෙන්න, ඉක්මනින් එමි; 12
එකිනෙකාට තම තමාගේ ක්‍රියාවේ

හැටියට දෙන පිණිස මා සමග විපාක
13 තිබේ. මම අල්ෆා සහ ඕමෙගාය,
පළමුවෙනියා සහ අන්තිමයාය,
14 පටන්ගැන්ම සහ කෙළවරය. ජීවන-
වෘක්ෂයට පැමිණෙන්ට අයිතිවාසිකම
ලැබෙන පිණිසත් දෙරටුවලින් නුවරට
ඇතුල්වන්ට පුළුවන්වන පිණිසත් තමුන්ගේ
සළු සෝදගන්නාවූ තැනැත්තෝ
15 ආශීර්වාදලද්දෝය. පිටත සිටින්නෝ
නම් බල්ලෝද මායම්කාරයෝද
වේශ්‍යාකම්කරන්නෝද මිනීමරන්නෝද
රූප වඳින්නෝද බොරුවකට
ප්‍රියවන්නාවූ, එය කරන්නාවූ සියල්ලෝද
වෙති.
16 යේසුස් වන මම සභාවන් උදෙසා මේ
දේවල් ගැන නුඹලාට සාක්ෂිදෙන්ට
මාගේ දූතයා එවීමි. මම වනාහි දවිත්ගේ
මුල සහ වංශයය, දීප්තිමත් පහන්
තාරකාවය.
17 ආත්මයාණන්වහන්සේද මනමාලීද:
වරෙන්නැයි කියති. අසන්නාද: වරෙන්නැයි
කියාවා. පිපාසා ඇත්තාද ඒවා. කැමති
කෙනෙක් ජීවන-වතුර නොමිලයේ
ගනීවා.
මේ පොතේ අනාගතවාක්‍ය වචන අසන 18
සියල්ලන්ට මෙසේ සහතිකලෙස කියමි,
එනම්: යමෙක් ඒ වචනවලට යමක්
එකතුකරන්නේ නම්, දෙවියන්වහන්සේ
මේ පොතෙහි ලියනලද පීඩා
ඔහුට එකතුකරනසේක. යමෙක් මේ 19
අනාගතවාක්‍ය පොතේ වචනවලින් යමක්
අහක්කරන්නේ නම්, මේ පොතෙහි ලියා
තිබෙන ජීවන-වෘක්ෂයෙන්ද ශුද්ධ
නුවරින්ද දෙවියන්වහන්සේ ඔහුගේ
කොටස අහක්කරනසේක යනුයි.
මේ කාරණා ගැන සාක්ෂිදෙන 20
තැනන්වහන්සේ කථාකොට: එසේය, මම
ඉක්මනින් එමියි කියනසේක. ආමෙන්,
ස්වාමිවූ යේසුස්වහන්ස, වැඩිය මැනව.
ස්වාමිවූ යේසුස්වහන්සේගේ කරුණාව 21
ශුද්ධවන්තයන් හා සමග වේවා. ආමෙන්.